1	සුනාමියෙන් හානියට පත් සිවර වරායන් නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය		2/1/2005	ප්‍රදාන	යුආන්	150,000,000	යුආන්	150,000,000	1,800,750,000	18,207,786	-
2	බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ නායකයින්ගේ පිළිරූ ඉදිකිරීම		4/18/2005	ප්‍රදාන	යුආන්	2,000,000	යුආන්	2,000,000	24,022,400	241,166	-
3	පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - වරණීය ගැණුම්කරුගේ ණය පහසුකම		8/30/2005	ණය	ඇ.ඩො.	300,000,000	ඇ.ඩො.	300,000,000	30,245,850,000	300,000,000	60
4	පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය- වරණීය ගැනුම්කරුගේ ණය පහසුකම		9/8/2006	ණය	ඇ.ඩො.	155,000,000	ඇ.ඩො.	155,000,000	15,903,062,000	155,000,000	
5	පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - අදියර II		12/25/2009	ණය	ඇ.ඩො.	891,000,000	ඇ.ඩො.	891,000,000	101,909,283,300	891,000,000	
6	ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාවය		8/30/2005	ප්‍රදාන	යුආන්	50,000,000	යුආන්	50,000,000	621,140,000	6,160,911	-
7	තෝරාගත් මාර්ග යටිතල පහසුකම් මූලිකාංගයන්ගේ ශක්‍යතා අධ්‍යයනය		12/5/2005	ප්‍රදාන	යුආන්	500,000	යුආන්	500,000	6,313,150	61,907	-
8	ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාවය		3/15/2006	ප්‍රදාන	යුආන්	20,000,000	යුආන්	20,000,000	255,040,000	2,482,877	-
9	දකුණු ආසියානු ක්‍රීඩා සඳහා සහයෝගය		3/15/2006	ප්‍රදාන	යුආන්	3,500,000	යුආන්	3,500,000	44,632,000	434,504	-
10	තෝරාගත් මාර්ග යටිතල පහසුකම් මූලිකාංගයන් ඉදිකිරීම		4/20/2006	ප්‍රදාන	ඇ.ඩො.	10,000,000	ඇ.ඩො.	10,000,000	1,026,975,000	10,000,000	-
11	බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පහසුකම් උත්ශ්‍රේණිගත කිරීම		9/19/2006	ප්‍රදාන	යුආන්	500,000	යුආන්	500,000	6,447,600	62,909	-
12	බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ නඩත්තුව සඳහා තාක්ෂණික මඟපෙන්වීම		10/21/2006	ප්‍රදාන	යුආන්	500,000	යුආන්	500,000	6,565,100	61,721	-
13	ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාවය		12/22/2006	ප්‍රදාන	යුආන්	40,000,000	යුආන්	40,000,000	550,972,000	5,123,662	-
14	ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාවය		2/27/2007	ප්‍රදාන	යුආන්	50,000,000	යුආන්	50,000,000	698,820,000	6,425,789	-
15	මඟී දුම්රිය අංගන 100ක් සැපයීම		5/15/2007	ණය	යුආන්	210,000,000	යුආන්	210,000,000	3,003,357,000	27,078,543	28
16	ඩීසල් බහුකාර්ය ඒකක 15ක් සැපයීම		5/15/2007	ණය	යුආන්	360,854,983	යුආන්	300,000,000	4,290,510,000	38,683,633	53
17	බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ නඩත්තුව		6/13/2007	ප්‍රදාන	ඇ.ඩො.	7,200,000	ඇ.ඩො.	7,200,000	798,343,200	7,200,000	120
18	හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය		10/30/2007	ණය	ඇ.ඩො.	306,726,736	ඇ.ඩො.	306,726,736	34,208,650,057	306,726,736	154
19	හම්බන්තොට බංකර පහසුකම් හා තටාකාංගන ව්‍යාපෘතිය		8/6/2009	ණය	ඇ.ඩො.	76,581,774	ඇ.ඩො.	65,094,508	7,479,404,524	65,094,508	17
20	කොළඹ කටුනායක අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	ඒ1 කොටස	8/6/2009	ණය	ඇ.ඩො.	74,792,723	ඇ.ඩො.	63,573,815	7,304,675,793	63,573,815	500
21		ඒ2 කොටස	8/6/2009	ණය	ඇ.ඩො.	82,401,797	ඇ.ඩො.	70,041,527	8,047,820,533	70,041,527	
22		ඒ3 කොටස	8/6/2009	ණය	ඇ.ඩො.	56,238,875	ඇ.ඩො.	47,801,344	5,492,407,858	47,801,344	
23		ඒ4 කොටස	8/6/2009	ණය	ඇ.ඩො.	78,568,605	ඇ.ඩො.	66,783,314	7,673,449,556	66,783,314	

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

24	ඉහළ උසාවි සංකීර්ණය අත්තිවැඩියාව හා නැවත සකස්කිරීම		8/25/2009	ප්‍රදාන	යුආන්	200,000	යුආන්	200,000	3,363,280	29,292	-
25	යන්ත්‍රසූත්‍ර හා උපකරණ පරීක්ෂාගය		11/23/2009	ප්‍රදාන	යුආන්	16,466,000	යුආන්	16,466,000	276,865,910	2,423,118	-
26	මත්තල හම්බන්තොට ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ව්‍යාපෘතිය		3/5/2010	ණය	ඇ.ඩො.	209,000,000	යුආන්	1,300,000,000	21,792,810,000	190,785,771	-
27	ශ්‍රී ලංකා ගුවන්විය දෙපාර්තමේන්තුවට ඩීසල් එන්ජින් ඒකක 13ක් සැපයීම		3/5/2010	ණය	ඇ.ඩො.	101,049,800	යුආන්	700,000,000	11,734,590,000	102,749,300	20
28	එම්. ඒ. 60 ගුවන්යානා 2ක් සැපයීම		9/9/2010	ණය	ඇ.ඩො.	105,400,000	යුආන්	280,000,000	4,634,868,000	41,114,296	-
29	උතුරු පළාතේ විදුලිබල අංශයේ සංවර්ධනය සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදන වැඩසටහන		9/9/2010	ණය	ඇ.ඩො.	37,246,343	ඇ.ඩො.	31,659,392	3,569,004,397	31,659,392	-
30	උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය	ඒ9 මාර්ගයේ ගල්කුළම සිට කි.මී. 230 කණුව සිට යාපනය දක්වා	9/9/2010	ණය	ඇ.ඩො.	83,554,722	ඇ.ඩො.	71,021,514	8,006,347,601	71,021,514	101
31		බී 11	9/9/2010	ණය	ඇ.ඩො.	50,011,357	ඇ.ඩො.	42,509,700	4,792,173,744	42,509,700	
32		ඒ 11 (මුලතිවු සිට කෝකිලායි දක්වා)	9/9/2010	ණය	ඇ.ඩො.	50,326,187	ඇ.ඩො.	42,777,300	4,822,340,639	42,777,300	
33		(ඒ32U) (ඒ32)(ඒ316)(ඒ318)	9/9/2010	ණය	ඇ.ඩො.	75,420,000	ඇ.ඩො.	75,420,000	8,502,194,646	75,420,000	
34		ඒ9 මාර්ගයේ කි.මී. 230 කණුව සිට යාපනය දක්වා	9/9/2010	ණය	ඇ.ඩො.	80,039,355	ඇ.ඩො.	70,583,452	7,956,964,302	70,583,452	
35	ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාවය 2010		11/17/2010	ප්‍රදාන	යුආන්	50,000,000	යුආන්	50,000,000	836,320,000	7,487,439	-
36	ප්‍රමුඛ මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම 1		12/16/2010	ණය	ඇ.ඩො.	152,800,000	ඇ.ඩො.	152,800,000	16,951,525,040	152,800,000	91
37	ප්‍රමුඛ මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම 2		3/31/2011	ණය	ඇ.ඩො.	500,000,000	ඇ.ඩො.	500,000,000	55,196,450,000	500,000,000	422
38	දක්ෂිණ අධිවේගී මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය	පින්නදූව සිට කොඩගොඩ දක්වා කොටස (කි.මී. 30 සිට කි.මී. 45)	2/17/2011	ණය	ඇ.ඩො.	88,400,000	ඇ.ඩො.	75,140,000	8,347,370,226	75,140,000	133
39		කොඩගොඩ සිට කොඩගම දක්වා කොටස (කි.මී. 45 සිට කි.මී. 61)	2/17/2011	ණය	ඇ.ඩො.	74,200,000	ඇ.ඩො.	63,070,000	7,006,503,063	63,070,000	
40	නවටකුලි - කරෙයිතිවු - හා මත්නාරම මාර්ගයේ කි.මී. 67ක කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම		4/29/2011	ණය	ඇ.ඩො.	56,903,310	ඇ.ඩො.	48,367,814	5,313,262,364	48,367,814	-
41	පුත්තලම - මඩිවිරිකඩේ - මත්නාරම මාර්ගයේ කි.මී. 113ක කොටසක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම		4/29/2011	ණය	ඇ.ඩො.	86,128,049	ඇ.ඩො.	73,208,841	8,042,079,085	73,208,841	-
42	උඩ පළාතේ විදුලිකරණය සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය		7/19/2011	ණය	ඇ.ඩො.	29,327,114	ඇ.ඩො.	24,928,047	2,729,573,770	24,928,047	-
								මුළු එකතුව	411,913,097,138	3,702,622,428	1,699

සටහන : යුආන් විනිමයෙන් අත්සන් කර ඇති ප්‍රමාණයන්, රුපියල් හා එක්සත් ජනපද ඩොලර් බවට පරිවර්තනය කිරීමේ දී ඒ ඒ මිවිසුම්ගත දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]

[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]

[This annex is also placed in the Library.]

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා පිළිතුරේ වැඩි කොටසක් සභාගත කළා. මේ ව්‍යාපෘති 42 තුළ මත්තල ගුවන් තොටුපොළ තිබෙනවා; නොරොච්චෝලේ විදුලි බලාගාරය තිබෙනවා; හම්බන්තොට වරාය තිබෙනවා. මේවා මූලික ව්‍යාපෘති ලෙස මම හඳුන්වනවා. මත්තල ගුවන් තොටුපොළ ඉදි කිරීම සඳහා අර ගෙන තිබෙන යූඑස් ඩොලර් මිලියන 208ක් cost overrun එකක් වෙලා තිබෙනවා කියලා දැන ගන්නට තිබෙනවා. මේ වාගේ ව්‍යාපෘති සඳහා වියදම් කර තිබෙන චීන ආධාර යටතේ ලබා ගත් රුපියල් බිලියන 38ක් -කෝටි 3800ක්- කොතරම් කාලයකින් ගෙවන්න අදහස් කර තිබෙනවාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා

(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)

(The Hon. (Dr.) Sarath Amunugama)

තමුන්නාන්සේ අහලා තිබෙන්නේ මෙහි සිටින සේවක සංඛ්‍යාව ගැනයි.

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

නැහැ, නැහැ. මගේ ප්‍රශ්නයේ පළමුවැනි කොටසින් අහලා තිබෙන්නේ ව්‍යාපෘති සංඛ්‍යාව ගැනයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා

(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)

(The Hon. (Dr.) Sarath Amunugama)

ඒ සේවක සංඛ්‍යාව මම තමුන්නාන්සේට ලබා දී තිබෙනවා. මත්තල ගැනත් සංඛ්‍යා ලේඛන මෙහි සඳහන් කර තිබෙනවා. ඒ යට කර තිබෙන මුදල් ආපසු ලබා ගන්නේ කොයි කාලයේද කියන එක මට මේ වෙලාවේ කියන්න බැහැ. එහි වෙළෙඳ කටයුතු අනුව තමයි අපට ඒක තීරණය කරන්න වෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඕනෑම තැනකින් ණයක් ගත්තාම, මෙපමණ කාලයකින්, මෙපමණ ආදායමකින්, මෙපමණ වියදමක් ගෙවනවා කියලා කියනවා.

එවැනි ව්‍යාපෘතියක මෙවැනි ණයබරතාවක් තබා ගෙන, ආදායම සොයන්නේ නැතිවද මුදල් අමාත්‍යාංශයේ ආර්ථික ඝාතකයකු ඉන්නවා කියලා විමල් වීරවංශ ඇමතිතුමා කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, අහන ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැත්නම්- [බාධා කිරීමක්] තැනකට ගෙනෙන්න කියනවානේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ඇහුවොත් මට උත්තරයක් දෙන්න පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා අහලා තිබෙනවා. මගේ ප්‍රශ්නයේ (අ) (iii) යටතේ අහලා තිබෙනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මත්තල ව්‍යාපෘතිය ගැන විස්තර මෙන්න මේ විධියට ඔබතුමාට දෙන්න පුළුවන්. මේකේ -[බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රශ්නයේ මෙහෙම අහලා තිබෙනවා: "the Chinese aid component in comparison to the full value of each project?" So, tell me what the full value is.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Now, I am going to give you an answer. As far as Mattala is concerned, ගිවිසුම් ගත දිනය 2010.05.03. ආධාර වර්ගය - ණය ආධාර. ප්‍රමාණය - ඇමෙරිකානු ඩොලර් මිලියන 209යි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි. මම කිව්වේ මිලියන 208යි කියලා. බලන්නේ නැතිව මම කියනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තමුන්නාන්සේ ඕවා ඔක්කෝම දන්නවා නම් අපෙන් අහන්නේ මොකටද? මිලියන 209යි කියලා මම කිව්වාම තමුන්නාන්සේ කියනවා මිලියන 208යි කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තමුන්නාන්සේ කියනවා, මම ප්‍රශ්නය ඇහුවේ නැහැ කියලා. කරුණාකර, අපව විහිළුවට ලක් කරන්න එපා. අපි දන්නවා, අහන ප්‍රශ්නය මොකක්ද කියලා. මේ රට ඔබතුමන්ලාගේ විතරක් නොවෙයි. අපේත් රට මේක. අපි විදේශිකයන් කියලා හිතාගෙනයි ඔබතුමන්ලා උත්තර දෙන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමාට මා හොඳ උත්තරයක් දෙන්න ලැහැස්තියි. මේ ගරු සභාවේ සම්ප්‍රදාය අනුව ඔබතුමන්ලා ප්‍රශ්න අහනවා, අපි උත්තර දෙනවා. ඒ දෙන හැම උත්තරයටම තමුන්නාන්සේලාගේ commentary එකක් මට අහන්න උවමනා නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපටත් අවශ්‍ය නැහැ, අහන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කරුණාකර අහ ගන්න. අපි දන්නවානේ තමුන්නාන්සේ ගුවන් විදුලියට ගිහිල්ලා පල් වෙන හැටි. දැන් මෙතැනත් ඒ විධියට කටයුතු කරන්න උවමනාවක් නැහැ. තමුන්නාන්සේට ප්‍රශ්න අහන්න අයිතිය තිබෙනවා; මට උත්තර දෙන්න අයිතිය තිබෙනවා. ඒකට අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නයත් අහන්න පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අහපු ප්‍රශ්නයට උත්තර දෙන්නකෝ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරු දීලා තිබෙනවා. දැන් තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයේ එක කොටසක චීනයෙන් ගෙන්වන කම්කරුවන් ගැන මා අහලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා ඒකට අදාළ උත්තරය තමයි දෙන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මේ විධියට පාර්ලිමේන්තුවේ වැඩ කරන්න බැහැ.

මම උත්තර දීගෙන යනකොට, උත්තරේ තුන් වැනි කොටසට එනකොට එතුමා වෙන commentary එකක් දෙනවා. ඒක රූපවාහිනියට හරියන්න පුළුවන්. නමුත් මේ සභාවට හරියන්නේ නැහැ ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේට වෙන අයත් එක්ක ඔය විධියට කථා කරන්න පුළුවන්. මාත් එක්ක කථා කරන්න එපා. ඕනෑ නම් මේ උත්තර -

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේත් ඔය කථාව රූපවාහිනියට හොඳ වෙන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මම මිලියන දෙසිය නවයයි කියනකොට එතුමා මිලියන දෙසිය අටයි කියනවා. එහෙම කරන්න පුළුවන්ද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉවසීමෙන් ප්‍රශ්න අහන්න; ඉවසීමෙන් පිළිතුරු දෙන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විපක්ෂයට විතර ද ඉවසීමක් තිබෙන්න ඕනෑ ගරු කථානායකතුමනි?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
හරි විධියට ප්‍රශ්නයක් ඇහුවොත් උත්තර දෙනවා. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3. ප්‍රශ්න අහන වෙලාවට සම්ප්‍රදායානුකූලව අහන්න. කථාවක්නේ පවත්වන්නේ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඒ විධියට කථා කරන්න හැදුවොත් මම ටීවී එකේ දමන්න දෙන්නේ ප්‍රශ්නය විතරයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඉතාම සද්භාවයෙන් මේ ප්‍රශ්නයට අදාළ ඔක්කොම කරුණු සංඛ්‍යා ලේඛන ඇතිව අපි ගෙනැවිත් තිබෙනවා, ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ විතරක් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි, තව මන්ත්‍රීවරුන් 15 දෙනෙක් ඉන්නවා ප්‍රශ්න අහන්න. ඉතින් ඒකට අවස්ථාව දෙන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමා ඒක කියපු ආකාරය හරි නැහැ. අපි මෙතැන ප්‍රශ්න අහන්නේ රට වෙනුවෙන්. රූපවාහිනියට දමනවාද නැද්ද කියන එක ඔබතුමා තීන්දු කරන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි. රට වෙනුවෙන් දෙන පිළිතුර භාර ගන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අපත් කැමැතියි, රට වෙනුවෙන් පිළිතුරු දෙන්න. ඔබතුමන්ලා ඒවා පිළිගන්නේ නැති එකයි වැරැද්ද. රට වෙනුවෙන් පිළිතුරු දෙන්නේ අපයි. ඔබතුමන්ලාගේ පක්ෂය පරාජිත පක්ෂයක්. දැන් අට සැරයක්ද, දහ සැරයක්ද පරාදයි. හැම වතාවේම ඡන්දෙට ගියා.

විදේශගත ශ්‍රමිකයන් : නිවාස ණය ක්‍රමය
வெளிநாட்டில் தொழில்புரிவோர்: வீடமைப்புக் கடன் திட்டம்
MIGRANT WORKERS : HOUSING LOAN SCHEME

2213/'12

3. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, විදේශගත ශ්‍රමිකයන් සඳහා රජයෙන් 30%ක දායකත්වය ලබාදෙන නිවාස ණය ක්‍රමයක් සකස් කිරීමට පියවර ගන්නා බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම නිවාස ණය ක්‍රමය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට එම නිවාස ණය ක්‍රමය යටතේ ණය ලබාගෙන ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

නිර්මාණ, පොරියියල් සේවෛකළ්, වීඩමෛප්පු, පොදු වසතිකළ් අමෛච්සරෛක් කේට්ට විනා:

(අ) මහින්ද චින්තනෙ - ඉලංකෛයෙ වෙට්රිපෙරච් චෙය්වෝම් කොළ්කෛත් තිට්ටත්තින් ජනසෙවන නිකழ්ච්චිත් තිට්ටත්තින් කීழ් වෙළිනාට්ටිල් තොழිල්පුරිපවර්කළුක්කු අරසිනාල් 30% පංකළිප්පුත් තොකෛ වழංකප්පටුකින්ර්තාන වීඩමෛප්පුක් කඩන් තිට්ටමොන්ර්ර තයාරිප්පතර්කු නටවටික්කෛයෙටුප්පතාක වාක්කුරුති අළික්කප්පට්ටුළ්ළතෙන්පතෛ අවර් අර්විවාරා?

(ஆ) (i) மேற்படி வீடமைப்புக் கடன் திட்டம் ஆரம்பிக்கப் பட்ட வருடம் யாதென்பதையும்,

(ii) இற்றைவரை மேற்படி வீடமைப்புக் கடன் திட்டத்தின் கீழ் கடன் பெற்றுக்கொண்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Is he aware that a pledge was made under the Janasevana Programme of "Mahinda Chintana - Dinavamu Sri Lanka" manifesto that measures would be taken to formulate a housing loan scheme for migrant workers with a 30 per cent contribution made by the Government ?

(b) Will he inform this House of -

(i) the year in which the aforesaid housing loan scheme was commenced; and

(ii) the number of families that have obtained loans under this housing loan scheme by now ?

(c) If not, why ?

ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ අවබෝධතා ගිවිසුමක් හරහා ඉලක්ක කණ්ඩායම්වලට ණය ක්‍රමයක් සකස් කිරීමට 2012 වසරේදී ගිවිසුමක් අත්සන් කර අවතීර්ණ වී ඇත.

(ii) අදාළ නොවේ.

විශේෂයෙන්ම විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාංශයක්, ඒ වාගේම ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයත් ඇතුළුව අමාත්‍යාංශ ගණනාවක් ඒකාබද්ධ වෙලායි මේ කටයුත්ත සිදු කරනු ලබන්නේ. ලබන 12වනදා මේ වැඩසටහනේ මූලික පියවර නිල වශයෙන් ආරම්භ කර මේ අයට නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා.

(ඇ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. විදේශ ශ්‍රමිකයන්ට සහනදායී ක්‍රමයට නිවාස ලබා දීමේ මෙම වැඩසටහන ඉදිරිපත් වුණේ "මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා" වැඩ පිළිවෙළ යටතේයි. ඒ කියන්නේ 2005 වසරේදියි එම වැඩසටහන ඉදිරිපත් වුණේ. අපි දැන් ඉන්නේ 2013 වසරේ. එතකොට, වසර 8ක් යන තෙක් මේ වැඩසටහන ක්‍රියාත්මක කරලා නැහැ. 2012 වසරේ විදේශ ශ්‍රමිකයන් 2,76,000දෙනෙක් අපේ රට වෙනුවෙන් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ලබා දුන්නා. මා අහන්න කැමැතියි,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නයද අහන්නේ, කථාවක්ද පවත්වන්නේ?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ පළමුවන අතුරු ප්‍රශ්නයයි අහන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කෙටියෙන් අහන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

රට වෙනුවෙන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

රට වෙනුවෙන් තමයි කවුරුත් කරන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මා මෙම ප්‍රශ්නය අහන්නේ රට විරුවන් වෙනුවෙන්. විදේශ ශ්‍රමිකයන් වෙනුවෙන් 2005 දී ලබා දුන්නු පොරොන්දුව, 2013 අද දවස වන තුරු ඉෂ්ට කරලා නැත්තේ ඇයි කියා මා අහන්න කැමැතියි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

"මහින්ත චින්තන ඉදිරි දැක්ම" වැඩසටහන 2016 දක්වා තමයි ප්‍රකාශයට පත් කර තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මා කියන්නේ, "මහින්ද චින්තන ඉදිරි දැක්ම" නොවෙයි; "මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා" වැඩසටහන ගැන.

ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු කථානායකතුමනි-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඩිලාන් පෙරේරා ඇමතිතුමාත්, අපත් සම්බන්ධ වෙලා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් තමයි මේ කටයුත්ත කරන්නේ. එතුමාටත් අයිතිය තිබෙනවා පැහැදිලි කිරීමක් කරන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් දෙ වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම අහපු පළමු වන අතුරු ප්‍රශ්නයට උත්තර දෙන්න කියන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්දෝ එකක් කියනවා ඇහුණා. ඒ ඇති. එතුමා කියපු එක මටත් හරියට තේරුණේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක තමයි. මම අහපු පළමුවෙනි අතුරු ප්‍රශ්නයට උත්තරය දෙන්න කියන්න. මටත් තේරුණේ නැහැ.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම උපකාර කරන්න හැදුවා. එපා කිව්වා නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමාට වාගේමයි. මටත් ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියපු දේ තේරුණේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයට උත්තරය දෙන්න කියන්න.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩසටහන 2016 අවුරුද්ද දක්වා තමයි ප්‍රකාශයට පත් කර තිබෙන්නේ. ඒ නිසා ඔබතුමා දැන්ම කලබල වෙන්න අවශ්‍යතාවක් නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කථා කරන්නේ "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" වැඩ පිළිවෙළ ගැන.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඒක ක්‍රියාත්මක කරන්න තව කල් තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා දැන් දෙ වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ දෙ වැනි අතුරු ප්‍රශ්නය මේකයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමාට පොඩ්ඩක් වයර් පැටලිලා. මම කිව්වේ "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" වැඩසටහන ගැනයි. දිනවමු ශ්‍රී ලංකා වැඩසටහන පටන් ගත්තේ 2005 දීයි. නමුත් ගරු කථානායකතුමනි, අවුරුදු 8ක් යන තුරු -2013 වන තුරු- මේ අය වෙනුවෙන් මේ වැඩසටහන ක්‍රියාත්මක වෙලා නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔය අතුරු ප්‍රශ්නය නොවෙයි නේ අහන්නේ. ඔබතුමා කථාවක් පවත්වනවා. කථා පවත්වන්නේ නැතිව ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම දෙ වැනි අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්නේ, වසර 8ක් ගිහිල්ලාත් රට විරුවන් වෙනුවෙන් මේ යෝජනාව ක්‍රියාත්මක කර නැත්තේ ඇයි කියලායි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
වසර 8ක් ගත වෙලා නැහැ ගරු කථානායකතුමනි. 2010 මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්තිය තුළත් මේ කරුණු ඇතුළත් වෙලා තිබෙනවා. ඔබතුමාට කලබලය තිබුණාට අපට කලබලයක් නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන් වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2011 වසරේ අපේ රටට මේ රට විරුවන්ගෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 5,144ක ආදායමක් ලැබුණා. 2012 සැප්තැම්බර් මාසය වෙන කොට ඔවුන්ගෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 4,419ක් ලැබුණා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ වාර්තාවක් කියවනවා නේ. ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන් වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා වැඩසටහන යටතේ 2005 දී ලබා දුන්න මේ පොරොන්දුව වසර 8ක් යන තුරු -මේ වන තෙක් - රට විරුවන් යයි කියන කොට්ඨාසය වෙනුවෙන් ඉෂ්ට කරන්න මේ ආණ්ඩුව ඇයි මෙච්චර තටමන්නේ, ඇයි මෙච්චර පැකිළෙන්නේ?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු කථානායකතුමනි, මෙතුමාටයි වයර් පැටලැවිලා තිබෙන්නේ. එකම ප්‍රශ්නය විවිධාකාරයෙන් අහනවා. මම මේ ප්‍රශ්නයට උත්තරයක් ලබා දුන්නා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්. වයර් පටලැවෙනවා, කාගෙ කාගෙත්. ප්‍රශ්නය කෙටියෙන් අහන්න. එවිට උත්තරය නිවැරදිව ලැබෙයි.

රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සඳහා වූ විදේශ සංචාර : වියදම්
இராஜதந்திர தொடர்புகளுக்கான வெளிநாட்டு விஜயங்கள்: செலவு
FOREIGN TOURS FOR DIPLOMATIC RELATIONS : EXPENSES

2378/'12

4. ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (4):

(අ) (i) ශ්‍රී ලංකාවේ සංවර්ධනය උදෙසා හා ජාත්‍යන්තරව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානි කරනු ලබන විදේශීය බලපෑම් අවම කරවීමට අවශ්‍ය අන්තර්ජාතික සහයෝගය ලබා ගැනීමට හිතකර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වැඩි දියුණු කිරීමේ අරමුණින් 2011 වර්ෂයේදී රජය විසින් සිදු කරන ලද විදේශ ගමන් කවරේද;

(ii) එම විදේශ සංචාර සඳහා සහභාගිවූවන් කවුරුන්ද;

(iii) ඒ වෙනුවෙන් වැය වූ මුදල කොපමණද;

(iv) එම විදේශ සංචාර නිසා ශ්‍රී ලංකාවට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වෙළිනාට්ටලුවල්කළ් අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) இலங்கையின் அபிவிருத்தியின் பொருட்டும் சர்வதேச ரீதியில் இலங்கையின் நற்பெயருக்குக் களங்கம் ஏற்படுத்துகின்ற வெளிநாட்டு நிர்ப்பந்தங்களைக் குறைப்பதற்குத் தேவையான சர்வதேச ஒத்துழைப்பினைப் பெற்றுக்கொள்வதற்கு சாதகமான இராஜதந்திர தொடர்புகளை மேம்படுத்திக்கொள்ளும் நோக்கத்துடனும் 2011ஆம் ஆண்டில் அரசாங்கத்தினால் மேற்கொள்ளப்பட்ட வெளிநாட்டு விஜயங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி வெளிநாட்டு விஜயங்களில் பங்கேற்றோர் யாவர் என்பதையும்;

(iii) இதன்பொருட்டு செலவாகிய பணத்தொகை எவ்வளவென்பதையும்;

(iv) மேற்படி வெளிநாட்டு விஜயங்களின் காரணமாக இலங்கைக்குக் கிடைத்த அநுகூலங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of External Affairs:

(a) Will he state -

(i) the number of foreign tours undertaken by the Government in the year 2011 with the objective of strengthening friendly diplomatic relations for the development of Sri Lanka and soliciting international support required to minimize foreign influence tarnishing the image of Sri Lanka;

(ii) the names of those who participated in the aforesaid foreign tours;

(iii) the amount of money spent on them; and

(iv) the benefits accrued to the country as a result of the aforesaid foreign tours?

(b) If not, why?

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)
ගරු කථානායකතුමනි, මෙය ඉතාම දීර්ඝ පිළිතුරක්. රජය විසින් රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සඳහා ඉදිරිපත් වුණ සියලුම අවස්ථා පිළිබඳ සම්පූර්ණ විස්තරයක් මෙම පිළිතුරේ අඩංගු වෙනවා. පිටු 75ක් පමණ තිබෙනවා. මම එම පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ලැයිස්තුව ඇමුණුම i හි දැක්වේ

(ii) ලැයිස්තුව ඇමුණුම ii හි දැක්වේ.

(iii) සමස්ත වියදම ශ්‍රී ලංකා රුපියල් 73,233,923.73 වේ.

(ජනාධිපති සංචාර පිළිබඳ සමස්ත පිරිවැය විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් දරනු නොලබන නිසා ජනාධිපති සංචාර සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති වියදම ඒ සඳහා වැය වූ සමස්ත පිරිවැය නොවේ.)

(iv) ලැයිස්තුව ඇමුණුම iii හි දැක්වේ

ඇමුණුම් පුස්තකාලයේ ද තබා ඇත.

(ආ) පැන නොනඟී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දීර්ඝ පිළිතුරක් නම් සභාගත කරන්න. ගරු මන්ත්‍රීතුමිය, අතුරු ප්‍රශ්න තිබේ නම් අහන්න.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ගරු කථානායකතුමනි, ඇත්තටම මම මේ ප්‍රශ්නය ඇහුවේ මේ කාරණය නිසායි. 2011 වර්ෂයේ දීපු පරිපූරක වෙන් කිරීමේ තිබෙනවා, රුපියල් මිලියන 293ක් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මේ වෙනුවෙන් වෙන් කළා කියලා. "සංවර්ධනය උදෙසා හා ජාත්‍යන්තරව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානි කරනු ලබන විදේශීය බලපෑම් අවම කරවීමට අවශ්‍ය අන්තර් ජාතික සහයෝගය ලබා ගැනීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වැඩිදියුණු කිරීමට සිදු වීම හේතුවෙන් විදේශ ගමන් සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලැස්ම" කියලා රුපියල් මිලියන 293ක් වැඩි පුර වැය

[ගරු අනෝමා ගමගේ මහත්මිය]

කරලා තිබෙනවා. එම නිසා මම මේ ප්‍රශ්නය ඇහුවේ 2012 පෙබරවාරි මාසයේදියි. මගේ අතුරු ප්‍රශ්නය මෙයයි. මම අතුරු ප්‍රශ්න තුනම ප්‍රයෝජනයට නොගෙන එක ප්‍රශ්නයක් පමණක් අහන්නම්, මෙය දීර්ඝ පිළිතුරක් නිසා. පසු ගිය වසර දෙක තුළම ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ලෝකයේ රටවල, විශේෂයෙන්ම යුරෝපයේ රටවල ප්‍රසිද්ධ වුණේ යහපත් අයුරින් නොවෙයි කියලා අපි හැමදෙනාම දන්නවා. ඒ වාගේම LLRC වාර්තාවේ නිර්දේශ එකක්වත් ක්‍රියාත්මක කළේ නැහැයි කියලාත් අපට චෝදනා තිබෙනවා.

රජය විසින් මේ දක්වා විශාල මුදලක් වියදම් කොට කර තිබෙන දේවල්වලින් සහ සිදු කර තිබෙන ගමන් බිමන්වලින් අත් වුණු ප්‍රතිඵල ගැන මම ඔබතුමාගෙන් කෙටියෙන් දැන ගන්න කැමැතියි.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වැරැදියි. මම හිතන්නේ නැහැ, මේ විධියේ ජාතික ප්‍රශ්නවලින් මේ විධියේ පටු දේශපාලන වාසියක් ලබා ගැනීමට උත්සාහ දැරීම කිසිසේත් උචිතයි කියා. මේ ගරු මන්ත්‍රීතුමිය කියනවා, ඒ වාර්තාවේ අන්තර්ගතයේ තිබෙන කිසිම නිර්දේශයක් ක්‍රියාත්මක වෙලා නැහැයි කියලා.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
නැහැ, මම එහෙම කියන්නේ නැහැ.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඔබතුමිය එහෙම කිව්වා. ඔබතුමිය කිව්ව එක වාර්තාගත වෙලා ඇති. ඔබතුමිය ඒ ප්‍රකාශය කළා.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
මම නොවෙයි ඒක කියන්නේ. යුරෝපයේ,-

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මම ඔබතුමියට කියනවා, ඒක සම්පූර්ණ අසත්‍යයක් කියලා.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
මානව හිමිකම් කොමිෂන් සභාවෙන් තමයි මේක කියන්නේ.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මම විතරක් නොවෙයි මේක කියන්නේ. ගරු කථානායකතුමනි, මීට පැය 48කට පෙර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් බෑන් කී මූන් මැතිතුමා නිව්යෝර්ක් නගරයේදී ජපන් කානාපතිතුමා හමු වුණු අවස්ථාවේ කියලා තිබෙනවා, ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳව එතුමා සෑහීමකට පත් වෙනවා කියලා. ජපානයේ නායකත්වයෙන් රටවල් 6කින් සමන්විත දූත පිරිසක් මෙහි පැමිණියා. ඒ අයගේ වාර්තාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්තුමාට භාර දෙන අවස්ථාවේදී, ඔබතුමිය කියන එකට හාත්පසින්ම විරුද්ධ දෙයක් එතුමා කියලා තිබෙනවා. එතුමා කියලා තිබෙනවා, ඒ පිළිබඳව සෑහෙන ප්‍රගතියක් සිදු වෙලා තිබෙනවා කියලා. ඔබතුමියගේ ප්‍රශ්නයට තව පිළිතුරක් හැටියට මම මෙහෙම කියනවා. ඔබතුමිය කියනවා නම් අප්‍රසාදයක් තිබෙනවා කියලා, බලන්න මීට මාසයකට පමණ ඉස්සෙල්ලා ලංකාවට පැමිණි ඕස්ට්‍රේලියාවේ ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ දූත පිරිසගේ අදහස්. ඕස්ට්‍රේලියාවේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන් එරට විදේශ ඇමතිවරයා මෙහි පැමිණියා. එතුමා තමයි සෙනෙට් සභික රොබර්ට් කාර්. එතුමා මොකක්ද කියලා තිබෙන්නේ? "යුද්ධය අවසන් වෙලා අවුරුදු තුනහමාරයි ගත වුණේ, ඉතාමත් සංකීර්ණ අභියෝගවලට ශ්‍රී ලංකාව ඉතාමත් සාර්ථකව මුහුණ දීලා තිබෙනවා. කවුරු මොනවා කිව්වත් ඕස්ට්‍රේලියාව අනිවාර්යයෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලයීය සමූළුවට සහභාගි වෙනවා" කියලා.

[බාධා කිරීමක්] ඔබතුමිය ප්‍රශ්නය ඇහුවා. දැන් මම පිළිතුරු දෙනවා. විපක්ෂය වෙනුවෙන් ජූලි බිෂොප් -විරුද්ධ පක්ෂයේ නියෝජ්‍ය නායිකාව හා ඡායා විදේශ ඇමතිනිය- මේ ගැන කිව්වා. සැප්තැම්බර් මාසයේ 13 වනදා ඕස්ට්‍රේලියාවේ මහ මැතිවරණයක් පැවැත් වෙනවා. ශ්‍රී ලංකාව සාර්ථකයි කියා විරුද්ධ පක්ෂය ආණ්ඩු පක්ෂයටත් වඩා තදින් විශ්වාස කරනවා. එම නිසා ඒ ගොල්ලොත් කිසිම පැකිලීමකින් තොරව මේකට සහභාගි වෙනවාය කියා කිව්වා.

ගරු කථානායකතුමනි, ජිනීවා නගරයේ ශ්‍රී ලංකාවට විරුද්ධව ඒ යෝජනාව ගෙන එන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයයි. ඇමෙරිකා එක්සත් ජනපදයේ පාර්ලිමේන්තුවේ විදේශ කටයුතු කමිටුවේ ජ්‍යෙෂ්ඨ සභිකයා -එනී ෆලියෝමාවේගා මැතිතුමා- වොෂින්ටන්වල ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කළා, ඇමෙරිකාව ගන්නා ක්‍රියා මාර්ගය සම්පූර්ණයෙන්ම වැරදියි කියා. එතුමා එහෙම ප්‍රකාශ කරනවා. මා නොවෙයි කියන්නේ, ඇමෙරිකාවේ විදේශ කටයුතු කමිටුවේ ජ්‍යෙෂ්ඨ සභිකයායි කියන්නේ. එතුමා, එතුමාගේම රජය විවේචනය කරනවා, "මේක අසාධාරණයි. මේක දේශපාලන සාධක මත කරන දෙයක්. මේක කිසිසේත් අනුමත කරන්නට බැහැ." කියා. එතුමා, එතුමාගේම රජය සම්බන්ධයෙන් බොහොම තදබල විවේචනයක් ඉදිරිපත් කළා. එම නිසා ඔබතුමිය කියන දෙය මා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ගරු ඇමතිතුමනි, මා නොවෙයි මේක කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමිය ප්‍රශ්නයක් අහන්න.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ගරු ඇමතිතුමා, ඔබතුමා ගොඩක් සාධක කිව්වාට, එක එක හේතු ඉදිරිපත් කළාට මා නොවෙයි මේ දේවල් කියන්නේ. පිට රට සම්මේලනයේ; මානව හිමිකම් කොමිෂන් සභාවෙන් තමයි කියන්නේ ඔබතුමන්ලා මේවා කරලා නැහැ කියා. මා නොවෙයි කියන්නේ.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඔබතුමියත් නොවෙයි කියන්නේ. මාත් නොවෙයි කියන්නේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්තුමා, ඕස්ට්‍රේලියාවේ විදේශ කටයුතු ඇමතිවරයා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 5, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
විදේශ කටයුතු ගරු අමාත්‍යතුමාගෙන් මම අහන්න කැමතියි, ඊයේ "අද" පත්තරේ තිබුණා, විදේශ දූත මෙහෙවරෙහි යෙදෙන ප්‍රධාන නිලධාරීන් 60 ගණනකින් 50කට ආසන්න පිරිසක් විදේශ දූත මෙහෙවරෙහි යෙදීමට සුදුසුකම් නැති දේශපාලන පත්වීම් ලැබූ අය කියා. මෙය සත්‍යය ද කියා ඔබතුමාගෙන් මම අහන්න කැමැතියි.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඒක සත්‍යයක් නොවෙයි, ගරු කථානායකතුමනි. සුදුසුකම් නැති කෙනෙක් අපි සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා. ඒ අයගේ සුදුසුකම් ගැන ළඟදී ප්‍රශ්නයක් අහලා තිබුණා. අපි පාර්ලිමේන්තුවට රටට සම්පූර්ණයෙන් අනාවරණය කරන්න සූදානම් ඒ පුද්ගලයන්ගේ සුදුසුකම් මොනවාද කියා. සුදුසුකම් නැති පුද්ගලයන් පත් කර නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු අමාත්‍යතුමනි, සුදුසුකම් කියා අදහස් කරන්නේ විදේශ දූත මෙහෙවරෙහි යෙදීමට විභාග pass කළ අදාළ පුද්ගලයන් කියන එක. ඔබතුමා දන්නවා නේ, විදේශ දූත මෙහෙවරෙහි හැමෝටම යෙදෙන්න බැරි බව. Foreign Service exam එකෙන් ගිය අය නේ විශාල සංඛ්‍යාවක් ඉන්නේ.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඒ අයගෙන් බලාපොරොත්තු වෙන කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ඒ පුද්ගලයන්ට තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
මොනවා හෝ කියනවා නම් කෙළින් කියන්න. එතකොට මම ඒකට හොඳට පිළිතුරු දෙන්නම්. [බාධා කිරීම්] ආණ්ඩුවෙන් පත් කළේ ආණ්ඩුවට සහයෝගය දුන්න පුද්ගලයෙක්. වෙන කවුරුවත් මේවා කළේ නැහැ. That is a political appointment made by the Government. It has nothing to do with this type of thing.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, පාර්ලිමේන්තුවේ හිමින් කියන කථා අනෙක් අයට ඇහෙන විත්තිය දැන ගන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
There are political appointments made by the Government but they do not fall into this. Whether you want to keep them or cancel them is your job, not ours. That is a political appointment. What he asked you was about non -political appointments.

I think the Minister was answering that all right when the Deputy Minister got up. - [*Interruption.*]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අනවශ්‍ය නම් සඳහන් කරන්න එපා.

ශල්‍ය අත්වැසුම් ආනයනය : සමාගම්
சத்திரசிகிச்சை கையுறைகள் இறக்குமதி: : கம்பனிகள்
IMPORT OF SURGICAL GLOVES : COMPANIES

2414/'12

5. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) (i) රජයේ රෝහල් සඳහා ශල්‍ය අත්වැසුම් ආනයනය කරන සමාගම් කවරේද;

(ii) ඉහත එක් සමාගමක් විසින් ආනයනය කර වැඩි මිලක් නියම කරන ලද අත්වැසුම් තොගයක් රජයේ රෝහල් වෙත ලබා දීම සඳහා අනුමතිය ලබා දී තිබේද;

(iii) එසේ වැඩි මිලට අත්වැසුම් අලෙවි කරන ඉහත සමාගමේ නම කුමක්ද;

(iv) එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගමේ අත්වැසුම් තොගය මිල දී ගැනීම වෛද්‍ය සැපයුම් අංශය ප්‍රතික්ෂේප කළේද;

(ii) එම අත්වැසුම් තොගය පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුව මිල දී ගෙන තිබේද;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(iii) එසේ නම්, ඊට අදාළ ලේඛන මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iv) ඒ සඳහා අනුමතිය ලබා දුන් බලයලත් නිලධාරියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පිළිගත් කුමවේදයන්ට පරිබාහිරව ඉහත සඳහන් අත්වැසුම් මිල දී ගැනීමේ ගනුදෙනුව සිදු කර තිබේ නම්, එයට හේතු කවරේද;

(ii) එවැනි ගනුදෙනුවක් සිදුකර තිබේ නම්, එය සිදු කළ අය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க ஆஸ்பத்திரிகளுக்காக சத்திரசிகிச்சை கையுறைகளை இறக்குமதி செய்கின்ற கம்பனிகள் யாவையென்பதையும்,

(ii) மேற்படி ஒரு கம்பனியினால் இறக்குமதி செய்யப்பட்டு அதிக விலை குறிக்கப்பட்ட கையுறைகள் தொகையொன்றை அரசாங்க ஆஸ்பத்திரிகளுக்கு வழங்குவதற்காக அனுமதியளிக்கப்பட்டுள்ளதா என்பதையும்,

(iii) இவ்வாறு அதிக விலைக்கு கையுறைகளை விற்பனை செய்கின்ற மேற்படி கம்பனியின் பெயர் யாதென்பதையும்,

(iv) அதன் பணிப்பாளர் சபை அங்கத்தவர்களின் பெயர்கள் யாவையென்பதையும்,

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி கம்பனியின் கையுறைகள் தொகையைக் கொள்வனவு செய்வதை மருத்துவ வழங்கல் பிரிவு நிராகரித்ததா என்பதையும்;

(ii) மேற்படி கையுறைகள் தொகை அங்கீகரிக்கப் பட்ட கேள்விப்பத்திர நடைமுறைக்கமைய கொள்வனவு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், இதற்குரிய ஆவணங்களைச் சபைக்குச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) இதற்காக அனுமதியளித்த அதிகாரம் வாய்ந்த உத்தியோகத்தர் யார் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) ஏற்றுக்கொள்ளப்பட்ட முறைமைக்குப் புறம்பாக மேற்படி கையுறைகளைக் கொள்வனவு செய்யும் கொடுக்கல் வாங்கல் நடைபெற்றிருப்பின் அதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(ii) அத்தகைய கொடுக்கல்வாங்கல் மேற்கொள்ளப் பட்டிருப்பின் அதனை மேற்கொண்டவர்களுக்கு எதிராக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state -

(i) the companies that import surgical gloves for Government hospitals;

(ii) whether approval has been granted for a stock of gloves imported by one of the above mentioned companies and priced too high, to be provided to Government hospitals;

(iii) the name of the aforesaid company which sells gloves at a higher price; and

(iv) the names of the board of directors of that company?

(b) Will he inform this House -

(i) whether Medical Supplies Division refused to purchase the stock of gloves of the aforesaid company;

(ii) whether that stock of gloves has been purchased following an accepted tender procedure;

(iii) if so, whether documents relevant to the above mentioned purchase will be submitted to this House; and

(iv) the authorized officer who granted approval for that purchase?

(c) Will he also inform this House -

(i) the reasons for such action if the transaction of the purchase of the aforesaid gloves has been done in contravention of accepted procedure; and

(ii) the measures that will be taken regarding those responsible, if such transaction has been carried out?

(d) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ හදිසි මිලදී ගැනීම් වෛද්‍ය සැපයීම් අංශය විසින් විදේශීය නිෂ්පාදකයන්ගෙන් සෘජුවම ශල්‍ය අත්වැසුම් ආනයනය කිරීම සිදු කරනු ලබයි.

(ii) වෛද්‍ය සැපයීම් අංශය මඟින් හදිසි මිලදී ගැනීම්වලදී දේශීය නියෝජිතයන්ගෙන් මිලදී ගන්නා නිසා හා එම මිලට නිෂ්පාදන ගාස්තු සහ බදු ඇතුළත් වන නිසා සාපේක්ෂව වැඩි මිලකට මිලදී ගනු ලබයි.

(iii) ෂිල්ඩ් මෙඩිකල් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය.

(iv) මිලදී ගැනීම් ක්‍රියාවලියේදී අයිතම මිලදී ගනු ලබන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවල විස්තර ලබා නොදේ.

(ආ) (i) 2012 වර්ෂයේදී වෛද්‍ය සැපයීම් අංශයට ලැබුණු ශල්‍ය ග්ලවුස් අතරින් ඉහත සඳහන් කළ ආයතන සපයන ලද Examination Gloves තොගයක් තත්ත්වයෙන් අසමත් වීම මත භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී.

(ii) ඔව්.

(iii) ඇමුණුමෙහි දැක්වේ. ඇමුණුම **සභාගත*** කරමි.

(iv) අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලය මඟින් එම ටෙන්ඩරය සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

(ඇ) (i) සහ (ii). පිළිගත් ක්‍රමවේදයන්ට පරිබාහිරව එවැනි ගනුදෙනුවක් සිදු කර නොමැත.

(ඈ) පැන නොනඟී.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*

** Annex tabled:*

REPORT OF THE TEC MEETING

Procurement Entity	Medical Supplies Division	Nature of the Procurement Committee	RPC
Title of the Procurement	Surgical Gloves Sterile Size 6 1/2"		
File No	MSD/LP/PU2/05/2012	Purpose of the TEC	Technical Evaluation
SR No	SR No. 590160	Date of the TEC	.01.2012
Quantity	1,686,400 Pairs		
TEC Appointed Date	25.01.2012		

Members of the Committee

1. Dr. Ananda Lamahewage
Consultant Surgeon/ LRH - Chairperson TEC
2. Dr.(Mrs) Ajantha Perera
Consultant Surgeon/ NHSL- Member TEC
3. Dr. U. D. P. Ratnasiri
Consultant Surgeon/DMH –Member TEC
4. Mr. H. M. H. B. Herath
DD (F), MSD – Member TEC
5. Mr. N. R. Pushpakumara ratne
AD(S), MSD – Member TEC

Coordinating Staff

1. Mrs. K. A. G. D. Dharmaratne
HMA, Procurement Unit, MSD

Name of the Tenderer	Qty	Unit Price	Total Cost	Delivery
Delmege Medical (Pvt) Ltd	1,686,400 Pairs	28.60	48,231,040.00	750,000 pairs- immediately, 500,000 pairs- within 1st week after the 1st lot. balance within 1st week after 2nd lot
MG Medicals	1,686,400 Pairs	29.00	48,905,600.00	Within 8-10 weeks
Medicare Pharma Lanka (Pvt) Ltd	1,686,400 Pairs	32.50	54,808,000.00	254,000 pairs-within 17 working days, 254,000 pairs- within next 10 working days, 254,000 pairs- within further another 10 working days, 254,000 pairs- within another 10 working days, 200,000 pairs- within another 10 working days, 200,000 pairs- within another 10 working days, 200,000 pairs- within another 10 working days, 70,400 pairs- within another 10 working days
Lloyds Auto Mart (Pvt) Ltd	1,686,400 Pairs	34.70	58,518,080.00	60,000 pairs- Immediately, balance within 45 days
Sonali & Sudesh	1,686,400 Pairs	34.94	58,922,816.00	420,000 pairs- Immediately, 90,000 pairs- 7 working days after 1st lot, 420,000 pairs 20 working days after 2nd lot, 420,000 pairs- 12 working days after 3rd lot, 336,400 pairs- 7 working days after 4th lot
Medicare Pharma Lanka (Pvt) Ltd	100,000 pairs	35.00	3,500,000.00	Immediately
Medicare Pharma Lanka (Pvt) Ltd	1,686,400 Pairs	37.00	62,396,800.00	170,000 pairs-within 14 working days, 170,000 pairs- within next 14 working days, 170,000 pairs- within further another 14 working days, 170,000 pairs- within another 14 working days, 170,000 pairs- within another 14 working days, 170,000 pairs- within another 14 working days, 170,000 pairs- within another 14 working days, 170,000 pairs- within another 14 working days, 156,400 pairs- within another 14 working days
Shield Medicals (Pvt) Ltd	1,686,400 Pairs	43.45	73,274,080.00	481,400 pairs- Immediately, 481,400 pairs- within 10 working days, 481,400 pairs- within 20 working days, 242,200 pairs- within 30 working days 110,780 pairs- within 40 working days
Hemsons International (Pvt) Ltd	1,686,400 Pairs	51.00	86,006,400.00	500,000 pairs- 1st month, 500,000 pairs- 2nd month, balance 3rd month

[ගරු ලලිත් දිසානායක මහතා]

Summary of the main decision taken/recommendation made

TEC recommends

	Read TRAC ION	Sample	Interference	Curing	Wet work (approximately)	Reading available Yes/No
DELNAAT	YES	✓	No	Thin gloves Tend to tear.	4 weeks	No
Mk MEDICAL	✓	✓	No	Poor fitting Tend to roll down (cuff)	8-10 weeks	No
MEDICARE	NO	✓	No	Donning difficult	12 weeks	No
Lloyds	✓	✓	No	Cuff rolls down ill fitting	6 ½ weeks	No
Sonalis Sudesh	~~YES~~ ✓	No ✓	No	Too much powder Inequal sizes	6½ wks	No
MEDICARE	✓	✓	No	Smelly Size difference noted	part immediately	No
MEDICARE	✓	✓	No	Donning difficult holes noted	~~20~~ wks	No
SHIELDS	✓	✓	YES	good quality in use for years	4/52	YES
HEMSON	✓	✓	YES	Good quality well known BRAND	12 wks	YES

We have experienced many difficulties due to irregular surface gloves. Therefore elbow length gloves were also taken into consideration in recommending suitable brands.

Name	Capacity	Agree with the above decision/s (Yes/No)	Signature
1. Dr. Ananda Lamahewage Consultant Surgeon/ LRH	Chairperson	YES	3.10.12
2. Dr.(Mrs) Ajantha Perera Consultant Surgeon/ NHSL	Member	~~Yes~~	
3. Dr. U. D. P. Ratnasiri Consultant ~~Surgeon~~/DMH	Member	Yes	
4. Mr. H. M. H. B. Herath DD (F). MSD	Member		
5. Mr. N. R. Pushpakumara ratne AD(S). MSD	Member		

DR. ANANDA LAMAHEWAGE
MBBS, MS (Col), FRCOG (UK)
Consultant Paediatric Surgeon
Lady Ridgeway Hospital
Colombo 08

DR U D P RATNASIRI
~~MBBS(SL) MS (Obs & Gyn)~~
FRCOG (UK)
Consultant Obstetrician & Gynaecologist
De Soyza Hospital for Women
Colombo 08.

MY No.MSD/LP/PU2/05/2012
Medical Supplies Division,
357,Deans Road.
Colombo 10.
05 .03.2012

The Manager
Mediare Pharma Lanka (Pvt) Ltd

Dear Sir,

SUPPLY OF SURGICAL ITEMS
ORDER REF. NO. MSD/LP/PU2/ORD/64/2012

Your quotation of 18/01/2012 accepted for the supply of following items is hereby confirmed.

Description of Item	Qty	Rate Rs.	Rate Cts	Value Rs.	Value Cts
Sterile Surgical Gloves, Latex, conforming to BS 4005 (1996) for single use sterile surgical rubber gloves, size 7 1/2. Each pair wrapped in paper with left and right marked and packed in peel open or tear open paper pouch and labelled accordingly **SR No. 590160**	150,000 Pairs **Shelf Life 48 months** 50,000 100,000	32	50	4,875,000	00
				4,875,000	**00**

Delivery : - **Within 03 working days** 9/3/2012

Please deliver same to the Medical Supplies Division, 357, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo10 with a certified photocopy of invoice/delivery note. If not delivered on time the order will be treated as cancelled.

Thanking you,

Yours faithfully,

Director
Medical Supplies Division
a/c
Copies: 1. Asst. Director (S)
2. HSCU (S)
3. SCU (S)

MY No.MSD/LP/PU2/05/2012
Medical Supplies Division,
357,Deans Road.
Colombo 10.
05.03.2012

The Manager
Delmege Medical (Pvt) Ltd

Dear Sir,

SUPPLY OF SURGICAL ITEMS
ORDER REF. NO. MSD/LP/PU2/ORD/63/2012

Your quotation of 18/01/2012 accepted for the supply of following items is hereby confirmed.

Description of Item	Qty	Rate Rs.	Rate Cts	Value Rs.	Value Cts
Sterile Surgical Gloves, Latex, conforming to BS 4005 (1996) for single use sterile surgical rubber gloves, size 7 1/2. Each pair wrapped in paper with left and right marked and packed in peel open or tear open paper pouch and labelled accordingly **SR No. 590160**	1,536,400 Pairs **Shelf Life 05 years** 250,000 pairs 150,000 pairs 600,000 pairs.	28	60	43,941,040	00
				43,941,040	**00**

Delivery : - **500,000 pairs** - **20th March**
500,000 pairs - **Two weeks after 1st lot** 3/4/2012
Balance - **Two weeks after 2nd lot** 17/4/2012

Please deliver same to the Medical Supplies Division, 357, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo10 with a certified photocopy of invoice/delivery note. If not delivered on time the order will be treated as cancelled.

Thanking you,

Yours faithfully,

Director
Medical Supplies Division
a/c
Copies: 1. Asst. Director (S)
2. HSCU (S)
3. SCU (S)

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, "ශල්‍ය අත්වැසුම් ආනයනය කරන සමාගම් කවරේද?" කියන පළමු වන ප්‍රශ්නයට උත්තරය ලැබුණේ නැහැ නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(*மாண்புமிகு லலித் திசாநாயக்க*)
(The Hon. Lalith Dissanayake)
ඇමුණුමෙහි සඳහන් වෙලා තිබෙනවා. ඔබතුමාට අවශ්‍ය නම් මම ඒක කියවන්නම්.

ජාත්‍යන්තර වශයෙන් මිලදී ගනු ලබන සමාගම්, රජයේ ඖෂධ නීතිගත සංස්ථාව, විදේශ නිෂ්පාදකයන්ගෙන් සෘජුවම ශල්‍ය අත්වැසුම් ආනයනය කිරීම සිදු කරනු ලබයි. එම සමාගම් හයක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ගැන මට දැන ගන්න ඕනෑ. ඒක කියවන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(*மாண்புமிகு லலித் திசாநாயக்க*)
(The Hon. Lalith Dissanayake)
Adventa Health - Malaysia, Neopharma Biotech - Asia, Dowell International (Pvt.) Limited, Beta Healthcare Products (Pvt.) Limited, Zhen Jiang Suhui Latex Products Company Limited - China.

ගරු මන්ත්‍රීතුමනි, හදිසි මිලදී ගැනීම් වෛද්‍ය සැපයීම් අංශයෙන් සිදු කරනු ලබන අතර, ඊට අදාළ සමාගම් තිබෙනවා. ඒවා තමයි, Delmege Medical (Pvt.) Limited, Medicare Pharma Lanka (Pvt.) Limited, Sisil Projects Consortium (Pvt.) Limited and Shield Medicals (Pvt.) Limited.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් ටික අපට දෙන්න බැරි ඇයි?

ගරු ලලිත් දිසානායක මහතා
(*மாண்புமிகு லலித் திசாநாயக்க*)
(The Hon. Lalith Dissanayake)
අප අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම්, ගම් ඉල්ලන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ඒවා මේ පාර්ලිමේන්තුවට දෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් දෙන්න බැරි ඇයි? මොකද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ විතරක් එහෙම? අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් ඉල්ලුවාම ඒවා දෙන්න ඕනෑ.

ගරු ලලිත් දිසානායක මහතා
(*மாண்புமிகு லலித் திசாநாயக்க*)
(The Hon. Lalith Dissanayake)
ඒක පෞද්ගලික සමාගමක්. අපට ගන්න බැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ඇයි හංගන්නේ?

ගරු ලලිත් දිසානායක මහතා
(*மாண்புமிகு லலித் திசாநாயக்க*)
(The Hon. Lalith Dissanayake)
අප අධ්‍යක්ෂ මණ්ඩලය එක්ක බැඳිලා නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ඇයි දෙන්න බැරි? මොකක්ද තිබෙන ප්‍රශ්නය?

ගරු ලලිත් දිසානායක මහතා
(*மாண்புமிகு லலித் திசாநாயக்க*)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා ප්‍රශ්නයක් අහපු නිසා උත්තර දෙන්න මා බැඳිලා ඉන්නවා. එපමණයි. පෞද්ගලික අංශයේ දේවල්වලට උත්තර දෙන්න අපට අවශ්‍යතාවක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඒක පුදුම කථාවක් නේ. ඒ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් ටික දුන්නා කියලා මොකක්ද තිබෙන ප්‍රශ්නය? දෙන්නේ නැත්තේ ආරක්ෂක හේතූන් මතද, නැත්නම් වෙන හොරයක් තිබෙනවාද?

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)
ඒක පිළිතුරු දෙන කෙනාගෙන්ම අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මට අයිතියක් තිබෙනවා ඒ ගැන අහන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(*மாண்புமிகு லலித் திசாநாயக்க*)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මිල දී ගැනීමේ ක්‍රියාවලියේදී අයිතම මිලදී ගනු ලබන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ විස්තර එම සමාගම්වලින් අපට ලබා දෙන්නේ නැහැ. ඒ නිසා අප ඒවා අහන්න යන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ඒක පුදුම කථාවක් නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(*மாண்புமிகு லலித் திசாநாயக்க*)
(The Hon. Lalith Dissanayake)
සමාගම තිබෙනවා. සමාගම bid එක ගන්නවා. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නේ නැත්නම් ඉගෙන ගන්න. කවදා හරි ඇමතිවරයෙකු වුණාම ඒවා ප්‍රයෝජනවත් වෙයි. ඒ සියලුම දේවල් දෙන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයට තිබෙන ප්‍රශ්නය ඒකම තමයි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Bid එක දෙනවා. ඊට පස්සේ -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපට දැන ගන්න ඕනෑ, කවුද ඒ ආනයනය කරන සමාගම්වල ඉන්නේ කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, අධ්‍යක්ෂවරු නැති සමාගම්වලටයි දීලා තිබෙන්නේ. එහෙම නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය අපේ ඖෂධවලට කරන හොරකමේ ප්‍රතිඵලය මේකම තමයි. මේක තමයි ප්‍රධාන ප්‍රශ්නය.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මොකක්ද හොරකම කියලා කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දැන් අතුරු ප්‍රශ්න තුනම ඉවරයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ වංචාව පිළිබඳව කථා කරන්න තමයි මම අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් ටික ඉල්ලුවේ. දැන් ඒ නම් ටික දෙන්නේ නැහැ. ඒ නිසා මම දැන් කියන්නම්, මොකක්ද සිදු වෙලා තිබෙන්නේ කියලා. ගරු කථානායකතුමනි, 2011 වර්ෂයේ අත්වැසුම් සම්බන්ධව ටෙන්ඩර් එකක් කැඳෙව්වා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාමාන්‍යයෙන් ප්‍රශ්න අහන්නේ ඔහොම නොවෙයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න වශයෙන් අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. රුපියල් 20කට, 23කට විතර ගන්න පුළුවන් ශල්‍ය අත් වැසුම් රුපියල් 45ට අරගෙන තිබෙනවා. ඊට අමතරව කොළඹ ජාතික රෝහල අරගෙන තිබෙනවා, රුපියල් 67.50ට. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2011 වර්ෂයේ ශල්‍ය අත් වැසුම් මිල දී ගැනීම සම්බන්ධයෙන් එහෙම දෙයක් සිදු වුණා ද, නැද්ද කියලා කරුණාකරලා ඔබතුමා මට කියන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමා අහපු ප්‍රශ්නයට අනුව උත්තර දීලා තිබෙනවා, කොයි ආකාරයෙන් ද අරගෙන තිබෙන්නේ සහ ඒ අර ගත්තු සමාගම් මොනවා ද කියලා. ඒවා වෛද්‍ය සැපයුම් අංශය සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ටෙන්ඩර් කරලා අරගෙන තිබෙනවා. ටෙන්ඩර් කමිටුවක් තිබෙනවා. එය ඇමුණුම් 1හි තිබෙනවා. ඒ කමිටුව අනුමැතිය දීලා තිබෙනවා. ඒ කමිටුව විශේෂඥ මණ්ඩලයකිනුයි සමන්විත වෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වහනවා, වහනවා. හෝ ගාලා වහනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ අනුව තුන් දෙනෙකුගෙන් මිලදී ගැනීම් කරලා තිබෙනවා. එච්චරයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වහනවා, වහනවා. පොත පෙරළ, පෙරළා වහනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ අනුව මිලදී ගැනීම් කරලා තිබෙනවා. එච්චරයි මට කියන්න තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම ඇහුවේ, රුපියල් 20ට, 23ට ගන්න පුළුවන් එක රුපියල් 60ට ගත්තේ නැද්ද කියලායි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා ඒ සමාගම ගැන වෙනම ප්‍රශ්නයක් අහන්න. ඒ සමාගමෙන් රුපියල් 45ට වඩා අරගෙන තිබෙනාවද, වංචා කරලා තිබෙනවාද කියලා වෙනම ප්‍රශ්නයක් අහන්න, අපි ඒකට උත්තර දෙන්නම්.

[ගරු ලලිත් දිසානායක මහතා]

ගරු කථානායකතුමනි, සමස්තයක් වශයෙන් ගත්තොත් එතුමා මගෙන් මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ රජයේ රෝහල් සඳහා ශල්‍ය අත් වැසුම් මිල දී ගන්නේ කොහොමද කියන එක සහ එසේ මිලදී ගැනීමක් කරලා තිබෙනවා ද කියලායි. මම ඒකට උත්තර දීලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අවසාන අතුරු ප්‍රශ්නයත් අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ඔය තරම් වැල්වටාරං කියන්න දෙයක් නැහැ. මම එතුමාගෙන් ඇහුවේ, රුපියල් 20ත්-23ත් අතර මිලකට තිබෙන ශල්‍ය අත් වැසුම් ටෙන්ඩරයකින් ගන්න පුළුවන්කම තියෙද්දි, දේශීය වශයෙන් රුපියල් 67.50ට මේ ශල්‍ය අත් වැසුම් අරගෙන තිබෙනවාද, නැද්ද කියන එකයි. මේ සඳහා වැය වන්නේ මේ රටේ මිනිස්සුන්ගේ මුදල්.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ප්‍රශ්නයට ශල්‍ය අත් වැසුම් අදාළ නැත්නම් වෙන මොකක්ද අදාළ වන්නේ?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එතුමා අසා තිබෙන ප්‍රශ්නයට මම උත්තර දුන්නා. මේ ශල්‍ය අත් වැසුම් ආනයනය කරන සමාගම් මොනවාද, ඒවා මිලදී ගන්නා ආකාරය කුමක්ද කියලා මම කිව්වා. මේ ශල්‍ය අත් වැසුම් දේශීය වශයෙන් ගන්න කොට වැඩි මිලට ගන්න සිද්ධ වනවා කියලා මෙහි සඳහන් කරලා තිබෙනවා. ඒක තමයි මට දෙන්න තිබෙන උත්තරය. ගරු මන්ත්‍රීතුමා අසන අනෙක් කාරණය පිළිබඳව වෙනම ප්‍රශ්නයක් අහන්න. ඒ අදාළ කොමිපැනියත් එක්ක කථා කරලා එතකොට අපට ඒකට උත්තර දෙන්න පුළුවන්. අපට හංගන්න දෙයක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඔබතුමාට තේරෙනවා. මේ කාරණය ඔබතුමාට බොහොම පැහැදිලියි. මම ඇහුවේ ශල්‍ය අත් වැසුම්-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාමාන්‍යයෙන් ප්‍රශ්නයක් අහන කොට අදාළ ඇමතිතුමාට හෝ නියෝජ්‍ය ඇමතිතුමාට ඒ විෂයය පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙනවාද කියන එක ගැන එතුමාත් -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ශල්‍ය අත් වැසුම දමන්න ඕනෑ එතුමාගේ ඔළුවේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6-2491/'12-(4), ගරු රන්ජන් රාමනායක මහතා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු කථානායකතුමනි, පිළිතුර සූදානම් වුවත්, මේ කාරණයට අදාළ කාන්තාවගේ පෞද්ගලිකත්වය පිළිබඳව ප්‍රශ්නයක් මතු විය හැකි නිසා පිළිතුර දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික නමක් සඳහන් කරලා ප්‍රශ්නයක් අහනවා නම්, එය උපදේශක කාරක සභාවේදී ඇහුවොත් හොඳයි නේද?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය තුන් වතාවක් අසා තිබෙනවා. තුන් වතාවේම පිළිතුර ලබා දෙන්න කල් ඉල්ලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නමක් කියා ප්‍රශ්නයක් අසන කොට අදාළ තැනැත්තියට අපහාසයක් වන පිළිතුරක් දුන්නොත් එම තැනැත්තියට එය හොඳද, නරකද? ඒ නිසා උපදේශක කාරක සභාවේදී මේ ප්‍රශ්නය ඇහුවොත් හොඳයි නේද?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, එසේ නම් මෙම ප්‍රශ්නය උපදේශක කාරක සභාවට යොමු කරන්නම්.

අවසර දෙන ලදුව ප්‍රශ්නය ඉල්ලා අස් කර ගන්නා ලදී.
வினா, அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.
Question, by leave, withdrawn.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ දේශපාලන පත්වීම්: ගැටලු
கல்வித்துறையில் அரசியல் நியமனங்கள்: பிரச்சினைகள்
POLITICAL APPOINTMENTS IN EDUCATION SECTOR : PROBLEMS

2971/'12

7. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රැකියා වියුක්ත උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් සිටියදී දේශපාලන බලපෑම් මත පුද්ගලයන් 745 දෙනෙකුට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධ රැකියා අවස්ථාවන් ලබා දී ඇති බවත්;

(ii) මූලික සුදුසුකම්වත් සපුරා නොමැති මෙවැනි නිලධාරීන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සේවයේ යෙදවීම නිසාවෙන් අද වන විට එම ක්ෂේත්‍රයේ විවිධ ගැටලුකාරී තත්ත්වයන් නිර්මාණය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දේශපාලන පත්වීම් ලබා දීම අධීක්ෂණය කළ බලධාරීන් කවුරුන්ද;

(ii) දැනුමෙන් පිරිපුන් උපාධිධාරීන් සිටියදී ඔවුන්ට අදාළ පත්වීම් නොදී වෙනත් බලපෑම් මත පත්වීම් ලබා දීමට කටයුතු කිරීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් දේශපාලන පත්වීම් ලබා දුන් නිලධාරීන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයන් ගැනීමටත්;

(ii) ලබා දුන් එම පත්වීම් අවලංගු කොට ඇති වන පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට වීනා:

(අ) (i) තොළිලත්ත පට්ටතාරිකළ් පෙරුම් එණ්ණික්කෙයිනර් උළ්ළපෝතු අරසියල් සෙල්වාක්කු කාරණමාක 745 පේරුක්කු කල්විත් තුරෙයිල් පල්වේරු තොළිල්වාය්ප්පුක්කළ් වළංගප්පට්ටුළ්ළතෙන්පතෙයුම්;

(ii) අටිප්පටෙයිත් තකෙමෙමකළෙක් කූටප් පූර්ත්ති සෙය්යාත ඉව්වාරාන උත්තියෝකත්තර්කළ් කල්විත්තුරෙයිල් සේවෙයිල් ඊටුපටුත්තප් පට්ටුළ්ළමෙයාල් ඉන්රු අත්තුරෙයිල් පල්වේරු පිරච්සිනෙකළ් ඒර්පට්ටුළ්ළ තෙන්පතෙයුම්

අවර් අරිවාරා?

(ආ) (i) මේර්කූරියවාරු කල්විත්තුරෙයිල් අරසියල් නියමනංකළ් වළංගප්පටුවතෙ මේර්පාර්වෙ සෙය්ත අතිකාරිකළ් යාර් එන්පතෙයුම්;

(ii) අරිවු නිරම්පිය පට්ටතාරිකළ් ඉරුක්කෙයිල් අවර්කළුක්කු උරිය නියමනංකළෙ වළංගාතු වේරු අළුත්තංකළින්මීතු තොළිල් වළංග නටවටික්කෙ එටුක්කප්පට්ටතර්කාන කාරණම් යාතෙන්පතෙයුම්;

අවර් කුරිප්පිටුවාරා?

(ඉ) (i) මේර්කූරියවාරු අරසියල් නියමනංකළෙ වළංගිය උත්තියෝකත්තර්කළ් තොටර්පාක උරිය නටවටික්කෙකළ් එටුප්පතර්කුම්;

(ii) වළංගප්පට්ට අන්ත නියමනංකළෙ ඉරත්තුච් සෙය්තු, ඒර්පටුම් වෙට්රිටංකළුක්කු පට්ටතාරි කළෙ ආට්චේර්ප්පතර්කුම්;

නටවටික්කෙ එටුප්පාරා එන්පතෙ අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ඊ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Education:

(a) Is he aware that-

(i) 745 persons have been provided with various employment opportunities within the education sector on political influence, while a large number of graduates remain unemployed ; and

(ii) various problematic situations have arisen in the education sector as a result of employing such officers who have not met even the basic qualifications in the aforesaid sector ?

(b) Will he state -

(i) the authorities who supervised the granting of political appointments in the education sector in the aforesaid manner; and

(ii) the reason for granting appointments on other influences, without granting appointments to graduates who are well equipped with knowledge ?

(c) Will he inform this House whether steps will be taken -

(i) to take proper action regarding the officers who granted the aforesaid political appointments; and

(ii) to cancel the appointments so granted and recruit graduates for vacancies created as a result ?

(d) If not, why ?

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

රැකියා විරහිත උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් සිටියදී දේශපාලන බලපෑම් මත පුද්ගලයන් 745 දෙනෙකු අධ්‍යාපන අමාත්‍යාංශයේ තනතුරු සඳහා අපි බඳවා ගෙන නැහැ, ගරු කථානායකතුමනි.

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන විද්‍යාපීඨ හා ජාතික පාසල්වල පුරප්පාඩු වූ විෂයයන් ඉගැන්වීම සඳහා ඇති අවශ්‍යතාවන් පදනම් කර ගෙන උපාධිධාරී අභ්‍යාසලාභී යෝජනා ක්‍රමය යටතේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා උපාධිධාරීන් 337ක් අනුයුක්ත කර ගෙන ඇත.

ඒ හැර කිසිවෙක් අධ්‍යාපන අමාත්‍යාංශයටවත්, ගුරු වෘත්තියටවත්, විද්‍යාපීඨවලටවත් ස්ථිර පත්වීම් සඳහා බඳවා ගෙන නැහැ.

මම කැමැතියි, ගරු මන්ත්‍රීතුමාට තොරතුරු ලබා දෙන්න. අඩිඩාලව්වේනෙයි ජාතික අධ්‍යාපන ආයතනයට දෙමළ විෂයය ඉගැන්වීම සඳහා අපි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලලා අභ්‍යාසලාභීන් අනුයුක්ත කර තිබෙනවා. රැකියාවක් දීලා නැහැ. ඒ සඳහා වැටුප් ගෙවන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නොවෙයි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය තමයි ඒ අනුයුක්ත කිරීමට අදාළ වැටුප් ගෙවන්නේ.

(ii) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

කිසිදු බලධාරියෙක් නොමැත.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

(ii) අදාළ නොවේ. එහෙම කරලාම නැහැ.

ගරු කථානායකතුමනි, මම එතුමාගෙන් උදව්වක් ඉල්ලන්න කැමැතියි. මම තොරතුරු තාක්ෂණය සඳහා මහින්දෝදය පාසල් දාහට උපාධිධාරීන් 920 දෙනෙකු බඳවා ගත්තා. ඉන් 630 දෙනායි පත් වීම් භාර ගත්තේ. 280ක් හිඟයි. මම ඒ 280 හොයනවා. මේ පත් වීම් ගත්ත 630 දෙනාගෙනුත් 159 දෙනෙකු අභියාචනා ඉදිරිපත් කර තිබෙනවා. සුදුසුකම් ඇති ඉංග්‍රීසි උපාධිධාරී ගුරුවරුන් 1,000ක් බඳවා ගෙන 260 දෙනෙකුට පත් වීම් දුන්නා. 93 දෙනායි පත් වීම් ටික ගත්තේ. ඉතිරි අය ආපසු ආවා. එතැන 169ක් හිඟයි. දැනට 93 දෙනායි ඉන්නේ. මට ඉංග්‍රීසි ගුරුවරුන් හැටියට උපාධිධාරීන් 907ක් ඕනෑ. මෙතැන කිසිම දේශපාලනයක් නැහැ. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා පුළුවන් නම් ඒ ගුරුවරු ටික ලබා දෙන්න කියලා.

විද්‍යාව විෂයයට 500 දෙනකුට අපි පත් වීම් දෙනවා. 489 දෙනායි තවම බඳවා ගන්න පුළුවන් වුණේ. 11ක් අඩුයි. ගණිතය විෂයයට 490කට පත් වීම් දුන්නා. 362යි පත් වීම් බාර ගත්තේ. උපාධිධාරීන් 138ක් තව අඩුයි. අපිට ඔවුන් ලබා දෙන්න. දේශපාලන බලපෑම් කිසිම දෙයක් නැහැ. මේ රටේ අවශ්‍යතාවන්ට අනුව උපාධිධාරීන් ඉන්නවා නම් ඕනෑ තරම් රක්ෂා අවස්ථා තිබෙනවා. ඒ විෂයයන් අනුව අවශ්‍ය පුද්ගලයෝ තමයි හිඟ.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මම අපේ අධ්‍යාපන ඇමතිතුමාගෙන් අහන්නේ මේ කාරණයයි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය කියන්නේ මේ රජයේ අමාත්‍යාංශයක් නේ. ඇමතිතුමා දැන් කිව්වා, උපාධිධාරීන් අනුයුක්ත කර තිබෙනවාය කියලා. උපාධිධාරීන් මේ තරම් ප්‍රමාණයක් කෙළින්ම බඳවා ගෙන තිබියදීත් ඒ ගොල්ලන් ස්ථිර කරලා ඒ සේවයට ගන්නේ නැත්තේ ඇයි?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඔබතුමා අහන්නේ එහෙම ප්‍රශ්න නොවෙයි. දැන් ඔබතුමා ඇහුවා නේ ලබා දුන් පත් වීම් අවළංගු කොට ඇති වන පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගන්න කටයුතු කරන්නේ ද කියලා. මම හොයනවා, දරුවන්ට උගන්වන්න ගුරුවරු නැතිව. ඔබතුමා මේ ප්‍රශ්නයේ දී කියනවා, ඒ ටික ගෙදර යවන්න කියලා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔය කියන විධියට නම් කිසිම දේශපාලනයක් නැහැ. අප උපදේශක කාරක සභාවට ගියාම පෙනෙනවා මෙතැන තිබෙන දේශපාලනය. මා ඒ නම් ලැයිස්තු ටිකත් හරියාකාරව සොයා ගන්න බලන්නම් කෝ. එතකොට පැහැදිලිව ඔබතුමාට කියන්න පුළුවන් නේ. ප්‍රශ්නය මේකයි ගරු ඇමතිතුමා. ඔබතුමා පුන පුනා කියනවා මෙහි දේශපාලනය නැහැ, මෙහි ප්‍රශ්න නැහැ කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ප්‍රශ්නය අහන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ප්‍රශ්න වැලයි නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මා කියන්නේ ඒක නොවෙයි. මේ ප්‍රශ්නයට නේ උත්තර දුන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ප්‍රශ්න වැලයි කියන කාරණය මැනවින් පැහැදිලි වෙනවා උපදේශක කාරක සභාවේදී ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන් නඟන ප්‍රශ්නවලින්ම. ආණ්ඩු පක්ෂයෙන් නේ වැඩියෙන්ම ඇමතිතුමාට කරදර කළේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
තමුන්නාන්සේගේ ප්‍රශ්නවලට නේ උත්තර දෙන්නේ. කථා පවත්වන්න-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔයිට වඩා ලස්සන නැද්ද ප්‍රශ්නයක් කෙටියෙන් අහන එක? පිළිතුරත්-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පිළිතුරක් දෙන්න, ප්‍රශ්නයක් අහන්න ගරු මන්ත්‍රීතුමනි. කථාවක් පැවැත්වීම නොවෙයි නේ කරන්න ඕනෑ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
හරි, මම මෙහෙම කියන්නම් කෝ එහෙම නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම කියන්න එපා. ප්‍රශ්නය අහන්න කෙටියෙන්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මම මෙහෙම අහන්නම් කෝ ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමාත් කෙටියෙන් පිළිතුර දෙන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, රුපියල් 10,000 දීමනාවකට උපාධිධාරීන් බඳවා ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට, එක එක තැන්වලට අනුයුක්ත කරලා තිබෙනවා නේ. දැන් පාසල්වල ගුරුවරුන්ගේ හිඟයකුත් තිබෙනවා නේ. ඒ අය කෙළින්ම බඳවා ගෙන ස්ථිර වැටුප් තලයක පිහිටුවන්නේ නැත්තේ ඇයි කියලා කරුණාකර මට කියන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එහෙම කරන්න බැහැ. ගුරු ව්‍යවස්ථාවක් තිබෙනවා. ගුරු ව්‍යවස්ථාවේ තිබෙන ආකාරයට ගුරුවරයකු බඳවා ගන්න කොට ඔහු උපාධිධාරියකු වෙන්න ඕනෑ, විභාගයක් පවත්වන්න ඕනෑ, සම්මුඛ පරීක්ෂණය පවත්වන්න ඕනෑ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, උපාධිධාරීන් තමයි ඒ ඉන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගුරු ව්‍යවස්ථාවට පටහැනිව බඳවා ගන්න මට පුළුවන්ද, මේ මන්ත්‍රීතුමා කිව්වා කියලා?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අතුරු ප්‍රශ්න තුනම අහලා අවසානයි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අතුරු ප්‍රශ්න දෙකයි ඇහුවේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ. එක් ප්‍රශ්නයකින් අතුරු ප්‍රශ්න 5ක් විතර අහනවා.

ග්‍රාම නිලධාරී පුරප්පාඩු : මාතර දිස්ත්‍රික්කය
கிராம உத்தியோகத்தர் வெற்றிடங்கள்: மாத்தறை மாவட்டம்
VACANCIES FOR GRAMA NILADHARIS : MATARA DISTRICT

1964/'11

8. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරී පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින බවත්;

(ii) ඉහත පරිදි ග්‍රාම නිලධාරී පුරප්පාඩු පැවතීම පරිපාලන කටයුතු කර ගෙන යාමට විශාල බාධාවක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වන විට, එම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින ග්‍රාම නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தில் அமைந்துள்ள அனைத்துப் பிரதேச செயலாளர் பிரிவுகளிலும் கிராம உத்தியோகத்தர்களுக்கான வெற்றி டங்கள் பாரிய அளவில் நிலவுகின்றதென்ப தையும்;

(ii) மேலே கூறப்பட்டவாறு கிராம உத்தியோகத்தர் வெற்றிடங்கள் நிலவுகின்றமை நிர்வாக நடவடிக்கைகளைப் பேணிவருவதற்கு பாரிய தடையாக அமைகின்றதென்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) தற்போது மேற்படி மாவட்டத்தில் ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிலும் நிலவுகின்ற கிராம உத்தியோகத்தர் வெற்றிடங்களின் எண்ணிக்கை தனித்தனியாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி வெற்றிடங்களைத் துரிதமாக நிரப்புவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Will he admit the facts that -

(i) there are many vacancies for Grama Niladharis in all Divisional Secretary's Divisions in Matara District; and

(ii) vacancies for Grama Niladharis existing in this manner is a big hindrance for the administrative activities?

(b) Will he inform this House -

(i) separately, the number of vacancies for Grama Niladharis in each Divisional Secretariat Division of that district at present; and

(ii) whether arrangements will be made to fill those vacancies expeditiously?

(c) If not, why ?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2012.12.31 දිනට මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී පුරප්පාඩු 186ක් පවතී.

(ii) නැත. පුරප්පාඩු පවතින වසම් සඳහා වැඩ බැලීමට මේ වන විටත් ග්‍රාම නිලධාරීන් පත් කර ඇති අතර, එම නිලධාරීන් විසින් ඒ ඒ වසම්වල රාජකාරී කටයුතු සාමාන්‍ය පරිදි ඉටු කරනු ලබයි.

(ආ) (i)

	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව	2012.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව
1	මාතර	66	13
2	මුලටියන	48	13
3	හක්මන	34	12
4	අතුරලිය	28	6
5	කඹුරුපිටිය	39	12
6	පිටබැද්දර	40	18
7	තිහගොඩ	40	11
8	කොටපොල	37	4
9	වැලිපිටිය	38	10
10	දෙවිනුවර	41	15
11	දික්වැල්ල	48	14
12	කිරින්ද පුහුල්වැල්ල	25	6
13	අකුරැස්ස	46	15
14	මාලිම්බඩ	29	8
15	පස්ගොඩ	43	11
16	වැලිගම	48	18
	එකතුව	**650**	**186**

මේ අනුව සියලුම පුරප්පාඩු සංඛ්‍යාව 186යි. මුළු මාතර දිස්ත්‍රික්කයේම අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව 650යි.

(ii) දිවයින පුරා පවතින ග්‍රාම නිලධාරී පුරප්පාඩු පිරවීම සඳහා 2012.10.05 දිනැති ගැසට් නිවේදනය අනුව මේ වන විටත් අයදුම් පත් කැඳවා අවසන් කර ඇති අතර, ඒ අනුව විවෘත තරග විභාගයක් පවත්වා සුදුසුකම් ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉදිරියේ දී බඳවා ගැනීමට කටයුතු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා සඳහන් කළා, මාතර දිස්ත්‍රික්කය තුළ පමණක් පුරප්පාඩු 186ක් තිබෙන බව. ගරු කථානායකතුමනි, ග්‍රාම නිලධාරී තනතුරු 650කින් 186ක් පුරප්පාඩු වී තිබෙනවා. දළ වශයෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් පුරප්පාඩු වෙලා තිබෙනවා. ග්‍රාම නිලධාරිවරයකු වැඩ බලන්න පත් කළාම එම ග්‍රාම නිලධාරිවරයාට තමන්ගේ කොට්ඨාසයේ වැඩ කටයුතු ටික පමණක් නොවෙයි, තවත් කොට්ඨාසයක වැඩ කරන්න සිදු වෙනවා. එතකොට කාර්යක්ෂමතාවයේ බරපතළ ඝෝදා පාළුවක් ඇති වනවා. ඒ නිසා මේ වෙනුවෙන් -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ නිසා කාර්යක්ෂමතාවයේ බරපතළ ඝෝදා පාළුවක් සිදු වෙනවාද? ඒක නේ ප්‍රශ්නය?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්. ඒ වෙනුවෙන් ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකට උත්තරය අහගන්න කෝ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු මන්ත්‍රීතුමනි, මේ තිබෙන ප්‍රශ්නය විසඳීමට තමයි ඉල්ලුම් පත්‍ර කැඳවා මේ විභාගය පවත්වන්නට දැන් කටයුතු කරන්නේ. මා හිතන විධියට ලබන මාසයේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් මේ විභාගය පවත්වන්නට කටයුතු යොදා තිබෙනවා. ඒ සඳහා අපට පුළුවන් ඉක්මන් පියවර දැන් ගනිමින් තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙටියෙන් අහන්න, විස්තර එපා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඇමතිතුමනි, විභාගය පවත්වා ඒ බඳවා ගන්නා මොහොත වනකොට තවත් පුරප්පාඩු කිහිපයක් ඇති වනවා. ඒ නිසා, ඇයි අමාත්‍යාංශයට බැරි -

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මොකක්ද ඒකට විසඳුම? ඒක හැමදාමත් සිදු වන දෙයක්. කොයි තනතුරකට වුණත් බඳවා ගැනීම් සිදු කරනකොට ඒ අතරතුර පුරප්පාඩු ඇති වනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ඒක තමයි. මට ප්‍රශ්නය අහන්න දෙන්නේ නැහැ නේ. මට දෙවෙනි අතුරු ප්‍රශ්නය අහන්න දෙන්න කෝ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ කථා පවත්වන්නේ නැතිව අතුරු ප්‍රශ්නය ඇහුවොත් පිළිතුරු දෙයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
මේ අහන්නේ මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයයි ගරු කථානායකතුමනි. සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම යම් කිසි මට්ටමකින් ග්‍රාම නිලධාරීන් පස් දෙනෙකුගේ වාගේ සංචිතයක් පවත්වාගෙන යන්න අමාත්‍යාංශයට බැරි ඇයි? අනෙක් කාලය තුළ වෙනත් වැඩ ආවරණය කරන්න දීලා -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්නය පමණක් අහන්න.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු කථානායකතුමනි, එවැනි දෙයක් කරන්න බැහැ. සංචිතයක් පවත්වාගෙන යන්න බැහැ. මොකද, අවශ්‍ය ප්‍රමාණයවත් දැන් නැතිවයි අපි ඉන්නේ. ඒ නිසා තමයි අපි දැන් ඉල්ලුම් පත්‍ර කැඳවා විභාගයක් පවත්වන්න කටයුතු කරන්නේ. මේක වැළැක්විය නොහැකි තත්ත්වයක්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, දැන් අවශ්‍ය සංඛ්‍යාවත් නැත්නම් -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔය තුන්වැනි අතුරු ප්‍රශ්නයද අහන්නේ?

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ඔව්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද අහන්නේ?

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද අහන ප්‍රශ්නය?

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අවශ්‍ය ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව නැත්නම්, තරග විභාගයක් පවත්වන්නේ අවශ්‍ය සංඛ්‍යාව බඳවා ගන්නයි. එතකොට දැන් සංචිතයක් පවත්වාගෙන යන්න බැරි cadre එකේ ප්‍රශ්නයක් නිසා නම් කවදාවත් මේ ප්‍රශ්නය නිරාකරණය කරන්න බැහැ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
සංචිතයක් පවත්වාගෙන යන්නේ කොහොමද, -

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඉතින් ඒ නිසා අවම වශයෙන්-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉතින් කෙටියෙන් අහන්න කෝ, සංචිතයක් පවත්වාගෙන යන්න බැරි මොකද කියලා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
සංචිතයක් පැවැත්වීමේ ක්‍රමයක් නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එහෙම ක්‍රමයක් හදන්න බැරි ඇයි?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒක කරන්න බැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඇයි බැරි?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
තමුන්නාන්සේ මගේ අමාත්‍යාංශයට ආවොත් මම කියලා දෙන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඒ ඇති.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ඒ ග්‍රාම නිලධාරීන්ට යම් කිසි වැඩ කොටසක් කරන්න භාර දීලා කරනවා නම් කරන්න පුළුවන්.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ටි.ජේ. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මොන ශ්‍රේණියකවත් එහෙම කරන්නේ නැහැ.

රට තුළ සිදු කළ සමස්ත බහාලූ මෙහෙයුම් ප්‍රමාණය : විස්තර

நாட்டின் மொத்த கொள்கலன் அசைவு : விபரம்
TOTAL CONTAINER MOVEMENT IN THE COUNTRY : DETAILS

2188/'11

9. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) පසු ගිය වර්ෂ පහක කාලය තුළ,

(i) රට තුළ සිදු කළ සමස්ත බහාලූ මෙහෙයුම් ප්‍රමාණය කොපමණද;

(ii) එක් එක් වරාය සහ නැංගුරම්පොළ අනුව රට තුළ සිදු කළ සමස්ත බහාලූ මෙහෙයුම් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ එක් එක් වරාය සහ නැංගුරම්පොළ අනුව මෙහෙයවන ලද දේශීය බහාලූ ප්‍රමාණය කොපමණද;

(iv) ඉදිරි වර්ෂ පහ තුළ සිදු වෙතැයි අපේක්ෂා කරන බහාලූ මෙහෙයුම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසු ගිය වර්ෂ පහක කාලය තුළ,

(i) ශ්‍රී ලංකාවේ වරායවල මෙහෙයවන ලද නැව් භාණ්ඩ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ මෙහෙයුම් වියදම සහ උපයාගත් ආදායමේ වටිනාකම රුපියල්වලින් කොපමණද;

(iii) වරාය අධිකාරිය විසින් මෙහෙයවන ලද සාමාන්‍ය නැව් භාණ්ඩ ප්‍රමාණය එක් එක් වරාය සහ නැංගුරම් පොළ අනුව කොපමණද;

(iv) එම භාණ්ඩ අතරින් බහුතර භාණ්ඩ ප්‍රමාණයක ආරම්භක නැවිගත කළ ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) கடந்த ஐந்து வருடங்களில்,

(i) நாட்டின் மொத்த கொள்கலன் அசைவையும்;

(ii) ஒவ்வொரு துறைமுகத்தின் ஒவ்வொரு கப்பல் நங்கூரமிடப்படும் பிரதேசத்திலும் நாட்டின் மொத்தகொள்கலன் அசைவை தனித்தனியாக வும்;

(iii) ஒவ்வொரு துறைமுகத்திலும் நங்கூரமிடல் பிரதேசத்திலும் இலங்கையில் கையாளப்பட்ட உள்நாட்டு கொள்கலன்களைத் தனித்தனியாக வும்;

(iv) அடுத்த ஐந்து வருடங்களுக்குமான கொள்கலன் அசைவின் முன்கணிப்பையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) கடந்த ஐந்து வருடங்களில்,

(i) இலங்கைத் துறைமுகங்களில் கையாளப்படும் கப்பல் சரக்குகளின் எண்ணிக்கையையும்;

(ii) அவற்றை கையாளுவதற்கான செலவினத்தை யும் ஈட்டப்பட்ட வருமானத்தையும் ரூபாய் பெறுமதியிலும்;

(iii) துறைமுக அதிகார சபையினால் ஒவ்வொரு துறைமுகத்திலும் ஒவ்வொரு கப்பல் நங்கூர மிடப்படும் பிரதேசத்திலும் கையாளப்பட்ட பொது கப்பல் சரக்குகளின் அளவைத் தனித்தனி யாகவும்;

(iv) அதிகப்படியான கப்பல் சரக்கு எங்கிருந்து அனுப்பப்பட்டது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he state for the last five years -

(i) the total container movement in the country ;

(ii) the total container movement in the country per port, per berth;

(iii) the domestic containers handled in Sri Lanka per port, per berth; and

(iv) the prognosis of container movement for the next five years?

(b) Will he inform this House for the last five years -

(i) the number of cargoes handled in ports of Sri Lanka;

(ii) their handling cost and the revenue earned in rupee value;

(iii) the quantity of general cargoes handled by the Ports Authority on per port, per berth basis; and

(iv) as to where most of the cargoes were originated?

(c) If not why?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Minister of Ports and Highways)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

*** සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

අමාත්‍යාංශය - වරාය හා මහාමාර්ග

ප්‍රශ්නය අසනු ලබන මන්ත්‍රීවරයා - ගරු රවි කරුණානායක මහතා

ප්‍රශ්නය අසනු ලබන දිනය - 2013.03.05

පාර්ලිමේන්තු ප්‍රශ්න අංක 2188/11 සඳහා පිළිතුරු

(අ) (i) රට තුළ සිදු කළ සමස්ත බහලු මෙහෙයුම් ප්‍රමාණය,

කොළඹ වරාය (බහලු ධාරිතාවය ටිස්සේ සම ඒකක)

වසර	2007	2008	2009	2010	2011
ටිස්සේ සම ඒකක	3,381,242 (තිස්තුන් ලක්ෂ අසූ එක් දහස් දෙසිය හතලිස් දෙකයි)	3,687,338 (තිස්හය ලක්ෂ අසූහත් දහස් තුන්සිය තිස්අටයි)	3,464,297 (තිස්හතර ලක්ෂ හැට හතර දහස් දෙසිය අනූ හතයි)	4,137,441 (හතලිස් එක් ලක්ෂ තිස් හත් දහස් හාරසිය හතලිස් එකයි)	4,262,887 (හතලිස් දෙලක්ෂ හැට දෙදහස් අටසිය අසූ හතයි)

(ii) එක් එක් වරාය හා නැංගුරම්පොළ අනුව රට තුළ සිදුකළ සමස්ත බහලු මෙහෙයුම් ප්‍රමාණය,

කොළඹ වරාය (බහලු ධාරිතාවය ටිස්සේ සම ඒකක)

පර්යන්තය/පාලම	2007	2008	2009	2010	2011
ජය බහලු පර්යන්තය	1,635,530 (දාසය ලක්ෂ තිස්පන් දහස් පන්සිය තිහයි)	1,756,090 (දාහත් ලක්ෂ පනස්හය දහස් අනූවයි)	1,579,676 (පහලොස් ලක්ෂ හැත්තෑ නව දහස් හයසිය හැත්තෑ හයයි)	1,987,071 (දහනව ලක්ෂ අසූ හත්දහස් හැත්තෑ එකකි)	2,071,908 (විසි ලක්ෂ හැත්තෑ එක් දහස් නවසිය අටයි)
සමඟි බහලු පර්යන්තය	196,241 (එක්ලක්ෂ අනූහය දහස් දෙසිය හතලිස් එකයි)	201,486 (දෙලක්ෂ එක්දහස් හාරසිය අසූ හයයි)	132,313 (එක්ලක්ෂ තිස් දෙදහස් තුන්සිය දහතුනයි)	179,320 (එක්ලක්ෂ හැත්තෑ නව දහස් තුන්සිය විස්සයි)	227,361 (දෙලක්ෂ විසි හත්දහස් තුන්සිය හැට එකයි)
සාම්ප්‍රදායික නැව් බඩු පාලම්	2,963	3,322	2,499	782	177
ශ්‍රී ලංකා වරාය අධිකාරිය (4=1+2+3)	1,834,734 (දහඅට ලක්ෂ තිස් හතර දහස් හත්සිය තිස්හතරයි)	1,960,898 (දහනව ලක්ෂ හැට දහස් අටසිය අනූ අටයි)	1,714, 488 (දාහත් ලක්ෂ දාහතර දහස් හාරසිය අසූ අටයි)	2,167,173 (විසිඑක් ලක්ෂ හැටහත් දහස් එකසිය හැත්තෑ තුනයි)	2,299,446 (විසිදෙලක්ෂ අනූ නවදහස් හාරසිය හතලිස් හයයි)
සවුත් ඒෂියා ගේට්වේ පර්යන්තය	1,546,508 (පහලොස්ලක්ෂ හතලිස්හය දහස් පන්සිය අටයි)	1,726,440 (දාහත් ලක්ෂ විසි හයදහස් හාරසිය හතලිහයි)	1,749,809 (දාහත් ලක්ෂ හතලිස් නව දහස් අටසිය නවයයි)	1,970,268 (දහනව ලක්ෂ හැත්තෑ දහස් දෙසිය හැට අටයි)	1,963,441 (දහනව ලක්ෂ හැට තුන්දහස් හාරසිය හතලිස් එකයි)
කොළඹ වරාය (6=4+5)	3,381,242 (තිස්තුන් ලක්ෂ අසූ එක්දහස් දෙසිය හතලිස් දෙකයි)	3,687,338 (තිස්හය ලක්ෂ අසූහත් දහස් තුන්සිය තිස් අටයි)	3,464,297 (තිස්හතර ලක්ෂ හැටහතර දහස් දෙසිය අනූ හතයි)	4,137,441 (හතලිස් එක් ලක්ෂ තිස්හත් දහස් හාරසිය හතලිස් එකයි)	4,262,887 (හතලිස් දෙලක්ෂ හැටදෙදහස් අටසිය අසූ හතකි)

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

(iii) කොළඹ වරායේ පමණක් පහත සඳහන් පර්යන්ත වල බහළු මෙහෙයුම් සිදු කරයි.

කොළඹ වරාය (දේශීය බහලු ධාරිතාවය විස්සේ සම ඒකක)

පර්යන්තය/පාලම	2007	2008	2009	2010	2011
ජය බහලු පර්යන්තය	395,325 (තුන්ලක්ෂ අනූපන්දහස් තුන්සිය විසිපහයි)	414,945 (හාරලක්ෂ දාහතර දහස් නවසිය හතලිස්පහයි)	391,827 (තුන්ලක්ෂ අනූ එක් දහස් අටසිය විසිහතයි)	538,660 (පන්ලක්ෂ තිස්අට දහස් හයසිය හැටයි)	625,406 (හයලක්ෂ විසිපන් දහස් හාරසිය හයයි)
සමඟි බහලු පර්යන්තය	24,857	26,177	18,776	24,242	22,000
සාම්ප්‍රදායික නැව් බඩු පාලම්	2,824	3,064	2,482	447	76
ශ්‍රී ලංකා වරාය අධිකාරිය (4=1+2+3)	423,006 (හාරලක්ෂ විසිතුන් දහස් හයයි)	444,186 (හාරලක්ෂ හතලිස් හතරදහස් එකසිය අසූහයයි)	413,085 (හාරලක්ෂ දහතුන් දහස් අසූ පහයි)	563,349 (පන්ලක්ෂ හැටතුන් දහස් තුන්සිය හතලිස් නවයයි)	647,482 (හයලක්ෂ හතලිස් හත්දහස් හාරසිය අසූ දෙකයි)
සවුත් ඒෂියා ගේට්වේ පර්යන්තය	380,070 (තුන්ලක්ෂ අසූ දහස් හැත්තෑවයි)	369,085 (තුන්ලක්ෂ හැට නව දහස් අසූපහයි)	338,907 (තුන්ලක්ෂ තිස් අටදහස් නවසිය හතයි)	368,895 (තුන්ලක්ෂ හැට අටදහස් අටසිය අනූ පහයි)	399,404 (තුන්ලක්ෂ අනූ නව දහස් හාරසිය හතරයි)
කොළඹ වරාය (6= 4+5)	803,076 (අටලක්ෂ තුන්දහස් හැත්තෑහයයි)	813,271 (අටලක්ෂ දහතුන් දහස් දෙසිය හැත්තෑ එකයි)	751,992 (හත්ලක්ෂ පනස් එක් දහස් නවසිය අනූ දෙකයි)	932,244 (නවලක්ෂ තිස් දෙදහස් දෙසිය හතලිස් හතරයි)	1,046,886 (දසලක්ෂ හතලිස් හයදහස් අටසිය අසූ හයයි)

(iv) ඉදිරි වර්ෂ පහ තුල සිදුවෙතැයි අපේක්ෂා කරන බහලු මෙහෙයුම් ප්‍රමාණය

කොළඹ වරාය (බහලු ධාරිතාවය විස්සේ සම ඒකක ඉදිරි වසර පහ සඳහා)

වසර	2012	2013	2014	2015	2016
විස්සේ සම ඒකක	4,270,000 (හතලිස් දෙලක්ෂ හැත්තෑ දහසයි)	4,450,000 (හතලිස්හතර ලක්ෂ පනස් දහසයි)	4,672,500 (හතලිස්හය ලක්ෂ හැත්තෑදෙදහස් පන්සීයයි)	4,900,000 (හතලිස් නවලක්ෂයයි)	5,152,000 (පනස්එක් ලක්ෂ පනස් දෙදහසයි)

2012 සිට 2016 වසර සඳහා මධ්‍යම පරිමාණයේ ඇස්තමේන්තු 5% ක් පමණ වෙනස්වීය හැකිය.

(ආ) (i) ශ්‍රී ලංකාවේ වරායවල මෙහෙයවන ලද නැව් භාණ්ඩ සංඛ්‍යාව

මෙහෙයවන ලද නැව් භාණ්ඩ ටොන් ප්‍රමාණය (මෙ.ටො.) සියලු වරායන්

වරාය	2007	2008	2009	2010	2011
කොළඹ	43,502,004 (හාරකෝටි තිස්පන් ලක්ෂ දෙදහස් හතරයි)	47,960,480 (හාරකෝටි හැත්තෑ නව ලක්ෂ හැටදහස් හාරසිය අසුවයි)	46,372,572 (හාරකෝටි හැටතුන් ලක්ෂ හැත්තෑදෙදහස් පන්සිය හැත්තෑදෙකයි)	58,767,643 (පන්කෝටි අසූහත් ලක්ෂ හැටහත් දහස් හයසිය හතලිස් තුනයි)	62,015,345 (හයකෝටි විසි ලක්ෂ පහලොස් දහස් තුන්සිය හතලිස් පහයි)
ත්‍රිකුණාමලය	2,214,784 (විසිදෙලක්ෂ දාහතර දහස් හත්සිය අසූ හතරයි)	2,162,766 (විසිඑක් ලක්ෂ හැට දෙදහස් හත්සිය හැටහයයි)	2,238,044 (විසිදෙලක්ෂ තිස්අට දහස් හතලිස් හතරයි)	2,153,706 (විසිඑක් ලක්ෂ පනස්තුන් දහස් හත්සිය හයයි)	2,573,651 (විසිපන් ලක්ෂ හැත්තෑතුන් දහස් හයසිය පනස් එකයි)
ගාල්ල	626,980 (හයලක්ෂ විසිහය දහස් නවසිය අසූවයි)	459,090 (හාරලක්ෂ පනස් නව දහස් අනූවයි)	166,851 (එක්ලක්ෂ හැට හයදහස් අටසිය පනස් එකයි)	318,043 (තුන්ලක්ෂ දහඅට දහස් හතලිස් තුනයි)	463,772 (හාරලක්ෂ හැට තුන්දහස් හත්සිය හැත්තෑදෙකයි)
කන්කසන්තුරය හා මයිලිඩ්ඩි	නැත	නැත	246,465 (දෙලක්ෂ හතලිස්හය දහස් හාරසිය හැට පහයි)	11,387	28,414
මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය	-	-	-	-	15,388
සියලු වරායන් (6=1+2+3+4+5)	46,343,768 (හාරකෝටි හැටතුන් ලක්ෂ හතලිස්තුන් දහස් හත්සිය හැට අටයි)	50,582,336 (පන්කෝටි පන්ලක්ෂ අසූ දෙදහස් තුන්සිය තිස් හයයි)	49,023,932 (හාරකෝටි අනූ ලක්ෂ විසිතුන් දහස් නවසිය තිස් දෙකයි)	61,250,779 (හයකෝටි දොළොස් ලක්ෂ පනස්දහස් හත්සිය හැත්තෑ නවයයි)	65,096,570 (හයකෝටි පනස් ලක්ෂ අනූහය දහස් පන්සිය හැත්තෑවයි)

(ii) ඒවායේ මෙහෙයුම් වියදම් සහ උපයාගත් ආදායමේ වටිනාකම රුපියල්වලින් ,

සියළු වරායන්

විස්තර	2007	2008	2009	2010	2011
මෙහෙයුම් වියදම්	11,749,592,680 (එක්දහස් එකසිය හැත්තෑහතර කෝටි අනූපන් ලක්ෂ අනූ දෙදහස් හයසිය අසූවයි)	12,062,984,304 (එක්දහස් දෙසිය හයකෝටි විසිනව ලක්ෂ අසූහතර දහස් තුන්සිය හතරයි)	11,239,594,938 (එක්දහස් එකසිය විසිතුන් කෝටි අනූපන්ලක්ෂ අනූහතර දහස් නවසිය තිස්අටයි)	12,059,622,067 (එක්දහස් දෙසිය පන්කෝටි අනූහය ලක්ෂ විසිදෙදහස් හැට හතයි)	11,430,116,072 (එක්දහස් එකසිය හතලිස් තුන්කෝටි එක්ලක්ෂ දාසය දහස් හැත්තෑ දෙකයි)
මෙහෙයුම් ආදායම්	21,956,196,158 (දෙදහස් එකසිය අනූපන් කෝටි හැට එක්ලක්ෂ අනූහය දහස් එකසිය පනස්අටයි)	21,464,537,163 (දෙදහස් එකසිය හතලිස්හය කෝටි හතලිස්පන් ලක්ෂ තිස්හත් දහස් එකසිය හැටතුනයි)	20,182,928,086 (දෙදහස් දහඅට කෝටි විසිනව ලක්ෂ විසිඅට දහස් අසූහයයි)	25,045,913,526 (දෙදහස් පන්සිය හතරකෝටි පනස් නවලක්ෂ දහතුන් දහස් පන්සිය විසිහයයි)	27,542, 063,756 (දෙදහස් හත්සිය පනස්හතර කෝටි විසි ලක්ෂ හැටතුන් දහස් හත්සිය පනස් හයයි)

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

කොළඹ වරාය රුපියල්

විස්තර	2007	2008	2009	2010	2011
මෙහෙයුම් වියදම්	11,012,230,713 (එක්දහස් එකසිය එක්කෝටි විසි දෙලක්ෂ තිස්දහස් හත්සිය දහතුනයි)	11,388,216,781 (එක්දහස් එකසිය තිස් අටකෝටි අසූ දෙලක්ෂ දාසය දහස් හත්සිය අසූ එකයි)	10,564,225,086 (එක්දහස් පනස්හය කෝටි හතලිස් දෙලක්ෂ විසි පන්දහස් අසූ හයයි)	11,382,766,418 (එක්දහස් එකසිය තිස්අටකෝටි විසි හත් ලක්ෂ හැටහය දහස් හාරසියදහ අටයි)	10797564011 (එක්දහස් හැත්ත නම කෝටි හැත්ත පන් ලක්ෂ හැට හතර දහස් එකොළහයි)
මෙහෙයුම් ආදායම්	21,401,779,156 (දෙදහස් එකසිය හතලිස් කෝටි දාහත් ලක්ෂ හැත්තෑනව දහස් එකසිය පනස් හයයි)	20,956,347,843 (දෙදහස් අනූපන් කෝටි හැටතුන් ලක්ෂ හතලිස් හත් දහස් අටසිය හතලිස් තුනයි)	19,750,039,880 (එක්දහස් නවසිය හැත්තෑපන් කෝටි තිස්නව දහස් අටසිය අසූවයි)	24,566,392,148 (දෙදහස් හාරසිය පනස්හය කෝටි හැටතුන් ලක්ෂ අනූ දෙදහස් එකසිය හතලිස් අටයි)	26,864,260,128 (දෙදහස් හයසිය අසූහය කෝටි හතලිස් දෙලක්ෂ හැට දහස් එකසිය විසි අටයි)

ත්‍රිකුණාමලය වරාය රුපියල්

විස්තර	2007	2008	2009	2010	2011
මෙහෙයුම් වියදම්	376,835,827 (තිස්හත් කෝටි හැටඅට ලක්ෂ තිස් පන්දහස් අටසිය විසි හතයි)	351,374,903 (තිස්පන් කෝටි දහතුන් ලක්ෂ හැත්තෑහතර දහස් නවසිය තුනයි)	365,696,869 (තිස්හය කෝටි පනස්හය ලක්ෂ අනූහය දහස් අටසිය හැට නවයිය)	349,203,579 (තිස්හතර කෝටි අනූ දෙලක්ෂ තුන්දහස් පන්සිය හැත්තෑ නවයයි)	314,997,652 (තිස්එක් කෝටි හතලිස් නව ලක්ෂ අනූහත් දහස් හයසිය පනස් දෙකයි)
මෙහෙයුම් ආදායම්	223,996,674 (විසිදෙකෝටි තිස් නව ලක්ෂ අනූහය දහස් හයසිය හැත්තෑ හතරයි)	249,422,576 (විසිහතර කෝටි අනූහතර ලක්ෂ විසිදෙදහස් පන්සිය හැත්තෑ හයයි)	291,084,485 (විසිනව කෝටි දස ලක්ෂ අසූහතර දහස් හාරසිය අසූ පහයි)	242,194,399 (විසිහතර කෝටි විසිඑක් ලක්ෂ අනූ හතරදහස් තුන්සිය අනූනවයයි)	265,726,111 (විසිහය කෝටි පනස්හත් ලක්ෂ විසිහය දහස් එකසිය එකොළහයි

ගාල්ල වරාය රුපියල්

විස්තර	2007	2008	2009	2010	2011
මෙහෙයුම් වියදම්	360,526,140 (තිස්හය කෝටි පන්ලක්ෂ විසිහය දහස් එකසිය හතලිහයි)	323,392,621 (තිස්දෙකෝටි තිස්තුන් ලක්ෂ අනූ දෙදහස් හයසිය විසිඑකයි)	309,672,982 (තිස්කෝටි අනූ හයලක්ෂ හැත්තෑ දෙදහස් නවසිය අසූදෙකයි)	327,652,070 (තිස්දෙකෝටි හැත්තෑහය ලක්ෂ පනස් දෙදහස් හැත්තෑවයි)	292,516,585 (විසිනව කෝටි විසිපන් ලක්ෂ දාසය දහස් පන්සිය අසූ පහයි)
මෙහෙයුම් ආදායම්	330,420,327 (තිස්තුන් කෝටි හාරලක්ෂ විසිදහස් තුන්සිය විසිහතයි)	258,766,744 (විසිපන් කෝටි අසූහත් ලක්ෂ හැටහය දහස් හතලිස් හතරයි)	141,803,720 (දාහතර කෝටි දහඅට ලක්ෂ තුන්දහස් හත්සිය විස්සයි)	237,326,979 (විසිතුන් කෝටි හැත්තෑතුන් ලක්ෂ විසිහය දහස් නවසිය හැත්තෑ නවයයි)	398,969,568 (තිස්නව කෝටි අසූනව ලක්ෂ හැටනව දහස් පන්සිය හැටඅටයි)

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය රුපියල්

විස්තර	2007	2008	2009	2010	2011
මෙහෙයුම් වියදම්	-	-	-	-	25,037,825 (දෙකෝටි පනස් ලක්ෂ තිස් හත් දහස් අටසිය විසි පහයි)
මෙහෙයුම් ආදායම්	-	-	-	-	13,107,949 (එක්කෝටි තිස් එක් ලක්ෂ හත්දහස් නව සිය හතලිස් නවයයි)

(iii) වරාය අධිකාරිය විසින් මෙහෙය වන ලද සාමාන්‍ය නැව් භාණ්ඩ ප්‍රමාණය එක් එක් වරාය සහ නැංගුරම්පොල අනුව,

කොළඹ වරාය (සාමාන්‍ය නැව් භාණ්ඩ - මෙ.ටො.)

පාලම/ නැංගුරම්පොල	2007	2008	2009	2010	2011
බණ්ඩාරනායක පාලම	986,449 (නවලක්ෂ අසූහය දහස් හාරසිය හතලිස් නවයයි)	717,827 (හත්ලක්ෂ දාහත් දහස් අටසිය විසි හතයි)	437,663 (හාරලක්ෂ තිස් හත්දහස් හයසිය හැටතුනයි)	493,584 (හාරලක්ෂ අනූ තුන්දහස් පන්සිය අසූහතරයි)	575,379 (පන්ලක්ෂ හැත්තෑ පන් දහස් තුන්සිය හැත්තෑ නවයයි)
වෙරළාසන්න නැංගුරම්පොල	26,784	19,575	14,217	2	0
නියමු පාළම	344,651 (තුන්ලක්ෂ හතලිස් හතරදහස් හයසිය පනස්එකයි)	306,587 (තුන්ලක්ෂ හය දහස් පන්සිය අසූහතයි)	163,954 (එක්ලක්ෂ හැට තුන්දහස් නවසිය පනස්හතරයි)	288,342 (දෙලක්ෂ අසූඅට දහස් තුන්සිය හතලිස් දෙකයි)	298,332 (දෙලක්ෂ අනූඅට දහස් තුන්සිය තිස්දෙකයි)
ජයබහලු පර්යන්තය	2,578	1,042	1,629	146	991
නවපෝෂක නැංගුරම්පොල	47,712	18,223	42	0	7
නව උතුරු පියරය	757,025 (හත්ලක්ෂ පනස් හත්දහස් විසිපහයි)	666,861 (හයලක්ෂ හැටහය දහස් අටසිය හැටඑකයි)	625,389 (හයලක්ෂ විසිපන් දහස් තුන්සිය අසූනවයයි)	679,280 (හයලක්ෂ හැත්තෑ නවදහස් දෙසිය අසූවයි)	674,226 (හයලක්ෂ හැත්තෑ හතර දහස් දෙසිය විසිහයයි)
දකුණු පියරය	340,652 (තුන්ලක්ෂහතලිස් දහස් හයසිය පනස් දෙකයි)	407,806 (හාරලක්ෂ හත්දහස් අටසිය හයයි)	526,255 (පන්ලක්ෂ විසිහය දහස් දෙසිය පනස් පහයි)	484,362 (හාරලක්ෂ අසූ හතර දහස් තුන්සිය හැට දෙකයි)	521,271 (පන්ලක්ෂ විසිඑක් දහස් දෙසිය හැත්තෑ එකයි)
විජය කුමාර පාළම	1,022,973 (දසලක්ෂ විසි දෙදහස් නවසිය හැත්තෑ තුනයි)	1,415,828 (දාහතර ලක්ෂ පහලොස් දහස් අටසිය විසිඅටයි)	1,084,518 (දසලක්ෂ අසූ හතර දහස් පන්සිය දහඅටයි)	1,317,677 (දහතුන් ලක්ෂ දාහත් දහස් හයසිය හැත්තෑ හතයි)	1,400,567 (දාහතර ලක්ෂ පන්සිය හැටහතයි)

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

+පිටකොටුව සහ වෙනත්	4,693	16,982	2,696	97	1,358
සමණ් බහළු පර්යන්තය	4,660	3,296	24,292	6,566	4,721
ඩොල්පින් තෙල් නැංගුරම්පොල	2,091,019 (විසිලක්ෂ අනූඑක් දහස් දහනවයයි)	1,536,382 (පහලොස් ලක්ෂ තිස්හයදහස් තුන්සිය අසූදෙකයි)	1,465,576 (දාහතර ලක්ෂ හැට පන්දහස් පන්සිය හැත්තෑ හයයි)	1,751,754 (දාහත්ලක්ෂ පනස් එක්දහස් හත්සිය පනස් හතරයි)	1,545,198 (පහලොස්ලක්ෂ හතලිස්පන් දහස් එකසියඅනූඅටයි)
ඒක ලක්ෂිත බෙය්යා නැංගුරම්පොල	1,938,657 (දහනව ලක්ෂ තිස් අටදහස් හයසිය පනස් හතයි)	2,360,490 (විසිතුන් ලක්ෂ හැටදහස් හාරසිය අනූවයි)	2,418,361 (විසිහතර ලක්ෂ දහඅට දහස් තුන්සිය හැට එකයි)	2,319,509 (විසිතුන් ලක්ෂ දහනව දහස් පන්සිය නවයයි)	2,884,320 (විසිඅට ලක්ෂ අසූහතර දහස් තුන්සිය විස්සයි)
එකතුව (13 =1සිට12 දක්වා)	**7,567,853 (හැත්තෑපන් ලක්ෂ හැටහත්දහස් අටසිය පනස්තුනයි)**	**7,470,899 (හැත්තෑහතර ලක්ෂ හැත්තෑදහස් අටසිය අනූනවයයි)**	**6,764,592 (හැටහත් ලක්ෂ හැටහතර දහස් පන්සිය අනූදෙකයි)**	**7,341,319 (හැත්තෑතුන් ලක්ෂ හතලිස්එක් දහස් තුන්සිය දහනවයයි)**	**7,906,370 (හැත්තෑනව ලක්ෂ හයදහස් තුන්සිය හැත්තෑවයි)**

ත්‍රිකුණාමලය වරාය (සාමාන්‍ය නැව් භාණ්ඩ - මෙ.ටො.)

පාලම/ නැංගුරම්පොල	2007	2008	2009	2010	2011
ප්‍රිමා ජැටිය	1,137,977 (එකොලොස් ලක්ෂ තිස්හත්දහස් නවසිය හැත්තෑහතයි)	954,737 (නවලක්ෂ පනස්හතර දහස් හත්සිය තිස්හතයි)	1,167,491 (එකොලොස් ලක්ෂ හැටහත් දහස් හාරසිය අනූඑකයි)	1,050,195 (දසලක්ෂ පනස් දහස් එකසිය අනූපහයි)	1,090,043 (දසලක්ෂ අනූ දහස් හතලිස් තුනයි)
ටෝකියෝ ජැටිය	708,381 (හත්ලක්ෂ අට දහස් තුන්සිය අසූ එකයි)	826,617 (අටලක්ෂ විසිහය දහස් හයසිය දාහතයි)	689,457 (හයලක්ෂ අසූනව දහස් හාරසිය පනස් හතයි)	738,372 (හත්ලක්ෂ තිස් අටදහස් තුන්සිය හැත්තෑදෙකයි)	985,041 (නවලක්ෂ අසූ පන්දහස් හතලිස් එකයි)
අෂ්රෆ් ජැටිය	202,183 (දෙලක්ෂ දෙදහස් එකසිය අසූතුනයි)	220,292 (දෙලක්ෂ විසිදහස් දෙසිය අනූදෙකයි)	215,396 (දෙලක්ෂ පහලොස් දහස් තුන්සිය අනූහයයි)	173,832 (එක්ලක්ෂ හැත්තෑ තුන්දහස් අටසිය තිස් දෙකයි)	384,713 (තුන්ලක්ෂ අසූ හතරදහස් හත්සිය දහතුනයි)
තෙල් ජැටිය	166,243 (එක්ලක්ෂ හැටහය දහස් දෙසිය හතලිස් තුනයි)	161,120 (එක්ලක්ෂ හැටඑක් එකසිය විස්සයි)	165,700 (එක්ලක්ෂ හැටපන් දහස් හත්සියයි)	191,307 (එක්ලක්ෂ අනූඑක් දහස් තුන්සිය හතයි)	113,854 (එක්ලක්ෂ දහතුන් දහස් අටසිය පනස් හතරයි)
එකතුව (5=1+2+3+4)	**2,214,784 (විසිදෙලක්ෂ දාහතර දහස් හත්සිය අසූ හතරයි)**	**2,162,766 (විසිඑක් ලක්ෂ හැට දෙදහස් හත්සිය හැටහයයි)**	**2,238,044 (විසිදෙලක්ෂ තිස් අටදහස් හතලිස් හතරයි)**	**2,153,706 (විසිඑක් ලක්ෂ පනස්තුන් දහස් හත්සිය හයයි)**	**2,573,651 (විසිපන් ලක්ෂ හැත්තෑතුන් දහස් හයසිය පනස්එකයි)**

ගාල්ල වරාය (සාමාන්‍ය නැව් භාණ්ඩ - මෙ.ටො.)

පාලම/ නැංගුරම්පොල	2007	2008	2009	2010	2011
ක්ලොසන්බර්ග් ජැටිය 1/2	626,980 (හයලක්ෂ විසිහය දහස් නවසිය අසූවයි)	459,090 (හාරලක්ෂ පනස් නවදහස් අනූවයි)	166,851 (එක්ලක්ෂ හැටහය දහස් අටසිය පනස් එකයි)	318,043 (තුන්ලක්ෂ දහඅට දහස් හතලිස් තුනයි)	463,772 (හාරලක්ෂ හැටතුන් දහස් හත්සිය හැත්තෑදෙකයි)

කන්කසන්තුරය වරාය මයිල්ඩ්ඩ් වරාය (සාමාන්‍ය නැව් භාණ්ඩ - මෙ.ටොං.)

පාලම/ නැංගුරම්පොල	2007	2008	2009	2010	2011
වරායෙන් පිටත/ මයිල්ඩ්ඩ් ජැටිය/ කන්කසන්තුරය මධ්‍ය ප්‍රවාහය	නැත	නැත	246,465 (දෙලක්ෂ හතලිස් හයදහස් හාරසිය හැට පහයි)	11,387	28,414

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය (සාමාන්‍ය නැව් භාණ්ඩ - මෙ.ටොං.)

පාලම/ නැංගුරම්පොල	2007	2008	2009	2010	2011
1/2 පියරයන්	-	-	-	-	15,388

සියලු වරායන් (සාමාන්‍ය නැව් භාණ්ඩ - මෙ.ටොං.)

වරාය	2007	2008	2009	2010	2011
කොළඹ	7,567,853 (හැත්තෑපන් ලක්ෂ හැටහත් දහස් අටසිය පනස් තුනයි)	7,470,899 (හැත්තෑහතර ලක්ෂ හැත්තෑ දහස් අටසිය අනූනවයයි)	6,764,592 (හැටහත් ලක්ෂ හැට හතර දහස් පන්සිය අනූ දෙකයි)	7,341,319 (හැත්තෑතුන් ලක්ෂ හතලිස් එක් දහස් තුන්සිය දහනවයයි)	7,906,370 (හැත්තෑනව ලක්ෂ හයදහස් තුන්සිය හැත්තෑවයි)
ත්‍රිකුණාමලය	2,214,784 (විසිදෙලක්ෂ දාහතර දහස් හත්සිය අසූ හතරයි)	2,162,766 (විසිඑක් ලක්ෂ හැට දෙදහස් හත්සිය හැට හයයි)	2,238,044 (විසිදෙලක්ෂ තිස් අට දහස් හතලිස් හතරයි)	2,153,706 (විසිඑක් ලක්ෂ පනස්තුන් දහස් හත්සිය හයයි)	2,573,651 (විසිපන් ලක්ෂ හැත්තෑතුන් දහස් හයසිය පනස් එකයි)
ගාල්ල	626,980 (හයලක්ෂ විසිහය දහස් නවසිය අසූවයි)	459,090 (හාරලක්ෂ පනස් නවදහස් අනූවයි)	166,851 (එක්ලක්ෂ හැටහය දහස් අටසිය පනස් එකයි)	318,043 (තුන්ලක්ෂ දහඅට දහස් හතලිස් තුනයි)	463,772 (හාරලක්ෂ හැට තුන්දහස් හත්සිය හැත්තෑ දෙකයි)
කන්කසන්තුරය හා මයිල්ඩ්ඩ්	නැත	නැත	246,465 (දෙලක්ෂ හතලිස් හයදහස් හාරසිය හැට පහයි)	11,387	28,414
මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය	-	-	-	-	15,388
සියලු වරායන් (6=1+2+3+4+5)	**10,409,617 (එක්කෝටි හාර ලක්ෂ නවදහස් හයසිය දාහතයි)**	**10,092, 755 (එක්කෝටි අනූ දෙදහස් හත්සිය පනස් පහයි)**	**9,415,952 (අනූහතර ලක්ෂ පහලොස් දහස් නවසිය පනස් දෙකයි)**	**9,824,455 (අනූඅට ලක්ෂ විසිහතර දහස් හාරසිය පනස් පහයි)**	**10,987,595 (එක්කෝටි නව ලක්ෂ අසූහත් දහස් පන්සිය අනූ පහයි)**

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ක්‍රියාත්මක වූයේ 2011 අප්‍රේල් සිට පමණි.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

(iv)

නැව් බඩු වර්ග	ආරම්භක රට
සීනි	ඉන්දියාව, කාශ්මීරය හා බ්‍රසීලය
පොහොර	එක්සත් අරාබි රාජධානිය , චීනය හා ඉන්දියාව
සිමෙන්ති	ඉන්දියාව, මැලේසියාව, ඉන්දුනීසියාව හා පකිස්ථානය
ක්ලින්කර්	මැලේසියාව, කාශ්මීරය, ඉන්දුනීසියාව, වියට්නාමය හා ඉන්දියාව
ජිප්සම	මැලේසියාව, කාශ්මීරය, ඉන්දුනීසියාව, වියට්නාමය හා ඉන්දියාව
තිරිඟු / ඉරිඟු	පකිස්ථානය , බ්‍රසීලය හා කැනඩාව
ගෑස්	ඕමානය
පාම් තෙල්	මැලේසියාව
වාහන	ජපානය, ඉන්දියාව, දකුණු කොරියාව, ඉන්දුනීසියාව , මැලේසියාව හා චීනය

(ඇ) පැන නොනඟී.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මාර්තු 03වැනි දින -ඒ කියන්නේ අදට දවස් තුනකට ඉස්සරවෙලා- "සන්ඩේ ලීඩර්" පුවත් පත වාර්තා කර තිබෙනවා, container movement ප්‍රමාණය සියයට 5.5කින් අඩු වෙලා තිබෙනවා කියලා. ඔබතුමා ඇමතිවරයා වශයෙන් ඒක යථා තත්ත්වයට පත් කරන්න කර ගෙන යන කටයුතු මොනවාද?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන මේ වාර්තාව ගැන මම කනගාටුව ප්‍රකාශ කරනවා. ඔබතුමා ඉල්ලා තිබුණ පිළිතුර අනුව 2007 වර්ෂයේ සිට අපි 20 සම ඒකක වශයෙන් ලබා දුන් සෑම පිළිතුරකම ඒ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. 2009 වර්ෂයේ -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මා වාර්තා කරන්නේ මහ බැංකු වාර්තාවකින් උපුටා ගෙන කර ඇති ප්‍රකාශයක් ගැනයි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

මා අද ඔබතුමාට සපයන්නේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරිත්වය මඟින් ලබා ගත් වසරින් වසරට අදාළව තිබුණු සියලුම තොරතුරුයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ තොරතුරු වැරදියි කියලාද ඔබතුමා කියන්නේ?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

මා වගකීමකින් කියනවා, මුළු ජාත්‍යන්තරය තුළම නාවික ක්ෂේත්‍රයේ යම් කඩා වැටීමක් තිබුණේ 2009 වර්ෂයේ විතරයි කියන එක. 2009 වර්ෂයේ විතරයි අපේ බහාලුවල අඩුවක් පෙන්වන්නේ. අනෙක් හැම වර්ෂය තුළම එවැනි තත්ත්වයක් නැහැ. 2012 වර්ෂය වැඩි වශයෙන්ම බහාලු මෙහෙයුම් කළ වර්ෂය බවට පරිවර්තනය වෙලා තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, එහෙම නම් වරායේ අලාභය වැඩි වෙලා තිබෙන්නේ ඇයි කියලා දෙවන අතුරු ප්‍රශ්නය වශයෙන් මා අහන්න කැමැතියි. ඔබතුමා කියන විධියට container movement එක වැඩි වෙලා තිබෙනවා නම් අලාභය කෝටි 6,800කට වැඩි වෙලා තිබෙන්නේ ඇයි?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා වරාය ස්ථාපිත කිරීමෙන් පසු වාර්තාගත මෙහෙයුම් ලාභයක්-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ, operations නොවෙයි. ලාභ අලාභ ගැන අහන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

මා ඔබතුමාට කියන්නම්. වාර්තාගත මෙහෙයුම් ලාභයක් ලබා ගන්න පුළුවන් වුණු එකම වර්ෂය තමයි 2012 වර්ෂය. පසු ගිය වර්ෂ ගණනාව තුළම වැඩිම මෙහෙයුම් ලාභය වුණේ රුපියල් මිලියන දොළොස්දහස් දෙසිය පණස්හතක මෙහෙයුම් ලාභයක්. ඒ අනුව, විදේශ විනිමය හුවමාරු අලාභය සියල්ලම සහ බදු ගෙවීම්වලින් පසු 2012 වර්ෂයේ දොළොස්වැනි මාසයේ 31වැනි දා වන කොට ශුද්ධ ලාභය රුපියල් මිලියන හාරදහස් එකසිය අසූහයක් ලබන්න තරම් ජයග්‍රහණයක් අපි ලබා තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා එහෙම කියනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

මා ඔබතුමාට ඒ විස්තර එවන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ විස්තර එවනවා නම් හොඳයි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardena)
බොහොම පැහැදිලිව ඔබතුමා අසා තිබුණු ප්‍රශ්නයට අබිබවා ගිහිල්ලායි පසු ගිය සතියේ මම මේ පිළිතුරු ටික ලැහැස්ති කළේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මා අහනවා. මම අහලා තිබෙන්නේ ඒකාබද්ධ ප්‍රශ්නයක්. ඔබතුමා හම්බන්තොට වරාය සම්බන්ධයෙන් අදාළ තොරතුරු සභාගත කර තිබෙනවා. ඒකේ ලාභ අලාභ සහ container movement කොපමණද, general cargo කොතරම් ප්‍රමාණයක් එතැනින් හුවමාරු කර තිබෙනවාද?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට වරායේ පරිපාලන ගොඩනැඟිල්ලේ වැඩ කටයුතු නිම වන තුරු කොළඹ වරායේ ගිණුම් ඒකකවලින් තමයි ක්‍රියා කර ගෙන යන්නේ. නමුත් ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් හම්බන්තොට වරාය සම්බන්ධව 2011 වර්ෂයේ ආදායම සහ වියදම සභාගත කරන ලද පිළිතුරෙහි සඳහන් කර තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මට ඒ නිසා ප්‍රශ්න අහන්න බැහැ. ඔබතුමා ඇමතිතුමා වශයෙන් දැන් වැඩ භාර අරගෙන තිබෙනවා. මා ඔබතුමාගෙන් ප්‍රායෝගික ප්‍රශ්නයක් අහන්න කැමැතියි. ඔබතුමා සතුටුද, වරායවල් හයක් ක්‍රියාත්මක කරලා මේකේ ලාභ අලාභ- [බාධා කිරීමක්]අවම මට්ටමට ලාභය වැඩි කරන්න පුළුවන් වැඩ පිළිවෙළක්-[බාධා කිරීම්]

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10 - 2214/'12 - (2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(මාණ්පුමිකු ලසන්ත අලකියවන්න)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
වෙනත් දිනයක් සඳහා කල් තබන ලදී.
Question ordered to stand down.

ගොවි ජනතාවට ඉන්ධන සහනාධාර : ක්‍රමවේදය
විවසායිකළුක්කු එරිපොරුළ් මානියම් : මුර෈මෙ
FUEL SUBSIDY TO FARMERS : METHODOLOGY

2418/'12

11. ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2012.02.11 දින හෝ ඊට ආසන්න දිනක සිදු කළ ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් අපහසුතාවට පත්ව ඇති ගොවි ජනතාවට සහන සැලසීම සඳහා ගැනීමට නියමිත හෝ ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ගොවි ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම සහනාධාරය ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) එම සහනාධාරය ලබා දෙනු ලබන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගොවි ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

(ii) ආර්ථිකයට විශාල මෙහෙයක් ඉටුකරන එම ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා නොදීම බලවත් අසාධාරණයක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2012.02.11ஆம் திகதி அல்லது அதற்கு அண்மித்த ஒரு தினத்தில் மேற்கொள்ளப்பட்ட எரிபொருள் விலையேற்றத்தின் காரணமாக அசௌகரியங்களுக்கு உள்ளாகியுள்ள விவசாயி களுக்கு நிவாரணமளிப்பதற்காக மேற்கொள்ளப் படவுள்ள அல்லது மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

(ii) மேற்படி விவசாயிகளுக்கு எரிபொருள் மானியம் வழங்கப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், குறித்த மானியம் வழங்கப்படும் முறைமை யாதென்பதையும்;

(iv) மேற்படி மானியம் வழங்கப்படும் கால எல்லை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) விவசாயிகளுக்கு எரிபொருள் மானியம் வழங்கப்படாவிடின், அதற்கான காரணங்கள் யாவையென்தையும்;

(ii) பொருளாதாரத்துக்கு பாரிய சேவையாற்றும் இந்த மக்களுக்கு எரிபொருள் மானியம் வழங்கா திருத்தல் பாரிய அநீதியாகுமென்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the measures which have been adopted or are to be adopted to provide relief to the farmers who were inconvenienced by the fuel price hike effected on or around 11.02.2012;

(ii) whether a fuel subsidy will be provided to those farmers;

(iii) if so, the methodology adopted for the provision of the aforesaid subsidy; and

(iv) the period of time for which the aforesaid subsidy will be provided?

(b) Will he also state -

(i) the reasons, if a fuel subsidy is not provided to the farmers; and

(ii) whether he admits that non provision of a fuel subsidy to those people who are rendering a great service to the economy is a grave injustice?

(c) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු (කලානිති) සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) දැනටමත් රජය ගොවි ජනතාවට විශාල වශයෙන් සහනාධාර ලබා දෙනවා.

පොහොර සහනාධාරය සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 50ක් ලබා දෙනවා.

ගොවි ණය සඳහා වන සියයට 8ක පොලියෙන් සියයට 6ක් රජය විසින් ගෙවනවා. Guaranteed price එක ගැන බැලුවොත්, නාඩු සහල් කිලෝ ග්‍රෑම් එකක මිල රුපියල් 28 සිට 32 දක්වා වැඩි කර තිබෙනවා. සම්බා කිලෝ ග්‍රෑම් එකක මිල රුපියල් 30 සිට 35 දක්වා වැඩි කර තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, මම අහන්නේ ඉන්ධන සහනාධාරය ගැන. අනික් සහනාධාර ගැන නොවෙයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු (කලානිති) සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒවාත් එක්ක තමයි කියන්නේ. ඊට අමතරව සහනාධාර ලබා දෙන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ඒ නිසා ප්‍රශ්නයේ ඉතිරි කොටස් අදාළ වන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මම ඇහුවේ ඉන්ධන සහනාධාර ගැන. එතුමා ගොවීන්ට දෙන සහනාධාර ගැන කියා ගෙන යනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)\

මුළු ක්ෂේත්‍රයම අරගෙන බලන්න ඕනෑ. ඔබතුමා ඇහුවේ ගොවීන්ට දෙන ඉන්ධන සහනාධාර ගැන නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ. ගරු කථානායකතුමනි, -

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)

මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, ".....ගොවි ජනතාවට සහන සැලසීම සඳහා ගැනීමට නියමිත හෝ ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?" කියායි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

ගොවි ජනතාවට දෙන ඉන්ධන සහනාධාරය ගැන තමයි මම ඇහුවේ. එතුමා කියනවා, ගොවි ජනතාවට දෙන අනික් සහනාධාර ගැන.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)

අපි ඒවාත් එක්කම නේ කියන්න ඕනෑ. තමුන්නාන්සේලාට විතරක් බැට් කරන්න දෙන්න බැහැ නේ. අපිත් ඉඳලා හිටලා බැට් කරන්න ඕනෑ.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)

දැන් අතුරු ප්‍රශ්න අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, 2012.02.11 වන දින - ඒ කියන්නේ ගිය අවුරුද්දේ- තෙල් මිල වැඩි කරනකොට, ඊට පහුව දාම නියෝජ්‍ය ඇමතිතුමා කියා තිබුණා, වැඩ පිළිවෙළක් සකස් කරලා පාසල් රථ වාහනවලටත්, පෞද්ගලික ප්‍රවාහන සේවයේ යෙදෙන අයටත්, පෞද්ගලික බස් හිමියන්ටත්, ගොවි ජනතාවටත් වැඩි වුණු ඩීසල් සහ පෙට්ල්වල මිල දරන්න දෙන්නේ නැහැ කියලා. ඒ අනුව ගොවි ජනතාවට ඉන්ධන සහනාධාරයක් දෙනවා කිව්වා. ඒ ගැන තමයි මා ඇහුවේ. මා අහන්නේ, 2012.02.11 වන දින ගොවි ජනතාවට දුන්නු ඒ පොරොන්දුව ඉෂ්ට කරන්නේ කවදාද කියන එකයි.

ගිය සතියේත් ඉන්ධන මිල වැඩි කළා. දැන් ආයෙත් මිල වැඩි කරනවා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)

හොඳයි, ඒ ඇති. සහන දෙන්නේ කවදාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එම ප්‍රශ්නයට මා පිළිතුරක් දුන්නා. දැන් එවැනි සහනයක් දෙන්න බලාපොරොත්තුවක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ කියන්නේ ඔබතුමා පිළිගන්නවා, 2012.02.11වන දින ඔබතුමන්ලා කියපු දේ අසත්‍යයි කියලා?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මෙය විශාල ප්‍රශ්නයක්. අපේ ආර්ථිකය සමබරතාවෙන් ගෙන යන්න යම් යම් තීරණ ගන්නවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කරන්න බැරි ඒවා කියන්නේ ඇයි ඇමතිතුමා?

ගරු කථානායකතුමනි, එහෙම නම් මීට පස්සේවත් ඉන්ධන මිල වැඩි කරන කොට ඉන්ධන සහනාධාරයක් දෙනවා කියලා අසත්‍ය කියන්නේ නැතුව ඉන්න කියන්න. එතකොට අඩුම තරමින් ගොවි ජනතාව කල්පනා කරයි නේ, මොකුත් දෙන්නේ නැහැ කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්, ඔව්. එහෙම හොඳයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක කියන්න එපාය කියන්න, අන්දන්න එපාය කියන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමාගේ උපදෙසුත් අපි සැලකිල්ලට ගන්නම්කෝ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ අන්දන එකෙන් තමයි ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12 -1965/'11- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයේ "කලුතර දිස්ත්‍රික්කයේ" යන්න "ගාල්ල දිස්ත්‍රික්කයේ" යනුවෙන් සංශෝධනය වන්න ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් මේ ප්‍රශ්නයට උත්තර දෙන්න බැහැ නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එම ප්‍රශ්නයේ "කලුතර දිස්ත්‍රික්කයේ" යන්න "ගාල්ල දිස්ත්‍රික්කයේ" යනුවෙන් නිවැරැදි කර ප්‍රශ්නයට පිළිතුරු දෙන්න කල් ගත්තාට කමක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එම ප්‍රශ්නය නැවත න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ප්‍රශ්න අංක 13-2189/'11-(2), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. හැබැයි ගරු කථානායකතුමනි, මා ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ, "පාසිකුඩා" ගැන නොවෙයි, "පේසාලෙයි" ගැන. Part (a) (i) of the Question states, “whether petroleum was found in Pasikuda …”

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් එම ප්‍රශ්නය නැවත වරක් අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. කමක් නැහැ. ඒ දෙන උත්තරය දෙන්න කියන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැවත ප්‍රශ්නය අහන්න කියන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am not the person who is printing the Order Paper. I have asked about Pesalai.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ප්‍රශ්නය වැරැදි බව පිළිගන්නවා. ප්‍රශ්නය වැරැදි බව පිළිගෙනත් උත්තර දෙන්න කියනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ දවස්වල කවුරුත් පාසිකුඩා යනවා නේ. ඒකයි මේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පාසිකුඩා කිව්වාම වෙන එක් කෙනෙක් උත්තර දෙයිද දන්නේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එම ප්‍රශ්නය නිවැරැදි කරලා නැවත අහන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. එම ප්‍රශ්නය නැවත අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඕනෑ නැහැ. උත්තර දෙන්න. රුපියල් 70,000ක් නාස්ති කරන්න ඕනෑ නැහැ නේ. ඒක හැර අනික් ඒවා ඔක්කොම අදාළයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එකක් වැරැදුණොත් ඔක්කොම වැරැදියි. [බාධා කිරීමක්] ඇමතිතුමා වාඩි වුණා. ඇමතිතුමා එයට පිළිතුරක් දුන්නා.

ඊළඟට ප්‍රශ්න අංක 14.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා නොවෙයි, මෙය මුද්‍රණය කරන්නේ. පාර්ලිමේන්තුවෙන් තමයි මුද්‍රණය කරන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් ඒ සම්බන්ධයෙන් සොයා බලා තමයි මෙයට උත්තර සොයා ගන්න වන්නේ. මා එය සොයා බලන්නම්. වැරැදිලා තිබෙන්නේ කාටද කියලා සොයා බලන්නම්. [බාධා කිරීමක්] ඒක තමයි කියන්නේ. පොඩ්ඩක් වැරැදුණාම ඒක පිළිගන්නත් තැන්පත් වන්න.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14-2215/'12-(2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. නමුත් නියෝජ්‍ය ඇමතිතුමා අතුරුදහන් වෙලා. මෙච්චර වෙලා එතුමා මේ ගරු සභාවේ හිටියා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පාසල් ප්‍රවාහන සේවා සපයන්නන් : ඉන්ධන සහනාධාර
பாடசாலை போக்குவரத்து சேவை வழங்குனர்கள்:எரிபொருள் மானியம்
SCHOOL TRANSPORT SERVICE OPERATORS : FUEL SUBSIDY

2419/'12

15. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2012. 02. 11 දින හෝ ඊට ආසන්න දිනක සිදු කළ ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් අපහසුතාවට පත්ව ඇති පාසල් ප්‍රවාහන සේවාවන් පවත්වා ගෙන යන අය සඳහා සහන සැලසීම වෙනුවෙන් ගැනීමට නියමිත හෝ ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම පාසල් ප්‍රවාහන සේවා සපයන්නන් හට ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම සහනාධාරය ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) එම සහනාධාරය ලබා දෙනු ලබන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රවාහන සේවා සපයන්නන් හට ඉන්ධන සහනාධාරයක් ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

(ii) පාසල් දරුවන් වෙනුවෙන් වැදගත් කාර්ය භාරයක් ඉටු කරන එම ජනකාවට ඉන්ධන සහනාධාරයක් ලබා නොදීම බලවත් අසාධාරණයක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2012.02.11 ஆம் திகதி அல்லது அதற்கு அண்மித்த தினத்தில் மேற்கொள்ளப்பட்ட எரிபொருள் விலையேற்றம் காரணமாக பாதிக் கப்பட்டுள்ள, பாடசாலை போக்குவரத்து சேவைகளை நடத்துகின்றவர்களுக்கு மானியம் அளிப்பதற்காக எடுக்கப்பட்டுள்ள அல்லது எடுக்கப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி பாடசாலை போக்குவரத்து சேவை வழங்குனர்களுக்கு எரிபொருள் மானியம் வழங்கப்படுமா என்பதையும்;

(iii) ஆமெனின், மேற்படி மானியம் வழங்கும் முறைமை யாதென்பதையும்;

(iv) மேற்படி மானியம் வழங்கப்படும் கால எல்லை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி போக்குவரத்துச் சேவை வழங்குனர் களுக்கு எரிபொருள் மானியம் வழங்கப்படா திருப்பின் அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) பாடசாலை மாணவர்களுக்கு முக்கியமானதொரு கடமையை ஆற்றும் இவர்களுக்கு எரிபொருள் மானியம் வழங்கப்படாமை பாரிய அநீதியாகும் என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the measures that have been adopted or that are to be adopted in relation to providing relief to school transport service operators who have been inconvenienced by the fuel price hike effected on or around 11.02.2012;

(ii) whether a fuel subsidy would be provided to them;

(iii) if so, the methodology followed in providing that relief; and

(iv) the period for which that subsidy would be provided?

(b) Will he also state -

(i) if the fuel subsidy is not provided to the aforesaid school transport service operators, the reasons for that; and

(ii) whether he admits that non provision of the fuel subsidy to those school transport service operators who provide an important service to school children, is a grave injustice?

(c) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) මේ සම්බන්ධයෙන් රජය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

1. පාසල් සිසුන් සඳහා ශ්‍රී ලංගම බස් රථවල ගමන් ගැනීමට මාසික වාර ප්‍රවේශ පත්‍ර සහන මිලට ලබා දේ. වාර ප්‍රවේශ පත්‍රයේ වාණිජ වටිනාකමත්, සිසුන් ගෙවන මිලත් අතර වෙනස රජයෙන් ශ්‍රී ලංගම වෙත ගෙවනු ලැබේ.
2. ශ්‍රී ලංගම පාසල් බස් රථ සේවා ඒ ලෙසම ක්‍රියාත්මක වේ.
3. සිසු සැරිය සේවාව ජාතික ගමනාගමන කොමිසම හරහා ක්‍රියාත්මක වේ. මේ යටතේ පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංගම සහ පුද්ගලික අංශයේ බස් රථ සඳහා සහනාධාර ලබා දේ.

මෙම ප්‍රශ්නයෙන් අසා ඇති පෞද්ගලික අංශයේ පාසල් ප්‍රවාහන සේවාවන් පාසල් සිසුන්ගේ දෙමව්පියන් සහ වාහන හිමියන් අතර එකඟතාව මත ක්‍රියාත්මක අවිධිමත් අංශයට අයත් සේවාවකි. මේ සඳහා සහනාධාර දීමට රජය මැදිහත් වීමෙන් එහි පරිපාලන කටයුතු සඳහා සහනාධාරය ඉක්මවා යන වියදමක් ඇති විය හැකිය. එසේම එමඟින් වෙළෙඳ පොළ තරගකාරිත්වයට අනවශ්‍ය බලපෑමක් ඇති වීමට ඉඩ ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයෙන් මම ඇහුවේ පාසල් ප්‍රවාහන සේවය පවත්වා ගෙන යන අය වෙනුවෙන් සහනාධාරයක් දෙනවාද කියලායි. ගරු ඇමතිතුමා පාසල් සිසුන්ට දෙන සහනාධාර ගැන කියවාගෙන ගියා. පාසල් ප්‍රවාහන සේවයටත් ඔබතුමන්ලා සහනාධාරයක් දෙනවා කියලා ප්‍රකාශ කර තිබෙනවා. ඒකයි මම ඔබතුමාට කිව්වේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, පාසල් ප්‍රවාහන සේවය කියන්නේ ශිෂ්‍යයන් ගෙන යන එක නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ. නැහැ

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැත්නම් වෙන මොකක්ද? පාසල් උස්සාගෙන යනවාද බස් එකේ? නැහැ නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙනම් මම යෝජනාවක් කරන්නද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
හොඳයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙනම් පාසල් ප්‍රවාහන සේවය කියලා තිබෙන පෞද්ගලික ප්‍රවාහන සේවයටත් ඔබතුමන්ලා season එකක් දෙන්න. එම ප්‍රවාහන සේවයට රුපියල් 800, 1,000, 2,000 ආදී වශයෙන් ගෙවනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම තේරුම් කර දෙන්නම්. පළමුවෙනි කාරණය මෙකයි. මේ සුවිශේෂ බස් සේවාව ලබා දීම වෙනුවෙන් අප ලංගමයට විශාල සහනාධාරයක් දෙනවා. ගොඩක් ළමයි ඒක පාවිච්චි කරනවා. ලංගමය සමඟ අප සාකච්ඡා කරන විට ඒ අය කියනවා, ඔවුන් පාඩු ලබන එක හේතුවක් තමයි මේ subsidy එක කියලා. ඒක වෙනම කථාවක්. නමුත් දැනට ඒ subsidy එක තිබෙනවා. සමහර විට ලංගමයයි, පෞද්ගලික බස් සේවයයි අතර ඇති කර ගත් යම් යම් එකඟතා අනුව ළමයි ප්‍රවාහනය කරනවා. ඔවුන්ටත් සහනයක් දෙනවා. නමුත් තුන්වැනි කොටසක් තිබෙනවා. වැන්වල, three-wheelersවල හා තවත් වෙන වෙන විධියට මේ ළමයි ප්‍රවාහනය සම්බන්ධයෙන් විවිධ ගනුදෙනු ඇති වෙනවා. ගම්බද ළමයි අර ලංගම ක්‍රමයෙන් පිටස්තරව යනවා. දැන් ඔබතුමා අහන්නේ ඒ අයටත් කිසි යම් සහනයක් දෙනවාද කියන එක නේ? ඒකට පිළිතුර "නැහැ" කියන එකයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ගරු කථානායකතුමනි, කුඩා වැන් රථවලින් දරුවන් ප්‍රවාහනය කරන පාසල් ප්‍රවාහන සේවය සම්බන්ධවයි මම කිව්වේ. ඒක නීත්‍යානුකූල එකක් නොවෙයි කියලා ගරු ඇමතිතුමා කියනවා. මම කියනවා, ඒක එහෙම පිටින්ම නීත්‍යානුකූල එකක් කියලා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ. නීත්‍යානුකූල නැහැ කියලා මම කියන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ වැන් රථ පළාත් සභාවල ලියා පදිංචි කරනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා මම කොහෙත්ම කියන්නේ නැහැ, ඒවා නීත්‍යානුකූල නොවෙයි කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ඒක කිව්වා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නමුත්, ලංගම සමඟ ගෙන යන වැඩසටහනට ඒවා ඇතුළු වෙන්නේ නැහැ. ඒකයි මම කිව්වේ. නීත්‍යානුකූල නැහැයි කියන්න බැහැනේ. ඒ අය සාමාන්‍ය විධියට ඒ කටයුතු කර ගෙන යනවා. මොකක් හරි වැරැද්දක් තිබෙනවා නම් පොලීසිය හෝ අදාළ අංශ කටයුතු කරයි. නමුත් මම කොහෙත්ම කියන්නේ නැහැ ඒවා නීත්‍යානුකූල නොවෙයි කියලා. ඇත්ත වශයෙන්ම ඒ අය ලොකු සේවයක් කරනවා කියලාත් මම පිළිගන්නවා. නමුත් ලංගම සමඟ ගෙන යන සහනාධාර ක්‍රමයට ඒවා ඇතුළත් වෙන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා වන ඔබතුමාගෙන් මා මේ කාරණයත් දැන ගන්න කැමැතියි. 2013.02.11 වැනිදායින් පසු නැවතත් තෙල් මිල වැඩි කළා. එසේ තෙල් මිල වැඩි කිරීම නිසා, පාසල් දරුවන්ගේ ප්‍රවාහන ගාස්තු වාගේම අනෙකුත් හැම දේකම වියදම වැඩි වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ ප්‍රවාහන සේවාවල අය කිරීම් වැඩි කිරීම නිසා මේ රටේ ඉන්න ලක්ෂ 40ක් පමණ වූ පාසල් දරුවන්ට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් සහනයක් දෙන්න ඔබතුමා මොකක් හෝ වැඩ පිළිවෙළක් සකස් කරනවාද කියා මා අහන්න කැමැතියි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එහෙම එකක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
CTB එකෙන් ලබා දෙන season tickets වල මිල ගණන් වැඩි කරලාද, නැද්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු රනිල් වික්‍රමසිංහ මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ශ්‍රී ලංකාවේ පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සැසි වාරය
இலங்கையில் நடைபெறவுள்ள பொதுநலவாய அரசுத் தலைவர்களின் கூட்டம்
COMMONWEALTH HEADS OF GOVERNMENT MEETING IN SRI LANKA

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

Hon. Speaker, the Commonwealth Heads of Government Meeting in 2011 in Perth adopted the Report on "Strengthening the Role of the Commonwealth Ministerial Action Group - CMAG". This gave effect to the earlier Resolution of Port of Spain in 2009, where it was agreed to strengthen the role of the CMAG to deal with the full range of serious or persistent violations of the Harare Principles. At the Perth meeting, it was also agreed that CMAG be: (i) the custodian of these values and (ii) more proactive to country situations with serious violations of Commonwealth values.

The media reports have stated that Sri Lanka will be discussed at the next CMAG meeting. The news release of the Ministry of External Affairs titled "Sri Lankan issues have no place in the CMAG Agenda - GL tells Chair of CMAG" states, "the exhaustion of the good offices role of the Secretary-General is a condition precedent for any specific country situation to be included in the agenda of the CMAG. This is clear from the rules relating to CMAG, adopted by the Commonwealth Heads of Government at their meeting in Perth, Western Australia, in October 2011". Another news release issued by the National News Agency of Bangladesh - BSS - states that Prime Minister Sheikh Hasina, the Chair of Commonwealth Ministerial Action Group called upon Colombo to take some positive steps to uphold the Commonwealth values and principles.

Therefore, in the background of these statements, will the Minister make a full statement disclosing to the House the present position regarding CMAG and the discussions with the Secretary General in relation to the good offices engagement pertaining to the Sri Lankan situation which is referred to in the External Affairs Ministry news release.

Thank you.

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)

The Hon. Leader of the Opposition has raised this issue and it affords me the opportunity of clarifying several matters in respect of which there appears to be a considerable measure of misunderstanding. I would like to assure the Hon. Leader of the Opposition, at the very outset, that one thing is crystal clear. There is not a shadow of doubt about that, namely that the CHOGM 2013 will be held in Sri Lanka in November this year. This is clearly evident from the departure statement made by His Excellency Kamalesh Sharma**,** Secretary-General of the Commonwealth when he left the shores of our country on the 13th of February. This is what His Excellency Kamalesh Sharma had to say, I quote:

> "My visit provided an opportunity to be briefed on the preparations for the 2013 Commonwealth Heads of Government Meeting (CHOGM), scheduled to be hosted by Sri Lanka in November, as decided by Commonwealth Heads of Government in 2009 and confirmed in 2011."

This is a decision made by no less than the Heads of Government of the Commonwealth. As my Friend, the Hon. Leader of the Opposition is aware, this decision was made by the Heads at their meeting in Port of Spain, Trinidad and Tobago in 2009 and it was reconfirmed by the Heads of Government in Perth, Western Australia in 2011. So, nobody can change it except the Heads. The Heads are not meeting before November. There cannot consequently be any conceivable doubt as to the venue of CHOGM to be held this year. I would like to make that very clear.

The Hon. Leader of the Opposition in his Question has referred to the Report adopted by Commonwealth Heads of Government Meeting in 2011. That report contains a series of very clearly defined steps that need to be taken before any matter can be placed on the Agenda of CMAG.

I am sure the Hon. Leader of the Opposition is familiar with this document. He himself names the document. That is the Report of the Commonwealth Heads of Government Meeting held in Perth in 2011. I would like to refer the Hon. Leader of the Opposition, in particular to paragraph 18 of the Report which he himself has referred to. Paragraph 18 deals with the Millbrook Commonwealth Action Programme on the Harare Declaration .

Subparagraph (i) of paragraph 18 makes it abundantly clear that the good offices role of the Secretary-General has to be fully exercised before any matter can be referred to the Commonwealth Ministerial Action Group known as CMAG. So, the Secretary-General is expected to play a pivotal role in engaging with the country in

[ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා]

question that is referred to as the good offices role of the Secretary-General and that is a condition precedent for any matter to be included in the Agenda of CMAG.

Furthermore, subparagraph (vii) of paragraph 18 states that CMAG can take up a matter only if response and progress remain inadequate. I would place this within quotes,

"...if response and progress remain inadequate."

So, that again is a condition that needs to be fulfilled compulsorily before any matter can be taken up as part and parcel of the Agenda of CMAG. This is reinforced by subparagraph (x) of paragraph 18 which states that this can happen only if, I quote:

" … all efforts and engagement have been exhausted and there continues to be no progress by the relevant member country in addressing the issues of concern, …"

So, these are all conditions. These are steps that cannot be dispensed with. They are part of a coherent procedure that is laid down in the very document that the Hon. Leader of the Opposition referred to. So, if there is continuity with regard to the exercise of the good offices role of the Secretary-General, then the matter cannot reach the Agenda of CMAG at all. That is crystal clear from the text of the document which my Friend has referred to.

Now, let us see whether this good offices role is active and vigorous now. Again, there can be no doubt whatsoever with regard to that matter. The answer is quite obvious. This is clear from the words which have been used by the Secretary-General in the departure statement which I referred to. The Secretary- General states, I quote:

"The Commonwealth agreed to pursue a partnership with Sri Lanka in various priority areas that were jointly identified during my last visit in September 2012."

That is, in the recent past, His Excellency Kamalesh Sharma visited our country twice. The first visit was in September 2012 and the second visit was in February 2013. He makes an evaluation of the progress that has been achieved by the Government of Sri Lanka during that intervening period of six months. This is what his Excellency Kamalesh Sharma says. These are his own words. I quote:

"There has been marked progress in a number of these areas in the last six months, as outlined in the annex to this statement."

He goes on to say, I quote:

"As a result of consultations during this visit, we have agreed to enhance collaboration in the areas outlined below:"

So, this collaboration was set in motion during his previous visit in September, 2012, and the Secretary-General says in his departure statement that this has been enhanced. That is, the level of it has been raised as a result of the discussions that the Secretary-General had with the Government of Sri Lanka during his subsequent visit in February 2013.

The Secretary-General enumerates the different areas in which active collaboration will take place between the Commonwealth and the Government of Sri Lanka.

So, this is a concrete manifestation of the good offices role, which is postulated as a condition precedent for any matter to be taken up by the Commonwealth Ministerial Action Group.

His Excellency the Secretary-General, in his departure statement, enumerates five such fields.

The first is, electoral institutions and processes. He met the Elections Commission and declared himself entirely satisfied with the results of those deliberations.

The second area that the Secretary General refers to is the Human Rights Commission. He identifies following areas as suitable areas of collaborations in that field: training and education of the Commission staff, expanding training of police personnel on human rights obligations, enhancing the training programme for journalists on human rights reporting, bolstering capacity to be involved in national reconciliation processes and strengthening capacity to investigate human rights abuses.

The third area is reconciliation and the Secretary General says, I quote:

"Sri Lanka's Lessons Learned and Reconciliation Commission (LLRC) Report is a pivotal nation plan for moving forward, ..."

Then, he says, I quote:

"We shall continue to explore opportunities where the Commonwealth can offer its collective wisdom and experience, …."

So, the Commonwealth is giving us the benefit of their wisdom and experience and we are engaged in a vigorous process of co-operation with the Commonwealth.

The fourth area is the judiciary and the Secretary General says that the best practices of the Commonwealth will be resorted to and that information will be placed at our disposal to enable decisions to be made in that regard.

The final area, which the Secretary General refers to, relates to the independent media. It states, I quote:

"Provision of technical expertise for Sri Lanka to undertake an institutional assessment of the Sri Lankan Press Council, …."

He also talks of:

"Provision of technical assistance options in support of the Sri Lankan Press Institute."

So, I am sure that all of this will convince the Hon. Leader of the Opposition that the good offices role of the Secretary General is something very much alive; it is something that is being carried forward with the utmost vigour and vitality and in that state of things, there is absolutely no foundation for any matter relating to Sri Lanka to be included in the agenda of CMAG.

Therefore, with great respect, I dissent from the sentence in the statement which was just made by the Hon. Leader of the Opposition. The Hon. Leader of the Opposition said, "Media reports have stated that Sri Lanka will be discussed at the next CMAG meeting". I say, in response, Mr. Speaker, that there is absolutely no basis or foundation for that to happen because such a course of action would be clearly incompatible with the governing instrument, which the Hon. Leader of the Opposition, himself referred to at the commencement of his remarks.

Then, I also wish to bring this to your notice, Mr. Speaker. There is a very valuable document here, the annex to the departure statement issued by the Secretary-General of the Commonwealth on the occasion of his departure from the Island on the 13th of February. He has already said that there is a marked progress during that period of six months. So, far from complaining, he is paying an unequivocal tribute to the Government of Sri Lanka, the gist of which is that, in these critical areas there has been substantial progress in the considered opinion of no less than the Secretary General of the Commonwealth.

He identifies four areas there, in which, according to him, there is a marked progress. One of these, Mr. Speaker, is public service strengthening, which is undoubtedly, a priority need in this country. The Secretary General says, I quote:

"The Commonwealth has worked with the Sri Lanka Institute of Development Administration (SLIDA) to formulate a human resource policy framework for the public service aimed at promoting political impartiality in recruitment and promotion practices. A Commonwealth expert is to be appointed at the SLIDA as a human resource policy adviser."

Then, on youth entrepreneurship, he identifies a series of measures, which the Commonwealth will pursue with the Government of Sri Lanka. I am sure that the Hon. Leader of the Opposition, as a former Minister of Youth Services and a former Minister of Education, will certainly agree that these are all very beneficial and relevant programmes.

One of these is a grassroots project to harness the potential of youth enterprise, entitled, "Harnessing Aptitude and Potential Entrepreneurial Skills in Youth"

The Commonwealth has also agreed to provide training and other support to build the long-term capacity of institutions in Sri Lanka that are focused on youth enterprise. The Commonwealth has agreed to deliver the Asia Conference on "Financial Inclusion and Literacy", focusing on youth, in March 2013. The Commonwealth has also supported the establishment and start-up activities of the Commonwealth Asia Alliance of Young Entrepreneurs. A very valuable initiative by the Commonwealth fully endorsed by the Government of Sri Lanka, has to do with their programmes with regard to strengthening of Local Government.

Finally, with regard to peace and reconciliation and also a very useful initiative with regard to the development of sports as an instrument which will bring together the different communities in this country.

So, from all of this, it is very clear that the good offices role of the Secretary General is something that is being engaged in, it is being pursued, in fact it is being strengthened and unless and until that is exhausted, there cannot possibly be any justification for Sri Lanka to be taken up in any shape or form by the Commonwealth Ministerial Action Group.

Now, I would like to make a concluding remark, Mr. Speaker. The Secretary-General also says this in his departure statement, I quote:

"Preparations for CHOGM 2013 are impressive and on track."

The Government of Sri Lanka is investing a great deal of time, effort and resources in elaborate and meticulous preparations in order to ensure that the outcome is entirely positive. Then, we have the support of many governments.

I would like to inform the Hon. Leader of the Opposition that Dr. Mohan Kaul, the Chairman of the Commonwealth Business Council, will be with us. He is meeting me tomorrow for an extended discussion. I have also arranged for him to meet all the Chambers of Commerce in Sri Lanka. So, we are working very hard to make the Commonwealth Business Council which will be held on the sidelines of CHOGM, a singular success.

So, that is the position. I think that is a complete answer to the issues raised by the Hon. Leader of the Opposition. This is the position today with regard to the discussions that we are having with the Secretary General

[ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා]

in respect of his good offices role, which we appreciate, from which we are benefiting and which is proceeding full steam ahead. Consequently, there is no reason for any anxiety or apprehension on the part of the Hon. Leader of the Opposition that Sri Lanka will figure in any way in substantive discussions in CMAG, because such a course of action would be demonstrably contrary to the very instrument which brought CMAG into operation and invested it with the broader mandate that was referred to by the Hon. Leader of the Opposition.

I thank you, Sir.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

පී.හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
பி.ஹரிசன் சமுதாய அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
P. HARRISON COMMUNITY DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

ගරු ඒ.ඩී. චම්පික ප්‍රේමදාස මහතා
(மாண்புமிகு ஏ.டி. சம்பிக பிரேமதாச)
(The Hon. A.D. Champika Premadasa)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.

ඛිනා විදුක්කප්පට්ටු, ඒත්‍රුක්කොள්ளප්පට්ටது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services for report.

ක්‍රීඩා පනත : නියෝග
விளையாட்டுக்கள் சட்டம் : ஒழுங்குவிதிகள்
SPORTS LAW: REGULATIONS

[අ.භා. 2.20]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.02.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, 1973 වර්ෂයේ එවකට සිටි ක්‍රීඩා අමාත්‍ය, කේ.බී. රත්නායක මැතිතුමා විසින් මේ රටේ ක්‍රීඩාව ගමට ගෙන යාමට ක්‍රීඩා සංගම් විධිමත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද පනත වසර 40කට පසුව පූර්ණ අධ්‍යයනයකින් පස්සේ මේ රටේ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් සංශෝධනයට ලක් කරමින් සකස් කළ නියෝග කීපයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හැකි වීම පිළිබඳව මා ඉතාමත් සන්තෝෂ වෙනවා.

ගරු කථානායකතුමනි මෙහි ඉතිහාසය ගැන කිව්වොත්, 1948 වර්ෂයේ අප නිදහස ලැබුවත් එවකට පැවැති රජය යටතේ ක්‍රීඩා විෂය වෙනම අමාත්‍යාවරයෙකුට හිමි වුණේ නැහැ -ක්‍රීඩාව සඳහා වෙනම අමාත්‍යාවරයෙකු හිටියේ නැහැ- කියන එක ඔබතුමා දන්නවා. 1966 දී තමයි මේ ක්‍රීඩාව වෙනම විෂයයක් හැටියට හඳුනා ගෙන වී.ඒ. සුගතදාස මැතිතුමා මේ රටේ ප්‍රථම ක්‍රීඩා අමාත්‍යාවරයා හැටියට පත් වුණේ. එතුමා එවකට සිටි හොඳ පැසි පන්දු ක්‍රීඩකයෙක්. එතුමාගේ කාලයේ ක්‍රීඩා සංගම් 35යි මේ රටේ ලියා පදිංචි වෙලා කටයුතු කළේ. 1966 වර්ෂයේදී එතුමා ක්‍රීඩා විෂය භාර අමාත්‍යාවරයා හැටියට කටයුතු කළත් 1970 සමඟි රජය යටතේ කේ.බී. රත්නායක මැතිතුමා මේ රටේ ක්‍රීඩා අමාත්‍යාවරයා හැටියට පත් වුණා. එතුමා ක්‍රීඩා අමාත්‍යාවරයා හැටියට පත් වෙනකොට සුගතදාස මැතිතුමාත්, කේ.බී. රත්නායක මැතිතුමාත් මේ ක්‍රීඩා සංගම්වල තිබෙන අවිධිමත්භාවය හඳුනා ගත්තා. ඒ අවස්ථාවේදී ඒ පිළිබඳව සොයා බලන්න කමිටුවක් පත් කළා.

ඒ අනුව ගරු කථානායකතුමනි, මේ රටේ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ක්‍රීඩා සංගම් විධිමත් කිරීම සඳහා 1971 ජනවාරි මාසයේ 31 වන දා ක්‍රීඩා අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙකු වන ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා. ගරු කථානායකතුමනි, මේ කමිටුවේ නිර්දේශ අනුව එවකට හිටපු ක්‍රීඩා අමාත්‍ය කේ.බී. රත්නායක මැතිතුමා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත මේ පාර්ලිමේන්තුවට ගෙනැවිත් සම්මත කර ක්‍රීඩා සංගම් විධිමත් කිරීම සඳහා දැවැන්ත වැඩ පිළිවෙළක් දියත් කළා. මේ අවස්ථාවේදී එවකට හිටපු ක්‍රීඩා අමාත්‍ය ගරු කේ.බී. රත්නායක මැතිතුමා අපි ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ. මේ රටේ ක්‍රීඩාවට මෙතෙක් දුර හෝ එන්න එතුමා දැරූ උත්සාහය, එතුමා මේ පාර්ලිමේන්තුවට ගෙනා පනත, ගෙනා රෙගුලාසි විශාල පිටුවහලක් වුණාය කියන එක විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

ක්‍රීඩා අමාත්‍යාවරයා හැටියට මා, ප්‍රථමයෙන්ම මේ පනත ගෙනා ගරු කේ.බී. රත්නායක මැතිතුමා ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරන්න කැමැතියි. ගරු කථානායකතුමනි, 1973 ගෙනා පනත මේ වන විට දශක හතරක කාලයක් තුළ, පුරා අවුරුදු 40ක කාලය තුළ තුන් වරක් සංශෝධනය කිරීමට කටයුතු යෙදිලා තිබෙනවා. 1993 දී, 1998 දී සහ 2005 දී මේ පනත සංශෝධනය කිරීමට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, 24 වාරයකට ආසන්න ප්‍රමාණයක් මේ පනතේ රෙගුලාසි, විටින් විට යම් ඡේද සංශෝධනය කර තිබෙනවා. මේ රෙගුලාසි සංශෝධනය කර තිබෙන්නේ එක් එක් පුද්ගලයන්ට අවශ්‍ය පරිදි මිසක් පූර්ණ අධ්‍යයනයකින් නොවෙයි ගරු කථානායකතුමනි. දශක හතරක කාලය තුළ -වසර 40ක් තුළ- මේ රටේ ක්‍රීඩාව වෙනුවෙන් මේ පනත පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් නොකළ නිසා අපි කල්පනා කළා, පුවත් පත් දැන්වීම් දමලා, ක්‍රීඩා සංගම් සියල්ල ගෙන්වා දින ගණනක වැඩ මුළු තියලා, පළාත් ක්‍රීඩා අමාත්‍යවරුන් පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට ගෙන්වා ක්‍රීඩා සංගම්වල තිබෙන අවධිමත්භාවය, ගැටලු සියල්ල අධ්‍යයනය කරලා සියලු දෙනාගෙන් අදහස් විමසා සංශෝධන කිහිපයක් කරන්න. වසර එකහමාරක දැඩි උත්සාහයක ප්‍රතිඵලයක් හැටියට තමයි මේ පනතේ 31 සහ 41 වගන්ති යටතේ අමාත්‍යවරයාට තිබෙන බලතල අනුව මේ නියෝග අද අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමනි, මීට කලින් මේ රෙගුලාසි 24 වරක් සංශෝධනය වුණත් කවදාවත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැහැ. ගැසට් කර අමාත්‍යවරයා ඒවා ක්‍රියාත්මක කර තිබෙනවා. පළමු වන වතාවට තමයි නීත්‍යානුකූලව අපි මේ කටයුත්ත කළේ කියන එකත් ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

මේ සංශෝධන ගෙන ඒමට හේතු වූ කාරණා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ක්‍රීඩා පනතට මෙම නියෝග ගෙන ඒමට හේතුව මෙයයි. ක්‍රීඩා අමාත්‍යවරයා වශයෙන් සිටි පසු ගිය කාලය පුරාම ක්‍රීඩාවේ පසු බෑමට හේතු මොනවාද කියලා මම දැක්කා. ඔබතුමාට ඉතාම කෙටියෙන් කියන්නම්. අපේ මිත්‍ර ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා සභාවේ ඉන්නවා. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ලෝක කුසලානය ජයග්‍රහණය කිරීමත් සමඟ 1996 දී අපේ රටට ඉමහත් කීර්තියක් ලැබුණා. ඒ වාගේම සුසන්තිකා ජයසිංහ ඇතුළු ක්‍රීඩක ක්‍රීඩිකාවන්, ඩන්කන් වයිට් වාගේ ක්‍රීඩකයන් ඔලිම්පික් තරගවලට ගිහින් ජයග්‍රහණ ලැබුවා. ගරු කථානායකතුමනි, නමුත් මෑත කාලයේ ක්‍රිකට් ක්‍රීඩාවේදී අපි පිට පිට හතර වාරයක් අවසාන තරගයට තේරී පරාජය වුණා. මෑත කාලයේ විස්සයි විස්ස තරගාවලි අපි පරාජයට පත් වුණා ගරු කථානායකතුමනි. මලල ක්‍රීඩාව ගත්තොත් අපට තිබෙන පුංචිම ජාත්‍යන්තර තරගාවලිය වන සාර්ක් කලාපීය තරගාවලියෙන් දෙවෙනියාට හිටි අපි දැන් බංගලාදේශයටත් පැරදිලා අද හතරවෙනි ස්ථානයට ඇවිල්ලා ඉන්නවා. සාර්ක් තරගවලින් පදක්කම් හතළිහක්, පණහක් ගත්ත අපි අවසාන කාලය වන විට පදක්කම් අටට, දහයට බැස්සා ගරු කථානායකතුමනි. ආසියානු ක්‍රීඩා උළෙලේදී පළමුවෙනි වතාවට එකම රන් පදක්කමක්වත් නැතිව අපි ලංකාවට ආවා. ඒ අනුව අපි පසු ගිය කාලය පුරා ක්‍රීඩාවේ බරපතළ පරාජයක් දැක්කා. මම ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට පත් වුණාට පසුව අභිගරු ජනාධිපතිතුමා සමඟ මේ පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් කළා. එතුමා මේ රටේ ක්‍රීඩාවට ආදරය කරන ජනාධිපතිවරයෙක් හැටියට ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ලොකු වැඩ පිළිවෙළක් හැදුවා. ගරු කථානායකතුමනි, ඒ සියල්ල සැලකිල්ලට අරගෙන අපි මේ කාරණා කෙරෙහි අවධානය යොමු කරලා, ඔබතුමාට මුලින් කිව්ව ආකාරයට මේ නියෝග ගෙනාවා.

ගරු කථානායකතුමනි, මේ නියෝග ගෙන ඒමට හේතු වශයෙන් මම ඔබතුමාගේ අවධානයට කාරණා 13ක් යොමු කරනවා. පළමුවෙනි එක තමයි නිල කාලය. ගරු කථානායකතුමනි, අපේ රටේ ක්‍රීඩා සංගම්වල නිලවරණයකට කාලය දෙන්නේ අවුරුද්දයි. ලෝකයේ අනෙක් රටවල අවුරුදු 4කින් තමයි ඡන්දයක් පවත්වන්නේ. මොකද, ජාත්‍යන්තර තරගාවලි පවත්වන්නේ අවුරුදු හතරකට වරක්. ඒ නිසා හැම වෙලාවේම පත් වන අයට ඒ රටේ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරන්නට කාලයක් තිබෙනවා. අපට කාලය තිබෙන්නේ අවුරුද්දයි. දැන් ඔබතුමා මේ දිනවල පත්තරවල දකිනවා ක්‍රිකට් නිලවරණය තිබෙනවා කියලා. ජනාධිපතිවරණයට වඩා අමාරුයි මේක. නිලවරණයක් කිව්වාම මහා යුද්ධයක්. හරිම අමාරුයි මේක. ගරු කථානායකතුමනි, සංගමයට කෙනෙක් පත් වෙනවා; අවුරුද්දයි කාලය තිබෙන්නේ; මාර්තු 31 ඡන්දය පවත්වනවා; අවුරුද්දක කාලයෙන් පළමුවෙනි මාස තුන මේ අය කරන්නේ හිටපු අයගේ වැරදි සොයන එක.

වැරදි සොයලා පත්තරවලට මොකක් හෝ කියලා නැවත පුටුවේ ඉඳගන්න තව මාස තුනක් යනවා. ඊළඟ මාස හයේදී ඊළඟ පාරත් එන්න ඡන්දයට දුවනවා. එතකොට රටේ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් වැඩ කරන්න මේ ගොල්ලන්ට වෙලාවක් නැහැ. මේ ගොල්ලෝ කරන්නේ ඊළඟ පාර -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අතුරු කමිටුවක් පත් කර තිබෙනවා නේද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා කියන එක හරි. අතුරු කමිටුත් පත් කර තිබෙනවා. හැබැයි මම ආවාට පස්සේ කිසිම අතුරු කමිටුවක් නැතුව කටයුතු කරන්න පුළුවන් විධියට වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, වසරක ඡන්ද බලය මේ රටේ ක්‍රීඩාවේ පසුබැස්මට බලපාලා තිබෙනවා. හොඳම උදාහරණය ක්‍රිකට්. අපේ රටේ ජනතාව ආගමට පසුව දෙවැනි තැනට අදහන්නේ ක්‍රිකට්. අපේ මිනිස්සු ක්‍රිකට් ක්‍රීඩාවට හරි ආදරෙයි. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? ගරු කථානායකතුමනි, මේ ක්‍රිකට් පාලක මණ්ඩලය කටයුතු කර තිබෙන්නේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය ගැන සිතලා නොවෙයි, ඊළඟ සැරේ ඡන්දෙන් එන්නේ කොහොමද කියන එක ගැන සිතලායි. ක්‍රිකට් පාලක මණ්ඩලයට ලැබෙන ආදායමෙන් සියයට 95ක්ම අපි වැය කරන්නේ අපේ ජාතික කණ්ඩායම නඩත්තු කරන්නයි, ක්‍රීඩා සංගම් නඩත්තු කරන්නයි විතරයි. ක්‍රීඩාවේ උන්නතියට වියදම් කරන්නේ නැහැ. පත් වන හැම ක්‍රිකට් පාලක මණ්ඩලයක්ම උත්සාහ කරන්නේ තමන්ට ඡන්දය දෙන ක්‍රිකට් සමාජ ටික සතුටු කරන්නයි. බෝලෙත් දෙනවා, බැට් එකත් දෙනවා, හැම දේම දෙනවා. පුදුම සල්ලියක් දීලා සංගම් සතුටු කරන්න තමයි බලන්නේ. ඒ නිසා මම යෝජනා කළේ මේ නිල කාලය අවුරුදු හතරක් දක්වා දීර්ඝ කරන්නයි. හැබැයි අපේ නිලධාරීන් කිව්වා, මේ කාලය අවුරුදු දෙකකට දීලා බලමු කියලා. ඒ නිසා අපි පළමුවන වතාවට අවුරුදු දෙකකට නිල කාලය දීර්ඝ කළා. දැන් අපිට අවුරුදු දෙකක්ම කනක් ඇහිලා ඉන්න පුළුවන් ගරු කථානායකතුමනි. මොකද, නිලවරණයකට අපි යන්නේ අවුරුදු දෙකෙන් දෙකට. මගේ අවධානය ඉදිරියේදී එය අවුරුදු හතරක් කරන්නයි.

ඊළඟ කරුණ තමයි ගරු කථානායකතුමනි, මේ සංගම්වල රැඳී සිටීමට දෙන නිල කාලය. මේ සංගම්වල උරුමක්කාරයෝ ඉන්නවා. සමහර ක්‍රීඩාවලට ඇත්තටම ආදරය කරන අය

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ඉන්නවා. නමුත් සමහර සංගම්වල ඉන්නවා, මේ ක්‍රීඩාව විනාශ කරන්න ආපු පිරිසක්.

අනුර දිසානායක මන්ත්‍රීතුමා දන්නවා, වොලිබෝල් ක්‍රීඩාව ගැන. අපේ ඩිලාන් පෙරේරා ඇමතිතුමා වොලිබෝල් ක්‍රීඩාවට කර තිබෙන කාර්ය භාරය පිළිබඳව ඔබතුමා දන්නවා. එතුමාට ඒ ගෞරවය දුන්නාට කමක් නැහැ.

ගරු කථානායකතුමනි, හොඳම ක්‍රීඩාව හැටියට සැලකෙන මලල ක්‍රීඩාව ගැන ඔබතුමා දන්නවා. අවුරුදු හතක කාලයක් තුළ එකම පිරිසක් පාලනය කළ නිසා අපේ මලල ක්‍රීඩාව බිමටම කඩා ගෙන වැටුණා. මේ තත්ත්වයට විසඳුමක් හැටියට අපි නීතියක් ගෙනාවා, එක් අයකුට වසර හතරකට වැඩිය එක සංගමයක ඉන්න බැහැයි කියලා. අවුරුදු හතරකට පස්සේ තව අවුරුදු දෙකක් ඉන්න පුළුවන්, එතකොට අවුරුදු හයයි, ඊට පස්සේ මේ සංගම්වල තනතුරක ඉන්න බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ වුණත් අවුරුදු හයක්-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අවුරුදු හයක් ඉන්න පුළුවන්, සභාපති ලේකම් වැනි ප්‍රධාන තනතුරුවල. ඊට පස්සේ ආපසු ඒ සංගමයේ ඔහුට ඉන්න බැහැ. ඔහු එතැනින් ඉවත් වෙලා -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කැඩි කැඩී හෝ අවුරුදු හයක් ඉන්න පුළුවන්?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔව්. එක දිගට අවුරුදු හයක් ඉන්නත් පුළුවන්. ඒ කියන්නේ දෙකෙන් දෙකට ගියොත් තුන් වරක්. අවුරුදු දෙකෙන් කැඩිලා අවුරුදු දෙක බැගින් තුන් පාරක් ඉන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මෙවර අවුරුදු දෙකක් ඉඳලා තව අවුරුද්දකින් පස්සේ තව අවුරුදු දෙකක් -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, එහෙම නොවෙයි. ඕනෑ නම් එක වරම අවුරුදු හයක් ඉන්න පුළුවන්. දැන් පවතින මේ ක්‍රමවේදය තුළ ගරු මන්ත්‍රීතුමා, අවුරුදු ගණනක්ම එක දිගට ඉන්න පුළුවන්. අපි කියන්නේ සාමාන්‍යයෙන් ක්‍රීඩාවක් වැඩිදියුණු කරන්න අවුරුදු හතරක්වත් දෙන්න ඕනෑ කියලා. එක වර අවුරුදු හයක් දීලා තිබෙනවා.

නැවත එනවා නම්, තනතුරෙන් ඉවත් වෙලා අවුරුදු දෙකකට පස්සේ තමයි ඔහුට එන්න අයිතිය තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඉස්සර සිදු වෙලා තිබුණේ ඇමතිතුමාගේ අනුමැතිය දුන්නා. ඇමතිතුමාට ඕනෑ වෙලාවක අනුමැතිය දෙන්න පුළුවන්. දැන් ඇමතිවරයාට ඒ අනුමැතිය දෙන්න බැහැ. ඒ නිසා අවුරුදු හයෙන් අනිවාර්යයෙන්ම ඔහු යන්න ඕනෑ. ඒ නිසා ක්‍රීඩාව බදා ගෙන සිටි සමහර අයට, ක්‍රීඩාව විනාශ කළ සමහර අයට මින් ඉදිරියට ඒ තැන්වල ඉන්න බැහැ ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණය තමයි ඡන්දය. අපට සර්ව ජන ඡන්ද බලය තිබුණාට, ක්‍රීඩා සංගම්වලට සර්ව ජන ඡන්ද බලය නැහැ. අපි අත ඔසවලායි ඡන්දය දෙන්න ඕනෑ. යම් යම් තැගි හෝග දීලා, බලපෑම් කරලා තමයි ඒ සංගම්වල ඉන්නේ. පසු ගිය අවුරුද්දේ මලල ක්‍රීඩා සංගමය විවෘත ඡන්දයකට ගියා. ජාත්‍යන්තර සංගමය අපව තහනම් කළා, "ඔබ රහස් ඡන්දයකට යන්න ඕනෑ" කියලා. ඒ ලෝකයේ හැම රටකම කරන දේ. ගරු කථානායකතුමනි, අපේ සංගම්වලට මේ පනත තුළින් පළමුවැනි වතාවට සර්ව ජන ඡන්ද බලය ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, ඒ සංගම්වලට වැඩි පිරිසක් එන්නේ ක්‍රීඩාවට තිබෙන ආදරයට වඩා තමන්ට මොන යම් හෝ දෙයක් කරගන්නයි. ඒවාට ව්‍යාපාරිකයෝ එනවා. හොඳම උදාහරණයට මා ක්‍රිකට් පාලක මණ්ඩලය ගන්නම්. මම ඔවුන්ගේ නම් කියන්න කැමැති නැහැ. ඒකේ ප්‍රබල තනතුරක් දරන පුද්ගලයෙකු ඉන්නවා. ඔහු තමයි ක්‍රීඩා භාණ්ඩ ආනයනය කරන්නේ. ඔහු උදේට ක්‍රිකට් පාලක මණ්ඩලයට එනවා; තමන්ගේ බඩු ටික Cricket Board එකට දමනවා; bank account එකේ balance එක බලනවා; cheque එක ලියා ගන්නවා; යනවා. ඔහු එන්නේ ක්‍රිකට් ක්‍රීඩාව හදන්න නොවෙයි, ඔහුගේ බඩු ටික විකුණා ගන්නයි. Badminton ගත්තත් එහෙමයි. Basketball ගත්තත් එහෙමයි. පා පන්දු ගත්තත් එහෙමයි. ඒවායේ ප්‍රධාන නිලතල දරන කිහිප දෙනෙකුට ඒ ක්‍රීඩා භාණ්ඩ ආනයන කරන සමාගම් තිබෙනවා. ඒගොල්ලෝ බලන්නේ බෝලේ හොඳද, නරකද කියන එක නොවෙයි. තමන් ආනයනය කරන ඒවා තමයි එයා අනුමත කරන්නේ. ඒ නිසා මේ නියෝගයෙන් පස්සේ නව ක්‍රමවේදය තුළ, ක්‍රීඩා භාණ්ඩ ආනයනය කරන කිසිවෙකුට ඒ සංගම්වල තනතුරුවලට තරග කරන්න බැහැ ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ඊළඟට පුහුණුකරුවන් ගැන බලන්න. දැන් පුහුණුකරුවොත් ඒ සංගම්වල ඉන්නවා. ක්‍රීඩා පුහුණුකරුවෝ සංගමයේ සභාපති හෝ ලේකම්. හොඳම උදාහරණය basketball. ඒකේ ජාතික පුහුණුකරුත්, උප සභාපතිත්, පුහුණුකරුවන්ගේ සංගමයේ සභාපතිත්, තේරීම් කමිටුවේ සභාපතිත් පුහුණුකරුමයි. අවුරුදු 14ක් තිස්සේ ඒ තනතුරු දරන්නේ ඔහුමයි. අද basketball ඉවරයි. දැන් ඔහු තමයි නීති ටික හදන්නේ. එතකොට ශ්‍රී ලංකා කණ්ඩායම වෙනුවෙන් basketball ක්‍රීඩා කරනවා නම් ඔහුගේ club එකට එන්න ඕනෑ. නැත්නම් ක්‍රීඩා කරන්න බැහැ. නමුත් මේ නව ක්‍රමවේදය තුළ පුහුණුකරුවන්ට නිලතලවලට තරග කරන්න බැහැ. ගරු කථානායකතුමනි, පුහුණුකරුවෙකු සභාපති වුණොත් මොකක්ද වෙන්නේ? අපි උදාහරණයක් ගනිමු. අපි හිතමු පුහුණුකරුවා තමයි අපේ ඩිලාන් පෙරේරා ඇමතිතුමා කියලා. එතුමා volleyball පුහුණුකරුවෙක්. එතුමා සංගමයේ සභාපති වෙනවා. එතකොට එතුමාට ඉන්න කණ්ඩායමට අවශ්‍ය විධියට තමයි නීති රීති හදන්නේ. එතකොට හැම දාම ඩිලාන් ඇමතිතුමා දිනුම්. එයින් ක්‍රීඩාවට බරපතළ අවාසියක් සිදු වෙනවා. ඒ නිසා මේ නව ක්‍රමවේදය තුළ පුහුණුකරුවන්ටත්, නිලතලවලට තරග කරන්න තහනම්.

ගරු කථානායකතුමනි, ඊළඟ ප්‍රශ්නය තමයි දෙමවුපියෝ. ගරු කථානායකතුමනි, badminton ජාතික තරගාවලියට ගියාම badminton court එක ඇතුළේ මරා ගන්නවා. තාත්තලා, අම්මලා ටික ගහ ගන්නවා. මොකක් නිසාද? තමන්ගේ පුතාව අදක්ෂ වුණත් ඔහු උඩට ගන්න අම්මා හෝ තාත්තා සංගමයේ තනතුරකට එනවා. ඇවිල්ලා හරියට ක්‍රීඩා කරන්න බැරි පුතාව උඩට ගන්න තමයි සංගමය ඇතුළේ ඉඳලා කටයුතු කරන්නේ. මේ සංගම්වල

විශාල දෙමව්පියන් පිරිසක් තමන්ගේ දරුවෝ වෙනුවෙන් මේ සංගමයේ තනතුරු හොබවනවා. ගරු කථානායකතුමනි, මේ පනතට ගෙන එන නියෝග තුළින් ඒ කිසිම කෙනෙකුට මින් පසු තරග කරන්න බැහැ.

ගරු කථානායකතුමනි, ඊළඟට විදේශ සංචාරවලට ගිහින් රට පනින අය. මේ සංගම්වලට විදේශ සංචාර හම්බ වෙනවා. හොඳම උදාහරණය තමයි ජූඩෝ සංගමය. ගරු කථානායකතුමනි, ජූඩෝ සංගමයේ ඉන්න නිලධාරීන්ගෙන් සියයට 95ක් රට පැනපු අයයි. ජපානයට tour එකක් ආපු ගමන් සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ජපානයට ගිහිල්ලා tournament එක කර ජපානයට පනිනවා. පැනලා අවුරුදු දෙකකින් ඇවිල්ලා ආපහු ඡන්දය ඉල්ලනවා. සමහරු ඇමෙරිකාවට යනවා; පනිනවා; හම්බ කරනවා; ආපසු එනවා. ජූඩෝ සංගමයේ සියයට 95ක් ඉන්නේ රට පැනපු මිනිස්සුයි. ක්‍රීඩාවේ නාමයෙන් විදේශගත වෙලා එහෙම රට පැනලා, ආපු නැති කෙනෙකු ඉන්නවා නම් මේ පනතට ගෙන එන නියෝග තුළින් මින් ඉදිරියට ඔවුන්ට ඒ සංගම්වලට තරග කරන්න බැහැ.

ගරු කථානායකතුමනි, ඊළඟට යම් කෙනෙකු සූදු ව්‍යාපාරයට සෘජුව සහ වක්‍රව සම්බන්ධ වෙනවා නම් මේ නියෝග අනුව එහෙම කෙනෙකුට ක්‍රීඩා සංගම්වල-

ගරු ජෝන් අමරතුංග මහතා
(මාණ්පුමිකු ජෝන් අමරතුංග)
(The Hon. John Amaratunga)
එහෙම කරන්නේ කාට ගහන්නද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඒකෙන් ගහන්නේ, ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාගේ අර Barnes Place එකේ ඉන්න උස කෙනාටයි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
අතීතයේ යෙදුණු අයද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
යෙදෙමින් ඉන්න අය. අතීතයේ නොවෙයි. යෙදෙමින් ඉන්න අය. අතීතය ගැන අපට කථා කරන්න බැහැ නේ. අපි කියන්නේ, මේ නාම යෝජනා භාර දෙන අවස්ථාව වන විට මේවායේ යෙදිලා ඉන්නවා නම් ඒ අයට තරග කරන්න බැහැය කියලායි. නාම යෝජනා දීලා ඊට පස්සේ යෙදෙන්නත් බැහැ. ඒ නිලය දරන කාලය තුළ කිසිම කෙනෙකුට ඒ වාගේ දේවල් කරන්න බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
වක්‍රව කියන්නේ මොකක්ද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
වක්‍රව කියන්නේ එවැනි තැනක තමන්ගේ බිරිඳ ඉන්නවා නම්, තමන්ගේ දරුවෙකු ඉන්නවා නම් ඒ තනතුරු දරන්න බැහැ කියන එකයි. ඒක තමයි අපි කියන්නේ.

ගරු කථානායකතුමනි, ඊළඟට මාධ්‍ය ආයතන. ඔබතුමන්ලා අපට දිගටම චෝදනා කළා නේ, මාධ්‍ය ආයතනවල ඉඳගෙන මේ තනතුරු දරනවා කියලා. ඒකත් අපි මේ නියෝගවලට දැම්මා. යම් කිසි පුද්ගලයෙකු යම් මාධ්‍ය ආයතනයක යම් තනතුරක් දරනවා නම් ඔහුට කිසිම සංගමයක තනතුරක් දරන්න බැහැ. ඔබතුමන්ලා අපට දිගටම ඒ ගැන චෝදනා කළා. ඒ නිසා ඒකත් අපි මේ පනතට නියෝග වශයෙන් ගෙනාවා. ගරු කථානායකතුමනි, නාම යෝජනා ලබා දීමේදී ගොඩාක් අක්‍රමිකතා-

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
දේශපාලනයේ නිරත අයට?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
දේශපාලනඥයන් කියන එක මට ගෙනෙන්න බැහැ. ඔබතුමාගේම පක්ෂයේ මිත්‍රයා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දාලා තිබෙනවා. මමත් පෞද්ගලිකව ඒ ස්ථාවරයේ ඉන්නවා. හැබැයි ඒකේ වාසි, අවාසි දෙකම තිබෙනවා. මොකද හොඳම උදාහරණය වශයෙන් මගේ මිත්‍ර ඩිලාන් පෙරේරා ඇමතිතුමා ගත්තෝතින්- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඒකේ තත්ත්වය මොකක්ද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඒකේ තත්ත්වය මේකයි. ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ දාපු නඩුවක තීන්දුවක් දීලා තිබෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට එතුමාට ඒ අයිතිය තිබෙනවා කියලා.

ගරු අර්ජුන රණතුංග මහතා
(මාණ්පුමිකු අර්ජුන රණතුංග)
(The Hon. Arjuna Ranatunga)
මම ඒ නඩුව දැම්මේ ක්‍රීඩකයෙක් හැටියට ඉඳලා පාර්ලිමේන්තුවට පත් වුණාට පස්සේයි. ඒ කියන්නේ ක්‍රීඩකයෙක් හැටියට ඉඳලා පාර්ලිමේන්තුවට පත් වුණාට පස්සේ එහෙම තහනම් කිරීමෙන් මානව හිමිකම් නැති වනවා කියලායි. මා හිතන හැටියට ඒක ඕනෑම කෙනෙකුට තිබෙන අයිතිවාසිකමක්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මා කිව්වේ වැරැද්දක් නොවෙයි.

ගරු අර්ජුන රණතුංග මහතා
(මාණ්පුමිකු අර්ජුන රණතුංග)
(The Hon. Arjuna Ranatunga)
නැහැ. ඒක නිවැරැදි කරන්න ඕනෑ. සමහර තැන්වල එය කියන නිසා මම ඒ ගැන ඔබතුමාව දැනුවත් කරන්නම්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඒ තීන්දුවේ තිබෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමාට ඒ අයිතිවාසිකම තිබෙනවා කියලායි. ඒ අයිතිවාසිකම ඔබතුමාට තිබෙනවා නම්, ඒක ගරු

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ඩිලාන් පෙරේරා ඇමතිතුමාටත් තිබෙනවා. හැබැයි ඒ පිළිබඳව තවම මම කැමැත්තකින් නැහැ. මේ පිළිබඳව යම් නීතිමය කටයුත්තක් කරලා ඒකත් ඉවත් කරන්න පුළුවන්ද කියන එක මගේ ලේකම්තුමා ඇතුළු අපි මේ වන විට නීතිපතිතුමාත් එක්ක සාකච්ඡා කරමින් යනවා. ඒක අපට අනුමත කර ගන්න පුළුවන් වුණොත්, අනිවාර්යයෙන් අපි තව රෙගුලාසියක් ගැසට් කරලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පනතට එයත් ඇතුළත් කරනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට නාම යෝජනා භාර දීමේදී ලොකු අක්‍රමිකතා සිදු වනවා. මේ නාම යෝජනා භාර දෙන්නේ සංගමයේ ලේකම්ටයි. සංගමයේ ලේකම්ට අභියෝගයක් වන නාම යෝජනාවක් ගෙනාවොත් එය හංගනවා. හංගලා කියනවා, nomination දුන්නේ නැහැ කියලා. ඒ නිසා මේ නියෝගය අනුව පිටපත සංගමයට ගෙනැල්ලා දීලා නාම යෝජනා සියල්ල අධ්‍යක්ෂ ජනරාල්වරයාට භාර දෙන්න ඕනෑ. ඒ කටයුත්ත අනුව කාටවත් අසාධාරණයක් වන්නේ නැහැ. [බාධා කිරීමක්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂයේ එහෙම දේවල් වනවා නම්, ඒක පිළිගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, ඊළඟට මෙම සංගම්වල තනතුරුවලට අධිකරණයෙන් වැරැදිකරුවන් වෙලා තිබෙන අය පත් වෙලා තිබුණා. දැනටත් අපේ සංගම්වල යම් යම් තනතුරුවල එහෙම අධිකරණයෙන් දඬුවම් ලැබූ අය ඉන්නවා. මින් ඉදිරියට මාස හයකට වැඩි දඬුවමක් ලැබූ කෙනෙක්-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඕනෑම වරදකටද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඕනෑම වරදකට. ඔබතුමා ඇතුළු, ළමා අපචාර ඇතුළු ඕනෑම එකකට- [බාධා කිරීම්] ඔබතුමා ඇතුළු කියලා කිව්වේ -[බාධා කිරීම්] මම ඒක ඉල්ලා අස් කර ගන්නවා. [බාධා කිරීම්]මේ සංවාදය එක දිගට ගියාම බොහොම අමාරු නිසා මම ඒක ඔබතුමාට කිව්වේ පොඩ්ඩක් හිනා වෙන්නයි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ළමා නොවෙයි වැඩිහිටි කියලා මම දන්නවා. ගරු කථානායකතුමනි, යම් පුද්ගලයෙකු උසාවියකින් වැරැදිකරුවෙක් කළෝතින් ඒ අයට මේ තනතුරු සඳහා ඉල්ලන්න බැහැ.

ගරු කථානායකතුමනි, ඊළඟට ක්‍රීඩා ක්ෂේත්‍රයේ තිබුණු බරපතළ ප්‍රශ්නයක් තමයි, පාසල් සංගම් සහ ජාතික සංගම් අතර තිබෙන ගැටලුව. ජාතික සංගමයත් එක්ක වැඩ කරන්න පාසල් සංගමය එන්නේ නැහැ. හොඳම උදාහරණය ක්‍රිකට්. ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාම කියනවා, පාසල් ක්‍රිකට් සංගමය අපේ සංගමයත් එක්ක එකට වැඩ කරන්නේ නැහැ කියලා. Sri Lanka Schools Rugby Football Association එකයි, අපේ Sri Lanka Rugby Football Union එකයි එකට වැඩ කරන්නේ නැහැ. හැබැයි අපට ක්‍රීඩකයෝ හදා දෙන්නේ පාසලෙන්. ක්‍රීඩකයින් හදා දෙන පාසල අපි එක්ක එකට වැඩ කරන්නේ නැහැ. මේ පනතට ගෙන එන නියෝග තුළින් ජාතික සංගමයත්, පාසල් සංගමයත් එකට වැඩ කරන්න ඕනෑ. ඒ අනුව ජාතික සංගමයේ සාමාජිකයෝ දෙන්නෙක් පාසල් සංගමයට එනවා. පාසල් සංගමයේ සාමාජිකයෝ දෙන්නෙක් ජාතික සංගමයට යනවා. ඒ අනුව අපි එකට වැඩ කරන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, මේ කිසිම සංගමයක් වැඩ කටයුතු කිරීමේදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළේ නැහැ. ඒ නිසා වැඩ කටයුතු කිරීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කරන්න ඕනෑය කියන එකත් මේ නියෝගයට ඇතුළත් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, තව වැදගත් දෙයක් තිබෙනවා. පසුගිය කාලයේ මේ සංගම්වල බරපතළ මූල්‍ය වංචා සිද්ධ වුණා. ඒ කියන්නේ සංගම්වලට විදේශ රටවලින් මුදල් එනවා. අපි දන්නේත් නැහැ, මුදල් එනවා, ආපහු යනවා. එතැන මහා වංචාවක් සිද්ධ වුණා. ඒ කියන්නේ ලංකාවට එක පාරටම ඩොලර් ගණන්වලින් මුදල් එනවා. පස්සේ බැලුවාම ඒ මුදල් වියදම් වෙලාත් නැහැ, ආපහු ඒ මුදල් පිට රටටම යනවා. ගරු කථානායකතුමනි, ඒ එන මුදල් සියල්ල විනිවිදභාවයකින් ගෙන ඒම සඳහා වැඩ පිළිවෙළක් මේ නියෝග තුළින් හදලා තිබෙනවා. මේ නියෝග මඟින් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ඉදිරිපත් කළ තව කාරණා විශාල ප්‍රමාණයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම සෑම දිස්ත්‍රික්කයකම ක්‍රීඩාවේ සංවර්ධනය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකාරවරයෙක් පත් කළ යුතුය කියන කරුණ ඇතුළු සංශෝධන ගණනාවක් මේ නියෝග තුළින් ගෙනැල්ලා තිබෙනවා. මේ නියෝග සියල්ල අපි ගෙනාවේ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කියන එක බොහොම ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ. මේ නියෝග මුද්‍රණය කිරීමේදී ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් දේ හරියට තිබෙනවා. නමුත් සිංහල භාෂාවේ කොටස්වල මුද්‍රණයේ ඉලක්කම්වල පොඩි අඩු පාඩුකම් කීපයක් තිබෙනවා. ඒක අපි බොහොම නිහතමානීව පිළිගන්න කැමැතියි. හැබැයි ඔබතුමන්ලා ඉංග්‍රීසි භාෂාව යටතේ සඳහන් වන සංඛ්‍යා ලේඛන එක්ක සිංහල භාෂාව යටතේ සඳහන් සංඛ්‍යා ලේඛන සංසන්දනය කරලා බැලුවොත් එම සංඛ්‍යා වැරැදියි. ඒ නිසා අපි ඒක නිවැරැදි කරන්න කටයුතු කරන බව මතක් කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපි මේ නියෝග හැදුවේ සියලු සංගම්වල එකඟතාවෙනුයි. ඒ සඳහා ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා සහ ගරු ටී.බී. ඒකනායක ඇමතිතුමා සාක්ෂි දරනවා ඇති. අපි සියලු සංගම් කැඳවා අවසාන පිටපත පෙන්වා, ඔවුන්ගේ අනුමැතියෙනුයි මේ නියෝග හැදුවේ. ඊට පස්සේ ඔවුන් මේ සඳහා සංශෝධන දෙක, තුනක් ගෙනාවා. අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙනෙන nomination එක සංගමයට දීලා පිටපත අපට භාර දෙන්න කියලා එක සංශෝධනයක් ගෙනාවා. අපි එවැනි සංශෝධන කෙරෙහි අවධානය යොමු කරනවා. ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාත් සංශෝධන කීපයක් අපට එවා තිබෙනවා. මේ සියල්ලම අපි භාර ගත්තා. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කිව්වා, මීට කලින් මෙවැනිම ගැසට් 24ක් අපි මුද්‍රණය කරලා තිබෙනවා කියලා.

ඉදිරි කාලයේ දී අපි බලාපොරොත්තු වනවා, අඩු පාඩුකම් මොනවා හරි තිබෙනවා නම් ඒවාත් සැලකිල්ලට අරගෙන නව සංශෝධනයක් තුළින් ඒ කටයුතු ටිකත් කරන්න.

ගරු කථානායකතුමනි, මේ නියෝග ඉතාම වටිනා නියෝග බව සඳහන් කරන අතර, සියලු පාර්ශ්වයන් එකට එකතු වෙලා, දේශපාලනයක් ඇඳා ගන්නේ නැතිව, ඡන්දයකට යන්නේ නැතිව, ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන්, ක්‍රීඩාවේ නාමයෙන් මේ නියෝගවලට තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන්නය කියලා ඉතාම ගෞරවයෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව මේ කෙටි කාලය තුළ අපි කළා වූ කාර්ය භාරය පිළිබඳව වචන කීපයක් මා කථා කරන්න

කැමැතියි. මේ විෂයයට ජාතික ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. අපි මෙතෙක් කල් වෙන් වෙන්ව තමයි කටයුතු කළේ ගරු මන්ත්‍රීතුමනි. අධ්‍යාපන අමාත්‍යාංශය වෙනම යනවා. පළාත් සභාව වෙනම යනවා. ක්‍රීඩා අමාත්‍යාංශය වෙනම යනවා. අපට ජාතික ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. මේ වසර එක හමාරක කාලය තුළ අපේ අමාත්‍යාංශයේ සියලු දෙනා එකතු වෙලා දැඩි කැප කිරීමක් කරපු නිසා අපට පුළුවන් වුණා, මේ රටේ ක්‍රීඩාවට ජාතික ප්‍රතිපත්තියක් හදන්න. පළමුවැනි වතාවට අපි සියලු දෙනා එකතුව ක්‍රීඩාව වෙනුවෙන් රටේ ජාතික ප්‍රතිපත්තියක් හදලා ඒ අනුව කටයුතු කරන්න දැන් සූදානම් වෙමින් යනවා. ඒ වාගේම දශක හතරකට පස්සේ පළමුවැනි වතාවට පූර්ණ අධ්‍යයනයක් ඇතිව අපි ක්‍රීඩා පනත යටතේ ගෙනෙන මේ නියෝග සංශෝධනය කරන්න කටයුතු කළා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ රටේ ක්‍රීඩකයන්ට තිබුණු බරපතළ ප්‍රශ්නයක් තමයි, තහනම් උත්තේජක භාවිතය. තහනම් උත්තේජක භාවිතය සම්බන්ධයෙන් රටේ කිසිම නීතියක් තිබුණේ නැහැ. මහාචාර්ය අර්ජුන ද සිල්වා මැතිතුමා පත් වුණාට පස්සේ අපි තහනම් උත්තේජක සම්බන්ධයෙන් නීති හදලා, UNESCO ගිවිසුම් අත්සන් කරලා, ඒ තහනම් උත්තේජක භාවිත කරන ක්‍රීඩකයන්, පුහුණුකරුවන්, ව්‍යාපාරිකයන් හිරේ යවන්න, ඔවුන්ට දඬුවම් දෙන්න, ජීවිතාන්තය දක්වා ක්‍රීඩා තහනම් කරන්න අවශ්‍ය අණපනත් ගෙනැල්ලා තිබෙනවා. ඒ අනුව තහනම් උත්තේජක පනත අපි තව කෙටි කාලයක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම යටිතල පහසුකම් සම්බන්ධයෙන් ජාතික වැඩ සටහනක් අපට තිබුණේ නැහැ. ගමේ ක්‍රීඩකයාට ජාතික මට්ටමට එන්න පුළුවන් වැඩ සටහනක් අපි පළමුවැනි වතාවට හැදුවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ ක්‍රීඩාංගන 314ක්, දිස්ත්‍රික්ක මට්ටමේ ක්‍රීඩාංගන 25ක්, පළාත් මට්ටමේ ක්‍රීඩාංගන 9ක් ආදී වශයෙන් ක්‍රීඩා සංකීර්ණ ලබා දෙනවාය කියලා අතිගරු ජනාධිපතිතුමා 2005 මහින්ද චින්තනයෙන් මේ රටේ ජනතාවට පොරොන්දු වුණා. අපි මේ ක්‍රීඩා සංකීර්ණ සියල්ල 2016 වන කොට හදලා අවසන් කරනවා. මේ අවුරුද්ද අවසාන වන කොට අපි ක්‍රීඩාංගන 16ක් ජනතා අයිතියට පවරන්න බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. අතිගරු ජනාධිපතිතුමා ප්‍රථම වරට මේ රටේ ක්‍රීඩා සංස්කෘතියක් ගැන කථා කළා. රටේ ක්‍රීඩා ආර්ථිකයක් ගැන කථා කළා. පදක්කම්, ජයග්‍රහණවලට සීමා වුණු මේ විෂයය පුළුල් කර රටේ සෑම කෙනෙකුම ක්‍රීඩකයෙකු බවට පත් කිරීම සඳහා දැවැන්ත වැඩ පිළිවෙළක් අපේ අමාත්‍යාංශය අද හදාගෙන යනවා. අපේ ඉලක්කය තමයි හැම කෙනෙකුම ක්‍රීඩකයෙකු කිරීම. ඒ සඳහා කමිටුවක් පත් කරලා, අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු සියලු දෙනාම එකතු වෙලා දැවැන්ත වැඩ පිළිවෙළක් කරගෙන යනවා. මේ රටේ ක්‍රීඩා සංස්කෘතියක් හදන්න අපිට මූලික හේතු කාරණා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද මේ රටේ ජනගහනයෙන් දහයෙන් එකක් දියවැඩියා රෝගයෙන් පෙළෙනවා. අසල්වැසි ඉන්දියාවේ ජනගහනයෙන් තුනෙන් එකක් අද දියවැඩියා රෝගයෙන් පෙළෙනවා. අද දරුවෝ ක්‍රීඩා කරන්නේ නැහැ. අද දරුවෝ ක්‍රීඩාවෙන් ඈත් වෙනවා. අද ප්‍රාථමික අධ්‍යාපනයේ යෙදෙන දරුවන්ගෙන් සියයට පහයි ක්‍රීඩා කරන්නේ. ඕස්ට්‍රේලියාව වාගේ රටවල ප්‍රාථමික අධ්‍යාපනයේ යෙදෙන දරුවන්ගෙන් සියයට 80ක් ක්‍රීඩා කරනවා. සෑම කෙනෙකුම ක්‍රීඩකයෙකු බවට පත් කරන්නත්, දැවැන්ත ක්‍රීඩා සංස්කෘතියක් රට තුළ හදන්නත් අපි මේ වන කොට කටයුතු කරගෙන යනවා. ඒ වාගේම මේ රටේ ආර්ථිකයට ක්‍රීඩාවෙන් දායකත්වයක් ලබා දෙන්න අපි මේ වන කොට දැවැන්ත වැඩ පිළිවෙළක් හදාගෙන යනවා.

ගරු කථානායකතුමනි, අපි දන්නවා ලෝකයේ දියුණු රටවල් ගැන. ඒ රටවල ආර්ථික බලවේගය බවට ක්‍රීඩාව පත් කරගෙන තිබෙනවා. පසු ගිය අවුරුද්දේ අපිට පුළුවන් වුණා, මේ රටේ ආර්ථිකයට ඩොලර් මිලියන 100ක් ගෙනැල්ලා දෙන්න. ජාත්‍යන්තර තරගාවලි 11ක් අපි ශ්‍රී ලංකාවේ පැවැත්වුවා. අපේ ඉලක්කය මේ ක්‍රීඩාව තුළින් ඩොලර් මිලියන 500ක් මේ රටේ ආර්ථිකයට ගෙනැත් දීමයි. ඒ සඳහා තමයි මේ නියෝග ගෙනාවේ. ඒ සඳහා තමයි ක්‍රීඩාව ජාත්‍යන්තර මට්ටමට ගෙන යන්න අපි කටයුතු කරන්නේ ගරු කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි, පළමුවැනි වතාවට -අවුරුදු 25කට පස්සේ- අධ්‍යාපන ඇමතිවරයාත්, ක්‍රීඩා අමාත්‍යවරයාත් සමඟ එකට ඉඳගෙන එක වැඩ පිළිවෙළක් හැදුවා ගරු කථානායකතුමනි. අතිගරු ජනාධිපතිතුමා සහ අපේ සහෝදර අමාත්‍යතුමන්ලා එකතු වෙලා පසු ගිය සතියේ ඒ වැඩ පිළිවෙළට කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දුන්නා. ඒ යටතේ පාසල් යන හැම දරුවෙකුටම මේ වර්ෂයේ ඉඳලා ක්‍රීඩාව අනිවාර්යය කළා, ගරු කථානායකතුමනි. ඒ අනුව පාසල් යන හැම දරුවෙකුම මේ අවුරුද්දේ ඉඳලා ක්‍රීඩා කරන්න ඕනෑ. ඔහුගේ විෂයයන්වලට අපි ක්‍රීඩාවත් ඇතුළත් කරනවා. ඒකට ලකුණු දෙනවා. ඔහුට පන්තියේ පළමුවැනියා වෙන්න ඕනෑ නම් විෂයයන් නවයටම "ඒ" සාමාර්ථය ගත්තාට වැඩක් නැහැ, ක්‍රීඩාවට ලකුණු ලබාගෙන නැත්නම්. ඒ වාගේම ඒ දරුවා ජාත්‍යන්තර මට්ටමේ පදක්කමක් දිනා ගත්තොත්, විශ්වවිද්‍යාලයට හෝ විද්‍යා පීඨයට ඇතුළත් වෙන්න ලකුණු 10ක් අඩු නම්, ඒ ජාත්‍යන්තර ජයග්‍රහණය සැලකිල්ලට අරගෙන ඔහුට විශ්වවිද්‍යාලයට එහෙම නැත්නම් විද්‍යා පීඨයට ප්‍රවේශ වෙන්න අපි අවස්ථාවක් ලබා දෙනවා. ඒ වාගේම ඒ ක්‍රීඩකයා ක්‍රීඩා කරන ගමන් විශ්වවිද්‍යාලයට ගියොත් අවුරුදු හතරේ පාඨමාලා කාලය, අවුරුදු පහ දක්වා දීර්ඝ කරන්නත් කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දුන්නා. අපි අවුරුදු 13න් පහළ තරගකාරී ක්‍රීඩා නැවැත්වුවා ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, ශිෂ්‍යත්වයට ලියන දරුවන් 3,20,000ක් ඉන්නවා. ලබන අවුරුද්දේ ඉඳලා ඒ සෑම දරුවකුම වෛද්‍ය පරීක්ෂණයකට භාජන කරලා ඒ එක් එක් දරුවා මොන ක්‍රීඩාවටද දක්ෂ කියන තීරණය දෙමව්පියන්ට දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ විධියට අපි අපේ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් පසු ගිය කාලය පුරා දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන ගිය බව මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අපට මේ සියලු කටයුතු කරන්න අතිගරු ජනාධිපතිතුමාගෙන් ලැබුණු සහයෝගය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. පසු ගිය කාලයේ රුපියල් බිලියන 10ක් ආයෝජනය කළා මේ රටේ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන්. ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් මේ කාලයේ මෙවැනි ආයෝජනයක් කළේ ඉතිහාසයේ පළමුවන වතාවටයි. හැම දාම අපේ Budget allocation එක වෙලා තිබුණේ මිලියන 200යි, එහෙම නැත්නම් මිලියන 300යි. නමුත් අද අපට අපේ Budget allocation එක විධියට බිලියන දෙකක්, දෙකහමාරක් දීලා තිබෙනවා. ඒ නිසා අපි අද ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් දැවැන්ත වැඩ පිළිවෙළක් හදලා තිබෙනවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා ක්‍රිකට් ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්න කියලා. ගරු කථානායකතුමනි, ඉතාම අවාසනාවන්ත සිද්ධියක් වුණා. අපේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයෝ ක්‍රිකට් පාලක මණ්ඩලයත් එක්ක සෑම වර්ෂයකම අත්සන් කරන ගිවිසුම් අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළා. ඊට හේතුව, ක්‍රීඩකයන් සඳහා අප ගෙවන

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

දීමනා අඩු කිරීමයි ගරු කථානායකතුමනි. එවකට හිටපු සභාපතිවරයකු විසින් ක්‍රීඩකයන්ට ගෙවන දීමනාව අනවශ්‍ය විධියට සියයට 25කින් වැඩි කළා. ඒක වැරැදියි. [බාධා කිරීමක්] හිටපු සභාපතිවරයෙක් කියලා මම කිව්වා නේ. ගරු කථානායකතුමනි, ලෝකයේ අනෙකුත් රටවල් ක්‍රීඩකයන්ට ගෙවන්නේ ලැබෙන ආදායමෙන් සියයට 25යි. අපි සියයට 78ක් ගෙව්වා. අපි කිව්වා එය සියයට 68ට අඩු කරන්න කියලා. අපි කරපු කප්පාදු අතරින් පළමුවැන්න තමයි, විදේශ සංචාරවලදී ඔවුන්ගේ බිරින්දෑවරුන්ට පළමුවැනි පන්තියේ ගුවන් ටිකට් පත් දෙන්න බැහැ කියපු එක.

ගරු කථානායකතුමනි, ඒ ක්‍රීඩකයන් IPL එකට ගියාම මාස එකහමාරක් ඉන්නේ පිට රට. ඒ කාලය තුළ අපි ගෙවන contract fee එක ගෙවන්නේ නැහැ කිව්වා. තුන්වැනි එක, අර වැරැදි විධියට ගෙවපු සියයට 25 අවලංගු කිරීම. අපට හම්බ වෙන සල්ලිවලින් අපට කරන්න වෙලා තිබෙන්නේ ජාතික කණ්ඩායම නඩත්තු කිරීම විතරයි. ගරු කථානායකතුමනි, අද තිබෙන ලොකුම ප්‍රශ්නය එයයි. ජාතික කණ්ඩායමට ක්‍රීඩකයන් එන්නේ 19න් පහළ කණ්ඩායමෙන්. ඔවුන්ට සංචාර නැහැ කියලා ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා කියනවා. ඔවුන්ට සංචාර දෙන්න අපට සල්ලි නැහැ. හම්බ කරන සියලු සල්ලි ක්‍රීඩකයන්ට ගෙවන්න අපට සිදු වෙලා. මේ කියපු මුදල අඩු කළාට පස්සේ වුණත් පළමුවැනි ක්‍රීඩකයන් අටදෙනාට මාසයකට රුපියල් ලක්ෂ 40ක් බැගින් හම්බ වෙනවා. ඒ කියන්නේ, අවුරුද්දකට රුපියල් ලක්ෂ 480ක්. ඒ, අර කියපු අඩු කිරීම් කළාට පස්සේ ලැබෙන මුදල. ඒ රුපියල් ලක්ෂ 480ට අමතරව IPL එකෙන් හම්බ වෙනවා මිලියන ගණනක්; Premier Leagues වලින් හම්බ වෙනවා වෙනම ගණනක්. Advertising වලින් හම්බ වෙනවා වෙනම ගණනක්. ඒ විධියට ඒ ක්‍රීඩකයන්ට වෙනම මුදල් හම්බ වෙනවා. මෙතරම් මුදලක් ලැබිලාත් ඒ ක්‍රීඩකයෝ කිව්වා, මේ මුදල් නැවත දුන්නේ නැත්නම් මොනම හේතුවක් නිසාවත් අපි මේ ගිවිසුම අත්සන් කරන්නේ නැහැ කියලා. ගිය අවුරුද්දේම මම ඒකට හසු වුණා. සංචාරයක් වෙලාවේ අවසාන මොහොතේ ගිවිසුම අත්සන් කරන්නේ නැතිව හිටියා. ඔවුන් තරගාවලියට ක්‍රීඩා කරන්නේ නැහැ කිව්වා. ඒ නිසා ගරු කථානායකතුමනි, අපි පෙර සූදානමක් වුණා. අපි අපේ දෙවන පෙළ හැදුවා. මම තේරීම් කමිටුවට කිව්වා දෙවන පෙළ නම් කරන්න කියලා. අපි ක්‍රීඩකයන්ට පැහැදිලිව උපදෙස් දුන්නා, ඔබ මේ ගිවිසුම අත්සන් කළේ නැත්නම් අපි දෙවන පෙළක් හදලා බංග්ලාදේශ කණ්ඩායම සමඟ පැවැත්වෙන තරගාවලියට ක්‍රීඩා කරන්න ඒ දෙවන පෙළට අවස්ථාව දෙනවා, ඒ විතරක් නොවෙයි, අපි ක්‍රීඩා රෙගුලාසි ගෙනැල්ලා රට වෙනුවෙන් ක්‍රීඩා කරන්න ඔබට අවස්ථාවක් දෙන්නේ නැහැ කියලා. ඒ අනුව, රෑ 9.00 වන කල් දීර්ඝ සාකච්ඡාවක් පැවැත්වුණා. අවසානයේ ඔවුන් අපට යෝජනා කළා, ඒ සියයට 25 අපට දෙන්න, ඒ මුදල ක්‍රීඩා සංවර්ධනයට ගන්න කියලා අපි ලිඛිතව කැමැත්ත දෙන්නම් කියලා. මම කිව්වා, එහෙම බැහැ, ක්‍රීඩා සංවර්ධනය කරන්නේ අපියි කියලා. ඒ අනුව ඔවුන් අවසානයේ රෑ 9.00ට තීන්දු කළා, අපේ ගිවිසුම අත්සන් කරන්න. ඒ අනුව බංග්ලාදේශය සමඟ ක්‍රීඩා කරන කණ්ඩායමේ 16දෙනාගේ නම් මට ලැබුණා. ඒ 16දෙනා අතරිනුත් එක්කෙනෙක් අත්සන් කරලා තිබුණේ නැහැ. මම ඒ නම් කපලා නම් 15යි අනුමත කළේ. ලියුම් ක්‍රිකට් පාලක මණ්ඩලයට ගියාම ඒ පුද්ගලයා ඇවිල්ලා අත්සන් කළා.

ගරු කථානායකතුමනි, ක්‍රීඩාවට විනයක් තිබෙන්න ඕනෑ. මම ඔබතුමන්ලාට කිව්වා, ක්‍රිකට් ක්‍රීඩාව කියන්නේ අපේ රටේ ජනතාව ආදරය කරන ක්‍රීඩාවක් කියලා. ක්‍රිකට් ක්‍රීඩාවේ තිබුණු ඒකාධිකාරය කඩලා, නව තරුණයන්ට අවස්ථාවක් ලබා දීලා, නව සංස්කෘතියක් හදලා 2015 ලෝක කුසලානය ශ්‍රී ලංකාවට ගෙන ඒම සඳහා අපි දැවැන්ත වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. එහිදී යම් යම් පාර්ශ්ව අමනාප වේවි.

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන් මේ රටේ මාධ්‍යයට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න කැමැතියි. පළමුවැනි වතාවට මේ සිද්ධියේදී මේ රටේ සියලු ජන මාධ්‍ය එක මතයක සිටියා. හැම දාම කවුරු හරි අපට විරුද්ධව සිටියා. මම ස්තුතිවන්ත වෙනවා ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාට. හැම දාම මට බණින අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මා සමඟ සිටියා. ඒ විතරක් නොවෙයි. සියලු මාධ්‍යවේදියෝ අපත් එක්ක ඒ සිටියා. ක්‍රීඩාවේ විනය වෙනුවෙන් ඉදිරි කාලයේ වුණත් අපි කැප වෙනවා. මේ ගිවිසුම අත්සන් කරන්න කලින් අපේ හිටපු ටෙස්ට් ක්‍රිකට් නායක සංගක්කාර තරගාවලියට ක්‍රීඩා කරන්න මාතර ගියා. අපි ඉඩ දුන්නේ නැහැ ඔහුට ක්‍රීඩා කරන්න. අපි කිව්වා ගිවිසුම අත්සන් කරලා ක්‍රීඩා කරන්න කියලා. ඔහුට මාතර ඉඳලා ආපසු එන්න සිදු වුණා.

අපි විනය සම්බන්ධයෙන් බොහොම තදින් ක්‍රියා කරනවා. තරාතිරම බලන්නේ නැහැ. තමුන්නාන්සේලා හැමදාමත් කියනවා, මේ ක්‍රීඩාවට දේශපාලනය සම්බන්ධ වෙලා තිබෙනවා කියලා. මා වගකීමකින් යුතුව කියනවා, මගේ කාලය තුළ ක්‍රීඩාව සඳහා දශමයකින්වත් දේශපාලනය සම්බන්ධ වෙලා නැහැ කියලා. මා ඔබතුමන්ලාට කියලා තිබෙනවා, මගේ කාලය තුළ මා සීගිරි ගල් පෙරළලා තිබෙනවා කියලා. ඒ නිසා බොරුවට චෝදනා එල්ල කරන්නට එපා. අපේ ආණ්ඩුව යටතේ ක්‍රීඩාව සඳහා කවදාවත් දේශපාලනය සම්බන්ධ වෙලා නැහැ. ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරන, ක්‍රීඩාවට ආදරය කරන රාජ්‍ය නායකයකු සිටින රටක, ක්‍රීඩාව වෙනුවෙන් හොඳම ආයෝජනයක් කරන්න පුළුවන් කාලයක් තමයි මේ. ඒ නිසා මේ කාලය තුළ මේ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් අපට කරන්නට පුළුවන් උපරිම කටයුතු අපි කරනවා. දේශපාලනයෙන් තොරව, ක්‍රීඩාවේදී අපි දෙගොල්ලන් එකට එක් වෙමුයි කියන යෝජනාව කරමින් මා නිහඬ වෙනවා. ඔබතුමන්ලාට ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ.භා. 2.52]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, සමස්තයක් වශයෙන් ගත්තාම, අද දින ඉදිරිපත් කර තිබෙන මෙම ක්‍රීඩා පනත යටතේ නියෝග හොඳයි කියලා මම ගරු ඇමතිතුමාට කියන්න කැමැතියි. හැබැයි, අතරින් පතර තමන්ට වුවමනා පුද්ගලයන්ට තරග කරන්න අවස්ථාවක් ලබා දීමටත්, සමහර පුද්ගලයන් ආරක්ෂා කිරීමටත්, සමහර පුද්ගලයන් ඉවත් කිරීමටත් මෙහි නීති-රීති තිබෙනවා, ගරු ඇමතිතුමනි. එතකොට මේ නීති-රීති ඇත්ත වශයෙන්ම -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. SPEAKER left the Chair, and MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] took the Chair.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමනි, මේ ගැසට් පත්‍රයේ සඳහන් නියෝග 15ඩී අනුව, a professional journalist in electronic or print media or an owner of such network cannot contest. විද්‍යුත් මාධ්‍ය ආයතනයක මාධ්‍යවේදියකුට තරග කරන්න බැහැ. අයිතිකාරයාට තරග කරන්න බැහැ. නමුත් නීති-රීති අනුව ප්‍රධාන විධායක නිලධාරියාව තමුන්නාන්සේලා ආරක්ෂා කරලා තිබෙනවා. මා මේ කාරණා ටික කියන්නේ ඒ නිසායි. අපේ අර්ජුන රණතුංග ගරු මන්ත්‍රීතුමා COPE එකේ සිටි අවස්ථාවක මා ප්‍රශ්නයක් ඇහුවා. නිශාන්ත රණතුංග මැතිතුමා CSN එකේ CEO.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, එතුමා නිලවරණයට නාම යෝජනා භාර දෙන්න කලින් ඉල්ලා අස් වුණා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමා අස් වුණාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ නාම යෝජනා භාර ගත්තේ එතුමා ඉල්ලා අස් වීමෙන් පසුවයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියන්නේ, නිශාන්ත රණතුංග මැතිතුමා දැන් CSN එකේ CEO නොවෙයි? [බාධා කිරීමක්] එහෙනම් ඒක බලපාන්නේ නැහැ. ඒ වාගේම - [බාධා කිරීමක්] මාධ්‍ය ආයතන අයිතිකරුවන් කියලා ඔබතුමා යම් යම් පුද්ගලයන්ව නවත්වන්න නේද, මේක කළේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා තමයි - විපක්ෂය තමයි - හැමදාම මේ කාරණය සම්බන්ධයෙන් ගැහුවේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ, අපි දැන් මාධ්‍ය ආයතන ගැන කථා කළේ නැහැ. නමුත් මා ඔබතුමාට කියන්නේ මේ නීති-රීති ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා නැහැ කියන එකයි. ඒක අපි පිළිගන්නට ඕනෑ. නමුත් කවදා හරි මේ නීති-රීති -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මට සමාවෙන්න. මා ඔබතුමාට බාධා කරන්නේ නැහැ. මේ සියලුම නියෝග නීතිපතිතුමාට යොමු කරලා, ඒවා අනුමත කරගෙන, ඒ සියලු කටයුතු කිරීමෙන් පසුව තමයි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මன් கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ, නීතිපතිතුමා කියන්නේ ආණ්ඩුවේ ප්‍රධාන නීති උපදේශක. ඉතින් නීතිපතිතුමාගේ තීරණය අවසන් තීරණය නොවෙයි. මේවා ශ්‍රේෂ්ඨාධිකරණයට ගියොත්, ඉතාම පැහැදිලියි, සමහර පුද්ගලයන්ව ආරක්ෂා කරන්නත්, සමහර පුද්ගලයන්ව තරග කිරීමෙන් වළක්වන්නත් තමයි මේ නීති-රීති ගෙනල්ලා තිබෙන්නේ කියලා. මා ඇමතිතුමාට දැන් -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා මට එක උදාහරණයක් කියන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා බලන්න, දැන් මාධ්‍ය ආයතනයක මාධ්‍යවේදියාට තරග කරන්න බැහැ. අයිතිකාරයාට තරග කරන්න බැහැ. නමුත් ප්‍රධාන විධායක නිලධාරියාට තරග කරන්න පුළුවන්. මොකක්ද ඒකෙ තර්කය? අපි නිශාන්ත රණතුංගව අමතක කරමු කෝ. A journalist in a media institution cannot contest; the owner cannot contest but the CEO can contest. So, what is the logic in it? It is up to you to decide because you are the Minister of Sports. I do not want to give advice.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුත්තේ දී අයිතිකාරයාට කරන්න පුළුවන් කාර්ය භාරයක්, විධායක නිලධාරියාට කරන්න පුළුවන් කාර්ය භාරයක් දෙකක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මට පෙනෙන විධියට මේ නීති-රීති සම්බන්ධයෙන් අද හෙටම විශාල වශයෙන් පුද්ගලයන් ශ්‍රේෂ්ඨාධිකරණයට යයි. එතකොට මේ සම්බන්ධයෙන් අර්ථ නිරූපණයක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලැබෙයි. ඔබතුමා ඇමතිවරයා හැටියට ඔබතුමාට ඒ අවසන් තීරණය ගන්න පුළුවන්.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

අනෙක ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කර තිබෙන නීති-රීතිවල දේශපාලනඥයා සම්බන්ධයෙන් කිසිම පැහැදිලි කිරීමක් නැහැ. I have a news report with me issued on Thursday, 30th June, 2011 which states, "Cricket's governing body on Thursday banned countries from appointing politicians to national boards, vowing to free the sport from undue Government influence.

The International Cricket Council meeting in Hong Kong said that it made this decision to uphold the important principle of free elections and the independence of the sport.

It was agreed that all member boards must implement the provisions before the annual conference in June 2012 and a further 12 months up to June 2013 would be allowed before any sanctions are considered".

එතකොට ජූලි මාසයට කලින් මේ දේශපාලනඥයන්ට දේශපාලන බලපෑම් නවත්වන්න කියලා ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලය ඔබතුමන්ලාට කියලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ නීති-රීති අනුව ඔබතුමා එහෙම පියවරක් අර ගෙන තිබෙනවාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දීලා තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය පිට දමන්න එපා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් එහෙම තීන්දුවක් දීලා නැහැ, ගරු ඇමතිතුමනි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ නඩු තීන්දුව කියෙව්වාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
එහෙම නම් ඔබතුමාට ICC එකට ලියන්න තිබුණා. නමුත් ඔබතුමා ලිව්වේ නැහැ නේ ගරු ඇමතිතුමනි. ඔබතුමා ICC එකට ලියලා කිව්වාද මට මේ විධියට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් තිබෙනවා කියලා. ඔබතුමා ලිව්වේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා දන්නවාද, ඉන්දියාවේ ෂරඩ් පවර් ඇමතිවරයෙක්? ඔබතුමා ඒක දන්නේ නැද්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ඒක වෙනම වැඩක්. ඔබතුමා කිව්වා නඩුවක් තිබෙනවා කියලා. එහෙම නඩුවක් තිබෙනවා නම් ඔබතුමාට රට වෙනුවෙන් ක්‍රිකට් පාලක මණ්ඩලය වෙනුවෙන් ලිපියක් ලියලා කියන්න තිබුණා, මෙහෙම නඩුවක් තිබෙනවා කියලා. ඔබතුමා එහෙම කිව්වේ නැහැ. ඔබතුමා කියලා තිබෙන්නේ "මම ICC රෙගුලාසි පිළිපදිනවා" කියලායි . " We will abide by the ICC rules" කියලායි. මම මේවා ඔබතුමාට කියන්නේ ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය සඳහායි. ඔබතුමා එක්ක මගේ පෞද්ගලික අමනාපයක් නැහැ. මොකද, ඒ අය කියලා තිබෙනවා දේශපාලනය අපේ ක්‍රිකට් පාලක මණ්ඩලයට ආවොත් ඉදිරියේ දී අපට තරග ලබා දෙන්නේ නැහැයි කියලා. ඔබතුමා internet එකේ තිබෙන දේවල් දැක්කාද දන්නේ නැහැ. ඔබතුමා බලන්න internet එකේ UN Human Rights Council website එකේ ලිපි 15ක් තිබෙනවා, ලංකාවේ ක්‍රීඩා සංගම්වල දේශපාලනය තිබෙනවා, ඒ නිසා මේ ක්‍රීඩා සංගම්වලට පිට රටවල සංචාරය කිරීම නවත්වන්න ඕනෑ කියලා. ඉතින් ඔබතුමාට තමයි අවසන් තීරණය ගන්න තිබෙන්නේ. මේ ජාත්‍යන්තර බලපෑම් ගැන තැකීමක් කරන්නය කියලා අපි ඔබතුමන්ලාට කිව්වා. එදා GSP සහනය නැති වුණාම අපි කිව්වා- [බාධා කිරීමක්] නැහැ. මම ඔබතුමාට කියන්නේ මේකයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් ඔබතුමා නවතින්නේ ජිනීවා ගිහිල්ලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
GSP සහනය ආරක්ෂා කර ගන්න කියලා අපි කිව්වා. GSP නැති වුණාට කිසිම පාඩුවක් නැහැයි කියලා ඔබතුමන්ලා කිව්වා. GSP නැති නිසා දැන් තමුන්නාන්සේලාට US Dollars 1.5 billion පාඩුයි. තමුන්නාන්සේලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගියේ GSP සහනය නැති වීමෙන් සිදු වන පාඩුව මකා ගන්නයි. [බාධා කිරීමක්] ඔබතුමාට ඕනෑ නම් කරන්න. නමුත් ජාත්‍යන්තර නීති-රීති තිබෙනවා. [බාධා කිරීමක්] ක්‍රිකට්වලටත් ජාත්‍යන්තර නීති-රීති තිබෙනවා. ඒ ජාත්‍යන්තර නීති-රීති අනුව දේශපාලනඥයන් ක්‍රීඩා සංගම්වලට බලපෑම් කිරීම, ඇතුළු වීම ගැන අවධානය යොමු කරන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, තේරීම් කමිටුව ගැනත් කියන්න ඕනෑ. තේරීම් කමිටුව ගනිමු. අනෙක් රටවල තේරීම් කමිටුවට පත් වන්නේ ක්‍රීඩාවෙන් විශ්‍රාම ගිහිල්ලා අවුරුදු 15කට 20කට පස්සේයි. ඔබතුමා බලන්න, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, එංගලන්තය වාගේ හැම රටකම ක්‍රීඩාවෙන් විශ්‍රාම ගිහිල්ලා අවුරුදු 15කට 20කට පසසේ තමයි තේරීම් කමිටුවට එන්නේ. අද අපේ තේරීම් කමිටුව ගත්තොත් ගරු සනත් ජයසූරිය මන්ත්‍රීතුමා ඉන්නවා. ඒ වාගේම අපේ හෂාන් තිලකරත්න මැතිතුමා ඉන්නවා. මේ තේරීම් කමිටුවේ ඉන්න අය දැන් ඉන්න ක්‍රීඩකයන් එක්ක ක්‍රිකට් ගහලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. තේරීම් කමිටුවේ දැන් ඉන්න අය වර්තමාන ක්‍රීඩකයන් සමඟ සෙල්ලම් කරලා තිබෙනවා. අනෙක් රටවල එහෙම නැහැ, ගරු ඇමතිතුමනි. [බාධා කිරීමක්]

No, you do not get the principle. You do not become a selector in the Selection Committee when your contemporaries are still playing cricket.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Who is doing that?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Why? Sanath Jayasuriya played with Mahela Jayawardene and Kumar Sangakkara.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් සෙල්ලම් කරන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
But, the international principle is that. Take for instance, Australia. To just give one example, the Chairman of the Cricket Board of Australia played Cricket in the '70s. He became a selector after 25 years because if the selectors have played with the members of the team -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම නම් අර්ජුන රණතුංග සභාපති වුණු එකත් වැරදියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක වෙනම වැඩක්. මම මේ කථා කරන්නේ-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒක වෙන වැඩක්? ඔබතුමන්ලාගේ ඒවා වෙන වැඩ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හරි, හරි. ඔබතුමන්ලාට ඕනෑ එකක් කරන්න. අපට ප්‍රශ්නයක් නැහැ. You can do what you like. නමුත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙකුත් රටවල්වල තේරීම් කමිටුවලට පත් වෙන්නේ තමන් සමඟ ක්‍රීඩා කළ අය -සමකාලීනයන්- ක්‍රීඩාවෙන් ඉවත් වුණාම. නමුත් අපේ රටේ එහෙම නැහැ. අපේ රටේ තේරීම් කමිටුවට පත් වෙලා ඉන්න හැම කෙනෙක්ම වර්තමාන ක්‍රීඩකයන් එක්ක සෙල්ලම් කර තිබෙනවා. ඒ අය අතර පරණ කෝන්තර තියෙනවා. පරණ අමනාපකම් තියෙනවා. එතකොට ඒ සියල්ලම පිරිමසා ගන්න කටයුතු කරනවා කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මා ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, හරුන් ලෝගාට් කියලා මහත්මයෙක් ගෙන්වා විශාල මුදලක් දීලා සකස් කරපු වාර්තාවට මොකද වුණේ කියලා. හරුන් ලෝගාට් කියලා මහත්මයෙක් ගෙන්වා මිලියන 25ක් විතර වියදම් කරලා වාර්තාවක් සකස් කළා. හරුන් ලෝගාට් කියන්නේ ICC එකේ හිටපු ප්‍රධාන විධායක නිලධාරියා. ඔහු ගිය අවුරුද්දේ ලංකාවට ගෙන්වා මිලියන 25ක් වියදම් කරලා වාර්තාවක් සකස් කළා. අපේ රටේ අර්ජුන රණතුංග වැනි දක්ෂ ක්‍රීඩකයන් ඉන්දැද්දී හරුන් ලෝගාට් කියන පුද්ගලයකු ගෙන්වා වාර්තාවක් හැදුවා. ඒ හදාපු වාර්තාවට මොකද වුණේ කියලා මා ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

දඹුල්ල ක්‍රීඩාංගනය ගැනත් මා මතක් කරන්න ඕනෑ. විශාල මුදලක් වියදම් කර සකස් කරපු එම ක්‍රීඩාංගනය අද පාළුවට ගිහිල්ලා තිබෙනවා. එහි තිබෙන පුටුත් විවිධ පුද්ගලයන් විසින් ගලවා ගෙන යනවා කියා ආරංචියි. මහනුවර පල්ලෙකැලේ ක්‍රීඩාංගනයේ තත්ත්වයත් ඒ වාගේමයි. ඒ ක්‍රීඩාංගනය ඉදි කරන්න පටන් ගත් කාලයේ මහනුවර ක්‍රීඩා සංගමයට අපි පොරොන්දුවක් දුන්නා, ඒ අයගේ රැස්වීම් පවත්වන්න සහ වෙනත් වෙනත් කටයුතු සඳහා මේ ක්‍රීඩාංගනයේ කාමරයක් සහ ස්ථානයක් වෙන් කර දෙනවා කියලා. ඉතින් එම පොරොන්දුව තවම ඉෂ්ට කර නැහැ කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්තයක් වශයෙන් මේ නීති-රීති හොඳයි. නමුත් අතරින් පතර ගැටලු තිබෙනවා. විශේෂයෙන්ම දේශපාලනඥයන් ක්‍රීඩාවට සම්බන්ධ වීම නැවැත්වීමට මේ නියෝගවල කිසිම පියවරක් අරගෙන නැහැ. ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලය පැහැදිලිව කියා තිබෙනවා, ජූනි මාසයේ 13 වැනිදාට කලින් ක්‍රිකට් පාලක මණ්ඩලයට පමණක් නොවෙයි, ක්‍රීඩා සංගම් සියල්ලටම එල්ල වන මේ දේශපාලන බලපෑම් නවත්වන්න අවශ්‍ය කටයුතු කර, නීති-රීති සකස් කරන්න ඕනෑය කියා. නමුත් තවමත් එවැනි නීති-රීති සකස් කර නැහැ. මේ විධියට ගියොත් ජූනි මාසය වන විට සමහර විට අපට ක්‍රීඩා සංවාර පවා නැවැත්වීමට සිදු වන අවදානමක් තිබෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

[අ.භා. 3.06]

ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාමත් වැදගත් කටයුත්තකටයි අද අපි මේ සම්බන්ධ වෙන්නේ. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද, 2013 අංක 1 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග අද දින ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ තමයි අපි ඒ සම්බන්ධව අදහස් ඉදිරිපත් කරන්නේ.

දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රීඩාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන්ගේ ඉල්ලීමක් වෙලා තිබුණා මේ සංශෝධන ඇති කරලා ක්‍රීඩාවේ නව උන්නතිය වෙනුවෙන් ක්‍රියා මාර්ගවලට ප්‍රවේශ වෙන්න කියලා.

මේ පාර්ලිමේන්තුවේ තිබුණු බොහෝ විවාදවලදී, ක්‍රීඩා අමාත්‍යාංශයට අදාළව තිබුණු විවාදවලදී විපක්ෂය විසින් කරන ලද යෝජනා පවා මේ සංශෝධනවලදී තමන්ගේ අදහස් විධියට

[ගරු මහින්ද අමරවීර මහතා]

අරගෙන ක්‍රීඩකයන්ගේ සුබසිද්ධිය වාගේම ක්‍රීඩාවේ උන්නතිය සඳහා ක්‍රීඩා අමාත්‍යතුමා මේ යෝජනාවලිය සකස් කර තිබෙන බව අපි ඉතා හොඳින් දන්නවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ කථාවේ පරස්පරයන් රාශියක් තිබෙනවා. එතුමා එක වෙලාවක කිව්වා, ICC එකේ නියෝග පිළිගන්නේ නැහැ කියා. හැබැයි ආයෙත් වරක් එතුමා කියනවා, හරූන් ලෝගාට මහත්මයා ගෙන්වලා මේ වාර්තාව සකස් කළ එක වැරදියි කියා. එතුමා ICC එකේ හිටපු CEOවරයායි. එහෙම නම් එතුමා ගෙන්වලා මේ කරපු කාර්යය පිළිබඳව අවතක්සේරු කිරීම වැරදියි. අපි ඒ අයගෙන් තමයි අදහස් ලබා ගන්න ඕනෑ. මම කියන්නේ නැහැ ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා මේ පිළිබඳව ප්‍රවීණයෙක් නොවෙයි කියා. එතුමා මේ පිළිබඳව දැනුවත් වෙලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ නම සඳහන් කරමින් කථා කළා. මම කිව්වේ ඒ වාර්තාව අනුව කටයුතු වෙනවාය කියලායි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ඒ වාර්තාව පදනම් කර ගෙන කටයුතු වෙනවා. අපි එක වාර්තාවකට විතරක් සීමා වෙන්න ඕනෑ නැහැ. හැබැයි ඒ වාර්තාවේ බොහෝ හොඳ යෝජනා ක්‍රියාත්මක කර තිබෙනවා. අද බලන්න අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා කියපු දේවල් අවතක්සේරුවට ලක් කරලා නැහැ. ක්‍රිකට් නායකයෙක් විධියට හිටපු එතුමාගේ අදහස් පවා සැලකිල්ලට අරගෙනයි මේ යෝජනාවලිය සකස් කරලායි තිබෙන්නේ. එතුමා මේ පාර්ලිමේන්තුවේ කරපු කථා මම අහගෙන ඉඳලා තිබෙනවා. එතුමා ක්‍රීඩාව පිළිබඳව හොඳින් දන්නවා. ඒ ගැන අපේ තර්කයක් නැහැ. ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් එතුමා කැප වීමක් කරනවා. හැබැයි එතුමා වරින් වර මේ පාර්ලිමේන්තුවේදී කරපු යෝජනා හූහාක් මේ සංශෝධනවල තිබෙනවා.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ඔය වාර්තාව සමඟ මගේ කිසිම සම්බන්ධතාවක් නැහැ.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

නැහැ, නැහැ. ඒ වාර්තාව සම්බන්ධයෙන් නොවෙයි මම කිව්වේ. අද මේ ගරු ක්‍රීඩා අමාත්‍යතුමා ඉදිරිපත් කරන සංශෝධන පිළිබඳව මම පැහැදිලිවම කියන්නේ පාර්ලිමේන්තුවේදී ඒ ගරු මන්ත්‍රීතුමා කරන ලද ඉල්ලීම් බොහොමයක් තිබෙනවාය කියන එකයි. එතුමාත් අවංකවම ඒක පිළිගන්නවා ඇති. ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා මේ තින්දු අරගෙන තිබෙන්නේ දේශපාලන කෝණයෙන් බලා නොව ක්‍රීඩාවේ උන්නතිය සඳහාය කියන එක ඒකෙන්ම පැහැදිලි වෙනවා. ඒක මම ඉතා අභිමානයෙන් මේ අවස්ථාවේදී සඳහන් කරනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා දිගින් දිගටම චෝදනා කළා, දේශපාලනඥයන්ට ක්‍රීඩා සංගම්වල තනතුරුවලට එන්න ඉඩ දෙන්න හොඳ නැහැ කියා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒක මම කියන එකක් නොවෙයි. ICC එකෙන් කියන එකක්.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ICC එකෙන් කියන එක හරි. නමුත් ඔබතුමා දන්නවා මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දී තිබෙන බව. අර්ජුන රණතුංග මැතිතුමාට තරග කරන්න අවස්ථාව ලබා නොදුන්නාම -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Minister, there is a point of Order being raised by Hon. Lakshman Kiriella.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මගේ කථාව අහගෙන හිටියා නම් -

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මම අහගෙනයි හිටියේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

එහෙම නඩුවක් තිබුණා නම් ක්‍රිකට් පාලක මණ්ඩලය හරි, ඇමතිවරයා හරි ICC එකට ලියන්න ඕනෑ මෙවැනි නඩුවක් තිබෙනවාය කියා. එහෙම ලියලා නැහැ නේ. හැම එකටම නඩු.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

අපි මේ කාරණය අනික් පැත්තට අරගෙන බලමු. ඔබතුමා කියන විධියට අතීතයේ මේ තත්ත්වය තිබුණා නම් ක්‍රිකට් ක්‍රීඩාව මේ තත්ත්වයට පත් වෙන්නේ නැහැ. අර්ජුන රණතුංග මැතිතුමාගේ නායකත්වය යටතේ ලෝක කුසලානය ගෙනෙන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ, දිවංගත ගාමිණී දිසානායක මැතිතුමා මේ සංගමයේ සභාපති විධියට කටයුතු කළේ නැත්නම්. එතුමා දේශපාලනඥයෙක්. අපි ඒකත් පැත්තකට දමන්න හොඳ නැහැ. දිවංගත ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා මේ කටයුතු ඉස්සරහට ගෙන යන්න වැඩ පිළිවෙළ රාශියක් හැදුවා. දිවංගත රොබට් සේනානායක මැතිතුමා මේ සම්බන්ධ විශාල වැඩ පිළිවෙළක් සකස් කළා. තිලංග සුමතිපාල මැතිතුමා වුණත් එහෙමයි. වොලිබෝල් සංගමයේ සභාපති විධියට ඩිලාන් පෙරේරා ඇමතිතුමා වොලිබෝල් ක්‍රීඩාව කොච්චර ඉස්සරහට ගෙනල්ලා තිබෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියන ඒවා හරි වෙන්න පුළුවන්. දිවංගත ගාමිණී දිසානායක මැතිතුමා ගැන, මේවා ඔක්කොම ගැන ICC එකට ලියන්න.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා කිව්වා ද්වේශයෙන් කථා කරන්නේ නැහැ කියා. ද්වේශයෙන් කථා කරන්නේ නැත්තේ නැහැ. මේක මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා ඉදිරිපත් කළාම ඔබතුමාට ඒක විඳවන්න බැරි වුණා. ඔබතුමා කියනවා, කිසිම තරහක්, අමනාපයක් නැහැ කියා. ඔබතුමා එතුමා සමඟ අමනාපයක් තිබෙනවා නේ. මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා තමයි හන්තානේ ඉඩම් හොරකම පිළිබඳ ප්‍රශ්නය පාර්ලිමේන්තුවට ගෙනාවේ. වෙන එකක්වත් නොවෙයි, ඒ හොරකම අල්ලා දුන්නු එකේ තරහ තමයි ඔබතුමා තුළ තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
බොරුවට points of Order ගෙනල්ලා මගේ කාලය කනවා. [බාධා කිරීමක්] ඔබතුමාගේ තිබෙන්නේ ඉරිසියාවක්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Kiriella, that is not a point of Order.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
හන්තානේ මුඩු ඉඩම් ටිකක් වෙනුවට ඔබතුමා හොඳ ඉඩම් ගත්තේ නැද්ද? තමුන්නාන්සේගේ පවුලේ උදවිය වෙනුවෙන් - [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මා ඔබතුමාට - [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාට පැහැදිලි කරන්න ඉඩ දීලා, ඊට පස්සේ ඔබතුමා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මා ඔබතුමාට කියන්නම්. ඉඩම් ගත්තා කියා මට නම් අධිකරණයකින් දඩ ගහලා නැහැ. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාවට රුපියල් ලක්ෂ 30ක් දඩ ගැහුවා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තමුන්නාන්සේත් සිටියා. ඔබතුමා ඒ පක්ෂයෙන් ඉවත් වෙලා ගිහින් අද විරුද්ධ පක්ෂයේ පොල් ගගා ඉන්නවා. තමුන්නාන්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දිගටම සිටියා නම් අද මේ වාගේ කෑ ගහගහ ඉන්න ඕනෑ නැහැ; මේ ආණ්ඩුවේ ප්‍රබල තනතුරක් දරන්න තිබුණා. ඒකට කේන්තියෙන්, ඊර්ෂ්‍යාවෙන් අද මේ ගෙන එන වැඩ පිළිවෙළ විවේචනය කිරීමේ අවශ්‍යතාවක් නැහැ. අනික් අය ඉඩම් ගත්ත එක ගැන පැත්තකින් තබමු. කොයි කෙනා ගත්තත්, මොන නායකයා ගත්තත් එය වැරැදියි නම් වැරැදියි. තමුන්නාන්සේ කියන්නේ නායකයකු ඉඩම් ගත්ත නිසා තමුන්නාන්සේ ගත්ත එක හරියි කියලාද? තමුන්නාන්සේ කියනවාද, එක් කෙනෙක් වැරැද්දක් කළාම තමුන්නාන්සේත් ඒ වැරැද්ද කරන එක හරියි කියලා? එතකොට ඒ වැරැද්ද මැකෙනවාද? තමුන්නාන්සේ මහජන නියෝජිතයෙක් නම්, තමුන්නාන්සේ දේශපාලනඥයෙක් නම් රටේ ජනතාවගේ වත්කම් තමන්ට ලබා නොගැනීමේ වගකීම තමුන්නාන්සේට තිබෙනවා. තමුන්නාන්සේ ඒකෙන් බැහැර වුණා. මා මීට වඩා ඒ ගැන කියන්නේ නැහැ. තමුන්නාන්සේ ගැන මීට වඩා බොහෝ දේවල් කියන්න තිබුණත්, ඒ සඳහා මෙය අවස්ථාවක් කර ගන්නේ නැහැ.

මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා දවස් ගණනාවක් නිදි වරා ගෙන, මහන්සි වෙලා, සියලු පාර්ශ්වයන්ගේ අදහස් අරගෙන තමයි මේ යෝජනාවලිය අද ගෙනැවිත් තිබෙන්නේ කියන එක ඉතාමත් පැහැදිලිව, ඉතාමත් වග කීමෙන් මට කියන්න පුළුවන්. මා කියන්නේ, මේ වාගේ දේවල් දිහා වෛරයෙන් බලන්න හොඳ නැහැ; මේ වාගේ දේවල් දිහා දේශපාලන කෝණයෙන් බලන්න ඕනෑ නැහැ කියලායි. ඔබතුමන්ලා අවංකව හිතුවොත් මේ නියෝග සම්බන්ධයෙන් කියන්න චෝදනාවක් නැහැ. පසු ගිය දිනවල ක්‍රිකට් ක්‍රීඩාවේ ඇති වී තිබුණු තත්ත්වය පිළිබඳව සියලු දෙනාම දන්නවා. ඒ ක්‍රීඩකයන්ගේ කොටස ගෙවන්න ගිහින් ඇති වුණු ප්‍රශ්නයට මුහුණ දුන්නු ආකාරය සියලු දෙනාම දන්නවා. ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා ගත්ත තීන්දුව නිසා ගම් මට්ටමේ ක්‍රීඩාව වැඩිදියුණු වුණා කියා කවදා හෝ දවසක අප හැම දෙනාටම සතුටු වෙන්න පුළුවන්කම ලැබේවි කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රිකට් ක්‍රීඩාවෙන් පටන් ගෙන අනික් ක්‍රීඩා සංගම්වල නිලවරණ සම්බන්ධවත් එතුමා වැදගත් තීන්දු ගත්තා. බොහොමයක් ක්‍රීඩා සංගම්වලත්, අනිකුත් සංගම්වලත් උරුමක්කාරයෝ, පොල්මෑකාරයෝ ඉන්නවා. ඔවුන් අවුරුදු 10ක්, අවුරුදු 15ක් වැනි දීර්ඝ කාලයක් දිගින් දිගටම මේ තනතුරු හොබවමින් සිටිනවා. හැබැයි ඒවායේ යටි අරමුණ තමන්ගේ business එක වන්න පුළුවන්; තමන්ගේ ආදායම් මාර්ගය වන්න පුළුවන්. එහෙම නැතුව ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් නොවෙයි, ඒ බොහෝ තනතුරු හෙබවූයේ. අලුතින් ගෙනෙන ලද සංශෝධන යටතේ දිගින් දිගටම එසේ රැඳී ඉන්නට පුළුවන්කමක් නැහැ. ඒ විතරක් නොවෙයි. වර්ෂයක් පාසා සිදු වන නිලවරණ වර්ෂ හතරක් දක්වා වැඩි කරන්න ගත්ත තීන්දුව ඉතාමත් අගය කරන්න ඕනෑ. පළමුව වර්ෂ දෙකකටත්, ඉන් පසුව එය වර්ෂ හතරක් දක්වා දීර්ඝ කරන්නත් එතුමාගේ අදහසක් තිබෙනවා. එතකොට මේ සංගම්වල ඉන්න නිලධාරීන්ට ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් අඩුම ගණනේ අවුරුද්දක්වත් කටයුතු කරන්න අවකාශය ඒ තුළින් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා ක්‍රීඩා සංස්කෘතියක් ගැන කථා කළා; ක්‍රීඩා ආර්ථිකයක් ගැන කථා කළා. එහි ප්‍රතිඵල අද අපට දකින්න ලැබෙනවා. අද හැම

[ගරු මහින්ද අමරවීර මහතා]

දිස්ත්‍රික්කයකම, හැම පළාතකම අංග සම්පූර්ණ ක්‍රීඩාංගණ ඉදි වනවා. පළාත් මට්ටමින් නාවලපිටියේ ක්‍රීඩාංගණයක් ඉදි වුණා. අනික් පැත්තෙන් කිලිනොච්චියේ ක්‍රීඩාංගනයක් ඉදි වුණා. මුලතිවුවලට ක්‍රීඩාංගනයක් ලැබෙනවා. ඒ වාගේම අනුරාධපුරය, මොනරාගල, බදුල්ල ආදී දිස්ත්‍රික්කයන්ට කිසිම අඩු පාඩුවක් නැති, සියලු අංශවලින් සමන්විත අංග සම්පූර්ණ ක්‍රීඩාංගන අද ඉදි වන්න පටන් ගෙන තිබෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ලබා දුන්නු ප්‍රතිපාදනවල සහ ක්‍රීඩා අමාත්‍යතුමා විධියට මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා ගත්ත වෙහෙස මහන්සියේ ප්‍රතිඵලයක් විධියටයි. මීට කලින් දරුවකුට swimming pool එකක පිහිනන්න කොළඹට එන්න ඕනෑ යුගයක් තිබුණා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ක්‍රීඩා අමාත්‍යවරයකු හැටියට කටයුතු නොකළත් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විධියට, කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයා විධියට කටයුතු කළ කාල සීමාවන් තුළ ගම්මාන මට්ටමේ පිහිනුම් තටාක සකස් කරලා දරුවන්ගේ ඒ අවශ්‍යතා සම්පූර්ණ කර ගන්න අවකාශය ලබා දුන්නු බව මට මතකයි.

ඒ වැඩ පිළිවෙළ අද ගම් මට්ටමට පවා ගිහිල්ලා අපේ ක්‍රීඩාවේ අනාගතය පිළිබඳ පාසල් දරුවන් තුළත් හොඳ විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. ක්‍රීඩාව තුළින් ඉහළට යන්න පුළුවන් කියන විශ්වාසය අද ඔවුන් තුළ ගොඩ නැඟිලා තිබෙනවා. ඒක තමයි වැදගත්ම කාරණය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය දිනක ඒකාබද්ධ කැබිනට් පත්‍රිකාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වුණා. එහි ඉතා හොඳ යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබුණා. එයට ජනාධිපතිතුමාගේ ආශිර්වාදයත් ලැබුණා. එතුමාත් ඒකට යෝජනා ඉදිරිපත් කර තිබුණා, සෑම පාසල් දරුවෙක්ම කුමන හෝ ක්‍රීඩාවකට යොමු කිරීම අත්‍යවශ්‍යයි කියලා. මෙයින් බලාපොරොත්තු වන්නේ කුමක්ද? පාසල් දරුවන් ක්‍රීඩාවලට යොමු කිරීම තුළින්ම, ඒ උනන්දු කිරීම තුළින්ම අනිවාර්යයෙන්ම අප තුළ විශ්වාසයක් ගොඩ නැඟෙනවා අනාගතයේදී අපට ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ ලබා ගන්න පුළුවන්කම ලැබෙනවාය කියලා. සමහර වෙලාවට අපට ලැබෙන පදක්කම් ප්‍රමාණය වැඩි වෙනවා, සමහර වෙලාවට අඩු වෙනවා. මේ ගැන සොයා බැලුවාම පරිපාලනයේ යම් යම් අතපසුවීම්, අඩු පාඩු මේවාට හේතු වුණාය කියන එක තමයි පැහැදිලිව සඳහන් කරන්න පුළුවන් වන්නේ. ඒවා වැළැක්වීමට, නැවැත්වීමට යෝජනා ගෙන ඒම පිළිබඳව ගරු ක්‍රීඩා අමාත්‍යතුමාට අපේ ගෞරවය පුද කරන්න ඕනෑ.

ක්‍රීඩා වෛද්‍ය පහසුකම් පිළිබඳව වතාවෙන් වතාව සාකච්ඡා වුණා. ඒ පිළිබඳව ගත්ත තීන්දු ගැන අප විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මහාචාර්ය අර්ජුන ද සිල්වා වෛද්‍ය නිලධාරිතුමා ක්‍රීඩා වෛද්‍යවරයා විධියට, ආයතනයේ ප්‍රධානියා විධියට පත් කරලා ක්‍රීඩා වෛද්‍ය ඒකකය ශක්තිමත් කරන්න ගත්ත තීන්දුව අප ඉතාම අගය කළ යුතු වෙනවා. ඒ ආයතනය තුළ පළපුරුදු වෛද්‍යවරු හිටියේ නැහැ; අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් හිටියේ නැහැ. ඒ සියල්ල සම්පූර්ණ කරමින්, අද ක්‍රීඩා වෛද්‍ය ඒකකය ඉතාම ඉහළ මට්ටමකට ගෙන ඒම මේ රටේ ක්‍රීඩකයන් ලද මහඟු සම්පතක් විධියට අපට සඳහන් කරන්න පුළුවන්.

අනික් කාරණය තමයි තහනම් උත්තේජක භාවිතය. මේ තහනම් උත්තේජක භාවිතය පිළිබඳව නිරන්තරයෙන් මේ රට පුරා වාගේම ජාත්‍යන්තරය පුරාමත් කථා බහට ලක් වුණා. ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා, ක්‍රීඩා ඒකකය මඟින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළවල් සමඟ ඒකාබද්ධ වෙලා ඒ තත්ත්වය අපේ රට තුළ ඇති නොවෙන මට්ටමට වැඩ පිළිවෙළක් සකස් කිරීම අගය කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණ කීපයක් විතරයි අපේ රටේ තිබුණේ. ඒ ක්‍රීඩාංගණවලට අලුතින් ක්‍රීඩාංගන ගණනාවක් එකතු වුණා. සූරියවැව ක්‍රීඩාංගණය, පල්ලෙකැලේ ක්‍රීඩාංගනය ඇතුළු තවත් ක්‍රීඩාංගන රාශියක් එකතු වීම හරහා අපේ රට තුළ ජාත්‍යන්තර මට්ටමේ තරග ගණනාවක් පවත්වන්න පුළුවන්කම ලැබුණා. එම ක්‍රීඩාංගන තිබුණු නිසාම ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය පැවැති අවස්ථාවේ තරග රාශියක් අපේ රට තුළ පවත්වන්න පුළුවන්කම ලැබීම අප ලැබූ ජයග්‍රහණ විධියට හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම 20-20 තරඟාවලිය මේ ක්‍රීඩාංගනවල පැවැත්වීම නිසා ඩොලර් මිලියන 100කට වැඩි ආදායමක් අපේ රටට උපයා ගන්න පුළුවන් වුණා. එය ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් ගත්තා වූ ඉහළ ක්‍රියා මාර්ගයක් විධියටයි අපි සලකන්නේ.

මම නැවතත් මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ක්‍රීඩා අමාත්‍යවරයා විධියට පසු ගිය සතිය පුරා ලොකු මෙහෙයුමක් කළා, මේ ක්‍රීඩකයන්ට ගෙවන පංගුව යම් ප්‍රමාණයකින් අඩු කරන්න. ඒ වාගේම ක්‍රීඩා සංගම්වල සිත් පිනවීම සඳහා යොදවන මුදල විශාල වශයෙන් අඩු කරලා, ක්‍රීඩාව වෙනුවෙන්, ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් ආයෝජනය කරන්න මුදලක් වෙන් කර ගැනීම පිළිබඳව අප එතුමාට ඉතාම ප්‍රශංසා කරනවා. අනාගතයේදී අපට දකින්න ලැබේවි, ගම්වලින් නැවත ක්‍රීඩකයන් මේ ජාතික කණ්ඩායමට එකතු වන ආකාරය. ඒ වාගේම ක්‍රීඩාව වෙනුවෙන් කැප වෙන පිරිස් වැඩි වන ආකාරය. මේ කරන ආයෝජන වැඩි වීම තුළ 2015 දී පවත්වන ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය ජයග්‍රහණය කරලා ඒ කුසලානය අනිවාර්යයෙන්ම අපේ රටට ගෙන එන්න මේ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථක පිටුවහලක් වෙයි කියලා විශ්වාසය තබමින්, අභිගරු ජනාධිපතිතුමා මේ සඳහා ලබා දෙන දායකත්වය පිළිබඳව, ඒ වාගේම ක්‍රීඩා අමාත්‍යතුමාගේ විශේෂ කැපවීම පිළිබඳව අපේ ප්‍රශංසාව පළ කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

[අ.භා. 3.22]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා පනත යටතේ නියෝග ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේ ඒ පිළිබඳව මගේ අදහස් එකතු කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

1973න් පසුව මෙය සංශෝධනය කරලා කාලීන වශයෙන් අවශ්‍ය පරිදි නවීකරණය කර තිබීම පිළිබඳව මම මුලින්ම ගරු ඇමතිතුමාට ප්‍රශංසා කරනවා. නමුත් ගරු ඇමතිතුමනි, රෙගුලාසි ගෙනෙන්නේ නැතිව 2013 මාර්තු මාසයේදී මේක නීතියක් බවට පරිවර්තනය කරන්න පුළුවන් වුණා නම් ඊටත් වඩා හොඳ විය හැකිව තිබුණා. මොකද, මේක කැලි කැලි අමුණලා අන්තිමට මේක තවත් ප්‍රශ්නවලට තුඩු දෙන කාර්යයක් බවට පත් වේවි කියන එක මා මේ අවස්ථාවේ අනාවැකියක් වශයෙන් කියනවා. මගේ මිත්‍ර ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා හඳුන්වලා දුන්නා වාගේ අනිවාර්යයෙන්ම මේක උසාවියට යනවා. එසේ උසාවියට යන අවස්ථාවේදී යම් විධියකින් මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදු වෙලා තිබෙනවා කියන මතය ඉදිරිපත් වෙන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේක බොහොම ඕනෑකමින්, පිරිසිදු

චේතනාවකින් ගෙනාවා වෙන්න පුළුවන්. නමුත් යම් අය මේක දිහා බලාවි ඒ අයගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙස. ඒ නිසා නීතිය අනුව මේක උසාවියට ඉදිරිපත් කළා නම් අනිවාර්යයෙන්ම උසාවියෙන් අර්ථ නිරූපණයක් ලැබිලා මේ සම්බන්ධයෙන් ඇති ප්‍රශ්න නිරාකරණය කරන්න පුළුවන් වෙයි කියන එක තමයි මම දකින්නේ. කලින් කිව්වා වාගේ මෙතැනට අවශ්‍ය වන්නේ නිර්දේශපාලනීකරණයයි. නමුත් ඔබතුමා මේක යම් විධියකින් පිරිසිදු කිරීමක් කරනවා කියලා පෙනෙනවා. මම මේක මීට පෙර විශ්වාස කළේ නැහැ. නමුත් මේ අවස්ථාවේ මම මේ ගැන කිව යුතුයි. ඊට පසුව එහි ඇති දුර්වලතා පෙන්වන්න අවශ්‍යයි.

මට යම් ප්‍රමාණයක මූල්‍ය කළමනාකරණ හා පරිපාලනමය දැනුමක් තිබෙන නිසා මම පළමුවෙන්ම මේ කාරණය කියනවා. ගරු ඇමතිතුමනි, sports bodies තිබෙන ක්‍රීඩා සමාජ 52ක් තිබෙනවා කියා ඔබතුමා දැනුවත් කළා. ඒවායේ මූල්‍යමය පැත්ත ස්වාධීන කමිටුවකට භාර දුන්නා නම් මේකේ තිබෙන ප්‍රශ්න සියයට 90ක්ම නැති වෙනවා. මොකද මුදල් කන්දරාවක් තිබෙන නිසා යම් විධියකින් එතැනට පුද්ගලයන් ඇදිලා යන ස්වරූපයක් තිබෙනවාය කියන එක මීට පෙර ලැබූ ප්‍රායෝගික දැනුම තුළින් හෙළිදරවු කරන්න අවශ්‍යයි. මීට පෙර යම් පුද්ගලයන් එතැනට ගියේ තමන් ළඟ තිබෙන ධනය දමන්න මිස එතැන තිබෙන ධනය ගන්න නොවෙයි. මම හිතන විධියට තවමත් පරක්කු නැහැ. ක්‍රීඩා සමාජ තුළ තිබෙන මූල්‍යමය අංශවල ස්වාධීන පරිපාලනයක් ගෙනියන්න පුළුවන් නම් ඒක ඉතාමත් වටිනා අදහසක් ලෙස මම ඔබතුමාට ඉදිරිපත් කරනවා. ක්‍රීඩා කර තිබෙන, ක්‍රීඩාවට ආදරය කරන, ක්‍රිකට් විතරක් නොවෙයි රගර්, ෆුට් බෝල්, එල්ලේ, ඕනෑම ක්‍රීඩාවකට සම්බන්ධ හැම දෙනාම කියන දේ තමයි මම ඔබතුමාට ඉදිරිපත් කළේ. දැන් වුණත් පරක්කු නැහැ. වැඩි කල් යන්න ඉස්සෙල්ලා සියලු දෙනාම ඒකාබද්ධ කරලා මේක නීතියක් වශයෙන් ගේන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්ද අමරවීර ඇමතිතුමා කථා කළේ හරියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඊයේ බලයට ආවා වාගෙයි. ඔබතුමන්ලාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය අවුරුදු 18ක් මේක ක්‍රියාත්මක කරමින් හිටියා. ඉතින් ඔබතුමන්ලා ඔබතුමන්ලාවම විවේචනය කරලා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දැන් බණ්ඩාරනායකලා පැත්තක තියලා ඇත් වීගෙන යනවානේ. රාජපක්ෂගේ පරිපාලනයත් අවුරුදු 8ක් ගෙන ගිහින් තිබෙනවා. මේ විධියට විවේචනය කළාම ඔබතුමන්ලා ඊයේ බලය ගත්තා වාගෙයි අපට හිතෙන්නේ. ඔබතුමන්ලා අවුරුදු 18ක් පොල් ගෑවාද? මේක වෙන්න ඉඩ තිබ්බාද? ඒක නිසා තමයි මම ඔබතුමාට ප්‍රශංසා කළේ, ඔබතුමා ක්‍රීඩා අමාත්‍යාවරයා වශයෙන් මේ සම්බන්ධව කටයුතු කිරීම ගැන. එතැන සිට මොනවාද කරලා තිබෙන්නේ? ඔබතුමන්ලා ක්‍රීඩාව දේශපාලනීකරණය කරනවා. ඒක තමයි මෙතැන තිබෙන වැරැද්ද. ක්‍රීඩාව නිර්දේශපාලනීකරණය වෙලා තිබෙනවා කියා ඔබතුමා කිව්වාට ඔබතුමාගේ රෙගුලාසි අනුව බලන්න. මම මේක කියවන්නේ සාරාංශයක් වශයෙනුයි. මම මෙහි ඉංග්‍රීසි පාඨය කියවන්නම්. The document I have here with me under "Regulations under the Sports Law, states, I quote:

"Upon being satisfied that the National Association applied for registration has complied with relevant laws, the Minister may direct the DG to inform that Association to remit Rs. 5,000/- as registration fee and then register it".

I am just giving you the points.

"Its Office-bearers and Committee Members shall be elected for two years at the AGM. The Minister may appoint one of its Committee Members.

Except with written permission of the Minister, no person who has served one term as President ……"

There again, it is the Minister's intervention. The next one is:

"The Minister shall appoint selection, ranking and seeding committees of a National Association."

"Every National Association shall appoint a Disciplinary Committee with a representative of the Ministry of Sports."

"Any person or Organization aggrieved by a decision of its National Association may submit a written appeal to the Minister….."

"Upon interim arrangements being made by the Minister, on suspension of registration of any Association,……."

මම මේකෙන් පෙන්වන්නේ මෙයයි. ඔබතුමා නොවෙයි, අපි හිතමුකෝ ක්‍රීඩාවේ පරිපාලනයට දේශපාලන අරමුණක් සහිතව හෙට තව කෙනෙක් ආවා කියලා. එතකොට මොකද වෙන්නේ? මේක ඔහුගේ අතේයි තිබෙන්නේ. කොල්වින් ආර්. ද සිල්වා මහත්මයා කිව්වා වාගේ අද මෙතැන ඉන්න කෙනෙකුට ව්‍යවස්ථාව හදනවා. නමුත් බැරි වෙලා හරි පසුව එතැනට පිස්සෙක් ආවොත්? මොනවාද වුණේ කියලා එදා ප්‍රශ්න කළා නේද, මොන විධියකින් හෝ එදා කියපු දේ අද ඇත්ත වෙලා තිබෙනවා නේද කියා එතකොට කියයි. අන්න ඒ සම්බන්ධයෙන් මම කියන්නේ, there is too much politicization. That needs to be rectified and corrected. ඒ වාගේම තමයි ඔබතුමාගේ ආණ්ඩුවේ ස්වරූපයම එතැන ගෙනියනවා. ඒක පෙන්වන්න ඕනෑ. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්නේ නැතිව එතැන ඒක රාශී කිරීමක් තිබෙනවා. You are centralizing the issue. Instead of doing that, you should have basically decentralized it. But, what you are doing is, arrogating powers. Due to the bad things that had gone on previously, it maybe necessary to rectify them at this moment. But overall, this is not only for today. This will be there till the next Minister of Sports wants to amend it. So, on that score, you are basically centralizing an activity that should definitely be decentralized.

මම හිතන විධියට ඔබතුමා මෙතැන තිබෙන මූල්‍ය පැත්ත වෙන් කළා නම් වෙනත් අරමුණු ඇතිව මෙතැනට එන පුද්ගලයින් සම්පූර්ණයෙන් මේකෙන් බැහැර වෙයි. ඒ වාගේම මෙහිදී පෙන්වා දෙන්න අවශ්‍ය කාරණයක් තිබෙනවා. මා හිතන විධියට වැඩි දෙනෙකු කථා කරන ක්‍රීඩාව තමයි, ක්‍රිකට්.

අපේ Cricket Board එකට නායකත්වය දීලා තිබෙනවා former President J.R. Jayewardene, the Hon. (Dr.) N. M. Perera, the Hon. Robert Senanayake, the Hon. Gamini Dissanayake and the Hon. Tyronne Fernando. All of them were politicians who had a penchant for this type of activity and brought up cricket to what it is today.

Special reference should be made to the late Hon. Gamini Dissanayake who spectacularly ensured that we got the ICC test status. He led the Cricket Board in such a way that he got the political inputs required in order to achieve the Government's intention at that particular moment and got the ICC test status. The first Cricket

[ගරු රවි කරුණානායක මහතා]

Board he appointed comprised persons of repute, who, as I said before, did not want to make money out of sports, but wanted to put money into it. If you look at the history, we had then as Vice-President of the Cricket Board, Killi Rajamahendran. People like the Hon. Arjuna Ranatunga, who is here, Aravinda de Silva, Sidath Wettimuny and Asantha de Mel will vouch that, at that time, there was no money in the Cricket Board. Killi Rajamahendran was able to bring in money and put it in at the call of the Hon. Gamini Dissanayake. Those are the type of people who led the sport at that time. I guess if you have an independent finance commission, that would happen again. You might be able to get philanthropists or benefactors to come in and contribute to sports rather than take money out of sports.

Sir, there is a letter which gives the amount of funds that were put in at a time when the Cricket Board did not have even five cents to call its own. I seek the permission of the Hon. Deputy Speaker to **table*** that letter.

Going on further, people like the Hon. Gamini Dissanayake and the Hon. Tyronne Fernando did not politicize cricket. They gave the political leadership that was required. I am the Member who moved the Private Members' Motion that politicians should not hold chairmanships in sports bodies, but sometimes that may have to be rectified and corrected because there have been some politicians who have put in a lot of effort. The Hon. Arjuna Ranatunga, the Hon. Thilanga Sumathipala and the Hon. Dilan Perera have come from various quarters and put in their best, but all of them were stymied somewhere. The Hon. Arjuna Ranatunga was stopped halfway; the Hon. Thilanga Sumathipala was stopped halfway from coming in, maybe for a different reason, and was not allowed to contest. Then, the Hon. Dilan Perera, from another perspective, and also the Hon. T.B. Ekanayake. There are all of them.

So, Hon. Minister, what I suggest is that there should be an overall review that goes on. I appreciate that you have brought in the two-term operation, which is a fairly good objective. නමුත් මේ කටයුතු ප්‍රායෝගිකව දේශපාලන අරමුණක් නැතිව ගෙන යන්න ඕනෑ. මෙහිදී ක්‍රීඩා ඇමතිවරයා වුණත් ඔබතුමාගේ දේශපාලනයෙන් මේ කටයුතු වෙන් කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය ඇති වෙනවා.

ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා බොහොම වැදගත් අදහසක් ඉදිරිපත් කළා. සනත් ජයසූරිය කියන්නේ දක්ෂම ක්‍රිකට් ක්‍රීඩකයෙක්. නමුත් මේ වාගේ අවස්ථාවක එතුමා Selection Committeeයේ සිටීම වටිනවාද කියන ප්‍රශ්නය එතුමා නැඟුවා. එහිදී, එතුමා සමඟ සම කාලීනව තරග කළ කුමාර සංගක්කාර, මහේල ජයවර්ධන වාගේ අය සමඟ ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. මොකද, පසු ගිය World Cup එකේදී යම් යම් හේතු උඩ සනත් ජයසූරිය ඒ තරග සඳහා සෙල්ලම් කරන්න සුදුසු නැහැ කියලා තීරණය කළ නිසා. දැන් සනත් ජයසූරිය මැතිතුමා Selection Committee එකේ chief selector. ඒ නිසා ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. ඕස්ට්‍රේලියාවේ සහ South Africaවල යම් කාලයකට පසුව, ඒ කියන්නේ අවුරුදු හයකට, හතකට, අටකට පසුව ඒ වාගේ තනතුරක් දරන්න පුළුවන්. ඒ තුළින් තමන්ගේ දැනුම පාවිච්චි කරන්න හැකියාව ලැබෙනවා. මම හිතන විධියට ඔබතුමා ඉදිරියේත් ඒ අදහස තිබෙනවා. කරුණාකරලා එය ක්‍රියාත්මක කරලා ඉදිරියට ගෙන යන්න පුළුවන් නම්, ඒක වටිනවා කියලා මා හිතනවා.

දැන් ඔබතුමන්ලාගේ දේශපාලන තීරණ නිසා ඇති වෙලා තිබෙන ප්‍රශ්න ක්‍රිකට් ක්‍රීඩකයන් තුළින් පියවා ගන්න උත්සාහ ගන්නවා. Suriyawewa International Cricket Stadium එක හදන්න මිලියන 4,800ක් ගියා. ඒ තීන්දුව ගත්තේ කවුද? දේශපාලනඥයෝ; කැබිනට් එක. ඒ නිසා Sri Lanka Cricket එක බංකොලොත් භාවයට පත් වුණා. ආයතනයට ණය බරක් ඇති නිසා අද මොනවාද වෙලා තිබෙන්නේ? Be it the World Cup, T20 or World Cricket League Championship, the ICC gives 25 per cent of the earnings to the players. අද ඔබතුමන්ලා අත්සන් කරන ගිවිසුම අනුව ක්‍රිකට් ක්‍රීඩකයන්ට සියයට 25ක් යන්නේ නැත්තේ ඔබතුමන්ලා ඒ මුදල අරගෙන තිබෙන නිසායි. ඒකට හේතු වශයෙන් ඔබතුමන්ලා කියන්නේ, "ශ්‍රී ලංකාවේ ක්‍රිකට් අපි වර්ධනය කරනවා, අපට ප්‍රවර්ධනය කරන්න පුළුවන් හැකියාව තිබෙනවා" කියලායි. එහෙම නම් මෙතෙක් කල් මොනවාද කළේ? ඒක කළේ නැහැ. මේ සියයට 25 International Cricket Council එකෙන් දෙන්නේ ක්‍රිකට් ක්‍රීඩකයන්ට. ඇයි ඒක දෙන්නේ? සමහර වෙලාවට ක්‍රීඩකයන්ට media contractsවලින් මුදල් ලැබෙනවා. දැන් කුමාර් සංගක්කාරට කොකා කෝලා එකත් සමඟ අවුරුදු හතර, පහක ගිවිසුමක් තිබෙනවා. බැරි වෙලාවත් ICC එක පෙප්සි කෝලා සමඟ ගිවිසුමක් ගැහුවොත්, කුමාර් සංගක්කාරට කොකා කෝලා සමඟ තිබෙන ගිවිසුමෙන් ලැබෙන ආදායම නැති වෙනවා. මාස දෙකකට පෙරත්, competition එකෙන් පසුව මාස තුනක් ගත වන තුරුත් ලැබෙන ආදායම නැති වෙනවා. ඒ බාධාව නිසා තමයි ක්‍රීඩකයන්ට මේ සියයට 25- එක් අයෙකුට විතරක් නොවෙයි මුළු කණ්ඩායමටම, 14 දෙනෙකු සිටියා නම් 14 දෙනාටම- දෙන්නේ. නමුත් දැන් ඔබතුමන්ලා මොනවාද කර තිබෙන්නේ? මම දන්නවා, ක්‍රිකට් ක්‍රීඩකයන්ට අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් ගෙවනවා කියලා යම් මතයක් තිබෙන බව. එහි යම් විධියක සත්‍යතාවක් තිබෙන්න පුළුවන්. නමුත් මෙතැන තිබෙන අරමුණ වෙනත් එකක්. ඒක ක්‍රිකට්වලට විතරක් නොවෙයි, rugger, football, elle සහ volleyball වාගේ ඕනෑ ක්‍රීඩාවක් සඳහා වෙන්න පුළුවන්. මම හිතන හැටියට මේ සියයට 25ක ආදායම දැන් නැති කරලා තිබෙන්නේ ඇයි කියන එක සම්බන්ධයෙන් ඇමතිතුමාට වගකීමක් තිබෙනවා.

දැන් ඇමතිතුමා කිව්වා නීතිය හැම කෙනාටම බලපානවා කියලා. ගිවිසුම අත්සන් කළේ නැහැ කියලා කුමාර් සංගක්කාර වැනි ජොෂ්ඨ ක්‍රීඩකයෙකුට ඒ වාගේ ප්‍රශ්නයක් ඇති කිරීම සාධාරණද ඇමතිතුමා? කුමාර් සංගක්කාර කියන්නේ ලෝකයම පිළිගන්නා ක්‍රීඩකයෙක්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

කුමාර් සංගක්කාරට අපි විශේෂයක් කළේ නැහැ. අපි කිව්වේ තරගාවලිවලට සහභාගි වෙන්න ඕනෑ නම් සියලුම ක්‍රීඩකයන් ගිවිසුම් අත්සන් කරන්න ඕනෑ කියලායි. එක් අයෙකුට ඒ වාගේ අවස්ථාවක් දුන්නොත් අනෙක් අයට නොදී ඉන්න බැහැ.

හැමෝටම එක නීතියක් තිබෙන්න ඕනෑ. ඒ නිසා ජාතික සංචිතයේ සිටින සියලු දෙනාම ගිවිසුම් අත්සන් කරනතෙක් ක්‍රීඩා

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කරන්න අපි ඉඩ දුන්නේ නැහැ. ඒක කුමාර් සංගක්කාරටත් එකයි. අලුතින්ම ආ ක්‍රීඩකයාටත් එකයි. අපි ඒක වෙනස් කරන්න ගියොත් අනෙක් අයට අසාධාරණයක් වෙනවා. අපි එයාට තරගයට සහභාගි වෙන්න දුන්නා නම් අනෙක් කිසිම කෙනෙක් ගිවිසුම අත්සන් කරන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, එහෙම වුණා නම්, ගිවිසුම් අත්සන් කිරීම අන්තිම පැය වෙන තුරු තියා ගන්න අවශ්‍යතාවක් නැහැ නේ. ඒ ඔක්කෝම අය අත්සන් කළේ නැහැ. ඔබතුමාලාගේ වාර්තාව අනුව ක්‍රිකට් ක්‍රීඩකයන් 24 දෙනෙක්ද කොහේද අත්සන් කරන්න තිබුණා. ඒ එක්කෙනෙක්වත් අත්සන් කළේ නැහැ නේ. එතකොට ඔබතුමන්ලා මොකක් ද කළේ? තුවක්කුවක් තියන්නේ නැතිව කිව්වා, අත්සන් කරන්න බැරි නම් අපි අලුත් කණ්ඩායමක් දානවා කියලා. ඒක ඔබතුමා ගත්ත තීන්දුවක් වෙන්න පුළුවන්. නමුත් ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයන්ට ඒක කරන එක සාධාරණ ද කියන ප්‍රශ්නය ඉස්මතු වෙනවා නේද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, ඒ යථාර්ථය මා මේ පාර්ලිමේන්තුවේ කියන්න කැමැති නැහැ. ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ඒක පාර්ලිමේන්තුවේ කියන එක හොඳ නැහැ. ඔබතුමාට මා පෞද්ගලිකව කියන්නම් මේ සිද්ධාන්තයේ පිටුපස සිටියේ කවුද, ඒකේ අරමුණ මොකක් ද කියන එක. ක්‍රිකට් ක්‍රීඩාවේ නාමයෙන් මා මෙතැන ඒක කියන එක හොඳ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

හරි.පාර්ලිමේන්තුවට හංගන්න දෙයක් නැහැ. නමුත් ඔබතුමාට දෙයක් තිබෙනවා නම්,- [බාධා කිරීමක්]

නැහැ. නැහැ. ඔබතුමා යම් දේවල් කියලා තිබෙනවා. මා ඒවා මෙතැන කියලා නැහැ. ඔබතුමා ඒක දන්නවා ඇති. එහෙත් මෙවැනි දෙයක් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම යුතුකමක්. මොකද, ක්‍රිකට් ක්‍රීඩාව එක් කෙනෙකුගේ, දෙන්නෙකුගේ අතේ තිබෙන දෙයක් නොවෙයි. මේ ක්‍රීඩාව එක් කෙනෙකුගේ, දෙන්නෙකුගේ, තුන්දෙනෙකුගේ අතට යවන්නත් හොඳ නැහැ. කුමාර් සංගක්කර ගැන කියනකොට ලෝකයම බලනවා ඇයි එයාව නවත්වන්න හදන්නේ කියලා. අන්න ඒ ප්‍රශ්නයට තමයි ඔබතුමාට උත්තර දෙන්න තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයටත් මට උත්තර දෙන්න පුළුවන් නම් හොඳයි. ක්‍රිකට් ක්‍රීඩකයන්ට ICC එකෙන් එන සියයට 25 ඇයි නවත්වා තිබෙන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, එහෙම ගෙවීමක් තිබුණේ නැහැ. ඒක නීති විරෝධී ගෙවීමක්.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

No, it is an international obligation. The ICC allocates 25 per cent of the earnings of the tournaments for cricketers.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, කිසිම රටක එහෙම ගෙවීම වැරදියි. ඒක ඩී.එස්. ද සිල්වා මහත්මයාගේ කාලයේ ක්‍රීඩකයෝ ගිහින් එතුමාට වැරදි අවබෝධයක් දීලා ගත්ත තීරණයක්. ඒක වැරදියි. ඒක ගෙවන්න බැහැ. ඒ විධියට කොහේවත් ගෙවන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

මා දන්නේ නැහැ. මා cricketers ලා සමඟ කථා කර තිබෙන නිසා තමයි කිව්වේ. ඒ ගොල්ලන් ගිවිසුම අත්සන් කරන්න අකැමැත්තක් දැක්වූවේ මේ නිසායි. මොකද, මේ කාරණය අදට නොවෙයි, හෙටටත් බලපානවා. මේක නැවත සංශෝධනය කරන තාක් කල් යම් විධියකින් ඒ ගොල්ලන්ගේ -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි සමාවන්න. සියයට 25ක් නොවෙයි, සියයට 45ක් ගෙවන්නම්. ඔබතුමා අපට කියන්නේ මේ ලැබෙන ආදායමෙන් National Cricket Team එක විතරක් නඩත්තු කරන්න කියලා ද? වෙන අපට කරන්න දෙයක් නැද්ද? එහෙම කළොත් මේ සල්ලිවලින් අපට නඩත්තු කරන්න පුළුවන් වෙන්නේ National Cricket Team එක විතරයි.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

ඔන්න ඔක තමයි තිබෙන ප්‍රශ්නය. අප දන්නේ නැහැ, ලැබෙන ආදායම මොකක් ද කියන එක. නමුත් වියදම මොකක් ද? ආදායම ගැන ඔබතුමා කියන්න දන්නේ නැහැ. නමුත් අපි දන්නවා වියදම. ඔබතුමන්ලා සූරියවැව පිටිටනියට මිලියන 4800ක් වියදම් කරනවා. ලැබෙන ආදායමෙන් සියයට 90 යන්නේ ඒවාට. ඒ වියදම, නාස්තිය නිබුණේ නැත්නම් මේ වාගේ ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. මා නිදසුනක් වශයෙන් කියන්නම්, Tamil Union Cricket and Athletic Club එකේ stadium එක ගැන. ඒක World Cup එකට ගන්න බලාපොරොත්තු වුණාම ජනශක්ති ඉන්ෂුවරන්ස් තුළින් කිව්වා, මිලියන 980කින් ඒ ගොල්ලෝ ඒ පිටිටනිය වැඩිදියුණු කරන්නම්, ශත පහක්වත් Sri Lanka Cricket එකෙන් අවශ්‍ය නැහැ කියලා. නමුත් ඒක ප්‍රතික්ෂේප කළා. ඇයි ප්‍රතික්ෂේප කළේ? පල්ලේකැලේ ක්‍රීඩාංගනයටත්, සූරියවැව ක්‍රීඩාංගනයටත් මුදල් ගන්න ඕනෑ නිසා. එදා ඒක කළා නම් සූරියවැව පිටිටනියේ මිලියන 4800ත්, පල්ලේකැලේ පිටිටනියේ මිලියන 1200ත් බර උසුලන්න අවශ්‍ය නැහැ Sri Lanka Cricket එක. එහෙම කළා නම් ආදායමෙන් සියයට 90 ක් යන්නේ නැහැ ඒවාට. ඒක තමයි අපි කිව්වේ. දේශපාලන අරමුණකින් ක්‍රිකට් ක්‍රීඩාවට වියදම් කරලා, ඊට පස්සේ ඒ බර ක්‍රිකට් ක්‍රීඩකයන්ට දමන එක තමයි අසාධාරණය.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය සඳහා අපි ඒ කළේ ආයෝජනයක්. පල්ලේකැලේ ක්‍රීඩාංගනය හදපු නිසා ක්‍රීඩකයන්ගේ දීමනාව කැපුවා නොවෙයි. අපට වාර්ෂිකව එන ආදායම් තිබෙනවා. ඒ ආදායම්වලින් තමයි අපට වියදම් කරන්න තිබෙන්නේ. හම්බන්තොට පිටිටනියයි මේ කාරණයයි පටලවා ගන්න එපා. මේ ක්‍රීඩකයන්ගේ ප්‍රශ්නයයි ඒකයි කාරණා දෙකක් ගරු මන්ත්‍රීතුමනි. පිටිටනිය හදපු එකට බිලියන දෙකහමාරක ප්‍රශ්නයක් තිබෙනවා. දැන් ඒක ගෙවන්න භාණ්ඩාගාරය එකඟ වෙලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
භාණ්ඩාගාරය තවම Sri Lanka Cricket එකට දීලා නැහැ නේ ගරු ඇමතිතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sri Lanka Cricket එකට ඕනෑ නැහැ. ඒක වරාය අධිකාරියට ගෙවනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සල්ලි ගන්න සටන් කරනවා. නමුත් තවම දීලා නැහැ. මේ මොහොත වෙන තුරු දීලා නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දැනට සාකච්ඡා කරනවා. ඒක- [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සාකච්ඡා නේ. ඔක්කෝම සාකච්ඡා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sri Lanka Cricket එකට ප්‍රශ්නයක් නැහැ මන්ත්‍රීතුමා. අපි ඒක ගෙවන්නේ නැහැ.භාණ්ඩාගාරය එක්ක සාකච්ඡා කරලා, භාණ්ඩාගාරය ඒ ආයතනවලට ගෙවනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
The Hon. Ravi Karunanayake)
එතකොට ඒ ණය බර උසුලන්න තිබෙන්නේ Sri Lanka Cricket එකට නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
උසුලන්න දෙයක් නැහැ. ඒක write-off වෙනවා. සල්ලි ගෙව්වාට පස්සේ ඉවරයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි, ඔය කියපු සියයට 90ක් යන්නේ ඒ ප්‍රශ්නය නිසා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා හම්බන්තොට පිට්ටනිය හදපු එක අයින් කරන්න. ඒක ප්‍රශ්නයක් කර ගන්න එපා. ඒ debts ටික පැත්තකින් තියන්නකෝ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි කියමුකෝ ඒක අයින් කළා කියලා. ඒක අයින් කරලා Sri Lanka Cricket එක ගන්නකෝ. Sri Lanka Cricket එකේ 288 දෙනෙක් වැඩ කරනවා. අවශ්‍ය වන්නේ 105 දෙනයි. කවුද, දේශපාලන අරමුණු ඇතිව ඒ අය අර ගෙන තිබෙන්නේ. එකසිය විස්සක්-,[බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලයේ එක්කෙනෙක්වත් බඳවා ගෙන නැහැ. මගේ කාලයේ එක්කෙනෙක්වත් දාලා නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම දන්නවා. ඒක තමයි මම කිව්වේ. ගරු මහින්ද අමරවීර ඇමතිතුමා කථා කළේ ඔබතුමන්ලා ඊයේ ආණ්ඩුව ගත්ත විධියටයි.

මේ කථා කරන ඔබතුමා ආණ්ඩුවේ පවිත් ගෙවන්න ඕනෑ. ඔබතුමාට විතරක් credit එක ගිහින් ආණ්ඩුවට විතරක් debit එක දමලා හරි යන්නේ නැහැ. ඔබතුමා මේ ආණ්ඩුවේ කොටස්කරුවෙක්. මේ 180 වැඩි කළේ ඔබතුමන්ලාගේ හිටපු ඇමතිවරුන්ගේ කාලයේයි. ඒ සම්බන්ධයෙන් බර උසුලන්න. ක්‍රිකට් ක්‍රීඩකයින්ට එන සියයට 25 නවත්වා තිබෙන්නේ ඔය කළ පාප කර්මය නිසා නේ. සූරිය වැව ප්‍රශ්නය වෙන්න පුළුවන්. Tamil Union එකේ ප්‍රශ්නය වෙන්න පුළුවන්. පල්ලේකැලේ ප්‍රශ්නය වෙන්න පුළුවන්. මේ staff එක වැඩි වීම සම්බන්ධ ප්‍රශ්නය වෙන්න පුළුවන්. ක්‍රිකට් ක්‍රීඩකයොත් හුහක් ආයෝජනය කරනවා. එදා වාගේ නොවෙයි අද. එදා අර්ජුන රණතුංග ක්‍රිකට් ගහන්න ආවේ මුදල්වලට නොවෙයි. ක්‍රීඩාව සඳහාමයි. නමුත් අද සම්පූර්ණයෙන්ම වෙනස් දෙයක් වෙලා තිබෙන්නේ. අද එන කෙනා සමහර විට මාස හයෙන් සම්පූර්ණයෙන් ක්‍රිකට් ක්‍රීඩාවෙන් එළියට යනවා. එතකොට රක්ෂාවත් නැහැ. යම්කිසි මුදල් ප්‍රමාණයක් යනවා. එතකොට advertisements දැම්මා වාගේ ඒ ගොල්ලන්ට බාධාවක් ඇති වෙනවා. ඒ සම්බන්ධයෙන් අප කියන්න ඕනෑ. ඒ වාගේම මේ රටේ TV rights තිබෙනවා. මේක තමයි Sri Lanka Cricket එකට තිබෙන ලොකුම සම්පත. නමුත් අවුරුදු හතර පහකට කලින් මට මතකයි හෂාන් තිලකරත්න උසාවි ගිය බව. ඔහු ඇවිත් ඒ සම්බන්ධව අප දැනුවත් කළා. එදා හිටපු ඇමතිවරු ඇමෙරිකානු ඩොලර් මිලියන 3500ක් සම්පූර්ණයෙන්ම හිතුමතයට එක කොම්පැනියකට දුන්නා. ඒක රටට ආයෝජනයක් නේද? රටට තිබෙන සම්පතක් නේද? ඒ මුදල් ක්‍රිකට් ප්‍රවර්ධනය කරන්න පාවිච්චි කරන්න තිබුණා නේද? Why is that not being questioned? Why should the cricketers be paying for that? That loss was so substantial that you could have developed this sport with that money alone without forfeiting 25 per cent. Why is the Government silent on that?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඉදිරියේදීත් independent finance committee එක තිබුණා නම් හොඳයි. සභාපති ධුරයේ හෝ ලේකම් ධුරයේ ඉන්න කෙනාට TV cricket rights වලට ඇඟිලි ගසන්න අයිතියක් නැහැ. ඒක independent lot එකක්. මේ Sri Lanka Cricket එකේ හෝ Rugby Union එකේ ඉන්න කෙනෙක් finance committee එකට අදහසක් යොමු කරන්න ඕනෑ, "මට මේක ඉදිරියට ගෙන යන්න ඕනෑ. ඒ නිසා මෙපමණ මුදලක් අවශ්‍යයි." කියා. ඒ වාගේම තමයි CSN - Carlton Sports Network- එකත්. රූපවාහිනියේ මොහාන්

සමරනායක කිව්වා, "කරුණාකර, මේක දෙන්න එපා. අපේ ආදායම නැති වෙනවා." කියා. ඒක ගණන් ගන්නේ නැතුව පැත්තකට දැම්මා. රජයට ලැබෙන්න තිබුණු ආදායමක් නැති වුණා. මහා රාජා ආයතනයෙන් ඉදිරිපත් කළා. ඒකට කිව්වා, "කිසිසේත්ම අවශ්‍යතාවක් නැහැ. මේක වෙන්න ඕනෑ, dedicated channel එකක් තිබුණා." කියා. ඊට පසු අවුරුද්දේ dedicated channel එකක් දැම්මා. ඒත් දුන්නේ නැහැ. ඒක රජයට ඊට වැඩිය හතර පස් ගුණයකින් වැඩි ආදායමක් ලබා ගන්න තිබුණු අවස්ථාවක්. මේවා ගත්තා නම් ක්‍රිකට් ක්‍රීඩකයන්ගෙන් සියයට 25ක් ගන්න අවශ්‍යතාවක් නැහැ. සියයට 90ක් මෙතැන වියදමක් දරන්නේ ඔය වාගේ ප්‍රශ්න තිබෙන නිසයි. ආදායමක් ගන්න තිබෙන්නේ එක තැනකින් නොවෙයි. මේ වාගේ පිරිසිදු පාලනයක් ගෙන ගියා නම් එතැනින් අවස්ථාව ගන්න පුළුවන් වේවි කියන අදහස ඔබතුමාට ඉදිරිපත් කරනවා.

මම කිව්වා වාගේ TV rights, sports advertising මීට වඩා විධිමත් කරන්න අවශ්‍යයි. මා ඔබතුමා සමඟ එකඟ වෙනවා. Cricketersලාට අවශ්‍ය ප්‍රමාණයට වැඩිය අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒක ඔවුන්ගේ දක්ෂතාව. They have got an inherent skill. You cannot deprive them of that. දේශපාලනඥයෝ එක් කෙනෙක් දෙදෙනෙක් එක පවුලක් වාගේ සමහර විට ඔක්කොම එක තැනකට එනවා. ඒක නවත්වන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම cricketersලාගේ දක්ෂතාව නිසා 100 ඒවා අවුරුදු ගණනාවකට 40ක් ගැහුවා කියා එයාට ලැබෙන්න තිබෙන advertisements නවත්වන්න අවශ්‍යතාවක් නැහැ. ඒවා පාවිච්චි කරන්න රටේ අභිවෘද්ධියට. ඒ වාගේම ක්‍රිකට් යොදා ගන්න රටේ tourism දියුණු කරන්න. මේ වාගේ ඒවා තමයි කරන්න අවශ්‍ය වන්නේ. ඔබතුමන්ලාගේ Regulations මඟින් මේවා කරන්න බැහැ. මේ සඳහා law එකක් ගෙනාවා නම්, ඊට වඩා හොඳට මේක සාර්ථකව කරන්න පුළුවන්. මේ Regulationsවලින් law එකක් කිරීමට subcommittee එකක් පුළුවන් තරම් ඉක්මනට ගෙනාවා නම් හොඳයි කියා මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

අපි හැම අවස්ථාවේදීම ක්‍රිකට් ගැන තමයි කථා කරන්නේ. නමුත් රග්බි බලන්න. රගර්වලත් එක කාලයකදී ලොකු සංවර්ධනයක් ඇති වුණා. දැන් නැවතත් වර්ධනයක් පෙනෙන්න තිබෙනවා. නමුත් ඒකේ වියදම කොහොමද? දැන් Colombo Racecourse එකේ හදන ක්‍රිකට් පිටිය බලන්න. කවුද, මේකේ බර උසුලන්නේ? අද කොළඹ දිස්ත්‍රික්කයේ ගෙවල් 65,800ක් හදන්න තිබුණු අවස්ථාවක මේ රුපියල් 50,000ක් දීලා අවුරුදු 30ක් ඉඩම්වල ජීවත් වුණු අයට පයින් ගහනවා වාගේ කටයුතු කර තිබෙන්නේ. මේ Colombo Racecourse එකේ rugby ground එක හදන මුදල්වලින් අඩු ගණනේ ගෙවල් 25,000ක් 30,000ක් විතර හදන්න තිබුණා. මෙන්න මේක තමයි යථාර්ථය. ක්‍රීඩාව සම්බන්ධයෙන් මෙහෙම කරන්න අවශ්‍ය නැහැ. ක්‍රීඩාව දියුණු කරන්න ඕනෑ. නමුත් ඒක කරන්න ක්‍රමයක් තිබෙනවා. ඒ වාගේම තමයි night racing. මේකත් ක්‍රීඩාවක් නේද? දෙසැම්බර් මාසයේ 16, 17 කොළඹ තිබුණු වැලි ගෝනි දැක්කාද? නිකම් ගංවතුරක් ගලලා වාගේ පෙනුණා. ඒකට රුපියල් මිලියන 380ක් වියදම් කර තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඇයි, ඔබතුමන්ලා කුහකව ඒ දිහා බලන්නේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි, ඔබතුමා ඒ කාරණයේ දී විතරක් පැන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මා අහන්නේ කොළඹ night races පවත්වන එකේ වැරැද්ද මොකක්ද කියලායි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Night races කිව්වාම, ඇයි ඒකට පැන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මගේ මිත්‍ර මන්ත්‍රීතුමා, night races පවත්වන එකේ තිබෙන වැරැද්ද මොකක්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා කියන්නේ මේකයි. කොළඹ දිස්ත්‍රික්කයේ ගෙවල් 65,800ක් කඩනවා. ඒකට රුපියල් 50,000ක් දෙනවා. නමුත් night races පවත් වන්නට පාර හදන්න වැලි ගෝනි ටික ගෙනෙන්න රුපියල් මිලියන 380ක් වියදම් කරනවා. ඒ ගැන තමයි මට තිබෙන කුහකකම.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක point of Order එකක් වෙන්නේ කොහේද? මා ලැම්බෝගිනි ගැන කිව්වේ නැහැ නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order, Hon. Minister?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මගේ මිත්‍ර රවි කරුණානායක මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා කොළඹ සිදු වන සංවර්ධනය ගැන දොස් කිව්වා. ඔබතුමා ජීවත් වන කොළඹ, කෝට්ටේ අවට විශාල සංවර්ධනයක් වනවා. ඔබතුමාට ඒක දරා ගන්න බැරි බව මට දැනෙනවා. ඒක ඔබතුමාට දරා ගන්න බැරිව, ඒකට විරුද්ධව කථා කරනවා. අද කොළඹ සිදු වන සංවර්ධනය මුළු රටම අනුමත කරන කොට, ඔබතුමා කොළඹ දිස්ත්‍රික්කයේ මහජන මන්ත්‍රීවරයෙකු වෙලත් ඒකට විරුද්ධව කථා කරනවා. අද කවුද කොළඹ නගරයේ සංවර්ධනයේ ප්‍රතිලාභ ලබන්නේ? පාර්ලිමේන්තුවේ හිටපු අර මන්ත්‍රීතුමා, හිටපු ලේකම්තුමා කවුද? සුන්දරලිංගම්ද කොහේද කියන මන්ත්‍රීතුමා. මා දකිනවා, ඔහු හැම දාම Independence Square එකේ ඇවිදිනවා. ඔහු හැම දාම කොළඹ ඇවිදිනවා. බලන්න, කොච්චර ලස්සනද කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක්ද, ඒ point of Order එකේ තිබෙන වටිනාකම? එතුමාගේ point of Order එක මොකක්ද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Then, Sir, why did you allow him to speak ? බැරි වෙලාවත් අප එවැනි point of Order එකක් මතු කළා නම්, කෙළින්ම නවත්වනවා. ඔබතුමා ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරවන්න. [බාධා කිරීමක්] මා ඒකට උත්තර දෙන්නම්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාටත් අවස්ථාව ලබා දුන්නා. එහෙම නම් වෙලාවට- [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට relax කරන්න ඕනෑ නැහැ. කෝට්ටේ සංවර්ධනය පටන් ගත්තේ අපි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එහෙම නම් නියම point of Order එක බලමු.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අප පටන් අර ගෙන ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළ තමයි ඉදිරියට ගෙනි යන්නේ. ඒකට අප බොහෝම කැමැත්තෙන් සතුට පළ කරනවා. කොළඹ දිස්ත්‍රික්කය සංවර්ධනය කරන්න පටන් ගත්තේ අපි. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් රාත්‍රියේ පවත්වන raceවලට රුපියල් මිලියන 380ක් වියදම් කරලා, ජේ.ආර්. ජයවර්ධන, පීටර් කේනමන්, රනිල් වික්‍රමසිංහලා අවුරුදු 30කට පෙර දුන්නු ඉඩම්වලින් ඒ ජනතාව එළවලා දමලා, ඒ ගොල්ලන්ට සල්ලි දෙන්නේ නැති ආණ්ඩුවක් මේක. ඒ කුහකකම ගැන තමයි අප කථා කරන්නේ. ඔබතුමන්ලා රාත්‍රී පවත්වන race ගැන මා කථා කළේ. ලැම්බෝගිනි ගැන කථා කළා නම් මොනවා කියයිද දන්නේ නැහැ. මේ රටට ලැම්බෝගිනි අවශ්‍ය වන්නේ මොකටද? මේ රටේ රෑට ගමන් කරන්න බස් නැහැ. ඔබතුමන්ලා ලැම්බෝගිනි ගැන කථා කරනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳ නැද්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි තමයි. ඔබතුමන්ලාගේ දේශපාලන නායකයන්ට රෑට සිංදු කියන්න ඒවා හොඳයි. ලැම්බෝගිනි, ෆෙරාරි මොනවාද ඒ? ඒවා ගැන කියන්නේ කුහකකමකට නොවෙයි. කුහකකම කියන්නේ, කොළඹ දිස්ත්‍රික්කයේ ජීවත් වුණු අභිංසක ජනතාව 65,800ක් පමණ එළවලා දමලා, එතැන සංවර්ධනය කරනවා කියලා, ඉන්දියන් කොම්පැනියකට හෝ චීන කොම්පැනියකට හෝ විකුණන එක තමයි කුහකකම කියන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒගොල්ලන්ට ගෙවල් දෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගෙවල් දෙනවා තමයි. ඒක මා දන්නවා. මට්ටක්කුලියේ තිබෙනවා, ගෙවල් 480ක්. ඒගොල්ලන් අවුරුදු 3ක් තිස්සේ ඒ මඩගොඩේ තමයි ඉන්නේ. 1,600ක් වතු තිබෙනවා. ඒ වතු 800ක් දක්වා අඩු කරන්න හදනවා. ඒකටද රටේ සංවර්ධනය කියන්නේ? මතක තබා ගන්න, රටේ සංවර්ධනය කියන්නේ එක් කෙනෙකුගේ, දෙදෙනෙකුගේ අවශ්‍යතාව නොවෙයි. රට සංවර්ධනය වනවා නම් අපි බොහොම සතුටුයි. අපි තමයි ඒක ආරම්භ කළේ. අපි එදා නිකම් දුන්නු ලයිට් ටික අද කපා දමා තිබෙනවා. අපි එදා නිකම් දුන්නු වතුර ටික කපලා එතැන මීටරයක් දාලා තිබෙනවා. අවුරුදු 30ක් තිස්සේ ජීවත් වුණු මිනිසුන්ට අද ඒ තැන නැති කරලා තිබෙනවා. ඔවුන්ව කොළඹ දිස්ත්‍රික්කයෙන් එළියට දමලා තිබෙනවා. ඒකටද, සංවර්ධනය කියලා කියන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කෝට්ටේ සංවර්ධනය කරන කොට හොඳයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒවාට අපි භය නැහැ. මොකද, සංවර්ධනය- [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අනුර දිසානායක මන්ත්‍රීතුමා කියනවා, හොඳයි ලු.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම් හොඳයි කියලා කියන්න. බොහොම හොඳයි. ගරු ඇමතිතුමා, දැන් එහෙමත් කියනවා නේද? ඔබතුමාට ඕනෑ වෙලාවට සීනුව වනනවා නේද? ඊට පසසේ සීනුවට ගහනවා, සීනුව නැති වෙන්න. කුහකකමට නොවෙයි අප මේ කථා කරන්නේ.අප කථා කරන්නේ රාත්‍රී පවත්වන race සම්බන්ධයෙන්. ඒවාත් ක්‍රීඩාවට සම්බන්ධද? ක්‍රිකට් ගැන අපි හොඳ කිව්වාම නිහඬව ඉන්නවා. රාත්‍රී පවත්වන raceවලට පාරවල් හදන්න විතරක් රුපියල් මිලියන 380යි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අනුර දිසානායක මන්ත්‍රීතුමා කියනවා, ඊර්ෂ්‍යාව ලු.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි දන්නවා. ඔබතුමන්ලා කියන්න ඕනෑ නැහැ. ඒ අය අතර තිබෙන සම්බන්ධකම්. අපිත් එක්ක එතුමන්ලා ළං වන කොට ඔබතුමන්ලා භයයි. එතකොට මැදට පනින්න හදනවා. ඔබතුමන්ලාගේ පක්ෂයේ මහලේකම්වරයා ජීවත් වෙන්න භයයි කියලා අද දහලනවා. කරුණාකරලා ඒ ගැන කථා කරන්න. මේ රටේ කථා කරන්න බැරි නම් ජිනීවාවලට යන්න කියන්න. මහින්ද සමරසිංහ යවන්න එපා. මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාව යවන්න කියන්න. [බාධා කිරීමක්] දැන් ඒ ගැන කැක්කුමක් තිබෙනවා නේද? මොනවාද ඒ ගැන කථා කළේ? එතැන කුහකකමක් නැහැ.

ඔබතුමන්ලාගේ මහලේකම්; අපේ නොවෙයි. එතුමා කියනවා, ජීවත් වෙන්න භයයි, මේ තත්ත්වය කොහොමද කියලා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් මොකද, නියෝජ්‍ය නායකකමට වුණේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකට ඔබතුමා ඇඟිලි ගහන්න ඕනෑ නැහැ නේ. ඒක අපේ පක්ෂයේ දෙයක් නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නියෝජ්‍ය නායකකමට මොකද වුණේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒවා ඔක්කොම හරි වෙලාවට ලැබේවි. ඔබතුමන්ලා වාගේ එක පවුලකට ඔක්කොම බෙදා ගන්නේ නැහැ. මෙතැන එක පක්ෂය ඔක්කොම බෙදා ගන්නේ නැහැ. ඒක වෙන්න ඉඩ දෙන්නෙත් නැහැ, මේ පක්ෂයෙන්. භය වෙන්න එපා, අපි කියනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් වෙන වෙන දේවල් කථා කරන්නේ ඔබතුමාගේ කථාව අවසන්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සෑහෙන වේලාවක සිට ඔබතුමන්ලා අනවශ්‍ය දේවල් කථා කරන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනවශ්‍ය නැහැ. අනවශ්‍ය පිල්ලට පැන්නා. රෑ race සඳහා රුපියල් මිලියන 380ක් වියදම් කරනවා කියලා කිව්වාම ඉස්සෙල්ලාම ලැම්බෝගිනි පත්තු වුණා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තවත් කාලය අවශ්‍යද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම කථා කළේ ක්‍රීඩාව සම්බන්ධයෙන්. මම මෙතෙක් දුර ක්‍රීඩාව සම්බන්ධයෙන් හොඳ අදහස් ඉදිරිපත් කළාම ඇමතිතුමා නිශ්ශබ්දව සිටියා. මම රෑ race සඳහා රුපියල් මිලියන 380ක් වියදම් කරනවා කියලා කිව්වාම පත්තු වුණා. ඔන්න ඔක තමයි වුණේ. ඉතින් ඒ සම්බන්ධයෙන් අපි කියන්නේ කරුණාකරලා ඇමතිතුමනි, මෙතැන හොඳ අදහස් ටිකක් ඉදිරිපත් වෙලා තිබෙනවා, ඒක නිවැරදි කරන්න. ඔබතුමා මෙච්චර අප්සෙට් වෙන්න ඕනෑ නැහැ. ඔබතුමාගේ ක්‍රීඩා අමාත්‍ය ධුරය වෙනස් වන්නේ නැහැ. ඉතින් ඒ නිසා ඒ තනතුර රැකගෙන වැඩ කටයුතු කරන්න. ඒ කරන ගමන් කරන්න තවත් දෙයක් තිබෙනවා.

ක්‍රීඩා සමාජ 52ක් තිබෙනවා. මේකෙන් වෙනස් වන national affiliated bodies තිබෙනවා. මේවාට පත් කරන ආකාරය ඔබතුමා ඉදිරියේම දැනුවත් කරන්න. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කිව්වා වාගේ selection bodies තිබෙනවා. ඒක දේශපාලනයෙන් නොවෙයි, යම්කිසි විධියක ක්‍රීඩාවේ දක්ෂයෝ පාවිච්චි කරලා ඉදිරිපත් කරන්න. නැත්නම් "ක්‍රීඩා ඇමතිගේ මෙන්න මෙයා, ක්‍රීඩා ඇමතිගේ අරයා, ජනාධිපතිගේ මෙයා" කියලා පත් කරන්න එපා. යම්කිසි විධියක criteria එකක් ඉදිරිපත් කරන්න. ඒ ඉදිරිපත් කිරීමෙන් විනිවිදභාවයක් තිබේවි. ඒකත් ක්‍රීඩාවේ අභිවෘද්ධිය වෙනුවෙන් ඉදිරිපත් වේවි කියන අදහසයි මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නේ.

එතකොට suspend කරන්න ඉස්සර වෙලා ඒකට පොඩි ක්‍රමවේදයක් ගෙනෙන්න. ඇයි මේක suspend කරන්නේ? මොකක්ද මේකේ තිබෙන්නේ? හැබැයි යම් විධියකින් ක්‍රීඩාව පැත්තෙන් හෝ හොඳ විධියට කර ගෙන යන කොට ආණ්ඩුව අකැමැති වුණොත් එතකොට ඒක suspend කරන්න ඒවි. ඒ දේ සිද්ධ වුණා අර්ජුණ රණතුංගට. මම හිතන විධියට එතුමා හොඳට කර ගෙන ගියා. යම් විධියේ ලොකු ප්‍රශ්න ඇති වුණා. ඒක වුණා. ඒ වාගේම අවස්ථාවක් ඇති වුණා, නිලංග සුමතිපාලට. දඹුල්ලේ ක්‍රීඩාංගනයක් කර ගෙන ගියා. වෙනින් අදහස් තිබෙන්න පුළුවන්. සමහර ඒවා මම පිළිගන්නේ නැති වෙන්න පුළුවන්. නමුත් ඒකත් කර ගෙන යන කොට බාධා වුණා, අරක කරන්න බැහැ, මේක කරන්න බැහැ. මෙයාට contest කරන්න බැහැ කියලා ඒ තත්ත්වය ඇති වුණා. ලක්ෂ්මන් කිරිඇල්ල කිව්වා වාගේ යම් විධියකින් තහංචි දමනවා. යම් අයට පුළුවන්, යම් අයට කරන්න බැහැ කියලා තහංචි දමනවා. මොනවා වුණත්, CEO's right එකත් include කරන්න. Journalist කෙනෙකුට පුළුවන් නම්, මෙතැන ownership එකට ප්‍රශ්නයක් තිබෙනවා නම් CEOටත් එකතු කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මන්ත්‍රීතුමා, ඒක අවසානයේදී සංශෝධනය කරනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම හොඳයි. ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම night racesවලටත් සංශෝධනයක් ගෙනෙන්න රජයේ සල්ලි පාවිච්චි කරන්න එපා කියලා. Air Force, army කට්ටිය දාලා ඒවා කරන්න එපා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ලැම්බෝගිනි වැඩියෙන් ගෙනෙන්න කියලාද කියන්නේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලැම්බෝගිනි ගෙනෙන්නේ ඔබතුමන්ලාට බෙදා ගන්න නේ. අපට නොවෙයි නේ. කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ආව දවසක අපි නිවැරදි කරන්නම්. භය වෙන්න එපා. වැඩි කල් යන්නේ නැහැ. අද ජනතාව බලාගෙන ඉන්නේ. ඔබතුමන්ලා ලැම්බෝගිනි ගේනවා. ඒ ගොල්ලන් බඩගින්නේ ඉන්නේ. ඔබතුමන්ලා ලැම්බෝගිනි ගෙනැල්ලා ජොලියේ ඒවා ලබා ගන්න පුළුවන්. බඩගින්න තිබෙන්නේ ජනතාවට. ඔබතුමන්ලාට නිසියාකාරයෙන් ලැම්බෝගිනි උත්තරයක් දේවි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
20ක්-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
20ක් නොවෙයි, ඔය ගොල්ලන් හැම දෙනාටම බෙදා ගන්න. ප්‍රශ්නයක් නැහැ.

මේ අවස්ථාවේදී කියන්නේ කරුණාකරලා ක්‍රීඩාවේ තිබෙන වටිනාභාවය නැති කර ගන්න එපා කියලයි. ගරු ඇමතිතුමා ක්‍රීඩා ඇමති වශයෙන් කටයුතු කළා. විහිළු සපයන ඇමති වශයෙන් එය අවසන් කරන්න එපා. මෙතැන තිබෙන ඒ වටිනාකම රැකගෙන රටේ ක්‍රීඩා සමාජවල අභිවෘද්ධියට වැඩ කරන්න, එය නිර්දේශපාලනීකරණය කරන්න කියලා අදහස් ඉදිරිපත් කරමින් මේ අවස්ථාවේදී කථා කරන්නට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිය ප්‍රකාශ කරමින් නිහඬ වනවා.

[අ.භා. 3.53]

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ක්‍රීඩාවේ අනාගතය සුරක්ෂිත කරමින්, ඒ වාගේම ශ්‍රී ලාංකීය ක්‍රීඩාව නව මාවතකට යොමු කරමින්, ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් ක්‍රීඩා පනතට අද දින ගෙන ආ සංශෝධන සම්පූර්ණයෙන්ම අනුමත කරමින්, එයට සහයෝගය දක්වමින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව සම්බන්ධයෙන් වචන ස්වල්පයක් මේ අවස්ථාවේදී කථා කරන්නට මම බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ මන්ත්‍රීතුමාගෙන් නොයෙකුත් චෝදනා ඉදිරිපත් වුණා, පසු ගිය අවුරුදු අට තුළ මොකද කළේ, එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ විශාල වශයෙන් මේ රටට වැඩ කළා, අපි තවම මොකුත් කළේ නැහැ කියලා. ඇත්ත වශයෙන්ම කියන්න ඕනෑ, අද ඉතාමත් ස්ථාවර කාලයක් බව. එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ එනම් 80 දශකයේ හඳපු දැවැන්ත බරපතළ ප්‍රශ්න අතිගරු ජනාධිපතිතුමා මේ රටේ නායකයා වුණාට පසුව විසඳන්න තිබුණා. මේ රටේ පැවැති යුද වාතාවරණය තුළ දේශපාලන සංස්කෘතියත් ඉතාමත් නරක තැනකට ගිහිල්ලා අවුරුද්දෙන් අවුරුද්ද මැතිවරණ පවත්වන කාලයක් තිබුණේ. ඒ බරපතළ ප්‍රශ්න විසඳලා, අද වන කොට යුද්ධයක් නැති සාමකාමී රටක පාර්ලිමේන්තුවේ 161 දෙනෙක් එක්ක, ශක්තිමත් දේශපාලන ස්ථාවරභාවයක් සහිතව අතිගරු ජනාධිපතිතුමාගේ අභීත නායකත්වය යටතේ, මහින්ද චින්තන ඉදිරි දැක්ම කියන වැඩ පිළිවෙළ යටතේ ආසියාවේ ආශ්චර්ය කරා යන මොහොතක තමයි අද මේ ක්‍රීඩාව වෙනුවෙන් ගරු මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යතුමා මේ පනතට නියෝග ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන කාරණය මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම 2010 පාර්ලිමේන්තු මැතිවරණයේදී "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" වැඩ පිළිවෙළට ජනතාව ඡන්දය ලබා දුන්නා. එහිදී පොරොන්දු වුණු ආකාරයට අතිගරු ජනාධිපතිතුමා ඇතුළු සන්ධාන ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව පිළිබඳව අනාගත බලාපොරොත්තු අර්ථවත් කරමින් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කරමින් ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා මේ රටේ ක්‍රීඩාවේ අනාගතය වෙනුවෙන් ශක්තිමත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඉතින් මේ මොහොතේ සාකච්ඡාවට ගැනෙන්නේ ඒ ක්‍රීඩා සංගම් පිළිබඳවයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලැබුණු ක්‍රීඩා අමාත්‍යාංශය හරියට අවුරුදු ගණනක් අස් කරලා නැති කාර්යාලයක් වාගේයි. ඔබතුමා ඇවිල්ලා මකුළු දැල් කඩලා, ඒක අස් පස් කරලා, ඒක පිළිවෙළකට හැදුවා. ඒ වාගේම ඒකට අරමුණක් ලබා දීලා අද ශක්තිමත් වැඩ පිළිවෙළක් රැගෙන යාම පිළිබඳව මේ රටේ ක්‍රීඩාවට ඇලුම් කරන තරුණ, තරුණියන් ඇතුළු සමස්ත ජනතාව වෙනුවෙන් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවාය කියලා කියන්න ඕනෑ. මේ රටේ නිදහසෙන් පස්සේ ක්‍රීඩාවේ භෞතික සංවර්ධනය සම්බන්ධයෙන් -ක්‍රීඩා පිටි, ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම සම්බන්ධයෙන්- තර්කානුකූල වැඩ පිළිවෙළක් කිසිම කාලයක - අපි දන්නා ඉතිහාසයේ, අපි කියවලා තිබෙන ඉතිහාසයේ- යෝජනා වෙලා තිබුණේ නැහැ. නමුත් ඔබතුමා අමාත්‍යාවරයා විධියට මේ රටේ ක්‍රීඩාවේ තිබෙන හැම ප්‍රශ්නයක්ම හොඳින් හඳුනාගෙන අද ඒවාට විසඳුම් ලබා දෙමින් යනවා.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 314ට මීටර් 200 track එකක් තිබෙන ක්‍රීඩා පිටි සමඟ ක්‍රීඩා සංකීර්ණ ලබා දෙමින්, එතැනින් හැදෙන තරුණයා තව ඉදිරියට ගෙනෙන්න දිස්ත්‍රික්ක 25ට ක්‍රීඩා සංකීර්ණ ලබා දෙමින්, එතැනින් හැදෙන තරුණයා ජාත්‍යන්තර මට්ටමට රැගෙන යාම සඳහා පළාත් ක්‍රීඩා සංකීර්ණ 9ක් හදලා ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක් අද ක්‍රියාත්මක කරමින් යනවා. මේවා වචන විතරක් නොවෙයි. අපි කිලිනොච්චියට ගියාම දැක්කා කිලිනොච්චි ක්‍රීඩා පිටිය හැදෙන ආකාරය. ජයතිලක ක්‍රීඩා පිටිය විවෘත කරලා තිබෙනවා. ඒ වාගේම අනුරාධපුරය ක්‍රීඩා පිටිය හැදෙනවා. ලංකාවේ දිස්ත්‍රික්ක විසිපහේ කොහේද ක්‍රීඩා පිටිය හදන්නේ, කොහේද මීටර් 400 track එකක් සහිත ඒ ක්‍රීඩා පිටිය හදන්නේ, ක්‍රිකට් ක්‍රීඩා පිටිය කොහේද හදන්නේ, swimming pool එක කොහේද හදන්නේ කියලා තීරණය කරලා අද ඒ කටයුතු සිදු වෙමින් පවතිනවා. ඉතින් මේවා වචන විතරක් නොවෙයි. 2016 දක්වා දිවෙන වැඩ පිළිවෙළක් විධියට අද ඒ ක්‍රීඩා ප්‍රතිපත්තිය ඉදිරිපත් කරලා ඉතාමත් සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යනවාය කියන එක මේ අවස්ථාවේ සඳහන් කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය වෙනුවෙන් කථා කරපු මන්ත්‍රීවරු පිළිබඳව කනගාටු වෙන්න ඕනෑ. "ක්‍රිකට් රගර්, රගර් ක්‍රිකට්, ක්‍රිකට් රගර්" එතැනින් එහා ක්‍රීඩාවක නමක්වත් කියනවා මට නම් ඇහුණේ නැහැ. නමුත් ගමේ ක්‍රීඩාව සම්බන්ධයෙනුත් අපි අවධානය යොමු කරන්න ඕනෑ. ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගමට ක්‍රීඩාව අරගෙන යන්න, ගමේ ක්‍රීඩා සංස්කෘතියක් ඇති කරන්න අද මේ රගෙන යන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන්. ලංකාවේ ග්‍රාම සේවා වසම් 14,000කට වඩා තිබෙනවා. මේ සියලුම ග්‍රාම සේවා වසමකටම අවශ්‍ය ක්‍රීඩා පහසුකම් ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරලා මේ වසරේ ඉඳලා ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලා බලාපොරොත්තු වීම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ලෝකයේ ඕනෑම රටකට ගිහිල්ලා ඇහුවොත් ඔබතුමන්ලාගේ රටේ වැඩි පුරම කරන ක්‍රීඩාව මොකක්ද කියලා සමහරු කියයි ක්‍රිකට් කියලා; සමහරු කියයි football කියලා; basketball කියලා; හොකී කියලා. නමුත් බැරි වෙලාවත් අපේ රටෙන් ඇහුවොත් විවේකය තිබෙන වෙලාවේ වැඩියෙන්ම කරන ක්‍රීඩාව මොකක්ද කියලා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට කියන්න තිබෙන්නේ නිවැරැදිව කරන ක්‍රීඩාවක් ගැන නොවෙයි. අපි කරන්නේ ටෙනිස් බෝලයෙන් ක්‍රිකට් ගහන එකයි. මේ රටේ සියයට 90ක්ම ග්‍රාමීය තරුණයා කරන්නේ තමන්ට ලැබෙන විවේක කාලයේදී ටෙනිස් බෝලයක් අරගෙන ක්‍රිකට් ගහන එකයි. ඒක මහා අපරාධයක් විධියට මම දකිනවා. ඔබතුමා කියපු විධියට ඔබතුමාගේ ක්‍රීඩා සංස්කෘතිය තුළින් volleyball, badminton, football වැනි ක්‍රීඩා ගමට අරගෙන යාම තුළින් ටෙනිස් බෝලය වෙනුවට football, volleyball වාගේ අනෙකුත් ආදේශක ක්‍රීඩා හඳුන්වා දීම තුළින් ග්‍රාමීය තරුණයාගේ ක්‍රීඩා කටයුතු දියුණු වෙනවා. ඒ වාගේම ටෙනිස් බෝලවලින් ක්‍රිකට් ගහලා certificate එකක් ගත්තු තරුණයෙකුට ඒ certificate එක අරගෙන interview එකකට යන්න බැහැ. Soft ball cricketවලින් අපට ජාතික තලයේ ක්‍රීඩකයෙක් බිහි කර ගන්න බැහැ.

මේ ක්‍රීඩා සංස්කෘතිය තුළින් පාසල්වලට දෙන ශක්තිය නිසා අපේ ගමේ තරුණ තරුණියන්ට හරි හැටි ක්‍රීඩාවක් කිරීමේ අවස්ථාව ලැබෙනවාය කියලා මා කියන්න ඕනෑ. මොකද, ක්‍රිකට් ක්‍රීඩාව leather ballවලින් කරන ක්‍රීඩාවක්. Softball cricket කියන්නේ එක සංස්කෘතියක්. මමත් සෙල්ලම් කරනවා, softball cricket. නමුත් ඒක සංස්කෘතියක් පමණයි. ගමේ ඉන්න talent එක තිබෙන තරුණයා අර ටෙනිස් බෝලයෙන් ක්‍රිකට් ගැහුවාම අපරාදේ ඒ talent එක නැති වෙලා යනවා. මහින්දානන්ද ඇමතිතුමා අද ක්‍රියාත්මක කරන්න යන දේවල් සහ අවශ්‍ය කරන පහසුකම් ඒ කාලයේ ක්‍රියාත්මක කළා නම් අද මේ ක්‍රීඩාවේ තත්ත්වය මීට වඩා වෙනස් වෙන්නට තිබුණා. ඒ වාගේම අද සමාජයත් වෙනස් වෙලා තිබෙනවා. බොහෝ විට ගෙවල්වල වෙනදා කරපු ක්‍රියාකාරකම් අද කරන්නේ නැහැ. අද ළිඳෙන් වතුර අදින්නේ නැහැ. අද ඇවිදිනවා අඩුයි. Three-wheeler එකේ, motorcycle එකේ යන්නේ. ඒ වාගේම ඇඹරුම් ගල, මිරිස් ගල, කුල්ල, වංගෙඩිය අද බොහෝ ගෙවල්වල කුස්සියෙන් අතුරුදන් වෙලා තිබෙනවා. නමුත් අප එදා කාපු තරම්ම අද්දක් කනවා. එදාට වඩා ජරාව අද අප කනවා. ඒක නිසා අද අප නොයෙකුත් රෝගවලට ගොදුරු වෙලා ඉන්නවා. මේක රටේ ආර්ථිකයට ඉතාමත් අශුභදායි දෙයක් වනවා වාගේම එය අනාගතයටත් බලපානවා. ගරු ඇමතිතුමා මේ ක්‍රීඩා සංස්කෘතිය ගමට අරගෙන යෑම තුළින් මා හිතන්නේ එය සමබර කිරීමේ හැකියාවක් ලැබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් විතරක් නිරෝගිමත් ජනකාවක් හදන්න බැහැ. මේ වැඩ පිළිවෙළ තුළින් ඉතාමත් නිරෝගිමත් ජාතියක් අපට හදා ගන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම මා ඉතාම සන්තෝෂ වනවා, පාසල් දරුවන්ට ක්‍රීඩාව අනිවාර්යය කිරීම ගැන. මේ රට ඉදිරියට අරගෙන යන්න පිරිපුන් දරුවන් අවශ්‍යයි; පිරිපුන් පුරවැසියන් අවශ්‍යයි. නිකම් ඉගෙන ගෙන, කැම්පස් ගිහිල්ලා, degree ගහපු අය වැඩක් නැහැ. උගත්කම විතරක් කිසිසේත් වැඩක් නැහැ, මිනිහෙකුගේ සාර්ථකත්වයට. අපට අවශ්‍ය වන්නේ අත්දැකීම් තිබෙන පිරිපුන් පුරවැසියන්. කණ්ඩායම් හැඟීම ඇති කරවන, අන්‍යයන්ට ගෞරව කරන්න පුරුදු කරන, ඉවසීම පුරුදු කරන, මිනිසුන්ට නොයෙකුත් කරුණු කාරණා පුරුදු කරන දෙයක් විධියට මේ ක්‍රීඩාව හඳුන්වන්න පුළුවන්. සෑම පාසල් දරුවකුටම ක්‍රීඩාව අනිවාර්යය කිරීම තුළින් නිරෝගිමත් මෙන්ම හැකියාවෙන් පිරිපුන් පරපුරක් බිහි වෙනවාය කියන කාරණය මා මතක් කරන්න ඕනෑ. ඒ අනුව ශක්තිමත් දරු පරපුරක් අපේ රටට අනාගතයේ බිහි වෙනවාය කියන කාරණය මේ අවස්ථාවේ ස්තුති පූර්වකව මතක් කරන්න ඕනෑ.

අපි ඉස්කෝලේ යන කාලයේ ක්‍රීඩා ගුරුවරයා ක්‍රීඩා පිටියේදී තමයි අපට ක්‍රීඩාව ඉගැන්වූවේ. කවදාවත් පන්ති කාමරවලදී ඒ ගුරුවරයා අප හමු වෙලාවත් නැහැ. නමුත් අද අලුත් ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා. ඒ තමයි මේ ක්‍රීඩා ගුරුවරයාම සෞඛ්‍යය විෂයයත් උගන්වන්න ඕනෑය කියන කාරණය. කරුණාකරලා මේ ක්‍රීඩා ගුරුවරයා සෞඛ්‍ය විෂයයෙන් ඉවත් කරලා ක්‍රීඩා පිටියේම තියන්න කියලා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම අද මේ ක්‍රීඩා ගුරුවරු බඳවා ගන්නේ විද්‍යා පීඨ හරහායි. එතැනිනුත් එහාට ගිහිල්ලා මේ ක්‍රීඩාව ගැන කැක්කුමක් තිබෙන, ක්‍රීඩාව ගැන හැඟීමක් තිබෙන, ඒ උණ තිබෙන මිනිස්සු ටිකක් බඳවා ගන්න කියා මා ඉල්ලා සිටිනවා. එවැනි අය තමයි මේ ක්‍රීඩාව ඉදිරියට අරගෙන යන්න අවශ්‍ය වන්නේ. අණපනත් වෙනස් කරලා අවශ්‍ය රෙගුලාසි සකස් කර ගෙන, විද්‍යා පීඨ හරහා පමණක් නොව ජාතික තලයට ආපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතරිනුත් ක්‍රීඩා ගුරුවරුන් බඳවා ගන්න කටයුතු කරන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන් තව එක කාරණයක් මතක් කරන්න ඕනෑ. ක්‍රීඩාවේ කුඩාම ඒකකය තමයි, ග්‍රාම නිලධාරි වසමක තිබෙන ක්‍රීඩා සමාජය. අද අපේ රටේ ග්‍රාම නිලධාරි වසම් තුළ තිබෙන ක්‍රීඩා සමාජ බොහෝ විට අක්‍රිය වෙලා තිබෙනවා. ග්‍රාම නිලධාරි වසම් 5කට, 10කට, 15කට ක්‍රීඩා සමාජයක් ඇති කරන වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න කියලා ඔබතුමාට මා යෝජනා කරනවා. ගම්වල ඉන්න මන්ත්‍රීවරු විධියට අපට දකින්න ලැබෙනවා, ග්‍රාම නිලධාරි වසමකට ක්‍රීඩා සමාජයක් කියන එක අද පුස්සක් බවට පත් වෙලා තිබෙන ආකාරය. මේක කීප තැනක විතරයි සාර්ථකව තිබෙන්නේ. බොහෝ විට අද ක්‍රීඩකයෝ ගන්නේ පාසල්වලින් විතරයි. ක්‍රීඩා සමාජ තුළින් ග්‍රාමීයව ක්‍රීඩකයින් එන තත්ත්වයක් අපට දකින්න ලැබෙන්නේ නැහැ. ඉදිරියේදී කොට්ඨාස ක්‍රමයට මැතිවරණ පැවැත්වීමේ ක්‍රමයක් එනවා. ඒ අනුව සමහර විට කොට්ඨාසයකට ක්‍රීඩා සමාජය ගණනේ ඇති කරන්න පුළුවන් වෙයි. කුඩාම ඒකකය පිළිබඳව පරීක්ෂාවක් කරලා ඒක වෙනස් කරන්න කටයුතු කරන ලෙසත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මට ලැබිලා තිබෙන්නේ විනාඩි දහයක කාලයක්. අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමා ක්‍රීඩාවට කරනු ලබන දායකත්වය ඉතාමත් ප්‍රශංසනීයයි. මා හිතන හැටියට නිදහසින් පස්සේ ඔබතුමා තමයි යථාර්ථය අවබෝධ කරගෙන තිබෙන්නේ. මේකේ තිබෙන හැම ප්‍රශ්නයක්ම අවබෝධ කරගෙන, නගරයට විතරක් සීමා කරන්නේ නැතිව ගමටත් මේ ක්‍රීඩාව අරගෙන ගිහිල්ලා අද ඉතාමත් සාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඔබතුමාට මා ස්තුතිවන්ත වනවා.

අපේ ප්‍රදේශයට කවදාවත් swimming pool එකක් ලැබිලා තිබුණේ නැහැ. ග්‍රාමීය ප්‍රදේශයක් වන අපේ ප්‍රදේශයේ නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයට පිහිනුම් තටාකයක් ලබා දීම පිළිබඳවත්, ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම සඳහා ඔබතුමා ලබා දෙන ශක්තිය පිළිබඳවත් ස්තුති කරමින් මම නිහඬ වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. Order, please! Before that, will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
I propose that the Hon. R. Yogarajan do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

[අ.භා. 4.05]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රය පිළිබඳව ආන්දෝලනාත්මක කතාබහක් සමාජයේ ඇති වෙලා තිබෙන වෙලාවකදීයි ගරු ක්‍රීඩා අමාත්‍යතුමා ඉදිරිපත් කර තිබෙන මෙම නියෝග මේ ගරු සභාවේ සාකච්ඡාවට ගන්නේ. ඇත්තටම මේ නියෝග පිළිබඳව අප බලන්නේ යම් මධ්‍යස්ථ ස්ථාවරයක ඉඳලායි. මෙහිදී ගරු අමාත්‍යතුමා යම් උත්සාහයක් දරා තිබෙනවා. අපි එය පිළිගන්නවා. අපි දකිනවා, එය මේ ක්ෂේත්‍රයේ දැන් ඇති වෙලා තිබෙන අරාජික ස්වභාවය වෙනස් කිරීමට ගන්නා පියවරක් හැටියට. මා ඒ අරාජික තත්ත්වය එක පාලන කාලයකට පමණක් ලඝු කරන්නේ නැහැ. මෙතැනදී අප දකින ගැටලුකාරී තත්ත්වයක් තිබෙනවා. අද අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ - විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාවේ- ඇති වෙලා තිබෙන, කාලයක් තිස්සේ වර්ධනය වෙලා තිබෙන මේ තත්ත්වය, අරාජිකත්වය, දේශපාලනීකරණය ආදි ස්වභාවයන් වෙනස් කරන්න මේ නියෝග ප්‍රමාණවත් ද කියන එක, මේ නියෝගවලින් පමණක් ඒ දේ කරන්න ඔබතුමාට හැකි ද කියන එක තමයි තිබෙන ගැටලුව ගරු ඇමතිතුමනි. එසේ වුවත් ඔබතුමා මේ දරන සාධනීය උත්සාහය පිළිබඳව, ඒ සාධනීය පැත්ත පිළිබඳව මධ්‍යස්ථ වශයෙන්, ප්‍රශංසනීය ආකාරයට දකින්න අපි සූදානම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිතර කථා බහට ලක් වන දෙයක් තමයි ක්‍රීඩාවට දේශපාලනය සම්බන්ධ වීම කියන කාරණය. ක්‍රීඩාවට දේශපාලනය සම්බන්ධ වීමයි, දේශපාලකයන් සම්බන්ධ වීමයි දෙකක්. යම් හැකියාවක් තිබෙන, යම් සංවිධාන ශක්තියක් තිබෙන, නායකත්වයක් ගන්න පුළුවන් දේශපාලකයන් ක්‍රීඩාවකට සම්බන්ධ වීම සුදුසු නම් අපි ඒ සුදුසුකම පිළිගන්න ඕනෑ. හැබැයි මෙතැන තිබෙන ගැටලුව වන්නේ ක්‍රීඩාවට දේශපාලකයන් සම්බන්ධ වීම නොවෙයි. ක්‍රීඩාව දේශපාලනීකරණය කිරීමයි; දේශපාලකයා සමඟ දේශපාලනය ක්‍රීඩාවට ගෙන ඒමයි තමයි ගැටලුව. අප පසු ගිය කාලයේත්, මේ මෑත කාලයේත් අපේ සමාජයේ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවට හැම ක්‍රීඩාවකම පරිහානිය දැක තිබෙන්නේ ක්‍රීඩාවට දේශපාලකයා සම්බන්ධ වූ නිසා නොවෙයි, දේශපාලනය සම්බන්ධ වීම සහ ඔවුන්ගේ දේශපාලන න්‍යාය ක්‍රීඩාව හරහා ක්‍රියාත්මක කරන්න, දේශපාලන බලය, දේශපාලන හයිය ක්‍රීඩකයන් හරහා ක්‍රියාත්මක කරන්න දරපු උත්සාහය නිසායි.

මෑත කාලයේ දිගින් දිගටම රගර් ක්‍රීඩාවේ අර්බුද අපි දකිනවා. මරා ගන්නේ නැතිව, ගැටුමක් නැතිව රගර් ක්‍රීඩා තරගාවලියක් අවසන් වූ අවස්ථා තිබෙනවා නම් ඒ ඉතාම අහඹු අවස්ථායි. ඒ පිටුපස තිබෙන්නේ මොකක්ද? ඒ පිටුපස තිබෙන්නේ, රගර් ක්‍රීඩාවට ආවේණිකව තිබෙන ක්‍රීඩා භූමියේදී පොර කන එක විතරක් නොවෙයි, රගර් ක්‍රීඩා භූමියේදී ඇහේ බාහු ශක්තිය පෙන්වන එක විතරක් නොවෙයි. ඉන් එළියේ තිබෙනවා රගර් ක්‍රීඩාවට දේශපාලනය සම්බන්ධ වීම කියන කාරණය. ඒ හරහා එම ක්‍රීඩාව දේශපාලනීකරණය වෙලා. අද දේශපාලන බලවතුන් තම තමන්ගේ හයිය පෙන්වන ක්‍රීඩාවක් බවට රගර් ක්‍රීඩාව පත් වෙලා තිබෙනවා. එතැන තමයි ගැටලුව තිබෙන්නේ. පසු ගිය කාලයේ අපි දැක්කා Carlton Sports Network එකට ක්‍රීඩා විකාශන අයිතිය ලබා දීම සම්බන්ධයෙන් ඇති වූ තත්ත්වය.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් මමත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඉන්නවා. එම කාරක සභාවට ක්‍රිකට් ආයතනය කැඳවපු වෙලාවේ අපි දැක්කා එම ආයතනය මොන තරම් දේශපාලනීකරණය වෙලාද කියලා. එතකොට දේශපාලකයා නොවෙයි ප්‍රශ්නය. ඒක ඇතුළේ තිබෙන දේශපාලන ක්‍රියාවලිය, න්‍යාය පත්‍රය විසින් යම් හයියක් තිබෙන, යම් හැකියාවක් තිබෙන, යමක් කරන්න උත්සාහ කරන කෙනෙකුටවත් ඉඩක් ඉතිරි කරලා නැහැ. ඉතින් ඒක සම්බන්ධයෙන් අදටත් රටට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අපේ ස්ථාවරය අපි පැහැදිලි කරන්නට ඕනෑ.ඇත්තෙන්ම ගැටලුව වන්නේ ක්‍රීඩාවට හැකියාවන් තිබෙන දේශපාලකයින් සම්බන්ධ වීම නොවෙයි, දේශපාලනය සම්බන්ධ වීමයි. එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

දේශපාලන මතිමතාන්තර හැටියට ගත්තොත් එහෙම, එක්සත් ජාතික පක්ෂ රජයේ පාලන කාලයේ දී මහවැලිය ගොඩනැඟීම පිළිබඳව ගාමිණී දිසානායක මහත්මයාටත් පොඩි විවේචන තිබුණා. ඒ දේශපාලන විවේචන. හැබැයි එතුමා ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් කළ කාර්ය භාරය, ක්‍රිකට් ක්‍රීඩාවට ගෙනෙන ලද තත්ත්වය, ඒ සඳහා වුණු මහන්සිය ගැන අපට අගය කිරීමක් තිබෙනවා. අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා, අද මන්ත්‍රීවරයකු හැටියටත්, ඒ වාගේම එදා ක්‍රිකට් ක්‍රීඩකයකු හැටියටත් ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කළ කාර්ය භාරය අපට මතකයි. නිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ද, එහෙම නැත්නම් අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා ද කියන එක නොවෙයි අපට තිබෙන ප්‍රශ්නය. ඒ තමන්ගේ හැකියාවෙන්, දක්ෂතාවෙන් එතැන යමක් කරන්න තිබෙන හැකියාව වෙනුවට තමන් දරන දේශපාලන බලය නිසා, තමන් සිටින දේශපාලන ස්ථාවරය නිසා, ක්‍රීඩාව දේශපාලනීකරණය කිරීමට යමෙකු උත්සාහ කරනවා නම් ඒක තමයි තිබෙන ගැටලුව.

දැන් මට තිබෙන ප්‍රශ්නය වන්නේ, දේශපාලකයා ක්‍රීඩාවට එන එක නොවෙයි, දේශපාලනය ක්‍රීඩාවට එන එක වළක්වන්න ඔබතුමාගේ මේ නියෝගවලට පුළුවන්කමක් තිබෙයිද කියන එකයි. ඒ සඳහා ඔබතුමාගේ මේ නියෝග ශක්තිමත් ද?

අපි ඇමතිතුමාට ඇත්තටම සුබ පතනවා. ඒ වාගේම පරිස්සමෙන් තනතුරයි, බෙල්ලයි බේරා ගෙන කටයුතු කරන්න. නැත්නම් ඔබතුමාටත් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වලා ප්‍රකාශ කරන්න වෙයි, "මට මරණ තර්ජන තිබෙනවා, දැන් මම භයෙන් තමයි ජීවත් වෙන්නේ. මට ගහන්න හදනවා; මට වැටෙන්න

ගහන්න හදන්නේ" කියලා. එහෙම පසු කාලයක කියන්න සිදු වන්නේ නැති වෙන්න, පසු කාලයක "මටත් මරණ තර්ජන තිබෙනවා" කියලා කියන ඇමති ලැයිස්තුවේ කෙනෙකු බවට පත් නොවෙන්න මේ දේ ක්‍රියාත්මක කරන්න හැකියාව ඔබතුමාට ලැබේවායි කියලා අපි ප්‍රාර්ථනා කරනවා. මෙතැන මේ නියෝගවල පිහිට තමයි අන්තිමේ දී ඔබතුමාට තිබෙන්නේ. එවැනි මාධ්‍ය සාකච්ඡාවක් නොපවත්වා මේ දේ කරන්න පුළුවන් ද, නැද්ද කියන එක තමයි ඔබතුමා ඉස්සරහා තිබෙන ක්‍රීඩාව. ඔබතුමා දැන් ක්‍රීඩා ඇමතිතුමා විතරක් නොවෙයි, ඔබතුමාට ක්‍රීඩාවකත් යෙදෙන්න සිදු වෙලා තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
කිසිම ප්‍රශ්නයක් නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ඒකෙදි මට පෙනෙන විධියට නම් ඔබතුමා සමත් වෙලා නැහැ. තවම ක්‍රීඩාවේ යෙදෙමින් සිටින නිසා අපට අවසාන අනාවැකියක් කියන්න බැහැ. මොකද, දැන් මේ නියෝග ගත්තොත් -දැන් මෙතැනත් ඒ ගැන සාකච්ඡා වුණා- මේ නියෝගවල 15. (1) (ඒ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

"සුදු ව්‍යාපාරයක සෘජුව හෝ වක්‍රව යෙදී සිටී නම්;"

ඒ වාගේම එම නියෝගවල 15.(1) (එ) යටතේ මෙසේ සඳහන් වනවා:

"එම ක්‍රීඩාවට අදාළ ක්‍රීඩා භාණ්ඩ, මෙවලම්, අයිතම හෝ උපකරණ නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, නිපදවීමේ, විකිණීමේ හෝ බෙදා හැරීමේ සෘජුව හෝ වක්‍රව යෙදී සිටී නම්; "

එතකොට මේ සෘජුව හෝ වක්‍රව කියන එක අර්ථ කථනය කරන්නේ කවුද? සෘජුව කරන සුදු ක්‍රීඩාව නම් අපි දන්නවා. වක්‍රව සිදු කරන සුදු ක්‍රීඩාව ගැන අපි දන්නේ නැහැ. එතකොට ඒක කොහොමද අර්ථ කථනය වන්නේ? එහෙම යෙදී සිටින පුද්ගලයෙකුට ක්‍රීඩා නිලවරණවලට ඉදිරිපත් වෙන්න බැරි නම්, එතකොට ඒ අවස්ථාව දැන් ප්‍රායෝගිකව සිදු වන්නේ නැද්ද? ඕකයි තිබෙන ගැටලුව. අපි මේ නියෝග හදනවා. ඒවා පුස්කොළ පොත් නොවෙයි නේ ගරු ඇමතිතුමනි. මේක මහාවංශය වාගේ, පුස්කොළ පොත් වාගේ කොහේ හරි අරගෙන තබන දෙයක් නොවෙයි. [බාධා කිරීමක්] ඒක තමයි, මේක භාවිතාවට නහන්න ඕනෑ නේ. මේක භාවිතාවට නහන්න ගියාම ප්‍රායෝගික යථාර්ථයේ දී අපි දකිනවා, දැනටත් ක්‍රියාත්මක වන්නේ එහි අනෙක් පැත්ත බව. උදාහරණයක් හැටියට මම එක කාරණයක් ගන්නම්. මට මෙහිදී යම් යම් පුද්ගලයන්ගේ නම් කියන්න සිදු වෙනවා. මා එම පුද්ගලයොත් එක්ක පෞද්ගලික ප්‍රශ්නයක් කොහෙත්ම නැහැ. මා ඒ අයව දන්නෙත් නැහැ; හඳුනන්නෙත් නැහැ. සමහර අයව දන්නවා. සමහර අයත් එක්ක එහෙම පෞද්ගලික බැඳීම් නැහැ. නමුත් අපි දන්නවා, පසු ගිය කාලයේ ක්‍රිකට් ලෝක කුසලාන තරගය අපේ රටට ලැබුණු අනගි අවස්ථාවක් බව. ඒ අනගි අවස්ථාව අවසානයේ දී අපට ඉතිරි වෙලා තිබෙන්නේ මොකක්ද? තරග පරදින එක වෙනම දෙයක්. තරග කියන්නේ දිනනවා, පරදිනවා. මේ මගේ ළඟම සිටින මන්ත්‍රීතුමා එදා ක්‍රිකට් ක්‍රීඩකයකු හැටියට ලංකාවට ක්‍රිකට් ජයග්‍රහණය ගෙනාපු කෙනෙක්. ඒක අපට අභිමානයක්.

අපි ලෝක කුසලානය දිනන්නම බලාගෙන තරග කළා නොවෙයි. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. අවසානයේ අපට ඉතිරි වුණේ මොකක්ද? මහා මුදල් නාස්ති පිළිබඳව, වංචා පිළිබඳව, දූෂණ පිළිබඳව, අක්‍රමිකතා පිළිබඳව, චෝදනා ගොඩක් පමණයි.

ඒ සිදු වුණ හානි භාණ්ඩාගාරයෙන් බේරනවා කියලා දැන් ඔබතුමා කියනවා. මීට කලින් එහෙම කිව්වා. භාණ්ඩාගාරය කියන්නේ කවුද? මෙතැන හරි අපභ්‍රංශයක් තිබෙනවා. භාණ්ඩාගාරය කියලා සල්ලි ආකරයක් නැහැ. සල්ලි වලක් නැහැ. භාණ්ඩාගාරය කියන්නේ මේ රටේ ජනතාව; ජනතාවගේ බදු මුදල්. අවසානයේ ජනතාව තමයි මේ වන්දිය ගෙවන්නේ. භාණ්ඩාගාරය කිව්වාට අපි නොවෙයි ගෙවන්නේ.ඒ කියන්නේ ක්‍රීඩා අමාත්‍යාංශය නොවෙයි ගෙවන්නේ, ජනතාවයි ගෙවන්නේ. අවසානයේ කියන්නේ ඒක නේ. ක්‍රීඩා අමාත්‍යාංශය නොවෙයි ගෙවන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුරාජ් දන්දෙනිය මහත්තයා එදා ICC Secretariat එකේ ප්‍රධානියා. ඒ බව මාධ්‍යවල පළ වුණා, අපි දැක්කා. ඔහු චෝදනාවලට ලක් වුණා. අන්තිමට ඒ ටිකට් අළෙවිය පිළිබඳ ගනුදෙනු ගැන කොම්පියුටර්වල තිබුණ දත්ත පවා නැති වුණා. එහෙම තිබෙද්දී සුරාජ් දන්දෙනිය මහත්තයා නැවතත් මේ නිලවරණවලට ඉදිරිපත් වෙනවා, ගරු ඇමතිතුමාගේ ආශීර්වාදය ඇතිව. මෙහි ඒ විධියේ එක වගන්තියක් තිබෙනවා නේ. මෙහි අපූරු වගන්තියක් තිබෙනවා. ඔබතුමා ඒක මොකක් නිසා දමා ගත්තාද මම දන්නේ නැහැ. ඔබතුමාට මාධ්‍ය සාකච්ඡා කියන්න වෙන්නේ මෙන්න මේ වාගේ වගන්තිවලටයි. එහි 14වන වගන්තියේ මෙසේ සඳහන් වනවා:

".....වෙනත් යම් තැනැත්තකු අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව තේරා ගැනීම සඳහා නම් කරනු ලැබිය හැකිය."

එතකොට තිබෙන ප්‍රශ්නය මෙකයි. මේ ක්‍රීඩා සංගම්වල නිලවරණයට ඉදිරිපත් වෙන්න නම්, "කණ්ඩායම් ඉසව්වක් සඳහා දෙවරකට වැඩි වාර ගණනක් හෝ තනි ඉසව්වක් හෝ ක්‍රීඩාවක් සඳහා එක් වරක් ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත්නම් මිස යම් ජාතික සංගමයක භාණ්ඩාගාරික හෝ-[බාධා කිරීමක්] කමක් නැහැ, කියන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම ජාතික මට්ටමේ සමහර ක්‍රීඩා තිබෙනවා. දැන් handball ක්‍රීඩාව ගත්තාම එහෙම එන්න මිනිස්සු නැහැ. එහෙම එන්න කට්ටිය නැහැ. ක්‍රිකට් පාලක මණ්ඩලයේ ආනා පුංචිහේවා වැනි අය ඉන්නවා. ඒ හොඳ පරිපාලකයෝ. මේක කලින් මේ පනතේ තිබුණු දෙයක්. මම අලුතින් ඇතුළත් කළ දෙයක් නොවෙයි. ඒ පනතේ තිබුණ දෙයක්. එවැනි අවස්ථාවකදී ඒ පුද්ගලයා ගැන සොයා බලා අමාත්‍යවරයාට අනුමැතිය දීමේ හැකියාවක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය තුළ ඒක මම ගත්තේ නැහැ. මම අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර තිබෙනවා. ඒ පුද්ගලයා පරිපාලනය සඳහා සුදුසු ද කියලා ඒ කමිටුව විසින් සොයලා බලලා තමයි අපි දෙන්නේ. අපි මේ නිර්ණායකයන් දැම්මොත් සමහර ක්‍රීඩාවලට ඇති වන ප්‍රශ්නය මෙකයි. ඒ කියන්නේ national games ගහලා තිබෙනවා නම්, රට වෙනුවෙන් තරග කරලා තිබෙනවා නම් සංගම්වල ප්‍රධාන තනතුරුවලට කට්ටිය එන්නේ නැති වෙනවා. එතකොට ඒ ක්‍රීඩාව නැති වෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
මම පිළිගන්නවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, එවැනි ප්‍රායෝගික ගැටලුවක් මත තමයි ඔය කොන්දේසිය ඇවිල්ලා තිබෙන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එතකොට දැන් අපි සුරාජ් දන්දෙනිය මහත්තයා ගනිමු. එතුමා ඉදිරිපත් වන්නේ handballවලට නොවෙයි නේ. එතුමා ඉදිරිපත් වන්නේ බැඩ්මින්ටන්වලට.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒකත් නිවැරදි කරන්න ඕනෑ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
විවාදයකට පැටලෙන්න එපා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ. මම ඒක නිවැරදි කරන්නම්. ඒ සියලු සංගම්වලිනුත් ඉල්ලීමක් කර තිබෙනවා. වෙනත් නාම යෝජනා නැහැ. එතුමාගේ නාම යෝජනාව පමණයි තිබෙන්නේ. ඉතින් මට දෙන්න වෙනත් කෙනෙක් නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා ඉදිරිපත් කරන්නේ අපූරු උත්තරයක් නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම හරියි කියලා කියන්නේ නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එක ටෙන්ඩර්කාරයෙක් ඉදිරිපත් වුණා වාගේ තමයි. CSN වාගේ තමයි. එක ටෙන්ඩර්කාරයෙක් ඉදිරිපත් වුණ එකක් නේ මේ කියන්නේ. සුරාජ් දන්දෙනිය මහත්තයා විතරයි ඉදිරිපත් වෙලා තිබෙන්නේ. එතකොට එතුමා ජාතික මට්ටමින් බැඩ්මින්ටන් ගහලාත් නැහැ. ඒක හරි. එතුමා ගෙදර බැඩ්මින්ටන් ගහලා තිබෙනවා ද කියලා මම දන්නේත් නැහැ. ඒක මට අදාළ නැහැ. එතුමාගේ මාමා තමයි ඩී.එස්. ද සිල්වා මහත්තයා. ඩී.එස්. ද සිල්වා මහත්තයා ගහන බැඩ්මින්ටන් ගැන මම දන්නේත් නැහැ. එතකොට මාමයි බෑණායි දෙන්නා දෙපැත්තට වෙලා බැඩ්මින්ටන් ගහනවාද කියලා මම දන්නේ නැහැ. ඒ ගහන බැඩ්මින්ටන්වලට රාජ්‍ය අනුග්‍රහය තිබෙනවා ද කියලා මම දන්නෙත් නැහැ. එහෙම නේ. නෝනායි, මාමායි, බෑණායි කට්ටිය බැඩ්මින්ටන් ගහන හැටි මට වැඩක් නැහැ. ඒ ගහපු එකත් සුදුසුකමක් හැටියට ඔබතුමා සැලකුවාද කියලා මම දන්නේත් නැහැ. [බාධා කිරීමක්] මාමලා, බෑණලා, නෝනලා ගහන බැඩ්මින්ටන් සුදුසුකමක් හැටියට හිතුවාද කියලා මම දන්නේ නැහැ. සුරාජ් දන්දෙනිය මහත්තයා ගැන දන්නවා. ඒකයි ප්‍රශ්නය තිබෙන්නේ. එතකොට ඔබතුමා කියනවා බැඩ්මින්ටන් නිලවරණයට ඉදිරිපත් වෙලා ඉන්නේ එක පුද්ගලයායි කියලා. ප්‍රශ්නය ඒ පුද්ගලයා කවුද කියන එකයි. ඒ පුද්ගලයා තමයි සුරාජ් දන්දෙනිය මහත්තයා. එතුමාට ඩී.එස්. ද සිල්වා මහත්තයාගේ තිබුණ ඥාති සම්බන්ධය, මාමා, බෑණාකම් අපට අදාළ නැහැ. ඒවා ඕනෑ නැහැ. ඒවා පැත්තකින් තියමු. රජ වාසලත් එක්ක තිබෙන සම්බන්ධයත් පැත්තකින් තියමු. සුරාජ් දන්දෙනිය මහත්තයා චෝදනාවකට ලක් වෙලා තිබෙනවා නේ.

ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයෙන් ලංකාවට ලැබුණ තත්ත්වය අනුව කටයුතු නොකිරීම පිළිබඳව එතුමා චෝදනාවකට ලක් වෙලා තිබෙනවා. පසු ගිය කාලයේ ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ වැඩිම ආන්දෝලනයට ලක් වුණු පුද්ගලයන් කිහිප දෙනා අතර එක් කෙනෙක් තමයි එතුමා. ඒකයි ප්‍රශ්නය. එතකොට එවැනි කෙනෙක් අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ නායකත්වයෙන් ඔබතුමා පත් කරන Selection Committee එක -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේ සභාවේ නැති කෙනෙකුට, මේ සභාවේ කථා කරන්න බැරි කෙනෙකුට ඒ දේ කියන එක අසාධාරණ නිසා මට එය නිවැරදි කරන්න අවස්ථාවක් දෙන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක මම පිළිගන්නවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ නිසා මට එය නිවැරදි කරන්න අවස්ථාවක් දෙන්න. ඔබතුමා කියන ඔය පුද්ගලයා හොරකමක් කළාය කියලා ක්‍රිකට් පාලක මණ්ඩලයෙන් හෝ ICC එකෙන් හෝ අපට කිසිම චෝදනාවක් එවා නැහැ.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
පොලීසියේ entry එකක් තිබෙනවා. ඒ ගැන පරීක්ෂණයක් කරලා නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිකට් පාලක මණ්ඩලයේ CDs දෙකක් නැතිවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වෙනවා. හැබැයි, ඒ World Cup තරගාවලිය ඉතාම හොඳට පවත්වා තිබෙනවා. ඒ වාගේම පිට්ටනි හදන එක වැනි සියලුම දේ රාජ්‍ය ආයතනවලටයි භාර දීලා තිබෙන්නේ. ඔහුට විරුද්ධව චෝදනාවක් හෝ පැමිණිල්ලක් එල්ල වෙලා තිබෙනවාය කියලා අපට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] මට තව තත්පරයක් දෙන්න. සුරාජ් දන්දෙනිය වාගේ ක්‍රීඩා නොකරපු තවත් විසි දෙදෙනෙකු එක් එක් සංගම්වල විවිධ තනතුරු සඳහා මෙවර අපට නාම යෝජනා දීලා තිබෙනවා. ඒ නිසා එක පුද්ගලයෙකුට මේ කරුණ සීමා කරන්න බැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඇත්තටම නාම යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ එක්කෙනෙක් විතරක් නම්, තවත් අයට ඉදිරිපත් වෙන්න කාලයක්

දෙන්න, යම් ක්‍රමයක්, අවස්ථාවක් හදන්න අපට බැරිද? අපට ඒ සඳහා අවස්ථාවක් නැද්ද? මේක තමයි තිබෙන ගැටලුව.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

මට පොඩි අවස්ථාවක් දෙන්න. විශේෂයෙන්ම එවැනි පුද්ගලයෙකුට මේ තනතුර දෙන්නේ නැතිව නැවත නාම යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාවක් හෝ ලබා දෙන්න. මොකද, ඔහුට සම්බන්ධ දේවල් අපි පසු ගිය කාලයේ දැක්කා නේ. ඒ මනුස්සයාට තවම චෝදනා තිබෙනවා. සමහර අයගේ චෝදනා ගැන පොලීසියෙන් පරීක්ෂණ කරන්නේ නැහැ. සමහර අය ගැන කමිටුවලින් පරීක්ෂණ කරන්නේ නැහැ.

දැන් අර "කන්ගැට්ටා" ගන්න. කටු ගෙය තුළ සිදු වූ හොරකමට එක පාරටම "කන්ගැට්ටා" අහු වුණා. ඒ වාගේ වංචාකාරයෝ නම් හොයා ගන්න පුළුවන්. නමුත් ක්‍රිකට් ආයතනයේ තිබුණු computer තබන desk දෙකක් උස්සා ගෙන යන්න පුළුවන් තත්ත්වයක් තිබුණා නම්, පරීක්ෂණයක් කරලා අද ඒ ගැන හොයා ගන්න පොලීසියට බැරි නම් පොලීසියේ තත්ත්වය මොකක්ද? එවැනි චෝදනා තිබෙන පුද්ගලයෙක් තමයි මේ. මා හෙට දීර්ඝව මේ ගැන කථා කරනවා. නමුත් මා නම් ඉල්ලා සිටින්නේ එවැනි අයට තනතුරු දෙන්න එපා කියලායි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බැඩ්මින්ටන් සංගමය ගත්තොත් මා දන්නා තරමට ඒ සංගමය පිට පිට අවුරුදු තුනක් අය වැයවත් ඉදිරිපත් කර නැහැ. ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ විගණන අංශයෙන් - audit එකෙන්- ඉල්ලපු දේවල්වලට බැඩ්මින්ටන් සංගමය උත්තර බැඳලා නැහැ. එවැනි තත්ත්වයක් දැන් තිබෙන්නේ. එවැනි තත්ත්වයක් තියෙද්දී, එවැනි ආයතන කඩා ගෙන වැටෙන මට්ටමට පත් වෙලා තියෙද්දී, පිට පිට අවුරුදු තුනක් අය වැය ඉදිරිපත් කරපු නැති සංගමයකට සුරාජ් දන්දෙනිය මහත්තයා වාගේ කෙනෙක් පත් වනවාය කිව්වාම ඒ සංගමයට දෙවියන්ගේම පිහිටයි. ඒ ගැන වෙන කියන්න දෙයක් නැහැ.

ගරු ඇමතිතුමනි, නිශාන්ත රණතුංග මහත්මයා ඉල්ලා අස් වුණා කියලා ඔබතුමා කිව්වා. අපි කවුරුත් දන්නවා, අපෙන් වත්කම් බැරකම් ප්‍රකාශ ගන්නවා කියලා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමතිවරු වත්කම් බැරකම් ප්‍රකාශ දෙන්න ඕනෑ නේ. වත්කම්, බැරකම් ප්‍රකාශ දෙන පුරවැසියන් විශාල පිරිසක් රටේ ඉන්නවා. මාර්තු 31 දිනට තිබෙන වත්කම් බැරකම් ප්‍රකාශ දෙන්න කිව්වාට පස්සේ ඒ අය කරන්නේ, මාර්තු 29වැනිදා විතර තමන්ගේ බැංකු accountsවල තිබෙන සල්ලි වෙන account එකකට දමන එකයි. ගරු ඇමතිතුමනි, එහෙම කරලා මාර්තු 31 දිනට වත්කම් බැරකම් පෙන්වනවා. ඒ වාගේ වැඩක් තමයි මේ මහත්මයාත් කරන්නේ. එහෙමනේ මේ කරන්නේ. ඇමතිතුමා කියනවා, ඒ මහත්මයා ඉල්ලා අස් වුණා කියලා. හැබැයි ඒ ඉවත් වුණ අයට ඕනෑ නම් ගිහිල්ලා පඩිය ගන්නත් පුළුවන්; වැඩ කරන්නත් පුළුවන්. [බාධා කිරීමක්] මා දන්නවා සනත් ජයසූරිය,- [බාධා කිරීමක්] ඒක තමයි ප්‍රශ්නය. මේ නියෝගයේ අඩුව ඒකයි. අඩු තරමින් ඔබතුමා මේ නියෝගයට තව වගන්තියක් ගෙනෙන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමනි, මා මේ බොහොම සාධනීය විධියටයි මේ කරුණු ඉදිරිපත් කරන්නේ. මේ නිලවරණවලට ඉදිරිපත් වන අය අඩු තරමින් අවුරුදු පහකට කලින්වත් තරගවලින් ඉවත් වන්න ඕනෑය කියලා ඔබතුමා මේ නියෝගයට වගන්තියක් ගෙනෙන්න. එතකොට අවුරුදු පහකට කලින් ඉවත් වුණු පුද්ගලයා දැන් තිබෙන ක්‍රියාවලියත් එක්ක සම්බන්ධයක් නැහැ. නිශාන්ත රණතුංග මහත්තයා වන්න පුළුවන්, සනත් ජයසූරිය මන්ත්‍රීතුමා වන්න පුළුවන්, ඒ ඕනෑ කෙනෙක් එන්නේ තව අවුරුදු පහකින් නම්, දැන් ඉන්න මිනිස්සුත් එක්ක බැඳීමක් නැහැ. මම හොඳම උදාහරණයක් කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තිලාන් සමරවීර කියන ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයා ක්‍රීඩාවෙන් ඉවත් වෙලා. දැන් මොහොතකට කලින් අපට ලැබුණු SMS පණිවුඩය ඒක. මේ ගරු සභාවේ ඉන්න අවස්ථාවේදීම අපට ලැබුණු පණිවුඩය තමයි ශ්‍රී ලංකා ටෙස්ට් ක්‍රිකට් කණ්ඩායමේ තිලාන් සමරවීර කියන ක්‍රීඩකයා, සියලු වර්ගයේ තරගවලින් ඉවත් වෙනවාය කියන පණිවුඩය. හේතුව මොකක්ද? තිලාන් සමරවීර ක්‍රීඩා කළේ නැහැ, one-day matchesවලට, T20 matchesවලට. ඔහු ක්‍රීඩා කළේ ටෙස්ට් තරගවලට විතරයි. ටෙස්ට් තරගවල දී ඔහු අසාර්ථක ක්‍රීඩකයෙක් නොවෙයි. ඔහුට තිබෙන එකම අවස්ථාව, එහෙම නැත්නම් තිලාන් සමරවීරගෙන් ලංකාවට ප්‍රයෝජනයක් ගන්න තිබෙන එකම අවස්ථාව තමයි ටෙස්ට් තරගවලට සහභාගි වීම. හැබැයි දැන් ඔහුට ඒ අවස්ථාවත් නැත්නම්, ඇත්තටම ඔහුට තිබෙන්නේ match බල බලා ඉන්නනේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, අපි නවක ක්‍රීඩකයන්ට අවස්ථාවක් ලබා දෙමින් යනවා. ඊළඟ තරගාවලි ජයග්‍රහණය කරන්න අපි නවක ක්‍රීඩකයන්ට යම් යම් අවස්ථා ලබා දෙන නිසා ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයන් එක්ක සාකච්ඡා කරලා මේ කටයුත්ත කරගෙන යනවා. යම් යම් තරගවලදී ඔවුන්ට ඉන්න අවස්ථාවක් දෙනවා. ඔවුන් අයින් කරලාම නැහැ. බංග්ලාදේශ තරගවලදී ඔහු කණ්ඩායමේ විසිදෙනා අතරත් හිටියා; තිස්දෙනා අතරත් හිටියා. නමුත් අවසාන පහළොස්දෙනා අතර හිටියේ නැහැ. හැබැයි එහෙම වුණාය කියලා ඔහු සම්පූර්ණයෙන් තරගවලින් අයින් කරලා නැහැ. අපි ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයන් එක්ක සාකච්ඡා කරලා කියා තිබෙනවා, යම් යම් අවස්ථා තරුණයන්ට දෙන්න කියලා. ඉතිහාසයේත් එහෙම වෙලා තිබෙනවා. හැබැයි ජ්‍යෙෂ්ඨයන් හිතා ගෙන ඉන්නවා ඔවුන්ට සෑම තරගයක්ම ලැබිය යුතුයි කියලා. ඔවුන් ක්‍රීඩා කරන්නේ තව පොඩි කාලයයි. ලෝක කුසලාන තරගාවලියෙන් අයින් කළා කියලා හෝ සෙල්ලම් කරන්න දුන්නේ නැහැ කියලා සනත් ජයසූරිය මහත්මයා අයින් වුණේ නැහැ. ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයන් එක්ක සාකච්ඡා කරලා මේ කටයුත්ත කර තිබෙනවා. අපි නවක ක්‍රීඩකයන්ටත් යම් අවස්ථාවක් දෙන්න ඕනෑ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ තර්කයේත් හරි පැත්තකුත් තිබෙනවා. නමුත් තිබෙන ගැටලුව මා කියන්නම්. පෞද්ගලිකව අපට සනත් ජයසූරිය මන්ත්‍රීතුමා එක්ක කිසිම ගැටලුවක් නැහැ. සනත් ජයසූරිය මන්ත්‍රීතුමා එකවර තීරණය කළාම, "මම අද ඉඳලා ක්‍රිකට් ගහන්නේ නැහැ, අද ඉඳලා මම Selection Committee එකට යනවා, අදත් මම ක්‍රිකට් ගහලා හෙට ඉඳලා Selection Committee එකට යනවා" කියලා මොකක්ද එන ගැටලුව? ඔහුත් එක්ක ක්‍රීඩා කරපු සමකාලීන අය තව ඉන්නවා. සනත් ජයසූරිය මහත්මයා තව අවුරුදු පහකින් ඇවිල්ලා මේ තනතුර භාර ගන්නවා නම් ඒක සුදුසුයි කියන එක ඉතාම පැහැදිලියි. ක්‍රීඩකයකු හැටියට හිටපු අර්ජුන රණතුංග මහත්මයා සුදුසුයි වාගේම ඒ ගැනත් අපට විවාදයක් නැහැ. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ මෙකයි. ඒ පත්වන නිලධාරියා සමඟ සමකාලීනව සෙල්ලම් කරපු, ඒ නිසා විවිධ ගැටලු ප්‍රශ්න මතු වුණු, පෞද්ගලික ප්‍රශ්න මතු වුණු අය ඉන්න පුළුවන්. එහෙම ඉන්න පුළුවන්නේ. ඔබතුමා ඒක

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

පිළිගන්නවානේ. එහෙම කෙනෙක් අදත් සෙල්ලම් කරලා එකවරම හෙට තේරීම් කමිටුවේ වාඩි වුණු ගමන් ඇති වන ගැටලුව මොකක්ද? අන්න එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ ප්‍රශ්නයට මේ නියෝගවලින් මොනවා හෝ සාධාරණයක් වෙන්න ඕනෑ. ඒ කියන්නේ, ඒ විධියට තනතුරු ගන්න බැරි වෙන්න ඕනෑ. ඒකයි මම කියන්නේ. මා දන්නේ නැහැ, තිලාන් සමරවීර ක්‍රීඩකයා ඒ තීරණය ගත්තේ ඒ නිසාද කියලා. නමුත්-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, මා මුලදීත් කිව්වා ලැබෙන මේ යෝජනා අරගෙන නැවත රෙගුලාසි සංශෝධනයක් කරනවා කියලා. අපි ඒ කාරණය සැලකිල්ලට ගන්නම්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

හොඳයි. තිලාන් සමරවීර ජොෂ්ඨ ක්‍රීඩකයකු හැටියට ඉවත් වුණා ද, නැත්නම් ටෙස්ට් ක්‍රිකට් විතරක් සෙල්ලම් කරපු කෙනකු හැටියට ටෙස්ට් ක්‍රිකට්වලටත් අවස්ථාවක් නැති වුණාට පස්සේ ඒ ක්‍රීඩාවේ වෙනත් බලාපොරොත්තුවක් නැති නිසා ඉවත් වුණාද කියන කාරණය මතු වෙනවා. ඔහුට තරග හම්බ වෙන්නේ නැත්නම් ඒ තිබුණු එකම අවස්ථාවත් නැති වුණාට පස්සේ ඔහුට තිබෙන්නේ එතැන බෝල දිහා බල බලා ඉන්න නොවෙයිනේ. අනෙක් අය සෙල්ලම් කරන match දිහා බල බලා ඉන්න නොවෙයිනේ. ඒ නිසා ඔහු තීරණය කරනවා අයින් වෙන්න. ඒක තමයි මෙතැන වෙලා තිබෙන්නේ. ඒක වෙන්න පුළුවන්. ඒක වෙන්න පුළුවන්කම තිබෙන්නේ, සෙල්ලම් කරන අයයි, සෙල්ලම් කරන අය තෝරන අයයි එකවර තේරී පත් වෙන්න ගියාමයි. සෙල්ලම් කරන අය තෝරන්නේත් සෙල්ලම් කර කර හිටපු අයමයි. එතැනයි මේ ගැටලුව. ඉතින් එවැනි තත්ත්වයක් ඇති කරන්න එපා. ඒක අසාධාරණයයි. එතැනදී නවකයන්ට තැන දෙන එක නොවෙයි වෙන්නේ, ඊට වඩා අර්බුද නිර්මාණය වන එක. ඒක වළක්වන්න බැහැ.

ඊළඟට, මෑත කාලයේ ලොකු ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා සල්ලි පිළිබඳව. ක්‍රීඩකයන්ට ලැබෙන දේවල් පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. දැන් මේ වරප්‍රසාද ක්‍රීඩකයන් ඉල්ලනවාය කියන ගැටලුවක් තමයි තිබෙන්නේ. ඒ වාගේම ඔබතුමන්ලාගේ පැත්තෙන් විවේචනයක් තිබෙනවා ඒවා ඉල්ලන එක අසාධාරණයි කියලා. ක්‍රීඩකයන්ට අනෙක් අයට වඩා වරප්‍රසාද ලැබෙනවා. අනෙක් අයට වඩා ගොඩක් දේවල් ලැබෙනවා කියන තර්කය තිබෙනවා. ඇත්තටම ක්‍රිකට් ක්‍රීඩකයන් මේ සල්ලි ඉල්ලන්න පටන් අරගෙන තිබෙන්නේ ඇයි? ඒ ගැටලුව ඉතාම පැහැදිලියි. ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන්ට දැන් හිතෙනවා වෙන්න පුළුවන්, අපි මේ අවුවේ කටට කාලා, දුක් විඳලා, මහන්සි වෙලා අපේ හැකියාවෙන් ක්‍රීඩා කරලා ලැබෙන මුදල්වලට මොකද වෙන්නේ කියලා. ඒවා ක්‍රිකට් ක්‍රීඩාවට යෙදවෙනවාද, නැත්නම් වෙන වෙන කානු පල්ලේ යනවාද කියලා හිතෙනවා ඇති. ඒක නිසා මේ සල්ලි අපි ඉල්ලන එක අසාධාරණ නැහැ කියලා හිතෙනවා ඇති. ඒක නේ මේ වෙලා තිබෙන්නේ.

මෑත කාලයේදී ක්‍රිකට් ක්‍රීඩාවට වෙච්ච හානිය ගැන බලනකොට ඒ ක්‍රීඩකයන් මහන්සි වෙලා උපයා දුන්නු මුදල් ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතියට යෙදුවා ද, එහෙම නැත්නම් කාට හරි තනතුරු, තාන්න මාන්න, වරප්‍රසාද, නිල නාම ලබා දෙන්න, තමන්ගේ කාලයේදී කරපු දේවල්ය කියා පෙන්වන්න කටයුතු කළ නිසා මේ හානිය වෙලා තිබෙනවාද කියා බලන්න ඕනෑ. ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය කිව්වේ නැහැ, ලංකාවේ ක්‍රිකට් තරග තියන්න නම් දඹුල්ලෙයි,පල්ලෙකැලේයි, බෙත්තාරාමයෙයි, හම්බන්තොට සූරියවැවයි මේ කියන හැම තැනකම grounds හදන්නය කියලා. මොකද, ලංකාව කියන්නේ ඉන්දියාව නොවෙයි; ලංකාව කියන්නේ ඕස්ට්‍රේලියාව නොවෙයි. ඕස්ට්‍රේලියාවේ විශාලත්වයයි, ඕස්ට්‍රේලියාවේ ක්‍රිකට් ක්‍රීඩාව පැතිරිලා තිබෙන විධියයි බලනකොට, ඉන්දියාවේ තිබෙන විශාලත්වය අනුව බලනකොට ඉන්දියාවේ ප්‍රාන්තයකට ක්‍රීඩා පිටියක් හදන එකයි ලංකාවේ ස්වභාවය අනුව ලංකාවේ ක්‍රීඩා පිටි හදන එකයි දෙකක්. පුද්ගලයාට අනුව නේ ඇඳුම මහන්න ඕනෑ. ඒ මිස ඇඳුමට ඕනෑ විධියට පුද්ගලයා හදලා හරියන්නේ නැහැ නේ. මේකත් හරියට ඒ වාගෙයි.

දැන් කරලා තිබෙන්නේ මොකක්ද? ඒ ලැබිච්ච මුදල් විනාශ කරලා, කාබාසිනියා කරලා, තමන්ගේ ප්‍රතිරූපය පුම්බා ගන්න ගිහිල්ලා අවසානයේදී නාස්තියක් තමයි වෙලා තිබෙන්නේ. ඒ නිසා දැන් ඒ ක්‍රීඩකයන්ට හිතෙනවා ඇති අපි උපයපු දේවල්, අපි ලබා ගත්තු දේවල් නැති කර ගන්නේ මොකටද කියා. ඒක නිසා තමයි ඒ අය ඒ මුදල් ඉල්ලන්නේ. මම ඉතා පැහැදිලිව කියන්නේ එහෙම ඉල්ලන්න හේතු වෙලා තිබෙන්නේ ක්‍රිකට් ක්‍රීඩාවට සිද්ධ කරපු විනාශය නිසාය කියන එකයි. ක්‍රිකට් ක්‍රීඩාව තුළින් ලැබිච්ච අවස්ථාව නැති කර ගත්තු එකයි, ඒක දේශපාලනීකරණය කිරීමයි තමයි මේකෙන් වෙලා තිබෙන්නේ. ඉතින් ඒක තවදුරටත් සිද්ධ වෙන්න තිබෙන ඉඩ කඩ මේ නියෝගවලින් වළක්වා නැහැ; මේ නියෝග සමත් වෙලා නැහැ. ඒක ගරු ඇමතිතුමාගේ දක්ෂකමකට හෝ අදක්ෂකමකට වඩා තවදුරටත් මේ නියෝග, ක්‍රීඩාවන් දේශපාලනීකරණය වීම වළක්වන්න තරම් ප්‍රබල වෙලා නැහැ. හැබැයි මම නැවතත් කියනවා, මම එහෙම කියන්නේත් මෙහි සාධනීය ලක්ෂණ තිබෙද්දි ඒවා හානි කර ගන්න එපාය කියන කාරණයත් ඉදිරිපත් කරමිනුයි කියලා.

ඊළඟට මම තවත් කරුණක් ගැන කියන්න ඕනෑ. අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා සමඟ පෞද්ගලිකවත් මම මේ ගැන සාකච්ඡා කළා. අපේ රටේ කාන්තා ක්‍රිකට් කණ්ඩායම ලබා ගත්තු ප්‍රගතිය අපි අගය කරන්න ඕනෑ. මොකද, 1988, 1989 සහ 1990 වසරවලදී ලංකාවේ ක්‍රිකට් කණ්ඩායම ගැන බැලුවොත්, ඔවුන් ලෝකයේ වෙනත් ක්‍රිකට් කණ්ඩායම් ඉදිරිපිට හිටපු තත්ත්වය ගැන බැලුවොත්, West Indies කණ්ඩායම සමඟ බැලුවොත් West Indies කණ්ඩායමේ ක්‍රීඩකයන් උසයි; ලංකාවේ අපේ අර්ජුන රණතුංග ඇතුළු ක්‍රීඩකයන්ගේ මිටියි. West Indies කණ්ඩායමේ ක්‍රීඩකයන්ගේ උසකමයි අපේ ක්‍රීඩකයන්ගේ මිටිකමයි විතරක් නොවෙයි තිබුණේ. හැකියාවන්, පහසුකම්, ඒ අයට තිබුණු අවස්ථාවන්, අපට තිබුණු ක්‍රිකට් තරග ප්‍රමාණය ආදී ඒ හැම දෙයක්ම ගැන බලනකොට මහා දැවැන්ත පරතරයක් තිබුණා. එවැනි පරතරයක් තිබියදී පවා අපේ ක්‍රිකට් කණ්ඩායම එදා දක්වපු දක්ෂතාවන් අපට අදත් මතක් වෙනවා. රෝයි ඩයස්, දූලීප් මෙන්ඩිස්, රොෂාන් මහානාම, අසංක ගුරුසිංහ, අර්ජුන රණතුංග, අරවින්ද ද සිල්වා වැනි ඒ හැමෝම දක්වපු මහා දැවැන්ත දක්ෂතාවන් නිසා අපට පුළුවන් වුණා, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ලෝකයේ යම් තැනකට ගෙනියන්න; අපේ ක්‍රිකට් ක්‍රීඩාවට ලෝකයේ යම් තැනකට එන්න. එදා අපේ කණ්ඩායම දිනන තරගවලට විතරක් "හෝයියා" කියා, පරදින තරගවලට අපි "හූ" කිව්වේ නැහැ. එදා අපි ප්‍රේක්ෂකයෝ. අපි බලාගෙන හිටපු අය. අපි නරඹන්නෝ. එදා සිදත් වෙත්තමුණි පළමුවැනි ද්විත්ව ශතකය ගහනකොට, ඉන්ද්‍රන් කුරුප්පු පළමුවැනි ද්විත්ව ශතකය ගහනකොට ඒ අය ඒ තරගය දිනුවාද පැරදුණාද කියන එක සොයන්න අපට වුවමනා වුණේ නැහැ. අපි ඒවාට අත්පුඩි ගැහුවා. එහෙම කරලා අපි ඒකෙන් යම් ජයග්‍රාහී හැඟීමක් ලැබුවා.

මම කියන්නේ ලංකාවේ අපේ කාන්තා ක්‍රිකට් කණ්ඩායමත් අපි අගය කළ යුත්තේ ඒ මතයේ ඉඳලාය කියන එකයි. මෑත කාලයේ ඔවුන්ගේ දක්ෂතා තුළින් ඔවුන් පෙන්වනවා, අනාගතයේ ලංකාවේ කාන්තා ක්‍රිකට් ක්ෂේත්‍රය දියුණු කරන්න පුළුවන්ය කියන කාරණය. ඒ විතරක් නොවෙයි. ලෝකය ඉදිරිපිට ලංකාවේ කාන්තා ක්‍රිකට් කණ්ඩායමට වැදගත් තැනකට එන්න පුළුවන්ය කියන කාරණය ඔවුන් පෙන්නුම් කරනවා. දැනට ඒ අය ලෝකයේ පස් වන තැනට ඇවිල්ලා තිබෙනවා. ඒ අයගේ පෞද්ගලික ජීවිත ගැන මාධ්‍යවල පළ වෙලා තිබෙනවා අපි දැක්කා. ඒ සමහර ක්‍රීඩිකාවන්ගේ නිවාසවල තත්ත්වය, ඒ අයගේ ආර්ථික පසුබිම, ඒ අයගේ ගෙවල්වල තත්ත්වය, ඒ අයගේ දෙමව්පියන්ගේ ආදායම් තත්ත්වය ගැන බැලුවොත් ක්‍රිකට් ක්‍රීඩාව කියන්නේ සුපිරි පන්තියට අයිති ක්‍රීඩාවක්ය කියන මට්ටමේ නොවෙයි ඒවා තිබිලා තිබෙන්නේ. ඔවුන්ගේ ධෛර්යය තමයි සුපිරි තත්ත්වයේ තිබිලා තිබෙන්නේ. ඔවුන්ගේ ධෛර්යය තමයි අංක එකට තිබුණේ. ඒක නිසා ඇත්තෙන්ම ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කර කාන්තා ක්‍රිකට් කණ්ඩායමට විශේෂ අනුග්‍රහයන් ලබා දෙන්න මැදිහත් වෙන්නය කියාත් මම ඉල්ලනවා.

ඒ විතරක් නොවෙයි. ක්‍රිකට් ක්‍රීඩකයින්ට තිබෙන තත්ත්වය ගැන මෙතුමන්ලා කොහොම දකිනවාද කියා අපට තේරෙන්නේ නැති වුණත්, අද ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන්ට තමන්ට සිද්ධ වන අසාධාරණයක් ගැන, තමන්ට සිද්ධ වන වැරැද්දක් ගැන කියන්න තැනක් නැහැ. මාධ්‍ය ඉදිරියට ඇවිත් අදහස් පළ කිරීමේ අයිතියක් ඔවුන්ට නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

අදහස් පළ කරන්න ඕනෑ තරම් අවස්ථාවන් තිබෙනවා. ක්‍රිකට් පාලක මණ්ඩලයට, අපි ළඟට එන්න ඕනෑ තරම් අවස්ථාවන් තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමා කියන එක නිවැරැදියි. ක්‍රිකට් පාලක මණ්ඩලය ඉදිරියට ඇවිත් අදහස් දක්වන්න, තේරීම් කමිටුව ඉදිරියට ඇවිත් අදහස් දක්වන්න, ඕනෑම ගැටලුවක් එතැනට ඇවිත් කියන්න තිබෙන ඉඩකඩ ස්වාධීන යථාර්ථයක් ඇතුළේ තිබෙන්න ඕනෑ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිකට් ක්‍රීඩකයන් දේශපාලනය ගැන කථා කරන්නයි, වේදිකාවල කථා කරන්නයි, වෙන දේවල් කථා කරන්නයි ගියොත් ඒ ගොල්ලෝ ක්‍රිකට් ගහන්නේ නැහැ. ක්‍රිකට් ක්‍රීඩකයින් ගිවිසුමක් අත්සන් කරනවා. ඒ අනුව ඒ අයට යම් යම් කොන්දේසි තිබෙනවා. පසු ගිය කාලයේ ක්‍රිකට් ක්‍රීඩකයෝ පරිපාලකයන් වෙන්න ගියා; තේරීම් කමිටුවේ සභාපති වෙන්න ගියා. ඒක තමයි විනාශය. ඒ අයට තිබෙන්නේ ක්‍රීඩා කරන්නයි. අපි ඒ අයට අවශ්‍ය සියලු පහසුකම් දෙනවා. අපි ඒ ගොල්ලන්ට ක්‍රීඩා කරන්න දෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

ඒක හරි. ප්‍රශ්නය මේකයි. එහෙම තිබෙන්නේ ඉහළත් නිර්දේශපාලනීකරණය වෙලා තිබෙන යථාර්ථයක් තුළයි. ක්‍රිකට් ක්‍රීඩාවේ වෙන්න පුළුවන්, වෙන ඕනෑම ක්‍රීඩාවක වෙන්න පුළුවන්, ඉහළ මට්ටමේ සිට දේශපාලනීකරණයක් නැත්නම් ඔබතුමා කියන එක නිවැරැදියි; ඔබතුමා කියන කාරණාවේ කිසි ගැටලුවක් නැහැ. එතකොට එතැන දේශපාලනය නැහැ නේ. එතැන තිබෙන්නේ ක්‍රීඩාව විතරයි. අද දේශපාලනයයි, ක්‍රීඩාවයි එකට බද්ධ වෙලායි තිබෙන්නේ. දැන් මේ ක්‍රීඩකයන් අසරණ වෙලා ඉන්නේ ක්‍රීඩාව විතරක් තිබෙන තැනක නොවෙයි; ක්‍රීඩාව සමඟ දේශපාලනය තිබෙන නිසායි. ඒ විතරක් නොවෙයි. එහි ප්‍රතිඵලයක් හැටියට ක්‍රීඩකයන්ටත් දේශපාලන පළි ගැනීම් කරන නිසාත් අද ක්‍රීඩකයන් අසරණ වෙලා ඉන්නවා. අන්න එම නිසා තමයි මෙම අසාධාරණ තත්ත්වය වෙනස් වන්න ඉඩක් හැදෙන්න ඕනෑකම තිබෙන්නේ. මා දන්නේ නැහැ, එයට හඳන ව්‍යූහය මොකක්ද කියලා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

මෑත කාලයේ ක්‍රීඩකයින්ට කිසිදු අසාධාරණයක් සිද්ධ වෙලා නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

මා දැන් මොහොතකට කලිනුත් කිව්වේ, අපි හිතමු, හෙට ඔබතුමන්ලා තිලාන් සමරවීර Selection Committee එක ඉදිරියට ගෙන්වනවා කියලා. එහිදී ඔබතුමන්ලාට තිලාන් සමරවීරගෙන් අහන්න පුළුවන්, "ඔයා සියලුම ක්‍රීඩාවන්ගෙන් අයින් වෙන්න යන්නේ මොකද? ඔයා retire වන්නේ මොකද? ඔයාට matches කිහිපයක් ලැබුණේ නැති නිසාද?" යනාදී වශයෙන් මොනවා හෝ දේවල්. හැබැයි ඒ ගැන රට දන්නේ නැහැ නේ. එතුමාට ඒ ගැන රටට කියන්නත් බැහැ. එකම දෙයයි කියන්න තිබෙන්නේ. "මම අයින් වුණා"යි කියන එක විතරයි කියන්න තිබෙන්නේ. එවැනි අවස්ථා ඕනෑ තරම් ඇති වෙනවා. පසු ගිය කාලයේ රගර් ක්‍රීඩකයන් මිය ගියා. ඒ ප්‍රවෘත්තිය විතරයි ප්‍රචාරය වන්නේ. හැබැයි එය ඇතුළේ දේශපාලන ක්‍රියාවලි ඕනෑ තරම් තිබෙනවා. ඒකයි තිබෙන ප්‍රශ්නය.

බැඩ්මින්ටන් නොගහන සුරාජ් දන්දෙනිය ජාතික බැඩ්මින්ටන් සංගමයේ සභාපති වශයෙන් පත් කර ගන්න හේතුවක් ඔබතුමාට තිබෙනවා. ඔබතුමාට කියන්න පුළුවන්, "එම තනතුර සඳහා ඉල්ලුවේ එක් කෙනායි" කියලා. එපමණයි. හැබැයි ඒක නොවෙයි, රටේ තිබෙන තත්ත්වය. සුරාජ් දන්දෙනිය එයට සම්බන්ධ වුණු විධිය, පරිහරණය කරපු විධිය සම්බන්ධයෙන් ගැටලු තිබෙනවා. එම නිසා ක්‍රීඩාවේ උන්නතිය සඳහා මා කියන්නේ, ක්‍රීඩකයින්ගේ ඉල්ලීම්, ඔවුන්ගේ දුක්ගැනවිලි මීට වඩා පැහැදිලිව පෙනෙන විනිවිදභාවයක් සහිතව ඉදිරිපත් කරන්න තැනක් හැදෙන්න ඕනෑය කියලායි. එවැනි ව්‍යූහයක් නිර්මාණය වන්න ඕනෑ. අපට පෙනෙන්නේ නැහැ, එම කාරණය මෙම නියෝග තුළ බැහැරුම් විධියට සලකා තිබෙනවාය කියලා.

විශේෂයෙන්ම නැවතත් මා අවධාරණය කරනවා, ප්‍රශ්නය තිබෙන්නේ දේශපාලකයින් ක්‍රීඩාවට එන එක නොවෙයි; දේශපාලනය ක්‍රීඩාවට එන එකයි කියලා. අන්න ඒ තත්ත්වය වළක්වන්න. ඒ විතරක් නොවෙයි. ක්‍රීඩකයින්ගේ ආත්මාභිමානය, ඔවුන්ගේ ගෞරවය, ඔවුන්ගේ ආත්ම ගෞරවය සහිතව ක්‍රීඩාව කරන්න ඉඩකඩ හදන්න අවශ්‍ය පසු බිම මෙම නියෝග තුළට ගෙනෙන්න ඔබතුමාට පුළුවන්කම තිබුණා. හැබැයි එය ප්‍රවේශමෙන් කරන්න ඕනෑ. මොකද, අපි දන්නවා, අපේ රටේ ක්‍රීඩා ඇමතිතුමන්ලාට සිදු වුණු අභාවාවක අත් දැකීම් තිබෙන බව. අපේ ගරු සී.බී. රත්නායක ඇමතිතුමා ක්‍රීඩාවේ ක්‍රීඩාවක් කළා. එතුමා ක්‍රීඩාව ඇතුළේ ක්‍රීඩාවක් කරන්න උත්සාහ කළා. හැබැයි ඒකෙන් එතුමා පරාජය වුණා. ඒක අපි කවුරුත් පිළිගන්නවා. එතුමා විශාල කාර්ය භාරයක් කරන්න පුළුවන් ගරු ඇමතිතුමෙක්.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අද එතුමා පෞද්ගලික බස් සේවයේ තිබෙන ගැටලු විසඳමින්, ගැමුණු විජේරත්න මහත්මයාත් එක්ක රණ්ඩු අල්ලමින් ඉන්නවා. එතුමා ඒ තැනට පත් වුණා. එවැනි අභාවාවක තත්ත්වයක් ඔබතුමාට ඇති නොවේවායි කියන ප්‍රාර්ථනාවත් සහිතව තමයි අද අප මේ කථා කරන්නේ. ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාට වාගේ මාධ්‍ය සාකච්ඡා තියන්න හෝ ගරු සී.බී. රත්නායක ඇමතිතුමාට අත් වුණු ඉරණම හෝ අත් නොවී ක්‍රීඩාව යම් කිසි දියුණු තැනකට ගේන්න, මේ නියෝගත් සමඟ තවත් නියෝග ඇති කර ගන්න ඔබතුමාට හැකි වේවායි කියා අප ප්‍රාර්ථනා කරනවා. අපේ අස්වර් මන්ත්‍රීතුමා නිතර කියනවා නේ, නීති කඩන්න බැරි වුණාට නීති නවන්න පුළුවන් කියලා. ඒ වාගේ නීති කඩනවා වෙනුවට නීති නවලා හරි මේ දේවල් කරන්න ඕනෑ. මම කියන්නේ ඒකට මේක හදන්න ඕනෑය කියලා. මේ ව්‍යුහය ශක්තිමත් කර ගන්න ඕනෑ.

ක්‍රිකට් නිලවරණය ළඟදි පැවැත්වෙනවා. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා සමීපයේ ඉන්න අපේ නිලංග සුමතිපාල මන්ත්‍රීතුමාත් එයට ඉදිරිපත් වෙනවා. අවසානයේ අපේ ප්‍රාර්ථනාව ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතියයි. ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් මේ ඉදිරිපත් කර තිබෙන නියෝගත්, තවත් දේවලුත් එකතු කර ගන්න ඔබතුමන්ලාට හැකි වෙනවා නම් අප හිතනවා එය අපේ රටේ ජයග්‍රහණයක් කියලා. ක්‍රීඩාවේ ජයග්‍රහණය ලබන්න නම් විශේෂයෙන්ම මේ තිබෙන පසුබිම, මේ පරිසරය වෙනස් වෙන්න ඕනෑ. මේ පරිසරය වෙනස් කරන්න හැකියාවක් හදා ගන්න ඕනෑ. අන්න ඒ තත්ත්වය ඇති කර ගන්න පුළුවන්කම ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි. මීළඟට ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා.

[අ.භා. 4.41]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව වචන කීපයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග යටතේ කථා කරන මේ අවස්ථාවේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා දිගටම කථා කළේ ක්‍රීඩාව දේශපාලනීකරණය වීම ගැනයි. එතුමා රගර් ක්‍රීඩාව ගැන කථා කළා. ගරු මන්ත්‍රීතුමනි, රගර් ක්‍රීඩාවේදී ගහ ගත්තේ අද විතරක් නොවෙයි. තමුන්නාන්සේලාගේ බලාපොරොත්තුව, කල්පනාව තිබෙන්නේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා රගර් ගහන කොට, එහෙම නැත්නම් යෝෂිත රාජපක්ෂ මහත්මා රගර් ගහන කොට ඒ දේශපාලන හයිය තිබෙන නිසා උණුසුම් වෙලා රගර් ක්‍රීඩකයන් අතර ප්‍රශ්න ඇති වෙනවාය, ප්‍රේක්ෂකයන් අතර ප්‍රශ්න ඇති වෙනවාය කියලා. හැබැයි නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා රගර් ගහන්න ඉස්සරත්, යෝෂිත රාජපක්ෂ මහත්මයා රගර් ගහන්න ඉස්සරත් රගර් තරගවලදී ඕනෑ තරම් උණුසුම් තත්ත්වයන් නිර්මාණය වෙලා තිබෙනවා. ප්‍රේක්ෂකයන් අතර ඕනෑ තරම් ඇන කොටා ගැනිලි, ගහ ගැනිලි, ක්‍රීඩකයන් අතර ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා යම් දේශපාලන වාසියක් ලබා ගැනීම සඳහා එවැනි චෝදනා කිරීම අප මේ වෙලාවේ ප්‍රතික්ෂේප කරනවා.

සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා අසූව දශකයේ ඔබතුමන්ලා ක්‍රිකට් දිහා බලබලා හිටියාය කියලා. අප නම් දැක්කේ අසූව දශකයේ ජනතා විමුක්ති පෙරමුණ ක්‍රිකට් ගහන දිහා බලබලා හිටපු ආකාරයක් නොවෙයි. ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමේ සටනකයි යෙදී සිටියේ. ඒ බවත් අප විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. හැබැයි අප එක කාරණයක් කියන්න ඕනෑ. ක්‍රීඩාවට විතරක් නොවෙයි, හැම දේකටම දේශපාලන නායකත්වය අවශ්‍යයි. පසු ගිය දිනවල ඇති වුණු ක්‍රිකට් ගිවිසුම්ගත වීමේ ප්‍රශ්නත් එක්ක මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ක්‍රීඩා අමාත්‍යාවරයා හැටියට ගත්ත නිසි තීන්දු, තීරණ විශේෂයෙන්ම මේ රටේ සියලුම දෙනා අගය කළා. ඒ වෙලාවේ ගත යුතු තීන්දුව එයයි කියලා ජනමාධ්‍යවේදීන් පවා ඒවා අනුමත කළා.

අප කවුරුත් දන්නවා අද අපේ රටේ ක්‍රියාත්මක වන්නේ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් බව. දරුවෙක් පාසලට ඇවිත් ඉගෙන ගෙන, විශ්වවිද්‍යාලයට ගිහින් උපාධිධාරියෙක් වෙලා සමාජයට, රටට සේවය කරන්න ආවාට පස්සේ ඔහුට යුතුකමක් තිබෙනවා තමන්ව ඒ තත්ත්වයට ගෙනාපු සියලු දෙනා වෙනුවෙන් යම් කිසි කාර්ය භාරයක් ඉටු කරන්න. ඒ වාගේම ජාතික මට්ටමට, ජාතික සංචිතයට, ජාතික ක්‍රීඩා කණ්ඩායමකට -ක්‍රිකට් වේවා, වොලිබෝල් වේවා, ඕනෑම ක්‍රීඩාවක් වේවා- ඒ තත්ත්වයට ඔහු නිකම්ම එන්නේ නැහැ. පාසල් කාලයේදී ගුරුවරු ඔහු පුහුණු කරනවා. ඒ වෙනුවෙන් රජය, මේ රටේ ජාතික ආර්ථිකය යම් කැප කිරීමක් කර තිබෙනවා. ඒ නිසා රටක ජාතික මට්ටමේ ක්‍රීඩා කණ්ඩායමකට තේරී පත් වෙන ඕනෑම ක්‍රීඩකයෙක්, ක්‍රීඩිකාවක් තමන්ගේ මුදලම පිටිපස්සේ යන්නේ නැතිව තමන්ගේ යුතුකම් සහ වගකීම් කොටසකුත් රට වෙනුවෙන් ඉටු කළ යුතුව තිබෙනවා. සියලුම ක්‍රීඩකයන් ඒ පිළිබඳවත් කල්පනා කරන එක හොඳයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු එක දෙයක් සම්බන්ධයෙන් මම ඔබතුමා සමඟ එකඟ වෙනවා. ඔබතුමා අපේ කාන්තා ක්‍රිකට් කණ්ඩායම පිළිබඳව කිව්වා. අද අප සතුටු වෙනවා, අපේ පිරිමි ක්‍රිකට් කණ්ඩායම වාගේම කාන්තා ක්‍රිකට් කණ්ඩායමත් හුඟක් ඉදිරියට ඇවිත් තිබීම ගැන. පසු ගිය දා පැවැති කාන්තා ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී පස් වන ස්ථානයට එන්න ඔවුන්ට හැකියාව ලැබුණා. අපේ කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන ක්‍රීඩිකාවනුත් එම කණ්ඩායමේ ඉන්නවා.

අපි පෞද්ගලිකව දන්නවා, විවිධ ආර්ථික අපහසුතා මධ්‍යයේ අද කාන්තා ක්‍රිකට් කණ්ඩායම හොඳ ගමනක් යන බව. එම නිසා ගරු ක්‍රීඩා අමාත්‍යාවරයාගේත්, ක්‍රීඩා අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ගේත් අවධානය යොමු වෙලා කාන්තා ක්‍රිකට් කණ්ඩායමත් අපේ පිරිමි ක්‍රිකට් කණ්ඩායමේ තත්ත්වයටම ගෙන එන්න සහ ඊට වඩා ඉදිරියට ගෙන යන්න අවශ්‍ය දිරිය, ශක්තිය ලබා දෙන්න ඕනෑ කියන කාරණයේදී අපි සියලුම දෙනා අත් දෙකම උස්සනවා කියලා මේ වෙලාවේදී මතක් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මේ රට ත්‍රස්තවාදයෙන් නිදහස් කර ගත්තාට පසුව යාපනයේ, එහෙම නැත්නම් රට පුරා ඕනෑම තැනක ක්‍රීඩා කරන්න නිදහස, අවස්ථාව, අයිතිය අද ලබා දීලා තිබෙනවා. අපි අපේ රටේ අධ්‍යාපනයට අවධානය යොමු කරනවා වාගේම, අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයට අවධානය යොමු කරනවා වාගේම අපි අනිවාර්යයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයටත් අවධානය යොමු කරලා අපේ විෂය භාර අමාත්‍යතුමා බලාපොරොත්තු වන, ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වන ක්‍රීඩා සංස්කෘතිය නිර්මාණය කරලා රටේ හැම පුරවැසියෙකුම ක්‍රීඩාවත් සමඟ ඉන්න පුද්ගලයෙක් බවට

පරිවර්තනය කිරීම සඳහා අපි ගමනක් යා යුතුව තිබෙනවා. එක පැත්තකින් ජාත්‍යන්තර වශයෙන් කීර්තිය අත් පත් කර ගන්න අපේ රට සාක් තරගාවලිය දිනන්න ඕනෑ; ආසියානු තරගාවලිය දිනන්න ඕනෑ; පොදු රාජ්‍ය මණ්ඩලීය තරගාවලි දිනන්න ඕනෑ; ලෝක කුසලන වාගේම ඔලිම්පික් තරගවලට සහභාගි වෙන්න ඕනෑ; අපි පදක්කම් දිනා ගන්න ඕනෑ. ඒක එක පැත්තක් විතරයි. නමුත් ඒ තත්ත්වයට, පදක්කම් දිනා ගෙන ජාත්‍යන්තර වශයෙන් අපේ රටට කීර්තියක් අත් කරලා දෙන්න යන ගමනට අමතරව තවත් කාරණා තිබෙනවා. අපි දන්නවා, අපේ රටේ ජාතික ආර්ථිකයට විශාල බාධාවක් වන බෝ නොවන රෝගවලින් ජනතාව බේරා ගැනීම සඳහා සියලු දෙනාගේම ශාරීරික යෝග්‍යතාව ඇති කිරීම නැත්නම් විවිධ ශාරීරික ක්‍රියාකාරකම්වලට යොමු කිරීමේ කාර්ය භාරය අද අපේ ක්‍රීඩා අමාත්‍යාංශයට, අධ්‍යාපන අමාත්‍යාංශයට, වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරී තිබෙන වග කීමක් බව. එම නිසා, විශේෂයෙන්ම පුද්ගලයකුට, පවුලකට ඒ වාගේම රටකට මේ සෞඛ්‍ය සම්පන්න භාවය ඉතා වැදගත් වෙනවා ආර්ථිකය පැත්තෙන් ගත්තාම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම විශේෂයෙන් මේ වෙලාවේ අගය කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. මේ වන විට අපේ රට තුළ, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ වාගේම වැදගත් තීන්දු තීරණ ගන්න අමාත්‍ය මණ්ඩලය ඇතුළු සියලු තැන්වල සාකච්ඡා කරමින් තිබෙන ඉතාම වැදගත් අවස්ථාවන් තුනකට අපි මුහුණ දෙනවා. එකක් තමයි ජාතික තරුණ ප්‍රතිපත්තිය. අපේ රටට මෙතෙක් තිබුණේ නැති ජාතික තරුණ ප්‍රතිපත්තියක් හදන්න අද ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා මැදිහත් වෙලා අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව කටයුතු කර ගෙන යනවා. ඒ වාගේම අද අපට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙන කාරණයක් තිබෙනවා. අපේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන්, අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් විශේෂඥයින් අද තිබෙන අධ්‍යාපන ක්‍රමය තුළින් බිහි වෙන්නේ නැහැ. ඒ නිසා නව අධ්‍යාපන පනතක් ගෙන ඒම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් මේ වන විට නිර්මාණය වෙලා, ඉදිරියේදී ඒ කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට නියමිතව තිබෙනවා. ඒ වාගේම ඉතාම වැදගත් කාරණය මෙයයි.

විශේෂයෙන් මම ක්‍රීඩා ක්ෂේත්‍රයේ හිටපු කෙනෙක් හැටියට බොහොම පැහැදිලිව මේ පිළිබඳව දන්නවා. මෙතෙක් ඉතිහාසයේ සිටි ක්‍රීඩා අමාත්‍යවරුන් මේ සඳහා යම් යම් උත්සාහයන් දැරුවා වාගේම ක්‍රීඩා ක්ෂේත්‍රයට උර දෙන, කර දෙන නිලධාරීන් විශාල වශයෙන් ඇප වුණා, කැප වුණා අපේ රට තුළ යම් ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කරන්නට. නමුත් ඒ අවස්ථාව උදා වුණේ නැහැ. වර්තමාන ක්‍රීඩා අමාත්‍යවරයාගේ නායකත්වය තුළ අද ක්‍රීඩා ප්‍රතිපත්තියක් හඳුන්වලා දෙන්නට හැකියාව ලැබිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා පාසල් ක්‍රීඩා එක පැත්තක, ඒ වාගේම ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා තව පැත්තක, පාසල් ක්‍රීඩා සංගම් වෙනම, ජාතික ක්‍රීඩා සංගම් වෙනම, ඒ වාගේම මහවැලි ක්‍රීඩා වෙනම, ජාතික ශිෂ්‍ය බට බලකායෙන් කරන ක්‍රීඩා වෙනම, ජාතික යෞවන ක්‍රීඩා උළෙල වෙනම. මේවායේ නිසි සම්බන්ධීකරණයක් තිබුණේ නැහැ. දැන් මේවා ඉතාම හොඳ තැනකට ගෙනැල්ලා තිබෙනවා.

2012 පළමුවෙනි මාසයේ 22 වෙනි දා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් වුණා. ඒක ඉතාම වැදගත්. මේ රටේ අධ්‍යාපන අමාත්‍යවරයා, උසස් අධ්‍යාපන අමාත්‍යවරයා සහ ක්‍රීඩා අමාත්‍යවරයා යන තුන් දෙනාම එකතු වෙලායි මේ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබෙන්නේ. අපි සතුටු වනවා, අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් අමාත්‍ය මණ්ඩලය ඒකට අනුමැතිය ලබා දීලා තිබෙනවා. මීට පෙර එන්න තිබුණු තැනකට, එන්න නියමිතව තිබූ තැනකට අපේ රට ගෙන ඒමට අපි මේ වන විට කටයුතු කරලා තිබෙනවා. මේ තත්ත්වයත් එක්ක අපි විශ්වාස කරනවා ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපට දිගු ගමනක් යන්නට හැකියාව ලැබෙනවා කියලා.

ඒ වාගේම අපි කවුරුත් දන්නවා, ක්‍රීඩාව දියුණු කරන්න නම් අනිවාර්යයෙන්ම පාසල් ක්‍රීඩාව පිළිබඳව අවධානය යොමු කරන්නට ඕනෑ කියන කාරණය. විද්‍යාගාරයකින් පරීක්ෂණයක් කරලා යම් දෙයක් පිළිබඳව යම් නිගමනයකට එනවා වාගේ පාසල් ක්‍රීඩා පිටිය තමයි ක්‍රීඩකයෙක් බිහි කරන විද්‍යාගාරය වෙන්නේ.

පාසල් ක්‍රීඩාව නැංවීම සඳහා විශේෂ වැඩ පිළිවෙළවල් යොදනවා වාගේම මේ කාරණය කෙරෙහිත් අපේ අවධානය යොමු කරන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් ක්ෂේත්‍රයේ ප්‍රාථමික අංශයේ දරුවන් ක්‍රීඩා කරන්නේ සියයට 5කටත් අඩු ප්‍රමාණයක් වීම අද කනගාටුවට කාරණයක්. මෙය ද්විතියික අංශයට යනකොට සියයට 3කටත් වඩා අඩු මට්ටමකට එනවා. උසස් අධ්‍යාපන තත්ත්වයට එනකොට මෙය සියයට 2කටත් වඩා අඩු මට්ටමකට එනවා. මේක ඉතාම නරක තත්ත්වයක්. ලෝකයේ දියුණු බොහෝ රටවල මේ ප්‍රතිශතය සියයට 50කට උඩිනුයි තිබෙන්නේ. එම නිසා මේ පිළිබඳව දෙමවුපියන්ගේ අවධානය යොමු කරන්නට ඕනෑ. දරුවන් පොතපතටම හිර කර, ඔවුන් තරගකාරී අධ්‍යාපනය තුළම කොටු කර ගෙන ඉන්නේ නැතිව ශාරීරික ක්‍රියාකාරකම්වලටත් යොමු කළ යුතු වෙනවා. එහෙම නැති වුණොත් විශාල ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිදු වෙනවා. හැබැයි, අපට එක ප්‍රශ්නයක් තිබෙනවා. පාසල්වල ක්‍රීඩාව නැංවීමට නම් අනිවාර්යයෙන්ම ශාරීරික අධ්‍යාපන උපදේශකවරුන් ඉන්න ඕනෑ. අද අප කවුරුත් පිළිගන්නවා ශාරීරික අධ්‍යාපන උපදේශකවරුන්ගේ -ක්‍රීඩා ගුරුවරුන්ගේ- ලොකු නිහයක් තිබෙනවාය කියා. මේ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාත් එක්ක අප සාකච්ඡා කළ අවස්ථාවේදී එතුමාත් මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කර අලුත් වැඩ පිළිවෙළවල් කිහිපයකට එන්නට අධ්‍යාපන අමාත්‍යතුමාටත්, සෞඛ්‍ය අමාත්‍යතුමාටත් උපදෙස් දී තිබීම ඉතාම වැදගත්.

පසු ගිය කාලය තුළදී ඉතාම අවාසනාවන්ත සිද්ධීන් ගණනාවක් වුණා.පාසල් නිවාසාන්තර ක්‍රීඩා තරගවලට සහභාගි වුණු දරු දැරියෝ තුන් දෙනෙක් ඒ තරගවලට සහභාගි වෙමින් සිටියදී ජීවිතක්ෂයට පත් වුණා. මේකට විශේෂ හේතුවක් තිබෙනවා. බොහෝ පාසල්වල ක්‍රීඩා පිළිබඳ හොඳ දැනුමක් තිබෙන පුහුණුකරුවෙක්, එසේත් නැත්නම් ශාරීරික අධ්‍යාපන උපදේශකවරයෙක් නැහැ. සමහර ළමයින් ඇඟ උණුසුම් කරන්නේ කොයි ආකාරයෙන් ද කියාවත් දන්නේ නැහැ. නිවාසාන්තර ක්‍රීඩා තරග පැවැත්වෙන කොට කවදාවත් මීටර් 1,500ක් දුවලා නැති දරුවකුට කියනවා, "කොහොම හරි ගිහින් අපේ නිවාසය වෙනුවෙන් මීටර් 1,500 දුවන්න" කියා. ඒ ළමයා කළිසම නවා ගෙන මීටර් 1,500 දුවන්නට යනවා. ශාරීරික ක්‍රියාකාරකම් සිදු වන්නේ කොහොමද, පේශීන්ගේ ක්‍රියාකාරිත්වය සිදු වන්නේ කොහොමද කියා කිසිම අවබෝධයක් නැතිව ඒ දරුවා දුවන්න ගිය අවස්ථාවේදී සිදු වූ අවාසනාවන්ත ඉරණම අප දැක්කා. ඒ වාගේම කවදාවත් මීටර් 5,000ක් දුවලා නැති දරුවෙකුට කියනවා, "මැරතන් තරගයට ඉදිරිපත් වෙන්න, අපේ නිවාසයට ලකුණක් අහිමි වෙනවා, මැරතන් තරගයට අනිවාර්යයෙන්ම ඉදිරිපත් වෙන්න" කියා. මූලික පුහුණුවක් ලබා නැති දරුවෝ ඒවාට ඉදිරිපත් කරන්නට යාම තුළ මෙවැනි අවාසනාවන්ත සිද්ධීන් වාර්තා වුණා වාගේම විවිධ රෝගාබාධවලට ලක් වුණු දරුවන් ගැනත් අපට අහන්නට ලැබුණා. එම නිසා පාසල්වල ශාරීරික අධ්‍යාපනය පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්නට සිදු වෙලා තිබෙනවා.

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

මේ පිළිබඳව තවදුරටත් කථා කරද්දී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ පාසල්වල සාමාන්‍යයෙන් ප්‍රාථමික අංශයේ, කණිෂ්ඨ අංශයේ දරුවන්ට නිවැරදිව ඉඳ ගන්නා අකාරය, නිවැරදිව ගමන් කරන ආකාරය, නිවැරදිව ඉරියව් පවත්වන ආකාරය පිළිබඳව කියා දෙන්න පවා ශාරීරික අධ්‍යාපනය පිළිබඳව දැනුමක් තිබෙන ගුරුවරුන් නැති අවස්ථා අප දකිනවා.

එම නිසා මේවා පිළිබඳව ගරු ජනාධිපතිතුමා විශේෂ අවධානය යොමු කර, විද්‍යා පීඨවලින් හෝ වෙනත් ආකාරයට හෝ ක්‍රීඩා ගුරුවරුන් බඳවා ගන්නවා වාගේම විශේෂිත ආකාරයට ක්‍රීඩා ගුරුවරුන් 250ක් අපේ රටේ අධ්‍යාපන පද්ධතියට බඳවා ගන්න විශේෂ තීන්දුවක් අර ගෙන තිබෙනවා. ඒ පිළිබඳව අප අතිගරු ජනාධිපතිතුමාටත්, ක්‍රීඩා අමාත්‍යතුමාටත්, අධ්‍යාපන අමාත්‍යතුමාටත් අපගේ ගෞරවය සහ ස්තුතිය පළ කරන්නට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප අද ඕනෑම දෙයක් සැලසුම් කරද්දී අපේ ආර්ථිකය පිළිබඳවත් සැලකිල්ලට ගන්නට ඕනෑ. අපි සංචාරක ව්‍යාපාරය ගැන සැලසුම් කරද්දී අපේ ආර්ථිකය පිළිබඳව සැලකිල්ලට ගන්නවා. ක්‍රීඩා ආර්ථිකයක් පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා මහින්ද චින්තනය තුළ බොහොම පැහැදිලිව කිව්වා. ක්‍රීඩාව තුළින් අපට ලොකු ආර්ථික ශක්තියක් ලබා ගන්නට පුළුවන්කම ලැබෙනවා. ඒකට අවශ්‍ය ජාත්‍යන්තර ක්‍රීඩාංගණ ටික අපේ රට තුළ නිර්මාණය වෙමින් පවතිනවා. හොඳම උදාහරණයක් තමයි හම්බන්තොට. හම්බන්තොට එක පැත්තකින් වරාය නිර්මාණය වෙලා. ඒකේ වැඩ කටයුතු ආරම්භ වන කොට හම්බන්තොට ප්‍රදේශයට අවශ්‍යව තිබුණු ජාත්‍යන්තර ක්‍රීඩාංගණයත් අද මේ වන කොට ඉදි වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ ප්‍රදේශයට අවශ්‍ය වෙලා තිබෙන ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදි වෙලා තිබෙනවා. මේ විධියට ගත්තාම ඒ ප්‍රදේශයේ ආර්ථික වශයෙන් පුළුල් දියුණුවක්, සංවර්ධනයක් ඇති කරන්නට විශේෂයෙන්ම හැකියාව ලැබී තිබෙනවා. දකුණේ තිබෙන ක්‍රීඩා සංවර්ධනයම උතුරේ කිලිනොච්චි ප්‍රදේශයේත් ඇති කරන්නට, ඒ මට්ටමට ගෙන එන්නට ජාත්‍යන්තර ක්‍රීඩාංගණ ඉදි කරමින් අවශ්‍ය කටයුතු කරන බව මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. මේ අනුව ක්‍රීඩාව තුළින් අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්නට පුළුවන් ආකාරයට වැඩ පිළිවෙළ නිර්මාණය වෙලා තිබෙනවා.

ඒ වාගේම යටිතල පහසුකම් ලබා දෙමින් ක්‍රීඩාව ගමට ගෙන යෑම සඳහා කටයුතු කිරීම පිළිබඳව මම අපේ ගරු ක්‍රීඩා අමාත්‍යතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. රාජ්‍ය නිලධාරීන්, ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු ඒ සියලු නිලධාරීන් එක්ක අත් වැල් බැඳ ගෙන, පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ සියල්ල එක්ක අත් වැල් බැඳ ගෙන අද හොඳ වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. ඉදිරියේදී අපේ රටේ ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාව ඉදිරියට ගෙන යෑම සඳහා සෑම ග්‍රාම නිලධාරී වසමකම වොලිබෝල් ක්‍රීඩා පිටියක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ නිර්මාණය කරන්න එතුමා කටයුතු කරලා තිබෙනවා. ඒක ඉතාම වැදගත්. ඒ සඳහා ආර්ථිකමය වශයෙන් ලොකු වියදමක් යන්නේ නැහැ. පොඩි ඉඩකඩක් ඇතුළේ ගමේ දරුවෝ ටිකට හවසට එකතු වෙලා ක්‍රීඩා කරන්න පුළුවන් මට්ටම ඒ තුළින් උදා වනවා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමට එන කොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අංග සම්පූර්ණ ක්‍රීඩාංගණයක්, ඒ ක්‍රීඩකයා හෝ ක්‍රීඩිකාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පළාත් මට්ටමට එන කොට පළාත් මට්ටමේ අංග සම්පූර්ණ ක්‍රීඩා සංකීර්ණයක්, ඒ වාගේම ඔහු කොළඹට එන කොට කොළඹ අංග සම්පූර්ණ ක්‍රීඩා සංකීර්ණයක් ඉදි කරන්න කටයුතු කරලා තිබෙනවා. අපි දැක්කා රවි කරුණානායක මන්ත්‍රීතුමා එක වෙලාවකදී කිව්වා ක්‍රීඩාව ගැන මොනවා කථා කළත් ක්‍රීඩාවට අවශ්‍ය පහසුකම් නැහැ කියලා. හැබැයි, කොළඹ අහවල් ක්‍රීඩාංගණය හදනවා, අහවල් ක්‍රීඩාංගණය වැඩිදියුණු කරනවා, ඒවාට වියදම් කරන මුදල් ඉතිරි කළා නම් නිවාස හදන්න පුළුවන් කියලා කියනවා. එක පැත්තකින් කියනවා ක්‍රීඩාවට අවශ්‍ය පහසුකම් නැහැ, යටිතල පහසුකම් සංවර්ධනය කරන්නේ නැහැ කියලා. තවත් අවස්ථාවකදී කියනවා, මේවා සංවර්ධනය කරන්න වැය වූ මුදල්වලින් ගෙවල් හැදුවා නම් ඊට වඩා හොඳයි කියලා. විපක්ෂය ඔහොම තමයි. විපක්ෂයට හැම දේම තේරෙන්නේ ගොඩක් වේලාව ගියාට පස්සේ, හරියට බැන් කී මූන් මහත්මයාට වාගේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කථාව අවසන් කළ යුතුයි.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
බැන් කී මූන් මහත්මයා දිගටම කිව්වා අපේ රටේ ගෙන යන වැඩ පිළිවෙළ වැරැදියි, ඒවායේ ප්‍රශ්න තිබෙනවා කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up now.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මගේ කථාව අවසන් කරන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බැන් කී මූන් මහත්මයා අද කියනවා, ශ්‍රී ලංකාවේ වැඩ පිළිවෙළ හොඳයි, දැන් හොඳ ප්‍රවේශයකට ඇවිල්ලා තිබෙනවා; යුද්ධය නිමා වුණාට පස්සේ ශීඝ්‍ර සංවර්ධනයකට යමින්, විශේෂයෙන්ම ප්‍රතිපත්තියක් හැටියට ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළ අද ක්‍රියාත්මක කරමින් ක්‍රමානුකූලව ඒ ප්‍රදේශවල නැවත පදිංචි කිරීම් සහ ඒ ප්‍රදේශවල සංවර්ධනයත්, සමස්ත රටේම සංවර්ධනයත් අද නිසි ආකාරයට කරමින් ඉදිරියට යනවා කියලා. බැන් කී මූන් මහත්මයාටත් ඒක මතක් වුණේ, ඔහු ඒක තේරුම් ගත්තේ පසුයි. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් මේවා දිහා බලා ගෙන හිටපුවාම මේ රට ගෙන යන්නේ කොතැනටද කියා තේරෙයි.

ක්‍රීඩා ක්ෂේත්‍රයෙන් වාගේම අනෙකුත් ක්ෂේත්‍රවලිනුත් අපේ රට ඉදිරියට යනවා. ඒ නිසා ඔවුන්ටත් ඉදිරි කාලයේදී අනිවාර්යයෙන්ම ඒ තත්ත්වයට පත් වෙන්න සිදු වෙනවා කියන එක මතක් කරනවා. ශක්තිමත් නායකයකු වන අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට විවිධ අභියෝග, විවිධ ප්‍රශ්න එද්දී ශක්තිමත්ව නොබියව ඒවාට මුහුණ දෙමින්, ඒ සියලු ගෞරවයන් ආරක්ෂා කර ගෙන ක්‍රීඩාව දේශපාලනීකරණය කරන්නේ නැතුව ක්‍රීඩා අංශයෙන් අපේ රට ඉදිරියට ගෙන යන්න කටයුතු කිරීම පිළිබඳව එතුමාට අපි ස්තුතිවන්ත වෙමින්, ඒ ගැන අපේ සතුට ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.4.58]

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේ සන්තෝෂ වෙනවා වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා ක්‍රීඩා පනත යටතේ ඉදිරිපත් කළ නියෝග පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව

ලැබීම ගැන. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මහින්ද චින්තන ඉදිරි දැක්ම ඉදිරිපත් කරමින්, නූතන ලෝකයේ ක්‍රීඩාව සමාජයේ ජව සම්පන්න තරුණයන්ට පමණක් නොව බාල මහලු සැම දෙනාටම විවෘත වූවක් බවත්, නිරෝගිභාවය, මානසික වර්ධනය සහ සාමූහිකත්වය යන මේ සියල්ලම දියුණු කරලා නිරෝගි සම්පන්න සමාජයක් බිහි කිරීම සඳහා ක්‍රීඩාවට වැඩි තැනක් දිය යුතුයි කියා ප්‍රකාශ කළා. එතුමා ඒ කාර්ය භාරය ඉටු කිරීම සඳහා දක්ෂ ඇමතිවරයෙක් පත් කළා. ඇමතිතුමා තමන්ට පැවරුණු කාර්ය භාරය හරියාකාරව ඉටු කළා. පසු ගිය කාලය තුළ ක්‍රීඩා ක්ෂේත්‍රය ගිය ගමන මොකක්ද, ක්‍රීඩා ක්ෂේත්‍රයේ සිදු වූ උන්නතිය මොකක්ද කියලා හොඳ අවබෝධයක් ලබා ගෙන තමයි 1973න් පසුව එතුමා මේ පනත යටතේ නියෝග පනවන්න උත්සාහ ගත්තේ. ඒ වෙනුවෙන් එතුමාට අපේ ගෞරවය මේ අවස්ථාවේ පුද කරනවා.

අපි දන්නවා ක්‍රීඩා සංගම්වල නිලවරණය පවත්වනවා කිව්වාම ඒක මුළු ලංකාවේම එදිනෙදා කථා බහට ලක් වන සිද්ධියක් වී තිබෙන බව.

සමහර නිලධාරින් ක්‍රීඩා සංගම් බදු අරගෙන සිටිනවා. සමහර නිලධාරින් ඒක ඔවුන්ගේ වත්කමක් වශයෙන් තියා ගෙන සිටිනවා. මේ පිළිබඳව අවබෝධයක් ඇතුව එතුමා අද නියෝග මාලාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. මේ නියෝග අනුව භාණ්ඩාගාරික, සභාපති, ලේකම් යන නිලධාරින්ගේ කාලය අවුරුදු දෙකකට සීමා කිරීම තුළ ඇත්ත වශයෙන්ම ක්‍රීඩාව පිළිබඳව තියෙන උනන්දුව, කැපවීම ඔවුන් මේ කාල සීමාව තුළ ඉටු කළ යුතුයි. ඒ වාගේම මේ අවුරුදු දෙකට එහා යනවා නම්, ඔවුන් නැවත එම නිල ඉල්ලීමට උත්සාහ කරනවා නම්, ඒ සඳහා ඇමතිවරයාගේ ලිඛිත අවසරය ලබා ගත යුතුයි. එම නිර්දේශය ලබා දීමේදී ඇමතිවරයා විසින් සැලකිල්ලට ගත යුතු කරුණු ගැන මේ නියෝගවල සඳහන් වනවා. නැවත තේරී පත්වීම සඳහා අපේක්ෂා කරනු ලබන නිලධරයාගේ අදාළ ධුර කාලය සැලකිල්ලට ගෙන, ජාත්‍යන්තර මට්ටමට ක්‍රීඩා ඉහළ නැංවීම, අදාළ ජාතික කණ්ඩායමේ කුසලතා මට්ටම වැඩි කිරීම, දක්ෂතා සහිත ක්‍රීඩකයන් හඳුනා ගැනීම, ක්‍රීඩා පරිපාලනයෙහි විනිවිදභාවය සහතික කිරීම පිළිබඳ ගන්නා ලද පියවරත් සැලකිල්ලට ගෙන ඇමතිවරයාට ඊළඟ අවුරුදු දෙක සඳහා ඔවුන්ට අවසරය ලබා දිය හැකියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සෑම ජාතික සංගමයකම විධායක කමිටුව සඳහා පාසල් සංගම්වලින් අවම වශයෙන් නියෝජිතයන් දෙදෙනෙකුවත් සිටිය යුතු බවත් මෙම නියෝගවල සඳහන් කර තිබෙනවා. මෙක ඉතාම වැදගත්. පාසල් ක්‍රීඩා සංගමය සමඟ ජාතික සංගමය සම්බන්ධ වන විට පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රය ඉතා ඉහළින් දියුණු කිරීමට කටයුතු කරන්න පුළුවන් වෙනවා. ඒ වාගේම ක්‍රීඩකයින්ට අවශ්‍ය පහසුකම් ලබා දීම ගැන බලන විට ඇත්ත වශයෙන්ම මම ඉතාම අගය කරනවා, මේ ඇමතිවරයා පත් වුණාට පසු ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩා ක්ෂේත්‍රවල - ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩකයන්ගේ- තිබෙන පහසුකම් අද අපේ ප්‍රදේශ වැනි දුෂ්කර ප්‍රදේශවල පවා ඇති කර තිබීම ගැන. විශේෂයෙන්ම දිස්ත්‍රික්කයක් හැටියට ගත්තාම අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ඉදි වෙමින් පවතිනවා. ඒ වාගේම ජල ක්‍රීඩාගාරයක් - පිහිනුම් තටාකයක්- දැනට ඉදි වෙමින් පවතිනවා. අපගේ අනුරාධපුර දිස්ත්‍රික්කය වාගේ දුර බැහැර ප්‍රදේශවල ක්‍රීඩකයින්ට ඒක ඉතා වැදගත් වෙනවා. ඔවුන්ට ඒ තුළ වටිනාකමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම රහස් ඡන්දයක් පැවැත්වීම ඉතාම වැදගත් වනවා. අපි දකිනවා, ක්‍රීඩා සංගම්වල මැතිවරණ කාලයේදී ඇත්ත වශයෙන්ම නිලධාරියෙකු තෝරා පත් කරන කාලය වන විට සමහර ඒවා යුද පිටි බවට පත් වෙලා තිබෙනවා කියලා. රහස් ඡන්දයක් තිබීම තුළින් ඇත්ත වශයෙන්ම ඡන්දදායකයෙකුට ඡන්දය පාවිච්චි කරලා නිරුපද්‍රිතව -කිසි කරදරයක් නැතුව- තමන්ගේ ගෙදරට යන්න පුළුවන් තත්ත්වයක් උදා කර ගන්න පුළුවන් වෙනවා. අපේ ක්‍රීඩා ඇමතිතුමා පසු ගිය වකවානුව තුළ ඉතා හොඳ අවබෝධයක් ලබා ගෙන මේ නියෝගය ගෙන එන්න ඇතැයි කියා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එතුමා ඉදිරිපත් කර තිබෙනවා යම් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයෙන් වෘත්තියමය ජනමාධ්‍යවේදියකු හෝ එවැනි ජාලයක හිමිකරුවන්ට මේ තරගවලට -මේ නිලවරණවලට- සහභාගි වීමට නොහැකි බව. ඇත්තෙන්ම ඒකත් විශේෂ කාරණයක් හැටියට අපි දකිනවා. අද මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍ය තුළින් සමහර ප්‍රශ්න වැඩි කරනවා. ඒක ඉදිරිපත් කරන අපේක්ෂකයාට වැඩි වාසිදායක තත්ත්වයක් නිර්මාණය කර දීලා ඔහුගේ ජයග්‍රහණය සඳහා කටයුතු කරන බව අපි පැහැදිලිව දකිනවා. ඒවා මාධ්‍ය තුළ හසුරුවන්න පුළුවන් ආකාරයක් ගැබ් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රජය මෙපමණ උත්සාහ ගත්තත් ග්‍රාමීය ක්‍රීඩා දෙස බැලුවාම ග්‍රාමීය ක්‍රීඩාව තිබෙන්නේ සමහර වකවානුවල පමණයි. අවුරුද්දේ එක් කාලයක තමයි ග්‍රාමීය ක්‍රීඩාව අපට දකින්න ලැබෙන්නේ. අප්‍රේල් මාසය කිට්ටුව අවුරුදු උත්සවයට සමගාමීව ග්‍රාමීය ක්‍රීඩාව ක්‍රීඩා ක්ෂේත්‍රයට ඇවිත් එක පාරටම බැහැලා යනවා; ඒක නැතුව යනවා. ග්‍රාමීය ක්‍රීඩා නැංවීම සඳහා කටයුතු කරන්නය කියා ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවනවා. වොලිබෝල් ක්‍රීඩා පිටි ග්‍රාමීය මට්ටමෙන් හදලා තිබෙනවා. නමුත් අද ඒවා වල් බිහි වෙලා. ඒවාට රුපියල් ලක්ෂ පහ දහය වියදම් කර තිබෙනවා. මෙහිදී මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ග්‍රාමීය ක්‍රීඩා නිලධාරින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස භාර ක්‍රීඩා නිලධාරින් තමන්ගේ ක්‍රියාවලිය කාර්ය භාරය හරිහැටි ඉෂ්ට කරනවාද කියන එක ඇත්ත වශයෙන්ම සොයා බලන්න කියා. එසේ බැලුවොත් තමයි, ඒ පිළිබඳව අවධානයක් යොමු කළොත් තමයි, ඒ ගැන පසු විපරමක් කළොත් තමයි රජය බලාපොරොත්තු වෙන ආකාරයට ග්‍රාමීය මට්ටමෙන් ක්‍රීඩාව දියුණු කරන්නට පුළුවන් වන්නේ. නැත්නම් ඒක ඒ තරම් දුරට සාර්ථක වන බවක් අපට දකින්නට නැහැ. ඒ සඳහා ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ග්‍රාමීය ක්‍රීඩා සමාජ ගැනත් කිව යුතුයි. මීට පෙර කථා කළ මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළා වාගේ ප්‍රාදේශීයව එහෙමත් නැත්නම් ග්‍රාම සේවා තුලානයකට ක්‍රීඩා සමාජයක් බිහි කිරීම ප්‍රායෝගිකව ඉතා අපහසු බව පෙනෙනවා. ප්‍රාදේශීය සභා මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් හෝ නැත්නම් ග්‍රාම සේවා වසම් කීපයක් එක්කාසු කරලා ක්‍රීඩා සමාජයක් බිහි කරලා ඒ ක්‍රීඩා සමාජය නැංවීම සඳහා කටයුතු කිරීම ඇත්ත වශයෙන්ම ඉතාමත් වටිනවා කියන එක මගේ හැඟීමයි.

අද ක්‍රීඩා ක්ෂේත්‍රය ගත්තාම අප දකිනවා, ක්‍රීඩකයන් ජාත්‍යන්තරව හෝ වෙනත් ආකාරයකින් ගිහිල්ලා ජයග්‍රහණය කළාම අපි ක්‍රීඩකයන් වර්ණනා කරනවා; හැම මාධ්‍යයක් තුළින්ම විවිධ ආකාරයෙන් අගයනවා. හැබැයි යම් කිසි ආකාරයකින් රට වෙනුවෙන් ගිහින් පරාජයට පත් වුණාම නැති අගුණ ප්‍රකාශ කරමින්, ඒ ක්‍රීඩකයා නැත්නම් ඒ ක්‍රීඩා කණ්ඩායම අපහාසයට ලක් කරනවා. ඔවුන් යන කොට ඔවුන් අපේ ජාතික සම්පතක් කියලා කිව්වාට බලාපොරොත්තු වන ජයග්‍රහණය නොලැබුණාට පසුව ඔවුන් විවේචනය කරන බව තමයි අපි දකින්නේ. මා හිතන හැටියට ඒක ශුභ කටයුත්තක් නොවෙයි; අපි අගය කළ යුත්තක් නොවෙයි. මොකද, ක්‍රීඩාව කියන්නේ ජය පරාජය දෙකම එක හා සමානව බලාපොරොත්තු විය හැකි දෙයක්. ජයග්‍රහණය ලබන වෙලාවේ ක්‍රීඩකයන්ට මල්මාලා දමා පිළිගන්නවාට වඩා ක්‍රීඩකයා

[ගරු එස්. සී. මුතුකුමාරණ මහතා]

රට වෙනුවෙන් ගිහින් පරාජය ලබලා එන අවස්ථාවේ මල් මාලා දමා පිළිගැනීමේ යුගයක් අපි බිහි කළ යුතුයි කියා මා මේ අවස්ථාවේ මතක් කර සිටිනවා. ඒ අනුව අපට පුළුවන් විය යුතුයි, ක්‍රීඩා නැංවීමේදී -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ වේලාව අවසන්.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
මට තව විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ක්‍රීඩා පිටි, ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩාව, නගරාසන්න ක්‍රීඩාව වාගේම ග්‍රාමීය මට්ටමෙන් ක්‍රීඩකයන් බිහි වීම ගැනත් කිය යුතුයි. ග්‍රාමීය මට්ටමෙන් ක්‍රීඩකයන් බිහි වන විට ඔවුන් දක්ෂතාව පෙන්නුවොත් තමයි ඔවුන්ට යටිතල පහසුකම් ලැබෙන්නේ. අපි දකිනවා, යටිතල පහසුකම් ලැබෙන ආකාරය. පොළොන්නරුව ප්‍රදේශයෙන් බර ඉසිළීමේ ක්‍රීඩකයා බිහි වන කොට පළාත් සභාවෙන් මුදල් ආධාර ඉල්ලුවා. නමුත් එම පළාත් සභාවෙන් කිසි ආධාරයක් දුන්නේ නැහැ. ඔහු ජාත්‍යන්තරයට ගිහිල්ලා ජයග්‍රහණය කරලා එන කොට තමයි පළාත් සභාවෙන් සල්ලි දෙන්න කැමැති වුණේ; අපේ වස්තුව කියලා පිළිගත්තේ;පළාතේ සම්පත කියලා පිළිගත්තේ. මේ වාගේ ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩකයන්ට මීට වඩා යටිතල පහසුකම් ලබා දීම තුළ ජාත්‍යන්තර මට්ටමෙන් සමස්ත ලංකා මට්ටමෙන් ක්‍රීඩකයන් බිහි කිරීමට හැකියාවක් ලැබෙන බව මා සඳහන් කරන්නට කැමතියි. ඒ සඳහාත් අපේ ගරු ක්‍රීඩා ඇමතිතුමාගේ අවධානය යොමු වේවායි පතමින් මා නිහඬ වනවා.

[අ.භා. 5.08]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා පනත යටතේ විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග මාලාවක් අපට ලබා දීලා ඒ නියෝග මාලාව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක්, මේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බණ්ඩාරගම මහජන ක්‍රීඩාංගනය පහසුකම් සහිත දියුණු ක්‍රීඩාංගණයක් බවට පත් කිරීම සඳහා ස්ථිරසාර ක්‍රියා මාර්ග ගැනීම පිළිබඳව මා පළමුවෙන්ම ගරු ක්‍රීඩා අමාත්‍යතුමාට ස්තුතියක් පළ කරන්න අවශ්‍යයි. මේ ක්‍රීඩාංගණය එක්සත් ජාතික පක්ෂයේ හිටපු අමාත්‍යවරයකු වන රාජා සමරනායක මැතිතුමා විසින් ඉඩම් අත්පත් කර ගෙන මූලික සංවර්ධන කටයුතු කරලා තිබුණු ක්‍රීඩාංගණයක්; දිස්ත්‍රික්කයේ තිබෙන විශාල ඉඩකඩක් ඇති ක්‍රීඩාංගණයක්. නමුත් ඉන් පසුව වසර දහසයක, දාහතක පමණ කාලය වන තෙක්ම -මේ ආණ්ඩුව පැවතුණු කාලය තුළත්- මේ ක්‍රීඩාංගණයේ කිසිම සංවර්ධනයක් සිද්ධ වුණේ නැහැ. මා මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණාට පසුව මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් වශයෙන් ඇසුවා; ඒ වාගේම උපදේශක කාරක සභාවට යොමු කළා. සී.බී. රත්නායක ඇමතිතුමා පොරොන්දු වුණා, මේ ක්‍රීඩාංගණය හදලා දෙනවා කියලා. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. ක්‍රීඩා ඇමතිතුමනි, ඔබතුමා තමයි මේ පොරොන්දුව ඉෂ්ට කළේ. ඒ පිළිබඳ තීරණය ගත්තාට පස්සේ ඔබතුමා පාර්ලිමේන්තුවේ ලොබියේදී මාව මුණ ගැහිලා, "ඔබතුමාගේ ඉල්ලීම පරිදි මේ වැඩේ සිද්ධ වෙනවා" කියන කාරණය සතුටින් ප්‍රකාශ කළා. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට ඒ පිළිබඳව මගේ බලවත් සතුට ඔබතුමාට ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ ක්‍රීඩාංගණයේ පස් කපලා පැවැත්වූ පළමුවන තරගයටත් මා බොරළුගොඩින් ක්‍රීඩා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මාගේ ජීවිතයේ විවිධාකාර ක්ෂේත්‍රවල නායකත්ව වර්ධනයන් හරහා යෞවන සමාජවල හා ක්‍රීඩා සමාජවල සාමාජිකයෙක්, නායකයෙක් විධියට මගේ ජීවිතයත් එක්ක බැඳිලා තිබෙන තැනක් තමයි බණ්ඩාරගම මහජන ක්‍රීඩාංගණය.

ඒ පොරොන්දුව ඉෂ්ට කිරීම සම්බන්ධව ඔබතුමාට විශේෂ ස්තුතියක් පිරිනමන්න මා මේ ලැබුණු අවස්ථාව උපයෝගි කර ගන්නවා.

ගරු ඇමතිතුමනි, අද ක්‍රීඩාව සම්බන්ධව අපේ රටේ තිබෙන ප්‍රවණතාව මේ විවාදය තුළත් පෙන්නුම් කරනවා. අද සමස්ත ක්‍රීඩා දෙස බැලෙන්නේ ක්‍රිකට් ක්‍රීඩාව හරහායි. සමස්ත ක්‍රීඩා දෙස ක්‍රිකට් හරහා බැලීමෙන් මේ රටේ ක්‍රීඩාවේ දියුණුව උදෙසා කිසිම ආකාරයක යහපතක් උදා කරන්නේ නැහැ. මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ශත වර්ෂයකට අධික කාලයක් වර්ධනය වෙලා, පසු ගිය වසර 40 තුළ වේගයෙන් වර්ධනය වෙලා, අපේ ක්‍රීඩකයන්ට ලෝක ශූරතාව ජය ගන්නට, අවස්ථා කිහිපයකදී අනුශූරයන් වන්නට අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම කිසිම තර්කයකින් තොරව අපේ ක්‍රීඩකයන් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතකයි 1979 වසරේ මා වසර 12ක දරුවකු විධියට බොහොම අසීරුවෙන් මගේ දෙමව්පියන්ගේ අවසරය අරගෙන මොරටුව සොයිසා ක්‍රීඩාංගණයේ තිබුණු ශ්‍රී ලංකා-බටහිර ඉන්දීය කොදෙව් සීමිත ඕවර් තරගය බලන්න ගිය අවස්ථාව. එදා බටහිර ඉන්දීය කොදෙව් ක්‍රීඩක කලිවරන්, අපේ පන්දු යවන්නන් විහිළුවකට ගත්තා. ඔහු ඉතාම සැහැල්ලුවෙන් තමයි අපට විරුද්ධව ක්‍රීඩා කළේ. නමුත් එදා සිට අවුරුදු තුනක්, හතරක් යන කොට අපට ටෙස්ට් තත්ත්වය ලැබුණා; ජාත්‍යන්තර අත් දැකීම් ලැබුණා. අද වන කොට අප බටහිර ඉන්දීය කොදෙව්වන් සමඟ තරග කරන කොට, underdog කියන තත්ත්වයට පත් වන්නේ බටහිර ඉන්දීය කොදෙව් ක්‍රීඩකයෝ. අපි දැන් හැම දාම ඉදිරියෙන් ඉන්නවා. විශාල කැපවීම් හරහා ක්‍රිකට් ක්‍රීඩාව අතින් අපේ රට අද ජාත්‍යන්තර මට්ටමට දියුණු වෙලා ඉන්නවා. අද තිබෙන ප්‍රශ්නය තමයි, ක්‍රීඩකයන්ට ගෙවීම් කරන්නේ කොහොමද, කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරන්නේ කොහොමද, පාසල් ක්‍රිකට් ක්‍රීඩාවට සහ ග්‍රාමීය ක්‍රීඩා සමාජවලට සලකන්නේ කොහොමද කියන ප්‍රශ්නය. මට පෙනෙන හැටියට ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් වර්තමානයේ මේ රටේ තිබෙන මූලිකම ප්‍රශ්නය තමයි, ප්‍රාදේශීය ක්‍රීඩා සමාජවලට සහ ක්‍රිකට් ක්‍රීඩා කරන පාසල්වලට අවශ්‍ය කරන පහසුකම් සැලසීම ඉතාම අඩු වෙලා තිබීම. ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳ නිලවරණ පැවැත්වෙන කාලයේ ක්‍රීඩා සමාජවලට මීට වඩා වටිනාකමක් තිබුණා. ඒවායේ අඩු පාඩු තිබුණු බව මා දන්නවා. නමුත් නිලවරණ පැවැත්වෙන කොට ක්‍රීඩා සමාජයට වටිනාකමක් තිබුණා; ක්‍රීඩා සමාජයේ සාමාජිකයාට, ක්‍රීඩා සමාජයේ ඡන්දයට වටිනාකමක් ලැබුණා.

අනෙක් අතට පාසල්වල ක්‍රීඩා තත්ත්වය ගත්තාම අද ඉතා බරපතළ විධියට පසුගාමී තත්ත්වයක තිබෙනවා. ඒ නිසා ජාත්‍යන්තර තලයේ තිබෙන ගැටලු නිරාකරණය කර ගන්නවා වාගේම, පාසල් ක්‍රිකට් ක්‍රීඩාව සහ ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ සඳහා ප්‍රමාණවත් තරම් ආධාර සපයන්නත්, තර්කානුකූල හා සාධාරණ

ක්‍රමයකට ඒ ආධාර බෙදා දෙන්නත් අවශ්‍ය ධෛර්ය සහ වාසනාව ගරු ඇමතිතුමාට ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ සඳහා මහ පෙන්වීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තුළින් කරන්නට අවශ්‍ය ශක්තිය ඔබතුමාට ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු ඇමතිතුමනි, මලල ක්‍රීඩකයකු හැටියට, පාසල් කාලයේ මලල ක්‍රීඩාව වෙනුවෙන් කැප වුණු කෙනකු හැටියට මේ රටේ මලල ක්‍රීඩාව පිළිබඳව මගේ ලොකු කම්පනයක්, කම්පාවක් තිබෙනවා. එදා ඩන්කන් වයිට් ලන්ඩන් ඔලිම්පික් උළෙලේදී මීටර් 400 කඩුලු පැනීමෙන් රිදී පදක්කමක් දිනා ගත්තා. ඉන් පස්සේ නාගලිංගම් එතීර් වීරසිංහම් උස පැනීමේ ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර තරග ජයග්‍රහණය කළා. ලූෂන් බෙනඩික් රෝසා මැරතන් සහ මීටර් 5,000 හා 10,000 වැනි දුර දිවීම තරගවලින් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගත්තා. ඩබ්ලිව්. විමලදාස, සුගත් තිලකරත්න, දමයන්ති දර්ශා වාගේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉහළ ජයග්‍රහණ ලබා ගත්තා. ඉන් පස්සේ සුසන්තිකා ජයසිංහ ජයග්‍රහණ ලබා ගත්තා. ඇත්ත වශයෙන්ම අවසානයේ ඇගේ ජයග්‍රහණය රිදී පදක්කමක් බවට පත් වුණා, ඒ තරගයේදී පළමුවැනි ස්ථානය දිනා ගත්ත මේරියන් ජෝන්ස්ගේ පදක්කම අහිමි කිරීමත් සමඟ.

මෑත කාලයේ මලල ක්‍රීඩාව සම්බන්ධව අපේ රටේ දීප්තිමත් යුගයක් පැවතුණා. ඒ දීප්තිමත් යුගය දැන් සම්පූර්ණයෙන්ම අවසන් වෙලා තිබෙනවා. මට අමතක කරන්න බැහැ, අපත් එක්ක දේශපාලන වශයෙන් එකඟ නැති වුණත් එස්.බී. දිසානායක ඇමතිතුමා ක්‍රීඩා අමාත්‍යවරයා වශයෙන් ඉන්න කාලයේ මලල ක්‍රීඩාව පිළිබඳව ලොකු සැලකිල්ලක් දක්වපු ආකාරය. ඒ කාලයේ ඉතා වැඩි සැලකිල්ලක් මලල ක්‍රීඩාව තුළට ඒමේ ප්‍රතිඵලයක් විධියට ජාත්‍යන්තර ජයග්‍රහණ ලබන්නත්, ඒ ජයග්‍රහණ සැලකිය යුතු කාලයක් පවත්වා ගෙන යන්නත් පුළුවන් ආකාරයේ ක්‍රීඩක, ක්‍රීඩිකාවන් රාශියක් අපට බිහි කරන්න පුළුවන්කම ලැබුණා.

ගරු ඇමතිතුමනි, අද අපි ක්‍රිකට්, පාපන්දු ගැන කථා කළත් ඇත්ත වශයෙන්ම සෑම දරුවෙකුම තමන්ගේ පාසල තුළ මලල ක්‍රීඩා ඉසව්වලට අඩු වැඩි වශයෙන් සහභාගි වෙනවාමයි. ක්‍රිකට් නොගහන දරුවෝ ඉන්නවා. Football නොගහන දරුවෝ ඉන්නවා. Volleyball නොගහන දරුවෝ ඉන්නවා. Basketball නොගහන දරුවෝ ඉන්නවා. හැබැයි දිවීම, පැනීම, වීසිකිරීම වැනි ඉසවු විවිධ මට්ටම්වලින් දරුවන් කරනවා. ඒ නිසා අද ක්‍රීඩාව පිළිබඳව වඩාත් සමීප දේ සිදු වෙන්නේ මලල ක්‍රීඩාව තුළයි. මලල ක්‍රීඩාවේ දක්ෂතා හඳුනා ගත්තාට පස්සේ, ඒ දක්ෂතා මත අනෙක් ක්‍රීඩාවලට යන්න පුළුවන්. අපි දන්නවා, දක්ෂ මලල ක්‍රීඩකයන් හඳුනා ගත්තාට පස්සේ, ධාවන දක්ෂතා ඇති ක්‍රීඩකයන්ට ආරාධනා කරලා පාසලේ රගර් කණ්ඩායමේ ගැළපෙන ස්ථානයන් ඔවුන්ට ලබා දෙන බව. මලල ක්‍රීඩාව හරහා කෙනෙකුගේ දක්ෂතා, ශාරීරික නිපුණතාවන්, ස්වභාවය හඳුනා ගත්තාම අපි ඔහුට ආරාධනා කරනවා, basketball team එකට එන්න කියලා; volleyball team එකට එන්න කියලා; netball team එකට එන්න කියලා. ඇත්තටම ක්‍රීඩකයෙකුගේ ක්‍රීඩාශීලිභාවය, ශාරීරික හැකියා අපි සැබෑ ලෙසම හඳුනා ගන්නේ මලල ක්‍රීඩාව හරහායි. මලල ක්‍රීඩාව හරහා එන දරුවන් මලල ක්‍රීඩකයන් ලෙසම ක්‍රීඩා ජීවිතය අවසන් කරන්න පුළුවන් වාගේම, වෙනත් ක්‍රීඩා සඳහා ඔවුන් හඳුනා ගැනීමේ හැකියාවත් අපට ලැබෙනවා. ඒ වාගේම සමස්තයක් විධියට තරගකාරී ලෙස ක්‍රීඩා කළත් නොකළත්, ජීවිතයට අවශ්‍ය කරන නායකත්ව ලක්ෂණ, ශාරීරික යෝග්‍යතාව ක්‍රීඩාව හරහා අපට ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා. මා ඒ කාරණය කියන්නේ, අදටත්, මේ කථා කරන මොහොතේත් තරුණ කාලයේ, පාසල් අවධියේ කරපු ක්‍රීඩාවෙන් ලැබූ තෘප්තිය, ලැබූ අත් දැකීම්, ඒ ශාරීරික යෝග්‍යතා අනුව ලැබූ ශක්තිවන්තකම් මතක් කරන ගමන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙන කොට මලල ක්‍රීඩාව පිළිබඳව මේ රටේ කිසිම සැලැස්මක් නැහැ. අද මේ රටේ මලල ක්‍රීඩාවට නිශ්චිත ප්‍රමුඛත්වයක් නැහැ. අද මේ රටේ මලල ක්‍රීඩාවට වටිනාකමක් දීලා නැහැ. අද මලල ක්‍රීඩාවට අවශ්‍ය මූලික පහසුකම් ගම්බද පාසල්වල ඇත්තේ නැහැ. මලල ක්‍රීඩාවේ පැනීමේ ඉසව් සඳහා අවශ්‍ය කරන උපකරණ තිබෙනවා. ඒවාට mattresses අවශ්‍යයි. ඒ වාගේම අනෙකුත් ක්‍රීඩා උපකරණ අවශ්‍යයි. ධාවන සපත්තු අවශ්‍යයි. අද මේ උපකරණ පාසල්වල ඇත්තේම නැති තරම්. අපි විපක්ෂයේ මන්ත්‍රීවරු වුණත් පාසලකට ගිහිල්ලා අපෙන් කෙරෙන්න ඕනෑ මොකක්ද කියලා ඇහුවාම, හූහක් වේලාවට ඒ පාසල් ක්‍රීඩා භාණ්ඩ හිඟය ගැන අපට සඳහන් කරනවා. ඒ නිසා අපේ විමධ්‍යගත මුදල්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ඒ සඳහා වෙන් කරනවා.

අපි පාසල්වල ගොඩනැඟිලි හදනවා. අනෙකුත් පහසුකම් සපයන්න උනන්දු වෙනවා. නමුත් ක්‍රීඩාවට ප්‍රමුඛතාවක් නැහැ කියන කාරණය මා කියන්න කැමැතියි. ඒ නිසා ඔබතුමාට මා සඳහන් කරන්නේ, ඒ ජාතික ක්‍රීඩා සැලැස්ම හොඳයි, ඒ පිළිබඳව තවත් සාකච්ඡා කරලා ඉදිරියට යා යුතු බවයි. හැබැයි ඉතා ඉක්මනින්ම මේ රටේ පාසල්වල ක්‍රීඩා අධ්‍යාපනය පිළිබඳව සහ ඒ අවශ්‍ය පහසුකම් සැපයීම පිළිබඳව, ක්‍රීඩා සමාජ සහ යෞවන සමාජ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම පිළිබඳව අපි කටයුතු කරන්න අවශ්‍යයි. ඒක ප්‍රමුඛතාවක් විය යුතුයි කියන කාරණයයි මා සඳහන් කරන්නේ.

ගරු ඇමතිතුමනි, මට ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඔබතුමා කැමැති නම්, මේ මොහොතේ වුණත් පිළිතුරු දෙන්න පුළුවන්. ක්‍රීඩා ධුර දැරීම පිළිබඳව මෙසේ සඳහන් වෙනවා. "යම් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයෙන් වෘත්තීයමය ජනමාධ්‍යවේදියකු හෝ එවැනි ජාලයක අයිතිකරුවෙකු වේ නම්" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තේරුම් ගන්න පුළුවන්. මාධ්‍යයක අයිතිකරුවෙකු කියන්නේ විශාල ප්‍රාග්ධනයක් තිබෙන කෙනෙක්. එවැනි කෙනෙකුට පුළුවන්කම තිබෙනවා, යම් ආකාරයකින් ඒ ධනය සහ බලය පාවිච්චි කරලා ඒ ඡන්ද ක්‍රියාදාමය තුළ බලයක් පාන්න.

පසු ගිය කාලවල අපි මේවා දැක්කා. හැබැයි මට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි මෙම තනතුරු සඳහා තරග කරන පුද්ගලයා යම් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයෙන් වෘත්තීයමය ජනමාධ්‍යවේදියකු නම් ඒ පුද්ගලයා මේ සඳහා නුසුදුස්සකු වේ කියලා සඳහන් වනවා. දැන් මේ රටේ වෘත්තීයමය ජනමාධ්‍යවේදීන් දහස් ගණනක් ඉන්නවා. විශේෂයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ ජනමාධ්‍යවේදීන් බොහෝ දෙනෙක් අද මේ ක්‍රීඩාව පිළිබඳව බොහොම උනන්දුවෙන් කටයුතු කරනවා. එතකොට ක්‍රීඩාව සම්බන්ධව උනන්දුවක් තිබෙන, පසු බිමක් තිබෙන වෘත්තීයමය ජනමාධ්‍යවේදීන් කියන්නේ කෝටිපතියෝ නොවෙයි. ඔවුන් විශාල ධනවතුන් නොවෙයි. ඔවුන් වැටුපකට පුවත් පතක සේවය කරනවා වන්න පුළුවන්. ඔවුන් රූපවාහිනී සේවයක හෝ ගුවන්විදුලි සේවයක වැටුපකට සේවය කරන්න පුළුවන්. හැබැයි ක්‍රීඩාව වෙනුවෙන් අවශ්‍ය කරන කැපවීමත්, දැනුමත් ඔවුන්ට තිබෙනවා. මේ වෘත්තීයමය මාධ්‍යවේදියා කියන අන්න ඒ කාණ්ඩයට මේ සීමාව පනවන්නේ ඇයි කියන කාරණය ඔබතුමාට පැහැදිලි කරන්න පුළුවන් නම් මම ස්තුතිවන්ත වනවා. ඔබතුමා මට පිළිතුරක් දෙනවාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, යම් යම් සංගම්වල තනතුරු දැරීමේදී ඒ තමන් දරන තනතුර පාවිච්චි කරමින් ඒ ක්‍රීඩාවේ විනාශයට යම් යම් කටයුතු කරපු උදාහරණ සහ කාරණා තිබෙනවා. ඉතිහාසයේ එහෙම අත් දැකීම් අපට තිබෙනවා. යම් යම් මාධ්‍යවේදීන් මේ වාගේ ඉඳලා තිබෙනවා. මේ යෝජනා අපේ පෞද්ගලික යෝජනා

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

නොවෙයි. සංගම්වලින් ඉදිරිපත් කරපු යෝජනා සැලකිල්ලට අරගෙන තමයි අපි මේ නියෝග සකස් කරලා තිබෙන්නේ. යම් මාධ්‍යවේදියකු ක්‍රීඩා සංගමයක යම් තනතුරක් දැරුවොත් ඔහුට පුළුවන් ඒ පිළිබඳව ලියන්න සහ කටයුතු කරන්න. ඒ වාගේම යම් යම් මාධ්‍ය පාවිච්චි කරමින් ඒ අවශ්‍ය පුද්ගලයන්ට පහර දෙන්න ඕනෑ නම් ඒ කටයුත්තත් කරන්න පුළුවන්. ඉතිහාසයේ මාධ්‍යවේදීන්ගෙන් ලොකු ඉල්ලීමක් තිබුණා, මේ පිළිබඳව නිදහසේ විවේචනය කරන්න ඔවුන්ට අවස්ථාවක් ලබා දෙන්න කියලා. මේ කටයුතු සම්බන්ධයෙන් මේ කාරණා තමයි අපි සැලකිල්ලට ගත්තේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

හොඳයි. ගරු ඇමතිතුමනි, ඔතැන තිබෙන ප්‍රශ්නය වන්නේ ඔබතුමන්ලා ඉතිහාසයේ හිටපු එක්කෙනෙක්, දෙන්නෙක් ගැන හිතලා මේ රටේ ඉතාම වටිනා සේවයක් කරන වෘත්තීයමය මාධ්‍යවේදීන් මෙම තනතුරු සඳහා නුසුදුස්සන් බවට පත් කිරීමයි. සමහර විට ඔවුන් ක්‍රීඩා මාධ්‍යවේදීන් නොවෙන්න පුළුවන්. නමුත් ඔවුන් වෙනත් ක්ෂේත්‍රවල විශේෂඥතාව දරන මාධ්‍යවේදීන් වන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම අතිවිශාල ප්‍රමාණයක් -දහස් ගණනක්- වුණු මාධ්‍යවේදීන් කියන සියලු දෙනාම එක නරක ගණයකට දමායි මේ වර්ගීකරණය කරලා තිබෙන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා මාධ්‍යවේදීන්ට අපි මේ යෝජනාව ඉදිරිපත් කළා. එතුමන්ලා මේ ගැන බොහොම පක්ෂව කථා කළා. ඒකේ අවුලක් හෝ ප්‍රශ්නයක් තිබුණේ නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ක්‍රීඩා මාධ්‍යවේදීන් කියලා සිටින පිරිස ඉතාම සීමිතයි නේ. නමුත් මෙතැන තිබෙන ගැටලුව ඒ අදාළ මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නය නොවෙයි. පාර්ලිමේන්තුව විධියට මේ නියෝග සලකා බලන මොහොතේ අපි බලන්නට ඕනෑ, ඒ අයගේ මූලික අයිතිවාසිකම් ගැන, ඒ අයට තිබෙන සමස්ත අයිතිවාසිකම් ගැන, ඒ වාගේම අනාගතයේ ඔවුන්ට තිබෙන අවස්ථාවන් ගැනයි. එතකොට සිටින මාධ්‍යවේදීන් කිහිප දෙනෙක් අපට ප්‍රශ්නයක් නැහැ කියන එක නොවෙයි ප්‍රශ්නය. ඒ අවස්ථාව අහිමි කිරීමයි ප්‍රශ්නය. මොකද වෘත්තීයමය මාධ්‍යවේදියා කියන ගණයට වැටෙන මාධ්‍යවේදීන් දහස් ගණනක් මේ රටේ සිටිනවා. මේ නියෝග තුළින් ඒ බොහෝ දෙනෙක්ව සීමා කිරීමට අවස්ථාව ලැබෙනවා.

මේ සියලු දෙනාට ඔබතුමාගේ අවසරය ගන්නත් සිද්ධ වනවා. රටේ ඒ අදාළ ක්‍රීඩා අමාත්‍යවරයා කවුද කියන එක මත මේ අවසරය ගැනීම හෝ නොගැනීම පදනම් වනවා. නමුත් විධායකයේ කොටසක් වන අමාත්‍යවරයාගේ පෞද්ගලික අනුමැතිය ලබා ගැනීම කියන එක අනවශ්‍ය දෙයක්. එය කළ යුතු වන්නේ ඉතාම සුවිශේෂ අවස්ථාවල පමණයි. ඒ නිසා වෘත්තීයමය මාධ්‍යවේදියා කියන අර්ථය මෙතැනට වැටීම නුසුදුසුයි කියන එක මම පෞද්ගලිකව දකිනවා. මාධ්‍ය අයිතිකරුවෙක් කියන තත්ත්වය ගැන මට ගැටලුවක් නැහැ.

ඒත් එක්කම තව ප්‍රශ්නයක් තිබෙනවා. වෘත්තීයමය මාධ්‍යවේදියා කියන එකේ අර්ථය මොකක්ද? "Professional Journalist" කියන්නේ කවුද? වෘත්තීයමය මාධ්‍යවේදියා කියන අර්ථ නිරූපණය නිශ්චිතව සඳහන් විය යුතුයි. මමත් කාලයක නිදහස් මාධ්‍යවේදියෙක් - freelance - වශයෙන් කටයුතු කළා. ඒකටත් මුදලක් ලැබුණා. ඒ විධියට මුදලක් ලැබෙන කෙනෙක් මේ ගණයට වැටෙනවාද? මොකද ඉස්සර වෘත්තීයමය ක්‍රීඩකයාට Olympics යන්න බැරි වුණා. ඒ කාලයේ සමහර දක්ෂ ක්‍රීඩකයෝ ඔවුන්ගේ ජීවිතයේ සුවිශේෂ අවස්ථා කීපයක මුදල්වලට තරග කිරීම හේතුවෙන් පසු කාලවල ඔවුන්ගේ පදක්කම් අහිමි කළ බව අපි දන්නවා. අද ඒ සීමාවන් ඇත්තේ නැහැ. වෘත්තීයමය ක්‍රීඩකයන්ට Olympicsවලට ක්‍රීඩා කරන්න බැහැයි කියලා කිව්වා. එහෙනම් වෘත්තීයමය මාධ්‍යවේදියා කවුද කියන අර්ථය ගැන නිශ්චිතව තීරණය වන්නට ඕනෑ. ඒකේ දිග පළල තිබෙන්නට ඕනෑ. නැත්නම් මේ හරහා මාධ්‍ය හා සම්බන්ධ ඕනෑම පුද්ගලයෙකුට ක්‍රීඩා පරිපාලනයට පැමිණීමට බාධා කරන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, සූදු ව්‍යාපාරයක සෘජුව හෝ වක්‍රව යෙදී සිටී නම් මේ තනතුරු දැරීම සඳහා නුසුදුස්සකු වනවා කියලා ඒ ප්‍රශ්නයම එයටත් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප දන්නවා අද ලෝකයේ සෑම ක්‍රීඩාවකටම පාහේ මේ සූදුව පිළිබඳ ප්‍රශ්නය ඇවිල්ලා තිබෙනවාය කියන කාරණය. ඔට්ටු අල්ලනවා. ජයග්‍රහණය, පරාජය පිළිබඳව ඔට්ටු අල්ලනවා. මේක අද ලෝක සංස්කෘතියේ කොටසක් බවට පත් වෙලා තිබෙනවා. අප පසු ගිය දවස්වල දැක්කා, විවිධ ක්‍රීඩා තරග පාවා දීම් සිදු වුණු ආකාරය. ක්‍රිකට් තරග පාවා දීම් සිදු වුණා. අපි දැක්කා, පාපන්දු තරග පාවා දීම් පිළිබඳව. ඒ වාගේ විවිධ මට්ටම්වල මේක සිදු වෙනවා. සූදුව හා සම්බන්ධ පුද්ගලයෝ ක්‍රීඩා පරිපාලනයට එකතු වුණාම තරග පාවා දීම් පිළිබඳව ඔවුන්ට බලපෑම් කරන්න අවස්ථාවක් තිබෙනවා. ඒ නිසා අන්තර් ජාතික ක්‍රිකට් කවුන්සිලයත් ඒ පිළිබඳව ඔවුන්ගේ රීති සකස් කරලා තිබෙනවා. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ මේ අර්ථ නිරූපණයේයි. මේ අර්ථ නිරූපණයේ තිබෙනවා, සූදු ව්‍යාපාරයක සෘජුව හෝ වක්‍රව යෙදී සිටී නම් කියලා. සෘජුව යෙදී සිටීම ගැන ගැටලුවක් නැහැ. මොකක්ද මේ වක්‍රව යෙදී සිටීම කියලා කියන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සූදුවේ වක්‍රව යෙදෙන කෙනාගේ ස්වභාවය මොකක්ද? ඒ සූදු ව්‍යාපාරයේ වක්‍රව යෙදී සිටින තැනැත්තාගේ ලක්ෂණ මොනවාද? ඉඳලා හිටලා කැසිනෝ එකට යන කෙනා ද, අශ්වයන්ට රේස් අල්ලන කෙනෙක් ද, එහෙම නැත්නම් ඔහු සූදු ව්‍යාපාරයට සම්බන්ධ පවුලක ඥාතියෙක් වෙන එකද? මේ වාගේ ප්‍රශ්න තිබෙනවා. ඇත්තටම මේ කාරණය ගැන නැවත වරක් නිශ්චිත වෙන්නට අවශ්‍යයි. නැවත වරක් මෙය තේරුම් ගැනීම අවශ්‍යයි. ඒ වාගේම ඒ අදාළ පුද්ගලයින්ටත්, සමාජයටත් මේ ගැන අර්ථයක් අවශ්‍යයි. ඒ නිසා වක්‍රව යන්නට ප්‍රායෝගික තේරුම අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නියෝගවල තිබෙන සමස්තය ගැන මා ඔබතුමාට ස්තුතිය පළ කරනවා. ඒක ඉදිරි පියවරක්. ඒකත් මා කියනවා. සීමිත ප්‍රශ්න කීපයක් ගැන මා කථා කරන්නේ, ඒ සියල්ල නරකයි කියන අර්ථයෙන් නොවෙයි. මේක ඉදිරි පියවරක් කියන එක ගැන කිසිම සැකයක් නැහැ. නමුත් හොඳම දේ වෙන්නේ සම්පූර්ණයෙන්ම යල් පැන ගිහිල්ලා තිබෙන ක්‍රීඩා පනතම සංශෝධනය කිරීම කියන එකයි මගේ නම් අදහස. මා වසර ගණනාවක ඉඳලා මේ ගැන කල්පනා කරන කෙනෙක්. ඔබතුමාට ඒ ධෛර්යය ලැබේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා. හැබැයි මේ සූදු ක්‍රීඩාවේ වක්‍රව යෙදීම කියන ප්‍රශ්නය ගැන අපත් කල්පනා කරන්න අවශ්‍යයි. මේ නියෝග හදිසියේම පාර්ලිමේන්තුව හරහා අනුමත කරන්නේ නිශ්චිත පුද්ගලයෙකු

ඉලක්ක කරලා ද කියන කාරණය ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන ගැටලුවක් තිබෙනවා. එහෙම නිශ්චිත පුද්ගලයින් ඉලක්ක කරලා නීති පනවන එක, නියෝග පනවන එක වැරැදියි. ප්‍රතිපත්තිය ගැන අපට එකඟ වන්නට පුළුවන්. ප්‍රතිපත්ති ගැන කථා කරන්න පුළුවන්. හැබැයි පුද්ගලයෙකු ඉලක්ක වනවා නම් ඒක වැරැදියි. අනික් අතට ඒ අර්ථ නිරූපණයන් නිශ්චිත වන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නියෝග පැනවූවාම තව ප්‍රශ්නයක් එනවා. ඔබතුමාගේ මතය අනුව සෘජුව හෝ වක්‍රව සූදු ක්‍රීඩාවට සම්බන්ධ ද නැද්ද කියලා ඔබතුමා අවසර දෙනවා වෙන්න පුළුවන්. හැබැයි අනික් අතට රටේ අනික් පුරවැසියන්ට මේ නියෝග හරහා අවස්ථාවක් ලැබෙනවා, ඔබතුමා ඒ ගත්ත අභිමතය අභියෝග කරන්න. පරිපාලන නීතියට වැටෙන Writ of Certiorari ආඥාවක් හරහා ඔබතුමාගේ තීරණය අභියෝග කරන්න මේ නියෝග හරහා අවස්ථාවක් ලැබෙනවා. මේ අවස්ථාව කලින් තිබුණේ නැහැ. මේක අවුලක්. ඒ නිසා මා ඔබතුමාට කියනවා, ඒ හරහා අත් හිටුවීමේ නියෝග, අධිකරණමය මැදිහත් වීම් වාගේ ප්‍රශ්න ඇති වන්නට පුළුවන් කියලා. ඒ පුද්ගලයින්ව වැළැක්වීමේ අරමුණින් මේ නියෝග අරගෙන ආවාත්, එහෙම නොවුණා වුණත් මෙවැනි නියෝග පැනවූවාම රටේ පුරවැසියන්ට අයිතිවාසිකම් ලැබෙනවා, මේ නියෝග අනුව ඇමතිවරයා තමන්ගේ අභිමතය විධායකයේ නියෝජිතයෙක් විධියට ක්‍රියාත්මක කළා ද කියලා හොයා බලන්න. නියෝග නැතිවාට වඩා නියෝග තිබෙන වෙලාවල්වල අධිකරණමය විමර්ශනයන්ට ලක් වීමේ හැකියාවක් තිබෙන නිසා ඔබතුමා අනතුරකට පත් වෙනවා. ඒ අනතුර එන්නේ ක්‍රීඩාවට සහ පොදුවේ සමස්ත ක්‍රියාදාමයටයි. මොකද අදාළ වැදගත් ධූරයක් දරන කෙනෙකුගේ තනතුර අධිකරණමය ක්‍රියාදාමයක් හරහා අත් හිටෙව්වොත් එහෙම ඒ ක්‍රීඩාවේ දියුණුවට ඉතා දිගු කාලීන බලපෑම් ඇති වන්නට පුළුවන්. ඒ නිසා මේ නියෝග පනවනවා වාගේම, නියෝග පැනවීමේ අනතුරකුත් තිබෙනවාය කියන කාරණය මතක් කරන්න ඕනෑ. ඒ නිසා තමයි අර්ථ නිරූපණය වැදගත් වෙන්නේ. අධිකරණයට ගිහිල්ලා පළමුවැනි දවසේම තහනම් නියෝගයක් කෙනෙකු ගන්න යනවා නම් මේකයි අර්ථ නිරූපණය, ඇමතිවරයාගේ අභිමතය ක්‍රියාත්මක කළේ මෙන්න මේ පදනම මත කියලා කියන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒක විවෘතව තිබුණොත් එක එක විනිශ්චයකාරවරු තමන්ගේ පෞද්ගලික මතයන් අනුව, තමන්ගේ පෞද්ගලික විශ්වාසයන් අනුව කටයුතු කිරීමට අවකාශ තිබෙනවා. ඒවා අනතුරුදායකයි. ඒකයි මා කියන්නේ. මා කියන්නේ නැහැ, එහෙම වෙනවා කියලා. මට පෙනෙනවා, මේ අනතුරු. ඒ නිසා පසු ගිය කාලයේ විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධව අධිකරණමය මැදිහත් වීම දැකපු කෙනකු හැටියට මා මතක් කරන්න කැමැතියි, මේවා අනතුරු දායක බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් රටේ නීති වෙනස් වන්න අවශ්‍යයි, රෙගුලාසි හදන්න අවශ්‍යයි. ක්‍රිකට්වලින් ඔබ්බට ගිය ක්‍රීඩාවක් මේ රටේ තිබිය යුතුයි. ඒ වාගේම, මේ හදන රෙගුලාසි නිශ්චිත, පැහැදිලි රෙගුලාසි විය යුතුයි කියන කාරණය ප්‍රකාශ කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.30]

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතවත් ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාගේ අමාත්‍යාංශය වන ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතට යටත් 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග පිළිබඳ විවාද කරන මේ මොහොතේ, සූදානම්ව නොසිටියත් කථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මම බෙහෙවින් සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශේෂ කාරණයක් මතක් කළ යුතුයි. අද දින ඒ කාරණය බොහෝ දෙනාට මතක් වුණේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා 2005 දී මේ රට භාරගත් අවස්ථාවේදී ප්‍රශ්න රාශියක් තිබුණා. අද වන කොට එදා තිබුණු ප්‍රශ්නවලින් සියයට 90කට වැඩි ප්‍රමාණයක් විසඳලා අපේ රට ඉතාම ශීඝ්‍රයෙන් ඉදිරියට ගමන් කරවන මේ මොහොතේ මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළ තුළ ක්‍රීඩාව සඳහා විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. එසේ අවධානය යොමු කරලා අතිගරු ජනාධිපතිතුමා ක්‍රීඩාව ඉදිරියට ගෙන යෑමට දක්ෂ ක්‍රීඩා අමාත්‍යවරයෙකු පත් කර තිබෙනවා. මම අපේ ගරු ඇමතිතුමා ඔසවා තබන්න කියන දෙයක් නොවෙයි මෙය. මම එතුමා එක්ක වැඩ කර තිබෙනවා. මා එතුමා වැඩ කරන ආකාරය දන්නා නිසයි මෙහෙම කියන්නේ. මා හිතන විධියට එතුමා ක්‍රීඩා අමාත්‍යතුමා ලෙස පත් වෙලා දැනට අවුරුද්දකට ටිකක් වැඩි කාලයක් පමණයි. මේ සුළු කාලය තුළ අපේ රටේ තිබෙන ක්‍රීඩා සංගම්වල සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ තිබෙන විවිධාකාර ප්‍රශ්න ඉතාම සූක්ෂ්මව, මොළය පාවිච්චි කරලා, කවුරුත් කරදරයට පත් නොවන ආකාරයට විසඳමින් යන මේ මොහොතේ මේ නියෝග ගෙනැල්ලා සම්මත කර ගැනීම මහින් එතුමා කරන්න හදන්නේ අමාත්‍යාංශයට - එතුමාට- තිබෙන බලතලත් නැවත විමධ්‍යගත කරලා මේ රටේ ක්‍රීඩාවේ උන්නතිය සඳහා කටයුතු කරන්නයි. ඒ නිසා අපි ගරු ක්‍රීඩා ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, හුහක් මහන්සි වෙලා මෙම නියෝග ගෙනෙමින් අපේ රටේ ක්‍රීඩාවේ උන්නතිය ඇති කිරීම සඳහා එතුමා කරගෙන යන ක්‍රියා දාමය ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ වැඩ පිළිවෙළ යටතේ සියලු පළාත්වල ක්‍රීඩාව දියුණු කරමින් යනවා. උතුරු පළාත ගත්තොත් කිලිනොච්චිය ක්‍රීඩාංගණය, උතුරු මැද පළාත ගත්තොත් අනුරාධපුරය ක්‍රීඩාංගණය, නැගෙනහිර පළාත ගත්තොත් ත්‍රිකුණාමලයේ Mac Haizer ක්‍රීඩාංගණය, මධ්‍යම පළාත ගත්තොත් මහනුවර දිගන ක්‍රීඩාංගණය, ඌව පළාත ගත්තොත් බදුල්ල ක්‍රීඩාංගණය, දකුණු පළාත ගත්තොත් හම්බන්තොට මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය, බස්නාහිර පළාත ගත්තොත් දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය, වයඹ පළාත ගත්තොත් වෙලගෙදර ක්‍රීඩාංගණය, සබරගමුව පළාත ගත්තොත් රත්නපුරය ක්‍රීඩාංගණය ආදි වශයෙන් ඒවායේ විශාල ක්‍රීඩාගාර නවයක් ඉදි කිරීමට දැනටමත් වැඩ පටන් ගෙන අවසානයි. එපමණක් නොවෙයි. දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රීඩාංගණ 25ක් තනන්න එතුමා කටයුතු ලැහැස්ති කරලා තිබෙනවා. වව්නියාව, ත්‍රිකුණාමලය, රත්නපුරය, පුත්තලම, පොළොන්නරුව, නුවරඑළිය, මුලතිව්, මොනරාගල, මාතර, මාතලේ, මන්නාරම, කුරුණෑගල, කිලිනොච්චිය, කෑගල්ල, මහනුවර, කළුතර, යාපනය, හම්බන්තොට, ගම්පහ, ගාල්ල, කොළඹ, බදුල්ල, අනුරාධපුරය, අම්පාර ආදි වශයෙන් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩාංගණ 25ක්, ක්‍රීඩාගාර 25ක් තනන්න එතුමා කටයුතු කරගෙන යනවා.

මම හිතන විධියට දැනටමත් සමහර තැන්වල වැඩ ආරම්භ කරලා ඉවරයි. එපමණක් නොවෙයි, අපේ රටේ - in all 324 AGA Divsions of our country - ඒ සියලුම AGA Divsionsවල ක්‍රීඩාංගණ තනන්න එතුමා මේ වන විට අපට සල්ලි වෙන් කර දීලා ඉවරයි. ඒ වාගේම වෙනත් කිසිම කාලයක නොලැබුණු ඉතා විශාල සහයෝගයක් මේ අවස්ථාවේ ක්‍රීඩා අමාත්‍යාංශය මහින් ලංකාවේ ක්‍රීඩාවට ලබා දෙනවා. අපේ රට දෙකඩ වී ප්‍රශ්න රාශියකට මුහුණ දීලා ඉඳලා එයින් ගොඩ එන මේ මොහොතේ

[ගරු ලොහාන් රත්වත්තේ මහතා]

සියලු ජාතීන්, සියලු ආගම් එකට සම්බන්ධ කරන්න පුළුවන් හොඳම ක්‍රමය ක්‍රීඩාව කියලා අතිගරු ජනාධිපතිතුමාත්, ගරු ක්‍රීඩා අමාත්‍යාතුමාත්, සියලු නිලධාරිනුත් පිළිගෙන ඒ සඳහා විශාල වැඩ පිළිවෙළක් කර ගෙන යාම පිළිබඳව එතුමන්ලා සියලු දෙනාටම නැවත වාරයක් ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම අද ක්‍රිකට් ක්‍රීඩාව ගැන විශාල වශයෙන් සාකච්ඡා වුණා. ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් තිබුණු ප්‍රශ්න රාශියක් විසඳලා, නැවත වරක් නිලවරණයකට ගිහිල්ලා හරියාකාරව ඒ නිලධාරින් පත් කර ගෙන ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට ගෙන යාම සඳහා ගන්නා උත්සාහය ගැන අපි නැවත වරක් ගරු ක්‍රීඩා අමාත්‍යාතුමාටත්, ඒ නිලධාරින්ටත් ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම රගර් ක්‍රීඩාව ගත්තොත් අද ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාටත්, යෝෂිත රාජපක්ෂ මහත්මයාටත් විපක්ෂයෙන් මොනවා කිව්වත්, එතුමන්ලා දෙදෙනා නොසිටින්නට මේ රටේ රගර් ක්‍රීඩාව කවදාවත් අද තිබෙන තත්ත්වයට ගේන්න බැරි වෙනවා. ඒ නිසා අපි එතුමන්ලා දෙදෙනාට මේ අවස්ථාවේ දී ස්තුතිවන්ත වෙනවා. ත්‍රිත්ව විද්‍යාලයේ රගර් ක්‍රීඩා කළ ක්‍රීඩකයකු හැටියටත්, මහනුවර ක්‍රීඩා සංගමයේ ක්‍රීඩා කළ ක්‍රීඩකයකු හැටියටත් මම කියන්නේ අද මේ රටේ අපට දකින්න ලැබෙන්නේ එදා තිබුණ රගර් ක්‍රීඩාව නොවෙයි, ඊට වඩා ඉතාම උසස් මට්ටමේ රගර් ක්‍රීඩාවක් බවයි. ඒ ගැන අපි ඉතාම සන්තෝෂයෙන් එතුමන්ලාට ප්‍රශංසා කරනවා. මින් ඉදිරියටත් එතුමන්ලාගේ සහයෝගය ලැබිලා මේ ක්‍රීඩාව තව තවත් ඉදිරියට ගෙන යාමට ඒ සියලු දෙනාටම ශක්තිය ධෛර්යය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, motor racing දිහා බැලුවත් එහෙමයි. අපි සියලු දෙනාම එකතු වෙලා මහනුවර "Kandy Night Race" කියලා motor racing තරගයක් පටන් ගත්තා. ඒ ගැන අපේ ක්‍රීඩා අමාත්‍යාතුමාත් දන්නවා. ඒක පිට පිට අවුරුදු දෙකක් පැවැත්වුවා. දැන් තුන් වැනි අවුරුද්දටත් පවත්වනවා. ඒ වාගේම කොළඹත් ඒ night race පටන් ගෙන ඉතාමත් හොඳින් ඒ ක්‍රීඩාවත් දියුණු වෙමින් යනවා. ඉදිරියට තවත් ඈත පළාත්වල යාපනය, ත්‍රිකුණාමලය, හම්බන්තොට ආදී ප්‍රදේශවලත් ධාවන පථ ඇති කරලා මෙවැනි තරග පවත්වලා අපේ රටේ එම ක්‍රීඩාවත් දියුණු කිරීමට පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන හැටියට අද විශේෂ දවසක්. මෙම විවාදයේ දී කථා රාශියකට අපි සවන් දුන්නා. සාමාන්‍යයෙන් කෙරෙන්නේ විපක්ෂයෙන් ඇවිල්ලා වැරදි රාශියක් කියන එකයි. ඒ වෙනුවට අද දින හොඳ වැඩක් කරන කොට ඒක හොඳ වැඩක් කියලා විපක්ෂයෙනුත් කිව්ව බව අපි ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ ගැන මේ අවස්ථාවේ විපක්ෂයට අපේ ප්‍රණාමය පුද කරනවා. මෙය විවාදයක් කිව්වාට කිසිම විවාදයක් නැහැ. ඒ නිසා ක්‍රීඩා අමාත්‍යාතුමා විසින් අද ඉදිරිපත් කර තිබෙන මෙම නියෝග අපේ රටේ ක්‍රීඩාවට ඉතාම යෝග්‍යයයි. සුළු සුළු අඩු පාඩු තිබුණොත් ඒවාත් නිවැරදි කර ගෙන මේවා ක්‍රියාත්මක කරලා අපේ රටේ ක්‍රීඩා තවත් උසස් මට්ටමකට ගෙන ආ යුතුයි. රගර් ක්‍රීඩාව, ක්‍රිකට් ක්‍රීඩාව පමණක් නොවෙයි, එල්ලේ ක්‍රීඩාව, වොලිබෝල් ක්‍රීඩාව වාගේම අපේ රටට අලුතින් ඇවිල්ලා තිබෙන baseball ක්‍රීඩාව ආදී සියලුම ක්‍රීඩාවන් මේ රටේ සියලු පළාත්වලට, සියලු ජාතීන් අතරට අර ගෙන ගිහිල්ලා මේ රට දියුණුව කරා යන ශීඝ්‍ර ගමනේ දී ක්‍රීඩාවත් දියුණු වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.40]

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා අමාත්‍යාතුමා විසින් ක්‍රීඩා පනත යටතේ ගෙනෙන ලද මේ නියෝග වෙනුවෙන් මේ උත්තරීතර සභාව හමුවේ වචන කිහිපයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම 1973ට පසුව ක්‍රීඩා පනත සංශෝධනය කරලා මේ හරහා අපේ රටේ ක්‍රීඩාවට යම් කිසි ශක්තියක් ලබා දෙන්නට මේ කරන කැප කිරීම, මේ දරන්නා වූ වෑයම වෙනුවෙන් ගරු ක්‍රීඩා අමාත්‍යාතුමාටත් අදාළ නිලධාරින්ටත් අපේ ප්‍රණාමය පුද කරන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු මොනවා කිව්වත් මෑත ඉතිහාසය තුළ අපේ රටේ ක්‍රීඩාවේ ඉතා විශාල ප්‍රගමනයක්, දියුණුවක් අපි දකිනවා. අපේ රටේ ක්‍රිකට් කණ්ඩායම ලෝක ශූරයන් බවට පත් වෙලා තිබෙනවා. ඊළඟට තවත් ලෝක ශූරතා තරගාවලි දෙකකින්ම ඉදිරියට එන්නට අපට පුළුවන් වුණා. පසු ගිය කාලය තුළ ක්‍රිකට් ක්‍රීඩාවේ විශාල දියුණුවක් අපි දැක්කා. ඒ වාගේම මලල ක්‍රීඩාව පැත්තෙන් ගත්තොත්, ඩන්කන් වයිට් මහත්මාට පස්සේ සුසන්තිකා ජයසිංහ මහත්මියට විශාල ජයග්‍රහණයකට යන්න පුළුවන් වුණා. ඒකත් මලල ක්‍රීඩාවේ අපි දැක්ක ලොකු දියුණුවක්; වෙනසක්. ඒ වාගේම නෙට් බෝල් ක්‍රීඩාව ඇතුළු අනෙකුත් සෑම ක්‍රීඩාවකම විශාල දියුණුවක් රටේ ඇති වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දියුණුවත් එක්ක එක පැත්තකින් ක්‍රීඩාවට මිලක් ලැබිලා තිබෙනවා; අපේ රටේ ක්‍රීඩකයින්ට වටිනාකමක් ලැබිලා තිබෙනවා. ඒකත් එක්ක තමයි මේ ප්‍රශ්න මතු වන්නේ. පසු ගිය කාලය තුළ ක්‍රීඩකයින්ගේ කැප කිරීම, කැප වීම, පුහුණුකරුවන්ගේ කැප කිරීම, කැප වීම එක්ක දියුණු වුණු ක්‍රීඩාවට මිලක්, වටිනාකමක් ලැබුණු වෙලාවේ ඉඳලා අපේ රටේ ප්‍රභූන්ගේ, ව්‍යාපාරික පෙළැන්තියේ, දේශපාලන අධිකාරියේ අවධානය ක්‍රමක්‍රමයෙන් මේකට යොමු වෙන්න පටන් ගත්තා. ඒ ලබා ගත්ත දියුණුවත් එක්ක තමයි අද යම් යම් නිලවරණවලට, සංගම්වල සභාපති ධුරවලට ඒ හැම කෙනාම එන්න හදන්නේ. ඉතින් ඒකේදී තමන්ගේ චේතනාව පරිශුද්ධ නම් කිසි වරදක් නැහැ. තමන් ඒ නිලතලවලට එන්නේ ක්‍රීඩාවේ දියුණුව සඳහා යමක් කරන්නට නම්, ගම්වල ඉන්න අහිංසක ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අත දෙන්නට නම්, අපේ රටේ දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තරයට ගෙන යන්න ඕනෑය කියන පිරිසිදු පරම චේතනාවෙන් නම් ඒකේ කිසි ගැටලුවක් නැහැ. ඕනෑම කෙනකුට මේකට එන්න අවස්ථාව තිබිය යුතුයි. ඒකෙදී වාරණ පනවා නැහැ. මේ සංශෝධන දිහා බලද්දී වුණත් එහෙම ලොකු වාරණ නැහැ. යම් යම් සීමිත වාරණ විතරයි පනවා තිබෙන්නේ. ගරු ක්‍රීඩා ඇමතිතුමා ඕනෑම කෙනකුට එන්න අවස්ථාව දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ක්ෂේත්‍රය තුළ දේශපාලනය තිබෙන්නට බැහැ. මෙය නිර්දේශපාලනීකරණය විය යුතුයි. ක්‍රීඩාව කියන්නේ පිරිසිදු දෙයක්. මේ තුළ දේශපාලනයවත්, උස් පහත්කම්වත් තිබෙන්න බැහැ. ඒ නිසා මේ නිලවරණවලට, නිලතලවලට එන අය පක්ෂ දේශපාලනයෙන් තොරව හොඳ චේතනාවත් එක්ක ඇවිත් ක්‍රීඩාවේ දියුණුවට කටයුතු කරනවා නම් එය ඉතාමත් හොඳ දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. අද සමහර වෙලාවට අපට හිතෙනවා, අපේ මලල ක්‍රීඩාව ඇතුළු පාසල් ක්‍රිකට් ක්‍රීඩාව පසුබෑමකට ලක් වෙලාදෝ කියලා. අපේ ගරු

අස්වර් මන්ත්‍රීතුමාත් දන්නවා ඇති, ඉස්සර පාසල් ක්‍රීඩා තරගයක් නරඹන්න විශාල පිරිසක් හිටියා. විශාල උද්යෝගයක් තිබුණා. පාසල් ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් ලොකු උනන්දුවක් තිබුණා. මුලින්ම පාසල්වල ක්‍රීඩා තරගවලින් තමයි දරුවන් දක්ෂතා දක්වා ඉදිරියට එන්නේ. ඊළඟට තමන්ගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන තරගවලින්.

ඊළඟට තමන්ගේ කලාපයේ, තමන්ගේ පළාත තුළ ජාතික ක්‍රීඩාවලින් දක්ෂතා දක්වලා තමයි ඉදිරියට එන්නේ. ගරු ඇමතිතුමනි, කියන්න කනගාටුයි සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ක්‍රීඩා තරග ගැන බලන්න කවුරුවත් නැහැ. ඒවාට මුදල් වෙන් කර තිබුණාට සමහර වෙලාවට ඒ මුදල් අපතේ ගිහිල්ලා. සමහර වෙලාවට මුදල් නැහැ. සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ක්‍රීඩා තරගයක් සඳහා මුදල් සොයා ගන්න අප ළඟටත් එන අවස්ථා තිබෙනවා. ඒවායේ කිසිම පිළිවෙළක් නැහැ. ගරු ඇමතිතුමනි, සමහර වෙලාවට මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින ක්‍රීඩා නිලධාරීන් වැඩ කරන්නේ නැහැ. අපි ඒක දැකලා තිබෙනවා. ඒ අය වෙනත් වෙනත් කටයුතුවල යෙදෙනවා. හැබැයි තමන්ගේ වැටුප ලබා ගන්නවා. මා මෙතැනදී ඒ නිලධාරීන් සියලු දෙනාවම මේකට ලඝු කරන්නේ නැහැ. මොකද, වැඩ කරන අයට එහි ගෞරවය ලැබෙන්නට ඕනෑ. නමුත් වැඩ නොකරන අයත් රාශියක් සිටිනවා. ඒ පිළිබඳවත් මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ක්‍රීඩා තරගයක් පවත්වන්න නම් ඒ සඳහා අරමුදලක් තිබෙන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම් මට්ටමේ බිම් මට්ටමේ සිටින ක්‍රීඩා සඳහා දක්ෂතා දක්වන දරුවන්ට විදේශ තරග සඳහා සහභාගි වන්නට යන්න සපත්තු දෙකක් ගන්න සල්ලි නැති වන අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට ඒ අයට ගුවන් ගමන් බලපත්‍රය ලබා ගන්න සල්ලි නැහැ. එවැනි අවස්ථාවල ඒ අය අපි ළඟට එනවා. සමහර වෙලාවට අපි දැකලා තිබෙනවා, ඒ අය ව්‍යාපාරික පෙළැන්තිය පසුපස යනවා; ගමේ සිටින ප්‍රභූවරුන් පසුපස යනවා. සමහර වෙලාවට ඒ දරුවන් අසරණයි. නමුත් මේ සඳහා ශක්තිමත් ක්‍රීඩා අරමුදලක් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම තිබෙනවා නම් ඒක ලොකු පහසුවක් වනවාය කියලා අපි හිතනවා. කොට්ඨාස ක්‍රීඩා තරගවලින් පසුව එතැනින් එහාට කලාප තරගවලට එනවා. කලාප තරගවල තත්ත්වයත් එහෙමයි. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ ජාතික ක්‍රීඩා ඇමතිවරයා වුණත්, මේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබෙන පාසල් මලල ක්‍රීඩාව පිළිබඳවත් අවධානය යොමු කරන්න. ඒක අධ්‍යාපන අමාත්‍යාංශයට නැතිව ඔබතුමා ළඟම තිබුණා නම් හොඳයි කියලායි මම හිතන්නේ. මොකද අපි පසු ගිය කාලයේ දැක්කා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩාව භාරව සිටින සමහර නිලධාරීන් පිට රට සවාරි ගහනවා; ඒ අය සල්ලි හම්බ කර ගන්නවා; ඒ සල්ලි වියදම් කර ගන්නවා. තමන්ගේ පාසල්වල ක්‍රීඩාව දියුණු කරන්නටවත්, ඒ ඒ පාසල්වල මලල ක්‍රීඩකයින් හෝ අනෙකුත් ක්‍රීඩකයින් ජාත්‍යන්තරයට ගෙන යන්නවත් ඒ අයගේ වැඩ පිළිවෙළක් නැහැ. ඒක ගැනත් අවධානය යොමු කරන්න කියලා අපි තමුන්නාන්සේට විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

අපි ඉතාමත් සතුටු වනවා, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ක්‍රීඩාවට ආදරය කරන කෙනෙක් වීම ගැන. එතුමා මලල ක්‍රීඩා සංගමයේ - AASL - සභාපති හැටියට කටයුතු කරපු කෙනෙක්. ඉතින් එහෙම නායකයකු යටතේ මේ ක්‍රීඩාව දියුණු කරන්න ගරු ඇමතිතුමාට ලොකු නිදහසක් ලැබිලා තිබෙනවා කියලා මා හිතනවා. ඒ වාගේම අපේ තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් -විශේෂයෙන්ම නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඇතුළු මේ පාර්ලිමේන්තුවේ දෙපැත්තේම සිටින පක්ෂ විපක්ෂ තරුණ මන්ත්‍රීවරුන්- සියලු දෙනාගේම අවධානය මේ ක්‍රීඩාව දියුණු කිරීම කෙරෙහි යොමු වෙලා තිබෙනවා. මේ රටේ නම ඉදිරියට ගෙන යන්නට මේ ක්‍රීඩාව දියුණු කරන්නට අපට වුවමනායි. ඒ සඳහා අපෙන් අවශ්‍ය කරන ඕනෑම සහයෝගයක් දෙන්න අපි කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගරු ඇමතිතුමාට අපේ ස්තුතිය පුද කරන්නට ඕනෑ. තමුන්නාන්සේ මේ ක්‍රීඩා පිටිටනි දියුණු කරන වෙලාවේදී දේශපාලනය බැලුවේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට හොඳම උදාහරණයක් තමයි මගේ මැතිවරණ කොට්ඨාසය වන වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ සර් ඇල්බට් එෆ්. පීරිස් ක්‍රීඩාංගණය. එය ඉදි කළේ නිටපු ඩීවර අමාත්‍ය ෆෙස්ටස් පෙරේරා මැතිතුමායි. පසු ගිය කාලයේ දී ගරු ඇමතිතුමා සෑම කොට්ඨාසයකම, සෑම පළාතකම, සෑම දිස්ත්‍රික්කයකම ක්‍රීඩා පිටි සංවර්ධනය කළා. ඒ ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේදී අත් හැර දමා තිබුණු, අවධානය යොමු නොවී තිබුණු වෙන්නප්පුව ඇල්බට් එෆ්. පීරිස් ක්‍රීඩාංගණය -මම හිතන්නේ වයඹ පළාතේ තිබුණු හොඳම ගෘහස්ථ ක්‍රීඩාංගණය- කෙරෙහි ඔබතුමා අවධානය යොමු කළා, දේශපාලනය බැලුවේ නැහැ. ඒ වාගේම මේ කාරණය ගැනත් ගරු ඇමතිතුමාට මගේ ප්‍රණාමය පුද කරන්නට කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මැදිහත් වෙලා ලක්ෂ 100ක මුදලක් වියදම් කරලා වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ සහ පුත්තලම දිස්ත්‍රික්කයේ අභිංසක පාසල් දරුවන් වෙනුවෙන් ආරම්භ කරපු -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නිර්මාණය කරපු ඒ පිහිනුම් තටාකයේ කටයුතු නිම කරන්නට ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරලා අවශ්‍ය සහයෝගය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මා මේ අවස්ථාවේ දී තමුන්නාන්සේගේ අවධානයට යොමු කරන්න කැමැතියි, විශේෂයෙන්ම දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හරිහමන් ක්‍රීඩා පිටියක් නැහැ; ක්‍රීඩා කරන්න හරිහමන් ස්ථානයක් නැහැ කියන කාරණය. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා අපේ ආසනය වෙනුවෙන් මා මතක් කරනවා.

ඒ වාගේම පුත්තලම් දිස්ත්‍රික්කය කියන්නේ අතීතයේදී මලල ක්‍රීඩාවට විශාල වශයෙන් ක්‍රීඩකයන් දායක කළ දිස්ත්‍රික්කයක්. වර්තමාන ක්‍රිකට් කණ්ඩායම ගැන බැලුවත් පුත්තලම් දිස්ත්‍රික්කය නියෝජනය කරන ක්‍රීඩකයන් එහි ඉන්නවා. ඒ නිසා අපි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා, එතුමා නිර්මාණය කරන ක්‍රීඩා පිටිටනිය වාගේම අනිකුත් ක්‍රීඩාවන් සඳහාත් අවශ්‍ය සහයෝගය පුත්තලම් දිස්ත්‍රික්කයට ලබා දෙන්නය කියා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ තරුණ ජවයක් තිබෙන, ක්‍රියාශීලී, වැඩ කරන අමාත්‍යවරයෙක්. ඔබතුමා නාවලපිටිය සංවර්ධනය කර තිබෙන ආකාරය අපි දැක්කා. ඒ නිසා තමුන්නාන්සේට මේ කටයුතු කරන්න ශක්තිය තිබෙන බව අප දන්නවා. මේ කටයුත්තේදී පක්ෂ, විපක්ෂ සියලු දෙනාම එකතු කර ගන්න ඕනෑ. නිලංග සුමතිපාල මන්ත්‍රීතුමන්ලා වැනි අය එකතු කර ගන්න. එතුමන්ලාට ඒ ශක්තිය තිබෙනවා. නිශාන්ත රණතුංග මැතිතුමන්ලා වැනි අයත් සමගි කර ගෙන, සියලු දෙනා එකතු කර ගෙන ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරනවා වාගේම අනිකුත් ක්‍රීඩා දියුණු කරන්නත් අවශ්‍ය ශක්තිය තමුන්නාන්සේට තිබෙනවා. ඒ ශක්තිය ලබා ගෙන මේ ක්ෂේත්‍රය දියුණු කරන්නය කියමින්, ඒ කටයුත්තේදී අපට දෙන්න පුළුවන් සහයෝගය ලබා දෙනවාය කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Thilanga Sumathipala. Before he starts, will an Hon. Member propose the Hon. Tharanath Basnayaka to take the Chair?

ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)

I propose that the Hon. Tharanath Basnayaka do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තාරානාත් බස්නායක මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. R. YOGARAJAN *left the Chair, and* THE HON. THARANATH BASNAYAKA *took the Chair.*

[අ.භා. 5.51]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31වැනි වගන්තියට යටත්ව 2013 අංක 1 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරන අවස්ථාවේදී වවන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මම ඉතාම සන්තෝෂ වෙනවා. ලංකාවේ අතිශය වැදගත් අංශයක් වන ක්‍රීඩාවේ අනාගතය පිළිබඳව අදත් හෙටත් -දින දෙකක් පුරා- මේ උත්තරීතර සභාවේ පැවත්වෙන මේ විවාදයට සහභාගි වෙන්නට ලැබීම ගැන තරුණ මන්ත්‍රීවරුන් හැටියට අපි සන්තෝෂ වෙනවා. ඒ වාගේම අපගේ ක්‍රීඩා ඇමතිතුමා මේ පිළිබඳව දැක්වූ උනන්දුව, මහන්සිය අපි අගය කරනවා. මා 1995 සිට ජාතික ක්‍රීඩා සංගම්වලට සම්බන්ධ වෙලා වැඩ කළ කෙනෙක්. මා අවුරුදු 18ක් තිස්සේ මේ රටේ ජාතික ක්‍රීඩා සංගම්වල ජාතික සංගමයක - විශේෂයෙන් ක්‍රිකට් පාලක මණ්ඩලයේ- උප සභාපති හැටියට පටන් අරගෙන එදා මෙදාතුර ක්‍රීඩා ඇමතිවරුන් වාගේම අමාත්‍යාංශයේ නිලධාරීන් එක්ක වැඩ කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන්ම මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ රටේ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ගැසට් පත්‍ර කොතෙකුත් ඉදිරිපත් කළත් එය නීත්‍යානුකූලව මහා සභාවට එහෙම නැත්නම් ජාතික සභාව වන මෙම උත්තරීතර සභාවට ඉදිරිපත් කළ යුතුව තිබුණත් කවදාවත් ඒවා ඉදිරිපත් කර තිබුණේ නැහැ. අද නිකම්ම නිකම් ගැසට් එකක් ඉදිරිපත් කරන දවසක් නොවෙයි. මේ රටේ ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය 2012 මැයි 16වන බදාදා ගැසට් කරලා එය මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරන්න සැලසුම් කරන අතරතුර අපගේ ක්‍රීඩා නීතියට නියෝග මාලාවක් ගෙනෙනවා. මේ නියෝග ඉදිරිපත් කිරීමෙන් ක්‍රීඩා පනතට අනුව වගන්ති 56ක් මේ ගැසට් පත්‍රයෙන් අලුතින් ඉදිරිපත් කරනවා. මෙය ක්‍රීඩා නීතිය සම්පූර්ණයෙන්ම වෙනස් කරනවා හා සමාන ඉතා විශාල භාර දුර කර්තව්‍යයක්. නමුත් විශාල මහන්සියක් වෙලා කතිකාවක් ඇති කරගෙන ක්‍රීඩා සංගම්වලට, ජාතික සංගම්වලට කථා කරලා එතුමා මේ ක්‍රියාදාමයේ නියැලෙනවා. මෙහිදී අපට වෙන් වෙන් වශයෙන් කථා කිරීමේ හැකියාවක් තිබෙනවා. මෙහිදී නියෝග 56ක් ඉදිරිපත් කර තිබෙනවා. මූලික සිද්ධාන්තයක් හැටියට ගත්තොත් ගරු ඇමතිතුමාගේ අරමුණ වෙලා තිබෙන්නේ මේකයි. 1973දී ඉදිරිපත් කර තිබෙන මේ ක්‍රීඩා පනතට මේ වනකොට අවුරුදු 40ක් ගත වෙලා තිබෙනවා. හැමෝම කියනවා ක්‍රීඩා පනත අලුත් වෙන්න ඕනෑය, වෙනස් වෙන්න ඕනෑය කියලා. එම ක්‍රීඩා පනත තිබෙන අතරතුර නියෝග තුළින් එහෙම නැත්නම් ක්‍රීඩා ඇමතිතුමාට තිබෙන බලතල පාවිච්චි කරමින් යම් කිසි දුරකට ක්‍රියා දාමයක් ඇති කරලා ප්‍රධාන ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් කරා රට මෙහෙයවන ක්‍රමවේදයක් එතුමා පළමු වතාවට මේ තුළින් පෙන්නුම් කර තිබෙනවා.

අපි මේවා වෙන් වෙන් වශයෙන් ගත්තොත් ප්‍රධාන කරුණු හැටියට මා දකින්නේ ජාතික ක්‍රීඩා සංගම්වල ප්‍රතිපත්තිමය එකඟතාවක් ඇති කිරීම සඳහා විනයක් ඇති කිරීමයි. හැම ජාතික සංගමයක්ම ඒ පාලන කාලයේදී ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඇති කිරීම, දීර්ඝ කාලීන වැඩසටහනක් ඇති කිරීම, මූල්‍යමය පරිපාලනයක් ඇති කිරීම, පරිපාලන ක්ෂේත්‍රයේ ඉන්න අයට යම් කිසි විනයානුකූල වැඩසටහනක් ඇති කිරීම ආදි කරුණු ඇතුළත්ව ක්‍රමවත් හා විධිමත් අරමුණකින් මෙම නියෝග ඉදිරිපත් කර තිබෙනවා. දහවල් කාලයේ සිට විපක්ෂයේ නොයෙකුත් මන්ත්‍රීවරු මෙම සංවාදයට සහභාගි වුණා. ඇත්තටම මට කාලය වෙන් වෙලා තිබුණේ හෙට දවසේ කථා කරන්නයි. නමුත් මා හිතුවා, අද සන්ධ්‍යාවේ කථා කිරීම යෝග්‍යයි කියලා. එම නිසා ඒ සම්බන්ධයෙන් මා ඉල්ලීමක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම නියෝග අනුව ජාතික සංගමයක් ලියා පදිංචි කිරීම ගැන ඇමතිතුමා ප්‍රථමයෙන්ම කථා කළා. ඒ සඳහා වර්තමාන යුගයට සාපේක්ෂිතව යම් කිසි මුදලක් වැඩි කරලා ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. ලියා පදිංචියෙන් පටන් ගෙන පාසල් සංගම් සහ ජාතික සංගම් අතර වඩාත් සමීප සබඳතාවක් ඇති කිරීම සඳහා නියෝග පනවා තිබෙනවා. එය අතිශය වැදගත්. මොකද, පාසල් පද්ධතිය තිබෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේයි. ක්‍රීඩාව තිබෙන්නේ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේයි. අද පළාත් ක්‍රීඩා ඇමතිවරු ඉන්නවා; පළාත් අධ්‍යාපන ඇමතිවරු ඉන්නවා. මෙහි සහසම්බන්ධතාවක් තිබෙන්න ඕනෑ. ඒ සහසම්බන්ධතාව ජාතික ප්‍රතිපත්තියත් සමඟ එකට යන්න ඕනෑ. එම නිසා ඒ ගැන විශේෂ අවධානයක් යොමු කිරීම ගැන අපි එතුමාට ප්‍රශංසා කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ජාතික සංගම් සඳහා පත් කරන නිලධාරී මණ්ඩලය ක්‍රීඩාව උදෙසා වඩාත් ක්‍රමවත් සහ ඵලදායී සේවාවක් ලබා දීම සඳහා නියෝග පනවා තිබෙනවා. මෙහිදී එතුමා වෙන්ව කථිකාවක් ඇති කර ගෙන වැඩසටහනක් සකස් කර තිබෙනවා. ජාතික සංගමයට ස්ථාවරභාවයක් ලබා දීම සඳහා යම් කිසි කෙනකු ජාතික සංගමයේ යම් කිසි ධුරයක් දරන එක් අවුරුදු කාල සීමාව අවුරුදු දෙක දක්වා වැඩි කර තිබෙනවා. ඒ අනුව එහි අවුරුදු 2ක සේවාවක් කළ කෙනකුට ඊළඟ වතාවේ නිලවරණයට ඉදිරිපත් වන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම නියෝග තුළ මා දකින ඉතා වැදගත්ම දේ ගැසට් නිවේදනයේ 13. (2) යටතේ සඳහන් වනවා. එය මෙසේයි:

"නැවත තේරී පත්වීම අපේක්ෂා කරනු ලබන නිලධරයාගේ අදාළ ධුරකාලය සැලකිල්ලට ගෙන සහ විශේෂයෙන්ම පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා, එනම්-

(අ) පළාත්, දිස්ත්‍රික් සහ කලාප මට්ටම්වල ක්‍රීඩා සංවර්ධනයෙහි නියුක්ත වී ඇති ආකාරය පිළිබඳ ව;"

බලන්න, එය කොපමණ වටිනවාද කියලා. තනතුරුවලට පත් වන අපේ සමහර නිලධාරීන්ට ගම් මට්ටමේ, දිස්ත්‍රික්ක මට්ටමේ, කලාප මට්ටමේ ක්‍රීඩා ගැන කිසිම අවබෝධයක් නැහැ. එම නිසා නැවත තේරී පත්වීම අපේක්ෂා කරන්නේ නම් ඒ ගැන වාර්තාවක් අවශ්‍ය වනවා. ඊළඟට අදාළ ජාතික කණ්ඩායමේ කුසලතා මට්ටම වැඩි කිරීම සඳහා ගන්නා ලද පියවර සැලකිල්ලට ගන්නවා. එය අතිශය වැදගත්. රට තුළ වෙන්න පුළුවන්, ජාතික කණ්ඩායමේ වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ජාත්‍යන්තර වෙන්න පුළුවන් අපට ඉලක්කයක් තිබෙන්න ඕනෑ. ලබා ගන්නා රන් පදක්කම් ප්‍රමාණය වෙන්න පුළුවන්, රිදී පදක්කම් ප්‍රමාණය වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ජාතික ක්‍රීඩාව තුළ ඒ අයගේ timing වෙන්න පුළුවන්, පනින දුර ප්‍රමාණය වෙන්න පුළුවන්, එවැනි යම් කිසි ඉලක්කයන් දීලා ඒවා ක්‍රියාත්මක වනවාද කියා බලන්න ඕනෑ. ඊළඟට දක්ෂතා සහිත ක්‍රීඩකයන් හඳුනා ගැනීම පිළිබඳ ගන්නා ලද පියවර සැලකිල්ලට ගන්නවා. අද බොහෝ විට අපි දකිනවා, කැලේ පිපෙන මල් කැලේම පර වෙලා යනවා. මා කලින් කිව්වා වාගේ ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියේදී ක්‍රීඩා ඇමතිතුමා කියනවා, මේ රටේ සහජ හැකියාවක් ඇතිව උපදින හැම දරුවකුටම රට නියෝජනය කරන්න සාධාරණ අවස්ථාවක් තිබෙන්න ඕනෑය කියලා. රට නියෝජනය කරන්න සාධාරණ අවස්ථාවක් තිබෙනවා නම්, ජාතික සංගම් තුළින් ඕනෑම ක්‍රීඩාවක් ක්‍රියාත්මක වෙනවා නම් රට පුරා පුළුල්ව විහිදුණු ඒ දක්ෂතාවන් තිබෙන අය හඳුනා ගැනීමට ඒ අයට පුළුවන්කම තිබෙන්න ඕනෑ. හඳුනා ගත් ක්‍රමවේදයත් සමඟ ඔවුන්ට පුහුණුව සඳහා අවස්ථාවක් දෙන්න, එහෙම නැත්නම් ඒ අයට ඉදිරිපත් වෙන්න අවස්ථාවක් දෙන්න, ඒ පුහුණු වුණු අය ජාතික මට්ටමින් සංචිතයකට එකතු කරන්න, එකතු වුණු අයව රඳවා ගෙන ජාතික කණ්ඩායම නිර්මාණය කරන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. එය අතිශය වැදගත්. ඊළඟට ක්‍රීඩා පරිපාලනයෙහි විනිවිදභාවය සහතික කිරීම පිළිබඳව ගන්නා ලද පියවර සැලකිල්ලට ගන්නවා. එයත් අතිශය වැදගත්. සමහර සංගම්වල වාර්ෂික වාර්තාවක් නැහැ. ඒ වාර්තාව හදන්නේ නිලවරණයට සති තුනකට, සති හතරකට පෙරයි. එහි ඉදිරි සැලැස්මක් නැහැ. ඒ වාගේම පත් වුණාට පස්සේ පරිපාලනයේ නිලධාරීන් එකතු කර ගෙන කමිටුවක් පත් කරනවා. ඒ කමිටුව විසින් management committee එකක් හෝ පත් කර ගෙන අවුරුද්ද පුරාම පවත්වා ගෙන යනවා.

ඒ වාගේම ක්‍රීඩා පරිපාලනයේ විනිවිදභාවය ගැන කිව්වා. ඊළඟ අවුරුද්දේ තමන්ගේ දර්ශනය, තමන් වැඩ කරන හැටි ජාතික කණ්ඩායමට, ජාතික සභාවට, නැත්නම් ජාතික සම්මේලනයට ඉදිරිපත් කරන්න කියනවා. ක්‍රීඩා අමාත්‍යතුමා මේ ගැන වෙනමම සලකා බලා, අනුගාමී තව එක් වරක් සඳහා වූ කාල සීමාවක් සඳහා එකී තැනැත්තන් නැවත පත් කිරීම සඳහා අවසරය ප්‍රදානය කරන්න නීති සකසා තිබෙනවා.

යම් කෙනෙක් කුමන හෝ පොරොන්දුවක් දීලා ක්‍රීඩා පරිපාලනයට ආවාය කියලා අපි හිතමු. ඔහු ඒ කියපු දේවල් කරලා නැත්නම්, සාමාජිකත්වයට ඔහුගේ අවශ්‍යතාවක් නැත්නම් ඇමතිතුමාට කියන්න පුළුවන්, "මා මේ ගැන හොඳට හොයලා බැලුවා, බහුතරයකගේ කැමැත්තක් ඔබතුමාට නැහැ, මට සහයෝගය දෙන්න අමාරුයි" කියලා. එය තමයි රටක ක්‍රීඩාව නියෝජනය කරන ඇමති කෙනෙකු සතු නිෂේධ බලය. ඒ වෙනුවෙන් මෙහි ලිඛිතව නීති සකස් කර තිබෙනවා. ජාතික සංගමයක වග කීමක් ගත්තොත් ඇත්තටම අපි බයයි. අපේ හිතේ යම් කිසි පීඩනයක් තිබෙනවා, "මේ අවුරුද්ද ඉවර වෙන්න කලින් මා මේ මේ දේවල් කරන්න ඕනෑ" කියලා. ඒක හොඳයි. ඒ පීඩනය තියෙන්න ඕනෑ. හොකී වෙන්න පුළුවන්, football වෙන්න පුළුවන්, රගර් වෙන්න පුළුවන්, එවැනි සංගමයක තනතුරු දරන්න තිබෙන ආසාවට තනතුරු අරගෙන එවැනි සංගමයක් මෙහෙය වන්න බැහැ. ඊට අදාළ නීති සැකසීම ගැන මා ඇමතිතුමාට ප්‍රශංසා කරනවා. එතුමා කිව්වා බොහොම හොඳට අවුරුදු හයක් ඉන්න පුළුවන් කියලා.

හැබැයි අවුරුදු හයක් නිකම් ඉන්න බැහැ. අවුරුදු දෙකකට පස්සේ තව වතාවක් එම තනතුරට ඉල්ලනවා නම් තමන් කරපු වැඩ පිළිබඳ වාර්තාවක් දෙන්න ඕනෑ. ඊට පස්සේ තව වතාවක් ඉල්ලනවා නම් යළිත් වාර්තාවක් දෙන්න ඕනෑ. මේක ඉතාම හොඳ දෙයක්. එහෙම දෙයක් නැත්නම්, කවුරු ක්‍රීඩා ඇමති වුණත් යම් අය ඇවිත් එතුමාට පීඩනයක් එල්ල කරනවා, "මට අවසර දෙන්න, මට ඡන්දය ඉල්ලන්න ඕනෑ" කියලා. සමහර විට ඒ අයට විශාල ඡන්ද බලයක් හෝ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කැමැත්තක් නැහැ. ඔවුන් මේ තනතුරුවලට ඇවිල්ලා මේ ආයතන සංවර්ධනය කරනවාට වඩා ඒවාට නොයෙකුත් විධියේ බලපෑම් ඇති කරනවා, තමන්ගේ පැවැත්ම සඳහා. මේ තත්ත්වය හුඟක් ක්‍රීඩා සමාජවල මා දැක තිබෙනවා. ක්‍රිකට් විතරක් නොවෙයි, අනික් පොඩි පොඩි ක්‍රීඩා සංගම් තුළ මේ ප්‍රශ්නය තිබෙනවා.

ඊළඟට තවත් වැදගත් කාරණයක් තමයි ජාතික සංගම්වල නිලතල දැරීම සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගන්නා ක්‍රමය. මේ කාරණයේදී මා පැහැදිලිව කියන්න ඕනෑ, වර්තමානයේ තිබෙන ක්‍රීඩා නීතියට අනුව සුදුසුකම් පිළිබඳව 15 වගන්තියේ අලුතින් නොයෙකුත් යෝජනා ඉදිරිපත් කර තිබෙන බව. මෙහි ක්‍රීඩා භාණ්ඩ විකුණන අය ගැන කියා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මටත් ක්‍රීඩා භාණ්ඩ ගෙන්වන ආයතනයක් තිබුණා. මම ඒකෙන් ඉවත් වුණා. මොකද, මම ක්‍රිකට් නිලවරණයට සම්බන්ධ වුණාම නැති ප්‍රශ්නයක් ඇති වෙන නිසා. මගේ භාර්යාවගේ නමටත් ඒ ආයතනයේ කොටස් තිබුණා. මම එතුමියටත් ඒකෙන් ඉවත් වෙන්න කිව්වා. මේ නීති ගෙනාපු එක ඉතාම හොඳයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා විවාදය ආරම්භයේදීම කිව්වා වාගේ, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වර්තමාන භාණ්ඩාගාරික මහත්මයාට අයත් ක්‍රීඩා භාණ්ඩ ගෙන්වන ආයතනයක් තිබෙනවා. ඒ ආයතනයෙන් පසු ගිය අවුරුදු තුනේ මිලියන 80ක විතර භාණ්ඩ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අරගෙන තිබෙනවා. මා හිතන්නේ නැහැ ක්‍රිකට් ආයතනය සල්ලි දීලා ක්‍රීඩා භාණ්ඩ ගන්න කොට, භාණ්ඩාගාරිකගේ ආයතනය අයින් කරලා ඒවා ගන්න පුළුවන් කියලා. එතකොට ප්‍රශ්නයක් තිබෙනවා. මම නම් දෙනිකව ව්‍යාපාරවල ඉන්න කෙනෙක් නොවෙයි. මේ නීතිය ගෙනාපු එක හොඳම දෙයක්. යම් කෙනෙකු ක්‍රීඩා භාණ්ඩ අළෙවි කරනවා නම්, ඒ ව්‍යාපාරයට සම්බන්ධ නම්, shuttlecock එකක්, racket එකක් ගෙන්වන කෙනෙකු නම්, පුහුණුකරුවකු නම්, ඒ පාලක මණ්ඩලයේ ඉන්නවා නම් ඔහු දරුවන්ට කියනවා, "මේක තමයි හොඳම එක, මේක ගන්න, මේක ගත්තොත් හොඳට ගහන්න පුළුවන්" කියලා. ඉතින් අර අහිංසක දරුවන්, දෙමව්පියන් ඒ ගැන හිතලා යම් කිසි බැඳීමක්, ආකර්ෂණයක් ඇති කරනවා මේ දරුවාට හොඳම දෙය ලබා දෙන්න. මේ පාලක මණ්ඩලවල තනතුරුවල ඕනෑම ක්‍රීඩාවකට අයත් ක්‍රීඩා භාණ්ඩ අළෙවි කරන අය ඉන්නවා නම් ඒක විශාල ප්‍රශ්නයක් කියලා මා හිතනවා. එය වැළැක්වීමේ නීති ගෙන ඒම පිළිබඳවත් මා ඇමතිතුමාට ගරු කරනවා.

සූදු ව්‍යාපාරයේ යෙදීම ගැනත් 15 වන වගන්තියේ සඳහන් කර තිබෙනවා. අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් ඒ ගැන කථා කළා, එය සෘජුව සහ වක්‍රව කෙරෙනවා කියලා. ඒකත් නිවැරදි වීම කෙනෙකුගේ කීර්ති නාමයට අතිශයින්ම හොඳයි. මාත් මේවාට සම්බන්ධ කරලා නොයෙකුත් මාධ්‍යවලින් කථා කරනවා. මට ඒවාට මුහුණ දෙන්න පුළුවන්. මොකද, සෘජුව හෝ වක්‍රව හෝ පෞද්ගලිකව ඒවාට මගේ කිසිම සම්බන්ධයක් නැහැ. ගරු ඇමතිතුමනි, මෙහිදී ඔබතුමාගේ පරමාර්ථය වන්නේ පුද්ගලයෙක් නොවෙයි, ක්‍රීඩාවේ සුබසිද්ධිය සහ කීර්ති නාමයයි. ඔබතුමා වැඩියෙන්ම කීර්ති නාමය ගැන හිතනවා කියලායි මා හිතන්නේ. මම හිතනවා ඒක හොඳ දෙයක් කියලා. ක්‍රීඩාවේ ගෞරවය තිබෙන්නේ ක්‍රීඩාව කෙරෙහි තිබෙන විශ්වාසය මත පදනම් වෙලායි. මැව් එකකදී අප කැමැති team එක පැරදුණාම ඒ ක්‍රීඩාවට ආදරය කරන, ක්‍රීඩාවත් එක්ක සම්බන්ධ අය සැක කරනවා

[ගරු තිලංග සුමතිපාල මහතා]

මෙතැන මොකක් හෝ දෙයක් වුණාද කියලා. සූදු ව්‍යාපාරය නිසා ඒ සැකය වැඩි වෙන්න පුළුවන් කියලා මා හිතනවා. එහි යම් කිසි සම්බන්ධතාවක් තිබෙනවා. ඒ නිසා මා හිතනවා ඔබතුමා බොහොම සද්භාවයෙන්, අවංක චේතනාවෙන් තමයි මේ නීති ගෙනාවේ කියලා. ඒ ගැන අපේ ප්‍රසාදය පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙහි අලුතින් දකින කරුණු රාශියකින් තවත් එක් කරුණක් තමයි නාම යෝජනා ලබා දීමේ ක්‍රමවත් ක්‍රමයක් ඇති කිරීම. බොහෝ ක්‍රීඩා සමාජවල සමහර අය නාම යෝජනා දෙන්න ඉස්සෙල්ලා, තමන්ට තේරී පත් වෙන්න අමාරු නම් -තමන්ට දිනන්න අමාරු නම්- තමන් සමඟ තරග කරන අනෙක් පුද්ගලයාට නාම යෝජනා ලැබුණේ නැහැ කියපු අවස්ථා තිබෙනවා. හැබැයි, ගරු ඇමතිතුමාගේ කථාවේදී කිව්වා වාගේ ඒ නාම යෝජනා කැඳවන්නේ ජාතික සංගමයෙන් නම්, නාම යෝජනා භාර දිය යුත්තේත් ජාතික සංගමයට විය යුතුයි කියායි අපි හිතන්නේ. ඔබතුමා අපට කිව්වා ඒක ඉදිරියේදී සංශෝධනය කරනවා කියලා. ඒක හොඳයි. මොකද, ඒ නාම යෝජනාව අධීක්ෂණය කරලා එවලේම පිටපතක් ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරියෙකුට ලබා දීලා,-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කථා කරන්න තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මම හිතුවේ තව විනාඩි 20ක් තිබෙනවා කියායි. මේ ක්‍රීඩා නීතිය පිළිබඳව නොයෙකුත් කථා තිබෙනවා. කෙසේ වෙතත් ගරු ඇමතිතුමා අද ගෙන ආ නියෝග පැහැදිලිවම මේ රටේ ක්‍රීඩාවේ අනාගත සුබසිද්ධිය සඳහා සද්භාවයෙන් ගෙන ආවාය කියන විශ්වාසය අපට තිබෙනවා. අද නොයෙකුත් ක්‍රීඩා සමාජ අපත් එක්ක සම්බන්ධ වෙලා ඉන්නවා. මහින්දානන්ද අලුත්ගමගේ මහතාගේ යුගය ක්‍රීඩාවේ වෙනසක්, ක්‍රීඩාවේ උන්නතිය සඳහා අවංකව සැබෑ වෙනසක් කිරීමේ අඩිතාලමක් -හොඳ foundation එකක්- දැමීමේ ආරම්භයක, එහෙම නැත්නම් බර අඩි තියලා පටන් ගන්නා ආරම්භක යුගයක්. ඔබතුමා ගිය අවුරුද්දේත් මේ අවුරුද්දේත් අවංකව ගන්නා වූ මහන්සියත්, ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය හා මේ ගෙනා නියෝගත් නිසා මේ රටේ අනාගත ක්‍රීඩාවේ දීර්ඝ ගමනක ආරම්භයක් වෙයි කියා අපි හිතනවා. එවැනි ආරම්භයක් ගන්න පුද්ගලයාට, වෙනසක් බලාපොරොත්තු වන පුද්ගලයාට එකවර මේ ඇති වන ප්‍රශ්නවලට මුහුණ දෙන්න හරි අමාරුයි. මොකද, මේ ක්‍රීඩාවල ඇලී ගැලී සිටින නොයෙකුත් කණ්ඩායම් ඉන්නවා. මම ඒ ගැන දන්නවා.

මම ක්‍රිකට්වලට සම්බන්ධ කෙනෙක්. මම මැරෙනකල් ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධයි. ඒ අපේ ආශාව; අපේ කැමැත්ත. හැබැයි, ඒ වුණත් ඔබතුමා මේ නියෝග ගෙනැල්ලා ක්‍රීඩාව වෙනුවෙන් සාධාරණ ක්‍රමවේදයක් හඳුන්වා දෙන්න. ඔබතුමාට මේ ප්‍රශ්නවලින් ඇති වන පීඩනය දරන්න අමාරුයි. නමුත් මම දන්නවා ඔබතුමාට ඒ ශක්තිය තිබෙනවා කියලා. එසේ ගන්න අමාරුයි කියන්නේ මේ නිසායි. ජාතික ක්‍රීඩා සමාජ පිටුපස අපට පෙනෙනවාට වඩා විශාල වළල්ලක් තිබෙනවා. ඒ වළල්ල තුළ ජාත්‍යන්තරයේ කොටස්කරුවෝත් ඉන්නවා. මම ඒ ගැන කියන්නම ඕනෑ ගරු ඇමතිතුමනි. රූපවාහිනී විකාශන අයිතිය අළෙවි කිරීම පිළිබඳවත් කිව යුතුයි. ඔබතුමා මෙතැනට ඇවිල්ලා අවුරුදු දෙකක් වාගේ කාලයක් තිස්සේ වැඩ කොටසක් කර ගෙන යනවා. යම් යම් නිලධාරීන්ට, සභාපතිවරුන්ට ලංකාවේ ක්‍රිකට් පාලනයෙන් ඉවත් වෙන්න සිද්ධ වුණු එක හේතුවක් තමයි ඒ ජාත්‍යන්තර වළල්ල. ලංකාවේ ක්‍රීඩාව පාලනය කරන්න ඕනෑ මූල්‍යමය ශක්තිය අනුව ක්‍රියා කරන අය ඒ වළල්ල තුළ ඉන්නවා. ඒක නිසා අපි හැම තිස්සේම ඔබතුමාට යථාර්ථය අවංකව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමාට ඒ කටයුතු කරන්න ශක්තිය ලැබේවි. විශේෂයෙන්ම අපේ සියලුම තරුණ මන්ත්‍රීවරුන් හිතන විධියට අලුත් යුගයක ආරම්භයකයි තමුන්නාන්සේ ඉන්නේ. ඒ ආරම්භයත් එක්ක මේ රටේ ක්‍රීඩාවේ අනාගතය අලුත් තලයකට ගෙන යන්න ගන්නා උත්සාහය, මහන්සිය සාර්ථක වේවායි කියා අපි අවංකවම ප්‍රාර්ථනා කරනවා. තමුන්නාන්සේ හොඳින් කල්පනා කරලා ඒ කියපු ජාත්‍යන්තර වළල්ල තුළ විධිමත්ව ක්‍රියාත්මක වෙයි කියා අපි විශ්වාස කරනවා. මොකද, ඒ කණ්ඩායම අපේ මේ උත්තරීතර සභාවේ ඉන්න කණ්ඩායමට වඩා බොහොම පුළුල්, බලවත් කණ්ඩායමක්. ඒ අය ලංකාවේ ඉඳලා නොවෙයි ඒ නියෝජනය කරන්නේ. එසේ කියමින් මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මේ කරපු වෙනසින් අපේ ක්‍රීඩාව අලුත් ලොවකට, අලුත් යුගයකට පැමිණේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

[අ. භා. 6.09]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට ක්‍රීඩා විෂය ගැන කථා කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. මොකද, මේ වසර බෝ නොවන රෝග වැළැක්වීමේ වසර හැටියටයි නම් කරලා තිබෙන්නේ. අපේ රෝහල්වල මිය යන සංඛ්‍යාවෙන් සියයට 70ක් මිය යන්නේ බෝ නොවන රෝගවලින්. බෝ නොවන රෝග කියලා කියන්නේ හෘදය රෝග, දියවැඩියාව වාගේ රෝගවලටයි. එම රෝගවලට ප්‍රධාන හේතුවක් වන්නේ ශරීරය වෙහෙස නොකිරීමයි. ඒ නිසා අද ජාතික මට්ටමින් බලන කොට යහපත් හා සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට ක්‍රීඩාව ඉතාම වැදගත් වෙනවා.

අපේ අතිගරු ජනාධිපතිතුමා මහින්ද චින්තන ඉදිරි දැක්මේ 66 වන පිටුවෙහි මෙසේ සඳහන් කරලා තිබෙනවා:

"නූතන ලෝකයේ ක්‍රීඩාව යනු සමාජයේ ජව සම්පන්න තරුණයන්ට පමණක් අයත් වූවක් නොව බාල මහළු සැම දෙනාටම විවෘත වූවකි. නිරෝගීත්වය, මානසික වර්ධනය සහ සාමූහිකත්වය යන මේ සියල්ලම ක්‍රීඩාව සමග එකිනෙකට සම්බන්ධය. එබැවින් ක්‍රීඩාව සංවර්ධනය කිරීම යනු අනාගත සමාජ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය වන්නාවූ ආයෝජනයක් බව මම විශ්වාස කරමි. එබැවින් ක්‍රීඩාව තුළින් පුද්ගලයා වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා ක්ෂේත්‍රයට සුවිශේෂී ශක්තියක් ලබා දීමට මම ක්‍රියා කරන්නෙමි."

අපි සතුටු වනවා, ගරු ක්‍රීඩා අමාත්‍යතුමා අතිගරු ජනාධිපතිතුමාගේ ඒ අරමුණ එහෙම නැත්නම් ඒ ඉලක්කය කරා යන්නට, පළමුවෙන්ම ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම ගැන. මේ ප්‍රතිපත්තිය සකස් කිරීමේදී එතුමා ප්‍රායෝගික වුණා. මමත් පළාත් සභාව නියෝජනය කළ අමාත්‍යවරයෙක්. එතුමා පළාත් ක්‍රීඩා අමාත්‍යවරුන් ගෙන්වූවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අද ක්‍රීඩාව විමධ්‍යගත වෙලායි තිබෙන්නේ. ඒ අනුව පළාත් සභාවල ක්‍රීඩා අමාත්‍යවරුන් සිටිනවා. ඔවුන් විශාල සේවාවක් කරනවා. එතුමා මේ සම්බන්ධයෙන්

පළාත් අමාත්‍යවරුන්ව දැනුවත් කළා. මෙය පළාත් මට්ටමෙන් වාගේම මුළු රටේම ක්‍රියාත්මක වෙනවා. ඒ අනුව පළාත් අමාත්‍යවරුන්ව දැනුවත් කරලා ඒ අයගේ සහයෝගය ලබා ගත්තා. ඒක ඉතාම වැදගත් වෙනවා. ඒ වාගේම අපේ ක්‍රීඩා අමාත්‍යවරයා දේශපාලනයේ කළ ගුණ දන්නා කෙනෙක්. එතුමා හිටපු ඇමතිවරුන්ව අමතක කළේ නැහැ. එතුමා මේ ප්‍රතිපත්තිය සකස් කිරීමේදී, හිටපු ක්‍රීඩා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමා වාගේම ගරු සී.බී. රත්නායක ඇමතිතුමා මෙම කාරණය ඉදිරියට ඇද ගෙන ආපු එක අගය කළා. එතුමා, "මම" කියලා සියලුම ලකුණු දා ගන්න ගියේ නැහැ. හිටපු ඇමතිවරු දෙදෙනාත් මේ කාරණයේදී විශාල දායකත්වයක් ලබා දුන්නා කියලා එතුමා මතක් කළා. ඒක ඉතාම වැදගත්. මොකද හේතුව? මේ දේශපාලන ගමන් මඟේදී එය වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රීඩා පනත යටතේ ගෙන එන ලද 17 වන නියෝගයේ සඳහන් රහස් ඡන්දය ක්‍රීඩා සංගම්වලට ඉතා වැදගත් වනවා. ඒ ක්‍රීඩා සංගමය සමහර විට සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමයක් වෙන්න පුළුවන්. සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමයක සභාපතිවරයා හැටියට මම කියන්නේ මෙයයි. වෙලේ ක්‍රිකට් ගහන එකට, ඉස්කෝලේ යන කාලයේ පාසල් බෑගයේ උපකරණ දා ගෙන ගිහින් ක්‍රිකට් ගහන එකට යම් කිසි අභිමානයක් තිබෙන්නට ඕනෑ. මේ නව නියෝග මඟින් රහස් ඡන්දයෙන් නිලධාරීන් පත් කිරීම හරහා එයට අභිමානයක් ලබා දීලා තිබෙනවා. එය ඉතාම වැදගත් වෙනවා. ක්‍රීඩා සංගම්වලට නිලධාරීන් පත් කිරීමේදී අතක් උස්සලා ඡන්දය දීමේදී ලොකු ගාම්භීරත්වයක් නැහැ. ඒ නිසා මේ රහස් ඡන්දය පාවිච්චි කිරීම වැදගත් වෙනවා, මේ සංගම් නියෝජනය කරන්නට පුළුවන්, වගකීමක් ගෙන කටයුතු කරන්නට පුළුවන් නිලධාරීන් පත් කර ගැනීමට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම නිල කාලය කියන දෙයත් වැදගත් වෙනවා. මීට කලින්, පත් වන ඒ නිලධාරීන්ගේ නිල කාලය එක අවුරුද්දයි. නිල කාලය ගැන සඳහන් කරන්නට කලින් මම වෙනත් වැදගත් කාරණයක් කියන්නට කැමැතියි. මෙම පනත යටතේ ගෙන එන 8 වන නියෝගය අපේ පාසල් ක්‍රීඩාවට ඉතා වැදගත් වෙනවා. ඒ තමයි සෑම ජාතික සංගමයකම විධායක කමිටුව සඳහා අදාළ පාසල් සංගම්වලින් අවම වශයෙන් නියෝජිතයින් දෙදෙනෙකුවත් සිටිය යුතුයි කියන කාරණය. ඒක ඉතාම වැදගත්. මොකද, මේ ක්‍රීඩාවේ මුල් ආරම්භය තිබෙන්නේ එතැන. අපේ ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා අද විපක්ෂය පැත්තේ සිටියත්, එතුමාත් ඉස්කෝලේ ක්‍රිකට් ගහලා තමයි අපට ක්‍රිකට් ලෝක කුසලානය ගෙනාවේ. එතුමාට ඉදිරියට යන්න මුල් වුණේ පාසලයි. පාසල තුළින් තමයි විශාල ක්‍රීඩකයින් සංඛ්‍යාවක් බිහි වෙන්නේ. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හරහා ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තරගාවලිය තිබෙනවා. පාසල්වල ජාතික තරගාවලි තිබෙනවා. මේ තුළින් තමයි ක්‍රීඩාවෙන් ඉදිරියට එන්නේ. මලල ක්‍රීඩකයින් බිහි වන්නේත් ඒ විධියටයි. ඒ පාසල් ක්‍රීඩකයාට ජාතික සංචිතවලට යන්න පුළුවන් අවස්ථාව ලබා දීලා තිබෙනවා. එක පැත්තකින් පාසල් ශිෂ්‍යයාට නායකත්වය සම්බන්ධව වගකීමක් බාර දීලා තිබෙනවා. නායකත්වයෙන් පිරි හොඳ පුරවැසියෙක් බිහි කරන්නට මෙය ඉතාම වැදගත් වෙනවා. ඉතාම කාලෝචිත නියෝගයන් ඉදිරිපත් කිරීම ගැන අපේ ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වන්නට ඕනෑ.

අනෙක් කාරණය තමයි, අපේ අන්තර් අමාත්‍යාංශ සම්බන්ධයක් නොමැති වීම. අපි තනි ගමනක් යන්නේ. එහෙම බැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයයි, ක්‍රීඩා අමාත්‍යාංශයයි අතර කිට්ටු සම්බන්ධයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම ගරු ක්‍රීඩා අමාත්‍යතුමා පසු ගිය කාලයේ කියලා තිබුණා, පාසල් යන දරුවෙක් අනිවාර්යයෙන්ම ක්‍රීඩා කරන්න ඕනෑ කියලා. පාසල් දරුවකුට ක්‍රීඩාව අවශ්‍යයි. මොකද, අද ක්‍රීඩාව කියන දේ වැදගත් වෙනවා. තරුණ පරපුරට අද බොහෝ දුරට ඉවසීම අඩුයි. ජය - පරාජය විඳ ගැනීමේ හැකියාව අඩුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අපි ආදරයෙන් පරාජය වුණාම සින්දුවක් ලිව්වා; නිසඳැස් කවියක් ලිව්වා. "මදු මල ලෙස මුදු මගේ ප්‍රියාදර මිහිරාවිය වෙතටයි" කියලා ලිව්වා. නමුත් අද එහෙම නොවෙයි. අද විශ්වවිද්‍යාල ශිෂ්‍යයා ආදරයෙන් පරාජය වුණාම මොකද කරන්නේ? එක්කෝ බස් එකේ යන කොට ඇසිඩ් ගහනවා. එහෙම නැත්නම් පිහියෙන් ඇනලා මරා දමනවා. ඔවුන් එවැනි තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා.

ඇයි ඒ? ඔහු ක්‍රීඩා කරලා නැහැ. සාහිත්‍ය පොතක් කියවලා නැහැ. සාහිත්‍යයේ තිබෙන සුන්දරත්වය දැකලා නැහැ. ඒ සුන්දරත්වය දැක්ක පුද්ගලයාට, ක්‍රීඩා කළ පුද්ගලයාට ජය පරාජය විඳ ගැනීමේ හැකියාවක් තිබෙනවා. එවැනි පෞරුෂයක් ඇති දරුවෙක් බිහි කරන්නට ක්‍රීඩාව වැදගත් වෙනවා. ගරු අමාත්‍යතුමා යෝජනා කර තිබුණා, විශ්වවිද්‍යාලයට යනකොට අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ලකුණු එකතු කිරීමේදී ජාතික මට්ටමෙන්, ජාත්‍යන්තර මට්ටමෙන් සහභාගි වුණු ක්‍රීඩාවලටත් යම් කිසි ලකුණු ප්‍රමාණයක් එකතු කළයුතුයි කියලා. ඒක ඉතා වැදගත්. අද හුඟක් දෙමව්පියන්ගේ බලාපොරොත්තුව මොකක්ද? පහ වසරේ ශිෂ්‍යත්වය සමත් කර ගැනීම, අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් සමත් වෙලා, විශ්වවිද්‍යාල අධ්‍යාපනයට යැවීම. ඒ ටික විතරයි ඔවුන් බලාපොරොත්තු වන්නේ. ඒ තුළින් බිහි වන නීතිඥයාට, දේශපාලනඥයාට, වෛද්‍යවරයාට සමාජය ගැන දැනීමක් නැහැ. එම නිසා හොඳ පුරවැසියෙක් බිහි කරන්නට ගරු ඇමතිතුමා කර ඇති ඒ යෝජනාව ඉතාමත් වැදගත් වෙනවා. ඊළඟට පාසල් සංගම්වල නීති-රීති ගැනත් කිව යුතුයි. පාසල් සංගම් විසින් අදාළ ක්‍රීඩාව සම්බන්ධයෙන් වූ ජාතික සංගමයේ රීති සහ නියෝගවලට එකඟව ක්‍රියා කළ යුතුයි. පාසල් සංගමයේ ව්‍යවස්ථාව විය යුත්තේ ජාතික සංගමයේ ව්‍යවස්ථාවමයි. ඒක ඉතාමත් වැදගත්. එතකොට ඒ අයට ඒ සංගමය ගැන යම් කිසි අවබෝධයක් ඇති වෙනවා. පාසල්වල සංගම් කරනවා. ජාතික තලයේ ක්‍රීඩා සංගමයත් පාසලට සම්බන්ධ කර ගැනීම ඉතා වැදගත් වෙනවා. එය මේ අවස්ථාවේදී මා ඉතා අගය කරනවා.

මේ ගැසට් නිවේදනයේ සඳහන් 10 වන නියෝගයට අනුව, යම් ජාතික සංගමයක කමිටු රැස්වීම සෑම මසකටම වරක්වත් පැවැත් වියයුතුයි. ඒ වාගේම පාසල් සංගම්වලින් අවම වශයෙන් එක් නියෝජිතයකු එකී රැස්වීම්වලට සහභාගි වියයුතු වෙනවා. ඔවුන්ට ඒ අයිතිය දී තිබෙනවා. එතකොට ජාතික සංගමයක කමිටු රැස්වීම මාසයකට වරක්වත් පැවැත්වෙනවා. ඒකට පාසල් සංගමයෙන් අවම වශයෙන් එක් නියෝජිතයෙකුවත් සහභාගි වෙනවා. බලන්න, පාසල් ශිෂ්‍යයන්ට ජාතික මට්ටමේ ක්‍රීඩා ගැන ලොකු දැනීමක්, අවබෝධයක් ඇති වෙනවා. ක්‍රීඩා ප්‍රතිපත්ති ගැන වන්නට පුළුවන්. නීති රීති ගැන වන්නට පුළුවන්. ඔවුන්ට ඒ අවබෝධය ලබා ගැනීම ඉතා වැදගත් වෙනවා.

ඊළඟට 12 (1) වන නියෝගයේ ජාතික සංගමයක නිලධාරීන්ගේ නිල කාලය ගැන සඳහන් වනවා. මෙම ගැසට් නිවේදනයේ 12 (1) නියෝගයට අනුව, අවුරුද්දක නිල කාලය අවුරුදු දෙකක් කර තිබෙනවා. ඒක ඉතා වැදගත් වෙනවා. අවුරුද්දක කාලයක් තුළ යම් නිලයක කටයුතු කරන්නට අමාරුයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අවුරුද්දක කාලයක් කියන්නේ ඉතා කෙටි කාලයක්. අවුරුදු දෙකක කාලයක් -මාස 24ක කාලයක්- නිල කාලය වශයෙන් ලබා දීලා බලාපොරොත්තු වන අරමුණු කරා යන්නට ඒ නිලධාරීන්ට බලය ලබා දී තිබෙනවා. නිල කාලය අවුරුදු දෙකකට එහා යනවා නම් ගරු අමාත්‍යතුමා ඒ බලය අර ගෙන තිබෙනවා. ගරු ඇමතිතුමා ඒ බලය අර ගෙන තිබෙන්නේ තනිවම නොවෙයි. ගරු ඇමතිතුමාගේ ලිඛිත අවසරය ගන්න ඕනෑ, ධුර කාලය අවුරුදු දෙකෙන් එහාට යනවා නම්.

13(2) නියෝගය යටතේ නැවත තේරී පත්වීම අපේක්ෂා කරන ලබන නිලධරයාගේ අදාළ ධුර කාලය සැලකිල්ලට ගෙන

[ගරු ලලිත් දිසානායක මහතා]

අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා, ජාත්‍යන්තර මට්ටමට ක්‍රීඩා ඉහළ නැංවීම; අදාළ ජාතික කණ්ඩායමේ කුසලතා මට්ටම වැඩි කිරීම; දක්ෂතා සහිත ක්‍රීඩකයන් හඳුනා ගැනීම; ක්‍රීඩා පරිපාලනයෙහි විනිවිදභාවය සහතික කිරීම ආදී කරුණු සැලකිල්ලට ගනු ලබනවා. මේ කරුණු කාරණා සම්පූර්ණ කර තිබෙනවා නම්, තවත් අවුරුද්දක් දෙකක් එහාට ධුර කාලය දරන්නට ඔහුට අවසරය ලැබෙනවා. ඒක අවශ්‍යයි. මොකද නිකම්ම පුටු රත් කර හිඳීමෙන් වැඩක් වෙන්නේ නැහැ. ඒ ක්‍රීඩාව තුළින් ජාතික මට්ටමේ ක්‍රීඩකයන් බිහි කිරීම, ජාත්‍යන්තර මට්ටමට ඒ ක්‍රීඩාව ගෙන යාම වැදගත් වෙනවා. එතකොට මේ ක්‍රීඩා සංගම්වල නිලතල දරනවා විතරක් නොවෙයි, ඒ ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහාත් මේ නිලධාරීන් යම් කිසි ගමනක් යන්න පෙළඹෙනවා. එම නිසා නිල කාලය අවුරුදු දෙකක් කිරීම ක්‍රීඩාවේ දියුණුවට ඉතාමත් වැදගත් වෙනවා.

14 වන නියෝගය යටතේ ඒ ධුර දැරීමට නුසුදුසුකම් මොනවා ද කියන එක ගැන සඳහන් වනවා. යම් තැනැත්තකු අධිකරණයක දී දඬුවම් ලැබ සිටීම, යම් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයෙන් වෘත්තීයමය ජනමාධ්‍යවේදියකු හෝ එවැනි ජාලයක අයිතිකරුවකු වීම; එම නිශ්චිත ක්‍රීඩා ජාතික සංවිතයේ හෝ ජාතික කණ්ඩායමේ තරගකරුවකුගේ දෙමාපියෙකු හෝ සහෝදර සහොදරයකු වීම යනාදී කරුණු එම නියෝගය යටතේ සඳහන් වනවා. මේ කරුණු කාරණා තුළින් ඒ ධුරවලට පත්වන අයට යම් බලපෑමක් කරන්න, ක්‍රීඩා ක්ෂේත්‍රය හරහා ඔවුන්ගේ පරිසරය තුළ ඇති වන බලපෑම ක්‍රීඩාව තුළට ගෙන ඒමට හැකියාවක් නැති වෙනවා. එම නිසා ඒක වැදගත් වෙනවා. පසු ගිය කාලවල අප දැක තිබෙනවා. යම් යම් පාපන්දු සංගම්වලට විවිධ නිලධාරීන් පත් කර ගෙන විවිධ විධායක සභා පත් කර ගෙන විදේශවලින් ලැබෙන මුදල් ක්‍රීඩා කටයුතුවලට යොදා ගන්නේ නැතිව, රටට ඵලදායී නොවන විධියට තමන්ගේ හිතූ මනාපයට යොදා ගෙන තිබුණු ආකාරය අප මාධ්‍ය තුළින් දැක තිබෙනවා. විනයක් ඇතිව කටයුතු කෙරෙනවා නම් සුදුසු නිලධාරීන් පත් වනවා නම් එවැනි දේවල් සිදු වන්නේ නැහැ. ඒ පත් වන නිලධාරීන්ගේ සුදුසුකම් පිළිබඳව දැඩි නීති තත්ත්වයක් ඇති කිරීම වැදගත් වෙනවා.

සෑම ජාතික සංගමයක් විසින් ම සෑම මුදල් වර්ෂයක්ම අවසන් වී මාස තුනක් ඇතුළත එම මුදල් වර්ෂය සම්බන්ධයෙන් වූ වරලත් ගණකාධිකාරිවරයකු විසින් සහතික කරන ලද විගණනය කළ ගිණුම් ප්‍රකාශයක් සහ වාර්ෂික වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මෙක වැදගත්. මොකද හේතුව, මෙවා මහජන මුදල්. අද ක්‍රිකට් ක්‍රීඩාව ගත්තොත් අති විශාල මුදල් සම්භාරයක් විදේශ විනිමය හැටියට ගෙනෙනවා. මේකෙන් වැඩි ප්‍රමාණයක් ක්‍රීඩකයන්ට සහ ක්‍රීඩා සමාජ නඩත්තුවට තමයි වැය කරන්නේ. මේ තුළ අපි වැදගත්කම දකින්න ඕනෑ. මේ ගෙනෙන මුදල, ක්‍රීඩකයන්ගේ දක්ෂතාව තුළ රටට කීර්තියත් සමඟ ලබා දෙන මුදල හරියාකාරව වියදම් වුණේ නැත්නම් මා හිතන්නේ අපට අපකීර්තියක් ගෙන එන්න ඒක තුඩු දෙනවා කියලායි.

අද ක්‍රිකට් ක්‍රීඩාව දෙස බැලුවාම යම් යම් නිලධාරීන් පත් වීමත් සමඟ ඒ නිලධාරීන්ගේ ක්‍රියා කලාපයන් නිසා ඒ ක්‍රීඩකයන් මහන්සි වෙලා රටට ගෙන එන කීර්තිය, ඒවායෙන් ගෙනෙන මුදල් ප්‍රමාණය ක්‍රීඩකයාට නැත්නම් රටට ගැළපෙන ආකාරයට වියදම් වන්නේ නැහැ. ක්‍රීඩා සංගම්වලට ගරු ඇමතිතුමා හඳුන්වා දුන් රීති පද්ධතිය ඉතාම වැදගත් වෙනවා. මොකද, බැලූ අතේ යන්නේ නැතුව, අයාලේ යන්නේ නැතුව, යම් ක්‍රමවේදයකට ක්‍රීඩාව ගෙන ඒම සඳහා විනයානුකූලව මේ කටයුතු කිරීම ඉතා වැදගත් වෙනවා. අපි බොහොම සතුටු වෙනවා. ක්‍රීඩාව කියන එක ඉතාම අත්‍යාවශ්‍ය දෙයක්. එකක් තමයි නිරෝගී පරපුරක් බිහි කිරීම. ඉවසිලිවන්තව ජය පරාජය විඳ ගන්න පුළුවන් බොහොම හොඳ නායකත්වයක් තිබෙන පුරවැසියන් බිහි කරන්න ක්‍රීඩාව වැදගත් වෙනවා. අද අපේ ක්‍රීඩා අමාත්‍යතුමා ඉතා හොඳ ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය හඳුන්වා දීම තුළින් අතිගරු ජනාධිපතිතුමාගේ අපේක්ෂාව ඉටු කර ගන්න සුවිශේෂ කැප කිරීමක් ඉටු කර තිබෙනවා. පාසල් මට්ටමේ තරග තිබෙනවා. මළල ක්‍රීඩාව ගත්තාම ක්‍රීඩා තරග තිබෙන කාලයට පමණයි මේ ක්‍රීඩකයෝ බිහි වන්නේ. ප්‍රාදේශීය ක්‍රීඩා තරග, දිස්ත්‍රික් ක්‍රීඩා තරග, පළාත් ක්‍රීඩා තරග ජාතික මට්ටමට එන විට මෙම ක්‍රීඩකයන් සඳහා මනා සම්බන්ධීකරණයක් කිරීම අවශ්‍ය වෙනවා. ප්‍රාදේශීය මට්ටමේ ක්‍රීඩා සමාජ තිබෙනවා. මේ ක්‍රීඩා සමාජ ඉතා වැදගත් කාර්යයක් ඉටු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පවතින ක්‍රීඩා සමාජ වැඩි ප්‍රමාණයක් ගත්තාම ඒ ක්‍රීඩාවේ ජවය, ශක්තිය මුල තමයි ක්‍රීඩා සමාජ. යෞවන සමාජ බල මණ්ඩලය වෙන්න පුළුවන්; ගමේ ක්‍රීඩා සමාජය තුළින් තමයි ශක්තිය ලබා දෙන්නේ. අන්න ඒ නිසා ගම තුළින් බිහි වෙන මළල ක්‍රීඩකයන් පුහුණු වැඩසටහන් සඳහා ගියාට මනා පුහුණුවක් ලැබෙන්නේ නැහැ. ක්‍රීඩාව පිළිබඳ නීති-රීති මෙන්න මේ වාගේ දේවල් ග්‍රාමීය මට්ටමෙන් ගත්තාම පාසල් මට්ටමෙන් ගත්තාම මෙතැන අපි අඩු පාඩුවක් දකිනවා. අපි මේ අඩු පාඩුව සකසන්න ඕනෑ.

ග්‍රාමීය මට්ටමේ සමහර ක්‍රීඩකයන් මළල ක්‍රීඩාවට ආවාම ඔවුන්ට ඒ පුහුණුව සඳහා නියම උපදේශනය හරියට ලැබෙන්න අපි කටයුතු කරන්න ඕනෑ. මේක පාසල් මට්ටමෙන් සහ ක්‍රීඩා සමාජ මට්ටමෙන් ඉටු කළ යුතු දෙයක්. බොහෝ දුරට ගත්තාම ප්‍රාදේශීය ක්‍රීඩා තරග තිබෙනවා. පසු ගිය මාසයේ ප්‍රාදේශීය ක්‍රීඩා තරග ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පැවැත්වුණා. මේ සඳහා එන කණ්ඩායමක් සිටිනවා. ක්‍රීඩා සමාජ පමණයි මේකට සම්බන්ධ වන්නේ. පාසල හැර ගිය, එක්කෝ පාසලේ ඉන්න ක්‍රීඩාවට ළැදි කිහිප දෙනෙක් පමණයි ක්‍රීඩා සමාජ තුළ ඉන්නේ. මෙන්න මේ ක්‍රීඩා සමාජ තව පුළුල් කරන්න ඕනෑ. පාසල්වල ඉන්න ක්‍රීඩකයන්, ප්‍රදේශයේ ඉන්න ක්‍රීඩකයන් සම්බන්ධ වීම තවත් පුළුල් කර ඒ ක්‍රීඩා සමාජවල ඉන්න ක්‍රීඩකයන්ට සුවිශේෂ වූ පුහුණුවක් ලබා ගන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. අපි පළාත් මට්ටමින් ගත්තත්, පළාත් සභා මට්ටමින් ගත්තත්, ජාතික මට්ටමින් ගත්තත් අපේ ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ විමධ්‍යගත අරමුදලින් යම් යම් ක්‍රීඩා කටයුතු සඳහා මුදල් වෙන් කරනවා. ඒක ඉතා වැදගත්. ඒක සැහැල්ලු පන්දු වෙන්න පුළුවන්, පාපන්දු වෙන්න පුළුවන්, වොලිබෝල් වෙන්න පුළුවන්. ඒක ඉතා වැදගත්. මොකද, ක්‍රීඩාවේ දියුණුව සඳහා, ක්‍රීඩා සමාජ හරහා සිදු වෙන දියුණුව නැත්නම් ඒ පුහුණුව අපි අගය කරන්න ඕනෑ.

මේ හැම ක්‍රීඩාවකම අපි බලන්න ඕනෑ, අවසානය. අවසාන ප්‍රතිඵලය ජාත්‍යන්තර ජයග්‍රහණය නම් තමයි මේ ක්‍රීඩාවේ වැදගත්කම රැඳෙන්නේ. අද අපි ක්‍රිකට් ක්‍රීඩාවෙන් මේ තත්ත්වයෙන් ඉන්නේ අපි ඒ තත්ත්වය ලබා ගත් නිසා; ලෝක කුසලානය අපි ලබා ගත් නිසා. ඒ වාගේම සුසන්තිකා වැනි ක්‍රීඩිකාවන් ඔලිම්පික් උළෙල නියෝජනය කරලා ඒ පදක්කම් දිනාගත් නිසා අනෙක් අයත් ඒ ඉලක්කයට යන්න පෙළැඹීමක් සිද්ධ වෙනවා. ඒ නිසා අපි පුළුවන් තරම් ඒ ජාත්‍යන්තර තලයේ, ජාතික මට්ටමේ ක්‍රීඩකයන් බිහි කිරීම සඳහා තව තවත් ඒ කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම වැදගත් වනවා, පාසලෙන් බිහි වන ක්‍රීඩකයාව නැංවීම සහ පාසලෙන් බිහි වන ක්‍රීඩකයා පාසලෙන් ඉවත්ව යෑමත් එක්කම ක්‍රීඩා සමාජයට සම්බන්ධ කිරීම තුළින් ඔහු ජාතික තලයට ගෙන එන්නට අවශ්‍ය කටයුතු කිරීම. නැත්නම් ඔහු පාසලෙන් බිහි වෙලා එතැනින්ම අත් හැරෙනවා. එහෙම වෙන්නේ නැතුව ඔහුව ඉදිරියට ගෙනෙන්න වැඩසටහන් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඔහු හඳුනා ගත්තාට පසුව, පාසලේ හය හත ශ්‍රේණියෙන් ක්‍රීඩාව පටන් ගන්නා ක්‍රීඩකයා අවසානයේ ජාතික තලයට ගෙන ඒම සඳහා ඔහුට එතැන සිටම අඛණ්ඩ සේවයක් සිදු වෙන්න ඕනෑ. ක්‍රිකට් ක්‍රීඩකයෙක් වුණත් පාසල්වලින් ක්‍රීඩා කරන්න ඒ ක්‍රීඩකයන්ට අවශ්‍ය සංවිත ඇති කරලා ඒ දක්ෂතා දක්වන ක්‍රීඩකයන්ට ප්‍රාදේශීය මට්ටමෙන් ජාතික කණ්ඩායමට එක් වන්න අවශ්‍ය ඒ පහසුකම අපි ලබා දෙන්න ඕනෑ. ඉතින් ඒ නිසා මෙවැනි තත්ත්වයක් ඇති කිරීම තුළින් තමයි අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වන මේ

ක්‍රීඩාව ගමට ගෙන යෑමට, ඒ වාගේම ජාතික මට්ටමේ ශූරයන් බිහි කිරීමට හැකියාවක් ඇති ක්‍රීඩාවක් බවට පත් වන්නේ. ඒ ගැන කථා කිරීමේදී ගරු ක්‍රීඩා අමාත්‍යතුමා සහ ඒ කාර්ය මණ්ඩලය ඉතාම සුවිශේෂී වූ කටයුතු ඉටු කරනවා. ඒ තුළින් අපට ඉදිරි කෙටි කාලයක් තුළ මේ රට තුළින් නැවත වතාවක් අපට ජාත්‍යන්තර තලයේ සහ ජාතික තලයේ ජයග්‍රහණයන් ලබා ගන්න පුළුවන් ක්‍රීඩකයන් රැසක් බිහි කිරීමට හැකියාව ශක්තිය ලැබෙයි කියා විශ්වාස කරනවා. ගරු ක්‍රීඩා අමාත්‍යතුමාට මේ වැඩසටහනත් එක්ක තමන්ගේ නිලධාරීන් එක්ක කටයුතු කරමින් ඉදිරි අනාගතයේදී අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වන ආකාරයට මේ රටට කීර්තියක් දෙන, හොඳ විනය ගරුක ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කිරීමට අවශ්‍ය ශක්තිය ලැබෙවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මේ පිළිබඳ වැඩිදුර විවාදය හෙට දිනට කල් තබමි.

එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.
එකැන් සිට විවාදය 2013 මාර්තු 06 වන බදාදා පවත්වනු ලැබේ.

අප්පෝතු පි. ප. 6.30 මණියාකිවිටවේ, අලුවල්කල් இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.

விவாதம் 2013 மார்ச் 06, புதன்கிழமை மீளத் தொடங்கும்.

It being 6.30 p.m., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Wednesday, 06th March, 2013.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ඇප ලබා දීමේ සමානාත්මතාව
பிணை வழங்கலில் சமத்துவம்
EQUITY IN GRANT OF BAIL

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" රජය අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත කඩිනමින් සම්මත කරන ලද නමුදු, ඇප ලබා දීමේ තත්ත්වයන් සම්බන්ධයෙන් වූ විධිවිධාන අදාළ කර ගැනීම පිළිබඳව තීරණය කිරීමට කිසිදු ප්‍රායෝගික මාර්ගෝපදේශයක් ලියා දක්වා නොමැති බව පෙනේ.

මෙම තත්ත්වය මත ව්‍යාකූල වූ එකිනෙකට වෙනස් ආකාරයේ පරාමිතීන් විවිධ පොලිස් ස්ථාන විසින් යොදා ගනිමින් තිබේ. එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති මූලික අයිතිවාසිකමක් වූ නීතිය ඉදිරියේ සමාන බව පිළිබඳව වූ මූලධර්මයට හානි සිදු වේ.

මෙම පනතේ විධිවිධාන ප්‍රකාර ඒකාකාර කාර්ය පටිපාටි සමූහයක් පැනවීම රජයේ අදහස වන්නේද යන්න ගරු අධිකරණ ඇමතිතුමා විසින් මෙම සභාවට දැනුම් දෙන්නේද?"

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මේ රටේ සෑම පුරවැසියෙකුටම නීතිය ඉදිරියේ සමාන රැකවරණය සනාථ කර තිබෙනවා. වරදක් පිළිබඳව සැක කොට අත් අඩංගුවට ගත් තැනැත්තෙක් සත්‍ය වශයෙන්ම ඔහු වරදකරුවෙක් වෙන්නත් පුළුවන්, නැති වෙන්නත් පුළුවන්. ඒ සෑම පුද්ගලයකුටම නීතියේ රැකවරණය සමාන වන්නට අවශ්‍යයි. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මූලික අයිතිවාසිකමක් හැටියට මේ කාරණය සඳහන් කර තිබෙනවා. ඒ වාගේම අත් අඩංගුවට ගැනීම පිළිබඳව විශේෂිත නීති හඳුන්වා දෙන කොට, අත් අඩංගුවේ තබා ගත හැකි කාලය පැය 24 සිට 48 දක්වා වැඩි කරන විට ගරු අධිකරණ ඇමතිතුමා මේ ගෞරවනීය සභාවේදීත්, ඒ වාගේම උපදේශක කාරක සභාවේදීත් සඳහන් කළා, මේ අත් අඩංගුව ගැනීම් සහ රඳවා ගැනීම් පිළිබඳව වැඩිමනත් රෙගුලාසි පනවනවා, ඒ පිළිබඳව පටිපාටීන් හඳුන්වා දෙනවා කියලා. නමුත් අපි දකින්නේ නැහැ, පැය 24 පැය 48 කරලා, අත් අඩංගුවට පත් වූ තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳව සීමා කිරීම් ඇති වුණා මිසක් වැඩිමනත් රෙගුලාසි ඇති වුණු තත්ත්වයක්.

මේ තත්ත්වය පිළිබඳව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂයෙන් සඳහන් කර තිබෙනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136.(1) (ඇ) අනු ව්‍යවස්ථාවට අනුව, පාර්ලිමේන්තුව ඇප දීම පිළිබඳ රීති පනවන්නේ නැති විට ශ්‍රේෂ්ඨාධිකරණයට බලය තිබෙනවා ඇප දීම පිළිබඳ රීති පනවන්න. දැන් එහෙම පනවලාත් නැහැ. මේ රටේ ඇප පිළිබඳව අදාළ වන ප්‍රධාන නීතිය ඇප පනතයි. ඒ ඇප පනත මඟින් යම් යම් මූල ධර්ම හඳුන්වා දී තිබෙනවා. ඇප දීම රීතිය විය යුතු බවත්, ඇප නොදීම ව්‍යතිරේකය විය යුතු බවත් සඳහන් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසියෙන් ඇප ලබා ගන්න තිබෙන බලයට අපි කියනවා පොලිස් ඇප කියලා. පොලිස් ඇප ක්‍රියාත්මක කිරීමේදී ස්ථානාධිපතිවරයා කටයුතු කරන්න ඕනෑ මොන කාර්ය පටිපාටිය අනුවද, ඔහු විසින් අනුගමනය කළ යුතු ප්‍රමිතීන් මොනවාද කියලා ඇප පනතේ නැහැ. ඒ වාගේම මහෙස්ත්‍රාත්වරයෙකු විසින් හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයෙකු විසින් ඇප ලබා දීමේදී අනුගමනය කරන්න ඕනෑ ප්‍රතිපත්ති මොනවාද කියලා විස්තරාත්මක සංග්‍රහයක් නොවෙයි ඇප පනත. දැන් මේ තත්ත්වය තුළ මේ රටේ අහිංසක ජනතාව ලොකු අනතුරකට පත් වෙලා තිබෙනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා සුළුපටු පුද්ගලයෙකු නොවෙයි. එතුමාම සඳහන් කරන ආකාරයට ජනාධිපති රාජපක්ෂ මැතිතුමාට කලින් මේ රටේ අගමැතිවරයා වන්නට හිටපු පුද්ගලයා; ආරාධනා ලබපු පුද්ගලයා එතුමායි. එහෙම පුද්ගලයෙකුගේ දරුවා පාසිකුඩාවලදී නියෝජ්‍ය පොලිස්පති විද්‍යාලංකාර මහත්මයාගේ දරුවා එක්ක ආරවුලක් ඇති කර ගත්තු වේලාවේ මේ රටේ සාමාන්‍ය මිනිසුන්ට අදාළ වන නීතිය ක්‍රියාත්මක වුණාද? සාමාන්‍ය ප්‍රතිපත්තිය අනුව තුවාලකරුවෙකු රෝහලේ ඉන්නවා නම් පොලිස් ඇප දෙන්නේ නැහැ. උසාවිය වුණත් ඇප දෙන්නේ නැහැ. ඒක තමයි සාමාන්‍ය ප්‍රතිපත්තිය. හැබැයි ඒක කොහේවත් ලියලා නැහැ. ඒක තමයි අපි සාමාන්‍යයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය. ඒ පිළිබඳව අත් දැකීම් තිබෙන අය මේ ගරු සභාවේත් ඉන්නවා. හැබැයි මේ රටේ බලගතුම, ශක්තිමත්ම පාලක සන්ධානයේ ප්‍රධාන පක්ෂයේ මහ ලේකම්වරයාගේ, අනාගතයේ -හෙට අනිද්දාම- අගමැති ධුරය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන්, ආසාවෙන් හා කැමැත්තෙන් ඉන්න පුද්ගලයාගේ දරුවාගේ අතින් නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ -දන්නේ නැති පුද්ගලයෙකු නොවෙයි. ප්‍රකට නියෝජ්‍ය පොලිස්පතිවරයෙක්- දරුවා පහර කෑවාම ඒ පිළිබඳව අදාළ-

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, I rise to a point of Order. This matter is *sub judice*.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳයි මම ඒ පිළිබඳව අවධානය යොමු කරන්නම්. [බාධා කිරීමක්] හොඳයි, මම ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්නම්.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නඩු පවරලා නැහැ නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අවසාන වාක්‍ය මම ඉල්ලා අස් කර ගන්නවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. කලබල වෙන්න එපා, කලබල වෙන්න එපා. [බාධා කිරීමක්] බොහොම හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ අවසාන වාක්‍ය අස් කර ගන්නවා.

දැන් මේ රටේ සුප්‍රකට දේශපාලනඥයෙකුගේ දරුවෙකු, මේ රටේ ඉහළම පොලිස් නිලධාරියෙකුගේ දරුවෙකුට පහර දුන්නාම එවැනි වෙලාවක කටයුතු කරන්න ඕනෑ ආකාරය මොකක්ද? දේශපාලනඥයෙකුගේ දරුවන්ට මේ රටේ නීතියේ විශේෂ වරප්‍රසාද තිබෙනවාද? මේ රටේ පොලිස් නිලධාරීන්ගේ දරුවන්ට විශේෂ වරප්‍රසාද තිබෙනවාද? මොකක්ද මේකේ තත්ත්වය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පොලිස් නිලධාරීන් අතරින් නීතිය, සාමය ආරක්ෂා කරන සාධාරණ නිලධාරීන් සැලකිය ප්‍රමාණයක් ඉන්නවා. හැබැයි සමහර පොලිස් නිලධාරීන් හිතා ගෙන ඉන්නවා පවතින රජයට කඩේ ගියාම, පවතින රජයේ ඇමතිවරුන්ගේ පිටු පස්සෙන් ගියාම, මොකක්ද ඇමතිතුමා කෙරෙන්න ඕනෑ, මොකක්ද මන්ත්‍රීතුමා කෙරෙන්න ඕනෑ කියලා ඒ දේවල් කරලා දුන්නාම තමන්ට හොඳට හරි යනවා කියලා. හැබැයි ආණ්ඩුවේ මැති ඇමති කෙනෙකු හා තමන්ගේ දරුවෙකු අතර ප්‍රශ්නයක් ඇති වුණාම තමයි ඒ ගොල්ලන්ට තේරෙන්නේ, "අනේ, පොලීසියේ අපි කොච්චර අසරණද; අපි කොච්චර දුක්ඛිත තත්ත්වයකට පත් වෙනවාද" කියලා.

ඒ නිසා පසු ගිය දා සිදු වුණු විශේෂ ප්‍රශ්නය මේ රටේ පොලිස් නිලධාරීන්ට හොඳ පණිවුඩයක් ලබා දෙනවා, මේ රටේ සාමාන්‍ය අහිංසක මිනිස්සුන්ට රටේ සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක නොකළොත් ඒ පාපය, ඒ කරුමය තමන් පසු පසත් එනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් අතට මේ රටේ තව ප්‍රශ්නයක් තිබෙනවා. අපි හිතනවා, මේ රටේ ජීවිත භය ඇති වෙන්නේ, මරණ භය ඇති වෙන්නේ, මරා දැමීම පිළිබඳ අවදානම ඇති වෙන්නේ ආණ්ඩුවට විරුද්ධව දේශපාලනය කරන, ආණ්ඩුවේ ප්‍රතිපත්ති හෙළා දකින, ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට එරෙහිව කටයුතු කරන දේශපාලනඥයන්ට, දේශපාලන ක්‍රියාකාරිකයන්ට සහ මාධ්‍යවේදීන්ට පමණක්ය කියලා. හැබැයි මේ රටේ ඊ ළඟට අගමැති වෙන්න හිතා ගෙන ඉන්න පුද්ගලයාත් කියනවා, "මාව මරන්න ලැහැස්ති වෙනවා" කියලා. ඔහුව මරා දමන්න ලැහැස්ති වෙනවා ලු. එක්සත් ජාතික පක්ෂයෙන් ඒ පුද්ගලයා මරනවා වෙන්න බැහැ. ජනතා විමුක්ති පෙරමුණට දැන් ඒ වාගේ රාජකාරියක් කරන්න හයියක් ඇත්තේත් නැහැ; කරන්නේත් නැහැ. එල්ටීටීඊය සම්පූර්ණයෙන්ම විනාශ කළා කියලා ආණ්ඩුව කියනවා. එහෙම නම්, මෛත්‍රී සිත් නිතර ඇති බව කියන ඔය දේශපාලනඥයාට තමන්ගේ ජීවිතය ගැන භයක් ඇති වෙන තත්ත්වයක් මේ රටේ ඇති වෙලා තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, මේ රටේ ඉන්න ප්‍රබලම, ශක්තිමත්ම ආරක්ෂාව යටතේ ඉන්න පුද්ගලයන්ටත් ජීවිත භය ඇති වෙනවා නම්, එවැනි තත්ත්වයක් මේ රටේ ඇති වෙලා තිබෙනවා නම් අධිකරණ ඇමතිතුමා හැටියට ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද කියලා පැහැදිලි කිරීමේ යුතුකමක් ඔබතුමාට තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ බරපතළ මිනී මැරුම් නඩුවල චෝදනාවට ලක් වුණු, අධි චෝදනා ගොනු කරනවා කියලා නීතිපතිවරයා විසින් දැනුම් දීලා තිබෙන එක්තරා පුද්ගලයෙකු විදේශගතව සිට අද පාන්දරින් ලංකාවට ආවා. රටේ සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක වෙනවා නම් කටුනායක ගුවන් තොටුපොළේ පරිගණකවල තිබෙන තොරතුරු අනුව ගුවන් තොටුපොළේදී ඒ පුද්ගලයාව අත් අඩංගුවට ගන්න අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා. බරපතළ වරදකට සැක කොට අත් අඩංගුවට ගන්න ඕනෑ පුද්ගලයෝ කටුනායක ගුවන් තොටුපොළේදී අත් අඩංගුවට ගන්නේ නැතුව ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපදෙස් ගන්න ඕනෑ සුදුසු පුද්ගලයන්ගෙන්. කටුනායක ගුවන් තොටුපොළේ ඉන්න අයත් උපදෙස් ගන්න ඕනෑ සුදුසු පුද්ගලයන්ගෙන්. ඒ සුදුසු උපදෙස් ලැබුණා නම් කටුනායක ගුවන් තොටුපොළේදී අත් අඩංගුවට ගැනීම සිදු වෙන්න ඕනෑ. නමුත් එහෙම අත් අඩංගුවට ගත යුතු පුද්ගලයෙකු ලංකාවට ඇවිල්ලා, ලංකාවේ තමන් තීරණය කර ගන්නා නවාතැන් පොළවල නතර වෙලා කලින් සූදානම් කර ගත්තු පරිදි ස්වකැමැත්තෙන් අත් අඩංගුවට පත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. මේ රටේ සාමාන්‍ය මිනිහාට ඒ අයිතිවාසිකම තිබෙනවාද? මේ රටේ දේශපාලනඥයෙක් අපරාධයක් සම්බන්ධයෙන් සැක කොට අත් අඩංගුවට ගැනීමක් සිදු වුණාම ඔහු රඳවා තබන්නේ බන්ධනාගාරයේ නොවෙයි. ඔහු ඉන්නේ බන්ධනාගාර රෝහලේ. සුපිරි සිරකරුවෙක් නම් ඔහු ඉන්නේ පෞද්ගලික රෝහලක. මේක රටේ සාමාන්‍ය මිනිහාට බලපාන නීතියද? නැහැ. මේ පිළිබඳව අද බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු අධිකරණ ඇමතිතුමනි, අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතට සංශෝධන ඉදිරිපත් කරන අවස්ථාවේදී මේ රටේ සැකකරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් විශේෂ රෙගුලාසි නීති පනවනවා, විශේෂයෙන් රැකවරණය ලබා දෙනවා කියලා ඔබතුමා කිව්වාට, එහෙම සිදු වෙලා නැහැ. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ප්‍රකාරව ඇප පිළිබඳව රීති පනවන්න අවශ්‍යයි. ඒවා සිදු වෙලා නැහැ. රටේ සාමාන්‍ය මිනිස්සුන්ට විතරක් නොවෙයි, අනෙක් හැමෝටමත් ජීවිත භය ඇති වෙන විධියේ මහා භයානක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. රටක නීතිය හා සාමය නැති වෙනවා නම්, රටේ නීතිය හා සාමය පිළිබඳ සැක සංකා මතු වෙනවා නම්, මිනිස්සුන්ට ජීවිත භයක් ඇති වෙනවා නම්, ආණ්ඩුවේ හිටියත්, විපක්ෂයේ හිටියත් යම් යම් පුද්ගලයන්ගේ දේශපාලනික ක්‍රියාකාරකම් නිසා ඔවුන්ව මරා දැමීමට ලක් වෙනවා කියලා හැඟීමක් ඇති වෙනවා නම් මේ රටේ යුද ජයග්‍රහණයෙන් පස්සේ අවුරුදු තුනක් ගත වෙන තැන ඇති වෙලා තිබෙන්නේ මොන වාගේ තත්ත්වයක්ද කියන කාරණය ගැන අපි හැමෝම සැලකිල්ලට ලක් කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ නීතිය පිළිබඳව හොඳින් දන්නා අධිකරණ ඇමතිවරයෙක් අපට ඉන්නවා. නමුත් මේ රටේ පාලනය තුළින් මේ රටේ ඇති කරලා තිබෙන ප්‍රතිපත්ති විරහිත, ප්‍රජාතන්ත්‍රවාදී මූල ධර්මවලට එරෙහි වාතාවරණය තුළ ඒ පාලන තන්ත්‍රයේ රූකඩයක් ලෙස ඉන්නවා හැරෙන්න අධිකරණ ඇමතිතුමාට කරන්න වෙන රාජකාරියක් අද ඉතුරු වෙලා නැහැ.

ඒ නිසා මේ රටේ හැමෝටම නීතිය එක හා සමානයි; මේ රටේ හැමෝටම එක ලෙස නීතිය ක්‍රියාත්මක වනවා; මේ රටේ දුප්පත් පොහොසත් හැමෝටම නීතිය එක හා සමානයි; මේ රටේ පොලිස් නිලධාරියාටත්, දේශපාලනඥයාටත්, ගමේ ඉන්න සිරිසේනටත්, ගුණවතීටත්, නිමල්ටත්, සුනිල්ටත් නීතිය එක හා සමානව ක්‍රියාත්මක වනවා; ඒ වාගේම මේ රටේ සිටින සුබ්‍රමනියම්ටත්, හුසේන්ටත් නීතිය එක හා සමානව ක්‍රියාත්මක වනවා කියලා සනාථ කරන සමාජයක් අද ඇති කරන්න අවශ්‍යයි.

මේ රටේ පැවැති යුද්ධයේදී අහිංසක මිනිස්සුන්ගේ ජීවිත දස දහස් ගණනක් කැප කරලා, යුද සෙබළු මාතෘ භූමිය මත තම රුධිරය පූජා කරමින් ත්‍රස්තවාදය පරාජයට පත් කරලා මේ රට ජයග්‍රහණය කළේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය කරන්නයි. ප්‍රජාතන්ත්‍රවාදයෙන් තොරව, මිනිස්සුන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීමෙන් තොරව, මිනිස්සුන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙන් තොරව නීතිය ඉදිරියේ සමානතාව පිළිබඳ මූලික මූල ධර්මය ආරක්ෂා කරන්නේ නැතිව මේ රටේ ඉදිරි ගමනක් නැහැයි කියන කාරණය මම ප්‍රකාශ කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඇති වෙලා තිබෙන මේ තත්ත්වයන්ට පිළිතුරක් වශයෙන් ගන්නා ක්‍රියා මාර්ග මොනවාද, ඒ පිළිබඳව ක්‍රියා මාර්ග ගන්නේ කවදාද, ඒ ක්‍රියා මාර්ග ගන්නේ කුමන අවස්ථාවකද කියන කාරණය මම ඔබතුමාගෙන් නිශ්චිතව දැන ගන්න කැමැතියි. බොහොම ස්තුතියි.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ඇප ලබා දීම සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය දිගින් දිගටම ආපු ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, අජිත් පෙරේරා මැතිතුමාත්, මමත් උපදේශක කාරක සභාවේදී දිගින් දිගටම මේ සම්බන්ධයෙන් ඔබතුමා දැනුවත් කළා. අද ඉතාමත් ව්‍යාකූල තත්ත්වයකට මේ ප්‍රශ්නය පත් වෙලා තිබෙනවා. කලිනුත් මේ තත්ත්වය තිබුණා.

Sir, before I get on to the subject, I must congratulate the Hon. Minister for the lovely wedding of his daughter, who got married to the son of Senior President's Counsel, Ikram Mohamed. It was a beautiful wedding and a graceful occasion.

Then, getting back to the topic, මේ අවස්ථාවේ නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෝ මේ ස්ථානයේ ඇති. ලංකාවේ ඇප සම්බන්ධ නීතිය තිබෙන්නේ ඉතාමත් නරක තත්ත්වයකයි. මම ගොඩාක් දුරට හැදෑරුවේ සිවිල් නීතියයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට නොකළ වැරදිවලට සිරගත වෙන්න සිදු වන බව ඔබතුමාත් දන්නවා. ඒවා සම්බන්ධයෙන් මම ගොඩාක් වෙලාවට ඇප ඉල්ලීම් ඉදිරිපත් කරලා ඇප ලබා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම අලිබාන් කියන ප්‍රාදේශීය සභා විපක්ෂ නායකතුමා සම්බන්ධවත්, තවත් මේ වාගේ හතර පස් දෙනෙකු වෙනුවෙනුත් මම ඇප ලබා ගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඇප සම්බන්ධයෙන් නීතිය හදාරන්න මට අවස්ථාව ලැබුණා. ගරු ඇමතිතුමනි, ඉතාමත් නරක තත්ත්වයකයි මේ ඇප සම්බන්ධ නීතිය තිබෙන්නේ. ඇප දෙන්නේ කාටද, ඇප නොදෙන්නේ කාටද කියලා තීන්දු වන්නේ බලපුළුවන්කාරකම් මතයි. ඔබතුමාට මම දිගින් දිගටම මේ ගැන කිව්වා. නීතිපති දෙපාර්තමේන්තුවේ අයටත් කිව්වා. නීතිපති දෙපාර්තමේන්තුව ඉතාමත් හොඳ දෙපාර්තමේන්තුවක්. හරියට වැඩ කරන තැනක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මේ දේශපාලන හස්තයට අහු වුණාට පස්සේ ඔවුන්ට හරියට වැඩ කරන්න බැහැ. තමන්ට, තමන්ගේ පියාට, තමන්ගේ දරුවාට, තමන්ගේ සහෝදරයෙකුට මේ දේ වෙන කල් දැනෙන්නේ නැහැ. තමන් ඒ දේ විඳින කොට තමයි තේරෙන්නේ. ගරු ඇමතිතුමනි, කවදා හරි විපක්ෂයකට වැටිලා ඔබතුමා හෝ ඔබතුමාගේ පවුලේ කෙනෙකුට මේ දේ වුණොත් ඔබතුමාටත් මේ ගැන තේරේවි. ඔබතුමා දන්නවා, දැන් මුස්ලිම් ජාතිකයන්ට -ඉස්ලාම් භක්තිකයන්ට- බිය දනවන වාතාවරණයක් රටේ ඇති වෙලා තිබෙනවා කියලා.

අග විනිසුරුතුමිය සම්බන්ධ ක්‍රියාදාමය ඔබතුමා දන්නවා. එංගලන්තයේ සාම්වරයෙක් සම්බන්ධයෙන් දීලා තිබෙන තීන්දුව ගැන ඔබතුමා දන්නවා. මේ ඔක්කෝම නීතියේ කඩා වැටීම්.

ගරු ඇමතිතුමනි, අද ඔබතුමා දන්නවා, Slave Island ප්‍රදේශය සම්බන්ධ නඩුව පිළිබඳව. මුස්ලිම් ජාතිකයෝ විශාල පිරිසකගේ ඉතා වටිනා නිවෙස් තිබෙන භූමිය ඉන්දියානු සමාගමකට දීමේ කාර්ය පටිපාටිය කර ගෙන යනකොට ඒ අදාළ පිරිස උසාවියට ගියාම උසාවියෙන් ලැබෙන තීන්දු දිහා බලන්න. නඩුකාරවරු තමන්ගේ කාර්ය භාරයට අදාළ නොවන ආකාරයේ හැසිරීම් ඉදිරිපත් කරලා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරලා මේ දේවල් තමන්ගේ හස්තයට ලබා ගෙන තිබෙන නිසා අද නීතිය කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ තමයි අප ජීවත් වෙන්නේ. නීතිය ඉතාමත් පහත් තත්ත්වයට ඇද දමන තත්ත්වයක් අද තිබෙන්නේ. තමන් වැඩ කළ ස්ථානයේ අධ්‍යක්ෂවරයෙක් වෙන්න පුළුවන්; ඒ වාගේ වග උත්තරකරුගේ විශාල සම්බන්ධකම් තිබෙන නඩුකාරවරු අද නඩු අහන්න පටන් අරගෙන තිබෙනවා. මේවා අප ඉතිහාසයේ කවදාවත් අහලා තිබුණේ නැති දේවල් ගරු ඇමතිතුමනි. නීතිය කියන එක රටේ දේශපාලන හස්තයක් බවට පත් වෙලා තිබෙනවා. දේශපාලන බලය තිබෙනවා නම්, මුදල් බලය තිබෙනවා නම් අද නීතිය තමන්ගේ ආධිපත්‍යය බවට පත් වෙලා තිබෙනවා. ඇප සම්බන්ධයෙන් කිසිම නීතියක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු ඇමතිතුමා, මේක ඔබතුමා හොඳට හිතට ගන්න. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ පුතාගේ සිදු වීම සම්බන්ධයෙන් එතුමා අදහස් දැක්වුවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

Sir, I rise to a point of Order.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Point of Order එකක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

Point of Order එකක් තිබෙනවා. මේ සභාවේ නැති මන්ත්‍රීවරයෙකුගේ නම සඳහන් කරන්න බැහැ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

පුතා ගැන කථා කරන්න කිසිම බාධාවක් නැහැ. පුළුවන් නම් පෙන්වන්න, පුතා ගැන කථා කරන්න බැහැ කියලා රීතිවල තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා රීති දන්නේ නැතිව කථා කරනවා. නඩු අංකයක් නැතිව, ඒවා ඉදිරිපත් කරන්නේ නැතිව, ඒ සම්බන්ධයෙන් විරුද්ධ වෙන්න බැහැ. එය ඔබතුමන්ලාම - Deputy Chairman of Committees විසින්- දුන්නු තීන්දුවක්. ඒ නිසා බාධා කරන්න එපා කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මොකක්ද තිබෙන්නේ?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මොකක්ද තිබෙන්නේ කියන කාරණය පිළිබඳව ඔබතුමාට මා පසුව කියලා දෙන්නම්. මට දැන් වේලාව නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අවස්ථාවේ දී යම් කිසි සිදු වීමක් වෙන්න ඉඩ තිබුණා. ඇමතිවරයෙකුගේ පුතෙක් වෙන්න පුළුවන්. ජනාධිපතිතුමාගේ පුතා වෙන්න පුළුවන්. මන්ත්‍රීවරයෙකුගේ පුතා වෙන්න පුළුවන්. ඒවා සාමාන්‍ය සිදුවීම්. අප ඒ සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ. ඒ ස්ථානයේ මොන විධියේ හරි සිදු වීමක් වුණා නම් ඇමතිවරයා හරි කවුරු හරි සාමාන්‍ය පුද්ගලයෙකුට අදාළ නීතියම ඒ පුද්ගලයින්ටත් අදාළ වෙන්න ඕනෑ. මොකක්ද සිදු වුණේ? විශාල දේශපාලන කැළඹීමක් රටේ ඇති වුණා. පැමිණිලිකරු ඉස්පිරිතාලයේ ඉන්න කොට පොලීසියෙන් සැකකරුට ඇප ලැබුණා. ඔබතුමා දන්නවා, පැමිණිලිකරු ඉස්පිරිතාලයේ ඉන්නවා නම් පොලීසියට ඇප දෙන්න බැරි බව. උසාවිය ඇප දෙන්නේත් නැහැ.

අපි නීතිඥවරු. ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් නීතිඥවරයෙක්. ඔබතුමාත් ඒ ගැන දන්නවා. අපේ නියෝජ්‍ය මහලේකම්තුමාත් ඒ ගැන දන්නවා. එතුමා හිටපු හොඳ විශිෂ්ට නඩුකාරයෙක්. ගරු රවුෆ් හකීම් ඇමතිතුමාත් ඒ ගැන දන්නවා. ඔබතුමන්ලා අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කරලා ඇප දෙන එක පැය 24 ඉඳලා පැය 48 දක්වා දිග් කළා. එහි කොන්දේසි මොනවාද? ඒවා කවුරුවත් දන්නේ නැහැ. ඕනෑ නම් පොලීසිය ඇප දෙනවා. ඕනෑ නම් පොලීසිය ඇප නොදෙනවා. උසාවියට ගියාමත් එහෙමයි, ගරු ඇමතිතුමනි. උසාවියේ නඩුකාරතුමන්ලාත් සමහර වෙලාවට ඇප දිය නොහැකි වරදක් නම් ඇප දෙන්නම බැහැ කියලායි හිතන්නේ. නඩුවක් තිබුණේ නැතත් පොලීසිය සඳහන් කළාම ඇප දෙන්නේ නැහැ. විශේෂයෙන්ම රජයේ දේපළක් බවට පත් කරලා ඒ මුදල් ප්‍රමාණය හරියට දැක්වූවාම ඇප දෙන්න බැහැ. නඩුකාරවරු බලන්නේත් නැහැ, මොකක්ද නඩුව කියලා.

ජනතාවට රටේ පවතින නීතිය ගැන කිසිම විශ්වාසයක් නැති ආකාරයේ තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. හැබැයි ඔබතුමා මේ ගැන සැලකිලිමත් වෙන්න. ඔබතුමාගේ කාලය තුළ තමයි නීතිය මේ ආකාරයෙන් හැසිරෙන්නේ. මා දන්නවා, ඔබතුමා හෘදය සාක්ෂියට එකඟව ක්‍රියා කරන පුද්ගලයෙක් කියලා. මා දන්නවා, ඔබතුමා මේවාට කැමැති නැහැ කියලා. මේ රටේ නායකයාට හරි, මේ නීති පනවන පුද්ගලයින්ට හරි කියන්න ඕනෑ, අනිවාර්යයෙන්ම මේ නීති පනවන කොට විශේෂයෙන්ම දුප්පත් මනුස්සයාට හිංසාකාරී ආකාරයෙන් මේවා පනවන්න එපා කියන කාරණය.

නීතිය ඒ සැටියෙන්ම ක්‍රියාත්මක වනවා නම් මේවා ප්‍රශ්න නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපිට කථා කරන්න දේකුත් නැහැ. හැබැයි බලන්න, ඒ සිදු වීමෙන් මොකද වුණේ කියලා. පොලීසියෙන් ඇප දුන්නා. ඒ කාරණාව අපට එතැනින් අමතක කරන්න පුළුවන්. වරදක් වුණා නම් ඒක නිවැරදි කරන්න, අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙන්න කියලා අපට කියන්න තිබුණා. හැබැයි ඊට පස්සේ මොකද වුණේ? ආණ්ඩුවේ බලවත්ම පුද්ගලයකුට කියන්න වුණා, "මගේ ජීවිතය අද අනතුරේ" කියලා. ගොඩක් වෙලාවට මමත් ආණ්ඩුවට විරුද්ධව කථා කරන කොට සමහර කට්ටිය කියනවා, ඔබතුමාගේ ජීවිතයත් අනතුරේ තිබෙන්න පුළුවන් කියලා. හැබැයි අප නම් අඬන්නේ නැහැ. අප කියන්නේ පුළුවන් නම් අපව මරපල්ලා කියලායි. මොකද ඇත්ත කථා කරන්න, වරදක් පෙන්වා දෙන්න අප භය නැහැ, ගරු ඇමතිතුමනි. අපට අපේ දෙමව්පියෝ ඒ ශක්තිය දීලා තිබෙනවා. හැබැයි අපට යම් කිසි අනතුරක් වුණොත් ඒ අනතුර සිදු වෙන්නේ ආණ්ඩුවෙන් කියන එකත් අප කෙළින්ම කියනවා. විශේෂයෙන්ම ජාත්‍යන්තර සංවිධානවලට වාගේම තානාපති කාර්යාලවලට අප ඒවා පිළිබඳව අනිවාර්යයෙන්ම දැනුවත් කරනවා. මොකද අපව ඝාතනය කරන්න මේ රටේ ත්‍රස්තවාදීන් නැත්නම්, මේ රටේ වෙනත් පුද්ගලයින් නැත්නම් අපේ මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා කිව්වා වාගේ ඒක වෙන්නේ රජයෙන්. අප නොවෙයි එහෙම කියන්නේ, ආණ්ඩුවේ ප්‍රබල අමාත්‍යවරයෙක්. එතුමා ඉතා දුකින් කථා කළා.

අවුරුදු 45ක දේශපාලන ඉතිහාසයක් තිබෙන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයෙක් එතුමා. එදා එතුමාට අගමැති ධුරය භාර දුන්නත්, එතුමා එය භාර ගත්තේ නැහැ කිව්වා. එතුමා එහිදී සඳහන් කළා, එතුමා අගමැති ධුරය භාර නොගත් නිසා තමයි ජනාධිපතිතුමාට මේ ජනාධිපති පුටුවේ වාඩි වෙන්න අවස්ථාව ලැබුණේ කියලා.

හැබැයි, එහෙම කරපු පුද්ගලයා සම්බන්ධයෙන් අද ක්‍රියා කරන්නේ කොහොමද? මා හිතන හැටියට ඒක එතුමාටත් හොඳ පාඩමක්. ඒ ඕවිල්ලාව පද්දන කොට, අගවිනිසුරුතුමිය අයින් කරන කොට, මේ රටේ නීතිය කඩා වැටෙනවා, නීතිය බල්ලාට යනවා, ඒ ඕවිල්ලාව ආපහු තමන් ළඟටත් එනවාය කියන එක එදා එතුමාටත් තේරුම් ගන්න තිබුණා. අද ඒ ඕවිල්ලාව කැරකිලා ඇවිල්ලා වැදුණේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටයි. දැන් තමයි එතුමාට තරු පෙනුණේ. නීතිය කඩා දැමීමාට පස්සේ නීතිය කඩා දමපු හස්තයටම ඒ ප්‍රතිඵල ලැබෙන්න පුළුවන්. කවදා හරි එය කැරකිලා ආපසු එනවා. ඒකාධිපති වියරුවේ, යහ පාලනය නොමැතිකමේ, නීතිය කඩා වැටීමේ ප්‍රතිඵල කවදා හරි ආපහු ඔබතුමන්ලාටත් ලැබෙනවා ගරු ඇමතිතුමනි. අන්තිමට ඒවා මේ ඇමතිවරුන්ට වදින කොට "නයා කනවෝ, කනවෝ" කියලා කෑ ගහයි. හැබැයි එතකොට පරක්කු වැඩියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට වෙනුවෙන් මේ නීති ආරක්ෂා කරන්න ඕනෑ. හැබැයි එවැනි දෙයක් අද රටේ සිදු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ කාරණයක් මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ රටේ ක්‍රීඩාව නංවන්න කියලා ඔබතුමන්ලා සුඛෝපභෝගී රේස් කාර් ගෙනාවා. ලැම්බෝගිනි, මැසරාටි වාගේ කාර් ගෙනාවා. ඒවායේ වටිනාකම රුපියල් ලක්ෂ 1,500යි, රුපියල් ලක්ෂ 1,700යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෙනසුරාදා රෑ ඒ කාර් දෙකක් රේස් ගිය නිසා පාරේ ගිය පුද්ගලයකු අනතුරට ලක් වෙලා ICU එකේ ඉන්නවා. හැබැයි කොල්ලුපිටිය පොලීසිය මේ වන තෙක් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා නැහැ ගරු ඇමතිතුමනි. ඒ රේස් කාර් පැදවූ

පුද්ගලයන් දෙදෙනා කවුද කියලා බලන්න. ඒ අය කාගේ පුත්තුද? කවුද ඒක වහන්නේ? කවුද ඒක හංගන්නේ? ඇප නීතිය ඒ අයට බලපානවාද? පැය 24 ද, 48 ද, සුමානයක්ද, මාසයක්ද බලපාන්නේ? ඔබතුමන්ලා ඒ ගැන පරීක්ෂා කර බලන්න. නීතිය හරියට ක්‍රියාත්මක කරන්න ගරු ඇමතිතුමනි. මේ කාරණය මා ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ සම්බන්ධ ප්‍රවෘත්ති ඔබතුමාට දැන ගන්න ලැබේවි ගරු ඇමතිතුමනි. ඔබතුමාගේ දරුවන් වෙනුවෙන්, මේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් නීතිය හරියාකාරව ක්‍රියාත්මක කරවන්න මහන්සි වනවා නම්, අධිකරණ ඇමතිවරයා ලෙස ඔබතුමා මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන් ක්‍රියාත්මක විය යුතුයි. සෙනසුරාදා වූ ඒ සිදුවීම සම්බන්ධයෙන් මේ වන තෙක් පොලීසිය කිසි ලෙසකින්වත් ක්‍රියාත්මක වෙලා නැහැ. පොලීසිය එය හංගනවා; යට ගහනවා. මොකද, ඒ ඉතා බලවත් පුද්ගලයන් දෙදෙනෙක්.

ඔබතුමන්ලා කියන විධියට රටේ ක්‍රීඩාව නංවන්න ගෙනාපු රේස් කාර් නිසා සිද්ධ වූ අනතුරක් ඒක. කවුද ඒ රේස් කාර් ගෙනාවේ? කොහෙන්ද ගෙනාවේ? කීයද ඒවාට ගෙවපු මුදල් ප්‍රමාණය? කීයක් රේගුවට ගෙව්වාද? මේවා පරීක්ෂා කරලා බලන්න. සමහර ඒවාට ගෙවීම් කරලා නැහැ. අන්න ඒ පුද්ගලයෝ අද අහිංසක ජනතාවගේ ජීවිතත් එක්ක සෙල්ලම් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද හදිසි ප්‍රතිකාර ඒකකයේ පසු වෙනවා ඒ අනතුරට ලක් වූ පුද්ගලයා. එහෙම නම්, කෝ ඔබතුමන්ලාගේ නීතිය? කෝ පැය 24 නීතිය? කෝ පැය 48 නීතිය? ගරු ඇමතිතුමනි, මේ නීතිය බලපාන්නේ නැහැ රටේ බල පුළුවන්කාරයන්ට. මේ නීතිය බලපාන්නේ නැහැ සල්ලිකාරයන්ට. මේ නීතිය බලපාන්නේ නැහැ ඔබතුමන්ලාගේ දරුවන්ට. මේ නීතිය බලපාන්නේ නැහැ රටේ ඉහළම නායකයාගේ පවුලට. මේ නීතිය බලපාන්නේ විපක්ෂයේ ඉන්න අපටත්, රටේ ඉන්න අහිංසක දුප්පත් මිනිසුන්ටත් පමණයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි ඔබතුමන්ලා හොඳට දැන ගන්න, දෙවයේ සරදම අනුව ඔබතුමන්ලාටත් කවදා හරි ඒ පාඩම ඉගෙන ගන්න සිදු වෙනවා කියලා. තමන්ගේ දරුවකු, තමන්ගේ සහෝදරයකු, තමන්ගේ නෑයකු මෙවැනි අනතුරකට ලක් වුණාට පස්සේ ඒ බල පුළුවන්කාරයකු ඊට උඩින් සිටියොත් ඔබතුමන්ලාටත් මේ ආනිශංසයටම මුහුණ දෙන්න සිදු වෙන බව.

අපි තුන්හතර සැරයක් මේ සම්බන්ධයෙන් ඔබතුමා දැනුවත් කළා ගරු ඇමතිතුමනි. මම දන්නවා, ඔබතුමාගේ හිතේ, ඔබතුමාගේ පපුවේ මෙය වැඩ කරනවා කියලා. හැබැයි ඔබතුමාටත් ගන්න පුළුවන් ක්‍රියා මාර්ග ඉතාම අතළොස්සයි. මොකද, ඔබතුමා ආණ්ඩුව ඉදිරියේ මුනිවත රකින්න ඕනෑ. හැබැයි ගරු ඇමතිතුමනි, ඔබතුමා හෘදය සාක්ෂියට එකඟව ඔබතුමාගේ දරුවන්ගේ නාමයෙන්, ඔබතුමාගේ දරුවන් වෙනුවෙන් නීතිය, යහ පාලනය තිබෙන රටක් නිර්මාණය කරනවා නම් ඔබතුමාට වගකීමක් තිබෙනවා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න. මම විශ්වාස කරනවා ඔබතුමා ගැන. වෙනත් ඇමතිවරයකු ඔය ඇමති ධුරයේ සිටියා නම් මා ඇත්තටම මේ ආයාචනය කරන්නේ නැහැ. ඔබතුමාට හෘදය සාක්ෂියට එකඟව ක්‍රියා කිරීමේ යම්කිසි හැකියාවක් තිබෙනවාය කියලා මා විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, මේ රටේ නීතිය පහළට ඇද දමන්න එපා. මේ රටේ නීතිය බල්ලාට යන්න දෙන්න එපා. ඒ නිසා ඇප ලබා දීම සම්බන්ධව ඔබතුමා නිසි ක්‍රමවේදයක් හදන්න ගරු ඇමතිතුමනි. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙතැන ඉන්නවා. නීතිපති දෙපාර්තමේන්තුවේ ඉන්න මා අගය කරන ජ්‍යෙෂ්ඨ නීතිඥවරු මේ ස්ථානයේ ඉන්නවා.

ඔබතුමන්ලාත් පොඩ්ඩක් සැලකිලිමත් වෙන්න. මා මීට කලිනුත් මේ සම්බන්ධයෙන් කිව්වා. ඔබතුමන්ලා මේ ගෙනෙන නීතිය, පැය 24ක කාලයක් රක්ෂිත භාරයේ රඳවා තබා ගැනීම පැය 48ක් දක්වා දීර්ඝ කරපු නීතිය බලපාන්නේ මේ විපක්ෂයේ සිටින අපටයි, රටේ සිටින දුප්පත් අයටයි. හැබැයි ඔබතුමන්ලාට තවම ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් වෙන්න අවස්ථාවක් උදා වන්නේ නැහැ. මොකද, ඔබලාට මේ ආනිශංසය තවම ලැබිලා නැති නිසා. ඔබතුමන්ලාගේ පවුලේ කාට හරි ඒ තත්ත්වය උදා වුණොත් තමයි ඔබතුමන්ලාට තේරුම් යන්නේ මේ නීතිය ඉතාම අවදානම් තත්ත්වයේ තිබෙනවාය කියන එක.

විශේෂයෙන්ම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මා දන්නා විධියට සාධාරණ පුද්ගලයෙක්. ඒ වාගේම එදා එතුමා ඒ ස්ථානයේ හැසිරුණු ආකාරය සම්බන්ධයෙන් අපට වැඩිමනත් දත්ත ලැබිලා නැහැ. හැබැයි, එතුමාගේ පුතා සහ වෛද්‍යාලංකාර මහතාගේ පුතා අතර සිදු වුණු සිද්ධිය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වූණු ආකාරය ගැන අපි සෑහීමකට පත් වන්නේ නැහැ ඇමතිතුමනි. ඒ ගැන ඔබතුමා අපට පිළිතුරක් දෙන්න. ඔබතුමා ඉතාම පිරිසිදුව ගෙනාපු, අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව ඇප ලබා දීම සම්බන්ධයෙන් වූ නීතිය මේ දෙපොළට ක්‍රියාත්මක නොවුණේ ඇයි? මේ සිද්ධියට සම්බන්ධ එක පුද්ගලයෙක් තවමත් රෝගාතුරව ඉස්පිරිතාලයේ ඉන්නවා. ඒ නිසා අනෙක් පාර්ශ්වයට ඇප දෙන්න කිසිම හැකියාවක් නැහැ. හැබැයි, ඊට පසුව සිදු වුණු සිදු වීම් ඊට වඩා ප්‍රබල ආකාරයෙන් රටේ දේශපාලන කැළඹීමක් බවට පත් වුණා. ආණ්ඩුව දෙදරා යන තරමේ දෙයක් බවට ඒ සිද්ධිය පත් වුණා. ඒ ඇමතිතුමාට කියන්න සිදු වුණා, "මම මේක වැරදිලා කියන දෙයක් නොවෙයි. හිතා මතාම මගේ දේශපාලන ගමන දුර්වල කරන්න, මර්දනය කරන්න, විනාශ කරන්න පිරිසක් ආණ්ඩුවේ සිටිනවා" කියලා. ඒ විතරක් නොවෙයි, එතුමා එහෙම විනාශ කරන්න බැරි නම්, එතුමාගේ ජීවිතය පවා විනාශ කරන්න මේ පිරිස සූදානම් බවත් සඳහන් කළා,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔය ප්‍රකාශයම විරුද්ධ පක්ෂයේ සිටින මටත් ප්‍රකාශ කරන්නට සිදු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ සීයා, මගේ පියා මට හොඳ පෞරුෂත්වයක්, හොඳ කොන්දක් දීලා තිබෙනවා. කෙළින් කථා කරන්න පුළුවන්, සොරකම් නොකරන, සොරකම දැක්කාම ඒ පිළිබඳව කෙළින් කථා කරන්න පුළුවන් හැකියාව එක්සත් ජාතික පක්ෂයේ තරුණ මන්ත්‍රීවරයකු වන මට අපේ පවුලෙන් ලැබිලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම්- [බාධා කිරීමක්] අපි භය නැහැ. අපි නැමෙන්නේ නැහැ. අපි කෙළින් කථා කරනවා. ඕනෑම පුද්ගලයෙකුට පුළුවන් නම් ඕනෑම දෙයක් කරන්න කියලා අපි අභියෝග කරනවා. හැබැයි, දැන ගන්න. මේ සියලු දේ තානාපති කාර්යාලවලට, අනෙකුත් සියලු තැන්වලට- [බාධා කිරීමක්] අස්වර් මන්ත්‍රීතුමාට මේවා ගාණක් නැහැ. ඔබතුමා එහෙටත් පනිනවා; මෙහෙටත් පනිනවා. ඔබතුමාට මේවා ප්‍රශ්නයක් නැහැ. එන එන පැත්තේ බබාලා වඩාගෙන ඔබතුමා එහෙට මෙහෙට ගොටට අල්ල අල්ලා ඉන්නවා. ඔබතුමාට ඕවා ප්‍රශ්නයක් නැහැ. හැබැයි කෙළින් දේශපාලනය කරන, හරියට දේශපාලනය කරන වන්දි හට්ටයන් නොවන අපට ඔය ප්‍රශ්නය තිබෙනවා. හැබැයි අපි භය නැහැ. ඔබතුමන්ලා වාගේ අපි පක්ෂය පාවා දෙන්නේත් නැහැ; ගිහිල්ලා අනෙක් අයගේ ළමයි වඩාගන්නේත් නැහැ; ගිහිල්ලා ගොටට අල්ලන්නේත් නැහැ. වයස අඩු වුණත් අපෙන් ඒවා ඉගෙන ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සල්ලිවලට, තානාන්තරවලට තමන්ගේ පාක්ෂිකයන් පාවා දෙන්නේ නැතිව ප්‍රතිපත්ති අනුකූලව දේශපාලනය කළා නම්, රටේ නීතිය වෙනුවෙන්, යහ පාලනය වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටියාය කියලා අපට ආඩම්බරයෙන් මැරෙන්න පුළුවන් නම්, ඒක තමයි අපි දේශපාලනයෙන් ලබා ගත් වැදගත්ම පාඩම කියලා මා අවසාන වශයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි. දේශපාලනය හරියට කළා නම්, කවදා හරි ඇමතිතුමාටත් ආඩම්බර වන්නට පුළුවන් තමන් එය හරියට කළාය කියලා. රටේ නීතිය, යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ ක්‍රියාවලියේ දී අපි මුලින්ම සිටියාය කියලා අපට අන්තිම හුස්ම හෙළන්නට පුළුවන් නම්, එය අපට දේශපාලනයෙන් ලබා ගන්නට පුළුවන් වැදගත්ම පාඩම

[ගරු සුජීව සේනසිංහ මහතා]

වනවා වාගේම, අපේ දෙමව්පියන්ටත්, ඒ දෙමව්පියන්ගේ දෙමව්පියන්ටත් ඒ මහින් පින් අත්කර දෙන්න පුළුවන් කියන එකත් මතක් කරමින් ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනා සංශෝධන සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කල් තැබීමේ යෝජනාවට අදාළව කරුණු කියමින් බොර දියේ මාළු බාන්නයි උත්සාහ කළේ. විපක්ෂයේ දේශපාලනය ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ පියාත්, අපිත් එක්සත් ජාතික පක්ෂය ඔය කියන දේශපාලනයට එදා මුහුණ දුන්නා. එදා 1989 දී මා පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරපු කෙනෙක්. ඒ නිසා විපක්ෂයේ දේශපාලනය ගැන, ජේ. ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස මහත්වරුන්ගේ දේශපාලනය ගැන අපට කියලා දෙන්න ඕනෑ නැහැ. එදා අපි නාම යෝජනා භාර දුන්නාට පසුව සවස 6.00, 7.00 වනකොට ගෙදරට පැමිණිය යුතුව තිබුණා. මොකද, රෑ වෙනකොට පිරිසක් අපේ පක්ෂයේ අයගේ ගෙවල්වලට ඇවිල්ලා දොරට තට්ටු කරලා, අපේ පක්ෂයේ මිනිසුන් ජේවීපී කාරයෝ කියලා අල්ලාගෙන ගිහිල්ලා, කෑගල්ලේ තිබුණු වික්‍රමසිංහ බංගලාවේ හිර ගෙදරට දමලා ඝාතනය කරපු යුගයක තමයි අපි දේශපාලනය කළේ. තමුන්නාන්සේලා වාගේ නොවෙයි, අපි එදා 1989 දී ඡන්දය ඉල්ලුවා.

එදා අපට එක පැත්තකින් ජේවීපිකාරයන්ගෙන් මරණ බය තිබුණා; අනෙක් පැත්තෙන් යූඑන්පීකාරයන්ගෙන් මරණ බය තිබුණා. අපි දන්නවා, එදා මේ රටේ තරුණ තරුණියන් 60,000ක් පරලොව යවපු ආණ්ඩුවක් තමයි රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව. දේශපාලනය ගැන මේ ගරු මන්ත්‍රීතුමන්ලාට කථා කරන්න දෙයක් නැහැ. ඒ නිසා තමුන්නාන්සේට-[බාධා කිරීම්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඉදිරිපත් කරන point of Order එක මොකක්ද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
The Hon. Deputy Minister mentioned the name of the Hon. Leader of the Opposition and said that 60,000 people - [*Interruption.*]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එහෙම නම් ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ගැන කිව්වේ මොකටද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, he cannot mention names.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නැහැ, නැහැ. ඒ දෙකම එකයි. මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ගැන කොච්චර කිව්වාද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්ථාවර නියෝගවලට පටහැනි දෙයක් තිබෙනවා නම් ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කන්න ඕනෑ වුණාම කබරගොයාත් තලගොයා වෙනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කොහෙද යන්නේ, මල්ලෙ පොල්.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එක්සත් ජාතික පක්ෂයේත්, ජේවීපිකාරයන්ගේත් තුවක්කුත් එක්ක තමයි අපි දේශපාලනය කළේ. ඒ නිසා අපි නම් ඒවාට බය වෙන්නේ නැහැ. බය වෙන්න ඕනෑ ඕවාට නොවෙයි. අහන්න අපෙන්. අහන්න මෙතුමන්ලාගෙන්. තාත්තලා දේශපාලනය කරන කොට මෙතුමන්ලා පුංචි කාලයේ ගෙවල්වල හිටියේ කොහොමද කියලා අහන්න. දරුවෝ බොහොම අමාරුවෙන් හිටියේ. ඒ නිසා ඉගෙන ගන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේලාට භීෂණය ගැන අහන්න ඕනෑ නම්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් අහන්න එපා, රනිල් වික්‍රමසිංහ මහත්තයාගෙන් අහන්න. ඔය දෙන්නාටම- [බාධා කිරීම්] නැහැ. අපි දේශපාලනය කරන කොට අර මොකක්ද එකේවත් තමුන්නාන්සේලා නැහැ. දැන් මෙතැන කෑ ගහනවා. ඒ නිසා වැඩිය අහන්න එපා. භීෂණය ගැන කථා කරන්න ඕනෑ නම් රනිල් වික්‍රමසිංහ මහත්තයාගෙන් අහන්න. වෙන කාගෙන්වත් අහන්න එපා. එතුමා කියලා දෙයි. දේශපාලනය කළ හැටි අපි දන්නවා. 1989 දේශපාලනය කළේ කොහොමද කියලා අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා අපරාධ නඩු විධාන සංග්‍රහය ගැන කථා කරනවා. පැය 24කට වඩා පොලිස් භාරයේ තියා ගන්න පුළුවන් නීතියක් මේ රටේ තිබුණා. ළමා අපචාර සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කළා. ඒ අනුව පැය 24කට වැඩිය තියා ගන්න පුළුවන්. ඒ වාගේම පසු ගිය කාලයේ නීතියක් ක්‍රියාත්මක වුණා. උසාවියට - විනිශ්චයකාරවරයකුට- ඉදිරිපත් කරලා පැය 48ක් තියා ගන්න නීතියක් අවුරුදු දෙකක කාලයක් ක්‍රියාත්මක වුණා. අද මේ රටේ විශාල වශයෙන් අපරාධ සිද්ධ වෙනවා; අපරාධ රැල්ලක් තිබෙනවා. පොලීසියකට අපරාධයක් නිරවුල් කර ගන්න, එහෙම නැත්නම් සැකකරුවකුගෙන් සොයා ගත් යම් භාණ්ඩයක්

සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන කටයුතු කරන්න විශාල කාලයක් ගත වෙනවා. ඒ නිසා ඒ පරීක්ෂණයට උදවු කරන්න තමයි මේ නීති ගෙනාවේ. නිකම්ම නොවෙයි. පොලිස් නිලධාරියා අදාළ සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරලා තමයි ඒ නියෝගය ගන්න ඕනෑ. [බාධා කිරීම්] සහකාර පොලිස් අධිකාරිවරයකුගේ වාර්තාවක් තිබෙනවා. [බාධා කිරීම්] ඒ නිසා මේ අය-

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා මගේ කථාවෙන් පස්සේ කථා කරන්න. තමුන්නාන්සේ පැය භාගයක් විතර කථා කළා නේ. මෙන්න මේ කරුණු හිතට ගන්න ඕනෑ. මෙය වැරදි විධියට අර්ථ නිරූපණය කරන්න එපා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මාතෘකාව ඇප පිළිබඳ ප්‍රශ්නයක්.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔව්. ඇප ගැන තමයි කථා කරන්නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ සිද්ධියේදී පරීක්ෂණ කටයුතු කරන්න කාලය අවශ්‍ය නම් පොලීසියෙන් ඇප දුන්නේ ඇයි?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
වාඩිවෙන්න, ගරු මන්ත්‍රීතුමා. තමුන්නාන්සේ කථා කළේ ඇප ගැන ද? [බාධා කිරීම්] තමුන්නාන්සේ කථා කළේ මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ගැන. දැන් මෙතැන නීති ගැන කථා කරන්න එනවා. වාඩිවෙන්න. [බාධා කිරීම්] ඇප ගැන නීතිය දන්නේ නැහැ. මමත් 1980 දී දිවුරුම් දුන්න නීතිඥවරයෙක්. අපිත් උසාවිවල කටයුතු කරලා තිබෙනවා. ඔබතුමන්ලා මේ ගැන දන්නේ නැහැ. දණ්ඩ නීති සංග්‍රහයේ 314 වන වගන්තිය කියන්නේ ඇප දෙන්න පුළුවන් වරදක්. පොලීසියට ඇප දෙන්න පුළුවන් වැරදි තිබෙනවා. මෙතුමන්ලා කල් තැබීමේ යෝජනාවක් ගෙනැල්ලා කෙස් පැළෙන තර්ක ඉදිරිපත් කරලා කියන්න යන්නේ මොකක්ද? වෙනත් සිද්ධියක් ගැන. ඒ සිද්ධියේ තුවාලකාරයාගේ අම්මා තාත්තාවත් ඒ සිද්ධිය ගැන කථා කරලා නැහැ. මේ අය මෙහේ ආණ්ඩු පෙරළන්න යනවා. [බාධා කිරීම්] මේ ගොල්ලෝ ආණ්ඩු පෙරළන්න යනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එතුමා පක්ෂයේ මහ ලේකම්.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අද මේ අයට - එක්සත් ජාතික පක්ෂයට- වැඩ සටහනක් නැහැ. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එක්සත් ජාතික පක්ෂයට වැඩ පිළිවෙළක් නැහැ. වැඩ පිළිවෙළක් නැති වුණාම මොකක්ද කරන්නේ? ඔය කට වචනයක්, එහෙම නැත්නම් කාගේ හරි සිද්ධියක් අල්ලා ගෙන ඒකෙන් ආණ්ඩු පෙරළන්න යනවා. ඒක හරියට අර එළුවා පස්සෙන් යනවා වාගේ තමයි. වැටෙයි, වැටෙයි කියලා බලා ගෙන ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ තරුණ කාලය අපරාදේ. අතිගරු ජනාධිපතිතුමා මේ රට ආණ්ඩු කරන්න ගත්තේ 2005 වසරේ සිටයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ ලොක්කෝ උතුරට ගියා ද? ඒ කාලයේ උතුරට යන්න බැහැ. එල්ටීටීඊකාරයින්ට - කොටින්ට- දණ ගහලා තමයි යන්න වුණේ. එදා තමුන්නාන්සේ මහනුවර උසාවියේ නැත්නම් කොළඹ උසාවියේ පෙනී සිටින කොට යාපනයේ ජනතාව පෙනී සිටියේ එල්ටීටීඊ උසාවියේ. ඒවා තමුන්නාන්සේට අමතකද? අපේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තමයි මේ රටට තිබෙන්නේ එක අධිකරණයයි කියන තත්ත්වයට පත් කළේ. එදා කොටි පොලීසි තිබුණා. අද පොලීසි ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 2005 දී ජනාධිපති ධුරයේ වැඩ භාර ගන්න කොට මේ රටේ කොටි පොලීසි තිබුණා; කොටි අධිකරණ තිබුණා. ජනතාව මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට ඡන්දය දුන්න නිසා අද මේ රටේ කොටි පොලීසි නැහැ; කොටි අධිකරණ නැහැ. එදා අපි 1994දී ආණ්ඩු බලය ගන්න කොට, මේ ගොල්ලන්ගේ ආණ්ඩුව කාලයේ තමයි තරුණ තරුණියෝ 60,000ක් අතුරුදහන් කරලා තිබුණේ.

පරාල ඇණ ගහලා, මිනිස්සුන්ගේ බෙලි කපලා මරා දමා තිබුණා. එක දවසක් උදේ අරණායක ඉඳලා මම මගේ දරුවා ධර්මරාජ විද්‍යාලයට එක්ක ගෙන යන කොට පාර අයිනේ මිනී තිබුණා අපි දැක්කා. පහළ කඩුගන්නාව පසු කරලා යන කොට ටයර් දාලා මිනීවලට ගිනි තියලා තිබුණා. මළ සිරුරුවලටවත් ගරුත්වයක් තිබුණේ නැහැ; ඒවා බල්ලෝ බළල්ලු කන තත්ත්වයට පත් කරලායි තිබුණේ. කළු දුම අස්සෙන් තමයි අපි එදා මහනුවරට ගියේ. ඒවා අපට අමතක නැහැ. තමුන්නාන්සේලා භීෂණය ගැන කථා කරන්න තානාපති කාර්යාලවලට යනවා. භීෂණය ගැන ඉගෙන ගන්න ඕනෑ නම් අතීතයේ තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේ තමුන්නාන්සේලාගේ නායකතුමන්ලා කළ දේවල් ගැන අපෙන් අහන්න. අපි කියන්නම්.

ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලාගේ හිටපු ජනාධිපති, ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ආණ්ඩු කාලයේ නීතියට ගරු කරපු හැටි මම කියලා දෙන්නම්. එදා ගම්පහ විවියන් ගුණවර්ධන මන්ත්‍රීතුමියගේ මූලික අයිතිවාසිකම් කඩ කළා, එතුමිය ගමන් කළ පෙළපාළියකට පොලීසිය ලවා ගස්සවලා. සුප්‍රීම් උසාවිය ඒ පොලිස් නිලධාරියාට දඩයක් ගැහුවා. එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ආණ්ඩුව ඒ දඩය ගෙව්වා. ඒ පොලිස් නිලධාරියාට promotion එකකුත් දුන්නා. මේ වාගේ දේවල් කරපු අය තමයි අද ඔය බණ කියන්නේ. ඒක තමයි ජනතාව ඒ ගොල්ලන්ව විශ්වාස කරන්නේ නැත්තේ. අද රටේ එහෙම තත්ත්වයක් නැහැ. එදා කොච්චර පැහැර ගෙන යාම් තිබුණාද? රෑට ඇවිල්ලා දොරට තට්ටු කරලා පැහැර ගෙන යනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ගෙවල්වල ඉන්න නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලයේ එක අම්මා කෙනකු මා සමඟ කිව්වා, "අනේ! බුදු සර් හවස් වෙන කොට අපට උණ ගැනෙනවා; මගේ දරුවා ඉන්නේ විශ්වවිද්‍යාලයේ නිසා" කියලා. මේවා අපට කියාපු දේවල්. අරණායක රිවිසඳ මධ්‍ය මහා

[ගරු ලලිත් දිසානායක මහතා]

විද්‍යාලයේ ශිෂ්‍යාවක් පැහැර ගෙන යාම සම්බන්ධව මට දැන ගන්න ලැබුණු පසු මම රාත්‍රියේ හමුදා camp එකට කථා කරලා ඒ ගැන ඇහුවා. එතකොට කිව්වා, "අපි ගැහැනු ළමයි ගෙනෙන්නේ නැහැ, මහත්තයෝ. අපි ගාව matronsලා නැහැ" කියලා. පසුවදා දැන ගන්න ලැබුණා ඒ ගැහැනු ළමයා දූෂණය කර මරා දමා තිබෙනවා කියලා. එදා ඒ හමුදා නිලධාරීන් තුන්දෙනකුට විරුද්ධව මාවනැල්ල උසාවියේ පෙනී සිටියේ මම. අපි අපේ ජීවිතවලට භය වුණේ නැහැ. රිවිසඳ විද්‍යාලයේ ඒ පාසල් ශිෂ්‍යාව දූෂණය කර මැරුවා. ඒ වාගේම මා නියෝජනය කරන අරණායක ආසනයේ ධනපාල එපිටවත්ත මහත්මයාගේ යාළුවා -රියැදුරු මහත්තයා- වාහනයත් එක්ක අරගෙන ගිහිල්ලා මැරුවා. Technical College එකේ හිටියේ. ඒ මහතාගේ නෝනාමහත්තයා අද අතරමං වෙලා. අපි තමයි නඩුවට කථා කළේ. මේවා එදා එක්සත් ජාතික පක්ෂය ඇතුළේ සිද්ධ වුණු දේවල්. මේවා අධිකරණයේ ලියැවිලා තිබෙනවා. අපි ඒවාට පෙනී සිටියා. අපි භය වුණේ නැහැ. අපි භීෂණයට භය වුණේ නැහැ. අපි අපේ රාජකාරිය කරලා තමයි මේ වාගේ නිදහසක් අද උදා කරගෙන තිබෙන්නේ.

පොලීසියට බලය අවශ්‍යයි. ඒ සම්බන්ධයෙන් කථා කරද්දී, මා එක කාරණයක් කියන්න කැමැතියි. ඔබතුමන්ලා කහවත්තේ ඝාතන ගැන කථා කළා. කහවත්තේ ඝාතන පහළොවක් සිද්ධ වුණා. ඒ සැකකරුවන් අද අල්ලලා තිබෙනවා. ඒකට කාලයක් ගියා. කොහොමද ඒවා සිද්ධ වුණේ කියන එක අද දැන ගන්න ලැබිලා තිබෙනවා. තංගල්ලේ ප්‍රාදේශිය සභා සභාපති විදේශිකයකුට වෙඩි තියලා මරන කොට ජනාධිපතිතුමාගේ ගම කියලා නිකම් හිටියේ නැහැ. නඩු දාලා ඒ අය remand කර තිබුණා. පසුවදා එළියට යැව්වාද? නැහැ. ඒ වාගේම කැලණියේ සිද්ධිය වෙලාවේ ඒ අදාළ අය පසුවදා වන කොට අත් අඩංගුවට ගත්තා. ඊළඟට කහවත්තේ සිද්ධියට අදාළ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු අදත් ඉන්නේ remand එකේ. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, මේ ආණ්ඩුව ඒ සිද්ධිවලදී බලය පාවිච්චි කළාද? නැහැ. කාටත් හරියට නීතිය ක්‍රියාත්මක කර තිබෙනවා. ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා උසාවියට තර්ජනය කළා කියලා කිව්වා. ඒවාට නිකම් හිටියාද? නැහැ. නඩු දැම්මා එතුමාට විරුද්ධව. එතුමා උසාවියේ පෙනී සිටියා. අපි දන්නවා ඒ කාලයේ මේ රටේ තිබුණු තත්ත්වය මොකක්ද කියලා. අනුරුද්ධ රත්වත්තේ ඇමතිතුමන්ලාට අසභ්‍ය වෝදනා දාලා, විවිධ දේවල් කරලා අත් අඩංගුවට ගත්ත හැටි, ලොහාන් රත්වත්තේ මැතිතුමන්ලා එල්ලුම් ගහට යවන්න කටයුතු කළ හැටි අපි දන්නවා. ඒ සිද්ධිවලදී අපි තනියම උසාවිවලට ගියා. අපි භය වුණේ නැහැ. එදා තෙල්දෙනිය උසාවියට ගිහිල්ලා රත්වත්තේ ඇමතිතුමා වෙනුවෙන් අපි පෙනී සිටියා. ඇයි ඒ? ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්. ඒ නිසා මේවා තේරුම් ගන්න ඕනෑ.

අද අපි සතුටු වෙනවා, තමුන්නාන්සේලාට එදා කරන්න බැරි වුණු දෙයක් අපේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉටු කිරීම ගැන. අද අපේ රටේ අධිකරණ අමාත්‍යාවරයා වශයෙන් කටයුතු කරන්නේ ගරු රවුෆ් හකීම් මැතිතුමා. මේක තමයි බුද්ධිමත් දේශපාලනය. තමුන්නාන්සේලාගේ පක්ෂයේ සියලු නායකයෝ තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් කැඩිලා අපේ ආණ්ඩුවට එනවා. වෙනස ඒකයි. ගරු රවුෆ් හකීම් මැතිතුමා වැනි නායකයින් අද අපත් එක්ක එකතු වෙලා මේ ගමන ශක්තිමත්ව යනවා. ඒ නිසා තමුන්නාන්සේලාට දූෂණය ගැන, භීෂණය ගැන අහගන්න ඕනෑ නම් වැඩිය දුර යන්න එපා. රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙන් අහගන්න. නැත්නම් අපෙන් අහන්න. නැත්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්න. එතුමාගේ තාත්තා එවකට දේශපාලනඥයකු හැටියට කටයුතු කළා. ඒ නිසා මේ භීෂණය ගැන තමුන්නාන්සේලා කථා කරන්න එපා. අපිත් භීෂණයට විරුද්ධයි. අපිත් නීතිගරුක, යුක්තිගරුක සමාජයක් තමයි බලාපොරොත්තු වන්නේ. අද එවැනි සමාජයක් නැහැ කියලා තමුන්නාන්සේලා මවන්න හැදුවාට වැඩක් නැහැ. අද යාපනයට යන කොට ජනතාව දන්නවා ඒ කාලයේ කොහොමද ඒ ප්‍රදේශ තිබුණේ කියලා. අද මායිම් ගම්මාන නැහැ. කොටි පොලීසි නැහැ. උතුර, නැගෙනහිර ප්‍රදේශ නියෝජනය කරන මුස්ලිම් මන්ත්‍රීවරු මේවා දන්නවා. එදා ත්‍රස්තවාදීන් විසින් ස්වාමීන් වහන්සේලා මැරුවා. කාත්තන්කුඩි පල්ලියේ ආගමික කටයුතුවල යෙදෙමින් සිටි අය පල්ලිය ඇතුළේම මැරුවා. ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කරන්න ගිය අය මැරුවා. නමුත් අද එහෙම දේවල් සිදු වන්නේ නැහැ. අද නීතියක් තිබෙන රජයක් තිබෙන්නේ කියන එක ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ නිසා බොර දියේ මාළු බාන්න යන්න එපා. ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ගැන කියලා හෝ වෙන දෙයක් ගැන කියලා හෝ අපේ ආණ්ඩුව පෙරළන්න තමුන්නාන්සේලාට මේ කපේදි බැහැ කියන එක ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Bismillahir Rahmanir Raheem.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, there is no point of Order. He has completed his speech. Ask him to sit down. - [*Interruption*.]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. එයාගෙ බෙල්ල කපන්න හදන්නේ එක්සත් ජාතික පක්ෂයේ සිරිකොත. අන්න ඒක දැනගන්න.

Sir, under the guise of -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඉතා ඉක්මනින් -

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, obituary notice වාගෙයි අපේ හිටපු ඇමතිවරයා කථා කළේ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
There is no point of Order. Throw him out and that is the point of Order.

Sir, under the guise of extricating certain information regarding the Criminal Procedure Code (Special Provisions) Act -

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Traitor!

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

We know who the traitors are at *Sirikotha*. One is you, yourself. Your neck is in the guillotine. You must understand that. You had better save your life from that and not from the Government. No Government will dare to kill ගැරඩි. මේ වාගේ ගැරඩි මරා පව් පුරවා ගන්න වෙනවා.

Sir, under the guise of extricating certain information, my Friend, the Hon. Ajith P. Perera, has shamefully endeavoured to cast aspersions on the judiciary and to throw mud at all the Judges in the Supreme Court and the other courts.

We, as responsible Members of the Government and as Members of a civilized society, wish to exonerate all Judges from the accusations made so ashamedly in this House today by the two Hon. Members of the Opposition, who spoke before me.

Judges are selected on a firm basis. Judges are very honourable people and that has to be accepted. Inasmuch as you point a finger at us, we can point 100 fingers at you to prove as to how you tampered with justice. Therefore, it is very unfair to cast such aspersions on the Hon. Members of the Judiciary who discharge their duty in the dispensation of justice.

මේ වාගේ පාපෝච්චාරණ උසාවියකදී කරන්න ගියා නම් නීතිය කඩා වැටෙනවා. උසාවියට අපි ගරු කරන්න ඕනෑ. අග්‍ර විනිශ්චයකාරතුමිය පිළිබඳව එදා මේ පාර්ලිමේන්තුවේදී කථා කරනකොට විරුද්ධ පක්ෂයේ මෙතුමන්ලා මොකක්ද කිව්වේ? අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ බලය විධායකය අතට ගත්තාය කියා චෝදනා කළා. අද මේ මන්ත්‍රීතුමන්ලා දෙදෙනා මොකක්ද කරන්නේ? ඊට හාත්පසින්ම වෙනස් විධියට තමන්ගේම වචන තමන්ම ගිල ගන්නවා.

The Judiciary separates from the Legislature and the Legislature separates from the Executive. We all have powers well defined under the Constitution.

நான் இந்தச் சபையிலே ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். எனது நண்பர் அமைச்சர் மாண்புமிகு ரவுப் ஹக்கீம் இன்று இந்த அரசாங்கத்துக்கு பலமிக்க ஒரு சக்தியாகத் திகழ்கின்றார். அதன் காரணமாகத்தான் எதிர்க்கட்சியினர் அவருக்கு எதிராக ஒவ்வொரு விதமான வேஷம்பூண்டு கோஷம் எழுப்புவதற்கு - குரல் எழுப்புவதற்கு - முனைந்திருக்கிறார்கள். மாண்புமிகு அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் அரசாங்கத்தின் சக்தியாக இருந்து வடக்கிலே பாரிய அபிவிருத்தித் திட்டங்களை முன்னெடுத்து வருகின்றார். ஆனால், தமிழ்நாட்டிலிருந்து இங்கே வந்து எங்களுடைய தமிழ் மீனவர்களுக்கு அநியாயம் செய்துவிட்டு செல்கின்றார்களே! அதைப்பற்றிக் அங்கு கேட்பதற்கு வைகோவுக்கு - கோபாலசாமிக்கு - முதுகெலும்பு இல்லையா? இலங்கைத் தூதரகத்துக்கு முன்னால் நின்றுகொண்டு ஆர்ப்பாட்டம் செய்கின்றார் இவர்! யார் ஐயா இந்தக் கோபாலசாமி? கோபாலசாமி கோபால் பற்பொடி - மூக்குப்பொடி போன்றவர்! அந்தக் காலத்தில் நாங்கள் பற்பொடி போட்டுத்தான் பற்களைத் துலக்குவோம். இந்தப் பல்பொடி அதற்கும் உதவாது. இவரைப் போன்றவர்கள் தங்களுடைய அரசியல் வாழ்வுக்கு எந்தவிதமான வக்குமில்லாததால் இப்படியாக அங்கே ஆர்ப்பாட்டம் செய்கின்றார்கள். தமிழர்களோ, முஸ்லிம்களோ, சிங்கள வர்களோ யாராக இருந்தாலும் இந்த நாட்டில் எங்களைப் பாதுகாப்பது எங்களுடைய அரசாங்கம்தான்!

இன்று பாருங்கள்! தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர்கள் ஜெனீவாவுக்குப் போயிருக்கின்றார்கள். சம்பந்தன் ஐயா அவர்கள் அங்கு சென்று சொல்கின்றார், "எது நடந்தாலும் இலங்கைக்கு எதிரான சர்வதேச விசாரணை ஒருநாள் நடந்தே தீரும்" என்று. இலங்கையின் அரசியல் யாப்பின்படி சம்பந்தன் ஐயா அவர்கள் செய்வது தேசத்துரோகமான ஒரு செயல்! யார் அவருக்கு இந்த அதிகாரம் கொடுத்தது? இந்த அரச சபையின் பிரதிநிதிகளாக இருக்கும் அவர்கள், வெளிநாடுகளுக்குச் சென்று நாட்டுக்கு விரோதமான செயற்பாடுகளில் ஈடுபடுகின்றார்கள். வெளி நாட்டுச் சக்திகள் மற்றும் மேற்கத்திய நாடுகள் அத்தகைய நடவடிக்கை எடுக்குமென்று சொல்வதும் அதனை இறுதிவரையிலே நம்புவதும் தமிழினத்தையே இழிவுபடுத்தக் கூடிய, எவ்வளவு வெட்கக்கேடான ஒரு செயல்! முன்னர் எந்தவொரு தமிழரும் அப்படிச் செய்யவில்லை.

அன்று சேர் பொன். இராமநாதன், சேர் பொன். அருணாசலம் போன்றவர்கள்மீது முஸ்லிம்கள் மத்தியிலே சில அபிப்பிராய பேதங்கள் இருந்தபோதும் அவர்கள் ஆங்கிலேய ஆட்சிக்கு விரோதமாக, இந்த நாட்டுக்காகப் போராடிய தனால்தான் இன்று மதிக்கப்படுகிறார்கள். அப்படியான அரும்பெரும் தலைவர்களின் வரிசையில்தான் டாக்டர் ஈ.பி. ஜாயா அவர்களும் இடம்பெறுகிறார் என்பதை நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இங்கே சில உறுப்பினர்கள் bail பற்றிக் கேட்கின்றார்கள். றிச்சட் டி சொய்சா அவர்களின் கொலைச் சந்தேக நபருக்கு bail கொடுக்கப்பட்டதா? அவர் எப்படி கொலைசெய்யப்பட்டார், என்ன குற்றத்தைச் செய்தார், என்பது இன்றுவரை வெளிச்சத்துக்கு வரவில்லை. நல்லூர் கோவில் முன்றலிலே, முன்னாள் அமைச்சராக இருந்த எனது நெருங்கிய நண்பர் மாண்புமிகு மகேஸ்வரன் அவர்களுடைய சகோதரன்மீது அசிட் வீசியது யார்? இன்றுவரையிலே அவரைக் கண்டுபிடித்திருக்கின்றார்களா? இந்தப் பிரேரணையைக் கொண்டு வருகின்றவர்களுக்கு ஏன், அதைப் பற்றிச் சொல்ல முடியாது? ஆனால், லம்போகினி பற்றி அடிக்கடி சொல்கின்றார்கள். இவர்கள் செய்கின்ற அநியாயங்களுக்காக ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியின் செயலாளர் நாயகம் ஹசன் அலி அவர்கள் நீதிமன்றம் செல்ல வேண்டும். ஏனெனில், இப்படியானவர்களுக்கு எதிராக வழக்குத் தொடர்கின்ற கடப்பாடு அவருக்கு உண்டு. இன்று இந்த நாட்டிலுள்ள பொறுப்புவாய்ந்த ஒரு முஸ்லிம் அரசியல் கட்சியின் செயலாளர் நாயகம் என்ற முறையிலே அவர் இதனைச் செய்ய வேண்டும்; எத்தனை guinea வேண்டுமானாலும் வாங்கிக்கொள்ளலாம். இப்பொழுது சபையில் அவருக்கு அருகாமையில் அமர்ந்திருக்கின்ற

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

කෞරව අස්ලම් අවර්කලුක්කුම් ඉන්තප් පොරුප්පු ඉරුක්කින්රතු. එනවේ, ඉවර්කළ් ඒනෙයෝරෛත් තූෂික්කුම්පෝතු අතු අවර්කළෙයේ තිරුම්පවුම් තාක්කුකින්රතු එන්පතෛ නාන් ඉංකු සුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්. ඉන්ත නාට්ටින් නීති මුරෛකළිලේ එංකළුක්කු නම්පික්කෛ ඉරුක්කින්රතු. ආකවේ, නීතිපතිකළුටෙය කෞරවත්තෛක් කාප්පතු ඉන්තක් කෞරව සපෙයින් කටමෛ ආකුම්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
පොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)
இறுதியாக, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எதிர்க்கட்சித் தலைவர் மாண்புமிகு ரணில் விக்கிரமசிங்க அவர்கள், சிறிகோத்தாவிலே 'ஷரீஆ' சட்டத்தைக் கொண்டுவருவதாகச் சொல்கின்றார். 'ஷரீஆ' சட்டமானது முஸ்லிம்களுக்குரியது. சிறிகோத்தாவிலுள்ள அனைவரையும் முஸ்லிம்களாகக் கருதியா, அவர் இந்த 'ஷரீஆ' சட்டத்தை அங்கு கொண்டுவர எண்ணுகிறார்? ஆகவே, இந்த 'ஷரீஆ' சட்டத்தை "நக்கலடிக்கக் கூடாது" என்று நான் மாண்புமிகு எதிர்க்கட்சித் தலைவரை எச்சரிக்க விரும்புகின்றேன். வாய்ப்பளித்தமைக்காக உங்களுக்கு நன்றி தெரிவித்து, என்னுடைய உரையை நிறைவுசெய்து கொள்ளுகின்றேன்.

ගරු රවූෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)
(මාණ්පුමිකු රවුප් හකීම් - නීතී අමෛච්චර්)
(The Hon. Rauff Hakeem - Minister of Justice)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන යෝජනාවේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ මැතකදී සම්මත කරන ලද "අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත" මඟින් ඇප ලබා දීමේදී පොලිසිය අනුගමනය කළ යුතු ප්‍රායෝගික මාර්ගෝපදේශයන් දක්වා නොමැති බව අපගේ අවධානයට යොමු කරවීමයි. මා මුලින්ම සඳහන් කරන්නේ එම විශේෂ විධිවිධාන පනත මඟින් මෙතෙක් ඇප ලබා ගැනීම සම්බන්ධයෙන් තිබූ කිසිම නීතිමය විධිවිධානයකට කවර හෝ ආකාරයක තහංචියක්, සීමාවක් හෝ කඩතුරාවක් පනවා නොමැති බවයි. ඇප ලබා ගැනීම සම්බන්ධයෙන් මූලික වශයෙන් ක්‍රියාත්මක වන්නේ 1997 අංක 30 දරන ඇප පනතයි. එසේම අපරාධ නඩු විධාන සංග්‍රහයේ 115 වැනි වගන්තියද මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් අදාළ වන බවට ගරු සභාවේ අවධානයට යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව පොලිසිය සම්බන්ධයෙන් අදාළ නොවන බව මා ඉතා පැහැදිලිව කියනවා. අධිකරණය විසින් ඇප දීමේදී අනුගමනය කළ යුතු මූලික මාර්ගෝපදේශන න්‍යායන් ඇප පනතේ 2 වන වගන්තියේ දක්වා තිබෙනවා. ඒ අනුව ඇප දීම රීතිය විය යුතු අතර ඇප ප්‍රතික්ෂේප කිරීම ව්‍යතිරේකය ලෙස දක්වා ඇති බවත්, එය පිළිගත් සංකල්පයක් බවත් -මූලධර්මයක් බවත්- අපි කවුරුත් දන්නවා. එසේම මහේස්ත්‍රාත්තුමාට වුවද අත්තනෝමතික ලෙස තම අභිමතය භාවිතා කොට සැකකරුවෙක් රක්ෂිත බන්ධනාගාරගත කිරීම කළ නොහැකි අතර ඔහුද ඇප පනතේ 14 වන වගන්තියේ දක්වා ඇති මාර්ගෝපදේශන න්‍යායයන් අනුගමනය කිරීමට බැඳී සිටින බවද ගරු මන්ත්‍රීතුමා හොඳින් දන්නා කාරණයක්. යම් හෙයකින් මහේස්ත්‍රාත්තුමා වෙනත් ආකාරයක උපනතීන් අනුගමනය කොට තීන්දුවක් දෙනු ලැබුවේ නම් එයට විරුද්ධව අභියාචනයක්, ප්‍රතිශෝධන ඉල්ලීමක් කිරීමේ හැකියාවක් සැකකරුට තිබෙන බවත් ගරු මන්ත්‍රීතුමා හොඳින් දන්නා කාරණයක්. නමුත් අද මේ සභාව කල් තබන අවස්ථාවේ ගෙන එන මේ විවාදය ගරු මන්ත්‍රීතුමන්ලා ව්‍යංගයෙන් -වක්‍රාකාරයෙන්- ප්‍රයෝජනයට ගන්නේ වෙනත් දේශපාලන අරමුණු වෙනුවෙන්ය කියන එක අපි දැක්කා. විශේෂයෙන් මැතකදී සිදු වුණු සමහර සිද්ධීන් සම්බන්ධයෙන් ප්‍රභූවරුන් පිළිබඳවත් මෙහිදී සඳහන් කළා.

විශේෂයෙන්ම එක දෙයක් පිළිබඳව මා කථා කරන්න ඕනෑ. ඇප පනතේ 6වන විධිවිධානයට අනුකූලව යම් සැකකරුවකු රෝහලේ සිටින විට ඇප ලබා දෙන්නේ නැහැයි කියන එක පිළිබඳව මෙහිදී සඳහන් කළා. මා අභියෝග කරනවා, එය සඳහන් වී තිබෙන්නේ කොකැනද කියා අපට පෙන්වන්න කියලා. ඇප පනතේ සඳහන් එම විධිවිධාන පිළිබඳව කියනවා නම්, එහි තිබෙන අභිමතය පොලීසිය මඟින් -

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු රවූෆ් හකීම් මහතා
(මාණ්පුමිකු රවුප් හකීම්)
(The Hon. Rauff Hakeem)
ඔබතුමා දැන් කථා කළා. මා කථා කළාට පස්සේ කථා කරන්න.

1997 අංක 30 දරන ඇප පනතේ 6. (1) යටතේ මෙසේ සඳහන් වනවා:

> "පොලිසිය මඟින් විමර්ශනය කරනු ලබන වරදක් ඇප දිය හැකි වරදක් වන අවස්ථාවක දී, පොලිස් ස්ථානය භාර නිලධරයා භාරයේ සිටින සැකකරු එම වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස එම ස්ථාන භාර නිලධරයාට නියම කරනු නොලැබිය යුතු නමුත් එම සැකකරු අත්අඩංගුවට ගෙන පැය විසිහතරක් ගතවීමට පෙර, එම නිලධරයා විසින් ලිඛිත පොරොන්දුවක් මත එම සැකකරු මුදා හැර, නියම කරනු ලබන දිනයක දී මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් වන ලෙස එම සැකකරුට නියම කරනු ලැබිය යුතු ය :"

එසේ වුවද, විමර්ශනයට පාත්‍රව ඇති, සිදු කරන ලදැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් විය හැකි මහජන ප්‍රතිචාරය මඟින් සාමය කඩවීමක් ඇති වීමට ඉඩ ඇති බව ස්ථාන භාර නිලධරයාගේ මතය වන අවස්ථාවක විතරක් ඒ අභිමතය වෙනත් ආකාරයකට කළ යුතුයි කියන එකයි එහි සඳහන් වෙලා තිබෙන්නේ. එබැවින් රෝහලක හෝ එවැනි වෙනත් ස්ථානයක සැකකරුවකු ප්‍රතිකාර ලබනවාය කියන තත්ත්වයන් උඩ එය ප්‍රතික්ෂේප කරනවාය කියන එක කිසි විටක මේ ඇප පනතේ සඳහන් නොවන බව අපි මතක තබා ගත යුතුයි.

There is a practice, a sort of a convention that has grown purely because when you look at an issue of hurt, whether it is a simple hurt or a grievous hurt, there maybe

a situation where the officer in charge may not be able to come to a conclusion. But if he finds that a particular issue is just an aberration and does not amount to a serious hurt, if there are no bones broken and if there is no necessity for a JMO's report or even if a JMO comes and sees, then he exercises his discretion. This is only a convention; I do concede that there can be abuse of this. And, because of the fear that some of the lower grade police officers have towards senior police officers, they may not be exercising their discretion. But, I must very clearly say our present attitude towards this. During the earlier debate, I gave you certain assurances and even this morning, in my discussion with the new Chief Justice, this matter was once again emphasized by him: the decision to appoint special Magistrates to go to prisons, sit there and have inquiries into granting of bail, because bail must be the rule, and not granting bail is an exception. It is a matter that has to be strictly followed. This is an issue regarding which the new Chief Justice's sentiments are very much with the policy of the Government where we would like to take immediate steps to see that no one should unnecessarily be kept in remand for an offence where bail could be easily granted. Therefore, to go and inspect and inquire into these matters, special courts to be sitting in the prisons itself is a decision that has been taken by His Lordship the Chief Justice and that will be implemented very soon.

Together with that, I must very clearly say that though there was an attempt made to portray some of the recent events as if the Government or politicians are interfering with the administration of justice, it is not so. Clearly, whatever incident has happened, the police on examination of the assaulted person, has come to the conclusion that it is a simple hurt. Under Section 314 of the Penal Code, if the offence is to be reported to the courts, definitely the police officer has the discretion to enlarge the suspects on bail and that has what has happened. I do not see why the Opposition is making such a hue and cry simply because the incident involved a VIP's son. But, then, definitely when you look at these issues, what the police has done is what normally the police should do. They need not unnecessarily keep in remand a suspect who is involved in an issue of hurt. Therefore, whatever is provided for under the Criminal Procedure Code, as what has happened, is what the police has done.

Therefore, let us not use these incidents to score brownie points for political purposes but look at the administration of justice in a dispassionate manner. I would invite the Opposition to co-operate with the Government to bring in more reforms, introduce these reforms and see that the unnecessary sufferings that the public is put into, by reason of our police officers and other people involved with the administration of justice, not being sensitive to the available provisions relating to discretionary power of both the police officers and the judicial officers, and to exercise them in keeping with the accepted norms.

Thank you very much, Mr. Presiding Member.

එකල්හි වේලාව අ.භා. 7.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2013 මාර්තු මස 06වන බදාදා අ.භා.1.00වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது, பி.ப 7.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2013 மார்ச் 06, புதன்கிழமை பி.ப 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது

It being 7.30 p.m., MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

Adjourned accordingly until 1.00 p.m. on Wednesday, 06th March, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102, Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year.
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 216 - இல. 2
Volume 216 - No. 2

2013 මාර්තු 06 වන බදාදා
2013 மார்ச் 06, புதன்கிழமை
Wednesday, 06th March, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) - [ගරු වික්ටර් ඇන්තනී මහතා] - පළමුවන වර කියවන ලදී

ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) - [ගරු බුද්ධික පතිරණ මහතා] - පළමුවන වර කියවන ලදී

ක්‍රීඩා පනත :

නියෝග

කල් තැබීමේ යෝජනාව:

උතුරේ තත්ත්වය පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව නොමහ යැවීම

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி உறுப்பினர் சட்டமூலங்கள்:

இலங்கை ஐக்கிய கிறிஸ்தவ நட்புரிமை (கூட்டிணைத்தல்) - [மாண்புமிகு விக்டர் அந்தனீ] - முதன்முறை மதிப்பிடப்பட்டது

ஸ்ரீ பாலாபிவூர்தி வர்தன சமிதிய (கூட்டிணைத்தல்) - [மாண்புமிகு புத்திக பதிரண] - முதன்முறை மதிப்பிடப்பட்டது

விளையாட்டுக்கள் சட்டம்:

ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:

வடக்கின் நிலைமை பற்றி சர்வதேச சமூகத்தைத் தவறாக வழிநடத்தல்

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

PRIVATE MEMBERS' BILLS:

United Christian Fellowship of Sri Lanka (Incorporation) Bill – [Hon. Victor Anthony] - Read the First Time

Sri Balabhivurdhi Wardana Samithiya (Incorporation) Bill – [Hon. Buddhika Pathirana] - Read the First Time

SPORTS LAW:

Regulations

ADJOURNMENT MOTION:

Misleading International Community of Situation in North

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මාර්තු 06 වන බදාදා
2013 மார்ச் 06, புதன்கிழமை
Wednesday, 06th March, 2013

අ.භ. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.

කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.

சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කටුපොත බස් නැවතුම්පළ : භාවිතයට නොගැනීම
கட்டுபொத்த பேருந்து தரிப்பு நிலையம்: கைவிடப்பட்டமை
KATUPOTHA BUS STAND: ABANDONMENT

1945/'11

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ, කටුපොත නගරයේ ඉදිකර ඇති බස් නැවතුම්පළ මීට වර්ෂ දාහතරකට පමණ පෙර විවෘත කළ බවත්;

(ii) විවෘත කළ දින සිට භාවිතයට නොගැනීම නිසා වෙළඳ කුටි 12 ක් ඇතුළු එම ගොඩනැගිලි විනාශ වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බස් නැවතුම්පළ හා වෙළඳ කුටි ප්‍රයෝජනයට නොගෙන අත හැර දැමීමට හේතු කවරේද;

(ii) එම ගොඩනැගිලි නැවත ප්‍රතිසංස්කරණය කර ජනතා අයිතියට පවරා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாணசபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருணாகல் மாவட்டத்தில் குளியாப்பிட்டிய பிரதேச சபை ஆளுகைப் பிரதேசத்தில் கட்டுபொத்த நகரில் நிர்மாணிக்கப்பட்டுள்ள பேருந்து தரிப்பு நிலையம் இற்றைக்கு சுமார் பதினான்கு ஆண்டுகளுக்கு முன்னர் திறந்துவைக்கப்பட்டதென்பதையும்;

(ii) திறந்து வைக்கப்பட்ட நாளிலிருந்து பயன்படுத்தப்படாமையின் காரணத்தினால் 12 விற்பனைக் கூடங்கள் அடங்கிய குறித்த கட்டிடம் அழிவடைந்து வருகிறது என்பதையும் அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பேருந்து தரிப்பு நிலையத்தையும் விற்பனைக் கூடங்களையும் பயன்படுத்தாது கைவிட்டுள்ளமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி கட்டிடத்தை மீண்டும் புனரமைத்து மக்கள் உரிமைக்கு ஒப்படைப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;
அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that -

(i) the Bus Stand which was constructed in Katupotha town in Kuliyapitiya Pradeshiya Sabha area of Kurunegala District was opened about 14 years ago; and

(ii) the aforesaid buildings including 12 stalls are decaying as they have not been used since the opening?

(b) Will he state -

(i) the reasons for abandoning the aforesaid Bus Stand and the stalls without making of any use; and

(ii) whether action will be taken to reconstruct the aforesaid buildings and to hand them over to public ownership?

(c) If not, why?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) නැත.

[ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා]

(ආ) (i) බස් නැවතුම්පළ හා වෙළෙඳ කුටි ප්‍රයෝජනයට නොගෙන අත හැර දැමීමක් සිදු වී නොමැත.

(ii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය යොමු කරලා දැන් ටික කාලයක් වෙනවා. මේ වන විට එම ස්ථානය ප්‍රතිසංස්කරණය කර තිබෙනවා. කෙසේ වෙතත්, දැන් එහෙම තත්ත්වයක් නැති බවට පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වන අතර, එය ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳවත් අපේ සතුට පළ කරනවා.

ශ්‍රී ලංකාවේ මැතිවරණ : විස්තර
இலங்கையில் நடைபெற்ற தேர்தல்கள்: விபரம்
ELECTIONS IN SRI LANKA: DETAILS

2190/'11

2. ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) පසු ගිය වර්ෂ 10ක කාලය තුළ ශ්‍රී ලංකාව තුළ පවත්වන ලද මැතිවරණ සංඛ්‍යාව කොපමණද;

(ii) සියලු පළාත් සභා මැතිවරණ එක් දිනයකදී පවත්වනු ලැබුවේද;

(iii) නොඑසේ නම්, එම මැතිවරණ එක වර නොපැවැත්වීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 ජනවාරි 01 වැනිදා සිට මේ දක්වා කාලය තුළ පවත්වන ලද එක් එක් මැතිවරණය සඳහා දරන ලද සමස්ත පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඊළඟ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නියමිත දිනය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය තුළ විද්‍යුත් ඡන්ද ක්‍රමය භාවිත නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පිළිතුරු දෙන්නේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පසු ගිය වර්ෂ 10ක කාලය තුළ ජනාධිපතිවරණ 02ක් ද, පාර්ලිමේන්තු මැතිවරණ 03ක් ද, පළාත් සභා ඡන්ද විමසීම් 03ක් ද (2012.09.08 දින පැවති පළාත් සභා ඡන්ද විමසීමද ඇතුළුව) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් 03ක් ද දින 24කදී පවත්වා ඇත.

(ii) නැත. 1993.05.17 දින එවකට ඒකාබද්ධව පැවැති උතුර හා නැඟෙනහිර පළාත් සභාව හැර ඉතිරි පළාත් සභා සියල්ලෙහිම ඡන්ද විමසීම් පවත්වා ඇත.

(iii) එම පළාත් සභා ඡන්ද විමසීම් එක වර නොපැවැත්වීමට හේතු:

(ආ) (i) 2005 ජනවාරි 1 වැනිදා සිට මේ දක්වා නොගෙවී ඇති මුදල් ප්‍රමාණය;

(ii) ඊළඟ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නියමිත දිනය;

(iii) ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය තුළ විද්‍යුත් ඡන්ද ක්‍රමය භාවිත නොකිරීමට හේතු

කවරේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) the number of elections held in Sri Lanka for the last 10 years;

(ii) whether elections for all Provincial Councils have been held on one day; and

(iii) if not, as to why they were not held together?

(b) Will he also state -

(i) the total cost per election held since 1st January 200 to date separately;

(ii) as to when the next Provincial Council election is due; and

(iii) as to why the electronic voting system is not being implemented within the election system of Sri Lanka?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

එකම දිනයක ඡන්ද විමසීම පැවැති පළාත් සභා වුවද පළමුවෙනි පළාත් සභා රැස්වීම නිශ්චිතව එකම දිනයකදී නොපැවැත්වීම නිසා විවිධ දිනයන්හි ධුර කාලය අවසන් වීම.

පළාත් සභාවල ධුර කාලය අවසන් වීමට ප්‍රථම විවිධ අවස්ථාවල පළාත් සභා විසුරුවා හැරීම.

(ආ) (i) 2005 ජනවාරි 01වැනි දින සිට 2011 වර්ෂයේ අවසානය දක්වා වූ කාලය තුළ පවත්වන ලද මැතිවරණවල සමස්ත පිරිවැය පහත දක්වා ඇත.

ඡන්ද විමසීමේ දිනය	ඡන්ද විමසීමේ නම	සමස්ත පිරිවැය (රුපියල්)
2005.11.17	ජනාධිපතිවරණය	715,937,310.65
2006.03.30	පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (ආයතන 286)	992,625,194.98
2006.05.20	පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (ආයතන 22)	
2008.03.10	පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (මඩකලපු දිස්ත්‍රික්කයේ ආයතන 09)	
2008.05.10	නැඟෙනහිර පළාතේ පළාත් සභා ඡන්ද විමසීම	147,319,093.89
2008.08.23	උතුරු මැද සහ සබරගමුව පළාත්වල පළාත් සභා ඡන්ද විමසීම	285,602,383.80
2009.02.14	මධ්‍යම සහ වයඹ පළාත්වල පළාත් සභා ඡන්ද විමසීම	394,448,757.21
2009.04.25	බස්නාහිර පළාතේ පළාත් සභා ඡන්ද විමසීම	404,537,399.46
2009.08.08	ඌව පළාතේ පළාත් සභා ඡන්ද විමසීම	131,524,639.96
2009.08.08	යාපනය මහ නගර සභාවේ හා වවුනියාව නගර සභාවේ ඡන්ද විමසීම	16,227,083.97
2009.10.10	දකුණු පළාතේ පළාත් සභා ඡන්ද විමසීම	219,092,032.43
2010.01.26	ජනාධිපතිවරණය	1,856,830,997.25
2010.04.08	පාර්ලිමේන්තු මැතිවරණය	1,953,845,873.09
2011.03.17	පළාත් පාලන ආයතන 234ක ඡන්ද විමසීම	2,126,812,337.97
2011.07.23	පළාත් පාලන ආයතන 65ක ඡන්ද විමසීම	
2011.10.08	පළාත් පාලන ආයතන 23ක ඡන්ද විමසීම	
2012.09.08	උතුරු මැද, නැඟෙනහිර හා සබරගමුව පළාත්වල පළාත් සභා ඡන්ද විමසීම	672,750,000.00

එක් එක් මැතිවරණ සඳහා වෙන වෙනම පිරිවැය සඳහන් කරලා තිබෙනවා. සමස්තයක් වශයෙන් total එකක් නැහැ.

(ii) කිසියම් පළාත් සභාවක ඡන්ද විමසීමෙන් පසු පැවැත්වෙන පළමු රැස්වීම් දිනයේ සිට වසර පහකින් ධුර කාලය අවසන් වේ. ධුර කාලය අවසන් වූ දින සිට සතියක් ඇතුළත ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා නාම යෝජනා දැන්වීම් පළ කිරීමට නියමිතය. ධුර කාලය අවසන් වීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීතිමය ප්‍රතිපාදන මත පළාත් සභා විසුරුවා හැරීමක් සිදු වුවහොත්, එසේ පළාත් සභාව විසුරුවා හළ දින සිට සතියක් ඇතුළත ඡන්ද විමසීමක් සඳහා නාම යෝජනා දැන්වීම පළ කළ යුතු වේ.

(iii) මැතිවරණ නීති සංශෝධනය අරමුණු කර ගෙන අවසන් වරට පැවැති පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විද්‍යුත් ඡන්ද ක්‍රමය ශ්‍රී ලංකාවේ භාවිත කිරීම ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන ඇත. එහෙත් මෙතෙක් ඒ සඳහා ඡන්ද විමසීම් නීති සංශෝධනය වී නොමැත.

(ඇ) අදාළ නොවේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම ඔබතුමාගේ අන්තිම උත්තරය පදනම් කර ගෙන හරස් ප්‍රශ්න අසන්නට පටන් ගන්නම්. මම හිතන හැටියට ඔබතුමා මැතිවරණ ක්‍රමය සැකසීම අනගි සේවයක් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සියයට 20ක 30ක ප්‍රතිඵලයක් තමයි තිබෙන්නේ. විපක්ෂ නායකතුමාත්, අපත් ඡන්ද කොමසාරිස්වරයා හමු වෙන්න ගිය අවස්ථාවේදී එතුමාත් මේ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළා. සියලුම නිර්දේශ දීලා තිබෙනවා නම්, මේ පාර්ලිමේන්තුව පැය 24න් වැඩ කරන්න පුළුවන් හැකියාව ඔප්පු කරලා තිබෙනවා නම් ඇයි ඔබතුමාට මේ විද්‍යුත් ඡන්ද ක්‍රමය හඳුන්වලා දෙන්න බැරි වන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

විද්‍යුත් ඡන්ද ක්‍රමය හඳුන්වා දීමට අවශ්‍ය යන්ත්‍ර පවා මොරටුව විශ්වවිද්‍යාලය පරීක්ෂාවට ලක් කර තිබෙනවා. ඔබතුමා ඒ බව දන්නවා. ගරු කථානායකතුමනි, දැන් පළාත් පාලන මැතිවරණ ඡන්ද ක්‍රමය වෙනස් වෙලා තිබෙනවා. අපි උත්සාහයේ යෙදිලා තිබෙනවා විද්‍යුත් ඡන්ද ක්‍රමය ලංකාවේත් ඇති කිරීමේ ඉලක්කය ඉෂ්ට කරන්න. ඒ ඡන්ද ක්‍රමය වඩා හොඳ නම් ආණ්ඩුවත් විරුද්ධ පක්ෂයත් එකතු වෙලා නිර්දේශ කළ පරිදි එය ඇති කිරීමට කටයුතු කරමු.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තුවෙත් තිබෙනවා, නමුත් පාවිච්චි කරන්නේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවෙත් අවුරුදු ගණනාවක් පාවිච්චි නොකළ විද්‍යුත් ඡන්ද ක්‍රමයක් තිබෙනවා. [බාධා කිරීමක්] එම නිසා අපට තවත් ප්‍රවේසම් වෙන්නට වෙලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමාගේ අතුරු ප්‍රශ්නයට උත්තරයක් දෙනවා ද?

[ගරු රවි කරුණානායක මහතා]

ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. අද ජනතාව අතර ඡන්ද ක්‍රමයත්, ඡන්දයත් ගැන විශ්වාසය සම්පූර්ණයෙන්ම බිඳී තිබෙනවා. ඒ වාගේම මෙය ඔබතුමාත් දන්නා කරුණක්. දැන් ඒක රහස්‍ය දෙයක් නොවෙයි. පසු ගිය ජනාධිපතිවරණයේ හංස පැටව් ගම්පහෙන් එනවා. නුවරඑළියේ ඒවා රත්නපුරයෙන් එනවා. මේ කාරණය ලොකු ප්‍රශ්නයකට තුඩු දී තිබෙනවා. එම නිසා විද්‍යුත් ඡන්ද ක්‍රමය හඳුන්වා දෙන එක අති විශේෂයි. ඒ වාගේම ඒ සඳහා යන වියදමත් අඩුයි. [බාධා කිරීමක්] ඔන්න ඉතින් ඉදිරියට යන්න හදන කොට පස්සට අදින්න හදනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් මේ සම්බන්ධයෙන් ඉතාමත් විශිෂ්ට ප්‍රකාශත් කර තිබෙනවා. ඇයි මේ සම්බන්ධයෙන් අපට එකට කටයුතු කරන්නට අවස්ථාව ඇවිල්ලා නැත්තේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, අප මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කර තිබෙනවා. මැතිවරණ කොමසාරිස්තුමාත් අධ්‍යයනය කර තිබෙනවා. ඒ ගැන නීති කෙටුම්පත් -[බාධා කිරීමක්] ඒකට නීති කෙටුම්පත් සම්පාදනය කිරීම දීර්ඝව කෙරන්නට ඕනෑ දෙයක්. ඒක හමාර වුණාට පස්සේ එය ඉදිරිපත් කිරීමේ කටයුතු ආරම්භ කරන්නට පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, පළාත් සභා ඡන්දයකට මිලියන තුන් හාර සියයක් විතර වියදම් කරනවා. මා හිතන විධියට පසු ගිය අවුරුදු ගණනාවට පළාත් සභා ඡන්දවලට කෝටි නවදාහක් පමණ වියදම් කර තිබෙනවා. මේ වාගේ අවස්ථාවක අප සියලු දෙනාම එකතු වෙලා කටයුතු කරන්නට ඕනෑ. ඡන්ද කොමසාරිස්තුමාටත් ප්‍රශ්නයක් තිබෙනවා.

අපේ විපක්ෂ නායකතුමා ඇහුවා, පළාත් සභාවේ සිටින මන්ත්‍රීවරුන් crossover කරන අවස්ථාවේ ඇති වන ඒ interim period change එක ගැන. අපේ එක්සත් ජාතික පක්ෂයෙන් මන්ත්‍රීවරු දහ දෙනෙකුත් ඔබතුමන්ලාගෙන් දොළොස් දෙනෙකුත් ඉන්නවා. ඇයි, ඒ සම්බන්ධයෙන් පුළුවන් තරම් ඉක්මනින් උත්තරයක් ලබා ගන්න බැරි?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)

ඔව්. අපි ඒ ගැන විරුද්ධ පක්ෂයටත් දැනුම් දීලා තිබෙනවා. ඉතා ඉක්මනින් ඒ කටයුත්ත කරන්න අදාළ වෙන නීති ගෙනෙන්න ඕනෑ නම් අපි නීති ගෙනෙනවා. මැතිවරණ කොමසාරිස්තුමාටත් එසේ පත් කරන්න පුළුවන් බවටත් අර්ථ නිරූපණයක් දීලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
කවුද දීලා තිබෙන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
අදාළ නීති අංශවලින් දීලා තිබෙනවා.

ජන සෙවණ නිවාස ණය යෝජනා ක්‍රමය : විස්තර
ஜனசெவன வீடமைப்புக் கடன் திட்டம்: விபரம்
JANA SEVANA HOUSING LOAN SCHEME : DETAILS

2216/'12

3. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජන සෙවණ වැඩසටහන යටතේ, පළමු වර්ෂ පහේදී පොලිය පමණක් ගෙවීමේ පහසුකම සහිත නිවාස ණය යෝජනා ක්‍රමයක් ඇතිකිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි එම නිවාස ණය යෝජනා ක්‍රමය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට එකී නිවාස ණය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නිවාස ණය ලබාදීමේදී ප්‍රතිලාභීන් තෝරා ගත් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள்,வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) "மகிந்த சிந்தனை- இலங்கையை வெற்றிபெறச் செய்வோம்" கொள்கைகளில் ஜனசெவன நிகழ்ச்சித்திட்டத்தின்கீழ், முதல் ஐந்து ஆண்டுகளில் வட்டியை மட்டும் செலுத்துவதற்கான வசதியைக்கொண்ட வீடமைப்புக் கடன் திட்டமொன்றை உருவாக்குவதாக வாக்குறுதியளிக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வாக்குறுதியின் பிரகாரம் உரிய வீடமைப்புக் கடன் திட்டம் ஆரம்பிக்கப்பட்ட வருடம் யாதென்பதையும்;

(ii) இதுவரை மேற்படி வீடமைப்புக் கடன் வழங்கப்பட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iii) வீடமைப்புக் கடன் வழங்கப்படும்போது பயனாளிகள் தெரிவுசெய்யப்பட்ட அடிப்படை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Is he aware that a pledge was made under the Jana Sevana Programme of "Mahinda Chintana - Dinawamu Sri Lanka" manifesto that a housing loan scheme with the facility of paying only the interest within the first five years would be set up ?

(b) Will he inform this House -

(i) the year in which the above-mentioned loan scheme was initiated as per the aforesaid pledge;

(ii) the number of families to which the above-mentioned loans have been granted so far; and

(iii) the basis on which the beneficiaries of housing loans were selected ?

(c) If not, why ?

ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) පළමු වසර පහේදී පොලිය පමණක් ගෙවීමේ පහසුකම් සහිත ණය යෝජනා ක්‍රමයක් වෙනුවට ඉතා අඩු පොලියට සහ තවත් වරප්‍රසාද ගණනාවක් ඇතුළත් කරමින් නිවාස ණය ලබා දීමේ යෝජනා ක්‍රමයක් 2005 සිට මේ දක්වා ක්‍රියාත්මක වේ. ඇමුණුම **සහාගත*** කරමි.

(ii) පවුල් 94,834යි.

(iii) නිවාස ණය සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී නිවාස අවශ්‍යතාවය ඇති, ඒ සඳහා පෙර සුදානම් හා ආපසු ගෙවීමේ හැකියාව ඇති අයදුම්කරුවන් තෝරා ගැනීම පදනම වේ.

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් අඩු පොළිය යටතේ ලබා දී ඇති නිවාස ණය පිළිබඳ තොරතුරු
(ණය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව , මුදල සහ තෝරාගත් පදනම)

වර්ෂය	ණය ලබාදී ඇති පවුල් සංඛ්‍යාව	මුදල	ප්‍රතිලාභීන් තෝරාගත් පදනම
2005	13,498	365.176	නිවාස අවශ්‍යතාවය ඇති පෙර සුදානම් හා ආපසු ගෙවීමේ හැකියාව ඇති අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනේ.
2006	9,494	324.061	නිවාස අවශ්‍යතාවය ඇති පෙර සුදානම් හා ආපසු ගෙවීමේ හැකියාව ඇති අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනේ
2007	6,777	303.092	නිවාස අවශ්‍යතාවය ඇති පෙර සුදානම් හා ආපසු ගෙවීමේ හැකියාව ඇති අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනේ
2008	10,587	611.870	නිවාස අවශ්‍යතාවය ඇති පෙර සුදානම් හා ආපසු ගෙවීමේ හැකියාව ඇති අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනේ
2009	5,110	307.270	නිවාස අවශ්‍යතාවය ඇති පෙර සුදානම් හා ආපසු ගෙවීමේ හැකියාව ඇති අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනේ
2010	5,145	298.480	නිවාස අවශ්‍යතාවය ඇති පෙර සුදානම් හා ආපසු ගෙවීමේ හැකියාව ඇති අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනේ
2011	18,340	2,684.990	නිවාස අවශ්‍යතාවය ඇති පෙර සුදානම් හා ආපසු ගෙවීමේ හැකියාව ඇති අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනේ
2012	25,883	4,506.180	නිවාස අවශ්‍යතාවය ඇති පෙර සුදානම් හා ආපසු ගෙවීමේ හැකියාව ඇති අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනේ
එකතුව	94,834	9,401.119	

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි ගරු කථානායකතුමනි. පොලිය පමණක් ගෙවීමේ පහසුකම් සහිත නිවාස ණය පොරොන්දුව ලබා දුන්නේ 2005 දීයි. 2005 දී ලබා දුන්නු මේ පොරොන්දුවට අද වන කොට වසර අටක් ගත වෙලාත්, මෙතුමා ලබා දුන්නු සංඛ්‍යා ලේඛනවලට අනුව මේ ණය ක්‍රමය ව්‍යාප්ත කරලා තිබෙන්නේ 94,000කට පමණයි. නමුත් සංඛ්‍යා ලේඛනවලට අනුව අපේ රටේ තමන්ගේම යැයි නිවසක් නොමැති පවුල් ලක්ෂ 15ක් ඉන්නවා. ඔබතුමන්ලා වසරකට ඔය 10,000ක පමණ ප්‍රමාණයකට මේ නිවාස ණය වැඩසටහන ව්‍යාප්ත කරලා මේ රටේ නිවාස නොමැති පවුල් ලක්ෂ 15ක නිවාස ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්නේ කොහොමද කියලා මම අහන්න කැමැතියි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, මැතකදී කරන ලද ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සමීක්ෂණයකට අනුව ගරු මන්ත්‍රීතුමා කිව්ව සංඛ්‍යාව වැරදියි. එතරම් නිවාස අවශ්‍යතාවක් අද අපේ රටේ නැහැ. විශේෂයෙන්ම එම ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සමීක්ෂණයට අනුව ඊට වඩා ඉතාමත් අඩු නිවාස සංඛ්‍යාවක් තමයි අපේ රටට අවශ්‍යතාව තිබෙන්නේ. මේ වන විට ලක්ෂයකට ආසන්න ප්‍රමාණයකට ණය නිකුත් කර තිබීම අපි සතුටු විය යුතු කරුණක් විධියටයි මම පෞද්ගලිකව දකින්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි ගරු කථානායකතුමනි. අද වන විට මීට පෙර ලබා දුන්නු නිවාස ණය නැවත වරක් අය කර ගැනීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වනවා. දැන් මෙතැනදී ලොකු වරදක් තිබෙනවා. මීට පෙර ක්‍රියාත්මක වුණු, රජයන් තුළින් කපා හැරිය ණයත් අද බලහත්කාරයෙන් අය කරමින් යනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා වැඩසටහන යටතේ ගරු ජනාධිපතිතුමා සියලුම නිවාස ණය කපා හරින්න යෝජනා කර තිබෙන මොහොතක, නිවාස ණය කපා හරිනවා පමණක් නොවෙයි, සින්නක්කර අයිතියත් ලබා දෙනවාය කියන පොරොන්දුව තිබෙන මොහොතක, ජනාධිපතිතුමාගේ ඒ ප්‍රතිපත්තියටත් පටහැනිව ඒ නිවාස ණය නැවත වරක් බලහත්කාරයෙන් අය කර ගෙන යන සාතකයා කවුද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, ණයක් කියනකොටම අනෙක් පැත්තෙන් කියැවෙනවා එය ආපසු ගෙවන්න ඕනෑය කියන එක. අපේ රටේ ඉතිහාසයේ මොනම කාලයකවත් ණය කපා හැරලාත් නැහැ, ණයක් දුන්නාට පස්සේ ඒකට නිදහසක් ලබා දීලාත් නැහැ. ඒ ලබා දුන් ණය වෙනුවෙන් ලැබෙන මුදල් නැවත වතාවක් ණය ලබා දීමේ ක්‍රියාවලියක් තමයි චක්‍රීය ක්‍රමයකට සිද්ධ වෙන්නේ. එම නිසා මෙතුමා කියපු කරුණ වැරදියි ගරු කථානායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි ගරු කථානායකතුමනි.

මේ කාරණය කියන්න ඔබතුමා මට පොඩි අවස්ථාවක් ලබා දෙන්න. මහින්ද චින්තන, දිනවමු ශ්‍රී ලංකා පොතේ, 22 වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

"දියවර, දියවර විසිරි, ජන උදාන, ගම් උදාන ආදී විවිධ නම්වලින් ඉදිකර ඇති නිවාස යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති නිවාස ණය හා පොළියද කපා හැර එම නිවෙස්වල සින්නක්කර අයිතිය ලබාදෙමි."

එලෙස කියන්නේ මා නොවෙයි. මහින්ද චින්තන ප්‍රතිපත්ති මාලාවේ 22 වන පිටුවේ දිනවමු ශ්‍රී ලංකා වැඩසටහන යටතේ තමයි එහෙම කියන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා නැවතත් ඔබතුමාට සිහි කැඳවීමක් කරන්න කැමැතියි. මොකද, ඡන්දය කාලයේ කියපු දේවල් දැන් අමතක වෙලා ඇති. කරුණාකරලා මට කියන්න, ජනාධිපතිතුමාගේ ඒ ප්‍රතිඥාව කවදාද තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරන්නේ? කවදාද කපා හැරිය ඒ නිවාස ණය නැවත අය කිරීමේ නින්දිත ක්‍රියාවලිය නතර කරන්නේ?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු කථානායකතුමනි, මම පිළිතුරක් ලබා දුන්නා. අපේ රටේ මැතිවරණ ඉතිහාසයේදී ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනවලින්, මැතිවරණයෙන් පස්සේත් කථා කරන ප්‍රතිපත්ති ප්‍රකාශනයක් තිබුණා නම් ඒ "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයයි. ඒ අනුව එහි සඳහන් සමහර කරුණු පොරොන්දු වුණ කාලයටත් කලින් ඉටු කරලා තිබෙනවා. ඒ වාගේම මීට ලබා දීපු වරප්‍රසාදවලට වඩා වැඩියෙන් ලබා දීපු ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරලා තිබෙනවා. එම නිසා මා හිතන හැටියට මේ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය අදාළ එකක් නොවෙයි.

හලාවත ධීවර ප්‍රජා උද්ඝෝෂණය : වෙඩි තැබීමේ සිද්ධිය

சிலாபம் பிரதேச மீனவர் ஆர்ப்பாட்டம் : சூட்டுச் சம்பவம்

FISHERFOLK DEMONSTRATION AT CHILAW : SHOOTING INCIDENT

2420/'12

4. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව 2012.02.15 වැනි දින හෝ ඊට ආසන්න දිනක හලාවත ප්‍රදේශයේ උද්ඝෝෂණයේ යෙදුණු ධීවරයෙකුට වෙඩි තබා ඝාතනය කර තිබේද;

(ii) එසේ නම්, ඝාතනයට ලක් වූ අයගේ නම කවරේද;

(iii) ඔහුගේ මරණයට අදාළ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරන්නේද;

(iv) එම ඝාතනය සිදු කිරීමට අණ දුන් තැනැත්තා කවුරුන්ද;

(v) එම ඝාතනය සම්බන්ධයෙන් රජය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) எரிபொருள் விலை அதிகரிக்கப்பட்டதற்கு எதிராக 2012.02.15ஆம் திகதி அல்லது அதற்கு அண்மித்ததொரு தினத்தில் சிலாபம் பிரதேசத்தில் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருந்த மீனவர் ஒருவர்மீது துப்பாக்கிப்பிரயோகம் மேற் கொள்ளப்பட்டு கொலைசெய்யப்பட்டுள்ளாரா என்பதையும்;

(ii) ஆமெனில், கொலை செய்யப்பட்டவரின் பெயர் யாது என்பதையும்;

(iii) இவரின் மரணம் சம்பந்தமான மருத்துவ அறிக்கையை சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) மேற்படி கொலையைச் செய்வதற்கு உத்தரவிட்ட நபர் யார் என்பதையும்;

(v) மேற்படி கொலை தொடர்பாக அரசாங்கம் மேற் கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்ப தையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) whether a fisherman who took part in a demonstration to protest against the increase of fuel prices has been shot dead at Chilaw area on or around 15.02.2012;

(ii) if so, the name of the person who was killed;

(iii) whether the medical reports pertaining to his death will be submitted;

(iv) the person who gave orders to kill the aforesaid person; and

(v) the steps that have been taken by the Government with regard to the aforesaid killing ?

(b) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය ගැන පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මේ ප්‍රශ්නයට අදාළ කාරණය සම්බන්ධයෙන් හලාවත අධිකරණයේ අංක 121/12 යටතේ නඩුවක් විභාග වෙමින් පවතිනවා. මිනී මැරුමකට සම්බන්ධ කරුණක් නිසා මේ ගැන පිළිතුරු දීම සුදුසු නැහැයි කියන එකයි ඔබතුමාට කියන්න තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම මේ අහන ප්‍රශ්නය නඩුවකට සම්බන්ධ කාරණයක් නොවෙයි. මේ ප්‍රශ්නයෙන් මම අහලා තිබෙන්නේ,"ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව 2012.02.15වැනි දින හෝ ඊට ආසන්න දිනක හලාවත ප්‍රදේශයේ උද්ඝෝෂණයේ

යෙදුණු ධීවරයෙකුට වෙඩි තබා ඝාතනය කර තිබේද" කියලායි. ඔව්ද, නැද්ද කියලායි මම අහන්නේ.

ඝාතනය කර තිබේ නම් ඝාතනයට ලක් වූ අයගේ නම කවරේද කියා මා අහලා තිබෙනවා. එයට පිළිතුර දෙන්න පුළුවන්. ඔහුගේ ඝාතනය සිදු වී ඇත්තේ කෙසේද කියා මා අහලා තිබෙනවා. එයට පිළිතුර වශයෙන් "වෙඩි තැබීමකින්" කියා කියන්න පුළුවන්. එහෙම කියන්න පුළුවන් නේ. එයට අදාළ වෛද්‍ය වාර්තා මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේද කියා මා අහලා තිබෙනවා. වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන්න බැරිකමක් නැහැ නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එය උසාවියේ කාර්යයක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කරන්න පුළුවන්ද, බැරිද කියලා මා අහනවා. ඉදිරිපත් කරන්න බැරි නම් බැහැ කියන්න, පුළුවන් නම් ඉදිරිපත් කරන්න. එපමණයි. ගරු කථානායකතුමනි, මෙයට අදාළ නඩුවක් උසාවියේ පවතිනවාය කියා ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැහැ. භූමි තෙල් ටිකක් ඉල්ලා ධීවරයන් උද්ඝෝෂණය කරන කොට මේ රටේ ආණ්ඩුවෙන් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කළාම, ඒ සම්බන්ධයෙන් අපට පාර්ලිමේන්තුවේ කථා කරන්න බැරි නම් අපි ඒ ගැන කථා කරන්නේ කොහේ ගිහින්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා තීරණයක් දෙනවා නම් ඔබතුමාගේ අවසරය පරිදි ප්‍රශ්නයේ (අ) (i) සහ (ii)ට උත්තර දිය හැකියි.

(අ) (i) මෙම උද්ඝෝෂණයේදී කලහකාරී අන්දමින් හැසිරුණු උද්ඝෝෂකයන් මැඩ පවත්වා පළවා හැරීම සඳහා -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
උත්තරය තිබෙනවා නේ. ඔබතුමා ළඟ උත්තරය තබා ගෙන උත්තර දෙන්නේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට උත්තරයක් එවපු පළියට එය කියවන්න බැහැ. මා වග කීමෙන් උත්තරය දෙන්න ඕනෑ. විරුද්ධ පක්ෂයේ ඔබතුමන්ලා හැම දෙයක්ම අහයි. නමුත් මේ සභාවේ ආරක්ෂා කර තිබෙන යම් කිසි ප්‍රතිපත්තියක් තිබෙනවා. කොයි පැත්තේ සිටියත් ඒ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමට අපි බැඳී සිටිනවා. *Sub judice* නීතිය යටතේ නඩුවකට අදාළ වන දෙයක් කියන්න බැහැ. ඔබතුමා ඉල්ලන නිසා ප්‍රශ්නයේ (අ) (i) සහ (ii) සම්බන්ධයෙන් මා උත්තරය දෙන්නම්. ඉතිරි කොටස්වලට මට උත්තර දෙන්න බැහැ.

(අ) (i) මෙම උද්ඝෝෂණයේදී කලහකාරී අන්දමින් හැසිරුණු උද්ඝෝෂකයන් මැඩ පවත්වා පළවා හැරීම සඳහා පොලිස් නිලධාරීන් විසින් වෙඩි තැබීමක් සිදු කර ඇති අතර, එසේ උද්ඝෝෂකයන් පළවා හැරීම සඳහා තබන ලද වෙඩි වැදීමෙන් වර්ණකුලසූරිය ඇන්ටනී ප්‍රනාන්දු නමැත්තා මිය ගොස් ඇත.

ඔබතුමා අහන ලද කාරණයට එක පිළිතුරක් ඒ.

(ii) හලාවත, වැල්ලව, එගොඩවැල්ල කොලනියේ පදිංචි වර්ණකුලසූරිය ඇන්ටනි ප්‍රනාන්දු. මට පිළිතුරු දිය හැක්කේ එපමණයි. මේ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් තිබෙන නිසා ඉතිරි කොටස් තුනට මට අද දිනයේ පිළිතුරු දෙන්න බැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එම ඝාතනය සම්බන්ධයෙන් රජය ගෙන ඇති පියවරත් කියන්න පුළුවන්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රජය ගෙන ඇති පියවර වශයෙන් අදාළ නඩු අංකයත් දැන් මම කියෙව්වා. [බාධා කිරීමක්]මේ අභිංසකයන් කියන අය වෙනුවෙන් ඔබතුමා පෙනී සිටිනවාද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඒ අය වෙනුවෙන් පෙනී සිටිනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
බොහොම හොඳයි. මොකද අනෙක් අය කවුරුත් යන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි පෙනී සිටිනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විපක්ෂයේ ඔහොම මන්ත්‍රීවරයෙක් සිටීම කොච්චර හොඳ දෙයක්ද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ප්‍රශ්නයට ගරු ඇමතිතුමාගේ පිළිතුර ප්‍රමාණවත්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අන්තිම ප්‍රශ්නයටත් උත්තර දෙන්න පුළුවන්. තම ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් දිනා ගැනීම උදෙසා සාමකාමී උද්ඝෝෂණයක යෙදෙන්නන් හට පහර දීම ඔබතුමන්ලා අනුමත කරනවාද, නැද්ද? ඇමතිතුමෙක් විධියට ඒකට පිළිතුර කියන්න පුළුවන්. ඒක උසාවියක ප්‍රශ්නයක් නොවෙයි නේ. ඔබතුමා මෙය අනුමත කරනවාද, නැද්ද? රජයේ ප්‍රතිපත්තිය ගැන අහන්නේ. අන්තිම ප්‍රශ්නය?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකක්ද අන්තිම එක?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඔබතුමා හිටපු පොලිස් නිලධාරියෙක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතකොට හොඳට වෙඩි තියන්න දන්නවා. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, රජය ගෙන ඇති පියවර කුමක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රජය ගෙන ඇති පියවර මම කිව්වා නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අන්තිම ප්‍රශ්නය.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අන්තිම ප්‍රශ්නය තිබෙන්නේ මෙහෙමයි. නොඑසේ නම්, ඒ මන්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, තම ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් දිනා ගැනීම උදෙසා සාමකාමී උද්ඝෝෂණයක යෙදෙන්නන් හට පහර දීම ඔබතුමන්ලා අනුමත කරනවාද, නැද්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එහෙම එකක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම එකක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක ඉවත් කරලා. මම එව්ව ප්‍රශ්නය මේ කියවන්නේ. මම එව්ව ඒ ප්‍රශ්නය ඉවත් කරලා. බලධාරියා විසින් කපා හරින ලදී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5 - 2972/'12-(1), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

වසා ඇති කුඩාපාන කණිෂ්ඨ විද්‍යාලය : ගොඩනැඟිලි
மூடப்பட்ட குடாபான கனிஷ்ட வித்தியாலயம் : கட்டிடங்கள்
CLOSED KUDAPANA JUNIOR SCHOOL : BUILDINGS

1966/'11

8. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මඟින් පාලනය වූ මාර/කුඩාපාන කණිෂ්ඨ විද්‍යාලය මීට වර්ෂ දහයකට පමණ පෙර සිට වසා දමා ඇති බවත්;

(ii) මේ වන විට පාසල සතු ගොඩනැඟිලි විනාශ වෙමින් පවතින බවත්;

(iii) පාසල සතු භූමියද විවිධ පුද්ගලයන් විසින් අත්පත් කරගැනීමට උත්සාහ දරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාර/කුඩාපාන කණිෂ්ඨ විද්‍යාලය සතු භූමිය හා එම ගොඩනැඟිලි වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම පාසල යොදා ගැනීමට අපේක්ෂිත කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට වින්නා:

(අ) (i) මාත්තරෙ මාවට්ටත්තින් මුලට්ටියන කෝට්ටක් කල්වි අලුවලකත්තිනාල් නිර්වකික්කප්පට්ට මාරෙ/කුඩාපාන කනිෂ්ඩ විත්තියාලයම් ඉර්රෙකුකු පත්තාණ්ඩුකළුක්කු මුන්නර් තොඩක්කම් මූඩප්පට්ටුළ්ළතෙන්බතෙයුම්;

(ii) தற்போது பாடசாலைக்குரிய கட்டிடங்கள் அழிவடைந்து வருகின்றன என்பதையும்;

(iii) பாடசாலைக்குச் சொந்தமான நிலத்தையும் கைப்பற்றுவதற்கு பல்வேறு நபர்கள் முயற்சிக் கின்றனரென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மாறை/குடாபான கனிஷ்ட வித்தியாலயத்திற்கு சொந்தமான நிலத்தையும் அதன் கட்டிடங் களையும் வேறு பயன்மிக்க பொருளாதார நடவடிக்கைகளுக்காக பயன்படுத்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், பாடசாலையைப் பயன்படுத்து வதற்கு எதிர்பார்க்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) MR/Kudapana Junior School administered by the Mulatiyana Divisional Education Office in Matara District has been closed for nearly ten years;

(ii) the buildings belonging to the school are decaying at present; and

(iii) various individuals make efforts to encroach upon the land belonging to the school?

(b) Will he inform this House -

(i) whether action will be taken to utilize the land and the aforesaid buildings belonging to the MR/Kudapana Junior School for any other productive economic activity; and

(ii) if so, of the purpose that the school is expected to be utilized?

(c) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මීට වසර දහයකට පෙර වුවමනාවෙන් වසා දැමීමක් කර නැති බවත් ශිෂ්‍ය සංඛ්‍යාව නොමැති වීම නිසා එකී පාසල වැසී ගිය බවත් එම අධ්‍යාපන කාර්යාලය විසින් දන්වා එවා තිබෙනවා.

කුඩාපාන කනිෂ්ඨ විද්‍යාලය නමින් වසර දහයකට පෙර පාසලක් පැවති නොමැති අතර 271-B කුඩාපාන ග්‍රාම නිලධාරී වසම තුළ මාර/ගොම්බද්දල නැහෙනහිර කනිෂ්ඨ විද්‍යාලය නමින් පාසලක් තිබී එය 2003.01.01 දින සිට සිසුන් නොමැතිකමින් වැසී ඇත.

(ii) එම පාසලට අයත් ගොඩනැඟිලි හා අනෙකුත් දේපළ 2010.03.12 දින මුලටියන ප්‍රාදේශීය ලේකම් වෙත බාර දී ඇත.

(iii) අදාළ නොවේ. ප්‍රාදේශීය ලේකම් ඒ පිළිබඳව වග කීම දැරිය යුතුයි.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. විවිධාකාර හේතු නිසා මෙසේ වැසී යන පාසල් ප්‍රාදේශීය ලේකම්වරයාට තමයි පැවරෙන්නේ. බොහෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව මූල්‍යමය ශක්‍යතාවක් හෝ ධාරිතාවක් නැහැ ඒ පාසල් වෙනත් ඵලදායී -ප්‍රයෝජනවත්- දෙයකට යොදවන්න. මෙතැනත් එවැනි ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ. ඒ නිසා වැසී යන පාසල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටම පවරන්නේ නැතිව ගුරුවරුන් පුහුණු කිරීම ආදී වෙනත් කටයුතු සඳහා යොදා ගන්නා වැඩ පිළිවෙළකට යන්න අධ්‍යාපන අමාත්‍යාංශයට බැරි ද ගරු ඇමතිතුමනි?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඒ ඒ පළාත්වල සංවර්ධන කමිටුවල සිටින සභාපතිවරයා බොහෝ විට ගරු ඇමතිතුමෙක්; ගරු මන්ත්‍රීතුමෙක්. ඒ අය විසින් රජය සතු එවැනි දේපළ වඩා ඵලදායකව හා කාර්යක්ෂමව යොදා ගැනීම සඳහා විවිධ යෝජනා ක්‍රම ඉදිරිපත් කරනු ලබනවා. ඒවා ප්‍රාදේශීය ලේකම්ට පවරන්නේ, එහෙම නොකළොත් වෙනත් අය විසින් ඒවා අයිති කරගනු ලබන නිසායි. එය මුලටියන ප්‍රාදේශීය ලේකම්ට භාර දී තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කර තිබෙන ආකාරයට ඒ පළාතේ අධ්‍යාපන කාර්යාලයට අපට කියන්න පුළුවන්, කඩිනමින් යම් කිසි ඵලදායී කටයුත්තකට එය යොදා ගන්න කියලා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, දැන් ගරු ඇමතිතුමා සඳහන් කළා ප්‍රාදේශීය ලේකම්ට පවරපු නිසා ඒ ගොඩනැඟිලි විනාශ වෙමින් පවතින්නේ නැහැ කියලා; ප්‍රාදේශීය ලේකම්ට පවරපු නිසා වෙනත් පුද්ගලයන් ඒ භූමිය අයිති කර ගනිමින් නැහැ කියලා. ප්‍රාදේශීය ලේකම්ට පැවරුවත් ඒ ගොඩනැඟිලි මේ මොහොත වන කොටත් විනාශ වෙමිනුයි තිබෙන්නේ. ඒවා කිසිම ප්‍රයෝජනවත් දෙයකට යොදා ගෙන නැහැ. වටේ ඉන්න පුද්ගලයන් ඒ භූමියේ කොටස් අල්ලා ගනිමිනුයි ඉන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, විස්තර වැඩක් නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ වාගේම, සන්ධ්‍යා කාලයේ විවිධ අපචාර කටයුතුවලටත් එය බොහෝ විට යොදා ගන්නවා. නමුත් නම යන්නේ පාසල් ගොඩනැඟිල්ලක් කියලායි. එහි අයිතිය ප්‍රාදේශීය ලේකම්ට පැවරුවාට පාසල් ගොඩනැඟිල්ලක් නාමයෙන් තමයි හඳුන්වන්නේ. ඒ නිසා වසා දමන පාසල් වෙනුවෙන් යම් ක්‍රියා මාර්ගයකට අධ්‍යාපන අමාත්‍යාංශයට සක්‍රියව දායක වන්න බැරි ඇයි ගරු ඇමතිතුමනි?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
අධ්‍යාපන අමාත්‍යාංශයට නොවෙයි, ඒ පාසල් පළාත් සභාවටයි අයිති.

දහතුන්වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභාවේ පාසල් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ වාගේ ප්‍රශ්න උපදේශක කාරක සභාවක් තිබෙන නිසා එහිදී සාකච්ඡා කළොත් වඩාත් ඵලදායී වෙයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පළාත් සභාවට ඉදිරිපත් කරන්න. එහෙම නැත්නම් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් සිටින සංවර්ධන කමිටුවේ දී මේවා ගැන ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඉදිරිපත් කළත් වැඩක් වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ සඳහා සල්ලි නැහැ යි කියලා යි කියලා තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පළාත් සභාවේ ප්‍රශ්න කොහොමද පාර්ලිමේන්තුව විසඳන්නේ?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, දැන් මාසයකුත් අවසන් වන්නට එනවා. පාසල්වල මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් නිකුත් කරනවාය කියන වක්‍රලේඛය එළියට එන්නේ කවදාද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මාසයක් අවසන් වන්නට හේතුව තමුන්නාන්සේට අපි පැහැදිලිව කිව්වා. පසු ගිය බ්‍රහස්පතින්දා ඒ ඒ පළාත්වල මහ ඇමතිතුමන්ලා සහ අධ්‍යාපන බලධාරීන් සමඟ සාකච්ඡා කළා. ඒ සාකච්ඡාව නිම වුණාට පසුව අපි කිව්වා උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන්නම් කියලා. උපදේශක කාරක සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය නැති බව උපදේශක කාරක සභා සාමාජිකයකු ලෙස ඔබතුමා කියා සිටිනවා නම්, -

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මා අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සාමාජිකයකු නොවෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
උපදේශක කාරක සභාවටත් ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරලා එය නිකුත් කරන එක තමයි හොඳ. එහෙම අවශ්‍ය නැහැ කියලා හිතනවා නම් අපි වක්‍රලේඛය ලබන සතිය වනකොට නිකුත් කරන්නම්. මොකද, මහ ඇමතිතුමන්ලා සමඟ සාකච්ඡාව දැන් අවසන් කර තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9 -2260/'12- (2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10 -2487/'12- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා කියා සිටින්නේ, මෙය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන ප්‍රශ්නයක් නොවන බවයි. මෙය වෙනත් අමාත්‍යාංශයකට යොමු කළ යුතු ප්‍රශ්නයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු කථානායකතුමනි, එම නිසා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය : කාර්ය භාරය
தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சு : செயற்பாடுகள்
MINISTRY OF PRIVATE TRANSPORT SERVICES : FUNCTIONS

2821/'12

11. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ කාර්යභාරය කවරේද;

(ii) අමාත්‍යාංශයේ සේවයේ නියුතු එහි කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේවන විට රට තුළ ධාවනයට යොදාගන්නා මුළු පුද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) නිසි ලියාපදිංචි වීමකින් අනතුරුව ධාවනය වන පුද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) නිසි ලියාපදිංචි වීමකින් තොරව ධාවනය වන පුද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) 2000, 2003 සහ 2006 යන වර්ෂවලදී ධාවනය කරවන ලද පුද්ගලික බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසු ගිය වර්ෂ අටක කාලය තුළ පුද්ගලික බස් ගාස්තු සංශෝධනය වූ අවස්ථා කවරේද;

(ii) ඉකුත් කාලසීමාව තුළ අනුමත කරන ලද බස් ගාස්තු වැඩි වීම් කවරේද;

යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

தனியார் போக்குவரத்து சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச் சின் செயற்பாட்டினையும்;

(ii) இந்த அமைச்சில் கடமையாற்றும் பணியாள் தொகுதி உறுப்பினர்களின் எண்ணிக்கை யினையும்

அவர் கூறுவாரா?

(ஆ) (i) இன்றுள்ளவாறாக நாட்டில் சேவையிலீடுபடுத்தப்படும் தனியார் பஸ்களின் மொத்த எண்ணிக்கையினையும்;

(i) உரிய பதிவுடன் சேவையிலீடுபடுத்தப்படும் தனியார் பஸ்களின் எண்ணிக்கையினையும்;

(iii) உரிய பதிவின்றி சேவையிலீடுபடுத்தப்படும் தனியார் பஸ்களின் எண்ணிக்கையினையும்;

(iv) 2000, 2003 மற்றும் 2006ஆம் ஆண்டுகளில் சேவையிலீடுபடுத்தப்பட்ட தனியார் பஸ்களின் எண்ணிக்கையினை வெவ்வேறாகவும்

அவர் கூறுவாரா?

(இ) (i) கடந்த 8 வருட காலத்தின் போது தனியார் பஸ் கட்டணங்கள் எப்போது திருத்தம் செய்யப் பட்டன என்பதையும்;

(ii) மேற்குறிப்பிட்ட காலப் பகுதியில் அங்கீகரிக்கப் பட்ட பஸ் கட்டண அதிகரிப்புகள் யாவை என்பதையும்

அவர் ஆண்டு வாரியாக இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Private Transport Services:

(a) Will he state -

(i) the functions of the Ministry of Private Transport Services; and

(ii) the number of staff members attached to the Ministry?

(b) Will he also state -

(i) the total number of private buses being operated in the country as of today;

(ii) the number of private buses being operated with a proper registration;

(iii) the number of private buses being operated without a proper registration; and

(iv) the number of private buses operated in the years 2000, 2003 and 2006 separately;

(c) Will he inform this House on per year basis -

(i) as to when the private bus fares have been revised during the last eight years; and

(ii) the increases of the bus fare approved during the aforesaid period?

(d) If not, why?

ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) (1) මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ විෂයයට අදාළ ප්‍රතිපත්ති, වැඩ සටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම;

(2) අදාළ අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරින් හා එකඟත්වයට පැමිණි කාලසීමාව සහ අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩ සටහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම;

(3) අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව සහ මහජන හිතකාමී අයුරින් ලබා දීම;

[ගරු සී.බී. රත්නායක මහතා]

(4) ආරක්ෂාකාරී විශ්වාසනීය මහී ප්‍රවාහන සේවා ලබා දීම;

(5) ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පැවරී ඇති අනෙකුත් සියලු විෂයයන් සහ

ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් අධීක්ෂණය කිරීම.

(ii) සේවක ප්‍රමාණය 32යි.

(ආ) (i) 2011 වර්ෂයේ දෙසැම්බර් වන විට බලපත්‍ර ලබා දී ඇති මුළු පුද්ගලික බස් රථ සංඛ්‍යාව 19699යි. එයින් පළාත් සභා බස් රථ සංඛ්‍යාව 16533යි. ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් බලපත්‍ර ලබා දී ඇති අන්තර් පළාත් බස් රථ සංඛ්‍යාව 3166ක්ද වෙනවා. මේ අතරින් ධාවනය වන මුළු පුද්ගලික බස් රථ සංඛ්‍යාව වන්නේ බස් රථ බලපත්‍ර අවලංගු කිරීම්, ධාවනයට නුසුදුසු තත්ත්වයේ පැවතීම ආදී කරුණු නිසා ධාවනයෙන් ඉවත් කරන ලද බස් රථ හැර ඉතිරිය වේ. තවද මීට අමතරව සංචාරක සහ වෙනත් කටයුතු සඳහා යොදා ගන්නා බස් රථ ද ඇත.

(ii) නිසි ලියා පදිංචි වීමෙන් අනතුරුව ධාවනය වන මුළු පුද්ගලික බස් රථ සංඛ්‍යාව 16602යි.

මෙයින් පළාත් සභා බස් රථ සංඛ්‍යාව 14,069යි. අන්තර් පළාත් බස් රථ සංඛ්‍යාව 2,533යි.

(iii) විවිධ සමීක්ෂණ හා ලැබෙන තොරතුරු මාර්ගයෙන් බස් රථ ප්‍රමාණයක් අවසර පත්‍ර ලබා නොගෙන ධාවනය වන බව වාර්තා වී ඇත.

(iv) 2000 වර්ෂය :

ධාවනය කළ මුළු පෞද්ගලික බස්රථ සංඛ්‍යාව 12,667කි. මෙයින්, පළාත් සභා බස් රථ සංඛ්‍යාව 10,089ක් ද, ධාවනය කළ අන්තර් පළාත් බස් රථ සංඛ්‍යාව 2,578ක් ද වේ.

2003 වර්ෂය :

ධාවනය කළ මුළු පෞද්ගලික බස් රථ සංඛ්‍යාව 13,266කි. මෙයින්, පළාත් සභා බස් රථ සංඛ්‍යාව 10,518ක් ද, ධාවනය කළ අන්තර් පළාත් බස් රථ සංඛ්‍යාව 2,748ක් ද වේ.

2006 වර්ෂය :

ධාවනය කළ මුළු පෞද්ගලික බස් රථ සංඛ්‍යාව 12,656කි. මෙයින්, ධාවනය කළ පළාත් සභා බස් රථ සංඛ්‍යාව 10,111ක් ද, ධාවනය කළ අන්තර් පළාත් බස් රථ සංඛ්‍යාව 2,545ක් ද වේ.

(ඇ) (i)

01.	2004	සැප්තැම්බර්	01
	2004	ඔක්තෝබර්	02
02.	2005	ජූනි	10
03.	2006	අප්‍රේල්	24
04.	2007	ජූලි	04
05.	2008	පෙබරවාරි	01
	2008	මැයි	27
	2008	නොවැම්බර්	12
06.	2009	ජනවාරි	06
	2009	සැප්තැම්බර්	22
07.	2010	ගාස්තු සංශෝධනය වී නොමැත.	
08.	2011	ජූලි	01

(ii)

01.	2004	සැප්තැම්බර්	01 - 9% (වැඩිවීම)
	2004	ඔක්තෝබර්	02 - 5% (වැඩිවීම)
02.	2005 ජූනි 10		- 13.8% (වැඩි වීම)
03.	2006 අප්‍රේල් 24		- 16% (වැඩි වීම)
04.	2007 ජූලි 04		- 17.5% (වැඩි වීම)
05.	2008 පෙබරවාරි 01		- 4.9% (වැඩි වීම)
	2008 මැයි 27		- 27.2% (වැඩි වීම)
	2008 නොවැම්බර් 12		- -11.6% (අඩු වීම)
06.	2009 ජනවාරි 06		- -4.3% (අඩු වීම)
	2009 සැප්තැම්බර් 22		- 5.3% (වැඩි වීම)
07.	2010 ගාස්තු සංශෝධනය වී නොමැත.		
08.	2011 ජූලි 01		- 7.6% (වැඩි වීම)
09.	2012 පෙබරවාරි 14		- 20% (වැඩි වීම)

(ඈ) අදාළ නොවේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. සී.බී. රත්නායක මැතිතුමා වාගේ දක්ෂ අමාත්‍යවරයකුට තෙල් මිල වැඩි වුණාම චිතරක් වැඩ කරන්න පටන් ගන්න අමාත්‍යාංශයක් භාර දීපු එක හරිම අපරාධයක්. මේ මාසය ඇතුළත දෙගමනක් තෙල් මිල වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව බස් ගාස්තු වැඩි කිරීමට අනුමැතිය ලබා දී තිබෙනවාද, එසේ දී තිබේ නම් කීයකින්ද කියා මම අහනවා.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ජූලි මාසය වනකොට තමයි බස් ගාස්තු වැඩි කරන්න පුළුවන් වෙන්නේ. ඊට අදාළ නිර්ණායකයන් තිබෙනවා. කරුණු 12ක් සංසන්දනය කරලා සියයට 4 ඉක්මවා ගියොත් තමයි බස් ගාස්තු වැඩි කරන්න වෙන්නේ. අප සියලු සංගම් සමඟ සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවලදී ගාස්තු වැඩි කිරීමකට එකඟතාවක් පළ කළේ නැහැ. ගාස්තු වැඩි කිරීමක් අනවශ්‍ය බව ඒ අය කියා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. ඔබතුමා දීලා තිබෙන බස් ගාස්තු සංශෝධන තුළින් 2004 සිට අද වෙන තුරු බස් ගාස්තු වැඩි වෙලා තිබෙන්නේ සියයට 135කින්. නමුත් තෙල් මිල සියයට 225කින් වැඩි වෙලා තිබෙනවා. ඒ දෙක අතර පරතරය බලන කොට, ඒ ගොල්ලන් පෞද්ගලික බස් ගාස්තු 2004 සිට අනිසි ලෙස වැඩි කර තිබෙනවාද, නැත්නම් අද ඒවා පාඩුවට දුවනවාද? මොකක්ද මේකේ තිබෙන සූත්තරය?

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, සමහර වෙලාවට මිල සංශෝධනය වීම ඉන්ධන මිල පමණක් පදනම් කර ගෙන ක්‍රියාත්මක වන්නේ නැහැ. බැංකු පොලී අනුපාතය, සේවක වැටුප් ඇතුළු කාරණා 12ක් ඊට එකතු වනවා. ඒවා සංසන්දනය කර බැලුවාම සියයට 4 ඉක්මවා යනවා නම් තමයි බස් ගාස්තු වැඩි කරන්නේ. ඒක තමයි මිල නියාමනය කිරීම. මිල නියාමනය කිරීමේදී සියයට 4 ඉක්මවා යන්නේ නැත්නම් බස් ගාස්තු වැඩි කළ යුතු නැහැ. වැඩි කරන්න අවශ්‍ය වන්නේ නැහැ. වෙන පැත්තකින් යම් සහන දෙනවා. සමහර විට බස් රථයක් මිලදී ගැනීමේදී රේගු බද්ද අඩු කර තිබෙනවා. ඔවුන්ට ඒ අවස්ථාව සලසා දී තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ අවස්ථාවේදී කියනවා බස් ගාස්තුවල සංශෝධනයක් ඇති වන්නේ නැහැයි කියලා. නමුත් තෙල් මිල වැඩි වුණාට පසුව පෞද්ගලික බස් සේවා සංගමයේ සභාපති ගැමුණු විජේරත්න මහත්මයා කියනවා ඔබතුමන්ලා සහනාධාර ක්‍රමයකට තෙල් දෙනවා කියලා පොරොන්දු වුණු නිසා තමයි මේ බස් ගාස්තු සංශෝධනය නොකරන්නේ කියලා. මේ නිසා කවුද ඇත්ත කියන්නේ කියලා පාරිභෝගිකයන් තුළ ප්‍රශ්නයක් මතු වෙනවා. කරුණාකර ඇත්ත මොකක්ද කියන්න.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, කිසිම හැංගිල්ලක් නැහැ; වහන් කිරීමක් නැහැ. පෞද්ගලික බස් සංගම් සමඟ අප සාකච්ඡා කළා. ඔවුන්ගේ ඉල්ලීම් මොනවාද කියලා අපට කිව්වා. ඔවුන් මූලාශ්‍රය සහනාධාරයක් ඉල්ලන්නේ නැහැ කියා ප්‍රකාශ කළා. මම ඒක පිළිගත්තේ නැහැ, හැබැයි අතට ගත්තා. අතට ගත්තාය කියන්නේ ඔවුන් ලිඛිතව දුන්නාම ඒ ගැන සාකච්ඡා කරලා ඔවුන්ට තීන්දුවක් දෙන්න පුළුවන්ද කියලා කල්පනා කරන්නම් කියලා කිව්වා. ඒක තමයි ඇත්ත තත්ත්වය. මේකෙදි කිසිම හැංගිල්ලක් නැහැ. මොකද ඔබතුමා කියන විධියට එක සංගමයක එක පුද්ගලයෙක් පමණක් නොවෙයි ඉන්නේ. තව සංගම් ගණනාවක් තිබෙනවා. මේ සංගම් ගණනාවත් එක්කම සාකච්ඡා කළ යුතුයි. එක පුද්ගලයෙක් වටා ගොනු වී, එහෙම නැත්නම් එක පුද්ගලයෙක් කියන කථාවක් අනුව කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ කියන කාරණයත් ඔබතුමා විශේෂයෙන් අවධාරණය කර ගන්න.

සිවිල් ආරක්ෂක බලකාය : විස්තර
சிவில் பாதுகாப்புப் படையணி: விபரம்
CIVIL DEFENCE FORCE : DETAILS

1967/'11

12.ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සිවිල් ආරක්ෂක බලකායේ සේවය කරන භටයින් දෛනික වැටුප් ලබමින්, අවුරුදු විස්සකට වඩා වැඩි කාලයක් සේවය කරනු ලබන බවත්;

(ii) සේවය ස්ථිර නොකිරීම හේතුවෙන්, එම භටයින් දැඩි සේවා අවිනිශ්චිතභාවයකින් කටයුතු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා සේවය කරනු ලබන සිවිල් ආරක්ෂක බලකායේ භටයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් දිස්ත්‍රික්කයේ සේවය කරනු ලබන එම භටයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සිවිල් ආරක්ෂක බලකායේ සේවය කරන භටයින්ගේ සේවය ස්ථිර කර විශ්‍රාම වැටුප් සහිත සේවාවක් බවට පත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) சிவில் பாதுகாப்பு படையணியில் கடமையாற்றுகின்ற படைவீரர்கள் நாளாந்த சம்பளத்தில் சுமார் இருபது வருடங்களுக்கும் அதிக காலமாக கடமையாற்றுகின்றனர் என்பதையும்;

(ii) சேவை நிரந்தரமாக்கப்படாமையினால், மேற்படி உத்தியோகத்தர்கள் அவர்களது சேவை தொடர்பில் உறுதியற்ற தன்மையுடன் செயலாற்றுகின்றனரென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) நாடு பூராவும் கடமையாற்றுகின்ற சிவில் பாதுகாப்பு படையணியிலுள்ள படைவீரர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) ஒவ்வொரு மாவட்டத்திலும் கடமையாற்றுகின்ற மேற்படி படைவீரர்களின் எண்ணிக்கை தனித்தனியாக எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) சிவில் பாதுகாப்பு படையணியில் கடமை யாற்றுகின்ற படைவீரர்களின் சேவையை நிரந்தரமாக்கி ஓய்வூதியமுள்ள சேவை யொன்றாக மாற்றுவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) அதற்கான முறையியலொன்று தயாரிக்கப் பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that -

(i) the soldiers serving in the Civil Defence Force have been working for over 20 years on the basis of daily wages; and

(ii) as a result of not being made permanent in the service, the aforesaid officers are carrying out their duties with a grave sense of job insecurity?

(b) Will he state -

(i) the number of officers serving in the Civil Defence Force islandwide; and

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) separately, the number of the aforesaid officers serving in each District?

(c) Will he inform this House -

(i) whether action will be taken to make the service of the officers serving in the Civil Defence Force permanent and pensionable; and

(ii) whether a methodology in this regard has been prepared?

(d) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවාවට ආධාර උපකාර වීමේ කාර්යය සඳහා පිහිටුවන ලද ග්‍රාමාරක්ෂක හමුදාව 2006.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි -අතිගරු ජනාධිපතිතුමා කරන ලද යෝජනාව අනුව- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වශයෙන් ස්ථාපනය කර ඇත.

(ii) සියලුම සිවිල් ආරක්ෂක භටයන් විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම පිළිබඳව දැනුවත් කර ඇත.

(ආ) (i) තිස්හත්දහස් පන්සියයක් (37,500) පමණ වේ.

(ii) ඒ පිළිබඳ විස්තර බලකා මූලස්ථාන අනුව ඉදිරිපත් කරමි. බලකා මූලස්ථාන 27ක් තිබෙනවා. මුළු භටයින්ගේ එකතුව 37,311යි.

අනු අංකය	බලකා මූලස්ථානය	මුළු එකතුව
1	සිෆාදෙ මූලස්ථානය	352
2	පොළොන්නරුව බලකාය	2,128
3	ත්‍රිකුණාමලය බලකාය	1,732
4	සේරුවිල බලකාය	1,572
5	මොරවැව බලකාය	1,132
6	කැබිනිගොල්ලැව බලකාය	2,154
7	වැලිඔය බලකාය	1,977
8	වවුනියා බලකාය	1,349
9	අනුරාධපුරය බලකාය	2,179
10	අම්පාර බලකාය	4,027
11	මහඔය බලකාය	2,321
12	විල්පත්තුව බලකාය	2,016
13	පුත්තලම බලකාය	1,225
14	බස්නාහිර බලකාය	1,941
15	හොරොව්පතාන බලකාය	735
16	කතරගම බලකාය	2,077
17	මහනුවර බලකාය	1,127
18	උහන බලකාය	1,526
19	කටුනායක බලකාය	161
20	වැලිසර උප බලකාය	198
21	සේරුපිට පුහුණු කඳවුර	280
22	මිහින්තලේ පුහුණු කඳවුර	169
23	ගල්කිරියාගම පුහුණු කඳවුර	154
24	කල්පිටිය පුහුණු කඳවුර	49
25	පහලලන්ද පුහුණු කඳවුර	109
26	මැදිරිගිරිය උප බලකාය	1,505
27	කිලිනොච්චි / මුලතිව් ඒකාබද්ධ අණදෙන මූලස්ථානය	3,116
	එකතුව	37,311

(ඇ) (i) ඔව්.

(ii) ඔව්.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ සිටින අය මේ මොහොත වන විට ස්ථිර කරලා වැටුප් තලයක පිහිටුවලා තිබෙනවා කියලා කියනවා. ඒ වාගේම පොලිස් සහායකයින් යම් ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන්ට තවම සේවා ස්ථිරභාවයක් නැහැ. ඊයේ පෙරේදා පොලිස් නිලධාරීන්ට ලැබුණු දීමනා වැඩි වීම ඒ අයට ලැබුණේත් නැහැ. පොලිස් සහායකයන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මේ දෙක වෙනස් ද? සිවිල් ආරක්ෂක භටයන් කියන අයයි පොලිස් සහායකවරු කියන අයයි එකම අය ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රධාන ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ සිවිල් ආරක්ෂක භටයන් ගැනයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

පොලිස් සහායකයන් වෙනුවෙනුත් යම් සහනයක් සලසන්න අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න පුළුවන් ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අවධානය යොමු කිරීම කරන්නම්. සිවිල් ආරක්ෂක බටයන් 37,311ක් මෙසේ දෙපාර්තමේන්තුවට අන්තර්ගත කිරීමත්, විශ්‍රාම වැටුප් අයිතිවාසිකම ලබා දීමත් අතිගරු ජනාධිපතිතුමා ලබා දුන් විශාල ජයග්‍රහණයක්. අපි ඒක ඒ ආකාරයෙන් තව දුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්නවා. ඔබතුමා දැන් කියන කාරණාව අමාත්‍යාංශයේ අවධානයට ගේන්නම්. [බාධා කිරීමක්]

ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමිය අහන්නේ දෙවැනි අතුරු ප්‍රශ්නය ද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමා, මමයි දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
දිගාමඩුල්ලේ කෙනෙක් ප්‍රශ්නය අහන එක වැදගත්. ඔබතුමිය සීනි ගැනද අහන්නේ?

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන - බෞද්ධ ශාසන, මත අනුවල්කළ් පිරති අමෛච්චර්)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)
ගරු මන්ත්‍රීතුමා, පොලිස් සහායකයෝ අයත් වෙන්නේ සිවිල් ආරක්ෂක සේවයට නොවෙයි, පොලිස් දෙපාර්තමේන්තුවටයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ඔව්, ඔව්. ඒක ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
උක් ගැනද, සීනි ගැනද මන්ත්‍රීතුමිය අහන්නේ?

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන)
(The Hon. M.K.A.D.S. Gunawardana)

නැඟී සිටියේය.
එලුත්තාර්.
rose.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ආරක්ෂක ඇමතිවරු දෙතුන් දෙනෙක් ඉන්නවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
දිගාමඩුල්ලද? ගරු මන්ත්‍රීතුමිය ප්‍රශ්නය අහන්න. දිගාමඩුල්ලේ සිවිල් ආරක්ෂක බලකායේ අය ඉන්නේ මෙහේ නොවෙයි. එහේ ඉන්නේ.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකට අදාළ නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට මොකක්ද පිළිතුර?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
පළමුවැනි අතුරු ප්‍රශ්නයට මම පිළිතුරු දුන්නා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ඒ ප්‍රශ්නය මේකට අදාළ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය අමාත්‍යාංශයේ අවධානයට යොමු කරන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
හොඳයි, ඔබතුමා ඒ ගැන අමාත්‍යාංශයේ අවධානයට යොමු කරනවා කියලා කිව්වා. එසේ අවධානයට යොමු කිරීම තුළ පොලිස් සහායකයන්ටත්, නිත්‍ය පොලිස් සේවයේ වාගේම යම් කිසි විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයට මෙම අතුරු ප්‍රශ්නය සම්බන්ධ නැහැ. ඔබතුමා කියූ කාරණය අමාත්‍යාංශයේ අවධානයට ගේන්නම්. ඊට අතිරේකව මට ඒ සඳහා උත්තරයක් දෙන්න බැහැ.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
අදාළ ප්‍රශ්නයෙන් පිට යන්න එපා. එතකොට අසීරුතාවට පත් වෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
අනෝමා ගමගේ මන්ත්‍රීතුමිය සීනි ගැන නම් අහයි.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
දැන් මේ දෙදෙනාගෙන් මම දකින්නේ කවුද? ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සහ ගරු අනෝමා ගමගේ මන්ත්‍රීතුමිය නැඟිටලා සිටිනවා. මට පෙනෙන්නේ එක් කෙනයි. පිටු පස්සේ සිටින මන්ත්‍රීවරිය පමණයි. [බාධා කිරීම්] එහෙම නම් අපි අතුරු ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව ගරු අනෝමා මන්ත්‍රීතුමියට දෙමු.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමතී) අනෝමා කමකේ)
(The Hon. (Mrs.) Anoma Gamage)
ගරු ඇමතිතුමනි, සිවිල් ආරක්ෂක භටයන්ගේ සේවය ස්ථිර කරලා තිබෙනවා කියලා ඔබතුමා කිව්වත් තවම ස්ථිර කරලා නැහැ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන)
(The Hon. M.K.A.D.S. Gunawardana)
කවුද කියන්නේ?

ගරු අනෝමා ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමතී) අනෝමා කමකේ)
(The Hon. (Mrs.) Anoma Gamage)
මම කියන්නේ. මම සිවිල් ආරක්ෂක සේවයේ නිලධාරීන් සමඟ පෙරේදාත් කථා කළා. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
කන්තලේ ප්‍රශ්නයක්. [බාධා කිරීම්]

ගරු අනෝමා ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) අනෝමා කමකේ)
(The Hon. (Mrs.) Anoma Gamage)
පසු ගිය මැතිවරණයේදී මෙම සිවිල් ආරක්ෂක-

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන තුරු ඉන්න. ප්‍රශ්නය එක වරයි අහන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමිය තොරතුරු හරියට දන්නේ නැහැ. 2006.09.13 වන දින 1462/20 දරන රජයේ ගැසට් පත්‍රයෙන් මේ අය දෙපාර්තමේන්තුවට අන්තර්ගත කරලා තිබෙනවා. [බාධා කිරීමක්] ඉන්න කෝ ඉතින් උත්තරය දෙන්න. "ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය." ඉවසන්න කෝ. මේක සීනි ප්‍රශ්නයක් නම් මම ඔබතුමිය කියන දේ අහ ගෙන ඉන්නවා. මේක සීනි ප්‍රශ්නයක් නොවෙයි. [බාධා කිරීමක්] මෙන්න කියනවා "සූකිරි" කියලා. මම දන්නේ නැහැ, "සූකිරි" කියලා කියනවා. ගරු කථානායකතුමනි, 2012 අගෝස්තු මාසයේ 03 වන දින කැබිනට් සංදේශය අනුමත කොට දැන් එය වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම ඉදිරියේ අදාළ ශීර්ෂයන් සඳහා කටයුතු කර ගෙන යනවා. ඒක දෙපාර්තමේන්තුව අනුගමනය කරන පිළිවෙතක්. එහෙම නැතිව ඔබතුමියටයි, මටයි ඕනෑ විධියට පසුවදාට විශ්‍රාම වැටුප ගෙවන්න බැහැ. ඒ නිසායි අපි කිව්වේ දැනට අනුමත කරලා, ඒක රජය විසින් කර ගෙන යනවා කියලා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
පිළිතුර පැහැදිලියි.

උතුරු මැද පළාතේ වකුගඩු රෝගීන්: විස්තර
වට මත්තිය මාකාණ සිරුනීරක නෝයාළර්කළ් : විපරම්
KIDNEY PATIENTS IN NORTH CENTRAL PROVINCE: DETAILS

2324/'12

13. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) (i) වර්ෂ 2004 සිට 2011 දක්වා කාල සීමාව තුළ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උතුරු මැද පළාතේ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇති වකුගඩු රෝගයට නිශ්චිත හේතු හඳුනා ගැනීම සඳහා උපයෝගි කර ගත් ක්‍රමවේදය කවරේද;

(iii) මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග තුළින් එම රෝග ව්‍යාප්තිය පාලනය වී තිබේද;

(iv) නොඑසේ නම්, එම රෝගය පාලනයට ගත වන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය පහසුකම් ඇති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) කොළඹ ජාතික රෝහලේ සහ මහනුවර මහ රෝහලේ ඇති වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය ශල්‍යාකර්ම කිරීමට පහසුකම් සහිත වාට්ටු සංඛ්‍යාව කොපමණද;

(iii) ශල්‍යාකර්මවලින් අනතුරුව අවශ්‍ය පහසුකම් යටතේ රජයේ රෝහල්වල රඳවා ගැනීමට හැකි වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) වෙළඳපොලේ පවතින තිහය නිසා දැනට අධික මිල ගණන් යටතේ අලෙවි කරන වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය ඖෂධ ප්‍රමාණවත් ලෙස රජයේ රෝහල්වලට ලබා දීමට කටයුතු කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාතාර අමෙච්සරෙක් කේට්ටවිනා:

(අ) (i) 2004ආම් ආණ්ටු මුතල් 2011ආම් ආණ්ටු වරෙයාන කාලප්පකුතියිල් අනුරාතපුරම් මට්රුම් පොලන්නරුවෙ මාවට්ටඞ්කළිල් අරික්කෙයිටප්පට්ට සිරුනීරක නෝයාළර්කළින් එණ්ණික්කෙ වරුටාන්ත රීතියාක වෙව්වේරාක එව්වළවෙන්පතෙයුම්;

(ii) වට මත්තිය මාකාණත්තිල් තීවිරමාකප් පරවියුළ්ළ සිරුනීරක නෝය්ක්කාන තිට්ටවට්ටමාන කාරණඞ්කළෙ ඉනඞ් කාණ්පතර්කු පයන්පටුත්තප්පට්ට මුරෙමෙ යාතෙන්පතෙයුම්;

(iii) ඉතුවරෙ මේර්කොළ්ළප්පට්ටුළ්ළ නටවටික්කෙකළ්මූලම් මේර්පටි නෝය් පරවුතල් කට්ටුප්පටුත්තප්පට්ටුළ්ළතා එන්පතෙයුම්;

(iv) ඉන්රේල්, මේර්පටි නෝයෙක් කට්ටුප් පටුත්තුවතර්කු එව්වළවු කාලම් එටුක්කුම් එන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ආ) (i) සිරුනීරක නෝයාළර්කළුක්කු සිකිච්සෙ අළිප්පතර්කුත් තේවෙයාන වසතිකළෙක් කොණ්ටුළ්ළ මරුත්තුවමනෙකළින් එණ්ණික්කෙ එත්තනෙයෙන්පතෙයුම්;

(ii) කොළුම්පු තේසිය වෛත්තියසාලෙයිලුම් කණ්ටි පොතු වෛත්තියසාලෙයිලුම් කාණප්පටුකින්ර සිරුනීරක නෝයාළර්කළුක්කුත් තේවෙයාන සත්තිරසිකිච්සෙකළෙ මේර්කොළ්ළක්කූටිය වාට්ටුකළින් එණ්ණික්කෙ එත්තනෙයෙන් පතෙයුම්;

(iii) සත්තිරසිකිච්සෙකළින් පින්නර් තේවෙයාන වසතිකළින් කීළ් අරස මරුත්තුවමනෙකළිල් තඞ්කවෛත්තුක්කොළ්ළක් කූටිය සිරුනීරක නෝයාළර්කළින් එණ්ණික්කෙ එත්තනෙයෙන් පතෙයුම්;

(iv) සන්තෙයිල් නිලවුකින්ර තට්ටුප්පාටු කාරණමාක තර්පෝතු අතික විලෙයිල් විර්පනෙ සෙය්යප්පටුකින්ර සිරුනීරක නෝයාළර්කළුක්කුත් තේවෙයාන මරුන්තුකළෙ පෝතියළවිල් අරස මරුත්තුවමනෙකළුක්කු පෙර්රුක් කොටුප්පතර්කු නටවටික්කෙ එටුක්කප්පට්ටුළ්ළතා එන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Health:

(a) Will he state -

(i) separately, the number of kidney patients reported from Anuradhapura and Polonnaruwa Districts in each of the years during the period from the year 2004 to 2011;

(ii) the methodology adopted to identify the specific cases of kidney disease which has rapidly spread in the North Central Province;

(iii) whether the spread of the aforesaid disease has been controlled through the measures taken so far; and

(iv) if not, the period of time that will be taken for the control of the aforesaid disease?

(b) Will he also state -

(i) the number of hospitals with adequate facilities where kidney patients can be treated;

(ii) the number of wards in Colombo National Hospital and in Kandy General Hospital with facilities to conduct surgeries required for kidney patients;

(iii) the number of kidney patients who can be kept in government hospitals with required facilities after they have undergone surgeries; and

(iv) whether measures have been taken to provide the government hospitals with adequate amounts of drugs required for kidney patients, which are sold at exorbitant prices at present due to the shortage prevailing in the market?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව

වර්ෂය	වාර්තාවූ රෝගීන් සංඛ්‍යාව
2003 -2008	6639
2009	1143
2010	1451
2011	1424
එකතුව	10657

පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව

වර්ෂය	වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව
2006-2008	1175
2009	365
2010	380
2011	854
එකතුව	2774

(ii) උතුරු මැද පළාතේ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇති වකුගඩු රෝගයට නිශ්චිත හේතු හඳුනා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල කිහිපයක ආචාර්යවරුන්ගෙන් සැදුම්ලත් පර්යේෂණ කණ්ඩායම් දහයක් රෝගයේ විවිධ පැතිකඩ (සමාජ හා ආර්ථික බලපෑම්, භූගත ජලනිධි හා පාංශු රසායනවල බලපෑම්, කෘෂිකර්මාන්තයේ බලපෑම් ආදී) ඔස්සේ මෙම රෝගයට අදාළව අංශ අටක් පමණ යටතේ පරීක්ෂණ සිදු කරයි.

(iii) ඉහත පර්යේෂණ කණ්ඩායම් විසින් වකුගඩු රෝගයට හේතු කාරක යයි නිශ්චිතව හඳුනාගත් සාධක පාලනය කිරීමට අදාළව ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම දැනටමත් අරඹා ඇත. නමුත් මෙම රෝගය නිදන් ගත රෝගයක් වන නිසා රෝගයට හේතුකාරක විය හැකි සාධකවල මීට වසර කිහිපයකට ඉහතදී නිරාවරණය වූවන්ද, ඉදිරියේදී රෝගීන් බවට පත් විය හැක. මේ නිසා දැනට රෝගය පාලනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග තුළින් රෝග ව්‍යාප්තිය පාලනය වී තිබේද යන්න නිශ්චිතව කීමට තවත් කාලයක් ගත වනු ඇත.

(iv) රෝගය පාලනය කිරීම සඳහා අවශ්‍ය සියලුම පියවර ගනිමින් පවතින අතර, රෝගයේ ස්වභාවය අනුව රෝගය පාලනය කිරීමට ගත වන කාලය මේ අවස්ථාවේදී නිශ්චිතව සඳහන් කළ නොහැක.

උදාහරණයක් ලෙස හැටේ දශකයේදී බෝල්කන්ස් අර්ධද්වීපයේ හඳුනා ගෙන ඇති මෙවැනිම වකුගඩු රෝගයක් සම්බන්ධයෙන් මේ වනතුරු නිශ්චිත හේතුවක් හඳුනා ගෙන නොමැත.

(ආ) (i) ශ්‍රී ලංකාවේ පහත සඳහන් රෝහල්වල වකුගඩු රෝගීන් සඳහා මූලික ප්‍රතිකාර කිරීමට පහසුකම් ඇත.

* ශ්‍රී ලංකා ජාතික රෝහල
* ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල
* ශික්ෂණ රෝහල් 15ක
* පළාත් මහ රෝහල් 03ක
* දිස්ත්‍රික් මහ රෝහල් 18ක
* මූලික රෝහල් 72ක සහ
* ජාතික වෘක්කවේද කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ මධ්‍යස්ථානය, මාලිගාවත්ත.

ඊට අමතරව ශ්‍රී ලංකා ජාතික රෝහල, මහනුවර ශික්ෂණ රෝහල, කරාපිටිය ශික්ෂණ රෝහල, අනුරාධපුර ශික්ෂණ රෝහල, ජාතික වෘක්කවේද

[ගරු ලලිත් දිසානායක මහතා]

කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල යන ආයතනවල වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය විට විශේෂ ප්‍රතිකාර පහසුකම් සපයා ඇත. පෞද්ගලික රෝහල් 7ක පමණ ද මෙවැනි විශේෂ ප්‍රතිකාර පහසුකම් ඇත.

(ii) ශ්‍රී ලංකා ජාතික රෝහල - වාට්ටු 02 (ඇඳන් 55)

මහනුවර ශික්ෂණ රෝහල - වාට්ටු 02 (ඇඳන් 55)

(iii) ඉහත සඳහන් කර ඇති ශ්‍රී ලංකා ජාතික රෝහල, මහනුවර ශික්ෂණ රෝහල, කරාපිටිය ශික්ෂණ රෝහල, අනුරාධපුර ශික්ෂණ රෝහල, ජාතික වෘක්කවේද කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ මධ්‍යස්ථානය සහ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල යන ආයතනවල ශල්‍යාකර්මවලින් පසු වකුගඩු රෝගීන් රඳවා ගැනීමේ පහසුකම් සපයා ඇත. මේ යටතේ දැඩි සත්කාර ඒකක සහ අවශ්‍ය අනෙකුත් ප්‍රතිකාර පහසුකම් ඇත.

(iv) වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය ඖෂධ ප්‍රමාණවත්ව සැපයීමට වෛද්‍ය සැපයුම් අංශය කටයුතු සලසා ඇති අතර සමහර මිල අධික ඖෂධ රෝගීන්හට ලබා දීම සඳහා ජනාධිපති අරමුදල ඔස්සේ කටයුතු යොදා ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ලෝක සෞඛ්‍ය සංවිධානය රුපියල් මිලියන 70ක් වැය කර අතුරු වාර්තා තුනකුත් ඊයේ පෙරේදා අවසන් වාර්තාවත් එළි දැක්වූවා. එයින් පෙන්වූවා, උතුරු මැද පළාත කේන්ද්‍ර කර ගත් වයස අවුරුදු 15ත්-70ත් අතර සියයට 15කට බරපතළ වකුගඩු රෝගයක් වැලඳී තිබෙනවාය කියා. මේ වාගේ බරපතළ ප්‍රශ්නයක් උද්ගත වී තිබියදීත් සෞඛ්‍ය අමාත්‍යාංශය නිදාගැලී මන්දගාමී ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ ඇයි කියා මම අහන්න කැමැතියි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය කිසිම දවසක නිදාගැලීව ඉඳලා නැහැ. ඔබතුමා සෞඛ්‍ය නියෝජ්‍ය ඇමති වෙන්න කලින් -2000දී- මහනුවර රෝහලේ වකුගඩු ඒකකය ආරම්භ කළේ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාව එන්න කලිනුයි. වාර්තාව කොටස් තුනකින් තමයි දීලා තිබෙන්නේ. නමුත් මේකට ස්ථීර හේතු කාරකයක් කියලා නැහැ, ගරු කථානායකතුමනි. අපි නිදා සහගතව ඉන්නේ නැහැ. දැන් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ උතුරු මැද ප්‍රදේශයේ විශේෂ වූ ප්‍රතිකාර සඳහා අවශ්‍ය කටයුතු කර ගෙන යනවා. මේවා සොයා ගැනීම සඳහාත් අවශ්‍ය කටයුතු කර ගෙන යනවා. මේ ප්‍රතිකාර ක්‍රමය පටන් ගත්තේ අද ඊයේ නොවෙයි. මහනුවර රෝහලේ රුධිර පිරිසිදු කිරීමේ dialysis යන්ත්‍ර 28ක් තිබෙනවා; කොළඹ 17ක් තිබෙනවා. ඒ වාගේම මාලිගාවත්ත 16ක් තිබෙනවා. මේ විධියට ගත්තාම රෝහල් 15ක පමණ මේ සියලු පහසුකම් ලබා දී තිබෙනවා. එක දවසකට dialysis machinesවලින් රෝගීන් 5,000කට පමණ ප්‍රතිකාර ලබා දෙනවා. ගරු කථානායකතුමනි, මෙම ප්‍රතිකාරය පෞද්ගලිකව කරනවා නම් මේ සඳහා එක රෝගියෙක් රුපියල් 7,500ක් වැය කරන්න ඕනෑ. මේ ඔක්කොම ලබා දෙන්නේ නොමිලේ. මේ රෝගීන්ට බෙහෙත් වර්ග විශාල ප්‍රමාණයක් දෙන්න ඕනෑ. මේවා ඉතාම මිල අධිකයි. මේ රෝගීන් සඳහා අවශ්‍ය කරන ඉතා මිල අධික බෙහෙත් අපි ලබා දෙනවා. අපි නිදාගැලීවී නැහැ. ඉතාම හොඳින් නිදහස් සෞඛ්‍ය සේවාවක් මේ රෝගීන් සඳහා ලබා දීමට අප කටයුතු කරනවා. මේ ගැන පළාත් සභාව ඒ වාගේම අන්තර් අමාත්‍යාංශ -කෘෂිකර්ම අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය- සියල්ල එකතු වෙලා කටයුතු කරනවා.

ලෝක සෞඛ්‍ය සංවිධානය වාර්තාව දුන්නේ අංශ - stages - තුනකින්. ඒ අනුව අපි කටයුතු කරලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පැහැදිලියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මගේ දෙවන අතුරු ප්‍රශ්නය. ගරු කථානායකතුමනි, මේක බොහොම සංවේදී ප්‍රශ්නයක්. ඒ නිසා ඒ සඳහා මම ඔබතුමාගේ සහයෝගය ඉල්ලා සිටිනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සහයෝගය දෙන්නම්. අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කෙටියෙන් අහන්නම්.

ගරු කථානායකතුමනි, ජාතික රෝහලට මසකට වකුගඩු රෝගීන් 2,500ක් පැමිණෙනවා. අපේ ජාතික රෝහලට පැමිණෙන වකුගඩු රෝගීන්ගෙන් එක් අයෙක් එක දවසකට නැති වෙනවා -මැරෙනවා-. මාසයකට තිස් දෙනෙක් නැති වෙනවා. හැබැයි, ජාතික රෝහලේ වකුගඩු රෝගීන් සඳහා කැප වූ වාට්ටුවක් නැහැ. ඔක්කොම කරන්නේ කායික වාට්ටුවේයි.

ඒ වාගේම එතුමා කථා කළා, රුධිර කාන්දුකරණ යන්ත්‍ර - hemodialysis machines - ගැන.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න, ඔබතුමාගේ දැනුම ප්‍රදර්ශනය කරන්නේ නැතුව.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
රටේම අවශ්‍යතාව රුධිර කාන්දුකරණ යන්ත්‍ර 1,000යි. නමුත් අපේ රටේ තිබෙන්නේ යන්ත්‍ර 170යි. දැයට ලැම්බෝගිනි කිරුළක් සඳහා රුපියල් කෝටි 1,200ක් වැය කරන කොට වකුගඩු රෝගීන්

සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් කරන්නේ නැත්තේ ඇයි කියලා මම ගරු සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, දැනට මේ රටේ සිටින රෝගීන් සඳහා අවශ්‍ය dialysis machines ප්‍රමාණය තිබෙනවා. කිසිම රෝගියෙකුට එම සේවාව පෞද්ගලිකව ලබා ගන්න අවශ්‍යතාවක් නැහැ. සමහරු පහසුව සඳහා පෞද්ගලික සේවාවක් ලබා ගන්නට යන්න පුළුවන්. රුධිර කාන්දුකරණය සිදු කිරීමට රුපියල් 7,000ක් පමණ වැය වනවා. දැන් මම කිව්වා. ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් හිතට ගන්න. මහනුවර, කොළඹ, මාළිගාවත්ත, ගාල්ලේ කරාපිටිය, කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, මඩකළපුව, මහියංගණය, මොනරාගල සහ යාපනය වැනි රෝහල් තිබෙන ප්‍රදේශවලින් ප්‍රධානවම මේ රෝගීන් සම්බන්ධයෙන් කොළඹටත් වැඩිය කටයුතු කරන රෝහල වන්නේ මහනුවර රෝහලයි. මේ මන්ත්‍රීතුමා කියන ආකාරයට වකුගඩු සැත්කම් සම්බන්ධයෙන් පොරොත්තු ලේඛනවල රැඳී සිටින්න අවශ්‍ය නැහැ. ඒ සැත්කම් කරනවා. විශේෂඥ වෛද්‍ය සේවාවන් පටන් ගෙන තිබෙනවා. දැන් අනුරාධපුරය රෝහලටත් විශේෂඥ වෛද්‍යවරයෙක් දාලා ශල්‍යාකර්ම කරන්න අවශ්‍ය පහසුකම් දීලා තිබෙනවා. ඒ නිසා මේ මන්ත්‍රීතුමා කියනවා වාගේ ඒ යන්තු 1,000ක් අපේ රටට අවශ්‍ය නැහැ. මෙතුමාට වැරදි තොරතුරු දීලායි තිබෙන්නේ. ඒ නිසා ඔබතුමා මේක පැහැදිලි කර ගන්න. දැනට ඉන්නා වකුගඩු රෝගීන් සඳහා රුධිර කාන්දුකරණය -dialysis- සඳහා අවශ්‍ය පහසුකම් සියල්ල තිබෙනවා. කිසි කෙනෙක් මුදල් ගෙවලා කරන්න ඕනෑ නැහැ. ඒ සියලු පහසුකම් ටික අපි සෞඛ්‍ය අමාත්‍යාංශයට සපයලා තිබෙනවා. තමුන්නාන්සේට වැරදි තොරතුරක් දීලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මම අහනවා. ගරු කථානායකතුමනි, මෙතුමාගේ පිළිතුරෙන් එතුමා ප්‍රකාශ කළා, ප්‍රමාණවත් බෙහෙත් තිබෙනවායි කියලා. මේ මොහොතේ -මේ තත්පරයේ- ජාතික රෝහලේ වකුගඩු රෝගීන්ට අවශ්‍ය Simulect බෙහෙත නැහැ. එක vial එකකට රුපියල් 1,50,000ක් වැය වනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තිබෙනවාද, නැද්ද කියා ඇහුවා නම් ඇති.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම වගකීමෙන් කියන්නේ. Mircera කියන බෙහෙත නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ මොහොතේ දුරකථනයෙන් කථා කර check කරන්න. රෝහලට කථා කරලා check කරන්න. බොරු නම් මා ඒ වගකීම භාර ගන්නවා. Simulect කියන බෙහෙත නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාත් ප්‍රතිකාර ගන්නවාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා අහන්න කැමැතියි තමුන්නාන්සේගෙන් කොළඹ රේස් පදින්න කෝටි ගණනක් මුදල් වැය කරන මොහොතේ, ඇයි මේ බෙහෙත් වෙනුවෙන් ප්‍රමාණවත් මුදලක් වෙන් කරන්නේ නැත්තේ?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, එතුමා ලැම්බෝගිනි ගැන කියනවා. මෙතුමා ජනාධිපතිවරයෙකුගේ පුතෙකු විධියට හිටපු කාලයේ photos ගහන්න ගියේ STF එක දා ගෙන. අතීතය අමතක කරන්න එපා. ඒක මේ රටේ ජනතාව දන්නවා. මා එදාත් කිව්වා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒක කියන්න ඕනෑ. ලැම්බෝගිනි ගැන කථා කරන කොට අපිත් කියනවා. අපේ ජනාධිපතිතුමා, අපේ අය ආරක්ෂා කරන්න අපි කථා කරනවා. මෙතුමා හිටපු ජනාධිපතිවරයෙකුගේ පුතෙක්. ඒ කාලයේ STF එක දා ගෙනයි කැලේ ගිහිල්ලා photos ගැහුවේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒක තේරුම් ගන්න. අපේ ජනාධිපතිතුමා,- [බාධා කිරීම්] ඔබතුමා තේරුම් ගන්න. අපේ ජනාධිපතිතුමා එංගලන්තයට අරගෙන ගියේ නැහැ ගෙදර තිබුණු බඩු; බිත්තියේ එල්ලපු පින්තූර.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, සමහර වෙලාවට ඒවාට ආදේශක වෙනත් බෙහෙත් ඇති.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති ඔබතුමාගේ තාත්තා යන කොට අරගෙන ගිය ඒවා.

ශාසනාරක්ෂක බල මණ්ඩල : මූල්‍ය ප්‍රතිපාදන
`சாசனாரக்ஷக்க' சபைகள் : நிதி ஏற்பாடுகள்
SASANARAKSHAKA BALAMANDALAYAS : FINANCIAL PROVISION

2489/'12

14. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) දිවයින පුරා ඇති ශාසනාරක්ෂක බල මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එක් එක් ශාසනාරක්ෂක බල මණ්ඩලය වෙත මුදල් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු යොදා තිබේද;

(iii) එසේ නම්, 2010 වර්ෂයේ සිට මේ දක්වා ලබාදී ඇති මුදල් ප්‍රතිපාදන වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශාසනාරක්ෂක බල මණ්ඩලය නමින් හෝ එයට සමාන නමකින් හෝ අරමුදලක් ආරම්භ කිරීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එම අරමුදල සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගන්නා ආකාරය කවරේද;

(iii) එම අරමුදලේ අභිප්‍රායන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) நாடு பூராகவுள்ள `சாசனாரக்ஷக்க' சபைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) ஒவ்வொரு `சாசனாரக்ஷக்க' சபைக்கும் நிதி ஏற்பாடுகளை மேற்கொள்ள நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறாயின் 2010ஆம் ஆண்டு தொடக்கம் இதுவரை வழங்கப்பட்டுள்ள வருடாந்த நிதி ஏற்பாடுகள் வெவ்வேறாக எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) `சாசனாரக்ஷக்க' சபை எனும் பெயரில் அல்லது அதனையொத்த ஒரு பெயரில் நிதியமொன்றை ஆரம்பிக்க நடவடிக்கை மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின் இந்நிதியத்துக்கு நிதி ஏற்பாடுகளைப் பெற்றுக்கொள்ளும் முறை யாது என்பதையும்;

(iii) நிதியத்தின் நோக்கங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) the number of Sasanarakshaka Balamandalayas functioning in the island;

(ii) whether arrangements have been made by now to make financial provisions for each Sasanarakshaka Balamandalaya; and

(iii) if so, separately the financial provisions made annually from year 2010 to date ?

(b) Will he inform this House -

(i) whether arrangements have been made to establish a fund in the name of Sasanarakshaka Balamandalaya or a similar name;

(ii) if so, the manner in which financial provisions will be obtained for the aforesaid fund; and

(iii) of the objectives of the aforesaid fund ?

(c) If not, why?

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒ ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශාසනාරක්ෂක බල මණ්ඩල සංඛ්‍යාව - 312යි.

(ii) ඔව්.

(iii) 2010 වර්ෂයේදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩල සඳහා කැපැල්, ගමන් වියදම් හා මුද්දර ගාස්තු වශයෙන් රුපියල් 4,590,000.00යි.

2011 වර්ෂයේදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩල සඳහා කැපැල්, ගමන් වියදම් හා මුද්දර ගාස්තු වශයෙන් රුපියල් 4,635,000.00යි.

2012 වර්ෂයේදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩල සඳහා කැපැල්, ගමන් වියදම් හා මුද්දර ගාස්තු වශයෙන් රුපියල් 4,574,375.00යි.

(ආ) (i) ඔව්.

(ii) දහම් පාසල් කොඩි අළෙවියෙන් සහ ගරුතර ස්වාමීන් වහන්සේලාගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන්.

(iii) සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සහ උන්නතිය සඳහාත් භික්ෂූන් වහන්සේලාගේ හා බෞද්ධ ප්‍රජාවගේ සුබසාධනය.

(ඇ) අදාළ නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා දුන්නු පිළිතුර අනුව ශාසනාරක්ෂක බල මණ්ඩල 312ට 2010 වර්ෂයේදී වියදම් කරලා තිබෙන්නේ රුපියල් ලක්ෂ 45යි. මේ ශාසනාරක්ෂක බල මණ්ඩලයකට පන්සල් තිබෙනවා-

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)

4,590,000ක මුදලක් වෙන් කර තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමා වැඩි කරන්න උත්සාහ කරනවා. නමුත් ඔබතුමාට එහෙම කරන්න දෙන්නේ නැහැ. ඒකයි වැඩේ.

ගරු කථානායකතුමනි, ගණන් හදලා බැලුවාම සාමාන්‍යයෙන් අපේ පඬුවස්නුවර ආසනය වාගේ ආසනයක ශාසනාරක්ෂක බල මණ්ඩලයට සාමාන්‍යයෙන් පන්සල් 80ක් විතර තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. එච්චර වෙන්නේ නැහැ. ලක්ෂ එකහමාරක් විතර තමයි ඒ මුළු විහාරස්ථානවලට වියදම් කරන්නේ. මේ ශාසනාරක්ෂක බල මණ්ඩලවල විශාල ප්‍රශ්න තිබෙනවා. ඔබතුමාත් මේ සම්බන්ධව දන්නවා. මම අහන්න කැමැතියි, මේ මුදල මීට වඩා වැඩි කරලා දෙන්න පුළුවන්ද කියලා. අපේ බුද්ධාගමේ චිරස්ථිතිය පිණිස වැඩ කරන ආණ්ඩුවක් විධියට හැම වේලාවේම කථා කරන ඔබතුමන්ලාට ශාසනාරක්ෂක බල මණ්ඩලවලට ලක්ෂ එකහමාරට වඩා වැඩියෙන් දෙන්න බැරිද?

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ගරු කථානායකතුමනි, ඒ ලක්ෂ එකහාමර දෙන්නේ ශාසනාරක්ෂක බල මණ්ඩලවලට නොවෙයි. ලක්ෂ එකහමාර දෙන්නේ දහම් පාසල්වලට පමණයි. දහම් පාසලක උපකරණ සඳහා 50,000කුත්, දහම් පාසලේ ගොඩනැඟිලි සඳහා ලක්ෂයකුත් දෙනවා. ඊට අමතරව ශාසනාරක්ෂක බල මණ්ඩලවල පන්සල්වලට බුද්ධ ශාසන අරමුදලින්, බුද්ධ ශාසන අමාත්‍යාංශයේ මුදලින්, ජනාධිපති අරමුදලින් ඒ ආදී විධියට විශාල වශයෙන් මුදල් ලබා දෙනවා. ඒ වාගේම දැයට කිරුළ යටතේත් ගෞරවනීය ස්වාමීන්වහන්සේලා සෑහීමකට පත් වෙන විධියට අපි විහාරස්ථානවල අවශ්‍යතාවන් ඉටු කරලා තිබෙනවා. අපි දහම් පාසල්වලට පොත් පත් ලබා දෙනවා. ඒ වාගේම දහම් පාසල් ගුරුවරුන්ට පත් වීම් ලබා දීලා තිබෙනවා. ඒ අයට වේතන ගෙවනවා. නිල ඇඳුම් ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ කටයුතු කර ගෙන යනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වේතනයක් නම් ගෙවන්නේ නැහැ. ඔබතුමා බුද්ධ ශාසන නියෝජ්‍ය ඇමතිතුමා විධියට "මුසාවාදා" කියනවා. එහෙම වේතනයක් ගෙවන්නේ නැහැ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
දහම් පාසල් ගුරුවරුන්ට පුස්තකාල දීමනාව හැටියට දීමනාවක් ගෙවනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඒක තමුන්නාන්සේ දන්නේ නැත්නම් හරියට අහගන්න. [බාධා කිරීම්] ගෙවනවා. මේ අය දන්නේ නැහැ. [බාධා කිරීම්] පුස්තකාල දීමනාව හැටියට රුපියල් 2,000ක මුදලක් දෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක පුස්තකාල දීමනාව.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඔව්, ඒක තමයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක වේතනයක් නොවෙයි.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
වේතනයක් දෙන්න බැහැ. ඒකට ක්‍රමයක් තිබෙන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය මෙයයි. මේ පුස්තකාල දීමනාව වේතනයක් -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්නය මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දහම් පාසල්වලට දෙන පුස්තකාල දීමනාව ගුරුවරුන්ට දෙන වේතනයක් බවට එතුමා පරිවර්තනය කර තිබෙන්නේ කොහොමද?

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
අනික් කාරණය, දහම් පාසල් ගුරුවරු වේතනයක් බලාපොරොත්තු වන්නේ නැහැ, තමුන්නාන්සේ ඔවුන් අවුස්සන්න හැදුවාට. ඒ ගොල්ලෝ ඒ කටයුත්ත කරන්නේ ස්වේච්ඡාවෙන්. ඒ කරන සේවාව වෙනුවෙන් තමයි ඒ ගොල්ලන්ට ගෙවන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දැන් ඇති. එයට පිළිතුර "ස්වේච්ඡාවෙන්" කියන එකයි. තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේකයි මා කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් වෙලාව අවසානයි. ඊළඟ ප්‍රශ්නයට යනවා. ප්‍රශ්න සඳහා වෙන් කර තිබෙන කාලය අවසානයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ. මේ තුන්වන අතුරු ප්‍රශ්නයයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ නොවෙයි. මා මේ සභාවේ කාලය පාලනය කරන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බුද්ධ ශාසනය භාර ඇමතිතුමාත් "මුසාවාදා" කියන කොට අපි මොකද කරන්නේ? එතුමා කිව්වා, වේතනයක් ගෙවනවා කියලා. දැන් කියනවා, වේතනයක් ගෙවන්නේ නැහැයි කියලා.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
දීමනාවක් ගෙවනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ චේතනයක් නොවෙයි, පුස්තකාල දීමනාවක් ගෙවන්නේ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඒක තමයි. පුස්තකාල හෝ එය දීමනාවක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ගුරුවරු පුස්තකාල දීමනාව චේතනයක් කර ගන්නේ නැහැ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
"චේතනයක්" කියා වැරැදීමක් වුණා. එයට සමා වන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා අහන්නේ මීට වඩා උදවු කරන්න කැමැති නැද්ද කියලායි.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඔබතුමන්ලාගේ කාලයේ මොනවත් දුන්නේ නැහැ නේ අනේ!

ලියා පදිංචි ඡන්දදායකයන් : විස්තර
பதிவுசெய்யப்பட்டுள்ள வாக்காளர்கள் : விபரம்
REGISTERED VOTERS : DETAILS

2822/'12

15.ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මුළු ජනගහනය කොපමණද;

(ii) වයස අවුරුදු 18 වැඩි ජනගහනය කොපමණද;

(iii) වයස අවුරුදු 18 වැඩි ජනගහනය අතරින් ලියා පදිංචි ඡන්ද දායකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඡන්ද බලය අහිමි කරන ලද සහ අඛණ්ඩව ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ඡන්ද දායකයන් විශාල සංඛ්‍යාවක් සිටින බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඡන්ද හිමි නාම ලේඛනය යාවත්කාලීන කිරීම වර්ෂයේ ජූනි මස පළමුවැනි දින සිට ජූලි මස තිස්එක්වැනි දින තෙක් කාලයට සීමා කරනු වෙනුවට එය වර්ෂය පුරා සිදු කිරීමට අවස්ථාව සැලසිය හැකිද;

(ii) ඡන්දය ප්‍රකාශ කිරීම අනිවාර්යෙන්ම සිදු කළ යුතු කටයුත්තක් බවට පත් කිරීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் மொத்த சனத்தொகையினையும்;

(ii) 18 வயதிற்கு மேற்பட்டோரின் சனத்தொகையினையும்;

(iii) 18 வயதிற்கு மேற்பட்ட சனத்தொகையினரில் பதிவு செய்யப்பட்டுள்ள வாக்காளர்களின் எண்ணிக்கையினையும்

அவர் இச்சபைக்கு அறியத் தருவாரா?

(ஆ) வாக்குரிமை அகற்றப்பட்டவர்களாகவும், கிரமமாக வாக்களிக்க முடியாமலும் அதிகமான வாக்காளர்கள் இருக்கின்றனர் என்பதை அவர் அறிவாரா?

(இ) (i) வாக்காளர் இடாப்புக்களின் இற்றைப்படுத்தலை ஒவ்வொரு வருடத்தினதும் யூன் 1 முதல் யூலை 31 வரையான காலப்பகுதிக்கு மட்டுப் படுத்தாமல் அதனை வருடம் முழுவதும் செய்வதற்கு அனுமதிக்கப்படுமா என்பதையும்;

(ii) வாக்களிப்பதை ஒரு கட்டாயமான செயற் பாடாக மாற்றுவது சாத்தியமா என்பதையும்

அவர் கூறுவாரா?

(ஈ) இன்றேல் ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) the total population of Sri Lanka;

(ii) the population over the age of 18 years; and

(iii) the number of registered voters out of the population over the age of 18 years?

(b) Is he aware that there are lot of voters who have been disenfranchised and have not been able to vote regularly?

(c) Will he state -

(i) whether updating the register of voters could be allowed throughout the year instead of constraining it for 1st June to 31st July of a year; and

(ii) whether it is possible to make voting a compulsory exercise?

(d) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2012 වර්ෂයට 20,263,723යි. (විසිමිලියන දෙසිය හැටතුන්දහස් හත්සිය විසිතුනයි.)

(ii) 2012 වසරේ පැවැත්වූ ජන හා නිවාස සංගණනයේ, සංගණන තොරතුරු පරිලෝකනය කිරීම අවසන් වූ පසු අවුරුදු 18ට වැඩි ජනගහනය ලබා දිය හැකි අතර දැනට ලබා දී ඇත්තේ 2001 සංගණනයේ දත්ත පදනම් කර ගෙන ඇස්තමේන්තු කර ඇති ජනගහනයයි. ඒ අනුව 2012 වර්ෂයට ඇස්තමේන්තුගත අවුරුදු 18ට වැඩි ජනගහනය 13,780,000කි. (දහතුන්මිලියන හත්සිය අසූදහසකි.)

(iii) 2012 වර්ෂයට 14,451,263යි. (දහහතරමිලියන හාරසිය පස්එක්දහස් දෙසිය හැටතුනයි.)

(ආ) * ඡන්ද දායකයන්ගේ ඡන්ද බලය අහිමි කරන්නට කිසිවකුට බලයක් නොමැත.

* 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියා පදිංචි කිරීමේ පනතේ විධිවිධාන මඟින් ශ්‍රී ලංකාවේ ඡන්ද බලය හිමි වන පුද්ගලයන් කවුරුන්දැයි නීතියේ පැහැදිලි කර ඇත.

* එම පනතෙහි විධිවිධාන ප්‍රකාර වාර්ෂිකව මැතිවරණ කොමසාරිස්වරයා විසින් කරනු ලබන මහ පෙන්වීම අනුව, ඡන්ද බලය හිමි තැනැත්තෙක් ඡන්ද නාම ලේඛනයට නම ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

* ඒ අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකුට ඡන්ද බලයට හිමිකමක් ඇතත් ඡන්ද හිමියකු ලෙස ලියා පදංචි වීමේ අවස්ථාව අහිමි වන්නේය.

* ඉහත කරුණු අනුව ඡන්ද බලය හිමි පුද්ගල සංඛ්‍යාවට වඩා ඡන්ද හිමි නාම ලේඛනයේ ඇතුළත් ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව අඩු වේ.

(ඇ) (i) සෑම වසරකම ජූනි මස පළමුවන දින සිට ඡන්ද හිමි නාම ලේඛනයට නම ඇතුළත් කිරීමේ කටයුතු ආරම්භ කළද, ගණන් ගැනීමේ ප්‍රදේශවල විශාලත්වය අනුව එම කටයුතු ඔක්තෝබර් මස අවසානය දක්වාම සිදු කරනු ලැබේ. එසේම අදාළ කාල සීමාව තුළ තොරතුරු ඉදිරිපත් කර ලියා පදිංචිවීමට නොහැකි වූවන්ට නොවැම්බර්, දෙසැම්බර් මාසවල තොරතුරු ඉදිරිපත් කර ලියා පදිංචිවීමට හැකියාව ඇත. එසේම දිස්ත්‍රික් ලියා පදිංචි කිරීමේ නිලධාරීන් වෙත අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමෙන්ද ඡන්ද හිමි නාම ලේඛනයට නම ඇතුළත් කර ගැනීමට අවස්ථාව සලසා ඇත.

(ii) ඡන්ද හිමියන්ට ශ්‍රී ලංකාවේ ඡන්ද විමසීමකදී ඡන්දය ප්‍රකාශ කිරීම අනිවාර්ය කර නොමැත. එසේ ඡන්දය ප්‍රකාශ කිරීම අනිවාර්ය කිරීම සඳහා කටයුතු කිරීමක් සිදු වී නැත.

ඡන්දයක් ප්‍රකාශ කිරීම හෝ ඡන්දය ප්‍රකාශ නොකිරීම ඡන්ද දායකයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් බව සඳහන් කරන්න කැමැතියි.

(ඈ) අදාළ නොවේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, තිබෙන නීතිය අනුව තමයි ඔබතුමා අපට උත්තරය ලබා දුන්නේ. නමුත් ඔබතුමා සභාපති ධුරය දැරූ මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ විශේෂ කාරක සභාවේ වාර්තාව තුළින් නිර්දේශ කර තිබෙන දේ මේ පිළිතුරට ඇතුළත් කරලා නැහැ. මම කියන්නේ, අද කොළඹ දිස්ත්‍රික්කයේ සිටින බව කියන 1,500,333ක් වන ඡන්ද දායකයන් ප්‍රමාණය ඇත්ත වශයෙන්ම 1,900,000ක් විය යුතුයි. බොහෝ තැන්වල සුළු ජාතිකයන් ලියා පදිංචි වෙලා නැහැ. මම නියෝජනය කරන උතුරු කොළඹ කොට්ඨාසයේ අඩු ගණනේ 8,000ක් පමණ ලියාපදිංචි වෙලා නැහැ. මුස්ලිම් අය 7,000ක් පමණ ලියා පදිංචි වෙලා නැහැ. බැරි වෙලාවත් ඒ ලියා පදිංචි කිරීම කරන මාසයේ ඒ තැන්වල ඒ අය හිටියේ නැත්නම් ඔය ප්‍රශ්නය ඉස්මතු වනවා. ඒ නිසා තමයි මම කිව්වේ ලියා පදිංචි කිරීමේ කටයුතු මාසයකට සීමා කරන්නේ නැතිව open registers තියන්න කියලා. එසේ කරන්න බැරි ඇයි? අද සියලු දේම computerize කරලා තිබෙන අවස්ථාවක ඇයි අපි මේ ගල් යුගයේ ජීවත් වන්නේ? මම මීට පෙර electronic voting system එක ගැන ප්‍රශ්නයක් අහපු නිසා මම මීට වැඩිය ඒ ගැන අහන්නේ නැහැ. නමුත් අපට ඉදිරියට යන්න බැරි ඇයි? මේ නිසා ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා අහන්නේ අපි rocket scienceවලට යන්නේ නැත්තේ මොකද කියලායි. ඒ යුගයට අපි ගමන් කරමින් සිටිනවා. අපි නිර්දේශ කළ පරිදි, ඡන්ද නාම ලේඛනය විවෘත කිරීම, ඕනෑම අවස්ථාවකදී ලියා පදිංචිවීමට හැකිවීම, නම් ඉවත් කිරීම කියන කාරණාවලට ඉදිරියේදී අවධානය යොමු කරනවා. ඒ වාගේම ලංකාවේ ලියා පදිංචි වන්න පුළුවන් එක තැනක පමණක් බවත් නීතියේ තිබෙනවා.

ස්ථාන ගණනාවක ලියා පදිංචි වෙන්න බැහැ. මේ ගැටලුව තමයි ඔබතුමාගේ උතුරු කොළඹ ජනතාව මුහුණ දෙන ප්‍රධානම ගැටලුව. එක තැනක පමණයි කෙනෙකුට ලියා පදිංචි විය හැක්කේ. මැතිවරණ කොමසාරිස්තුමා පරිගණකයෙන් හොයා ගෙන පසු ගිය වතාවේ ඒවා නිවැරදි කළ බව ඔබතුමා දන්නවා. හෝමාගම නම් 8,000ක් ඡන්ද ලැයිස්තුවෙන් අයින් කළා, තව තැනක ලියා පදිංචි වෙලා හිටපු නිසා. මැද කොළඹ අය තව තැනක ලියා පදිංචි වෙලා හිටපු නිසා ඡන්ද දහස් ගණනක් අයින් කරන්න සිද්ධ වුණා. ඒවා ඔබතුමන්ලා දන්නා දේවල්. අප ඒවා දැනගෙන හිටියේ නැහැ. ඔබතුමන්ලා දන්න දේවල් නිසායි මෙහෙම සිද්ධ වුණේ. ඒවා සුද්ධ කරන්න සිදු වුණේත් ඒ නිසායි. දෙතුන් තැනක ලියා පදිංචි වෙලා ඡන්ද පාවිච්චි කරනවා ගරු කථානායකතුමනි. ඒ යුගය ඉවර කරන්න ඕනෑ. ඒකයි අපේ රජයේ ක්‍රියාදාමය. ඒ අනුව එක ඡන්දයක් පමණයි එක් කෙනෙකුට හිමි වන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා දුන්නු උත්තරය මේ ප්‍රශ්නයට බොහොම උදවු වෙනවා. කොළඹ නගර සභාව අපි දිනුවේ එහෙම සුද්ද කරපු නිසායි. ඔබතුමන්ලා තමයි අවුරුදු 18ක් මේ වාගේ වංචා කර කර හිටියේ. මෙය ඉතාම වැදගත් ජාතික ප්‍රශ්නයක්. ඡන්ද ප්‍රතිඵල සහ ඡන්දය සම්බන්ධයෙන් ජනතාවගේ විශ්වාසය නැත්තටම නැති වෙලා තිබෙන අවස්ථාවකයි මා මේ ප්‍රශ්නයක් ඇහුවේ. මේ වාගේ මේ රටේ තිබෙන ප්‍රශ්න නිසා මීට වැඩිය විශ්වාසයක් ඇති කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න ඕනෑ. ලක්ෂ 210ක ජනගහනයක් ඉන්නවා, එයින් ඡන්ද දායකයන් -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔය ඇති.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඇයි ඉතුරු ලක්ෂ 20 ලියා පදිංචි කරලා නැත්තේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මැතිවරණ නීතිය හදලා තිබෙන්නේ පාර්ලිමේන්තුවෙන් ගරු කථානායකතුමනි. ඒ නීති අනුගමනය කරන්න මැතිවරණ කොමසාරිස් බැඳී සිටිනවා. මැතිවරණ ලැයිස්තුවට හිතෙන හිතෙන විධියට ඡන්ද දායකයන් ඇතුළු කරන්න බැහැ. ඡන්ද දායකයා දැන ගන්න ඕනෑ, ඒ පෝරමය ලැබුණාම ඒක පුරවලා භාර දෙන්න. ඔහුගේ නම ඡන්ද නාම ලේඛනයේ නැත්නම් ආපසු ඇතුළු කර ගන්න අවස්ථාව තිබෙනවා. ඒකටත් උනන්දුවක් දක්වන්නේ නැති නිසා තමයි මේ ගැටලුව මතු වෙලා තිබෙන්නේ. නමුත් ඔබතුමා කියපු දේ පිළිබඳව අප සාකච්ඡා කරලා තිබෙනවා. අප නිර්දේශ කළේ, එක වරක් ලංකාවේම ඡන්දදායක ලැයිස්තුවක් හදන්නත්, මිය යන අය පසුව අයින් කරන්නත්, නියමිත වසයට එන අලුත් අය ඇතුළු කරන්නත්. එතකොට මේ කාරණය අවුරුද්දට කිහිප සැරයක් කරන්න ඕනෑ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කවදාද ඒක කරන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක මැතිවරණ කොමසාරිස්තුමා කරයි. It is a good proposal. We all must get together and implement it.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා කවදාද කරන්නේ කියලා?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ආණ්ඩුවට ආවාට පස්සේ අපි ඒක කරනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආපු විගස අපි ඒක කරනවා. අපි ඒ පොරොන්දුව දෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය. ප්‍රශ්න අංක 6-3141/'12-(1), ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7-3166/'12-(1), ගරු ඊ. සරවනපවන් මහතා.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
ගරු කථානායකතුමනි, ගරු ඊ. සරවනපවන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)
ගරු කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් ලබා දිය යුතු නිසා මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
இலங்கை ஐக்கிய கிறிஸ்தவ நட்புரிமை (கூட்டிணைத்தல்) சட்டமூலம்
UNITED CHRISTIAN FELLOWSHIP OF SRI LANKA (INCORPORATION) BILL

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.

ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஸ்ரீ பாலாபிவூர்தி வர்தன சமிதிய (கூட்டிணைத்தல்) சட்டமூலம்
SRI BALABHIVURDHI WARDANA SAMITHIYA (INCORPORATION) BILL

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services for report.

ක්‍රීඩා පනත : නියෝග
விளையாட்டுக்கள் சட்டம் : ஒழுங்குவிதிகள்
SPORTS LAW : REGULATIONS

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [මාර්තු 05]

ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது. சம்பந்தப்பட்ட வினா - [மார்ச் 05]

Order read for resuming Adjourned Debate on Question - [05th March]

"ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.02.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." - [ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

"தேசிய அரசுப் பேரவையின் 1973ஆம் ஆண்டின் 25ஆம் இலக்க விளையாட்டுக்கள் சட்டத்தின் 31ஆம் பிரிவுடன் சேர்த்துவாசிக்கப்படும் அச்சட்டத்தின் 41ஆம் பிரிவின் கீழ் விளையாட்டுக்கள் அமைச்சரினால் ஆக்கப்பட்டு 2013 சனவரி 15ஆம் திகதிய 1793/3ஆம் இலக்க அதிவிசேட வர்த்தமானப் பத்திரிகையில் பிரசுரிக்கப்பட்டதும் 2013.02.21ஆம் திகதி சமர்ப்பிக்கப்பட்டதுமான ஒழுங்குவிதிகள் அங்கீகரிக்கப்படுமாக" - [மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே]

"That the Regulations made by the Minister of Sports under Section 41 read with Section 31 of the Sports Law No. 25 of 1973 and published in the Gazette Extraordinary No. 1793/3 of 15th January 2013, which were presented on 21.02.2013, be approved." - [The Hon. Mahindananda Aluthgamage]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.
வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.
Question again proposed.

[අ.භා. 2.07]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු කථානායකතුමනි, මෙය ක්‍රීඩාව කෙරෙහි විශේෂ අවධානය යොමු වන අවස්ථාවක්. ක්‍රීඩා ඇමතිතුමා ප්‍රකාශ කළ ආකාරයට මෙය හොඳ යෝජනාවක් කියලායි මා හිතන්නේ. ක්‍රීඩාවට පමණක් නොවෙයි, රටේ පාලකයන්ට පවා උදාහරණයකට ගන්න පුළුවන් කාරණයක් ගැන තමයි අද අප කථා වන්නේ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් මෙහිදී මාතෘකාවට භාජන වී තිබෙන්නේ conflict of interest සහ විනිවිදභාවයයි. ජාතික ක්‍රීඩා සංගම්වල තනතුරුවලට පත් වන්න පුළුවන් මොන මොන පුද්ගලයන්ටද, මොන මොන පුද්ගලයන් එකී තනතුරුවලට පත් නොවිය යුතුද යන්න සම්බන්ධයෙන් ක්‍රීඩා ඇමතිතුමා මෙම නියෝගවල සඳහන් කර තිබෙනවා. ක්‍රීඩා ඇමතිතුමා ක්‍රීඩා ක්ෂේත්‍රය සම්බන්ධ විෂය කරුණක් වශයෙන් මෙය ඉදිරිපත් කළත්, රටේ ජනාධිපතිතුමාගේ ඉඳලා පහළට යන කල් මේ ක්‍රියා දාමය අනුගමනය කළ යුතු බවයි මා හිතන්නේ. එහෙම කළොත් ඔබතුමන්ලා තුළ තිබෙන මේ රට ආසියාවේ ආශ්චර්යය කරන බලාපොරොත්තුව ඉටු කර ගන්න පුළුවන් කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපි විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, ක්‍රීඩා ඇමතිතුමා මේ ස්ථානයේ සිටියා. මා හිතන හැටියට එතුමා මේ මොහොතේ මඳකට සභා ගර්භයෙන් පිටතට යන්න ඇති. එතුමා අද ඉතාම දුකෙන් ක්‍රීඩාව ගැන කථා කළා.

[ගරු සුජීව සේනසිංහ මහතා]

එතුමාගේ කථාවේ සඳහන් වුණු කොටසක් මා කියවන්නම්. එහි මේ විධියට සඳහන් වනවා:

"ගරු කථානායකතුමනි, ක්‍රීඩා පනතට නියෝග ගෙන එන්නට හේතුව මෙයයි. ක්‍රීඩා අමාත්‍යවරයා වශයෙන් හිටපු පසු ගිය කාලය පුරාම ක්‍රීඩාවේ පසුබෑමට හේතු මොනවාද කියා මා දැක්කා. ඔබතුමාට ඉතාම කෙටියෙන් කියන්නම්." එහෙම කියලා එතුමා අර්ජුන රණතුංග මැතිතුමා ගැන කියලා තිබෙනවා, සුසන්තිකා ජයසිංහ මහත්මිය ගැන කියලා තිබෙනවා, ඩන්කන් වයිට් මහත්මයා ගැන කියලා තිබෙනවා. ඒ වාගේ විශාල ඉතිහාසයක් තිබුණු අපේ ක්‍රීඩාව පසු ගිය අවුරුදු කිහිපය තුළ අඳුරු යුගයකට ගෙනැවිත් තිබෙන බව එතුමා ප්‍රකාශ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම එතුමා මේ විධියටත් කියනවා;

"නමුත් මෑත කාලයේ ක්‍රිකට් ක්‍රීඩාවේදී අපි පිට පිට හතර වාරයක් අවසාන තරගාවලියට ගිහින් පරාජය වුණා. මෑත කාලයේ විස්සයි විස්ස තරගාවලිය අපි පරාජයට පත් වුණා ගරු කථානායකතුමනි. මලල ක්‍රීඩාව සම්බන්ධයෙන් අපට තිබෙන පුංචිම ජාත්‍යන්තර තරගාවලිය තමයි සාර්ක් තරගාවලිය. සාර්ක් කලාපීය තරගාවලියෙන් දෙවැනියට හිටිය අපි දැන් බංගලාදේශයටත් පැරදිලා අද හතර වැනි ස්ථානයට ඇවිල්ලා ඉන්නවා. සාර්ක් තරගවලින් පදක්කම් හතළිහක්, පණහක් ගත්ත අපි අවසාන කාලය වන විට පදක්කම් අටට, දහයට බැස්සා ගරු කථානායකතුමනි. ආසියානු ක්‍රීඩා උළෙලේ දී පළමු වැනි වතාවට එකම රන් පදක්කමක්වත් නැතිව අපි ලංකාවට ආවා. ඒ අනුව අපි පසුගිය කාලය පුරා ක්‍රීඩාවේ බරපතළ පරාජයක් දැක්කා." ඊළඟට එතුමා කියනවා, අතිගරු ජනාධිපතිතුමා ක්‍රීඩාවට ආදරය කරන ජනාධිපතිවරයකු හැටියට,- [බාධා කිරීමක්] මා හිතන්නේ එතුමා තිගැස්සී නැඟිට තිබෙනවා, එතුමාගේ කාලය තුළ ක්‍රීඩාවට මොකද වුණේ කියලා.

ගරු කථානායකතුමනි, ඔබතුමාට විශේෂයෙන්ම මතක ඇති සුසන්තිකා ජයසිංහ, දමයන්ති දර්ශා, ශ්‍රියානි කුලවංශ, ශ්‍රියන්ත දිසානායක, අර්ජුන රණතුංග, අරවින්ද ද සිල්වා යන මේ ක්‍රීඩකයන් අපේ රට ජාත්‍යන්තරයට අරගෙන ගිය බව. ඔවුන් අපේ රටට කීර්තියක් ලබා දුන්නා. අද හැබැයි ක්‍රීඩා ඇමතිතුමාම කියනවා, අපේ රටේ ක්‍රීඩාව බිංදුවට බැහැලා කියලා ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමාට මා ඇත්තෙන්ම ප්‍රශංසා කරනවා. එතුමා යම් කිසි කාර්ය භාරයක් කරයි කියලා මා හිතනවා. එතුමාට දක්ෂතාවක් තිබෙනවා. මේ කථාව කරනකොට එතුමාට මතක්වන්නට ඇති, එතුමා ක්‍රීඩා අමාත්‍ය ධුරය ලබා ගන්නා අවස්ථාවේ දී කළ කථාව. අපි ඇමතිතුමාට එදා මේ කාරණා ඉදිරිපත් කළාම, එදා එතුමා කළේ වෙන කථාවක්. ඒ කථාව මා කියවන්නම්. එය හැන්සාඩ්ගත වෙලා තිබෙනවා ගරු කථානායකතුමනි. 2011 මැයි 25වැනි දින හැන්සාඩ් වාර්තාවේ 694 වැනි තීරුවේ මෙසේ සඳහන් වෙලා තිබෙනවා:

"ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කියනවා, ක්‍රිකට් ක්‍රීඩාව වැටිලා කියලා. කවුද කියන්නේ ක්‍රිකට් ක්‍රීඩාව වැටිලා කියලා? ඔබතුමා ඔප්පු කරන්න. ක්‍රිකට් ක්‍රීඩාව වැටිලා නැහැ කියා මම ඔබතුමාට වග කීමකින් කියනවා."

ඊළඟට, එම තීරුවේම එතුමාගේ කථාවේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"එක් දින තරගවලින් අද අපි ලෝකයේ දෙවැනි තැනට ඇවිල්ලා ඉන්නවා. වෙන මොනවාද? අපි World Cup එකේ දී semi-final ආවා.

අද පිතිකරුවන්ගේ ගණයෙන් කුමාර සංගක්කාර උඩට ඇවිල්ලා ඉන්නවා. අද මුත්තයියා මුරලිදරන්ලා උඩටම ඇවිල්ලා ඉන්නවා. කොහේද, අපි වැටිලා තිබෙන්නේ? අපේ ක්‍රිකට් ක්‍රීඩාවේ කිසිම වැටිල්ලක් නැහැ. හැබැයි, අර්ජුන මන්ත්‍රීතුමා හොඳ කථාවක් කිව්වා. පහළ කණ්ඩායම් ගැන එතුමා කිව්වා. මම එතුමාත් එක්ක එකඟයි. මේ ගහන කට්ටිය ගහලා යයි; ඊළඟට ක්‍රිකට්වලට මොකද වෙන්නේ කියන එක අර්ජුන මන්ත්‍රීතුමා ඇහුවා. මම ඒකට එකඟයි. "

ගරු කථානායකතුමනි, එතුමා එදා කියනවා - අවුරුද්දකුත් මාස ගණනාවකට පෙර- මේ ක්‍රීඩාව වැටිලා නැහැයි කියලා. හැබැයි, අද ක්‍රීඩාව වැටිලා කියලා එතුමා පිළිගන්නවා. ඔබතුමා දකින්න ඇති අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමන්ලා, අර්ජුන රණතුංග මන්ත්‍රීතුමන්ලා, අපි දිගින් දිගටම මේ කාරණය කිව්වා. හැබැයි එතුමා අදවත් තේරුම් අර ගෙන තිබෙනවා, මේ ක්‍රීඩාව වැටිලා කියලා. ඒක ලොකු දෙයක්. ගරු කථානායකතුමනි, එතකොට මේ ක්‍රීඩාව වැටුණේ කාගේ ආණ්ඩු කාලය තුළද? ක්‍රීඩාවට ආදරය කරන පුද්ගලයෙක් වශයෙන් ජනාධිපතිතුමා විශාල ශෝකයකට පත් වෙලා තිබෙනවා කිව්වා. එතුමාගේ අවුරුදු අටක කාලය තුළ. එතකොට එතුමා මොනවාද කළේ? [බාධා කිරීමක්] අපි අඬන්නම්. මේක බලන කොට අද අපට අඬන්න වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, පසු ගිය 05 වැනිදා "දි අයිලන්ඩ්" පුවත් පත්හි 9 වැනි පිටුවේ කාටුන් එකක් මම දැක්කා. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ඉතාම අමාරුවෙන් විකට්ටුව ආරක්ෂා කරන්න ඉන්නවා. විකට්ටුව පිටිපස්සේ ඩොලර් නයෙක් ඉන්නවා. විශාල මුදල් ප්‍රමාණයක් එක්ක කරන මේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් එතුමාට අමාරු කාර්ය භාරයක් තිබෙනවා. මේකේ මාෆියාවක් තිබෙනවා. ඔක්කොම කට්ටිය ඉන්නවා ඒ සල්ලි ටික ඩැහැ ගන්න. විශාල පිරිසක් ඒක වටේ කැරකෙනවා.

එතකොට එතුමාට තිබෙන කාර්ය භාරය අමාරුයි කියලා අපි පිළිගන්නවා. ගරු කථානායකතුමනි, හැබැයි මේ තනතුරුවලට එන කොට තියෙන්න ඕනෑ සුදුසුකම් මොනවාද කියලා එතුමා ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම එතුමා නුසුදුසුකම් ඉදිරිපත් කර තිබෙනවා. මේකට තවත් එකතු වෙන්න ඕනෑ. බාර් අයිතිකාරයෝ ඉන්නවා නම් ඒ කට්ටියක් මේකෙන් අයින් කරනවා කියලා එකතු කරන්න කියලා මම එතුමාගෙන් ඉල්ලනවා. ඒ වාගේම එතුමා දේශපාලනඥයෝ ගැනත් සඳහන් කර තිබුණා. ආණ්ඩුවේ ඇමතිවරු, මන්ත්‍රීවරු ඉන්නවා නම් ඒ අයත් මේකෙන් අයින් කරන්න, ඒ අයගේ පවුල්වල කට්ටියත් අයින් කරන්න. මොකද, ඒක තමයි හරි ක්‍රමය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair,* and MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම සූදුවලට සම්බන්ධයක් තිබෙනවා නම් ඒ අයටත් මේකට සම්බන්ධ වෙන්න බැහැ. ඒ වාගේම ක්‍රීඩාවට සම්බන්ධ වෙළෙඳාම් තිබෙනවා නම් ඒ අයටත් සම්බන්ධ වෙන්න බැහැ. ඒක හොඳයි. නවත් මේකට එකතු වෙන්න ඕනෑ. ඒ එකතු වෙන කොට විනිවිද භාවය, conflict of interest මේ වාගේ දේවල් ඇතුළත් වෙන කොට රටේ පිරිසිදු පුද්ගලයකුට - මම හිතන විධියට සියයට සියයක් බලාපොරොත්තු වෙන්න බැහැ. වැඩියෙන්ම පිරිසිදු පුද්ගලයාට- මේකට පත් වෙන්න අවස්ථාව ලැබෙනවා. එතුමා ගෙනා මේ ක්‍රියාදාමය හොඳයි; සියයට 60ක් 70ක් හොඳයි.

හැබැයි, එතුමාට තිබෙන ප්‍රශ්නය තමයි එතුමාට උනන්දුවක් තිබුණත් දේශපාලන බලවේග එතුමා වටේත් කැරකෙන එක. එහිදී අපට හරියටම හිතා ගන්න බැහැ, මේ ගෙනා සමහර නීති ගෙනාවේ කාට ගහන්නද, කාව අයින් කරන්නද කියලා. තිලංග සුමතිපාල මහත්මයා අයින් කරන්නද, අර්ජුන රණතුංග මහත්මයා අයින් කරන්නද කියලා අපට හිතා ගන්න බැහැ. මේකට තව තව ඒවා ඇතුළත් වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිශාන්ත රණතුංග මැතිතුමා ක්‍රිකට් පාලක මණ්ඩලයේ ලේකම් තනතුර දරන විට CSN සමාගමේ තව තනතුරක් දැරුවා මට මතකයි. ඒකට tender ලැබෙනවා. අපි දිගින් දිගටම කිව්වා, මේක වැරදියි කියලා. ඒ විතරක් නොවෙයි. "කෝප්" එකේ මේක සාකච්ඡාවට භාජනය වුණා. එහිදී කිව්වා, conflict of interest කියලා. මේක මේ ආණ්ඩුවේ ඉන්න සමහර අයට තේරෙන්නේ නැහැ. ඒකේ හොරකමක් වනවාද, නැද්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. එතැන අනිවාර්යයෙන්ම හොරකමක් වුණා. ඊටත් වැඩිය එවැනි අය ඒ තනතුරු දරන්න සුදුසු නැහැ කියන එක "කෝප්" එකේදී වාර්තා වුණා. මේක මම ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට කිව්වාම එදා එතුමා මට අභියෝග කළා. එය හැන්සාඩ් වාර්තාවේ සඳහන් වනවා. මා එය කියවන්නම්. 2012 ඔක්තෝබර් 23 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 721වැනි තීරුවේ මෙහෙම සඳහන් වෙනවා:

"...කෝප් වාර්තාවේ කිසිම තැනක නිශාන්ත රණතුංග මහත්තයාට විරුද්ධව චෝදනාවක් ඇවිල්ලා නැහැ. කරුණාකරලා ගරු මන්ත්‍රීතුමා ඒක ඉල්ලා අස් කර ගන්න"

එතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ සිටියා නම් හොඳයි. ඒ වාගේම එතුමා කියා තිබෙනවා, "ගරු මන්ත්‍රීතුමනි, නිශාන්ත රණතුංග මහත්තයා සුදුසු නැහැ කියලා කෝප් වාර්තාවේ කොහේවත් කියැවිලා නැහැ" කියලා. එහෙම කියැවිලා නැහැ කියලා පුළුවන් නම් ඔප්පු කරන්න කියලා මා එතුමාට කියනවා. අද මම "කෝප්" වාර්තාව ගෙනාවා. මේ වන විට එතුමා මෙතුමන්ලාගේ නීති ගැන දැන ගෙන CSN ආයතනයේ විධායක ධුරයෙන් අස් වෙලා තිබෙනවා කියලා අපට ආරංචි ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේවාට සම්බන්ධකම් තිබුණා නම් මේ අයට මේවාට ඉදිරිපත් වෙන්න බැහැ. මේ නීතිය ගෙනෙන්න ඕනෑ යම් මාධ්‍ය ආයතනයකට සම්බන්ධයක් තිබුණා නම් අවුරුදු 5ක් යන තුරු මේවාට සම්බන්ධ වෙන්න බැරි වන විධියට. පුළුවන් නම් අවුරුදු, 7ක් 8ක් කරන්න. නැත්නම් ඕනෑම කෙනකුට හෙට අයින් වෙලා තරග කරන්න පුළුවන්. එතකොට ඔබතුමන්ලා කරන්නේ, ඒ පිරිස අයින් වුණාට ඒ පුද්ගලයින්ගේ proxy ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන එක. වෙනත් පුද්ගලයකු තමන්ගේ නම වෙනුවෙන් ඉදිරිපත් කරනවා. ඉතින් ඔබතුමන්ලා හදන්නේ තවත් මේ හොරකම වගා කරන්නද, හොරකම වගා කර ගෙන කන්නද? නැත්නම් මේ උනන්දු කරන්නේ කාව පෝෂණය කරන්නද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ළඟ "කෝප්" වාර්තාව තිබෙනවා. එහි 58 වන පිටුවේ "පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අදහස් හා තීරණ" යටතේ මෙසේ සඳහන් වනවා :

"ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම්තුමා ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන සංවිධානයකට ටෙන්ඩරය ලබාදීම පිළිබඳව කමිටුවේ අප්‍රසාදය ප්‍රකාශ කරන ලදි."

ඒ විතරක් නොවෙයි. ඊළඟට මෙසේ සඳහන් වනවා :

"මණ්ඩලය විසින් ලබා ගත් මුළු ණය ප්‍රමාණය රු. මිලියන 22.5 බව කාරක සභාවේ අවධානයට යොමු කරන ලදි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ World Cup එක කාලයේ. ඊළඟට මෙසේ සඳහන් වනවා :

"එම මුදල් ප්‍රමාණය අතුරු කමිටුවේ අනුමැතිය මත, ඔස්ට්‍රේලියානු සංචාරයේදී ඉතාම මැනවින් කටයුතු කිරීම වෙනුවෙන් එක්තරා නිලධාරීන් පිරිසකට ගෙවූ බව අනාවරණය කරන ලදි. ඔවුන්ගේ නම් ලයිස්තුවක් එවන මෙන් උපදෙස් දෙන ලදි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිශාන්ත රණතුංගලා, සුරාජ් දන්දෙනියලා කියන ඒ පිරිස නැවත ඉදිරිපත් වෙලා තිබෙනවා. CSN ආයතනයෙන් අයින් වුණාය කියනවා. ඒ ආයතනයට සම්බන්ධ කවුද කියා CSN ආයතනය ගැන අපි දිගින් දිගටම කිව්වා. හැබැයි තමුන්නාන්සේලා ඒවා පිළිගත්තේ නැහැ. විශේෂයෙන්ම උපාලි ධර්මදාස මැතිතුමා මේ ගැන කියා තිබෙනවා. "The Island" website of 12th June, 2012 states:

"Cricket Chief exposes Nishantha Ranatunga".

It goes on to state:

" ..... Dharmadasa admitted that Carlton Sports Network (CSN) was indeed owned by the sons of President Mahinda Rajapaksa".

2012 ජූනි 12 වැනි දා "The Island" website එකේ තමයි එහෙම කියා තිබෙන්නේ. අපි නොවෙයි එහෙම කියා තිබෙන්නේ. රටටම කිව්වා නැහැ කියලා. නමුත් උපාලි ධර්මදාස මහත්මයා කියපු දෙයක් මේ විධියට සඳහන් කර තිබෙනවා:

".....previously denied any involvement of President's sons with CSN".

එහෙම සඳහන් වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. විනිවිදභාවය නැති කරන්න එපාය කියා දිගින් දිගටම අපි කිව්වා. ඒවා සොරකම්වලට තුඩු දෙනවාය; විශාල මුදල් ප්‍රමාණයක් සොරකමට ලක් වෙනවාය කියා අපි කිව්වා. හැබැයි මෙතුමන්ලා ඒක ගණන් ගත්තේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි ක්‍රෝධයෙන් කථා කරනවාය; වෛරයෙන් කථා කරනවාය කියා අපට ඇඟිල්ල දික් කළා. අපට වෛරයක් නැහැ, ක්‍රෝධයක් නැහැ. අර්ජුන රණතුංග මන්ත්‍රීතුමන්ලා අවුරුදු ගණනක් තිස්සේ මහන්සි වෙලා තමයි ක්‍රිකට්වලට මේ කීර්තිය ලබා දුන්නේ. අද මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා කියන කථාව හරි. ඒ ක්‍රීඩකයන් දහ දෙනාට, පහළොස් දෙනාට මේ මුදල බෙදා ගන්න බැහැ. ඒ ක්‍රීඩකයන් විශාල ප්‍රමාණයක් ගම්වල අයයි, එහෙම නැත්නම් අහුමුළුවල ක්‍රීඩා කරන අයයි. ඒ ක්‍රීඩකයන්ගේ ශක්තියෙන්, ශ්‍රමයෙන් තමයි මේ ටෙස්ට් ක්‍රිකට් තරගවලට ක්‍රීඩා කරන ක්‍රීඩකයන් මේ මුදල් ලබා ගන්නේ. ඒත් අනිවාර්යයෙන්ම එතුමා කී ආකාරයට ඒ ක්‍රීඩකයන්ටත් සීමා සම්බාධක පනවන්න ඕනෑ. අද ලෝකයේ ප්‍රචලිත වුණු ක්‍රිකට් ක්‍රීඩාවය කියන්නේ විශාල මුදල් ප්‍රමාණයක් ලංකාවට ගලා ගෙන එන ක්‍රීඩාවක්. එහෙම නම් ඒ ක්‍රීඩාව පාවිච්චි කරන්න ඕනෑ රටේ අනිකුත් ක්‍රීඩා

[ගරු සුජීව සේනසිංහ මහතා]

සංවර්ධනය කිරීම සඳහා. අපි ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, අනිවාර්යයෙන්ම නිශාන්ත රණතුංග මැතිතුමාගේ ඉදිරිපත් වීම වළක්වන්නය කියා. එතුමා අවංක නම් එතුමාට අවස්ථාව තිබෙනවා. එතුමාට අපේ සහයෝගය දෙනවා. ඒ විතරක් නොවෙයි ඇමතිතුමා සඳහන් කරලා තිබුණා, සුරාජ් දන්දෙනිය පමණයි බැඩ්මින්ටන් ගහලා තිබෙන්නේ කියා. නැහැ, එතුමා බැඩ්මින්ටන් ගහලා නැහැ. ඔය ආයෙත් වංගුවෙන් එන්න හදන්නේ ආයෙත් ගණනක් කපා ගන්නයි. ලෝක ක්‍රිකට් කුසලානය කාලයේ මොකක්ද කළේ කියා ඔබතුමා දන්නවා ඇති. රුපියල් කෝටි ගණනක විශාල මුදල් ප්‍රමාණයක් වංචා කළා. මම නම් වශයෙන් කියන්නේ නැහැ. සුරාජ් දන්දෙනිය තනියෙන් ඒක කළාය කියා මම කියන්නේ නැහැ. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශාල මුදල් ප්‍රමාණයක් ගැන මේ පත්තරවල සඳහන් වෙනවා. මට පත්තර හතරක් ඉදිරිපත් කරන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. ගරු ඇමතිතුමා සඳහන් කළා සුරාජ් දන්දෙනිය මහත්මයා පමණයි ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළේ කියලා. නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහි සඳහන් වෙනවා ජාත්‍යන්තර බැඩ්මින්ටන් සංගමයේ එකම නියෝජිතයා, මේ පිළිබඳ මනා කුසලතාවක් ඇති මහාචාර්ය රංජිත් සිල්වා මැතිතුමාත් මේ සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ බව. හැබැයි ඒ සම්බන්ධයෙන් මෙතුමා අනාවරණය කරලා නැහැ. එතුමාට මේ තනතුර දුන්නේ නැහැ. බැඩ්මින්ටන් නොගහපු, තමන්ගේ පවුලේ කෙනෙකුවත් බැඩ්මින්ටන් නොගහපු ඒ පුද්ගලයාට ආපසු හොර පාරේ එන්න ඉඩ සලස්වනවා. පුද්ගලයන් කීප දෙනෙක් අයින් කරලා තමන්ට ඕනෑ පුද්ගලයන් ආපසු එතැනට ගේනවා.

ඇත්තටම මම ඉතාම ආඩම්බර වෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමා යහ පාලනය, ඒ වාගේම විනිවිදභාවය, conflict of interest සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීම ගැන. යුනෙස්කෝ සංවිධානය ඉදිරිපත් කළ fair play, විනිවිදභාවය සහ තනතුරුවලට පත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය පිළිබඳ විස්තරයක් මම සොයා ගත්තා. මම එය **සභාගත*** කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා එය කියවන්න.

එහි සඳහන් වෙනවා දේශපාලනය මේවාට ගාවා ගන්න බැහැ කියලා. ICC එකෙන් කියා තිබුණා දේශපාලනය මේකට ගාවන්න එපා, ආණ්ඩුවේ ඉන්න ඇමතිවරුන්ගේ පවුල්වල උදවිය මේවාට ගාවා ගන්න එපා, විශේෂයෙන්ම මත් ද්‍රව්‍ය, මත්පැන්, ඒ වාගේම සූදුවලට සම්බන්ධ කට්ටිය, ක්‍රීඩා ක්ෂේත්‍රයේ වෙළෙඳාමට සම්බන්ධ කට්ටිය මේවාට ගාවා ගන්න එපාය කියලා. මොකද මේ පිරිස එන්නේ වෙනත් බලාපොරොත්තුවකින්. මේ පිරිස අනිවාර්යයෙන්ම ඉවත් කරලා මෙය ශුද්ධ කරන ආකාරය මේ නීති රීතිවල ඇතුළත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, එම විස්තරය ඔබතුමා පොඩ්ඩක් කියවලා බලන්න. හැබැයි වැදගත් වන්නේ මේකයි ගරු ඇමතිතුමනි. මේක භාර දෙන්න ඕනෑ අපට නොවෙයි, ජනාධිපතිතුමාටයි. මේ ක්‍රීඩාව සම්බන්ධයෙන් කරන්න කියපු දේම ආණ්ඩුවටත් කරන්න කියලා මේක ජනාධිපතිතුමාටත් භාර දෙන්න. තමන්ගේ සහෝදරයන්, තමන්ගේ පවුලේ අය ඔය තනතුරුවලට දමන එක හොඳ නැහැ. පසු ගිය දිනක පැවැති විවාදයකදී මම ගාමිනී සෙනරත් මැතිතුමා ගැන සඳහන් කළා. එතුමා ජනාධිපතිතුමාගේ අතිරේක ලේකම්. එතුමා Sri Lanka Insurance Corporation එකේ Chairman. තව බැංකුවක Chairman. ඒ වාගේම සමාගමක බිලියන ගණනක කොටස් අරගෙන තිබෙනවා. ඒකේ Chairman. මේවා නිසා තමයි විනිවිදභාවය නැහැයි කියන්නේ. ක්‍රීඩා ඇමතිතුමා මේක ඉවර වෙලා ගිහින් පූජා කරන්න ඕනෑ ජනාධිපතිතුමාට, "මෙන්න ජනාධිපතිතුමනි විනිවිදභාවය, conflict of interest, මේක තමයි ලෝකයේ අනුගමනය කරන රීතිය" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අනුව ක්‍රියා කළොත් අප බලාපොරොත්තු වන සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය යම් තාක් දුරකට මේ රටේ ස්ථාපනය කරන්න පුළුවන් වෙයි කියි මා හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිශාන්ත රණතුංග මැතිතුමා සම්බන්ධයෙන් මෙහි සඳහන් වෙනවා. එතුමා අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාගේ මල්ලි. මම එතුමා ගැන කථා කරන කොට හරි නම් අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා විරුද්ධ වෙන්න ඕනෑ. හැබැයි එතුමා මට කවදාවත් විරුද්ධ වෙලා නැහැ. එතුමාගෙන් මම කරුණු අහලාත් නැහැ; එතුමා මට විරුද්ධ වෙලාත් නැහැ. විශේෂයෙන්ම 2012 ඔක්තෝබර් 27 දින "The Island" website එකේ මෙසේ සඳහන් වෙනවා:

> "Nishantha Ranatunga's role, a conflict of interest: Sri Lanka Cricket Chairman Upali Dharmadasa said yesterday".

හැබැයි එතුමාත් එක්ක දැන් වැඩ කරනවා මේ සුදුසු නැහැ කියන පුද්ගලයන්. මේ සමහර පුද්ගලයන්ට Lake Drive එකේ ගෙවල් දෙකක් තිබෙනවා; රුපියල් ලක්ෂ 1,000ක් විතර වටිනවා. මේවා ගත්තේ කොහෙන්ද? අග විනිසුරුතුමිය සම්බන්ධයෙන් ඔබතුමන්ලා පරීක්ෂණයක් කළා නේ. මේ අය සම්බන්ධයෙනුත් පරීක්ෂණයක් කළා ද? මේ අය tax ගෙවලා තිබෙනවාද, මොකක්ද කරන ව්‍යාපාරය, ක්‍රිකට්වලට සම්බන්ධ වෙන්න කලින් කරපු ව්‍යාපාර -බුලත් වික්කාද, ටොෆි වික්කාද, කාර් වික්කාද- මොනවාද, කොහෙන්ද මේ මුදල් ඇවිත් තිබෙන්නේ, කොහොමද මේ ගෙවල් ගත්තේ කියලා පොඩ්ඩක් පරීක්ෂා කර බලන්න. ඒවා පරීක්ෂා කර බැලුවොත් ඔබතුමාට තේරෙයි එකම පිරිසක් මේ ක්‍රිකට් ක්‍රීඩාවේ තිබෙන විශාල මුදල් ප්‍රමාණයක් බෙදා ගන්න, බදා ගන්න, මේක කාලා වමාරලා මැරෙන්න මේක වටේ කැරකෙන බව.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ අමාත්‍යාංශය භාර ගෙන දැන් ටික කලක් වෙනවා. ඔබතුමාට මේකේ යම් කිසි දෙයක් කරන්න ඕනෑ නම්, අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ නම් ඔබතුමාට දැන් ඒකට අවස්ථාවක් ලැබිලා තිබෙනවා. අප දන්නවා ඔබතුමා යම් දෙයක් කරන්න පුළුවන් පුද්ගලයෙක් බව. හැබැයි එතුමාට ඒ කරන්න පුළුවන් ප්‍රමාණය රඳා පවතින්නේ එතුමාට කරන බලපෑම අනුවයි. උඩින් කාව හරි සනසවන්න, කොහේ හරි ඉන්න පවුලක් සනසවන්න, ඒ පවුලේ දරුවන් සනසන්න මේ නීති හදනවා නම් එතුමා කරන්න බලාපොරොත්තු වෙන කාර්ය භාරය ඉටු වන්නේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එතුමා අරගෙන තිබෙන උත්සාහය හොඳයි. එතුමා තබා තිබෙන ඒ අඩියට අපේ සහයෝගය ලබා දෙනවා. මේ පවුල්වලට සම්බන්ධ, මේ ජාවාරම්වලට සම්බන්ධ, මේ ව්‍යාපාරවලට සම්බන්ධ අය මේකට ගේන්න දෙන්න එපා. ඒ නීතියක් මේකට ඇතුළත් කරන්න. මේකේ එවැනි අය ඉන්නවා, මම නම් වශයෙන් සඳහන් කරන්නේ නැහැ. අර්ජුන රණතුංග මැතිතුමන්ලා දන්නවා. ක්‍රිකට් ක්‍රීඩාවට මෙහෙවර කරපු පතාක යෝධයන් ඉන්නවා. කලින් හිටපු කට්ටිය ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් මොනවත් කළේ නැත්නම් අර්ජුන රණතුංග මැතිතුමාටත් ලෝක ක්‍රිකට් කුසලානය ලංකාවට ගේන්න හම්බ වන්නේ නැහැ. ඒක එතුමාගේ තනිකර දක්ෂකමක් නොවෙයි. හැබැයි එතුමාට ඒ ශක්තිය තිබුණා. බන්දුල වර්ණපුර, දුලිප් මෙන්ඩිස්, අනුර තෙන්නකෝන් වැනි විශාල පිරිසක් ඉතිහාසයේ කරපු ක්‍රියාදාමය නිසා තමයි එතුමාටත් නායකයෙක් වශයෙන් ඒ කටයුත්ත කරන්න ශක්තිය ලැබුණේ; අවස්ථාව ලැබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කලිනුත් ප්‍රකාශ කළා මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව පහළට වැටෙන්නේ නැහැ කියලා.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

අර්ජුන රණතුංග මැතිතුමන්ලා ඒකට ස්ථාවරයක් ලබා දීලා තිබෙනවා, අඩිතාලමක් දමා තිබෙනවා, platform එකක් හදලා තිබෙනවා. කවුරු මොනවා කිව්වත් ක්‍රිකට් ක්‍රීඩාව වැටෙන්නේ නැහැ.

හැබැයි, එහි සාර්ථකත්වය සඳහා ක්‍රීඩා අමාත්‍යතුමා දරන ආකල්පය, අනුගමනය කරන ක්‍රියා පිළිවෙත් අනිවාර්යයෙන්ම බලපානවා. ඒ විතරක් නොවෙයි. ක්‍රිකට් කමිටුව ඇතුළු මේ සියලු දෙනා ක්‍රියා කරන ආකාරයත් මේකට බලපානවා. හැබැයි ක්‍රිකට් ක්‍රීඩාව වැටෙන්නේ නැහැ. මොකද, මේකට platform එකක් හදලා දීලා තිබෙනවා. ඒ ගැන අපි ආඩම්බර වෙනවා. අපි කියන්නේ නැහැ අනිවාර්යයෙන්ම හැම ක්‍රිකට් තරගයක්ම ජයග්‍රහණය කරන්න ඕනෑ කියලා. ගරු ඇමතිතුමා වරක් කිව්වා ලෝක කුසලාන තරගවලදී අවසන් මහා තරගයට අපේ කණ්ඩායම හතර වතාවක් ආවා කියලා. ඒක ජයග්‍රහණයක්. ලෝකයේ ක්‍රිකට් ක්‍රීඩා කරන හොඳම රටවල් එක්ක තරග කරලායි අපේ රට අවසන් මහා තරගයට හතර වතාවක් ආවේ. ඒක විශාල ජයග්‍රහණයක්. තව ඉදිරියේදීත් ඒ විධියට එයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ක්‍රිකට් ක්‍රීඩාවෙන් ලැබෙන මුදල් ටික පාසල් තරගවලදී දුවන කොට හෘදය අක්‍රිය වෙලා වැටෙන ළමයාගේ medical check-up එක කරන්න යොදවන්න තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මාස ගණන තුළ දුවන කොට ළමයි තුන්දෙනෙක් මැරිලා වැටිලා තිබෙනවා. ඉතිහාසයේ කවදාවත් ළමයි දුවන කොට මැරිලා වැටුණේ නැහැ. ඒ මුදල් පාසල්වල ක්‍රීඩා කරන දරුවන්ට medical check-up එකක් කර ගන්න යොදන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම Cricket World Cup එකට කලින් විශාල මුදල් ප්‍රමාණයක් ගලා ගෙන ආවා. ඒ මුදල්වලට මොකද වුණේ? ක්‍රිකට් පාලක මණ්ඩලයේ තිබුණු මුදල්වලට වුණු දෙයක් නැහැ.

හම්බන්තොට ක්‍රීඩාංගණයක් හැදුවා, ඒකට රුපියල් බිලියන 5.8ක් වැය වුණා. මේ දවස්වල ඒකේ ඉන්නේ හරක්. හම්බන්තොට දියුණු කරනවාට අපි විරුද්ධ වෙන්නේ නැහැ. හම්බන්තොට දියුණු කරලා ඒ දියුණුව පුළුවන් තරම් එහි ජනතාවට ලබා දෙනවාට අපි විරුද්ධ වෙන්නේ නැහැ. අනිවාර්යයෙන්ම හම්බන්තොට දියුණු කරන්න ඕනෑ ප්‍රදේශයක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉල්ලපු නැති ක්‍රිකට් ක්‍රීඩාංගණයක් ලබා දෙන එක ද දියුණුව කියලා කියන්නේ? ඒකෙනුත් කොමිස් ගැහුවා. අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා දන්නවා, අංග සම්පූර්ණ ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හදන්න රුපියල් බිලියන1.8ක්, රුපියල් බිලියන 2ක් යයි කියලා. නමුත් ඒ සඳහා රුපියල් බිලියන 5.8ක් වැය කළා. ක්‍රීඩාංගණයක් අවශ්‍යයි කියලා ඉල්ලුවේ නැහැ. අද වෙන කොට එහි ක්‍රීඩා කරලා තිබෙන්නේ තරග කීයද? තරග 10කට වැඩිය ක්‍රීඩා කරලා නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇයි මේ රුපියල් බිලියන 5.8ක් විනාශ කළේ? ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට, ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමාට තමන්ගේ අමාත්‍යාංශ දියුණු කර ගන්න ඒ මුදල් දෙන්න තිබුණේ නැද්ද? අධ්‍යාපනයට දෙන්න තිබුණේ නැද්ද? අපේ රටේ සීනි නිෂ්පාදනය පිළිබඳව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අපට ඉල්ලුමේ හැටියට සීනි නිෂ්පාදනය කර ගන්න අවස්ථාවක් නැහැ. සීනි විශාල ප්‍රමාණයක් - සියයට 80ක්, 90ක් විතර- අපි ගේන්නේ පිට රටින්. ඒ සල්ලි මෙවාට යෙදෙව්වා නම් වැදගත්. අපි හම්බන්තොට උක් වවන්නයැ? හම්බන්තොට ක්‍රීඩාංගණයේ අපට වෙන වගාවක් කරන්න පුළුවන්ද? බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මොකටද මේවා කරන්නේ? විශාල මුදල් ප්‍රමාණයක්, ඒ කියන්නේ සියයට 30ක්, සියයට 40ක් කොමිස් ගහනවා. රට දියුණු කරනවා කියලා රටට කියනවා, රටට ආදරෙයි කියලා පපුවට ගහ ගන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පිරිස රටට නොවෙයි තමන්ටයි ආදරේ. තමන්ගේ කාර්ය භාරය කර ගන්නවා. රටේ දුප්පත් ජනතාව ඉතා අමාරුවෙන් ජීවත් වෙන්නේ. ක්‍රීඩාව නංවන්න ඕනෑ, කෘෂි කර්මය නංවන්න ඕනෑ. මම පෙන්වා දුන්නා අපි කෘෂි කර්මයෙන් පහත වැටිලා තිබෙන බව. කෘෂි පලදාව පහත වැටිලා, සෞඛ්‍ය සේවාව පහත වැටිලා. අද බෙහෙත් ගන්න ඕනෑ පෞද්ගලික බෙහෙත් ශාලාවලින්. කාගේ වරදද මේ? අවුරුදු 5ක් යන කොට ආසියාවේ ආශ්චර්ය අපේ ගෙවල් තුළට එයි කියලා අපේ ගම්වල උදවිය දොරවල් ඇරගෙන හිටියා. රෑට ගෙවල්වල දොරවල් වැහුවේ නැහැ. ආසියාවේ ආශ්චර්ය එන කල් රෑ තිස්සේ දොරවල් ඇරලා තැබුවා. ආපු ආශ්චර්යයක් නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ආශ්චර්ය ඇවිල්ලා තිබෙන්නේ සුළු පිරිසකට පමණයි.

මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා කිව්වා, "වකුගඩු රෝගීන් මැරෙනවා. කොහොමද රෝගය හැදෙන්නේ කියලා හොයා ගන්න බැහැ" කියලා. අද ඒක බොහෝ දෙනෙක් දන්නවා. ක්‍රීඩාවෙන් ලැබෙන මුදල් ටික මේවාට යොදන්න බැරි ද? රුපියල් බිලියන 5.8ක් එක ක්‍රිකට් ක්‍රීඩාංගණයට පමණයි වැය කළේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එතකොට අනෙක් ක්‍රීඩාංගණ දෙක? ඉන් එකකට රුපියල් බිලියන 2.8යි. ඒ ක්‍රීඩාංගණ තුනට රුපියල් බිලියන 10ක් විතර වැය වුණා. ඒ ක්‍රීඩාංගණ අවශ්‍ය වෙලා තිබුණේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මොකටද ඒවා කළේ? ඒ කොමිස් ගහපු උදවියම ආපහු වටෙන් එනවා, සුරාජ් දන්දෙණිය වාගේ අය. එතුමා කථා කරනවා මම බලා ගෙන හිටියා. "මේ සැරේ ලෝක කුසලාන තරගාවලියේදී මම අමුතුම එකක් කරන්න යන්නේ" කියලා කිව්වා. හිතා ගන්නවත් බැරි එකක් කරනවා කිව්වා. මෙහෙන් band ගහනවා, එහෙන් whistle ගහනවා, ලංකාවට අමුතුම ආශ්චර්යයක් පෙන්නුවා; ලෝක කුසලාන තරගය සංචාරකයෝ විශාල ප්‍රමාණයක් එන ක්‍රියාදාමයක් කියලායි කිව්වේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද වුණේ? ක්‍රිකට් ක්‍රීඩාව බංකොලොත් වෙලා ගියා. අද බලන කොට ඇමතිතුමාට බංකොලොත් වුණු ආයතනයක් කර ගහන්න සිදු වෙලා තිබෙනවා. හැබැයි එතුමාට ඒක කරන්න පුළුවන්. අපි සහයෝගය දෙනවා. අපි කාලකණ්ණි වෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි මේ රටට අදරය කරන පිරිසක්. අපි විවේචනය කරන්නේ ගරු ඇමතිතුමාටත් යම් දෙයක් හදා ගන්න පුළුවන් නම් හදා ගෙන ඉදිරියට යන්නයි. එතුමාට ඒ ශක්තිය තිබෙන්නට ඕනෑ. ඔබතුමන්ලා එහෙයියෝ වුණොත්, ඔබතුමන්ලා කාගේවත් වන්දිභට්ටයෝ වුණොත් මේ කාර්ය භාරය කරන්න බැහැ. හැබැයි අද රටේ ඇති වෙලා තිබෙන්නේ එසේ වන්දිභට්ටයෝ නොවී, එහෙයියෝ නොවී තමන්ගේ අමාත්‍යාංශය දරා ගෙන ඉන්න බැරි තත්ත්වයක්. අපි දැක්කා සී.බී. රත්නායක මහත්මයාට මොකද වුණේ කියලා. එතුමා හොඳ කාර්ය භාරයක් කරන්න පටන් ගත්තා. එතුමාට යන්න වුණා. හැබැයි මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට මේක කරන්න අවස්ථාවක් ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. [බාධා කිරීමක්]

මම ගියා rugger match එක බලන්න. අපි ඊර්ෂ්‍යාවට කියනවා නොවෙයි. නාමල් රාජපක්ෂ මහත්මයා රගර් දියුණු කරනවා නම් හොඳයි. අපි විරුද්ධත්වයක් නැහැ. අපි රගර් ක්‍රීඩාවට, ක්‍රිකට් ක්‍රීඩාවට ආදරෙයි. නාමල් රාජපක්ෂ මහත්මයා හොඳට රගර් සෙල්ලම් කළ මන්ත්‍රීවරයෙක්. අපි නැහැ කියන්නේ නැහැ. එතුමාගේ මල්ලිට එච්චර හොඳට රගර් සෙල්ලම් කරන්න බැහැ. හොඳට රගර් සෙල්ලම් කළේ නාමල් රාජපක්ෂ මහත්මයායි. එතුමා captain වුණා නම් අපේ කිසි විරුද්ධත්වයක් නැහැ. අපි ඒ කාලයේ රගර් බැලුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් මොකක්ද වුණේ? නුවර match එක ඉවර වෙන විට ඔක්කොටම ගැහුවා. ගැහැනුන්ටත් ගැහුවා. හොඳ වෙලාවට අපි මාරු වුණා. මමයි, අයියයි එහා පැත්තෙන් බැස්සා. Army එකෙන් නැහලා ගැහුවේ. මේකද ඔබතුමන්ලා රටේ බලාපොරොත්තු වන සදාචාරය? මේකද ක්‍රීඩාව? මේකද ක්‍රීඩාවේ උන්නතිය? මේකද ආසියාවේ ඓශ්වර්යය? ඔබතුමන්ලා රගර් බැරි නම්, ගුඩු බැරි නම්,

[ගරු සුජීව සේනසිංහ මහතා]

ඕනෑ එකක් ගහන්න. සුදුසු තැනැත්තාට සුදුසු තැන ලබා දෙන්න. හැබැයි, මේ businessවලට ඇතුළත් වෙන්න එපා. තමන්ගේ තාත්තා රටේ ලොක්කා නම් ඒ ගෞරැත්වය ආරක්ෂා කර ගන්න. එතුමා යුද්ධයේදී හොඳ කාර්ය භාරයක් කළා. ඉදිරි අනාගතයේදී ඔබතුමන්ලාට වග කියන්නට තිබෙනවා. උපාලි ධර්මදාස මහතා පැවසුවා යැයි එක්තරා වාර්තාවක් මෙසේ සඳහන් කරනවා:

> "…Upali Dharmadasa admitted that Carlton Sports Network (CSN) was indeed owned by the sons of President Mahinda Rajapaksa".

මේ අපි නොවෙයි කියන්නේ. අනුර කුමාර දිසානායක මැතිතුමන්ලා, අර්ජුන රණතුංග මැතිතුමන්ලා, අපි දිගටම මේ ගැන කිව්වා. "නැහැ" කිව්වා. නමුත් ධර්මදාස මහත්මයා, -එතුමන්ලා දැම්ම පුද්ගලයා- කියනවා මේ විධියේ සම්බන්ධයක් තිබෙනවා කියලා. එහෙම නම් අපි මේවා කාටද කියන්නේ? කියන විට අපට බණිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "Ceylon Today" කියන පුවත් පතේ සඳහන් වෙනවා, "Mafia running Sri Lanka Cricket" කියා. මාෆියා කියන දේ සාමාන්‍යයෙන් තිබෙන්නේ ඉතාලියේයි. ඇමෙරිකාවේත් තිබෙනවා. අද මේ රටේ හැම තැනම දුවන්නේ ඒවා තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එහෙම නම් විශේෂයෙන්ම ක්‍රීඩාව සම්බන්ධයෙන් උනන්දුවක් තිබෙනවා නම්, -රගර් ක්‍රීඩාව හෝ වේවා, ක්‍රිකට් ක්‍රීඩාව හෝ වේවා, ගුඩු හෝ වේවා- ක්‍රීඩාව දියුණු කරන්න පුළුවන්. මොකද, ආසියාව දියුණු වෙනවා. ඔබතුමන්ලාගේ දක්ෂතාවට නොවෙයි මේ රට දියුණු වෙන්නේ. සාමාන්‍යයෙන් ආසියාවේ ආර්ථික වර්ධන වේගය සියයට 8.2ක් විතර වෙනවා. චීනයේ නිල නොලත් ආර්ථික වර්ධන වේගය සියයට 10.2ක් වනවා. දැන් ඉන්දියාවේ ආර්ථික වර්ධන වේගය පොඩ්ඩක් බැහැලා තිබෙනවා. නමුත් සියයට 6.2ක් තිබෙනවා. නිකම් හිටියත් මේ රට දියුණු කරන්න පුළුවන්. දැන් යුද්ධය අවසන්. යුද්ධයට ගියා කියන මුදල, විශාල මුදල් ප්‍රමාණයක් අද ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙනවා. කලින් යුද්ධයට ගියේ රුපියල් බිලියන 140යි. දැන් ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ලබා දෙන මුදල රුපියල් බිලියන 290යි. මේ අනුව බැලුවාම අපි දැන් ඉන්දියාවේ යුද්ධයකුත් කරනවාද දන්නේ නැහැ. එතකොට කොහේටද මේ මුදල් යන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යුද්ධය පැවතුණු අවස්ථාවේදී රට දියුණු කරන්න අපට යම් කිසි බාධාවක් පැවතුණා නම් පැවතියේ ඒ යුද්ධය සඳහා මුදල් යෙදවූ නිසායි. ඒ කාලයේ අපි රුපියල් බිලියන 140ක් නැත්නම් රුපියල් බිලියන 150ක් යුද්ධය වෙනුවෙන් වියදම් කළා. ඒ, bulletsවලට, බෝම්බවලට, අහස් යානාවලට තෙල් ගහන්න, ආරක්ෂක භටයින්ට වාගේ දේවල්වලටයි. එතකොට දැන් ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ වියදම රුපියල් බිලියන 290ක් වෙන්නේ කොහොමද? අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමාට මේකෙන් රුපියල් බිලියන 5ක් දෙන්න කෝ; බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට තව රුපියල් බිලියන 5ක් දෙන්න කෝ; මොනවා හෝ කරලා පෙන්වන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද එහෙම දෙයක් සිදු වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආචාර්ය ඉන්ද්‍රරත්න මැතිතුමා කියනවා අපි අද දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 25ක් වියදම් කරන්නේ දූෂණයටයි කියලා. මේ දූෂණයේ මුදුන් මල්කඩ තමයි ක්‍රීඩාව. සී.බී. රත්නායක ඇමතිතුමා කිව්වා ලංකාවේ දූෂිතම ආයතනය ක්‍රිකට් ආයතනය කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා මේ අවස්ථාවේ මේ සභාවේ සිටියේ නැතත් එතුමාට මම මේ දේ ප්‍රකාශ කරනවා. ඔබතුමාට හැකියාවක් තිබෙනවා; දක්ෂතාවක් තිබෙනවා; හැබැයි, "එහෙයියෙක්" වුණොත්, ඔය කියන කියන විධියට රූකඩ නැටුවොත් නම් ඔබතුමාට ක්‍රීඩාව දියුණු කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඔබතුමාට සම්පූර්ණ වෙනසක් කරන්නට බැරි වෙයි. නමුත් ඔබතුමාගේ අවධානය යොමු කරලා මේ ආයතනය කෙළින් කරලා, ක්‍රීඩාවට අවශ්‍ය නීති රීති සකස් කරලා, මෙයින් හොරකම ඉවත් කරන්න ඔබතුමාගේ උපරිම අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා. එහෙම නැත්නම් තව අවුරුදු දෙකකදී ඔබතුමාට කරන්න වෙන්නේ, තවත් මරණයකට සිදු වුණ කථාවක්. එතුමාට ඉදිරියේදී කියන්නට සිදු වන්නේ ක්‍රිකට් ක්‍රීඩාව තවත් පහළට ගියා කියන එකයි. ඒ නිසා මම ඉතා බැගෑපත්ව ඔබතුමාගෙන් එක කාරණයක් ඉල්ලා සිටිනවා. ඔබතුමා කළ කාර්ය භාරය හොඳයි. අපි ඒ සඳහා ඔබතුමාට ප්‍රසංශා කරනවා. මේ ආයතනය පිරිසිදු කිරීම සඳහා ඇතුළත් කිරීමට තව යෝජනා කිහිපයක් මම ඔබතුමාට ඉදිරිපත් කළා. ඔබතුමා මේක ගිහින් ජනාධිපතිතුමාට ඉදිරිපත් කරන්න. ආණ්ඩුව සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී conflict of interest කියන එක -විනිවිද භාවය කියන දේ- හරියටම, අකුරටම ඉටු කරන්න කියලා ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්න කියා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Then, the Hon. Gamini Lokuge. You have 10 minutes.

[අ.භා. 2.35]

ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු සුජීව සේනසිංහ මැතිතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්නට ලැබීම මම ඉතාම අගය කරනවා. එතුමා තවමත් පරණ ක්‍රෝධයෙන්, වෛරයෙන් කථා කිරීම ගැන මම කනගාටු වෙනවා. අද අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට දියුණු කරන්න වැඩ පිළිවෙළ ගණනාවක් ආරම්භ කරලා තිබෙනවා. [බාධා කිරීමක්] මම ගැන කථා කළා නම් මම ඒකට උත්තර දෙනවා. නමුත් ක්‍රීඩාව දියුණු කිරීම සඳහා අද ගරු මහින්දානන්ද අලුත්ගමගේ ක්‍රීඩා ඇමතිතුමා ඉතාමත් වැදගත් නියෝග කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

එතුමා අවංකව ඒවා ඉදිරිපත් කර තිබෙනවා. හිටපු ක්‍රීඩා ඇමතිවරයෙක් හැටියට ඒ පිළිබඳව එතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මොකද මෙහි විනිවිදභාවයක්, ඒ ක්‍රීඩාවට අවශ්‍ය උදවිය එම තනතුරුවලට පත් වීමත් තමයි එතුමා කල්පනා කළේ. මේ මොන සංශෝධන ගෙනාවත් සමහරවිට ඒවායේ යම් අඩු පාඩු තිබෙන්නට පුළුවන්. නමුත් එතුමාගේ උත්සාහය ඉතාම වැදගත් උත්සාහයක් හැටියටයි අප දකින්නේ. එම නිසා මේ පිළිබඳව එතුමාට අප ප්‍රශංසා කරනවා. ඒ වාගේම මෙහි තව පොඩි අඩුපාඩු කිහිපයකුත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික සංගම්වලට පත් කරනකොට ජාතික සංගමයට පත්වන නිලධාරියා ගැන පමණක් කල්පනා කර වැඩක් නැහැ. ඒ ජාතික සංගමයේ සාමාජික සංගම් තම නිලවරණ හරියාකාරව පවත්වනවාද කියන එකත් බලන්නට ඕනෑ. ජාතික සංගම්වල සමාජික සංගම් මොන ආකාරයෙන්

නිර්මාණය වෙලා තිබෙනවාද, ජාතික සංගම්වලට එන්නේ ඒ සංගම්වල නිලවරණ සාර්ථකව පවත්වලාද කියන එක අප බලන්න ඕනෑ. සමහර ජාතික සංගම්වලට සාමාජික සංගම් හතරයි පහයි තිබෙන්නේ. ඒ හතර පහ එකතු වෙලා ජාතික සංගමයක් පිහිටුවා ගත්තාම ඒක ලංකාවේම ක්‍රීඩාවක් පාලනය කරන ආයතනයක් බවට පරිවර්තනය වෙනවා. ක්‍රිකට් ගත්තත්, ක්‍රිකට් ආයතනයට ඡන්දය දෙන්න එන සාමාජික සංගම් හරියාකාර නිලවරණ පවත්වා තිබෙනවා ද, ඒ අනුව ඒවාට සුදුසුකම් ඇති අය පත් වෙලා ඉන්නවා ද, ඒ නිලවරණවලින් එන අය එන්නේ ඡන්දය පාවිච්චි කරන්න සුදුසුකම් ලැබූ ක්‍රීඩා සංගම්වලින්ද කියන එක පරීක්ෂා කර බලන්න ඕනෑ. එහෙම නැත්නම් අප මොන සංශෝධන ගෙනාවත්, අවසානයේ ඡන්දය පාවිච්චි කරලා පත් වන්නේ අවශ්‍ය සුදුසුකම් ලැබූ අය නොවෙයි. අද මලල ක්‍රීඩා සංගම් තිබෙනවා. බැඩ්මින්ටන් සංගම් තිබෙනවා. ගුඩු විදිමේ සංගම් තිබෙනවා. මේ ආදී විවිධ ජාතික ක්‍රීඩා සංගම් පිහිටුවා තිබෙනවා. මේ සංගම් පිහිටුවනකොට ඒ සංගම්වල සාමාජිකත්වය ගන්නා සංගම්වලටත් පත් වන්නේ හරියාකාර නිලවරණ පවත්වා මේ කියන විධියේ සුදුසුකම් ඇති අයද කියන එක විමසන්න පුළුවන් වන විධියට මෙයට යම් කිසි සංශෝධනයක් නැත්නම් ඒ සඳහා වූ වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියා මම මෙහිදී ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට යොජනා කරනවා. එසේ නැතිව මවු සංගමය දිහා විතරක් බලා වැඩක් නැහැ. මේ මවු සංගමයට පත් වන උදවියට ඡන්දය පාවිච්චි කරන සාමාජික සංගම් හරියාකාරව විනිවිදභාවයක් ඇතිව ඒ කටයුතු කර ගෙන යනවාද කියා බලන්න ඕනෑ. එහෙම නැත්නම් අප බලන්නේ මවු සංගමයට පත් වන උදවිය දෙස විතරයි. මවු සංගමයට ඒ අය පත් වන්න ඡන්දය දෙන්න එන නියෝජිතයන්ගේ සංගම් හරියාකාරව පවත්වා ගෙන යනවාද, ඒවා පවත්වා ගෙන යන්නේ කොයි ආකාරයෙන්ද, ඒවා වාර්ෂික නිලවරණ පවත්වා තිබෙනවාද, ඒවා නියමාකාරයෙන් ක්‍රීඩා තරගවලට සහභාගි වී තිබෙනවා ද, ක්‍රීඩා සංගමයක් හැටියට ඒ අය සුදුසුකම් ලබා තිබෙනවාද කියා බලන්නේ නැත්නම් මවු සංගමයට කොයි තරම් නිලධාරීන් පත් කළත් වැඩක් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අතර සමහර ජාතික සංගම්වලට ක්‍රීඩා සමිති තුනයි හතරයි තිබෙන්නේ. එහෙම නම් ජාතික සංගමයක් වෙනවා නම් රට පුරා කොයිතරම් ක්‍රීඩා සංගම් සංඛ්‍යාවක් තිබෙන්නට ඕනෑ ද කියා නීතියක් එන්න ඕනෑ. ඒ අනුව තමයි මවු සංගමයේ සාමාජිකත්වය ලබා ගන්නට පුළුවන් වන්නේ. අපි උඩ තට්ටුවට විතරක් මේ ගැන කථා කර හරි යන්නේ නැහැ. යට තට්ටුවේ ඉඳලා එන ආකාරය ගැන අප කල්පනා කරන්නට ඕනෑය කියන එක මේ අවස්ථාවේදී මා කියන්නට කැමතියි. ඒ වාගේම මේ සංගම්වල කටයුතුවල විනිවිදභාවයක් ඇති වීම ඉතාමත් වැදගත් වෙනවා.

අද මේ නියෝගවලින් ඉතාම වැදගත් යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වෙනකොට සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ සමහර කාරණා නිවැරදි කර ගන්න පුළුවන්කමක් ඇති වෙනවා. නමුත් ගරු මන්ත්‍රීතුමනි, එක කාරණයක් ගැන මම කනගාටු වෙනවා. මේ රටේ ජනාධිපතිතුමාට තමයි තමුන්නාන්සේ චෝදනා කරන්නේ. යුද්ධ කාලයේ තමුන්නාන්සේලාගේ පක්ෂය හැසිරුණේ කොහොමද කියන එක තමුන්නාන්සේලා ජාතියක් හැටියට කල්පනා කර බලන්නට ඕනෑ. එදා ඒකට හරියකාරව උදව්වක් කළා නම් අද තමුන්නාන්සේලා කරන විවේචනය අප පිළිගන්නවා. මාත් ඔය පක්ෂයේ සිටි කෙනෙක්. හැමදාම තමුන්නාන්සේලා වැරදියට විවේචනය කළේ. යුද්ධ කාලයේ තමුන්නාන්සේලා කළ විවේචන තමුන්නාන්සේලාට මතක නැහැ. එදා යුද්ධය ජයග්‍රහණය කරනවාය කියා තමුන්නාන්සේලා විශ්වාස කළේ නැහැ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ විශ්වාස කළාට පක්ෂයක් හැටියට තමුන්නාන්සේගේ පක්ෂය විශ්වාස කළේ නැහැ. [බාධා කිරීම්] නමුත් තමුන්නාන්සේලාගේ පක්ෂයේ කවුරුවත් ඒ ගැන විරුද්ධත්වය ප්‍රකාශ කළේත් නැහැ.

අවංකව මම දන්නවා, තමුන්නාන්සේලා ඒකට පක්ෂ වුණ බව. නමුත් පක්ෂයක් හැටියට ඒ සඳහා කටයුතු කළේ නැහැ. ඒ පක්ෂය තුළ ඒ වරද නිවැරදි කරන්න තමුන්නාන්සේලාට ශක්තියක් තිබුණෙත් නැහැ. අපි නම් උත්සාහ කළා. බැරි වුණු නිසා අතහැරලා ආවා. [බාධා කිරීමක්] කිව්වා. ඇත්ත. මම පිළිගන්නවා. නමුත් තමුන්නාන්සේලා පක්ෂයක් හැටියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා, පක්ෂ තීන්දු අනුව එදා ඡන්දය පාවිච්චි කළේ ආණ්ඩුව පරාජයට පත් කරන්නයි; යුද්ධය කඩාකප්පල් කරන්නයි. අද තමුන්නාන්සේලා විපක්ෂයක් හැටියට ආණ්ඩු බලය ගන්න කල්පනා කර ගෙන කථා කරනවා මිසක්, ඇත්ත තත්ත්වය - යථාර්ථය- පිළිබඳව කථා කරන්නේ නැහැ.

අද අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට, නාමල් රාජපක්ෂ මැතිතුමාට සහ අනෙකුත් උදවියට. එතුමන්ලා මැදිහත් වෙලා ක්‍රීඩාව ජයග්‍රහණය කරන්න, ක්‍රීඩාව දියුණු කරන්න විශාල වැඩ කොටසක් කළා.

රගර් ක්‍රීඩාව ගත්තාම, එදා රගර් ක්‍රීඩාවට monopoly එකක් තිබුණා. එක්සත් ජාතික පක්ෂයේ සභාපතිතුමාගේ monopoly එකක් තිබුණා. අද ඒක වෙනස් වෙලා. අද ඒක අනෙකුත් ක්‍රීඩා සමාජවලට ගිහින් තිබෙනවා. ඒ අයට ඡන්ද බලය හිමි වෙලා තිබෙනවා. ඒ ක්‍රීඩාව කලින් කලට එක එක පාලකයන්ට ඕනෑ විධියට පාලනය කළා. නමුත් අද විවෘත වෙලා තිබෙනවා. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කල්පනා කරන්නේ ඒ වැඩ පිළිවෙළ තවත් ශක්තිමත් කරන්නයි. අපට යුතුකමක් තිබෙනවා, ක්‍රීඩාව වෙනුවෙන් කල්පනා කරලා ඒ ශක්තිමත් කරන වැඩ පිළිවෙළට උදව් කරලා ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කරන්න; ශක්තිමත් කරන්න. අද ක්‍රීඩා ක්ෂේත්‍රයේ විවිධ අවස්ථා අපි ජයග්‍රහණය කර තිබෙනවා. එහෙම ජයග්‍රහණය කළේ ක්‍රීඩාවේ හිටපු ප්‍රවීණයන් දුන් ශක්තියත්, ඒ අය දුන් දායකත්වයත්, ඒ අය දුන් ආදර්ශයත් නිසායි.

අද ක්‍රිකට් ක්‍රීඩාව ගත්තත් අපි ඉහළ මට්ටමක ඉන්නවා. ජාතික මට්ටමේදී, ජාත්‍යන්තර මට්ටමේදී අපි දෙවන ස්ථානයට ඇවිත් තිබෙනවා. පළමු ස්ථානයට එක වරක් ඇවිත් තිබෙනවා. අනෙක් හැම වාරයකම වාගේ ඉතා දක්ෂ ලෙස ක්‍රීඩකයන් ක්‍රීඩා කර තිබෙනවා. ක්‍රීඩකයන් විවේචනය කරනවා අපි දැක්කා. ඒක වැරැදියි. අපි ක්‍රීඩකයන් උනන්දු කරන්න ඕනෑ. ක්‍රීඩකයන් ශක්තිමත් කරන්න ඕනෑ. ඒ ආයතන ශක්තිමත් කරන්න ඕනෑ. එහෙම ක්‍රියා කළොත් විතරයි මේ රටේ ක්‍රීඩාව දියුණු කරන්න හැකි වන්නේ.

සුසන්තිකා ජයසිංහ මැනිනිය ක්‍රීඩා කරන විට එතුමියට මොන තරම් ප්‍රශ්න ඇති වුණාද? මාධ්‍ය තුළින් මොන තරම් විවේචන ඇති වුණාද? නමුත් එතුමිය දක්ෂ ලෙස ක්‍රීඩා කරලා, ජාත්‍යන්තරයට ගිහින් ලංකාවට කීර්තියක් අත් කර දුන්නා. ඒ වාගේ ක්‍රීඩකයන් ගණනාවක් සිටිනවා. අපි ඒ අයට අපේ ගෞරව ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒ වාගේ යුගයක් නැවත ඇති කරන්න මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ගෙන යන මේ වැඩ පිළිවෙළට අපි පක්ෂ භේදයෙන් තොරව උදව් කරන්න ඕනෑ; ඒ වැඩ පිළිවෙළ ශක්තිමත් කරන්න ඕනෑ. යටගියාව ගැන කථා ඕනෑ තරම් කරන්න පුළුවන්. හැම කෙනෙකුගේම යටගියාව ගැන කථා කරන්න පුළුවන්. හැම කෙනෙකුගේම යටගියාවේ අඩු පාඩු ගැන කථා කරන්න පුළුවන්. ඒ ගැන කඩදාසි තිබෙනවා; විස්තර තිබෙනවා. ඒ ගැන කථා කිරීමෙන් අද ක්‍රීඩාවට ප්‍රයෝජනයක් ඇති වන්නේ නැහැ. අද ක්‍රීඩාවට ප්‍රයෝජනයක් ඇති වෙනවා නම්, ඉදිරියට යන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. අන්න ඒ වැඩ පිළිවෙළ තමයි අද ඇතිකර තිබෙන්නේ. ඒකට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉතාම හොඳ නායකත්වයක් දෙනවා. ඒ පිළිබඳව මැදිහත් වෙලා ක්‍රියා කරනවා. ඒ වාගේම නාමල් රාජපක්ෂ මැතිතුමාන්ලා ඇතුළු හැම කෙනෙක්ම මේ විෂය සම්බන්ධව ඉතාම හොඳ මැදිහත්වීමක් සිදු කර තිබෙනවා. ඒක ක්‍රීඩාවේ හොඳ අනාගතයක් කියා මා විශ්වාස කරනවා.

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා අද හොඳ ප්‍රවිෂ්ටයකට පැමිණ සිටිනවා. එහෙම නම් එතුමාට අපි උදව් කරන්න ඕනෑ. මෙහි තවත් අඩු පාඩු තිබෙනවා නම් ඒවා පෙන්නුම් කරලා, ඒවා නිවැරදි කරලා මේ ව්‍යාපාරය ශක්තිමත්ව ගෙන යන්න. ඒ නිසා තමයි මම කිව්වේ, ජාතික ක්‍රීඩා සංගම් නිලධාරීන් පත් කරන විට ඒ පත් වන සාමාජික සංගම් මේ පනතට අනුව සුදුසුකම් ලබා තිබෙනවාද කියලා. සමහර ක්‍රීඩා සංගම් තිබෙනවා, තම තමන්ගේ තුන් හතර දෙනෙක් එකතු කරගෙන නිලවරණයට ඡන්දය පාවිච්චි කරන්න විතරක් ලෑස්ති කර ගෙන සිටින. ඒ අයගෙන් පත් වන සභාපතිවරු හරියට වැඩ කරයි කියලා මම හිතන්නේ නැහැ. මූල ඉඳන්ම මේ කටයුතු සම්පූර්ණයෙන්ම නිරාකරණය කරන්න ඕනෑ. මේ නියෝග ගෙන ඒම පිළිබඳව අපේ සතුට හා අපේ ස්තුතිය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.45]

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜூன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉතාම වැදගත් නියෝග කිහිපයක් සම්බන්ධව මේ ගරු සභාවේ සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මටත් අදහස් දක්වන්න වැඩි කාලයක් ලබා දීම ගැන විපක්ෂයේ සංවිධායකතුමාටත් ඒ වාගේම ථිඵන්ඒ පක්ෂයේ සියලුම දෙනාටත් මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. එක අතකින් මම දුක් වෙනවා. මොකද, අපේ ක්‍රීඩා අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා සෑහෙන මහන්සියක් අරගෙන මෙවැනි වැදගත් පනතකට අදාළ නියෝග ගෙනෙන වෙලාවේ අවාසනාවකට වාගේ එතැනින් ඔබ්බට ගිහින් එක්සත් ජාතික පක්ෂයේ වැරදි කියමින් ආණ්ඩුවට ගිය ඇමතිවරු කථා කළා. ඒ ගැන මම ඉතාම කනගාටු වෙනවා. මම ඒ ගැන කියන්න වැඩිය කාලය ගන්නේ නැහැ.

විශේෂයෙන්ම මම ගරු ක්‍රීඩා ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා, ක්‍රීඩාව ආරක්ෂා කරන්න ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න යන බව අලුතින් හඳුන්වා දී තිබෙන මේ සංශෝධනවලින් අපට පෙනෙන නිසා. නමුත් මම එතුමාට ඉතා වග කීමෙන් කියන්න ඕනෑ, එතුමාට මේ සංශෝධන ලබා දුන් උපදේශකවරු ක්‍රීඩාව අර්බුද රාශියකට ඇද දමා ඇති බව. නමුත් එතුමා අපට ප්‍රකාශ කළා, "සංශෝධන සහිතව මෙවා ක්‍රියාත්මක විය යුතුයි" කියලා.

මම මේ ගරු සභාවට මතක් කරන්න ඕනෑ, ගරු කේ.බී. රත්නායක හිටපු ක්‍රීඩා ඇමතිතුමා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත හරහා ක්‍රීඩා සංවර්ධනයට සහ යහ පැවැත්මට අවශ්‍ය නීති රීති සකස් කොට තිබුණු බව. ඒ පනත ඉතාම ගෞරවනීය පනතක්. සමහර විට මේ ගෙනැත් තිබෙන සංශෝධනවල තිබෙන අඩුපාඩු නිසා, මේ සංශෝධනවලින් කියන සමහර කාරණා නිසා ඒ පනත හැල්ලුවට පත් වන අවස්ථා කීපයක් තිබෙනවා.

අද බොහෝ දෙනා ජාතික සංගම්වල තනතුරුවලට එන්නේ, තමන්ගේ දේවල් කර ගන්න, තමන්ට නමක් හදා ගන්න, මේ සංගම්වලින් මුදල් හොරකම් කර ගන්න, එහෙමත් නැත්නම් මේ සංගම්වලට තමන්ගේ ඥාතීන් දමලා රැකියා ලබා දෙන්න. ක්‍රීඩාවට ආදරයෙන් ඒ තනතුරුවලට එන අය අඩු බව අපි පසු ගිය කාලයේ දැක්කා.

ක්‍රීඩා පනත තුළින් ක්‍රීඩා ඇමතිතුමාට කිසියම් බලයක් ලබා දීම ගැන මම විරුද්ධ වන්නේ නැහැ. ඕනෑම ඇමතිවරයකුට වගකීමකින් කටයුතු කරන්න බලයක් ලබා දිය යුතුයි. නමුත් ඒ බලය හරහා දූෂිත පුද්ගලයන් එහෙමත් නැත්නම් නුසුදුසු පුද්ගලයන් තනතුරුවලට පත් කරනවා නම් එතුමා රටට කරන්නේ ලොකු විනාශයක්. ඒ නිසා මේ නියෝගවල බොහෝ කරුණු සංශෝධනය වෙලා ක්‍රියාත්මක වනවා නම්, අපි ඒකට සහයෝගය දිය යුතුයි කියලා මා හිතනවා.

විශේෂයෙන්ම කවුරු නැහැයි කිව්වත් පසු ගිය කාලය තිස්සේ අපි දැක්කා ක්‍රීඩාවට දේශපාලන බලපෑම් ආපු බව. ක්‍රීඩාව හුහක් දුරට විනාශ වුණේ දේශපාලන බලපෑම් නිසායි. අපි දැක්කා, ඇමතිතුමාත් අසරණ වෙන සමහර අවස්ථා. මට මතකයි, එක කාරණයක්. IPL තරගාවලියකදී අපේ කණ්ඩායමේ ඉන්න ක්‍රීඩකයන්ට නැවත එන්න කියලා එතුමා කථා කළ වෙලාවේ, ඉන් දින කීපයකට පසුව නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඒ IPL තරගාවලියට ගිහිල්ලා, තෑගි දෙන උත්සවයටත් සහභාගි වුණා. එතැනින් පසුව සියලු දේ වෙනස් වුණු අන්දම අපි දැක්කා. ඉතින් මෙවැනි දේවල් නිසා පසු ගිය කාලයේ ක්‍රීඩාවට ලොකු විනාශයක් වුණා. අපේ බලාපොරොත්තුව, ක්‍රීඩාව ආරක්ෂා කිරීමයි. ක්‍රීඩා ඇමතිතුමා ආරක්ෂා කිරීමයි. ඒ සඳහා මේ නියෝග හුහක් උදව් වනවා.

මම ඇයි ඇමතිතුමාට බලය දෙන්න ඕනෑ කියන මතයේ ඉන්නේ? ඇමතිවරයෙක් වුණාම බලයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම ඒ බලය හරි විධියට පාවිච්චි කරන්න ඕනෑ. මොකද, පසු ගිය කාලවල අපි දැක්කා, ඇමතිවරු තමන් දන්නා, අනවශ්‍ය පුද්ගලයන් ඒ ඒ තනතුරුවලට පත් කරන්න ඒ බලය යොදන්න මහන්සි වුණු අන්දම.

මට මේ අවස්ථාවේදී මතක් වනවා, ගරු ගාමිණී දිසානායක හිටපු ඇමතිතුමා. ඒ ඇමතිතුමා ක්‍රිකට් ක්‍රීඩා නොකළත්, ක්‍රිකට් පාලක මණ්ඩලයට එන්න නුසුදුසු තත්ත්වයක් තිබුණත්, එවකට හිටිය වින්සන්ට් පෙරේරා ක්‍රීඩා අමාත්‍යතුමා එතුමාට අවසර ලබා දුන්නා ක්‍රිකට් නිලවරණවලට ඉදිරිපත් වන්න. ඒ හරහා අපි ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තරයට අරගෙන ගිහිල්ලා ලෝක කුසලානය ජයග්‍රහණය කළා; ලෝක කුසලාන අවසන් තරගවලට ආවා. ක්‍රිකට් මේ තත්ත්වයට ගෙන එන්න එතුමා ලොකු සංවර්ධන වැඩ පිළිවෙළක් කළා.

විශේෂයෙන්ම මට මතකයි, එතුමා වසර අටකට වැඩි කාලයක් ක්‍රිකට් ආයතනයේ ඉන්න, හිටපු ක්‍රීඩා ඇමතිතුමාගේ බලය යොදලා අවස්ථාව හදා ගත් බව. අන්න ඒක තමයි මම කියන්නේ එවැනි සුදුසු පුද්ගලයන් පත් කිරීමේ බලය -සමහර අය මේකට විරුද්ධ වෙයි - ඇමතිවරයාට දිය යුතු බව. අපි අද සන්තෝෂ වනවා, ඒ බලය ඇමතිතුමා පාවිච්චි කිරීම ගැන. අපට එය ඒ තරම් ලොකු ප්‍රශ්නයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම කිව යුතු අනෙක් කාරණාව මෙයයි. මෙතැන නැති වුණත් මම කියන්න ඕනෑ අපේ ඩිලාන් පෙරේරා ඇමතිවරයා වොලිබෝල් සංගමයේ ඉතාමත් හොඳ වැඩ කොටසක් කරගෙන යනවාය කියා. එතුමා වොලිබෝල් සංවර්ධනය වෙනුවෙන් මේ රට පුරාම ලොකු සංවර්ධන ක්‍රියාදාමයක් දියත් කොට යන බව අපි දැනුවත් වෙලා තිබෙනවා. ඒ වාගේම වොලිබෝල් ක්‍රීඩකයනුත් අපට කථා කරලා කියලා තිබෙනවා. ඉතින් එවැනි පුද්ගලයන්ට ක්‍රීඩාවේ රැඳෙන්න ඇමතිතුමාගේ බලය අවශ්‍යයි. මම කියනවා, ඒක අයින් කර ගන්න එපා කියලා. තමුන්නාන්සේ ඒ බලය තියා ගෙන හරි පුද්ගලයන් ඒ තැනට ගෙනෙන්න වැඩ කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අලුත්ම විකාරය තමයි සුරාජ් දන්දෙනිය මහත්මයා ගැන මේ දවස්වල සිදු වන කථා බහ. සුරාජ් දන්දෙනිය මහත්මයා මෙතැන නැති නිසා මම එතුමා ගැන කියන්න යන්නේ නැහැ. නමුත් ක්‍රිකට් පරිපාලනයට ආවේ කොහොමද කියලා මම කියන්න ඕනෑ.

එතුමාගේ මාමා තමයි හිටපු ක්‍රිකට් ක්‍රීඩක ඩී.එස්. ද සිල්වා මහත්මයා. එතුමා ක්‍රිකට් ආයතනයේ සභාපති වෙලා ඉන්න කොට ලෝක ක්‍රිකට් කවුන්සිලයෙන් - ICC එකෙන්- මේ රටේ පවත්වා ගෙන කාර්යාලය සඳහා එතුමා අධ්‍යක්ෂ හැටියට පත් කර ගත්තා. ඔහුගේ සුදුසුකම් බැලුවේ නැහැ. අඩු ගණනේ කිහිප දෙනෙකුව interview කෙරුවේ නැහැ. ඔහුව පත් කළේ ඥාති බෑණා හින්දා පමණයි. අයදුම්පත් කැඳවන්නේ නැතුව මේ ක්‍රිකට් කවුන්සිලයේ රැකියාවට එතුමා පමණක් නොවෙයි, එතුමාගේ සහෝදරයාත් ඩී.එස්. ද සිල්වා මහත්මයා පත් කළා. ගරු ඇමතිතුමනි, ලෝක කුසලාන තරඟාවලියේ විකුණපු ටිකට් පත් පිළිබඳව අද වෙන කල් දැනුවත් කිරීමක් කරලා නැහැ. අපි දැක්කා, ක්‍රිකට් ආයතනයේ computers ඇතුළේ තිබුණු hard disks පවා නැති වෙලා තිබුණු ආකාරය. එච්චර හොඳ ආරක්ෂාවක් තිබෙන ක්‍රිකට් ආයතනයේ computerවල තිබෙන hard disks පවා ගලවාගෙන යන්න පුළුවන් සුරාජ් දන්දෙනිය මහත්මයාව දැන් බැඩ්මින්ටන් පරිපාලනයට ගෙනෙන්න හදනවා කියලා පුවත් පත්වල තිබෙනවා මම දැක්කා. මම හිතනවා, ඔබතුමා එවැනි දේවල්වලට සහභාගි නොවේවිය කියලා. ඒ වාගේ පුද්ගලයන්ට එන්න දෙනවා නම් තමයි අපට ප්‍රශ්නයක් වෙන්නේ. මොකද අනවශ්‍ය පුද්ගලයන් වුණත් ගෙනෙන්න බලයක් මේ තුළින් ක්‍රීඩා ඇමතිවරයාට ලැබෙන නිසා. මම හිතනවා, ඒ ගැන එතරම් ලොකු ප්‍රශ්නයක් නැහැ කියලා. මොකද අපි ඇමතිතුමා ගැන ලොකු බලාපොරොත්තුවකින් ඉන්න නිසා. ඒක නිසා මම ඇමතිතුමාගෙන් ඉල්ලනවා, මෙවැනි දේවල්වලට නම් සහභාගි වෙන්න එපා කියලා. හුහාක් දෙනෙකු පාර්ලිමේන්තුවේදී කථා කරපු දෙයක් තමයි මේ සංශෝධනවල ඇති වටිනාකම. මම ගරු ඇමතිතුමාට පසු ගිය දින කිහිපයකට ඉස්සෙල්ලා ලියුමක් එව්වා. ඒ ලියුම හරහා සංශෝධන සහිත යෝජනාවලියක් මම එතුමාට එව්වා. මම එතුමාට එවපු ඒ යෝජනාවලිය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

මේ සංශෝධන පදනම් වන්නේ දැනට ක්‍රියාත්මක වන ක්‍රීඩා පනතට සාදා ඇති නියෝගවලට බව මම ඉතාමත් වගකීමකින් කියනවා. එනම් 1973 අංක 25 දරන ක්‍රීඩා පනත මේ අනුව නියෝග අංක 11, 12, 13, 14, 15, 16, 17, 26, 31, 33 සහ 34 යන නියෝග සංශෝධනය විය යුතු බව මම පැහැදිලි කරන්න ඕනෑ. මෙහිදී විශේෂයෙන්ම අපි සැලකිලිමත් විය යුතු කාරණයක් තිබෙනවා. අපි මේ කරන්නේ ක්‍රීඩාව ආරක්ෂා කිරීම මිස පුද්ගලයන් ආරක්ෂා කිරීම නොවන බව මම ඉතාමත් වගකීමකින් කියනවා. මීට අමතරව නව ගැසට් නිවේදනයේ සඳහන් නියෝග පැරණි නියෝග අංක සමඟ නොගැළපෙන බැවින් එයද සම්බන්ධ කිරීමට ඉතාමත් අසීරු කරුණක් වෙලා තිබෙන බව මම ඇමතිතුමාට ඉතාමත් කාරුණිකව කියනවා. ඒ නිසා මම හුහාක් දුරට පැරණි ව්‍යවස්ථාව පදනම් කරගෙන තමයි අංක සහිත සංශෝධන ඉදිරිපත් කරන්නේ. විශේෂයෙන්ම නියෝග අංක 11, 12 ජාතික සංගම් නිලධාරීන්ගේ ධුර කාලය සම්බන්ධ කරුණක් නිසා මේ නියෝග දෙකම ගැන මම සභාවට දැනුවත් කරන්න ඕනෑ. ඒක දීර්ඝව තිබෙන දෙයක්. නමුත් මගේ යෝජිත සංශෝධනය ගැනත් ඔබතුමා දැනුවත් කරන්න ඕනෑ. එම සංශෝධනයන්හි මෙසේ සඳහන් වෙනවා:

"ජාතික ක්‍රීඩා සංගමයක නිලධාරීන් සහ කාරක සභිකයින් එම ජාතික ක්‍රීඩා සංගමයේ අනුබද්ධ ක්‍රීඩා සමාජයක හෝ ආයතනයක සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය. ඔවුන් වසර දෙකක ධුර කාලයක් සඳහා වසර දෙකකට වරක් පවත්වනු ලබන මහා සභා රැස්වීමකදී තෝරා ගනු ලැබිය යුතුය.

සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ධුරයක ඇති වන යම් පුරප්පාඩුවකදී, එම තනතුරු මහා සභා රැස්වීමකදී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී පුරවා ලිය හැකිය. වෙනත් යම් පුරප්පාඩුවක් මහා සභාවක අනුමැතියට යටත්ව කාරක සභාවකදී පුරවනු ලැබිය හැකිය."

නියෝග අංක 12 යටතේ මා මෙසේ සඳහන් කරනවා:

"(i) මේ නියෝග වලංගු වීමෙන් පසු යම් කිසි ජාතික ක්‍රීඩා සංගමයක සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උපසභාපති, උපලේකම් හා උපභාණ්ඩාගාරික වශයෙන් පිට-පිට ධුර කාල දෙකක් දැරූ කිසිම තැනැත්තෙක් එම ධුරය අවසන් කළ දින සිට වසර දෙකක කාලයක් යන තෙක් එම ධුරයන් සඳහා නැවත තෝරා ගැනීම පිණිස ඉදිරිපත් වීමට සුදුසුසන් නොවන්නේය. ධුර දරන්නන්ගේ උපරිම ධුර දැරීමේ කාලය වසර හතරක් ඉක්ම යා නොහැක.

එසේ වුවද, සභාපති ධුරය දැරූ තැනැත්තා සඳහා පමණක් ඔහු විසින් අදාළ සංගමයේ ක්‍රීඩාවේ උන්නතියට සිදු කොට ඇති සේවය පිළිබඳව කරනු ලබන විමර්ශනයකින් පසු අමාත්‍යාවරයා සෑහීමකට පත් වන්නේ නම් ඔහුට තවත් එක් වරක් පමණක් අමාත්‍යාවරයාගේ ලිඛිත අනුමැතිය යටතේ එම ධුරය සඳහා ඉදිරිපත් විය හැකිය. ඔහුගේ තනතුර හොබ වනු ලබන කාලය වසර හයකට වැඩි නොවිය යුතුය.

(ii) තවද, ඕනෑම නාම යෝජනාකරුවකුට එකම අවස්ථාවක, එකම කාල පරිච්ඡේදයක ජාතික සංගම් දෙකක හෝ වැඩි සංඛ්‍යාවක ධුර දැරීම කළ නොහැකිය."

ගරු ඇමතිතුමනි, මා මේ කාරණාව කියන්නේ ප්‍රධාන වශයෙන් මේ හේතුව නිසායි. පසු ගිය කාලයේ අපි දැක්කා, ඔලිම්පික් කමිටුවේ සභාපතිවරයා අපි දන්නා තරමට අත් පන්දු සංගමය, වෙඩි තැබීමේ සංගමය, දුනු විදීමේ සංගමය වැනි සංගම් රාශියක නිලතල දරමින් සිටි බව. එතකොට මෙය කරන්නේ වෙන දෙයකට නොවෙයි; ඔලිම්පික් සංගමයේ සභාපති ධුරය සඳහා එතුමාට ඡන්ද පදනම හදා ගන්නයි. ඉතින් මා ඉල්ලා සිටිනවා, මේ යෝජනා වන නම් ක්‍රීඩා දෙකකට, තුනකට ලබා නොදී එක ක්‍රීඩාවකට පමණක් ලබා දෙන්න කියලා. මා එය පැහැදිලිව කියා තිබෙනවා.

ඒ වාගේම නියෝග අංක 13ත් ඉතාම වැදගත් දෙයක්. මා එහි මෙසේ සඳහන් කරනවා:

"(i) යම් තැනැත්තකු අදාළ ජාතික ක්‍රීඩා සංගමය විසින් ලේඛනගත කරනු ලබන හෝ ලියා පදිංචි කරනු ලබන හෝ අනුමත කරනු ලබන යම් ප්‍රධාන ක්‍රීඩා තරඟාවලියකදී හෝ ක්‍රීඩා උත්සවයකදී හෝ සංගමය විසින් සංවර්ධනය කරනු ලබන ක්‍රීඩා තරඟාවලියකදී, කණ්ඩායම් තරඟාවලියකදී හෝ තනි තරඟයකදී දස වරකට වැඩි වාර ගණනක් සහභාගි වී ජයග්‍රහණ ලබා ඇත්නම් හෝ එක් වරක්වත් ජාතික කණ්ඩායම නියෝජනය කර ඇත්නම් මිස යම් ජාතික සංගමයක භාණ්ඩාගාරික ධුරය, උප භාණ්ඩාගාරික ධුරය හැර එම සංගමයේ නිලධාරියකු හෝ කමිටු සාමාජිකයකු වශයෙන් ඒ තැනැත්තා නම් කරනු නොලැබිය යුතුය.

(ii) එසේ වුවද, සභාපති ධුරය සඳහා පමණක් "i" වන අතුරු ඡේදයේ සඳහන් ක්‍රීඩා සුදුසුකම් සපුරා නොමැති වුවද, අදාළ ක්‍රීඩාව සංවර්ධනය කිරීමට හැකියාවක් ඇති, දූෂණ, අක්‍රමිකතා, චෝදනාවලට ලක්ව නොමැති සහ විවිධ අනුග්‍රහයන් ලබා දීමට හැකි එක් අයෙකු සඳහා පමණක් ක්‍රීඩා විෂය භාර අමාත්‍යාවරයාගේ ලිඛිත අනුමැතිය යටතේ එකී ධුරය සඳහා ඉදිරිපත් විය හැක."

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු අර්ජුන රණතුංග මහතා]

මෙහිදී තරග 10ක් කියා විශේෂයෙන්ම මා සඳහන් කරන්නේ මේ කාරණය නිසායි. ගරු ඇමතිතුමනි, අත් දැකීම් එක්ක මා දැක්කා, පළමුවන පෙළ ක්‍රීඩා කිරීම ක්‍රිකට් පාලක මණ්ඩලයට එන්න අවශ්‍ය සුදුසුකමක් හැටියට. උදාහරණයක් හැටියට මා ක්‍රිකට් පාලක මණ්ඩලය ගන්නම්. ගරු ඇමතිතුමනි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාලයේ බොහෝ දෙනෙක් කළේ එක තරගයකට සහභාගි වන එකයි. කණ්ඩායම තෝරන කොට 11දෙනකුගේ නම් ඇතුළත් වනවා. නමුත් ඔවුන් ක්‍රීඩා කරන්නේත් නැහැ; පිටිටනියටවත් බහින්නේ නැහැ. නමුත් ඔවුන්ගේ නම තිබෙනවා. ඒ නම හරහා ඒ ගොල්ලෝ ජාතික ක්‍රීඩා ආයතනවලට සුදුසුකම් ලබනවා. අපි අවස්ථාවන් 10ක් දැම්මොත් අනිවාර්යයෙන්ම මේ නුසුදුසු පුද්ගලයන් එක තරගයක් ක්‍රීඩා කරලා - උදාහරණයක් වශයෙන් වොලිබෝල් ක්‍රීඩාවත් ගන්න පුළුවන්. වොලිබෝල් ක්‍රීඩාව සඳහා කණ්ඩායමක් නම් කරන කොට 12දෙනකු නම් කරනවා. නමුත් එක වරකට ක්‍රීඩා කරන්නේ හයදෙනායි. ඕනෑ නම් එක ක්‍රීඩකයෙක්, ක්‍රීඩකයන් දෙදෙනකු බංකුවේම තබන්න පුළුවන්. නමුත් ඒ ක්‍රීඩා කරපු හැටියට තමයි මේ පුද්ගලයන්ව බොහෝ විට දැනුවත් වන්නේ. එම නිසා මා හිතනවා, මෙය ඉතාමත් වැදගත් කාරණාවක් කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මවිසින් යෝජිත සංශෝධන අඩංගු නියෝග අංක 14 යටතේ සහ නව ගැසට් නිවේදනයේ අංක 15 යටතේ දක්වා ඇති නිලධාරීන්ගේ සුදුසුකම් පිළිබඳව ගැටලු රාශියක් පවතිනවා. මෙයින් ප්‍රධාන ගැටලු කීපයක් මම මේ සභාවට කියන්න කැමැතියි. දැනට ඉදිරිපත් කර ඇති ගැසට් නිවේදනයේ සඳහන් වන කරුණු ප්‍රමාණවත් නැති බව මම කිව යුතුයි. මේ රටේ වැරැදි කරන හැම දෙනාටම දඬුවම් ලැබිලා නැහැ. මේකට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ එක්කෝ මුදල් බලය, නැත්නම් දේශපාලන බලය.

මම සංශෝධනයක් ලෙස මාගේ යෝජිත සංශෝධන ඇතුළත් නියෝග අංක 14 (1) (ඇ) මේ සභාවට ඉදිරිපත් කරනවා. මෙහිදී මම ප්‍රධාන කාරණා කීපයක් ගැන තමයි දැනුවත් කරන්නේ. යෝජිත සංශෝධන නියෝග අංක 14(1) (ඇ) මෙසේය:

"(ඇ) යම් වරදක්, දූෂණයක්, අක්‍රමිකතාවක් සඳහා නිසි බලය ඇති අධිකරණයකින් හෝ රජය පිළිගනු ලබන විනය මණ්ඩලයකින් හෝ රජය පිළිගත් එවැනි ආයතනයකින් වරදකරුවෙකු කරනු ලැබ ඇත්නම් හෝ වරදකරුවකු කර සිටිනම් හෝ දඬුවම් විඳ ඇත්නම් හෝ"

ඒ විධියට මෙම කොටස වෙනස් කරන්න කියලා ගරු ඇමතිවරයාගෙන් මම ඉල්ලා සිටිනවා.

එපරිදිම මාගේ යෝජිත සංශෝධන ඇතුළත් නියෝග අංක 14 (1) (ඈ) පහත සඳහන් පරිදි ඉදිරිපත් කරනවා:

"(ඈ) යම් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයන්හි වෘත්තීයමය ජනමාධ්‍යවේදියෙකු හෝ එවැනි මාධ්‍ය ජාලයක සෘජුව හෝ වක්‍රව අයිතිකරුවෙකු ලෙස සිටි නම් හෝ සිටියේ නම් හෝ එම ආයතනයක සෘජුව හෝ වක්‍රව සේවයේ යෙදී සිටින්නකු නම් හෝ"

එවැන්නකු මේ සඳහා සුදුසු නැහැ කියලා මම කියනවා. මම මේ සංශෝධනය ඉල්ලා සිටින්නේ ඇයි? ගරු ඇමතිතුමනි, මේ සංශෝධනයේ "සිටියේ නම්" කියා දමන්නේ ඕනෑම කෙනෙකුට මේ නාම යෝජනා දෙන්න දවස් කීපයකට ඉස්සෙල්ලා තමන් සේවය කරන ආයතනයෙන් ඉවත් වෙලා නාම යෝජනා දීලා ඒකට සුදුසුකම් ලබන්න පුළුවන් නිසායි. ඔබතුමාට කැමැති නම්, ඒ සඳහා වසර පහක් හෝ දහයක් හෝ යම් කාලයක් නියම කරලා මෙවැනි පුද්ගලයන් ඒ වසර පහක හෝ දහයක කාලය මාධ්‍ය ආයතනයකට සම්බන්ධ නොවී ඉන්න ඕනෑ, ඊට පස්සේ තමයි එන්න පුළුවන් වන්නේ කියලා සඳහන් කරන්න පුළුවන්.

ඒ වාගේම මාගේ යෝජිත සංශෝධන ඇතුළත් නියෝග අංක 14 (1) (ඊ) පහත සඳහන් පරිදි ඉදිරිපත් කරනවා:

"(ඊ) ඒ තැනැත්තා ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් නිල බලයෙන් ජාතික සංගමයකට පත් කරන්නේ නම් මිස, ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරනු ලැබ ඇති රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක විධායක නිලධාරියෙකු වේ නම් හෝ"

ඒ අයුරින් ඒ කොටස වෙනස් වන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා.

මෙහි සූදු ව්‍යාපාරය ගැනත් සඳහන්ව තිබෙනවා.

මාගේ යෝජිත සංශෝධන ඇතුළත් නියෝග අංක (14) (1) (උ) පහත සඳහන් පරිදි ඉදිරිපත් කරනවා:

"(උ) ඔට්ටු ඇල්ලීමේ සූදු ව්‍යාපාරයක් කර ගෙන යෑමට සෘජුවම හෝ වක්‍රව සම්බන්ධව සිටී නම් හෝ සිටියේ නම් ඒ තැනැත්තා, යම් ජාතික සංගමයකට තෝරා පත් කරනු ලැබීමට හෝ අන්‍යාකාරයෙන් සංගමයක වැටුප් සහිතව හෝ වැටුප් රහිතව යම් ධුරයක් දැරීමට හෝ තව දුරටත් දරමින් සිටීමට හෝ නාමිකයකු වීමට නුසුදුස්සකු වන්නේය.

මෙම ඡේදයේ කාර්යය සඳහා ඔට්ටු ඇල්ලීම යන්නට, ඔට්ටු ඇල්ලීමේ හෝ අහඹු ජයග්‍රහණ සහිත හෝ ජයග්‍රහණ සඳහා සම්මිශ්‍රිත අවස්ථා සහිත ක්‍රීඩාවක යෙදීමේ යම් ක්‍රීඩාවක් හෝ ලෝකයේ කවර තැනක හෝ පැවැත්වෙන, තුරග තරග හා සූදු ව්‍යාපාරය ඇතුළු යම් ක්‍රීඩා ඉසව්වක ප්‍රතිඵලය පදනම් වන කවර හෝ ස්වරූපයේ මූල්‍ය සම්ප්‍රේෂණයක් ඇතුළත් වේ."

ගරු ඇමතිතුමනි, මම මේ මඟින් කියා සිටින්නේ සූදු ව්‍යාපාරය සම්බන්ධයෙන් තිබෙන දේ කිසිම ලෙසකින් ප්‍රමාණවත් නැහැ කියලායි. ඒකට ප්‍රධානම හේතුව වෙලා තිබෙන්නේ පසු ගිය කාලය පුරාම සමස්ත ක්‍රීඩාවට සූදු අංශයෙන් ප්‍රශ්න ගොඩක් ඒමයි. තරග පාවාදීම් අපි දැක්කා. ඒ වාගේම ක්‍රිකට් ක්‍රීඩාවට පමණක් නොවෙයි, පා පන්දු ක්‍රීඩාව ඇතුළු ලෝකයේ හැම තැනම තිබෙන ක්‍රීඩාවන්වලට සූදු ව්‍යාපාරය ඇවිල්ලා මේ ක්‍රීඩාව විනාශ වෙලා තිබෙනවා. මම ඉස්සෙල්ලා සංශෝධනයේදි කිව්වා, වසර කීපයක කාලයක් දමන්න කියලා.

සූදු ව්‍යාපාරයට සම්බන්ධ වෙලා ඉන්න අයට තමන්ගේ ව්‍යාපාරයෙන් කාලයකට ඉස්සෙල්ලා ඉවත් වෙන්න පුළුවන්. නමුත් කාලයකට ඉස්සෙල්ලා ඉන් ඉවත් වුණත් ඒ ව්‍යාපාර තිබෙන්නේ තමන්ගේ පවුලේ ව්‍යාපාරයක් වශයෙනුයි. ඒ ව්‍යාපාරය තමන්ගේ තාත්තා කරන්න පුළුවන්, සීයා කරන්න පුළුවන්, මාමා කෙනෙකු කරන්න පුළුවන්, නැන්දා කෙනෙකු කරන්න පුළුවන්. තමනුයි, තමන්ගේ නෝනායි, දරුවොයි කරන්න ඕනෑ නැහැ. නමුත් ඒ ගොල්ලන්ට ඒ සම්බන්ධතාව තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් සූදු ව්‍යාපාරය කරන පවුලක මා හිටියා නම් හෝ මගේ සහෝදරයෙකු ඉන්නවා නම් ක්‍රිකට් ආයතනයට ආපුවාම මට ක්‍රීඩකයන්ට බලපෑම් කරන්න පුළුවන්, සූදු ව්‍යාපාරයේ යෙදෙන්න කියලා. මා ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා, මේ ගැන ලොකු අවධානයක් යොමු කරලා මේ වෙනස් කිරීම ඇති කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම නියෝග අංක 14 (1) (ඌ) සභාවට ඉදිරිපත් කරන්න මා කැමැතියි. එහි තිබෙන්නේ "මුදල් අයකර ක්‍රීඩා පන්ති, ක්‍රීඩා පාසල් හා ආයතන සෘජුව හෝ වක්‍රව පවත්වාගෙන යනු ලබන්නෙකු නම් හෝ" කියලායි.

අප දැක්කා, පසු ගිය කාලයේ මුදල් අය කර පන්ති පවත්වන කෙනෙකු. ඒ වාගේ කෙනෙකු ක්‍රීඩා සංගමයේ නිලතල දැරීමේ දී ඔහුට අයථා බලපෑම් කරන්න තිබෙන අවස්ථා වැඩියි. විශේෂයෙන්ම පුහුණුකරුවෙකු හැටියට මේ පුහුණුකරුවාට තේරීම් කමිටුවට බලපෑම් කරන්න පුළුවන්. මේ හරහා නිවැරැදි, සුදුසු කණ්ඩායමක් තෝරනවාද කියන කාරණය අපට ලොකු ප්‍රශ්නයක් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම නියෝග අංක 14 (1) (ඒ) යටතේ මෙසේ සඳහන් වෙනවා. එහිදී කියනවා, " ක්‍රීඩකයෙකුගේ හෝ ක්‍රීඩා කණ්ඩායමක වැටුප් ලබන ක්‍රීඩා පුහුණුකරුවකු හෝ පෞද්ගලික කළමනාකරුවෙකු වේ නම් හෝ ඔවුන්ගේ ඒජන්තවරයෙකු වන්නේ නම්" මේ සඳහා සුදුසු නැහැයි කියලා. ක්‍රීඩා සංගම්වලට ඉදිරිපත් වන අයෙකුට ඊට ටික කාලයකට ඉන් ඉවත් වෙලා ඕනෑම දෙයක් කරන්න පුළුවන්. මෙවැනි නියෝගයක් පැනවිය යුත්තේ ඒ නිසයි.

විශේෂයෙන්ම ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ අනික් කාරණය තමයි, පසු ගිය කාලයේ ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධ ඒජන්තවරුන් සම්බන්ධයෙන් වුණු වසංගතය. ඇමතිතුමා ඒ ගැන දන්නවා. මා හිතන්නේ ඔබතුමාත් ඒ ගැන ලොකු තීරණ ගත්තා. අප ඒ ගැන සන්තෝෂ වනවා. ඔබතුමා හොඳ දේවල් කරන කොට මා හැම දාම හොඳයි කියන කෙනෙක්. මේ ඒජන්තවරුන්ගෙන් පසු ගිය කාලයේ වුණු විනාශය මට වඩා ඔබතුමා දන්නවා. ඒජන්තවරුන් මෙම සංගම්වලට පවා ඇතුළත් වෙලා හිටියා. අද සමහර ක්‍රිකට් ක්‍රීඩකයින්ගේ ඒජන්තවරු නැත්නම් කළමනාකාරවරු ක්‍රිකට් ආයතනයේ හිටපු කාලවල තිබුණා. මෙවැනි නීතියක් හරහා මේ පුද්ගලයින් මෙතැනට එන එක නවත්වන්න ඉතාමත් ලේසියෙන් තමුන්නාන්සේට පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම නියෝග අංක 16 යටතේ ඡන්ද පාවිච්චි කිරීමේ ක්‍රමවේදය පිළිබඳ සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. රහස්‍ය ඡන්ද පාවිච්චි කිරීම පිළිබඳව අපගේ විරුද්ධතාවක් නැති වුණත්, සමහර විට ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් මහ සභාවට පැමිණෙන පුද්ගලයා එම ක්‍රීඩා සමාජය ගත්ත තීරණය වෙනස් කර වෙන කෙනෙකුට ඡන්දය ලබා දෙන්න පුළුවන්. ඒ ගැන පොඩ්ඩක් ඔබතුමාගේ අවධානය යොමු කරලා, ඒ සම්බන්ධයෙන් යම් තීරණයක් ලබා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

නියෝග අංක 17 (1), (2), (3), (4) සභාවට මා ඉදිරිපත් කරන්න කැමැතියි. එහි මෙසේ සඳහන් වෙනවා:

"17 (1) ජාතික සංගම්වල තේරීම් කමිටු, නිලධායක කමිටු වල, සභා විභජන කමිටුවල ඒ ඒ ජාතික සංගම් විසින් යෝජනා කරනු ලබන සුදුසුකම් සපුරා ඇති නාම යෝජනාකරුවන්ගේ ජීව දත්ත තොරතුරු විමසා බලා ජාතික සංගම් විසින් දෙනු ලබන නිර්දේශ සැලකිල්ලට ගෙන ක්‍රීඩා අමාත්‍යවරයා විසින් අදාළ කමිටු පත් කරනු ඇත.

(2) යම් තැනැත්තෙකු

(අ) අදාළ ක්‍රීඩාව සම්බන්ධව ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ නිපුණතාවයක් ලබා නොමැති නම්;

(ආ) මුදලට ක්‍රීඩා පුහුණු පන්ති පවත්වන්නෙකු නම් හෝ තක්කාලීන ක්‍රීඩා ජාතික කණ්ඩායමක, ජාතික සංචිතයක ක්‍රීඩා පුහුණු කරුවෙකු නම්;

(ඇ) ක්‍රීඩා කණ්ඩායමක හෝ ක්‍රීඩකයෙකුගේ පුද්ගලික කළමනාකරුවෙකු හෝ ඒජන්තවරයෙකු නම්;

(ඈ) ජාතික ක්‍රීඩා සංචිතයක හෝ ජාතික කණ්ඩායමක හෝ ජාතික කනිෂ්ඨ කණ්ඩායමක ක්‍රීඩකයින් සිටින, දෙමාපියන්ට, සහෝදර සහෝදරියන්ට මෙම කමිටුවල සාමාජිකත්වය දැරීමට හෝ නාමිකයෙකු වීමට සුදුස්සන් නොවේ.

(3) සෑම කමිටුවක්ම තමන් වෙත පැවරී ඇති රාජකාරීන් සම්බන්ධව විනිවිදභාවයෙන් යුත් තෝරා ගැන්මේ ක්‍රමවේදයක් සකස් කොට ජාතික සංගමය මඟින් ක්‍රීඩා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය.

(4) මෙම කමිටු සඳහා ජාතික සංගමයේ නාම යෝජනා අනුව තෝරා පත් කරනු ලබන අයවලුන්ට අමතරව විෂය භාර අමාත්‍යවරයාට විෂය දැනුවත්කමක් ඇති එක් අයෙකු පත් කළ හැක".

ඉහත සඳහන් නියෝග අංකවලට අමතරව, තේරීම් කමිටුවට ලැබිය යුතු කාල සීමාව වසර දෙකක් දක්වා දික් කරන්න කියලා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා හිතනවා තේරීම් කමිටුවට දෙන කාලය වසර දෙක දක්වා දීර්ඝ කළොත්, එහි සාමාජිකයන්ට ඒ ක්‍රියාදාමය කර ගෙන යන්න පුළුවන් කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පසු ගිය කාලයේ දැක්කා තේරීම් කමිටුවල සමහර සාමාජික මහත්වරු අවුරුදු 10ක් පමණ රැඳී හිටියා දේශපාලන බලපෑම් එක්ක; දේශපාලන ආරක්ෂාව එක්ක. මා හිතන්නේ ඇමතිවරුන්ටත් අයින් කර ගන්න බැරි අය අවුරුදු 10ක් තිස්සේ තේරීම් කමිටුවල රැඳී සිටියා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)
මා අයින් කළා.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මා දන්නවා, ඔබතුමා අයින් කළා. ඔබතුමාට පොඩ්ඩක් හයිය තිබුණා අයින් කර ගන්න. අපි ඒ ගැන සන්තෝෂ වනවා. මොකද, අපි දැක්කා එවැනි පුද්ගලයෝ පසු ගිය කාලයේ ක්‍රීඩකයන්ගෙන් මුදල් අරගෙන, සමහර අය ක්‍රීඩකයන්ගේ ඒජන්තවරුන්ගෙන් මුදල් අරගෙන තේරීම් කමිටුව හරහා ක්‍රීඩකයෝ පත් කරනවා. එවැනි අසාධාරණකම් ගොඩක් පසු ගිය කාලයේ සිදු වුණා.

ගරු ඇමතිතුමනි, මා දීර්ඝ වශයෙන් කාරණා ඉදිරිපත් කළාට, තව විශේෂ කාරණා කිහිපයක් ඔබතුමාගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරනවා.

සියලුම ජාතික සංගම් මූල්‍ය කටයුතු පරිපාලනයේදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුයි. එසේ නොකරන ඕනෑම පුද්ගලයකුට හෝ ආයතනයකට නීත්‍යානුකූලව දඬුවම් කිරීම ඇමතිවරයා සතු වග කීමකි. රාජ්‍ය ටෙන්ඩර් පටිපාටියට අනුකූලව ස්වාධීන ටෙන්ඩර් මණ්ඩලයක් මඟින් ටෙන්ඩර් පිරිනැමීම සිදු කළ යුතු ය. ගරු ඇමතිතුමනි, ඔලිම්පික් කමිටුව සඳහාත් යම් යෝජනා මාලාවක් ඉදිරිපත් කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා

සිටිනවා. ජාතික සංගම්වල ව්‍යවස්ථාවල විශාල අඩු පාඩු පවතින බැවින් පරිපාලනයේ පහසුව සඳහා ක්‍රීඩා සංවර්ධනයට තුඩු දෙන, දූෂණ, අක්‍රමිකතා පිටු දකින ආකෘතියක් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් සකස් කොට ඒ අනුව ජාතික සංගම් ව්‍යවස්ථාව සකස් කිරීම අනිවාර්ය කළ යුතුයි. ඊට අමතරව යම් ක්‍රීඩා සමාජයකට තේරී පත් වුණු මණ්ඩලයක සාමාජිකයකු හෝ සාමාජික පිරිසක් විසින් සංගමයේ ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරමින් මූල්‍ය කටයුතු පිළිබඳව තීරණ ගැනීමේදී මූල්‍ය පාඩුවක් කර ඇත්නම් -ඒකට කියන්නේ bankruptcy කියලායි- විශුද්ධිකරණය කර, ඊට වගකිව යුතු සියලුම පුද්ගලයන්ට නැවත ක්‍රීඩා පරිපාලනයට ඇතුළු වීමට ඇති අයිතිය තහනම් කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා ඇත්තටම මේ යෝජනා සියල්ලම ඉදිරිපත් කළේ රජය අපහසුවට පත් කරන්නවත්, එහෙම නැත්නම් ඇමතිවරයා අපහසුවට පත් කරන්නවත් නොවෙයි. විශේෂයෙන්ම පසු ගිය කාලයේ අපි දැක්කා ඇමතිවරයාටත් බලපෑම් එනවා. මෙවැනි රෙගුලාසි ඇති කිරීමෙන් ඔබතුමා ආරක්ෂා වනවා. ඒ වාගේම ඔබතුමාට ඒ කාර්යය ඉතාමත් හොඳට කරන්න පුළුවන් වනවා.

මා විශේෂයෙන්ම කිව යුතු කාරණයක් තිබෙනවා අතුරු පාලක කමිටු ගැන. ඒ සම්බන්ධව සමහර අතුරු පාලක මණ්ඩල මාත් එක්ක එකඟ වෙයි. පසු ගිය කාලයේ අතුරු පාලක මණ්ඩල ගොඩක් තිබුණා. චෝදනාවක් තිබුණා, අතුරු පාලක මණ්ඩලවල ක්‍රියාදාමය හරියට වුණේ නැහැ කියලා. මා වග කීමකින් කියනවා, ක්‍රිකට් ආයතනයේ තිබුණු අතුරු පාලක මණ්ඩලවලින් තමයි ක්‍රිකට් ක්‍රීඩාව ආරක්ෂා වුණේ කියලා. නමුත් එසේ නොවුණු එකම අතුරු පාලක මණ්ඩලය තමයි ඩී.එස්. ද සිල්වා මහතාගේ අතුරු පාලක මණ්ඩලය. දේශපාලන බලපෑම නිසා, ඒ වාගේම ඉතාම දුර්වල පුද්ගලයන් හිටපු නිසා එහි පරිපාලනය, වැඩ හරි විධියට කර ගන්න බැරි වුණාය කියන එක ඉතාමත් වග කීමකින් මා කියනවා. මොකද, අපි දැක්කා මේ රටේ අතුරු පාලක මණ්ඩලවල හිටපු හේමගම අමරසූරිය, රියන්සි විජේතිලක යන මහත්වරු හුහක් වැදගත් විධියට වැඩ කළ බව. ඒ වාගේම ක්‍රිකට් ක්‍රීඩාව ආරක්ෂා කරන්න භය නැතුව ඉදිරිපත් වුණා. ඇමතිතුමා තමයි ඒගොල්ලෝ පත් කරන්නේ. එතකොට ඇමතිතුමාට වග කීමක් තිබෙනවා ඒ පුද්ගලයන් හරි දේ කරනවාද කියලා සොයා බලන්න. නමුත් හුහක් වෙලාවට පාලක මණ්ඩලයක් වුණාම ක්‍රීඩා සමාජවලටයි වගකීම තිබෙන්නේ. සංගම්වලින් ඡන්දය දෙන්න එන්නේ තමන්ට මොනවා හෝ හම්බ කර ගන්න. මා හිතන්නේ පසු ගිය කාලය පුරාම එවැනි දේ සිද්ධ වුණා. මා නම් තවමත් විශ්වාස කරන්නේ, ඩී.එස්. ද සිල්වාගේ අතුරු පාලක මණ්ඩලය වාගේ නොවෙයි, හොඳ අතුරු පාලක මණ්ඩලයක් පත් කළොත් ඕනෑම ක්‍රීඩාවක් ආරක්ෂා කරන්න පුළුවන් වෙයි කියලායි.

ගරු ඇමතිතුමනි, ආණ්ඩුවේ තරුණ මන්ත්‍රීවරු කිහිප දෙනෙකු දැන් ගරු සභාවේ සිටින නිසා මා විශේෂයෙන් මේ කාරණාව කියන්න ඕනෑ. අපි දැක්කා පසු ගිය කාලයේ තරුණ මන්ත්‍රීවරුන් විසින් තිලංග සුමතිපාල මහතාට ක්‍රිකට් ආයතනයට එන්න කියා යෝජනා කර තිබෙනවා. එතුමා එනවාද, නැද්ද කියන එක නොවෙයි මට තිබෙන ප්‍රශ්නය. ලෝක ක්‍රිකට් කවුන්සලයේ නීති පද්ධතියක් තිබෙනවා. ඒ නීති පද්ධතියේ තිබෙන ප්‍රධානම දෙයක් තමයි -

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

ගරු මන්ත්‍රීතුමා, මට විනාඩියක් දෙන්න. එහෙම යෝජනා කළේ නැහැ. ඒක බොරුවක්.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ඒ ගැන මා දන්නේ නැහැ. පුවත් පතක පළ වූ දෙයක් මා කිව්වේ.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

අප කියපු එකම දෙය තමයි, අපේ කණ්ඩායමේ ගරු සනත් ජයසූරිය මන්ත්‍රීතුමාට සහ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාට අවස්ථාවක් දෙනවා නම් අප ඒ ගැන ප්‍රසාදය පළ කරනවා කියන එක. ඒ මිසක් අපට බැහැ එතුමාව යෝජනා කරන්න. අනෙක් කාරණය මේකයි ගරු මන්ත්‍රීතුමනි. ඒ අය කරපු දේ හොඳද නරකද කියන එකවත් judge කරන්න අපට බැහැ.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන නොවෙයි මා මේ කියන්න හදන්නේ. ලෝක ක්‍රිකට් කවුන්සලයේ නීති පද්ධතියක් තිබෙනවා. හැම පුවත් පතකම පළ වුණා ආණ්ඩුවේ මන්ත්‍රී කණ්ඩායමෙන් එවැනි යෝජනාවක් වුණා කියලා.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

නැහැ, නැහැ.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

එහෙම නම්, ඔබතුමන්ලා එය නිවැරැදි කරන්න. මොකද, එය ලෝක ක්‍රිකට් කවුන්සලයට ගියාම- [බාධා කිරීමක්] තරුණ මන්ත්‍රී කණ්ඩායම එම යෝජනාව කළා කියලායි තිබුණේ. ගරු මන්ත්‍රීතුමා, එය ලෝක ක්‍රිකට් කවුන්සලයට ගියාම ඉදිරියේදී අපට ප්‍රශ්නයක් ඇති වන්න පුළුවන්. එතුමා සුදුසුද නැද්ද කියන එක මම ඉදිරියේදී කියන්නම්. නමුත් මන්ත්‍රී කණ්ඩායමේ නියෝජිතයකු හැටියට ගියොත් සිද්ධ වන්නේ මොකක්ද? එය දේශපාලන බලපෑමක් හින්දා එයින් අපට ඉදිරියේදී ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා විතරක් නොවෙයි, ලෝක ක්‍රිකට් කවුන්සලය - ICC එක - අපේ ක්‍රිකට් තහනම් කරන තත්ත්වයකට වුණත් යන්න පුළුවන්. ඉදිරියේදී අපට එය ලොකු ප්‍රශ්නයක් වන්න පුළුවන් නිසායි මා මේ කාරණය වග කීමකින් යුතුව ගරු ඇමතිතුමාට කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව අවසන් කරන්න ඉස්සර වෙලා තවත් කාරණා කීපයක් කිව යුතුයි. විශේෂයෙන් ක්‍රීඩකයන්ගේ චිනය අද ලොකු කථා බහකට ලක් වෙලා තිබෙනවා. අපි දැක්කා ගරු ඇමතිතුමා ඒ සඳහා ඉතාම ප්‍රබලව තීරණ ගන්නවා. අපි ඒකට කැමැතියි. ඒ ගත්තු තීරණ ගැන මමත් පෞද්ගලිකව සෑහීමකට පත් වෙනවා. මොකද, ක්‍රීඩාව තමයි ප්‍රධාන. ක්‍රීඩකයෝ එනවා; යනවා. නමුත් ක්‍රීඩාව රැකිය යුතුයි. අර්ජුන රණතුංග එන්න පුළුවන්, සනත් ජයසූරිය එන්න පුළුවන්, මහේල ජයවර්ධන එන්න පුළුවන්. ක්‍රීඩකයෝ එහෙම එනවා; යනවා. අපි ගියා. මේ ඉන්න අයත් කවදා හරි යනවා. නමුත් ක්‍රීඩාව රැක ගැනීම සඳහා ඔබතුමා ගන්නා නිවැරැදි තීරණවල අපි ඉන්නවා ගරු ඇමතිතුමනි. එක පැත්තකින්, මේ ප්‍රශ්නයට වග කිවයුත්තනුත් ඉන්නවා ගරු ඇමතිතුමනි. මා දැන් ඒ කාරණයටයි එන්නේ. පසු ගිය කාලය තුළ වැරැදි පරිපාලනයක් එක්ක ක්‍රිකට් පාලක මණ්ඩලය අර්බුද බොහොමයකට ලක් වුණා. එයට ප්‍රධානම හේතුව වුණේ මූල්‍ය කළමනාකාරිත්වය නිසි විධියට

තිබුණේ නැති එකයි. එක එක බලපෑම්වලට අනුව කටයුතු කළා; ක්‍රීඩාංගණ හැදුවා. ඊයේ මෙහිදී සමහර ගරු මැති ඇමතිවරු කිව්වා ක්‍රීඩාංගණ හදන්න ඕනෑ කියලා. මා ඉතාම වග කීමෙන් යුතුව කාරණයක් කියනවා. පසු ගිය ලෝක ක්‍රිකට් තරගාවලිය පටන් ගන්න කොට සභාපති හැටියට සිටියේ මමයි. මා ඉතාම වගකීමකින් කියන්න ඕනෑ, ක්‍රීඩාංගණ තුනක් හදන්න කියලා ලෝක ක්‍රිකට් කවුන්සලය අපට කවදාවත් කිව්වේ නැති බව. අද ඒ ක්‍රීඩාංගණ පරිපාලනය කර ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මා හිතන විධියට අද හමුදාවෙන් තමයි ඒවා පාලනය කරන්නේ. ඒ බිල් ගෙවන්නේ ක්‍රිකට් ආයතනයෙන්. දැන් ඊට වඩා වැඩි බිල් ගෙවනවා කියලා කියනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, බාධා කරනවාට සමා වන්න. හමුදාව ක්‍රිකට් ක්‍රීඩාංගණ පාලනය කරනවා නොවෙයි. ඒවා නඩත්තු කිරීම සඳහා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සේවකයන්ට වැටුප් ගෙවන්න ඕනෑ. අපි ක්‍රිකට් පාලක මණ්ඩලයේ සේවකයන් අඩු කළා. ඒ නිසා අපි යෝජනා කළා ත්‍රිවිධ හමුදාවේ අය යොදවන්න කියලා. එතකොට අපට ලොකු ලාභයක් එනවා. එහෙම නොකළා නම්, ඒ ක්‍රීඩාංගණ තුනට සේවකයන් යොදවන්න අපට ලොකු මුදලක් යනවා. ඒවායේ නඩත්තුව පමණයි ඒ අය කරන්නේ. ඒ නිසා ක්‍රිකට් පාලක මණ්ඩලයට ඉතිරියක් තිබෙනවා.

ගරු අර්ජුන රණතුංග මහතා
(මාණ්පුමිකු අර්ජූන රණතුංග)
(The Hon. Arjuna Ranatunga)

ඒක හොඳයි. හොඳ දෙයක් නම් හොඳයි කියලා මම කියනවා ගරු ඇමතිතුමා. නමුත් මා කියන්නේ, ඇයි අප මේ තත්ත්වයට පත් වුණේ කියන එක ගැනයි. ඒ අනවශ්‍ය වියදම් නිසා තමයි අද අප මේ තත්ත්වයට පත් වුණේ.

අපේ ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමා මේ අවස්ථාවේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාගේ මිත්‍රයා.

ගරු අර්ජුන රණතුංග මහතා
(මාණ්පුමිකු අර්ජූන රණතුංග)
(The Hon. Arjuna Ranatunga)

ඔව්, මිත්‍රයා තමයි. එතුමා ගැන කියන්න ඕනෑ. මේ රටේ පළමුවැනි වතාවට, තමන්ගේ රටට ක්‍රීඩා කරන්නේ නැතිව පෞද්ගලික තරගාවලියකට යන්න ක්‍රීඩකයන්ට අවසර ලබා දුන්නේ හිටපු ක්‍රීඩා ඇමතිවරයකු වූ එතුමායි. එතුමා ඒ කරපු ක්‍රියාදාමයේ ප්‍රතිඵල හැටියට ක්‍රීඩකයන් ඒවායේ වැඩි වාසි ගැනීම නිසා අද විනය කඩා වැටිලා. ඒ තත්ත්වය පාලනය කර ගැනීම සම්බන්ධයෙන් අද අසීරු තත්ත්වයකට පත් වෙලා ඉන්නේ අපේ මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමායි. මම කියනවා නියපොත්තෙන් කඩන්න තිබුණු එක අද පොරවකින් නොවෙයි, ඊටත් වඩා ලොකු එකකින්වත් කඩන්න බැරි වෙලා තිබෙනවා කියලා. අපි දැක්කා පසු ගිය දවස්වල සමහර ක්‍රීඩකයන් හැසිරුණු හැටි. අපි 2008 දී ක්‍රීඩකයන් හදන්න හදන කොට ඒ අය කොහේටද දිව්වේ? ඔවුන් දිව්වේ කෙළින්ම ජනාධිපතිතුමා ළඟටයි. තමුන්නාන්සේලා දන්නවා සිද්ධ වූ දේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ රටේ සංස්කෘතියට, මේ රටේ සදාචාරයට ආදරය කරන කෙනෙක්. අපි ක්‍රිකට් ගැහුවේත් ඒ විධියටයි. අපි ඒ සදාචාරය, ක්‍රිකට් ක්‍රීඩාව ආරක්ෂා කළ යුතුයි. ක්‍රිකට් ක්‍රීඩාව අපේ පෞද්ගලික දෙයක් නොවෙයි. විනය කියන එක අපට තිබුණේ නැත්නම් කවදාවත් මේ ක්‍රීඩාව මෙතරම් ඉස්සරහට ගෙන යන්න ලැබෙන්නේ නැහැ. මම ඉතාම වගකීමකින් යුතුව ඒ කාරණය කියනවා. පසු ගිය කාලයේ ඉන්දියාවේ පැවැත්වුණු IPL තරගාවලියට යන්න ඉල්ලීම් කරපු සියලු ක්‍රීඩකයන්ටත් මම දොස් කියනවා.

මොකද, ඒ ගොල්ලන්ට කියන්න පුළුවන් අපට තරගාවලියක් තිබුණේ නැහැයි කියලා. නමුත් ගරු මන්ත්‍රීවරුනි, ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධව මා ළඟ ලිඛිතව කරුණු තිබෙනවා. රටේ ක්‍රීඩාවක් තිබෙනවා නම් ඒ ගොල්ලෝ අනිවාර්යයෙන්ම සුදුසුකම් ලබා ගෙන හිටියේ ඊට කලින් අවුරුද්දේ තරගාවලියට පමණයි. මෙවැනි අනවශ්‍ය දේවල් සිදු වුණ නිසා තමයි අද ක්‍රීඩකයන්ගේ විනය හුහාක් පහත් තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ක්‍රීඩකයන්ගේ මුදල් ගැන ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා තීරණ ගන්නවා අපි දැක්කා. මම ඒ තීරණවලට එකඟ වෙනවා. නමුත් අනෙක් පැත්තෙන් බැලුවාම අද ක්‍රිකට් පාලක මණ්ඩලයට මේ තත්ත්වය උදා කළ පුද්ගලයෝ තවමත් ක්‍රිකට් පාලක මණ්ඩලයේ ඉන්නවා. ඔවුන්ට කිසිම දඬුවමක් දීලාත් නැහැ; දඬුවමක් දෙන්නේත් නැහැ. ඉතින් මේ තත්ත්වය වෙනස් විය යුතුයි. දඬුවම් දෙන්න ගියොත් ඔබතුමාටත් ප්‍රශ්නයක් වෙන්න පුළුවන් කියලා මම දන්නවා. ක්‍රීඩකයන් සම්බන්ධයෙන් බලන විට සාධාරණත්වයක් තිබෙනවාද? මම ඒ ගැන එකඟ වන්නේ නැහැ. මොකද, පසු ගිය කාලයේ පරිපාලනය කළ හැම දෙනාම කළේ මේ ක්‍රීඩකයන් සන්තෝෂයෙන් තියන්න කටයුතු කිරීමයි; ඔවුන් තමයි හොඳම අය කියලා ඒ ක්‍රීඩකයන් ලවා ජනාධිපතිතුමාටත්, ඇමතිතුමාටත් කියවා ගන්න කටයුතු කිරීමයි. මම ඒවා දැක්කා. නමුත් අපේ කාලයේ ක්‍රීඩකයෝ කවදාවත් පරිපාලනය ගැන කථා කළේ නැහැ. නමුත් අද ඉන්න ක්‍රීඩකයෝ ඇවිල්ලා පරිපාලනය ගැන කථා කරනවා; සභාපති හොඳයි කියනවා; ලේකම් හොඳයි කියනවා. එහෙම නැත්නම් භාණ්ඩාගාරික හොඳයි කියනවා. තේරීම් කමිටුවේ සභාපති විය යුත්තේ කවුද කියලා කියනවා. එහෙම කාලයක් තිබුණා. මේක තමයි විනය නැති වීම කියන්නේ. ඒ පිළිබඳව ලොකුම ගෞරවය අපි ගාමිණී ලොකුගේ ඇමතිතුමාට දෙන්න ඕනෑ. එතුමා හිටියා නම් මම කොහොමත් ඒක කියනවා. එතුමාගෙන් සිදු වුණ විනාශය අපි දැන් ගෙවන්න පටන් අර ගෙන තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ අවස්ථාවේ තේරීම් කමිටුවේ සභාපති සනත් ජයසූරිය මන්ත්‍රීතුමා මේ සභාවේ සිටීම ගැන මා සන්තෝෂ වෙනවා. මා මේ කියන්නේ මගේ මතයක්. තිලාන් සමරවීර ක්‍රීඩකයා ක්‍රිකට් පරිපාලනයත් එක්ක සාකච්ඡා කළාය කියලා මම දන්නවා. නමුත් එතුමා ක්‍රිකට් ක්‍රීඩාවෙන් සමු ගෙන තිබෙනවා. මා මේ කියන කාරණය මා දකින දෙයක්; මට තේරෙන දෙයක්. තිලාන් සමරවීර සහ ප්‍රසන්න ජයවර්ධන කියන ක්‍රීඩකයන් දෙදෙනා විතරයි සියලුම තරගවලට ක්‍රීඩා කරන්නේ නැත්තේ. ඒ කියන්නේ ප්‍රසන්න ජයවර්ධන සහ තිලාන් සමරවීර හුහාක් වෙලාවට ක්‍රීඩා කරන්නේ ටෙස්ට් තරගවලට පමණයි. නමුත් විස්සයි විස්ස ක්‍රීඩා කරන, ඕවර් පණහ ක්‍රීඩා කරන, ටෙස්ට් තරග ක්‍රීඩා කරන අපේ ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයෝ ඕනෑ තරම් ඉන්නවා. සනත් ජයසූරිය මන්ත්‍රීතුමනි, මම කියන්නේ ඔබතුමාට නොවෙයි. ඔබතුමා සහ කමිටුවට කියන්නේ මෙවැනි තීරණ ගන්න කොට තවත් කල්පනා කරලා තීරණ ගන්න කියලායි. මොකද, මෙවැනි ක්‍රීඩකයෝ අවුරුදු ගණනාවක් -සමහර විට කියන්න පුළුවන් මේ තරගාවලිය විතරයි එළියේ තියන්නේ කියලා-

ගරු සනත් ජයසූරිය මහතා
(மாண்புமிகு சனத் ஜயசூரிய)
(The Hon. Sanath Jayasuriya)

මහේලත් සංගක්කාරත් තුවාල වෙලා ඉන්න කොට අපි තේරීම් කමිටුවේ සාකච්ඡා කරලා තිලාන් සමරවීර ජ්‍යෝෂ්ඨ ක්‍රීඩකයෙක් හැටියට ගෙනාවා. ඊට පස්සේ බංග්ලාදේශ සංචාරයේ දී අපට අවස්ථාවක් තිබෙනවා, යොවුන් ක්‍රීඩකයකු ගෙනැල්ලා බලන්න. මොකද, ඉදිරියේ දී ක්‍රිකට් ක්‍රීඩාව දියුණු වෙන්න ඕනෑ නම් යොවුන් ක්‍රීඩකයින් ගැන බලන්න ඕනෑ. තිලාන් සමරවීරට අපි කිව්වා, බංග්ලාදේශ සංචාරයේදී අපි ඔයා ගැන වැඩිය බලන්නේ නැහැ, හැබැයි, අපි ඔයාට කොන්ත්‍රාත්තුවක් දෙනවා කියලා. ඒ අය test cricket විතරක් ගහන නිසා මේ අවුරුද්ද පුරාම ඒ අය special contract එකකට ගෙනාවා.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

මන්ත්‍රීතුමනි, මෙතැන දී ඔබතුමාගේ ක්‍රියාදාමය ගැන නොවෙයි මා කියන්නේ. මා දකින විධියට මේ ක්‍රීඩකයන් දෙදෙනා ක්‍රීඩා කරන්නේ ටෙස්ට් තරගවලට පමණයි. ඒ නිසා ඒ සඳහා වැඩිපුර අවස්ථාවක් මේ ක්‍රීඩකයන් දෙදෙනාට ලබා දිය යුතුයි. ක්‍රීඩා තුනම කරන ක්‍රීඩකයෝ ඉන්නවා. සංගක්කාර වෙන්න පුළුවන්. ඩිල්ෂාන් වෙන්න පුළුවන්. මහේල ජයවර්ධන වෙන්න පුළුවන්. සමහර විට ඒ ගොල්ලන් අයින් කළොත් තමුන්නාන්සේටත් ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. තිලාන් සමරවීර ගෙනාවේ මේ ක්‍රීඩකයන් දෙදෙනාට තුවාල වුණ නිසායි. නමුත් එක සංචාරයක් හරියට සාර්ථක වුණේ නැහැයි කියලා ඒ අය කණ්ඩායමෙන් ඉවත් කරන්න බැහැ. මම දකින දේ ඔබතුමාට කියන්නේ. ඒක හරිද, වැරදිද කියන එක තමුන්නාන්සේ තීරණය කර ගන්න. [බාධා කිරීමක්]

ගරු සනත් ජයසූරිය මහතා
(மாண்புமிகு சனத் ஜயசூரிய)
(The Hon. Sanath Jayasuriya)
ඒක ඔබතුමාගේ පෞද්ගලික තීරණයක්.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

නැහැ, මගේ පෞද්ගලික තීරණයක් නොවෙයි. ඔබතුමා වැරදි තැනට යන්න එපා. ඒක පෞද්ගලික තීරණයක් කියලා කවදාවත් කියන්න එපා. ඒක මට තේරුණ දෙයක්. මොකද, ලංකාවේ ක්‍රිකට්වලින් තේරීම් කරන්න පුළුවන් නම්, මෙතරම් කාලයක් ක්‍රීඩා කළ මෙවැනි ක්‍රීඩකයන්ට මේ විධියට සලකනවා නම් ක්‍රිකට්වලට තමුන්නාන්සේ කරන -[බාධා කිරීමක්] නැහැ, කරුණාකරලා තමුන්නාන්සේ මට බාධා කරන්න එපා. තමුන්නාන්සේගේ කථාවේ දී කියන්න. ඒක හරියි කියලා තමුන්නාන්සේ හිතනවා නම්, ඉදිරියේදී ක්‍රිකට්වලට වෙන්නේ මොකක්ද කියලා අපි බලා ගෙන ඉදිමු. නමුත් මම ඉතාමත් වගකීමකින් කියනවා මේක මගේ පෞද්ගලික තීරණයක් නොවෙයි, රටේ ක්‍රීඩාව දන්නා අයගේ තීරණයක් කියලා. තමන්ට ඕනෑ ඕනෑ අය ගෙනැල්ලා එක වෙලාවකට කපන්නයි, තව වෙලාවකට දමන්නයි අවශ්‍යතාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මතක් වන තවත් දෙයක් මෙතැනදී කියන්න ඕනෑ. මට ඒ කාරණය මතක් වුණු එක හොඳයි. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම තේරීම් කමිටුවක් පත් කරන කොට විශ්‍රාම ගියේ නැති අයව පත් කිරීමේ ගැටලුවක් තිබෙනවා. උදාහරණයක් විධියට සනත් ජයසූරිය මහත්මයා තේරීම් කමිටුවට පත් වන විට ක්‍රීඩාවෙන් විශ්‍රාම ගොස් තිබුණේ නැහැ. තේරීම් කමිටු සාකච්ඡාවේදී තමයි එතුමා කිව්වේ මින් ඉදිරියට ක්‍රීඩා කරන්නේ නැහැ කියලා. [බාධා කිරීමක්] සනත් ජයසූරිය මහත්මයා ක්‍රීඩකයකු හැටියට සිටියදී තමයි තේරීම් කමිටුවට ආවේ. මේක අපේ රටේ සිදු වුණු ඉතාමත් අප්‍රසන්න දෙයක් කියලා මා හිතනවා. මොකද, ක්‍රීඩකයකු හැටියට ඉන්න කොට තේරීම් කමිටුවට එන එක මම කවදාවත් අනුමත කරන්නේ නැහැ. මොකද, අවුරුදු තුන හතරක් සංගක්කාර, මහේල, තිලාන් සමරවීර වැනි අය එක්ක එතුමා එකට ක්‍රීඩා කර තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඔබතුමා කියන කාරණයේ යම් තර්කයක් තිබෙනවා. මොකද, සමකාලීන ක්‍රීඩකයකු එක්ක ක්‍රීඩා කළ නිසා යම් ප්‍රශ්නයක් මතු වේවිද කියන සාධාරණ සැකය තිබෙනවා. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, මොන කටයුත්ත කළත් මේ කණ්ඩායම අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්වයි කටයුතු කරන්නේ. තිලාන් සමරවීර මැතිතුමාගේ ප්‍රශ්නය ගැන අප සාකච්ඡා කළා. සභාපතිතුමා මා එක්ක ඒ ගැන කථා කළා. එහිදී රටම පිළිගන්නවා, අපි 2015 ලෝක කුසලානය ජයග්‍රහණය කරන්න නම් අලුත් කණ්ඩායමකට, තරුණ කණ්ඩායමකට අවස්ථාව දෙන්න ඕනෑ කියලා. ඒ නිසා අපි කථා කරලා තිලාන් සමරවීර මහත්මාට US Dollars 70,000ක special contract එකක් දීලායි ඒ සියල්ල කළේ. නමුත් මා ඔබතුමාට කියනවා, ඊළඟ සංශෝධනයේදී ඔබතුමා ඔය කියන කාරණය ගෙනෙන බව. අනිවාර්යයෙන් ඊළඟ සංශෝධනයේදී විශ්‍රාම ගොස් අවුරුදු පහකින් පස්සේවත් ගන්න අවශ්‍ය කටයුතු කරනවා. හැබැයි ඇමතිවරයා හැටියට මා වගකීමකින් කියනවා, මේ කාලය තුළ ක්‍රීඩකයකුට අසාධාරණයක් නොවෙන්න කටයුතු කරනවා කියලා.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු ඇමතිතුමනි, 2015 ලෝක කුසලාන තරගාවලිය දිනන්නේ ටෙස්ට් තරගවලින් නොවෙයි. තනි දින තරගවලින්. ඒකට තරුණ ක්‍රීඩකයින් ඇතුළත් කරන එක ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. ටෙස්ට් තරගවලටත් තරුණ ක්‍රීඩකයින් දමන එක ගැන මගේ කිසිම විවේචනයක් නැහැ. තරුණ ක්‍රීඩකයින්ට අවස්ථාව දෙන්න ඕනෑ. සනත් ජයසූරිය මහත්මයා කියනවා වාගේ තරුණ ක්‍රීඩකයින් දමන්න ඕනෑ. නමුත් ක්‍රීඩා කරන ක්‍රීඩකයකු තේරීම් කමිටුවට පත් කරන එකයි මට තිබෙන ප්‍රශ්නය. ඉතින් ඒක සාධාරණද, නැද්ද කියන එක මහජනතාව දැන් තීරණය කර තිබෙනවා. සනත් ජයසූරිය මහත්මයා පුවත් පත් සාකච්ඡාවකදී තමයි කිව්වේ මා මින් ඉදිරියට ක්‍රිකට් ගහන්නේ නැහැ කියලා. ඒ වනතුරු ක්‍රිකට් ගැහුවා. අපි දැක්කා මාස කිහිපයකට ඉස්සෙල්ලාත්-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, එතුමා පත් කරන්න කලින්-

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු ඇමතිතුමනි, මා කියන්නේ ඒක වැරදියි කියන එකයි. [බාධා කිරීමක්] ඔන්න ඔබතුමා හොඳ තැනකට ආවා. ඒ කියන්නේ එදා ඒ වරද කළ නිසා අපි අද මේ වරද කරනවා කියන එකනේ. ඔබතුමාගෙන් අපි බලාපොරොත්තු වන්නේ කරපු වැරදි කරන එක නොවෙයි. ඒ වැරදි නැවත නොකිරීමයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඔබතුමාගේ යෝජනාවට මා එකඟයි. ඊළඟ සංශෝධනයකදී අපි ඒක ගෙනෙනවා. මම කිව්වේ ඒකයි. කලිනුත් එහෙම හිටියා.

හැබැයි අපට ඒ ප්‍රශ්නය මතු වුණේ නැහැ. ඒක කවුරුත් මතු කළේ නැහැ. ඔබතුමා මෙතැන ඒ කාරණය කියනකම් අපට ඒ ප්‍රශ්නය ආවේ නැහැ. හැබැයි ඒක සාධාරණ ඉල්ලීමක්. දැනට අසාධාරණයක් වෙන්නේ නැහැ. දැනට කෙරෙන තේරීම් ඉතාම හොඳින් වෙනවා.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ඒක අපට ඉදිරි කාලයේදී බලන්න පුළුවන්. මම කවදාවත් තේරීම් කමිටුවේ සභාපති කෙනකුව විවේචනය කරන්නේත් නැහැ; මා ඒ ගැන කථා කරන්න යන්නෙත් නැහැ. තේරීම් කමිටුවට තේරුණු කිසිම ක්‍රීඩකයකු මම විවේචනය කරන්නේ නැහැ. මොකද, ඒක මගේ ප්‍රතිපත්තියක්. නමුත් ක්‍රීඩකයකුට අසාධාරණයක් වෙනවා නම් හිටපු ක්‍රීඩකයකු හැටියට ඒ ගැන සාකච්ඡා කිරීම මට තිබෙන අයිතිවාසිකමක්. හැබැයි කවදාවත් හිතන්න එපා මේක මගේ පෞද්ගලික මතයක් කියලා. මොකද, සමහර වෙලාවට වෛරයෙන් මේ කටයුත්ත කරන්න සිද්ධ වෙන්න පුළුවන්; තරහ කාරයෝ ඉන්න පුළුවන්. අපි එකට ක්‍රීඩා කරන කොට අපි අකැමැති කෙනකුව ක්‍රිකට් තේරීම් කමිටුවේ සභාපති වෙලා යම් කිසි කෙනකු අයින් කළොත් ඕනෑ කෙනකුට ඇඟිල්ල දිගු කරලා කියන්න පුළුවන් තිබුණු පරණ තරහක් පිටයි මේක කළේ කියලා. මම කියන්නේ නැහැ එහෙම වෙනවා කියලා. නමුත් එහෙම වෙන්න පුළුවන්. අන්න ඒ නිසා තමයි මා මේ අවස්ථාවේ මතක් කරන්නේ ඒ ගැන පොඩ්ඩක් කල්පනා කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම කාන්තා ක්‍රිකට් කණ්ඩායම ගැනත් අපි වචන කිහිපයක් කථා කළ යුතුයි. විශේෂයෙන්ම 2008 මම ක්‍රිකට් ආයතනයේ ඉන්න කොට කාන්තා ක්‍රිකට් කණ්ඩායම ඉතාමත් පහළට වැටිලායි තිබුණේ. ඒ කණ්ඩායම ඉහළට ගෙනෙන්න අපි ලොකු වෙහෙසක් ගත්තා. අද ඔවුන් ලෝකයේ පස්වැනි ස්ථානයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම හුඟක් දුෂ්කරතා මැදයි මේ ක්‍රීඩිකාවන් මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. අපි සියලු දෙනාගේ සුබ පැතුම් එම කණ්ඩායමේ නායිකාව, පුහුණුකරුවන් ඇතුළු සියලුම දෙනාට මා මේ වෙලාවේ පුද කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමාගෙන් කාරණා කිහිපයක් අහන්න තිබෙනවා. ඔබතුමා පසු ගිය කාලයේ නිම්බස් ගනු දෙනුව සම්බන්ධයෙන් කමිටුවක් පත් කළා. එහි වාර්තාවකුත් ඔබතුමා ඉදිරිපත් කර තිබෙනවා. අඩුම ගණනේ මේ වාර්තාව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට භාර දෙන්නය කියලා මා ඉල්ලා සිටිනවා. මොකද, මෙහි සිටින දූෂිතයන් ගැන ඔබතුමාත් දන්නවා; මාත් දන්නවා. නමුත් ඔබතුමාට කරන්න පුළුවන් දෙයකුත් නැහැ. මොකද, ඒ අයට දඬුවම් දෙන්න ඔබතුමාට බැහැ නේ. ඒ නිසා කරුණාකරලා එය අල්ලස් හෝ දූෂණ චෝදනා පිළිබඳව විමර්ශන කොමිසම වෙත භාර දෙන්න. [බාධා කිරීමක්] ඔව්, ඔව්. මාත් ඒක දන්නවා. ඒ හපන දත් ටික දෙන්න තමයි මේ යෝජනාව ගෙනාවේ. එතකොට ඔබතුමාටත් හපන්න පුළුවන්. උඩින් හපන්න නොදී අපි ඔබතුමාව ආරක්ෂා කරනවා. [බාධා කිරීමක්] ඒක තමයි. එතැනින් එහාට කරන්න බැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඔබතුමාත් දන්නවා ඇති, මේ කරුණ අල්ලස් හෝ දූෂණ චෝදනා පිළිබඳ විමර්ශන කොමිසම වෙත ගිහින් තිබෙන බව.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

නැහැ, තවම ගිහිල්ලා නැහැ, ඇමතිතුමනි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඔබතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා පිළිබඳ විමර්ශන කොමිසන් සභාවට ගිහිල්ලා බලන්න. පැමිණිල්ලක් ගිහිල්ලා තිබෙනවා. ඒ ගැන පරීක්ෂණ පැවැත්වෙනවා. මා වග කීමකින් යුතුවයි ඔබතුමාට කියන්නේ. ඔබතුමා ගිහිල්ලා බලන්න.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ඒ වාර්තාව ලබා දීලා තිබෙනවා කියලාද ඔබතුමා මට කියන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

වාර්තාව නොවෙයි. පැමිණිල්ලක් ගිහිල්ලා තිබෙනවා.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ඒක හරි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

සමාවෙන්න ගරු මන්ත්‍රීතුමනි. මට තත්පරයක් දෙන්න. ඒ පැමිණිල්ල විභාග කරනකොට ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අනිවාර්යෙන් ඒ වාර්තාව අපෙන් ඉල්ලනවා. අපි ඒ වාර්තාව දෙන්න බැඳිලා සිටිනවා. මට බලෙන් ගිහිල්ලා ඒක දෙන්න බැහැ. පරීක්ෂණ පැවැත්වෙනකොට අපි ඒක දෙනවා. අපි ඒක අනිවාර්යෙන්ම දෙනවා.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

මොකද, ඔබතුමාටත් පහසුවක් වෙන්නයි අපි මේ කථා කරන්නේ. පසු ගිය කාලයේ රූපවාහිනී නාලිකා ගනුදෙනුවලින් ලොකු මුදලක් සොරකම් කළා. ඒකට හිටපු ඇමතිවරුත් සම්බන්ධ වුණා. මා ඉතාම වගකීමකින් යුතුව කියනවා, මේ රටේ මහජනතාව ඒ ගැන දැනුවත් විය යුතු බව. 2008දී මා සහභාගි වූ ඉන්දියානු සංචාරයේ දී ඩොලර් මිලියන 12ක් ලැබුණා, තනි දින තරග පහකට. නමුත් ගාමිණී ලොකුගේ ඇමතිතුමා නිම්බර්ස් ආයතනය සමග ගනුදෙනුවක් කළා. ඒකට ලැබුණේ ඩොලර් මිලියන 3යි. එතකොට අනෙක් මුදල්වලට මොනවාද වුණේ? මට තනි දින තරග පහයි තිබුණේ ඇමතිතුමනි. ගාමිණී ලොකුගේ ඇමතිතුමාගේ කාලයේ දී තනි දින තරග පහකුත්, විස්සයි විස්සේ තරග දෙකකුත් තිබුණා. ඉතින් මේ සල්ලිවලට මොනවාද වුණේ කියන එක ගැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ වාර්තාව ලබා දීම ගැන ඔබතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මා කාලය ගොඩක් ලබා ගත්තා. විශේෂයෙන්ම මට ඒ කාලය ලබා දුන් සියලු දෙනාටම මගේ ස්තුතිය පුද කරනවා.

ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරන්න කැමැතියි. මා මෙම සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ හුඟක් සොයලා බලලා, කරුණු සාකච්ඡා කරලා යි. මේ සංශෝධන ගැන සලකා බලා, මේ රටේ ක්‍රීඩාව වෙනුවෙන් ඒවා ඇතුළත් කර ගන්න. මොකද, මේ සංශෝධන ඔබතුමාට විතරක් නොවෙයි, ඉදිරියේ දී වෙනත් ඇමතිවරයකු පත්වුණත්, ඒ ඇමතිවරයාටත් පහසුවෙන් වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන් තත්ත්වයක් ඇති කරනවා. මා

[ගරු අර්ජුන රණතුංග මහතා]

ඔබතුමාට ඉතා ඕනෑකමින් කියා සිටිනවා, මේ සංශෝධනත් එක්ක ඔබතුමා මේ නියෝග ගෙන එනවා නම් අපේ කිසිම විරුද්ධත්වයක් හෝ අකමැත්තක් නැහැ කියලා. හැබැයි, කරුණාකරලා මේ සංශෝධන එයට ඇතුළත් කරන්න කියලා ඉතා වග කීමෙන් ඉල්ලා සිටිනවා. මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 3.34]

ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)

(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින අපි ඉතා සතුටු වනවා, අපේ රටේ ක්‍රීඩාව සම්බන්ධයෙන් ඉතා වැදගත් විවාදයක් පැවැත්වෙන අවස්ථාවක එයට සහභාගි වන්නට ලැබීම පිළිබඳව. ඒ වාගේම අපේ අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව එයට සම්බන්ධ වන්නට අවස්ථාව ලැබීම පිළිබඳවත් මා සතුටු වනවා.

අද වනකොට අපේ රටේ ක්‍රීඩාව සම්බන්ධයෙන් පවතින මූලිකම නීතිය වන්නේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතයි. මේ ක්‍රීඩා පනතට සංශෝධන තුනක් මීට පෙර ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම 24 වතාවක දී එයට රෙගුලාසි ඉදිරිපත් කරලා තිබෙනවා. මේ 24 වතාව තුළ ඉදිරිපත් කරපු සමහර රෙගුලාසි අවලංගු කිරීමත් ඇතුළත්ව ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් නීති රීති ක්‍රියාත්මක කරන්න මේ නියෝග මඟින් උත්සාහ කරලා තිබෙනවා.

ඒ වාගේම ප්‍රථම වතාවට ක්‍රීඩාවේ ඉතා වැදගත් එක් අංශයක් පිළිබඳව මෙවැනි පුළුල් ආකාරයේ නියෝග විශාල ප්‍රමාණයක් එක් අවස්ථාවක දී ඉදිරිපත් වන පළමු වැනි අවස්ථාව මෙය කියලා කිව්වොත් එය නිවැරදියි කියලා මා හිතනවා. මේ පනත ඉදිරිපත් කර තිබෙන්නේ 1973 වසරේ දීයි. අද ගත වන්නේ 2013 වසරයි. මේ අවුරුදු 40ක කාලය තුළ මේ අයුරින් පුළුල් අධ්‍යයනයක් කරලා, කරුණු කාරණා විශාල ප්‍රමාණයක් පිළිබඳව එක වර නියෝග විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කරපු අවස්ථාවක් විධියටයි මා පෞද්ගලිකව මේ අවස්ථාව දකින්නේ. විශේෂයෙන්ම අද අපි ඒ ගැන ඉතා සතුටු වනවා. අපේ රටේ ක්‍රීඩාව පිළිබඳව අපි මුලින්ම ධනාත්මකව සිතිය යුතුයි. විශේෂයෙන්ම වර්තමානයේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් අපේ ක්‍රීඩා අමාත්‍යතුමා ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කරමින් පවතින මොහොතකයි මේ නියෝග ඉදිරිපත් කරන්නට කටයුතු කර තිබෙන්නේ.

එම නිසා හිටපු සියලුම රජයන්, හිටපු සියලුම ක්‍රීඩා ඇමතිවරුන්, සියලුම පාලක සංගම් වර්තමානයේදී ක්‍රීඩාව මේ මට්ටමට ගෙන ඒම සඳහා කරන ලද කටයුතු අපි කෘතවේදීව සිහිපත් කළ යුතු වෙනවා. එතැනින් ඉදිරියට ක්‍රීඩාව දියුණු කර ගැනීම සඳහා තමයි අද මේ කටයුතු ආරම්භ කරන්න සිදු වෙලා තිබෙන්නේ.

අපේ රටේ ක්‍රීඩා 48ක සංගම්වල පරිපාලනය සම්බන්ධයෙන් තමයි අද මේ නියෝග ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මට මේ විවාදයේදී හිතුණා, අපේ රටේ ක්‍රීඩාව කියන්නේ ක්‍රිකට් විතරද කියලා. ක්‍රිකට් විතරක් නොවෙයි අපේ රටේ ක්‍රීඩාව කියන්නේ. ඒක බොහොම පැහැදිලිව අවබෝධ කර ගන්න ඕනෑ. ඒක මේ විවාදයේදී මට පෙනී ගිය එක කරුණක්. අර්ජුන රණතුංග මැතිතුමාට ක්‍රිකට් පිළිබඳව කථා කරන්න සම්පූර්ණ අයිතියක් තිබෙනවා. ඒක ඇත්ත. නමුත් අපි සියලු දෙනාම අවබෝධ කර ගන්න ඕනෑ ක්‍රීඩාව කියන්නේ ක්‍රිකට් විතරක් නොවෙයි කියන එක. මේ නියෝග ඉදිරිපත් වෙන්නේත් ක්‍රීඩා 48ක් වෙනුවෙන්. ඒ නිසා අපි ක්‍රිකට් ක්‍රීඩාවේ හොඳ පිළිබඳ විතරක් හිතලා, ක්‍රිකට් ක්‍රීඩාවේ පවතින අර්බුද තත්ත්වය ගැන පමණක් හිතලා සමස්ත ක්‍රීඩාව පිළිබඳවම තීන්දු තීරණ ගැනීම කොහෙත්ම නිවැරදි වෙන්නේ නැහැ. ඒ නිසා සමස්ත ක්‍රීඩාව පිළිබඳව අනිවාර්යයෙන්ම අපේ අවධානය යොමු කළ යුතු වෙනවා.

අද අපේ රටේ ඕනෑම ක්‍රීඩාවක ඉදිරි පැවැත්ම තීරණය වන ප්‍රධානතම සාධකයක් බවට ක්‍රීඩා සංගම් පත් වෙලා තිබෙනවා. ක්‍රීඩා අමාත්‍යාංශ තිබෙනවා, ක්‍රීඩා දෙපාර්තමේන්තුව තිබෙනවා, පළාත් සභා ක්‍රීඩා අමාත්‍යාංශ තිබෙනවා. පරිපාලනමය වශයෙන් ඒවා තිබෙන අතර, ක්‍රීඩාවෙන් ක්‍රීඩාවට ගත්තොත් ඒ ක්‍රීඩාවේ දියුණුව රඳා පවතින ප්‍රධාන සාධක අතරින් වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන්නේ අදාළ සංගම් විසින්. ඒ අනුව තමයි නීති රීති පවා සකස් වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි ඒ සංගම් පරිපාලනය පිළිබඳව මේ නියෝග ඉදිරිපත් කරන්න කටයුතු කළේ. එය ඉතාම කාලෝචිතයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ සඳහා ඉදිරිපත් විය යුතු තවත් කරුණු දෙකක් තිබෙනවා. විශේෂයෙන්ම මේ ක්‍රීඩා සංගම්වල පුහුණුකරුවන් සහ විනිසුරුවන් පිළිබඳව තීන්දු තීරණ ගන්නේත් ඒ සංගම් විසින්. පුහුණුකරුවන් පත් කරන්නේ, පුහුණුකරුවන් සඳහා විභාග පවත්වන්නේ, විනිසුරුවන් පත් කරන්නේ, විනිසුරුවන් සඳහා විභාග පවත්වන්නේ, ශ්‍රේණි උසස් කරන්නේ, ඒ විභාගවල විෂය මාලා සියල්ලක්ම හදන්නේ, විභාග පවත්වන්නේ ඒ සංගම් විසින්. එම නිසා මා පෞද්ගලිකව දකින්නේ, අමාත්‍යාංශය විධියට මේ කටයුතු සම්බන්ධ මැදිහත් වීමක් අනිවාර්යයෙන්ම අවශ්‍ය බවයි.

උදාහරණයක් විධියට ගත්තොත්, අපේ රටේ ජාතික අධ්‍යාපන ආයතනය මඟින් පාසල්වල ඉගැන්වීම සඳහා ඒ විෂය මාලා සකස් කිරීම යනාදී කටයුතු පිළිබඳ නියාමනයක් කරලා මග පෙන්වීමක් කරනවා. ක්‍රීඩාව සම්බන්ධයෙන්ද එවැනි ආයතනයක අවශ්‍යතාව අද රට හමුවේ තිබෙනවා. අද එල්ලේ ක්‍රීඩාව වෙන්න පුළුවන්, වොලිබෝල් ක්‍රීඩාව වෙන්න පුළුවන්, පාපන්දු ක්‍රීඩාව වෙන්න පුළුවන්, ඒ ක්‍රීඩා සංගම් තුළ අදාළ ක්‍රීඩාව පිළිබඳව ඉහළම නිපුණතාවක්, දැනුමක් තිබෙන අය ඉන්නවාය කියා අපට උපකල්පනය කරන්න පුළුවන්කමක් නැහැ. එවැනි දැනුමක්, ඉහළ අවබෝධයක් තිබෙන අය ඒ සංගමයේ හිටියොත් පුහුණුකරුවන් තේරීම, විනිසුරුවන් තේරීම සහ ක්‍රීඩාවේ ඉදිරි පැවැත්ම පිළිබඳව ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. නමුත් ඒ පිළිබඳව නියම දැනුමක් තිබෙන අය සංගම්වලින් එළියේ ඉන්නවා නම් ඒ අයගේ දැනුම ක්‍රීඩාවේ උන්නතිය සඳහා පාවිච්චි වෙන්නේ නැහැ. අප මෙන්න මේ විෂමතාව නැති කර ගත යුතුව තිබෙනවා. මේක අද ප්‍රධානතම ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

අද අපේ රටේ ක්‍රීඩාවේ යම් කිසි ආකාරයක වර්ධනයක් සිදු වෙලා තිබෙනවා. ක්‍රීඩාව තවත් ඉදිරියට ගෙන යාම සඳහා අප ක්‍රීඩාව පිළිබඳ දීර්ඝ අධ්‍යයනයක් කරලා කටයුතු කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවක් අද තිබෙනවා. අප දන්නවා, අද බොහෝ විට මේ ක්‍රීඩා පුහුණුකරුවන් විශේෂයෙන්ම ශාරීරික යෝග්‍යතාව පිළිබඳව අවධානයක් යොමු කරන්නේ නැති බව. ක්‍රීඩාවට ගිය හැටියේම බෝලයක්, bat එකක්, නැත්නම් racket එකක් දීලා පසුව දා ඉඳන්ම කෙළින්ම ඒ අදාළ ක්‍රීඩාව කරන්න පටන් ගන්නවා. මේක විශාල අඩු පාඩුවක්. ක්‍රීඩා කිරීම හොඳ කාරණයක්. නමුත් ශාරීරික යෝග්‍යතාව කෙරෙහි අවධානයක් යොමු කරන්නේ නැතිව ක්‍රීඩාව දියුණු කිරීමට මොනම ආකාරයකින්වත් පුළුවන්කමක්

ලැබෙන්නේ නැහැ. මේ තත්ත්වය පිළිබඳව අවධානය යොමු කරලා ක්‍රීඩා අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව පසු ගිය දවස්වල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ඒ ගැන අප සතුටු වෙනවා. මේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කර තිබෙනවා අපේ රටේ පාසල් ශිෂ්‍යයන්ගෙන් සියයට 5ක් තමයි ක්‍රීඩාවලට සම්බන්ධ වන්නේ, ඕස්ට්‍රේලියාව වැනි රටවල පාසල් ශිෂ්‍යයන්ගෙන් සියයට 79ක් ක්‍රීඩාව සඳහා සම්බන්ධ වෙනවාය කියලා. රටවල් දෙක සංසන්දනය කළාම එකම ජනගහනයක් සිටින්නේ. නමුත් ඕස්ට්‍රේලියාව ක්‍රීඩා අතින් අද අපට වඩා ඉතාම ඉහළින් ඉන්නේ. එම නිසා පාසල් අවධියේ සිටම ළමයින් ක්‍රීඩාවන් සඳහා යොමු කිරීමේ කාර්ය භාරය අද අනිවාර්යයෙන්ම ආරම්භ කළ යුතුව තිබෙනවා.

ක්‍රීඩාවන් සඳහා අවශ්‍ය කරන ශාරීරික යෝග්‍යතාව උත්පත්තියෙන් එන එකක්. එම නිසා එක එක්කෙනා අතර තිබෙන වෙනස්කම් අප අවබෝධ කර ගත යුතුයි. අපොස සාමාන්‍ය පෙළ විභාගයට දරුවන් තුන් ලක්ෂයක් වාඩි වෙනවා. ඒ විභාගය තියලා අප තෝරා ගන්නවා මෙන්න මේ අය තමයි සමත් වෙන්නේ කියලා. එහෙම විභාගයක් නැත්නම් අපට මේ අය හඳුනා ගන්න පුළුවන්කමක් නැහැ. එම නිසා අපේ රටේ පාසල් සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාව පිළිබඳව සොයා බලා, ඔවුන්ට සහජයෙන් ලැබුණු ශාරීරික යෝග්‍යතා අනුව ඒ අයට සුදුසු ක්‍රීඩාවන් පෙන්වා දීලා, ඒ ක්‍රීඩාව ඉදිරියටම කර ගෙන යාම සඳහා පසුබිම සකස් කළ යුතුව තිබෙනවා. වේගය කියන සාධකය ගත්තොත්, ශක්තිය කියන සාධකය ගත්තොත්, නම්‍යතාව කියන සාධකය ගත්තොත් එය "ඒ" කියන දරුවාට වඩා "බී" කියන දරුවාගේ වෙනස් වෙන්න පුළුවන්. අපි උදාහරණයක් ගනිමු. නම්‍යතාවෙන් අඩු දරුවෙක් ජිම්නාස්ටික් ක්‍රීඩාවට යොමු කරනවාට වඩා උත්පත්තියෙන්ම නම්‍යතාව තිබෙන දරුවෙක් ජිම්නාස්ටික් ක්‍රීඩාවට යොමු කළොත් ඒ දරුවාට ජිම්නාස්ටික් ක්‍රීඩාවෙන් ඉදිරියට යන්න පුළුවන්.

අපේ රටේ ක්‍රීඩාව තවත් ඉදිරියට ගෙන යෑමට නම් ප්‍රධානතම වශයෙන් ක්‍රීඩා සංගම්වලට පුහුණුකරුවන් පත් කිරීම, උසස් කිරීම සහ විනිසුරුවන් පිළිබඳ කටයුතුවලදී රජයේ අමාත්‍යාංශයේ මැදිහත් වීම අනිවාර්යයෙන්ම අවශ්‍යයි. විශේෂයෙන්ම පාසල් පද්ධතිය තුළින්ම ක්‍රීඩා සඳහා දරුවන් තේරීමත් අද කාලෝචිත අවශ්‍යතාවක් බවට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අද මේ ක්‍රමය පාසල් පද්ධතියෙන් තරමක් ඈත් වෙලා තිබෙනවා. අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදීත් අපි මේ පිළිබඳව කථා කළා. පාසල් දරුවන් ක්‍රීඩා පිටියේ ක්‍රියාකාරකම්වලින් අද ඈත් වෙලා තිබෙනවා. අද සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය කියන විෂයය ප්‍රශ්න පත්‍රයක් බවට පත් කරලා තිබෙනවා. පිටවනියේ කරපු ක්‍රියාකාරකම් ටිකත් අද නැවතුණු තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මෑතකදී අපි ක්‍රීඩා අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩලය පත්‍රිකාවේ සඳහන් කරුණු ඉතාමත් ඉක්මනින් ක්‍රියාත්මක කිරීමේ කාලෝචිත අවශ්‍යතාව අනිවාර්යයෙන්ම තිබෙන බව අපි සඳහන් කළ යුතුයි. එවිට තමයි අපට ජාත්‍යන්තර මට්ටමේ ඉලක්ක ජය ගන්නට පුළුවන්කම ලැබෙන්නේ. එහෙම නොවුණොත් අපට ඒ ඉලක්ක ජය ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

උත්පත්තියෙන්ම -සහජයෙන්ම- අපේ රටේ අයගේ දක්ෂතාවන් වැඩියි. ලෝකයේ අනෙක් රටවල් එක්ක සන්සන්දනය කරන කොට ඕනෑම ක්‍රීඩාවක ජ්‍යෙෂ්ඨ අංශයේ දක්ෂතාවන්වලට වඩා කනිෂ්ඨ අංශයේ දක්ෂතාවන්වලින් අපේ රට ඉහළින් සිටිනවා. මේක ඉතාමත් හොඳ උදාහරණයක්. මලල ක්‍රීඩාව වෙන්න පුළුවන්, table tennis ක්‍රීඩාව වෙන්න පුළුවන්, ජාත්‍යන්තරයේ අනෙක් රටවල් එක්ක කනිෂ්ඨ අංශය සන්සන්දනය කළොත් අපේ රටේ කනිෂ්ඨ අංශය ඉහළ අංශවලට වඩා ඉදිරියෙන් ඉන්නවා. නමුත් ජ්‍යෙෂ්ඨ අංශයේදී මේ තත්ත්වය පහළ මට්ටමකට පත් වෙනවා. විශේෂයෙන්ම ඒකට හේතුව මූලික අවධියේ සිට ක්‍රීඩාවන්වලට නියමිත සුදුස්සන් තේරීම සඳහා පැහැදිලි වැඩ පිළිවෙළක් අපේ රට තුළ ක්‍රියාත්මක නොවීමයි.

මේ රෙගුලාසි නිසා අපේ රටේ ක්‍රීඩාවේ උන්නතිය සඳහා ප්‍රධාන වගකීමක් දරන ක්‍රීඩා සංගම්වල පරිපාලනය සහ ඉදිරි කටයුතු විධිමත් වීමක් සිදු වන බව මම පෞද්ගලිකව දකිනවා. විශේෂයෙන්ම ක්‍රීඩා කටයුතු ආරම්භ කිරීම සඳහා පාසල් දරුවන්ගේ සිට සියලුම දෙනාට මෑතකදී ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ගෙන තිබෙන ක්‍රීඩා ප්‍රතිපත්තියත් ඉතාමත් කාලෝචිත බවයි මා මේ අවස්ථාවේ සඳහන් කරන්නේ. ඒ නිසා වර්තමාන ක්‍රීඩා අමාත්‍යතුමාට අපි සුබ පතනවා. ඒ වාගේම අපි අපේ සහයෝගය හා දායකත්වය සෑම අවස්ථාවකදීම එතුමාට ලබා දෙනවා. සමස්ත ක්‍රීඩාව දියුණු කිරීම සඳහා එතුමා දරන උත්සාහය පිළිබඳව අපි අපේ ප්‍රණාමය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි තව එක දෙයක් සඳහන් කරන්නට ඕනෑ. ඒ තමයි අපේ රටේ ජාතික කණ්ඩායම්වල සිටින ක්‍රීඩකයින්ගේ විනය. එක් අතකට අපි කනගාටු වෙනවා. බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, ජාතික කණ්ඩායමක් නියෝජනය කරනවා කියලා වෙනත් බලයක්, මවා ගත් වෙනත් ශක්තියක් කාටවත් ඇති වෙන්න විධියක් නැහැ කියන එක. ඒ අය නියෝජනය කරන්නේ රට. ඒ අයගේ ක්‍රියාකාරිත්වය අනිවාර්යයෙන්ම රටේ කීර්තියට බලපානවා. එම නිසා අපි විශේෂයෙන්ම ජාතික කණ්ඩායම් නියෝජනය කරන ක්‍රීඩකයින්ට ක්‍රීඩාවේ සැබෑ අරමුණු කියා දිය යුතු වෙනවා. ක්‍රීඩාවෙන් බලාපොරොත්තු වන සැබෑ පරමාර්ථයන් ඉටු කර ගැනීමට නම් අනිවාර්යයෙන්ම අපි ඒ විනය කියන සාධකය ඇති කළ යුතුයි. එයින් තොර ක්‍රීඩාවක් නැහැයි කිව්වොත් අනිවාර්යයෙන්ම එය නිවැරදියි. ඒ නිසා ජාතික කණ්ඩායම් නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ යුතුකමක් තිබෙනවා ඒ අයගේ විනයගරුක බව මේ රට හමුවේ ප්‍රදර්ශනය කරන්න. පහළ මට්ටමේ සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ටත් තම ආදර්ශය ලබා දීමේ වගකීම ජාතික කණ්ඩායම් නියෝජනය කරන සියලුම ක්‍රීඩකයින්ට තිබෙන බව අපි මේ අවස්ථාවේ සඳහන් කළ යුතුයි. විශේෂයෙන්ම සියලුම ක්‍රීඩා සංගම් වාගේම ක්‍රීඩා අමාත්‍යාංශයත් ජාතික කණ්ඩායම්වල ක්‍රීඩකයින්ගේ විනය පිළිබඳව අනිවාර්යයෙන්ම දැඩි අවධානයක් යොමු කළ යුතුයි කියන යෝජනාවත් මම මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා. ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Sajith Premadasa. Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Sriyani Wijewickrama to take the Chair?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I propose that the Hon. (Mrs.) Sriyani Wijewickrama do now take the Chair.

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

[අ.භා. 3.51]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රීඩා ක්ෂේත්‍රයේ උන්නතිය තකා, ඒ වාගේම ක්‍රීඩා ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය තකා නියෝග ගණනාවක් ඉදිරිපත් වී තිබෙන අවස්ථාවක මෙම විවාදයට සම්බන්ධ වෙලා අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය පිළිබඳව මා දරන අදහස් කිහිපයකුත් ඉදිරිපත් කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. ප්‍රථමයෙන්ම මම අපේ ක්‍රීඩා ඇමතිතුමාට සුබ පතන්නට කැමැතියි. එතුමා අලුත් නියෝග ගණනාවක් පනවලා ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ යම් ධනාත්මක වෙනසක් ඇති කරන්නට උත්සාහයක් දරන බව අපට පේනවා. කොයිතාක් දුරට එතුමාගේ උත්සාහය සාර්ථක වෙයිද, නොවෙයිද කියන කාරණය පදනම් වන්නේ විවිධ පාර්ශ්වයන්වලට ගැනිකම් දක්වන්නේ නැතිව, විවිධ බල පරාක්‍රමයන්වලට යටත් වන්නේ නැතිව, හෘදය සාක්ෂියට එකඟව ක්‍රීඩා ඇමතිවරයා හැටියට ක්‍රීඩා ක්ෂේත්‍රය වෙනුවෙන් තමන් කළ යුතු යුතුකම් සම්භාරය ක්‍රියාත්මක කිරීම තුළින්. මම විශ්වාස කරනවා ඒ තුළින් අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ යම් ධනාත්මක වෙනසක් ඇති කරන්නට පුළුවන් වෙයි කියලා. ඒ නිසා මම ප්‍රථමයෙන්ම අපේ ක්‍රීඩා ඇමතිතුමාට සුබ පතනවා මේ නව නියෝග හරහා ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ හොඳ වෙනසක්, රටට යහපත් ගුණාත්මක, හරාත්මක, ධනාත්මක වෙනසක් ඇති කරන්නට ධෛර්යය, ශක්තිය ලැබෙවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නමුත් විශේෂයෙන්ම අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩා ක්ෂේත්‍රයට අත්ත සෝචනීය, අත්ත බෙදනීය තත්ත්වයක් උදා වුණු වකවානුවකයි -මේ කථා කරන මොහොතේත්- අපි අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය නංවාලීමට උත්සාහ කරන්නේ. අපේ රටේ ක්‍රිකට් ක්ෂේත්‍රය ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයට ගිහින් සියයට 4 පොලියට ඩොලර් මිලියන 450ක් හිඟා කන්නට උත්සාහ කරන යුගයක; ඒ වාගේම ලෝක කුසලාස ක්‍රිකට් තරගාවලියට ලබා දුන්න රුපියල් මිලියන 2ක රූපවාහිනී යන්ත්‍ර අතුරුදහන් වුණු යුගයකයි අපි අද මේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නංවාලීම, පුනර්ජීවනය ගැන සාකච්ඡා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අපි පිළිගන්නවා තරගකාරී ක්‍රීඩා ක්ෂේත්‍රයට රට යොමු කිරීම, තරගකාරී ක්‍රීඩාවලින් රට ජයග්‍රහණය කර වීම වාගේම ග්‍රාම නිලධාරී වසමේ සිට කොට්ඨාස මට්ටමෙන්, දිස්ත්‍රික්ක මට්ටමෙන්, පළාත් මට්ටමෙන් ජාතික ක්‍රීඩා තරගාවලීන් හරහා අපේ රටේ සියලුම ක්‍රීඩා ක්ෂේත්‍රයන් නංවාලීමේ වගකීම ක්‍රීඩා අමාත්‍යාංශය සතු බව. විශේෂයෙන්ම ජාතික සංගම් 48කට වැඩි ප්‍රමාණයක් අපේ රටේ තිබෙන මොහොතක අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය උසස් මට්ටමකට ගෙන එන්නට නම් මේ ක්‍රීඩා සංගම් මනා පරිපාලනයකට ලක් වන්නට ඕනෑ. මේ ක්‍රීඩා සංගම්වල මනා පරිපාලනය තුළින්, ශක්තිමත් ක්‍රියාදාමයන් තුළින් අපේ රටේ සමස්ත ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශාල ප්‍රගතියක් ලබා ගැනීමේ හැකියාවක් අපට ලැබෙනවා. විශේෂයෙන්ම අපට මතක් වෙනවා මේ අවස්ථාවේදී මේ අමාත්‍යාංශය හොබවපු, ඒ වාගේම ක්‍රිකට් ක්ෂේත්‍රය ගැන කථා කරනවා නම් ඒ ක්‍රිකට් ක්ෂේත්‍රයට ශක්තිය ලබා දුන්න, ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා, කේ.බී. රත්නායක මැතිතුමා සහ ගාමිණී දිසානායක මැතිතුමා. මේ ක්‍රීඩා ක්ෂේත්‍රය, ක්‍රිකට් ක්ෂේත්‍රය නංවාලන්නට අමරණීය වැඩ කොටසක් එතුමන්ලා ඉෂ්ට කළ ආකාරය අපට මතක් වෙනවා. විශේෂයෙන්ම ක්‍රිකට් ක්ෂේත්‍රය තුළින් අපේ රට විශාල ප්‍රගතියක් ලබා තිබෙන මොහොතක්. මේ ප්‍රගතිය ලබා දීමට ඒ නායකත්වය ලබා දුන්නේ දිවංගත ගාමිණී දිසානායක මැතිතුමා ප්‍රමුඛ කණ්ඩායම. එදා ක්‍රිකට් ක්ෂේත්‍රයේ ටෙස්ට් වරම් ලබා ගැනීමේ සටනේ සිට මෙම ක්‍රීඩාවට ශක්තිමත් අඩිතාලමක් දමන්නට යෙදුණු යුගය මම මතක් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ක්‍රීඩා සංගම් ගැන කථා කරන විට ක්‍රීඩා සංගම් ශක්තිමත් කිරීම වැදගත් වෙනවා.

වින්සන්ට් පෙරේරා මැතිතුමා ක්‍රීඩා ඇමතිව සිටි කාලයේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ වැඩ කටයුතුවලට ගාමිණී දිසානායක මැතිතුමාගේ ආගමනය සිදු වනකොට, වින්සන්ට් පෙරේරා මැතිතුමා තමන්ගේ දේශපාලන සහකරුවා වූ එතුමාට කිසිම පැකිලීමකින් තොරව කිව්වා, "ඔබතුමා මේ වගකීම භාර ගන්නවා නම්, වගකීම භාර අර ගෙන එම තනතුරේ දීර්ඝ කිරීම් ලබා ගන්න අපේක්ෂා කරනවා නම්, ඔබතුමාගේ කාල වකවානුව තුළ අනිවාර්යයෙන්ම එක පැත්තකින් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රගතියක් පෙන්වන්නට ඕනෑ; තවත් පැත්තකින් ඉදිරි මාර්ග සිතියම - ඉදිරි සැලැස්ම ඉදිරිපත් කරන්නට ඕනෑ"ය කියා. ඒ කාල වකවානුව තුළ ක්‍රිකට් ක්‍රීඩාව නංවාලන්නට, ක්‍රීඩා සංගම් ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නට ඒ වාගේ හොඳ ශක්තිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටට ක්‍රිකට් ක්‍රීඩාවේ ටෙස්ට් වරම් ලබා දීමේ මහා විප්ලවය, ඒ මහා ගමන ක්‍රියාත්මක කරනකොට අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවට මහා මුදල් සම්භාරයක් තිබුණේ නැහැ. ගාමිණී දිසානායක මැතිතුමාගේ නිර්මාණශීලී නායකත්වය තුළ, එතුමා දක්ෂ - පක්ෂ භපන්කම් තිබෙන ව්‍යාපාරික ක්ෂේත්‍රය සම්බන්ධ කර ගෙන, පෞද්ගලික ක්ෂේත්‍රය සම්බන්ධ කර ගෙන, දානපති ක්ෂේත්‍රය සම්බන්ධ කර ගෙන අපේ රටට ටෙස්ට් වරම් ලබා දීමේ ගමන ක්‍රියාත්මක කළ ආකාරය අපට මතක් වෙනවා. ගාමිණී දිසානායක මැතිතුමා විශේෂයෙන් ම රාජා මහේන්ද්‍රන් මැතිතුමා සමග අත්වැල් බැඳගෙන, මහාරාජා ව්‍යාපාරය සහයෝගය බද්ධ කර ගෙන, මේ රටට ටෙස්ට් වරම් ලබා දීමේ ගමන ක්‍රියාත්මක කළ මොහොතේ අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩකයින්ට තඹ දොයිතුවක්වත් වියදම් කරන්නට සමපත් නොතිබුණු මොහොතක එදා කටයුතු කළ ආකාරයෙන් අද දවසේ ක්‍රිකට් ක්‍රීඩාවේ ප්‍රගතියට ඒ පාඩම් ඉගෙන ගැනීම වැදගත් වෙනවාය කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ක්‍රීඩා සංගම් දිහා බැලුවාම මේ ක්‍රීඩා සංගම්වලට එක් එක් බලවතුන්, පුද්ගලයින් අරක් ගෙන සිටිනවා. ඒ අය සදාකාලිකවම මේ සංගම්වල ඉහළ නිලතලවල වැජඹෙන්නට උත්සාහ කරනවා. අද ක්‍රීඩා සංගම් ක්ෂේත්‍රය යම් ආකාරයකට හමුදාකරණය වෙලාය කියා කියන්නට පුළුවන්. අද ක්‍රීඩා සංගම් ක්ෂේත්‍රය දේශපාලනීකරණය වෙලාය කියා තවත් අය කියන්නට පුළුවන්. නමුත් දේශපාලනඥයින්

සම්බන්ධ කර ගන්න එකේ කිසිම වරදක් නැහැයි කියා මා විශ්වාස කරනවා. හමුදාකරණය වීමේ කිසිම අඩු පාඩුවකුත් නැහැ. නමුත් මේ කරන, කියන හැම දෙයකින්ම ප්‍රතිඵලයක් ලැබෙන්නට ඕනෑ. Results-oriented වන්නට ඕනෑ. නිලතල දරන්නේ හමුදා ක්ෂේත්‍රයේ පුද්ගලයන් වන්නට පුළුවන්; දේශපාලන ක්ෂේත්‍රයේ පුද්ගලයෙක් වන්නට පුළුවන්. දක්ෂතාව, හැකියාව, කැපවීම මත ප්‍රතිඵල ලබා දෙනවා නම්, එක පවුලකින් දහ පහළොස් දෙනෙක් මේ සංගම්වල හිටියාට මට ප්‍රශ්නයක් නැහැ. අන්න එයයි වැදගත්කම කියන එක මා විශ්වාස කරනවා. Results-oriented වන්නට ඕනෑ. ප්‍රතිඵල ලැබෙන්නට ඕනෑ. ප්‍රතිඵලදායි යම් දෙයක් තිබෙනවා නම්, පක්ෂ, විපක්ෂ, ජාති, ආගම්, කුල-මල, එක පවුලේද, පවුල් දහයකද, පවුල් විස්සකද කියන එක වලංගු නැහැ. ක්‍රීඩා ක්ෂේත්‍රය නංවා ලන්නට හැකියාව තිබෙන්නට ඕනෑ. හැබැයි ප්‍රතිඵල තුළින්. කයිවාරුවලින් නොවෙයි. ප්‍රකාශනවලින් නොවෙයි. බෙරිහන් දීම් තුළින් නොවෙයි. ප්‍රතිඵලවලින් ඒවා ඔප්පු කරන්නට ඕනෑය කියන එක මා විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, ක්‍රීඩා සංගම් ශක්තිමත් කරන්නට ඕනෑ. මේ ක්‍රීඩා සංගම්වල පත්වීම් ලබා දෙනකොට හැකියාව මත පදනම් වූ, දක්ෂතා මත පදනම් වූ ක්‍රමවේදයක් සකස් කරන්නට ඕනෑ. අපේ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා දන්නවා, ඒකට ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා, "meritocracy or merit-based" කියා. සුදුසුකම කේන්ද්‍ර කර ගෙන මේ පත්වීම් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒවා විනිවිදභාවයෙන් යුක්ත වන්නට ඕනෑ. එහෙම නැතිව හෙංචයියලා කොට්ඨාසයක් පත් කර ගෙන, සුවව කීකරු ගෝලබාලයින් කොට්ඨාසයක් පත් කර ගෙන, අතකොළුවන්, අඳබාලයින්, එහෙයියන් කොට්ඨාසයක් පත් කර ගෙන කිසිම දවසක අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය නංවාලන්නට පුළුවන්මක් නැහැයි කියන එකයි මගේ විශ්වාසය. එම නිසා ජාතික ක්‍රීඩා සංගමයක නිලයක් දැරීමේදී, ඒ නිල කාලය දීර්ඝ කර ගැනීමේදී මේ හැම දෙයකදීම දේශපාලන රැකවරණය පැත්තක දමා, ඒ පුද්ගලයාගේ හැකියාව ඉස්මතු වෙන ක්‍රමවේදයක්, ක්‍රමෝපායක් සකස් කිරීම වැදගත්ය කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් අප විවිධ පුද්ගලයින් ඉදිරිපත් කරනකොට හුදෙක් රට නියෝජනය කිරීමට සහභාගිත්වයේ නාමයෙන් ඉදිරිපත් කරනවාද එහෙම නැත්නම් පැහැදිලි ඉලක්ක, ජයග්‍රාහී ඉලක්ක ලබා ගැනීමේ අරමුණින්, අදිටනින් අප මේ වැඩසටහන් ක්‍රියාත්මක කරනවාද කියන එක සිතා බලන්නට ඕනෑ.

අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ හැම ක්‍රීඩාවකටම විධිමත් සැලැස්මක අවශ්‍යතාව තිබෙනවා. විශේෂයෙන්ම කණ්ඩායම් තෝරා ගැනීමේදී නිකම් යාළුවෝ සතුටු කරන්නට නාම මාත්‍ර පත්වීම් ලබා දෙනවා වෙනුවට රටට ගෞරවයක් ලබා දෙන ආකාරයට, රටට ජයග්‍රහණයක් ලබා දෙන ආකාරයට, දක්ෂතාවලින් පිරිපුන් කණ්ඩායම් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් අපි සකස් කර ගන්නට ඕනෑ. මොකද, මේ හැම දෙයකටම වියදම් දරන්නේ රජයයි. ක්‍රීඩකයින්ට ප්‍රතිලාභ ලැබෙනවා වාගේම පෙරළා අපේ රටටත් ප්‍රතිලාභයක් හිමි විය යුතුයි කියා මම විශ්වාස කරනවා.

විශේෂයෙන්ම ජාතික මට්ටමේ වේවා, පළාත් මට්ටමේ වේවා, ප්‍රාදේශීය මට්ටමේ වේවා රට නියෝජනය කරන ක්‍රීඩකයින් විනයානුකූලව හැසිරෙන්නට ඕනෑ. දේශපාලනඥයින්ගේ හැසිරීම් රටාව අද බොහෝ දෙනා ඉලක්ක කර ගන්නා යුගයක විශේෂයෙන්ම රට නියෝජනය කරන ක්‍රීඩකයින්, මේ රටේ ගරුත්වය රැකෙන ආකාරයට, ඒ වාගේම ආත්ම ගරුත්වයත් සුරැකෙන ආකාරයට නිහතමානීව නිස්කලංකව තම හැසිරීම් රටාව සහ ගුණාංගයන් ලොවට ප්‍රදර්ශනය කළ යුතු කාලය එළඹිලා තිබෙනවාය කියා මම විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේ කුමන ක්‍රීඩාවක් වුණත් තෝරා ගැනීමේ නිර්ණායකයන් ප්‍රසිද්ධ කරන්න ඕනෑ. තෝරා ගැනීම් කල් වේලා ඇතුව කරන්න ඕනෑ. අන්තිම මොහොතේ රටේ අනන්‍යතාව, රටේ අවශ්‍යතාව පැත්තක දමා යාළු හිතවතුන්, සුවව කීකරු ගෝලබාලයින් තමන්ගේ හිතවත්කමේ නාමයෙන් මේ තෝරා ගැනීමේ ක්‍රියාවලිය සිද්ධ වුණොත් අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සදාකාලිකවම පරිහානියට පත් වෙනවා නොඅනුමානයි කියන එක මා විශ්වාස කරනවා. ක්‍රීඩා අමාත්‍යාංශය, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රීඩා විද්‍යායතනය, ක්‍රීඩා වෛද්‍ය ආයතනය, ක්‍රීඩා පුහුණු වීමේ වැඩසටහන, ජාතික ක්‍රීඩා සභාව, ජාතික ඔලිම්පික් කමිටුව ආදී මේ හැම ක්ෂේත්‍රයක්ම ඒකාබද්ධව කටයුතු කරන්න ඕනෑ. ඒකාබද්ධව කටයුතු කරලා විධිමත්ව සැලසුම් සහගතව ජාත්‍යන්තර ක්‍රීඩා තරගවලට මුහුණ දෙන සැලැස්මක් ක්‍රියාත්මක කරන්න ඕනෑ කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රිකට්වලට පමණක් සීමා වුණාට මදි. අනෙකුත් ක්‍රීඩාවලදීත් ක්‍රීඩා දින දර්ශනයක්, ක්‍රීඩා මාර්ගෝපදේශ සැලැස්මක්, මාර්ග සිතියමක්, කෙටි කාලීන මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන සැලැස්මක් අනුව අපි ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේ සැලසුම් හරහා තමයි පුහුණු සංචිත සකස් කරන්නට ඕනෑ. පුහුණු සංචිත සකස් කිරීමේ නිසි ක්‍රමවේදයක් අද නැහැ. බොහෝ දේවල් ක්‍රියාත්මක වන්නේ *ad hoc* ක්‍රමයට. අවිධිමත් ක්‍රමයට තමයි මේ වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ. ක්‍රිකට් ක්ෂේත්‍රය තුළ එය හරියට ක්‍රියාත්මක වුණත් අනෙකුත් ක්‍රීඩා සඳහා මේ පුහුණු සංචිත හරියාකාරව ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ වාගේම ක්‍රීඩා ක්ෂේත්‍රයන් තුළ පැහැදිලි ජාතික මාර්ග සිතියමක් අද පෙනෙන්නට නැහැ කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මගේ අදහස් ඉදිරිපත් කරන මේ මොහොතේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. බොහෝ ක්‍රීඩා සංගම්වලට දිස්ත්‍රික් නියෝජනත්වයක් නැහැ. බොහෝ ක්‍රීඩා සංගම් අගනුවර කේන්ද්‍ර කර ගෙනයි ක්‍රියාත්මක වන්නේ. වැඩිම වුණොත් පළාත් මට්ටමට යයි. දිස්ත්‍රික් මට්ටමට කොට්ඨාස මට්ටමට ක්‍රීඩා සංගම් ව්‍යාප්ත කරලා බිම් මට්ටමෙන් නැඟී එන, අපේ රටට ශක්තිය ලබා දෙන ඒ පහන් තරුවලට ඒ ක්‍රීඩා ක්ෂේත්‍රය නමැති ඉණිමගේ පහළම තලයේ සිට ඉහළම තලය දක්වා යන්නට අවස්ථාව සැකසෙන්නට ඕනෑය කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය මේ අවස්ථාවේ තවත් කාරණයක් කෙරෙහි යොමු කරවන්න ඕනෑ. අපි රටක් හැටියට හැම ක්‍රීඩාවකටම සම්බන්ධ වුණත්, අපේ රටට ප්‍රගතියක් ලබා ගන්න පුළුවන් ක්‍රීඩා ක්ෂේත්‍ර හඳුනා ගෙන, ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. ඒ අනුව ක්‍රිකට් ක්ෂේත්‍රය ගැන කථා කළොත් මා ඔබතුමාට යෝජනා කරනවා, රට පුරාම cricket academies පටන් ගැනීමේ වැදගත්කමක් තිබෙන බව. ඒවා ආරම්භ කරන්න ඕනෑ පළාත් මට්ටමින් ද දිස්ත්‍රික් මට්ටමින්ද කියන එක ප්‍රායෝගිකව සැලසුම් කර බලන්නට ඕනෑ. නමුත් ක්‍රිකට් පුහුණු ආයතන - cricket academies - මේ රට තුළ ක්‍රියාත්මක කිරීමේ වැදගත් අවශ්‍යතාවක් තිබෙනවා. මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි මේ කාරණයට. මා සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය ගැන පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවාම ඔබතුමා කිව්වා, පොරොන්දු වූ ආකාරයට ඉතාමත් ඉක්මනින් cricket academy එකක් පටන් ගන්නවා කියලා. අද වන විටත් ඒ cricket academy එක පටන් අරගෙන නැහැ. මා ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මගේ ඒ යෝජනාව බාලගිරි දෝෂයට ලක් කරන්නේ නැතුව ඉක්මනින්ම ඒ cricket academy එක පටන් ගන්න කටයුතු කරන්න කියලා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තිබෙන්නේ සීමා සහිත කාලයක්. ඒ නිසා මගේ අදහස් ඉදිරිපත් කිරීමට- [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා අපි කොළඹත් හදනවා, මහනුවරත් හදනවා, හම්බන්තොටත් හදනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම හොඳයි.

ගරු ඇමතිතුමනි, යුද ජයග්‍රහණයක් ලබා තිබෙන මේ මොහොතේ විශේෂයෙන්ම සංහිඳියාවේ නාමයෙන් මා ඉල්ලා සිටිනවා, මේ ක්‍රීඩා ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමේ වැඩසටහන උතුරු නැඟෙනහිර බල ප්‍රදේශයටත් ක්‍රියාත්මක කරන්නට ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා. ඔබතුමා කියනවා, හම්බන්තොට ක්‍රිකට් පුහුණු ආයතනය - cricket academy එක - ඉක්මනින්ම පටන් ගන්නවා කියලා. ඔබතුමා ඒක මාස ගණනාවකට කලිනුත් කිව්වා. මා විශ්වාස කරනවා ඔබතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඒ යුතුකම ඉෂ්ට කරයි කියලා. එය ඉටු වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මා කියන්නට ඕනෑ අද ක්‍රිකට් ක්ෂේත්‍රයේ මහා බරපතළ මූල්‍ය අර්බුදයක් තිබෙන බව. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ රෙගුලාසි ඉදිරිපත් කළාය කියා ඉබේටම ක්‍රිකට් ක්ෂේත්‍රයේ තිබෙන ඒ අර්බුදය විසඳෙනවාද කියලා. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ක්‍රිකට් ක්ෂේත්‍රය තුළ තිබෙන මේ මහා මූල්‍ය ඌනතාවට, අර්බුදයට සුලමුල මොකක්ද කියන එක හොයන්න කියලා. මා ඔබතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරවන්න කැමැතියි. විශේෂයෙන්ම ක්‍රිකට් ක්ෂේත්‍රය තුළ අද උද්ගත වී තිබෙන මූල්‍ය අර්බුදයට හේතු වූ කරුණු කාරණා හඳුනා ගෙන, ක්‍රිකට් ක්ෂේත්‍රයේ ඉදිරි ගමන ශක්තිමත් කරන්න කියලා මා යෝජනා කරනවා.

ගරු ඇමතිතුමනි, මා ඊළඟට ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි, දඹුල්ල ක්‍රිකට් ක්‍රීඩාංගණයට. මේ වන විට එය ඉතාමත්ම අබල දුබල තත්ත්වයකයි තිබෙන්නේ.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
Madam, I rise to a point of Order.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතැන point of Order එකක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. බාධා කිරීමක් කරන්නේ. ඒ නිසා මට කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] අබල දුබල වී තිබෙන දඹුල්ල ක්‍රීඩාංගණය-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, දඹුල්ල ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කරන්නට යම් කිසි පියවරක් ගන්නය කියා මා තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මා විශේෂයෙන්ම මේ අවස්ථාවේ- [බාධා කිරීම්] මා ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නට කැමැතියි -

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
Madam, I rise to a point of Order.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, මේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ බරපතළ ගැටලු රැසක් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාගේ රීති ප්‍රශ්නයට ඉඩ දෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් රුපියල් ලක්ෂ 3,000ක් වැය කර කෑගල්ල ප්‍රදේශයේ මීටර් 200ක ධාවන පථයක් සහිත ක්‍රීඩාංගණයක් හදලා තිබෙනවා. [බාධා කිරීම්] මහා මුදල් කන්දරාවක් නාස්ති කර තිබෙනවා. පිළියන්දල ප්‍රදේශයේ පිහිනුම් තටාකයක් හදන්න රුපියල් ලක්ෂ 800ක් වැය කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රුපියල් ලක්ෂ 750ක් වැය කර ජාතික ක්‍රීඩා උළෙලක් පවත්වන්නට බැරි, සුදුසු ප්‍රමිතියක් නොමැති ක්‍රීඩාංගණයක් මධ්‍යම ඉංජිනේරු කාර්යාංශයෙන් පොළොන්නරුවේ හදලා, ඊට අමතරව තවත් රුපියල් ලක්ෂ 300ක් වැය කර තිබෙනවා. ඒ ක්‍රීඩා අමාත්‍යාංශයේ සල්ලි; රටේ සල්ලි. ඒ වාගේම නාවලපිටියේ ක්‍රීඩාංගණය හදන්න රුපියල් ලක්ෂ 600ක් වැය කර තිබෙනවා. ඒ ක්‍රීඩාංගණයත් ප්‍රමිතියෙන් තොරයි. තවමත් වතුර පිරෙන ක්‍රීඩාංගණයක් බවට නාවලපිටියේ ක්‍රීඩාංගණය පත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, කෑගල්ලට රුපියල් ලක්ෂ 300ක් නාස්ති කර තිබෙනවා. පිළියන්දලට රුපියල් ලක්ෂ 800ක් නාස්ති කර තිබෙනවා. පොළොන්නරුවට රුපියල් ලක්ෂ 750ක් සහ තවත් ලක්ෂ 300ක් නාස්ති කර තිබෙනවා. නාවලපිටියට රුපියල් ලක්ෂ 600ක් නාස්ති කර තිබෙනවා. ඒ වාගේ මුදල් කන්දරාවක් නාස්ති කළේ ඇයි? යම් කිසි කටයුත්තක් ක්‍රියාත්මක වනවා නම් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් නිසි ප්‍රමිතියකට ඒක ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි කියා මා මේ අවස්ථාවේදී අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ මානව සම්පත් සංවර්ධනය පිළිබඳව-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Madam, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාට අවස්ථාව ලබා දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක point of Order එකක් නොවෙයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම කියන්නේ කොහොමද? මම තවම කිව්වේ නැහැ නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාට point of Order එක ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට කියන්න ඉඩ දෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාගේ රීති ප්‍රශ්නයට ඉඩ දෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොන වගන්තිය යටතේද රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මෙතුමා අහන්නේ රීති ප්‍රශ්නයක් නොවෙයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, තාත්තා ජනාධිපති හැටියට හිටපු කාලයේ ඔබතුමා රාජකීය විද්‍යාලයේ Under 15 team එකට හොරෙන් නම දා ගත්තේ කොහොමද කියලා කියන්න. ඔබතුමාට ඒකට සුදුසුකම් තිබුණේ නැහැ. ඔබතුමා ඒ selection එකේ හිටියේ නැහැ. ඔබතුමා තාත්තාගේ ජනාධිපතිකම පාවිච්චි කරලා cricket team එකට නම දා ගත්තේ නැද්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමාට පොට වැරදිලා. මම Royal College එකේ under 15 ගැහුවේ නැහැ. එතුමාට පොට වැරදිලා. මම Under 15 ගහන්න ඒ කාල වකවානුවේ Royal College එකේ හිටියේ නැහැ. බොහොම ස්තුතියි, අසත්‍යයක් කිව්වාට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම විශේෂයෙන්ම මේ කාරණය කෙරෙහි ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ක්‍රීඩා ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය පිළිබඳව නව තාක්ෂණික දැනුම ලබා දෙන්නට, විද්‍යාත්මක දැනුම ලබා දෙන්නට අලුත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ වාගේම විශේෂයෙන්ම පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයත්, ජාතික ක්‍රීඩා ක්ෂේත්‍රයත් බද්ධ කිරීම සඳහා යම් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මන්ත්‍රීතුමාගේ කාලය අවසානයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට වැඩි පුර විනාඩි පහක් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ කාලයත් අවසානයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ කථාව අවසන් කරන්න විනාඩියක කාලයක් දෙන්න. Hon. Eran Wickramaratne, can I have three minutes from your time?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Yes.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාගේ කාලයෙන් මට විනාඩි තුනක් ලැබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාගේ කාලයෙන් ඔබතුමාට විනාඩි පහක කාලයක් ලබා දීලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

කමක් නැහැ. එතුමා තව දෙනවා. භය වෙන්න එපා. එතුමා අවසර දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අවසාන වශයෙන් මේ කාරණය කෙරෙහි ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි. ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අද මූල්‍ය අර්බුදයකට ලක් වී තිබෙන මොහොතක මේ රටේ ප්‍රවීණයින්, මේ රටේ ක්‍රිකට් විශේෂඥයන් විවිධ නිර්දේශ, විවිධ යෝජනා ඉදිරිපත් කරද්දී ක්‍රිකට් ආයතනය කෝටි එකහමාරක් වියදම් කරලා "ලෝගාට් වාර්තාව" නමින් වාර්තාවක් සකස් කරන්නට යෙදුණා. මේ රටේ ප්‍රවීණයින් වසර ගණනාවක් මුළුල්ලේ ඒ ලබා දුන්නු උපදෙස් තකන්නේ නැතුව කෝටි එකහමාරක් නාස්ති කරලා ලෝගාට් වාර්තාවක් සකස් කළේ ඇයි කියලා මම අහන්න කැමැතියි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා ක්‍රීඩාව නිර්දේශපාලනීකරණය කිරීම ගැන -දේශපාලනය ඉවත් කිරීම ගැන-කථා කරනවා. මේ රටට මහා විශාල ගෞරවයක් ලබා දුන්නු අර්ජුන රණතුංග මැතිතුමා ඉන්නවා. එතුමාගේ දායකත්වය, එතුමාගේ සේවය මේ ක්‍රිකට් ක්‍රීඩාව නංවාලන්නට ඔබතුමා ලබා ගන්නේ නැත්තේ ඇයි කියලා මම අහන්න කැමැතියි.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඔබතුමාට බලපෑම් තිබෙනවා ගන්න එපා කියලා. අර්ජුන රණතුංග මැතිතුමා රාජ්‍ය පාර්ශ්වයේ හිටියා නම් අද එතුමාගේ උපදෙස්, එතුමාගේ අදහස් උදහස් ලබා ගන්නවා. නමුත් අද එතුමා විරුද්ධ දේශපාලන ගමනක් යන නිසා අපේ රටට කීර්තියක් ගෙනාපු, අපේ රටට ගෞරවයක් ගෙනාපු එතුමාගේ උපදෙස් ගන්න බැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

Madam, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමාට එතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

කෝටි එකහමාරක් වියදම් කරලා පිට රට ඉන්න හරුන් ලෝගාට් ලවා නිකම් පුස් වාර්තාවක් හදා ගත්තා. ඒවා නතර කරන්න මේ අයට කොන්දක් නැද්ද? මොන විහිළුවක්ද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ නම සඳහන් කරලා කිව්වා, ඇමතිවරයාට කොන්දක් නැහැ කියලා. මම ඔබතුමාගෙන් අහනවා, ඔබතුමා මට කොන්දක් තිබෙනවාද, නැද්ද කියලා දන්නවාද කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

නම සඳහන් කරලා තිබෙනවා නම් ඒ කරුණ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙසට මා කියා සිටිනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන් මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර point of Order හඳුනා ගෙන ඒවාට ඉඩ දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අර්ජුන රණතුංග මැතිතුමා වාගේ මේ රටට ගෞරවයක් ගෙනාපු, මේ රටට කීර්තියක් ගෙනාපු පුද්ගලයින් යෝජනා ඉදිරිපත් කරන කොට, නිර්දේශ ඉදිරිපත් කරන කොට ඒවාට සවන් දෙන්නේ නැහැ. මොකද එතුමා විරුද්ධ පාර්ශ්වයක සිටින හින්දා. නමුත් පිටු 16ක විතර වාර්තාවක් සඳහා හරුන් ලෝගාට්ට කෝටි එකහමාරක් වියදම් කරන්න ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට පුළුවන්. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා මගේ කථාවට කොතරම් බාධා කළත්, එතුමා ඉදිරිපත් කර තිබෙන නියෝග හරහා මේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය නංවාලන්නට එතුමාට හැකියාව, දක්ෂතාව හා උනන්දුව ඇති වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය නංවාලන්නට කොන්ද කෙළින් තබා ගෙන, හෘදය සාක්ෂියට එකඟව, බලපෑම්වලින් තොරව එතුමා ගන්නා වූ සියලුම ක්‍රියාදාමයන්ට පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව අපේ සහයෝගයත් ලබා දෙනවාය කියමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. ඊළඟට ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමා.

[අ.භා.4.16]

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතික ක්‍රීඩා සංගම් නියෝග සංශෝධනය වන මේ අවස්ථාවේදී ක්‍රීඩා අමාත්‍යතුමා විසින් ඉතා සුවිශේෂී වූ වැදගත් නියෝග රාශියක් ගෙනැවිත් තිබෙනවා. ක්‍රීඩාවට වාගේම ක්‍රීඩාවේ පරිපාලනයටත් වසර 40ක පමණ කාලයක් නිස්සේ සම්බන්ධ වූ කෙනකු හැටියට එම නියෝග සම්බන්ධයෙන් මගේ අදහස් ඉදිරිපත් කරමින් වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන සන්තෝෂ වනවා. ඒ වාගේම අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරන ඔබතුමිය මූලාසනයේ සිටින අවස්ථාවේදී මට කථා කරන්න ලැබීම ගැනත් මා ඉතා සතුටු වනවා.

1948 දී නිදහස ලබා වසර 18ක් යන තුරු මේ ක්‍රීඩාව පැවැතියේ ජනසතු සේවා අමාත්‍යාංශය යටතේයි. ඉන් පසු ක්‍රීඩා විෂයය වෙනම අමාත්‍යාංශයක් බවට පත් වුණේ 1966 දියි. ඊට පස්සේ විවිධ ක්‍රීඩා අමාත්‍යවරු සිටියා; නියෝජ්‍ය අමාත්‍යවරු සිටියා. විවිධ හැලහැප්පීම් තුළින් සෙමින් සෙමින් ඉදිරියට පැමිණි අපේ මේ ක්‍රීඩාවට දුවිලි ගසා දමා නැවත වරක් සෘජුව නැඟී සිටින්නට පුළුවන් වුණේ, මහින්ද චින්තනය තුළින්, මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළින් හා ඒ ප්‍රතිපත්තිය තුළින් ක්‍රීඩාවට දෙනු ලැබූ සුවිශේෂී ස්ථානය නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්ත වශයෙන්ම විවිධ ක්‍රීඩා අමාත්‍යවරු සිටියා. එතුමන්ලා තමන්ට හැකි ශක්ති ප්‍රමාණයෙන් ක්‍රීඩාව දියුණු කරන්නට පටන් ගත්තා. මෙහිදී බන්දුල බස්නායක හිටපු ක්‍රීඩා ඇමතිතුමා -අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන- ගැන සුවිශේෂී වූ සඳහනක් කරන්න මා කැමැතියි. මොකද, එතුමාගේ පුත්‍රයා වන තාරානාත් බස්නායක මන්ත්‍රීතුමා අද මේ සභා ගැබේ සිටින නිසා. බන්දුල බස්නායක මැතිතුමා අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට කටයුතු කළා. එතුමා හිටපු ශාරීරික අභ්‍යාස උපදේශකවරයෙක්. 1975 දී දශ ප්‍රයාම ශූරයකු බවට එතුමා පත් වුණා. ඒ වාගේම ජාතික හොකී කණ්ඩායමේ නායකයා හැටියටත්, අත් පන්දු කණ්ඩායමේ පුහුණුකරු හැටියටත් එතුමා කටයුතු කළා. ක්‍රීඩාව පිළිබඳව විප්ලවයක් ඇති වන මේ යුගයේ වර්තමාන ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ඉතාම වැදගත් නියෝග ගෙන එනු ලබන මේ අවස්ථාවේදී එවන් ක්‍රීඩා අමාත්‍යවරයකු ගැනත් සඳහන් කිරීම උචිතයි කියා මා හිතනවා. මොකද, එතුමාගේ පුත්‍රයාත් අද මේ සභා ගැබේ සිටින නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1948 වසර අපේ ක්‍රීඩාව පිළිබඳව ස්වර්ණමය වසරක් හැටියට තමයි අපි හිතන්නේ. මොකද, 1948 ඔලිම්පික් තරගාවලියේදී මීටර් 400 කඩුලු පැනීමෙන් ඩන්කන් වයිට් රිදී පදක්කමක් දිනා ගත්තා. ඊට පස්සේ 2000 වසරේ ඔලිම්පික් තරගාවලියේදී සුසන්තිකා ජයසිංහ තවත් රිදී පදක්කමක් දිනා ගෙන ජාතියට විශාල අභිමානයක්, ගෞරවයක් ගෙන දුන්නු බව අපි දන්නවා. ඒ වාගේම ක්‍රිකට් ක්‍රීඩාවෙන් අපි ලෝක ශූරයන් බවට පත් වුණා; වසර ගණනාවක් අනු ශූරයන් හැටියටත් පත් වුණා. ජාත්‍යන්තර ක්‍රිකට් තරගවලින් අප විශාල ජයග්‍රහණයන් ලැබුවා වාගේම අන්ත පරාජයනුත් අපට ලැබී තිබෙනවා. ක්‍රීඩා ක්ෂේත්‍රයේ සියලුම හැලහැප්පීම්, ජයග්‍රහණයන් හා පරාජයන් හමුවේ ක්‍රීඩාව ඉතා පැහැදිලි ඉලක්කයක් කරා ගෙන යෑම සඳහා, ඇත්ත වශයෙන්ම ක්‍රීඩාවේ උන්නතිය සඳහා වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා විසින් ගෙන එන ලද මේ නියෝග ඉතාම සුවිශේෂී වූ නියෝග හැටියටයි මා දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රීඩා සංවර්ධනය යනු අනාගත සමාජ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වූ ආයෝජනයක් බව කියමින් ක්‍රීඩා ක්ෂේත්‍රයට සුවිශේෂී ශක්තියක් දෙන්න තමයි මහින්ද චින්තනය තුළින් බලාපොරොත්තු වන්නේ. ඒ සඳහා සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කරලා රටේ ක්‍රීඩාව දියුණු කරන්න දිවා රෑ මහන්සි වන මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට මේ අවස්ථාවේදී මගේ සුවිශේෂී වූ ස්තුතිය පුද කරනවා, ක්‍රීඩාවට සම්බන්ධ කෙනෙක් හැටියට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම නියෝගවල මා දකින එකම එක විශේෂත්වයක් වන්නේ පාසල් දරුවන් ක්‍රීඩාව සඳහා උනන්දු කර වීමට ගනු ලබන වෑයමයි.

ඇත්ත වශයෙන්ම අද ඉදිරිපත් කරන නියෝගවල තිබෙනවා, "සෑම ජාතික සංගමයකම විධායක කමිටුව සඳහා අදාළ පාසල් සංගම්වලින් අවම වශයෙන් නියෝජිතයන් දෙදෙනෙකුවත් සිටිය යුතු බවට එම ජාතික සංගමයේ ව්‍යවස්ථාවේ විධිවිධානයක් ඇති බවට සහතික විය යුතු ය." කියලා. ඒ සම්බන්ධතා වැඩි කර ගැනීමේ අරමුණින් සියලු පාසල් සංගම් විසින් අදාළ ක්‍රීඩාව සම්බන්ධයෙන් වූ ජාතික සංගමයේ රීති සහ නියෝගවලට අනුකූලව ක්‍රියා කළ යුතු බවත් මේ නියෝගවල සඳහන් වෙලා තිබෙනවා. ජාතික ක්‍රීඩා සංගම් 52ක් පමණ අපේ රටේ තිබෙනවා. විධායක කමිටුවලට පාසල් සංගම්වල නියෝජිතයින් පැමිණිලා, ඔවුන් හරහා ඒ පාසලට අදාළ ක්‍රීඩාව හඳුන්වා දුන්නාම අපට පුළුවන් වෙනවා, දරුවන් තුළ ක්‍රීඩාව පිළිබඳ විශේෂ උනන්දුවක් ඇති කරවන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද විභාග කේන්ද්‍ර කරගෙන තමයි අධ්‍යාපන ක්‍රමය සකස් වෙලා තිබෙන්නේ. ඒක ඉතා අවාසනාවන්ත තත්ත්වයක්. විභාග කේන්ද්‍ර කර ගත්ත අධ්‍යාපන ක්‍රමයක් සකස් වෙලා තිබෙන්නේ අද සමාජය තරගකාරී බවට පත් වෙලා තිබෙන නිසායි. දෙමව්පියන් ළමයින් ක්‍රීඩාවට හෝ වෙනත් බාහිර ක්‍රියාකාරකම්වලට යොදවන්නේ නැතිව, අතිරේක පන්තිවලට - tuition classesවලට- හැම තිස්සේම ගෙන යන නිසා ළමයින්ට ඔවුන්ගේ ළමා කාලය හරියට ගෙවා ගන්න බැරි වෙලා තිබෙනවා. ශාරීරික, මානසික දුබලතා ඇති, පිරිහුණු, අලස, සමාජ සම්බන්ධතා නැති පොත් ගුල්ලන් වැනි නිද්‍රාශීලී ජනතාවක් තමයි ක්‍රීඩාව පාසලට ගෙන ගියේ නැත්නම් බිහි වෙන්නේ. ඒ තත්ත්වය හොඳින් වටහා ගෙන අපේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යතුමා පාසල් දරුවන් ක්‍රීඩා සඳහා උනන්දු කරවීමට ගන්නා වෑයම ප්‍රශංසනීයයි කියලා තමයි මා කියන්නේ.

ඊයේ-පෙරේදා තරුණයන් පිරිසක් වැවක ඔරු පදින්න ගිහිල්ලා දියේ ගිලෙද්දී ඔවුන් බේරා ගන්න උත්සාහ කරන්නේ නැතිව, ඒ අවස්ථාව වීඩියෝ කරපු තරුණයෙකු අපි දැක්කා. සමාජ සම්බන්ධතා නැති, සංවේදී හදවතක් නැති ඒ විධියේ අය බිහි වන්නේ ඇත්ත වශයෙන්ම ක්‍රීඩා කිරීමෙන් ලද අත් දැකීම් නැති නිසායි. සමාජ සම්බන්ධතා නැති, ක්‍රියාකාරකම්වලට සම්බන්ධ නැති පුද්ගලයන් තමයි ඒ වාගේ කටයුතු කරන්නේ.

අද ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශාල පෙරළියක් ඇති වෙන්න මේ නියෝග උපකාර වෙනවා. ඒ නියෝගවලට අප එකඟ වෙන්නේ ඒ නිසායි. ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා වාගේ අද ප්‍රාථමික අධ්‍යාපනය ලබන දරුවන්ගෙන් සියයට 5ක් පමණක් ක්‍රීඩාවට යොමු වන බවටයි ගණනය කරලා තිබෙන්නේ. නමුත් ඕස්ට්‍රේලියාවේ ඒක සියයට 79ක් වනවා. ඒකෙන්ම අපට තේරෙනවා, අප මොන තරම් අවම මට්ටමින් ද අපේ දරුවන් ක්‍රීඩාවට යොමු කරලා තිබෙන්නේ කියලා. මේවාට අදාළ ලස්සන කවියක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

"දැන ඉගෙන ගත්තම - තමයි කෙනෙකුගේ වත්කම
ගුණ නුවණ දැක්කම - ඔබට සලකයි රටේ ඔක්කොම"

ඒ කියන්නේ දැන ඉගෙන ගත්තාම උගත්කම තමයි අපේ වත්කම. යානවාහන, වතුපිටි නොවෙයි. නමුත් ඒ උගත්කමට පමණක් කවුරුවත් සලකන්නේ නැහැ. ඒ චරිතයට ගුණ නුවණත් සමඟ හොඳ ගුණාංගත් එකතු වෙන්න ඕනෑ. ඒ චරිතයට හොඳ ගුණාංග එකතු වෙන එක ක්‍රමයක් තමයි, ක්‍රීඩාව. ක්‍රීඩාව තුළින් අප නොදැනුවත්වම දරුවන්ගේ චරිතයට හොඳ ගුණාංග එකතු වෙනවා. ඕනෑම ක්‍රීඩාවක් කරන්නේ යම් කිසි සීමාවක් තුළ සිටයි. ඒ සීමාව තුළ ක්‍රියා කරන දරුවාගේ චරිතයේ අනිවාර්යයෙන්ම හික්මීමක් ඇති වෙනවා. ඒ වාගේම තමයි ඕනෑම ක්‍රීඩාවකට විනිශ්චයකාරවරු ඉන්නවා. විනිශ්චයකරුවාගේ අණට කීකරු වුණු දරුවා පන්තියේ දී ගුරුවරයාට කීකරු වෙනවා. ඒ වාගේම ගෙදර දී දෙමව්පියන්ට කීකරු වෙනවා. ඕනෑම ක්‍රීඩාවක නීති රීති තිබෙනවා. ඒ නීති රීතිවලට ගරු කරන දරුවා සමාජයට ගියාම සමාජයේ තිබෙන නීති රීතිවලටත් ගරු කරනවා. ඒ වාගේම උනන්දුව, අධිෂ්ඨානය ඇති වෙනවා. වීර්යය ඇති වෙනවා. ජය පරාජය එක සේ බාර ගන්න පුළුවන් ශක්තියක් ඇති වෙනවා. ජය ගන්න කොට ප්‍රීති ඝෝෂා කරනවා. පරාජය වෙනුවට අඬනවා. නමුත් ඒකෙන් සැලෙන්නේ නැහැ. ඒ නොසැලෙන ගතිය ඇති වුණොත් තමයි ජීවිතයට මුහුණ දෙන්න හැකි වන්නේ. තමාගේ ජීවිතයේ මොකක් හරි අඩු පාඩුවක් වුණු හැටියේ - විභාගයක් fail වුණත්- දිවි නසා ගන්න පවා තරුණ තරුණියන් අද බොහෝ විට යොමු වන්නේ ඔවුන් ක්‍රීඩාවට යොමු නොවුණු නිසායි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් තමයි ඔබතුමාට තිබෙන්නේ.

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
ඒ නිසා ඇත්ත වශයෙන්ම මේ කාර්යය ගැන අප ගොඩක් සතුටු වනවා.

අමාත්‍ය මණ්ඩල නිර්දේශයක් මඟින්, ආබාධිත නොවන සියලු පාසල් සිසුන්ට 2013 සිට ක්‍රීඩාව අනිවාර්යය කර තිබෙනවා. ව්‍යක්තීය ආයතනවල, උසස් අධ්‍යාපන ආයතනවල දරුවන්ට ක්‍රීඩා පහසුකම් ලබා දී තිබෙනවා. පහ ශ්‍රේණියෙන් පසු හය ශ්‍රේණියේ සියලු දරුවන් වෛද්‍ය පරීක්ෂණයකට ලක් කර ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතා අනුව ඔවුන් සුදුසු ක්‍රීඩාවකට යොමු කරන්න කටයුතු කර තිබෙනවා. විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන්ට විශේෂ අවස්ථා දී තිබෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන් සඳහා විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාලයත් වසරකින් දීර්ඝ කර තිබෙනවා. මේ අතින් බලන කොට, "මහින්ද චින්තන" අනුව ක්‍රීඩාව පාසල තුළට ගෙන ගොස්, දරුවන් ඊට උනන්දු කොට, උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ක්‍රීඩා කෞශල්‍යයද උපයෝගි කරගනිමින්, දිවයිනේ සෑම තැනම ක්‍රීඩාවට අවශ්‍ය යටිතල පහසුකම් සපයමින්, කරන්නන් වාලේ නොව නියම තාක්ෂණයට අනුව, විද්‍යානුකූලව විශේෂඥ වෛද්‍ය කණ්ඩායමකගේ නිරීක්ෂණය යටතේ ක්‍රීඩා කරන්න අවස්ථාව සලසමින්, සමාජයට හිතකාමී, ආර්ථික සංවර්ධනයට උර දෙන නිරෝගි සමාජයක් ඉදිරියේදී දායාද කිරීම කියන උතුම් අරමුණ ඉෂ්ට කරගන්න මේ ඉදිරිපත් කර තිබෙන නියෝග ඇත්ත වශයෙන් ඉවහල් වෙනවා. මේ නියෝග ඉදිරිපත් කළ ගරු ක්‍රීඩා ඇමතිතුමාට මගේ ප්‍රණාමය නැවත වරක් පුද කරමින් මගේ වචන ස්වල්පය මෙයින් සමාප්ත කරනවා. ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු ෆිලික්ස් පෙරේරා අමාත්‍යතුමා.

[අ.භා. 4.27]

ගරු ෆිලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳ කථා කරද්දී සඳහන් නොවූ කරුණු කිහිපයක් ගැන කථා කරන්නයි මගේ බලාපොරොත්තුව. විශේෂයෙන්, Paralympicsවලට යන ආබාධිතයන් ගැන කථා කරන්නයි මගේ බලාපොරොත්තුව. අපි විශේෂයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමා බොහොම ජවයකින් යුතුව මෙසේ සංශෝධන රැසක් ගෙනැල්ලා ක්‍රීඩාවට විශේෂත්වයක් ලබා දීමට අද කටයුතු කරනවා. මා ඒ සංශෝධන එකක් ගැනවත් කථා කරන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම බැලුවා 2012 ජාතික තරුණ ප්‍රතිපත්තිය. බංග්ලාදේශය 'තරුණයා' වශයෙන් හඳුන්වන්නේ අවුරුදු 18ත් 35ත් අතර අයයි. බෲනායිවල එම වයස් මට්ටම අවුරුදු 15-40යි. ඉන්දියාවේ අවුරුදු 13-35; මලයාසියාවේ අවුරුදු 15-40; මාලදිවයිනේ අවුරුදු 18-35; පාකිස්තානයේ අවුරුදු 15-29; සිංගප්පූරුවේ අවුරුදු 15-35. ලංකාවේ අවුරුදු 15ත්-29ත් අතර අය තමයි 'තරුණයා' කියලා හඳුන්වන්නේ. පාකිස්තානය සහ ලංකාව කියන රටවල් දෙකම එක මට්ටමකයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ආබාධිත තැනැත්තන් සඳහා පැවැත්වෙන ක්‍රීඩා උළෙලවලදී අපට විශාල ජයග්‍රහණ රැසක් ලැබී තිබෙන බව මා කියන්න ඕනෑ. අද ඔලිම්පික් තරගාවලිය තිබෙනවා. ඒ වාගේම Paralympics තිබෙනවා. බිහිරි අය වෙනුවෙන් Deaflympics කියලා තරගාවලියක් තිබෙනවා. ඒ වාගේම, විශේෂ ඔලිම්පික් ක්‍රීඩා උළෙලක් තිබෙනවා, "Special Olympics" කියලා. ඒ, මානසික ආබාධවලට ලක් වූ අයට. Paralympics ක්‍රීඩා උළෙලට පසු ගිය වර්ෂයේ අපේ රටෙන් ක්‍රීඩකයන් 7දෙනෙක් සහභාගි වෙලා තිබෙනවා. සංඛ්‍යාත්මකව බලද්දී අපේ රට ලෝකයේ 15වැනි හෝ 16වැනි තැනට ඇවිල්ලා තිබෙනවා. ගරු ක්‍රීඩා ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරලා අපට උදව් කරන්න කියලා. අපේ සමාජ සේවා අමාත්‍යාංශයේ තිබෙන ජාලයත් එක්ක එකතු වෙලා ඔබතුමාට පුළුවන් වෙනවා ඒ ආබාධිත අය උසස් තත්ත්වයකට ගෙන එන්න. මොකද, ඒ අය මානසික අතින් බොහොම වැටිලා ඉන්නේ. එදා යුද්ධයට ගිය හොඳ ජවයක් තිබුණු අය අද ආබාධිත වෙලා. ඒ ආබාධිත අය වෙනුවෙන් මොනවාද අපට කරන්න පුළුවන්? ඒ අය ක්‍රීඩාවට යොමු කළාම ඒ අයගේ මානසික අහේනිය නැති කරලා සමාජයටත් සේවාවක් කරන තත්ත්වයට පත් කරන්න පුළුවන් කියන කාරණය මා කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද උතුරේ ක්‍රීඩා පිටි හදන්න තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, ලොකුම බාධාව තමයි උතුරේ සමහර තැන්වල -අක්කර 5, 6 වාගේ භූමි ප්‍රමාණවල- තවමත් බිම් බෝම්බ තිබීම. වියට්නාමයේ යුද්ධය අවසන් වෙලාත් අද වන කල් මුළුමනින් බිම් බෝම්බ ඉවත් කරගන්න බැරිව තිබෙනවා. අප මේ කරුණු කාරණා ටිකත් මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟට තවත් කාරණයක් කියන්න ඕනෑ. දේශපාලන වශයෙන් බලද්දීත් අපේ අතිගරු ජනාධිපතිතුමා හොඳ ක්‍රීඩකයෙක් නේ. සමහර විට කහ කාඩ් පෙන්නනවා; රතු කාඩ් පෙන්නනවා; නොයෙකුත් කාඩ් පෙන්නනවා; දඬුවම් පහරවල් එල්ල කරනවා. කොතරම් උත්සාහ කළත් එතුමා දේශපාලන ක්‍රීඩා පිටියෙන් ඉවත් කරන්න අද වන කල් බැරිව තිබෙනවා. එසේ වීම නිසා අද රට ලොකු ජයග්‍රහණයක් ලබා තිබෙනවා. එතුමා අපට ප්‍රකාශ කළේ හැම දරුවකුම ක්‍රීඩාවට යොමු කරන්න ඕනෑ කියලායි. ඊට පෙර සෑම දරුවකුගේම ශරීර සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කරන්න, පරීක්ෂා කරලා ශරීර සෞඛ්‍ය තත්ත්වය අනුව ළමයින් ක්‍රීඩාවට යොමු කරන්න කියලා තමයි එතුමා කිව්වේ. එතුමා ඊයේ පෙරේදා කැබිනට් එකේදීත් ඒ ගැන කථා කළා. මොකද, පසු ගිය දා පාසල් ශිෂ්‍යාවක් මැරතන් ධාවන තරගයකදී මරු මුවට පත් වුණා. මේ විධියට පාසල් දරුවන් දෙදෙනෙක් විතර දැනට මිය ගොස් තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා මේ තත්ත්වය ගැන විශේෂයෙන්ම හිතලා, අද මේ ක්‍රීඩාව නව මාවතකට ගෙන එන්නට උත්සාහ කරනවා.

අපි දන්නවා, ශක්තිමත් ශරීරයක් තුළ තමයි ශක්තිමත් මනසක් ඇති වන්නේ කියලා. ජය පරාජය දෙකම පිළිගන්නට පුළුවන් වන්නේ ක්‍රීඩාව තුළිනුයි. සමහර අවස්ථාවල යම් දෙයකින් පරාජයට පත් වුණාම, විශේෂයෙන්ම විභාගවලින් අසමත් වුණාම ළමයින් වස බොනවා. ඇයි? ඒ අයට පරාජය දරා ගන්නට බැහැ. තව සැරයක් විභාගයට පෙනී සිටින්න පුළුවන් නේද කියලා හිතා ගන්න තරම්වත් මානසික තත්ත්වයක් ඒ අයට නැහැ. අද මේ ළමයින් ටියුෂන් ගිහිල්ලා, ගිහිල්ලා, අවසානයේ දී සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? අවසානයේ දී ඒ ළමයින් අද විශාල වශයෙන් ශාරීරික දුබලතාවන්ට පත්වෙලා තිබෙනවා. විශේෂයෙන්ම දියවැඩියා රෝගීන් බවට පත් වීම නිසා. ඉන්දියාවේ

විතරක් දියවැඩියා රෝගීන් ලක්ෂ 400ක් සිටිනවා. අපේ රටත් විශාල වශයෙන් මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ, ඒ අවශ්‍ය ශාරීරික ව්‍යායාම නොලැබීම නිසාය කියන එක පැහැදිලිව පෙනෙනවා. ඒ නිසා තමයි දැන් ගම්පහ දිස්ත්‍රික්කය තුළත් walking tracks හදන්න ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා අද කටයුතු කර තිබෙන්නේ. එතුමා මේ walking tracks හදලා මිනිසුන්ට ව්‍යායාම කරන්න ඉඩ සලස්වා තිබෙනවා. මොකද, මිනිසුන්ට ව්‍යායාම කරන්න තැනක් තිබුණේ නැහැ. ඒක අවශ්‍ය දෙයක්. අපි එද්දී දකිනවා, දැන් මේ පාර්ලිමේන්තුව අවටත් walking tracks හදලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අනාගතය පිළිබඳව හිතලා, ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිණිස ඇති කර තිබෙන දීර්ඝ කාලීන වැඩ පිළිවෙළවල් ලෙසයි අපි මේවා දකින්නේ.

අනෙක් පැත්තෙන්, ක්‍රීඩාව නිසා අපේ ආර්ථිකයටත් ලොකු වාසියක් ලබා ගන්න පුළුවන්. විශේෂයෙන්ම අපේ අල්ලපු රට වන ඉන්දියාව තුළ ක්‍රිකට් උමතුවක් තිබෙනවා. ඒ රටේ ක්‍රිකට් උමතුවක් තිබෙනවා විතරක් නොවෙයි, ඒ රටේ විශාල පිරිසක් ඒ සඳහා කැප වෙලා සිටිනවා. ඒගොල්ලන් ක්‍රිකට් ක්‍රීඩාව හරහා ලෝකයේ සෑම තැනම සංචාරය කරනවා. ඉතින් මේ ක්‍රීඩා පිටි දියුණු කරද්දී මේ ක්‍රීඩා පිටි දියුණු කරන්න මුදල් වියදම් කරන එක වැරැදියි කියලා කවුරු අර්ථ කථනය කළත්, හොඳින් ක්‍රීඩා පිටි දියුණු කිරීම තුළින් මොකක්ද සිදුවන්නේ? අපේ ක්‍රීඩා පිටි හොඳින් දියුණු කළාම ඒ ක්‍රීඩාවල යෙදෙන්නට වෙනත් රටවල අයටත් අපේ රටට එන්න පුළුවන්. අපි මැලේසියාව ගැන කල්පනා කරද්දී; ඊළඟට අනෙකුත් රටවල් ගැන කල්පනා කරද්දී, විදේශිකයන්ට තවමත් අපේ රටේ හෝටල්වල සහනදායක මිලකට නවාතැන් ගන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. එහෙම නවාතැන් ගන්න පුළුවන් දර්ශනීය ස්ථාන මෙහි තිබෙනවා. ඒ නිසා සංචාරක ව්‍යාපාරය සඳහාත් මේ ආයෝජනය අපට උදවු කර ගන්නට පුළුවන්.

ඔබතුමන්ලාත් දන්නවා ඇති අර, ඔස්කා පිස්ටෝරියස් කියන ආබාධිත ක්‍රීඩකයා ගැන; Paralympics සඳහා තරග කරපු ක්‍රීඩකයා ගැන. අන්තිමේ දී ඔහු කිව්වා මට අනෙක් ක්‍රීඩකයන් එක්කත් තරග කරන්න දෙන්න කියලා. අනෙක් අය එක්කත් ඔහු තරග කළා. නමුත් අවසානවන්ත විධියට වැලන්ටයින් දිනයේ දී එතුමාගේ පෙම්වතිය ඔහුට surprise එකක් දෙන්න ඇවිල්ලා, වෙඩි වැදිලා මියගියා. ඒකත් ඉතිහාසයේ සඳහන් වන කාරණයක්. කෙසේ වෙතත් අද මේ සංචාරක ව්‍යාපාරය හරහා කරන ක්‍රීඩා ගැන බැලුවොත්, surfing තිබෙනවා; ජල ක්‍රීඩා තිබෙනවා; swimming තිබෙනවා. ඒවාත් දියුණු කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ආබාධිත පුද්ගලයන් ගැන බලන්න ඕනෑ. ආබාධිත පුද්ගලයන්ට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, ආබාධිත අයට අවශ්‍ය ක්‍රීඩා උපකරණ මිලදී ගන්න, තවත් නොයෙකුත් දේවල් මිලදී ගන්න තිබෙන ආර්ථික ප්‍රශ්න. ඉතින් ඔබතුමන්ලාට පුළුවන්, මේ ක්‍රිකට් තරග නැරඹීම සඳහා නිකුත් කරන ටිකට්වලින් එක ටිකට් එකකින් රුපියල් 10ක්, 20ක් වැනි මුදලක් මේ අය සඳහා වෙන් කර දෙන්න. එවැනි මුදලක් වෙන් කර දුන්නොත් මේ අය සඳහා මට එයින් ලොකු වැඩක් කරන්න පුළුවන් කියලා මා හිතනවා. මට ඒක හොඳින්ම ඒත්තු යන්නේ මේ නිසායි. පසු ගිය වර අපි සංවර්ධන ලොතරැයියෙන් සියයට 8.5ක් ලබා ගෙන ආබාධිත අය සඳහා ගෙවල් 1,200ක් හදලා දීලා තිබෙනවා. ඉතින් ඔය ටිකට් එකකින් රුපියල් 25ක් දෙනවා කියලා කියන්නේ සිගරැට් එකක් ගන්න සල්ලි නේ; විනෝද වන සල්ලි නේ. ඒ නිසා ක්‍රීඩා අමාත්‍යාංශයත් එක්ක කථා කරලා අපට යම් මුදලක් ඒ අය වෙනුවෙන් අරගෙන දෙන්න. මේ ආබාධිත අය සඳහා ක්‍රීඩා උපකරණ ටිකක් මිලදී ගන්න, ඒ අයව ශක්තිමත් කරවන්න, ඒ අයගේ මානසික තත්ත්වය සම තැනකට ගෙනෙන්න අපට උදවු කරන්න කියලා තමයි මගේ ඉල්ලීම තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරයි කියලා මා හිතනවා.

ඊළඟට අපේ ආබාධිත රණවිරුවන් ගැනත් කියන්නට ඕනෑ. යුද හමුදාවේ ආබාධිත රණවිරුවන් විශාල පිරිසක් සිටිනවා. ඒ වාගේම සිවිල් ආබාධිත අයත් සිටිනවා. ඒ අයගේ මානසික අතෘප්තිය නැති කර ගන්නට ඒ අය කියනවා අපට උදවු කරන්න කියලා. Paralympics ඉස්සෙල්ලාම පටන් ගත්තේ රෝද පුටු තරගයකින්. දැන් එහි ක්‍රීඩා රැසක් තිබෙනවා. ඒ අනුව අපි දකිනවා, ඒ ආබාධිත අයට කොච්චර හොඳින් ක්‍රීඩා කරන්න පුළුවන්ද කියලා. ඊයේ පෙරේදා අපේ ශ්‍රවණාබාධිත ළමයින් ටිකක් ගිහිල්ලා ජයග්‍රහණයන් භුක්ති විඳලා, පදක්කම් රැසක් අපේ රටට අරගෙන ආවා. ඒ අයට මා ස්තුති කළා. ඒ අයව මා අපේ නිවසට ගෙන්වලා, සාකච්ඡා කරලා ඒ අයට ප්‍රශංසා කළා. ඉතින් මේ ප්‍රශංසාව තිබුණොත් ආබාධිත අය කොන් වන්නේ නැහැ. මොකද, අපේ රටේ සියයට 7ක් ආබාධිත අය ඉන්නවා. යම් යම් රිය අනතුරු නිසා දවස ගාණේ ආබාධිත වන අය සිටිනවා. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරන්නය කියන එක තමයි මගේ ඉල්ලීම.

මම දීර්ඝව කථා කරන්නේ නැහැ. කථා කරන්න බොහෝ දේවල් තිබුණා. බොහෝ දෙනෙක් කථා කළා. ඉස්සෙල්ලාම කියන්න පුළුවන්, බ්‍රිතාන්‍යයේ වෙසෙන ආබාධිත පුද්ගලයන්ගේ සංඛ්‍යාව මිලියන 11ක් විතර වෙනවා කියලා. මෙයින් ක්‍රීඩාවට සියයට 20ක් සම්බන්ධ වනවා. පසු ගිය අවුරුද්දේ -2012- බ්‍රිතාන්‍යා මේ අය සඳහා පවුම් මිලියන 08ක් වියදම් කරලා තිබෙනවා. බ්‍රිතාන්‍යයේ ආබාධිත තැනැත්තන් සෑම හය දෙනෙකුගෙන්ම එක් කෙනෙක් පමණක් ක්‍රීඩාවට යොමු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව එක තත්පරයක් දෙන්න.

ලංකාවේ ආබාධිත ක්‍රීඩකයන් ලන්ඩන් Paralympics තරගාවලියේ මීටර් 400 ඉසව්වෙන් ලෝකඩ පදක්කමක් දිනා ගත්තා. 2008 වර්ෂයේ කිලිනොච්චියේදී මෝටාර් ප්‍රහාරයක් හේතුවෙන් ආබාධිත වුණු කෙනෙක් තමයි මෙදා පාර ලෝකඩ පදක්කමක් දිනා ගත්තේ. එම්.ඩී. ගාමිණී මහතාට රෝද පුටු ටෙනිස් තරගවලින් ලෝකයේ දක්ෂයන් දහ දෙනා අතරට ඇතුළුවීමට පුළුවන් වුණා. එතුමාත් ලෝකඩ පදක්කමක් දිනා ගත්තා. ඒ වාගේම ආබාධිත වොලිබෝල් කණ්ඩායම 2011 දී ලෝකඩ පදක්කම දිනා ගත්තා. මේ කරුණු ගැන බලද්දී මේ ආබාධිත අයගේ පැත්ත ගැනත් අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. ක්‍රීඩා අමාත්‍යාංශයේ දක්ෂ නිලධාරීන් කණ්ඩායමක් ඉන්නවා. මම හිතන්නේ ඒ ගොල්ලෝ සාධාරණව මේ ප්‍රශ්න දිහා බලයි. මේ පැත්ත ගැනත් බලලා අපේ සමාජ සේවා අමාත්‍යාංශයත් එකතු කර ගෙන තමුන්නාන්සේලා පරිපාලනය කරන්න. ඒ අයටත් උදවු කරන්නය කියා මා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ඊළඟට හර්ෂ ද සිල්වා ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 4.37]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මා වැඩි වේලාවක් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. විනාඩි 05ක කාලයක් ගන්නවා.

අපේ ගරු ඇමතිතුමා කිව්වා, ආර්ථිකයට ක්‍රීඩාව දායක වනවා, ඒ නිසා ආර්ථික සංවර්ධනය සඳහා අපි ක්‍රීඩාව පාවිච්චි කරන්න ඕනෑ කියලා. ඒක සම්පූර්ණ ඇත්ත. නමුත් අපි කල්පනා කරලා බලන්න ඕනෑ, අපි ගන්නා තීරණවලින් සමහර විට ආර්ථිකය සංවර්ධනය වනවා වෙනුවට එය ඍතනය වෙලා යන්නත් ඉඩ තිබෙන බව. ඕනෑ කෙනෙක් කල්පනා කළෝතින් ග්‍රීසියට මොකද වුණේ කියලා, 2004 අවුරුද්දේදී ග්‍රීසියේ ඔලිම්පික් තරගය තියන්න ගිහිල්ලා අතිශයින් පාඩු වුණා. 2004 ඔලිම්පික් උළෙලින් සති ගණනකට පසුව ඔවුන්ට සිද්ධ වුණා, ඔවුන්ගේ අය වැය ඉදිරිපත් කරන්න යුරෝපා සංගමයට. යුරෝපා සංගමයේ අය වැයේ උපරිමය රටකට ගන්න පුළුවන් සියයට 3යි. නමුත් ග්‍රීසියේ ඔලිම්පික් උළෙලත් එක්ක මෙය සියයට 6.1කට ඉහළ ගියා. ඒකත් එක්ක ග්‍රීසියේ ආර්ථිකයේ විශාල කඩා වැටීමක් සිද්ධ වුණා. මම කියන්නේ නැහැ, ඔලිම්පික් උළෙල නිසා පමණක් ග්‍රීසියේ ආර්ථිකය කඩා වැටුණා කියලා. නමුත් ඒකත් දායක වුණා කියන එක මේ ලෝකයම අද පිළිගන්නා දෙයක්. දැන් අපි දන්නවා, ග්‍රීසියේ ආර්ථිකය කඩා වැටිලා, ග්‍රීසියේ බැඳුම්කරවල අපේ ආයෝජන කරලා රුපියල් කෝටි ගණන් අපේ රටේ සාමාන්‍ය ජනතාවගේ බදු සල්ලි නැති නැති නාස්ති වෙලා; විනාශ වෙලා තිබෙනවා කියලා. එහෙම වුණේ මහ බැංකුවේ ඒ පුද්ගලයන්ගේ අනුවණ ක්‍රියාවක් නිසාය කියලා කවුරුත් දන්නවා.

මම මේ කියන්න හදන්නේ ක්‍රීඩාව සංවර්ධනය සඳහා ප්‍රයෝජනයට ගන්න කොට ඉතාමත්ම බුද්ධිමත්ව මේ වැඩය කරන්න ඕනෑ කියන කාරණයයි. මොකද, අපේ පොදු රාජ්‍ය මණ්ඩලයේ ක්‍රීඩා උළෙල හම්බන්තොට පවත්වන්න ලැහැස්ති වුණ වෙලාවේ, ඔය "pmplegacy" කියන ආයතනය රුපියල් මිලියන 800ක් වියදම් කරලා අපට උපදෙස් ලබා දුන්නා, කොහොමද ඒක කරන්නේ කියලා. මේකට ලැබුණු උපදෙස්වලින් ඔවුන් කිව්වා, කිසි ගැටලුවක් නැහැ, 2018 දී මේ පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල හම්බන්තොට පවත්වන්න කියලා. මෙතැනදී ඇත්ත වශයෙන්ම ඔවුන් බලාපොරොත්තු වුණේ එදා තිබුණු රුපියලේ වටිනාකමට අනුව රුපියල් බිලියන 265ක් මේ සඳහා වියදම් කරන්න. එදා රුපියල් බිලියන 265ක් කියලා කිව්වේ, එදා ඩොලර් එකක අගය රුපියල් 110 ගණනේ ගණන් බලලායි. නමුත් අද ඩොලර් එකක අගය රුපියල් 130යි. මොකද, ආර්ථිකය කඩා වැටීමත් එක්ක අද ගණන් බැලුවොත් රුපියල් බිලියන 313ක් එහෙමත් නැත්නම් රුපියල් කෝටි 31,000ක් වෙනවා. ඒ කියන්නේ, අපේ මුළු රටේම ජාතික හා පළාත් ආයතනවලින් මේ සියලුම ඉස්පිරිතාලවලට වියදම් කරන සම්පූර්ණ මුදල වාගේ තුන් ගුණයකටත් වඩා වැඩි මුදලක් මේ උළෙල සඳහා වැය කරන්න තමයි ඔවුන් බලාපොරොත්තු වෙලා සිටියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ වාසනාවකට තමයි අපට ඒ අවස්ථාව ලැබුණේ නැත්තේ. මම එදා සිටම කිව්වා, ඇත්ත වශයෙන්ම අපට ඒ අවස්ථාව ලැබුණා නම් අපට ගමන් කරන්න සිදු වන්නේ අපේ ආර්ථිකයේ සංවර්ධනය කරා නොවෙයි ආර්ථිකයේ ව්‍යසනය කරායි. මොකද, අපි දන්නවා, අද වන කොට අපි ඉතා විශාල ණය උගුලක පැටලී සිටින බව. මම දන්නේ නැහැ, එය ඔබතුමිය දන්නවාද කියලා. මේ දැන්; මම කථා කරන මේ අවස්ථාවේදී, - මේ මොහොතේදී- ජාතික ඉතිරි කිරීමේ බැංකුව - NSB එක- ඩොලර් බිලියනයක වාණිජමය ණයක් ගන්න HSBC එකත් එකක සාකච්ඡා කරලා ගිවිසුමක් ගැහුවා. අද මේ දැන්!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, NSB එක කවදාද ඩොලර් ණය දුන්නේ? ගෙවල් හදන්න ඩොලර් ණය දෙනවාද NSB එකෙන්? දෙන්නේ නැහැ නේ? එහෙනම් කාටද මේ කොළේ වහන්න හදන්නේ? අපේ ණය ගෙවා ගන්න බැරිව NSB එකට කියනවා, ආණ්ඩුවට ඩොලර් බිලියනයක ණයක් අරගෙන දෙන්න කියලා. මම අසත්‍යයක් කියනවා නම් හෙට කියන්න පුළුවන්, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මෙතැනට ඇවිල්ලා පට්ටපල් අසත්‍යයක් කිව්වා කියලා. එහෙම දෙයක් නොවෙයි.

මම මේ කියන්න හදන්නේ රටේ ආර්ථිකය සංවර්ධනය කරන්න ක්‍රීඩාව භාවිත කරනවා නම්, හොඳට හිතා බලා කල්පනා කරලා ඒ දේ කරන්න ඕනෑය කියලායි. මම වැඩි වෙලාවක් කථා කරන්නේ නැහැ. නමුත් මම කලින් කිව්වා වාගේ එක කාරණයයි මට කියන්න තිබෙන්නේ. ඒ pmplegacy සමාගම දීපු වාර්තාවේ මේ ඩොලර් මිලියන 8 වියදම් කළේ මේ විධියටයි කියලා ඒගොල්ලන් කියනවා. එනම් ආණ්ඩුවෙන් ඩොලර් මිලියනයයි, පෞද්ගලික සමාගම් ඉතිරි ඩොලර් මිලියන 7 වියදම් කළා කියලා. අපි දන්නවා නේ Saint Kitts ද කොහෙදෝ ගියා. Dance දැම්මා, බාල් නැටුම් දැම්මා. පත්තරවල ඒවා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කැමැතියි ඔබතුමියට පෙන්වන්න, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ගිය අවුරුද්දේ ජූනි මාසයේ 07වැනිදා අසන ලද ප්‍රශ්නය.

"එම එක් එක් ක්‍රියාමාර්ගය සඳහා වියදම් වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද?"

අවුරුදු 41ක මගේ හොඳ මිත්‍රයා වන අපේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා ඉතාමත්ම උද්‍යෝගයෙන් මේ වැඩේ කරනවා. එතුමාගේ වැඩ කටයුතු පිළිබඳව මම පෞද්ගලිකවම සන්තෝෂ වනවා. අවශ්‍ය වේලාවට එතුමා දැඩි පියවරත් අරගෙන තිබෙනවා. නොයෙකුත් පුද්ගලයන්ට රැවටෙන්නේ නැතිව මේ වැඩේ හොඳට කර ගෙන යන්න කියලා එතුමාට මම සුබ පතනවා. එතුමා කියනවා, අපි රුපියල් මිලියන 100යි වියදම් කළේ කියලා.

"ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අහලා තිබෙනවා, ප්‍රතිපාදන ලබා ගත් ආකාරය ගැන. මම ඔබතුමාට කිව්වා, රජයෙන් ලබා ගත් මුදල. අනෙක් මුදල් සියල්ලම පුද්ගලික දාන පරිත්‍යාග. විගණනය අවසන් වූ වහාම මා ඒ විස්තර -කොහෙන් කොහෙන්ද මුදල් ලැබුණේ කියලා- උපදේශක කාරක සභාවේදී ලබා දෙන්නම්"

ඒ විධියට ඒ ප්‍රශ්නයට එතුමා පිළිතුරු දීලා තිබෙනවා.

මම අද හොයා බැලුවා, තව වෙනකම් මේ විගණනය අවසන් කරලා නැහැ. මේවාට සල්ලි ගෙව්වේ කවුද? ඔවුන්ගෙන් මේ උපදෙස ගන්න. ඒ ඩොලර් මිලියන අටෙන් ඩොලර් මිලියන 7ක් - රුපියල් මිලියන 700ක්- කවුද ගෙව්වේ කියලා සොයන්න. මහ බැංකුව නේ මේකට මූලිකත්වය ගත්තේ. මහ බැංකුවේ අධිපතිවරයා තමයි ගරු ක්‍රීඩා ඇමතිතුමාත් එක්ක මේ ක්‍රීඩා උළෙල සම්බන්ධ සංවිධායක කමිටුවේ සම සභාපති හැටියට වැඩ කළේ. අපි අද ලබා ගත් ලියුමකට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් මෙන්න මෙහෙම කියනවා. මම මේ ලිපිය **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2011 pmplegacy එකට වියදම් කරපු රුපියල් මිලියන 800 වෙනුවෙන් කරන විගණනය ගැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඉහත හැන්සාඩ්ගත කළ ලිපියේ මෙසේ සඳහන් වනවා.

"එම ප්‍රශ්නයට පිළිතුරු එවන ලෙස දන්වා 2011.07.27, 2012.08.10 හා 2012.09.24 මහා බැංකු අධිපති වෙත ලිපි යවා ඇත. මෙම ප්‍රශ්නය 2012 අගෝස්තු 23 දින විමසා ඇති අතර, පිළිතුරු නොලද හෙයින් අප විසින් දිගින් දිගටම කල් ලබා ගෙන ඇති අතර, නැවත එය 2013 අප්‍රේල් මස 09 වන අභහරුවාදා පිළිතුරු ලබා දීමට නියමිතව ඇත.

මෙම ප්‍රශ්නයට මහා බැංකුවෙන් පිළිතුරක් ලැබුණ හොත්, 2013 අප්‍රේල් මස 09 වන දිනට මෙම පිළිතුර ලබා දිය හැකි බව කාරුණිකව දැනුම් දෙමි."

මම මේ කියන්න හදන්නේ මෙහෙම මුදල් වියදම් කරන කොට ඒකේ වග කීමක් තිබෙන්න ඕනෑය කියලායි. ඒ වියදම් කරන මුදල් කොහෙන්ද ලැබෙන්නේ? ඒවා විගණනය කරන්න අමාත්‍යාංශයට හෝ මේ ක්‍රීඩා උළෙල සංවිධානය කරපු "2018 හම්බන්තොට" කියන පෞද්ගලික ආයතනයට වග කීමක් තිබෙනවා.

මම මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම කියන්න උත්සාහ කරන්නේ ක්‍රීඩාව ආර්ථිකයේ වර්ධනයට සහ සංවර්ධනයට අතිශයින්ම බලපානවා කියලායි. ඩිලාන් පෙරේරා ඇමතිතුමා වොලිබෝල් ක්‍රීඩාව සම්බන්ධව කටයුතු කරනවා. අපේ හොඳ හිත මිත්‍ර සනත් ජයසූරිය මැතිතුමා ක්‍රිකට් ක්‍රීඩාව මඟින් විශාල දායකත්වයක් අපේ ආර්ථිකයට ලබා දීලා තිබෙනවා. අපේ අර්ජුන රණතුංග මැතිතුමාත් එහෙමයි. අපි මේ ගැන නැවත මතක් කරලා දෙන්න ඕනෑ නැහැ. ශ්‍රී ලංකාවේ ක්‍රීඩකයන් අපේ ආර්ථිකයට ලොකු දායකත්වයක් ලබා දීලා තිබෙනවා. ඒක නැහැ කියන්නේ නැහැ. නමුත් මේ වාගේ ලොකු වැඩ කටයුත්තක් කරන කොට ඒවාට හරි උපදෙස් අරගෙන ආර්ථිකයට හානි නොවන ආකාරයෙන් මුදල් වියදම් කරන්න ඕනෑය කියන එක තමයි මම මෙතැනදි කියන්න බලාපොරොත්තු වුණේ. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු සනත් ජයසූරිය මහතා.

[අ.භා. 4.45]

ගරු සනත් ජයසූරිය මහතා
(மாண்புமிகு சனத் ஜயசூரிய)
(The Hon. Sanath Jayasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ජාතික ක්‍රීඩා සංගම් නියෝග සංශෝධනය පිළිබඳ විවාදයේදී කථා කරන්නට අවස්ථාවක් ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ක්‍රීඩා අමාත්‍යතුමා අවුරුදු එකහමාරක් විතර කාලයක් තිස්සේ දීර්ඝව සාකච්ඡා කරලා හොඳම විධියට ඒ සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. මේ සභාවේ ඊයේත් මේ පිළිබඳව සාකච්ඡා කළා. අදත් සාකච්ඡා කරනවා. එතුමා හොඳම දේ අපේ රටට ගෙනැවිත් තිබෙනවාය කියා මා හිතනවා. ඒ නිසා මේ සංශෝධන ගෙන ඒම පිළිබඳව ගරු ක්‍රීඩා අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සංශෝධන නිසා හොඳ දෙයක් වෙනවා. මෙච්චර කාලයක් ජාතික ක්‍රීඩා සංගම්වලට පත් වන අයට ඇවිල්ලා ඒ අයට කටයුතු කරන්න තිබුණේ අවුරුද්දක කාලයක් විතරයි. මම හිතන විධියට අවුරුද්දක කාලයක් තුළ දී සියලු දේවල් කරන්න ගොඩක් අමාරුයි. ඒ අය මාස හතරක් විතර වැඩ කර ගෙන යන කොට අනෙක් මාස හය වැඩ කරන්නේ ඊළඟ නිලවරණයෙන් නැවත වරක් මේ සංගම්වලට පත්වීමේ ඡන්ද ව්‍යාපාරය සඳහායි. මේ නියෝගවලින් ඒ කාලය අවුරුදු දෙකක් කරලා තිබෙනවා. අවුරුදු දෙකක කාලයේදී ක්‍රිකට් හෝ වේවා, වෙනත් සංගමයක් හෝ වේවා, ක්‍රීඩාව දියුණු කරන්නේ කොහොමද කියලා කල්පනා කරලා ඒ වැඩ කටයුතු කරන්නට තමයි බලාපොරොත්තු වන්නේ. ඒ නිසා විශේෂයෙන්ම නිල කාලය අවුරුදු දෙකක් කළ එක ගොඩාක් හොඳයි කියලා මම හිතනවා. ක්‍රිකට් ක්‍රීඩාව පැත්තෙන් බැලුවත් ඒ නිල කාලය අවුරුදු දෙකක් කළ එක හොඳයි. අපි හැමෝම කථා කරන්නේ ක්‍රිකට් නිලවරණය ගැනයි. ඒ නිසා ඒ සංගමයට පත් වන සභාපතිතුමාට කාලයක් තිබෙනවා ජාතික වශයෙන් ශ්‍රී ලංකාව පුරාම ක්‍රිකට් ක්‍රීඩාව ව්‍යාප්ත කරන්නේ කොහොමද, පාසල්වලටත්, ක්ලබ්වල ක්‍රීඩා කරන අයටත් එක හා සමානව යන්නේ කොහොමද කියලා බලන්න. ඒ නිසා මම හිතනවා අද ක්‍රීඩා අමාත්‍යාංශය හොඳ වැඩ පිළිවෙළකට ඇවිල්ලා තිබෙනවා කියලා. ගරු ඇමතිතුමා තීරණ තීන්දු ගනිද්දී ක්‍රීඩාව වෙනුවෙන් හොඳ තීරණ තීන්දු අර ගෙන තිබෙනවා. ඒ ගැන මම ගොඩාක් සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතෙක් නොතිබුණු anti-doping system එකක් ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. ගරු ක්‍රීඩා ඇමතිතුමා ප්‍රොෆෙසර් අර්ජුන ඩි සිල්වා එතැන ප්‍රධානියා කරලා ඒක වෙනමම යුනිට් එකක් හැටියට අද ලංකාව පුරාම තිබෙනවා. මේ anti-doping system එක ගැන මෙච්චර කාලයක් ක්‍රීඩකයන් දැනුවත් වෙලා තිබුණේ නැහැ. ඇත්තටම ප්‍රොෆෙසර් අර්ජුන ඩි සිල්වා මුළු ලංකාව පුරාම ඒ ගැන දැනුවත් කිරීම් කර තිබෙනවා. ඉතිහාසයේ දැක්කා තහනම් උත්තේජක ගැනීම නිසා අපරාදේ මොන තරම් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ අපට අහිමි වුණාද කියලා. හොඳම උදාහරණය තමයි මංජුල. එයාට ඒ පදක්කම ලැබුණත් ඒක දිගටම තියා ගන්න බැරි වුණා. දැන් ඒ ගැන අලුතින් නීති රීති ගෙනැල්ලා තිබෙනවා. මේ නියෝගවල ඒකත් තිබෙනවා. මින් පස්සේ ඒවාට සම්බන්ධ වුණොත් ඒ කවුරු හෝ වේවා ඒ පුහුණු කිරීමේ කටයුතු කරන එක්කෙනාත් -ඒවාට සම්බන්ධව ඉන්න අයටත් - ඒ සඳහා දඬුවම් ලැබෙනවා. මේවා ඉතිහාසයේ මෙතරම් කාලයක් නොතිබුණු දේවල්. ඒවා අද මේ ක්‍රීඩාවලට අලුතින් ඇවිල්ලා තිබෙනවා. ඇත්තටම මේ anti-doping system එක ආපු එක ලංකාවේ හැම ක්‍රීඩාවකටම හොඳයි. ඒ ගැන දැනුවත් කරලා හොඳ තැනකට යන එක හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ක්‍රීඩාව පැත්තෙන් කථා කරද්දී විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාව ගැනත් වචනයක් කියන්න ඕනෑ. ක්‍රිකට් ක්‍රීඩා සංගම්වලටත් මේ නියෝගවලින් යම්කිසි දෙයක් කරන්න පුළුවන්. මම කලින් කිව්වා වාගේ දිස්ත්‍රික් සංගම්වලිනුත් ලංකාව පුරා තිබෙන අනෙක් සංගම්වලිනුත් බලන්න ඕනෑ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම සඳහා අවුරුදු දෙකක කාලය තුළ දී මේ ආයතනයෙන් උපරිම ප්‍රයෝජනය ගන්නේ කොහොමද කියලා.

ක්‍රිකට් ක්‍රීඩාව අද මුළු ලංකාව පුරාම පැතිරිලා තිබෙනවා. මා හිතනවා, ක්‍රිකට් ක්‍රීඩාව විතරක් නොවෙයි, අනෙක් ක්‍රීඩාවනුත් ඒ වාගේම රට පුරා ව්‍යාප්ත වෙන්න ඕනෑ කියලා. නමුත් ජාත්‍යන්තරයේ ඉහළම තැන ලැබී තිබෙන්නේ අපේ ක්‍රිකට් ක්‍රීඩාවටයි. ඒක ලැබුණේ ක්‍රීඩා අමාත්‍යාංශයේත්, අධ්‍යාපන අමාත්‍යාංශයේත් කැප වීම මතයි. විශේෂයෙන් අද අපේ පාසල්වල ක්‍රිකට් ක්‍රීඩාව දියුණුම තැනකට ඇවිල්ලා තිබෙනවා. අවුරුදු 25ක්, 30ක් ආපස්සට බැලුවොත්, වයස අවුරුදු 11න් පහළ ක්‍රිකට් කණ්ඩායම, අවුරුදු 19න් පහළ ක්‍රිකට් කණ්ඩායම ආදී වශයෙන් පාසල් තුළ තිබුණු වැඩ පිළිවෙළ නිසා තමයි අද මේ තරම් හොඳ ක්‍රිකට් ක්‍රීඩකයින් පිරිසක් ලංකාවේ බිහි වෙලා තිබෙන්නේ. අනෙක් ක්‍රීඩාවනුත් ඒ විධියේම හොඳ තැනක තිබුණොත්, ඒ කියන්නේ අනෙක් ක්‍රීඩා සම්බන්ධයෙනුත් ඒ විධියේ වැඩ පිළිවෙළක් පාසල්වලින් පටන් ගන්න පුළුවන් වුණොත් මා හිතනවා ජාත්‍යන්තර තලයට යන්න, ක්‍රිකට් ක්‍රීඩාව ගිය තැනට යන්න පුළුවන් කියලා. ක්‍රිකට් ක්‍රීඩාව විතරක් නොවෙයි, අනෙක්

[ගරු සනත් ජයසූරිය මහතා]

ක්‍රීඩාවනුත් ඉදිරියට යන්න ඕනෑ කියලා අපි මෙතැනට ඇවිල්ලා කිව්වාට මදි. ඒ සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. අපි ඒක කරන්නේ කොහොමද කියන එක බලන්න ඕනෑ. මොකද, ක්‍රිකට් ක්‍රීඩාව වුණත් එක පාරටම ජාත්‍යන්තර තලයට ගියේ නැහැ. එක්තරා පිළිවෙළකටයි ගියේ. වයස අවුරුදු 11න් පහළ කණ්ඩායමේ පටන්ම ක්‍රීඩා කරපු අය තමයි අද මේ තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අනෙක් ක්‍රීඩාවලදීත් මේ කරපු කැප කිරීම කරන්න ඕනෑ. ඒ කියන්නේ පාසල්වල ක්‍රිකට් ක්‍රීඩාව සඳහා යම් කිසි කැප කිරීමක් කරලා තිබෙනවා නම් අනෙක් ක්‍රීඩාවලටත් ඒ කැප කිරීම කරන්න ඕනෑ. එහෙම නැත්නම් අපට ඒ බලාපොරොත්තු වන තැනට යන්න අමාරුයි කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම අද ක්‍රිකට් ආයතනය තුළ මූල්‍යමය ප්‍රශ්නයක් තිබෙන බව කියනවා. ක්‍රිකට් ආයතනයට පත් වන සභාපතිතුමන්ලා මොන වාගේ අය විය යුතුද කියලා අද මේ ඉදිරිපත් කර ඇති නියෝග තුළ සඳහන් වනවා. මා හිතන විධියට ක්‍රීඩා අමාත්‍යතුමා සියලු දෙනා සමඟ සාකච්ඡා කරලායි මේ සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ ඉදිරිපත් කර තිබෙන දේවල් හරිම පැහැදිලියි. ක්‍රිකට් ආයතනය ක්‍රීඩකයින් වෙනුවෙන් ලොකු කැප කිරීමක් කරන්නේ.

පසු ගිය කාලයේ මාධ්‍ය විසින් කථා කරපු දෙයක් තමයි ක්‍රීඩකයින්ට මෙච්චර ගණනක් ගෙවන ගමන් clubsවලටත් යම් කිසි ප්‍රමාණයක් ගෙව්වාට පස්සේ මුළු ලංකාව පුරාම ක්‍රිකට් දියුණු කරන්න අමාරුයි කියන එක. ඇත්තටම මම ක්‍රීඩා කරද්දිත් මට ඒක දැනුණේ නැහැ. මම ක්‍රීඩා කරද්දිත් ක්‍රිකට් පාලක මණ්ඩලයට ගිහිල්ලා කියනවා අපට ගෙවන ගණන මදියි කියලා. හැබැයි අපි ඒ ගැන සාකච්ඡා කරලා ඒ ප්‍රශ්නය විසඳා ගෙන තමයි ඉදිරියට ගිහිල්ලා තිබෙන්නේ. ඉතින් පසු ගිය කාලයේ ක්‍රීඩා කරපු නායකයනුත් ඒක කරලා තිබෙනවා. මේක අලුත් දෙයක් නොවෙයි. ගොඩක් වෙලාවට මාධ්‍යයෙන් පෙන්වන්න උත්සාහ කරනවා, ක්‍රීඩකයින් සල්ලි පසුපස දුවනවා කියලා. එහිදී අපි බලන්න ඕනෑ ක්‍රීඩකයකුට ක්‍රීඩා කරන්න පුළුවන් වන්නේ කොච්චර කාලයක්ද කියන එක. මොකද, ක්‍රීඩකයකු අවුරුදු 30ක්, 40ක් ක්‍රීඩා කරන්නේ නැහැ. අවුරුදු 15ක් ක්‍රීඩා කළාට පස්සේ ඒ ක්‍රීඩකයා ජීවත් වෙන්නෙත් ඒ හම්බ කර ගත්තු දෙයින් තමයි. ඒක මහජනතාවත්, පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුනුත් දැන ගන්න ඕනෑ. මොකද, පසු ගිය කාලයේ ක්‍රීඩා කරපු ක්‍රීඩකයින් ඉන්නවා අද වන කොට ඉන්න තැනක්වත් නැති අය. ඒ තත්ත්වයට වැටුණු ක්‍රීඩකයින් ගොඩක් ඉන්නවා. ඒ නිසා අපි ඒ තත්ත්වයට යන්නේ නැතිව, ක්‍රිකට් ආයතනය ක්‍රීඩකයින්ව දැනුවත් කරලා, පරණ ක්‍රීඩකයින්ට කොහොමද දෙන්න පුළුවන්, වෙනත් ප්‍රදේශවලට මේක කොහොමද දෙන්න පුළුවන් කියලා සාකච්ඡා කළා. අවසානයේදී ක්‍රීඩකයින් කැමැති වුණා, ක්‍රිකට් දියුණුව සඳහා සියයට 25ක් ක්‍රිකට් ආයතනයට දීලා ලංකාව වෙනුවෙන් ක්‍රීඩා කරන්න. සමහර වෙලාවට මාධ්‍යයෙන් මේවා කියන කොට ක්‍රීඩකයින්ගේ පැත්තෙනුත් වැරදි අවබෝධ ඇති වන්න පුළුවන්. මමත් ක්‍රීඩකයකු හැටියට, නායකයකු හැටියට එදා මේ දේ කරලා තිබෙනවා. අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාත් ඒකම කරලා තිබෙනවා. ඒ නිසා ඒක අලුත් දෙයක් නොවෙයි. අපි දැන ගන්න ඕනෑ අපේ ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන එක ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා තිලාන් සමරවීර ක්‍රීඩකයා ගැන ඇහුවා. මා ඒ වෙලාවේ උත්තර දෙනවාට වඩා මේ වෙලාවේ යම් කිසි දෙයක් කියන්න ඕනෑ කියා හිතුවා. තිලාන් සමරවීර කියන ක්‍රීඩකයාත් ලංකාව වෙනුවෙන් ක්‍රීඩා කරපු හොඳ ක්‍රීඩකයෙක්.

මම හිතනවා, එතුමාගෙන් ගන්න පුළුවන් උපරිම ප්‍රයෝජනය අපි අරගෙන තිබෙනවාය කියා. අපි මේ අවුරුද්දට කොන්ත්‍රාත්තුවකුත් දීලා තිබෙද්දි, යොවුන් ක්‍රීඩකයන් සොයද්දි තමයි එතුමා ක්‍රීඩාවෙන් සමු ගත්තේ. ඒක එතුමාගේ පෞද්ගලික තීරණයක්. අපි ඒ තීරණයට හිස නමා එතුමාට යන්න ඉඩ දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තේරීම් කමිටුවේ සභාපති හැටියට මම ක්‍රීඩා ඇමතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා, කොළඹ ඇතුළු ලංකාවේ අනෙක් ප්‍රදේශවල tournament එකක් හෝ වයස අවුරුදු 23න් පහළ Sara Trophy එකක් හෝ උතුරේත්, නැඟෙනහිරත් පටන් ගන්නය කියා. එහෙම පටන් ගත්තොත් තමයි උතුරු ප්‍රදේශයෙනුත්, නැඟෙනහිර ප්‍රදේශයෙනුත් ක්‍රීඩකයන් ලබා ගන්න අපට පුළුවන් වෙන්නේ. දැනට එවැනි තත්ත්වයක් නැහැ. තේරීම් කමිටුවේ සභාපතිතුමා හැටියට මම විධායක කමිටුවෙනුත්, ක්‍රීඩා ඇමතිතුමාගෙනුත් විශේෂ ඉල්ලීමක් කරනවා, ඉක්මනින්ම ඒක පටන් ගන්නය කියා. මොකද, යුද්ධය ඉවර වුණායින් පසුව වෙන්නේ මොකක්ද කියා ජනතාව බලා ගෙන ඉන්නවා. එවැන්නක් පටන් ගත්තොත් ඒක අපි දෙන හොඳ ආදර්ශයක් වේවි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ඒ cricket tournament එක යම්කිසි තැනකින් පටන් ගත්තොත් උතුරු, නැඟෙනහිර ප්‍රදේශවලිනුත් ලංකාව නියෝජනය කරන ක්‍රීඩකයන් අපට ලැබේවිය කියා මා හිතනවා. ඒ අදහසත් ප්‍රකාශ කරන අතර මේ සංශෝධන පිළිබඳව මා බෙහෙවින්ම සතුටු වෙන බවත් කියන්න ඕනෑ. මෙම නියෝග මඟින් ජාත්‍යන්තර තත්ත්වය දක්වා යන්නට තරම් අපේ රටේ ක්‍රීඩාව දියුණු කරන්නට කටයුතු කිරීම ගැන ගරු ඇමතිතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 5.48]

ගරු තාරානාත් බස්නායක මහතා
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රීඩා පනත යටතේ නියෝග පිළිබඳ විවාදය පැවැත්වෙන අද වටිනා දවසක් හැටියට සඳහන් කරන්න පුළුවන්. නිදහසේ ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් මුළු රට පුරාම ඇති කර තිබෙන යුගයක, රටේ දැවැන්ත සංවර්ධනයක් ක්‍රියාත්මක වන වකවානුවක, ක්‍රීඩාව දැනට පවතින තත්ත්වයෙන් තව ඉදිරියට අරගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ක්‍රීඩා පනතට අදාළ නියෝග විවාදයට ගැනීම ගැන මා ඉතාමත් සන්තෝෂ වෙනවා. වර්තමාන ක්‍රීඩා අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා බුද්ධිමත්ව, බොහොම කල්පනාකාරීව හිතා බලා ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් මේ පනතට අදාළ නියෝග ඉදිරිපත් කරන්න කටයුතු කර තිබෙනවා. ක්‍රීඩාව පිළිබඳව එදාට වඩා අද යම්කිසි වෙනසක්, දියුණුවක්, උද්‍යෝගයක් ග්‍රාමීය මට්ටමෙන් පවා ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රීඩා ඉතිහාසය ගැන කථා කරනවා නම් එදා තිබුණේ ක්‍රීඩා මාෆියාවක්ය කියන එක මා කියන්න ඕනෑ. මුදලාලිකරණය වෙච්ච, ව්‍යාපාරයකට ගොදුරු වුණු ක්‍රීඩා සංගම් තමයි තිබුණේ. යම් යම් පිරිස්වල ඕනෑ එපාකම් අනුව තමයි එදා කටයුතු කළේ. විශේෂයෙන්ම එදා මේ පරිසරයේ හිටපු ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩකයන් ක්‍රීඩාව පිළිබඳව සිතුවේ ඉතාමත්ම ශෝචනීය ආකාරයෙනුයි. අද ඒ පරිසරය, ඒ පසුබිම වෙනස් වෙලා තිබෙනවා. ක්‍රීඩාවට උචිත තැන, ක්‍රීඩාවට හිමි විය යුතු තැන, ඊට හිමි වටිනාකම අද ක්‍රමක්‍රමයෙන් ලැබෙමින් පවතිනවාය කියන එක ග්‍රාමීය මට්ටමේ තරුණ ප්‍රජාවගේ අදහස් තුළින් පවා අද දක්නට ලැබෙනවා. හොඳ කායික, මානසික නිරෝගිතාවයෙන් යුතු, අන් මත ගරු කරන, අන් මත ඉවසන, විශේෂයෙන්ම නායකත්වයට ගරු කරන හොඳ පෞරුෂත්වයකින් යුතු පුරවැසියන් බිහි කිරීමේ කාර්ය භාරය ඉටු වන්නේ ක්‍රීඩාව තුළිනුයි.

මේ පිළිබඳව හඳුනා ගත්ත, සැබෑවටම දැක්ක දක්ෂ නායකයෙක් තමයි අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒ වාගේම මේ රජය, ක්‍රීඩා අමාත්‍යාවරයා ඇතුළු ඒ සියලුම නිලධාරීන් අද මේ ක්‍රීඩා පනත තුළින් ක්‍රීඩාවේ සංස්කෘතිය හා එයට අනුබද්ධ සියලු දේවල් සාකච්ඡා කරලා ක්‍රීඩාව නව තැනකට ගෙන ඒමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ ගැන අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයට අප ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එදා තිබුණු ක්‍රීඩා සමාජ පරිසරයයි, අද තිබෙන ක්‍රීඩා සමාජ පරිසරයයි දිහා බැලුවාම සැබෑ වෙනසක් ඇති වෙලා තිබෙන බව අපට පෙනෙනවා. ගමේ ඉන්න තරුණ තරුණියන් තුළ පවා බලාපොරොත්තු ඇති වන ආකාරයට අද මේ ක්‍රීඩාව සෑම ප්‍රදේශයක් කරාම ව්‍යාප්ත කරලා, ඔවුන්ගේ ඒ අපේක්ෂාව ඉෂ්ට සිද්ධ කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් අද ක්‍රීඩා අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වෙනවා. පළාත් මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින්, ග්‍රාමීය මට්ටමින් ඒ නිලධාරීන්ට වගකීම පැවරෙන කොට, ඒ අය ඒ පිළිබඳව යුහුසුළුව ක්‍රියාත්මක වෙන කොට, අද ඒ ග්‍රාමීය ප්‍රදේශවල ඉන්න තරුණ තරුණියන් බොහොම උනන්දුවෙන් ක්‍රීඩා කටයුතුවල නියැලෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ අතිගරු ජනාධිපතිතුමා ක්‍රීඩාව පිළිබඳව බොහොම උනන්දුවක් දක්වන නායකයෙක්. එතුමා අය වැයෙන් ක්‍රීඩා කටයුතුවලට, ඒ පහසුකම්වලට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කරලා ඒ කටයුතු කරන්න ක්‍රීඩා අමාත්‍යාවරයාට අද වගකීම පවරා තිබෙනවා. මුලින්ම අප ග්‍රාමීය මට්ටමින් ක්‍රීඩා කරන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්න ඕනෑ. ක්‍රීඩාවට අවශ්‍ය ඒ පරිසරය නිර්මාණය කර දීම තුළින් ක්‍රීඩකයාගේ හැකියාවන්, දක්ෂතාවන්, කුසලතාවන් ඔප් නංවා ගන්න පුළුවන්. අද ඒ පරිසරය සැකසිලා තිබෙනවා. ග්‍රාමීය මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින්, පළාත් මට්ටමින් ක්‍රීඩාංගණ ඉදි කරලා, ඒවාට අවශ්‍ය පහසුකම් ලබා දීලා, ගමේ ඉන්න තරුණ තරුණියන්ගේ හැකියාවන්, දක්ෂතාවන් ඔප් නංවලා ඔවුන් ජාත්‍යන්තර තලයට අරගෙන යන්න පුළුවන් වාතාවරණය අද නිර්මාණය කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ක්‍රීඩා පනත යටතේ මේ නියෝග ඉදිරිපත් කරලා අවුරුදු ගණනාවක් තිස්සේ තිබුණු ඒ නීති-රීති, රෙගුලාසි වෙනස් කරලා නූතන සමාජයට, පරිසරයට ඔබින ආකාරයට, ක්‍රීඩකයාට ගැළපෙන පරිදි ඒවා සකස් කර තිබෙනවා. එදා මේ සමහර නීති, රෙගුලාසි තිබුණේ ක්‍රීඩකයාට ගැළපෙන පරිදි නොවෙයි. එදා තිබුණේ සමහර පුද්ගලයන්ට පමණක් සීමා වුණු නීති-රීති. අපට අවශ්‍ය වන්නේ ක්‍රීඩකයෙකුට ක්‍රීඩා කරන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කර දීලා, ඔහුගේ දක්ෂතා දියුණු කරලා, ජාත්‍යන්තර මට්ටම දක්වා ඔහු රැගෙන ගිහින්, "මගේ මවුබිම ලංකාව" කියලා ඔහුට අභිමානයෙන් කියන්න පුළුවන් තත්ත්වයක් නිර්මාණය කර දීමයි. මේ තත්ත්වය තේරුම් ගෙන අද මේ නීති-රීති වෙනස් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම අපේ අතිගරු ජනාධිපතිතුමා අද හොඳ තීන්දුවක් අරගෙන තිබෙනවා. එතුමා කියා තිබෙනවා සෑම පාසල් දරුවෙක්ම අනිවාර්යයෙන්ම ක්‍රීඩාවට යොමු කරන්න කියලා. සාමාන්‍ය පෙළ, උසස් පෙළ වැනි විභාගවලදී ක්‍රීඩාව සඳහා සම්බන්ධ වුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශේෂ වූ අවස්ථාවක් දීලා තිබෙනවා. තම ක්‍රීඩා කෞශල්‍ය ඔප් නංවා ගනිපු, ඒ දක්ෂතා ඉදිරිපත් කරපු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහනිකවලට අද වටිනාකමක් ලැබිලා තිබෙනවා. ඒ නිසා මේ සංශෝධන තුළින් අද පාසල් මට්ටමින් ක්‍රීඩා කරන දූ දරුවන්ටත් වටිනාකමක් ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට බෙහෙවින් සන්තෝෂ විය හැකි කාරණයක් තිබෙනවා. හිටපු අමාත්‍ය බන්දුල බස්නායක මැතිතුමා මගේ පියා. එතුමා කාලයක් ක්‍රීඩා අමාත්‍යාවරයා -අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන- හැටියට කටයුතු කළා. මා දකින ආකාරයට එතුමා ක්‍රීඩාව පිළිබඳ මනා අත් දැකීමක්, හොඳ පළපුරුද්දක් තිබෙන පුද්ගලයෙක්. එතුමා ආසියාවේම ශාරීරික අධ්‍යාපන ගුරුවරයෙක් හැටියටත්, ගුරු උපදේශකවරයෙක් වශයෙනුත් කටයුතු කර පසුව ක්‍රීඩා අමාත්‍යාවරයා -අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන- වශයෙන් පත් වෙලා තමන්ගේ කාල වකවානුවේදී ක්‍රීඩාව වෙනුවෙන් විශාල කැප කිරීමක් කළා. එතුමා ඒ කටයුතු කරන කාලයේ මම එතුමාගේ ඒ වැඩ කටයුතුවලට සම්බන්ධ වුණු නිසා මා ඒ ගැන දන්නවා. අද ක්‍රීඩා අමාත්‍යාවරයා වශයෙන් ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ දෙස පිටිපස්සේ ඉඳගෙන වුණත්, මගේ පියා බොහොම සන්තෝෂයෙන් බලාගෙන ඉන්නවා. අද එතුමා ක්‍රීඩාව නියම තැනට ගෙනැල්ලා, ක්‍රීඩකයාට නියම වටිනාකමක් ලබා දෙන්න කටයුතු කරමින් සිටින ආකාරය පිළිබඳව එතුමාත් සන්තෝෂයෙන් බලාගෙන ඉන්නවා. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ගරු ක්‍රීඩා අමාත්‍යතුමාට අපි බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම තරුණ මන්ත්‍රීවරු හැටියට අපේ දායකත්වය, අපේ ශක්තිය, ධෛර්යය එතුමාට ලබා දෙනවා. විශේෂයෙන්ම ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයා හැටියට එතුමා වෙත ලබා දෙන්න පුළුවන් දායකත්වය අපි ලබා දෙන්න සූදානමින් ඉන්නවා කියන එක මේ අවස්ථාවේ සඳහන් කරන්නට ඕනෑ.

ක්‍රිකට් ක්‍රීඩාව කියන්නේ අපේ ගම්වල තරුණ පිරිස් කරන ක්‍රීඩාවක්. අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ඉතාමත් අභිමානයෙන් යුතුව මුළු ලෝකයේම කථා කරන්න පුළුවන් මාතෘකාවක්. ක්‍රිකට් ක්‍රීඩාව ගමට අරගෙන යන්න පුළුවන් වාතාවරණයක් අද නිර්මාණය කරලා තිබෙනවා. මේ සියලුම කරුණු කාරණා ගත්තාම රගර් ක්‍රීඩාව, ඒ වාගේම බාස්කට් බෝල් ක්‍රීඩාව සහ අනෙකුත් ක්‍රීඩාවන් එදාට වඩා අද ඉදිරියට ඇවිල්ලා තිබෙනවා කියන එක ඔබ අපි පිළිගන්නා කාරණයක්. විශේෂයෙන්ම මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා තරුණයෙක් හැටියට, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට රගර් ක්‍රීඩාවට සහ බාස්කට් බෝල් ක්‍රීඩාවට විශාල දායකත්වයක් දක්වනවාය කියන කාරණය. ඒ ක්‍රීඩාවන් එදා තිබුණාට වඩා අද වෙනත් තැනකට ගෙනැල්ලා වෙනස් කරන්න හැකියාව ලැබිලා තිබෙනවා. ඒ නිසා එතුමාට මේ කටයුතු කරන්න තව තවත් ශක්තිය ධෛර්ය ලැබෙන්නට ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

ගරු කාරුනාත් බස්නායක මහතා
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)
අද ක්‍රීඩාවට අවශ්‍ය පරිසරය නිර්මාණය වෙන්න ඕනෑය කියන කාරණයත්, ඒ සඳහා අපි දායකත්වය දක්වනවාය කියන කාරණයත් මේ අවස්ථාවේ සඳහන් කරමින් මට මේ අවස්ථාව ලබා දුන් මූලාසනයේ ගරු මන්ත්‍රීතුමියට සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට ස්තුති වන්ත වෙමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට කථා කරන්නේ ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඊට ප්‍රථම ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம *அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு ஜானக பண்டார *அவர்கள் தலைமை வகித்தார்கள்.*
Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair and* THE HON. JANAKA BANDARA *took the Chair.*

[අ.භා. 5.08]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1973 ක්‍රීඩා පනතට නව නියෝග ඇතුළු කිරීම සඳහා පවත්වන විවාදයේදී මාත් කරුණු කිහිපයක් එකතු කරන්නට කැමැතියි. විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, අද මේ විවාදය ගෙන යන කොට ක්‍රීඩාවට විශාල දායකත්වයක් දක්වන ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා මේ සභාව තුළ සිටිනවා. ඒ වාගේම අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා, සනත් ජයසූරිය මන්ත්‍රීතුමා සුප්‍රසිද්ධ ක්‍රිකට් ක්‍රීඩකයින්. ඒ වාගේම නිලංග සුමතිපාල මන්ත්‍රීතුමාත් ඉන්නවා. සමහර වෙලාවට මම නොදන්නා සහ මට අමතක වුණු තවත් අය ඇති. ඒ අය ක්‍රීඩාවට විශාල දායකත්වයක් දක්වලා තිබෙනවා. නමුත් ඒ වාගේ මන්ත්‍රීවරු, අපේ මිතුරෝ ඉන්න කොට මේ විෂයය ගැන වාද විවාද කිරීමට අපට අපහසුතාවකුත් තිබෙනවා. අපේ ක්‍රීඩා ඇමතිතුමා එක්ක මම එකඟ වෙනවා. මොකද දේශපාලනයේ නියැළී සිටින මන්ත්‍රීවරු විශේෂයෙන්ම නිල තල ගැනීම සුදුසු නැහැ කියන එක එතුමා ප්‍රකාශ කළා. ගරු ක්‍රීඩා ඇමතිතුමා ඔහුගේ ආරම්භක කථාවේදී සඳහන් කළා, ඒ පිළිබඳවත් යම් කිසි අලුත් ක්‍රියාදාමයක යෙදෙන්න එතුමා අනාගතයේදී බලාපොරොත්තු වෙනවා කියලා. නීතිමය ප්‍රශ්නයක් තිබුණා; ඒ නීතිමය ප්‍රශ්නය විසඳා ගෙන එතැනින් ඉස්සරහට එන්න ඕනෑ කියලා කිව්වා. බොහෝ අය ඒකට ප්‍රතිවිරුද්ධ අදහස් ප්‍රකාශ කළා. පසු ගිය කාලයේ ක්‍රීඩාවට විශාල දායකත්වයක් දක්වපු මැති ඇමතිවරු අපේ පාර්ලිමේන්තුවේ හිටියා. ඒ අය සතු ගෞරවය මේ නිසා කිසි අඩුවක් වෙන්නේ නැහැ. එකලට ඒක සුදුසු වෙන්න පුළුවන්. නමුත් අද සමාජයේ වැඩි වැඩියෙන් අධ්‍යාපනය ලැබූ අය සිටියදී, ඒ වාගේම විශාල සෙනහක් ක්‍රීඩාවෙන් ඉදිරියට ඇවිල්ලා සිටින අවස්ථාවකදී මෙම නිල තල හොබවන්න දේශපාලනඥයන් හැර වෙනත් අයට අවස්ථාවක් තිබෙන්නට ඕනෑ.

අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කිව්වා, සමස්තයක් හැටියට ගත්තොත් හුඟක් යහපත් නියෝග අද ඉදිරිපත් කර තිබෙනවා කියලා. මට නියමිත සීමිත කාලය පාවිච්චි කරලා මා ඒ යහපත් දේවල් ගැන කථා කරන්න යන්නේ නැහැ. ඒ තිබෙන අඩු පාඩු පෙන්වා දෙන්න තමයි මා උත්සාහ කරන්නේ. මට තව අමතර කරුණක් කියන්න අවශ්‍යයි. අද ක්‍රීඩාවෙන් ඉදිරියට එන්න නම් ජාතිකව පමණක් නොවෙයි ජාත්‍යන්තරවත් තරග කරන්න ඕනෑ. ජාත්‍යන්තරව තරග කරන විට, - ශ්‍රී ලංකා පාසල් කණ්ඩායමට වෙන්න පුළුවන්- හුඟක් වෙලාවට පිට රට යන්න වෙනවා. ඒ සඳහා ticket ගන්න සහ වෙනත් වියදම්වලට මුදල් අවශ්‍යයි. හුඟක් දරුවන්ට කියනවා කොහොම හරි සම්පූර්ණ මුදල හෝ කොටසක් සොයා ගන්න සහාය දෙන්න පුළුවන්, දායකත්වය ලබා දෙන්න පුළුවන් sponsor කෙනෙක් සොයා ගන්න කියලා. සමහර විට ගම්බද ඉන්න අපේ හුඟක් අයට ඒ වාගේ සම්බන්ධතා අඩුයි; සම්බන්ධතා නැහැ. ඒ නිසා අපහසුතා ඇති වී තිබෙනවා. ඒ නිසා ක්‍රීඩා අමාත්‍යාංශය තුළම වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නට පුළුවන් නම් එවැනි ක්‍රීඩකයන්ටත් හොඳ අවස්ථාවක් ලැබෙනවා. මොකද, හුඟක් දක්ෂ පුද්ගලයන් ඇති. නමුත් ඒ අයට ඉදිරියට එන්න අවස්ථාව නැති වන්නට පුළුවන්, ඒ සම්පත්-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ක්‍රීඩා අරමුදලින් බොහෝ ක්‍රීඩකයන්ට උදව් කරනවා. නමුත් අපේ නිර්ණායක වගයක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා හැමෝටම උදව් දෙන්න විධියක් නැහැ. ප්‍රධාන තරගවලට ක්‍රීඩා අරමුදලෙන් සම්පූර්ණ අනුග්‍රහය ලබා දෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ස්තුතියි. මා කියන්නේ ඊට වැඩිය පහළ මට්ටමටත් ඒ උදව්ව කරන්න පුළුවන් නම්, පහළ මට්ටමේ තරගවලට සහභාගි වන ක්‍රීඩකයන්ටත් ඒ අරමුදලින් මුදල් ලබා දෙන්න පුළුවන් නම්, විශේෂයෙන්ම ගම්බද ඉන්න කොළඹ ආයතන සමඟ සම්බන්ධතාව නැති ක්‍රීඩකයන්ට ඒක උපකාරයක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ නියෝග කියවන විට පැහැදිලි වුණ එක කරුණක් මා කියන්න ඕනෑ. රෙගුලාසිවලින්, නියෝගවලින් විතරක් ක්‍රීඩා සමාජ තුළ යහ පාලනයක් ඇති කරන්න බැහැ. මේ නියෝගවල අරමුණ යහ පාලනයක් ඇති කිරීමයි. නමුත් රෙගුලාසිවලින් සහ නියෝගවලින් පමණක් යහපාලනයක් ඇති කරන්න බැහැ. රෙගුලාසිවලින් සහ නීතිවලින් පමණක් යහපාලනයක් ඇති කරන්නට පුළුවන් නම්, මේ රටේ යහපාලනයක් තිබෙනවා. නමුත් අපි දන්නවා, එහෙම යහපාලනයක් නැහැ කියලා. ඒ නිසා තමයි අපි මේ නියෝග ගැන කථා කරන්න ඕනෑ; ඒවායේ දුර්වලතා ගැන කථා කරන්නට ඕනෑ. නමුත් අපි ඊට එහා යන්නත් ඕනෑ.

දැන් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩා ප්‍රතිපතියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකේ 16 වන වගන්තියේ තිබෙනවා, ක්‍රීඩා සංවිධානවල ස්වායත්තත්වය පිළිබඳව. ක්‍රීඩා සංවිධානවලට නිලධාරීන් තෝරා ගැනීමේදී ක්‍රීඩා සංවිධානවල ස්වායත්තත්වය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පරිසරය සැකසීමට අදාළ කරුණු තිබෙනවා. "ක්‍රීඩා සංවිධානවල නිලධාරීන් තෝරා ගැනීමේදී ඒ අයගේ ස්වායත්තත්වය ආරක්ෂා වන පරිදි සුදුසු පුද්ගලයන් පත් කර ගැනීමට ඉවහල් වන නෛතික පිළියම් යෙදීම අවශ්‍යයි" කියනවා. මා හිතනවා මේ අනුව තමයි මේ නියෝග ඉදිරිපත් කරන්න ඇත්තේ කියලා. නමුත් මේ නියෝගවල දුර්වලතා තිබෙනවා. සමහර කරීකයක් මට පෙර මේ කරුණු සඳහන් කළා. නමුත් මා නැවත සඳහන් කරන්න ඕනෑ.

15 වෙනි නියෝගයේ (i) (ඇ) හි මෙසේ සඳහන් වෙනවා:

"යම් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයෙන් වෘත්තීමය ජනමාධ්‍යවේදියකු හෝ එවැනි ජාලයක අයිතිකරුවකු වේ නම්;"

එවැනි අය මෙම නිලතල හෙබවීමෙන් බැහැර කරලා තිබෙනවා. නමුත් ඇත්තටම මේකට ඇතුළු කරන්න තිබුණ තවත් කාරණයක් තිබෙනවා. මේ ජන මාධ්‍ය ආයතන තුළ ප්‍රසිද්ධ නිලධාරීන් සිටිනවා නම්, ඒ අයත් මේ කාණ්ඩයට ඇතුළත් කළා

නම් හොඳයි. ප්‍රධාන විධායක නිලධාරියා වාගේ අය මෙම තනතුරු හොබවන එක සුදුසු නැහැ කියන්න ඕනෑ. සමහර වෙලාවට එවැනි ආයතනයක අයිතිකරුට වඩා බලවත් වනවා ප්‍රධාන විධායක නිලධාරියා. මොකද, අයිතිකරු කොටස්කරුවෙක් වෙන්න පුළුවන්. නමුත් කළමනාකාරිත්වය තුළ ඔහුගේ විධායක බලය පාවිච්චි කරන්නේ නැහැ. නමුත් විධායක නිලධාරින් ඒ විධායක බලය පාවිච්චි කරනවා. ඇත්තටම මෙහෙම හිතමු.

පුද්ගලයෙක් ඉන්නවා. ඔහුට හොරකම් කන්නට අවස්ථා දහයක් තිබෙනවා. ඒ අවස්ථා දහයෙන් නවයකදී ඔහු හොඳට ක්‍රියා කරනවා. එතකොට ඒ පුද්ගලයා හොඳ පුද්ගලයෙක් කියලා අප සඳහන් කරනවා. නමුත් දහ වන අවස්ථාවේදී ඔහු හොරකම් කළොත්? අවස්ථා නවයකදී හොඳට ක්‍රියා කළා; එක අවස්ථාවකදී හොරකම් කළා. එතකොට ඔහු හොරෙක් වෙනවා. මා කියන්නේ මේ නියෝගවලට ගෙනා සංශෝධන ප්‍රගතිශීලි මදි බවයි. මේක තව ඉදිරියට ගෙන යන්නට ඕනෑ. මීට වඩා ප්‍රගතිශීලි ලෙස මේ නියෝග අපට සංශෝධනය කරන්නට පුළුවන් නම් හොඳයි.

"යම් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයෙන් වෘත්තීයමය ජනමාධ්‍යවේදියකු හෝ ප්‍රසිද්ධ නිලධාරියකු හෝ එවැනි ජාලයක අයිතිකරුවකු වීම;" යනුවෙන් සංශෝධනය කරන්නට පුළුවන් නම් මේ නියෝග බොහොම ප්‍රගතිශීලි බව සඳහන් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි තව කරුණක් තිබෙනවා. මේ නිලතලවලට ඉල්ලන අයගේ කාලසීමාව සීමා කරන්න කියලා තිබෙනවා. මේ ගැන හුහක් කරුණු කිව්වා. එක එක ක්‍රීඩා සමාජවල සමහර අය අවුරුදු 25, අවුරුදු 30 මේ තනතුරු හොබවන බව කිව්වා. ගරු මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, ඔලිම්පික් සංගමයේ සිටින සභාපතිතුමා වෙනත් වෙනත් ක්‍රීඩා සංගම්වලත් ප්‍රසිද්ධ නිලතල හොබවනවා කියලා. මේ නිලතලවලට සීමාවක් තියන එක හොඳයි කියන එක තමයි මගේ මතයත්. එය ප්‍රගතිශීලි යැයි කියන්නට පුළුවන්. ඒක මූලධර්මයක් හැටියට අපි ඇත්තටම පිළිගන්නවා නම්, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන කොට ඇයි ඒ මූල ධර්මය පිළිනොගත්තේ? දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන කොට අප ඒ ගැන කිව්වා. නමුත්, "එහෙම මූලධර්මයක් අවශ්‍ය නැහැ, කාල සීමාවක් අවශ්‍ය නැහැ. මිනිස්සු ඡන්දය දෙනවා නම් අවුරුදු 20ක්, නොවෙයි 30ක් හිටියත් කමක් නැහැ" කිව්වා. මේ සිටින අපේ ඇමතිවරු ඔක්කෝම ඒකට පක්ෂව අත ඉස්සුවා, ඒ අවස්ථාවේදී. මේ එකම මූල ධර්මය. අපි මේ නියෝග ගෙන එන්නේ යහපාලනය සම්බන්ධයෙන් නම්, මේවා යහපාලනයට සුදුසුයි කියලා මාත් පිළිගන්නවා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් ඒක බලපනවා. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ඇති කරන්නේ ඡන්දය දීමෙන් පමණක් නොවෙයි. එතකොට කිව්වා, ජනාධිපතිතුමාට ඔක්කෝම අය ඡන්දය දෙනවා නම් දිගින් දිගටම ඒ තනතුරේ ඉන්න පුළුවන් කියලා. මේ නියෝගවලින් කියන්නේ, මේ ක්‍රීඩා සංගම් ස්වාධීන කරන්න ඕනෑ, ඒ නිලතලවලට මැතිවරණ තියන්න ඕනෑ බවයි. නමුත් මේ අය දෙවනාවක් ආවත්, හය වනාවක් ආවත් එකම අය තමයි එන්නේ. ඉතින් දෙකම එකයි. රට ගැන හිතුවත්, මේ සංගම් ගැන හිතුවත් මේ අය එන්නේ ඡන්දයෙන්.

මේ නියෝග ඉදිරිපත් කිරීමෙන් දැන් මේ සභාව තුළ පිළිගැනීමක් තිබෙනවා, ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ, යහපාලනය කියන්නේ ඡන්දයකින් විතරක් සීමා කරන්නට පුළුවන් දෙයක් නොවෙයි කියන එක. එහිදී පුද්ගලයනුත් සීමා කරන්න අවශ්‍යයි. හරියට පාලන කටයුතු කරලා අලුත් දර්ශනයක් අනුව ඒ ආයතන ගෙන යන්නට අනෙක් පුද්ගලයන්ටත් අවස්ථාවක් දෙන්නට ඕනෑ. එම නිසා ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තිබෙන රටවල, ජනාධිපතිවරු සිටින රටවල ඒ ධුර කාලය දෙවරකට සීමා කර තිබෙනවා. සමහර වෙලාවට එක කාල සීමාවක් අවුරුදු හතරකට හෝ පහකට සීමා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථා කළේ ඒ මූලධර්මය ගැන. මේ නියෝගවලට ඇතුළත් කර තිබෙන මූලධර්මය මා පිළිගන්නවා. නමුත් කනගාටුවෙන් කියන්න ඕනෑ, ඒ මූල ධර්මය ගැන අප 2010 වර්ෂයේත් සිතුවා නම් මීට වඩා හොඳ යහපාලනයක් මේ රටේ ඇති කරන්න තිබුණු බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සුදුසු නැති අය නැවත නැවත මේ සංගම්වලට ඇතුළු වීම පිළිබඳව විවාදයක් තිබුණා. අද සුරාජ් රන්දෙනිය මැතිතුමාගේ නම සඳහන් වුණා. ඔහු මාත් එක්ක Big Match වලදී ක්‍රීඩා කර තිබෙන ක්‍රීඩකයෙක් බව කියන්න ඕනෑ. මගේම පාසලේ නොවෙයි, අනෙක් පාසලෙන්. ඔහු ගැන අද මෙතැන සඳහන් කළා. සඳහන් කරලා කිව්වා, ඔහු දැන් ක්‍රිකට්වල නොවෙයි, බැඩ්මින්ටන්වල නිලතලවලට ඉදිරිපත් වෙන්න යනවා කියලා. අද මෙතැන ඒ ගැන අවධානමක් ඇති කළා. ඇත්තටම අපට පුද්ගලයන්ගෙන් වැඩක් නැහැ. අපි මෙතැන කථා කරන්නේ ප්‍රතිපත්ති ගැනයි. ඒ පුද්ගලයා එතැනට එන්න සුදුසු නැත්නම් මේ නියෝගවලින් එකක් ඔහු කඩ කරන්න ඕනෑ. එතකොට තමයි ඒ පුද්ගලයා එතැනට එන්න සුදුසු නැත්තේ. මම මෙහෙම කියන්නේ ඇයි? හුහක් වෙලාවට වැරැදි දේවල් සිදු වෙනවා; දූෂණ ඇති වෙනවා; නමුත් අපි ඒ දූෂණ ගැන සොයා බලන්නේ නැහැ. අපි දූෂණ ගැන දඬුවම් කරන්නෙත් නැහැ. ඊට පසු අවුරුදු හතර පහක් ගිහින් ඒ අය වෙනත් සමාගමකින් එන විට අපිට කියන්න කරුණු නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
එච්චරද තිබෙන්නේ?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔව්. ඔබතුමාගේ කාලය විනාඩි 13යි. ඇත්ත වශයෙන්ම ඔබතුමාගේ කාලය අවසන්. නමුත් තව විනාඩි දෙකක් කථා කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ප්‍රශ්නයක් නැහැ. කාලය තිබෙනවා නම් ටිකක් වැඩියෙන් කථා කරනවා. කාලය නැත්නම් විනාඩි දෙකෙන් ඉවර කරන්නම්. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ හා ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමාගේ කාලය ගැනයි මම ඇහුවේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි 13ක කාලයක් ඔබතුමාට වෙන් කර තිබෙනවා. ඒක අවසන්. නමුත් තවත් විනාඩි දෙකක් වැඩිපුර ලබා දෙන්නම්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ප්‍රශ්නයක් නැහැ. මම ඒ විනාඩි දෙකෙන් කථාව අවසන් කරන්නම්.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

නුසුදුසු අය පැමිණීම ගැන අද සාකච්ඡා කළා. නමුත් පසු ගිය කාලයේ සිදු වුණු වංචාවන් ගැන අපි සොයා බලා තීරණ ගත්තේ නැති නිසා තමයි මේ වාගේ අය නැවත මෙතැනට එන්නේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ගැන කරුණක් දෙකක් කියලා මගේ කථාව අවසන් කරන්නම්.

නිම්බස් කොම්පැනිය එක්ක තිබෙන ගිවිසුම ගැන අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා කථා කළා. ඒ වාගේම මම මේ කාරණයත් මතක් කරන්නට ඕනෑ. සමර්සෙට් එන්ටර්ටේන්මන්ට් එකයි ශ්‍රී ලංකා ක්‍රිකට් එකයි අතර ගිවිසුමක් තිබුණා. ඒ ගිවිසුමේ අක්‍රමිකතාවන් තිබෙනවා. ඒ ගැන සොයලා බලන්න ශ්‍රී ලංකා ක්‍රිකට් එකෙන් කමිටුවක් පත් කළා. ඒ කමිටුවට මයියා ගුණසේකර මහතා, හරිස්චන්ද්‍ර මහතා, රංජනී ජයකොඩි මහත්මිය ආදීන් පත් කළා. අපට දැන ගන්න ඕනෑ, ඒ කමිටු වාර්තාවට මොනවාද වුණේ කියා. මොකද, ඒ ගිවිසුමේ තිබෙනවා, ශ්‍රී ලංකා ක්‍රිකට්වල අළෙවිය සම්බන්ධව. අවුරුදු 25කට විකුණන්න ඔවුන්ට අයිතිය දීලා තිබෙනවා කියා. ඒ වාගේම ශ්‍රී ලංකා ක්‍රිකට් එකේ ගිණුම් බැලුවාම, 2008, 2009 සහ 2010 වසරවල විගණකාධිපතිගේ ප්‍රශ්නවලට පිළිතුරු ලැබිලා නැහැ. ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් ගැන කථා කරන නිසා, මා මේ කරුණු ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. එක කාරණයක්, සමර්සෙට් එන්ටර්ටේන්මන්ට් එකේ ගිවිසුමේ මොකක් කියන එක. අපිට ඒක දැන ගන්න අවශ්‍යයි. [බාධා කිරීමක්] මම අහන්නේ report එක ගැන. [බාධා කිරීමක්] බොහොම ස්තුතියි.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම 2008, 2009, 2010, 2011 සහ 2012 වසරවල ශ්‍රී ලංකා ක්‍රිකට් එකේ financial statements සභාගත කරන්න පුළුවන්ද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා උපදේශක කාරක සභාවට එන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
උපදේශක කාරක සභාවට නොවෙයි, පාර්ලිමේන්තුවටම දෙන්න පුළුවන්ද කියලයි මම අහන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සම්ප්‍රදායක් -

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
එයට හේතුව මෙකයි. 2008, 2009 සහ 2010 වසරවල විගණකාධිපතිවත් පිළිතුරු දීලා නැහැ. ඒ නිසා තමයි මම අහන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා උපදේශක කාරක සභාවට එන්න, මම සියල්ල දෙන්නම්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
බොහොම ස්තුතියි. එතකොට අපිට ඒක ලබා ගන්න පුළුවන්.

එක කරුණක් කියලා මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වනවා. දුසැරිය කියා අපි හුඟක් වෙලාවට හිතන්නේ මුදලක් හෝ සම්පතක් අතට ගත්තොත් කියන එකයි. නමුත් අද දුසැරිය ඇති වන්නේ එහෙම නොවෙයි. අද දුසැරියට අමතරව රජයම කොල්ල කෑමක් තිබෙනවා. මුදල් කොල්ලකෑමක් විතරක් නොවෙයි. ඒකට "state capture" කියා කියනවා. අපි දන්නවා, මේ ක්‍රීඩා අළෙවියට නාළිකාවක් දෙන විට ක්‍රීඩාවට පමණක් නාළිකාවක් ඇති කර දෙන්න ඕනෑ කියා. ඒ නිසා සිරසට, ස්වර්ණවාහිනියට, දෙරණට, රූපවාහිනියට, අයිටීඑන් එකට ඒ අයිතිවාසිකම අහිමි වුණා. ඒක දෙන විට ඉල්ලුම් කළේ නැහැ. ඒ අයට යෝජනාවල් ඉදිරිපත් කරන්න දුන්නේ නැහැ. මොනවාද කළේ? කැබිනට් මණ්ඩලයට ගියා. කැබිනට් මණ්ඩලයෙන් අවසරයක් ගත්තා. නීති රාමුව වෙනස් කළා. අක්‍රමිකතාවක් සිදු කළා. දුසැරියක් ඇති කළා. නමුත් ඒක ඇති කළේ මුදල් ගන්නා මට්ටමෙන් නොවෙයි. ඒක ඇති කළේ නීතිය වෙනස් කිරීමෙන්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පාර්ලිමේන්තුවේ හිටපු මහලේකම්තුමාගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත් කරලා ඒක ඉතාම විනිවිදභාවයෙන් සිදු වුණා. කිසිම දූෂණයක් සිද්ධ වෙලා නැහැ කියා වාර්තා වෙලා තිබෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මොන වාර්තාද කියා කරුණාකර කියන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
CSN ගනුදෙනුව සම්බන්ධ වාර්තාව මම මේ කියන්නේ. [බාධා කිරීමක්]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම අහන්නේ- [බාධා කිරීමක්] ඒ වාර්තාව පාර්ලිමේන්තුවට [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම කිව්වා, සභාගත කරන්නම් කියා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
හරි, ඒ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කාලය අවසන්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මම අවසන් කරනවා. මම කියන්නේ, මෙයයි. නීතිය වෙනස් කරලා දූෂණයක් කර තිබෙනවා කියලා මා සඳහන් කරනවා. ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි, බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. ඊළඟට ගරු කනක හේරත් මන්ත්‍රීතුමා.

[අ.භා. 5.26]

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ 2013 අංක1 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග ගරු සභාවට ඉදිරිපත් කරන අවස්ථාවේ ඒ පිළිබඳව මටත් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා බෙහෙවින් සතුටු වනවා.

ක්‍රීඩා ක්ෂේත්‍රයේ පරිපාලනයේ අර්බුද ඇති වී තිබෙන අවස්ථාවක තමයි, ඒ වාගේම ක්‍රීඩා ක්ෂේත්‍රය යම් කිසි පසුබෑමකට ලක් වී තිබෙන අවස්ථාවක තමයි දශක හතරකට පසුව, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ අද දින මෙම නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. ඉතිහාසයේ ප්‍රථම වතාවට අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් අද ක්‍රීඩාවට; ක්‍රීඩා ක්ෂේත්‍රයට වරප්‍රසාද රාශියක් ලැබිලා තිබෙනවා. ක්‍රීඩා අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත් ක්‍රීඩා ඉතිහාසයේ ප්‍රථම වතාවට ක්‍රීඩා පනත යටතේ නියෝග මාලාවක් මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එම නියෝග සම්මත කර ගැනීම තුළින් ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට එතුමා බලාපොරොත්තු වනවා.

ක්‍රීඩා සංගම්වල පරිපාලනය නිවැරදි නොවුණොත් ක්‍රීඩාවේ ප්‍රගතියක් ලබා ගන්න හැකියාවක් නැහැ. ඒ නිසා තමයි අද මේ නියෝග සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. මේ නියෝග ඉතාමත් වැදගත් නියෝග හැටියට අපි දකිනවා. විශේෂයෙන්ම අද දින ඉදිරිපත් කර තිබෙන 13 වන නියෝගයට අනුව ප්‍රධාන නිලතලයන් සඳහා එක් වරක් තෝරා පත් කර ගනු ලබන නිලධාරීන් නැවතත් තෝරා පත් කර ගැනීමට හැකියාවක් නැහැ. ඒ ගැන විශේෂයෙන්ම අපේ අවධානය යොමු කරන්නට ඕනෑ. කාලයක් තිස්සේ ක්‍රීඩා පරිපාලනයේ උරුමක්කාරයන් හැටියට එහෙමත් නැත්නම් ඒ ක්‍රීඩා පරිපාලනයෙන් යැපෙන්නන් හැටියට ක්‍රියා කරලා අනෙක් කිසිවෙකුට ඒ ක්‍රීඩා පරිපාලනය තුළ අවස්ථාවක් ලබා දීලා නැහැ. ඒ නිසා අද ක්‍රීඩාවට ආදරය කරන පිරිසකට අවස්ථාවක් ලැබිලා තිබෙනවා, නැවතත් නිලධාරීන් හැටියට පත් වෙලා මේ ක්‍රීඩාවේ ප්‍රගතිය වෙනුවෙන් කටයුතු කරන්න. ඒ වාගේම විශේෂයෙන්ම අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ඒ නිලධාරීන් නැවත පත් කර ගන්නත් අවස්ථාවක් ලැබී තිබෙනවා. එයත් ඇත්තටම වැදගත් වනවා. විශේෂයෙන්ම නිල කාලය වසර දෙකක් දක්වා දික් කිරීම තුළින් ක්‍රීඩා සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කරලා වසරක් ඇතුළතදී එය සංවර්ධනය කරන්න බැරි වුණත් අපට ඒ ඉලක්කයන් කරා ගමන් කරන්නට පුළුවන් ආකාරයට ඒ වසර දෙක තුළදී ක්‍රියා කරන්න හැකියාවක් ලැබිලා තිබෙනවා. ඒකත් ඉතාමත් වැදගත් කාරණයක් හැටියට මා දකිනවා. මේ සෑම මට්ටමකම ක්‍රීඩාවන් සංවර්ධනය කර ඒ පිළිබඳව සලකා බලන්නත් ඔවුන්ට අවස්ථාවක් ලැබෙනවා, ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම නියෝග අංක 29, 30, 33 ඉතා වැදගත් වනවා. ප්‍රාදේශීය සංගම්වල ක්‍රීඩා සංවර්ධන කටයුතු වඩාත් ක්‍රමවත්ව පවත්වා ගෙන යෑම පිළිබඳව සොයා බලන්නත් අද මේ නියෝග තුළින් අවස්ථාව ලැබෙනවා. අපි දන්නවා, සමහරක් දිස්ත්‍රික්ක ක්‍රීඩා සංගම් තිබෙනවා. ක්‍රිකට් වේවා, පාපන්දු වේවා, ඒ සියලු සංගම්වලින් ජාතික මට්ටමට එද්දී එහෙමත් නැත්නම් නිලධාරීන් බවට පත් වෙද්දී ඒ ගොල්ලන් කිසිම නිලවරණයක් නැතිව, කිසි කෙනෙක් දැනුවත් කිරීමක් නැතිව කෙළින්ම ජාතික මට්ටමේ නිලධාරීන් බවට පත් වනවා. ඒ පිළිබඳව මේ සම්බන්ධතා තබා ගැනීම තුළින් මා හිතනවා, ඉදිරි කාලයේදී ඒ කටයුතු නිරාකරණය කර ගන්නට හැකියාවක් ලැබෙයි කියලා. ඒ වාගේම ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ සංගම් අතර සම්බන්ධතාවක් ඇති වීම තුළින් සමහරක් අවස්ථාවලදී මේ ජාතික මට්ටමට මේ ක්‍රීඩාව දියුණු කරන්න මුදල් ලැබිලා තිබෙනවා. සමහර වෙලාවට පුහුණු සංචිත පවත්වලා කටයුතු කරන්න මුදල් ලැබුණත් මේ ප්‍රාදේශීය මට්ටමේ තිබෙන සංගම්වලට නැත්නම් දිස්ත්‍රික් මට්ටමේ තිබෙන සංගම්වලට ඒ මුදල් ප්‍රතිපාදන ලැබෙන්නේ නැහැ. එහෙමත් නැත්නම් සහයෝගයක් ලබා දෙන්නේ නැහැ. ඒ නිසා ග්‍රාමීය මට්ටමේ තිබෙන ක්‍රීඩාව -විශේෂයෙන්ම අපි මේ කථා කරන ප්‍රසිද්ධ ක්‍රීඩාවන්- පහත වැටෙන්න හේතු වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් ඉදිරි කාලයේදී මේ නියෝග තුළින් ක්‍රියාත්මක වන්න පුළුවන් වෙයි කියන බලාපොරොත්තුව තිබෙනවා.

මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අද ජාතික මට්ටමේ ජාතික කණ්ඩායම් නියෝජනය කිරීමට ක්‍රීඩා සමාජවලින් ඉඩ දෙන්නේ නැහැ.

ක්‍රීඩා සමාජවලින් කිව්වොත්, ජාතික මට්ටමේ, එහෙමත් නැත්නම් ජාතික කණ්ඩායම නියෝජනය කරන්න එපා කියලා ඒ ක්‍රීඩකයා අසරණ වෙනවා. ඒ ක්‍රීඩකයාට ක්‍රීඩා කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ පිළිබඳවත් සලකා බලා අපේ ගරු ඇමතිතුමා ඉදිරි කාලයේදී කටයුතු කරයි කියා අප බලාපොරොත්තු වනවා.

34වන නියෝගය යටතේ, නිලධාරි මඩුල්ලක් පත් කිරීමෙන් පසුව මාස දෙකක කාලයක් ඇතුළත ක්‍රීඩා සංවර්ධන සැලැස්මක් ක්‍රීඩා අමාත්‍යාංශයට ලබා දිය යුතුයි. ඒකත් ඉතාමත් වැදගත් නියෝගයක්. වසර දෙකක කාලයක් ක්‍රීඩා සංගම්වලට ලබා දෙනවා නම්, මා හිතනවා තරගාවලි පවත්වනවා විතරක් නොවෙයි, ක්‍රීඩා සංවර්ධනය සඳහා සැලැස්මක් ඇති කරලා, සංචිත පවත්වා ගෙන, පුහුණු පාඨමාලා පැවැත් වුවහොත් තමයි අපේ ග්‍රාමීය මට්ටමේ තිබෙන ක්‍රීඩාව දියුණු කරන්න හැකියාව ලැබෙන්නේ කියලා. ඒ නිසා ඒකත් ඉතාම වැදගත් නියෝගයක්.

ගරු ඇමතිතුමනි, 8, 9, 10 නියෝග යටතේ, පාසල් සංගම් සහ ජාතික සංගම් අතර සම්බන්ධතාවක් ඇති කිරීමට ඔබතුමා කටයුතු කර තිබෙනවා. ඒක ඉතාමත් වැදගත්. මොකද, ජාතික මට්ටමේ සංගම් සහ පාසල් සංගම් අතර හුහක් අවස්ථාවල ගැටුම් ඇති කර තිබෙනවා. විශේෂයෙන්ම අප තේරුම් ගන්න ඕනෑ ක්‍රීඩාව ආරම්භ වන්නේ දරුවාගේ පාසල් කාලයේදී. ඒ නිසා පාසලේ සංගමය සමඟත්, ජාතික මට්ටමේ සංගමය සමඟත් සම්බන්ධතාවක් ඇති කිරීම ඉතාමත් වැදගත් කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කායික හා මානසික සමබරතාවයෙන් යුතු නිරෝගි පරපුරක් බිහි කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් අන්තර් අමාත්‍යාංශ සම්බන්ධතාව පිහිටුවීමේ වැඩ පිළිවෙළ අනුව අද ක්‍රීඩා

[ගරු කනක හේරත් මහතා]

අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය තුළින් ඒකාබද්ධ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා, වැඩසටහනක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වැඩසටහන තුළින් අද සෑම ශිෂ්‍යයෙකුම ක්‍රීඩාවකට අනිවාර්යයෙන්ම යොමු කිරීමට කටයුතු කර තිබෙනවා. ඒක ඉතාමත් වැදගත් කාරණයක්. අපි දන්නවා අපේ තිබෙන තරගකාරී විභාග තමයි උසස් පෙළ හා සාමාන්‍ය පෙළ. ඒ විභාගවලට පෙනී සිටින කාලයේදී අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ක්‍රීඩාවෙන් තරමක් බැහැර වෙලා අධ්‍යාපනය පිළිබඳව විතරක් කටයුතු කරනවා. එමඟින් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අපේ රටට අහිමි වන අවස්ථා තිබෙනවා. ඒ නිසා ඒකත් ඉතාමත් වැදගත් කාරණයක්.

සෑම වර්ෂයකදීම, සෑම ශිෂ්‍යයෙකුටම ශාරීරික යෝග්‍යතා වාර්තාවක් ලබා ගන්න යෝජනා කර තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා පසු ගිය කාලයේදී ඒ කාරණය දැනුම් දුන්නා. ඒකත් වැදගත් කාරණයක්. මොකද, පසු ගිය සතියේදී අරණායක ප්‍රදේශයේ උස්සාපිටිය රිවිසඳ විද්‍යාලයේ දියණියක් මිය ගියා මීටර් 5,000 දිවීමේ තරගයට සහභාගි වෙලා. මෙවැනි වාර්තාවක් ලබා ගෙන තිබුණා නම්, ඒ දියණියට මිය යන්න සිදු වන්නේ නැහැ. මොකද, ඒ වාර්තාවෙන් තමන්ගේ ශරීර සෞඛ්‍ය පිළිබඳව දැනුවත් වන නිසා. ඒ නිසා අපි හිතනවා ඉදිරි කාලයේදී සෑම පාසලකම, සෑම වර්ෂයකදීම මෙවැනි යෝග්‍යතා වාර්තාවක් ලබා ගන්න කටයුතු කරයි කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් පසුව සියලුම දරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යොමු කරලා, ඔවුන්ව සුදුසු ක්‍රීඩාවකට යොමු කිරීමත් ඉතාමත් වැදගත් කාරණයක් හැටියට මා මේ අවස්ථාවේදී සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අතිගරු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම යටතේ මහින්ද චින්තන ඉදිරි දැක්ම ක්‍රියාත්මක කරමින් ක්‍රීඩාවේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කටයුතු කර තිබෙනවා. ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් ඇති කිරීමට අද කටයුතු කරලා, ඒ තුළින් ක්‍රීඩා ක්ෂේත්‍රයේ විධිමත් සංවර්ධනයක්, ජාතික ක්‍රීඩා සංස්කෘතියක් බිහි කරන්න, ක්‍රීඩා ආර්ථිකයක් බිහි කරන්න, දක්ෂ ක්‍රීඩකයන් ග්‍රාමීය මට්ටමෙන් හඳුනා ගන්න අවස්ථාව සලසා තිබෙනවා. විශේෂයෙන්ම අපි ස්තුතිවන්ත වනවා ගරු ඇමතිතුමාට අද පළාත් මට්ටමෙන්, දිස්ත්‍රික් මට්ටමෙන්, ඒ වාගේම ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රීඩා සංකීර්ණ, ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමට කටයුතු කිරීම සම්බන්ධව. අද ඒවා ගමට ගිහිල්ලා තිබෙනවා. ප්‍රසිද්ධ ක්‍රීඩා පමණක් නොවෙයි, සෑම ක්‍රීඩාවක්ම අද ගමට ගිහිල්ලා, සෑම ක්‍රීඩාවක්ම ප්‍රචලිත කිරීම සඳහා කටයුතු කර තිබෙනවා. ඒක ඉතාමත් වැදගත් කාරණයක්.

උතුරු නැඟෙනහිර පළාත්වල වසර තිහක පමණ කාලයක් යුද්ධය පැවතුණු නිසා ඒ ප්‍රදේශවල ක්‍රීඩාව අඩාල වෙලා තිබුණා. අද ක්‍රිකට් ක්‍රීඩාව වේවා, පා පන්දු ක්‍රීඩාව වේවා, ඒ සියල්ලක්ම ප්‍රචලිත කිරීම සඳහා ඒ ප්‍රදේශවල ක්‍රීඩාංගණ සංවර්ධනය කරනවා. අද උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ඉන්නා තරුණ තරුණියන්ට ඒ අවස්ථාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ක්‍රීඩා වෛද්‍ය ආයතනය ශක්තිමත් කිරීම තුළින් එහි ප්‍රධානත්වය දරන මහාචාර්ය අර්ජුන ද සිල්වාගේ නායකත්වයෙන් විශාල වැඩ කොටසක් කරනවා. ඒක ඉතාම වැදගත්. විශේෂයෙන්ම තහනම් උත්තේජක භාවිතා කිරීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා කටයුතු කිරීම ඉතාමත් වැදගත් කාරණයක් හැටියට දකිනවා. දක්ෂ අමාත්‍යාවරයෙක්, කාර්යක්ෂම අමාත්‍යාවරයෙක් යටතේ තිබෙන ක්‍රීඩා අමාත්‍යාංශය තුළ විශාල වැඩ කොටසක් මේ කාලය තුළදී ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ පනවපු නියෝග තුළින් අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වන ඒ ජාත්‍යන්තර ජයග්‍රහණ ලබන්නට අපේ ක්‍රීඩක, ක්‍රීඩිකාවන්ට හැකියාව ලැබෙවාය කියා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි. මී ළඟට ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය.

[අ.භා. 5.37]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රථමයෙන්ම ක්‍රීඩා අමාත්‍යතුමන්ට ස්තුතිවන්ත වෙනවා, ක්‍රීඩාව සම්බන්ධයෙන් 1973 අංක 25 දරන පනතට නව නියෝග මාලාවක් ගෙනැල්ලා ක්‍රීඩාව විධිමත් කරන්නට කටයුතු කිරීම සම්බන්ධයෙන්. ඒ වාගේම මේ නියෝග මඟින් විශේෂයෙන්ම යම් යම් නීති පැනවීමක් සිදු කරලා තිබෙන බව අපට පෙනෙනවා.

විශේෂයෙන්ම මේ නියෝග පැනවීම තුළින් ජාතික සංගම්වල තනතුරු දැරීමේදී ඒ ඒ පුද්ගලයන් සතු සුදුසුකම් වාගේම මුදල් පරිහරණය, කළමනාකාරිත්වයේදී අනුගමනය කළ යුතු විනිවිදභාවයන් ගැන සලකා බලා තිබෙනවා. ඒ වාගේම ක්‍රීඩාවේ නියැළී ඇති පළපුරුදු දක්ෂ පුද්ගලයන් පක්ෂග්‍රාහිත්වයකින් තොරව, ජාති, ආගම්, පක්ෂ භේදවලින් තොරව නිලතලවලට පත් කිරීමට මේ නියෝග මඟින් අවස්ථාව ලැබෙනවා. විශේෂයෙන්ම සහජ හැකියාවන් තිබෙන ගමෙන් ගමන ආරම්භ කරන ඒ තරුණ තරුණියන්ටත්, -ඒ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ටත්- අපේ රටටත් අද දින පනවන්නට බලාපොරොත්තු වන මේ නියෝග මඟින් යහපතක් වේවිය කියන දැඩි විශ්වාසයක් මා තුළ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඒ ක්‍රීඩා සංවිතයන්ට තෝරා ගැනීම සම්බන්ධයෙන් මෙහිදී විශේෂයෙන් සාකච්ඡා කෙරෙනවා. සමහර විට මේ ක්‍රීඩාව ගැන විවිධ විවේචන, දෝෂාරෝපණ පවතින අවස්ථා තිබෙනවා. ඒවා යම් තරමකට හෝ අඩු වෙලා සාධාරණ තේරීමක් ඇතුව සුදුසු අයට ඒ සුදුසු තැන ලැබිලා අපේ රටේ ක්‍රීඩාව ඉහළට නංවන්නට අද පනවන්නට යෙදෙන නියෝග මාලාවන් හේතු වේවිය කියන දැඩි අධිෂ්ඨානයෙන් යුතුවයි මම අද මේ විවාදයට සම්බන්ධ වෙන්නේ. ක්‍රීඩාව ගැන කථා කරද්දී, ගමේදී අපි සාමාන්‍යයෙන් පවත්වන කඹ ඇදීමේ ඉඳන් සුපිරි ක්‍රීඩාවක් විධියට සලකන ක්‍රිකට් ක්‍රීඩාව දක්වා වූ සියලුම ක්‍රීඩාවන් ක්‍රීඩා ගණයට වැටෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජාතික ක්‍රීඩාව තමයි වොලිබෝල් ක්‍රීඩාව. ජාතික වොලිබෝල් සංගමයේ සභාපතිතුමා ඉන්නවා. අපි ජාතියක් විධියට අපේ වොලිබෝල් ක්‍රීඩාවත් ජාතික තලයට ගෙනෙන්න කටයුතු කරන්න අවශ්‍යයි. ක්‍රිකට් ක්‍රීඩාව නිසා අපේ රටට ආඩම්බරයක්, අභිමානයක් ඇතිවෙලා තිබෙනවා වාගේම අපේ රට ලෝකයට ගෙන යන්නටත් එය මාර්ගයක්

වෙලා තිබෙනවා. ඒ වාගේම අපි ජාතියක් විධියට වොලිබෝල් ක්‍රීඩාවත් ඉදිරියට ගෙන එන්නට කටයුතු කළ යුතුයි කියන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ හැම ක්‍රීඩාවකටම උසස් මට්ටමකින් පුහුණුව ලබා දීමෙන් නුදුරු අනාගතයේදී අපගේ ජාතික ක්‍රීඩාව වාගේම අනිකුත් ක්‍රීඩාවනුත් ඉහළ නංවන්නට හැකියාවක් ලැබෙනවා.

අපේ රටේ ගමක් ගත්තොත් යම් කිසි පිරිසක් විතරයි ක්‍රීඩාවල යෙදෙන්නේ. නමුත් අපේ රටේ තිබෙන සියලු ක්‍රීඩා ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා කටයුතු කරන්නට අපේ රජයට අවස්ථාව ලැබුණොත් හැම කෙනකුම ක්‍රීඩා කරන පුද්ගලයන් බවට පත් වෙයි කියා මා හිතනවා. හැම කෙනකුම ක්‍රීඩා කරන පුද්ගලයන් බවට පත් වුණොත් අපේ ශ්‍රී ලාංකීය ජාතිය මීට වඩා ශක්තිමත්, නිරෝගිමත් ජාතියක් වනවා දකින්න අපට පුළුවන් වනවා. ග්‍රාමීය, නාගරික හැම කොටසක්ම නියෝජනය කරන විධියට ක්‍රීඩාව උසස් තලයකට ගෙන එන්නට කටයුතු කරන්නට හැකියාව අපේ ගරු අමාත්‍යතුමන්ට තිබෙන බවත් විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. ඒ වාගේම පාසල් මට්ටමේ, ප්‍රාදේශීය මට්ටමේ, ජාතික මට්ටමේ සංචිත අතර සම්බන්ධතාව ඇති කිරීම ක්‍රීඩාවේ දියුණුව සඳහා ඉතා වැදගත් කටයුත්තක් විධියටයි මා සලකන්නේ.

1996 අවුරුද්දේ ක්‍රිකට් ලෝක කුසලානය අපේ රට දිනා ගත්තා. ඒ නිසා අපේ රට ජාත්‍යන්තර වශයෙන් විශාල කීර්තියකට පත් වුණා. අපට හැම දාමත් ඒ පිළිබඳව අභිමානයෙන් කථා කරන්නට, එය අභිමානයෙන් සමරන්නට හැකි වෙලා තිබෙනවා. එදා 1996 අවුරුද්දේ හිටපු ක්‍රිකට් නායක අර්ජුන රණතුංග, ඒ වාගේම සනත් ජයසූරිය, ක්‍රිකට් පරිපාලනය සම්බන්ධයෙන් කටයුතු කළ තිලංග සුමතිපාල යන මැතිතුමන්ලා අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වශයෙන් සිටීම ගැන අපි සතුටු වනවා. මේ ක්‍රීඩාව දියුණු කරන්නට අවශ්‍ය සම්පත් විශාල ප්‍රමාණයක් අපි ළඟ තිබෙනවා. ක්‍රීඩාව වෙනුවෙන් අපේ රජයෙන් කෙරෙන්න ඕනෑ කටයුත්ත ඉටු කිරීමේදී ඒ සියලු දෙනාගේම අදහස් හා යෝජනා ලබා ගෙන ක්‍රීඩාව පිළිබඳව ඉතාමත් හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්නට හැකියාව ලැබෙනවාය කියන කරුණ මා සඳහන් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාට මා ස්තුති කරන්න ඕනෑ, එතුමාගේ මැදිහත් වීමෙන් පසු ගිය දා අම්පාර ඩී.එස්. සේනානායක ජාතික පාසලට පිහිනුම් තටාකයක් ලබා දීම ගැන. එය මා ඉගෙන ගත් පාසලයි. ඒ වාගේම මා මේ අවස්ථාවේදී එක ඉල්ලීමක් කරන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, මේ වන කොට අම්පාර දිස්ත්‍රික්කයට දිස්ත්‍රික් ක්‍රීඩාංගණයක් අනුමත වෙලා තිබෙනවා. ඒ සඳහා මුදල් වෙන් වෙලා තිබෙනවා. යම් යම් ගැටලුකාරී තත්ත්වයන් තිබෙන්නට පුළුවන්. මොන ගැටලුව තිබුණත් ඔබතුමාට එය විසඳන්නට පුළුවන්. අම්පාර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මෙම කටයුත්ත ඉක්මනින් ඉටු කර දෙන්නට අපි මැදිහත් විය යුතු වනවා. අපේ ඉල්ලීම එයයි. හැකි ඉක්මනින් ක්‍රීඩාංගණයේ වැඩ කටයුතු ආරම්භ කරන්නට කටයුතු කරන්න. එහෙම නැත්නම් දේශපාලනය කරන අපි වග කියන්නට ඕනෑ. එම නිසා ගරු අමාත්‍යතුමනි, ඒ කටයුත්තක් ඉක්මනින් ඉටු කර දෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු රෝහණ දිසානායක නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 5.45]

ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග සම්බන්ධයෙන් විවාදය පැවැත්වෙන මේ වෙලාවේ මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා ඉතාම සතුටු වනවා.

විශේෂයෙන්ම ඉතාම ප්‍රායෝගික ජනාධිපතිතුමකු වශයෙන් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා "මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුළින් මේ රටේ ක්‍රීඩාව සංවර්ධනය කරන්න නායකත්වය දෙන වෙලාවේ මහින්දානන්ද අලුත්ගමගේ අපේ ක්‍රීඩා ඇමතිතුමා ඉතාම දක්ෂ ආකාරයෙන් වග කීමක් ඇතුව අවුරුදු 40කට පස්සේ - දශක 4කට පමණ පස්සේ- රටට, කාලයට, ලෝකයට උචිත ලෙස මේ ක්‍රීඩා නියෝග ගෙන ඒම ඉතා වැදගත් කාරණයක් ලෙස මා සලකනවා. ක්‍රීඩා ඇමතිතුමා රටේ පවතින ක්‍රීඩා තත්ත්වයත්, වටපිටාවත් ගැන හොඳ අවබෝධයක් ඇතිව ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න කටයුතු කරන ආකාරය පිළිබඳවත් අප සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මම නියෝජනය කරන මාතලේ දිස්ත්‍රික්කය හොකී ක්‍රීඩාවේ තොට්ටිල්ල - "Cradle of Hockey" in Sri Lanka - වශයෙන් තමයි හඳුන්වන්නේ. හොකී ක්‍රීඩාව ආරම්භ වුණේ 1930 දීයි. අද මේ රටට, ලෝකයට හොකී ක්‍රීඩකයෝ සපයන - supply කරන - පුරවරයක් බවට අපේ පුරවරය පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ගැන අපට ආඩම්බරයක් තිබෙනවා. ඒ වාගේම ගරු ඇමතිතුමා ගෙන එන මේ නියෝග තුළින් ඉදිරි කාලයේදී ක්‍රිකට්, මලල ක්‍රීඩාව, පා පන්දු, අත් පන්දු, ඒ වාගේම ගෘහස්ථ ක්‍රීඩා, badminton, table tennis යන ක්‍රීඩාවල වෙනසක් දකින්න පුළුවන් කියන විශ්වාසයක් අපට තිබෙනවා.

දවසෙන් දවස අපේ රටට ලැබෙන පදක්කම් වැඩි කර ගැනීමට අපට අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා ජයග්‍රහණ ලබා ගන්න ඕනෑ. ඒ වාගේම හොඳ මානසික සහ ශාරීරික සමබරතාවකින් යුක්ත හොඳ පුරවැසියන් පිරිසක් අපේ රටට අවශ්‍ය වෙලා තිබෙනවා; සෞඛ්‍ය සම්පන්න පිරිසක් අපට අවශ්‍ය වෙලා තිබෙනවා; අභියෝග ජය ගන්නා පිරිසක් වශයෙන් අපට මේ ජයග්‍රහණ හඹා යන්න අවශ්‍ය වෙලා තිබෙනවා. මේ සියලු කටයුතු සම්පූර්ණ කර ගෙන, එකට කැටි කර ගෙන මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා මේ නියෝග ඉදිරිපත් කිරීම යුගයේ අවශ්‍යතාවක් ඉටු කිරීමක් හැටියට මා දකිනවා.

මම මේ රටේ ප්‍රධාන ක්‍රීඩා සංගම් දෙකක හිටපු සභාපතිවරයෙක්. මම ශ්‍රී ලංකා හොකී සංගමයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළා. ඒ වාගේම මේස පන්දු සංගමයේ සභාපතිවරයා වශයෙනුත් මම කටයුතු කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කර තිබෙන මේ නියෝග නිසා මෙතෙක් යම් යම් තැන්වල තිබුණු අකටයුතුකම්, ඒ වාගේම දුර්වල තැන් අකාමකා ගෙන වග කීමක් ඇතිව මේ සංගම් ඉදිරියට ගෙන යන්න පුළුවන්කම ලැබෙනවා. මේ සංගම් පවත්වා

[ගරු රෝහණ දිසානායක මහතා]

ගෙන යාමේ නිල කාලය අවුරුද්දක් නිසා ඒ සංගම් ආරම්භ කරලා මාස කීපයක් යනකොට -එහා පැත්ත බලා මෙහා පැත්ත බලන කොට- කාලය අවසන් වෙලා ගිහිල්ලා. කාලය දීර්ඝ කිරීම නිසා යම් කිසි ස්ථාවර තත්ත්වයකින් යුක්තව ඒ ක්‍රීඩා සංගම් මඟින් රටට හොඳ ප්‍රතිඵල ලබා දෙන්න අවස්ථාවක් ලැබී තිබෙනවා. ඒ වාගේම තමයි මේ නියෝග නිසා රහස් ඡන්දයක් පාවිච්චි කිරීමට අවස්ථාව සැලසෙන නිසා යම් කිසි බලපෑමකින් තොරව වඩාත් ප්‍රජාතන්ත්‍රවාදීව ඒ කටයුත්ත ක්‍රියාත්මක කරන්නත් අපට අවස්ථාව ලැබී තිබෙනවා. මේ රටේ ක්‍රීඩාවට අලුතෙන් එකතු වුණු ඉතාම වැදගත් අවස්ථා දෙකක් හැටියට අප එය දකිනවා.

පසු ගිය කාලයේ නිදහස් අධ්‍යාපනයත් එක්ක ක්‍රීඩා පාසල් ඇති වුණා. මාතලේ දිස්ත්‍රික්කයේ අකුරම්ගොඩ පාසල ක්‍රීඩා පාසලක් බවට පත් වෙලා තිබුණා. ඒ වාගේම මහනුවර දිස්ත්‍රික්කයේ වලල ජාතික මහා විද්‍යාලය වාගේ ක්‍රීඩා පාසල් ඒ කාලයේ තිබුණා. මේ ක්‍රීඩා පාසල් තුළ ක්‍රීඩා සංචිත ඇති කරලා, උදේ ඉඳලා රාත්‍රී වෙනකම් ක්‍රීඩකයෝ පුහුණු කරලා ක්‍රීඩාව පිළිබඳව මානසිකත්වයක් ධනාත්මකව ඇති කරලා පාසල තුළින් දරුවන් ක්‍රීඩාවට යොමු කිරීමේ කටයුත්ත ක්‍රියාත්මක කළ යුතුයි කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ක්‍රීඩා සංගමය, පාසල, ජාතික සංගම්, පළාත් සභාව, ප්‍රාදේශීය සභාව, රේඛීය අමාත්‍යාංශය කියන ආයතන ඔක්කොම එකට එක්කහු වෙලා වග කීමකින් යුතුව මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න කටයුතු කිරීම පිළිබඳවත් අප සතුටු වනවා. මේ වාගේ ධනාත්මක දේවල් තමයි අප එතැන දී දකින්නේ. ඒ වාගේම කොළවලට පමණක් සීමා වුණු සංගම් තිබෙනවා. "Paper Associations" කියලා අප ඒවා හඳුන්වනවා. අප දැකලා තිබෙනවා, ඒවායේ කිසිම ක්‍රීඩාවක් අවුරුද්දක් තිස්සේ කරන්නේ නැති බව. කවදාවත් ප්‍රතිඵල අරගෙන දී නැහැ. ඒවායේ කිසිම කෙනෙකු ක්‍රීඩාවට සම්බන්ධ වෙලා ප්‍රතිඵල අරගෙන දීලා, පදක්කමක් දිනලා, අඩු ගණනේ සහභාගිත්වයක්වත් - participation කියන එකවත්- ලබා දී නැහැ. හැබැයි එහෙම කරලා ජාතික නිලවරණයට ආවාම paper එක දාලා, ඡන්ද අයිතිය අරගෙන කෘත්‍රිම මිනිසුන් ටිකක් ඒ සංගම්වලට පත් කරපු අවස්ථාවන් ඉතිහාසයේ අප දකිනවා. මා හිතන්නේ මේ අලුත් නියෝග තුළින් කෘත්‍රිම කෙනෙකුට, ක්‍රීඩාව නොකරන කෙනෙකුට, ක්‍රීඩාව පිළිබඳ අවබෝධයක් නැති කෙනෙකුට, ක්‍රීඩාවට ආශීර්වාද නොකරන කෙනෙකුට අවස්ථාවක් හිමි වෙන්නේ නැහැ. ක්‍රීඩාවේ නියැළෙන, හසළ වුවමනාවක් සහ හැකියාවක් තිබෙන, සහජ දක්ෂතාවක් තිබෙන පිරිසක් තමයි මේ සංගම්වලට එන්නේ. ඒ නිසා paper associations කියන ඒවා මා හිතන්නේ මේ නියෝගත් එක්ක නැති වෙලා ගිහිල්ලා, අවංක පිරිසක් මේ ක්‍රීඩා සංගම්වල පරිපාලනයට පත් වෙයි කියලා අප හිතනවා. විශේෂයෙන් ඩිලාන් පෙරේරා ඇමතිතුමා වොලිබෝල් සංගමයේ සභාපති වශයෙන් පත් වුණාට පසුව ඉතාම වග කීමෙන් වොලිබෝල් ක්‍රීඩාව මේ රටේ නංවන්න කටයුතු කළා. මේ රටේ ජාතික ක්‍රීඩාව තමයි වොලිබෝල් ක්‍රීඩාව. මා හිතන හැටියට වොලිබෝල් ක්‍රීඩාව අතින් පිම්මක් ගණනාවක් අප උඩට ගිහිල්ලා තිබෙනවා. මේ වාගේ අවස්ථාවන්වල එවැනි සභාපතිවරු අවශ්‍යයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියකින් අවසන් කරන්න.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
මට විනාඩි දහයක් දුන්නා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි නවයක් වුණා, කාල වේලාව කළමනාකරණය කිරීම තුළ.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවත් එක්ක රටේ නිරෝගී පරපුරක් බිහි කිරීමේ දී ඇති වන නොයෙක් කරුණු කාරණා ගැන පක්ෂ විපක්ෂ දෙපැත්තෙන්ම අද කථා කළා. විපක්ෂයේ මන්ත්‍රීවරු පවා අද මේ නියෝගවල වැදගත්කම සහ මේ සංශෝධනවල වැදගත්කම අගය කරලා කථා කළා. විශේෂයෙන් ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණු ගැන අප මතක් කරන්න ඕනෑ. TEN Sports, NEO Cricket, Time Warner Sports වාගේ ආයතන ගණනාවක් ඒ යුගයේ තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප විදේශීය නාලිකා ඔස්සේ තමයි ලෝකයේ තිබෙන ක්‍රීඩා බැලුවේ. තාක්ෂණය - techniques - වාගේ දේවල් අප දැක්කේ විදේශීය නාලිකාවලින්. CSN නාලිකාව කියන්නේ දේශීය නාලිකාවක්. CSN නාලිකාව වාගේ දේශීය නාලිකාවක් මේ රටේ බිහි වෙලා ක්‍රිකට් ක්‍රීඩාව වාගේම අනිකුත් ක්‍රීඩා විකාශනය කරන කොට මා හිතන්නේ එහි වැදගත්කම අප දකින්න ඕනෑ කියලායි. එහි තිබෙන අඩුපාඩු ගැන නොවෙයි බලන්න ඕනෑ. එහි ගුණදොස් නොවෙයි අප කථා කරන්න ඕනෑ. ලංකාවේ පැවැත්වෙන ක්‍රීඩා, ලෝකයේ පැවැත්වෙන ක්‍රීඩා වාගේ දේවල් අපේ නාලිකා ඔස්සේ මේ රටට පමණක් නොවෙයි, ලෝකයටම විකාශනය කරනවා. දේශීය දේ අගය කරන්නත් මේ වෙලාවේ අප අවස්ථාවක් කර ගත්තොත් ඉතාම වටිනවා. මොකද TEN Sports, NEO Cricket වාගේ දේවල්-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා ගෙනාපු නියෝග ඡන්දයකින් තොරව අද අනුමත වීමම එතුමා ලද ජයග්‍රහණයක්; මේ රටේ සමස්ත ක්‍රීඩා ක්ෂේත්‍රය ලද ජයග්‍රහණයක්; මහින්ද චින්තනයෙන් ක්‍රීඩාව ලද ජයග්‍රහණයක්. සමස්ත නිරෝගී පරපුරක් බලාපොරොත්තු වන ජයග්‍රහණ හඹා යන අප වාගේ රටකට ලොකු ජයග්‍රහණයක් කියන එකත් මේ වෙලාවේ මතක් කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

[5.54 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Mr. Presiding Member, we are witnessing today the birth of a new era in sports. I must initially congratulate the Minster of Sports, the Hon. Mahindananda Aluthgamage, for the great strides he has made in so short a period in order to build up a healthy nation

through sports. Sir, the President, His Excellency Mahinda Rajapaksa, will go down in history not only as a great leader of a nation, but also as a great captain who dealt a terrible blow to Prabhakaran and won the match at Nanthikadal.

Sir, as far as sports is concerned, this is what the "Mahinda Chintana - Vision for the Future" states.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. JANAKA BANDARA *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Deputy Speaker, this is what the "Mahinda Chintana - Vision for the Future" states on sports, I quote:

"Sports are not confined to the energetic youth but encompass the young and the old. Fitness, mental development and a team spirit are interconnected with sports and I believe that the development of sports is an essential investment for the future. Therefore I will strengthen sports to ensure the balanced development of all citizens."

This is the pledge the President has given to the nation and he is implementing those proposals contained in the "Mahinda Chintana - Vision for the Future".

Sir, if we are to make Sri Lanka a leading country in sports, it is imperative for us to be a healthy, disciplined, united, prosperous and a proud nation in our mission. Accordingly, the Hon. Minister of Sports, the Hon. Mahindananda Aluthgamage, has become the first-ever Minister in the history of sports who has enforced the Sports Association Orders in a more practical way. In this regard, my respect and thanks are due to him.

Also, I recall the name of the Hon. K.B. Ratnayake, who was the first Minister of Sports in this country. In 1975, I remember, with a vivid memory, watching the first Limited Overs World Cup held at the Kennington Oval in London. The Hon. K.B. Ratnayake came at that time accompanied by the then Speaker of Parliament, the Hon. Stanley Tillekeratne. They were returning after attending a Commonwealth parley at the Isle of Man.

Sir, I think it is very essential that all these things are done in the proper way. As far as cricket is concerned, I must recall that about 30 to 40 years ago, a very high standard was maintained. There was not much competition among schools at that time. Then, there were good coaches, masters of the game. The coaches of these days want to win by hook or crook. But, in those days, they always looked at the child, whether he had got the talent and also they ensured discipline in children at that time.

Then, I recall one of the prolific writers of today contributing useful articles to the local newspapers and one of our early Nalandian players, Mr. Premasara Epasinghe. He also writes on various other subjects like Buddhism, archaeology, education and business management. Those are very educative and informative.

When he was playing for the Nalanda College at that time, the Hon. Gamini Jayawickrama Perera played the role of fast bowler, and Epasinghe recalled that he was in the mould of Chaminda Vaas or even better at that time. He established a record by taking five wickets for 55 runs. "Epa" took two catches off his bowling.

Sir, there had been several able coaches and I do not want to quote all the names. But, one name that comes to my mind at this moment is B.J.H. Bahar, who established the First Indoor Cricket at Zahira College, Colombo.

Then, in 1969, I think Epasinghe selected a team to go to India, which consisted of players like Mithra Wettimuny, Ajith de Silva, Bandula Warnapura, Lalith Kaluperuma, Tony Opatha and various others. I am happy, Sir, that Bandula Warnapura, although he dented his name by taking part in the South African Tournament, Kerry Packer's, together with Tony Opatha, had come back to help develop cricket in this country.

I must also congratulate the new Chairman of the Selection Committee, our Colleague, the Hon. Sanath Jayasuriya, the "crackerjacker" in world cricket. He is doing a very good job. He intervened at the correct time and saved a very big catastrophe from befalling cricket. The senior players refused to sign the contract. Sanath convinced them to sign it and now, they are playing as a team. Otherwise, what would have happened is, against Bangladesh, we would have to field a "B" team. Today, Bangladesh is an upcoming cricketing nation. At the first preliminary match they played at the Sanath Jayasuriya Playground in Matara, 400 odd runs were scored by the Sri Lankan Team and Bangladesh overtook that score. So, we have to be very careful in these matters.

While speaking about cricket, one name that we cannot forget is Tony Greig, who had done a great job. Tony Greig and, I think, Epasinghe had the distinction of commentating on the World Cup Finals in 1996 played at the Gaddafi Stadium, Lahore, Pakistan. While Tony was describing on television the win hit of Sri Lanka, when Arjuna Ranatunga glided McGrath through the vacant

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

slip position, "Epa" described it to Sri Lanka over the airwaves of the SLBC, which are unforgettable memories for the two of us.

Then, Sir, I must also pay tribute to the SLBC or the then Radio Ceylon, as it was called earlier. රටට ක්‍රිකට් ගෙන ගියේ Radio Ceylon එක කියන එක ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති හඩසන් සමරසිංහ මැතිතුමා එදා "දස දෙස" වැඩසටහනින් අපට මතක් කළා. එපමණක් නොවෙයි. අපේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව තමයි දෙමළ භාෂාවෙන් දවස පුරා සජීවී ක්‍රිකට් විස්තර විචාරය - live cricket commentaries - මගේ පුරෝගාමීත්වයෙන් එතුමා ආරම්භ කළේ. ක්‍රිකට් වෙනුවෙන් කරන සේවාවට හඩසන් සමරසිංහ මැතිතුමාටත් අපි අපේ ප්‍රණාමය මෙම සභාවේදී පුද කරනවා.

ඒ එක්කම, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, M.S.M. Bilal won the Colombo Billiards Championship at the Moors' Sports Club only last week well organized by former MP, Shafeek Rajabdeen, the President. The first World Champion that Sri Lanka produced was M.J.M. Lafir of the Moors' Islamic Cultural Home - MICH. I think we have to honour his name in a more positive way, which should not be forgotten.

Then, about putting up of a new stadium, I would kindly request the Hon. Minister to have the Stadium at Santhankerny -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, your time is up. You have to wind up now.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, give me one more minute.

Regarding the Santhankerny Stadium in Kalmunai, I moved a Motion earlier in this House to highlight that matter.

Then, an Hon. Member talked about the "මාමා, බෑනා" - D.S. de Silva and Suraj Dandeniya. But, the Hon. Arjuna Ranatunga himself played under D.S. de Silva. මාමලා බෑනලා ගැන කථා කරන කොට අයියා - මල්ලි ගැන කථා කරන්නේ නැත්තේ ඇයි කියලා අප අහනවා. What is sauce for the goose is sauce for the gander as well, it should be remembered.

At this moment, Sir, I must also pay a tribute to Mr. Anura Jayawickrama, Secretary to the Ministry, and the Director-General of Sports, Ms. Ranjani Jayakody for helping the Minister to "score" well. I wish the Hon. Minister of Sports all good luck in promoting all sports in this country!

[අ.භා. 6.03]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා ක්‍රීඩා පනතට නියෝග රැසක් ඉදිරිපත් කිරීම මඟින් අපේ ක්‍රීඩාවේ ප්‍රජාතන්ත්‍රීකරණය නිසි විධියට මෙහෙයවන්න එතුමා ලොකු උත්සාහයක් ගන්නා බව පෙනුණා. එතුමාගේ කථාවේදී එතුමා පැහැදිලි කළා, සමහර ආයතන නින්දගම් වාගේ, බල කඳවුරු වාගේ සමහර අයගේ ආධිපත්‍යයට යටත් කරගෙන තිබෙනවා; ඒ තත්ත්වය වෙනස් කරලා අප ඒවායෙහි ප්‍රජාතන්ත්‍රීකරණ ස්වරූපයක් ඇති නොකළොත් ක්‍රීඩාවේ උන්නතිය ගොඩ නැහෙන්නේ නැහැ කියලා. ප්‍රමාද වෙලා වුවත්, ගැඹුරින් අධ්‍යයනය කරලා මේ පනතට වැදගත් නියෝග ඉදිරිපත් කරමින් ක්‍රීඩාව මේ රටේ දියුණු නොදියුණු හැම තැනකටම එක සමානව ගෙන යන්න එතුමා දැරූ ප්‍රයත්නය අපි අගය කරන්න ඕනෑ. මා එතුමාට කියන්න කැමැතියි, ලොකු අභියෝග රැසක් එතුමාට තිබෙන බව. මා එහෙම කියන්න හේතුවක් තිබෙනවා. ක්‍රීඩාවට මෙසේ නීති රීති, නියෝග පනවන්න අවශ්‍ය නැහැ අපි අපේ සමාජය තුළ ක්‍රීඩාවේ ස්වයංවිනය ආරක්ෂා කරනවා නම්. අප මුල් කාලයේ ක්‍රීඩාව හඳුනාගත්තේ, ක්‍රීඩාව තුළින් විනය, ශික්ෂණය, පෞරුෂය, නීරෝගී බව, සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව ආදිය වර්ධනය වනවා කියලායි. එකී මූල ධර්ම ගැන අපි එදා කථා කළා. නමුත් මා කියන්න කැමැතියි අද ක්‍රීඩාවේ හැඩ තල ඊට වඩා වෙනස් වෙමින් තිබෙන බව. ක්‍රීඩාව මුදලාලිකරණය වෙමින් තිබෙනවා. ක්‍රීඩාව ආර්ථික ග්‍රහණයට යටත් වෙමින් තිබෙනවා. ක්‍රීඩාව කීර්තිය, ධනය, බලය සඳහා යොදාගෙන තිබෙනවා. මෙය තමයි ජාත්‍යන්තරවම අපට දකින්න තිබෙන දේ. ඒ නිසා ක්‍රීඩා ඇමතිවරයාට අද සිදු වී තිබෙනවා ක්‍රීඩා ක්ෂේත්‍රයේ තිබෙන මේ අභියෝග ජයග්‍රහණය කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් මාත් ඇතුළු අපි හැමකෙනෙක්ම දන්නා කාරණයක් තිබෙනවා. දැන් හැම ක්‍රීඩාවකටම ඒජන්තයෝ ඉන්නවා. හැම ක්‍රීඩාවක් පිටුපසම බුකිකාරයෝ ඉන්නවා. හැම ක්‍රීඩාවක් පිටුපසම ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදනය කරන සමාගම් ඉන්නවා. මේවායේ බලපෑම ඇත්ත වශයෙන්ම ජාත්‍යන්තරයි. එයත් ජාත්‍යන්තරකරණය වෙලා තිබෙනවා. ඒ නිසා ඒවායේ ග්‍රහණයෙන් ක්‍රීඩාව මුදාගෙන ක්‍රීඩාවේ තිබෙන හර ධර්ම, සාර්ථකත්වය, ඉදිරියට ගෙන යෑමේ වැදගත්කම අප තේරුම් ගත යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාට කියන්න කැමැතියි, අද ලෝකයේ ක්‍රීඩාව පර්යේෂණාත්මක පැත්තට යොමු කර තිබෙන බව. 1965 දී "සමාජ විද්‍යාව හා ක්‍රීඩාව" මැයෙන් ලෝකය තුළ පර්යේෂණ ආරම්භ කළා. අද හැම රටකම "ක්‍රීඩාව හා ප්‍රචණ්ඩත්වය", "ක්‍රීඩාව හා ගෝලීයකරණය", "ක්‍රීඩාව හා හැඟීම්", "ක්‍රීඩාවේ දේශපාලනීකරණය" ආදි සියල්ල පිළිබඳ පර්යේෂණාත්මක පැතිවලින් අවධානය යොමු කර තිබෙනවා. ඊට හේතුව, ක්‍රීඩාව අද සමාජ පුරුෂාර්ථ වැට කඩුලු ගලවාගෙන, මූල්‍ය ආධිපත්‍යයට යට වෙමින්, ඒ හර ධර්ම විනාශ කරමින් යන තත්ත්වයකට පත්ව තිබීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා පිටිය තමයි සාමූහිකත්වයේ, ප්‍රබලත්වයේ, සංහිඳියාවේ, මිත්‍රත්වයේ, එක්සත්කමේ, සාමයේ තෝතැන්න. ඒ නිසා මේ සමාජ ප්‍රශ්නවලට විවිධ පැතිවලින් උත්තර දෙන්න ක්‍රීඩාව නිසි මහට යොමු කිරීමේ වැදගත්කමක් තිබෙනවා. රටක සංවර්ධනය මනින කොට ආර්ථික වර්ධනය පමණක් නොව මානව සම්පත් සංවර්ධනයත් දර්ශකයක්

හැටියට ගන්නවා. ඒ නිසා අප නීරෝගී පරපුරක් බිහි කරනවා වාගේම, යහපත් සිතුම් පැතුම් ඇති රටක් වෙනුවෙන් පෙනී සිටින, පෞද්ගලික අභිමතාර්ථ පරාජය කරමින් සාමූහික ප්‍රයත්න ඉස්සරහට ගෙන යන ජාතියක්, ජනතාවක් ගොඩ නහන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මා විශ්වාස කරනවා, සාමය හා සංහිඳියාව වෙනුවෙන් ක්‍රීඩාව පාවිච්චි කරන්න පුළුවන් කියලා. ක්‍රීඩා පිටියේ දී අපට ජාති, කුල, ආගම්, ඇති නැති පරතර නැහැ. අපි ඔක්කොම එකයි. මා ගරු ඇමතිතුමාට ප්‍රශංසා කරනවා, එතුමා පසු ගිය දවස්වල ගත් උත්සාහයට. උතුරු නැඟෙනහිර යුද්ධයේ දී මේ්ටාර් අතට ගත්, බිම් බෝම්බ අටවපු තරුණයන් 180ක් එතුමා කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයට ගෙන්වලා, ජාතික පුහුණු සංචිතයට එකතු කළා. ඉලක්කයට වෙඩි තබන තරුණයන් තුන් දෙනෙක් ජාත්‍යන්තර තරග සඳහා එතුමා පුහුණු කළා. ක්‍රිකට් ක්‍රීඩකයෝ, ඒ වාගේම කරාටේ ක්‍රීඩකයෝ පුහුණු කළා. මේක තමයි අපට අවශ්‍ය. ගරු සනත් ජයසූරිය මන්ත්‍රීතුමා වැදගත් කථාවක් කිව්වා. එතුමා කිව්වා, අපි උතුරු නැඟෙනහිර ක්‍රීඩා සමාජ වර්ධනය කරලා, ක්‍රීඩාව උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම තුළින් සහ විද්‍යාත්මක ප්‍රවේශ ඇති කිරීම තුළින් අප අතර තිබෙන වෙනස, පරතරය, අපේ ඔළුවේ ගොඩනැඟී තිබෙන ජාතිවාදී අදහස් පරාජය කරන්නට පුළුවන් කියලා. මා එතුමාගේ අදහසට ගරු කරනවා. ඒක අපට අවශ්‍යයි. මේ අවධියේ අපි ඒ වෙනුවෙන් ක්‍රීඩාව පාවිච්චි කරන්නට ඕනෑය කියලා මා හිතනවා. සාමය හා සංහිඳියාව තහවුරු කරන්න නම් ක්‍රීඩාව පාවිච්චි කරන්න ඕනෑ. ඒ සඳහා සමාජය පෙළ ගැස්වීම අරමුණු කර ගනිමින් ක්‍රීඩාවේ පුරුෂාර්ථ මත අපි එක රටක, එක පුරවැසියන් ලෙස ක්‍රීඩා පිටියේ පෙනී සිටින්න පුළුවන් ගුණය ලෝකයට පෙන්වන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් එයට බාධා කරන අභියෝග තිබෙනවා කියලා මම කිව්වා. ක්‍රීඩාව මුදලාලිකරණය වීම, ධනය පසුපස හඹා යන මානසිකත්වයක් ගොඩනැඟීම යන මේවා තුළ අප බලාපොරොත්තු වන පුරුෂාර්ථ බිඳ දැමෙමින් තිබෙනවා. එවැනි වෙලාවක ඒ සියලු සාර ධර්ම ආරක්ෂා කරගෙන අද දින ක්‍රීඩා පනත යටතේ නියෝග ඉදිරිපත් කරමින්, ක්‍රීඩාව ප්‍රජාතන්ත්‍රීකරණය කරන්නට, ක්‍රීඩාවේ උන්නතිය දියුණු කරන්නට ගන්නා පියවර ගැන ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා. ඉදිරියේ දීත් එතුමා හමුවේ මතුවන සියලු අභියෝග පරාජය කරන්න ධෛර්ය හා ශක්තිය එතුමාට ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ ක්‍රියාවේ දී එතුමා සමඟ අපිත් කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 6.10]

ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)

(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)

(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා පනත යටතේ ගෙනෙන නියෝග සම්බන්ධයෙන් වන දින දෙකක විවාදය ක්‍රීඩා ඇමතිතුමා වෙනුවෙන් මා අවසන් කරන්නේ ඉතාම සතුටින්. අමාත්‍යවරයකු වන මා අධීක්ෂණය කරන මගේ නායකයා අතිගරු ජනාධිපතිතුමා වුණත්, මාත්, ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමාත් ක්‍රීඩා සංගම්වල සභාපතිවරුන් හැටියට අපගේ නායකයා වන්නේ මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමායි. එතුමා තමයි අපේ "බොස්." මේ විවාදය අවසන් කරන්න කියලා ක්‍රීඩා ඇමතිතුමා හැටියට එතුමා මගෙන් ඉල්ලීමක් කළාම - මට නියෝගයක් කළාම - මා එය පිළිපැදිය යුතුව තිබෙනවා. මා ඉතාම සතුටින් තමයි එය කරන්නේ.

දවස් දෙකක් තිස්සේ ක්‍රීඩා පනත යටතේ ගෙන ආ නියෝග පිළිබඳව විවාද කළා. ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාගේ මහ පෙන්වීම යටතේ, අපේ ක්‍රීඩා සභාවේ ගරු සභාපති වෛද්‍ය මහියා ගුණසේකර මැතිතුමා, නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද මැතිතුමා, අපි ඕනෑම අවස්ථාවක ක්‍රීඩා සංගමයට ගියාම අපට උදවු උපකාර කරන රංජනී ජයකොඩි අධ්‍යක්ෂ ජනරාල් තුමිය, ක්‍රීඩා අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම් ශාන්ත වීරසිංහ මැතිතුමා, සුගතදාස ක්‍රීඩාංගණයේ සභාපති බ්‍රිගේඩියර් ප්‍රියන්ත සමරතුංග මැතිතුමා, සුරේෂ් රත්නසිංහම් මහතා, ඒ ප්‍රේමචන්ද්‍ර මහතා, මහාචාර්ය අර්ජුන ද සිල්වා මැතිතුමා, ක්‍රීඩා වෛද්‍ය ඒකකයට මහා විප්ලවීය වෙනසක් ගෙනාපු අපේ ආදරණීය මිත්‍ර වෛද්‍ය තුරෙයිරාජා මැතිතුමා, පී.ඒ. අබේරත්න මැතිතුමා, හිටපු පොලිස්පති ජයන්ත වික්‍රමරත්න මැතිතුමා යන සියලු දෙනාගේම සාමූහික ප්‍රයත්නයකින් පසුව තමයි, ගරු සී.බී. රත්නායක ඇමතිතුමාගේ කාලයේ, ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමාගේ කාලයේ සාකච්ඡා ආරම්භ වෙලා තිබුණු මේ නියෝග අද දින ගරු ඇමතිතුමා විසින් මහ පොළොවේ යථාර්ථයක් බවට පරිවර්තනය කරන්නේ.

මේ විවාදය පුරාම මට දැනුණේ, වැඩියෙන් කියවුණේ, මේ නියෝග හොඳයි කියන එකයි. මේ ගැන නොහොඳ කියපු කට්ටියක් ඒ කාරණය කිව්වේ මේක හොඳයි කියලා දැනගෙන, විරුද්ධ පක්ෂය හැටියට මේවාට විරුද්ධ වුණේ නැතිනම් ඒ විරුද්ධ පක්ෂය නොවේය කියන තැන ඉඳගෙනයි. කාලයකට පසුව අපට පෙනෙනවා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225 දෙනාම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එකඟ වන, එකමුතුව සම්මත කරන නියෝග බවට මේ නියෝග පත්වෙලා තිබෙනව බව.

ක්‍රීඩාවෙන් සහ කලාවෙන් තමයි ජාති, කුල, ආගම් භේද පැත්තකට දමලා අපේ රට එකමුතු කරන්න පුළුවන් වන්නේ. ජාති, කුල, ආගම් භේද පැත්තකට දමලා, දේශපාලන පක්ෂ භේදත් පැත්තකට දමලා මුළු පාර්ලිමේන්තුවම එක මතයකට ගෙන එන්නට අද ගරු ක්‍රීඩා ඇමතිතුමාට හැකි වෙලා තිබෙනවා. මේ ගත් පියවර තවත් ඉදිරි පියවරයන් දක්වා ගෙන යාමට ශක්තියක් හා ධෛර්යයක් කර ගන්නය කියා අපි එතුමාට සුභ පැතුම් පිරිනමනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ සිට අද දවස දක්වාම ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගෙන් පටන් ගෙන, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමන්ලා මෙම විවාදයේදී කථා කළා. අද දවසේ විරුද්ධ පක්ෂයේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා, ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කථා කරමින් යම් යම් ආකාරයේ කාරණා කටයුතු මතු කළා.

ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කාරණා කටයුතු මතු කරමින්, " හොඳයි, හැබැයි" - "Yes, but" - කියලා තමයි කිව්වේ. හැබැයි, ඒ "but" එක කියැවුණේ simple lettersවලින්. "Yes" කියැවුණේ capital lettersවලින්. එතුමා කියනවා, CSN නාළිකාව ගෙනාපු එක "හොඳයි, හැබැයි" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් කාලයක් තිස්සේ අපේ රටේ සෑම ක්‍රීඩා ක්ෂේත්‍රයකම තිබුණ ලොකුම අඩුව තමයි ලංකාවට කියලා ක්‍රීඩා නාළිකාවක් නැතිකම. අද Carlton Sports Network එක හරහා ලංකාවට ක්‍රීඩා නාළිකාවක් ලැබුණා. ඒක හොඳද, නැද්ද කියලා ක්‍රීඩාව පැත්තෙන් බලමු. ක්‍රීඩාවට ඒක හොඳයි. දැන් ඒ ආයතනයේ නම Carlton වුණු එකයි ප්‍රශ්නය. එහෙම නැත්නම් ප්‍රශ්නයක් නැහැ. ඒකේ නම Eran and Michelle Company වුණා නම් හොඳයි. එතුමාගේ සහෝදරයා මිෂෙල් මාත් එක්ක එකම විද්‍යාලයේ එකම පන්තියේ ඉගෙන ගත් කෙනෙක්. හෙට හවස අපි හමු වෙනවා, රාජකීය විද්‍යාලයේ කණ්ඩායමක් එක්ක. ඔහු ගිටාර් එක ගහන්න එයි. ඉතින් එතුමාගේ නමින් ගියා නම් හොඳයි.

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

ඒ නිසා Carlton Sports Network කියන්නේ ලංකාවට ලැබුණ ප්‍රථම ක්‍රීඩා නාළිකාව. ඒක අපට ලැබුණ සම්පතක්. අපි ඒක අගය කරනවා. අපි ඒක අගය කරන්න ඕනෑ.

ඊළඟට ගරු ඇමතිතුමාට මම කියන්න කැමැතියි, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා හරුන් ලොගාඩ්ගේ වාර්තාව අර ගෙන ඒ පිළිබඳව පුන පුනා කිව්වේ ඔබතුමාට නොවෙයි කියලා. එතුමා වාගේ උදවිය යූඑන්පී එකේ සිටිද්දී ජෝන් අර්ල් කියන සුද්දාව පිට රටින් ගෙන්වලා යූඑන්පී එක හදන්න කෝටි ගණනක් දීලා වාර්තාවක් හදපු එක වැරදියි කියලා විපක්ෂ නායකතුමාට කියන්නයි එතුමාට ඕනෑ කරලා තිබුණා. එතුමා ඒක තමයි හරුන් ලොගාඩ් වාර්තාව අර ගෙන ඔබතුමාට කිව්වේ. ඒ නිසා ඔබතුමාට නොවෙයි ඒ ගැහුවේ. ඔබතුමාට ගැහුවාට, "විද්දේ හාවට වැදුණේ පඳුරට". ඒ නිසා පඳුරටම වැදුණාවේ. ඔබතුමාට නොවෙයි විපක්ෂ නායකතුමාට කියන්නයි ඕනෑකම තිබුණේ. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ කථාව පුරාම තිබුණේ මේ ක්‍රීඩා සංගම් කවුරු පරිපාලනය කළත් meritocracy, ඒ කියන්නේ ප්‍රතිඵල තිබෙනවා නම් ප්‍රශ්නයක් නැහැ කියන කාරණයයි. ඉතින් ක්‍රීඩා ඇමතිතුමා කළේත් ඒකම තමයි. 13(2) වන නියෝගයේ තිබෙන්නේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කියපු meritocracy කියන එකයි . 13 (2) වන නියෝගයේ තිබෙන්නේ ක්‍රීඩාව පරිපාලනය කරන්නේ ඩිලාන් පෙරේරාද, ලසන්ත අලගියවන්නද, එහෙම නැත්නම් තිලංග සුමතිපාලද, උපාලි ධර්මදාසද, එහෙම නැත්නම් හමුදාවේ දයා රත්නායකද, පාලිත ප්‍රනාන්දුද, බ්‍රිගේඩියර් වීරසේකරද කියන එක නොවෙයි, කවුරු කළත් මින් පස්සේ තමාගේ කාලයෙන් පස්සේ නැවත එනවා නම් මෙන්න මේ කියන කාරණා සපුරා තියෙන්න ඕනෑ කියන එකයි. ජාත්‍යන්තර මට්ටමට ක්‍රීඩා ඉහළ නැංවීමට ලකුණු දෙනවා. අදාළ ජාතික කණ්ඩායමේ කුසලතා මට්ටම වැඩි කිරීමට ලකුණු දෙනවා. දක්ෂතා සහිත ක්‍රීඩකයන් හඳුනා ගැනීමට ලකුණු දෙනවා. ක්‍රීඩා පරිපාලනයෙහි විනිවිදභාවය සහතික කිරීමට ලකුණු දෙනවා. මේ කාරණා සියල්ලටම මණ්ඩලයකින් ලකුණු දෙනවා. ඒ ලකුණු අනුව කුසලතාවන් පෙන්නුවා නම් විතරයි සංගමයේ නිලධාරීන්ට ඉස්සරහට යන්න පුළුවන්කම ලැබෙන්නේ. ඉතින් meritocracy තිබෙනවා. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කියපු එක අකුරටම මේ නියෝග තුළ තිබෙනවා.

අනෙක් කාරණය මෙයයි. ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්වා, දේශපාලනඥයන් මේ ක්‍රීඩා සමිති සම්මේලනවල ඉන්න එකට එතුමා සම්පූර්ණයෙන්ම විරුද්ධයි කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දේශපාලනඥයන් ඉන්නවාටද විරුද්ධ, ක්‍රීඩා සංගම්වලට දේශපාලනය එනවාටද විරුද්ධ? මම හිතන විධියට දේශපාලනඥයන් ක්‍රීඩා සංගම්වලට ගියාම ඒකට දේශපාලනය එන නිසා තමයි විරුද්ධ. එහෙම නැත්නම් දේශපාලනඥයන් ආවාට ඔබතුමාට විරුද්ධ වෙන්න බැහැ නේ. මොකද, අපිත් දේශපාලනඥයන් නිසා.

හැබැයි ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා, ක්‍රිකට් පැත්තෙන් ගත්තොත් ගාමිණි දිසානායක, වොලිබෝල්වලින් ගත්තොත් ඩී.බී. වික්‍රමසිංහ, රෙජී රණතුංග, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ, යූඑන්පී එකේ මර්වින් ජේ. කුරේ, අශෝක වඩිගමංගාව, අද ඩිලාන් පෙරේරා, -වොලිබෝල්වලින්- ඉන්නවා. එල්ලේවලින් ගත්තොත් ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉන්නවා. ක්‍රීඩා සංගමයක සභාපති ධුරයක් දරා ජනාධිපති පුටුවට ගිය ලංකාවේ එකම කෙනා එතුමායි. එතුමා මලල ක්‍රීඩා සංගමයේ සභාපති වුණා තරුණ කාලයේ. වරිත රත්වත්තේ මැතිතුමා, -ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාගේ පක්ෂයේ හිටපු සභාපතිතුමා- වොලිබෝල් ක්‍රීඩාවට අනුපමේය සේවයක් කරපු මහත්මයෙක්. හැබැයි එතුමා එක්සත් ජාතික පක්ෂයේ සභාපති. එතුමා යූඑන්පී එකේ සභාපති කියලා එතුමා වොලිබෝල් ක්‍රීඩාවට කරපු සේවය පැත්තකට දමන්නේ නැහැ. ඒ නිසා යම් කිසි කෙනකු ඒ පුටුවට ආවායින් පස්සේ දේශපාලනීකරණය කරනවා නම්, එය වැරදියි. උදාහරණයක් හැටියට මම ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා එක්ක ක්‍රිකට් ක්‍රීඩාවේ එක කාරණයකට විරුද්ධයි. ඒකෙදී ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා එක්ක මම එකඟයි.

අද පාර්ලිමේන්තුවේ වැඩියෙන්ම කථා වුණෙත් ක්‍රිකට් ගැනයි. යූඑන්පී එකේ අය වැඩියෙන්ම කථා කළේත් ක්‍රිකට් ගැනයි. ක්‍රීඩා පනත යටතේ ගෙනෙන ලද නියෝග සම්බන්ධයෙන් විවාදයේදී සියයට 75ක්ම කථා කළේ ක්‍රිකට් ගැනයි. ඇයි ඒ? ක්‍රිකට් තමයි සල්ලි තිබෙන තැන. වොලිබෝල්, එල්ලේ, table tennis, කබඩි ගැන කථා කරන්නෙත් නැහැ. ඇයි ඒ? සල්ලි නැහැ. ක්‍රිකට් වාගේ සල්ලි තිබෙන තැනකයි මා ඉන්නේ. ගරු ක්‍රීඩා ඇමතිතුමනි, ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා ඉන්න තැනයි මා ඉන්නේ. මම බදුල්ල දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපති. බදුල්ල පාපන්දු සංගමයේ සභාපති. මම බැඩ්මින්ටන්වල නැහැ. හැබැයි බැඩ්මින්ටන් ක්‍රීඩාවේ කිසිම තනතුරක නැතිවත්, ගිය සුමානයට ඉස්සෙල්ලා සුමානයේ බදුල්ල නගරයට අවශ්‍ය බැඩ්මින්ටන් ගෘහස්ථ ක්‍රීඩාගාරය මම හදලා දුන්නා. දිවා රාත්‍රී සෙල්ලම් කරන්න පුළුවන් වන විධියට එම ක්‍රීඩාගාරය හදලා දුන්නා. ඒවා කරන්න නිලතල ඕනෑ නැහැ. බදුල්ලට කවදාවත් නොදීපු බැඩ්මින්ටන් ගෘහස්ථ ක්‍රීඩාගාරය හදලා දුන්නේ අපි. එහෙම කළේ ක්‍රීඩාවට තිබෙන ආදරය නිසායි. හැබැයි බදුල්ල දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපති වුණත්, ක්‍රිකට් වැනි ක්‍රීඩාවකදී සංගම් හරහා සභාපතිවරුන් පත් වීම තුළින් මහා ලොකු ප්‍රජාතන්ත්‍රවාදයක් මැවෙනවා කියන කථාව බොරුවක් කියන එක මා කියන්න කැමැතියි. ඒක අමූලික බොරුවක්.

ක්‍රිකට් සංගමයට සල්ලි තිබෙන නිසා සංගම් හරහා ඡන්දය දීලා එන කොට clubs ටිකයි සංගම් ටිකයි අල්ලා ගන්නවා, වැඩ කරන්න. එකකොට එහෙම අල්ලා ගන්න අය එන්නේ ඊළඟට පත්වීමේ බලාපොරොත්තුවෙන්. හැබැයි ක්‍රීඩා ඇමතිතුමා විසින් ඒ සඳහා සුවිශේෂී වූ හැකියාවක් තිබෙන, විශේෂයෙන් මුදල් කළමනාකරණය කරන්න පුළුවන් පිරිසක් දාලා interim committee එකක් පත් කළා නම් ඊට වඩා හොඳයි කියලයි මම කල්පනා කරන්නේ. ඒ කාරණයේදී මම ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා එක්ක ඉන්නවා. ක්‍රිකට් වාගේ ආයතනයක් පරිපාලනය කරන්න ක්‍රීඩා ඇමතිතුමා ඒ සඳහා හැකියාව තිබෙන පුද්ගලයින් පිරිසක් දැම්මා නම් හොඳයි. තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ක්‍රිකට්වලට යම් සේවයක් කරපු කෙනෙක්. උපාලි ධර්මදාස මහත්මයා ගැන මා දන්නේ නැහැ. නමුත් ජයන්ත ධර්මදාස මහත්මයා තමයි බදුල්ලට සේවයක් කළේ. තිලංග සුමතිපාල මහත්මයා බදුල්ලට සේවයක් කළේම නැහැ. බදුල්ලට යම් දෙයක් කළේ ජයන්ත ධර්මදාස මහත්මයායි. ආනා පුංචිහේවා මහත්මයා කොච්චර සේවයක් කළාද? World Cup එකත් ගෙනාවා. හැබැයි ආනා පුංචිහේවා මහත්මයා එළියට යනකොට තිලංග මහත්මයායි, ධර්මදාස මහත්මයායි, අර්ජුන මහත්මයායි එකට හිටපු අය. ඒ තුන්ගොල්ලන්ම එකතු වෙලා තමයි ආනා පුංචිහේවා මහත්මයා - World Cup එක ගෙනාපු මනුෂ්‍යයා- එළියට දැම්මේ. හැබැයි මේ හැම කෙනාම යම් යම් දේවල් කළා.

දඹුල්ල ක්‍රීඩාංගණය සෑදීමේ සම්පූර්ණ ගෞරවය තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාට හිමි වෙනවා. අපි එතුමාට ඒ ගැන ගෞරව කරනවා. ඒ ගෞරවය එතුමාට දෙන්න ඕනෑ. අද කියනවා, "සනත් ජයසූරිය මන්ත්‍රීතුමා Selection Committee එකේ Chairman වෙච්ච එක වැරදියි, එතුමාගේ සමකාලීනයෝ ඉන්න කොට" කියලා. හැබැයි අරවින්ද ද සිල්වා මහත්මයා Chairman වුණා. කවුරුවත් ඔය ප්‍රශ්නය ඇහුවාද? එතුමාගේ සමකාලීනයෙක් සනත් ජයසූරිය මැතිතුමා. සනත් ජයසූරිය මැතිතුමාට ඒ නිසා අසාධාරණයක් වුණා කියලයි මම කල්පනා කරන්නේ. මොකක් හෝ ඇති වුණු හුටපටයක් නිසා එතුමාට World Cup එකේ එක match එකකවත් සෙල්ලම් කරන්න දුන්නේ නැහැ. අපි දන්නා විධියට one-day matches ගහන්න මේ තරම් දක්ෂ මනුෂ්‍යයෙක් ලෝකයේ කොහේවත් නැහැ. හැබැයි අරවින්ද ද සිල්වා තමන්ගේ

සමකාලීනයෝ ඉන්දැද්දී තේරීම් කමිටුවේ සභාපති වුණාම නෝ කථා, නෝ සිනා. සනත් ජයසූරිය මහත්මයා අද සභාපති වුණු එක අපට හොඳයි. සනත් ජයසූරිය, අර්ජුන රණතුංග, මුත්තයියා මුරලිදරන් -මේ අය- ලංකාවේ සුවිශේෂී ගණයේ ක්‍රීඩකයින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේ අය ලංකාවේ ආයෙත් බිහි වෙන්නේ නැහැ. ඒ අය ලංකාවේ ක්‍රිකට් සංකේත. ඒ නම් තුන ලංකාවේ ක්‍රිකට් සංකේතය කියා කිව්වත් කවුරුවත් විරුද්ධ වෙන්නෙත් නැහැ. මොකද, ඒ නම් තුන සැබැවින්ම ලංකාවේ ක්‍රිකට් ඉතිහාසයේ සංකේත නිසයි - "Master Blaster", "Captain Cool". මුත්තයියා මුරලිදරන්ලා ආයෙත් කවදාද එන්නේ? ඒවා අපි දාපු නම් නොවෙයි. ජාත්‍යන්තරයෙන් ඒ අයට දම්පු නම්. ලංකාවේ නම අද ලෝකයේ බොහෝ තැන්වල රඳා පවතින්නේ ක්‍රිකට් ක්‍රීඩාව තුළින් ඒ අය කරපු සේවය නිසායි. සනත් ජයසූරිය මහත්මයා පාර්ලිමේන්තු මන්ත්‍රී වුණාම ඒ දවස්වල සමහර අය කිව්වා, ක්‍රිකට් ක්‍රීඩකයෙක් හැටියට මන්ත්‍රී වෙච්ච එක හරි වැරදියි කියලා. නමුත් ඉන්දියාවේ ක්‍රිකට් ක්‍රීඩකයෙක් වෙච්ච සචින් තෙන්ඩුල්කාර් මන්ත්‍රී වුණාම "නෝ කතා. නෝ සිනා." [බාධා කිරීමක්] ඉම්රාන් ඛාන් මන්ත්‍රී වුණේ නැහැ. ඉඳල, ඉඳලා පරාද වුණා නේ. [බාධා කිරීමක්] No, he lost.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපි හැම දෙයක් දිහාම පාට කණ්ණාඩි දමා ගෙන බලන්න හොඳ නැහැ. ඊළඟට, අපේ සමහර මන්ත්‍රීවරුන් රගර් ක්‍රීඩාව ගැන ද්වේශයෙන් යුතුවයි කථා කළේ. නාමල් රාජක්ෂ මන්ත්‍රීතුමා Sri Lanka Schools Rugby Team එකේ captain වුණේ වර්තමාන ජනාධිපතිතුමා අගමැති වෙන්නත් ඉස්සෙල්ලායි. එතුමා විපක්ෂ නායක වෙලා හිටපු කාලයේදීයි. නාමල් රාජපක්ෂ මැතිතුමා රගර් ක්‍රීඩාව පිළිබඳව හැකියාව පෙන්නුවේ ඒ කාලයේදීයි. ඒ, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වෙලා හිටපු කාලයේදීයි. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ජනාධිපතිතුමාගේ පුතා වෙච්ච පලියට රගර් ගහන්න පුළුවන් නම් ඒක කළාම මොකද? අද ලංකාවේ රගර් ක්‍රීඩකයන්ට සහ රගර් ලෝලීන්ට නවසීලන්තයේ All Blacksලාට ගහන, ඔස්ට්‍රේලියාවට සෙල්ලම් කරන, දකුණු අප්‍රිකාවට සෙල්ලම් කරන ඒ අද්විතීය රගර් ක්‍රීඩකයන් ගෙන්වලා පියවි ඇසින් බලා ගන්න පුළුවන් tournaments ආරම්භ කළේ නාමල් රාජපක්ෂ මහත්මයාට පින් සිද්ධ වෙන්නයි. එතුමාට ඒ ගෞරවය දෙමු. රටක් විධියට එහෙම කරන එක හොඳයි. කොහොමද ඒක නරකයි කියන්නේ?

යෝෂිත රාජපක්ෂ මහත්මයලා එකතු වෙලා motor racing කළාම සමහර අය ඒක විවේචනය කළා. දැන් යෝෂිත රාජපක්ෂ මහත්මයා එල්ලේ සංගමයේ සභාපති වෙන්න යනවා. කවුරුවත් ඒ ගැන කියන්නේ නැහැ. ඇයි අර කාරණය අල්ලාගෙන ඉරාන් වික්‍රමරත්න මහත්මයාට එහෙම ලෙහෙසියෙන් ලැම්බෝගිනි කිය කියා ගහන්න පුළුවන් නේ. හැබැයි ඉදිරියේදී යෝෂිත රාජපක්ෂ මහත්මයා ගමේ ක්‍රීඩාවක් වෙන එල්ලේ සංගමය -තාත්තා කරපු වැඩේ- බාර ගන්න යනවා, ඒක ගැන කියන්නේ නැහැ. මොකද, එතකොට ලකුණු ලැබෙනවා නේ. ලකුණු කපන්න ලැම්බෝගිනි පාවිච්චි කරනවා. එල්ලේ ක්‍රීඩාව නංවලා ගන්න, ඒකේ නායකත්වයට යෝෂිත රාජපක්ෂ මහත්මයා එන එක කොච්චර හොඳද? ඒ නිසා මේ හැම දෙයක් ගැනම දේශපාලන කෝණයෙන් බලා හොඳ දෙයටත් නිකම් එහෙන් මෙහෙන් කැලි දමන්න එපාය කියා මම ඉරාන් වික්‍රමරත්න මහත්මයාට කියනවා. මොකද, ඔබතුමා මා ඉතාම ගරු කරන, අපේ ඉස්කෝලේ හොඳ opening batsman කෙනෙක්. හොඳින් සෙල්ලම් කරපු කෙනෙක්. එතුමාට one-day match නම් බැහැ, technically බොහොම correct. ආයෙත් ඉතින් out කරන්න බැහැ, wall තමයි. රාහුල් ද්‍රාවිඩ් වාගේ තමයි. ලෙහෙසියෙන් out කරන්න බැහැ. හොඳ opening batsman කෙනෙක්.

ඒ වාගේම volleyball ක්‍රීඩාව ගැනත් පොඩ්ඩක් හරි කථා කළේ නැත්නම් volleyball ක්‍රීඩා ලෝලීන් මට දොස් කියාවි. මම මේ තනතුර බාර ගත්තායින් පසුව beach volleyball වේවා, indoor volleyball වේවා ඒ දෙඅංශයෙන්ම අපි ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ආසියාවේ රටවල් 67ක් අතරින් අපි Super 8 එකේයි ඉන්නේ. මොකද, volleyball සම්මේලනයේදී ඕස්ට්‍රේලියානු කලාපය අයිති වන්නේ ආසියානු කලාපයටයි. Super 8 එකේයි අපි ඉන්නේ. Beach Volleyball Teams අටයි ලංකාවේ සෙල්ලම් කළේ. මම බාර ගන්නකොට 150යි සිටියේ. මම බාර ගන්නකොට DSI Beach Volleyball තරග වෙලාවේ 891යි සිටියේ. දැන් teams 5137ක් සෙල්ලම් කරනවා, teams 5137ක් සෙල්ලම් කරනවා. දේශපාලනඥයන් එපාය කියනවා. ජනාධිපති රන් කුසලාන තරග මාලාවක් බාර ගන්නකොට 494යි. දැන් teams 6107ක් සෙල්ලම් කරනවා. අහලා තිබෙනවාද ලෝකයේ කොහේවත් එක තරග මාලාවකට මෙච්චර teams ගණනාවක් සෙල්ලම් කරනවාය කියා. දේශපාලනඥයන් එපාලු. ජාතික වොලිබෝල් තරග මාලාවේ teams 410යි මම බාර ගන්නකොට හිටියේ. දැන් teams 4850ක් තිබෙනවා. ලංකාවේ Beach Volleyball Teams 8යි ගැහුවේ. දැන් teams 150ක් තිබෙනවා. ලංකාවේ කණ්ඩායම ආසියාවේ පස් වන තැනට ඇවිල්ලා තිබෙනවා. දේශපාලනඥයන් එපාය කියනවා. ඇයි මේ එපා කියන්නේ? අපි සන්ධානෙ නිසයි. වෙන මොකුත් නිසා නොවෙයි. වොලිබෝල් අංශයෙන් ලංකාවට යමක් කළාය කියා හර්ෂ ද සිල්වා මහත්මයාට නිකම්ම කියවුණා. ඉරාන් වික්‍රමරත්න මැතිතුමාට එහෙමවත් කියවුණේවත් නැහැ. කියන්න ඕනෑය කියා හිතනවා. ආයෙත් යට ගහනවා, ඇයි මේක සන්ධානෙ නේ. මෙතැනදී බලන්න ඕනෑ, දේශපාලකයා ගැන නොවෙයි. දේශපාලනීකරණය කරනවා නම් වැරදියි. හැබැයි දේශපාලකයා හරි කවුරු හරි meritocracy අනුව, යම්කිසි ප්‍රතිඵල පෙන්වා තිබේ නම් ඒ අයට ඒ කාරණා කටයුත්ත කරගෙන යන්න ඉඩ දෙන්න ඕනෑ.

අවසානයේදී ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට මම එක කාරණයක් විතරක් මතක් කරන්න ඕනෑ. තමුන්නාන්සේ පුන පුනා කිව්වා මේ පළමුවෙනි පියවර විතරයි, මේක ඉස්සරහට අරගෙන යන්න ඕනෑය කියලා. ඒක අරගෙන යන්න. ඔලිම්පික් කමිටුවට, ඊළඟට තේරීම් කමිටුවලට, වෙනත් ක්ෂේත්‍රවලටත් මේ වාගේ රෙගුලාසි දමන්න. ඒවා දමන්න ඕනෑ. නැත්නම් ඔබතුමා ක්‍රීඩා සම්මේලනවලට දමපු මේ රෙගුලාසි අවසානයේ නිසි ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනෙන්නේ නැහැ. මට මතකයි, වරක් සුසන්තිකා ජයසිංහ මැතිනිය ඇහුවා, "මම දුවන කොටත් ඔලිම්පික් මෙහෙමයි, මගේ දුව දුවන කොටත් මෙහෙමයි, මගේ මීනිපිරිය දුවන කොටත් මෙහෙම වෙයිද?" කියලා. මම නොවෙයි සුසන්තිකා ජයසිංහ මැතිනිය ඇහුවේ. ඒ නිසා දැන් මේ දමලා තිබෙන ක්‍රීඩා රෙගුලාසි, අණපනත් අනුව මේ කිසි තැනක කිසි කෙනෙකුට අරක් ගෙන ඉන්න බැහැ. ක්‍රීඩා සම්මේලනවල අරක් ගෙන ඉන්න බැහැ වාගේම, ක්‍රීඩාවේ වෙනත් ස්ථානවලත් එහෙම කාට කාටත් අරක් ගෙන ඉන්න බැරි විධියට ගරු ඇමතිතුමා කටයුතු කරනවා කියලා අපට විශ්වාසයක් තිබෙනවා.

ගරු ක්‍රීඩා ඇමතිතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කිව යුතුයි. ඔබතුමා කොන්ද කෙළින් තියාගෙන, බය නැතිව තීන්දු ගන්න කෙනෙක්. ක්‍රීඩාවට අවශ්‍ය වන්නේ කොන්ද කෙළින් තියාගෙන බය නැතිව තීන්දු ගැනීමයි. සනත් ජයසූරිය මහත්මයා එහෙම දන්නවා, සමහර වෙලාවට ක්‍රීඩාවේ හිටපු සමහර නායකයන් ගන්න තීන්දු ක්‍රීඩා පිටියට හරි යන්නේ නැහැ. එහෙම හරි නොගියාම media වලින් බණිනවා. හැබැයි හරි ගියාම හොඳ කියනවා. ඒ වාගේ තමයි. ඔබතුමා captain. ඔබතුමා ගන්න තීන්දු බොහොමයක් හරි ගිහිල්ලා තිබෙනවා. හැබැයි සමහර තීන්දු ගන්න සමහර ක්‍රීඩා ඇමතිවරු බය වුණා. ඇයි? ඒ අවදානම ගන්නේ නැතිව match එක draw වෙන්න ඇරියා. ඔබතුමා, "නැහැ, මම අවදානම අරගෙන match එක ජයග්‍රහණය කරන්න

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

පුළුවන්" කියන මට්ටමට ආපු නිසා අද ඔබතුමාට පුළුවන් වෙලා තිබෙනවා මේ ක්‍රීඩා රෙගුලාසි හරහා ජාති, කුල, ආගම් භේදවලින් තොරව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාම එක තැනකට ගේන්න. කොන්ද කෙළින් තියාගෙන එවැනි තීන්දු ගන්න හැකියාව ඇති ඔබතුමා ක්‍රීඩා සම්මේලනවල අප ඉතාම අගය කරනවා කියලා කියන්නේ අපේ මේ ක්‍රීඩා පවුලේම උදවිය ඔබතුමා අගය කරනවාය කියන කාරණයයි. ඒ නිසා තව තවත් ශක්තිවන්තව කොන්ද කෙළින් තියාගෙන තීන්දු, තීරණ ගැනීමට ඔබතුමාට ශක්තිය, ධෛර්යය ලැබෙවායි කියා ප්‍රාර්ථනා කරමින්, ඉතාම ක්‍රීඩාශීලී විලාසයෙන් ඉඳගෙන, මගේ කථාවේදී බාධා නොකර මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් නියෝජ්‍ය කථානායකතුමාටත් ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The Adjournment Motion is to be moved by the Hon. (Dr.) Sarath Weerasekara.

උතුරේ තත්ත්වය පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව නොමඟ යැවීම
வடக்கின் நிலைமை பற்றி சர்வதேச சமூகத்தைத் தவறாக வழிநடத்தல்
MISLEADING INTERNATIONAL COMMUNITY OF SITUATION IN NORTH

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
Sir, I move,

"With the conclusion of the war, our country has embarked upon a massive development drive with a colossal sum of money being channelled by the Government for the development of the North. When the economic development rate of the country in general is 8 per cent, it is 22 per cent in the North. This is a clear demonstration of the pace with which the Northern Province is developing. The Army has cleared the areas of landmines and almost all displaced persons have been resettled. Housing and educational facilities have also been put in place.

Despite these massive development activities taking place in the North, certain political parties have started issuing statements that completely distort the real situation in these areas. They are hell-bent in discrediting and betraying the country both locally and internationally by propagating diabolical lies such as that the Military is constantly harassing the Tamils; the displaced people have not been resettled and that the demining process is a deception.

Despite having a comprehensive understanding of the activities taking place in the North, these elements conduct themselves in a manner with the objective of deceiving the people living abroad. One of their objectives can be seeking foreign funds to resuscitate the LTTE by spreading the lie that the Tamil people are subjected to harassment.

Therefore, it is resolved that all groups engaged in spreading these lies be asked to desist from engaging in such treacherous acts."

Hon. Deputy Speaker, we know the Government has destroyed one of the most ruthless terrorist organizations in the world, the LTTE, and brought peace to our country. We, the three communities in this country suffered for 35 years, till 19th May, 2009.

After the war, it can be observed that there are massive development projects being carried out. Also, we see very clearly that the Government is giving extra-special attention to the North by commiting a huge sum of money to develop the North. Mainly because the LTTE has destroyed the lives of the Tamil people and I, as an officer who was in the Service for 39 years, have seen the massive destruction caused by the LTTE to the lives of the Tamil people and their property. Also, today, I see how development has taken place, the change that has occurred for good which is unbelievable. The Tamil people have obviously benefited, which is confirmed by the fact that the growth rate in the North today is 22 per cent whereas that of the rest of the country is only 8 per cent. But, with all these, what do the Tamil parties, specially the TNA, do and say to the world? They say that there is a systematic campaign against democracy and the Tamil people. They say that there is no development in Jaffna, the Tamils are ill-treated, the demining story is a bluff, the IDPs are not properly looked after and there is continuous harassment of the Tamils by the Army et cetera. Now, the TNA is travelling to Geneva to campaign against Sri Lanka. Their consistent treacherous attempt to paint a wrong picture in the eyes of the international community is to undermine the economy in Sri Lanka to dissuade investment, persuade tourists to boycott the country, reduce volumes of international trade and strike at the root of economy in Sri Lanka which is, at the moment, vibrant.

Sir, before I appraise this Assembly about the development in the North, first, I would like to ask the TNA whether they have any moral right to speak on behalf of the Tamils in the North.

In terrorism, Sir, there is no middle man as we know; either you are a terrorist or not a terrorist. Why do they call the TNA a "proxy of the LTTE"? It is because they never condemned any of the atrocities committed by the

LTTE. When the LTTE killed reputed Tamils like the Hon. (Dr.) Neelan Tiruchelvam, the Hon. A. Amirthalingam, the Hon. A. Thangathurai and the Hon. Lakshman Kadirgamar, and systematically destroyed the entire democratic leadership of Tamils, the TNA kept mum.

During the "peace time" when the LTTE came to the Government-controlled areas and extorted Tamils in broad daylight and forcibly took away children for their army, where were the Hon. Sumanthiran and the Hon. Suresh Premachandran? I was the Commander, Northern Naval Area based in KKS at that time and I protested when the LTTE regularly came into the schools and by force took away children for their protest marches.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
Mr. Presiding Member, I know how the principals who protested were brutally assaulted by the LTTE and some were even shot at. Where was Gajendrakumar Ponnambalam at that time? In his suite in USA? What were the responses of the TNA or TNPF towards the Tamil students whose education was consistently disrupted by LTTE at that time? If they did behave in that cowardly manner during that period, what right do they have today to speak when the Army entered the Jaffna University for one day only to stop commemorating that ruthless killer who was responsible for the total devastation of Tamils?

Mr. Presiding Member, during the last days of the war, when the Tamils were fleeing into the Government controlled-areas, how many were point-blankly killed by terrorists? Even at that moment, did the TNA ask the LTTE to stop that? What about that 12-year old innocent little boy whose both legs were chopped off by the terrorists when he was running into the arms of his parents? Only a terrorist or a terrorist sympathizer could abstain from condemning such a barbaric act and we know that the Hon. M. Sumanthiran, the Hon. Suresh Premachandran and the Hon. Gajendrakumar Ponnambalam did abstain from it.

So, Sir, I do not think that these Tamil parties have any moral right to speak about the Tamils now because they were waiting like eunuchs when the Tamils were really harassed, extorted, conscripted and killed by the LTTE.

Now, having said about the nature and the genuinity of those who criticize the Government, I would now like to mention briefly about the post-war development activities in the North.

As you know, Sir, the most important post-conflict development challenges the Government faced were the demining of approximately 5,000 square kilometres, resettlement of approximately 300,000 IDPs, rehabilitation of 12,000 LTTE cadres and reintegration them into society, reconstruction and economic development.

The LTTE laid a large amount of anti-tank mines, anti -personnel mines and improvised explosive devices as it ran away when the Army was advancing. As at present, the Army has removed 469,000 anti-personnel mines, 390,000 improvised explosive devices and 1,400 anti-tank mines. This, they have done with great risk to their own lives. As a result, the innocent Tamils who were forced to vacate their houses within 10 minutes notice by the LTTE could come and resettle safely. I do not want to ask the TNA whether they have even offered a cup of tea to these noble soldiers who were engaged in demining. I do not want to even state that the TNA is now shedding crocodile tears for Tamils, because I do not want to insult the crocodile.

As of today, 142,300 families have been resettled and the balance will be resettled by mid 2013. Many houses have been built and the Army alone from the soldiers' money has built more than 5,000 houses for the poor Tamils.

His Excellency the President also must be commended for conceiving an Army for designing and implementing a very successful rehabilitation model. It resulted in total reintegration of 11,000 ex-LTTE cadres to society within just three years. Also, 212 ex-LTTE cadres have been already selected for university education and will be doctors, lawyers and engineers in a few years' time. All 512 child soldiers are now with their parents. Matrimony, according to their wishes, was facilitated irrespective of their level of radicalization. Peace villages were established to facilitate re-unification

[ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා]

of married persons who were undergoing rehabilitation at different centres.

Recently, 200 women were recruited to the Army and 3,500 ex-LTTE cadres, after rehabilitation, including women were recruited to the Civil Defence Force. They get a monthly salary of about Rs. 20,000. They have realized their mistakes and now joined hands with the Civil Defence Force to rebuild the nation.

So far, the Government has spent more than Rs. 425 billion for the reconstruction and development of the North and East Provinces. After May 2009, the Government has initiated "Uthuru Wasanthaya", a mega development drive to develop the Northern Province. This massive plan is aiming to make the five districts of the North; Jaffna, Kilinochchi, Mullaitivu, Vavuniya and Mannar to be the most-developed parts in the country.

Under this, projects are carried out to expedite demining activities and resettlement, build and repair houses, roads, bridges, develop health and education, boost livelihood of people and social infrastructure. Projects to construct irrigation systems and water supply and sanitation are also carried out to develop the Northern Province.

Today, in the North, 900 schools are functioning with 260,000 students and 13,967 teachers. When compared to other countries under similar circumstances, the achievements of the Sri Lankan Government in restoring the damage done for 30 years within just three years are highly commendable.

The TNA Members of Parliament are the Members of DDC and in actual fact, they are fully aware of the massive development that is taking place. But, so far, they have not uttered a single word about it, let alone appreciating same. On the contrary, there is a diabolical attempt on their part to distort the real picture and give a wrong picture to the international community with ulterior motives. One of their objectives can be the seeking of foreign funds to resuscitate the LTTE by spreading the untruth that Tamil people in the North are not looked after properly.

Therefore, it is resolved that all groups engaged in spreading these untruths be asked to desist from engaging in such treacherous acts.

Thank you.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

එම යෝජනාව ස්ථිර කරන්නේ ගරු තාරානාත් බස්නායක මන්ත්‍රීතුමා.

ගරු තාරානාත් බස්නායක මහතා
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින් එම වැදගත් යෝජනාවට කරුණු කිහිපයක් එකතු කරන්නට ලැබීම ගැන මා ඉතාමත් සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම අප රට ඉතිහාසයේ ඉඳලා ගත්තාම, අපට මතක ඇති කාලයේ සිට අපේ රටේ තිබුණු සංවර්ධනය, ඒ වාගේම අපේ රටේ තිබුණු ආර්ථිකමය හා සමාජයීය තත්ත්වයන් පසෙකලා මේ රටේ නිදහසේ ජීවත් වීමට තිබුණු අයිතිය පිළිබඳව කථා කරන්නට එදා අපට අවස්ථාව තිබුණේ නැහැ. අවුරුදු 30ක් තිස්සේ මේ රටේ යුද්ධයක් තිබුණා. විශේෂයෙන්ම 2005 දී අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා හැටියට පත් වුණා. මේ රටේ සමස්ත ජනතාව -මහජන නියෝජිතයන්, ඒ වාගේම ජාති ආගම් කුල මල භේදයකින් තොරව සියලු දෙනාම, මේ රටේ ජීවත් වන හැම කෙනෙක්ම- පක්ෂ භේදයකින් තොරව -එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ අනෙකුත් පක්ෂ- මේ රටේ පත් වුණු නායකයාගෙන් ඉල්ලුවේ "අපට ජීවත් වෙන්න තිබෙන නිදහස ටිකෙන් ටික අස්ථාවර වෙලා මේ රට දෙකඩ වෙන්න යන අවස්ථාවක අපට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් ඇති කරලා දෙන්න" කියායි. මේක තමයි එදා එතුමාගෙන් අපි ඉල්ලූ එකම ඉල්ලීම. එතුමා ජනතාවට ආදරය කරන නායකයෙක් හැටියට ඒ දැවැන්ත වූ අභියෝගය ඉතාමත්ම ඕනෑකමින් හා ඉතාම වගකීමෙන් යුතුව භාර ගත්තා.

2005 දී එතුමා බලයට පත් වෙලා මේ රටේ කුරිරු ත්‍රස්තවාදය අවසන් කිරීම සඳහා කළ මෙහෙයුමේ ආරම්භයත් එක්ක විවිධ වූ බාධක, විවිධ වූ කම්කටොලු, විවිධ කුමන්ත්‍රණ, ඒ වාගේම අදටත් තිබෙන විදේශ බලපෑම් දැඩි ලෙස එල්ල වුණා. එසේ බලපෑම් එල්ල වුවත්, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගමේ ඉපදුණු නායකයෙක් හැටියට, විශේෂයෙන්ම ජනතාවට ආදරය කරන නායකයෙක් හැටියට, ඒ වාගේම දරුවන් කෙරෙහි ආදරය, සෙනෙහස දක්වන නායකයෙක් හැටියට ජනතාවගේ විශ්වාසය ආරක්ෂා කරමින් එදා ජනතාවට දුන් පොරොන්දු ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරන්න ඕනෑය කියන එක හිතේ තබා ගෙන, එල්ල වුණු සියලුම බලපෑම්වලට යටත් නොවී ඒවාට මුහුණ දීලා සියලුම දෙනාට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් මේ රටේ ඇති කරන්න කටයුතු කළා. ඒ නිසා අද පාර්ලිමේන්තුවේදී විපක්ෂයේ කවුරු කොහොම කථා කළත් ඒ සියලුම දෙනාට මෙන්ම සමස්ත ජාතියක් හැටියට අප සියලුම දෙනාට මේ රට තුළ නිදහසේ ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් අද ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා උතුරු නැගෙනහිර පළාත්වල කිසිදු සංවර්ධනයක් ඇති වුණේ නැහැ. අපේ පළාත්වල සංවර්ධනය යම්තාක් දුරට ක්‍රියාත්මක වුණත් එම ප්‍රදේශවල සංවර්ධනයක් ඇති වුණේ නැහැ. නමුත් සමස්තයක් හැටියට ගත්තාම අද රටේ දැවැන්ත වූ සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධනයේ වේගය පිළිබඳව කථා කරනවා නම් අද ඉගෙන ගන්නා පොඩි දරුවා පවා දන්නවා එදාට වඩා අද අපේ ලංකාව වෙනස් වෙලා රට දියුණු වෙනවාය කියන එක. අද අපේ රටේ ආර්ථික මට්ටම ගත්තාම අනෙක් රටවල් සමඟ කරට කර ඉන්න පුළුවන්. භෞතික සම්පත් වාගේම මානව සම්පත් මේ රටේ ඇති කරලා සංවර්ධනයට අවශ්‍ය පරිසරය නිර්මාණය කර දීමේදී අද අපේ රට අනෙකුත් රටවල් සමඟ කරට කර ඉන්නවාය කියන එක මේ අවස්ථාවේ මා සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 30ක් තිස්සේ තිබුණු යුද්ධය නිසා අපේ රට අවුරුදු 50ක් පස්සට ගිහිල්ලායි තිබුණේ. අපි අවුරුදු 50ක් පස්සට ගිහිල්ලායි සිටියේ. ඒ නිසා අවුරුදු 50ක් පස්සට ගිය ඉතිහාසය අපට එක වරම නැවත ඉදිරියට ගේන්න බැහැ. සංවර්ධිත රටක් බවට පත් වෙන්න අපට තව ටික කාලයක් ගත වෙනවා.

ඒ පාලන කාලයන් තුළ, පාලන තන්ත්‍රයන් තුළ හිටපු නායකවරු යම් යම් අවස්ථාවන්වලදී, යම් කම් කාල හෝරාවලදී, යම් යම් දශකවලදී මේ රටේ ඇති කළ අවිනිශ්චිත ක්‍රියාමාර්ග තුළින් ඇති වුණු භීෂණ තත්ත්වයන් හා උද්වේගකාරී තත්ත්වයන් නිසා අද අපේ රට ඉතාමත්ම ඉක්මනින් සංවර්ධනය කරා ගෙනයන්න අපහසුයි. අපේ රට දියුණු වෙන්න අරගෙන තවම අවුරුදු 3යි. මේ රට දැවැන්ත සංවර්ධනයක් කරා ගෙන යන්න පටන් අරගෙන තවම ගතවුණේ අවුරුදු 3යි, 4යි. ඒ නිසා මේ රට තිබෙනවාට වඩා තවත් ඉදිරියට අරගෙන යන්න ටික කාලයක් යනවා. අතිගරු ජනාධිපතිතුමා එදා තිබුණාට වඩා වෙනස් ක්‍රමවේදයක් අද පටන් ගෙන තිබෙනවා. ඒ අනුව ඉතිහාසයේ තිබුණේ නැති අලුත් සංවර්ධන ව්‍යාපෘති අද පටන් ගෙන තිබෙනවා. අද මේ සියලු දෙනාම සංවර්ධනය දකින යුගයක්. අද උතුරු සහ නැඟෙනහිර පළාත්වලත් විශාල සංවර්ධනයක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. අපට අද තරුණයින් හැටියට, තරුණ මන්ත්‍රීවරුන් හැටියට පාර්ලිමේන්තුව නියෝජනය කරන්නට අතිගරු ජනාධිපතිතුමාගේ ආශීර්වාදය ලැබුණා. එම අවස්ථාව අපට ලැබුණ නිසා විශේෂයෙන් අපට ඒ ප්‍රදේශවල සංවර්ධන ක්‍රියාදාමයන්වලට සහභාගි වෙන්නට හැකියාව ලැබුණා. ඒ නිසා අපි ඒ ප්‍රදේශවල සංචාරයේ ගියා.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ, අපේ ගරු නාමල් රාජපක්ෂ තරුණ මන්ත්‍රීතුමා සමඟ මා ඇතුළු තරුණ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් කිහිප වතාවක්ම ඒ ප්‍රදේශවල සංචාරයේ ගිය බව. විශේෂයෙන්ම අප කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සංචාරය කළා. ඉතිහාසයේ කවදාකවත් අපි බලාපොරොත්තු වුණේ නැහැ ඒ ප්‍රදේශයට යන්න. නමුත් අපට ඒ අවස්ථාවේ ඒ වාසනාව ලැබුණා. ඒ ප්‍රදේශයේ අමුතුම පරිසරයක් තිබුණේ. මෙහේට වඩා එහේ පරිසරය වෙනස්. ඒ අයගේ මානසික තත්ත්වය, ඒ අය ඒ පරිසරයට මුහුණ දෙන ආකාරය, ඒ අයගේ අදහස්, ඒ අයගේ යෝජනා වාගේම ඒ අයගේ සිනහවේ පවා වෙනසක් ඇති වෙලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සන්තෝෂයෙන් කියන්නට ඕනෑ, අපේ තරුණ නායක ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා සමඟ අපි ඒ ප්‍රදේශවලට ගිහින් ඒ ප්‍රදේශවල සෑම ඉස්කෝලයකටම ගිය බව. අප ඒ දරුවන්ගේ අවශ්‍යතාවන් සොයා බැලුවා. ඒ අයට අවශ්‍ය භෞතික සම්පත් හා මානව සම්පත් ලබා දෙන්න කටයුතු කළා. ඒ ප්‍රදේශවල ඒ විද්‍යාලවල විදුහල්පතිවරු, ගුරුවරු සහ ළමයින් කිව්ව කථාවක් තමයි, අපි කවදාවත් රාජ්‍ය නායකයෙක් දැකලා නැහැ කියන එක. රාජ්‍ය නායකයෙකුගේ පුතෙක් කවදාවත් අපේ ඉස්කෝලේට ඇවිත් නැහැ කිව්වා. ඔබතුමා තමයි මුලින්ම ආවේ කිව්වා. ඒ තරම් සංවේදීව ළං වෙලා අපි ඒ ප්‍රදේශයේ ජනතාවත් සමඟ ඇසුරු කළා. අද ඒ අයට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්පත් ලැබී ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඒ ප්‍රදේශයේ ගොවි ජනතාව ගැනත් වචනයක් කියන්නට ඕනෑ. යපනය දිස්ත්‍රික්කයේ සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වැඩිපුරම ඉන්නේ ගොවි ජනතාවයි. ඉතිහාසයේ තිබුණු කුරිරු යුද්ධයත් සමඟ මේ අයට එදා ගොවිතැන් කරන්න සුදුසු පරිසරයක් තිබුණේ නැහැ. නැවත වතාවක් අපි ඒ ප්‍රදේශවලට ගිහින් වාරි ක්ෂේත්‍රයේ පහසුකම් ලබා දෙන්නට කටයුතු කළා.

අපේ වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා මේ අවස්ථාවේ මේ සභාවේ ඉන්නවා. එතුමාගේ අමාත්‍යාංශය යටතේ විශේෂ ප්‍රතිපාදන ඒ ප්‍රදේශවලට ලැබුණ නිසා වැව් රාශියක් ප්‍රතිසංස්කරණය කළා. අද ඒ වාරි පද්ධතිය තුළින් කෘෂි කර්මාන්තය දියුණු කරන්න ඒ අයට හැකියාව ලැබිලා තිබෙනවා. මෙවැනි සංවර්ධන ක්‍රියාදාම රාශියක් අද ඒ ප්‍රදේශවල ඇති වෙලා තිබෙනවා. විදුලිය, පානීය ජලය, මාර්ග පද්ධති වාගේ සියලුම සංවර්ධන කටයුතු උතුරු සහ නැඟෙනහිර පළාත්වල ක්‍රියාත්මක වන විට මේ පිළිබඳව දරා ගන්න බැරි, -මේ රටේ සංවර්ධනයත් සමඟ මේවා දරා ගන්න බැරි- විරුද්ධ පක්ෂ අද මේවාට කෙනෙහිලිකම් කරනවා. මම ඒකයි කලින් කිව්වේ. අතිගරු ජනාධිපතිතුමාට මේ යුද්ධය අවසන් කිරීමේදී විදේශ බලපෑම් තිබුණා වාගේම අද මේ රටේ ඉඳගෙන මේවාට කෙනෙහිලිකම් කරන පිරිසක් සිටිනවා. ඒ විරුද්ධ පක්ෂවල නියෝජිතයින් එදා කොහේද හිටියේ? ඒ අයට අමතක වෙලා තිබුණා මේ රටේ යුද්ධය අවසන් කරන්න. මේ රටේ යුද්ධය තිබුණේ කොහේද? යුද්ධය තිබුණ කාලයේ මේ අය කොහේද හිටියේ? මේවා ගැන අද කථා කරන්නේ නැහැ. යුද්ධය ඉවර කරලා, මේ රටේ සංවර්ධනය ඇති කරන්නට අතිගරු ජනාධිපතිතුමාට අත හිත දෙන්නට ඕනෑ කියන කාරණය හිතන්නේ නැතිව ඒ අය මේ රට තවත් අස්ථාවර කරන්නට උත්සාහ කරනවා. සිංහළ, දමිල, මුස්ලිම් කියන සියලුම ජාතීන් එකතු වෙලා නිදහසේ ජීවත් වන පරිසරය නැති කරන්නට ඒ අය උත්සාහ කරනවා. ඒ අය අද විදේශ රටවලට ගිහින් ඒ අයට උල්පන්දම් දීලා මේ රටේ අස්ථාවර භාවයක් ඇති කරන්නට කටයුතු කරනවා. අපි දකින හැටියට මේ මාතෘ භූමියේ ඉඳ ගෙන මේවා කරන අයට යාදෙන්නේ නැහැ. ඒ අයට මේ ආත්ම භවයේදීම ඒවාට විඳවන්නට වෙයි කියලා මම හිතනවා. මොකද, උතුරු නැඟෙනහිර තිබුණ යුද්ධයේදී අපේ රණ විරුවන් අතිගරු ජනාධිපතිතුමාට ශක්තිය, ධෛර්ය දෙමින් තමන්ගේ ජීවිතය පරදුවට තබා ක්‍රියා කළා. ඒ රණ විරුවනුත් තමන්ගේ ජීවිතයට ආදරය කරන පිරිසක් වුණත් ඒ සියලු දේවල් පැත්තකින් තියලා රට වෙනුවෙන් දිවි පිදුවා. මට එහෙම කියන්න පුළුවන්. මොකද, මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ ත්‍රිවිධ හමුදාව ඇතුළු පොලීසියේ රණ විරුවන් විශාල ප්‍රමාණයක් සිටියා. ඔවුන්ගෙන් විශාල පිරිසක් මවු බිම වෙනුවෙන් තමන්ගේ ජීවිත පූජා කළා. ඒ ප්‍රදේශයේ සිටින රණ විරුවන්ගේ දෙමව්පියන්, සහෝදර සහෝදරියන් යුද්ධයේ තිබුණු ඒ කුරිරු තත්ත්වයට, අමිහිරි බෛදවාචකයට මුහුණ දුන් නිසා අපිත් ඒ පිළිබඳ අත් දැකීම් ලැබුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සියලුම රණ විරුවන් මේ රට නිදහස් කර ගන්න කරපු කැප කිරීම වෙනුවෙන් ඒ අයට දෙන්න ඕනෑ අභිමානය වෙනුවට, විරුද්ධ පක්ෂවල ඉන්න මේ අය විදේශීය රටවල ගිහින් ඒ අයගේ අභිමානය කෙළෙසන අන්දමින් අද කටයුතු කරනවා. අපි කියන්නේ මේ මාතෘ භූමියේම පය ගහලා ඉඳගෙන ඒ කටයුතු කරන්න ඒ ගොල්ලන්ට අයිතියක් නැහැ කියලායි. රණ විරුවන් කරපු වැදගත් දේට අපි ගරු කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන තරුණ මන්ත්‍රීවරු වශයෙන් උතුරු, නැඟෙනහිර පළාත්වලට ගිහින් ඒ සංවර්ධන කටයුතු නිරීක්ෂණය කරලා, ඊට අපේ දායකත්වයත් ලබා දෙන්න හැකියාව ලැබුණා. ඒ නිසා තවමත් ඒ අයට කාලය තිබෙනවා ඒ ප්‍රදේශවලට ගිහින් ඒ සංවර්ධනය බලන්න. අපි ඒ අයගෙන් ඉල්ලා සිටිනවා ඒ ප්‍රදේශවලට ගිහින් ඒ සංවර්ධනය බලලා ඊට අවශ්‍ය සහයෝගය අතිගරු ජනාධිපතිතුමාට ලබා දෙන්න කියලා. නමුත් ඒ අය යන්නේ නැහැ. මොකද ඒ අයට ඒ ප්‍රදේශවලට යන්න බැහැ. ඒ අයට යන්න බැරි හේතුවක් තිබෙනවා. ඒ අය එදා හිටියේ කොහේද, අද ඉන්නේ කොහේද? ඔවුන් එදා ඒ පළාත්වල හිටියේත් නැහැ; අද ඉන්නෙත් නැහැ. මේ අය ඩොලර්වලට, එක එක්කෙනාගේ කථාවලට යට වෙලා රටේ අස්ථාවරභාවය ඇති කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුත් මේ රජය ජනතා හිතවාදී රජයක්; ජනතාව විසින් පත් කරපු රජයක්. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය කොයි මොහොතකවත් කෙළෙසන්න බැහැ. සමහර අය යම් යම් ආකාරයෙන් විවිධ කුමන්ත්‍රණ කළත්, ජනතාවගේ ආශීර්වාදයෙන් පත් වුණු නායකයකු නිසා ජනතාව එතුමාට ආදරෙයි; රජයට ආදරෙයි.

එම නිසා කවුරු මොන කතන්දර කිව්වත්, මේ රජය ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ, මේ සංවර්ධන ක්‍රියාදාමය බිඳ හෙළන්න මේ උත්තරීතර සභාවේ විරුද්ධ පක්ෂවල ඉන්න යම් යම් මන්ත්‍රීවරු කරන උත්සාහය සාර්ථක වන්නේ නැහැ.

රජයක් හැටියට අපේ සහයෝගය අතිගරු ජනාධිපතිතුමාට ලබා දීලා මේ කටයුතු සාර්ථක කරන්න අප කටයුතු කරනවා. අනෙක් රටවල් සමඟ ගත්තාම අද මේ රට සංවර්ධිත තත්ත්වයට පත් වන යුගයක් ඇති වෙලා තිබෙනවා. මේ රට ආසියාවේ

[ගරු කාරුනාත් බස්නායක මහතා]

ආශ්චර්යය බවට පත් කරන්න පුළුවන් යුගයක් නිර්මාණය වන අවස්ථාවක, ඒ කටයුත්තට දායකත්වය දක්වන ලෙස සියලුම ජන කොටස්වලින් අප ඉල්ලා සිටිනවා. විදේශ බලපෑම්වලට යට නොවී, ඩොලර්වලට යට නොවී මේ රටේ ඉටු කරන්නට තිබෙන මේ දැවැන්ත වූ කාර්ය භාරයට සහයෝගය දක්වා, අනාගත දරු පරම්පරාවට මේ රටේ නිදහසේ ජීවත්වන්නට හැකි පරිසරය ඇති කර දුන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගෙන යන කාර්ය භාරයටද ශක්තිය, ධෛර්ය ලබා දෙන්න කියා ඒ හැම දෙනාගෙන්ම ඉල්ලා සිටිමින්, මට කථා කිරීමට මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් හා නිහඬ වෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව එතුමාත්, ගරු කාරුනාත් බස්නායක නවක මන්ත්‍රීතුමාත් දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කළා.

මානුෂික මෙහෙයුම හේතුවෙන් ශ්‍රී ලාංකික සියලු ජන කොට්ඨාසවලට සාමය භුක්ති විඳීමේ වරප්‍රසාදය අපේ රජය ලබා දුන්නා වාගේම, ඒ ගැටුම් පැවැති ප්‍රදේශවල ජනතාවගේ කැඩී බිඳී ගිය, විනාශ වී ගිය ජන ජීවිත නැවත ගොඩ නැංවීම සඳහා වූ දැවැන්ත මෙහෙවරක්ද අපේ රජය ඉටු කර තිබෙනවා.

විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර ප්‍රදේශවල අවතැන් වූ පවුල් දැනට පදිංචි කර අවසන්. ඒ අනුව උතුරේ පවුල් 153,012ක් ද, නැඟෙනහිර පළාතේ පවුල් 72,464 ක් ද නැවත පදංචි කර අවසන් අවසන් කර තිබෙනවා. කෙසේ වෙතත් 2013 මාර්තු මස 05 වන දින වන විට යාපනය දිස්ත්‍රික්කයේ විවෘත සුබසාධන මධ්‍යස්ථාන 42ක සිටි අවතැන් වූ පවුල් 1195ක පුද්ගලයන් 4205 දෙනෙක් පදිංචිව සිටියා. මේ සුබසාධන මධ්‍යස්ථානවල සිටි පිරිසට අමතරව ස්වකීය ඥාතීන් සහ හිත මිතුරන් සමඟ පවුල් 5249කට අයත් 17,749ක පමණ තවත් අවතැන් වූ පිරිසක් ඉන්නවා. මොවුන්ගේ මුල් ගම්බිම් ජාතික ආරක්ෂක හේතූන් මත ආරක්ෂක හමුදාව විසින් මේ වනතුරු නිදහස් කර නැහැ.

මෙයට අමතරව, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාම්පූර් ප්‍රදේශයේ යෝජිත ආර්ථික මධ්‍යස්ථානය සහ තාප බලාගාරය හේතුවෙන් පවුල් 443ක් සුබසාධන මධ්‍යස්ථාන 03ක පදිංචිව සිටින අතර, තවත් පවුල් 782ක් ස්වකීය ඥාතීන් සහ හිත මිතුරන් සමඟ ජීවත් වෙනවා. මොවුන් වෙනුවෙන් විකල්ප නිවාස ලබා දීමට රජය කටයුතු කර ගෙන යනවා. එලෙස විකල්ප නිවාස පිළිගත් පවුල් 56ක් දැනටමත් යළි පදිංචි කර තිබෙනවා.

ඉහත සුබසාධන මධ්‍යස්ථානවල පදිංචි පවුල් සඳහා මූලික පහසුකම් සහිත නිවාස ඇති අතර, රජය විසින් අවශ්‍ය පොදු පහසුකම්, එනම් පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම සිදු කරනු ලබනවා. මෙම මධ්‍යස්ථානවල ප්‍රතිසංස්කරණ සහ අනිකුත් අදාළ සේවා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය විසින් සිදු කරන අතර, ඒ වෙනුවෙන් මෙම වසරේ රුපියල් මිලියන 28.0ක ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

උතුරේ සුබසාධන මධ්‍යස්ථානවල කලින් පදිංචිව සිටි පිරිස්වලින් පහත සඳහන් පරිදි වරින් වර ආරක්ෂක හමුදා විසින් ඔවුන්ගේ මුල් ගම්බිම් නිදහස් කිරීම හේතුවෙන් යළි පදිංචි කර තිබෙනවා. පවුල් 2043කට අයත් පුද්ගලයන් 6914ක් වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 04ක පූර්ණවශයෙන් සහ තවත් ග්‍රාම නිලධාරී වසම් 05ක අර්ධ වශයෙන් 2011 ජූනි මස යළි පදිංචි කර තිබෙනවා.

තවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02ක ග්‍රාම නිලධාරී වසම් 03කට අයිති පවුල් 639කට අයත් පුද්ගලයන් 2219ක් 2012 නොවැම්බර් මස යළි පදිංචි කර තිබෙනවා.

යාපනය අර්ධ ද්වීපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 435ක් ඇති අතර නැවත පදිංචි කිරීම සඳහා නිදහස් කර නැත්තේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 16ක් හා තවත් ග්‍රාම නිලධාරී කොට්ඨාස 09ක් අර්ධ වශයෙන් වේ. එලෙස නිදහස් කර නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස 03ක බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

ඒ අනුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජය විසින් අතිවිශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරමින් මෙම ජනතාවට සහන සැලසීම සඳහා කටයුතු කර තිබෙනවා. වර්ෂ 30ක පමණ කාල සීමාවක් තුළ ලෝකයේ සිටි දරුණුම ත්‍රස්තවාදී සංවිධානය සමඟ සටන් කළ අවස්ථාවක මිනිසුන් අවතැන් වීම නවත්වන්න අපට පුළුවන්කමක් නැහැ. නමුත් ඒ සිදු වුණු විනාශවලින් ජනතාව මුදා ගෙන, ඔවුන්ගේ ජන ජීවිත ගොඩ නැංවීම සඳහා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය ප්‍රමුඛතාවක් දෙමින්, අනෙකුත් ප්‍රදේශවලටත් වඩා විශාල මුදල් ප්‍රමාණයක් වැය කරමින්, ඒ ප්‍රදේශවල ජනතාවගේ ආර්ථික ශක්තිය ගොඩ නැංවීමට කටයුතු කර තිබෙන බව සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි.

සාමාන්‍යයෙන් ත්‍රස්තවාදී සංවිධානයක් යටපත් කළාට පසු, ඔවුන්ට ත්‍රස්තවාදී ක්‍රියා කිරීමේ ශක්තිය නැති වුණත්, ඔවුන් තුළ තිබූ ඒ සංවිධාන ජාලය වෙනත් විවිධ ආකාරවලින් ක්‍රියාත්මක වන බව අපට පෙනෙනවා. මේ අවස්ථාවේදී එල්ටීටීඊ සංවිධානයේ අන්තර් ජාතික ජාලය විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඔවුන් විසින් ගෙන යනු ලබන විවිධ අසත්‍ය ප්‍රචාර තුළින් මෙරට ජනතාවත් පිටරට ජනතාවත් නොමඟ යැවීමට කටයුතු කරන බව රජය ඉතා හොඳින් දන්නවා. රජය මේ පිළිබඳව අන්තර් ජාතික මට්ටමින් වාගේම ජාතික මට්ටමින්ද ජනතාව දැනුවත් කිරීමත්, විවිධ රටවල නියෝජිතයන් දැනුවත් කිරීමත් කර තිබෙනවා. එය තවදුරටත් කර ගෙන යනවා.

මේ රටේ පොදු රාජ්‍ය මණ්ඩලයීය නායකයන්ගේ රැස්වීම පැවැත්වීමට තීරණය කළාට පසු, මෙවැනි අසත්‍ය ප්‍රකාශ පදනම් කර ගනිමින් එම තීරණය වෙනස් කිරීමට වෙර දරන පිරිස් සිටින බව අපි දන්නවා. ඊයේ විදේශ කටයුතු ගරු ඇමතිතුමා ඒ පිළිබඳව ඉතා සවිස්තරාත්මක ලෙස පැහැදිලි කර දුන්නා. ත්‍රස්තවාදය අවසන් කිරීමේ ඒ දැවැන්ත අභියෝගය මේ රජය භාර ගත්තා වාගේම, අපි කරන සංවර්ධන වැඩ කටයුතු යටපත් කරමින්, විවිධ අසත්‍ය ප්‍රකාශ කරමින් මේ රජයට එරෙහිව ගෙන යන ඒ වැඩ පිළිවෙළ සාර්ථක වීමට මේ රජය ඉඩ තබන්නේ නැති බව මා ප්‍රකාශ කරන්න කැමැතියි. අපි සැම විටම මේ රටට ආදරය කරන රජයක් හැටියට ත්‍රස්තවාදය දුරු කර දැමීමා වාගේම, අසත්‍ය ප්‍රචාර තුළින් ත්‍රස්තවාදයට නැවත හිස එසවීමටත් ඉඩ නොතබන බව ප්‍රකාශ කරමින්, මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමාට ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.02ට, 2013 මාර්තු 07 වන බ්‍රහස්පතින්දා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 7.02 மணிக்கு பாராளுமன்றம், 2013 மார்ச் 07, வியாழக்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 7.02 p.m. until 1.00 p.m. on Thursday, 07th March, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 216 - இல. 3
Volume 216 - No. 3

2013 මාර්තු 07වන බ්‍රහස්පතින්දා
2013 மார்ச் 07, வியாழக்கிழமை
Thursday, 07th March, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

කල්තැබීමේ යෝජනාව:
අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ஒத்திவைப்புப் பிரேரணை :
கல்விக்கான நிதி ஒதுக்கீடு போதாமை

வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

ADJOURNMENT MOTION:
Insufficient Allocation of Funds for Education

WRITTEN ANSWERS TO QUESTIONS

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මාර්තු 07වන බ්‍රහස්පතින්දා
2013 மார்ச் 07, வியாழக்கிழமை
Thursday, 07th March, 2013

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] *මූලාසනාරූඪ විය.*
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] *தலைமை வகித்தார்கள்.*
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2012 දෙසැම්බර් 17 දිනැති අංක 1789/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(ii) 2003 අංක 25 දරන මුදල් පනතේ 2 වගන්තියේ 1 උප වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 දෙසැම්බර් 31 දිනැති අංක 1791/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතින් අවසන් වරට සංශෝධිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1789/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

(i) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 22 දිනැති අංක 1794/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය; සහ

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 22 දිනැති අංක 1794/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය.- [කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

2011 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය: විස්තර
2011 உலகக் கிண்ண கிரிக்கட் போட்டித்தொடர் : விபரம்
2011 WORLD CUP CRICKET TOURNAMENT : DETAILS

1826/'11

2. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3) :

(අ) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියට අදාළව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සිදු කළ වියදම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ප්‍රීමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ විකාශන අයිතිය ලබා දී තිබෙන සමාගමේ නම කුමක්ද;

(ii) එම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන පුද්ගලයා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී ශ්‍රී ලංකාවට ලැබුණු මුදල් සම්භාරයෙන් හම්බන්තොට ක්‍රීඩාංගණය ගොඩනැගීමට සහ අනෙකුත් ක්‍රීඩාංගණ සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

විළයාට්ටුත්තුරை අමைச්சரைக් கேட்ட வினா:

(அ) 2011 உலகக் கிண்ண கிரிக்கட் போட்டித்தொடர் சம்பந்தமாக இலங்கை கிரிக்கட் நிறுவனத்தினால் மேற்கொள்ளப்பட்டுள்ள செலவினங்கள் பற்றிய அறிக்கை ஒன்றைச் சமர்ப்பிக்க முடியுமா என்பதை குறிப்பிடுவாரா?

(ஆ) (i) இலங்கை பிரிமியர் லீக் கிரிக்கட் போட்டித் தொடரின் ஒளிபரப்பு உரிமை வழங்கப்பட்ட கம்பனியின் பெயர் யாதென்பதையும்;

(ii) மேற்படி நிறுவனத்தின் பிரதான நிறைவேற்று உத்தியோகத்தராக செயற்படுகின்ற நபர் யாரென்பதையும்

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா?

(இ) 2011 உலகக் கிண்ண கிரிக்கட் போட்டித் தொடருக்காக இலங்கைக்குக் கிடைத்த பெரும் பணத்தொகையிலிருந்து அம்பாந்தோட்டை விளையாட்டு மைதானத்தை அமைப்பதற்கும் ஏனைய மைதானங்களுக்காகவும் செலவிடப்பட்ட தொகை தனித்தனியாக எவ்வளவென்பதையும் அவர் இச் சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු බුද්ධික පතිරණ මහතා]

asked the Minister of Sports :

(a) Will he state whether he will submit a report on the expenses borne by Sri Lanka Cricket with relevance to the 2011 World Cup cricket tournament?

(b) Will he inform this House of -

(i) the name of company to which the telecast rights of Sri Lanka Premier League cricket tournament have been awarded ; and

(ii) the name of the person who serves as the Chief Executive Officer of the aforesaid institution?

(c) Will he also inform this House of the amounts of money spent separately for the construction of the Hambantota stadium and the other stadiums out of the colossal sum of money received by Sri Lanka at the 2011 World Cup cricket tournament?

(d) If not, why?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට පෙර ඔබතුමාගේ අවධානය යොමු කළ යුතු කාරණයක් තිබෙනවා. මේ ප්‍රශ්නයට මගේ පිළිතුර සූදානම්. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් විටින් විට මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මගෙන් මේ අහන්නේ දොළොස්වන වතාවටයි. එක එක විධියට අහනවා, එකම ප්‍රශ්නය. දොළොස්වන වතාවට මම මේ උත්තර දෙන්නේ. ඔබතුමාගේ අවධානයට ඒකත් යොමු කරනවා. එකම ප්‍රශ්නය විවිධ විධියට අහනවා.

මේ ප්‍රශ්නයට පිළිතුර මෙකයි.

(අ) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියට අදාළව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මුදල් වැය කොට ඇත්තේ ක්‍රීඩාංගණ ඉදි කිරීම හා නවීකරණය සඳහා පමණි. අනෙක් සියලු කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත්තේ අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සලය විසිනි.

(ආ) (i) ශ්‍රී ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ සියලුම වාණිජ අයිතීන් පවරා ඇත්තේ සිංගප්පූරුවේ සමර්සෙට් එන්ටර්ටෙන්මන්ට් වෙන්චර්ස් පුද්ගලික සමාගම බැවින් විකාශන අයිතිය ලබා දීම සිදු කරන්නේ එම සමාගම විසිනි.

(ii) ප්‍රිමියර් ලීග් තරගාවලියේ විකාශන අයිතිය ලබා දීම සම්බන්ධව ක්‍රිකට් ආයතනය කටයුතු නොකළ නිසා විකාශන සිදු කළ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා කවුරුන්ද යන්න ක්‍රිකට් ආයතනය දැනුවත් කර නොමැත.

(ඇ) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියෙන් ලැබුණු මුදල් ක්‍රීඩාංගණ සඳහා වියදම් වූ ප්‍රමාණය

ක්‍රිකට් ක්‍රීඩාංගණ	වැය කළ මුදල (රු.මි.)
මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය-හම්බන්තොට	4,283,971,010,88 මිලියන හාරදහස් දෙසිය අසූතුනක් පමණි.
ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රීඩාංගණය - කොළඹ	1,657,258,697.06 මිලියන එක්දහස් හයසිය පනස්හතක් පමණි.
පල්ලේකැලේ ජාත්‍යන්තර ක්‍රීඩාංගණය - පල්ලෙකැලේ	1,243,418,241.00 මිලියන එක්දහස් දෙසිය හතළිස්තුනක් පමණි.

(ඈ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සඳහන් කළා ක්‍රීඩාංගණ සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණයන්. ක්‍රීඩාංගණ තුනක් වෙනුවෙනුයි මුදල් වෙන් කර තිබෙන්නේ. එයින් දෙකකට දළ වශයෙන් රුපියල් මිලියන 1,200කට ආසන්න ප්‍රමාණයක් වෙන් කරද්දී හම්බන්තොට ක්‍රීඩාංගණයට ඒ වාගේ තුන් ගුණයකටත් වඩා වැඩි මුදලක් වෙන් කර තිබෙනවා. එක ක්‍රීඩාංගණයකට තුන් ගුණයක් වෙන් කරන වෙලාවේ, ඒ මුදලත් කොටස් දෙකකට බෙදලා තව ක්‍රීඩාංගණ දෙකකට දීලා, ක්‍රීඩාංගණ පහකට මුදල් වෙන් කරන්න කටයුතු නොකළේ ඇයි?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමා, මා නැවතත් කියනවා හම්බන්තොට ක්‍රීඩාංගණය සම්බන්ධ ඔය ප්‍රශ්නයට මා දොළොස් වතාවක් පිළිතුරු දී තිබෙන බව. මා ඔබතුමාට නැවතත් පිළිතුර කියන්නම්.

ගරු මන්ත්‍රීතුමා, පල්ලේකැලේ ජාත්‍යන්තර ක්‍රීඩාංගණය සහ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණය නවීකරණයක්. හම්බන්තොට මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය අලුත් ඉදි කිරීමක්. නවීකරණයකට යන වියදමයි, අලුතින් ක්‍රීඩාංගණයක් ඉදි කිරීමට යන වියදමයි දෙකක්. ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේ වාහන නවත්වන්න පුළුවන් 20යි. මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ වාහන 282ක් නවත්වන්න පුළුවන්. අක්කර ප්‍රමාණය ගත්තාමත් හත් ගුණයකින් වැඩියි; seating capacities ගත්තාමත් වැඩියි; pavilion එක ගත්තාමත් දෙදහස් ගණනක් ඉන්න පුළුවන්. වර්ග මීටර් ප්‍රමාණය අනුව ගත්තාම ඒකේ කිසිම වැඩි වීමක් වෙලා නැහැ. ඔබතුමා දන්නවා, ගොඩනැඟිල්ලක් අලුත්වැඩියා කරන්නයි, ගොඩනැඟිල්ලක් අලුතින් හදන්නයි යන වියදම දෙකක් කියලා. ඒ නිසා සාමාන්‍ය ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තුව අනුව මේකේ කිසි වැරැද්දක් නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. දැන් මේ මොහොත වන කොට ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති ධුරය සඳහා උපාලි ධර්මදාස මැතිතුමාගේ නාම යෝජනාව ඔබතුමා නිර්දේශ කර නැහැ කියනවා. ඒ කියන්නේ, දැන් තිලංග සුමතිපාල මහතාගේ නම ඔබතුමා නිර්දේශ කර තිබෙනවාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔබතුමා උත්තරයක් දෙන්න කෝ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උත්තරය තමයි, "අදාළ නොවේ" කියන එක.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ක්‍රිකට් ක්‍රීඩාවට අදාළවයි අහන්නේ. ඇයි, එතුමා මඟ හරින්නේ? අපි දන්නවා, මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට උත්තර දෙන්න පුළුවන් කියලා. එහෙම නම් මේක අදාළ නොවෙන්නේ-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකරලා ඉක්මන් කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, සාධාරණව උත්තර දෙන්න. ඔබතුමා උත්තර දෙන්න පුළුවන් ඇමතිවරයෙක් නේ.

කථානායකතුමා

(ii) එසේ නම්, එම ප්‍රතිලාභ කවරේද;

(iii) එම ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා කටයුතු කළ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් සාමාජිකයාගේ නම, තනතුර සහ ඒ සඳහා ඇති සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

විළයාට්ටුත්තුරෙ අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) 2018 பொதுநலவாய நாடுகளின் விளையாட்டு விழாவை இலங்கை பெற்றுக்கொள்வதற்காக செலவிடப்பட்ட பணத்தொகை எவ்விதம் திரட்டப்பட்டதென்பதையும்;

(ii) மேற்படி செலவுகள் மேற்கொள்ளப்பட்ட விடயங்கள் தனித்தனியாக யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி போட்டியின் அனுசரணை உரிமையை இலங்கைக்கு பெற்றுக்கொள்வதற்காக மேற் கொள்ளப்பட்ட செலவின் காரணமாக இந் நாட்டுக்கு பயன்கள் கிடைத்தனவா என்பதையும்;

(ii) ஆமெனின், கிடைத்த அத்தகைய பயன்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி விளையாட்டு விழாவை இலங்கை பெற்றுக்கொள்வதற்காக செயலாற்றிய குழுவின் அங்கத்தவர் எண்ணிக்கை எவ்வளவென்ப தையும்;

(iv) மேற்படி ஒவ்வொரு அங்கத்தவரினதும் பெயர், பதவி மற்றும் அதற்கான தகைமைகள் தனித்தனியே யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Sports:

(a) Will he state -

(i) the manner in which the amount of money spent to get the opportunity to host the Commonwealth Games - 2018 in Sri Lanka, was obtained; and

(ii) separately, the items on which the above expenses were made?

(b) Will he inform this House -

(i) whether Sri Lanka has received any benefit as a result of the expenses made to get the opportunity to host the aforesaid games in our country;

(ii) if so, the benefits gained;

(iii) the number of members in the Committee which took action to get the opportunity to host the aforesaid games in Sri Lanka; and

(iv) separately, the name, designation and relevant qualifications of each of the aforesaid members?

(c) If not, why?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මුළු ආයෝජනයෙන් යම් ප්‍රතිශතයක් රජයෙන්ද හා ඉතිරිය පෞද්ගලික අංශයෙන්ද ප්‍රතිපාදන සපයා ගෙන ඇත.

පෞද්ගලික අංශයේ මැදිහත්වීම භෞතික හා මූල්‍යමය වශයෙන් අංශ දෙකකින් සිදු විය. භෞතිකව පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයින්, ඉහළ මට්ටමේ ක්‍රීඩකයින්, ගායනයෙන්, නර්තන ශිල්පීන්, කලාකරුවන්, මාධ්‍යකරුවන්, වෛද්‍ය කාර්ය මණ්ඩලය, ක්‍රීඩා පරිපාලකයින්, පරිගණක විශේෂඥයින්, බැංකු කරුවන්, අපනයන ආනයනකරුවන් සහාය ලබා දී ඇත.

මූල්‍යමය වශයෙන් සෘජු මූල්‍ය සහායන් ගෘහ නිර්මාණ සේවා, නවාතැන් පහසුකම්, ගමන් පහසුකම් සහ පරිගණක, විදුලි සන්දේශ යන සේවා සැපයීමේදී නොමිලේ සහ අඩු මිලට ලබා දී ඇත.

(ii) ලංසු පත්‍රිකාව සකස් කිරීමේ කාර්යයේ යෙදුණු පී.එම්.සී. ලෙගසි සමාගම සඳහා

	රුපියල් මිලියන
වෘත්තිමය සේවය	331,354,502
ගුවන් ටිකට්පත් සඳහා	4,037,988
නවාතැන් සහ අනිකුත් වියදම්	2,959,072
	338,357,562

විශේෂ පර්යේෂණ කටයුතු සඳහා

	රුපියල් මිලියන
නාගරික සංවර්ධන අධිකාරිය	2,966,786
ද නිල්සන් සමාගම	1,313,760
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව	61,000
මුදුණය කිරීමේ වියදම්	3,064,500
	345,757,608

(ආ) (i) ඔව්.

(ii) 2018 පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම අරමුණු කොට ලන්සු පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමේදී ඉහත සඳහන් වියදම් දැරීමට අනිවාර්යයෙන්ම සිදු වේ. එම ලන්සුව ශ්‍රී ලංකාවට නොලැබුණු බැවින් 2018 පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නිබූ අවස්ථාව අහිමි විය.

(iii) සාමාජික සංඛ්‍යාව 04කි.

(iv)

	නම	තනතුර සහ සුදුසුකම්
01	ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා	ක්‍රීඩා අමාත්‍ය
02	අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා	ශ්‍රී ලංකා මහ බැංකු අධිපති
03	ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා	පාර්ලිමේන්තු මන්ත්‍රී - හම්බන්තොට
04	ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා	විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා සහ වොලිබෝල් සංගමයේ සභාපති

(ඇ) පැන නොනඟී.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, 2018 පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලේ ලංසු තැබීමේ ලියවිල්ලට කීයක් වැය වුණාද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒක මේ වෙලාවේ කියන්න අමාරුයි ගරු මන්ත්‍රීතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ලංසුව සඳහා රුපියල් මිලියන 400ක් කියලා තමයි මේකේ සඳහන් වෙලා තිබෙන්නේ. අනෙක් වියදම් අත හැරලා මම කිව්වේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට මේ වෙලාවේ ඒක හරියටම කියන්න අමාරුයි ගරු මන්ත්‍රීතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ඒ කමිටුවේ සභාපතිතුමාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔව්, මම තමයි ඒ කමිටුවේ සභාපතිතුමා. නමුත් ඒකේ මූල්‍ය කටයුතු මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි සිදු කෙරුණේ. තරගාවලිය සංවිධානය කිරීමේ කටයුත්ත තමයි එහිදී අපි කළේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ළඟ තිබෙන මේ පුවත් පත් ලිපියේ, ඒ කමිටුවේ සභාපතිතුමා විධියට සඳහන් කරලා තිබෙන්නේ අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයාගේ නම. ඒකයි මම මේ කියන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, සභාපතිතුමා හැටියට මමයි කටයුතු කළේ. එහි මූල්‍ය කටයුතු පිළිබඳ සභාපති විධියට කටයුතු කළේ එතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2011 වර්ෂයේ "ලංකාදීප" පත්‍රයක පළ කරලා තිබෙනවා,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය, ප්‍රශ්නය අහන්න. කථාවක් කරන්න බැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මම අහන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔය කීවැනි ප්‍රශ්නයද? ඔබතුමා දැන් අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2018 පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලේ සංවිධායක කමිටුවේ සභාපති සහ මහ බැංකුවේ අධිපති කියලා තමයි සඳහන් කරලා තිබෙන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔය දෙවැනි අතුරු ප්‍රශ්නය නේද ඇහුවේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, පළමුවැනි අතුරු ප්‍රශ්නයට ඔබතුමා කිව්ව එකට,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ, එහෙම බැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම බැහැ නේද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම බැහැනේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සභාපතිතුමා කවුද කියලා හොයා ගන්න බැරුවයි මම මේ දහලන්නේ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මෙතුමා කියනවා "මම" කියලා. අපිත් නිවාඩ් කබ්රාල් මහත්මයා කියනවා එතුමා කියලා.

ලංසුවේ ගණන කීයද ඇහුවාම කමිටුවේ සභාපතිතුමා ඒක දන්නේ නැහැ. සභාපතිතුමා ඒක දැන ගන්න ඕනෑ නේ. එහෙම නම් මම නිවාඩ් කබ්රාල් මහත්මයාගෙන් ඒ ගැන අහන්නම්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔය කී වෙනි අතුරු ප්‍රශ්නයද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේවා අදාළ පළමුවෙනි අතුරු ප්‍රශ්නයටම තමයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, මේ දෙවෙනි අතුරු ප්‍රශ්නය. ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට පැහැදිලිවම කිව්වා මේ කමිටුවේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් සිටියේ නිවාඩ් කබ්රාල් මහත්මයා කියලා. එතුමා තමයි ඒ සියලු කටයුතු කළේ. ඔබතුමා ප්‍රශ්නයක් හැටියට ලංසුවේ ගණන විතරක් ඇහුවා නම් මම ඒ ප්‍රශ්නයට අද උත්තරය දෙනවා. ඔබතුමා මගෙන් අහන්නේ අවුරුදු 2කට පෙර වුණ සිද්ධියක් ගැන. ඔබතුමා මගෙන් මේ පිළිබඳව වෙනම ප්‍රශ්නයක් ඇහුවොත්, -ඕනෑ නම්- ඔබතුමාට වෙනම පාර්ලිමේන්තුවේදී පිළිතුරක් දෙන්නම්. දැන් අවසාන අතුරු ප්‍රශ්නය අහන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අවසාන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඔබතුමා කියන නිසා මම එහෙම කරන්නම්. 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා කටයුතු කළ කමිටුවේ හිටපු සභාපතිතුමා විධියට මුදල් මෙපමණයි කියලා දැන ගන්න ඕනෑ නේ. සභාපතිවරයා දන්නවා මෙපමණ මුදල් ප්‍රමාණයක් ගියා කියලා. අවුරුදු කීයක් ගියත් ඔබතුමාට එහෙම අමතක වුණා කියලා කියන්න බැහැ. ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක් නේ. ඒ නිසා රුපියල් මිලියන 400ක් මේ ලංසුවට ගියා කියලා සභාපතිවරයා විධියට ඔබතුමා පිළිගන්නවාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, මට හරියටම සංඛ්‍යාව කියන්න අමාරුයි. නමුත් මේක ජාත්‍යන්තර තරගයකට ලංසු ඉදිරිපත් කිරීමක්. ප්‍රදේශීය ලේකම් කොට්ඨාස තරඟාවලියකට නොවෙයි මේ ලංසු ඉදිරිපත් කළේ. ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක් ඡන්දය දෙන, ජාත්‍යන්තර තරඟාවලියක්. එවැනි ක්‍රීඩා තරගයක් සඳහා ලංසු ඉදිරිපත් කිරීමේදී ලංසු ඉදිරිපත් කිරීමට පිළිගත් කෙනෙක් සොයන්නට ඕනෑ. අපි ඒ සඳහා යොදා ගත්තේ ජාත්‍යන්තර අත්දැකීම් තිබෙන සමාගමක්. ඒ සඳහා යම් මුදලක් වැය කළා. මම මේ සම්බන්ධයෙන් වැය වූ සියලුම මුදල් සම්බන්ධයෙන් කලින්, පාර්ලිමේන්තුවේදී උත්තර දීලා තිබෙනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මගෙන් ඇහුවා. කොපමණ මුදලක් මේ සඳහා වැය කළාද කියන සියලු කාරණා සම්බන්ධයෙන් අපි උත්තර දීලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මුදල් වැය කරන විට පාර්ලිමේන්තුවට වාර්තා කරනවා නම්, මේ වාගේ කිසි ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, සමාවන්න. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේදී මේ සියලුම කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළා. මෙතුමා මගෙන් මේ පිළිබඳව වෙනම ප්‍රශ්නයක් ඇහුවා නම් මට පිළිතුරු දෙන්න තිබුණා.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය : වගකීම්
இலங்கைத் துறைமுக அதிகாரசபை: பொறுப்புகள்
SRI LANKA PORTS AUTHORITY : LIABILITIES

2191/'11

13. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත වගකීම් ප්‍රමාණය එක් එක් වරාය අනුව කවරේද;

(ii) වරාය අධිකාරිය විසින් ඇපවීම් සහ බැංකු ඇප ලබාදුන් හෝ ඔවුන් විසින් ලබා නොගත් ණය සඳහා වගකීම භාරගත් අවස්ථා කවරේද;

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ එළඹී ගිවිසුම ඉහත (අ)(i)හි දී ඇති වගකීම් සඳහා ඇතුළත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා වරාය අධිකාරියට අයත් හෝ වරාය අධිකාරිය වෙත පවරා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි වරාය අධිකාරියට අයත් ඉඩම් එම ඉඩම්වල ප්‍රමාණයන්ද සමඟ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වෙන් කර ඇති ඉඩම්වල සිදුකරමින් තිබෙන ක්‍රියාකාරකම් කවරේද;

(iv) වරාය අධිකාරිය විසින් නඩත්තු කිරීම සඳහා මුදල් වියදම් දරන ඉඩම් හෝ ගොඩනැගිලි සහිත ඉඩම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2011 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලැබූ ශුද්ධ ලාභය කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

තුරෙමුකඟ්කළ, නෙදුඟ්සාලෙකළ අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) ඉලංකෙත් තුරෙමුක අතිකාරසපෙයින් පොරුප්පුකළ ඔව්වොරු තුරෙමුකත්තුක්කුමාක තනිත්තනියාකවුම්;

(ii) තුරෙමුක අතිකාරසපෙ තංකළාල් පෙරප්පටාත කටනුක්කාක උත්තරවාතම් කොටුත්ත අල්ලතු වංකි උත්තරවාතම් කොටුත්ත අල්ලතු පොරුප්පුකළෙ වකික්කුම් සන්තර්ප්පංකළෙයුම්;

(iii) (අ) (i) ඉල් කුරිප්පිටප්පට්ට පොරුප්පුකළිල් ඉලංකෙ කිරික්කෙට් සපෙක්කු වළංකප්පට්ට පොරුප්පුකළ් සිරප්පාකක් කූරප්පට්ටුල්ළතා එන්පතෙයුම්

අවර් ඉච්සපෙක්කුත් තෙරිවිප්පාරා?

(ආ) (i) නාට්ටිල් තුරෙමුක අතිකාරසපෙක්කුච් සොන්තමාන අල්ලතු තුරෙමුක අතිකාරසපෙක්කු උරිත්තාන නිලංකළින් විස්තීරණත්තෙයුම්;

(ii) කොළුම්පු මාවට්ටත්තිල් තුරෙමුක අතිකාරසපෙක්කුච් සොන්තමාන නිලංකළින් විස්තීරණත්තෙත් තනිත්තනියාකවුම්;

(iii) තුරෙමුක අතිකාරසපෙයින් ඔතුක්කප්පට්ටුල්ළ අල්ලතු නිරුවප්පට්ටුල්ළ නිලංකළිල් මේට්කොල්ළප්පටුම් සෙයට්පාටුකළෙයුම්;

(iv) තුරෙමුක අතිකාරසපෙ පරාමරිප්පුක්කාකච් සෙලවුසෙය්යුම් නිලංකළ් අල්ලතු කට්ටිටංකළෙක් කොණ්ට නිලංකළෙයුම්

අවර් කූරුවාරා?

(இ) 2011ஆம் ஆண்டு முதல் இற்றைவரையான இலங்கைத் துறைமுக அதிகாரசபையின் தேறிய இலாபத்தையும் அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he inform this House -

(i) the total liability of Ports Authority of Sri Lanka on per port basis;

(ii) the instances where the Ports Authority has given guarantees, bank guarantees or undertaken liabilities for loans not taken by them; and

(iii) whether the undertaking given to Sri Lanka Cricket is highlighted within the liabilities given in (a) (i) above?

(b) Will he state -

(i) the extent of lands in the country owned by the Ports Authority or vested in the Ports Authority;

(ii) the lands in the Colombo District owned by the Ports Authority along with the extent separately;

(iii) the activities that are being done on the allocated or erected lands of the Ports Authority; and

(iv) the lands or lands with buildings that the Ports Authority expends money for maintenance?

(c) Will he also state the net profit of the Ports Authority of Sri Lanka for the year 2011 to date ?

(d) If not, why?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Minister of Ports and Highways)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි

(අ) (i)

ජංගම හා ජංගම නොවන වගකීම්.

විස්තර		2011		
	කොළඹ වරාය (රු)	ත්‍රිකුණාමල ය වරාය (රු)	ගාල්ල වරාය (රු)	එකතුව (රු)
ජංගම හා ජංගම නොවන වගකීම්	135,217,363,257 (දහතුන් දහස් පන්සිය විසිඑක් කෝටි හැත්තෑතුන් ලක්ෂ හැට තුන්දහස් දෙසිය පනස් හතයි)	179,692,284 (දාහත් කෝටි අනූ හය ලක්ෂ අනූ දෙදහස් දෙසිය අසූ හතරයි)	211,733,223 (විසි එක් කෝටි දාහත් ලක්ෂ තිස් තුන් දහස් දෙසිය විසි තුනයි)	135,608,788,764 (දහතුන් දහස් පන්සිය හැට කෝටි අසූ හත් ලක්ෂ අසූ අටදහස් හත්සිය හැට හතරයි.)

[ගරු රෝහිත අබෙගුණවර්ධන මහතා]

(ii) ශ්‍රී ලංකා වරය අධිකාරිය සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම් වෙනුවෙන් හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘති කොන්ත්‍රාත්තුව සඳහා විවෘත්‍ය නියෝගයක් නිකුත් කරන ලදි. මෙමඟින් කොන්ත්‍රාත්කරු සඳහා තාවකාලික වගකීමක් ඇති කර ඇත. මෙම වගකීමෙන් කොටසක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සපයන ලද මුදල්වලින් දැනටමත් පියවා ඇත.

(iii) නැත.

(ආ) (i)

	වරාය	ඉඩම් ප්‍රමාණය අක්කර
1	කොළඹ වරාය	522
2	ත්‍රිකුණාමලය වරාය	5108
3	ඔලුවිල් වරාය	175
4	ගාල්ල වරාය	94
5	හම්බන්තොට වරාය ආශ්‍රිත ඉඩම්	2728
6	වෙනත්	110
7	එකතුව (7=1+2+3+4+5+6)	8737

ඇමුණුම

කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි වරාය අධිකාරිය සතු ඉඩම්

අනු අංකය	විස්තරය	අක්කර	රූඩ්	පර්චස්
	වරාය අධිකාරිය නිල නිවාස			
1	තනිකඩ නේවාසිකාගාරය, රොක් හවුස්ලේන්, කොළඹ 15	0	3	6.00
2	ද සේරම් පෙදෙස නිල නිවාස, කොළඹ 15	3	2	35.00
3	එළිහවුස් පෙදෙස නිල නිවාස, කොළඹ 15	6	3	31.00
4	ඩිප්දීන් නිල නිවාස, අළුත්මාවත පාර, කොළඹ 15	2	0	8.00
5	සල්ගාදු නිල නිවාස, අළුත්මාවත පාර, කොළඹ 15	1	0	30.00
6	ශාන්ත ජේම්ස් වීදිය නිල නිවාස, කොළඹ 15	0	1	2.00
7	බලුමැන්ඩල් පෙදෙසේ නිල නිවාස, කොළඹ 15	29	2	14.00
8	රාමනාදන් මාවත නිල නිවාස, කොළඹ 13	1	1	23.00
9	අළුත්මාවත නිල නිවාස (ගල්පල්ලිය අසල), කොළඹ 15	3	3	34.00
10	අළුත්මාවත නිල නිවාස, කොළඹ 15	0	0	27.00
11	අබ්දුල්හමීඩ් වීදිය නිල නිවාස, කොළඹ 12	0	1	36.00
12	වාර්ලිමන්ට් පාර නිල නිවාස, කොළඹ 06	0	0	23.52
13	බෞද්ධාලෝක මාවත නිල නිවාස, කොළඹ 07	0	1	21.76
14	වෝල්ස් මාවත නිල නිවාස, කොළඹ 15	0	3	10.00
15	මෝගන් පාර නිල නිවාස, කොළඹ 02	1	1	9.00
	ඉඩම			
16	බෙරේ වැව අවට ඉඩම් (ඩී.ආර්.විජේවර්ධන මාවත මොගන් පාර කිව් පාර)	16	3	16.48
17	කැනල් අංගනය, කොළඹ 01	5	1	32.00
18	සෙබස්තියන් ඉඩම, කොළඹ 10	0	2	33.00
19	වරාය පිවිසුම් මාර්ගයට යාබදව ඇති ගුදම හා ඉඩම	1	2	13.70
20	මහපොළ අභ්‍යාස ආයතනය, කොළඹ 15	13	6	27.00
21	මහපොළ අභ්‍යාස ආයතනයට යාබද තෙල් ටැංකි සහිත ඉඩම කොළඹ 15	0	3	37.71
22	මහපොළ අභ්‍යාස ආයතනය ඉදිරිපිට ඉඩම, කොළඹ 15	0	0	18.10
23	ධීවර වරාය ප්‍රදේශය, කොළඹ 15	4	0	3.00
24	අංක 126, අළුත්මාවත පාරේ කොළඹ 15	0	0	20.97
25	රොක් හවුස් මාවතේ පිහිටි ඉඩම, කොළඹ 15	0	0	1.72
26	රොක් හවුස් මාවතේ පිහිටි ඉඩම, කොළඹ 15	1	0	22.82
27	වෝල්ස් පටුමගේ තෙල් ටැංකි සංකීර්ණය, කොළඹ 15	9	0	1.30
28	ඛාන් ඔරලෝසු කණුව ඉදිරිපිට කොළඹ 01	0	0	2.20
29	අංක670, බලුමැන්ඩල් පාර, කොළඹ 15	0	0	10.00
30	අංක 30, එලිලේන්, කොළඹ 15	0	1	4.87
31	අංක 668, බලුමැන්ඩල් පාර, කොළඹ 15	0	0	6.05
32	අංක 680, බලුමැන්ඩල් පාර, කොළඹ 15	0	0	17.00
33	ඩිලාසාල් වීදිය, කොළඹ 15	0	0	30.26
34	අළුත්මාවත පාර, කොළඹ 15	1	3	27.00
35	සමර්හිල් පෙදෙසේ ඉඩම, කොළඹ 15	0	1	22.00
36	බලුමැන්ඩල් පාර (හින්දූ සිද්ධස්ථානය), කොළඹ 15	0	0	12.60
37	ද සේරම් ගේට්ටුව අසල ඉඩම (බෞද්ධ සිද්ධස්ථානය), කොළඹ 15	0	0	23.62
38	බලුමැන්ඩල් පාර (බෞද්ධ සිද්ධස්ථානය), කොළඹ 15	0	0	30.00
	උප එකතුව	**111**	**1**	**3.68**
39	කොළඹ වරාය ඇතුලත ඉඩම්	410	0	0.00
	මුළු එකතුව	**521**	**1**	**3.68**

(ii) අදාළ තොරතුරු ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) සියලුම ඉඩම් සම්බන්ධයෙන් විස්තරයක් තිබෙනවා. කියවන්නට දීර්ඝ කාලයක් යනවා. මා එය **සභාගත*** කරනවා.

(iv) වරාය අධිකාරිය සතු සියලුම ඉඩම් හා දේපළ නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම සඳහා වරාය අධිකාරිය කටයුතු කරනු ලබයි.

(ඇ)

කාලය	ශුද්ධ ලාභය(රු.මිලියන)	වෙනත් කරුණු
2011 වර්ෂය	583	බදු හා විදේශ විනිමය ලැබීම්/ පාඩු පසු ශුද්ධ ලාභය
2012 ජූනි දක්වා	7,213	බදු හා විදේශ විනිමය ලැබීම්/ පාඩු පෙර ලාභය

(ඈ) පැන නොනඟී.

සභාමේසය මත තබන ලද ඇමුණුම:
සභාපීඨයේ මේසය මත තබන ලද ලිඛිත පිළිතුර :
Annex tabled:

**** සභාමේසය මත තබන ලද ලේඛනය:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :*
** Document tabled:*

පැලිගොඩ ඉඩම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට භාවිතා කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යෝජිත පරිපාලන ගොඩනැඟිල්ල ඉදිකිරීම් සඳහා කැනල් අංගනය වෙන් කර ඇත.

කිව් පාරේ පිහිටි ඉඩම වරාය අධිකාරියේ ඉංජිනේරු කොට්ඨාසය මඟින් ගබඩා ද්‍රව්‍ය සුරක්ෂිතව තැබීම සඳහා යොදවා ඇත.

කොළඹ 02 මෝගන් පාරේ පිහිටි ඉඩම වරාය සේවකයන් සඳහා නිල නිවාස ඉදි කිරීම සඳහා වෙන් කර ඇත.

බෙරේ වැව අවට ඉඩම් රාජ්‍ය ආරක්ෂක හා සංවර්ධන අමාත්‍යාංශය සමඟ එක්ව සංචාරක කලාපයක් ඇති කිරීම සඳහා ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කිරීමට නියමිතව ඇත.

මහර ගල්වල පරිශ්‍රය නැව් අලුත්වැඩියා කිරීම සම්බන්ධ ආයතනයකට අංගනයක් ඉදිකිරීම සඳහා ලබා දීමට නියමිතය.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම් කොටස් කිහිපයක් වරාය ආශ්‍රිත කර්මාන්ත කිහිපයක් සඳහා බදු වශයෙන් ලබා දී ඇත. ඉතිරි ඉඩම් කොටස් සඳහා ආයෝජන කැඳවා ඇත. ඉඩම් කොටස් කිහිපයක අනවසර පදිංචිකරුවන් රැඳී සිටියි.

ඔලුවිල් වරාය ආශ්‍රිත ඉඩම් ඔලුවිල් වරාය ඉදිකිරීම් හා වරාය සංවර්ධන කටයුතු සඳහා යොදා ගෙන ඇත.

ගාල්ල වරාය ආශ්‍රිත ඉඩම් ඉදිරි සංවර්ධන කටයුතු සඳහා සහ සංවර්ධන සැලැස්මට අනුව පරිසර හිතකාමී සංවර්ධනයක් සඳහා යොදා ගැනීමට නියමිතය.

මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය ආශ්‍රිත ඉඩම් වරාය කටයුතු හා ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට නියමිතය.

කන්කසන්තුරේ හා පේදුරුතුඩුව වරායන් ආශ්‍රිත ඉඩම් වරාය කටයුතු හා ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට නියමිතය.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් අහහරුවාදා උත්තරයක් දුන්නා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා කිව්වා, container movements අනුව ආදායමේ වර්ධනයක් තිබෙනවාය කියා. 2012 වර්ෂයේ නොවැම්බර් මාසය, දෙසැම්බර් මාසය සහ 2013 ජනවාරි මාසය වන විට සියයට 2.1ක් ඊට පෙර අවුරුද්දට වඩා ආදායම අඩු වෙලා තිබෙනවා. ඔබතුමා සඳහන් කළා, වාර්තාගත වැඩි වීමක් තිබෙනවාය කියා. ඒ අවස්ථාවේදී විස්තර මා ළඟ නොතිබුණු නිසයි ඇමතිතුමනි, අතුරු ප්‍රශ්න අහන්න බැරි වුණේ. ඔබතුමා දත්ත දීලා තිබුණේ 2011 වර්ෂයටයි. 2012 වර්ෂයේ ආදායම අඩු වෙලා තිබෙනවා. මේ සම්බන්ධව ඇමතිතුමා වශයෙන් ඔබතුමා මොනවාද කරන්නේ?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ගරු කථානායකතුමනි, රවි කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නයේ (ඇ) කොටසෙන් විතරයි අපේ ශුද්ධ ලාභය සහ පාඩුව ගැන අහලා තිබෙන්නේ. මුළු ප්‍රශ්නයෙන්ම අහලා තිබෙන්නේ වරාය අධිකාරිය සතු ඉඩම් සහ දේපොළ සම්බන්ධවයි. එදා ඔබතුමා ඇසූ ප්‍රශ්නවලට අපි පිළිතුරු සැපයුවා. වසර 5කදී අපේ වර්ධනය, ඒ වාගේම 2012 වර්ෂයේදී ලැබූ ලාභය සම්බන්ධයෙන් අපි ඔබතුමාට කරුණු ඉදිරිපත් කළා. තවත් ප්‍රශ්නයක් අහනවා නම් මට ඒකට උත්තර දෙන්න පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඇමතිතුමනි, ඔබතුමා පිළිතුර සභාගත කළාම ගෙදර ගිහින් ඒක විශ්ලේෂණය කරලා තමයි අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් වන්නේ.

අද ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්නේ ඔබතුමා විෂය භාර ඇමතිවරයා හැටියටයි. වරායේ සභාපති කැඳවූ අවස්ථාවේදී අප අහපු ප්‍රශ්නවලට එතුමා උත්තර දෙන කොට ඔබතුමා බලා ගෙන හිටියා. ඒ දී තිබෙන ගිණුම් හරිද? ඒකේ මූල්‍යමය කොටස මුදල් අමාත්‍යාංශයට බාර දී තිබෙනවා. වරාය අධිකාරියේ - Ports Authority එකේ- අලාභය, හම්බන්තොට වරායේ තිබෙන වියදමත් එක්ක ගත්තාට පස්සේ මිලියන 3,800යි. ඇයි මේවා වසන් කරන්නේ, ගරු ඇමතිතුමනි?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාට මේක බාර දී නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

විස්තර නැතිව ප්‍රශ්නය අහන්න. ප්‍රශ්නය අහන්න, එතකොට එතුමාට පිළිතුරු දෙන්න පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්න වචන දෙකෙන්, තුනෙන් අහන්න ගියොත් අපි ප්‍රශ්න අහලා වැඩක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එහෙම නම් මෙතැන තිබෙන ක්‍රමවේදයන් වෙනස් කරන්න ඕනෑ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Standing Orders වෙනස් කරන්න වෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, තමුන්නාන්සේට ඕනෑ විධියට බැහැ නේ මේක කරන්න. එහෙම නම් මේ ගැන සාකච්ඡා කරලා අප මේ ස්ථාවර නියෝග වෙනස් කරගෙන එහෙම කරමු. ඔය ඔක්කොම විස්තර කියන කොට පිළිතුරු දෙන එක්කෙනාටත් පැටලෙනවා. ඒ නිසා තමන්ට දැන ගන්න ඕනෑ දේ කෙටියෙන්, සෘජුව අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්ථාවර නියෝග අනුව -

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ප්‍රශ්නය අහන්න. ප්‍රශ්නය අහනවා වෙනුවට ජාතක කථා කියන එක නවත්වන්න කියලායි කියන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එදා මා ප්‍රශ්න ඇහුවේ නැත්තේ ලාභයක් තිබුණාය කියලා කිවූ නිසායි. පස්සේ තමයි පෙනෙන්නේ ලාභය මූල්‍ය ව්‍යදම් වෙනුවෙන් සම්පූර්ණයෙන්ම මුදල් අමාත්‍යාංශයට වෙන් කළාය කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුරු දෙන කොට විස්තර කරන්නේ නැතිව කෙටියෙන් පිළිතුරු දෙන්න. එතකොට එතුමාට අවස්ථාව තිබෙනවා, තව ප්‍රශ්න අහන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, මා බොහොම පැහැදිලිව එතුමාට ලාභය ගැන කිව්වා. එතුමාට මා දීපු එක - [බාධා කිරීමක්] මා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන සංඛ්‍යා ලේඛන වැරැදි නම් -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අප මෝඩයෝ වශයෙන් සලකන්න එපා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඉතින් අහගෙන ඉන්නේ නැහැ නේ. [බාධා කිරීම්] මෙතුමාගෙන් ණය අරගෙන වාගෙයි හරියට කථා කරන්නේ. මා දී තිබෙන සංඛ්‍යා ලේඛන වැරැදි නම් මේ පාර්ලිමේන්තුවට රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න, මා වැරැදි තොරතුරු සපයනවාය කියලා. ගරු කථානායකතුමනි, මා වග කීමෙන් කියනවා, මා ඉදිරිපත් කළ හැම සංඛ්‍යා ලේඛනයක්ම සත්‍යයි කියා. සත්‍ය තොරතුරු තමයි මා තමුන්නාන්සේට ඉදිරිපත් කළේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, දැන් එතුමා පිළිතුරක් දී තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි මේක වසන් කරන්නේ? ඒක මුදල් අමාත්‍යාංශයට බාර දීලායි තිබෙන්නේ. ශුද්ධ ලාභය කිව්වාම මූල්‍ය වටිනාකමත් ඒකට එකතු කරන්න ඕනෑ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
දෙවි හාමුදුරුවනේ! ශුද්ධ ලාභය ගැන තමයි දැන් කිව්වේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ශුද්ධ ලාභය කියන්නේ? එකැන දීලා තිබෙන්නේ operating profit එක. ඔබතුමන්ලා අපත් එක්ක ගිණුම් සම්බන්ධයෙන් සෙල්ලම් කරන්න එපා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena) \
මේ තොරතුරු දෙන්නම්, ගෙදර අරගෙන යන්න. මම ආපසු මේ ගැන කියන්නම් ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මා හිතන හැටියට වාද කරන්න තිබෙන්නේ මෙතැන නොවෙයි. ඒකට අදාළ කමිටුවක් තිබෙනවා. ඒ කමිටුවට යන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
උපදේශක කාරක සභාවට එන්න, මන්ත්‍රීතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට කියන්න කොයි උපදේශක කාරක සභාවටද කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක සොයා ගන්න ඔබතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කියන දේ මම කරන්නම්. මට කියන්න කොහෙන්ද ඒක කරන්න පුළුවන් කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මගේ කාමරයට ඇවිත් ඕක ඇහුවා නම් මම කියනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පසුව මම ඇවිල්ලා ඔබතුමා එක්ක කථා කරන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය ගරු කථානායකතුමනි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මේ දෙවන අතුරු ප්‍රශ්නයලු, හතක් විතර අහලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ අවසාන අතුරු ප්‍රශ්නය. ඉවසීමෙන් අහන්න. ඉවසීමෙන් පිළිතුරු දෙන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් වරායවල් ගණනාවක් හදලා තිබෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
පක්ෂයෙන් අහන්නත් බැහැ නේ, මගෙන් අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි, පක්ෂයෙන් අහන්න බැරි මොකද? ඔබතුමා වයර් මාරු කර ගන්න එපා. අපේ පක්ෂයේ වැඩ ටික අපි කර ගන්නම්. මම මේ අහන්නේ ජාතික ප්‍රශ්නයක් ගැන.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විහිළුවට ගන්න එපා. වගකීමෙන් කටයුතු කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් වරාය ගණනාවක් හදලා තිබෙනවා. කන්ටේනර් ප්‍රමාණය සියයට 2.4ක ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවා. ඉන්දියාවෙන් ලංකාවට අපනයනය කරන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. මින් පසුව කන්ටේනර් කොහෙන්ද සොයා ගන්න පුළුවන් වන්නේ, අලාභයක් නොවන විධියට කොහොමද කටයුතු කරන්නේ කියන එක ඇමතිතුමා කරුණාකරලා අපට හෙළිදරවු කරන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, අපි බොහොම පැහැදිලිව මතක් කරන්නට ඕනෑ. ලෝකයේ අනෙකුත් වරායවල් සමඟ තරඟකාරිත්වයට ගැළපෙන ආකාරයට තමයි අපි දකුණු කොළඹ වරායේ වැඩ ආරම්භ කරලා තිබෙන්නේ. දිය කඩනය අවසන් කරලා තිබෙනවා. දකුණු කොළඹ වරාය, ඒ වාගේම පළමුවන දකුණු පර්යන්තය, නැගෙනහිර පර්යන්තය යන මේවායේ වැඩ අවසන් කරන්නේ අවුරුදු 25කින් 50කින් -ඉදිරියේදී - එන විශාල නැව් ඇතුළත් කර ගනිමින් මේ වරාය ක්ෂේත්‍රය දියුණු කරන්නයි. අපට ඉදිරි අනාගතයේදී මේ කොළඹ වරායෙන් විතරක් මුළු ආසියාවම එක්ක තරඟ කරන්න බැහැ. ඒ නිසා තමයි අපි මේවා වැඩි දියුණු කර ගෙන අපේ බහලුම් වැඩි කර ගැනීමට මේ වරායවල් ඇති කරන්නේ. මේ රටවල් එක්ක තිබෙන තරඟකාරිත්වයට අපිත් ඇතුළු වෙලා ලෝකයේ ප්‍රධාන වරායවල් දහයට ඇතුළත් වීමේ වගකීමෙන් අපි මේ කටයුතු කර ගෙන යනවා ගරු මන්ත්‍රීතුමා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් හොඳයි.

"සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩ පිළිවෙළ: වතු සේවක නිවාස

"செமட நிவசக்-ஹிதட செவணக்" வேலைத்திட்டம்: தோட்ட ஊழியர்களுக்கு வீடுகள்

"SAMATA NIWASAK-HITHATA SEVANAK" PROGRAMME : HOUSES FOR ESTATE WORKERS

2221/'12

14. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩ පිළිවෙළ යටතේ, වර්ෂ 2015 වන විට සෑම වතු සේවක පවුලකටම මූලික පහසුකම් සහිත නව නිවසක් ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වන විට නව නිවාස හිමි වූ වතු සේවක පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ඉදි වෙමින් පවතින වතු නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

නිර්මාණ, පොරියියල් සේවෛකළ්, වීඩමෛප්පු, පොදුවසතිකළ් අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) மகிந்த சிந்தனை தொலைநோக்குக் கொள்கைகளில் "செமட நிவசக்-ஹிதட செவணக்" வேலைத்திட்டத்தின் கீழ் 2015ஆம் ஆண்டாகின்றபோது சகல தோட்ட ஊழியர்களின் குடும்பங்களுக்கும் அடிப்படை வசதிகளைக்கொண்ட புதிய வீடொன்றை வழங்குவதாக வாக்குறுதி அளிக்கப்பட்டுள்ளதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வாக்குறுதிக்கமைய இதுவரை புதிய வீடுகள் கிடைக்கப்பெற்ற தோட்ட ஊழியர் குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) தற்போது நிர்மாணிக்கப்பட்டுவரும் தோட்ட வீடுகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Is he aware that a pledge was made under the "Samata Niwasak - Hithata Sevanak" programme of the Mahinda Chintana - A vision for the future manifesto that each estate worker family would be provided with a new house with basic facilities by the year 2015 ?

(b) Will he inform this House of the number of -

(i) estate worker families that have received new houses as per the pledge mentioned above ; and

(ii) estate houses that are being constructed at present ?

(c) If not, why ?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) වතු සේවක පවුල් 2,558යි.

නිවාස හිමි වූ වතු සේවක පවුල්

වතු නිවාස ඉදි කරන ලද ආයතනය	ඉදි කරන ලද නිවාස සංඛ්‍යාව			
	2010	2011	2012	එකතුව
වැවිලි මානව සංවර්ධන භාරය	-	161	70	231
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	1619	397	311	2327
එකතුව				2558

(අ) (ii) වතු නිවාස සංඛ්‍යාව 4,031කි.

එක් එක් වර්ෂවල ඉදි වෙමින් පැවති වතු නිවාස

වතු නිවාස ඉදි කරන ලද ආයතනය	ඉදි වෙමින් පවතින නිවාස සංඛ්‍යාව			
	2010	2011	2012	එකතුව
වැවිලි මානව සංවර්ධන භාරය	378	489	603	1470
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	1248	831	482	2561
එකතුව				4031

(ඇ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 1994 වන කොට වතු නිවාස 230,000ක අවශ්‍යතාවක් තිබුණා. මා අහන්න කැමැතියි, මහින්ද චින්තනයේ සඳහන් වූ ආකාරයට 2015 වන විට ඒ කාල වකවානුව තුළ වතු නිවාස සියල්ලේම අඩු පාඩු මහ හරවා ගෙන මේ සියලුම වතු නිවාස ඉදි කරන්නට හැකියාව තිබෙනවාද කියලා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, අපි සඳහන් කළේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් පමණක් ඉදි කරනු ලබන නිවාස සංඛ්‍යාවයි. ඊට අමතරව වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් අපිට වඩා වැඩි නිවාස ප්‍රමාණයක් ඉදි කර තිබෙනවා. ඒ වාගේම මහින්ද චින්තන ප්‍රතිපත්ති මාලාව තුළම සඳහන් කර තිබෙනවා, මේ සඳහා විදේශ ණය ආධාර ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා කියලා. මේ වන විට ඒ විදේශ ණය ආධාර ලබා ගැනීමේ අවසාන පියවරට ඇවිල්ලා තිබෙනවා. එම නිසා ඉදිරි කාල සීමාව තුළදී ඒ ඉලක්කය සපුරා ගන්න පුළුවන්කමක් තිබෙන බව මා වග කීමකින් යුතුව මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වී තිබෙන ආකාරයට, වතු නිවාස ප්‍රශ්නය විසඳන්නට වාර්ෂිකව රුපියල් කෝටි 500ක්, ඒ කියන්නේ රුපියල් මිලියන 5,000ක් වෙන් කරනවාය කියා තිබෙනවා. එලෙස ඔබතුමන්ලා වෙන් කර තිබෙනවාද?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ අනෙකුත් සියලුම අමාත්‍යාංශ ඒකාබද්ධව ගත්තාම වෙන් කරන මුදල ඊට ආසන්න මුදලක් බවට පත් වෙයි. කෙසේ හෝ විදේශ ණය ආධාරත් සමඟ ඒ නිවාස ප්‍රමාණය සකස් කර, නිම කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා වග කීමෙන් ප්‍රකාශ කළා 2015 වන කොට අපේ රටේ වතු නිවාස ප්‍රශ්නය විසඳන්නට ඒ සියලුම නිවාස ඉදි කරනවාය කියා. 2015 වෙන්න තව අවුරුදු දෙකයි තිබෙන්නේ. එහෙම නම් ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අඩුම ගණනේ වසරකට වතු නිවාස පමණක් ලක්ෂයක් හැදෙන්නට ඕනෑ. ඔබතුමා වග කීමකින් මේ උත්තරීතර සභාවට ප්‍රකාශ කරනවද, වාර්ෂිකව වතු නිවාස ලක්ෂය ගණනේ 2015 වන කොට -මේ අවුරුදු දෙක තුළ- ඒ 203,000ක නිවාස අවශ්‍යතාව සපුරනවා කියලා?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, ඊයෙත් මා මේ ගරු සභාවට කිව්වා, අපේ රටේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් මෑතකදී කරන ලද සමීක්ෂණය අනුව මෙතරම් වතු නිවාස ප්‍රමාණයක් ඉදි කිරීමට නියමිතව නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, එම නිසා ඔබතුමාගේ සංඛ්‍යා ලේඛන අපි කොහෙත්ම පිළිගන්නේ නැහැ. රටේ අවශ්‍යතාව අනුව නිවාස ලබා දීමේ වගකීම අනිවාර්යයෙන්ම ආණ්ඩුවක් විධියට අපි භාර ගන්නවා.

බයෝ බවර් ලංකා සමාගම නිෂ්පාදනය කළ බැක්ටීරියාව: ඩෙංගු මර්දනය

பயோ பவர் லங்கா நிறுவன உற்பத்தியான பற்றீரியா : டெங்கு ஒழிப்பு

BACTERIUM PRODUCED BY BIO BAUR LANKA COMPANY: ERADICATION OF DENGUE

2910/'12

15. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) බයෝ බවර් ලංකා සමාගම විසින් මීට වර්ෂ තුනකට පෙර ඩෙංගු මදුරු මර්දනය සඳහා නිෂ්පාදනය කළ බැක්ටීරියාව ඒ සඳහා කියුබාවෙන් ගෙන්වන ලද බීටිඅයි බැක්ටීරියාවට වඩා සාර්ථක ප්‍රතිඵල පෙන්වා ඇති බවත්;

(ii) එසේ වුවද තවමත් එම බැක්ටීරියාව ඩෙංගු මදුරු මර්දනය සඳහා යොදා ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බීටිඅයි බැක්ටීරියාව සඳහා වැය වන මුදලින් අඩකට වඩා අඩු මුදලකින් සපයා ගත හැකි ඉහත සඳහන් බැක්ටීරියාව නිෂ්පාදනය කිරීමට අවශ්‍ය පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) දේශීය නිෂ්පාදනයක් වන එම ප්‍රබල බැක්ටීරියාව ඩෙංගු මර්දනය සඳහා යොදා ගැනීමට ඉදිරියේදී පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பயோ பவர் லங்கா நிறுவனத்தினால் இற்றைக்கு மூன்று வருடங்களுக்கு முன்னர் டெங்கு நுளம்பு ஒழிப்புக்காக உற்பத்தி செய்யப்பட்ட பற்றீரியா, இதன்பொருட்டுக் கியுபாவிலிருந்து கொண்டு வரப்பட்ட பீ.ரீ.ஐ. பற்றீரியாவைவிடச் சிறந்த பெறுபேறுகளைக் காட்டியுள்ளது என்பதையும்;

(ii) எனினும், மேற்படி பற்றீரியா இதுவரை டெங்கு நுளம்பு ஒழிப்புக்காகப் பயன்படுத்தப்படவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) பீ.ரீ.ஐ. பற்றீரியாவுக்காகச் செலவாகும் பணத்தில் அரைவாசிக்கும் குறைவான பணத் தொகையில் பெற்றுக்கொள்ளக்கூடியதாக உள்ள மேலே குறிப்பிடப்பட்ட பற்றீரியாவை உற்பத்தி செய்வதற்குத் தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) உள்நாட்டு உற்பத்தியான குறித்த ஆற்றல்மிக்க பற்றீரியாவை டெங்கு ஒழிப்புக்காக பயன் படுத்துவதற்கு எதிர்காலத்தில் நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health :

(a) Is he aware that-

(i) the bacterium produced by Bio Baur Lanka Company three years ago for the eradication of dengue, has shown better results than the BTI bacterium imported from Cuba for the same purpose; and

(ii) the aforesaid bacterium has not been used for the eradication of dengue up to now, despite its better performance?

(b) Will he state -

(i) the reasons for not taking steps to produce the aforementioned bacterium which could be produced at a cost which is less than half the cost of BTI bacterium ; and

(ii) whether measures will be taken in future to use that powerful bacterium which is a local product, for dengue eradication?

(c) If not, why ?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒ ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) බයෝ බවර් ලංකා සමාගම විසින් නිෂ්පාදිත Bacto Bti සහ කියුබාවෙන් ගෙන්වන ලද Bactivec Bti යන දෙවර්ගයම මදුරු කීටයන් මර්දනය සඳහා සාර්ථක ප්‍රතිඵල පෙන්වා ඇත.

(ii) දැනටමත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් බයෝ බවර් ලංකා සමාගම විසින් නිෂ්පාදනය කරන ලද Bacto Bti බැක්ටීරියාව කීට නාශක කටයුතු සඳහා යොදා ගෙන ඇත. 2010 සිට මේ දක්වා ලීටර් 4,000ක් පමණ මීලට ගෙන ඇත.

(ආ) (i) කාර්මික තාක්ෂණ ආයතනය මඟින් බයෝ බවර් ලංකා සමාගමට මෙම නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම හා ගුණාත්මක විශ්ලේෂණ වාර්තාවක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

(ii) ඔව්. ජලය එක් රැස්වී ඇති පහසුවෙන් ඉවත් කළ නොහැකි ස්ථාන සඳහා ඉදිරියේදී මෙම බැක්ටීරියාව යොදා ගැනීමට බලාපොරොත්තු වේ.

(ඇ) පැන නොනඟී.

ඔබතුමා අහපු ප්‍රශ්නයට අනුව දැනට ලබා ගෙන ඇති ප්‍රමාණයන් ගත්තොත්, දැනට බයෝ බවර් ලංකා සමාගමෙන් 2010 වර්ෂයේදී ලීටරයක මිල රුපියල් 2,492 බැගින් ලීටර් 2,000ක් අරගෙන තිබෙනවා. 2012 වර්ෂයේදී බයෝ බවර් ලංකා සමාගමෙන් ලීටරය රුපියල් 3,250 බැගින් ලීටර් 2,000ක් ලබාගෙන තිබෙනවා. කියුබාවෙන් ගෙන්වලා තිබෙන්නේ, 2010 අවුරුද්දේ ලීටරය රුපියල් 3,356 ගණනේ ලීටර් 10,000ක ප්‍රමාණයකුයි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා පිළිගත්තා, බයෝ බවර් ලංකා සමාගම මඟින් කරන දේවල් සාර්ථකව කරගෙන යනවා කියලා. මම තමුන්නාන්සේගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ජනාධිපති කාර්ය සාධක බලකාය පිහිටුවීම, ධූමායනය වැනි කෙටි කාලීන ක්‍රමවලට පසු ගිය කාලය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශය විශාල වියදමක් දරා තිබෙනවා. ඩෙංගු මර්දනය කිරීම සඳහා ලංකාවේ බැක්ටීරියාවක් නිෂ්පාදනය කරන්න පුළුවන්කම තිබෙන නිසා ඒ සඳහා මීට වඩා වැඩි දායකත්වයක් ලබා දිය යුතුයි කියලා මම හිතනවා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් ගන්නා වූ පියවර මොකක්ද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, ඩෙංගු මදුරුවා මර්දනය සම්බන්ධයෙන් ප්‍රධාන කරුණ මේක නොවෙයි. ජලය එක් රැස්වී ඇති, පහසුවෙන් ඉවත් කළ නොහැකි ස්ථාන සඳහා මෙම බැක්ටීරියාව යොදා ගැනීමට පුළුවන්. නමුත් මෙහි ක්‍රියා කාලය සතියක් විතර වාගේයි තිබෙන්නේ. ඩෙංගු මර්දනය කිරීමේදී ප්‍රධාන අරමුණ වෙන්නේ බෝවෙන ස්ථාන විනාශ කිරීමයි. මොකද මේ බැක්ටීරියා වතුර එකතු වෙන තැන්වලට දමන්න ඕනෑ. ඊට වඩා පහසුයි ඒ ස්ථාන නැති කර දැමීම. මොකද මේ බැක්ටීරියාව කීටයා බෝවෙන තැනට ඉසිමෙන් තමයි කීටයා නැති වෙන්නේ. කීටයා, බෝවෙන ස්ථානයෙන් තුරන් කර දැමීම තමයි ප්‍රධාන වෙන්නේ. මෙහි කාලයක් සතියයි තිබෙන්නේ. නැවත සතියකින් ඩෙංගු මදුරුවන් ඇති වෙනවා. ඒ නිසා ධූමායන කටයුතු හොඳයි. ගරු කථානායකතුමනි, මූලික වශයෙන්ම ඒ බෝවෙන ස්ථාන ඉවත් කිරීම තමයි ඉතාමත් අවශ්‍ය වෙන්නේ. මේ බැක්ටීරියාව එක ක්‍රමවේදයක් පමණයි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 2011 ඩෙංගු රෝගීන් 28,473ක් වාර්තා වෙද්දී 2012 දී 44,456කට එය වැඩි වෙලා තිබෙනවා. විශාල වර්ධනයක් වෙලා තිබෙනවා. 2012 වර්ෂයේ මරණ සංඛ්‍යාව 183යි. ඒ වෙන කොට මරණ සංඛ්‍යාව 21ක්ව තිබිලා තිබෙනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
12යි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

21ක් කියා තමයි අපට වාර්තා වෙලා තිබෙන්නේ. කොහොම වුණත් මෙය අපේ රටේ ඉතා බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඩෙංගු පරීක්ෂාවට අවශ්‍ය උපකරණ සමහර රජයේ රෝහල්වල නැහැ. උදාහරණයක් විධියට මගේ කුලියාපිටිය ආසනයේ තිබෙන රෝහලකට ගිය අවස්ථාවක මට දැන ගන්න ලැබුණා, පිටතින් පරීක්ෂණ කර ගෙන එන්න කියා තුණ්ඩුවක් දෙන බව. ඉතින් මෙයින් සිද්ධ වන්නේ මරණ සංඛ්‍යාව වැඩි වන එකයි. ඒ වාගේම ඩෙංගු රෝගීන්ගේ ප්‍රතිශතය වැඩි වීමටත් එය බලපානවා. මේ සම්බන්ධයෙන් පියවර ගන්නේද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, ප්‍රථමයෙන් කියන්න ඕනෑ, මේ රෝගයෙන් සිදු වන මරණ සංඛ්‍යාව අඩු කිරීම ගැන. පළමුවන අභියෝගය තමයි එය. සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට අපි මරණ සංඛ්‍යාව අඩු කිරීම සඳහා කටයුතු කර තිබෙනවා. පැහැදිලිව බැලුවොත් මරණ සංඛ්‍යාවේ අඩු වීමක් තිබෙන බව පෙනෙනවා.

ඊළඟ දේ තමයි රෝගය පාලනය කිරීම. [බාධා කිරීමක්] මරණ සංඛ්‍යාව අවුරුද්දෙන් අවුරුද්ද අඩු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ. ඒ රෝගය බෝ වීමයි. රෝගය වැලඳීම නොවෙයි, මරණ සංඛ්‍යාව අඩු වෙලා තිබෙනවා. ප්‍රධාන දේ මරණයෙන් බේරා ගැනීමයි. වැඩි වටිනාකම තිබෙන්නේ ජීවිතයක නේ. ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය වගකීම් ඉටු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙය ලෝකයේම සිද්ධ වනවා. තායිලන්තය, ඉන්දියාව වාගේ රටවල් ගත්තොත් ඒ රටවල මෙම රෝගයෙන් විශාල මරණ සංඛ්‍යාවක් සිදු වනවා. නමුත් අපි එය පාලනය කර තිබෙනවා. මහ ජනතාවගේ දායකත්වය මෙයට අවශ්‍ය වනවා. අපි වෛද්‍යවරු පුහුණු කර තිබෙනවා. රෝහල්වල ඒ පහසුකම් තිබෙනවා. කෙනෙක් ඉක්මනින් ප්‍රතිකාර ගන්න ඕනෑය කියා පිටතට ගියොත් හැරෙන්නට, අපේ රෝහල්වල තිබෙන labsවලින් මේ කටයුතු කර ගන්නට අවශ්‍ය සියලු පහසුකම් අපි ලබා දීලා තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඔබතුමාගේ පිළිතුරට මා එකඟ වන්නේ නැහැ. ඉක්මනින් කර ගන්න ඕනෑ නිසා නොවෙයි, රෝගීන් පෞද්ගලිකව ප්‍රතිකාර ගන්නේ, ගරු කථානායකතුමනි. පෞද්ගලිකව සල්ලි දීලා කර ගන්න බැරි වීම නිසා බොහෝ අය මැරෙනවා. මොකද, බොහෝ අයට ලේ සාම්පලයක් අරගෙන ගිහින් පෞද්ගලිකව කර ගන්න හැකියාවක් නැහැ, ගරු කථානායකතුමනි. ඒ විධියට අහිංසක මිනිසුන්ව ලසු කරන්න එපා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා සෞඛ්‍ය සේවාව වෙනුවෙන් රුපියල් බිලියන 125ක් වෙන් කර තිබෙනවා. එම නිසා එය හැල්ලුවට ලක් කරන්න එපා. සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා අපි කටයුතු කර තිබෙනවා. එක රෝහලක එහෙම සිදු වුණා කියලා තමුන්නාන්සේ එහෙම කියන්න එපා. ඊට වඩා දෙගුණයකින් අපි ඒ සේවාව ලබා දී තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය.

චීන සංස්කෘතික මධ්‍යස්ථානය : විස්තර
சீன கலாசார நிலையம்: விபரம்
CHINESE CULTURAL CENTRE : DETAILS

1554/'11

1. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) විහාරමහා දේවී උද්‍යානය අසල ඉදි කර ඇති චීන සංස්කෘතික මධ්‍යස්ථානය 2002 - 2004 කාල

සීමාව තුළදී ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ අග්‍රාමාත්‍ය ධුරය යටතේ චීන රජයෙන් ශ්‍රී ලංකා රජයට ලැබුණු ත්‍යාගයක්ද;

(ii) එය පූර්ණ ප්‍රදානයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) චීන සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදි කිරීම් ආරම්භ වූ දිනය සහ අවසන් වූ දිනය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුළු පිරිවැය සහ එය අවසන් කිරීමේදී දැරීමට සිදු වූ පිරිවැය කොපමණද;

(iii) එම ව්‍යාපෘතියෙහි ශ්‍රමය සඳහා වැය වූ පිරිවැය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ව්‍යාපෘතියේ සේවයේ යෙදවූ දේශීය සහ විදේශීය සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී ව්‍යාපෘතියේ විදේශික ශ්‍රමිකයන්ට, ඔවුන් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබූ සමාගම හෝ රට විසින් ලබා දී තිබූ තනතුරු නාමයන් කවරේද;

(iii) චීන සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම් ව්‍යාපෘතියේ සේවකයන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

කලාසාර, කලා අලුවල්කළ් අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) විකාරමහාදේවි පූංකාවිට්කු අරුකිල් නිර්මාණික්කප්පට්ටුල්ළ චීන කලාසාර නිලෙයම්, කෙළරව රණිල් වික්කිරමසිංක අවර්කළ් පිරදමරාකප් පදවි වකිත්ත 2002 - 2004 වරෙයාන කාලප්පකුදියිල් චීන අරසාංකත් තිටමිරුන්දු ඉලංකෙ අරසාංකත්තිර්කුක් කිටෙත්ත ඔරු නන්කොටෙයා එන්පතෙයුම්;

(ii) අදු ඔරු පූරණමාන නන්කොටෙයා එන්පතෙයුම්

අවර් කූරුවාරා?

(ආ) (i) චීන කලාසාර නිලෙය නිර්මාණත්තින් ආරම්පත් තිකති මර්රුම් මුටිවුත් තිකති ආකියවර්රෙයුම්;

(ii) මේර්පටි කරුත්තිට්ටම් තොටර්පාක උත්තේසික්කප් පට්ට මොත්තච් චෙලවු මර්රුම් අදු මුටිවුරුම් වේලෙයිල් ඉරුතිච්චෙලවු ආකියවර්රෙයුම්;

(iii) ඌලියත්තුක්කාකච් චෙලවුචෙය්යප්පට්ට චෙල විනත්තෙයුම්

අවර් මේලුම් කූරුවාරා?

(ඉ) (i) ඉක්කරුත්තිට්ටත්තිල් වේලෙක්කමර්ත්තප්පට්ට උල්නාට්ටු මර්රුම් වෙළිනාට්ටුත් තොළිලා ළර්කළින් එණ්ණික්කෙයෙ වෙව්වේරාකවුම්;

(ii) මේර්පටි කරුත්තිට්ටත්තුක්කාක කම්පනි අල්ලතු නාටු ඔන්රිනාල් ඉලංකෙක්කුක් කොණ්ටු වරප්පට්ට වෙළිනාට්ටුත් තොළිලාළර්කළුක්කු වළංකප්පට්ට පතවිප් පෙයර්කළ් යාවෙ එන්පතෙයුම්;

(iii) චීන කලාසාර නිලෙය නිර්මාණක් කරුත් තිට්ටත්තින් තොළිලාළර්කළ් චාර්පාකච් චෙලුත්තප්පට්ට ඌලියර් චේමලාප නිති මර්රුම් ඌලියර් නම්පික්කෙප් පොරුප්පු නිති ආකිය වර්රින් පෙරුමතියෙයුම්

අවර් ඉච්චපෙක්කුත් තෙරිවිප්පාරා?

(ඊ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Culture and the Arts:

(a) Will he state whether -

(i) the Chinese Cultural Centre constructed near Viharamahadevi Park was a gift from the Chinese Government to the Sri Lankan Government received under the premiership of the Hon. Ranil Wickramasinghe during 2002 - 2004; and

(ii) it was an outright gift?

(b) Will he also state -

(i) the commencing date and the completion date of the construction of the Chinese Cultural Centre;

(ii) the total cost estimated for the above project and the final cost at the time of its completion; and

(iii) the cost incurred on the labour?

(c) Will he inform this House -

(i) the number of local and foreign workers employed in the project, separately;

(ii) the designations given to the foreign workers of the aforesaid project by the company or country by whom they were brought to Sri Lanka; and

(iii) the values of the EPF and ETF paid on behalf of the workers of the Chinese Cultural Centre construction project?

(d) If not why?

ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)

(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

ගරු කථානායකතුමනි, මෙතුමා අසා තිබෙන්නේ විහාරමහා දේවී උද්‍යානය අසල ඉදි කර අති චීන සංස්කෘතික මධ්‍යස්ථානයක් සම්බන්ධයෙනුයි. එහෙම මධ්‍යස්ථානයක් විහාරමහා දේවී උද්‍යානය අසල නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් එච්චරයි. එහෙමද?

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මා හිතන්නේ එසේයි. එතුමා අසා තිබෙන්නේ චීන සංස්කෘතික මධ්‍යස්ථානයක් ගැනයි. එහෙම එකක් නැහැ.

රොෂෙන් චානක මරණය : වන්දි
ரொஷேன் சானக்கவின் மரணம் : நட்டஈடு
DEATH OF ROSHEN CHANAKA: COMPENSATION

2550/'12

5. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2011 මැයි 30 දින කටුනායක ප්‍රදේශයේදී සිදු වූ වෙඩි තැබීමකින් රොෂෙන් චානක නැමැති තරුණයෙකු මිය යෑම සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණ සිදු කළේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තරුණයා මිය යෑම පිළිබඳව සෙවීමට පත් කළ මහානාම තිලකරත්න ඒකපුද්ගල කොමිෂන් සභා වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(ii) මිය ගිය තරුණයාගේ පවුලට වන්දි මුදල් ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) මෙම සිදුවීමේදී තුවාල ලැබූ අයට හා දේපළ හානි වූ ආයතනවලට වන්දි ලබා දීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

පිරිතම අමාත්‍යතුමා බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) මම පිළිතුරක් දෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

(ii) ඔව්.

(iii) රුපියල් මිලියන එකක්.

(iv) ඔව්.

(ඇ) අදාළ නැත.

ගරු කථානායකතුමනි, අධිකරණයේ තවම මේ නඩු කටයුත්ත පවතිනවා. ඒ නිසා පිළිතුරු දිය හැකි ආකාරයට තමයි මම පිළිතුර දුන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම අහන්නේ මහානාම තිලකරත්න ඒකපුද්ගල කොමිෂන් සභා වාර්තාව ගැනයි. ඒක අධිකරණයට අදාළ එකක් නොවෙයි. රොෂෙන් චානකගේ ඝාතනය පිළිබඳව පත් කළ ඒකපුද්ගල කමිටුවේ වාර්තාව ඉදිරිපත් කරන්නේද කියලායි මම අහන්නේ. ගරු කථානායකතුමනි, ඒක අධිකරණයේ වාර්තාවක් නොවෙයි.

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state whether police investigations were conducted with regard to the death of a youth named Roshen Chanaka that was caused by a shooting which took place in Katunayake area on 30th May, 2011?

(b) Will he inform this House -

(i) whether the report of the Mahanama Thilakarathna one-man Commission that was appointed to investigate into the death of the aforesaid youth, will be submitted;

(ii) whether compensation has been paid to the family of the deceased youth;

(iii) if so, the amount of money so paid; and

(iv) whether arrangements have been made to compensate the persons who sustained injuries and the institutions of which properties were damaged in this incident ?

(c) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) මම පිළිතුරක් දෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

(ii) ඔව්.

(iii) රුපියල් මිලියන එකක්.

(iv) ඔව්.

(ඇ) අදාළ නැත.

ගරු කථානායකතුමනි, අධිකරණයේ තවම මේ නඩු කටයුත්ත පවතිනවා. ඒ නිසා පිළිතුරු දිය හැකි ආකාරයට තමයි මම පිළිතුර දුන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අතිගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් ඒකපුද්ගල කමිටුවක් පත් කළා. ඒ කමිටුවෙන් එතුමාට වාර්තාවක් ලබා දීලා තිබෙනවා. සාමාන්‍යයෙන් අතිගරු ජනාධිපතිතුමාට ලබා දෙන වාර්තා ප්‍රසිද්ධියට පත් කරන්නේ නැහැ. ඒ නිසායි මම ඒ ප්‍රශ්නයට පිළිතුර දුන්නේ නැත්තේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය පළමුවැනි අතුරු ප්‍රශ්නයටම අදාළයි. ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ජනාධිපතිතුමා සහ මහානාම තිලකරත්න මහතා අතර ඇති වූ ප්‍රශ්නයක් නොවෙයි. සාමකාමී උද්ඝෝෂණයකදී වෙඩි පහරකින් රොෂෙන් වානක නැමැති තරුණයා ඝාතනයට ලක් වුණා. එය ප්‍රසිද්ධියේ වූ සිද්ධියක්. එහිදී තවත් අය තුවාල වුණා. එතකොට ඒ පිළිබඳ පත් කළ කමිටුවේ වාර්තාව මේ රටේ ජනතාව දැන ගත යුතු නැද්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ගැන පොලිස් පරීක්ෂණයක් කරලා සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා අධිකරණයට වඩා ඉහළින් ඔබතුමාටවත්, අපටවත් කටයුතු කරන්න බැහැ. අධිකරණයේ තවම ඒ පරීක්ෂණය පැවැත්වෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ඒ කාරණාවට අදාළව සිටි පොලිස්පතිතුමාට උසස්වීමක් ලැබුණා, බ්‍රසීලයේ තානාපති ධුරයට. ඒ සිදුවීමෙන් තුවාල වූ බොහෝ පිරිසක් සිටිනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීමේදී කිව්වා, දේපළවලට සහ අත පයවලට හානි වුණු අයට වන්දි ගෙවිවා කියලා. ඒ ගෙවූ වන්දි මුදල කොපමණ ප්‍රමාණයක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ඒක අහලා නැහැ. ඒක අහන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ප්‍රශ්න අංක 5 (ආ) (iv)න් අසා තිබෙන්නේ එයයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඒ සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණයේ විභාගයක් පැවැත්වෙනවා. ගරු ෆිලික්ස් පෙරේරා ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කළ කමිටුව මඟින්, සේවකයන් 68දෙනකුට වන්දි මුදල් ගෙවීම පිළිබඳ පරීක්ෂණ කටයුතු කරමින් තිබෙනවා. ඒ අතරතුර 13 දෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් තිබෙනවා. ඒ නිසා දැනට වැඩ කටයුතු නැවතිලා තිබෙනවා. අද තත්ත්වය ඒකයි.

හිටපු පොලිස්පතිතුමා තානාපති කෙනකු කළේ මේ කාරණය නිසා නොවෙයි. ඒ කාලයේ ජේවීපී එක ඝාතනය කරන්න කටයුතු කරපු පොලිස්පතිලාටත් තානාපතිකම් දීලා තිබෙනවා, ජේවීපී එකයි අපියි හිටපු හවුල් ආණ්ඩුවෙන්. අපේ හවුල් ආණ්ඩුවේ හිටපු ජේවීපී එකේ මන්ත්‍රීතුමන්ලාත් එය අනුමත කළා. ඔවුන් කළ සේවාව සලකා තමයි තානාපති සේවාවට පත් කරන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6, ගරු අනුර දිසානායක මහතා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පළමුවැනි අතුරු ප්‍රශ්නයේම කොටසක් හැටියට තමයි එකක් ඇහුවේ. අතුරු ප්‍රශ්නයක් නොවෙයි ඒක. ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න මට ඉඩ දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමා, ඒ හිටපු පොලිස්පතිතුමා භාර ගත්තා ඒ ඝාතනයේ වගකීම. ඒකට එතුමාට ලැබුණු දඩුවම තමයි තානාපති ධුරයට උසස්වීම. ගරු ඇමතිතුමනි, මා අහන්න කැමැතියි, ඔබතුමා කියපු, අපි ආණ්ඩුව සමඟ හිටපු කාලයේ තනතුරු දුන්නේ කාටද කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන ක්‍රමයට අහන්න, තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නේ නැතිව.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ක්‍රමයට ඇහුවේ. පිළිගත් ක්‍රමයට ඇහුවේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ අධිකරණයේ විභාගයට භාජන වෙලා තිබෙන කාරණයක් සම්බන්ධයෙන්. හිටපු පොලිස්පතිතුමා එතැනට ගිහින් කාටවත් වෙඩි තැබුවේ නැහැ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, තමුන් කරන ප්‍රකාශය අධිකරණයට සම්බන්ධ බරපතළ ප්‍රශ්නයක් කර ගැනීමට උත්සාහ දරන්න එපා. ඕනෑ නම් දැන් ඔබතුමාට පුළුවන් අධිකරණය හමුවට ගිහින් පාර්ශ්වකරුවකු හැටියට ඒකට මැදිහත් වන්න. මෙතැනට ඇවිත් එක් එක්කෙනාට චෝදනා නොකර, ඒ චෝදනා අරගෙන අධිකරණයට ගිහින් පාර්ශ්වකරුවකු හැටියට මැදිහත් වෙන්න. මට දිය හැකි එකම උපදෙස එයයි.

පළාත් සභා පාසල් : විදුහල්පති පුරප්පාඩු
மாகாண சபை பாடசாலைகள்: அதிபர் வெற்றிடங்கள்
PROVINCIAL COUNCIL SCHOOLS : VACANCIES FOR PRINCIPALS

2906/'12

6. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - மாண்புமிகு அநுர திஸாநாயக்க சார்பாக)
(The Hon. Sunil Handunnetti on behalf of the Hon. Anura Dissanayake)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට පළාත් සභා යටතේ පාලනය වන පාසල්වල පවතින විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව පළාත් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විදුහල්පති පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது மாகாண சபைகளின்கீழ் நிருவகிக்கப் படும் பாடசாலைகளில் நிலவும் அதிபர் களுக்கான வெற்றிடங்களின் எண்ணிக்கை மாகாண வாரியாக வெவ்வேறாக யாதென்ப தையும்;

(ii) மேற்படி அதிபர் வெற்றிடங்களை நிரப்பு வதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state -

(i) separately, in relation to each province, of the number of vacancies for principals existing at present in the schools which come under Provincial Councils; and

(ii) of the action that has been taken to fill the aforesaid vacancies?

(b) If not, why ?

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

බස්නාහිර	922
වයඹ	373
නැගෙනහිර	734
උතුර	536
උතුරු මැද	464
ඌව	547
දකුණ	650
මධ්‍යම	645
සබරගමුව	295
	5,166

(ii) 2005 වර්ෂයේ පවත්වන ලද සීමිත තරග විභාගය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබූ 212/2010 හා 979/2009 නඩුවල තීන්දු 2012.01.24 හා 2012.01.26 දෙදින ලැබීමෙන් අනතුරුව

- 2012 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණ පවත්වා

  ශ්‍රී ලංකා විදුහල්පති සේවය 3 පන්තිය සඳහා - 1,115 ද

  ශ්‍රී ලංකා විදුහල්පති සේවය 2 - II ශ්‍රේණිය සඳහා - 1,616 වශයෙන් 2,731

  2012.12.31 දින වන විට 2,731දෙනකු සඳහා විදුහල්පති පත්වීම් ලබා දී පළාත් සභා වෙත නිදහස් කර ඇත.

- ශ්‍රී ලංකා විදුහල්පති සේවය 2-II ශ්‍රේණිය සඳහා බඳවාගත් නිලධාරීන් 1,800ක් පමණ 2013 වර්ෂය අවසන් වන විට පළාත් සභා වෙත නිදහස් කිරීමට කටයුතු කරමින් පවතී.

  ඒ අනුව 4,500ක් පමණ 2013 වර්ෂය අවසන් වන විට පළාත් සභා වෙත නිදහස් කෙරෙනු ඇත.

- ශ්‍රී ලංකා විදුහල්පති සේවය I පන්තිය සඳහා උසස් කිරීම් සඳහා ගැසට් නිවේදනය පළ කර අයදුම් පත් කැඳවා ඇත. 2013 වර්ෂය තුළ එම උසස්වීම් සිදු කරනු ලබයි.

- ශ්‍රී ලංකා විදුහල්පති සේවය 3 පන්තිය සඳහා බඳවාගැනීමේ ගැසට් නිවේදනය 2013 සැප්තැම්බර් මස සිදු කිරීමටද කටයුතු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

ඒ.එච්.එම්. මොහිදීන් මහතා : වන්දි මුදල්
திரு.ஏ.எச்.எம்.மொஹிதீன்: நட்டஈடு
MR. A.H.M. MOHIDEEN : COMPENSATION

3010/'12

8. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා - (ගරු මොහමඩ් අස්ලම් මහතා වෙනුවට)
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு மொஹமட் அஸ்லம் சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Mohamed Aslam)

වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගාල්ල ව්‍යාපාරිකයන්ගේ වාණිජ ඉඩම් අත් පත් කරගනු ලැබූ බවත්;

(ii) ඒ යටතේ ඉඩම් අත් පත් කරගැනීමේ පනතේ 460වැනි පරිච්ඡේදයේ 10(1)(අ) වගන්තිය යටතේ නිකුත් කළ අංක ගාකස/මුඅ/3/1/2002/08 හා 2005.10.13 දිනැති නිවේදනය අනුව පවරාගත් ගාල්ල, දංගෙදර, ජීන්රියා මාවතේ, අංක 79බී දරන ස්ථානයේ පදිංචි ඒ.එච්.එම්. මොහිදීන් මහතාගේ ව්‍යාපාරික ස්ථානය පිහිටි අංක 215 දරන ඉඩම් කැබැල්ල වෙනුවෙන් වන්දි මුදලක් මෙතෙක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ව්‍යාපාරික ස්ථානය කඩා ඉවත් කොට පවරාගත් ඉහත සඳහන් ඉඩම වෙනුවෙන් මොහිදීන් මහතාට නොපමාව වන්දි මුදලක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

තුරෙමුකඟ්කළ්, නෙටුඤ්චාලෙකළ් අමෙච්චරෙකැ කේට්ට විනා:

(අ) (i) කාලි - කොළඹ පුරාතන වීථියෙ විස්තරික්කුම් කරුත්තිට්ටත්තිර්කාක කාලි වර්ත්තකර්කළින් වණිකක් කාණිකළ් සුවීකරික්කප්පට්ටුළ්ළන එන්පතෙයුම්;

(ii) ඉතන්කීළ් කාණි කොළ්ළල් චට්ටත්තින් 460ආම් අත්තියායත්තින් 10(1)(අ) පිරිවින්කීළ් වෙළියිටප්පට්ට කාකච/මුඅ/3/1/2002/08ආම් ඉලක්ක 2005/10/13ආම් තිකතිය අරිවිත්තලින් පිරකාරම් සුවීකරික්කප්පට්ට, කාලි, තන්කෙතර ජිප්රියා මාවත්තෙයිල් 79 පි ඉලක්ක ඉටත්තිල් වසික්කුම් තිරු.ඒ.එච්.එම්.මොහිදීනින් වර්ත්තක නිලෙයම් අමෙන්තුළ්ළ 215ආම් ඉලක්ක කාණිත්තුණ්ඩු චාර්පාක ඉතුවරෙ නට්ටඊට්ටුත් තොකෙ වළංකප්පටවිල්ලෙ එන්පතෙයුම්

අවර් අරිවාරා?

(ආ) මේර්පටි වර්ත්තක නිලෙයත්තෙ උටෙත්තකර්ර්, සුවීකරික්කප්පට්ට මේර්පටි කාණියින් චාර්පාක තිරු. මොහිදීනුක්කු තාමතමින්රි නට්ටඊට්ටුත් තොකෙයෙ වළංකුවතර්කාන නටවටික්කෙ එටුප්පාරා එන්පතෙ අවර් ඉච්චපෙයිල් අරිවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Ports and Highways:

(a) Is he aware that -

(i) commercial lands of the businessmen of Galle were acquired for the Galle-Colombo main road expansion project; and

(ii) no compensation has been awarded up to now for lot No. 215 acquired under the said project as per the notice bearing No. ගාකස/මුඅ/3/1/2002/08 and dated 13/10/2005 issued in terms of Section 10(1) (a) of Chapter 460 of the Land Acquisition Act, where the business premises of Mr. A.H.M. Mohideen residing at No. 79B, Jiffriya Road, Dangedara, Galle, was located?

(b) Will he inform this House whether steps will be taken to pay compensation to Mr. Mohideen immediately for the said land acquired after demolishing and removing the business premises?

(c) If not, why ?

ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)

(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)

(The Hon. Nirmala Kotalawala - Minister of Ports and Highways)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) ඔව්.

ගාල්ල - කොළඹ - හම්බන්තොට මාර්ගයේ කි.මී. 115.5 - 116.5 දක්වා කොටස පුළුල් කිරීමේදී අංක 215 දරන ඉඩම් කැබැල්ලෙන් හෙක්ටෙයාර 0.0022ක ප්‍රමාණයක් අත් පත් කරගෙන ඇත. ඒ සඳහා වන්දි වශයෙන් රුපියල් 323,000.00ක මුදලක් අනුමත කර තිබුණි. නමුත් එම මුදල ප්‍රමාණවත් නොවන බවට අදාළ ඉඩම් හිමියා විසින් ඉඩම් අත් පත් කරගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. එමඟින් තීරණය වූ වන්දි මුදල පිළිබඳව මෙතෙක් ගාලු කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දී නැත. එම තීරණය ලැබුණු වහාම අදාළ ගෙවීම් කළ හැකි බව කාරුණිකව දන්වමි.

(ඇ) පැන නොනඟී.

රජයේ සේවකයන් : දේපොළ ණය

அரச ஊழியர்கள் : ஆதனக் கடன்

PUBLIC SERVANTS : PROPERTY LOAN

3163/'12

9. ගරු ජෝන් අමරතුංග මහතා - (ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය වෙනුවට)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார ஜயசிங்க சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) රජයේ සේවකයන් සඳහා සියයට හතරක පොලී පදනම මත රාජ්‍ය බැංකුවලින් ලබා දෙන දේපළ ණය මුදල් ලබා දීම මේ වන විට අත් හිටුවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, රජයේ සේවකයන් සඳහා එම දේපළ ණය නැවත ලබා දීම ආරම්භ කරන දිනය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) அரச ஊழியர்களுக்கு நான்கு சதவீத வட்டி அடிப்படையில் அரச வங்கிகளிலிருந்து வழங்கப்படுகின்ற ஆதனக் கடன் வழங்கல் தற்போது இடைநிறுத்தப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், அரச ஊழியர்களுக்கான மேற்படி ஆதனக் கடன் வழங்குதலை மீண்டும் ஆரம்பிக்கும் திகதி யாதென்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු ජෝන් අමරතුංග මහතා]

asked the Minister of Finance and Planning:

(a) Is he aware that the property loans, which are granted to public servants by state banks at an interest rate of 4 per cent have been suspended by now ?

(b) If so, will he state the date on which the granting of property loans to public servants will be recommenced?

(c) If not, why ?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) අත් හිටුවා නැත.

2005 වර්ෂයේ සිට 2012.12.31 දක්වා 82363 දෙනෙකු සඳහා ණය මුදල් නිදහස් කර ඇති අතර, ලබා දී ඇති මුළු ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 70,461කි.

දේපළ ණය පොලී ගෙවීම වෙනුවෙන් 2012 වර්ෂයේ දී රුපියල් බිලියන 1.7ක ප්‍රතිපාදන රජය මඟින් වෙන් කර ඇති අතර, ඒ සඳහා 2013 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තුගත කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් බිලියන 1.9කි.

(ආ) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා විය යුතුය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන
கல்விக்கான நிதி ஒதுக்கீடு போதாமை
INSUFFICIENT ALLOCATION OF FUNDS FOR EDUCATION

[අ.භා. 1.55]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර, වෙනිසියුලානු ජන රජයේ ජනාධිපති හියුගෝ චාවේස් මැතිතුමාගේ අභාවය පිළිබඳව අපගේ ශෝකය ප්‍රකාශ කරන අතර, හියුගෝ චාවේස් ජනාධිපතිවරයාට අපේ ආචාරය පිරිනමනවා.

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ දී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මේ වනවිට ග්‍රාමීය පාසල් විශාල වශයෙන් වැසී ගොස් ඇති අතර තවත් පාසල් විශාල ප්‍රමාණයක් වැසී යාමේ අනතුරකට මුහුණ පා තිබේ. මෙය සාපේක්ෂ වශයෙන් සාක්ෂරතාව ඉහළ අගයක ඇතැයි රටකට ආඩම්බර විය හැකි තත්ත්වයක් නොවේ.

එසේම ග්‍රාමීය පාසල්වල නඩත්තු කටයුතු බිඳ වැටී ඇති අතර සනීපාරක්ෂක පහසුකම්, ක්‍රීඩා පහසුකම්, විද්‍යාගාර පහසුකම් අවම වෙමින් තිබේ. තිබෙන අවම පහසුකම්වල නඩත්තු කටයුතු සඳහා යැයි කියමින් දෙමව්පියන්ගෙන් මුදල් අය කිරීම විවිධ අවස්ථාවල සිදුවන අතර, එය දෙමවුපියන් මත අමතර බරක් පටවා තිබේ.

මෙම තත්ත්වය විසින් පෙන්වා දෙන්නේ, ආණ්ඩුව විසින් පාසල් අධ්‍යාපනය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවෙමින් ඇති බවය. එබැවින් අධ්‍යාපනය සඳහා අවශ්‍ය තරමේ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කළ යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි. "

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය කියන්නේ රටේ අනාගත සංවර්ධනයේ පදනමයි. විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් එක්ක ලෝකය, සමාජය වෙනස් කරන්න පුළුවන් වන්නේ දැනුම තුළින්. දැනුමෙන් ලබා ගන්නා ඒ තොරතුරු, කරුණු, තාර්කික බුද්ධියත් එක්ක සංකලනය වුණාම තමයි අලුත් නිර්මාණශීලි දේවල් ලෝකයට, සමාජයට එකතු වන්නේ. ඒ නිසා අනාගත ශ්‍රී ලාංකීය සමාජයේ සංවර්ධනයේ පදනම අධ්‍යාපනය කියන එක ගැන විවාදයක් නැහැ. එය කවුරුත් පිළිගන්නා දෙයක්. ඒ නිසා තමයි රටක අධ්‍යාපනය ආණ්ඩුවේ ප්‍රධාන භාරදූර වගකීමක් විධියට සැලකෙන්නේ. ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙනුත් එම භාර දූර වගකීම, පවතින ආණ්ඩුව වෙත පැවරිලා තිබෙන්නේ අන්න ඒ කියන අර්ථයෙන්. නමුත් ආණ්ඩුවේම ප්‍රධාන අමාත්‍යවරයකු වන

අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා පසු ගිය දවසක ඉතා පැහැදිලිව, විවෘතව කියලා තිබුණා, "අපේ රටේ නිදහස් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවාව බරපතළ සෝදා පාළුවකට ලක් වී ඇත." කියලා. අධ්‍යාපනය පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ දී මා ඒ කරුණ මතක් කරන්න කැමැතියි.

"අධ්‍යාපනය විතරක් නොවෙයි, සෞඛ්‍ය ක්ෂේත්‍රයත් බරපතළ සෝදාපාළුවට ලක් වී ඇත" යනුවෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන අමාත්‍යාවරයකු විධියට එතුමා පිළිගෙන තිබෙනවා. එතකොට, අධ්‍යාපනය සංවර්ධනයේ පදනමයි කියන ඒ ශ්‍රේෂ්ඨ කියමන, ඒ ශ්‍රේෂ්ඨ දැක්ම මත ඉඳ ගෙන අපි අපේ රටේ අධ්‍යාපනය පිළිබඳව සාකච්ඡා කරද්දී, ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය ඉතාම වැදගත් කාලෝචිත එකක් වන බව මා හිතනවා. එතුමාගේම පක්ෂයේ හිටපු පරණ හිත මිත්‍ර බන්දුල ගුණවර්ධන මහතා තමයි දැන් අධ්‍යාපන ඇමතිවරයා හැටියට ඉන්නේ.

මධ්‍යම ආණ්ඩුවේ සහ පළාත් සභාවල අධ්‍යාපන ඇමතිවරුම 12 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. ඒ අධ්‍යාපන ඇමතිවරු 12 දෙනාම රටේ අධ්‍යාපනය සෝදාපාළුවට ලක් කළාය කියන එක තමයි ඒ ප්‍රකාශය තුළ එතුමා පැහැදිලිව කිව්වේ. ඒක තමයි ගරු කථානායකතුමනි, අද රට මුහුණ දී තිබෙන බරපතළ ප්‍රශ්නය.

පාසල්වලට මුදල් අය කිරීමේ ප්‍රශ්නය මෑත කාලීනව යම් සංවාදයකට ලක් වුණේ, හොරණ ප්‍රදේශයේ අවුරුදු 13ක් වයසැති පුංචි දැරියකගේ සිද්ධියයි. පාසලේ තීන්ත ආලේප කරන්න සල්ලි ගෙනෙන්න කිව්වාට පස්සේ, දෙමව්පියන්ට ඒ සල්ලි දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ තාත්තා ගල් වළක කුලී වැඩ කරනවා; ඒ තත්තාට හරිහමන් ආදායමක් නැහැ. ඒ අම්මා බඩේ තුවාලයක් නිසා අසනීප වෙලා. ඒ අම්මාට බෙහෙත් ගන්න සල්ලි ටිකක් සොයා ගන්න විධියක් නැහැ. එවැනි තත්ත්වයක ඉන්න පවුලක පුංචි දැරියකට, තීන්ත ගාන්න රුපියල් 800ක් ගේන්න කියලා ඉස්කෝලෙන් කිව්වාම, තාත්තාගෙන් ඒ මුදල ඉල්ලා ගන්න විධියක් නැහැ; අම්මාගෙන් ඉල්ලා ගන්න විධියක් නැහැ. ඒ නිසා අල්ලපු පොල් වත්තට පැනලා පොල් ගෙඩි අටක් සොරකම් කරලා පාසලේ තීන්ත ගාන්න සල්ලි අරගෙන යන්න සූදානම් වුණා. ඉතින්, මේ සිදු වීමත් එක්ක ඇති වුණු ආන්දෝලනාත්මක තත්ත්වය නිසා තමයි, පාසල්වල සල්ලි අය කිරීම් පිළිබඳව මෑත කාලීනව නැවත ඇත්තටම සංවාදයක් ඇති වුණේ. නමුත් ඒ සිද්ධිය මත පදනම් වෙලා ඒ සංවාදය ඇති වුණාට පාසල්වල මුදල් අය කිරීම කියන එක අද ඊයේ පටන් ගත් එකක් නොවෙයි. මෙහි ඉතිහාසය කියනවා නම්, බන්දුල ගුණවර්ධන ඇමතිතුමා දන්නේත් නැතිව ඇති, සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් ඉන්න කාලයටත් කලින්, තාරා ද මෙල් මහත්මිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරිය වශයෙන් සිටි අවධියේ පාසල් කළමනාකරණ කමිටු පිහිටුවීම පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් වුණා.

පාසල් කළමනාකරණ කමිටු පිහිටුවා පාසලේ සියලුම නඩත්තු කටයුතු, ඉදි කිරීම් කටයුතු, පාසල් ගුරුවරුන්ගේ පඩිනඩි ගෙවීම් ආදී ඒ සියලු කටයුතු දෙමාපියන්, පාසලේ ආදී ශිෂ්‍යයින් වාගේම ගුරුවරුන් මත පටවන පාසල් කළමනාකරණ කමිටු ඇති කරන කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් වුණා. ඒ කැබිනට් පත්‍රිකාව එදා පරාද කළා. ඒ නිසා ඒක ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඒ වෙලාවේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා පැහැදිලිව කිව්වා, "මේක කැබිනට් පත්‍රිකාවක් නැතිව චක්‍රලේඛන මඟින් ක්‍රියාත්මක කරන්න පුළුවන් වැඩක්. මම අධ්‍යාපන ඇමති වෙලා හිටියා නම් මම කරන්නේ ඒ වැඩේ." කියලා. පසු කාලීනව එතුමා අධ්‍යාපන ඇමති ධුරය දරන කොට, පාසල්වල නඩත්තුව දෙමාපියන්, ආදී ශිෂ්‍යයින් සහ ගුරුවරුන් මත පැටවෙන පාසල් කළමනාකරණ කමිටු පිහිටුවීමේ චක්‍රලේඛ එන්න පටන් ගත්තා අපි දැක්කා. ඒ චක්‍රලේඛනවලින් තමයි ඇත්තටම අද වන කොට ඉඩ ප්‍රස්ථාව හදලා තිබෙන්නේ පාසල්වලින්, පාසල්වල ළමයින්ගෙන් සල්ලි අය කරන්න. ආණ්ඩුව කොයි තරම් කිව්වත් මේ මුදල් අය කරන්න එපා, මුදල් අය කරන්න නීතියෙන් තහනම් කියලා, ඒවා පටිපල් බොරු. අර සිද්ධිය ඇති වුණු වෙලාවේ ජනාධිපතිවරයාගේ හිතේ එක පාරටම මහා සංවේදීකමක් ඇති වුණා වාගේ කිව්වා, "පාසල් ළමයින්ගෙන් මුදල් අය කරන එක සම්පූර්ණයෙන්ම තහනම්. මේක වහාම නතර කරන්න" කියලා. එතුමාත් ඉන්න කැබිනට් මණ්ඩලය තමයි මේ අධ්‍යාපන කැබිනට් පත්‍රිකාව ගෙනාවේ. එතුමාත් ඉන්න අමාත්‍ය මණ්ඩලය තමයි මේවාට අදාළ කරන ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ. මේ නොදන්නා දෙයක් නොවෙයි. එක පාරටම හීනෙන් නැඟිටලා වාගේ, එහෙම නැත්නම් බබෙක් වාගේ කථා කිරීමේ අවශ්‍යතාවක් නැහැ. වරදින කොට එහෙම තමයි. මොනවාවත් දන්නේ නැහැ. තොත්ත බබා. අනේ! ඔක්කෝම කියලා දෙන්න ඕනෑ. ඒ විහිළුව කරලා, **ඒ** ප්‍රෝඩාව කරලා මේ රටේ ජනතාව, දෙමාපියන් රවටන්නයි හදන්නේ.

ගරු කථානායකතුමනි, ඉතා පැහැදිලියි මේ ක්‍රියාවලිය එන්නේ ලෝක බැංකු උපදෙස් මත බව. කොයි තරම් අධිරාජ්‍ය විරෝධය ගැන කෑ ගැසුවත්, කොයි තරම් මූල්‍ය අරමුදල, ලෝක බැංකුව පිළිබඳව විවේචන ඉදිරිපත් කළත් මේ කොල්ලකාරී ආර්ථිකයේ සුජාත දියණියක් බඳු වූ ලෝක බැංකු උපදෙස් මත අධ්‍යාපනය පවත්වා ගෙන යාම මේ ආණ්ඩුවටත් යථාර්ථයක් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ලෝක බැංකුවේ ණය ආධාර මත ක්‍රියාත්මක වන ඔය සපිරි පාසල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ. ඔවුන් තමයි කියන්නේ, අද අධ්‍යාපනය සඳහා ආණ්ඩුව වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණය වැඩියි; ඒකත් අඩු කරන්න; තව තවත් අධ්‍යාපනය පෞද්ගලික අංශයට පවරන්න; ඒ සඳහා අවශ්‍ය කරන සැලසුම් හදන්න; ඒකට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ හදන්න; ඒ වැඩ පිළිවෙළ හදන්න ප්‍රතිපත්ති සම්පාදනය කරන්න, අවශ්‍ය තරම් ණය ආධාර දෙන්න අපි සූදානම් කියලා.

ඒක තමයි ලෝක බැංකුව කියපු දේ. ඒ විතරක් නොවෙයි. ඊයේ පෙරේදා සෞඛ්‍ය ක්ෂේත්‍රයටත් තවත් ඩොලර් මිලියන 200ක ණය ආධාර මුදලක් දෙන්න ලෝක බැංකුව එකඟ වුණා. ඒකේ ව්‍යාපෘතිය මොකක්ද? ඒ ව්‍යාපෘතියෙන් කියන්නෙත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පෞද්ගලික අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා ඩොලර් මිලියන 200ක ණය ආධාරයක් දෙනවාය කියායි. සෞඛ්‍ය ක්ෂේත්‍රයත් පෞද්ගලික අංශයට පැවරීම සඳහා ලෝක බැංකුව ඉතා පැහැදිලිව පිඹුරු පත් හදා, සැලසුම් හදා මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට දෙනවා. ඇමතිවරු ගිරව් වාගේ ඒවා කැබිනට් මණ්ඩලයට දමලා, කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරවා ගෙන, කැබිනට් මණ්ඩලයෙන් ඒ අධ්‍යාපනය පෞද්ගලීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. ඒක තමයි මේ සිද්ධ වෙලා තිබෙන්නේ. මේක බන්දුල ගුණවර්ධන ඇමතිතුමා පසු කාලයකදී කර ගහපු දෙයක්. එතුමාට කලින් මේ ක්‍රියාවලිය ආවා. එතුමාට ඒක වෙනස් කරන්න තිබුණා. නමුත් එතුමා ඒක වෙනස් කළේ නැහැ. එතුමා නිදහස් අධ්‍යාපනය ගැන කොයි තරම් යටිගිරියෙන් කෑ ගැහුවත් එතුමා ඒක වෙනස් කළේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව.

ඇත්ත වශයෙන්ම ඉතා පැහැදිලිව කියනවා නම් පන්ති කාමරයෙන් තමයි මේක පටන් ගත්තේ. පන්ති කාමරයට කොස්සක් ඕනෑ වුණාම, ඉදලක් ඕනෑ වුණාම, ගුරුතුමියගේ මේසයට මේස රෙද්දක් ඕනෑ වුණාම ළමයින්ට කියලා දෙමව්පියන් හරහා කොස්සක් ගන්න, ඉදලක් ගන්න එහෙම නැත්නම් මේස රෙද්දක් ගන්න පුංචි මුදලක් එකතු කළා. එතැනින් තමයි මේක පටන් ගත්තේ. ඒක තමයි මේකේ ප්‍රාථමික අවධිය වුණේ. ප්‍රාථමික අවධියේ ඒක නතර කර ගන්න බැරි වුණා. එදා තිබුණු

[ගරු විජිත හේරත් මහතා]

ආණ්ඩුවලට ඒක නතර කර ගන්න වුවමනාවක් තිබුණේ නැහැ. ඒ නිසා ඒක වර්ධනය වුණා. ඒ නිසා දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ වනකොට ඉස්කෝලෙ විදුලි බිල, ගුරුවරුන්ගේ පඩි නඩි, මුරකාරයාගේ පඩිය, ඒ පාසලට මොනවා හරි සේවාවක් සඳහා අමතරව බඳවා ගන්නා ඕනෑම සේවකයෙකුගේ පඩි නඩි ගෙවන්න, පාසලේ නඩත්තු කටයුතු, බාහිර ක්‍රියාකාරකම් ආදී සියල්ලකටම දැන් ළමයින්ගෙන් සල්ලි අය කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. පාසලේ ක්‍රීඩා උත්සවය පවත්වන්න මුදල් නැහැ. ඊට අවශ්‍ය මුදල් එකතු කරන්න- [බාධා කිරීමක්] ඒ ආණ්ඩුවේ ඉඳලා තමයි අපි කැබිනට් පත්‍රිකා පැරැද්දුවේ. ඒ ආණ්ඩුවෙන් තමයි කැබිනට් පත්‍රිකා ගෙනාවේ. එදා තමයි අපි කැබිනට් පත්‍රිකා පැරැද්දුවේ. ඒ කාලයේත් කිව්වා. ඒ කාලයේ කිව්වේ මෙහේ නොවෙයි. කැබිනට් මණ්ඩලයේදීත් කිව්වා; අපි එළියේදීත් කිව්වා. ඒ නිසා තමයි අපි කැබිනට් පත්‍රිකාව පැරැද්දුවේ. එතකොට අපි ආවා විතරයි. අවුරුදු 22යි. එතකොට ඔය කළමනාකරණ කමිටු ගැන අපි දන්නෙත් නැහැ. එතකොට අපේ ළා බාල අවධිය. ඒ නිසා ඒ කාලයේ අපි ඔය කළමනාකරණ කමිටු ගැන දැනගෙන සිටියේ නැහැ. ඊයේ පෙරේදා පිනට පහළ වෙලා, මොකක්දෝ ප්‍රශ්නයක් නිසා ඇමතිකමක් හම්බ වුණාට.

අද සල්ලි නැත්නම් පාසලේ ක්‍රීඩාවලට සම්බන්ධ වෙන්න විධියක් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ශිෂ්‍ය භටයෙක් වෙන්න, නැත්නම් බාලදක්ෂ කණ්ඩායමට බැඳෙන්න, තූර්ය වාදක කණ්ඩායමට බැඳෙන්න අවශ්‍ය කරන ඇඳුම් පැළඳුම් ගන්න, ඒ අවශ්‍ය කරන උපකරණ ගන්න අද සල්ලි එකතු කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. කොයි තරම් දක්ෂතාව තිබුණත්, කොයි තරම් ක්‍රීඩා කුසලතාව තිබුණත් සල්ලි නැත්නම් ඒ ක්‍රීඩා තරගවලට සහභාගි වෙන්න බැරි තත්ත්වයක් අද ළමයින්ට උදා වෙලා තිබෙනවා. මේ බෙදනීය ඉරණම අද මුළු රටෙම තිබෙනවා. ඈත පිටිසර සූරියවැව ඉස්කෝලේ ඉඳලා, කිලිනොච්චි, මුලතිව්, වවුනියාවේ පාසල්වල, මඩකලපුවේ පාසල්වල සහ කොළඹ, ආනන්ද, නාලන්ද රාජකීය ආදී ජනප්‍රිය ජාතික යයි කියන ප්‍රධාන පාසල්වල පවා අද මේක යථාර්ථයක් වෙලා තිබෙනවා. ඇයි ඒ? රජය නිදහස් අධ්‍යාපනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන එන්න එන්නම කප්පාදු කර තිබෙනවා. අධ්‍යාපන වගකීමෙන් අද ආණ්ඩුව මිදිලා තිබෙනවා. ආණ්ඩුව ඒ වගකීමෙන් මිදිලා තිබෙන නිසා තමයි දෙමව්පියන් මත මේ බර පැටවිලා තිබෙන්නේ. පොල් ගෙඩි 8කට අවුරුදු දහතුනේ දැරිය හිරේ යන කොට, මේ තත්ත්වයට මුහුණ දීපු දහස් සංඛ්‍යාත දරු දැරියන් මේ රටේ අද ඉතාම දුක්ඛිත තත්ත්වයෙන් අධ්‍යාපනය හදාරන කොට, මේ පාසල් දූ දරුවෝ තමන්ගේ දෙමව්පියන් මත බර පටවලා ඒ අම්මලා තාත්තලාගෙන් ඉල්ලා ගන්න සල්ලිවලින් ඉස්කෝලය නඩත්තු කරන කොට ඒක මේ ආඩම්බරකාර තාත්තාට පේන්නේ නැහැ. මහින්ද චින්තනයේ නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් මැදිහත් වෙනවාය කියපු ආඩම්බරකාර තාත්තාට ඒක දැනෙන්නේ නැහැ; පේන්නේ නැහැ. ඒක තමයි ඇත්ත ප්‍රශ්නය.

2010 දී අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.54ක් වෙන් කළා. 2010 දී වෙන් කරපු ඒ ගණන 2013 -මේ අවුරුද්ද- වෙන කොට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.17 දක්වා අඩු වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, පසු ගිය කාලයේ විශ්වවිද්‍යාල ආචාර්යවරු, මහාචාර්යවරු ඉතිහාසයේ පළමුවෙනි වතාවට picket boards අරගෙන, සටන් පාඨ කියමින්, පෙළපාළි ගිහිල්ලා උද්ඝෝෂණය කළේ වෙන මොකටවත් නොවෙයි. අධ්‍යාපනයට රජය වෙන් කරන මුදල සියයට 6ක් දක්වා වැඩි කරන්නැයි කියන්න. එය අනුමත වුණු යුනෙස්කෝ සංවිධානය හමුවට ගිහිල්ලා මේ ආණ්ඩුව එකඟ වුණු ඒ මුදල - ප්‍රතිපාදනය- වෙන් කරන්න කියන එක තමයි එදා ඒ විශ්වවිද්‍යාල ආචාර්යවරු හඬ නඟලා කිව්වේ. එතකොට බොහෝ දෙමව්පියන්ට, ගුරුවරුන්ට ඒක හරියටම දැනුණේ නැහැ. සමහර අයට තේරුණේ නැහැ. පොල් ගෙඩි 8ක් හොරකම් කරපු නිසා ඒ දරුවා උසාවි දමලා දඩ නියම වෙන කොට තමයි මේ ප්‍රශ්නයේ සංවේදීකම, බරපතළකම දැනෙන්න පටන් ගත්තේ. වෙනත් වචනවලින් හරි, වෙනත් අර්ථවලින් හරි එදා සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරන්න කියලා විශ්වවිද්‍යාල ආචාර්යවරු කිව්වේ මෙන්න මේ තත්ත්වය දැකපු නිසායි.

අද ලංකාවේ ජනගහනය වැඩි වෙනවා. පාසල් ශිෂ්‍ය ජනගහනය වැඩි වෙනවා. ඔතළිස් දෙලක්ෂයක් වන අපේ පාසල් සිසු දරු දැරියන්ට අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල එන්න එන්නම කප්පාදු කරනවා නම් අනාගත සංවර්ධනයේ පදනම අධ්‍යාපනය බවට පත් වන්නේ නැහැ. අනාගත සංවර්ධනයේ පදනම අධ්‍යාපනය කියලා අපි පිළිගන්නවා නම්, දැනුමේ කේන්ද්‍රස්ථානය බවට ලංකාව පත් කරනවා කියලා කයිවාරු ගහනවා නම් ප්‍රතිපාදන අඩු කිරීමෙන් කවදාවත් ඒ අරමුණ කරා - ඒ ඉලක්කය කරා- යන්න බැහැ. නමුත් අද මොකක්ද තිබෙන තත්ත්වය? ගරු කථානායකතුමනි, 2010 දී පළාත් සභා පාසල්වලට, ඒ කියන්නේ ග්‍රාමීය මට්ටමේ පාසල්වලට දළ දේශීය නිෂ්පාදිතයෙන් වෙන් කරපු ප්‍රතිශතය සියයට 1.04යි. ඒ ප්‍රමාණයත් 2013 වෙන කොට සියයට 0.74 දක්වා අඩු වුණා. ඒ කියන්නේ මොකක්ද? අපේ රටේ පාසල්වලින් වැඩි ප්‍රමාණයක්ම තිබෙන්නේ ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි පාසල්. මුළු පාසල් ප්‍රමාණයෙන් සියයට 80ක් පමණ තිබෙන්නේ ග්‍රාමීය වශයෙන් පිහිටි පාසල් ලෙසයි. ඒ පාසල්වලට වෙන් කරන ප්‍රතිපාදන තමයි බරපතළ විධියට කප්පාදු කරලා තිබෙන්නේ. මේ වසර තුන ඇතුළත -2010 සිට 2013 දක්වා- වෙන් කරපු මුදල් ප්‍රමාණය සියයට 1.04 සිට සියයට 0.74 දක්වා අඩු වෙනවා කියලා කියන්නේ, හරියටම අවුරුදු තුනකදී සියයට 25කින් ග්‍රාමීය පාසල්වලට වෙන් කරන ප්‍රතිපාදන ආඩම්බරකාර තාත්තාගේ ආණ්ඩුව කප්පාදු කරලා තිබෙනවා කියන එකයි. ඒක තමයි ඇත්ත කථාව. ඒ කප්පාදු කිරීම නිසා තමයි අවුරුදු 13ක අහිංසක දැරියට පොල් ගෙඩි 8ක් හොරකම් කරන්න සිද්ධ වුණේ. ඒක විදුහල්පතිවරයාගේ ප්‍රශ්නයක් නොවෙයි; ඒක පාසලේ ගුරුවරුන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. පාසලේ ගුරුවරුන්ට බැණලා වැඩක් නැහැ; පාසලේ විදුහල්පතිවරයාට බැණලා වැඩක් නැහැ. විදුහල්පතිවරයා සහ ගුරුවරුන් මේ විධියට සල්ලි අය කරන තත්ත්වයට පත් කළේ ආණ්ඩුව සල්ලි දෙන්නේ නැති නිසායි. පළාත් සභාවෙන් සල්ලි දෙන්නේ නැහැ, මධ්‍යම ආණ්ඩුවෙන් සල්ලි දෙන්නේ නැහැ. ඒ වුණත් පාසල පවත්වාගෙන යන්න සිද්ධ වෙනවා. ඒ වගකීම පැවරෙන්නේ විදුහල්පතිවරයාටයි; ඒ වගකීම පැවරෙන්නේ ආචාර්ය මණ්ඩලයටයි. ඒ අයට කරන්න දෙයක් නැහැ. මොකක්ද ඒ අය කරන්නේ? දෙමව්පියෝ, ආදී ශිෂ්‍යයෝ රැස් කරනවා, පාසල් සංවර්ධන කමිටුව රැස් කරනවා. එහෙම රැස් කරලා ඒ දෙමව්පියන්ට, ඒ ආදී ශිෂ්‍යයන්ට,- [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේ සම්භාවනීය අමුත්තන්ගේ ගැලරියේ අසුන් ගෙන සිටින ජාතික මුද්‍රා නාට්‍ය කලාවේ උන්නතියට මහඟු සේවයක් කළ වජිරා චිත්‍රසේන මැතිනිය මම ගෞරවයෙන් පිළිගනිමි.

මේ අවස්ථාවේදී ගරු ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමාගේ නම මූලාසනයට යෝජනා කරන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, "ගරු ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම පැහැදිලිව නිල වශයෙන්, නීත්‍යානුකූලව 1975 නිකුත් කළ චක්‍රලේඛනය අනුව, - මුලදී තිබුණේ- පාසල් සංවර්ධන සමිතියේ වාර්ෂික සාමාජික මුදල රුපියල් 3යි. පාසල් සංවර්ධන කමිටුවේ පහසුකම් හා සේවා ගාස්තුව පළමුවෙනි වසරේ සිට පස්වන පන්තිය දක්වා මසකට රුපියල් 3යි. ඒ කියන්නේ අවුරුද්දට රුපියල් 36යි. හයවෙනි පන්තියේ සිට ඉහළ දක්වා මසකට රුපියල් 5 බැගින් අවුරුද්දකට රුපියල් 60යි. ඒක තමයි 1975 නිකුත් කළ චක්‍රලේඛනය අනුව පාසල්වල අනුමත පහසුකම් හා සේවා ගාස්තුව වාගේම පාසල් සංවර්ධන කමිටුවේ කටයුතු සඳහා අය කළ යුතු නිල, නීත්‍යානුකූල මුදල. ඒ තත්ත්වය තමයි අද මේ වෙනස් කර ගෙන, වෙනස් කර ගෙන ඇවිල්ලා තිබෙන්නේ. රුපියල් 5 නොවෙයි, මාසයකට රුපියල් 5 නොවෙයි ඒ වාගේ දහස් ගුණයක් අය කරනවා. රුපියල් 5,000, 7,000 මාසයකට අය කරන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ගණන් මිනුම්වලට අනුව අද ලංකාවේ තිබෙන පාසල් 9,731න් මධ්‍යම ආණ්ඩුවට අයත් වෙලා තිබෙන පාසල් 342 හැරුණාම පළාත් සභාවලට තිබෙන පාසල් 9,389ම ගම්බදව පිහිටා තිබෙන ගම්බද ළමයි අධ්‍යාපනය ලබන තැන්. ඒ අයගෙන් තමයි වැඩි පුරම මේ මුදල් අය කිරීම සිදු වෙන්නේ. ඒ අයගේ දෙමවුපියන් තමයි මේකෙන් වැඩිම පීඩාවට පත් වෙන්නේ. ඒ පීඩාවට පත් කිරීම සඳහා දැන් අය වැය තුළ ප්‍රතිපත්ති සකස් කරලා තිබෙනවා. අපි දැක්කා, 2012 නොවැම්බර් මාසයේ ඉදිරිපත් කළ අය වැය යෝජනාව. මුදල් ඇමතිවරයා විධියට අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ඒ අය වැය යෝජනාව. ඒ අය වැය යෝජනා තුළ, ඒ අය වැය කථාවේ ඉතා පැහැදිලිව එතුමා මොකක්ද කිව්වේ? අධ්‍යාපනය සඳහා අපි දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක් වෙන් කරලා තිබෙනවා. නමුත් ඒ සියයට 4ක් වෙන් කරලා තිබෙනවා කියලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
{Expunged on the order of the Chair.]

ඊට පස්සේ වාක්‍යයෙන් එතුමා කිව්වේ මොකක්ද, දෙමවුපියන් විසින් දරන වියදමද ඇතුළත්ව තමයි ඒ සියයට 4 තිබෙන්නේ කියලා.

එතුමාම අනියමින් පිළිගත්තා, ඒ කථාව ඇතුළේ දෙමව්පියන්ගෙන් මුදල් අය කරනවාය කියා. අය වැය කථාවේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක් වෙන් කර තිබෙනවා. හැබැයි මේකේ වැඩි පංගුවක් තිබෙන්නේ දෙමවුපියන්ගෙන් අය කරන මුදල්ය කියා පිළිගත්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හිටපු ගමන් පොල් ගෙඩි අට කැඩුව දැරියගේ සිද්ධියේදී, තමා එහෙම එකක් අය වැයේදී කිව්වා නේද කියා අමතක වුණා. බලන්න කොයි තරම් හාස්‍යජනක ද කියා; කොයි තරම් විහිළුජනක ද කියා; කොයි තරම් ජුගුප්සාජනකද කියා. අය වැය කථාවෙදී කියනවා, සියයට හතරක් වෙන් කරනවාය කියා. හැබැයි ඒ සියයට හතරේ වැඩි පංගුවක් තිබෙන්නේ දෙමව්පියන්ගෙන් අය කරන ඒවාය කියපු ජනාධිපතිවරයාට-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, he is violating the Standing Orders. He is referring directly and through innuendos to the Head of the Government. That is the Executive President. ඒ. Executive President තමයි රටේ ළමයින්ට ඉතාමත් ම ආදරය දක්වන තාත්තා. ඒක දැන ගන්න ඕනෑ. රටේ ළමයින්ට ආදරය දක්වන තාත්තා එතුමා තමයි. ඒක දැන ගන්න. [බාධා කිරීම්]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම අසත්‍යයක් කිව්වේ නැහැ. මම ජනාධිපතිවරයාට අපහාස කළේත් නැහැ. ජනාධිපතිවරයා විවේචනය කළේත් නැහැ. ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවේ ඔය තමුන්නාන්සේගේ පැත්තේ ඉඳලා කිව්ව කථාව මතක් කළා. ඒ කථාව මොකක් ද? රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක් අධ්‍යාපනයට වෙන් කරනවා. ඒකෙන් වැඩි පංගුවක් දෙමවුපියන්ගෙන්; දෙමවුපියන් දරන්නේ කියා එතුමා කිව්වා. [බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! The Hon. Member was referring to the Hon. Minister of Finance. [බාධා කිරීම්]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

එතුමා කියපු එක අර හොරණ ළමයා පොල් ගෙඩි අට කඩා ගත් වෙලාවේ අමතක වුණා ද කියන ප්‍රශ්නය- [බාධා කිරීම]ඒක හැන්සාඩ්වලින් ඉවත් කරන්න බැහැ. ඒක ඔය පුත්තලම් බූරුවන්ට තේරෙන්නේ නැති වුණාට ඉස්කෝලේ ගිය ළමයෙකුට තේරෙනවා. ඒක පුත්තලම් බූරුවන්ට තේරෙන්නේ නැහැ. ඒක පුත්තලම් බූරුවන්ට තේරුම් ගන්නට පුළුවන් අධ්‍යාපනයක් ලැබුණේ නැහැ. අධ්‍යාපනය වෙන් කළ මුදල් අල්භාජ් බදිඋද්දීන් මොහමඩ් හිටපු අධ්‍යාපන ඇමතිවරයා හරියට වෙන් කළා නම් මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මොළය පෑදෙන්නට තිබුණා. නමුත් ඒ තත්ත්වය අද ඇති වෙලා නැහැ. ඒකට මට කරන්නට දෙයක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කථාවට අනුවම 2012 වර්ෂයේදී පළාත් පාසල් 3389ට වෙන කළ මුදල -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! If there is anything against the Standing Orders, that will be expunged from the Hansard. However, the Hon. Member was referring to the speech of the Hon. Minister of Finance.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 වර්ෂයේදී පාසල් 3389ට වෙන කළ මුදල එතුමාගේ කථාවට අනුවම රුපියල් මිලියන 61,646 යි. ඒ වාගේම 2012 වර්ෂයේදී අමතර පන්ති ගාස්තු සහ දෙමාපියන් විසින් දරන ලද මුළු වියදම රුපියල් මිලිය 64,950යි.

ඕකෙන් තමයි සියයට 4 හැදුණේ. ඒ ගැන පැහැදිලිව කියනවා. ආණ්ඩුවෙන් වෙන් කළ ගණන රුපියල් මිලියන 61,646යි. දෙමවුපියන්ගෙන් අය කරන ගණන රුපියල් මිලියන 64,950යි කියා. දැන් කොයි එකද වැඩි? ආණ්ඩුවෙන් වෙන් කළ ගණනද? දෙමවුපියන් වෙන් කළ ගණනද? මේක තේරෙන්නේ නැත්තේ කාටද? මේක පුත්තලම් බූරුවන්ට තේරුණේ නැති වුණාට, මේ රටේ අධ්‍යාපනය හදාරන අධ්‍යාපනය ගැන අඛමල් රේණුවක හෝ කැක්කුමක් තිබෙන ඕනෑම කෙනෙකුට තේරෙනවා. දෙමවුපියන් තමයි වැඩිපුර මුදල් -රුපියල් මිලියන 64,950ක්- වෙන් කර තිබෙන්නේ; වියදම් කර තිබෙන්නේ. ඒක තමයි ඇත්ත. ඒ තත්ත්වයට අද මේ රටේ අධ්‍යාපනය කඩා ගෙන වැටිලා තිබෙනවා. මේක නිකම්ම ආවේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක ආවේ චක්‍රලේඛ හරහා.

මුලදී කැබිනට් පත්‍රිකාවෙන් කර ගන්න බැරි වුණු දේ වෙනුවෙන් චක්‍රලේඛ නිකුත් කළා. ආරම්භක චක්‍රලේඛය 2008 සැප්තැම්බර් මාසයේ 7 වන දා නිකුත් කළා. ඒක තමයි 2008/35 චක්‍රලේඛය. හැබැයි, ඒ චක්‍රලේඛයෙන් වංචාවක්, ප්‍රෝඩාවක් කළා. මේක නියාමන ව්‍යාපෘතියක් විධියට තමයි ඉදිරිපත් කළේ. තෝරා ගත්ත පාසල් කිහිපයක් නම් කර, කලාප අටක් නම් කර, ඒ කලාප අට සඳහා නියාමන ව්‍යාපෘතියක් විධියට මේක ක්‍රියාත්මක කර බලනවාය කියා, අන්න ඒ සඳහා ඉඩ ප්‍රස්ථාව හදන්න තමයි චක්‍රලේඛ නිකුත් කළේ. ඒ චක්‍රලේඛ නිකුත් කරන විට හරි සුන්දර වචන දමා තිබෙනවා. ආරම්භයේ ඉඳලා හරි ලස්සන වචනවලින් මේ වගකීම දෙමවුපියන්ට සහ පාසල් ආදි ශිෂ්‍යයන්ට පැවරුවාම පාසල ගැන ආදරයක් ඇති වෙනවා; කැක්කුමක් ඇති වෙනවා; ඒ කැක්කුම ආදරය මත පාසල දියුණු වෙනවා. එහෙම ලස්සන වචන දැම්මා. ඇත්තටම ගත්තොත් ලස්සන සුරංගනා වචනවලින් පුරවා ඒක ඇතුළත විස කවපු, අධ්‍යාපන ක්ෂේත්‍රයට විස බැස්සූ චක්‍රලේඛ. ඒක හරියටම ගත්තොත් අනාගත සිසු පරපුරේ පණ හිඳින වස ගුලියක් චක්‍රලේඛවල තිබෙනවා. අනාගත ශිෂ්‍ය පරම්පරාවේ පණ හිඳින වස ගුලියක් තමයි මේ 2008/35 චක්‍රලේඛයත්, 2010 ඉදිරිපත් කළ චක්‍රලේඛයත්. මේ චක්‍රලේඛවලට මොනවාද කළේ? ඒ කාලයේදී වෛවර්ණ දවටනවල ඔතලා ඒක අලෙවි කළා. ඒ වෛවර්ණ දවටනවල තමයි තිබෙන්නේ, පාසලේ නඩත්තුව, පාසලට ආදරය කිරීම, මේ ඔබේ දරුවාගේ පාසලයි, එය රැක ගැනීම අපේ පරම යුතුකමයි කියා. එවැනි ලස්සන වචන දමා වෛවර්ණ දවටනවල ඔතලා තමයි අනාගත දරු පරම්පරාවේ පණ නසන විස ගුලිය මේ චක්‍රලේඛ හරහා අධ්‍යාපන අමාත්‍යාංශය සම්මත කර ක්‍රියාවට නහන්නේ. ඒ චක්‍රලේඛයේ මොනවාද සඳහන් වී තිබෙන්නේ? 2008/35 චක්‍රලේඛයේ පැහැදිලිව මෙහෙම සඳහන් වෙනවා:

> "පාසලේ ගුණාත්මක සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා පාසල් නහා සිටුවීමේ නියාමන වැඩසටහන 2006 වර්ෂයේ කොළඹ, වත්තේගම, අම්බලන්ගොඩ, වව්නියා දකුණ (යාපනය වෙනුවට), හලාවත, තඹුත්තේගම, වැල්ලවාය, කෑගල්ල යන කලාප 08ක සියලු ම පාසල්වල ද ජාතික පාසල්වල ද නවෝද්‍යා පාසල්වල ද ක්‍රියාත්මක කිරීමට අංක 2005/24 දරන චක්‍රලේඛයෙන් උපදෙස් දෙන ලදී..."

> "2006 වසරේ දී ක්‍රියාත්මක වූ කලාප හා අනෙකුත් පාසල්වලට අමතරව 2007 වර්ෂයේ දී පළාතකින් එක් කලාපයක් බැගින් තවත් කලාප 09ක එනම් කළුතර, හඟුරන්කෙත, තංගල්ල, මන්නාරම, සමන්තුරේ, කුලියාපිටිය, හිඟුරක්කොඩ, බදුල්ල හා ඇඹිලිපිටිය යන කලාපවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. 2008 වර්ෂයේ එක් පළාතකින් කලාප දෙක බැගින් වන පරිදි තෝරා ගත් කලාප 18ක මෙම නියාමන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මීනුවන්ගොඩ, කැලණිය, ගලේවෙල, හැටන්, අකුරැස්ස, හම්බන්තොට, වලිකාමම්, වව්නියා (උතුර), පදිරිප්පු, අක්කරෙයිපත්තු, ඉබ්බාගමුව, නිකවැරටිය, පොලොන්නරුව, දිඹුලාගල, වැලිමඩ, බිබිල, නිවිතිගල හා බලංගොඩ මෙම කලාප වේ. මේ අනුව මේ වන විට තෝරා ගත් කලාප 35ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ."

පටන් ගත්තේ කලාප අටකින්. එයට තව කලාප 9ක් එකතු කළා. ආපසු වතාවක් තව කලාප 18ක් එකතු කළා. සියල්ල එකතු වෙලා එන කොට කලාප 35ක මෙය ක්‍රියාත්මක වෙනවා. අදියරෙන් අදියර, පියවරෙන් පියවර දැන් මේ නියාමන ව්‍යාපෘතිය ව්‍යාප්ත කරගෙන ආවා. ඉස්සෙල්ලාම පටන් ගත්තේ කොස්සට ඉදලට සල්ලි ගන්නයි. ඊට පස්සේ නියාමන ව්‍යාපෘතියක් විධියට චක්‍රලේඛනයක් මඟින් කලාප මට්ටමින් ව්‍යාප්ත කරගෙන අවසානයේ දී මුළු රටටම ක්‍රියාත්මක වන තත්ත්වයට ආවා. අද තිබෙන්නේ අන්න ඒ ඛේදනීය තත්ත්වයයි. මට මතක හැටියට පෙබරවාරි 28 වැනිදා ගරු බන්දුල ඇමතිතුමා දින නියම කරලා කිව්වා, පාසල් ළමයින්ගෙන් මුදල් අය කිරීම සම්පූර්ණයෙන්ම නතර කරන චක්‍රලේඛන ගෙනෙනවාය කියලා. අද වන තුරු ඒ චක්‍රලේඛන ගෙනාවේ නැහැ. එතුමාට ඒක ගෙනෙන්න බැහැ. පාසල් ළමයින්ගෙන් ශත පහක්වත් සල්ලි අය කරන්නේ නැහැ, අය කරන්න දෙන්නේ නැහැ, ඒ සඳහා නීති පනවනවා, නීති ක්‍රියාත්මක කරනවා කියලා පුළුවන් නම් අද මේ සභාවට කියන්න කියලා මා එතුමාට අභියෝග කරනවා. ප්‍රායෝගිකව එය ඔප්පු කරලා පෙන්වන්න. එතුමාට ඒක කියන්න බැහැ. එතුමා ඒක කිව්වොත් හෙට ගෙදර යන්න වෙනවා. මුදල් අමාත්‍යාංශයෙන් මේ කටයුත්ත සඳහා මුදල් වෙන් කරන්නේ නැහැ. අධ්‍යාපනයට මුදල් වෙන් කරන්නේ මුදල් අමාත්‍යාංශයෙනුයි. එහෙම වුණොත්

එතුමාට ඇමතිකම නැති වෙනවා. ඒක එතුමාගේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. එතුමා මුහුණ දී තිබෙන මේ ඇත්ත අර්බුදයේ තත්ත්වය මේකයි. මේ අර්බුදය නිසා එතුමා කර වටක් ගිලිලා ඉන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ප්‍රශ්නය තිබෙන්නේ පළාත් සභා පාසල්වලයි.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
පළාත් සභා පාසල්වලක් ඒකයි සිදු වෙන්නේ. "පළාත් සභා පාසල් මට අයිති නැහැ. ඒක අයිති ශක්‍රයාගේ පුතා වයිමාට. වයිමා ආවොත් පුළුවන් පළාත් සභා පාසල්වල අධ්‍යාපනය නහා සිටුවන්න. මට කරන්න දෙයක් නැහැ"යි කියන කථාවලින් මේකට උත්තර ලැබෙන්නේ නැහැ. පළාත් සභාවලට හෝ මධ්‍යම ආණ්ඩුවට හෝ මේ කවර ආයතනයකට අයිති වුණත් මේ රටේ සමස්ත අධ්‍යාපනය අයිති මධ්‍යම ආණ්ඩුවට. ඒ වාගේම ඒවා පාලනය කරන්න ඕනෑ මධ්‍යම ආණ්ඩුවෙන්; මේ පාර්ලිමේන්තුවෙන්. ඒකට වග කියන්න ඕනෑ රටේ අධ්‍යාපන ඇමතිවරු. ඇමතිවරු පැටවු ගැහුවාට මේකට උත්තර ලැබෙන්නේ නැහැ. ඒකට ප්‍රතිපත්ති සැලැසුම් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. චක්‍රලේඛන වෙනස් කරනවාය කියලා කිව්වේ මේ කරුණු පරණ චක්‍රලේඛනයේ තිබෙනවාය කියලා ඇමතිතුමා දන්නා නිසයි. එක එක ආණ්ඩුවල ඇමතිවරු කියනවා එහෙම සල්ලි ගන්න බැහැ, එහෙම නීතියක් නැහැ කියලා. අධ්‍යාපන සේවා අමාත්‍යතුමා වශයෙන් අලුතින් පත් කරපු අපේ දුම්න්ද දිසානායක ඇමතිතුමා හොරණ සිද්ධිය ඇති වුණු වෙලාවේ මාධ්‍යවලින් කිව්වා, "අපි අය කරන්නේ නැහැ, දෙමව්පියෝ තමයි කැමැත්තෙන් සල්ලි දෙන්නේ" කියලා. මේකේ වැරැද්දත් ආපසු දෙමව්පියන්ට පැටෙව්වා. ඇත්තටම මොකක්ද වෙන්නේ ගරු ඇමතිතුමා? ඉස්කෝලේට දෙමව්පියෝ සහ ආදි ශිෂ්‍යයෝ ටික කැඳවනවා. කැඳෙව්වාට පස්සේ වේදිකාව ඉස්සරහ විදුහල්පතිතුමා වාඩි වෙනවා. වාඩි වෙලා රැස්වීමේ මූලික න්‍යාය පත්‍රය පටන් අර ගන්නවා. ඊට පස්සේ කියනවා, "මේ ඔබේ දරුවා යන පාසල. බලන්න ඔය වහල දිහා. උළු කැට කැඩිලා. ඔය වහලින් තෙමෙනවා. ඔබේ දරුවා තමයි ඔය පන්තියේ ඉන්නේ. ඔබේ දරුවා තමයි තෙමෙන්නේ. බලන්න බිම. සිමෙන්ති පොළොව කැඩිලා. හැම තැනම වළවල්. ඒ පන්තියේ ඉන්නේ ඔබේ දරුවා. බලන්න ඔය පන්ති කාමරයේ කළු ලෑල්ල දිහා. ඒකේ ඇණ ටික ගැලවිලා. ලියන්න චෝක් කෑල්ලක් නැහැ. ඒ පන්තියේ ඉන්නේ ඔබේ දරුවා" කියලා. ඉතින් හදවත පැළෙන්න එනවා ඒ දෙමව්පියන්ට. ඉස්කෝලේ හැම තැනම කැලේ හැදිලා ගේට්ටුව කැඩිලා තාප්පේ ගැලවිලා නම් විදුහල්පතිතුමා කියනවා, "අර බලන්න තාප්පය දිහා. තාප්පය ගැලවිලා. ගේට්ටුව කැඩිලා. ළමයි ටික interval එකේ ඔතැනින් දුවනවා. එහෙම දුවන කොට පාරේ වාහනයකට හැප්පෙන්න පුළුවන්. ඒ ඔබේ දරුවා. ඔබේ දරුවා තමයි මේ ඉස්කෝලේ ඉගෙන ගන්නේ. ඒ නිසා මොනවා හරි කරලා මේ ප්‍රශ්නයට උත්තරයක් හොයන්න" කියලා. එහෙම කිව්වාම මොන අම්මාගෙද, මොන තාත්තාගෙද හදවත උණු වෙන්නේ නැත්තේ? හැම අම්මා තාත්තා කෙනෙකුගේම හදවත උණු වෙනවා. ආණ්ඩුව සල්ලි දෙන්නේ නැහැ. අධ්‍යාපන ඇමතිගේ අම්මා මුත්තා මතක් වෙනවා. හැබැයි කරන්න දෙයක් නැහැ. අභිංසකකමට, නැති බැරිකමට කුලී වැඩක් කරලා හෝ අර පන්ති කාමරයේ සිමෙන්ති දාන්න, පන්ති කාමරයේ වහලයට උළු කැටයක් දමන්න යෝජනා කරනවා.

තාත්තා කෙනෙක් නැඟිටලා කියනවා, "ගරු විදුහල්පතිතුමනි, අපිට මේ ප්‍රශ්නය තේරෙනවා. ඔබතුමා උපරිමයෙන් මහන්සි වන බවත් අපට තේරෙනවා. ඔබතුමා කලාප අධ්‍යාපන කාර්යාලයට ගිහිල්ලා සල්ලි ඉල්ලූ බවත් අපි දැක්කා. ඔබතුමා අධ්‍යාපන ඇමතිතුමා ළඟට ගිහින් රස්තියාදු වෙලා පින්සෙන්ඩු වෙන හැටිත් අපි දැක්කා. ඔබතුමාට මේකට උත්තරයක් නැති බව අපට තේරෙනවා. ඉතින් එම නිසා මම යෝජනා කරනවා, එක දෙමවුපියකුගෙන් මාසයකට රුපියල් 1,200 ගණනේ සියලුම දෙමවුපියන්ගෙන් මුදල් අය කරන්න" කියලා. එහෙම කිව්වාම තව අම්මා කෙනෙක් "ඔව්, මගේ දරුවාත් මේ ඉස්කෝලයට එනවා. අපි ඒකට එකඟයි. අමාරුවෙන් හරි අපි ඒ සල්ලි දෙන්නම්. ඒ යෝජනාව මම ස්ථිර කරනවා ගරු විදුහල්පතිතුමනි" කියලා කියනවා. අනෙක් අම්මලාට කර කියා ගන්න දෙයක් නැහැ, ලජ්ජාවෙන් ඉන්නවා. දැන් මේකට විරුද්ධ කවුද? එතකොට විදුහල්පතිතුමා අහනවා, "දැන් කියන්න, කවුද මේ යෝජනාවට විරුද්ධ? විරුද්ධ එක අම්මා කෙනෙක් ඉන්නවාද, තාත්තා කෙනෙක් ඉන්නවාද" කියලා. අනේ! අම්මලා වෙව්ලනවා. විරුද්ධව අත උස්සන්න පුළුවන්ද? විරුද්ධව අත උස්සන්න බැහැ. එහෙම අත ඉස්සුවොත් මොකද වෙන්නේ? පහුවදා තමන්ගේ ළමයා ඉස්කෝලේ යවන්න බැහැ. එහෙම වුණොත් පන්ති භාර ගුරුතුමිය, එහෙම නැත්නම් විදුහල්පතිතුමා ඒ ළමයාට අරියාදු කරනවා. ඒ ළමයා පන්තියේ කොන් වෙනවා. ඉතින් මේකට භය වෙව්ව අම්මා තාත්තා ගල් කඩලා, කුලී වැඩ කරලා හෝ තමන්ගේ ඔරුව විකුණලා හෝ ඉස්කෝලෙට ඕනෑ කරන රුපියල් 1,200 දෙනවා. ඒක තමයි ඇත්ත. හැම මාසයටම විවිධ පාසල්වල විවිධ දේවල්වලට මුදල් එකතු කරනවා. මම ගණන් හදලා කියන්නම්. මම ඒවා පෙන්වන්නම්.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඔබතුමා කිව්ව ආකාරයට හැම මාසයකම මුදල් අය කරන විද්‍යාලයක් පුළුවන් නම් කියන්න?

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
කොළඹ රාජකීය විද්‍යාලය. මම පෙන්වන්නම් රිසිට් එක. රුපියල් 5,700ක් එකතු කරනවා. මම තව උදාහරණ පෙන්වන්නම්. ඔබතුමා මේ ප්‍රශ්නය අහපු වෙලාවේ මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා අධ්‍යාපන ඇමති කාලයේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීවරයා රිසිට් පෙන්වලා පාසල්වල සල්ලි එකතු කරනවා කියලා කිව්වාම සුසිල් ඇමතිතුමා කිව්වා, "පුළුවන් නම් මට කියන්න කොයි ඉස්කෝලෙද කියලා. රිසිට් එකක් පෙන්වන්න. හෙටම ඒ සල්ලි ටික ආපහු අය කරනවා" කියලා. අද වන තුරු ඒ සල්ලි ආපහු අය කළේ නැහැ. ඒ නිසා මම අභියෝග කරනවා. දැන් රිසිට් පෙන්වන්නම්. විදුලි ගාස්තු, security ගාස්තු අය කරපු බිල් පෙන්වන්නම්. පුළුවන් නම් ආපහු අය කරලා පෙන්වන්න.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
රාජකීය විද්‍යාලය-[බාධා කිරීමක්]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
රාජකීය විද්‍යාලය විතරක් නොවෙයි. උඩ වලවේ ඉස්කෝලෙත් අය කරනවා. රාජකීය විද්‍යාලයේ සිට ඇත පිටිසර උඩ වලවේ කනිෂ්ඨ විද්‍යාලය දක්වා, සූරියවැව ඉස්කෝලය දක්වා අය කරනවා. මේ තියෙන්නේ ලියුම්-කියුම් දෙමවුපියන් එවපු. මේ තිබෙන්නේ ඒ පාසලෙන් නිකුත් කරපු කුවිතාන්සි. මාසයක් පතා

[ගරු විජිත හේරත් මහතා]

සල්ලි එකතු කරන කුවිතාන්සි. ඕනෑ නම් තව මීටි ගණන් ගෙනැල්ලා පෙන්වන්නම්. මම ඔබතුමාට කිව්වේ එක උදාහරණයයි. මේ ලියුම්වල තිබෙන්නේ ඒවා. සල්ලි එකතු කරන ප්‍රමාණයන් ගැන දෙමවුපියන් කියලා තිබෙනවා. මේක තිබෙන්නේ 2008/35 දරන චක්‍රලේඛයේ. එහි 7(1) වගන්තියේ මෙය ඉතා පැහැදිලිව කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සල්ලි එකතු කරන්න බලය පවරලා විතරක් නොවෙයි, මෙන්න මෙහෙමයි කියන්නේ:

"07. පාසල් සංවර්ධන කමිටුවේ කාර්ය

7.1 සැළසුම්කරණය

(අ) පාසල් සැළසුම්කරණය මඟින් පාසලේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා පස් අවුරුදු පාසල් සංවර්ධන සැලැස්මක් සහ එක් අවුරුදු ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් පිළියෙල කළ යුතු ය."

කවුද ඒක කරන්න ඕනෑ? අර කියපු කමිටුවෙන්. පස් අවුරුදු සැලැස්ම සහ එක් අවුරුදු ක්‍රියාත්මක වැඩ පිළිවෙළ කියන මේ දෙකම ඒ කමිටුවෙන් තමයි ක්‍රියාත්මක කරන්න ඕනෑ. එතකොට තමයි පාසලේ සියලු කටයුතු අර විධියට වෙන්නේ.

මේ චක්‍රලේඛනයේ 10.4 වගන්තියෙන් -මේ විෂ ගුලියේ 10.4 වගන්තියෙන්- මොකක්ද කියන්නේ? එහි මෙසේ සඳහන් වනවා:

"10.4 පාසල මඟින් ක්‍රියාත්මක කරන විවිධ වැඩසටහන් සඳහා මුදල් එකතු කිරීමට හෝ වෙනත් විවිධාකාර ආධාර ලබා ගැනීමට කටයුතු කළ හැකිය."

දැන් අධ්‍යාපන සේවා ඇමතිතුමාට කියන්න පුළුවන්ද, සල්ලි එකතු කරන්න නීතියක් නැහැ කියලා. පුළුවන් නම් මට කියන්න, මේ චක්‍රලේඛනය වැරදියි කියලා. මාධ්‍යවලට, FM නාලිකාවට එතුමා කිව්වේ "නැහැ, එහෙම සල්ලි එකතු කරන්නේ නැහැ, සල්ලි එකතු කරන්න බැහැ, නීතියෙන් තහනම්" කියලා. නීතියෙන් තහනම් නැහැ. 2008/35 චක්‍රලේඛනයේ 10.4 වගන්තිය කියන්නේ මොකක්ද?

අධ්‍යාපන සේවා ඇමතිතුමනි, දන්නේ නැත්නම් චක්‍රලේඛය දැන්වත් කියවන්න. ඒ චක්‍රලේඛය යටතේ තිබෙන, පාසල් නහා සිටුවීමේ වැඩසටහන පිළිබඳ උපදෙස් සංග්‍රහයේ 10.4 යටතේ මෙසේ සඳහන් වෙනවා:

"පාසල මඟින් ක්‍රියාත්මක කරන විවිධ වැඩසටහන් සඳහා මුදල් එකතු කිරීමට හෝ වෙනත් විවිධාකාර ආධාර ලබා ගැනීමට කටයුතු කළ හැකි ය. ....."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙමයි තිබෙන්නේ. ඒ අනුව තමයි සල්ලි එකතු කරන්නේ. ඊළඟට එහි 10.6 යටතේ මෙසේ සඳහන් වෙනවා:

"පාසල් නහා සිටුවීමේ ගිණුමට

-ගිණුමකුත් තිබෙනවා. ගිණුමක් විවෘත කරන්නත් ඉඩ ප්‍රස්ථාව මේ චක්‍රලේඛයෙන් හදලා තිබෙනවා-

පහත සඳහන් මූලාශ්‍රවලින් ලැබෙන මූල්‍යමය ලැබීම් ගිණුම් ගත කළ යුතු ය."

සල්ලි ගිණුම්ගත කරන්න ඕනෑ විධියක් කියනවා. දැන් මොකක්ද කියන්නේ? ඒකේ යෝජනා හතක් තිබෙනවා. ගොඩක් දෙමවුපියෝ මේවා දන්නේ නැහැ. ගොඩක් දෙමවුපියෝ විදුහල්පතිතුමාට බණිනවා. මේ ඉස්කෝලේ විදුහල්පති සල්ලි හම්බ කරනවා; හොරකම් කරනවා; ගත්ත සල්ලිවලට කරන දෙයක් නැහැ කියලා ඒ දෙමවුපියෝ විදුහල්පතිතුමාට බණිනවා. නමුත් බණින්න ඕනෑ කාටද? මේ ආණ්ඩුවටයි. මේ ආණ්ඩුවේ ඇමතිවරු තමයි මේ චක්‍රලේඛ නිකුත් කරන්නේ. එතැන තමයි මේ ප්‍රශ්නයේ මූල තිබෙන්නේ. එහෙම නැතුව අහිංසක විදුහල්පතිතුමාව අල්ලා ගෙන වැඩක් නැහැ. ඒ වාගේම එම උපදෙස් සංග්‍රහයේ 10.6 යටතේ මොකක්ද කියන්නේ? එහි යෝජනා 7ක් තිබෙනවා. පළමුවැනි එක මොකක්ද? රාජ්‍ය අරමුදල්. ඒ කියන්නේ, ආණ්ඩුවෙන් ලැබෙන මුදල්. දෙවැනි එක, දෙමාපිය පරිත්‍යාග. අන්න මා කිව්වේ ඒකයි. සුන්දර වචනය දාලා දවටනයක ඔතලා තිබෙන්නේ. මුදල් බලෙන් ගන්නවා නොවෙයි, "පරිත්‍යාග" කියා තිබෙන්නේ. පරිත්‍යාග කියා වචනය තිබෙනවා. නමුත් ඒ සල්ලි ගන්න විධිය මේ රටේ ලක්ෂ සංඛ්‍යාත දෙමවුපියෝ දන්නවා. මේ රටේ හතළිස් දෙලක්ෂයක් දරුවෝ දන්නවා, සල්ලි ගන්නේ කොහොමද කියලා. පරිත්‍යාගවලින්ද කියලා ඒ අය දන්නවා. තුන්වැනි එක, සුභපතන්නන්ගේ පරිත්‍යාග. පාසලට සුභපතන්නන්ගෙනුත් සල්ලි ගන්නවා. All the best! හතරවැනි එක, ගොඩනැඟිලි, භූමිය හා උපකරණ භාවිත කිරීමට දීමෙන් ලැබෙන ආදායම්. ඉස්කෝලේ පිට්ටනිය, ඉස්කෝලේ ශාලාව භාවිත කිරීමට දෙන්න පුළුවන්. දැන් අපි දකිනවා ඉස්කෝලවල සංගීත සංදර්ශන තිබෙනවා. පිට්ටනියේ සංගීත සාජ්ජ තිබෙනවා. ඒවා තිබෙන කොට විකාර සිද්ධ වෙනවා. එහිදී වන සංස්කෘතික පරිහානිය, ළමයින්ගේ අධ්‍යාපනයට වන හානිය ගැන නොසලකා විදුහල්පතිවරයා හා ආචාර්ය මණ්ඩලය සල්ලි ගැන හිතලා පිට්ටනියේ, ශාලාවේ විවිධ ප්‍රසංග පවත්වනවා. මොකටද, සල්ලි හම්බ කර ගන්න. වෙන කරන්න දෙයක් නැහැ. ඒක විදුහල්පතිතුමාට පැවරිලා තිබෙන වගකීමක්.

ඊළඟට පස්වැනි එක, විෂයයක් යටතේ නිෂ්පාදිත භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්. භාණ්ඩ විකුණලා සල්ලි හම්බ කරන්න පුළුවන්. ඉතින් දිනයක් නියම කර ගෙන ඉස්කෝලේ පොළක් පවත්වනවා. පොළෙන් භාණ්ඩ ගන්න කියා දෙමවුපියන්ට ආරාධනා කරනවා. අනේ, එන්නේ දෙමවුපියෝ ටික දෙනායි. ඉස්කෝලේම ගුරුවරුයි, ළමයින්ගේම දෙමවුපියෝයි විකුණන්න ගෙනාපු බඩු ටික අරගෙන යනවා. ඒ අම්මලාම තමයි පොළට බඩු ගෙනාවේ. තමන්ගේ දරුවාට කිව්වා, මුකුණුවැන්න මිටියක් අරගෙන යන්න කියලා. තමන්ගේ දරුවාට කිව්වා කෙහෙල් මුවක් අරගෙන යන්න කියලා. හැබැයි ගන්න කෙනෙකු නැහැ. ඒවා ගෙනියපු ළමයාගේ දෙමවුපියෝම නැවත සල්ලි දීලා ගන්නවා. ඉතින් පොළේ ආදායම ඉස්කෝලේට එනවා. ඒ සල්ලිවලින් ඉස්කෝලේ තීන්ත ආලේප කරනවා. මෙන්න ක්‍රමය. ඒ ක්‍රමය චක්‍රලේඛයේ තිබෙන්නේ.

ඊළඟට හයවැනි එක, අනුමත විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති තුළින් උපයා ගන්නා ආදායම්. විවිධ ව්‍යාපෘති අනුමත කර ගෙන ඒ තුළින් සල්ලි උපයන්න පුළුවන්. ඊළඟට හත්වැනි එක, වෙනත් ආදායම්. ආදායම් ලබා ගන්න මාර්ග විවෘත - open - කර තිබෙනවා. වෙනත් ආදායම්වලින් සල්ලි හම්බ කරන්න ක්‍රම තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කැසිනෝවලින්ද?

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
කැසිනෝවලින්ද කියා දන්නෙත් නැහැ. මොකද, එහෙම තහනම් කියලාත් නැහැ. කැසිනෝවලින් හෝ බූරු පොළක් ඉස්කෝලේ දාලා හෝ සල්ලි හම්බ කරන්න ඉඩ ප්‍රස්ථාව

තිබෙනවා. මොකද, එහෙම කරන්න එපා කියලා නැහැ. ඒවාත් වෙනත් ආදායම් ක්‍රම. එකම දේ කමිටුවෙන් අනුමත කරන්නේ. කමිටුවේ පිස්සු හාදයෙකු හෝ දෙදෙනෙකු හිටියොත් ඒවා අනුමත වෙනවා. සල්ලි මත පාසලේ අධ්‍යාපනය තීරණය කරන චක්‍රලේඛ නිකුත් කළාම ඒවා වළක්වන්න බැහැ. ඊට පස්සේ තව හොඳ chance එකක් දෙනවා සල්ලි එකතු කරන අයට. බලන්න අධ්‍යාපන සේවා ඇමතිතුමනි, උපදෙස් සංග්‍රහය. මොකක්ද කියන්නේ? දැන් සල්ලි එකතු කරන්න යෝජනා 7ක් යටතේ ඉඩ පහසුකම් දීලා, නිකම් ඉන්නේ නැහැ. ඒකට මූලික වෙලා, මැදිහත් වනවා නේ කට්ටියක්. සාමාන්‍යයෙන් ආදි ශිෂ්‍ය සංගමයේ කිහිප දෙනෙකු මේකට පොඩ්ඩක් කර තියලා, බර තියලා අදිනවා. සමහර අය ඇත්තටම පාසලට ආදරයට එලෙස කරනවා. සමහර අය වෙන වෙන වුවමනාවලට කරනවා. මොකද, උපදෙස් සංග්‍රහයේ තව කරුණක් පැහැදිලිව තිබෙනවා. එහි 10.14 යටතේ මොකක්ද කියන්නේ? එහි මෙසේ සඳහන් වෙනවා:

"එසේම මෙම ආදායම් ඉපයීමට සම්බන්ධ වූ අය සිටී නම් එම පාර්ශ්වයන්ට එම ආදායමෙන් කොටස් බෙදා දීමේ සීමාව හා ගිණුමට බැර කිරීමේ සීමාව පාසල් සංවර්ධන කමිටුව විසින් තීරණය කළ යුතු ය."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න දුන්නු උපදෙස්. සල්ලි එකතු කරන්නත් පුළුවන්. එකතු කර ගන්න යෝජනාත් තිබෙනවා. ඊට පස්සේ කියනවා, කොටස් බෙදා ගන්නත් පුළුවන් කියලා.

මෙම ආදායම් ඉපයීමට සම්බන්ධ වූ අය සිටී නම් -ඒ සල්ලි උපයන්න සම්බන්ධ වුණු අය සිටී නම්- එම පාර්ශ්වයන්ට එම ආදායමෙන් කොටස් බෙදා දීමේ සීමාව හා ගිණුමට බැර කිරීමේ සීමාව පාසල් සංවර්ධන කමිටුව විසින් තීරණය කළ යුතුය. ලක්ෂ පහක්, දහයක් හෙව්වොත් කොයි තරම් ප්‍රමාණයක් පාසලේ පොදු ගිණුමට දානවාද, උපයන්න මැදිහත් වුණු අය අතරේ කොයි තරම් කොටස් ප්‍රමාණයක් බෙදා ගන්නවාද කියලා පාසල් සංවර්ධන කමිටුව විසින් තීරණය කරනවා. මේ අනුව බලන විට කොටස් වෙළෙඳ පොළක් වෙලා - share market එකක්- වෙලා තිබෙන්නේ. දැන් අධ්‍යාපන ඇමතිතුමා කියනවා, සල්ලි එකතු කරන්න බැරි ලු. සල්ලි එකතු කරන්න නොවෙයි, මේ චක්‍රලේඛයට අනුව එකතු කරපු සල්ලිවල කොටස් බෙදා ගන්නත් නීතිය තිබෙනවා. ඒකයි ඇත්ත කථාව. මේ චක්‍රලේඛය වෙනස් කරන්නේ නැතුව, "අනේ සල්ලි එකතු කරන්න බැහැ, ඒක නීතියෙන් තහනම්, කිසිම දෙමව්පියෙකුගෙන් සල්ලි එකතු කරන්න බැහැ, කවුරු හරි එකතු කරලා තිබෙනවා නම් මට කියන්න" කියලා බොරුවට කෑ ගහලා වැඩක් නැහැ. මේ රටේ දෙමව්පියෝ, මේ රටේ සමහර ගුරුවරු පවා ඇත්තටම මේ චක්‍රලේඛ ගැන තවම හරියට දන්නේ නැහැ. සමහර ගුරුවරු විදුහල්පතිතුමාට බනිනවා. මොකද ගුරුවරු හිතනවා, විදුහල්පතිතුමා තනියෙන් හම්බ කරගෙන කනවා, විදුහල්පතිතුමා මේ සල්ලි හොරකම් කරනවා කියලා. මේ චක්‍රලේඛයෙන් ඒ කමිටුවට බලය පවරලා තිබෙනවා. ඒ කමිටුව මඟින් සල්ලි එකතු කරනවා විතරක් නොවෙයි, කොටස් බෙදා ගැනීමකුත් කරනවා. ඒකට අවශ්‍ය කරන ප්‍රතිපාදන මේ චක්‍රලේඛවල තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට මෙහි 11.11 වගන්තියෙන් මොකක්ද කියන්නේ? 11.11 වගන්තියේ මෙසේ සඳහන් වනවා:

"පාසල් සඳහා සේවාවක් ලබා ගැනීම පිණිස තාවකාලික ව යම් කිසි පුද්ගලයකු බඳවා ගනු ලබන්නේ නම් එම පුද්ගලයාගේ නම සඳහන් කර පාසල් සංවර්ධන කමිටුවෙන් අවසර ලබා ගත යුතු ය."

ඒක දැන් හරි පැහැදිලියි. දැන් ගුරුවරු ආණ්ඩුවෙන් දෙන්නේ නැහැ. ළමයි උපවාස කරනවා, තමන්ගේ ඉස්කෝලේ ගුරුවරු නැහැ, ගුරුවරයෙක් දෙන්න කියලා. ඒ ළමයින්ට පොලීසිය තඩි බානවා. ළමයින් ඒ උපවාසය කරමින් සිටි කූඩාරමට පොලීසිය ගිහිල්ලා මාරාන්තික විධියට පහර දුන්නා. ඒ ළමයි මොනවාද ඉල්ලුවේ? ඒ ළමයි ලැම්බෝගිනි ඉල්ලුවේ නැහැ. ඒ පාසලේ දරුවෝ ලැම්බෝගිනි ඉල්ලලා උපවාස කළේ නැහැ. Race පදින්න racing cars ඉල්ලලා උපවාස කළේ නැහැ. ඒ ළමයි ඉල්ලුවේ, අපට ඉගෙන ගන්න අපේ පාසලට ගුරුවරයෙක් දෙන්න කියලායි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මට විනාඩි 50ක් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
යෝජනාව ස්ථිර කරන්න විනාඩි 5ක් වෙන් කරලා තිබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් ගුරුවරුන්ට පඩි ගෙවන්න, සේවකයන්ට පඩි ගෙවන්න, මුරකාරයන්ට පඩි ගෙවන්න කියලා තිබෙනවා. ඒක තමයි නියාමන ව්‍යාපෘති විධියට පටන් ගත්තේ. මේ තිබෙන්නේ, "පාසල් නඟා සිටුවීමේ නියාමන වැඩසටහන" සියලුම පාසල්වල ක්‍රියාත්මක කරනවා කියන චක්‍රලේඛයයි. මේ චක්‍රලේඛ දෙකම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ චක්‍රලේඛයේ ඉතා පැහැදිලිව තිබෙනවා, කොහොමද සල්ලි එකතු කරන්නේ කියලා. අපේ ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රශ්නයක් ඇහුවා, කොහොමද සල්ලි එකතු කරන්නේ, කොහේද receipt තිබෙන්නේ කියලා. මම පෙන්වන්නම් Royal College එකේ රිසිට් පත. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මම ඒවා කියන්න ඕනෑ.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
අහපු දේ කියන්න.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
අහපු දේත් කිව්වා. ඊට වැඩි පුරයි මේ කියන්නේ. ඔබතුමා කිව්වා කොළඹ රාජකීය විද්‍යාලයට වාගේ ඒවාට එන්නේ සල්ලි තිබෙන ළමයි කියලා. සල්ලි තිබෙන ළමයි කිහිප දෙනෙක් එනවා ඇති. නමුත් සමහර දරුවන් දුෂ්කර ගම්මානවලින් ශිෂ්‍යත්ව

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු විජිත හේරත් මහතා]

විභාගයෙන් වැඩි ලකුණු අරගෙන ඈය වෙලා, කුඹුරු උකස් කරලා තමයි කොළඹ රාජකීය විද්‍යාලයට ඉගෙන ගන්න එන්නේ. එහෙම නැතුව හැමෝම පොහොසත් අය නොවෙයි. මෙහි තිබෙනවා, school fees එකතු කරන විධිය. SDS Fees යටතේ Security Fund එකට රුපියල් 1,020යි. Record Books and Stationery Fund එකට රුපියල් 780යි. Library Fund එකට රුපියල් 420යි. Sports Fund එකට රුපියල් 720යි. Electricity Fund එකට රුපියල් 720යි. Technological Expenses Fund එකට රුපියල් 600යි. Repair and Maintenance Expenses Fund එකට රුපියල් 480යි. Sanitary Services Fund එකට රුපියල් 480යි. වැසිකිලි හෝදන්න, වැසිකිලිවල නඩත්තු කටයුතු සඳහාත් ළමයින්ගෙන් සල්ලි එකතු කරනවා. Miscellaneous Expenses Fund එකට රුපියල් 480යි. ඊට අමතරව තමයි පහසුකම් ගාස්තු - Facility Fees - රුපියල් 60ක් එකතු කරන්නේ. මේ තිබෙන්නේ කුවිතාන්සිය.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඔය අය කිරීම කරලා තිබෙන්නේ අවුරුද්දකටද, මාසයකටද?


ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
රාජකීය විද්‍යාලයේ එක ළමයෙකුගෙන් පාසලට ලැබෙන මුදල රුපියල් 5,736යි. ආසන්න වශයෙන් ළමයින් 8,400ක් ඉන්නවා. කොළඹ රාජකීය විද්‍යාලය, රුපියල් 5,736 ගණනේ හැම ළමයෙකුගෙන්ම එකතු කරන මුදලෙහි එකතුව රුපියල් හාරකෝටි අසූඑක් ලක්ෂ අසූදෙදහස් හාරසියයි.

එම මුදල දොළහෙන් බෙදුවාම එක මාසයකට රුපියල් 40,15,200ක් එකතු කරනවා. මේ කියන ගාස්තු සඳහා කොළඹ රාජකීය විද්‍යාලය එක මාසයකට රුපියල් 40,15,200ක් එකතු කරනවා.


මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්නපුර, දියවින්න විද්‍යාලයේ ළමයි 140දෙනායි ඉන්නේ. එම පාසලේ නිවාසාන්තර මලල ක්‍රීඩා තරගයට එක ළමයකුගෙන් රුපියල් 1,000 ගණනේ සල්ලි එකතු කරනවා. එතකොට sports meet එකට විතරක් රුපියල් 1,40,000ක් සල්ලි එකතු කරනවා. හැම දෙමවුපියකුම රුපියල් 1,000ක් යවන්න ඕනෑ. මේක තමයි තත්ත්වය. එම නිසා මේ අපරාධය වහාම නතර කරන්න. පාසලට ළමයකු ඇතුළත් කර ගනිද්දී, පාසලේ ළමයින් ඉගෙන ගනිද්දී මේ විධියට පාසල් ළමයින්ගෙන් සල්ලි එකතු කරලා දෙමවුපියන් මත බර පටවන එක වහාම නතර කරන්න. මේ චක්‍රලේඛය නතර කරලා, නීතිය ක්‍රියාත්මක කරලා, අධ්‍යාපනයට වෙන් කරන ප්‍රතිපාදන වහාම වැඩි කරන්න කියා රජයට බල කරමින් මගේ කථාව අවසන් කරනවා.

***සභාමේසය මත තබන ලද ලේඛන:**
சபாபீடத்தில் வைக்கப்பட்ட சுற்றுநிருபங்கள்:
Circulars tabled:



දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා அமைச்சர் Minister 2784832 2784807 2785617
ලේකම් செயலாளர் Secretary 2784812
කාර්යාලය அலுவலகம் Office 2785141-50 Fax: 2784846
විද්‍යුත්/மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk
ඔබේ අංකය உமது இல. Your No.
මගේ අංකය எமது இல. My No. ED/01/12/06/14/0
දිනය திகதி Date 2009.01
අධ්‍යාපන අමාත්‍යාංශය கல்வி அமைச்சு Ministry of Education
"ඉසුරුපාය" பத்தரமுல்ල. "இசுருபாயா" பத்தரமுல்லை. "Isurupaya" Battaramulla.
පත්‍ර සටහන හා තොරතුරු පත්‍ර සඟවා ඔබේ අංකය எமது இல. My No. ED/01/12/06/14/0
දිනය திகதி Date 2009.01 මී
වත්මන් අංක – 2008/35 (I)
සියලු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්
සියලු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්
සියලු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්
සියලු කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්
සියලු විදුහල්පතිවරයන්
පාසල් නඟා සිටුවීමේ නියාමන වැඩසටහන
පාසල් ආශ්‍රිතයේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම අරමුණු කර ඇති පාසල් නඟා සිටුවීමේ නියාමන වැඩසටහන පිළිබඳ නිකුත් කර ඇති 2008.09.15 දිනැති හා අංක 2008/35 දරන වත්මන්පත්‍ර අමතර විමසයි.
02. අංක 2008/35 දරන වත්මන්පත්‍රය මඟින් මෙම වැඩසටහන හඳුන්වා දී ඇති පාසල්වලට අමතරව 2006 සිට 2008 දක්වා ඉහළ පාසල් ලකුණ රෝහා හෙන ඇති පාසල් හඳුන්වා දී 2009 වර්ෂයේ දී රෝහා ගැනීමට නියමිත ඉහළ පාසල්වල ද මෙම පාසල් නඟා සිටුවීමේ වැඩසටහන මින් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට නියමිතය.
03. සබඳ කොමාන්ඩ්, විශාඛපුර, ඉඹරියන, වවුනාරඒවි, සන්නාගල්, කිරිදල්ල, ගොනගොඩදූවාව, මහියංගනය හා මාවනැල්ල යන කළාපයන්හි නියමු පාසල්වල ද මෙම වැඩසටහන 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරේ.
04. ඉහත පරිදි සඳු පාසල්වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අංක 2008/35 දරන වත්මන්පත්‍රයේ සඳහන් උපදෙස් හා මාර්ගෝපදේශ අනුව කටයුතු කරන ලෙස දන්වමි.
05. පාසල් නඟා සිටුවීමේ වැඩසටහනේ ආරම්භක හා අවස්ථෝචිත ප්‍රතිඵල ළඟාකර ගත හැකි වන පරිදි පාසල් සංවර්ධන කමිටුව හා පාසල් කළමනාකරණ සභාවෙහි කටයුතු කරමු අයෙකි අවධාරණ කරමි.
එම්.ඒ.ධර්මදාස
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
පිටපත්
1. විශෙෂාධිපති
2. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
4. සබඳ අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්
5. කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්



දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා அமைச்சர் Minister 2784832 2784807 2785617
ලේකම් செயலாளர் Secretary 2784811
කාර්යාලය அலுவலகம் Office 2785141-50 Fax: 2784846
විද්‍යුත්/மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk
ඔබේ අංකය உமது இல. Your No.
මගේ අංකය எமது இல. My No. ED/01/12/06/14/01
දිනය திகதி Date 2010.09.07
අධ්‍යාපන අමාත්‍යාංශය கல்வி அமைச்சு Ministry of Education
"ඉසුරුපාය", ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ பத்தரமுல்ல "இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை "Isurupaya", Sri Jayawardhanapura Kotte Battaramulla.
වත්මන් අංක : 2010/28
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරයන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්
සියලු ම විදුහල්පතිවරයන්
පාසල් නඟා සිටුවීමේ වැඩසටහන
පාසල් නඟා සිටුවීමේ වැඩසටහන පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2008.09.15 දිනැති අංක 2008/35. 2009.01.09 දිනැති 2008/35 (i) හා 2010.02.10 දිනැති 2008/35 (ii) දරන වත්මන්පත්‍රවලට අමතර වශයෙනි.
02. ඉහත වත්මන්පත්‍ර හා වත්මන්පත්‍ර සංශෝධන මඟින් වාර්ෂිකව පාසල් නඟා සිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන කළාප හා පාසල් තෝරාගැනීමේ නිර්ණායක හා පාසල්වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ මාර්ගෝපදේශ ද ඇතුළත් කර ඇත. එම කළාප හා පාසල්වල මෙම වැඩසටහන නියාමන වැඩසටහනක් ලෙස හඳුන්වා දී ඇත. එහෙත් පාසල් නඟා සිටුවීමේ වැඩසටහන මින් ඉදිරියේ දී නියාමන වැඩසටහනක් ලෙස නොව බව දැන්වීම් පාසල් නඟා සිටුවීමේ වැඩසටහන මින් ඉදිරියට සියලුම ෆෝකස් පාසල්වල ක්‍රියාත්මක කළ යුතු බව යි.
03. මෙම වැඩසටහන මෙතෙක් ක්‍රියාත්මක පාසල්වල හා මින් ඉදිරියට ක්‍රියාත්මක කරනු ලබන පාසල්වල අංක 2008/35 වත්මන්පත්‍රයේ පාසල් නඟා සිටුවීමේ වැඩසටහන පිළිබඳ උපදෙස් හා මාර්ගෝපදේශ අනුව කටයුතු කරන ලෙස දන්වමි.
04. පාසල් නඟා සිටුවීමේ වැඩසටහනේ ආරම්භක හා අවස්ථෝචිත ප්‍රතිඵල ළඟා කර ගත හැකි වන පරිදි පාසල් සංවර්ධන කමිටුව හා පාසල් කළමනාකරණ සභාවෙහි කටයුතු කරමු අයෙකි අවධාරණ කරමි.
සුනිල් එස්. හිටුන්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
පිටපත්
1. විශෙෂාධිපති
2. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
4. සබඳ අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්
5. කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කාලීන වැදගත්කමකින් යුත් යෝජනාව මා ස්ථිර කරනවා. ඒ සම්බන්ධව මා පසුව කථා කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු ටී.බී. ඒකනායක අමාත්‍යතුමා.

[අ.භා. 2.42]

ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව පටන් ගන්න කලින්, වමේ දේශපාලනයේ ඉතා ශක්තිමත් නායකයකු විධියට බටහිරට ගැනි නොවී, වමේ දේශපාලනය ශක්තිමත් කරමින්, වමේ ව්‍යාපාරය ශක්තිමත් කරමින්, දක්ෂිණාංශයට යට නොවී සිටි වෙනිසියුලාවේ හිටපු ජනාධිපති හියුගෝ චාවේස් මැතිතුමාගේ අභාවය පිළිබඳව අපේ කනගාටුව පළ කරන්න කැමැතියි. දරුණු අසනීප තත්ත්වයක් හේතුවෙන් මිය ගිය එතුමා වෙනුවෙන් මුළු රටේම වමේ ව්‍යාපාරය ආචාරය, ගෞරවය පළ කරන මේ මොහොතේ, අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙනුත්, රජය වෙනුවෙනුත් අපේ ශෝකය හා ආචාරය පළ කරනවා. එතුමාට ආචාර කිරීම සඳහා ගරු විමල් වීරවංශ අමාත්‍යතුමාත්, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාත් එම අවමංගල උත්සවයට සහභාගි වී තිබෙන බවත් මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. අවසාන වශයෙන්, වමේ ව්‍යාපාරයේ නායකයකු වෙනුවෙන් අපේ ආචාරය යළිත් පුද කරනවා.

අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරමින් අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා විවිධ කාරණා පැහැදිලි කළා. හැබැයි, අද අධ්‍යාපනය පිළිබඳව ඇති ශක්තිමත් ප්‍රවේශය ගැන එතුමාට කියන්න අමාරු වුණා. එතුමා පොල් ගෙඩි අටේ සිද්ධිය ගැන පුන-පුනා කථා කළා.

පසු ගිය වර්ෂ 16ක කාලය පුරාම ශ්‍රී ලංකාව තුළ පාසල් අධ්‍යාපනයේ සංවර්ධනයක් සිදු වී ඇති බව පැහැදිලියි. මෙහිදී සාක්ෂරතාව නහා සිටුවීම සඳහා වූ අධ්‍යාපනයේ දායකත්වය බැලිය යුත්තේ, 1940 දී සියයට 40ක් වශයෙනුත්, 1960 දී සියයට 72ක් වශයෙනුත් තිබූ සාක්ෂරතාව 2010 වසර වන කොට සියයට 96 දක්වා වර්ධනය වීම තුළිනි. මෙහි ඉතා ඉහළ වර්ධනයක් තිබෙන බව මහ බැංකු වාර්තාවට අනුව පැහැදිලියි. මෙය සම්පූර්ණයෙන්ම නිදහස් අධ්‍යාපනය තුළින් ළඟා කර ගත් ජාතික ඉලක්කයක් බව කියන්න ඕනෑ. 1994 වසරේ සියයට 90.6ක් වූ ද්විතීයික චක්‍රයට පිවිසෙන ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය, 2011 වසර වන විට සියයට 98.5 දක්වා වර්ධනය වීම තුළින් පෙන්නුම් කරන්නේ, ප්‍රාථමික චක්‍රය සාර්ථකව නිමවා ද්විතීයික අධ්‍යාපන චක්‍රය සඳහා ප්‍රවේශ වීමේ අවස්ථා වැඩි වී ඇති බවයි. මේ ආකාරයටම 1994 සිට 2011 දක්වා ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ඇතුළත් වීම සියයට 89.4 සිට සියයට 98.26 දක්වා වර්ධනය වීමත් සුවිශේෂී ජයග්‍රහණයක් බව කියන්න කැමතියි. 1994 දී 22ක් වූ ගුරු ශිෂ්‍ය අනුපාතය, 2011 වන විට 17 දක්වා අඩු වීම තුළ ඉගෙනුම් අවශ්‍යතා සඳහා ගුරුවරුන්ගේ සැපයීම කොතරම් දුරට සහතික කර ඇති බව පැහැදිලියි.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ පරිගණක පහසුකම් පුළුල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2005 දී සියයට 16ක් වූ පරිගණක සාක්ෂරතාව, 2011වන විට සියයට 38 දක්වා වර්ධනය වීම අධ්‍යාපන ක්ෂේත්‍රය ලබා ඇති විශාල ජයග්‍රහණයක් බව කියන්න ඕනෑ. එය දැනුම් කේන්ද්‍රීය සමාජයක් කරා යෑමේ මූලික අඩිතාලම බවත් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ඉලක්ක සපුරාලීමට අපි ක්‍රියාත්මක විය යුතුයි. ජාත්‍යන්තර වශයෙන් සැසඳීමේදී 2010 වසරේ ශ්‍රී ලංකාවේ ගුරු ශිෂ්‍ය අනුපාතය සියයට17යි. බංගලාදේශය සියයට 43යි, නේපාලය සියයට 32යි, පාකිස්තානය සියයට 40යි. මේ ආසියාවේ රටවල තත්ත්වයයි.

ප්‍රාථමික චක්‍රය සම්පූර්ණ කරන ශිෂ්‍ය අනුපාතය 2010 වසරේ සංඛ්‍යා ලේඛන අනුව බැලුවාම, ශ්‍රී ලංකාව සියයට 99.5ක ඉලක්කයකට ඇවිල්ලා තිබෙනවා. ඕස්ට්‍රේලියාව සියයට 98.1යි, ජර්මනිය සියයට 100යි, ජපානය සියයට 100යි, කොරියාව සියයට 100යි, ස්වීඩනය සියයට 99.0යි, නෝර්වේ සියයට 99.0යි, සවුදි අරාබිය සියයට 85.0යි, නයිජීරියාව 74.0යි, පාකිස්තානය 67.0යි.

සංඛ්‍යා ලේඛන අනුව ද්විතීයික චක්‍රය සඳහා ශිෂ්‍ය සහභාගිත්ව අනුපාතය ශ්‍රී ලංකාව සියයට 98.5යි, ඕස්ට්‍රේලියාව සියයට 85යි, සයිප්‍රසය සියයට 96යි, ප්‍රංශය සියයට 99යි, හොංකොං සියයට 75යි, අයර්ලන්තය සියයට 99යි, කොලොම්බියාව සියයට 74යි, භූතානය සියයට 52යි, බංගලාදේශය සියයට 47යි. මේ සංඛ්‍යා අනුව, ඉතිහාසය පුරා අපේ අධ්‍යාපනයේ වර්ධනය සිදුව ඇත්තේ කෙසේද කියා අපට මැනවින් තහවුරු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විවිධ අවස්ථාවලදී අපොස සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි කියන විෂයයන් සමත් ශිෂ්‍ය අනුපාත ගත්තාම 2002 වසරේ ගණිතය සියයට 39.97යි, විද්‍යාව සියයට 54.56යි, ඉංග්‍රීසි භාෂාව සියයට 23.84යි.

2005 වසරේ මේ අනුපාතයේ වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. 2005 වසරේ ගණිතය සියයට 44.03යි, විද්‍යාව සියයට 54.75යි, ඉංග්‍රීසි භාෂාව 36.18යි. 2010 වසරේ නැවත මේ අනුපාතය වර්ධනය වෙලා තිබෙනවා. 2010 වසරේ ගණිතය සියයට 60.38යි, විද්‍යාව සියයට 61.72යි, ඉංග්‍රීසි භාෂාව සියයට 42.36යි. 2011 දී නැවත එම අනුපාතයේ වර්ධනය ආරම්භ වනවා. 2011 වසරේ ගණිතය සියයට 55.33යි, විද්‍යාව සියයට 62.40යි, ඉංග්‍රීසි භාෂාව සියයට 44.57යි.

මේ ආකාරයෙන් වර්ධන වේගය පිළිබඳව විවිධ සංඛ්‍යාලේඛන තියෙද්දී පාසල් වැසී යෑමේ කාරණයත් අපට කථා කරන්න වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දරුවන් පාසල්වලට ඇතුළු කිරීමේ ප්‍රතිශතය පළාතෙන් පළාතට අද අඩු වෙලා තිබෙනවා. මේක ජාතික ප්‍රශ්නයක්. අතීතයේ පවුලක සිටි දරුවන් සංඛ්‍යාව සහ අද පවුලක සිටින දරුවන් සංඛ්‍යාව දිහා බැලුවාම, අද පවුලක සිටින්නේ දරුවන් එක්කෙනයි, දෙන්නයි. වැඩිම වුණොත් තුන් දෙනායි. ඒ නිසා උපත් අනුපාතය පිළිබඳ ප්‍රශ්නය පාසල්වලට දරුවන් ඇතුළු කිරීමේදී බලපාන බව විවිධ සංඛ්‍යා ලේඛනවලින් අපට පැහැදිලි වෙලා තිබෙනවා.

2005 සහ 2012 වසර අතර කාලය තුළ වැසුණු පාසල් ප්‍රමාණය දැක්වෙන වාර්තා මා ළඟ තිබෙනවා. බස්නාහිර, මධ්‍යම, දකුණ, උතුර, නැඟෙනහිර, වයඹ, උතුරු මැද, ඌව, සබරගමුව කියන සියලු පළාත්වල 2005 දී පාසල් 39ක්, 2006 දී පාසල් 40ක්, 2007 දී පාසල් 74ක්, 2008 දී පාසල් 14ක්, 2009 දී පාසල් 104ක්, 2010 දී පාසල් 79ක්, 2011 දී පාසල් 16ක්, 2012 දී පාසල් 36ක් වසා දමා තිබෙනවා.

මෙසේ වසා තිබී, පාසල් 1,000 වැඩ සටහන යටතේ නැවත විවෘත කරන ලද පාසල්වල තොරතුරු මා ළඟ තිබෙනවා. ඒ අනුව බස්නාහිර පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 08යි; ඒවාට ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 189යි. මධ්‍යම පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 2යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 55යි. දකුණ

[ගරු ටී. බී. ඒකනායක මහතා]

පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 2යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 373යි. උතුර පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 6යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 204යි. නැගෙනහිර පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 5යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 87යි. වයඹ පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 7යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 161යි. උතුරු මැද පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 3යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 174යි. සබරගමුව පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 1යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 82යි. මේ අනුව වසා තිබූ පාසල් 34ක් පාසල් 1000 වැඩ සටහන යටතේ අලුතින් ආරම්භ කරන්න පුළුවන් වෙලා තිබෙනවා; නව සිසුන් 1,325ක් ඇතුළත් කරගන්න හැකියාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරද්දී අප විශේෂයෙන් කියන්න ඕනෑ, පසු ගිය ඉතිහාසයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ වසා දැමූ පාසල් පවා අද ක්‍රියාත්මක වන වැඩ සටහන් යටතේ විවෘත කර තිබෙන බව. උදාහරණයක් හැටියට මහව කලාපය ගන්න පුළුවන්. මහව කලාපයේ වලස්වැව විද්‍යාලය, මොරගස්වැව විද්‍යාලය සහ තවත් පාසලක් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ වසා දමා තිබුණා. අද ඒ පාසල් තුනම නැවත විවෘත කරලා ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය ලබා දෙන ඉහළම පාසල් බවට පත් කරන්න අපි කටයුතු කර තිබෙනවා. ගරු අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමා වලස්වැව විද්‍යාලය ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දෙන පාසලක් විධියට ප්‍රවර්ධනය කරන්න කටයුතු කළා. ඒ වාගේම පලාපත්වල විද්‍යාලයත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබා දෙන විද්‍යාලයක් ලෙස ප්‍රවර්ධනය කරන්න කටයුතු කර තිබෙනවා. ඒ අනුව අපට පෙනෙනවා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ, ප්‍රාථමික අධ්‍යාපනයෙහි අලුත් වෙනසක් ඇති වෙලා තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල්වල මුදල් අය කිරීම පිළිබඳව අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කථා කළා. හුඟක් පාසල්වල දෙමව්පියන් කැමැතියි තම දරුවන් යන පාසල් තවතවත් ප්‍රවර්ධනය කිරීම සඳහා බාහිර ක්‍රියාකාරකම් වර්ධනය කරන්න. උදාහරණයක් විධියට ක්‍රීඩා අංශය ගන්න පුළුවන්. ක්‍රීඩා අංශයේ විවිධ ඉසව් තිබෙනවා. රගර් ක්‍රීඩාව ප්‍රවර්ධනය කරන්න ගියාම අතිවිශාල මුදලක් වැය වනවා. ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රවර්ධනය කරන්න ගියාමත් අතිවිශාල මුදලක් වැය වනවා. ඒ සඳහා වැය වන මුදලින් සියයට සියයක්ම රජයෙන් ලැබෙන්නේ නැති වන්න පුළුවන්. තමන්ගේ දරුවා ක්‍රිකට් ක්‍රීඩාවෙන් දක්ෂයකු කිරීම සඳහා ආනන්ද විද්‍යාලයේ ක්‍රීඩා අංශයට දෙමව්පියන් කොපමණ මුදල් පරිත්‍යාග කරනවාද කියලා අපේ ගරු අර්ජුන රණතුංග මැතිතුමා දන්නවා. ඒ වාගේම, රාජකීය විද්‍යාලයේ රගර් ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සඳහා දෙමව්පියන් කොපමණ දායකත්වයක් ලබා දෙනවාද? බස් රථ ගන්න දායකත්වය ලබා දෙනවා. අපි දන්නවා කුරුණෑගල මලියදේව විද්‍යාලයේ rugger team එක ශක්තිමත් කරන්න දෙමව්පියන් විශාල වශයෙන් දායක වූ බව.

ජපානයට සම්බන්ධකම් තිබුණු දෙමව්පියෝ විද්‍යාලයට බස් රථ ගෙනැවිත් දුන්නා; වෑන් රථ ගෙනැවිත් දුන්නා. මහනුවර ට්‍රිනිටි විද්‍යාලයේ දෙමව්පියන් පාසලේ බාහිර අංශ, අධ්‍යාපන අංශ ප්‍රවර්ධනය කරන්න විශාල වශයෙන් මුදල් ලබා දෙනවා. එය බලකිරීමක් නිසා වත්, ආණ්ඩුවේ දායකත්වය නියෝජනය කිරීම සඳහා වත් කරන දෙයක් නොවෙයි. ඒ නිසා ඒ කාරණය මේ ආණ්ඩුවේ වැරැද්දක් විධියට, අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අධ්‍යාපන ඇමතිවරයාගේ වැරැද්දක් විධියට හුවා දැක්වීම බංකොලොත් ක්‍රියාවක් කියලා මම හිතනවා. මව්පියන් කරන ඒ කාර්යයෙන් සිද්ධ වන්නේ පාසල් තවතවත් ශක්තිමත් වීමයි. ලංකාවේ පාසල් ප්‍රමාණය අනුව පාසල් විසි ගණනක් තමයි තරගකාරී මට්ටමේ පාසල් විධියට තිබෙන්නේ. තරගකාරී මට්ටමේ තිබෙන ඒ සෑම පාසලක්ම කල්පනා කරනවා අනෙක් තරගකාරී පාසල්වලට වඩා තමන්ගේ පාසල අධ්‍යාපනයෙන් විතරක් නොව, බාහිර ක්‍රියාකාරකම්වලින්ද ශක්තිමත්ව ගොඩ නඟන්න. අපි දන්නවා, රජයේ මුදල් පාවිච්චි කරන, ඒ වාගේම විදේශ මුදල්ද පාවිච්චි කරන, වෙනත් සමාගම්වලින් පාලනය කරන පාසල් තිබෙන බව. ගල්කිස්ස සාන්ත තෝමස් විද්‍යාලය, කිංස්වුඩ් විද්‍යාලය වාගේ බාහිර විධියට පාලනය වන පාසල් ගත්තාම ඒවායෙහි අති විශාල මුදලක් අය කරනවා. එසේ අය කරන මුදල් ප්‍රමාණයවත් රජයක් විධියට අපි දන්නේ නැහැ. ඒ විද්‍යාලයේ විදුහල්පතිවරයා පත් කිරීමේ අයිතියවත් රජයට නැහැ. නමුත් රජය අතිවිශාල මුදලක් -භාගයකට වඩා වැඩි මුදල් ප්‍රමාණයක්- ඒ පාසල්වලට වියදම් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, තවත් විනාඩියයි තිබෙන්නේ ඔබතුමාට.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
එහෙම තමයි ඒ විද්‍යාල පෙළ හැඩ ගැහිලා තිබෙන්නේ.

ඒ නිසා මොන ආකාරයෙන් චක්‍ර ලේඛ ක්‍රියාත්මක වුණත්, ආදී ශිෂ්‍යයන් විසින් පාසල් සංවර්ධන සමිති පිහිටුවාගෙන ඒ මඟින් තමන්ගේ පාසල වෙනුවෙන් උදවු උපකාර කරන්න ඒ අය කටයුතු කරනවා. අපි දන්නවා ආනන්ද විද්‍යාලය, නාලන්ද විද්‍යාලය, රෝයල් කොලේජ් එක වාගේ පාසල් ගත්තාම ඒවායේ ආදී ශිෂ්‍යයින් 2001 කණ්ඩායම, 2002 කණ්ඩායම, 2003 කණ්ඩායම, 2004 කණ්ඩායම යනුවෙන් ආදී ශිෂ්‍ය සංගම් හදාගෙන සිටින බව. මොකද, පාසල වෙනුවෙන් උදවු උපකාර කරන්න ආදී ශිෂ්‍යයින්ගේ ඒ තරම් උනන්දුවක් තිබෙනවා. ඒ විධියට කණ්ඩායම් හදා ගෙන තමන් ඉගෙන ගත් පාසලට මුදල් ආධාර ලබා දෙන්න ඒ අය සංවිධානාත්මකව පෙළ ගැසෙනවා. ඒ විධියට පෙළ ගැසෙන්න බැහැයි කියලා කාටවත් චක්‍රලේඛ යවන්න පුළුවන්කමක් නැහැ. ඉස්කෝලෙට උදවු කරන්න එපා කියලා ආදී ශිෂ්‍ය සංගම්වලට, ඒ වාගේම පාසල් සංවර්ධන සමිතිවලට කියන්න පුළුවන්කමක් නැහැ. මොකද, ඒක පාසලේ ඉගෙන ගත් ශිෂ්‍යයන් විසින් පිහිටුවාගෙන තිබෙන පාසල් සංවර්ධන සමිතිවල අයිතියක්. ඒ නිසා මේ කාරණය පිළිබඳව ඉතාමත් කල්පනාවෙන් ක්‍රියා කළ යුතුයි.

අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාටත් මතක ඇති, ජනතා විමුක්ති පෙරමුණ කාලයක් පාසල්වල විද්‍යාගාර කඩලා බෝම්බ හදන්න රසායනික ද්‍රව්‍ය ඇතුළු විවිධ උපකරණ අරගෙන ගියා. පොරමඩල විද්‍යාලයේ විද්‍යාගාරය කැඩුවා; ඉබ්බාගමුව මහා විද්‍යාලයේ විද්‍යාගාරය කැඩුවා; විජයබා විද්‍යාලයේ විද්‍යාගාරය කැඩුවා. දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා තිබුණු ඒවා තමයි එහෙම අරගෙන ගියේ. ඒවා ගැන අද කවුරුවත් කථා කළේ නැහැ. නිදහස් අධ්‍යාපනය ලබා ගත්තේ ඒ සම්පත්වලින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවා අපි දන්න දේවල්. ඒ විද්‍යාගාර සම්පූර්ණයෙන්ම කඩලා ඒ සම්පත් අරගෙන ගියා. ඒ පිළිබඳව අදටත් පොලීසියේ පැමිණිලි තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කථාව දැන් අවසන් කළ යුතුයි. ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

ඒ නිසා විදුරු කාමරවල ඉඳගෙන ගල් ගසන්න එපා. යහපත් අධ්‍යාපනයක් ලබා දීම සඳහා ගෙන යන වැඩ පිළිවෙළේ දී ඒක විපක්ෂයේද, ආණ්ඩුවේද, එහෙම නැත්නම් වෙනත් පක්ෂයකද කියන එක නොවෙයි වැදගත් වන්නේ. නිදහස් අධ්‍යාපනය කාටත් පොදුයි. කන්නන්ගර මැතිතුමා බලාපොරොත්තු වුණේ නිදහස් අධ්‍යාපනය තුළින් සියලු දෙනාටම හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්නයි. අද අපි ඒක හොඳින් ඉටු කරනවා. තමුන්නාන්සේලා හැමදාම කරන්නේ මඩ ගහන එක. අධ්‍යාපනය ගැන විශාල හැඟීමක් තිබෙන කෙනෙකු විධියට, දරුවන්ට ලෙන්ගතුකමක් තිබෙන කෙනෙකු විධියට, අද ගමේ අධ්‍යාපන ප්‍රතිඵල වැඩි වැඩියෙන් ලැබෙනකොට මේ ආඩම්බරකාර තාත්තා තමයි ඒ ගැන වැඩියෙන්ම සන්තෝෂ වන්නේ.

නැණ පහන් දල්වන්න, බාහිර ක්‍රියාකාරකම් ශක්තිමත් කරන්න අද රජය ගෙන යන වැඩ පිළිවෙළ ගැන අතිගරු ජනාධිපතිතුමාටත්, අධ්‍යාපන ඇමතිතුමාටත්, අධ්‍යාපන සේවා ඇමතිතුමාටත්, විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ සියලු දෙනාටමත් අපේ ගෞරවය පුද කරන්නට ඕනෑ. එතුමන්ලා කරන ජාතික සේවාවට අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. බොහොම ස්තුතියි.

[අ.භා. 2.58]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් වන විවාදයට සහභාගි වෙමින් මා කියා සිටින්න කැමැතියි, අධ්‍යාපනය ගැන අපි බොහෝ දේවල් කථා කර තිබෙන බව. අධ්‍යාපනය පිළිබඳව නොයෙක් අවස්ථාවල කල් තැබීමේ යෝජනා ඉදිරිපත් කරමින් විවාද කර තිබෙනවා. ඒ වාගේම මේ සභාවෙන් පිටතදීත් මේ ගැන කථා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අපි එකක් කියනවා; ආණ්ඩුව තව එකක් කියනවා. ඒක තමයි හැමදාමත් සිදු වන්නේ. මේ සම්බන්ධයෙන් බොහෝ දේවල් පෙන්වා දුන්නත්, බොහෝ දේවල් සම්බන්ධයෙන් කථා කළත්, ඒවා නිවැරදි වන ආකාරයක් පිළිබඳව නම් අපට පෙනෙන්නේ නැහැ. ඒ ගැන බොහොම කනගාටුයි. එකක් නොවෙයි, නොයෙකුත් වක්‍රලේඛ නිකුත් කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය තරම් වක්‍රලේඛ නිකුත් කර තිබෙන අමාත්‍යාංශයක් තව නැතිව ඇති. හැබැයි ඒවායින් මොන වක්‍රලේඛයද ක්‍රියාත්මක වන්නේ කියන එක ගැන අප පසු විපරමක් කළ යුතුයි.

අපේ අධ්‍යාපන ඇමතිතුමා පාසල්වල මුදල් එකතු කිරීම සම්බන්ධයෙනුත් අලුතෙන් වක්‍රලේඛයක් නිකුත් කරනවා කියලා තිබෙනවා. එම වක්‍රලේඛය දැන් මුද්‍රණය කරලාද, නැද්ද කියන්න මම දන්නේ නැහැ. සති දෙකක් ඇතුළත ඒ වක්‍රලේඛය පාසල්වලට යවනවාය කියනවා. මා දන්න විධියට නම් ඔය වක්‍රලේඛය යැව්වත් වැඩක් වන්නේ නැහැ. වක්‍රලේඛ උල්ලංඝනය කරන එක ගැන නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ උඩ ඉඳලා පහළට යනකන් - පාසල් දක්වාම යනකන් - ගාණක්වත් නැහැ. මේ පාසල්වල මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් මේ දිනවල අපි දිගින් දිගටම කථා කරනවා. රටේ ලොකු මතයක් ඒ පිළිබඳව ඇති වෙලා තිබෙනවා. රටේ නිදහස් අධ්‍යාපනයේ ඵල ලබා ගැනීමේ දී ඒ සඳහා කඩ ඉම් - වැටවල් - යොදමින් පවතිනවා වාගේ තමයි දැන් පෙනෙන්නේ. මොකද, දෙමවුපියන්ට තමන්ගේ දරුවන්ව නඩත්තු කර ගන්නවත් බැරිව; පාසල් යවලා ළමයින්ට අධ්‍යාපනය ලබා දෙන්නටවත් බැරිව අද ලතවෙමින් සිටින අවස්ථාවක පාසලට තීන්ත ගාන්න, තවත් දේවල්වලට සල්ලි ගෙනෙන්න කියලා පාසල්වලින් කියනවා. ළමයාව ඉස්කෝලෙට දමා ගන්නත් සල්ලි ගෙනෙන්න කියනවා. ඉතින් දෙමවුපියන් මේවා කරගන්නේ කොහොමද?

මා එක දෙයකින් ආරම්භ කරන්නම්. පාසල්වල මුදල් එකතු කිරීම තහනම් කරලා තිබෙද්දීත් එවැනි සිදුවීමක් ගැන අද උදේ මට එක්කෙනෙක් කථා කරලා කිව්වා. මහර, කැන්දලියද්දපාළුව, වැලිපිල්ලෑව ජයකොඩි විද්‍යාලයේ 8ඩී ශ්‍රේණියේ පන්ති භාර ගුරුවරයා ළමයින්ගෙන් රුපියල් 500 ගණනේ එකතු කරනවා කියලා දැන ගන්නට ලැබී තිබෙනවා. ඊයේත් එකතු කර තිබෙනවා. අද මේ වනකොටත් එකතු කරනවාලු. ඕනෑ නම් සොයලා බලන්න. අර පොල් ගෙඩි සොරකම් කරපු කථාව අපි පැත්තකින් තබමු කෝ. මම මේ වග කීමෙන් කියන්නේ. "The Island" පුවත්පතේ එවැනි ප්‍රවෘත්තියක් පළ වෙලා තිබෙනවා. මේක ජනාධිපතිතුමාගේ ප්‍රදේශයේ පාසලක්.

තංගල්ල ප්‍රදේශයේ හුංගම විජයබා ජාතික පාසලට තම දරුවා ඇතුළත් කර ගන්න රුපියල් 4000ක් දෙන්න වන්දෙසේන මහත්මයා තමන්ගේ ඔරුවයි හබලයි විකුණලා තිබෙනවා. ඉතින් මේවා විපක්ෂයේ අපි කියන ඒවා විතරක් නොවෙයි නේ. මේවා මාධ්‍යවේදීන් වාර්තා කරන ඒවා. මේ විධියට සල්ලි එකතු කර ගැනීම් පිළිබඳව ෆයිල්ස්වලින් තවත් ඕනෑ තරම් දේවල් කියන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතින් ඔය වක්‍රලේඛ ගැහුවා කියලා ප්‍රතිඵලයක් තිබෙනවාද? ඒවා ශත පහකට ගණන් ගන්නවාද? ළමයි ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මෙච්චර කල් තිබුණ වක්‍රලේඛ බලන්න. මුදල් ගන්න බැහැ. එක පන්තියකට ළමයි 45කට වැඩිය ගන්න බැහැ. එහෙම තිබෙන්නේ මොන පන්තියේද? මම මෙතැන කට කැඩෙනකම්, ඕනෑ තරම් කියලා තිබෙනවා ආනන්ද, නාලන්ද, රෝයල් වාගේ පාසල්වල පන්තියක ළමයි පනස් ගණන් ඉන්නවා, මේ වක්‍රලේඛ ක්‍රියාත්මක වෙනවා නම් ඒ ළමයි ගියේ කොහොමද කියලා වැඩිපුර ඉන්න අය ගැන කියන්න කියලා. මම අභියෝග කරලා තිබෙනවා. ළමයි 45ට වඩා, 46, 47, 48, 49 වැනි තැනට ඒ පාසලට ගිය ළමයි ඇතුළත් කර ගත්තේ කොහොමද කියලා විදුහල්පතිවරයාගෙන් අහලා තිබෙනවාද? ඒ ගැන පරීක්ෂණ පවත්වලා තිබෙනවාද? අපි දැකලා තිබෙනවා ඕනෑ තරම් ආයතනවල -පොලීසියේ වෙන්න පුළුවන්, වෙනත් ආයතන වෙන්න පුළුවන්- වැඩ තහනම් කර තිබෙනවා. අධ්‍යාපනයේ මෙච්චර ප්‍රශ්න තිබෙනවා. හරිහැටි දඬුවම් දීලා තිබෙන්නේ කාටද? අපි පෙන්වා දීලා තිබෙන ඒවායින් දඬුවම් දීලා තිබෙන්නේ කාටද? දඬුවම් දුන්නත් ඒවා නිකම් දියාරු වෙන ඒවා. එකයි ඇත්ත.

දැන් බලන්න පසු ගිය දවස්වල අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විද්‍යාව ප්‍රශ්න පත්‍රය පිළිබඳව ප්‍රශ්නයක් ආවා. ඒ විද්‍යාව ප්‍රශ්න පත්‍රය පිළිබඳව ප්‍රශ්නය ආවාම විභාග දෙපාර්තමේන්තුවෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වුවා. ඒ කරපු පරීක්ෂණයේ වාර්තාව තවම ඉදිරිපත් කරලා නැහැ. ඉතින් මේවා මොකටද? දැන් ජනාධිපතිතුමාත් කියනවා, පාසල්වලට සල්ලි එකතු කරන්න බැහැයි කියලා. සල්ලි එකතු කරන්න බැහැයි කියලා ජනාධිපතිතුමා තදින්ම කියලා තිබෙනවා මම දැක්කා. ඒ කියන්නේ ජනාධිපතිතුමාටත් මේ රට පාලනය කර ගන්න බැහැයි කියන එකද? අධ්‍යාපන ඇමතිතුමා හොරකම් කරන්නේ නැති, පුද්ගලයෙක් වශයෙන් හොඳ කෙනෙක් බව මම පෞද්ගලිකව දන්නවා. නමුත් මේක කර ගන්න බැරි ඇයි? මේක කර ගන්න බැහැ නේ. උපදේශක කාරක සභාවට ගියත්, වෙනත් තැනක් ගත්තත් අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ඉවරයි නේ.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

කඩා වැටිලා ඉවරයි නේ. ඉස්සර පාසල්වල ප්‍රගතිය බලන පාසල් පරීක්ෂකවරු හිටියා. දැන් ඒ පරීක්ෂකවරු පාසල්වලට යන්නේ කොහොමද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාසලට යන කොට කෝල් එකක් දීලා කියනවා" මචං අද අපි එනවා" කියලා. මේවා මට ගුරුවරු කියන ඒවා. එහෙම තමයි යන්නේ. ඉස්සර පාසල් පරීක්ෂවරු කඩා පනිනවා. ඒ අය ඇවිල්ලා බලනවා, ගුරුවරු උගන්වනවාද කියලා. අද ගුරුවරයාගේ ප්‍රගතිය බලන්නේ කවුද? ට්‍යුෂන් ගුරුවරුන්ට පින් සිද්ධ වෙන්න අද පාසල්වල ප්‍රතිඵල ගන්නවා. කීයෙන් කී දෙනාද පාසල්වල හරියට වැඩ කරන්නේ? අපි නිදහස් අධ්‍යාපනය ගැන කථා කරනවා. නමුත් ඒකයි යථාර්ථය. ඒක නිසා තමයි පාසල්වලට සල්ලි දෙන්න සමහර ළමයින් පූජා භූමි ළඟ මල් විකුණන්නේ. එහෙම නැත්නම් තමන්ගේ අධ්‍යාපනය ලබා ගන්න තවත් දුක් ගැහැට විඳින්නේ. පාර දිගේ මල් විකිණීම වාගේ දේවල් තමයි අද කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ, එක පැත්තක්. අනෙක් පැත්තෙන් බැලුවාම විදුහල්පතිවරු පාසල් නඩත්තු කරන්නේ කොහොමද? විදුලිබිල ගෙවන්න තිබෙනවා. ගරා වැටෙන ගොඩනැඟිලි යථා තත්ත්වයට පත් කරන්න තිබෙනවා. ටෙලිෆෝන් බිල් ගෙවන්න තිබෙනවා. මේක නිසා නේ අපි කියන්නේ අධ්‍යාපනයට මීට වැඩියෙන් මුදල් වෙන් කරන්න කියලා. අපේ සටන ඒකයි. අපි හැම තිස්සේම කියන්නේ ජාතික අය වැයෙන් අධ්‍යාපනයට මීට වඩා මුදල් වෙන් කරන්න කියලායි. පසු ගිය කාලය පුරාම විශ්වවිද්‍යාල ආචාර්යවරු පාරවල් ගානේ ගියේත්, අපි මේ පාර්ලිමේන්තුව දෙවනත් වන තෙක් කෑ ගැහුවේත් ඒ විධියට මුදල් වෙන් කරන්න කියලායි. මේකට මුදල් වෙන් කරන්න බැරි වුණාට අනෙක් ඕනෑ එකකට මුදල් වෙන් කරන්න ආණ්ඩුවට පුළුවන් නේ. කටුනායක වගලා හරි මත්තල එයාර්පෝට් එකට මුදල් වෙන් කරන්න පුළුවන්. නැව් එන්නේ නැති වරායවලට මුදල් වෙන් කරන්න පුළුවන්. හම්බන්තොට ප්‍රදේශයේ ඉඳලා හිටලා වාහන එන ගම් ඇතුළේ පාරවල් දැවැන්ත විධියට කාපට් කරන්න සල්ලි තිබෙනවා. ඒවා කරන්න පුළුවන්. මේ රටේ ජීවනාලිය බඳු අධ්‍යාපනයට සල්ලි වෙන් කරන්න ආණ්ඩුවට බැහැ. එහෙම නම් මේකේ වෙනස මොකක්ද? ඒකෙන්ම තේරෙනවා නේද මේ ආණ්ඩුවේ තිබෙන කළමනාකරණය; ආණ්ඩුවේ තිබෙන අසාර්ථකකම; ප්‍රමුඛත්වය දෙන්න ඕනෑ මොනවාටද කියලා හඳුනා ගෙන නොමැතිකම. මේ රටේ වෙන මොනවාද තිබෙන්නේ? තෙල් තිබෙනවාද? වෙනත් වටිනා වස්තු තිබෙනවාද? අපට තිබෙන්නේ මානව සම්පත පමණයි. මේ රටේ පාසල් දරු දැරියෝ ලක්ෂ 40ක් ඉන්නවා. මේ ඔළු ටික හදන්නේ නැතිව, මේවාට අවශ්‍ය සම්පත් ටික දෙන්නේ නැතිව, මේවාට අවශ්‍ය ක්‍රමවේද හදන්නේ නැතිව, අධ්‍යාපනය තුළ කරන දේශපාලන ව්‍යාපාරවලින් අන්තිමට මොකක්ද වෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට විනාශය කරා යන එකයි. කාටවත් ඒක වළක්වන්න බැහැ.

දැන් විවිධ ව්‍යාපෘති පටන් ගන්නවා. එක කාලයක "ඉසුරු පාසල්" පටන් ගත්තා. ඊළඟට "නවෝදය පාසල්" පටන් ගත්තා. දැන් පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් පටන් ගත්තා. ඊට පස්සේ දෙමව්පියන් විරුද්ධ වුණාම ඒවා අයින් කර දමනවා. ඉකින් ඒ සැලැස්මක් නැතිකම නේ. පටන් ගන්න කලින් හරියට සමීක්ෂණයක් කරන්න ඕනෑ. මේ පාසල් දහසට ගන්නේ මොන පාසල්ද? භූගෝලීය පසුබිම හරියට අධ්‍යයනය කරන්න ඕනෑ. දැන් බලන්න, පෝෂක පාසල් ආදි වශයෙන් වර්ගීකරණය කරගෙන සමහර ප්‍රාථමික පාසල් වැහුවා. වැහුවාම මොකක්ද වුණේ? ඒ අවට ඉන්න දෙමාපියන්ට කිලෝ මීටර් 10ක්, 15ක් දුර ගෙවා ගෙන යන්න ඕනෑ තමන්ගේ දරුවා ඉස්කෝලයට යවන්න. එහෙම වුණේ සැලැස්මක් නැතිකම නිසානේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැලැස්මක් නැතිව කොහොමද මේ රටේ දරුවන්ට අධ්‍යාපනය දෙන්නේ? අපි හැමදාම කියන්නේ ඒකනේ. සමබර පෞරුෂයකින් යුත් පුරවැසියෙක් බිහි කරනවා කියනවා. කොහේද බිහි කරලා තිබෙන්නේ? එහෙම වෙලා තිබෙනවා නම් අන්තර් ජාලය තුළින් sex පිළිබඳව වැඩිපුරම බලන අය ඉන්න රට වෙනවාද අපේ ලංකාව? සමබර දරුවන් බිහි කරන තැනට අපේ රට තල්ලු කර තිබෙනවාද? ඒ තැනට ගෙනෙන්න අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද? ඒ කෙරෙහි අපි අවධානය යොමු කළ යුතුයි. හැබැයි ඒ වෙනුවෙන් අවධානය යොමු කරන්න බැරි වුණාට අධ්‍යාපන අමාත්‍යාංශයට -මා දන්නේ නැහැ, කාගේ උවමනාව මතද කියලා- කර්නල්වරු පත් කිරීම වාගේ කටයුතුවලට ආණ්ඩුවට ඕනෑ තරම් ප්‍රතිපාදන සහ උවමනාව තිබෙනවා. දැන් එක වතාවක් කර්නල්වරු පත් කළා. ඔය කර්නල්වරු හිටපු ඉස්කෝලවල තමයි ඊයේ පෙරේදා ගහ ගත්තේ. ඒ කියන්නේ, ප්‍රධාන පාසල් දෙකක. ඒ පාසල්වල ඔය කර්නල්වරු තමයි ඉන්නේ. පුහුණුවකුත් දීලයි ගෙනාවේ. හමුදා පාලනය ගෙනැල්ලාත් ඒවා ටික පාලනය කර ගන්න බැහැ. ඊළඟට ඊට පහළ පාසල්වලටත් දෙනවා, මේජර්වරු, කපිතාන්වරු. දැන් පහළ පාසල්වලටත් කර්නල්වරු දෙනවා. මොකක්ද මේ කරන්න හදන්නේ? පාසල් නවදහස් ගණනක් තිබෙනවා. හාරදහස් ගණනක් පාලනය වෙන්නේ හමුදාවේ නිලතල එක්ක. මා දන්නේ නැහැ, මේ හදන්නේ වක්‍රාකාරව පාසල් පද්ධතියත් හමුදාව විසින් පාලනය කරන්නද කියලා. මොකද, පාසල් පන්දහසක් පාලනය කරනවා බැසිල් රාජපක්ෂ මැතිතුමා. ඉතිරි පාසල් ටික පාලනය කරන්න ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට දුන්නාට පසු මා දන්නේ නැහැ, මෙතුමාට පාලනය කරන්න පුළුවන් වේවිද කියලා. මේවා වැරදි සංකල්ප. රටේ අධ්‍යාපනය වෙනුවෙන් මීට වඩා කරන්න ඕනෑ තරම් දේවල් තිබෙනවා. ඒවා නොකර මේවා කරන එකයි අපට තිබෙන ප්‍රශ්නය. අපේ රටේ පාසල් යන දරුවන්ගෙන් සියයට 30ක් විතර මන්ද පෝෂණයෙන් පෙළෙනවා. පසු ගිය දිනවල එක දරුවකුට ප්‍රශ්නයක් වුණාම ජනාධිපතිතුමා කියා තිබුණා, මින් ඉදිරියට ක්‍රීඩා තරගවලට සහභාගි වන ළමයින්ගේ ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කරන්න කියලා. මේ ක්‍රීඩා කරන ළමයින්ගේ ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කළොත්, ඒ අයගෙන් භාගයකට ක්‍රීඩා කරන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, එතරම් සෞඛ්‍ය සම්පන්න දරුවන්ම නොවෙයි අපේ රටේ ඉන්නේ. තුන් වේල කන්න බැරි තත්ත්වයේ ඉන්නවා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්. හරියකට කිරි ටිකක් බොන්න විධියක් නැතිව ඉන්නවා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්. ඒත් දෙමාපියන් දුක් විඳලා කොහොම හරි ඒ ළමයින්ව පාසල් යවනවා ඒ දරුවන්ගේ ඇස් පාදලා ඒ ළමයින්ගෙන්වත් ජීවිතය ගොඩ යන්න ඕනෑ කියලා හිතන නිසා. ඒ නිසා මේ එක එක නීති රාමු දැම්මා කියලා, එක එක වක්‍රලේඛන ඉදිරිපත් කළා කියලා මේවා එකකවත් වලංගුතාවක් නොමැති වීම පිළිබඳව අපි කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක වෙලාවකට මට හිතෙනවා මේ අධ්‍යාපන පරිපාලන සේවයේ විභාග තිබියදී, රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරිනුත් අධ්‍යාපන අමාත්‍යාංශයට දාලා කටයුතු කරන එකත් වරදක් කියලා. මොකද, SLEAS සහ SLAS කියලා විභාග දෙකක් තිබෙනවා. රාජ්‍ය පරිපාලන සේවකයන්ට තිබෙන්නේ එක විභාගයක්, අධ්‍යාපන පරිපාලන සේවකයන්ට තිබෙන්නේ තව විභාගයක්. මේ තනතුරුවලට පත් වෙන්න ඕනෑ ඇත්ත වශයෙන්ම අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින්. ඒකෙදී රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරින්ට වැරදි කියලා හරි යන්නේ නැහැ. ඉහළ මට්ටමින් ඒ දේවල් හරියාකාරව කරන්න දැන ගන්න ඕනෑ. ඒවාට නිසි සුදුසුකම් තිබෙන පුද්ගලයින් පත් කරන්න ඒ අය දැන ගන්න ඕනෑ. එකකොට අධ්‍යාපන සේවාව -Education Service- ගැන අවබෝධයක් තිබෙන අය පත් වෙනවා. විදුහල්පතිවරු මාරු කිරීමේදී, උසස්වීම් දීමේදී එය ඉතා

වැදගත් වෙනවා. පසු ගිය කාලයේ ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන්ට අසාධාරණකම් වුණා. දේශපාලනික අවශ්‍යතාව මත දිගින් දිගටම පත්වීම් දුන්නා. මේ ළඟදීත් එක්දහස් හත්සිය ගණනකට පත්වීම් දුන්නා කියලා අමාත්‍යතුමාම පාර්ලිමේන්තුවේදී පිළිගත්තා. එහෙම වුණාම මේවා කඩා වැටෙන එක නවත්වන්න පුළුවන්ද? මොන චක්‍රලේඛන දැම්මත්, මොන නීති දැම්මත් ඒවා පහළ මට්ටමින් ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ චක්‍රලේඛන අද නිකම් joke එකක් වෙලානේ. අද මේ චක්‍රලේඛන විහිළුවක් වෙලා තිබෙන්නේ. ඉතින් අපි කොච්චර කථා කළත් මෙතැනින් එහාට මේකට මොකක්ද කරන්න තිබෙන්නේ. සුදුසුකම් නැති මිනිස්සු දානවා නම්, ඉවක් බවක් නැතිව මුදල් එකතු කිරීම් කරනවා නම්, ඉවක් බවක් නැතිව පරිපාලනයේ ගැටලු තිබෙනවා නම්, ඒවා විසඳන්නේ නැත්නම්, ඒ අයට දඬුවම් දෙන්නේ නැත්නම් මොකක්ද කරන්න ඕනෑ.

මම මීට කලිනුත් ගරු අමාත්‍යතුමාට කිව්වා, මා නියෝජනය කරන කුලියාපිටිය ආසනයේ කලාප අධ්‍යක්ෂවරයා පසු ගිය දිනක කර තිබෙන දෙයක් සම්බන්ධව. පාසල් 164ක විදුහල්පතිවරු කැඳවා එතුමා කියා තිබෙනවා, "දැන් වයඹ පළාත් සභා මැතිවරණය ළඟ එනවා. මහ ඇමතිවරයාට උදව් කරන්න campaign එකක් හදන්නයි තමුන්නාන්සේලා කැඳෙව්වේ" කියලා. තවම මහ ඇමතිවරයාවත් එතුමාගේ campaign එක ගැන සාකච්ඡා කරන්න අවශ්‍ය අය කැඳවා නැහැ. මා මේ වගකීමෙන් කියන්නේ. එතකොට විදුහල්පතිවරු ටික වැඩේට ලෑස්තියි. හැබැයි ඔක්කෝම නොවෙයි. එතැන හිටපු බොහෝ අය කලකිරීමට පත් වෙලා තිබෙනවා. ඒ අය කියනවා, "අපි විරුද්ධ වුණොත් අපිව ගෙදර යවනවා, කවුද අපේ ළමයින්ට කන්න බොන්න දෙන්නේ" කියලා. මීට කලින් ප්‍රශ්නයක් දාලා ඒ පැත්තේ එක් කෙනෙක් interdict කළා.

පුදුම දේශපාලනයක් තිබෙන්නේ. ඡන්ද කාලයක බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොන කාලයේද විදුහල්පතිවරු ගෙවල් ගානේ ඇවිදින්න ගියේ? මම මගේ ආසනය ආශ්‍රයෙන් මේවා කියන්නේ. ඔබතුමා හොයලා බලන්න, මේ අසත්‍ය නොවෙයි. අපේ නිලධාරිතුමන්ලාත් ඉන්නවා. පසු ගිය ඡන්ද හැම එකකදීම එහෙමයි කළේ. කෙළින්ම කලාප කාර්යාලය ළඟට යනවා, බස් එකක දෙකක ඔක්කොම සෙනඟ දමා ගන්නවා. බෝතල් ටිකකුත් දමා ගන්නවා. ඊට පස්සේ යනවා. හැබැයි යන්නේ අපේ ආසනයට නොවෙයි. ගල්ගමුවට, යාපහුවට යනවා ඇවිදින්න. ගුරුවරු, විදුහල්පතිවරු ගෙවල් ගානේ ඇවිදිනවා. මෙහෙම වුණාම විදුහල්පතිවරු සත පහකට ගණන් ගන්නවාද? අනිත් අය එක්ක එකට මත්පැන් බොනවා. එහෙම කළාම විදුහල්පතිවරුන්ට ඒ පාසල් පාලනය කරන්න පුළුවන්ද? මෙන්න මේ තත්ත්වයට අද ඔවුන් පිරිහිලා තිබෙනවා. එදා මම මේ ගැන ඇමතිතුමාට කිව්වා. ඇමතිතුමා ඒ ගැන බැලුවාද දන්නේ නැහැ. මේවා ගැන බලන්න ගරු ඇමතිතුමනි. අප ඔබතුමාට ගරු කරනවා. මේවා සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගන්න.

මට තව කාරණයක් කියන්න තිබෙනවා. මේ කාරණය උසස් අධ්‍යාපනයට සම්බන්ධ ප්‍රශ්නයක්. විශ්වවිද්‍යාලවලට තේරුණු සිසුන්ට දැන් හමුදා පුහුණුව දෙනවා නේ. විශ්වවිද්‍යාලවලට යන්න ඉස්සර වෙලා මේ හමුදා පුහුණුව ලබා දෙන්න පසු ගිය දවස්වල මාදුරුඔය ප්‍රදේශයට දරුවන් පිරිසක් අරගෙන ගියා. මේ පුහුණුව ලබා දීමේදී එක ළමයෙකුට අවුලක් ඇති වුණා. ඒ පුහුණුව නිසා ඒ ළමයා පොඩ්ඩක් upset ගියා. අන්තිමට මොකක්ද වුණේ? මට දැන් ඒක මෙතැන කියන්න බැහැ. ඒක කියන එක ඒ ළමයාට කරන අගෞරවයක්. අන්තිමට ඒ ළමයා මානසිකව යම් ප්‍රශ්නයකට මුහුණ දුන්නා. ඊට පස්සේ ඒ මානසික ප්‍රශ්නයක් තිබෙන මේ ළමයා ගම්පහ එක තැනකදී බස් රථයෙන් බැස්සුවා. ඔබතුමා හොයා බලන්න. දැන් ඒ ළමයාගේ මනස අවුල් වෙලා පිස්සු හැදිලා ඉන්නේ. ඒ ළමයා නාන්න, ඇඳුම් හෝදන්න වතුර බාල්දි 200ක් ඇදලා තිබෙනවා. ඒ දෙමවුපියන් තමයි ඒ ගැන කියන්නේ. ඒ ළමයා දැන් mentally out. දෙමවුපියන්ට කියලාත් නැහැ. ඒ විදුහල්පතිවරයාගෙන් අහලා බලන්න, මාදුරුඔයේදී මොනවාද වුණේ කියලා. මේවා ගැන කවුරුවත් හරියට බලන්නේ නැහැ; පසු විපරම් කරන්නේ නැහැ; මොකක් හරි ප්‍රශ්නයක් වුණාම ගෙනැත් දමනවා. මීට ඉස්සර වෙලා දියතලාව පැත්තෙත් ඔහොම වුණා. ඔනෑ ඒවා නොවෙයි නේ මේ කරන්නේ. මේක මිලිටරිකරණය කරන්න ඔනෑ නම් කෙළින්ම ඔක්කොම කර ගන්න. මේක වක්‍රව කරන්න එපා. විශ්වවිද්‍යාල ළමයින්ටත් මේක කරනවා; පාසල්වල විදුහල්පතිවරුන්ටත් මේ පුහුණුව දෙනවා. ඊළඟට ගුරුවරුන්ටත් දෙන්න ගනීවි. මේක ලොකු අවුලක්. මේ අවුලෙන් අන්තිමට දුක් විඳින්නේ මේ රටේ අහිංසක තරුණ පරපුර. අපේ ජාතියටයි මේකෙන් අන්තිමට දුක් විඳින්න වන්නේ. මම ඉතාම කනගාටුවෙන් කියනවා, අප පසු ගිය කාලයේ පෙන්වා දුන් ඒ ප්‍රශ්නවලට හරියාකාරව කටයුතු කර නැති බව. "දුන්න දුනුගමුවේ, ඊතල කිතලගමුවේ" කියනවා වාගේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අවශ්‍ය දේට නොවෙයි විසඳුම් ලබා දෙන්නේ. අපේ කථාවලදී මේවා පෙන්වා දෙන වෙලාවට මොකක් හරි නිකම් වචන හරඹයක් කරන්නේ නැතිව මේවා ඇත්තටම වටහා ගෙන කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.14]

ගරු දුමින්ද දිසානායක මහතා (අධ්‍යාපන සේවා අමාත්‍යතුමා)

(மாண்புமிகு துமிந்த திசாநாயக்க - கல்விச் சேவைகள் அமைச்சர்)

(The Hon. Duminda Dissanayake - Minister of Education Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගැන වචන කීපයක් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. මගේ හිත මිත්‍ර, උගත්, බුද්ධිමත් විජිත හේරත් මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ දැන් හිටියා නම් හොඳයි කියලා මට හිතෙනවා. එතුමන්ලා රටේ තරුණයන් ගැන කථා කරනවා; රටේ තරුණයන් ගැන හඬ නඟනවා. එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා වයස 22ත් පාර්ලිමේන්තුවට ආපු මම ඒ කාලයේ ඒවා මොනවාද දන්නේ කියලා. මම පාර්ලිමේන්තුවට ආවේ අවුරුදු 22දී නොවෙයි 21දී, ලංකාවේ ළාබාලම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විධියට. තරුණයෙක් ළාබාල වයසින් පාර්ලිමේන්තුවට ආවාම ඒක හැල්ලුවට ලක් කරන විජිත හේරත් මන්ත්‍රීතුමන්ලා, එළියට ගිහින් තරුණයන් වෙනුවෙන් පෙනී සිටින්නේ කොහොමද කියන එක පිළිබඳව මට ප්‍රශ්නයක් තිබෙනවා. තරුණයෙක් මේ වාගේ තැනකට ආවාම ඒකේ වටිනාකමක් දකින්නේ නැති උදවිය රටේ සමස්ත තරුණයන් ගැන කථා කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මම මේ රටේ තරුණයන්ගෙනුත් අහනවා. තරුණයෙක් විධියට ඒ පිළිබඳව මම කනගාටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පරණ කියමනකුත් තිබෙනවා නේ, "බල්ලෙක් බිරුවාට කන්දක් පහත් වෙන්නේ නැහැ" කියලා. මම මේ වෙලාවේ ඒකත් මේ ගරු සභාවට මතක් කරනවා.

විජිත හේරත් මන්ත්‍රීතුමා අද සභාව කල් තබන අවස්ථාවේදී ග්‍රාමීය පාසල් වහන එක ගැනයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. මා හිතන හැටියට පාසල් වැහෙන ප්‍රමාණය සහ අරින ප්‍රමාණය පිළිබඳව නොවෙයි අද අපට ප්‍රශ්නය තිබෙන්නේ.

අපේ රටේ තරුණ තරුණියන්ට, දූ දරුවන්ට අවශ්‍ය කරන දැනුම පාසල තුළින් ලැබෙනවාද? අපි ආසියාවේ ආශ්චර්යය කරා යන්න හදන මේ ගමනේදී රටේ පාලම් හදනවා; පාරවල් හදනවා;

[ගරු දුමින්ද දිසානායක මහතා]

රට සංවර්ධනය වෙනවා. අපේ හිතවත් අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා මතක් කළා අද නැව් එන්නේ නැති වරායයන් හදනවාය කියා. ඔව්, නැව් ආවේ නැති වුණත් අපි වරායයන් ටික හදන්න ඕනෑ; ගුවන් තොටුපළවල් හදන්න ඕනෑ; රට සංවර්ධනය කරන්න ඕනෑ. මොකද, ඒවා හදන්නේ නැතිව කවුරුවත් එන්නේ නැහැ. රටේ භෞතික සම්පත් සංවර්ධනය වෙනකොට ඒවා කළමනාකරණය කරන්න හොඳ මානව සම්පතක් ඉන්න ඕනෑ. ඒ සඳහා මේ රටට හොඳ බුද්ධිමත් පිරිසක් බිහි කර ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි වර්තමාන අධ්‍යාපන අමාත්‍යවරයා විධියට ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා අධ්‍යාපන ක්ෂේත්‍රයේ මහා පෙරළියක් ඇති කරමින් වෙනස්කම් රාශියක් ඇති කරන්න යන්නේ. ඒ වෙනස්කම්වලින් කිහිපයක් මේ වනකොට ස්ථාපිත කර තිබෙනවා. අපි පිළිගන්නවා, යම් යම් ප්‍රශ්න, ගැටලු තිබෙන බව. මොකද, අපි වැඩ කරන්නේ විශාල පිරිසක් එක්කයි. අද රටේ ශිෂ්‍ය ප්‍රජාව එහෙම නැත්නම් පාසල් දූ දරුවන් සංඛ්‍යාව ලක්ෂ 40කට -මිලියන හතරකට- ආසන්නයි. ඒ වාගේම සේවක මහත්ම මහත්මීන්, ගුරුවරුන් සංඛ්‍යාවත් විශාල ප්‍රමාණයක් වෙනවා. ඒ අයත් එක්ක කටයුතු කරනකොට සමහර වෙලාවට අතපසු වීම් වෙන්න පුළුවන්. සමහර වෙලාවට වැරදි සිද්ධ වෙන්න පුළුවන්. හැබැයි මේ සුළු අතපසු වීම් වෙනුවෙන්, එක්කෙනෙක් දෙදෙනෙක් කරන වැරදි වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන සේවා අමාත්‍යාංශය හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යන සමස්තයටම දොස් කියන්න බැහැ.

මා කලින් මතක් කළ විධියට අපි කල්පනා කරන්න ඕනෑ වැහෙන පාසල් ප්‍රමාණයයි, ඇරෙන පාසල් ප්‍රමාණයයි ගැන නොවෙයි. තිබෙන පාසල්වලින් නිසි අධ්‍යාපනයක් ලැබෙනවාද, නිසි අධ්‍යාපනයක් ලබා දෙන්නට අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දී තිබෙනවාද කියන කරුණු ගැනයි. පාසලක් වහන්න ප්‍රධානම හේතුව තමයි පාසලට අවශ්‍ය කරන ප්‍රමාණයට සෑහෙන දරුවන් ප්‍රමාණයක් නොසිටීම. මම හිතන හැටියට අපේ ගරු ඇමතිතුමා සංඛ්‍යා ලේඛන සහිතව ඒ කරුණු ඉදිරිපත් කරාවි. ළමයින් 20ට අඩු පාසල් කීයද, ළමයින් 10ට අඩු පාසල් කීයද යනාදී කරුණු ගැන විස්තර සහිතව එතුමා කතා කරාවි. අපි දරුවන්ට හරි අධ්‍යාපනයක් ලබා දෙනවා නම් අපට පාසල් සංඛ්‍යාව ගැන නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. මේක මගේ පෞද්ගලික මතය. අධ්‍යාපන සේවා අමාතවරයා විධියට නොවෙයි මම මේ කියන්නේ. අවශ්‍ය ළමයින් ප්‍රමාණය ඉන්නවා නම් අපි ඒ පාසල ශක්තිමත් කරන්න ඕනෑ. ඒ වාගේම අවශ්‍ය ළමයින් ප්‍රමාණය නැත්නම් නමට විතරක් ඒ පාසල පවත්වා ගෙන ගිහින් වැඩක් නැහැ. ඒ පාසලේ තිබෙන්නේ 1 වසරේ සිට 5 වසර දක්වා විතරක් නම් අපට ගුරුවරුන් අඩු ප්‍රමාණයක් තියා ගන්න පුළුවන්. හැබැයි 6 වසරෙන් ඉහළට එක පන්තියක ළමයින් දෙන්නෙක්, තුන් දෙනෙක් තියා ගෙන ඒ ළමයින්ට විෂයයන් අටක් උගන්වන්න සුදුසු ගුරු මණ්ඩලයක් දෙන්න බැරි නම් ඒ පාසල නිකම් ඇරලා තිබුණාට තේරුමක් වෙන්නේ නැහැ. එහෙම නම් ඒ පාසල ගැන හිතනවාට වඩා ඒ දරුවො ටික පහසුකම් තිබෙන වෙනත් පාසලකට අරගෙන ගිහින් ඒ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් දෙන්න අපට පුළුවන්. ඒක මගේ පෞද්ගලික මතය මිසක් අධ්‍යාපන අමාත්‍යාංශයේවත්, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේවත්, මේ ආණ්ඩුවේවත් මතය නොවෙයි. තරුණයෙක් විධියට මා දරන මතය ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගේ කථාවේදී භාගයක්ම කියැවුණේ පාසල්වලින් සල්ලි එකතු කරන එක ගැනයි. එතුමා මගේ නමත් සඳහන් කළා. මුදල් එකතු කරන්න ආණ්ඩුවෙන් කියා නැති බව මම FM නාලිකාවලට කිව්වාය කියා එතුමා කිව්වා. එතුමාට පොඩ්ඩක් වැරදුණා. මම කිව්වේ දරුවන්ගෙන් මුදල් එකතු කරන්නය කියා නැහැ කියන එකයි. හැබැයි එතුමා ඒ චක්‍රලේඛය මුල ඉඳලා අගට යනකම් කියෙව්වා. අපි කියා තිබෙන්නේ පාසල් නගා සිටුවීමේ සමිතියට මුදල් එකතු කරන්න පුළුවන් විධියේ චක්‍ර ලේඛයක් තිබෙනවාය කියන එකයි. ඒ, පාසල් නගා සිටුවීම සඳහායි. අපි එතුමාට මතක් කරන්න ඕනෑ, ඒ වාගේම අනෙක් උදවියටත් මතක් කරන්න ඕනෑ, ගමේ පන්සල හැදුණේ කොහොමද කියන එක ගැන. ගමේ පන්සල හැදුවේ ආණ්ඩුවෙන් නොවෙයි. ගමේ දායකයෝ එකතු වෙලා තමන්ගේ අස්වැන්නෙන් වී බුසලක්, දෙකක් එකතු කරලා ගමේ චෛත්‍යය හැදුවා, ගමේ ආවාසය හැදුවා, ගමේ පන්සල සංවර්ධනය කළා. එහෙම තමයි ගමට පන්සලක් ලැබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි අපි අද මහා ඉස්කෝලය හැටියට කියා ගන්නා ඒවා, සංවර්ධිතයි කියන ඉස්කෝල බොහෝ ප්‍රමාණයක අතීතය ගැන බැලුවොත් ඒ පාසල්වල මුලින් තිබිලා තිබෙන්නේ hall එකක් විතරයි. ඒ hall එකේ තිබෙන්නේ asbestos sheetsවත්, උළුවත් නොවෙයි. ගමේ උදවිය එකතු වෙලා කණු 4ක්, 5ක්, 6ක් සිටුවලා, කොට බිත්තියට මැටි ගහලා, බිමට මැටි දාලා, පොල් අතුවලින් සෙවිලි කළ පාසල් තමයි අද මහා පාසලක් බවට පත් වෙලා තිබෙන්නේ. එහෙම නම් මේ පාසල් පද්ධතිය පෝෂණය වුණේ, මේ පාසල් පද්ධතිය සංවර්ධනය වුණේ තනිකරම ආණ්ඩුවේ මැදිහත් වීම තුළ නොවෙයි. ආණ්ඩුව ක්‍රමවේදය හැදුවා, ආණ්ඩුව වැඩ පිළිවෙළ හැදුවා, ආණ්ඩුව අවශ්‍ය පහසුකම් ටික ලබා දුන්නා. ඊට අමතර සියලු පහසුකම් ටික ගමේ දෙමව්පියෝ එකතු වෙලා, ගමේ දානපතියෝ එකතු වෙලා ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, අපේ දරුවෙක් අපි ගිය පාසලට නොගියත් අපි අදටත් ඒ පාසල්වලට ආදරෙයි. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය ඇතුළු විද්‍යාල 4ක ආදි ශිෂ්‍යයෙක් විධියට මම අදටත් ඒ විද්‍යාල 4ටම ආදරෙයි. ඒ, අධ්‍යාපන සේවා අමාත්‍යවරයා විධියට නොවෙයි. මගේ අතීතය ගැන කථා කරන කොට මම ගිය මුල් පාසලේ සිට රාජකීය විද්‍යාලය දක්වාම මතක් කරනවා. ඒ මොකද, අපි අකුරු කළේ අහවල් පාසලේ, අපි මේ තත්ත්වයට ගෙන ආවේ මේ පාසලයි කියලා අප තුළ කෙළෙහි ගුණ දැක්වීමක් තිබෙනවා. දානපතියෝ, එහෙම නැත්නම් පාසලේ ආදි ශිෂ්‍යයෝ නිසා පාසල ශක්තිමත් වන ස්වභාවයක් එදා ඉඳලා තිබුණා. මම අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයට යන කාලයේ එදාත් පන්තිය paint කරන්න ඕනෑ වෙන කොට, desks ටික පාට කරන්න ඕනෑ වෙන කොට අපි ගෙදරින් තීන්ත ටින් එක, පින්සල අරගෙන ගිහිල්ලා තමයි ඒ කටයුත්ත කළේ. මේක අමුතුවෙන් සිද්ධ වුණු, එහෙම නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවෙන් සිද්ධ වුණු කාරණයක් නොවෙයි. මේ ආකාරයට පාසල රැකගෙන ආවත් මම කලින් කිව්වා වාගේ,-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට කථා කරන්න තව විනාඩියයි තිබෙන්නේ.

ගරු දුමින්ද දිසානායක මහතා
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)
විනාඩි 15ක් තිබෙනවා කියලායි මම හිතුවේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි 10ක් දක්වා අඩු කළා.

ගරු දුමින්ද දිසානායක මහතා
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)
තව විනාඩි දෙකකවත් කාලයක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක මහා අරුමයක් නොවෙයි. එදා ඉඳලා මේ ක්‍රමය පැවතුණා. හැබැයි, අපි දන්නවා මේ ක්‍රමවේදය ඇතුළේ වැරදිකාරයෝ ඉන්නවා කියා. සමහර වෙලාවට එක විදුහල්පති කෙනෙක් හෝ කණ්ඩායමක් මේ ක්‍රමවේදය වැරැදි විධියට පාවිච්චි කරන්න පුළුවන්. අපි කියන්නේ මේකයි. සමස්තය ගැන කථා කරන්න. එක වැරැදිකාරයෙක් නිසා මුළු පාසල් පද්ධතියම අඩාළ කරන්න සූදානම් වෙන්න එපා. ඔබතුමන්ලා ගුරුවරු ගැන, විදුහල්පතිවරු ගැන සැක කරලා ඒ හැමෝටම එක හා සමානව එක හැන්දෙන් බෙදන්න එපා. වැරැදි කරන පුද්ගලයා කවුද කියලා අපට නම් කරන්න. අපි ඔබතුමන්ලා දෙගොල්ලෝ එකතු වෙලා වැරදිකාරයා හොයලා දඬුවම් දෙමු. හැබැයි එක වැරැදිකාරයෙක් නිසා විද්‍යාල දියුණු කරපු ගුරුවරුන්ගේ, විද්‍යාල දියුණු කරපු විදුහල්පතිවරුන්ගේ චිත්ත ශක්තිය, මානසික ශක්තිය කඩා බිඳ දමන්න ඔබතුමන්ලා සූදානම් වෙන්න එපා. අපි දෙගොල්ලෝ එකතු වෙලා අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කළ යුතුයි කියන කාරණාව මා මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් පොල් ගෙඩි අටේ කථාවත් මා මතක් කරන්න ඕනෑ. මේ කාරණය එළියට ප්‍රසිද්ධ කරන්න එපා කියලා මා මාධ්‍ය ආයතනවලින් ඉල්ලනවා. ඒකට හේතුව තමයි අද විජිත හේරත් මන්ත්‍රීතුමන්ලා ඒ දරුවාව ආරක්ෂා කරන්න කථා කරනවා. මමත් බන්දුල ගුණවර්ධන ඇමතිතුමාත්, මුළු ආණ්ඩුවමත් ඒ පොල් ගෙඩි අටේ සිද්ධිය වෙලාවේ විදුහල්පතිවරයාත් රැක්කා; දරුවාත් රැක්කා. අද කවුරු හරි කියන්න උත්සාහ කරනවා නම්, දරුවා පොල් ගෙඩි අට හොරකම් කළේ පාසලෙන් කියපු රුපියල් 800 ගෙනියන්න කියලා අපි ඒක පිළිගන්නේ නැහැ. පිළිගන්නේ නැති වෙන්න එක කාරණයක් තමයි පොල් ගෙඩියක අද තිබෙන මිල බැලුවත් පොල් ගෙඩි අටෙන් රුපියල් 800ක් හොයන්න බැරි වීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි අපි වැඩිහිටියෝ විධියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට, දේශපාලනඥයෝ විධියට පුංචි එකා හරි වැරැද්දක් කළා නම් ඒ වැරැද්ද කියලා දෙනවා මිසක් ඒ වැරැද්ද වෙනුවෙන් පෙනී සිටින්න අපි සූදානම් වෙන්නේ නැහැ. ඒ දරුවා තමන්ගේ නොතේරුම්කමට හෝ ඒ වැඩේ කළා නම් අපි ඒ දරුවාට ඒ වැරැද්ද පහදලා දෙනවා මිසක් ඒ දරුවාගේ පැත්තේ හිටගෙන ඒ දරුවා කරපු වැඩේ නිවැරදියි කියලා ඒ දරුවාට කියනවා නම් ඒක වැරදියි. දරුවෝ ඉන්න තාත්තෙකුට ඒක කියන්න පුළුවන්කමක් නැහැ. තමන් හදන දරුවෝ තමන්ගේ නොවෙයි නම් ඒ දේ කියන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරන්න කැමැතියි. දරුවෝ ගැන හිතන කොට, දරුවෝ ගැන කථා කරන කොට අපි මේ කථා කරන්නේ අනාගතයේ මේ රට භාර ගන්න සිටින දරුවා ගැන, අනාගතයේ අපේ පුටුවේ වාඩි වෙන්න සිටින දරුවා ගැන, අනාගතයේ මේ රටේ සංවර්ධනයට නායකත්වය දෙන්න ඉන්න පුද්ගලයෝ ගැන කියන එක අමතක කරන්න එපා. ඒ නිසා ඒ දරුවන්ව යහ මඟ යවනවා මිසක්, ඒ දරුවන්ට හරි මාර්ගය පෙන්වා දෙනවා මිසක්, ඒ දරුවන් වැරැදි පාරේ යන කණ්ඩායමක වැරැදි පූර්වාදර්ශයක් බවට පත් කරන්න එපා කියන කාරණාව මා මතක් කරනවා.

අපේ ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශයත්, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් මේ රටේ මානව සම්පත මෙහෙය වන අමාත්‍යාංශ විධියට මේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් පාසල් අරින්නට, පාසල් වහන්නට දරුවන්ගේ අනාගතය සුබවාදී කරන්නට, සංවර්ධනය කරන්නට පුළුවන් උපරිම දේ කරනවා කියන කාරණය මා මතක් කරනවා. ඒ වෙනුවෙන් බුද්ධිමත් උදවියට, අපිත් සමඟ අත් වැල් බැඳ ගන්න කැමැති උදවියට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව -හන්දි ගාණේ mike ඉස්සරහා කථා කරන්නේ නැතිව- අපිත් එක්ක විවෘතව කථා කරන්න එන්න කියා ආරාධනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Then, the Hon. Sajith Premadasa.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දී ඇති වෙලාව කොපමණද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Thirty minutes.

[අ.භා. 3.26]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රටට දැයට වැදගත් වන අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ මේ විවාදයට එකතු වෙලා මගේ අදහස් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරන විට වරෙක ආණ්ඩු පාර්ශ්වයෙන් කියනවා, ඉතිහාසයේ කිසිම දවසක මේ වාගේ සම්පත් ප්‍රමාණයක් අධ්‍යාපන ක්ෂේත්‍රයට වෙන් කරලා නැහැයි කියලා. 2005 දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට අධ්‍යාපනයට වෙන් වුණේ 3.03යි. එය 2011 වන විට 1.86 දක්වා අඩු වෙලා තිබෙනවා. නමුත් අධ්‍යාපන ක්ෂේත්‍රය නැංවීමට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට මෙය සියයට 6ක් කරන්නට ඕනෑය කියා අප කියනවා. අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6 දක්වා නංවාලිය යුත්තේ ඇයි කියන තර්කය මගේ කථාව තුළ තහවුරු කරන්නට - සාක්ෂාත් කරන්නට- මා බලාපොරොත්තු වෙනවා.

පාසල්වලට යන දූ දරුවන්ගෙන් මුදල් අය කිරීම අද ප්‍රධාන මාතෘකාවක් බවට අප සියලු දෙනාම හඳුනා ගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් නිකුත් කර තිබෙන චක්‍රලේඛ සමූහය දිහා බැලුවාම, මේ හැම චක්‍රලේඛයකින්ම මුදල් අය කිරීම තහනම් කරලා තිබෙනවා. 2012/19 චක්‍රලේඛයෙන් පළමු වසරට ඇතුළත් වෙන දූ දරුවන්ගෙන් මුදල් ඉපැයීම, මුදල් අය කිරීම තහනම් කරලා තිබෙනවා. 2008/17 චක්‍රලේඛයෙන් 6 සිට 11 වසර දක්වා ළමයින් ඇතුළත් කරන මොහොතේ මුදල් අය කිරීම තහනම් කරලා තිබෙනවා. 2008/47 චක්‍රලේඛය තුළින් උසස් පෙළට ඇතුළු වෙන දූ දරුවන්ගෙන් මුදල් අය කිරීම තහනම් කරලා තිබෙනවා. 2008/41 චක්‍රලේඛය තුළින් පාසල් ආදී ශිෂ්‍යයින්ට එහෙමත්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නැත්නම් වෙනත් සංගම්වලට පාසල් යන දූ දරුවන්ගෙන් මුදල් අය කිරීම තහනම් කරලා තිබෙනවා. නමුත් මේ චක්‍රලේඛ සමූහය දිහා බලන විට එක චක්‍රලේඛයක් තිබෙනවා. මේක සැහවුණු චක්‍රලේඛයක්. ඒ, 2008/35 චක්‍රලේඛය. ඒකෙන් මොකක්ද අදහස් කරන්නේ? සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාට පින් සිදු වන්නට මේ රටේ බිහි වුණු නිදහස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාසල් යන දූ දරුවන්ගෙන් චක්‍රාකාරයෙන් මුදල් එකතු කිරීම හෝ එම කර්තව්‍යයට අනුබල ලබා දීමයි. විශේෂයෙන්ම අපේ ආණ්ඩු පාර්ශ්වයේ අධ්‍යාපන ක්ෂේත්‍රය නියෝජනය කරන ගරු ඇමතිතුමන්ලාගෙන් මම මේ කාරණය අහන්න කැමැතියි. මේ රටේ නිදහස් අධ්‍යාපනයක් ක්‍රියාත්මක වෙනවා නම්, ජනාධිපතිතුමා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ හුංගම විජයබා ජාතික පාසලේ උසස් පෙළ පන්තියට එස්.එච්. චන්ද්‍රසේන මැතිතුමාගේ දරුවාව ඇතුළත් කරන විට රුපියල් 4,000ක් සොයා ගන්නට බැරිව, තමන්ගේ ඔරුව විකුණලා තමයි එතුමා රුපියල් 4,000 සොයා ගත්තේ. නිදහස් අධ්‍යාපනයක් ක්‍රියාත්මක වෙනවා නම් හුංගම විජයබා ජාතික පාසල එතුමාගෙන් මුදල් අය කරන්නේ ඇයි? එක් අයෙකුගෙන් පමණක් නොවෙයි උසස් පෙළ සඳහා ඇතුළු වුණ දූ දරුවන් 130 දෙනාගෙන්ම ඒ මුදල අය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි රුපියල් 4,000ක් අය කර ගෙන රුපියල් 1,460කට රිසිට් පතක් දීලා තිබෙනවා.

අපේ රටේ නිදහස් අධ්‍යාපනයක් ක්‍රියාත්මක වෙනවා නම්, අපේ රටේ අධ්‍යාපනය නිවහල් නම්, මධ්‍යම ආණ්ඩුවෙන්, පළාත් සභාවෙන් ඇයි මේ පාසල්වලට අවශ්‍ය පහසුකම් සපයන්නේ නැත්තේ? දුරකථන බිල්පත් පියවන්න, විදුලි බිල්පත් පියවන්න, ජල බිල්පත් පියවන්න ප්‍රමාණවත් මුදලක් අද අධ්‍යාපන ක්ෂේත්‍රයට ලැබෙන්නේ නැහැ. ඒ හේතුව නිසා තමයි අද රට තුළ ලොකු ඉල්ලීමක් තිබෙන්නේ දළ දෙශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් වැනි ප්‍රමාණයක් අධ්‍යාපන ක්ෂේත්‍රයට වෙන් කරන්න කියලා. මේ මුදල් අය කිරීම පිළිබඳව අද විවිධ තර්ක විතර්ක, වාද විවාද ඇති වුණා. 2008/35 චක්‍රලේඛනයෙන් ස්ථාපනය කරනු ලබන, පාසල නඟා සිටුවීමේ කමිටු කියන නාමයෙන් මේ මුදල් එකතු කර ගන්නා ක්‍රියාවලිය ක්‍රියාත්මක වන්නේ ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි උදාහරණ දෙකක් ගනිමු. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසලක්. ඒ පාසලේ වාර්ෂික ජල බිල්පත හා විදුලි බිල්පත රුපියල් ලක්ෂ 8ක් වෙනවා. හැබැයි, රජයෙන් ලබා දෙන දායකත්වය එක්ලක්ෂ පණස්දාහයි. ඉතිරි හය ලක්ෂ පණස්දාහ පාසල හොයා ගන්න ඕනෑ. එපමණක් නොවෙයි. අනුරාධපුර ස්වර්ණපාලි බාලිකා විද්‍යාලයේ මාසික විදුලි බිල්පත රුපියල් 60,000යි. ජල බිල්පත රුපියල් 1,80,000යි. මුළු ගණන එකතු කළොත් අවුරුද්දකට රුපියල් 7,80,000ක් වෙනවා. හැබැයි රජයේ ලැබෙන්නේ රුපියල් එක්ලක්ෂ හතළිස්හතර දාහයි. ඉතිරි ටික කොහෙන් ලබා ගන්න ද? ඒ ටික දරුවනේගන් අය කර ගන්නවා. අනුරාධපුර ස්වර්ණපාලි බාලිකා විද්‍යාලයේ දූ දරුවන් 4460ක් දැනුම-මිනුම ලබා ගන්නවා. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාල ජාතික පාසලේ දූ දරුවන් 4500ක් අධ්‍යාපනය ලබා ගන්නවා. රජයෙන් ලබා නොදෙන -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் அவர்கள்] *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. R.. YOGARAJAN *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයෙන් ලබා නොදෙන ඒ හිඟ මුදල ලබා ගන්න සිදු වෙලා තිබෙන්නේ, පාසලේ දූ දරුවන්ගෙන්. ලජ්ජයි කථා කරන්න, ගරු ජනාධිපතිතුමා බිහි වුණු හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසල්වලිනුත් අද වන විට ළමයින්ගෙන් මුදල් අය කර ගැනීමේ නින්දිත ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙනවා. නමුත් ගරු ඇමතිතුමා මේ උත්තරීතර සභාවට ඇවිත් කියනවා, මේ සියලු දෙයම නතර කරන්න සති දෙකකින් චක්‍රලේඛනයක් නිකුත් කරනවා කියලා. ඒ චක්‍රලේඛනයටත් බාලගිරි දෝෂය. මේ මොහොත වෙනතෙක්, ඉදිරිපත් කරනවාය කියන ඒ චක්‍රලේඛනය ඉදිරිපත් කර නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය දිහා බලනවිට, මුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේම බරපතළ කඩා වැටීමක් තිබෙනවා. බරපතළ පහළ වැටීමක් තිබෙනවා. බලන්න, අද අධ්‍යාපන ක්ෂේත්‍රය සහමුලින්ම දේශපාලනීකරණය වෙලා.

පසු ගිය කාලයේ -2010.12.31 වන දා - ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තුන් වන ශ්‍රේණියට බඳවා ගන්න අයදුම් පත් කැඳෙව්වා. අයදුම් පත් 37,000ක් ආවා. විභාගයකුත් තිබ්බා. ඒ විභාගයට අය කරන විභාග ගාස්තුත් රුපියල් තුන්සියයේ සිට රුපියල් දාහ දක්වා වැඩි කළා. 37,000ක් පැමිණි ඒ විභාගයෙන් 410 දෙනෙක් තෝරා ගත්තා. හැබැයි, ඒ 410 තෝරාගත්තාට පස්සේ, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට තමන්ගේ දේශපාලන හෙංචයියන් 783 දෙනෙක් බඳවා ගන්න අංක 2012/ඊඩී/ඊ13 දරන වෙනම ම කැබිනට් පත්‍රිකාවක් ගරු ඇමතිතුමා 2012.03.28 වන දා ඉදිරිපත් කළා. තමන්ගේ පර්ශ්වයට සම්බන්ධ දේශපාලන ගෝල බාලයින් 783 දෙනෙක් ශ්‍රී ලංකා අධ්‍යාපන පිරිපාලන සේවයට බඳවා ගන්නට කටයුතු කරනවා.

මේක එක තැනක සිදු වන දෙයක් නොවෙයි. අද මේ ක්ෂේත්‍රවල සිටින ගුරුවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ, අධ්‍යාපන පරිපාලකයන්ගේ අනුදැනුම නොමැතිව, අත්තනෝමතිකව, ඒකාධිපති වියරුවෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරන කුට ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. අද අපේ රටේ ගුරුවරු 219,000 දෙනෙක් ඉන්නවා. විදුහල්පතිවරු 14,000 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. අද මේ කිසිම කෙනෙකුගේ අදහස් උදහස් විමසන්නේ නැතුව, ඒ අයගේ සේවා ව්‍යවස්ථා සංශෝධනයට ලක් කරලා අධ්‍යාපන සේවාව කප්පාදු කිරීමේ කුට වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවාය කියන එක මේ අවස්ථාවේ මම ප්‍රකාශ කරන්න කැමැතියි.

අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින බරපතළ ප්‍රශ්නයක් තමයි ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව. 2008.12.03 වන දා සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා පිළිගත්තා,

අතුරු වැටුප් යෝජනාවක් දමලා ගුරු, විදුහල්පති වැටුප් විෂමතාව ඉවත් කරන්න වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ කියලා. ඒ අනුව, රුපියල් මිලියන 6700ක් -රුපියල් බිලියන 6.7ක්- වෙන් කළ යුතුයි කියන යෝජනාව මත 2009 අය වැයෙන් රුපියල් මිලියන 3,000ක් වෙන් වුණා. නමුත් මුදල් වෙන් වුණේ නමට පමණයි. ගුරු වැටුප්, විදුහල්පති වැටුප් විෂමතාව විසඳන්න ඒ තඹ සතයක්වත් යොදා ගෙන නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුහල්පති සේවය ගැන කථා කරන විට 2006 දී ගැසට් පත්‍රයක් නිකුත් කරලා, විභාගයක් පවත්වා 2009 නොවැම්බර් 13 වන දා 2 - II ශ්‍රේණියට 1980 දෙනෙක් බඳවා ගත්තා. 3 වන ශ්‍රේණියට 2200 දෙනෙක් බඳවා ගත්තා. ඊට අමතරව 2012 ඔක්තෝබර් 2 වන දා නැවත වරක් 3 වන ශ්‍රේණියට 1700 දෙනෙකුත්, 2 - II ශ්‍රේණියට 2000කට ආසන්න ප්‍රමාණයකුත් බඳවා ගත්තා. ඒ අය අරලියගහ මන්දිරයට ගෙන්වා තමයි බඳවා ගැනීම සිදු කළේ. විදුහල්පති ශ්‍රේණියට 7880 දෙනෙක් බඳවා ගත්තා. හැබැයි, කනගාටුදායක කාරණාව මොකක්ද? ඒ අයගෙන් බහුතරයකට විදුහල්පති තනතුරු ලබා දීලා නැහැ. දේශපාලන හෙංචයියන් වැඩ බලන විදුහල්පතිවරුන් හැටියට පත් කරලා, නීත්‍යානුකූල ක්‍රමයට බඳවා ගත්ත 7880 දෙනා අද වන විට නියෝජ්‍ය විදුහල්පතිවරුන්, අංශ ප්‍රධානීන්, උප ගුරුවරුන් වැනි පහළ මට්ටමට දමලා තිබෙනවා. ඇමතිතුමා සේවා ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් 2012.08.08 වන දා 12/111101/530/035 යන කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා යෝජනා කළා, දේශපාලන ගෝලබාලයින් හෙංචයියන් පිරිසක් විදුහල්පතිවරුන් හැටියට පත් කරන්න. විභාග ක්‍රමයෙන් 7880 දෙනෙක් බඳවා ගත්තත් ඒ අයට විදුහල්පති තනතුරු නැහැ. නමුත් තමන්ගේ දේශපාලන ගෝලබාලයින් පිරිසකට වැඩ බලන පත්වීම් ලබා දීලා, ඒ අය ස්ථිර කරන්න කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා, විශේෂයෙන්ම මේ වැඩ බලන හෙංචයියන් බොහෝ දෙනකු විභාගය අසමත් වුණු අය. එහෙම නැත්නම් ඒ විභාගයට පෙනී නොසිටි උදවිය. අද මොකක්ද මේ සිදු වන විහිළුව?

විදුහල්පති ශ්‍රේණියේ පළමු වන ශ්‍රේණියේ 23 දෙනෙකුට කර්නල් තනතුරු දුන්නා. තවත් පිරිසක් සම්මුඛ පරීක්ෂණයකට ලක් කරමින් සිටිනවා ලෙප්ටිනන්, කර්නල් තනතුරු, කපිතාන් තනතුරු, මේජර් තනතුරු ලබා දෙන්න. කපිතාන් තනතුරු, මේජර් තනතුරු ලබා දෙන්න පෙර, අර බඳවා ගත් 7880ක් වන පිරිසට නියම විදුහල්පති තනතුර ලබා දෙන්න කටයුතු කරන්න කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා වැඩ පිළිවෙළේ තිබෙනවා, "දරුවන්ට දිවා ආහාරය සඳහා බත් වේලක් නොමිලේ ලබා දෙන්නෙමි" කියලා. මෙහෙම සඳහන් වන්නේ 18 වන පිටුවේ, අනු අංක 5 වන පොරොන්දුව යටතේ. සියලුම දරුවන්ට දිවා ආහාරයක් ලබා දෙනවාය කියනවා. අද පාසල් 9,714ට යන දු දරුවන් 39,68,104 දෙනෙක් සිටිනවා. හැබැයි, දිවා ආහාරය ලබා දෙන්නේ තෝරා බේරලා 88,890 දෙනෙකුට. සිසු පරපුරෙන් සියයට 27කටයි දිවා ආහාරය ලබා දෙන්නේ. අද සිසු පරපුරෙන් සියයට 27කට දිවා ආහාරය ලබා දෙන කොට, එදා රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ආණ්ඩුව සියලුම දු දරුවන්ට -හතළිස් තුන්ලක්ෂයකට- නිල ඇඳුම් ලබා දුන්නා. එදා රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ආණ්ඩුව දු දරුවන් හතළිස් තුන්ලක්ෂයකට දිවා ආහාර මුද්දරය ලබා දෙන කොට, මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ? පාසල් දු දරුවන් සියයට 27කට දිවා ආහාරය ලබා දෙන අතර, සියයට 73කගේ දිවා ආහාර අයිතිවාසිකම කප්පාදු කරනවා. මෙලෙස දිවා ආහාර අයිතිවාසිකම කප්පාදු කරන්නේ ඇයි?

විජිත් විජයමුණි ද සොයිසා හිටපු අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා 2011 අගෝස්තු 11 වැනිදා මේ සම්බන්ධයෙන් මා අහපු ප්‍රශ්නයකට මේ උත්තරීතර සභාවේ දී පිළිතුරක් දී තිබෙනවා. හැන්සාඩ් වාර්තාවේ ඒක ඇතුළත් වෙලා තිබෙනවා. මේ රටේ පාසල් යන දු දරුවන්ගේ මන්ද පෝෂණ ප්‍රතිශතය 2005 වර්ෂයේ සියයට 12යි, 2010 වර්ෂය වන කොට එය සියයට 17 දක්වා වැඩි වෙලා තිබෙනවාය කියලා විජිත් විජයමුණි ද සොයිසා අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා මේ උත්තරීතර සභාවට ප්‍රකාශ කර තිබෙනවා. ඒ බව 2011 අගෝස්තු මස 11 වැනි දින හැන්සාඩ් වාර්තාවේ ඇතුළත් වෙලා තිබෙනවා. පාසල් යන දු දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය ඉහළ යමින් තිබෙන මොහොතකත්, පාසල් යන දු දරුවන්ගෙන් සියයට 27කට පමණක් දිවා ආහාරය ලබා දී, ඉතුරු සියයට 73ට දිවා ආහාරය ලබා දීම කප්පාදු කරන්නේ ඇයි කියන කාරණය මා මේ අවස්ථාවේ අහන්න කැමැතියි.

මිහින් ලංකා ව්‍යාපෘතිය වැනි නාස්තිකාර ව්‍යාපෘතිවලට මේ රටේ රාජ්‍ය සම්පතින් රුපියල් මිලියන 8,500ක් වැය කර තිබෙනවා. මේ වාගේ අසාර්ථක, අලාභදායී ව්‍යාපෘති වෙනුවෙන් රටේ ජනතාවගේ මුදල් ධනස්කන්ධයක් වැය කරන්න පුළුවන් මොහොතක, මේ රටේ පාසල් යන දු දරුවන්ගෙන් කොටසකට පමණක් -සියයට 27කට පමණක්- තෝරා බේරා, පෙරලා, කිරලා, මැනලා දිවා ආහාරය ලබා දෙනවා. සියයට 73කගේ දිවා ආහාර අයිතිවාසිකම මේ ආශ්චර්යවත් ආණ්ඩුව කප්පාදු කරන්නේ ඇයි කියන කාරණය මා නැවත වරක් අහන්නට කැමැතියි.

Then, there is the question of Moulavi teachers. We are once again thankful to the Minister for appointing a hundred odd Moulavis but there seems to be another hundred to be appointed and it will take a long time. The All- Ceylon Muslim Educational Conference is always persisting that Moulavis should be appointed. From all the Arabic Colleges, year in and year out, there are Moulavis who pass out. Therefore, I would kindly urge the Minister to appoint Moulavis and help Arabic and Islamic education in the colleges.

In Sura 96: Verse 1 of the Holy Quran, it states, I quote:

"Iqra' Bismi Rabikallazi Khalaq"

which means, "Read, educate yourself in the name of God who created you". This Quranic Sura was well quoted by His Excellency President Mahinda Rajapaksa when he went as the Chief Guest to open a four-storeyed building at the Muslim Ladies' College in Bambalapitiya. The Hon. Minister was also present. I am very thankful to the Hon. A.H.M. Fowzie, his son, Mr. Nauzer Fowzie and the family members who donated funds for it. Also, the Hon. Basil Rajapaksa, Minister of Economic Development laid the foundation stone recently at the Fathima Muslim Ladies' College in Bandaranaike Mawatha, which is one of the primary State-controlled Muslim Girls' Schools in the Island and Z.A.M. Refai Hadjiar has come forward to donate the necessary funds for it.

Then, Sir, there is a request to restore the Malay Language as a subject for the GCE (Ordinary Level) Examination. Now, Sir, it is quite absurd to restore the Malay Language as a subject for the Advanced Level Examination when, for obvious reasons, it has been discontinued for the Ordinary Level Examination. I have a letter written by the Conference of Sri Lankan Malays - COSLAM - signed by Mr. T.K. Azoor, the President and a former Principal of Zahira College, Colombo. Sir, I **table*** this letter.

All the details are there. There are 350 million people who speak the Malay language. It is the *Lingua Franca* of Indonesia, Malaysia, Brunei and also, in other countries like Singapore, Thailand, Philippines and Surinam, significant minorities are speaking. Particularly, Malays in this country have contributed a lot for the safety and security of the country from the time of the English rulers. They have developed canals and there are various places we could recall their habitations like in Jawatta, Ja-Ela and Chavakachcheri.

Malays are dedicated, very patriotic and very well-known throughout the world, particularly in Sri Lanka. People of the calibre of great leaders like T.B. Jayah and Justice M.T. Akbar, came from this distinguished clan.

Jaffna schools need a lot of help and assistance. Although at one time, Jaffna was very high in educational standards, certain schools have fallen from that standard now. Particularly, after the destruction of Jaffna, Osmania College and Khadeeja College, which were two great colleges that were run very well catering to the Muslims of the entire Northern and other provinces, are also in a dilapidated condition today. I think lately, பிரசைகள் குழு யாழ்ப்பாணத்திலே கூடியது. The Deputy Mayor of Jaffna presided over that and also Moulavi Sufiyan is taking a lot of interest. Jaffna is a place that produced great leaders like Senator A.M.A. Azeez - அறிஞர் ஏ.எம்.ஏ. அஸீஸ் -, Justice M.M. Abdul Cader, Dr. M.H.M. Abdul Cader and the first Muslim Mayor of Jaffna Quazi, M.M. Sultan. There had been a lot of cultural and other activities. Even leaders from India came and had lectures in these colleges and addressed Meelad Shareef meetings and the the other functions in Jaffna from time to time. Therefore, all these need to be attended to very urgently.

I would also like to mention that there is a high level of educational standard in the Eastern Province today. I must emphasize that. Once in the 1960's, when we went to a village like Maruthamunai from where Senator Mashoor Moulana comes, we could not find a graduate or an Advanced Level student. But, today in one house you find two lady doctors and that is the advancement made. I hope and pray that playground facilities will be given to all these schools in order to help them to develop their sporting skills.

Thank you very much.

[අ.භා. 5.01]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාමීය පාසල් වැසි යාම පිළිබඳව විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවේ ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

අධ්‍යාපනය අද දවසේ බොහෝ දෙනාගේ සාකච්ඡාවට බඳුන් වෙන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. එහෙම වෙලා තිබෙන්නේ අධ්‍යාපනය හරහා මේ රටේ ජාත්‍යන්තරව අප අත්පත් කර ගත්ත කීර්තියකට වඩා මෑත කාලයේ සිදු වුණු බරපතළ අපකීර්තිමත් සිදුවීම් පාදක කරගෙනයි. මා හිතන හැටියට පාසල් වසා දැමීමත් අපේ රට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ලබපු අපකීර්තිමත් අත් දැකීමක එක අවස්ථාවක්. අප දැක්කා පසු ගිය කාලයේ අධ්‍යාපනය සෑම සමාජයකම පැවැත්ම වර්ධනය තීරණය කරන සාධකයක් වුණු ආකාරය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේ ලංකාවේ පාලකයෝ -විශේෂයෙන් මේ රජය- ලංකාව දකුණු ආසියාවේ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය කරනවාය කියලා පැවසුවා. ඒ වාගේම ජනාධිපතිවරයා පැවසුවා, ක්ෂිතිජයට ඉහළින් බලන දරුවෙකු බිහි කිරීම එතුමාගේ අරමුණයි කියලා. ඒ ප්‍රකාශය බොහෝ අයට නොතේරුණත්, ක්ෂිතිජය කියන්නේත් මායාවක් වන නිසා මේ රජයේ අරමුණ වුණේ අධ්‍යාපනය තුළ මායාවක් කිරීම වෙන්න ඇති. කොහොම වුණත් පසු ගිය කාලයේ අධ්‍යාපනයේ ප්‍රශ්න ගොඩක් ඇති වුණු ආකාරය අප දැක්කා. ප්‍රශ්න පත්තර වරදිනවා. පෙළ පොත් වරදිනවා. පාසල් වහනවා. ප්‍රශ්න පත්තරවල වැරදීම් තිබුණා. පෙළ පොත් බෙදා හැරීමේ දෝෂ තිබුණා. ඒ වාගේම පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පනත්,

---

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අජිත් කුමාර මහතා]

පෞද්ගලික සරසවි පනත්, පෞද්ගලික පාඨමාලා, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ගැටලු, අනධ්‍යයන සේවකයන්ගේ ගැටලු, ශිෂ්‍යයන්ට මර්දනය ගෙන ඒම වැනි බරපතළ ප්‍රශ්න ගණනාවකුත් මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වෙන්න ගත්තා. ඒකයි මම කිව්වේ මේ කරුණු පදනම් කරගෙන තමයි පසු ගිය කාලයේ සාකච්ඡාවක් මතු වුණේ කියලා. මේ දෙනිකව එන ප්‍රශ්න මේ රටේ අධ්‍යාපනයේ දැවෙන ප්‍රශ්න විධියට සාකච්ඡා වෙන්න පටන් ගත්තා. ඒ නිසා මොකද කළේ? මේ ප්‍රශ්නත් එක්ක ගැටුණු, මේ ප්‍රශ්නත් එක්ක හෙම්බත් වුණු ජනතාවත් මේ දෛනිකව එන ප්‍රශ්නත් එක්ක අරගළ කරන්න පටන් ගත්තා. පාසල්වල දරුවෝ, දෙමව්පියෝ, ආචාර්යවරු, විශ්වවිද්‍යාල ආචාර්යවරු, ඒ වාගේම විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම්, ශිෂ්‍ය සංවිධාන මේ දෛනිකව එන ප්‍රශ්නත් එක්ක විවිධ අරගළවලට මැදිහත් වෙන්න, අරගළ කරන්න පටන් ගත්තා. විවිධ ඉල්ලීම් ඔස්සේ සාකච්ඡා පටන් ගත්තා. පාලකයිනුත් මොකද කළේ? ඒ මොහොතේ අධ්‍යාපනයේ පැන නඟින මොකක් හරි ප්‍රශ්නයක් මතු කරගෙන ඒකට ඒ වෙලාවට උත්තරයක් දෙන්න පටන් ගත්තා. ඒ නිසා ජනවාරි මාසයේ පෙළ පොත් බෙදා දීමේ ප්‍රශ්න තිබෙනවා. නිල ඇඳුම් ලබා දීමේ ප්‍රශ්න තිබෙනවා. විභාග තියෙන කාලෙට විභාගවල දෝෂ තිබෙනවා. ප්‍රතිඵල පිට වෙන කාලෙට ප්‍රතිඵලවල දෝෂ තිබෙනවා. මේ වාගේ කාලයෙන් කාලයට රටේ අධ්‍යාපනයේ ඵල භුක්ති විඳින දරුවන්ටත්, ජනතාවටත් කථා කරන්න, සටන් කරන්න මාතෘකා තිබුණා වාගේම, පාලකයන්ටත් එක මාතෘකාවක් විසඳලා ඉවර වෙන්න කලින් තව මාතෘකාවක් එන්න පටන් ගත්තා. ඒ නිසා එක ප්‍රශ්නයකින් එක ප්‍රශ්නයක් යටපත් වෙලා මේ අධ්‍යාපනයේ තිබෙන අර්බුදයේ ප්‍රතිඵල මත විවිධ අරගළ පැන නඟින්න පටන් ගත්තා. පාලකයෝත් ඒක ඉතාම හොඳින් කළමනාකරණය කරගෙන ගියා. ඒ නිසා එක ප්‍රශ්නයක් එනවා. ඒකට අරගළයක් එනවා; උද්ඝෝෂණයක් එනවා; ඉල්ලීමක් එනවා. ඒක ඉවර වෙන්න කලින්, ඒකට උත්තර එන්න කලින් තව ප්‍රශ්නයක් එනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනයේ විතරක් නොවෙයි අනිකුත් ක්ෂේත්‍රවලත් එහෙමයි. කාලයෙන් කාලයට මේ පාලකයන් ප්‍රශ්නයක් ගේනවා. ඒ ප්‍රශ්නය වර්ධනය කරලා, ජනතාව හිරිවට්ටලා, ජනතාව මං මුළා කරලා ප්‍රධාන ප්‍රශ්න සියල්ල යට ගහන්න සැලසුම් කරනවා. පාලකයෝත් ජනතාවට ඒ උගුල ගෙනාවා. ජනතාවත් යම් ප්‍රමාණයකට ඒකට අහු වුණා කියලා තමයි අපට පේන්නේ. ඒ නිසා දැන් මොකක්ද වන්නේ? ඒ වෙලාවේ එන සිද්ධියක් පදනම් කරගෙන අප මේ සාකච්ඡාව පටන් ගන්නවා. අප දැක්කා පසු ගිය කාලයේ අධ්‍යාපනය පිළිබඳ බරපතළ සංවාදයක් ඇති වුණු ආකාරය. ඒ සංවාදය ආවේ පාසල් දැරියකට පොල් ගෙඩි 8ක් විකුණන්න වීම පිළිබඳ ප්‍රශ්නයේදීයි. ඒකෙදි මේ සමාජයේ ඉතාම සංවේදී කථාබහක් පටන් ගත්තා.

රටේ ජනාධිපතිතුමා බරපතළ විධියට සංවේදී වුණා, කනගාටු වුණා කියලා මාධ්‍යවල, විවිධ සාකච්ඡාවල කථා වෙනවා අපි දැක්කා. ඒ ප්‍රශ්නයේදී මොකක්ද කළේ? ඇය පාසල් දැරියක්. මේක ලංකා ඉතිහාසයේ සිදු වූ පළමුවැනි සිදුවීම වාගේ සාකච්ඡාවට ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් හැම දාම මේ වාගේ සිදුවීම් වනවා. ඒ සිද්ධියේදී සමහරු විදුහල්පතිතුමාට බැන්නා. සමහරු දෙමවුපියන්ට බැන්නා. මේ මහ එවුන් මේවාට වග කියන්න ඕනෑ, ළමයින්ට අධ්‍යාපනය සරි කර ගන්න අවශ්‍ය වියහියදම් හොයා දුන්නේ නැඟැ කියලා සමහරු දෙමවුපියන්ට බැන්නා. සමහරු අධිකරණයට බැන්නා. සමහරු පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට බැන්නා. සමහරු පොලීසියට බැන්නා. අන්තිමේදී ජනාධිපතිතුමා මේ රටේ නායකයා විධියට ඒකට සංවේදී වෙලා ඉතා හිත හොඳ පුද්ගලයකු බවට එතුමා පත් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ පාලකයින්ට කිසි ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඒ නිසා දැන් මොකක්ද වෙන්නේ? මේ රටේ අධ්‍යාපනයේ ප්‍රතිඵල භුක්ති විඳින දරුවන්ගෙනුත්, දෙමවුපියන්ගෙනුත්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙනුත්, ශිෂ්‍යයන්ගෙනුත්, ශිෂ්‍ය ව්‍යාපාරවලිනුත් අපි ඉල්ලා සිටිනවා, දෛනිකව පැන නඟින මේ සිද්ධි මත පදනම් වෙලා කරන අරගළයට එහා ගිහිල්ලා මේ සමස්ත අධ්‍යාපනයේම වෙනසක් සඳහා වූ අරගළයකට, මතවාදයකට, සංවිධානයවීමකට මැදිහත් වන්න කියලා. එවැනි එක සිද්ධියක් හෝ සිද්ධි දාමයක් පදනම් කර ගෙන ඒ ඒ මොහොතේ පටන් ගන්නා අරගළ, මැදිහත්වීම්වලින් මේ රටේ පාලකයින්ට ඇත්ත ප්‍රශ්න යට ගහන්න පුළුවන්. ඒ නිසා පාලකයෝ මොකද කරන්නේ? දවසෙන් දවස ප්‍රශ්න මතු කරලා සමාජය මං මුළා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ අය කියනවා, අධ්‍යාපනයට ප්‍රතිපත්තියක් නැහැ, මේ පාලකයින්ට ප්‍රතිපත්තියක් නැහැ කියලා. ඒක ඇත්තද? ඒක එහෙම නොවෙයි කියලා අප විශ්වාස කරනවා. මේ පාලකයින්ට අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් තිබෙනවා. ඔවුන්ට අරමුණක් තිබෙනවා. ඔවුන්ගේ අරමුණු බැලුවාට පස්සේ මෙහෙම වෙන්නේ ඇයි කියලා තේරුම් ගන්න පුළුවන්. ලෝක බැංකුවේ, මූල්‍ය අරමුදලේ කොන්දේසි එක්ක විවිධ ව්‍යාපෘති එනකොට, නවෝද්‍යා පාසල් කියලා එනකොට, ඉසුරු පාසල් කියලා එනකොට, සපිරි පාසල් කියලා එනකොට, විවිධ යෝජනා එනකොට මේ රටේ අධ්‍යාපනය පිළිබඳ තේරුමක් තිබෙන අය කියනවා, අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තියක් නැහැ කියලා. නැහැ, ඇත්තටම ඒක වැරැදියි. අධ්‍යාපනයට ප්‍රතිපත්තියක් නැද්ද? අපි දන්නා විධියට ලංකාවේ අධ්‍යාපනයට ප්‍රතිපත්තියක් තිබෙනවා. මේ රටේ චිතරක් නොවෙයි, ලෝකයේ පාලකයින්ටත් අධ්‍යාපනයට ප්‍රතිපත්තියක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කථාවේ ඇත්ත වන්නේ මොකක්ද? සත්‍ය කථාව වන්නේ මොකක්ද? මේ පාලකයෝ ඒ ප්‍රතිපත්තිය හංගලා ගහන්නේ; හංගලා තිබෙන්නේ. ඇත්ත ප්‍රතිපත්තිය මොකක්ද? ප්‍රතිපත්තියක් නැත්නම්, වැඩ පිළිවෙළක් නැත්නම් මේ පාසල් පද්ධතිය පවත්වා ගෙන යන්න, මේ ක්‍රියාවලිය පවත්වා ගෙන යන්න බැහැ. ඇත්ත කාරණය මොකක්ද? ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය වන්නේ ජනතාවට උගන්වන, දරුවන්ට උගන්වන, අනාගතය සඳහා යහපත් මිනිස්සු නිර්මාණය කරන, අනාගතයේදී මේ රටටත්, ලෝකයටත් ජයග්‍රහණ ගේන්න පුළුවන් නිර්මාණශීලී චින්තන හැකියාවක් තිබෙන දරුවන් සහිත අනාගත පරපුරක් බිහි කරන එක නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පාලකයින්ගේ මූලික අරමුණු දෙකක් තිබෙනවා. එකක් තමයි, මේ ආර්ථික ක්‍රමය අනුව මිනිස්සු බහුතරයක් පීඩාවට පත් කිරීම. අපි දේශපාලන විද්‍යාවේදී මෙයට කියනවා, "සූරා ගෙන කනවා කියලා". නැහැ. මේ පාලකයෝ ඊට එහා ගිහිල්ලායි තිබෙන්නේ. සූරා ගෙන කාලා ඔවුන්ගේ මහන්සියේ ප්‍රතිඵලය උපරිම අරගෙන, දැන් ඊට එහා ගිහිල්ලා සමස්ත පීඩිත ජනතාව හාරා ගෙන කන තැනට මේ පාලකයෝ ඇවිල්ලා තිබෙනවා. අන්න ඒ මිනිස්සුන්ව හාරා ගෙන කන ආර්ථික දේශපාලන ක්‍රියාවලිය පවත්වා ගෙන යාම සඳහා දෘෂ්ටිමය වශයෙන් ඒකට අවනත මිනිහෙක් හදන එක තමයි මේ පාලකයින්ගේ අරමුණ. ඒක මේ අධ්‍යාපනයේ හැම තැනකම පෙනෙන්න තිබෙනවා. මේ පාලනයට, මේ ආර්ථික ක්‍රමයට, බහුතරයක් මිනිස්සු පීඩාවට පත් කරන ක්‍රමයට අවනත මිනිහෙක්, හීලෑ වුණු මිනිහෙක්, ශික්ෂණය කරන මිනිහෙක්, ශික්ෂණය කරන්න පුළුවන් අනාගත සමාජයක් නිර්මාණය කරන එක තමයි මේ පාලකයින්ගේ අරමුණ. ඒක එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවටත් එකයි, ඒක පොදු පෙරමුණු ආණ්ඩුවටත් එකයි. අද බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා අධ්‍යාපන විෂයට නායකත්වය

දෙන මේ පාලනයේත් ඒ අරමුණ එහෙමම තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක එතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. මේ පාලනයේ ප්‍රශ්නයක්. ඒ එක අරමුණක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි කාරණය තමයි, මේ පාලන ක්‍රමය පවත්වා ගෙන යන්න ශ්‍රමිකයෝ ටිකක් ඕනෑ. වැඩකාරයෝ ටිකක් ඕනෑ. මෙවලම් - gadgets - ටිකක් ඕනෑ. අන්න ඒ මෙවලම් ටික හදා ගන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනය කියලා ඔවුන් පාරම් බාන අධ්‍යාපනයේ සීමාව තිබෙන්නේ කොතැනටද? ඔවුන් නිදහස් අධ්‍යාපනය කියන අධ්‍යාපනයේ සීමාව තිබෙන්නේ ඔවුන්ට අවශ්‍ය උපකරණ ටිකක්, ඔවුන්ට අවශ්‍ය ශ්‍රමිකයෝ ටිකක් හදා ගන්නා සීමාවට විතරයි. ඉන් එහාට ඔවුන් අධ්‍යාපනයේ සීමාව පළල් කරන්නේ නැහැ. ඒ නිදහස ලබා දෙන්නේ නැහැ. ඒක තමයි ඉතිහාසයේ ඉඳලා අපට තිබෙන අත්දැකීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අනෙක් කාරණය මොකක්ද? ඔවුන්ගේ පාලනය, ඔවුන්ගේ ක්‍රමය, ඔවුන්ගේ දේශපාලනය, ඔවුන්ගේ ආර්ථික ක්‍රියාවලිය පවත්වා ගෙන යන්න, ඒකට අවනත මිනිහෙක් හදා ගන්නා සීමාවට විතරයි ඔවුන් අධ්‍යාපනය ලබා දෙන්නේ.

ඒක ඉතා පැහැදිලියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්තයක් වශයෙන් ඒ ක්‍රියාවලියට එරෙහිව තමයි මේ රටේ බහුතරයක් වන පීඩාවට පත් වුණු දෙමවුපියන්, වැඩිහිටියන්, ආචාර්යවරුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇතුළු උගත් බුද්ධිමත් සියලු දෙනා, සංවිධානය විය යුත්තේ, සංවිධානය කළ යුත්තේ කියලා මා විශ්වාස කරනවා. මෙවැනි සිද්ධියක් පමණක් අරගෙන කථා කරන එක පාලකයන්ට වාසියි. ඒ නිසා අපි සමස්තයක් හැටියට ගෙන මේ ප්‍රශ්න කථා කරමු. දැන් මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? තමන්ට අවනත මිනිසුන් නිර්මාණය කර ගැනීමේ ක්‍රියාවලිය දිහා ඉතිහාසයේ ඉඳලා බලන්න. ඒ සඳහා හදපු පෙළ පොත බලන්න. හදපු වැඩ පිළිවෙළ බලන්න. එසේ ශික්ෂණය කිරීමේ ක්‍රියාවලිය බලන්න. එය දිගටම ඇවිල්ලා තිබෙනවා. අද ඒ ක්‍රියාවලිය ඊට වඩා ගැඹුරින් මේ පාලකයන්ට ඕනෑ කරලා තිබෙනවා. මොකද, මේ පාලකයන්ගේ අලුත් ආර්ථික උපාය මාර්ග ක්‍රියාත්මක කරන්න නම්, ඔවුන්ගෙන් ප්‍රශ්න කරන, අරගළ කරන, නිර්මාණශීලීව හිතන, පළල් විධියට හිතන මිනිසුන් සිටින එක බාධාවක්. ඒ නිසා තවත් ශික්ෂණය කරපු, හීලෑ කරපු, අවනත කරගත් මිනිසුන් අනාගත පරම්පරාව තුළ නිර්මාණය කර ගැනීමේ වුවමනාව අද වෙනදාටත් වඩා ඇති වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද ඒක වෙනදාටත් වඩා වුවමනායි. එක පැත්තකින් මර්දනය ගෙනැල්ලා මේ සමාජය අවනත කරන්න, හීලෑ කරන්න, භය කරන්න හදනවා වාගේම, අනෙක් පැත්තෙන් පෙර පාසලේ ඉඳලා විශ්වවිද්‍යාලයේ උපාධිය අවසන් වන අවස්ථාව දක්වා ශික්ෂණය කරන්න හදනවා. මර්දනයෙන් ශික්ෂණය කරනවාට වඩා ඔවුන්ගේ පාලන ක්‍රමයට අවනත අධ්‍යාපනයෙන් ශික්ෂණය කරන එක පහසුයි. ඒක තමයි මේ රටේ ඉතිහාසයේ ඉඳලා හිටපු පාලකයන්ගේ ක්‍රමෝපාය වුණේ. දැන් ඒ තත්ත්වය එළියට ඇවිල්ලා තිබෙනවා. වෙනදා හංගලා ගැහුවේ. අද ඒක එළිපිටට ඇවිල්ලා තිබෙනවා. පාසල් ශිෂ්‍යයා තවත් අවනත කර ගන්න, හීලෑ කරගන්න තමයි විදුහල්පතිවරු ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝග හා විධි විධාන යටතේ කර්තල්වරුන් බවට පත් කරන්නේ. මිලිටරිකරණ මානසිකත්වය යටතේ ශිෂ්‍යයා ඒ පුහුණුවට, ඒ ශික්ෂණයට ලක් කරන්නයි හදන්නේ. ඒ නිසා තමයි විශ්වවිද්‍යාලයට ඇතුළත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හමුදා පුහුණුවක් ලබා දෙන්නේ. ඒ ශික්ෂණය හදන්න, ඒ brainwash එක දෙන්න තමයි එහෙම කරන්නේ.

පෙළපොත්වල වැරදි ඇති වන්නේත් ඒ නිසා තමයි. පෙළ පොත්වලට සමහර පාඩම් එන්නේ ඒ නිසා තමයි. ඒ අරමුණ ඉතා පැහැදිලියි. ඒ අරමුණ හෙළිදරවු කරන එක, ඒ අරමුණට එරෙහිව අරගළ කරන එක මේ රටේ ශිෂ්‍යයන්ගේත්, විද්වතුන්ගේත්, බුද්ධිමතුන්ගේත්, දෙමවුපියන්ගේත් කාර්ය භාරය බවට පත් වෙලා තිබෙනවා. එහෙම පළල් ලෙස අරගළයක් නොකරනතාක් මේ ප්‍රශ්නය අපට බේරා ගන්නට බැහැ.

අද මොකක්ද සිදුවෙලා තිබෙන්නේ? පසු ගිය දා සිදු වුණු පොල් ගෙඩි කිහිපයක් සොරකම් කිරීමේ සිද්ධිය පිළිබඳව, පාසල් වසා දැමීමට සිදු වීම පිළිබඳව, පෙළපොත්වල වැරදි ඇති වීම පිළිබඳව, දෙමවිපියන්ට පාසල්වල හුනු ගාන්න සිදු වීම පිළිබඳව, දෙමවිපියන්ට ඉස්කෝලේ වැට හදන්න සිදු වීම පිළිබඳව, ආදි ශිෂ්‍ය සංගම්වලට පාසලේ වගකීම භාර ගන්නට සිදු වීම පිළිබඳ යන මේ සියල්ලට අද පදනම වෙලා තිබෙන්නේ මොකක්ද?

ඉතා පැහැදිලියි. අද තමන්ගේ වුවමනාවන් සඳහා තමන්ට ඕනෑ කරන ශ්‍රමයකයන් හදා ගන්න, තමන්ට අවනත හීලෑ මිනිහෙක් හදා ගන්න වුමනාවෙන් වැඩ කරන පාලකයෝ අනුක්‍රමයෙන් ඇවිල්ලා තිබෙන්නේ කොතැනටද? අධ්‍යාපනයේ වගකීමෙන් සම්පූර්ණයෙන් රාජ්‍ය නිදහස් වීමේ පියවරකට තමයි අද ඇවිත් තිබෙන්නේ. ඒ වාගේම අධ්‍යාපනය වෙළෙඳ භාණ්ඩයක් බවට පත් කිරීමේ ක්‍රියාවලියට ඇවිල්ලා තිබෙනවා. අධ්‍යාපනය අයිතියක් නොවෙයි, වරප්‍රසාදයක් කියන තැනට ඇවිල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම නම් අපි ඒකට විරුද්ධව මැදිහත් වෙන්න ඕනෑ. 1977 ඉඳලා දළ ජාතික නිෂ්පාදිතයෙන්- ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව වෙලාව තිබෙනවාද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට වෙන් කළ විනාඩි 15 අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
"මේ ඔබේ දරුවාගේ පාසලයි" කියලා පාසලේ බෝඩ් එක ගහලා, "උඹේ දරුවාගේ ඉස්කෝලය නම් උඹ හුණු ගාගනින්, උඹ වැට හදා ගනින්, වැසිකිළි හදා ගනින්, ළමා උයන හදා ගනින්" කියලා අධ්‍යාපනයේ සම්පූර්ණ බර දරුවාට පටවලා, අධ්‍යාපනය වෙළෙඳ භාණ්ඩයක් බවට පත් කරලා, අධ්‍යාපනයට වෙන් කරන මුදල් කප්පාදු කරන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් විධියට තමයි අද මේ පාසල් වසා දැමීමේ තැනට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා පාසලට එන දරුවා ගැන විතරක් නොවෙයි, පාසලට නොඑන දරුවා ගැනත් හිතලා, මේ රටේ නිදහස් අධ්‍යාපනය කියන සීමාවෙන් එහාට ගිහිල්ලා සියලු දෙනාට අධ්‍යාපනයේ සම අවස්ථාව ලබා ගැනීමේ අරගළයට මේ රටේ ජනතාව, මේ රටේ ශිෂ්‍යයන්, මේ රටේ විද්වතුන් සහ බුද්ධිමතුන් එකතු වෙයි කියලා අපි හිතනවා. ඒ සඳහා අපි ඔවුන්ට ආරාධනා කරනවා. බොහොම ස්තුතියි.

[ப.ப. 5.15]

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கல்வி தொடர்பான ஒத்திவைப்புப் பிரேரணைமீது உரையாற்று வதற்கு எனக்கும் சந்தர்ப்பம் கிடைத்தமைக்காக நான் மகிழ்ச்சியடைகின்றேன். இன்று இங்கு பேசிய அனைவரும் கல்வியில் மாற்றங்களை ஏற்படுத்த வேண்டுமென்பதை

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

வலியுறுத்தியிருக்கிறார்கள். அந்தக் கருத்தையே நானும் கொண்டிருக்கின்றேன். இந்த நாட்டிலே கல்வியானது மக்களால் அவர்களின் உயிர்நாடியாகக் கருதப்படுகின்றது. எங்கள் நாடு அதிசிறந்த கல்வியாளர்களை உருவாக்கிய நாடு. அந்த நிலைமையை நாங்கள் தொடர்ந்தும் தக்கவைத்துக் கொள்ள வேண்டுமென்பதுதான் எங்களுடைய அவாவாக இருக்கின்றது. கல்வி முன்னேற்றத்தினூடாகத்தான் இந்த நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்த முடியும். அந்தவகையில், இந்தச் சந்தர்ப்பத்திலே நான் எனது பிரதேசம் சார்ந்த கல்வி நிலைமைகள் பற்றி இங்கு சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன்.

முப்பது ஆண்டுகால யுத்தம் எங்கள் தமிழ் மக்களின் கல்வியைச் சிதைத்துவிட்டது. மக்களின் கல்வி நிறுவனங்கள் எல்லாம் யுத்தத்தினால் அழிவுற்றன. குறிப்பாக, யுத்தம் கொடுமையாக நடைபெற்ற வன்னி மாட்டங்களில் கல்வி நிலைமை மிகவும் மோசமாக இருக்கின்றது. யுத்தத்துக்குப் பின்னர், இழந்த எமது கல்வி நிலையை மேம்படுத்துவதற்காக நாங்கள் எல்லோரும் சேர்ந்து முயற்சி செய்து கொண்டிருக்கின்றோம். இப்போது மீள்குடியேற்றத்துக்குப் பிறகு, மூன்று - மூன்றரை ஆண்டு குறுகிய காலத்துக்குள் எல்லாப் பாடசாலைகளும் இயங்கக்கூடிய ஒரு சூழ்நிலை உருவாக்கப்பட்டிருக்கின்றது. கணிசமானளவு கட்டிட மற்றும் பௌதிக வளங்கள் கிடைக்கப்பெற்றிருக்கின்றன. இதற்காக நான் மேதகு ஜனாதிபதி அவர்களுக்கும் குறிப்பாக பொருளாதார அபிவிருத்தி அமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ மற்றும் கல்வி அமைச்சர் ஆகியோருக்கும் நன்றி தெரிவிக்கக் கடமைப்பட்டிருக்கிறேன். ஏராளமான பௌதிக வளங்களைப் பெற்றுத்தருவதற்கு அவர்கள் மிகவும் உறுதுணையாக இருந்தாலும் பற்றாக்குறைகள் தொடர்ந்தும் இருந்து கொண்டேயிருக்கின்றன. பாடசாலைகளை இயக்கக் கூடிய அளவுக்கு பௌதிக வளங்களை நாங்கள் பெற்றிருந்தாலும் முழுமையான ஒரு கல்வி நிறுவனமாக அப்பாடசாலைகளை மாற்றுவதற்குரிய வளங்களை நாங்கள் எதிர்காலத்திலே பெற்றாக வேண்டும். அதனூடாகத்தான் இழந்த வட மாகாண கல்வி நிலையை மேம்படுத்த முடியுமென்று நான் கருதுகின்றேன்.

தற்போது 'ஆயிரம் பாடசாலைகள் திட்டம்' அரசினால் அறிமுகப்படுத்தப்பட்டிருக்கிறது. பாடசாலைகளுக்கு மேலதிக வசதிகளை வழங்கி அவற்றை ஒரு நிறைவான கல்வி நிறுவனமாக மாற்றுவதுதான் அரசின் நோக்கமாகும். ஆயினும், குறைபாடுகளுக்கு மத்தியில் இயங்கும் எங்கள் பாடசாலைகளில் இந்தத் திட்டத்தினை அமுல்படுத்துவதால் மட்டும் பிரச்சினைகளைத் தீர்த்துவிட முடியாது. எங்கள் பகுதிகளில் 'ஆயிரம் பாடசாலைகள் திட்டம்' அமுல்படுத்தப்படுகின்றபோது நாங்கள் சில நெருக்கடிகளைச் சந்திக்கவேண்டி வருகிறது. குறிப்பாக, இன்று யாழ்ப்பாணம், கிளிநொச்சி மற்றும் வன்னி மாவட்டங்களில் இருக்கின்ற உயர்நிலைப் பாடசாலைகளில் ஏற்கெனவே ஏராளமான வளப் பற்றாக்குறைகள் இருக்கின்றன. ஆயிரம் பாடசாலைத் திட்டத்தின் அபிவிருத்தியில் முதற்கட்டமாகத் தெரிவு செய்யப்பட்ட 26 பாடசாலைகளுக்கு விஞ்ஞானகூடங்கள் வழங்கப்படுவதை நாங்கள் வரவேற்கிறோம். ஆனால், விஞ்ஞானகூடங்கள் மட்டும் அந்தப் பாடசாலைகளின் குறைபாடுகளைத் தீர்த்துவிடாது. ஏனென்றால், பிரபல பாடசாலைகள் உட்படப் பெரும்பாலான பாடசாலைகளில் 15 வகுப்பறைகளுக்கு மேல் கட்டிட வசதிகள் இல்லை. ஆகவே, கட்டிட வளப் பற்றாக்குறையைத் தீர்ப்பதற்கு கல்வி அமைச்சு உரிய விசேட நடவடிக்கைகளை எடுக்கவேண்டும். எங்களுக்கு அதற்கான நிதி வசதிகளைப் பெற்றுத்தருவதற்கு உதவ வேண்டுமென்பதை நான் இச்சந்தர்ப்பத்திலே தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன்.

ஆசிரியர் பற்றாக்குறையைப் பொறுத்தவரை எங்கள் பகுதிகளில் பாரிய பிரச்சினைகளை நாங்கள் எதிர் கொள்கின்றோம். குறிப்பாக வட மாகாணத்திலே கணிதம், விஞ்ஞானம், Physics, Chemistry, Biology, ICT, English போன்ற பாடங்களுக்கு 1,338 ஆசிரியர்களுக்கான பற்றாக்குறை காணப்படுகின்றது. இதில் முக்கியமாக ஆங்கில பாடத்தைப் பொறுத்தவரை 713 ஆசிரியர்களுக்கான பற்றாக்குறை இருக்கின்றது. அதுபோல ICT பாடத்துக்காக 175 ஆசிரியர்கள் பற்றாக்குறையாக இருக்கின்றனர். கணித பாடத்தைப் பொறுத்தவரை 121 ஆசிரியர்களும் விஞ்ஞான பாடத்தைப் பொறுத்தவரை 159 ஆசிரியர்களும் மேலும் சில பாடங்களுக்குமாக மொத்தம் 1,338 ஆசிரியர்கள் எங்களுக்குத் தேவைப்படுகின்றார்கள். இப்பாடங்களுக்கான ஆசிரியர்கள் பற்றாக்குறையானது வட மாகாணத்தில் பாரியதொரு பிரச்சினையாகக் காணப்படுகின்றது. இப்பற்றாக்குறையானது கல்வியின் தரத்தை மேம்படுத்துவதற்கு மிகவும் இடையூறாக இருக்கின்றது என்பதை நான் இந்த அவையிலே தெரிவிக்க விரும்புகின்றேன். இங்கு எனக்குத் தரப்பட்டுள்ள குறுகிய நேரத்துக்குள் வடமாகாணத்திலுள்ள ஆசிரியர் பற்றாக்குறை பற்றி வலய ரீதியாகத் தனித்தனியாகக் குறிப்பிட முடியாததால், அந்தப் *பட்டியலை ஹன்சாட்டில் பதிவுசெய்ய அனுமதிக்குமாறு கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களை வேண்டிக்கொள்கின்றேன்.

யுத்த காலத்திலும் சரி, யுத்தத்துக்குப் பின்னரான காலத்திலும் சரி - மக்கள் மீள்குடியேறிய காலத்திலும் சரி - எங்களது பிரதேசத்தில் தொண்டர் ஆசிரியர்கள் ஆற்றிய பணி மிகவும் மகத்தானது. வன்னி மாவட்டத்திலுள்ள பாடசாலைகளில் ஆசிரியர்கள் இல்லாமையினால் அவை இயங்க முடியாத நிலைமை ஏற்பட்டபோது, இந்தத் தொண்டர் ஆசிரியர்கள்தாம் அர்ப்பணிப்புடனான அளப்பெரும் சேவையை ஆற்றினார்கள். இவ்வாறு வன்னி மாவட்டத்தில் கிட்டத்தட்ட 600 பேர் பத்து வருடங்களுக்கு மேலாகத் தொண்டர் ஆசிரியர்களாகக் கடமையாற்றிக் கொண்டிருக் கின்றார்கள். இவர்களை ஆசிரியர் சேவைக்குள் உள்வாங்குவதற்கான முயற்சிகளைக் கௌரவ அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்களும் கௌரவ அமைச்சர் பந்துல குணவர்தன அவர்களும் முன்னெடுத்து வருகின்றார்கள். அவர்களின் பத்துவருட கால - யுத்தகால மற்றும் மீள்குடியேற்ற கால - சேவையை மதித்து, அவர்களுடைய உண்மையான அர்ப்பணத்துக்குரிய பரிசாக அவர்களுக்கு நிரந்தர ஆசிரியர் நியமனங்கள் வழங்குவதனை விரைவுபடுத்தவேண்டும் என்று நான் இந்தச் சபையிலே வேண்டுகோள் விடுக்க விரும்புகின்றேன்.

அவ்வாறே, இன்னுமொரு முக்கியமாக விடயத்தையும் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். இப்பிரச்சினையானது நாடுதழுவிய ஒரு பிரச்சினையாகக்கூட இருக்கின்றது. அதாவது, கிராமப்புறப் பாடசாலைகளின் அபிவிருத்தி வடக்கிலே மிகவும் மோசமாக இருக்கின்றது. நகர்ப்புறங்களில் கல்வி வளர்ச்சி வேகம் அதிகமாக இருக்கின்ற அதேநேரத்தில், கிராமப் புறங்களில் அவ்வேகம் குறைவாக

කරුව අවසානයේ පළ කර ඇත.

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

இருக்கின்றது. இதனால், ஏராளமான மாணவர்கள் நீண்டதூரம் பயணம் செய்து, கல்வி நடவடிக்கைகளில் ஈடுபடவேண்டிய துர்ப்பாக்கிய நிலைமையும் ஏழைப் பெற்றோர்களின் பிள்ளைகள் தங்களது உயர் கல்வி வாய்ப்பை இழக்கவேண்டிய நிலைமையும் ஏற்படுகின்றது. இதனால், கிராமப்புறங்களி லிருந்து நல்ல அறிவார்ந்த சமூகம் உருவாகுவதற்கு தடை ஏற்படுகின்றது. ஆகவே, நாங்கள் இது தொடர்பாக கூடிய கவனம் செலுத்தி, எதிர்காலத்தில் கிராமப்புறப் பாடசாலைகளின் முன்னேற்றத்தில் அதிக அக்கறை செலுத்தவேண்டும். கிராமப்புறப் பாடசாலைகளில் உயர்தரத்தில் குறிப்பாக விஞ்ஞான, கணிதப் பிரிவுகளை நடத்துவதற்கான வசதிகள் இல்லாமையினால், க.பொ.த. சாதாரண தரப் பரீட்சையில் விஞ்ஞானம் மற்றும் கணித பாடங்களில் சிறந்த பெறுபேறுகளைப் பெற்ற மாணவர்கள்கூட, கலைத்துறையில் கற்க வேண்டிய நிர்ப்பந்தத்துக்கு உள்ளாகின்றார்கள். இல்லையெனில், அவர்கள் விரும்பினால் கிட்டத்தட்ட 40-50 கிலோமீற்றர் தூரம் சென்றுதான் - குறிப்பாக வன்னி போன்ற பிரதேசங்களில் உள்ள மாணவர்கள் - விஞ்ஞான, கணித துறைகளில் உயர்தரம் கற்கவேண்டிய கட்டாயநிலை ஏற்படுத்தப்பட்டிருக்கின்றது. ஆகவே, இந்த நிலைமைகளை மாற்றவேண்டும்; கிராமப்புறக் கல்வி வளர்ச்சிக்கு அதிக முக்கியத்துவம் கொடுக்கப்பட வேண்டும் என்பதை நான் இங்கே வலியுறுத்துகின்றேன்.

கல்வி நிருவாக சேவையைப் - SLEAS - பொறுத்தவரையில், கல்வியைச் சீரான நிர்வாகக் கட்டமைப்புக்குள் கொண்டுவந்து, அதனைச் செயல்படுத்து வதற்காக வட மாகாணத்தில் 141 பேருக்கான பற்றாக்குறை இருக்கின்றது. இவ்வெற்றிடங்களை நிரப்புவதற்கு விசேட பரீட்சையொன்றினை நடத்தி, அதன்மூலம் தகுதியானவர்களை அச்சேவைக்குள் உள்வாங்குவதற்கு நடவடிக்கை எடுப்பதாக கௌரவ அமைச்சர் அவர்கள் உறுதியளித்திருக்கின்றார். எனவே, அதனை விரைவுபடுத்த வேண்டும். அவ்வாறே, எங்களது மாகாணத்தில் அதிபர் சேவையிலும் - SLPS - 550 பேருக்கான பற்றாக்குறையாக இருக்கின்றது. இப்போது கிட்டத்தட்ட 550 பேர் பதில் கடமை நிறைவேற்று அதிபர்களாக - performing principals - ஆசிரியர் துறைக்குள்ளிருந்து உள்வாங்கப்பட்டிருப்பதால், அங்கு ஆசிரியர் வளங்கூட தேவையில்லாமல் முடக்கப்படும் நிலைமை தோன்றியிருக்கின்றது. ஆகவே, இந்த SLPS 550 பேரையும் அதிபர் சேவைக்குள் உள்வாங்குவதற்குரிய நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ளவேண்டும்.

அவ்வாறே, ஆங்கில ஆசிரியர்களின் பற்றாக்குறை தொடர்பாகவும் நான் இங்கு வலியுறுத்துகின்றேன். வட மாகாணத்தில் தமிழ் மொழிமூலப் பாடசாலைகளில் ஆங்கில ஆசிரியர்களை உள்வாங்குவதற்கு தகைமையானவர்கள் பற்றாக்குறையாக உள்ளனர். அங்கு ஆங்கிலப் பட்டதாரிகள் அல்லது டிப்ளோமா முடித்தவர்கள் மிகவும் குறைவாகவே உள்ளனர். இவ்வாறானவர்கள் ஏற்கெனவே ஆசிரிய சேவைக்குள் உள்வாங்கப்பட்டு விட்டார்கள். ஆகவே க.பொ.த. உயர்தரப் பரீட்சையில் ஆங்கிலத்தில் விசேட சித்தி பெற்றவர்களை உள்வாங்கி, அவர்களுக்கு விசேட பயிற்சி அளிப்பதன்மூலம் ஆங்கில ஆசிரியர்களை நியமிப்பதற்கு நடவடிக்கை எடுக்க முடியும் என்பதையும் நான் இங்கு வலியுறுத்துகின்றேன். ஒட்டுமொத்தமாக எமது பிரதேசத்தில் நிலவுகின்ற பாடசாலைக் கட்டிடங்கள் பற்றாக்குறை, ஆசிரியர்கள் பற்றாக்குறை, கல்விசார் உத்தியோகத்தர்கள் பற்றாக்குறை, நூலகம் மற்றும் கணினிக்கூடப் பற்றாக்குறை, ஆய்வுகூட வசதிகள் இல்லாமை போன்றவற்றைக் கௌரவ அமைச்சர் அவர்கள் கவனத்தில் எடுத்து அவற்றைப் பூர்த்தி செய்வதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அதேவேளையில் எமது பிரதேசத்திலுள்ள 330 primary ஊட்டப் பாடசாலைகளில் 129 பாடசாலைகள் மட்டுமே பாடசாலைகள் அபிவிருத்தித் திட்டத்தின்கீழான அபிவிருத்திக் கெனத் தெரிவுசெய்யப்பட்டுள்ளன. எனவே, ஏனைய ஊட்டப் பாடசாலைகளையும் அபிவிருத்தி செய்வதற்கு உரிய நடவடிக்கை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். எமது பிரதேசப் பாடசாலைகளின் அபிவிருத்திக்கு உதவிய அவுஸ்திரேலியா, சுவிற்சர்லாந்து, இந்தியா, அமெரிக்கா போன்ற நாடுகளுக்கும் பாடசாலைக் கல்வி வளர்ச்சிக்கு உதவிய UNICEF, ChildFund Sri Lanka, ChildFund Korea, Save the Children Fund, Sewalanka Foundation, FORUT ஆகிய நிறுவனங்களுக்கும் நான் இச்சந்தர்ப்பத்தில் நன்றி தெரிவிக்கக் கடமைப்பட்டுள்ளேன்.

அதேநேரத்தில் இன்னுமொரு முக்கியமான விடயத்தையும் நான் இச்சந்தர்ப்பத்தில் குறிப்பிட வேண்டியவனாக இருக்கின்றேன். தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் இந்தச் சபையிலே, கௌரவ அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் கல்வி வளர்ச்சிக்கு இடையூறாக இருக்கின்றார் என்னும் கருத்தை முன்வைத்திருக்கின்றார். இது அப்பட்டமாக ஏற்றுக் கொள்ளப்பட முடியாத நியாயமற்ற கருத்து. யுத்த காலத்திலும் யுத்தத்துக்குப் பின்னரும் வட மாகாணத்திலே, குறிப்பாக யாழ்ப்பாணம், கிளிநொச்சி போன்ற மாவட்டங்களிலே, வீழ்ச்சியடைந்திருந்த கல்வி நிலையை உயர்நிலைக்குக் கொண்டுவருவதற்காக மாண்புமிகு அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் எடுத்துவரும் முயற்சியை அம்மாகாணக் கல்விச் சமூகம் மறுக்க முடியாது; பாராட்டுகிறது. மேலும், உடுவில் பெண்கள் கல்லூரியிலே நடைபெற்ற சம்பவத்தைத் திரிபுபடுத்தி அவர் இங்கு குறிப்பிட்டார். உண்மை அதுவல்ல. அந்தக் கல்லூரியிலே நடைபெற்ற பிரச்சினை ஒன்றுக்காக உடுவில் கல்விச் சமூகம் - ஆசிரியர்கள், பெற்றோர்கள், மாணவர்கள் - அப் பிரச்சினையிலே தலையிட்டு நடவடிக்கை எடுக்கவேண்டு மென கௌரவ அமைச்சர் அவர்களை வலியுறுத்தியிருந்தனர். அவர் ஒரு பொறுப்புள்ள அமைச்சர் என்ற வகையிலே அப்பிரச்சினையில் தலையிட்டு தென்னிந்தியத் திருச்சபை, கல்வித் திணைக்களம், உடுவில் கல்விச் சமூகம், ஆசிரியர்கள், பெற்றோர்கள், மாணவர்கள், ஆகியோரின் ஏற்றுக் கொள்ளுதலுடன்கூடிய சுமுகமான ஒரு தீர்வை ஏற்படுத்தி அக்கல்லூரி பிரச்சினைகள் எதுவுமின்றித் தொடர்ந்தும் இயங்குவதற்கு நடவடிக்கை எடுத்தார். ஆகவே, நியாயமற்ற வகையில் அவரைக் குறைகூறுவதை விடுத்து, அச் சேவையைப் பாராட்டுவதுதான் பொருத்தமானதென நான் நினைக்கின்றேன்.

உண்மையிலேயே வட மாகாணத்தில் தமிழ் மக்களின் கல்வியைச் சீரழித்த தமிழ் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர்கள், தாம் கல்வி மேம்பாட்டில் அக்கறை செலுத்துவதுபோன்று நடிப்பது வேதனையானது. பாடசாலைகளிலிருந்தும் பல்கலைக்கழகங்களிலிருந்தும் மாணவர்களை வீதிகளில் இறக்கி, வலுக்கட்டாயமாக ஆயுதப் பயிற்சிக்கு இழுத்துச்சென்று அவர்களின் கல்வியைச் சீரழிக்க முற்பட்ட தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர்கள் இன்றும் இந்த அவையிலே இருக்கின்றார்கள். நாங்கள் கல்வியைச் சீரழிப்பதாக அவர்கள் கூறுவது மிகவும் வேடிக்கையான விடயம். இவர்கள் சீரழித்த கல்வியை

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

මේම්පඩුත්තුවතර්කාකත්තාන් නාංකළ් අයරාතු උළైත්තු වරුකින්රෝම්. එමදු කෞරව අමෛච්චර් අවර්කළ් කල්වියින් මේම්පාට්ටුක්කාක මේර්කොණ්ඩ නටවටික්කෛකළ් පර්රි කල්වි අමෛච්චර් මාණ්පුමිකු පන්තුල කුණවර්තන අවර්කළ් නන්කු අරිවාර්. එමදු අමෛච්චර් අවර්කළ් පල විසේට කූට්ටංකළුක්කූටාකවුම් විසේට නටවටික්කෛකළුක්කූටාකවුම් කල්වියිල් මේම්පාටුකළෛක් කොණ්ටුවන්තුළ්ළාර්. ආකවේ, ඉවෛපර්රි අරියාමල්, අන්ත උරුප්පිනර් කූරිය ඉන්ත විටයත්තෛ නාන් වන්මෛයාකක් කණ්ටිත්තු අතනෛ මරුක්කින්රේන්. යාෂ්. කල්විච් චමූකමෝ, වට මාකාණ කල්විච් චමූකමෝ ඉවර්කළුටෛය කරුත්තෛ ඔරුපොළුතුම් ඒර්රුක්කොළ්ළාතු එන්පතෛ නාන් ඉන්ත අවෛයිලේ තෙරිවිත්තු, එමදු කල්වි මේම්පාට්ටුක්කාක කල්වි අමෛච්චම් කල්විත් තිණෛක්කළඞ්කළුම් තොටර්න්තුම් උතව වේණ්ටුමෙන වලියුරුත්ති, විටෛපෙරුකින්රේන්. වණක්කම්.

***සභාමේසය මත තබන ලද ලියවිල්ල:**
**சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணை :*
**Schedule tabled:*

Vacancy for the subjects Science , Maths, ICT & English
Ministry of Education -NP - 01.03.2013

Zone →	Kilinochchi				Mullaithivu			Thunukkai			Madhu		Mannar			Vavuniya North		Vavunya South			Jaffna			Valikamam			Thenmaradchy	Island				Vadamaradchy			Total
Division →	Kandavalai	Karachchi	Poonagari	Palai	Karaithuraipattu	Puthukudyiruppu	Veli Oya	Manthai East	Oddusuddan	Thunukkai	Manthai West	Madhu	Mannar	Nanaddan	Musali	Omanthai	Nedunkerny	Vavuniya	Cheddikulam	Sinhala Medium	Jaffna	Nallur	Kopay	Uduvil	Thellipalai	Sandilipay	Sankanai	Chavakachcheri	Karainagar	Velanai	Kayts	Neduntivu	Point Pedro	Karaveddy	Maruthankerny	
Maths	7	27	7				6	1	1	4	2	2	5	10	5	5	7	6	4	3								6		4	5	4				121
Combined Maths	1	1	1		2	2					1	1	6	3		1	1	7	3	4								6								40
Science	9	30	7		7	6	5	2	4	3	4	1	6	8	5	7	7	5	10	7								8		5	6	4			3	159
Physics	1	2	1		3	3	1	1	2	1		1	8	3	1	1	1	1	1	4								5	1		1		1	1		45
Chemistry		2			2	3	1		1			1	9	3	1	1	1	1	1	4						1		4			1	1	1	1		40
Biology		4	1		2	2	1	1	2	1		1	4	3	1		1	1	1	4						1		4	2	2	2		2	2		45
ICT		1	1		5	4	6	2	6	2	6	1	4	5	6	2	3	17	6	6	13	9	12					8	1	3	3	2	18	14	9	175
English	30	52	30	12	4	2	6	11	21	13	3	1	8	20	6	55	49	39	49	17	14	30	32	22	19	33	22	50		3	3	3	26	25	3	713
Total	48	119	48	12	25	22	26	18	37	24	16	9	50	55	25	72	70	77	75	49	27	39	44	22	19	35	22	91	4	17	21	14	48	43	15	1338
Sub Total	227				73			79			25		130			142		201			110			98				91	56				106			1338

Grand Total - 1338

[අ.භා. 5.30]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Will an Hon. Member propose the Hon. Yogarajan to take the Chair?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ආර්. යෝගරාජන් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව සම්බන්ධයෙන් -අද රටේ අධ්‍යාපනික ප්‍රශ්නය සම්බන්ධයෙන්- අදහස් ටිකක් එකතු කිරීමයි මගේ අභිලාෂය වන්නේ.

මා හිතන විධියට ගරු ඇමතිතුමාට ගරු මන්ත්‍රීවරු ගණනාවක් මේ සම්බන්ධයෙන් අදහස් යොමු කරලා ඇති. රටක අධ්‍යාපනය කියන්නේ ඉතාමත්ම වැදගත් විෂයක්. මේක රටක් හදන්න පුළුවන් වාගේම රටක් නැති කරන්න පුළුවන් විෂයක්. අධ්‍යාපනය පාවිච්චි කරලා තමයි සිංගප්පූරුව ශීඝ්‍රයෙන් සංවර්ධනය වුණේ. මැලේසියාවත් සංවර්ධනය වුණේ ඒ ආකාරයෙන්මයි. අපේ රටට ආසන්නයේ තිබෙන මාලදිවයින අධ්‍යාපනය පාවිච්චි කරලා ඉතාමත් කෙටි කාලයකින් ශීඝ්‍ර සංවර්ධනයක් ඇති කර ගත් ආකාරයත් අපට පෙනෙන්න තිබෙනවා. The literacy rate there is 99. 9 per cent. It only exemplifies what I am basically trying to say, that this is not a regional deficiency. If you want to make a thing happen, it can certainly be made to happen.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1994 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පොදුජන එක්සත් පෙරමුණට මේ රට භාර දෙන අවස්ථාවේදී පාසල් 11,832ක් මේ රටේ තිබුණා. ජාතික පාසල් වෙන්න පුළුවන්; පළාත් සභා පාසල් වෙන්න පුළුවන්. නමුත් ඒකකයක් වශයෙන් ඉස්කෝල 11,832ක් තිබුණා. මේ සම්බන්ධයෙන් ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ ප්‍රශ්නයක් ඇහුවාම ලැබුණු පිළිතුර අනුව මේ රටේ දැන් තිබෙන පාසල් ප්‍රමාණය 8,900ට අඩු වෙලා තිබෙනවා කියා දැන ගන්න ලැබුණා. අඩු වැඩි වීම ගැන නොවෙයි මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ. මේ රටේ අධ්‍යාපනයේ සාරවත්භාවය තිබෙනවාද, නැද්ද කියන එක ගැනයි ප්‍රශ්නය තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහස් අධ්‍යාපනයක් තිබෙනවා කියන රටක 1946 සිට මේ අධ්‍යාපන ක්‍රමය පාවිච්චි කර තිබෙන්නේ රටේ අභිවෘද්ධියටද, නැත්නම් දේශපාලන අරමුණකටද, නැත්නම් දරුදැරියන් වැරදි මාර්ගයේ යවන්නද කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම ආණ්ඩුවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය මොකක්ද කියන එක හෙලිදරවු කරන්න අවශ්‍යයි. මා දන්නා විධියට ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා නිර්දේශපාලනීකරණයක් තුළින් ලොකු කාර්ය භාරයක් කරන්න හදනවා. අපි ඒක අගය කරනවා. මගේ සිතිවිල්ල අනුව දේශපාලනඥයින් විදුහලක ගේට්ටුවට එහා යන්න හොඳ නැහැ. ගියොත් ඒ පාසල නැති වෙන එක විතරයි වෙන්නේ. ඒ නිසා නිර්දේශපාලනීකරණය තුළින් කටයුතු කිරීමයි අවශ්‍ය වන්නේ. හැබැයි හැම කොනකම දේශපාලනය තිබෙන නිසයි අද අධ්‍යාපනය මෙවැනි තත්ත්වයකට වැටිලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය ගැන කථා කරද්දී අපට නොයෙක් තර්ක විතර්ක ගෙනෙන්න පුළුවන්; සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.8ක් මුදල් වෙන් කර තිබෙනවා කියන එක බොහොම පැහැදිලිව දැන් ඔප්පු වෙලා තිබෙනවා. දැන් මේකෙදී නොයෙක් කාරණා කියන්න පුළුවන්. ව්‍යක්තීය පුහුණුවීම් කරන අමාත්‍යාංශයක කොටසක් තිබෙනවා කියාවි; සෞඛ්‍ය අමාත්‍යාංශයේ තව කොටසක් තිබෙනවා කියාවි. ඒවා සම්පූර්ණයෙන් ගණනය කරලා එකතු කළාම ඒවායේ කොච්චර ප්‍රතිශතයක් තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. නමුත් අධ්‍යාපනය සඳහා අපේ අය වැය තුළින් වෙන් කර තිබෙන්නේ සියයට 1.8යි කියන එක දැන් හෙලිදරවු වෙලා ඉවරයි. දැන් මේක ඇතිද රටක ඉදිරි දැක්මක් සහිතව කටයුතු කරන්න? සංඛ්‍යා ලේඛන පෙන්නුවාට මදි. අධ්‍යාපනයේ සාරවත්භාවයට මේ සල්ලි ප්‍රමාණය ඇතිද කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. මෑතක ඉඳලා බොහොම දුක් මුසු තත්ත්වයේ කථාන්දර අපට අහන්න ලැබිලා තිබෙනවා. මම මේවා උපුටා ගෙන කථා කරන්න හදන්නේ දේශපාලන අරමුණකින් නොවෙයි. මෙහි බැරෑරුම්කම පෙන්වන්නයි.

මාර්තු මාසයේ 05 වැනිදා "දිවයින" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා.

> "තාත්තා පවුල ජීවත් කළ ඔරුව විකුණා දුව පාසලට දාන්නට මුදල් ගෙවලා."

මේ සිද්ධිය සිදු වී තිබෙන්නේ හුංගම දකුණු බටඅත ප්‍රදේශයේ. තංගල්ල, හුංගම විජයබා විදුහලට- [බාධා කිරීම්] ඉතින් තංගල්ලේ මෙවැනි දෙයක් ඇති වෙනවා නම් ඒක ලොකු ප්‍රශ්නයක්. ඒ වාගේම තමයි හොරණ ප්‍රදේශයේ කුඩා දැරියක් තමන්ගේ අධ්‍යාපන කටයුතු ඉදිරියට ගෙන යන්න අවශ්‍ය නිසා අල්ලපු වත්තෙන් පොල් ගෙඩි අටක් ගත්තාය කියලා ලොකු ආන්දෝලනයක් ඇති වුණා. ඒ සම්බන්ධයෙන් ඇති වුණු ප්‍රශ්නය අපි සියලු දෙනාම දන්නවා. මේක දැක්ක ජනාධිපති බොහොම කම්පා වෙලා ඒ ගැන විමර්ශනයට ලක් කරන්න කිව්වා. එයින් පසු සිදු වුණ දේ මොකක්ද? මේවා වෙනවා කියලා මුලින් දැන ගත්තේ නැද්ද? මීට පෙර කුඩා දරුවෙක් කළු ගහට විසි කළ එක දැක්කේ නැද්ද? මම කියන්නේ මෙවැනි ප්‍රශ්නයක් ඇති වුණාම එහි තිබෙන බැරෑරුම් තත්ත්වය ගැනයි. මේවා මධ්‍යය තුළින් පෙන්වන්න අවශ්‍යයද? ඒ නිසා මානුෂික ආණ්ඩුවක්ය කියන මේ ආණ්ඩුව අධ්‍යාපන ක්‍රමයේ තිබෙන බැරෑරුම්කම ගැන මීට වඩා ඕනෑකමකින් කටයුතු කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෑතකදී පානදුර ප්‍රදේශයේ පියකු විසින් තමන්ගේ බිරිඳත් ළමයින් දෙදෙනාත් මැරුවේ අධ්‍යාපනයට යන වියදම් සහ ජීවත් වන්න බැරි තත්ත්වයකුත් ඇති වුණු නිසායි. එහෙම නම් මේ රටේ අධ්‍යාපනයට මුදල් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවාය කියන එක මේවායින් බොහොම හොඳින් ඔප්පු වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව මොනවාද කරන්නේ? වෙන් කරන්න මුදල් මදියි කියනවා. නමුත් අනෙකුත් අමාත්‍යාංශවලට හරියාකාරව මුදල් බෙදා දී තිබෙනවාද කියන ප්‍රශ්නය ඇති වෙනවා. මේ රටේ සල්ලි නැහැ නොවෙයි. ඕනෑ තරම් සල්ලි තිබෙනවා. නමුත් ඒ සල්ලි; සීමිත සම්පත් අසීමිත ඉල්ලීම් සඳහා වෙන් කරන කොට ඒවා වෙන් කළ අමාත්‍යාංශ ඒ කටයුතු හරියට කරලා තිබෙනවාද නැද්ද කියන එක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය. දැන් බලන්න, රටේ සල්ලි නැහැයි කියන ආණ්ඩුව මාගම්පුර වරාය ළඟ තට්ටු 14ක රජයේ බිල්ඩිමක් හදනවා, US Dollar මිලියන 900ක්, එහෙම නැත්නම් රුපියල් කෝටි 11,700ක් වියදම් කරලා. එතැන වරායක් හදලා තිබෙනවා. මාස 25කට නැව් 25ක්වත් ඇවිල්ලා නැති මේ අවස්ථාවේ රුපියල් කෝටි 11,700ක් තරම් මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නට අවශ්‍යද? මේවා අධ්‍යාපනයට පාවිච්චි කළා නම් කොයි තරම් ප්‍රයෝජනයක් තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි සල්ලි නැහැයි කියා මේ ආණ්ඩුව කියනවා. නමුත් ගිය මාසයේ ඇමතිවරු 10 දෙනෙක් පැටව් ගැහැව්වා. ඒ සඳහා අවශ්‍ය වියදම් කවුද ගෙවන්නේ? බදු ගෙවන අහිංසක ජනතාවයි. ඒ තුළින් අන්තිමේදී අධ්‍යාපනයට තිබෙන පෝෂණය නැති වෙනවා. ඉදිරි දැක්මක් සහිතව කටයුතු කරන්නය කියා ඇමති මණ්ඩලයට කිව්වත් ඒ වියදම නාස්තියක් නොවෙයිද කියා මම ගරු ඇමතිතුමාගෙන් අහනවා. සල්ලි නැහැ කිය කියා අධ්‍යාපන ඇමතිතුමා එහෙ මෙහෙ ගියාට වැඩක් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාම ඉඳගෙන සිටින, 67 දෙනෙක් ඉන්න කැබිනට් මණ්ඩලයක අත උස්සා සම්මත කළාම ඔබතුමාත් මේ ප්‍රශ්නයේ කොටස්කරුවෙක් බවට පරිවර්තනය වෙනවා. ඒ සම්බන්ධයෙන් මට එක කාරණයක් අහන්න තිබෙනවා. මේ වනකොට පාසල් ගණනාවක් -3200ක්- අඩු කරලා තිබෙනවා. ඒ 3200 අඩු කිරීමෙන් තිබෙන පාසල් ඊට වඩා හොඳ තත්ත්වයකට ගෙනල්ලා තිබෙනවාද? අප දන්නා විධියට යම් යම් තැන්වල ශීඝ්‍ර සංවර්ධනයක් කෙරෙනවා. කිසි ප්‍රශ්නයක් නැතිව ඒක අපි කියනවා. නමුත් ඉතිරි පාසල් ටික තවත් කඩා වැටෙන්න ඉඩ දීමෙන් ඒවා වහන්න වෙන තත්ත්වයට ගෙනල්ලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් අපිත් දේශපාලනය කරන කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්වල පවා යම් යම් දුර්වලතා තිබෙනවා. සමහර විදුහල්පතිවරුන් හම්බ වෙන්න ගියාම කියන්නේ අමාත්‍යාංශයට ලියුම් යැව්වාම ඒවාට උත්තර ලැබෙන්නේ නැහැ; ඇමතිතුමන්ලා හම්බවෙන්න ගියාම ඒවාට පිළිතුරක් ලැබෙන්නේ නැහැ කියායි. නමුත් ඒ මුදල් අසල්වැසි පාසල්වලට වෙන් කර තිබෙනවාය කියනවා. මම හිතන්නේ Corporate Plan එකක් අනුව මේ කටයුතු කරන එක තමයි අවශ්‍ය වෙන්නේ. ඒක ජාතික ප්‍රතිපත්තියක්. ගරු ඇමතිතුමනි, අධ්‍යාපනය සම්බන්ධයෙන්

[ගරු රවි කරුණානායක මහතා]

ඔබතුමා ලොකු blue print එකක් දමලා අවුරුදු දෙකක් විතර කථා කරලා තිබෙනවා. මේ ප්‍රශ්නය ගැන මෙච්චර කල් කථා කරන්න අවශ්‍යද? තව දුර දිග යන්නේ නැතිව මේකට විසඳුමක් ලබා දෙන්න. විදුහල්පතිවරුන් සියලු දෙනාම ගෙන්වා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයටවත් කඩිනමින් මේ කටයුතු කර ගෙන යන්න. මා නියෝජනය කරන උතුරු කොළඹ ප්‍රදේශයේ තවම ජාතික පාසලක් නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ ඒ ප්‍රශ්නය තිබෙනවා. නමුත් ඒ සම්බන්ධයෙන් තවම විසඳුමක් ඉදිරිපත් කරලා නැහැ. නිල ඡන්ද දායකයෝ 115,000ක් ඉන්නවා; 185,000ක ජනතාවක් වාසය කරනවා. අනික් ප්‍රදේශවලිනුත් ළමයින් එන ඉතාමත් හොඳ පළාත් සභා පාසල් තිබෙනවා. නමුත් ජාතික පාසලක් බවට ඒවා වැඩිදියුණු කළාම ඒවාට සම්පත් ලැබෙන බව අප සියලු දෙනාම දන්නා කරුණක්. ඇයි ඒකට අපට උත්තරයක් දීලා නැත්තේ? ඒ වාගේම කොළඹ නගර සභා ප්‍රදේශය තුළ ජාතික පාසල් පහක්, හයක් තමයි තිබෙන්නේ. නමුත්මේ බල ප්‍රදේශය තුළ දරුවන් කී දෙනෙක් බිහි වෙනවාද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Hon. Member, you have to conclude. You have only one more minute.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I was given 15 minutes. I started at 5.32 p.m. අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරන මෙවැනි අවස්ථාවක සංවර්ධනාත්මක විවේචනයක් කිරීම තමයි අවශ්‍ය වෙන්නේ. මම හිතන හැටියට ඔබතුමා දක්ෂ නිලධාරීන් ගණනාවක් යොදා ගෙන තිබෙනවා. එතුමන්ලාගේ සේවය නිසියාකාරව පාවිච්චි කරන්නේ නැති ප්‍රශ්නයයි තිබෙන්නේ. කරුණාකරල එතුමන්ලා ගෙන්වා මේ සම්බන්ධයෙන් ශීඝ්‍ර සංවර්ධනයක් ලබා දෙන්න. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අධ්‍යාපනයට ඉමහත් සේවයක් කළා. ඒ තල්ලු වීම නිසා තමයි, එදා කරපු දෙය නිසා තමයි තවමත් ඉදිරියට යන්න හැකියාව ලැබී තිබෙන්නේ. දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා අවුරුදු දෙකක් මේ තනතුර රැක ගෙන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල පෙරළියක් කළා. ඒ නිසා තමයි අද අපට අධ්‍යාපනය තුළින් ඉදිරියට යන්න හැකියාව ලැබී තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් කරුණාකරල ඔබතුමන්ලාගේ ස්ථාවරය, ඉදිරි දැක්ම පෙන්නුම් කරන්න අවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් කථා කළොත්, අද දරුවන් ලක්ෂයක් විතර විශ්වවිද්‍යාල වරම් ලැබීමට සමත් වුණත් ඔවුන් සියලු දෙනාටම විශ්වවිද්‍යාලවලට යන්න අවස්ථාවක් නැහැ. ඒ නිසා තමයි ආණ්ඩුව පෞද්ගලික විශ්වවිද්‍යාල සංකල්පය ඉදිරියට ගෙනැල්ලා තිබෙන්නේ. නමුත් අත පත ගගා තමයි ඔබතුමන්ලා ඒක ගේන්නේ. එහි ස්ථාවරයක් නැහැ. එස්.බී. දිසානායක ඇමතිතුමාගෙන් ඇහුවාම කියනවා "ඔව්, ගේන්න ඕනෑ" කියලා. ලේකම්තුමාගෙන් ඇහුවාම කියනවා, "ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තවම හෙළිදරවු කරලා නැහැ" කියලා.

2013 මාර්තු මාසයේ 04වැනිදා -මීට දවස් තුන හතරකට ඉස්සෙල්ලා- "Daily Mirror" පුවත් පතේ පළ වූ වාර්තාවක මෙහෙම සඳහන් වනවා:

"SB Asks Students to Explore Indian Education Market"

එස්.බී. දිසානායක මැතිතුමා උසස් අධ්‍යාපන ඇමති වන්නේ ඉන්දියාවටද, ලංකාවටද? මේ වාගේ ඇමතිවරු ඕනෑයැ ලංකාවට? "SB Asks Students to Explore Indian Education Market" ඉතින් මේක කියන්න ඇමතිවරයෙක් ඕනෑයැ? මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා තීන්දුවක් ගන්න. අපේ යම් විදේශ විනිමය ප්‍රමාණයක් එළියට යනවා නම්, එම විදේශ විනිමය ප්‍රමාණය ලංකාව තුළ රඳවා ගන්න අවශ්‍යතාවක් තිබෙනවා නම් කරුණාකරලා භය නැතුව තීන්දුව ගන්න. ඔබතුමන්ලා මීට සම්බන්ධ අය ගෙනැල්ලා, ලොකු ප්‍රශ්න ඇති කරලා, ජාතිවාදී, ආගම්වාදී ප්‍රශ්න ඇති කරමින් ඒක වටේ දහලමින් දේශපාලනය කරන්න හදනවා. ජාතික ප්‍රශ්නවලදී එහෙම කරන්න එපා. අධ්‍යාපන ප්‍රශ්නය කියන්නේ ජාතික ප්‍රශ්නයක්. ඒ සඳහා විසඳුමක් ලබා ගන්න අවශ්‍යයි. අපි නිදහස ලබා ගෙන අවුරුදු 65ක් ගත වෙලාත් තවම එක තැන කැරකී කැරකී ඉන්නේ මේ වාගේ ඉතාම ළාබාල දේශපාලන වැඩ කරන නිසායි. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා තීන්දුවක් ගත්තොත් මම දන්නවා ඒක ක්‍රියාත්මක කරනවා කියලා. ඒ වාගේම එස්.බී. දිසානායක ඇමතිතුමාට අපි අභියෝග කරනවා, කරුණාකරලා ආණ්ඩුවේ තත්ත්වය සහ ඉදිරි දැක්ම හෙළිදරවු කරන්න කියලා. මෙවැනි ප්‍රකාශ කරනවාට වැඩිය හොඳයි "ඔව්, අපි මෙහෙම තමයි ගෙනියන්න හදන්නේ. අපි පෞද්ගලික විශ්වවිද්‍යාල මෙන්න මෙච්චර ප්‍රමාණයක් ගේන්න හදනවා" කියලා කිව්වා නම්. දැන් ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට කියන්න පුළුවන් ඒක එස්.බී. දිසානායක ඇමතිතුමාගේ පෞද්ගලික මතයක් කියලා.

පෙබරවාරි 16 වැනිදා "Daily Mirror" පුවත් පතේ මෙහෙම තිබෙනවා:

"Private Universities to be set up through BOI"

ඒ කියන්නේ ආයෝජන මණ්ඩලය තුළින් මෙවැනි විශ්වවිද්‍යාල ඇති කරන්න අවස්ථාව -අවකාශය- සලසා දෙනවා කියන එකයි. මේක හරිද නැද්ද කියන එක පිළිබඳව උසස් අධ්‍යාපන ඇමතිතුමා හරියට පිළිතුරක් දුන්නේ නැතත්, අඩු ගණනේ අධ්‍යාපන ඇමතිතුමා මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළ යුතුයි කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා. පෙබරවාරි 03 වැනිදා "The Sunday Times" පුවත් පත් වාර්තාවේ තව දුරටත් මෙහෙම තිබෙනවා:

"Foreign Universities invited to invest in Sri Lanka."

"Ferdinando appointed Acting Secretary of Investment Promotion Ministry"

ඉතින් ඇයි මේ වාගේ ප්‍රතිවිරුද්ධ අදහස් ඇති ප්‍රකාශ මේ ආණ්ඩුව තුළින් ඉදිරිපත් වෙන්නේ? තමාගේ වම් අත දන්නේ නැහැ දකුණු අත කරන්නේ මොකක්ද කියන එක. මේක තුළින් දේශපාලන ප්‍රශ්නයක් ඇති නොවෙනවා නොවෙයි. අහිංසක දරුවාගේ අනාගතයත් එක්ක සෙල්ලම් කරන එක තමයි මේ කරන්නේ.

මට අවශ්‍ය වන්නේ ඔබතුමන්ලාට මේ අදහස් ඉදිරිපත් කරන්නයි. අද විදුහල්පතිවරු 1,200 දෙනෙකුගේ පමණ අඩුවක් තිබෙනවා. මීට පෙර දෙමළෙන් කථා කළ කිළිනොච්චි දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමා මතක් කළා යාපනය දිස්ත්‍රික්කයට ඉංග්‍රීසි ගුරුවරුන් 1,400ක් මදියි කියලා. ඒ තත්ත්වය ලංකාව පුරාම බැලුවොත් ඉංග්‍රීසි ගුරුවරුන් 15,000ක් විතර හිඟ වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා මොකක්ද කරන්න හදන්නේ? මේවාට වැඩිය ඔබතුමන්ලා බොහොම ආඩම්බරයෙන් කියනවා අපේ ඉංග්‍රීසි ගුරුවරු 25,000ක් විතර මාලදිවයිනට, කොරියාවට, ඉන්දියාවට ගිහින් තිබෙනවා කියලා. අපේ ගුරුවරු පිට රට යවන්නේ නැතුව අපේ රටේ අධ්‍යාපනය

පෝෂණය කරන්න වැඩ කටයුතු කරන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා. කරුණාකරල අධ්‍යාපනය සම්බන්ධයෙන් බොහොම සෘජු ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරන්න. මොකද, මේක භය නැතිව ඉදිරිපත් කරන්න අවශ්‍යයි. අධ්‍යාපනය තුළ නිර්දේශපාලනීකරණ ප්‍රතිපත්තියක් ඇති කරන්න අවශ්‍යයි. මෙන්න මේක කරලා රටට බුද්ධිමත් තරුණ තරුණියන් බිහි කරන අධ්‍යාපන ක්‍රමයක් නිර්භීතව ඇති කරන්න ඕනෑය කියන එක මතක් කරමින්, කරුණාකරල ඒ සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන්න කියන අදහස නැවතත් ඉදිරිපත් කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 5.45]

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පාසල් වැසී යාම පිළිබඳව අද දින ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කළා. එතුමාගේ යෝජනාවේ අන්තර්ගත වෙලා තිබෙනවා මේ රටේ පාසල්වලට අවශ්‍ය කරන පහසුකම් නොලැබීම එසේ පාසල් වැසී යාමට හේතුවක් වෙලා තිබෙනවා කියලා. මම සන්තෝෂ වෙනවා, ලක්ෂ 40ක් පමණ වූ මේ රටේ ශිෂ්‍ය දරුවන් වෙනුවෙන් මේ අවස්ථාව ලබා ගැනීම ගැන. අද ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් තම කථාවේදී එතුමන්ලාගේ සුපුරුදු දේශනයම කළා. මට මතකයි 1969 දී විතර ඔය වාගේ දේශනයක් තිබුණා. ශිෂ්‍යයෝ වශයෙන් අපිත් ඒ දේශනයට සහභාගි වුණා.

ඒ කථා ගෙලිය, ඒ අදහසම තමයි අද මේ සභාව තුළ රැව් පිළිරැව් දුන්නේ. ඔවුන්ට කරන්න පුළුවන් දෙයක් නැහැ. එතුමාගේ කථාවෙන් මේ පාසල් වැසී යාම නතර කිරීම පිළිබඳව යම් කිසි අර්ථ නිරූපණයක් වුණාද කියා මට තේරුණේ නැහැ. අපි දකින විධියට පාසල් වැසී යන්න තිබෙන ප්‍රධාන හේතුව තමයි මේ රටේ ගම්බද ශිෂ්‍යයෝ ක්‍රමානුකූලව නගරයේ පාසල්වලට පැමිණීම. ඒ අනුව ශිෂ්‍යයෝ වැඩි නගරයේ පාසල්වලට පහසුකම් දීම සිදු වන විට ගමේ පාසලට අවශ්‍ය කරන පහසුකම් ලබා දීමේදී විවිධ ගැටලු ඇති වෙනවා. මේ ආපු අධ්‍යාපන රටාව තුළ අත් දැකීම් ලබමින් තමයි අද අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ ආණ්ඩුව අලුත් ක්‍රමයක් හැටියට මහින්දෝදය පාසල් ඇති කරලා, ඒ අවට පෝෂිත පාසල් ඇති කරලා සෑම ළමයකුටම ලබා දිය හැකි සම්පත් ලබා දීමේ උපක්‍රමය කර ගෙන යන්නේ.

අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයට වාගේම අනුරාධපුර නගරයේ තිබෙන බාලිකා විද්‍යාලයට එප්පාවල වාගේ ප්‍රදේශවල සිට සෑම දාම උදේ වාහන 10ක් 12ක් යනවා. අනෙක් පාරවලිනුත් එනවා. 4,000ක්, 5,000ක් වාගේ ශිෂ්‍ය සංඛ්‍යාවක් එම විද්‍යාලවල ඉගෙනුම ලබනවා. මේකෙන් බහුතරයක් ගම්බද පාසල් ශිෂ්‍යයෝ. මේකට පිළියම් යොදන මේ අවස්ථාවේදී පාසල් 1,000 වැඩසටහන තුළ අපේ නගරබද වාගේම ගම්බද ශිෂ්‍යයාටත් කෙටි දුරක් ඇතුළත තමන්ගේ අධ්‍යාපනය ලැබීමට මෙන්ම, ඒ අධ්‍යාපනයට අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දෙනවා නම් ඇත්ත වශයෙන්ම සෑම ශිෂ්‍යයෙකුටම තමන්ගේ අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍ය කරන පහසුකම් එක හා සමානව ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනවාරි මාසය වන විට සමහර පාසල්වල ක්‍රමානුකූලව ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වෙලා ළමයි සංඛ්‍යාව නව දෙනා, අට දෙනා එහෙම නැත්නම් හත් දෙනා වෙනවා. මම ජනවාරි මාසයේ අලුත්වැව ඉස්කෝලෙට ගියා. ඒ ඉස්කෝලයේ ඉන්නේ ශිෂ්‍යයෝ නව දෙනයි. ඒ ශිෂ්‍යයෝ නව දෙනාට ගුරුවරුන් හතර දෙනෙකු ඉන්නවා. ඊට කිලෝමීටර් දෙකකට, දෙකහමාරකට විතර එහා තවත් ඉස්කෝලයක් තිබෙනවා. එම ශිෂ්‍යයෝ නව දෙනා ඒ ඉස්කෝලයට යැව්වා නම් අර ගුරුවරුන් හතර දෙනා වෙනත් ඉස්කෝලවලට අවශ්‍ය කරන පුරප්පාඩු පුරවන්නට යොදා ගන්න තිබුණා. නමුත් එය සිදු වන්නේ නැහැ. ක්‍රමානුකූලව ඒ පාසල ඊළඟ අවුරුද්ද වන විට අනිවාර්යයෙන්ම වැහෙනවා. ඒ වැසී යෑම මේ චක්‍රලේඛනයෙන් මුදල් ලබා ගැනීම නිසාවත් එහෙම නැත්නම් අධ්‍යාපන ක්‍රමයේ වෙනසක් නිසාවත් ඇති වන තත්ත්වයක් නොවෙයි. ඒ ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමානුකූලව අඩු වීම තුළ අපි දකිනවා ඒ පාසල් ක්‍රමානුකූලව -ටිකෙන් ටික, ටිකෙන් ටික- වැහෙන බව. අපේ සමහර අය එවැනි අවස්ථාවල තමන්ගේ ඉස්කෝලේ අඩු වන ළමයින් ප්‍රමාණය දිහා බලන්නේ නැහැ. තමන්ගේ ගමේ තමන් ඉගෙන ගත්ත ඉස්කෝලය තියා ගන්න ඕනෑ කියන චින්තනය තුළ ඉඳ ගෙන තමයි සමහර අය පාරට බැහැලා උද්ඝෝෂණය කරන්නේ. ඉස්කෝලයේ ළමයින් දස දෙනෙකු සිටියත් කමක් නැහැ, පාසල තියා ගන්න උත්සාහ කරනවා. ඒ මානසිකත්වයෙන් දෙමවුපියන් මුදා ගන්නට පුළුවන් වුණොත් අපට මේ පාසල් 1,000 වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට පුළුවන් වනවා.

මම ගිය සතියේ අපේ ප්‍රදේශයේ තිබෙන ගල්වඩුවාගම ඉස්කෝලයට ගියා. ඒ පාසලට අවුරුදු 28කට පසුව තමයි සංගීත ගුරුවරයෙක් සහ නැටුම් ගුරුවරියක් ඇවිල්ලා තිබෙන්නේ. දෙමවුපියන් ඉල්ලා සිටිනවා ඒ පාසල හුදකලා විද්‍යාලයක් බවට පරිවර්තනය කරලා දිගටම ගෙන යන්න කියලා. නමුත් ඊට කිලෝමීටර් දෙකහමාරකට එහායින් මහින්දෝදය පාසල් 1,000 වැඩසටහන යටතේ පිහිටු වූ පාසලක් මේ අවුරුද්දේ සිට ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ඒ පාසලේ සිට එප්පාවල මධ්‍ය මහා විද්‍යාලයට තිබෙන්නේත් කිලෝමීටර් තුනක් විතර දුරක්. මේ ගල්වඩුවාගම ඉස්කෝලය පවත්වා ගෙන ගිහින්, මේ ගුරුවරුන් දෙදෙනා බැරි වෙලාවත් මේ පාසලෙන් අයින් වුණොත් සාමාන්‍ය පෙළ හා උසස් පෙළ පන්ති දක්වා යන විට ඒ ළමයින්ට ගුරුවරුන් නැති වනවා. එවිට ඒ ළමයින්ගේ අධ්‍යාපනය කඩා හැලෙනවා.

එසේ කඩා හැලෙන නිසා, දෙමව්පියන්ගේ තිබෙන සංකල්පය වෙනස් කර අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය මේකයි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සංකල්පය මේකයි කියා කල්පනා කර කටයුතු කරන්න ඕනෑ. සමහර ප්‍රායෝගික ප්‍රශ්න තිබෙන පාසල් තිබෙනවා. සියයට සියයක් නොවෙයි. ප්‍රාථමික පාසලක් හැදුවාම ඒ ප්‍රාථමික පාසලට ළමයින්ට කිලෝ මීටර් කිහිපයක් දුර පයින් යන්නට තිබෙනවා. අප ඉස්කෝලේ ගිය කාලයේ කිලෝ මීටර් හතරක් විතර පයින් ගිහිල්ලා තමයි අප අධ්‍යාපනය ලැබුවේ. මේ ක්‍රමය වෙනස් කිරීම සඳහා ජනතාව තුළ තිබෙන මානසික මට්ටම වෙනස් කරන්නට ඕනෑ. අප ඒ කාලයේ පාසල් කටයුතු කර ගෙන ගියේ කොහොමද කියා හිතන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සමහර ගරු මන්ත්‍රීවරු විවිධ දේවල් සම්බන්ධව කථා කළා. පාසල්වල ශාරීරික අභ්‍යාස සම්බන්ධව කථා කළා. පොල් ගෙඩි කථාව විටින් විට උලුප්පා පෙන්වන්නට උත්සාහ ගත්තා. ඉස්කෝල වැසී යාම වළක්වා ගැනීමේ යෝජනාවට මේ පොල් ගෙඩි සම්බන්ධ කථාව සම්බන්ධ නැහැ. පොල් ගෙඩි කථාව එක්තරා පුවත් පතක මා දැක්කා. ඒ ගැන අප කථා කළ යුතු නැහැ. මොකද, ඒ නිසා ඒ දැරිය ලොකු අපහසු තත්ත්වයකට පත් වෙනවා. පොල් ගෙඩි කථාව එක එක පුවත් පත් එක එක ආකාරයට වාර්තා කර තිබුණා. මෙතුමන්ලා පොල් ගෙඩි කථාව ගෙන ඒම තුළ මේ යෝජනාවට යම් කිසි ප්‍රයෝජනයක් ඇති වුණාය කියා අප විශ්වාස කරන්නේ නැහැ.

[ගරු එස්. සී. මුතුකුමාරණ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් පිහිටුවීමේදී භූමිය පිළිබඳව හිතන්නේ නැතිව, ඉදිරි ජනගහනය ගැන හිතන්නේ නැතිව යම් යම් ව්‍යාපෘති ඒ ප්‍රදේශවල ක්‍රියාත්මක කරනකොට පාසල් ගොඩනැඟිලි හැදුවා. ළඟ තිබෙන ඉස්කෝලය ගැන හිතුවේ නැහැ. ඒ වාගේම තමයි ගල්වඩුවාගම තිබෙන ඉස්කෝලයට කිලෝ මීටර් භාගයක් එහා තිබුණා, කාගම කට්ටියාව ජනපදය බිහි වෙනකොට බිහි වුණු යාය 2 විද්‍යාලය. ඊට මෙහායින් තිබෙන ගල්වඩුවාගම ඉස්කෝලය මහවැලියක් එක්ක ආවා. එතකොට මුල් ජනපදයේ තිබුණු කාගම කට්ටියාව 2 විදුහල ඉබේම වැහුණා. මොකද, මේ ඉස්කෝල දෙක අතර තිබෙන පරතරය එතරම් විශාල නොවන නිසා. මේ රටේ නායකයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමා මේ ගෙන යන වැඩ පිළිවෙළ-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
එතුමා ශිෂ්‍යයන්ගෙන් කරුණු දැනගෙන තමයි මේ කැසිකිළි වැසිකිළි පන්දාහක් එකවර ලබා දුන්නාය කියන්නේ. එය ඉතාම වටිනා දෙයක්. මට නියමිත කාලය අවසාන නිසා දීර්ඝ වශයෙන් කථා කරන්නට අවස්ථාවක් නැහැ. මීට ප්‍රථම කථා කළ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, විලව්චිය මහා විද්‍යාලයේ ගුරුවරුන් 18 දෙනෙක් අඩුයි කියා ස්ට්‍රයික් එකක් තිබුණාය කියා. ඒක අමුලික අසත්‍යයක්. මෙම විද්‍යාලයට අවශ්‍ය වී තිබෙන්නේ එකම එක පුහුණු ගුරුවරියක් පමණයි. අනෙක් ගුරු අවශ්‍යතා සියල්ලම තියෙනවා. මොකද එතැන ගැටලුවක් තිබෙනවා. යුද්ධ කාලයේ එම විද්‍යාලයට ගුරුවරුන් නො එන වෙලාවේ එහි පැමිණ ඉගැන්වූ ආරක්ෂක අංශයට සම්බන්ධ ගුරුවරුන් දැන් පළාත් සභාව විසින් ස්ථිර කර තිබෙනවා. ඒ ගුරුවරුන්ගේ ඉගැන්වීම හොඳ නැත කියන මතයක් ගෙන ගිහින් තමයි මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ. එම නිසා උතුරුමැද පළාත් සභාව දැන් ඒ ප්‍රදේශයට ආවේනික ගුරුවරුන් බඳවා ගැනීම සඳහා ගැසට් කර ඉල්ලුම් පත්‍ර කැඳවා තිබෙනවා. ඒ ගුරුවරුන් අවුරුදු 10ක් එම විද්‍යාලයේ සේවය කිරීම අවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමාට හා අධ්‍යාපන අමාත්‍යතුමාට මා මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. ඉස්කෝල පිළබඳව අධ්‍යාපනය පිළිබඳව හොඳ අධ්‍යයනයක් කර හතළිස් ලක්ෂයක් පමණ වන සිසුන්ට සේවය කිරීමට, ඔවුන්ගේ අනාගතය ගොඩ නැඟීමට අවස්ථාව ලැබෙවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු මැද පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යවරයා ගැනත් මා මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. මොකද, එතුමා උතුරු මැද පළාත් සභාවෙන් කර ගෙන යන වැඩ පිළිවෙළ තුළ එක්තරා රටාවකට ඉගැන්වීමට නැත්නම් ගුරුවරුන්ට නිකරුණේ කාලය ගත කරන්නට ඉඩ නොදී ඉගැන්වීමට කාලසටහනක් හදා තිබෙනවා. ඒ කාල සටහන තුළ උතුරු මැද පළාතේ පාසල්වල අධ්‍යාපනය ලබන සියලුම සිසුන්ගේ අධ්‍යාපනය සාර්ථකව ඉදිරියට ගෙන යාමට හැකි වේවායි පතමින් වෙමින් මා නිහඬ වෙනවා. බොහෙම ස්තුතියි.

[අ.භා. 5.56]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්බද පාසල් වැසියාම සම්බන්ධයෙන් මෙම යෝජනාව ගෙනා ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ මේ අවස්ථාවේ නොසිටියත්, මගේ මැතිවරණ කොට්ඨාසයේ වැසී ගිය පාසල් රාශියක් යළි විවෘත කළ මන්ත්‍රීවරයෙකු හැටියට ඊට විරුද්ධ මතයකුයි මා දරන්නේ. මගේ මැතිවරණ කොට්ඨාසයේ වැසී ගිය පාසල් තුනක් යළි විවෘත කර තිබෙනවා. අලුතෙන් පාසල් දෙකකුත් හදා ඒ කටයුතු කරගෙන යනවා. ඒ පාසල් වැසී යන්නට හේතු රාශියක් තිබෙනවා. ගම්බද පාසල්වල අඩු පාඩු විතරක් නොවෙයි ජනගහනය පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා. ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා ද්විතියික පාසල් සංකල්පය ගෙනා අවස්ථාවේ එතුමාට මගේ සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා. මේක හොඳ කටයුත්තක්.

එතුමාගේ දේශපාලනය ගැන හිතන්නේ නැතුව අතිගරු ජනාධිපතිතුමාගේ ආශිර්වාදයත් එක්ක එතුමා මේ රටේ අභිංසක දුප්පත් දරුවන් වෙනුවෙන් ගත්ත එඩිතර තීන්දුවක් ඒ. මගේ මැතිවරණ කොට්ඨාසයේ විතරක් පාසල් 9ක් ද්විතියික පාසල් කරන්න කටයුතු කරන විට එක පාසලක විරෝධයක් ආවා, කරන්න එපාය කියා. මම පාසලට ගිහින් සොයා බැලුවාම දැනගන්න ලැබුණා, "මේ පාසලේ පළමුවන පන්තිය තියෙන්න ඕනෑ. ඒ නිසා මේ පාසල ද්විතීයික පාසලක් කරන්න එපා" කියා පාසල් සංවර්ධන සමිතියෙන් යෝජනාවක් ගෙනාවාම නිකම් ඉඳලා තිබෙනවා.

අනෙක් පාසල පටන් ගන්නා විට ලොකු උද්ඝෝෂණයක් කළා. පාර වහලා, පාර මැද වළං ගෙනැවිත් බත් උයාගෙන ගමේ ඔක්කොම නැවත පාසල ඉල්ලන්න පටන් ගත්තා. මම අපේ ඇමතිතුමාට කථා කර කිව්වා, මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවාය කියා. ඇමතිතුමා කිව්වා, ඒ උදවිය එක්කගෙන එන්න කියා. මම ඒ අය එක්කගෙන ගියා. එතුමා බොහොම සංවේදී පුද්ගලයෙක්. මගේ අදහස මම එතුමාට ඉදිරිපත් කරමින් කිව්වා, "මේ දුෂ්කර ගම්මාන ඔක්කෝගේම දරුවෝ එන්න තිබෙන පාසල මේක. ඒ ගොල්ලෝ තේරුම් ගත්තේ නැහැ. දේශපාලකයෙක් පිටුපස ඉඳලා මේ සංකල්පය හොඳ නැහැ කියලා කියපු නිසා ඒ උගුලේ මේ මිනිස්සු වැටිලා තිබෙන්නේ. එම නිසා මේ පාසල නැවත වරක් ලබා දෙන්න" කියා. එතුමා බොහොම නිහතමානීව නැවත වරක් ඒ පාසල ලබා දුන්නා. ළඟදි තවත් පාසලක එහෙම ගැටලුවක් ආවා. ඒ පාසල තියෙනවා. නමුත් ඒ පාසල අවශ්‍ය නැහැ කියා ආපහු කිව්වා. මගේ ආසනයේ දෙපැත්තටම උද්ඝෝෂණ ආවා. එක උද්ඝෝෂණයක් ආවා පාසල ඕනෑ කියා. අනෙක් උද්ඝෝෂණය ආවේ පාසල එපා කියා. එහිදිත් මම ගරු ඇමතිතුමා එක්ක සම්බන්ධ වෙලා එතුමාට කරුණු ඉදිරිපත් කර දැන් අලුතෙන් ඉස්කෝලයක් හදනවා. ලබන මාසයේ ඒ ඉස්කෝලය විවෘත කරනවා. ගැටලුවක් තිබුණා නම් අපේ රජය ඒ ගැටලුව විසඳන්න කටයුතු කර තිබෙනවා. කලවාන අලුත් ඉඩමක් අරගෙන අද දෙමව්පියෝ එකතු කර ගෙන අපි නව ප්‍රාථමික පාසලක් හදනවා.

මා ළඟ තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011, 2012 සහ 2013 පළමුවන පන්තියට ශිෂ්‍යයෝ ඇතුළත් වුණු පාසල්වල විස්තර. 2011 අවුරුද්දේ සමන්පුර මහා විද්‍යාලයේ දරුවෝ දහ දෙනයි හිටියේ. අපේ ඇමතිතුමාගේ ද්විතීයික පාසල් සංකල්පය නිසා මේ අවුරුද්දේ දරුවෝ 28 දෙනෙක් ඒ පාසලට ඇතුළත් කළා. ගමේ පාසලේ අඩු පාඩු සියල්ලම හදලා දුන්නා. සමන්පුර මහා විද්‍යාලයට ගමේ සියලුම දරුවන් ඇතුළත් කළා.

ඒ වාගේම හඟරංගල විද්‍යාලයේ පළමුවන පන්තියට 2011 වර්ෂයේ දරුවන් තුන් දෙනායි හිටියේ. මේ අවුරුද්දේ 85 දෙනෙක් ඇතුළත් කළා. හඟරංගල විද්‍යාලය කියන්නේ දුෂ්කර පාසලක්. ඒ වාගේම වේවැල්කඳුර පාසලේ පළමුවන පන්තියට ළමයි 20 දෙනායි හිටියේ. මේ වතාවේ පළමුවන පන්තියට දරුවෝ 32 දෙනෙක් ඇතුළත් වුණා. කුකුළේගම විද්‍යාලය කියා දරුවෝ තුන් දෙනෙක් හිටපු ඉස්කෝලෙට මේ වතාවේ 17 දෙනෙක් ඇතුළත් වුණා. ඒ වාගේම කලවානේ කෝපි කෑල්ල පාසල වහපු ඉස්කෝලයක්. අපේ ජානක බණ්ඩාර මන්ත්‍රීතුමා එදා සබරගමු පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන් සිටි කාලයේ මා එතුමාත් සමඟ ගිහින් වහපු පාසලේ දරුවෝ තුන් දෙනෙක් එක්කාසු කරලා ගුරුවරු දෙදෙනෙක් දීලා පාසලක් විවෘත කළා. මගේ මැතිවරණ කොට්ඨාසයේ කන්දක් උඩ ඉහළම තිබෙන පාසල. ඒ පාසලට දරුවෝ 11 දෙනෙක් මේ අවුරුද්දේ ඇතුළත් වුණා. දැන් දරුවෝ 22 දෙනෙක් සිටිනවා. ඒ විධියට වැහී යන පාසල් ගණනාවක් අපි ඇරියා. ඊළඟට තපස්සර කන්ද විද්‍යාලය කියා විද්‍යාලයක් තිබුණා. මේ විද්‍යාලයට සිංහල එක දරුවායි හිටියේ. ගරු ඇමතිතුමනි, මේක කලවාන නගරයේ තිබුණු ඉස්කෝලයක්. දරුවෝ 12 දෙනායි ඉස්කෝලයටම ඇතුළත් කර හිටියේ. මම ඉස්කෝලයේ නම වෙනස් කළා. කලවාන රාජකීය විද්‍යාලය කියා නම තැබුවා. ඒ ඉස්කෝලයට අවශ්‍ය රුපියල් ලක්ෂ 20ක විතර සම්පත් ලබා දුන්නා. මේ වතාවේ ළමයි 138 දෙනෙක් පළමුවන පන්තියට ඇතුළත් කරලා දැන් 168 දෙනෙක් ඒ ඉස්කෝලයේ ඉන්නවා. රුපියල් පනස් තුන් ලක්ෂයක් දීලා ගොඩනැඟිල්ලක් හදලා තිබෙනවා. ඒක මැයි මාසයේ විවෘත කරනවා. මේ රජයෙන් පාසල්වලට උදව් කළේ නැහැ කියා කාටවත් කියන්න බැහැ. මගේ ආසනය හා අගලවත්ත ආසනය යාබදව කොළඹෑව පාසල කියා ඉස්කෝලයක් තිබෙනවා. පසු ගිය අවුරුද්දේ මේ විද්‍යාලයේ දරුවෝ පස් දෙනෙක් හිටියා. ඒ පස් දෙනා සිටින විට මා ඉස්කෝලයට ගිහින් ඇහුවා, ලබන 2013 අවුරුද්දට පළමුවන පන්තියට දරුවෝ කී දෙනෙක් ඇතුළත් කරනවාද කියා. ගමේම ඉන්නේ හතර දෙනායි. ඒ හතර දෙනාම ඇතුළත් කරනවා; ඉස්කෝලේ හදලා දෙන්න කිව්වා. ඉස්කෝලෙට තීන්ත ගාලා, දැල් ගහලා, වැසිකිළි පද්ධතියක් හදලා දීලා දරුවෝ හතර දෙනෙක් මේ ඉස්කෝලයේ පළමුවන පන්තියට ගන්න රුපියල් ලක්ෂ 7කට වඩා වැඩි වියදමක් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න කනගාටුයි. ඒ ඉස්කෝලය හැදුවාට පසු හිටපු පස් දෙනාත් ජනවාරි මාසයේ අයින් කර ගෙන ගියා.

මා ගිය මාසයේ 14 වැනිදා ඒ ඉස්කෝලයට ගියා. ගිහිල්ලා ගමේ ඔක්කොම අය එකතු කරලා ඇහුවා, "රජයේ සල්ලි ලක්ෂ ගණනක් දීලා හදපු ඉස්කෝලය වැහෙන විධියට කවුද මේ දරුවෝ ටික ගෙනිව්වේ කියලා." මේවා අද මේ යෝජනා ගෙනෙන කට්ටියගේ වැඩ. රට හැම තැනම පෙත්සම් ගැහුවා, "ඉස්කෝලය රජයෙන් වැහුවා" කියලා. ඒ ඉස්කෝලය අපි වැහුවේ නැහැ. ඒ ඉස්කෝලයට අපි අවශ්‍ය කරන සම්පත් දුන්නා. මා මුළු ගමේම කට්ටිය එකතු කරලා මේ ගැන දැනුවත් කළා. දරුවෝ හය දෙනෙකු ගෙනැල්ලා ඊට පහු වැනි සුමානයේ මා ආපසු ඉස්කෝලය විවෘත කළා, ගරු ඇමතිතුමනි. රුපියල් ලක්ෂ හත හමාරක් දීලා හදපු ඉස්කෝලය වහන්න කවුද කටයුතු කළේ? ගමේ මිනිසුන්ට විෂබීජ දාලා, "ඔන්න ආණ්ඩුවෙන් ඉස්කෝල වහනවා" කියනවා. මෙක තමයි අලුත් ක්‍රමය. කරන්න මොකක්වත් නැත්නම් ඉන්න ළමයි ටික අයින් කරලා හරි, "ඉස්කෝලය වහනවා" කියනවා. මා අතිගරු ජනාධිපතිතුමාටත් මේ කාරණය කිව්වා. රුපියල් ලක්ෂ පහක් දීලා ඒ ඉස්කෝලය හදලා, තව රුපියල් ලක්ෂ දෙකක් දීලා වැසිකිළි පද්ධතියකුත් හදලා අවශ්‍ය කරන සම්පත් ලබා දුන්නා.

ගරු ඇමතිතුමාට බොහොම හොඳ සංකල්පයක් තමයි තිබෙන්නේ. ගමේ දරුවෙකුට මේ රටේ ඉහළම තැනකට යන්න තමයි අප මේ ද්විතීයික පාසල් දාහ හදන්නේ. ඒ ද්විතීයික පාසල් දාහත් එක්ක, ප්‍රාථමික පාසල් පන්දාහක් හදන කොට අවට පාසල්වල සිටින දරුවන්ගේ අඩු වීමක් වෙනවා. මා ළඟ තොරතුරු තිබෙනවා. කලවාන කොට්ඨාසයේ පාසල්වල 2005 වර්ෂයේ දරුවන් 10,099ක් හිටියා. 2012 වන කොට ඉන්නේ දරුවන් 8,875යි. මේ අවුරුදු හත තුළ කලවාන කොට්ඨාසයේ පාසල්වල විතරක් දරුවන් 1,224 දෙනෙක් අඩු වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, පාසල්වල ඉන්න දරුවන් ප්‍රමාණය අඩු වෙනවා. ඒකට ඔබතුමාටවත් මටවත් කරන්න දෙයක් නැහැ. මොකද, ඒ නිසා නගරබද පාසල්වලට දරුවෝ වැඩි වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
අපේ ගරු ඇමතිතුමාට මේ ඔක්කෝටම උත්තර දෙන්න තිබෙන නිසා මා වැඩි වෙලා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමාගේ දේශපාලනය ගැන තීන්දුවක් අරගෙන නොවෙයි, ඔබතුමා මේ කටයුතු කරන්නේ. මේ රටේ අනාගතය බාර ගන්න ඉන්න දරුවන් වෙනුවෙන්, අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ඒ වැඩ පිළිවෙළත් එක්ක කටයුතු කරන්නට ඔබතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා - නැත.

[අ.භා. 6.04]

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනතා විමුක්ති පෙරමුණේ විජිත හේරත් මන්ත්‍රීතුමා අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළත් එතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. එතුමා මේ අවස්ථාවේ සභාවේ නැතත්, අධ්‍යාපනය පිළිබඳව විපක්ෂයට කියන්න තිබෙන සියලුම දේ කියන්න ඉඩ හැරලා, අප නිහඬවම එතුමන්ලාට අවස්ථාව ලබා දුන්නා. නමුත් ඒවාට උත්තර දෙනකොට දරුවන්ට ආදරය කරන කිසිම කෙනෙකු විපක්ෂයේ නොසිටීම පිළිබඳව මා කනගාටු වෙනවා.

පසු ගිය කාල පරිච්ඡේදය තුළ, විපක්ෂයේ මන්ත්‍රීවරුන් කරපු කථා අතරින් ගරු යෝගරාජන් මන්ත්‍රීතුමාත්, රවි කරුණානායක මන්ත්‍රීතුමාත්, අජිත් කුමාර මන්ත්‍රීතුමාත් තමයි -අප පිළි ගත්තත්, නොගත්තත්- අධ්‍යාපනය පිළිබඳ සාධනීය වූ කරුණු රාශියක් ඉදිරිපත් කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ රටේ ද්‍රවිඩ ජාතිකයකු ලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා, ඉංජිනේරුවකු විධියට, අධ්‍යාපනයට ගැළපෙන ආකාරයට පාර්ලිමේන්තුව තුළ හැසිරීමේ ආදර්ශය දෙන්න පුළුවන්කම තිබෙන බුද්ධිමත් මන්ත්‍රීවරයෙකු නිසායි එසේ කථා කරන්න ඔබතුමාට පුළුවන්කම ලැබුණේ. ඒ ගැන ඔබතුමාට උගන්වපු ගුරුවරුන්ට ස්තුතිවන්ත වේවා කියලා මා කියන්න කැමැතියි.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

අපි නිදහස් අධ්‍යාපනයේ දරුවෝ. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ලංකාවේ ප්‍රථම අධ්‍යාපන ඇමතිතුමා වශයෙන් නිදහස් අධ්‍යාපනය හඳුන්වා දෙන අවස්ථාවේ පැවසුවේ, "වරප්‍රසාද ලත් සුළු පිරිසකට සීමා වෙලා තිබෙන අධ්‍යාපනය දුප්පතුන්ගේ නිත්‍ය උරුමයක් බවට පත් කරන බව"යි. උපතින් ඉඩ කඩම්, යාන වාහන, හරකා බාන අහිමි පරම්පරාවල දරුවන්ට, නැත්නම් ප්‍රාග්ධනය අහිමි අයට ලාංකීය සමාජ ක්‍රමය තුළ දෙමවුපියන්ට බරක් වෙන්නේ නැතිව දෙපයින් නැඟී සිටින්නට ශක්තිය ලබා දෙන්නටත්, බහුවිධ කුසලතා හා නිර්මාණාත්මක හැකියා සහිත සත්පුරුෂයන් පිරිසක් සමාජයට දායාද කිරීමත් අරමුණු කරගෙන තමයි මධ්‍ය විද්‍යාල සංකල්පය එතුමා හඳුන්වා දුන්නේ.

ඒ අනුව මධ්‍ය විද්‍යාල සංකල්පය හා මහා විද්‍යාල හරහා බිහි වුණු පරම්පරාව තමයි අද දිනයේ විවිධ ක්ෂේත්‍රවල ශ්‍රී ලාංකීය ආර්ථිකයේ ඉහළ තැන්වලට පැමිණ සිටින්නේ. ඒත් අවාසනාවකට වාගේ, ඒ වෙනස කරන අවස්ථාවේදී එවකට තිබුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවත්, එවකට තිබුණු මාධ්‍යයත් එළව එළවා කන්නන්ගර මැතිතුමාට පහර දුන්නා. එතුමාට පහර දෙමින් ඒ අවස්ථාවේ කිව්වේ, "එතුමා මෝඩයෙක්, එතුමා ගොඩයෙක්" කියලායි. එතුමාට "ගොඩයෙක්" කිව්වේ, එතුමා කළුතර දිස්ත්‍රික්කයේ ඉත්තෑපාන කියන ගමේ උපන් නිසා. මෝඩයෙක් කිව්වේ, ලංකාවේ ඈත එපිට ගම්මානවල දරුවන්ටත් අධ්‍යාපනයෙන් ඉහළට නඟින්න අවස්ථාව ලබා දෙන්න උත්සාහ දැරීම මෝඩ ප්‍රයත්නයක් ලෙස සැලකූ නිසා. විශේෂයෙන්ම පළමුවන අධ්‍යාපන ඇමතිවරයා වූ ඒ ඇමතිතුමාට ඉංග්‍රීසි මාධ්‍යය විසින් එල්ල කරපු ප්‍රහාරය තරම් ප්‍රහාරයකට වෙන කෙනෙක් මුහුණ දීලා තිබුණේ නැහැ. එතුමා නිදහස් අධ්‍යාපන පනත ගෙන ඒමෙන් පසු, එහි ප්‍රතිඵලයක් ලෙස, මැතිවරණයට ඉදිරිපත් වුණු අවස්ථාවේ ඒ මැතිවරණයෙන් පරාජයට පත් වුණා. පරාජයට පස්සේ ජීවිතයේ අවසාන භාගයේදී ඉතාම දුඃඛිත තත්ත්වයකට පත් වෙලා, ජීවත්ව සිටින තෙක් ජීවිතය ගෙවීම සඳහා මසකට රුපියල් 500ක දීමනාවකුත්, රුපියල් ලක්ෂයක ප්‍රදානයකුත් මේ ගරු සභාව මඟින් ලබා ගන්න එතුමාට සිද්ධ වුණා.

ඊට කලින් බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී, අතිමහත් බහුතර සිංහල බෞද්ධ පිරිසකට මිෂනාරී අධ්‍යාපනය ක්‍රමය යටතේ සිද්ධ වෙච්ච අසාධාරණය නැති කිරීම සඳහා යුග මෙහෙවරක් ඉෂ්ට කළ යුග පුරුෂයා වුණේ ශ්‍රීමත් අනගාරික ධර්මපාල මැතිතුමායි. එතුමා, හෙන්රි ඔල්කට් මැතිතුමා, මීගෙට්ටුවත්තේ ගුණානන්ද හාමුදුරුවෝ, හික්කඩුවේ ශ්‍රී සුමංගල හාමුදුරුවෝ සමඟ එකතු වෙලා විශාල අභියෝගවලට මුහුණ දෙමින්, තමන්ගේ පෞද්ගලික ඉඩකඩම්, දේපොළ ඇතුළු සියලුම පෞද්ගලික ධනය පරිත්‍යාග කරලා ආනන්දය, ධර්මරාජය, ගාල්ලේ මහින්දය වැනි පාසල් පිහිටුවමින් ලංකාවේ උපනුපන් දරුවන්ට අධ්‍යාපනය ලබන්න පාසල් 122ක් සාදන්න වෙහෙසුණා. එතුමා තරම් බරපතළ ලෙස විවේචනයට, විචාරයට හා නිර්දය ප්‍රහාරයට ලක් වුණු ජන නායකයෙක් අපේ මෑත ඉතිහාසය තුළ නැහැ. බොහෝ දේ දරා ගැනීමේ අසීමිත ශක්තියක් තිබූ එතුමා පාසල් 122ක් හදලා ඒ කර්තව්‍යය කර ගෙන යන කාලයේදී එතුමාට කිව්වේ, "මුට්ටකාසිකාරයෙක්, හොරෙක්" කියලා. ඒ අවස්ථාවේ, බැරිම තැන එතුමා තීන්දුවක් ගත්තා, මේ රට දාලා යන්න. එතුමා ඉන්දියාවට ගිහිල්ලා, බුද්ධගයාව ගොඩනඟලා ඒ ජාතික වැඩ පිළිවෙළ ඉන්දියාව තුළ ක්‍රියාත්මක කරමින් ශාසනික මෙහෙවරක යෙදුණා. එක අවස්ථාවක එතුමා අත් අකුරින් ලියලා සඳහන් කරලා තිබුණා, "මම මිය ගිය පසු බැරි වෙලාවත් ලංකාව පැත්තට හිසවත් හරවන්න එපා" කියලා. ඒ මළ මිනියේ හිසවත් ලංකාව පැත්තට හරවන්න එපා කියලා තමයි පාසල් 122ක් හදලා අධ්‍යාපනයට සේවය කළ අනගාරික ධර්මපාල මැතිතුමා කිව්වේ.

ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යතුමිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තමයි පාසල් රජයට පවරා ගත්තේ. ඒ පවරා ගන්න අවස්ථාවේදී මෙහෙම නොවෙයි විරෝධය තිබුණේ. පාසල් වහලා, පාසල් ඇතුළට දෙමවුපියෝ ඇවිල්ලා, පාසලේ වැඩ කටයුතු නතර කරලා, දෙමවුපියෝ පල්ලියේ මිදුලේ -පාසල තිබෙන තැන- උයලා, පිහලා, කන්න දීලා, පාසල් මාස ගණන් වහලා තමයි උද්ඝෝෂණය කළේ. පාසල් පවරා ගැනීමේ සිද්ධියෙන් පස්සේ ඒ ආණ්ඩුව නැවත බලයට ආවේ නැහැ. ගම් මට්ටමට, බිම් මට්ටමට ගමේ සාමාන්‍ය ජනයාට ඕනෑම වෙනසක් කරන්න යනවා නම්, ඒ වෙනසට එළව එළවා පහර දීම අපේ රට තුළ ඉතිහාසය පුරාම ක්‍රියාත්මක වෙලා තිබෙනවාය කියන එක අපේ ඉතිහාසයේ සාක්ෂිවලින් පැහැදිලි වෙනවා.

අතිගරු ජනාධිපතිතුමා මේ රට නිදහස් කර ගත්තාට පසුව, ආපස්සට ගිට රට නැවත ගොඩනැඟීම සඳහාත්, මේ රටේ සම්පත් හා මිනිස්සු මත වැඩි විශ්වාසය තියලා රට ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීම සඳහාත්, දැනුම කේන්ද්‍රීය සංවර්ධන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහාත්, අධ්‍යාපනයේ දැවැන්ත වූ වෙනසක් කිරීම සඳහාත්, සාමාන්‍ය ගමේ ජනතාවගේ දරුවාගේ අධ්‍යාපනයේ ඇත්ත හැරවුම් ලක්ෂ්‍යයක් නිර්මාණය කිරීම සඳහාත් ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ වගකීම අපට භාර දුන්නා.

එහිදී මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සහිත පාසල් 1,000ක් ප්‍රතිනිර්මාණය කිරීමත්, ඒ මත පදනම් වූ පෝෂිත පාසල් 5,000ක් ළමා මිතුරු ප්‍රවේශයක් සහිත පාසල් ලෙස ගොඩ නැංවීමත් 2012 සිට 2016 දක්වා ආරම්භ වෙලා තිබෙනවා. ඒ අතර කාල පරිච්ඡේදය තුළදී විවිධ ප්‍රශ්න, අර්බුද, චෝදනා, ඇතැම් විට අභූත චෝදනා රාශියක් ලැබෙන්න පුළුවන්. නමුත් අපි නිදහස් අධ්‍යාපනයේ දරුවෝ ලෙස හෘදය සාක්ෂියට එකඟවත්, අවංකවත් නිදහස් අධ්‍යාපනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම සඳහා දිවිහිමියෙන් කැප වෙලා සිටින බව මේ ගරු සභාවේදී මා මතක් කරන්න කැමැතියි. ඉතිහාසයේදීවත් නොවුණු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන මේ අවස්ථාවේදී විපක්ෂයේ විවිධ දේශපාලන අරමුණු තිබෙන ඇතැම් අයගෙන් මෙවැනි ප්‍රහාරයක් එල්ල වන්නේ ඇයි කියන එක මා ඔබතුමාට පැහැදිලි කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකක් තමයි, ඇති හැකි අයගේ දරුවොත්, නැති බැරි අයගේ දරුවොත් කියන දෙගොල්ලෝම දෙමවුපියන්ගේ දරුවෝ. ඔවුන් ජාතියේ සම්පතක්. ඒ දරුවන්ගෙන් ලක්ෂ තුනක්, තුනහමාරක් වර්ෂයකට පළමු ශ්‍රේණියට ඇතුළු වනවා. ඒ ඇතුළු වන දරුවන්ගෙන් ඉතා විශාල ප්‍රමාණයක් 1 සිට 5 ශ්‍රේණිය දක්වා ප්‍රාථමික අධ්‍යාපනය සාර්ථකව නිම කරනවා. සමහර වෙලාවට ගුණාත්මක වශයෙන් යම් යම් ප්‍රශ්න තිබෙන්න පුළුවන්. නමුත් ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්තානය, නේපාලය, භූතානය, ඇෆ්ගනිස්ථානය වැනි රටවල් සමඟ සාපේක්ෂව සැසඳීමේදී අපේ ප්‍රාථමික අධ්‍යාපනය තිබෙන්නේ ලෝකයේ ඉතාම ඉහළ මට්ටමක. ඒත් ද්විතීයික අධ්‍යාපන ලබලා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය වන විට ලක්ෂ ගණනක් සමාජගත වෙනවා. එතැනින් එහාට අධ්‍යාපනයක් ලබන්නේ නැහැ. සියයට 60ක්, 65ක් පමණයි උසස් පෙළ අධ්‍යාපනය ලබන්න ඉදිරිපත් වෙන්නේ. ඔවුන් 12, 13 ශ්‍රේණිවලදී අධ්‍යාපනය ලබලා, උසස් පෙළ විභාගයට පෙනී සිටීමෙන් පස්සේ අපි විශ්වවිද්‍යාලට ඇතුළු කර ගන්නේ 20,000ක්, 25,000ක් පමණයි. උසස් පෙළ විභාගය විශ්වවිද්‍යාලයට දරුවන් ඇතුළු කර ගැනීමේ විභාගයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, අපේ ගජදීර ඇමතිතුමාත් දන්නවා ඒ කාලයේ විශ්වවිද්‍යාලයට ඇතුළු

කර ගත්තේ University Entrance Exam කියලා වෙනම විභාගයක් පවත්වලා බව. උසස් පෙළ විභාගය තිබෙන්නේ විශ්වවිද්‍යාලයට ළමයින් ඇතුළත් කර ගන්න නොවෙයි. දරුවෙකුගේ පළමු වැනි ශ්‍රේණියේ සිට ආරම්භ වන අධ්‍යාපනය සාමාන්‍ය පෙළ, උසස් පෙළ දක්වා ගිහින් ඒ දක්වා ලබා ගත්ත සාධන මට්ටම නිර්ණය කිරීමේ විභාගයක් තමයි අ.පොෂ (උසස් පෙළ) පරීක්ෂණය. එහිදී තව ලක්ෂ ගණනක් සමාජගත වෙනවා, විශ්වවිද්‍යාල ප්‍රවේශය හෝ ඉහළ අධ්‍යාපනය නොලබා. දැන් සෑම වර්ෂයකදීම ලක්ෂ තුනක්, තුනහමාරක් අධ්‍යාපන පද්ධතියට ඇතුළු වන කොට, එයින් 25,000ක් පමණ විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන කොට, වර්ෂ ගණනක් මේ අධ්‍යාපන කඩ ඉමේ ගිහිල්ලා සෑම වර්ෂයකදීම ලක්ෂ තුනක් පමණ දරුවෝ නිසි දක්ෂතා, කුසලතා හා නිර්මාණාත්මක හැකියාවන් අත්පත් කර නොගෙන විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය විසින් අතර මං කරනවා. ඒ දරුවන්ට එසේ වෙලා තිබෙන්නේ අපේ අධ්‍යාපනයේ සම්පත් බෙදී යෑමේ විෂමතාව නිසා කියලා අපි පැහැදිලිව පසු ගිය කාලය තුළදී තේරුම් බේරුම් කර ගත්තා. මක්නිසාදයත් උසස් පෙළ හදාරන දරුවන්ගෙන් සියයට 21ක් පමණයි විද්‍යා සහ ගණිත අංශයෙන් අධ්‍යාපනය ලබන්නේ. ඈත එපිට ගම්මානවල පාසල්වල විද්‍යාගාර නැහැ. විද්‍යා ගුරුවරු නැහැ. විද්‍යා ගුරුවරයාව අපි ඒ ප්‍රදේශයට යැවිවත් විවිධ හේතූන් හදා ගෙන -ඉස්සර කාලයේ- නගරයට මාරු වෙනවා. ඒ නිසා 1AB එකම පාසලක්වත් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ක් තිබෙනවා.

තමුන්නාන්සේ කිව්වා හරි. සබරගමුව පළාතේ දෙමළ මාධ්‍යයෙන් උසස් පෙළ විද්‍යා අංශයෙන් අධ්‍යාපනය ලබන්න එකම පාසලක්වත් තිබුණේ නැහැ. මුස්ලිම් ප්‍රදේශවලත් එහෙමයි. මේ නිසා සියයට 21ක දරුවන් ප්‍රමාණයකටයි විද්‍යා, ගණිත අංශයෙන් අධ්‍යාපනය ලබා දුන්නේ. වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගණිතඥයන්, විද්‍යාඥයන්, පර්යේෂකයන්, නව නිපැයුම්කරුවන් කියන විද්‍යාත්මක චින්තනයක් සහිත අය බිහි කරන්න දරුවන්ගෙන් සියයට 21කටයි අධ්‍යාපනය ලබා දුන්නේ.

ලෝකයේ රක්ෂා අවස්ථා බහුල ලෙස තිබෙන්නේ; ජීවනෝපාය වැඩිය තිබෙන්නේ; රක්ෂා ඉල්ලා සිටින අය නොවෙයි, රක්ෂා ලබා දෙන අය බිහි කරන්නේ වාණිජ අංශයෙන්. ඒ අය ව්‍යවසායකයන් ලෙස හඳුන්වනවා. අවදානමකට මුහුණ දෙමින්, යම් යම් තීන්දු තීරණ අරගෙන තව ලක්ෂ ගණන් පිරිසකට කර්මාන්තශාලා, ව්‍යාපාර, වෙනත් පරිශ්‍රයනාදිය තුළින් රැකියා අවස්ථා ජනිත කරනවා. ඒ ක්ෂේත්‍රය ගෝලීයකරණය යටතේ දිනෙන් දින වැඩෙනවා.

බැංකු, රක්ෂණය, ප්‍රවාහනය, ගබඩාකරණය, සන්නිවේදනය, සංචාරක, අලෙවිකරණය, කළමනාකරණ ක්ෂේත්‍ර ඒ යටතට වැටෙනවා. හැබැයි අධ්‍යාපනය ලබන්නේ දරුවන්ගෙන් සියයට 27යි. වාණිජ විද්‍යාගාර නැහැ. ගණකාධිකරණ ගුරුවරයෙක් නැහැ. ආර්ථික විද්‍යාවට ගුරුවරයෙක් ඈත පළාත්වලට දෙන්න බැහැ. උපාධිධාරී ගුරුවරයා දැම්මත් ටික දවසකින් ආපහු මාරුව හදාගෙන එනවා. ඒ නිසා සියයට 27යි වාණිජ අංශයෙන් අධ්‍යාපනය ලබන්නේ.

සියයට 51ක් දරුවන් උසස් පෙළ කලා අංශයෙන් අධ්‍යාපනය ලබනවා. ඔවුන් විෂයයන් වශයෙන් තෝරා ගන්නේ මොනවාද? සිංහල භාෂාව, බෞද්ධ සංස්කෘතිය, දේශපාලන විද්‍යාව. ඒ සියයට 51ක් කියන්නේ භාගයකට වැඩි පිරිසක්. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කලා උපාධිධාරී පාඨමාලාවන් වැඩි වශයෙන් තිබුණු නිසා සිංහලයි, බෞද්ධ සංස්කෘතියයි, දේශපාලන විද්‍යාවයි කරලා, කලා උපාධිධාරීන් තොග වශයෙන් බිහි වුණා. ඒ අය ඉගෙන ගත්ත දේට සරිලන රැකියාවක් තිබුණේ නැහැ. තිබෙන රැකියාවලට අවශ්‍ය උගතුන් බිහි වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා නිදහස් සෞඛ්‍යයට හෙද, හෙදියන් බඳවා ගන්න අපොස උසස් පෙළ සමත් අය සෙව්වා. හෙද, හෙදි වෘත්තිය සඳහා, ඈත එපිට දිස්ත්‍රික්කවල උසස් පෙළ විද්‍යා අංශයෙන් සමත් අය අවශ්‍ය ප්‍රමාණයට සොයා ගන්නට කිසිසේත් පුළුවන්කමක් තිබුණේ නැහැ. මම මේ පාසල් දහසේ සංකල්පය යටතේ අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් ඉංග්‍රීසි මාධ්‍ය උපාධිධාරීන් දහසක් මේ පාසල්වලට යවන්න බඳවා ගන්න උත්සාහයක් දැරුවා. ඉංග්‍රීසි උපාධිධාරීන් දෙසීයහැට දෙනෙකු පත්වීම් ගත්තා. අද වෙන කොට පත්වීම් අරගෙන පාසල්වලට ගිහිල්ලා වාර්තා කරලා තිබෙන්නේ අනූතුන් දෙනයි. ඉංග්‍රීසි ගුරුවරුන් වශයෙන් උපාධිධාරීන් දහසක් බඳවා ගන්න රජය අනුමැතිය දීලා ඒ අනුව දෙසීය අනූදෙනෙකු පත්වීම් ලිපි අරගෙන තිබුණත්, ජනාධිපතිතුමා අය වැය ලේඛනයේ සඳහන් කළ පරිදි පාසල් පාදකව ඔවුන් බඳවා ගැනීම නිසා - school-based appointments දීපු නිසා- අනූතුන් දෙනායි තවම පත්වීම් භාර අරගෙන තිබෙන්නේ. තව නවසිය ගණනකට ඉංග්‍රීසි ගුරු පත්වීම් තිබෙනවා. හැබැයි උපාධිධාරීන් නැහැ. ඒ නිසා අපි ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබා ගන්න කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා. බලහත්කාරයෙන් ගිහිල්ලා උද්ඝෝෂණ කළාය, පිකට්ං කළාය කියලා ඉංග්‍රීසි ගුරුවරයා දාන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ අයට, ඊට වඩා විවිධ අවස්ථා පෞද්ගලික අංශයේ තිබෙනවා නම් ඒ අය ගුරුවරුන් වශයෙන් එන්නේ නැහැ.

මේ සමාජයේ රැකියා විශාල ප්‍රමාණයක් තිබෙන විවිධ ක්ෂේත්‍ර තිබෙනවා. ගුවන් නියමුවෝ ඉන්නවා. වරාය කේන්ද්‍රීය සංවර්ධනයක්, ගුවන් කේන්ද්‍රීය සංවර්ධනයක්, බල ශක්ති කේන්ද්‍රීය සංවර්ධනයක්, වාණිජ හා වෙළෙඳ කේන්ද්‍රීය සංවර්ධනයක් සඳහා අපි ගමන් කරනවා. මෙවැනි සංවර්ධන ඉලක්ක සාක්ෂාත් වෙන කොට, ආර්ථිකය ප්‍රසාරණය වෙන විට දැනුම කේන්ද්‍රීය සංවර්ධනය තුළින් අවශ්‍ය දැනුම් සම්භාරය රටේ දරුවන්ට එකතු කරන්න ඕනෑ. එහෙම එකතු කරන්න බැරිවීම නිසා පසු ගිය දශක තුන තුළ සිද්ධ වුණේ මොකක්ද? ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාට කිසි අයිතියක් නැහැ, ඒ ගැන කථා කරන්න. මොකද, පෑන, පැන්සල, පොතපත අතට දෙන්න ඕනෑ තරුණයන්ට සයනයිඩ් කරලක් බෙල්ලේ ගැට ගහලා, මුහුදු වෙරළෙන් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක් වශයෙන් වෙනම රටක් ලෙස කඩා ගැනීම සඳහා මරා ගෙන මැරෙන්න කියා උගන්වපු එක තමයි එතුමන්ලාගේ කාලයේ කළේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ කාලයේ. දැන් ඕවා ජීනීවාවලට ගිහින් කියන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එදා අපි කුඩා කාලවල වෛද්‍ය විශේෂඥයන්, ගණකාධිකාරිවරුන්, දිසාපතිවරුන්, උපදිසාපතිවරුන්, ඉංජිනේරුවරුන් වශයෙන් මේ රටේ පාලනයට හවුල්කරුවන් බවට පත් වුණු වැඩි පිරිසක් ද්‍රවිඩ ජාතිකයන්. නමුත් ප්‍රභාකරන් ඇතුළු එල්ටීටීඊ එක තමන්ගේ වර්ගයට, තමන්ගේ වර්ගයේ දරුවන්ට කරපු විනාශය මුදලින් තක්සේරු කරන්න බැහැ. ඒ පසු බැම නිසා අද මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සහිත පාසල් දහස යටතේ ඒ ප්‍රදේශවල, උතුරු නැගෙනහිර පළාතේ හැදෙන ද්විතීයික පාසල් සඳහා උපාධිධාරීන් සොයා ගන්න බැහැ. ඔවුන්

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

අවුරුදු 30ක් යුද්ධය කළා. ළමා සොල්දාදුවන් ලෙස යුද්ධයට ළමයින් බඳවා ගත්තා. යුද්ධයේදී ඔවුන් නැති වුණා. ඒ ප්‍රදේශවල ප්‍රචණ්ඩත්වය ඇති වුණා. දකුණේත් ඒකම සිද්ධ වුණා, ඊට පෙර සිට. 1971 කැරැල්ලට, 1989 කැරැල්ලට මේ අධ්‍යාපනය වගඋත්තරකරුවකු වනවා. ඇයි? අවුරුදු 20ක්, අවුරුදු 22ක්, අවුරුදු 25ක්වන කොට ඔවුන් ජීවිතය ගොඩ නහන්න අපේක්ෂා කරනවා. තමන් ලබා ගත් අධ්‍යාපනයට අනුව රක්ෂාවක් ලැබෙන්නේ නැහැ. එම නිසා ජීවනෝපායයක් සලසා ගන්න බැහැ. ගෙදරට බරක් වෙලා තව දුරටත් ඉන්න බැහැ. එම අවස්ථාවේදී මේ දේශපාලන න්‍යායවාදියෝ ඇවිල්ලා, ඔවුන් තුළ වෛරය පමණක් ඇති කරලා, වෛර දේශපාලනය තුළ දං ගෙඩිය දක්වා ඔවුන් අරගෙන ගියා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
න්‍යායවාදියෝ නොවෙයි යක්ෂයෝ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

එම අවස්ථාවේදී ඒ තරුණ තරුණියන්ගේ හිත්වලට දුන්නු අදහස්වලට අනුව ඔවුන් පළමුවෙන් තමන් හැදූ වැඩූ දෙමවුපියන්ට වෛර කළා; තමන්ට ඉගැන්වූ පාසලට, ගුරුවරුන්ට වෛර කළා. ඊට පස්සේ සමස්ත සමාජයටම වෛර කරලා හිනැහෙන්න බැරි පිරිසක් බවට පත් වුණා. හිනැහෙන්නේ නැතුව ඔවුන් පළි ගත්තා. ඔවුන් සමස්ත සමාජයේම පාසල් ටික ගිනි තැබුවා. ඔවුන් විදුහල්පතිගේ ගෙදරට ආවා, T56 එකක් අරගෙන. ඊට පස්සේ විදුහල්පතිතුමාට දණ ගහන්න කිව්වා. දණ ගහපු විදුහල්පතිට කිව්වා, "ඔළුව වැඩියි. තට්ටය ගාන්න ඕනෑ"යි කියලා. ඊට පස්සේ විදුහල්පතිතුමාව අරගෙන ගිහින් ගහේ බැන්දා. ගහේ බැඳලා මැරුවා. මරලා දණිස්සට පහළින් මිනිය අරගෙන ගිහින් වළලන්න කිව්වා. මනුස්සකම දණිස්සෙන් පහළට දැම්මා. මේ රටේ දරුවන් පාරට ඇදලා දැම්මා. මේ විෂබීජ තුළ පාසල බේරා ගැනීම සඳහා දෙමවුපියන්ට පාසල් තාප්පයේ ලියන්න සිද්ධ වුණා, "මෙය ඔබේ දරුවාගේ පාසලයි" කියලා. මේ අධ්‍යාපනයට අවශ්‍ය වෙනස නොකිරීම නිසා උතුරේත්, දකුණේත් සමස්ත සමාජයේ නිදහස් අධ්‍යාපනයේ දරුවෝ තමන් හැදූ වැඩූ දෙමවුපියන්ට, උපන් බිමට ආදරය කරන්නේ නැති පිරිසක් බවට පත් වුණා. ඔවුන්ට පාසලට ගිනි තබන්න පුළුවන් නම්, කෘෂි සේවා මධ්‍යස්ථානයට ගිනි තබන්න පුළුවන් නම්, තමන්ට ඉගැන්වූ ගුරු හාමුදුරුවන් මරන්න පුළුවන් නම්, තමන්ට ඉගැන්වූ විදුහල්පති හාමුදුරුවන් මරන්න පුළුවන් නම්, විදුහල්පතිව මරන්න පුළුවන් නම් ඒ ලබා දුන්නු අධ්‍යාපනයෙන් ඇති ඵලය කුමක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

දශක තුනක් අපේ රටේ ඉතිහාසය ලේවලින් ලිව්වා. මේ දශක තුනේම අපට ඇහුණේ යකඩ ගැටෙන අමිහිරි ශබ්දයයි; අපට දැනුණේ උණ්ඩයේ අමිහිරි සුවඳයි. හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ තරුණ අසහනය පිළිබඳව වාර්තාවක් සකස් කරන්න කියලා කිව්වා. ඒ වාර්තාව සකස් කිරීම භාර වුණේ මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමාටයි. මේ කරුණු විභාග කර බලා එතුමා කිව්වා, "මේ තරුණයන්ට වෛරය දීලා මෙහෙම කුලප්පු කරන්න පුළුවන්කම ලැබුණේ, මේ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වෙනුවට මානව හිතවාදී දරුවන් පිරිසක් හදන අධ්‍යාපන ක්‍රමයක් කළේ නැති නිසා"යි කියලා. එතුමන්ලාමයි අද දවසේ මේ යෝජනාව ගෙනෙන්නේ.

මේ තත්ත්වය හොඳින් තේරුම් ගෙන, රාජ්‍ය නායකයා ලෙස අතිගරු ජනාධිපතිතුමා තීන්දුවක් ගත්තා, මේ රටේ කොළඹ නගරයේ, ගාල්ල නගරයේ, මාතර නගරයේ, කුරුණෑගල නගරයේ, මහනුවර නගරයේ, යාපනය නගරයේ යම් කිසි පාසලක මොනවා හෝ පහසුකමක් තිබෙනවා නම්, එවැනි පහසුකම් සහිතව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අඩුම වශයෙන් පාසල් තුන බැගින් ද්විතීයික පාසල් දහසක් ප්‍රතිනිර්මාණය කළ යුතුයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට සිතියම්ගතකරණය කරලා මේ පාසල් දහසෙන් පාසල් 834ක් තෝරා ගෙන තිබෙනවාය කියන කාරණය මම ඔබතුමාට සඳහන් කරන්න ඕනෑ. එහි උතුරු නැඟෙනහිරත් සහිතව දෙමළ මාධ්‍ය පාසල් 206ක් තිබෙනවා. විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය ඇමතිතුමා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසය වන රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ප්‍රදේශයේ මේ ද්විතීයික පාසල පිහිටුවන විට විද්‍යා අංශයක් කවදාවත් තිබුණේ නැති ඒ වතුකරේ ජනතාවට විද්‍යා අංශය සහිත මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරයත් ඉදි වනවා.

ඊට පස්සේ රත්නපුර දිස්ත්‍රික්කය අවසන් වන විට ඊට මෙහායින් තිබෙන අවිස්සාවෙල්ලේ තිබෙන ද්‍රවිඩ පාසලේ ප්‍රාථමික අංශය අපි ඉවත් කළා. ඉවත් කරලා ඊට කිට්ටුව වත්තේ වෙන කොටසක් අරගෙන ප්‍රාථමිකය පළාත් සභාව විසින් හදන අතර, ද්විතීයිකය අපි සංවර්ධනය කරනවා. හැබැයි මේ ද්‍රවිඩ පාසල්වලට වඩා වෙනස් ප්‍රතිපත්තියක් මුස්ලිම් ජනතාව සිටින ප්‍රදේශවල මේ වැඩ පිළිවෙළේදී පාවිච්චි කළා.

ප්‍රාථමිකය ඉවත් කර ගැනීමට මුස්ලිම් ප්‍රදේශවල දෙමවුපියෝ ඇතුළු ව්‍යාපාරික ප්‍රජාව එකතු වෙලා ස්වකැමැත්තෙන් ඒ ඉඩම් සල්ලිවලට ගත්තා. සමහර තැන්වල ප්‍රාථමිකය ඔවුන්ගේ සල්ලිවලින් හැදුවා. ද්විතීයිකය අපට හදා දෙන්න කිව්වා.

මම උදාහරණයක් ලෙස සඳහන් කළොත්, බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාසයේ අටලුගම කියලා ගමක් තිබෙනවා. ඒ ගමේ 26,000ක මුස්ලිම් ජනතාවක් ජීවත් වනවා. ඒ ගමට එක පාසලයි තිබෙන්නේ. හැබැයි කවදාවත් ඒ 26,000න් කිසිම මුස්ලිම් ජාතිකයෙක් ඒ ගමේ පාසලට ගිහිල්ලා ඉගෙන ගෙන කිසි දවසක විශේෂඥ වෛද්‍යවරයෙක්, ඉන්ජිනේරුවෙක්, ගණකාධිකාරිවරයෙක් වෙලා නැහැ. ඒ නිසා ඒ පළාතේ ද්විතීයික පාසල හදන කොට; ඒ සංකල්පය අරගෙන එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ තිබෙන අනෙක් පක්ෂ ඔක්කොටම අයත් මුස්ලිම් ජාතිකයෝ එකතු වෙලා රුපියල් කෝටි එක හමාරකට ඉඩමක් සල්ලිවලට ගත්තා. මම ඒ ප්‍රදේශයට ගිය අවස්ථාවකදී ඒ ප්‍රදේශයේ අම්මලා මට කිව්ව ආකාරයට තමන්ගේ විවාහයේදී දමන ඉතාම වටිනා තැල්ලක් වාගේ ආභරණයක්- ඒකට වෙන වචනයක් කිව්වා, මම හරියට දන්නේ නැහැ. [බාධා කිරීමක්] "තාලිය" කියන ඒ රත්තරන් ආභරණයත් ඒ සම්මාදමට දමා අවශ්‍ය මුදල් සියල්ල එකතු කරලා තමයි ඒ මුස්ලිම් ජනතාව රුපියල් කෝටි එක හමාරකට ඉඩමක් අරගෙන ඒ ගත් ඉඩමේ ප්‍රාථමිකය හැදුවේ කියලා. ද්විතීයික පාසල හැදීම අපි ආරම්භ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පාසලක් පටන් ගත්තා, කුලියාපිටිය මැතිවරණ කොට්ඨාසයේ කැකුණගොල්ලේත්. කැකුණගොල්ලේත් ප්‍රාථමිකය ඉවත් කරන්න, මේ ප්‍රදේශයේ මුස්ලිම් ව්‍යාපාරික ප්‍රජාවත්, දෙමවුපියනුත් එකතු වෙලා ඉඩමක් අරගෙන ප්‍රාථමිකය හැදුවා. ද්විතීයිකය අපෙන් ඉල්ලා ගත්තා.

මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා නියෝජනය කරන නාවලපිටිය මැතිවරණ කොට්ඨාසයේ මුස්ලිම්වරුනුත් ඒ ක්‍රියා මාර්ගයම ක්‍රියාත්මක කළා. අපේ සිංහල දරුවන් ඉගෙන ගන්නා ප්‍රාථමිකය ඉවත් කරන කොට සමහර බංකොලොත් දේශපාලන පක්ෂ ඒ දරුවන්ගේ අම්මලා පාරේ බුදි කරවද්දි, මුස්ලිම් ජනතාව අලුත් ආදර්ශයක් තමන්ගේ දරුවෝ වෙනුවෙන් රටට පෙන්වා දුන්නාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ ඔවුන් ඒක තේරුම් ගත් නිසායි. මේ නිදහස් අධ්‍යාපනයේ වෙනසට කරන ප්‍රහාරය එන්නේ මොකද කියන එක පිළිබඳව ඔවුන් දැන ගත්තා.

මේ කිසිවෙකුත් මේ පාර්ලිමේන්තුවේ කථා කළේ නැති; මාධ්‍යය තුළ වත් කිසිම ප්‍රහාරයක් එල්ල වන්නේ නැති ඇති හැකි අයගේ අධ්‍යාපනය සහ නැති බැරි බහුතර පිරිසගේ අධ්‍යාපනය අතර ප්‍රධාන වෙනස්කම් පහක් තිබෙනවා. එය ඇති වන්නේ කෙසේද? මේ සභාවේදී ඒ ගැන කථා වෙලා නැහැ. මේ ගරු සභාවට මම බොහොම වග කීමකින් යුතුව එම කරුණු ඉදිරිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයට පවරා නොගත් පාසල් 78ක් තිබෙනවා. මේ පාසල් 78න්, 36ක් රජයේ ආධාර ලබනවා. ඒ 36ට රජයේ ආධාර වශයෙන් ලැබෙන මුදලින් ගුරුවරුන්ට වැටුප් ගෙවීම සඳහා වර්ෂයකට රුපියල් මිලියන 704ක් ලබා දෙනවා. ඒ කියන්නේ බදු ගෙවන ජනතාවගෙන් රුපියල් මිලියන 704ක් පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ට වැටුප් ගෙවන්න අපි ලබා දෙනවා.

ඒ පුද්ගලික පාසල්වල ජාතියේ දරුවෝ 123,519දෙනෙක් ඉගෙනුම ලබනවා. ගුරුවරු 5,474දෙනෙක් ඉන්නවා. St. Thomas' College, St. Joseph's College, St. Peters College, St. Benedict's College, Zahira College, Musaeus College, Carey College, Ladies' College, Bishop's College, St. Anthony's College, Trinity College, Holy Cross College, Holy Family Convent, Wesley College, De Mazenod College, Hillwood College එම පුද්ගලික පාසල්වලින් සමහරක්. ශාන්ත ජෝෂප් විද්‍යාලයේ ශිෂ්‍යයෝ 5,787දෙනෙක් ඉන්නවා. ශාන්ත පීතර විද්‍යාලයේ ශිෂ්‍යයෝ 5,826ක් ඉන්නවා. සහිරා විද්‍යාලයේ 4,736ක් ඉන්නවා. මියුසියස් විද්‍යාලයේ 5,632ක් ඉන්නවා. මේවා පෞද්ගලික පාසල්. ඒවායෙන් සමහරක් රජයෙන් වැටුප් ලබනවා. සමහර ඒවා එහෙම නැහැ. හැබැයි වටිනා මනුෂ්‍ය ජීවිත 123,000කට වඩා වැඩි ප්‍රමාණයක් හොඳින්, විනය ගරුකව, ඉතාම ශික්ෂණයෙන් යුතුව, ඉතාම කැපවීමෙන් යුතුව, ඉතා විශාල වගකීමක් සහිතව, ඉලක්කයක් ඇතිව, ක්‍රීඩා කෞශල්‍යයෙන් යුතුව ඉගෙනුම ලබනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, ජාත්‍යන්තර පාසල් පද්ධතියකුත් ඇති වුණා. ඒ ජාත්‍යන්තර පාසල්වලත් ලක්ෂ තුනකට ආසන්න දරුවෝ පිරිසක් ඉගෙනුම ලබනවා. ලක්ෂ හතරක් පහක් පමණ වන ඒ දරුවනුයි, අපේ පාසල්වලට යන දරුවනුයි අතර බොහෝ අවස්ථාවලදී පෙනෙන වෙනස්කම් 5ක් තිබෙනවා. ඒ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. අපේ පාසල්වලට දරුවන් ඇතුළත් කිරීම සඳහා මව්පියෝ දරුවා ඉපදෙන්නත් කලින් උප්පැන්නය හදනවා; වතුර බිල වෙනස් කරනවා; විදුලිය බිල වෙනස් කරනවා; ගෙවල් කුලියට ගන්නවා; ගෙවල්වලට ගිහිල්ලා කලින් පදිංචි වෙනවා. දරුවා පාසලට දැමීම පිළිබඳව තමයි දරුවා ඉපදෙන්නත් කලින් සිතන්නේ. එහෙම සිතුවාට ඒ සියලු දරුවන් ඒ පාසල්වලට ඇතුළත් කර ගන්න ඉඩක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මේ වර්ෂයට අදාළ සංඛ්‍යා ලේඛනයක් මා ඉදිරිපත් කරනවා. කොළඹ රාජකීය විද්‍යාලයේ 2013 වර්ෂයේ පළමුවැනි වසරට සිසුන් ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර ලැබුණා 2,429ක්. එහි පළමුවැනි ශ්‍රේණියේ පන්ති 10යි තිබෙන්නේ. 411දෙනකු පමණයි ඇතුළත් කර ගත්තේ. අනෙක් දරුවන් 2,018 දෙනාගේම මව්පියෝ කියනවා තම දරුවා කොහොම හරි රාජකීය විද්‍යාලයට ඇතුළත් කර දෙන්න කියලා. විශාඛා විද්‍යාලයට 1,908දෙනෙක් ඉල්ලුම් කළා. 210 දෙනකු පමණයි ඇතුළත් කර ගත්තේ. තවත් 1,698 දෙනකුට ඒ පාසලට යන්න ඉඩ නැහැ. පානදුර සුමංගල බාලිකා විද්‍යාලයට 725 දෙනෙක් ඉල්ලුම් කළා. 210 දෙනකු පමණයි ඇතුළත් කර ගත්තේ. මහනුවර ධර්මරාජ විද්‍යාලයට 1,105 දෙනෙක් ඉල්ලුම් කළා. 210 දෙනකු පමණයි ඇතුළත් කර ගත්තේ. 895 දෙනකුට ඉඩ නැහැ. මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයට 1,239 දෙනෙක් ඉල්ලුම් කළා. 205දෙනකු පමණයි ඇතුළත් කර ගත්තේ. 1,034 දෙනකුට ඉඩ නැහැ. මාතර රාහුල විද්‍යාලයට ඉල්ලුම් කළා 961 දෙනෙක්. ඇතුළත් කර ගත්තේ 245 දෙනකු පමණයි. 716 දෙනකුට ඉඩ නැහැ. මාතර සුජාතා බාලිකා විද්‍යාලයට ඉල්ලුම් කළා 800 දෙනෙක්. ඇතුළත් කර ගත්තේ 207 දෙනකු පමණයි. මේ විධියට සියලු පාසල් ගැන කියන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විස්තරය ඇතුළත් ලේඛනය මගේ කථාවේ කොටසක් ලෙස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියලා ඉල්ලා සිටිමින් මම එය **සභාගත*** කරනවා.

මට නොවෙයි කිසිම අධ්‍යාපන ඇමතිවරයකුට මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මොකද, මේ පාසල් කීපයට දරුවා ඇතුළත් කිරීම සඳහා දෙමව්පියෝ පොරබදනවා. හැබැයි ඇති හැකි කවුරුවත් දරුවකු පාසලට දැමීම ගැන පොඩ්ඩක්වත් සිතන්නේ නැහැ. ඇයි ඒ? අය කරන මුදල ගෙව්වාම තමන්ගේ ළමයා පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසලකට ඇතුළත් කරන්න ඒ අයට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්තරා පෞද්ගලික පාසලක 2013 වර්ෂයට පමණක් එක දරුවකු වෙනුවෙන් අය කර තිබෙන ගාස්තුව රුපියල් 303,750යි. විගණනය කළාම අපේ අමාත්‍යාංශය සොයා ගත් තොරතුරු අනුව, 2013 වර්ෂයට දෙමව්පියෝ එක දරුවකු වෙනුවෙන් ඒ පාසලට ගෙවලා තිබෙනවා රුපියල් 303,750ක්. ඒ, මුදල් අය කරන පාසලක්. ඇති හැකි අයට කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත්, අර පොල් ගෙඩි 8 සහ රුපියල් 800 සම්බන්ධයෙන් සමාජ සංවාදයක් ඇති කරන්නේ නැති බැරි අයගේ කතන්දරය තවත් හැල්ලුවට ලක් කරන්නයි. එතකොට ඒ එක වෙනසක්.

දෙවැනි වෙනස තමයි, සාමාන්‍යයෙන් අපේ රටේ ප්‍රාථමික අධ්‍යාපනය ලබන්නේ මවු භාෂාවෙන්; සිංහල හෝ දෙමළෙන්. මවුගේ උකුලේ නැළවෙනකොට අපිට කථා කරපු භාෂාවෙන් තමයි අපි මූලික අධ්‍යාපනය ලබන්නේ. ඒ ලෝකයේ පිළිගැනීම. ජර්මනියේ ජර්මන් භාෂාවෙනුත්, ප්‍රංශයේ ප්‍රංශ භාෂාවෙනුත්, චීනයේ මැන්ඩරින් භාෂාවෙනුත් වශයෙන් තමන්ගේ මවු භාෂාවෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබන්නට ඕනෑ කියලා තමයි UNESCO එකෙන් කියන්නේ. හැබැයි, ඇති හැකි අයගේ දරුවන් අද පළමුවැනි පන්තියේ ඉඳලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබනවා. සිංහල අම්මා ඇවිල්ලා සමහර වෙලාවට අපටම කියලා තිබෙනවා, "දරුවාට ඉංග්‍රීසි නම් හොඳටම පුළුවන්, පොඩි ප්‍රශ්නයකට තියෙන්නේ සිංහල භාෂාවයි. සිංහල උගන්වන්න

**** කථාව අවසානයේ පළ කර ඇත.***

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

හාමුදුරු කෙනෙක්වත් සොයසොයා ඉන්නේ" කියලා. දරුවන්ට උගන්වන්නේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඊළඟට තුන්වැනි වෙනස මේකයි. අපේ දරුවන් විතරක් නොවෙයි, දරුවන්ගේ අම්මලාත් අතිරේක පන්තිවලට ගිහින් පහ වසර ශිෂ්‍යත්ව විභාගයට දරුවන් ඉදිරිපත් කරනවා. දරුවාට ළමා කාලයක් දෙන්නේ නැතිව, දරුවාගේ ළමා කාලය උදුරා ගෙන ඔවුන්ව පහ වසර ශිෂ්‍යත්ව විභාගයට යවනවා. හැබැයි, ඇති හැකි අයගේ දරුවාට swimming, dancing, music උගන්වමින් ළමා කාලය ගත කරන්න දෙනවා. ඒ දරුවන්ව ශිෂ්‍යත්ව විභාගයට වාඩි කරවන්නේම නැහැ. ඊළඟට හතරවැනි වෙනස මේකයි. ඇති හැකි අයගේ දරුවාට 10,11 වසරවල උගන්වන්නේ, Chemistry, Physics, Zoology, Botany, Accounts, Economics. ඒ දරුවන්ට රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ගණකාධිකරණය යන මේවා තමයි 10,11 වසරවල උගන්වන්නේ. අපේ ළමයින්ට 10, 11 වසරවල දී උගන්වනවා, අනිවාර්ය විෂයයන් හයක්. ඊළඟට, මේ basketවලින් තුනක් තෝරා ගන්න කියලා කියනවා. අපේ දරුවා අපොස සාමාන්‍ය පෙළ විභාගයට ඉදිරිපත් වෙද්දී, ඇති හැකි අයගේ දරුවා British Council එකෙන් පවත්වන London O/Level Exam එකට ඉදිරිපත් වෙනවා. ඊට පසුව මේ සහතික දෙකම එක සමාන - equal - කරනවා. ඒ ජාත්‍යන්තර විභාගවල ප්‍රශ්න පත්‍ර අපේ විභාගවල ප්‍රශ්න පත්‍රවලට වඩා බොහොම ලේසියි. ඒ ප්‍රශ්න පත්‍රවල කොම්බු, ඉස්පිලි, පාපිලි වැරැදියි කියලා බලු කපුටෙක්වත් කියන්නේ නැහැ. ඒවා ගැන කිසිම උද්ඝෝෂණයක් නැහැ. ඒ ප්‍රශ්න පත්‍රවලට ලෝකයේ රටවල් 180ක ළමයින් මුහුණ දෙනවා. ඒවායේ වැරැදි හැටහුටහමාරක් තිබෙනවා. කිසිම රටක් ඒ ගැන වචනයක් කථා කරන්නේ නැහැ. ඒ නිසා ඇති හැකි කෙනාගේ සහතිකයයි මේ සහතිකයයි සමාන කරනවා.

ඇති හැකි අයගේ දරුවෝ අද දවසේ සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව ඉගෙන ගන්නේ නැහැ. පසු ගිය සතියේ "The Sunday Times" පුවත් පත මා ළඟ තිබෙනවා. එහි තිබෙනවා, "Do you know what to do after O/Levels?" සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව මොකක්ද කරන්නේ කියලා අහලා තිබෙනවා. ඊළඟට තිබෙනවා, "Visit Malaysia Education Exhibition on March 16 & 17" මැලේසියාවේ අධ්‍යාපන ප්‍රදර්ශනය බලන්න එන්න කියනවා. "Malaysia's Top Seven Universities" ඊළඟට, "O/Level Entry" කියලා තිබෙනවා. ඒ කියන්නේ O/Level සමත් නම් යන්න පුළුවන්. "Access to over 100 Universities after O.Levels" දැන් විශ්ව විද්‍යාලයට යන්න පුළුවන් O/Level සමත් නම්. ඒ ගැන මේ මන්ත්‍රීතුමන්ලා කවුරුවත් කියනවාද? සල්ලි තිබෙන අයගේ දරුවන් London O/Level දක්වා විතරයි ඉගෙන ගන්නේ. එතැනින් එහාට මේ රටේ අපේ දරුවන්ට, ජාතියේ දරුවන්ට - හැබැයි සල්ලි තිබෙන්නට ඕනෑ- වෙනත් රටකට ගිහිල්ලා එහි University College එකකට ඇතුළත් වෙන්න පුළුවන්. විශ්වවිද්‍යාල විද්‍යායතනයකට ඇතුළත් වෙන්න පුළුවන්. ඊට පසුව අවුරුදු තුනකින් උපාධිය ලැබෙනවා. අපි අපේ දරුවාට කියනවා, 12, 13 වසරවල ඉගෙන ගෙන උසස් පෙළ විභාගය කරන්න කියලා. උසස් පෙළ විභාගය කරලා, ප්‍රතිඵලවලට රණ්ඩු වෙලා, Z-Scoreවලට රණ්ඩු වෙලා, ඒවා අපේ රටේ ප්‍රධාන මාතෘකා බවට පත් කරනවා. මේ මනුෂ්‍ය ජීවිත ගැන තඹ දොයිතුවකට හිතන්නේ නැතිව, ඒ ප්‍රශ්න පත්‍ර නිරීක්ෂණය කිරීම වර්ජනය කරන්නට සූදානම් වෙනවා. අපේ දරුවන්ට අන්නන්න පුළුවන් ඔක්කොම අන්නලා, අපේ දරුවා විශ්වවිද්‍යාලයට යන්න බලා ගෙන ඉන්නකොට අර සල්ලි තිබෙන කෙනාගේ දරුවා සාමාන්‍ය පෙළ විභාගය කරලා අවුරුදු තුනකින් උපාධිධාරියෙක් බවට පත් වෙනවා. ඒක නොවෙයිද ඇත්ත? ඒ ගැන විවාදයක් කවදාවත් මේ පාර්ලිමේන්තුවේ කරලා තිබෙනවාද? මේ ජනතා විමුක්ති පෙරමුණ ඒ ගැන විවාදයක් කරලා තිබෙනවාද? ජනතා විමුක්ති පෙරමුණට "The Sunday Times" පුවත් පත පෙනෙන්නේ නැද්ද? ඒ පුවත් පතේ වරදක් ගැන නොවෙයි මම මේ කියන්නේ. ඕනෑම පුවත් පතක් ගත්තාම අපිට දකින්නට ලැබෙන ප්‍රායෝගික යථාර්ථය.

ඇයි, මේ නිදහස් අධ්‍යාපනයට ගහන කට්ටියට මේවා පෙනෙන්නේ නැත්තේ? දැන් අපේ රටේ හා ලෝකයේ වෙනත් රටවල අයට ඕස්ට්‍රේලියාවට යන්න ඕනෑ වුණාම බෝට්ටුවල එල්ලිලා ගිහිල්ලා, මුහුදු වතුර බීලා, මීනී මස් කකා ඉඳලා පොලිසියට අහු වෙලා එළියට දමනවා. නමුත් London O/L කරලා ගිහිල්ලා ඒ සල්ලි ටික බැන්දාට පස්සේ Australian මහ කොමසාරිස් කාර්යාලය ශබ්දය ඇහෙන්න උඩ පැනලා තමයි visa එකට සීල් එක ගහන්නේ. එතකොට උඩින් ඕස්ට්‍රේලියාවට යනවා. එල්ලිලා බෝට්ටුවල යන්න ඕනෑ නැහැ. හැබැයි කවුරුවත් ඒ ගැන කථා කරන්නේ නැහැ. මේ වරප්‍රසාද ලත් අයගේ දරුවන්ට තිබෙන අයිතිය ගැන කථා නොකර, වරප්‍රසාද අහිමි අතිමහත් බහුතරයට හා මධ්‍යම පන්තියේ දරුවන්ගේ අධ්‍යාපනයට එළව එළවා පහර දීම තමයි මෙතැන දී සිද්ධ වන්නේ. අපි මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් කරන්න බලාපොරොත්තු වන්නේ ඇති හැකි අයගේ දරුවන්ට සල්ලිවලට යම් කිසි අවස්ථාවක් නිර්මාණය වෙනවා නම්, ඒ සියලු අවස්ථා ටික ගමේ දරුවන්ටත් ලබා දීමේ අධ්‍යාපන වෙනසයි. ඒක තමයි අපි මේ කරන්නේ කියන එක මම බොහොම අවංකව තමුන්නාන්සේලාට කියන්නට කැමැති වෙනවා. ඒ වෙනසයි මේ කරන්නේ. ඒක අමාරු වෙනසක්. එතකොට අපි දන්නවා මේ පන්තිය වෙනස් කිරීම මහින්ද රාජපක්ෂ යුගයේදී කරන්න බැරි නම් සසර වසනා තාක් කල් මේ අධ්‍යාපනයේ ගමේ මිනිස්සුන්ට අවශ්‍ය වෙනස කරන්නට ලැබෙන්නේ නැහැයි කියන එක. ඒ ටිකත් මම මේ අවස්ථාවේදී කියන්නට කැමැති වෙනවා.

මම මේ අවස්ථාවේ පෞද්ගලික පාසල්වල ගුරු සිසු සංඛ්‍යාව හා ඇතුළත් වීමේ ගාස්තු සම්බන්ධ වාර්තාවක් **සභාගත*** කරනවා.

ඊළඟට සමහර මන්ත්‍රීවරු අද කිව්වා සමහර පාසල් වහනවා කියලා. එහෙම කවුරුවත් පාසල් වහන්නේ නැහැ. කිසිම පාසලක් ඕනෑකමින් වැසීමේ ප්‍රතිපත්තියක් රජයට නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් තිබෙන්නේ මෙහෙමයි. අපේ රටේ දරුවෝ 50ට අඩුවෙන් එන පාසල් සියයට 17ක් තිබෙනවා. ඒ පාසලට එන්නේ දරුවෝ 50කට අඩුවෙන්. ඒ, ලංකාවේ තිබෙන පාසල් 9731න් සියයට 17ක්. ඒ පාසල්වල දරුවෝ සංඛ්‍යාව කොහොමද? පාසල් 275කට එක දරුවෙක්වත් ඇතුළු වෙලා නැහැ. ඒ පාසල් 275 පළමුවැනි ශ්‍රේණියට එක් කෙනෙක්වත් ඇවිල්ලා නැහැ. අපි ජීවත් වන මේ බස්නාහිර පළාතේ පාසල් 15කට එක්කෙනෙක්වත් ඇවිල්ලා නැහැ. එක ළමයෙක් විතරක් ඉන්න පාසල් 123ක් තිබෙනවා. විදුහල්පතිතුමා ඉන්නවා. ගුරුතුමන්ලා ඉන්නවා. ළමයි එක්කෙනායි ඉන්නේ. එහෙම පාසල් 123ක් තිබෙනවා. ඒ වුණත් තියා ගන්න කියලා නේ කියන්නේ. වහන්න එපා කියනවා. ළමයි දෙදෙනෙක් ඉන්න පාසල් 147ක් තිබෙනවා. ළමයි තුන් දෙනෙක් ඉන්න පාසල් 181ක් තිබෙනවා. ළමයි තුන් දෙනායි ඉන්නේ. ළමයි හතර දෙනෙක් ඉන්න පාසල් 210ක් තිබෙනවා. ළමයි පස් දෙනෙක් ඉන්න පාසල් 223ක් තිබෙනවා. මේ අය වැසිකිළි ගැන කථා කරනවා. වැසිකිළි ගැන නොවෙයි කියන්න ඕනෑ. වැසිකිළි යන්න මනුෂ්‍ය ජීවිත ඕනෑ. පාසලක එක ළමයෙක් විතරක් ඉන්න කොට ඒ ළමයාට සමාජානුයෝජනයක් ඇති වෙනවාද, ඉගෙන

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ගන්න උත්තේජකයක් ඇති වෙනවාද කියලා ඔබතුමාම කල්පනා කර බලන්න. මුළු පාසලේම ඉන්නේ ළමයි තුන් දෙනායි. ඉගෙන ගන්න පුළුවන්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ තිබෙන පාසල්වලින් සියයට 25ක් ළමයි දස දෙනකුට අඩු පාසල්. මේ තිබෙන මුළු පාසල් 9731න් සියයට 25ක් කියන්නේ හතරෙන් එකක්. හතරෙන් එකකට පළමුවැනි ශ්‍රේණියට ළමයින් දහ දෙනෙක්වත් ඇතුළත් වෙලා නැහැ. මෙවා මේ මතු පිට කථා නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම අනෙක් ටිකත් කියලාම ඉන්නම්. ළමයි 100ට අඩු පාසල් සියයට 31ක් තිබෙනවා. ළමයි 500ට අඩු පාසල් සියයට 70ක් තිබෙනවා. මේ රටේ මුළු පාසල් පද්ධතියෙන් පාසල් සියයට 70ක ළමයි 500ට අඩුයි. පාසල් සියයට 90ක ළමයි 1000ට අඩුයි. ළමයි 50ට අඩු මුළු පාසල් ගණන 1621යි.

ලංකාව පුරා පැතිරුණු මේ පාසල් 1621 තුළ දරුවන් 45,425 දෙනායි ඉගෙන ගන්නේ. පාසල් 1621ක ළමයි 50,000ට අඩුයි. ගුරුවරු 8,732ක් ඉන්නවා. ඒ කියන්නේ සෑම ළමයි පස් දෙනකුටම එක ගුරුවරයකු ඉන්නවා. ලෝකයේ දියුණුම රටකවත් මෙහෙම නැහැ. දියුණුම රටක පාසලක වුණත් සාමාන්‍යයෙන් ළමයි 20 දෙනකුට ගුරුවරයකු බැගින් ඉන්නේ. අපේ රටේ පාසල් 1,621ක ළමයින් 45,425 දෙනකුට ගුරුවරු 8,732ක් ඉන්නවා කියන්නේ ගුරු සිසු අනුපාතය 1:5යි. ඒ වාගේම ළමයින් 5,000ට වැඩි පාසල් 11ක් තිබෙනවා. ඒ ටික ගැන තමයි අපි කථා කරන්නේ. 5,000කට වඩා ළමයින් ඉන්න දැවැන්ත, ඉහළ කීර්ති නාමයක්, සම්ප්‍රදායක් හා දීර්ඝ කාලීන ප්‍රෞඪ ඉතිහාසයක් තිබෙන පාසල් 11ක් තිබෙනවා. ඒ පාසල් 11 තුළ ළමයින් 55,000ක් ඉගෙනුම ලබනවා. නමුත් රට පුරා විසිරුණු පාසල් 1,621ක ඉගෙනුම ලබන්නේ 45,000යි. මේ සංඛ්‍යා ලේඛන සියල්ල හැන්සාඩ් ගත කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිමල් ප්‍රේමසිරි මහතා තමන්ගේ උසස් අධ්‍යාපනය පිණිස පාසල් වැසී යාමට හේතු පිළිබඳ පර්යේෂණයක් කර තිබෙනවා. මෙවා නිකමට හිතෙන දේශපාලන කාරණා නොවෙයි. ඒ පර්යේෂණ වාර්තාවට අනුව 2009 දී වැසුණු පාසල් සංඛ්‍යාව 104යි. 2010 දී වැසුණු පාසල් සංඛ්‍යාව 79යි. 2011 දී වැසුණු පාසල් සංඛ්‍යාව 16ට අඩු වෙලා තිබෙනවා. 2012 දී වැසුණු පාසල් සංඛ්‍යාව 36යි. ඒ වාගේම ඒ පර්යේෂණ වාර්තාවේ මෙහෙම සඳහන් වෙනවා :

"පාසල් වැසී යාමට බලපෑ සාධක නම්, විදුහල්පතිවරුන්ගේ දුර්වල කළමනාකරණය හා පරිපාලනය,

දීර්ඝ කාලයක් තිස්සේ පැවතෙන ගුරු හිඟය, ග්‍රාමීය පාසල් පිළිබඳ ඉහළ නිලධාරීන්ගේ අවධානය

අඩු වීම, ළමා ජනගහනය අඩු වීම, කිලෝ මීටර් 2-3ක් වැනි දුරකින් පාසල් 3-4ක්

ආරම්භ කිරීම, පාසල හා දෙමාපියන් අතර තිබෙන අන්‍යෝන්‍ය සම්බන්ධතාවය අඩු මට්ටමක පැවතීම,

දරුවන් පාසල වෙත යොමු කරන ලද දෙමාපියන්ගේ අඩු අධ්‍යාපන මට්ටම නිසා පාසල සමඟ

පවත්වන දුරස්ථ සම්බන්ධතාවය හා දරුවන් පාසල වෙත යොමු කරන ලද දෙමාපියන්ගෙන්

බහුතරය කම්කරු වෘත්තියෙහි යෙදෙන නිසා පාසල පිළිබඳ සොයා බැලීමට තිබෙන කාලය අඩු වීම."

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

මේ සඳහා යෝජනා කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. 01. "පාසල් පද්ධතිය තුළ විශාල බෙදීම් නිර්මාණය කිරීමට හේතු වී ඇති ඉසුරු පාසල්, නවෝද්‍යා පාසල්, ජනප්‍රිය පාසල්, 1ඒබී පාසල්, 1සී පාසල්, 2 වර්ගයේ පාසල්, 3 වර්ගයේ පාසල් ආදී වර්ගීකරණය ඉවත් කර සියලුම පාසල් ප්‍රාථමික, කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ ලෙස පොදු වර්ග කිරීමකට ලක් කළ යුතුය". ඒක තමයි මේ කරලා තිබෙන්නේ. අපි මේ පාසල් වැසී යාම වළක්වන්න පොදු වර්ගීකරණයක් කර තිබෙනවා. පාසල් වර්ග දෙකයි. ගෙවල් ළඟ කිලෝ මීටර් දෙකක් දුරින් දරුවාට යන්න හොඳ ළමා මිතුරු ප්‍රවේශයක් සහිත ප්‍රාථමික පාසලක් මේ තුළින් ලැබෙනවා. 2012 සිට 2016ට විදුලිය, පානීය ජලය, ළමා මිදුල, ක්‍රියාකාරී කාමරය, ගුරුවරු, ආරක්ෂිත වැට මේ සියල්ල සහිත 1ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඇති පාසල් 5,000ක් නිර්මාණය කරනවා. එයින් 1600 ගණනක මූලික අදියර ගිය අවුරුද්දේ පටන් ගත්තා. මේ වර්ෂයේ පළමු වාරය නිම වීමෙන් පසු ඒ පෝෂිත පාසල්වල ඉතිරි සියල්ල සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලක්ෂ 5 බැගින් ලබා දීමේ ක්‍රියාවලිය ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා මට ඉෂ්ට කරලා දෙනවා කියන ප්‍රතිඥාව දීලායි ගියේ කියන එක මා තමුන්නාන්සේලාට මතක් කරනවා. ඒ නිසා පොතේ තිබෙන ඒවා නොවෙයි. මේ ආණ්ඩුවට සැලසුමක් තිබෙනවා; වැඩ කරන විධියක් තිබෙනවා. වැඩ කරන්න සම්පත් හොයා ගන්නේ අමාරුවෙන්. මේ වන විට මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 409ක් මේ මහ පොළොවේ ඉදි වෙනවා. මගේ අධීක්ෂණ මන්ත්‍රීතුමා වශයෙන් ගරු මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා ඒ වැඩ පිළිවෙළේ ඉදි කිරීම් කටයුතු භාරව, ඒ සඳහා අවශ්‍ය ගුරුවරු ලබා දීම භාරව සිටිමින් ඉතාම විශාල කාර්ය භාරයක් කැපවීමෙන් යුතුව ඉෂ්ට කරන බවත් මා මේ ගරු සභාවට දැනුම් දෙනවා.

පාසල් 1000 වැඩසටහන යටතේ 2012 වර්ෂයේදී පමණක් නැවත විවෘත වෙච්ච පාසල් තිබෙනවා, 34ක්. බස්නාහිර පළාතේ 8යි, මධ්‍යම පළාතේ 2යි, දකුණු පළාතේ 2යි, උතුරු පළාතේ 6යි, නැඟෙනහිර පළාතේ 5යි, වයඹ පළාතේ 7යි, උතුරු මැද පළාතේ 3යි, සබරගමුව පළාතේ1යි. එකතුව 34යි. ඒ පාසල්වල සිටින ගුරුවරු 145යි, දරුවන් සංඛ්‍යාව 1325යි.

මම මෙතැනදී එක මැතිවරණ කොට්ඨාසයකට අදාළ විස්තර චිතරක් කියන්න කැමැතියි. බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාසයේ මිල්ලනිය දේවරක්ෂිත විද්‍යාලය ද්විතීයික පාසලක්. ඒ යටතේ වසා දමා තිබුණු පාසල් දෙකක් ඇරියා. කැටගොඩ ප්‍රාථමික විද්‍යාලයේ 2012දී හිටියේ ළමයින් 50යි, 2013දී ළමයින් 53 දෙනායි. ඉඹුලඟේන ප්‍රාථමිකයේ 2012 දී හිටියේ ළමයින් 33 දෙනායි, මේ අවුරුද්දේ ළමයින් 38 දෙනෙක් ඇතුළු වුණා. දොඹගොඩ සීලරතන විද්‍යාලය ද්විතීයික පාසලක්. ඊට සම්බන්ධ ප්‍රාථමිකය අලුතින් ඇරියා. ඒක වසා දමා තිබුණු පාසලක්. බටගොඩ ප්‍රාථමික පාසලේ ළමයින් 42 දෙනායි හිටියේ. තව පාසලක් විවෘත වීම නිසා මේ අවුරුද්දේ ඒ පාසලට ඇතුළු වුණේ ළමයින් 36 දෙනායි. ඒ වාගේම, වල්ගම සද්ධාතිස්ස විද්‍යාලය සහ විද්‍යාගම ලෝකපිල ලක්ෂ්මී විද්‍යාලය. එහි ප්‍රාථමිකය වසා තිබුණු එකක්. ළමයින් 22 දෙනායි හිටියේ. මේ අවුරුද්දේ ළමයින් 54 දෙනෙක් ඉන්නවා, පන්ති දෙකයි. තක්ෂිලා මධ්‍ය විද්‍යාලයට සම්බන්ධ කරලා විවෘත කළා, හෑගල්ල ප්‍රාථමික විද්‍යාලය. එහි මේ අවුරුද්දේ ළමයින් 42 දෙනෙක් ඉන්නවා. බෝපේ රාජසිංහ විද්‍යාලය ද්විතීයික පාසලක් බවට පත් කළා. එහි 2011දී හය වසරේ පන්ති 2යි, 2012දී හය වසරේ පන්ති 3යි. 2013දී හය වසරේ පන්ති 4යි. ළමයින් 168ක් අලුතින් ඇතුළු වුණා. වේරගල කණිෂ්ඨ පාසල, අංගම්පිටිය කණිෂ්ඨ පාසල, බෝපේ කණිෂ්ඨ පාසල, දඹෝර කණිෂ්ඨ පාසල, උඩගම කණිෂ්ඨ පාසල යන මේවා ඊට පෝෂිත පාසල් වශයෙන් තිබෙනවා.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

"ශ්‍රී ලාංකීය නිදහස් අධ්‍යාපනය සැබෑ හැරවුම් ලක්ෂ්‍යය. මහින්දෝදය ද්විතීයික පාසල් වැඩසටහනින් පිබිදෙන බණ්ඩාරගම" යනුවෙන් නම්කොට, "හිත මිතුරෝ" නම් හොරණ අධ්‍යාපන කලාපයේ විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන හා විදුහල්පති පදනම මට පොතක් එවා තිබෙනවා. හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම ඒ පොත **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පාසල් වැසී යෑමට හේතුව, පාසල් පද්ධතිය කඩා වැටිලාය කියන මිථ්‍යාව බිඳ ලන්නට අවශ්‍ය කරුණු සඳහන් පත්‍රිකා දෙකක් ඔබතුමාගේ අවසරය ඇතිව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි. තව විනාඩි පහයි තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
සම්මත කරන යෝජනාවක් නොවන නිසා, මගේ කථාව ඉවර කරන්න සභාවේ එකඟතාව ඇතිව විනාඩි 15ක් දෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
7.00න් පසුව සභාව ගෙන යන්න බැහැ. Adjourn කරලායි තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මුදල් එකතු කිරීමේ වගකීම පුරුදු කිරීමේ කාර්යය, අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමේ කටයුත්ත කළේ, 1983 සැප්තැම්බර් මාසයේ 29 වැනිදා එක්සත් ජාතික පක්ෂ රජය සමයේ හිටපු එස්.බී.කේ.කේ. වේරගොඩ අධ්‍යාපන ලේකම්තුමායි. ඒ අනුව පාසල් සංවර්ධන අරමුදලක් පිහිටෙව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතාම කෙටියෙන් ඒ තොරතුරු කියවනවා. ඒ අනුව අනු කමිටු පිහිටුවා තිබෙනවා. ඒවා යටතේ පහත සඳහන් කටයුතු කළ යුතුව තිබෙනවා.

භෞතික සම්පත් අනු කමිටුව :

රාජ්‍ය අංශය හා පාසල් ප්‍රජාව සපයන සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමෙන් හා නාස්තිය වළක්වාලීමේ අරමුණින්, පාසල් ගොඩනැගිලි, පාසල් භූමිය වටා වැට, තාප්පය, ජලය හා විදුලිය සැපයීම ආදිය සැලසුම් කිරීම, ඉදි කිරීම හා නඩත්තු කටයුතුවල යෙදීම, පාසල් ප්‍රජාව සතුව ඇති භෞතික හා මානව සම්පත් පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කිරීම, පාසල් ලී බඩු සහ පන්ති කාමර උපකරණ නඩත්තුව, පාසල් වත්ත පවිත්‍රව තබා ගැනීම සහ එයින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම.

පුස්තකාල හා අධ්‍යාපනික උපකරණ අනු කමිටුව:

පුස්තකාලය සඳහා පොත් සහරා සැපයීම, අධ්‍යාපන උපකරණ සපයා ගැනීම හා නඩත්තුව, පුස්තකාල උපකරණ සපයා ගැනීම හා නඩත්තුව.

පෙළ පොත් දිවා ආහාර, නිල ඇඳුම් හා නේවාසිකාගාර කටයුතු පිළිබඳ අනු කමිටුව:

පෙළ පොත් අවශ්‍යතා නිර්ණය කිරීම, ලබා ගැනීම, බෙදා හැරීම හා එලදායී පරිහරණය, පාසල් දිවා ආහාර සංඛ්‍යා ලේඛන සහ අවශ්‍යතා පිළියෙල කිරීම.

මේ ආදී වශයෙන් ඉතා විශාල චක්‍රලේඛයක් සකස් කරලා මුළු රටම කළඹලා, ඒවාට සල්ලි දෙන අයට බදු සහන දීලා වෙනම පාසල් සංවර්ධන අරමුදලක් ඇති කරන්නයි මේ චක්‍රලේඛනය නිකුත් කළේ. මේ කල් තැබීමේ යෝජනාව ගෙනාපු මහත්වරුන්ගේ කියවීම සඳහා මේ මුළු චක්‍රලේඛයම හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ සමඟම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය බලයට පත් වුණාට පස්සේ, 1995දී එම්.ඩී.ඩී. පීරිස් මහතා විසින් පාසල් සංවර්ධන මණ්ඩල අහෝසි කරමින් නිකුත් කරපු නිවේදනයත් මා හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා.

සල්ලි එකතු කරන්නම කියලා සියලුම විධිවිධාන ඇතුළත් කරපු චක්‍රලේඛනය තමයි, 1993 සැප්තැම්බර් 29වැනි දා වේරගොඩ ලේකම්තුමා අත්සන් කරලා එක්සත් ජාතික පක්ෂයේ අධ්‍යාපන ඇමතිතුමා හා ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරපු චක්‍රලේඛය. ඒ ගැන නොදන්නා අය වැඩි වැඩියෙන් ඒක කියවන්න. මොකද, ඒ සමඟර අයගේ තාත්තලා නායකයන්, අධ්‍යාපන ඇමතිලා, ජනාධිපතිතුමන්ලා වෙලා ඉඳලා තිබෙනවා. ඒ නිසා ඒ කාලයේ තිබුණු චක්‍රලේඛනත් කියවලා එන එක හොඳයි. මේ රටේ දරුවෙකුගෙන් අනිවාර්ය කිරීමෙන් හා බලහත්කාරයෙන් -අවශ්‍යයෙන්ම ගෙවන්න කියලා- කිසිදු මුදලක් පාසල් අධ්‍යාපනය තුළ අය කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය චක්‍රලේඛනයක් ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව නිකුත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ රටේ පාසල්, පන්සල්, පල්ලි යන ඒවා ගොඩ නැඟිලා තිබෙන්නේ ජනතාව විසින්, සුබ පතන්නන් විසින් හැම දාම කරන පරිත්‍යාගවලින් තමයි.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඔබතුමන්ලා ඒ චක්‍රලේඛනය නිකුත් කරනවාද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්. එය නිකුත් කිරීම ගැන පළාත්වල ඉන්න මහ ඇමතිතුමන්ලා සමඟ අප පසු ගිය සතියේ කථා කළා. ඔවුන්ගේ අදහසුත් සැලකිල්ලට ගෙන තමයි එය කරන්න වන්නේ. මොකද අපට අවශ්‍ය නැහැ නැති බැරි මිනිසුන්ගේ, අමාරුවෙන් ජීවත් වෙන අයගේ සල්ලි ගන්න. එවැනි දරුවන්ගේ අනාගතය වෙනුවෙන් මුදල් ගෙවන, ඒ දරුවන්ට ශිෂ්‍යත්ව දෙන, නේවාසික ශාස්තු ගෙවන මනුෂ්‍යයන් විශාල පිරිසක් මේ රටේ ඉන්නවා. වෙනත් දරුවෙක් තමන්ගේ දරුවා මෙන් සලකා, කැපකරු ලෙස

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ඉදිරිපත් වෙලා ඒ දරුවා හදා ගන්නා අම්මලා තාත්තලා ඉන්නවා. දරුවන් නැති අයට, දරුවන්ගේ අගය දන්නේ නැති අයට, දරුවන්ට තිබෙන අමාරුකම් පිළිබඳ ඇත්ත දැනුමක් නැති අයට, ජාත්‍යන්තරකරණය වුණු අයට මේ තිබෙන ප්‍රශ්නය වැටහෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව එක කරුණක් විතරක් සඳහන් කරන්න ඕනෑ.

2013.03.04 දින පළ වූ "දිනමිණ" පුවත් පතේ 10වැනි පිටුවේ මෙසේ සඳහන් කර තිබෙනවා:

"සා. පෙළ විභාගය අසමත් ගණන වසරින් වසර වැඩි වෙලා
මුදල් හා ක්‍රම සම්පාදනය අමාත්‍යාංශය පවසයි"

මෙහෙම පවසන්නේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය නම්, එම අමාත්‍යාංශයේ කාගේ හරි වයර් මාරුවීමක් වෙලා තිබෙනවා. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගෙන් මොකුත් වැඩිදුර අහගන්නේ නැත්නම් හොඳයි. මා හිතන්නේ නැහැ, මේ වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් නිකුත් කරපු එකක් කියලා. නමුත් පළ වුණු විධිය බලනකොට-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් කථාව අවසන් කළ යුතුයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ නිසා, 1994, 2005, 2011 යන වර්ෂවල අපොස සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ කියන විභාග දෙකේම සම්පූර්ණ ප්‍රතිඵලවල විශ්ලේෂණාත්මක විග්‍රහය ඇතුළුව -වසරින් වසර මේ විභාගවල ප්‍රතිඵල වැඩි වෙලා තිබෙන ආකාරය දැක්වෙන- අධ්‍යාපනයේ අනිකුත් ප්‍රවණතා ඇතුළත් මේ සම්පූර්ණ වාර්තාවත් හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව එක කාරණයක් කියලා අවසන් කරනවා. අධ්‍යාපනයේ දර්ශක අනුව 1994දී ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළු වීමේ ප්‍රතිශතය 89.2ක් වූ අතර, 2011 වන විට එය 98.26 දක්වා වැඩි වෙලා තිබෙනවා. ද්විතියික පාසල් සඳහා ශිෂ්‍ය පිවිසීමේ අනුපාතය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම සාක්ෂරතාව වැඩි වෙලා තිබෙනවා. මේ දර්ශක අතරින් ප්‍රාථමික අධ්‍යාපනයෙන් ඇද හැලීමේ අනුපාතය අඩු වෙලා තිබෙනවා. ඒ සියලු විස්තරත් මා **සභාගත*** කරනවා.

මම අවසාන වශයෙන් කියන්නේ මේකයි. මේ දරුවන් ජාතියේ දරුවන්. ඔවුන් හදන්න අපි එකතු වෙලා වැඩ කරමු. මේ දරුවන් මිනීමරුවන් කරලා, ප්‍රචණ්ඩත්වයට නැඹුරු කරලා, රටට ආදරය කරන්නේ නැති මිනිසුන් බවට පත් කරලා ලබන සක්විති රජකමට වඩා, මේ දරුවන්ට අවශ්‍ය සම්පත් ටික දීලා කානුවක මැරිලා වැටෙන එක හොඳයි කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

සභාමේසය මත තබන ලද ලියවිල්ල :
சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:
Document tabled:

2013.විභාගයේ දී 1 වසරට සිසුන් ඇතුළත් කිරීම

පළාත	පාසල	ලබුණු සමස්ත ඉර්ෂුමීපත් සංඛ්‍යාව	පත්ති සංඛ්‍යාව	ඇතුළත් කරගත් සිසුන් ප්‍රමාණය
බස්නාහිර	රාජකීය විද්‍යාලය, කොළඹ	2429	10	411
	විශාඛා විද්‍යාලය, කොළඹ	1908	05	210
	පාණදුර සුමංගල බා. වි.	725	05	210
මධ්‍යම	ධර්මිරාජ විද්‍යාලය මහනුවර	1105	05	210
	මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර	1239	05	205
දකුණ	රාහුල විද්‍යාලය, මාතර	961	06	245
	සුජාතා බා. විද්‍යාලය මාතර	800	06	207
	මහින්ද විද්‍යාලය ගාල්ල	1060	05	208
	ච්චිමන්ඩි විද්‍යාලය ගාල්ල	1241	06	254
	සංඝමිත්තා බා. විද්‍යාලය ගාල්ල	1278	07	294
වයඹ	මලියදේව පිරිමි විද්‍යාලය කුරුණෑගල	843	06	250
	මලියදේව බා.විද්‍යාලය කුරුණෑගල	827	05	209
සබරගමුව	ශා. ජෝසප් බා. විද්‍යාලය සෑගල්ල	1620	05	208
	පරාගසන් උසස් බා. විද්‍යාලය රත්නපුර	1400	06	252

එකල්හි වෙලාව අ. භා.7.00 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2013 මාර්තු 08 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது, பி.ப. 7.00 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2013 மார்ச் 08, வெள்ளிக்கிழமை பி. ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது

It being 7.00 p.m., MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

Adjourned accordingly until 1.30 p.m. on Friday, 08th March, 2013.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

පදියතලාව ජුම්මා දේවස්ථානය: දේපොළ
பதியதலாவ ஜும்மா பள்ளிவாசல்: ஆதனங்கள்
PADIYATALAWA JUMMA MOSQUE: PROPERTIES

3009/'12

1. ගරු මොහමඩ් අස්ලම් මහතා
(மாண்புமிகு மொஹமட் அஸ்லம்)
(The Hon. Mohamed Aslam)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර - මහනුවර ප්‍රධාන මාර්ගයේ පිහිටි පදියතලාව ජුම්මා දේවස්ථානය සඳහා වකුෆ් මණ්ඩලය විසින් අවසන් වරට භාරකරුවන් පත් කරනු ලැබූ දිනය කවරේද;

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මොහමඩ අස්ලම් මහතා]

(ii) එම භාරකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඔවුන්ට ලබාදුන් භාරකාරත්වය අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් මුස්ලිම් පල්ලියට අයත් ව්‍යාපාරික ස්ථාන සඳහා වකුග් පනතේ විධිවිධාන අනුව බදුගිවිසුම් නොමැති වීම නිසා එම දේපල එහි පදිංචිකරුවන්ගේ හෝ කළමනාකරුවන්ගේ ආධිපත්‍යයට යටත් දේපල බවට පත් වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) හි සඳහන් තත්ත්වය පිළිබඳව නොපමාව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්;

(ii) එකී මුස්ලිම් පල්ලියට අයත් දේපල ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් දීමටත්;

කටයුතු කරන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

පිරිතම අමෙස්චරුම් පෙළත්ත සාසන, මත අලුවල්කළ් අමෙස්චරුමානවරෙක් කේට්ට විනා:

(අ) (i) අම්පාරෙ - කණ්ඩි පිරිතාන වීතියිල් අමෙන්තුළ්ළ පතියතලාව ජූම්මා පළ්ළි වාසලුක්කු වක්පු සපෙයිනාල් ඉරුතියාක නම්පික්කෙප්පොරුප්පාළර්කළ් නියමික්කප්පට්ට තිකති යාතෙන්පතෙයුම්;

(ii) මේර්පඩි නම්පික්කෙප් පොරුප්පාළර්කළින් පෙයර්කළ් මර්රුම් මුකවරිකළ් යාවෙ යෙන්පතෙයුම්;

(iii) ඉවර්කළුක්කු වළංකප්පට්ට පොරුප්පුටෙමෙ මුටිවුරුම් තිකති යාතෙන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ආ) මේර්පඩි පළ්ළිවාසලුක්කු සොන්තමාන වර්ත්තක නිලෙයංකළුක්කු වක්පු චට්ටත්තින් ඒර්පාටුකළින් පිරකාරම් කුත්තකෙ උටන්පඩික්කෙකළ් ඉන්මෙයාල් මේර්පඩි ආතනංකළ් ඉවර්රිල් වතිපවර්කළින් අල්ලතු මුකාමෙයාළර්කළින් ආතික්කත්තිර්කු උළ්ළාකිය ආතනංකළාක ආකියුළ්ළතෙ අවර් අරිවාරා?

(ඉ) (i) මේර්පඩි (ආ)ඉල් කුරිප්පිටප්පට්ටුළ්ළ නිලෙමෙ පර්රි මුස්ලිම් සමය, කලාචාර අලුවල්කළ් තිණෙක්කළත්තින්මූලම් තාමතමින්රි මුරෙ චාර්න්තතොරු විචාරණෙයෙ මේර්කොළ්වතර්කුම්;

(ii) මේර්පඩි මුස්ලිම් පළ්ළිවාසලුක්කුච් චොන්තමාන ආතනංකළෙප් පාතුකාප්පතර්කුත් තේවෙයාන නටවටික්කෙකළෙ මේර්කොළ්වතර්කු ආලෝචනෙ වළංකුවතර්කුම්

නටවටික්කෙ එටුප්පාරා එන්පතෙයුම් අවර් කුරිප්පිටුවාරා?

(ඊ) ඉන්රේල්, ඒන්?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state—

(i) the date on which the trustees for the Padiyatalawa Jumma Mosque located on the Ampara-Kandy main road, were appointed for the last time by the Wakf Board ;

(ii) the names and addresses of those trustees ; and

(iii) the date on which the trusteeship entrusted to them lapses?

(b) Is he aware of the fact that the business establishments belonging to the aforesaid mosque have become properties of the persons who reside in them or manage them owing to non availability of lease agreements in terms of the provisions of the Wakf Act?

(c) Will he also state whether arrangements will be made to—

(i) initiate a formal inquiry into the state of affairs mentioned in (b) above through the Department of Muslim Religions and Cultural Affairs without delay; and

(ii) to give instructions to take necessary steps to preserve the properties belonging to the aforesaid mosque?

(d) If not, why ?

ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)

(මාණ්පුමිකු ටි.එම්.ජයරත්න - පිරතම අමෙස්චරුම් පෙළත්ත සාසන, මත අලුවල්කළ් අමෙස්චරුම්)

(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

(අ) (i) 2009.08.02.

(ii) නම: අල්හාජ් එම්.එම්. සිද්දික්

ලිපිනය : සිද්දික් ස්ටෝර්ස්, කෙළින් වීදිය, පදියතලාව

(2009.08.02 සිට 2010.08.01 දක්වා විශේෂ භාරකරු ලෙස ද, 2010.08.02 සිට නව භාරකාර මණ්ඩලය පත් කරන තෙක් පනතේ විධිවිධාන පරිදි ස්ථාන භාරකරු ලෙස ද කටයුතු කරයි.)

(iii) 2010.08.01.

නව භාරකාර මණ්ඩලයක් 2013.01.20 දින ඡන්ද විමසීමක් පවත්වා පත් කරගෙන ඇති අතර අදාළ නෛතික ලියකියවිලි දෙපාර්තමේන්තුව වෙත ලද පසු වකුග් මණ්ඩලය වෙත යොමු කර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) නැත.

(ඇ) (i) ඔව්.

(ii) ඔව්.

දැනටමත් බදු ගිවිසුම් කෙටුම්පත් කර වකුගඩු මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

(ඈ) අදාළ නොවේ.

(அ) (i) 2009.08.02

(ii)பெயர்: அல்ஹாஜ் எம்.எம். சித்தீக்

முகவரி: சித்தீக் ஸ்டோர்ஸ், பிரதான வீதி,
பதியதலாவ.

2009.08.02 ஆம் திகதி முதல் 2010.08.01 வரை விசேட நம்பிக்கையாளராகவும் 2010.08.02 முதல் புதிய நம்பிக்கையாளர் சபை நியமிக்கப்படும் வரை வக்பு சபை விதிகளுக்கமைய நம்பிக்கைப் பொறுப்பாளராகவும் கடமையாற்றுகிறார்.

(iii) 2010.08.01

புதிய நம்பிக்கையாளர் சபையொன்று 2013.01.20ஆம் திகதிய வாக்கெடுப்புமூலம் நியமிக்கப்பட்டிருப்பதோடு, அதற்குரிய ஆவணங்கள் திணைக்களத்திற்கு கிடைத்ததன் பின்னர், வக்பு சபைக்கு சமர்ப்பித்துச் சபையின் அனுமதிக்குப் பின்னர், தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமம்.

(ஆ) இல்லை.

(இ) (i)ஆம்.

(ii)ஆம். தற்போது ஆதனவரி நகல் பிரதி ஒன்றைத் தயாரித்து, வக்பு சபையின் அனுமதிக்காகச் சமர்ப்பித்துள்ளோம்.

(ஈ) பொருத்தமற்றது.

(a) (i) 02nd August, 2009

(ii) Name: Al-Haj M.M. Siddik

Address: Siddik Stores, Main Street,
Padiyatalawa

(He was appointed as the special trustee from 02nd August, 2009 to 01st of August, 2010 and thereafter he was functioning as person in charge of the mosque until new trustees are appointed as per the provisions of the Wakfs Act.)

(iii) 01st August, 2010

The new Board of Trustees has been selected on 20th January, 2013 by an election. They will be appointed as Trustees of the aforesaid mosque by the Wakf Board after receiving the legal documents.

(b) No.

(c) (i) Yes.

(ii) Yes.

The Department has submitted a draft lease agreement to the Wakf Board for its approval.

(d) Not applicable.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.


சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 216 - இல. 4
Volume 216 - No. 4

2013 මාර්තු 08 වන සිකුරාදා
2013 மார்ச் 08, வெள்ளிக்கிழமை
Friday, 08th March, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :
උපදේශක කාරක සභා : සාමාජිකයන් ආදේශ කිරීම

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

නොපැමිණීමේ අවසරය :
ගරු ආර්.දුමින්ද සිල්වා මහතා

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

එකතුකල අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

රේගු (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

ඔට්ටු ඇල්ලීම හා සූදු බදු පනත (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

මුදල් පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත :
පළමුවන වර කියවන ලදී.

මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා :
වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායී කටයුතු සඳහා යොදා ගැනීම

පොල් කර්මාන්තයෙහි සහ පොල් සම්පත්වල සංවර්ධනය හා ප්‍රවර්ධනය විධිමත් කිරීම

කල් තැබීමේ යෝජනාව :
දළදා මාළිගාව ආසන්නයේ ඇති සුරා සැල් ඉවත් කිරීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

ஆலோசனைக்குழு : உறுப்பினர்களைப் பதிலீடு செய்தல்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

அறிவிப்புக்கள்:

ஆலோசனைக் குழு : உறுப்பினர் பதிலீடு

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

வராதிருக்க அனுமதி:

மாண்புமிகு ஆர். துமிந்த சில்வா

நிதி முகாமைத்துவம் (பொறுப்பு) (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

பொருளாதாரச் சேவை விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

மதுவரி (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் (திருத்தம்) சட்டமூலம் :

முதன்முறை மதிப்பிடப்பட்டது

துறைமுக, விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் (திருத்தம்) சட்டமூலம் :

முதன்முறை மதிப்பிடப்பட்டது

தொலைத்தொடர்பு அறவீட்டுச் (திருத்தம்) சட்டமூலம் :

முதன்முறை மதிப்பிடப்பட்டது

சேர் பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

சுங்கம் (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

பந்தய, சூதாட்ட விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம் :

முதன்முறை மதிப்பிடப்பட்டது

வரி மேன்முறையீட்டு ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

நிதிச் சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

திருமணப் பதிவு (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

முஸ்லிம் திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

பிறப்புக்கள், இறப்புக்கள் பதிவு (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

நொத்தாரிசு (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

கண்டிய திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

ஆவணப் பதிவு (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

அற்றோனித் தத்துவம் (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

மீள குடியமர்த்துதல் அதிகாரசபை (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

தனிநபர் பிரேரணைகள்:

நெற்பயிர்ச்செய்கை மேற்கொள்ள முடியாதுள்ள வயற் காணிகளைப் பயனுள்ள நடவடிக்கைகளுக்குப் பயன் படுத்துதல்

தெங்குக் கைத்தொழில், தெங்குசார் வளங்கள் ஆகியவற்றின் அபிவிருத்தியையும் மேம்பாட்டையும் ஒழுங்கமைத்தல்

ஒத்திவைப்புப் பிரேரணை:

தலதா மாளிகைக்கு அருகிலுள்ள மதுபானச்சாலைகளை அகற்றுதல்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Consultative Committees: Substitution of Members

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

LEAVE OF ABSENCE:
Hon. R. Dumindha Silva

FISCAL MANAGEMENT (RESPONSIBILITY) (AMENDMENT) BILL:
Read the First time

ECONOMIC SERVICE CHARGE (AMENDMENT) BILL:
Read the First time

EXCISE (AMENDMENT) BILL:
Read the First time

STRATEGIC DEVELOPMENT PROJECTS (AMENDMENT) BILL:
Read the First time

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY (AMENDMENT) BILL:
Read the First time

TELECOMMUNICATION LEVY (AMENDMENT) BILL:
Read the First time

VALUE ADDED TAX (AMENDMENT) BILL:
Read the First time

CUSTOMS (AMENDMENT) BILL:
Read the First time

BETTING AND GAMING LEVY (AMENDMENT) BILL:
Read the First time

NATION BUILDING TAX (AMENDMENT) BILL:
Read the First time

INLAND REVENUE (AMENDMENT) BILL:
Read the First time

TAX APPEALS COMMISSION (AMENDMENT) BILL:
Read the First time

FINANCE BILL:
Read the First time

MARRIAGE REGISTRATION (AMENDMENT) BILL:
Read the First time

MUSLIM MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL:
Read the First time

BIRTHS AND DEATHS REGISTRATION (AMENDMENT) BILL:
Read the First time

NOTARIES (AMENDMENT) BILL:
Read the First time

KANDYAN MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL:
Read the First time

REGISTRATION OF DOCUMENTS (AMENDMENT) BILL:
Read the First time

POWERS OF ATTORNEY (AMENDMENT) BILL:
Read the First time

RESETTLEMENT AUTHORITY (AMENDMENT) BILL:
Read the First time

MEMBERS' PRIVATE MOTIONS:
Utilizing Paddy Lands that cannot be cultivated with Paddy for Productive Purposes

Regularizing the Development and Promotion of the Coconut Industry and Coconut Resources

ADJOURNMENT MOTION:
Removing of Liquor Shops in Proximity of Dalada Maligawa

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මාර්තු 08 වන සිකුරාදා
2013 மார்ச் 08, வெள்ளிக்கிழமை
Friday, 08th March, 2013

අ.භා. 1.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.30 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

උපදේශක කාරක සභා : සාමාජිකයින් ආදේශ කිරීම
ஆலோசனைக்குழு : உறுப்பினர் பதிலீடு செய்தல்
CONSULTATIVE COMMITTEES: SUBSTITUTION OF MEMBERS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ස්ථාවර නියෝග 106අ ප්‍රකාරව, තේරීම් කාරක සභාව විසින් උපදේශක කාරක සභාවන් සඳහා මතු දැක්වෙන ආකාරයට පත් කිරීම් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

(i) ගරු පාඨලී චම්පික රණවක මහතා විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සේවයෙන් නිදහස් කොට ඒ වෙනුවට ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය පත් කිරීමට;

(ii) ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා බනිජ තෙල් කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සේවයෙන් නිදහස් කොට ඒ වෙනුවට ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා පත් කිරීමට;

(iii) ගරු ඩලස් අලහප්පෙරුම මහතා පරිසර හා පුනර්ජනනීය බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සේවයෙන් නිදහස් කොට ඒ වෙනුවට ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා පත් කිරීමට;

(iv) ගරු ඩුලිප් විජේසේකර මහතා තාක්ෂණ, පර්යේෂණ හා පරමාණුක බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සේවයෙන් නිදහස් කොට ඒ වෙනුවට ගරු පාඨලී චම්පික රණවක මහතා පත් කිරීමට;

(v) ගරු කනක හේරත් මහතා තාක්ෂණ, පර්යේෂණ හා පරමාණුක බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සේවයෙන් නිදහස් කොට ඒ වෙනුවට ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා පත් කිරීමට;

(vi) ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සේවයෙන් නිදහස් කොට ඒ වෙනුවට ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා පත් කිරීමට;

(vii) ගරු එස්.බී. දිසානායක මහතා ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සේවයෙන් නිදහස් කොට ඒ වෙනුවට ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා පත් කිරීමට;

(viii) ගරු හුනෙයිස් ෆාරූක් මහතා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සේවයෙන් නිදහස් කොට ඒ වෙනුවට ගරු සරත් කුමාර ගුණරත්න මහතා පත් කිරීමට.

II

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2013 මාර්තු මස 08 වන සිකුරාදා, එනම් අද දින පස් වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ X වැනි කොටස සහ හයවැනි කාණ්ඩයේ XI වැනි කොටස; 2011 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VII වැනි කොටස, හතරවැනි කාණ්ඩයේ IV වැනි කොටස මම ඉදිරිපත් කරමි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාවේ එකී කොටස් මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් 2005, 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂ සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා පළාත් පාලන හා පළාත් සභා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් 2011 වර්ෂය සඳහා සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කෘෂිකර්ම කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් 2010 වර්ෂය සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා සී/ස ඇල්කඩුව වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

උපදේශක කාරක සභා වාර්තා
ஆலோசனைக் குழு அறிக்கைகள்
CONSULTATIVE COMMITTEE REPORTS

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2008 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2010 සහ 2011 වර්ෂ සඳහා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තා.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 1 -1946/'11- (2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මහින්ද චින්තන ඉදිරි දැක්ම : ධීවර ප්‍රජාව සඳහා නිවාස

"மஹிந்த சிந்தனை - தொலைநோக்கு": மீனவர்களுக்கு வீடுகள்

"MAHINDA CHINTANA - A VISION FOR THE FUTURE" HOUSES FOR FISHERFOLK

2222/'12

3. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩ පිළිවෙළ යටතේ, ධීවර නගර හා ගම්මාන ඉලක්ක කර ගෙන නිවාස 30,000 ක් ඉදිකිරීම සඳහා රුපියල් කෝටි 150ක් වෙන් කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි රුපියල් කෝටි 150 ක මුදලක් වෙන් කළේ කුමන වර්ෂයේ අය වැයෙන්ද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාසවල පදිංචිකර ඇති ධීවර පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කටපොළොව, නීරක වලමුල්කල් අපිවිරුත්ති අමෙච්චරෙයි කේට්ට විනා:

(அ) மஹிந்த சிந்தனை - தொலைநோக்குக் கொள்கைகளில் "செமட நிவசக்-ஹிதட செவணக்" வேலைத் திட்டத்தின்கீழ், மீனவ நகரங்கள் மற்றும் கிராமங்களை இலக்காகக்கொண்டு 30,000 வீடுகளை நிர்மாணிக்க 150 கோடி ரூபாவை ஒதுக்குவதாக வாக்குறுதி அளிக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வாக்குறுதியின் பிரகாரம் 150 கோடி ரூபா எந்த ஆண்டு வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்பட்டது என்பதையும்;

(ii) இன்றளவில் நிர்மாணப் பணிகள் பூர்த்தி செய்யப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) குறித்த வீடுகளில் குடியமர்த்தப்பட்டுள்ள மீனவக் குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Is he aware that a pledge was made under the "Samata Niwasak - Hithata Sevanak" programme of the "Mahinda Chintana - A vision for the Future" manifesto that Rs. 1.5 billion will be allocated for the construction of 30,000 houses targeting fishing towns and villages?

(b) Will he inform this House -

(i) the year in which a sum of Rs. 1.5 billion was allocated from the Budget as per the pledge mentioned above;

(ii) the number of houses of which construction work has been completed by now; and

(iii) the number of fisher families which have been settled in the aforesaid houses?

(c) If not, why ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. කෝටි 150ක් වැය කරලා ධීවර නිවාස 30,000ක් ඉදි කරනවාය කියලා මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් පොරොන්දු වෙලා තිබෙනවා. මේ වන විටත් ඒ මුදල් වෙන් කර නැතැයි කියන කාරණය දැන් ඇමතිතුමාගේම පිළිතුරෙන් පැහැදිලි වෙනවා. මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් මේ රටේ ධීවර ප්‍රජාවට නිවාස 30,000ක් හදන්නට කෝටි 150ක් වෙන් කරනවාය කිව්ව පොරොන්දුව ක්‍රියාත්මක වෙන්නේ නැද්ද කියලා මා එතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මෙහෙමයි තිබෙන්නේ. 2005 දී ධීවර නිවාස වැඩ පිළිවෙළ යටත් කරලා තිබුණා, වෙනමම අමාත්‍යාංශයකට. ඒ වෙලාවේ යටිතල පහසුකම් සංවර්ධන හා ධීවර නිවාස අමාත්‍යාංශය කියලා වෙනමම අමාත්‍යාංශයක් තිබුණා. 2006 දී මේ වැඩ පිළිවෙළ ජාතිය ගොඩ නැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයට දීලා තිබෙනවා. 2008 දී මේ වැඩ පිළිවෙළ ජාතිය ගොඩ නැඟීමේ අමාත්‍යාංශයට දී තිබෙනවා. දැන් ඒ ඔක්කොම ඉවරයි. ඒ වෙලාවේ ඒකට මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. මගේ ළඟ වාර්තා නැහැ, මොනවාද වෙලා තිබෙන්නේ කියලා බලන්න. කොහොම වුණත් අප දැන් නිවාස ව්‍යාපෘතිය අපේ අමාත්‍යාංශය යටතේ ආරම්භ කර තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කයේ දැයට කිරුළ ප්‍රදර්ශනය දවසේ නිවාස සියයක් හදලා අප පළමුවැනි නිවාස ව්‍යාපෘතිය ජනාධිපතිතුමාගේ අතින් විවෘත කරනවා. අනිකුත් ව්‍යාපෘති ආයෝජන මාර්ගයෙන් අප හැම දිස්ත්‍රික්කයක් පුරාම ආරම්භ කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමනි, තරහා නැතිව මගේ පළමුවන අතුරු ප්‍රශ්නයට පොඩ්ඩක් උත්තර දෙන්න පුළුවන්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒකට මට හරියට කියන්න බැහැ. මොකද, පසු ගිය කාලයේ මේ අමාත්‍යාංශය තිබුණේ නැහැ. ඒකයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මා අහනවා.

විශේෂයෙන්ම වර්තමාන ජනාධිපතිතුමාම දියවර නිවාස වැඩසටහන කියලා බොහොම උදාර සංකල්පයක් දියත් කළා. ධීවර නිවාස ඉදි කරන්න එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වුණු ඒ මුදල් මේ වන විටත් වෙන් කරලා නැහැ කියන කාරණය මා කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ. රුපියල් මිලියන 8,500ක් -රුපියල් කෝටි 850ක්- මිහින් ලංකා වැනි කිසිම වැදගැම්මකට නැති ව්‍යාපෘතිවලට වෙන් කරන කොට, මේ රටේ ධීවර ප්‍රජාවට වෙන් කරනවායි කිව්ව රුපියල් කෝටි 150 වෙන් කරන්නේ නැතුව මේ ආණ්ඩුව ප්‍රමුඛතාවන් පටලවාගෙන තිබෙනවා නේද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. මගේ පැත්තෙන් බැලුවාම නම් මිහින් ලංකා වැනි ගුවන් සේවයක් - ආර්ථික වශයෙන් ඉතා අඩු මුදලකට යා හැකි budget airlines - හැම රටකම තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම අද මැද පෙරදිග යන අහිංසක අපේ කාන්තාවන්ට හා පිරිමින්ටත්, දුප්පත් කට්ටියටත්, බුද්ධ ගයාව වැනි සිද්ධස්ථාන වඳින්න යන කට්ටියටත් ඒ වාගේ ගුවන් යානයක් නැත්නම් ඉතාමත්ම අපහසුතාවකට පත් වනවා. ඒ නිසා එයත් ප්‍රමුඛතාවක්, මෙයත් ප්‍රමුඛතාවක්. මේ ව්‍යාපෘතිය ඉදිරියේදී ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මා අහනවා. ධීවර නිවාස 30,000ක් හදනවා කියලා මහින්ද චින්තන ඉදිරි දැක්මේ කිව්වා. දැනට ගෙවල් 100ක් හදන්නට සැලසුම් කරලා තිබෙනවා කියලා ඔබතුමාගේ උත්තරයෙන් කිව්වා.

එතකොට ඉතුරු වනවා 29,900ක්. ඔබතුමා මේ උත්තරීතර සභාවට වග කීමෙන් ප්‍රකාශ කරනවාද, ධීවර නිවාස ඒ 29,900 ඉදිරි ජනාධිපතිවරණයට පෙර, ඒ කියන්නේ ඉදිරි වසර හතර අතුළත අනිවාර්යයෙන්ම -නිශ්චිතවම- අවසන් කරනවා කියලා. ඔබතුමා ප්‍රතිඥාවක් දෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පැහැදිලිවම නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ප්‍රතිඥාවක් දෙන්නේ නැහැ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මට කොහොමටවත් ප්‍රතිඥාවක් දෙන්න බැහැ. හැබැයි, මා බලාපොරොත්තු වනවා පුළුවන් තරමක් හදන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ, මහින්ද චින්තන ඉදිරි දැක්මේ තිබෙන ඒ පොරොන්දුව බොරුවක්?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
බොරුවක් වන්නේ නැහැ. මොකද, මහින්ද චින්තනය තව ඉදිරියට යනවා නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
බොරුවක් වනවා නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. මහින්ද චින්තන ඉදිරි දැක්ම තව අවුරුදු හතරකින් ඉවර වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා හිතුවාට ඒක තව අවුරුදු හතරකින් ඉවර වෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
රුපියල් කෝටි 150ක් වෙන් කර, ගෙවල් 30,000ක් හදනවා කියලා පොරොන්දු වෙලා, දැන් මෙතුමාම මේ උත්තරීතර සභාවට කියනවා, ඒ කෝටි 150 වෙන් කරලාත් නැහැ; ඒ ගෙවල් 30,000න් ගෙවල් 100යි හදන්නේ; 29,900ක් හදන්න ඉතිරි වනවා; ඒ 29,900 හදනවාය කියන පොරොන්දුව දෙන්නත් බැහැ කියලා. ඒක පුදුම විහිළුවක් නේ. ඒක සම්පූර්ණ විහිළුවක් නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමා හැන්සාඩ් වාර්තාවට එකම දේ දෙසැරයක් කියනවා. එක සැරයක් කිව්වාම ඒවා හැන්සාඩ් වාර්තාවේ සටහන් වනවා. නැවත නැවත කියන්න ඕනෑ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
හැන්සාඩ් වාර්තාවට නොවෙයි, රටේ ජනතාවගේ දැන ගැනීමටයි කියන්නේ. ගරු කථානායකතුමනි, මහින්ද චින්තනයේ "දියවර ගම්මාන" වැඩසටහන කියන්නේ උදාර සංකල්පයක්. ඇත්ත වශයෙන්ම උදාර සංකල්පයක්. නමුත් කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ මහින්ද චින්තනයේ තිබුණු "දියවර ගම්මාන" උදාර සංකල්පය, අද මහින්ද චින්තන ඉදිරි දැක්මෙන්ම කුණු බක්කියට විසි කරලා තිබෙන බව. ඒක සාධාරණද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමාගේ පියා මොන තරම් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්ද? එතුමාට මා බොහොම ගරු කරන කෙනෙක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ පියා ගැන නොවෙයි මා කථා කරන්නේ. මේ කථා කරන්නේ වර්තමානයේ ජාතියේ පියා ගැන.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමාගේ පියාගේ "ජන සවිය" වැඩසටහන කොහොමද කෙරුණේ? ඒ වාගේ තමයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අපි මේ කථා කරන්නේ, වර්තමානයේ මේ රටේ ඉන්න ආඩම්බරකාර තාත්තා ගැන.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ විසිපන්දාහේ තැන්පතුවේ ශත පහක්වත් නැහැ නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නයෙන් පැනලා යන්න එපා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එතුමා හිටියා නම් ඒවා කරයි. ඒ වාගේම අපි ඉදිරියේදී තවත් ඉදි කිරීම් කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහපු ප්‍රශ්නයට උත්තරය දෙන්න. මගේ පියාණන් කිව්වේ නැහැ නේ කෝටි 150ක් වෙන් කරලා, ධීවර නිවාස 30,000ක් හදනවා කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ, නැහැ. මා කිව්වේ "ජන සවිය" ගැන.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා ඔබතුමා මට මේකට උත්තර දෙන්න. "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව තිබෙනවා, ගෙවල් 30,000ක් හදන්න කෝටි 150ක් වෙන් කරනවා කියලා. ඔබතුමා කියනවා, ගෙවල් 100යි හදන්නේ කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හදලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉතිරි නිවාස 29,900 ඉදිරි ජනාධිපතිවරණයට පෙර හදනවා කියලා ඇයි ප්‍රතිඥාවක් දෙන්න බැරි? ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මම මේ ධුරය භාර ගත්තේ 2010 වර්ෂයේ මැද භාගයේ. මේ ඔක්කෝම සැලසුම් කරලා පළමුවැනි ව්‍යාපෘතිය විධියට නිවාස දෙදහක් හදන්න දැන් මම කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ විධියට ඒ ව්‍යාපෘතිය හැම දිස්ත්‍රික්කයකම ඉදිරියට යනවා. මම කියන්නේ නැහැ, මේ නිවාස 29,900 එක වරට හදන්න පුළුවන් කියලා. විශාල ප්‍රමාණයක් හදලා ඉවර කරලා තමයි ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
29,900න් කීයක් හදනවාද කියන්න පුළුවන්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එහෙම එක වරම මට කියන්න බැහැ, මේ දවස්වලට මේ ගණන හදනවා කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉතින් එකවරම 30,000ක් හදනවා කියලා ජනාධිපතිවරණයේදී කිව්වා නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. එකවරම හදනවා කිව්වේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එක වරට 30,000ක් හදනවා කියලා ජනාධිපතිවරණයේදී කියන්න පුළුවන් නම් ඇයි දැන් කියන්න බැරි?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
"මහින්ද චින්තන ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කොහේවත් එකවරට හදනවා කියලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කඩින් කඩ හදනවා කියලාද තිබෙන්නේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්. නැතුව කොහොමද නිවාස හදන්නේ එකවරම?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ, "මහින්ද චින්තන ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය නැවතත් මුද්‍රණය කළාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එකවර නිවාස 30,000ක් හදන්න පුළුවන් සමාගමවත් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගෙවල් 29,000ක් තෝරලා සායම් කළා නම් ඉවරයි නේ.

ප්‍රශ්න අංක 4-2410/'12-(2), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේක වැදගත් ප්‍රශ්නයක්. දිගින් දිගටම කල් ඉල්ලනවා නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ. කල් දාලා නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ප්‍රශ්නය අහන තුන්වැනි වතාව. ඔබතුමාත් දන්නවා නේ. මේක පොලීසිය සම්බන්ධ වැදගත් ප්‍රශ්නයක්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නවලට ඉක්මනින් පිළිතුරු දෙන්න. මොකද, එතුමා මහ ඇමති තරගයට ගියාම එතුමාට පිළිතුරු ගන්න වේලාවක් නැති වෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ඔබතුමා හිතා ගෙන ඉන්න හැටි තමයි. කලබල වෙන්න එපා. මගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නකෝ, කරුණාකරලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ කියන්නේ ඒ යෝජනාවට අකැමැතිද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අකැමැතියි. ඒ එතුමාගේ ඔළුවේ තිබෙන එකයි. ඒකට කලබල වෙන්න එපා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිට්ප්පට්ටදු.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5 -2537/'12- (3), ගරු අනුර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිට්ප්පට්ටදු.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 -2777/'12- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිට්ප්පට්ටදු.
Question ordered to stand down.

බීටිඅයි බැක්ටීරියාව : භාවිත නොකිරීම
பீ.ரீ.ஐ. பற்றீரியா : பயன்படுத்தப்படாமை
BTI BACTERIUM : NON-USE

2911/'12

7. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ඩෙංගු මර්දනය සඳහා පසු ගිය වර්ෂයේදී කියුබාවෙන් ආනයනය කළ බීටිඅයි බැක්ටීරියා විශාල ප්‍රමාණයක් මේ වන විටත් භාවිතයට ගෙන නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කියුබාවෙන් ආනයනය කළ බීටිඅයි බැක්ටීරියාවෙන් මේ වන විට භාවිතයට නොගෙන ඉතිරිව ඇති ප්‍රමාණය කොපමණද;

(ii) ඩෙංගු රෝගය වසංගත තත්ත්වයට පත්වන තෙක් මදුරුවන් මර්දනය සඳහා එම බැක්ටීරියාව ප්‍රයෝජනයට නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

සුකාදාර අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) ටෙංකු ඔලිප්පුක්කාක කටන්ත වරුටත්තිල් කියූපා විලිරුන්තු ඉරක්කුමති සෙය්යප්පට්ට පී.ෆී.ඉ. පත්‍රීරියාක්කළිල් පෙරුම්පකුති ඉන්‍රුවරෙ පයන් පටුත්තප්පටාතුළ්ළතෙ අවර් අරිවාරා?

(ආ) (i) කියූපාවිලිරුන්තු ඉරක්කුමති සෙය්යප්පට්ට පී.ෆී.ඉ. පත්‍රීරියාක්කළිල් ඉන්‍රුවරෙ පයන් පටුත්තප්පටාතු එන්ජියුළ්ළ අළවු එව්වළ වෙන්පතෙයුම්;

(ii) ටෙංකු නෝය් කොල්ළෙනෝය් නිලෙමෙක්කු මාරුම්වරෙ නුළම්පුකළෙ ඔලිප්පතර්කාක මේර්පඩි පත්‍රීරියාක්කළෙප් පයන්පටුත්තාතිරුප් පතර්කාන කාරණංකළ් යාවෙ එන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ඉ) ඉන්‍රේල්, ඒන්?

asked the Minister of Health:

(a) Is he aware that a large amount out of the BTI bacterium that was imported from Cuba has not been used upto now?

(b) Will he state-

(i) the amount of BTI bacterium that remains unused out of the amount that was imported from Cuba ; and

(ii) the reasons for not using that bacterium to control mosquitoes until dengue menace reaches epidemic proportions?

(c) If not, why ?

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - சுகாதார அமைச்சர்)
(The Hon. Maithripala Sirisena - Minister of Health)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

ජාතික ඩෙංගු මර්දන ඒකකය මඟින් එවන ලද වාර්තාවට අනුව,

(අ) ඩෙංගු මර්දනය සඳහා පසු ගිය වර්ෂයේ (2012) දී කියුබාවෙන් බීටිඅයි බැක්ටීරියා ආනයනය කර නොමැත. 2010.09.15 දින කියුබාවෙන් බීටිඅයි බැක්ටීරියා කීටනාශක ලීටර් 10,000ක ප්‍රමාණයක් මිල දී ගන්නා ලදී.

(ආ) (i) සියලු කියුබානු බැක්ටීරියා කීට නාශක ප්‍රාදේශීය කාර්යාල සඳහා නිකුත් කර ඇති අතර, මේ වන විට ඒවා සියල්ල භාවිත කර අවසන් වී ඇත.

(ii) දිවයින පුරා ප්‍රාදේශීය මට්ටමින් එම බැක්ටීරියාව මදුරු මර්දනය සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් එතුමා පැහැදිලි කරපු නිසා මම එතුමාට කරදර කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, එතුමාට හැමෝම කරදර කරන නිසා.

ගරු කථානායකතුමනි, මම එක අතුරු ප්‍රශ්නයක් පමණක් අහනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, විවිධ රටවලින් මෙරටට අවශ්‍ය ඖෂධ වර්ග 7, 500ක් පමණ ආනයනය කරනවා කියලා ඔබතුමා දන්නවා. මෙම ඖෂධ ගෙන්වන ව්‍යාපාරිකයින් මෙම ඖෂධවලින් සියයට 800 දක්වා ලාභ ලබා ගෙන තමයි ඒවා අළෙවි කරන්නේ. ගරු ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම ෆාමසිවලින් ඖෂධ මිලදී ගැනීමේදී සාමාන්‍ය පාරිභෝගිකයන්ට විශාල මිල ගණන් ගෙවලා තමයි ඒවා මිලදී ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ආනයනය කරන මිලට වඩා සියයට 800ක් පමණ වූ වැඩි මුදලකටයි ව්‍යාපාරිකයින් මේ ඖෂධ විකුණන්නේ. සෞඛ්‍ය ඇමතිතුමා විධියට මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේ ගන්නා පියවර කුමක්ද කියලා අපට දැන ගන්න පුළුවන්ද?

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ගරු කථානායකතුමනි, පළමුවැනි දේ තමයි අහලා තිබෙන ප්‍රශ්නයට අදාළ කාරණයක් නොවෙයි එතුමා අහන්නේ. නමුත් මම ඒකට පිළිතුරක් දෙන්නම්. විශේෂයෙන්ම පෞද්ගලික වෙළඳ පොළේ ඉතාමත්ම අධික මිලකට මේ ඖෂධ අළෙවි කරන නිසා, අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව වෙළඳ අමාත්‍යාංශයෙන් මේ සම්බන්ධයෙන් ගැසට් නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා. මොකද මිල සම්බන්ධයෙන් කටයුතු කරන්නේ වෙළඳ අමාත්‍යාංශයයි. මේ වන විට අපි පළමුවැනි පියවර විධියට සියලුම ඖෂධ අළෙවි සැල්වල ඖෂධ labelවල වාගේම, ඒ ඖෂධ ගබඩා කරලා තිබෙන සෑම පෙට්ටියකම මිල සඳහන් කිරීමට දැනට දැනුම් දීලා තිබෙනවා. ඊළඟට දෙවැනි පියවර විධියට අපි ඖෂධ මිල පාලනයක් සම්බන්ධයෙන් ඉදිරියේදී පියවර ගන්නවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු ඇමතිතුමනි, හැබැයි එකම ගැටලුව මේකයි. ඒ සම්බන්ධයෙන් මොන පියවර ගත්තත් පසු ගිය කාලයේ දිගින් දිගටම ඒ කටයුත්ත සිදු වෙලා නැහැ. සමහර syringes ෆාමසියෙන් ගන්න කියලා රෝහලෙන් කියනවා. එය ෆාමසියෙන් ගත්තේ රුපියල් 100ට නම් රෝහල මිල දී ගෙන තිබෙන්නේ රුපියල් 300 වාගේ මිලකටයි. අපි එය සංසන්දනය කර බැලුවා. ඒ මිල දෙක අතර තිබෙන්නේ විශාල පරතරයක්. රජයේ විශාල මුදල් නාස්තියක් තිබෙනවා. මා හිතන්නේ ඒකට ඔබතුමා වගකියන්න ඕනෑ නැහැ කියලායි. ඒකට කවුරුන් වග කියන්න ඕනෑද කියා අපි දන්නේ නැහැ. නමුත් ඇයි එහෙම වෙන්නේ? ඒක පාරිභෝගිකයන්ට දරා ගන්න බැහැ.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ගරු කථානායකතුමනි, අපි මේ ප්‍රශ්නයට හුඟක් අවස්ථාවල උත්තර දීලා තිබෙනවා. බොහොම දීර්ඝව පිළිතුරු දිය යුතුයි ඖෂධ මිල සහ ඖෂධ මිල පාලනය සම්බන්ධයෙන්. එක් එක් වෙළඳ ආයතන එක් එක් ආකාරයට අළෙවි කරනවා. ඒ නිසා තමයි මිල පාලනයක් සඳහා තබන පළමුවැනි පියවර විධියට, දැනට සඳහන් මිල පැහැදිලිවම මුද්‍රණය කරන්න කියලා කියා තිබෙන්නේ. ඊළඟට අපි දෙවැනි පියවර විධියට මිල පාලනයක් ඇති කරනවා.

උතුරු මැද පළාතේ වකුගඩු රෝගීන් : විස්තර
வட மத்திய மாகாணத்தில் சிறுநீரக நோயாளர்: விபரம்
KIDNEY PATIENTS IN NORTH CENTRAL PROVINCE : DETAILS

3099/'12

8. **ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2012 වර්ෂය වන විට උතුරු මැද පළාතේ හඳුනාගෙන ඇති වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2012 දක්වා කාල සීමාව තුළ වකුගඩු රෝගය වැළඳීමෙන් උතුරු මැද පළාතේ මිය ගිය සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝගයෙන් ජනතාව මුදා ගැනීමට රජය ගෙන ඇති පියවර කවරේද;

(iv) වකුගඩු රෝගය ඇති වීම සහ කෘෂිරසායනික ද්‍රව්‍ය හා රසායනික පොහොර භාවිතය අතර සම්බන්ධතාවක් තිබේද;

(v) වකුගඩු රෝගය හා ඒ ප්‍රදේශයේ ජනතාව බීමට ගන්නා ජලය අතර සම්බන්ධතාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2012ஆம் ஆண்டளவில் வட மத்திய மாகாணத்தில் இனங்காணப்பட்டுள்ள சிறுநீரக நோயாளர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) 2000ஆம் ஆண்டு முதல் 2012ஆம் ஆண்டு வரையான காலப்பகுதிக்குள் வடமத்திய மாகாணத்தில் சிறுநீரக நோயினால் பாதிக்கப் பட்டு உயிரிழந்தவர்களின் எண்ணிக்கை வருடாந்த அடிப்படையில் தனித்தனியே எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி நோயிலிருந்து மக்களை பாதுகாப் பதற்காக அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) சிறுநீரக நோய் ஏற்படுவதற்கும், விவசாய இரசாயனப் பதார்த்தங்கள் மற்றும் இரசாயன உரப் பயன்பாட்டுக்கும் இடையே தொடர் புள்ளதா என்பதையும்;

(v) சிறுநீரக நோய்க்கும் மேற்படி பிரதேச மக்கள் குடிப்பதற்குப் பயன்படுத்தும் நீருக்கும் இடையே தொடர்புள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the number of kidney patients identified in the North Central Province by the year 2012;

(ii) separately, on annual basis the number of patients that died of kidney disease in the North Central Province during the period from the year 2000 to 2012;

(iii) the steps taken by the government to save people from the aforesaid disease;

(iv) whether there is any connection between the kidney disease and the use of agro-chemicals and chemical fertilizers; and

(v) whether there is a connection between the kidney disease and the water consumed by the people of the aforesaid area ?

(b) If not, why ?

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2012 වර්ෂය වන විට උතුරු මැද පළාතේ හඳුනාගත් වකුගඩු රෝගීන් සංඛ්‍යාව

අනුරාධපුරය දිස්ත්‍රික්කය

වර්ෂය	**රෝගීන් සංඛ්‍යාව**
2003-2008	6,639
2009	1,143
2010	1,451
2011	1,424
2012 (නොවැම්බර් දක්වා)	977

පොළොන්නරුව දිස්ත්‍රික්කය

වර්ෂය	**රෝගීන් සංඛ්‍යාව**
2006-2008	1,175
2009	365
2010	380
2011	854
2012 (නොවැම්බර් දක්වා)	305

(ii) 2012 වර්ෂය වනවිට උතුරුමැද පළාතේ වකුගඩු රෝගය වැළඳීමෙන් මියගිය සංඛ්‍යාව

අනුරාධපුර දිස්ත්‍රික්කය

වර්ෂය	**වාර්තා වූ මරණ සංඛ්‍යාව**
2004	165
2005	105
2006	194
2007	202
2008	167
2009	332
2010	246
2011	212
2012 (නොවැම්බර් දක්වා)	144

පොළොන්නරුව දිස්ත්‍රික්කය

වර්ෂය	වාර්තා වූ මරණ සංඛ්‍යාව
2004	94
2005	33
2006	102
2007	92
2008	79
2009	91
2010	79
2011	160
2012 (නොවැම්බර් දක්වා)	57

(iii) * වකුගඩු රෝගාශ්‍රිත විශේෂඥ නිපුණතා සහිත මානව සම්පත වැඩිදියුණු කිරීම.

* වකුගඩු රෝග ප්‍රතිකාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

* රෝගය පිළිබඳ වෛද්‍ය සහ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.

* වකුගඩු රෝග පාලනයට අදාළව ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම.

(iv) කෘෂි රසායනික සහ රසායනික පොහොර මෙම රෝගයට හේතුකාරක විය හැකි බවට අනුමාන කර ඇති නමුත් ස්ථිර නිගමනයකට පැමිණ නැත.

(v) බීමට ගන්නා ජලය මෙම රෝගයට හේතු කාරක විය හැකි බවට අනුමාන ඇති නමුත් ස්ථිර නිගමනයකට පැමිණ නැත.

(ආ) පැන නොනඟී.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා කිව්වා, බීමට ගන්නා ජලය මෙම රෝගයට හේතු කාරක විය හැකි බවට අනුමාන කර ඇති නමුත් තවම ස්ථිර නිගමනයකට පැමිණ නැහැයි කියලා. ඒ වාගේම කෘෂි රසායනික සහ රසායනික පොහොර ද්‍රව්‍ය මෙම රෝගයට කෙළින්ම බලපානවාය කියලා තවම ස්ථිර නිගමනයකට ඇවිල්ලා නැහැයි කියලා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මා කියන්න කැමැතියි, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශ කරපු හතර වැනි වාර්තාවේ මේ ගැන පැහැදිලිව සඳහන් කර තිබෙන බව. ශ්‍රී ලංකාවේ සල්ලිවලින් ලක්ෂ 700ක් දීලා මේ වාර්තාව ගෙන්වා ගන්න අවුරුදු දෙකක් ගත වුණා. ඔබතුමාත් මේ ගැන දන්නවා ඇති. ඔබතුමාගේ අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ පාලිත මහීපාල කියන අධ්‍යක්ෂවරයා මේ වාර්තා ටික හංගාගෙන සිටි බව. එම වාර්තාවේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, මේ රටට ගෙන්වන කෘෂි රසායනික ද්‍රව්‍ය සහ පොහොර ප්‍රමිතියෙන් තොරව ගෙන්වීම නිසා මේ වකුගඩු රෝගයට ඒවා කෙළින්ම සම්බන්ධකම් තිබෙනවා කියලා. උපකල්පනයක් නොවෙයි, මෙහි හරියටම තත්ත්වය ඒකයි. ඒක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. ඒ නිසා මා ඔබතුමාගෙන් අහනවා, එම සම්පූර්ණ වාර්තාව මේ ගරු සභාවේ සභාගත කරනවාද කියලා. ඒ අනුව කටයුතු කරන්නට ඔබතුමා ඉදිරිපත් වෙනවාද කියන කාරණයත් මා දැන ගන්න කැමැතියි.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන විධියට වාර්තා හතරක් නැහැ. කලින් අපට මූලික වාර්තාවක් ආවා. ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් අවසාන වාර්තාව ආවේ පසු ගිය සතියේයි. පසු ගිය සතියේ අවසාන වාර්තාව එන්නට පෙර පළමුවැනි මූලික වාර්තාව ආපු අවස්ථාවේත් අපි ඒ වාර්තාවේ සඳහන් කරුණු අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළා. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය අමාත්‍ය අනු කාරක සභාවක් පත් කළා. නමුත් අවසාන වාර්තාව එන තෙක් ඒ සම්බන්ධයෙන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම නවත්වලායි තිබුණේ. පසු ගිය සතියේ තමයි වකුගඩු රෝගය සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් අවසාන වාර්තාව ආවේ. පසු ගිය සතියේ ආපු නිසා අවසන් වාර්තාවේ තිබෙන කරුණු මේ වන විට අපි අධ්‍යයනය කරමින් සිටිනවා. මම ලබන සතියේ එය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනවා.

ඉන්පසුව වකුගඩු රෝගය වැළැක්වීම සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය දී ඇති උපදෙස් හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ජාතික වැඩ සටහනක් සකස් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා දුන්න පිළිතුර ගැන මට සෑහීමට පත් වෙන්න බැහැ. අතුරු වාර්තා තුනක් ආවා. උතුරු මැද පළාත වාගේ පළාතක තිබෙන මේ වාගේ ව්‍යසනයක් ගැන ඔබතුමා මේ විධියේ සැහැල්ලු පිළිතුරක් දීම ගැන එක පැත්තකින් මම කනගාටු වෙනවා.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, දැන් අනුරාධපුර රෝහලේ dialysis machines 22ක් තිබෙනවා. අද වෙන කොට වැඩ කරන්නේ එයින් 13යි. ඒවායින් dialysis කරන්න පුළුවන් වන්නේ රෝගීන් 40කට පමණයි. දැනට මාස තුනකට ඉස්සරවෙලා පදවිය රෝහලට මැෂින් එකක් අර ගෙන ගිහිල්ලා තිබෙනවා. තවම ඒ සඳහා පුහුණු නර්ස් කෙනෙක් හෝ එකම නිලධාරියෙක්වත් නැහැ. තවම මැෂින් එක වැඩ කරන්නේ නැහැ. මැදවිච්චිය රෝහලේ දැනට වකුගඩු රෝගීන් තුන්දහස් ගණනක් ලියාපදිංචි වෙලා ඉන්නවා. හැබැයි එකම dialysis machines එකක්වත් නැහැ. ඔබතුමා කියන විධියට ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාව ක්‍රියාත්මක කරන්න පෙර අඩුම තරමින් ඒ මිනිසුන්ගේ ලේ පිරිසිදු කරන්න ඕනෑ. ඊයේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, සියලුම පහසුකම් සලසා තිබෙනවාය කියා. මම අදට තිබෙන තොරතුරු අනුවයි කථා කරන්නේ. අද ඒ රෝහල්වල තත්ත්වය මේකයි.

ඔබතුමාගේ ලැයිස්තුව අනුව බැලුවාම පසු ගිය කාලය තුළ විසිදහසත්, විසිපන්දහසත් අතර ගණනක් මැරිලා තිබෙනවා. යුද්ධයට වඩා මිනිස්සු මැරෙන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා මේ වකුගඩු රෝගය. ඉතින් රජය මේ වාගේ සැහැල්ලු වැඩ පිළිවෙළක් අනුගමනය කරන්නේ මොකද කියන එක මා අහන්න කැමැතියි.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන විධියට අනුරාධපුරය, පොළොන්නරුව දිස්ත්‍රික්කවල විතරක් නොවෙයි, මේ වන විට දිවයිනේ බොහෝ ප්‍රදේශවල වකුගඩු රෝගය තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේත් තිබෙනවා; අම්පාර දිස්ත්‍රික්කයේත් තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයෙනුත් මේ වන විට වාර්තා වෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ගෙන යන ජාතික වැඩ පිළිවෙළේදී අපි මේ වන විටත් අතිවිශාල මුදලක් වැය කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ආකාරයට මෙය කිසිසේත්ම සැහැල්ලුවට අරගෙන නැහැ. ඉතාමත්ම බරපතළ ප්‍රශ්නයක් විධියට සැලකිල්ලට අරගෙනයි රජය මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ.

[ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා]

අපි රෝහල්වලට dialysis machines සපයා තිබෙනවා. ඒ වාගේම ඉදිරියටත් සපයනවා. සමහර වෙලාවට ඒ යන්ත්‍ර නිතර වැඩ කරන නිසා - සාමාන්‍යයෙන් ඒක යන්ත්‍රයක ස්වභාවය - ඒවා කැඩෙන අවස්ථා තිබෙනවා. එවිට නැවත අපි ඒවා අලුත්වැඩියා කිරීම් කරනවා. ඒ නිසා ඒ සඳහා දෙන ඖෂධ ඒ වාගේම අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, තාක්ෂණික උපකරණ මේ සියල්ලම අපි ලබා දීමේ කටයුතු කරනවා. දැනට දිවයිනේ රෝහල් ගණනාවක විශේෂ වකුගඩු ඒකක පිහිටුවා තිබෙනවා. කොළඹත් තිබෙනවා; අනෙක් ප්‍රදේශවලත් තිබෙනවා. ඒ නිසා මේ ගැන ඉතාම දැඩි අවධානයකින්, වග කීමකින් අපි කටයුතු කරන්නේ. ඉතා විශාල මුදලක් මේ සඳහා අපි දැනට වැය කරනවා. නමුත් ලෝක සෞඛ්‍ය සංවිධානය දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී අපි විශ්වාස කරනවා, වකුගඩු රෝගය වැළැක්වීම සම්බන්ධයෙන් දීර්ඝ කාලීනව තමයි අපට යම් ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වන්නේ කියලා.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමා අන්තිමට කිව්වේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා කියලායි. දැන් උතුරුමැද විතරක් නොවෙයි, අනෙකුත් කෘෂිකාර්මික ප්‍රදේශවලත් විශේෂයෙන් අපේ ගරු කථානායකතුමා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේත් මේ රෝගය දැන් ව්‍යාප්ත වෙලා තිබෙනවා. මේක ලොකු වසංගතයක්.

ඉතින් ඒ වසංගතය ගැන ලෝක සෞඛ්‍ය සංවිධානය කියන හැටියට උතුරු මැද පළාතේ ජනගහනයෙන් සියයට 15කට විතර මේ රෝගය වැළඳිලා තිබෙනවාය කියන එකයි ඒ ගොල්ලන්ගේ මතය වෙලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, සෞඛ්‍ය ඇමතිතුමා හැටියට ඔබතුමා මේක තහවුරු කරාවි. සියයට 15ක් වශයෙන් ගත්තොත් දැනට උතුරු මැද පළාතේ ලක්ෂ 12ක්, 13ක් වන ජනගහනයෙන් ලක්ෂ එකහමාරකට, දෙකකට කිට්ටු ප්‍රමාණයකට මේ රෝගය වැළඳිලා තිබෙනවා. දීර්ඝකාලීනව මේක ක්‍රියාත්මක වෙන්න ගියොත් තව අවුරුදු හතරක්, පහක් යනකොට මේ ජනතාවගේ මළකඳන් ටික තමයි අපට දකින්න ලැබෙන්නේ.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(මාණ්පුමිකු මෛත්‍රිරිපාල සිරිසේන)
(The Hon. Maithripala Sirisena)

ගරු කථානායකතුමනි, මේවා මෙතුමා හිතලා කියන සංඛ්‍යා ලේඛන. මම දැන් මෙතැන වාර්තා ඉදිරිපත් කළා.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

හිතලා නොවෙයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවේ අඩංගු කරුණු අනුව තමයි මම මේ කියන්නේ. මට මේක අහන්න දෙන්නකෝ. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාට හරියට කේන්ති යනවා නේ. මෙහෙම කේන්ති යනවා නම් අගමැතිකම බලාපොරොත්තු වෙන්න බැහැ. කේන්ති ගන්න එපා.

කථානායකතුමා
(සභානායකයා අවර්ගයා)
(Mr. Speaker)

කථා පවත්වන නිසා නේ කේන්ති යන්නේ. කරුණාකරලා තමුන්නාන්සේ ප්‍රශ්නය කෙටියෙන් අහන්න. දැන් හුහාක් ඇහුවා.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඡන්දය දෙන්න ජනතාව ඉන්න ඕනෑ. එහෙම නොවුණොත් මීළඟ අගමැතිකම බලාපොරොත්තු වෙන්න බැහැ.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(මාණ්පුමිකු මෛත්‍රිරිපාල සිරිසේන)
(The Hon. Maithripala Sirisena)

ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න, මොකක්ද කියලා.

කථානායකතුමා
(සභානායකයා අවර්ගයා)
(Mr. Speaker)

ඒ කිසිවක් අදාළ නැත.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(මාණ්පුමිකු මෛත්‍රිරිපාල සිරිසේන)
(The Hon. Maithripala Sirisena)

ප්‍රශ්නය අහන්න. අදාළ නැති ඒවායි අහන්නේ.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

මේක ඔබතුමාට මරණීය තර්ජන ඇවිල්ලා තිබෙන අවස්ථාවක්.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(මාණ්පුමිකු මෛත්‍රිරිපාල සිරිසේන)
(The Hon. Maithripala Sirisena)

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ ප්‍රශ්නය අහන්න.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

මම ඇහුවා.

කථානායකතුමා
(සභානායකයා අවර්ගයා)
(Mr. Speaker)

ගරු ඇමතිතුමා, එතුමාගේ සෞඛ්‍යය ගැනත් බලන්න. මොකද, ඒ දිස්ත්‍රික්කයේ නේ.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(මාණ්පුමිකු මෛත්‍රිරිපාල සිරිසේන)
(The Hon. Maithripala Sirisena)

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාටත් ප්‍රතිකාර කරන්නම්.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

මට ප්‍රතිකාර කරන්න ඉස්සෙල්ලා ඔබතුමාගේ සෞඛ්‍යය ගැන විතරක් නොවෙයි, ඔබතුමාගේ ජීවිතාරක්ෂාව ගැනත් බලා ගන්න වෙයි. මොකද, ඔබතුමා පුවත් පත්වලට කියා තිබෙන ආකාරයට.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(මාණ්පුමිකු මෛත්‍රිරිපාල සිරිසේන)
(The Hon. Maithripala Sirisena)

ගරු කථානායකතුමනි, 2012 වර්ෂයේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේත්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් රෝගීන් සංඛ්‍යාව ඉදිරිපත් කළා. 2012 වර්ෂයේ අනුරාධපුරයේ රෝගීන් සංඛ්‍යාව 144යි, පොළොන්නරුවේ 57යි.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

ඕක තමුන්නාන්සේගේ ඉදිරිපත් කිරීම. ලෝක සෞඛ්‍ය සංවිධානය කියා තිබෙනවා මේ රෝගීන්ගේ ප්‍රමාණය සියයට 15ක් කියලා.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
ඔබතුමා කියන ආකාරයට ඒ රෝගීන් සියයට 15ක් ඒ ප්‍රදේශවල නැහැ. අප ඒ ගැන වග කීමකින් කටයුතු කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔය මැරුණු ගණන.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඔබතුමා ඔය කියන්නේ මැරුණු සංඛ්‍යාව.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-1947/'11-(2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගුරු සහායකවරුන් : විස්තර
ஆசிரிய உதவியாளர்கள் : விபரம்
TEACHER ASSISTANTS : DETAILS

2325/'12

13. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) ස්වේච්ඡා සේවයේ නියුතු ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුක්ත කර ඇති බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙස බඳවා ගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) දැනට සේවයේ නියුතු ගුරු සහායකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ගුරු සේවයේ 3-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද ගුරු සහායකවරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් ගුරුවරයකුට දැනට ගෙවනු ලබන මාසික වේතනය කොපමණද;

(v) ගුරු සහායකවරුන්ගේ තනතුරු නාමය වෙනස් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගුරු සහායකවරුන් ලෙස බඳවා ගත් සියලු දෙනා ගුරු සේවයට බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ ස්ථිර කර අදාළ ශ්‍රේණියේ වැටුප් තලයක පිහිටුවීමටත්;

(ii) ගුරු සහායකවරුන් ලෙස බඳවා ගත් දිනයේ සිට බලපවත්වන පරිදි ඔවුන් සේවයේ ස්ථිර කිරීමටත්;

කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) தொண்டர் சேவையில் ஈடுபட்டுள்ள ஆசிரியர்கள் ஆசிரிய உதவியாளர்களாக கல்வி அமைச்சின்கீழ் சேவையில் ஈடுபடுத்தப்பட்டுள்ளனர் என்பதை அவர் அறிவாரா?

(ஆ (i) தொண்டர் ஆசிரியர்கள் ஆசிரிய உதவியாளர் களாக ஆட்சேர்க்கப்பட்ட வருடம் யாது;

(ii) தற்போது சேவையில் ஈடுபட்டுள்ள ஆசிரிய உதவியாளர்களின் எண்ணிக்கை யாது;

(iii) ஆசிரிய சேவை 3-II தரத்துக்கு உள்ளீர்க்கப் பட்ட ஆசிரிய உதவியாளர்களின் எண்ணிக்கை யாது;

(iv) மேற்குறிப்பிடப்பட்ட ஓர் ஆசிரியருக்கு வழங்கப் படும் தற்போதைய மாதாந்த சம்பளம் யாது;

(v) ஆசிரிய உதவியாளர்களின் பதவிப் பெயரை மாற்றுவதற்கு நடவடிக்கை எடுக்கப்படு கின்றதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) ஆசிரிய உதவியாளர்களாக ஆட்சேர்க்கப்பட்ட அனைவரையும், ஆசிரிய சேவையின் ஆட்சேர்ப்பு நடைமுறையின்கீழ் நிரந்தரமாக்கி, குறித்த தரத்திற்கான சம்பள மட்டத்தில் அமர்த்துவதற்கும்;

(ii) ஆசிரிய உதவியாளர்களாக ஆட்சேர்க்கப்பட்ட திகதி முதல் அமுலுக்குவரும் வகையில் இவர்களை சேவையில் நிரந்தரமாக்குவதற்கும்

நடவடிக்கை எடுப்பாரா என்பதையும் அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that the teachers engaged in volunteer service have been employed under the Ministry of Education as teacher assistants?

(b) Will he inform this House -

(i) the year in which the volunteer teachers were recruited as teacher assistants;

(ii) the number of teacher assistants employed at present;

(iii) the number of teacher assistants absorbed into Grade 3-II of the Teacher Service;

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

(iv) the monthly salary paid to a teacher of the aforesaid Service; and

(v) whether action will be taken to change the designation of the teacher assistants ?

(b) Will he also inform this House whether action will be taken -

(i) to confirm all those who were recruited as teacher assistants in service under the recruitment procedure pertaining to the Teacher Service and place them on the relevant salary step; and

(ii) to confirm them in service with effect from the date on which they were recruited as teacher assistants ?

(c) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.

(ආ) (i) අංක අමප/06/2282/229/085-II හා 2007.01.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 4,700ක් වන ස්වේච්ඡා ගුරුවරුන් දිවයිනේ සියලු පළාත් පාසල් සඳහා ගුරු සහායකවරුන් ලෙස බඳවා ගැනීමට ක්‍රියාත්මක වී ඇති අතර එක් එක් පළාත්වල බඳවා ගනු ලබන වර්ෂය වෙනස් වී ඇත.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, සමාවෙන්න. ප්‍රශ්නයේ (ආ) (i) කොටසින් මම අසා තිබෙන්නේ, ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙස බඳවා ගනු ලැබූ වර්ෂය කවරේද කියලායි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
වර්ෂය 2007. එක් එක් පළාත අනුව වර්ෂය වෙනස් වී තිබෙනවා.

බස්නාහිර	2007
උතුරු මැද	2007
මධ්‍යම	මෙතෙක් බඳවා ගෙන නැත
සබරගමුව	2008
දකුණ	බඳවා ගෙන නැත
වයඹ	2008, 2009
නැඟෙනහිර	2009
ඌව	2007, 2008
උතුර	2008

(ii) සේවයේ නියුතු ගුරු සහායකවරුන් සංඛ්‍යාව එක් එක් පළාත අනුව පහත පරිදි වේ.

බස්නාහිර	204
උතුරු මැද	831
මධ්‍යම	-
සබරගමුව	302
දකුණ	-
වයඹ	683
නැඟෙනහිර	265ක් බඳවා ගෙන ඇති අතර දැනට 22ක් සේවයේ නියුතු වේ. 206ක් ගුරු විද්‍යාලවල පුහුණුව ලබයි.
ඌව	614
උතුර	1007

(iii) අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගුරු සහායකවරුන් ගුරු සේවයේ 3-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට හැකියාවක් නොමැත.

(iv) අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ගුරු සහායක පත්වීම ලබා වසර 05ක් තුළ ගුරු පුහුණුව හෝ උපාධිය සම්පූර්ණ කළ අයවලුන් ගුරු සේවයේ 3-I ශ්‍රේණියට පත් කර ස්ථිර කරනු ලබන අතර ඔවුන්ව එම ශ්‍රේණියේ වැටුප් තලයේ පිහිටුවනු ලැබේ. 6/2006 (iv) අනුව පුහුණුව ලැබූ ගුරුවරුන් සඳහා TS 2 කාණ්ඩයේ 3-I ශ්‍රේණියේ 2වන පියවර වන රු.14,315.00 හා උපාධිය ලැබූ ගුරුවරුන් සඳහා TS 2 කාණ්ඩයේ 3-I ශ්‍රේණියේ 8වන පියවර වන රු. 15,395.00 වේ.

(v) නැත.

(ඇ) (i) ඉහත (ආ) (iv) පිළිතුරෙහි සඳහන් ආකාරයට අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සුදුසුකම් සම්පූර්ණ කළ අයවලුන් එදින සිටට ස්ථිර කර 3-I ශ්‍රේණියේ වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.

(ii) නැත. ඉහත (ආ) (iv) හි පිළිතුරෙහි සඳහන් අංක 2006/ඊඩී/ඊ/139 හා 2006.11.28 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ලද අංක අමප/06/2282/229/085-II හා 2007.01.11 දිනැති තීරණය අනුව බඳවා ගත් දින සිට වසර 05ක් තුළ ගුරු පුහුණුව හෝ උපාධිය සම්පූර්ණ කළ අයවලුන්ට ගුරු සේවයේ 3-I ශ්‍රේණියට පත් වීමක් ලබා දෙන අතර, පරිවාස කාලය අවසානයේ නියමිත සුදුසුකම් සම්පූර්ණ කළ අයවලුන් එදින සිට ගුරු සේවයේ ස්ථිර කරනු ලැබේ.

(ඇ) ඉහත (ආ) (iv) පිළිතුරම අදාළ වේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. ගරු ඇමතිතුමනි, ගුරු විදුහල්වල පුහුණුව ලැබූ අය, ඒ වාගේම දුරස්ථ ගුරු පුහුණුව ලැබූ අය 2012 සැප්තැම්බර් 20 සහ 24 අතර විභාගයට මුහුණ දීලා ප්‍රතිඵල එන තෙක් මාස 6ක් තිස්සේ බලා ගෙන ඉන්නවා. විශේෂයෙන්ම ඒ ගුරු සහායකවරුන් බොහොම ලොකු අසහනයකින්, පීඩනයකින් විඩාවට පත් වෙලා සිටිනවා. මාස 6ක් ගත වෙලාත් ඒ ප්‍රතිඵල නිකුත් කරලා නැහැ. මේ ප්‍රතිඵල නිකුත් කරලා මේ අයව ප්‍රතිඵලවලට අනුකූලව ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන්නේ කවදාද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ජාතික අධ්‍යාපන ආයතනය විසින් පිළිගත් විභාග පටිපාටිය අනුගමනය කරලා ඒ නිශ්චිත දිනයේදී

ප්‍රතිඵල නිකුත් කිරීම සිදු කරනවා. ඒ සඳහා කිසිම පමාවක් නැහැ. ඒ කර ගෙන යන ක්‍රියා පටිපාටිය අනුව තමයි විභාග ප්‍රතිඵල නිකුත් කිරීම කරන්නේ. උදාහරණයක් වශයෙන් කියන්න පුළුවන් විභාග දෙපාර්තමේන්තුව පවත්වන විභාගවලත් එහෙමයි කියා. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය පවත්වලා කාලයක් ගත වෙනවා ඒ ප්‍රතිඵල පරීක්ෂා කරලා නිකුත් කරන්නට. සාමාන්‍යයෙන් අප්‍රේල් මාසයේදී තමයි සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන්නේ. සෑම වකවානුවකම ඒ ක්‍රියාවලිය සිදු වන්නේ ඒ කාල වකවානුව තුළ. ඔබතුමාට වැරදී තොරතුරක් තමයි දීලා තිබෙන්නේ. අපි ප්‍රතිඵල ලැබුණු වහාම සුදුසුකම් සම්පූර්ණ කළ අය සේවයේ පිහිටුවීම කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගෙන් ඇහුවේ සේවයේ පිහිටුවීම කරන්නේ කවදාද කියලා?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ප්‍රතිඵල ලැබුණු වහාම සේවයේ පිහිටුවීම කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඒ අය මාස 6ක් තිස්සේ බලා ගෙන ඉන්නවා. ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ අය රුපියල් 3,000ක් වැනි සොච්චම් මුදලකට තමයි මේ සේවාව වසර 5ක් තිස්සේ කර ගෙන ආවේ. මේ අය මේ ප්‍රතිඵලවලින් පසුව ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන විට හිඟ වැටුප් ලබා දීමේදීත්, ඒ වාගේම සේවයේ පිහිටුවීමේදීත් ගුරු සහායක පත් වීම් ලැබුණු 2007 ජූනි මාසයේ සිට මේ අය සේවයේ පිහිටුවන්නට සහ එදින සිට හිඟ වැටුප් ලබා දෙන්නට කටයුතු කරනවාද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
නැහැ. එහෙම දෙන්න බැහැ නීත්‍යානුකූලව. රජයේ මුදල් ප්‍රතිපත්තිය අනුව ගුරු සහායකවරුන් කියන්නේ ගුරු ව්‍යවස්ථාවට අනුව ගුරු සේවය සඳහා සුදුසුකම් ලැබූවෙක් නොවෙයි. අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමත් අය ස්වේච්ඡාවෙන්, තමන්ගේ කැමැත්ත මත පාසලේ වැඩ කරලා තිබෙනවා. එතැනදී ආණ්ඩුව කරුණා සහගත ලෙස ඒ දෙස බලා, ඔවුන්ට ගෙවීමක් කරලා තිබෙනවා. ඒ වාගේම අවුරුදු 5ක කාල පරිච්ඡේදය තුළදී අවශ්‍ය සුදුසුකම සම්පූර්ණ කර ගන්නා ලෙස දැනුම් දීලා තිබෙනවා. එවැනි සුදුසුකමක් සම්පූර්ණ කර නොගෙන සිටින අයට දරුවන්ගේ ජීවිත බාර දෙන්න බැහැ. ඒ නිසා අපි කිසි සේත් හිඟ වැටුප් ගෙවීමට බැඳිලා නැහැ. ගුරුවරුන්ටයි වැටුප් ගෙවන්නේ. ගුරු සේවයට බඳවා ගත්ත දවසේ සිට වැටුප් ගෙවනවා. ගුරු සහායකයා කියන්නේ ස්වේච්ඡාවෙන්, කැමැත්තෙන් ගිහින් පාසලක වැඩ කළ කෙනෙක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මම ඒ ප්‍රශ්නය ඇහුවේ සංවේදී ආණ්ඩුවක් නිසා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
සංවේදී නිසා තමයි රුපියල් 3,000ක් ගෙවලා පුහුණුවකුත් ලබා දීමට කටයුතු කර තිබෙන්නේ. ඒ වාගේම කරුණා සහගත සහ දයානුකම්පිත ක්‍රියාවලියක් ලෙස අවුරුදු 5ක් තුළ රජයේ රක්ෂාව හා විශ්‍රාම වැටුප දෙන්න කථා කරලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ජාතික ගීයේ නිර්මාතෘ ආනන්ද සමරකෝන් මැතිතුමාගේ නමින් මහා විද්‍යාලයක් වැවල ප්‍රදේශයේ ස්ථාපනය කර තිබෙනවා. ඔව්වර සංවේදී ආණ්ඩුවක් නම් ජාතික ගීයේ නිර්මාතෘවරයාගේ නමින් පිහිටු වූ ආනන්ද සමරකෝන් විද්‍යාලයේ ප්‍රාථමික අංශය වසා දමන්නට කටයුතු කරන්නේ ඇයි කියා අනුකම්පාසහගත, දයානුකම්පිත ගරු ඇමතිතුමාගෙන් මා අහන්නට කැමතියි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ඒක පළාත් සභාවේ පාසලක් වන්නට ඕනෑ. එවැනි ප්‍රතිව්‍යුහගත කිරීමක් තිබෙනවාද කියා මම පළාත් සභාවෙන් විමසා බලා ඔබතුමාට -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ප්‍රතිව්‍යුහගත කිරීමක් නොවෙයි. ඒක වසා දැමීමක්. ඒක ඉස්සර තිබුණේ වැවල ප්‍රාථමික විද්‍යාලය කියායි. වැවල ප්‍රාථමික විද්‍යාලය කොළඹ දිස්ත්‍රික්කයේ පිලියන්දළ කලාප කොට්ඨාසයේ පාසලක්. ඔබතුමා හොඳට දන්නවා. ආනන්ද සමරකෝන් ශ්‍රීමතාණන්ගේ නමින් පිහිටු වූ ඒ විද්‍යාලයේ ප්‍රාථමික අංශය දැන් වසා දමන්නට හදනවා. ඔබතුමා සංවේදීකම ගැන කථා කරන නිසා මම අහන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ආනන්ද සමරකෝන් ශූරීන් උපන් ගම හෝමාගම මැතිවරණ කොට්ඨාසයේ පාදුක්කට කිට්ටුව ලියන්වල කියන ගමයි. එතුමාට ගෞරවයක් වශයෙන් ආනන්ද සමරකෝන් කණිෂ්ඨ විද්‍යාලයක් පිහිටුවා ඒ ප්‍රදේශයේ තැනූ පාලම ප්‍රථම වතාවට ආනන්ද සමරකෝන් ශූරීන්ගේ නමින් ආනන්ද සමරකෝන් අනුස්මරණ පාලම ලෙස නම් කොට ඇති බව එතුමාට ගෞරවයක් ලෙස සඳහන් කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
පාලම ගැන නොවෙයි මා කථා කරන්නේ ඉස්කෝලය ගැන. [බාධා කිරීම්]

පොලිස් කොස්තාපල්වරුන් : උසස් වීම්
பொலிஸ் உத்தியோகத்தர்கள் : பதவியுயர்வு
POLICE CONSTABLES : PROMOTIONS

2493/'12

14. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2007 වර්ෂයේ සිට මේ දක්වා පොලිස් කොස්තාපල් ශ්‍රේණියේ සිට පොලිස් පරීක්ෂක ශ්‍රේණිය දක්වා උසස්වීම් ලද නිලධාරීන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(ii) මේ වන විට එකී තනතුර සඳහා උසස්වීම් ලැබීමට සුදුසුකම් සහිතව සිටින පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් අතරින් ඉහත උසස්වීම් ලබා දීම සඳහා මේ වන විට නිර්දේශ කර ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එකී නිර්දේශයන්ට අනුව ඔවුන්ට උසස්වීම ලබා දෙන දිනය කවරේද;

(v) උසස්වීම් ලැබීමට සුදුසුකම් ඇති නමුත්, ඒ සඳහා නිර්දේශ කර නොමැති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(vi) ඔවුන්ට උසස්වීම් ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සුදුසුකම් සපුරා ඇති පොලිස් නිලධාරීන්ට උසස්වීම් නොලැබීමේ හේතුව මත ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ අංක 145, 147, 151 හා 152 නඩුවලට අදාළව 2012.01.19 දිනැති තීන්දුව ප්‍රකාරව ඔවුන්ට එකී උසස්වීම් ලබා දීමට කටයුතු යොදන්නේද;

(ii) එසේ නොකරන්නේ නම්, එමගින් අධිකරණයට අපහාස කිරීමක් සිදු වන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පිරිසිදු අමෙරිකානු සාසන, මත අලුවල්කළ අමෙරිකාරුමානවරෙක් කේට්ට විනා:

(අ)(i) 2007ආම් ආණ්ඩු මුතල් ඉට්‍රෙවරෙ පොලිස් කාන්ස්ටබිල් තරත්තිලිරුන්තු පොලිස් පරිසෝතකර් තරම්වරෙ පතවියුයර්වු පෙට්‍ර උත්තියෝකත්තර්කළින් එණ්ණික්කෙ වරුටාන්ත රීතියිල් වෙව්වේරාක යාතෙන්පතෙයුම්;

(ii) තර්පෝතු මේර්පටි පතවික්කු පතවියුයර්වු පෙරුවතර්කු තකෙමෙයුටෙයවර්කළාක උළ්ළ පොලිස් උත්තියෝකත්තර්කළින් එණ්ණික්කෙ යාතෙන්පතෙයුම්;

(iii) ඉවර්කළිල් මේර්පටි පතවියුයර්විනෙප් පෙරුවතර්කු තර්පෝතු සිපාරිසු සෙය්යප්පට්ටුළ්ළ උත්තියෝකත්තර්කළින් එණ්ණික්කෙ යාතෙන්පතෙයුම්;

(iv) ඉච්සිපාරිසුකළින් පිරකාරම් ඉවර්කළුක්කු පතවියුයර්වු වළංකප්පටුම් තිකති යාතෙන්පතෙයුම්;

(v) පතවියුයර්විනෙප් පෙරුවතර්කු තකෙමෙයිරුන්තුම් අතන්පොරුට්ටු සිපාරිසු සෙය්යප්පටාත උත්තියෝකත්තර්කළින් එණ්ණික්කෙ යාතෙන්පතෙයුම්;

(vi) ඉවර්කළුක්කු පතවියුයර්වු වළංකාමෙක්කාන කාරණම් යාතෙන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ආ) (i) තකෙමෙකළෙ පූර්ත්තිසෙය්තුළ්ළ පොලිස් උත්තියෝකත්තර්කළුක්කු පතවියුයර්වු කිටෙක්කාතතන් අටිප්පටෙයිල් උයර් නීතිමන්ත්‍රත්තිල් තාක්කල් සෙය්යප්පට්ටුළ්ළ 145, 147, 151, மற்றும் 152 ஆகிய இலக்கமுடைய வழக்குகளுக்கேற்ப 2012.01.19ஆம் திகதிய தீர்ப்பின் பிரகாரம் இவர்களுக்கு குறித்த பதவியுயர்வுகளை வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) அவ்வாறு செயற்படாதவிடத்து, நீதிமன்றத்தை அவமதிக்கும் செயலாக இது அமையுமென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) separately for each year, the number of officers promoted from Police Constable grade to the grade of Inspector of Police from the year 2007 up to now;

(ii) the number of police officers who have acquired qualifications by now to be promoted to the aforesaid post;

(iii) the number of officers who have been recommended by now to be promoted out of them;

(iv) the date on which they will be promoted on the aforesaid recommendations;

(v) the number of officers with qualifications to be promoted but not recommended for that; and

(vi) the reasons for not granting them promotions ?

(b) Will he inform this House -

(i) whether arrangements will be made to promote those police officers in compliance with the ruling dated 19.01.2012 relevant to cases bearing numbers 145,147,151 and 152 which were filed at the Supreme Court as a result of not promoting the police officers who have fulfilled the required qualifications; and

(ii) whether he admits that failure to do so would amount to contempt of court ?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

තනතුර	2007 වර්ෂය	2008 වර්ෂය	2009 වර්ෂය	2010 වර්ෂය	2011 වර්ෂය	2012 වර්ෂය
පොලිස් කොස්තාපල් සිට පොලිස් සැරයන්	1322	762	1278	4110	01	21
කාන්තා පොලිස් කොස්තාපල් සිට කාන්තා පොලිස් සැරයන්	680	447	-	58	-	02
පොලිස් කොස්තාපල් රියදුරු සිට පොලිස් සැරයන් රියදුරු	13	03	03	167	-	07
පොලිස් සැරයන් රියදුරු සිට මහ සැරයන් ප්‍රවාහන	-	-	-	-	01	30
මහ සැරයන් ප්‍රවාහන සිට උප පොලිස් පරීක්ෂක ප්‍රවාහන	-	01	-	-	-	-
පොලිස් සැරයන් සිට උප පොලිස් පරීක්ෂක	1333	11	235	222	-	09
කාන්තා පොලිස් සැරයන් සිට කාන්තා උප පොලිස් පරීක්ෂක	31	-	50	02	-	-
උප පොලිස් පරීක්ෂක සිට පොලිස් පරීක්ෂක	739	20	99	1076	13	24
කාන්තා උප පොලිස් පරීක්ෂක සිට කාන්තා පොලිස් පරීක්ෂක	16	01	-	145	-	02
පොලිස් පරීක්ෂක සිට ප්‍රවාහන පොලිස් පරීක්ෂක	98	34	07	27	01	06
එකතුව	4232	1279	1672	5807	16	368

(ii)

තනතුර	උසස්වීම් පටිපාටිය අනුව සුදුසුකම් ලබන නිලධාරීන් සංඛ්‍යාව
පොලිස් කොස්තාපල් සිට පොලිස් සැරයන්	9274
කාන්තා පොලිස් කොස්තාපල් සිට කාන්තා පොලිස් සැරයන්	573
පොලිස් කොස්තාපල් රියදුරු සිට පොලිස් සැරයන් රියදුරු	712
පොලිස් සැරයන් සිට උප පොලිස් පරීක්ෂක	7257
කාන්තා පොලිස් සැරයන් සිට කාන්තා උප පොලිස් පරීක්ෂක	587
පොලිස් සැරයන් රියදුරු සිට උප පොලිස් පරීක්ෂක ප්‍රවාහන	486
උප පොලිස් පරීක්ෂක සිට පොලිස් පරීක්ෂක	1325
කාන්තා උප පොලිස් පරීක්ෂක සිට කාන්තා පොලිස් පරීක්ෂක	192
පොලිස් පරීක්ෂක සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක	556
කාන්තා පොලිස් පරීක්ෂක සිට ප්‍රධාන කාන්තා පොලිස් පරීක්ෂක	34

(iii) පොලිස් පරීක්ෂක තනතුරේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට පුරප්පාඩු 262ක් සඳහා සහ කාන්තා පොලිස් පරීක්ෂක තනතුරේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට පුරප්පාඩු 12ක් පිරවීම සඳහා මේ වන විට කටයුතු සකස් කරමින් පවතී.

(iv) පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්ගේ අයදුම්පත් කැඳවා, සම්මුඛ පරීක්ෂණ පවත්වා, උසස්වීම් ලබාදීමට කටයුතු කරගෙන යනු ලැබේ.

(v)

තනතුර	උසස්වීම් පටිපාටිය අනුව සුදුසුකම් ලබන නිලධාරීන් සංඛ්‍යාව
පොලිස් කොස්තාපල් සිට පොලිස් සැරයන්	9274
කාන්තා පොලිස් කොස්තාපල් සිට කාන්තා පොලිස් සැරයන්	573
පොලිස් කොස්තාපල් රියදුරු සිට පොලිස් සැරයන් රියදුරු	712
පොලිස් සැරයන් සිට උප පොලිස් පරීක්ෂක	7257
කාන්තා පොලිස් සැරයන් සිට කාන්තා උප පොලිස් පරීක්ෂක	587
පොලිස් සැරයන් රියදුරු සිට උප පොලිස් පරීක්ෂක ප්‍රවාහන	486
උප පොලිස් පරීක්ෂක සිට පොලිස් පරීක්ෂක	1325
කාන්තා උප පොලිස් පරීක්ෂක සිට කාන්තා පොලිස් පරීක්ෂක	192

(vi) පහත සඳහන් හේතු නිසා ඒ ඒ තනතුරු සඳහා උසස්වීම් ලබාදීමට නොහැකි වී ඇත.

* පොලිස් කොස්තාපල් / කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් සැරයන් සහ කාන්තා පොලිස් සැරයන් තනතුරු වලට උසස්වීම් ලබාදීම සඳහා සලකා බැලීමේදී මේ වන විට පොලිස් සැරයන් තනතුරේ නිලධාරීන් 3552 ක ප්‍රමාණයක් අතිරික්තව පවතී, එබැවින් පුරප්පාඩු නොමැත.

* පොලිස් සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබාදීම සඳහා කටයුතු සූදානම් කර ඇතත්, නිලධාරීන් පිරිසක් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති නඩු කිහිපයක් හේතුවෙන් නිතිපති උපදෙස් මත තාවකාලිකව නවතා ඇත.

* උප පොලිස් පරීක්ෂක තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුරට / කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුරේ සිට කාන්තා පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබාදීම සඳහා එම තනතුරුවල පුරප්පාඩු නොමැත. මේ වන විට පොලිස් පරීක්ෂක තනතුරේ නිලධාරීන් 473ක් සහ කාන්තා පොලිස් පරීක්ෂක නිලධාරීනියන් 122ක ප්‍රමාණයක් අතිරික්තව පවතී.

* පොලිස් පරීක්ෂක තනතුරේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබාදීම සඳහා සලකා බැලීමේදී වසර 08කට වඩා පොලිස් පරීක්ෂක තනතුරේ සේවා කාලයක් ඇති නිලධාරීන් පමණක් සැලකිල්ලට ගතයුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය මගින් නියෝගයක් ලබා දී තිබීම නිසා එම නිලධාරීන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව පමණක් පිරවීම සඳහා උසස්වීම් ලබාදීමට කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(ආ) (I) උක්ත පෙත්සම්වල පෙත්සම්කරුවන්ගෙන් සුදුසුකම් ලත් සියලුම නිලධාරීන්ට උසස්වීම් මේ වන විට ලබාදී ඇත.

(II) අදාළ නැත.

(ඇ) පැන නොනගී.

[මෙම පිළිතුර පුස්තකාලයේ ද ඛ ඇත.]
[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This answer is also placed in the Library.]

අද ලෝක කාන්තා දිනය. ඒ නිසා මේක ඉතා වැදගත්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔහොම ඉන්න ටිකක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම නැඟිටිටේ කාන්තා දිනය නිසායි. වෙල්ගම ඇමතිතුමාත් නිනා වෙනවා.

ගරු කථානායකතුමනි, සෑහෙන වේලාවක් ගත කොට දීර්ඝ උත්තරයක් මට ලබා දීම සම්බන්ධව මම අපේ ඇමතිතුමාට බොහොම ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ප්‍රශ්නය ඔබතුමාත් දන්නවා ගරු කථානායකතුමනි. මෙය පොලිස් සේවයේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක්. පොලිස් කොස්තාපල්ගේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක දක්වා උසස් වීම් දීමේදී කිසියම් වූ නිශ්චිත පටිපාටියක් නැහැ ගරු කථානායකතුමනි. ඒ නිසා පොලිස්පතිතුමාට වුවමනා විධියට නැත්නම් ඔහුගේ කැමැත්ත අනුව තමයි ඒ උසස්වීම් ටික දෙන්නේ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විධියට අපිත් ඒ ගැන සොයා බැලිය යුතුයි කියලා මා විශ්වාස කරනවා. අවුරුදු දහයක් ගියාම හෝ අවුරුදු පහළොවක් ගියාම ගරු කථානායකතුමනි, පොලීසියේ පොලිස් කොස්තාපල්වරයකුට අඩුම වශයෙන් සැරයන් තනතුරක්, එතැනින් පස්සේ සැරයන් තනතුරේ ඉන්න එක්කෙනාට අවුරුදු 15 සිට 20 දක්වා කාලයකදී උප පොලිස් පරීක්ෂක තනතුරක් ලබා දීමේ කිසියම් වූ ක්‍රමවේදයක් මේ පොලිස් දෙපාර්තමේන්තුවට නැහැ ගරු කථානායකතුමනි.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ගරු ඇමතිතුමනි, පොලිස් කොස්තාපල්වරුන්ගේ ඉඳලා ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් දක්වා අයට උසස්වීම් දීමේදී විවිධ ලකුණු මට්ටම් ගන්නේ නැතුව -ක්‍රමානුකූල ක්‍රියාමාර්ගයක් නොමැතිව දෙනු ලබන මේ උසස් වීම් වෙනුවට- අඩුම තරමින් ඔවුන්ගේ සේවා කාලය -service- හෝ ඒ වැඩ කරපු කාලය තුළ ඔවුන් දැක් වූ දක්ෂතාවන් සලකා බලා උසස් වීම් ලබා දීමේ යම් කිසි ක්‍රියා පටිපාටියක් රජය විධියට ඔබතුමන්ලා හදන්න සූදානම්ද? එහෙම ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්න ඔබතුමන්ලා බලාපොරොත්තු වනවාද කියා මා අහන්න කැමැතියි. ඒක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. පොලිස් සේවයේ ඉන්න විශාල-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. වැදගත් අදහසක්. මට මේ අවස්ථාවේ මතක් වන්නේ විවියන් ගුණවර්ධන මැතිනියගේ නඩුව.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔන්න ඉතින් ඒ ගමන වෙන එකක් කියනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මටත් කියන්න අයිතිය තිබෙනවා නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි, කියන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ රටේ හිටපු ප්‍රසිද්ධම දේශපාලන කාන්තාවක් පොළව දිගේ ඇද ගෙන ගියාට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දඬුවම් කළා. පසුව දා ඒ පොලිස් නිලධාරියාට උසස් වීමක් දුන්නා, ආණ්ඩුව; ඔබතුමන්ලාගේ ආණ්ඩුව. ඒ, එදා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයට සලකපු හැටි. පොලීසිය-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ගමන වෙන එකක් කියනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පොලීසියේ උසස් වීම් ලබා දීමේදී "පිල්ල පැනලා උසස් වීම් දෙනවා" කියලා ඔබතුමාම කිව්වා. කවුද ඒවා පටන් ගත්තේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පටන් ගත්ත එක නොවෙයි. කවුරු හෝ ඒක අවසන් කරමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාගේ අදහස ගැනයි මා කියන්නේ. ඒක බොහොම හොඳ යෝජනාවක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොකක් හරි කථාවක් ගෙනැල්ලා ගහනවා මේ ප්‍රශ්නය අස්සට.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මගේ අක්කා මහ පාරේ ඇද ගෙන ගිය කථාව මා කියන එක වැරදිද? ඒ මේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීතුමියක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබේ සැප මගේ සතුටයි. කියන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එදා එහෙම උසස් වීම් දුන්නු රටේ අද ඔබතුමා චෝදනා කරනවා, පිල්ල පැනලා උසස්වීම් දෙන ක්‍රමවේද හුහක් තිබෙනවා, ඒ සඳහා නිශ්චිත ක්‍රමයක් හදන්න කියලා. ගරු කථානායකතුමාත් ඒ ගැන දන්නවා. ඒ වාගේ ක්‍රමවේද හදන එක හොඳයි. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නාම ගරු කථානායකතුමනි, ඒ නඩුව පවරන පොලිස් නිලධාරින්ට විතරක් නොවෙයි, ඒ සමාන තනතුරුවල ඉන්න රාශියකට ඉබේම උසස් වීම් ලැබෙනවා. පොලීසියේ කටයුතු කිරීමේදී ඒ උසස් වීම් ගැනත් ගැටලු මතු වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අදහස මා ඉදිරිපත් කරන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොදු වැඩ පිළිවෙළක් හැදුවා නම් කවුරුවත් උසාවි යන්නේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පොදු වැඩ පිළිවෙළක් සකස් කිරීම හොඳයි. අපි ඒ වාගේ අලුත් අදහස් ගැන සැලකිලිමත් වෙලා, යමක් කිරීමේ උත්සාහයක යෙදෙන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

මා ඔබතුමාට යොමු කළ, ශ්‍රේෂ්ඨාධිකරණට ගොනු කළ 145, 147, 151, 152 අංක දරන නඩුවලට අදාළ 2012.01.19වන දින තීන්දුවේදී වුණේ- ගරු කථානායකතුමනි, මා ඔබතුමාගෙන් විනාඩි කිහිපයක් ඉල්ලනවා ඒ ගැන ටිකක් පැහැදිලි කර දෙන්න.

ගරු කථානායකතුමනි, 2007 වර්ෂයේදී පොලිස් සැරයන් තනතුරට interviews තිබුණා. එහිදී ලකුණු 47 සිට 61 දක්වා පරාසය තුළ ලකුණු ලබා ගත්තු පොලිස් සැරයන්වරුන්ට උප පොලිස් පරීක්ෂක තනතුරු වුවමනාය කියලා නඩුවක් දැම්මා. ඒකට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දුන්නා, ඔවුන් ඒ තනතුරට උසස් කරන්න කියලා. ඊට පස්සේ ඊ ළඟට හිටපු 660 දෙනාත් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දැම්මා. ගරු කථානායකතුමනි, අයටත් උසස්වීම් දෙන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝග කළා. නමුත්, ඒ තීන්දුව පිළිගෙන අපටත් සාධාරණයක් වෙයි කියලා හිතපු, පොලිස් සේවයට ගරු කරමින් උසාවි නොගිය අයට මේ වන තුරු ඒ උසස්වීම් හම්බ වුණේ නැහැ.

ගරු කථානායකතුමනි, මේක ලොකු ප්‍රශ්නයක්. තමන්ගේ දෙපාර්තමේන්තුවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා නඩු පවරන්නේ නැතුව, තමන්ට සාධාරණත්වයක් වේවි කියලා බලාපොරොත්තු වුණු මේ අය සම්බන්ධයෙන් රජය ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද? රජය විධියට ඔබතුමන්ලාට ඒ සියලු දෙනාටම එක හා සමාන විධියට සලකන ක්‍රියාදාමයක් ආරම්භ කරන්න පුළුවන්ද? ඒකයි මගේ ප්‍රධානම ප්‍රශ්නය. කරුණාකරලා ඔවුන්ටත් මේ උසස්වීම් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලන්න කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමා ඉදිරිපත් කරපු කාරණාව අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පොලිස් මාරුවීම් සම්බන්ධයෙන් කථා කරන කොට පොලිස් මූලස්ථානයේ ඉන්න අයට විතරක් - පොලිස් කොස්තාපල්වරුන්ගේ ඉඳලා උප පොලිස් පරීක්ෂකවරුන් දක්වා වන පහළ නිලධාරීන්ට- අවුරුදු 15, 20 පොලිස් මූලාස්ථානයේ වැඩ කරන්න ඉඩ දීලා තිබෙනවා. අනෙක් අය තැන් තැන්වලට මාරු කරනවා. ගරු කථානායකතුමනි, මාරු කිරීමේ ක්‍රමවේදයක් තිබෙනවා නම්, ඒක සියලු දෙනාටම එක හා සමාන විය යුතුයි. පොලිස් මූලස්ථානයේ ඉන්න අයට "ටක් ටක්" ගාලා උසස්වීම් පවා ලැබෙනවා. මොකද ඔවුන් එහි සිටින උසස් නිලධාරීන් හඳුනනවා; සම්බන්ධතා තිබෙනවා. මේ කාරණය කිව්වාම පොලිස් මූලස්ථානයේ අය මාත් එක්ක තරහ වෙයිද දන්නේ නැහැ. ඒක මට ප්‍රශ්නයක් නොවෙයි. නමුත් වැදගත්කම තිබෙන්නේ, මාරුවීම් ලබා දීමේදී සියලු දෙනාටම සමාන ක්‍රමවේදයක් අනුගමනය කරන එකයි. ඒ සඳහා ඔබතුමා කටයුතු කරනවාද නැද්ද කියලා මා අහන්න කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

සාධාරණව තමයි කටයුතු කෙරෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ කාරණයත් ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නම්. මෙතුමා ප්‍රශ්නයෙන් අහලා තිබුණේ උසස්වීම් ගැන. දැන් අහන්නේ මාරු කිරීම් ගැන. ඒ ගැන වෙනම ප්‍රශ්නයක් අහනවා නම් හොඳයි. උසස් වීම්, මාරුකිරීම් ගැන සිරිකොතටත් මේ උපදේශය දෙනවා නම් හොඳයි. එතකොට ඔබතුමාටත් යහපතක් නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක අපි අපේ පක්ෂයත් එක්ක බලා ගන්නම්. ඔබතුමාට බොහොම ස්තුතියි. ඔබතුමා කරත්ත රෝදය තල්ලු කර කර ඉන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. සාධාරණයක් වෙයි.

දුම්රිය මැදිරි පෞද්ගලික සමාගම්වලට පැවරීම : ආදායම

புகையிரதப் பெட்டிகள் தனியார் கம்பனிகளுக்கு ஒப்படைப்பு: வருமானம்

HANDING OVER OF RAILWAY CARRIAGES TO PRIVATE COMPANIES : INCOME

2968/'12

15. **ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දුම්රිය මැදිරි කිහිපයක් මේ වන විට පෞද්ගලික සමාගම්වලට පවරා දීම හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ආදායම් අහිමිවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) දුම්රිය මැදිරි පෞද්ගලික සමාගම් වෙත පවරා දීම මගින් දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම කොපමණද;

(ii) දුම්රිය මැදිරි පෞද්ගලික සමාගම්වලට ලබා දීම තුළින් දුම්රිය සේවය පෞද්ගලීකරණය කිරීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පෞද්ගලික සමාගම්වලට පවරා දී ඇති දුම්රිය මැදිරි නැවත දුම්රිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර දුම්රිය සේවය පෞද්ගලීකරණයවීමට ඉඩ නොදී රැක ගැනීමට කටයුතු කරන්නේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) புகையிரத திணைக்களம் சில புகையிரதப் பெட்டிகளை ஏற்கெனவே தனியார் கம்பனிகளுக்கு ஒப்படைத்திருப்பதன் காரணமாக புகையிரதத் திணைக்களத்திற்கு கிடைக்க வேண்டிய வருமானம் இழக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) புகையிரதப் பெட்டிகளை தனியார் கம்பனி களுக்கு ஒப்படைப்பதன்மூலம் புகையிரதத் திணைக்களத்திற்குக் கிடைக்கும் வருமானம் எவ்வளவென்பதையும்;

(ii) புகையிரதப் பெட்டிகளை தனியார் கம்பனி களுக்கு ஒப்படைப்பதன்மூலம் புகையிரதச் சேவையை தனியார் மயப்படுத்த எதிர்பார்க்கப் படுகின்றதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) தனியார் கம்பனிகளுக்கு ஒப்படைக்கப்பட்டுள்ள புகையிரதப்பெட்டிகளை மீண்டும் புகையிரதத் திணைக்களத்திற்குப் பெற்றுக்கொள்ள நடவடிக்கை யெடுத்து, புகையிரதச் சேவையை தனியார் மயமாக்குவதற்கு இடமளிக்காது பாதுகாப்பதற்காக நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Is he aware that the Department of Railways has lost earnings it should have received as a result of several railway carriages being handed over to the private companies by the Department?

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

(b) Will he state -

(i) the income received by the Department of Railways by handing over the railway carriages to the private companies; and

(ii) whether the privatization of the railway service is being contemplated by handing over carriages to private companies?

(c) Will he inform this House whether action will be taken to have the railway carriages handed over to the private sector returned to the Department of Railways and safeguard the railway service without allowing it to be privatized?

(d) If not, why ?

ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපති වීම ගැන ඔබතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
බොහොම ස්තුතියි. අද කාන්තා දිනය නිසා මම කට පරිස්සම් කර ගන්නවා.

ගරු කථානායකතුමනි, පිළිතුර මෙයයි.

(අ) දුම්රිය මැදිරි පෞද්ගලික සමාගම් වෙත පවරා දී නොමැත. සිදු කර ඇත්තේ මැදිරි කීපයක් කුලී පදනම මත සුඛෝපභෝගි ලෙස ධාවනය කිරීමට අවස්ථාව සලසා දීම පමණි. ආදායම අහිමි වී නැත. ඒ වෙනුවට නව ආදායම් මාර්ගයක් උත්පාදනය වී ඇත.

(ආ) (i) බිලූ ලයින් ආයතනයේ රාජධානි මැදිරිවලින් ලැබෙන මසක ආදායම රුපියල් 49,42,080.00කි.

එක්ස්පෝ කොන්සොලිඩේටර්ස් (පුද්ගලික) ආයතනයේ එක්ස්පෝ මැදිරිවලින් ලැබෙන මසක ආදායම රුපියල් 54,10,080.00කි.

(ii) නැත.

දුම්රිය මැදිරි පෞද්ගලික සමාගම් වෙත ලබා දීම තුළින් පෞද්ගලීකරණය කිරීමට නොව පුද්ගලික අංශය සහභාගි කරවා ගෙන නව දුම්රිය පහසුකම් ඇති කර නව ආදායම් මාර්ගයක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

(ඇ) දැනටමත් අදාළ මැදිරි දුම්රිය දෙපාර්තමේන්තුව භාරයේ පවතින බැවින් එසේ කිරීමට අවශ්‍යතාවක් නැත.

(ඈ) ඉහත (ඇ) අනුව අදාළ නොවේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.
ඇමතිතුමනි, චීන දුම්රිය කට්ටල් 11ක් ප්‍රවාහනය සඳහා පෞද්ගලික සමාගම්වලට ලබා දුන්නේ නැහැයි කියාද ඔබතුමා කියන්නේ?

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
චීන දුම්රිය කට්ටල් කියන්නේ මොකක්ද? දුම්රිය පෙට්ටිද, එහෙම නැත්නම් Powersetsද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
සමස්ත ලංකා දුම්රිය සේවකයන්ගේ පොදු සේවක සංගමයත් මේ ගැන අදහස් ප්‍රකාශ කර තිබෙනවා. ප්‍රවාහනය කිරීමට හැකියාව තිබියදී ප්‍රවාහන අමාත්‍යාංශය දුම්රිය බලවේග කට්ටල් 11ක් සහ සුඛෝපභෝගි දුම්රිය 2ක් අඩු මිල ගණන් යටතේ පෞද්ගලික සමාගම්වලට ලබා දී තිබෙනවා කියලා. අපට ලැබී තිබෙන තොරතුරු අනුව ඒ තුළින් ඇමෙරිකානු ඩොලර් 78,000ක පාඩුවක් වෙලා තිබෙනවා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මේකයි සිද්ධ වෙලා තිබෙන්නේ. පරණ දුම්රිය මැදිරි තිබුණා. ඒවා ඉවත් කරලා තිබුණේ. ඒවා පෞද්ගලික අංශයට දුන්නා, සුඛෝපභෝගි විධියට නැවත හදන්න. ඒ ගොල්ලෝ රුපියල් ලක්ෂ 80ක්, රුපියල් ලක්ෂ 100ක් පමණ වියදම් කරලා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු පරණ මැදිරි අලුතින් හැදුවා. ඒවා අපි ධාවනය කරනවා. අපි තමයි tickets විකුණන්නේ. නමුත් ඒ ගොල්ලෝ තමයි market කරන්නේ. මා හිතන හැටියට ඔබතුමාත් ඒ මැදිරියක ගිහින් ඇති. සාමාන්‍යයෙන් කොළඹ සිට මහනුවර දක්වා යන්න රුපියල් 800ක්, රුපියල් 1,000ක් පමණ ගන්නවා. එහිදී කෑම පැකට් එකක් දෙනවා, වතුර බෝතලයක් දෙනවා. ඒ වාගේම ඒ මැදිරි air-condition කරලා තිබෙනවා. TV තිබෙනවා. ඉතින් කැමැති අය ඒ මැදිරියේ යනවා. එයින් first-class ticket එකේ මුදල අපට ලැබෙනවා.

දැන් ඒගොල්ලන් ඒක high market එකට දමලා, first-class ticket එකේ මුදල අපට දෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, රජයට මේක කරන්න පුළුවන්කමක් තිබුණේ නැද්ද?

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
රජයේ දුම්රිය දෙපාර්තමේන්තුවට සල්ලි නැහැ, මේ දුම්රිය මැදිරිය රුපියල් ලක්ෂ 100ක් වියදම් කරලා අලුත්වැඩියා කරන්න. ඒක නිසා ඒ අයට එම දුම්රිය මැදිරිය අලුත්වැඩියා කර ගෙන ධාවනයේ යොදවන්න දෙනවා. ඒ අය පළමුවැනි පන්තියේ ටිකට් එකේ මුදල අපට ගෙවනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මා ඔබතුමාගෙන් ඊළඟ අතුරු ප්‍රශ්නය අහනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නයද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
දෙවැනි අතුරු ප්‍රශ්නය. නැහැ, තුන්වැනි අතුරු ප්‍රශ්නය ගරු කථානායකතුමනි.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මේ අහන්නේ 1(අ) අතුරු ප්‍රශ්නය.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කමක් නැහැ, තව එක අතුරු ප්‍රශ්නයක් ඇහුවාම ඇති, ගරු කථානායකතුමනි. මොකද, එතැනින් එහාට එතුමාගෙන් මේ ගැන අහලා වැඩක් නැහැ. මොකද, මේ සියලු දෙයක් සම්බන්ධයෙන්ම කියන්නේ මෙච්චර විශාල පාඩුවක් දරලා තිබෙනවා කියලායි. ඒ පිළිතුරත් එක්ක මා හිතන්නේ එතැනින් එහාට අහලා වැඩක් නැහැ කියලායි.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
අහන්න, අහන්න. ඕනෑ එකක් අහන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඊට අමතරව, මේ කාරණය ගැනත් මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඔබතුමා දන්නවා, දුම්රිය හරස් මාර්ග සඳහා ආරක්ෂිත ගේට්ටු යෙදිය යුතු ස්ථාන 626ක් ලංකාවේ තිබෙන බව. ඒ සම්බන්ධයෙන් දිගින් දිගටම ප්‍රශ්න ඇති වුණා. 2012 වසරේ දී එවැනි දුම්රිය අනතුරු නිසා සිදු වූ මරණ 84ක් ගැන වාර්තා වෙලා තිබෙනවා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු මන්ත්‍රීතුමනි, එය මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මේ ප්‍රශ්නයට අදාළ නැහැ, ගරු ඇමතිතුමනි. මම මෙය අහන්නේ රටේ කාලීන ප්‍රශ්නයක් නිසායි. මා දන්නවා ඔබතුමා මෙයට උත්තර දෙනවා කියලා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මා එයට උත්තර දෙනවා. මොකද, ඔබතුමා බොහොම හොඳ දක්ෂ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම මගේ පෞද්ගලික උපදේශකවරයෙක්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔබතුමාව අමාරුවේ වැටෙද්දී මා බේරාගෙන තිබෙනවා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක මා පිළිගන්නවා. ඒක නේ මා කිව්වේ ඔබතුමා මගේ පෞද්ගලික උපදේශකවරයෙක් කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ගැන සොයා බලන්නට ඕනෑ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අපට දේශපාලන භේදයක් නැහැ නේද, ගරු ඇමතිතුමනි? අපි ඔබතුමාව බේරාගෙන තිබෙනවා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒකට දේශපාලන භේදයක් නැහැ. අපේ ඔය ඉස්සරහ වාඩි වෙලා සිටින මහත්මයා, මේ side එකෙන් වාඩි වෙලා සිටින මහත්මයා, අපි ඔක්කොම එකයි. ගරු කථානායකතුමා ගැන මම කථා කරන්නේ නැහැ. මොකද, එතුමා දැන් සිටින්නේ ඉහළ පුටුවක නිසා. නැත්නම් ඉස්සෙල්ලා එතුමා සිටියේ මගේ ළඟ. එතකොට නම් එතුමා ගැන මම කථා කළා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඇමතිතුමා, ඒ විෂය මොකක්ද?

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
විෂය මොකක්ද කියලා ඔබතුමාට කියන්න බැහැ. ඔබතුමා ඇවිල්ලා ඉන්නේ මගේ අග බිසවගේ ගමෙන්. ඉතින් මම කොහොමද ඔබතුමාට ඒවා ගැන කියන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, මට ඇත්තටම මේ කාරණය දැනගන්නට ඕනෑ. අපේ ප්‍රදේශවල අලුවිවේ එහෙම මේ ආරක්ෂිත දුම්රිය ගේට්ටු නොතිබීම නිසා සිදු වුණු අනතුරුවලින් කිහිප දෙනෙක් මරණයට පත් වුණා. දුම්රිය හරස් මාර්ග සඳහා ආරක්ෂිත ගේට්ටු යෙදිය යුතු ස්ථාන 626ක් ලංකාවේ තිබෙනවා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඇත්ත.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
2012 වසරේ දී එවැනි දුම්රිය අනතුරු නිසා 84 දෙනෙක් මරණයට පත් වෙලා තිබෙනවා. මෙය මා දිගින් දිගටම අහපු ප්‍රශ්නයක්. මා හිතන හැටියට මේ සඳහා විශාල මුදලක් වැය වන්නේත් නැහැ, මේ රටේ නාස්ති වන මුදල් එක්ක බලනකොට.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු මන්ත්‍රීතුමනි, මෙතැනට ගේට්ටුව දමන්නේ නැතිව බෙල් එකයි, ලයිට් එකයි පමණක් සවි කරනවා නම්, අඩු ගණනේ ලක්ෂ 40ක් වැය වෙනවා, එක unit එකකට. ලංකාවේ එක එක්කෙනා කියනවා, රුපියල් 45,000ට පුළුවන්; 80,000ට පුළුවන්; ලක්ෂයකට පුළුවන් කියලා. නමුත් අපි ඒවා අත්හදා බලනකොට දැක්කා, ටික දවසක් යනකොට මේ timing වෙනස් වෙනවා. එතකොට සිදු වෙන්නේ මොකක්ද? පොඩ්ඩක් හරි timing වෙනස් වෙලා කෝච්චිය යන වෙලාවටම දුම්රිය හරස් මාර්ගය හරහා බස් එකක් ආවොත් මොකද වෙන්නේ? ඒ නිසා මේක හරි ප්‍රමිතියට කරනවා නම් රුපියල් ලක්ෂ 40ක් විතර වැය වෙනවා, bell and light විතරක් සවි කරන්න.

ඔබතුමාම කිව්වා, එවැනි ස්ථාන හයසිය ගණනක් තිබෙනවාය කියලා. උතුරෙ ඒවා හැදුවාට පස්සේ තවත් වැඩි වෙනවා. මම හිතන්නේ එතකොට 800ක් විතර වෙයි. මේ සඳහා අපි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරනවා. දැනට අපි හඳුනා ගෙන ඇති තැන්වලට bell and light ගේට්ටු 200ක් විතර සවි කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
බොහොම ස්තුතියි.

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශයේ විදේශ සංචාර : විස්තර

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரது வெளிநாட்டுப் பயணங்கள்: விபரம்

FOREIGN TOURS OF MINISTER OF FOREIGN EMPLOYMENT PROMOTION AND WELFARE : DETAILS

2192/'11

2. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවී කරුණානායක මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2)

(අ) පසුගිය වර්ෂ දෙකක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය විසින් සිදුකරන ලද මුළු විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ සංචාරය කළ රටවල් කවරේද;

(iii) එම සංචාරයන් සම්බන්ධව දක්වා ඇති අරමුණු සපුරා ගැනීමේ අවශ්‍යතාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය විසින් කැඳවාගෙන යන ලද නිලධාරීන් සංඛ්‍යාව සහ එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී සංචාරයන් සඳහා යොදා ගන්නා ලද අරමුදල් මහජන මුදල්ද, නැතිනම් සංචාරය කරන ලද රටවල රජයන් විසින් ප්‍රදානය කරන ලද මුදල්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) கடந்த இரண்டு வருடங்களில்,

(i) வெளிநாட்டு வேலைவாய்ப்பு, ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரினால் மேற்கொள்ளப் பட்ட மொத்த வெளிநாட்டுப் பயணங்களின் எண்ணிக்கையையும்;

(ii) அவ்வாறு விஜயம் மேற்கொண்ட நாடுகளையும்;

(iii) இவ்விஜயங்களினால் அடைந்த நோக்கங் களையும்

வருடாந்த அடிப்படையில் அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ)(i) ஒவ்வொரு விஜயத்தின் போதும் அமைச்சருடன் சென்ற அதிகாரிகளின் எண்ணிக்கையையும் ஒவ்வொரு விஜயத்துக்கும் ஏற்பட்ட செலவினத்தை வெவ்வேறாகவும்;

(ii) மேற்கூறப்பட்ட விஜயங்களின்போது பயன் படுத்தப்பட்ட நிதி பொதுப் பணமா அல்லது விஜயம் மேற்கொள்ளப்பட்ட நாடுகளின் அரசாங்கத்தினால் வழங்கப்பட்ட பணமா என்பதையும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Employment Promotion and Welfare:

(a) Will he inform this House for the last 2 years on per year basis-

(i) the total number of foreign tours made by the Minister of Foreign Employment Promotion and Welfare;

(ii) the names of the countries so visited; and

(iii) the necessity to achieve the objective set regarding such visits?

(b) Will he state-

(i) the number of officials accompanied by the Minister and the cost incurred for each visit separately; and

(ii) whether the funds used for the aforesaid tours were public money or money granted by the governments of the countries visited?

(c) If not, why?

ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 07යි.

(ii) ඇමුණුමෙහි 'ඇ' තීරුව බලන්න.

(iii) ඇමුණුමෙහි 'ඇ' තීරුව බලන්න.

මෙම අමාත්‍යාංශය 2010.11.22 දින පිහිටුවන ලද හෙයින් පිළිතුරට අදාළ කොරතුරු 2010.11.22 දින සිට 2011.12.31 කාල සීමාව දක්වා වූ කොරතුරු වේ.

(ආ) (i) ඇමුණුමෙහි 'ඉ' සහ 'ඊ' තීරු බලන්න.

(ii) ඇමුණුමෙහි 'උ' තීරුව බලන්න.

(ඇ) පැන නොනඟී.

ඇමුණුම

2011 වර්ෂය

අ සංචාරයේ නම	ආ සංචාර ප්‍රමාණය	ඇ සංචාරය කල රටවල නම්	ඈ සංචාරයන් සම්බන්ධව දක්වා ඇති අරමුණු සපුරාගැනීමේ අවශ්‍යතාව	ඉ අමාත්‍යවරයා විසින් කැඳවාගෙන යන ලද නිලධාරීන් සංඛ්‍යාව	ඊ එක් එක් සංචාර සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන්	උ ඉහතකී සංචාරයන් සඳහා යොදාගන්නා ලද අරමුදල් මහජන මුදල්ද, නැතිනම් සංචාරය කරන ලද රටවල රජයන් ප්‍රදානය කරන ලද මුදල්ද යන වග			
						උ1 සංචාරය කරන ලද රටවල රජයන් විසින් ප්‍රදානය කරන ලද මුදල්	උ2 අමාත්‍යාංශය	උ3 ශ්‍රී.ල.ෆ්.ජේ.නි කාර්යාංශය	උ4 වෙනත් සංවිධාන
"කොළඹ ප්‍රොසෙස්" සමුළුව	01	බංගලාදේශය	ශ්‍රමික සංක්‍රමණය පිළිබඳව වූ "කොළඹ ප්‍රොසෙස්" අමාත්‍යවරුන්ගේ සමුළුවට සහභාගිවීම	1	453,737.00		453,737.00		
අමාත්‍යවරයාගේ කටාර්, එක්සත් අරාබි සහ සවුදි අරාබි සංචාර	01	කටාරය, සවුදි අරාබිය සහ එක්සත් අරාබි එමීර්	විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන්	4	1,712,761.79		1,712,761.79		
අමාත්‍යවරයාගේ මැලේසියා සංචාරය	01	මලයාසියාව	විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන්	3	708,371.00		708,371.00		
අමාත්‍යවරයාගේ දකුණු කොරියානු සංචාරය	01	දකුණු කොරියාව	විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන්	3	689,471.00		689,471.00		
අමාත්‍යතුමාගේ එක්සත් රාජධානිය සහ ඉතාලි සංචාර	01	එක්සත් රාජධානිය සහ ඉතාලිය	හර්වර්ඩ්ෂයර් විශ්ව විද්‍යාලයේ සහාය ඇතිව මෙරට හෙද විදුහලක් ආරම්භ කිරීම සඳහා එකඟතාවයකට එළඹීම	2	1,447,855.96		1,447,855.96		
අමාත්‍යතුමාගේ සයිප්‍රස් සංචාරය	01	සයිප්‍රසය	විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන්	2	858,412.80		858,412.80		
අමාත්‍යවරයාගේ ජිනීවා සංචාරය	01	ස්විට්සර්ලන්තය	ජාත්‍යන්තර විගමණිකයින් සඳහාවූ සමුළුවේ සියවන සැසිවාරයට සහභාගිවීම	01	1,180,922.00		1,180,922.00		

කඩා දමන ලද ගොඩනැගිලි හා අත්පත් කරගෙන ඇති ඉඩම් : වන්දි මුදල්

உடைத்த கட்டிடங்கள் மற்றும் சுவீகரித்த காணிகள் : நட்டஈடு

DEMOLISHED BUILDINGS AND AQUIRED LANDS : COMPENSATION

3142/'12

9. **ගරු ජෝන් අමරතුංග මහතා** (ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ஆர். எம். ரஞ்சித் மத்தும பண்டார சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. R.M. Ranjith Madduma Bandara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර නගරයේ ආරම්භ කර ඇති නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කරන මාර්ග පුළුල් කිරීම සඳහා සින්නක්කර ඉඩම්වල පිහිටි සැලසුම් අනුමත කර ඉදිකළ ගොඩනැගිලි කඩා ඉවත් කිරීමට කටයුතු කරන බවත්;

(ii) එම කටයුතු පූර්ව දැනුම්දීමකින් තොරව, නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හා යුධ හමුදාව යොදවා බලහත්කාරයෙන් සිදු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මාර්ගය පුළුල් කිරීම සඳහා නීතියට පටහැනිව කඩා බිඳ දමන ලද ගොඩනැගිලිවලට හා අත්පත් කරගෙන ඇති ඉඩම්වලට වන්දි ගෙවීමක් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ජෝන් අමරතුංග මහතා]

පිරිසම අමෙච්චරුම් පුත්ත සාසන, මත අලුවල්කළ් අමෙච්චරුමානවරෙක් කේට්ට විනා:

(අ)(i) මොනරාකලෙ මාවට්ටත්තිල් පටල්කුම්පුරු නකරත්තිල් ආරම්පික්කප්පට්ටුළ්ළ නකර අපිවි රුත්තික් කරුත්තිට්ටත්තින්කීළ් නටෙපෙරුම් වීති විස්තරිප්පින්පෝතු අනුමති උරිමෙක් කාණි කළිල් අමෙන්තුළ්ළ, කට්ටිට වරෙපටංකළ් අංකීකරික්කප්පට්ටු අමෙක්කප්පට්ටුළ්ළ කට්ටි ටංකළෙ තකර්ත්තු අකට්රුවතට්කු නටවටික්කෙ මේට්කොළ්ළප්පටුකින්රතු එන්පතෙයුම්

(ii) ඉන්ත නටවටික්කෙකළ් මුන් අරිවිත්තලින්රි නකර අපිවිරුත්ති අතිකාර සපෙයින් අලුවලර් කළෙයුම් ඉරාණුවත්තිනරෙයුම් ඊටුපටුත්ති පලාත්කාරමාක
මේට්කොළ්ළප්පට්ටුළ්ළතෙන්පතෙයුම්

අවර් අරිවාරා?

(ආ) වීතියෙ විස්තරිප්පුක්කාක සට්ටවිරෝතමාක උටෙක් කප්පට්ට කට්ටිටංකළුක්කුම් සුවීකරික්කප්පට්ටුළ්ළ කාණිකළුක්කුම් නට්ටඊටු වළංකප්පටුමා එන්පතෙ අවර් කුරිප්පිටුවාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that-

(i) action is being pursued to demolish buildings constructed with approved plans in freehold lands for widening of roads carried out under the town development plan launched in the Badalkumbura Town in Monaragala District ; and

(ii) such activities have been executed forcibly, deploying the officials of the Urban Development Authority and the Army without giving notice in advance?

(b) Will he state whether compensation will be paid for the buildings demolished and lands acquired in violation of laws for widening of the roads?

(c) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සැලසුම් අනුමත කර ඉදිකරන ලද ගොඩනැඟිලි කඩා ඉවත් කිරීමක් සිදු නොකළ අතර, මාර්ග රක්ෂිතය තුළ අනවසරයෙන් ඉදිකර තිබූ ගොඩනැඟිලි කොටස් කඩා ඉවත් කරන ලදී.

(ii) මාර්ග සංවර්ධන අධිකාරියෙන් 2012.01.03 දින අදාළ පුද්ගලයින්ට පූර්ව දැනුම්දීමක් සිදු කර ඇත. බලහත්කාරයෙන් කඩා ඉවත් කිරීමක් සිදු කර නැත.

(ආ) වන්දි ගෙවීමක් සිදු නොකරයි.

(ඇ) ඉඩම් හිමියන් විසින් සිය කැමැත්තෙන් මාර්ග රක්ෂිතය තුළ අනවසරයෙන් ඉදිකර තිබූ තම ගොඩනැඟිලි කඩා ඉවත් කර ගනිමින් නගර සංවර්ධනයට සහයෝගය ලබා දුන් බැවින් වන්දි ගෙවීමේ අවශ්‍යතාවක් පැන නැඟී නොමැත.

යාපනය දිස්ත්‍රික්කයේ ඒ-ශ්‍රේණියේ මාර්ග : ප්‍රතිසංස්කරණ කටයුතු

யாழ். மாவட்ட ஏ-தரத்திலான வீதிகள் : புனரமைப்புப் பணிகள்

A-GRADE ROADS IN JAFFNA DISTRICT : RENOVATION WORK

3167/'12

10. **ගරු ජෝන් අමරතුංග මහතා** (ගරු ඊ. සරවනපවන් මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ஈ. சரவணபவன் சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. E. Saravanapavan)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති, මාර්ග සංවර්ධන අධිකාරියට අයත්, කන්කසන්තුරෙයි පාර,පලාලි පාර, පේදුරුතුඩුව පාර, මහනුවර පාර හා ප්‍රධාන වීදිය යන ඒ ශ්‍රේණියේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු 2009 මැයි මස 19 වැනි දිනට පසුව ආරම්භ කර ඇතත් මේ දක්වා එම එක් මාර්ගයක හෝ එම කටයුතු අවසන් කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු භාරගත් කොන්ත්‍රාත් සමාගම දේශීය සමාගමක්ද; නොඑසේ නම්, විදේශීය සමාගමක්ද;

(ii) මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යොදවනු ලබන්නේ විදේශීය ණය ආධාර යටතේ ලබා ගන්නා මුදල්ද; නොඑසේ නම්,රාජ්‍ය මුදල්ද;

(iii) ඉහත කී මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර වර්ෂ 3ක් ගත වී ඇතත්, මෙතෙක් එම කටයුතු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) யாழ்ப்பாண மாவட்டத்தில் அமைந்துள்ளதும் வீதி அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமானதுமான, காங்கேசன்துறை வீதி, பலாலி வீதி, பருத்தித்துறை வீதி, கண்டி வீதி மற்றும் பிரதான வீதி ஆகிய `ஏ' தரத்திலான வீதிகளின் புனரமைப்புப் பணிகள் 2009 மே மாதம் 19 ஆம் திகதிக்குப் பின்னர் ஆரம்பிக்கப் பட்டுள்ள போதிலும் இதுவரை மேற்படி எந்தவொரு வீதியினதும் மேற்படி பணிகள் பூர்த்திசெய்யப்பட வில்லையென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீதிகளை புனரமைக்கும் பணிகளை பொறுப்பேற்றுள்ள ஒப்பந்தக் கம்பனி உள் நாட்டுக் கம்பனியா இன்றேல் வெளிநாட்டுக் கம்பனியா என்பதையும்;

(ii) இந்த புனர்நிர்மாணப் பணிகளுக்காக பயன் படுத்தப்படும் நிதி வெளி நாட்டுக் கடனுதவியா இன்றேல் அரசின் நிதியா என்பதையும்;

(iii) மேற்படி வீதிகளின் புனரமைப்புப் பணிகள் ஆரம்பிக்கப்பட்டு 03 வருடங்கள் கழிந்துள்ள போதிலும், இதுவரை அந்தப் பணிகளைப் பூர்த்தி செய்ய முடியாமைக்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Is he aware that even though the commencement of renovation activities of the A-grade roads, namely Kankesanturai Road, Palali Road, Point Pedro Road, Kandy Road and Main Street which are located in Jaffna District and coming under the Road Development Authority have been commenced after 19th May 2009, renovation work of at least one of those roads has not been completed up to now?

(b) Will he inform this House-

(i) whether the company which obtained the contract for the aforesaid road renovation work is a local company or a foreign company ;

(ii) whether this money is obtained under foreign loans or public funds that are utilized for the aforesaid renovation activities ; and

(iii) of the reasons for the inability to complete the aforesaid renovation even though 3 years have lapsed since the commencement of that work?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

මෙම මාර්ග සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම 2009 වසරේදී සිදු වුවත් වැඩ ආරම්භ කළ දිනයන් සහ අවසන් කරනු ලබන දිනයන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

මාර්ගය	වැඩ ආරම්භ කළ දිනය	වැඩ නිම කළ යුතු දිනය
කන්කසන්තුරෙයි පාර, පලාලි පාර සහ පේදුරුතුඩුව පාර	2011.06.09	2013.12.08
මහනුවර-යාපනය පාර (ගල්කුලම සිට කි.මී.230 දක්වා)	2011.02.07	2013.08.06
මහනුවර - යාපනය පාර (කි.මී. 230 සිට යාපනය දක්වා)	2011.02.22	2013.08.21

(ආ) (i) විදේශීය සමාගම්

(ii) කොන්ත්‍රාත් වටිනාකමින් 85%ක් විදේශීය අරමුදල් වන අතර, ඉතිරි 15% ශ්‍රී ලංකා රජයේ අරමුදල් වේ.

(iii) ඉහත (අ) පිළිතුරෙහි සඳහන් පරිදි වැඩ නිම කළ යුතු දිනට අවසන් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

(ඇ) පැන නොනඟී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12 - 2195/'11- (2), ගරු රවි කරුණානායක මහතා

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනා. කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්. දුමින්ද සිල්වා මහතා පිළිබඳ නිවාඩු යෝජනාව, ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කිරීම.

නොපැමිණීමේ අවසරය : ගරු ආර්. දුමින්ද සිල්වා මහතා
வராதிருக்க அனுமதி : மாண்புமிகு ஆர். துமிந்த சில்வா
LEAVE OF ABSENCE : HON. R. DUMINDHA SILVA

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 (ඊ) ව්‍යවස්ථාව යටතේ කොළඹ මැතිවරණ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්. දුමින්ද සිල්වා මහතාට 2013 මාර්තු 22 වන දින සිට මාස තුනක කාලයක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නෙපැමිණීමට අවසර දිය යුතුය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව, වැනිසියුලාවේ ජනාධිපති ලෙස කටයුතු කළ, ඒ වාගේම වැනිසියුලාවේ ජනාධිපති ලෙස ජනතාව විසින් කිහිප වරක් තෝරා පත් කර ගත් හියුගෝ වාවේස් මැතිතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුව වෙනුවෙන්, ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අපගේ ශෝකය පළ කර සිටිනවා. අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද ශෝක පණිවිඩය අන්තර්ගත කරන ලෙස ඉල්ලා සිටිමින්, මා එය **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද ශෝක ප්‍රකාශය:
சபாபீடத்தில் வைக்கப்பட்ட இரங்கல் செய்தி :
Condolence Message tabled:

"දිගු කලක් අසනීපව සිටි වෙනිසියුලාවේ බොලිවේරියානු ජනරජයේ ජනාධිපති අතිගරු හියුගෝ වාවේස් ප්‍රියාස් මැතිතුමාගේ අභාවය පිළිබඳ පුවත ඇසීමෙන් මම දැඩි ශෝකයට පත් වූයෙමි. ඔබතුමාටත් අභාවප්‍රාප්ත ජානාධිපතිතුමාගේ පවුලේ සාමාජිකයන්ටත්, එසේම වෙනිසියුලා රජයට සහ එරට ජනතාවටත් ශ්‍රී ලංකා රජයේත්, ජනතාවගේත් ශෝකය මෙයින් පළ කෙරෙනු ඇත. අභාවප්‍රාප්ත ජනාධිපති වාවේස් මැතිතුමා ශ්‍රී ලංකාවේ මිත්‍රයකු වූවා පමණක් නොව අප දෙරට අතර මිත්‍රත්වය හා සබඳතා ශක්තිමත් කිරීමෙහිලා විශේෂ උනන්දුවක් දැක්වූ අයෙකු ද විය. එතුමා සමඟ පැවැත්වූ සාකච්ඡාවල දී එතුමා පළ කළ මිත්‍රශීලී අදහස් අදත් මා සිහිපත් කරනුයේ ඉමහත් සුභද හැඟීමෙනි. මෙම ශෝකජනක අවස්ථාවේ දී ඔබත්, අභාවප්‍රාප්ත වාවේස් මැතිතුමාගේ පවුලේ සාමාජිකයනුත්, වෙනිසියුලානු ජනතාවත් සමඟ අපි සැවොම ශෝකය බෙදා ගනිමු. දේශයේ නායකයාගේ අභාවය පිළිබඳව මුළු රටම ශෝක වන මෙම අවස්ථාවේ දී සමස්ත ශ්‍රී ලාංකික ජනතාව ද මා සමඟ එක්ව ශෝකය පළ කරන බව යළිදු අවධාරණය කරනු කැමැත්තෙමි.

අපගේ ඉමහත් සංවේගය පිළිගනු මැනවි."

"I was deeply saddened to learn of the passing away of His Excellency Hugo Chavez Frias, President of the Bolivarian Republic of Venezuela after a prolonged illness. The Government and people of Sri Lanka join me in conveying our deepest condolences to you, members of the bereaved family and the government and people of Venezuela. The late President was a true son of Venezuela and as the leader was deeply committed to the welfare and development of his country, and a strong advocate for the developing world.

The late President Chavez was a friend of Sri Lanka and played a significant role in further enhancing our bilateral relations. I warmly recall my meetings with the late President, and his expressions of friendship and support for my country. At this difficult hour, our thoughts and prayers are with you, the family of the late President and the people of Venezuela.

The Government and people of Sri Lanka together with me stand in solidarity, as your country mourns the passing away of your great leader. Please accept Excellency, the assurances of my highest consideration."

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Hon. Speaker, on behalf of the Hon. Leader of the Opposition and on behalf of the United National Party, I wish to associate myself with the sentiments expressed by the Hon. Dinesh Gunawardena, Chief Government Whip on the demise of the great leader, Hugo Chavez.

Thank you.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අනුර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ලතින් ඇමෙරිකානු කලාපයේ මේ සියවසේ සමාජවාදය පිළිබඳ විශාල බලාපොරොත්තු ඇති කරන ලද, විශේෂයෙන්ම ලෝකය පුරා පරාධීන රාජ්‍යයන් වෙත අධිරාජ්‍යවාදය විසින් එල්ල වී තිබෙන තර්ජනවලට නොබියව මුහුණ දුන් යුගයේ ශ්‍රේෂ්ඨ පුරුෂයකු වූ හියුගෝ වාවේස් මැතිතුමා අභාවප්‍රාප්ත වීම පිළිබඳව අප පක්ෂයේ ශෝකයත් මේ අවස්ථාවේ පළ කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වෙනිසියුලාවේ ජනාධිපති හියුගෝ වාවේස් මැතිතුමාගේ අභාවය පිළිබඳ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද ශෝක ප්‍රකාශ මමද අනුමත කරමි.

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් හා යෝජනා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත
நிதி முகாமைத்துவம் (பொறுப்பு) (திருத்தம்) சட்டமூலம்
FISCAL MANAGEMENT (RESPONSIBILITY) (AMENDMENT) BILL

"2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත

பொருளாதாரச் சேவை விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்

ECONOMIC SERVICE CHARGE (AMENDMENT) BILL

"2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

පිරිතම අමෙච්චරුම් පෙළත්ත සාසන, මත අලුවල්කළ් අමෙච්චරුමානවර් සාර්පාක මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2013 මාර්ච් 19, සෙව්වාය්ක්කිළමෙ ඉරණ්ටාම්මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් කට්ටළෙයිටප්පට්ටදු.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත

மதுவரி (திருத்தம்) சட்டமூலம்

EXCISE (AMENDMENT) BILL

"(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

පිරිතම අමෙච්චරුම් පෙළත්ත සාසන, මත අලුවල්කළ් අමෙච්චරුමානවර් සාර්පාක මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2013 මාර්ච් 19, සෙව්වාය්ක්කිළමෙ ඉරණ්ටාම්මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් කට්ටළෙයිටප්පට්ටදු.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත

செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் (திருத்தம்) சட்டமூலம்

STRATEGIC DEVELOPMENT PROJECTS (AMENDMENT) BILL

"2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

පිරිතම අමෙච්චරුම් පෙළත්ත සාසන, මත අලුවල්කළ් අමෙච්චරුමානවර් සාර්පාක මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2013 මාර්ච් 19, සෙව්වාය්ක්කිළමෙ ඉරණ්ටාම්මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් කට්ටළෙයිටප්පට්ටදු.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත

துறைமுக, விமானநிலைய அபிவிருத்தி அறவீட்டுச் (திருத்தம்) சட்டமூலம்

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY (AMENDMENT) BILL

"2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 9 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

පිරිතම අමෙච්චරුම් පෙළත්ත සාසන, මත අලුවල්කළ් අමෙච්චරුමානවර් සාර්පාක මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2013 මාර්ච් 19, සෙව්වාය්ක්කිළමෙ ඉරණ්ටාම්මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් කට්ටළෙයිටප්පට්ටදු.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත

தொலைத்தொடர்பு அறவீட்டுச் (திருத்தம்) சட்டமூலம்

TELECOMMUNICATION LEVY (AMENDMENT) BILL

"2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

පිරිතම අමෙච්චරුම් පෙළත්ත සාසන, මත අලුවල්කළ් අමෙච්චරුමානවර් සාර්පාක මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2013 මාර්ච් 19, සෙව්වාය්ක්කිළමෙ ඉරණ්ටාම්මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් කට්ටළෙයිටප්පට්ටදු.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

එකතුකල අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත

சேர் பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்

VALUE ADDED TAX (AMENDMENT) BILL

"2002 අංක 14 දරන එකතුකල අගය මත බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

රේගු (සංශෝධන) පනත් කෙටුම්පත

சுங்கம் (திருத்தம்) சட்டமூலம்

CUSTOMS (AMENDMENT) BILL

"(235 වන අධිකාරය) වූ රේගු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

ඔට්ටු ඇල්ලීම හා සූදු බදු පනත (සංශෝධන) පනත් කෙටුම්පත

பந்தய, சூதாட்ட விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்

BETTING AND GAMING LEVY (AMENDMENT) BILL

"1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත

நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்

NATION BUILDING TAX (AMENDMENT) BILL

"2009 අංක 9 දරන ජාතිය ගොඩනැඟීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත

உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்

INLAND REVENUE (AMENDMENT) BILL

"2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත

வரி மேன்முறையீட்டு ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம்

TAX APPEALS COMMISSION (AMENDMENT) BILL

"2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

මුදල් පනත් කෙටුම්පත

நிதிச் சட்டமூலம்

FINANCE BILL

"1995 අංක 16 දරන මුදල් පනත, 2003 අංක 25 දරන මුදල් පනත, 2012 අංක 12 දරන මුදල් පනත සහ 1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස ද; බෝග රක්ෂණ බද්දක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත

திருமணப் பதிவு (திருத்தம்) சட்டமூலம்

MARRIAGE REGISTRATION (AMENDMENT) BILL

"(112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත

முஸ்லிம் திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலம்

MUSLIM MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL

"(115 වන අධිකාරය වූ) මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත

பிறப்புக்கள், இறப்புக்கள் பதிவு (திருத்தம்) சட்டமூலம்

BIRTHS AND DEATHS REGISTRATION (AMENDMENT) BILL

"(110 වන අධිකාරය වූ) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත
நொத்தாரிசு (திருத்தம்) சட்டமூலம்
NOTARIES (AMENDMENT) BILL

" (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත
கண்டிய திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலம்
KANDYAN MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL

"(113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
ஆவணப் பதிவு (திருத்தம்) சட்டமூலம்
REGISTRATION OF DOCUMENTS (AMENDMENT) BILL

"(117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත
அற்றோனித் தத்துவம் (திருத்தம்) சட்டமூலம்
POWERS OF ATTORNEY (AMENDMENT) BILL

"(122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත
மீள குடியமர்த்துதல் அதிகாரசபை (திருத்தம்) சட்டமூலம்
RESETTLEMENT AUTHORITY (AMENDMENT) BILL

"2007 අංක 9 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ නැවත පදංචි කිරීමේ අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 මාර්තු මස 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

மீள் குடியேற்ற அமைச்சரின் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Minister of Resettlement; to be read a Second time upon Tuesday, 19th March, 2013 and to be printed.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද දින පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරන ලද පහත සඳහන් පනත් කෙටුම්පත්වල විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඵ) 5 (අ) ව්‍යවස්ථාවට යටත් වන බව නීතිපතිතුමා විසින් ප්‍රකාශ කර ඇති අතර, ඒ අනුව ස්ථාවර නියෝග 46 අ (2) (අ) යටතේ එම පනත් කෙටුම්පත්වල පිටපත් පාර්ලිමේන්තුවට වාර්තා කිරීම පිණිස එක් එක් පළාත් සභාවලට යොමු කරන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට නියෝග කරමි.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන)
මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන)
උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන)

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1, 2, 3 සහ 4 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 20(7) දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, අද දින ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත්වල සමහර ඒවායේ පිටපත් අපට තවම ලැබිලා නැහැ. කීපයක් අපේ මෙස මත තබා තිබෙනවා. නමුත් අනික් ඒවා ගැන හරියාකාරව අපට දැන ගන්න අවස්ථාව ලැබෙන්නේ කොහොමද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමන්ලාට දැන් ඒවා ලැබෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමා කියනවා නම් අප පිළිගන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා පෞද්ගලික මන්ත්‍රී යෝජනා. පළමුවෙනි යෝජනාව, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. එතුමා පැමිණ නැහැ. දෙවැනි යෝජනාව, ගරු බුද්ධික පතිරණ මහතා.

වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායී කටයුතු සඳහා යොදා ගැනීම
நெற்பயிர்ச்செய்கை மேற்கொள்ள முடியாதுள்ள வயற்காணிகளைப் பயனுள்ள நடவடிக்கைகளுக்குப் பயன்படுத்துதல்
UTILIZING PADDY LANDS THAT CANNOT BE CULTIVATED WITH PADDY FOR PRODUCTIVE PURPOSES

[අ. භා. 2.45]

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කුඹුරු ඉඩම් ගොඩ කිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායී කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත්, ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු කථානායකතුමනි, ඔබතුමාත් ගොවියෙක් විධියට, කෘෂි කාර්මික පදනමක් සහිත දිස්ත්‍රික්කයක්, ප්‍රදේශයක්, පවුලක් නියෝජනය කරන පුද්ගලයෙක් විධියට මේ යෝජනාව ගැන ඔබතුමාගේත්, මේ ගරු සභාවේත් නියත වශයෙන්ම අවධානය යොමු වෙයි කියා මම විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමාත් මමත් නියෝජනය කරන්නේ එකම දිස්ත්‍රික්කය. ඒ කියන්නේ මාතර දිස්ත්‍රික්කය. අපි දන්නවා මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන වකවානුවේ,- අද ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ගරු කෘෂිකර්ම ඇමතිතුමා හක්මන මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරමින් 1983 අතුරු මැතිවරණය ජයග්‍රහණය කරලා එදා මේ උත්තරතර සභාවේ -පාර්ලිමේන්තුවේ- එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කළා. නිල්වලා ගඟ යෝජනා ක්‍රමය නිසාම පමණක් නොවෙයි, තවත් බොහෝ කාරණා නිසා මාතර දිස්ත්‍රික්කයේ අතීතයේ වී වගා කළ බොහෝ ගොවි බිම් -කෘෂි කාර්මික ප්‍රදේශ- විවිධ හේතු නිසා අද වී වගා කළ නොහැකි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම එක හේතුවක්,- [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

අතන් පිටකු, සභානායක් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you may continue.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම සඳහන් කරමින් සිටියේ මාතර දිස්ත්‍රික්කයට පමණක් නොවෙයි මේ ප්‍රශ්නය බලපාලා තිබෙන්නේ කියන කාරණයයි. තවත් බෝහෝ දිස්ත්‍රික්කවලට මේ කාරණය අඩු වැඩි වශයෙන් බලපාලා තිබෙනවා. හැබැයි මාතර දිස්ත්‍රික්කය නියැදියක් විධියට - උදාහරණයක් විධියට- අරගෙන කථා කළොත්, බොහෝ කුඹුරු ඉඩම් මොනම ආකාරයකින්වත් නැවතත් වී වගා කළ නොහැකි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි දන්නවා, බොහෝ ප්‍රදේශවල ලවණතාව මතු වීම සිදු වෙනවා. මාතර දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, ඒ වාගේම මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඇතැම් කාල වකවානුවලදී ලවණ මතු වීමේ ප්‍රවණතාව කුඹුරු ඉඩම් සම්පූර්ණයෙන්ම විනාශ වෙන්නට එක හේතුවක් වෙලා තිබෙනවා. එම ලවණ මතු වීම සහ විවිධ හේතු නිසා යළි වී වගා කළ නොහැකි වූ කුඹුරුවල පස යළිත් වී වගා කළ හැකි තත්ත්වයට පරිවර්තනය කිරීමේ හැකියාව තිබෙනවා. ඒ සඳහා මොනවාද ගන්න පුළුවන් ක්‍රමවේද? එහෙම කළ නොහැකි නම් මේ සඳහා ඔරොත්තු දෙන, ඒ ධාරක හැකියාව තිබෙන නව බීජ වී වර්ග නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබෙනවා.

අපි දන්නා දෙයක් තමයි -ගරු කෘෂිකර්ම ඇමතිතුමාත් මාත් එක්ක එකඟ වෙනවා ඇති- මීට දශක දෙකකට විතර කලින් මාතර නිල්වලා ගඟ දෙපැත්තේ, විශේෂයෙන් තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බණ්ඩත්තර වගේ ප්‍රදේශවල ලවණතාවට ඔරොත්තු දෙන සමඟර වී වර්ග වගා කළා. ඒ වී වර්ග සම්පූර්ණයෙන්ම කෙටි කාලයකින් අස්වැන්න නොලැබෙන වී වර්ග වෙන්න පුළුවන්. හැබැයි, යම් කිසි දීර්ඝ කාලයක් ගත වුණත්, යම් කිසි මට්ටමක අස්වැන්නක් ලැබුණා. නූතන යුගයේ වගා කරන වී වර්ග තරම්ම ඒකක වපසරියකින් -වගා කරන භූමි ප්‍රමාණයෙන්- ලැබෙන අස්වැන්නේ සංඛ්‍යාත්මක වශයෙන් විශාල ප්‍රමාණයක් නැති වුණත් යම් ප්‍රමාණයක අස්වැන්නක් ලබා ගන්න පුළුවන්. නමුත් අද දවසේ ගොවි ජනතාව බලාපොරොත්තු වන්නේ ඒකක වපසරියක අඩු පිරිවැයකින් සහ කෙටි කාලයකින් වැඩි අස්වැන්නක් ලබා ගන්න පුළුවන් වී වර්ග වගා කරන්නයි.

අතීතයේ අපේ සාම්ප්‍රදායික වී වර්ග ගණනාවක් අද වගාවෙන් ඈත් වෙලා තිබෙනවා. ඉතින් ඒ කුඹුරු අද ප්‍රයෝජනයට ගන්න බැරි වෙලා තිබෙන එක හේතුවක් තමයි මේක. දැන් අපි මේ කථා කරන කාරණය ගැන කවුරුවත් අබමල් රේණුවක් තරම්වත් අවිශ්වාසයක් ඇති කර ගන්න එපා. අපි මේ කියන්නේ වී වගා කරන්න පුළුවන් කුඹුරු ඉඩම් ගොඩ කිරීමක් ගැන නොවෙයි.

මේ යෝජනාව ඉතාමත් පරිස්සමින් පරිශීලනය කරලා කියවලා බැලුවොත් පේනවා, පවතින නීති රීති උල්ලංඝනය කිරීමක්වත්, එහෙම නැත්නම් පවතින නීති රීති අභිබවා යෑමක්වත්, එහෙම නැත්නම් මේ කුඹුරු ඉඩම්වල ඉදි කිරීමේ කටයුතු, එහෙම නැත්නම් කොන්ක්‍රීට් වනාන්තර ගොඩ නැඟීමක් ගැනවත් නොවෙයි අපි මේ යෝජනාවෙන් කරුණු ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. මේ යෝජනාවේ මුඛ්‍ය පරමාර්ථය ඉතා පැහැදිලිව සහ නිශ්චිතව, නිරවුල්ව දක්වලා තිබෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මට මේ විධියට කියන්නට හේතු වෙලා තිබෙන්නේ මොකද? අපේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා, ඉතිහාසයේ බිහි වුණු කෘෂිකර්ම ඇමතිවරුන් අතර ඉතා දුෂ්කරම ධුර කාලයක් දරන්නට සිදු වෙලා තිබෙන කෘෂිකර්ම අමාත්‍යාවරයෙක් විධියට අපේ ගරු සභාව පිළිගත යුතුව තිබෙනවා. ඒකට හේතුව මෙයයි. එතුමා කෘෂිකර්ම අමාත්‍යාංශයේ වගකීම් දැරුවාට ගොවිජන සේවා විෂය ක්ෂේත්‍රය එතැනින් අයින් වෙලා. මේක හරියට කට තිබෙනවා, දත් සෙට් එක නැහැ වාගේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපි තරයේම විශ්වාස කරන්නේ මෙයයි. කෘෂි කර්මාන්තය, ගොවිජන සේවා වාගේම වාරිමාර්ග කියන විෂයයන් තුනම එක ඒකකයක් ලෙස තිබෙනවා නම් තමයි අපේ රටේ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩා විධිමත්, වඩා නිවැරදි සහ වඩා ඵලදායී තීන්දු ගන්න පුළුවන්කම තිබෙන්නේ. නමුත් අවාසනාවකට එහෙම තත්ත්වයක් නැහැ. ඒ නිසා අද කෘෂි කර්මාන්තය ගැන ඇමතිතුමාට වගකීම් දරන්න පුළුවන් වන්නේ එක්තරා වපසරියක පමණයි. කෘෂි කර්මාන්තයට අදාළ වාරි ජලය සහ වාරි කර්මාන්ත ගැන කථා කරන විට ගරු අමාත්‍යවරයාට කැබිනට් අමාත්‍යාවරයෙක් විධියට යම් වග කීමක් දරන්න පුළුවන් හැකියාව තිබේවි. නමුත් ඒ ගැන යම් කිසි බලාත්මක, වග කිව යුතු ප්‍රකාශයක් කිරීමේ වාස්තවික තත්ත්වයක් නැහැ. ගොවිජන සේවා ක්ෂේත්‍රයට අයත් කාරණා පිළිබඳව ගරු කෘෂිකර්ම ඇමතිතුමාට එවැනි වගකීම් සහිත තීන්දු ගන්න සහ ඒ ගැන ප්‍රකාශ කරන්න පුළුවන්කම නැහැ.

අද මේ වැදගත් යෝජනාව සාකච්ඡා කරන මොහොතේදී ගොවිජන සේවා, කෘෂිකර්ම සහ වාරිමාර්ග කියන විෂය තුනේම ගරු අමාත්‍යතුමන්ලා මේ සභාවේ සිටියා නම් වඩා ඵලදායී වනවාය කියන විශ්වාසය මගේ තිබෙනවා. ඒ වාගේම මේ විෂයයන් තුන අමාත්‍යවරුන් තුන් දෙනෙකුට යන්නේ නැතිව එක අමාත්‍යාංශයක් යටතේ තිබුණා නම් -අපේ දිස්ත්‍රික්කයේ ගරු මහින්ද යාපා අබේවර්ධන ඇමතිතුමාට තිබුණා නම්- තවත් හොඳයි. [බාධා කිරීම්] ඇමතිතුමා ඉන්නවා. ඇමතිතුමා අපට කුමක් හෝ උත්තරයකුත් දෙනවා. ඒ උත්තරය හැන්සාඩ්ගත වීමකුත් වෙනවා. නමුත් අවසාන විග්‍රහයේදී ඵලදායී, හරයාත්මක, ධනාත්මක යමක් සමාජගත වෙනවාද කියන කාරණය විතරයි අපි කිරලා මැනලා තක්සේරු කළ යුතුව තිබෙන්නේ. ගරු ඇමතිතුමා පිළිතුරක් දෙයි. ඒක අපි පිළිගන්නවා. මේ තීන්දු, මේ ප්‍රකාශ ගරු ඇමතිතුමා කරනවා. මේවා ක්‍රියාත්මක කරන්නේ නිලධාරීන්. අද නිලධාරී කුටියේ මේ ක්ෂේත්‍රවලට අදාළ එක නිලධාරියෙක්වත් අපට දකින්න ලැබෙනවාද? එක මහත්මයෙක් ඉන්නවා පේනවා. මම දන්නේ නැහැ ඒ මහත්මයා මේ ක්ෂේත්‍රයට අදාළ කෙනෙක්ද, වෙනත් ක්ෂේත්‍රයකට අදාළ කෙනෙක්ද කියලා. එතකොට-

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ඒ වෙනුවෙන් ඕනෑම උත්තරයක් දෙන්න මම ඉන්නවා නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඔව්. උත්තර දෙන්න පුළුවන්; කථා කරන්න පුළුවන්. නමුත් මේ කාරණය පසේ පැළ කරද්දී, පසේ මේ බීජ රෝපණය කරලා මේ කටයුත්ත ඉදිරියට ගෙන යන්න ක්‍රියාත්මක වෙන්න ඕනෑ නිලධාරීන් ගරු ඇමතිතුමා කියන දේ අහගෙන ඉඳලා ටිකක් කථා කිරීම පමණයි වෙන්නේ. පෞද්ගලික මන්ත්‍රී යෝජනා විධියට ඉදිරිපත් කරන මේ කාරණා හුදු සංකේතයක් විධියට ඉදිරිපත් කිරීම, ස්ථිර කිරීම, ප්‍රසංශා කරමින් දෙපාර්ශ්වයේම ගරු මන්ත්‍රීවරුන් කථා කිරීම සහ ඉන් පසුව ආපසු සැරයක් යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා ඒ වෙනුවෙන් යම් අදහසක් දැක්වීම කියන කාරණා ටික හැරුණු කොට අවසානයේදී, දවස අවසානයේදී, මාසය අවසානයේදී, පාර්ලිමේන්තු සැසි වාරය අවසානයේදී, අවුරුදු 6කින් පාර්ලිමේන්තු කාලය අවසානයේදී සමාලෝචනයක් කරලා බැලුවොත් මේකෙන් සමාජයට ලැබෙන ප්‍රතිඵලය ශූන්‍යයි කියන කාරණය තමයි අපට කනගාටුවෙන් වුණත් කියන්නට වෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ යෝජනාව ඉදිරිපත් කරන මේ මොහොතේදී මාතර දිස්ත්‍රික්කයේ කුඩා ගම්මාන 1,658ක් ඇතුළත් වන ග්‍රාම නිලධාරී වසම් 650 තුළ හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16 තුළ ගොවිජන

සේවා මධ්‍යස්ථාන මට්ටමෙන් බැලුවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් බැලුවත් අද බරපතළ ප්‍රශ්නයක් බවට පත් වී තිබෙන්නේ මේ කාරණයයි. නිල්පාට, කොළපාට, රතුපාට ආදී වශයෙන් මේ බොහෝ දේශපාලන නියෝජිතයන්ගේ ආශීර්වාද මැද්දේ මේ කාරණය සිදු වෙනවා. එක පක්ෂයකට පමණක් එහෙම කියන්නට මා මුග්ධ වන්නේ නැහැ; කුහක වන්නේ නැහැ. මේ පක්ෂ තුනේම, සමහර විට පළාත් සභාවේ වන්නට පුළුවන්, ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා වන්නට පුළුවන්, එසේ නැත්නම් වෙනත් ජනතා නියෝජිතයන් වන්නට පුළුවන්, ඔවුන්ගේ ආශීර්වාදයෙන් නීති විරෝධී අන්දමින් කුඹුරු ඉඩම් ගොඩ කිරීමේ ව්‍යාපාරයක් සිද්ධ වෙමින් යනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ කාරණය මාතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, ලංකාවේ බොහෝ දිස්ත්‍රික්කවල සිද්ධ වෙනවා. කුණු ටිකක් දාලා, ඊළඟට දිරා ගෙන යනවාය කියන ලී කොටයක් දාලා පටන් ගන්න වැඩය අන්තිමට කොන්ක්‍රීට්වලින් කෙළවර වෙලා බොහෝ තැන්වල ගොඩ නැගී තිබෙන්නේ විවාහ මංගල උත්සව හා සම්මන්ත්‍රණ පවත්වන reception halls. ස්ථිර ගොඩනැඟිලි හැදෙන තැන දක්වා ගිහින් තිබෙනවා. මේ සම්බන්ධයෙන් ගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද? මේ සම්බන්ධයෙන් යම් යම් මැදිහත් වීම් සිද්ධ වුණත්, අවසාන විග්‍රහයේදී මේ ජාවාරම දිගින් දිගටම යනවා. දැන් අපට හාල් ටික ලබා ගන්න, එළවලු ටික ලබා ගන්න, වෙනත් අල වර්ග ටික ලබා ගන්න කෘෂිකාර්මික කටයුතු සඳහා ඒවා යොදා ගන්න තත්ත්වයක් නැහැ. මීට අවුරුදු දහයකට පහළොවකට කලින් මාලිමඛඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පසු කර ගෙන අකුරැස්ස - මාතර පාරේ යනකොට පාර දෙපැත්තේ ඉන්නල වගා කරන ගොවීන් කොච්චර හිටියා ද කියන එකට ගරු කෘෂිකර්ම ඇමතිතුමාත් මා සමඟ එකඟ වෙනවා ඇති. අද කෘෂිකර්ම ඇමතිතුමායි, මායි දෙන්නාම අකුරැස්ස පාරේ ගියොත් ඒ ගොවියෝ නැහැ. ඉන්නල වගා කළ ප්‍රදේශ වේගයෙන් ක්ෂිණ වෙමින්, හැකිළෙමින් යනවා. ඒවා කුඹුරු ඉඩම් නම්, ඒ ඉඩම්වල මොනම ආකාරයෙන්වත් වී වගා කරන්නට බැරි නම්, වෙනත් විකල්ප වී වර්ග ඒ ප්‍රදේශවලට හඳුන්වා දෙන්නටත් බැරි නම් ඒ ඉඩම්වල වෙනත් භෝග වගා කරන්නට පුළුවන්කම තිබෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එ කාලයේ ඒවා වගා කළේ වේලිවල. කුඹුරුවල නොවෙයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හරි. ගරු ඇමතිතුමාට ලැබෙන වෙලාවේදී උත්තර දෙන්නකෝ. වේලිවල තමයි එදා ඉන්නල වගා කළේ. අද වී වගා කරන්නට බැරි කුඹුරු තිබෙනවා නම් ඒ කුඹුරුවල ඉන්නල වගා කළා නම් ඇති වැරැද්දක් නැහැ. ඒකයි මා කියන්නේ. මේක පටලවා ගන්න එපා. එදා වගා කළේ වේලිවල. ඒක හරි. [බාධා කිරීමක්] අර්තාපල් ගැන නොවෙයි මේ කියන්නේ. අපේ ප්‍රදේශවල වැවෙන දෙයක් නොවෙයි නේ අර්තාපල්. මා මේ කථා කරන්නේ වෙනත් ක්ෂේත්‍රයක් ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඉතා පැහැදිලිව මේ කාරණය සඳහන් කරන්නට අවශ්‍යයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරිගව සම්පත මාතර දිස්ත්‍රික්කයට සාපේක්ෂව ප්‍රතිශතාත්මකව වැඩියි. හැබැයි හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන දේශගුණික තත්ත්වය සැලකුවොත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරිගව සම්පතට අවශ්‍ය ආහාර නිෂ්පාදනය කරන්නට පුළුවන් තත්ත්වය මාතරට සාපේක්ෂව අඩුයි. මාතර තෙත් කලාපයට අයිති වීමත් හම්බන්තොට වියළි කලාපයට අයත් වීමත් තමයි ඒකට හේතුව.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරිගව සම්පත වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා නම් මාතර දිස්ත්‍රික්කයේ වී වගා කරන්නේ නැති කුඹුරු; මොනම විධියකින්වත් වී වගා කරන්නට නොහැකි කුඹුරු නිස්කාරණයේ අවුරුදු පහ, දහය, පහළොව, විස්ස පුරන් වෙලා තිබෙන යුගය නිමා කර, හම්බන්තොට කිරිගව සම්පතට අවශ්‍ය ආහාර නිෂ්පාදනය සඳහා පාවිච්චි කරන්නට පුළුවන්කම තිබෙනවා. මේ සඳහා සමෝදානික වැඩ පිළිවෙළකුයි අවශ්‍ය. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, පශු සම්පත් අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා අමාත්‍යාංශය ඇතුළු මේ හා සම්බන්ධ අනෙකුත් අමාත්‍යාංශත් සම්බන්ධ කර ගෙන අපට මේ වැඩ පිළිවෙළ ඇති කරන්නට පුළුවන්. සමහර විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයත් අපට ලබා ගන්ට පුළුවන්කම ලැබේවි. එහෙම ලබා ගන්නට පුළුවන්කම තිබෙනවා නම්, මාතර දිස්ත්‍රික්කයට තිබෙන වටිනා සම්පතක් වන ඔබතුමාත් මාත් එකඟ වෙන රුහුණු විශ්වවිද්‍යාලයේ මාපලාන කෘෂි විද්‍යාපීඨයේ ඉන්න විශේෂඥයන්ගේ සහ ඒ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ශක්තිය, දැනුම, ඔවුන්ගේ හැකියාවන්, ඔවුන්ගේ ධාරිතාවන් මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පර්යේෂණ කරන්නට දිරි ගන්වන්නට යොදා ගන්න පුළුවන් නම් ඒ පර්යේෂණ හරහා ලැබෙන නව නිර්මාණයන් හා නව පර්යේෂණ වාර්තා මේ සඳහා පාවිච්චි කරන්නට පුළුවන්. හැබැයි, කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට විතරක් කරන්න ගියොත් මේ කටයුත්ත කර ගන්න බැහැ. මේ කාරණයේදී සමෝදානික වැඩ පිළිවෙළක් වැදගත් වෙනවාය කියා මම අවධාරණයෙන් ප්‍රකාශ කරන්නේ ඒ නිසායි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඒ විතරක් නොවෙයි. දැන් ගොවියා නිෂ්පාදනය කළාට වැඩක් නැහැ. වෙළෙඳ පොළ ඇති කරන්න ඕනෑ. නැත්නම් කාටද විකුණන්නේ? කවුද මිලදී ගන්නේ? එහෙනම් වෙළෙඳ පොළ ඇති කරන්න පුළුවන් යාන්ත්‍රණයක් එතැනට බද්ධ කළ යුතුව තිබෙනවාය කියන එකයි මගේ විශ්වාසය. දැවැන්ත වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නට අවශ්‍ය මූලික තත්ත්වය නිර්මාණය කිරීමට උපස්ථම්භනයක් - motivation එකක්- ලබා ගන්නට පුළුවන්කම ලැබෙයි කියන විශ්වාසයෙනුයි -අන්න ඒ අරමුණ පෙරදැයි කර ගෙනයි- මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. වී වගා කරන්න බැරි නම් එක්කෝ පළා වර්ග වෙනත් භවභෝග, ඉන්නල වාගේ අල වර්ග ඊට අමතරව කිරි ගව සම්පතට අවශ්‍ය ආහාර වගා කරන්න සමහර කෙනෙක් කැමැති වෙන්න පුළුවන්. මේ ප්‍රදේශවලට ගැළපෙන මල් වර්ග නිෂ්පාදනය කර ජාත්‍යන්තරයට අළෙවි කරන්න තව සමහර කෙනෙක් කැමැති වෙන්න පුළුවන්. ජාත්‍යන්තර අපනයන කේන්ද්‍රීය නිෂ්පාදන කරන්න පුළුවන්කම තිබෙනවා නම් අපනයන කේන්ද්‍රීය නිෂ්පාදනවලටත් මේ භූමිය යොදා ගැනීමේ හැකියාව තිබෙනවා. මොකද, දේශීය අවශ්‍යතාව ඉක්මවා ගිහින් අපිට ජාත්‍යන්තරය ඉලක්ක කරන, ජාත්‍යන්තරය ආමන්ත්‍රණය කරන නිෂ්පාදන සඳහා මේ ප්‍රදේශ සහ මේ භූමිය යොදා ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ සම්බන්ධව අද ගරු කෘෂිකර්ම ඇමතිතුමාත් මා සමඟ එකඟ වෙනවා ඇති.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිල්වලා ව්‍යාපාරය, නිල්වලා ව්‍යාපාරයේ අඩු පාඩු, නිල්වලා ව්‍යාපාරයෙන් සිදු වුණු මකාලිය නොහැකි වැරැදි ගැන මා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ඒකට හේතුව පසු ගිය අය වැය විවාදයේදී වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ මම විනාඩි 55ක් නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ වුණු අඩුපාඩු ගැන කථා කරන්නට යෙදුණු නිසායි. එදා මම කොළ පාට ආණ්ඩුවෙන් වුණු වැරැදි පමණක් නොවෙයි; නිල් පාට ආණ්ඩුව මේ පිළිබඳව දැක්වූ කුඩම්මාගේ සැලකිලි පිළිබඳවත් කථා කරන්නට යෙදුණා. ඒ නිසා නිල්වලා ගඟ ව්‍යාපාරය, පුරන් වූ කුඹුරු පිළිබඳව කථා කරමින් කාලය නාස්ති කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. හැබැයි, මා එක දෙයක් කියනවා.

අද නිල්වලා ගඟ ව්‍යාපාරය නිසා පුරන් වුණු කුඹුරු අක්කර දහස් ගණනක් තිබෙනවා. විශේෂයෙන් කිරල කැලේ ව්‍යාපෘතිය හරහා පුරන් වුණු කුඹුරු අක්කර දහස් ගණනක් අපි අද

[ගරු බුද්ධික පතිරණ මහතා]

නිෂ්ප්‍රයෝජන ප්‍රදේශ විධියට අත් හැර දමා තිබෙනවා. ඒ නිසා අද දවසේ අපට බරපතළ අවශ්‍යතාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද නිල්වලා ගඟ ව්‍යාපාරයෙන් විනාශ වුණු බොහෝ කුඹුරුවල නිකම් වැවෙන්නන් වාලේ වැවුණු ආක්‍රමණශීලී පැළෑටි සමඟර විට ටිකියා වාගේ තෘණ වර්ග හැරුණු විට වෙනත් කිසිම දෙයක් නැහැ. අයාලේ කුඹුරකට බහින ගවයෙක් ඒ තණකොළ ටිකක් කෑවොත් හැරෙන්න ඒ කුඹුරුවලින් ගන්න තිබෙන ප්‍රයෝජනය අඩු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, ලංකාවේ සියලුම කෘෂි කාර්මික කුඹුරු පිළිබඳව යළි සමාලෝචනයක් කරමින් යම් කිසි කටයුත්තකට මැදිහත් වීමේදී මේ ආණ්ඩුවේ ඇතැම් ඇමතිවරුන් පිළිබඳව කල්පනා කර බලන විට ඒ ඇමතිවරුන්ට සාපේක්ෂව ඔබතුමා ගැන ප්‍රමාණික විශ්වාසයක් අපිට තිබෙනවා. හොරකම් කරන්න වුවමනාවක් නැති ඔබතුමාට අවංකව වැඩ කරන්න පුළුවන්; ඔබතුමා සැබෑ මහත්මයෙක් කියන විශ්වාසය අපිට තිබෙනවා. ඒක ප්‍රමාණික විශ්වාසයක්; සමඟර ඇමතිවරුන්ට සාපේක්ෂව බලන විට ප්‍රමාණික විශ්වාසයක්. ප්‍රමාණික යම් විශ්වාසයක් තිබෙන නිසා අප හිතනවා ඔබතුමා මේ කටයුත්තට -[බාධා කිරීමක්] අනික් අයට සාපේක්ෂව කියා කිව්වේ ඒකයි. [බාධා කිරීමක්] දැන් විදුලිය නැති වුණා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ. කරුවලේ කියන්නේ. ඒකයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒක තමයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසියේ වටේ අකුණු ගහන කොට රටේ උත්තරීතරම ආයතනයේත් තත්ත්වය මේක නම් මේ රටට දෙවියන්ගේම පිහිටයි. ආලෝකය නැති නිසා අපටම අපේ ආලෝකය සපයා ගන්න සිදු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ කටයුත්තේදී ගරු ඇමතිතුමා මෙතැනට ඇවිල්ලා පිළිතුරක් දෙනවාය කියලා සඳහන් කළා. ඔබතුමා පිළිතුරක් දීම ගැන මට සතුටුයි. හැබැයි මා මේ කාරණය පිළිබඳව කනගාටු වෙනවා. ඔබතුමාගෙන් අපට ලැබෙන්නේ, හුදෙක් මේ විවාදයේ දී විෂය භාර අමාත්‍යවරයාගෙන් පිළිතුරක් ලැබිය යුතු නිසා ලබා දෙන පිළිතුරක් නම් අර මගේ සතුට දෙවැනි කාරණය නිසා ක්ෂය වෙලා යනවාය කියන කාරණය මා සඳහන් කරන්න ඕනෑ. ඇයි? මේ යෝජනාව ඉදිරිපත් කර, මේ යෝජනාව පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය තුළ දළ වශයෙන් අවුරුදු දෙකකට වැඩි කාලයක් තිබ්බා අද දවසේ විවාද වෙනවා.

ගරු කෘෂිකර්ම ඇමතිතුමා ඇවිල්ලා මම මේ ඔක්කොම වෙනුවෙන් -නිලධාරීන් වෙනුවෙන්, අනික් ඇමතිවරු වෙනුවෙන්- උත්තරයක් දෙනවාය කියනවා. ගරු ඇමතිතුමාට එහෙම උත්තරයක් දෙන්න පුළුවන් වීම ගැන සතුටු වන අතරේ ඒක හුදෙක් ඇමතිතුමා කියන විධියට උත්තරයක් දීම නම් මා ඒ ගැන කනගාටු වනවා. මා බලාපොරොත්තු වන්නේ මේකට පිළිතුරු කථාව විධියට ලැබෙන පිළිතුර පමණක් නම් නොවෙයි කියන කාරණය මා මේ අවස්ථාවේ දී මේ ගරු සභාවට කියන්න ඕනෑ. පිළිතුරෙන් එහා ගිය දෙයක් අපට අවශ්‍යයි. අප බලාපොරොත්තු වන්නේ පිළිතුරෙන් එහා ගිය ක්‍රියාදාමයකුයි. සමඟර විට මේ ක්‍රියාදාමයේ සමඟර කොටස් දැනටමත් ඔබතුමන්ලා ආරම්භ කර තිබෙන්න පුළුවන්; පර්යේෂණ මට්ටමේ තිබෙන්න පුළුවන්; ක්‍රියාත්මක වෙමින් තිබෙනවා වෙන්න පුළුවන්. හැබැයි ගොවීන්ගේ නාමයෙන් ඔබතුමාගෙන් මා ඉතා ගෞරවයෙන් ඉල්ලන්නේ මෙයයි.

අද ගොවියාට ගොවි විශ්‍රාම වැටුප අහිමි වෙලා තිබෙනවා. ගොවියන්ගේම අරමුදලින් ගොඩ නැඟුණු ගොවි විශ්‍රාම වැටුප ඔබතුමාත් ගරු කරන, ඔබතුමාත් එක්ක බොහොම සමීප මතවාදීමය තත්ත්වයක කටයුතු කළ දිවංගත ගාමණී ජයසූරිය මැතිතුමා තමයි හඳුන්වා දුන්නේ. 1987 ඉන්දු - ලංකා ගිවිසුම වෙලාවේ ඇමති පට්ටම් දාලා ගාමණී ජයසූරිය මැතිතුමන්ලා අයින් වෙද්දී, මන්ත්‍රී ධුර දෙවැනි තැනට තියලා කල්පනා කරපු ඔබතුමන්ලාත් එක්ක මතවාදීමය වශයෙන් සමාන තත්ත්වයක හිටපු දිවංගත ගාමණී ජයසූරිය මැතිතුමා හඳුන්වා දුන් ගොවි විශ්‍රාම වැටුප අද සහමුලින්ම කප්පාදු කර තිබෙනවා. ඒ වෙනුවට විකල්ප ගොවි විශ්‍රාම වැටුපක් ගෙනෙනවාය කියලා මේ ගරු සභාවේ කියන්නම් වාලේ කියවලා කියවලා අද වන කොට මාස හයකට වඩා ගිහිල්ලා තිබෙනවා. ගොවි විශ්‍රාම වැටුප අහෝසි කරලාත් අවුරුදු එක හමාරක් විතර ගිහිල්ලා තිබෙනවා.

අද වන තුරු ගොවි විශ්‍රාම වැටුප නොවෙයි, විකල්ප ක්‍රමයක් පිළිබඳවවත් අඩු ගණනේ ඡායා මාත්‍රයක ධවල පත්‍රිකාවක්වත් ඉදිරිපත් කර ගන්න බැරි වුණු රජයෙන් අප ඉල්ලනවා, කරුණාකර මේ වෙනුවෙන් සාධනීය ක්‍රියාමාර්ගයකට මුල පුරන්න, කෘෂිකර්ම ඇමතිතුමා විධියට ඔබතුමා අනිකුත් අමාත්‍යාංශත් එක්ක එක්කාසු වෙලා ඒකාබද්ධ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. ඵලදායී, එහෙත් වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල වෙනත් බව බෝග වගා කරලා ගොවීන්ට ආදායමක් ලබන්න, හිස් ඉඩම් වඩා ඵලදායී ලෙස පරිභෝජනයට ගන්න, ජාත්‍යන්තරය ඉලක්ක කළ රැකියා අවස්ථා සහ දේශීය රැකියා අවස්ථා ජනිත කරන්න, ජාත්‍යන්තර අපනයනය ඉලක්ක කළ කෘෂි නිෂ්පාදන ප්‍රමාණයක් මේ භූමිවල ඇති කරන්න පුළුවන් වැඩ පිළිවෙළකට මුල පුරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අද පිළිතුරක් දීමෙන් එහා ගිහිල්ලා ඔබතුමා මේ කටයුත්තට මැදිහත් වෙලා, ඒ වෙනුවෙන් මුල පුරලා, මේ හා බැඳුණු අනිකුත් අමාත්‍යාතුමන්ලා එකතු කරගෙන මේ වැඩ කටයුත්ත ආරම්භ කරයි කියන විශ්වාසය තබමින් මා මේ යෝජනාව ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Ajith P. Perera will now second the Motion.

[අ. භා. 3.09]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කරුණු ඉදිරිපත් කළ අවස්ථාවේ ඉඳලාම සභාවේ රැඳී සිටිමින් ඒ දක්වන කරුණුවලට සවන් දෙන්න ඔබතුමාගේ තිබෙන කැමැත්ත පිළිබඳව මා මුලින්ම විෂය භාර ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් අද මේ මොහොත වන විට මේ පාර්ලිමේන්තු සභාවේ රැඳිලා ඉන්න සම්පූර්ණ මන්ත්‍රීන් ගණන 20කට අඩුයි. මා ඒ ප්‍රශ්නය මතු කරන්නේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මේ පාර්ලිමේන්තුව මෙහෙම පවත්වාගෙන යන්නත් බැහැ.

අද මන්ත්‍රීවරුන් ප්‍රශ්න අහන පැයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 15ක් තිබුණා. ඒ වැදගත් ප්‍රශ්නවලින් එකකට හෝ පිළිතුරු දෙන්න ආවේ අදාළ ඇමතිවරුන්ගෙන් කිහිප දෙනෙකු පමණයි. සෞඛ්‍ය ඇමතිතුමා, ප්‍රවාහන ඇමතිතුමා සහ තවත් ඇමතිවරුන් දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් පමණයි හිටියේ.

අනෙක් ඇමතිවරුන්ට අද වෙන වැඩ තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට සිකුරාදාට එන එක, විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනාවලට සැලකිල්ලක් දක්වන එක, ඒවාට ගෞරවාන්විතව සලකන එක, ඒ අහන ප්‍රශ්නවලට පිළිතුරු දෙන එක, ඒ වාගේම වගකීමෙන් ඒ පිළිබඳ විවාදවලට සම්බන්ධ වන එක අද මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායෙන් ඇත් වෙලා තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sunil Handunnetti, what is your point of Order?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද න්‍යාය පත්‍රය අපේ මේස මත නැහැ. නමුත් මම එකක් ගෙන්වා ගත්තා. එහි සඳහන්ව තිබෙනවා, පනත් කෙටුම්පත් 21ක් අද පිළිගන්වන බව. ඒ පනත් කෙටුම්පත් අපේ මේස මත තියලා නැහැ. ඒවා අද දින පිළිගන්වන බවට සටහන් වනවා. නමුත් මන්ත්‍රීවරුන්ට ලැබිලා නැහැ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒ ප්‍රශ්නයට කථානායකතුමා උත්තරයක් දුන්නා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Speaker has already made a statement in that regard. There is a delay, but those Bills will be distributed in a few minutes' time. Do not worry.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අද දවස අවසන් වෙන්න කලින් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. එහෙම නොවුණොත්, ඊළඟ පාර්ලිමේන්තු දිනයේදී තමයි අපට මේවා ලැබෙන්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
තව ස්වල්ප වේලාවකින් ඔබතුමාට ලැබෙයි.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු කථානායකතුමා ඒකට උත්තරයක් දීලා තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ, නැහැ. උත්තරයක් දුන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පැහැදිලි කරන්නම්. අද මේ වන තෙක් ඒ පනත් කෙටුම්පත් අපට ලැබිලා නැහැ. ඒක ප්‍රමාදයක්. අපි ඒක පිළිගන්න ඕනෑ. කථානායකතුමා කිව්වා, අද දවස තුළ දෙන්නම් කියලා. ඒ විතරක් නොවෙයි, අද න්‍යාය පත්‍රය ලැබුණේත් නැහැ, අපට. අද න්‍යාය පත්‍රය හැටියට ලැබුණේ ෆොටෝ කොපි කරපු කොළ කීපයක්. ඒත් ටිකක් ප්‍රමාද වෙලා. ඊට පස්සේ සභාවේ කටයුතු කෙරෙන අතරමැද දී දුන්නා. මේ පනත් කෙටුම්පත්වල ප්‍රමාදයට හේතුව අපි දන්නවා. ඒ හේතුව තමයි, පනත් කෙටුම්පත් විශාල ප්‍රමාණයක් අන්තිම මොහොතේ කඩිනමින් ඉදිරිපත් කරන්න සූදානම් වන එක. ඉතින්, දැන් ආණ්ඩුවේ සැලසුම මොකක්ද? අය වැය සම්මත වෙලා දැනට මාස ගණනක් වනවා. මාස හතරකට වැඩියි. මාස හතරක් මේ කටයුතු ගැන කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැතුව බලා ගෙන ඉඳලා, මාර්තු මාසයේ 31 වන දා මතක් වන කොට, අන්තිම මොහොතේ මතක් වෙනවා අය වැයට අදාළ පනත් කෙටුම්පත් සම්මත කරන්න ඕනෑ කියලා. ඒක තමයි අද වෙලා තිබෙන ප්‍රශ්නය. ඒක තමයි මේ ආණ්ඩුවේ තිබෙන ප්‍රශ්නය. අලුත් පනත් කෙටුම්පත් 21ක් ඇතුළත් කරන නිසා තමයි අද න්‍යාය පත්‍රය ලැබුණේ නැත්තේ; තවමත් ලැබුණේ නැත්තේ; තවමත් ඒක මහ එන්නේ. ඒ කෙටුම්පත් තවම මුද්‍රණය වනවා. එක පැත්තකින් ඒවා නිසි වේලාවට ලබා ගැනීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකමක්. අනෙක් අතට මේ ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අනෙක, මේ පරමාධිපත්‍යය සහිත උත්තරීතර පාර්ලිමේන්තුව!

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
උත්තරීතර පරමාධිපත්‍යය සහිත පාර්ලිමේන්තුව. ඇත්තටම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ නැති යෝජනාත් සම්මත කළා නේ. ඔබතුමාත් හිටියා නේ. ඒ නිසා එහෙව් පාර්ලිමේන්තුවේ මේ පොඩි පොඩි ටෙක්නිකල් ප්‍රශ්න කථා කරලා වැඩක් නැහැ. න්‍යාය පත්‍රයේ නැති යෝජනා සම්මත කරන්න තරම් වූ පාර්ලිමේන්තුවක් මේක. ඒ නිසා ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, එවැනි පාර්ලිමේන්තුවක මේවා කථා කරලා වැඩක් නැහැ.

මා ස්තුතිවන්ත වනවා, විෂය භාර ගරු කෘෂිකර්ම ඇමතිතුමාට, මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉදීම ගැන.

ගරු බුද්ධික පතිරණ ඇමතිතුමා ඉදිරිපත් කළ මේ යෝජනාව ස්ථිර කරන ගමන් ඒ ගැන කාරණා කීපයක් කියන්න ඕනෑ. මේ යෝජනාවේ තිබෙනවා, සම්පූර්ණයෙන්ම කුඹුරු ඉඩම් විධියට භාවිත කරන්න බැරි, වගා කරන්න බැරි ඉඩම් භාවිත කිරීම ගැන. අපි පාර්ලිමේන්තුවට පිවිසෙන කොට අපට පෙනෙනවා, පාර්ලිමේන්තුවට ඔබ්බෙන් ජයවර්ධනපුර රෝහල ඉදිරිපිට තිබෙන ඒ වෙල්යාය. අද වන කොට පසු ගිය කන්නයේත් වගා කරපු මේ වෙල් යායේ සමහර ස්ථාන ගොඩ කරනවා; සමහර ස්ථාන හාරනවා; සමහර ස්ථානවල බැම්ම බඳිනවා. නගරය අලංකාර කිරීමේ කටයුත්තක් හැටියට ඒක ඉතාම හොඳයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ නගරය ලස්සන කරන්න ඕනෑ. අපි ඒ ගැන අපේ සතුට ප්‍රකාශ කරනවා. අපි මෙය ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගන්න අවශ්‍යයි. විශේෂයෙන්ම අපේ රටේ බස්නාහිර පළාතේ කුඹුරු ඉඩම් පිළිබඳව යම් ආකාරයක ඵලදායී වැදගත් නිශ්චිත ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මගේ පියා ගොවියෙක්. මගේ පියා රජයේ සේවයට අමතරව, ඉතා සතුටින් කරපු දෙයක් තමයි ගොවිතැන.

ඔහු මිය යන්න මාස හයකට පෙරත්, ඒ වන තෙක්ම ගොවිතැන් කටයුතුවලට සම්බන්ධ වුණා. එයින් බොහොම ලොකු සතුටක් අත් වින්දා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

නැහෙනහිර පළාත සහ උතුරු මැද පළාත සමඟ සසඳන කොට, ඊට සාපේක්ෂව අපේ බස්නාහිර පළාතේ වී ගොවිතැනේ අස්වැන්නේ අඩුවක් තිබෙනවා. ඒත් වටිනාකමක් තිබෙනවා. විශේෂයෙන්ම තමන්ගේ භාවිතයට අවශ්‍ය වී ටික තමන්ගේ කුඹුරෙන් ලබා ගැනීමේ සතුට වෙනුවෙන්, ඒ ආත්ම තෘප්තිය වෙනුවෙන් වාගේම දුප්පත් මිනිසුන්ට තිබෙන එකම රැකියාව නිසා අදටත් ඒ ජනතාව කුඹුරු ගොවිතැනේ යෙදෙනවා. හැබැයි බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ රජය කියනවා, කුඹුරු ඉඩම් ඉඩම් ගොඩ කරන්නේ නැහැ කියලා. ගරු ජනාධිපතිතුමාත් පසු ගිය අය වැය කථාවේදී කිව්වා, "කුඹුරු ඉඩම් ගොඩ කිරීමට ඉඩ නොදීමේ ප්‍රතිපත්තිය කිසි සේත්ම වෙනස් නොකරමි" කියලා. ඒක හොඳයි. හැබැයි ගරු ඇමතිතුමනි, නගරය ලස්සන කරන්න නාගරික සංවර්ධන අධිකාරියෙන් මේ පාර්ලිමේන්තුවේ සිට කිලෝ මීටරයක් එහා පැත්තේ තිබෙන කුඹුරු ඉඩම් ගොඩ කරනවා. දැන් ඒ කුඹුර මැද්දේ අක්කර දෙකක් විතර ගොඩ කරලා තිබෙනවා. මා ඒක වැරදියි කියනවා නොවෙයි. ඒකෙන් පෙනෙන්නේ, නිසි ඇළ මාර්ග සකස් කරලා, වැහි වතුර රඳා හිටින්න අවශ්‍ය ජලාශ ඉදි කරලා, නිසි කළමනාකරණයක් ඇතිව අපට වටිනා ගොඩ ඉඩම් මතු කර ගන්න පුළුවන් බවයි. ඒ වාගේම කෘෂි කර්මාන්තයට වඩා ඵලදායී විධියට ජලය නිසි ලෙස බැස යන ආකාරයට ඉඩම් සකස් කර ගන්න පුළුවන් බවයි. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බස්නාහිර පළාතේ කුඹුරු ඉඩම් නිසි කළමනාකරණයක් සහිතව භාවිත කිරීම ගැන මගේ පක්ෂයේ නායක, විපක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා මීට අවුරුදු 10කට කලින් -2005 අවුරුද්දේ- සඳහන් කරන කොට ආණ්ඩුව කිව්වේ, "මේ බලන්න රනිල් වික්‍රමසිංහ කුඹුරු ඉඩම් ගොඩ කරන්න යනවා, දේශ ද්‍රෝහියෙක්" කියලා. නමුත් එතුමා කිව්වේ හුදු කුඹුරු ඉඩම් ගොඩ කිරීමක් ගැන නොවෙයි. එතුමා කිව්වේ, බස්නාහිර පළාතේ තිබෙන වී වගා කිරීමට කිසි සේත්ම නොහැකි කුඹුරු ඉඩම් නිසි කළමනාකරණයක් සහිතව, නිසි ආකාරයකට භාවිත කිරීමට අවශ්‍ය කරන ප්‍රතිපත්තියක් සකස් කරන්න ඕනෑ බවයි. ඒක තමයි ඔබතුමන්ලා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ලා අද කොළඹ නගරයේ කරන්නේ. එය අපේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුරේ වෙන්න පුළුවන්, බණ්ඩාරගම වෙන්න පුළුවන්, හොරණ වෙන්න පුළුවන්. ගම්පහ දිස්ත්‍රික්කයේ වෙන්න පුළුවන්.කොළඹ දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ලේ, කැස්බෑවේ වෙන්න පුළුවන්. ඒ කොයි තැනකත් කරන්න පුළුවන්. ඒ කුඹුරු ඉඩම් නිසි කළමනාකරණයක් සහිතව භාවිත කළ යුතුයි. ඵලදායී ලෙස වී වගාව කෙරෙන්නේ නැත්නම් ඒ බිම් සුදුසු ගොඩ ඉඩම් බවට පත් කරන්න, වතුර බැස යන ඇළ මාර්ග සකස් කරන්න සහ වැසි ජලය එකතු කිරීම සඳහා අලුත් ජලාශ ඉදි කරන්න කටයුතු කරන්න ඕනෑ. ඒකට උදාහරණය අද ඔබතුමන්ලාම දෙනවා. බලන්න දියවන්නාව කෙළවර ඉඩම් දිහා. ඒ නිසා මේවා කරන්න බැරි දේවල් නොවෙයි. මේවා දේශ ද්‍රෝහී වැඩ නොවෙයි. මේවා මේ රටේ වටිනා භූමිය නවීන කාලයට ගැළපෙන පරිදි සකස් කර රටේම ජනතාව වෙනුවෙන් කරන සංවර්ධන කටයුතු වශයෙන් සලකන්න අවශ්‍යයි.

ගරු මහින්ද යාපා අබේවර්ධන ඇමතිතුමනි, ඔබතුමාට කෘෂිකර්ම විෂය භාර දුන්නත් ඔබතුමාට ගොවිජන සේවා විෂය අයිති නැහැ. ඒ වාගේම වාරිමාර්ග විෂයත් ඔබතුමාට අයිති නැහැ. අද ඔබතුමා, ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා යම් තීරණයක් ගත්තාට, ඒ තීරණය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කරන ප්‍රායෝගික ශක්තිය, යාන්ත්‍රණය ඔබතුමා වටා එකතු වෙලා නැහැ. ඒවා ගැන කිසි උනන්දුවක් නැහැ. දැන් ඔබතුමා කලබල වුණා, ඔබතුමාගේ නිලධාරීන් කිසිවෙකු අද පාර්ලිමේන්තුවේ නිලධාරීන්ගේ කුටියේ නැහැයි කියන කොට. ඔබතුමා කිව්වා, "නැහැ මා ඉන්නවා" කියලා. ඇත්ත. ඔබතුමා ගැන අපට ගෞරවයක් තිබෙනවා. ඔබතුමා වැදගත් දේශපාලනඥයෙක්. නමුත් ඒ නිලධාරීන් අද එන්නේ නැති එකෙන් පෙනෙන්නේ මොකක්ද? ඔවුන් හිතන්නේ, "මොනවා වුණත් මොකද" කියන එකයි. "බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මොකක්දෝ ප්‍රශ්නයක් අහලා තිබෙනවා; මොකක්ද යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යෝජනාවට පිළිතුරු දෙන්න ඇමතිතුමා නොගියොත් ලජ්ජාවක්. ඒ නිසා ඇමතිතුමා ගිහිල්ලා මෙන්න මේ උත්තරය දුන්නොත් හොඳයි. හැබැයි ඉතින් ඒවා අපට වැඩක් නැහැ, අපට ඕනෑ දෙයක් අප කරනවා. අපට ඕනෑ නැති දෙයක් නොකර ඉන්නවා." මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන්ගේ මතය වැදගත්කමක් නොමැති ලෙසට තමයි ඒ නිලධාරීන් හිතන්නේ. මොකද අද ඒ අයට එන්න බැරි? ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න අදාළ වග කිවයුතු නිලධාරීන්ට අද මේ පාර්ලිමේන්තුවට පැමිණීම අකැපද? මොකක්ද අද එන්න බැරි හේතුව?

මේ පාර්ලිමේන්තුවට අද එන්න බැරි තරමට, මීට වඩා ලොකු වැඩ තිබෙනවාද ඒගොල්ලන්ට? නැහැ. මේ තමයි ඕනෑ නැතිකම. "ඇමතිතුමා ඒවා බලා ගනීවි" කියන එක තමයි ඒ අයගේ අදහස. ඒ අය පාර්ලිමේන්තුවට එන්නේ පිළිතුරු සපන්න පමණක් නොවෙයි, අපේ කථා අහන්නයි. අපි කියන දේ අහන්නයි. මේ ගරු සභාවේ මතය අහන්න සහ ඒ බරපතළකම ඇඟට ගන්නයි. නමුත් අද ඒ නිලධාරීන් ඇවිල්ලා නැහැ. එන්න ඕනෑ නැහැ කියලා හිතා ගෙන ඉන්නවා. ඒක තමයි මේ පාර්ලිමේන්තුවේ ගණපූරණයවත් මේ මොහොතේ නැත්තේ. මේ මොහොතේ විෂය භාර ඇමතිවරු පස් දෙනෙකු පමණයි මේ ගරු සභාවේ ඉන්නේ. ඒක තමයි අවාසනාව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කාරණා කිහිපයක් සඳහන් කරන්න අවශ්‍යයි. මේ විෂය ගැන ගරු ජනාධිපතිතුමා පසු ගිය අය වැය යෝජනාවලදී අවධානය යොමු කර තිබෙනවා. එතුමා කියා තිබෙනවා, "පුරන් කුඹුරු නැවත ගොඩ කිරීමට ඉඩ නොදීමට රජය ගෙන ඇති තීරණය කිසිසේත් වෙනස් කරන්නේ නැහැ."යි කියලා. එහෙම කිව්වාට දියවන්නාවට ඒක අදාළ නැහැ. ඒක කෝට්ටේ ප්‍රදේශයට අදාළ නැහැ. ඒ ගැන බලන්න ඔබතුමාට වෙන කොහාටවත් යන්න ඕනෑ නැහැ. කෝට්ටේ අක්කර දෙකක් ගොඩ කරලා තිබෙනවා. මම ඒක වැරැදියි කියලා කියනවා නොවෙයි. මම මේ කියන්නේ ප්‍රතිපත්තියක් නැහැයි කියන එකයි.

එම අය වැය යෝජනාවල තව දුරටත් සඳහන් කර තිබෙනවා, "එවැනි ඉඩම් හිමිකරුවන් සිය ඉඩම් 2013 ජූනි මස 30වන දිනට පෙර කෘෂි කාර්මික කටයුතුවලට යොදා නොගන්නේ නම් ඒවා අද ගොවි ක්‍රමයට කෙටි කාලීන පළතුරු, එළවලු හා මල් වගා කිරීමට ඉදිරිපත් වන පුද්ගලයන්ට බෙදා දීමට යෝජනා කරනවා." කියලා. ඇත්ත වශයෙන්ම ඒක ඉතාම හොඳ යෝජනාවක්. දැන් ඒ යෝජනාව මෙලෙසම ක්‍රියාත්මක කරන්න බැරි ප්‍රශ්න තිබෙනවා. මොකද මගේ පියාට අයිති ඒ වාගේම මටත් අයිති කුඹුරු තිබෙනවා, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ආසනයේ ගෝනදුව ප්‍රදේශයේ. මට මතකයි, මම කුඩා කාලයේ මගේ පියා සමඟ ඒ වගා කටයුතුවලට සම්බන්ධ වුණු ආකාරය. ඒවායින් අපට ලොකු තෘප්තියක් ලැබුණා. වඩදිය සමඟ එන ලුණු හෝදා ගෙන යන්න ගං වතුර ආපු නැති නිසා ඒවායේ වගා කරන්න බැහැ. මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා යෝජනා ක්‍රමය අසාර්ථක වුණා වාගේම කළුතර දිස්ත්‍රික්කයේ බොල්ගොඩ වාරි මාර්ග යෝජනා ක්‍රමයත් අසාර්ථක වුණා.

1970 ගණන්වල අග භාගයේ ඉඳලා කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වුණු බොල්ගොඩ වාරි මාර්ග යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන්ම අසාර්ථක වුණා. ඒ පොම්ප මධ්‍යස්ථාන නිල්වලා යෝජනා ක්‍රමයේ වාගේම ටික කාලයකින් ගැලවිලා ගියා. ඒවා නැවත හැදුවේ නැහැ. ඒ වාගේම ඒ කැපූ ඇළේ සහ බොල්ගොඩ ගඟේ ඉදි කරපු බැම් කැඩිලා ගියා. අලුතෙන් සකස් කළේ නැහැ. කෘත්‍රිමව කළු ගඟේ බැඳපු බැම්මත් සමඟ ගං වතුර සම්පූර්ණයෙන් නතර වුණා. ඉන් පස්සේ බණ්ඩාරගම, කළුතර ප්‍රදේශවල ඒ පහත්

බිම්වල තිබුණු ගොවිතැන සම්පූර්ණයෙන්ම නතර වුණා. අද ඒවා පුරන් වෙලා තිබෙනවා. මේ මොහොතේ ඒවායේ කුඹුරු වගා කරන්න බැහැ. ඒ වාගේම මල් වවන්නත් බැහැ; වෙනත් අපනයන බෝග වවන්නත් බැහැ. ඒකට හේතුවක් තිබෙනවා. මොකද ජලය බැස යන්නේ නැහැ. ඒ නිසා හුදු අඳ ගොවි ක්‍රමයට පුද්ගලයන්ට ඒ ඉඩම් ලබා දීමෙන් මේ ප්‍රශ්න විසඳන්න බැහැ.

එහෙම නම් ඔය විකල්ප සුළු අපනයන බෝග හෝ වෙනත් මොනවා හෝ යෝජනා කරන විකල්ප බෝග වගා කිරීමට අවශ්‍ය පරිදි ජලය බැස යාමට අවශ්‍ය කරන ඒ නිසි සැලැස්ම භූමියේ සකස් කරන්න ඕනෑ. මොකද ඒ ප්‍රදේශවල කුඹුරු වගා නොකළාට වැහි වතුර එක් රැස් වෙනවා. ඒවා ඉතා ඉක්මනින් බැස යන්නේ නැහැ. ඉතින් කුමන වගාවක්වත් මේ කුඹුරුවල කරන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම මදුරුවෝ බෝ වෙනවා. ඒ වාගේම වෙනත් විවිධ ප්‍රශ්න මතු වෙනවා. ගරු ජනාධිපතිතුමා අය වැය යෝජනාව ඉදිරිපත් කරපු ආකාරයට නිසි ලෙස වගා නොකරන කුඹුරු ඉඩම් වෙනත් පුද්ගලයෙකුට ලබා දෙනවා නම් ඒවාට අවශ්‍ය කරන ඒ භූමියේ වෙනස්කම් ඇති කරන්නට අවශ්‍යයි. ඇළ මාර්ග සහ වතුර එක් රැස්වීම සඳහා වූ ආයෝජනය ආණ්ඩුව කරන්න ඕනෑ. ඇත්තටම ඒ ආයෝජනය ආණ්ඩුව කරනවා නම් අමුතුවෙන් අඳ ගොවීන්ට දෙන්න ඕනෑ නැහැ. මාත් ඇතුළු ඉඩම් හිමියෝ නැවත වගා කරන්න සූදානම්.

සියලුම ඉඩම් හිමියෝ නැවත වගා කරන්න සූදානම්. අද වතුර බැස යන්නේ නැති එකයි ප්‍රශ්නය. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ඒ වාගේම දකුණු පළාතේ ඇතැම් වෙලාවලට වයඹ පළාතේත් ඒ ප්‍රශ්නය තිබෙන්න පුළුවන්. මේ පහත් බිම් ප්‍රදේශවල ප්‍රායෝගිකව වී වගාව කළ නොහැකි නිසා අත හැර දමන ලද ඒ භූමිය -ඒ කුඹුරු බිම්- ගරු ජනාධිපතිතුමා කියපු පරිදි වෙනත් විකල්ප බෝග වගා කිරීම සඳහා ඉඩ සලසා දීමට ආණ්ඩුවට ලොකු අභියෝගයක් තිබෙනවා. ඒ නිසා ඒකට ආයෝජනය කරන ආකාරය දැන් ඔබතුමාට කියන්න පුළුවන් වෙන්න ඕනෑ. නිකම්ම අඳ ගොවීන්ට දෙනවාය කිව්වාට හරි යන්නේ නැහැ නේ. අය වැය යෝජනා ඉදිරිපත් කරලා දැනට මාස හතරකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. මේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් කොපමණ මුදලක් වෙන් කරලා තිබෙනවාද? එක් එක් පළාතෙන් ඉලක්කගත කාරණා මොනවාද? ඒ පිළිබඳව රජයට තිබෙන දර්ශනය, රජයේ වැඩ පිළිවෙළ කුමක්ද කියන කාරණා ගැනත් ඔබතුමාගෙන් පිළිතුරක් අපි බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ. භා. 3.24]

ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අසම්පූර්ණ යෝජනාවක් තමයි මේ මහත්මයා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මුළු ලංකාවේම වර්ග ප්‍රමාණය අක්කරවලින් ගත්තාම ලක්ෂ 160යි. මුළු ලංකාවේම ගොඩ ඉඩම්, මඩ ඉඩම්, සරු ඉඩම්, නිසරු ඉඩම් සියල්ලම ගත්තාම අක්කර ලක්ෂ 160යි. දැනට ජනගහනය ලක්ෂ 205ක් ඉන්නවා. ගොඩ, මඩ, සරු, නිසරු ආදී වශයෙන් වෙන් කළත්, ලක්ෂ 205ක ජනගහනයට මේ ඉඩම් ප්‍රමාණය බෙදුවාම එක් කෙනකුට ලැබෙන්නේ අක්කර 3/4යි. නමුත් එක් අයකුගේ වාර්ෂික පෝෂණය සඳහා අක්කර 2,1/2ක සශ්‍රීකත්වය හා ඵලදාව අවශ්‍යයි. මෙය තමයි ලංකාවේ තිබෙන මහා අර්බුදය. ආර්ථික හා නිෂ්පාදන අර්බුදය මෙයයි. එක් කෙනකුට ලැබෙන්නේ අක්කර 3/4යි. නමුත් එක් කෙනකුගේ වාර්ෂික පෝෂණය සඳහා අක්කර 2,1/2ක් අවශ්‍යයි. එම ඉඩම් ප්‍රමාණය ලබා ගන්න නැහැ. ඒ සඳහා ක්‍රම දෙකයි තිබෙන්නේ. එකක් තමයි, ගොවිතැන් බත් කළ හැකි සෑම ඉඩම් අක්කරයකින්ම හතර ගුණයක් අස්වැන්න ලබා ගත හැකි ක්‍රම අනුව ගොවිතැන් කළ යුතුයි. එය තමයි මුළු රටටම ඇති වෙලා තිබෙන මහා අභියෝගය. දෙවන ලෝක යුද්ධයේදී පරමාණු බෝම්බ දමා ජපානය විනාශ කළාම ජපානයට පිට රටවලින් බඩු ගෙනෙන්න සල්ලි තිබුණේත් නැහැ; නැව් තිබුණේත් නැහැ. ජපානය තීන්දුවක් ගත්තා, කිසි කෙනකුට හෙක්ටයාර් හතරකට වැඩි ඉඩම් ප්‍රමාණයක් තබා ගන්න තහනම්, ඒ හෙක්ටයාර් හතරෙන් හතර ගුණයක, පස් ගුණයක අස්වැන්නක් ලබා ගත යුතුයි, එහෙම නැත්නම් ආණ්ඩුව එම ඉඩම් ආපසු රාජසන්තක කරනවා කියලා. මේ ක්‍රමයෙන් අවුරුදු තුනක් ඇතුළත ජපානය ස්වයංපෝෂිතභාවයක් ලැබුවා. ඒක අමතක කරන්න එපා.

මේ රටට බුරුමයෙන් ශත 05ට මිල්චාට් හාල් ගෙනැවිත් විකුණන අවස්ථාවේදී ගරු ඩී.එස්. සේනානායක මැතිතුමා මේ රටේ හාල් නිපදවීම සඳහා මුළු රජ රට හා නැහෙනහිර ප්‍රදේශයේ ගොවි ජනපද ව්‍යාපාරයක් ආරම්භ කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් අද ලංකාවේ අනුභව කරන හාල් ඇට 100කින් 25ක් ලැබෙන්නේ අම්පාර දිස්ත්‍රික්කයෙන්; 27ක් ලැබෙන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්; ඉකිරි ප්‍රමාණය ලැබෙන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් හා අනුරාධපුරය දිස්ත්‍රික්කයෙන්. එම නිසා ඩී.එස්. සේනානායක මැතිතුමා වී ඇටයක්වත් නොලැබුණු ඒ ප්‍රදේශ කෘෂි කාර්මික වාසස්ථාන බවට හරවා ලංකාවේ අද තිබෙන සශ්‍රීකත්වයට මුල් ගල තැබුවාය කියන එක ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. සිංහල හාලේ බත් කන කොට සෑම බත් පිහානකින්ම වී කුරුල්ලකු ප්‍රමාණයේ බත් මීටක් පමණ පැත්තකට කරලා ගරු ඩී.එස්. සේනානායක මැතිතුමාට පින් දෙන්න ඕනෑ, 1931 සිට එතුමා අභාවප්‍රාප්ත වන තුරු මේ රටේ කෘෂි කර්මාන්තය මේ තත්ත්වයට ගෙන ඒම ගැන.

එපමණක් නොවෙයි. යුද්ධය කාලයේදී ගරු ඩී.එස්. සේනානායක මහත්මයා පාරට බැහැලා, ආහාර සඳහා වී විතරක් නොවෙයි, අල වර්ගවලටත් බහිමුයි කියලා, ලංකාවේ අමතක කර තිබුණු දේශීය අල වර්ග 53ක් වෙළෙඳ පොළට දමලායි එතුමා ඇස් දෙක පියා ගත්තේ. කලකට පෙර වෙළෙඳ පොළේ එම අල වර්ග නැති වෙලා තිබුණා. යුරෝපීය අල වර්ග හා ආහාර වර්ගවලින් වෙළෙඳ පොළ උතුරා ගියා. නමුත් දැන් ඒවා හෙමිහිට ආපසු ජනිත වෙමින් තිබෙනවා. මා ගම්වල පොළවල්වලට ගිහින් නිලධාරීන්ගෙනුත්, ගොවියන්ගෙනුත්, වෙළෙඳුන්ගෙනුත් මේ සම්බන්ධයෙන් අහනවා. කවදාවත් නොදුටු අල වර්ග දැන් මිනිසුන්ගේ ගෙවල්වල ආහාර සඳහා භාවිත වනවා.

වී ගොවිතැන ගැන පමණක් නොවෙයි මා මේ අවස්ථාවේදී කියන්නේ. බස්නාහිර පළාත ගැනයි මේ ගරු සභාවේ වැඩිදෙනෙක් කථා කළේ. බස්නාහිර පළාතේ කෝට්ටේ රාජධානියේ බත් පාත්‍රය හැටියට ගණන් ගත්තේ මුතුරාජවෙලයි. මේ වෙල් යාය පැලියගොඩින් පටන් ගෙන හලාවතින් තමයි අවසන් වුණේ. මේක තමයි කෝට්ටේ රාජධානියේ සශ්‍රීකත්වයේ අත්තිවාරම. පෘතුගීසීන් ඇවිල්ලා, ලන්දේසීන් ආපුවාම, ලන්දේසීන් පාරවල් හැදුවේ නැහැ, ඇළවල් කැපුවා. ඒගොල්ලන් කැලණි ගඟ ඉවුරේ ඉඳලා හැමිල්ටන් ඇළ කපලා, ඒ ඇළ හැනැප්ම 80ක් දක්වා පුත්තලමට ගෙන ගියා, කොප්පරා ගෙනෙන්නත්; කුරුඳු ගෙනෙන්නත්, ලුණු, කරවල හුවමාරු කිරීමත් සඳහා. ඒ නිසා සිදු වෙච්ච දේ මොකක්ද? ඒ ඇළ කැපීම හේතුකොට ගෙන මුහුදේ වතුර බහුලව කිහිප පොළකින් මුතුරාජවෙළට ගලාගෙන ඇවිල්ලා, අද මුතුරාජවෙළ ලුණුවලින් පිරිලා ප්‍රයෝජනයකට ගන්න බැරි තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. මේක තමයි කෝට්ටේ රාජධානියේ බෙදවාචකය.

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

මේ කැලණි ගඟෙන් මෙහා පැත්තේ කෝට්ටේ වැව් 19ක් සිංහල රජ්ජුරුවෝ රාජ ආඥාවකින් හදලා තිබුණා. මේ වැව් දහනවයම ගොවිතැන් සඳහා නොවෙයි. වැසි වතුර - ගං වතුර - කැලනි ගඟේ රඳවාගෙන මිනිසුන් පදිංචි ස්ථාන ආරක්ෂා කර ගැනීම සඳහා යි මේ වැව් 19 තිබුණේ. නමුත් පහත් බිම් ගොඩ කරන ව්‍යාපාර කියලා ආරම්භ කරලා, මේ වැව් යට කරලා දමලා තිබෙනවා. දැන් ඒ වැව් ටික නැහැ. ගෙවල් මැද්දෙන්; පාරවල් මැද්දෙන්; ඉඩකඩම් මැද්දෙන් දැන් වතුර ගලනවා. තවමත් ඉතිරි වෙලා තිබෙනවා, බොරලැස්ගමුවේ වැව. තව තිබෙනවා, කැස්බෑව වැව. බණ්ඩාරගම වැව් අටක් ඉතිරි වෙලා තිබෙනවා. මම භයක් ගිහින් බැලුවා. තවත් ඒවායේ අවශ්‍යතා හුඟාක් තිබෙනවා. මෙය අද ලංකාවේ තිබෙන එක මූලික තත්ත්වයක්. නමුත් වාසනාවකට වාගේ ලංකාවේ යම් කිසි පුනරුදයක් ඇවිල්ලා තිබෙනවා. ලංකාවේ පළමුවැනි වතාවට ශ්‍රම භෝග, විශේෂයෙන්ම එළවලු වර්ග, පළා වර්ග, අල වර්ග නිෂ්පාදනය විශාල සංඛ්‍යාවකින් වැඩි වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා මවිත වේවි, එළවලු, පලතුරු නිෂ්පාදනය, පළා නිෂ්පාදනය පස් ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. කටුනායක ඉඳලා ගුවනින් සති පතා රුපියල් ලක්ෂ ගණනක ගොටුකොළ, මුකුණුවැන්න ආදිය පිට රටට ගෙන යනවා. තමුන්නාන්සේලා කොළඹ ඉඳලා නුවරට හෝ කොළඹ ඉඳලා රත්නපුරයට හෝ යම් කිසි දිහාවකට ගිහින් බලන්න. ඒ යන පාර දිගේ තිබෙනවා, ජීවිතයට නොදුටු එළවලු කඩ. එම ප්‍රමාණය සියයට 5කින් වැඩි වෙලා.

මම ඇඹිලිපිටියේ කෙසෙල්කැන් වෙළෙඳ පොළට ගියා. එහි සිටින නිලධාරින්ගෙනුයි, වෙළෙන්දන්ගෙනුයි මම ඇහුවා. සතියකට කෙසෙල්කැන් 24,000ක් කොළඹට හා අනෙකුත් ප්‍රදේශවලට පටවනවා කියලා කිව්වා. මේවා ඉස්සර තිබුණේ නැහැ. මේ සුවිසල් ප්‍රතිඵල රාශියක් අද අපට ලැබිලා තිබෙනවා. වී ගොවිතැනට අමතරව ලංකාවට නුපුරුදු භෝග දෙකක්, තුනක් දැන් ඇවිල්ලා තිබෙනවා. එකක් තමයි බඩ ඉරිඟු. ඒවා ලංකාවේ තිබුණේ නැහැ. බඩ ඉරිඟු අපේ ආහාරයක් නොවෙයි, පිටින් ආපු ආහාරයක්. අද බඩ ඉරිඟුවලින් අපි ස්වයං පෝෂිතයි. පසු ගිය අවුරුද්දේ අපි බඩ ඉරිඟු ටොන් 7,000ක් පිට රට යැව්වා. අපි අද එයින් ස්වයං පෝෂිතයි.

දෙවෙනි එක, දකුණු ඇමෙරිකාවෙන් ආවා, මඤ්ඤොක්කා. ලංකාවේ දැන් විශාල වශයෙන් මඤ්ඤොක්කා පැතිරිලා තිබෙනවා. ලංකාවේ විතරක් නොවෙයි මඤ්ඤොක්කා අලයක් නොතිබුණු වියට්නාමය අද මඤ්ඤොක්කා නිෂ්පාදනය අතින් ආසියාවේ පළමුවැනි තැනට ඇවිල්ලා තිබෙනවා. චීනයේ නිෂ්පාදනය කරනවා; ආසියාවේ නිෂ්පාදනය පටන් ගෙන තිබෙනවා. අප්‍රිකාවේ ප්‍රධාන ආහාරය මඤ්ඤොක්කා. මෙතෙක් කල් ලෝකයේ ආහාර අතර වී තිබුණා; තිරිඟු තිබුණා; බඩ ඉරිඟු තිබුණා. එච්චරයි තිබුණේ. හතරවැනි එක විධියට තමයි දැන් මඤ්ඤොක්කා එම ලැයිස්තුවට ඇතුළත් වෙලා තිබෙන්නේ. අපි මේවා ගැන කල්පනා කළ යුතුයි. අද අල වර්ග විශාල වශයෙන් හදුනාගෙන තිබෙනවා.

අද සූපර්වේදය - ඉවුම් පිහුම් කලාව - පිසීමේ කලාව - දියුණු වෙමින් තිබෙනවා. ළමයින්, මවුවරුන්, කාන්තාවන්, රාජකාරි කරන කාන්තාවන්, මේ සෑම කෙනෙකුම අලුත් රසවත්ආහාරයක් ගෙදර හදන්නට ඉතාම වේගයෙන් පුරුදු වේගෙන යනවා. විශේෂයෙන් අපේ දරුවෝ අලුත් රසවත් ආහාරයක් පිළියෙළ කරන්නට උනන්දු වෙනවා. පියාට රසවත් ආහාරයක් පිළියෙළ කර දෙන්නට; මවුට රසවත් ආහාරයක් පිළියෙළ කර දෙන්නට; රසවත් පැණි කෑමක් සකස් කරලා දෙන්නට ආදී වශයෙන් අපේ ළමයින් උනන්දුවක් දක්වනවා. ඒ අනුව අපේ ළමයින් අද අලුත් තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා.

මම මේ අවස්ථාවේ කියා සිටිනවා, ලංකාවේ නිෂ්පාදනය වැඩි කිරීම හැර අපට වෙන කිසිම හවිහරණක් නැහැයි කියලා. සෑම බිම් අඟලක්ම ගොවිතැන් බත් කළ යුතු අවස්ථාවක් ඇවිල්ලා තිබෙනවා. මක් නිසාද, සරු, නිසරු, ගොඩ, මට ඉඩම් වශයෙන් අපේ රටේ ඉඩම් බෙදිලා ගියාම එක්කෙනකුට ලැබෙන්නේ අක්කර තුන් කාලයි. ඒක මදි. එක ළමයෙක්, එක වැඩිහිටියෙක් පෝෂණය කරන්න අවුරුද්දකට අක්කර 2 1/2ක් අවශ්‍යයි. ඒක ලබා ගැනීම සඳහා අපි දැන් අක්කරයකින් ලබා ගන්නා ආදායම හතර ගුණයකින් වැඩි කර ගන්න ඕනෑ. ඒ වැඩි කිරීමේ මහා කර්තව්‍යයට; ඒ ඉණිමහට අපි ගොඩවෙලායි ඉන්නේ.

ඒ නිසා මම අපේ කෘෂිකර්මාන්තය - ගොවිතැන- භාර ඇමතිතුමා ඉතාම ඇප කැප වුණු ඇමතිතුමෙක්. එතුමා කෘෂිකර්මාන්තය දන්නවා. ලේවල කෘෂිකර්මාන්තය තැන්පත් වෙලා තිබෙන මිනිහෙක්. ගරු ඩී.එස්. සේනානායක මැතිතුමා දේවත්වයෙන් සලකන උතුම් පුද්ගලයෙක්. මමත් එතුමාට සලකන්නේ එසේමයි. ඩී.එස්. සේනානායක මහත්මයා එදා ඔය පියවර ගත්තේ නැත්නම් මෙලහකටත් ලක්ෂ ගණනක් ජනතාව සාගතේ බඩගින්නේ මැරිලා ඉවරයි. වනාන්තරයෙන් යට වෙලා තිබුණු මුළු රජරට ප්‍රදේශය එතුමා විවෘත කළා. වනාන්තරයෙන් යට වෙලා තිබුණ ගල්ඔය මිටියාවත විවෘත කළා. මේ රටේ ඉවත දමලා තිබුණ වී වර්ග 350ක් අපි දැන් නැවත වගා කරලා තිබෙනවා.

වීවල නම්, මේ දරුවෝ දන්නේ නැහැ. අද වී වර්ග 350ක් තිබෙනවා. ඒ වී වෙලලා ගබඩා කරලා, පරෙස්සම් කරලා ගන්නෝරුවේ වී බැංකුවේ තැන්පත් කරලා තිබෙනවා. "අවුරුදු 200කින් මිසක් එවා එළියට ගන්න එපා, මේ වී වර්ග නැති වෙලා ගියාම අපේ මුණුබුරන්ගේ පරම්පරාවලට ඒ වී බැංකුව කඩලා ඒවා අර ගෙන අලුතින් වගා කරන්න ලැබේවා" කියලා වී වර්ග 350ක් තැන්පත් කරලා තිබෙනවා. අපි අනාගතයට සූදානම් වෙලා තිබෙන්නේ ඒ ආකාරයටයි.

මේ යෝජනාව ගෙනාවාට මම සන්තෝෂයි. මේ යෝජනාව ගෙනාවාට විතරක් මදි. ගෙදරක සෑම මල් පෝච්චියකින්ම, මල් පාත්තියකින්ම මේ රටේ ස්වයංපෝෂණය සඳහා ඇප කැප වුණු ජනතාවක් හදමු. අතිගරු ජනාධිපතිතුමා කිව්වා වාගේ ඒක හදන්න වයසක උදවියට බණ කියලා වැඩක් නැහැ. මේ රට හදන්න භාර දෙන්න ඕනෑ අර ඉන්න දරුවන්ටයි. මේ ළමයි තමයි මේ රටේ ඊළඟ පරම්පරාව. පහේ පන්තියේ ප්‍රතිඵල දැක්කාම, ගෙවතුවලට තිබෙන ඇප කැප වීම දැක්කාම මේ ළමයි අතරින් තව අවුරුදු පහළොවකදී මේ මන්ත්‍රණ සභාවේ පුටුවල වාඩිවෙන ළමයි අද මේ ගැලරියේ වාඩිවෙලා ඉන්න බව පෙනෙනවා. මේ රටේ ජනාධිපති, අගමැති වන උදවිය අර ළමයි අතර ඉන්නවා. ඒ ළමයින්ගේ ගතිගුණ පහේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵලවලින්, දහයේ සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵලවලින් පෙනෙනවා. ඒ නිසා ඒ ළමයින්ගේ දෝතට ලංකාව භාර දීලා විසිඑක්වන ශත වර්ෂයේ නවෝදයේ පුරෝගාමීන් හැටියට ඒ අයට සලකලා මේ කටයුත්තෙන් පාඩමක් ඉගෙන ගන්නා මෙන් ඉල්ලමින් මගේ කථාව සමාප්ත කරනවා.

[අ. භා. 3.38]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මම පළමුකොටම අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. හැබැයි, එතුමා හරිහැටි කරුණු කාරණා අවබෝධ කර ගෙන නොවෙයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ.

අපේ රටේ පුරන් කුඹුරු තිබෙන එක ඇත්ත. පුරන් කුඹුරු නැවත වගා කිරීම සඳහා පසු ගිය කාලවකවානුවේ අපි විශාල වැඩ පිළිවෙළක් දියත් කළා. අපට ලැබී තිබෙන සංඛ්‍යාලේඛනවල හැටියට තවමත් අක්කර 35,000ක විතර ප්‍රමාණයක් පුරන් කුඹුරු හැටියට අපේ රටේ තිබෙනවා. ඒකට විවිධ හේතූන් තිබෙනවා. අපේ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේ ජල බස්නාව පිළිබඳ ගැටලුව, කරදිය පිළිබඳ ගැටලුව තිබෙනවා. ඒ වාගේම අප විසින් ඇති කර ගත්ත දේවලුත් තිබෙනවා. ඔබතුමා කිව්ව නිල්වලා ව්‍යාපාරය එකක්. නිල්වලා ව්‍යාපාරය ඔබතුමන්ලාගේආණ්ඩුව කාලයේ ක්‍රියාත්මක කළ වැඩ සටහනක් නිසා ඒක අද අපට අභිමිවෙලා ගිහිල්ලා තිබෙනවා. එතැන අක්කර 5000ක් තිබෙනවාය කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

ඒ වාගේ අපට අහිමි වුණු බිම් රාශියක් තිබෙනවා. කළුතරත් එහෙම තිබෙනවා කියා එතුමා කිව්වා. කවදාවත් නැවත වගා කරන්න බැරි ස්ථානත් ඒ අතරේ තිබෙනවා. නමුත් මම කියන්න සතුටුයි තමුන්නාන්සේට නිල්වලා ව්‍යාපාරය තුළ අසාර්ථක වුණු කුඹුරු අක්කර 5,000න් මේ වර්ෂයේ මේ මොහොත වන විට අක්කර 470ක් වගා කර තිබෙන බව. අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, හදබිම අධිකාරිය අපි සියලු දෙනාම ගිහිල්ලා අලුත් බීජ ඒ ගොවීන්ට ලබා දීලා පැරණි සාම්ප්‍රදායික වී වගා කරලා අද සාර්ථක අස්වැන්නක් නෙළන්න කටයුතු කරලා තිබෙනවා. ඔබතුමා එන්න ලබන සඳුදා උදේ 11.00ට ගොඩගම යායට. එතැන අපි ගොයම් කපන්න ලෑස්ති කර තිබෙනවා. හැබැයි මට අද උදේ කථා කර කිව්වා, වැහැලා වතුර පිරිලා තිබෙනවා, යන්න බැහැ කියලා. මා දන්නේ නැහැ, කොහොම වේවිද කියලා. නමුත් එදිනට එම කටයුතු සිදු කරන්න අපි දින වකවානු ලකුණු කර ගෙන තිබෙනවා. උදේ 11.00ට අලුත් සහල් මංගල්‍යය ආරම්භ කරන්න කටයුතු කර තිබෙනවා. ඔබතුමා එන්න එතැනට. එතැනම තිබෙනවා අක්කර 250ක්. පාලටුව යායේ තවත් අක්කර 170ක් විතර වගා කර තිබෙනවා. ඉතින් මේ විධියට ක්‍රමක්‍රමයෙන් අපි මේ කටයුත්ත කරගෙන යනවා. මේ වෙනුවෙන් විශාල කාර්ය භාරයක් මේ රජයෙන් ඉටු කර තිබෙනවා.

විශේෂයෙන් අපේ ගරු සූරියප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා වාගේ සාම්ප්‍රදායික වී වර්ග ගොවීන්ට ලබා දීලා තිබෙනවා. ගිය කන්නයේදීත් මම මුල් වෙලා කොටවිල යායට සාම්ප්‍රදායික බීජ ලබා දුන්නා. කොටවිල යායේ සාර්ථකව ඒ කටයුත්ත කෙරුවා. ඒ විධියට මේ වැඩ පිළිවෙළ කරන්න පුළුවන් ස්ථානවල කරගෙන යනවා. ඒ ගැන ගොවීන් ඉතාමත් සතුටට පත් වෙලායි ඉන්නේ. අවුරුදු ගණනාවකින් මේ කටයුත්ත කළේ. එහි මූලික වියදම රජය මඟින් දැරුවා. මොකද, අවුරුදු 30ක් තිස්සේ මේ බිම් සකස් කර තිබුණේ නැහැ. ගොවිතැන් කර තිබුණේ නැහැ. ගොවිතැන් කරන්න උවමනා කරන මූලික කටයුතු ටික අපි රජය මඟින් කර දුන්නා. ඒකට උවමනා කරන මුදල් දුන්නා. එහෙම ගොවීන් උනන්දු කරලා තමයි මේ කටයුත්ත කළේ. දැන් ඉතාමත් සාර්ථක යායක් තිබෙනවා. ඔබතුමාට 11 වැනිදා උදේ වරුවේ නිවාඩු තිබෙනවා නම් මාත් එක්ක එන්න ඒ කටයුත්තට සහභාගි වෙන්න. මම පෙන්වන්නම් ඒ යායේ කරලා තිබෙන්නේ මොනවාද කියලා. අපි මේ කාල සීමාව තුළ ඒ විධියේ විශාල සංවර්ධන වැඩ කොටසක් කරලා තිබෙනවා.

මෙම යෝජනාවෙන් කියන්නේ, පුරන් කුඹුරු එහෙම නැත්නම් වගාවට ගන්න බැරි ඒවායේ වෙනත් භෝග වගා කරන්න ඉඩ දෙන්න කියලායි. ඒකනේ ඔබතුමා මේ කියලා තිබෙන්නේ. වී වගා කරන්න බැරි නම් වෙන මොනවා හෝ වගා කරන්න ඉඩ දෙන්න කියලායි කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක මේ පනතේ තිබෙනවා. මෙතුමා මේ පනත කියවන්නේ නැතිවයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 34.(1) වන වගන්තිය යටතේ කියා තිබෙනවා, "කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරය ඇතිව හැර කිසිදු තැනැත්තකු විසින් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් කෘෂිකාර්මික වගාව සඳහා හැර වෙනත් යම් කාර්යයක් සඳහා භාවිත නොකළ යුතුය" කියා. නමුත් "කෘෂිකර්මය" කියන එක නිර්වචනය කර තිබෙනවා, 101වන වගන්තිය යටතේ. එහි මෙසේ සඳහන් වනවා:

" 'කෘෂිකර්මය' යන්නට, -

(i) වී, කෙත් භෝග, කුළු බඩු, කාර්මික භෝග, එළවළු, පළතුරු, මල්, තණබිම් හෝ සත්ත්වාහාර වගා කිරීම;

(ii) කිරි පට්ටි පාලනය සහ ගොවිපළ සතුන් ඇති කිරීම සහ බෝ කිරීම;

(iii) පැළ සහ පළතුරු තවාන් ; සහ

(iv) මීමැසි පාලනය සහ මිරිදිය ධීවර කර්මාන්තය ඇතුළත් වේ;"

ඉතින් ඔබතුමා තව මොනවාද කරන්න කියන්නේ? තමුන්නාන්සේ මේක අවබෝධ කර ගෙන නැහැ. ඔක්කෝටම කලින් මේ පනත කියවා බලන්න. තමුන්නාන්සේ ඒක කියවන්නේ නැතිව නිකම් මොනවා හෝ කථා කරනවා. ඒ පනතේ අවසර තිබෙනවා මේ කාර්යය කරන්න. මේ වැඩ පිළිවෙළ අපි දැනටමත් ක්‍රියාත්මක කර ගෙන යන වැඩ පිළිවෙළක්. දිවි නැගුම යටතේ කරන වැඩ පිළිවෙළත් ඒ වාගේමයි. මම සතුටින් කියනවා, නිල්වලා ව්‍යාපාරය බලන්න සඳුදා එන්න කියලා මා එක්ක යන්න. ගිහිල්ලා බලන්න, කොයි ආකාරයෙන්ද වගා කර තිබෙන්නේ කියලා. ඒ ගොවීන්ගේ අස්වැන්න කොහොමද කියලා බලන්න. අවුරුදු 35කට පස්සේයි දැන් ගොවිතැන් කරන්නේ. ඒකයි අපි කියන්නේ. කෘෂිකර්මාන්තයේ කළ යුතු දේ ගැන නොකළ යුතු දේ ගැන තමුන්නාන්සේලා අපට අමුතුවෙන් මතක් කරන්න උවමනා නැහැ. ඒ කටයුතු සියල්ලම මේ වන කොට කර ගෙන යනවා.

ඔබතුමන්ලාගේ අනවබෝධය තමයි අපට තිබෙන ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමා මතක් කළා වාගේ පසුගිය කාල වකවානුවේදී මේ වැඩ පිළිවෙළ තුළින් අපි ජයග්‍රහණ රාශියක් ලබා තිබෙනවා. අපට තව දිනන්න දේවල් විශාල ප්‍රමාණයක් තිබෙන එකත් ඇත්තයි; තව කරන්න වැඩ රාශියක් තිබෙන බව ඇත්තයි. 2005 වනකොට අපේ රටේ බඩ ඉරිහු නිෂ්පාදනය කළේ රටේ අවශ්‍යතාවෙන් සියයට 20යි. අද මේ වනකොට අපේ අවශ්‍යතාව ඉක්මවා ගිහිල්ලා, සියයට 120ක් විතර අපි නිෂ්පාදනය කරනවා. මේ වකවානුවේදී අපි මෙච්චර කාලගුණ විපර්යාසයකට ලක් වෙලා වර්ෂාව නිසා බඩ ඉරිහු වගාවෙන් සියයට 40ක් විතර විනාශ වෙලාත්, අවම වශයෙන් බඩ ඉරිහු මෙට්‍රික් ටොන් 180,000ක් මේ කන්නයේ අපි නිෂ්පාදනය කරනවා. එහෙම නොවුණා නම් -අපි බලාපොරොත්තු වුණු ආකාරයට කාලගුණය හොඳින් තිබුණා නම්- මේ වතාවේ අපේ බඩ ඉරිහු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 250,000ක් ඉක්මවා යනවා. මින්නේරිය වැනි කෘෂිකාර්මික ප්‍රදේශවලට මේ මොහොත වනකොටත් වහිනවා; අදත් වහිනවා. කවදාවත් සිද්ධ නොවුණු දෙයක්. මඩකලපුව ප්‍රදේශයට අදත් වහිනවා. කවදාවත් මෙවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. එහෙම නොවුණා නම් අපේ ඉලක්කය වුණේ බඩ ඉරිහු මෙට්‍රික් ටොන් 250,000ක් ඉක්මවා යන්නයි. අනෙක් වගාවනුත් ඒ වාගේමයි. මේ මොහොත වනකොට අපේ රට සෝයා බෝංචිවලින් ස්වයංපෝෂිත වීමේ ඉලක්කයට ළං වෙලායි ඉන්නේ. දේශගුණ විපර්යාසය නිසා විවිධ ගැටලු, ප්‍රශ්න අපට ඇති වුණා. ඒ නිසා යම් යම් පසුබෑම් සිද්ධ වුණා. ගොවිතැන කාලගුණයත් එක්ක දැඩි ලෙස බැඳී තිබෙනවා.

බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඉන්නල වගා කරන්න කථා කරනවා. අපේ පළාතේ ඉන්නල වගා කළ බව ඇත්තයි. ඒ වගා කළේ වේලිවලයි. එහෙම නැතිව වගුරු බිම්වල ඉන්නල වගා කරන්න බැහැ. වගුරු බිම්වල මොන අල වර්ගයක්වත් වගා කරන්න බැහැ. ඒක තමුන්නාන්සේ තේරුම්

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

ගන්න. තමුන්නාන්සේ දන්න තරම ඒකෙන්ම තේරෙනවා. ඒකයි මම කිව්වේ තමුන්නාන්සේ අනවබෝධයෙන් කටයුතු කර තිබෙනවාය කියා. තමුන්නාන්සේ කියන මාලිම්බඩ, කරගොඩ - උයන්ගොඩ, තලහගම කියන මේ ප්‍රදේශ සියල්ලේම ඉතාම සාර්ථක වේලි වගාව කළා. කුඹුරේ වී වගා කරනවා. වේලිවල එළවලු වගා කරනවා, ඉන්නල වගා කරනවා. ඒ විධියට ඒ ප්‍රදේශයේ සංකීර්ණ ගොවිතැනක් තමයි කළේ. ඒකට හේතුව තමයි ඒ ප්‍රදේශයේ කුඹුරුවල තිබුණු අසාර්ථකභාවය. හුහාක් වෙලාවට වැස්ස වැඩි නිසා, නිල්වලා ගහ ගලන නිසා ඒ කුඹුරු අසාර්ථක වෙනවා. ඒ වෙනුවට උස මට්ටමේ වේලිවල එළවලු, ඉන්නල ආදී ගොඩ වගාවන් කළා. ඒකෙන් තමයි ඒ ප්‍රදේශයේ මිනිස්සු ජීවත් වුණේ. වී වගාව හරි ගියොත් එහෙමයි. වැරදුණොත් අඩු වශයෙන් ගොඩ වගාව හරි තිබුණා. ඒ විධියේ ගොවිතැන් කටයුත්තක් තමයි අපේ ප්‍රදේශයේ කළේ. ඒක මේ අද ඊයේ කරපු එකක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඉපදෙන්නත් කලින්, අපි ඉපදෙන්නත් කලින් අපේ දෙමවුපියන්ගේ කාලයේ ඉඳලා කරපු කාර්යයක් ඒක. අද මේ අපි යන්නේ ඊට වඩා ඉදිරියට යන ගමනක්. මේ මොහොත වනකොට අපේ මුළු දිස්ත්‍රික්කය පුරාම අල වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්නේ දෙවුන්දර කලාපයේයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා යෝජනා ක්‍රමයට අදාළ ප්‍රශ්නය ගැන යම් පැහැදිලි කිරීමක් කළා. බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාත් ඒ ගැන පැහැදිලි කළා. නමුත් මම ඔබතුමාට කියන්න ඕනෑ, පුරන් කුඹුරු අස්වැද්දීමේ ජාතික මහෝත්සවය පැවැත්වුවේ මගේ නිවසට ආසන්නයේ පිහිටි බණ්ඩාරගම, කඹුරුගොඩ වෙල් යායේ බව. ඒකට ගිහින් එනකොට අතරමහදී තමයි ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාට බෝම්බ ප්‍රහාරයකුත් එල්ල වුණේ. එදා පුරන් කුඹුරු අස්වැද්දීමේ ජාතික උත්සවය පවත්වපු මාදන්ගහ වෙල්යායේ අක්කර පහක් විතර තමයි තිබෙන්නේ. අක්කර 200ක පමණ ප්‍රදේශයේ බොල්ගොඩ ගහ දක්වා ප්‍රමාණයේ කිසිම කටයුත්තක් වෙලා නැහැ. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පුරන් කුඹුරු අස්වැද්දීමේ කටයුතු සම්පූර්ණයෙන්ම අසාර්ථක වෙලා තිබෙනවාය කියා මම ඔබතුමාට දැනුම් දෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ප්‍රදේශයේ මන්ත්‍රීවරයකු හැටියට තමුන්නාන්සේගේ වගකීම තමුන්නාන්සේ ඉෂ්ට කරලා නැහැ. තමුන්නාන්සේලා ඉදිරිපත් වෙලා ඒ කටයුත්ත කරන්න ඕනෑ. තමුන්නාන්සේලා ඉදිරිපත් වෙලා ගොවීන් ගෙනෙන්න ඕනෑ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මම විපක්ෂයේ මන්ත්‍රී කෙනෙක්.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

මේකෙදි විපක්ෂයයි කියා එකක් නැහැ. මම අද මේ මන්ත්‍රීතුමාට ආරාධනා කළා, සඳුදාට මාත් එක්ක යන්න එන්නය කියා ගොයම් කපන උත්සවයට. ඔබතුමන්ලා එන්න. [බාධා කිරීමක්] ඔබතුමා වැඩේ පටන් ගන්න. අපේ ඇමතිතුමා ඉන්නවා. මම ඉන්නවා. සම්පූර්ණ සහයෝගය දෙන්නම්. දොස් කිය කියා ඉන්නේ නැතිව, දොස් කිය කියා මෙතැන කෑ ගහන්නේ නැතිව රටටම ඇහෙන්න බොරුවට මේවා කියන්නේ නැතිව තමුන්නාන්සේ වැඩේ පටන් ගන්න. තමුන්නාන්සේ ඒ කාර්යය පටන් ගන්න. මම එනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බොහොම ස්තුතියි ගරු ඇමතිතුමනි. අපි කරමු.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

වුවමනා කරන කටයුතු අප කරන්නම්. ඒකයි කාරණය. ඔබතුමා ඒ බව තේරුම් ගන්න. මේ රජයේදී අප කෘෂිකර්මාන්තයට ගියාම, රටේ යහපත වෙනුවෙන් යමක් කරන්න ගියාම තමුන්නාන්සේලා ද, අපි ද කියලා ප්‍රශ්නයක් නැහැ. අපි කවුරුත් එකට එකතු වෙලා මේ වැඩේට බහිමු. එහෙම අවංකව කටයුතු කරනවා නම් මේ වෙන කොට අපේ රට මීට වඩා හුහක් ඉස්සරහට ගිහිල්ලා. ඔබතුමන්ලා කකුලෙන් අදින විධියේ වැඩ කරන්න එපා. මම ඉතාම සතුටු වෙනවා එතුමා ඒකට ඉදිරිපත් වීම ගැන. අප එහෙම යන්න ඕනෑ. මේක අපේ රට. අපට වෙනත් රටක් නැහැ. අපේ ජාතියට කන්න දීමේ වගකීම අපට තිබෙනවා. ඒ වගකීම ඉතාම සාර්ථකව භාර ගත්ත ආණ්ඩුවක් මේ ආණ්ඩුව. ඒ කටයුත්ත අප මේ වෙන කොට ඉතා ශක්තිමත්ව ඉටු කර තිබෙනවා. ඒ නිසා අප තමුන්නාන්සේලාට කියන්නේ මේකයි. මේ කටයුත්තේදී අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා හරියට පනතවත් කියවලා ඇවිත් මේ යෝජනාව ඉදිරිපත් කළා නම් මම සතුටු වෙනවා. එතුමා කියන්නේ, "අපේ අමාත්‍යාංශ කඩලා තිබෙන්නේ, ඒ නිසා මට දත් නැහැ" කියලායි. මට හොඳට දත් තිබෙනවා. ඕනෑ නම් ඔබතුමා චුණත් හපන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නැහැ. එහෙම කරනවාට නොවෙයි. ඔබතුමාත් අපේ ගමේ. අපේ ඥාතියා. එහෙම කරනවාට නොවෙයි මම මේ කියන්නේ. එහෙම අවශ්‍ය නැහැ. අපට ඕනෑ හැටියට වැඩ කරන්න පුළුවන්. [බාධා කිරීමක්] ඒක නම් එතරම් හොඳ වැඩක් නොවෙයි. කමක් නැහැ, එහෙම හරි හොඳයි.

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා අපේ ගමේ, අපේ ඥාතියා. ඔබතුමා අපත් එක්ක කටයුතු කරන්නේ. ඔබතුමා විශාල වැඩ කොටසක් කරන්න උත්සාහ කරනවා. මම මෙතුමාට ගමේදී කියන්නේ "රැහැයියා" කියලායි. මොකද පේන්නේ නැහැ, සද්දය විතරයි ඇහෙන්නේ. අපට එතුමාගේ සද්දය විතරයි ඇහෙන්නේ. රැහැයියා වාගේ කෑ ගහනවා. නමුත් ඒවායේ කිසිම තේරුමක්, හරයක් නැහැ. දැන් මේ අද ඉදිරිපත් කර තිබෙන යෝජනාවෙනුත් මේ පනතේ තිබෙන දෙය නැවත කරන්න කියලා එතුමා කියනවා. ඉතින් ඒකේ තේරුම මොකක්ද? ඕනෑ දෙයක් කරන්න පුළුවන්. පුරන් කුඹුරුවල තමන්ට කැමැති ඕනෑම වගාවක් කරන්න පුළුවන්. හැබැයි එක්සත් ජාතික පක්ෂය කාලයේ කිව්වා වාගේ ගොඩ කරන්න විතරයි බැරි. ගොඩ කරන්න විතරක් ඉඩ දෙන්නේ නැහැ. අනික් ඕනෑම වගාවක් කරන්න පුළුවන්. [බාධා කිරීමක්] ඒක නේ, කියන්නේ. තමුන්නාන්සේලා ඒකටත් මොනවා හරි කියනවා. එහෙම කියන්නේ නැතිව අපි එකට එකතු වෙලා වැඩ කරමු. වෙලාවකට එකක් කියනවා. ආයෙත් තමුන්නාන්සේ කියනවා ඒක හොඳයි කියලා. ආයෙත් කියනවා ඒක නරකයි කියලා. එහෙම කියන්නේ නැතිව අපි රට වෙනුවෙන් එකතු වෙලා වැඩ කරමු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීට වඩා මට එතුමාට කියන්න දෙයක් නැහැ. අපේ රටේ කෘෂිකර්මාන්තය වෙනුවෙන් එතුමා දක්වන උනන්දුව ගැන මම ඉතා සතුටු වෙනවා. ඒ වාගේම අපි සියලු දෙනාම එකතු වෙලා මේ කටයුත්ත සාර්ථකව කරමු කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Mover of this Motion will get five minutes.

[අ. භා. 3.52]

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කළ වෙලාවේදී කෘෂිකර්ම ඇමතිතුමා පිළිබඳව මම සඳහන් කළා, මේ ආණ්ඩුවේ ඇතැම් ඇමතිවරුන්ට වඩා අපට එතුමා ගැන ප්‍රමාණික විශ්වාසයක් තිබෙනවාය කියලා. නමුත් එතුමා කළ පිළිතුරු කථාවත් සමඟ ඒ කිව්ව දේ මට ආපහු ඉල්ලා අස් කර ගන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කැස්බෑවියක් සහ කිකිළියක් අතර වෙනසක් තිබෙනවා. කැස්බෑවිය වෙරළට ඇවිත් බිත්තර සිය ගණනක් දමලා කිසිම සද්දයක්, හැලහොල්මනක් නැතිව ආපසු මුහුදට යනවා. කිකිළිය එක බිත්තරයක් දමලා මුළු රටටම ඇහෙන්න කෙකර ගාලා අඬලනවා. ගරු ඇමතිතුමාගේ උත්තරය තුළත් පේන්නේ අර කැස්බෑවියට වඩා කිකිළියගේ භූමිකාවයි කියන එක මම මේ ගරු සභාවේදී කියන්න අවශ්‍යයි. මම එහෙම කියන්නේ ඇයි? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇමතිතුමාම කියනවා නිල්වලා ගඟ යෝජනා ක්‍රමයෙන් පුරන් වුණු කුඹුරු අක්කර 5,000ක් ගැන. එයින් අක්කර එකසිය ගණනක වගා කිරීමක් කරලා ඒ ගැන මහා උජාරුවට කථා කරනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අක්කර 250ක් වගා කළා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අක්කර 250ක්. අක්කර 5,000කින් 250යි වගා කර තිබෙන්නේ. ඒ එක්කම මේ නිලධාරීන් ඇමතිවරු රැවටීමේ කලාව කොයි තරම් ප්‍රගුණ කර තිබෙනවාද කියලා කියනවා නම් අද පාර්ලිමේන්තුවේ නිලධාරීන්ගේ කුටියේ කවුරුවත් නැහැ. බොහෝ උන්සව තියලා, අවුරුදු ගණනක් වගා කර නැති, පුරන් වූ කඹුරු යළි වගා කිරීමේ ව්‍යාපෘතිය කියලා වැඩ පටන් ගන්නවා. හැබැයි ඒවායේ පසු විපරමක් නැහැ. දිගින් දිගටම ඒ කටයුත්ත සිද්ධ වෙනවාද කියලා සොයා බැලීමක් නැහැ. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කරන්නට යෙදුණු කාරණය ඒකයි. මෙවර මේ කුඹුරු අක්කර 200ත් වගා කරන්න පටන් ගනීවි. මේක අවුරුදු කීයක් අඛණ්ඩව සිදු වෙයිද? ඒකයි සොයා බැලිය යුතුව තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මේ කාරණයත් මා කිව යුතුයි. අද එතුමා මේ කුඹුරු කියන තැනින් පටන් අරගෙන තව බොහෝ වගාවන් ගැන කථා කළා. අද කොළඹ අර්තාපල් කිලෝ එකක් රුපියල් 120ක් වෙද්දි බදුල්ලේ අර්තාපල් කිලෝ එක රුපියල් 40, 45 දක්වා පහළ බැස තිබෙනවා. මේ නිසා අද බදුල්ල, ඌව පරණගම, වැලිමඩ වාගේ ප්‍රදේශවල අල ගොවියා අනෝරා දුක් විඳින, අන්ත අසරණ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. නමුත් මම ඒ ගැන කථා කරන්නේ නැහැ.

අපි කථා කරමින් ඉන්න ප්‍රස්තුත මාතෘකාව පුරන් වූ කුඹුරුයි; පුරන් වූ කුඹුරු යළි අස් වැද්දීමයි. ඇමතිතුමා කියනවා මා මේ පනත කියවලා නැහැ කියා. මම ලජ්ජා වෙනවා; මම දුක් වෙනවා. මා අද දවසේ පමණක් මේ පනත දෙවරක් කියවලායි තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔය පනතේ වගන්ති තිබුණාට ඔය වගන්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න ගියාම නිලධාරිවාදයේ ගිලටීනයට අහු වෙලා අහිංසක ගොවි ජනතාව අනේකවිධ දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දෙනවා. ඔබතුමා උජාරුවෙන් කථා කරන මාතර දිස්ත්‍රික්කයේත් එහෙමයි. ඒකයි යථාර්ථය. අද මාතර දිස්ත්‍රික්කයේ කුඹුරක වී වගා කරන්න පුළුවන් තත්ත්වයක් නැති තැන ඒ කුඹුරේ වෙනත් විකල්පයක් වගා කරන්න ගියාම විවිධ නිලධාරීන් තමුන්ගේ වුවමනා එපාකම් වෙනුවෙන් ඒ ගොවීන්ට අනේකවිධ වද වේදනා දෙනවා. ඒ පිළිබඳව සාක්ෂි ඇතිව කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. මා සතුව සාක්ෂි තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමා අද ආපු නැති නිලධාරීන් දුන්නු උත්තර ටිකක් අරගෙන, ඒ කඩදාසි ටික එකතු කරගෙන මෙතැන කථා කරනවා. එතුමා හොඳ ගොවියෙක්. නමුත් මේ කියන කරුණු කාරණා සියල්ලෙන් බැහැර වෙලා එතුමා අප ගැන යම් යම් දේවල් කිව්වාට, අපේ පක්ෂය ගැන යම් යම් දේවල් කිව්වාට වැඩක් නැහැ. නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ වැරැදි, අඩු පාඩු වුණා නම් එතුමාට එදා ඒ ගැන කියන්න තිබුණා. එතුමා 1983 සිට 1988 දක්වා අවුරුදු 5ක් හිටපු ආණ්ඩුවක් මඟිනුයි නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළේ. එදා එතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. එතුමන්ලා එදා මොනවාද කළේ? එහෙම නම් එතුමන්ලා ඒකට වග කියන්න ඕනෑ. අපි ඒ වෙන කොට ඉපදිලා නැති වෙන්නත් පුළුවන්. අපි එදා මව් කුසේ වත් නොසිටියා වෙන්න පුළුවන්. හැබැයි, එතුමන්ලාට දැත්වල ගෑවුණු ඒ පාපයන්ගේ මඩවලින් ගැලවෙන්න බැහැ කියන කාරණය මා කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනාව අංග සම්පූර්ණ යෝජනාවක්. මේ යෝජනාව ගෙනාවේ අදාළ අණපනත් කියවලායි. මේ පාර්ලිමේන්තුව වචන සාප්පුවක් බවට, කථා සාප්පුවක් බවට පත් කර ගැනීමේ දේශපාලනයක නිරත වන්නවත්, බාධා කරමින්, නැඟිට නැඟිට තමන්ගේ පාණ්ඩිත්‍ය පෙන්වන තෝතැන්නක් බවට පත් කර ගන්නවත් මා සූදානම් නැහැ. මා කරුණු, කාරණා, සාධක ඇතිවයි කථා කළේ. මේ කටයුත්තට ඔය කියන පනතේ වගන්තිවලින් මේ මේ ආවරණ ලැබිලා තිබෙනවා කියා සඳහන් කළත් එවැනි තත්ත්වයක් ගමේ භූමිය තුළ ගොවියාට නැහැ. ඒ නිසා තමයි මා ගරු කෘෂිකර්ම ඇමතිතුමාට කිව්වේ, යළි වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් - උදාහරණයක් විධියට පාලටුව, තුඩාව, ගොඩගම සහ තිහගොඩ ආදී ප්‍රදේශවල තිබෙන කුඹුරු ඉඩම්- ලාභ උත්පාදනය කළ හැකි වෙනත් වගාවන් සඳහා යොදා ගැනීමේ වැදගත්කම ගැන. දැන් මෙතැන ගරු ආර්ථික සංවර්ධන ඇමතිතුමා ඉන්නවා. එතුමාගේ අමාත්‍යාංශය වන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබෙන රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යාපීඨය, ඒ වාගේම කාර්මික විද්‍යාල හා තාක්ෂණික විශ්වවිද්‍යාලවල තිබෙන කෘෂි අංශ හා බැදුණු ආයතන තිබෙනවා නම් එම ආයතන යනාදි සියල්ල එකතු කරගෙන මේ ගමන යන්න වුවමනායි. අපේ දැනුමේ අඩු පාඩු සොයන්න කලින් ගරු ඇමතිතුමන්ලා අතින් සිදු වෙලා තිබෙන අඩු පාඩුකම්, අත පය බැඳ තිබීම කියන කාරණය හේතුවෙන් කරගන්න බැරි වෙලා තිබෙන කටයුතු ගැන සොයා බලන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැන සිද්ධ වෙලා තිබෙන කාරණය මොකක්ද? අවසාන වශයෙන් මා ඒ ගැන කියනවා. ගරු කෘෂිකර්ම ඇමතිතුමාගේ අත පය බැඳලා කෘෂිකර්මය කියන ළිඳට දාලායි තිබෙන්නේ. ඉතින් ඇමතිතුමා මරු විකල්ලෙන් අත පය ලිහාගෙන ගැලවෙන්න දහලනවා. එහෙම දහලන කොට, කුඹුර මඩ වෙනවා වාගේ එතුමා ඉන්න ළිඳත් මඩ වෙලා තිබෙනවා. නමුත් එතුමා අපට කියනවා, "ළිඳ මඩ

[ගරු බුද්ධික පතිරණ මහතා]

කළේ උඹලා" කියලා. අපට චෝදනා කරලා වැඩක් නැහැ. අත පය බැඳලා ළිඳකට දාපු ඇමතිතුමෙකු මරු විකල්ලෙන් ළිඳෙන් ගොඩ එන්න දහලන කොට ළිඳ මඩ වෙලා, ළිඳ බොර වෙලා තිබෙනවා. ඒකට අපට චෝදනා කරලා වැඩක් නැහැ. මා අවසාන වශයෙන් ගරු ඇමතිතුමාට කියන්නේ අපට චෝදනා එල්ල කරනවාට වඩා, එතැනින් එහාට ගිහිල්ලා අනෙකුත් ඇමතිතුමන්ලාත් එක්ක මේ හා බැඳුණු ක්ෂේත්‍රවල සමෝධානික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලායි. ඔය පනත තවදුරටත් ලියවිල්ලක් විතරයි. ඒ ගැන තවතවත් කථා කිරීම නොවෙයි වැදගත්. ගොවීන් තැළීම නවත්වන්න කියන එකයි අප කියන්නේ. ගොවීන් තැළීම නවත්වලා මේ කටයුත්තට අවංක කැප කිරීමක් කරන්න ගරු ඇමතිතුමනි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු සූරියප්පෙරුම මැතිතුමා කියපු අනෙක් කාරණා සම්බන්ධයෙන් වෙනම යෝජනාවක් ගෙනැල්ලා මේ සභාවට ඉදිරිපත් කරන්න කියලා එතුමාට කියමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා. තෙරුවන් සරණයි! බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පොල් කර්මාන්තයෙහි සහ පොල් සම්පත්වල සංවර්ධනය හා ප්‍රවර්ධනය විධිමත් කිරීම

தெங்குக் கைத்தொழில், தெங்குசார் வளங்கள் ஆகியவற்றின் அபிவிருத்தியையும் மேம்பாட்டையும் ஒழுங்கமைத்தல்

REGULARIZING THE DEVELOPMENT AND PROMOTION OF THE COCONUT INDUSTRY AND COCONUT RESOURCES

[3.59 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Chairman of Committees, I move the following Private Members' Motion:

"වාණිජමය නිෂ්පාදන අතර ඉතා වැදගත් ස්ථානයක් පොල්වලට හිමි වන හෙයින් පොල් සම්පත් සහ ඒවායේ පරිසරය තිරසාරව පවත්වා ගන්නා අතරම දළ දේශීය නිෂ්පාදිතයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලෙස පොල් කර්මාන්තය සහ පොල් සම්පත්වල සංවර්ධනය විධිමත් කොට ප්‍රවර්ධනය කිරීම උදෙසා අර්ථාන්විත පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

Sir, I **table*** the Tamil and the English translations of that Motion to be included in Hansard.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොල් ගස කියන්නේ කප් රුක. පොල් ගසේ සියලු දේම මනුෂ්‍යයාට ප්‍රයෝජනවත් වෙනවා. කප් රුක වාගේම තමයි තල් ගසත්. පොල් ගසෙන් ලබා ගත හැකි ප්‍රයෝජන තිබෙන්නේ එකක්, දෙකක් නොවෙයි. මේ පිළිබඳව ආප්තෝපදේශයක් ද්‍රවිඩ භාෂාවෙන් තිබෙනවා. ඒ කියන්නේ පොල් ගසට වතුර දමා ඒකෙන් ප්‍රතිඵලකාරයක් අහන්න එපා; ඉල්ලන්න එපා. යථා කාලයේදී හිසෙන්, - ඒ කියන්නේ පොල් ගෙඩියෙන්, පොල් ගෙඩියේ වතුරෙන්- ප්‍රතිඵලකාරය ලැබෙයි කියන එකයි. ඒක ද්‍රවිඩ භාෂාවෙන් තිබෙන්නේ මෙහෙමයි.

நன்றி ஒருவருக்குச் செய்தக்கால் அந்நன்றி
என்று தருங்கொல் எனவேண்டா - நின்று
தளரா வளர்தெங்கு தாளுண்ட நீரைத்
தலையாலே தான் தருதலால்.

என்று ஔவையார் பாடலில் கூறப்பட்டிருக்கின்றது. எனவே, நான் இங்கு தென்னை பற்றிய பல விடயங்களைக் கூறுவதற்கு முனைகின்றேன்.

The coconut palm which is called, *Cocos Nucifera* is a member of the palm family, Arecaceae. It is the only accepted species in the genus Cocos. The term "coconut" can refer to the entire coconut palm, the seed or the fruit, which botanically is a drupe, not a nut. Cocoanut is the archaic form of the word coconut. Derived from the 16th Century, in Portuguese and Spanish, "coco: means head or skull, because of the three small holes on the coconut shell that resemble human facial features, gives name to a bugbear.

Found throughout the tropical and subtropical areas, coconut is known for its great versatility as seen in many domestic, commercial and industrial uses of its different parts. Coconuts are part of the daily diet of many people. Coconuts are different from other fruits because they contain a large quantity of water and when immature, they are known as tender-nuts or jelly-nuts and may be harvested for drinking. When mature, they still contain some water and can be used as seed nuts or processed to get oil from the kernel, charcoal from the hard shell and coir from the fibrous husk.

Sir, therefore, coconut is a unique plantation in this country. Of course, coconut is grown in tropical countries, in a vast area of the Philippines and also along Kerala and Goa, in India. They make coir from the fibrous husk.

අපි ඒ දවස්වල කෝච්චියේ කතරගම යන විට අපේ ස්ත්‍රීන් පොල් ලෙලි තලනවා, කෙඳි ගන්නවා, කඹ අඹරනවා පෙනෙනවා. ඒ වාගේම ඒ අය පොල් කටුවලින් ලස්සන ලස්සන භාණ්ඩ නිර්මාණශීලීව හදනවා. ඒ අය පොල් කටු, පොල් මල්

කථාව අවසානයේ පළ කර ඇත.
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

වාගේම අනෙකුත් දේවලින් සාදන ලද විසිතුරු භාණ්ඩ අපි විදේශිකයන්ටත් විකුණනවා. "ලක්සල" වාගේ තැනකට ගියාම පෙනෙවා එතැන ඒ වාගේ දේවල් හරියට තිබෙන බව. විදේශිකයන් ඒවා මිලදී ගන්නවා. ඉතාම ආසාවෙන් අපි ඒවා දිහා බලා ගෙන ඉන්නවා.

The endosperm is initially in its nuclear phase suspended within the coconut water. As development continues, cellular layers of endosperm deposit along the walls of the coconut, becoming the edible coconut "flesh". That is the kernel. When dried, the coconut flesh is called, copra. Copra වලින් තෙල් ගන්නවා. ඉස්සර අපේ ගම්වල සෙක්කු තිබුණා. මහරගම ප්‍රදේශයේත් සෙක්කු තිබුණා. මම පිරිමි ළමයි සහ ගැහැනු ළමයි එක්ක සෙක්කුව පැදලා තිබෙනවා. සෙක්කුව මඟින් අපට ගමේදීම තෙල් ලබා ගැනීමේ හොඳ අවස්ථාවක් ඇති වුණා.

Coconut oil is also widely used in soap and cosmetics. The clear liquid coconut water within is a refreshing drink. The husks and leaves can be used as material to make a variety of products for furnishing and decorating. It also has cultural and religious significance in many societies that use it.

පොල්මල් ගැන අප දන්නවා. ඒවා මංගල්‍ය උත්සවවලට ගන්නවා. පන්සල්වල, පල්ලිවල, කෝවිල්වල උත්සවවලට ගන්නවා. පොල්මලින් ඒ උත්සව අලංකාර කරනවා.

අපේ ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ දිවි නැගුම වැඩ පිළිවෙළ යටතේ- ඒ ප්‍රතිපත්තිය යටතේ- කන්තාවන්ට ගෘහ කර්මන්තයක් වශයෙන් පොල් ගස උපයෝගි කර ගෙන කරන ගෘහ කර්මාන්ත සාර්ථකව කර ගෙන යන්න හොඳ අවස්ථාවක් ඇති කරන්න පුළුවන්. හැම ගෙවිලියකටම ඒකෙන් හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන්. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ අංශයට එතුමාගේ අවධානය යොමු කර තිබෙනවාය කියන එක අපට ඒකාන්තත වශයෙන් විශ්වාසයි.

I have so many reports prepared by the Chilaw Plantations Trust and Kurunegala Plantations Limited. Mr. Panduka Jayasinghe, Chairman of Kurunegala Plantations Limited has given us a full view of the entire coconut industry. That report is very valuable and should be read by all.

අපේ පාඨශාලාවල ළමයින් අද ගැලරියේ ඉන්නවා. පොල් කර්මාන්තය හොඳ අධ්‍යයනයක් ලබන්න වුවමනා නම් මේ වාර්තා කියවන්න කියලා මා මේ වාර්තා **සභාගත*** කරනවා.

ඒ එක්කම මා මේ කාරණයත් කියන්න ඕනෑ. "කප්රුක" tabloid පුවත් පත බලන්න. "දිනමිණ" පත්තරයේ අතිරේකයක් වශයෙන් තමයි Lake House එකෙන් මේක නිකුත් කරන්නේ. මේක අද "දිනමිණ" පත්තරයේ තිබෙනවා. "තිනකරන්" පත්තරයේ තිබෙනවා. "Daily News" පත්තරයේ තිබෙනවා. Lake House එකෙන් හොඳ සේවාවක් කරන්නේ. "ක්ෂිතිජය", "කාන්තා", "මංචු" යනාදි වශයන් හුඟක් tabloid පුවත් පත් නිකුත් වෙනවා. ඒවායින් අපේ ළමයින්ට හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමේ හොඳ අවස්ථාවක් එළැඹෙන බව මා මේ ගරු සභාවේදී කියන්න සතුටුයි. Professor H.P.M. Gunasena, Chairman, Coconut Research Institute writes an article to "Kapruka" tabloid newspaper and gives a description of new coconut varieties discovered by the Coconut Research Institute, different varieties of coconut which suit different climate zones, coconut varieties that bear nuts in a short period and of coconut-related products.

අද "කප්රුක" tabloid පුවත් පතේ තිබෙනවා coconutවලින් හොඳ ice cream, 100 per cent coconut milk ice cream හදන්න පුළුවන් කියලා. අනේ, මට අවස්ථාවක් තිබුණා නම් මේ ගැලරියේ ඉන්න පාසල් ළමයි එළියට යන කොට මේ අයිස්ක්‍රීම් බෙදා දෙන්න ඒක මට සන්තෝෂයක්. නැවත වාරයක් ඒගොල්ලෝ පාර්ලිමේන්තුවට එනකොට මේ අයිස් ක්‍රීම් ලබා ගන්න පුළුවන් කියන එකත් මා මේ අවස්ථාවේදී මතක් කර දීමට කැමතියි.

මේ ආදී වශයෙන් ජාතියට ලොකු සේවයක් කරන වෘක්ෂයක් තමයි පොල් ගස කියන්නේ. පොල් ගස ගැන කියනකොට අපේ ගරු කථානායකතුමා ප්‍රකාශ කරන ලද දෙයක් උදාහරණයක් වශයෙන් කියන්න පුළුවන්. I quote an article which appeared on the website, "cdjemin.gov.lk" on 10th February, 2012:

> "The Hon. Chamal Rajapaksa, Speaker of the Parliament of Sri Lanka stated that a mini coconut triangle has since been identified and emphasized that it is a matter of national importance that we make full use of this triangle. Then it will be possible to meet the full demand of coconuts in the country.
>
> This was stated by him at the District-wise inaugural ceremony of Island-wide Kapruka Purawara Programme at Hambantota."

The inauguration ceremony was held recently. A large crowd was present. The Minister, Hon. Jagath Pushpakumara was also there in order to see what the Hon. Speaker is doing in his own area.

It further states:

> "In the presently identified Mini Coconut Triangle in Tangalle, annual production of coconut is from 4000 to 5000 nuts. The Coconut Research Institute has commenced several researches to identify varieties of coconut suitable for the area which can ensure increased harvests. Hon. Speaker further explained with samples, the ways and means of deriving additional income from coconut related by-products..."

ඒක තමයි මම කිව්වේ. පොල් ගෙඩියෙන්, පොල් කිරිවලින් සහ අනෙකුත් දැවලින් ගෘහ කර්මාන්තයට ආශ්‍රිත නිෂ්පාදනයන් කරනවා. පොල් කිරිවලින් ටොෆි,අයිස්ක්‍රීම්, බුල්ටෝ වැනි රසකැවිලි නිෂ්පාදනය කරනවා. [බාධා කිරීමක්] බුල්ටෝ හදන්න පුළුවන් කියා අපේ බොරලුගොඩ නායකතුමාත් කියනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා යෝජනා කළා, ගැලරියේ සිටින ළමයින්ට පොල් කිරිවලින් නිෂ්පාදිත අයිස්ක්‍රීම් ලබා දීමට කටයුතු කරනවාය කියා. කවදාද ලබා දෙන්නේ, කොහොමද ලබා දෙන්නේ, කොහොමද හදන්නේ කියන කාරණා ගැන එතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඒකද point of Order එක? පොල් ගෙඩියෙන් ගහන්න වෙලා තිබෙන්නේ ඒ ඔළු ගෙඩියට.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Azwer, you carry on.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මම ඒ ළමයින්ට කියනවා, මේ ඔළු ගෙඩියට ගහන්න පොල් ගෙඩියක් අරගෙන එන්න කියලා. ඔළු ගෙඩියක් නැති කෙනෙක් නේ මේ කථා කරන්නේ. ළමයින්ට කොහොමද සලකන්නේ කියා අපි දන්නවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා ළමයි උස්සන්න දන්නවාද? තමුන්නාන්සේලාගේ නායකතුමා ළමයෙක් උස්සලා තිබෙනවාද? ජාතියේ පියා, මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි ඒකත් කරන්නේ. තමුන්නාන්සේලා ඒකවත් දන්නේ නැහැ. තමුන්නාන්සේලාට පොර පොල් ගහන්නවත් දන්නේ නැහැ. ඒකයි අද වෙලා තිබෙන්නේ. ඒ පොල් කඹවලින් තමුන්නාන්සේලාගේ කටවල් බැඳ තබන්න ඕනෑ. [බාධා කිරීමක්] Sir, there are Coconut Triangles in Sri Lanka. Kurunegala, Gampaha and Puttalam are in one such Triangle. Tsunami took away thousands and thousands of productive coconut acreage.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, you have already taken 15 minutes.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Okay. I will finish within two minutes. Sir, in Puttalam, there had been great coconut growers. The late Speaker, Hon. H.S. Ismail was such a man. When coconuts were plucked, he went and remained there to see that every single nut was counted and entered into his income. පොල්මල් තලනවා. මල් තලනවා, තල් මලනවා. ඒ නිසා අපි ඉතාමත්ම සන්තෝෂ වෙනවා. අපේ පොල් වැනි ලා තැඹිලි වැනි - [බාධා කිරීමක්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියා නැහැ. පොල් සුජීව කියා ඉන්නවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

සුජීව. පුන්නක්කු සුජීව කියාත් අපි අහලා තියෙනවා. අපේ ජනාධිපතිතුමා ඉතාමත්ම බුද්ධිමත්ව, කාලෝචිතව කල්පනා කරලා පොල් සංවර්ධනය සඳහා පළමුවන වතාවට අමාත්‍යාංශයක් හදලා අපේ ජගත් පුෂ්පකුමාර මැතිතුමාට භාර දීලා තිබෙනවා. එතුමා ඉතාමත්ම ලස්සනට එහි වැඩ කටයුතු කර ගෙන යනවා. එස්.සී.එම් මරික්කාර් මහත්මයා කල්පිටියේ හිටියා. සුනාමිය එන්න ඉස්සර නැහෙනහිර ප්‍රදේශයේ ලොකු කුනාටුවක් හැමුවා. ඒ කුනාටුවෙන් පොල් ගස් ලක්ෂ ගණනක් විනාශ වුණා. දැන් නැවත වගා කරනවා නේද? දැන් විරුද්ධ පක්ෂයේ නායකතුමා එයි. අජිත් මහත්මයා ඉස්සර පොල් බෑ දෙකක් අරගෙන මේ ගරු සභාවට ආවා. දැන් ඒ පොල් බෑ දෙක කෝ? අපේ ජගත් පුෂ්පකුමාර අමාත්‍යතුමාගේ කාර්යක්ෂමභාවය නිසා පොල් මිල පහත වැටී තිබෙනවා. පොල් ඉවර වුණාම පතෝල කරලක් අරගෙන ගියා. දැන් පතෝලය කොට වුණාම වෙන දෙයක් කියනවා. SMS ගහන්නය කියා කොල්ලන්ට කෙල්ලන්ට කියනවා. මේක තමයි ඔයගොල්ලන් කරන කෝලම. නමුත් රටක් හදනවා. රටක් සංවර්ධනය කරනවා. ප්‍රෞඩත්වයක් ඇති ජාතියක් හදනවා. ජාතියක් හැදීමේ ඒ ව්‍යායාම එතුමා පත් කළ ඇමති මණ්ඩලය ඒකරාශි වෙලා එකමුතුව රටක් හැදීමේ ඒ සේවය කර ගෙන යනවා කියන එක ප්‍රකාශ කරනවා. මා පිළිතුරු කථාව පසුව කරන්නම්. බොහොම ස්තුතියි.

**** සභාමේසය මත තබන ලද යෝජනාවේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනය:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட பிரேரணையின் தமிழ் மற்றும் ஆங்கில மொழிபெயர்ப்பு:*
** Tamil and English translations of Motion tabled:*

"வர்த்தக ரீதியான உற்பத்திகளில் தென்னை முக்கிய இடத்தை வகிப்பதால், வளங்களையும், சுற்றாடலையும் நிலைத்துநிற்கச் செய்கின்ற அதேவேளை, நாட்டின் மொத்த உள்நாட்டு உற்பத்திக்கு குறிப்பிடக்கூடியளவு பங்களிப்புச் செய்யக்கூடிய விதத்தில் வளர்ச்சியடையும் அபிவிருத்தியை ஒழுங்கமைத்து தென்னைக் கைத்தொழில் மற்றும் தென்னைசார் வளங்கள் ஆகியவற்றை மேம்படுத்துவதற்கு அர்த்தபுஷ்டியுள்ள நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டுமென இப்பாராளுமன்றம் தீர்மானிக்கின்றது."

"Since coconut occupied an important place in the commercial products, this Parliament resolves that meaningful steps be taken to regularize development and to promote coconut industry and coconut resources, which would grow as a significant contributor to the Gross Domestic Product of the country while sustaining the resources and its environment."

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
I propose that the Hon. R. Yogarajan do now take the Chair.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

[අ. භා. 4.15]

ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ, උගත් ගරු අස්වර් මන්ත්‍රීතුමා පොල් කර්මාන්තය පිළිබඳව පළල් අදහසක් ගැබ් වී තිබෙන පේළි තුන හතරක යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. මේ පොල් ගහට "කප් රුක" කියාත් එතුමා කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සදාම් හුසේන් මහත්මයා ඉන්න කාලයේදී මම ඉරාකයට ගියා. ඒ නියෝජිතයෝ මාව අරගෙන ගියා, නොයෙක් ගම්බද පළාත් පෙන්වන්න. මා එක නිවසකට ගිහිල්ලා ඒ නිවසේ ප්‍රධානියාගෙන් ඇහුවා, "ඔබට ළමයින් කී දෙනෙකු ඉන්නවාද" කියලා. ඔහු කිසිම උත්තරයක් නොදී කිව්වා, "මගේ මිදුලේ තිබෙන රට ඉඳි ගස් ටික ගණන් කරන්න, ඒ රට ඉඳි ගස්වලින් මගේ දරුවෝ සංඛ්‍යාව පෙන්නුම් කරනවා, ළමයෙක් ඉපදුණාම අප රට ඉඳි ගහක් වවනවා, ඒ ගස් තමයි ඕනෑම පිට කෙනෙකුට අපේ ගෙදර ඉන්න දරුවෝ සංඛ්‍යාව තෝරා ගන්න පුළුවන් ක්‍රමය" කියලා. ලෝකයේ සෑම ජනතාවකටම බලපාන කාරණා තුනක් තිබෙනවා. එකක් තමයි බත් ලබා දෙන ධාන්‍ය ඇටය. අනික තමයි, කිරි ලබා දෙන ගවයා හෝ සතා. තුන්වැනි කාරණය තමයි, පොල් ගහ වාගේ කිරි ලබා දෙන අනික් වෘක්ෂ. තල් ගහ තිබෙනවා. ඔටුවා ඉන්නවා. ඉරිහු තිබෙනවා. යුරෝපයේත් ඒ වාගේ තිබෙනවා. පොල් කර්මාන්තය තමයි මේකේ හරය වන්නේ. මා හුහක් ඉතිහාසයට යන්නේ නැහැ.

අපේ පොල් කර්මාන්තය ටිකක් පහළට වැටිලා තිබුණා, ජාත්‍යන්තර මිල පහළ වැටීම නිසා. ඒ වාගේම අපට තරගකාරීව දෙන්නෙකු, තුන් දෙනෙකු මතු වුණා. ලෝකයේ ඉහළම තැනක තිබුණු අපේ පොල් කර්මාන්තයට පිලිපීන දූපත්වලින් බරපතළ තරගයක් ආවා. ආසියාවේ අනික් රටවලිනුත් දැන් තරගයක් ඇවිල්ලා තිබෙනවා. මේ වාගේ අවස්ථාවක තමයි පොල් ගහට නව ජීවනයක් දීම සඳහා ගරු ජනාධිපතිතුමා සහ පොල් කර්මාන්තය බාර අපේ ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර ඇමතිතුමා අවුරුදු දෙක තුනක් තිස්සේ මේ පියවර අරගෙන තිබෙන්නේ. මේක බොහොම වැදගත් සන්ධිස්ථානයක්. ලංකාවේ දකුණට පොල් ගහ, උතුරට තල් ගහ ආවේණික වෙලා තිබෙනවා. මේ ගස් දෙක පෝෂණය නොකළොත් අපේ ලංකාව ආධ්‍යාත්මිකව බංකොලොත් රටක් වෙනවා. මේක අපේ සුර පුර හා සමානයි.

සෑම රටකම ඉතිහාසයත් එක්ක ගැළපුණු ගස් ටිකක් තිබෙනවා. ඒ වාගේ ලංකාවට බැඳුණු ගස් ටිකක් තිබෙනවා. ඒ ගස් වනාඟී බෝ ගහ, වී පැළය, පොල් පැළය, කොස් පැළය සහ කිතුල් පැළය. ඔය ගස් පහට ආපසු නව ජීවනයක් දෙන්න අප ලැස්ති වෙලා ඉන්නවා. ඉන්දියාව, ලංකාව වාගේ ආසියානු රටවල් කවදාවත් බෝ ගස්, නා ගස් වඩු වැඩකට ගන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ නමක් පිට දුන් නා ගහට අප පොරොවක් තියන්නේ නැහැ. ඒක අපට පූජනීයයි. නා ගහ තමයි ඉන්දියාවේත් විෂ්ණු දෙවියන්ගේ වෘක්ෂය. ඉන්දියාවේත් ඒ ගහට අත තියන්නේ නැහැ. බොහොම ගෞරවයෙන් මේ ගහට සලකනවා. ලෝකයේ ජනගහනයෙන් සියයට 60ක් අනුභව කරන්නේ බත්. බත් ගන්නේ වී ඇටයෙන්. වී ගන්නේ වී පැළයෙන්. අනික තමයි පොල් පැළය. මේ පොල් පැළය ශාන්තිකර සාගරයේ පාවෙලා ඇවිල්ලා වැලිගම ගොඩ ගහලා මුල් වගාව ලැබුණාය කියලා තමයි විශ්වාස කරන්නේ. මේක මතයක් පමණයි. මේ පැළය දැන් ජනප්‍රිය වෙලා තිබෙනවා. ඉංග්‍රීසි ආණ්ඩු ආපු කාලයේ තමයි මේක කෘෂි කර්මාන්තයක් හැටියට, වාණිජ කර්මාන්තයක් හැටියට කළේ.

ගරු ඇමතිතුමනි මට මතකයි, දැන් අවුරුදු හත, අටකට ඉස්සෙල්ලා ලංකාවේ පොල් නිෂ්පාදනය අවුරුද්දකට පොල් ගෙඩි කෝටි 300කට වැඩි වන මට්ටමකට ඇවිල්ලා තිබුණු බව. දැන් පොඩ්ඩක් පහළ වැටිලා තිබෙනවා. මේක බේදවාචකයක්. ලංකාවේ පොල් ගෙඩි කෝටි 300ක් තිබෙනවාය කියන්නේ එක් කෙනෙකුට සෑහෙන ප්‍රමාණයක පොල් තිබෙනවාය කියන එකයි. ඒ තරම් ප්‍රමාණයක් මිනිසුන් පොල් අනුභව කරනවා. ඒ සඳහා අප පියවර රාශියක් ගත්තා. මා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ඇමතිතුමාත් එක්ක මේ පොල් ගස් අලුතින් වවන නොයෙක් තැන්වලට ගිහිල්ලා බැලුවා. මා හරි සන්තෝෂයි, මෙහෙම ක්‍රියාශීලී, උනන්දුවක් ඇති ඇමතිවරයෙක් පොල් කර්මාන්තයට ඇප කැප වෙලා කටයුතු කිරීම ගැන. මා ඇවිල්ලා ගරු ජනාධිපතිතුමාට වාර්තාවකුත් දුන්නා, "මේ මහත්මයා පොල් කර්මාන්තය නඟා සිටුවීම ගැන වැදගත් රාජකාරියක් කරනවා"ය කියලා.

ලක්ෂ ගණනින් පොල් පැළ ගෙනැත් තිබෙනවා. මේක බොහොම වැදගත් දෙයක්. මම යම් කිසි තැනකට ගියාම අහම්බෙන් දැක්කා, -මට තැන මතක නැහැ. - හොඳ ලස්සන පොල් ගහක් තිබෙනවා. එහි සෑම වල්ලකම ගෙඩි 18යි, 20යි. මමත් ගෙඩියක් ගෙදර ගෙනැත් පැළ කළා, දැනට අවුරුදු 8කට 10කට ඉස්සෙල්ලා. දැන් ඒ ගහේ ගෙඩි තිබෙනවා. දැන් අවුරුදු දෙක තුනක විතර සිට මම කවදාවත් පොල් ගෙඩියක් කඩෙන් අරගන්නේ නැහැ. අර ගහේ කඩන්නත් භයයි. ඕනෑ වෙලාවක පොල් ගෙඩි තිහ හතළිහක් කඩා ගන්න පුළුවන්. කප් රුකක් හා සමානයි. මේ වගාව ආපහු නැඟිටුවන්න ඕනෑ.

ගරු පොල් සංවර්ධන ඇමතිතුමනි, ඔබතුමාට පින් ලැබෙනවා, අපේ රට වෙනුවෙන්, අපේ ජාතිය වෙනුවෙන්, අපේ ශිෂ්ටාචාරය වෙනුවෙන් කරන පූජනීය දෙයක් හැටියට සලකලා, බෝ ගහකට කරන සැලකිල්ල පොල් ගහකටත් දක්වලා මෙය නඟා සිටුවන්න. මේ ගහ තමයි අපේ මීළඟ පරම්පරාවට පිට දීලා බුදු වෙන්න තිබෙන ගහ. මේ පොල් ගහ අපට අතිඋතුම් ගහක්. මේ ගහට කප් රුක කියන්නේ ඉල්ලන ඕනෑම දෙයක් මේ ගහෙන් දෙන නිසායි. මේ ගහේ අහක දමන්න කිසිම දෙයක් නැහැ. අරාබිකරයේ තල් ගහෙනුත් අහක දමන්න කිසිම දෙයක් නැහැ. අපේ ජන ජීවිතය හැඩ ගැහිලා තිබෙන්නේ මේ පොල් ගහත් එක්ක. පොල් ගහක් නැති ගෙදරක් නිකම් පාළු පිට්ටනියක්. සාමාන්‍යයෙන් පොල් ගස් හතරක් පහක් ගෙදරක තිබෙන්න ඕනෑ. නැත්නම් ඒක මදිකමක්. හොඳ ඵලදාව තිබෙන පොල් ජනප්‍රිය කරන්න අවශ්‍යයි. මේ පොල් ගස ලංකාව පුරාව වැවෙන්නේ නැහැ. උස කඳු සහිත ප්‍රදේශවල වැවෙන්නේ නැහැ. වැලි සහිත මුදුබඩ සහ තැනිතලා භූමිවල ඉතා ලස්සනට හැදෙනවා. හලාවත, කුරුණෑගල, පුත්තලම පොල් ත්‍රිකෝණය. මුළු ලංකාවේම තිබෙන පොල් ඵලදාවෙන් සියයට 75ක් විතර පොල් ත්‍රිකෝණයෙන් ලැබෙනවා. නමුත් ඉඩම් කැබැලි කිරීම නිසා පොල් ගස් විනාශයට පත් වුණා. දැන් මම මේ සම්බන්ධව ඉල්ලීමක් කරනවා. මෙය පාසලින් පටන් ගන්න ඕනෑ. පොල් ගහේ වටිනාකම අපේ දරුවන්ට කියා දෙන්න ඕනෑ; අපේ දෙමවුපියන්ට විශේෂයෙන් අම්මාට කියා දෙන්න ඕනෑ. තාත්තා රාජකාරියකට වැඩ පොළට ගියත් අම්මා තමයි ගෙදර ඉන්නේ. එත්තේ පොල් ගෙඩි හත අටක් වැටිලා තිබෙනවා නම් එය ගෙදරට ලොකු ආර්ථික වාසියක්. ඒ නිසා මම මේ යෝජනාව අනුමත කරනවා.

එසේ අනුමත කරන ගමන් මම යමක් කියන්න ඕනෑ, පොල් සංවර්ධන ඇමතිතුමා ගැන. මෙතුමා ලක්ෂ සංඛ්‍යාත පොල් පැළ ප්‍රමාණයක් ලංකාව පුරා බෙදා දීලා ඒවා වවා ගෙන යනවා. සෑම

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

තැන්වලම ඒවා දැන් මුල් ඇදලා, පැළ රෝපණය වෙලා ඉහළට නැඟී ගෙන යනවා. මම ගිය හැටියේ අහන්නේ, "කවදාද, මේවා වැව්වේ, කොහෙන්ද මේවා ලැබුණේ?" කියලා. මේක ඉතාම වැදගත්. මම ඕනෑම තැනකට ගියොත් අහනවා, "කෝ, ඔබගේ ගෙවත්ත, කෝ ඔබගේ පොල් ගහ, පොල් ගස් කීයක් වත්තේ තිබෙනවාද? "කියලා. ගෙවත්තක් නැති ගෙදර පාළු පිටිටනියක්. ගෙදරක අලංකාරය ගෙවත්ත. සෑම ගෙදරකම ගෙවත්තක් තිබෙන්න ඕනෑ. ගෙවත්ත තමයි අම්මාගේයි, දරුවන්ගේයි ආලෝකය, ආභරණය, ලස්සන. අපේ කථාවල සඳහන්ව තිබෙනවා, "ඉඟුරු දුරු ඈ යුතු" කියලා. සියලුම එළවලු ජාති, බෙහෙත් ජාති ගේ වටේ තිබෙන්න ඕනෑ. උයන්න දේ ගෙනෙන්න අම්මා පොළට යන්නේ නැහැ. අම්මා ගේ වටේ ගිහින් උයන්න අවශ්‍ය එළවලු ප්‍රමාණය ඇතිළියට අරන් එනවා. ඒ නිසා ලංකාවේ ලොකු පුනරුදයක්.

මේ ලංකාව ගොඩ ආවේ එහෙන් යුද්ධ කරන ගමන්, ජනාධිපතිතුමා උතුම් වැඩක් කළ නිසයි. සෑම කෙනෙකුටම පෝර ගෝනියක් දුන්නා. පෝර ගෝනියෙන් ගහලා තමයි අපි මේ යුද්ධය දිනුවේ. නිෂ්පාදනය පස් ගුණයකින් ඉහළට ආවා. කවදාවත් වැව්වේ නැති කුඹුරුවල වවන්න පටන් ගත්තා. ගස් හැදෙන්න පටන් ගත්තා. එළවලු එලදාව, පොල් රබර් තේ හැදෙන්න පටන් ගත්තා. භාණ්ඩාගාරය පිරුණා. යුද වියදම් සියල්ල කැපුණා, පෝර ගෝනියෙන් කළ ඒ හාස්කම නිසා. ඒ හාස්කම පොල් ගසෙනුත් අපට ලැබෙනවා, කිසිම සැකයක් නැහැ.

පොල් ගහක් හිටවලා අවුරුදු හතරයි, පහයි අතර කාලයේ තමයි එලදාව ලැබෙන්නේ. එලදාව ලබා ගැනීම සඳහා ගතවන ඒ කාලය තුළ පොල් වගාව නිරීක්ෂණය කිරීම මට ඉතාම ප්‍රීතිමත් දෙයක්. ඒ ගෞරවය පොල් කර්මාන්තය භාර ගරු ඇමතිතුමාට පූජා කරමින් අස්වර් මහත්තයා ගෙනාපු කප් රුකක් බඳු පැළැටියක් පිළිබඳව ජනතා අවබෝධයක් ඇති කිරීමේ මේ මනා යෝජනාව මා ස්ථිර කරනවා.

ගැලරියේ මේ කථා අහගෙන සිටින ළමයි ටික තමයි අපේ දේවතාවියෝ. මේ ළමයි ගෙදර ගිහිල්ලා කප් රුක වනාහි කුමක්ද කියලා හිතන්න ඕනෑ. "සිතුම්ණ" කියන්නේ මොකක්ද, "ඇලඩින්ගේ පුදුම පහන" කියන්නේ මොකක්ද කියලා හිතන්න ඕනෑ. ඉල්ලන ඕනෑම දෙයක් දෙන, අහක දමන්න කිසිම දෙයක් නැති ගහක් හැටියටයි සිංහල රජ කාලයේ ඉඳලා පොල් ගහ හඳුන්වන්නේ. ගෙදර අම්මාට පිට දීලා ශක්තිය දෙන පැළැටියයි පොල් ගහ. ඒ නිසා ලංකාවේ සියලුම ගස් සමඟ ගළපා පොල් ගහ අපට කප් රුකක් බවට පත් වේවා කියමින් අස්වර් මන්ත්‍රීතුමාගේ යෝජනාව මම ප්‍රීතියෙන් අනුමත කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු අජිත් පී. පෙරේරා මහතා.

[අ. භා. 4.27]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවේ තිබෙන වචනාර්ථය අනුව ගත්තාමත් මෙය ඉතාම සාරගර්භ යහපත් යෝජනාවක්. අප ජීවත් වන ප්‍රදේශයේ පුරෝගාමී නායකයෙකු වුණු ආතර් වී. දියෙස් මැතිතුමා ඒ කාලයේ රටේ තිබුණු ආහාර අහේනියට පිළියමක් විධියට හැම ගෙදරකම කොස් පැළයක් හිටවන්න උපදෙස් දීලා ගමෙන් ගම කොස් ඇට බෙදා දීපු ඒ විස්තරය වැඩිහිටියන්ගෙන් අපි අසා තිබෙන බව මට මතකයි. ඒ නිසා එතුමාට "කොස් මාමා" කියලා කිව්වා. මේ රටේ මොන තරම් අසීරු යුග පැමිණියත්, මහ බැංකුව කොහොම කිව්වත්, බිම් මට්ටමේ තිබෙන සැබෑ දුප්පත්කම ඉතාම ගැඹුරු ලෙස වර්ධනය වෙලා තිබෙන අවස්ථාවක දුප්පත් පොහොසත් හැමෝටම ආහාරයට ගන්න පුළුවන් ප්‍රියමනාප මහා වටිනා සම්පතක් කොස් ගස. රට පුරා සෑම නිවසකම කොස් ගස ව්‍යාප්ත වෙලා අද අපට ලබා ගන්න පුළුවන් වුණේ "කොස් මාමා" හින්දායි.

පොල් ගැන කථා කරන වෙලාවේ මම ඒ උදාහරණය කිව්වේ, අපේ එදිනෙදා අවශ්‍යතා වෙනුවෙන් පොල් ගසක් වගා කර ගන්නවා කියන එකට එහා ගිහිල්ලා වචනයේ සැබෑ අර්ථයෙන්ම කප් රුකක් වුණු පොල් ගස පිළිබඳව තව තවත් වැඩියෙන් දැනුවත් කරන්නයි. විශේෂයෙන්ම පර්වස් 10, 15, 20 වැනි කුඩා බිම් කොටස්වල වුවත්, වගා කර ගන්න පුළුවන් විධියට ඒ ගස එතරම් විශාල නොවන ප්‍රභේදයන්ගෙන් ලබා ගැනීම අද අපට අවශ්‍ය වෙලා තිබෙනවා.

මා මේ කාරණය කියන්න හේතුවක් තිබෙනවා. මම මගේ නිවස ඉදිරිපිට ගිය සතියේ පොල් පැළ 4ක් සිටෙව්වා ගරු ඇමතිතුමනි. ඒ ප්‍රදේශයේ පැළ තවානක ඉන්න මගේ මිතුයකුගෙන් මට උපදෙස් ලැබුණා, මේ ගස් ටිකක් ලොකුවට හැදෙනවා, වර්ගය හොඳයි, ඵලදාව හොඳයි, හැබැයි ඔබතුමාට තිබෙන ඔය ඉඩකඩ ප්‍රමාණයේ හැටියට උපරිම ගස් හතරයි සිටුවාගන්න පුළුවන් කියලා. එහෙත් ඒ ගසේ තිබෙන ප්‍රයෝජනය සහ මිදුලක වගා කරන්න පුළුවන් විධියේ ගසක් වීම කියන කාරණය හින්දා මම මගේ නිවසේ මිදුලේ පොල් සිටෙව්වා. නමුත් මට තේරුම් ගිය දෙයක් තිබෙනවා. වැඩි ඵලදාව, රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ගැන සැලකිලිමත් වනවා වාගේම ගසේ ප්‍රමාණය, වපසරිය අඩු කර ගන්න පුළුවන් නම් වැඩි ගස් ප්‍රමාණයක් වගා කරගන්නත් පුළුවන්. මට ඒ තාක්ෂණය ගැන ලොකු අවබෝධයක් නැහැ. මට ගිය සතියේ මුහුණ දෙන්න සිදු වූ අද්දැකීමයි මා ඔබතුමාට බොහොම හොඳ හිතින් කිව්වේ ගරු ඇමතිතුමනි. මම දන්නවා ඔබතුමා ලොකු සේවයක් කරනවා කියලා.

ඒ වාගේම ගොවි පවුලකින් පැවතගෙන එන කෙනකු විධියට, අදටත් වගාව කිරීම ගැන පෞද්ගලික අවධානයක් තිබෙන කෙනකු හැටියට, එහි ප්‍රයෝජනය ගැන, පාරිසරික වශයෙන් සහ ආර්ථික වශයෙන් තිබෙන වටිනාකම ගැන දන්නා කෙනකු විධියට මා ඔබතුමාට කියන්නේ මේ අලුත් ප්‍රභේද, විශේෂයෙන් නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවලට ගැළපෙන ප්‍රභේද හඳුන්වා දීම ගැන අවධානය යොමු කරන්න කියලායි ගරු ඇමතිතුමනි. මට පෙනෙන දේ තමයි පොල් වගාව කෙරෙහි දැන් වැඩිපුර අවධානය යොමු වන්නේ කර්මාන්තයක් වශයෙනුයි කියන කාරණය. එය ලොකු අර්බුදයක තිබුණා. යම් ප්‍රමාණයකට ඉන් ගොඩ ඇවිල්ලාත් තිබෙනවා. මා ජීවත් වන කළුතර දිස්ත්‍රික්කයේ අද විශාල ඉඩම් ඇත්තේ නැහැ. තිබෙන ඉඩම් ඉතා ඉක්මනින් කුඩා කොටස්වලට වෙන්වීගෙන යනවා. එහෙත් ආර්ථික ප්‍රයෝජනය ගැන සිතලා, ගසේ තිබෙන අලංකාරය ගැන සිතලා, එහි තිබෙන සෙවණ ගැන සිතලා සහ පොදුවේ පාරිසරික වටිනාකම ගැන සිතලා අපි පොල් වගාවට ප්‍රමුඛතාවක් දිය යුතුයි. එදා කොස් මාමා කොස් වවන්න උපදෙස් දුන්නා වාගේ අපට පොල් මාමා කෙනකුත් අවශ්‍ය කාලයක් උදා වෙලා තිබෙනවා. මේ අවස්ථාව මට ලබා දීපු ගරු අස්වර් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ වටිනා යෝජනාව ඉදිරිපත් කරලා මේ වාගේ ගෞරවනීය සභාවක අවධානය යොමු කරවීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වටිනා කාලය මා භාවිත කරන්න කැමැතියි, වැදගත් ප්‍රශ්නයක් කෙරෙහි අවධානය යොමු කරවන්න. මේ රටේ නීති අධ්‍යාපනය ලබාගැනීම සඳහා තිබෙන ප්‍රධානතම මාර්ගයක් තමයි ශ්‍රී ලංකා නීති විද්‍යාලයට වාර්ෂිකව ප්‍රවේශ වීම සඳහා පැවැත්වෙන නීති විද්‍යාල ප්‍රවේශ විභාගය.

2012 වසරේ පැවැති නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල පිළිබඳව මතු වූ අර්බුදකාරී තත්ත්වය නිසා ඒ පිළිබඳව වග කිවයුතු, සංස්ථාගත නීති අධ්‍යාපන සභාව තීරණය කළා, සිසුන් කණ්ඩායම් දෙකක් එකවර බඳවා ගෙන, විශේෂයෙන්ම සිංහල මාධ්‍යයෙන් පිළිතුරු ලියපු සිසුන්ට සිදු වූ අසාධාරණය වළක්වා ගැනීමට පියවර ගන්න. ඒකෙන් සිදු වූ වරද නිවැරදි නොවුණත් යම් ආකාරයක සහනයක් සිසුන්ට ලැබුණා. වර්තමානයේ පවතින "නීතියේ පසුබිම" කියන විෂය නිර්දේශයේ තිබුණු අඩු පාඩු නිසාත්, ඒ වාගේම පරිවර්තනය කිරීමේදී ඇති වෙලා තිබුණු සුවිශේෂ අර්බුද නිසාත් ලකුණු කිරීමේ ක්‍රියාවලිය සහ ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ ක්‍රියාවලිය තුළ තිබුණු ඉතාම බරපතළ, සැක සහිත තත්ත්වය නිසාත්, නැවත වරක් 1999ට කලින් තිබුණු සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ භාෂාව -ඒ භාෂා ප්‍රශ්න පත්‍රය සඳහා සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ කියන භාෂා තුනෙන් එකක් තෝරා ගැනීමට පුළුවන්- ඇතුළත් විභාග ක්‍රමයට යන්න තීරණය කළා.

එතැනදී ගැටලුවක් මතු වුණා, නිසි දැනුම් දීමක් නොමැතිව එකවරම ඒ වෙනස කිරීම නිසා දැනටමත් නීති විද්‍යාල ප්‍රවේශ විභාගයට සූදානම් වුණු සිසුන්ට වන අසාධාරණය ගැන. ඒ කාරණය පිළිබඳව අප අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදී කරුණු දැක්වුවා. ඒ වාගේම ඒ පිළිබඳව තීරණ ගන්නා නීති අධ්‍යාපන සභාවේ සාමාජිකයන්ගේ අවධානය අප පෞද්ගලිකව යොමු කළා. එහි ප්‍රතිඵලයක් විධියට අපට පුළුවන්කම ලැබී තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 වර්ෂයේ අගෝස්තු මාසයේ පැවැත්වෙන නීති විද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා "නීතියේ පසුබිම" - "The Background to the Law" - කියන ඒ කලින් තිබුණු විෂය නිර්දේශයම නැවත ලබා ගන්න. ඒ නිසා මා පළමු කොට නීති අධ්‍යාපන සභාවට ස්තුතිවන්ත වන්න ඕනෑ, සිසුන්ගේ පැත්තේ ඉඳලා මේ අවුරුද්ද සඳහා ඒ පැරණි විෂය නිර්දේශය නැවත ලබා දීම ගැන. ඒ වාගේම ඔවුන් ප්‍රකාශ කර තිබෙනවා ඊළඟ වසරේ ඉඳලා නැවත සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ භාෂාව පිළිබඳව මනින අලුත් විභාග ක්‍රමයට යනවා කියලා. ඊළඟ අවුරුද්දේ ඉඳලා යන විභාග ක්‍රමය ගැන අපට ගැටලුවක් නැහැ. නමුත් එතැනත් යම් යම් ගැටලු තිබෙනවා. ඒවා අපට සාකච්ඡා කර විසඳා ගන්න පුළුවන්. ඒ නිසා මා විශේෂයෙන් ඒ කාරණය ගැන අවධානය යොමු කරවනවා.

මෙම වසරේ නීති විද්‍යාල ප්‍රවේශ විභාගයට පෙනී සිටින සිසුන්ට වුණු අසාධාරණය දැකලා, එය විසඳීමට මැදිහත් වුණු නීති අධ්‍යාපන සභාවට මගේ ස්තුතිය පිරිනමන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.35]

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)

(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොල් කර්මාන්තය සහ පොල් ආශ්‍රිත සම්පත් සංවර්ධනය හා ප්‍රවර්ධනය විධිමත් කිරීම පිළිබඳව වැදගත් යමක් සඳහන් කරන්නට මට අතිරේක, සුවිශේෂී අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත්, ඒ සම්බන්ධයෙන් විමසිලිමත් වී පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනාවක් ඉදිරිපත් කළ අප හිතවත් ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාටත් පළමුවෙන්ම මා ස්තුතිවන්ත වනවා. එතුමා කොයි පැත්තේ හිටියත් ඇස් ඇරගෙනයි ඉන්නේ. එතුමාට නොදැනෙන්න, එතුමාට හොරෙන් කිසිවක් කරන්න බැහැ. එතුමා ප්‍රශ්න කරනවා. එතුමා විවේචනය කරනවා. සටකපට ප්‍රශංසාවට වඩා සාධාරණ විවේචනය ගොඩක් වටිනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එබැවින් මා නැවත නැවතත් ගරු අස්වර් මන්ත්‍රීතුමාට ස්තුතිය පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශිෂ්‍ය අවධියේදී අප උගත් පරිදි ශ්‍රී ලංකාවේ ප්‍රධාන නිර්යාත වැවිලි වර්ගවලින් එකක් වූ පොල් කර්මාන්තය පසු කාලීනව අන්ත පිරිහීමකට ලක් වුණා. ඒ තත්ත්වය යටතේ තමයි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රථම වතාවට පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය කැබිනට් අමාත්‍යාංශයක් හැටියට ස්ථාපිත කළේ. මට එහි ඇමති පදවිය ලැබුණේ 2010 අවුරුද්දේ නොවැම්බර් මාසයේ. එදා මට මේ අමාත්‍යාංශය භාර ගන්න සිද්ධ වුණේ එලොව පොල් පෙනෙන වෙලාවකයි. මට මතකයි විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙකු මේ ගරු සභාවට පොල් බෑ දෙකක් ගෙනැල්ලා, මේ බෑය රුපියල් 35යි; මේ බෑය රුපියල් 35යි; දෙකම රුපියල් 70යි කියලා මේ ගරු සභාවට ඒවා ප්‍රදර්ශනය කරපු ආකාරය. ඒක මට දැනුත් මැවිලා පෙනෙනවා.

අපි තේරුම් ගත්තා, ඒ ප්‍රශ්නයට විසඳුම් සොයන්නේ කොයි ආකාරයටද කියලා. එක කාරණයක් විධියට කෙටි කාලීන, මැදි කාලීන සහ දීර්ඝ කාලීන වශයෙන් මේ සඳහා විසඳුම් සොයන්න අපි අවස්ථාවක් උදා කර ගත්තා. ක්ෂණිකව -කෙටි කාලීනව- මේ පොල් මිල අඩු කිරීම සඳහා රජය සතු වතුවල පොල් ටික ගෙනැල්ලා ස්වයං රැකියා ලාභීන්ගේ සංගමයත් එක්ක එකතු වෙලා අපි රුපියල් 30ට පොල් විකුණන්න පටන් ගත්තා. එතකොට වැඩි මිලට විකුණන අයට පොල් අළෙවි කර ගන්න බැරුව ඒ අයත් මිල අඩු කරලා පොල් විකුණන්න කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණාව මෙයයි. එදා රුපියල් 350ට පොහොර මිටියක් ලබා දෙමින් වී වගාවට පොහොර සහනාධාරය ලබා දුන්නා. තේ වගාවට, රබර් වගාවට ඒ සහනාධාරය ලැබුණා. අපේ අතිගරු ජනාධිපතිතුමාගෙන් කරපු ඉල්ලීමට අනුව ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ සුවිශේෂ මැදිහත් වීම මත අනෙකුත් භෝගවලටත් පොහොර සහනාධාරය ලැබුණා. කොළඹ වරායට ගෙනැල්ලා ගොඩ බාන පොහොර මල්ලක් සඳහා රුපියල් 4,200ක් වැය කරනවා. පොහොර මල්ලකට රුපියල් 4,200ක් වැය කරන කොට පොල් වගාව ඇතුළු අනෙකුත් සෙසු භෝග වගා කරන ඕනෑම කෙනෙකුට රුපියල් 1,200ට ඒ පොහොර මල්ලක් ගන්න පුළුවන්. හැම කිලෝ 50ක පොහොර මල්ලකටම රජය රුපියල් 3,000ක වියදමක් දරනවා. මේ සඳහා රජය වාර්ෂිකව මිලියන 50,000ක් වැය කරනවා. මැදි කාලීන පියවරක් හැටියට පොල් වගාවට පොහොර යොදන්න ජනතාවගේ උනන්දුවක් ඇති වුණා.

තුන්වැනි කාරණාව තමයි දිගු කාලීන සැලසුම. අපි පළමුවැනි වතාවට, පොල් වගාව සම්බන්ධයෙන් 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය සඳහා වූ ක්‍රමෝපාය සැලැස්මක් සකස් කරලා, කැබිනට් මණ්ඩලය අනුමත කරලා මේ උත්තරීතර සභාවටත් ඉදිරිපත් කළා, මෙන්න මේ වාගේ සැලැස්මක් කරන්න යනවා කියලා. 2011 වර්ෂය වන විට පොල් වගා කිරීමේ මණ්ඩලය මැදිහත් වෙලා වර්ෂයකට වැඩියෙන්ම නිපද වූ පොල් පැළ ප්‍රමාණය පොල් පැළ ලක්ෂ 24ක් පමණ වෙනවා. 2011 වර්ෂයේ මේ පැළ ප්‍රමාණය පැළ ලක්ෂ 40 දක්වා වැඩි කරන්න අපට හැකියාව ලැබුණා. අපි 2012 වර්ෂයේදී අපේ අමාත්‍යාංශය සතු ව්‍යාවස්ථාපිත මණ්ඩල - පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය, කුරුණෑගල වැවිලි සමාගම, හලාවත වැවිලි සමාගම- සහ කජ්රුක ප්‍රජා තවාන්වල ඉන්න කණ්ඩායම් ඔක්කෝම එකතු වෙලා පොල් පැළ ලක්ෂ 90කට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කළා. අපි 2016 වර්ෂය වන විට වගා කරන්න බලාපොරොත්තු වන පොල් පැළ සංඛ්‍යාව තුන් කෝටි විසි ලක්ෂයක් හෙවත් මිලියන 32ක්. අපි වගා කරන පැළ සංඛ්‍යාව පළමුවැනි අවුරුද්දේ මිලියන 4යි, දෙවැනි අවුරුද්දේ මිලියන 9යි. අපි මේ අවුරුද්දේ මිලියන නවයහමාරක් සහ ලබන අවුරුද්දේ මිලියන නවයහමාරක් හැටියට පැළ තුන්කෝටි විසි ලක්ෂයක් වගා කරනවා. අපි 2016 දී සිටුවන්න බලාපොරොත්තු වුණු ප්‍රමාණය අවුරුදු දෙකකට කලින් එනම්, 2014 දෙසැම්බර් මාසයේදී සිටුවා ඒ ඉලක්කයට ළඟා වීමේ සැලැස්මක් අපි ක්‍රියාත්මක කරගෙන යන බව සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි.

[ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා]

එපමණක් නොවෙයි. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඉතාම වටිනා අදහසක් ඉදිරිපත් කළා. සෙත්සිරිපායේ දෙවැනි අදියර නව ගොඩනැඟිල්ලට අපේ අමාත්‍යාංශය ඊයේයි ප්‍රවිෂ්ට වුණේ. ඒ අවස්ථාවේදී අපි නිලධාරීන් සමඟ සාකච්ඡා කළා, නාගරික පොල් වගාව ඇති කරන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කරපු යෝජනාව අපි ගෞරවයෙන් පිළිගන්නවා. පොල් පැළ සඳහා නව ප්‍රභේදයන් හඳුනා ගෙන, නිවාසයකට අවශ්‍ය පොල් පැළයක් හෝ දෙකක් ලබා දෙමින් නාගරික පොල් වගාව ඇති කිරීමේ සැලැස්මක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන බව ඔබතුමාට සඳහන් කරන්න කැමැතියි. ඔබතුමාගේ අදහස් ඉදිරිපත් කිරීම ගැන ස්තුතිය පළ කරන්නටත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමා කුරුණෑගල වැවිලි සමාගම, හලාවත වැවිලි සමාගම ගැන කිව්වා. ඒ වැවිලි සමාගම් 1992 වර්ෂයේදී පෞද්ගලීකරණය කරපු වැවිලි සමාගම්. අපි මේ වැවිලි සමාගම් රජයට පවරා ගත්තා පමණක් නොවෙයි, අපි මේ වන විට මිලියන 300කට වැඩි ප්‍රමාණයක් ලාභාංශ හැටියට භාණ්ඩාගාරයට ලබා දීලාත් තිබෙනවා. ඒවා එදා පෞද්ගලික අංශයට පැවරීමෙන් ක්‍රමක්‍රමයෙන් පාඩු සිදු වුණා. පොහොර ටික යෙදෙව්වේ නැහැ. කම්කරු ආරවුල් තිබුණා. ගස් ටික කපලා විකුණුවා මිසක් ඒකට ආයෝජනය කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් අක්කරයට තිබිය යුතු පොල් පැළ ප්‍රමාණය 64ක්.

සමහර වතුවල අක්කරයකට පැළ 40ක්වත් තිබුණේ නැහැ. අන්න ඒ අඩු පාඩු සම්පූර්ණ කර පැළ වගා කිරීම හා කල් ඉකුත් වූ ගස් ඉවත් වන කොටම නැවත වගා කිරීම -යටි වගාව- වාගේ වැඩසටහන් අපි ක්‍රියාත්මක කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඊ-රාජ්‍ය ප්‍රතිපත්තිය අනුගමනය කරන බව මා සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා. පලෙයි වත්තෙන් ලැබෙන ආදායම, පාසිකුඩා වත්තෙන් කඩන පොල් ගෙඩි ගණන, අම්පාර දිස්ත්‍රික්කයේ කොරෙයි වත්තෙන් කඩන පොල් ගෙඩි ගණන, අනුරාධපුරයේ ධාතුසේනපුර වත්තේ එදා කඩා එකතු කර තිබෙන පොල් ගෙඩි ගණන සවස 6.00වන කොට අපි දන්නවා. ඒ පිළිබඳ විස්තර, තොරතුරු තාක්ෂණය ඔස්සේ e-mail එකකින් සවස 6.00වන කොට මට ලැබෙනවා; අපේ ලේකම්තුමාට ලැබෙනවා; අපේ අතිරේක ලේකම්තුමාට ලැබෙනවා; සෑම ආයතනයකම ප්‍රධාන කාර්යාලයට, සභාපතිවරුන්ට ලැබෙනවා. ඒ සඳහා අපට වෙනම වැඩසටහනක් තිබෙනවා. පලෙයි වත්තේ වැඩ කරන check-roll කම්කරුවන් ගණන කීයද, පාසිකුඩා වත්තේ වැඩ කරන check-roll කම්කරුවන් ගණන කීයද යනාදී තොරතුරු උදේ 10.00වන කොට ලැබෙනවා; සවස 1.00වන කොට ලැබෙනවා. මෙයින් බලාපොරොත්තු වන්නේ මොකක්ද? රටේ වංචාව, දූෂණය නැති කරලා පොල් නිෂ්පාදනය ලබා ගන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සමහර වතුවල check-roll කම්කරුවන් 25දෙනායි වැඩ කරන්නේ. නමුත් සමහර වතුවල ප්‍රධානීන් check-roll එකේ පනස්දෙනකුගේ නම් දමලා මුදල් වංචා කරන අවස්ථාවන් තිබෙන බව අපි දන්නවා; ඔබතුමාත් දන්නවා. ඒක කරන්න බැහැ. දැන් අපට එම අවස්ථාවේම ගිහින් පරීක්ෂා කරන්න පුළුවන්, කීදෙනකු වැඩ කරනවාද කියලා. මට මතකයි, මීට මාසයකට පමණ පෙර එක වත්තක තිබිය යුතු ප්‍රමාණයට වඩා පොල් ගෙඩි 5,000ක් වැඩිපුර තිබෙන බවට අපට තොරතුරු ලැබුණු බව. ඊට පසුව දා උදේම අපේ විගණන අංශය ගිහින් පරීක්ෂා කළා. කලින් දවසේ රෑ පොල් ගෙඩි 1,200ක් ඉවත් කරලා තිබෙනවා. පොල් ගෙඩි 3,800යි වැඩියෙන් තිබුණේ. අපි එම අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් විනය පියවර ගත්තා. අපේ අතිගරු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම යටතේ තොරතුරු තාක්ෂණය යොදා ගෙන අප එම කටයුතු කළා පමණක් නොවෙයි. මේ ක්‍රම භාවිතය තුළින් 2012 වර්ෂයේ වැඩිම පොල් අස්වැන්න පළමුවන වතාවට කුරුණෑගල වැවිලි සමාගමට ලබා ගන්න හැකියාව ලැබුණු බව සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා කෙටි කාලයක් තුළදී අපි වෙබ් අඩවියක් නිර්මාණය කළා. ආයතනය තුළ ක්‍රියාත්මක වන පොල් කළමනාකරණය සඳහා මා සඳහන් කළ ආකාරයට අන්තර්ජාලගත ප්‍රගති මෙහෙයුම් පද්ධතිය ස්ථාපිත කරන්න අපට හැකියාව ලැබුණා. රාජ්‍ය ආයතනයක් මඟින් ක්‍රියාත්මක කළ ප්‍රථම අන්තර්ජාල ප්‍රගති මෙහෙයුම් පද්ධතිය මෙය බව කියන්න ඕනෑ. අපේ අමාත්‍යාංශය පිහිටුවා අවුරුදු දෙකක් තුළ අපට මේ කටයුතු කරන්න හැකියාව ලැබීම ගැන නිහතමානීව අපේ සතුට ප්‍රකාශ කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. Skype තාක්ෂණය යොදා ගෙන සාකච්ඡා පැවැත්වෙනවා. මොකද, අපේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා නිලධාරීන් කොළඹට ගෙන්වනවා වෙනුවට, Skype තාක්ෂණය යොදා ගෙන අපේ අමාත්‍යාංශයේ ඒ ඒ ආයතනවල ඉඳගෙන ඒ මෙහෙයුම්, ප්‍රගති සමාලෝචන කටයුතු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ වාගේම විශේෂයෙන්ම පොල් වෙන්දේසිය විධිමත් කිරීම සඳහා ජාලගත තොරතුරු පද්ධතියක් ලෙස online ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා. ඕනෑම කෙනකුට එම ස්ථානයට එන්නේ නැතිව, register වෙලා වෙන්දේසියෙන් පොල් මිල දී ගැනීම සඳහා අන්තර්ජාලය ඔස්සේ ප්‍රවේශ වන වැඩසටහනක් අපි ක්‍රියාත්මක කර ගෙන යනවා. Skype තාක්ෂණය යොදා ගැනීමෙන් අපි බලාපොරොත්තු වන්නේ මොකක්ද? නිලධාරීන්ගේ කාලය හා ඉන්ධන පිරිවැය ඉතිරි කර ගැනීමයි. ඒ වාගේම දුරස්ථ වීඩියෝ සම්මන්ත්‍රණ මඟින් මේවා ක්‍රියාත්මක කරන්නත් අපි බලාපොරොත්තු වනවා.

විශේෂයෙන්ම පොල් අස්වැන්නේ වැඩි වීම ගැන මා මුලින් සඳහන් කළා. 2011 වර්ෂයේ පොල් වගා කිරීමේ මණ්ඩලයේ පොල් අස්වැන්න 62,14,635යි. මෙම ක්‍රම භාවිත කර තිබෙන නිසාම 2012 වර්ෂයේ පොල් අස්වැන්න 73,16,814 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම 2011 වර්ෂයේ පොල් පර්යේෂණායතනයේ පොල් අස්වැන්න 46,08,732යි. 2012 වර්ෂයේ එම ප්‍රමාණය 50,85,685 දක්වා වැඩි වෙලා තිබෙනවා. 2011 වර්ෂයේ කුරුණෑගල වැවිලි සමාගමේ පොල් අස්වැන්න 155,63,170යි. 2012 වර්ෂයේ එම ප්‍රමාණය 181,01,299 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඉතිහාසයේ වැඩිම අස්වැන්න කුරුණෑගල වැවිලි සමාගමට ලබා ගන්න හැකියාව ලැබුණා. 2011 වර්ෂයේ හලාවත වැවිලි සමාගමේ මුළු පොල් අස්වැන්න 145,07,856යි. 2012 වර්ෂයේදී එම ප්‍රමාණය 158,10,472 දක්වා වැඩි කර ගන්න අපට හැකියාව ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොල් කර්මාන්තය නඟා සිටුවීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදයන් කිහිපයක් හඳුනා ගැනීමට ගත වූ කෙටි කාලය තුළ අපට හැකියාව ලැබුණා. පොල් වගාව සඳහා ජනතාව උනන්දු කරවීමට අප සුවිශේෂී ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළා. "කප්රුක පුරවර පොල් සංවර්ධන වැඩසටහන" කියා අප හඳුන්වන්නේ එයයි. සෑම දිස්ත්‍රික්කයකින්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හෝ දෙකක් එක අවුරුද්දකට තෝරා ගෙන ඒ කොට්ඨාසයේ වගා කරන්න පුළුවන් භූමිවල උපරිම වශයෙන් වගා කරන්න "කප්රුක පුරවරයක්" හැටියට ඉලක්කගත වැඩසටහනක් අපි ආරම්භ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අමාත්‍යාංශය මම භාර ගන්න කොට පොල් සංවර්ධන නිලධාරීන් හිටියේ 114 දෙනායි. පොල් සංවර්ධන නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලය හිටියේ 160 දෙනායි. පොල් සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 325 දක්වා වැඩි කරන්න අවශ්‍ය කටයුතු සකස් කර දුන්නාට අතිගරු ජනාධිපතිතුමාට මම ස්තුතිවන්ත වනවා. උපාධිධාරී අභ්‍යාසලාභීන් බඳවා ගන්නා අවස්ථාවේදී අපේ අමාත්‍යාංශයේ මේ ව්‍යාප්ත වැඩසටහනට උපාධිධාරීන් 729ක් දක්වා ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු කළාට අතිගරු ජනාධිපතිතුමාට අපි ඒ සම්බන්ධයෙන් විශේෂ ස්තුතිය හා ගෞරවය පළ කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම "කප්රුක පුරවර වැඩසටහන" යටතේ මේ දක්වා කප්රුක පුරවර 91ක් අපි හඳුනා ගෙන තිබෙනවා. මේ ක්ෂේත්රයට සම්බන්ධ පුද්ගලයින් ස්වේච්ඡා සංවිධාන ලෙස "කප්රුක සමිති" හැටියට බල ගන්වන්නත් අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, පොල් ආශ්රිත අමුද්රව්ය එකතු කිරීම සම්බන්ධවත් අපි ස්වේච්ඡා සමිති බල ගන්වා තිබෙනවා. ජනලේඛන හා සංඛ්යාලේඛන දෙපාර්තමේන්තුවේ 2001 වාර්තාව අනුව ලංකාවේ දිළිඳුම ප්රාදේශීය ලේකම් කොට්ඨාසය මොනරාගල මැතිවරණ කොට්ඨාසයේ මම නියෝජනය කරන සියඹලාන්ඩුව ප්රාදේශීය ලේකම් කොට්ඨාසය කියලායි එදා කිව්වේ. ඒ සියඹලාන්ඩුව ප්රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 14,000ක් ඉන්නවා. අපි මේ "කප්රුක පුරවර වැඩසටහන" මඟින් අරුමයක් කළේ නැහැ; විශේෂ වැඩසටහන් කළේ නැහැ. අපි මේ "කප්රුක පුරවර වැඩසටහන" ඔස්සේ ඒ ස්වේච්ඡා සංවිධාන බල ගන්වලා පොල් ගස ආශ්රිත දේවල්වලින් අමතර ආදායම් ලබා ගන්නා ක්රමය අපි ඒ අයට කිව්වා. ඒ අනුව අපි ඒ අයට පොල් කටු එකතු කරන්න කිව්වා. පොල් කටු ටික එකතු කර ගෙන පොල් කටු ටික මිලදී ගන්නා වැඩසටහනක් අපි හඳුන්වා දුන්නා. සියඹලාන්ඩුව ප්රදේශයේ පවුල් 14,000ක් ඉන්නවා. උදාහරණයක් හැටියට ගත්තොත් ඒ හැම පවුලකින්ම මාසයකට රුපියල් 50ක පොල් කටු විකුණුවොත්, මාසයකට රුපියල් ලක්ෂ 7ක අමතර ආදායමක් ලැබෙනවා. ළිපට දැමූ පොල් කටු, කැලයට දැමූ පොල් කටු, ඩෙංගු මදුරුවා බෝ කළ පොල් කටුවලට මාසයකට රුපියල් ලක්ෂ 7ක් බැගින් අවුරුද්දකට රුපියල් ලක්ෂ 84ක අමතර ආදායමක් ලබා ගන්නා වැඩ පිළිවෙළක් සියඹලාන්ඩුව ප්රාදේශීය ලේකම් කොට්ඨාසයට අපි හඳුන්වා දුන්නා. මෙවැනි වැඩසටහන් තමයි අපි රට පුරා ව්යාප්ත කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, ඒ වාගේම වැටෙන පොල් අත්තෙන් ඉරටු ටික එකතු කරලා ඒවාට මුදල් ලබා දෙන ක්රමයක් පමණක් නොවෙයි, ගෙවත්තෙන් ලබා ගන්නා පොල්වල ලෙලි ටික එකතු කරලා ඒ මඟිනුත් ආදායමක් ලබා ගන්නා වැඩ පිළිවෙළක් අපි හඳුන්වා දෙනවා. අපේ ගරු අස්වර් මන්ත්රීතුමා කිව්වා වාගේම, කතරගම යනකොට පමණක් නොවෙයි, "පෙට්ටි කුට්ටම්" කියන යන්ත්රය උපයෝගී කර ගෙන සෑම ප්රාදේශීය ලේකම් කොට්ඨාසයකම පොල් ලෙලි පොල් කොහු බවට පරිවර්තනය කරන machines සකස් කරලා ඒ ප්රදේශවල තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ජනිත කරන වැඩසටහන් අපි නිර්මාණය කරනවා.

මඩුල්ලේ, නාගහමඩ අපි ඒ සඳහා එක මධ්යස්ථානයක් පටන් ගත්තා. අපි දැන් ගොඩකවෙල, මාවත්ගම කියන කොට්ඨාසයේත් ඒ පුහුණු වැඩසටහන් ආරම්භ කළා. බෙලිඅත්තේ වහරක්ගොඩ කියන ස්ථානයේත් අපි ඒ පුහුණු වැඩසටහන් දැන් ආරම්භ කළා. දිවුලපිටියේ 100ක් පුහුණු කරන මධ්යස්ථානයක් අපි ආරම්භ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, පා පිසි, බුරුසු පිට රට යවන ආයෝජක මහත්තයෙක් මට හම්බ වුණා. මම ඔහුගෙන් ඇහුවා, තමුන්නාන්සේ මේ බුරුසු කොපමණ ප්රමාණයක් අවුරුද්දකට පිට රට යවනවාද කියලා. එතුමා මට කිව්වා, අවුරුද්දකට බුරුසු කන්ටේනර් හයයි යවන්නේ කියලා. අවුරුද්දකට කොපමණ ඉල්ලුමක් තිබෙනවාද කියලා මම ඔහුගෙන් නැවත ඇහුවා. කන්ටේනර් 26ක් ඉල්ලුම තිබෙනවා, නමුත් යවන්නේ හයයි කියලා ඔහු මට කිව්වා. මේ සම්බන්ධයෙන් පුහුණු කරලා මේවාට අවශ්ය මහ පෙන්වීම අපි ලබා දෙනවා.

මේ පුහුණුව ලබා දෙන එක මධ්යස්ථානයක සිටින 50කින් හොඳම 25 දෙනෙක් තෝරා ගෙන "දිවි නැගුම" වැඩසටහනත් එක්ක සම්බන්ධ වෙලා ඔවුන්ට ඒ උපකරණ කට්ටල ලබා දීලා ගෙදර ඉඳගෙන ඒ බඩු ටික හදලා ඒවා මිලදී ගන්නා මධ්යස්ථානයට ගෙනෙන වැඩ පිළිවෙළක් අපි සකස් කරනවා. අඩු ගණනේ ඉදිරි අවුරුදු 2 තුළ 5,000කට වැඩි පිරිසකට අපි ඒ තුළින් රැකියා අවස්ථා නිර්මාණය කරනවා. ඒ අනුව ගමේ තමන්ගේ ගෙදර ඉඳලා රැකියාව කරන වැඩ පිළිවෙළක් අපි හඳනවා කියන එක තමුන්නාන්සේලාට මම මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, ඒ වාගේම පොල් සංවර්ධන අධිකාරිය හරහා අළෙවි සංවර්ධන තොරතුරු ලබා දීම, පොල් වගා කිරීමේ මණ්ඩලය හරහා පොල් වගාකරුවන් පුහුණු කිරීම වාගේම, කප්රුක ආයෝජන ණය වැඩසටහන හරහා මූල්ය සම්පාදන ලබා දීමත්, චක්රීය අරමුදල් ලබා දීමත් අපි සිදු කරනවා. ඒ වාගේම බැංකු එක්ක සාකච්ඡා කරලා ව්යවසායකයින් දිරි ගැන්වීම සඳහා වාහන මිලදී ගැනීමට ණය ලබා දීමේ වැඩසටහන්ද අප ක්රියාත්මක කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, අපි 2011 වර්ෂයේ දී "කප්රුක සමිති" 1,216ක් පිහිටෙව්වා. 2012 වර්ෂයේ දී "කප්රුක සමිති" 1,671ක් පිහිටෙව්වා. මේ වන විට අපි "කප්රුක සමිති" 3,887ක් පිහිටුවලා තිබෙනවා. 2016 වර්ෂය වන කොට රට පුරා "කප්රුක සමිති" 7,100ක් පිහිටුවන්න අප බලාපොරොත්තු වනවා.

අපි "කප්රුක පුරවර" වැඩ සටහන යටතේ පමණක් 2011 වර්ෂයේ පැළ 47,850ක් නොමිලේ බෙදා දුන්නා. 2012 වර්ෂයේ "කප්රුක පුරවර" වැඩ සටහනේ නව වගා වැඩ පිළිවෙළ යටතේ පැළ 15,04,222කුත්, පුනරුත්ථාපන වැඩ සටහන යටතේ පැළ 97,936කුත් බෙදා දෙන්න අපි කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, අපි සන්තෝෂයෙන් ප්රකාශ කරනවා, මේ වර්ෂය තුළ -මේ කෙටි කාලය තුළ- "කප්රුක පුරවර" වැඩ සටහන යටතේ අප පැළ 3,69,264කුත්, පුනරුත්ථාපන වැඩ සටහන යටතේ පැළ 7,527කුත් බෙදා දී තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, අපි 1950 ඉඳලා 2012 වර්ෂය තෙක් අපේ පොල් අස්වැන්න ගණන් හදලා බැලුවා. ඒ අස්වැන්න මේ අවුරුදු ගණනෙන් බෙදුවාම දළ වශයෙන් පොල් ගෙඩි දසලක්ෂ 2,600ත් 2,700ත් අතර ප්රමාණයක් තමයි අපට ලැබෙන්නේ. 1950 අවුරුද්දේත් දළ වශයෙන් මේ ප්රමාණයමයි තිබුණේ. 1950 වර්ෂය වන කොට ලංකාවේ ජන ගහනය දසලක්ෂ 7ක් -ලක්ෂ 70ක්- පමණ වුණා. අද ඒ ප්රමාණය තුන්ගුණයකින් වැඩි වෙලා. නමුත් පොල් නිෂ්පාදනය වැඩි වුණේ නැහැ. ඉඩම් කට්ටි කඩලා පොල් වගාකරුවන් පොල් වගාවෙන් ඉවත් වුණා. පොල්වලට හොඳ මිලක් තිබුණේ නැහැ. වගාකරුවන්ට වුවමනාවක් තිබුණේ නැහැ. එය කම්මැළියන්ගේ වගාවක් බවට පරිවර්තනය කළා.ඒ නිසා අපි පොල් වගාව සඳහා සහන ලබා දුන්නා. මේ රටේ ජන ගහනයෙන් සියයට 98ක් පොල් පරිභෝජනය කරනවා. එදා ලක්ෂ 70ක් වෙනුවෙන් කරපු පොල් නිෂ්පාදනය අද ලක්ෂ 210ක් වන ජන ගහනයට සාපේක්ෂව වැඩි වෙලා නැහැ. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා ඉලක්කයක් ලබා දුන්නා 2016 වර්ෂය වන විට පොල් ගෙඩි දසලක්ෂ 3,650ක් දක්වා නිෂ්පාදනය වැඩි කරන්න කියලා. අන්න ඒකයි අපේ අමාත්යාංශයේ ඉලක්කය.

අපේ සෙසු ගරු මැති-ඇමතිතුමන්ලාගේ, කැබිනට් මණ්ඩලයේ, අතිගරු ජනාධිපතිතුමාගේ, මුදල් අමාත්යාංශයේ, විශේෂයෙන් ආර්ථික සංවර්ධන අමාත්යතුමාගේ සහාය ඇතිව අපි ඒ කටයුතු කරගෙන යනවා. මහවැලි සංවර්ධන අධිකාරිය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව අපට සහාය ලබා දෙනවා. ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්යතුමාගේ නායකත්වයෙන් මහවැලි බල ප්රදේශවල ඒ කටයුතු කරගෙන යනවා. විශේෂයෙන් බන්ධනාගාර ප්රතිසංස්කරණ අමාත්යතුමාගේ මැදිහත් වීම යටතේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් බීජ තවාන් සකස් කරලා කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, 1978 වර්ෂයේ ඇති වූ සුළි සුළං උවදුර නිසා නැහෙනහිර ප්රදේශයේ පොල් වගාව විනාශ වෙලා තිබුණා. අවුරුදු 30ක් තිස්සේ පැවැති යුද්ධය නිසා උතුර ප්රදේශයේ පොල් වගාව විශාල වශයෙන් විනාශ වෙලා ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, උතුර ප්රදේශයේත්, නැහෙනහිර

[ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා]

ප්‍රදේශයේත් අපි බීජ තවාන් සකස් කරලා දැවැන්ත ලෙස පොල් වගාව ව්‍යාප්ත කිරීමට කටයුතු කරගෙන යනවා. 2010 දී අපේ පොල් අස්වැන්න විධියට ලැබුණා ගෙඩි මිලියන 2,317ක්. අපි 2011 වර්ෂයේදී ඉලක්ක කළේ ගෙඩි මිලියන 2,700යි. අපි සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා මේ ප්‍රමාණය ගෙඩි මිලියන 2,808 දක්වා වැඩි කරන්න අපට හැකියාව ලැබුණු බව. ඒ වාගේම 2012 වර්ෂයේදී අප ඉලක්ක කළේ පොල් ගෙඩි මිලියන 2,900යි. අපි ඒ ඉලක්කය ඉක්මවා ගිහින් ගෙඩි මිලියන 2,940ක් ලබා ගත්තා. දැන් අපට වර්ෂාව ලැබුණත් පසු ගිය කාලයේ දැවැන්ත නියඟයක් තිබුණා. පුත්තලම ප්‍රදේශයේත්, ඒ වාගේම වාරියපොළ වාගේ ප්‍රදේශවලත් ගස් ලක්ෂයක්, එකහමාරක් විතර අපට අහිමි වුණා, ඒ දැවැන්ත නියඟය නිසා. නමුත් අපි ඒවා අභියෝගයක් හැටියට සැලකුවේ නැහැ. අපට වළක්වන්න බැරි දේවල් සම්බන්ධයෙන් අපට කරන්න දෙයක් නැහැ. නමුත් අපි පොල් වගාව වැඩි කරන්න කටයුතු කරගෙන යනවා. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත, ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ සහාය මත 2011 සිට ලබා දුන් පොල් පොහොර සහනාධාරය නිසාම, පොල් අස්වැන්න වැඩි කරගන්න හා ගෙඩියක පිරිවැය රුපියල් 4කින් පමණ අඩු කරගන්න අපට හැකියාව ලැබුණු බව මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාවට නඟන රජයේ ප්‍රමුඛතම ගෘහ ආර්ථික ඒකක නඟා සිටුවීමේ වැඩ සටහන වන "දිවි නැඟුම" වැඩ සටහන සඳහා අවශ්‍ය පොල් පැළ සපුරාලීමේ වග කීමත් අපි භාරගත්තා. ඒ අනුව 2012 වර්ෂය අවසන් වන විට සපයන ලද පොල් පැළ ප්‍රමාණය මිලියන 5කට ආසන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල්වල අධ්‍යාපනය ලබන අපේ පාසල් දරු දැරියෝ අපත් එක්ක ඉන්නවා. ඒ ශිෂ්‍ය ප්‍රජාව සම්බන්ධ කරගෙන පොල් වගා කිරීමේ වැදගත්කම අපි මැනවින් වටහා ගත්තා. ඒ අනුව අපි "කප්රුකයි - සිප් නැණයි" අධ්‍යාපනික වගා වැඩ සටහන නිර්මාණය කළා. බඳුන්වල සකස් කළ පොල් පැළ දෙකක් අපි භය වසරේ සෑම දරුවකුටම නොමිලේ ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, භය වසර දරුවන්ට බඳුන් කළ පොල් පැළ ලබා දෙනවා පමණක් නොවෙයි, ක්‍රියාකාරකම් අත්පොතකුත් ලබා දෙනවා. ඒ දරුවා පොල් පැළය සිටු වන දවසේ සිට පොල් පැළයේ උස, වට ප්‍රමාණය වාගේම අවුරුදු හතරක් තුළ පැළය මෝරා හැදෙන කොට ක්‍රම ක්‍රමයෙන් ඇති වන වෙනස්කම් සම්බන්ධයෙන් ඒ අත්පොතෙහි සටහන් කරනවා. ඒ විධියට අපි 2011 වර්ෂයේ පොල් පැළ 2,65,956ක් ලබා දුන්නා. පසු ගිය 2012 වසරේ පොල් පැළ 3,41,407ක් ලබා දුන්නා. මේ වර්ෂය තුළත් ඒ වැඩ සටහන ක්‍රියාත්මක කරනවා. 2016 වර්ෂය වන විට අපේ ශිෂ්‍ය ප්‍රජාව සම්බන්ධ කර ගෙන පොල් පැළ 18,00,000ක් වගා කරලා, හැම ගෙදරකටම අවශ්‍ය පොල් ගස් ටික හදන වැඩ පිළිවෙළට අපි යොමු වෙලා තිබෙනවාය කියන එක මම මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා පසු ගිය අය වැය කථාවේ දී මේ උත්තරීතර සභාවට කිව්වා, අක්කර පහ දක්වා ඉඩම්වලට නොමිලේ පොල් පැළ ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා කියලා. ඒක ක්‍රියාත්මක කරන්නය කියා එතුමා මට උපදෙස් දුන්නා; නියෝග කළා. අපි ඒ වැඩ සටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනවාය කියලා මේ උත්තරීතර සභාවට ප්‍රතිඥා දෙන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම පොල් වගාවට විශාල වශයෙන් බලපාන රෝග කිහිපයකට මුහුණ පෑමට අපට සිදු වුණා. ඒ සියල්ලටම ඉතාම සාර්ථකව මුහුණ දෙන්න අපි කටයුතු කළා. වැලිගම ප්‍රදේශයේ පැවැති කොළ මැළවීමේ හා කොළ කුණුවීමේ රෝගය අපි හඳුනා ගත්තා. වැලිගම ප්‍රදේශයේ පැළ ලක්ෂ තුනහමාරකට වැඩි ප්‍රමාණයක් ඉතාම කඩිනමින් ව්‍යාප්ත වුණු ඒ මාරාන්තික රෝගයට මුහුණ දුන්නා. අපි රෝග මුක්ත කලාපයක් හඳුනා ගෙන ඒ ප්‍රදේශයේ පොල් පැළ සහ ඒ ආශ්‍රිතව තිබුණ වෙනත් දේවල් පිටතට ගෙන යන්න දෙන්නේ නැතිව මුර කපොලු යොදලා පුළුවන් තරම් විශේෂඥ උපදෙස් අර ගෙන ක්‍රම ක්‍රමයෙන් ඒ ගස් ප්‍රමාණය ඉවත් කරලා, ඒ රෝගය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම නවත්වන්න කටයුතු කළා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රදේශයේ, තංගල්ල ප්‍රදේශයේ සහ වලස්මුල්ල ප්‍රදේශයේත් අපි මේ තත්ත්වය හඳුනා ගත්තා. අපි ඒවා මැඩ පැවැත්වූ නිසා දැන් එකම රෝගී ගසක්වත් නැහැ. ඒ ප්‍රදේශයේ රෝගය ව්‍යාප්ත වීම නවත්වා ගන්න හැකියාව ලැබුණා. ගාල්ල දිස්ත්‍රික්කයේත් ඒ තත්ත්වය තිබුණා. අපි ගාල්ල දිස්ත්‍රික්කයේත් මැඩ පැවැත්වුවා. දැන් මාතර දිස්ත්‍රික්කයේ වැලිගම, දෙනිපිටිය වගේ ප්‍රදේශවලට ඒ රෝගය සීමා කර ගෙන ඒ ගස් ඉවත් කරමින් සිටිනවා. ඒ රෝගය කුරුණෑගලට, හලාවතට, කළුතරට වාගේ සෙසු ප්‍රදේශවලට ව්‍යාප්ත වෙන්න දෙන්නේ නැතිව පාලනය කරන්න කටයුතු කර ගෙන යනවාය කියන එක විශේෂයෙන්ම මම මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මයිටා උවදුරත් ඒ වාගේමයි. ඒ උවදුරේදී පොල් ගෙඩිය කුඩා වෙනවා. එහෙම නැත්නම් හොඳ කොළ පාට ගෙඩිය පැත්තකින් කළු පාට වෙලා තිබෙනවා. හරියට කිඹුලාගේ හම වාගේ. මයිටා කියන ඇහැට පෙනෙන්නේ නැති සතා පොල් ගෙඩියේ යුෂ උරා බිව්වාම තමයි ඒ තත්ත්වය ඇති වන්නේ. පොල් වගාවෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයකට එය ව්‍යාප්තවෙලා තිබුණා. මේ සම්බන්ධයෙන් අපට මෙතෙක් තිබුණු එකම විසඳුම දැවි තෙල් නැත්නම් කටුපොල් තෙල්වලට සබන් කුඩු දිය කරලා, නැත්නම් ගෙන්දගම් කුඩු දිය කරලා පොල් වලුවල තැරිවලට ගාන එකයි. දැන් අපට ඒක විශාල ප්‍රශ්නයක්. පොල් ගෙඩි කඩා ගන්නවත් මිනිස්සු නැති අවස්ථාවක ඒ කටයුත්ත ප්‍රායෝගිකව කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා විසඳුමක් හැටියට අපේ පොල් පර්යේෂණායතනයේ නිලධාරින් විලෝපීය මයිටාවෙක් හඳුනා ගෙන තිබෙනවා. ඒ මයිටාවාගෙන් අපට හානි කරන මයිටාවා විනාශ කරන ක්‍රමයක් හඳුනා ගෙන ඒ අනුව කටයුතු කර ගෙන යනවා. විද්‍යාගාර 11ක් හදලා, විලෝපීය මයිටාවන් නිෂ්පාදනය කරලා ඒ පැකට් 48,850ක් දැනටමත් බෙදා හැර තිබෙනවා. ඒ අනුව ක්‍රම ක්‍රමයෙන් ඒ තත්ත්වය නැති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සම්බන්ධයෙන් පොල් පර්යේෂණායතනයට අපි ස්තුතිවන්ත විය යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පළිබෝධ නාශක හේතු කොට ගෙන පොල් වගාවට සිදු වන හානියෙන් මිදීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේද රාශියක් හඳුනා ගෙන තිබෙනවා.

ඒ වාගේම තවත් තිබෙන ලොකුම ලෙඩක් තමයි, කළු කුරුමිණියාගේ ප්‍රශ්නය. මේ අවස්ථාවේ ගැලරියේ අපේ දරුවන් රැසක් ඉන්න නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. අපි පිහියක් අර ගෙන වල් කප කපා, එහෙම නැත්නම් කැලය ශුද්ධ කරමින් ඉන්න කොට, අම්මා හරි, මල්ලි හරි, නංගි හරි ගෙන එන තේ කෝප්පය ගන්න පිහිය පොල් ගහේ ගහනවා, පෙනෙන තැනක් නිසා. තේ එක බීලා නැවත පිහිය ගන්නවා. ඒ පිහිය ගැහීම නිසා පොල් ගහ තුවාල වෙනවා. ඒ තුවාලයෙන් එන ඉස්මවල සුවඳ නිසා කළු කුරුමිණියා ඇවිල්ලා බිත්තර 200ක් පමණ දමනවා. ඒක අපි කාටවත් දැනෙන්නේ නැහැ. අපිම ඒ විනාශය අත් කර ගන්නවා. එහිදී ඒ කළු කුරුමිණියා මුළු ගහම විනාශ කරනවා. කළු ගලක් වගේ හොඳට තිබෙන ගහ කඩා වැටෙන තෙක්ම අපි දන්නේ නැහැ.මේ සඳහා අපි පෙරමොන උගුල් හඳුන්වා දීලා තිබෙනවා. ඒ පෙරමොන උගුල් ඇටවුවාම සිදු වන්නේ, කුරුමිණි පිරිමි සතාට සිතෙනවා, ගැහැණු සතෙක් ළඟ සිටිනවා කියලා. ඒ නිසා පිරිමි සතා එම ඉව ඔස්සේ සොයාගෙන යනවා. ඒ සුවඳ ඔස්සේ එතැනට ගියාම එම කුරුමිණියා හසුවන්නේ උගුලකටයි. සබන් වතුර සහිත එම උගුලට කුරුමිණියා වැටිලා මැරෙනවා.

අපි මේ වැඩසටහන ඔස්සේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනයේ පෙරමොන උගුල් 2,500ක් සවි කරලා කුරුමිණියන් විශාල සංඛ්‍යාවක් විනාශ කළා. අපි මනම්පිටිය ප්‍රදේශයෙනුයි එය ආරම්භ කළේ. ඒ ප්‍රදේශයේ කුරුමිණියන් අපි විනාශ කළා. ගිය සතියේ අපි සෙවණගල ප්‍රදේශයට පෙරමොන උගුල් 4,000ක් ලබා දුන්නා. ඒ වාගේම මේ පළිබෝධ විනාශ කිරීම සඳහාත් අපි අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

අපට ඇති වන දැවැන්ත ප්‍රශ්නයක් තමයි, ඉඩම් කැබැලි කිරීම. අක්කර 10ට වැඩි ඉඩම් කඩන්නට දෙන්නේ නැහැ. එයට අවසරය ගන්නට ඕනෑ. අක්කර පහට වැඩි ඉඩම් කඩන්නට ඉඩ නොදීම දක්වා මේ සීමාව අඩු කරන්නට අපි බලාපොරොත්තු වනවා. ඉදිරියේ දී අපි එම නීති සංශෝධනය ගෙනෙන්නට බලාපොරොත්තු වෙනවා. එතැනදී අක්කර පහට අඩු පොල් ඉඩම් විතරයි කැබැලි කරන්නට පුළුවන් වන්නේ. අක්කර පහට වැඩි පොල් ඉඩම් කැබැලි කිරීම සීමා කරන්නට අපි බලාපොරොත්තු වනවා.

ගරු අජිත් පී.පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මෙතෙක් පොල් පර්යේෂණ ආයතනය විසින් හඳුනා ගත් ප්‍රභේද ඉතාම කිහිපයක් පමණයි තිබෙන්නේ. අපි ඉතාම කෙටි කාලයක් තුළ ලෙඩ රෝගවලට ඔරොත්තු දෙන, ඒ වාගේම ජලය අඩුවෙන් පාවිච්චි කරන, නියඟයට ඔරොත්තු දෙන පොල් ප්‍රභේද කිහිපයක් පසුගිය අවුරුද්දේ හඳුනා ගත්තා. එකක්, "කප්සුවය" හැටියටත්, අනෙක් ප්‍රභේදය "කප් සෙත" හැටියටත් හඳුන්වා දුන්නා.

අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ අපට අයිස් ක්‍රීම් නිෂ්පාදනය සඳහා විශාල කිරි අවශ්‍යතාවක් තිබෙනවා. අපි අත්හදා බැලීමක් හැටියට උත්සාහ කළා, පොල් කිරිවලින් අයිස් ක්‍රීම් නිෂ්පාදනය කරන්න. එය ඉතාමත් සාර්ථක වුණා. මේ ළඟ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ තිබෙන පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් අපේ අළෙවි සැලක් තිබෙනවා. මා හිතන හැටියට එහි උදේ වරුවේ නිෂ්පාදනය කරන පොල් කිරි අයිස්ක්‍රීම් ප්‍රමාණය සවස් වනතෙක් ඉතිරි වන්නේ නැහැ, අස්වර් මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] ඔව්, ඒක තමයි. අපි බලාපොරොත්තු වනවා, ඉදිරියේ දී මෙය රට පුරා ව්‍යාප්ත කරන්න. එතකොට අපිට පුළුවන්, ඒ අයිස්ක්‍රීම් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා කිරි ජනතාවට පානය කිරීම සඳහා ලබා දෙන්න. එතකොට අපට පිටරටින් ආනයනය කරන කිරි ප්‍රමාණය සීමා කරන්න පුළුවන්. අපි නිෂ්පාදනය කරන පොල් කිරි ප්‍රමාණය අයිස් ක්‍රීම් සැදීම සඳහා හඳුන්වා දෙන්න අපට පුළුවන්. අපි ඒ වාගේම පොල් වතුර -

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, ඔය පොල් කිරිවලින් හදන අයිස් ක්‍රීම් ඉතාමත් ප්‍රණීතයි කියලා අපි දන්නවා. පාර්ලිමේන්තුව නරඹන්නට එන මේ දරුවන්ට පාර්ලිමේන්තුවේ දී එම අයිස්ක්‍රීම් එකක රස විඳින්නට අවස්ථාව සලසා දෙන්න ඔබතුමාට හැකියාවක් තිබෙනවාද?

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

අපි පොල් කිරිවලින් අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීම ආරම්භ කළා විතරයි. එය තවමත් ළදරු අවධියේයි පවතින්නේ. අපි මේ නිෂ්පාදනය ව්‍යාප්ත කළාට පසුව ඉදිරියේ දී එහෙමත් කරන්න පුළුවන්.

ඒ වාගේම දිසිදි පොල් ගැනත් මා මතක් කරන්නට ඕනෑ. මේ DC මෝල්වල දිනකට පොල් ගෙඩි 50,000කින් විතර දිසිදි පොල් හදනවා. එතකොට දවසකට පොල් වතුර ලීටර් 50,000ක් විතර අපතේ ගියා. මේ අපතේ ගිය පොල් වතුර ටික ප්‍රණීත පානයක් හැටියට සකස් කරලා අද අපි අපනයනය ආරම්භ කරලා තිබෙනවා. ඒ සඳහා ඇමෙරිකාවෙන් සහ යුරෝපයෙන් විශාල ඉල්ලුමක් තිබෙනවා, අපට සපයා ගන්න බැරි තරමට. අපි අපතේ යවපු පොල් වතුර; කානු දිගේ යවපු පොල් වතුරවලට මුදල් ගෙනෙන - විදේශ විනිමය ගෙනෙන - වැඩසටහනක් හැටියට අපි එය නිර්මාණය කරලා තිබෙනවාය කියන එක විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා, ඔබතුමා පැය භාගයක් කථා කරලා තිබෙනවා. දැන් කථාව අවසන් කළා නම් හොඳයි.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

තව විනාඩි දෙකක් දුන්නා නම්, මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ඒ වාගේම කප්රුක ආයෝජනය සඳහා ඉතාම අඩු පොලියකට ණය මුදල් ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම පසුගිය අවුරුද්ද තුළ, අපි එක පැත්තකින් තැඹිලි, එක පැත්තකින් coir matting, copra, coconut shell charcoal, DC යන මෙවායින් විශාල ආදායමක් ලබාගෙන තිබෙනවා. විශේෂයෙන්ම යේමනය, ඊජිප්තුව වාගේ රටවලට අපි දිසිදි පොල් විශාල ප්‍රමාණයක් අපනයනය කරලා තිබෙනවා. ඒ වාගේම නෙදර්ලන්තය, ජපානය වාගේ රටවලට පොල් කටු අඟුරු විශාල ප්‍රමාණයක් අපනයනය කරලා තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදය, රුසියාව, ජපානය වැනි රටවලට සක්‍රීය කාබන් විශාල ප්‍රමාණයක් අපනයනය කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ උන්නතිය සඳහා විවිධාකාරයෙන් දායක කරවා ගත හැකි වෙනත් රාජ්‍යයන් සමඟ එකඟතාවක් ගොඩනඟා ගැනීමට අප ගත කළ කෙටි කාලය තුළ සමත් වූ බව සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ. මෙමඟින් සිදු කර ගත හැකි අත්දැකීම් හුවමාරුවත්, තාක්ෂණ දැනුම හුවමාරුවත් ඉතාමත්ම වැදගත් බව මා අමුතුවෙන් සඳහන් කළ යුතු නැහැ.

ගත වූ කෙටි කාලය තුළ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමඟ අප ගිවිසුම්ගත වෙලා, අපට විශාල අන්‍යෝන්‍ය සහයෝගයක් ලැබිලා තිබෙනවා. කෙන්යාවේ නයිරෝබි නුවර පිහිටි World Agroforestry Centre කියන ආයතනයත් එක්ක සම්බන්ධ කර පොල් වගාව එක්ක අතුරු වගාව වැඩි කරන්න අභිගරු ජනාධිපතිතුමා කියුබාවට ගිය අවස්ථාවේ කියුබාව සමඟ ද්වි පාර්ශ්වික ගිවිසුමකට අත්සන් කළා. එම ගිවිසුම ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරන්න අපි දැන් කටයුතු කරගෙන යන බව විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අක්කරයක භූමියක් තුළ පොල් ගස් 64යි සිටුවන්න පුළුවන්. සියයට 28ක භූමි ප්‍රමාණයක් ඒ සඳහා යන්නේ. සියයට 72ක් ඉතිරි වෙනවා. මේ සියයට 72 තුළ ගම්මිරිස්, කිරිඅල, අන්නාසි, කොකෝවා වැනි නොයෙක් භෝග වගා කරලා අමතර ආදායම් ලබා ගන්න පුළුවන් ක්‍රමවේද තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වන බව මතක් කරන්න කැමැතියි.

අපි හැම කෙනකුම පුංචි කාලයේ පොල් වගාව සම්බන්ධව, පොල් ගස ගැන රචනා ලියලා තිබෙනවා. "පොල් ගස වනාහි තාල වර්ගයට අයත් ගසකි" කියලා පටන් අරගෙන පොල් ගසෙන්,

[ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා]

ගෙඩියෙන්, මදයෙන්, පොල් කටුවෙන්, පොල් ඉරටිටෙන්, පොල් කෙන්දෙන්, පොල් පිත්තෙන් මේ හැම දෙයකින්ම ගන්නා ප්‍රයෝජන ලියලා පොල් ගසෙන් ඉවත දමන්න කිසි දෙයක් නැති නිසා "පොල් ගස කප්රුක ලෙසද හඳුන්වයි" කියලයි රචනාව අවසන් කළේ. මේ ගැලරියේ සිටින හැම දරුවකුටම වාගේම අපටත් එය මතකයි. ඒ නිසා මේ පොල් ගස අපට නැතිවම බැරි ගසක්. විශේෂයෙන් අපේ රටේ සියයම 99ක්ම පොල් පරිභෝජනය කරනවා. ඉදිරියට මේ පොල් ගස ආරක්ෂා කරන්න අපව උනන්දු කරමින්, ඒ සඳහා අපව දිරිමත් කරමින් මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කළ ගරු අස්වර් මන්ත්‍රීතුමාට අපේ කෘතවේදීත්වය පුද කරමින් මේ වැඩසටහන සාර්ථක කර ගන්න දැවැන්ත ශක්තියක් වූ අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ටත් අපේ අමාත්‍යාංශය යටතේ පවතින පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම, සීමාසහිත හලාවත වැවිලි සමාගම වැනි ආයතනවල ප්‍රධානීන් ඇතුළු සියලුම කාර්ය මණ්ඩලවලටත් අපේ ස්තුතිය පුද කරනවා.

අතිගරු ජනාධිපතිතුමා ඉතාමත් අභියෝගාත්මක අවස්ථාවක මේ අමාත්‍යාංශය බිහි කරලා මා කෙරෙහි විශ්වාසයක් තබා ඒ වගකීම මට භාර දුන්නා. ඒ වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, අපේ සහෝදර අමාත්‍ය මණ්ඩලයේ සියලු දෙනාටමත්, මේ රටේ මුළුමහත් ජනතාවටත් ස්තුතිය පුද කරන අතර, මේ වැඩසටහන සඳහා සාර්ථක අදහස්, හොඳ අදහස් ඉදිරිපත් කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටත් ස්තුතිය හා ගෞරවය පළ කරමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාවේ කටයුතුවලට අදාළව ඉදිරිපත් කරන්න තිබෙන පනත් කෙටුම්පත් ප්‍රමාණය සභාවේ කටයුතු අවසන් වෙන්න කලින් සභාගත කරන්න පක්ෂ නායක රැස්වීමේදීත් එකඟතාවට පත් වෙලා තිබෙනවා. ගරු සභා නායකතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ සිටින නිසා සභාව කල් තැබීමේ අවස්ථාවට පෙර මා නැවත දැන ගන්න කැමැතියි, න්‍යාය පත්‍රයේ සඳහන් වන ඒ පනත් කෙටුම්පත් 21 මේ ගරු සභාවට සභාගත කරනවාද කියලා. මොකද, නීතිමය අවශ්‍යතාවක් වුණොත්, දින 07ක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට යාමේ අවස්ථාවක් ඒ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් තිබෙනවා නම්, ඒ අවස්ථාව අදින් පස්සේ නැති වෙනවා. අද -සිකුරාදා- තමයි අවසාන දිනය. ඉදිරි දින හත තුළ පාර්ලිමේන්තුව රැස් වන්නේ නැහැ. එම පනත් කෙටුම්පත් න්‍යාය පුස්තකයට ඇතුළත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්කෝ න්‍යාය පුස්තකයෙන් ඒවා ඉවත් කර ගන්න ඕනෑ. එහෙම නැත්නම් එම පනත් කෙටුම්පත් මේ ගරු සභාවට සභාගත කරන්න ඕනෑ. අද දවසේ සභාවේ කටයුතු අවසන් කරන්න කලින් ඒ කටයුත්ත සිද්ධ වෙනවාද කියලා මා දැන ගන්න කැමැතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Leader of the House.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින පක්ෂ නායක රැස්වීමේදී අපි සියලුම පක්ෂ නායකයින්ට ඒ පනත් කෙටුම්පත් ලබා දුන්නා. ඒවා විවාද කිරීම සඳහා නියමිත දින අපි නියම කර ගත්තා. ඒ නිසා මා හිතන්නේ නැහැ මෙතුමා කියන විධියේ ප්‍රශ්නයක් ඇති වේවි කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අඩු පාඩුවක් තිබෙනවා නම් අද දවස ඇතුළත ඒ ටික ඔබතුමා වෙත එවීමට අපි ලේකම් කාර්යාලයට උපදෙස් දෙන්නම්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය මගේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. මේ පනත් කෙටුම්පත් සභාගත කරන්න ඕනෑ. නැතිව පක්ෂ නායක රැස්වීමේදී දෙන එක නොවෙයි ස්ථාවර නියෝගවල ක්‍රමය. ඒ වාගේම ඒ ගැන මම කථා කරන කොට මට දෙන එකයි, තව කෙනෙක් කථා කරන කොට ඒ කෙනාට දෙන එකයි සභා සම්මත ක්‍රමය නොවෙයි.

ස්ථාවර නියෝගවල ක්‍රමය ඒක නොවෙයි. ඒ නිසයි මම මේ ප්‍රශ්නය මතු කරන්නේ. පක්ෂ නායක රැස්වීමේදී එකඟ වුණේ පක්ෂ නායකයින්ට බෙදා දෙන්න නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාගත කරන්නයි. න්‍යාය පුස්තකයේ තිබෙනවා නම් එය නීතියක් බවට පත් වෙන්නේ සභාගත කිරීමෙනුයි. එහෙම නැතිව පෞද්ගලිකව මන්ත්‍රී කෙනෙකුට ලබා දීමෙන් නොවෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම ඒ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. පක්ෂ නායක රැස්වීම කියන්නේ පාර්ලිමේන්තුව නොවෙයි. පක්ෂ නායක රැස්වීමට ආවේ නැති මන්ත්‍රීවරුන් විශාල පිරිසක් ඉන්නවා. මම ඒ වෙලාවේ මහලේකම්තුමාගෙන් ඇහුවාම මහලේකම්තුමා කිව්වා, අද අපට ලැබෙන්න සලස්වනවාය කියා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ජනතාවට අවස්ථාවක් ලබා දෙන එක හොඳයි. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යන්න අවසර තිබෙන්නේ රටේ පුරවැසියන්ටයි. රටේ පුරවැසියන්ට මේ පනත් කෙටුම්පත්වල අන්තර්ගත ප්‍රතිපාදන අධ්‍යයනය කරලා අවශ්‍ය නම් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගිහිල්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කර ගන්න අවස්ථාව දෙන්න ඕනෑ. ඒ නිසා පෞද්ගලික මට්ටමෙන් කෙටුම්පතේ ඡායා පිටපතක් දුන්නාය කියන එක මේ ප්‍රශ්නයට විසඳුමක් නොවෙයි. අනෙක් අතට මේකෙන් පෙනෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි වැදගත් පනත් කෙටුම්පත් 21ක් පිළිබඳව සූදානමක් නැහැ කියන එක. මාර්තු 31 දිනය ගැන බලාගෙනයි මේ වැඩ කරන්නේ. අය වැය සම්මත කරලා මාස හතරක් වෙනවා. ඉතින් මේක ලොකු ප්‍රශ්නයක්. රටේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු කථානායකතුමා මේ ස්ථානයේදී පොරොන්දු වුණා, අද සභා කටයුතු අවසන් වීමට කලින් ඒ පනත් කෙටුම්පත් ටික ලබා දෙනවාය කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ වෙලාවේදී එක පාරට ඒ ගැන මොකුත් කියන්න බැහැ. ලේකම් මණ්ඩලය සමඟ සාකච්ඡා කරලා ඒ ගැන සොයා බලා මන්ත්‍රීවරුන්ට සහ ජනතාවට ඒ අවස්ථාව ලැබෙන පරිදි අපි කටයුතු කරන්නම්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Hon. Alhaj A.H.M. Azwer, please.

[අ. භා. 5.14]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
දේශයේ කප් රුක පොල් ගස කියනවා වාගේම මම හිතනවා, මැති ඇමතිවරුන්ගේ කප් රුක ගරු ජගත් පුෂ්පකුමාර ඇමතිතුමාය කියා. මම එතුමා ගැන එහෙමයි වර්ණනා කරන්න කැමැතියි. එතුමා ඒ තරම් කඩිසරව විශාල වැඩ කොටසක් ඉටු කරනවා. වැටී තිබුණු පොල් කර්මාන්තය නැගිට්ටුවන්න වෙර දරන, වීර්යයක් ඇති, ශක්තියක් ඇති, බුද්ධිමත් ඇමතිවරයෙක්ය කියා මම මේ සභාවේදී එතුමා ගැන කියන්න සන්තෝෂයි.

මා ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කිරීම ගැන ගරු මන්ත්‍රී ජේ.ආර්.පී. සූරියප්පෙරුම ශ්‍රීමතාණන්ට මා ස්තුතිවන්ත වෙනවා. ඒ සමඟම හොඳ අදහස් පළ කළ ගරු අජිත් පී.පෙරේරා මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

උතුරට-තල් රුප්පාව; දකුණට-පොල් රුප්පාව; නැඟෙනහිරට - රට ඉඳි රුප්පාව. මොකද, නැඟෙනහිර පළාතේ කාත්තන්කුඩිය ප්‍රදේශයේ එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා නියෝජ්‍ය ඇමතිතුමාගේ නායක්වයෙන් රට ඉඳි වගා කර ගෙන යන බව මා ඉතා සන්තෝෂයෙන් මේ සභාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි. දැන් ඒවායින් අස්වැන්නත් ලැබෙනවා. පාරේ යන මිනිස්සුන්ටත් කඩා ගෙන යන්න පුළුවන් විධියට තමයි මහ පාර මැද්දේ ඒවා වගා කරලා තිබෙන්නේ. මා මේ පිළිබඳව තවත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එය න්‍යාය පුස්තකයේත් පළ වෙලා තිබෙනවා. රට ඉඳි වගාව සංවර්ධනයටත් පියවර ගන්නය කියා මා ගරු කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

Mr. M.M. Mahusoon and Mr. P. Sivarajah of the Faculty of Agriculture of the Eastern University have stated: “A field survey was conducted in the districts of Kurunegala and Puttalam in the 'Coconut Triangle', to study the goat production systems in the area and the problems faced. A random sample of 150 goat farmers, from 5 villages in the two districts, were interviewed using a structured questionnaire”. They have further stated, "These farms differed in resource characteristics. Women are more involved in rearing of goats”.

When we talk of the usefulness of women, domestically and also in cottage industry, I should like to remind you, Sir, in this House that I am wearing a badge in my lapel today. ඒක ජාත්‍යන්තර කාන්තා දිනය පිළිබඳ badge එක. අද උදෑසන අරලියගහ මන්දිරයේදී මේ පිළිබඳව ලොකු උත්සවයක් තිබුණා. ඒ පිළිබඳව දේශනයකුත් තිබුණා. The Director General of the Civil Security Department, Rear Admiral Ananda Peiris informed me at this meeting that about 650 acres of coconut plantation is now being cultivated in the Vavuniya and Kilinochchi Districts.

At the International Women’s Day Ceremony held at Temple Trees today, some of the rehabilitated LTTE cadres - nearly 3,600 have now been rehabilitated - came there and gave a dance performance. It was very beautiful and well– appreciated Sir, by all present.

I also want to mention, Sir, what Prof. Kshanika Hirimburegama said at this function.

"ජනාධිපති ආර්යාව සියලුම කාන්තාවන්ට ආදර්ශයක්. කාන්තාවක් වශයෙන් ඇයගේ ඉවසිලිමත්බව හා කාරුණිකව, නිහඬව තම ස්වාමිපුරුෂයාට සහ පුතුනට පවුල් ශක්තියක් ලබා දෙමින් හා ඒ අතරම ළඳරු අධ්‍යාපනය තුළින් රටෙහි දරුවන්ට ද කළ සහ කරනා සේවය අතිමහත්ය. පවුල් ඒකකය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලාංකික කාන්තාවන්ට තමන්ගේ අභියෝග ජය ගෙන ඉදිරියට යාමට ශක්තිය ඇත. ලෝකයේ ප්‍රථම අගමැතිවරිය වූයේද ශ්‍රී ලාංකික කාන්තාවකි" යනුවෙන් ඉතා සාරගර්භ දේශනයක් කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිනී මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මහත්මිය කියා සිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ජාත්‍යන්තර කාන්තා දිනය සමරන්නට එතැනට ගියත් පොල් ගස ගැන තමයි අපට අසන්නට සිද්ධ වුණේ.

මෙහිදී කාන්තාවගේ හෙවත් මවගේ කාර්ය භාරය අතිමහත්ය. ශ්‍රී ලාංකික කාන්තාවනට අද දවසේ ඇති ප්‍රධානතම අභියෝගයන්ද තම පවුල මඟින් අනාගත පරම්පරාව නිවැරැදි ආකල්ප සහිතව ඉදිරියට ගෙන යන්නේ කෙසේද යන්න වේ. මේ තත්ත්වය අන් අය යටතේ සිටින කෙනෙකු තම අයිතිවාසිකම් ඉල්ලමින් බැඟෑපත් වීම ලෙස නොව, බලය සහිත අයෙකු තම යුතුකම් ඉටු කරන ආකාරය සහ යුතුකම් ඉටු කර තමා සතුටු වීම හා සමාන තත්ත්වයකි. ශ්‍රී ලාංකීය පවුල නිවැරැදි මහට ගතහොත් අප මවුබිම "ආසියාවේ ආශ්චර්යය" බවට ඉතා ඉක්මනින් පත් කළ හැකි වන බව එහිදී තවදුරටත් අදහස් පළ කරමින් ක්ෂණිකා හිරිඹුරේගම මහත්මිය කියා සිටියාය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොල් ගස ගැන විවිධ මතිමතාන්තර තිබුණා. It is about *Pol Sambol*. Who spread this *durmathaya* -දුර්මතය -කියන එක මම ගරු ඇමතිතුමාගෙන් අහනවා. ඒක කවදා හරි එතුමා හෙළි කරන්න ඕනෑ. මොකද Prof. H.M.P. Gunasena, Chairman of the Coconut Research Institute explains this, which is very useful. එදා කිව්වා පොල් සම්බෝල කෑවොත්, පොල්තෙල් භාවිත කළොත් කොලස්ටරෝල් හැදෙනවාය කියලා. එය මොන තරම් දුර්මතයක්ද කියන එක-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have been allotted only five minutes and you must conclude now.- [*Interruption.*]

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු මන්ත්‍රීතුමනි, මම කාරණයක් කියන්නද?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔව්, කියන්න ගරු ඇමතිතුමනි.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට අදාළව මම එක කාරණයක් කියන්න ඕනෑ. ඇමෙරිකාවේ විශ්වවිද්‍යාලවල විද්‍යාඥයින් පර්යේෂණ කර තිබෙනවා. එහිදී හෙළිවී තිබෙනවා මේ පොල් තෙල් භාවිතය Alzheimer's රෝගයට ඉතාම හොඳයි කියලා. පොල් තෙල්වලින් හොඳ මතක ශක්තියක් ඇති වෙනවාය කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
පෙරදිග ලෝකයේ කවුරු හරි පොල් සම්බෝල හොඳ නැහැය කියලා කිව්වාම අපිත් මෙහේ ඒකම කියනවා. මොන තරම් මිථ්‍යාවක්ද අප මේ රටේ පිළිපදින්නේ කියන එක මහාචාර්ය එච්.පී.එම්. ගුණසේන මහත්මයා අපට අපට දැන් හොඳින් අවබෙ ෝධ කර දෙනවා:

> "The Science Faculty of the University of Kelaniya, the Medical Faculty and the Coconut Research Institute conducted many research projects on the use of coconut oil for food and the impact of them on people's health. That research revealed that coconut oil could be used to treat many ailments of humans.
>
> No additives are used in manufacturing food products form coconut oil. Some times, aromatics are added to coconut oil but that causes no harm."

So, he has taken away our fear in the use of coconut oil. Also I must say -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Thank you.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I will finish, Sir. Just give me one more minute.

Eastern Provinceවල, අපේ ෆයිසාල් කාසිම් මැතිතුමා මේ පොල් සංවර්ධන කාර්යයේ යෙදී තිබෙන බව අපේ හසන් අලි මන්ත්‍රීතුමා මට මතක් කළා. එතුමා මුස්ලිම් කොංග්‍රසයේ ලේකම්තුමා. ඔලුවිල් ප්‍රදේශයේ coir industries තිබෙනවා. කඹ හදනවා. නැහෙනහිර පළාතේත් පොල් තිබෙනවා. උතුරේ කයිට්ස් වැනි දූපත්වලත් තල් සමඟ පොල් වැවෙනවා. තමුන්නාන්සේ ඉන්නා වූ කන්ද උඩරට තේ වැවිවත් ඒ ඒ තැන්වලත් පොල් ගස් වගා කරනවා.

අපේ ශුද්ධ නබිනායකතුමාත් කියා තිබෙනවා, මොකක් හරි ප්‍රයෝජනයක් වෙනුවෙන් ගහක් කැපුවොත්, ගහක් විනාශ කළොත් තවත් ගසක් වැවිය යුතුය කියලා. ගරු ඇමතිතුමනි, අන්න ඒ ආදර්ශය තමයි අප ගත යුත්තේ. ගෙවල් හදන කොට, නව නිවාස සංකීර්ණ හැදෙන විට ඒ ඒ ස්ථානවල පොල් ගස් සිටුවන්නය කියලා ගරු ඇමතිතුමා යෝජනාවක් ගේන්න ඕනෑ. ඒක ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ ඉතාමත්ම ප්‍රයෝජනවත්, කාලීන විෂයකට අදාළ අමාත්‍යාංශය කාර්ය ශූර, බුද්ධිමත්, තරුණ නායකයෙකුට පවරා තිබීම ගැන මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. එපමණක් නොවෙයි. එතුමාගේ පිළිතුරු කථාවෙන් අපට හොඳටම උකහා ගන්නට පුළුවන් වුණා එතුමා ජාතිය වෙනුවෙන් අති විශිෂ්ට සේවයක් ඉටු කරනවා කියන කාරණය. එහෙම නම් අතිගරු ජනාධිපතිතුමාගේ පැතුම, බලාපොරොත්තුව එයින් මනාව ඉෂ්ට වෙනවා කියන කාරණයත් මතක් කරමින්, මූලාසනය හොබවන ඔබතුමාට සහ මේ යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ සියලුම මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. පොල් ගස වැවේවා! තල් ගස වැවේවා! රට වැවේවා! එසේ ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Now, Motion No. 4 is to be moved by the Hon. Thilanga Sumathipala. He is not here.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙම ගරු සභාවට වාර්තා කරන්නට කැමැතියි, පාර්ලිමේන්තුවේ මහ ලේකම් මණ්ඩලය විසින් මා හට ප්‍රකාශ කර ඇති පරිදි ඉදිරි දිනවලදී සාකච්ඡාවට ගැනීමට නියමිත පනත් කෙටුම්පත් මේ වන විට ලැබී තිබෙන බව. අපි එම පනත් කෙටුම්පත් ටික මේ අවස්ථාවේදී සියලුම මන්ත්‍රීවරුන් වෙත බෙදා දීමට කටයුතු කරනවා.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින පක්ෂ නායක රැස්වීමේදී ගන්නා ලද තීරණය පරිදි මෙම ගරු සභාව 2013 මාර්තු මස 19 වන දින පෙර වරු 9.30 දක්වා කල් තැබිය යුතු යයි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

දළදා මාළිගාව ආසන්නයේ ඇති සුරා සැල් ඉවත් කිරීම

தலதா மாளிகைக்கு அருகிலுள்ள மதுபானசாலைகளை அகற்றுதல்

REMOVING OF LIQUOR SHOPS IN PROXIMITY TO DALADA MALIGAWA

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"දළදා වහන්සේ වැඩ සිටින්නා වූ ඓතිහාසික සෙංකඩගල නගරයේ නීත්‍යානුකූල වුවත්, දළදා මාළිගාව ආසන්නයේ සුරා සැල් ස්ථාපිත කර තිබීම දළදා වහන්සේට මෙන්ම මහානායක ස්වාමීන් වහන්සේලා ඇතුළු මහා සංඝරත්නයටද බලවත් අපහාසයක් වන හෙයින් මෙම සුරා සැල් ඉවත් කරන ලෙස ජාතික සංඝ සම්මේලනය ඉල්ලීමක් කර ඇති බැවින් අවශ්‍ය පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කර අදාළ සුරා සැල් වසා දැමීමට රජය විසින් පියවර ගත යුතු යැයි මේ ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1815 බ්‍රිතාන්‍ය හමුදා සමඟ කන්ද උඩ රටට ආපු ජෝන් ඩොයිලි මහත්මයා සඳහන් කරනවා කන්ද උඩ රට පළාත්වල මද්‍යසාර අඩංගු එකම සුරා සැලක්වත් තිබුණේ නැහැ කියලා. ඔහු පවසන ආකාරයට මද්‍යසාර අඩංගු සුරාව පාවිච්චි කිරීම කොතරම් දරුණු අපරාධයක්ද කියලා කිව්වොත් උඩ රට නීතිය අනුව මුළු උඩ රට ප්‍රදේශය පුරාම රජතුමාගේ අණසකට යටත්ව ජනතාවට දැනුම් දීලා තිබෙනවා මද්‍යසාරය පාවිච්චි කිරීමේ ඵල විපාක ගැන. ඒ වාගේම විශේෂයෙන්ම මහනුවර දළදා මාළිගාව අබියස මද්‍යසාර භාවිත කර කෝලාහල කරන පිරිස් රජතුමා ඉදිරියට ගෙනැත් රජතුමා විසින් දඬුවම් දීලා තිබෙනවා. විශේෂයෙන්ම සිංහල රාජ නීතිය අනුව ඒ කාලයේ කන්ද උඩ රට පළාත්වල සුරා සැල් තහනම් කරලා තිබෙනවා. කන්ද උඩ රට රාජධානිය -ශ්‍රී ලංකාවේ භූමි තලයෙන් සියයට 70ක්- පාලනය වුණේ මහනුවර රජතුමා යටතේ. විශේෂයෙන් උතුරුකරයේ යාපනය දිස්ත්‍රික්කය ඇතුළු සියයට 30ක් පමණ තමයි යුරෝපීය ජාතීන් යටතේ පාලනය වුණේ. ජෝන් ඩොයිලි මහත්මයා කියනවා, මහනුවර රජතුමා යටතේ පාලනය වුණු මේ සියයට 70 භූමි ප්‍රමාණය තුළ එකම සුරා සැලක්වත් තිබුණේ නැහැ කියලා. නමුත් විශේෂයෙන්ම 1815න් පසුව, 1818 කැරැල්ල ඇති වුණා; 1848 කැරැල්ල ඇති වුණා. ඒ අනුව 1848න් පසුව උඩ රට පළාත් තේ කර්මාන්තයට හා කෝපි කර්මාන්තයට විවෘත වෙන්න පටන් ගත්තා. යුරෝපීය ජාතිකයින් පමණක් නොවෙයි ව්‍යාපාරිකයින් විශාල පිරිසක් සුරා සැල් විවෘත කරන්න කන්ද උඩ රට පළාත්වලට ආවා. අද කවුරු මොනවා කිව්වත් විශාල ආදායමක් ලැබෙන ව්‍යාපාරයක් තමයි මේ සුරා සැල් කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ යෝජනාවෙන් මා විශේෂයෙන්ම අවධානය යොමු කරවන්නේ මහනුවර හරස් වීදි - cross streets - ගැනයි. ඔබතුමා මහනුවර ඉගෙන ගත් කෙනෙක්. මහනුවර හරස් වීදි ගැන ඔබතුමා දන්නවා. කොළඹ වීදිය, යටිනුවර වීදිය, කොටුගොඩැල්ල වීදිය, වඩුගොඩපිටිය විදිය, දේව වීදිය යන මේ හරස් වීදිවල මත්පැන් අලෙවිය සඳහා එස්එල්11 කියා ලයිසන් එකක් තිබෙනවා. ඒ කියන්නේ, එතැනම බෝතල් කඩලා, එතැනම වීදුරුවට වත් කරලා, එතැනම ඉඳගෙන පානය කරන්නට පුළුවන්. සාමාන්‍යයෙන් සවස පහමාරෙන් හයෙන් පස්සේ මේ හරස් වීදිවල ඇවිදින කොට දකින්නට තිබෙන මෙය ඉතාමත් අභෝභන දර්ශනයක්. මහනුවර නගරයේ හරස් වීදිවල විතරක් මා හිතන්නේ එස්එල්11 වර්ගයේ සුරාසැල් විසිපහක් තිහක් විතර තිබෙනවා. නගරය ආශ්‍රිතව පවත්වන මේ සුරාසැල් නීත්‍යානුකූල සුරාසැල්. සුරාබදු පනත අනුව සුරාබදු කොමසාරිස්තුමා මේවාට අවසර දී තිබෙනවා. එම නිසා පාර්ලිමේන්තුවට අලුත් පනතක් ගෙනැවිත් විශේෂයෙන් මේ හරස්වීදිවල තිබෙන සුරාසැල් වහන්න යම් කිසි පියවරක් ගන්නා ලෙස මා රජයෙන් ඉල්ලීමක් කරනවා.

මහනුවර නගරය කියන්නේ, ලෝක උරුම නගරයක්. මේ රටේ සියයට හැත්තෑපහක් ඉන්නේ බෞද්ධයෝ. ඒ වාගේම අපේ දළදා වහන්සේ වැඩ සිටින නගරය. බෞද්ධයන් පමණක් නොවෙයි, මේ හරස් වීදිවල ක්‍රිස්තියානි ආගමික ස්ථානත් තිබෙනවා. හින්දු ආගමික ස්ථානත් තිබෙනවා. ඒ වාගේම මුස්ලිම් ආගමික ස්ථානත් තිබෙනවා. මා කලින් කිව්වා වාගේ මේ හරස් වීදිවලට පුද්ගලයෝ මත්පැන් බොන්න ගියාම එතැනම බෝතල් කඩලා එතැනම වීදුරුවට වත් කරලා දෙනවා. මේක අශෝභන දර්ශනයක්. මහනුවර නගර සීමාව තුළ සංචාරක හෝටල් ගණනාවක් තිබෙනවා. අවශ්‍ය පුද්ගලයන් එක්ක සාකච්ඡා කර, මහනුවර නගරය විනීත නගරයක් කරන්න ක්‍රියාත්මක වන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා

(மாண்புமிகு அஜித் பீ. பெரேரா)

(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම සුවිශේෂී වැදගත්කමකින් යුතු, කාලීන යෝජනාවක් ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙනවා. අප බෞද්ධයින් හැටියට බෞද්ධාගමේ ශ්‍රී ලාංකික සංකේතයක් වන දන්ත ධාතූන් වහන්සේ කෙරෙහි ඉතාම ගැඹුරු හැඟීමෙන් යුතු භක්තියක්, ගෞරවයක් තිබෙනවා. ඒ ආසන්න ප්‍රදේශයේම ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගමික දේවස්ථානත් දීර්ඝ කාලයක් කිස්සේ පවතිනවා. අපේ රටේ ඉතාම සුප්‍රකට ආගමික සිද්ධස්ථානයක් හැටියට විතරක් නොවෙයි, අපේ රටේ ජනතාවගේ හැසිරීම, ජනතාවගේ ස්වභාවය, ජනතාවගේ ආචාරධර්ම පිළිබඳ පැහැදිලි කඩක් විධියට අපට මහනුවර නගරය, දළදා මාළිගාව සහ ඒ අවට ප්‍රදේශය දක්වන්නට පුළුවන්. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ඉතාමත්ම වටිනා යෝජනාවක්.

අනෙක් කාරණය, මේ යෝජනාවට ඉඩ නොදී ඉන්නට මේ ආණ්ඩුවට කිසිම ප්‍රශ්නයක් තිබෙන්නට බැහැ; කිසිම ගැටලුවක් තිබෙන්නට බැහැ. මේ ආණ්ඩුව මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළින් "මතට නිත" ප්‍රතිපත්තියක් හැටියට ඉදිරිපත් කර තිබෙනවා. මතට නිත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන විට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනිවාර්යයෙන්ම මේ රටේ මිනිස්සු පානය කරන මත්පැන් ප්‍රමාණය අඩු විය යුතුයි; මේ රටේ මිනිස්සු පාවිච්චි කරන දුම්වැටි ප්‍රමාණය අඩු විය යුතුයි. ඒක තමයි මතට නිත කියා කියන්නේ. ඒ වාගේම මේ රටේ ඉහළම ධුරය දරන තැනැත්තාගේ සිට, විෂය භාර අමාත්‍යවරයාගේ සිට සියලු දෙනාම, "මතට නිත තබන්න අප ලැහැස්තියි, මම බොන්නේත් නැහැ, අපට බොන්න ඕනෑත් නැහැ" කියන එක මේ සමාජයට පෙන්වා දිය යුතුයි.

මත -මත්පැන්- ඒ වාගේම දුම්වැටි සහ අනෙකුත් සියලුම මත්ද්‍රව්‍ය කියලා කියන්නේ මේ රට විනාශය කරා අරගෙන යන, මේ රටේ අනාගතය විනාශය කරා අරගෙන යන දේවල්. ඒ නිසා අපි ඔක්කොම එකතු වෙලා මතට නිත තබමු. නමුත් අවසානයකට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවටම ඉදිරිපත් වුණු සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම් කරන්නේ මහින්ද චින්තන වැඩ පිළිවෙළේ මහිමය නිසා, ආසියාවේ ආශ්චර්යය නිසා අද වන විට අපේ රටේ භාවිතා කරන මත්පැන් ලීටර් ප්‍රමාණය මතට නිත යටතේ එන්න එන්න වැඩි වෙලා තිබෙන බවයි. මේ අවස්ථාවේ විෂය භාර නියෝජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එහෙම නොවෙයි නම් එතුමාට පැහැදිලි කරන්න පුළුවන්. ඔබතුමාට පැහැදිලි කරන්න පුළුවන්ද, මතට නිත යටතේ මේ රටේ භාවිතා කරන මත්පැන් ලීටර් ප්‍රමාණය ආණ්ඩුවේ සංඛ්‍යා ලේඛන අනුව වැඩි වෙලා තිබෙන්නේ කොහොමද කියා. ඒ වාගේම පාවිච්චි කරන දුම් වැටි ප්‍රමාණයත් විශේෂයෙන් අඩුවක් නොවී තවදුරටත් සැලකිය යුතු ඉහළ මට්ටමක පවතිනවා. ඒ වාගේම රජයේ දේශපාලනඥයන්ගේ අනුග්‍රහය ලබමින් හෙරොයින් ජාවාරම්කරුවෝ, ගංජා ජාවාරම්කරුවෝ-ගංජා වගාකරුවෝ- අද මේ රටේ සෑම ප්‍රදේශයකම කටයුතු කරනවා. ඒ අය රජයේ අනුග්‍රහය ලබනවා. ඒ නිසා අද මතට නිත නොවෙයි, නිතට මත වෙලා තිබෙනවා. අරලිය ගහ මන්දිරයේ ඉඳලා අද මත්පැනින් සංග්‍රහ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -[බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Hon. Alhaj A.H.M. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒක අභූත චෝදනාවක්. අරලිය ගහ මන්දිරයේ පැත්ත පළාතට ඒ මොනවාවත් ගෙනෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා කථා කරන විට ඒ ගැන සඳහන් කරන්න.[බාධා කිරීමක්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාට මම කියන්නම්. [බාධා කිරීමක්] පසු ගිය ජනාධිපතිවරණ දෙකේදිම -මම නීතිඥවරයෙක්- නීතිඥවරුන් අරලිය ගහ මන්දිරයට ගෙනැවිත් මත්පැනින් සංග්‍රහ කළා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඇයි, සිරිකොත?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
සිරිකොතේ මත්පැන් දෙන්නේ නැහැ. කවුද දුන්නේ?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
තමුන්නාන්සේගේ නායකයා. [බාධා කිරීමක්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
විහිළු කථා කියන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අරලිය ගහ මන්දිරයේදී නීතිඥ මහත්වරුන්ට මත්පැනින් සංග්‍රහ කළා. මම මේ ගැන සාක්ෂි දරන්නම්. ඕනෑ නම් ඔප්පු කරන්නම්. මම වගකීමෙන් කියන්නේ. අපි ආදර්ශයෙන් මතට තිත තැබිය යුතුයි. ඇත්තටම මතට තිත තබන්න ඕනෑ නම් අපි දළ දා මාලිගාව අවට පරිශ්‍රයෙන් පටන් ගෙන ඒ ප්‍රදේශයට අදාළ හරස් විදිවල තිබෙන මත්පැන්හල් වසා දැමීමට අවංකව කටයුතු කළ යුතුයි. බෞද්ධකම හදවතේ තිබෙනවා නම්, බෞද්ධ ධර්මයේ මූලධර්මයන් විශ්වාස කරනවා නම්, පාර්ලිමේන්තුවට ජනතාවට බොරු කියන්නේ නැත්නම් අපි මෙම මත්පැන්හල් වසා දැමීමට කටයුතු කළ යුතුයි; අවංකව කටයුතු කළ යුතුයි. බොහොම ස්තුතියි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Bismillahir Rahmanir Raheem.

Sir, I am happy and thankful to my good old Friend, who is a Friend even now, for moving this Motion in the House. I totally agree with all the suggesstions made and the sentiments he expressed in the House.

"සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි". ඉතාම ප්‍රත්‍යක්ෂව අපට වැටහෙනවා, සුරා පානය කරන්න නරකයි කියා. සමහර රටවල කුඩු ගේන විට බෙල්ල කපා දමනවා; මරණ දණ්ඩනය දෙනවා. අරාබි රටවල පමණක් නොවෙයි. ඕස්ට්‍රේලියානුවෝ දෙදෙනෙක් කුඩු අරගෙන ගිහින් මැලේසියාවේදී අහු වුණා. ඒ අයට මරණීය දණ්ඩනය නියම කළා. ඕස්ට්‍රේලියානු ආණ්ඩුව බලගතු ආණ්ඩුවක්. නමුත් කොතෙක් කීවත් ඒකට සවන් දුන්නේ නැහැ, මැලේසියාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහනුවර පමණක් නොවෙයි. අපි ඉතාමත්ම භක්ති පූර්වකව සඳහන් කළ යුතුයි, -මෙනෙහි කළ යුතුයි- මීරා මක්කම් පල්ලිය ගැන. තමුන්නාන්සේ ඒ ගැනත් සඳහන් කළා. එදා ඒ පල්ලිය වෙනුවෙන් ඉඩකඩම් දුන්නේ සිංහල රජවරුයි කියන එක මේ රටේ මුස්ලිම්වරුන් කවදාවත් අමතක කර නැහැ. ඒ වාගේම තමයි පෘතුගීසීන් ඇවිත් මුහුදුකරයෙන් මුස්ලිම්වරුන් පලවා හැරි විට ඒ ගොල්ලන් සංක්‍රමණය වුණේ කන්ද උඩරටටයි. එකකොට ඒ.සී.එස්. හමීඩ් මහත්මයාට "ගේ" නමක් තිබෙනවා. අනෙක් අයටත් "ගේ" නම් තිබෙනවා. "අදින බිඳින කපන කොටන රාජමුහන්දිරම් අහමද් ලෙබ්බේ" කියා නමකුත් ව්‍යවහාර වෙනවා. ඒ වාගේම තවත් වාසගමක් තිබෙනවා. ඒක හරියට මෙතැන පැහැදිලි නැහැ. මම ඒක පසුව කියන්නම්. මේ වාගේ හොඳ සංස්කෘතික අඩිතාලමක් දැමුවා.

රජ පවුලේ අය මුස්ලිම්වරු විශ්වාස කළා. ඒගොල්ලන් නාඩි අල්ලලා තමයි රජ පවුලට වෙදකම් කළේ. දළ දා මාළිගාව ළඟ පමණක් නොවෙයි, දැන් බෙරුවල ඇතුළු අනිකුත් තැන්වලත් සුරාසැල් තිබෙනවා. බුද්ධ ශාසනය ආරක්ෂා කර පෝෂණය කරන බවටත්, අනික් ආගම්වල සංස්කෘතිය, සභ්‍යත්වය, ඇදහීම තහවුරු කරන බවටත් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් -Constitution එකෙන්- කියැවෙනවා. එපමණක් නොවෙයි, අද තිබෙන නීතිය අනුව පල්ලි, පන්සල්, කෝවිල් වාගේ ස්ථානවලට මීටර් 500කට එහායින් තමයි සුරාසැල් තිබිය යුත්තේ. ඒ නීතිය අප අනුගමනය කළොත් මේ ප්‍රශ්නය මතු වෙන්නේ නැහැයි කියන කාරණයයි මා කියන්නේ.

මා තව කාරණයක් තමුන්නාන්සේට මතක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ජාතික නායකයෙක් වාගේම විශාරද අධ්‍යාපනඥයෙක් තමයි එදා හිටපු ආචාර්ය ටී.බී. ජායා මැතිතුමා. එතුමා ගැන තමුන්නාන්සේ දන්නවා. එතුමා හුඟක් කාලයක් All-Ceylon Muslim League එකේ සභාපති වශයෙන් සේවය කළා. අගනා සේවයක් රටටත් කළා; ජාතියටත් කළා; තමන්ගේ සමූහයටත් කළා. මාත් එවකට All-Ceylon Muslim League එකට බැඳුණු අලුත් -නවක- සාමාජිකයෙකු වශයෙන් ඒ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ඉන්න කොට පිටකොටුවේ ඉඳලා අපේ අයෙක් වතුර බෙසමක් අරගෙන ආවා. එහි බුද්ධ රූපය ඇඳලා තිබුණා. ඔහු කිව්වා, "සර්, මේවා පිටකොටුවේ විකුණනවා"ය කියලා. එතැන හිටපු සමහර සාමාජික මහත්වරු කිව්වා, "ඒ ගොල්ලන් මොකක් හරි ජාවාරමක් කරනවා නේ ඉතින් මොකද?" කියලා. ආචාර්ය ජායා මැතිතුමා තිගැස්සුණා. එතුමාට හොඳට අවබෝධ වුණා, මේක විකුණන්නට ඉඩ දෙන්න බැහැ කියන කාරණය.

සමහර විට පදික වේදිකාවල මුස්ලිම්වරුන් බඩු -චතුර බෙසම්- විකුණන්නට පුළුවන්. ඒකෙන් ලොකු ඇබැද්දියක් ඒ සමූහයාට සිදු වීම වැළැක්වීමට ලියුමකුත් ලියලා, ඒ බෙසමත් ජායා මහතා මගේ අතට දුන්නා. මා හිතන හැටියට අද විජයරාම මාවතේ තමයි ඒ.පී. ජයසූරිය මැතිතුමා වාසය කළේ. එතුමා එදා Minister of Home Affairs ඇමතිතුමා. එතුමාට ගිහිල්ලා දෙන්නය කිව්වා. වහාම පොලීසියට හා ආරක්ෂක නියෝජිතයන්ට නියෝග කර ඒ භාණ්ඩය අලෙවි කිරීම නැවැත්තුවා. ආචාර්ය ජායා මැතිතුමා, දොස්තර එම්.සී.එම්. කලීල් මැතිතුමා, සර් රාසික් ෆරීද් මැතිතුමා, සර් මොහොමඩ් මාකාර්, බදිඋද්දීන් මහ්මුද් මැතිතුමා යන නායකයන් සෙසු ආගම්වලට ගෞරව කළා; අනික් සංස්කෘතිවලට ගෞරව කළා. ඒ වාගේම තමයි අපේ රටේ හිටපු නායකවරුන් වන ඩී.එස්. සේනානායක මැතිතුමා, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා, පොන්නම්බලම් රාමනාදන් මැතිතුමා, පොන්නම්බලම් අරුනාචලම් මැතිතුමා ආදී මේ සියලු දෙනාමත් එව්.එස්. ඉස්මයිල් අපේ හිටපු කථානායකතුමා, මුදලියාර් එම්.එස්. කාරියප්පර් මැතිතුමා, එස්. තොණ්ඩමන් මැතිතුමා - තමුන්නාන්සේගේ නායකතුමා- අප ඉතාමත්ම ගරු කරන කෙනෙක්- වාගේ අයත් අනිකුත් ආගම්වලට ගරු සරු දැක්වූවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බීමත්කමින් තොර සමාජයක් ඇති කරන්නය කියා තමයි ඉස්ලාම් ධර්මයේ කියන්නේ. කුර්ආනයේ "වල්මයිසිරු -වල්කින්සීර්- වල් අම්රු" කියා තිබෙනවා. "වල්මයිසිරු" කියන්නේ මත්පැන් පැනටයි. "වල්කින්සීර්" කියන්නේ සූකර මාංශවලටයි - ඌරු මස්වලටයි. එදා ජෝන් අමරතුංග මහත්මයා ගෘහ කාරක සභාවේදී ඒක ඉල්ලුවා. අපි කිව්වා, "එපා" කියලා. එදා ගරු වී.ජ.මු. ලොකුබණ්ඩාර මහත්මයා කථානායකතුමා වශයෙන් හිටියා. එතුමා ඌරු මස, හරක් මස මන්ත්‍රීවරුන්ට සැපයීම නැවැත්වූවා. අප මේ පාර්ලිමේන්තුවට එන්නේ කන්න නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ නිසා තමයි පත්තරවලින් අපට ගහන්නේ. හරක් මසුත් පාර්ලිමේන්තුවට ගෙන ඒම නැවැත්වා; ඌරු මසුත් ගෙන ඒම නැවැත්වූවා. ඒවා ආපසු ඕනෑය කියන කොට මොන තරම් දුරට අනික් ආගම්වල අයගේ ඇදහීම පිළිබඳව ඒ අයට නොවැටහීමක් තිබෙනවා ද කියන එක අපට පිළිගන්න වෙනවා. මා කථානායකතුමාට suggest කළා, "එහෙම නම් මොන මසක්වත් පාර්ලිමේන්තුවට වුවමනා කරන්නේ නැහැ, අපි vegetarian meals දෙමු, එළවළු, බත් සහ අනිකුත් දේවල් දෙමු" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙරුවල, කෙච්චිමලේ, අකුරැස්සේ ගොඩපිටිය -පෝරුව: මහනුවර, කහටපිටිය, නැහෙනහිර ප්‍රදේශවල පල්ලි ආසන්නව සමහර විට මත්පැන් ශාලා තිබෙනවා. අපේ මිනිස්සුත් බොනවා. ඒ වැරැදි කරනවා. නමුත් හොඳ නිරෝගී සම්පන්න දේශයක් හදන්නට ඕනෑ නම්, හොඳ දරු පරපුරක් හදන්නට වුවමනා කරනවා නම් මත්පැනින් දුරු වී සිටීම ඉතාමත් වැදගත්. පල්ලි, පන්සල් හා අපේ ශුද්ධ භූමිය වූ බෞද්ධ ලෝකයේ මුදුන් මල් කඩ වන දළ දා මාළිගාව ආසන්නයේ තිබෙන්නා වූ සියලුම මත්පැන් ශාලාවල් වැහීම පිණිසයි ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා මේ කල් තැබීමේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. නමුත් ඉන් ඔබ්බට ගිහිල්ලා මත්පැන් පානය කිරීම නවත්වන්න කියලා මා අප සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. රැට පොඩ්ඩ පොඩ්ඩ බීලා දවල්ට බිව්වේ නැහැයි කියන සියලු දෙනාම රැට එකඟ විය යුතුයි. සමහර අය අපට චෝදනා කරනවා. නමුත් ඒ ගොල්ලන්ගේ කාලයේ සිරිකොතේ කොහොමද මත්පැන් දුන්නේ කියන එක අප හොඳාකාරවම දන්නවා. මා මත්පැන් බොන්නේ නැහැ. කවදාවත් මත්පැන් බීලාත් නැහැ; කටේ කියලාවත් නැහැ. අපි ඒවා දන්නවා. රැයේ පෙරේදා සිරිකොත ඇතුළට රිංගපු අයට මේවා තේරෙන්නේ නැහැ, අනෙක් අයට මෙහෙම කිව්වාට.

අද ඉතාම සන්තෝෂයි කියන්න. අරලියගහ මන්දිරයේ බණ දේශනාවක් තිබෙනවා. ගරු බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා ඒ ගැන දන්නවා. මාත් බණ අහන්න යනවා. අනෙකුත් අයත් යනවා. සිල්වත් කාන්තාවන් එනවා. සංඝයා වහන්සේලා වඩිනවා. සිල් මාතාවන් එනවා. 7,000ක් 8,000ක් විතර ජනතාව අරලියගහ මන්දිරයට එනවා. බලන්න ඕනෑ, කාන්තා පක්ෂය වාඩි වෙලා ලස්සනට බණ අහන ආකාරය. එවැනි ශ්‍රද්ධාවන්ත ජාතියක් ගොඩනැඟීමේ ව්‍යායාමයක, එවැනි සත් ගුණවත් ක්‍රියාදාමයක තමයි තිස් අවුරුදු මහා උවදුරකින් රට බේරා ගත් අපේ රටේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යෙදිලා ඉන්නේ. ඒ වාගේම තමයි ශිරන්ති රාජපක්ෂ ආර්යාවත් ඒවාට සහාය දෙන්නේ.

ඒ එක්කම තව දෙයක් කියන්න ඕනෑ. කාන්තා පක්ෂයටත් මේ පිළිබඳව හොඳ අත් දැකීම් තිබෙනවා; පළපුරුද්ද තිබෙනවා. ඒ ගොල්ලන් තමයි දුක් විඳින්නේ. අපේ ජනාධිපතිතුමා පදවිප්‍රාප්ත වෙලා කන්ද උඩරට තේ වතුවලට ගියා. මාත් ගියා. ආරුමුගම් තොණ්ඩමන් මහත්තයා සහ අනෙකුත් අයත් සිටියා. තේ වතුවල වාසය කරන දුප්පත් කාන්තාවෝ ජනාධිපතිතුමාට කිව්වා, "සර්, අපට තිබෙන එකම එක කරදරය, මේ අපේ පිරිමි අය බී ගෙන එන එක. රැට අපට ඉන්න දෙන්නේ නැහැ. කනකර බඩු ඔක්කොම උකස් තියලා බොනවා. මේක සර් කොහොම හරි නවත්වන්න" කියලා. ජනාධිපතිතුමා කිව්වා, "අපට බාර් නවත්වන්න කොහොම හරි පුළුවන්. නමුත් ඔබලාගේ ස්වාමි පුරුෂයන්ගේ බීම නවත්වන්න පුළුවන් ඔබලාටයි" කියලා.

මේ බලන්න, මේ වාර්තාවේ සඳහන් වනවා, ගැහැණු ළමයින් හා පිරිමි ළමයින් එක්ව ලෝක වාර්තාවක් පිහිටුවලා තිබෙනවා. මොකක්ද ඒ ලෝක වාර්තාව? The Guinness World Records Certificate states, I quote:

> "The largest keyboard ensemble consisted of 160 participants and was conducted by Anton Dias Louis Boniface (Sri Lanka), at the Nelum Pokuna Mahinda Rajapaksa Theatre in Colombo, Sri Lanka, on 23 December 2012."

This was conducted by Mr. Anton Dias Louis Boniface. Our congratulations to him!

ශ්‍රී ලංකාවේ මේ ළමයි 160 දෙනෙක් බීමතින් තොරව, දුරාචාරයෙන් තොරව සිට ගිනස් වාර්තාවක් පිහිටුවලා තිබෙනවා. ඒ පිළිබඳව කවුරුවත් මෙනෙහි කර බලලා නැහැ. It was brought to my notice that this record has been created.

So, we must have a society built on a religious background - Buddhism, Hinduism and Christianity. All religions forbid you to take alcohol. So, let us stick to that.

අපි එය මේ පාර්ලිමේන්තුවේ වචනවලින් පමණක් පෙන්වලා මදි. අපි අපගේ හැදියාවෙන්, අපේ චරියාවෙන් පෙන්විය යුතුයි, බීමතින් තොර සමාජයක් හදන බව. බුද්ධ ශාසන කටයුතු භාරව ඉන්න අපේ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා මේ පිළිබඳව වෙර වැයම් දරලා ක්‍රියාශූරත්වයෙන් යුතුව වැඩ කර ගෙන යනවා. එතුමා බෞද්ධාගමට පමණක් නොවෙයි, අපේ ආගම්වලටත් උදවු කරනවා; අහදියා පාසල්වලට උදවු කරනවා. ඒ මඟින් හොඳ සමාජයක්, නීතිගරුක සමාජයක්, ශික්ෂිත සමාජයක් ඇති කිරීමේ ඒ කර්තව්‍යය ඉටු කරනවා. අපේ අගමැතිතුමා තමයි බුද්ධ ශාසන ඇමතිතුමා. එතුමා වෙනුවෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විශාල කාර්ය භාරයක් ඉටු කරනවා. අපි දන්නවා, ත්‍රිකුණාමලයට ගියාම සිංහල, දුවිඩ, මුස්ලිම් සියලු මිනිසුන් ඔබතුමාට දක්වන ආදරය. ත්‍රිකුණාමලයේ, තිරුකෝනේස්වරම් කෝවිල තිබෙනවා; ඒ වාගේම මුස්ලිම් පල්ලි තිබෙනවා. ඒ ආශ්‍රිත මත්පැන් ශාලා තිබෙනවා. ඒවා අයින් කරන්න ඕනෑ. ඒවා දුරස්ව තබන්න කියන්නේ නැහැ. ඒවා නවත්වන්න කියලා මම කියනවා. බොහොම ස්තුතියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාලීන වැදගත් මාතෘකාව ගැන අදහස් ප්‍රකාශ කරන්න ලැබීම ගැන සන්තෝෂ වනවා.

මේ යෝජනාව, මේ ආණ්ඩුවට අභියෝගයක්වත්, මේ ආණ්ඩුවට කරන්න බැරි දෙයක්වත් ඉදිරිපත් කරන යෝජනාවක් නොවෙයි. මේ යෝජනාවෙන් හරි පැහැදිලිව කියන්නේ ආණ්ඩුව ජන වරමක් ලැබූ ප්‍රතිපත්තිය ක්‍රියාවට නඟන්න කියන එකයි. ඒ ප්‍රතිපත්තිය තමයි "මතට නිත" ප්‍රතිපත්තිය. "මතට නිත" ප්‍රතිපත්තිය මුළු රටේම ප්‍රායෝගිකව එකවර ක්‍රියාත්මක කරන්න බැරි නම්, මහා නායක ස්වාමීන් වහන්සේලා වැඩ සිටින, අපේ මුළු රටේම ගෞරවයටපාත්‍ර වුණු දළ දා වහන්සේ වැඩ සිටින මහනුවර නගර සීමාවේවත් ආදර්ශයක් හැටියට සුරා සැල් ස්ථාපිත කිරීම වහාම නවත්වලා, අදාළ පර්ශ්ව සමඟ සාකච්ඡා කරලා තිබෙන සුරා සැල් වසා දමන්න කියලා තමයි මේ යෝජනාවෙන් කියන්නේ. මේක ආණ්ඩුවට අමුතුවෙන් ඉදිරිපත් කරන්න ඕනෑ යෝජනාවක් නොවෙයි. මේක ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නඟන්න කියලා අවධානය යොමු කිරීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ප්‍රායෝගිකව කරන්න බැරි වෙලා තිබෙන්නේ ඇයි? ප්‍රායෝගිකව කරන්න බැරි වෙලා තිබෙන්නේ, සුරා සැල් පවත්වා ගෙනයෑම පමණක් නොවෙයි, ඒ සුරා සැල්වලට අවශ්‍ය කරන මත්පැන් නිෂ්පාදනය කිරීම, ඒ සුරා සැල්වල අයිතිය පවා අද පවතින්නේ රජයේ බලගතු පාර්ශ්ව අතේ වීම නිසායි. ඒ කටයුතු පවතිනවා දේශපාලනඥයන් අතේ. එතකොට දේශපාලන බලය සම්බන්ධ ප්‍රශ්නයක් බවට මේක පත් වෙනවා. ඒ නිසා තමයි මහා නායක හාමුදුරුවරු ඉල්ලීම් කළත් අද මේ යෝජනාව ක්‍රියාවට නඟන්න බැරි වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි අද ආණ්ඩුවේම පාර්ශ්වයක් හැටියට හෙළ උරුමය ඒ ඉල්ලීම් කළත්, අපේ විපක්ෂය හැටියට ලක්ෂ්මන් කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනාවත් එය ප්‍රායෝගිකව ක්‍රියාවට නඟන්න බැරි වෙලා තිබෙන්නේ.

මෙහි තිබෙන තව බරපතළ පැත්තක් ගැන මා අවධාරණය කරන්න කැමැතියි. අද වන කොට නිල වශයෙන් මත්පැන් නිෂ්පාදනය කිරීමේ බලපත්‍ර ලබා ගත් ආයතන, පුද්ගලයෝ ඒ බලය පාවිච්චි කරලා, රේගු දෙපාර්තමේන්තුවේ ඇස් වහලා ලංකාවට ස්ප්‍රීතු ගෙන්වනවා. ලංකාවට ස්ප්‍රීතු ගෙන්වනවා විතරක් නොවෙයි, ඒ ස්ප්‍රීතු තමන්ගේ නිෂ්පාදනාගාරවල කලවම් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ෆෝමලින් එක්ක. ඒ කියන්නේ මිනී කල් තබා ගන්න පාවිච්චි කරන ෆෝමලින් එක්ක අද අරක්කු නිෂ්පාදනය කරන ස්ප්‍රීතු කලවම් කරනවා. ඒ වාගේම යූරියා කලවම් කරනවා. නිල ස්ප්‍රීතුවලට එවැනි දේ කලවම් කරලා මත්පැන් නිෂ්පාදනය කරනවා, තරුණ ජීවිත කෙටි කාලයකින් අවසන් කරන්න.

ඇත්තටම ගරු අස්වර් මන්ත්‍රීතුමා කියපු දේ නිවැරදියි. නමුත් අද අනුරාධපුරයේ, නුවර, මාතලේ පළාත්වල තරුණයෝ වැඩිපුර මිය යන්නේ ආසනික් ප්‍රශ්නය නිසාම නෙවෙයි. වකුගඩු රෝගය හැදෙන්නේ ආසනික්වලින් කියලා අපි කියනවා. නමුත් ඇත්ත දේ මෙකයි. අද අඩු ආදායම් ලබන දුප්පත් තරුණ තරුණියන්, විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත් ඒ මත් පැන් නිෂ්පාදකයන්ගේ ප්‍රධාන වෙළෙඳ පොළක් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන වතුකරය ඒ අයගේ ප්‍රධාන වෙළෙඳ පොළක් බවට පත් වෙලා තිබෙනවා. මිනී කල් තබා ගන්න පාවිච්චි කරන ෆෝමලින් දාලා, යූරියා දාලා හදන බාල මත් පැන්වලට අද ලංකාවේ ලොකු වෙළෙඳ පොළක් තිබෙනවා. ඔවුන් ඒ සඳහා අවශ්‍ය කරන ස්ප්‍රීතු රේගුවෙන් ගෙන්වන්නේ සුවඳ විලවුන් බලපත්‍ර පාවිච්චි කරලා. සුවඳ විලවුන් නිෂ්පාදනයට අවශ්‍ය කරන දේ ගෙන්වන බලපත්‍ර පාවිච්චි කරලා අද ස්ප්‍රීතු ගෙන්වනවා. සුවඳ විලවුන් බලපත්‍රය යටතේ රේගුවේ ඇස් වහලා විවිධ ආකාරයෙන් ස්ප්‍රීතු ගෙනෙනවා. ඒවා ගෙනැල්ලා ෆෝමලින් දාලා, යූරියා දාලා මත් පැන් නිෂ්පාදනය කරලා ලංකාවේ තරුණ පරම්පරාවේ අනාගතය අඳුරු කරන තත්ත්වයට පත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අවුරුද්දේ -2012- ඔක්තෝබර් මාසයේ මේ පිළිබඳව රේගු නිලධාරීන් විසින් වැටලීම් කළා. ප්‍රබල දේශපාලනඥයෙකුගේ ස්ථානයක් වැටලීම් කළා. මා මාධ්‍ය වාර්තාවේ තිබෙන ඒ කාරණාව කියන්නම්. ඒ වාර්තාවට අනුව containers දෙකක යූරියා තිබුණා. ඒ මත් පැන් නිෂ්පාදනය කරන ස්ථානයේ, ඒ distillery එකේ තිබුණේ මොනවාද? Containers දෙකක යූරියා තිබුණා. Containers පහක ෆෝමලින් තිබුණා. ඒ මොකටද? මෘත ශරීරාගාරයක් එනැන තිබෙනවාද? මිනී කල් තබා ගන්නා රෝහලක්ද ඒක? නැහැ. ඒ ෆෝමලින් containers පහ පරිහරණය කරන්නේ, බොන්නේ කවුද? අපේ රටේ අනාගත තාරුණ්‍යය. ආණ්ඩුවේ "තාරුණ්‍යයේ හෙටට" පොවන්නේ ෆෝමලින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තාරුණ්‍යයේ හෙටට ආණ්ඩුවේ දේශපාලනඥයෝ පොවන්නේ ෆෝමලින්. මිනිහෙක් මැරුණාට පස්සේ ෆෝමලින් ගහන එක වෙනම දෙයක්. හැබැයි ජීවත් වෙලා ඉන්න මිනිසුන්ට ෆෝමලින් ගහන එක තරම් අපරාධයක් තවත් නැහැ. ඒක තමයි ඇත්ත. ඒක නිසා ඇත්තටම අද බොදු බළ සේනා හාමුදුරුවරු පාරට බැහැලා උද්ඝෝෂණය කරන්න ඕනෑ මුස්ලිම් ව්‍යාපාරිකයාගේ ව්‍යාපාරයට විරුද්ධව නොවෙයි, අනාගත තරුණ පරම්පරාවේ ජීවිත අඳුරු කරන මේ අපරාධවලට විරුද්ධවයි.

මේවා නේ අපරාධ. දේශපාලන බලවතුන් තමන්ගේ බලය පාවිච්චි කරලා මේ විධියට තව අවුරුදු පහක්, දහයක් ෆෝමලින් ගැහුවොත් අපේ රටේ තරුණයන්ට මොකද වෙන්නේ? පණ තිබෙන මිනිසුන්ට ෆෝමලින් ගහනවා. පණ තිබෙන මිනිසුන්ට යූරියා ගහනවා. යූරියා ගහන්නේ, වී වගාවට නොවෙයි; පොල් පැළයට නොවෙයි; තේ ගහට නොවෙයි, ජීවත් වන තරුණයාටයි. ආණ්ඩුව එක මත් පැන් බෝතලයකින් රුපියල් 450ක බද්දක් අය කරන්න ඕනෑ. හැබැයි දේශපාලනඥයෙකුගෙන් රුපියල් මිලියන 350කට වැඩි ප්‍රමාණයක් එහෙම අය කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අයථා විධියට පවත්වා ගෙන යන මේ ව්‍යාපාරය නතර කළෝතින් -ස්ප්‍රීතු ගෙන්වලා, ෆෝමලින් කලවම් කරලා, යූරියා කලවම් කරලා නීති විරෝධීව හදන මේ අරක්කු නතර කළෝතින්- ලංකාවට බිලියන ගණනක ආදායමක් ඉතුරු වෙනවා. කොහාටද, භාණ්ඩාගාරයට. භාණ්ඩාගාරයේ සල්ලි නැහැ, සල්ලි නැහැ කිය කියා පී.බී. ජයසුන්දර මහත්මයා "ආර්ථික ඝාතකයා"ය කියලා උල තියන්න හදනවා නේ. අන්න භාණ්ඩාගාරයට සල්ලි එන ක්‍රම. රේගු දෙපාර්තමේන්තුව මේකට හරියට මැදිහත් වෙනවා නම්, සුරා බදු කොමසාරිස්තුමා මේකට හරියට මැදිහත් වෙනවා නම්, ඕනෑම දේශපාලන බලවතෙක් වුණත් කමක් නැහැ මේ ෆෝමලින්වලින් ජනතාවගේ ජීවිත විනාශ කරන මේ ව්‍යාපාරය නතර කරනවා කියලා රජය ඊට ප්‍රතිපත්තිමය වශයෙන් මැදිහත් වෙනවා නම්, ඒ හරහා අනියමින් රජයටත් ආදායමක් එනවා. එතකොට අරක්කු නිෂ්පාදනයට නීත්‍යානුකූල ස්ප්‍රීතු ගෙන්වන්න ඕනෑ. අපි අහන්නේ, මේ ස්ප්‍රීතු ගෙන්වන කොම්පැනිවලට අදාළව, නීතිය ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලාට බැරි ඇයි කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවනවා. අපි දන්නවා, සමහර ආයතන සුරා බදු දෙපාර්තමේන්තුවෙන්ම අවසර අරගෙන තිබෙනවා කියලා. ඇක්මී ලංකා ඩිස්ටිලර්ස් කියන ආයතනයට බලපත්‍ර තිබෙනවා. වවුළුගල ඩිස්ටිලර්ස් කියලා ආයතනයක් තිබෙනවා. තව එක එක නම්වලින් තිබෙන ආයතන තිබෙනවා.

ඊට අමතරව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න ඕනෑ කාරණයක් තිබෙනවා. Herbal products තිබෙනවා. Herbal productsවලට natural alcohol ගෙන්වනවා, ලීටර් 14,000ක්. තව ආයතනයක් තිබෙනවා, මැජෙස්ට්‍රි නැවුරල් ෆුඩ් කියලා. ඒ ආයතනය 2012 අවුරුද්දේ විතරක් වාර හයකට ලීටර් 20,000 ගණනේ ගෙනැල්ලා තිබෙනවා. එක වරකට ලීටර් 20,000 ගණනේ ලංකාවට මේ ස්ප්‍රීතු ගෙන්වලා තිබෙනවා. තව ආයතනයක් තිබෙනවා. ඒ ආයතනය වාර හතරකට natural alcohol හැටියට ලීටර් 20,000 ගණනේ අවුරුද්දකට ලීටර් 80,000 ගෙන්වලා තිබෙනවා. එක ආයතනයක් අවුරුද්දකට ලීටර් 120,000ක් ගෙන්වනවා. ඒවා ගෙන්වන්නේ මොකටද? Scent ගස්සන්නද? නැහැ. ඒවා ගෙන්වන්නේ තරුණයන්ට scent ගස්සන්න නොවෙයි, තරුණයන්ට ෆෝමලින් ගස්සන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ආයතන raid කළෝතින් පෙනේවි, ඒ ආයතනවල වැඩි පුරම තිබෙන්නේ ස්ප්‍රීතු නොවෙයි කියලා. ඒ ආයතනවල වැඩි පුරම තිබෙන්නේ ෆෝමලින් සහ යූරියායි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ නිසා මේ අපරාධය නතර කරන්න රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න ඕනෑ. අපි කියනවා, මේ සඳහා රජය නිහඬ වෙනවා නම් මේ රටේ මහ ජනතාවගේ උද්ඝෝෂණයක් ඇති වෙන්න ඕනෑ කියලා. මම විශ්වාස කරනවා, ඒකට මහ නායක හාමුදුරුවන්ගේත්, මුළු මහත් සංඝරත්නයේත් ආශීර්වාදය තිබෙනවා කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is a point of Order being raised by the Hon. Ajith P. Perera

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභානායකතුමා සඳහන් කළා, අද අපට භාර දෙන්න තිබුණු පනත් කෙටුම්පත් විසිඑකම භාර දීලා තිබෙනවා කියලා. දැන් වේලාව ප.ව. 6.00යි. තවමත් මට ලැබිලා තිබෙන්නේ පනත් කෙටුම්පත් 15යි. එතකොට තව හයක් ලැබෙන්න තිබෙනවා. සභානායකතුමා සභාව කල් තබන අවස්ථාවේ කිව්වා, ඒවා ලැබී තිබෙනවාය කියලා. ඒක වැරැදියි. මම මේ කාරණය කියන්නේ හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වීම සඳහායි. මේ ක්‍රමය නිසා කාර්ය පටිපාටිය සම්පූර්ණයෙන්ම අඩාළ වෙනවා. මොකද නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා කියපු කාරණය වැරැදියි. මමත් රැඳිලා ඉන්නේ මේ පනත් කෙටුම්පත් 21 මට බලන්න අවශ්‍ය නිසායි. විපක්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක හැටියට මගේ රාජකාරිය ඒ ගැන බලන එක. ඒ නිසා මම තවමත් බලාපොරොත්තුවෙන් ඉන්නවා, ඒවා ලැබෙයි කියා. සභාවේ කටයුතු අවසන් වෙන්න තව සවල්ප මොහොතයි තිබෙන්නේ. තවත් පනත් කෙටුම්පත් හයක් එන්න අවශ්‍යයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණාවේදී අපට මහා සංඝරත්නයේ විතරක් නොවෙයි අන් ආගමිකයන්ගේත් සහාය අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුස්ලිම් ප්‍රජාව, දෙමළ ජනතාව, විශේෂයෙන්ම මේකෙන් පීඩාවට පත් වන උතුරු, නැඟෙනහිර ජනතාව, ඔබතුමා නියෝජනය කරන වතුකරයේ ජනතාව -වතුකරයේ දරුවන්- මේ ඇත්ත තත්ත්වය දන්නවා නම් - අපි අරක්කු කියලා බොන්නේ ෆෝමලින් කියලා දන්නවා නම්- බොයිද? යූරියා ඇඟට ගහනවා කියලා දන්නවාද? ඒ මිනිස්සු දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලපත්‍ර පාවිච්චි කරලා නීත්‍යානුකූල කසිප්පු පෙරිල්ලකුයි මේ තිබෙන්නේ. ඒ නිසා මේ තත්ත්වය වළක්වන්න රජයට පියවරක් ගන්න බැරි නම් මේ රටේ මහ ජනතාව, සිවිල් ව්‍යාපාර ඇතුළු සියලු ජනතා ව්‍යාපාර මේකට එකතු වෙන්න ඕනෑ. මා හිතන හැටියට තමුන්නාන්සේලාට මේ පියවර ගන්න බැහැ.

ඊළඟට මා ඔබතුමාගේ අවධානය යොමු කරනවා, අද දින ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් පිළිබඳව. මා කලිනුත් කිව්වා වාගේ සභානායකතුමා අපට කිව්වා, අද ඉදිරිපත් කළ පනත් කෙටුම්පත්වල සියලුම පිටපත් පක්ෂ නායක රැස්වීමට ලබා දීලා තිබෙනවා කියලා. අපේ පක්ෂයේ කණ්ඩායම් නායකවරයා වන අනුර දිසානායක මන්ත්‍රීතුමාගෙන් මා මේ පිළිබඳව ඇහුවා. එතුමා කිව්වේ, ඊළඟ සභා වාරයට න්‍යාය පත්‍රය - Order Paper එක- හැදුවා, හැබැයි ඒ අයට මේ සියලුම පනත් කෙටුම්පත් ලබා දුන්නේ නැහැ කියලායි. පක්ෂ නායකයින්ට මේ පනත් කෙටුම්පත් ලබා දුන්නා කියන එක වැරැදියි. එය සත්‍ය නැහැ. මෙම සභාවටයි ඒවා ලැබෙන්න ඕනෑ. පක්ෂ නායකයින්ටත් මේ සියලුම පනත් කෙටුම්පත්වල පිටපත් ලබා දීලා නැහැ. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත් මේ සභාවේ සිටින නිසා මා වැරැදි නම් නිවැරැදි කරන්න. පනත් කෙටුම්පත් කිහිපයක් පමණයි පක්ෂ නායකයින්ටත් ලබා දීලා තිබෙන්නේ, සියල්ලම ලබා දීලා නැහැ. දැනට මටත් ලැබී තිබෙන්නේ යම් ප්‍රමාණයක් පමණයි.

මෙය පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. මෙය අපේ පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය අපහසුතාවට පත් කරන්න අප කරන දෙයකුත් නොවෙයි. කාර්ය මණ්ඩලය මෙයට වග කියන්න ඕනෑත් නැහැ. මෙය එතුමන්ලාගේ වග කීමක් නොවෙයි. මෙය ආණ්ඩුවේ න්‍යාය පත්‍රයේ ගැටලුවක්. මෙම පාර්ලිමේන්තුව උත්තරීතරම ස්ථානයයි, පාර්ලිමේන්තුව අධිකරණයටත් වඩා උත්තරීතරයි කියලා තමුන්නාන්සේලා කියනවා නම් ඒ පරමාදර්ශය කෝ? ඒ ආදර්ශය කෝ? අධිකරණයට යන්න තිබෙන අවස්ථාවත් උල්ලංඝනය කරන ක්‍රමයක් තමයි මේ තිබෙන්නේ. අද මේ සභාව අවසාන වන තෙක් මමත් මේ සභාවේ රැඳී සිටිනවා. මේ සභාව අවසාන වන මොහොතේදීවත් මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ මහජන පරමාධිපත්‍ය අයිතිය රැක දෙමින් මෙම පනත් කෙටුම්පත්වල පිටපත් සියලුම මන්ත්‍රීවරුන්ට ලබා දෙයි කියා අපි බලාපොරොත්තු වනවා.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ වැඩ බලන ඇමතිවරයා හැටියට මා ඉතාම සන්තෝෂ වනවා, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මෙම කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ නොසිටියා නම් එම යෝජනාව ස්ථිර කරන්නේ මමයි. ඒ මොකද, විශේෂයෙන්ම බෞද්ධ රටක් හැටියටත්, බෞද්ධයින් හැටියටත් අපි ඒ බෞද්ධ ප්‍රතිපත්ති රකින්න බැඳිලා ඉන්නවා. ඒකේ කිසිම විවාදයක් නැහැ. ඒ වාගේම සකල ලෝක වාසී බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ වූ දළ දා හාමුදුරුවන්ට අපි කරන සැලකිල්ලත්, භක්තියත් පූජාවක්

[ගරුඑම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා]

හැටියට කරන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ සම්පාදනය කළ යුතුව තිබෙනවා. එම නිසා දළ දා හාමුදුරුවන් වැඩ සිටින ඒ පූජනීය අගනගරයේ විතරක් නොවෙයි, ලංකාවේ සියලුම ආගම් සම්බන්ධ පූජනීය සිද්ධස්ථාන පිහිටා තිබෙන පූජනීය නගරවල මත්පැන්හල් අවලංගු කරන්නට ඕනෑය කියන මතයක අපි ඉන්නවා. ඒ වාගේම මගේ පෞද්ගලික මතයක් හැටියට මත්පැන්හල් සම්පූර්ණයෙන් අවලංගු කරනවා නම් මගේ සතුට මා ප්‍රකාශ කරනවා.

කෙහොම වුණත් අපි ගෞරවනීය මහා සංඝ රත්නයට කන් දිය යුතුවාක් මෙන්ම අපි ඊළඟට අනිවාර්යයෙන්ම අපේ අනාගත පරපුර ගැන කල්පනා කළ යුතුව තිබෙනවා. අද යම් යම් ප්‍රදේශවල පාසල් වියේ පසු වන සමහර දරුවන් අතළොස්සක් වාගේ ප්‍රමාණයක් මත්පැන්වලට ඇබ්බැහි වන ගතියක් දකින්නට තිබෙනවා. ඒ වාගේම ආගම ධර්මය අනුව කටයුතු නොකරන සියලුම දෙනා ඒ ආගමේ තිබෙන නීති රීති හරිහැටි පිළිපදිනවා නම් රජයකට ඒ සම්බන්ධව අලුතින් නීති රීති පැන විය යුතු වන්නේ නැහැ. නමුත් අපට තිබෙන කනගාටුව, අපේ රටේ බොහෝදෙනෙක් තම තමන්ගේ ආගම්වල තිබෙන නියමයන් පිළිපදින්න කටයුතු කරන්නේ නැති එකයි.

ඒ වාගේම අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමා කිව්වා, මත්පැන් පිටු දැකීමේ කටයුත්ත පවුල් සංස්ථාව ඇතුළෙන් ආරම්භ කරලා රටේ ප්‍රචලිත ව්‍යාපාරයක් හැටියට ගෙන යන්නට ඕනෑය කියලා. අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩපිළිවෙළ තුළින් "මතට තිත" වැඩ පිළිවෙළ අද සාර්ථක තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක පෞද්ගලිකව අපි දන්නවා. ඒක අපේ අමාත්‍යාංශය යටතේ ගැනෙන විෂයක්. පොලිස් වාර්තා දිහා බැලුවාම එය අපට පෙනෙනවා. පොලීසිය සහ සුරා බදු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධකම් පවත්වමිනුයි අපි මතට තිත වැඩ පිළිවෙළ සම්බන්ධව කටයුතු කරනු ලබන්නේ. අපේ රටේ ඒ සම්බන්ධව විශාල වශයෙන් මෙහෙයුම් සිද්ධ වනවා.

මත්පැන් විතරක් නොවෙයි, අනෙකුත් තහනම් ඖෂධ වර්ග, විනාශකාරී ඖෂධ වර්ග, ගංජා, හෙරොයින් වැනි දේවල් ඇතුළු විනාශකාරී සියලු දේවල් අත් අඩංගුවට ගැනීමේ වේගය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම පනවනු ලබන දඩ මුදල්, දඬුවම් බොහොම වැඩි කරලා තිබෙනවා. සමහර අය ඒවාටත් භය නැතිව මුදල් බලාපොරොත්තුව මේ දේවල් කරනවා. නමුත් ඒකට රජයට පමණක්ම ඇඟිල්ල දිගු කළ යුතු නැහැ. මොකද මම එහෙම කියන්නේ, රජයක් හැටියට අපි ඒ අවශ්‍ය නීති රීති පනවනවා. කිරිඇල්ල මන්ත්‍රීතුමා ඉල්ලා සිටියා වාගේ ඉදිරියේදී ඒ අවශ්‍ය අංශ සමඟත්; කටයුතු කළ යුතු අය සමඟත් සාකච්ඡා කරලා මේ දේවල් අවලංගු කරන්නට අපි කටයුතු කර ගෙන යනවාය කියන එක මම සන්තෝෂයෙන් මේ සභාවට ප්‍රකාශ කරනවා. ස්තුතියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Ajith P. Perera, what is your point of Order?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අද දවසේ පොරොන්දු වුණු හැටියට අද දින ඉදිරිපත් කළ පනත් කෙටුම්පත් 21 සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් තවමත් අපට ලැබිලා නැහැ. ඒවා ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන බව කියනවා. ඒක අපට අදාළ වන්නේ නැහැ. මොකද රාජ්‍ය භාෂාව වන්නේ සිංහලයි. ඒ පනත් කෙටුම්පත් භාෂා තුනෙන්ම තිබෙන්න ඕනෑ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කථා කළාට පස්සේ ඔබතුමාට අවස්ථාව ලබා දෙන්නම්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ න්‍යාය පත්‍රයේ ඇතුළත් වෙලා තිබුණු පනත් කෙටුම්පත් 21 හි පිටපත් මා වෙත ලැබිලා නැහැ. එම පිටපත් ලබා දෙනවා කියලා සභානායකතුමා කිව්වත්, තවමත් ඒක කෙරිලා නැහැ. සභාවේ කටයුතු අවසන්වීමට මොහොතක් තිබියදීත් මම මේ කාරණය කියනවා. සභානායකතුමාගේ ප්‍රකාශය වග කීමෙන් තොරව කරපු ප්‍රකාශයක් බවත් මම කියන්න කැමැතියි. ඒ නිසා මුද්‍රණාලයේ තිබෙන දේවල් සභාගත කළා වන්න බැහැ. මේ සභාවට යම් ගෞරවයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම අධිකරණයකට යාමට යම් පාර්ශ්වයක් බලාපොරොත්තු වනවා නම්, අධිකරණය වෙත යන්නේ කුමන කෙටුම්පතක් මත පදනම්වද කියන එක බලා කියා ගැනීමේ අයිතිවාසිකම, ඒ අවස්ථාව ඒ ඒ පාර්ශ්වයන්ට ලබා දෙන්න අවශ්‍යයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Sunil Handunnetti, what is your point of Order?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, න්‍යාය පුස්තකයේ සඳහන් අද ඉදිරිපත් කළ පනත් කෙටුම්පත් 21න් මේ සභාවේ රැඳෙමින් මේ ගැන කථා කළ මට පමණක් අවසානයේදී ඒවායේ ඉංග්‍රීසි පිටපත් 21ම සහ සිංහල පිටපත්වලින් 15ක් ලැබිලා තිබෙනවා. හැබැයි පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය ඒක නොවෙයි. මෙතැනට ඇවිල්ලා කෑ ගහන කෙනාට; කථා කරන කෙනාට විතරක් ඒ පනත් කෙටුම්පත්වල පිටපත් ලබා දීලා තිබෙනවා. මේ සභාවේ සිටින අනෙකුත් සියලු සභික මන්ත්‍රීවරුන්ගේ මේස මත ඒවා තැබුවේ නැති බව අපට පෙනෙනවා. මම මේ ගැන කථා නොකළා නම්, මටත් මෙය ලැබෙන්නේ නැහැ. මේකෙන් අවසානයේ කරන්නේ මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන් හැල්ලු කිරීමක්. තමුන්නාන්සේලාගේ මේ කටයුත්ත තිබෙන්නේ, "අපට ඕනෑ නීතියක් ක්‍රියාත්මක කරන්න පුළුවන්"ය කියන පදනමෙන්. විශේෂයෙන් ඔබතුමන්ලා -ආණ්ඩුව- කියනවා නම්, මේ පාර්ලිමේන්තුව උත්තරීතරයි කියලා ඒ උත්තරීතර බව රැකෙන්නේ පාර්ලිමේන්තු සම්ප්‍රදායන් ආරක්ෂා කළොත් පමණයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපි අපේ විරෝධය පානවා.

ඒ වාගේම තමයි මේ පනත් කෙටුම්පත් මත යම් පාර්ශ්වයක් අධිකරණයට යන්න උත්සාහ කරනවා නම්, හෝ අවශ්‍යතාවක් තිබෙනවා නම්, සිංහලෙන්, දෙමළෙන්, ඉංග්‍රීසියෙන් කියන ත්‍රිවිධ භාෂාවෙන් මේ පනත් කෙටුම්පත් සභාගත විය යුතුව තිබෙනවා. ඒ අවශ්‍යතාව නැතිව තමයි අද පාර්ලිමේන්තු වාරය අවසන් කරන්නේ කියන කාරණයත් මම මේ අවස්ථාවේදී වාර්තාගත වීම සඳහා අවධාරණය කරනවා.

මහජන නියෝජිතයෙකු හැටියට; පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට; ජනතා පරමාධිපත්‍ය නියෝජනය කරන පුද්ගලයෙකු හැටියට ඒ සඳහා මම මගේ විරෝධය පානවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. A.H.M. Azwer.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ හිතවත් මිත්‍රයා ආරම්භයේදී කළ ප්‍රකාශයට පටහැනි ප්‍රකාශයක් දැන් කරන්නේ. මොකද, එතුමන්ලාට ඒ අණ පනත් සියල්ල ඉංග්‍රීසි භාෂාවෙන් ලැබිලා තිබෙනවා කියන එක- ඒකයි ඇත්ත.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක වැරැදියි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
පොඩ්ඩක් ඉන්න. මම පිළිගන්නවා ඒවා සිංහල භාෂාවෙන් සහ ද්‍රවිඩ භාෂාවෙන් ලැබිය යුතුයි කියලා. නමුත් ගරු සභානායකතුමා සභාව නොමහ යැවිවේ නැහැ. අද උදෑසනම මේ ප්‍රශ්නය අපේ විරුද්ධ පක්ෂයේ සංවිධායකතුමා අහන විට ගරු කථානායකතුමා කිව්වා ලැබෙනවා කියලා. අද පොඩි ප්‍රමාදයක් ඇති වෙලා තිබෙනවා. මෙහේ නොවෙයි නේ ඒවා මුද්‍රණය කරන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඉස්සර කාලයේ Motion එකක් ගෙනාවා, පාර්ලිමේන්තුවට printing press එකක් ඕනෑ කියලා. අද වනතුරු එය සිද්ධ වෙලා නැහැ. අපි එය ඉදිරි කාලයේදී බලමු. එතැනින් මුද්‍රණය කරලා එන්න ඕනෑ. සමහර විට ඒ ප්‍රමාදය පමණයි තිබෙන්නේ. නමුත්, වංචාවක් හෝ වෙනත් වැරැද්දක් සිදු වෙලා නැහැ. කොහොම හරි දැන් ලැබිලා තිබෙනවා. අනෙක් භාෂා දෙකෙනුත් දැන් ලැබෙනවා. දැන් අපි ගියත් ඒවා අපේ මේසය උඩ තබනවා. එහෙම නැත්නම් ඔබතුමා නියෝගයක් කරන්න ඒවා ඔක්කෝම තැපෑලෙනුත් යවන්න කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔක්කෝම ලැස්තියි කියන එක තමයි මා අවධාරණය කර සිටින්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Lakshman Kiriella, what is your point of Order?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග දිහා බලන කොට, ගරු අස්වර් මන්ත්‍රීතුමා කියන විධියට පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් තැපෑලෙන් යවන්න බැහැ. අපේ මේස මත තිබෙන්න ඕනෑ. [බාධා කිරීමක්] It has to be tabled.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
No, no - [*Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේකෙන් පෙන්නන්නේ මොකක්ද? අද මේ පාර්ලිමේන්තුව නිකම් කච්චේරියක් වගෙයි. ස්ථාවර නියෝග අනුව වැඩ කරන්නේ නැහැ. [බාධා කිරීමක්] පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී එකක් කියනවා. පක්ෂ නායක රැස්වීමේදී මට කිව්වා, අද පාර්ලිමේන්තුව අවසන් වෙන්න කලින් මේ පනත් කෙටුම්පත් සියල්ල දෙනවා කියලා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමාත්- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක සිද්ධ වෙලා නැහැ නේ. ඒකයි අප කියන්නේ. [බාධා කිරීම්] මේක කච්චේරියක් නොවෙයි. මේක පාර්ලිමේන්තුව.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Ajith P. Perera, what is your point of Order?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 23 (1) හි සඳහන් වෙනවා, "සියලුම නීති සහ අනුනීති පැනවීම නැතහොත් සැදීම ද එකී සියලුම නීති සහ අනුනීති පළ කිරීම ද, ඉංග්‍රීසි භාෂාවෙන් වූ පරිවර්තනයක් ද ඇතිව ජාතික භාෂා දෙකෙන් ම විය යුත්තේ ය." කියා. ඒ කියන්නේ සිංහල භාෂාවෙන් සහ දෙමළ භාෂාවෙන්. එහෙම නම් සිංහල භාෂාවෙන් සහ දෙමළ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

භාෂාවෙන් තමයි මේ රටේ නීති පනවන්නේ. නීතිය පනවන්නේ සිංහල භාෂාවෙන් සහ දෙමළ භාෂාවෙන්. පරිවර්තනය තමයි ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන්න ඕනෑ. අප ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කරනවා නම් කරන්න අවශ්‍ය වන්නේ සිංහල සහ දෙමළ භාෂා; ඒ කියන්නේ අපේ රාජ්‍ය භාෂා පදනම් කරගෙනයි. ඒ නිසා කාරණය බොහොම පැහැදිලියි. මෙය ස්ථාවර නියෝගවලට පටහැනියි; අපේ මේසය මත තබලා නැහැ; ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි. ඒ නිසා මේ පනත් කෙටුම්පත් 21 ගැනම ඉදිරි පියවරක් තබන්න පුළුවන්කමක් නැහැ කියලා මම කියා සිටිනවා. මේ විරෝධතාව සටහන් කර තබන්න කියලා ඉල්ලා සිටිනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී මේ පිළිබඳව තීරණයක් ගත්තා-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. මා දැන් මගේ නියෝගය පළ කරනවා.

According to the procedures of Parliament, all Bills have to be tabled in Parliament in all three languages. As per the Deputy Secretary-General of Parliament, only 15 Bills are available in all three languages. He will certify as to what are the Bills that have been tabled today. Those 15 Bills will be accepted as tabled in the proper procedure and all other Bills will be treated as not tabled in Parliament today. That is my Ruling.

Thank you.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 6.15ට, 2013 මාර්තු 19 වන අඟහරුවාදා පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 6.15 மணிக்கு, பாராளுமன்றம், 2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை மு.ப.9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 6.15 p.m. until 9.30 a.m. on Tuesday, 19th March, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102, Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year.
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 216 - இல. 5
Volume 216 - No. 5

2013 මාර්තු 19වන අඟහරුවාදා
2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை
Tuesday, 19th March, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:
මහජන ආරක්ෂක ප්‍රකාශනය

නිවේදන:
2013 මාර්තු 08 දින ඉදිරිපත් කළ පනත් කෙටුම්පත්: කථානායකතුමාගේ තීරණය
පනත් කෙටුම්පත්: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
නීති විරෝධී ලෙස එතනෝල් ස්ප්‍රීතු ගෙන්වීම

රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
අර්ල් ගුණසේකර පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා] - පළමුවන වර කියවන ලදී

වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

பிரதான உள்ளடக்கம்

சனாதிபதியிடமிருந்து வந்த செய்தி:
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

அறிவிப்புகள்:
2013 மார்ச் 08ஆம் திகதி சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்: :சபாநாயகரின் தீர்ப்பு
சட்டமூலங்கள் : உயர்நீதிமன்றுக்கு மனுக்கள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா

சட்டவிரோதமாக எதனோல் ஸ்பிரிட் இறக்குமதி

பாதுகாப்புச் சேவைகள் ஏவல் மற்றும் பணியாட்டொகுதிக் கல்லூரி (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
ஏர்ல் குணசேகர மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்] - முதன்முறை மதிப்பிடப்பட்டது

துறைமுக, விமானநிலைய அபிவிருத்தி அறவீட்டுச் (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

பொருளாதாரச் சேவை விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

மதுவரி (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

தொலைத்தொடர்பு அறவீட்டுச் (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ANNOUNCEMENTS:
BILLS PRESENTED ON 08TH MARCH, 2013: Speaker's Ruling
Bills : Petitions to the Supreme Court

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Illegal Import of Ethanol Spirits

DEFENCE SERVICES COMMAND AND STAFF COLLEGE (AMENDMENT) BILL:
Read the First Time

PRIVATE MEMBERS'BILLS:
Earl Gunasekara Foundation (Incorporation) Bill – [Hon. Alhaj A.H.M. Azwer] - Read the First Time

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

ECONOMIC SERVICE CHARGE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

EXCISE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

TELECOMMUNICATION LEVY (AMENDMENT) BILL
Read a Second, and the Third time, and passed as amended

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මාර්තු 19වන අඟහරුවාදා
2013 மார்ச் 19, செவ்வாய்க்கிழமை
Tuesday, 19th March, 2013

පූ.භ. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] *මූලාසනාරූඪ විය.*
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] *தலைமை வகித்தார்கள்.*
The Parliament met at 9.30 a.m,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
சனாதிபதியிடமிருந்து வந்த செய்தி
MESSAGE FROM THE PRESIDENT

මහජන ආරක්ෂක ප්‍රකාශනය
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
PUBLIC SECURITY PROCLAMATION

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පහත සඳහන් සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා:

"ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

අංකය : ජීජේඑල්/308

2013 මාර්තු මස 03 වන දින
කොළඹ දී ය.

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයෙන් මා විසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයින් දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ සක්‍රිය සේවය සඳහා කැඳවන ලදී.

ඉහත කී ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව ත්‍රස්තවාදය සහ යම් මහජන කැළඹීමක් වැළැක්වීම සහ මැඩ පැවැත්වීම පිණිස බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ
ජනාධිපති"

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

2013 මාර්තු 08 දින ඉදිරිපත් කළ පනත් කෙටුම්පත්: කථානායකතුමාගේ තීරණය
2013 மார்ச் 08ஆம் திகதி சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்: சபாநாயகரின் தீர்ப்பு
BILLS PRESENTED ON 08TH MARCH, 2013: SPEAKER'S RULING

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
2013 මාර්තු මස 08 වැනි දින පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් 21 පිළිබඳව විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් 2013 මාර්තු මස 11 වැනි දින මා වෙත යොමු කරන ලද ලිපියේ සඳහන් කරුණු සහ ගරු විපක්ෂ නායකතුමා විසින් 2013 මාර්තු මස 18වන දින මා වෙත ලිඛිතව වාර්තා කරන ලද කරුණු පිළිබඳව මාගේ තීරණය දැනුම් දීමට කැමැත්තෙමි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78වන ව්‍යවස්ථාවෙන් සහ පාර්ලිමේන්තුවේ 45වන ස්ථාවර නියෝගයෙන් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සලස්වා ඇත. ඒ අනුව උක්ත පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පනත් කෙටුම්පත්හි නාමයන් පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවන ලද අතර, පනත් කෙටුම්පත් පළමුවන වර කියවන ලදුව එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලද සේ සලකා පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව එම පනත් කෙටුම්පත් දෙවන වර කියවීම පසු දිනට නියම කිරීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දෙන ලදී.

එසේ වුවද, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවේදී ඊට අදාළ ගැසට් පත්‍රය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තැබිය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලින් නියම කර නොමැති බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම පිළිබඳව 1999 වර්ෂය තෙක් පැවැති සම්ප්‍රදාය වූයේ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළ වහාම අංකයක් ලබා දෙමින්, මුද්‍රණය කළ පනත් කෙටුම්පතම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර බෙදා හැරීමයි. මෙම සම්ප්‍රදායේ පැවැති ව්‍යාකූලතාවන් නිසා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන දිනයේදී ඊට අදාළ ගැසට් පත්‍රය මන්ත්‍රීවරුන්ගේ මේසය මත තැබීමේ සම්ප්‍රදාය බිහි වූ අතර, එම සම්ප්‍රදාය මේ වන තෙක් පවතී.

2013 මාර්තු මස 08 වැනි දිනට නියමිත න්‍යාය පත්‍රය සකස් කොට මුද්‍රණයට යැවීමෙන් පසු පාර්ලිමේන්තුවේ සභානායක ලේකම් විසින් එදිනට තවත් පනත් කෙටුම්පත් 20ක් ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරන ලෙස විධිමත්ව ඉල්ලා සිටි හෙයින් ප්‍රතිශෝධිත න්‍යාය පත්‍රයක් පිළියෙළ කරන ලදී.

ප්‍රතිශෝධිත න්‍යාය පත්‍රය රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කොට ලබා ගැනීමට ප්‍රමාද වූ හෙයින්, පාර්ලිමේන්තුවේ සභාලේඛන කාර්යාංශය මඟින් මුද්‍රණය කරන ලද ප්‍රතිශෝධිත න්‍යාය පත්‍රයේ පිටපත් 2013 මාර්තු මස 08 වැනි දින පැමිණ සිටි මන්ත්‍රීවරුන්ට ලබා දීමට කටයුතු කර තිබුණු අතර, එහි පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම් දීමෙහි අංක 1-21 දක්වා පනත් කෙටුම්පත්, 45 වැනි ස්ථාවර නියෝගයට අනුකූලව සභාවට යථා පරිදි ඉදිරිපත් කරන ලදී.

එම අවස්ථාවේදී එම පනත් කෙටුම්පත්වලට අදාළ සියලුම ගැසට් පත්‍ර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මේස මත තබා

[ගරු කථානායකතුමා මහතා]

නොමැති බව විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් පාර්ලිමේන්තුවට දැනුම් දුන් අතර, සභානායකතුමා සඳහන් කළ පරිදි එම දිනය තුළදීම අදාළ ගැසට් පත්‍ර, පැමිණ සිටින සියලුම මන්ත්‍රීවරුන්ට ලැබීමට සලස්වන බව මා විසින් දැනුම් දෙන ලදී.

පනත් කෙටුම්පත් 21ට අදාළ ගැසට් පත්‍රවල ඉංග්‍රීසි පිටපත් ලැබී ඇති නමුත් භාෂාත්‍රයෙන්ම ගැසට් පත්‍ර ලැබී ඇත්තේ පනත් කෙටුම්පත් 15ක පමණක් බව අජිත් පී. පෙරේරා, සුනිල් හඳුන්නෙත්ති සහ ලක්ෂ්මන් කිරිඇල්ල යන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් එදින විටින් විට සභාවට දැනුම් දෙන ලදී.

එදින පාර්ලිමේන්තු රැස්වීම පස්වරු 7.30ට අවසන් වීමට නියමිතව තිබූ නමුත් පෞද්ගලික මන්ත්‍රී යෝජනා ඉදිරිපත් කර තිබූ මන්ත්‍රීවරුන් දෙදෙනකුගේ නොපැමිණීම මත එම යෝජනා ඉදිරිපත් නොකිරීම නිසා පස්වරු 6.15ට පාර්ලිමේන්තුවේ කටයුතු අවසන් විය. එම අවස්ථාව වන විට සිංහල සහ දෙමළ භාෂාවලින් ලැබී නොතිබුණු,

විදුලි සංදේශ බදු (සංශෝධන),

එකතුකල අගය මත බදු (සංශෝධන),

ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන),

දේශීය ආදායම් (සංශෝධන),

බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) හා මුදල්-

යන පනත් කෙටුම්පත්වල පිටපත්, සිංහල සහ දෙමළ භාෂාවලින් පාර්ලිමේන්තුව වෙත ලැබෙන අවස්ථාවේදී පැමිණ සිටි මන්ත්‍රීවරුන් විසිර ගොස් සිටි හෙයින්, මාගේ නියමය පරිදි පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් එදින පැමිණ සිටි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පමණක් එදිනම ලැබීමට සලස්වන ලදී.

ඉහත කරුණු අනුව මෙම පනත් කෙටුම්පත් 21 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට පටහැනිව කටයුතු කර නොමැති බව දන්වනු කැමැත්තෙමි.

තවද, මින් ඉදිරියට පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදී අදාළ ගැසට් පත්‍ර, භාෂාත්‍රයෙන්ම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට ලබා දීමට හැකි වන පරිදි, අදාළ අමාත්‍යාංශ විසින් කල් වේලා ඇතිව පාර්ලිමේන්තුවේ මහලේකම් කාර්යාලයට ලබා දීමට පියවර ගත යුතු බවට දැඩි ලෙස අවවාද කර සිටිමි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, මා මේ ගැන ඔබතුමාත් දැනුවත් කර තිබුණා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව එදා රැස්වෙන අවස්ථාවේදී මේවා මුද්‍රණය කර තිබුණේවත් නැහැ. විටින් විට මේ පනත් කෙටුම්පත් මුදල් අමාත්‍යාංශයේ වාහනවලින් පාර්ලිමේන්තුවට ගෙනාවා. මුද්‍රණය කර තිබුණා නම් ඔබතුමා කියන තත්ත්වය ගැන අපට සාකච්ඡා කරන්න පුළුවන්. ඒත් මුද්‍රණය කර තිබුණේ නැහැ. වෙන එකක් තියා න්‍යාය පත්‍රය තිබුණේත් නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා පිළිතුර දෙන්නකෝ. ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා මට දැනුම් දුන්නා-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔබතුමා ඔබතුමාගේ අදහස ප්‍රකාශ කරන්නකෝ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා මට දැනුම් දුන්නා, මහලේකම්තුමා ළඟට ගිහින් ඒ ප්‍රශ්නය ගැන දැන ගන්න තිබුණාය කියා. මෙතැන කාරණා දෙකක් තිබෙනවා. එකක් තමයි න්‍යාය පත්‍රය. අනික තමයි පනත් කෙටුම්පත. මම ඉස්සෙල්ලා න්‍යාය පත්‍රය ගැන කියන්නම් ගරු කථානායකතුමනි. The Order Paper is issued everyday on which Parliament conducts its Business. එදා න්‍යාය පත්‍රයක් තිබුණේ නැහැ. අපි 225 දෙනාම තමයි මේ සභාව කියන්නේ. එදා න්‍යාය පත්‍රයක් තිබුණේ නැහැ. මා එදා පාර්ලිමේන්තු රැස්වීම්වලට සභාගී නොවුණාට එදා දවල් රැස්වීම පටන් ගන්න ඉස්සෙල්ලා මම ඇහුවා, මොකක්ද අද න්‍යාය පත්‍රයේ තිබෙන්නේ කියලා. ඒ වනකොට න්‍යාය පත්‍රයක් නිකුත් කරලා නැහැ කිව්වා. මේ සභාව කියන්නේ අප 225 දෙනාටමයි; එක පුද්ගලයෙක්, දෙදෙනෙක්, තුන් දෙනෙක් නොවෙයි. එහෙම නම් ඒ 225 දෙනාටම න්‍යාය පත්‍ර ලැබුණේ නැත්නම් අපි එදින කටයුතු කරන්නේ කොහොමද?

ගරු කථානායකතුමනි, දෙවැනි කාරණය තමයි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම. 45වන ස්ථාවර නියෝගයෙහි මේ විධියට සඳහන් වෙලා තිබෙනවා:

"45. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතු යැයි පාර්ලිමේන්තුවේ නියෝගයක් නොමැතිව ද දැනුම්දීමෙන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වන ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත් ව අමාත්‍ය මණ්ඩලයේ ඇමතිවරයකුට හෝ නියෝජ්‍ය ඇමතිවරයකුට හෝ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළ හැකිය. ..... "

ඒ අනුව පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න ඕනෑ. ඉදිරිපත් කරන්න නම් පනත් කෙටුම්පත තිබෙන්න ඕනෑ. රජයේ මුද්‍රණාලයෙන් අපට ලැබී තිබෙන කරුණු අනුව බලන විට මේ සියල්ලම එදා දහවල් 2.00 වනකොට මේ පාර්ලිමේන්තුවට ලැබී තිබුණේ නැහැ. දහවල් 2.00 වනකොට ඉස්සෙල්ලාම ආවේ Value Added Tax (Amendment) Bill එකේ ඉංග්‍රීසි පිටපත පමණයි. කොහොමටත් දැන් ඒ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවකට භාජනය වෙලා තිබෙනවා. අනික් ඒවා එක එක වෙලාවල්වලට තමයි ආවේ. ඒ වෙලාවේ තිබුණේ නැහැ. ගරු කථානායකතුමනි, එදින හැන්සාඩ් වාර්තාව අරගෙන බැලුවොත් ඔබතුමාට පෙනේවි, විශේෂයෙන්ම එහි මේ ගැන සඳහන් කර තිබෙන බව.

එහි ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කියා තිබෙනවා, සමහර පනත් කෙටුම්පත්වල පිටපත් තවම ලැබිලා නැහැ කියලා. එහිදී ඔබතුමා කියා තිබෙනවා, "ඔබතුමන්ලාට දැන් ඒවා ලැබෙනවා" කියලා. ඊට පස්සේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කියා තිබෙනවා, "ඔබතුමා කියනවා නම් අප පිළිගන්නම්" කියලා. ඒත් බොහෝ වෙලා යන තුරු අපට මොකුත් ලැබී තිබුණේ නැහැ.

ගරු කථානායකතුමනි, 2013 මාර්තු 08වැනි දා හැන්සාඩ් වාර්තාවේ Columns 557 සහ 558 කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. Column 558හි සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මෙසේ කියා තිබෙනවා:

"ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද න්‍යාය පත්‍රය අපේ මේස මත නැහැ. නමුත් මම එකක් ගෙන්වා ගත්තා. එහි සඳහන්ව තිබෙනවා, පනත් කෙටුම්පත් 21ක් අද පිළිගන්වන බව. ඒ පනත් කෙටුම්පත් අපේ මේස මත තියලා නැහැ. "

ඒ අවස්ථාවේදී ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් ඒ කාරණයම ප්‍රකාශ කර තිබෙනවා.

එම හැන්සාඩ් වාර්තාවේ Column 576හි සඳහන්ව, තිබෙනවා, යෝගරාජන් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණි බව. එම හැන්සාඩ්

වාර්තාවේම Column 591 සහ Column 592හි සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සඳහන් කර තිබෙනවා මේ පනත් කෙටුම්පත් ලැබී නැති බව. ඒ අවස්ථාවේදී ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත් අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් සඳහන් කර තිබෙනවා ඒ පනත් කෙටුම්පත් ලැබී නැති බව. ඒ කියන්නේ ඒ වෙන කොට ඒවා මේ ගරු සභාවට ගෙනැත් මන්ත්‍රීවරුන්ට දෙන්න අපොහොසත් වෙලා තිබෙනවා. ඒකට හේතුව මෙකයි. අප රජයේ මුද්‍රණාලය සමඟ සාකච්ඡා කළා. ඒ අවස්ථාව වන විට ඒ සමහර ඒවා මුද්‍රණය කර තිබී නැහැ. මුද්‍රණය කර තිබුණේ නැත්නම් ගැසට් එකත් නැහැ. අප දන්නවා මුද්‍රණාලයෙන් ගැසට් එකට නොම්මරයක් දමන බව. ඒත් ඇත්ත වශයෙන්ම ගැසට් කරන්නේ නැහැ. ඉතින් ගැසට් එකක් තිබුණේ නැහැ. මේ අනුව 45වන ස්ථාවර නියෝගය යටතේ ඒ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ නැහැ. මොකද මේ ගරු සභාවට අපේ මන්ත්‍රීවරු 225 දෙනාම අයිතියි. අප ඔක්කොම එකට එකතු වෙලා තමයි වැඩ කරන්න තිබෙන්නේ. රජය අපට කියා තිබුණා පනත් කෙටුම්පත් ගණනාවක් බ්‍රහස්පතින්දා ඉදිරිපත් කරනවාය කියලා. On that day, the Bills were not available. The Bills were in the process of being printed and had been sent by a vehicle from the Finance Ministry. When I spoke to the Secretary-General in the evening, he said, "Sir, we have not got all of them".

Then, you sent me some of them, not the whole lot. So, the House was not possessed of all the Bills at that time. When the House adjourned, only 15 Bills had been given in all three languages.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත් සියල්ලෙහිම ඉංග්‍රීසි පිටපත් තිබුණා නේද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
නැහැ ගරු කථානායකතුමනි. ගෙනැල්ලා තිබුණේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නමුත් සිංහල ඒවා සහ දෙමළ ඒවා-

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
එදා පස් වරු 2.00 වන කොට එවලා තිබුණේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගැසට් පත්‍රය දිහාත් බලන්න. ගැසට් පත්‍රයේ දිනය විධියට තිබෙන්නේ නියමිත පරිදි සභියකට-

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගැසට් පත්‍රයේ ඒ දිනය ලියලා තිබෙනවා. ඒත් print කරලා තිබුණේ නැහැ. They have taken the order. You must call for the Government Printer immediately. We can go to Narahenpita - ගරු කථානායකතුමනි, අපත් මේ තොරතුරු සොයා ගත්තා. මේක පාර්ලිමේන්තුව නොමඟ යැවීමක්. ඒ විධියට දිනය දැම්මාට කමක් නැහැ සභියකට ඉස්සර වෙලා අපට ඒවා දුන්නා නම්. පෙබරවාරි මාසයේ දිනයක් දැම්මාට කමක් නැහැ. හැබැයි, සභියකට ඉස්සර වෙලා අපට ඒ පිටපත් ඕනෑ. එහෙත් print කරන්න ආරම්භ කළේ කවදාද? බ්‍රහස්පතින්දායි ඒ නියෝගය දීලා තිබෙන්නේ. ඒ කියන්නේ, කෙටුම්පත් සකස් කරලා තිබුණේ නැහැ. කෙටුම්පත් සකස් කරලා තිබුණේ නැති නිසා තමයි අප කියන්නේ- You are turning Parliament into a joke. The normal procedure is, you put the date and whatever it is you print it and send it within a week. Then, we have no problems. We are not going to kick up a row about the date. මට ලැබිලා තිබෙන වාර්තාව අනුව, දවල් 1.30ට විතර තමයි මේ කෙටුම්පත් එවන්න පටන් ගත්තේ. Value Added Tax (Amendment) Bill එක තමයි ඉස්සර වෙලාම එව්වේ. ඒවායේ දෙමළ පිටපත් එවන කොට රාත්‍රී 8.00 වෙලා තිබෙනවා. න්‍යාය පත්‍රයේත් කොටසයි තිබුණේ. අපට න්‍යාය පත්‍රය දීලා තිබුණේත් නැහැ. දිනය දාලා තිබුණත් සභියකට ඉස්සර වෙලා වත් ඒ කෙටුම්පත් මුද්‍රණය කර තිබුණේ නැහැ. සමහර ඒවා සිකුරාදා උදේ තමයි මුද්‍රණයට ගියේ.

ඒ නිසා ගරු කථානායකතුමනි, අනෙක් අයගේ අදහස්වලටත් ඇහුම් කන් දීලා මේ ගැන වෙනම සාකච්ඡා කරමු. අපි විශේෂයෙන්ම රජයේ මුද්‍රණාලයට කථා කළා. මුද්‍රණාලයට කථා කළාම, ඒ අය කියන්නේත් මේවා විටින් විට මුද්‍රණය කළ බවයි. එහෙම නම්, මේ පනත් කෙටුම්පත්වල දින දාලා තිබෙනවා නම් ඒක මේ පාර්ලිමේන්තුව නොමඟ යැවීමක්. ඒ දමපු දිනය කුමක් වුණත් කමක් නැහැ, අපට පෙන්වන්න සුමානයකට කලින් හෝ ඒවා මුද්‍රණය කරලා තිබුණා නම්. නමුත් ඒවා මුද්‍රණය කරලා තිබුණේ නැහැ. "ඉදිරිපත් කිරීම" කියන සිංහල වචනවල අදහස මොකක්ද? ඉදිරිපත් කරනවාය කිව්වාම සියලුම මන්ත්‍රීවරුන්ට ඒවා ලැබිලා තිබෙන්න ඕනෑ. ඉදිරිපත් කරන අවස්ථාවේදීවත් ඒවා අපට ලැබී තිබුණේ නැහැ. ගරු කථානායකතුමනි, මේ සියල්ලම ඉදිරිපත් කරනවාය කියන අවස්ථාවේදීවත් ඇමතිතුමා ළඟ සියලුම පනත් කෙටුම්පත් තිබුණේ නැහැ. ඒ වාගේ තත්ත්වයක් තිබුණේ. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඔබතුමා කියන කාරණය අපට පිළිගන්න පුළුවන් මේවා මුද්‍රණය කරලා තිබුණා නම්, මේ න්‍යාය පත්‍රයේවත්. එසේ මුද්‍රණය කරලා නොතිබීම ගැන කරුණු කියන්නයි මම විශේෂයෙන්ම-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නමුත් අපි ළඟ තිබෙන්නේ "පනත් කෙටුම්පත් ඉදිරිපත් කළ දිනය" කියලා නේ. එහෙම නම් අපි වෙනම පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ මේ දිනය වන විට මෙවා ගැසට් කරලා තිබුණාද කියලා. නමුත් දැනට ඉදිරිපත් වී තිබෙන, ඔබතුමාගේ ලිපියේ තිබෙන කරුණු පිළිබඳව සොයා බලලා නේ මගේ තීරණය දීලා තිබෙන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, ඔබතුමා කිව්වේ දිනය ගැන. මම දැන් අලුත් ප්‍රශ්නයක් මතු කරලා තිබෙනවා, අපව නොමඟ යැව්වාද කියලා. මොකද, මේවා මුද්‍රණය කරලා තිබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අලුත් ප්‍රශ්නය ගැන අපේ අවධානය තදින්ම යොමු කරන්න ඕනෑ. මොකද, අපි ඒ විස්තර දන්නේත් නැහැ නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

February මාසයේ දිනය දාලා, මුද්‍රණය කළාට කමක් නැහැ. අපි ඒ ගැන සොයන්න යන්නේ නැහැ. Those are technical issues. නමුත් මෙතැන මේ පාර්ලිමේන්තුව නොමඟ යවන තත්ත්වයක් තිබෙනවා. ඒකයි මම කියන්නේ. මේ අය කැඳවලා සියලුම details අරගෙන, printing details අරගෙන බලමු මොකක්ද සිදු වුණේ කියලා. The English copy of the Value Added Tax (Amendment) Bill was brought in but now the Value Added Tax (Amendment) Bill is anyway being challenged.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මම නියෝගයක් දීලා තිබෙනවා. ඊට අමතරව ගරු විපක්ෂ නායකතුමා කරුණු කිහිපයක් මතු කළා. ඒ මතු කළ කරුණු පිළිබඳව විවාදයක් අවශ්‍ය නැහැ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Point of Order? පොඩ්ඩක් ඉන්නවා ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි,

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු විපක්ෂ නායකතුමා මගේ නියෝගයට අමතරව කරුණු කිහිපයක් ඉදිරිපත් කළා. ඒ පිළිබඳව සභානායකතුමාගේ පැහැදිලි කිරීමෙන් පස්සේ අවශ්‍ය පිළිතුරු නොලැබෙනවා නම් අවස්ථාව දෙන්නම් අදහස් ඉදිරිපත් කරන්න. [බාධා කිරීමක්] ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால் அமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ කරුණු පිළිබඳව ඔබතුමාගේ තීරණය ප්‍රකාශයට පත් වී තිබෙනවා. ඊට අතිරේකව කරුණු තිබෙනවා නම් අප කාටත් සොයා බලන්න පුළුවන්. ඒ ගැන ගැටලුවක් නැහැ. මේ අවස්ථාවේ මේ කාරණයටත් මා විපක්ෂ නායකතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. දැන් එතුමා හැන්සාඩ් වාර්තාවේ තිරු අංක සඳහන් කරමින් කරුණු ඉදිරිපත් කළා. එදින හැන්සාඩ් වාර්තාවේ තිරු අංක 608හි ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කියා තිබෙනවා, ඉංග්‍රීසි පිටපත් 21 ම ලැබී තිබෙන බව. [බාධා කිරීමක්] නැහැ, නොවෙයි. මේ හැන්සාඩ් වාර්තාවේ තිබෙන දේ මට කියන්න ඉඩ දෙන්න. ඔබතුමාට කියන්න මා ඉඩ දුන්නා නේ. සිංහල පිටපත් ලැබෙමින් තිබුණා. ඒවා ලැබුණු විගස පාර්ලිමේන්තුවෙන් මන්ත්‍රීවරුන්ට බෙදා හැර තිබෙනවා. එදා පාර්ලිමේන්තුවේ හිටියේ මන්ත්‍රීවරු අතළොස්සයි. කනගාටුයි කියන්න, මන්ත්‍රීවරු බොහොම අතළොස්සයි එදා පාර්ලිමේන්තුවේ හිටියේ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාත් හිටියේ නැහැ; මාත් හිටියේ නැහැ. සභානායකතුමා සඳහන් කළ පරිදි ඒ දවස තුළ මන්ත්‍රීවරුන්ට ලබා දීම සඳහා මේ පනත් කෙටුම්පත් මුද්‍රණය කරමින් තිබුණා.

පනත් කෙටුම්පත් 21 ක් මුද්‍රණය කරමින් පවතිනකොට තිබෙන ප්‍රමාදය මත සභාව හමාර වීමට කලින් මෙතැනට ලබා දීම සඳහා කටයුතු කෙරුණා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා, අය වැය විවාදය අවසන් කළේ දෙසැම්බර් මාසයේ 8 වන දායි. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය අවසාන දිනය වන තෙක් සිටිය එක තමයි මෙතැන ගැටලුව වෙලා -ප්‍රශ්නය වෙලා- තිබෙන්නේ. ඒකටයි ප්‍රතිකර්මය සොයන්න ඕනෑ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඒකට ප්‍රතිකර්මයක් සෙවීම ඉතාම හොඳයි. විපක්ෂ නායකතුමාත් අපත් බොහොම කලින් ඉල්ලීමක් කර තිබුණා, මේ පාර්ලිමේන්තුවට පාර්ලිමේන්තු නීතිපති කෙනෙක් පත් කරන්නය කියා. එතකොට මේ කටයුතු expedite වෙනවා. අපේ ක්‍රමවේදය අනුව කටයුතු කරන කොට විවිධ තැන්වල ප්‍රමාදයන් රාශියක් සිදු වෙනවා. සමහර වෙලාවට යල් පැන ගිය ස්ථාවර නියෝග, නීති වෙනස් කර ගන්න වෙනවා. විපක්ෂ නායකතුමාත් අපිත් අවුරුදු ගණනාවකට කලිනුත් කියා සිටියා, මේ කටයුතු ඉක්මනින් පිළිවෙළ කර ගන්න පාර්ලිමේන්තුවට ප්‍රධාන නීති නිලධාරියෙක් සිටිය යුතුයි කියා. ඒක ඉතාම වැදගත්. මේක අද මතු වුණු වැදගත් කාරණාවක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මෙය පක්ෂ නායකවරුන් සමඟ සාකච්ඡා කර වහාම ක්‍රියාත්මක කළ යුතුයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

මම විශේෂයෙන් සඳහන් කළේ 45 වන ස්ථාවර නියෝගය අනුව පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම පිළිබඳ ක්‍රියා පිළිවෙළ සම්බන්ධයි. ඒ වෙලාවේ තිබුණේ නැහැ. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා පසුව කියන විට කොටසක් ඇවිත් තිබුණා. අපි ඒකයි බැලුවේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ වෙලාවේ ඉංග්‍රීසි භාෂාවෙන් සියලුම දේ තිබුණා. [බාධා කිරීමක්] මෙතැන තිබුණා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා මේක අරගත්තේ පස වරු 2.00ට. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට

මේක ලැබිලා තිබුණේ පස් වරු 5.00ට විතර. ඒත් මෙතැන තිබුණේ "At the Commencement of Public Business" කියා. ඒ වෙලාවේ අව්වු ගහලා නැහැ. ඒකයි මම කියන්නේ. Print කරලා හරි මෙහාට ආවා නම් කමක් නැහැ. That is what we are telling.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Print වෙනවා. එතැන ඉඳලා මෙතැනට එන්න තිබුණු අපහසුතාව - There was a delay in delivery. All of us agreed to it at the Party Leaders' Meeting.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ආරම්භයේදීම ඉංග්‍රීසි භාෂාවෙන් සියල්ලම තිබුණා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙතැන ඔක්කොම තිබුණා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අපි ඉස්සෙල්ලා අනුර දිසානායක මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, පසු ගිය කාලයේ මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය පිළිබඳව අපේ රටේ විශාල විවාදයක් ගියා. විටින් විට බොහෝ අය අදහස් දක්වමින් මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය පිළිබඳව සාකච්ඡා කළා. අපි හිතනවා, මෙහි උත්තරීතරභාවය ආරක්ෂා වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, රීතීන් සහ සාම්ප්‍රදායනුත් ආරක්ෂා කිරීමෙන් පමණයි කියලා. එසේ නැතිව වාක්‍යවලින්, විටින් විට පැන නැහෙන ප්‍රශ්න මත ඉදිරිපත් කරන කරුණුවලින් මෙහි උත්තරීතරභාවය ආරක්ෂා වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට ගරු අමාත්‍යතුමා පනත් කෙටුම්පත් ටික ඉදිරිපත් කරනවා යැයි කියූ අවස්ථාවේ දී ඒ පනත් කෙටුම්පත් මේසය උඩ තිබුණේ නැහැ. මා හිතන හැටියට සභකාර මහ ලේකම්තුමිය මේ ගැන සාක්ෂි දරනවා ඇති. මා එතුමියගෙන් විටින් විට විමසා සිටියා, මේ පනත් කෙටුම්පත් මේ පාර්ලිමේන්තුවේ සභාගත කෙරේවිද කියලා. එතුමියටත් ඒ ගැන නිශ්චිත අදහසක් තිබුණේ නැහැ. එතුමියත් කිව්වේ, "මුද්‍රණාලයෙන් මෙහාට ලැබෙන පරිදි තමයි මේවා සභාගත කරන්න සිද්ධ වෙන්නේ" කියලායි. මා හිතන හැටියට එතුමිය මේ ගැන සාක්ෂි දරයි. අවසානයේ දී තමයි මේ පනත් කෙටුම්පත් සභාගත කළේ නැත්නම් පස්සේ හරි අපට එවන්නය කියන අදහසක් අපි එතුමියට ඉදිරිපත් කළේ. ඒ, මොනවාද මේ පනත් කෙටුම්පත් කියලා දැන ගන්න. මොකද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විවාදයට සහභාගී වීමට පෙර, පනත් කෙටුම්පත් සභාගත කරන මොහොතේදීවත් ඒ පනත් කෙටුම්පත් නැත්නම් මේ පාර්ලිමේන්තුවේ එම පනත් කෙටුම්පත් ගැන විවාද කිරීමේ තේරුමක් නැහැ.

ඉන් අනතුරුව සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ප්‍රශ්නය මතු කරන කොට සභාව කල් තබලාත් අවසන්. සභාව කල් තබලා අවසන් වී කල් තැබීමේ විවාදය අවස්ථාවේදී තමයි අවසන් අවස්ථාවට සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය පැන නැඟුවේ. එතකොටත් විටින් විට අපේ සේවක මහත්තුරුන් විසින් අපට පැවසුවේ සමහර පනත් කෙටුම්පත්වල ඉංග්‍රීසි පිටපත් ලැබී තිබෙනවා, නමුත් සියලුම භාෂාවලින් පිටපත් නොමැති නිසා සභාගත කිරීමෙන් ඔවුන් වැළැකී සිටිනවා කියලායි. ඒක තමයි ඔවුන්ගේ අදහස බවට පත් වෙලා තිබුණේ. මේක අපි සේවක මහත්වරුන්ගෙන් විමසුවා; කාර්ය මණ්ඩලයෙන් විමසුවා. ඔවුන්ගේ අදහස බවට පත් වී තිබුණේ ඒකයි. ගරු කථානායකතුමනි, අනතුරුව තමයි ඔබතුමා පැවසුව විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත, එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත, රේගු (සංශෝධන) පනත් කෙටුම්පත, ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත, බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත, මුදල් පනත් කෙටුම්පත කියන මේ පනත් කෙටුම්පත් හයේ ඉංග්‍රීසි, දෙමළ, සිංහල පිටපත් තුනම රැගෙන රාත්‍රී දොළහට - ගරු කථානායකතුමනි, මා ඉතා වගකීමෙන් කියන්නේ- අපගේ කාර්යාලයට නිලධාරි මහත්මයෙක් පැමිණ, කාර්යාලයේ දොරට තට්ටු කරලා අහනවා, "මේ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුව තිබුණු පනත් කෙටුම්පත් වගයක් දැන් ඇවිල්ලා තිබෙනවා, ඒ පනත් කෙටුම්පත් කාර්යාලයට දීලා යන්නද?" කියලා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභා කාලයේදී ඉදිරිපත් කළ යුතු, සභාගත කළ යුතු පනත් කෙටුම්පත්, යම් කවර හෝ දේශපාලන පක්ෂයකට රාත්‍රී 12.00ට ලබා දීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ රීතීන් හෝ සම්ප්‍රදායයන් ආරක්ෂා වන්නේ නැහැ. පසු ගිය කාලය පුරාවටම තිබුණේ මෙහි උත්තරීතරභාවය පිළිබඳව සාකච්ඡා; උත්තරීතරභාවය පිළිබඳ විවාද.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සම්ප්‍රදායයන් ඇති වනවා, නැති වනවා නේ. ඒක ප්‍රශ්නයක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔව්, ඒක හරි. සම්ප්‍රදායයන් එහෙම වන්න පුළුවන්. නමුත් ගරු කථානායකතුමනි, අපි ඉවත් කළ යුතු වන්නේ වැරදි සම්ප්‍රදායයන්. අපි ආරක්ෂා කළ යුතු වනවා, නිවැරදි සම්ප්‍රදායයන්. හැබැයි දැන් මෙතැන සිදු විය යුතුව තිබුණේ නිවැරදිව සිදු වන සම්ප්‍රදායයක්. සභාවට කියන අවස්ථාවේදී පනත් කෙටුම්පත් ටික මේසය මත තැබීම. මම හිතන හැටියට ඒක ඉතාමත් හොඳ නිවැරදි සම්ප්‍රදායයක්.

හැබැයි දැන් ඒ නිවැරදි සම්ප්‍රදායන් ඉවත් කොට කාර්යාලවලට රාත්‍රී 12ට තට්ටු කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ලේඛන ඉදිරිපත් කිරීමේ සම්ප්‍රදායන් සුදුසු නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉස්සරත් එහෙම වෙලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, මා දන්නවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
රාත්‍රියේත් හදිසියේ බෙදනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැන් අවුරුදු 11ක්, 12ක් විතර වෙනවා. මේ අවුරුදු 12 ඇතුළත මා දැකපු පළමුවැනි අවස්ථාව තමයි මේ, සභාගත කරනවාය කියන අවස්ථාවේ පනත් කෙටුම්පත් ගරු සභාවේ නොතිබී කාර්යාලයට ගොස් තට්ටු කර ලබා දීම. ගරු කථානායකතුමනි, ඔබතුමා මතු කළා මේක. ඔබතුමා විශේෂයෙන්ම කාර්ය මණ්ඩලයට අවවාද කළා, නියමිත පරිදි දෙන්න කියලා. ඒකෙන්ම පෙනෙන්නේ ඔබතුමාගේ හෘදය සාක්ෂියට අනුව ඔබතුමාත් දන්නවා මෙතැන සිදු වී තිබෙන්නේ පාර්ලිමේන්තුවේ තිබෙන අවශ්‍ය මූලධර්මයන් ආරක්ෂා කිරීම නොවන බව. ඒ නිසා තමයි, "අවවාද කරනවාය" කියන ප්‍රකාශයක් ඔබතුමාට මෙතැනදී කරන්න සිදු වුණේ. එහෙම නැතුව ඔබතුමා ඊට වඩා දරුණු ප්‍රකාශයක් කරනවා. නමුත් මා හිතන හැටියට ඔබතුමාගේ සීමාවන් තුළ එවැනි ප්‍රකාශයක් පමණයි ඔබතුමාට කළ හැකි වන්නේ. අවවාද කිරීමක් වාගේ දෙයක්. ඒකෙන්ම පෙන්නුම් කරන්නේ, මොන තරම් විධියට මේ තිබිය යුතු සම්ප්‍රදායන්, රීතින් උල්ලංඝනය කර තිබෙනවාද කියන එකයි. ඉතින් අප අහන්නේ එහෙම විවාදයක් මේ පාර්ලිමේන්තුවේ පැවැත්විය යුතු ද?

ගරු සභානායකතුමා සහ විශේෂයෙන්ම අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි ඔබතුමා, මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායන් පිළිබඳව විටින් විට මේ ගරු සභාවේ ඉතාමත් වෙගවත් කථාවන් පැවැත්වූවා. හැබැයි ඔබතුමාගේ හෘදය සාක්ෂියට එකඟ ද මේ සිදු වන දේ? අඩුම තරමේ ගරු කථානායකතුමනි, මෙහෙම කියනවා නම්, "සැබැවින්ම අතපසු වීමක් සිදු වී තිබෙනවා; එය පාර්ලිමේන්තු සම්ප්‍රදායයක් බවට පත් කර ගත යුතු නැහැ; ඒ වැරැද්ද පිළිබඳව පාර්ලිමේන්තුවෙන් අප යම් ප්‍රමාණයකට කනගාටුව ප්‍රකාශ කරනවා; නමුත් මාර්තු මාසයේ 31වැනිදාට පෙර මේ පනත් කෙටුම්පත් සම්මත කර ගත යුතුව තිබෙනවා; ඒ නිසා තමයි අප මේක සම්මත කරන්නේ." කියලා. අඩුම තරමේ උඩඟුභාවයකින් තොරව, උද්ධච්චභාවයකින් තොරව එවැනි නම්‍යශීලිත්වයක් තිබුණා නම්! එතකොට පාර්ලිමේන්තුවේ අද මේවා සාකච්ඡාවට බඳුන් කරන්නේ, විශේෂ හේතුවක් සේ සලකා. එතකොට හරි. විශේෂ හේතුවක් සේ සලකා. එතකොට ඒක සම්ප්‍රදායයක් වන්නේ නැහැ. ඒක අනාගතයට අත් දැකීමක් බවට පත් වන්නේ නැහැ. මෙවැනි විශේෂ අවස්ථාවක් නිසා, ආණ්ඩුව පත් වී තිබෙන අතිශය දුෂ්කර හා කනගාටුදායක තත්ත්වය නිසා මේ පනත් කෙටුම්පත් සාකච්ඡාවට බඳුන් කරන්න කියලා ඉල්ලීමක් කරනවා නම්, ඒ පිළිබඳව සලකා බලන්නට පුළුවන්. නමුත් ගරු කථානායකතුමනි, මේ රීතිවලට, සම්ප්‍රදායන්වලට, ව්‍යවස්ථාවට මුවා වෙමින් මේ ගැන සාකච්ඡා කරන්න, මේවා සම්මත කරන්න හදනවා නම් එයින් අපි වැරදි සම්ප්‍රදායයක්, වැරදි අත් දැකීමක් මේ පාර්ලිමේන්තුවේ අනාගතයට ඉතුරු කරනවාය කියන එක තමයි මගේ අදහස.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම දීපු තීන්දුවට විරුද්ධව-[බාධා කිරීමක්] හොඳයි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ රීති ප්‍රශ්නය?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, 45වන ස්ථාවර නියෝගය යටතේ තිබෙනවා, " ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පතක් මෙසේ ඉදිරිපත් කරනු ලැබූ විට ....." කියලා. මගේ ගෙදරටත් රෑ 12.00ට ආවා. ගරු කථානායකතුමනි, මමත් අවුරුදු 25ක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. හැබැයි මට නම් මතක නැහැ, කිසිම දවසක රෑ 12.00ට අපේ ගෙදරට ඇවිල්ලා පනත් කෙටුම්පතක් භාර දෙන්න හදපු ක්‍රමයක්. ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතකද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
1989 මතක නැද්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
1989 වුණේත් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සමහර දේවල් කාට කාටත් අමතක වෙනවා. මම පිළිගන්නවා, මෙතැනදී සිංහල සහ දමිළ භාෂාවලින්-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි සහයෝගයෙන් වැඩ කරන්න සූදානම්. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ රජය පිළිගන්නවා නම් අත පසුවීමක් වුණා කියලා අපි මෙහිදී අවශ්‍ය සහයෝගය දෙන්න සූදානම්. නමුත් මේක සම්ප්‍රදායයක් කර ගන්න එපා. හැම දාම රෑ 12.00ට අපේ ගෙදරට ඇවිල්ලා පනත් කෙටුම්පත් දෙන්න පටන් ගත්තොත්-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම එය අනුමත කරන්නේ නැහැ. මම ඒක තමයි අවවාදයක් කළේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම එදා දවසේම පාර්ලිමේන්තුවේ හිටියා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දඬුවම් දෙන්න පුළුවන් බලයක් මට තිබුණා නම් මම ඒකත් කරනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ පොඩ්ඩක් ඉන්නකෝ. එක මන්ත්‍රීවරයෙක් කථා කරනවා නේ. [බාධා කිරීමක්] එතුමාට කථා කරන්න ඉඩ දෙන්න එපායැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එදා දවසම මා පාර්ලිමේන්තුවේ සිටියා. ඇත්ත වශයෙන්ම එදා හැන්දෑවේ 6.00ට තමයි මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කළේ. එවිට අනුර දිසානායක මන්ත්‍රීතුමාත්, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් සිටියා. එතකොට -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කියා තිබෙනවා, එතුමාට ඉංග්‍රීසි භාෂාවෙන් පනත් කෙටුම්පත් 21ම ලැබුණා, සිංහල භාෂාවෙන් පනත් කෙටුම්පත් යම් ප්‍රමාණයක් ලැබී තිබෙනවා කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඒ වෙලාවේ මූලාසනයේ සිටි අපේ ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමා නියෝගයක් කරලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එම නියෝගය, table කළේ නැහැ කියලා නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නමුත් ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවේ ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී - At the Commencement of Public Business තමයි පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිවැරැදි වෙලාවට ගැසට් කර තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නියෝගයේදී මගේ නමත් සඳහන් වුණා. පළමුවන කාරණය තමයි, සභාවේ කටයුතු ආරම්භයේදී කිසිම භාෂාවකින් එකම පනත් කෙටුම්පතක්වත් අපේ මේස මත තිබුණේ නැහැ. මා දිගින් දිගටම ඔබතුමාට ඒ ප්‍රශ්නය මතු කළා. ඉංග්‍රීසි භාෂාවෙන් පනත් කෙටුම්පත් 21 සම්පූර්ණ වුණේ පස් වරු 6.00ට, 6.30ට ආසන්න වෙලාවකදීයි. මමයි ඒ ප්‍රශ්නය මතු කළේ. මා වග කීමෙන් කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙතැන පනත් සියල්ලම තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, සවස 2.30ට මහ ලේකම්තුමා දීර්ඝ නාමය කියවන විට ඉංග්‍රීසි භාෂාවෙන්වත් පනත් කෙටුම්පත් 21 ම තිබුණේ නැහැ. ඉන් පස්සේ විටින් විට කාණ්ඩ වශයෙන් ඉදිරිපත් වුණා. අවසානයේදී ඒ ප්‍රශ්නය නහන්න මමත් මූලික වුණා. සිංහල භාෂාව සහ දෙමළ භාෂාව තමයි නීති සෑදීමේ භාෂාවන්. එතකොට සිංහල භාෂාවෙන් සහ දෙමළ භාෂාවෙන් පනත් කෙටුම්පත් 6ක් ලැබිලා ම තිබුණේ නැහැ. අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා පොරොන්දු වුණා, අපට ඒ පනත් කෙටුම්පත් දෙනවා කියලා.

ගරු කථානායකතුමනි, තව කරුණක් වැරැදි ලෙස ඔබතුමාට වාර්තා වෙලා තිබෙනවා. මගේ නිවස ඉදිරිපිට තිබෙන මගේ අසල්වැසියාගේ නිවසටයි මේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා භාර දුන්නේ. එසේ භාර දුන්නේ ඒ දවස ඇතුළතදීත් නොවෙයි. භාර දුන්නේ පසු දින පාන්දර 1.00ටයි. ගරු කථානායකතුමනි, මම මේ දේවල් කියන්නේ ඔබතුමාගේ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව ගැන බලන්න වන නිසායි. මොකද ඔවුන්ට පොලිස් ආරක්ෂාව නැහැ. රාත්‍රී කාලයේ මේ වාගේ අවස්ථාවක හදිසියේ බල්ලෙක් සපා කෑවා නම්, එහෙම නැත්නම් හොරෙක්, හතුරෙක් කියලා සැක හිතලා පහර දීමක් සිද්ධ වුණා නම්, ඔබතුමාගේ කාර්ය මණ්ඩලය විපතට පත් වනවා. හදිසියේ "ශ්‍රීස් යකා" කියලා කියන්නත් පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එසේ කරන්න සිද්ධ වුණේ මේකයි. එදින පාර්ලිමේන්තුව පස් වරු 7.30 වන තෙක් පැවැත්වීමට නියමිතව තිබුණා. නමුත් පස් වරු 7.30 වෙන්න ඉස්සෙල්ලා සභාවේ කටයුතු අවසන් වුණා. සභානායකතුමා ප්‍රකාශ කළේ මෙම පනත් කෙටුම්පත් සභාව තුළදී මන්ත්‍රීවරුන්ට බෙදනවා කියලායි. ඒ ප්‍රකාශය කරන කොට කාල වේලාව තිබුණා. ඒ නිසා තමයි මම කිව්වේ මේවා කොහොම හරි බෙදා දෙන්න කියලා. කාගේ කාගේ හරි අඩු පාඩුකම් අපි සම්පූර්ණ කරන්න එපායැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මට ලැබී තිබෙන තොරතුරු අනුව මුද්‍රණාලයේ කටයුතු අවසන් වුණේ රාත්‍රී 8.00ටයි. මේ ගැන අපි හොයා බැලුවා. භාෂා තුනෙන් මේ සම්බන්ධ මුද්‍රණ කටයුතු අවසන් වුණේ රාත්‍රී 8.00ටයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක මම දන්නේ නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ නිසා පස් වරු 7.30 වෙනකම් පාර්ලිමේන්තුවේ කටයුතු පැවැත්වුණා වුණත්, මේ පනත් කෙටුම්පත් එදා බෙදා දෙන්න

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

බැහැ. අනෙක් කරුණ, ස්ථාවර නියෝග 45 අනුව අදාළ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන මොහොතේ එය සභාවේ තිබෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනවා කියලා කියන්නේ එහි නම කියවන එක පමණක් නොවෙයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක හරි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නීති පනවන භාෂාවෙන් එනම්, සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් මෙය අපට -මන්ත්‍රීවරුන්ට- කියවා දැන ගෙන තේරුම් ගැනීමට අවස්ථාව තිබෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නියෝගය හරහා අපට පෙනෙනවා, අනාගතයේ මෙවැනි වැරැදි සිදුවීම වළක්වන්න ඔබතුමා කටයුතු කරනවා කියලා. ඒ ගැන බොහොම ස්තුතියි.

නමුත් මේ සිදුවීමෙන් පෙනෙන දේ තමයි, පාර්ලිමේන්තු සම්ප්‍රදායන් ගැන නොසලකා අපට බලය තිබෙනවා; අපට හැම දේම කර ගන්න පුළුවන්; කොහොම හරි කර ගන්න පුළුවන් කියන පදනම තුළ සිටීම නිසා රාජ්‍ය තන්ත්‍රයම අකාර්යක්ෂම වෙලා තිබෙනවා කියන එක. මේක රටට හොඳ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අවසානයට කිවූ ටික මමත් පිළිගන්නවා. Hon. Azwer, you can raise your point of Order now.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Thank you, Mr. Speaker. It is a late Order that you are giving me. Anyway, Sir, the Standing Order is very clear -[*Interruption.*] Do not worry. I was a little late in raising the point of Order.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You are always late.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කලබල වෙන්න එපා. කාගේ කාගේත් දුර්වලකම් තිබෙනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, my point of Order is this. The Standing Order is very clear that when an Order is made from the Chair, it is binding and if anybody wants to raise any point on it, they can ask for a debate later. But, what the Hon. Leader of the Opposition endeavours to do in his assertion is to canvass your Order and he is also virtually repeating what you said from the Chair.

Therefore, I say that whatever they have said is against the Standing Orders as far as the Order of the Chair is concerned and I request to expunge all that. Once upon a time I moved a motion in this House that there must be a separate printing press in Parliament in order to avoid such unavoidable circumstances and delays. Therefore, I would kindly urge you, Sir, that we must take this up very seriously. I think the Hon. Leader of the House and others would agree that we must have our printing press, a small one, at least to print the Order Papers and other amendments and enactments. Thank you.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ යෝජනාවත් හොඳයි. ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ පිළිබඳව කථා කරන්න හැමෝටම අවස්ථාව දෙන්න බැහැ. පක්ෂ නායකයන්ට විතරයි මට අවස්ථාව දෙන්න පුළුවන්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මටත් අවස්ථාවක් දෙන්න, ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම නියෝගයක් දුන්නාට පස්සේ නැවත ඒක වෙනස් කරන්න බැහැ. හිටපු කථානායක ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා. [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම හිටපු කථානායක කියලාවත් විශේෂයක් කරන්න අවශ්‍ය නැහැ. ඔබතුමා දුන් තීන්දුවට විරුද්ධව නොවෙයි මම කථා කරන්නේ. ඔබතුමාගේ කථාව අනුවත් ඒ තීන්දුවෙන් ඇති වෙච්ච යම් යම් කාරණා පිළිබඳවත් අපට නොපැහැදිලි තත්ත්වයන් තිබෙනවා. ඒ නිසා Party Leaders' Meeting එකක් කැඳවලා මේ පිළිබඳව තව දුරටත් සාකච්ඡා කරන්න කියා මා යෝජනා කරනවා. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් ඒකට එකඟයි.

ගරු කථානායකතුමනි, දෙවැනි කාරණය මේකයි. මේ විවාදයේදී මතු වූ කරුණු අනුව මට ප්‍රශ්නයක් එනවා, අවසාන මොහොතේ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් මේ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ගැන. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ කටයුතු කරන කොට, ඒ වාගේම රටේ

කටයුතු කරන කොට රාජ්‍ය භාෂාවලට මූලිකත්වය ලැබිය යුතුයි. රාජ්‍ය භාෂා දෙකක් තිබෙනවා. ඒ තමයි සිංහල භාෂාව සහ දෙමළ භාෂාව.

මේ පනත් කෙටුම්පත් ද්‍රවිඩ භාෂාවෙනුත්, සිංහල භාෂාවෙනුත් පාර්ලිමේන්තුවේ තිබුණේ නැහැයි කියන එක මේ සියලුම කථාවලින් පැහැදිලි වනවා. ඒකත් මේ සාකච්ඡාවට ගන්න අපට පුළුවන් වෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
We cannot question the Hon. Speaker's Order now.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
I am not going to contest that. We need a clarification regarding this. I am not going to object to that. We are not going to challenge it.

ගරු කථානායකතුමනි, රාජ්‍ය භාෂා දෙක සහ link language එකක් හැටියට ඉංග්‍රීසි භාෂාව පාවිච්චි කරන්නට පුළුවන් කියන එක තමයි රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව තිබෙන්නේ. නමුත් රාජ්‍ය භාෂා දෙකක් හැටියට තිබෙන ද්‍රවිඩ සහ සිංහල භාෂා අත්හැරලා ඉංග්‍රීසි ඉස්සරහට දමලා, ඒකෙන් පමණක් මේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරන්නට පුළුවන් කියන එක මා පිළිගන්නේ නැහැ. ඔබතුමාගේ අවධානය සඳහා මා මෙය යොමු කරවනවා. මේ කාරණා දෙකම ගැන අපි එකතු වෙලා සාකච්ඡා කරමු.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Mr. Speaker, you gave an Order. I only tried to supplement it by saying, "when the Gazette is issued and printed". That is what you have implied. Here, we have a situation which you were not aware of but which we became aware of: that the Gazette was not printed. So, I think the best situation is, - I would agree with the Hon. Joseph Michael Perera - if the Government Benchers are also agreeable, to speak about this at the Party Leaders' Meeting immediately because some of these things are not problems of Parliament itself. Otherwise, we will get into an argument on both sides. If you can give us 10 minutes, we could meet you and find a way of sorting it out.

I am also happy that the Hon. Azwer agreed with me. He has said that there is a need for a press, which means he has accepted the fact that there had been a delay in the Government Press. That is what I am saying.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. [බාධා කිරීමක්] එහි තිබෙන්නේ table කරනවා කියලායි. Table කිරීමක් අවශ්‍ය නැහැ. එය වැරැදියි. යෝගරාජන් මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Hon. Speaker, I was presiding at the time this issue came up. The Hon. Sunil Handunnetti agreed that 21 Bills were available in English. I inquired from the Deputy Secretary-General who was in the House and he confirmed that six Bills were not available in Tamil and Sinhala. Since all the Bills should be made available in all three languages to the Members, I made a Ruling that those six Bills had not been tabled properly. You maybe overruling me, Sir. As the Hon. Speaker, you maybe entitled to do so. But, I think you should do that with the consent of the House. Thank you.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ Order එකේ යොදපු වචනය වැරැදියි. Table කියන වචනය නොවෙයි සඳහන් කරන්න තිබුණේ, වෙනත් වචනයක්. එහෙම කළා නම් කවුරුවත් අමාරුවේ වැටෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
රවි කරුණානායක මන්ත්‍රීතුමනි, මම දැන් කිව්වා නේ පක්ෂ නායකවරුන්ට විතරයි කථා කරන්න දෙන්නේ කියලා. [බාධා කිරීමක්] එහෙම නම් ඊට පසුව මේ ටික කරගෙන යන්න ඉඩ හරින්න ඕනෑ. [බාධා කිරීමක්]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, let at least one Member from a party speak.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මට පෙනුණේ නැහැ. ඔබතුමා කළු පාට ඇඳගෙන සිටින්නේ. ඒ නිසා පෙනුණේ නැහැ. [බාධා කිරීමක්] ඔහොම ඉන්න පොඩ්ඩක්.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම අනවශ්‍ය points of Orderවලට ඉඩ දෙන්නේ නැහැ. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you Sir. What I am wearing is not black.

I have just two points. The first one is, on that particular day there was a Party Leaders' Meeting - the Leader of the House and the Chief Government Whip will agree - and I inquired whether those Bills were available. They said they would be on the table. I left the meeting, came here and found only three of the Bills and that too only in English. I took it back to the meeting. They kept on saying that before Parliament adjourns, the Bills would be tabled. It was not tabled. To me it was delivered at 1.30 a.m. the next morning. As has already been pointed out, Article 24 of the Constitution requires that the legislation be made in Sinhala and Tamil with a translation in English.

Now, it is conceded by the Hon. Speaker as well as everybody else that Sinhala and Tamil copies were not tabled. Gazetting is a separate issue. A Bill must be gazetted two weeks prior to it being presented in Parliament.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දවස් හතකට පෙර.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Therefore, I urge that the Hon. Speaker looks into the violation of Constitutional provisions in this instance, where the Bills, in Tamil and Sinhala, had not been presented to Parliament.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සිංහල ඒවා හයක් ඇවිල්ලා තිබුණේ නැහැ. දෙමළ ඒවාත් හයක් ඇවිල්ලා තිබුණේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, after what has been said before with regard to the presention of Bills et cetera, I would like to point out that it is mandatory that the Bills be brought before the Consultative Committee. - [*Interruption*.] What are these extraneous sources trying to say? I am addressing the Hon. Speaker, not you, Hon. Member.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I am telling you.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am coming to the point, Sir.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අනෙක් ඒවාට උත්තර දෙන්න යන්න එපා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බලන්නවත් ඕනෑ නැහැ. ගරු කථානායකතුමනි, මෙවැනි පනත් කෙටුම්පත් මේ පාර්ලිමේන්තුවේ විවාද කරන්නට පෙර කාරක සභාවක් ඉදිරියට ගෙනෙන්නට අවශ්‍යයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගෙනැල්ලා නැද්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගෙනැල්ලා නැහැ. ඒ සම්බන්ධයෙන් මා ඔබතුමාව දැනුවත් කළා. මේ වාගේ -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම කථා කරමින් සිටිනවා. ඔබතුමා පොඩ්ඩක් ඉන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා කථා කළාට පසුව ඔබතුමා කියන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පසු ගිය 13වැනි දා උදේ මම ගරු කථානායකතුමාට කථා කරලා කිව්වා, මේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා දීලා තිබෙනවා කියලා. එදින -මම කථා කළ 13වැනි දා- දහවල් 2.00ට උපදේශක කාරක සභා රැස්වීමක් පැවැත්වෙනවා කියලා අපට කිව්වා. අපට වෙනත් වැඩ නැහැ යි කියලා හිතාගෙන ආණ්ඩුව මේ විධියට කටයුතු කරනවා නම් ඒක බොහොම අසාධාරණයි. මෙයට සාධාරණ වෙලාවක් දිය යුතුයි කියන එකයි මම කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඔබතුමා කියන්නේ, උපදේශක කාරක සභාවක් තිබුණේ නැහැ කියලාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, අපි උපදේශක කාරක සභාව රැස් වුණා. න්‍යාය පත්‍රය අනුව කටයුතු කළා. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුත් ඒකට සහභාගි වුණා. එදා ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ආවේ නැහැ. අපි නිත්‍යානුකූලව ඒ වැඩ කටයුතු ඔක්කොම කරලා තිබෙනවා. රවි කරුණානායක මන්ත්‍රීතුමා ආවේ නැහැයි කියලා උපදේශක කාරක සභා රැස්වීම නවත්වන්න බැහැ නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමා පීලි පැන්නාට මට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක තමයි උත්තරය.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ ආණ්ඩුව වාගේ අපි වැඩ නැති අය නොවෙයි නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විපක්ෂ නායකතුමා මොකක්ද කියන්නේ?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
These are important Bills that have to be discussed at the Consultative Committee. You must give at least one week's notice for the Hon. Members to come for the Committee. But, they were not given even 24 hours' notice and you are trying to get all these Bills through in one day. ඒක හරියන්නේ නැහැ නේ. You are making a mockery of Parliament. ඒකට සහභාගි වුණ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියාවි මොකක්ද වුණේ කියලා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එකම දේ නේ කියන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, මම කියන්න හදන්නේ Consultative Committee එක ගැනයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක දැන් මෙතැනට අදාළ වන්නේ නැහැ නේ. රවි කරුණානායක මන්ත්‍රීතුමා දැන් ඒක ඉතා පැහැදිලිව ඉදිරිපත් කළා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. එහෙම නම් විනාඩියකින් අවසන් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, බදාදා හවස 2.00ට උපදේශක කාරක සභාව තිබෙනවාය කියලා මගේ office එකට පාර්ලිමේන්තුවෙන් පුද්ගලයෙක් ඇවිල්ලා පණිවිඩය දුන්නේ පැය 24ක කාලයක් ඇතුළතයි. ඊට කලින් දවසේ. මම පාර්ලිමේන්තුවට එන කොට හවස 2.20 වුණා. මොකද, අපට තවත් වැඩ තිබුණ නිසා. එතකොට උපදේශක කාරක සභා රැස්වීම ඉවර කරලා ඔවුන් නැහිටලා යනවා. එතැන ගරු ඇමතිතුමා හිටියා. මම ගරු ඇමතිතුමාට කිව්වා විනාඩි 20ක් පරක්කු වුණා, මොකද, අපට කොටුවේ ඉඳන් එන්න තිබුණේ, වෙනත් වැඩ තිබුණා, අපි මේ ගැන දැන ගත්තේ ඊයේ හැන්දෑවේ කියලා. එතකොට ගරු ඇමතිතුමා මගෙන් ඇහුවා, දැන් මොකක්ද කරන්න ඕනෑ කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා එන කොට ඒක අවසන් වෙලා. ඒ නිසා ඒකට සහභාගි වෙන්න බැරි වුණා. ඒක නේ කියන්නේ?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඊට පස්සේ ගරු ඇමතිතුමා-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, -[බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට සහභාගි වෙන්න බැරි වුණා කියන එක නේ කියන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා point of Order එකක් ඉදිරිපත් කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
I am on a point of Order. Let me finish it.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් කිව්වා, ඔබතුමා එන කොට උපදේශක කාරක සභා රැස්වීම අවසන් වෙලා කියලා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඉතිරි ටිකත් කියන්න දෙන්න කෝ,ගරු කථානායකතුමනි. මට මයික් එක දෙන්නකෝ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මට කථා කරන්න මයික් එක දෙන්නකෝ. මම ඇමතිතුමාට complain කළාම ඇමතිතුමා නැවත දෙවැනි වතාවටත් කාරක සභාව කැඳෙව්වා. දෙවැනි වතාවට කැඳවලා අපි නැවත කාරක සභාව පැවැත්වුවා. මම කියන්න ගියේ ඇමතිතුමාගේ හොඳ. ඇමතිතුමා අහ ගෙන ඉන්නේ නැහැ නේ. පැන්නා නේ. නමුත් අපට ලැබුණ වෙලාව මදියි කියන එකයි මම කියන්න හදන්නේ. දැනුම් දීලා පැය 24ක්වත් නැතිව අපි පනත් 21ක් ගැන study කරන්නේ කොහොමද?

අනික, විනාඩි 20න් පනත් කෙටුම්පත් 11ක් ගැන මේ අය සාකච්ඡා කර අවසන් කරලා. ඇත්ත වශයෙන්ම මේ පනත් කෙටුම්පත් ගැන study කරන මන්ත්‍රීවරුන් හැටියට මෙවැනි කටයුතුවලදී අපට කාලය අවශ්‍යයි. මීට පස්සේ මෙහෙම කරන්න එපා ගරු කථානායකතුමනි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මේ පිළිබඳ යථා තත්ත්වය මම පැහැදිලි කරන්න ඕනෑ. පළමුවෙන්ම කියන්න ඕනෑ මේ පනත් කෙටුම්පත්වලින් ඉදිරිපත් කර තිබෙන්නේ පසු ගිය අය වැය යෝජනා බව. ඒවා මේ ගරු සභාවට ඉදිරිපත් කරලා සභාවේ සම්මත වුණු යෝජනා. ඒ යෝජනාවලට නෛතික පසුබිමක් දීම සඳහා පමණයි මේ සංශෝධන ඉදිරිපත් කළේ. ඒ නිසා කරුණාකර, ගරු මන්ත්‍රීතුමන්ලා හිතන්න එපා මේවා අලුතින්ම ඉදිරිපත් කළ දේවල් කියලා. ඒක පළමුවැනි කාරණය.

ඊළඟට උපදේශක කාරක සභා රැස්වෙන්න දවස් තුනක් කල් දීමයි අවශ්‍ය වන්නේ. ඒ දවස් තුන කල් දීලා තිබෙනවා. අපි රැස් වෙන කොට ඔබතුමන්ලා කවුරුවත් ඇවිල්ලා හිටියේ නැහැ. අපි ඒ න්‍යාය පත්‍රය අනුව වැඩ කටයුතු අවසන් කළා. අපි විතරක් නොවෙයි, මුදල් අමාත්‍යාංශයේ සියලුම නිලධාරින් ඇවිත් සිටියා. අපේ පක්ෂයේ ගරු ඇමතිවරු ඇවිත් සිටියා. ගරු කථානායකතුමනි, අපි එකින් එක අරගෙන සාකච්ඡා කර සම්මත කර ඉවර වුණාට පස්සේ දැන් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාම පිළිගත්ත පරිදි, විනාඩි 20ක් ප්‍රමාද වෙලා එතුමා ආවා. ඒ වෙලාවේ මම තීරණයක් ගත්තා, අපි නැවත වරක් reconvene කරන්න. ගරු මන්ත්‍රීතුමාත් ඒක පිළිගන්නවානේ. අපි ආයෙමත් ඔක්කෝම ගෙන්වා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව දුන්නා. එතුමාත් බොහොම ව්‍යක්ත ලෙස පනත් කෙටුම්පත් 4ක්, 5ක් ගැන කරුණු ඉදිරිපත් කළා. ඒ නිලධාරින් උත්තර දුන්නා. ඒ විධියට අපි ඒ කටයුතු කළා. පළමුවැනි කාරණය තමයි මේවා අය වැය ලේඛනයට සම්බන්ධ යෝජනා වීම.

දෙවැනි කාරණය දවස් තුනක කල් දීමක් සිද්ධ වෙලා තිබීම. තුන්වන කාරණය තමයි ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි, නැවතත් සත්භාවයෙන් සියලු දෙනා කැඳවා මේ ගැන සාකච්ඡා කරන්න අවස්ථාවක් ලබා දීම. ඒකට එතුමාත් මට ස්තුති කළා. සමහර අය කැමැති වුණේත් නැහැ. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට එතුමා ඉල්ලීමක් කළ නිසා ඒ ගැන සලකා බලන්න මගේ යුතුකමක් තිබෙනවා. ඒ නිසා නැවත වරක් අපි එතුමාට සවන් දෙන්න අවස්ථාව දුන්නා.

අවසාන කාරණයත් මා කියන්නම්. මීට කලින් මෙතුමන්ලාත් suggest කරලා තිබෙන විධියට අනාගතයේදී සමහර ඒවා ගැන අපට internet එකෙන් කරුණු ඉදිරිපත් කරන්න වේවි. පරණ විධියට හැමදාම යන්න බැහැ. ඒ ගැන අපි නැවත වරක් බලමු. මුද්‍රණාලයක් අවශ්‍යද, මේවා internet එකෙන් යවනවාද කියන ඒවා ගැන අපි බලන්න ඕනෑ. ඒ නිසා කරුණාකර මේ ගැන ටිකක් නම්‍යශීලී විධියට බලන්න. මේකේදී විවාදය කොට කරන්නවත්, විපක්ෂයේ තමුන්නාන්සේලාගේ අදහස්වලට අගෞරව කරන්නවත් කිසිම ආකාරයක චේතනාවක් නැහැ. සත් භාවයෙන් කළ වැඩක්. අපට අද පරිවර්තන ප්‍රශ්න තිබෙනවා.

අද තිබෙන යථා තත්ත්වය මොකක්ද ගරු කථානායකතුමනි? එක පාරට මේවා පරිවර්තනය කර ගන්න අමාරුයි. ඒ වාගේම නීතිපතිතුමාගෙන් අවසර ගන්න සිද්ධ වෙනවා. ඒ විධියේ procedural problems තිබෙනවා. මම බොහොම සන්තෝෂ වෙනවා, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඉතාමත් නම්‍යශීලී අදහසක් ඉදිරිපත් කළ එක ගැන. නම්‍යශීලී විධියටයි අපි කටයුතු කරන්න ඕනෑ. අද අපට යම් යම් ප්‍රශ්න තිබෙනවා. ඔබතුමන්ලාටත් එහෙමයි. මම එකක් කියන්නම්.

දැන් බලමු, හැන්සාඩ් වාර්තාව ගැන. ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, ඒ වාගේම විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාටත් මතක ඇති, ඉස්සර අපි මේ සභාවේ කථා කළාම පහුවෙනි දා එනකොට ඊයේ හැන්සාඩ් වාර්තාව අපේ මේස උඩ තිබෙනවා. හැන්සාඩ් වාර්තාව මුද්‍රණය ප්‍රමාද වෙනවාය කියා අපි කොතරම් කථා කරලා ඇද්ද? හිටපු රජයේ සේවකයෙක් හැටියට මම කියන්න ඕනෑ හැන්සාඩ් වාර්තාව අච්චු ගහන්න අපි ඒ කාලයේ වෙනම section එකක් හැදුවාය කියන එක. එවැනි ප්‍රායෝගික ප්‍රශ්න තිබෙනවා. අපි නැහැ කියන්නේ නැහැ. සද්භාවයෙනුයි අපි මේවා කරන්නේ. ඒවා ගැන විරුද්ධත්වය ප්‍රකාශ කරන්න තමුන්නාන්සේලාට අයිතිය තිබෙනවා. අපි ඒක නැහැ කියන්නේ නැහැ. සද්භාවයෙන් කරන මේ වැඩේ ගැන පක්ෂ නායකයන් සාකච්ඡා කරලා කරුණාකර තීරණයක් ගන්න. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ගෙනාව යෝජනාව හොඳයි. ආයෙත් මේ ගැන විවාදයක් කරන්න බැහැ, ගරු කථානායකතුමනි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
There is a point of Order being raised by the Hon. Eran Wickramaratne.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්ව දෙය අපට පිළිගන්න බැහැ. පැය 24ක කාලයක් පමණයි දීලා තිබුණේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට විනාඩි 20ක් ප්‍රමාද වෙලා හෝ එන්න ලැබුණා. මට එන්න ලැබුණේම නැහැ. පාර්ලිමේන්තුව තුළ පවතින මේ කාරක සභා ක්‍රියාවලිය ඔබතුමා කිව්ව ආකාරයෙන් විහිළුවක් කරන්න එපා කියා අපි ඉල්ලනවා. මොකද, මේ අතර බොහොම වැදගත් පනත් කෙටුම්පත් තිබෙනවා. අපි මේ පනත් කෙටුම්පත්වලට විරුද්ධයි කියා කිව්වෙත් නැහැ; එකඟයි කියා කිව්වෙත් නැහැ. අපි ඉල්ලුවේ හරියට මේවා අධ්‍යයනය කරලා සාකච්ඡා කරන්න ඕනෑය කියා විතරයි. ඒ අවස්ථාව අපට ලබා දුන්නේ නැහැ කියන එක සඳහන් කරන්න ඕනෑ. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තමුන්නාන්සේ ආවේ නැහැ කියා පාර්ලිමේන්තුවේ අපේ වැඩ නවත්වන්න බැහැනේ. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අපි විවාදය කරන්නේ මේ සභා ගර්භයේයි. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පනත් කෙටුම්පතක් උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන්නේ ඒ පිළිබඳව මන්ත්‍රීවරුන්ගේ අදහස් දක්වා ඒකට ඇහුම්කන් දීම හෝ නොදීම සිදු කරන්නයි. ඒ නිසා ඒවාට කාලය දෙන්න ඕනෑ. මීට පසුව මෙවැනි ප්‍රමාදයක් සිදු වෙන්න දෙන්න බැහැ. ඒ නිසා දැන් ඉදිරි කටයුතු කර ගෙන යනවා. මගේ තීරණය ඒ විධියටම තිබෙනවා. සභානායකතුමාත් ඒ පිළිබඳවමද කථා කරන්නේ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ඔව්. ගරු කථානායකතුමනි, ඔබතුමා අද මේ පිළිබඳව තීරණයක් ලබා දුන්නා. ඒ වාගේම යම් යම් ආයතනික ප්‍රශ්න නිසා යම් අතපසු වීම් ඇති වී තිබෙන බව ඔබතුමාත් ප්‍රකාශ කළා. ඒක අපිත් පිළිගන්නවා. නමුත් ඒ සඳහා අප අනාගතයේදී කළ යුතු වැඩ පිළිබඳව පක්ෂ නායක රැස්වීමේදී ඔබතුමා දැඩි තීන්දුවක් දී තිබෙනවා. ඒක ඉතාම හොඳයි.

එය අපේ නිලධාරින්ටත්, අනිකුත් ආයතනවලටත් හොඳ පණිවුඩයක් ලබා දෙන තීන්දුවක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නිලධාරින්ට විතරක් නොවෙයි, ඇමතිවරුන්ටත්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා හරි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්. ඇමතිවරුන්ටත්, ඔක්කොටම. ඒ නිසා අපි ඉදිරියේදී ඒ ගැන කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත්වලින් 15කට වැඩි ප්‍රමාණයක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කර තිබෙනවා. එයින් පෙනී යන්නේ මේ පිළිබඳව උනන්දුවක් දක්වන අය ඒ අවශ්‍ය කටයුතු ඉෂ්ට කර තිබෙන බවයි. ඒ නිසා කොහොමත් ඒ පනත් කෙටුම්පත් පහළොව විවාදයට ගන්න අපට පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ අභියෝගයට ලක් නොකරපු පනත් කෙටුම්පත් ටික පිළිබඳව ඔබතුමාගේ නියෝගය අනුව අපි විවාද කරගෙන යමු. ඒ සමඟම, පක්ෂ නායක රැස්වීමේදී අපේ ඉදිරි වැඩ පිළිවෙළ පිළිබඳව සාකච්ඡා කරමු කියලා මා යෝජනා කරන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නියෝගය අනුව අපට දැනුම් දෙන්න වෙයි, ගැසට් නොකරපු පනත් කෙටුම්පත් මොනවාද කියලා. අනික් පනත් කෙටුම්පත් ගැන විවාද කරන්න අපි ලැස්තියි. ගැසට් කරලා නැති ඒවා අපට දැනුම් දෙන්න. අදම අපට කියන්න, මේ කීපයෙන්-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගැසට් කරලා නැහැ කියන්නේ ඇයි? සියල්ලම ගැසට් කර තිබෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
එදා සවස දෙකහමාර වෙන කොට පාර්ලිමේන්තුවට ලැබුණේ මොන පනත් කෙටුම්පත්ද කියලා දැන් check කරගෙන අපි ඒවා ගැන විවාද කරමු. Let that be the test. Any Bill that had come to Parliament by 2.00 or 2.30 p.m we will accept, others we will reject.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඒවා ගැන සොයා බලනතුරු ඉදිරි කටයුතු කරගෙන යනවා.

II

පනත් කෙටුම්පත් : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්

சட்டமூலங்கள்: உயர்நீதிமன்றுக்கு மனுக்கள்

BILLS : PETITIONS TO THE SUPREME COURT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව පහත සඳහන් පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම්වල පිටපත් මා වෙත ලැබී ඇති බව ස්ථාවර නියෝග අංක 50(2)(අ) යටතේ පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

[ගරු කථානායකතුමා]

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන)-පෙත්සම් දෙකක්
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) - පෙත්සම් එකක්
එකතු කළ අගය මත බදු (සංශෝධන) - පෙත්සම් එකක්
ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) - පෙත්සම් දෙකක්
ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) - පෙත්සම් දෙකක්
දේශීය ආදායම් (සංශෝධන) - පෙත්සම් දෙකක්
බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) -පෙත්සම් එකක්
මුදල් - පෙත්සම් එකක්
නොතාරිස් (සංශෝධන) - පෙත්සම් එකක්
ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) - පෙත්සම් එකක්
ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) - පෙත්සම් එකක්

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2006, 2007 සහ 2008 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා කෘෂිකර්ම කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2011 වර්ෂය සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා එතුමාගේ අදහස් දැක්වීමේදී කිව්වා, පනත් කෙටුම්පත් 15ක් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් තිබෙනවා කියලා. නමුත් ඔබතුමාගේ දැනුම් දීමේදී කියැවුණේ පනත් කෙටුම්පත් 11ක් ගැනයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම කියන දේ තමයි වලංගු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අන්න හරි. ඒක හරි.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා - පැමිණ නැත.
ගරු ජයරත්න හේරත් මහතා - පැමිණ නැත.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister Economic Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ජා-ඇල, කණුවන වත්ත, කපාල කන්ද පාර, අංක 103 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එම්.සී. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) රත්නපුර, ෆාම් ගාඩන්, තැන්නවත්ත මාවත, අංක 658/15 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එන්.රුවන්සිරි ද අල්විස් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු කථානායකතුමනි, මම කුලියාපිටිය, මකුල්වැව, "සිරිකෙත" නිවසෙහි පදිංචි එච්.පී. විමලසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම අරණායක, මේනම, වාඩියගෙදර පදිංචි, එච්.එම්.සී. කුමාරිහාමි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා - පැමිණ නැත.
ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කිරිදිගඟ හරහා පාලමක් ඉදි කිරීම : විස්තර
கிரிந்தி ஆற்றின் குறுக்காக பாலம் அமைத்தல் : விபரம்
CONSTRUCTION OF BRIDGE OVER KIRINDIGANGA : DETAILS

1968/'11

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්වත්තාවෙල විදුහල් මාවතට නුදුරුව, කිරිදිගඟ හරහා ගම්මාන කිහිපයක් සම්බන්ධ කරමින් පාලමක් ඉදි කිරීම සඳහා මැනුම් කටයුතු සිදු කර, ඇස්තමේන්තු සැකසුවත් මේ වන තෙක් පාලම ඉදි කර නොමැති බවත්;

(ii) එම ස්ථානයේ පාලමක් නොමැති වීමෙන් ගම්මාන කිහිපයක ජනතාව දැඩි දුෂ්කරතාවකට මුහුණ පාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පාලම ඉදි කිරීම සඳහා සැලසුම් සකස් කර තිබේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகலை மாவட்டத்தின் வெள்ளவாய பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள மல்வத்தாவெல பாடசாலை வீதிக்கு அருகில் கிரிந்தி ஆற்றுக்கு குறுக்கே பல கிராமங்களை தொடர்புபடுத்தும் வகையில் பாலமொன்றை அமைப்பதற்கு அளவை நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு மதிப்பீடுகள் தயாரிக்கப் பட்டபோதிலும் இற்றைவரை பாலம் அமைக்கப் படவில்லை என்பதையும்;

(ii) மேற்படி இடத்தில் பாலமொன்று இல்லாததால் பல கிராமங்களை சேர்ந்த மக்கள் பெரும் கஷ்டத்திற்கு முகம்கொடுத்துள்ளார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பாலத்தை அமைப்பதற்கு திட்டங்கள் வகுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இதற்காக நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி பணத்தொகை எவ்வள வென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Is he aware that -

(i) even though survey activities were done and estimates were made to construct a bridge over the Kirindiganga adjacent to the Malwaththawela school lane in the Wellawaya Divisional Secretary's Division in Moneragala District connecting a number of villages, the bridge has not been constructed so far; and

(ii) the people in a number of villages face immense hardships owing to the non-availability of a bridge at that place?

(b) Will he inform this House -

(i) whether plans have been made to construct the aforesaid bridge;

(ii) whether provisions have been allocated for that purpose; and

(iii) if so, the amount of money so allocated?

(c) If not, why?

ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Minister of Ports and Highways)
ගරු කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙම ස්ථානයට පාලමක් අවශ්‍ය නොවේ.

(ii) මෙම ස්ථානයට මීටර 500ක් දුරින් පාලමක් පිහිටා ඇත.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න නැහැ.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය : වත්කම් ලේඛනය

நிதி, திட்டமிடல் அமைச்சு : சொத்துகள் பதிவு இடாப்பு

MINISTRY OF FINANCE AND PLANNING : ASSETS REGISTER

2200/'11

2. ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය තුළ වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යන්නේද;

(ii) එසේ නම්, එකී ලේඛනය පවත්වා ගෙන යන පුද්ගලයාගේ නම කවරේද;

(iii) අමාත්‍යාංශයෙහි ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(iv) අමාත්‍යාංශයේ වැඩිම වැදගත්කමක් සහිත වත්කම් පහ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය තුළ කිසියම් ව්‍යාජ වත්කම් පවතින බව වත්කම් පරීක්ෂා කර බැලීම තුළින් අනාවරණය වී තිබේ ද;

(ii) එසේ නම්, එම වත්කම් හා ඒවායේ වටිනාකම් කවරේද;

(iii) එම වත්කම් පොත්වල සටහන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நிதி, திட்டமிடல் அமைச்சில் சொத்துகள் பதிவு இடாப்பு ஒன்று பேணப்படுகின்றதா என்பதையும்;

(ii) அவ்வாறாயின், மேற்குறிப்பிட்ட பதிவு இடாப்பினைப் பேணும் நபர் யார் என்பதையும்;

(iii) அமைச்சின் தேறிய சொத்துப் பெறுமதி யாதென்பதையும்;

(iv) அமைச்சிலுள்ள 5 மிக முக்கியமான சொத்துகள் யாவை என்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) (i) சொத்துக்களின் உறுதிப்படுத்தல் மூலம் கற்பனைச் சொத்துகள் எவையாவது அமைச்சில் கண்டுபிடிக்கப்பட்டனவா என்பதையும்;

(ii) அவ்வாறாயின், அச்சொத்துகளின் பெயர்கள் மற்றும் பெறுமதிகள் யாவையென்பதையும்;

(iii) அச்சொத்துகள் தொடர்பான பதிவுகள் மேற்கொள்ளப்பட்டனவா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) whether an asset register is maintained in the Ministry of Finance and Planning;

(ii) if so, the person who maintains the aforesaid register;

(iii) the net asset value of the Ministry; and

(iv) the 5 most important assets in the Ministry?

(b) Will he inform this House -

(i) whether there are any fictitious assets found in the Ministry through assets verification;

(ii) if so, names and the values of those assets; and

(iii) whether those assets have been brought into the books?

(c) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ගණකාධිකාරී (සැපයීම්)

(iii) අමාත්‍යාංශය සතු මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම 2012.12.31 දිනට රුපියල් මිලියන 821.20 වේ.

(iv) අමාත්‍යාංශය සතු වැඩිම වඩිනාකමක් ඇති ස්ථාවර වත්කම් හා අදාළ විස්තර පහතින් දැක්වේ. වත්කම් පිළිබඳව විස්තර ඇමුණුමේ හි සඳහන් වේ. ඇමුණුම **සභාගත*** කරමි.

* ඉඩම් හා ගොඩනැඟිල්ල

* රථ වාහන

* යන්ත්‍ර හා යන්ත්‍රෝකරණ

* ලී බඩු හා කාර්යාල උපකරණ

* පරිගණක හා කොටස්

(ආ) (i) අමාත්‍යාංශය සතු කිසිදු ව්‍යාජ වත්කමක් නැත.

(ii) (ආ) (i) අනුව අදාළ නොවේ.

(iii) (ආ) (i) අනුව අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

සභාමේසය මත තබන ලද ඇමුණුම:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

වත්කම් වර්ගය	විස්තරය	ගණනය කල පදනම	2012.12.31 දිනට වටිනාකම (රුපියල් මිලියන)
ඉඩම හා ගොඩනැගිලි	i) කොළඹ 01, ලෝටස් පාරේ අංක 65 පිහිටි මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ල	ඓතිහාසික වටිනාකමක් හා අවුරුදු 90ක් පමණ පැරණි වැදගත් ස්ථානයක පිහිටා ඇති මෙම ගොඩනැගිල්ල මිල කල නොහැකිය	-
	ii) කොළඹ 10, විපුල සේන මාවත පිහිටි මුදල් අමාත්‍යාංශයට අයත් නිලනිවාස	නක්සේරු දෙපාර්තමේන්තුවේ අගය කිරීම	12.8
	iii) කොළඹ 05, ඉසිපතන මාවත, මුදල් අමාත්‍යාංශයට අයත් නිලනිවාස	නක්සේරු දෙපාර්තමේන්තුවේ අගය කිරීම	527.5
රථ වාහන	i) කාර් රථ 26	වෙළඳපල වටිනාකම	88.1
	ii) වෑන් රථ 08	-එම-	36.4
	iii) ජීප් රථ 10	-එම-	77.6
	iv) කැබ් රථ 08	-එම-	31.6
	v) ත්‍රීවිල් 02	-එම-	0.3
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	i) වායු සම්කරණ 30	වෙළඳපල වටිනාකම	
	ii) ජායා පිටපත් යන්ත්‍ර 21	-එම-	
	iii) ශීතකරණ 07	-එම-	15.4
	iv) රූපවාහිනී 13	-එම-	
	v) ෆැක්ස් යන්ත්‍ර 20	-එම-	
ලී බඩු හා කාර්යාල උපකරණ	i) මේස 407	වෙළඳපල වටිනාකම	
	ii) පුටු 645	-එම-	
	iii) විදුලිපංකා 326	-එම-	24.4
	iv) වාතේල්මාරි හා කබඩ් 245	-එම-	
පරිගණක හා කොටස්	i) පරිගණක 135	වෙළඳපල වටිනාකම	
	ii) ප්‍රින්ටර් 83	-එම-	7.1
	iii) ස්කැනර් 09	-එම-	
		මුළු වටිනාකම	821.20

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම අගය කරනවා මෙවැනි ප්‍රාග්ධන රෙජිස්ටරයක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ තිබීම සම්බන්ධයෙන්. නමුත් අපි දැනුවත් වෙලා තිබෙනවා, මුදල් අමාත්‍යාංශයට අයත් රථ වාහන 4ක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සේවයේ නොයොදවා යම් ආසනයක පෞද්ගලික වැඩ කටයුත්තක් සඳහා පාවිච්චි කරනවා කියලා. මේ වාහන ඒ ප්‍රදේශයේදී භාවිත කරන numbers සහ්‍ය numbers නොවෙයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණාකරලා මේ ගැන සොයා බලන්න පුළුවන්ද? මේවා කුරුණෑගල තමයි තිබෙන්නේ. මේ රථ වාහන 4න් මොනවාද ප්‍රවාහනය කරන්නේ කියන එක සොයා බලා පුළුවන් තරම් ඉක්මනට අප දැනුවත් කරන්න. මට ඒ නොම්මර දෙන්න පුළුවන්. නමුත් ඒ නොම්මර ව්‍යාජ නොම්මර බවට අපි දැනුවත් වෙලා තිබෙනවා. ඒකයි මට තිබෙන ප්‍රශ්නය.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ඒ කාරණය පෙන්වා දුන්නාට. එහෙම දෙයක් අපට වාර්තා වෙලා නැහැ. කරුණාකරලා මට ඒ විස්තර පෞද්ගලිකව දෙන්න. මම සොයලා බලලා ඒ ගැන කටයුතු කරන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉස්සෙල්ලා ඇහුවේ අතුරු ප්‍රශ්නයක් නොවෙයි වාගේයි මට දැනුනේ. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අතුරු චෝදනාවක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න කෙටියෙන් අහන්න පුරුදු වෙන්න, කථා පවත්වන්නේ නැතිව. හොඳයි, දැන් අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම බොහොම ඉක්මනින් අහන්නම්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා ගොඩනැඟිලි පිළිබඳ විස්තර සියල්ලම සභාගත කළ නිසා අපි දන්නේ නැහැ කොතරම් ගොඩනැඟිලි ප්‍රමාණයක් rent එකට අරගෙන තිබෙනවාද කියලා. අපි දන්නා විධියට ඔබතුමන්ලා හුඟක් ගොඩනැඟිලි කුලී පදනමට අරගෙන තිබෙනවා. එම නිසා මුදල් හිඟයක් තිබෙන, ආර්ථික ප්‍රශ්න තිබෙන මේ අවස්ථාවේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මීට වැඩිය වගකීමකින් කටයුතු කරන්න ඕනෑය කියන කාරණය මම කියනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක ප්‍රශ්නයක් නොවෙයි. ඒක උපදේශයක් දීමක්. එම නිසා ඒක උපදේශක කාරක සභාවට යොමු කළ යුතු කාරණයක්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එසේ නම් මා දෙවෙනි අතුරු ප්‍රශ්නය අසන්නම්, ගරු කථානායකතුමනි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ කරුණු ටික මට දෙන්න. මා ඒ ගැන - [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේම කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරයෙකු කියනවා, ඔබතුමාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරී ආර්ථික සාතකයෙක්ය කියා. ඔබතුමන්ලාගේම කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක් කියන මේ පුද්ගලයා , ඔබතුමාගේ ප්‍රධාන නිලධාරී වශයෙන් කටයුතු කරනවා. මොනවාද-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක මේ ප්‍රශ්නයට අදාළ ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක මේ ප්‍රශ්නයට අදාළ වන්නේ නැහැ. ඒකට වෙනම ප්‍රශ්නයක් අහන්න. ඕනෑ නම් එතුමාගෙන්ම අහන්නකෝ. මගෙන් අහන්නේ මොකටද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3 -2328/'12-(2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නන්දා මාලනී මහත්මිය ඇතුළු කණ්ඩායමේ ක්වේට් සංචාරය: විශේෂ පරීක්ෂාව

திருமதி நந்தா மாலினி குழுவினரின் குவைட் விஜயம் : விசேட சோதனை

VISIT OF MRS. NANDA MALINI'S GROUP TO KUWAIT : SPECIAL CHECKING

2494/'12

4. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ගායන ශිල්පිනී නන්දා මාලනී මහත්මිය ඇතුළු කණ්ඩායමක් 2012.02.01 දින ක්වේට් රාජ්‍යය වෙත ගමන් කිරීමේ දී එරට ආරක්ෂක අංශවල විශේෂ පරීක්ෂාවට ලක් වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එවැනි පරීක්ෂාවකට ලක් කිරීමට හේතු කවරේද;

(iii) එම පරීක්ෂාවේදී සැක කටයුතු කරුණක් හෝ හෝඩුවාවක් ඇය වෙතින් හෝ ඇයගේ කණ්ඩායමෙන් හමු වී තිබේද;

(iv) ඉහත සිදුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය පරීක්ෂණයක් සිදු කර තිබේද;

(v) ඒ සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් කරුණු විමසා තිබේද;

(vi) මෙම පරීක්ෂා කිරීම අසත්‍ය තොරතුරු මත සිදු කර ඇත්නම්, එම අසත්‍ය තොරතුරු ලබා දුන් පාර්ශ්වයන් හඳුනා ගෙන තිබේද;

(vii) එසේ නම්, ඔවුන්ගේ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නන්දා මාලනී මහත්මියට සිදු වූ අපහසුතාවය සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பாடகி நந்தா மாலினி உள்ளிட்ட குழுவினர் 2012.02.01ஆம் திகதி குவைட் நாட்டிற்கு விஜயம் செய்தபோது அந்நாட்டின் பாதுகாப்புப் பிரிவின் விசேட சோதனைக்கு உட்படுத்தப் பட்டுள்ளனரென்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், இவ்வாறான சோதனைக்கு உட்படுத்தப்பட்டமைக்கான காரணம் யாதென் பதையும்;

(iii) மேற்படி சோதனையின்போது ஏதேனும் சந் தேகத்திற்கிடமான பொருளோ அல்லது தடயமோ இவரிடமிருந்து அல்லது அக்குழுவின ரிடமிருந்து கண்டறியப்பட்டதா என்பதையும்;

(iv) மேற்படி சம்பவம் தொடர்பாக இலங்கை அரசாங்கம் விசாரணையொன்றை மேற் கொண்டதா என்பதையும்;

(v) இது சம்பந்தமாக இராஜதந்திர மட்டத்தில் ஏதேனும் வினவுதல்கள் மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;

(vi) மேற்படி சோதனையிடல்கள் போலித் தகவல்களின் அடிப்படையில் மேற்கொள்ளப் பட்டிருப்பின் அத்தகைய போலித் தகவல்களை வழங்கிய தரப்பினர்கள் அடையாளம் காணப்பட்டுள்ளனரா என்பதையும்;

(vii) ஆமெனில், இவர்களின் விபரங்களை சமர்ப் பிப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) திருமதி நந்தா மாலினிக்கு நேரிட்ட அசௌகரியம் சம்பந்தமாக அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதை அவர் குறிப் பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of External Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that a group including Mrs. Nanda Malini, a songstress, were subjected to special checking by the security personnel of the State of Kuwait on their arrival in that country on 01.02.2012;

(ii) if so, of the reasons for subjecting them to such checking;

(iii) whether any suspicious matter has been discovered in her possession or in the possession of her troupe or whether any clue has been found regarding the possession of such matters during that checking;

(iv) whether the Government of Sri Lanka has carried out an investigation regarding the aforesaid incident;

(v) whether inquiries have been made at diplomatic level in that regard;

(vi) if this checking has been done on false information, whether the party that furnished such false information has been identified; and

(vii) if so, whether their details will be submitted ?

(b) Will he state the measures taken by the Government regarding the embarrassment caused to Mrs. Nanda Malini ?

(c) If not, why?

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்ட லுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) නොදනී. ඕනෑම විදේශිකයෙකු රටකට ඇතුළු වීමේදී ඔවුන් හා ඔවුන් ගෙනෙන බඩු බාහිරාදිය පරීක්ෂා කිරීමේ පූර්ණ බලතල අදාළ රටෙහි ආගමන විගමන හා රේගු නීතිරීති මගින් අදාළ බලධාරීන්ට ලබා දී තිබේ.

(iii) එවැන්නක් වාර්තා වී නොමැත.

(iv) තානාපතිවරයා, ෂේක් අබ්දුල්ලා මලික්- ගුවන් තොටුපළෙහි අපරාධ පරීක්ෂණ ප්‍රධානී හමුවී කරුණු විමසා ඇත. රටෙහි පවතින නීතිරීති අනුව ඒ සම්බන්ධයෙන් කිසිවක් ඔහු විසින් තානාපතිවරයාට පවසා නැත.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ

(ආ) නන්දා මාලනී මහත්මිය සහභාගි වී ඇත්තේ පෞද්ගලික පර්ශ්වයක් විසින් සංවිධානය කරන ලද සංගීත සංදර්ශනයකටය. නමුත් තානාපතිවරයා විසින් ඇයට සිදු වූ අපහසුතාව සම්බන්ධයෙන්, ඇයට හා අදාළ පාර්ශ්වයන් හට කනගාටුව ප්‍රකාශ කොට ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අපේ රටේ බොහෝ දෙනාගේ ගෞරවයට පාත්‍ර වුණු, ඒ වාගේම සමාජයට ඉතා විශාල සේවයක් කරන ප්‍රවීණ ගායිකාවක් තමයි විශාරද නන්දා මාලනී මහත්මිය. එතුමියට කුවේට් රාජ්‍යයේදී මුහුණ පාන්නට සිදු වුණු මේ ප්‍රශ්නය පිළිබඳව ඔබතුමාට කියන්නත් කනගාටුයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයක් විධියට අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම මේ අතුරු ප්‍රශ්නය ගරු ඇමතිතුමාගෙන් අහන්න ඉස්සෙල්ලා, ඒ ගැන පොඩ්ඩක් විස්තර කරන්න ඕනෑ. මොකද,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර අදාළ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එතුමියත් එක්ක ගිය සංගීතවේදීන්ගේ තබලාව පළලා තිබෙනවා. භාණ්ඩ පරීක්ෂා කරන යන්ත්‍රය තුළට දැමීම නිසා ගිටාර් එකේ තත් ඔක්කොම කැඩිලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම කැඩුවාද, පැළුවාද කියලා ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න කලින් මා මේ ඔබතුමාට කියන්නේ. මේක විශාල ප්‍රශ්නයක්; සංගීත කණ්ඩායමට සිදු වුණු අකරතැබ්බයක්.

එතකොට බට නළා ඔක්කොම බිම පොළොවේ ගහලා තමයි පරීක්ෂා කර තිබෙන්නේ. සාමාන්‍යයෙන් කුමන හෝ සංගීත කණ්ඩායමක් පෞද්ගලික සංචාරයකට ගියත් ඒ රටේ තානාපතිවරයාට නැත්නම් තානාපති කාර්යාලයට යම්කිසි විධියක වගකීමක් තිබෙනවා. යම් සම්බන්ධයක් ඇතුව තමයි එහෙම යන්නේ කියන එක ඔබතුමාත් දන්නවා ඇති. මම කියන්නේ නැහැ, මේක පෞද්ගලික සංචාරයක් කියා. මේ සිද්ධියේදී-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථාව ඇති. එතැනම අතුරු ප්‍රශ්න දෙකක්ද තුනක්ද තිබෙනවා, ඇමතිතුමාට උත්තර දෙන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තවත් එක අතුරු ප්‍රශ්නයක් අහලා මම අවසාන කරන්නම්. මම එතුමාට කරදර කරන්නේ නැහැ. විශේෂයෙන් ලංකාවේ නිර්මාණ ශිල්පීන් මේ වාගේ සංචාරයකදී අකරතැබ්බවලට මුහුණ දීම සම්බන්ධව ප්‍රශ්නයකටත් වැඩිය මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් ඒ ඒ තානාපති කාර්යාල නිලධාරීන් දැනුවත් කරන්නය කියා; මෙහෙන් යන කණ්ඩායම් සංවිධානය කරන ඒ රටේ ශ්‍රී ලාංකිකයන් සමඟ යම්කිසි සම්බන්ධතාවක් ඇති කර ගෙන ඔවුන්ට යම්කිසි කරදරයක්, අකරතැබ්බයක් ඇති නොවන්නට කටයුතු කරන්නය කියා. මොකද, සංගීතය කියන්නේ අපි සියලු දෙනාටම අදාළ වන කාරණයක්. මෙහෙන් යම්කිසි පිරිසක් යන විට ඒ රටේ සිටින ශ්‍රී ලාංකිකයන්ගෙන් ඒ රටේ තානාපති කාර්යාලයට ලිපියක් ගෙන්වා ගෙන යම්කිසි විධියක සම්බන්ධීකරණයක් ගොඩ නහලා ඔවුන්ට යම්කිසි සහනයක් ලබා දෙන්න, සාධාරණයක් ඉෂ්ට කර දෙන්න කියලා ඒ ඒ තානාපති කාර්යාලවලට උපදෙසක් දෙන්න පුළුවන්ද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගුරුවරයෙකුට ගෝලයකුගෙන් ලැබෙන උපදෙස් කරුණාකර, ක්‍රියාත්මක කරන්න.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, ඒ පිළිබඳ කිසිම ගැටලුවක් නැහැ. අපිට ඒ උපදෙස් තානාපති කාර්යාලයට දෙන්න පුළුවන්. ඒත් එහෙම කටයුතු කිරීමේදී යම්කිසි සීමාවක් තිබෙනවා. අපේ රටට කවුරු හෝ ඇතුළු වන අවස්ථාවකදී ඒ පුද්ගලයාගෙන් ප්‍රශ්න ඇසීමට හෝ ගෙනෙන බඩුබාහිරාදිය පරීක්ෂා කිරීමට ජාත්‍යන්තර නීතිය හා සම්ප්‍රදාය යටතේ අපේ රටට සම්පූර්ණ අයිතියක් තිබෙනවා. අපිට ඒ අයිතිය තිබෙන විධියටම විදේශීය රටවලටත් ඒ අයිතිය තිබෙනවා, ගරු කථානායකතුමනි. එම නිසා එක්තරා සීමාවකට එහා විදේශීය රටවල ක්‍රියා පටිපාටිය පාලනය කිරීමට අපිට පුළුවන්කමක් නැහැ. ඒත් අපි පැහැදිලිව කියන්න ඕනෑ, නන්දා මාලනී මැතිනිය විශිෂ්ට සේවයක් කර තිබෙන බව. ඒක අපි විවාදයක් නැතුව පිළිගන්නවා. අපි තානාපති කාර්යාලයට උපදෙස් දී තිබෙනවා, උපරිම උත්සාහය දරන්නය කියා; මේ විධියේ අසීරුතාවලට ශ්‍රී ලාංකිකයන් පත් නොවීමට කරන්න පුළුවන් හැම දෙයක්ම කරන්නය කියා. ඒත් ඒ රටට තමයි අවසාන වගකීම තිබෙන්නේ. එක්තරා සීමාවකට එහා ඒ රටේ ක්‍රියා පටිපාටිය පාලනය කිරීමට අපට නීතිමය හෝ වෙනත් අයිතියක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඇමතිතුමා දුන්නු පිළිතුර සම්බන්ධව දෙවන අතුරු ප්‍රශ්නය හැටියට මා මේ ප්‍රශ්නය අහනවා.

ගරු කථානායකතුමනි, ඇමතිතුමා දුන්නු පිළිතුරෙන් මා එක විධියකට සෑහීමට පත් වන්නේ නැහැ. මොකද තබ්ලා පළලා, බට නළා ටික පොළොවේ ගහලා, වයලීන් එක කුඩු කරලා තිබෙනවා. ඉන්දියාවෙන් කණ්ඩායම් එන කොට VIP Lounge එකෙන් එක්කගෙන යන්නේ. ෂාරුක් ඛාන්ලා එන කොට, අනික් බොලිවුඩ නළු නිළියෝ එන කොට ඔක්කොම අරගෙන යනවා, VIP Lounge එකෙන්. මෙතුමාට අදාළ කාරණයක් නොවෙයි මා මේ කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ලංකාවේ දී වුණු දෙයක් නොවෙයි නේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපිට එහේ VIP සැලකිලි නැහැ. VIP දෙන්න ඕනෑය කියලා මා කියන්නේ නැහැ. නමුත් මා කියන්නේ මෙයයි. ඔබතුමා ඒ අදාළ තානාපති නිලධාරීන්ට කරුණාකර උපදෙස් දෙන්න, මේ වාගේ දේවල් ගැන සොයා බලන්නය කියලා. පරීක්ෂා කරන එක හරි. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ තබ්ලා එකක් ගෙනැල්ලා පිහියකින් පළන කොට ඒ පුද්ගලයෝ ගිහිල්ලා කොහොමද මේ වාගේ වැඩ පිළිවෙළක් සකස් කරන්නේ කියන එකයි. මා ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙයයි. ඒ තානාපති කාර්යාලයේ නිලධාරීන් එක්ක, ඒ රටේ සංගීත සන්දර්ශන පවත්වන හෝ ඒ artistesලා ගෙනෙන කට්ටිය අතර සම්බන්ධයක් හදාගෙන වැඩ කරන්නය කියන ඉල්ලීමයි මා කරන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, හොඳයි.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, ඒ පරීක්ෂණය කරපු පිළිවෙළ අපි කොහෙත්ම අනුමත කරන්නේ නැහැ. ඒක සුදුසුයි කියලා අපි කියන්නේත් නැහැ. ඒක නුසුදුසුයි. ඒ පිළිබඳව තානාපති කාර්යාලයට පුළුවන් ප්‍රමාණයට ඒ අය කටයුතු කරනවා. අනාගතයේ දී ඒ විධියේ සිදුවීම් වැළැක්වීමට අපි විධිමත් ක්‍රියා පිළිවෙළක් දියත් කරනවා. ක්වේට් රජය අනුගමනය කරපු ක්‍රියා පටිපාටිය ගැන තමයි මෙතැන ප්‍රශ්නයක් වෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේවා එක එක රටවල්වල තිබෙන ප්‍රශ්න. අපි ගියාමත් සමහර වෙලාවට සපත්තු උස්සාගෙන, belt ගලවාගෙන, කලිසමත් පහත් කරගෙන තමයි යන්න වෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමනි, ඔබතුමා අපේ රටේ විදේශ කටයුතු ඇමති.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මයික් එක දාන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න. කථා බැරිය. ප්‍රශ්නය පමණයි. ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ රටේ ගෞරවනීය බෞද්ධ ස්වාමීන් වහන්සේලා දෙපළකට ඉතාමත් කෲර ලෙස මේ වෙලාවේ ඉන්දියාවේ ප්‍රශ්නයක් ඇති කරලා තිබෙනවා. ඇයි, ආණ්ඩුව මේ වාගේ නිහඬතාවක සිටින්නේ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නය නන්දා මාලනී මහත්මිය සම්බන්ධ ප්‍රශ්නයක්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා වීරකැටියේ පල්ලි ගැන කථා කරනවා. ඇයි, මේ වාගේ බෞද්ධ ස්වාමීන් වහන්සේලා ගැන කථා කරන්නේ නැත්තේ?

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මෙය කිසිසේත්ම මේ ප්‍රශ්නයට අදාළ වන්නේ නැහැ. ඒක වෙනත් සිද්ධියක්; බරපතළ සිද්ධියක්. ඒ ගැන කිසිම ගැටලුවක්

නැහැ. එය මේ ප්‍රශ්නයට අදාළ වන්නේ නැහැ. [බාධා කිරීමක්] අද උදෑසන ඉන්දියාවේ සිටින තානාපතිතුමාට මම උපදෙස් දුන්නා, ඒ පිළිබඳව දැඩි විරෝධය පළ කරන්නට කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 - 2969/'12 - (1), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය : ඇස්බැස්ටස් තහඩු පිළිබඳ පැමිණිල්ල

இலங்கை தரக் கட்டளைகள் நிறுவகம் : எஸ்பெஸ்ரஸ் கூரைத்தகடு பற்றிய முறைப்பாடு
SRI LANKA STANDARDS INSTITUTION : COMPLAINT ON ASBESTOS ROOFING SHEETS

2987/'12

7. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
තාක්ෂණ, පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) ප්‍රමිතිය සහතික කළ භාණ්ඩයක ප්‍රමිතිය අඛණ්ඩව සුරක්ෂිත කිරීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ගන්නා පියවර කවරේද;

(ii) ඊට අදාළ චක්‍රලේඛ, රෙගුලාසි හෝ නියමයන් තිබේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වෙළඳපලේ ඇති S.L.S ප්‍රමිති සහතිකය සහිත ඇස්බැස්ටස් සෙවිලි තහඩු වර්ගයක ප්‍රමිතිය අඩුවීම පිළිබඳ පරීක්ෂණ පවත්වන ලෙස බණ්ඩාරගම ජගත් චන්ද්‍ර පෙරේරා සහ බුද්ධි ජයවික්‍රම පෙරේරා යන අය විසින් 2011.09.23 දින ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට පැමිණිලිකර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත පැමිණිල්ලට අදාළව පරීක්ෂණයක් නොපැවැත්වීමට හේතුව කවරේද;

(ii) ඉහත සඳහන් සෙවිලි තහඩු සඳහා S.L.S ප්‍රමිතිය පිරිනැමූ දිනය කවරේද;

(iii) එම සෙවිලි තහඩුවල ප්‍රමිතිය අඛණ්ඩව පවත්වාගෙන යෑම සහතික කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත පැමිණිල්ලෙහි සඳහන් සෙවිලි තහඩු නිෂ්පාදන සමාගම විසින් තම නිෂ්පාදනවල S.L.S ප්‍රමිතිය පවත්වාගෙන යන්නේද පිළිබඳව පරීක්ෂා කිරීමට 2011 වර්ෂය තුළ සිදුකළ විද්‍යාත්මක පර්යේෂණයන් කවරේද;

(ii) එම පර්යේෂණ සිදු කළ දින කවරේද;

(iii) ඊට අදාළ වාර්තා ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில்நுட்பம், ஆராய்ச்சி, அணுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தரம் உறுதி செய்யப்பட்டுள்ள ஒரு பொருளின் தரத்தைத் தொடர்ச்சியாகப் பேணிக்காப்பதற்கு இலங்கை தரக் கட்டளைகள் நிறுவகம் மேற்கொள்கின்ற நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) அது தொடர்பான சுற்றறிக்கைகள், ஒழுங்குவிதிகள் அல்லது கட்டளைகள் இருப்பின் அவை யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) சந்தையில் உள்ள S.L.S தரச் சான்றிதழைக் கொண்டுள்ள ஒருவகை எஸ்பெஸ்ரஸ் கூரைத்தகட்டின் தரக்குறைவு தொடர்பாக விசாரணை மேற்கொள்ளுமாறு பண்டாரகம ஜகத் சந்திர பெரேரா மற்றும் புத்தி ஜயவிக்ரம பெரேரா ஆகியோர் 2011.09.23ஆம் திகதி இலங்கை தரக்கட்டளைகள் நிறுவகத்தில் முறைப்பாடு செய்துள்ளதை அவர் அறிவாரா?

(இ) (i) மேற்படி முறைப்பாடு தொடர்பாக விசாரணை நடத்தப்படாமைக்கான காரணம் யாது என்பதையும்;

(ii) மேற்படி கூரைத்தகடுகளுக்கு S.L.S தரச் சான்றிதழ் வழங்கப்பட்டுள்ள திகதி யாது என்பதையும்;

(iii) மேற்படி கூரைத்தகடுகளின் தரத்தை தொடர்ச்சியாகப் பேணிவருவதை உறுதி செய்வதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) (i) மேற்படி முறைப்பாட்டில் குறிப்பிடப்பட்டுள்ள கூரைத்தகட்டை உற்பத்தி செய்கின்ற நிறுவனம் அதன் உற்பத்திகளின் S.L.S தரத்தைப் பேணிவருகின்றதா என்பது பற்றி பரிசோதனை செய்வதற்காக 2011ஆம் ஆண்டு மேற்கொள்ளப்பட்ட விஞ்ஞான ரீதியான ஆராய்ச்சிகள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஆராய்ச்சிகள் மேற்கொள்ளப்பட்ட திகதிகள் யாவை என்பதையும்;

(iii) அவை தொடர்பான அறிக்கைகளை சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

asked the Minister of Technology, Research and Atomic Energy:

(a) Will he state -

(i) the steps taken by the Sri Lanka Standards Institution to ensure the continuation of the standard of an item of which the standard has been certified; and

(ii) the circulars, regulations and orders pertaining to them if any ?

(b) Is he aware that a complaint has been made to the Sri Lanka Standards Institution by Jagath Chandra Perera and Buddhi Jayawickrama Perera of Bandaragama on 23.09.2011 demanding an inquiry pertaining to the decline of the standard of a certain type of SLS certified Asbestos roofing sheet available in the market ?

(c) Will he inform this House-

(i) the reason for not conducting an inquiry pertaining to the above complaint;

(ii) the date on which the SLS accreditation was awarded to the aforesaid roofing sheet; and

(iii) the steps taken to certify the continuous maintenance of the standard of the aforesaid roofing sheets ?

(d) Will he also state-

(i) the scientific research carried out by the roofing sheet manufacturing company mentioned in the above complaint in the year 2011 to ascertain whether their products maintain SLS standards;

(ii) the dates on which the aforesaid researches were carried out; and

(iii) whether the relevant reports will be submitted ?

(e) If not, why?

ගරු පාඨලී චම්පික රණවක මහතා (කාක්ෂණ, පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - தொழில்நுட்ப, ஆராய்ச்சி, அணுசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Technology, Research and Atomic Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ප්‍රමිති සහතිකය ලබා ගත් භාණ්ඩයක ප්‍රමිතිය අඛණ්ඩව පවත්වා ගැනීම තහවුරු කිරීමට පහත සඳහන් පියවර ගෙන ඇත. භාණ්ඩයක ප්‍රමිතිය සහතික කිරීමේදී ඇගයීමට ලක් කරන තත්ත්ව කළමනාකරණ පද්ධතියේ සෑම අංගයක්ම පසු විපරම් ක්‍රියාවලියකට භාජනය කරනු ලැබේ. එසේ කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ තත්ත්ව විගණන කණ්ඩායම් විසිනි. ISO 9001 සහතිකය ලබා ගත් නිෂ්පාදකයන් - මේ ආයතනය ISO 9001 සහතිකය ලබාගෙන තිබෙනවා.- සම්බන්ධයෙන් වසරකට වරක් කරනු ලබන අතර, අනෙක් නිෂ්පාදකයන් සම්බන්ධයෙන් වසරකට දෙවරක් තත්ත්ව විගණනයන් සිදු කරනු ලැබේ.

(ii) (1) තත්ත්ව කළමනාකරණ ඇගයීමට ලක් කිරීමට අදාළ වනුයේ, "තත්ත්ව පද්ධතිය සඳහා අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශයයි. (GL-CP-01)".

මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙනවා, වක්‍රලේඛ, රෙගුලාසි ගැන. ඇත්තටම වක්‍රලේඛ, රෙගුලාසියකට වඩා මාර්ගෝපදේශයක් - guideline එකක් - තමයි මේ සම්බන්ධයෙන් තිබෙන්නේ.

මෙම ලේඛනය SLS සහතිකය ලබා ගැනීම සඳහා වන අයදුම්පත් කට්ටලය සමඟ ඉල්ලුම්කරුවන්ට ලබා දෙනු ඇත.

(2) පසු විපරම් ක්‍රියාවලිය/ තත්ත්ව විගණනයට අදාළ වනුයේ "සමාගම් ඇගයීම ((GL-CP-01)" පිළිබඳ ලේඛනයයි. මෙය අභ්‍යන්තර ලේඛනයකි.

(ආ) ඔව්.

(ඇ) (i) පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන විසින් පරීක්ෂණයක් පවත්වා ඇත.

තත්ත්ව වාර්තා ඇගයීමකට ලක් කිරීම:

පැමිණිල්ල ලැබීමෙන් පසු මෙම ඇගයීම කර ඇත. ප්‍රමිතිවලට අනුකූලව මෙම සමාගම විසින් භාණ්ඩය නිෂ්පාදනය කර ඇති බව ඇගයීමේදී තහවුරු වී තිබේ.

සිද්ධිය පිළිබඳ කරුණු සොයා ගැනීම:

පැමිණිල්ල පිළිබඳව කරුණු දක්වන ලෙස අදාළ සමාගමට දන්වන ලදි. පරීක්ෂණයකින් පසුව සමාගම විසින් වාර්තා කරන ලද්දේ පැමිණිල්ලට අදාළ සිද්ධියට හේතු වී ඇත්තේ, නිෂ්පාදන භාණ්ඩයේ තත්ත්වයේ අඩුපාඩුවක් නොවන බවත් වෙනත් හේතූන් බවත්ය.

භාණ්ඩයේ තත්ත්වය පරීක්ෂාවට ලක් කිරීම:

රසායනාගාරයේ පරීක්ෂාවට ලක් කිරීම සඳහා පැමිණිල්ලට හේතු වූ තහඩුවට අදාළ තොගයෙන්ම තවත් තහඩුවක් ලබා ගැනීමට උත්සාහ කරන ලදි. පරීක්ෂා කිරීම සඳහා අතුරන නොලද තහඩු නිෂ්පාදකයා වෙත හෝ පැමිණිලිකරු වෙත නොතිබුණි. පැමිණිල්ල ලැබී තිබුණේ අදාළ තොගය නිෂ්පාදනයෙන් මාස 05කට පසුවය. භාවිත කරන ලද තහඩුවක් රසායනාගාර පරීක්ෂාවට ලක් කිරීමෙන් නිවැරදි ප්‍රතිඵල ලබා ගත නොහැකි බව වාර්තා වී තිබේ.

(ii) මෙම සමාගමේ නිෂ්පාදනය කරන ලද මෙම භාණ්ඩ වර්ගය සඳහා 1993 දී ප්‍රමිති සහතිකය ලබා දී ඇත. පැමිණිල්ලට අදාළ තහඩුව නිෂ්පාදනය කර ඇත්තේ මෙම සමාගමේ නව නිෂ්පාදනාගාරයක වන අතර, එයට ප්‍රමිති සහතිකය ප්‍රදානය කර ඇත්තේ 2010.10.15 වන දින දීය.

(iii) ඉහත සඳහන් පරිදි, සහතික කළ භාණ්ඩයේ ප්‍රමිතිය අඛණ්ඩව පවත්වා ගෙන යාම සහතික කිරීම සඳහා තත්ත්ව විගණන පවත්වන ලදි. 2011.11.24 සහ 2012.07.20 යන දිනයන්හිදී එවැනි තත්ත්ව විගණනයන් අදාළ සමාගම සම්බන්ධයෙන් සිදු කර ඇත. භාණ්ඩ නිෂ්පාදනය ප්‍රමිතියට අනුව සිදු කර ගෙන යන බව එම විගණන තුළින් තහවුරු විය.

(ඇ) (i) සමාගම විසින් 2011 වසර තුළදී සිදු කළ විද්‍යාත්මක පර්යේෂණයන් පිළිබඳව නොදනී. සමාගමක් විසින් සිදු කරන ලද පර්යේෂණ පිළිබඳව තත්ත්ව කළමනාකරණ පද්ධතියේදී හෝ තත්ත්ව විගණනයේදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පරීක්ෂා කරනු නොලැබේ.

තත්ත්ව කළමනාකරණ පද්ධතියට හා තත්ත්ව විගණනයන්ට අදාළ වනුයේ භාණ්ඩයේ ප්‍රමිතිය සහතික කිරීමට අදාළ වන පරාමිතීන් නිර්ණය කිරීමට සිදු කරන විද්‍යාත්මක පරීක්ෂණ වේ. මෙම පරාමිතීන් නම් උස, දිග, පළල, ඝනකම, බිඳුම්බර, තෙතමනය උරා ගැනීම, ඝනත්වය යන ඒවා වේ. මෙම පරාමිතීන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ, 2011 වසර තුළ සමාගම විසින් සිදු කර ඇති බව තත්ත්ව විගණනවලින් පැහැදිලි විය.

(ii) එම පරීක්ෂණ සමාගම විසින් අබණ්ඩව සිදු කරන ලද බව 2011 වසර තුළ සිදු කළ තත්ත්ව විගණනයේදී තහවුරු විය.

(iii) සමාගමේ පරීක්ෂණ සැලසුම හා සමාගම විසින් කරන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ලබා ගත් පරීක්ෂණ වාර්තා **සභාගත*** කරනු ලැබේ.

(ඉ) පැන නොනඟී.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ඇති වෙලා තිබෙන ප්‍රමිතිකරණය පිළිබඳව පසු විපරම් කරන්න තිබෙන දුෂ්කරතා පිළිබඳව මා අය වැය විවාදයේදීත් කරුණු දැක්වූවා.

දැන් අදාළ සිද්ධියෙන් පීඩාවට ලක් වුණු තැනැත්තාට ඒ විද්‍යාත්මක පරීක්ෂණයේ ප්‍රතිඵලය දක්වලා නැහැ. ඒක දැනුම් දීලාත් නැහැ. ඒ වාගේම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ස්ථාවරය වන්නේ, "පරීක්ෂා කරන්න බැහැයි" කියන එකයි. හැබැයි ඒ ඇස්බැස්ටස් සෙවිලි තහඩු භාවිත කළ ඒවා නොවෙයි. රූපවාහිනී දැන්වීමක තිබුණ ආකාරයටම, මෙම ඇස්බැස්ටස් සෙවිලි තහඩු වහලට සවි කරද්දී එම සෙවිලි තහඩුත් කඩා ගෙන වහලට නැග්ග තැනැත්තා වැටෙනවා. ඒවා පාවිච්චි කළ ඒවා නොවෙයි. සවි කරන මොහොතේයි කඩා ගෙන වැටෙන්නේ. දැන් තිබෙන ප්‍රශ්නය තමයි, මමත් පැමිණිලි කරලා, ඒ තැනැත්තාත් පැමිණිලි කරලා මාස ගණනක් යන තෙක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඒ ස්ථානයට ගියේ නැහැ. ඒ නිසා අදාළ සමාගම කෙරෙහි පක්ෂපාතීත්වයක් තිබෙනවාද කියන කාරණය ගැන ඔබතුමා සොයා බලනවාද?

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු මන්ත්‍රීතුමනි, අපට ලබා දීලා තිබෙන තොරතුරු අනුව අදාළ සමාගම විසින් ඒ තොගයේ ඇස්බැස්ටස් ෂීට් 5,600ක් හදලා තිබෙනවා. ඔබතුමා විසින් සඳහන් කරන ලද ඒ පුද්ගලයාගේ පැමිණිල්ලට අදාළව එතැන ඇස්බැස්ටස් ෂීට් 29ක් තිබුණු බව දැන ගන්නට ලැබී තිබෙනවා. ඒ වාගේම තවත් ඇස්බැස්ටස් ෂීට් 44ක් අතුරලා නැතුව තිබිලා තියෙනවා. ඔබතුමා උපදේශක කාරක සභාවේදී මේ ප්‍රශ්නය ඇසුවාට පස්සේ අපේ ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයේ අය එතැනට ගිහින් තිබෙනවා. ඒ වන කොට පරීක්ෂා කරන්න පුළුවන් මට්ටමේ කිසිම ඇස්බැස්ටස් සෙවිලි තහඩුවක් තිබිලා නැහැ. ඒ වාගේම අර 5,600ම ඇස්බැස්ටස් ෂීට් වෙළෙඳ පොළට නිකුත් වෙලා, ඒවා අලෙවි වෙලා තිබෙනවා. ඒ වාගේම අදාළ ප්‍රතික්ෂේප කළ ඇස්බැස්ටස් ෂීට් 29ට වෙනත් ඇස්බැස්ටස් ෂීට් 29ක් ලබා දීලා තිබෙනවා.

ඒ 29ත් පසුව ඒ ගොල්ලන් වෙළෙඳ පොළට දාලා තිබෙනවා. ඒ පැත්තට යම් කිසි පක්ෂපාතීත්වයක් තිබුණාද කියලා අපට බලන්න පුළුවන්. නමුත් අදාළ වාර්තාවට -ප්‍රමිති කාර්යාංශයට අනුකූලව කරන ලද වාර්තාවට- අනුව නම් ඒ ගොල්ලන් ISO 9001ට අනුකූලව නිෂ්පාදන කටයුතු කරන බව තමයි වාර්තා වෙලා තිබෙන්නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔය කියන ඇස්බැස්ටස් සෙවිලි තහඩු තොගයෙන් භාගයක් බිම තිබුණා. භාගයක් වහලේ සෙවිලි කළා. බිම තිබුණු කොටස බැලූ බැල්මට බාල බව පෙනුණු නිසා ඒ කොටසට තහඩු දීලා ගියා. හැබැයි ඒ පුද්ගලයාට තුවාල සිදු වුණු ඒ සිදුවීමට අදාළ ඇස්බැස්ටස් තහඩු අදටත් ඒ වහලයේ තිබෙනවා, ඒ වහලයේ කටයුතු සම්පූර්ණ කර නැහැ. තමුන්නාන්සේගේ ප්‍රමිති ආයතනයේ නිලධාරීන් ඒ වහලයට නැඟලා මේ අදාළ තහඩු පරීක්ෂා කිරීමට සහ ඒවායේ මිමි ගැනීමට කටයුතු කළේ නැහැ. මේ පිළිබඳව මම උපදේශක කාරක සභාවේදී පැමිණිලි කළාට පස්සේ, අය වැය විවාදයේදී මම මේ පිළිබඳව කථා කළාට පස්සේ, ඒ ප්‍රමිති ආයතනයේ නිලධාරීන් ප්‍රමාද වෙලා ආවා. හැබැයි එහෙම ප්‍රමාද වෙලා ආවාට පස්සේවත් එම නිලධාරීන් වහලයට නැඟලා ඒ තහඩුවක් ගලවා ගන්න හරි, තහඩුවේ කොටසක් ඉවත් කරන්න හරි කටයුතු කළේ නැහැ. මොකක්ද ඒකේ තේරුම?

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමනි. ඒ අදාළ පැමිණිලි කරපු පාර්ශ්වය වහලයේ තහඩු සවි කළාට පස්සේ ඒ තහඩුව ගලවලා පරීක්ෂා කරන්න ප්‍රමිති කාර්යාංශයට බැහැ. ඒ වාගේම ඔබතුමා උපදේශක කාරක සභාවේදී ප්‍රකාශ කරලා තිබුණා, "දැන් තහඩු බිම තිබෙනවා, ගිහින් පරීක්ෂා කරන්න" කියලා. එහෙම පරීක්ෂා කරන්න ගියාම බිම එහෙම තහඩුවක් තිබිලා නැහැ. තහඩු සියල්ලම ඒ අදාළ පුද්ගලයා තමන්ගේ වහලයේ සවි කරලායි තිබෙන්නේ. එතුමාගේ වහලය ගලවලා ඒ සෙවිලි තහඩු ගන්න බැහැ. මොකද වහලයට තහඩුවක් සවි කිරීමේදී ඇණ, මුරිච්චි ගහනවා. එය සවි කිරීමට නොයෙක් දේ කරනවා. පාවිච්චි කරපු තහඩුවක් හා පාවිච්චි නොකරපු තහඩුවක් අතර බොහොම පැහැදිලි වෙනසක් තිබෙනවා. ඒකෙන් එහි ස්ථාවරත්වය මනින්න පුළුවන්කමක් නැහැ. ඇත්තටම මේ අදාළ පුද්ගලයාගේ පැමිණිල්ල ලැබී තිබෙන්නේ සිද්ධිය සිදු වෙලා මාස පහකට පස්සේයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ, නැහැ. ඒක වැරැදියි.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

මම දන්නේ නැහැ. මට ලබා දී තිබෙන තොරතුරු අනුව එහෙමයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, ඔබතුමාව සම්පූර්ණයෙන්ම නොමඟ යවලා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

මම මේ කියන්නේ ප්‍රමිති කාර්යාංශයෙන් මට ලබා දී තිබෙන තොරතුරු අනුවයි. ඔබතුමාගේ මේ අදාළ පැමිණිලිකරු ඒ පැමිණිල්ල කරලා තිබෙන්නේ ඒ සිදුවීම වෙලා මාස පහකට පසුවයි. ඒ අවස්ථාවේ විමසලා බලන කොට සෙවිලි තහඩු සෑම තොගයක්ම වෙළෙඳ පොළට නිකුත් වෙලා ඉවරයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මගේ අවසන් අතුරු ප්‍රශ්නය මෙයයි. ඇණ, මුරිච්චි ගැහුවාම යම් යම් ගැටලු මතු වෙන්න පුළුවන් බව ඇත්ත. ගරු ඇමතිතුමනි, ඇණ, මුරිච්චි ගැහුවාම තහඩුවේ ඝනකම අඩු වෙන්නේ නැහැ නේ.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කිව්වා, ISO 9001 සහතිකය දෙන කොට බලන පරාමිතීන් ගැන.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

වහලයට නැග්ගේ නැහැ. වහලයට නැගලා බැලුවා නම් හරි.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඒ පරාමිතීන්වල එකක් තමයි ඝනකම. උස, දිග, පළල, ඝනකම, බිඳුම්බර, තෙතමනය උරා ගැනීම හා ඝනත්වය කියන මේවා තමයි මනින්නේ.

ඉතින් ගරු කථානායකතුමනි, වහලකට සවි කර තිබෙන තහඩු පරීක්ෂා කිරීමේ කටයුත්ත ඉතා අමාරුයි. ඒවා ගලවා එළියට අරගෙන තමයි ඒ කටයුත්ත කරන්න ඕනෑ. ඇත්තටම තත්ත්ව පරීක්ෂාවේදී සාමාන්‍යයෙන් අපි කරන්නේ, අදාළ කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කරන තොගවලින් සාම්පල් ගෙන ඒවා පරීක්ෂාවට ලක් කිරීමයි. හැබැයි මට ලබා දී තිබෙන තොරතුරු අනුව නම් ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළ සුද්ගලයා මාස 5කට පසුව තමයි මේ තොරතුරු ලබා දී තිබෙන්නේ. එතකොට මේ ප්‍රශ්නය මතු වෙලා ඉවරයි.

සිවිල් ආරක්ෂක නිලධාරීන් : අනුරාධපුර දිස්ත්‍රික්කය
சிவில் பாதுகாப்பு அலுவலர்கள் : அநுராதபுர மாவட்டம்
CIVIL SECURITY OFFICERS : ANURADHAPURA DISTRICT

3101/'12

8. ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සේවය කරන සිවිල් ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිලධාරීන් ආරක්ෂක අංශයේ රාජකාරිවලට අමතරව වෙනත් රාජකාරි සඳහා යොදවා තිබේද;

(iii) එසේ නම්, එම රාජකාරි කවරේද;

(iv) අමතර රාජකාරිවල යෙදීම සඳහා අතිකාල දීමනා හා වෙනත් දීමනා ලබා දෙන්නේද;

(v) එසේ නම්, එක් නිලධාරියෙකුට ලැබෙන එම දීමනාවල වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සිවිල් ආරක්ෂක නිලධාරීන් කුඹුරු ගොවිතැන, ගඩොල් කැපීම සහ එළුවන් හා ඌරන් ඇති කරන ගොවිපළවල සේවය කිරීම වැනි අමතර රාජකාරිවල යොදවා තිබේද;

(ii) ගඩොල් කර්මාන්තයේ යොදවා ඇති එක් නිලධාරියෙකු සෑම මාසයකම අනිවාර්යයෙන්ම ගඩොල් 2000ක් සෑදිය යුතු බවට නියෝගයක් පනවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுர மாவட்டத்தில் சேவையாற்றுகின்ற சிவில் பாதுகாப்பு அலுவலர்களின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுக்கும் அமைய தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி அலுவலர்கள் பாதுகாப்புப் பிரிவின் கடமைகளுக்கு மேலதிகமாக வேறு கடமைகளில் ஈடுபடுத்தப்பட்டுள்ளனரா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி கடமைகள் யாவை என்பதையும்;

(iv) மேலதிக கடமைகளில் ஈடுபடுகின்றமைக்காக மேலதிக நேரக் கொடுப்பனவுகள் மற்றும் வேறு கொடுப்பனவுகள் வழங்கப்படுகின்றனவா என்பதையும்;

(v) ஆமெனில், ஒரு அலுவலருக்கு கிடைக்கும் மேற்படி கொடுப்பனவுகளின் பெறுமதி எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சிவில் பாதுகாப்பு அலுவலர்கள் வேளாண்மை, செங்கல் வெட்டுதல் மற்றும் ஆடுகள், பன்றிகளை வளர்க்கும் பண்ணைகளில் சேவை யாற்றுதல் போன்ற மேலதிக கடமைகளில் ஈடுபடுத்தப்பட்டுள்ளார்களா என்பதையும்;

(ii) செங்கல் கைத்தொழிலில் ஈடுபடுத்தப்பட்டுள்ள ஒரு அலுவலர் ஒவ்வொரு மாதமும் கட்டாயமாக 2000 செங்கற்களை உற்பத்தி செய்ய வேண்டுமென கட்டளையிடப்பட்டள்ளதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) separately, and in relation to each Divisional Secretary's Division the number of Civil Security Officers serving in the District of Anuradhapura;

(ii) whether the aforesaid officers have been assigned with other duties in addition to the duties in the security service;

(iii) if so, what those duties are;

(iv) whether overtime payments and other allowances are paid for engaging in additional duties; and

(v) if so, the value of the aforesaid allowances received by an officer?

(b) Will he state -

(i) whether the Civil Security Officers have been assigned with additional duties such as engaging in cultivation and brick industry and working in farms where goats and pigs are reared; and

(ii) whether an order has been given making it compulsory for each officer deployed in bricks industry to make 2,000 bricks every month?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා හා බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i)

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	සිවිල් ආරක්ෂක භටයින් සංඛ්‍යාව
1	අනුරාධපුර නැඟෙනහිර නුවරගම් පළාත	370
2	අනුරාධපුර මධ්‍යම නුවරගම් පළාත	165
3	කැකිරාව	58
4	ගල්නෑව	18
5	තඹුත්තේගම	34
6	තලාව	29
7	මැදවච්චිය	1469
8	පලුගස්වැව	-
9	කහටගස්දිගිලිය	319
10	ගලෙන්බිඳුණුවැව	140
11	රඹෑව	34
12	මිහින්තලය	161
13	පලාගල	169
14	ඉපලෝගම	1
15	නාච්චදූව	1
16	රාජාංගනය	9
17	තිරප්පනය	11
18	මහවිලච්චිය	1723
19	පදවිය	263
20	නොච්චියාගම	303
21	හොරොව්පතාන	835
22	කැබිතිගොල්ලෑව	1244

(ii) ඔව්.

(iii) 1. ආගමික ආයතන සංවර්ධන කටයුතු

2. අධ්‍යාපන ආයතන සංවර්ධන කටයුතු

3. පුරා විද්‍යා අංශයට සම්බන්ධ කටයුතු

4. විදුලි වැට නඩත්තු කිරීම / ඉදි කිරීම සම්බන්ධ කටයුතු

5. කෘෂි සංවර්ධනයට අදාළ සංවර්ධන කටයුතු සහ සත්ව පාලනයට අදාළ කටයුතු

6. ඉදි කිරීමේ ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු

(iv) ඉහත සියලුම කාර්යයන්හි යොදවනු ලබන්නේ සම්මත රාජකාරී කාල සීමාව තුළ පමණි.

(v) අදාළ නොවේ.

(ආ) (i) ඉහත (අ) (iii) පිළිතුර හා සබැඳේ.

(ii) නැත.

(ඇ) අදාළ නොවේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ඇමතිතුමා පිළිගත්තා, මේ රට බේරා ගන්න විශාල කැපවීමක් කළ සිවිල් ආරක්ෂක නිලධාරීන් සත්ව පාලන කටයුතුවල, ඒ වාගේම ගඩොල් කැපීමේ කටයුතුවල නිරත වනවා, එසේ නිරත වන්නේ රාජකාරී කාල සීමාව තුළදී පමණයි කියා. මා ඒක පිළිගන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, රාජකාරී කාල සීමාවට අමතරවත් ඔවුන් ඒ කටයුත්තේ නිරත වෙලා ඉන්නවා. ඒ විතරක් නොවෙයි. ශ්‍රාමාරක්ෂක නිලධාරියකු ගඩොල් 2,000ක් දෙන්න ඕනෑය කියා අනිවාර්ය කරලා තිබෙනවා. ඒ අයට කිසිම අතිකාල දීමනාවක් ලැබෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. සමහර මැති ඇමතිවරුන්ගේ ගෙවල්වලට එළවලු ගෙනෙන්න කඩේ යවන්නත් මේ අය පාවිච්චි කරනවා. ඔබතුමන්ලා පොරොන්දු වුණා, මේ අයව ස්ථිර කරනවා කියලා. එම නිසා මා අහනවා, මේ අයව ස්ථිර කරලා ඒ සියලු දීමනාවන් දෙන්නේ කවදාද කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අපේ මාතෘ භූමිය බේරා ගැනීම සඳහා විශාල පරිත්‍යාගයක් කළ මේ භටයන් ස්ථාවරභාවයට පත් කිරීම, අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය හා මැදිහත් වීම මත 2006.09.13 දින 1462/20 දරන රජයේ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර තිබෙනවා. අදාළ කරුණු එහි අන්තර්ගත කර තිබෙනවා.

එපමණක් නොවෙයි. ඒ මහ පෙන්වීම යටතේ නිලධාරියාගේ සේවය ස්ථිර කරලා විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීම සඳහා ඉදිරිපත් කරපු අමාත්‍ය මණ්ඩල සංදේශය 2012 අගෝස්තු 03 වැනිදා අනුමත කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඉන් අනතුරුව සම්ප්‍රදායානුකූලව සිදු වන්නේ වැටුප් පරිමාණ තීරණය කිරීමයි. ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට යවනවා. ගරු මන්ත්‍රීතුමා අසන අතිකාල ආදී දේවලුත් තීරණය වන්නේ ඒ වැටුප් ක්‍රම අනුවයි. මේ අය ඉටු කරන සේවාව අපි අගය කරනවා. ජාතික සංවර්ධනයේ මහා කාර්ය භාරයක් මේ අය ඉෂ්ට කරනවා. ජාතික සංවර්ධනය වෙනුවෙන් ඉටු කරන කාර්ය භාරයේදී අහවල් දේ කරන්න එපා කියලා තමුන්නාන්සේලා යෝජනා කරන්න එපා. රටේ නිෂ්පාදනය මෙන්ම අනෙකුත් සෑම ක්ෂේත්‍රයක්ම ජාතික සංවර්ධනයේ වැදගත් අංගයන්. ඒ කටයුතු ඉෂ්ට කිරීම වෙනුවෙන් ඒ අයට අපි ගරු කරනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඔබතුමාගේ ඒ පිළිතුර ගැන මට සෑහීමට පත් වන්න බැහැ. ඒ අය ස්ථිර කරන දිනය කවදාද කියලායි මම ඇහුවේ. මීට කලින් පැවැත් වූ හැම මැතිවරණයක් එනකොටම මේ අය ස්ථිර කරන්න පටන් ගන්නවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔවුන් ස්ථිර කිරීම අමාත්‍ය මණ්ඩලය අනුමත කරලා තිබෙනවා. ඒ අනුව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අදාළ තීරණ ගැනීමෙන් පසු ඒ කාර්යය සිදු වනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. උතුරු මැද පළාතේ විශේෂයෙන්ම පදවිය වාගේ ප්‍රදේශවල අධ්‍යාපන කටයුතුවලට මේ ග්‍රාමාරක්ෂක නිලධාරීන් යොදවනවා. ඒ කියන්නේ ඔවුන් පාසල්වල ඉගැන්වීම් කටයුතු කරනවා. කානු ශුද්ධ කරන ඒවා, කඩේ යන ඒවා, එළවලු ගෙනෙන ඒවා කළාට ප්‍රශ්නයක් නැහැ. යුද්ධය අවසන් වෙලා අවුරුදු තුනක් වනවා. හැබැයි ඒ ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් මේ නිලධාරීන් යෙදවීමේදී අඩුම තරමින් ඔවුන්ට ඒ සම්බන්ධව පුහුණුවක් ලබා දෙන්න ඕනෑ. එහෙම නැතිව මේ නිලධාරීන් ඒ සඳහා යෙදවීම ඒ දරුවන්ට කරන අසාධාරණයක් වනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කානු කපන්නයි, වළවල් හාරන්නයි මේ අය යෙදවීම හොඳයි කියලා ගරු මන්ත්‍රීතුමා කිව්වා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
හොඳයි කියලා නොවෙයි කිව්වේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
යම් කිසි දැනුමක් තිබෙනවා නම්, ඒ දැනුම අපේ දරුවන්ට ලබා දීම සඳහා යම් පාසලක් උදව්වක් ඉල්ලා සිටිනවා නම් ඒක ලබා දීමේ කිසිම වැරැද්දක් නැහැ, ගරු කථානායකතුමනි. උගන්වන හැම කෙනාම රජයේ ගුරු සේවයේම කෙනෙක් වෙන්න ඕනෑ නැහැ.

කලින් ප්‍රශ්නයක දී කිව්වා, නන්දා මාලනී ගේ බෙරේ පැළුවා කියලා. [බාධා කිරීමක්] දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වේ ඒ විධියටයි. අපේ ග්‍රාමාරක්ෂක භටයන් - [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නන්දා මාලනීගේ බෙරේ පැළුවා කියලා මම කිව්වේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, එතුමා වෙන කාගේද බෙරයක් ගැනයි කිව්වේ. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පිට රටක රේගුවේදී වෙච්ච දෙයක් ගැන කිව්වේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කියපු දේ කියපු හැටියෙන්ම භාර ගන්න එපා. ටිකක් හදලා ගන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්, ඔවා ටිකක් රසවත් වෙන්න ඕනෑ. දැන් අපි අභිමානවත් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ජාතියට දායාද කරලා තිබෙනවා. ඉන්පසුව අද මේ ගරු සභාව රැස් වුණු පළමුවැනි දවසේ දී අපි ඒ ගෞරවය ප්‍රකාශ කරන්නට ඕනෑ.

අපේ සංවර්ධන ක්‍රියා දාමයට මේ අය තමන්ගේ දැනුම අනුව යමක් එකතු කරනවා නම් එය වැළැක්වීම සඳහා අදහස් දැක්වීම සුදුසු නැහැයි කියන එකයි මගේ අදහස.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, අවසන් ප්‍රශ්නය අහන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම අපි බොහොම ගරු කරන ඇමතිවරයෙක් හැටියට මෙතුමා කානු කපන එකයි, අධ්‍යාපනයට උදවු කරන එකයි සමාන කිරීම ගැන මම කනගාටු වනවා. විශේෂයෙන්ම මේ අයව යොදවලා උතුරු මැද පළාතේ දරුවන්ට අධ්‍යාපනය ලබා දුන් නිසා ද, පසු ගිය අවුරුද්දේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන තත්ත්වය ලංකාවේ 24 වැනි තැනට පත් වෙලා තිබෙන්නේ? ඔබතුමන්ලාගේ අධ්‍යාපන ප්‍රතිපත්තිය මෙක ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක අධ්‍යාපන ඇමතිතුමාගෙන් වෙනම ප්‍රශ්නයක් ලෙස අහන්න. මට කියන්න තිබෙන්නේ මෙපමණයි.

රොටුඹ මධ්‍යම බෙහෙත් ශාලාව : ප්‍රතිසංස්කරණය
ரொட்டும்ப மத்திய மருத்துவசாலை : புனரமைப்பு
ROTUMBA CENTRAL DISPENSARY: RENOVATION

1970/'11

11. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි, රොටුඹ මධ්‍යම බෙහෙත් ශාලාව මේ වන විට වසා දමා ඇති බවත්;

(ii) වසා දැමූ බෙහෙත් ශාලාවේ ගොඩනැගිලි විනාශ වෙමින් පවතින බවත්;

(iii) බෙහෙත් ශාලාව වසා දැමීම නිසා ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවයකට මුහුණ පා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බෙහෙත් ශාලාවේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) මේ වන විට ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, රොටුඹ මධ්‍යම බෙහෙත් ශාලාව සඳහා කඩිනමින් වෛද්‍යවරයකු පත් කර ප්‍රදේශයේ ජනතාවට සහන සැලසීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාර අමෙච්චරෙක් කේට්ට වීනා:

(අ)(i) මාත්තරෙ මාවට්ටත්තින් පස්කොට ප්‍රිරදේස සෙයලාලර් ආලුකෙප් ප්‍රිරදේසත්තිල් අමෙන්තුල්ල රොට්ටුම්ප මත්තිය මරුත්තුව සාලෙ තර්පෝදු මූඩප්පට්ටුල්ලදෙන්පදෙයුම්;

(ii) මූඩප්පට්ටුල්ල මරුත්තුවසාලෙයින් කට්ටිඩඞ්කළ් අළිවඩෙන්දු වරුකින්ර දෙන්පදෙයුම්;

(iii) මරුත්තුවසාලෙ මූඩප්පට්ටුල්ලදනාල් ඉප් ප්‍රිරදේසත්තිලුල්ල මක්කළ් පෙරුම් අසෙලකරියත් තිර්කු මුකම්කොටුත්තුල්ලාර්කළ් එන්පදෙයුම්

අවර් අරිවාරා?

(ආ) (i) මේර්පඩි මරුත්තුවසාලෙයින් කට්ටිඩඞ්කළෙප් පුනරමෙප්පදර්කු නඩවඩික්කෙ එඩුප්පාරා එන්පදෙයුම්;

(ii) තර්පෝදු ඉදර්කාන නිදි ඒර්පාඩුකළ් ඔදුක්කප්පට්ටුල්ලදා එන්පදෙයුම්;

(iii) ආමෙනිල්, රොට්ටුම්ප මත්තිය මරුත්තුව සාලෙක්කු උඩනඩියාක මරුත්තුවරොරුවරෙ නියමිත්තු ඉප්ප්‍රිරදේසත්තිලුල්ල මක්කළුක්කු නිවාරණම් පෙර්රුක්කොටුප්පදර්කු නඩවඩික්කෙ එඩුප්පාරා එන්පදෙයුම්;

(iv) ආමෙනිල්, අත් තිකදි යාදෙන්පදෙයුම්

අවර් ඉච්සෙයික්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) the Rotumba Central Dispensary situated in the Pasgoda Divisional Secretary's Division area in the Matara District has been closed down at present;

(ii) the buildings of the aforesaid dispensary which has been closed down are getting destroyed; and

(iii) the people in the area are faced with a great inconvenience due to the closure of the aforesaid dispensary?

(b) Will he inform this House -

(i) whether steps will be taken to renovate the buildings of the aforesaid dispensary;

(ii) whether allocations have been made for that purpose by now;

(iii) if so, whether steps will be taken to appoint a doctor to the Rotumba Central Dispensary and provide relief to the people in the area; and

(iv) if so, the date on which it will be done?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රොටුඹ මධ්‍යම බෙහෙත් ශාලාව වසා නොමැත.

(ii) එම බෙහෙත් ශාලාවේ ගොඩනැගිලි විනාශ වී නොමැත.

(iii) එම ප්‍රදේශයේ ජනතාව කිසිදු අපහසුතාවකට පත් වී නොමැත.

(ආ) (i) ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය නොවේ.

(ii) අදාළ නොවේ.

(iii), (iv) 2011.11.14 දින සිට මේ දක්වා මෙම බෙහෙත් ශාලාවේ එම්.බී.බී.එස්. උපාධිධාරී වෛද්‍ය නිලධාරිනියක් සේවය කරයි.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරන අවස්ථාවට වඩා දැන් තත්ත්වය වෙනස්. ඊයේ පෙරේදාත් මම ආපසු ඒ ගැන බැලුවා. ඒ නිසා අතුරු ප්‍රශ්න නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සොයා බලන එක හොඳයි.

ප්‍රශ්න අංක 12- 2201/'11- (2), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13 - 2330/'12 - (2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රය පිළිබඳව මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රය පිළිබඳව ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නයට එතුමාට උත්තර දෙන්න පුළුවන් වුණා නම්, මගේ ප්‍රශ්නයට උත්තර දෙන්න බැරි ඇයි කියලා මා දැන ගන්න කැමැතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ප්‍රශ්නයකට පැහැදිලිව පිළිතුරු දෙන්නට කල් ඉල්ලුවාම එයට ඉඩ දෙන්නට ඕනෑ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

හදුරුක්කන්ද ගල් කොරිය: පරිසර විනාශය
ஹதுருக்கந்த மலையிலுள்ள கற்குழி: சுற்றாடல் அழிவு
HANDURUKKANDA QUARRY: ENVIRONMENTAL DESTRUCTION

2495/'12

14.ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1):

(අ) (i) කුරුණෑගල හා මාවතගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් හදුරුක්කන්ද නමැති කන්දේ හෝ එයට ආසන්නව වෙනත් කන්දක පිහිටි කලුගලක් කඩා දමමින් ගල් කොරියක් පවත්වා ගෙන යන්නේද;

(ii) ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමතිය ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

(iv) එම ගල්කොරිය පවත්වා ගෙන යන අය කවුරුන්ද;

(v) එම ගල්කොරියේ හිමිකාරිත්වය ඇත්තේ ආයතනයකට නම්, එහි නම, ලිපිනය සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(vi) එම ගල පිහිටි ඉඩමේ අයිතිකරුවන්ගේ නම්, ලිපිනයන් සහ එක් එක් පුද්ගලයාට අයත් ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) එම ගල කඩා ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කලුගල් කොරිය පිහිටි කඳුවැටියෙන් පෝෂණය වන වැව් පිහිටා තිබේද;

(ii) එම කඳුවැටිය ආශ්‍රිතව සිදු කරන කලුගල් කැඩීම හේතුවෙන් සිදු වන පරිසර විනාශය නිසා ඒ යටතේ පෝෂණය වන වැව්වල ජල මූලාශ්‍රවලට, ජීවීන්ට සහ ස්වාභාවික භූමියට සිදු වන හානිය සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருணாகல் மற்றும் மாவத்தகம பிரதேச செயலாளர் பிரிவுகளுக்கு சொந்தமான ஹதுருக்கந்த எனும் மலையில் அல்லது அதற்கு அண்மித்ததொரு மலையில் அமைந்துள்ள கருங்கற் பாறைகளை உடைத்து கற்குழி யொன்று பேணிவரப்படுகின்றதா என்பதையும்;

(ii) இதற்கு மத்திய சுற்றாடல் அதிகார சபையின் அனுமதி பெறப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், இதனோடு தொடர்புடைய ஆவணங் களைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) மேற்படி, கற்குழியை பேணிவருபவர் யார் என்பதையும்;

(v) மேற்படி கற்குழி ஏதேனுமொரு நிறுவனத்திற்கு சொந்தமானதெனின் அதன் பெயர், முகவரி மற்றும் பணிப்பாளர் சபை அங்கத்தவர்களின் பெயர் முகவரிகள் யாவையென்பதையும்,

(vi) மேற்படி கற்பாறை அமைந்துள்ள காணியின் உரிமையாளர்களின் பெயர், முகவரி, மற்றும் ஒவ்வொரு உரிமையாளருக்கும் சொந்தமான காணியின் அளவு வெவ்வேறாக யாவை யென்பதையும்;

(vii) மேற்படி கற்பாறையை உடைத்தகற்றுவதற்கான காரணம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கற்குழி அமைந்துள்ள மலைத் தொடரிலிருந்து நீரைப் பெறுகின்ற வாவிகள் ஏதும் உள்ளதா என்பதையும்;

(ii) மேற்படி மலைத்தொடரைச் சார்ந்தாக இடம்பெறும் கருங்கல் உடைத்தலினால் சுற்றாடலுக்கு விளைகின்ற அழிவின் காரணமாக இதிலிருந்து நீரைப்பெறுகின்ற வாவிகளின் நீர் மூலங்களுக்கும், உயிரினங்

களுக்கும், இயற்கைத் தரைக்கும் ஏற்படுகின்ற சேதம் தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment and Renewable Energy:

(a) Will he inform this House -

(i) whether a quarry is run by splitting the rock on the mountain known as Hadurukkanda or a mountain close to that which belong to the Kurunegala and the Mawathagama Divisional Secretary's Divisions;

(ii) whether the approval of the Central Environment Authority has been granted for that;

(iii) if so, whether the documents relevant to the aforesaid approval will be submitted;

(iv) as to who run that quarry;

(v) if the quarry belongs to an institution, its name, address and names and addresses of the members of the board of directors;

(vi) separately, of the names and addresses of the owners of the land in which the aforesaid rock is located and the extents of land belonging to each person; and

(vii) of the reasons for splitting and removing that rock?

(b) Will he state -

(i) whether there are tanks which are fed by the mountain in which the aforesaid rock is located; and

(ii) of the steps to be taken to prevent the damage caused to the sources of water of the tanks fed by the mountain, animal life and natural environment owing to splitting rocks that surround the aforesaid range of mountains?

(c) If not, why?

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා)

(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர்)

(The Hon. A.D. Susil Premajayantha - Minister of Environment and Renewable Energy)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිලැස්ස ඉහළගම ග්‍රාමසේවා වසමේ පිලිකඩ වත්ත නැමැති ඉඩමේ කළු ගල් කැඩීම සඳහා පහත සඳහන් පරිදි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් බලපත්‍ර නිකුත් කර ඇත.

Ø අකිල ඉංජිනියරින් පුද්ගලික සමාගම විසින් පවත්වා ගෙන යනු ලැබූ ගල්කොරිය සඳහා රංජිත් මාපා යන අය වෙත නිකුත් කරන ලද IML/B කාණ්ඩයේ බලපත්‍රය කොන්දේසි උල්ලංඝනය වීම හේතුවෙන් භූ විද්‍යා හා පතල් කාර්යාංශය විසින් අත්හිටුවා ඇත.

Ø එයට යාබදව එච්.ඒ. සමන් යන අය විසින් IML/B කාණ්ඩයේ ගල් කොරියක් පවත්වා ගෙන යනු ලබයි.

Ø එච්.ඒ. සමන් යන අයගේ ව්‍යාපෘතියට මීටර් 250ක් පමණ දුරින් එස්.ඩී.කේ. පතිරාජ යන අය විසින් IML/C කාණ්ඩයේ ගල් කොරියක් පවත්වා ගෙන යනු ලබයි.

Ø එච්.ඒ. සමන් යන අයගේ ව්‍යාපෘතියට කිලෝ මීටර් 01ක් පමණ දුරින් වී.වී. කරුණාරත්න සහ සමාගම විසින් IML/B කාණ්ඩයේ ගල් කොරියක් පවත්වා ගෙන යනු ලබයි.

(ii) ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පහත සඳහන් පරිදි පරිසර නිර්දේශ නිකුත් කර ඇත.

Ø අංක NWP/CEA/NRM/07/Ku/Ma/MM/354/11 හා 2012.01.05 දිනැති පරිසර නිර්දේශ - අකිල ඉංජිනියරින් පුද්ගලික සමාගම, 180/60, ජයවිමන වත්ත, සියඹලාගොඩ, පොල්ගස්ඕවිට.

(මෙම ගල් වලෙහි ක්‍රියාකාරිත්වය භූ විද්‍යා හා පතල් කාර්යාංශය විසින් අත් හිටුවා ඇත.)

➢ අංක NWP/CEA/NRM/07/Ku/Ma/MM/319/11 හා 2012.01.10 දිනැති පරිසර නිර්දේශ - එච්.ඒ. සමන්, අංක 379, වෙලගෙදර මාවත, වැව රවුම, කුරුණෑගල.

➢ අංක NWP/CEA/NRM/07/Ku/Ma/MM/917/12 හා 2012.07.17 දිනැති පරිසර නිර්දේශ - එස්.ඩී.කේ. පතිරාජ, අංක 64, ඩෙසි මවුන්ට්, පිලැස්ස.

➢ අංක NWP/CEA/NRM/07/Ku/Ma/MM/77-R1/11 හා 2012.09.24 දිනැති පරිසර නිර්දේශ - වී.වී. කරුණාරත්න සහ සමාගම, නො. 579, බුළුගහ හන්දිය, නුවර පාර, කැලණිය.

(iii) ඔව්. ඇමුණුම **සභාගත*** කරමි.

(iv) පහත නම් සඳහන් අය විසින් එම ගල් කොරි පවත්වාගෙන යනු ලබන බව වාර්තා වී ඇත.

➢ රංජිත් මාපා (මෙම ගල් වලෙහි ක්‍රියාකාරිත්වය භූ විද්‍යා හා පතල් කාර්යාංශය විසින් අත් හිටුවා ඇත.)

➢ එච්.ඒ. සමන්

➢ එස්.ඩී.කේ. පතිරාජ

➢ වී.වී. කරුණාරත්න

(v)

ආයතනයේ නම	ලිපිනය	අධ්‍යක්ෂ මණ්ඩලය
අකිල ඉංජිනියරින් පුද්ගලික සමාගම	180/60, ජයවිමන වත්ත, සියඹලාගොඩ, පොල්ගස්ඕවිට	එස්.ඩී.කේ. ධර්මප්‍රිය ඩී.සී. වීරක්කොඩි ඩබ්.ඩී.ඩබ්.ඩබ්. විජේදාස
වී.වී. කරුණාරත්න සහ සමාගම	නො. 579, බුළුගහ හන්දිය, නුවර පාර, කැලණිය	වී. කරුණාරත්න වී.යූ.පී. කරුණාරත්න වී.එස්.එස්. කරුණාරත්න වී.එම්.පී. කරුණාරත්න ටී.වී.ටී.ආර්. කරුණාරත්න

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(vi) එම ගල පිහිටි ඉඩමේ අයිතිකරුවන්ගේ නම්, ලිපිනයන් සහ එක් එක් පුද්ගලයාට අයත් ඉඩම් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි බව වාර්තා වී ඇත.

අයිතිකරුවන්ගේ නම	ලිපිනයන්	ඉඩම් ප්‍රමාණය
රංජිත් මාපා	අකිල ඉංජිනියරින් පුද්ගලික සමාගම, 180/60, ජයවිමන වත්ත, සියඹලාගොඩ, පොල්ගස්ඕවිට.	අක්කර 04
එච්.ඒ. සමන්	අංක 379, වෙලගෙදර මාවත, වැව රවුම, කුරුණෑගල.	අක්කර 11 රූඩ්03 පර්වස් 32
එස්.ඩී.කේ. පතිරාජ	අංක 64, ඩෙසි මවුන්ට්, පිලැස්ස.	අක්කර 02 රූඩ් 02 පර්වස් 30
වී.වී. කරුණාරත්න	නො. 579, බුළුගහ හන්දිය, නුවර පාර, කැලණිය.	අක්කර 19 රූඩ් 02 පර්වස් 28

(vii) ප්‍රදේශයේ මහා මාර්ග ඉදි කිරීම් හා වෙනත් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කළු ගල් සැපයීම සඳහා.

(ආ) (i) මෙම ස්ථානයට ආසන්නව ටැම්පාන ජලාශය පිහිටා ඇත. උපරිම ජල සැපයුම් මට්ටමේ සිට ආසන්න වශයෙන් මීටර් 250-300ක් පමණ දුරින් ඉහත කැණීම් කටයුතු අත් හිටුවන ලද කළු ගල් වැඩපළ පිහිටා ඇත. මෙම කඳුවැටියේ දකුණු දෙසින් මෙම වැඩපළ පිහිටා ඇති අතර, මෙම කඳුවැටිය මඟින් නිර්මාණය වන ජල මූලාශ්‍ර එහි බටහිර දෙසට වන නිම්නය දිගේ ගලා යන බැවින් ටැම්පාන ජලාශයේ ජල මූලාශ්‍රවලට සැලකිය යුතු බලපෑමක් සිදු නොවේ. කඳුවැටියට පතිත වන වැසි ජලය බාධාවකින් තොරව එම ජලාශයට වහනය වන අතර, අවසර දී ඇති ව්‍යාපෘති මඟින් ජලවහන රටාවට බාධාවක් නොමැත.

(ii) කළු ගල් කැඩීම හේතුවෙන් ඒ ආශ්‍රිතව පෝෂණය වන වැව්වල ජල මූලාශ්‍රවලට, ජීවීන්ට සහ ස්වභාවික භූමියට සිදු වන හානිය අවම කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේදී එම බලපත්‍ර සඳහා කොන්දේසි ඇතුළත් කර ඇති අතර ප්‍රදේශයේ ජලාශවලට ප්‍රවේශ වන ජලවහන රටාව වෙනස් නොවන පරිදි ඇති ස්ථානවලට පමණක් කැණීම් කටයුතු කිරීම සඳහා අවසර ලබා දීම සිදු කරයි. එසේම බලපත්‍ර අලුත් කිරීමට ප්‍රථම මධ්‍යම පරිසර අධිකාරියේ සහ වයඹ පළාත් පරිසර අධිකාරියේ නිර්දේශ ලබා ගනු ලැබේ.

තවද බලපත්‍රලාභීන් විසින් එම බලපත්‍ර කොන්දේසිවලට අනුව කටයුතු කරන්නේදැයි පරීක්ෂා කර බැලීම සිදු කරන අතර, එම කොන්දේසි කඩවන අවස්ථාවලදී බලපත්‍ර අත් හිටුවීමට සිදු කරනු ලබයි.

(ඇ) පැන නොනඟී.

**සභාමේසය මත තබන ලද ඇමුණුම:*
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

NWP/CEA/NRM/07/KU/MA/MM/319/11

2012-01-10

වයඹ පළාත් කාර්යාලය, අංක 162, මීගමුව පාර, කුරුණෑගල.
දුරකථන අංක 037 7877277 / 037 2233885

ප්‍රාදේශීය කළමනාකරු,
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,
අංක 11,
මොන්හැකුලම පාර,
වැකැර / කුරුණෑගල.

පරිසර නිර්දේශය - කළුගල් කැණීම, පිලිකඩ එස්ටේට්, පිලැස්ස, ඉහළගම.

උක්ත කරුණට අදාල ඔබේ අංක Ku/IML/C/NWP/MQUR/2011/3435 හා 2011.10.07 දිනැති ලිපිය හා කුරුණෑගල, වැවරවුම්, වෙළගෙදර මාවත, අංක 379 යන ලිපිනයේ පදිංචි එච්.ඒ. සමන් මහතා විසින් ඉදිරිපත් කරන ලද 2011.11.15 දිනැති කළුගල් කැණීම පිළිබඳව මූලික පොත්පාර ලබා ගැනීමේ ප්‍රයෝජනවලිය හා බැඳේ.

ඒ අනුව මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 695 පිලැස්ස ඉහළගම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි ශෂිඳුරන් මංගල ප්‍රමිලා මහත්මියට අයත් ආර්.ඩබ්.පී.එම්.පී. රාජපක්ෂ සුසීද්ධ නොතාරිස් මහතා විසින් ලියා තහනික කරන ලද ඔප්පු අංක 6065 හා ඔඩ්.එම්.පී.පී. රණුක්හවුල්ල බලයලත් මිණින්දෝරු තෘන විසින් මෙන සාදන ලද 2005.11.16 දිනැති අංක 1927 දරණ පිහිටි කළුගල් පිලිකඩ එස්ටේට් නැමැති අක්කර 11 රූඩ් 3 ක් හා පර්චස් 32 ක් වශාල ඉඩමේ පිහිටි කළුගල් කැණීම් සඳහා පමණක් පරපෝ සඳහන් කොන්දේසි වලට යටත්ව ඔබගේ අනුමැතිය ලබා දීමට මෙයින් නිර්දේශ කරමි.

කොන්දේසි :-

01. අදාල ස්ථානයේ කළුගල් කැණීම් සඳහා 1992 අංක 33 දරණ පතල් හා බනිජ දුව්‍ය පනතේ විධිවිධාන වලට අනුකූලව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයෙන් කැණීම් බලපත්‍රය ලබා ගත යුතුය.

02. මෙම පරිසර නිර්දේශය නිකුත් කරනු ලබන දින සිට මාස 12 ක කාල සීමාවක් තුලදී කළුගල් කැණීම් සඳහා පමණක් නිකුත් කරනු ලැබේ. මෙම වලංගු කාලය දිර්ඝ කිරීමට වලංගු කාල සීමාව ඉක්මවීමට මාසයට පූර්ව ම සඳහා ඉල්ලුම් කල යුතුය.

03. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන සියලුම ගණ අපද්‍රව්‍ය (සේවක සේවිකාවන්ගේ ගෘහස්ථ ගණ අපද්‍රව්‍ය ඇතුලත්ව)

3.1 සිසිලම ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ ජල මාර්ගයකට / ජලාශයකට එකතුවන ස්ථානයකට බැහැර නොකල යුතුය.

3.2 මාවතගම ප්‍රාදේශිය සභාවේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් කවර හෝ පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගත යුතුය.

3.3 සිසිලම විටකදී විවෘත භූමිය තුල පිළිස්සීම සිදු නොකල යුතුය.

3.4 ගණ අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම සම්බන්ධයෙන් කර්මාන්තකරු පෞද්ගලිකව වගකිව යුතු වේ.

3.5 සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් නිකුත්වන ගෘහෝත්ත අප ජලය (Domestic Waste Water) නියමිත පරිදි සැලසුම් කොට ඉදිකරන ලද මතුපිටින් වැසූ උරා ගැනීමේ වලකට (Soakage Pit) බැහැර කල යුතුය.

04. කර්මාන්ත ක්‍රියාවලිය සඳහා හෝ සේවක සේවිකාවන්ගේ පරිභෝජනය සඳහා අංක 1466/5 හා 2006.10.10 දරණ ගැසට් නිවේදනය මඟින් තහනම් කරන ලද, මයික්‍රෝන 20 (20 µm) හෝ ඊට අඩු ඝණකම සහිත පොලිතීන් හෝ පොලිතීන් නිෂ්පාදන භාවිතා නොකල යුතුය.

05. 05.01 ගල්වලේ මතුපිට පස් තට්ටුව ඉවත් කිරීමේදී කැණීම් සඳහා අවශ්‍ය වන ප්‍රදේශය තුල පමණක් මතුපිට පස් තට්ටුව ඉවත් කළයුතු අතර එසේ ඉවත් කරනු ලබන පස් යාබද ඉඩම්වල ගොඩගැසීම නොකළ යුතු අතර එම පස් වැසි ජලය සමග කෝදාගෙන යාම වැළැක්වීමට අවශ්‍ය පූර්ව ක්‍රියාමාර්ග ගත යුතුය.

05.02 ගල මතුපිට පස් තට්ටුවේ පාංශු බාදනය වැලැක්වීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

05.03 කළුගල් කැණීමෙන් ජනිතවන ගල්තුඩු වැසිජලය ඔස්සේ යාබද පහත්බිම් වෙත කෝදායාම වැළැක්වීම සඳහා අවශ්‍ය පූර්ව උපාය මාර්ග අනුගමනය කළයුතුය.

06. ඉඩම් කැණීම් සිටුපුදු සම්පූර්ණයෙන් අවසන් වූ පසු ඉඩම් අයිතිකරුවන් හා බිදු ලබාගත් පෞද්ගලික ආයතන විකාබද්ධව එම භූමියේ ඉවත් කරන ලද පස් තට්ටුව අනිකාට කුසුදු පරිදි ගාස්ත්‍රෝක්තව සිදු කල යුතුය.

07. බෝර වලවල් යැකසීම සඳහා ජැක්හැමර් පමණක් භාවිතා කල යුතුය.

08. කළගල කැණීම කලයුතු භූමි ප්‍රමාණය සහ බෝර වලෙහි ගැඹුර භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් නිකුත් කරනු ලබන කැණීම් බලපත්‍රයෙහි සඳහන් ප්‍රමාණයට පමණක් සිදුකල යුතුය.

09. ගල් පිපිරවීම සිදු කරනු ලබන කාල වේලාවන්හිදී හැර මෙම ගල් වලේ ක්‍රියාකාරීත්වය නිසා උද්ගත වන ශබ්දය අදාල ඉඩමේ මායිම වල පෙ.ව. 6.00 ත් ප.ව. 6.00 ත් අතර කාලය තුල ඩෙසිබල් 55 (db) හෝ ඊට අඩුවෙන් පවත්වා ගත යුතුය.

10. එක් වරකදී එක් බෝර වලක් පමණක් පිපිරවීම සිදු කල යුතුය.

11. මෙම කළගල් වලෙහි ගල් පිපිරවීමේ ක්‍රියාවලිය සිදු කිරීම පිළිබඳ සේවා කාලය පෙ.ව 08.00 ත් ප.ව 4.00 ත් අතරට සීමා කල යුතුය.

12. මෙම ගල්වලේ වෙඩි පිපිරවීමේදී ජනිත වන භූමි කම්පනය හා වාතයේ පිපිරුණු අධි පීඩන ඵටෝම අන්තර්වාර ප්‍රමිතීන්ට අනුකූල වන ලෙස සිදු කල යුතුය.

12.1 භූමි කම්පනය උපරිම අංශු ප්‍රවේගය තත්පරයට මිලි මීටර් 04 (04mm/Sec) ට අඩුවෙන්ද.

12.2 වාතයේ පිපිරුම් අධි පීඩන ඵටෝම ඩෙසිබල් 115 කට (රේඛීය උපරිම) අඩුවෙන්ද වන පරිදි කටයුතු කිරීමට වල බලා ගත යුතුය.

12.3 ගල් කැබලි විසිවීම වැලැක්වීම සඳහා ආරක්ෂිත දැල්, රබර් වයර් හා වැලි ගෝනි යන ආදිය භාවිත කල යුතුය.

13. පිපිරවීම් ආරම්භ කිරීමට පූර්ව අසල්වැසියන්ට හා අසල පිහිටි මාර්ගයේ ගමන් කරන්නන්ට ආරක්ෂාවීම සඳහා සංඥා නිකුත් කල යුතුය.

14. වෙඩි පිපිරවීමේදී යාබද ඉඩම වලට බාධාවක් නොවන පරිදි කළගල් කර්මාන්තය පවත්වාගෙන යා යුතුය.


15. කළගල් කර්මාන්තය හේතුවෙන් අවට පිහිටි ගෘහ වලට හා වෙන කවුන්ට සිසිදු අපුරුසින් හානි සිදු නොවන ආකාරයට ආරක්ෂණ ක්‍රමයක් සැකසිය යුතුය.

16. කැණීම් කිරීමෙන් පසු ඇතිවන වලවල් තුලට ජලය එකතුවීමෙන් මදුරුවන් බෝවීමට ඇති අවස්ථා වැලැක්විය යුතුය.

17. මෙම පාරිසරික නිර්දේශය උපයෝගි කරගෙන යෝජිත භූමියේ නොවන වෙනත් සිසිම ස්ථානයක කැණීම් නොකල යුතුය.

17.1 පාංශු බාදනය වැලැක්වීමට සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රම යෙදිය යුතුය.

17.2 කැණීම් භූමිය වටා ප්‍රමාණවත් ස්වාරක්ෂක කලාපයක් පවත්වාගත යුතුය.



18. 2011.11.15 දිනැති අයදුම්පතේ සඳහන් යන්තු සූත්‍ර වලට අමතරව වෙනත් යන්තු සූත්‍ර භාවිතා කිරීම හෝ ක්‍රියාකරවීම සඳහා මධ්‍යම පරීක්ෂාගාරයේ සහ අදාළ පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

19. සළුකල් සුවාහනය කිරීම සඳහා පොදු මාර්ග භාවිතා කරන්නේ නම් ඒ සඳහා අදාළ ආයතන වල පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

20. සළුකල් සුවාහනය කිරීමේ දී විධිමත්ව ආවරණය කරන ලද වාහන වල පමණක් සුවාහනය කිරීමට පියවර ගත යුතුය.

21. පුදුරුත දුව්‍ය භාවිතයට ගන්නාහෙක් වැඩබිම තුල ආරක්ෂිතව ගබඩාකර තැබීම සඳහා පහසුකම් සලසා තිබිය යුතුය.

22. මෙම කර්මාන්තය පවත්වාගෙනයාමේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින කුමන හෝ අප්‍රසන්නතා තත්වයක් මැඩ පවත්වා ගැනීම පිණිස අදාළ පළාත් පාලන ආයතන හා මධ්‍යම පරීක්ෂාගාර විසින් පරීක්ෂා දුෂණය පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු සෑම විටම බැඳී සිටිය යුතුය.

23. මෙම කර්මාන්තය ක්‍රියාත්මක කිරීම සඳහා මාවතගම ප්‍රාදේශීය සභාවෙන් ලිඛිත අවසරය ලබා ගත යුතුය.

24. මෙම නිර්දේශිත ලිපිය මෙම කර්මාන්තකරුට ඉඩමේ අයිතිය පහවුරු කිරීම සඳහා නීතුත් කරනු ලබන ලියවිල්ලක් ලෙස භාවිතා නොකළ යුතුය.

25. මෙම පරීක්ෂාගාර නිර්දේශය වලංගු වන්නේ තු විද්‍යා සම්මේලන හා පතල් කාර්යාංශය මගින් නීතුත් කරනු ලබන කැණීම් බලපත්‍රය වලංගු වන කාලසීමාව දක්වා පමණි.

26. මෙම පරීක්ෂාගාර නිර්දේශයේ අඩංගු වන යම් කොන්දේසි උල්ලංඝනය වීමක් සිදු කර ඇත්නම් එම ප්‍රවාහයේ කළඟල් කැණීම සඳහා සැපිය පරීක්ෂාගාර නිර්දේශය නීතුත් කිරීමට ඔබගේ පරීක්ෂාගාර අධිකාරිය පියවර ගොඩනඟා ඔවිද සැලසිය යුතුය.

ප්‍රේමරත්න දිසානායක,
නියෝජ්‍ය අධ්‍යක්ෂ,
මධ්‍යම පරීක්ෂාගාර අධිකාරිය,
වයඹ පළාත් කාර්යාලය,
කුරුණෑගල.

වෙනුවට,
එස්.එම්.ජී.ආර්. සුබසිංහ,
ප්‍රධානාගාර නිලධාරී.

පිටපත් :
1. ගරු සභාපති, ප්‍රාදේශීය සභාව, මාවතගම. (දැ.ගැ.පි, අ.ක.ස)
2. අධ්‍යක්ෂ (ස්වාභාවික සම්පත් සැළසීමානුකරණ හා පසු විපරම් ඒකකය), මධ්‍යම පරීක්ෂාගාර අධිකාරිය, බත්තරමුල්ල. (දැ.ගැ.පි)
3. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාවතගම. (දැ.ගැ.පි)
4. ප්‍රධානාධිපති, පොලිස් ස්ථානය, මාවතගම. (දැ.ගැ.පි)
5. එච්.ඒ.සමන්, අංක 379, වෙලගෙදර මාවත, වැවපවුම, කුරුණෑගල. (දැ.ගැ.පි, අ.ක.ස)

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, තෙලෙන් බැට කාපු අපේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා යාන්තම් තෙලෙන් ගැලවිලා තිබෙනවා. ඊළඟට පරිසරය අහු වෙලා තිබෙන්නේ. එතුමාට ඒක ඒ තරම් ප්‍රශ්නයක් නොවෙයි කියලා මා හිතනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහන්න කැමැතියි. හදුරුක්කන්ද කියන කන්ද තිබෙන්නේ හෝර්ටන් තැන්න කඳු වළල්ලේ අවසාන බෑවුමෙයි. ඇත්තටම එම කන්දෙන් ගලාගෙන යන වතුරවලින් තමයි ටැම්පාන ජලාශය පෝෂණය වෙලා කුරුණෑගල නගරයට වතුර එන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ නිලධාරීන් ලබා දී තිබෙන පිළිතුර මම පිළිගන්නේ නැහැ. මොකද, එම කඳුවැටියේ ජල උල්පත් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඔබතුමාට තේරෙනවා ඇති, මීටර් 250ක් එහායින් කළු ගල් කැණීම් කටයුතු නතර කළත් කොයි තරම් අවැඩක් සිද්ධ වෙනවාද කියලා. අඩි 400 ක් විතර උසින් පිහිටි කන්දක් ගැනයි මම මේ කථා කරන්නේ. ඒ නිසා මෙතරම් වැදගත් කඳු බෑවුමක් විනාශ වෙන කොට -දැන් කැණීම් කටයුතු නතර කරලා තිබෙන්න පුළුවන්- එහි කළු ගල් කැණීම සඳහා මීට කලින් එම බලපත්‍රය ලබා දුන් අයට විරුද්ධව ඔබතුමා යම් කිසි පියවරක් ගන්නවාද නැද්ද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

අනිවාර්යයෙන්ම බලපත්‍රයක් නිකුත් කිරීමේදී භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ පමණක් නොවෙයි මධ්‍යම පරිසර අධිකාරියේ අවසරයත් ඒ සඳහා අවශ්‍ය වෙනවා. ඒ වාගේම ග්‍රාම සේවා නිලධාරී, ප්‍රාදේශීය ලේකම් සහ දිස්ත්‍රික් ලේකම් කියන තුන්දෙනාගේ නිර්දේශයක් අවශ්‍ය වෙනවා. ඔබතුමා මට යම් කාලයක් ලබා දෙනවා නම්, ඒ ආකාරයෙන් සියලුම කාර්ය පටිපාටීන් අනුගමනය කර මෙය නිකුත් කර තිබේද යන්න පරීක්ෂා කරලා එහි යම් ආකාරයක කාර්ය පටිපාටි අනුගමනය නොකරපු අවස්ථාවක් තිබෙනවා නම් ඒ වෙනුවෙන් විනය පියවර ගන්න සූදානම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අනෙක් කාරණය මේකයි. ජනප්‍රවාදයේ තිබෙන්නේ ඉරුගල්බණ්ඩාර දෙවියෝත් වළගම්බා රජ්ජුරුවෝත් මේ කන්දේ හිටියාය කියලායි. මේ කන්ද උඩට ගියාම හලාවත මුහුදත් පෙනෙනවා. මේ කන්ද තිබෙන්නේ මාවතගම ආසනයේයි.

දැනට වී.වී. කරුණාරත්න කම්පැනි කියන එකෙන් මේ කළුගල කඩා ගෙන යනවා. කරුණාකරලා මේ ගැන පරීක්ෂණයක් කරලා මේ ගල කැඩීම මෙතැනින් නතර කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, කඩන්න ගල් වලවල් මීට වඩා තිබෙනවා. නමුත් මේ වාගේ ඒවාට අවසර දීමෙන් සිද්ධ වන්නේ අපේ තිබෙන ස්වාභාවික සම්පත් සියල්ල විනාශ වීමේ අවදානමක්, තර්ජනයක් ඇති වීමයි. ඒ නිසා කරුණාකර මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා මේ වැඩ පිළිවෙළ වහාම අහෝසි කරන්න කටයුතු කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු මන්ත්‍රීතුමනි, පරිසර අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව 22වැනි දින පෙරවරු 11.00ට පැවැත්වෙනවා. එයට සහභාගි වන ලෙස ඔබතුමාට මා ආරාධනා කරනවා. අපේ නිලධාරීන් සියලු දෙනාම ඒ කාරක සභාවට එනවා. ඒ තත්ත්වය එසේ නම් ඒ කාර්යය වහාම අත්හිටුවන්නය කියලා මට එවේලේම නියෝගයක් දෙන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි.

පෞද්ගලික රෝහල්වල සේවය කරන විදේශීය වෛද්‍යවරුන් : සුදුසුකම්
தனியார் மருத்துவமனைகளில் பணியாற்றும் வெளிநாட்டு மருத்துவர்கள்: தகைமைகள்
FOREIGN DOCTORS SERVING IN PRIVATE HOSPITALS : QUALIFICATIONS

2970/'12

15. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මෙරට පෞද්ගලික රෝහල්වල බොහෝ විදේශ ජාතික වෛද්‍යවරුන් සේවය කරන බවත්;

(ii) එම වෛද්‍යවරුන්ගෙන් බහුතරයක් නිසි සුදුසුකම් සපුරා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙරට පෞද්ගලික රෝහල්වල සේවය කරන විදේශීය වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වෛද්‍යවරුන් අතරින් නිසි සුදුසුකම් සපුරා නොමැති වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙරට සේවය කරනු ලබන විදේශීය වෛද්‍යවරුන්ට ලියා පදිංචිය ලබාදීමේදී ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබන්නේද;

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

(iv) මේ වනවිට ලියා පදිංචිය ලබා ඇති සුදුසුකම් සපුරා නොමැති විදේශීය වෛද්‍යවරුන්ගේ ලියා පදිංචිය අහෝසි කොට ඔවුන් අතින් අසරණ රෝගීන් ජීවිතාවදානමට ලක්වීම මහ හැරවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාර අමෙච්සරෙක් කේට්ට විනා:

(අ)(i) இந் நாட்டின் தனியார் மருத்துவமனைகளில் பெருமளவு வெளிநாட்டு மருத்துவர்கள் பணி யாற்றுகிறார்கள் என்பதையும்;

(ii) மேற்படி மருத்துவர்களின் பெரும்பாலானவர்கள் உரிய தகைமைகளை பூர்த்தி செய்யவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இந் நாட்டின் தனியார் மருத்துவமனைகளில் பணியாற்றும் வெளிநாட்டு மருத்துவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) அந்த மருத்துவர்களில் உரிய தகைமைகளைப் பூர்த்தி செய்யாத மருத்துவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) இந் நாட்டில் பணிபுரியும் வெளிநாட்டு மருத்துவர்களை பதிவு செய்கின்றபோது அவர் களின் தகைமைகளை பரிசோதிப்பதற்கான வேலைத் திட்டமொன்று நடைமுறையில் இருக்கின்றதா என்பதையும்;

(iv) இதுவரை பதிவு செய்யப்பட்டுள்ள ஆனால் தகைமைபெறாத வெளிநாட்டு மருத்துவர்களின் பதிவினை இரத்துச்செய்து அவர்களினால் அப்பாவி நோயாளர்கள் ஆபத்துக்குள்ளாவதை தடுக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) many foreign doctors serve in private hospitals in this country; and

(ii) a majority of these doctors are not properly qualified?

(b) Will he inform this House -

(i) the number of foreign doctors who serve at private hospitals in this country;

(ii) out of them, the number of doctors who are not properly qualified;

(iii) whether a programme will be implemented for checking the qualifications of foreign doctors when the foreign doctors serving in this country are registered; and

(iv) whether he will take action to avoid the risk to the lives of helpless patients by cancelling the registration of those doctors from foreign countries who are already registered, but do not possess the necessary qualifications?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යාතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) මෙරට පෞද්ගලික රෝහල්වල සේවය කරන විදේශ ජාතික වෛද්‍යවරුන් නිසි සුදුසුකම් සපුරා ඇත.

(ආ) (i) විදේශීය විශේෂඥ වෛද්‍යවරුන් 26ක් මෙරට පෞද්ගලික රෝහල්වල සේවය කරනු ලැබේ.

(ii) සියලු දෙනාම බඳවා ගෙන ඇති තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇත.

(iii) ඔව්.

වෛද්‍ය ආඥාපනතේ 67(අ) වගන්තිය යටතේ තාවකාලික ලියා පදිංචිය ලබා දෙන්නේ ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන විදේශීය විශේෂඥ වෛද්‍යවරුන් සඳහා වන අතර එසේ ලියා පදිංචිය ලබා දීමේ දී ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂාවට ලක් කෙරේ. ඒ සඳහා වඩාත් විධිමත් වූ පරිපාලන ක්‍රමවේදයක් අදාළ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය ඇතිව දැනට සකසා ඇති අතර ඒ අනුව කටයුතු කෙරෙමින් පවතී.

(iv) 2013 වසර සඳහා ලියා පදිංචිය ලබා දී ඇති විදේශීය විශේෂඥ වෛද්‍යවරුන් සියලු දෙනාම සුදුසුකම් සපුරා ඇති වෛද්‍යවරුන්ය.

(ඇ) පැන නොනඟී.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ ප්‍රකාශ කළා සියලු දෙනාම නිසි සුදුසුකම් සපුරා තිබෙනවාය කියලා. තමුන්නාන්සේ ඒ බව තහවුරු කර ගත්තේ මොන ආයතනය මගින් ද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, වෛද්‍යවරුන් ලියා පදිංචි කිරීම අමාත්‍යාංශයට හිතුමතයට කරන්න බැහැ. ඒ සඳහා මම කිව්ව විධියට වෛද්‍ය ආඥා පනතේ 67 වගන්තිය යටතේ තමයි වෛද්‍ය සභාව විසින් කටයුතු කරනු ලබන්නේ. ඒ කියන්නේ මෙරට වෛද්‍යවරයෙක් අනිවාර්යයෙන්ම ලියා පදිංචි වෙන්න ඕනෑ. පිට රටින් ආවොත් ඔවුන්ටත් ඒ සුදුසුකම්, ඒ තත්ත්වයන් තිබෙන්න ඕනෑ. ඒ අනුව තමයි ඒ නිලධාරීන් කටයුතු කරන්නේ. කලින් කලට අපේ අමාත්‍යාංශය ඔවුනුත් සමඟ සාකච්ඡා කරලා තමයි ඒක තීන්දු කරන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, සාමාන්‍යයෙන් තාවකාලික ලියා පදිංචියක් තමයි ප්‍රථමයෙන් දෙන්නේ. මාස 3ත්-6ත් අතර කාලයකට තමයි දෙන්නේ. නමුත් මේ විදේශීය විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඒ කාලය අවුරුදු 10 දක්වා දීර්ඝ කර තිබෙනවා. ඊට අමතරව 2011 දී කොළඹ ප්‍රධාන පෙළේ රෝහල් හතරක කරන ලද සමීක්ෂණයේදී හෙළිවෙලා තිබෙනවා සුදුසුකම් නොලත් වෛද්‍යවරු 184 දෙනකු විශේෂඥ වෛද්‍යවරුන් ලෙස අදටත් සේවය කරනවාය කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඊට අමතරව පෞද්ගලික රෝහල්වල මේ වාගේ සුදුසුකම් නොමැති විශේෂඥ වෛද්‍යවරු විසින් කළ සැත්කම් ගණනාවක් අසාර්ථක වෙලා අන්තිමට ඒකට කර ගහන්න වෙලා තිබෙන්නේත් රජයේ වෛද්‍යවරුන්ටයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, රිජ්වේ ආර්යා ළමා රෝහලේත් ඒ වාගේ අවස්ථා ගණනාවක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේ කියන පිළිතුර මට කිසිසේත් පිළිගන්න බැහැ. තමුන්නාන්සේ කියන විධියට සියලුම සුදුසුකම් ඒ අයට තිබෙනවා. ඒක වැරදියි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, පළමුවැනි කාරණය මම කියන්නම්. තමුන්නාන්සේ ප්‍රශ්නය අහලා ඉවරද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, හරි. කථා කරන්න බැහැ. ප්‍රශ්නයනේ අහන්නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, පළමුවැනි දේ තමයි රාජ්‍ය අංශයෙන් නිදහස් සෞඛ්‍ය සේවාව පූර්ණ වශයෙන් මේ රටේ ජනතාවට ලබා දෙන එක. හැබැයි, මෙහිදී අපට පෞද්ගලික අංශය ප්‍රතික්ෂේප කරන්න බැහැ. පෞද්ගලික රෝහල් 190ක් විතර තිබෙනවා. රජයේ රෝහල්වල හදවත් සැත්කම් සඳහා 5000ක් විතර පෝලිමේ ඉන්නවා. ඒ අතර පෞද්ගලික අංශයේ රෝහල් සැත්කම් 25,000ක් විතර කරලා තිබෙනවා. ඒ නිසා අපි පෞද්ගලික අංශයටත් උදවු කරන්න ඕනෑ. පෞද්ගලික අංශයෙන් සේවාවන් සපයා ගැනීමේ දී අදාළ ප්‍රමිතියට අනුව මේ රටේ වෛද්‍යවරුන් ලියා පදිංචි කිරීම පිළිබඳව වෛද්‍ය සභාවේ උපදෙස් මත, ඒ නීති-රීති අනුව තමයි කටයුතු කරන්නේ. මෙන්න මේ රෝහලේ සුදුසුකම් නැති වෛද්‍යවරයෙක් ඉන්නවා කියලා අපට ලිඛිතව පැමිණිල්ලක් ඉදිරිපත් කළොත් අනිවාර්යයෙන් ඔහුට විරුද්ධව කටයුතු කරන්න අපට පුළුවන්. නමුත් එවැනි පැමිණිල්ලක් අපට ලැබිලා නැහැ. ඔබතුමා කියන ආකාරයට අපට හොර වෛද්‍යවරු තියා ගන්න අවශ්‍යතාවක් නැහැ. අපි එහෙම කරන්නේ නැහැ. මොකද, අපි මේ රටේ වෛද්‍යවරුන්ගේ ගුණාත්මකභාවය ආරක්ෂා කරන්න ඕනෑ.

අපට තමයි ඒ බලතල තිබෙන්නේ. නමුත් එහෙම පැමිණිල්ලක් ලැබිලා නැහැ. ඔබතුමා ඒ ලැයිස්තුව දුන්නා නම් අපට සොයා බලා කටයුතු කරන්න පුළුවන්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
තමුන්නාන්සේ හරි කථාවක්නේ කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි කථාව නොවෙයි. තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඒකට ප්‍රවේශයක් අවශ්‍යයි නේ. ගරු කථානායකතුමනි, ඇයි මෙතුමාට බැරි පෞද්ගලික රෝහල්වල ඉන්න වෛද්‍යවරුන්ගේ සුදුසුකම් පරීක්ෂා කරන්න අවශ්‍ය ක්‍රමවේදයක් හදන්න. තාක්ෂණික නිල කමිටුවක් පත් කරන්නේ නැත්තේ ඇයි කියලා මම අහනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, ලියා පදිංචි කරන්නේ අපි. ඉතින් පැමිණිල්ලක් නැතිව රෝහල්වලට ගිහිල්ලා හොයන්න අවශ්‍යතාවක් නැහැ. අපට කවුරු හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා නම් එහෙම කරන්න පුළුවන්. ඒ පැමිණිල්ල තමුන්නාන්සේ කරන්න. එවිට මා හොයලා බලන්නම්. ගරු කථානායකතුමනි, අපි ලියා පදිංචි කිරීම කරනවා. පැමිණිල්ලක් ආවොත් අපි ඒ ගැන හොයා බලනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය.

ඇන්තනි ප්‍රනාන්දු මහතාගේ මරණය : වන්දි
திரு. அன்ரனீ பர்னாந்துவின் மரணம் : நட்டஈடு
DEATH OF MR. ANTHONY FERNANDO : COMPENSATION

2551/'12

5. ගරු රවි කරුණානායක මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Sunil Handunnetti)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2012 පෙබරවාරි 15 දින හලාවත ප්‍රදේශයේදී සිදුවූ වෙඩි තැබීමකින් ඇන්තනි ප්‍රනාන්දු නැමැති ධීවර කාර්මිකයෙකු මිය ගිය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වෙඩිතැබීමට අදාළව පොලිස් පරීක්ෂණ සිදු කළේද;

(ii) මියගිය එම ධීවර කාර්මිකයාගේ පවුලට වන්දි මුදල් ලබාදී තිබේද;

[ගරු රවි කරුණානායක මහතා]

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) 2012 பெப்புருவரி மாதம் 15ஆம் திகதி சிலாபம் பிரதேசத்தில் இடம்பெற்ற துப்பாக்கிச் சூடு காரண மாக அன்ரனீ பர்னாந்து எனப்படும் மீன்பிடித் தொழிலாளி இறந்தார் என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி துப்பாக்கிச் சூடு தொடர்பாக பொலிஸ் விசாரணை மேற்கொள்ளப்பட்டதா என்பதை யும்;

(ii) இறந்த மேற்படி மீன்பிடித் தொழிலாளியின் குடும்பத்துக்கு நட்டஈட்டுத் தொகை வழங்கப் பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அப்பணத்தொகை எவ்வளவு என்ப தையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that a fisherman named Anthony Fernando was killed in a shooting that took place in Chilaw area on 15th February 2012?

(b) Will he state -

(i) whether police investigations were carried out with regard to the aforesaid shooting;

(ii) whether compensation has been paid to the family of the aforesaid fisherman who was killed; and

(iii) if so, the amount that has been paid?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) 2012.02.15 දින හෝ ඊට ආසන්න දිනකදී ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව හලාවත පැවැති උද්ඝෝෂණයේදී **කලහකාරී** අන්දමින් හැසිරෙමින් සාමය කඩවන අයුරින් කටයුතු කළ උද්ඝෝෂකයන් මැඩ පවත්වා පලවා හැරීම සඳහා කටයුතු කිරීමේදී වෙඩි වැදීමකින් වර්ණකුලසූරිය ඇන්ටනී ප්‍රනාන්දු නැමැත්තා මිය ගොස් ඇත.

(ආ) (i) ඔව්, මේ සම්බන්ධව පොලිස් පරීක්ෂණ සිදු කර ඇති අතර හලාවත ම/ඵ නඩු අංක බී121/12 යටතේ අධිකරණ කටයුතු සිදු කෙරේ.

(ii) වන්දි මුදලක් ගෙවා නොමැත, එහෙත් කරුණාසහගත දීමනාවක් ගෙවා ඇත.

(iii) රුපියල් ලක්ෂ පහක් පමණි. (රු. 500,000)

(ඇ) අදාළ නොවේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 9 - 3143/'12 - (1), ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නල්ලූර්, මානිපායි සහ චුන්නාහම් ප්‍රාදේශීය සභා : උසස් කිරීම
நல்லூர், மானிப்பாய் மற்றும் சுன்னாகம் பிரதேச சபைகள்: தரமுயர்த்தல்
NALLUR, MANIPAI AND CHUNNAKAM PRADESHIYA SABHAS : UPGRADING

3168/'12

10. ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) යාපනය දිස්ත්‍රික්කයෙහි නල්ලූර්, මානිපායි (වලිකාමම් නිරිතදිග), චුන්නාහම් (වලිකාමම් දකුණ) යන ප්‍රාදේශීය සභා නගර සභා ලෙස උසස් කරන මෙන් ඉල්ලා විධිමත්ව සකස් කළ ඉල්ලුම්පත් අදාළ දෙපාර්තමේන්තු හරහා යොමු කර මාස කිහිපයක් ගතවී ඇතත් මේ දක්වා ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් සිදුවී නැති බව එතුමා දන්නෙහිද?

(ආ) එම ඉල්ලීම අනුව ඉහත පළාත් පාලන ආයතන නගර සභා ලෙස උසස් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) யாழ்ப்பாண மாவட்டத்தின் நல்லூர், மானிப்பாய் (வலிகாமம் தென்மேற்கு), சுன்னாகம் (வலிகாமம் தெற்கு) ஆகிய பிரதேச சபைகளை நகர சபைகளாகத் தரம் உயர்த்துமாறு கோரி முறைசார்ந்த விதத்தில் தயாரிக்கப்பட்ட விண்ணப்பங்கள் ஏற்புடைய திணைக்களங்கள் ஊடாக அனுப்பப்பட்டு பல மாதங்கள் கடந்துள்ள போதிலும் இதுவரை அது தொடர்பாக எவ்வித முன்னேற்றத்தையும் காண முடியவில்லையென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி கோரிக்கைக்கமைய மேற்குறிப்பிட்டுள்ள உள்ளூராட்சி நிறுவனங்களை நகர சபைகளாகத் தரமுயர்த்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that no progress has been made so far in response to the request made to upgrade the Nallur, Manipai (Walikamam Southwest) and Chunnakam (Walikamam South) Pradeshiya Sabhas in the Jaffna District, to Urban Councils through a formal applications channelled through the relevant department many months ago?

(b) Will he inform this House whether necessary steps will be taken to upgrade the aforementioned local government institutions to urban councils as per the above request?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 අධිකාරය) අනුව කොටයාස සීමා නිර්ණය කිරීම පිණිස වන ජාතික සීමා නිර්ණය කමිටුව හා දිස්ත්‍රික් සීමා නිර්ණය කිරීමේ කමිටු මඟින් පළාත් පාලන ආයතනවල කොටයාස සීමා නිර්ණය කිරීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. එබැවින් යාපනය දිස්ත්‍රික්කයේ නල්ලූර්, මනිපායි (වලිකාමම් නිරිතදිග), චුන්නාහම් (වලිකාමම් දකුණ) යන පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීමේ කාර්යයන් සීමා නිර්ණය කමිටුවේ කාර්යයන් අවසන් වූ පසුව ඉටු කරන බව දැනුම් දෙමි.

(ආ) ඉහත (අ) පරිදි කටයුතු කරනු ඇත.

(ඇ) පැන නොනඟී.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

නීති විරෝධී ලෙස එතනෝල් ස්ප්‍රිතු ගෙන්වීම
சட்டவிரோதமாக எதனோல் ஸ்பிரிட் இறக்குமதி
ILLEGAL IMPORT OF ETHANOL SPIRITS

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23.(2) යටතේ මෙම ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, එතනෝල් ස්ප්‍රිතු අඩංගු කන්ටේනර් 02ක් රේගුවේ හා සුරාබදු දෙපාර්මේන්තුවේ අත් අඩංගුවට පත්වීම ආශ්‍රිතව උද්ගත වී ඇති අර්බුදකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවීමට අපේක්ෂා කරනවා.

"මතට තිත" යන්න කලකට ඉහත ආණ්ඩුවේ ජනප්‍රිය සටන් පාඨයක්ව පැවතියත් ලංකාව තුළ මත්පැන් නිෂ්පාදනය අති විශාල ලාභයක් උපදවන කර්මාන්තයක් බව සත්‍යයක්. එසේම ලීටර් 11.2ක වැඩිම ඒක පුද්ගල මත්පැන් පරිභෝජනයක් ඇති රට බවට පත්වීමේ වාර්තාවට ද හිමිකම් කියන ලංකාව තුළ මෙම කර්මාන්තයට ව්‍යාපාරිකයන්ගේ ඇති උනන්දුව සිතා ගත හැකිය. එබැවින් මෙම අති විශාල ලෙස ලාභ උපදවන කර්මාන්තයට දේශපාලනයේ මැදිහත්වීම ද මෑත කාලයේ සිට විශාල ලෙස ඉහළ ගොස් තිබෙනවා. මත්පැන් නිෂ්පාදනයට යොදා ගන්නා ස්ප්‍රිතු කන්ටේනර් දෙකක් නීතිවිරෝධී ලෙස මෙරටට ආනයනය කිරීමට අදාළ සිදුවීමද සලකා බැලිය යුත්තේ මෙම තත්ත්වය තුළයි.

වාර්තා වන අන්දමට තිනර් ලෙස හඳුන්වා දෙමින් මෙරටට ආනයනය කරන ලද මෙම කන්ටේනර් දෙකෙන් මෙරටට ආනයනය කිරීම තහනම් කර ඇති අධිසාන්ද්‍රික එතනෝල් ස්ප්‍රිතු ලීටර් 210 බැගින් අඩංගු බැරල් 315ක් හමු වී තිබෙනවා. මෙම සමස්ත ස්ප්‍රිතු ප්‍රමාණය ලීටර් 66,150ක් වන අතර, වටිනාකම රුපියල් කෝටි 11කට අධිකයි.

ඒ නිසා ගරු කථානායකතුමනි, මෙය සාමාන්‍ය කෙනකුට කරන්න පුළුවන් වැඩක් නොවෙයි. සාමාන්‍යයෙන් මෙරටට ආනයනය කළ හැක්කේ ප්‍රතිශතය සියයට 80කට වඩා අඩු සැර ස්ප්‍රිතු පමණයි. එහෙත් මෙම ස්ප්‍රිතුවල සියයට 96ක සැර ප්‍රතිශතයක් අඩංගු බව පරීක්ෂණවලින් හෙළිදරවු වී තිබෙනවා. මෙතරම් විශාල ප්‍රමාණයක් සහ ඉහළ වටිනාකමක් ඇති ස්ප්‍රිතු ප්‍රමාණයක් ආනයනය කර ඇත්තේ කිසි සේත්ම කුඩා පරිමාණ නීතිවිරෝධී මත්පැන් නිෂ්පාදකයන් අතර බෙදා දීමට නොවන බව ඉතා පැහැදිලියි. මේවා ආනයනය කිරීම පිටුපස දේශපාලන හා මුදල් බලය ඇති ව්‍යාපාරිකයන් සිටිනවා මෙන්ම, ඒවා ආනයනය කර ඇත්තේද එබඳු දේශපාලන හා මුදල් බලය ඇති මහා පරිමාණ මත්පැන් නිෂ්පාදකයන් වෙනුවෙන්.

ආණ්ඩුවද නියෝජනය කරන මත්පැන් නිෂ්පාදකයන් කිහිප දෙනකු සිටින බවත්, ඔවුන් සුවඳ විලවුන්, තිනර් ආදී නිෂ්පාදන සිදු කිරීම සඳහා යැයි කියමින් අඩු බදු ප්‍රතිශත යටතේ ආනයනය කරන ලද ස්ප්‍රිතු යොදා ගනිමින් මත්පැන් නිෂ්පාදනය කරවන බවත්, එම ස්කාගාර දිවයිනේ විවිධ ස්ථානවල පිහිටා ඇති බවත් ජනතාව පවසනවා.

ගරු කථානායකතුමනි, සමහර වාර්තා අනුව පසු ගිය අවුරුද්දේ සුවඳ විලවුන් සකස් කිරීම සඳහා ආනයනය කොට තිබෙන ස්ප්‍රිතු ප්‍රමාණය බැලුවොත්, අපේ රටේ ජනතාව සුවඳ විලවුන්වලින් නාන්න ඕනෑ. ඒ තරමට ස්ප්‍රිතු ගෙනැවිත් තිබෙනවා සුවඳ විලවුන් හදන්න කියලා.

ඒවායේ නිෂ්පාදන කටයුතු අධීක්ෂණය සඳහා පත් කොට ඇති ඇතැම් රජයේ නිලධාරීන් දූෂණයට යට කර ගනිමින්ද දෙපාර්තමේන්තුවල අතළොස්සක් විධායක මට්ටමේ නිලධාරීන්ගේ සහය ලබා ගනිමින්ද මෙම ජාවාරම හොඳින් සිදු වන බව පැවසෙනවා. රජයේ දෙපාර්තමේන්තුවල වසර 3, 5 කාලයකට වරක් ස්ථාන මාරුවීම් සිදු වීම සාමාන්‍ය පිළිවෙතයි. එහෙත් මෙබඳු ජාවාරම්වලට සම්බන්ධ නිලධාරීන් කිහිප දෙනකු වසර 12කට අධික කාලයක් දේශපාලන බලය උපයෝගි කර ගනිමින් එම මර්මස්ථානවල රැඳී සිටින බව පැවසෙනවා.

මෙම කන්ටේනර් දෙකට අදාළ වැටලීම ආශ්‍රිත සිදුවීම් අනුව වරායට ගෙනා මෙම කන්ටේනර් දෙකෙහි තිනර් යනුවෙන් සඳහන් වුවද, ඒවායේ නිමි ඇඳුම් අඩංගු බවට රේගුවට පැමිණිල්ලක් ලැබී තිබෙනවා. ඒ අනුව බහලුම් විවෘත කිරීමෙන් තොරව සිදු කරන ලද

[ගරු අනුර දිසානායක මහතා]

ස්කෑන් පරීක්ෂාවකදී ඒවායේ බැරල් අඩංගු බව සොයා ගැනීමෙන් පසු, විවෘත කර පරීක්ෂා කිරීම සඳහා තොටළඟ රේගු බහලුම් අංගණයට ගෙන යමින් තිබුණා. සුරා බදු නිලධාරීන් විසින් පසුගිය 13 වැනි දින අත් අඩංගුවට ගනු ලැබුවේ, මෙසේ රැගෙන යමින් තිබූ කන්ටේනර් දෙකයි. සාමාන්‍යයෙන් එම ස්ථානයට ගෙන යනු ලැබෙන බහලුම් විවෘත කර රසායනාගාර පරීක්ෂාවක් සිදු කරනවා. එසේ වූවා නම් එතැනදීත් මේවායේ ව්‍යාජභාවය හෙළිදරවු විය යුතුව තිබුණා. ජාවාරම්කරුවන්ට මේවා නිරුපද්‍රිතව එළියට ගැනීමට අදාළව තිබූ සැලසුම කුමක්දැයි පැහැදිලි නොවුණත්, මෙබඳු ස්ත්‍රීතු කන්ටේනර් ලංකාවට ආ පළමු අවස්ථාව මෙය නොවිය හැකි යි.

දැන් පවසන පරිදි සිදුවීමට අදාළ ආනයනකරුවන් දෙදෙනා පලා ගොස් තිබෙනවා. එබඳු ආනයන සිදු කිරීම සාමාන්‍ය පුද්ගලයෙකුට කළ නොහැකියි. ඒ සඳහා පුද්ගලයෙකු හෝ සමාගමක් වශයෙන් සම්පූර්ණ තොරතුරු අදාළ රාජ්‍ය ආයතනවලට ලබා දී ආනයනකරුවෙක් ලෙස ලියා පදිංචි විය යුතුව තිබෙනවා. එබැවින් මෙම පුද්ගලයන් පිළිබඳ සියලු තොරතුරු ආණ්ඩුව සතුව තිබිය යුතුයි. අදාළ දෙපාර්තමේන්තු සතුව, අදාළ නිලධාරීන් සතුව මෙම තොරතුරු අනිවාර්යයෙන්ම තිබිය යුතුයි. ඒ අනුව ඔවුන් හඳුනාගැනීම හෝ නීතියේ රැහැනට හසු කර ගැනීම අපහසු විය නොහැකියි.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ප්‍රශ්නවලට අදාළ අමාත්‍යවරයා මෙම ගරු සභාව හමුවේ පිළිතුරු දෙනු ඇතැයි අපේක්ෂා කරනවා.

(1) මෙම බහලුම් අත් අඩංගුවට ගැනීමට අදාළ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ මොනවාද?

(2) එම පරීක්ෂණවලින් මේ දක්වා සොයා ගෙන ඇති කරුණු මොනවාද?

(3) මේ දක්වා ආනයනකරුවන් අත්අඩංගුවට ගැනීමට අසමත් වී ඇත්තේ මන්ද?

(4) මෙබඳු කුට ජාවාරම් මැඩලීම සඳහා ඉදිරියේදී ගැනීමට අපේක්ෂා කරන පියවර කවරේද?

මේ කරුණු පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර කුමාර දිසානායක මහතා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ නඟන ලද ප්‍රශ්නය පිළිබඳව අපේ අදහස් දක්වන්න කැමැතියි.

ශ්‍රී ලංකා රේගුවට ලැබුණු තොරතුරක් මත, මෙම බහලුම් දෙක රේගු හා ආනයන පාලන රෙගුලාසි උල්ලංඝනය කර ආනයනය කරන ලද බහලුම් ලෙස සැක කර 2013.03.07 දින පරීක්ෂණ ආරම්භ කර මෙම බහලුම් රේගුවේ අවසරයකින් තොරව මුදා හැරීම වළකාලීමට කටයුතු කර ඇත.

2013.03.12 දින මෙම බහලුම් දෙක ස්කෑන් කර ඇති අතර, ඒ අනුව රේගු මුද්‍රා සහිතව මෙ බහලුම් දෙක පරීක්ෂා කර බැලීම සඳහා තොටළඟ "ග්‍රේලයින් 2" බහලුම් පරීක්ෂණ අංගණයට ගෙන යෑමට කටයුතු කර ඇත. එසේ ගෙන යමින් සිටියදී ඊතයිල් මධ්‍යසාර ලීටර් 65,100ක් අඩංගු කන්ටේනර් දෙකක් නිහිවිරෝධී ලෙස මෙරටට පැමිණ ඇති බවට ලද තොරතුරු මත 2013.03.13 දින රාත්‍රියේ ඉහුරු කඩේ හන්දිය වරාය පිවිසුම් මාර්ගයේදී සුරාබදු නිලධාරීන් විසින් මෙම බහලුම් අත් අඩංගුවට ගෙන ඇත. ඉන්පසු සුරාබදු හා රේගු නිලධාරීන්ගේ එකඟත්වය මත මෙම කන්ටේනර් දෙක අදාළ ආයතන දෙකෙහිම මුද්‍රා සහිතව තොටළඟ රේගු ග්‍රේලයින් කන්ටේනර් බහලුම් අංගණයේ රඳවා ඉදිරි පරීක්ෂණ කටයුතු සිදු කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, 2013.03.14 දින රේගු මධ්‍යම විමර්ශන කාර්යාංශය විසින් පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලද අතර, මෙම භාණ්ඩ පරීක්ෂාව සඳහා අදාළ සියලුම පාර්ශ්වවලට භාණ්ඩ පරීක්ෂාවට සහභාගි වන ලෙස දැනුම් දුන් අතර ආනයනයකරු නොපැමිණීම හේතුවෙන් භාණ්ඩ පරීක්ෂාව එදින කළ නොහැකි විය.

රේගු අධ්‍යක්ෂ ජනරාල් හා සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ගන්නා ලද තීරණයකට අනුව ආනයනකරු හෝ නියෝජිතයකු නොමැතිව 2013.03.16 දින රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා සහ රේගු හා සුරාබදු නිලධාරීන් ඉදිරියේ මෙම බහලුම් පරීක්ෂා කරන ලද අතර එහි අඩංගු වන්නේ රේගුවට ප්‍රකාශ කරන ලද භාණ්ඩ නොවන බවත්, එහි තිබූ නිල් පැහැති බැරල් විවෘත කිරීමේදී ඒවායේ අඩංගු වනුයේ ඊතයිල් මද්‍යසාර බව සුරාබදු නිලධාරීන් විසින් හඳුනා ගන්නා ලද අතර එම ඊතයිල් මද්‍යසාරවල සැර ප්‍රමාණය 96%ක් බව තහවුරු කර ගන්නා ලදී. එය ඔබතුමා කියූ ආකාරයට හරි. ඉන් අනතුරුව මෙම බහලුම් රේගු හා සුරාබදු මුද්‍රා තබා සුරක්ෂිත කර ඇත. එම බහලුම් දෙකක 2013.03.19 දින ආනයනකරු හා සුරාබදු හා රේගු නිලධාරීන් ඉදිරියේදී පරීක්ෂා කර වට්ටෝරුගත කිරීමට හා ඉන් අනතුරුව මෙම පරීක්ෂණවලට අදාළ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා අසන ලද දෙවන ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

මෙම බැරල්වල 96%ක සැරකින් යුත් ඊතයිල් මද්‍යසාර ඇති බවට සුරාබදු නිලධාරීන් හඳුනාගෙන ඇත. රසායනික විශ්ලේෂණයක් සිදු කර මෙය තහවුරු කර ගැනීම සඳහා සාම්පල් ලබා ගෙන රජයේ රස පරීක්ෂක වෙත යොමු කිරීම සිදු කිරීමට අපේක්ෂිතය.

ඔබතුමාගේ ප්‍රශ්න අංක 3ට පිළිතුර මෙසේයි.

මෙම බහලුම් දෙකම ආනයනය කර ඇත්තේ එක් ආනයනකරුවෙකි. 2013.03.19 දින භාණ්ඩ පරීක්ෂා කිරීමේ අවස්ථාවට තමා සහභාගි වන බවට ආනයනකරු දැනුම් දී ඇති අතර රේගු ආඥා පනත යටතේ ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ඇත.

ප්‍රශ්න අංක 4ට පිළිතුර මෙසේයි.

මෙම වැටලීම සිදු කරන ලද්දේ සුරාබදු නිලධාරීන් විසින් සොයා ගන්නා ලද තොරතුරු මත විමර්ශනය කිරීමෙනි. ඉදිරියටත් තොරතුරු සොයාගෙන මෙලෙස නීත්‍යානුකූල නොවන ලෙසට ස්ත්‍රීතු ආනයනය කරන්නේ දැයි විමසිලිමත්ව සිටින ලෙස සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සුරාබදු නිලධාරීන් දැනුවත් කර ඇත.

තවද, රේගු දෙපාර්තමේන්තුවේ නීති බලාත්මක කිරීමේ සියලුම අංශයන් මේ පිළිබඳව දැනුවත් කර ඇති අතර ඉදිරියේදී රසායනික ද්‍රාවණ ආනයනය අවදානම් භාණ්ඩ ලෙස නම් කර ඒවා පරිගණක මාර්ගයෙන් සම්පූර්ණ පරීක්ෂාවට භාජනය කිරීමට හැකි වන පරිදි අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. එපමණක් නොව, පොදු වශයෙන් රජය දන්වා තිබෙන්නේ රටේ නීත්‍යානුකූල

ආදායම ලබා ගැනීමට අදාළ දෙපාර්තමේන්තු දැඩි ලෙස කටයුතු කිරීම අත්‍යවශ්‍ය බවයි. එවැනි නියමිත ගෙවීම් පැහැර හරින හෝ අනවසර භාණ්ඩ ගෙනෙන ආනයනකරුවන්ට විරුද්ධව උපරිම ලෙස ක්‍රියා කරන ලෙස දන්වා තිබේ.

තවද, ලීටර් 11.2ක වැඩිම ඒක පුද්ගල මත්පැන් පරිභෝජනයක් ඇති රට බවට ලංකාව පත් වී ඇති බව ද සඳහන් කර ඇත. කෙසේ වෙතත්, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා සපයා ඇති තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය ලීටර් 11.2ක් නොව සංශුද්ධ මද්‍යසාර ලීටර 2.7ක් වේ.

මේ රටේ මහ ජනතාවට හිමි, රජයට හිමි ඒ ආදායම කවුරු හරි පැහැර ගන්නවා නම්, ඒ යුතුකම උල්ලංඝනය කරනවා නම් කිසිම සැකයක් නැතිව පන්න පන්නා ගිහිල්ලා ඒ අයට නිසි දඬුවම් දෙනවාය කියලා තමුන්නාන්සේ ඉදිරියේ මම ප්‍රතිඥා දෙනවා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත
பாதுகாப்புச் சேவைகள் ஏவல் மற்றும் பணியாட்டொகுதிக் கல்லூரி (திருத்தம்) சட்டமூலம்
DEFENCE SERVICES COMMAND AND STAFF COLLEGE (AMENDMENT) BILL

"2008 අංක 5 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.

2013 අප්‍රේල් මස 09 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2013 ஏப்பிரல் 09, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 09th April, 2013 and to be printed.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2013 මාර්තු මස 19 වැනි අඟහරුවාදා, 20 වැනි බදාදා සහ 21 වැනි බ්‍රහස්පතින්දා රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ. භා. 6.30 ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

අර්ල් ගුණසේකර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஏர்ல் குணசேகர மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
EARL GUNASEKARA FOUNDATION (INCORPORATION) BILL

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I move,

"That leave be granted to introduce a Bill to incorporate the Earl Gunasekara Foundation."

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Minister of Ports and Highways)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி கல்வி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Education for report.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රධාන කටයුතු; අද දින න්‍යාය පත්‍රයේ වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන), ආර්ථික සේවා ගාස්තු (සංශෝධන), සුරාබදු (සංශෝධන), විදුලි සංදේශ බදු (සංශෝධන) නමැති පනත් කෙටුම්පත් දෙවැනි වර කියවීම. ගරු (ආචාර්ය)

[ගරු කථානායකතුමා]

සරත් අමුණුගම අමාත්‍යතුමා. ගරු ඇමතිතුමා කථාව ආරම්භ කරන්න ඉස්සර වෙලා, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත

துறைமுக, விமான நிலைய அபிவிருத்தி அறவீடு (திருத்தம்) சட்டமூலம்

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.

Order for Second Reading read.

[පූ.භා. 11.25]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් "වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියැවිය යුතුය" යි මා යෝජනා කරනවා. ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත, සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත ද හා විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවීම සඳහා සාකච්ඡාවට භාජනය කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විවාදයට ලක් කිරීමට තිබුණු යම් යම් පනත් කෙටුම්පත් උසාවියේ අභියෝගයට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා අද අපි සාකච්ඡාවට භාජනය කරන්නේ පනත් කෙටුම්පත් හතරක් දෙවැනි වර කියැවීම පිළිබඳවයි. ඒ පනත් කෙටුම්පත් හතර නම් වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත, ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත, සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පතයි. මේ පනත් කෙටුම්පත් හතර තමයි අද අප සාකච්ඡාවට භාජනය කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පළමුවෙන්ම කියන්න ඕනෑ, මේ සංශෝධන ඉදිරිපත් වන්නේ අතිගරු ජනාධිපතිතුමා මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිවරයා හැටියට 2013 අය වැය ඉදිරිපත් කළාට පස්සේ ඒ අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නෛතික බලය ලබා දීමට බව. ඒ අය වැය යෝජනා ගැන අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තිබෙනවා. මේ සභාවේ අනුමැතිය ලබා දී තිබෙනවා. ඒ අවශ්‍ය සංශෝධන තමයි අප දැන් නැවත වරක් සාකච්ඡාවට භාජනය කරන්නේ.

මා මතක් කළ යුතු දෙවැනි කාරණාව, අප මේ තීරණ ගන්නේ රජයේ ප්‍රතිපත්ති අනුවයි කියන එකයි. මේවා අය වැය ලේඛනයට ඇතුළත් වුණා. ඊට පෙර කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කළා. අපේ පාර්ලිමේන්තු කණ්ඩායමේ සාකච්ඡා කළා. මේ ආදී වශයෙන් මේවා මේ සභාවට එන්නේ රජයේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යෑම සඳහායි. සාමාන්‍යයෙන් අපි අනුගමනය කරන ප්‍රතිපත්තිය තමයි, "The Opposition can have its say, the Government must have its way" කියන එක. අන්න ඒක තමයි අප ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන්නේ. අපි මේ කරුණු ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේලාගේ මත අත්‍යවශ්‍යයි. අපි ඒවා සලකා බලනවා, විවිධ මට්ටම්වලදී. අප Consultative Committee එකේදී ඒවා පිළිබඳ සියල්ල කථා කරගෙන, ඊට පස්සේ අද තමයි තමුන්නාන්සේලාත් අපත් මේ නියමිත විවාදයට ඉදිරිපත් වන්නේ. Consultative Committee එකේදී අවස්ථාව සලසන්නේ අපට ඒ සම්බන්ධයෙන් සම්මුතියෙන් ඉදිරියට යන්න පුළුවන්ද කියලා සාකච්ඡා කරලා, අවශ්‍ය සංශෝධන තිබෙනවා නම් ඒවා පිළිබඳ දැනුම් දීලා ඒවා ක්‍රියාත්මක කරන්නයි. මා පසුව කරුණු පෙන්වා දෙන්නම්. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා යම් යම් සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඒවා ගැනත් සලකා බලා තිබෙනවා. අද අප සාකච්ඡා කරන්න බලාපොරොත්තු වන සංශෝධන මොනවාද යන්න සහ ඒවායේ හරය මොකක්ද කියලා මා තමුන්නාන්සේලාට කෙටියෙන් තේරුම් කරලා දෙන්නම්. පළමුවැනි එක තමයි, වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනතට - Ports and Airports Development Levy Bill එකට- ගෙනෙන සංශෝධනය. අපි ඒ පනතට සංශෝධනයක් ගෙනෙනවා, දේශීය හා ජාත්‍යන්තර ඛනිජ තෙල් මෙහෙයුම්වල කටයුතුවලට අවශ්‍ය සේවා සපයන ස්ථානයක් ලංකාවේ ප්‍රවර්ධනය කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු දිරි ගැන්වීමට; 2003 අංක 26 දරන ඛනිජ තෙල් සම්පත් පනතේ අර්ථ දක්වනු ලබන පරිදි ඛනිජ තෙල් මෙහෙයුම් කටයුතු ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිදු කිරීම සඳහා භාවිත කිරීමට අවස්ථාවෝචිත පරිදි ගබඩා කිරීම, සකස් කිරීම, අලුත්වැඩියා කිරීම, සේවා කිරීම හෝ අපනයනය කිරීම සඳහා, ඛන්ධිත පහසුකම් යටතේ උපකරණ, මෙවලම්, ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය ආනයනය කිරීම, වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදුවලින් නිදහස් කිරීමට.

විශේෂයෙන් අපි බලාපොරොත්තු වනවා, ලංකාව තුළ තෙල් පිරිපහදු ඇති කරලා, -පිටින් තෙල් ගෙනැල්ලා- බදු නැතිව පිරිපහදුවෙන් පිට රටවලට තෙල් විකුණන්න අවස්ථා සලසන්න සහ ඒ ආයෝජනවලට අවස්ථා සැලසීමට. තමුන්නාන්සේලා දන්නවා, ලංකාවේ ත්‍රිකුණාමලයේ විශාල තෙල් ගබඩා තිබෙනවා. තමුන්නාන්සේලා කරුණාකරලා ගිහින් ඒවා බලන්න. පසු ගිය යුද්ධ කාලයේ මුළු ආසියාවේම තිබුණ ලොකුම තෙල් ටැංකි තිබෙන්නේ ත්‍රිකුණාමලයේ. ඒ පිළිබඳව තමුන්නාන්සේලා දන්නවා. අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා හොඳට දන්නවා. ඉන්දු - ලංකා ගිවිසුමට පවා මේ කාරණය මාතෘකා වුණා. ඒක ලංකාවට තිබෙන ලොකු සම්පතක්. දැන් අපි LIOC එකත් එක්ක ඒවා පාවිච්චි කරනවා. ඒ වාගේම අපේ ඛනිජ තෙල් සංස්ථාවට විශාල ආදායමක් ලබා ගන්න පුළුවන් මාර්ගයක් තමයි තෙල් ගබඩා කිරීම, පිරිපහදු කිරීම සහ ආසියාවේ තිබෙන නැව්වලට ඒ පහසුකම් ලබා දීම. එම නිසා ඒ ක්ෂේත්‍රයට අපි යන්න කැමැතියි. ඊට අවශ්‍ය පහසුකම් මේ බදු සහනය තුළ අපි ලබා දෙනවා. ඇත්ත වශයෙන් අය වැයේදී තමුන්නාන්සේලා ලක්ෂණ දෙකක් දැක්කා. එකක් තමයි, යම් යම් ක්ෂේත්‍රවලට නව බදු පැනවීම. අනෙක් තමයි තවත් ක්ෂේත්‍රවලට දිරි ගැන්වීම් හැටියට තිබෙන බදු අයින් කිරීම. නිරන්තරයෙන්ම අපි ඒක කරනවා. හැම අවුරුද්දේම අය වැය දිහා බලපුවාම අපට මේ තත්ත්වයන් දෙකම

පෙනෙනවා. එක පැත්තකින් නව බදු සහ අනෙක් පැත්තෙන් උනන්දු කිරීම සඳහා බදු සහන ලබා දීම.

දෙවෙනි කාරණය මෙයයි. දෙවෙනි පනත් කෙටුම්පත ගැන නම් වාද විවාද තියෙයි කියා මම හිතන්නේ නැහැ. ඒ තමයි සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත. මේක මේ රටේ දීර්ඝ කාලීනව තිබුණ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම අපි දන්නවා කළුතර, ගාල්ල වාගේ දිස්ත්‍රික්කවල රා මැදීම කරනවා. උඩ රට පළාත්වල කිතුල් තිබෙනවා. දකුණු පළාත්වල රා තිබෙනවා. අපි තීරණයක් අරන් තිබෙනවා, මේවා මැදීමේදී ඉස්සර තිබුණ නීති-රීති, බන්ධන ගොඩක් අඩු කරලා ඒවාට ඉඩ දෙන්න. අපේ ගරු සභාවේ සිටින දෙපැත්තේම මන්ත්‍රීවරුන් පිළිගන්නවා ඇති මේ නීති සංශෝධනය කිරීම ඉතාම අවශ්‍යයි කියලා. අපි හොඳට දන්නවා, කිතුලක් මදින්න ගියොත් ඒ මනුෂ්‍යයාට නොයෙක් ප්‍රශ්න ඇති වෙනවා කියලා. රජයේ නිලධාරීන්ගෙන් ප්‍රශ්න; පොලීසියෙන් ප්‍රශ්න. හැම රජයකින්ම ඒ සහනය ලබා දෙන්න උත්සාහ කරලා තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා අද මේ රටට ආනයනය කරන දේවලින් විශාල මුදලක් පිට රට යන්නේ සීනි සඳහා බව. මේ ප්‍රශ්නයට අපි කෙසේ හෝ විසඳුමක් දෙන්න ඕනෑ. මොකද, ලෝකයේ තෙල් වාගේම සීනි මිලත් වැඩි වෙනවා, අඩු වෙනවා. ඒ අවස්ථාවලදී රටේ මුදල් අංශයේ ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ වාගේම අපේ ජීවන වියදම ගැන කල්පනා කරලා බලන විට, ජීවන වියදම ගණන් කිරීමේදී පවා බොහෝ දුරට සීනිවලට යන වියදම ගණන් ගන්නවා. සීනි මිල වැඩි වුණාම අපේ උද්ධමනය වැඩි වුණා කියලා සංඛ්‍යා ලේඛන හදනවා. සීනි මිල අඩු වුණාම අපේ උද්ධමනය අඩු වුණා කියලා ඒ අංශය දිහා බලන්න පුළුවන්. ඒ මොනවා වුණත් ජාතික කර්තව්‍යයක් හැටියට මේ රටේ දේශීය වශයෙන් නිපදවන්න පුළුවන් සීනි හා ඊට විකල්ප දේවල් අපි සකස් කරලා දෙන්න ඕනෑ. නිරන්තරයෙන් අපි ඒ සම්බන්ධයෙන් කියලා තිබෙනවා. මට මතකයි මම රාජ්‍ය පරිපාලන ඇමතිවරයා වශයෙන් ඉන්න කාලයේ තමයි තීරණයක් ගත්තේ, පුළුවන් තරම් මේ සහනය දෙන්න කියලා. විශේෂයෙන් එන්.එම්. පෙරේරා මැතිතුමාගේ කාලයේ මේ යෝජනා ගෙන එන විට එතුමාට නොයෙක් විධියේ දරුණු අපහාස, උපහාස කළා. බොරු මාධ්‍ය සටන් ඇති කරලා එතුමාට අපහාස කළා. ඇත්ත වශයෙන් අපි අවංකව කියන්න ඕනෑ, ඒ වෙලාවේ නිර්භයව ඒ තීන්දු ගත්තා නම් අද තත්ත්වය හුඟක් හොඳයි. එහෙම වුණා නම් ගම්බද පළාත්වල මිනිසුන්ට මීට වඩා හොඳ ආදායමක් ලබා ගන්න හැකි වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තවත් ප්‍රශ්න තිබෙනවා. මම මේ විෂයට අදාළ නොවුණත් කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. ගමේ මනුෂ්‍යයෙකු ගෙයක් හදා ගන්න කොස් ගහක් කපා ගන්න ගියාම නොයෙක් විධියේ නිලධාරිවාදයට යටත් වෙන්න වෙනවා. ඊට අදාළ නීති-රීතිත් අපි දැන් සංශෝධනය කර ගෙන යනවා.

කෙසේ නමුත්, සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපි සියලුම දෙනා එකතු වෙනවා. ඒ පනත් කෙටුම්පත ගැන නම් වාදයක්, විවාදයක් වෙන්නේ නැහැ. ඒ පනත් කෙටුම්පත වෙලාවට ලැබුණාද, නැද්ද කියලාවත් බලයි කියා මම හිතන්නේ නැහැ. මොකද, අපි කවුරුත් එකඟ වෙනවා ඒක හොඳ වැඩක් කියලා. [බාධා කිරීමක්]

විශේෂයෙන්ම ඒ අංශය ගැන අපේ දෙපැත්තේම ලොකු උනන්දුවක් තිබෙනවාය කියා මා හිතනවා. [බාධා කිරීමක්] ඇත්ත වශයෙන්ම මට පෙනෙන දෙයක් තිබෙනවා. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, අද රටේ සුරා පරිභෝජනය වැඩි වෙලාය කියා. එක විධියකට ජනගහනය වැඩි වෙනකොට ඒක නවත්වන්න බැහැනේ. අපට නිදහස ලැබෙන කොට ජනගහනය හිටියේ ලක්ෂ 80යි. අද ලක්ෂ 210යි. [බාධා කිරීමක්] මගේ පෞද්ගලික මතය නම් අප මේ ප්‍රශ්නය දෙස මීට වඩා ප්‍රබුද්ධ විධියට බලන්න ඕනෑය කියන එකයි. ඒකයි මගේ අදහස. විශේෂයෙන් "soft liquors" කියන ඒවා දෙස මීට වඩා නම්‍යශීලිව බලන්න ඕනෑ. [බාධා කිරීමක්] ඔබතුමාගේ වෙලාවේදී කථා කරන්න. මට කථා කරන්න ඉඩ දෙන්න.

විශේෂයෙන්ම කසිප්පු උවදුර අද මේ රටේ ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. අප සියලු දෙනාම නාමිකව නැත්නම් ප්‍රචාරය ගන්න මේවාට විරුද්ධයි කියා කියනවා. නමුත් ඒකේ අවසාන ප්‍රතිඵලය මේ රටේ හුඟක් දුරට කසිප්පු වැඩි වෙන එකයි. ඒ තුළින් අර ග්‍රාමීය මට්ටමේ තිබෙන රාජ්‍ය පරිපාලනය, පොලිස් පරිපාලනය ඔක්කොම අවුල් වියවුල් තත්ත්වයට පත් වෙනවා. එම නිසා අප මේ ගැන කල්පනා කර බලන්නට ඕනෑ. ඒ දෙවැනි කාරණයයි.

තුන්වෙනි කාරණය විදුලි සන්දේශ බදු පිළිබඳවයි. ගිය වර අය වැය විවාදයේදී බොහෝ දෙනෙක් මේ ගැන කථා කළා. මේක හොඳ දෙයක්ය කියා කිව්වා. Internet සහ නව තාක්ෂණික මට්ටමකට යන්න අද අපේ රටේ තිබෙන විදුලි සන්දේශ ක්‍රමය ගැන අපි උනන්දු කරන්න ඕනෑ. අද අපේ ජනගහනයටත් වඩා mobile telephones තිබෙනවා. විශේෂයෙන් අධ්‍යාපනය සඳහා, සන්නිවේදනය සඳහා ඒකෙන් උපරිම ප්‍රයෝජනය ගන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැංකු ක්‍රමය ගැන ළඟදී අප සාකච්ඡාවක් කළා. බැංකු ක්‍රමය තුළ විශේෂයෙන් පුද්ගලික බැංකු අද ඉදිරියෙන් ඉන්නවා. එම බැංකු, ශාඛා පිහිටුවනවාට වඩා මොබයිල් යන්ත්‍ර ක්‍රමය තුළින් තම බැංකු කටයුතු ක්‍රියාත්මක කරනවා. ඒ මඟින් මුදල් deposit කරන එක, මුදල් ගෙවන එක සිදු කරනවා. දේශීය හා විදේශීය වශයෙන් ඒ කටයුතු සිදු කරනවා. මේ විධියට මේවා දැන් වෙනස් වේගෙන යනවා. මේ ගැන විශේෂඥ දැනුම ඇති මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේ ඉන්නවා. අප ඒ නව ක්‍රමවලට යන්නට ඕනෑ. ඉදිරිපත් කරන හැම සංශෝධන පනත් කෙටුම්පතකින්ම අප කරන්න හදන්නේ දැන් තිබෙන තත්ත්වය වඩා නම්‍යශීලි කිරීමයි. ඒ තුන් වැනි එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් පනත් කෙටුම්පත යටතේ විශේෂයෙන්ම වාහන සම්බන්ධව බදු අඩු කිරීමක් සිදු කරනවා. භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා single cab රථ සහ සැහැල්ලු ට්‍රක් සඳහා අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද ගෙවීමෙන් නිදහස් කරනවා. ඒ වාගේම සංචාරක සංවර්ධනය සඳහා පිරිවැටුම් බදු සීමාව රුපියල් මිලියන 12 සිට කාර්තුවකට මිලියන 3 දක්වා වැඩි කරනවා. මේ විධියට විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රය දෙස බලා සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා පහසු බදු ක්‍රමට යන්නයි මෙයින් අදහස් කරන්නේ. සම්පූර්ණයෙන්ම මේ පහසු බදු ක්‍රමය ඇති කර අවසානය කියා මා කියන්නේ නැහැ. අනාගතයේදී මීටත් වඩා සහන දෙන්නට අපට සිදු වෙයි. නමුත් මේ නිසා තිබුණු තත්ත්වයට වඩා හොඳ පියවරකට අප යන බව කියන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මෙහි තව එක කාරණයක් තිබෙනවා. මූල්‍ය ආයතනවල බදු ගෙවීමෙන් පසු ලාභයෙන් සියයට එකක් වන රක්ෂණ බද්දක් පැනවීම; මෙම බදු ආදායම 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදලේ ගිණුමකට බැර කිරීම; මේ ආදී වශයෙන් තිබෙන සංශෝධන අප මේ සභාවට ඉදිරිපත් කරනවා. සමහර සංශෝධන අද උසාවියේ අභියෝගයට ලක් කර තිබෙනවා. සිකුරාදා විතර වෙනකොට අපට එහි ප්‍රතිඵල දැන ගන්නට පුළුවන් වෙයි. ඒ අනුව ඉතිරි පනත් කෙටුම්පත් ද තමුන්නාන්සේලා ඉදිරියට ගෙනැවිත් ඒ සංශෝධන ඒකමතිකව නැත්නම් අවශ්‍ය විධියට සකස් කර සම්මත කර ගන්න පුළුවන් වෙයි. එම නිසා පසු ගිය අය වැයෙන් අපට ඉදිරිපත් කරන්නට පුළුවන් වුණු නව අදහස් අන්තර්ගත කර තිබෙන මේ සංශෝධනවලට තමුන්නාන්සේලාගේ සහාය ඉල්ලනවා.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ඒ වාගේම තමුන්නාන්සේලාගේ හොඳ අදහස් තිබෙනවා නම් ඒවා අපි කල්පනා කර බලන්න කැමැතියි. කාරක සභා අවස්ථාවේදී අපිට ඒවා ඇතුළත් කරන්න පුළුවන්. ඒවාත් යෝජනා කරන ලෙස ඉල්ලමින් තමුන්නාන්සේලා සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊළඟට ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා.

[පූ.භා. 11.40]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනත් කෙටුම්පත් හතරෙන් ප්‍රධාන වශයෙන් ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා. ඊට ප්‍රථමයෙන් විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කෙටියෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න කැමැතියි. මේ කරන්න යන්නේ ඉතාමත්ම හොඳ ක්‍රියාවලියක් බව අපි පිළිගන්නවා. සියයට 20ට තිබුණු අන්තර්ජාල සේවා - internet - සැපයුම් බද්ද සියයට 10ක් වන විධියට අඩු කර තිබෙනවා. මෙහෙම කළාම කාට හෝ කියන්න පුළුවන් මේ නිසා භාණ්ඩාගාරයට ලැබෙන බදු ප්‍රමාණය අඩු වෙනවාය කියා. නමුත් ඇත්ත වශයෙන්ම ජනතාවට සහ රටේ සංවර්ධනය සඳහා ඒකෙන් වන කාර්ය භාරය ඉතාමත්ම විශාලයි. ඒ නිසා එවැනි දේවල් පිළිබඳව ආණ්ඩුවට අපේ ප්‍රසාදය පළ කරනවා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් අපේ අදහස් ලබා ගැනීම පිළිබඳවත් ඔබතුමන්ලාට කෘතඥතාව පුද කරනවා.

අපි බලන්න ඕනෑ, broadband connection සඳහා පනවා ඇති VAT තවදුරටත් අපේ රටේ ජනතාවට ගෙන යන්නේ කොහොමද කියා; ප්‍රධාන වශයෙන්ම ග්‍රාමීය ජනතාවට broadband ගෙන යන්නේ කොහොමද කියා. කාලයක් තිස්සේ අපි සාකච්ඡා කළා, fixed internet එහෙම නැත්නම් kiosks හදලා නැණසල මාර්ගයෙන් මේවා ගෙන යන්න ඕනෑ කියා. ඇත්ත වශයෙන්ම මෙම නැණසලවල් හදන්න ආණ්ඩුව විශාල මුදල් ප්‍රමාණයකුත් වියදම් කළා. නමුත් යථාර්ථය හැටියට මේ නැණසල්වල ඒ තරම් internet පාවිච්චි වන්නේ නැහැ . ගොඩක් දුරට දැන් පාවිච්චි වන්නේ mobile broadband කියන එක. අපේ ජංගම දුරකථන සමාගම් සියල්ල mobile broadband හඳුන්වා දී තිබෙනවා. මේ ළඟදි මම දැක්කා, එක ආයතනයක් 4G පවා හඳුන්වා දී තිබෙන බව. එතකොට අපි කල්පනා කරන්න ඕනෑ, කොහොමද mobile broadband එක ග්‍රාමීය - rural - ජනතාවට ලබා දෙන්නේ කියන එක.

මේ රට ඉතාමත්ම ශීඝ්‍රයෙන් ආශ්චර්ය කරා යනවාය කියා ආණ්ඩුව කොච්චර කිව්වත් ජනතාවට වියදම් කරන්න පුළුවන් මුදල් ප්‍රමාණය දැන් එන්න එන්න සීමා වෙනවා. මොකද, හෙට අනිද්දා විදුලි බිලත් සියයට 60කින් වැඩි වුණාම මධ්‍යම පාන්තික පවුලකට අන්තර්ජාල සේවා භාවිත කරන්න පුළුවන් වන්නේ මීල අඩු වුණොත් පමණයි කියන එක මම නැවතත් මතක් කර දෙන්න කැමැතියි. ගරු ඇමතිතුමා කිව්වා වාගේ mobile banking වැනි දේවලින් අපිට හැකි වෙනවා, ජනතාවගේ යම්කිසි ආර්ථික ක්‍රියාවලියක් කරන්න වියදම් වෙන ප්‍රමාණය - transaction cost කියා අපි කියනවා - අඩු කර ගන්න.

ICT Agency එකේ මුල සිටම අධ්‍යක්ෂ හැටියට කටයුතු කළ රැඩ්ලි දිසානායක මහතා ඊයේ ඊ මේ ලෝකයෙන් සමු අරගෙන තිබෙනවා. ඒ ගැන මම කනගාටු වෙනවා. අපි එතුමාට එතුමාගේ ආගම පරිදි ස්වර්ග සම්පත්තිය ලැබෙවා කියා ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ පවුලටත් අනෙකුත් සියලුම දෙනාටත් අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

Now, Mr. Deputy Speaker, I want to touch on the Economic Service Charge. ඇත්ත වශයෙන්ම මේකෙන් මොකක්ද කරන්නේ? "2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 13 වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආර්ථික සේවා ගාස්තුවලින් ශ්‍රී ලංකා මහ බැංකුව නිදහස් කිරීම වේ." කියා එහි සඳහන් වෙනවා. ඒක තමයි මේ කරන්න යන්නේ. ලොකු විපර්යාසයක් කරන්න යනවා කියා මහ ලොකුවට කිව්වාට මේකෙන් කරන්නේ මහ බැංකුවට පනවන ආර්ථික සේවා ගාස්තු අයින් කරන එකයි. මේ අය කරන ආර්ථික සේවා ගාස්තුව ඉතාමත්ම සුළු ප්‍රමාණයක්. දැන් අපි research unit එකෙන් අහලා බැලුවා, මෙය දශම 0.025ක් වාගේ ඉතාමත්ම සුළු ප්‍රමාණයක්. වෙනත් බදු අයිති වන්නේ නැති පිරිවැයට තමයි මේ බද්ද ගහන්නේ.

අපි හොයලා බැලුවා, ශ්‍රී ලංකා මහ බැංකුව 2010 දී ආර්ථික සේවා ගාස්තු වශයෙන් කොපමණ මුදලක් ගෙවලා තිබෙනවා ද කියලා. ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 95යි. ශ්‍රී ලංකා මහ බැංකුව 2011 දී ආර්ථික සේවා ගාස්තු වශයෙන් ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 120යි. ලාභය රුපියල් මිලියන 46,000යි. ඔහොම ලාභ ලබන ආයතනයකින් රුපියල් මිලියන 120ක් වැනි කුඩා ප්‍රමාණයක් ලබා ගැනීම අනවශ්‍යයි කියලා පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනැල්ලා සම්මත කරන්නේ මොනවාටද කියලා අපි අහනවා. අපේ ගරු ඇමතිතුමා කිව්වා, රා මදින උදවියට පොඩි tax relief එකක් දෙනවාය කියලා. ඒක හොඳයි. කමක් නැහැ. නමුත් විශාල ලාභ ලබන ආයතනයෙන් ඇයි බදු අය කර ගන්නේ නැත්තේ? මොකක්ද ඒකට හේතුව? මේක අපේ මහ බැංකු අධිපති කබ්රාල් මැතිතුමාත්, ලේකම් ජයසුන්දර මැතිතුමාත් අතර තිබෙන ප්‍රශ්නයක්ද? මහ බැංකුවෙන් භාණ්ඩාගාරයට ලැබෙන බද්ද දැන් නවත්වා ගන්න හදනවා. මම නැවතත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මේ ගැන හොයා බලන්න කියලා. මොකද, මේක නැවැත්වීම අනවශ්‍යයි. මේ බද්ද ගහන්න. මේ බද්ද ගැහුවාය කියලා මහ බැංකුවට කිසි පාඩුවක් වෙන්නේ නැහැ, ජනතාවට සෙතක් පමණයි සිද්ධ වෙන්නේ.

මේ නීතිය සංශෝධනය කරන එක හොඳයි. මොකද, නීතිය කඩනවාට වඩා සංශෝධනය කරලා නොකඩා ඉන්න එක හොඳයි. නමුත් මා ඉතාමත්ම වැදගත් දෙයක් මේ සභාවේ සාකච්ඡා කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මහ බැංකුව දිගින් දිගටම රටේ නීතිය උල්ලංඝනය කරනවා. මා ඉතාමත්ම වග කීමෙනුයි මේ කාරණය කියන්නේ. නීතිය අපි සම්පාදනය කරලා තිබෙනවා. නීති සම්පාදනය කරලා ඒවා පිළිපදිනවා වෙනුවට දැන් අවුරුදු ගණනක් තිස්සේ මහ බැංකුව රජයට ගෙවිය යුතු, ඒ වාගේම රජයෙන් නැවත මහ බැංකුවට ගෙවිය යුතු මුදල් අති විශාල ප්‍රමාණයක් නොගෙවා සිටිනවා. භාණ්ඩාගාරයට තාවකාලික අත්තිකාරමක් දෙන්න මහ බැංකුවට පුළුවන්. ඒක අපි කවුරුත් දන්නවා. මුදල් මැවීමෙන් එහෙම නැත්නම් සාමාන්‍ය ව්‍යවහාරයේ දී කියනවා වාගේ සල්ලි අච්චු ගැසීමෙන් ඒක කරන්න පුළුවන්.

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය මම කියවන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉංග්‍රීසි භාෂාවෙන් විතරයි තිබෙන්නේ, ගරු ඇමතිතුමනි, ඔබතුමාගේත් අවධානය මේකට යොමු කළොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"PART IV - CREDIT OPERATIONS WITH THE GOVERNMENT

89. The Central Bank may make direct provisional advances to the Government to finance expenditures authorized to be incurred out of the Consolidated Fund:"

Having done that, it further states, I quote:

"Provided that every such advance shall be repayable within a period not exceeding six months, and the total amount of such advances outstanding at any time shall not exceed ten *per centum* of the estimated revenue of the Government for the financial year in which they are made."

සෘජුවම මෙතැන කියලා තිබෙනවා, මහ බැංකුවෙන් භාණ්ඩාගාරයට තාවකාලික අත්තිකාරමක් දෙන්න පුළුවන් කියලා. භාණ්ඩාගාරයේ වියදම් තිබෙනවා. පඩි ගෙවන්න තිබෙනවා. නොයෙකුත් වැඩ කටයුතු කරන්න තිබෙනවා. සමහර වෙලාවට ඒ අවශ්‍ය බදු ලැබෙන්නේ නැහැ. අපි දැක්කා, ස්ත්‍රීතු ගෙනැල්ලා බදු ගෙවන්නේ නැතිව ඉන්නවා. බදු හොරු ඉන්නවා. වැටි වංචාකාරයෝ ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමායි, මමයි PAC එකේදී අනන්තවත් දකිනවා, බදු ගෙවන්නේ නැතිව කොච්චර මිනිස්සු පැනලා යනවාද කියන එක. ඒ නිසා ආණ්ඩුව ඉතාමත්ම අපහසුතාවකට පත් වෙනවා. අපේක්ෂා කරන මුළු ආදායමෙන් සියයට 10ක් දක්වා තාවකාලික අත්තිකාරමක් මහ බැංකුවෙන් ගෙවන්න පුළුවන්. නමුත් මේ තාවකාලික අත්තිකාරම මාස හයක් ඇතුළත මහ බැංකුවට නැවතත් ගෙවන්න ඕනෑ. 2010 දී මේ අත්තිකාරම තිබිලා තිබෙන්නේ රුපියල් බිලියන 78යි. ඒ කියන්නේ කෝටි 7,800යි. මේක 2010 දී ගෙවලා නැහැ. මාස හයෙන් අත්තිකාරම ගෙවන්න ඕනෑ කියලා 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 89 වැනි වගන්තියේ සෘජුවම සඳහන් වෙනවා. ඒක තමයි නීතිය.

මා දන්නා විධියට 1948 ඉඳලා 2013 වෙන තෙක් මේ 89වන වගන්තිය සංශෝධනය කරලාත් නැහැ. එහෙම නම් මේ නීතිය උල්ලංඝනය කිරීමක් මෙතැන වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පස්සේ මම සොයලා බැලුවා, 2011 දී කොච්චර ගෙවන්න තිබෙනවාද කියලා. ගරු ඇමතිතුමනි, රුපියල් බිලියන 95ක් ගෙවන්න තිබෙනවා. රුපියල් කෝටි 9,500ක් තාවකාලික අත්තිකාරම ගෙවලා නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක තාවකාලික නොවෙයි ගරු ඇමතිතුමනි, සදාකාලික අත්තිකාරමක් වෙලා. [බාධා කිරීමක්] හරි, හරි. පොඩ්ඩක් වචනයක් පැටලුණා. නමුත් හරය අහගෙන ඉන්නකෝ ගරු මන්ත්‍රීතුමා. හරය අහ ගෙන ඉන්න. වචන අපි කාටත් පැටලෙනවා. ඔබතුමාටත් එදා සිංදුව කියන්න ගිහින් වචනයක් පැටලුණා. කමක් නැහැ. මේ තාවකාලික අත්තිකාරම සදාකාලික අත්තිකාරමක් වෙලා තිබෙනවා. එහෙම නම් මා කියනවා, මේක තමයි ලොකුම බොල් ණය කියලා. මේක තමයි අවුරුදු ගණනක් තිස්සේ ගෙවලා නැති බොල් ණය. මම මේ කියන කථාව මුදල් නියෝජ්‍ය ඇමතිතුමාට පිළිගන්න වෙනවා. 2003 රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව අවසාන වතාවට මේ අත්තිකාරම ගෙවිවාට පස්සේ කිසිම දවසක මේ ආණ්ඩුව මේ මුදල ගෙවලා නැහැ. දැන් මොකක්ද, මේකෙන් වෙන්නේ? ඇයි, මේ මුදල ගෙවන්න කියලා නීතිය යොදලා තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අතිගරු ජනාධිපතිතුමා Mattala Airport එක විවෘත කළ වෙලාවේ "ඔව්, යටිතල පහසුකම් හදන්න, සංවර්ධනය කරන්න අපට ණය ගන්න ඕනෑ" කියලා කියා තිබෙනවා කියලා අද පත්තරයක සඳහන්ව තිබෙනවා මම දැක්කා. අපි එහෙම නැහැයි කියලා කියන්නේ නැහැ. ණය ගන්න ඕනෑ. නමුත් ඒවායේ ප්‍රමුඛතාව මොනවාද, කොහෙන්ද ඒ ණය ගන්නේ කියන එක පිළිබඳව තමයි අපේ විවේචනය තිබෙන්නේ. නමුත් මේ භාණ්ඩාගාරය නොයෙකුත් අනවශ්‍ය දේශපාලන ව්‍යාපෘති සඳහා මුදල් වියදම් කරන එක මේ රටට ලොකු ගැටලුවක් වෙලා තිබෙනවා. ඒක නිසා උද්ධමනය ඉහළ යනවා; රුපියල බාල්දු වෙනවා. මේවා තමයි ගැටලු. සමහරු කියනවා, "අන්න ආර්ථික ඝාතකයෝ අතැන ඉන්නවා" කියලා. තව සමහරු කියනවා, "නැහැ, ඒ ආර්ථික ඝාතකයෝ මෙතැන ඉන්නවා" කියලා. ආර්ථිකය ඝාතනය කරනවා කියලා කියන්නේ අනවශ්‍ය ව්‍යාපෘති සඳහා මුදල් වියදම් කිරීමයි. ඒ තුළින් රටේ උද්ධමනය වැඩි වෙනවා; රුපියල බාල්දු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්කෝ මුදල් පනතේ 89වන වගන්තිය පිළිපදින්න ඕනෑ. එහෙමත් නැත්නම් නීතිය වෙනස් කරන්න ඕනෑ. මොකද, නීතියක් සම්පාදනය කරන කොට කාට හරි ඕනෑ වුණු නිසා ඔහේ නීති සම්පාදනය කළේ නැහැ නේ. ඇත්ත වශයෙන්ම මේ ගැන කල්පනා කර බලන්න ඕනෑ. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා, මුදල් ඇමතිවරයා හැටියට ඉන්න කොට තමයි මේ නීති ගෙනාවේ. මා වැරදි නැහැ කියා මා හිතනවා. අපි මහ බැංකුව නිර්මාණය කළ අවස්ථාවට, පොඩ්ඩක් පස්සට යමු. ඇයි මේ මහ බැංකුව නිර්මාණය කළේ? ඉස්සර තිබුණේ පෞද්ගලික බැංකුයි. මහ බැංකුවක් කියලා එකක් තිබුණේ නැහැ. මහ බැංකුව ඉස්සරවෙලාම නිර්මාණය කළේ 1950 දීයි. මා හිතන්නේ සර් ආතර් රණසිංහ-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ජෝන් එක්ස්ටර්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
No, John Exter was the Governor. John Exter became the Governor because, I think, Sir Arthur Ranasinghe, if I am not mistaken, refused to take the job.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
He was the Secretary to the Treasury.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
That is correct. He was the Secretary to the Treasury. එතුමා කිව්වා, "මට මහ බැංකුවේ පළමුවන අධිපති ධුරය භාර ගන්න බැහැ" කියලා. ජෝන් එක්ස්ටර් ඇමෙරිකාවෙන් තමයි ලංකාවට එක්ක ආවේ. මේ මහ බැංකුවේ නිර්මාතෘ අධිපතිවරයා ඇමෙරිකන් ජාතිකයෙක්. ඔහුගේ දර්ශනයට අනුව තමයි, ඒ monetarist view එකට අනුව තමයි මහ බැංකුව මේ රටේ නිර්මාණය කළේ.

ඇත්ත වශයෙන්ම හරි ලස්සන කථාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දවස්වල නම් මේවා වෙන්නේ නැහැ. අද මොන ඇමති කෙනෙකුගේ වුණත් ව්‍යාපෘතියක් විවෘත කරන්න ඊට වඩා ලොකු කෙනෙක් ගියෝතින් -ජනාධිපතිවරයා හෝ රටේ නායකයා ගියෝතින්- ඒ රටේ නායකයා තමයි ගොඩක් වෙලාවට ප්‍රධාන ආරාධිත අමුත්තා බවට පත් වන්නේ. Either the

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

President or the Prime Minister becomes the chief guest, not the person who is really involved with the project. නමුත් මම කියවලා බොහොම ලස්සන දෙයක් සොයා ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1950 දී මහ බැංකුව විවෘත කළ වෙලාවේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ, ජේ.ආර්. ජයවර්ධන මුදල් ඇමතිතුමායි. ඩී.එස්. සේනානායක මැතිතුමා අගමැතිවරයා හැටියට එයට සහභාගි වුණා. නමුත් එතුමා අගමැතිවරයා වුණත් විශේෂිත ආරාධිත අමුත්තෙක් විතරයි. ජේ.ආර්. ජයවර්ධන මහතා තමයි මුදල් ඇමතිවරයා හැටියට හිටියේ. එතුමා එතකොට කියපු කථාවක් තමයි මෙන්න මෙය. Hon. Minister, what the Hon. J.R. Jayewardene said - it is very interesting - was this: "I trust that you …", meaning the Central Bank, "…will remember that money was made for man, and not man for money". What was he trying to say?

ඒ දවස්වල එතුමාට තිබුණා, Keynesian දැක්මක්. හරිද? අපි කවුරුත් දන්නවා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මහවැලි ව්‍යාපාරය නිර්මාණය කළ අවස්ථාවෙත් Keynesian දැක්මෙන් ඒ වැඩ කටයුත්ත කළ බව. ඉහත ප්‍රකාශයෙන් එතුමා කියන්නේ, "මහ බැංකුව මුදල් නිර්මාණය කරලා තිබෙන්නේ මිනිසා වෙනුවෙනි" කියලායි. නැතුව මුදල්වලට හයේ, මුදල් සඳහා මිනිසා නොව, මිනිසා සඳහා මුදල් කියලායි කියන්නේ. So, what he was trying to say there, Sir, was that the monetary policy must be implemented in such a way that you can bring development and welfare for the people. ඒක තමයි එතැනින් කියන්න හදන්නේ. ඒක තමයි Keynesian දර්ශනය කියලා අප ගොඩක් දුරට තර්ක කරන්නේ. නමුත් -[බාධා කිරීමක්] ඔබතුමන්ලා යන්නේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආර්ථික දර්ශනයේ කියන එක තමයි මා මේ කියන්න හදන්නේ. ඔබතුමා ඒක පිළිගන්නවා. [බාධා කිරීමක්] ඒක හොඳයි. වරදක් නැහැ. නමුත් ගරු ඇමතිතුමනි, ඩී.එස්. සේනානායක මැතිතුමා මොකක්ද කියා තිබෙන්නේ? එතුමා අවවාද කර තිබෙනවා. එතුමා කියා තිබෙනවා, "මහ බැංකුවේ මුදල් කළමනාකරණය හරියට කළේ නැත්නම් අති විශාල උද්ධමනයක් එන්න පුළුවන්; එහෙම වුණොත් ජනතාවට විශාල ජීවන බරක් පැටවෙන්න පුළුවන්" කියලා. ඒ වාගේම වග කීමකින් යුතුව මහ බැංකුවක් පරිපාලනය කරන්නේ කොහොමද කියන එක ඒ කාලයේ තිබුණු ඩොමීනියන් රටවල් වන කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වාගේ රටවල්වලින් අපට ඉගෙන ගන්න අවශ්‍යයි කියලා තිබෙනවා. දැන් එතැනදී තමයි මේ තාවකාලික සදාකාලික අත්තිකාරමේ ප්‍රශ්නය එන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙලාව තිබෙනවා නේ. මට විනාඩියක් දෙනවාද? මා anecdote එකක් කියන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්, කියන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Lord Keynes කථා කරන ගමන් කිව්වා, "In the long run, we are all dead" කියලා. එතකොට එතුමාගේ ප්‍රධාන ශිෂ්‍යාව වන Joan Robinson කිව්වා, "Yes, but not all at the same time" කියලා. ඒ වාගේ එතුමාගේ Keynesian දර්ශනයෙන් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි හුඟක් දුරට ආර්ථික ක්‍රියාවලිය සකස් කළේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම හොඳයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තමුන්නාන්සේ දන්නවා, විශේෂයෙන් ටී.බී. ඉලංගරත්න මහත්මයාගේ උපදේශකවරු හැටියට සිටියා කැලේගම සහ-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ලාල් ජයවර්ධන.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Yes. They were Keynesians.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක හරි. ඔබතුමා කියපු Lord Keynesගේ anecdote එකට පස්සේ මා තවත් anecdote එකක් කියන්නම් කෝ. You know, we studied what is called "intertemporal utility functions". What that means is, we are concerned not only about this generation, but also about the next generation. එතකොට මේ generation එකේදී ණයක් ගත්තොත් ඒ ණය ගෙවන්න වෙන්නේ ඊළඟ generation එකට. That is the intertemporalness of the problem of debt. දැන් කාට හෝ කියන්න පුළුවන්, "ණය ගන්න එකේ කිසි වැරැද්දක් නැහැ; අපි ණය අරගෙන මේ කාලයේදී, අපේ අවුරුදු හයේදී අපි වැඩේ කර ගන්නවා" කියලා. අපේ අවුරුදු හයේදී අපි වැඩේ කර ගත්තාට ඊළඟ අවුරුදු හයේදී තමයි ඒක ගෙවන්න වෙන්නේ. ගරු ඇමතිතුමනි, එතැනදී තමයි අපි ඉතාමත්ම පැහැදිලිව කියන්නේ දේශපාලනයකින් තොරව අපි ඉතාමත්ම බුද්ධිමත්ව මේ ණය ගන්න ඕනෑ කියලා. මා නැවතත් අපේ argument එකට එන්නම්. එතකොට මේ තාවකාලික අත්තිකාරම සදාකාලික අත්තිවාරම වීම තුළින් මුදල් නීති පනතේ 89වැනි වගන්තිය අමු අමුවේ උල්ලංඝනය වනවාය කියන එක මා ඉතාමත්ම වග කීමෙන් ඔබතුමාට කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම එදා මහ බැංකුවෙන් භාණ්ඩාගාරයට මේ මුදල් දුන්නේ ඇයි? එතකොට මහ බැංකුවෙන් භාණ්ඩාගාර බිල්පත් තුළින් රජයට ණය දුන්නේ නැහැ. හරි නේ. මොකද, 1962 හිටපු මහ බැංකු අධිපතිවරයා තමයි ඩී.ඩබ්ලිව්. රාජපතිරණ මැතිතුමා. ගරු ඇමතිතුමනි, එතුමාට කථා කරලා තිබෙනවා Public Accounts Committee එකට. වර්තමානයේ ඔබතුමා සභාපති වන, මා සාමාජික වන Public Accounts Committee එකට 1962 දී කථා කරලා, -ඒ කාලයේ මන්ත්‍රීවරු අහලා තිබෙන්නේ වැදගත් ප්‍රශ්න - මහ බැංකුවේ අධිපතිතුමාගෙන් අහලා තිබෙනවා, " අධිපතිතුමා, ඔබ මේ මුදල් අව්වු ගසමින් භාණ්ඩාගාර බිල්පත් ලබා ගන්නේ ඇයි?" කියලා. දැන් ඒක මෙහෙමනේ වෙන්නේ. භාණ්ඩාගාර බිල්පත් ඉදිරිපත් කරන්නේ රටේ කාගෙන් හෝ ණයක් අරගෙන, ඒ ණය තුළින් මොකක් හෝ සංවර්ධන ව්‍යාපාරයක් හෝ එදිනෙදා ජීවත් වන්න අවශ්‍ය මුදල් ලබා ගැනීමටයි. එතකොට මම අපේ නියෝජ්‍ය කථානායකතුමාගෙන් ණයක් ගත්තොත් භාණ්ඩාගාර බිල්පතක් හැටියට එතුමාගේ HSBC බැංකුවෙන් Bank of Ceylon එකට ඒ මුදල් යන එක විතරයි වෙන්නේ. එතකොට මුදල් මැවීමක් මෙතැන සිද්ධ වෙන්නේ නැහැ.

නමුත් මහ බැංකුවෙන් ණයක් ගන්නවා කියන්නේ මුදල් මැවීමක්. මොකද මහ බැංකුවට විතරයි පුළුවන්කම තිබෙන්නේ මුදල් අච්චු ගහලා භාණ්ඩාගාර බිල්පත් තුළින් රජයට ණයක් දෙන්න. ඒ දේ නොකළ යුතුයි කියන තැන ඉඳලා තමයි ගොඩාක් දුරට මේ නීති සම්පාදනය වුණේ. ඩී.ඩබ්ලිව්. රාජපතිරණ මහතා කියලා තිබෙනවා,"ගරු මන්ත්‍රීතුමනි, අකැමැත්තෙන් තමයි මට මේ ණය ගන්න සිදු වෙන්නේ, ණය ගත්තේ නැත්නම් සියයට 8 දක්වා පොලී අනුපාතය ඉහළ දාන්න වෙයි." කියලා. ඒකෙන් සංවර්ධනයට රුකුලක් වෙන්නේ නැහැ කියලා එදා කියලා තිබෙනවා. මොන රජයක් වුණත්, මොන අධිපතිවරයෙක් වුණත් ආර්ථිකයේ අවශ්‍යතාවට වඩා මුදල් නිර්මාණය කරනවා නම් සමස්ත මිල ඉහළ යනවා. ඒකට තමයි අපි උද්ධමනය කියන්නේ. රුපියල බාල්දු වෙනවා. එහෙම නැත්නම් සංචිත අඩු වෙලා රුපියලේ අගය කඩාගෙන වැටෙනවා. මේක ඉතාම වැදගත් දෙයක්. අපි හොඳට තේරුම් ගන්න ඕනෑ, මොකක්ද මෙතැන වෙන්නේ, ඇයි එහෙම වෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කැමැතියි අවුරුදු එකහමාරක් ආපස්සට යන්න. 2011දී ගෙවුම් ශේෂ අර්බුදය කොහොමද නිර්මාණය වුණේ? කොහොමද ඒක නිර්මාණය වුණේ? ඒක නිර්මාණය වීමට හේතු සාධක වුණේ මොකක්ද? හේතු සාධක වුණේ කවුද? ඒකට වග කිව යුත්තේ කවුද? පාඩු ලබන රජයේ ආයතනවලට විශාල ලෙස ණය දීමෙන්, නාස්තිකාර රජයේ ව්‍යාපෘතිවලට ණය දීමෙන්, කෘත්‍රිම ලෙස පොලී අනුපාතය අඩු කිරීමෙන්, ශීඝ්‍රයෙන් ආර්ථිකයේ මුදල් ප්‍රමාණය වැඩි කිරීමෙන්, - monetary growth was exceedingly high, it went up to about 35 per cent - ආනයන වැඩි කිරීමෙන්, අපනයන අඩු වීමෙන්, රුපියලේ අගය කෘත්‍රිමව තබා ගැනීම තුළින් රුපියල අවප්‍රමාණය වීමට ඉඩ නොදීමෙන්, විදේශ සංචිත වෙළෙඳ පොළට විකුණලා, අවසානයේදී විදේශ සංචිත කඩාගෙන වැටීමෙන් රුපියල අතිවිශාල ලෙස බාල්දු වුණා. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල, රුපියල් 110 ඉඳලා රුපියල් 130 වෙන තෙක් බාල්දු වුණා. මේකෙන් මොකක්ද වුණේ? මේකෙන් වුණේ ජනතාවට අතිවිශාල පහරක් වැදුණු එකයි. ඒකත් එක්ක සියලුම දේවල්වල මිල ඉහළ ගියා. ඉන්ධන මිල ඉහළ ගියා. විදුලි බිල ඉහළ ගියා. තේ කෝප්පයේ මිල ඉහළ ගියා. ගෑස් මිල ඉහළ ගියා. වැලි ලොරියේ මිල ඉහළ ගියා. හැම දේම ඉහළ ගියා.

ගරු විමල් වීරවංශ ඇමතිතුමා මේ දවස්වල කියනවා, ඒකට හේතුව ආර්ථික ඝාතකයන් රුපියල අවප්‍රමාණය කිරීමයි කියලා. ආර්ථික ඝාතක ක්‍රියාවලියට උදාහරණයක් හැටියට එතුමා දීලා තිබෙන්නේ රුපියල අවප්‍රමාණය කිරීමයි. ජයසුන්දර තමයි මේ රුපියල අවප්‍රමාණය කළේ කියනවා. එතුමා ළඟදී සිංහල පත්තරයකට දීපු interview එකක් මම කියෙව්වා. එතුමා කියනවා, ජනාධිපතිතුමා මේ සභාවේදී රුපියල සියයට තුනකින් අවප්‍රමාණය කරනවා කියලා කියන කොට මහ බැංකුවේ අධිපති නිවාඩ කබ්‍රාල් මහතා ඔළුවේ අත ගහ ගත්තා කියලා. මහ බැංකුවේ අධිපතිතුමා ඒ පිළිබඳව දැන ගෙන හිටියේ නැහැ කියනවා. එතුමා කියනවා, 2015, 2016 වෙන කොට ආණ්ඩුවට විපක්ෂයට යන්නයි සිද්ධ වෙන්නේ කියලා. මේ ආර්ථික ක්‍රියාවලියේ කඩා වැටීම තුළ දැන් සියයට 8ක, 9ක ආර්ථික වර්ධනයක් නැහැ නේ. දැන් ආණ්ඩුව කියන විධියට ආර්ථික වර්ධනය සියයට 6ට විතර අඩු වෙලා. ඒ කඩා වැටීමට හේතුව තමයි ආර්ථික ඝාතකයන්ගේ ක්‍රියාවලිය. ඇයි රුපියල බාල්දු වුණේ? මොකක්ද ඒකට හේතුව? මම විග්‍රහ කරපු විධියට ජයසුන්දරයි, කබ්‍රාලුයි දෙන්නාම ඒකට වග කියන්න ඕනෑ. මොකද මෙතැන තිබෙන්නේ භාණ්ඩාගාරයෙන් වියදම් කිරීම සහ ඒ සඳහා මහ බැංකුවෙන් මුදල් ලබා දීමයි - accommodating monetary policy.

ආර්ථික විද්‍යාව හදාරපු කෙනෙක් හොඳට මේ පිළිබඳව දන්නවා. මෙතැන දෙපැත්තේම වැරැදි තිබෙනවා. එකක් තමයි භාණ්ඩාගාරය පාඩු ලබන ආයතනවලට ණය දීම. අනෙක් එක තමයි රජය අනවශ්‍ය සුදු අලි finance කිරීම. තවත් එකක් තමයි ආනයන බදු අඩු කිරීම. ගරු ඇමතිතුමනි, මේ සියල්ල සිදු කරන්න කවුද මුදල් ලබා දුන්නේ? If it is not accommodating monetary policy, there is no way that this can be done.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Thank you very much, Hon. Member.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
How much time do I have, Sir?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You have exceeded your time.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Give me two or three minutes, I will wind up.

We have to be very concerned. කවුද, මේ මුදල් ලබා දුන්නේ? එහෙම නම් මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවන්නේ මහ බැංකුවෙන්; Treasuryයෙන් නොවෙයි. නමුත් මහ බැංකුවේ අධිපතිවරයා ගැන එක දෙයක් මා කියන්න ඕනෑ. මහ බැංකුවේ ලාභය ආණ්ඩුවට දෙන කොට හැම අවුරුද්දේම වාගේ මුදල් - cash - තමයි දෙන්නේ. අපිත් නිවාඩ කබ්‍රාල් අධිපතිතුමා මෙවර තීරණයක් ගෙන තිබෙනවා, ඒ මුදල් වෙනුවට භාණ්ඩාගාර බිල්පත් අඩු කිරීමක් සිද්ධ කිරීමට. මා එය කියෙව්වා. එය තවම officially ඉදිරිපත් කරලා නැහැ. මා හිතන හැටියට එය ඉතා බුද්ධිමත් ක්‍රියාවලියක්. ඒ පිළිබඳව -යම් කිසි විධියකින් මූල්‍ය විනය ආරක්ෂා කර ගන්න කර තිබෙන උත්සාහයට- එතුමාට අපේ ප්‍රශංසාව පළ කරනවා.

මට නියමිත කාලය අවසන් නිසා මගේ කථාව ඉක්මනට නවත්වන්න කියා අපේ නියෝජ්‍ය කථානායකතුමා කියනවා. අවසානයේදී -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට නියමිත වේලාව අවසන් වී තිබෙන නිසායි ඔබතුමාගේ කථාව නතර කරන්න කියන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
That is right. So, I will wind up now.

මට තව විනාඩියක් දෙන්න, I will wind up. Therefore, we have to be very careful because we have to have financial discipline. To bring financial discipline, in 1949 the Hon. J.R. Jayewardene brought in the Monetary Law Act. Please refer to Section 89 of that and ensure that the Central Bank does not accommodate the Treasury in

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

wasteful expenditure. If you do that, the people will ultimately suffer.

Thank you very much.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඉලික්ස් පෙරේරා අමාත්‍යතුමා - නැත.
ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා - නැත.
ගරු රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමා.

[අ.භා. 12.07]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Minister of Ports and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත, සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත, වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත යන මේ පනත් කෙටුම්පත් හතර දෙවන වර කියැවීමේ විවාදයට ගන්නා මේ අවස්ථාවේදී අපේ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය, ඒ වාගේම අපේ ජොෂ්ඨ අමාත්‍ය සරත් අමුණුගම මැතිතුමා ඒවා පිළිබඳ කරුණු කාරණා බොහොම පැහැදිලිව ඉදිරිපත් කළා.

මෙම අවස්ථාවේදී විපක්ෂය නියෝජනය කරමින් අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කරුණු පැහැදිලි කළා. මා එතුමාට ස්තුතිවන්ත වනවා, විශේෂයෙන්ම විදුලි සංදේශ සංශෝධන පනත් කෙටුම්පත ගැන රජයට එතුමාගේ ප්‍රසාදය පළ කිරීම සම්බන්ධයෙන්. හොඳ දේ දැක්කාම හොඳයි කියන්න එතුමා පසුබට වුණේ නැහැ. ඒ සම්බන්ධයෙන් එතුමාට දැනෙන දේ එතුමා ප්‍රකාශ කළා. විදුලි සංදේශ වැඩ පිළිවෙළ ග්‍රාමීය මට්ටමට ගලා ගෙන යෑම සඳහා භාණ්ඩාගාරයට ලැබිය යුතු මුදල් අඩු කිරීමක් කර ගෙන, රටේ සංවර්ධනයට සන්නිවේදනය ප්‍රධාන සාධකයක් බවට පත් කර ගෙන තිබීම ගැන විපක්ෂයත් අපට යහපත් ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් මා එතුමාට ස්තුතිවන්ත වනවා.

ඒ විතරක් නොවෙයි. එතුමා මහ බැංකුව සම්බන්ධවත් අදහස් ප්‍රකාශ කළා. ඔබතුමා ප්‍රකාශ කළා, මහ බැංකුව විසින් භාණ්ඩාගාරයට ගෙවිය යුතු බදු ගෙවීම් සම්බන්ධව. ඒ මුදල් ගෙවීම් සම්බන්ධව අවශ්‍ය කාරණා ඉදිරිපත් කරමින් ඔබතුමා ඇහුවා, " මේ ලාභ ලබන මහ බැංකුව වාගේ තැනක් මේ බදු පැහැර හරින්නේ ඇයි?" කියලා. ඇත්ත වශයෙන්ම ඔබතුමාගේ ප්‍රකාශයත් එක්ක රටේ මතයක් ඇති වෙයි, මහ බැංකුව වාගේ තැනක් බදු පැහැර හරිනවාය කියලා. ඒ මතය තමයි රටට යන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් අපි බොහොම පැහැදිලිව මතක් කරන්නට ඕනෑ. ඔබතුමා පෙන්වා දුන්නා, මහ බැංකුව විසින් ලබන ලාභය මිලියන ගණනාවක් කියලා. ඒ ලබන සියලුම ලාභය අවසානයේ දී එකතු වන්නේ රජයේ මහ භාණ්ඩාගාරයටයි. ඒ නිසා -[බාධා කිරීමක්] ඔබතුමා පසුව පැහැදිලි කරන්න. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවේ දී මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්‍රාල් මැතිතුමාගේ නම වැඩිපුර කියවුණා. ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ ලේකම්, ආචාර්ය පී.බී. ජයසුන්දර මැතිතුමාගේ නමත් විටින් විට කියවුණා. සාමාන්‍යයෙන් මේ විධියට එම නම් කියවීමට හේතු සාධක වන්නේ යම් භීතිකාවක්, එහෙම නැත්නම් යම් බියක් -

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඇමතිතුමනි, ඔබතුමන්ලා දෙන තොරතුරු තමයි අපි කියන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
හොඳයි, මම එතැනට එන්නම්.

මහ බැංකුවත්, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයත් කෙරෙහි ආර්ථික විශ්ලේෂඥයකු වන ඔබතුමා බියක් ඇති කර ගන්නට එපා. රටේ සංවර්ධනය, යටි තල පහසුකම් දියුණු කරමින් අපට රජයක් විධියට රටේ ජනතාව බලාපොරොත්තු වන සංවර්ධනය ඇති කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති වනවාය කියන එක අපි ඔබතුමාට මේ අවස්ථාවේ දී බොහොම පැහැදිලිව මතක් කරන්නට ඕනෑ.

අද මේ බදු පනත් කෙටුම්පත් ගැන කථා කරනකොට සරත් අමුණුගම ඇමතිතුමාත් මේ කාරණය ගැන බොහොම පැහැදිලිව සඳහන් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මතට නිත" වැඩ පිළිවෙළ සම්බන්ධයෙනුත්, ඒ වාගේම මේ රටේ මත් පැන් පරිභෝජනය සම්බන්ධයෙනුත් නොයෙකුත් අවස්ථාවල සිදු වන නොයෙකුත් විවේචන ගැන අපට අහන්නට ලැබිලා තිබෙනවා. පසුගිය දිනෙක ප්‍රධාන පුවත්පතක සඳහන් වෙලා තිබුණා, ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය ලීටර් 11.2ක් යනුවෙන්. යම් යම් අවස්ථාවල විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය තුළින් එවැනි වාර්තා අපට දකින්නට ලැබුණා. නමුත් මේ සම්බන්ධයෙන් ඇති සුරා බදු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය ලීටර් 2.75ක ප්‍රමාණයක් කියන එකයි නිවැරදි තොරතුර වන්නේ කියන කාරණයත් මේ වේලාවේ දී මතක් කරන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද හේතුව, මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමා 2005 නොවැම්බර් මාසයේ 19 වැනිදා මේ රටේ ජනාධිපතිවරයා හැටියට මේ රජය භාර ගත්තාට පසුව සුරාබදු දෙපාර්තමේන්තුව හරහා සංචාරක මණ්ඩලයේ "ඒ" ශ්‍රේණියේ සංචාරක නිවාඩු නිකේතනයකට හැර එකම මත් පැන් බලපත්‍රයක්වත් ලබා දීලා නැහැ. සංචාරක මණ්ඩලයේ "ඒ" ශ්‍රේණියේ නිවාඩු නිකේතනයකට අනිවාර්යෙන් මත්පැන් බලපත්‍රයක් ඇතුළත් වෙනවා. එම සංචාරක නිවාඩු නිකේතනය අයත් වන්නේ "ඒ" ශ්‍රේණියට නම් ඒ නිබෙන නීති රීති අනුව එයට මත් පැන් බලපත්‍රයක් අයිති වෙනවා. ඒ හැරෙන්නට මේ වසර ගණනාව ඇතුළත - 2005 සිට 2013 වෙනකන් - එකම මත් පැන් බලපත්‍රයක්වත් අපේ ආණ්ඩුවෙන් ලබා දීලා නැහැ යි කියන එක අපි බොහොම වගකීමකින් කියනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඉතිහාසයේ හිටපු කිසිම ජනාධිපතිවරයෙකුට, ජනාධිපතිවරියකට අපහාස කරන්න අපි කථා කරන්නේ නැහැ. අපි රජයකට අපහාස කරන්න කථා කරන්නේ නැහැ. නමුත් අපට එක කරුණක් කියන්න සිද්ධ වනවා. ඉතිහාසයේ යම් යම් සංඛ්‍යා ලේඛන හා දත්ත ලබා ගැනීමේදී පැවැතුණු හැම ආණ්ඩුවක්ම; පවතින හැම ආණ්ඩුවක්ම ඒ කාලවලදී තමන්ගේ දේශපාලන මිත්‍රයන්ට, දේශපාලනඥයන්ට නොයෙකුත් වෙලාවල්වලදී මෙවැනි දේවල් ලබා දීලා තිබෙනවාය කියන එක අපට පෙනෙනවා. ඒක අපි බොහොම පැහැදිලිව මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක තමයි ඉතිහාසයේ තත්ත්වය. නමුත් මහින්ද චින්තනය තුළින් "මතට නිත" කියන වැඩ පිළිවෙළ ඉදිරිපත් කර අද වන කොට එය ඉතාමත්ම වග කීමකින් ඉටු කරලා තිබෙන බව අපට පැහැදිලිවම කියන්න පුළුවන්කමක් තිබෙනවා. යහපත් සමාජයක්, ඒ වාගේම ගුණගරුක සමාජයක්, ඒ වාගේම අධ්‍යාපනය ලබන දරු පිරිසක් මේ රටට දායාද කිරීමේ වගකීම තමයි අද අපට පැවරී තිබෙන්නේ.

පසු ගිය අය වැය ලේඛනය ඉදිරිපත් කරපු අවස්ථාවේදී ඒ අය වැය ලේඛනය තුළින් ගෙනාපු යෝජනා අනුව මේ යම් යම් මුදල් පනත් කෙටුම්පත් සංශෝධන සහිතවයි අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. විශේෂයෙන්ම ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත ගත්තත්, ඒ වාගේම වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත ගත්තත්, අද එදාට වැඩිය රටේ ආර්ථික මර්මස්ථාන ශක්තිමත් වන කාල වකවානුවක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට අපි මතක් කරන්න ඕනෑ, ඊයේ අපි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විවෘත කළ බව. කටුනායකින් ගුවන් යානයට නැඟලා ඊට පස්සේ මත්තලින් ඒ ගුවන් යානයෙන් ගොඩ බැහැලා එන්න කියලා විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්ට අපි ආරාධනා කළා. කටු ගස් තිබුණු ඒ සම්පූර්ණ පරිසරයට; ඒ ප්‍රදේශයට හීනයක් වෙලා තිබුණු; පුංචි දරුවෝ කොස් කොළ දෙක, තුනක් එකතු කරලා කෙසෙල් බඩ කැල්ලකට ගහලා තමන් plane එකක් උඩ යවනවා කියලා කියපු මේ පුංචි දරුවන්ට සැබෑවටම අහස් යාත්‍රාවක් - plane එකක්- දකින්න අද පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි අනාගතයේදී ඒ දරුවෙකුට කපිතාන්වරයෙකු වන්න, ගුවන් සේවා සමාගමක රැකියාවක් ලබන්න පුළුවන් තත්ත්වයක් අද ඇති කරලා තිබෙනවා. ඒ වාගේම ඒ දරුවන්ට ගුවන් යානාවක සියලු කටයුතු ගැන හදාරන්න පුළුවන් තත්ත්වයක් අද ඇති කරලා තිබෙනවා. මේවා දැකලා සතුටු වන්න. එක්සත් ජාතික පක්ෂය පමණක් නොවෙයි, විපක්ෂය හැටියට තමුන්නාන්සේලා හැමෝම අනාගතයේ කවදා හරි දවසක ආණ්ඩුවක් ගැන හිතනවා නම්, එදාට ඒ ගන්න ආණ්ඩුව එක වරායකට සීමා නොවිය යුතුයි. එක ගුවන් තොටුපොළකට සීමා නොවිය යුතුයි. එක අධිවේගී මාර්ගයකට සීමා නොවිය යුතුයි. පරිගණක පාවිච්චි කරන මේ රටේ දරු සම්පත වැඩි විය යුතුයි. ඒ වාගේම සමාජයේ ජංගම දුරකථන, ගෘහස්ථ දුරකථන පාවිච්චි කරන සංඛ්‍යාව වැඩි විය යුතුයි. මම හිතන්නේ මේ තුළින් තමයි රටක ආර්ථිකය ශක්තිමත් වෙමින් රට ඉදිරියට ගෙන යන්න පුළුවන්කමක් ඇති වන්නේ.

මත්තල අපේ නව ගුවන් තොටුපොළ විවෘත කළාට පස්සේ අපේ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සිටින හින්දා මොනවා හරි විවේචන තියෙයි කියලා මම බලාපොරොත්තුවෙන් හිටියා. මම හිතන්නේ තවම ගුවන් තොටුපොළ ගැන මුකුත් කිව්වේ නැහැ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අදයි කියන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
අදයි කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දෙපළම කථා කරලා අවසන් වුණාම පිළිතුරු කථාව කරන්නයි මම අද බලාපොරොත්තුවෙන් හිටියේ. නමුත් වේලාසනින් මගේ කථාව ආරම්භ කරන්න සිදු වුණු නිසා එතුමන්ලාට පිළිතුරු දෙන්න මට අවස්ථාවක් නැති වෙනවා. නමුත් හෙට හරි කමක් නැහැ, මම ඒ අවශ්‍ය පිළිතුරු ටික දෙනවා කියන කාරණයත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මොකද හේතුව, මේ ආර්ථිකය ශක්තිමත් කරනවා වාගේම, තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයත් ශක්තිමත් කරලා දෙන්නත් අපට අවශ්‍ය වෙලා තිබෙනවා.

මොකද, අපට විපක්ෂයක් අවශ්‍යයි. හොඳ විපක්ෂයක්; ශක්තිමත් විපක්ෂයක්; කැඩිච්ච නැති විපක්ෂයක් හදන්න ඕනෑ. ඒ නිසා තමයි- [බාධා කිරීම්] නැහැ. නැහැ. මේ පැත්තේ අවුලක් වෙන්නේ නැහැ. මේ පැත්තේ කිසි දෙයකට අවුලක් වෙන්නේ නැහැ. ඒ ගැන බය වෙන්න එපා. සමහර වෙලාවට මෙහේ පුංචි ප්‍රශ්නයක් ඇති වුණත් ඒක උදේට ඇති වුණොත් හවසට ඉවරයි. ඔය පැත්තේ ඒවා තමයි දිග්ගැස්සිලා යන්නේ. ඔය පැත්තේ ඇති වන ප්‍රශ්න ආත්ම ගණනාවක් යනවා. මොකද, හේතුව? නායකයා ගහන්නේ හීතල ගැහිල්ලක්. [බාධා කිරීම්] නැහැ. නැහැ. කිසි ප්‍රශ්නයක් නැහැ. එහෙම කිසිම ප්‍රශ්නයක් නැහැ. සාමාන්‍යයෙන් නෝනයි මහත්තයයි අතර ප්‍රශ්න නැති ගෙදරක් තිබෙනවාද? එහෙම නොවෙයි. නමුත් ඔය ප්‍රශ්න ඊට වඩා භයානකයි. පෙනෙනවා නේ ඔය දෙපොළටම ගහන ගැහිල්ල. මම මාතෘකාවෙන් පිට යනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඊයේ බැසිල් ඇමතිතුමා ආවේ නැත්තේ මොකද?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
බැසිල් ඇමතිතුමා ඊයේ කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේ නිරීක්ෂණ කටයුත්ත සඳහා ගියා. [බාධා කිරීම්] අපි එහෙමයි. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. අපි සාමාන්‍යයෙන් වැඩ කරන අය. අපි වැඩ කරන්න ඕනෑ. මොකද, ඊළඟට විවෘත කරන්න තිබෙන්නේ ඒ මාර්ගය.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒවාට කලබල වෙන්න එපා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
කලබල වෙන්න එපා. [බාධා කිරීම්] මම ඇහුවොත් එහෙම ඔය දෙන්නාට- [බාධා කිරීම්]

එතුමා වැඩ කරනවා. ඔය, ප්‍රශ්න නිර්මාණය කරන්න කරන උත්සාහයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට හේතුව මොකක්ද, සාමාන්‍යයෙන් කථාවක් තිබෙනවා, ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන තැන ඉන්න කෙනකුට ඕනෑ කරන්නේ තවත් තැනකත් ප්‍රශ්නයක් නිර්මාණය කරන්නයි. දැන් ඔය ගෙදර ප්‍රශ්න තිබෙනවා. අපේ ගෙදර ප්‍රශ්න නැහැ. ඔය ගෙදර ප්‍රශ්න තිබෙන නිසා අපේ ගෙදරත් ප්‍රශ්න ඇති කර ගත්තාම තමයි ඔයගොල්ලන්ට කාලකණ්ණි සතුටක් ලබන්න පුළුවන් වන්නේ. නමුත් ඒ කාලකණ්ණි සතුට ලබන්න හම්බ වෙන්නේ නැහැ. අපේ ගෙදර ප්‍රශ්න නැහැ. අපේ ගෙදර හොඳයි. ඒකේ කිසිම අවුලක් වන්නේ නැහැ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඇයි, බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ආවේ නැත්තේ?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
බැසිල් ඇමතිතුමා ආවේ නැත්තේ මොකද කියලා අහන්න ඉස්සරවෙලා, ඔබතුමා ඔබතුමාගේ නායකයාගෙන් අහන්න, පල්ලෙහා අයට කපන්නේ ඇයි කියලා. මුලින්ම ඒක අහලා ඉන්න. මුලින් ගිහිල්ලා ඔබතුමාගේ නායකයාගෙන් ඒක අහලා ඉන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
බැසිල් ඇමතිතුමා ආවේ නැත්තේ ඇයි කියලා කියන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඒක මම කියන්නම්. අරක අහලා මට උත්තර දීලා ඉන්න. එතකොට මම ඔබතුමාට ඒක කියලා දෙන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපේ රටේ ජනතාව වෙනුවෙන් අපි අපේ වගකීම සහ යුතුකම ඉටු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ආර්ථික සේවා ගාස්තුව සම්බන්ධයෙන් කථා කරන කොට අද මේ වන විට අපේ රටේ කරන්නට බලාපොරොත්තු වන ආර්ථික වැඩ පිළිවෙළ තුළ සංචාරක ව්‍යාපාරය ඉතාමත්ම ශක්තිමත් කිරීමට අවශ්‍ය කරන ක්‍රමවේදයන් සකස් කර ගෙන යනවා. විශේෂයෙන්ම ඔබතුමා ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන කෙනෙක්. ගාලු පාර ආශ්‍රිතව ඔබතුමාගේ මැතිවරණ බල ප්‍රදේශය තුළ එදා 2009 මැයි මාසයේ 19 වැනිදාට පෙර සංචාරක ව්‍යාපාරයේ නියැලුණු ජනතාවට සිද්ධ වුණේ මොකක්ද කියලා ඔබතුමාට දකින්න ලැබුණා. අඩු ගණනේ තමන්ගේ ව්‍යාපාරික ස්ථානයේ ලයිට් බිල ගෙවා ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබුණා. සංචාරක නිවාඩු නිකේතන වහලා දැම්මා. සංචාරක නිවාඩු නිකේතනවල රැකියා කළ අයට කරන්න දෙයක් නැති වුණා. ඔවුන් ගිහිල්ලා කුලී වැඩ කරන්න ලැහැස්ති වුණා. නමුත් අද මේ වන විට ලංකාවට සංචාරකයන්ගේ පැමිණීමේ ඉතා ශීඝ්‍ර වර්ධනයක් ඇති වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම නම් සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා සංචාරක ව්‍යාපාරයට හවුල් වෙන පෞද්ගලික අංශය ශක්තිමත් කිරීම අපේ යුතුකමක් වෙනවා. ඒ වාගේම සංචාරකයන් ලංකාවට පැමිණෙන විට ඔවුන්ගේ සිත් ඇද ගන්නා වූ මනරම් පරිසරයක් ඇති කිරීම අපේ වගකීමක් බවට පරිවර්තනය වෙනවා. අපි ඒක කළ යුතු යි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි සංචාරක හෝටලයක් හැදුවාට මදි. ඒ ප්‍රදේශයේ තිබෙන යටිතල පහසුකම් දියුණු කරන්න ඕනෑ. මාර්ග පද්ධතිය හදන්න ඕනෑ. වෙරළ පිරිසිදුව තබන්න ඕනෑ. සංචාරකයන් යන එන අපේ රටේ සංස්කෘතිය විදහාපාන ස්ථාන දියුණු කරන්න ඕනෑ. ඒ වාගේම සංචාරක ව්‍යාපාරය පවත්වා ගෙන යෑමේදී බලපාන බදුවල සංශෝධනයක් කරන්න ඕනෑ. ඒ තුළ තමයි අපට මේ ව්‍යාපාරය ශක්තිමත් කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ. එදා අපි දැක්ක මඩකලපුව, ත්‍රිකුණාමල මුහුදු තීරයන් -පාසිකුඩා, කල්කුඩා වැනි- නිකම්ම නිකම් මුහුදු වෙරළවල් ලෙසයි තිබුණේ.

සංචාරක ව්‍යාපාරය අද දැඩි ලෙස ඒ ප්‍රදේශවල ව්‍යාප්ත වෙලා තිබෙනවා. අවි දරා ගත්ත එල්ටීටීඊ සංවිධානයට, වේළුපිල්ලේ ප්‍රභාකරන්ට එදා අවුරුදු 13, 14 දුවිඩ ජාතික දරුවාගේ අතට ආයුධයක් දෙන්න පුළුවන් වුණේ ඔවුන්ට ආර්ථික ශක්තියක් තිබුණේ නැති නිසයි. ඒ පැතිවල සංවර්ධනය දිහා බලපු නැති නිසයි. ඒ නිසා ඒ එල්ටීටීඊ සංවිධානයට ශක්තිමත් වෙන්න ලේසි වුණා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැවත කවදාකවත් එල්ටීටීඊ ත්‍රස්තවාදයක් මේ රට තුළ බිහි වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ ප්‍රදේශ සංවර්ධනය වෙලා, සංචාරක ව්‍යාපාරය දියුණු වෙලා, යටිතල පහසුකම් ඇති වෙලා තිබෙනවා. දකුණට, බස්නාහිරට වාගේම වයඹට ලැබෙන සංවර්ධනය උතුරට, නැඟෙනහිරට අරගෙන ගියාම ඒ ප්‍රදේශවල ත්‍රස්තවාදයක් ඉස්මතු නොවෙන පරිසරයක් ඇති කරන්න පුළුවන්. අන්න ඒ තත්ත්වය ඇති කිරීමයි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ අපේ රජයේ වගකීම කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ නිසයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය කෙරෙහි නැඹුරු වන ව්‍යාපාරික ප්‍රජාව ශක්තිමත් කිරීමටත් අවශ්‍ය කරන වැඩ පිළිවෙළ අපි දියත් කරගෙන යන්නේ.

විශේෂයෙන්ම විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් අපි බලාපොරොත්තු වන්නේ, මේ රටේ සන්නිවේදනය ශක්තිමත් කිරීමයි. අද ශ්‍රී ලංකාව තුළ ජංගම දුරකථන පාවිච්චි කරන සංඛ්‍යාව 203,24,070ක ප්‍රමාණයක්. ඒ වාගේම අන්තර්ජාල හා ඊමේල් භාවිතා කරන ප්‍රමාණය 9,42,461ක්. ස්ථාවර දුරකථන භාවිතා කරන පිරිස 34,49,391ක් වෙනවා. මේ අනුව අපට පුළුවන් වෙලා තිබෙනවා හැම කෙනකු අතරම සන්නිවේදනය ශක්තිමත් කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. අපට මතකයි ඉතිහාසයේ යම් යම් අවස්ථාවලදී ගෘහස්ථ දුරකථන පහසුකම් ලබා ගන්න දේශපාලනඥයකුගේ උදව් ගන්න සිද්ධ වුණා. ඒ අය පස්සේ ගිහින් තමන්ගේ ඉල්ලුම් පත්‍රය ප්‍රමුඛතා ලේඛනයට ඇතුළත් කරන්න සිද්ධ වුණා. මම කැපැල්, විදුලි සන්දේශන සහ උඩරට සංවර්ධන නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කරන කාලයේ අනේ! ජනතාව අපි ළඟට ඇවිල්ලා පෝලිමේ ඉඳලා කියන්නේ දුරකථනයක් ලබා දෙන්න කියලයි. "විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වුණා, අපට දුරකථනයක් අරගෙන දෙන්න" කියලා ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා ගාවට ගිහිල්ලා දුරකථන පහසුකම් ඉල්ලන තත්ත්වයක් ඇති වෙලා තිබුණා. අද ඒ තත්ත්වය නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලෝකයේ දියුණුවත් සමඟම අපට පුළුවන් වෙලා තිබෙනවා ඒ තත්ත්වය මේ රට තුළ ස්ථාපිත කිරීමට. මේ හැම දෙයක් තුළින්ම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තනය තුළින් ජනතාවට ලබා දුන් ඒ වගකීම ඉටු කරන්න පුළුවන් තත්ත්වයක් අපි ඇති කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේත් අතිගරු ජනාධිපතිතුමා මතක් කළා ණය ගැනීමේ කාරණය සම්බන්ධව. අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අපි ණය ගන්න එක ගැන මේ ගරු සභාවේ කරුණු ඉදිරිපත් කළා. අපි ණය ගන්නවා. බොහොම පැහැදිලිව ඊයේ අතිගරු ජනාධිපතිතුමා කිව්වා, ණය අරගෙන රටේ ජනතාවට කන්න දීලා නැහැ කියලා. ණය අරගෙන කන්න දීලා, ඒ ණය බර වැඩි වෙලා රට ආර්ථික වශයෙන් ගිලා බසින තත්ත්වයකට වැටෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. අපි ණය අරගෙන තිබෙන්නේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් අවශ්‍ය කරන වැඩ පිළිවෙළටයි. තව දශක දෙක තුනක් යන කොට රට ආර්ථික වශයෙන් ගොඩ නඟන වැඩ පිළිවෙළටයි අපි ණය අරගෙන තිබෙන්නේ. අපි වරායවල් හදනවා; ගුවන් තොටුපොළවල් හදනවා; අධිවේගී මාර්ග හදනවා; විදුලි බලාගාර හදනවා; සංචාරක ව්‍යාපාරය දියුණු කරනවා.

ධීවර ව්‍යාපාරය ශක්තිමත් කරනවා. හැම ගමකම ඉන්න මිනිසුන් ස්වයං රැකියාලාභීන් හැටියට නඟා සිටුවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ශක්තිමත් කරමින් අප මේ ගමන යනවා. අන්න ඒ වගකීම ගැනයි අප මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අප ඒ වගකීමෙන් පිට ගිහින් ඉතිහාසයේ වෙනත් ආණ්ඩු වාගේ ඒ ලියා දීපු ලියවිල්ල අමතක කර වැඩ කර නැහැ. "මහින්ද චින්තන", "මහින්ද චින්තන ඉදිරි දැක්ම" කියන වැඩ පිළිවෙළවල් තුළින් අප අපේ සංවර්ධන ක්‍රියාදාමය ඉදිරියට ගෙන යනවා.

මට තව විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ ආණ්ඩුවෙන් ඒ වගකීම හරියාකාරව ඉටු වෙයි කියලා ජනතාව බලාපොරොත්තු වෙනවා. ජනතාව අපෙන් බලාපොරොත්තු වෙන, ඔවුන් අපෙන් ඉල්ලන, ඒ අවශ්‍යතා ඉටු කරන්න අප බැඳී සිටිනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. අද උදේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා එතනෝල් ස්ප්‍රීතු කන්ටේනර් දෙකක් පිළිබඳව ඉදිරිපත් කරපු ප්‍රශ්නය සම්බන්ධයෙන් අප එවෙලේම ක්‍රියාත්මක වුණා. විශේෂයෙන්ම වරාය විෂයය භාර අමාත්‍යවරයා හැටියට මෙය දැනගත් විගසම සුරාබදු දෙපාර්තමේන්තුවට, ඒ වාගේම රේගු අධ්‍යක්ෂවරයාට මම පෞද්ගලිකව දුරකථනයෙන් දැනුම් දුන්නා මේ සම්බන්ධයෙන් අවශ්‍ය කරන කටයුතු සොයා බලන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප සුරාබදු දෙපාර්තමේන්තුවට ඉතාම ස්තුතිවන්ත වෙනවා. ඔවුන් ඇවිල්ලා ඒ පැමිණිල්ල සම්බන්ධයෙන් සොයා බලා, අවශ්‍ය කටයුතු කරලා ඒ අත් අඩංගුවට ගැනීම් කළා. කවුරු හෝ කෙනෙක් මේ වැරැදිවලට සම්බන්ධ වෙනවා නම්, ඒ වැරැද්ද කළේ කුමන පුද්ගලයෙක් වුණත්, තරාතිරම නොබලා ඒ අවශ්‍ය දේවල් කරන්න, ඔවුන් රටේ නීතිය ඉදිරියට ගෙන යන්න අප කැප වෙනවාය කියන කාරණය මම මතක් කරනවා. මේ සියලු පනත් සංශෝධන ඉදිරිපත් වන්නේ රටේ ජනතාවගේ අවශ්‍යතාවලට සහ ජනතාවගේ යුතුකම්, වගකීම් ඉටු කරන්නයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2013 මාර්තු මස 19 වන අඟහරුවාදා, එනම් අද දින පස්වරු 3.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සභාගී වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

සභාවේ වැඩ කටයුතු පස් වරු 1.00 වන තෙක් අත්හිටවනු ලබනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා (ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා) ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *in the Chair.*

[1.00 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Chairman of Committees, I am more than surprised to find that the Members of the Opposition are evading these Bills which are before the House. Many Opposition Members were listed to speak before me but none of them were present here. I do understand their attitude because they do not want the Government to attain progress economically, socially or otherwise.

Sir, it is only yesterday that we had the miracle, I should say, of a new international airport being opened in the City of Mattala, in the Hambantota District, our Hon. Speaker's Electorate. Now, that is a remarkable feature because the "Mahinda Chintana - Vision for the Future" "අලුත් ශ්‍රී ලංකාවක් - සුබ අනාගතයක්" very clearly refers to this.

මහින්ද චින්තනයේ හුඟක් දේවල් ගැන සඳහන් වෙලා තිබෙනවා. රටේ ආර්ථිකය නංවාලීම, සදාචාරය ආරක්ෂා කිරීම, සියලුම ජාතීන්ගේ සහ ආගම්වල සංහිඳියාව, ප්‍රගතිය වෙනුවෙන් කටයුතු කිරීම ගැන එහි සඳහන් වනවා. ළමා පරපුරේ ක්‍රීඩා කෞශල්‍යය නංවාලීම පිණිස රට පුරාම ජාත්‍යන්තර ක්‍රීඩාංගන ආරම්භ කර තිබෙනවා. එපමණක් නොව ඒවාට සියලු අයුරින් උදව් වනවා. ප්‍රවාහන කටයුතු දියුණු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේ නියෝජනය කරන උතුරු ප්‍රදේශයේ කොටින් විසින් විනාශ කළ දුම්රිය මාර්ග යථා තත්ත්වයට පත් කර තිබෙනවා. සිල්පර කොටන් ගලවාගෙන ගිහින් බංකර් හදාගෙන අවුරුදු 30ක් පුරා මේ රටේ ස්වෛරීත්වය, එක්සත්භාවය නැති කරලා රට දෙකඩ කරන්නට වෙර දැරූ ඒ කෲර, මඟ කකුල් දෙකේ කොටින් කළ විනාශයෙන් මේ රට මුදා ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අද මෙම රජය අප රටේ මහා මාර්ග පද්ධතිය දියුණු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඔබතුමා A-9 පාරේ යන විට නිකම් ස්වර්ගයට යනවාදෝ කියා හිතෙනවා නේද? රෝමය තමයි පාරවල් සෑදීම -මාර්ග පද්ධති ඉදි කිරීම- සම්බන්ධයෙන් ඉතිහාසයේ ප්‍රසිද්ධ වෙලා තිබුණේ. රෝම ඉතිහාසයේ උච්චතම දියුණුව පරදවා අද අපේ පුංචි ලංකාව හාස්කමක් කර තිබෙනවාය කියන එක අපි මේ පාර්ලිමේන්තුව තුළින් ඉතාම සන්තෝෂයෙන් රටටත්, ලෝකයටත් හෙළි කරනවා. කොටින් විනාශ කළේ කාගේ දේපොළද? කාගේ සම්පත්ද? කාගේ දරුවන්ද? විශේෂයෙන්ම උතුරේ දුප්පත් ජනතාවට කෝච්චිවල යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. දැන් ඒ ප්‍රදේශයේ කෝච්චි පාර හදා ගෙන යන බව අපි දැක්කා. ඒ වාගේම ත්‍රිකුණාමලය, මඩකළපුව ආදී ප්‍රදේශවලට යන්න එදා හොඳ පාරවල් තිබුණේ නැහැ. එදා කොළඹ සිට ගාල්ලට යන්නට පැය දෙකක් තුනක් ගත වුණත් අද ඒ ගමන යන්නට expressway එකක් තිබෙනවා. අද කොට්ටාව ප්‍රදේශයෙන් යනකොට මැලේසියාවේ ගමන් කරනවා වාගෙයි අපට හැඟෙන්නේ; ජර්මනියේ ගමන් කරනවා වාගෙයි අපට හැඟෙන්නේ. උඩුනුත්, යටිනුත් පාරවල්. සුරපුරක් වාගේ හරිම ලස්සනයි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අද මහාමාර්ග පද්ධතිය තුළින් ආශ්චර්යවත් ලංකාවක් උදා කර දී තිබෙනවා. ඒ වාගේම තමයි පොතුවිල් සිට කොළඹට එන මාර්ගයත්. අද මනම්පිටිය පාලම කොච්චර ලස්සනට හදා තිබෙනවාද කියා බලන්න. ඉස්සර කෝච්චියයි, රථවාහනයි ගමන් පතයක යන්නේ. ඒ වාගේම තමයි වාලච්චේනෙයි-ඕට්ටමාවඩි නමැති ස්ථානයෙන් කෝච්චිය එනකොට ගේට්ටුව වහනවා. එතකොට අනික් පාරේ යන වාහන නවත්වා ගෙන ඉන්න ඕනෑ. සමහර වෙලාවට පැය කාලක්, භාගයක් පමණ වාහන නවත්වා ගෙන ඉන්නට සිද්ධ වෙනවා. ගේට්ටුව වැහුවේ නැත්නම් සුනේ සුන්.

අපේ හිටපු ඇමති එම්.එස්.එස්. අමීර් අලි මැතිතුමාගේ මැදිහත් වීමෙන් මොන තරම් ආශ්චර්යවත්, ලස්සන පාලමක් එහි හදා තිබෙනවාද? අපි ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ස්පාඤ්ඤ දේශයට ගිහින් එතුමා ආධාර ලබා ගැනීමේ මාර්ගය උදා කර දීමෙන් පසු රජය වෙනුවෙන් ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා විසින් ඒ කටයුතු සියල්ල දැන් නිම කර තිබෙනවා. මනම්පිටිය පාලම විවෘත කළේ අතිගරු ජනාධිපතිතුමායි.

මත්තල ගැන කියන්නට වුවමනා කරන්නේත් නැහැ. අද ශ්‍රී ලංකාවේ අහස ලස්සනයි. ජනාධිපතිතුමා කියා සිටියා: "ගුවන් යානා අහසේ පියාසර කරන දැකුම්කළු දර්ශනය බලා අපේ දූ

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

දරුවන්ට සන්තෝෂ වන්නට පුළුවන්"! මහින්ද චින්තනයේ මේවා සඳහන් කර තිබෙන හැටි බලන්න. අද මේ ගැලරියේ පාසල් ළමයින් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. මහින්ද චින්තනය හැම පාසලකම හැම ළමයෙක්ම කියවන්න ඕනෑ; කට පාඩම් කරන්න ඕනෑ. ආශ්චර්යවත් ශ්‍රී ලංකාවක් නිර්මාණය කරන, ඔබ හැමගේ අනාගතය තිරසාර කිරීමේ මහාර්ඝ වැඩ පිළිවෙළක් මහින්ද චින්තනය තුළින් මොනවට රටට හෙළි කර තිබෙනවාද?

මහින්ත චින්තන ඉදිරි දැක්මේ 13 වන පිටුවේ මත්තල ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ගැන සඳහන් කර තිබෙනවා. ඒ වාගේම මහින්ද රාජපක්ෂ වරාය හැදුවා. වරාය හදන විට ගලක් ගැන කිව්වා. දැන් ඒ ගල ගෙනිහින් තියා තිබෙනවා සිරිකොතේ. විපක්ෂ නායකතුමා ඇතුළු සිරිකොතේ අය සියලු දෙනාම මේ සභාවේ හැම තිස්සේම කථා කරන්නේ ගලක් ගැන; නැවක් ගැන නොවෙයි. ඒ අයට වුවමනා කරන්නේ ගල්. සිරිකොතට එක ගලක් මදි නම් අපි ලැහැස්තියි ගල් සියයක් වුණත්, දහසක් වුණත් යවන්න. මෙතැන ඉන්න අපේ ගරු ඉන්දික බණ්ඩාරනායක නියෝජ්‍ය ඇමතිතුමාත් ඒක අනුමත කරනවා. මහින්ද චින්තන ඉදිරි දැක්මේ 27 වෙනි පිටුවේ සඳහන් වනවා, වරායක් මෙන්ම අලුතින් ගුවන් තොටුපොළක්ද ලංකාවේ ඉදි වන්නේ යටත් විජිත අවධියෙන් පසුවයි කියා.

ලෝකයේ හැම තැනම මේ වාගේ ගුවන් තල පිහිටන්නේ නැහැ. ඇමෙරිකාවේ ජෝන් එෆ්.කෙනඩි ගුවන් තොටුපොළ තිබෙනවා. ඒ වාගේම ප්‍රංශයේ ඩිගෝල් ජනාධිපතිවරයාගේ නමින් ගුවන් තොටුපොළක් තිබෙනවා. ජෝර්දානයේ කිං හුසෙයින් සහ සවුදි අරාබියාවේ කිං ෆහඩ් කියලා ගුවන් තොටුපොළවල් හැදුණා. ඒ වාගේම තමයි චාන්ගි ගුවන් තොටුපොළ. සිංගප්පූරුවේ තිබෙන ඉතාමත්ම ලස්සන ප්‍රදේශයක චාන්ගි තමයි එම ගුවන් තොටුපොළ පිහිටා තිබෙන්නේ. දියුණු වන ඕනෑම රටකට international airports දෙකක් තිබෙන්නට ඕනෑ. මෙපමණ කල් තිබුණේ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පමණයි. දැන් ඒක ඉතාමත් ලස්සනට හදලා තිබෙනවා. අපේ ප්‍රණාමය එහි සභාපති ප්‍රසන්න වික්‍රමසූරිය මැතිතුමාට පිරිනමන්නට කැමැතියි. මේ අතින් එතුමා අගනා සේවයක් කරනවා. ඒ වාගේම තමයි අපේ කමල් රත්වත්තේ මහත්මයා ලබා දෙන දායකත්වය. ඒ වාගේ සෙසු නිලධාරී මහත්වරු ඉතාමත්ම හොඳින් දක්ෂකමින් වැඩ කරනවා. ළැදියාවකින්, මහන්සි වෙලා වැඩ කරනවා. ඒ වාගේම මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වෙනවා, කිලෝ මීටර් 04ක දිගින් යුතු ගුවන් පථයක් සහිත මත්තල ගුවන් තොට ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළයි කියා. එදා මහින්ද චින්තනයෙන් ඒ බව කිව්වේ - election manifesto - එකටයි. අද එය ඉෂ්ට වෙලා අවසානයි.

"දකුණේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට මෙන්ම ආයෝජන සහ සංවර්ධන කලාපවල වර්ධනයටත් මෙමගින් කදිම අවස්ථාවක් උදා වනු ඇති බව මම විශ්වාස කරමි" යනුවෙන් මේ පොතේ ලියා තිබෙනවා. අද ඇහැට පෙනිලා හොඳට බලලා සන්තෝෂ විය හැකි දර්ශනීය ගුවන් තොටුපොළ දැන් ලංකාවේ දකුණු කෙළවරේ -මාගම් පුරයේ- මත්තල ප්‍රදේශයේ හදලා අවසානයි. ලෝකය දැන් මෙය සඳහන් කරන්නේ "City of Mattala" කියලා. Air Arabia ඉස්සෙල්ලාම ආවා. ලංකාවාසී සියලු ජනතාවට සන්තෝෂ විය හැකි තවත් කාරණයක් කියන්නට ඕනෑ.

The person who piloted the Air Arabia plane was a Sri Lankan. So, you can see to what extent Sri Lanka has advanced even in piloting planes. The Sri Lankan pilots and crew can man any flight anywhere in the world.

අතිගරු ජනාධිපතිතුමා අද "ඩේලි නිව්ස්" පත්තරයට මෙසේ කියලා තිබෙනවා. "Daily News" of Tuesday, March 19, 2013 states, "Let our children fly above us". පත්තරයේ ඒ පිළිබඳව පිංතූරයක් දාලා තිබෙනවා. It also states, "China's special representative at MRIA…" අපි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට BIA කියනවා වාගේ ලෝකය මේ ගුවන් තොටුපොළ MRIA වශයෙනුයි හඳුන්වන්නේ.

It further states under the caption "The pride of Ruhuna and gateway to prosperity", I quote:

> "Opening the gateway to the country's prosperity and adding a golden chapter to Sri Lanka's aviation history, President Mahinda Rajapaksa yesterday opened the Mattala Rajapaksa International Airport (MRIA). MRIA, the second international airport of the country was commissioned amidst pomp and pageantry in the historic city of Hambantota."

අපි සියලු දෙනාම ගියා. රට වැසියන් වශයෙන් ජනතාවටත් අපි ආරාධනා කළා. රටේ ජනතාව දියුණුව කරා යෑම අභිප්‍රාය කර ගෙන තිබෙනවා. ඒ අයට ඒ පිළිබඳ ආශාවක් තිබෙනවා. ඒ අය විසින් තෝරා පත් කර ගත්ත විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ වාගේ දියුණුවක්-

They do not want to see development of the country in that fashion. Today's "Daily News" also reports under the caption "China's special representative at MRIA launch, Mattala symbol of close Sino-Lanka friendship", I quote:

> "Addressing the inauguration of the country's second international airport, Mattala Rajapaksa International Airport (MRIA), Chinese Political Consultative Conference Vice President Luo Fuhe said China always respects the sovereignty and social and economic well-being of other nations. He said China encourages its entrepreneurs..."

උදේ පාන්දර ඒ ගුවන් තොටුපළ විවෘත කරන අවස්ථාවේදී මට යම් දෙයක් මතක් වුණා. මේ අලුත් අවුරුද්ද උදා වන අවස්ථාවේ ජනාධිපතිතුමාගේ පාර්ලිමේන්තු කටයුතු ලේකම් කුමාරසිරි හෙට්ටිගේ මැතිතුමා අපට සුබ පැතුමක් එවා තිබුණා. ඒ ගුවන් තොටුපළත් සමඟ සංසන්දනය කරන විට මෙය මොන තරම් කාලෝචිතදැයි කියවලා බලන්න. උදේ පාන්දර අප චමත්කාරජනක පරිසරය දෙස බලනවා. මෙන්න බලන්න කුමාරසිරි හෙට්ටිගේ මැතිතුමා හිමිදිරිය ගැන වර්ණනා කළ හැටි.

"දුක් තැවුල් සංකා අතැර
සිත් සතන් සොම්නසින් ඉපිලෙන.....
සත් සියක් සියපත් පුබුදුවන
නැවුම් හිමිදිරිය මව්බිමට සපැමිණ !"

මොන තරම් ලස්සනද ඒ දර්ශනය? එදා උදේ පාන්දර මෙන්න මේ ආකර්ෂණීය දර්ශනය තමයි අප මත්තලදී දුටුවේ. ආශ්චර්යවත් ලංකාවක් පිබිදීමේ මාර්ගය ඒ තුළින් අප දැක්කේ. The English translation of that verse states, I quote:

> "The dawn,
> That drives woes and grief away
> embraces Mother Lanka
> and fills minds with immense pleasure
> injecting life to countless lotus to bloom."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම එය දෙමළ භාෂාවෙනුත් කියන්න ඕනෑ නේ.

"துயரங்களையும் ஏக்கங்களையும் கைவிட்டு
மனங்கள் மகிழ்ச்சியால் பொங்கி வழியும்
பலநூறு தாமரைகளை மலரச் செய்விக்கும்
புத்தம்புதிய அதிகாலை தாயகத்திற்குப் புலர்ந்ததே!"

இவ்வாறு குமாரசிறி ஹெட்டிகே அவர்கள் வர்ணித் துள்ளார்.

இந்த நாட்டிலே ஒரு பாரிய அபிவிருத்தி - பொருளாதாரப் புரட்சி ஏற்பட்டுக்கொண்டிருக்கின்றது. இந்த நேரத்தில்தான் நான் ஒன்றைச் சொல்ல வேண்டும். அதாவது எங்களுடைய மக்கள் இப்பொழுது சௌபாக்கியமான ஒரு நிலைமைக்கு வந்திருக்கின்றார்கள். இன்று கொழும்பிலுள்ள தமிழர்களும் முஸ்லிம்களும் சிங்களவர்களுடன் சமாதானமாக வாழ்கின் றார்கள்; தங்களுக்குத் தேவையான தொழில்களைச் செய்கின் றார்கள்; வாணிபத்தில் ஈடுபடுகின்றார்கள்; விழாக்களை நடத்துகின்றார்கள். அதேநேரம் கோயில்கள், பாடசாலைகள் போன்ற எல்லா இடங்களிலும் விழாக்கள் நடைபெறுகின்றன. ஆனால், தென்னிந்தியாவிலே இருக்கின்றவர்கள் என்ன செய்கின்றார்கள்? மாணவர்களைத் தூண்டிவிடுகின்றார்கள்! இவ்வாறு இந்த மாணவர்களுக்கு நஞ்சூட்ட வேண்டாம் என்று கலைஞராக இருந்தாலும் சரி, கலைச்செல்வியாக இருந்தாலும் சரி நான் தமிழ்நாட்டுத் தலைவர்களிடம் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். உங்களுடைய அரசியல் போராட்டத்துக் காக, அந்தத் தமிழ் மக்களுடைய வாக்குகளைப் பெறுவதற்காக நீங்கள் அங்கே பச்சிளம் பாலகர்களை வழிதவறச் செய்யாதீர்கள்! என்று நான் கேட்கின்றேன். இறுதியில் அதன் பலாபலன்களை அனுபவிக்க வேண்டி வரும் என்பதையும் நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

බලන්න, දැන් ඉන්දියාවෙන් බුද්ධිමත් අය එනවා; අධ්‍යාපනඥයෝ එනවා. මෙහේ "වේල් විලා" එකට සහ "කම්බන් විලා" එකට ඒ ගොල්ලෝ සහභාගි වෙනවා. ඒ අයට කිසිම හානියක් සිද්ධ වෙනවාද? ඒ කිසිම කෙනකු වෙත ගල් කැටයක්වත් වීසි කරලා තිබෙනවාද? අද මෙන්න මේ විධියට "සුඩර් ඔළි" එකේ දානවා. සමහර විට "සුඩර් ඔළි" මේ රට ගිනි තබන්නට වෙර වැයම් දරනවා වෙන්න පුළුවන්.

அதாவது இன்று அவர்கள் இந்த நாட்டை எரிக்கப் பார்க்கின்றார்கள்! ஆனால், அவர்களும் இந்த நாட்டில் வாழ்கின்றவர்கள்! அந்தப் பத்திரிகையின் உரிமையாளர் சரவணபவன் ஐயா அவர்களிடம் நான் அன்றும் இது குறித்துச் சொல்லியுள்ளேன். ஒருமுறை ஓர் அபாயத்திலிருந்து அவரையும் 'சுடர் ஒளி' பத்திரிகையையும் காப்பாற்றியவன் நான் என்ற முறையில் அவர்களுக்கு ஞானம் பிறப்பதற்காக சகோதர மனப்பான்மையுடன் நல்ல புத்திமதிகளைச் சொல்கின்றேன்.

இன்று இந்த நாட்டைப் பிரிப்பதற்காக சம்பந்தன் ஐயா அவர்களும் சுரேஷ் பிரேமச்சந்திரன் அவர்களும் மாவை சேனாதிராஜா அவர்களும் ஜெனீவாவுக்குச் சென்றிருக்கின் றார்கள். அது எப்படியாவது நடக்கும் என்று அவர்கள் சொல்கின்றார்கள். "ஜெனீவா குறித்த இந்திய அறிக்கை ஈழத் தமிழர்களுக்குச் செய்யும் பச்சைத் துரோகம்" என்று அங்கே வைகோ சொல்கின்றார். ஏன் இப்படிச் செய்ய வேண்டும்? இந்த நாட்டில் அன்று போராட்டம் நடந்தது தமிழ் மக்களுக்கு எதிராகவல்ல. ஆயுதம் தாங்கிய பயங்கரவாதிகளுக்கு எதிராகத்தான் அந்தப் போராட்டம் நடைபெற்றது. தமிழர் களுக்கு எதிராக நடைபெற்ற மனித உரிமை மீறல்கள் பற்றி அங்கே அவர்கள் கதைக்கின்றார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அன்று காத்தான்குடியில் தொழுகையில் ஈடுபட்டுக்கொண்டிருந்தவர் களையும் ஏறாவூரில் சிறுபிள்ளைகளையும் விடுதலைப் புலிகள் கொன்ற விதம் பற்றிக் கேளுங்கள்! அந்த நேரத்திலே நாங்கள் அங்கு ஓடோடிச் சென்றோம். செய்யத் அலிஸாஹிர் மௌலான, எம்.பீ. அவர்களும் எம்முடன் இருந்தார். ஏறா வூரிலே அந்த மக்கள் அழுதவண்ணம் இருந்தார்கள். அப்பொழுது அங்கு ஒரு மூதாட்டி பன்பெட்டியொன்றைத் தூக்கிக்கொண்டு எங்களிடம் ஓடோடி வந்தார். அந்த ஊர் மக்கள் நாம் அங்கு சென்றால் காலையிலே பால் அப்பம் தருவார்கள். அதைத்தான் அவர் அங்கு கொண்டு வருகின்றார் என்று நாங்கள் நினைத்தோம். ஆனால், அந்தப் பாவிகளினால் வயிறு கிழிக்கப்பட்டுக் குடல் வெளியேறிய நிலையில் ஒரு பச்சைப் பாலகன் அந்தப் பன்பெட்டியினுள் காணப்பட்டான். அதனைப் பார்த்த எனக்கு ஒரு மாத காலம் சாப்பிடக்கூட முடியாமல் போனது. இதைப் பற்றி எல்லாம் ஏன் ஜெனீவாவில் பேசக்கூடாது? அரந்தலாவையிலே 34 பிக்குகளைக் கொன்றார்கள்! அந்தப் பிக்குகள் மனிதர்கள் இல்லையா? அவர்களுக்காகவும் நாங்கள் குரல் கொடுக்க வேண்டும். எங்கே மனிதாபிமானம் சென்றது? இன்று பிரபாகரனுடைய மகன் கொல்லப்பட்டதைப் பற்றிக் கூறுகின்றார்கள்! ஆனால், ஏறாவூரிலே, காத்தான்குடியிலே, அழிஞ்சிப்பொத்தானையிலே, பள்ளித்திடலிலே மற்றும் ஏனைய இடங்களிலே அந்தத் தாய்மார் இன்னமும் அழுகின்றார்கள்! அதுமாத்திரமல்ல, அண்மையில் இடம்பெற்ற ஒரு தொலைக்காட்சிச் செவ்வியிலே புலிகளோடு இருந்த ஒரு பெண்மணி சொல்கின்றார், "என்னுடைய கணவனை அவர்கள் பிடித்துச் சென்றுவிட்டார்கள்" என்று. தமது இராணுவத்திலே சேர்ப்பதற்காகப் பத்து வயதுக்குக் கீழ்ப்பட்ட பிள்ளைகளையும் அவர்கள் பிடித்துச் சென்றிருக்கின்றார்கள். சம்பந்தன் ஐயா அவர்கள் ஜெனீவாவிலே ஏன் இதையும் சொல்ல முடியாது? என்று நான் இந்தச் சபையிலே கேட்க விரும்புகின்றேன்.

இன்று யாழ்ப்பாணத்திலிருந்து துரத்தப்பட்ட முஸ்லிம் களின் காணிப் பிரச்சினை மற்றும் எல்லைப் பிரச்சினை பற்றி எல்லாம் பிரஸ்தாபிக்கப்படுகின்றது. இன்று அவர்களுக்குரிய காணிகளை சம்பந்தன் ஐயா அவர்கள் ஏன் அளந்து கொடுக்கக்கூடாது? என்று நீதியாக நடக்கின்ற என் அன்புக் குரிய நண்பர் கௌரவ செல்வராசா அவர்களிடம் கேட்கின்றேன். இதுபற்றிக் கலைச்செல்வியோ, கலைஞரோ ஏன் கேட்கக்கூடாது? முஸ்லிம்கள் என்ற முறையிலே யாழ்ப்பாணத்திலிருந்து அவர்களைத் துரத்தியடித்தார்கள். அவர்களும் மனிதர்கள்தானே!

ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸின் ஸ்தாபகத் தலைவர் எம்.எச்.எம். அஷ்ரஃப் அவர்களின் அரசியலில் எனக்கு உடன் பாடு கிடையாது. அதுகுறித்து அன்று எந்த நாளும் இச்சபையில் தர்க்கம் புரிந்திருக்கிறேன். ஆனால் பின்னர் அவர் மிகவும் நுண்ணிய புத்தியுடன் ராஜதந்திர ரீதியிலே சிந்தித்துச் செயற்பட்டார். அதற்காக அவருடைய பெயர் வரலாற்றிலே பதியப்படும். அதாவது, அன்று சகோதரர் எம்.எச்.எம். அஷ்ரஃப் அவர்களை, "வடக்கையும் கிழக்கையும் சேர்த்து ஈழத்தை அமைப்போம், எங்களோடு வந்து சேருங்கள்!" என்று பிரபாகரன் அழைத்தபோது அவர் அதற்கு முடியாது என்று சொல்லிவிட்டார். "நான் உங்களோடு சேர முடியாது; இந்த நாட்டின் ஏனைய பகுதிகளிலே - சிங்களப் பகுதிகளிலே - முஸ்லிம்கள் வாழ்கின்றார்கள்; அவர்களுக்கு எந்தவிதமான ஆபத்தும் வந்துவிடக்கூடாது. அதனால், நாங்கள் முழுநாட்டு மக்களோடும் சேர்ந்திருக்க வேண்டும்" என்று அவர் சொன்னார். இதுதான் இராஜதந்திர அரசியல்!

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, please wind up now.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, there is a lot of time and only another two or three speakers. So, give me another five minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I can give you only two more minutes.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I will take five more minutes. - [*Interruption.*] Those Members have taken an Oath not to help, directly or indirectly, create a separate State. But, what they are doing in Geneva is, violating our Constitution. It is against the Oath they have taken. They want a separate State. That is a violation of the Oath they, including the Hon. Sampanthan, have taken in this House. Therefore, Sir, they have to be tried in a court when they come back. They are acting against the Constitution of Sri Lanka and are being unpatriotic at the highest level. It is sedition.

இப்படிப் பார்க்கும்பொழுது, அவர்களுக்கு எதிராகத்தான் நாங்கள் விசாரணை மேற்கொள்ள வேண்டும். நான் ஒன்றைக் கேட்கின்றேன். சம்பந்தன் ஐயா அவர்கள் இங்கில்லை; அவர் வந்தால் பதில் சொல்லட்டும்! இந்தியாவிலே, தமிழ்நாட்டில் வெளிவரும் தமிழ்ப் பத்திரிகைகளில் இதனை எழுதட்டும்! அங்கே நடக்கின்றவைகளை ஏன் ஜெனீவாவில் நீங்கள் சொல்லக்கூடாது? நாட்டைப் பிரிப்பதற்கு வெளிநாட்டுக்குச் சென்று பிரசாரம் செய்கின்ற ஒருவரை அந்த நாட்டுக்குள் மீண்டும் வருவதற்கு அந்த அரசாங்கம் இடமளிக்குமா? இந்தியா அல்லது தமிழ்நாட்டு அரசாங்கம் அதற்கு உடன் படுமா? காவிரி நீர்ப் பிரச்சினையை எடுத்துக் கொள்ளுங்கள்! தமிழ்நாட்டு மக்கள் நீரில்லாமல் வாடுகின்றார்கள். அதைப்பற்றி அவர்கள் பேசட்டும்! அவர்களுக்கு ஈழத் தமிழர் களைப் பற்றி என்ன தெரியும்? இங்கே தமிழர்கள் நல்ல முறையிலே வாழ்கின்றார்கள். வேல்விழா, கும்பாபிஷேகவிழா, கம்பன் விழா மற்றும் கொழும்பு தமிழ்ச் சங்கத்திலே புத்தக வெளியீட்டு விழாக்கள் என்று எத்தனையோ விழாக்கள் இங்கு வருடாவருடம் நடைபெறுகின்றன. இதனை நான் அன்றும் சொன்னேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! நாங்கள் இங்கே மிகவும் அழகாக, ஒற்றுமையாக வாழ்கின் றோம். ஆனால், சிலர் சில அசம்பாவிதங்களைச் செய்து விடுகின்றார்கள். இங்கே பாருங்கள்! நேற்று முன்தினம் - மார்ச் 17ஆம் திகதி - வெளியான 'சுடர் ஒளி' பத்திரிகையிலே இவ்வாறு ஒரு செய்தி பிரசுரமாகியிருக்கிறது:

"பௌத்த பிக்கு மீது தஞ்சையில் தாக்குதல் - தஞ்சாவூர் பெரிய கோவிலுக்கு சென்ற இலங்கையைச் சேர்ந்த பௌத்த பிக்கு ஒருவர் மீது நேற்று தாக்குதல் நடத்தப்பட்டுள்ளது. வட மாநிலங்களைச் சேர்ந்த தொல்லியல் ஆய்வு மாணவர்கள் 18 பேர் தஞ்சாவூர் பெரிய கோவிலுக்கு ஆய்வுக்காகச் சென்றுள் ளனர். இவர்களுள் இலங்கையைச் சேர்ந்த பௌத்த பிக்கு ஒருவரும் இருந்துள்ளார் எனத் தெரிய வந்ததையடுத்து இந்தத் தாக்குதல் மேற்கொள்ளப்பட்டுள்ளது. நாம் தமிழர் கட்சி, தமிழ் தேசப் பொதுவுடமைக் கட்சி, ம.தி.மு.கவினர் உள்ளிட்ட தமிழ் அமைப்பினர் ஆகியோர் இந்தத் தாக்குதலை நடத்தியுள்ளனர். சம்பவத்தில் 12 பேர் கைது செய்யப்பட்டுள்ளனர்."

நாங்கள் இதனைக் கண்டிக்கின்றோம். யாராக இருந்தாலும் அவர் ஒரு மனிதர்! நீதி கோரிப் போராடுகின்ற அவர்களே, இந்த அநியாயத்தைச் செய்யலாமா?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Azwer, please wind up now.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Give me five more minutes, Sir.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

You have already taken three minutes more. Please wind up now.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Give me another two minutes then.

The Muslims wear the Hijab. That is a part of the religion. That cannot be changed. Other problems can be tackled and it has been tackled properly. We are also happy about the whole turn of events.

Now what is happening? What is the concept of Hijab? You can ask the Hon. Sooriyapperuma, he will tell you. What is the Hijab? The first concept is to conceal the body. It is a universal dress. Not only for the Muslims, but for all. What is happening in Sri Lanka? Father-daughter, uncle-niece, teacher-student, මේ තරම් අපචාර ඇති වන්නේ ඇයි? ඇස තමයි ඒකට හේතු වන මුඛ්‍ය කාරණය.

The second concept is manners, behaviour. Safeguard manners before building up a moral society.

A Buddhist Bhikku has been attacked in a railway station in Egmore Railway Station, Madras. What is the right they have? Tamil Nadu people are daily coming here. I ask "Are you trying to provoke the Sinhalese in this country against the Tamil Nadu people?" Do not do these foolish things. Selvarajah never did that. 'தந்தை' S.J.V. Chelvanayagam, never did that.

அவர் சாத்வீகப் போராட்டத்தை மாத்திரந்தான் நடத்தி னார்; அதுவும் சிங்களவர்களுக்கு எதிராக அல்ல. எஸ். டபிள்யூ.ஆர்.டி. பண்டாரநாயக்க அவர்களோடு செய்த உடன்படிக்கை இரத்துச் செய்யப்பட்ட பிறகு...-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you very much, Hon. Azwer.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Give me another half a minute, Sir.

- டட்லி சேனாநாயக்க அவர்களோடு பேச்சுவார்த்தைக்கு வந்தார்; அவர் வர முடியாதென்று சொல்லவில்லை.

இந்த நாட்டிலே வாழ்கின்ற முஸ்லிம்கள் - 'அதபு' - ஒழுக்கத்தோடு ஹிஜாபை அணிவார்கள். அதனை யாராலும் நிறுத்த முடியாது. நிறுத்துவதற்கு எத்தனிக்கவும் கூடாது. அப்படிச் செய்பவர்கள் அரசாங்கத்துக்கு எதிராளிகள்! அவர்கள் வெளிநாட்டுச் சக்திகளுடன் சேர்ந்து சூழ்ச்சியில் ஈடுபட்டிருக் கின்றார்கள். அதற்கு இந்த அரசாங்கம் ஒருக்காலும் இடம் கொடுக்காது. ஆகவே, அன்புக்குரிய முஸ்லிம் தாய்மார்கள், சகோதரிகள் பயப்படத் தேவையில்லை. நீங்கள் தயங்காது வழமைபோல் ஹிஜாப் அணியுங்கள்.

[අ.භා. 1.24]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් ක්ෂේත්‍රයට අදාළ සංශෝධන පනත් කෙටුම්පත් හතරක් අද ඉදිරිපත් වෙලා තිබෙනවා. ඇත්තටම ගත්තොත්, මේ සංශෝධන පනත් කෙටුම්පත් නිවැරැදිව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ගන්න මුදල් අමාත්‍යාංශයට බැරි වුණා. මුදල් ඇමතිවරයා වෙනත් වෙනත් අමාත්‍යාංශවල වැඩ බලන්න, ඒවා අධීක්ෂණය කරන්න යනවා, අධ්‍යාපන අමාත්‍යාංශයට ගිහිල්ලා අධ්‍යාපන ඇමතිවරුන් සහ නිලධාරීන් වැඩ කරන්නේ කොහොමද කියලා සොයා බලනවා, තමන්ගේ අමාත්‍යාංශයේ වැඩ ටික හරියට කර ගන්න බැරිව. අද මේ පාර්ලිමේන්තුවට මේ පනත් කෙටුම්පත් නිවැරැදි ආකාරයට ඉදිරිපත් කර ගන්න බැරි වුණේ මුදල් ඇමතිවරයාගේ වැරැද්දෙන් කියන එක ඉතා පැහැදිලිව ඔප්පු වෙලා තිබෙනවා. මුදල් ඇමතිවරයා තමයි අපේ රටේ මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ. රටක් විධියට ගත්තාම, අද මේ රටේ අර්බුදයටම ගිහින් තිබෙන්නේ ආර්ථික ක්ෂේත්‍රය සහ මූල්‍ය ක්ෂේත්‍රයයි. ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයත්, මූල්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයත් හොබවනු ලබන අයගේ දුර්වලතාව තමයි ඇත්තටම මේ අර්බුදයට ප්‍රධාන හේතුව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය අය වැය ඉදිරිපත් කරපු වෙලාවේ ගරු මුදල් ඇමතිතුමා සියයට 3කින් රුපියල බාල්දු කරනවා කියලා ඊට පස්සේ පාර්ලිමේන්තුවටත් කියන්නේ නැතිව රුපියල මුළුමනින් පා වෙන්න ඉඩ හැරියා. ශ්‍රී ලංකාවේ මුදලේ අගය අද වන කොට හොඳටම බාල්දු වෙලා තිබෙනවා. ඒ බාල්දු වීම නිකම්ම සිද්ධ වුණා නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ බාල්දු කිරීම සිද්ධ කළේ, 2009 ජූලි මාසයේ 16වැනි දා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමඟ අත්සන් කරපු ගිවිසුමත් එක්කයි. එදා ඩොලර් බිලියන 2.6ක ණය මුදල ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් ක්‍රියාත්මක කරන්න ශ්‍රී ලංකාවේ ආණ්ඩුව බැඳුණා. අධිරාජ්‍ය විරෝධයක් ගැන කොයි තරම් කථා කළත්, බටහිර විරෝධයක් ගැන කොයි තරම් කථා කළත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ, ලෝක බැංකුවේ ආර්ථික මූලෝපායයන් අකුරක් නැර, ඉස්පිල්ලක් පාපිල්ලක් නැර ක්‍රියාත්මක කරන ආණ්ඩුවක් තමයි මේ තිබෙන්නේ. අද රටේ ආර්ථිකය තුළ බරපතළ කඩා වැටීමක් ඇති වෙලා. ඒ කඩා වැටීමට උත්තර විධියට විවිධ ක්ෂේත්‍රවලට බදු පනවන්නේ, විවිධ සේවා සඳහා අය කරන ගාස්තු වැඩි කරන්නේ තමන්ගේ වැරැදි ආර්ථික ප්‍රතිපත්තිය මේ රටේ ජනතාව මත පටවන්නයි. මේ රටේ දුප්පත් ජනතාවගේ උප්පැන්න සහතිකයේ, මේ රටේ දුප්පත් ජනතාවගේ විවාහ සහතිකයේ, මේ රටේ දුප්පත් ජනතාවගේ මරණ සහතිකයේ ගාස්තු වැඩි කරන්නේ ඒ වැරැදි ආර්ථික ප්‍රතිපත්තිය මේ රටේ ජනතාව මත පටවන්නයි. අද මේ ඉදිරිපත් කරලා තිබෙන විවිධ මූල්‍ය පනත් කෙටුම්පත් හරහාත් සිද්ධ වෙන්නේ ඒකම තමයි.

එදා රුපියලේ අගය බාල්දු වෙන්න ඉඩ හැරියාට පස්සේ ආණ්ඩුව කිව්වා, අපේ රටේ අපනයනවලට වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන්, අපනයන වැඩි වෙන කොට රටේ ආදායම වැඩි වෙනවා කියලා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එසේ රුපියල බාල්දු කළාට පස්සේ අපේ රටේ ආනයනය සහ අපනයනය පිළිබඳ සංඛ්‍යා ලේඛන විශ්ලේෂණය කළොත් හරි පැහැදිලිව ඔප්පු වෙනවා අපනයන ආදායම වැඩි වෙලා නැහැ කියලා. ඇත්තටම ගත්තොත්, ආනයන වියදම වැඩි වෙලා තිබෙනවා. අප අපනයන ආදායම වැඩි කළා නම් අපේ රටේ නිෂ්පාදනය වැඩි වෙලා, ඒ නිෂ්පාදනය ලෝක වෙළඳ පොළට ගිහිල්ලා ඒ තුළින් අපේ රටේ ආර්ථිකය ඉස්සරහට යන්න ඕනෑ. නමුත් එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ.

මේ රටේ කවුරුත් දන්නවා අද මේ කථා කරන මොහොත වන කොට එක් පැත්තකින් ඉන්ධන ගාස්තුව -පෙට්‍රල්, ඩීසල් මිල- වැඩි කර තිබෙන බව. ඒ වැඩි කිරීමත් එක්කම හෙට අනිද්දා බස් ගාස්තු වැඩි වෙනවා. අප්‍රේල් මාසයේ මුල ඉඳලා විදුලිය ගාස්තුව වැඩි වෙනවා. ඒ විතරක් නොවෙයි. මේ වන කොට වෙළඳ පොළේ හාල් මැස්සන් කිලෝ එකක් රුපියල් 950යි, 1,000යි. හරියට ගණන් හදලා බැලුවොත් හාල් මැස්සෙකු රුපියල් 1.50යි. හාල් මැස්සෙකු රුපියල් 1.50ක් වුණේ ඇයි? හිටපු ගමන් හාල් මැස්සන් ගණන් වැඩි වුණේ ඇයි? යුද්ධයෙන් පස්සේ මහා සුරංගනා කථා කියලා සිහින පෙන්නලා අපට කිව්වා, රටේ නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන්, කෘෂි කර්මාන්තය දියුණු කරන්න පුළුවන්, සීවර කර්මාන්තය නඟා සිටුවන්න පුළුවන් කියලා.

හැබැයි අද වෙනකොටත් මේ රටේ ජනතාවට කන්න දෙන්නේ මන්නාරමේ, කල්පිටියේ එහෙම නැත්නම් නැහෙනහිර වෙරළේ වේලන හාල්මැස්සන් නොවෙයි. තායිලන්තයෙන් ගෙනෙන හාල්මැස්සෝයි. තායිලන්තයට පසු ගිය කාලයේ ගංවතුර ආවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Foreign බඩු.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Foreign බඩු. තායිලන්තයට ගංවතුර ආවාට පස්සේ එහෙන් ගෙන්වන හාල්මැස්සන්ගේ මිල වැඩි වුණා. යුද්ධයෙන් පස්සේ රටේ නිෂ්පාදනය වැඩි කරන්නට තිබුණු අනගි අවස්ථාව අප පැහැර හැර තිබෙනවා. රටේ නිෂ්පාදනය වැඩි කරන්නේ නැතිව රටක ආශ්චර්යවත් ආර්ථිකයක් හදන්නට බැහැ. ඒක තමයි මේ ඔප්පු වෙලා තිබෙන්නේ. රට වටේටම මුහුදු තියාගෙන පසු ගිය 2012 අවුරුද්දට අප පිට රටින් මාළු ගෙන්වීම සඳහා රුපියල් මිලියන 16,000ක් වියදම් කර තිබෙනවා.

අද ගරු සරත් අමුණුගම ඇමතිතුමා කියනවා, සීනි ගෙන්වන්න ලොකු මුදලක් වියදම් කරනවාය කියා. ඔව්. ගිය අවුරුද්දට විතරක් පිට රටින් සීනි ආනයනය කරන්න රුපියල් මිලියන 47,000ක් අප වියදම් කර තිබෙනවා. මේවා මේ රටේ

[ගරු විජිත හේරත් මහතා]

දුප්පත් ජනතාවගේ සල්ලි. ඒ බර මදිවාට තව සීනි ඇමති කෙනෙකුත් පත් කර තිබෙනවා. ඒ ඇමතිතුමාගේ නඩත්තුවත් දැන් ගෙවන්න වෙන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාවටයි. ඒ විතරක් නොවෙයි. පිටරටින් හාල් ගෙන්වන්නේ නැහැයි කියා මහ ලොකුවට පුරාජේරු කිව්වා. නමුත් පසු ගිය අවුරුද්දට රුපියල් මිලියන 2,000ක සහල් මේ රටට ආනයනය කර තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ මේ ආණ්ඩුව රටේ නිෂ්පාදනය වැඩි කිරීම හරහා රටේ තරුණ තරුණියන්ට රැකියා උත්පාදනය කරන්න ඒ හරහා රටේ ආර්ථිකය ඉහළ නංවන්න ක්‍රියා මාර්ග අර ගෙන නැහැයි කියන එක ඉතා පැහැදිලියි.

ආර්ථික මූලෝපායයන් සකස් වන්නට ඕනෑ එතැනටයි. රටක ආර්ථිකය ආශ්චර්යවත් ආර්ථිකයක් බවට පරිවර්තනය කරන්නට නම් කළ යුතු වන්නේ රටේ නිෂ්පාදනය වැඩි කරන එකයි. ඒ නිෂ්පාදනයට ජනතාව සහභාගි කර ගන්න එකයි. ඒ විතරක් නොවෙයි. ඒ ජනතා සහභාගිත්වය මත ගොඩ නැඟෙන ආර්ථිකයේ ප්‍රතිලාභයන් මේ රටේ සියලු ජනතාවට සාධාරණව බෙදී යන්නට ඕනෑ. එවැනි සාධාරණ ආර්ථික ක්‍රියාවලියක් සිද්ධ වෙනවා නම් අපේ රටේ බඩු මිල ඉහළ යන්නේ නැහැ. හාල්මැස්සකුගේ මිල රුපියල් 1.50ට ඉහළ නඟින්නේ නැහැ. තෙල් මිල මේ වාගේ අහස උසට නඟින්නේ නැහැ. විදුලි බිල මේ විධියට වැඩි කරන්න ඕනෑ නැහැ. එදා විදුලි බිල වැඩි කරද්දී, එදා පෙට්‍රල්, ඩීසල් මිල වැඩි කරද්දී හිටපු ඇමතිවරු රටේ ජනතාවට පට්ටපල් අසත්‍යය කිව්වා. හැබැයි දැන් ගරු චම්පික රණවක හිටපු විදුලිබල හා බලශක්ති ඇමතිතුමා ඉරිදා පත්තරයකට කියා තිබෙනවා, විදුලි බිල වැඩි වෙන්න ප්‍රධාන හේතුව වෙන මොකවත් නොවෙයි, රුපියල බාල්දු කළ නිසායි; රුපියලේ වටිනාකම නැති වුණු නිසායි; ඒ නිසා අප ගන්න තෙල් ටිකට අපට වැඩිපුර වියදම් කරන්න සිද්ධ වුණු නිසායි කියලා. අපේ විදුලිබිල වැඩි කරන්න ඒක ප්‍රධාන හේතුවක් වුණාය කියනවා. හේතු ගොඩක් අතර ඒක එක ප්‍රධාන හේතුවක්. එතුමා අමාත්‍යාංශයෙන් ගියාට පස්සේ දැන් එහෙම කියනවා. දැන් ඉතින් පොඩි කලකිරීමකින්නේ ඉන්නේ. මොකද, එතුමාට වෙන් කර තිබෙන්නේ මුළු සමස්ත අය වැයෙන්ම සියයට 0.04යි. පවුලේ සාමාජිකයන්ට -අයියලාට, මල්ලිලාට- අය වැයෙන් සියයට 54ක් වෙන් වෙනකොට, තාක්ෂණ, පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍යාංශයට වෙන් වෙලා තිබෙන්නේ සියයට 0.04යි. ඉතින් කනගාටුයි. ඒ කනගාටුව ප්‍රකාශ වෙන්න ඇත්ත කියනවා.

රුපියලේ අගය බාල්දු කළේ වෙන මොකක්වත් නිසා නොවෙයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් මතයි. ඒ උපදෙස් ක්‍රියාවට නඟන්න තමයි රුපියලේ අගය බාල්දු කළේ. රුපියලේ අගය බාල්දු කළාට පස්සේ තමයි මේ රටේ ආර්ථිකය එන්න එන්නම කඩා වැටෙන්න පටන් ගත්තේ. ඒ ප්‍රතිපත්තිමය තීන්දු ගත් ඇමතිවරු, ඒ ප්‍රතිපත්තිමය තීන්දු ගත් කැබිනට් මණ්ඩලය අද තමතමන් වගකීමෙන් නිදහස් වෙන්න එක එක්කෙනාට බෝලය පාස් කරනවා. නිකම් අහක ඉන්න නිලධාරින්ට බෝලය පාස් කරනවා. නිලධාරින්ට බෝලය පාස් කරලා වැඩක් නැහැ. මේ වැරදි ආර්ථික ප්‍රතිපත්තිමය තීන්දු ගත් සමස්ත කැබිනට් මණ්ඩලයම- ප්‍රධාන වශයෙන් මුදල් ඇමතිවරයා හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමතිවරු- මේකට වගකියන්න ඕනෑ. ඒ වගකීම භාර ගන්නේ නැතිව ඔය ආශ්චර්යයට යන්නට බැහැ. රටේ ජනතාවට ඇත්ත දැන ගන්න අයිතියක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය ඇතුළේ තමයි අද අපේ රටේ ආර්ථිකය සම්පූර්ණ ණය මත රඳා පවතින ආර්ථිකයක් බවට පත් වෙලා තිබෙන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ගැනීම පටන් ගත් වෙලාවේ ඉඳලා දිගින් දිගට සෘජුවම ආණ්ඩුව මැදිහත් වෙලා ණය ගත්තා. දැන් ආණ්ඩුව අලුත් උපක්‍රමයක් පාවිච්චි කරනවා. කොළය වහලා ආණ්ඩුවේ වෙනත් ආයතන හරහා ණය ගන්නවා. ලංකා බැංකුව, මහජන බැංකුව, ඉතිරිකිරීමේ බැංකුව පාවිච්චි කරලා ආණ්ඩුව එක එක ව්‍යාපෘතිවලට ණය ගන්නවා.

ඒ ණය අරගත්තාට පසු ආණ්ඩුවේ ණය ප්‍රමාණය අඩුවෙන් පෙන්වන්න පුළුවන්. හැබැයි, ලංකා බැංකුවේ ණය ප්‍රමාණය වැඩියි. මහජන බැංකුවේ ණය ප්‍රමාණය වැඩියි. වෙනත් ආයතනවල ණය ප්‍රමාණය වැඩියි. එතකොට ආණ්ඩුවට කියන්න පුළුවන්, අපි ගත්ත ණය ප්‍රමාණය අඩුයි, බැංකු තමයි ණයට අරගෙන තිබෙන්නේ කියා. හැබැයි, අද මේ ආණ්ඩුව ඉතා පැහැදිලිව කරන්නේ මොකක්ද? කොළය වහලා ලංකා බැංකුව, මහජන බැංකුව පාවිච්චි කරලා ආණ්ඩුවේ බැංකු ටික පාවිච්චි කරලා එක පැත්තකින් විදේශ ණය ගන්නවා. අනෙක් පැත්තෙන් මේ රටේ දුප්පත් ජනතාව මහන්සි වෙලා හම්බ කරලා බැංකුවේ දමන මුදල් ටික මහා පරිමාණයෙන් පාවිච්චි කරනවා. එහෙම කොළය වහලා ගන්න ණය ප්‍රමාණය අද වේගයෙන් ඉහළ ගිහින් තිබෙනවා. එහෙම ණය අරගෙන මොනවාද කර තිබෙන්නේ?

අස්වර් මන්ත්‍රීතුමා මහා පුරාජේරුවෙන් මත්තල ගුවන් තොටුපොළ ගැන කථා කළා. ඒක අද අපේ රටේ ආර්ථික සංවර්ධනයේ ප්‍රමුඛතාව දෙන්න ඕනෑ එකක් නොවෙයි. ඒක ඉතා පැහැදිලිව කියනවා. තමන්ගේ හීනමානයන් තමන්ගේ උන්මාදයන් මොනවා හෝ තිබෙන මානසික ආබාධයන් තුරන් කර ගන්න, තමන්ගේ නම පවත්වා ගන්න කරන වැඩවලින් අපේ රටේ සාමාන්‍ය ජනතාව තවත් මහා ණය උගුලක පැටලෙනවා. මත්තල ගුවන් තොටුපොළ ඇස්තමේන්තු කළේ කීයටද? ඩොලර් මිලියන 209ට. ඩොලර් මිලියන 209ට ඇස්තමේන්තු කරලා ඒ 209න් ඩොලර් මිලියන 190ක්ම ණය. ලජ්ජයි. ඔකද, ආශ්චර්යය? ණයට මුදල් අරගෙන ගුවන් තොටුපොළවල් හැදුවයි කියන එක ආශ්චර්යයක්ද? මිලියන 19යි ආණ්ඩුව දැම්මේ. මිලියන 190ක්ම ණය. පොලියත් එක්ක ඒ ණය ගෙවන්න වෙන්නේ මේ රටේ ජනතාවටයි. ඒ මුදල් ටික මදි වුණාට පස්සේ තව ඩොලර් මිලියන 80ක් ඕනෑය කියා පසු ගිය දවස්වල කැබිනට් පත්‍රිකා දැමුවා. ඒ අමතර වියදම් ඇයි? ප්‍රචාරක වියදම්, cutout ගහන්න, පත්තර දැන්වීම් දමන්න, සංදර්ශන පවත්වන්න ආදී වශයෙන් ඒ අමතර වියදම්වල බරත් මේ රටේ ජනතාව මත පටවනවා. අනේ, ගෙදර යන්න බස් එකක් නැතිවුණාම, පාරේ බස් එක නැතිවුණාම, බස් ගාස්තුව වැඩි වුණාම මගීන්ට පුළුවන් බස් හෝල්ට් එකට වෙලා උඩ බලාගෙන, අහසේ යන සුද්දාගේ ප්ලේන් එක දිහා බලාගෙන ඉන්න. ඒ ප්ලේන් එක දිහා බලාගෙන හිටියාම ගෙදර යන බස් ගාස්තුව අඩු වෙනවාද? නැහැ. නමුත් ඔබතුමන්ලා ණය අරගෙන තෙල් මිල වැඩි කරලා, බස් ගාස්තුව වැඩි කරලා සාමාන්‍ය දුප්පත් ජනතාව බස් හෝල්ට් එකේ අතරමං කරලා දැන් සුරංගනා නිල් අහසක් පෙන්වනවා. නිල් අහස කොහොමත් තිබෙනවා. මේවා ආශ්චර්යය නොවෙයි. මේවාට ආශ්චර්යය කියලා කියනවා නම් ඒ, ආශ්චර්යය ගැන හරියට දන්නේ නැති මන්ත්‍රීවරුයි.

ඒ විතරක් නොවෙයි. මේ ණය සම්පූර්ණයෙන්ම ගත්තේ චීනයේ එක්සිම් බැංකුවෙන්. මේවාට සියයට 7.4 ගණනේ පොලිය ගෙවන්න ඕනෑ. ඒ පොලිය ගෙවන්නේ අහිංසක දුප්පත් ජනතාවගේ තෙල් මිල වැඩි කරලා, බයිසිකලයේ ත්‍රී වීලරයේ ගාස්තුව වැඩි කරලා. බස් රියේ, දුම්රියේ ගාස්තුව වැඩි කරලා. ගෙදරට එන විදුලි බිල වැඩි කරලා. ඒ විතරක් නොවෙයි. මාතර ඉඳලා බෙලිඅත්ත යන රේල් පාරේ දුර කීයද? නිවැරදිව ගත්තොත් කිලෝමීටර් 26.75යි. දළ වශයෙන් කිව්වොත් කිලෝමීටර් 27යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කිලෝමීටර් 27 හදන්නත් ණය ගත්තේ කොහෙන්ද? චීනයේ එක්සිම් බැංකුවෙන්. ඒ එක්සිම් බැංකුවෙන් ඩොලර් මිලියන 278ක් ණය අරගෙන තිබෙනවා. ඒ ඩොලර් මිලියන 278 ගත්තොත් මේ මාතර-බෙලිඅත්ත රේල් පාරේ එක කිලෝමීටරයක් හදන්න ඩොලර් කෝටියක් වියදම් කරනවා. ඒ කියන්නේ රුපියල්වලින් ගත්තොත් රුපියල් කෝටි 130ක් වියදම් කරනවා, මාතර-

බෙලිඅත්ත රේල් පාරේ එක කිලෝමීටරයක් හදන්න. හරියට බෙදලා බලන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. සාමාන්‍යයෙන් ගත්තොත් එක කිලෝමීටරයකට සිල්පර කොට 1,500ක් විතර තිබෙනවා. සාමාන්‍යයෙන් අඩි එකහමාරේ දුරින්; මේ ඉන්න පාසල් ළමයි හරියට අඩිය තිබ්බොත් ඒ ළමයින්ගේ අඩිය තබන පා සටහන්වල දුරින් සිල්පර කොටයක් තිබෙනවා. සාමාන්‍යයෙන් එක කිලෝමීටරයකට සිල්පර කොට 1,500ක් තිබෙනවා. ගණන් හදලා බලන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ දුම්රිය මාර්ගයේ සිල්පර කොට දෙකක් අතර දුර හදන්න -අඩි එකහමාරක් හදන්න- මේ එක්සීම් බැංකුවෙන් ණය අරගෙන රුපියල් ලක්ෂ 86ක් වියදම් කරනවා. කල්පනා කරලා බලන්න. එක්සීම් බැංකුවෙන් ණය අරගෙන තිබෙනවා. සිල්පර කොට දෙකක් අතර දුර හදන්න රුපියල් ලක්ෂ 86ක් යනවා. අඩියක් තියන කොට රුපියල් ලක්ෂ 86ක් යනවා. ඊ ළඟ අඩියට රුපියල් ලක්ෂ 86යි. හරියට ගත්තොත් සිල්පර කොට එක්දහස් පන්සියක දුර ප්‍රමාණය -කිලෝමීටරයක දුර - හදන්න මේ සා මුදලක් වියදම් කරනවා. ඇයි මේ? මේක තමයි ආණ්ඩුවේ කොමිස් මාෆියාව. ණය ගන්න මෙච්චර ආශා ඒකයි. ලංකාවේ දුම්රිය දෙපාර්තමේන්තුව මාතර ඉඳලා බෙලිඅත්තට යන රේල් පාර හදන්න කිලෝමීටරයකට ඇස්තමේන්තු කළේ කීයද? කිලෝමීටරයකට රුපියල් ලක්ෂ පනස් හතරයි.

ෆිලික්ස් ඇමතිතුමා ප්‍රවාහන ඇමති වෙලා හිටපු කාලයේ ලංකාවේ දුම්රිය දෙපාර්තමේන්තුව කිව්වා, එක කිලෝමීටරයක් රුපියල් ලක්ෂ පනස් හතරෙන් හදන්න පුළුවන් කියලා. ඇමතිතුමනි, ඔබතුමාට ඒ ගැන මතක ඇති. ජපානයෙන් ඇවිල්ලා සුනාමියෙන් විනාශ වුණු රේල් පාර හදන්න කීයක් කිව්වාද? අවුරුදු එක හමාරක් ඕනෑය කිව්වා, ජපන් සමාගම. මට මතක හැටියට ඩොලර් මිලියන එකසිය පනහක් ඉල්ලුවා. එහෙමත් කියලා අවුරුදු එක හමාරක් ඕනෑය කිව්වා. නමුත් අපේ රටේ දුම්රිය සේවකයෝ ඔබතුමාත් විස්මයට පත් කරමින් දවස් පනස් හයෙන් ඒ දුම්රිය පාර හදලා පෙන්නුවා. [බාධා කිරීමක්] සේවකයෝ විතරක් නොවෙයි, ඉංජිනේරුවෝ කවුරුත් මැදිහත් වෙලා. ඔබතුමාත් මුල දී "බැහැ, බැහැ" කියලා -

ගරු ෆිලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
අසත්‍යය කියන්න එපා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඔබතුමාට පුදුම හිතුණා. ඔබතුමාගේ ඇස් ගෙඩි දෙක උඩ ගියා, මේක කර ගන්න පුළුවන් වේවි ද කියලා. අපේ සේවකයෝ, ඉංජිනේරුවෝ- [බාධා කිරීමක්] නැහැ, නැහැ, මේකයි ඇත්ත කථාව. ඉංජිනේරු මහත්වරු, සේවකයෝ, තාක්ෂණ නිලධාරීන් ඇවිල්ලා කිව්වා, "නැහැ, අපි වග කීම් බාර ගන්නම්" කියලා. ඊට පස්සේ ඔබතුමා එකඟ වුණා. සන්තෝෂයි, දුම්රිය පාර හදලා පෙන්නුවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මම තමයි එහි නිර්මාතෘ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Right. ඔබතුමාට ඒ ගෞරවය දෙන්නම් කෝ. ඔබතුමාට ඒ ගෞරවය දෙනවා. කමක් නැහැ. සේවකයෝ නොවෙයි, මේ සිල්පර කොට ඇද්දේ, ගල් ඇද්දේ. මෙතුමා. කමක් නැහැ, ඒ ගෞරවය එතුමාට දෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒකේ නිර්මාතෘ මේකට අත උස්සනවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
නිර්මාතෘ. හරි කමක් නැහැ. ෆිලික්ස් පෙරේරා මැතිතුමා තමයි ඒකේ නිර්මාතෘ. හරි, එහෙම කියමු කෝ. එතුමා නිර්මාතෘ වෙලා ඒ රේල් පාර හැදුවා නම්, ඇයි මේ සිල්පර කොට දෙකක් අතර දුර හදන්න රුපියල් ලක්ෂ අසූහයක් වැය වන්නේ? ඔබතුමාත් කැබිනට් මණ්ඩලයේ ඉන්නවා නේ. ඔබතුමා එහි නිර්මාතෘ කියලා ඔබතුමාම කියනවා නම්, ඔබතුමා කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක් විධියටත් ඉන්නවා නම්, ඔබතුමා ප්‍රශ්න කරලා අහන්න කෝ ඇයි මෙච්චර ණය ගන්නේ, ඇයි මෙච්චර වියදම් කරන්නේ කියලා. ඔබතුමා අත්දැකීමෙන් එය කියලා දෙන්න කෝ. ඔබතුමාම පෙන්නුවා නේ වැඩ. වැඩ පෙන්වපු කෙනෙකු විධියට ඔබතුමාට පුළුවන්, හයිය තිබෙනවා, මේක ඔප්පු කරලා පෙන්වන්න. ඔබතුමාට ඒක කරන්න බැහැ. ඇයි? ඔබතුමා ඒ කාර්යය කළොත් ඔබතුමාට සමාජ සේවා අමාත්‍යාංශයත් නැති වෙනවා. ඒ ගැන අපි දන්නවා. ඒ ගැන අපි අනුකම්පා කරනවා. ඒක ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක තමයි මේ මුදල් අමාත්‍ය ධුරය දරන කවර හෝ විධායක ජනාධිපතිවරයෙකු සතු ආශ්චර්යවත් බලය. ආශ්චර්යවත් ආර්ථිකයක් නොවෙයි මේ තිබෙන්නේ. ආශ්චර්යවත් බලය පාවිච්චි කරනවා. ඒ බලය පාවිච්චි කරලා මේ සා විශාල ණයක් අරගෙන අපේ රටේ ජනතාව තවත් කබලෙන් ළිපට ඇද වටිටනවා. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ගැන ඔබතුමා දන්නවා නේ. ගරු ෆිලික්ස් පෙරේරා ඇමතිතුමනි, ඔබතුමාගේ ජා-ඇල ප්‍රදේශය හරහා නේ මේ අධිවේගී මාර්ගය යන්නේ.

2013 පෙබරවාරි මාසයේ 15 වැනිදා දාපු කැබිනට් පත්‍රිකාවෙන් මෙහෙම කියනවා. මුදල් ඇමතිවරයා තමයි මේ කැබිනට් පත්‍රිකාව දමන්නේ. දුර කිලෝමීටර් විසිපහයි දශම අටයි. ආසන්න වශයෙන් අපි කිලෝමීටර් විසිහයක් කියලා කියමු කෝ. ඒ කිලෝමීටර් විසිහය හදන්න වියදම රුපියල් මිලියන පනස්දෙදාස් තුන්සිය අසූවයි. එක කිලෝමීටරයකට රුපියල් මිලියන දෙදාස් තිහයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කියන්නේ අඩි තුනක් හදන්න රුපියල් ලක්ෂ විසිඑකයි. මේක තමයි තත්ත්වය. චීනයෙන් ණය ගන්නවා. ණයවලට පොලී ගෙවනවා. ඒ පොලී ගෙවන්න මේ රටේ ජනතාවගේ තෙල් මිල වැඩි කරනවා. කන හාල්මැස්සා එකයි පනහ දක්වා වැඩි කරනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
හැම ආණ්ඩුවක්ම ණය ගන්නවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
හැම ආණ්ඩුවක්ම ණය අරගෙන තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. හැම ආණ්ඩුවක්ම ණය ගන්න එක ඇත්ත. හැබැයි මේ වාගේ කිසිම ආණ්ඩුවක් ණය ගත්තේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 1950 ඉඳලා අපි ණය අරගෙන තිබෙනවා. 1950 දී අපි ගත්ත මුළු ණය ප්‍රමාණය රුපියල් කෝටි හැටපහයි දශම හතරයි. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Alhaj Azwer, please sit down.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
2005 වන කොට අපි ගත්ත ණය ප්‍රමාණය රුපියල් කෝටි දෙලක්ෂ විසිදෙදාස් දෙසීය තිස්හතරයි. 2005 දක්වාම අපි ගත්ත මුළු ණය ප්‍රමාණය රුපියල් කෝටි දෙලක්ෂ විසිදෙදාස් දෙසීය තිස්හතරයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have only one more minute.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Okay. I will wind up my speech. 2010 වනකොට රුපියල් කෝටි හාරලක්ෂ පනස්නවදාස් විසිහතරක් ණය අරගෙන තිබෙනවා. 2011 දී රුපියල් කෝටි පන්ලක්ෂ දහතුන්දහස් තුන්සිය තිස්අටක් ණය අරගෙන තිබෙනවා. 2012 වන කොට රුපියල් කෝටි හයලක්ෂ හැටදාහක් අරගෙන තිබෙනවා.

ඒ කියන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2005 වන කොට තිබුණු ණය ප්‍රමාණය වාගේ තුන් ගුණයක්, ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා, මේ අවුරුදු හත ඇතුළත. ඒක ආශ්චර්යයද? ඒක මහා විශ්වකර්මයක් ද? 2005 ගත්ත මුළු ණය ප්‍රමාණය වාගේ තුන් ගුණයකින් ණය ප්‍රමාණය වැඩි වීම ආශ්චර්යය ද? ඒක පුදුමය ද? ඒක පුදුමය නොවෙයි. ලජ්ජා වන්න ඕනෑ. ඒක බංකොලොත්කම. ඒක බංකොලොත්කමේ අන්තිම කෙළවර. ඒක ආර්ථිකයේ ආශ්චර්යය නොවෙයි. ඒ නිසා මේ සා විශාල ණය කන්දරාවක් වෙලා රටේ ජනතාවගේ බඩු මිල වැඩි කරලා, තෙල් මිල වැඩි කරලා, හෙට අනිද්දා විදුලි බිල වැඩි කරලා, ජනතාව කබලෙන් ළිපට වට්ටනවා. අර පෞද්ගලික බස් හිමියන්ටත් දැන් කියලා තිබෙනවා, ලබන අවුරුද්දේ පළමුවන දින වන කොට හැම බස් එකේම ලා නිල් පාට ගාන්න කියලා. ඒ බස් රථ හිමියෝ ඉන්ධන ගාස්තු වැඩි වීම නිසා ආණ්ඩුවෙන් සහනාධාරයක් ඉල්ලනවා. සහනාධාරයක් ඉල්ලන බස් රථ හිමියන්ට දැන් මොකක්ද දුන්නේ? "උඹලා පුළුවන් නම් බස් ගාස්තු වැඩි කරපල්ලා" කියලා කිව්වා. එහෙමත් කියලා දැන් කියනවා, නිල් පාට ගාන්නත් කියලා. නිල් රැල්ල ඇවිල්ලා. දැන් බස් එකටත් නිල් රැල්ල ඇවිල්ලා. නිල් රැල්ල බස් එකට ගියාම රුපියල් ලක්ෂයක් විතර යනවා, බස් එකේ තීන්ත ගාන්න. ඒකත් අල්ලන්නේ සාමාන්‍ය මහී ජනතාවගෙන්. බස් ගාස්තුව double, triple වෙනවා. ඒක නිසා මේක ආශ්චර්යය නොවෙයි. මේක ලජ්ජා වන්න ඕනෑ කාරණාවක්. ණය අරගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පදයට නටලා ඒ අනුව මේ රටේ ආර්ථිකය බංකොලොත් කරලා, විනාශ කරලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵල මත තමයි මේ ආර්ථික බදු එන්නේ. මේ බදු පනවලා ගාස්තු වැඩි වෙන්නේ. ඒ නිසා ගාස්තු වැඩි කරන එකට, මේ බදු පනවන එකට අපේ විරුද්ධත්වය අපි ප්‍රකාශ කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Felix Perera.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මට කොයි තරම් වේලාවක් තිබෙනවාද?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have 25 minutes.

[අ.භා. 1.45]

ගරු ෆිලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
මම විජිත හේරත් මන්ත්‍රීතුමාට පුංචි උත්තරයක් දෙන්නත් ඕනෑ. ඔබතුමන්ලාගේ වෘත්තීය සමිති නායකයා මානවඩු. මානවඩුගෙන් අහන්න, රේල් පාර හැදුවේ කොහොමද කියලා. සුනාමිය ආපු වෙලාවේ -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොතකුත් ගැහුවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔව්, පොතකුත් ගැහුවා. සුනාමිය ආපු වෙලාවේ මම වෘත්තීය සමිති සියල්ලක්ම එකට එකතු කළා. තමුන්නාන්සේලාගේ වෘත්තීය සමිති, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති සේරම එකට එකතු කර ගෙන බාර තුනක් වුණා. කළුතර බෝධියට එකයි, කන්දෙ විහාරයට එකයි, මාතරට එකයි. මම කතෝලිකයෙක් වුණත් මම කිව්වා, භාර වෙන්න කියලා. ඒ විධියට මානසිකත්වයෙන් සන්නද්ධ කරලා- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. දෙයියෝ ද? දෙයියන්ගේ ලෙඩ හැදෙනවා නේ කාට කාටත්. පැපොල වාගේ. [බාධා කිරීමක්] මේක අහගන්න හොඳට. එහෙම භාර වෙලා, බස් එකසිය ගණනක සියලු දෙනාම එකට අරගෙන ගිහින් එක තැනක තියලා, non-stop ගමනක් ගිහින් තමයි ඒ රේල් පාර හැදුවේ. හැබැයි අපි එය හැදුවේ මෙහෙමයි. අපි බැලුවා, මහ පාර තිබෙනවා. මහ පාරෙන් එහා පැත්තේ රේල් පාර. මහ පාරට මොකුත් වෙන්නේ නැතිව රේල් පාර ඇඹරිලා. ඒකට හේතුව? මට තිබෙනවා, ICTAD registration එකකුත්. මම ඒ දවස්වල constructions කරලා තිබෙනවා. බලපුවාම ඒ තැන්වල පොළව soft. එය වඩා හොඳට ශක්තිමත් කරලා රේලි පීලි එළන්න පුළුවන් නම් ප්‍රශ්නයක් නැහැයි කියන එක කිව්වා. නමුත් සිග්නල් දමන්න අපට බැරිව ගියා. අඩු ගණනින් ඒ කටයුතු කළාට සිග්නල් ටික දැම්මේ නැහැ. බෝක්කුවලට මොකුත් වෙලා තිබුණේ නැහැ. වතුර ටික ගිහින් තිබුණා. ඒ බෝක්කුම නැවත පාවිච්චි කළා. තමුන්නාන්සේලා කියන න්‍යායයේ හැටියට ඔය රේල්පාරවල මිල ගණන් වැරදියි. බෝක්කු දමන්න ඕනෑ, පාලම් දමන්න ඕනෑ, සිග්නල් හදන්න ඕනෑ. ඒවාට තමයි වැඩි පිරි වැයක් යන්නේ. කිලෝමීටරයක ගණන පුංචි -[බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වවුනියාවේ ඉඳලා ඕමන්තට රේල් පාර හැදුවේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවක මහත්තුරු විසින්. ඒකට ගිය ගණන කීයද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඒක මම දන්නේ නැහැ. මම දුම්රිය ඇමති නොවෙයි නේ දැන්. ශ්‍රමය පාවිච්චි කෙරුවොත් කර ගෙන යන්න පුළුවන් බොහෝ දේවල් තිබෙනවා. නමුත් අද තිබෙන තත්ත්වය හැටියට

තාක්ෂණයත් ඕනෑ වෙලා තිබෙනවා. ඒකයි ප්‍රශ්නය. එතකොට තාක්ෂණය අපට පිටින් ගන්න වෙනවා. තාක්ෂණය නිකම් දෙන්නේ නැහැ. Computer එකක් ගත්තාම රුපියල් එක් ලක්ෂ ගණනක් වෙනවා. Fridge එකක් ගත්තාම රුපියල් 35,000යි. එන්න එන්න නැනෝ තාක්ෂණික උපකරණ පුංචි වෙන්න පුංචි වෙන්න ඒවායේ මිල අධිකයි. නමුත් ප්‍රවාහනය ලෙහෙසියි. අපි ඒ පැත්ත අමතක කරනවා. කෙසේ වෙතත් මම කියන්න කැමැතියි, අද - [බාධා කිරීමක්] තත්පරයක් ඉන්න. [බාධා කිරීමක්] ඒ කියන්නේ "කොට මොඩිල්- ළඟ පිකප්" කියන එකද? [බාධා කිරීමක්] "දිග මොඩිල් තල්ලු ස්ටාර්ට්." ආ! කමක් නැහැ, එහෙම හිතා ගන්න.

අද ලෝක ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා. මම තමුන්නාන්සේලාට මතක් කරන්නම්, ආර්ථිකය ගැන තමුන්නාන්සේලා කියනවා නේ. 2008 ලෝක ආර්ථිකය කඩා ගෙන වැටුණා. Lehman Brothers, Goldman Sachs, Morgan Stanley, Merrill Lynch ඇමෙරිකාවේ මේ බැංකු එකක්වත් තවම හරියට ඇරලා නැහැ.

ගරු සුජීව සේනසිංහ මහතා
(*மாண்புமிகு சுஜீவ சேனசிங்க*)
(The Hon. Sujeewa Senasinghe)
ඒවා private බැංකු.[බාධා කිරීමක්]

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(*மாண்புமிகு பீலிக்ஸ் பெரேரா*)
(The Hon. Felix Perera)
බයිලා නොවෙයි, මේවා ඇත්ත. අපේ private ආයතන කඩා වැටිලාත් ඒගොල්ලන්ට සහන දීලා අපි ඒවා පවරා ගත්තා. සෙලාන් එක වැටුණා; අපි සහන දුන්නා.

ගරු සුජීව සේනසිංහ මහතා
(*மாண்புமிகு சுஜீவ சேனசிங்க*)
(The Hon. Sujeewa Senasinghe)
වැටුණේ නැහැ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(*மாண்புமிகு பீலிக்ஸ் பெரேரா*)
(The Hon. Felix Perera)
මොකද, වැටුණේ නැත්තේ? බිංදුවට බැස්සා. අපි ඒක පවරා ගත්තා. ඒ වාගේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඇත්තම කථා කරනවා නම්, අපි දන්නවා ඉන්දියාවත් එක්ක බලද්දී අද අපේ රටේ වෙළෙඳ ශේෂය වැඩි වී තිබෙන බව. අපි ඉන්දියාවෙන් බස් ගෙන්වනවා; දුම්රිය ගෙන්වනවා, three-wheelers ගෙන්වනවා. අපි ඉන්දියාවට මොනවාද export කරන්නේ? අපි චීනයට මොනවාද export කරන්නේ? මේ වෙළඳ පරතරය නැති කර ගන්න පුළුවන් ක්‍රමවේද අපි හැදුවොත්, වක්‍ර බදු වෙනුවට සෘජු බදු හොඳට ගත්තොත් අපට පුළුවන් ආර්ථිකය ගොඩ නඟන්න. අපි දන්නවා 1974 දී ලංකාවේ තිබුණු බදු ප්‍රතිපත්තිය ස්ව තක්සේරු ක්‍රමයක් කියා. මම බදු ගෙවන්න ඕනෑ නම්, මම ම තමයි බදු වටිනාකම තක්සේරු කර ගන්නේ. මම තක්සේරු කරලා, මම ම ගෙවන්න ඕනෑ. ඒ ස්ව තක්සේරු බදු ප්‍රතිපත්තිය නිසා අපේ රටට එන්න තිබෙන මුදල් ටික තවමත් කොහේ හෝ තැන්පත් වෙලා තිබෙනවාය කියන එක තමයි මගේ මතය. ඒක නිසා බදු ප්‍රතිපත්තිය හරියට ක්‍රියාත්මක කරන්න ඕනෑ. ස්ව තක්සේරු කරද්දී තමුන්ගේ හදවතින්ම නැහෙන අවශ්‍යතාවක් සේ සලකලා, උපයන මුදලට ගැළපෙන පරිදි බදු ගෙවීම තක්සේරු කර ගෙන, ගෙවීමට අපි සූදානම්ද කියන ප්‍රශ්නය මතු වනවා. ඒක තමයි ඇත්ත. තමුන්නාන්සේලා දන්නවා නේ ඉස්සර සුද්දාගේ කාලයේ බලු බද්ද කියා එකකුත් තිබුණු බව. අද ඒවා නැහැ නේ. අද රා ලබා ගැනීමට ගහක් මැද ගැනීමට අවකාශය සලසා දී තිබෙනවා. ඒක හොඳද, නරකද? එන්.එම්. පෙරේරා මැතිතුමාත් පොල් ගහක් මැද ගන්න අවසර දුන්නා. හේතුව, අද මත්පැන්වලින් මොනවාද වෙන්නේ කියලා දන්නවා නේ. අහිතකර මත්පැන් පානය කිරීමෙන් අද විශාල වශයෙන් මිනිසුන් ලෙඩ වෙනවා. ඇමෙරිකන් ඩොලර් මිලියන-

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
අර අල්ලපු containers දෙක කාගේද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(*மாண்புமிகு பீலிக்ஸ் பெரேரா*)
(The Hon. Felix Perera)
මා නම් දන්නේ නැහැ. ගිහිල්ලා අහ ගන්න ඕනෑ කාගේද කියලා.

ඇත්තම කියනවා නම් අපේ සල්ලි විශාල ප්‍රමාණයක් නාස්ති වෙලා යනවා. ඉන්දියාවෙත්, ලංකාවෙත් වෙළෙඳ පරතරය ඉතා භයානක විධියට දැන් වෙනස් වෙමින් යනවා. මත්පැන් ගැන කථා කරද්දී මා කියන්න කැමැතියි මේ කාරණය. අපට මත්පැන්වලින් බදු ආදායම එන්නේ කීයද? අපේ ලංකාවේ මත්පැන් අලෙවි සැල් වර්ග කිහිපයක් තිබෙනවා. එහි තොග වෙළෙඳ මධ්‍යස්ථානයට කියන්නේ රබ් 3 -බලපත්‍ර ක්‍රමාංකය- කියලා. ඒ යටතේ අලෙවි සැල් 59ක් තිබෙනවා. ඒ අලෙවි සැලකින් වාර්ෂික බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුව වශයෙන් කීයද ලැබෙන්නේ? රුපියල් ලක්ෂ 5යි; තොග වෙළෙඳාමට හම්බ වෙන්නේ රුපියල් ලක්ෂ 5යි. ඒ බලපත්‍ර ගාස්තු වැඩි කරන්න කියලා මා කියනවා. සිංගප්පූරුවේ නම් අවුරුදු දෙකෙන් දෙකට bars වෙන්දේසි කරනවා. ලංකාවේ දෙන්නේ පරම්පරාවට. ඊළඟට wine stores තිබෙනවා 1,078ක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ඇමතිවරු කී දෙනෙකුට තිබෙනවාද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(*மாண்புமிகு பீலிக்ஸ் பெரேரா*)
(The Hon. Felix Perera)
ඒකට ඉතින් කරන්න දෙයක් නැහැ.

දැන් බලන්න උදාහරණයක් වශයෙන් කිව්වොත් wine stores තිබෙනවා 1,078ක්. වාර්ෂික බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුව වශයෙන් කීයද ගන්නේ? මහ නගර සභා ප්‍රදේශවල රුපියල් ලක්ෂ 3යි. නගර සභා ප්‍රදේශවල රුපියල් ලක්ෂ 2යි. අනෙකුත් ප්‍රදේශවල රුපියල් 150,000යි. අද සේරම bars ටික supermarkets අරගෙන. ඒ අය ලබන අලෙවි ආදායම ඉතා ඉහළ මට්ටමක පවතිනවා. ඔවුන්ට මාසයකට රුපියල් ලක්ෂ 4ක්, 5ක් ගෙවනවා. ඒ රජයට ලැබෙන්න තිබෙන බදු ආදායම්. ඒවා ඒගොල්ලෝ බෙදා ගන්න ක්‍රමයක් හදා ගෙන. ඒවා කළමනාකරණය කරන්න කියලා මා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ඊළඟට උතුරු ප්‍රදේශය ගනිමු. අපේ රටේ හැම ප්‍රදේශයේම රා තැබෑරුම් වෙන්දේසි කරනවා. නමුත් උතුරු ප්‍රදේශයේ රා තැබෑරුම් වෙන්දේසි කිරීමක් නැහැ. දැන් උතුරු පළාත නිදහස් කරලා තිබෙනවා. ඒ නිසා ඒ ප්‍රදේශයේ පවත්වා ගෙන යන රා තැබෑරුම් වෙන්දේසි කරන්න. අපේ රටේ සමහර ප්‍රදේශවල සංචාරක කලාප තිබෙනවා. තල් ගහක් මැද ගන්න අවසර දුන්නාම, අපට පුළුවන් ඒ විෂයයට අදාළව ගම්මානයක් හදලා සංචාරකයන්ටත් පෙන්වන්න. මාතලේ පැත්තේ කුළුබඩු වර්ග වවලා පෙන්වන්න තිබෙනවා වාගේ පෙන්වන්න පුළුවන්. ඒ වාගේ කළමනාකරණ කාර්යයන් රාශියක් අපට කරන්න වෙනවා ආර්ථිකය හදා ගන්න.

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

අනෙක් කාරණය තමයි බදු ගෙවන අයට ඇති පිළිගැනීම. විශේෂයෙන්ම ඒගොල්ලන්ට වරප්‍රසාද ඕනෑ; සමාජ පිළිගැනීමක් ඕනෑ. අද සමාජයේ ඔවුන්ට පිළිගැනීමක් නැහැ. උදාහරණයක් ගනිමු. අපි කියනවා, සර්ප වෙදා කියලා. සර්ප වෙදා කියන්නේ සර්පයන්ට බෙහෙත් කරන කෙනෙකු නොවෙයි නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. සර්ප වෙදා කියන්නේ සර්පයෝ දෂ්ට කළාම බෙහෙත් කරන කෙනාට. නමුත් සමාජයේ පිළිගැනීම මොකක්ද? කැඩුම් බිඳුම් වෙද මහතා බැංකු කඩනවාද, ගෙවල් කඩනවාද? නැහැ. ශරීරයේ කැඩුම් බිඳුම්වලට වෙදකම් කරනවා. නමුත් ඔහොම තමයි අර්ථකථනය තිබෙන්නේ. මේ අර්ථකථන තිබෙන තුරු සමාජ පිළිගැනීමක් නැහැ. නියමිත පරිදි බදු ගෙවන අයට සහන දෙනවා නම්, වාහන permit එකක් දෙනවා නම්, නොයෙකුත් දේවල් දෙනවා නම් හොඳයි. ලක්ෂ පහකට බදු වශයෙන් ගෙවන්නේ සියයට හතරයි. මගේ මතකයේ හැටියට ලක්ෂ තිහෙන් හෝ පනහෙන් එහා තමයි සියයට 25ක් ගෙවන්න ඕනෑ වෙන්නේ. සියයට 25ක් ගෙව්වාට කමක් නැහැ. හැබැයි, සමාජයේ පිළිගැනීමක් තිබෙන්න ඕනෑ. බදු හරියාකාරව නොගෙවීම නිසා සෘජු බදු වෙනුවට වක්‍ර බදු ගන්න රජයට සිදු වෙලා තිබෙනවා.

තමුන්නාන්සේලා ඩීසල් ගැන කථා කරනවා. තව අවුරුදු ගණනාවකින් පෙට්‍රල් ඩීසල් වාගේ ඉන්ධන නැත්තට නැති වෙනවා නේ. අපේ හිටපු ඇමතිතුමා ඒ ගැන හොඳ අර්ථකථනයක් දුන්නා. අපි මොනවාද කරන්නේ? අපට හුළං ටික තිබෙනවා. අපට ජලය තිබෙනවා. අපි වෙනත් ක්‍රමවලින් මේක හදා ගන්න ඕනෑ. එහෙම නැතුව විවේචනය කරලා හරි යන්නේ නැහැ. ණය ගන්නේ මොකටද? අතිගරු ජනාධිපතිතුමා ඊයේ කිව්වා අපි ණය ගන්නේ කන්න නොවෙයි කියලා. අපි ණය ගන්නේ සංවර්ධන කටයුතු කරන්නයි. සංවර්ධනය කරපු පමණින් එක දවසකින් ප්‍රතිඵල ලැබෙනවා නම් මොනවා කරන්න බැරිද? මේවා දීර්ඝ කාලීනව යන්න ඕනෑ. තමුන්නාන්සේලා එදා අතිවිශාල වියදමක් දරලා මේ පාර්ලිමේන්තුව හැදුවා. අද ඒක පාඩුවක් වෙලා තිබෙනවාද? මන්ත්‍රීවරුන් ගණන 225ක් වුණායින් පස්සේ මේකේ අවශ්‍යතාව තව දුරටත් ඇති වුණාද, නැති වුණාද, මදි වුණාද, වැඩි වුණාද? ඒවා ගැන කල්පනා කරන්න ඕනෑ. එදා මහවැලිය හදද්දී අපිත් තමුන්නාන්සේලාව විවේචනය කළා, ඔව්වර ලොකු ව්‍යාපෘතියක් හදන්නේ මොකටද කියලා. එදා සිමෙන්ති කොට්ටය කීයද, අද සිමෙන්ති කොට්ටය කීයද? ඒවා තමයි අපි කල්පනා කරන්න ඕනෑ. එම නිසා අනාගතය වෙනුවෙන් කරන ආයෝජන පාඩුවක් විධියට සලකන ජනතා විමුක්ති පෙරමුණේ ඒ වැරදි ප්‍රතිපත්තිය අත හරින්න ඕනෑ. ඔබතුමන්ලාගේ වැරදි ප්‍රතිපත්තිය අත් හරින්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා කියන්නේ හොරකම් නොකර ඉන්න කියලාද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
නැහැ. හොරකම් නොකර ඉන්න නොවෙයි. ඔබතුමන්ලා අර බස් ගිනි තියපු ඒවා නිසාත් පාඩුවක් වෙලා තිබෙනවා. ඒ තුළින් ආර්ථිකය කඩා වැටීම නිසා පාඩුවක් වෙලා තිබෙනවා නේ. තමුන්නාන්සේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග ඇමති වෙලා ඉන්දෙද්දී එක වැවක් හදන්න උත්සව කීයක් තිබුණාද? අපිත් ගියා, තමුන්නාන්සේගේ උත්සවයක් බලන්න. දහස් ගණන් ගෙනැල්ලා, වැව කපලා, වැව හදලා, කෑම දීලා මොන විගඩමක් කෙරුවාද? දේශපාලන ප්‍රචාරය සඳහා ඒවා අවශ්‍යයි. අපි කරන දේවල් මිනිස්සු දැන ගන්න ඕනෑ. පිං කැටෙකට සල්ලි දාන්නේ කොහොමද? පිං කැටෙට සද්දෙට සල්ලි දාන්න ඕනෑ. පිං කැටෙට රුපියල් 50, 100 කොළ දාන්නේ නැහැ නේ. රටක ආර්ථිකය නංවද්දී ජනතාව දැනුවත් කරලා, ජනතාව ශක්තිමත් කරලා කටයුතු කරන්න ඕනෑ.

මම ඊයේ ගියා අධිවේගී මාර්ගය බලන්න. මුලින් කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ වැඩ කළේ කොරියන් සමාගමක්. ඒක වරද්දා ගත්තා. වරද්දා ගත්තාට පස්සේ තමයි චීනයට දෙන්න සිදු වුණේ. චීනය නොවෙයි ඉස්සෙල්ලාම ඉදි කිරීම් කෙරුවේ. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත්, මමත් ඒ පාරේ සංචාරය කෙරුවා. ගිහිල්ලා බලන්න පාලම් කීයක් දාලා තිබෙනවාද කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කවදාද ගියේ?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගිය ඉරිදා ගියේ. පාලම් කීයක් දාලා තිබෙනවාද කියලා බලන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මත්තල ගුවන් තොටු පොළට ආවේ නැහැ?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මම මත්තලටත් ගියා, එතැනටත් ගියා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමා පැහැදිලිව කිව්වා, බැසිල් ඇමතිතුමා මත්තල ගුවන් තොටු පොළ විවෘත කරන එකට ආවේ නැත්තේ එතුමා කටුනායක අධිවේගී මාර්ගය බලන්න ගිය නිසා කියලා. දැන් ඔබතුමා කියනවා ඒක බලන්න ගියේ සතියකට කලින් කියලා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
එදා නොගිය කොටසක් බලන්න එතුමා ගියා. [බාධා කිරීමක්] අධිවේගී මාර්ගය තවම හදලා ඉවර නැහැ නේ. අගෝස්තු මාසයට ඉස්සෙල්ලා හදන්න ඕනෑය කියලා තීන්දුවකට ඇවිල්ලා තිබෙනවා. එතකොට තමුන්නාන්සේලාත් ඒකේ යන්න කෝ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තමුන්නාන්සේ බැලුවේ කොහේද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මම බැලුවේ කෙළවර. මේ බදු ප්‍රතිපත්තිය තමුන්නාන්සේලා විවේචනය කිරීම ගැන අපි ඉතාමත් කනගාටු වෙනවා. මේ ලෝකයේ තිබෙන ආර්ථික අවපාතය කොයි කාටත් තේරුම් ගන්න පුළුවන් නේ. මේ ආර්ථික අවපාතය නිසා ලෝකයේ රටවල ආර්ථිකය වැටිලායි තිබෙන්නේ. නමුත් අපි ඒ තරමටම වැටුණේ නැහැ. ග්‍රීසිය ගැන බලන්න, තායිලන්තය ගැන බලන්න,

ඇමෙරිකාව ගැන බලන්න, ස්පාඤ්ඤය ගැන බලන්න, අනෙක් රටවල් ගැන බලන්න. ඒ විධියට හැම රටකම ආර්ථිකය වැටී ගෙන, වැටී ගෙන යනවා. නමුත් අපි පොහොර සහනාධාරය දීමෙන් අපේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කරලා තිබෙනවා. පොහොර සහනාධාරය දෙන්න රජයට කීයක් වියදම් වෙනවාද? අධ්‍යාපනය සඳහා රජයට කීයක් වියදම් වෙනවාද? කල්පනා කරලා බලන්න. පිට රටින් බෙහෙත් ගෙනෙන්න විතරක් ඩොලර් කෝටි 500ක් අපි වියදම් කරනවා. අධ්‍යාපනය වැඩියෙන් දීලා සාක්ෂරතාව සියයට 97ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. කවුරුවත් මේවා ගැන කල්පනා කරන්නේ නැහැ නේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
සාක්ෂරතාව වැඩි වෙලා නැහැ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(මාණ්පුමිකු பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
වැඩි වෙලා තිබෙනවා. හැම කෙනකුටම ලියන්න, කියන්න පුළුවන්. ඔබතුමා නීතිඥයෙක් වුණාට අනික් අයටත් ලියන්න, කියන්න පුළුවන්. ඔබතුමාට නඩු එන්නේ නැත්තේ ඒ මිනිසුන්ට මොළය තිබෙන නිසා. "මම වැරදිකාරයා"යි කියා නොකියන්න ඒ ගොල්ලන්ට මනසක් පහළ වෙලා තිබෙනවා. "මා වැරැද්දක් කළේ නැහැ"යි කියන හැඟීම තිබෙන නිසා ඒ ගොල්ලෝ නීතිඥයෙක් අල්ලා ගන්නවා. එම නිසා තමයි ඔබතුමාටත් වැඩක් තිබෙන්නේ. එහෙම නැත්නම් ඔබතුමාත් වේළෙනවා.

මා ඔබතුමාට මේ පිළිබඳව යමක් කියන්න ඕනෑ. අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමාට සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය භාර දීලා තිබෙනවා. සීනි ගෙන්විය යුතු ප්‍රමාණය කොපමණද කියා එතුමා කියා දුන්නා. [බාධා කිරීමක්] එතුමා අනිවාර්යයෙන්ම ඒ කටයුත්ත කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමා සීනි ගෙන්වනවාද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(මාණ්පුමිකු பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
අනිවාර්යයෙන්ම එතුමා ඒ කටයුත්ත කරනවා. ලංකාවේ සීනි නිෂ්පාදනය කරනවා. උක් ගස්වලින් සීනි නිෂ්පාදනය කරනවා. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා වැඩිපුරම දැකලා තිබෙන්නේ එතුමා නිදි කිරන එකයි.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(මාණ්පුමිකු பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
නැහැ, නැහැ. එතුමා නිදි කිරන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ පක්ෂය තමයි වැඩියෙන්ම නිදි කිරන්නේ. [බාධා කිරීමක්] එතුමා සුදු සීනි තමයි වැඩියෙන් හදන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමන්ලා මොනවා කථා කළත්, ඇත්ත වශයෙන්ම කියනවා නම් අපේ රටේ පැවැති යුද්ධය දිනපු නිසා අද මානසික සහනයක් ඇති වෙලා තිබෙනවා නේ. මා අද උපාධි ප්‍රදානොත්සවයකට සහභාගි වුණා. දැන් ලෝකයේ 10 දෙනකුගෙන් එක් කෙනකුට මානසික ආතතිය තිබෙනවා. [බාධා කිරීමක්] කොහේද? ලංකාවේද? කවුද ඕවා කරන්නේ? ඔය NGOලා හරහා ඕවා කරන්නේ. තමුන්නාන්සේලාගේ ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමාගෙන් අහන්නකෝ, මොකද කරන්නේ කියලා. [බාධා කිරීම්] අහන්නකෝ, ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමාගෙන්.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ජීනීවා ගිහින් කේලාම් කියලා, කේලාම් කියලා රට විනාශ කළා. ඇත්තම කියනවා නම් ඒ වාගේ දෝහියෝ ඉන්නේ තමුන්නාන්සේලාගේ පැත්තේ. [බාධා කිරීමක්] මෙදා පාර නත්තලට ගිහින් එල්ටීටීඊ එක බලලා ආවා. එල්ටීටීඊ එක බලන්න ගියා. එල්ටීටීඊ එකට තෑගිත් අරගෙන ගියා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ පක්ෂයේ නායකයෙක්. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දෙමළ ඩයස්පෝරාවේ බලාපොරොත්තුව තිබෙන්නේ දේශපාලන විසඳුමක් නොවෙයි, කෙසේ හෝ වෙනම රාජ්‍යයක් ලබා ගන්නයි. වෙනම රාජ්‍යයක් ලබා ගැනීමට කරන මේ ප්‍රයත්නයේදී අපේ අය එක්සත් වන්න ඕනෑ. අපේ අය කල්පනා කරන්න ඕනෑ, මේ දිනා ගත්ත නිදහසින් රට සංවර්ධනය කරන්න නම් අනාගත ආයෝජනයක් කරන්න ඕනෑය කියලා. උදාහරණයක් වශයෙන් අපි අධ්‍යාපනයට වියදම් කරනවා. මේ රටේ අධ්‍යාපනයට රුපියල් මිලියන 1,000කට වඩා වියදම් කරනවා. තමුන්නාන්සේලාට කියන්න පුළුවන් ඒක වියදමක් කියලා. අධ්‍යාපනයට වියදම් කරන එක වියදමක් කියලා තමුන්නාන්සේලාට අර්ථ කථනය කරන්න පුළුවන්. ඒක ආයෝජනයක්. [බාධා කිරීම්] රුපියල් මිලියන 1,025ක් වියදම් කරන එක වියදමක්ද? [බාධා කිරීම්] අධ්‍යාපනයෙන් කොහොමද ගහන්නේ? [බාධා කිරීම්] ආණ්ඩුව කොහොමද හොරකම් කරන්නේ? ආණ්ඩුව හොරකම් කරන්නේ නැහැ. [බාධා කිරීම්] කවුද ඒ?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමතිවරු.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(මාණ්පුමිකු பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
නම් කියන්නකෝ කවුද කියලා. නම් කියන්න කවුද කියලා. [බාධා කිරීම්] කවුද, කවුද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආණ්ඩු පක්ෂයේ සියලු දෙනාම.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආණ්ඩුවෙන් ඔබතුමාට කොපමණ ගෙවන්න තිබෙනවාද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(මාණ්පුමිකු பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මට?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආණ්ඩුවෙන් ඔබතුමාට කොපමණ ගෙවන්න තිබෙනවාද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මට ගෙවන්න තිබෙන එක මා බලා ගන්නම්කෝ. ඔබතුමා කරදර වෙන්න ඕනෑ නැහැ නේ. [බාධා කිරීම්] මට ගෙවන්න කිසි දෙයක් නැහැ. මට ඇති සමාගමක් නැහැ. එම නිසා -[බාධා කිරීම්] අද කථාවට බොහොම බාධා සිද්ධ වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කියන්න කැමැතියි, පොල් අරක්කුවල තමයි මෙතනෝල් නැත්තේ කියලා. සාමාන්‍යයෙන් මෙතනෝල් මිලිලීටර් 5,000කට -[බාධා කිරීම්] මෙතනෝල් තමයි නැත්තේ. එතනෝල් තිබෙන්න ඕනෑ. එතනෝල් සහ මෙතනෝල් කියා කොටස් දෙකක් තිබෙනවා නේ. එතනෝල් තිබෙන්න ඕනෑ. මෙතනෝල් නැහැ. තමුන්නාන්සේලාට මා ඒකත් කියලා දෙන්නම්. C_2H_5OH කියන එක තමයි එතනෝල්වල chemical formula එක. ඒක දැන ගන්න. [බාධා කිරීමක්] නැහැ. එතනෝල්වල විද්‍යාත්මක සූත්‍රය ඒකයි.

ඊළඟට ඇමෙරිකාවේ මේවා පෙරන්නේ cornවලිනුයි, -

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගැලරියේ පාසල් ළමයි ඉන්නවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කමක් නැහැ. ළමයි හිටපුදෙන්. [බාධා කිරීම්] ලංකාවේ රාවලින් පෙරන එකට ඇත්ත වශයෙන්ම මෙතනෝල් එන්නේ නැහැ.

"රා" විතරයි හොඳම දේ. ඒ නිසා තමයි අපි ගහක් මැද ගන්න අවස්ථාව දෙන්නේ. බොන්න, රා කෝප්පයක්. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි නොදන්නා කාරණයක් තිබෙනවා. රටවල් ධාන්‍ය නිෂ්පාදනය කරනවා නේ. ධාන්‍ය නිෂ්පාදනය කළාම දීර්ඝ කාලයක් තියා ගන්න බැහැ. අතිරික්ත නිෂ්පාදනයක් ආවාම, ධාන්‍ය ටිකක් කල් ගියාම, ඒවායේ ගුල්ලෝ හැදෙනවා. තවත් නොයෙකුත් දේවල් හැදෙනවා. කොහොම ගබඩා කෙරුවත් පෝෂණය අඩු වනවා. ඒ නිසා බොහෝ දියුණු රටවල් ඒවායෙන් spirit හදලා තියා ගන්නවා. අරක්කු පරණ වෙන්න, වෙන්න ගණන් නේ. ඇත්තටම එහෙමයි. වයින් පරණ වෙන්න, වෙන්න ගණන්. If it is 20 years old or 35 years old, එතකොට ගණන වැඩි වනවා. [බාධා කිරීමක්] සමහර රටවල් පවතින්නේ මේ ක්‍රමවේදවලින්. තමුන්නාන්සේලාට මේක වැරැදි වෙන්න පුළුවන්. අපි මෝඩයෝ කියලා හිතන්න එපා. සමහර විට මේක වැරැදි වෙන්න පුළුවන්. නමුත් බොහෝ රටවල-

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - சீனிக் கைத்தொழில் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Sugar Industry Development)
ගරු ෆිලික්ස් පෙරේරා ඇමතිතුමනි, රනිල් වික්‍රමසිංහ මහත්තයාත් එහෙමයි. පරණ වෙන්න, පරණ වෙන්න ගණන් යනවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගණන් යනවා නේ? ඒක නේ එතුමාව ඉවත් කරලා දමන්නේ නැත්තේ. ආරක්ෂා කරලා තිබෙනවා, vat එකක දමා ගෙන.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පරණ කරපු කෙනාම තමයි ඒ කියන්නේ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඇමෙරිකාවේ මේක කරන්නේ cornවලින් සහ rye කියන ධාන්‍යවලින්. ලංකාවේ මේක කරන්නේ "රා"වලින්. මෙතනෝල්වලින් තමයි එක එක සුවඳ විලවුන් හදන්නේ. Spirit, spray කරන paints කියන මේ ඔක්කොම හදන්නේ මෙතනෝල්වලින්. ඇත්ත වශයෙන්ම ආර්ථික වශයෙන් අතිරික්ත නිෂ්පාදනයක් ලැබුණාම ඒ නිෂ්පාදන ආරක්ෂා කර ගන්න නම් මේ ක්‍රම තිබෙන්න ඕනෑ. බොහෝ දෙනෙක් කියනවා, මේක වැරැදියි කියලා. නමුත් ආර්ථික පැත්තෙන් වෙන රටවල් කළමනාකරණය කරන්න මේවාත් උපයෝගී කර ගන්නවා. දැන් කැසිනෝ බලන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Spirit ගෙනැල්ලා අරක්කු හදන්නේ කවුද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
Spirit ගෙනැල්ලා අරක්කු හදන එක වැරැදියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
කවුද කරන්නේ?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කවුරු හරි කරනවා නම් ඒක වැරැදියි. වැරැදි දේ වැරැදියි. වැරැදි දේ වැරැදියි කියන එක කියන්න ඕනෑ නේ.

ජපානය, බුරුමය, වියට්නාමය කියන ඔය ඔක්කොම රටවල් කරන්නේ මොකක්ද? ඒ රටවලුත් අතිරික්ත නිෂ්පාදනවලින් spirit හදලා තියා ගන්නවා. අද සමහර රටවල ඒ වාගේ ක්‍රම තිබෙනවා. අපේ රටවල ගොවියාට අතිරික්ත නිෂ්පාදනයක් තිබුණාම, මිල පහළ ගිහිල්ලා දෙවැනි වතාවේ එම ගොවියා වගා කරන්නේ නැහැ. ඒ රටවල එහෙම නොවෙයි. ඒ අතිරික්ත නිෂ්පාදනය සුරක්ෂිත කරන්න, අතුරු නිෂ්පාදන කරන්න ක්‍රමවේද තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනෙක් කාරණය වන්නේ, තාක්ෂණික බදු ක්‍රමයක් හදා දීලා දැන් තවත් බදු සහනයක් දීලා තිබෙනවා. ඒකෙන් තාක්ෂණික දේවල්වලට ලොකු සහනයක් ලැබෙනවා. ITPPO system එකෙන් telecommunicationවලට බදු අඩු කරලා තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා, දැන් බොහෝ ව්‍යාපාරිකයෝ බඩු මිලදී ගන්නේ mobile telephone එක on කරලායි. Mobile telephone එක on කෙරුවොත් දඹුල්ලේ එළවලු මිල තිබෙනවා; කොළඹ එළවලු මිල තිබෙනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
දැන් පෙන්වන්න, මිල ගණන්.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මා ළඟ දැන් mobile telephone එක නැහැ. එළියට එන්න, ඕනෑ නම් ඒ මිල ගණන් මම පෙන්වන්නම්. මාළු මිල තිබෙනවා. දඹුල්ලේ එළවලු මිල තිබෙනවා. තඹුත්තේගම එළවලු මිල තිබෙනවා. [බාධා කිරීම්] මේ තාක්ෂණයට බදු සහන ලබා දෙන්න ඕනෑ. මේ විහිළුවක් නොවෙයි. එළියට ආවොත් ඇත්තටම මම ඒ මිල ගණන් පෙන්වන්නම්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Minister, you have one more minute.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
අද මගේ වෙලාව කෑවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. (Dr.) Harsha De Silva, what is the point of Order?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එතුමා අසත්‍ය ප්‍රකාශ කරනවා. Sir, the Hon. Minister is misleading the House. He says that they introduced the vegetable prices into mobile phone networks. I am the one who did it.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. You carry on, Hon. Minister.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මොකක්ද කියන්නේ?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මමයි ඒ ක්‍රමය පටන් ගත්තේ. ආණ්ඩුව නොවෙයි. අවුරුදු අටකට කලින් මම තමයි ඒක කළේ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔබතුමා කරලා තිබෙනවාද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම තමයි කළේ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඉතින් බොහොම හොඳයි. ඒක නේන්නම් මම කිව්වේ, mobile telephone එකේ තිබෙනවා කියලා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම තමයි කළේ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කවුරු කෙරුවාද මම දන්නේ නැහැ, mobile telephone එකේ තිබෙනවා කියලායි කිව්වේ. ඔබතුමා කලබල වන්නේ ඇයි?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අනුන්ගේ ළමයින්ට උප්පැන්න දෙන්න හදන්න එපා, ගරු ඇමතිතුමනි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය, ඔබතුමිය මා ලඟට එන්න ඕනෑ නැහැ. හර්ෂ මන්ත්‍රීතුමා ළඟට ගිහිල්ලා බලා ගන්න. මා ළඟට එන්න ඕනෑ නැහැ. අර රම්බෝ මන්ත්‍රීතුමා ළඟට ගිහිල්ලා බලා ගන්න. වෙලාව අවසන් නිසා මගේ කථාව මෙතෙකින් නතර කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.09]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා බොහොම සන්තෝෂ වනවා අපේ ජොෂ්ඨ ඇමතිවරයකු වන - ජොෂ්ඨ නොවෙයි, ජ්‍යෙෂ්ඨ වෙන්න ඉන්න. වැඩ පෙන්වන්න පෙන්වන්න ජ්‍යෙෂ්ඨ වනවා. ඒකයි සිදු වෙන්නේ- ෆිලික්ස් පෙරේරා ඇමතිතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්නට ලැබීම ගැන. විශේෂයෙන්ම අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් විශාල ගණනක් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් වෙලා තිබෙනවා. මේ හේතුව මත සමහර කාරණා පිළිබඳව මා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් අද රට තුළ ආර්ථික වශයෙන් ඇති වෙලා තිබෙන ප්‍රශ්න ගණනාවක් ගැන මූලික අවධානය යොමු කරවන්න මා බලාපොරොත්තු වනවා.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

පළමුවෙන්ම වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බඳු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්න මා කැමැතියි. විශේෂයෙන්ම එම බදු සංශෝධනය කිරීමෙන් සිදු වන්නේ, බනිජ තෙල් මෙහෙයුම්වලදී ගබඩා කිරීම, සකස් කිරීම, අලුත්වැඩියා කිරීම, සේවා කිරීම හෝ අපනයනය කිරීම සඳහා භාවිත කිරීම සඳහා බන්ධිත පහසුකම් ඇති උපකරණ, මෙවලම්, ද්‍රව්‍ය, පාරිභෝගික වරාය හා ගුවන්තොටුපල බද්දෙන් නිදහස් කිරීමයි. එක පැත්තකින් රජයට මෙයින් වාසියක් ලැබෙනවා නම් කමක් නැහැ. හැබැයි, මට තේරෙන හැටියට නම්, හම්බන්තොට වරායේ අලුතින් හදන්නට හදන තෙල් ගුදම්, නැත්නම් ඒ අලුත් ව්‍යාපෘතිවලට අදාළ ආයෝජන ආදායම් බද්දෙන් නිදහස් කිරීමේ වැඩ පිළිවෙළකට තමයි මේ ආණ්ඩුව යන්නේ. ඇත්ත වශයෙන්ම අලුත් ආයෝජන එනකොට, ඒ ආයෝජනවලට අවශ්‍ය පහසුකම් ටික සූදානම් කරන්න තමයි මේ වැඩ පිළිවෙළ සකස් කරන්නේ කියලා මා විශ්වාස කරනවා. ඒක නැහැ යි කියලා කවුරු හරි කියනවා නම්, කරුණාකරලා මට මේ අවස්ථාවේ උත්තරයක් දෙන්න. ඒ උත්තරය වැදගත් වෙයි කියලා මා විශ්වාස කරනවා. හම්බන්තොට වරායෙන් සූදානම් වුණේත් නැව්වලට තෙල් සැපයීම පටන් ගන්නයි. ඒක තමයි මූලික අරමුණ වුණේ. නමුත් ඒ වැඩ පිළිවෙළ පැත්තකින් තියලා, වරායට කෙළින්ම නැව් ගෙන්වන වැඩ පිළිවෙළකට ආණ්ඩුව ගියා. එසේ නැව් ගෙන්වීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වූණත්, එහි ප්‍රතිඵලය වුණේ මොකක්ද? ඒ වරායට අවුරුද්දකටම ඇවිල්ලා තිබෙන්නේ නැව් 25ක් විතර. ඒ ආපු නැව් ගැනත් සොයලා බලපුවාම, මම හිතන විධියට වැලි ගෙනාපු නැව් 10ක් විතර තිබෙනවා. අනෙක් ඒවාත් ආර්ථික වශයෙන් වැදගත් වන ඒවා නොවෙයි. කොළඹ වරායට බාන්න තිබෙන වාහන හම්බන්තොට වරායට අරගෙන ගිහිල්ලා බාලා, හම්බන්තොටින් ආපසු කොළඹට ගෙනෙනකොට සාමාන්‍යයෙන් රුපියල් 15,000කින් විතර ත්‍රී වීල් එකක මිල වැඩි වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් පොඩි කාර් රථයකට රුපියල් 60,000ක් විතර වැඩි වෙලා තිබෙනවා. ඉතින් කොළඹ වරායක් තියෙද්දී, මේ වාහන ටික හම්බන්තොට වරායට අරගෙන ගිහිල්ලා, හම්බන්තොටින් ආපසු කොළඹට ගෙන ඒමට කල්පනා කරන මොළයක් කවුරුහරි පුද්ගලයෙකුට තිබෙනවා නම්, ඒ පිළිබඳව නැවත දෙපාරක් හිතන්න සිද්ධ වනවා.

ඊයේ විවෘත කරපු මත්තල ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් ගත්තොත්, ඒකම තමයි සිද්ධ වෙමින් තිබෙන්නේ. ඒ ගුවන් තොටුපොළ විවෘත කරපු ගමන් එක පාරටම මම ඒ ගැන දොස් කියනවා නොවෙයි. මේ වැඩ කරන එක හොඳයි. හැබැයි කරන්න තිබෙන්නේ මේවා නොවෙයි. මම ඒකයි හැම වෙලාවේම කියන්නේ, ජනතාව ඉල්ලන සංවර්ධනය එකක්, ආණ්ඩුව බලෙන් පටවන සංවර්ධනය තව එකක් කියලා. කවදාවත් මේ රටේ මිනිස්සු කිව්වේ නැහැ, හම්බන්තොට වරායක් ඉදිකරලා, නැව් ටික එතැනට ගෙනෙන්න කියලා. හැබැයි, ආණ්ඩුවක් විධියට තමුන්නාන්සේලා එහෙම තීන්දුවක් ගත්ත එක හොඳයි. ඒකට කමක් නැහැ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මෙකයි. කවුද මේ මුදල් සම්බන්ධයෙන් වගකීම භාර ගන්නේ? මේ ආයෝජන වෙනුවෙන් අපේ රටේ අභිංසක දුප්පත් අම්මලා, තාත්තලාගේ දරුවන්ට, අනාගත පරම්පරාවට තව අවුරුදු 30,40ක් යනතෙක් මේ ණය ගෙවන්න සිද්ධ වන තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා.

මත්තල ගුවන් තොටුපොළ ගත්තාම, මත්තල ගුවන් තොටුපොළෙන් ලාභ ලබන විධියක් ගැන මේ ආණ්ඩුව කල්පනා කරලා තිබෙනවාද? මම පසු ගිය සතියේ පැවැති COPE එකේදීත් මේ ගැන ප්‍රශ්න කළාම කිව්වේ, 2026 වසර වනකොට මත්තල ගුවන් තොටුපොළෙන් ලක්ෂ දහයක සෙනඟක් එහාට මෙහාට කරන්න බලාපොරොත්තු වනවා කියලා යි. 2026 දී ලක්ෂ 10ක සෙනඟක් මත්තල ගුවන් තොටුපොළෙන් යවන්න බලාපොරොත්තු වනවා. තවම 2013 වසර ගත වෙන්නේ. 2013 වසරේ ඉඳලා තව අවුරුදු 10කුත් ගිහිල්ලා, තවත් අවුරුදු 03ක් ගියාම ලක්ෂ 10ක සෙනඟක් මත්තල ගුවන් තොටුපොළෙන් එහා මෙහා යවන්න බලාපොරොත්තු වනවා.

අපි දන්නේ නැහැ ඒක ඉෂ්ට වෙයිද නැද්ද කියලා. ක්‍රියා දාමය ඒකයි. හැබැයි, අපි ඒකට ගෙවන්න හදන මුදල කොච්චරද? ඒක තමයි අපි බලන්න ඕනෑ. දැන් බලාපොරොත්තු වෙනවා වසරකට ගුවන් ගමන් වාර 30,000ක්. වසරකට ගමන් වාර 30,000ක් බලාපොරොත්තුවක් තියා ගෙන මේ වැඩ පිළිවෙළ සකස් කරනවා කියලා තමයි මේ ගොල්ලෝ කිව්වේ. 30,000ක් නොවෙයි, 3000ක් වෙන්න ඇති. කොහොම ඒ ගමන් වාර ක්‍රියාත්මක කරනවාද කියලා මම දන්නේ නැහැ. නමුත් දළ වශයෙන් ගත්තාම එක දිනකට ගමන් වාර 82ක් එහාට මෙහාට යන්න ඕනෑ. ඒ කියන්නේ ගුවන් යානා 41ක් එන්න ඕනෑ. 41ක් ආපසු යන්න ඕනෑ. දැනට තිබෙන තත්ත්වය බැලුවාම කටුනායකට දිනකට ගුවන් යානා 65ක් එනවා; ගුවන් යානා 65ක් යනවා. මේක තමයි කටුනායක තිබෙන තත්ත්වය. කටුනායක ගුවන් තොටුපොළට ශ්‍රී ලංකන් එයාර්ලයින් එකේ ගුවන් යානා 35 වතාවක් එනවා. ඕතිහාද් එයාර් එක හය වතාවක් යනවා. ඒ අනුව, දවසකට එහාට මෙහාට ගමන් කරන ගුවන් යානා 65න් 41ක්ම ශ්‍රී ලංකන් එයාර්ලයින් එකේ ගුවන් යානා සහ ඕතිහාද් එයාර් එකේ ගුවන් යානා. කටුනායක තත්ත්වය ඒකයි. මම මේ කියන්නේ අද තත්ත්වය. ශ්‍රී ලංකන් එයාර්ලයින් සහ ඕතිහාද් එයාර් කියන ආයතන දෙකේ ගුවන් යානා 41ක් කටුනායක සිට ක්‍රියාත්මක වෙනවා. ඒවා අපේ ලංකාවේම ගුවන් සමාගම් දෙකක යානා. ඉතිරි ගුවන් යානා 24 තමයි අනෙක් රටවලින් එන ඒවා. යම්කිසි විධියකින් අපට ලාභයක් ලැබෙනවා නම් අන්න ඒ හරහා තමයි අපට ලාභයක් ලැබෙන්නේ. මේ කටුනායක තත්ත්වය. ඒ අතර ඉන්දියානු සමාගම්වල ගුවන් යානා දෙකක් එනවා. එයාර් ඉන්දියා සමාගම, එයාර් ඉන්දියා එක්ස්ප්‍රස් එකේ ගුවන් යානා. ඒ ගොල්ලන්ගේ ගුවන් යානා එන්නේ දිනකට එක වතාවයි. කටුනායකට ජාත්‍යන්තර ගුවන් සමාගම්වලට අයත් ගුවන් යානා 21යි එන්නේ. ඉන්දියන් එයාර්ලයින්-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එයාර් ඉන්දියා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එයාර් ඉන්දියා එක දැන් නැහැ නේ. මේ විධියට බැලුවාම ගුවන් සමාගම් 20න් 9යි අපේ රටට එන්නේ. ඒක සාමාන්‍යයෙන් තිබෙන ගුවන් සමාගම්වලින් අඩකටත් අඩු තත්ත්වයක්.

ඒ වාගේම වසරකට කටුනායකට යන එන මහී සංඛ්‍යාව මිලියන හයයි. ඒ මිලියන හය සඳහා ලංකාවේ කටුනායක ගුවන් තොටුපොළේ terminals හතරක් තිබෙනවා. හීතඋ ගුවන් තොටුපොළ ගත්තොත් වසරකට යන එන මහීන් සංඛ්‍යාව මිලියන 65ක්. ඒ අය සඳහා terminals හයක් තිබෙනවා. මත්තල ගුවන් තොටුපොළෙන් මහීන් මිලියන එකක් බලාපොරොත්තු වෙනවා නම්, -ඒ දින වකවානු මම දන්නේ නැහැ - ඒ මිලියන එක වෙනුවෙන් අපි රුපියල් කෝටි 2646ක් මත්තලට වියදම් කරනවා. ජනාධිපතිතුමා පොඩි කාලයේ හිතන්න ඇති කවදා හරි දවසක එතුමා තමන්ගේ ගමේ ගුවන් තොටුපොළක් ඉදි කරනවා කියලා. එහෙම කළා නම් කමක් නැහැ. ඒක හොඳයි. මම සංතෝෂ වෙනවා ඒකට. එතුමා පොඩි කාලයේ හිතන්න ඇති මම නායකයෙක් වුණොත් කවදා හරි මත්තලින්-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා මට විනාඩියක් දෙන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි, ඔබතුමා කියන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා කියන ගණන් හුහක් වැරදියි. කොහොම වුණත් ලංකාවට දෙවැනි runway එකක් හදන්න ඕනෑ. කටුනායක හරි, ඔබතුමාට උදව්වක් හැටියට මම මේ කියන්නේ. ඒ දෙවැනි runway එකට යන වියදම කොහේ හැදුවත් අපට දරන්න වෙනවා. ඒ නිසා ඒක අයින් කරලා කියන්න කොච්චර වියදම් වනවාද කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි. මම මෙහෙම කියන්නම්. දෙවැනි runway එක ගැන මම මෙහෙම කියන්නම්. මම ඔබතුමාට මෙන්න මෙහෙම තර්කයක් ගෙනාවොත්, ඔබතුමා ඒකට එකඟ වෙනවාද කියන්න. අද ලංකාවේ [බාධා කිරීමක්] දෙදෙනෙකුට ඉඩ දෙන්න බැහැ. ලංකාවට දෙවැනි runway එකක් අවශ්‍යයි කියමු. මේ එන -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ ගැන වාද විවාද නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි, වාද විවාද නැහැයි කියමු.

මේ සංචාරක ව්‍යාපාරය තුළින් දැනට එන්නේ ලක්ෂ 10යි. ලක්ෂ 10ටත් අඩුයි. ඇමෙරිකාවේ, එංගලන්තයේ ඉන්න අපේ දෙමළ ජනතාව ලංකාවට ඇවිල්ලා යාපනයට යන එකත් ගණන් ගන්නේ සංචාරකයින් විධියටයි. ඒ වාගේම මෙහෙට ඇවිල්ලා ආපසු transit යන අයත් සංචාරකයින් විධියටයි ගණන් ගන්නේ. ඒ ඔක්කෝම එක්ක ගණන් බැලුවාම ලක්ෂ 10යි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
2016 වන කොට අපේ අරමුණ ලක්ෂ-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, ඔය කථාවම තමයි හම්බන්තොට වරාය හදන කොටත් කිව්වේ. මොකක්ද විමල් වීරවංශ මහත්තයා කිව්වේ? නැව් 400ක් යනවා කිව්වා, හම්බන්තොට pass කරලා. අද අඩුම තරමින් නැව් 4ක්වත් වරායට ගෙන්වා ගන්න පුළුවන් වෙලා තිබෙනවාද? අඩුම තරමින් එක දවසකට එක නැවක්වත් ගෙන්වා ගන්න තමුන්නාන්සේලාට පුළුවන් වෙලා තිබෙනවාද? [බාධා කිරීමක්] ඒක තමයි මම කියන්නේ. මේ යන වියදම හොයා ගන්න යම් කිසි විධියේ ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. ඒකයි මම කියන්නේ. SriLankan Airlines එකේ සභාපතිතුමා interview එකක් දීලා කියා තිබෙනවා, තල්මසුන් බලන්න පුළුවන්, යාල වනෝද්‍යානය බලන්න පුළුවන්, මේ වාගේ ගොඩක් කාරණා නිසා සංචාරකයින් දකුණට ගෙන්වා ගන්න පුළුවන් කියලා. ඒක හොඳයි. හැබැයි ඔබතුමන්ලා දැන ගන්න ඕනෑ අද-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාගේ කාලයේ තමයි මත්තලට සැතපුම් දෙකක් එහා- [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි, හරි. අපි බලාපොරොත්තු වුණේ ජාත්‍යන්තර- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඔබතුමා අහගෙන ඉන්නකෝ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ඥානය ගැන මම බොහොම සන්තෝෂ වනවා. ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. තව airport එකක් හදා ගන්න උවමනා කරනවා නම් domestic airport එකක් හදා ගන්න තිබුණා. දැන් අද මොකක්ද ඔබතුමන්ලා කරන්නේ? අපට කියන්නේ මත්තලින් බැහැලා ආපසු කොළඹට එන්න කියලායි. අපි සිංගප්පූරු යන්න දැන් මත්තලට යන්න ඕනෑ. සාමාන්‍යයෙන් පැය 3කට කලින් airport එකේ ඉන්න ඕනෑ. එතකොට මෙහේ ඉඳලා highway එකේ ගියත් හම්බන්තොටට යන්න දැනට පැය තුනහමාරක් යනවා. එහෙම බලන කොට අපි පැය 08කට කලින් මෙහෙන් යන්න ඕනෑ, හම්බන්තොටට යන්න. මීට කලින් අපට මෙහේ ඉඳලා කටුනායකට පහසුවෙන් යන්න පුළුවන්කම තිබුණානේ. දැන් මොකක්ද මේ වෙලා තිබෙන්නේ? අනික, හැම මිනිහෙකුටම එහෙම යන්න බැහැ. දැන් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අද රත්මලානේ ඉඳලා මත්තලට යන්න රුපියල් 3,500ක්, 4,000ක් අය කරන පොඩි jet පාවිච්චි කරන්න ඔබතුමන්ලාට සිද්ධ වෙලා තිබෙනවා. මොකක්ද, මේ ඔබතුමන්ලා කරන්නේ? දැන් අපට ඇමෙරිකා යන්න, සිංගප්පූරු යන්න, යුරෝපයට යන්න ඕනෑ වුණාම රත්මලානට ගිහිල්ලා රත්මලානෙන් බඩු ටිකත් pack කරගෙන මත්තලට යන්න ඕනෑ. දවස් එකහමාරකට කලින් ලෑස්ති වෙන්න ඕනෑ මේ වැඩේට. ඉතින් මෙහෙම සංවර්ධනය කරනවා වඩා හොඳයි- [බාධා කිරීමක්] ඔළුවක් තිබෙනවා නම් කල්පනා කරන්න එපායැ. මනස්ගාතනේ මේ. Domestic airport එකක් තිබුණා නම් ප්‍රශ්නයක් නැහැ. කොළඹින් බැහැලා මත්තලට ගිහින් මත්තල domestic airport එකෙන් බැහැලා ගිහිල්ලා සත්තු බැරි නම් ඕනෑ දෙයක් බලාගෙන එන්න පුළුවන්. තමුන්නාන්සේ නුවරඑළියේත් දැන් domestic airport එකක් හදා ගන්න. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මෙකයි. [බාධා කිරීමක්] අනේ! මම ඔබතුමාට කරදර කළේ නැහැ. එතකොට -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අපි airports 05ක් හදනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි. 05ක් හදා ගන්න. හොඳයි, හොඳයි. බාන්න planes නැති එකයි ප්‍රශ්නය. කඩදාසිවලින් හදලයි යවන්න වෙන්නේ. පොඩි එවුන්ට ගිහින් සරුංගල් අරින්නයි වෙන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මහවැලිය හදන කොට-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මහවැලිය හදන කොට බොහොම පැහැදිලිව- [බාධා කිරීමක්] අද ලෝකයේ ඇත රටවල්වලට යන්න planes නැතිව ඉන්නවා.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

යන ප්‍රමාණය අඩු වෙලායි තිබෙන්නේ. ඇයි ඒ? මුළු ලෝකයේම තිබෙන ආර්ථික අවපාතය නිසා. ඒ වාගේම ගුවන් ගමන්වල වියදම් වැඩිකම නිසා. ඒ නිසා මිනිස්සු බලනවා ළඟ ළඟ තිබෙන රටවල්වලට යන්න. ඔබතුමා මේ තොරතුරු කියවා බලන්න. ඔබතුමා කියවන පුද්ගලයෙක්නේ. මට ප්‍රශ්නයක් නැහැ, මත්තල බැරි නම් ඕනෑ කැනක හදා ගත්තාට. අපේ රටේ අභිංසක, දුප්පත් මිනිස්සුන්ට දෙන්න තිබෙන සහන ටික නැති කරලයි මේ සියලු දේවල් කරන්නේ. ආසාවක් තිබෙනවා නම් මත්තල airport එක විතරක් නොවෙයි, ෂැංග්‍රිලාත් එහේ හදා ගන්න, ලංකාවේ අගනුවරත් එහේ කරන්න. ඔක්කෝම කර ගන්න. හැබැයි මේ රටේ දුක් විඳින මිනිස්සුන්ට දෙන්න තිබෙන සහන ටික කපන්න එපා. ගිය නොවැම්බර් මාසයේ ඉඳලා මේ වන තුරු සමෘද්ධි සහනාධාර දීලා නැහැ. මිලියන 6,800ක්. ශත පහක් ගෙවා නැහැ මේ වන තුරු. ගොවි විශ්‍රාම වැටුප ගෙවා නැහැ 95,000කට. අපේ චන්ද්‍රසේන නියෝජ්‍ය ඇමතිතුමා ඡන්ද කාලයේ විතරක් ගිහිල්ලා එහේ එක්දහස් ගණනකට නියං සහනාධාර දුන්නා. මම COPE එකේදී නිලධාරීන්ගෙන් ඇහුවා, "කොහොමද අනුරාධපුරයේ විතරක් ගෙවිවේ, අනෙක් අයට නියඟය ආවේ නැද්ද?" කියලා.

ඒ නිලධාරීන් කිව්වා, ඇමතිතුමා කියපු නිසා ගෙවිවාය කියා. එතකොට මම ඇහුවා, "එහෙම නම් ආයෙත් ගෙවන්න තව ඇමති කෙනෙක් කියන්න ඕනෑද?" කියා. ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය හැම කෙනෙක්ම දායක වෙලා කරපු එකක්. ඡන්දය නිසා අනුරාධපුරයට විතරක් ගොවි විශ්‍රාම වැටුප් දුන්නා. මම ඇහුවා, එහෙම නම් ඊළඟට වයඹ පළාතේ ඡන්දයක් තිබෙනකොට වයඹට; මධ්‍යම පළාතේ ඡන්දයක් තිබෙනකොට මධ්‍යම පළාතට; දකුණු පළාතේ ඡන්දයක් තිබෙනකොට දකුණට ආදී වශයෙන්ද ගොවි විශ්‍රාම වැටුප දෙන්නේ කියා. එතකොට එහෙම නම් ගොවි විශ්‍රාම වැටුප ගන්න ඡන්දයක් එන්න ඕනෑ.

දැන් ඊළඟට ඔබතුමන්ලාගේ කටයුතු ගැන බලන්න. මාර්තු 19 වැනි දා G90506 දරන Air Arabia ගුවන් යානයක් එනවා. ඒක සාජා බලා පිටත් වෙලා යනවා. ඒක කටුනායක ඉඳලා මත්තලට ඇවිල්ලා, මත්තලින් සාජාවලට යනවා. ඒ එකක්. මාර්තු 25 කටුනායකින් පිටත් වන චීන ගුවන් යානයත් මත්තලින් කරකවලා බැංකොක් හරහා බෙයිජිං බලා පිටත් වෙනවා. ඒ අනික් එක. ඊළඟට මාර්තු 26, 27, 29 දින තුනේ ගුවන් ගමන් තුනක් තිබෙනවා. ඒවා නියම ගුවන් ගමන් තුනක්. "කටුනායකින් මාල දිවයින බලා යන SriLankan Airlines ගුවන් යානා තුනක් මත්තලට ගොඩ බා යළි මාල දිවයින බලා පිටත්වනු ලැබේ" කියායි සඳහන් වෙන්නේ. ඉතින් මේක පුදුම කථාවක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගුවන් යානයේ රෝද දෙක ඇතුළට ගන්නකොටම ආයෙත් පහළට දමන්න වෙනවා. ගුවන් යානය ඉහළට ගිහිල්ලා ටික වෙලාවක් යනකොට රෝද දෙක ඇතුළට ඇකිළෙනවා. ඒ එක්කම -මත්තලට යනකොට- ආයෙත් රෝද දෙක එළියට දමන්න වෙනවා. මේක හරියට private bus එකක් වාගෙයි. මාතර හරහා කොළඹට යනකොට ගාල්ලෙනුත් බස්සවලා යනවා වාගේ වැඩක් තමයි මෙතැනදි වෙලා තිබෙන්නේ. මේකෙන් සිද්ධ වෙන්නේ මොකක්ද? මාල දිවයිනට යන ශ්‍රී ලන්කන් ගුවන් යානාවලට මත්තලිනුත් ගොඩ බාලා යන්න සිදු වෙලා තිබෙනවා. කවුද මේවායේ වගකීම භාර ගන්නේ? කීයක් යනවාද මේවාට? එක සාමාන්‍ය ගුවන් ගොඩ බෑමකට අපෙන් කීයක් වැය වෙනවාද? ලක්ෂ ගණනක් ඉවරයි. එතකොට මේ පාඩු ලබා තිබෙන SriLankan Airlines තවත් පාඩු ලබනවා. Mihin Lanka එක තවත් පාඩු ලබනවා. දැන් මෙතනදි කිව්වා, මත්තල නත්තලක්ය කියා. මත්තල නත්තලක් නොවෙයි, වල්මත් වෙලායි තිබෙන්නේ. මේක තමයි අද සිද්ධ වෙමින් තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොල්ලෙක් motorcycle එකකට තෙල් ටිකක් ගහ ගෙන ගිහින් තමන්ගේ ගෑණු ළමයා බලලා එනවා වාගේ වැඩක් තමයි මේ වෙන්නේ. ඇයි? මෙතැනින් ගිහිල්ලා මත්තලින් බහිනවා. මත්තල ඉඳලා ආපහු මාලදිවයිනට යනවා. මම ඒකයි අහන්නේ. කරුණාකර මේකේ plan එක මොකක්ද කියා කියන්න. මේකෙන් මොකක්ද සිද්ධ වෙන්නේ? නොරොච්චෝලේ වාගේ තවත් කරච්චලයක් හදා ගත්තු එක විතරයි මේකෙන් සිද්ධ වෙන්නේ. තව ටිකක් කල් ගියාම ඔබතුමන්ලා කියාවි, නොරොච්චෝලෙත් අපි පවරනවාය කියා. ඊළඟට තව ටිකක් කල් ගියාම කියාවි, මත්තලත් පවරනවාය කියා. මත්තලත් හදපු අයටම -චීන්නුන්ටම- පවරාවි. චීන්නුන්ට තමයි මේක පවරන්න වෙන්නේ. ඇයි? මේක හදන්න ගත්තු ණය ගෙවන්න බැරි වුණාම අපට විශාල අර්බුදයකට යන්න වෙනවා. ඔබතුමන්ලා ජපානයට ගිහින් අවුරුදු 40ක soft loan එකක් ගෙනාවා. ඒකට කමක් නැහැ. ඒ මුදල් යොදවලා කරන කටයුතු ගැනත් කියන්න ඕනෑ. විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා, මාතර-බෙලිඅත්ත රේල් පාරේ එක කිලෝ මීටරයක් හදන්න කොච්චර වැය වෙනවාද කියලා. මේ සල්ලිවලට මොනවාද වෙන්නේ? අපි ඒකයි අහන්නේ. ඒක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. තව සති දෙකකින් විතර මත්තල ගැන මම ආයෙත් කථා කරන්නම්. ගුවන් යානා ගමන් ගැන විස්තර ටික අතට ගත්තාම මත්තලින් බහින ඒවා ටික කියාගෙන යාවි. මත්තලට යනකම් ගිහිල්ලා, මත්තලින් බැහැලා ආපහු මෙහේ එනවා. මත්තලින් වත්තලට යනවා. ඒක තමයි අද සිද්ධ වෙමින් තිබෙන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කිලිනොච්චි යනවාය කියා මැදවච්චියෙ ගියා වාගෙයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක කිව්වේ මම නොවෙයි. ඒක මට අදාළ නැහැ. ඔබතුමන්ලා උපාධිධාරීන්ට පත්වීම් දුන්නා. අද වනකොට අලුත් වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. දැන් ඒ ගොල්ලන්ට හමුදා පුහුණුවක් දෙන්න යනවා. හමුදා පුහුණුව සඳහා යාමට අදාළ භාණ්ඩ ලැයිස්තුවක් එවා තිබෙනවා. ඒ අනුව ගෙනෙන්න තිබෙන දේවල් දැක්කාම බඩ, පපුව පත්තු වෙනවා. මොකද, ඒ එක ළමයෙකුට රුපියල් 10,000යි හම්බ වෙන්නේ. ගම්පහ දිස්ත්‍රික්කයෙන් තමයි ඒක ඉස්සෙල්ලාම පටන් ගන්න යන්නේ. මොකක්ද ඒකට කියන්නේ? [බාධා කිරීමක්] රට නගන නිල් රැල්ල? නැහැ, නැහැ. නිල්ල නගන ස්වර්ණ කිකිණි රාවේ. ඒක තමයි කියන්න තිබෙන්නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, මම කියා දෙන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මේ ගොල්ලන්ට ගෙනෙන්නය කියා තිබෙන භාණ්ඩ ලැයිස්තුව බලන්න. අත් දිග කමිස දෙකයි, අත් කොට කමිස දෙකයි, දිග කලිසම් දෙකයි. කොට කලිසම් හතයි, කලිසමට ගැළපෙන බඳින පටි එකයි.

ඊළඟට උපාධිධාරිනියන් සඳහා ගේන්න කියපු බඩු මම දැන් කියන්නම්. සාරි දෙකයි, සාරියට ගැළපෙන පාවහන් යුගල් එකයි, ටී ෂර්ට්ස්, ඩෙනිම් කලිසම් අවශ්‍ය පරිදි. දිග කලිසම්, ගවුම්, බ්ලවුස් අවශ්‍ය පරිදි. ඊළඟට කොට්ට, මෙට්ට, ඇඳ ඇතිරිලි. මේවා training එකට අරගෙන යන්න ඕනෑ. කවුද මේ අය? අපේ උපාධිධාරීන්, රජයේ සේවයට බඳවා ගත්ත කට්ටිය. මේ අයට රුපියල් 10,000යි හම්බ වන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම කියන්නම්. කරුණාකරලා මේවා ගැන හොයා බලන්න. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමන්ලා දැන් නිලධාරීන්ගේ මැදිරියේ ඉන්නවා නේ. ඔබතුමන්ලා මේවා ගැන හොයා බලන්න. මගේ ආසනයේ, පඩුවස්නුවරට ගිහින් මම හොයා බැලුවා. ගරු ඇමතිතුමනි, ඒ ළමයි පදවියට දමා තිබෙනවා. ඒ කියන්නේ අනුරාධපුරයටත් එහා. මේ එක ළමයෙකුට රුපියල් 10,000යි ලැබෙන්නේ. ඒ ළමයෙකුට බෝඩිම් ගාස්තු වශයෙන් රුපියල්

6,500ක් යනවා. අම්මා තාත්තා අසනීප වෙලා ඒ ළමයා ගෙදර ආවොත් අර රුපියල් 10,000න් 350ක් කපනවා. ඉන්න බෝඩිමට රුපියල් 6,500ක් යනවා. එතකොට ඒ ළමයාට ඉතුරු වන්නේ කීයද? මේ අයගෙන් සමහරු බැඳපු අය. ඒ සමහර අයට ළමයි ලැබෙන්නත් ඉන්නවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තමුන්නාන්සේලා උපාධිධාරීන්ට මොනවාද කළේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙහෙමයි ගරු ඇමතිතුමනි. මේක යම් ක්‍රමවේදයක් අනුව කරන්න තිබුණා නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමන්ලා උපාධිධාරීන්ට මොනවාද දුන්නේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම දන්නවා. දෙන්න පුළුවන් නම් දෙන්න ඕනෑ. නැත්නම් නොදී ඉන්න ඕනෑ. [බාධා කිරීමක්] හරි. ගරු ඇමතිතුමනි, දෙන්න පුළුවන් නම් දුන්නාට කමක් නැහැ. දෙන්න බැරි ඒවා දීලා තමයි මෙහෙම වෙලා තිබෙන්නේ. මේ දෙන්න බැරිවීමේ ප්‍රතිඵලය. මෙච්චර ගණනකට අපි දෙන්න කිව්වේ නැහැ. මම ගිහින් නඩුව දැම්මේ නැත්නම් ඔය එක්කෙනෙකුටවත් රැකියා හම්බ වන්නේ නැහැ. ඔබතුමන්ලා රැකියා දුන්නේ පෞද්ගලිකව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උපාධිධාරීන්ට. එහෙමයි දුන්නේ. මතක තියා ගන්න. ඔය 58,000කට දුන්නේ මම ගිහින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුව දමපු නිසායි. නැත්නම් හම්බ වෙයි. ඔබතුමන්ලා ඔහොම දෙන්නේ නැහැ.

මෙහෙම දුන්නාට පස්සේ ඒ අයට මොකක්ද කළේ? අන්තිමට මේ අය බඩු ලැයිස්තු අරගෙන යන්න ඕනෑ. ඔබතුමා මේක හොයලා බලන්න. කරුණාකරලා ඒ අයගේ ගම්වලට පත්වීම් ටික දෙන්න. ඒකයි අප ඉල්ලන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමන්ලාගේ කාලයේ එකම උපාධිධාරියෙකුටවත් රස්සාවක් දුන්නාද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙතුමාත් නිටපු ආණ්ඩුව තමයි සෘණ එකයි දශම දෙකට- [බාධා කිරීමක්] ඉන්න, ඉන්න. කලබල වෙන්න එපා. 1998 දී මෙතුමා ආණ්ඩුව පැත්තට ගිහින් මොකක්ද හදනවා කිව්වේ? පාට පාට තිබෙන දේදුන්නක් හදනවාය කිව්වා. ඒ දේදුන්න හදන්න තමයි මෙතුමා 1998 දී අපේ පක්ෂයේ හය දෙනෙක් එක්ක ආණ්ඩුව පැත්තට ගියේ. එහෙම ගිහිල්ලා 2001 වෙන කොට අපට භාර දුන්නේ සෘණ එකයි දශම දෙකක ආර්ථිකයක්. මතක තියා ගන්න. ඒකේ උපාධිධාරීන්ට රැකී රක්ෂා දෙන්න බැහැ. ඇයි? ණය ප්‍රතිශතය 105ට. ආර්ථික වර්ධනය සෘණ එකයි දශම දෙකට ගිහින් තිබුණු ආර්ථිකයක් තිබුණේ. එහෙම ආර්ථිකයක් තිබුණේ.

අද අපට තව කාරණයක් ගැන කථා කරන්න තිබෙනවා. [බාධා කිරීමක්] මට බාධා කරන්න එපා. බලන්න, ඊයේ පෙරේදා දින දෙකකදී තමිල්නාඩුවේදී අපේ හාමුදුරුවන්ට පහර දුන්නා. තමිල්නාඩුවේ අන්තවාදීයෝ පාරට බැහැලා අපේ රටින් ගිය වන්දනාකරුවන්ට පහර දුන්නා. අපේ ගෞරවණීය ස්වාමීන්ද්‍රයන් වහන්සේට පහර දුන්නා. මේවා දැක්කාම සිංහල බෞද්ධයන් වන අපට හරිම වේදනාවක් දැනෙනවා. කවුද මේවා ඇති කළේ? මේ ලංකාව ඇතුළේ මුස්ලිම් ජනතාවට ඉන්න දෙන්නේ නැහැ. "හලාල්" කියලා එකක් පටන් ගත්තා. ඒකට ආණ්ඩුවේ සහයෝගය තිබුණා. ඒකට ආණ්ඩුවේ සහයෝගය තිබුණේ නැහැ කියලා කවුරු හරි කියන්න බලන්න මට? මම ඒක ඔප්පු කර පෙන්වන්නම්. තමුන්නාන්සේලා ඇමතිවරු එක්කෙනෙක් දෙන්නෙක් කියයි, "අනේ අප නම් ඕවාට නැහැ, අප සද්ද නැතිව හිටියා, අප දන්නෙත් නැහැ" කියලා. හැබැයි ආණ්ඩුව මේ හලාල් ප්‍රශ්නයේදී- [බාධා කිරීමක්] අස්වර් මන්ත්‍රීතුමා ඉඳගන්න, කෑ ගහන්නේ නැතිව. මේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් කථා කරන්නේ නැති

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

සිංහල බෞද්ධයන් විධියට අප මුස්ලිම් ජනතාව වෙනුවෙන් කථා කරනවා. මම කියන්නේ මුස්ලිම් ජනතාවට ද්‍රෝහියෝ වෙන්න එපාය කියලා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Dayasiri Jayasekara, please wind up now.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම තව විනාඩියක් දෙකක් ගන්නවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩියක් දෙන්න පුළුවන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තව වෙලාව තිබෙනවා. TNA එකේ සම්පන්දන් මන්ත්‍රීතුමාගේ විනාඩි 5ක් මට ගන්න කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රශ්නය ඇද්දාට පස්සේ මොකද වුණේ? ලංකාව ඇතුළේ මුස්ලිම් ජනයාට විරුද්ධව දැවැන්ත අර්බුද, ප්‍රශ්න මතු වුණා.

මේවා පිටුපස සිටියේ කවුද? මේවාට උඩ ගෙඩි දුන්නේ කවුද? මේ සිදුවීම් වැටලීමට පොලීසියට අත ගහන්න බැරි වන විධියට වැළැක්වූයේ කවුද? අප අහන්නේ ඒකයි. පෝස්ටර් ගහන්නේ පොලීසියෙන්. මේ වාගේ දේවල් කරන කොට මොකද වෙන්නේ? මම සිංහල අන්තවාදියෙකුත් නොවෙයි; දෙමළ අන්තවාදියෙකුත් නොවෙයි; මුස්ලිම් අන්තවාදියෙකුත් නොවෙයි. මා ඒ සියල්ලට විරුද්ධයි. මා එදත් කිව්වේ ඒකයි. අප සියලු දෙනා එකට ජීවත් වෙන්න ඕනෑ මේ රටේ. තමුන්නාන්සේලා දැන් මොකක්ද කරලා තිබෙන්නේ? මේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නයත් එක්ක අපි ජිනීවා මානව හිමිකම් කමිටුවට යන කොට ඇති වන තත්ත්වය මොකක්ද? මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා ඊශ්‍රායලයට විරුද්ධව පලස්තීනයත් එක්ක එකතු වුණා. එතුමා කිව්වා, මුස්ලිම් සහෝදර රටවලට අපි සහයෝගය දෙන්න ඕනෑ කියලා. අද මොකක්ද සිද්ධ වෙමින් තිබෙන්නේ? ජිනීවා මානව හිමිකම් කමිටුවේදී අපට විරුද්ධව ගෙනෙන යෝජනාවලට මුස්ලිම් රටවල් සියල්ල සහයෝගය දෙන්නේ නැති තැනකට අද තල්ලු වෙමින් තිබෙනවා.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ඇයි ඒ? ඒකට හේතු වෙලා තිබෙන්නේ වෙනත් දෙයක් නොවෙයි. මේ කරන කටයුත්තට විරුද්ධව මේ රට ඇතුළේ ආණ්ඩුවක් විධියට යම්කිසි පියවරක් ගත්තේ නැහැ කියලා ඒ රටවල් සියල්ල විශ්වාස කරන එකයි හේතුව. අද අනෙක් පත්තරවලත් දාලා තිබුණා, දකුණු ඉන්දියාවේ පහර දීමට දෙමළ අන්තවාදීන් විතරක් නොව මුස්ලිම් අන්තවාදීනුත් සහයෝගය දෙනවා කියලා. මේකයි දැන් මෙය තල්ලු වෙලා තිබෙන තැන. අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අපි ද්‍රවිඩ ජනතාවට ආදරෙයි. අපි හැම දාම කියන්නේ කරුණාකර ද්‍රවිඩ ජනතාව රවටන්න එපා කියලායි.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එහා යනවා කියලා; Thirteen Plus කියලා; දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එහා ගිය බලයක් දෙනවා කියලා දෙමළ ජනතාව රැවටීමේ ප්‍රතිඵලය තමයි දැන් මේ ඇති වෙමින් තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා ඉන්දියාවට ගිහිල්ලා පොරොන්දු වුණා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එහා ගිය බලයක් දෙනවා කියලා. දැන් ඉන්දියාව එය අසමීන් සිටිනවා. ඉන්දියාව අද ප්‍රකාශ කරන්නේ මොකක්ද? දකුණු ඉන්දියාවේ ඉන්න කරුණානිධි, ජයලලිතා ඇතුළු අය ගිහින් කියනවා, ලංකාවට විරුද්ධව ගෙනෙන යෝජනාවට ඉන්දියාව සහයෝගය දිය යුතුයි, එහෙම නොවුණොත් අපි හෙට උදේ අයින් වෙනවා කියලා. මේක දැවැන්ත අර්බුදයක්. කවුරු හරි හිතනවා නම් හෙට උදේ, අනිද්දා උදේ මේවා ෂේප් කර ගන්න පුළුවන් කියලා, තමුන්නාන්සේලාට සිද්ධ වෙලා තිබෙන්නේ ලොකු වැරැදීමක් කියලා මා කියන්න කැමැතියි. මේවා දවස ගණනේ එනකොට අපි දිගින් දිගට ආණ්ඩුවට කිව්වා, කරුණාකර මේකට විරුද්ධව යම්කිසි පියවරක් ගන්න කියලා. මොකක්ද සිද්ධ වුණේ? මුස්ලිම් ජනතාව කැඳවලා කිව්වා, මුස්ලිම් නායකයන් කැඳවලා කිව්වා අපි තමුන්නාන්සේලා බලා ගන්නවා, යූඑන්පී එකත් එක්ක එකතු වෙන්න එපා කියලා. එච්චරයි කිව්වේ. වෙන එකක් නොවෙයි කිව්වේ.

යූඑන්පී, ශ්‍රී ලංකා භේදය නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙතැන සමස්ත මුස්ලිම් ජනතාවට ප්‍රශ්නයක් තිබෙනවා. මෙතැන සමස්ත දෙමළ ජනතාවට ප්‍රශ්නයක් තිබෙනවා. අවුරුදු ගණනක් තිස්සේ අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට එල්ල වූ තර්ජනයට එරෙහිව නැඟිටලා, අප ඔක්කෝම එකතු වෙලා ඒ අර්බුදය දෙයියනේ කියලා අවසන් කර දමා තිබෙන වෙලාවක් මේක. ත්‍රස්තවාදය අවසානයි. නමුත් දෙමළ ජනතාවගේ ප්‍රශ්න විසඳලා නැහැ. දෙමළ ජනතාව පැහැර ගෙන යෑම්, මර්දනය කිරීම්, ඔවුන්ගෙන් කරන පළිගැනීම්, ඔවුන්ට කරන පහර දීම් තවම ඉවර නැහැ. ඒ නිසා අප කියන්නේ කරුණාකර ඉන්දියාවත් එක්ක එකතු වෙලා දැන්වත් මේකට විසඳුමක් දෙන්න කියලායි. ඉන්දියාවේ මධ්‍යම රජයත් එක්ක කථා කරන්න.

මම දැක්කා හෙළ උරුමයේ අපේ චම්පික රණවක මහත්මයා කියා තිබෙනවා, ඉන්දියාවේ යන එක නතර කරන්න කියලා; දකුණු ඉන්දියාවේ යන එක නතර කරන්න කියලා. ඒක පුදුම කථාවක්. ඒ කියන්නේ, වන්දනාවේ යන එක නතර කරන්න කියන එකයි. හේතුව, එහේදි ගහන නිසයි. දැන් ඒකද විසඳුම? හෙට අනිද්දා මේ සිංහල අන්තවාදීන් ගිහිල්ලා වැල්ලවත්තේ කෝවිලකට, දෙකකට පැනලා පූසාරිලා දෙදෙනකු අරගෙන ගිහිල්ලා ගිනි තැබුවොත් තමුන්නාන්සේලා මොනවාද කියන්නේ? මේ ජාතිවාදී රැල්ල දැන්වත් මර්දනය කරන්න කටයුතු කරන්න කියලායි අප ඉල්ලන්නේ. මේක ලේසියෙන් නතර වෙන වැඩක් නොවෙයි. මේක ඉතා ඉක්මනින් ගිනි තියන්න පුළුවන් වැඩක්. දකුණු ඉන්දියාවේ ද්‍රවිඩ දේශපාලනඥයන්ට අප කියන්න කැමැතියි, කරුණාකර බොර දියේ මාළු බාන්න ලෑස්ති වෙන්න එපා කියලා. අපේ සිංහල ජනතාවට එහේදි හිරිහැර කරන කොට, අපේ හාමුදුරුවරුන්ට පහර දෙන කොට ලංකාවේ සිංහල බෞද්ධයා බැරි වෙලාවත් ගිහින් වැල්ලවත්තේ ඉන්න දෙමළ ජනතාවට හිරිහැර කරන්න පටන් ගත්තොත් කවුද වග කියන්නේ ඒකට? මෙන්න මේ තැනට මේ ප්‍රශ්නය උග්‍ර වෙලායි තිබෙන්නේ. "ජිනීවා, ජිනීවා" කියන කොට, ඔබතුමන්ලා හැම දාම කාට හරි චෝදනා කරලා නිකම් ඉන්නවා; කාට හරි කෑ ගහලා නිකම් ඉන්නවා. Channel 4 එකට නඩු දමනවා කිව්වා කෙහෙළිය රඹුක්වැල්ල මහත්මයාලා. මම කියනවා දමපු නඩුව කොහේද තිබෙන්නේ කියා කරුණාකර කියන්න කියලා. මහා ලොකුවට කියනවා ජිනීවා එකේ ඉදිරිපත් කරන ඒවා අසත්‍යය කියලා. අසත්‍යය නම් ඔප්පු කරන්න. බැරි නම් නිකම් අසත්‍යයට ඒ වාගේ කථා නොකියා ඉන්න. Channel 4 එකට විරුද්ධව නඩු දමනවා කියපු මේ ආණ්ඩුවෙන් මා අහන්න කැමැතියි කවදාද Channel 4 එකට නඩු දමන්නේ කියලා. Channel 4 එකට පස්සේ තවත් එකක් එනවා. Killing fields නොවෙයි. තවත් එකක් එනවා ඊළඟට.

මේවා දවස ගණනේ ගෙනැවිත් පෙන්වන විට දකුණු ඉන්දියාව රත් වෙනවා. ඊළඟට දකුණු ඉන්දියාවේ අන්තවාදියෝ උත්සාහ කරනවා අපේ අහිංසක අම්මලා තාත්තලාට පහර දෙන්න; හාමුදුරුවරුන්ට පහර දෙන්න. ඒක පටන් ගත්තේ දේශපාලනඥයින්ගෙන්. මම කියනවා කරුණාකරලා මේකට අත ගහන්න කියලා. ලොකු විනාශයකටයි අපි යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම බලන්න, අද මේ රටේ තිබෙන ආර්ථික අර්බුදය. අද රට ඇතුළේ ආර්ථික අර්බුදයක් තිබෙනවා. අද මොකක්ද කරන්නේ? තමුන්නාන්සේලා ජාතික ලොතරැයි මණ්ඩලයේ තිබුණ සල්ලි රුපියල් මිලියන 702ක් ගන්නවා. ඒ වාගේම රුපියල් මිලියන 800ක් විදුලි සංදේශ නියාමන කොමිෂන් එකෙන් -ටෙලිකොම් එකෙන්- ගන්නවා. තිබෙන සල්ලි ටික යටින් අදිනවා. විමල් වීරවංශ මහත්මයා කියනවා, ආර්ථික ඝාතකයෝ ඉන්නවා කියලා. මේ ආණ්ඩුවේ ඇමතිවරු තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා තමයි කැබිනට් එකේ ඉන්නේ. කැබිනට් එකේ ඉන්න නායකයා ජනාධිපතිතුමා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Dayasiri Jayasekara, please wind up now.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව එක විනාඩියක් ලබා දෙන්න. කැබිනට් එකේ ඉන්න ඇමතිවරුන් තමයි මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාව පත් කරන්නේ; පත් කරන්න නායකත්වය දෙන්නේ. කැබිනට් එක සාමූහිකව වග කියන්න ඕනෑ. නමුත් කැබිනට් මණ්ඩලය සාමූහිකව වග කියන්නට ඕනෑ අවස්ථාවේදී විමල් වීරවංශ මහත්මයා ඇවිත් කියනවා, ආර්ථික ඝාතකයෙක් ඉන්නවා කියලා. පී.බී. ජයසුන්දර මහත්මයාටයි එහෙම කියන්නේ. තමුන්නාන්සේලා දන්නවා, ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ පාස්කරලිංගම් මහත්මයා හිටියා. ඊළඟට හිටියා ඒ.එස්. ජයවර්ධන මහත්මයා. ඒ සියලුම දෙනා කරන්නේ ජනාධිපතිවරු කියන විධියට වැඩ කිරීම. ඒකයි කරන්නේ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් අන්තිමට පී.බී. ජයසුන්දර ආර්ථික ඝාතකයා වෙලා. ආර්ථික ඝාතකයා පී.බී. ජයසුන්දර නම්, ඒ ආර්ථික ඝාතකයා පත් කරන්නේ කවුද? ආර්ථික ඝාතකයා පත් කළ අය ගැන වග කියන්නේ කවුද? අන්න එතැනට තමයි අද අපි පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මම කියන්නේ කරුණාකරලා දැන්වත් නිවැරදි මාවතට මේ ආර්ථිකය අරගෙන යන්න කියලායි. තමුන්නාන්සේලා මත්තල ගුවන් තොටුපොළ හදයි; තමුන්නාන්සේලා හම්බන්තොට වරායවල් හදයි; තව තව දේවල් හදයි. නමුත් ඒවායේ බර අහිංසක දුප්පත් මිනිසුන්ගේ පිට උඩට වැටෙනවාය කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.41]

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සංශෝධන පනත් පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මට පෙර කථා කළ අපේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දයාසිරි ජයසේකර මැතිතුමා මතු කළ කාරණා කිහිපයකට පිළිතුරු දෙන්නට ඕනෑ කියලා මට හිතුණා. ගුවන් සේවය ගැන, ගුවන් තොටුපොළ ගැන, විශේෂයෙන් මත්තල ගුවන් තොටුපොළ ගැන එතුමා යම් යම් කරුණු මතු කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ සිවිල් ගුවන් සේවා ඉතිහාසයේ තිබුණු ලොකුම සිහිනයක් තමයි ඊයේ අපි විවෘත කළ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ. අද ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියනවා නම් මේක රාජපක්ෂ නම දමා ගැනීමක්, එහෙම නැත්නම් තමන්ගේ ප්‍රදේශයේ ගුවන් තොටුපොළක් ඉදි කර ගැනීමට පුංචි කාලයේ තිබුණු සිහිනයක් සාක්ෂාත් කර ගැනීමක් කියලා ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. එහෙම සිහින තිබෙනවා. නායකයින්ට එහෙම සිහින තිබුණාට කමක් නැහැ. ඒක හොඳයි. නමුත් මෙතැන එතැනින් එහාට ගිය දැවැන්ත වටිනාකමක් තිබෙනවා. ඊයේ විවෘත කළ ගුවන් තොටුපොළට සිවිල් ගුවන් සේවා ඉතිහාසයේ විශාල වටිනාකමක් තිබෙනවා. අපේ රටේ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ඉදි කළාට පසුව ඒ හරහා මේ රටට ලැබුණු වාසි රාශියක් තිබෙනවා. මම හිතනවා 1950 ගණන්වල සිට මේ ගුවන් තොටුපොළෙන් ලැබුණු airport tax එක විතරක් එකතු කරලා බැලුවා නම් මේ රටේ තව ගුවන් තොටුපොළවල් කිහිපයක් හදන්න පුළුවන් මුදලක් අපේ රටට එකතු වුණා කියලා. ඊට අමතරව රේගුව හරහා, වෙනත් වෙළෙඳ ව්‍යාපාර හරහා සහ ජාතික ගුවන් සේවය සහ අනෙකුත් ගුවන් සේවාවන් හරහා දැවැන්ත මුදලක් මේ ගුවන් තොටුපොළට එකතු වෙලා තිබෙනවා. ඒ මුදල් සියල්ල අන්තිමට භාණ්ඩාගාරයටයි එන්නේ. ඒ මුදල් භාණ්ඩාගාරය හරහා වෙනත් වෙනත් ව්‍යාපෘතීන්වලට යොදවනවා. එහෙම යොදවන්නේ නැතිව හම්බ කළ සියලු මුදල් සිවිල් ගුවන් සේවයේම තිබුණා නම් තවත් ගුවන් තොටුපොළවල් රාශියක් හදන්න තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ නායකයාට කොන්දක් තිබුණා මේ ගුවන් තොටුපොළ හදන්න. මම විශ්වාසයෙන් ගුවන් නියමුවෙක්.

මම මේ කාරණය කියන්නට ඕනෑ. මේ ගැන දන්නේ නැතිව, කථා කරනවා. කථා කරලා යනවා. අද අපේ රටට එන ගුවන් යානාවල සහ අපේ රටෙන් පිට වන ගුවන් යානාවල අමතර ඉන්ධන ප්‍රමාණයක් ගෙන යන්න ඕනෑ. ඒ අපට විකල්ප ගුවන් තොටුපළක්, අමතර ගුවන් තොටුපළක් නැති නිසායි. මෙහාට land කරන aircraft, මෙහෙන් take off කරන aircraft විශාල ඉන්ධන ප්‍රමාණයක් ගෙන යනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඇයි? හදිසි අවශ්‍යතාවක් වුණොත් මේ රටේ තවත් ගුවන් තොටුපළක් නැති නිසා ඉන්දියාවට යන්නට ඕනෑ. ඉන්දියාවට ගිහින් land කරලා, ගොඩ බැස්සවීමේ ගාස්තු ගෙවලා, තවත් විශාල මුදලක් දීලා නැවත වතාවක් ඉන්දියාවේදී ඒ දැවැන්ත ඉන්ධන ප්‍රමාණය පුරවා ගෙන යනවා. මෙහාට අමතර ගුවන් තොටුපළක් නොතිබුණු නිසා, හැම දාම මෙහාට එන යන හැම ගුවන් යානාවක්ම ඉන්ධන සඳහා විශාල මුදලක් වැය කරනවා. ඒක ගුවන් නියමුවෝ සියලු දෙනාම දන්නවා. ඒක ජාතික ගුවන් සේවයේ ගුවන් නියමුවෝත් දන්නවා. ජාත්‍යන්තර ගුවන් සේවාවේ නියමුවෝත් දන්නවා. විකල්ප ගුවන් තොටුපළක් නැති නිසා මේ රටට එන්නට තිබුණු විශාල මුදලක් නාස්ති වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට එවැනි අවස්ථාවක් එළඹුණා. බැංකොක් නුවර සිට ලංකාවට එනකොට ලංකාවේ ගුවන් තොටුපළේ කාලගුණික තත්ත්වය හොඳ නැහැයි කිව්ව නිසා ඉන්දියාවේ ට්‍රිවුරාපලි, ඉන්දියාවේ ට්‍රිවැන්ඩ්‍රම් කියන ගුවන් තොටුපළවලට අප ගුවන් යානා ගෙන ගිහින් තිබෙනවා. ඒ සඳහා දැවැන්ත මුදලක් නාස්ති වෙලා තිබෙනවා. මෙතැන ඇවිත් මෙතුමන්ලා අසත්‍ය කථා කරනවා; කරුණු කාරණා දන්නේ නැතිව කථා කරනවා. මේ දත්ත දුන්නු අයත් එක්ක ඉස්සෙල්ලා මේ ගොල්ලෝ කථා කරන්න ඕනෑ. මත්තල ගුවන් තොටුපළ ඉදි කිරීම තුළින් මේ රටට ලැබෙන ආර්ථික වාසිය ඉතා විශාලයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද තවත් කාරණාවක් කිව්වා. ගුවන් තොටුපළක් ඉදි කළ ගමන්ම ගුවන් යානා එන්නේ නැහැ. මේ ගුවන් තොටුපළ market කරන්න ඕනෑ. අප එහෙම කියන්නේ, මේ ගුවන් තොටුපළේ වටිනාකම ගැන හිතලායි. එක පැත්තකින් මෙයින් සිවිල් ගුවන් සේවයට ලොකු වාසියක් වෙනවාය කියා අප කිව්වා. අනෙක් පැත්තෙන් හම්බන්තොට කියන්නේ කොහේ ද? අප පුංචි කාලයේ බැද්දේගම නවකථාව කියවනකොට හම්බන්තොට මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය - සිළිඳුගේ, බබුන්ගේ ජීවන රටාව- ඒ නවකථාව තුළින් දැක්කා. හම්බන්තොට කියන්නේ දුෂ්කර පරිසරයක් තිබෙන ප්‍රදේශයක්. ඒ කාලයේ තරුණ පිරිස් මත්තල ගංජා වැව්වා. කුරක්කන් කාලා, කැකිරි කාලා ජීවත් වෙව්ව මිනිස්සු. ඒ දුෂ්කර පරිසරයත් එක්ක, ඒ කර්කෂ බිමත් එක්ක තමන්ගේ ජීවිතය ගැට ගසා ගත් මිනිස්සු. ඒ මිනිසුන්ට මේක ලොකු සිහිනයක්. දැන් ඒ මිනිසුන්ගේ සිහිනය සැබෑ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඇයි මා එහෙම කියන්නේ? අපට කොච්චර සිහින තිබුණත් අප ලෝකය දකිනකොට තමයි, ලෝකයත් එක්ක එකතු වෙනකොට තමයි අපට දියුණු වෙන්න හිතෙන්නේ. මත්තල ගුවන් තොටුපළට මගීන් එනකොට, එතැනින් අපේ මගීන් යනකොට, ජාත්‍යන්තර ලෝකයත් එක්ක අපේ ලෝකය සම්බන්ධ වෙනකොට හම්බන්තොට කර්කෂ බිමේ ජීවත් වන දුප්පත් අහිංසක ගොවි ජනතාව මේ ලෝකය දකිනකොට, ඒ ලෝකයත් එක්ක එකතු වන්නට ඒ ජනතාවට සිහින ඇති වෙනවා; ආකල්පමය වෙනසක් ඇති වෙනවා. මේක දැවැන්ත විප්ලවයක් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 1989 කාලයේදී එක්සත් ජාතික පක්ෂය විශාලම තරුණ සංහාරයක් කළේ හම්බන්තොට ප්‍රදේශයේයි. ඔය ප්‍රදේශය තමයි මේ රටේ පන්ති පරතරය නිසා; සමහර වෙලාවට ඇති හැකි අයගේ හැකියාවන් දැකලා, ඒ අයට තිබෙන දේවල් දැකලා තමන්ට ඒ දේවල් නැති නිසා ඇති හැකි අය සමඟ වෛරයෙන් තරුණ කැරළි ඇති වෙව්ව ප්‍රදේශය. ඔය වාගේ තැනක ගුවන් තොටුපළක් ඇති වනකොට, නව ලෝකයත් එක්ක ඒ ජනතාව මුහු වනකොට ඇයි අප ඊර්ෂ්‍යා කරන්නේ? ඒක කරන්නට එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මත්තල ගුවන් තොටුපොළ එක පාරටම නොවෙයි, ක්‍රමක්‍රමයෙන් දියුණු වන්නට ඕනෑ. කටුනායක ගුවන් තොටුපළ ආරම්භ කළ කාලයේත් එහෙමයි. කටුනායක ගුවන් තොටුපළ ඇති වෙනකොට අපේ රටේ රත්මලාන ගුවන් තොටුපළ තිබුණා. වෙනත් වෙනත් ගුවන් තොටුපළවල් තිබුණා. මේ රටේ සිවිල් ගුවන් සේවා ඉතිහාසයේ විශාල වෙනසක් කටුනායක ගුවන් තොටුපළ හරහා සිද්ධ වුණා.

කටුනායක ගුවන් තොටුපොලත් එක්ක තමයි ගම්පහ දියුණු වන්නේ. කටුනායක ගුවන් තොටුපොලත් එක්ක තමයි වයඹ දියුණු වන්නේ. කටුනායක ගුවන් තොටුපොලත් එක්ක තමයි උතුරු මැද පළාත, අපේ ප්‍රදේශ දියුණු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ඊයේ මත්තල ගුවන් තොටුපොළ විවෘත කරන අවස්ථාවට ගියා. මත්තල ගුවන් තොටුපොළේ ඉඳලා ඇල්ල වැල්ලවාය, බණ්ඩාරවෙල ප්‍රදේශයට යන්න ගතවන්නේ පැයයි, එකහමාරයි. එතැන ඉඳලා පාසිකුඩා, මඩකළපුව ප්‍රදේශයට පැයයි එකහමාරයි. ගාල්ලට, මාතරට පැයයි, එකහමාරයි. අධිවේගී මාර්ග හැදුවාම ගතවන කාලය ඊටත් වඩා අඩු වෙනවා. දකුණු පළාත කියන්නේ විශාල ප්‍රදේශයක්. ඒ වාගේම උඹ පළාත, මධ්‍යම කඳුකරය දියුණු වීම සඳහා මේ ගුවන් තොටුපොළ අනිවාර්යෙන්ම හේතු වෙනවා. ඒ නිසා ද්වේෂයෙන් කථා කරන්න එපා. මේක මේ රටේ ඉතිහාසය වෙනස් කර නව යුගයකට යන ගමනක්.

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය හම්බන්තොට වරාය ගැන කථා කරනවා. තමුන්නාන්සේලා ලෝක සිතියම අරගෙන බලන්න. ලංකාව කියන්නේ ලෝක සිතියමේ හරියටම මැද තිබෙන රටක්. [බාධා කිරීමක්] ලෝක සිතියමේ හරියටම මැද තිබෙන මේ රටට පහළින් තිබෙන්නේ සප්ත මහා සාගරයයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පෙර අපරදිග නැව්වලට සේවා සපයන්න, පහසුකම් ගන්න තමයි සිංගප්පූරු වරාය ඇති කර තිබෙන්නේ. නිදහසින් පසු අපේ රටේ කිසිම නායකයෙකුට මේ හම්බන්තොට වරාය හදන්න කොන්දක් තිබුණේ නැහැ. අද මේ වරාය හදලා පෙර අපරදිග නැව්වලට සේවා සපයා ඉදිරි කාලයේදී මේ වරාය තුළින් දැවැන්ත විදේශ විනිමයක් අපේ රටට ලබා ගන්න පුළුවන් අවස්ථාව තිබෙනවා. [බාධා කිරීමක්] ඒක තමුන්නාන්සේලා කිව්වා වාගේ එක පාරටම නොවෙයි. කොළඹ වරාය හදලා අවුරුදු කීයකට පසුවද දියුණු වෙලා තිබෙන්නේ? අද දකුණු කොළඹ වරාය හදනවා, ගරු මන්ත්‍රීතුමනි.[බාධා කිරීමක්] ඒ වරාය පුළුල් කරන්නේ ඇයි? වරාය දියුණු වෙන නිසායි. වරායෙන් විදේශ විනිමය ලැබෙන නිසායි. ඒවාට කාලයක් ගත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ වරාය හරහා දැවැන්ත මුදලක් මේ රටට එනවා. මේක තමයි අපේ රටේ අනාගතය. ඒක විශේෂයෙන් කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් සියල්ලක්ම අය වැයත් එක්ක ඉදිරිපත් වුණු යෝජනා හා සම්බන්ධ ඒවායි. මේවා සියල්ලක්ම සම්මත කර ඉවරයි. මෙහිදී එක කාරණාවක් තමුන්නාන්සේලා අපි දැක්කා. එනම් වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පතේ තිබෙන්නේ බනිජ තෙල් මෙහෙයුම් වැඩි දියුණු කිරීම සම්බන්ධයි. තමුන්නාන්සේලා දන්නවා, අපේ රටේ බනිජ තෙල් සම්පත නැති බව. අපි අද බනිජ තෙල් ගවේෂණ කටයුතු කරනවා. අපේ රටේ බනිජ තෙල් පිරිපහදු කටයුතු තමයි කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඇහුවා, මත්තල බනිජ තෙල් පිරිපහදු කටයුතු වාගේම බනිජ තෙල් බන්ධිත පහසුකම් වැඩි කරන්න යනවාද කියා. ඔව්. ඒක ඇත්ත. මත්තල ගුවන් තොටු පොළේ ඒ ගුවන් යානාවලට අනිවාර්යයෙන්ම බන්ධිත පහසුකම් තිබෙන්න ඕනෑ. ඒ වාගේම ඒ දකුණු වරායේ බන්ධිත පහසුකම් තිබෙන්න ඕනෑ. ඒවා දියුණු කරන්න ඕනෑ. ඒවාට අවශ්‍ය කරන මුදල් අප හොයා ගන්න ඕනෑ. ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කටුනායක ගුවන් තොටු පොළේ සහ දකුණු කොළඹ වරායේ පහසුකම් දියුණු කරන්න ඕනෑ. මේවායේ සමහර බන්ධිත ගුදම් අවුරුදු ගණනාවක් පැරණියි. මේ දේවල් දියුණු කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ අය අපේ රටේ ආර්ථිකය ගැන කථා කරනවා. මේ රටේ ඉතිහාසයේ රාජ්‍ය ණය සහ රාජ්‍ය ආදායම සමාන වූ ප්‍රථම අවස්ථාව මෙයයි. රාජ්‍ය ණය කියන්නේ මොනවාද? පුනරාවර්තන වාගේ දේවල්. හැබැයි, අපේ රටේ ප්‍රාග්ධන ණය වැඩි වී තිබෙනවා. ඒක අපි පිළිගන්නවා. මොනවාටද ප්‍රාග්ධන ණය අරගෙන තිබෙන්නේ? ප්‍රාග්ධන ණය අරගෙන තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමා කිව්වා වාගේ කන්න දෙන්න නොවෙයි. ප්‍රාග්ධන ණය අරගෙන තිබෙන්නේ මේ රට දියුණු කරන්නයි. මේ රටේ වාරි යෝජනා ක්‍රම සියල්ලක්ම ක්‍රියාත්මක කරන්න; අපේ ප්‍රදේශයේ දැදුරු ඔය වාගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න; ඒ වාගේම විදුලිබල උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න තමයි ප්‍රාග්ධන ණය අරගෙන තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මේ අය නොරොච්චෝලේ තාප බලාගාරය ගැන කථා කරනවා. නොරොච්චෝලේ තාප බලාගාරය හදන්න තිබුණේ මීට අවුරුදු ගණනාවකට ඉස්සෙල්ලායි. නොරෝච්චෝලේ තාප බලාගාරය හදන්න තමුන්නාන්සේලාගේ නායකයින්ට කොන්දක් තිබුණේ නැහැ. එක සංවිධානයකින් එපා කියද්දි ඒක නවත්වනවා; ආගමික සංවිධාන එපා කියද්දි නවත්වනවා. ඉහළ කොත්මලේ හදන්න තමුන්නාන්සේලාගේ නායකයින්ට කොන්දක් තිබුණේ නැහැ. නමුත් අපේ නායකයාට ඒවා කරන්න පුළුවන් වුණා. එතුමා ජල විදුලි බලාගාර හැදුවා.

ඒ ජල විදුලි බලාගාරවලින් දෙන්න පුළුවන් ශක්තිය විදුලිය උත්පාදනයට ලබා දෙනවා. ඒ වාගේම නොරොච්චෝලේ බලාගාරයේ යම් යම් අඩු පාඩු තිබෙනවා නම් ඒ අඩු පාඩු දෙවැනි සහ තුන්වැනි අදියරවල දී අවසන් කරගෙන අනාගතයේ දී ජාතික විදුලි බල පද්ධතියට එයින් දැවැන්ත ශක්තියක් ගෙන එනවා. ඒ වාගේම තමයි සම්පූර්ණ විදුලි බලාගාරය ඉදි කරනවා. එක පැත්තකින් දැවැන්ත වාරි යෝජනා ක්‍රම, තව පැත්තකින් විදුලි බලාගාර, වරාය, ගුවන් තොටුපොළ, ඒ හා සමහම අධිවේගී මාර්ග ඉදි වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හෙට අනිද්දා වන කොට කොළඹ ඉඳලා නුවරට යන අධිවේගී මාර්ගය ආරම්භ කරනවා. කඩවත, එඩේරමුල්ල, මීරිගම, අඹේපුස්ස හරහා නුවර අධිවේගී මාර්ගය ගමන් කරනවා. ඊළඟට මීරිගම, දම්පැලැස්ස නගරය, වාරියපොල හරහා -වයඹ පළාත හරහා- උතුරු අධිවේගී මාර්ගය ඉදි කිරීම හෙට අනිද්දා ආරම්භ කරනවා. මේක තමයි අපේ රටේ දියුණුව. තමුන්නාන්සේට කියන්න ඕනෑ, අපේ වයඹ පළාතේ මිනිස්සු කොළඹට එන කොට වැඩියෙන්ම දුක් විඳින්නේ ඔය කටුනායක ගුවන් තොටුපොළින් පස්සේ තිබෙන කොටසේ දී බව. අපි traffic එකට සීදුව හන්දියේ ඉන්නවා; කඳාන හන්දියේ ඉන්නවා; මහබාගේ ඉන්නවා; වත්තල ඉන්නවා. ජා-ඇල ඉන්නවා; පැලියගොඩ ඉන්නවා. හැබැයි මේ අධිවේගී මාර්ගය හැදුණාට පස්සේ වයඹ පළාතේ මිනිසුන්ට, කටුනායකින් එහා පැත්තේ ගම්පහ දිස්ත්‍රික්කයේ මිනිසුන්ට, අනුරාධපුරයේ, උතුරු මැද පළාතේ මිනිසුන්ට කටුනායකට ඇවිල්ලා අධිවේගී මාර්ගයට ආවාට පස්සේ විනාඩි 15න් කොළඹට එන්න පුළුවන්. ඇයි මේවාට ද්වේෂ කරන්නේ? ඇයි මේවාට ඊර්ෂ්‍යා කරන්නේ? ඇයි මේ ඇහින් පෙනෙන සංවර්ධනය දකින්න බැරි? අවුරුදු ගණනාවක් තිස්සේ කොළඹ වරායට අත තිබ්බේ නැහැ. හැබැයි දකුණු කොළඹ වරායේ ඉදිකිරීම් කටයුතු අවසාන කරලා හෙට අනිද්දාට එය විවෘත කිරීමටයි යන්නේ. මේවා තමයි ප්‍රාග්ධන ණය අරගෙන කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනික් කාරණය තමයි, මෙතැන දී ගරු මන්ත්‍රීවරුන් මහ බැංකුව සහ අපේ භාණ්ඩාගාරය අතර ඇති ගනුදෙනු සම්බන්ධයෙන් කථා කළා. 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 89වැනි වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "The Central Bank may make direct provisional advances to the Government to finance expenditures authorised to be incurred out of the Consolidated Fund:"
>
> මේ පනතේ තවදුරටත් මෙසේ සඳහන් වෙලා තිබෙනවා:
>
> "Provided that every such advance shall be repayable within a period not exceeding six months,…"

මහා භාණ්ඩාගාරය සහ මහ බැංකුව අතර සිදු වන ගනුදෙනු ඉතා ඉක්මනට ඒ දෙගොල්ලෝ අතර පියවා ගන්නවා. මේ සිද්ධ කරන්නා වූ ගනුදෙනුවල දී සමහර වෙලාවට ලාභ ලබන කොට ඒ දේවල්වලට taxes එහෙම නැත්නම් මොනවා හරි surpluses තිබෙනවා නම් ඒ surpluses අය කර ගැනීමේ ක්‍රමය ඒ දෙගොල්ලන්ටම තිබෙනවා. මෙතැන දී ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් වුණාය කියලා මහ බැංකුවත්, මහා භාණ්ඩාගාරයත් ඒ වගකීම්වලින් නිදහස් වෙන්නේ නැහැ, ගරු

නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. තමන් අතර සිදු කරන ගනුදෙනුවල දී රටේ ජනතාවට, රටේ ආර්ථිකයට පාඩුවක් නොවන විධියට ඒ දේවල් අය කර ගැනීමේ ක්‍රමවේදය ඒ අය තුළ තිබෙනවා. රාජ්‍ය ආයතනවල ගනුදෙනු කරද්දී, රාජ්‍ය ආයතනවලට මුදල් දීලා, මහා භාණ්ඩාගාරය මුදල් දීලා ඒ ගනුදෙනු කරද්දී ඒ අය කර ගැනීම් ඒ විධියටම කර ගන්නවා. ඒ වාගේම බදු තිබෙනවා නම් ඒවා කිසිම විධියකින් අය නොකර ගැනීමේ ක්‍රමවේදයක් නැහැ. ඒක අපි පැහැදිලිව කියන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අප මෙතැනදී රජයට ප්‍රශංසා කරන්න ඕනෑ, සුරා බදු ගැන කථා කරද්දී අද මේ කිතුල් සහ පොල් නිෂ්පාදනවලින් -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
හකුරු සහ පැණි නිෂ්පාදනයට වාගේම රා කර්මාන්තයට දීලා තිබෙන සහනය ඉතාමත් හොඳ දෙයක්. මේ රටේ කිතුල් නිෂ්පාදන කරන්නේ නැති, මදින්නේ නැති කිතුල් ගස් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ අයට තමයි මේ සහනය දීලා තිබෙන්නේ. මේවා තමයි මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත්වල අන්තර්ගතය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක පැත්තකින් අප මේ කාරණය පිළිගන්නට ඕනෑ. වරාය සහ ගුවන් තොටු පොළ, ඛනිජ තෙල් අංගණ, ඒවාවල බන්ධිත වැඩිදියුණු කරන්න ඕනෑ. අනික් පැත්තෙන් බලන විට මේ ආර්ථික සේවා ගාස්තුවලින් කාටවත් කිසිම හානියක් වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් internet සම්බන්ධයෙනුත් සඳහන් කරන්න කැමැතියි. අද අපේ රටේ ශිෂ්‍යයෝ, තොරතුරු ලබා ගන්න අය, නව ලෝකයත් එක්ක තොරතුරු ගනුදෙනු කරන අය විශාල ප්‍රමාණයක් මේ internet සමඟ ගනුදෙනු කරනවා.

අද රජයේ බලාපොරොත්තුව, සෑම ආගමික සිද්ධස්ථානයකම, එහෙම නැත්නම් සෑම ග්‍රාම සේවා වසමකම නැණසල පිහිටුවන්නයි. එහෙම නම් මේ internet සඳහා ගාස්තු අඩු කර තිබීම සම්පූර්ණයෙන් මහජනතාවට පහසුව සලසා දීමක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව, ජනතාවගේ ආණ්ඩුව. මේ ආණ්ඩුව පෙරළන්න විවිධාකාර කුමන්ත්‍රණ එනවා. මේ ආණ්ඩුව පෙරළන්න විවිධාකාර බලවේග එනවා. අප අතර තිබෙන ජාතික සංහිඳියාව, ආගමික සංහිඳියාව නැති කරන්න එක එක බලවේග එනවා. අවුරුදු තිහක යුද්ධයක් නිමා කරලා ආණ්ඩුව නිකම් සිටියේ නැහැ. උතුරේ ජනතාව අමතක කළේ නැහැ. දෙන්න පුළුවන් සංවර්ධනය ආණ්ඩුව උතුරට ලබා දීලා තිබෙනවා. මේවා විනාශ කරන්න බලවේග එනවා. ඒක නිසා අපි ජනතාවගෙන් ඉල්ලනවා, ඉවසීමෙන් ඉන්න කියලා. මේ රට ඊළඟ සහස්‍රයට ගෙන යන්න මේ ජනාධිපතිවරයා හැර වෙන කිසිම කෙනෙක් නැහැ කියමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 3.00]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අගය කරනවා, මට වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. මගේ මිත්‍ර ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ ආවේගශීලි කථාවට උත්තරයක් දුන්නේ නැත්නම් විපක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් මාගේ කාර්යය නිසියාකාරව ඉෂ්ට කළේ නැහැයි කියලා මම හිතනවා. එතුමා ඇහුවා, කටුනායක අධිවේගී මාර්ගයට ඇයි ඊර්ෂ්‍යා කරන්නේ කියලා. අනේ, දෙවියනේ! අපි ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. නමුත් රුපියල් මිලියන 6,500කින් හදන්න පුළුවන් අධිවේගී මාර්ගය, රුපියල් මිලියන 45,800ක් වියදම් කරලා හදන නිසා තමයි අපි තරයේම විරුද්ධත්වය ප්‍රකාශ කරන්නේ. රුපියල් මිලියන 6,500ක් යන එකට ඒ වාගේ අට ගුණයක් වියදම් කරන්න අවශ්‍යද? මෙන්න මේක තමයි සංවර්ධනයට තිබෙන බාධාව. රුපියල් 100ක් වියදම් කරන්න ඕනෑ තැනට ඔබතුමන්ලා රුපියල් ලක්ෂයක් වියදම් කරන නිසා අද රට ණය බරින් පෙළෙනවා. ඔබතුමන්ලා කථා කරන්නේ ලංකාව සල්ලි අව්වු ගහන මැෂිමක් වාගේ කියලා හිතාගෙන. අහිංසක ජනතාව තමයි ඒ සල්ලි ඔබතුමන්ලාට ලබා දෙන්නේ. මේ සල්ලි හම්බන්තොටින් හෝ කාගේ හෝ පෞද්ගලික බුදලයකින් හෝ එන්නේ නැහැ. ඒක තමයි අපට තිබෙන දුක. අපිත් රට සංවර්ධනය කළා. හැබැයි අපි රට සංවර්ධනය කළේ ජනතාවට කිසිදු බරක් පටවන්නේ නැතිව. අද කියන්න, සාමය ලැබිලා අවුරුදු හතරක් ගියා නම් කොහේද ඒ ප්‍රතිලාභය තිබෙන්නේ කියලා. එදා රුපියල් 190ට තිබුණු පිටි කිරි පැකට් එක අද රුපියල් 280යි. එදා රුපියල් 25ට තිබුණු සීනි කිලෝ එක අද රුපියල් 110යි. එදා රුපියල් 28ට තිබුණු භූමිතෙල් ලීටරය අද රුපියල් 89යි, 90යි. මේකටද රටේ සංවර්ධනය කියන්නේ? ඔබතුමන්ලා බොහොම දක්ෂයි, අරක හදනවා මේක හදනවා කියලා කියන්න. ඔබතුමන්ලාගේ සාක්කුවෙන් මුදල් අරගෙන ඒවා හදනවා නම් කමක් නැහැ. අහිංසක ජනතාවගේ සල්ලිවලින් තමයි ඒවා හදන්නේ. නමුත් ඒ ජනතාව බෙහෙත් ටික ගන්න රෝහල් අද වහලා තිබෙනවා. අධ්‍යාපනය ලබන්න පෞද්ගලිකව සල්ලි ගේන්න ඕනෑය කියලා අහිංසක දරුවන්ට හිංසා පීඩා කරනවා. මතකද, හොරණ සිද්ධිය? අහිංසක කුඩා දරුවෙක් තමන්ගේ අධ්‍යාපන කටයුතු කර ගන්න පාසලට ගෙනයන්න සල්ලි නැතෙයි කියලා අසල්වැසියකුගෙන් පොල් ගෙඩි අටක් ගත්ත සිද්ධිය? හොරකම් කළේ නැහැ. "අනේ! මගේ අධ්‍යාපනයට බාධාවක් ඇති කරන්න එපා"කියලා ඇය කිව්වා. කෝ ඒ සම්බන්ධයෙන් තිබෙන මානුෂික බව? ඒ නිසා අපි කියනවා, ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, කරුණාකරලා ඊර්ෂ්‍යාව මෙතැනට ගාවන්න එපා කියලා. ඔබලාගේ දූෂණය නැති කළා නම් ඊර්ෂ්‍යාවක් එන්නේ නැහැ. ඊර්ෂ්‍යාවේ මුල තමයි මේ තිබෙන දූෂණය. කරුණාකරලා ඒකට උත්තර දෙන්න.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
දූෂණයටද, ඊර්ෂ්‍යාව?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔන්න ඔක තමයි කියන්නේ. ඔබතුමාට උත්තරයක් නැත. රුපියල් මිලියන 6,500ක් යන තැනට රුපියල් මිලියන 45,800ක් වියදම් කරන්න යනවා නම් ඒ මුදලින් පාරවල් එකක් නොවෙයි පාරවල් අටක් හදන්න පුළුවන්. ඒක තමයි තිබෙන ප්‍රශ්නය.

දෙවෙනි කරුණ. [බාධා කිරීමක්] ඔව්, රත්වත්ත මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා ඊයේ මන්තලට ගිහින් අව්වේ ඉඳලා ලස්සනට නටලා, එය විවෘත කළා. හරි. ඒකට කිසි ප්‍රශ්නයක් නැහැ. ඔබලා මීට අවුරුදු දෙකකට ඉස්සරවෙලාත් මේ වාගේ ගිහිල්ලා වරායක් විවෘත කළා. ඒ විවෘත කරපු වරායට මාස විසිපහකටම නැව් විසිහතරයි ඇවිත් තිබෙන්නේ. මේකටද රටේ සංවර්ධනය කියන්නේ? කවුද ඒ බර උසුලන්නේ? ඔබතුමන්ලාද?

[ගරු රවි කරුණානායක මහතා]

ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය තමයි සංවර්ධනය කියන්නේ මොකක්ද කියලා දන්නේ නැතිකම. ඔබතුමන්ලා පාලමක් හදයි ගහක් නැති තැනක. ඒකටද රටේ සංවර්ධනය කියන්නේ? එදා හම්බන්තොට වරාය විවෘත කරන කොට ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ? "හම්බන්තොට වරාය අසලින් දවසකට නැව් 400ක් යනවා. මෙයින් සියයට 10ක් ආවත් අපට ඇති" කිව්වා. අනේ මන්ත්‍රීතුමනි, සියයට 10 නොවෙයි, සියයට දශම 01ක්වත් ඇවිල්ලා නැහැ නේ එතැනට. ඉතින් ඒකටද මේ රටේ සංවර්ධනය කියන්නේ? ඒ නිසා කරුණාකරලා විහිළු සපයන්න එපා. ඔබතුමන්ලාට රටේ සංවර්ධනයක් කරන්න ඕනෑ නම් ජනතාවට බරක් පටවන්නේ නැතිව කරන්න.

Ensure that people do not carry the burden. If you carry the burden, go ahead. You have all the right to do anything and everything you want. But, unfortunately, at the expense of the people, you are living in a fool's paradise. That is the problem.

අපි දැන් හම්බන්තොට වරාය ගැන කථා කරන එක මොහොතකට පැත්තකින් තියමු කෝ.

ඔබතුමන්ලා ඊයේ මත්තලට ගියා, අලුතින් ආරම්භ කරපු ගුවන් තොටුපොළට. ඔබතුමන්ලා ගිහින් විවෘත කළා. ඊට පස්සේ මොකක්ද කිව්වේ? එතැන ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් විවෘත කළාය කිව්වා. සාමාන්‍යයෙන් එතැන සිදු කරන අතිවිශේෂම දේ refuel කිරීම කියනවා. නමුත් එතැන oil tank එකක් තිබෙනවාද? ගරු සභාවේ දැන් ඇමතිවරු දෙදෙනෙකු, තුන් දෙනෙකු ඉන්නවා. අපේ ජීවන් කුමාරතුංග ඇමතිතුමනි, ඔබතුමා ඊයේ එතැනට ගිහින් මුද්දරයකුත් issue කළා. මා ඔබතුමන්ලාට වග කීමෙන් කියනවා, ඒ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ oil tank එකක් නැහැ කියලා. ඉතින් කොහොමද තෙල් දෙන්නේ? අහසෙන්ද? එතැන ගබඩා කරන්නේ මොනවාද? තෙල් bowser දෙකක් කොළඹින් අරගෙන ගියා. ඒ bowser එකක තෙල් ලීටර් 45,000ක් තිබුණා. bowser දෙකේම තෙල් ලීටර් 90,000යි. ලීටර් 10,000ක තවත් bowser එකක් ගියා. ඒ ඔක්කෝම එකතු කළාම තෙල් ලීටර් 100,000යි. ඊයේ ආවා "flydubai" aircraft එක. එතැනින් ඩුබායිවලට යන්න තෙල් ලීටර් 90,000ක් ගත්තා. ඊට පස්සේ ඉතුරු වුණේ තෙල් ලීටර් 10,000යි. තව ගුවන් යානයක් තෙල් ගන්න ඕනෑ වෙලා එතැනට ආවා නම් කියයි, "අපි ළඟ තෙල් නැහැ, වතුර ඕනෑ නම් ගහ ගෙන පලයල්ලා" කියලා. මේකටද රටේ ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් විවෘත කළාය කියන්නේ? විළිලජ්ජාවක් නැහැ.

මත්තල ඉඳන් යුරෝපයට යන්න අඩු ගණනේ තෙල් ලීටර් 175,000ක් යනවා. නමුත් එතැන තිබෙන්නේ තෙල් ලීටර් ලක්ෂයක් නම් කොහොමද යන්නේ? මත්තලට ඇවිල්ලා, එතැනින් තෙල් ලීටර් ලක්ෂයක් අරගෙන, ආපහු කටුනායකට ඇවිල්ලා ඉතුරු තෙල් ලීටර් 75,000 ගන්නද කියන්නේ? ඒකටද රටේ සංවර්ධනය කියන්නේ? අපට කිසි සේත්ම අවශ්‍ය නැහැ මේ ගැන කුහකකමකින් කථා කරන්න. මේ කරන ඒවා ඇති ලෝකයට පෙන්වන්න. කිසි සේත්ම කුහකකමින් තොරව අපි අහනවා, හම්බන්තොට වරායෙන් වාගේම, මේ ගුවන් තොටුපොළ නිසා වැඩි වුණු වියදම ජනතාවට දරා ගන්න පුළුවන්ද කියලා. මේක තමයි තත්ත්වය.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ එකම දේ තමයි මේ ආණ්ඩුව රැකීම. ඒක රැක්කේ නැත්නම් අන්තිමට ගෙදර යන්න වේවි. නමුත් අපට තිබෙන්නේ රට ආරක්ෂා කරන්න මිසක්, ඔබතුමන්ලාගේ දූෂිත, අකාර්යක්ෂම සහ පවුල්වාදය තිබෙන මේ ආණ්ඩුව රැකීම නොවන බව අප මේ අවස්ථාවේදී විපක්ෂය වශයෙන් වග කීමෙන් කියනවා. ඒවා තමයි සැබෑ සංවර්ධනයට තිබෙන බාධා. ඒවා අයින් කරන්න. දූෂණය නැති කරන්න. සැබෑ සංවර්ධනය ඇති කරන්න. ප්‍රාග්ධන වියදම් ඉතා අයිකියි. ඔබතුමන්ලා අද කටයුතු කරන්නේ අසීමිත සම්පත් තිබෙන විධියටයි. ඊයේ ජනාධිපති ලස්සනට කිව්වා, "අපි මේ ණය ගන්නේ කන්න නොවෙයි" කියලා. ඇත්ත. කන්න නොවෙයි, ජොලි කරන්නයි ගන්නේ. ඒක ඊට අන්තයි නේ.

නොරොච්චෝලේ විදුලි බලාගාරය හැදුවා. විදුලි බිල අඩු වුණාද? නැහැ. ඔබතුමන්ලා දකුණු අධිවේගී මාර්ගය හැදුවා. ඒකෙන් ජීවන වියදම හා ප්‍රවාහන ගාස්තු අඩු වුණාද? නැහැ. බස් ගාස්තු සියයට 25කින් විතර වැඩි වුණා. ඒ වාගේම හම්බන්තොට වරාය හැදුවා. එය ඉදිකිරීමෙන් මේ රටේ ජීවන වියදම අඩු වුණාද? අපනයන වැඩි වුණාද? නැහැ. අපනයන සියයට 4.1කින් අඩු වුණා. ජීවන වියදම ගිය අවුරුද්දට වඩා සියයට 10කින් වැඩි වුණා. තව අවුරුද්දක් ඉදිරියට ගිහින් සැසඳුවාම සියයට 20.2කින් ජීවන වියදම වැඩි වෙනවා. එහෙම නම් කොහේටද මේ ප්‍රාග්ධන වියදම යන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම කොළඹ දකුණ වරායේ breakwater එක ඉදි කර තිබෙනවා. ඒකෙන් මොනවාද වෙලා තිබෙන්නේ? කොළඹ වරායේ සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවාද? දැන් Colombo South Container Terminal එක තිබෙනවා. ඒක සැබෑවක්. නමුත් 2011 අවුරුද්ද එක්ක බැලුවාම සියයට 4.1කින් පැමිණෙන containers ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. එහෙම නම් රටේ සංවර්ධනය කොහේද තිබෙන්නේ? ඉතින් අපි මේවා කියන්නේ කුහකකමකින්ද? මේ සැබෑ දේවල්. අපි ඒවා කියනකොට, අපි "දේශ ද්‍රෝහියෝ." ඒ වැරදි කරන අය, ලංකාවේ කොඩිය බදා ගෙන ඉඹ, ඉඹ ඉඳලා "දේශ ප්‍රේමියෝ" වෙනවා. මේ විධියේ සංවර්ධනයක් නොවෙයි අපට අවශ්‍ය වන්නේ. අපට අවශ්‍ය වන්නේ සැබෑ සංවර්ධනයක් ඇති වන එකයි.

මේ ආණ්ඩුව දෙනකම් ගන්නවා. දැන් පුදුම සංකල්පයක් තිබෙන්නේ. මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්‍රාල් මහ ලොකුවට කිය කියා යනවා, ණය ගන්න ඕනෑ නැහැ අමාරුයි, අරක හරි, මේක හරි, අපට US Dollar මිලියන 8,000ක් තිබෙනවා කියලා. හැබැයි, ණයක් ගන්න පුළුවන් තැනක ශත පහක් තිබුණත් ඒක ගන්නවා. දෙනතුරු ණය ගන්නවා. IMF එක එළවලා, ආපහු ඉඹලා ගෙනාවා. දැන් කියනවා ණය දෙන්නේ නැහැ කියලා. ඊට පස්සේ කියනවා, අපට ණය ඕනෑ නැහැ කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ණය දෙන්න මෙහාට ආවේ ඉල්ලීමක් කරපු නිසා. නැත්නම් ඒ අය ලංකාවට ආදරෙන් ඇවිල්ලා ණය දෙනවාද? නැහැ. ඒ වාගේම ලෝක බැංකුව කියනවා, "අපි මේ ණය දෙන්නේ තමුන්ලාගේ දූෂණය අඩු කරලා-

The World Bank has basically emphasized that they will give loans only if you ensure that there is a cost-benefit analysis on them, good governance and corruption is reduced.

One of today's newspapers highlights that Sri Lanka has set a record of being the 79th worst country of corruption. So, day by day, the world is losing confidence in us. When the country is going through an absolute economic turmoil, when the country is technically bankrupt and repawned by this Government, they are basically looking at anything and everything and trying to pay tomorrow's loans from today's borrowings.

Then, they went to Japan to get loans but they are conditional loans. They have not just promised this US Dollars 489 million to Mahinda Rajapaksa to do whatever

he wants. It was promised on the condition that good governance prevails, peace orientation and devolution of power takes place. If that is not the case they will reject, rebuff that.

The world has suddenly found that there is a huge problem in Sri Lanka, that the Government of Sri Lanka is only working for nearly 157 Ministers and Deputy Ministers and not for the 21 million people living in the country.

මේක තමයි තිබෙන ප්‍රශ්නය.

මේ කථා කරන මොහොතේත් ජිනීවාවල ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අපි සියලු දෙනාම ඒක රාශී වෙලා ඒක දිනන්න තිබෙන අවස්ථාවක මහින්ද සමරසිංහ ගමේ වන්ඩියෙක් වාගේ කියනවා, "උඹලාට ඕනෑ එකක් කරපල්ලා" කියලා. ඔවුන් හිතනවා, ලංකාවේ ඉඳගෙන හූ කිව්වාම මුළු ලෝකයම ඇවිල්ලා ඒ ගොල්ලන්ගේ ඉස්සරහ දණ ගහවි කියලා. මෙහෙම නොවෙයි, රටක් ඉදිරියට ගෙන යන්න අවශ්‍ය වන්නේ. ඔබතුමන්ලා වටිටන රටේ ආර්ථිකය හදන්න තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයටයි. ජීවන් කුමාරතුංග මැතිතුමනි, 2001 දීත් ඒක නේ වුණේ. ඔබතුමන්ලා 2001දී සියයට 2.1ක ඍණ ආර්ථිකයක් ඇති කරලා, ආර්ථිකය කඩා වටිටලා ආණ්ඩුව අපට දුන්නා. අපි නැවත හදා දුන්නා. එදා හදපු ඒ තල්ලුවෙන් තමයි තවම දුවන්නේ. ඔබතුමන්ලා මොනවා කළත් අපට කමක් නැහැ. නමුත් අන්තිමේදී රටේ ජනතාවට තමයි ඒ බර උසුලන්න වෙන්නේ. ඒක තමයි අපට තිබෙන දුක.

මම ඉතා ඕනෑකමින් මේ කාරණය කියනවා. දෙනතුරු ගන්න ආණ්ඩුවට දැන් ඉන්දියාවෙන් ලැබෙන්නේ නැහැ; යුරෝපයෙන් ලැබෙන්නේ නැහැ; ඇමෙරිකාවෙන් ලැබෙන්නේ නැහැ. දැන් චීනයත් හිතනවා, "යකෝ, මුන්ට දීලා ඉවරයි, ඒත් කිසිම කෙළෙහි ගුණයක් නැහැ" කියලා. ඒකත් අමාරු නිසා දැන් ජපානයට ගිහිල්ලා කියනවා, "අනේ, දෙන්න පුළුවන් ප්‍රමාණය දෙන්න" කියලා. 2005 ජනවාරි මාසයේ පළමුවැනි දා වන කොට බිලියන 1,784ක ණයක් තිබුණු රටක, අද මේ කථා කරන මොහොත වන කොට සම්පූර්ණ ණය බර බිලියන 6,900 දක්වා වැඩි වෙලා.

Sir, the strange irony is that a country which had a total public debt of Rs. 1,784 billion as of 1st January, 2005 is having a total public debt of Rs. 6,900 billion as of January, 2013. But, this type of increase in debt has not had a resultant increase in the asset ability of the country. No such thing has happened. Is the Government held accountable for what it is doing? They borrow money to pay yesterday's loans. When the Government borrowed money at 8 to 9 per cent, we told them not do so especially regarding the HSBC loan and the ICICI loan. We told them that commercial borrowing to pay for social benefits cannot sustain itself and today, the Government is in a debt trap. The real development that has got to flow in and penetrate to people is stalled. Who is basically complaining about this? It is the innocent people of this country.

ඒ නිසා තමයි අපි මෙහෙම කියන්නේ. ජනතාව මුල් කොටගෙන, ඒ අයගේ ජීවන වියදම අඩු කරගෙන, අධ්‍යාපනය සුරක්ෂිත කරගෙන, රෝහල්වලට ගියාම බෙහෙත් තිබෙන රෝහලක් බවට පත් කරගෙන, රටේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කරගෙන, යහ පාලනයක් ඇති කරගෙන, ජාත්‍යන්තර ලෝකයේ සහයෝගය තියාගෙන තමයි රටේ සංවර්ධනයක් ඇති කරන්න ඕනෑ කියලා අපි මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. අද සංශෝධන පනත් කෙටුම්පත් ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ආණ්ඩුවේ අදක්ෂතාව අද උදේ ඔප්පු වුණා නේද? අය වැය අවසන් වෙලා මාස තුනක් ගත වෙලා තිබෙනවා. නමුත් මේවා අන්තිම පැයේ ගෙනෙන්නේ, මොනවාද කරන්න තිබෙන්නේ කියලා ඒ අය දන්නේ නැති නිසායි. ඔබතුමන්ලාගේ අදක්ෂතාව විපක්ෂයේ වැඩ කටයුතුවලට බාධාවක් වෙන්න ඉඩ දෙන්න බැහැ. තමුන්නාන්සේලාට තිබෙන කටයුත්ත හරියට කරන්න බැරි නම් අද උදේ කළා වාගේ බලහත්කාරයෙන් කරන්නේ නැතුව, "ඔව්, වැරැද්දක් තිබෙනවා" කියලා වැරැද්ද පිළිඅරගෙන ඉදිරියට යන්න පුළුවන් නම් අන්න එතැන තමයි මනුෂ්‍යභාවයක් තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ ශක්තිය පාවිච්චි කරන්නේ අංක ගණිතයට අනුවයි. "අපට මෙන්න මෙච්චර මන්ත්‍රීවරු සංඛ්‍යාවක් ඉන්නවා, ඒ නිසා උඹලා ඕනෑ එකක් කියපල්ලා, අපට ඕනෑ එකක් අපි කරනවා."යි කියනවා. මෙන්න මේ වාගේ තත්ත්වයක් නිසා තමයි රට දෙදරන්න පටන් අරගෙන තිබෙන්නේ.

ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා කියලා කියන්නේ අපි ගරු කරන ඇමතිවරයෙක්. අද එතුමා කියනවා, තමාට ජීවත් වීමේ හැකියාව අද ලොකු ප්‍රශ්නාර්ථයක් වෙලා තිබෙනවා කියලා. අපි පිළිගන්නවා. අද යන විධියට ඇමතිවරයෙකුට ලිපිකරුවෙකුට තිබෙන බලතලවත් නැහැ. එතුමා එහෙම කියන්නේ යම් විධියකින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරක්ෂා කර ගන්න ඕනෑ නිසයි. කොළඹ දිස්ත්‍රික්කයේ රැස්වීමකදී ඊයේ කුමාර වෙල්ගම ඇමතිතුමා මොනවාද කිව්වේ? මේ පැත්තෙන් ඒ පැත්තට පැනපු අලි ටික බලලා මොනවාද කිව්වේ? "මුන් ඇවිල්ලා මොනවාද කරන්නේ, අපේ පක්ෂයේ තිබෙන සාරවත්භාවය නැති කරලා -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තිබෙන ඒ සාරවත්භාවය නැති කරලා- නැවත මුන් පනින ගමනක් තිබෙන්නේ." යැයි කියන්න කුමාර වෙල්ගම ඇමතිතුමාට හැකියාවක් තිබුණු එක අපි අගය කරනවා. එතුමාට එහෙම කියන්න හැකියාව තිබුණා. තාවකාලිකව මෙතැනින් එතැනට පැන පැන, දේශපාලනය ගැන ප්‍රශ්න කර කර, රටේ ප්‍රජාතන්ත්‍රවාදය වළලාගෙන, ඒකාධිපති පාලනයකට ගමන් කරමින් රට ඉදිරියට ගෙන යන්න පුළුවන්ද කියන එක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය. ඒ නිසා මේ පනත් කෙටුම්පත් ගෙනෙන එක නොවෙයි, අද අපට අවශ්‍ය වන්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

No, no. There is a decision by the Hon. Speaker that he will not be allowed to take the Chair. When was that changed?

ගරු ජීවන් කුමාරණතුංග මහතා (කැපැල් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க - தபால் சேவைகள் அமைச்சர்)
(The Hon. Jeewan Kumaranatunga - Minister of Postal Services)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you can continue with your speech.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No. There is a decision by the Hon. Speaker. So, you cannot preside. Please tell as to when that decision was changed.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, I am presiding.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
We cannot allow you to preside. I questioned this before you took the Chair.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You cannot question the Chair. You proceed with your speech.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
We are not questioning the Chair. We are questioning the Hon. Azwer. - [*Interruption*.] The Hon. Speaker has given an undertaking that you will not be in the Chair.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you had better follow the Standing Orders.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Not the Standing Orders; the Hon. Speaker has given us a word.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
It was the Hon. Deputy Chairman of Committees who invited me to take the Chair. That is all. I am a Member of Parliament.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am not concerned of that. - [*Interruption*.] We have got an undertaking. - [*Interruption*.] We are not going to allow this type of thing to go on in Parliament. - [*Interruption*.]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is no such Ruling given by the Hon. Speaker. Hon. Member, you carry on because I do not want to -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am sorry. I am not going to carry on with my speech. We, as the United National Party, have a backbone. We have been given an assurance and we need that to be carried out.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You can take it up with the Hon. Speaker, please.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes. We will take it up with the Hon. Speaker. You have to suspend the House for that. We cannot allow this type of thing to go on.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Exactly.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Ajith P. Perera was humiliated by you. That is why you were removed from the Chair. - [*Interruption*.] That Ruling was given by the Hon. Speaker. There should be no subtle -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I am kindly reminding you that you cannot question the Chair.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am not questioning the Chair. I am questioning the Hon. Azwer.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You cannot do that.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker has given us an assurance.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Standing Orders are very clear. The Presiding Member has all the right that the Hon. Speaker has. - [*Interruption*.] Please set an example to others.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
There is no need for me to set an example. You should set an example from the Chair.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is a peaceful House listening to you. Why do you not continue with your speech?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. ගරු කථානායකතුමා එදා තීන්දුවක් ගත්තා. ඒ තීන්දුව වෙනස් කර තිබෙනවාද කියා මා දැන ගන්න කැමැතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I have presided before. This is the third occasion. - [*Interruption*.]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No, no. But,-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
At the previous Sessions also I presided. You all were not present in the House at that moment to question it. Anyway, I am going by the Standing Orders, nothing else.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
There is a sense of precedence that is created from what you are doing. - [*Interruption*.]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is somebody in the Chair. You carry on, please. If not, I will call upon the next speaker. That is all.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am sorry. You cannot take up this matter like a point of Order. We want this matter to be referred to the Hon. Speaker. Suspend the House and let the Speaker give us a word on this matter.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The point of Order is overruled. Please carry on.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No. This cannot go on like this.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne))
ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනයේ සිටිනවා. මගේ පෞද්ගලික අදහස මෙයයි. ප්‍රශ්නයක් තිබෙනවා නම් කථානායකතුමා පැමිණි වෙලාවක ඒ ගැන සාකච්ඡා කරන එක වෙනම කථාවක්. එහෙම නැතුව මෙය විවාදයට බාධාවක් වෙන්න ඉඩ දෙන්න බැහැ. [බාධා කිරීමක්] එතුමාගේ නම යෝජනා කරලා එතුමාට වාඩි වෙන්න කියා කිව්වා නේ. [බාධා කිරීමක්] එළියේ ඉන්න සේවකයෙක් නොවෙයි නේ එතුමාව වාඩි කෙරෙව්වේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! I can only ask you to carry on with your speech, Hon. Ravi Karunanayake. That is all.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Mr. Presiding Member, I rise to a point of Order. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කථානායකතුමා තීන්දුවක් ගත්තා, ඔබතුමාට මූලාසනයේ ඉන්න දෙන්නේ නැහැයි කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, the Hon. Speaker has not made such an announcement in the House. Anything of the sort you are now saying has not been announced by him.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමා එම තීන්දුව ප්‍රකාශයට පත් කළා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
When I asked about this, he said, "no order has been made". So, Hon. Ravi Karunanayake, you can carry on with your speech now.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමා එම තීන්දුව ප්‍රකාශයට පත් කළා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is nothing new in this. Hon. Ravi Karunanayake, please carry on. . - [*Interruption*.]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
How can you be presiding all this time? - [*Interruption.*]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Ravi Karunanayake, please carry on.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
It has been very categorically said and an assurance has been given to all of us. We cannot allow this type of thing to go on in Parliament.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I have been telling you this over and over again. You kindly take it up with the Hon. Speaker. That is all. Now, you carry on with your speech.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
There is nothing to take up with the Hon. Speaker. He has given an assurance.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
If you continue in this vein, I have no alternative but to call upon the next speaker.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am sorry. Do you think that you can allow Parliament to go on in the way you want? We are Members of Parliament. Just because you all have might, might is not right.

ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. DEW Gunasekara, please - එහෙම නම් සවස 3.30වන තෙක් කල්දමන්න.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඉඩ දෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I have presided on three occasions during the recent Sessions. You can go through the Hansard. None of you were here to raise a matter like this. In any case, the Chair has all the right. You carry on with your speech. - [*Interruption.*] I suspend Sittings for five minutes.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 3.30ට නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 3.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 3.30 p.m. and then resumed, MR. DEPUTY SPEAKER *in the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තුතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලා පාර්ලිමේන්තු සම්ප්‍රදාය රකින්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන එක මා බොහොම අගය කරනවා. ඒ වාගේම Assistant Secretary-Generalටත් ස්තුතිවන්ත වනවා. දැන් ඒවා අවසන්. මේ රටේ ආර්ථිකය කඩා වැටී තිබෙන අවස්ථාවක මේ සභාවේ මූලාසනයත් කඩන්න පුද්ගලයකු එවිව නිසා තමයි අපි මෙතැන ප්‍රශ්නය පටන් ගත්තේ. එදා අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට ප්‍රශ්නයක් ඇති කරලා මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය නැති කරන්න හැදුවා. අද එය මතක් කරමින්, ඔබතුමන්ලා යන ගමන අපි අගය කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Deputy Speaker, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
There is a point of Order being raised by the Hon. Dinesh Gunawardena.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා, ගරු නියෝජ්‍ය කථානායකතුමා සහ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා නොමැති අවස්ථාවක මූලාසනය ගැනීමේ Panel එකක් තිබෙනවා. ඒ Panel එකට අපහාස කිරීම සුදුසු නැහැ. එම නිසා ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට මා ඉතාම ගෞරවයෙන් කියනවා, මොන ප්‍රශ්න තිබුණත්, ඒවා විසඳා ගැනීමේ පාර්ලිමේන්තු සම්ප්‍රදායක් තිබෙනවා, එසේ නැතුව පාර්ලිමේන්තුවේ මූලාසනය දරන තැනැත්තන්ට තමන්ට හිතෙන පරිදි එක් එක් වචන පාවිච්චි කිරීමෙන් හෝ විවේචනය කිරීමෙන් වළකින්න කියලා. එයයි, පාර්ලිමේන්තු සම්ප්‍රදාය.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම අවස්ථාවේදී මේ සභාවේ හිටපු නැති ඇමතිවරයෙක් ඇවිත් මේ සම්බන්ධයෙන් කියනවා. ඔබතුමා කියන්න, මා මොන වචනයද පාවිච්චි කරලා තිබෙන්නේ කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කථා කරන්න දන්නේ නැත්නම් ඉඳ ගන්න. [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා අහන්නේ, අපහාස කළ වචන මොනවාද කියලායි. [බාධා කිරීම්] අපහාස කළ වචන මොනවාද? [බාධා කිරීම්] ඔබතුමා හිතුමතයට නිකම් කෑ ගැහුවා කියලා හරි යන්නේ නැහැ. [බාධා කිරීම්] මා අහනවා, කථා කරපු වචන මොනවාද කියලා. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Dinesh Gunawardena, you can raise your point of Order.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, it is very clear. මේ පාර්ලිමේන්තුවේ සිටියත්, නැතත් Chair එකේ සිටින තැනැත්තාට මන්ත්‍රීවරයකු challenge කරනවා නම් ඒ මන්ත්‍රීවරයා "අ" යන්න දන්නේ නැති බබෙක් කියන එක මා කියනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Ravi Karunanayake. [බාධා කිරීම්] ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] කරුණාකරලා ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] Hon. Members, the Hon. Ravi Karunanayake is on his feet. කරුණාකරලා ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] Order, please! ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. [බාධා කිරීම්] කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
හොඳ සම්ප්‍රදාය.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
The Hon. Member cannot challenge the Chair. - [*Interruption.*]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා කථා කරනවා. ඇහෙන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You cannot challenge the Chair. Whoever is in the Chair has to be respected by the House. - *[Interruption.]*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීම්] Hon. Deputy Speaker, right is might, not might is right. Just because he shouts, it does not mean that we get frightened and sit down. All we did was, when his name was called to take the Chair, we opposed him. But, he came and sat there. Who is disrespecting the Chair? When we said, "Do not come", he comes. That is the problem. He comes, sits and then chairs.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Deputy Speaker, the Deputy Chairman of Committees who presided over there, called me to the Chair. He has all the right, and Sir, this Member chose to insult the Chair. I must bring to your notice that I was not removed by the Speaker.- [*Interruption.]*

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

Hon. Deputy Speaker, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Harin Fernando, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, let me finish.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Harin Fernando, what is your point of Order? කරුණාකරලා එක මන්ත්‍රීතුමෙක් එක වර කථා කරන්න. මේක පාර්ලිමේන්තුව. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

Hon. Deputy Speaker, we met the Hon. Speaker last time when we were faced with this problem and the Hon. Speaker assured us that the Hon. Azwer will never take the Chair.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

That is not a point of Order.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Dayasiri Jayasekara, what is your point of Order.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරයකු මූලාසනයට පැමිණෙන්න නම්, සාමාන්‍යයෙන් අපි -සභාවෙන්- යෝජනාවක් ගේන්න ඕනෑ. මේ අවස්ථාවේදී සභාවේ යෝජනාවක් අනුව නොවෙයි, අස්වර් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණියේ. එතුමා බලහත්කාරයෙන් තමයි මූලාසනයට ඇවිල්ලා ඉඳ ගත්තේ. බලහත්කාරයෙන් මූලාසනයේ ඉඳ ගැනීම සම්ප්‍රදාය නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මම ඔබතුමාට ගෞරවයෙන් කියන්නේ, බලහත්කාරයෙන් කෙනෙකු මූලාසනයට ඇවිල්ලා ඉඳ ගන්නවා කියන්නේ ඒක අපට කරන අපහාසයක්; පාර්ලිමේන්තුවට කරන අපහාසයක් කියලායි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, please kindly listen to my point of Order. The Hon. Dayasiri Jayasekara is even challenging the Order made by the Deputy Chairman of Committees at that time. He invited me. I was never asked not to take the Chair. The Hon. Speaker has - [*Interruption.*] .

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

Sir, I was never asked by the Hon. Speaker not to take the Chair; no order has been made by the Hon. Speaker to that effect. Therefore, Sir, they were insulting the Chair at that time, and also now they are choosing to insult the Hon. Deputy Speaker who -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Now, I have given enough opportunity to either side. Hon. Ravi Karunanayake, you continue with your speech.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I respect the Deputy Speaker for coming and taking the Chair and bringing respect to the Chair; we never disrespect the Chair. It was others who came and sat there and disrespected the House and that is the problem. I guess my good Friend's - a veteran speaker - amiable and generous disposition got somewhat perturbed. He came running and started shouting; I do not understand as to why he did so. I am sure sanity has prevailed now and his cooler thoughts are making him feel as to what he uttered. All I say is, never mind. Everybody errs and it is human. Let us go forward. But, ensure that these types of things do not happen again. We are very conciliating as an Opposition. But, that does not mean we take any rubbish that you put in there.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මූලාසනයට ඇවිල්ලා මේ ප්‍රශ්නය විසඳීම අපි අගය කරනවා. මේ අවස්ථාවේදී ගරු සභාවට අගමැතිතුමාත්, හිටපු අගමැතිතුමාත්, සියලු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුත් පැමිණ සිටිනවා. අපි මෙතැන වැදගත් දෙයක් අහනවා. අපි මේ පනත් කෙටුම්පත් ගැන කථා කරනවා. අද ජාත්‍යන්තර ලෝකය දිහා බැලුවාම ලංකාව හුදකලාවෙයි ගමන් කරන්නේ. ලංකාවට ආදරය කළ, අපට ඉතාමත් මිත්‍රශීලීව සිටි

ඉන්දියාව අද කොහේද සිටින්නේ? එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ සමුළුවේදී මානව අයිතිවාසිකම් පිළිබඳව ගෙනාපු යෝජනාවට නිදහසින් පස්සේ පළමුවැනි වතාවට අපට විරුද්ධව ඉන්දියාව ඡන්දය දුන්නා.

අදත් විපක්ෂයක් වශයෙන් අපි ආණ්ඩුවට උදවු කරන්න යන අවස්ථාවක ආණ්ඩුව කියනවා, අපේ සහයෝගය ඕනෑ නැහැ කියලා. අපට එහෙම කිව්වත්, එම ඡන්දයෙන් දිනලා එන්න ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා. නමුත් අද මේ කියන අවස්ථාවේදී ඉන්දියාවටවත් යන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා නේද? මේ කියන අවස්ථාවේදී ගරුතර බෞද්ධ ස්වාමීන් වහන්සේලා දෙනමක් සම්බන්ධව ඉන්දියාවේදී ඇති වූ ප්‍රශ්නය අපි පිළිකුල් කරනවා. ඒ වාගේම එය තරයේ ප්‍රතික්ෂේප කරනවා. අප මේ ආණ්ඩුවෙන් අහනවා, මෙහේ ලොකුවට සද්ද කර කර මුළු ලෝකයටම තමන්ගේ නිදොස්භාවය ප්‍රකාශ කරන අවස්ථාවේදී ඇයි මේ ආණ්ඩුව ඉන්දියාවට කථා කරලා මේ ස්වාමීන් වහන්සේලාට වුණු දේ ගැන විමසන්නේ නැත්තේ කියලා. මහාබෝධි සංගමයේ ස්වාමීන් වහන්සේලා ඉතාමත් අනගි සේවයක් ඉන්දියාවේ කරනවා. එක පැත්තකින් අකුරස්සේ මුස්ලිම් ප්‍රශ්නයක් ඇති කර ගෙන මේ ආණ්ඩුව මෙහේ ලොකුවට දඟලනවා. අනෙක් පැත්තෙන් හලාල් ප්‍රශ්නයක් උස්සා ගෙන යනවා. ඊයේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විවෘත කරනකොට හැන්දෑවේ වීරකැටියේ ක්‍රිස්තියානි පල්ලිවලට ගහලා තිබෙනවා. ඒ වාගේම වත්තල හින්දු දේවස්ථානයකට ප්‍රශ්න ඇති කරලා තිබෙනවා. ජාත්‍යන්තර ලෝකයක් එක්ක සමඟිතාවක් ඇති කර ගෙන ආගමික ප්‍රශ්න විසඳීම අතිවිශේෂයි. අපේ රටේ ත්‍රස්තවාදී ප්‍රශ්නයක් ඇති වුණා. නමුත් කරුණාකර ආගම් ප්‍රශ්න ඇති කරන්නේ නැතුව ගමන් කරන්න ඕනෑ කියන එක කියන්න ඕනෑ.

අගමැතිතුමා, හිටපු අගමැතිතුමා, ෆවුසි ඇමතිතුමා වාගේ අයගේ අදහස් ගොනු කර ගෙන ආණ්ඩුවක් විධියට යන්න පුළුවන් නම් තිබෙන ප්‍රශ්න අඩු වෙනවා මිසක් වැඩි වෙන්නේ නැහැ නේද? ඒ නිසා අපි අහනවා, අද ඉන්දියාවේ ස්ථාවරය පිළිබඳව ආණ්ඩුව මොනවාද කියලා තිබෙන්නේ කියා. දැන් පෙළපාළි යනවා. නමුත් ආණ්ඩුවෙන් ඒ ගැන ප්‍රකාශයක් කරලා තිබෙනවාද? අප ජිනීවා ගැන කථා කරනවා. මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා Labour GSP නැති වෙන කොට අප කිව්වා ඇහලුම් සඳහා මේ රටේ බදු පනවන්න එපා කියලා. එක්සත් ජාතික පක්ෂය ලබා දුන්, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියලා තහවුරු කළ Labour GSP එක දැන් නැති වෙලා තිබෙන්නේ. එයින් US Dollars 1,100 million රටට අහිමි වෙනවා. එදා මහ බැංකුවේ අධිපති කිව්වේ මොනවාද? "මොන පිස්සුද, විපක්ෂය හීන ලෝකෙක ඉන්නේ" කියලා කිව්වා. අද වාණිජ මණ්ඩලය කියනවා, රුපියල් බිලියන 145ක් ලංකාවට අහිමි වෙලා තිබෙනවා කියලා. රුපියල් බිලියන 145ක් කියන්නේ රුපියල් කෝටි 14,500ක්. මේවා කජු ඇටද? කොස් ඇටද? අහිංසක දුප්පත් ජනතාවගේ භූමිතෙල් මිලට තව රුපියල් 10ක් එකතු කරන්නේ එම සහනය ලබා ගන්න බැරි නිසායි.

අද වෙන කොට ඇහලුම් කර්මාන්තශාලා 271ක් වැහිලා තිබෙන්නේ. Two hundred and seventy one garment factories had been closed down because of the loss of Labour GSP that had been there. I am asking the Senior Ministers who are here, is this the way you take the economy to the cleaners at a time when every single cent is important to this country? You have a sense of arrogance to question the EU when you are beholden to them for giving the Labour GSP to you. You said, “No, we do not want that”. I do not want the country to be subservient, in any way, to any country to get its dues. But, when we get something, we have got to protect it. Today, if you had that Rs. 145 billion at the disposal of the exporters, you do not need to tax the people, increase petrol prices and to impose a 50 per cent increase on electricity charges, in turn increasing the cost of living, which is going up by the day. If you had that Rs. 145 billion, then you could have utilized the taxes on that in order to ensure that you give at least a 20 per cent salary increase to the private sector. Hon. Vasudeva Nanayakkara, I know you are very concerned about increasing the revenue. But remember, on the other side of the economy, you have got to reduce your cost. If you increase your cost and try to reduce your revenue, it would be a recipe for disaster and that is what is going on at this particular moment.

දැන් මේ කථා කරන වෙලාවේ මා කිව්වා වාගේ ජාතිවාදී, ආගම්වාදී ප්‍රශ්න සමථයකට පත් කරලා රටට යම් විධියක ඉදිරි දැක්මක් සහිත අන්තවාදී නොවන දේශපාලන නායකත්වයක් අවශ්‍යයි. රටේ මෙවැනි දේවල් ඇති වුණොත් ජිනීවාවලින් එන උත්තරය අපේ රටට හිතකාරී වෙන්න බැහැ. මේ අවස්ථාවේදී අපි ආණ්ඩුවෙන් ඉල්ලනවා, කරුණාකර ලෝකයේ රටවල්වලින් ජිනීවා සමුළුවට ගෙනෙන යෝජනාව ලංකාවට අහිතකර වන විධියට කටයුතු කරන්න දෙන්න එපා කියා. අපි කවදාවත් කියන්නේ නැහැ ඒ රටවල අවශ්‍යතාව අනුව කටයුතු කරන්න කියලා. ලංකාවේ කීර්ති නාමය ආරක්ෂා කරන්න කියන එක විතරයි එක්සත් ජාතික පක්ෂය වශයෙන් අප ආණ්ඩුවෙන් ඉල්ලන්නේ. එවැනි ප්‍රශ්න ඇති වෙන කොට අන්තිමට මුළු ලෝකයම ලංකාව දෙස බලන්නේ මොකක් හෝ ප්‍රශ්නයක් තිබෙන විධියටයි. ගමේ චණ්ඩියෝ වාගේ කෑ ගැහුවාම මුළු ලෝකයම අපේ කකුල් ළඟ දණ ගහයි කියලා හිතන්න එපා. ලෝකය තිබෙන්නේ ලංකාව ඇතුළේ නොවෙයි, ලංකාව තිබෙන්නේ ලෝකය ඇතුළේයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
ඔයගොල්ලන් චණ්ඩි පාටි දාන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා ගිහිල්ලා චණ්ඩි පාටි දාන්න. විමල් වීරවංශ වාගේ මාරාන්තික උපවාසයක් කරන්න. ඇයි, ඔබතුමන්ලා බැන් කී මූන්ලාට පෙන්නුවේ? [බාධා කිරීමක්] ඔබතුමා මෙතැන කෑ ගහලා වැඩක් නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි පුංචි රටවල්.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පුංචි රටවල් තමයි. මීට වැඩිය පුංචි රටවල් මීට වැඩිය සාර්ථකත්වයක් ලබලා තිබෙනවා. [බාධා කිරීමක්] අපට වැඩිය පොඩි රටක් තමයි මාලදිවයින. මාලදිවයින මීට වැඩිය සාර්ථක ලෙස තමන්ගේ ප්‍රශ්න විසඳා ගෙන තිබෙනවා. අරක පුච්චලා, මේක පුච්චලා, බැන් කී මූන්ට බැණලා, ජිනීවා යන රටවල්වලට බැණලා, ඇමෙරිකාවට මුකුළු කරලා හරියන්නේ නැහැ. අපි

[ගරු රවි කරුණානායක මහතා]

ඔක්කෝම අමතක කරමු, අපේ හිතවත්ම ඉන්දියාවත් එක්ක දැන් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? ඉන්දියාව අපිත් එක්ක තරහාද? මොනවාද ඒ අය කියන්නේ? ඒ ගොල්ලෝ කියන්නේ කරුණාකරලා මහින්ද රාජපක්ෂ බැන් කී මූන්ට කියපු දේ කරන්න, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයෙන්ම පත් කරපු අය විසින් හදපු LLRC එක අනුව කටයුතු කරන්න, ජී.එල්. පීරිස් ඉන්දියාවේ External Affairs Ministerට 2012 මාර්තු මාසයේ කළ ප්‍රකාශය ක්‍රියාත්මක කරන්න කියන එකයි. ඊට වැඩිය මොකුත් කියන්නේ නැහැ. ඒ වාගේම තමන්ගේම ස්වායත්ත කොමිසමක් වන LLRC එකේ තිබෙන දේවල් ක්‍රියාත්මක කරන්න. [බාධා කිරීමක්] මේවා ගැන අපෙන් අහන්න එපා. අපි ඉන්නේ විපක්ෂයේ නේ. ඔබතුමන්ලා අපට චණ්ඩි පාට් දාලා හරියන්නේ නැහැ. ඔය චණ්ඩි පාට් ගිහිල්ලා Senator Kerryට දාන්න, ඕවා ඩෙව්ඩ් මිලිබෑන්ඩ්ට දාන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉන්දියාවත් එක්ක අපේ අරියාදුවක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි නැත්තේ? අද ස්වාමීන්වහන්සේ නමකට ඉන්දියාවට ගිහිල්ලා ඉන්න බැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ එහේ ඉන්න gangstersලා කට්ටියක්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි. මෙහේ ඉන්න gangstersලා වාගේ තමයි. මෙහේ gangsters ලාත් එක්ක බලන කොට කිසි වෙනසක් නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මා හිතන විධියට 100ක් විතර අත් අඩංගුවට අරගෙන තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අත් අඩංගුවට ගන්න එක බොහොම හොඳයි. ඉතින් ඇයි, ආණ්ඩුව ප්‍රකාශයක් කරන්නේ නැත්තේ? විපක්ෂය විධියට අපි කියනවා, මේ ආණ්ඩුව ඉතාම ලජ්ජා සහගත විධියට වැඩ කටයුතු කරනවා කියලා. මේ ස්වාමීන් වහන්සේලාට කරපු අගෞරවය ගැන කිව්වේ නැත්තේ ඇයි? ඒවා ගැන කියන්නේ නැතිව නිදහසේ ශබ්ද නැතිව ඉන්නේ ඇයි? ඔබතුමන්ලා එක පැත්තකින් අන්තවාදය වපුරනවා. ඊට පසු එයට ලැබෙන උත්තරය අනුව රටේ සම්පූර්ණ සමගිය නැති වනවා. අර කිව්වා වාගේ එක පැත්තකින් වීරකැටිය, හම්බන්තොට පල්ලි පිච්චුවා. අනෙක් පැත්තෙන් අකුරැස්සේ මුස්ලිම් පල්ලිය පිච්චුවා. අනෙක් පැත්තෙන් වත්තල හින්දු කෝවිල. මොකක්ද මේ රටේ තිබෙන ප්‍රශ්නය? ශ්‍රී ලංකාව කියන්නේ සාර්වආගමික රටක්. ශ්‍රී ලාංකික අනන්‍යතාව තමයි එහි වැදගත්ම දේ. එහි සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සියලු ජාතීන් සිටිනවා. ඒ නිසා මේ වාගේ පනත් ගෙනෙනවාට වඩා වැදගත් වන්නේ මේ රටේ සමගිය ඇති කිරීමයි.

මා කිව්වා වාගේ අද මේ රටේ ජීවන වියදම අඩු කරන්නට අවශ්‍ය නම් තිබෙන input cost එක අඩු කරන්නට අවශ්‍යයි. අද විදුලි බිල සියයට 50කින් වැඩි කරන්නට හදනවා. මහජන උපයෝගීතා කොමිසමෙන් අපි මේ ගැන අහනවා. විදුලි බල මණ්ඩලයෙන් මේ විදුලි බිල වැඩි කරන්න කියනවා ලු. විදුලි බිල වැඩි කරන්න අවශ්‍ය නම් අපට කියන්න, මේ විදුලි බිල වැඩි කරන්න අවශ්‍ය වන්නේ ඇයි කියලා. මේක දූෂණයද, අකාර්යක්ෂමතාවද, නැත්නම් අනෙක් රජයේ ආයතන විදුලි බිල් ගෙවන්නේ නැතිකමද? මුල්‍ය අර්බුදයක් තිබෙනවාද? එහෙම නැතිව නිකරුණේ අපට ඇවිල්ලා කිව්වොත් විදුලි බිල සියයට 50කින් වැඩි කරන්නට ඕනෑ යි කියලා, ඒක හරි ප්‍රශ්නයක් වනවා. අපේ ෆවුසි ඇමතිතුමා එදා තෙල් මිල අඩු කරන්නට ඕනෑ යි කියලා ඉතාමත් ඕනෑකමින් සටන් කළා. අන්තිමට එතුමාව පැත්තකට දමලා, දැන් ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් බවට පත් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] එතුමාගේ ආසනයත් දෙකට කඩලා. අයියෝ! තිබුණු ආසනයත් නැති කරලා තිබෙනවා. මැද කොළඹ, උතුරු කොළඹ, ෆවුසි නම නැතිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලනය කරන්න පුළුවන්ද? නුවරින් පුද්ගලයකු මෙතැනට පැන්නයි කියලා, මෙතැන තිබෙන ඡන්ද ටික ගන්න හිතනවා නම් තිබෙන ඡන්ද ටිකත් නැතිව යන එකයි සිදු වන්නේ. අන්න ඒ වාගේ කටයුතු කරගෙන යන එක අපි අගය කරනවා. ඒක තමයි අපි කිව්වේ, අපි රට බෙරා ගන්නම්, ඔබතුන්ලා තමන්ගේ පක්ෂයේ කටයුතු කරගෙන යන්න කියලා. අපට ඇවිල්ලා තිබුණු හෙණය දැන් ඔබතුමන්ලාට වැදිලා ඉවරයි. මේ වාගේ ජ්‍යෙෂ්ඨයෝ, පක්ෂයට සම්පතක් බවට පරිවර්තනය වෙලා තිබුණු අයට අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? අගමැතිතුමා ඉතාමත් අනගි සේවයක් කර තිබෙනවා. මම හිතන විධියට මේවා බලාගෙන එතුමා හඬනවා ඇති, මොකක්ද මේ පක්ෂයට වෙන්නේ කියලා. මේක තමයි සැබෑ තත්ත්වය. ඒ නිසා තමන්ලා පක්ෂයට මොනවා කළත් කමක් නැහැ, රටේ ආර්ථිකයත් එක්ක සෙල්ලම් කරන්න එපාය කියලා අපි මේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුනුත් සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. ඒ කියන ගමන්ම - [බාධා කිරීමක්] ඔව්. ඒ විතරක් නොවෙයි, මා මෙතැනදීත් කිව්වා අඩු ගණනේ එතැන තෙල් ටැංකියක් නැහැ තෙල් ටික -

Hon. Deputy Minister of Finance and Planning, Hon. Prime Minister, you need one million litres of oil stored at that international airport. Today, Mattala is not a normal, domestic airport. It has risen to the status of an international airport. So, it has to have the minimum standards that are expected of an international airport. But, you do not have one million litres of oil there; you have only 100,000 litres of oil, two bowsers. If one airplane comes and refuels, it would take a minimum of 90,000 litres of oil, which happened yesterday to "flydubai". Thereafter, there would be no oil left for the rest of the airplanes that would come. So, how on earth can you call this "sustainable development"? This is "cosmetic development" at the expense of the people and this is what we are basically opposed to. This is just to have a display, to hit the headlines, which makes no sense in economic terms.

Talking about cost reduction, I said, in India, the oil prices are coming down. Sri Lanka is the only country, when world oil prices come down, that increases its oil prices, not once or twice, but three times. Today, you can bring oil to the Colombo Port at Rs. 79 a litre and you are retailing it at Rs. 163. I do not need to point out that the

difference, the spread or the profit is used to cover the inefficiency, corruption, the hedging deal, all put together, and it is a fact that the Government is basically exploiting the situation. So, at least when the world oil prices come down, give that relative reduction or the benefit to the consumer. But, it is not happening. The "Ceylon Today" of 18th March, 2013 carried the caption "No reduction in fuel prices - LIOC" even though India reduced those by two Indian Rupees. Two Indian Rupees is Rs. 5 in Sri Lankan terms. That is a substantial reduction. Why is that not happening in our country? The reduction you have achieved in certain costs has been increased on the other side with additional Cabinet Ministers being appointed. Last time you increased oil prices to ensure that the increase in cost owing to the appointment of five new Cabinet Ministers and six Deputy Ministers is reimbursed by the people. Why should people reciprocate, and what have they got to do with the appointment of some inefficient Ministers? That is what we are asking.

අපට අවශ්‍ය වන්නේ අපේ රට ආරක්ෂා කිරීම මිසක්, මෙවැනි අදක්ෂ ආණ්ඩුවක් ආරක්ෂා කිරීම නොවෙයි. තමුන්නාන්සේලා මේ රට සංවර්ධනය කිරීමේ නාමයෙන් අද මේ රටේ තිබෙන සල්ලි ටික සූරා කාලා, මේ රටේ ආර්ථිකය කාබාසිනියා කරලා තිබෙන අවස්ථාවක් මේ. ඉතින් අපි මේ අවස්ථාවේ ආණ්ඩුවෙන් ඉල්ලනවා, කරුණාකර මේක නවත්වන්න කියා. රටේ ආර්ථිකයත් එක්ක විහිළු කරන්නට එපා. අද ජනතාවට ජීවත් වන්නට බැහැ. මාසයේ වැටුප සුමානයක් ජීවත් වන්නට මදියි. අද නිදහස් අධ්‍යාපනය කියන එක නාමිකව පමණයි ඉතිරි වෙලා තිබෙන්නේ. හැම පාසල් දරුවකුටම මාසයකට රුපියල් 500ක, 600ක මුදලක් පාසලට ගෙන එන්නට සිදු වන තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. චක්‍ර ලේඛ නිකුත් කරලා තිබුණාට සල්ලි ගෙනාවේ නැත්නම් ළමයින් ඉස්කෝලෙට ගන්නේ නැහැ. අද රෝහල්වලට ගියොත් බෙහෙත් නැහැ. මේක තමයි සැබෑ තත්ත්වය. මේ ගැන කථා කරන්න දෙන්නෙක්, තුන්දෙනෙකුටවත් කොන්දක් නැත්නම් මේ කැබිනට් මණ්ඩලයේ 67 දෙනෙක් තියාගෙන වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කර තිබෙන මේ සුරාබදු (සංශෝධන)පනත් කෙටුම්පත ගැන කථා කරනකොට මම මේ ගැනත් අහන්න කැමැතියි. Customs එකට containers දෙකක් ඇවිල්ලා තිබෙනවා. කවුද මේවා ගෙනාවේ? කවුරු වෙනුවෙන්ද ගෙනාවේ? අද මේ සඳහා නොයෙක් නම් පාවිච්චි කරනවා. මම දන්නවා, අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා අහලා තිබෙනවා, ඇයි මේ මගේ නම පාවිච්චි කරන්නේ කියලා. ඒ අභිංසක මන්ත්‍රීවරුන්ගේ නම් පාවිච්චි කරන්නේ ඇයි? ඒ වාගේම ලක්ෂ්මන් ඇමතිතුමාගේ නමත් පාවිච්චි වෙලා තිබෙනවා. මේ වාගේ කිහිප දෙනෙකුගේ නම් පාවිච්චි කරලා තිබෙනවා. සැබෑ නම ඉදිරිපත් වෙලා නැහැ. කවුද -[බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුප්පිනர් ஒருவர්)
(An Hon. Member)
ලක්ෂ්මන් ඇමතිතුමා කියනවා, එතුමාගේ නොවෙයි ලු.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
එතුමාගේ නොවෙයි ලු. මාතරින් නොවෙයි ලු. පුත්තලමෙන් නොවෙයි ලු. පුත්තලමෙන් කිව්වාම මිල්රෝයි ඇමතිතුමාගේ නම ගෑවෙන්නේ නැහැ. කිසි ප්‍රශ්නයක් නැහැ. එහෙනම් කුරුණෑගලින්ද? කුරුණෑගලින් නම් කවුද? සිදු වෙන්න ඇත්තේ මොකක්ද? ඔබතුමන්ලා නිහඬව සිටින්නේ ඇයි? සමහර අය අපට ඇවිල්ලා කියනවා, මේක ගැන කියන්න කියලා. මේක හරි වැඩක් නේ. ඉතින් එහෙම නම් රුපියල් පහක් තිබෙනකොට ප්‍රශ්නයක් ඇති කරන මේ ආණ්ඩුව, රුපියල් මිලියන 120ක් ගෙවන්න තිබුණු එකට ලක්ෂ 20ක් ගෙවලා මේ ප්‍රශ්නය නිහඬ කරලා තිබෙනවා නේද? කවුද මේ පිටුපස සිටින්නේ? කාගේ නම පාවිච්චි කරලාද මේ කටයුතු කරන්නේ?

දැන් ඒ හැම මන්ත්‍රීවරයාම තමුන් දෙස බලනවා, "මම නම් නොවෙයි" කියලා. එහෙම නම් මේ කියන්නේ කවුරු ගැනද කියලා කියන්න ඇමතිවරයෙක් ඉදිරිපත් වෙනවාද? අපට මේ ගැන දැන ගන්න අවශ්‍යයි. ගරු ඇමතිතුමා උදේ කිව්වා, මේක හෙළිදරවු කර ගන්න දෙපැත්තටම අවශ්‍යතාව තිබෙනවා කියලා. නමුත් ඇමතිතුමා බොහොම නිහඬ ස්වරූපයකින් කටයුතු කරනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු (කලානිති) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, දැන් පරීක්ෂණයක් පවත්වා ගෙන යනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
පරීක්ෂණයක් පවත්වනවා කියන්නේ? මේ L/C එක බැලුවාම දැන ගන්න පුළුවන් නේ කවුද L/C එක පාවිච්චි කළේ, L/C ඇරියේ කවුද කියලා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු (කලානිති) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කවුද කියලා නියම වෙලාවට හෙළිදරව් කරනවා. තමුන්නාන්සේ කියන විධියට ඒවා කරන්න බැහැනේ. මේවාට නීතියක් තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
අනේ, ඔබතුමන්ලා කවදාවත් අපි කියන දේ කරන්නේ නැහැනේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු (කලානිති) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ළඟදීම ඒ ගැන ප්‍රකාශයක් කරනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
රුපියල් මිලියන 120ක දඩයක් ගහන්න තිබෙන අවස්ථාවක රුපියල් ලක්ෂ 20ක දඩයක් ගහලා හරියනවාද? [බාධා කිරීම්] කිසි ලජ්ජාවක් නැතිව අභිංසක මිනිසුන්ට ගන්න තිබෙන හාල්මැස්සෝ කිලෝවක මිල රුපියල් 400 සිට 800 දක්වා වැඩි කරනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු (කලානිති) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
දැනටත් ඒ පරීක්ෂණය කර ගෙන යනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඉතින් පරීක්ෂණයක් කරන්න ඕනෑද? මේ ඇමති කවුද කියලා අද කැබිනට් මණ්ඩලයම දන්නවා. ඔබතුමා දන්නේ නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, මම දන්නේ නැහැ. දන්නවා නම් පරීක්ෂණයක් ඕනෑ නැහැ නේ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
විනිමය වංචා කරලා පවුම් 3500ක් ගෙනාවේ කවුද කියන එක හෙළි කරනවාද? රවි කරුණානායක මන්ත්‍රීතුමා කියනවාද? Passport එකත් impound කරලා තිබෙන්නේ. ඒවා කරන්නේ කවුද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ, මේ අස්වර් මැතිතුමාට - ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ නම කිව්වා. මම අහනවා-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාගේ නම කියන්න අවස්ථාවක් ලැබුණේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නම කිව්වා. ඒ විනිමය පරීක්ෂණය උසාවියේ තිබෙනවා. මම බය නැහැ. ඒ විනිමය පරීක්ෂණය තිබෙනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
විනිමය වංචා කරලා passport එකත් impound කරලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
US Dollars මිලියන තුනක් රටට ගෙනාවා. මේ ප්‍රශ්නය අවුරුදු හතරක් ඇද ගෙන යනවා. අද ඒකට උත්තර දෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මම අස්වර් මන්ත්‍රීතුමාට කියනවා, පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට යටත්ව ඒක මෙතැන කියන්නේ නැතිව මෙතැනින් එළියට ගිහින් කියන්න කියලා. මම අපහාස නඩුවක් දමලා ඔප්පු කරලා පෙන්වන්නම්. මැලිබන් එකෙන් බිස්කට් හොරකම් කරපු එක වාගේ නොවෙයි, මේ ප්‍රශ්නය. මෙවා කියන්න අපි බය නැහැ. ඔබතුමා චෝදනා ඉදිරිපත් කරනවා. [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Let the Hon. Member speak, Hon. Azwer.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
He is

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නේ. අපි විනිමය හොරකම් කරනවාලු. අපි මේ රටට සල්ලි ගෙනෙනවා. අපි අහනවා මොකක්ද ඒකේ තිබෙන වැරැද්ද කියලා. එතකොට කියනවා හොරකම් කරනවා කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
රට ඉඳි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. රට ඉඳි. මොනවාද කළේ නැත්තේ? මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැලිබන් එකෙන් පන්නලා තිබෙන්නේ.[බාධා කිරීමක්] ඔබතුමා මාව ඉලක්ක කළා. මම කියනවා, මේ රටට විදේශ විනිමය ගෙනාවේ මමයි කියලා. ඒකේ තිබෙන වැරැද්ද පෙන්වන්න කියලා මම අභියෝග කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, how long will you take?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I will take as much time as you give me.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You have exceeded your time by about four minutes.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Well, the problem was created by your people, not our people.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
There is no problem at all. You have lost the national - [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Can you wind up now?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes, certainly. If you say so, I will do that. But, give me just five minutes to bring it to a close.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Please wind up in two minutes.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I will try to do that.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම රූපවාහිනිය බලා ගෙන ඉන්න කොට දැක්කා ඔබතුමා කියනවා, lipstick ගාලා කට්ටියක් ඉන්නවා කියලා. එතැන ලොකු කලබලයක් ඇති වුණා. ඒක අද පත්‍රයේ වාර්තා කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමා lipstick ගැන කථා කරලා කාන්තාවන්ට යම්කිසි ප්‍රශ්නයක් ඇති කළා. ඒක ප්‍රශ්නයක් කියලා මම හිතන්නේ නැහැ. ඒකෙන් තවත් ලස්සන වෙනවා මිසක් අඩුවක් වෙන්නේ නැහැ. ඒක එක්නෙකුට බලපෑවා. ඔබතුමා හරියට කියලා ඇති. ඒ කථාවෙන් එක්කෙනකුට ප්‍රශ්නයක් ඇති වුණා මිසක්, වෙනත් කෙනෙකුට ප්‍රශ්නයක් ඇති වුණා කියලා මම හිතන්නේ නැහැ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවත් lipstick ගෑවා වාගේ තමයි මේ රටේ ආර්ථිකය සංවර්ධනය කරන්නේ. ඒ lipstick ටික ගියාට පස්සේ මොලොව දෙයක් නැහැ. හරියට බොලිවුඩ් film එකක් වගෙයි. ඒ film එකක් පැය දෙකක් බැලුවත් එක තැනකම තමයි හිර වෙලා තිබෙන්නේ. අන්න ඒ වාගේ සංවර්ධනයක් තමයි ඔබතුමන්ලාට තිබෙන්නේ.

නොරොච්චෝලේ විදුලිබලාගාරයක් හැදුවා; විදුලි බිල අඩු වුණේ නැහැ. මත්තල airport එකක් හැදුවා; passengersලා වැඩි වෙයිද කියලා අපි බලමු. හම්බන්තොට වරායක් හැදුවා; එන containers ප්‍රමාණය අඩු වුණා මිසක් වැඩි වුණේ නැහැ. ඒ වාගේම කොළඹ වරායේ සංවර්ධනයක් ඇති වුණා; ජීවන වියදම වැඩි වුණා මිසක් අඩු වුණේ නැහැ.

මේ අවස්ථාවේ සුරා බදු සම්බන්ධයෙන් කථා කරන විට ඉතා ඕනෑකමින් මම කියන්නේ ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා මේ එතනෝල් ගෙන්වීම ගැන දන්නවා. නමුත් මේක යටපත් කරන ආකාරයක් තමයි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මේ අවස්ථාවේ ඉතා ඕනෑකමින්, වගකීමකින් අහනවා කාගේ ඕනෑකම නිසාද මේ කාරණය යටපත් කරන්නේ කියලා. මේ රහස දවසෙන් දෙකෙන් සොයා ගන්න පුළුවන්. ඒක අමාරු නැහැ. L/C ඇරියේ කවුද කියලා අපට කියන්න. ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වුණේ කවුද කියලා ඔබතුමන්ලා දන්නවා. මේකට රුපියල් මිලියන 120ක් දඩ ගහන්න ඕනෑ කියලා ඇමතිවරයෙක් තමයි අද මට කිව්වේ. මම එතුමාගේ කියන්නේ නැහැ. මොකද, එතුමා අපට ඒක කිව්ව එක මම අගය කරනවා. ඒ ගොල්ලන් කියනවා, අනේ අපට වෙලා තිබෙන දේ කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මෙවැනි පිටස්තර පුද්ගලයන් ඇවිල්ලා මේ වාගේ දේවල් කරලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැති වුණත් කමක් නැහැ. නමුත් රට නැති කරන එක තමයි ප්‍රශ්නය කියන එක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පුද්ගලයෙක් මට කිව්වා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව මිනිත්තුවක් දෙන්න. වෙලාව තිබෙනවා නේ. ඔබතුමාගේ ඉල්ලීම පරිදි තව මිනිත්තුවකින් මම අවසන් කරන්නම්.

The other issue I raise at this particular moment is about the oil tanks in Trincomalee. These oil tanks were leased out to the Lanka Indian Oil Company about 8 - 9 years ago, maybe 10 years ago. Today, the Deputy Minister of Petroleum Industries, the Hon. Sarana Gunawardena, at an interview with a TV channel, mentioned that the Hon. Susil Premajayantha has brought in a Cabinet Paper to abrogate this Agreement and to take back the oil tanks. I am informed that the Chairman of the Ceylon Petroleum Storage Terminal Limited has been told to take these oil tanks back and negotiations are going on. Is this correct? At a time when you are trying to bring in changes in the field of oil industry, we ask you, is it correct? Is it sensible? When there is an investment in the country, you are trying to create a problem by abrogating this Agreement. Worse so, is that you are basically dealing with an Indian company. At a time when we are trying to ensure that we get Indian support, are you trying to intensify the anti-Indian campaign that is going on? On one side you are bringing Chinese exporters and investors into this country and on the other, you are chasing away the Indian investors who have invested a colossal amount of money, at a time when India is absolutely an essential friend of ours. So, we are asking, if the Deputy Minister of Petroleum Industries, the Hon. Sarana Gunawardena says that the Hon. Susil Premajayantha has put forward a Cabinet Paper to abrogate the oil Agreement, is this correct? If not, an apology should be made to LIOC or to the Indian Government for trying to create unwanted problems.

So, all I want to say is, at the end of everything, the benefit should accrue to the people, not to an incompetent or a corrupt Government and that is what we, the United National Party, are very concerned because the economy of the country is in absolute dire straits. When this country's economy is put to absolute test, we are the ones who have to resurrect this country and bring it back to normal order.

Thank you, Sir.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Thank you. ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා.

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

[අ.භා. 3.58]

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පනත් කෙටුම්පත් කිහිපයක් පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමෙන් පසු අදහස් දක්වන්න ලැබීම ගැනත් මා සතුටු වෙනවා, එතුමා දක්වන ලද අදහස් කිහිපයකට උත්තර දෙන්නට අවස්ථාව ලැබෙන නිසා.

රවි කරුණානායක මන්ත්‍රීතුමා මත්තල ගුවන් තොටුපොළ ගැන කථා කළේ ද්වේෂ සහගතවයි. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ඉදි කිරීම තුළින් ලංකාව ඇතුළේ මෙච්චර කල් නොනිබිව්ව, තවත් ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ඇති වී තිබෙනවා. ලංකාවේ ප්‍රධාන අවශ්‍යතාවක් වෙච්ච ඒ ගුවන් තොටුපොළ අද හදා තිබෙනවා. ඒක මත්තලට වැඩක් නැහැ, හම්බන්තොටට වැඩක් නැහැ කියලා රවි කරුණානායක මන්ත්‍රීතුමා අද කෑ ගැහුවත්, එදා "Regaining Sri Lanka" වැඩ සටහන ඇතුළේ එක්සත් ජාතික පක්ෂය වැල්ලවායේ ගුවන් තොටුපොළක් හදන්න යෝජනා කරලා තිබුණා. දැන් මට ප්‍රශ්න කිහිපයක් අහන්න තිබෙනවා. එදා එක්සත් ජාතික පක්ෂයේ "Regaining Sri Lanka" වැඩ සටහනේ වැල්ලවායේ ගුවන් තොටුපොළක් හදන යෝජනාවක් තිබුණේ නැද්ද? එහෙම නැත්නම් එවැන්නක් තිබෙනවා කියලා ජනතාවට කළේ ප්‍රෝඩාවක්ද, බොරුවක්ද? එවැනි යෝජනාවක් තිබුණා නම් ඒ ගුවන් තොටුපොළ හදන්න වෙන්නේත් මේ විධියටම ණය අරගෙනයි. ඒක ලංකාවේ සල්ලිවලින් හදන්න බැහැ. එහෙම නැත්නම් රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ ගෙදරින් සල්ලි ගෙනැල්ලා ඒක හදන්න බැහැ. ඒක හදන්න වෙන්නේ විදේශ ණය අරගෙනයි. එහෙම නැත්නම් රවි කරුණානායක මන්ත්‍රීතුමා විදේශ රටකින් විදේශ විනිමය ගෙනාවා වාගේ ක්‍රමයකට සල්ලි ගෙනැල්ලා ඒක හදන්න ඕනෑ. රවි කරුණානායක මන්ත්‍රීතුමා මොන ක්‍රමයකට මේක හදන්න - [බාධා කිරීමක්] ද්වේශයෙන් තමයි මේ කථා කරන්නේ.

ලංකා ඉතිහාසයේ ස්වර්ණමය යුගයක් තමයි මේ එළැඹුණේ. දැන් ලංකාවේ තවත් ගුවන් තොටුපොළක් ආරම්භ වෙලා තිබෙනවා. ප්ලේන් එකක් අද ඒ ගුවන් තොටුපොළට එනවාද කියලා තමයි තමුන්නාන්සේලා දැන් ගණන් හදන්නේ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියනවා, කටුනායකින් උඩට ගන්න ප්ලේන් එකක රෝද ටික මත්තලට යන්න පෙර අකුළා ගන්නවත් වෙලාව නැහැ කියලා. මේ අය මේ කථා කරන්නේ අද තිබෙන තත්ත්වය එක්කයි. හැබැයි, මේ ගුවන් තොටුපොළ හැදුවේ අදට නොවෙයි. මේ ගුවන් තොටුපොළ හැදුවේ අනාගතයටයි. මේ ගුවන් තොටුපොළ හැදුවේ අනාගතයට මුහුණ දෙන්නයි; අනාගත ආර්ථික සංවර්ධනයට මුහුණ දෙන්නයි. තිස් වසරක යුද්ධයෙන් පසුව පිබිදෙන ශ්‍රී ලංකාවේ, ආසියාවේ කේන්ද්‍රස්ථානය බවට දවසින් දවස වර්ධනය වෙන ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් වර්ධනය කර ගැනීමේ අපට අවශ්‍යව තිබෙනවා. සංවර්ධනයේ ඉහළම තැනට ගියාට පසු ඒ අවශ්‍යතා අපට දැනෙනවා. කටුනායක ගුවන් තොටුපොළට එන ගුවන් යානා ප්‍රමාණය වැඩි වෙලා, දැනට මිලියනය ඉක්මවා පැමිණෙන විදේශිකයන් ප්‍රමාණයත් වැඩි වෙලා, කටුනායක ගුවන් තොටුපොළෙහි traffic තත්ත්වයක් ඇති වුණාට පසු මත්තල ගුවන් තොටුපොළක් හදලා වැඩක් නැහැ. කොළඹ වරාය තිබෙද්දීත්, ඉතිහාසය පුරාවටම, එක්සත් ජාතික පක්ෂ යුගයේ නොවෙයි ඊටත් ඉස්සර ඉඳලා හම්බන්තොට වරායක් හදන්න යෝජනා කර තිබුණා. හැබැයි, හම්බන්තොට වරාය හදන්න පුළුවන් වුණේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට විතරයි; මේ ආණ්ඩුවට විතරයි. ඒ වාගේම මේ ගුවන් තොටුපොළ මත්තල නොවෙයි, වීරවිල නොවෙයි හම්බන්තොට ප්‍රදේශයේ කොහේ හරි තැනක හදන්න වුවමනාව තිබුණා. හැබැයි, කාටවත් ඒක කර ගන්න බැරි වුණා. ඒ පුළුවන්කම ලැබුණේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ අනුවයි.

චීනයෙන් ණය ගන්නවා කියලා තමුන්නාන්සේලා බොහොම වේදනාවෙන් කෑ ගහනවා. හැබැයි, රජය ඒ ණය අරගෙන ජනතාවට කන්න බෙදා දීලා නැහැ. මේ ණය අරගෙන තව කාගේ හරි කෑමට බීමට වියදම් කරලා නැහැ. මේ ණය අරගෙන තිබෙන්නේ රටේ අනාගතය වෙනුවෙන්. රටේ අනාගතය වෙනුවෙන් තමයි ඒ මුදල් ආයෝජනය කර තිබෙන්නේ. ඒ නිසා මේ වෙලාවේදී "එදා වේල" බිස්නස් එකක් ගැන හිතන්න නරකයි. රවි කරුණානායක මන්ත්‍රීතුමා එහෙම කථා කරනකොට අපට ටිකක් කනගාටු හිතෙනවා. ව්‍යාපාරික ප්‍රජාව නියෝජනය කරන, ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් කථා කරන කෙනෙක් තමයි රවි කරුණානායක මහත්මයා. එතුමාට ව්‍යාපාර සැහෙන සංඛ්‍යාවක් තිබෙනවා. එතුමා ව්‍යාපාර පිළිබඳව නීතිය ඉදිරිපිටත් කථා බහට ලක් වෙනවා. ව්‍යාපාර ගැන එතරම් දුරට දන්න කෙනෙක් වෙලාත් "එදා වේල" බිස්නස් එකක් ගැන තමයි එතුමා කථා කරන්නේ. නමුත් ආණ්ඩුවක් එහෙම කර ගෙන යන්න බැහැ. ආණ්ඩුවක් කර ගෙන යනවාය කියන්නේ "එදා වේල" බිස්නස් එකක් නොවෙයි. චීනයෙන් අද මේ මුදල් ණයට අරගෙන, අද ඒවා පාවිච්චි කරලා, අදම ඒවායේ ප්‍රතිඵලය ගන්න බැහැ. ඒක pavement business එකට නම් හොඳයි. ස්වයං රැකියා කරන උදවිය එදා උදේට කාගෙන් හරි ණයක් ගන්නවා. තව තැනකට ගිහිල්ලා ඒ රුපියල් 1000ට බඩු ටිකක් අරගෙන ඇවිල්ලා, ඒ බඩු ටික විකුණලා පොලී මුදලාලිට රුපියල් 1100ක්, 1200ක් විතර පොලියත් එක්ක මුදලුත් බේරලා කීයක් හරි අරගෙන ගෙදර යනවා. ගෙදර ගිහිල්ලා එදා ලැබුණු මුදල කාලා බීලා ඉවර කරනවා. ආයෙත් හෙට උදේට ඇවිල්ලා තව රුපියල් 1000ක් ණයට අරගෙන පොළේ වෙළඳාම් කරනවා. හැබැයි, ඒ විධියට ආණ්ඩු කරන්න බැහැ. ඒ වෙලාවේම මේ ආයෝජනවල ප්‍රතිඵලය ගන්න බැහැ. දීර්ඝ කාලීන ආයෝජන තමයි මේ කරලා තිබෙන්නේ. චීනයෙන් ණය අරගෙන, දැවැන්ත සංවර්ධන වැඩ පිළිවෙළක් එක්ක, දැක්මක් ඇතිව මත්තල ගුවන් තොටුපොළ හැදෙනකොට, හම්බන්තොට වරාය හැදෙනකොට ඒ ආශ්‍රිතව කර්මාන්තපුර ඇති වෙනවා; ඒ ආශ්‍රිතව සේවා සැපයෙන ස්ථාන සකස් වෙනවා; ඒ ආශ්‍රිතව සංචාරක ප්‍රදේශයක් නිර්මාණය වෙනවා. ඒවාත් එක්ක තමයි අපි අනාගතයට මුහුණ දෙන්නේ. සංචාරක ව්‍යාපාරය හරහා මේ රට ආසියාවේ කේන්ද්‍රස්ථානයක් හැටියට වර්ධනය කරන්න තමයි මේ අවශ්‍ය කටයුතු සූදානම් කරන්නේ. ඒ නිසා අපි ඒවා ගැන වැරදි විධියට බලන එක වැරදියි.

එක්සත් ජාතික පක්ෂයට බලයට එන්න වුවමනා බව අපට තේරෙනවා. එක්සත් ජාතික පක්ෂයට බලයට එන්න තිබෙන වුවමනාව සඳහා මේ රටේ කෙරෙන සංවර්ධන ව්‍යාපෘති දිහා

වපරැහින් බලන එක තමයි අපට තිබෙන ගැටලුව. මේ සංවර්ධන ව්‍යාපෘති හරහා රටේ ජනතාව ආරක්ෂා කරන්න, රටේ ජනතාව වෙනුවෙන් පෙනී සිටින්න රජයට වගකීමක් තිබෙනවා; යුතුකමක් තිබෙනවා. රටේ ඉදිරි පරම්පරාව වෙනුවෙන්, රටේ ජනතාව වෙනුවෙන් තමයි මේ සියල්ල ගොඩ නගන්නේ. මේවා ගොඩ නගන්නේ හෙට දවසේ උපදින දරුවන් වෙනුවෙන්. එහෙම නම් රවි කරුණානායක මන්ත්‍රීතුමන්ලා ඊට විරුද්ධව කථා කරන එක වැරදියි. එතුමන්ලා දැනගන්න ඕනෑ මේ සියලු ඉදි කිරීම් තුළින්ම පිළිබිඹු වෙන්නේ අපේ රටේ දරුවන්ගේ අනාගතය බව.

ඊළඟට මම මතක් කරන්න කැමැතියි බදු වැඩි වීම පිළිබඳව. මෙතුමන්ලා බදු වැඩි වීම පිළිබඳව කථා කරනවා. තෙල් මිල වැඩි වීම පිළිබඳව කථා කරනවා. ඔව්, සමහර අවස්ථාවලදී තෙල් මිල වැඩි කරන්න වෙනවා. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යන කොට අපටත් තෙල් මිල වැඩි කරන්න වෙනවා. නමුත් ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල යම් අවස්ථාවකදී සතියට දෙකට එහාට මෙහාට උච්චාවචනය වුණාට, ඒ අවස්ථාවෙන් අවස්ථාවට තෙල් මිල අඩු කරන්න අපට පුළුවන්කමක් නැහැ. අප යම් කිසි මිල සූත්‍රයක් පාවිච්චි කරමින් මේ වැඩ කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ඉන්ධන කියන කාරණයේදී අප සහනාධාර විශාල ප්‍රමාණයක් ලබා දෙනවා. ධීවරයන්ට ලබා දෙන සහනාධාර, විදුලි ජනනය සඳහා ලබා දෙන මුදල ඒ අතර ඉතාම වැදගත්. ඒ වාගේම නැවත චතාවක් බනිජ තෙල් සංස්ථාවට, බනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය සඳහා ලැබිය යුතු විශාල මුදල් ප්‍රමාණයක් තිබෙනවා. අප මේ සියල්ල දරා ගන්නවා. ඒවා දරා ගන්න ගමන් තමයි මේ මිල යම් කිසි මට්ටමක පවත්වාගෙන යන්නේ. නමුත් අනික් පැත්තෙන් අප ජනතාවට දෙන සහන නවත්වලා නැහැ. ජනතාවට විදුලිය ලබා දීමේදී ලබා දෙන සහන ඉවත් කර නැහැ. අපේ ගොවීන්ට ලබා දෙන පොහොර සහනාධාරය නතර කර නැහැ. අපේ ධීවර ජනතාවට ලබා දෙන ඒ තෙල් සහනාධාරය නතර කර නැහැ. පාසල් දරුවන්ට දෙන පෙළ පොත් ටික, නිල ඇඳුම් ටික නතර කර නැහැ. මේ හැම දෙයක්ම සමබර කර ගැනීම තමයි ආණ්ඩුවක වගකීම වන්නේ. රජයක් විධියට මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ ඒ සමබරතාව අප ආරක්ෂා කරනවා. එක පැත්තකින් බඩු මිල ඉහළ යන කොට, අනික් පැත්තෙන් ඒ සහනාධාර අප ලබා දෙනවා. යම් යම් ක්ෂේත්‍රයන්හි බදු අඩු කරලා, වැට බදු අඩු කරලා යම් යම් බදු මට්ටම්වලටත් සහන ලබා දීලා උත්සාහ කරන්නේ ආයෝජන අවස්ථා වැඩි කරන්නයි. නිෂ්පාදනය වැඩි කරන්නයි. අපනයනය වැඩි කරන්නයි. ඒක තමයි මේ ප්‍රතිපත්තිය. එවැනි වැඩ පිළිවෙළක් ඇතිවයි අප ගමන් කරන්නේ. ඒ නිසා එක සිද්ධියක් අරගෙන අපට කථා කරන්න බැහැ. ගත්ත ණය ප්‍රමාණයක් අරගෙන, හදපු පාරේ කාපට් කිලෝමීටරයකට යන මුදල අරගෙන තර්ක කරන එක වැරදියි. ඊට වඩා පුළුල්ව අප හිතන්න ඕනෑ.

අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කරුණු කීපයක් කිව්වා. එතුමා කිව්වා, මේ ආර්ථිකය වැරැදි පාරකයි යන්නේ කියලා. අපට තේරෙන කාරණාව තමයි හර්ෂ මන්ත්‍රීතුමන්ලාට ඕනෑ විධියට නොවෙයි මේ ආර්ථිකය යන්නේ කියන එක. මේ ආර්ථිකය ගොඩ නැංවෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඇතුළු මේ රජයට, මේ කැබිනට් මණ්ඩලයට, මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුකූලවයි. මේ ආර්ථිකය යන ගමන් මාර්ගය හර්ෂ මන්ත්‍රීතුමන්ලාට ඕනෑ විධියට ගමන් කරන්නේ නැහැ. හර්ෂ මන්ත්‍රීතුමන්ලාට ඕනෑ විධියට ආර්ථිකය ගමන් කරවන්න සෑහෙන කාලයක් බලා ඉන්න වේවි; සෑහෙන්න ඕන බලන්න වේවි. මොකද හර්ෂ මන්ත්‍රීතුමාට කවදාවත් මේ ආර්ථිකය හසුරුවන්න ලැබෙන්නේ නැති නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහ බැංකුවේ අධිපතිතුමාගේ, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ නම් සඳහන් කරලා සමහර අවස්ථාවලදී බරපතළ විවේචන ඉදිරිපත් කළා. මේ අය පුද්ගලයන් දෙන්නෙක් විතරයි. අප සමස්ත ආණ්ඩුවක්. මේක සමස්ත රජයක්. සමස්ත රජයක්, සමස්ත ආණ්ඩුවක් විධියට තමයි මේ සියල්ලෝම තීන්දු ගන්නේ. ඒ අය රජයේ නිලධාරීන් විධියටයි තීන්දු ගන්නේ. ඒ අය රජයේ නිලධාරීන් විධියටයි තීන්දු, තීරණ ක්‍රියාත්මක කරන්නේ. දේශපාලනික වශයෙන් සාමූහිකව, එකම බැම්මක් ඇතුළේ තීන්දු ක්‍රියාත්මක වීමක් එහිදී සිදු වන්නේ. යම් යම් අවස්ථාවලදී ඒ පිළිබඳව විවේචන කරන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් විධියට ඒ විවේචනය කිරීමේ අයිතිය අපේ පක්ෂය ඇතුළේ තිබෙනවා. මේ ආණ්ඩුව ඇතුළේ තිබෙනවා. හැබැයි ඒකෙන් කියන්නේ නැහැ ඒ අයව හුදකලා කරන්නය කියලා. ඒ අය වෙනම අරගෙන ඒ අය කරපු දේවල් වැරැදියි කියන්න අපට බැහැ. ඒ සියලුම දේවල් අපි එකතු වෙලා ආණ්ඩුවක් විධියට සිද්ධ කරන කර්තව්‍යයන්. ඒ උදවිය අද ගැන හිතලා නොවෙයි තීන්දු ගන්නේ. ඒ අය හර්ෂ මන්ත්‍රීතුමන්ලාට ඕනෑ විධියට, රවි කරුණානායක මන්ත්‍රීතුමන්ලාට ඕනෑ විධියට මේ ආර්ථිකය හසුරුවන්නේ නැහැ. ඒ අය මේ ආර්ථිකය හසුරුවන්නේ රටේ ජනතාවට ඕනෑ විධියටයි. රටේ ජනතාව හෙට දවසේ බඩගින්නේ නොතියන විධියටයි. අප තිස් වසරක් තිස්සේ යුද්ධ කළා. ඒ යුද්ධය අවසන් කළේ මේ රටේ ජනතාව බඩගින්නේ තියන්නේ නැතිවයි. අනාගතයේදී මේ රටේ ස්වයංපෝෂිත ආර්ථිකයක් බිහි කරන්න සංවර්ධන යුද්ධයක් සිද්ධ කරන මේ වෙලාවේ, යම් යම් අවස්ථාවලදී ඒ ආර්ථික විශේෂඥයන් යම් යම් දේවල් සැලකිල්ලට ගෙන ඒ තීන්දු, තීරණ අරගන්නවා.

මේ තීන්දු තීරණ ගන්නේ මේ රටේ අනාගතය ගැන සිතලායි. අද ගැන සිතලා, හෙට ගැන සිතලා, තවත් මාසයක් ගැන සිතලා නොවෙයි මේ තීන්දු තීරණ ගන්නේ. තවත් අවුරුදු ගණනාවක් ඉස්සරහට මේ රට හොඳින් පවත්වාගෙන යෑම සඳහා තමයි, මේ රටේ ඉදිරි පරම්පරාව වෙනුවෙන් සුබිත මුදිත රාජ්‍යයක් බවට, ආසියාවේ ආශ්චර්යය බවට මේ රට පත් කරන්න අවශ්‍ය නිසා තමයි මේ තීන්දු තීරණ ගන්නේ. අපි උදාහරණයක් ගනිමු. මේ බදු අඩු කිරීම් යෝජනා ඉදිරිපත් කරලා තිබෙන කොට මේ සම්බන්ධයෙන් කොපමණ විවේචන ආවාද? හැබැයි මේ යෝජනා කරලා තිබෙන්නේ මොනවාද? බවුසර්, බුල්ඩෝසර, ග්‍රේඩර් ආදිය සඳහා තිබෙන බදු අයින් කරන්න කියලායි, එකතුකළ අගය මත පනවා තිබෙන බදු අයින් කරන්න කියලායි. ඇයි මේවා අඩු කරන්න කියන්නේ? මේවා හරහා ගමේ ඉන්න මිනිසුන්ට සෙත සැලසෙන නිසායි එහෙම කියන්නේ. ගමේ පාර හැදෙන කොට, ගමේ පාරේ වැඩ කෙරෙන කොට එහි ප්‍රතිලාභය ගමේ ජනතාවට හම්බ වෙනවා. ගමේ පාරවල් හැදෙන එක විතරක් නොවෙයි ප්‍රතිලාභය. යන්ත්‍ර සූත්‍ර පැමිණීම හරහා, ගමට -වැඩ කරන කාර්මිකයාගේ ඉඳලා සැමට- යම්කිසි සෙතක් සැලසෙන නිසා තමයි මේ වාගේ යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ යෝජනා කර තිබෙන බදු අඩු කිරීම් සියල්ල ගත්තාම, ඒ හැම එකකම යම්කිසි හරයක් තිබෙනවා. ඒ හැම එකක්ම ඉදිරිපත් කරලා තිබෙන්නේ රටේ සංවර්ධනය ඉස්සරහට ගෙන යන්නයි. නිෂ්පාදන ආර්ථිකය ඉස්සරහට ගෙන යන්න ඕනෑ කරන යෝජනා තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විදේශ රැකියාවල නියුක්ත අයට මේ රටට ඇවිල්ලා ව්‍යාපාර ආරම්භ කරන්න අවස්ථාව සලසා දී තිබෙනවා. ඒ හරහා උත්සාහ කර තිබෙනවා පිට රට තිබෙන විදේශ විනිමය ප්‍රමාණය ලංකාවට ගෙන එන්න. නොයෙක් නොයෙක් උපක්‍රම පාවිච්චි කරනවා. මේ රට ඉස්සරහට ගෙන යන්න ඕනෑ කරන ක්‍රමෝපායයන් විධියටයි මේවා පාවිච්චි කරන්නේ. ඒ වාගේම, අප විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ හැම අවස්ථාවකදීම බලාපොරොත්තු වෙලා තිබෙන්නේ මොකක්ද? මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ සංවර්ධනයේ ක්‍රියා දාමය ඉස්සරහට ගෙන යමින් පුංචි මිනිසුන්ට සලකන්න මේ හැම අවස්ථාවකදීම උත්සාහ කරලා තිබෙනවා. කුඩා ව්‍යවසායකයාට ඉස්සරහට එන්න තමයි ඉඩ කඩ හදලා තිබෙන්නේ. පුංචි ව්‍යාපාරිකයාගෙන් පටන් ගෙන

[ගරු මනුෂ නානායක්කාර මහතා]

ඒ පුංචි ව්‍යාපාරිකයා එතැනින් ඉස්සරහට ගෙන යන වැඩ පිළිවෙළක් ගැන කල්පනා කරලා තිබෙනවා.

ව්‍යාපාරයක් නොකරන කෙනාට ව්‍යාපාරයක් කරන්න අත හිත දෙන්න මේ හැම අවස්ථාවකදීම වැඩ කටයුතු කර තිබෙනවා. ඒ දිහා තමයි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා බොහොම වපර ඇසින් බලන්නේ. ඒ ගැන අපට කනගාටුයි. ජනතා විමුක්ති පෙරමුණ එහෙම බැලුවාට අපට කමක් නැහැ. ජනතා විමුක්ති පෙරමුණට තිබෙන පළපුරුද්ද සහ ඔවුන්ගේ ක්‍රමවේදයට අනුව ඒ අය එහෙම බැලුවාට කමක් නැහැ. හැබැයි එක්සත් ජාතික පක්ෂය කියන්නේ ඊට වඩා වෙනස් පක්ෂයක්. එක්සත් ජාතික පක්ෂයට ඊට වඩා හොඳ ඉතිහාසයක් තිබුණා. අද අපට කනගාටුයි, අද එක්සත් ජාතික පක්ෂයේ ඉතිරි වෙලා ඉන්න කණ්ඩායමට ජනතාව සම්බන්ධයෙන් තිබෙන කැක්කුම මොකක්ද කියලා හිතන කොට. ජනතාව සම්බන්ධයෙන් අද ඒ අයට තිබෙන කැක්කුම අපට පැහැදිලි වෙනවා. එහෙම කියන්න හේතුව මොකක්ද? මේ රටේ ප්‍රශ්න ඉවර වෙන කොට; එක් පැත්තකින්, යුද්ධය අවසන් කරලා සියලු ප්‍රශ්න ඉවර වෙන කොට ඒ අය හලාල් ප්‍රශ්නයක් අරගෙන බරපතළම ප්‍රශ්නය ලෙස එය ඉස්සරහට ගෙන යන්න දැන් උත්සාහ කරනවා. අද මේ අවස්ථාව වන විට මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්න අවශ්‍ය නැති තරමට ඒ ප්‍රශ්නය යම්කිසි මට්ටමකට නිවිලා ගිහින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පැහැදිලිවම කියන්න ඕනෑ, ඉන්දියාවේ ස්වාමීන් වහන්සේලා දෙනමකට ප්‍රහාර එල්ල කිරීම අපි තරයේ හෙළා දකින බව. රජයක් විධියට පමණක් නොවෙයි, පුද්ගලිකව අපි සියලු දෙනා එය තරයේ හෙළා දකිනවා. හැබැයි ඒ සම්බන්ධයෙන් කට වහගෙන සිටියා කියලා කවුරු හරි කියනවා නම් ඒක වැරැදියි. ඒ සඳහා රාජ තන්ත්‍රිකව ගත යුතු ක්‍රියා මාර්ග මේ වන කොට ගෙන තිබෙනවා සහ ඉදිරියටත් ගනිමින් පවතිනවා. ඒ වාගේම තමයි ඕනෑම ආගමකට, ඕනෑම ජාතියකට, ඕනෑම පාර්ශ්වයකට තමන්ගේ ආගම රැකගන්න, තමන්ගේ ආගම වෙනුවෙන් කථා කරන්න අයිතියක් තිබෙනවා. ඒ වාගේම තමයි බොදු බල සේනා සංවිධානයටත් අයිතියක් තිබෙනවා; මුස්ලිම් සංවිධානවලටත් අයිතියක් තිබෙනවා; ක්‍රිස්තියානි සංවිධානවලටත් අයිතියක් තිබෙනවා. අපි ඒ අයිතිය සුරක්ෂිත කරන්න ඕනෑ. එහෙම නැතිව ඒ සංවිධානවලට ගහන්න වත්, ඒ සංවිධාන ආණ්ඩු මට්ටු කරන්න වත් අපට පුළුවන්කමක් නැහැ. ඒ සංවිධානවලට අයිතියක් තිබෙනවා තමන්ගේ ආගම ආරක්ෂා කරගැනීම වෙනුවෙන් කථා කරන්න. හැබැයි මතක තියාගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ අස්සේ; මේ මතවාදය, මේ සාකච්ඡාව යන අතුරතුරේදී එක්සත් ජාතික පක්ෂයේ සන්නිවේදන බලකායේ නායකයා වූ මංගල සමරවීර මහත්මයා සූක්ෂ්ම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ මොකක්ද? බොර දියේ මාළු බාන්න හොඳට පුරුදු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකර්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

මහත්මයා පටන් ගත්තා මුස්ලිම් ගම්මානවල මුස්ලිම් ව්‍යාපාරිකයන්ට මරණීය තර්ජනය කරලා ලියුම් යවන්න. මුස්ලිම් ව්‍යාපාරිකයන් බිය වද්දන සංවිධානාත්මක වැඩ සටහනක් පටන් ගත්තා. ඒ වැඩ සටහන ක්‍රියාත්මක කරලා ඊට පසු දා මාධ්‍ය ඉස්සරහට ඇවිල්ලා කියනවා, මෙන්න මුස්ලිම් ජනතාවට ප්‍රහාර එල්ල කරනවා, මේ සඳහා ආණ්ඩුව වග කිව යුතුයි කියලා. මේක සංවිධානාත්මක කුමන්ත්‍රණයක්. ඒ වාගේම තමයි ජිනීවා සමුළුව පැවැත්වෙන මේ අවස්ථාවේදී මේ ගැටලුව ඉස්මතු කරලා අරගෙන, මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කරලා, මේ ගැන විදේශ රටවල කථා කරලා, මේක ජාත්‍යන්තර මාධ්‍යයට දීලා, මේ රටට තිබෙන සහයෝගය ක්‍රමක්‍රමයෙන් අඩු කරන්න එක්සත් ජාතික පක්ෂය ඇතුළු විපක්ෂය ක්‍රියාත්මක වෙනවා. රටට ආදරයට නොවෙයි එහෙම කරන්නේ. බලයට තිබෙන කෑදරකමටයි එහෙම කරන්නේ. අපි ඒක පැහැදිලිව කියන්න ඕනෑ. ගරු රවි කරුණානායක මහත්මයා කිව්වා මේ රටට ආදරෙයි කියලා. ඒ, රටට ආදරය කෙනෙක් නොවෙයි. බලයට කෑදර කෙනෙක්. ඒ බලයට කෑදරකම අමතක කරලා රටට ආදරේ විධියට හැසිරෙන්න කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.13]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. වැදගත් පනත් කෙටුම්පත් කීපයක් සම්බන්ධයෙන් කථා කරන අවස්ථාවක් මෙය. මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා අපේ පක්ෂයේ හිටපු මන්ත්‍රීවරයෙක්. එතුමා කථා කරන කොට මම විමතියෙන් බලාගෙන සිටියා, මේ එතුමාද කථා කරන්නේ කියලා.

කෙසේ වෙතත්, එතුමා මීට පෙර කළ කථා සීඩී එකේ ටේප් කරලා මගේ ළඟ තිබෙනවා. ඉතා හොඳයි, අර විමල් වීරවංශ ඇමතිතුමා කියනවා වාගේ ලෝකයේ වෙනස් නොවන එකම දෙය තමයි වෙනස්වීම. එතුමා රවි කරුණානායක මන්ත්‍රීතුමා ගැනත් කිව්වා. ඒ මන්ත්‍රීතුමා ගැන කියන විටත් එතුමා කිව්වා තමන්ට ආදරය කරන පිරිස කියලා. කෙසේ වෙතත් ප්‍රතිපත්ති ඇතිව දේශපාලනය කරන්න පුළුවන් නම් මා හිතන්නේ දේශපාලනඥයකු වශයෙන් මේ රට වෙනුවෙන් කරන්න පුළුවන් උතුම්ම දෙය එයයි කියා. උතුම්ම දෙයටත් වඩා මූලික දෙය එයයි. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප ඔය අනවශ්‍ය දේවල්වලටම උත්තර දෙන්න යන්නේ නැහැ. මම ඒ නිකමට කිව්වේ. මොකද ඒ කථාව අසා සිටින විට මා මවිතයට පත් වුණා, මේ කථා කරන්නේ එක කටින්මද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු (සංශෝධන), ආර්ථික සේවා ගාස්තු (සංශෝධන), ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන), ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන), එකතු කළ අගය මත බදු (සංශෝධන), විදුලි සංදේශ බදු (සංශෝධන) කියන පනත් කෙටුම්පත් ගැන අපේ ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමා අදහස් කීපයක් ප්‍රකාශ කළා. ගරු ඇමතිතුමනි, අප සවස් වරුවේ කථා කරන කොට ඔබතුමා බොහෝ විට මේ ගරු සභාවේ නැහැ. ඔබතුමා කථා කළාට පස්සේ උදේ පැය කීපයක් ගරු සභාවේ ඉන්නවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සුරා බදු සම්බන්ධව කිව්වා. ඔබතුමා සාමාන්‍යයෙන් ප්‍රායෝගික ඇමතිවරයෙක්; මන්ත්‍රීවරයෙක්. මම ඒක ගොඩක් අගය කරනවා. දේශපාලන වාසියක් නොලැබුණත්, ඔබතුමා හුඟක් වෙලාවට ප්‍රායෝගික වශයෙන් ඇත්ත සඳහන් කරන්න උත්සාහ කරන බව මා දැක තිබෙනවා. හැබැයි ඔබතුමා මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක ඉඳලා දරන අදහස් සම්බන්ධයෙන් මම එකඟ වන්නේ නැහැ. හැබැයි එතැන ඉඳලා හරි ඔබතුමා එක්සත් ජාතික පක්ෂයෙන් ලබා ගත්ත ඒ දැනුම හා ඔබතුමාගේ දැනුම, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිත් එක්ක මා හිතන හැටියට හොඳ කාර්ය භාරයක් ඉටු කරනවා. ඒ කාර්ය භාරය මේ ආණ්ඩුවටත් යම් කිසි ආකාරයකින් කියා දෙන්න ඔබතුමා විශේෂ උත්සාහයක් දරනවා. ඒකෙන් වැඩකුත් වෙනවා කියලා මට පේනවා.

ගරු ඇමතිතුමනි, සුරාව සම්බන්ධයෙන් කථා කරන අවස්ථාවේදී ඔබතුමා කිව්වා රටේ සුරා භාවිතය වැඩි වෙලා තිබෙනවාය කියලා. ජනගහනය වැඩි වෙලා නිසා එහෙම

වෙන්නත් පුළුවන්. එතකොට අනිවාර්යයෙන්ම වැඩි වෙනවා. මේවා නීති දමලා, තහනම් කරලා නවත්වන්න පුළුවන් දේවල් නොවෙයි. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් බදු පනවද්දි බදු ප්‍රමාණය වැඩි කරලා ඒ ක්ෂේත්‍රයේ යෙදිලා ඉන්න අය අධෛර්යවත් වන ආකාරයෙන් බදු පනවන්න පුළුවන්කමක් තියෙන්න ඕනෑ. නමුත් ගරු ඇමතිතුමනි, ජනාධිපතිතුමා මීට වැඩිය වෙනස් අදහසක් දැරුවේ. එතුමා මතට තිත කියලා පටන් අරගෙන,- [බාධා කිරීමක්] මොනවා කියනවාද මම දන්නේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)
(මාණ්පුමිකු විමල් වීරවන්ස - නිර්මාණ, පොරියියල් සේවෛකළ්, වීටමෛප්පු, පොදු වසතිකළ් අමෛච්චර්)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

මම දන්න කාරණයක් කියන්නම්. ක්‍රිස් ඩිවලොපර්ස් කියන ආයතනය විශාල නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කරන්න ආවා. එක්තරා මන්ත්‍රීවරයෙක් Rs. 10 million ඉල්ලුවා කියලා අද ඒකේ අය ඒ මන්ත්‍රීතුමාගේ නමත් දමලා පැමිණිලි කරලා තිබෙනවා, Commission to Investigate Allegations of Bribery or Corruption එකේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)

ඒක මේකට අදාළ දෙයක් නොවෙයි නේ. ඔව්, කමක් නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

ඒ මන්ත්‍රීතුමාට කියන්නේ ක්‍රිස්ටෙන් කියලා. එයාගේ නම ක්‍රිෂ්ටෙන්.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)

ඔබතුමා ඉඳගන්න. ක්‍රිස්ටෙන් ගැන කථා කළ මේ ඇමතිතුමා කථා කරන කොට මට ඇත්තටම හිනාත් යනවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීමක්]

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ලජ්ජා නැතිව කථා කරනවා. ජනාධිපතිතුමාට ජැක් එක ගැහුවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ලජ්ජා සහගතයි. දේශපාලනය පටන් ගත්තේ අහිංසක ජනතාව වෙනුවෙන්. අද මොකක්ද කරන්නේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(Mr. Deputy Chairman of Committees)

Order, please!

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)

අද කථා කරනවා. [බාධා කිරීම්] ලංකාවේ ඉන්න පොහොසත්ම පුද්ගලයා බවට පත් වෙලා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(Mr. Deputy Chairman of Committees)

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, subject එකට අදාළව කථා කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)

ලජ්ජා නැතිව එතුමා කථා කරනවා. අද පොහොසත්ම පුද්ගලයා බවට පත් වෙලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(Mr. Deputy Chairman of Committees)

Hon. Minister, please allow him to speak. Hon. Sujeewa Senasinghe, please carry on with your speech.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)

ලජ්ජයි. ලජ්ජයි. [බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, what is your point of Order?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඉතාම වගකීමෙන් කියනවා -

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, that is not a point of Order. - [*Interruption*.]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඉන්න, ඉන්න. ඔබතුමාද තීරණය කරන්නේ?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I will decide that.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා මගේ නම සඳහන් කරමින් විවිධ දේ කිව්වා. මට අපහාසයක් වන දේවල් තිබුණොත් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට නියෝග කරන ලෙස ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If there is anything against the Standing Orders, that will be expunged from Hansard. Hon. Sujeewa Senasinghe, you carry on with your speech.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
තවත් කාරණයක් තිබෙනවා. මම කියූ දේ ගැන- [බාධා කිරීමක්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අමුණුගම ඇමතිතුමා සඳහන් කළා- [බාධා කිරීමක්] Sir, you better stop him. මේ මාළු කටවල් අපට නැහැ ඇමතිතුමනි. ඉතින් නවත්වන්න පොඩ්ඩක්. [බාධා කිරීමක්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ලජ්ජා නැද්ද? [බාධා කිරීමක්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
තව ටිකක් කථා කරන්න කෝ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, you carry on with your speech. Hon. Azwer, please sit down.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පගා ගහන පුද්ගලයා තමයි පගා ගහන බව දන්නේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීමක්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඔබතුමා ගැන නොවෙයි කථා කරන්නේ; Sir, I did not mention any name. තොප්පිය දමා ගන්න එපා. ඇමතිතුමනි, මම කවුරු ගැනවත් කථා කළේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, again I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ මහජන ධනය ශතයක් හෝ සොරකම් කරලා තිබෙන-[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න.[බාධා කිරීමක්] ඇයි මොකද නලියන්නේ? නිකම් "සිරසට" දමා ගන්න කථා කරන්න එපා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I am sorry, Hon. Wimal Weerawansa, that is not a point of Order. Please sit down. Hon. Sujeewa Senasinghe, you carry on.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
I did not mention the name of any Minister.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමා subject එකට අදාළව කථා කරන්න කෝ, එක එක දේවල් අහන්නේ නැතිව.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
I did not mention the name of any Minister and you had better know -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, why do you not speak to the subject matter please?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
I am speaking to the subject. So, let me speak.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You are creating problems. - [*Interruption*.] Hon. Azwer, Hon. Wimal Weerawansa please sit down.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, we know how certain Members and certain Ministers have done their businesses. There are certain people who came into politics without a cent and now they have become business moguls in the country. ඇමතිතුමනි, ලැජ්ජා වෙන්න ඕනෑ ඔබතුමා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඔබතුමා අපට කියන්න එන්න එපා. අපි ශත පහක්වත් අල්ලලාත් නැහැ, අල්ලන්නෙත් නැහැ. දේශපාලනයට ආවේ දුප්පත් ජනතාවගේ ලේ, රීරි මාංශවලින්. අද මොනවාද කරන්නේ? රුපියල් ලක්ෂ 1,500ක් පාවිච්චි කළා තමන්ගේ ඡන්දයට. රුපියල් ලක්ෂ 1,500ක්. මට පුදුම මේකයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එක්සත් ජාතික පක්ෂයෙන් පැනපු දෙන්නෙක් තමයි වටේ ඉන්නේ, දෙපැත්තෙන්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order? This is the last chance I will allow you to raise a point of Order.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මිනිස්සු පාරට ගත්තේ. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. දැන් ඔබතුමා කථා කරන්න. ඔබතුමා කෙළින්ම attack කරන්නේ නැතිව කථා කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට වෙලාව ඕනෑ. මට දිගටම බාධා කළා. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You are running out of time. - [*Interruption*.]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මම ඔප්පු කරනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ලෙඩක් නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද මේ? කථා කරන්න දෙනවාද, නැද්ද? [බාධා කිරීමක්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වාගේ මොනවා කථා කරනවාද දන්නේ නැහැ. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, please sit down. Please allow the Hon. Member to speak.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Let me speak, Sir.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Manusha Nanayakkara, what is your point of Order? - [*Interruption*.]

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මගේ point of Order එක අහන්න පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න කෝ. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, please sit down. There is a point of Order being raised by the Hon. Manusha Nanayakkara. What is your point of Order?

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මගේ ගැටලුව මේකයි. ඇත්තටම ක්‍රිස් එකෙන් මිලියන 10ක් ඉල්ලුවාද, නැද්ද? ඉල්ලුවේ නැත්නම් නැහැ කියන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I am sorry. That is not a point of Order.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ආණ්ඩුවට ගියේ. අපට කියන්න එනවා පගා ගන්නේ නැහැ කියා. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, ඔබතුමා කථා කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වෙලාව දෙන්න.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sajin De Vass Gunawardena, what is your point of Order? - [*Interruption.*] Order, please! There is a point of Order being raised by the Hon. Sajin De Vass Gunawardena.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු විමල් වීරවංශ ඇමතිතුමාගේ ගෞරවයට හානි වන විධියට මෙතුමා කථා කළා. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I have already given a ruling on that. So, if there is anything against the Standing Orders, that will be expunged from Hansard.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ඒක තමයි. දැන් මෙතුමාට කියන්න තියෙන්නේ එක දෙයයි.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒක කිව්වා නම් ඉවරයි නේ.ඉල්ලුවේ නැත්නම් නැහැ කියන්න. ඒක කියන්නේ නැතිව නිකම් ඉන්නවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, you continue with your speech.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ගැන මට ආඩම්බරයි. සැහෙන මන්ත්‍රීවරුන් පිරිසක් මගේ කථාවට අවධානය යොමු කරමින් ඉතා කළමනාකාරීව මට බාධා කළා. බොහොම ස්තුතියි. විරුද්ධ පක්ෂයේ තරුණ මන්ත්‍රීවරයෙකු වශයෙන් මට සන්තෝෂයක් තිබෙනවා. එක් ඇමතිවරයෙක් -බංකොළොක් ඇමතිවරයා- [බාධා කිරීම්] ආයෙත් පටන් ගත්තා. මාළු කඩය වාගෙයි. [බාධා කිරීම්]

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අමුණුගම අමාත්‍යතුමා කථා කළ දෙය සම්බන්ධයෙන් මම කථා කළේ. එතුමා කිව්වා, මත්පැන් පානය රටේ ඉතා ඉහළ මට්ටමක පවතිනවාය කියා. ගරු ඇමතිතුමනි, ජනාධිපතිතුමා සඳහන් කළේ මතට තිත තබනවාය කියලායි. ඒ කිවූ දෙයත් සමඟ ඔබතුමා කිවූ දෙය ගැලපෙන්නේ නැහැ කියා මා හිතනවා. අප පිළිගන්නවා, රටේ සංචාරකයින්ගේ වැඩි වීමත් සමඟ රටේ ජනතාව වැඩි වීමත් සමඟ මත්පැන් භාවිතයේ වැඩි වීමක් තිබෙන්නට පුළුවන් කියා.

විශේෂයෙන් ගරු ඇමතිතුමනි, අර containers දෙක සම්බන්ධයෙන් අප සඳහන් කරන්නට කැමතියි. මේ containers දෙක සම්බන්ධයෙන් මා ඔබතුමාගේ අවධානය යොමු

කරවනවා. මෙහි සුරාබදු දෙපාර්තමේන්තුවට අයත් බදු ප්‍රමාණයකුත්, ස්කාගාර සංස්ථාවට අයත් බදු ප්‍රමාණයකුත් තිබෙනවා. මේ බදු ප්‍රමාණය විශේෂයෙන්ම ගරු ඇමතිතුමනි, කෝටි 12ක් වාගේ ප්‍රමාණයක්. මේ බදු ප්‍රමාණය අය කර ගන්නට ඕනෑ. මේ බදු ප්‍රමාණය අය කර ගන්නවා ද නැද්ද කියන දෙය සම්බන්ධව ඔබතුමා අනිවාර්යයෙන්ම අපට උත්තරයක් දෙන්න ඕනෑ. ඒ වාගේම ගරු ඇමතිතුමනි, මේ ගනුදෙනුවට සම්බන්ධ ඇමතිවරයෙක් ඉන්නවා නම් - එහි සඳහන් කර තිබුණා, ප්‍රබල ඇමතිවරයෙක් මේ පසුපස ඉන්නවාය කියා- ඒ සම්බන්ධව සොයන්න රහස් පොලීසියට භාර කර නීතියෙන් දඬුවම් කරන්න ඔබතුමා කටයුතු කරන්නට ඕනෑ. මේ මුදල විශාල මුදලක්. මේ containers දෙකේ ඇඳුම් ගෙනාවා නොවෙයි, කාර් ගෙනාවා නොවෙයි ඇමතිතුමනි. Containers දෙකක බහා නීති විරෝධී දෙයක් ගෙනැල්ලා රටේ ආර්ථිකයට ආදායමක් වශයෙන් ලබා ගන්නට පුළුවන් රුපියල් කෝටි 12ක් වාගේ ප්‍රමාණයක්-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ ගැන කලිනුත් සඳහන් කළා. අප මේ ගැන සම්පූර්ණ පරීක්ෂණයක් කරනවා. මෙතුමාගේ කථාව මා අහගෙන හිටියා. මේ වෙලාවේ එක එක ඇමතිවරුන් මේකට සම්බන්ධ කර ගැනීම ඉතාම අසාධාරණයි.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු ඇමතිතුමනි, අප ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේකයි. බදු ක්‍රමයට අනුව බෝතලයට තමයි බදු ප්‍රමාණය වැටෙන්නේ. ස්ප්‍රීතු විශාල ප්‍රමාණයක් ගෙනැවිත් තිබෙන්නේ. තොග වශයෙන් නොවෙයි. Permission නැතිව ගෙනා දෙයක් නොවෙයි. ඒ බදු ප්‍රමාණය අනිවාර්යයෙන්ම කෝටි 12ක මුදල් ප්‍රමාණයක් වෙනවා. ඔබතුමා කිව්ව ආකාරයට රටට ලැබෙන්න තිබෙන මුදලක්. එය අය කර ගන්න ඔබතුමා යම් කාර්ය භාරයක් කරන්න.

විශේෂයෙන්ම අපේ රටේ සාක්ෂරතා හැකියාව ගැන ගරු ෆිලික්ස් පෙරේරා ඇමතිතුමා සඳහන් කළා. ලංකාවේ සාක්ෂරතා හැකියාව සියයට 97ක් කියා එතුමා කිව්වා. එතුමන්ලා මේ රටේ සාක්ෂරතාවය සියයට 90 සිට සියයට 97 දක්වා ඉහළ නංවා තිබෙනවාය කියා කිව්වා. නැහැ ගරු ඇමතිතුමනි, මේ රටේ සාක්ෂරතාවය සියයට 91.6යි. ඒ සාක්ෂරතාවය අවුරුදු ගණනාවක් තිස්සේ තිබුණු ප්‍රමාණයක්. එක අංගයක් පමණක් එහාට මෙහාට වෙන්න පුළුවන්. නමුත් විශාල වෙනසක් වෙලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මත්තල ගුවන්තොටුපළ සෑදීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. හම්බන්තොට වරාය හැදීම සම්බන්ධයෙන් අප විරුද්ධ නැහැ. අද අපේ විරුද්ධත්වය තිබෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේවා ගැන කියන දේවල් සහ මේවා කරන ක්‍රමය සම්බන්ධවයි. හම්බන්තොට වරාය සඳහා දරන වියදම බිලියන 130යි. මේ වියදමත් එක්ක අවුරුදු තුනක් යනකොට ආදායම ලබනවාය කියා අපට පොරොන්දු වුණා. ඔය

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

තිබෙන ඇමතිවරයෙක් කිව්වා, හම්බන්තොට අසලින් නැව් 400ක් යනවාය කියා. ඒ නැව් 400න් නැව් 200කට තෙල් ගැහුවාම විශාල මුදල් ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්ය කියා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හම්බන්තොට වරාය හදා අවුරුදු තුනක් ගිහිල්ලා. අද වෙනකොට එක නැවකට තෙල් ගහලා නැහැ. අයිනෙන් යන නැවකට තෙල් ගැහුවාය කියා ඔබතුමන්ලාට පුළුවන් නම් පෙන්වන්න. එහෙම දෙයක් කර නැහැ. [බාධා කිරීමක්] මා මගේ කාලය නාස්ති කරන්නේ නැහැ, ඔය වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

සම්බන්ධයෙන් කථා කරන්න. මා මගේ මාතෘකාවට බැහැලා කථා කරන්නම්. හැබැයි මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

මම ළඟදීම උත්තර දෙනවා. විශේෂයෙන් හම්බන්තොට වරාය සම්බන්ධයෙන් අප අහනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

කිව්වා නැව් 400ක් යනවා කියා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

මොනවාද නැව් ගැන දන්නේ? පොල් ගස් නැගපු, මිනිස්සු මරපු, මං කොල්ල කාපු, නැව් ගිනි තිබ්බ, බැංකු ගිනි තිබ්බ අය අද දේශපාලනයට ඇවිත් ගෙවල් හදාගෙන, කාමරවල AC දමාගෙන, කාර් අරගෙන කෝටිපතියෝ බවට පත් වෙලා. [බාධා කිරීමක්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංස)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -[බාධා කිරීමක්]

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මෙතුමා ගැන කවුද කථා කළේ? [බාධා කිරීමක්] මෙතුමා තොප්පිය දමා ගෙන. [බාධා කිරීම්] මෙතුමා ගැන නොවෙයි මා කථා කළේ. [බාධා කිරීම්] අනේ බැංකි වූන්! මෙතුමා ගැන නොවෙයි මා කථා කළේ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Wimal Weerawansa. What is your point of Order?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංස)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

නැත්නම් නැහැ කියන්න. මා ඔප්පු කර පෙන්වනවා. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. ඔබතුමා කථා කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට ක්‍රිස් එකට සම්බන්ධයකුත් නැහැ. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමා කථා කරන්න. That is not a point of Order. - [*Interruption.*]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම නඩුව කරන්නේ ටාටා ආයතනයෙන්. ක්‍රිස් එකේ ලොක්කා මොනවා හෝ කරලා. ක්‍රිස් ගානවා; ක්‍රිස් බිස් ගානවා. [බාධා කිරීම්]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. R. Yogarajan, what is the point of Order?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Mr. Deputy Chairman of Committees, the Opposition Members have a right to speak. If the Ministers are going to disturb like this, you will have to name them.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I will look after that. Hon. Sujeewa Senasinghe, please carry on.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Thank you. - [*Interruption.*] අයියෝ! ඇති තරම් මඩ ගහන්න. එතකොට අපට හොඳයි. පත්තරෙත් දාන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Minister of Ports and Highways)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! A point of Order is being raised by the Hon. Rohitha Abeygunawardana. What is the point of Order? - [*Interruption.*] There is a point of Order being raised. Please do not shout. - [*Interruption*.]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හම්බන්තොට වරායෙන් එක නැවකටවත් තෙල් ගහලා නැහැ කියලා මෙතුමා ප්‍රකාශ කළා. මෙතුමා දෙන ඕනෑම නැවකට මම තෙල් ගහන්න ලැහැස්තියි. අද රෑට මෙතුමා නැවක් දෙනවා නම් මම ඒකට තෙල් ගහන්න ලැහැස්තියි. [බාධා කිරීම්] ඕනෑම වෙලාවක.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Sujeewa Senasinghe, you carry on.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඇමතිතුමා කියන දේ හරි. ඇමතිතුමාගේ කථාව අවසන් නිසා ඔබතුමාට කථා කරන්න අවස්ථාවක් නැති නිසා මා ඒ ගැන කථා කරන්නේ නැහැ. ඔබතුමාට මා එදාත් කිව්වා, ඔබතුමාගේ කථාව මගේ කථාවෙන් පසුව නැත්නම් ඔබතුමාට ඔප්පු කරන්න පුළුවන් චෝදනා ගැන මා කථා කරන්නේ නැහැ කියා. මොකද, ඔබතුමාට කථා කරන්න අවස්ථාවක් නැති නිසා. හැබැයි, යම් කිසි කාරණා කිහිපයක් තිබෙනවා. ඒවාට උත්තර ලබා දෙන්න මම ඔබතුමාට විනාඩියක් ලබා දෙන්නම්. ගරු කරන ඇමතිවරුන්ට අපි එහෙම කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමන්ලාට විශේෂයෙන්ම හැදියාවක් තිබෙනවා; කථා කරන්න පුළුවන් හැකියාවක් තිබෙනවා; හොරකම් කරලා නැහැ; පල් හොරු නොවෙයි; මංකොල්ල කාලා නැහැ; බැංකු ගිනි තියලා නැහැ; බැංකු කොල්ල කාලා නැහැ. අන්න එවැනි ඇමතිවරුන්ට උත්තර දෙන්න අප සූදානම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම වරායේ සේවකයන් ගැන වරාය අධිකාරියේ සභාපතිතුමා -ආචාර්ය ප්‍රියත් බී. වික්‍රම- කර තිබෙන ප්‍රකාශයක් 03.03.2010 දිනැති "ඩේලි නිවුස්" පත්‍රයේ මෙසේ සඳහන් වෙනවා, I quote:

> "The Hambantota Port Phase One will be completed by end of October one year ahead of schedule. It is expected to generate 5,000 direct and 50,000 indirect job opportunities."

ඒ විධියට මෙහි සඳහන් වෙනවා. හැබැයි, මට ලැබී තිබෙන දත්ත අනුව -වැරදි වෙන්න පුළුවන්- 300කට අධික ප්‍රමාණයක් මේ අවස්ථාවේදී සේවයේ යෙදෙන්නේ නැහැ. දැන් උත්තර දෙන්න එපා. ඔබතුමන්ලා කිව්වා, මත්තල ගුවන් තොටුපොළ සම්බන්ධයෙන්; හම්බන්තොට වරාය සම්බන්ධයෙන්. නමුත් ඒ ඔබතුමන්ලා බලාපොරොත්තු වුණ ආකාරයේ ඉලක්ක සපුරා ගන්න හැකියාව ලැබිලා නැහැ. අපි ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා, ඒ කාලයේ මහවැලිය පටන් ගන්නා විට විවේචන තිබුණාය කියා. අප ඒ බව දැක්කා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා, "ඇයි මේක මෙච්චර ඉක්මනින් හදන්නේ? මේක සුදු අලියෙක් බවට පත් වෙයි" කියා. නැහැ. සංවර්ධනයක් තිබෙනවා නම්, ඒකෙන් සංවර්ධනයක් ලැබෙනවා

නම්, සමහර හොඳ කාරණා තිබෙනවා නම් අප ඒවා දක්වනවා. ඒ ස්ථානයේදී අහස් යානා හදිසියේදී බාන්න වුණොත් මත්තල ගුවන් තොටුපොලේ බාන්න පුළුවන්. ඒ වාගේ හදිසි අවස්ථාවලදී මේවා ප්‍රයෝජනයට ගන්න පුළුවන්. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය වන්නේ බිලියන 130ක් වාගේ ප්‍රමාණයක් හම්බන්තොටට වියදම් කරනකොට ඒ ප්‍රමාණය ඔබතුමන්ලා ගන්නේ සියයට 7.2 පොලියට නැත්නම් 6.2 පොලියට ණයටයි. මේ ණයවලට අපිට grace period එකක් ලැබෙන්නේ නැහැ. ඇමතිතුමනි, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය ඒ අවස්ථාවේදී මහවැලිය නිර්මාණය කළේ මෙගාවොට 780ක් බලාපොරොත්තුවෙන් බව ඔබතුමා දන්නවා. එය අපතේ ගියේ නැහැ. ඒ වාගේම ඔබතුමා දන්නවා, අප කිලෝමීටර් තුන් සිය ගණනක ඇළවේලි මාර්ග හැදුව බව. ඇමතිතුමනි, අද වනතුරු ඒවා එකක්වත් leak වන්නේ නැහැ. මේ ආකාරයේ විශාල කාර්ය භාරයක් එක්සත් ජාතික පක්ෂය කාලයේ කළා. Grace period එක අවුරුදු 10යි. ඒකට ඩොලර් මිලියන 780යි ගියේ. මොරගහකන්ද ව්‍යාපෘතියට පමණක් මිලියන 790යි. එය මොගාවොට් 20 ඉතා පොඩි ව්‍යාපෘතියක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හම්බන්තොට වරායෙන් යම් කිසි කාර්ය භාරයක් ඉටු වෙනවා ඇති. හැබැයි, හම්බන්තොට වරාය වෙනුවෙන් ආපු එක නැවක් නැහැ. අපි කියන්නේ ඒකයි. කොළඹට ආ නැව් ටික හම්බන්තොටට හැරෙව්වා. ඒ ගිය නැව් ප්‍රමාණය පමණයි. නැත්නම් හම්බන්තොට වරාය හැදුව නිසා විශේෂයෙන්ම ආ නැවක් මේ අවස්ථාව වන විට නැහැ. හැබැයි, ඉදිරි අනාගතයේ ඔබතුමන්ලාගේ හැකියාවට මා තව එකක් කියන්න ඕනෑ.

ලොයිඩ්ස් රක්ෂණය නැහැයි කියලා මම සඳහන් කළා. ඒ රක්ෂණය හම්බ වෙලා තිබෙනවායි කියලා මට දැන් ආරංචියක් ආවා. ඒ රක්ෂණය ලැබිලා තිබෙනවාද කියන කාරණය ඇත්තද නැත්තද දන්නේ නැහැ.[බාධා කිරීමක්] විස්තර මගේ කථාව ඉවර වෙලා දෙන්නම්. එහෙම ලැබුණා නම් විශේෂයෙන්ම හොඳයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි බලාපොරොත්තු වෙන්නේ ඔබතුමන්ලා මේ වියදම් කළ මුදලට යම් දෙයක් ලැබෙයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිතුමා සඳහන් කරනවා, රුපියල් බිලියන 200කට අධික ප්‍රමාණයක් ගල කඩන්න ගියා කියලා. ඔබතුමන්ලා කිව්වා, ගලක් නැහැයි කියලා. කමක් නැහැ, ඒ ගලත් කඩලා ඔබතුමන්ලා සඳහන් කළ ආකාරයෙන් -කට බරියා සඳහන් කළ ආකාරයෙන් - නැව් පන්සියයෙන් අඩුම ගණනේ නැව් පහක් එනවා නම් හොඳයි. මේ අය බෝට්ටුවල ගියේ නැති අය; බයිසිකල්වල ගියේ නැති අය. දැන් අපිට කියනවා, පගා ගහනවා කියලා. පගා මරුවෝ. අඩි පහක් උස නැහැ. අඩියට පගා ගැහුවොත්, මිලියන දහයක් ගැහුවොත් මිලියන 50ක් ගහලා. ඉතින් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවඞ්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, point of Order එකක් නැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

point of Order raise කරන්න දෙන්න එපා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවඞ්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(Mr. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, what is the point of Order?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවඞ්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

ඉල්ලුව බව මම ඔප්පු කරලා පෙන්වනවා. මොකද කියන්නේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

අභියෝගය භාර ගන්නවාද?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Sujeewa Senasinghe, you carry on.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
මම හිතුවේ නැහැ, ගොරකයෙක් කියලා. මම හිතුවා, මොකක් හෝ දේශපාලනයක් කරන්න හැකියාවක් තිබෙනවා, කථා කරන්න හැකියාවක් තිබෙනවා කියලා. මම හිතුවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

වුණාට මොකක් හෝ හැදියාවක් ඇති

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

කියලා. අර ඊට එහා පැත්තේ ඉන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

අනේ! නියෝජ්‍ය අමාත්‍යතුමා, ලජ්ජා නැද්ද? එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කාලයේ හොඳට ගරුත්වයක් තිබුණු ඇමතිවරු නේද? දැන් ගිහින් අල්ලනවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

[ගරු සුජීව සේනසිංහ මහතා]

ලජ්ජා නැද්ද? එහා පැත්තට යන කොට අපි අර්ල් ගුණසේකරලා අගය කළ අය. දැන්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ලජ්ජා නැති -[බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please!

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ලජ්ජා නැතිව-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Alhaj A.H.M. Azwer, what is the point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බර කරත්තයක්වත් නැති එක් කෙනෙක් සම්රාස්ගෙන් රුපියල් මිලියන 10ක් ඉල්ලලා තිබෙනවා. ඒ කවුද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

නේද? මෙතුමා ඒක හෙළි කරන්න. Commission to Investigate Allegations of Bribery or Corruption එකේ නම තිබෙනවා. එවැනි කෙනෙකුට මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න පුළුවන්ද? රුපියල් මිලියන 10ක් ඉල්ලුවා, සම්රාස්ගෙන්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Sujeewa Senasinghe, කථා කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
රුපියල් මිලියන 10ක් කොමිස් ඉල්ලුවා. පුළුවන් නම් නැහැ කියන්න. මම ඔප්පු කරනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නම්බුකාර දේශපාලනඥයෙක් ගිහිල්ලා අන්තිමට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

අද අපට ලජ්ජයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, කථා කරලා වාඩි වෙන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අන්තිමට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

අයියෝ නියෝජ්‍ය ඇමතිතුමා, චෝ! [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Sujeewa Senasinghe, කථා කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අයියෝ නියෝජ්‍ය ඇමතිතුමා, චෝ! ගන්න දෙයක් නැහැ. මෙතෙක් කල් අපේ ගරුත්වයක් තිබුණා. මම දැක්කේ නැහැ, මෙච්චර වෙලා, පස්ස අල්ලා අල්ලා ඉන්නවා එහා පැත්තේ. [බාධා කිරීම්]මොකක්ද, ඔබතුමාට කොච්චර ගරුත්වයක් අපේ තිබුණාද? මේ වාගේ අල්ලන්නකෝ බැසිල් රාජපක්ෂ මහත්තයාගේ. අල්ලන්නකෝ අපේ රෝහිත අබේගුණවර්ධන මහත්තයාගේ. අල්ලන්නකෝ, අපේ සරත් අමුණුගම මහත්තයාගේ. අල්ලන්නකෝ ෆවුසි මහත්තයාගේ. අල්ලන්නකෝ එස්.බී. දිසානායක මහත්තයාගේ. ඔය ඉන්නේ එහා පැත්තේ ඩිව් ගුණසේකර මහත්තයා. අපි භය නැහැ. මෙන්න මේ වාගේ ගරු කරන ඇමතිවරු එක්ක එකතු වෙන්න. ඔය වාගේ බංකොලොත්, දෙකේ කොළේ ඇමතිවරු එක්ක එකතු වෙන්න එපා. දුප්පත් ජනතාවගෙන් දේශපාලනයට ඇවිල්ලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, you have only two more minutes.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවට නොවෙයි, - [බාධා කිරීම්] මම කියන්නේ මන්ත්‍රීවරුන් ගැන නොවෙයි. මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවට තියා කාමරයකටවත් ගෙන්වා ගන්න එපා, ඔබතුමන්ලා. දේශපාලනය කරලා ජනාධිපතිතුමා කළ ලොකුම- [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is the point of Order, Hon. Wimal Weerawansa?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා මගේ නම සඳහන් කරමින් -

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ. නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඉන්න, ඉන්න කියන කල් ඉන්න ලොක්කා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If there is anything against the Standing Orders, that will definitely be expunged. Hon. Sujeewa Senasinghe, you carry on.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එහෙම කියලා බැහැ. මේ ගොල්ලෝ මාධ්‍යයට-

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]
කියලා කියන්නේ මෙතුමාගේ නම නම් මම ඉල්ලා අස් කර ගන්නවා. [බාධා කිරීමක්] නැහැ. නැහැ, මම දන්නේ නැහැ. නම දිගයි නේ. මොකක්ද දිග නමක් තිබෙන්නේ. වීරවංශත් නොවෙයි නම. වෙන නමක් තිබෙන්නේ. ඉතින් මම දන්නේ නැහැ. ඇත්ත නම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නම් මම ඉල්ලා අස්කර ගන්නවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ලජ්ජා නැද්ද,-

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නම් ඇත්ත නම, මම ඉල්ලා අස් කර ගන්නවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Sujeewa Senasinghe, you have only one more minute.

දැන් අවසාන කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ලජ්ජයි. මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවට නොවෙයි, පාර්ලිමේන්තු කණ්ඩායමට නොවෙයි, අඩුම ගණනේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කැන්ටින් එකටවත් දමන්න වටින්නේ නැහැ. කැන්ටින් එකෙත් ඉන්නේ මීට වඩා හොඳ මහත්තුරු. මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුවට නොවෙයි පාර්ලිමේන්තුවේ එළියේ කඩල විකුණන්න දමන්න ඕනෑ. කඩල විකුණන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අපට නඩු දමනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Members, please listen to me. There are students in the Gallery. So, mind your language when speaking.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I know that. He also must behave. - [*Interruption*.] He took my time. I do not care what he says.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, now, your time is over.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay, I will give you one more minute.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හම්බන්තොට වරාය ගැන මට කථා කරන්න ලැබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දේශපාලනයට ආවේ දුප්පත් ජනතාව වෙනුවෙන් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලජ්ජයි. "සාගතෙන් පෙළෙනවුන් - දැන් ඉතින් නැගිටියව්" කියලා ආපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අද ලංකාවේ ලොකුම සල්ලිකාරයා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

- [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you. The next speaker is the Hon. Y.G. Padmasiri.

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2013 අය වැය යෝජනාවල-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Vasudeva Nanayakkara. What is your point of Order?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි බොහොම ප්‍රවේශමෙන් මේ වෙලාවේ සභා ගර්භයේදී ගරු මන්ත්‍රීතුමා හා ගරු ඇමතිවරයා අතර ඇති වූ වාග් හුවමාරුවට ඇහුම්කන් දුන්නා. ඒ පාවිච්චි කළ වචනත්, ගම්‍ය වන ලෙස එල්ල කරපු ඒ නින්දිත කථා සියල්ලමත් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න ඔබතුමා ඉඩ දෙනවාද කියලායි මා අහන්නේ?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If there is anything against the Standing Orders, that will be expunged.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, what is your point of Order?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I did not use any language that is not suitable. But you, the Hon. Vasudeva Nanayakkara, being a Senior Minister, called me, " තමුසේ, බූරුවා". And, last time when you spoke -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Padmasiri, you carry on with your speech.

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, - [*Interruption.*]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
You should know how to speak as a Senior Minister.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
I am asking for a ruling on my point of Order.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, what is your point of Order?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මා point of Order එකක් ඉල්ලුවා. ඊට පස්සේ ගන්න. තේරෙන්නේ නැහැ නේ මේ ළමයාට. වාඩි වෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා ඔක්කෝම මකා දමනවා කිව්වාට, මේ CD පට අද මේගොල්ලෝ ගෙනියලා "සිරස" නාලිකාවේ ප්‍රචාරය කර ගන්නවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒවා මකන්න බැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ඔබතුමා කරුණාකරලා ඒ පිළිබඳ වගකීම අරගෙන, ඔය ප්‍රකාශය කරන්න. මේ අපහාසාත්මක, අවලාදාත්මක කථා මේගොල්ලන්ගේ නාලිකාවේ ප්‍රචාරය කර ගන්න,- [බාධා කිරීම්] මොකද, ඒගොල්ලෝ එකට එකතු වෙලා තමයි-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay, we will check and then release the CDs.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I did not mention any name. I know the Parliamentary language. I have read Hansards and if I have used certain language which is not suitable, they can be taken off. But, they cannot take my speech off. I made my speech without mentioning names. That is not filth. I used language that can be used in Parliament. That may not be the proper language but that can be used in Parliament. - [*Interruption.*] I agree. Being a junior Member, I agree.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Anything said against the Standing Orders will be expunged.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I am waiting for a ruling on my point of Order. - [*Interruption*.] You cannot let this happen.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, give me one minute. I have to answer. Sir, that can be done. That is why there are rules. According to rules, you must speak. According to rules, if I am using a tactic to say something, that is allowed in Parliament. The only thing is, I cannot mention names and I cannot mention the Ministry of a Minister. I can say, "ගෑනු හොරා" which is an open thing. It is not meant for anybody. I was disturbed every minute. - [*Interruption.*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I will give my ruling Hon. Y.G. Padmasiri, you carry on with your speech now. - [*Interruption.*] දැන් කරුණාකරලා සියලු දෙනාම නිශ්ශබ්ද වෙන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You cannot be raising points of Order all the time.

[අ.භා. 4.43]

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

2013 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අය වැය ලේඛනයේ සඳහන් ඉතාම වැදගත් බදු යෝජනා කීපයකට අදාළ පනත් කෙටුම්පත් කීපයක් පිළිබඳව සාකච්ඡා වන මේ අවස්ථාවේදී මටත් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

[ගරු වයි.ජී. පද්මසිරි මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් අද අපි දකිනවා, නාගරික පහසුකම් ගමට ගෙන යන, ගමේ සුන්දරත්වය නගරයට ගෙන එන යුගයක් උදා වෙලා තිබෙන බව. ඊයේ මත්තලදී ගරු ජනාධිපතිතුමාගේ කථාවෙත් සඳහන් වුණා, ගමේයි නගරයේයි කෙරෙන මේ වෙනස්කම් අලුත් ක්‍රමයට කරන්නේ කොහොමද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් අතර තිබෙන ඉතා වැදගත් පනත් කෙටුම්පතක් තමයි සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත. ඒ නිසා ඒ පිළිබඳව පමණක් මම කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ තුළ ඉතා වැදගත් යෝජනාවක් තිබෙනවා.

සීනිවලට ආදේශනය කළ හැකි දේශීය හකුරු, පැණි හා අතිරේක නිෂ්පාදන පුළුල් කිරීම සඳහා කිතුල් ගස් මෙන්ම පොල් ගස් මැදීමට බලපත්‍ර රහිතව ඉඩ දීම.

මෙය අපේ ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතට, සබරගමුව පළාතට, දකුණු පළාතේ ඇතැම් දිස්ත්‍රික්කවල ඇතැම් කොට්ඨාසවලටත්, ඒ වාගේම උඹව පළාතටත් වැදගත් වන යෝජනාවක්. මෙයට ඉතිහාසයක් තිබෙනවා. අපේ ඉතිහාසය දිහා බැලුවාම පෙනෙනවා, පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්න අය යම් යම් සංවර්ධන යෝජනා දිහා බලන ආකාරය ආණ්ඩු පක්ෂයට ආවාම වෙනස් වෙන බව. ඒ වාගේම ඇතැම් යෝජනා පිළිබඳව බොහොම දීර්ඝ කාලයක් ගියාට පස්සේ කියනවා, -අවුරුදු 20, 25 ගත වුණාට පස්සේ- අහවල් යෝජනාව එදා ඉදිරිපත් වුණු විධියට ක්‍රියාත්මක කළා නම් එහි ප්‍රතිඵල අද ගන්න තිබුණා කියලා. අන්න ඒ වාගේ ඉතිහාසයේ සිද්ධ වුණ වැදගත් දෙයක් නැවතත් මතක් කරන්න ඕනෑ. එදා මුදල් අමාත්‍ය ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා 1964 - 65 වර්ෂ සඳහා ඉදිරිපත් කරපු අය වැය ලේඛනයෙන් පොල් ගහක් මැද ගැනීමට ගැමි ජනතාවට අවසර දුන්නා. වර්ෂයකට රුපියල් 15ක බදු මුදලක් ගෙවලා පොල් ගහක් මැද ගැනීමට හැකි ඉඩ ප්‍රස්ථාව එදා සලසා දුන්නා. නමුත් ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ, එදා හිටපු විපක්ෂය වාගේම ආගමික අංශ ඒකට නොයෙකුත් විරෝධතාවන් ඉදිරිපත් කරපු නිසා. ඒ ආණ්ඩුව පෙරළෙන තැනට ඒ යෝජනාව හේතු වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ, සමසමාජ, කොම්යුනිස්ට් සහාග ආණ්ඩුව ඊ ළඟ මැතිවරණයෙන් පරාජය වෙන තෙක්ම, පොල් ගස් මැදීමට අවසර දීම නිසා රට මත් පැනින් වනසන්න යනවාය කියන ඒ වැරදි චෝදනාව මතු කරලා ඒ යෝජනාව අකර්මණ්‍ය කරලා දැම්මා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2004 - 2011 කාලය තුළ සීනි ආනයනය පිළිබඳව මම සංඛ්‍යාලේඛන කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ රටට සීනි ගෙන්වීමට 2004දී වැය වෙලා තිබෙනවා, මිලියන 11,048ක්. ඒ කියන්නේ බිලියන 11ක්. 2005දී මිලියන 13,303ක්, 2006දී මිලියන 23,256ක්, 2007දී මිලියන 16,753ක්, 2008දී මිලියන 21,988ක්, 2009දී මිලියන 25,045ක්, 2010දී මිලියන 41,077ක් වැය වෙලා තිබෙනවා. මේක විශාල මුදලක්. අපේ අය වැයෙන් තුන්වැනි තැනට වැඩිම මුදලක් වැය වෙන්නේ සීනි ආනයනයටයි. එහෙම නම් මේ අය වැයේ තිබෙන වැදගත්ම යෝජනාවක් තමයි පොල්, කිතුල් ගස් මැද ගැනීමට අවසර ලබා දීමෙන් සීනි වෙනුවට ආදේශන හැටියට අතිරේක නිෂ්පාදන ඇති කිරීම සඳහා ජනතාව දිරිමත් කිරීමට ගෙන ඇති යෝජනාව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි බදුවලින් බලාපොරොත්තුවන එක ප්‍රධාන කාරණයක් තමයි, දිරිගැන්වීම. නිෂ්පාදකයා, ආයෝජකයා, ගොවියා කියන මේ කවුරුත් බදු ප්‍රතිපත්තිවලින් යම් දිරිගැන්වීමක් කිරීමයි රජය බලාපොරොත්තු වෙන්නේ. ඒ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. දැන් තිබෙන්නේ ඒක ක්‍රියාත්මක කිරීමයි. එදා 1964-65 කාලයේ මේ රටේ ගැමි ජනතාව අතර පොල් ගස් නැගීමට, කිතුල් ගස් මැදීමට සිටි සංඛ්‍යාවත් එක්ක බැලුවාම අද ඉන්නේ ඉතාම අඩු සංඛ්‍යාවක්.

අපි මේ පිළිබඳව අවධානය යොමු කළ යුතුව තිබෙනවා. මට මතකයි, අපේ රටේ 1970 - 1977 කාලයේ සිට ලුණුවිල බණ්ඩිරිප්පුවේ ගස් මැදීම පිළිබඳ විශේෂ පුහුණු කිරීමේ වැඩසටහනක් තිබුණු බවත්, ඒ පුහුණුවට මමත් එක් කෙනෙක් යැව්ව බවත්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)
ඔහු අදත් ජීවත් වෙන්නේ පොල් ගස් නැඟීමෙන් සහ පොල් ගස් මැදීමෙන් තමයි.

මා මේ අවස්ථාවේදී රජයට, විශේෂයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයටත්, ඒ වාගේම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයටත් යෝජනා කරන්න කැමැතියි, මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමට නම් විශේෂයෙන්ම ගැමි ක්ෂේත්‍රයට ගස් මැදීම පිළිබඳව නැවතත් පුහුණුවක් ලබා දීමේ වැඩ පිළිවෙළක් සහ ඒ සඳහා රක්ෂණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. විශේෂයෙන් අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ අවධානය මේ සඳහා යොමු වීම වැදගත් වනවා. මේ රටේ දුගී බව නැති කිරීම ඉලක්ක කර ගත් දිවි නැඟුම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී පොල්, කිතුල් පමණක් නොවෙයි, උතුරේ තල් කර්මාන්තයත් වඩ -වඩා දියුණු කිරීමට දුප්පත් පවුල්වල රැකියා විරහිත තරුණයින්ගෙන් මේ සඳහා කැමති අය පුහුණු කරමින් ඔවුන් මේ කර්මාන්තය දෙසට යොමු කිරීම ඉතාම වැදගත් වනවාය කියන එක මා මේ අවස්ථාවේදී පෙන්වා දෙන්න කැමැතියි. මේ බදු යෝජනා ක්‍රියාත්මක කරමින් අපේ සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන යමින් මේ රජයේ ඉලක්ක කරා යන ගමන සාර්ථක කර ගැනීමට හැකි වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.51]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය හා පාර්ලිමේන්තුවේ අරමුණු ගැන අද උදෑසන සිටම සාකච්ඡාවට ලක් වුණා. පනත් කෙටුම්පතක් සම්මත කරන්න අවශ්‍ය කරන ක්‍රියාදාමය පිළිබඳ අවධානයක් නැතුව, ඒවා ගැන නොසලකා, අවසානයේදී ස්ථාවර නියෝගවලට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන ආකාරයට කටයුතු කරමින්, පාර්ලිමේන්තුව විහිළුවක් බවට පත් වන තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. යම් යම් පුද්ගලයන්ගේ වුවමනාවන් පිට, යම් යම් මුදලාලිලාගේ -ඒ අය ඉන්දියාවෙන් ආපු මුදලාලිලා වන්න පුළුවන්, වෙනත් රටකින් ආපු මුදලාලිලා වන්න පුළුවන්- වුවමනාවන් පිට කටයුතු කරන තවත් පිරිසක් අද මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. "මේක පාර්ලිමේන්තුවේ ගිහින් කියන්න. අසවල් මන්ත්‍රීවරයා ගැන මේ චෝදනාව කරන්න.

එතකොට අපට ඒකේ වාසියක් ලබා ගන්න පුළුවන්" කියලා ඒ මුදලාලිලා කිව්වාම, ඒ පුද්ගලයන්ගේ අදහස් මේ පාර්ලිමේන්තුවේ කියන කේවට්ටයෝ එක් කෙනෙක්, දෙදෙනෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ අරමුණ ඒක නොවෙයි. මූලාසනය දරන ඔබතුමාගේ වග කීමත් එවැනි අරමුණු වළක්වන එකයි.

ඒ විතරක් නොවෙයි. තවත් දෙයක් මේ පාර්ලිමේන්තුවේ සිද්ධ වනවා. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් නැඟී සිටින කොට මේ microphone එක switch on වන්නේ බොහොම ප්‍රමාද වෙලා බොහොම අකැමැත්තෙනුයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මන්දගාමීව.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මන්දගාමීව. හරියට වාසුදේව නානායක්කාර ඇමතිතුමා කිව්වා වාගේ. හැබැයි ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් වැරදිලා නැඟිට්ටත්, මේ ඇමතිතුමා නැඟිටින්නේ කථා කරන්න තමයි කියා මේ microphone එක switch on වනවා. මා මෙය කියන්නේ හිතා මතා තමයි. හදිසියෙන්, මේ දැන් සිදු වුණු දේ ගැන දැකලා කේන්තියට කියනවා නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ microphone එක පාලනය කරන නිලධාරියා කවුද කියා මා ඔහු අඳුනන්නේ නැහැ. මා ඔහුගේ නම දන්නේ නැහැ. මා ඔහුව දැකලා නැහැ. මේ පසු ගිය කාලය පුරාවට මේ microphones switch on වන එක, switch off වන එක දිහා මා බලා ගෙන සිටියා. මේ පාර්ලිමේන්තුවේ වැඩිම කාලයක් ගත කරන මන්ත්‍රීවරයකු වශයෙන් අනික් අය හැසිරෙන විධිය, මේ microphones හසුරුවන විධිය දැකපු කෙනෙක් හැටියටයි මා මෙය කියන්නේ. ඒ පුද්ගලයාගේ නම සොයා ගෙන, ඒ පුද්ගලයාගේ වර්යාව, ඉතිහාසය, අරමුණු ගැන ඊළඟ දවසේ අර්ථ විවරණ දෙන්න අවස්ථාව තබන්න එපා කියා කියමින්, කාර්ය පටිපාටිය, යහ පාලනය ගැන කථා කරන මේ මොහොතේ ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පිළිබඳව ඔබතුමා ගරු කථානායකතුමාගේත් අවධානය යොමු කරවන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අද-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔය අනෙක් ප්‍රශ්නය.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන කථා කරන කොට පාර්ලිමේන්තුවේ කේවට්ටයෝ ඉන්නවා කියලා කිව්වා. එතුමාට එහෙම කියන්නත් බැහැ. ඒක සියලු දෙනාටම අගෞරව කිරීමක්. ඒක ඉල්ලා අස් කර ගන්න ඕනෑ. අනෙක අද අපි දැක්කා, microphone එක සුජීව සේනසිංහ මහත්තයාටයි දෙන්නේ කියලා. විමල් වීරවංශ මහත්තයාට හෝ මට දෙන්නේ නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Member, you carry on with your speech.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගම්වල කියමනක් තිබෙනවා, "පුහුල් හොරා කරෙන් දැනේ" කියලා. සමහර වෙලාවට යාපනය පළාතෙත් ඒ කියමන භාවිත කරනවාද දන්නේ නැහැ. ඒ "පුහුල් හොරා කරෙන් දැනේ" කියලා කියන්නේ ඇයි? මොනවා හරි අවුල් සහගත දේවල් හිත ඇතුළේ තිබෙන කොට තමන්ට අදාළ නැති දේවල්වලටත් නැඟිටිනවා; ප්‍රතිචාර දක්වනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මේ විෂිළුවට තව දුරටත් ඉඩ දෙන්න නරකයි. ඒ වාගේම හිතේ අමාරු තිබුණු එවැනි පුද්ගලයෝ ගැන අද දවස ඇතුළතත් අවස්ථා කීපයක ගරු කථානායකතුමා ප්‍රතිචාර දැක්වූවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි මේ විෂය පිළිබඳව සාකච්ඡා කරද්දී අපේ රටේ ආර්ථික සංවර්ධනය පිළිබඳව; අපේ රටේ අනාගතය පිළිබඳව බොහොම වැදගත් සන්ධිස්ථානයකට අපි ඇවිල්ලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය දවස්වල මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විවෘත කිරීම සඳහා ආණ්ඩුව ඉතාම ලස්සන මාධ්‍ය ව්‍යාපාරයක් අරගෙන ගියා. ඒක ඉතාමත්ම වටිනවා. "දින 10යි, දින 9යි, දින 8යි, දින 7යි, දින 6යි, දින 5යි, දින 4යි, දින 3යි, දින 2යි, දින 1යි, මෙන්න අපි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විවෘත කළා" කියලා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාගම්පුරයට ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් ලැබුණු එක ගැන බස්නාහිර පළාතේ පදිංචිකරුවන් හැටියට අපට සන්තෝෂයි. මොකද රටකට ගුවන් තොටුපොළවල් අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම හම්බන්තොට ප්‍රදේශයේ වරායක් ඉදිකිරීම ගැන පළමුවෙන්ම අදහස් ප්‍රකාශ කරපු පක්ෂය හැටියට, හම්බන්තොට වරායක් ඉදිකිරීම ගැනත් අපට සන්තෝෂයි. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ ඒ මේ රටේ ප්‍රමුඛතාව තිබෙන ප්‍රශ්න නොවන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මම ඔබතුමාට තව කාරණයක් කියන්නම්. මම නියෝජනය කරන අටලුගම ආසනයේ ඉමිතියාස් කියලා මගේ මුස්ලිම් මිත්‍රයෙක් ඉන්නවා. ගිය ඉරිදා මම ඒ ඉමිතියාස් කියන මගේ මිත්‍රයා හම්බ වන්න යනකොට "මන්ත්‍රීතුමා දින 14යි" කියලා කිව්වා. මම එතුමාගෙන් ඇහුවා, මොකක්ද මේ දින 14 කථාව කියලා. "නැහැ, විදුලි බිල වැඩි වන්න තව දින 14යි" කිව්වා. මම මේක හිතට ගත්තා. ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමනි, මම මේක එච්චර seriously ගත්තේ නැහැ.

මම ඊයේ උදේ පානදුර උසාවියට ගියාම සිදු වූ තව සිද්ධියක් කියන්නම්. මම අදාළ පුද්ගලයාගේ නම කියලාම කියන්නම්. නීතිඥ රෝහණ මනම්පේරි මහත්තයා පානදුර උසාවියේ නීතිඥ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කාමරයේදී මාව හම්බ වුණු වෙලාවේ "මචං දින 13යි" කියලා කිව්වා. මොකද මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විවෘත කරන තෙක් දින ගණන් කර ගෙන, ගණන් කර ගෙන ආපු ආණ්ඩුවේ campaign එකත් එක්ක ජනතාව ඉන්නේ Olympicsවලට දින ගණන් කරන්න වාගේ දින ගණන් කරන mood එකෙන්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔක නිබන්ධනයක්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම නම කියලායි කියන්නේ. නීතිඥ රෝහණ මනම්පේරි මහත්තයා මගේ පක්ෂයේ කෙනෙකුත් නොවෙයි. එතුමාගේ පාක්ෂිකත්වය තිබෙන්නේ වෙනත් පක්ෂයකටයි. දැන් ඔය විධියට අප්‍රේල් පළමු වැනිදා වෙනකම් දින 12යි, දින 11යි, දින 10යි, දින 9යි කියලා දින ගණන් කරන්නේ මේ රටේ දුප්පත් අහිංසක මිනිස්සු. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ විදුලි පාරිභෝගිකයෝ දළ වශයෙන් මිලියන පහක් සිටිනවා. ඒ මිලියන පහෙන් මිලියන තුනකට, ඒ කියන්නේ ඒකක 180ක් දක්වා පරිභෝජනය කරන පිරිසට සියයට 50කට ආසන්න ප්‍රමාණයකින් අනිවාර්යයෙන්ම විදුලි බිල වැඩි වනවාමයි. අප්‍රේල් මාසයෙන් පස්සේ සියයට 50කට වැඩි ප්‍රමාණයකින් අනිවාර්යයෙන්ම විදුලි බිල වැඩි වනවා. ඒක තමයි අදාළ මිල වැඩි කිරීමේ සූත්‍රය. දැන් ජනතාව දින ගණන් කරනවා, තව දින 12යි, 11යි, 10යි, 09යි කියලා. හැබැයි මේ විධියට දින ගණන් කරලා අප්‍රේල් පළමු වැනිදා කියන ගැළපෙන දවසට ජනතාව මෝඩයෝ; ජනතාව මේ ගැන ප්‍රතිචාර දක්වන්නේ නැති පිරිසක්; මොනවා කළත් අපට ඡන්දය දෙනවා කියා හිතලා විදුලි බිල වැඩි කරනවා. එහෙම කරන එකෙන් ප්‍රශ්නයක් වන්නේ අපට නොවෙයි, ඒකක 180ට වඩා අඩුවෙන් පාවිච්චි කරන අහිංසක සාමාන්‍ය මිනිස්සුන්ටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සූත්‍රය අනුව විදුලි ඒකක 300ට වඩා වැඩියෙන් වැය කරන අයට විදුලි බිල වැඩි වන්නේ සියයට 14ක්, 22ක් අතර ප්‍රමාණයක් බව ඔබතුමා දන්නවාද? ඒ කියන්නේ දුප්පතාට විදුලි බිල වැඩි වනවා සියයට 50කින්. පොහොසත් මිනිසුන්ට විදුලි බිල වැඩි වන්නේ සියයට 14ත් සියයට 22 ත් අතර ප්‍රමාණයකින්. පුදුම සාධාරණයක්. මට මේක තේරුම් ගන්න බැහැ. මොකක් හරි සූත්‍රයක් තිබෙනවා නම් ඒ ගැන වග කිව යුතු ඇමතිවරුන් අපට කියලා දෙන්න ඕනෑ. විදුලිබල විෂය භාරව හිටපු ඇමතිතුමා ඉන්නවා. එතුමා හරි අපට මේක ගැන තේරුම් කර දෙන්නට වටිනවා, මොකක්ද මේ සූත්‍රය කියන එක. ඇත්ත කථාව තමයි, මේ රටේ ජනතාවගේ ප්‍රමුඛතාව හඳුනාගෙන නැතිව අප වෙනත් දේවල් කරන එක.

පසුගිය දවස්වල හම්බන්තොට වරායේ අර තිබෙනවාය කියපු ගල කැඩුවාට පසුවත් නැව් එන්නේ නැති නිසාද කොහෙද එහි මාළු බාන සිද්ධියක් ගැන බොහොම ලොකු විවරණයක් ඇති වුණා. ඒ කියන්නේ හම්බන්තොට වරාය ධීවර වරායක් බවට පරිවර්තනය වෙමින් තිබෙනවා කියලා. ඇත්ත වශයෙන්ම ඒක අපට සතුටක් නොවෙයි. අපේ රටේ ජනතාවගේ ධනය උකස් කරලා, ජාතිය උකස් කරලා තමයි ඒ වරාය ඇති කරලා තිබෙන්නේ. රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුව ඒ වරාය හැදුවා නම්, ඒ වරායේ ඉදිරි පියවර වෙනුවෙන් අවශ්‍ය දේවල් ඉක්මනින් කරන්නට අවශ්‍යයි. නමුත් අද නැව් එන්නේ නැති නිසා භය නැතිව වරාය ඇතුළේ මාළු අල්ලනවා. ඒ වාගේ මගේ ප්‍රාර්ථනය වන්නේ මත්තල ගුවන් තොටුපොළට නම් එහෙම වෙන්න එපා කියන එකයි. මත්තල ගුවන් තොටුපොළ, ගුවන් යානා එන, ඒ වාගේම බොහොම කාර්ය බහුල ගුවන් තොටුපොළක් වේවා කියන එකයි මගේ ප්‍රාර්ථනය. හැබැයි යම් හෙයකින් අර කවුද කිව්වා වාගේ මත්තල ගුවන් තොටුපොළේ කිඹුල්ලු දකින්න වුණොත්, ගුවන් තොටුපොළට අලි එන තත්ත්වයක් ඇති වුණොත්, මම හිතන්නේ සංචාරකයන්ට සතුන් බලන්න යාල යන්න වුවමනා වෙන එකක් නැහැ. අපට මත්තල ගුවන් තොටුපොළ පථයේ ඉඳලා සතුන් බලන්න පුළුවන් වෙයි. ඉතින් එය මගේ ප්‍රාර්ථනය නොවෙයි. ඒක නොවෙයි සිදු වෙන්නට ඕනෑ දේ. මෙහි ප්‍රමුඛතාව මොකක්ද? ප්‍රමුඛතාව හඳුනා ගන්නට බැරි ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේවා හදන එක ගැන අපි ස්තුතිවන්ත වෙනවා. මොකද, රටට ගුවන් තොටුපොළවල් අවශ්‍යයි, රටට වරායන් අවශ්‍යයි. ඒවා කරන්න. හැබැයි ඒ එක්කම දුක් විඳින, පීඩා විඳින, අහිංසක දුප්පත් මිනිසාගේ වේදනාව ගැනත් සිතන්න. දීර්ඝ කාලීනව ප්‍රමාණවත් වැටුප් වැඩි වීමක් නැති රජයේ සේවකයන් ගැන, ඒ වාගේම කිසිම සැලකිල්ලකට ලක් නොවී සිටින පෞද්ගලික අංශයේ සේවකයන් ගැන, ඒ වාගේම ඉතාම අසීරුවෙන් දුඃඛිතව ජීවත් වන වතු අංශයේ සේවය කරන අපේ කම්කරුවන් ගැන, ඒ අය ගැනත් හිතන්න අවශ්‍යයි. අද ඔවුන් ගැන කයිවාරු ගසමින් ජනතාව රවටනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. අද අපේ රටේ තිබෙන වටිනාම දේපොළ විදේශිකයන්ට උකස් කරනවා, බදු දෙනවා, විකුණනවා. කියනකොට නම් කියන්නේ, අපි විදේශිකයන්ට කිසිම දෙයක් දෙන්නේ නැහැ යි කියලා යි. හැබැයි, අද වනකොට මේ පාර්ලිමේන්තුවේ සිටින සමහරුන් විදේශික ඒජන්තයන්ගේ නියෝජිතයන් බවට පත්වෙලා තිබෙනවා. අපි දන්නවා, ඉන්දියාවේ "ටාටා" සමාගම තමන්ගේ නියෝජිතයා වශයෙන් පත් කර තිබෙන තැනැත්තා අද අපේ රටේ අධිකරණ කටයුතුවලට ඇඟිලි ගසන බව. අපේ රටේ දේපොළ තක්සේරුකරණයට ඔහු පෞද්ගලිකව ඇඟිලි ගසනවා. ඒ වාගේම ඒවාට සම්බන්ධ වෙලා සිටින නීතිඥවරුන්ට හිරිහැර, අපහාස කරන්නට කටයුතු කරනවා. ඒ වාගේම ඒ "ටාටා" සමාගමේ සිටින නියෝජිතයා මෙම ව්‍යවස්ථාදායකයේ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පෞද්ගලිකව අපහාස කරන්නට අවශ්‍ය කරන සැලසුම් සකස් කරනවා. මෙය ඉතාම බරපතළ තත්ත්වයක්. ඒ නිසා තමයි අද මේ ගරු සභාවේ දී සමහර දේවල් අපට අහන්නට ලැබෙන්නේ. ඒ නිසා මෙහි ඇත්ත කථාව තේරුම් ගන්නට අවශ්‍යයි.

ඒ වාගේම තවත් ලජ්ජා හිතෙන කාරණයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔබතුමාට මා එක් කාරණයක් මතක් කරන්නම්. මීට අවුරුදු තුනකට කලින් ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් සභා මැතිවරණ ව්‍යාපාරයට උදව් කරන්න කළුතර ඉඳලා අපි ගියා. ඒ ගිය අවස්ථාවේ දී අපේ එක්තරා අපේක්ෂකයෙක් ඒ වේදිකාවට නැඟලා කිව්වා, "මගේ තාත්තාට ජනතා විමුක්ති පෙරමුණෙන් වෙඩි තබපු වෙලාවේ මගේ තාත්තාගේ පපුවෙන් ගලාගෙන ගියේ රතුපාට රුධිරය නොවෙයි, කොළපාට රුධිරය" කියලා. එහෙව් තාත්තාගේ පුතා, මේ එක්සත් ජාතික පක්ෂය කවදාවත් පාවා දෙන්නේ නැහැ යි කියලා මම සිටි තැනමයි කිව්වේ. ඊට පසුව කථා කළේ මමයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැබැයි එහෙම කියපු මිනිස්සු තනතුරුවලට, මුදල්වලට එක්සත් ජාතික පක්ෂය පාවා දීලා, දහඅටවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනුවෙන් ආණ්ඩු පක්ෂය ශක්තිමත් කරන්න ඒ පැත්තට ගියා. ලජ්ජා නැතිව එහෙම ගියා නම්, අද එක්කෝ කට වහගෙන කීයක් හරි හම්බ කරගෙන ඉන්නට ඕනෑ. එහෙම නැතිව කෙළින් කථා කරන, එඩිතරව කථා කරන මන්ත්‍රීවරුන්ට මේ පාර්ලිමේන්තුවේ "පාට්" දමන තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඒ වාගේ අය තමන්ගේ ඉතිහාසය ගැන අපි වාගේ නිශ්ශබ්දව සිටින මිනිසුන්ගෙන් අහගන්නේ නැතිව, කට පරිස්සම් කරගෙන ඉන්නවා නම් හොඳයි කියන කාරණය මතක් කරමින් මා නතර වනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Jayarathna Herath [*Pause*] - not here. The Hon. Eric Prasanna Weerawardhana [*Pause*]- not here. Then, the next speaker is the Hon. R. Yogarajan.

[5.04 p.m.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Hon. Deputy Chairman of Committees, I am pleased to speak here today on four Bills related to finance that have been presented as a consequence of the Budget that was presented in November, 2012.

Sir, we see here that our Members of Parliament from the Opposition are being harassed, disturbed and are not being allowed to say what has to be said. This is very unfortunate. Parliament is the only place where the Members of Parliament are guaranteed the right to speak openly without fear; without any consequences of legal or other impediments; where the actions and inactions of the Government can be pointed out and issues may be raised for answer by the Government.

I know very well that the Hon. Sujeewa Senasinghe, my Colleague, came well prepared with a very responsible, logical and analysed speech on the four Bills that are being discussed today. However, as soon as he started speaking, a Minister from the Government side interrupted him. He interrupted him because the Hon. Sujeewa Senasinghe is appearing on behalf of thousands of people who live in Slave Island, who protest against the takeover of their homes for the benefit of some foreign investors. He, as a lawyer, has the right to practise his profession. It is guaranteed by the Constitution. But, however, just because he appears for these poor people without a fee to defend their right to their homes, he is being harassed not only in this Parliament but even outside.

But, it is so unfortunate that a responsible Minister, the Minister in charge of housing, can cast aspersions on the character of an Hon. Member of Parliament who has come here to discharge his duties responsibly, by disturbing him, calling him names and saying all types of things. This provoked him. It provoked the Hon. Sujeewa Senasinghe to counterattack. If you behave yourselves, there is no reason for us to counterattack. So, you must learn that this is Parliament where we have the right to speak and you must allow us to speak.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
You also must learn to respect the political leaders.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
We do respect political leaders.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
You must respect the political leader who brought you into politics.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
My leader who brought me into politics and gave me this status today in this country is no more. I have not forgotten him.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
I am referring to the recent past.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
He is no more. I have not forgotten him. I was the person who brought a Motion to the House Committee that a portrait of my late leader must be unveiled in this premises.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
I am referring to the recent past.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Yes, Hon. Sajin De Vass Gunawardena, I know you very well and you know me too well.

You know why I left that Party. It is not because I did not like that Party or that leader, it was because he was hanging on to your coat-tails. There was no other reason.

I know that this Government is today defending itself in Geneva because of your actions. You have been running around the world trying to defend this Government. That is because you have failed to do certain things, which I thought and felt that this Government will not do for the minorities in this country. That is why I left the Party that was with your Government and came to this side. So, I feel today that I have been justified in what I did. I did it on a question of principle and not on questions of people or persons.

The Hon. Sujeewa Senasinghe was not only harassed today in this Parliament, he had been harassed in courts also. He has been pushed to a corner in courts with the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

on behalf of the Government. This is very unfortunate.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Sajin De Vass Gunawardena?

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Hon. Deputy Chairman of Committees, the Hon. Member, - [*Interruption.*]-

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
No, in this Parliament we have been -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
One second, please! There is a point of Order being raised by the Hon. Sajin De Vass Gunawardena.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Please allow me to speak. The Hon. Member made a reference to an intimidation made by the Bench, no less than the Supreme Court. That is a derogatory statement that he is making against the institution and the establishment of Judiciary. Please expunge that.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, do not mention the Supreme Court.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
In Parliament, you have been saying - [*Interruption.*] How many aspersions were cast on the Chief Justice in this same House just a month ago? - [*Interruption.*] -

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
That was the subject under discussion in this House then. A Motion was -

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
That may be. But, even today, you said that Parliament was supreme and we have the right. The actions of Members of Parliament cannot be questioned within this Parliament.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
A Motion was brought after a Parliamentary Select Committee process and it was discussed in this House.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Okay. Let me speak. If it is found that I have spoken against the Standing Orders, the Hon. Speaker has the right to expunge. But, I have to say what I want to say. Do not intimidate us. - [*Interruption.*] - Hon. Sajin De Vass Gunawardena, you could have stayed two more days in Geneva but you came.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
I did not go.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
We thought you were there.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
I did not go.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Maybe that is why we are going to fail the day after tomorrow. - [*Interruption.*]

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
We are not going to fail. Not us, but it is the Tamil community.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
No, it is not the Tamil community.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
The Tamil community is going to fail because of

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

like you.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

I am not a traitor to my community. It is a question - [*Interruption.*] Hon. Sajin De Vass Gunawardena, please, I am not a traitor to my community. I have stood by my community always. Today, you have been a

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

to this country because there was a Resolution passed by the UNHRC last year. You agreed to implement the recommendations of the LLRC but you have not done it and today, you are facing a bigger, a more serious - [*Interruption.*]-

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

We have done that. - [*Interruption.*] The facts available are not being taken into consideration. - [*Interruption.*]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

No. This is the whole problem. - [*Interruption.*] I came here to talk about the Bills related to finance, but you are diverting me - [*Interruption.*]

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

But, you were talking about Hon. Sujeewa Senasinghe.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

I do have to because he was disturbed. - [*Interruption.*] This is the whole problem.- [*Interruption.*] This Government has lost its tolerance - [*Interruption.*] Because of your excessive arrogance - [*Interruption.*] Because people like the Hon. Manusha Nanayakkara, for whatever benefit, jumped to your side and gave you a two -thirds majority, you think that you can do anything - [*Interruption.*] This Hon. Manusha Nanayakkara is a person for whom I got nomination to contest the Provincial Council Elections in Galle. - [*Interruption.*] What happened? He ditched the CWC in three months and ran to the UNP. - [*Interruption.*]

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

From the UNP he came to this Parliament. - [*Interruption.*] Within three months, he ditched the UNP and jumped to your side. Dishonourable people like him - [*Interruption.*]

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

But, I must appreciate one thing. You came and helped me at the Southern Provincial Council Election. I must appreciate that. I must say that.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

That is a personal between you and me. At that time I was a Member of the CWC and I had the right to work for you. That is a different matter. But, this fellow is a shame. This person is a shame to Parliament, to politics. He is a dishonourable person.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

තමුන්නාන්සේ CWC එක ගැන කියන්න එපා. තමුන්නාන්සේ CWC එකේ ඉන්න කාලයේ කරපු දේවල් මෙතැන කරන්න එපා. [බාධා කිරීම්] තමුන්නාන්සේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නිසා මම ඒ ගැන කියන්නේ නැහැ.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

You go and ask them. Even today the CWC knows how much I have contributed to that Party and to those people. Everybody in this House knows how I have contributed to my community and my Party. - [*Interruption.*] Okay. Now, Hon. Sajin de Vass Gunawardena, please do not disturb me. - [*Interruption.*]

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

We will not disturb you.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

My Colleague was intimidated in the courts. Then, when he was going to Kandy -

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

You cannot say that. You are a lawyer.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
I am not a lawyer. I am no lawyer, Hon. Sajin De Vass Gunawardena.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
How can you say that he was intimidated. You cannot say that.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
If I know that it was done, I can speak on behalf of my Colleague. - [*Interruption*.]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please allow the Hon. Yogarajan to speak.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ජාතිවාදය.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Hon. Deputy Minister of Health you can say "ජාතිවාදය". But you -

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Ajith P. Perera?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට නිදහසේ තමන්ගේ කථාව කරන්න අවස්ථාව තියෙන්න ඕනෑ. පුරුද්දක් විධියට දැන් විනාඩියෙන් විනාඩියට නැඟිට නැඟිට බාධා කරනවා. ඒක වෙන්න බැහැ. ඔබතුමාගේ රාජකාරිය ඒ නිදහස ආරක්ෂා කර දෙන එකයි. එහෙම නැත්නම් දැන් මේක දමලා අපි යන්න යනවා. එච්චරයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Yogarajan, why do not you speak on the subject?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Subject එකේ ප්‍රශ්නය වෙනම එකක්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If you divert your speech to personal matters it will be a problem. You carry on with your speech, Hon. Yogarajan.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
I have the right to speak of what happened in this House today. The Hon. Sujeewa Senasinghe was not only intimidated here, he has been intimidated on the road. He was travelling to Kandy. The police is following him. They are blocking his vehicle. They are questioning him about the case that he is appearing for in courts. This is not the way to run a democratic country. An individual cannot do his politics, cannot do his job as a Member of Parliament, he cannot do his job as a lawyer.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
What has happened?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
What is this democracy? You are objecting to my talking about community. I represent a - [*Interruption*.] No. You objected to my talking about my community and asked me what I am doing for your community. You see, I am not a communal person. I am the only Tamil Member in this House who is married to a Sinhalese lady; I am not a communal person. But, you are a person who is known to have burnt down a Mosque in Mawanella.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, මම සිංහලෙන් කිව්වාම ඔබතුමාට තේරෙනවා ඇති නේ. මම මාවනැල්ලේ පල්ලි ගිනි තිබ්බා කියලා ඔබතුමා කියනවා. තමුන්නාන්සේ පුළුවන් නම් ඒ චෝදනාව ඔප්පු කරන්න. පොලීසියේ පැමිණිලි තිබෙනවාද? පුළුවන් නම් ඔප්පු කරන්න.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
This is what people know.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මම රේඩියෝ එකක් ගත්තේත් හෂීම් මුදලාලිගේ කඩෙන්. තමුන්නාන්සේ ජාතිවාදය අවුස්සන්න එපා. අපි මාවනැල්ලේ මුස්ලිම් මිනිස්සුත් එක්ක හොඳින් ඉන්නවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Lalith Dissanayake, please sit down.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
When I talk about a Member being intimidated and not being allowed him to speak in this Parliament, you disturb me.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපි ජාතිවාදය අවුස්සන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
අපි ජාතිවාදය අවුස්සනවා නොවෙයි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පුළුවන් නම් කියන්න මොන පල්ලියද ගිනි තිබ්බේ කියලා. ඔබතුමා ඒ කථාව ඉල්ලා අස් කර ගන්න ඕනෑ. කොයි පොලීසියේද ඒ ගැන පැමිණිල්ලක් තිබෙන්නේ? කරපු නැති දේවල් කියන්න එපා.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Today I made a statement to the "Indian Express" newspaper saying that the intimidation of pilgrims who come to to Tamil Nadu, India, is unfair - [*Interruption.*] I did not say so; you also do not disturb me.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කට තිබුණ පලියට මේ වාගේ දේවල් කියන්න එපා. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Lalith Dissanayake, he did not mention your name. So, please sit down.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මම ගිනි තිබ්බ පල්ලිය මොකක්ද? මුස්ලිම් මිනිස්සුන්ට මම මොනවා හරි කරලා තිබෙනවාද? මෙතැන අසත්‍ය කියන්න එපා.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Today I made a statement to the "Indian Express" newspaper. I said that the intimidation of pilgrims, students, sportsmen and visitors to India which took place, is unfortunate. It should not be done by the Tamil people in Tamil Nadu because they have a culture of hospitality. I have told them openly that this should stop not because I am in fear but that is the tradition of the Tamil people.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
තමිල්නාඩුවේ ඉන්න ඔයගොල්ලන්ගේ ඥාතීන්ට කියන්න කෝ. [බාධා කිරීම්]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
ඒ ගොල්ලන්ට තමයි කිව්වේ. ඒ ගොල්ලන්ට තමයි කිව්වේ. ඒක තමයි "Indian Express" එකට කිව්වේ. මෙහේ පත්තරවලට නොවෙයි. [බාධා කිරීම්] වාඩි වෙනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපේ මිනිස්සු මැරුවා කියලා ඔය පැත්තෙන් කිව්වේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ මිනිස්සු මරන කොට, හමුදාවේ සොල්දාදුවන් මරන කොට ඒවා කිව්වේ නැහැ. දැන් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. [බාධා කිරීම්]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
If you are going to talk about the killing of soldiers, then I will have to talk about the killing of civilians about which the whole world is looking at you.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Lalith Dissanayake, කරුණාකරලා වාඩි වෙන්න.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Today the people of Tamil Nadu should not react against the people of Sri Lanka. They should react against the Government of Sri Lanka. When your Ministers go to Tamil Nadu, if there is a black-flag demonstration, I would welcome it. If your armed forces are going to Tamil Nadu for training and those people are emotionally affected in the protest, I would welcome that and I also appeal to the Government of India that they must vote with the US on the Resolution that is coming before UNHRC. Only then I feel the Government, which is so arrogant and irresponsible, can be brought to justice.

Talking about the levies that have come up, you all are people who talk about "රට විරුවෝ". You say that there are people who go abroad, work, send their earnings back to this country. They are the people who sustain the economy. Your balance of payments will go awry if not for those people.

[ගරු ආර්. යෝගරාජන් මහතා]

You have said in one of the Bills that they will be exempted from -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Give the mike to the Hon. R. Yogarajan.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
This is the harassment -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No. It is due to some technical fault, Hon. Yogarajan. Your mike was not purposely turned off.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Okay, it was some technical fault.

Sir, this country survives because of the remittances of our workers overseas. But, what are you doing to them? You have offered, when they come back and start a business, to exempt them from Turnover Tax. But, how much is your Turnover Tax threshold? Rs. 12 million. Do you think any of these people who go abroad, work there and come back are going to have a turnover of Rs. 1 million a month for them to be exempted from Turnover Tax? This is something you are showing them as a concession, which will never reach them. This is just a bluff! So, to call them "*Rata Viruwo*", to talk so big about them and then not give them anything is what you are doing. This is the way you are deceiving all the people in this country.

Now, you have brought in a Telecommunication Levy (Amendment) Bill, in which you say that you are going to reduce the Telecom Levy from 20 to 10 per cent for internet users. Yes, you have to develop access to the internet among the general public in this country. But, this is a small amount for those who access the internet. It is more of a concession to those who are involved in BPO operations. Maybe, that is the future of our export industry. So, we have to support that industry.

But, at the same time, why do you not think of the "*Rata Viruwo*" that you talk so big about? You have imposed a Rs. 3 levy on every overseas call. This is in addition to the 20 per cent Telecom Levy that anybody has to pay. When the Telecom Levy first came about, it came through the Ministry of Environment. It was only a 5 per cent levy. They said that was for the collection and disposal of e-waste.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, you have only one more minute.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Okay, Sir.

But, what has happened? To date, not a single telephone or mobile phone has been seized and disposed of by the Government. But, you continue with this levy and have increased it to 20 per cent. So, what happens to this Rs. 3? *Rata Viruwo* are people who are living away from their families. They leave their children, wives and husbands here and go abroad. The children want to speak to their mother or the father. The telecommunication companies are charging as less as Rs. 2 for predetermined numbers. But, the Government is charging Rs. 3 on that. How very unfair? If you are really concerned about the *Rata Viruwo*, why do you not reduce this levy?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
On telecommunication, they are charging less so that the amount that is charged on the interest automatically comes down.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
No, it does not.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
They are already getting the benefit of reduction by having competition.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
The user has to pay Rs. 3 a minute.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
On a reduced amount.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Not on a reduced amount. It is not 3 per cent but Rs. 3.

It is not a percentage. You pay Rs. 3 per minute as the IDD levy.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
No, I am not talking about that. - [*Interruption*.]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
His time is up, Hon. Minister. Hon. Yogarajan, please wind up now. - [*Interruption*.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Hon. Minister, the Deputy Chairman of Committees wants me to wind up. So, please do not disturb me.

The companies, through competition, have reduced their tariff. When they reduce it, the consumer gets it into his left pocket. Then, you come and rob it from him for Government revenue. So, everything that you do is to rob the people to increase revenue and waste funds like you wasted in Mattala.

[අ.භා. 5.25]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීට කලින් කථා කළ ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමා ජාතිවාදය_ගැනයි කථා කළේ. මගේ මිනිස්සු, මගේ community එක කියමින් තමයි එතුමා කථා කළේ. පාර්ලිමේන්තුවේදී එහෙම කථා කරන්න එපා. ඒ ගැන අපට බොහොම කනගාටුයි. එදා ප්‍රභාකරන් මේ රටේ මිනිස්සු මැරුවා. සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ යන සියලු ජාතීන්වල අය මැරුවා. හැබැයි එදා කවුරුවත් ඔය විධියට කථා කළේ නැහැ. අහිංසක වතු කම්කරුන්ගේ සාමාජිකත්වය අරගෙන, වෘත්තිය සමිති හදා ගෙන අද බොහොම යහතින් එතුමන්ලා මෙතැන වැජඹෙනවා. ඒ නිසා ඒ විධියට කථා කරන්න එපාය කියා මම ඒ ගරු මන්ත්‍රීතුමාට කියනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න තමයි අද මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් කියන සියලු ජනතාවට නිදහසේ ජීවත් වෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේට මතක ඇති මේ සභාවේ සිටි කී දෙනෙක් එදා මැරුවාද කියලා. අපේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ හිටපු ඇමතිතුමා ඇතුළු විශාල සංඛ්‍යාවක් මැරුවා. නිදහස වෙනුවෙන් කථා කළ තමුන්නාන්සේලාගේ අයත් මැරුවා. මේ රටේ නිදහස ඇති කළ නිසා තමයි අද අපේ ජනාධිපතිතුමා වෙන්නායිවලට ගියාම "හූ" කියන්නේ. එදා ප්‍රභාකරන් මරන්නේ නැතිව, බේරා දීලා ජිනීවා හෝ කොහේ හරි යුරෝපීය රටකට යන්න නිදහස් කළා නම් අද ඔය එල්ටීටීකාරයින්ගේ, ඩයස්පෝරාකාරයින්ගේ සද්ද ඇහෙන්නේ නැහැ. එදා එතුමා ත්‍රස්තවාදය මේ රටෙන් මුලිනුපුටා දමා තමන්ගේ රාජකාරිය හරියට ඉටු කළ නිසා තමයි අද මේ යෝජනා එන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා අපට ගහනකොට කවුද හිටියේ? දළදා මාලිගාවට ගහනකොට ජිනීවාවල කථා කළාද? ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කරන්න ගිය උපාසක උපාසිකාවන් මරනකොට ජිනීවාවල හෝ ඉන්දියාවේ අය කථා කළාද? අඩු ගණනේ ඉන්දියාවේ කවුරුවත් පිකටින් කළාද? නැහැ නේ. කාත්තන්කුඩි පල්ලියේ මුස්ලිම් ජනතාව සිකුරාදා ආගම කියනකොට මැරුවා. කවුරුවත් ඒ වෙනුවෙන් පිකටින් කළාද? ජිනීවාවල මානව හිමිකම් කවුන්සිලයට යෝජනා ගෙනාවාද? නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට නිදහස් කර ගෙන, මේ රටේ ඒකීයභාවය ගොඩ නහා අද සියලු දෙනාම සතුටින් ඉන්නකොට තමයි දැන් ජිනීවා ගිහින් මානව හිමිකම් ගැන කථා කරන්නේ. ඇයි? මේ රටේ දේෂාභියෝග ගෙනාවේ මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟවයි. මමත් ඒකට අත්සන් කළා. ඒ හැකියාව මට තිබුණා. ව්‍යවස්ථාව අනුව එහෙම අත්සන් කරන්න පුළුවන්. අපි ව්‍යවස්ථාවට පිටින් ගිහිල්ලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිතුමා පැහැදිලිව කියා තිබෙනවා, ඊළඟට උතුරු පළාතේ ඡන්දය තියනවාය කියා. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම කියන්නේ යුද්ධය තිබුණු කාලයේ සිදුවුණු ත්‍රස්තවාදී ක්‍රියා ගැන සමාලෝචනය කරන්න, ඒ කාලයේ තිබුණු අත් දැකීම් කියන්න තිබුණු කොමිසමක්. ඒක වාර්තාවක් විතරයි.

ඇමෙරිකන්කාරයාට කියන්න බැහැ, ඒක මේ රටේ ක්‍රියාත්මක කරන්න ඕනෑය කියා. ඒක ව්‍යවස්ථාවක් නොවෙයි. නමුත් අතිගරු ජනාධිපතිතුමා කිව්වා පාර්ලිමේන්තු කාරක සභාවට එන්නය; ඇවිල්ලා කියන්නය කියා. මේවා තැන තැන වේදිකාවල ගිහින් කථා කරලා බැහැ. ජිනීවාවල ගිහින් කථා කරලා බැහැ. මේවා මේ පාර්ලිමේන්තුවේ, මේ උත්තරීතර ආයතනයේ කථා කර අප බලය බෙදීම පිළිබඳව කථා කරමුය කියා කිව්වා. එදා ඒ මොනවත් නැතිව දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. නීති-රීති තිබුණේ නැහැ නේ; උසාවි යන්න වුණෙත් නැහැ නේ. ඒ නිසා තමුන්නාන්සේලා මේවා හිතට ගන්න. ජිනීවා සමුළුවට කියන්න අද මොනවාද තිබෙන්නේ? සුදු වැන්වලින් ඇවිල්ලා මිනිස්සු මරනවාද? රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කාලයේදී වාගේ අද වධකාගාර තිබෙනවාද? නැහැ නේ. එදා එහෙම නොවෙයි. රිවර්ඩ් ද සොයිසා වාගේ කී දෙනෙක් මැරුවාද? එදා ජේවීපී කට්ටිය ඇවිල්ලා identity cards එකතු කරලා මිනිස්සු මරන යුගයක් තිබුණා. අද මේ රටේ එවැනි තත්ත්වයක් තිබෙනවාද?

අද මේ රටේ එහෙම දෙයක් නැහැ නේ. අද පොලිසියකට ගියාම පැමිණිල්ල භාර ගන්නේ නැද්ද? භාර ගන්නවා නේ. එවැනි නිදහසක් තිබෙනවා. එහෙම නම් මේ මානව හිමිකම් කඩවීම කියන්නේ මොකක්ද? මේක අසත්‍යයක්. මොකද, ප්‍රභාකරන් මැරුණ නිසා නැවත ඒ ත්‍රස්තවාදය මේ රටට ගේන්න අද ඊළාම්වාදීන්ට ඕනෑ වෙලා තිබෙනවා. බටහිර රටවලටත් ඒක ඕනෑ කර තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා රනිල් වික්‍රමසිංහ මහත්තයාට ඡන්දය දීලා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් හැදුවාට වැඩක් වුණේ නැහැයි කියලා. එක්සත් ජාතික පක්ෂයේ අලියාට කතිරය ගහපු අය කතිරය ගැහුවේ ප්‍රභාකරන් එක්ක ගිවිසුම් ගහන්න නොවෙයි. නමුත් රනිල් වික්‍රමසිංහ මහත්තයාට ගිවිසුම් ගහන්න සිද්ධ වුණා. ඉන්දියාවෙන් ඇවිල්ලා උඩින් පරිප්පු දමන කොට, ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්ෂණිකව ගේන්න සිද්ධ වුණා. ඒවා කැමැත්තෙන් කළ දේවල් නොවෙයි. ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදය තිබෙන කාලයේ බටහිර රටවලට ඒ විධියට මේ රටට බලපෑම් කරන්න හැකියාවක් තිබුණා. අද ඒ බලපෑම කරන්න බැහැ. අද "මෙහෙම කරපන්" කියලා කියන්න බැහැ. බල කිරීමක් කරන්න බැහැ. අන්න ඒ නිසා තමයි ජිනීවා යෝජනා සම්මත කරලා මෙතැනට ගේන්න හදන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි එක දෙයක් කියන්න ඕනෑ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යෝජනා සම්මත කරලා ගේන්න පුළුවන්කම තිබෙන්නේ Security Council එකට - ආරක්ෂක මණ්ඩලයට- විතරයි. යෝජනා සම්මත කරලා රටකට බල කරන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යෝජනා ගේන්න පුළුවන්. ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ නිර්දේශය දෙන්න ඕනෑ. අපට බල කරන්න බැහැ. පසු ගිය සතියේ අපට හොඳ කථාවක් තිබුණා. ඒක ගේන්න පුළුවන් වන්නේ Security Council එකට විතරයි. Security Council එකට

[ගරු ලලිත් දිසානායක මහතා]

ගියොත් චීනය වාගේ රටවල් අපටත් ආරක්ෂාවට ඉන්නවා. ඒ නිසා ඇමෙරිකාවට බලෙන් මේක ගේන්න බැහැ. ඇමෙරිකාව මානව හිමිකම් ගැන කථා කරනවා. අද ඉරානය මොකක්ද කරන්නේ? එතකොට සිරියාවට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? සදාම් හුසේන්ලාට කළේ මොකක්ද? අද ඇෆ්ඝනිස්ථානයට කරලා තිබෙන්නේ මොකක්ද? එතකොට මේවා කාගේද? එහෙම නම් ඇමෙරිකන්කාරයාට ගිහිල්ලා ඉරාකයට ගහන්න හොඳයි; එහෙම නැත්නම් ඇෆ්ඝනිස්ථානයට ගහන්න හොඳයි. හැබැයි, ඇමෙරිකන්කාරයා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ගැන කථා කරනවා. මොකක්ද සිද්ධ වන්නේ? ඊශ්‍රායලයට ගහනවා. පලස්තීනයට ගහන්න සල්ලි දෙන්නේ කවුද? ඇමෙරිකාව. කොපමණ මුදලක් යනවාද? අද ඇමෙරිකාවේ සොල්දාදුවන් මැරෙන්නේ කොහේද? ඒ අය මැරෙන්නේ ඇෆ්ඝනිස්ථානයේ තලේබාන්කාරයෝ මරන්න ගිහිල්ලා. මෙන්න මේකද ප්‍රජාතන්ත්‍රවාදය කියලා මම අහනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේලා රටක් හැටියට මේ ගැන කථා කරන්න. මේ සම්මුතිය ආවොත් ඒකෙන් බලපෑම් කරන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට විතරක් නොවෙයි. මේ රටටයි ගේන්නේ. ඇමෙරිකන්කාරයා මේක ගේන්නේ මේ රටට. ඒ නිසා අපි ඔක්කොම එකතු වෙලා මේ ගැන කථා කරමු. එහෙම එකතු වෙලා රටක් හැටියට, ජාතියක් හැටියට එකට නැඟී සිටින්න ඕනෑ. දෙමළ, සිංහල මිනිස්සු හැටියට නොවෙයි. මගේ community එක, එහෙම නැත්නම් මට කථා කරන්න පුළුවන් වන්නේ මගේ සිංහලකම ගැනයි. මේක මගේ රට, මම ඉපදුන රට. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මේක තමුන්නාන්සේටත් අයිතියි. තමුන්නාන්සේ ඉතිහාසය කියවන්න. එදා තමිල්නාඩුවෙන් ගහලා - මට ඒ අධිරාජ්‍යයාගේ නම මතක නැහැ- එළවනකොට ද්‍රවිඩ ජනතාව ඇවිල්ලා පදිංචි වුණේ ලංකාවේ යාපනයේ. ඒ අයට අපි සැලකුවා. සිංහල මිනිස්සු සැලකුවා. පිළිගත්තා. කවදාවත් අනෙක් පැත්තට හැරෙව්වේ නැහැ. ඒ කියන්නේ සිංහල මිනිස්සු වන අපි හොඳ මිනිස්සු; ශ්‍රී ලාංකිකයෝ ආගන්තුකයන්ට සලකන මිනිස්සු.

ඉතිහාසයේ ඉඳන් එහෙම සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා වැරදි විධියට කථා කරන්න එපා. මේක මානව හිමිකම් කඩ වන රටක් නොවෙයි. මානව හිමිකම් නිවැරදි විධියට ආරක්ෂා වන්නේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මත්තල ගුවන් තොටුපොළ ගැනත් කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයට එවැන්නක් කරගන්න බැරි වුණා. මෙරටට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව 2016 වන කොට ලක්ෂ 25 දක්වා වැඩි කරගන්න අපි බලාපොරොත්තු වෙනවා. ලක්ෂයක් වූ ඒ ප්‍රමාණය දැන් ලක්ෂ 10ක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පිට රටින් එන ගුවන් යානයක් හදිසියේ කටුනායක ගුවන් තොටුපොළට බස්වන්න බැරි වුණොත් ඒ අය නැවත යන්න ඕනෑ ඉන්දියාවට. එහෙම නැත්නම් මාලදිවයිනට යන්න ඕනෑ. ඒ නිසා ඒ එන හැම ගුවන් යානයක්ම අතිරේක ඉන්ධන පුරවාගෙනයි එන්නේ. ඒ ගුවන් යානය කටුනායකට බස්වන්න ඔවුන්ට බැරි වන යම් හදිසි අවස්ථාවකදී තවත් සැතපුම් ගණනාවක් ගෙවා ඉන්දියාවට යන්න සිදු වන නිසා ඉන්ධන පුරවාගෙන එනවා. එසේ පුරවා ගෙන එන අතිරේක තෙල් ටිකේ බර ප්‍රමාණය අනුව, ඔවුන් අනිවාර්යයෙන් ගුවන් යානයේ seats ගණනක් හිස් කරගෙන එන්න ඕනෑ. ගුවන් යානා සමාගම්වලට තිබුණු ඒ ගැටලුව මත්තල ගුවන් තොටුපොළ ආරම්භ කිරීමත් සමඟ අද ඉවත් වෙනවා. ඒ නිසා ජාත්‍යන්තර ගුවන් සේවාව සම්බන්ධයෙන් තිබෙන වගකීම කටුනායක airport එකට විතරක් නොවෙයි අද පැවරෙන්නේ. අද ඒ ගුවන් යානාවලට මත්තලට යන්න පුළුවන්. ඒ නිසා අද ලංකාවට එන කොට හදිසි අවස්ථාවකදී භාවිතයට ගන්න වෙනම ඉන්ධන පුරවාගෙන එන්න අවශ්‍යතාවක් නැහැ. කලින් කියපු විධියට ගුවන් යානයේ seats හිස්ව තබාගන්නේ නැතිව එන්න පුළුවන්කමක්, හැකියාවක් ලැබෙනවා මත්තල ගුවන් තොටුපළ ආරම්භ වීම නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි තවත් දෙයක් කල්පනා කරන්න ඕනෑ. අපේ රටේ ගුවන් තොටුපොළක් හදනවා නම් ඒක රත්මලානේ හදලා හරි යයිද? නැහැ. එහෙම නැත්නම්, ඒක හිඟුරක්ගොඩ හදලා හරි යයිද? නැහැ. එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවත් අහුණකොළපැලැස්සේ ගුවන් තොටුපොළක් හදන්න යෝජනා කළා. ඒ අයත් ඒකට සැලසුම් හදාගත්තා. එහෙම බලද්දී, ගුවන් තොටුපොළ හදන්න ඒ අය සැලසුම් කළ අහුණකොළපැලැස්සෙන් මත්තලටයි අප මාරු කරලා තිබෙන්නේ. එහෙම නම්, මත්තලට ගුවන් යානා එන්නේ නැහැ කියලා එක්සත් ජාතික පක්ෂයේ අයට අද කියන්න බැහැ. අනෙක් අතට, වරායක්, ගුවන් තොටුපොළක් කියන්නේ දීර්ඝ කාලීන ආයෝජනයක් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ ගැලරියේ පුංචි දරුවෝ ඉන්නවා. පාර්ලිමේන්තුවට එන මේ පුංචි දරුවන් හෙට දවසේ අප ඉන්න තැනට එනවා. ඔවුන් වෙනුවෙන් තමයි ඒ ගුවන් තොටුපොළ ආරම්භ කරලා තිබෙන්නේ. ඔවුන්ගේ අනාගතය වෙනුවෙනුයි ඒ ආයෝජනය. ඔවුන් ඉපදෙන කොට තිබුණේ නැහැ මත්තල ගුවන් තොටුපොළක්. මට ඉදිරි අනාගතයේදී එහි ප්‍රයෝජන සියල්ල භුක්ති විඳින්න බැරි වෙවි. නමුත් මගේ දරුවාට ඒ අවස්ථාව ලැබෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට දීපු කතිරයට ගැළපෙන විධියට එතුමාගේ කාලයේදී දරුවන් වෙනුවෙන් මේ රටට වත්කමක් ඉතිරි කර තිබෙනවා. අද හම්බන්තොට වරායක් ඇති කරලා තිබෙනවා. ඒ වාගේම හම්බන්තොට ගුවන් තොටුපොළක් ඇති කරලා තිබෙනවා. අපි ඊයේ මත්තල ගිහින් සිටියා. අවු රස්නේ නිසා ඉන්න අමාරු වුණා. එහෙම නම් අප හිතට ගන්න ඕනෑ, අපට පැය තුනක් හතරක් ඉන්න එක එච්චර අමාරු නම් ඒ ප්‍රදේශයේ මිනිසුන් කොච්චර දුකක් විඳිනවා ඇත්ද කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද සංවර්ධනයක් ඇති වෙනවා. ඒ ගුවන් තොටුපොළ සහ වරාය නිසා ඒ ප්‍රදේශයේ ලොකු සංවර්ධනයක් ඇති වෙනවා. සංචාරක ව්‍යාපාරය ගත්තොත්, 2016 වන කොට සංචාරකයන් ලක්ෂ 25ක් අපේ රටට ගෙන්වා ගැනීමට තමයි අප ඉලක්ක කරන්නේ. අල්ලපු රට වන ඉන්දියාවට එන සංචාරකයන් ප්‍රමාණය ලක්ෂ 250යි. තායිලන්තයට එන ප්‍රමාණය ලක්ෂ 300යි; වියට්නාමයට එන ප්‍රමාණය ලක්ෂ 250යි. අප ඉලක්ක කරන්නේ එච්චර ලොකු ගණනක් නොවෙයි. අපි ලක්ෂ 25යි ඉලක්ක කරන්නේ. එහෙම නම් ඒ සඳහා අවශ්‍ය කාමර ටික තිබෙන්න ඕනෑ. මෙතුමන්ලා කෑ ගැහුවා රජය ඉඩම් විකුණනවා, ඉඩම් අඩු ගණනටයි දෙන්නේ කියලා. එහෙම නැහැ. සංචාරකයන් එනකොට අපි අවශ්‍ය කාමර ටික හදලා තියන්න ඕනෑ. කාමර 1,500යි දැනට තිබෙන්නේ. අපි එම ප්‍රමාණය 15,000ට ගෙනෙන්න ඕනෑ. අපි ඒවා හදන්න කටයුතු කරලා තිබෙනවා. Shangri-La එක, Hyatt එක, Marriott එක ගාලු මුවදොර ආදි ප්‍රදේශවල හෝටල් ටික ඉදි කරන කොට ඒ කෑ ගහපු අයට ඉදිරි අනාගතයේ ඒ ආශ්චර්යය දකින්න පුළුවන් වේවි කියලා මම හිතනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඇති කරපු ඒ ආශ්චර්යය හොඳින් බලාගන්න දරුවන්ට අනිවාර්යයෙන් පුළුවන්. අපි මේ වෙනස තේරුම් ගන්න ඕනෑ. අප ඒවා විවේචන කරන්න ඕනෑ ඊර්ෂ්‍යාසහගත කෝණයකින් බලලා නොවෙයි. රාජපක්ෂ රජයක් යටතේ මේ රටේ විශාල සංවර්ධනයක් ඇති වුණේ නැහැ කියලා කියන්න කාටවත් බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් දෙයක් කියන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා ඇතුළු අය අද උදේ ඉඳන් කෑ ගැහුවා මේ පනත් කෙටුම්පත් ඔවුන්ට ලැබුණේ නැහැ

කියලා. එතුමන්ලා මේක අලුත් දෙයක් හැටියට හඳුන්වන්න හැදුවා. මේක අලුත් දෙයක් නොවෙයි. අපේ ජනාධිපතිතුමා 2013 අය වැය යෝජනාවේ මේ යෝජනා පැහැදිලිව සඳහන් කර තිබෙනවා. එතුමා මොකක්ද කියා තිබෙන්නේ? උදාහරණයක් විධියට, සීනි කර්මාන්තය ගැන එහි සඳහන් කර තිබෙන කාරණය ගනිමු. 2013 අය වැය කථාවේදී එතුමා කියනවා, "...සීනි වලට ආදේශනය කළ හැකි දේශීය හකුරු, පැණි හා අතිරේක නිෂ්පාදන පුළුල් කිරීම සඳහා කිතුල් ගස් මෙන්ම පොල් ගස් මැදීමට ඉඩදීමටද යෝජනා කරනවා. හකුරු, පැණි හා සීනි නිෂ්පාදන දිරිගැන්වීම සඳහා එම භාණ්ඩ ආනයනය සඳහා බලපවත්නා බදු ඉහළ මට්ටමක පවත්වා ගැනීමට මා යෝජනා කරනවා." කියලා. ගස් මැදීමට තිබෙන බද්ද අද අයින් කර දමා තිබෙනවා. ඒ නිසා පොල් ගසයි, කිතුල් ගසයි මදින්න අවශ්‍ය සහනය අද තිබෙනවා. ඒකෙන් මොකක්ද සිද්ධ වෙන්නේ? අඩු ගණනේ ඒ දේශීය නිෂ්පාදකයන් බොහෝ ධෛර්යයට පත් වෙනවා. හකුරු ටිකක් හදාගෙන ආවත් පොලීසියෙන් අද අල්ලන්නේ නැහැ.

ඉතින්, මේක අලුත් දෙයක් නොවෙයි. මේ අය කෙස් පැලෙන තර්ක ගෙන එමින්, මේ පාර්ලිමේන්තුව වැරදියි, වැරදි පැත්තකට යන්නේ, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය මේ කටයුතු හරියට කරලා නැහැ කිව්වා. ඒ වාගේ ගොඩක් දේවල් කිව්වා. නමුත් අපි මේ සාකච්ඡා කරන්නේ, මේ ක්‍රියාවට නංවන්නේ අය වැය යෝජනාවේ තිබුණ දේවල්. මේ යෝජනා අලුතින් හඳුන්වලා දෙනවා නොවෙයි. මේක අපි තේරුම් ගන්න ඕනෑ. ඒ අනුව අපි කටයුතු කරන්න ඕනෑ.

ඊ ළඟට, වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත ගැන බලමු. අපි අද කර්මාන්ත දියුණු කරන්න ඕනෑ. ඒ කර්මාන්ත දියුණු කිරීමේදී වැදගත් වන්නේ විශේෂයෙන්ම ප්‍රතිඅපනයනයයි. ගුවන් තොටුපොළ බද්ද පිළිබඳව මේ පනත් කෙටුම්පතේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. මේක 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනතට ගෙනෙන ලද සංශෝධනයක්. මෙම සංශෝධනය මඟින් ප්‍රධාන වශයෙන් වෙන්නේ ප්‍රතිඅපනයනය සහ භාණ්ඩ නිෂ්පාදනයට අදාළ අමු ද්‍රව්‍යයක් වශයෙන් ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක පිරිවැය රක්ෂණය සහ නැව් ගාස්තු සම්බන්ධ බදු නිදහස් කිරීමයි. ප්‍රතිඅපනයනයක් සඳහා කරනු ලබන නිෂ්පාදනයක් වෙනුවෙන් බදු සහන ලබා දීම තමයි මේකෙන් සිදු වන්නේ. විපක්ෂය මේවාට විරුද්ධ වෙනවා; මේ පනත් කෙටුම්පත් හම්බ වුණේ නැහැ කියනවා. මේවා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ගෙදර ගෙන යන්න කරන දේවල් නොවෙයි. ප්‍රතිඅපනයන සඳහා බදු සහන ලබා දීම තුළින් මේ රටේ නිෂ්පාදකයාට විදේශ විනිමය උපයා ගන්න හැකියාවක් ලැබෙනවා. මේක අය වැයේ සඳහන් කරුණක්. අතිගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කළ යෝජනාව ක්‍රියාත්මක කරන්නයි මේ පාර්ලිමේන්තුවේ අවසරය පතන්නේ. නමුත් විපක්ෂයෙන් කිව්වා, අපි මේ ගැන දන්නේ නැහැ, තව දවසකට කල් දාන්න කියලා. ඇයි අපි කල් දාන්නේ? අද රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා කිව්ව ආකාරයට, මේ පනත් කෙටුම්පත් ටික අද සම්මත කළේ නැත්නම් හෙට මේ වරප්‍රසාදය ලබන්න තිබෙන අයට ඒක ලබන්න බැරි වෙනවා. එහෙම නම් මේ යෝජනා නීතියක් බවට පත් කරන්න ඕනෑ. අපි මේ පිළිබඳව අද පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරලා, හෙට දවසේ නීතියක් බවට පත් කිරීම තුළින් ඒ ප්‍රයෝජනය ලබන්නේ මේ රටේ අභිංසක ජනතාවයි. විරුද්ධ පක්ෂයෙන් ගෙනාව කෙස් පැලෙන තර්කවලට මුල් තැන දීලා, ගරු කථානායකතුමා මේ පනත් කෙටුම්පත් සාකච්ඡා කිරීම ප්‍රතික්ෂේප කළා නම් අභිංසක ජනතාවට, ව්‍යවසායකයන්ට මෙයින් ලැබෙන වරප්‍රසාදය නැති වෙලා යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ කලුතර දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීතුමා calendar එකක් ගැන කිව්වා. දින 14යි, දින 13යි කියලා. මාත් සාමාජිකයන් බදවා ගන්න ගමේ ඇවිදින විට එක්සත් ජාතික පාක්ෂිකයෙකුගේ ගෙදරකට ගොඩ වුණා. ඒ ගෙදර රන්බණ්ඩා කියලා මහත්මයෙකුගේ. එතුමා පොතක් හදලා ඒකේ ලියලා තිබුණා දින 780යි කියලා. ඒ එක එක දින කපලා දින 600ට විතර අඩු කර තිබුණා. ඉන් පසුව දින අඩු කරන එක නවත්වලා තිබුණා. මම ඇහුවා, තමුන්නාන්සේ එක්සත් ජාතික පක්ෂයේ හොඳ සාමාජිකයෙක්. ඇයි මේ දින 780 සිට ඇවිල්ලා, දින 600දී නවත්වලා තිබෙන්නේ කියලා. "සර්, අපේ ආණ්ඩුවක් එයි කියන බලාපොරොත්තුවෙන් තමයි යූඑන්පී ආණ්ඩුවක් එන්න තව දින 780යි, දින 600යි කියලා ලිව්වේ, නමුත් දින 600ට එන විට වැඩක් නැහැ කියලා තේරුණා, එක පැත්තකින් සජිත් කඩා ගෙන යනවා. අනෙක් පැත්තෙන් තව කෙනෙක් යනවා. රනිල් එපා කියලා තව කට්ටියක් කියනවා. සමහර රූපවාහිනී මාධ්‍යවලින් හවසට විපක්ෂ නායකතුමාට ඉවර වෙන්නම ගහනවා. ඉතින් අපට ආණ්ඩුවක් හදන්න බැහැ, ඒ නිසා මම කැලැන්ඩරය කටු ගාලා දැම්මා" කියලා එතුමා මට කිව්වා. ඒ දින එකක්වත් දැන් නැහැ. සම්පූර්ණයෙක් ඒ කැලැන්ඩරය කටු ගාලා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. දැන් ඒ දින දර්ශනය පවත්වාගෙන යන්නේ නැහැ. අපි නම් දින 14න් ලස්සනට ගුවන් තොටුපොළ විවෘත කළා. ඒ නිසා තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් දින ගණින calendar එකක්වත් අද හදන්නේ නැහැ. අද එහෙම calendar එකක්වත් පවත්වාගෙන යන්න බැහැ. ඇයි ඒ? තමුන්නාන්සේලාට ගමනක් නැහැ; නායකයෙක් නැහැ. නායකත්වය බෙදිලා. ඉදිරියට යන දර්ශනයක් නැහැ. හිටපු ඔක්කොම නායකයෝ අපිත් එක්ක ඉන්නේ. එදා මම මූලාසනයේ සිටින විට disturb කළ ගරු අස්වර් මන්ත්‍රීතුමා අද අපිත් එක්ක ඉන්නේ. ගරු කාදර් මන්ත්‍රීතුමා ඉන්නේ අපිත් එක්ක. ඒ විධියට බැලුවාම එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ විශාල ගණනක් අපිත් එක්ක ඉන්නේ. ගරු හකීම් මන්ත්‍රීතුමා අපිත් එක්ක ඉන්නේ. එතුමා අද ඇමතිවරයෙක්.

ඒ විතරක් නොවෙයි අතාවුල්ලා ඇමතිවරයා අපිත් එක්ක ඉන්නේ. මේක තමයි වෙනස. ඒ වාගේම අපේ කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමාත් ඉන්නවා. මම මූලාසනයේ සිටින විට විපක්ෂයේ ඉඳගෙන කෑ ගහනවා, රාජිත සේනාරත්න ඇමතිතුමා, බන්දුල ගුණවර්ධන ඇමතිතුමා. ඒ වාගේම අපේ කඳු රටින් ආපු මන්ත්‍රීතුමා. අද මේ සියලු දෙනාම අපට එකතු වෙලා සිටිනවා. ඒ විධියට බැලුවාම ඒ පුද්ගලයා ඒ දින දර්ශනය කටු ගාපු එක හරි. ඔහු හිතා ගෙන හිටියා අඩු ගණනේ යම් ගමනක් යයි කියලා. නමුත් ඉන්න ටික දෙනාවත් ඉදිරි ගමනක් යන්නේ නැහැ, ඒ අය ලොක්කෝ වෙන්න දහලනවා විතරයි. සමහර අය කප්පම් ඉල්ලන්න ගිහින්, අල්ලස් ඉල්ලන්න ගිහින් තිබෙනවා. ඒ ආණ්ඩුව හදන්න යන කට්ටියට, අපව විවේචනය කරන මන්ත්‍රීවරුන්ට පැමිණිලි වැටෙනවා ලක්ෂ 10ක් 15ක් සල්ලි ඉල්ලුවාය කියලා.

ඒ නිසා එක්සත් ජාතික පක්ෂයට ගමනක් නැහැ. ඒ නිසා කෑ ගැහෙනවා. රවි කරුණානායක මන්ත්‍රීතුමා හැමදාම කියනවා, මේ රටේ ආර්ථිකය කඩා වැටෙනවා කියලා. නමුත් මේ රටේ ආර්ථිකය කඩා වැටෙන්නේ නැහැ. අද එක හාල් ඇටයක්වත් පිට රටින් ගෙන්වන්නේ නැහැ. කවුරු මොනවා කිව්වත් අද මේ රටේ මිලියන 20ක් වන ජනගහනයට වඩා ජංගම දුරකථන තිබෙනවා. එදා ගමට විදුලිය ලැබිලා තිබුණේ සියයට 75කටයි. අද සියයට 95ක් දක්වා එය වැඩි වෙලා තිබෙනවා. අද අපට ගම්වලට යන්න පුළුවන්. අද ගම්වල පාරවල් කාපට් කර තිබෙනවා. මේ ආකාරයෙන් අද මේ රටේ ඉතාම හොඳ සංවර්ධනයක් සිදු වෙලා තිබෙනවා. ගමට සංවර්ධනය ගිහිල්ලා තිබෙනවා. ග්‍රාම සේවා වසම් 14,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒ හැම ග්‍රාම සේවා වසමකම සංවර්ධනයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ සංවර්ධනය සැබෑ ලෙසින් දකින්න අපි ගමට යන්න ඕනෑ. ජීවන වියදම වැඩි වන එක නවත්වන්න බැහැ. ඒක කවදාකවත් අඩු වෙලා නැහැනේ. අපි දන්නවා ඒ කාලයේ අපේ තාත්තා පඩි අරගෙන ගෙනාපු මුදල. එදා අපි ඉස්කෝලේ යන කොට සතියකට pocket money විධියට දුන්නේ රුපියලයි නැත්නම් දෙකයි.

[ගරු ලලිත් දිසානායක මහතා]

1964 මම මහනුවර ධර්මරාජ විද්‍යාලයේ නේවාසිකාගාරයේ ඉන්න කොට මට සතියකට දුන්නේ රුපියලයි. ඒ pocket money එකෙන් තමයි මම ජීවත් වුණේ. නමුත් අද ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. අද ජීවන වියදම ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒත් එක්කම ආදායමත් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒක නවත්වන්න බැහැ. නමුත් මේ රට අද යම් කිසි ස්ථාවර මට්ටමක තිබෙනවා. මේ රට කඩා වැටුණේ නැහැ. මේ රටේ එක බැංකුවක්වත් කඩා වැටුණේ නැහැ. මූල්‍ය ස්ථාවරත්වයක් තිබෙනවා. මේ රටේ අද විවිධ සම්පත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ණය අරගෙන තිබෙන බව ඇත්තයි. එදා අපේ ආදායම රුපියල් සියයක් නම් ණය ගත්තේ රුපියල් 10යි. අද අපේ ආදායම රුපියල් 1,000ක් වන කොට රුපියල් 200ක් විතර ණය ගන්න පුළුවන්. ඒ නිසා ණය අනුපාතය ගත්තොත් දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 78.8ක වගේ ප්‍රමාණයකයි තිබෙන්නේ. ඒක ඉහළ ගිහිල්ලා නැහැ. නමුත් විපක්ෂය හැම වෙලාවේම උත්සාහ කරන්නේ මාධ්‍ය හරහා වැරදි මතයක් ඉදිරිපත් කරන්නයි. මොකද, අද රජයේ මාධ්‍ය තිබෙන්නේ දෙකයි. ඒ, රූපවාහිනී සංස්ථාවයි, ITN එකයි. නමුත් අද රජයට විරුද්ධව කොච්චර මාධ්‍ය තිබෙනවාද? ඒ නිසා ඔවුන්ට මේ මාධ්‍ය හරහා ලොකු දෙයක් කරගෙන යන්න පුළුවන්. දැන් බලන්න, වරායට ගෙනැල්ලා තිබෙනවා කන්ටේනර් එකක්. එක මනුෂ්‍යයකු කියනවා මේක පිටුපස දේශපාලන හස්තයක් තිබෙනවා කියලා. එහෙම නම් නම් නම හෙළි කරන්න කවුද කියලා. කාටවත් ඒක කියන්න බැරිකමක් නැහැනේ. කවුද ගෙන්නුවේ කියලා කියන්න. නමුත් මේ ප්‍රකාශන කරන අය කවුරුත් නැහැ. ඊයේ පෙරේදා වරායට ඛනිජ තෙල් ගෙනාවාම එක්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිති නායකයා මාධ්‍යයට කථා කරලා කියනවා, මේ ගෙනැවිත් තිබෙන්නේ බාල තෙල් කියලා. පරීක්ෂණයක් කරලත් නැහැ. හොඳ වෙලාවට ගරු ඇමතිතුමා ඒ වෙලාවේම මාධ්‍ය හරහා ප්‍රකාශයක් කළා එහෙම දෙයක් නැහැ කියලා. නමුත් අද ඇතැම් අය මාධ්‍ය හරහා මතයක් ඇති කරන්න උත්සාහ කරනවා, මේ ආණ්ඩුව යන ගමන වැරදියි කියලා.

ඒ වාගේම ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මා හිතන විධියට වැස්සකටවත් ඉස්පිරිතාලයකට ගොඩ වෙලා නැහැ. හැබැයි එතුමා කියනවා, ඉස්පිරිතාලවල බෙහෙත් හිහයි කියලා. අද බලන්න, caesarean එකකින් දරුවකු ගන්න පෞද්ගලික රෝහලක කොපමණ මුදලක් අය කරනවාද කියලා. ඊයේ පෙරේදා මගේ යාළුවෙකු මට කිව්වා, පෞද්ගලික රෝහලක එම සැත්කමට රුපියල් ලක්ෂයක් අය කළා කියලා. නමුත් අද රජයේ රෝහල්වල මේ සේවාව නොමිලයේ ලබා දෙනවා. ඉතින් අද මේ තත්ත්වය තිබෙනවා. ඒ වාගේම මා හිතවත් මහත්මයකුට ඊයේ පෙරේදා පෞද්ගලික රෝහලකින් හදවත් සැත්කමක් කළා. රුපියල් ලක්ෂ 11ක් වැය වුණාලු. හදවත් සැත්කමකට රුපියල් ලක්ෂ 8ත්, 11ත් අතර මුදලක් වැය වනවා. නමුත් රජයේ රෝහල්වල මේ සැත්කම කරන්නේ නොමිලයේයි. අද පිළිකා රෝහලේ පිළිකා රෝගීන්ට කොච්චර ප්‍රතිකාර කරනවාද? රජයෙන් රුපියල් බිලියන 125ක් වෙන් කරලා ජනතාවට මේ සියලු සේවාවන් නොමිලයේ ලබා දෙනවා. නමුත් මේ අය නිකරුණේ කියවනවා, ඉස්පිරිතාලයකට ගියාම බෙහෙත් නැහැ කියලා. නමුත් ජනතාව දන්නවා, ඉස්පිරිතාලයකට ගියාම බෙහෙත් ටික තිබෙන බව; x ray එක ගන්න බව; ශල්‍ය වෛද්‍යවරයා ප්‍රතිකාර කරන බව. ඒ නිසා මේ අය මොනවා කිව්වත් අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ගමේ ජනතාවට සහන සලසා තිබෙනවා. අපි මේ රටේ වෙනසක් ඇති කර තිබෙනවා. අද ඉදිරිපත් කර තිබෙන වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත, ආර්ථික සේවා (සංශෝධන) පනත් කෙටුම්පත, සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත යන මේ පනත් කෙටුම්පත් මේ රටේ අහිංසක ජනතාවගේ ජීවන වියදම වැඩි කරන ඒවා නොවෙයි. සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් ඔට්ටු ඇල්ලීම වාගේ දේවල්වලට බදු වැඩි කර තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිව එක දෙයක් කියන්න ඕනෑ. අද මේ ගෙනෙන සංශෝධන පනත් කෙටුම්පත් අතිගරු ජනාධිපතිතුමා අය වැය යෝජනා හැටියට ඉදිරිපත් කළ ඒවා. ඒ නිසා මේවා ඒ අය වැය යෝජනා නීතියක් බවට පත් කර, මේ රටේ ජනතාවට සහන සලසන්න ගෙනා සංශෝධන හැර, බඩු මිල ඉහළ දමන එහෙම නැත්නම් ජනතාවට බර පැටවෙන බදු නොවෙයි කියන කාරණය ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
විනා විවාදයෙන් පිළිගනු ලැබිණි.
අනුව, පනත් කෙටුම්පත දෙ වන වර කියවන ලදී.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]
තීරණය කරන ලදී.
"සිටුමූලම් මුලුප් පාරාළුමන්රක් කුලුවුක්කුච් චාට්පිප්පුමොරු" [මාණ්පුමිකු කලානිති චරත් අමුණුකම]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Sarath Amunugama.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]
කුලුවිල් ආරායප්පට්ටදු.
[කුලුක්කලින් පිරතිත් තවිසාළර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.]
Considered in Committee.
[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.]*

1 සිට 4 දක්වා වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.

1ආම් වාසකත්තිලිරුන්තු 4ආම් වාසකම් වරෙ චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.
චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.
චට්ටමූලම් තිරුත්තමින්රි අරික්කෛ චෙය්යප්පට්ටදු.

Clauses 1 to 4 ordered to stand part of the Bill.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendments.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු (කලානිති) චරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
I move,

"That the Bill be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.
විනා විවාදයෙන් පිළිගනු ලැබිණි.
අනුව, චට්ටමූලම් මූන්රාම්මුරෛ මතිප්පිටප්පට්ටු නිරෛවේට්රප්පට්ටදු.
Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත
பொருளாதாரச் சேவை விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்
ECONOMIC SERVICE CHARGE (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I move,

"That the Bill be now read a Second time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]
தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Sarath Amunugama.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.]*

1 සිට 4 දක්වා වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.
1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Clauses 1 to 4 ordered to stand part of the Bill.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendments.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I move,

"That the Bill be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත
மதுவரி (திருத்தம்) சட்டமூலம்
EXCISE (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I move,

"That the Bill be now read a Second time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]
தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Sarath Amunugama.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.]*

1 සිට 3 දක්වා වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.
1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Clauses 1 to 3 ordered to stand part of the Bill.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendments.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I move,

"That the Bill be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත
தொலைத்தொடர்பு அறவீட்டுச் (திருத்தம்) சட்டமூலம்
TELECOMMUNICATION LEVY (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I move,

"That the Bill, be now read a Second time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Sarath Amunugama.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
*[*MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.]*

1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1, ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.)
வாசகம் 2.- (2011ஆம் ஆண்டின் 21ஆம் இலக்க, தொலைத்தொடர்பு அறவீட்டுச் சட்டத்தின் 2ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 2. - *(Amendment of the section 2 of the Telecommunication Levy Act No. 21 of 2011.)*

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, 2 වන සහ 3 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'මාසය සම්බන්ධයෙන් එම විදුලි සංදේශ සේවා ලැබීමේ දී ක්‍රියාකරු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවල අගය මත' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.)
வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 12ஆம் பிரிவைத் திருத்துதல்.)

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, 20 වන පේළියේ සිට 24 වන පේළිය දක්වා (ඒ පේළි දෙකම ඇතුළුව) පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සංදේශ සමාගම් අතර සහ දේශීය ක්‍රියාකරුවන් සහ විදේශීය විදුලි සංදේශ සේවා සපයන්නන් අතර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා අතර ඇති කර ගත් අන්තර් සම්බන්ධතා සේවාවන් සහ ප්‍රවේශ සේවාවන්' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (හානිපූරණය.)
வாசகம் 4.- (நட்டோத்தரவாதம்.)
CLAUSE 4. - *(Indemnity.)*

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

(1) "2 වන පිටුවේ, 32 වන සහ 33 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ බලය දෙන ලද යම් ක්‍රියාකරුවකු විසින් යම් ග්‍රාහකයකුගෙන් 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2013 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ දී මෙම පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි විදුලි සංදේශ බද්ද අය කර එකතු කරන අවස්ථාවක දී, එම බද්ද සියලු කාර්ය සඳහා වලංගු ලෙස අය කර, එකතු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:
> එසේ වුව ද, මේ වගන්තියේ ඉහත කී විධිවිධාන එකී කාල සීමාව තුළ දී අය කර එකතු කරනු ලැබූ එම බදු මුදල් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් නිකුත් කරන ලද යම් නීරණයකට හෝ ආඥාවකට හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවතින නීති කෘත්‍යයකට බල නොපෑ යුතු ය."

(2) "3 වන පිටුවේ, 1 වන පේළියේ සිට 5 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) පේළි ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4, as amended, ordered to stand part of the Bill.

5 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Clause 5, ordered to stand part of the Bill.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.55ට, 2013 මාර්තු 20 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.
அதன்படி பி. ப. 5.55 மணிக்கு பாராளுமன்றம், 2013 மார்ச் 20, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.
Adjourned accordingly at 5.55 p.m. until 1.00 p.m. on Wednesday, 20th March, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 216 - இல. 6
Volume 216 - No. 6

2013 මාර්තු 20 වන බදාදා
2013 மார்ச் 20, புதன்கிழமை
Wednesday, 20th March, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)
பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)
PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත : පළාත් සභාවලට යොමු කිරීම

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

දකුණු ඉන්දියාවේදී භික්ෂූන් වහන්සේ ප්‍රමුඛ ශ්‍රී ලාංකිකයන්ට පහර දීම

වරප්‍රසාද:

හිරිහැරයට සහ අගෞරවයට ලක් කිරීම

2013 මාර්තු 10 දින "සිළුමිණ" වාර්තාව

රේගු (සංශෝධන) පනත් කෙටුම්පත:

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

பிறப்புக்கள், இறப்புக்கள் பதிவு (திருத்தச்) சட்டமூலம் : மாகாண சபைகளுக்கு ஆற்றுப்படுத்தல்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா

தென்னிந்தியாவில் பௌத்த பிக்குகள் உட்பட இலங்கையர் மீதான தாக்குதல்கள்

சிறப்புரிமை:

தொந்தரவு மற்றும் அச்சுறுத்தல்

2013 மார்ச் 10 ஆந் திகதிய 'சிலுமின' அறிக்கை

சுங்கம் (திருத்தம்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Births and Deaths Registration (Amendment) Bill : Forwarding to Provincial Councils

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Attacks on Sri Lankans in South India including Buddhist Monks

PRIVILEGE:

Harassment and Intimidation

"Silumina" Report of 10th March 2013

CUSTOMS (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed as amended

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මාර්තු 20 වන බදාදා
2013 மார்ச் 20, புதன்கிழமை
Wednesday, 20th March, 2013

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත : පළාත් සභාවලට යොමු කිරීම
பிறப்புக்கள், இறப்புக்கள் பதிவு (திருத்தச்) சட்டமூலம் : மாகாண சபைகளுக்கு ஆற்றுப்படுத்தல்
BIRTHS AND DEATHS REGISTRATION (AMENDMENT) BILL : FORWARDING TO PROVINCIAL COUNCILS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

2013 මාර්තු මස 08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පතෙහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඇ (5) (අ) ව්‍යවස්ථාවට යටත් වන බව නීතිපතිතුමා විසින් 2013 මාර්තු මස 19 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති අතර ඒ අනුව ස්ථාවර නියෝග 46අ (2) (අ) යටතේ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම පිණිස එම පනත් කෙටුම්පතෙහි පිටපත් එක් එක් පළාත් සභාවට යොමු කරන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරමි.

ලිපිලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25ඇ වගන්තිය යටතේ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් "ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය" (එස්.අයි.බී.ඒ) පිළිගැනීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලද්දව 2013 පෙබරවාරි 22 දිනැති අංක 1798/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය. - [උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු එස්.බී. දිසානායක මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් 2010 සහ 2011 වර්ෂ සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

උපදේශක කාරක සභා වාර්තා
ஆலோசனைக் குழு அறிக்கைகள்
CONSULTATIVE COMMITTEE REPORTS

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් පහත සඳහන් වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(1) 2010 වර්ෂය සඳහා සීදුව විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව;

(2) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(3) 2010 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(1) 2009 වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(2) 2010 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(3) 2009/2010 වර්ෂය සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(4) 2010 වර්ෂය සඳහා පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Minister of Wildlife Resources Conservation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම 2009 සහ 2010 වර්ෂ සඳහා තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ වාර්ෂික වාර්තා සහ ගිණුම් ප්‍රකාශ සම්බන්ධයෙන් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැවත පදිංචි කිරීමේ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් නැවත පදිංචි කිරීමේ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(1) 2008 සහ 2009 වර්ෂ සඳහා නැවත පදිංචි කරවීමේ අධිකාරියේ වාර්ෂික වාර්තා සහ ගිණුම් ප්‍රකාශ; සහ

(2) 2010 වර්ෂය සඳහා නැවත පදිංචි කරවීමේ අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කුරුණෑගල, බමුණාවල, සමගි මාවත, අංක 366 දරන ස්ථානයෙහි පදිංචි එස්.සී.ආර්. වික්‍රමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සරණ ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු දිලිප් වෙදආරච්චි මහතා - පැමිණ නැත.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම රක්වාන, දෙනියාය පාර, අංක 79 දරන ස්ථානයෙහි පදිංචි ජී.එම්.ජේ.සී. මුහන්දිරම් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවිස්සාවේල්ල, මාදොල, ගංගානි උද්‍යානය, අංක ඒ162/7 දරන ස්ථානයෙහි පදිංචි ටී.ආර්. පතිරණ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 1-1971/'11 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය අධ්‍යාපන කලාපයට අදාළ මේ ප්‍රශ්නය පිළිබඳව දකුණු පළාත් සභාවෙන් තවමත් පිළිතුරු ලැබී නැති නිසා පිළිතුරු දීමට මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

රැකියා විරහිත උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම : ක්‍රියා පටිපාටිය
தொழிலற்ற பட்டதாரிகளைப் பகிரங்க சேவையில் சேர்த்துக்கொண்டமை: நடைமுறை
RECRUITMENT OF UNEMPLOYED GRADUATES TO PUBLIC SERVICE : PROCEDURE

2428/'12

3. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
The Hon. Sajith Premadasa)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) රැකියා විරහිත උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ වැඩ පිළිවෙළක් 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක කළේද;

(ii) එසේ නම්, එම වැඩ පිළිවෙළ යටතේ උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) එම ක්‍රියාපටිපාටිය රැකියා විරහිත සෑම උපාධිධාරියෙකුටම සාධාරණය ඉටු වන සේ ක්‍රියාත්මක වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පොදු නිරුවාහ, උළ්නාට්ටලුවල්කළ් අමෙච්චරෛක් කේට්ට විනා:

(அ) (i) தொழிலற்ற பட்டதாரிகளை அரச சேவைக்காக சேர்த்துக்கொள்வதற்கான வேலைத்திட்டமொன்று 2012ஆம் ஆண்டில் அமுலாக்கப்பட்டதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வேலைத்திட்டத்தின் கீழ் பட்ட தாரிகளைப் பகிரங்க சேவைக்காக சேர்த்துக் கொள்ளப்பட்டபோது கடைப்பிடிக்கப்பட்ட நடைமுறை யாதென்பதையும்;

(iii) அந்நடைமுறையானது தொழிலற்ற ஒவ்வொரு பட்டதாரிக்கும் நியாயம் ஈடேற்றப்படுகின்ற வகையில் நடைமுறைப்படுத்தப்பட்டிருக்கின்றதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Will he state -

(i) whether a programme to recruit unemployed graduates to the Public Service had been implemented in the year 2012;

(ii) if so, the procedure adopted in recruiting graduates to the Public Service under the aforesaid programme; and

(iii) whether the aforesaid procedure is implemented in a manner that is fair to every unemployed graduate?

(b) If not, why ?

ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்ட லுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) 2012.02.16 දින 'දිනමිණ', 'ඩේලි නිවුස්' හා 'තිනකරන්' යන පුවත් පත්වල උපාධිධාරී අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා පුවත් පත් දැන්වීමක් පළ කරන ලදි. ඒ අනුව 2012.03.30 දින දක්වා කාලය තුළ අයදුම් කළ සියලු දෙනාම දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් ලත් උපාධිධාරීන් වර්ෂය පදනම් කර ගෙන පත්වීම් ලබා දී ඇත.

(iii) ඔව්.

කිසිදු දේශපාලන හෝ වෙනත් කරුණක් හේතුවෙන් අසාධාරණයක් නොවන ලෙස මෙම අභ්‍යාසලාභීන් බඳවා ගෙන ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මා අහනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පසු ගිය දවස්වල සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයට උපාධිධාරීන් 50,000ක් පමණ කැඳෙව්වා. විශේෂයෙන්ම ඒ අය කැඳවා තිබෙන්නේ පත්වීම් ලබා දෙනවා කියලායි. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, රාජ්‍ය සේවයට අන්තර්ගුහණය කර ඒ අයට ස්ථිර රාජ්‍ය සේවක පත්වීම් ලබා දුන්නාද කියලා.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන කොට මේ සියලුම උපාධිධාරීන්ගේ සේවය ස්ථිර කිරීම සඳහා අමාත්‍යාංශයක් විධියට ඒ කටයුතු කර තිබෙනවා. අප්‍රේල් මාසයට ඉස්සර වෙලා -මේ මාසය අවසන් වීමට පෙර- ඒ වර්ෂය පදනම් කර ගෙන, වර්ෂයක් තුළ පුහුණුවක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි.

[ගරු විජය දහනායක මහතා]

ඒ පුහුණුව සම්පූර්ණ කරන සියලු දෙනාටම ස්ථිර පත්වීම් ලබා දීමට අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කර තිබෙනවා. ඒ ලිපි සියල්ලක්ම මේ වන විට තැපැල් කරන්නට සකස් කරලායි තිබෙන්නේ. ඒ සියලු දෙනාටම ස්ථිර පත්වීම් ලැබෙනවා ගරු මන්ත්‍රීතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් ඇසුවේ ඒ ප්‍රශ්නය නොවෙයි. එදා දවසේ උපාධිධාරීන් 50,000ක් සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයට කැඳෙව්වේ ස්ථිර පත්වීම් ලබා දීලා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරනවා කියලායි. මා ඔබතුමාගෙන් ඇසූ ප්‍රශ්නය තමයි, එදා දවසේ ඒ උපාධිධාරීන් 50,000ට රාජ්‍ය සේවයට පත්වීම් ලැබුණාද, නැද්ද කියන එක.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයට උපාධිධාරීන් සියල්ලම රැස් වුණේ ස්ථිර පත්වීම් ලබා ගැනීම සඳහා නොවෙයි. වර්ෂයක පුහුණුව සම්පූර්ණ කර තිබෙන අයට ස්ථිර පත්වීම් ලබා දෙන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කරනවා කියා තමයි අප අමාත්‍යාංශයක් හැටියට නිතරම කිව්වේ. ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට වර්ෂයක පුහුණුව අවසන් කර තිබෙන අයට ස්ථිර පත්වීම් ලබා දෙන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබෙනවා. ඒ සියලු දෙනාටම පත්වීම් ලබා දෙනවා. වර්ෂය අවසන් වනවාත් එක්කම අනෙක් සියලු දෙනාටම -51,000ටම- ස්ථිර පත්වීම් ලබා දෙනවා කියා අප සතුටින් ප්‍රකාශ කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වෙලා තිබෙනවා, "ක්ෂිතිජයට ඉහළින් ලෝකය දැකිය හැකි මිනිසකු හැදීම විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ අරමුණ විය යුතුයි" කියලා. නමුත් අද අපට දකින්නට ලැබෙන දේ තමයි, ලක්ෂ ගණුනින් රාජ්‍ය සම්පත වියදම් කරලා බිහි වන මේ උපාධිධාරින්ව අද උපයෝගි කර ගන්නේ, එළවලු බීජ බෙදීමට, පොල් පැළ බෙදීමට වාගේ සුළු සුළු රාජකාරිවලට සහ දේශපාලන ව්‍යාපෘතිවලට බව.

ඒ නිසා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා මේ කාරණය අහන්න කැමැතියි. උපාධි තලයට ප්‍රවේශ වුණු අපේ රටේ අනාගත තරුණ පරපුරට, ලක්ෂ ගණුනක් වැය කරලා පුහුණුව ලබා දීලා ඇට බෙදන්න, පොල් පැළ බෙදන්න වාගේ ඒ අය හැල්ලුවට ලක් කරන රාජකාරි ලබා නොදී, තිරසාර රාජ්‍ය තාන්ත්‍රික සේවාවක් තුළ ඉඳගෙන, රටට ඵලදායී එකතුවක් එකතු කරන්නට ඒ අයට ලබා දිය යුතු, ඒ සුදුසු තලයේ පිහිටුවන පත්වීම් ලබා දෙන්නට කටයුතු කරනවාද?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයක් හැටියට මේ කාර්යය කිරීමට ලැබීම ගැන අප සතුටු වෙනවා. වෙනත් රජයන් මේ කාර්ය භාරය ඉෂ්ට නොකළ නිසා තමයි මේ වන කොට 51,000ක් පමණ මේ සඳහා ඉල්ලුම් කළේ. රජයක් හැටියට, මේ රටේ ඉගෙන ගත් ඒ උපාධිධාරින්ට ඔවුන් ලබා තිබෙන අධ්‍යාපනයට අනුව අවශ්‍ය රැකියා ලබා දීම විශාල අභියෝගයක්. එහෙම වුණත් අතිගරු ජනාධිපතිතුමා "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කිව්ව ආකාරයට මේ රටේ ඉගෙන ගත් ඒ උපාධිධාරින්ට ඒ අවශ්‍ය ස්ථානය ලබා දෙන්නට අවශ්‍ය කටයුතු කරලා තිබෙනවාය කියලා අප ඉතාමත් සතුටින් කියනවා. ඒ නිසා අප කියනවා, වෙන කිසිම රජයකට මේ අභියෝගයට මුහුණ දෙන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ කියලා. සමහර දේශපාලන පක්ෂ මේ උපාධිධාරින් උපයෝගී කර ගත්තේ ඔවුන්ගේ සටන් පාඨ කියමින් පවතින රජයට විරුද්ධව නොයෙක් බලවේග හදන්නයි. නමුත් අප ඉතාම සතුටින් කියනවා, අද ඒ දේශපාලන පක්ෂවලට සහ වෙනත් කිසිම අයෙකුට ඔවුන්ගේ දේශපාලන අරමුණුවලට උපාධිධාරින් යොදවා ගන්න අවස්ථාව ලැබිලා නැහැ කියලා. උපාධිධාරින්ගේ අපේක්ෂාවන් ඉෂ්ට වෙලා තිබෙනවා. ඒ නිසා අප සතුටින් කියනවා, උපාධිධාරින් වෙනුවෙන් ඉතාමත් සුදුසුම ක්‍රියා මාර්ගය අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ රජය අරගෙන තිබෙනවා කියලා. මේ රටේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරමින් යන අතරතුර විශාල මුදලක් වෙන් කරලා මේ රටේ උපාධිධාරින් 51,000ක් වෙනුවෙන් යම් පුහුණු කාලයක් ලබා දීලා, පුහුණුව අවසන් කළ අයට ස්ථිර පත්වීමක් ලබා දීලා, ඒ සඳහා සුදුසු වැටුප් තලයක තියලා ඒ අවශ්‍ය කාර්ය භාරය ඉෂ්ට කරලා තිබෙනවාය කියලා අප ඉතාමත් සතුටින් කියනවා.

දැන් වෙනත් කිසිම කාර්යයකට උපාධිධාරින් යොමු කර ගැනීමට නොහැකි නිසා සමහර අයට හිතේ විශාල කලකිරීමක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉතින් රජයක් හැටියට ඒ උපාධිධාරින් වෙනුවෙන් ඒ කාර්ය භාරය ඉෂ්ට කරන්න පුළුවන්කම ලැබීම ගැන අපි සතුටු වනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය අහන්න කලින් ඔබතුමාට කියන්න කැමැතියි, 1994 වසර දක්වා තිබුණු ආණ්ඩුවලින් වාර්ෂිකව අනිවාර්යයෙන්ම උපාධිධාරින් සේවයට බඳවා ගත්ත බව. එදා මේ විධියට උපාධිධාරින් 10,000ක්, 20,000ක්, 30,000ක්, 50,000ක් විරැකියා පෝලිමේ තැබුවේ නැහැ.

මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා කිව්වා, ඒ උපාධිධාරින් සුදුසු තලයක, සුදුසු සේවාවක පිහිටුවනවාය කියලා. 2005 වර්ෂයේ උපාධිධාරින් හැටියට බඳවා ගත් අයට ලබා දී තිබෙන රැකියා සම්බන්ධයෙන් මා පොඩි උදාහරණයක් කියන්නම්. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික රුධිර මධ්‍යස්ථානයට බඳවා ගෙන තිබෙන අයට නිවාඩු විෂයය, වැටුප් විෂයය, අතිකාල දීමනා විෂයය, ප්‍රවාහන විෂයය හාර දීලා තිබෙනවා. සමහරු ගබඩාවේත් සේවය කරනවා. එම නිසා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, රුපියල් ලක්ෂ ගණුනක් වැය කරලා බිහි කරන, මේ රටට උතුම් ම සම්පතක් වන උපාධිධාරින් රටට අගයක් එකතු කරන සේවා තලයක ස්ථාපනය කරන්නට ඔබතුමන්ලා වග බලා ගන්නවාද කියලා.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය සේවය තුළ කුමන තානාන්තරයක පිහිටුවා සිටියත්, රට වෙනුවෙන් ඒ අයගෙන් යම් කාර්ය භාරයක් ඉෂ්ට වෙනවා නම් ඒක තමයි මේ රට වෙනුවෙන් කරන්න පුළුවන් ලොකුම සේවය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම උපාධිධාරි අභ්‍යාසලාභී කණ්ඩායමට බඳවා ගත් සියලු දෙනා අද ඉතාම සතුටින් මේ රැකියා භාර ගෙන තිබෙන බව අපි දකිනවා.

ඒ රැකියා ස්ථානවල ඉතාම සතුටින් ඒ නිලධාරීන් සේවය කරනවා. ඒ ස්ථානවල ඉඳගෙන ඒ නිලධාරීන්ට මීටත් වැඩිය සේවාවක් කරන්න ඉදිරියේදී අවස්ථාව ලැබෙයි කියලා අපි හිතනවා. ඒක නිසා අවශ්‍ය කාර්ය භාරය ඉෂ්ට කළාය කියලා රජයක් හැටියට අපි සතුටු වනවා.

රජයේ රෝහල්වලට මෙට්ට සැපයීම : විස්තර

அரச வைத்தியசாலைகளுக்கு மெத்தைகள் வழங்கல்: விபரம்

SUPPLY OF MATTRESSES TO GOVERNMENT HOSPITALS : DETAILS

2496/'12

4. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වර්ෂ 2009 සිට 2012 දක්වා කාල සීමාව තුළ රජයේ රෝහල්වලට මෙට්ට සැපයූ ආයතන කවරේද;

(ii) එම ආයතන කෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, එම කාල සීමාව තුළ ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතනවල නම් සහ ලිපින කවරේද;

(iv) 2011 වර්ෂයේදී හෝ 2012 වර්ෂයේ මුල් කාලයේදී හලාවත දිස්ත්‍රික් මහ රෝහලට මෙට්ට සැපයූ ආයතනයේ හිමිකරුගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් සහ ලිපින කවරේද;

(v) එම ආයතනය සැපයූ මෙට්ට සංඛ්‍යාව සහ ඒවායේ වටිනාකම කොපමණද;

(vi) එම මෙට්ට තොගය රෝහලට ලැබුණු දිනය කවරේද;

(vii) එම මෙට්ට මිලදී ගැනීම අනුමත කළ නිලධාරියාගේ හෝ නිලධාරීන්ගේ නම් සහ තනතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මෙට්ට තොගය වෙනුවෙන් ලබා දුන් ප්‍රමිති සහතිකය ඉදිරිපත් කරන්නේද;

(ii) එම මෙට්ට භාවිත කළ හැකි අවම කාල සීමාව කොපමණද;

(iii) ඒවා මේ වන විට භාවිත කරනු ලබන්නේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(v) ඉහත මෙට්ට සැපයූ ආයතනය වෙනත් රෝහල්වලටද මෙට්ට ලබා දී තිබේ නම්, එම එක් එක් රෝහලට ලබා දී ඇති මෙට්ට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාර අමෙච්සරෙක් කේට්ට වීනා:

(අ) (i) 2009ආම් ආණ්ඩු මුදල් 2012ආම් ආණ්ඩු වරෙ අරසාඞ්ක වෛත්තියසාලෙකළුක්කු මෙත්තෙකළෙ වළඞ්කිය නිරුවනඞ්කළ් යාවෙයෙන්පතෙයුම්;

(ii) කුරිප්පිට්ට නිරුවනඞ්කළෛත් තෙරිවු සෙය්යුම් පෝදු ඒර්රුක්කොළ්ළප්පට්ට කේල්විප්පත්තිර නටෙමුරෛපින්පර්රප්පට්ටුළ්ළතා එන්පතෙයුම්;

(iii) ආමෙනිල්, අක්කාලප්පකුදියිනුළ් කේල්විප් පත්තිරඞ්කළෛ මුන්වෛත්ත නිරුවනඞ්කළින් පෙයර්කළ් මර්රුම් මුකවරිකළ් යාවෛ යෙන්පතෙයුම්;

(iv) 2011ආම් ආණ්ඩු අල්ලතු 2012ආම් ආණ්ඩින් ආරම්ප කාලප්පකුදියිල් සිලාපම් මාවට්ට වෛත්තියසාලෛක්කු මෙත්තෙකළෛ වළඞ්කිය නිරුවනත්තිනතු උරිමෙයාළරතුම් පණිප්පාළර් සපෛ අඞ්කත්තවර්කළිනතුම් පෙයර්කළ් මර්රුම් මුකවරිකළ් යාවෛයෙන්පතෙයුම්;

(v) මේර්පඩි නිරුවනම් වළඞ්කිය මෙත්තෙකළින් එණ්ණික්කෛ මර්රුම් අවර්රින් පෙරුමති එව්වළවෙන්පතෙයුම්;

(vi) ඉන්ත මෙත්තෙකළ් වෛත්තියසාලෛක්කුක් කිටෛත්ත තිකති යාතෙන්පතෙයුම්;

(vii) මේර්පඩි මෙත්තෙකළ් කොළ්වනවු සෙය්යප් පටුවතෙ අඞ්කීකරිත්ත උත්තියෝකත්තරින් අල්ලතු උත්තියෝකත්තර්කළින් පෙයර්කළ් මර්රුම් පතවිකළ් යාවෛයෙන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ආ) මේර්පඩි මෙත්තෙකළ්,

(i) සාර්පාක වළඞ්කප්පට්ටුළ්ළ තරච් චාන්රිතළෛ සමර්ප්පිප්පාරා එන්පතෙයුම්;

(ii) පයන්පටුත්තක්කූටිය ආකක් කුරෛන්ත කාල එල්ලෛ යාතෙන්පතෙයුම්;

(iii) තර්පෝතු පයන්පටුත්තප්පටුකින්රනවා එන්පතෙයුම්;

(iv) ඉල්ලෛයෙනිල්, අතර්කාන කාරණඞ්කළ් යාවෛයෙන්පතෙයුම්;

(v) මේර්පඩි මෙත්තෙකළෛ වළඞ්කිය නිරුවනම් වේරු වෛත්තියසාලෛකළුක්කුම් මෙත්තෙකළෛ වළඞ්කියිරුප්පින් අන්ත ඔව්වොරු වෛත්තිය සාලෛක්කුම් වළඞ්කියුළ්ළ මෙත්තෙකළින් එණ්ණික්කෛ තනිත්තනියාක එව්වළවෙන්පතෙ යුම්

අවර් ඉච්සපෛක්කු අර්විවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Health:

(a) Will he state -

(i) the names of the institutions that supplied mattresses to the government hospitals during the period from 2009 to 2012 ;

(ii) whether the accepted tender procedure has been followed in selecting the aforesaid institutions;

(iii) if so, the names and addresses of institutions that submitted tenders;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(iv) the names and addresses of the owner and the members of the board of directors of the institution which supplied mattresses to the Chilaw District Hospital in the year 2011 or during the early part of the year 2012;

(v) the number of mattresses supplied by the aforesaid institution and their value;

(vi) the date on which the hospital received the aforesaid stock of mattresses; and

(vii) the name/s and post/s of the officer or the officers who sanctioned the purchase of the aforesaid mattresses ?

(b) Will he inform this House in relation to the above stock of mattresses -

(i) whether he will submit the standards certificate;

(ii) the minimum period they can be used;

(iii) whether they are being used at present;

(iv) if not, the reasons for same; and

(v) if the supplying institution has supplied mattresses to other hospitals as well, separately the number of mattresses supplied to each such hospital ?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)

(මාණ්පුමිකු ලලිත් දිසානායක - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2009 සහ 2010 වසර සඳහා - සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය

2011 වසර සඳහා - ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම

2012 වසර සඳහා - මෙවට මිල දී ගෙන නොමැත.

(ii) පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර ඇත.

(iii) 1. ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම, 49/16, අයිස්ලන්ඩ් බිල්ඩින්, ගාලු පාර, කොළඹ 03.

2. සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය, සියෙස්ටා මන්දිරය, 327, ගාලු පාර, කොළඹ 03.

3. ඉනෙක්ස් ඒජන්සීස් (පුද්ගලික) සමාගම, 29 ඒ, ශ්‍රී පේමරත්න මාවත, මොරටුමුල්ල, මොරටුව.

(iv) ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගමෙන් මිල දී ගෙන ඇති අතර, එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ විස්තර නොමැත.

(v) මෙවට සංඛ්‍යාව 200යි.

(vi) 2 011.11.21

(vii) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව "ඊ" විසින් අනුමත කර ඇත.

ප්‍රසම්පාදන කමිටු නියෝජිතයන්

කේ.ඩී.එල්.කේ ගුණවර්ධන මහතා - සභාපති, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවෘත්ති හා ප්‍රචාරණ)

වී. වික්‍රමරාජා මහතා - සාමාජික, අධ්‍යක්ෂ (පාලන)

වයි.එල්.එස්.පී.කේ. පෙරේරා මහතා, අධ්‍යක්ෂ (මුදල්) වැය

(ආ) (i) කිසිදු ආයතනයක රබර් මිශ්‍රිත කොහු මෙට්ට සඳහා ප්‍රමිති සහතික ලබා දී නොමැත.

(ii) අවුරුදු 01යි.

(iii) ඔව්.

(iv) අදාළ නොවේ.

(v) ඉහත ප්‍රසම්පාදන කමිටු අනුමැතියට අනුව අනුරාධපුර සම සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා මෙට්ට 342ක් ලබා දී තිබේ.

(ඇ) පැන නොනඟී.

ගරු දයාසිරි ජයසේකර මහතා

(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)

(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙම මෙට්ට සැපයූ සමාගමේ සභාපති, ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩලය කවුද කියලා පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කර නැහැ. නියෝජ්‍ය ඇමතිතුමනි, ඖෂධ පැත්තකින් තබන්න කෝ. ඔබතුමා ඖෂධවල විස්තර කියන්නනේ භය. මෙම මෙට්ට සැපයූ සමාගමේ සභාපති, ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩලය කවුද කියලා පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරන්නේ නැද්ද?

ගරු ලලිත් දිසානායක මහතා

(මාණ්පුමිකු ලලිත් දිසානායක)

(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ටෙන්ඩර් පටිපාටියේ දී ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය කවුද කියන එක අපට අවශ්‍ය වන්නේ නැහැ. අදාළ සමාගම්වලින් ලැබෙන ටෙන්ඩර් අනුව ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පිළිබඳව සලකා බලනවා. ඒ අධ්‍යක්ෂ මණ්ඩලය කවුද කියලා පරිපාලනය සම්බන්ධයෙන් සොයා බලන්න අපට අවශ්‍යතාවක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා

(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)

(The Hon. Dayasiri Jayasekara)

නැහැ, නැහැ, මම අහන ප්‍රශ්නයට උත්තර ඕනෑ.

ගරු ලලිත් දිසානායක මහතා

(මාණ්පුමිකු ලලිත් දිසානායක)

(The Hon. Lalith Dissanayake)

රජය අනුගමනය කරන මෙම ටෙන්ඩර් පටිපාටිය අනුව අදාළ සමාගම්වලින් මිල ගණන් කැඳවනවා. ඊට අමතරව අපි වෙනත් තොරතුරු සොයන්න යන්නේ නැහැ. ඒක අපට අයිති දෙයක් නොවෙයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතකොට ඒ තොරතුරු අවශ්‍ය නැහැ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක හරි කථාවක් නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපට ඒක අදාළ නැහැ. මේ ප්‍රශ්නයට අදාළ සමාගම්වල තොරතුරු අපි ළඟ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ කියන්නේ මේ මෙට්‍රස් මිලදී ගන්නවා විතරයි? එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින්නේ කවුද කියලා සොයන්නේ නැහැ?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අදාළ සමාගම්වල තොරතුරු අපි ළඟ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙට්‍රස් මිලදී ගන්නවා, නමුත් ඒවා මිලදී ගන්න සමාගම මොකක්ද කියලා දන්නේත් නැහැ; ඒ අධ්‍යක්ෂවරුන් කවුද කියලා දන්නේත් නැහැ. ඒවා සොයන්නේ නැහැ ලු. මේක පුදුම කථාවක්.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ සමාගම ගැන උත්තර දීලා තිබෙනවා. තමුන්නාන්සේ අසත්‍යය කියන්න එපා. මේවා මිලදී ගත් සමාගම්වල විස්තර පිළිතුරේ තිබෙනවා. සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල අපි කැඳවන්නේ නැහැ. මන්ත්‍රීතුමා ඒක තේරුම් ගන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අධ්‍යක්ෂ මණ්ඩල කැඳවන එක නොවෙයි. සාමාන්‍යයෙන් ටෙන්ඩර් කැඳෙව්වාම, ඒ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර ඇතුළත් කරනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නැහැ, නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නමුත් ඔබතුමාට යුතුකමක් තිබෙනවා, මම ඇහුවාම ඒ විස්තර දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගෙන් ලබා ගන්න පුළුවන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා දෙන්නේ නැහැනේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
දෙන්න ඕනෑ නැහැ. ඔබතුමාට ඕනෑ නම් සමාගම් රෙජිස්ට්‍රාර්ගෙන් ගන්න පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙට්ට 200ක් අමාත්‍යාංශය විසින් රෝහලට එවා තිබුණා. නමුත් දැන් මේ මෙට්ට පාවිච්චි කරන්න බැරිව හලාවත රෝහලේ ගොඩ ගසා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සියලුම විස්තර මා ළඟ තිබෙනවා. රූප සටහන් එක්ක මම පෙන්වන්නම්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේකේ අධ්‍යක්ෂ මණ්ඩලය කවුද කියලා කියන්නත් බැරි නම් මේ පාවිච්චි කරන්න බැරි මෙට්ට සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්න කීන්දුව මොකක්ද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අදාළ සමාගම මෙම මෙට්ට තොගය සැපයීමෙන් පසු ඒ සැපයීම අදාළ ප්‍රමිතියට නොවීම නිසා නැවත ඔවුන්ට ලියුම් යවා තිබෙනවා, ප්‍රමිතියට අදාළ නොවන ටික ඉවත් කරගෙන නැවත අලුත් ඒවා දෙන්න කියලා. ඒ අනුව "හලාවත මහ රෝහලට මෙට්ට සැපයීම - සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එවන ලද ලිපිය අනුව, ඔබ වෙත භාර දුන් මෙට්ට තොගය නැවත භාර ගනිමි. මෙම මෙට්ට තොගය පසු ගිය තොගයට වඩා හොඳ තත්ත්වයේ ඇති බව දැනුම් දෙනු කැමැත්තෙමි" කියා ලිපියක් යවා තිබෙනවා. ඔවුන් ඒ මෙට්ට ප්‍රමිතියට අදාළව භාර නොදීම නිසා ඒවා ඉවත් කරගෙන අලුත් ඒවා ලබා දීලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොපමණ කාලයකට මේවා වලංගු වනවාද කියලා මා ඇහුවේ වෙන එකක් නිසා නොවෙයි. මෙම මෙට්ට අහල් 4ක් විතර ඝනකමට තිබුණාට ලෙඩ්ඩු බුදියා ගත්තාම පැදුරෙන් පහළට වැටෙනවා වාගේ වැටෙනවා. මම ගිහිල්ලා බැලුවා. ඒකයි මම කියන්නේ. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා ගෙනැල්ලා මෙහෙම හුවමාරු කර ගන්න පුළුවන්ද? ඒකයි මම අහන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලවල ඉන්න අය කවුද කියලා. ඇයි කියන්නේ නැත්තේ?

හොරකම් තිබෙන ඔක්කොම ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩලවල නම් කියන්නේ නැහැ. එදත් එහෙමයි. කොළ ටික දාලා ඔක්කොම වැහුවා. අදත් ඒකයි කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මෙට්ට සංඛ්‍යාව ආපහු යවා ගෙන්වා ගන්නට කලින් මේ සල්ලි ටික ඒ ගොල්ලන්ට ආපහු දුන්නේ ඇයි කියා මම අහනවා. ප්‍රමිතිය සොයා බලා සෑහීමකට පත් වෙන්නේ නැතිව සල්ලි දීලා, මෙට්ට ටික ආපහු බාර දුන්නාට වැඩක් නැහැ. මෙච්චර වැරදි තිබෙනවා නම් ඇයි මේ මෙට්ට බාර ගත්තේ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ පිළිබඳව උපදේශක කාරක සභාවේදී සොයා බලා ගරු මන්ත්‍රීතුමාට වාර්තාවක් ලබා දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මේ සියලු විස්තර සම්බන්ධයෙන් අදාළ ක්‍රමවේදය අනුව තමයි කටයුතු කළේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන් වන අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්. අනුරාධපුරයට යවපු මෙට්ටත් මේ වාගේමද එහෙම නැත්නම් නැවත මෙට්ට නොගන්න මේ සමාගම සම්බන්ධයෙන් යම්කිසි තීන්දුවක් ගන්නවාද කියා මම අහනවා. එහෙම නැත්නම් මෙට්ට වෙනුවට පැදුරු ගෙනවිත් දෙන්නය කියා ඒ ගොල්ලන්ට කියන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරාධපුරයෙන් පැමිණිල්ලක් ලැබී නැහැ. හලාවතින් තමයි පැමිණිල්ලක් ලැබුණේ. ඒ අනුව කටයුතු කර තිබෙනවා. සමාගම් හතකින් මිල ගණන් කැඳවා තිබෙනවා. මිල ගණන් අනුව අඩුම මිලට තිබුණු දෙය අරගෙන තමයි අදාළ ඉල්ලීමට අනුව කටයුතු කර තිබෙන්නේ. වැඩිම මිලකට අරගෙන නැහැ. ඒ අදාළ ටෙන්ඩර්කරුගෙන් අඩුම මිලට තමයි අරගෙන තිබෙන්නේ.

මුලටියන ප්‍රජා ජල පිරිපහදු මධ්‍යස්ථානය : විදුලිබලය සැපයීම

முலட்டியன சனசமூக நீர் சுத்திகரிப்பு நிலையம் : மின் விநியோகம்

MULATIYANA COMMUNITY WATER TREATMENT CENTRE : SUPPLY OF ELECTRICITY

1973/'11

7. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි මුලටියන ප්‍රජා ජල පිරිපහදු මධ්‍යස්ථානයේ යන්ත්‍රාගාරයට විදුලිබලය නොමැතිවීම නිසා එම ප්‍රදේශයේ ජනතාව පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට නොහැකිවීමෙන් බරපතල ගැටලු රාශියකට මුහුණපා ඇති බවත්;

(ii) ඒ සඳහා අරමුදල් සැපයීමට අදාළ බලධාරීන් පොරොන්දු වූවත්, මේ දක්වා ඒ සඳහා ප්‍රතිපාදන ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජල පවිත්‍රාගාරය සඳහා කඩිනමින් විදුලිය ලබා ගැනීමට අවශ්‍ය අරමුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் முலட்டியன பிரதேச சபை ஆளுகைப் பிரதேசத்தில் அமைந்துள்ள முலட்டியன சனசமூக நீர் சுத்திகரிப்பு நிலையத்தின் இயந்திரக்கூடத்திற்கு மின்சாரம் இல்லாத காரணத்தால் சுத்தமான குடிநீரைப் பெற்றுக்கொள்ள இயலாமல் இப்பிரதேச மக்கள் பல பாரிய பிரச்சினைகளுக்கு முகம் கொடுத்துள்ளார்கள் என்பதையும்;

(ii) இதற்கு நிதி வசதியினை வழங்குவதற்கு சம்பந்தப்பட்ட அதிகாரிகளினால் உறுதிமொழி வழங்கப்பட்டாலும் இற்றைவரை இதற்கு நிதி ஏற்பாடுகள் வழங்கப்படவில்லையென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) நீர் சுத்திகரிப்பு நிலையத்திற்கு துரிதமாக மின்சாரத்தை வழங்குவதற்குத் தேவையான நிதியைப் பெற்றுக்கொடுக்க நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், அது எத்தேதியில் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Drainage:

(a) Is he aware that -

(i) the residents are confronted with a host of problems as a result of not being able to obtain pure drinking water since electricity has not been supplied to the plant of the Mulatiyana Community Water Treatment Centre located in the Mulatiyana Pradeshiya Sabha area in Matara District; and

(ii) even though the relevant authorities have pledged to provide funds for this purpose, the financial provisions have not yet been provided?

(b) Will he inform this House -

(i) whether action will be taken to provide funds required for the immediate supply of electricity for the water treatment plant; and

(ii) if so, the date on which it will be done?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජල පවිත්‍රාගාරය සඳහා විදුලි බලය ලබා දී ඇත.
(ii) අදාළ නොවේ.
(ආ) (i) පැන නොනඟී.
(ii) පැන නොනඟී.
(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ ජල යෝජනා ක්‍රමයට යන්ත්‍ර ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය විදුලි බලය මුලින්ම දක්ෂිණ සංවර්ධන අධිකාරියෙන් ලබා දෙනවාය කියලා දිගින් දිගටම සඳහන් කළත්, එහෙම ලබා දීමක් සිද්ධ වුණේ නැහැ. අවසානයේ මේ ජල පාරිභෝගිකයන්ට කිව්වා, ඒ අයගෙන් සල්ලි දමලා මේ වියදම පියවා ගන්න, ඒ මුදල් ප්‍රතිපූරණය කරලා දෙන්නම් කියලා. දක්ෂිණ සංවර්ධන අධිකාරියෙන් ඒ මුදල් ප්‍රතිපූරණය කර දෙනවාය කියලාත් කිව්වා. පසු ගිය දිනවල ගෙනාපු දිවි නැගුම පනතත් එක්ක මේ මොහොත වන විට දක්ෂිණ සංවර්ධන අධිකාරිය අහෝසිත් වෙලා. ඔබතුමාත් සභාපති ධුරයේ සිටියා. අර මුදල් දක්ෂිණ සංවර්ධන අධිකාරියෙන් දුන්නෙත් නැහැ. දිවි නැගුම දෙපාර්තමේන්තුව නිසා දක්ෂිණ සංවර්ධන අධිකාරියත් නැති වෙලා. දැන් මේ පුද්ගලයන්ට ඒ මුදල් ලැබෙන්නේ කොහොමද? එදා අර දුන්න වචනය කෙරෙහි විශ්වාසය තියලා ඒ ගමේ අභිංසක මිනිස්සු මුදල් ටික ටික දමලායි මේ කටයුත්ත කළේ. ගරු ඇමතිතුමනි, මේ වෙනුවෙන් ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ අවුරුද්දේ ජනවාරි 13වැනි දා ප්‍රජාමූල සංවිධානයත් එක්ව රුපියල් 74,675ක් ගෙවලා මේකේ සම්බන්ධතාව ලබාගෙන තිබෙනවා. එය ලබා ගෙන තිබෙන්නේ ජනවාරි මාසයේයි. දැන් අපි ඉන්නේ මාර්තු මාසයේයි. ඔබතුමාත් සහභාගි වෙලා අප කාගේත් සාකච්ඡාවෙන් ඇති කරපු ජාතික ජල භාරය දැන් මෙයට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ මුදල ප්‍රතිපූරණය කිරීම සඳහා වූ ඉල්ලීම ජාතික ජල භාරය විසින් සැලකිල්ලට භාජනය කරන්න සූදානම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
බොහොම ස්තුතියි ගරු ඇමතිතුමා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජලය ලබා ගන්නා ඒ දිය උල්පතේ හෙවත් දිය බුබුළේ ඇති ජලයේ අධික ලවණ ගතියක් තිබෙන නිසා ඒ තුළින් රෝග ඇති වීමේ අවදානමක් තිබෙනවා කියලා ඒ ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ වෙනුවට අසල තිබෙන මීදෙල්ල දොළ ජල මාර්ගයට අහල් හයක පයිප්පයක් යොදලා ජලය ලබා ගැනීම තමයි සාර්ථක, එහෙම වුණොත් මේ ලවණ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවා කියලා කියනවා. මේ අරමුදල හරහා ඒ පයිප්ප මිලදී ගන්න මුදල් යොදවන්නත් බලාපොරොත්තු වෙනවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි දැනටමත් ඒ වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා ජාතික ජල භාරය මැදිහත් වීමෙන්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තවත් අතුරු ප්‍රශ්න තිබෙනවාද ගරු මන්ත්‍රීතුමනි?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු ඇමතිතුමා ඒ ආකාරයට සඳහන් කළාට මේ මොහොත වන කොට පවතින තත්ත්වය එය නොවෙයි. පසු ගිය දිනවල මුලටියන සම්බන්ධීකරණ කමිටුවේදීත් අනුමත කරලා ඉල්ලීමක් කර තිබුණත්, දැනටමත් කටයුතු ආරම්භ කර තිබෙනවා කියා ගරු ඇමතිතුමා කියපු තැනින් ඒ පුද්ගලයන්ට ජලය ලබා දෙන්න වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විරුද්ධ වෙලා තිබෙනවා. ඒකට හේතුව, ඒ ජලය ලබා ගන්න තිබෙන්නේ රක්ෂිතයක් හරහා වීමයි. ඒ නිසා, දැනටමත් ඒ කටයුතු සිද්ධ වනවා කියා ගරු ඇමතිතුමා කියන කාරණය ඇත්තටම සිද්ධ වන්නේ නැහැ. අනුමත කරලා සංවර්ධන කමිටුවත් එකඟ වෙලා තියෙද්දී, ප්‍රාදේශීය සභාවත් එකඟ වෙලා තියෙද්දී ඒ ජනතාවට ජලය ලබා නොදෙන්න බාධා වෙලා තිබෙන මේ ගැටලුව විසඳා ගන්න අමාත්‍යාංශය දක්වන මැදිහත් වීම මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමා, කවදාද ඔය සංවර්ධන කොමිටිය රැස් වුණේ?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමාගේ මූලිකත්වයෙන්-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මා අහන්නේ, සංවර්ධන කොමිටිය කවදාද රැස් වුණේ කියලායි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමාගේ මූලිකත්වයෙන්-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමා, සංවර්ධන කොමිටිය රැස්වූ දිනය මොකක්ද කියලා කියන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, මා ඒ දිනය සටහන් කරගෙන නැහැ. නමුත් මා ඔබතුමාට ඒ ගැන කියන්නම්. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමාගේ සභාපතිත්වයෙන්-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එහෙම නම් ඔබතුමාගේ දැන ගැනීම සඳහා මම පිළිතුර ලබා දෙන්නම්. 2013.02.21 වන දින වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. තවම මාසයක්වත් ගත වෙලා නැහැ. අද දිනය මාර්තු 20. කලින් සංවර්ධන කමිටුවේදී මේ ප්‍රශ්නය මතු වුණ බව ඇත්ත. ඔබතුමා කියන කාරණය සඳහා මැදිහත් වෙලා වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා පසු ගිය මාසයේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒ මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කලින්. අපි ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ කලින්. ඒක ගිය මාසයේ සිදු කරලා තිබෙන්නේ. මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ මාස තුන හතරකට කලින්. ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පාර්ලිමේන්තුවේ කටයුතු හෙමින් සිදු වුණත් අපි ඊට වඩා වේගයෙන් ප්‍රශ්න විසඳලා තිබෙනවා.

රජයට අයත් සමාගම් : සමස්ත ප්‍රාග්ධනය

அரசாங்கத்துக்குச் சொந்தமான கம்பனிகள் : மொத்த முதலீடு

GOVERNMENT-OWNED COMPANIES : TOTAL CAPITAL

2203/'11

8. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු නොලබන, පසු ගිය වර්ෂ දහය තුළදී පිහිටුවනු ලැබූ, රජයට අයත් සියලුම සමාගම්වල නම් කවරේද;

(ii) ඉහත සඳහන් සමාගම් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන්නේද;

(iii) නොඑසේ නම්, එම සමාගම් අධීක්ෂණය කරනු ලබන්නේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසු ගිය වර්ෂ දහයක කාලය තුළ,

(i) රජය විසින් කිසියම් බද්දක් අය කර ගෙන ඇති හෝ රජය වෙත ලාභාංශ ලබා දී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) රජය විසින් මුදල් ගෙවන ලද, එහෙත් රජය වෙත කිසිදු මුදලක් ආපසු ලබාදී නොමැති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ආයතනය වෙත රජය විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතන සමස්තයක් ලෙස, එක් එක් වර්ෂය සඳහා ලාභයක් හෝ අලාභයක් ලැබුවේද;

(v) එම එක් එක් ආයතනයේ සේවය කරන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(vi) රජය විසින් එම එක් එක් ආයතනය සඳහා යොදවන ලද සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

යන්නත් ඉහත (අ)(i) හි සඳහන් කළ සමාගම්වලට අදාළව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

නිති, තිට්ටමිටල් අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) கணக்காய்வாளர் தலைமை அதிபதித் திணைக்களத்தினால் கணக்காய்வுக்கு உட்படுத்தப் படாத, கடந்த 10 வருடங்களுள் நிறுவப்பட்ட அரசாங்கத்திற்குச் சொந்தமான சகல கம்பனி களையும்;

(ii) மேலே குறிப்பிடப்பட்டுள்ள கம்பனிகள் அரசாங்க பொறுப்புமுயற்சிகள் திணைக்களத் தினால் கண்காணிக்கப்படுகின்றனவா என்ப தையும்;

(iii) இன்றேல், நிதி திட்டமிடல் அமைச்சில் யாரால் அது மேற்கொள்ளப்படுகின்றது என்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) மேலே (அ) - (i) இல் குறிப்பிடப்பட்டுள்ள கம்பனிகள் தொடர்பில்,

(i) அறவீடு விதிக்கப்பட்ட அல்லது அரசாங்கம் பங்கிலாபங்களைப் பெற்றுக்கொண்ட தாபனங்களின் எண்ணிக்கையினையும்;

(ii) எந்த விதமான நிதியினையும் மீளப்பெறாமல் அரசாங்கத்தினால் கொடுப்பனவு செலுத்தப் பட்டுவரும் தாபனங்களின் எண்ணிக் கையினையும்;

(iii) ஒவ்வொரு தாபனத்திற்கும் அரசாங்கத்தினால் செலுத்தப்பட்ட தொகையினை வெவ் வேறாகவும்;

(iv) இந்த தாபனங்கள் ஒவ்வொரு வருடத்திற்கும் தேறிய இலாபத்தினையா அல்லது நட்டத் தினையா அடைகின்றன என்பதையும்;

(v) ஒவ்வொரு தாபனத்திலுமுள்ள ஊழியர்களின் எண்ணிக்கையினையும்;

(vi) ஒவ்வொரு தாபனத்திலும் அரசாங்கம் முதலீடு செய்துள்ள மொத்த மூலதனத்தினையும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) all the Government owned companies established during the last 10 years which are not audited by the Auditor General's Department;

(ii) whether the aforesaid companies are monitored by the Public Enterprise Department; and

(iii) if not, by whom in the Ministry of Finance and Planning, the above companies are audited ?

(b) Will he also state for the last 10 years pertaining to the companies mentioned in (a) (i) -

(i) the number of entities that have been charged a levy, or paid dividends to the Government;

(ii) the number of entities that have been paid by the Government without receiving any finance back;

(iii) the amount that has been paid by the Government to each entity separately;

(iv) whether those entities are netting an overall profit or loss for each year;

(vi) the number of employees in each entity; and

(vii) the total capital employed to each entity by the Government?

(c) If not, why?

**** සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
**Annexes tabled:*

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඇමුණුම I හි (අ) තීරුව බලන්න.

(ii) ඔව්.

(iii) අදාළ නොවේ.

(ආ) (i) ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් -2011 වසර සඳහා ලාභාංශ රු.මි. 6,720.4ක් භාණ්ඩාගාරයට ලබා දී ඇත.

(ii) ඇමුණුම1හි (ආ) ii තීරුව බලන්න.

(iii) ඇමුණුම 1හි (ආ) iii තීරුව බලන්න.

(iv) ඇමුණුම II බලන්න.

(v) ඇමුණුම 1හි (ආ) v තීරුව බලන්න.

(vi) ඇමුණුම 1හි (ආ) vi බලන්න.

ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) පැන නොනඟී.

ඇමුණුම I

අනු අංකය	අ	ආ			
	i	ii	iii 2011.12.31 දිනට රු.මි	v සේවක සංඛ්‍යාව	vi 2011.12.31 දිනට රු.මි
1	මිහින් ලංකා (පුද්) සමාගම	ආපසු ලබා දී නොමැත	2,543	238	3,004
2	සී/ස නාවික හා ගුවන් සේවා තොරතුරු සහ පර්යේෂණ (පුද්.) සමාගම	මුදල් ගෙවා නොමැත	මුදල් ගෙවා නොමැත	8	30
3	පොලිප්ටෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	ආපසු ලබා දී නොමැත	52.8	6	112.5
4	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම	මුදල් ගෙවා නොමැත	මුදල් ගෙවා නොමැත	190	305
5	රක්නා ආරක්ෂක (පුද්.) සමාගම	මුදල් ගෙවා නොමැත	මුදල් ගෙවා නොමැත	2,835	5
6	ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලොජිස්	මුදල් ගෙවා නොමැත	මුදල් ගෙවා නොමැත	24	100
7	ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව	මුදල් ගෙවා නොමැත	මුදල් ගෙවා නොමැත	54	නැත
8	ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව	මුදල් ගෙවා නොමැත	මුදල් ගෙවා නොමැත	171	3.9
9	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්	මුදල් ගෙවා නොමැත	මුදල් ගෙවා නොමැත	2,348	6,715
10	සී/ස රාජ්‍ය වාණිජ (සමූපකාර තොග වෙළඳ) සමාගම	මුදල් ගෙවා නොමැත	මුදල් ගෙවා නොමැත	5	නැත
11	ලංකා සතොස	ආපසු ලබා දී නොමැත	699	2772	රු.70
12	සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	මුදල් ගෙවා නොමැත	මුදල් ගෙවා නොමැත	6	36
13	සී/ස ගල්ඔය වැවිලි සමාගම	මුදල් ගෙවා නොමැත	මුදල් ගෙවා නොමැත	965	516

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ඇමුණුම II

අනු අංකය	ආයතනයේ නම	ලාභය/අලාභය									රු.මි
		2002	2003	2004	2005	2006	2007	2008	2009	2010	2011
1	මිහින් ලංකා (පුද්) සමාගම	-	-	-	-	(195)	(3,160)	(1,300)	(1,221)	(940)	(1,966)
2	සි/ස නාවික හා ගුවන් සේවා තොරතුරු සහ පර්යේෂණ (පුද්.) සමාගම	-	-	-	-	-	-	-	2	(0.2)	(0.8)
3	පොලිප්ටෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	-	-	-	-	-	-	-	(5.4)	(11)	(11.8)
4	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම	-	-	-	-	-	-	-	-	-	10
5	රක්නා ආරක්ෂක (පුද්.) සමාගම	-	-	-	-	-	13.47	57.48	71.97	80.15	307.87
6	ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලොජිස්	-	-	-	-	-	0.69	0.56	2.04	7.65	46.85
7	ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව	-	-	-	-	-	-	150	239	295	458
8	ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව	-	-	-	-	23	23	76	63	21	77
9	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්	-	-	-	-	-	-	-	732	10,499	2,132
10	සි/ස රාජ්‍ය වාණිජ (සමුපකාර තොග වෙළඳ) සමාගම	-	-	-	-	-	-	(0.5)	(0.03)	(3.2)	(3)
11	ලංකා සතොස	-	-	-	(3.9)	(17.5)	(0.006)	12	22	37	79
12	සි/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	-	-	-	-	-	-	-	-	-	0.75
13	සි/ස ගල්ඔය වැවිලි සමාගම	-	-	-	-	-	(2)	(67)	(211)	(267)	(124)

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මේ යටතට SriLankan Airlines එක එහෙම නැද්ද? ඒකත් private audit එක යටතේ COPE එකට ඇවිල්ලා තිබෙනවා. ඔබතුමා ඒක ඉදිරිපත් කළේ නැද්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මට ලැබී තිබෙන තොරතුරු අනුව මේ 13 තමයි ලබා දී තිබෙන්නේ. මිහින් ලංකා තිබෙනවා. අනෙක් එක නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී විගණනයට ලක් කරන අවස්ථාවේ දී අපට දක්නට ලැබෙන බොහොම දුර්වල සාධකයක් තිබෙනවා. ඒක තමයි private auditorsලා ඔබතුමන්ලා කාටවත් වගකියන්නේ නැති එක. මොකද, ඒ අය වග කියන්නේ shareholdersලාටයි. Shareholdersලා මුදල් අමාත්‍යාංශයත් එක්ක කිසිසේත්ම සම්බන්ධයක් නැහැ. මුදල් අමාත්‍යාංශයේ Department of Public Enterprises එක හොඳට වැඩ කටයුතු කර ගෙන යනවා. රජයට අයිති මෙවැනි පෞද්ගලික කොම්පැනි Department of Public Enterprises එක යටතට ගේන්නේ නැත්තේ ඇයි?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

සම්ප්‍රදායික වශයෙන් Department of Public Enterprises එකෙන් තමයි -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

But, its accounts are being given through them. So, why are they not held accountable?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

We will consider that. It has not been considered before; you have made the suggestion and we will look into that.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දෙවන කාරණය මෙකයි. මේ අවුරුදු පහට මිහින් ලංකා ආයතනයේ සම්පූර්ණ අලාභය රුපියල් මිලියන 13,800යි. ඔබතුමන්ලා මේ අලාභය අඩු කරන්න මොනවාද කරන්නේ? දවසින් දවස ඔබතුමන්ලා ප්‍රාග්ධනය දමනවා; අලාභය වැඩි වෙනවා. SirLankan Airlines එකෙත් අලාභය වැඩි වෙනවා. ජනතාව ගෙවන බදු මුදල්වලින් මෙවැනි ප්‍රශ්න ඇති කිරීම රටටත් අහිතකරයි; ජනතාවටත් අහිතකරයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණයේ යම්කිසි සත්‍යයක් තිබෙනවා. අපි ඒ ගැන ටිකක් ගැඹුරින් බලන්න ඕනෑ. විශේෂයෙන්ම Air Lanka කාලයේ ඉඳලා -ඔබතුමා හොඳට දන්නවා- අපේ ගුවන් සේවාවන්වල එක්තරා ප්‍රශ්නයක් තිබුණා.

සියලුම රජයයන් ඒකට සහභාගි වුණා. මොකද, ප්‍රාග්ධනය හුහක් අඩුයි. රජය දෙන ප්‍රාග්ධනය - capital එක - අඩුයි. ඒ ඒ ආයතනවලට කියනවා, ඔයගොල්ලෝ ගිහින් බැංකුවලින් ණය අරගෙන, නැත්නම් ණය දෙන වෙනත් ආයතනවලින් අරගෙන ඒක ක්‍රියාත්මක කරන්න කියා. එතකොට operating profits තිබුණත් හුහක් දුරට ණය පියවීම සඳහා තමයි වියදම් කරන්න සිද්ධ වන්නේ. ඒකේ balance sheet එක ඇත්ත වශයෙන්ම ඔබතුමා කියනවා වාගේ හුහක් දුරට අසාර්ථක බවක් - heading south - පෙනෙන්න තිබෙනවා. අපි රජයක් හැටියට මුල ඉඳන්ම Air Lanka එකට උදවු කළා. මට මතකයි, ඔබතුමාත් හොඳට දන්නවා, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මේකට හුහක් සම්බන්ධ වෙලා වැඩ කළා.

ඒ කාලයේත් ඔය ප්‍රශ්නය තිබුණා. මොකද, මූලික ප්‍රාග්ධනය මදි. එතකොට expand කරන්නත් අමාරුයි, සැලසුම් කරන්නත් අමාරුයි. ඒක අපට තේරුම් ගන්න පුළුවන්. මොකද, හුහක් දුප්පත් රටවලට ගුවන් සේවයකට අවශ්‍ය සම්පූර්ණ ප්‍රාග්ධනය යට කරන්නත් බැහැ. ඉතින් දැන් අපි මේ ගැන තාත්විකව බලා පරීක්ෂා කර ගෙන යනවා. SirLankan Airlines ආයතනය කියනවා, ඒ ගොල්ලන්ට තව අවුරුදු 5ක් ඇතුළත profitable වෙන්න පුළුවන් කියලා. ඒ අය business plan එකක් හදලා ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම මිහින් ලංකා සමාගමත් එක්ක බද්ධ වෙලා ඒකාබද්ධ schedule එකක් යටතේ වැඩ කරන්නත් බලාපොරොත්තු වෙනවා. අපි එකක් කියන්න ඕනෑ. ඔබතුමා මට වඩා හොඳට දන්නවා, අද හැම රටේම budget airlines තිබෙනවා. සිංගප්පූරුවෙන්, ඒ වාගේම හොංකොංවලින් හොඳ නිදසුන් ගන්න පුළුවන්. තමුන්නාන්සේ දන්නවා, Tiger Airways කියලා තිබෙනවා, SilkAir කියලා තිබෙනවා, තායිලන්තයේ වෙනම තිබෙනවා. අද market එකේ වලනය අනුව මේ විධියේ ගුවන් සේවාවන් හදනවා. ඒකත් අපි සලකලා බලන්න ඕනෑ.

අනිත් කාරණය මේකයි. අපි ඊයේත් සාකච්ඡා කළා. අපි දැන් ප්‍රක්ෂේපණය කරනවා. 2016 වන විට මේ රටට සංචාරකයෝ ලක්ෂ 25ක් ගෙන්වීමට අපි project හදලා තිබෙනවා. ඒ සඳහා වැඩසටහනක් තිබෙනවා. අපි ක්‍රමක්‍රමයෙන් ඒ සඳහා යනවා. තමුන්නාන්සේලාට තොරතුරු ඉදිරිපත් කරන්න පුළුවන්, සාකච්ඡා කරන්න පුළුවන්, විවාද කරන්න පුළුවන්. එතකොට අපට ඉදිරිය ගැන කල්පනා කරලා තමයි ගුවන් තොටුපොළවල්, ගුවන් සේවාවන් සහ වෙනත් දේවල් ගැන කථා කරන්න පුළුවන් වන්නේ. ඒ පසු බිමෙන් තමයි අපි මේ දිහා බලන්නේ. පාර්ලිමේන්තුවේ අපි මේවා දිහා බලන්න, මේවා ගැන විමසන්න, විචාරය කරන්න සියලු දෙනාටම අයිතියක් තිබෙනවා කියා මම පිළිගන්නවා. ඒ ගැන අපට කිසි විධියකින් විරුද්ධ වෙන්න බැහැ. ඒ නිසා ඔය පසු බිමෙන් තමයි අපි කටයුතු කරන්නේ. රජයක් හැටියට අපි හැම වෙලාවේම කළමනාකරණය තුළින් වඩාත් හොඳ තත්ත්වයක් ඇති කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බොහොම අගය කරනවා ඇත්ත තත්ත්වය පිළිබඳව එවැනි සවිස්තර පිළිතුරක් ලබා දීම. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අදාළ කරන්නේ මේ යටතේම ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පිළිබඳවයි. ඒ ආයතන දෙකක්. ගිය අවුරුද්දේ ඒවායේ සම්පූර්ණ අලාභය රුපියල් කෝටි 1,300,555ක්. ඒ ආයතන දෙකක්. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව සමෘද්ධිය ඇතුළු සම්පූර්ණ සහනාධාරවලට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 530යි. ඉතින් මේ සම්බන්ධයෙන් බලන කොට රටේ තිබෙන ආයතන දෙකක් රටේ ජනතාවට ලබා දෙන සහනාධාරවලටත් වැඩියෙන් ගිලලා තිබෙනවා. තවත් මේ වාගේ ආයතන තිබෙනවා. එකක් මිහින් ලංකා ආයතනය. Airport and Aviation Authority එකේ තව කොටසක් private sector එකට තිබෙනවා.

ඒක යටතේ තමයි Mattala Airport එක එන්නේ. Mattala Airport එක ඔබතුමන්ලා පසු ගිය 18 වන දා බොහොම ආඩම්බරයෙන් විවෘත කළා. ඒකේ oil tank එකක්වත් නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

වෙනම දේශනයක් කරනවා. කමක් නැහැ කියන්න. ප්‍රශ්නය අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා හැම රටකටම වාගේ ගිහින් තිබෙනවා. Mattala Airport එකට ජාතන්තර airport එකක තත්ත්වය ඇති කරන්න oil tank එකක් අවශ්‍යයි. අඩු ගණනේ ලක්ෂ 10ක -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඉන්න මම උත්තරයක් දෙන්නම්.

ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)

ගරු මන්ත්‍රීතුමා කරුණාකර ගිහින් බලන්න. මම ටිකට් එකක් දෙන්නම්. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු ඇමතිතුමා කිව්වොත් අප ඒක පිළිගන්නට ඕනෑ නේ. [බාධා කිරීමක්] අප වාද කරන්නට ඕනෑ නැහැ.[බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මත්තල ගැන වාද කරන වෙලාවක් නොවෙයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

I will give the answer. [බාධා කිරීමක්] දැන් ඔබතුමා - [බාධා කිරීමක්] ඉන්න, මා උත්තර දෙන්නම්. ඔබතුමා සද්භාවයෙන් ඒ ප්‍රශ්න නැඟුවා. ඊයේ මට ඒ ගැන සම්පූර්ණ උත්තරයක් දෙන්න අවස්ථාව නොලැබුණු නිසා මා ඒ ගැන කියන්න කැමතියි. ඔබතුමා නැඟූ ප්‍රශ්න එකින් එකට උත්තර දෙන්න අවස්ථාව ලැබීම ගැන මම බොහොම සන්තෝෂ වෙනවා.

පළමුවෙන්ම ප්‍රශ්නයක් ආවා, ඇයි මත්තල මේක හැදුවේ කියා. ඒ පළමුවන ප්‍රශ්නයට මම උත්තර දෙනවා. මත්තලට හැකැප්ම හතරක් එහායින් තිබෙන ස්ථානයේ දෙවැනි ජාතික ගුවන් තොටුපොළ හදන්නයි එක්සත් ජාතික පක්ෂයේ සැලැස්ම තිබුණේ. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඒ ස්ථානයට මොකක්ද කියන්නේ? මොකද අපට ප්‍රශ්නයක් තිබෙනවා. Second runway එකක් ලංකාවේ හදන්න ඕනෑ. ඒක හදන්නේ කොහේද කියා ලොකු විවාදයක් තිබුණා. [බාධා කිරීමක්] මට උත්තර දෙන්න ඉඩ දෙන්න. ලංකාවේ ගුවන් සේවාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මෙතෙක් කල් කටුනායක තිබෙන runway එකෙන් තමයි අපි මේ කටයුතු operate කළේ. මේ රටට දෙවැනි ගුවන්

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

තොටුපොළක් අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේක හදන්න අප මීට වඩා ඉක්මන් විය යුතුව තිබුණා. [බාධා කිරීමක්] ඉන්න මම කියන්නම්. [බාධා කිරීමක්] හැතැප්ම දහයක්. [බාධා කිරීමක්] අහගෙන ඉන්න. තමුන්නාන්සේලා කියන දෙය අප අහගෙන හිටියා. ලංකාවේ දෙවෙනි runway එක හදන්නේ කොහේද කියා විවිධ මත ආවා. එක අවස්ථාවක මතයක් ආවා සීගිරියේ හදන්නය කියා. එතකොට මට හොඳට මතකයි මොන්ටි ගොපල්ලව මැතිතුමා තමයි ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරයාව හිටියේ; ඒ වාගේම සංස්කෘතික ඇමතිවරයාව හිටියේ. එතුමා ප්‍රකාශයක් කළා, සීගිරියේ දෙවෙනි runway එක හදන්න එපා කියලා. [බාධා කිරීමක්] මට උත්තර දෙන්න ඉඩ දෙන්නේ නැද්ද? අහපු ප්‍රශ්නයටයි උත්තර දෙන්නේ. දැන් මොනවා ද කියන්නේ?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order. - [*Interruption*.]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I have to give a composite answer. Sir, how I give the answer is up to me and not for some insignificant Member of Parliament who has just turned up here. That is a matter for me. - [*Interruption*.]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Ajith Perera, you can raise it later. I will give you an opportunity. ඇමතිතුමාගේ උත්තරය අවසානයේ ඔබතුමාගේ point of Order එකට අවස්ථාව දෙන්නම්.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඊට පස්සේ හිහුරක්ගොඩ ගැන කථා කළා. ඊට පස්සේ කුණ්ඩසාලේ ගැන කථා කළා. විවිධ යෝජනා ආවා. විරුද්ධ පක්ෂයේ නායකතුමාට හොඳට මතක ඇති. අනිල් මුණසිංහ මැතිතුමා විශාල වශයෙන් ලොකු තරගයක් කළා, මේක මතුගමට ගෙන යන්න ඕනෑ කියලා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මෙතුමා පැය භාගයක් කථා කළත් ඉඩ දෙන්න වෙයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මූලාසනයට කථා කරන ස්වරූපයක් තිබෙනවා. ඔබතුමා පාර්ලිමේන්තුවේ හැසිරෙන්න ඉගෙන ගන්න. මේක පාර්ලිමේන්තුව.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා ඉගෙන ගන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝග ප්‍රකාරව ගරු ඇමතිවරයාට උත්තර දෙන්න අවස්ථාව තිබෙනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභා ගර්භයේදී මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා එක්කත් ලොකු ගැටුමක් ඇති වුණා. දෙවැනි runway එක හදන්නේ කොහේද කියලා ඇහුවාම මහින්ද සමරසිංහ මැතිතුමා කිව්වා, එතුමාගේ ආසනයේ හදන්නය කියලා. අල්ලපු ආසනයේ මන්ත්‍රීතුමා කිව්වා, එතුමාගේ ආසනයේ හදන්නය කියලා. මෙහෙම ඉතිහාසයක් තිබෙනවා. ඒ අවස්ථාවේදී තමයි තමුන්නාන්සේලා යෝජනා කළේ මේ දැන් හදලා තිබෙන තැන ඉඳන් කිලෝ මීටර් 10ක් එහා මේක හදන්න ඕනෑය කියලා. එතකොට තමුන්නාන්සේලා කොහොමද අහන්නේ මත්තලට ගෙන ගියේ ඇයි කියලා. එතැන මතභේදයක් නැහැ.

දෙවැනි කාරණාව මම කියන්න ඕනෑ. ඒ කාලයේ මට මතකයි, මොනරාගල මන්ත්‍රීතුමා-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, පිළිතුරු ලබා දෙන්න. මේක ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් නොවෙයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා අහපු නිසා මම දෙවැනි කාරණාව කියන්න ඕනෑ. Second runway එක අපි හැදුවා. තමුන්නාන්සේලා මත්තලට ගියාද? අපි ඔක්කෝම ගිය සුමානේ ගියා. ඒ, ලංකාවේ තිබුණු දුප්පත්ම පළාතක්. අපි ඉතාම සන්තෝෂයි කියන්න, අද ලංකාවේ දුප්පත්ම පළාතක් ඉතාමත් දියුණු වන තත්ත්වයට පත් වෙලා තිබෙනවාය කියා; සම්පත් ලබා දීලා තිබෙන, යටිතල පහසුකම් දීලා තිබෙන පළාතක් බවට පත් වෙලා තිබෙනවා කියා. ඒක අපි ඇස් දෙකෙන්ම දැක්කා. තමුන්නාන්සේලා එක් කෙනෙක්වත් ගිහිල්ලා බැලුවාද? මේ ගොල්ලන්ට half-rate tickets හරි දීලා යවන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ තිබෙන වැරැද්ද මේකයි. තමුන්නාන්සේලා හිතන්නේ ලංකාව කියන්නේ උතුරු කොළඹ කියලායි. මැදවච්චියෙන් එහාට ගිහිල්ලා නැහැ. නමුත් කිලිනොච්චිය ගැන කථා කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තර දීලා අවසානද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කරුණාකරලා සද්භාවයෙන් මේ ප්‍රශ්න විභාග කරලා බලන්න. අපි උදවු කරන්නම්, ගිහිල්ලා බලන්න. මාධ්‍යවේදීන් එක්ක ගෙන ගිය එකටත් අකැමැතියි. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
Mr. Deputy Speaker -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Hon. Deputy Speaker, the Hon. Minister mentioned about the plan of the then UNP Government and what I had done as the Leader of the Opposition. I would just clarify the facts. We had a plan to expand the Katunayake Airport. Therefore, the Sri Lanka Air Force had to be shifted out from there. They chose Kuda Oya, which was about 11 miles away. Certainly, an airstrip was to be built for the Sri Lanka Air Force along with a second airstrip. Then, we were going to have the control tower. But, the rest of it were going to be big aircraft-hanger type buildings. අඩු මුදලට ගොඩනැඟිලි හැදීමයි අපේ අදහස වුණේ. දැන් මත්තල වෙලා තිබෙන්නේ, hundreds of millions of rupees -කෝටි ගණන්- had been spent on terminals and all that. It is Rs. 40 billion.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
So, what?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
That was never there in our plan. - [*Interruption*.] නැහැ, නැහැ. මෙතුමා කිව්වේ - [බාධා කිරීම්] Wait, wait. - [*Interruption*.]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
දැන් මෙතැන කටුනායක දියුණු කරන්න සැලැස්මක් නැහැ. කටුනායක වහලා, - Can you account for that Rs. 40 billion? What happened to it? You did not require Rs. 40 billion for the terminals. Someone had played it out. - [*Interruption*.] මේ කාරණය ටිකක් අහගන්න. Certainly, building the airstrip was okay. You have taken it to Mattala and I do not have a problem with that.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Good. Now, you have admitted that. Please tell that to your *golayas*.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
You have built the airstrip. We have no issue on that. - [*Interruption*.] Wait.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You all can have an Adjournment Debate on this.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Yes, they can have an Adjournment Debate on this, Sir.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The question has been answered. Thank you very much. We are running out of time.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
But, we cannot agree on spending Rs. 40 billion for the terminal buildings. That is what the Hon. Member has been saying.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු පියංකර ජයරත්න මහතා.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගෙනෙන්නේ වැරැදි මත. මා අහන්න කැමැතියි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගුවන් තොටුපොළ හැදුවාට සජිත් ප්‍රේමදාස මැතිතුමා විරුද්ධ ද කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order, Hon. Member?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I have a question: where is the oil tank?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 9 - 2430/12 (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! දිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා. [බාධා කිරීමක්] කරුණාකර දිවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමාට පිළිතුරු දෙන්න අවස්ථාව දෙන්න.

දිවර ප්‍රජාවට සහන : ක්‍රියා පටිපාටිය
மீனவ சமுதாயத்துக்கு நிவாரணம்: நடவடிக்கைமுறை
RELIEF TO FISHING COMMUNITY: PROCEDURE

2430/'12

9. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ දිවර කර්මාන්තයේ නියැලෙන සියලුම දිවර ප්‍රජාවට ජීවන වියදම් සහනාධාරයක් හෝ ඉන්ධන සහනාධාරයක් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීමට අනුගමනය කරන ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) එක් දිවරයෙකුට ලබා දීමට බලාපොරොත්තු වන සහනාධාර මුදල කොපමණද;

(iv) එම මුදල ගණනය කිරීමට යොදා ගන්නා නිර්ණායකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කටපොරොළිල් නීරියල් වළ අපිවිරුත්ති අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் கடற்றொழிலில் ஈடுபடும் அனைத்து மீனவ சமுதாயத்தினருக்கும் வாழ்க்கைச் செலவு மானியம் அல்லது எரிபொருள் மானியம் வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) அவ்வாறாயின், அதனை நடைமுறைப்படுத்த எடுக்கப்படும் செயன்முறை யாதென்பதையும்;

(iii) ஒரு மீனவருக்கு வழங்க எதிர்பார்க்கப்படும் மானியத் தொகை எவ்வளவு என்பதையும்;

(iv) அந்தத் தொகையைக் கணிப்பீடு செய்யப் பயன்படுத்தப்படும் அளவுகோள் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House -

(i) whether action will be taken to grant a cost of living allowance or a fuel subsidy to the fishing community engaged in the fisheries industry in Sri Lanka;

(ii) if so, the procedure that will be followed to implement it;

(iii) the amount of the financial assistance expected to be provided to each fisherman;

(iv) the criteria that have been used to calculate the above-mentioned amount?

(b) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (දිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඉන්ධන සහනාධාරය මාසිකව දිස්ත්‍රික් දිවර සහකාර අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශ කරනු ලබන ක්‍රියාකාරී දිවර යාත්‍රා සඳහා ලබා දෙනු ලබයි. ප්‍රධාන කාර්යාලය මඟින් දිස්ත්‍රික් කාර්යාලවලට නිකුත් කරන කූපන් පත් දිවර යාත්‍රා හිමියන්ට දිස්ත්‍රික් දිවර කාර්යාල මඟින් නිකුත් කරනු ලබන අතර එම කූපන් පත් අනුමත ඉන්ධන පිරවුම්හල්වලට ඉදිරිපත් කිරීමෙන් ඉන්ධන සඳහා අදාළ සහනාධාරය ලබා දේ.

(iii) ලබා දෙනු ලබන සහනාධාර මුදල දිවරයා සතුව ඇති යාත්‍රා වර්ගය අනුව වෙනස් වේ.

අනු අංකය	යාත්‍රා වර්ගය	ලබා දෙනු ලබන සහනාධාර මුදල මාසිකව (රු)
01	බහුදින යාත්‍රා (IMUL)	31200/-
02	එක්දින යාත්‍රා (IDAY)	19200/-
03	පිටත එන්ජිම සහිත ෆයිබර් ග්ලාස් (OFRP)	9375/-
04	පාරම්පරික එන්ජිම සහිත යාත්‍රා (MTRB)	9375/-

(iv) ඔව්.

කුමන වර්ගයේ යාත්‍රාවකට හෝ ඩීසල් ලීටරයක් සඳහා රු. 12.00ක සහනාධාරයක් ද

භූමිතෙල් ලීටරයක් සඳහා රු. 25.00 ක සහනාධාරයක් ද හිමි වේ.

එක් එක් යාත්‍රා වර්ගය සඳහා මාසිකව භාවිත වන ඉන්ධන ප්‍රමාණය සඳහා වන පිළිගත් අගයන් පහත පරිදි වේ.

යාත්‍රා වර්ගය	භාවිත වන ඉන්ධන වර්ගය	මාසිකව භාවිත වන ඉන්ධන ප්‍රමාණය (ලීටර්)	මාසික සහනාධාරය (රු)	වාර්ෂික සහනාධාරය (රු)
IMUL	ඩීසල්	2,600	31,200/-	374,400/-
IDAY	ඩීසල්	1,600	19,200/-	230,400/-
OFRP	භූමිතෙල්	375	9,375/-	112,500/-
MTRB	භූමිතෙල්	375	9,375/-	112,500/-

(ආ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මා අහනවා. ගරු ඇමතිතුමනි, ලංකාවේ ධීවර දිස්ත්‍රික්ක 15ක, ධීවර පරීක්ෂක කොට්ඨාස 149ක ඔක්කෝම ධීවර පවුල් 185,00ක් ඉන්නවා. මා මේ කථා කරන්නේ කරදිය ධීවර කර්මාන්තය ගැනයි. යැපෙන්නන් 823,000ක් ඉන්නවා. ඒ ධීවර පරපුරට මාර්තු මාසයට ලබා දිය යුතු ධීවර ඉන්ධන සහනාධාරය මෙතෙක් ලැබිලා නැහැ. ඒ කියන්නේ, කූපන්පත් නිකුත් කරලා නැහැ. ධීවර දෙපාර්තමේන්තුවට කථා කළාම කියනවා, "ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඒ කූපන්පත් එවලා නැහැ" කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පොඩි ප්‍රමාදයක් තිබෙනවා. නමුත් ලබන සතිය වන කොට ඒවා ලබා දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්න. ඔබතුමා මට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට කථා කරලා ඇහුවාම ඒ අය කියනවා, "භාණ්ඩාගාරයෙන් මුදල් එවලා නැහැ" කියලා. ගරු ඇමතිතුමනි, මෙතෙක් කල් ක්‍රියාත්මක වුණ ඒ ඉන්ධන සහනාධාරය මාර්තු මාසයට නොලැබීම තුළින් මා කිව්ව ලක්ෂ 9කට ආසන්න ධීවර ප්‍රජාව අසරණ වෙලා තිබෙනවා. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, කවදාද-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නොලැබීම නොවෙයි, ප්‍රමාදයක් වෙලා තිබෙනවා. එපමණයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මාර්තු මාසයට ලබා දිය යුතු ඉන්ධන සහනාධාරය ලබා දීමට කටයුතු කරන්නේ කවදාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මා හිතන හැටියට භාණ්ඩාගාරය කියලා තිබෙනවා, ලබන සතියේ ඉඳලා ලබා දෙනවා කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් ඒ ඉන්ධන සහනාධාරය ලබා දුන්නායින් පසුව ඩීසල්වල මිල සියයට 43කින් වැඩි වෙලා තිබෙනවා. ගණන් වශයෙන් කිව්වොත්, රුපියල් 84.30 ඉඳලා රුපියල් 121.30 දක්වා රුපියල් 37ක වැඩි වීමක් තිබෙනවා. ඒ කියන්නේ, සියයට 43.89ක වැඩි වීමක් තිබෙනවා.

මේ ඉන්ධන මිල ඉහළ යෑමත් සමඟ එයට සමාන්තරව ඉන්ධන සහනාධාරයේ වැඩිවීමක් ක්‍රියාත්මක කරන්නට ඔබතුමන්ලා කටයුතු කරනවාද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ, එහෙම ප්‍රශ්නයක් මතු වෙලා නැහැ. මොකද, අපි ජාතික ධීවර සම්මේලනයත් එක්ක පසු ගිය දවස්වලත් සාකච්ඡා කළා. එවැනි ඉල්ලීමක් නැහැ. මොකද, අපි ලබා දෙන සහනාධාරය මෙය විතරක් නොවෙයි. අපි ධීවර කර්මාන්තය ආදායම් බද්දෙන් නිදහස් කර තිබෙනවා. සියලුම බලපත්‍ර ගාස්තු නිදහස් කර තිබෙනවා. අපි රක්ෂණයක් ලබා දීලා තිබෙනවා; විශ්‍රාම වැටුප් දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ධීවර ණය යෝජනා ක්‍රමය යටතේ ගිය අවුරුද්දට රුපියල් බිලියනයක් වෙන් කරලා ණය සහනාධාර දුන්නා. රුපියල් මිලියන දෙකකට අඩු ණයවලට පොලිය සියයට 5.5යි. ඒ පොලියෙන් සියයට 4ක් ආණ්ඩුවෙන් ගෙවනවා. අනෙක් ණයවලට පොලිය සියයට 8යි. ඒ ණය යෝජනා ක්‍රමය යටතේ මේ අවුරුද්දට තව රුපියල් බිලියන දෙකක් වෙන් කරලා තිබෙනවා. මේ සියලුම සහනාධාර ධීවරයාට ලැබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා සහනාධාර ගැන සඳහන් කළා. නමුත් ධීවර ප්‍රජාවට හඳලා දෙනවායි කිව්ව නිවාස 30,000 හැදෙන්නේ නැහැයි කියන එක සඳහන් කළේ නැහැ. මොකද, ධීවර නිවාස 30,000ක් හදන්න රුපියල් කෝටි 150ක් වෙන් කරනවායි කිව්වා. ඒක කෙරෙන්නේ නැහැයි කියලා ඔබතුමා පාර්ලිමේන්තුවේ දී කිව්වා. මේ ඉන්ධන සහනාධාරය ක්‍රියාත්මක කරනවායි කියලා මහින්ද චින්තන වැඩසටහනේ සඳහන් වෙලා තිබෙනවා. ඉදිරියටත්, අඛණ්ඩව මේ සහනාධාරය මේ ආකාරයෙන් ක්‍රියාත්මක කරන්නට රජය කැප වෙලා තිබෙනවාද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
රජය වශයෙන්, ධීවර අමාත්‍යවරයා වශයෙන් මේ සියල්ලම කවදා වෙන තෙක් තිබෙනවාද කියලා කියන්න මට බැහැ. දැනට ක්‍රියාත්මක වනවා. ජාතික ධීවර සම්මේලනයත් එක්ක කළ සාකච්ඡාවේ දී ජනාධිපතිතුමා කියලා තිබෙනවා, පුළුවන් තරම් දුරට දිගටම මෙය ක්‍රියාත්මක කරනවායි කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අඩුම ගණනේ ලබන ජනාධිපතිවරණය තෙක්?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඊට එහාට යයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඊට එහාට යනවා?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්. මොකද, තවදුරටත් ඉස්සරහට යනවා නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10-2497/'12-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

රාජ්‍ය ආයතනවලට උපාධිධාරීන් පත් කිරීම: උසස්වීම් ක්‍රමවේදයක්

අරස நிறுவனங்களில் பட்டதாரி நியமனங்கள் :பதவியுயர்வு முறைமை
APPOINNTMENT OF GRADUATES TO GOVERNMENT INSTITUTIONS : PROMOTION PROCEDURE

1974/'11

12.ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2005 වර්ෂයේ දී උපාධිධාරීන් සඳහා පත්වීම් ලබා දීමේ රජයේ වැඩ පිළිවෙළ යටතේ අධි සේවක පදනම මත රාජ්‍ය ආයතන සහ රජයේ පාසල්වල මූල්‍ය සහකාර, සංවර්ධන සහකාර හා කළමනාකරණ සහකාර ලෙස පත්වීම් ලබා දුන් බවත්;

(ii) ඔවුන් සඳහා මේ දක්වා උසස්වීම් ක්‍රමවේදයක් සකසා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රජයේ පාසල්වල සේවය කරනු ලබන ඉහත පත්වීම්ලාභීන්ට එම පාසල්වල හෝ වෙනත් පාසල්වල ගුරු පත්වීම් ලබාගැනීමේ හැකියාවක් තිබෙද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පත්වීම්ලාභීන් සඳහා උසස්වීම් ක්‍රමවේදයක් සකස් කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005 ஆம் ஆண்டில் பட்டதாரிகளுக்கு நியமனம் வழங்கும் அரசாங்கத்தின் வேலைத்திட்டத்தின் கீழ் மிகை ஊழியர் அடிப்படையில் அரச நிறுவனங்களிலும் அரச பாடசாலைகளிலும் நிதி உதவியாளர், அபிவிருத்தி உதவியாளர் மற்றும் முகாமைத்துவ உதவியாளர் என நியமனங்கள் வழங்கப்பட்டதென்பதையும்;

(ii) இவர்களுக்கு இற்றைவரை பதவியுயர்வு முறைமையொன்று உருவாக்கப்படவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) அரச பாடசாலைகளில் பணியாற்றும் மேற்படி நியமனம் பெற்றவர்களுக்கு இப்பாடசாலை களில் அல்லது வேறு பாடசாலைகளில் ஆசிரிய நியமனங்களை பெறுவதற்கான சாத்தியம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், இதற்கு பின்பற்றப்படவேண்டிய முறைமை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி நியமனம் பெற்றவர்களுக்கு பதவியு யர்வுக்கான முறைமையொன்று உருவாக்கப் படுமா என்பதையும்;

(ii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்கு மென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) under the Government programme of granting appointments to graduates, appointments as Financial Assistants, Development Assistants and Management Assistants at public institutions and government schools were granted in 2005 on supernumerary basis; and

(ii) no promotion procedure has been formulated for them up to now?

(b) Will he state -

(i) whether it is possible for those appointees serving in government schools to obtain teaching appointments to the same schools or other schools; and

(ii) if so, the procedure to be followed in that respect?

(c) Will he inform this House -

(i) whether a promotion procedure will be formulated for the aforesaid appointees; and

(ii) if so, the time frame required for that?

(d) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) 2005 වර්ෂයේදී බඳවා ගත් උපාධිධාරීන් වෙනුවෙන් උසස්වීම් ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 2010.10.16 දිනැති බඳවා ගැනීම් පටිපාටිය අනුව (ආශ්‍රිත නිලධාරි) සකස් කර අනුමැතියට යොමු කළ අතර, කැබිනට් පත්‍රිකාව 2010.08.27වන දිනැති කැබිනට් තීරණය මඟින් අනුමත කර ඇත. එකී කැබිනට් පත්‍රිකාවට අනුව කඩ ඉම් විභාග පවත්වා බඳවා ගැනීමේ පටිපාටිය අනුව කටයුතු කරමින් සිටියදී, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් සියලුම අමාත්‍යාංශවලට බඳවා ගත් උපාධිධාරීන් අන්තර්ග්‍රහණය කිරීම සඳහා වැඩසටහන් නිලධාරි සේවා ව්‍යවස්ථාව සකස් කර 2012.02.14වන දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලදි.

ඒ අනුව, අංක 01/2012 සහ 2012.05.31වන දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය මඟින් දැනුම් දී ඇත්තේ, මෙම වැඩසටහන් නිලධාරි ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන තෙක් ඒ ඒ අමාත්‍යාංශවල බඳවා ගැනීම් පටිපාටි ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලෙසයි. එම නිසා ඔවුන්ගේ බඳවා ගැනීම් පටිපාටියට අදාළ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත. උසස් වීම් ක්‍රමවේදය වැඩසටහන් නිලධාරි සේවා ව්‍යවස්ථාව අනුමත වූ පසුව ඒ අනුව සකස් වනු ඇත.

(ආ) (i) ඔව්.

(ii) ඔවුන්ට ගුරු සේවයට බැඳෙන්න පුළුවන්. ගුරු සේවා ව්‍යවස්ථාව අනුව විවෘත තරග විභාගයට පෙනී සිට සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අයට පාසල් පදනම් කර ගෙන ගුරු සේවයට බැඳෙන්න පුළුවන්. බඳවා ගැනීම් මත පවත්වන විභාග සමත්වීම හා සුදුසුකම් සපුරාලීම මත ගුරු සේවයට තේරී පත් වූ විට එම පත්වීම් භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කළ හැකිය.

(ඇ) (i) වැඩසටහන් නිලධාරි සේවා ව්‍යවස්ථාව අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ලබා දෙන උපදෙස් අනුව ඉදිරියේදී සැකසීමට නියමිතව ඇත.

(ii) එය අධ්‍යාපන අමාත්‍යාංශය නොව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් තීරණය කළ යුතු කාර්යයකි.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් තාවකාලිකව නවත්වා තිබෙන ඔබතුමා කියන මේ වැඩසටහන් නිලධාරි සේවයට මේ අය ඇතුළත් කර ගත්තාට පසුව ඒ අයට ජ්‍යෙෂ්ඨත්වය සහ වැටුප් වර්ධක ලැබෙන්නේ, මුල් බඳවා ගත් දිනයට අනුරූපවද, එහෙම නැත්නම් මෙය අනුමත වන දිනයට අනුරූපවද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

දේශපාලන වශයෙන් මට එම ප්‍රශ්නයට උත්තරයක් දෙන්න පුළුවන්කමක් නැහැ. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයත් දෙන්නා වූ උපදෙස් අනුව ඒ අමාත්‍යාංශ විසින් රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව එය තීරණය කළ යුතු වනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

2012 වර්ෂයේදී බඳවා ගත් උපාධිධාරීන් සම්බන්ධයෙනුත්, අධ්‍යාපන අමාත්‍යාංශයට ඇතුළත් වුණු අය සම්බන්ධයෙනුත් ක්‍රියාත්මක වන්නේ මේ ප්‍රතිපත්තියමද, එහෙම නැත්නම් වෙනත් ප්‍රතිපත්තියක්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මේ ප්‍රතිපත්තිය නොවෙයි. උපාධිධාරීන් කිසිවෙක් ගුරු සේවයට ඇතුළත් කර නැහැ. ඔබතුමා දන්නවා, ගුරු ව්‍යවස්ථාව අනුව ගුරු සේවයට බඳවා ගැනීමේ ක්‍රම දෙකයි තිබෙන්නේ කියලා. උපාධිධාරියෙක් විවෘත තරග විභාගයට හෝ වෙනත් විභාගයකට පෙනී සිට, ඒ විභාගයේ ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වී ගුරු සේවයට බැඳෙනවා. ඒ එක ක්‍රමයක්. දෙවන ක්‍රමය අනුව, විද්‍යා පීඨවල අවුරුදු තුනක් පුහුණුව ලැබීමෙන් පසු අභ්‍යාසලාභී ශික්ෂණ ඩිප්ලෝමාධාරියකු බවට පත්වීමෙන් පසු පමණයි ගුරු ව්‍යවස්ථාවට අනුව ගුරු සේවයට කෙනකු අනුයුක්ත කළ හැක්කේ. ඒ සඳහා වෙනත් ක්‍රමයක් නැහැ. පුරප්පාඩු තිබෙන තනතුරු සඳහා පළාත් සභාව විසින් සහ අපේ අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන විභාගවලට අභ්‍යාසලාභී උපාධිධාරීන්ට ඉදිරිපත් වෙලා ගුරු සේවයට ඇතුළු වන්න පුළුවන්. ඒ පිළිබඳව කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔවුන්ව ගුරු සේවයේ 3:1 හි පිහිටුවීමෙන් පසු, ගුරු සේවයට අදාළ උසස්වීම් යනාදිය ලැබීම ගැනත් කිසි ප්‍රශ්නයක් මතු වන්නේ නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

[ගරු බුද්ධික පතිරණ මහතා]

මෑත කාලයේ බඳවා ගත් අභ්‍යාසලාභී උපාධිධාරීන් ගුරු සේවයට අවශ්‍ය උපාධිධාරීන් බවට පත් කර ගන්න සුවිශේෂී විභාගයක් පවත්වනවාද, නැත්නම් පොදු විභාගයක් පවත්වනවාද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
සුවිශේෂී විභාගයක් නොවෙයි. අපි ලබන සතියේ ඒ සඳහා පුවත් පත් දැන්වීම් පළ කරනවා. ඒ ඒ පාසල්වල උසස් පෙළ විද්‍යා, වාණිජ, කලා, තාක්ෂණික අංශවල තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව අනුව කඩිනම් බඳවා ගැනීමේ ක්‍රියාවලියකට -කෙටි ලිඛිත පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට- මේ උපාධිධාරීන්ට සහභාගි වෙන්න පුළුවන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
කී දෙනෙක් බඳවා ගන්නවාද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව අනුව.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
තවම ගණනය කරලා නැද්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගණනය කරලා ඒ ටික පුවත් පතේ පළ කරනවා. එතකොට පුවත් පත කියවන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පත්තරයෙන් තමයි ඔක්කොම බලන්න වන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13, ගරු රවි කරුණානායක මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොට්ටාව ධර්මපාල විද්‍යාලය ළඟ මනුස්සයෙක් බෙල්ලේ වැල දමා ගන්න බලාගෙන ඉන්නවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ ගැන පොඩ්ඩක් අහන්න දෙමු නේද, නියෝජ්‍ය කථානායකතුමනි?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉතාම වැදගත් ප්‍රශ්නයක් අහන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක ඒගොල්ලන්ට වටිනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙක් තමයි එල්ලෙන්න යන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අපේ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා සහ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා එළියට ගිහිල්ලා බෙල්ලේ වැල දමා ගන්න එක ගැන කථා කර ගත්තා නම් පාරිලමේන්තුවේ කාලය ඉතිරි වනවා. දෙන්නා එක්ක එළියට ගිහිල්ලා කථා කර ගන්න.

ගරු රවි කරුණානායක මහතා ප්‍රශ්නය අහනවාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ඒ ප්‍රශ්නය අහන්න දෙන එක හොඳයි නේද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අහන්න දෙන එක හොඳයි. නමුත් වාචික ප්‍රශ්න සඳහා තව විනාඩි පහයි තිබෙන්නේ. වෙලාව නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැත්නම් ජනාධිපතිතුමා ඔබතුමා සම්බන්ධව විමර්ශනයක් තියයි, මේ ප්‍රශ්නය අහන්න දුන්නේ නැතිව ඒ පුද්ගලයා බෙල්ලේ වැල දමා ගෙන මැරුණා කියලා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ඒක හොඳ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේක ජනතාවගේ ප්‍රශ්නයක්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමන්ලා දෙන්නා එළියට ගිහිල්ලා අහන්න. [බාධා කිරීම්] හොඳයි. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඉක්මනට අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වනවා. ඔබතුමාත් දන්නවා, කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ විශාල ප්‍රශ්නයක් තිබුණු බව. මේ ප්‍රශ්නය පිළිබඳව අපි දවස් ගණනාවක් කථා කළා.

අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදීත් අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා මේ ප්‍රශ්නය ඇහුවාම කිව්වා එයට පිළිතුරක් දෙනවා කියලා. ඉත්තෑපානේ ධම්මාලංකාර නායක

හාමුදුරුවොත් මේ ගැන ජනාධිපතිතුමාට කියලා තිබුණා. නමුත් දැන් වනකොට මේ ප්‍රශ්නයට උත්තරයක් ලබා නොදීම නිසා පුද්ගලයෙක් ගසක් උඩට නැඟලා බෙල්ලේ වැල දමා ගන්න හදනවා. අධ්‍යාපන ඇමතිතුමාත් නියෝජනය කරන දිස්ත්‍රික්කයේ පාසලක් නිසා කරුණාකර මෙයට උත්තරයක් ලබා දෙන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය පළාත් සභා පාසලක්. පළාත් සභාවේ පළාත් අධ්‍යාපන අමාත්‍යතුමාත්, එම ප්‍රදේශයේ සිටින පළාත් සභා මන්ත්‍රීවරු සහ අමාත්‍යවරු මේ ප්‍රශ්නය විසඳන්නට මැදිහත් වෙලා තිබෙනවා. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත්, සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත්, මාත් මේ ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් උපදෙස් දීලා තිබෙනවා. ඒ නිසා මේ වනවිට බෙල්ලේ වැල දමා ගන්න කවුරුවත් නැහැ. ඒ පුද්ගලයා ගහෙන් බැහැලා. ඒ පුද්ගලයාගේ ජීවිතය සම්බන්ධයෙන් කිසිම අවදානමක් නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගස් නඟින ඒවා ගැන, ගහෙන් බහින ඒවා ගැන කථා කරන්න පාර්ලිමේන්තුවේ කාලය ගන්න අවශ්‍ය නැහැ.

මීළඟට 13 වැනි ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අහන්න. පරිසර හා පුනර්ජනනීය බලශක්ති ඇමතිතුමා පිළිතුරු දෙන්න. [බාධා කිරීමක්] දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, දැන් ඒ පුද්ගලයා ගහෙන් බැහැලා ලු. ඔබතුමා වාඩි වන්න. [බාධා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉතාම ඕනෑකමින් ඔබතුමාට කියනවා, මේ කථාව censor කරන්න කියලා. මොකද, ඒ අය මේ කථාව ඇහුවොත් බෙල්ලේ වැල දමා ගනීවි. ඒ නිසා කරුණාකරලා මේ කථාව දැන්ම censor කරන්න. එළියට යන්න දෙන්න එපා.

රාජ්‍ය දැව සංස්ථාව : මූල්‍ය කටයුතු
அரசாங்க மரக் கூட்டுத்தாபனம் : நிதி நடவடிக்கைகள்
STATE TIMBER CORPORATION : FINANCIAL ACTIVITIES

2205/'11

13. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) රාජ්‍ය දැව සංස්ථාවට අදාළව, පසු ගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යෙදවූ මුළු ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව සහ එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයකුගෙන් ලැබූ ලාභය කොපමණද;

(iv) රජය වෙත ගෙවන ලද අඩු කිරීම් හෝ බදු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසු ගිය වර්ෂ පහක කාලය තුළ රාජ්‍ය දැව සංස්ථාවට ලබාදුන් කවර හෝ මුදලක් කපා හරිනු ලැබුවේද;

(ii) එසේ නම්, එසේ කපා හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(iv) එය සිදු කළ දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසු ගිය වර්ෂ පහක කාලය තුළ එම මුදල් භාවිත කරන ලද ආකාරයට වඩා කාර්යක්ෂම ලෙස රාජ්‍ය දැව සංස්ථාවට එම මුදල් පරිහරණය කළ හැකිව තිබුණේද;

(ii) එසේ නම්, එය කළ හැකි ආකාරය කවරේද;

(iii) එසේ කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

සුற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) கடந்த ஐந்து ஆண்டுகளில் அரசாங்க மரக் கூட்டுத்தாபனம் தொடர்பில்,

(i) பயன்படுத்தப்பட்ட மொத்த மூலதனம் மற்றும் ஒதுக்குகள் என்பன யாவையென்பதையும்;

(ii) இலாபம் அல்லது நட்டம் எவ்வளவு என்பதையும்;

(iii) மொத்த பணியாட்டொகுதியினர் எண்ணிக்கை, கிரயம் மற்றும் ஒரு பணியாளருக்கான இலாபம் போன்றன யாதென்பதையும்;

(iv) கழிப்பனவுகள் அல்லது அரசாங்கத்திற்கு செலுத்திய அறவீடுகள் யாதென்பதையும்

வருடாந்த அடிப்படையில் கூறுவாரா?

(ஆ) (i) அரசாங்க மரக் கூட்டுத்தாபத்தின் ஏதாவது பணம் கடந்த 5 ஆண்டு காலங்களில் பதிவழிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், பதிவழிக்கப்பட்ட தொகை யாதென்பதையும்;

(iii) என்ன காரணத்திற்காக அவ்வாறு செய்யப் பட்டது என்பதனையும்;

(iv) அவ்வாறு எப்போது நடைபெற்றது என்பதையும்

அவர் கூறுவாரா?

(இ) (i) அரசாங்க மரக் கூட்டுத்தாபனம் கடந்த 5 ஆண்டு காலப்பகுதியிலே அது பணம் பயன்படுத்திய விதத்தைவிட சிறந்த முறையில் வினைத்திறனாக பயன்படுத்தியிருக்க முடியுமா என்பதையும்;

(ii) அவ்வாறாயின், அது எவ்வாறு செய்யப்படுகின்றது என்பதையும்;

(iii) இன்றேல், ஏன் அவ்வாறு செய்யப்படவில்லை என்பதையும்

அவர் சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු රවි කරුණානායක මහතා]

asked the Minister of Environment and Renewable Energy:

(a) Will he state in relation to the State Timber Corporation for the last five years on per year basis -

(i) the total capital and reserves employed;

(ii) the profit or loss;

(iii) the total staff, cost and profit per employee; and

(iv) the deduction or levies paid to the Government?

(b) Will he also state -

(i) whether any money granted to the State Timber Corporation has been written off for the last five years;

(ii) if so, the amount written off;

(iii) for what reason it was done; and

(iv) as to when it was occurred?

(c) Will he inform this House -

(i) whether the State Timber Corporation could have efficiently used the money better than the way they were used for the last five years;

(ii) if so, as to how it is done; and

(iii) if not, as to why it is not so?

(d) If not, why?

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Environment and Renewable Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රාජ්‍ය දැව සංස්ථාවට අදාළව, පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී යෙදවූ මූල ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

වර්ෂය	මූල ප්‍රාග්ධනය (රු.)	සංචිත ප්‍රමාණය (රු.)
2008	41,503,668.00	1,890,927,832.00
2009	41,503,668.00	2,249,479,914.00
2010	41,503,668.00	2,470,036,182.00
2011	41,503,668.00	2,770,993,214.00
2012	41,503,668.00	2,738,730,480.00 (පුරෝකථනය කරන ලද)

(ii) ලැබූ ලාභය පහත සඳහන් පරිදි වේ.

වර්ෂය	ලාභය (බදු අය කළ පසු) (රු.)
2008	282,039,007.00
2009	358,529,082.00
2010	220,556,268,.00
2011	300,957,032.00
2012	(32,262,737.00) (පුරෝකථනය කරන ලද)

(iii) කාර්ය මණ්ඩලයේ මූළු සේවක සංඛ්‍යාව සහ එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයකුගෙන් ලැබූ ලාභය පහත සඳහන් පරිදි වේ.

වර්ෂය	මූළු සේවක සංඛ්‍යාව	එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය (රු.)	එක් සේවකයකුගෙන් ලැබූ ලාභය (බදුවලට පෙර ලාභය මත) (රු.)
2008	2,499	341,288.00	258,920.00
2009	2,457	365,345.00	329,919.00
2010	2,346	384,446.00	374,093.00
2011	2,267	420,599.00	266,210.00
2012	2,187	448,598.00 (පුරෝකථනය කරන ලද)	259,596.00 (පුරෝකථනය කරන ලද)

(iv) රජය වෙත ගෙවන ලද බදු ප්‍රමාණයන් පහත සඳහන් පරිදි වේ.

වර්ෂය	ස්කන්ධභාගය (රු.)	අනිකුත් බදු (රු.)	එකතුව (රු.)
2008	606,864,432.00	701,226,997.00	1,308,091,429.00
2009	749,879,136.00	885,180,424.00	1,635,059,560.00
2010	758,318,131.00	1,187,541,001.00	1,945,859,132.00
2011	777,852,620.00	750,895,287.00	1,528,747,907.00
2012	831,555,555.00 (පුරෝකථනය කරන ලද)	1,240,278,414.00 (පුරෝකථනය කරන ලද)	2,071,833,969.00 (පුරෝකථනය කරන ලද)

(ආ) (i) රාජ්‍ය දැව සංස්ථාව වාණිජමය ආයතනයක් ලෙස මහා භාණ්ඩාගාරය මඟින් මූදල් ලබා ගැනීමක් සිදු නොකරයි.

(ii) ඉහත (i) අනුව අදාළ නොවේ.

(iii) ඉහත (i) අනුව අදාළ නොවේ.

(iv) ඉහත (i) අනුව අදාළ නොවේ.

(ඇ) (i) ඉහත (ආ) (i) හි පිළිතුර අනුව අදාළ නොවේ.

(ii) ඉහත (ආ) (i) හි පිළිතුර අනුව අදාළ නොවේ.

(iii) ඉහත (ආ) (i) හි පිළිතුර අනුව අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා නව අමාත්‍ය ධුරයක වැඩ භාරගෙන තිබෙන අවස්ථාවේදී කරුණාකර කියන්න පුළුවන්ද ඔය ප්‍රමාණයට තිබෙන reserves කොපමණද කියලා. මා හිතන විධියට negative reserves එහෙමත් හුහක් ඔය තුළ තිබෙනවා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

Reserve එකෙන් කොච්චරද, capital එකෙන් කොච්චරද කියලා-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Capital එක Rs. 41 million කිව්වාට ඕකේ තිබෙනවා fictitious asset එකක්, අඩු ගණනේ මිලියන 27,000ක. ඒ නිසා ඔය තිබෙන ශේෂ පත්‍රය නොවෙයි හෙළිදරවු කර තිබෙන්නේ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

අපි අවසාන ගිණුම් වාර්තාව උපදේශක කාරක සභාවට ඉදිරිපත් කර COPE එකට ගන්නවා නේ. 2011, 2012ත් දැන් සූදානම් කරලයි තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක අගය කරනවා. මේකේ සේවක පිරිස-

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
සිකුරාදා පෙර වරු 11.00ට උපදේශක කාරක සභාව රැස් වෙනවා. බොහෝ දුරට ඒකට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පළමුවන අතුරු ප්‍රශ්නය ඇහුවෙත් නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න වැලක් ඇහුවා. ගරු මන්ත්‍රීතුමනි, දැන් වෙලාව පහු වෙලායි තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, අධික සේවක පිරිසක් ඉන්නවා කියලා-

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
සේවක සංඛ්‍යාව ක්‍රමානුකූලව අඩු කරලා තිබෙනවා. 2008 වර්ෂයේ 2,499ක් වුණු සේවක සංඛ්‍යාව 2012 වන කොට 2,187 දක්වා 312කින් අඩු කර තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, හැබැයි තාවකාලිකව වැඩ කරන 780ක පිරිසක් ඉන්නවා නේද? ඒ සංඛ්‍යාවත් අඩු කරලා මේක ලාභ උපයන්න පුළුවන් මාර්ගයකට ගන්න-

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
දැනට ලාභ උපයනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැව සංස්ථාව මීට වැඩිය-

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
දැව සංස්ථාව දැනට ලාභ උපයනවා විතරක් නොවෙයි, මහා භාණ්ඩාගාරයට පසු ගිය වර්ෂයේ මිලියන 600ක් ලබා ගත්තා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ තුළින් රක්ෂා ඇති කරන්නත් පුළුවන්, ඒ වාගේම රටට ආනයනය කරන දැව ප්‍රමාණය අඩු කරන්නත් පුළුවන්. ඉතින් කරුණාකර,-

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔබතුමා සිකුරාදා උපදේශක කාරක සභාවට ඇවිත් මට අනෙක් උපදෙස් ටිකත් දෙන්න. මම ඒ ටික ක්‍රියාත්මක කරන්නම්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 14 - 2433/'12 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා තුන්වන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් ප්‍රශ්න වැලක් ඇහුවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා හිතන විධියට දැවවලින් මේක යාවි මත්තල oil ටැංකියටත්. කරුණාකර, මා අහනවා -උත්තර දෙන්න අවශ්‍ය නැහැ- oil ටැංකි තිබෙනවාද, නැද්ද කියලා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හම්බන්තොට වරාය -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වරාය නොවෙයි airport එක.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඉතින් මම මේ ගැන පැහැදිලි කරන්න එපායැ. ඒ තෙල් ටැංකි තුනෙන් එකක් ටොන් 20,000යි. අනික් තෙල් ටැංකි දෙක - supply කරන ටැංකි දෙක- ටොන් පන්දාහේ දෙකක්. එතකොට හම්බන්තොට වරායේ තිබෙන තෙල් ටැංකි සංකීර්ණයෙන් ටොන් 30,000ක සංචිතයක් පවත්වාගෙන යන්න පුළුවන්. දැන් ඒක භාවිතා කරනවා. ඉදිරි මාස තුන, මාස හය, අවුරුද්ද සඳහා දවසකට අවශ්‍ය කරන තෙල් ප්‍රමාණය -දෛනිකව අවශ්‍ය වන්නා වූ තෙල් ප්‍රමාණය- කොපමණද කියන එක සිවිල් ගුවන් සේවා

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

අමාත්‍යාංශය විසින් තෙල් සංස්ථාවට ලබා දී තිබෙනවා. එක බවුසර් එකකින් තෙල් ටොන් 33,000 බැගින් බවුසර් පහකින් දවසකට දෙවතාවක් හම්බන්තොට ඉඳලා මත්තල දක්වා ප්‍රවාහනය කරනු ලබනවා. ඒ අනුව තෙල් ලීටර් 330,000ක් දවසකට ප්‍රවාහනය කරනවා, හම්බන්තොට වරායේ සිට මත්තල ගුවන් තොටුපළ දක්වා. එතකොට දවසකට එන ගුවන් යානා සංඛ්‍යාවට අවශ්‍ය ප්‍රමාණයටත් වැඩියෙන් සංචිතයක් පවත්වාගෙන යනවා, ගුවන් තොටුපළේ තිබෙන සංචිත මඟින්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න මම කියනකම්.ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත්තල ගුවන් තොටුපළේ තෙල් සංස්ථාව මඟින්-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා ඒ ප්‍රශ්නයට පිළිතුර ලබා දුන්නා. ගරු සජිත් ප්‍රේමදාස මහතා - [බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Hon. Deputy Speaker,-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Sir, he has misled Parliament.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
No, no.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Hambantota oil tanks are meant for ships. What you have to use at Mattala Airport is aviation fuel. You cannot run planes with ship fuel. - [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව විවාද කරන්න වෙනම දිනයක් වෙන් කර ගන්න. ගරු සජිත් ප්‍රේමදාස මහතා ප්‍රශ්න අංක 14.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
Hon. Deputy Speaker, I want to explain. The Hon. Leader of the Opposition is misleading the House. - [*Interruption.]* I am not giving way. - [*Interruption.]* What I say is, there is enough stock to supply fuel to the planes landing in Mattala Airport.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, පිළිතුරු දෙන්න. ඔය උඩින් යටින් යන ඒවා පස්සේ කථා කරන්න. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. මේ පැයෙන් විනාඩි 45ක් විතර ඔබතුමා නැඟිටලා හිටියේ. දැන්වත් වාඩි වෙන්න.

ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය : විස්තර
இலங்கையின் பொருளாதார வளர்ச்சி வேகம் : விபரம்
ECONOMIC GROWTH RATE OF SRI LANKA : DETAILS

2433/'12

14. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආර්ථික වර්ධන වේගයන් සෑහීමකට පත් විය හැකි මට්ටමක පැවතියේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005ஆம் ஆண்டிலிருந்து 2011ஆம் ஆண்டு வரையான காலப்பகுதிக்குள் இலங்கையின் பொருளாதார வளர்ச்சி வேகம் ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி பொருளாதார வளர்ச்சி வேகங்கள் திருப்தியடையத்தக்க மட்டத்தில் நிலவியதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) separately the economic growth rate of Sri Lanka in each year during the period from the year 2005 up to 2011; and

(ii) whether the aforesaid economic growth rates were at a satisfactory level?

(b) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2005 සිට 2011 දක්වා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගයන් පහත වගුවේ දක්වා ඇත.

වසර	2005	2006	2007	2008	2009	2010	2011
ආර්ථික වර්ධන වේගය %	6.0	7.4	6.8	6.0	3.5	8.0	8.3

(ii) ඔව්.

ප්‍රධාන වශයෙන් ලෝක ආර්ථික අර්බුදය හේතුවෙන් මෙරට ආර්ථිකය මන්දගාමී වූ 2009 වසර හැර ශ්‍රී ලංකාව 2005 සිට 2011 වසර දක්වා සියයට 6ක හෝ ඊට වැඩි ප්‍රමාණයක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීමට සමත්ව ඇත.

2005 සිට 2011 වසර දක්වා කාලය තුළ සාමාන්‍ය වර්ධන වේගය සියයට 6.6ක් විය.

යුද්ධයක් පැවතියද මෙවැනි වර්ධනයක් ළඟා කර ගැනීම විශේෂ වේ.

2010 සිට 2011 වසරවල ආර්ථික වර්ධන වේගය පිළිවෙළින් සියයට 8ක් සහ සියයට 8.3ක් විය.

පසු ගිය වසර 60ක කාලය තුළ අඛණ්ඩව වසර දෙකක් එබඳු දැවැන්ත ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගත් පළමු අවස්ථාව එය විය.

1977 සිට 2004 දක්වා සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය වූයේ සියයට 4.8කි.

ඒ අනුව 2005 වසරේ සිට ඉහළ ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යාමට හැකිවී තිබේ.

(ආ) පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ ආර්ථික වර්ධන වේගය පිළිබඳව ඔබතුමා බොහොම උද්දාමයෙන් කථා කළා. ආර්ථික වර්ධන වේගය සංඛ්‍යා ලේඛනයකට පමණක් සීමා වුණාට හරි යන්නේ නැහැ. ඒක ජනතාවට දැනෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි මෙපමණ ආර්ථික වර්ධන වේගයක් සිදු වුණා නම් ගිය වසරේ නොවැම්බර් මාසයේ ඉඳලා මේ වසරේ මාර්තු මාසය වෙනකම් -මාස 5ක්- සමෘද්ධි සහනාධාරය වෙනුවෙන් භාණ්ඩාගාරය මුදල් වෙන් කර නැත්තේ ඇයි කියලා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, අපේ මුළු වියදම් ප්‍රමාණයත් ආදායම් ප්‍රමාණයත් සංසන්දනය කර බැලුවාම සමෘද්ධි සහනාධාරය කියන්නේ සුළු කොටසක්. මීට ටික වෙලාවකට ඉස්සර මේ සභාවේ දීපු පිළිතුරකින් අපට දැනගන්න ලැබුණා, යම් යම් ප්‍රායෝගික හේතු නිසා ඒ ගෙවීම් කරන්න බැරි වුණා, ඒවා නැවත වරක් ගෙවනවා කියලා. ඇත්තම කියනවා නම්, ගිය වර්ෂයේ අවසානයේ සිට මේ වර්ෂයේ මුල දක්වා යම් යම් ගණන් හිලවු සකස් කිරීමට අපට සිද්ධ වුණා. නමුත් අපට පුළුවන් ඔබතුමාට කියන්න, පෙබරවාරි, මාර්තු ඉඳන් ඒ සෑම ගෙවීමක්ම නියම විධියට කෙරෙනවා කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිගත්තා ගිය නොවැම්බරයේ ඉඳලා මේ මාර්තු මාසය වන කල් සමෘද්ධි සහනාධාරය පවුල් ලක්ෂ 15කට ලබා දීලා නැහැ කියලා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ තරම් මහා විශාල ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා නම්, ඔය සුළු සුළු ගණන් හිලවු එහාට මෙහාට කරන්න සිදු වුණා නම් සමෘද්ධි සහනාධාරයත් පවුල් ලක්ෂ 15කට ලබා නොදෙන මොහොතක ගොවි විශ්‍රාම වැටුප පවුල් ලක්ෂ 10කට ලබා නොදෙන්නේ ඇයි කියලා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමා, ගොවි විශ්‍රාම වැටුප ගැන අපි මේ සභාවේ බොහෝ අවස්ථාවල සාකච්ඡා කරලා තිබෙනවා. මම එහි පසු බිම ඔබතුමාට කියන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පසු බිම ඕනෑ නැහැ. මම අහපු ප්‍රශ්නයට උත්තරය දෙන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

පසු බිම නොකියා ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන එක කරන්න බැහැ නේ. මා වචනයෙන් දෙකෙන් ඒ ගැන කියන්නම්. මුල් සලාකය විධියට මාසිකව රුපියල් 500ක් ගෙවන්න තමයි ඒ ගිවිසුම අනුව තිබුණේ. නමුත් යම් යම් දේශපාලන තීරණ නිසා ඒ රුපියල් 500 රුපියල් 5,000 දක්වා ප්‍රතිලාභ හැටියට- [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැහැ, නැහැ. කොහේද රුපියල් 5,000ක් දෙන්නේ? කාටද රුපියල් 5,000ක් දෙන්නේ?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

කොහොම හරි, ඒ ප්‍රතිලාභයට වඩා ගෙවන්න පටන් ගත්තා. ඒ නිසා ඒ සංචිතයේ තිබුණු මුදල් නැති වුණා විතරක් නොවෙයි, විශාල ප්‍රමාණයක් ගෙවීමේ වගකීමකුත් දැන් තිබෙනවා. අපි දැන් ඒ මුදල් සකස් කරගෙන යනවා නව රක්ෂණ ක්‍රමයක් තුළ. ඒ ගෙවපු සියලුදෙනාත් මේකට ඇතුළත් කරලා ඒ අයට පාඩුවක්

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

නොවන විධියට ඒ ගෙවීම් කරන්න අවශ්‍ය කටයුතු කරගෙන යනවා. වැඩි කල් යන්න ඉස්සර වෙලා අපි ඒ පනත් කෙටුම්පත මේ සභාවට ගෙනෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ඇමතිතුමා පොඩ්ඩක් නිවැරැදි කරන්න ඕනෑ. රුපියල් 1,000ත් රුපියල් 4,166ත් අතර මුදලක් තමයි ගොවි විශ්‍රාම වැටුප වශයෙන් ලබා දෙන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ ගණන අනුව බැලුවාම, 4,100යි, 5,000යි අතර ලොකු වෙනසක් නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමා, ඔබතුමා උජාරුවට කිව්වා නේ, ඓතිහාසික මහා සංවර්ධන වේගයක් පවතිනවා කියලා. නමුත් අද වන කල් මාස පහක් තිස්සේ සමෘද්ධි සහනාධාරය දීලා නැහැ. ඔබතුමා ඒක පිළිගත්තා. අද වන කල් ගොවි විශ්‍රාම වැටුප ලබා දීලා නැහැ.

මම තුන්වෙනි අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් අහන්නට කැමැතියි, මහින්ද චින්තනයේ පොරොන්දු වෙලා තිබෙන පරිදි පාසල් ළමුන් 43 ලක්ෂයකට දිවා ආහාරය ලබා දෙන්න මුදල් වෙන් කරන්නේ නැද්ද කියලා?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, මහින්ද චින්තනයේ කියලා නැහැ හෙට මේ සහන ඔක්කොම ලබා දෙනවා කියලා. [බාධා කිරීම්] ඇත්ත කියන්න ඕනෑ නේ. මේ රජය පවතින කාලය ඇතුළත අපි ඒවා ක්‍රම ක්‍රමයෙන් ලබා දෙනවා. අපේ රජය කාලය තුළ ඒ සියලුම සහන ලබා දෙනවා. ඇත්තට මුහුණ දෙන්න ඕනෑ නේ.

වී අලෙවි මණ්ඩලය : වී මිලදී ගැනීම
නෙල් සන්තෙප්පඩුත්තල් සභෙ : නෙල් කොල්වනවු
PADDY MARKETING BOARD : PURCHASE OF PADDY

2498/'12

15. ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගොවීන්ගෙන් වී මිල දී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම වී තොගවලින් සහල් නිෂ්පාදනය සඳහා යොදා ගත් වී ප්‍රමාණය කොපමණද;

(iii) එකී කාල සීමාවේ දී කෘමි හානි හෝ නොසැලකිලිමත්කම යන කාරණා හේතුවෙන් වී අලෙවි මණ්ඩලයේ ගබඩා තුළදී විනාශයට පත්වූ වී ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වී අලෙවි මණ්ඩලය මිලට ගැනීමෙන් පසුව කෘමි හානි හෝ අනෙකුත් හේතූන් මත විනාශයට පත් වූ වී තොග සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2008ஆம் ஆண்டு தொடக்கம் 2011ஆம் ஆண்டு வரை விவசாயிகளிடமிருந்து நெல் கொள்வனவு செய்வதற்காக நெல் சந்தைப்படுத்தல் சபை செலவிட்டுள்ள பணத்தொகை யாதென்பதையும்;

(ii) மேற்படி நெல் கையிருப்பு மூலம் அரிசி உற்பத்தி செய்வதற்காகப் பயன்படுத்தப்பட்டுள்ள நெல்லின் அளவு யாதென்பதையும்;

(iii) குறிப்பிட்ட காலப் பகுதியில் பூச்சிகளினால் ஏற்பட்ட சேதம் மற்றும் கவனயீனம் ஆகிய காரணங்களினால் நெல் சந்தைப்படுத்தல் சபைக்குரிய களஞ்சியங்களில் அழிவடைந்த நெல்லின் பெறுமதி யாதென்பதையும்வருட வாரியாக தனித்தனியாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) நெல் சந்தைப்படுத்தல் சபை கொள்வனவு செய்ததன் பின்னர் பூச்சிகளினால் அல்லது ஏனைய காரணங்களினால் அழிவடைந்த நெல் கையிருப்பு தொடர்பாக மேற்கொள்ளப்பட்ட நடவடிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he state separately in relation to each year -

(i) the amount of money spent by the Paddy Marketing Board to purchase paddy from the farmers during the period from the year 2008 to the year 2011;

(ii) the quantity of paddy used for production of rice, out of the aforesaid paddy stocks; and

(iii) the value of the quantity of paddy that was destroyed inside the warehouses of the Paddy Marketing Board due to damage caused by pests or negligence?

(b) Will he inform this House the course of action taken regarding the stocks of paddy that were destroyed due to damage caused by pests or other causes after being purchased by the Paddy Marketing Board ?

(c) If not, why?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගොවීන්ගෙන් වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය වැය කර ඇති මුදල් ප්‍රමාණය.

කන්නය	වටිනාකම (රුපියල් මිලියන)
2008 යල	158
2008/09 මහ	1,062
2009 යල	367
2009/10 මහ	1,995
2010 යල	3,185
2010/11 මහ	98
2011 යල	2,137
එකතුව	**9,002**

(ii) මෙට්‍රික්ටොන් 54,054යි.

(iii) නොසැලකිලිමත්කම හේතුවෙන් කිසිදු වී ප්‍රමාණයක් වී අලෙවි මණ්ඩලයේ ගබඩා තුළදී විනාශයට පත් වී නොමැත. විශේෂයෙන් ස්වාභාවික විපත්, වල් අලි, වන සතුන් හා කෘමීන්ගෙන් විනාශයට පත් වූ වී ප්‍රමාණයේ වටිනාකම පහත පරිදි වේ. එය මිලදී ගත් මුළු වී තොග ප්‍රමාණයේ වටිනාකමෙහි ප්‍රතිශතයක් වශයෙන් සියයට 0.33කි. (සියයට දශම තුනයි තුනකි)

වර්ෂය	විනාශයට පත් වූ ප්‍රමාණයේ වටිනාකම (රුපියල් මිලියන)
2008	1
2009	5
2010	17
2011	7

(ආ) * එම විනාශයට පත් වූ වී තොග සමීක්ෂණය කර ඇති අතර, ඒවා සත්ව ආහාර සඳහා නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.

* මෙම ගබඩා රක්ෂණය කර ඇති බැවින් එම හානිවලට අදාළ වටිනාකම ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු යොදා ඇත.

* මෙම කෘමි හානි අඩු කර ගැනීමට සුදුසු පරිදි ධූමනය කටයුතු අවස්ථානුකූලව සිදු කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, එහි වටිනාකම කොපමණද කියලා අහලා තිබෙනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මම ඔබතුමාට කිව්වා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
2008 දී මිලියන 1යි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ. හානි වුණ වී ප්‍රමාණයේ වටිනාකම?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
හානිය තමයි මම කිව්වේ. 2008 දී මිලියන 1යි. 2009 දී මිලියන 5යි. 2010 දී මිලියන 17යි. 2011 දී මිලියන 7යි. එකතුව මිලියන 30යි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න තිබෙනවාද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම හිතන්නේ 2010 -2011 යල සහ මහ කන්නවලදී ගත්ත වී නිරීක්ෂණයට ඔබතුමා ගියා. වැලිකන්ද, සේනපුර සහ අසේලපුර යන ගබඩාවල වී කිලෝග්‍රෑම් 583,000ක් තිබිලා තිබෙනවා.

ඒ වාගේම අරලගංවිල හතේ කණුව ඉසෙඩ් ඩී ගබඩාවේ වී කිලෝ ලක්ෂ 5කට අධික ප්‍රමාණයක් ගුල්ලන්ගෙන් හා කෘමීන්ගෙන් හානි වෙලා තිබුණා. ඔබතුමා ගිහින් ඒවා නිරීක්ෂණය කර තිබුණා. මම අහන්නේ මෙච්චර කාලයක් දිගින් දිගටම මෙහෙම වී විනාශ වෙන්න දීලා මොකක්ද මේ නිලධාරීන් කළේ? ඔබතුමා ගැන නොවෙයි මට ප්‍රශ්නයක් තිබෙන්නේ. මේ නිලධාරීන් පිළිබඳවයි මට ප්‍රශ්නයක් තිබෙන්නේ. මේක දිගින් දිගටම සිද්ධ වෙන කාරණයක් ඇමතිතුමනි. ඔබතුමා කියනවා, "කිසිම දෙයක් වෙලා නැහැ. මම ඒවා බලා තිබෙන්නේ. ඔක්කොම හරි. හැබැයි, නිලධාරීන්ගේ අතේ ප්‍රශ්නයක් තිබෙනවා" කියා. පසු ගිය සතියේ අනුරාධපුරයේ වී ගන්නවා කියා ඔබතුමා කිව්වාට හැරිසන් මන්ත්‍රීතුමා ගිහින් "වෙක්" කර තිබුණා. එතකොට පෙනුණා, එතැන වී ගැනෙන්නේ නැති බව. ඔබතුමා කිව්වාට පහළ තට්ටුවේ ඉන්න අයගෙන් මේ වැඩය කෙරෙන්නේ නැහැ. මොකක්ද මේකට ඔබතුමා ගන්නා පියවර?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඇත්ත වශයෙන්ම ගං වතුරෙන් තමයි මේ හානිය වෙලා තිබෙන්නේ. මහියංගනයේ ගබඩා වගයක් තිබුණා. ඒ ගබඩා අලි කඩලා විනාශයට පත් කළා. අපි කවුරුත් දන්නා දෙයක්, ගංවතුරෙන් යම්කිසි හානියක් වූ බව. නිසි වෙලාවට ධූමනය

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

කරලා ඉවර වෙලා නිලධාරීන් ඒ වැඩ කටයුතු කර තිබෙනවා. හැබැයි, හැරිසන් මන්ත්‍රීතුමා කියපු කාරණය සම්බන්ධව ප්‍රශ්නයක් තිබුණා. ඒක සෙනසුරාදා නැත්නම් ඉරිදා දවසක්. වහාම ඒ කළමනාකරුවාගේ වැඩ තහනම් කළා. මමත් මේ කන්නයේදී කොහොම හරි අල්ලා ගන්න හිටියේ. හැරිසන් මන්ත්‍රීතුමා ගිහින් ඉවර වෙලා ඒ පරීක්ෂණය කරලා ඒ සම්බන්ධව අප දැනුවත් කළා. අපි ඒ වෙලාවේම ඔහුගේ වැඩ තහනම් කළා. ඒ වාගේම කියන්න කැමැතියි, මේ හැම ගබඩාවක්ම රක්ෂණය කර තිබෙන බව. කන්න 10ක 11ක වී තිබෙනවා. ඒ වී වෙළෙඳ පොළට දමන්න බැහැ. මොකද, වෙළෙඳ පොළේ ඇති තරම් වී තිබෙනවා.

නියඟයෙන් විශාල හානියක් වූ බව අපි දන්නවා. ඒ සම්බන්ධව ලොකු ප්‍රශ්නයක්, කුතුහලයක් තිබුණා. මාධ්‍ය මඟිනුත් ඒවා ප්‍රකාශයට පත් වුණා. සහල් හිඟයක් ඇති වෙයි කියා හිතුවා. නමුත් එහෙම වුණේ නැහැ. ජනවාරි මාසයත් හිඟයකින් තොරව ගෙවිලා ගියා. වී අලෙවි මණ්ඩලය ඒවා අලෙවි කරන්න තීරණය කළත් අපිට විකුණා ගන්න බැරි වුණා. මේක තමයි අද පවතින තත්ත්වය. අද වීවලින් ස්වයංපෝෂිත වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි අපි මේවා එළියට දමන්නේ නැත්තේ. වෙළෙඳ පොළට වී දැමුවොත් වෙළෙඳ පොළේ මිල තවත් පහළ බහිනවා. රජයක් හැටියට ගොවියා රකින්න අපිට තීන්දු තීරණ ගන්න වෙනවා. පොහොර සහනාධාරය දෙනවා වාගේම මේ සම්බන්ධවත් තීන්දු තීරණ ගන්න වෙනවා. පාඩුවක් වුණත් ගොවියා වෙනුවෙන් යම් යම් තීන්දු තීරණ ගන්න වෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇමතිතුමනි, ගොවීන්ගෙන් වී මිලදී ගැනීම සඳහා ස්ථාවර මිලක් හදා ගන්න ඕනෑ. වී නිෂ්පාදනය කර විනාශ වෙන්න දෙනවාට වැඩිය- සත්ව ආහාර සඳහාත් විශාල ප්‍රමාණයක් දීලා තිබුණා. - සත්ව ආහාරවලට දෙනවාට වැඩිය අඩු මිලට වෙළෙඳ පොළට දෙන එක වටිනවා. මම හිතන්නේ වී මිලදී ගැනීම සඳහා ස්ථාවර මිලක් ඇති කරන එකත් ආණ්ඩුවට පාඩුවක්.

දෙවනුව, ඒ මිල දී ගත් ඒවා නරක් වෙනවා නම්, එසේ නරක් වෙන්නට පෙර අඩු මිලට වෙළෙඳපොළට නිකුත් කරන එකත් මම හිතන හැටියට යම්කිසි විධියකට ආණ්ඩුවට පාඩුවක් තමයි. නමුත් ඊට වඩා අඩුවෙන් විකිණීමෙන් ආණ්ඩුවට විශාල පාඩුවක් සිද්ධ වෙනවා. දැනුත් මේ වාගේ වී තොග විශාල වශයෙන් තිබෙනවා. ඒ නිසා මේ විධියේ යම්කිසි සාධාරණත්වයක් කරන්න බලාපොරොත්තුවක් ඔබතුමාට නැද්ද? ඒ කියන්නේ ගොවියාට වාගේම පාරිභෝගිකයාටත් සලකන ක්‍රමවේදයක්.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වී තියා ගත්ත නිසා ඒවා විනාශ වෙලා නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2010-2011 ඒවා?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපි ඒ වී කොටලා වෙළෙඳ පොළට නිකුත් කර තිබෙනවා. විනාශ වෙලා තිබෙන්නේ අඩියක් විතර ගංවතුරට යට වුණ වී ටිකයි, ඒ වාගේම ලෝක ආහාර සංවිධානයෙන් අපට ලැබුණා තාප මඟින් ක්‍රියාත්මක කරන අලුත් ගබඩා ටිකයි. ඒ වී ටිකයි විතරයි. ඒ ගබඩා හදපු සමහර තැන්වලත් අඩියක් විතර යට වුණා. ඉතාමත්ම ස්වල්ප තොගයක් තමයි විනාශ වෙලා තිබෙන්නේ. දශම 3ක් පමණ. රුපියල් බිලියන 9ක වී ගන්න කොට, මිලියන 100ක විතර වී තමයි විනාශ වෙලා තිබෙන්නේ. දශම 3යි. ප්‍රතිශතයක් විධියට ගත්තාම ඔබතුමා හිතන විධියේ මහා විනාශයක් සිදු වෙලා නැහැ. මම ඒ ඉතාමත් වගකීමෙන් කියනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය ඇහුවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, දෙකයි ඇහුවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා දැන් කාලය වැඩිපුර ගිහිල්ලායි තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේකත් අහන්න ඉඩ දෙන්න.

ගරු ඇමතිතුමනි, වෙළෙඳ ඇමතිතුමා විධියට ඔබතුමා කෘෂිකර්ම ඇමතිතුමාත් එක්ක එකතු වෙලා විශාල වැඩ කොටසක් කරගෙන යනවා. ගිය සතියේ දුරකථන අංකයක් දීලා තිබෙනවා මම දැක්කා. 1977 කියන නොම්මරය තමයි දීලා තිබෙන්නේ. ඒ නොම්මරයට "කෝල්" එකක් ගත්තාම කියනවා, ලක් සතොසේ දේවල් යාවත්කාලීන කරලාත් නැහැ කියා. මේවා යාවත්කාලීන කරන්නේ කවදාද කියලා මම අහනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මේක ආරම්භ කළේ පසු ගිය සිකුරාදා. ලෝක පාරිභෝගිකයන්ගේ දිනයේ. සති දෙකක් විතර යන තෙක් මේකේ අඩු පාඩු තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක අපි පිළිගන්නවා. නමුත් ඒකේ මොකුත් නැහැ. කිසිම දෙයක් නැහැ.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නැහැයි කියන්න බැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රුපියල් තිහකුත් කපා ගත්තා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
යම් යම් අඩු පාඩු තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම දැන් පෙන්වන්නම්.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
යම් යම් අඩු පාඩු තිබෙනවා කියන එක අපි පිළිගන්නවා. පටන් ගන්න දවසේත් අපි ඒක කිව්වා. හැබැයි, මේක ඉතාමත්ම හොඳ දෙයක්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි වටය.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අහන එකට උත්තරයක් දෙන්න ඕනෑ. නැත්නම් හවසට එතුමාගේ කථාව විතරක් ටීවී එකේ යනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එහෙම නම් ඔබතුමා ටීවී එකට කියන්න. [බාධා කිරීම්]

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ආණ්ඩුවේ ඉන්න අපි නෝන්ඩි වෙනවා. ඒ නිසා අපිත් පිළිතුරු දෙන්න ඕනෑ. මෙතුමා ටීවී එකටයි කථා කරන්නේ. වැඩ නැහැ. ටීවී එකේ විතරයි වැඩ යන්නේ. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි වටය.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා සහ නියෝජ්‍ය අමාත්‍යතුමා : විදේශ සංචාර

பொருளாதார அபிவிருத்தி அமைச்சர் மற்றும் பிரதி அமைச்சர்: வெளிநாட்டு விஜயங்கள்

MINISTER AND DEPUTY MINISTER OF ECONOMIC DEVELOPMENT : FOREIGN TOURS

2202/'11

2. ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) පසු ගිය වර්ෂ දෙකක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් සහ නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් සිදු කරන ලද මුළු විදේශ සංචාර සංඛ්‍යාව වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ සංචාරය කරන ලද රටවල් කවරේද;

(iii) මෙම සංචාර සම්බන්ධයෙන් සඳහන් අරමුණ ඉටුකර ගැනීමට තිබූ අවශ්‍යතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම එක් එක් සංචාරය සඳහා අමාත්‍යතුමා හෝ නියෝජ්‍ය අමාත්‍යතුමා කැටුව ගිය නිලධාරීන් සංඛ්‍යාව සහ එම එක් එක් සංචාරය සඳහා වැය වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී සංචාර සඳහා වියදම් කරන ලද මුදල් රජයේ මුදල්ද; එසේ නැතහොත් ඉහත සඳහන් සංචාරය කරන ලද රටවල රජයන් විසින් ලබා දෙන ලද මුදල්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) கடந்த 2 வருடங்களில்,

(i) பொருளாதார அபிவிருத்தி அமைச்சரினாலும் பிரதி அமைச்சரினாலும் மேற்கொள்ளப்பட்ட வெளிநாட்டு விஜயங்கள் யாவையென்பதையும்;

(ii) விஜயம் செய்த நாடுகளின் பெயர்கள் என்னவென்பதையும்;

(iii) இவ் விஜயங்கள் தொடர்பாக நிர்ணயிக்கப்பட்ட இலக்குகள் யாவையென்பதையும் அவர் இச் சபைக்கு வருடாந்த அடிப்படையில் வெவ்வேறாகத் தெரிவிப்பாரா?

(ஆ) (i) அமைச்சருடனும் பிரதி அமைச்சருடனும் சென்ற அதிகாரிகளின் எண்ணிக்கை மற்றும் ஒவ்வொரு விஜயத்துக்கான செலவினம் போன்றன வெவ்வேறாக யாவையென்பதையும்;

(ii) மேற்குறிப்பிட்ட விஜயங்களுக்குப் பயன்படுத்தப் பட்ட நிதியானது அரச பணமா அல்லது விஜயம் செய்த நாடுகளின் அரசாங்கங்களினால் வழங் கப்பட்ட பணமா என்பதையும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform this House for the last two years on per year basis -

(i) the total number of foreign tours made by the Minister and the Deputy Minister of Economic Development separately ;

(ii) the names of the countries visited; and

(iii) the necessity to achieve the objective set in regarding the above visits?

(b) Will he state -

(i) the number of officials accompanied by the Minister and the Deputy Minister and the cost incurred for each visit separately; and

[ගරු රවි කරුණානායක මහතා]

(ii) whether the funds used for the aforesaid tours were public money or money granted by the governments of the countries visited?

(c) If not, why?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුර සභාගත කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. මම මෙතැන ඉන්නවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
වෙලාවත් එක්ක ඔබතුමාට-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වෙලාව නැහැයි කියන්නේ මොකද? ආණ්ඩුවට වෙලාව නැහැයි කියලා කියනවා. එහෙම නම් උදේ සිට හැන්දෑව වෙන තෙක් තිබුණු කාලය අඩු කළේ? කරුණාකරලා එහෙම කියන්න එපා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

අමාත්‍ය/නියෝජ්‍ය අමාත්‍ය	වර්ෂ 2011සඳහා සහභාගී වූ විදේශ සංචාර සංඛ්‍යාව	වර්ෂ 2012 සඳහා සහභාගී වූ විදේශ සංචාර සංඛ්‍යාව
ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා	නැත. ගරු ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා රජයේ වියදමින් කිසිම විදෙස් සංචාරයක යෙදී නොමැත.	
ගරු නියෝජ්‍ය අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා	03	03
ගරු නියෝජ්‍ය අමාත්‍ය මුත්තයියා මුතු සිවලිංගම් මැතිතුමා	01	02

(අ) (ii), (iii) සහ
(ආ) (i), (ii)

	වර්ෂය	සහභාගී වූ රට	සහභාගී වූ අරමුණ	කැටුව ගිය නිලධාරීන් සංඛ්‍යාව හා වැය වූ මුදල	වියදම් කළේ රජයේ මුදල්ද, අදාළ රටවල් විසින් ලබා දෙන ලද මුදල්ද
ගරු නියෝජ්‍ය අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා	2011 මාර්තු	ජර්මනිය, බර්ලින්	" ITB 2011 Travel & Tourism Fair" සඳහා සහභාගී වීම සංචාරක ව්‍යාපාරයේ දියුණුව හා සංචාරකයින් ආකර්ෂණය සඳහා දැනුවත් කිරීම මාධ්‍ය සම්මුඛ සාකච්ඡා හරහා ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රචාරණය	නිලධාරීන් ගණන -01 එම්.බී.කිරිඇල්ල මහතා, වැ.ඛ කළමනාකරණ අධ්‍යක්ෂ, සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වැය වූ මුදල රු 623,718.00	සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් මුදල් වැය කරන ලදී.
	2011 ජනවාරි	නේපාලය, කත්මන්ඩු	සංචාරක අමාත්‍යවරුන් සඳහා වූ "SAARC" තෙවැනි සම්මේලනයට හා ඒ හා බැඳුණු සංචාරක ව්‍යාපාරය සම්බන්ධ "SAARC" කාර්ය මණ්ඩලයන් සමඟ පැවැත්වූ සාකච්ඡාවට සහභාගී වීම	නිලධාරීන් ගණන -02 එස්.එස්.හෙට්ටිආරච්චි මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විපුල වනිගසේකර, සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය වැය වූ මුදල රු. 411,550/=	ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයෙන් මුදල් වෙන් කරන ලදී.
	2011 ජූනි	ඉන්දුනීසියාව	ආසියාව සඳහා සංචාරක ආචාර ධර්ම පිළිබඳ සමුළුව හ දේශීය ප්‍රජාව සඳහා එහි සමාජ ආර්ථික බලපෑම පිළිබඳ සාකච්ඡාවක් සඳහා	නිලධාරීන් ගණන -02 ආර්.ඩී.ඒ රණසිංහ මහතා, අධ්‍යක්ෂ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය කේ.ඩී.එස්.එස් වීරසේකර, සහකාර අධ්‍යක්ෂ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	ඉන්දුනීසියානු රජයෙන් අනුග්‍රහය දක්වන ලදී.
	2012 මාර්තු	ජර්මනිය, බර්ලින්	" ITB 2012 Travel & Tourism Fair" සඳහා සහභාගී වීම මාධ්‍ය සම්මුඛ සාකච්ඡා හරහා ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රචාරණය	නිලධාරීන් ගණන -01 විශාකා ගුණරත්න, කණිෂ්ඨ කළමණාකරු, වැය වූ මුදල රු. 591,950/=	සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් මුදල් වැය කරන ලදී.

	2012 සැප්තැම්බර්	දකුණු කොරියාව	ව්‍යාපාරික සාකච්ඡාවක් සඳහා	නිලධාරීන් ගණන -01 උදය කුමාර විජේතුංග මහතා පෞද්ගලික කාර්ය මණ්ඩල නිලධාරී	දකුණු කොරියානු රජයෙන් අනුග්‍රහය දක්වන ලදී.
	2012 නොවැම්බර්	චීක්සත් රාජධානිය	ලෝක සංචාරක වෙළඳපළ සඳහා සහභාගී වීම සඳහා (WTM 2012 Travel fair)	නිලධාරීන් ගණන - 02 භාග්වර ගුණරත්න මහතා, සභාපති සංචාරක සංවර්ධන අධිකාරිය, සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය අයිශ්වර්යා අමරසිංහ, කණිෂ්ඨ කළමණාකාරිනී, සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වැයවූ මුදල - රු. 1,257,650/-	සංචාරක ප්‍රවර්ධන කාර්යංශයෙන් මුදල් වැය කරන ලදී.
ගරු නියෝජ්‍ය අමාත්‍ය මුත්තයියා මුතු සිවලිංගම්	2011 ජනවාරි	ඉන්දියාව	"Pravasi Bharathiya Divas Convention" සඳහා සහභාගී වීමට	නිලධාරීන් සහභාගි වී නැත. වැය වූ මුදල රු.118,882.00	ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කරන ලදී.
	2012 ජනවාරි	ඉන්දියාව	"Pravasi Bharathiya Divas Convention" සඳහා සහභාගී වීමට	නිලධාරීන් ගණන -01 එස්. කාර්තිකා, පෞද්ගලික සහකාර වැය වූ මුදල රු. 577,667/=	ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කරන ලදී.
	2012 ජනවාරි	නේපාලය	'Second BIMSTEC Material Meeting on Poverty Alleviation' සඳහා සහභාගී වීමට	නිලධාරීන් ගණන -02 එස්. මුරලිදරන් මහතා, පෞද්ගලික වෛද්‍ය ආර්.එච්.ඩබ්.ඒ කුමාරසිරි මහතා, අධ්‍යක්ෂ වැය වූ මුදල රු. 392, 651.50/=	ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කරන ලදී.

(අ) අඩංගු නොවේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ ඇමතිතුමා; ආර්ථික සංවර්ධන ඇමතිතුමා අවුරුදු 5ක් අමාත්‍යාංශයට නායකත්වය දීලා තිබෙනවා. මේ අමාත්‍යාංශයෙන් රටට සිද්ධ වෙලා තිබෙන දේ ගැන කිව්වොත්, අවුරුදු 8ක් තිස්සේ අපනයනයන් ඊට පෙර අවුරුද්දට වඩා අඩු වෙලා තිබෙනවා. 2012 අවුරුද්දේ අපනයනය 2011 අවුරුද්දට වඩා සියයට හතයි දශම -

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අහපු ප්‍රශ්නයට තමයි මම උත්තර දීලා තිබෙන්නේ. ඔය කරුණත් ප්‍රශ්නයක් වශයෙන් අහන්න, මම උත්තර දෙන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ප්‍රශ්නය තමයි මම මේ අහන්නේ.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ඔබතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයෙන් ඔය ප්‍රශ්නය අහලා නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

හොඳයි, එහෙම නම් මම අනෙක් පැත්තෙන් අහන්නම්කෝ. ඔබතුමාගේ ඇමති කොහේවත් රටකට ගිහිල්ලා නැහැ, එම අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරු ගිහිල්ලා තිබෙනවා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ඇමති ගිහිල්ලා ඇති.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පොඩ්ඩක් ඉන්නකෝ. මම නේ ප්‍රශ්නය අහන්නේ. ඔබතුමාට උත්තර දෙන්න මම ප්‍රශ්නයක් ඇහුවා. ඒක ප්‍රධාන ප්‍රශ්නයට පරිබාහිරව යනවා නම් -

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ඔබතුමා පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුව ඕක වෙනම ප්‍රශ්නයක් වශයෙන් අහන්න. එතකොට අපි උත්තර දෙන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සම්ප්‍රදාය අනුව තමයි මම ප්‍රශ්න අහන්නේ.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ඔබතුමා දැන් අහන ප්‍රශ්නය ඔබතුමාගේ පළමු ප්‍රශ්නයට අදාළ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම දැන් අහන්න හදන ප්‍රශ්නය ඔබතුමා දන්නවාද?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
හොඳයි, අහන්න, අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ලබා දුන් පිළිතුර අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඇමති මේ රටින් පිට ගිහිල්ලා නැහැ.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගිහිල්ලා ඇති.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පොඩ්ඩක් ඉන්නකෝ. මම තවම ප්‍රශ්නය අහලා ඉවර නැහැ.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
එතුමාගේ පෞද්ගලික වියදමින් ගිහිල්ලා ඇති.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමාට එච්චර සල්ලි තිබෙනවාද?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
දන්නේ නැහැ. "ගිහිල්ලා ඇති" කියලා කිව්වේ ඒකයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තමුන්ගේ රටට ඔච්චරම ආදරෙයිද? තමන්ගේ පෞද්ගලික සල්ලිවලින් අමාත්‍යාංශයේ වැඩවලට යනවාද?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගිහින් තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම හොඳයි.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
අපි යන්නේ පෞද්ගලික සල්ලිවලින්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි, අමාත්‍යාංශයේ සල්ලිවලින් ගිහිල්ලා නැහැ. එහෙම ගිහිල්ලා නැති නිසා තමයි මේ රටේ ආර්ථිකය කඩා වැටිලා ගිය අවුරුද්දේ අපනයනය සියයට 7.4කින් අඩු වෙලා තිබෙන්නේ. ඒ වාගේ අවුරුදු 9ක්ම මේ රටේ අපනයනය අඩු වෙලා තිබෙනවා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලා ආර්ථිකය පිළිබඳ විශේෂඥයෝ නම් අවුරුදු 20ක් ඔය පැත්තේ ඉන්නේ නැහැ නේ. ඒ අදක්ෂතාව නිසා තමයි අවුරුදු 20ක් තිස්සේ ඔය පැත්තේ වේළි වේළි ඉන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපෙයි ඔබතුමන්ලාගෙයි වෙනස මේකයි. ඔබතුමන්ලා බොරු කරලා දැන් බොරුව හෙළිදරවු වෙලා තිබෙනවා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ්சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ඒ නිසා ඒ ගැන කථා කරන්න එපා. ඔබතුමන්ලා කථා කරනවා විතරයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි බොරු කරන්නේ නැහැ. අපි සැබෑ තත්ත්වය පෙන්නලා හෙට අනිද්දා වෙන කොට ඔය පැත්තට ආවාම අපි අවුරුදු 50ක් ඔය පැත්තේ ඉන්නවා, ඔබතුමන්ලා අනා ගන්න විධියට.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
අවුරුදු 20ක් තිස්සේ වේළි වේළී ඉන්නවා. ඔබතුමා ඔච්චර දක්ෂ නම් මේ පැත්තේ ඉන්න එපායැ. දුන්නු අවුරුදු දෙකේත් ඉන්න බැරි වුණා. දැන් අවුරුදු 20ක් තිස්සේ වේළි වේළී ඉන්නවා. ඉතින් ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන්, වෛරයෙන් කථා කරන්නේ නැතිව ප්‍රශ්නය අහන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට ප්‍රශ්න දෙකම දෙන්නේ මේ පැත්තෙන් පැනපු දෙන්නෙක්. අහන්නෙත් ඔහු, පනින්නෙත් ඔහු.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් ප්‍රශ්න අහලා ඉවරයි නේද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අහලා ඉවර නැහැ. මම පළමුවැනි අතුරු ප්‍රශ්නය ඇහුවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තව එක ප්‍රශ්නයක් අහන්න. ඊට පස්සේ අපි නවත්වමු.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි, discount එකක් දෙන්නේ නැද්ද?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
අහන්න දෙයක් නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, what is your point of Order?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සියයට 33ක discount එකක් දෙනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I move for the closure of Question Time because now the time is 2.29 p.m. You cannot go ahead.- [*Interruption*.] There would not be enough time for the other Items. The Members must be given ample time to speak on the Debate on the Customs (Amendment) Bill that is to be taken up. This is against the Standing Orders also.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අහන අතුරු ප්‍රශ්න එකක්වත් මුල් ප්‍රශ්නයට අදාළ ප්‍රශ්න නොවෙයි. ඒවා හරියාකාරව අහනවා නම් උත්තර දෙන්නට පුළුවන්. මේ අහන අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්න අප බැඳී නැහැ.

කුරුණෑගල ශික්ෂණ රෝහලේ හෘද ඒකකය: ශල්‍යාගාරය

குருநாகல் போதனா மருத்துவமனை இருதயநோய்ப் பிரிவு : சத்திரசிகிச்சைக் கூடம்

CARDIAC UNIT OF KURUNEGALA TEACHING HOSPITAL : OPERATING THEATRE

2973/'12

5. ගරු අජිත් පී. පෙරේරා මහතා (ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවට)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மாண்புமிகு அகில விராஜ் காரியவசம் சார்பாக)
(The Hon. Ajith P. Perera on behalf of the Hon. Akila Viraj Kariyawasam)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) හෘද ශල්‍යාකර්ම සිදු කිරීමට අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ හා ඖෂධ නොමැති වීම සහ 2008 වර්ෂයේදී ඉදි කළ හෘද ඒකකයේ ශල්‍යාගාරය මේ වනතුරුත් ස්ථාපිත නොකිරීම යන හේතු නිසාවෙන් කුරුණෑගල ශික්ෂණ රෝහලේ හෘද රෝග ශල්‍ය විශේෂඥ වෛද්‍යවරුන් එම රෝහලෙන් ඉවත්ව ගොස් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල ශික්ෂණ රෝහලේ ඉදි කළ හෘද ඒකකයේ ශල්‍යාගාරය විවෘත කරන දිනය කවරේද;

(ii) එම රෝහලේ හෘද ශල්‍යාකර්ම සිදු කිරීම සඳහා හිඟ වී ඇති වෛද්‍ය උපකරණ හා ඖෂධ පිළිබඳව වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) හෘද ශල්‍යාකර්ම සිදු කරනු ලබන සියලුම රෝහල්වල පවතින අඩු පාඩු සොයා බලා, අදාළ ඖෂධ හා උපකරණ ලබා දී අසරණ හෘද රෝගීන්ගේ ජීවිත බේරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) இருதய சத்திரசிகிச்சை மேற்கொள்ளவதற்காக அத்தி யாவசியமான மருத்துவ உபகரணங்கள் மற்றும் மருந்துகள் இன்மை மற்றும் 2008ஆம் ஆண்டு நிர்மாணிக்கப்பட்ட இருதய நோய்ப் பிரிவின் சத்திர சிகிச்சைக் கூடம் இன்றுவரை நிறுவப்படாமை ஆகிய காரணங்களால் குருநாகல் போதனா மருத்துவமனை யின் இருதயநோய் சத்திர சிகிச்சை மருத்துவ நிபுணர்கள் மேற்படி மருத்துவமனையிலிருந்து வெளியேறியுள்ளனர் என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) குருநாகல் போதனா மருத்துவமனையில் நிர் மாணிக்கப்பட்டுள்ள இருதயநோய்ப் பிரிவின் சத்திரசிகிச்சைக் கூடம் திறந்துவைக்கப்படும் திகதி யாதென்பதையும்;

(ii) மேற்படி மருத்துவமனையில் இருதய சத்திர சிகிச்சைகளை மேற்கொள்வதற்கு பற்றாக்குறை யாகவுள்ள மருத்துவ உபகரணங்கள் மற்றும் மருந்துகள் தொடர்பான அறிக்கையொன்றைப் பெற்றுக்கொள்ள நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) இருதய சத்திரசிகிச்சைகளை மேற்கொள்ளும் சகல மருத்துவமனைகளிலும் காணப்படுகின்ற குறைபாடுகளை ஆராய்ந்து சம்பந்தப்பட்ட மருந்துகள் மற்றும் உபகரணங்களை வழங்கி அப்பாவி இருதய நோயாளர்களை காப்பாற்ற நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that Consultant Cardiologists attached to the Kurunegala Teaching Hospital have left the hospital, owing to the non-availability of essential medical appliances and medicines required to perform cardiac surgeries and the non-functioning of the operating theatre constructed in the cardiac unit in the year 2008, up to now?

(b) Will he inform this House -

(i) the date on which the operating theatre constructed in the cardiac unit of the Kurunegala Teaching Hospital will be opened ;

(ii) whether action will be taken to obtain a report relating to the non-availability of medical appliances and medicines required for performing cardiac surgeries at the aforesaid hospital; and

(iii) whether arrangements will be made to save the lives of the innocent patients by making a survey of the shortcomings in all hospitals where cardiac surgeries are performed and making the required medicines and appliances available to them?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) හෘද ශල්‍යාගාර ඒකකයෙහි නිමවීම් කටයුතු මූල්‍යමය ගැටලුකාරී තත්ත්වයන් මත තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් කුරුණෑගල ශික්ෂණ රෝහලට මෙතෙක් හෘද හා උරස් ශල්‍යකර්ම පිළිබඳ වෛද්‍යවරයෙක් අනුයුක්ත කර නැත.

(ආ) (i) ඉදිකිරීම් කටයුතු නිම වන තෙක් විවෘත කරන දිනයක් දැනුම් දිය නොහැක.

(ii) වෛද්‍ය උපකරණ හෝ ඖෂධවල හිඟයක් නොමැත.

(iii) ඔව්.

දෛනිකව සිදු කෙරෙන හෘද සැත්කම් ප්‍රමාණය ඉහළ නංවා රෝගීන්ට සහන සැලසීමේ ක්‍රියා පිළිවෙතක් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නියමු ව්‍යාපෘතියක් ලෙස කරාපිටිය ශික්ෂණ රෝහල, මහනුවර ශික්ෂණ රෝහල සහ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල යන රෝහල් ආශ්‍රිතව ක්‍රියාත්මක කර ඇත.

(ඇ) පැන නොනඟී.

උතුරු නැඟෙනහිර පළාත් පාලන සේවා සංවර්ධන ව්‍යාපෘතිය : වැය කළ මුදල
வடக்கு, கிழக்கு உள்ளூராட்சி சேவைகள் அபிவிருத்திக் கருத்திட்டம் : செலவிட்ட பணம்
NORTH-EAST LOCAL GOVERNMENT SERVICE IMPROVEMENT PROJECT : MONEY SPENT

3169/'12

6. ඒ. විනායගමූර්ති මහතා (ගරු ඊ. සරවනපවන් මහතා වෙනුවට)
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி - மாண்புமிகு ஈ. சரவணபவன் சார்பாக)
(The Hon. E. Saravanapavan on behalf of the Hon. E. Saravanapavan)

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) උතුරු නැඟෙනහිර පළාත් පාලන සේවා සංවර්ධන ව්‍යාපෘතිය (NELSIP) මඟින් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා උතුරු හා නැඟෙනහිර පළාත් වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ එක් එක් පළාත් පාලන ආයතනය විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඇතැම් යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන් විසින් වෙනස් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, වෙනස් කර ඇති එම යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) வடக்கு — கிழக்கு உள்ளூராட்சி சேவைகள் அபிவிருத்திக் கருத்திட்டத்தின் மூலம் (NELSIP) 2010 ஆம் ஆண்டு முதல் 2012 ஆம் ஆண்டு வரை வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களுக்காக செலவழிக்கப் பட்டுள்ள பணத்தொகை வெவ்வேறாக யாது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்குறிப்பிடப்பட்ட கருத்திட்டத்தின் கீழ் ஒவ் வொரு உள்ளூராட்சி நிறுவனத்தினாலும் தயா ரிக்கப்பட்டு முன்வைக்கப்பட்ட சில பிரே ரணைகள் மாவட்ட இணைப்பாளர் குழுவின் இணைத்தலைவர்களால் மாற்றப்பட்டுள்ளது என்பதை அறிவாரா;

(ii) ஆமெனில், மாற்றப்பட்டுள்ள குறித்த பிரே ரணைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state separately, the amount of money spent for the Northern and the Eastern Provinces from the year 2010 up to 2012 by the North-East Local Government Service Improvement Project (NELSIP)?

(b) Will he inform this House -

(i) whether he is aware that certain proposals prepared and submitted by each of the Local Government Institutions under the aforesaid project have been changed by the co-chairmen of the District Co-ordinating Committees ; and

(ii) if so, what the proposals that have been changed are?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ව්‍යාපෘතියේ කටයුතු 2011 වසරේ සිට ආරම්භ විය. ඒ අනුව ව්‍යාපෘතියේ වියදම් ඒ ඒ පළාත් අනුව පහත දක්වා ඇත.

පළාත	මුළු ව්‍යාපෘති කාලසීමාව සඳහා වෙන් කළ මුදල රු.මී.	2012 වසර වන විට මුළු වියදම රු.මී.	මුළු ව්‍යාපෘති කාලසීමාව සඳහා වෙන් කළ මුදලින් දැනට වියදම
නැඟෙනහිර පළාත	4,681.71	1,911.43	39.48%
උතුරු පළාත	3,626.43	1,148.67	27.24%
එකතුව	8,308.14	3,060.10	33.36%

	2011 වසර		2012 වසර	
	වෙන්කළ මුදල	වියදම මුදල	වෙන්කළ මුදල	වියදම මුදල
නැඟෙනහිර පළාත	1,405.00	62.86	2,107.00	1,848.57
උතුරු පළාත	1,088.00	160.67	1,632.00	988.00
එකතුව	2,493.00	222.53	3,739.00	2,636.47

(ආ) (i) දිස්ත්‍රික් සභාපතිවරුන් විසින් යෝජනා වෙනස් කර නැත.

මෙම ව්‍යාපෘතියේ සැලැස්මට අනුව උප ව්‍යාපෘති තෝරා ගනු ලබන ක්‍රමවේදය පහත පරිදි වේ.

* පළාත් පාලන ආයතනයේ සහභාගිත්ව සංවර්ධන සැලැස්මේ අන්තර්ගත ව්‍යාපෘතියක් වීම
* ප්‍රාදේශීය සංවර්ධන කමිටු අනුමතිය ලබා ගැනීම
* දිස්ත්‍රික් සංවර්ධන කමිටු අනුමතිය ලබා ගැනීම
* පළාත් සැලසුම් කමිටු අනුමතිය ලබා ගැනීම
* ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ එකඟතාවය ලබා ගැනීම.

පළාත් පාලන ආයතනයේ සහභාගිත්ව සංවර්ධන සැලැස්මේ ප්‍රමුඛතා පදනම මත ව්‍යාපෘති තෝරා ගැනීම සිදු කරනු ලැබේ. නමුත්, සමහර පළාත් පාලන ආයතන මගින් අඩු ප්‍රමුඛතාවක් පවතින ගොඩනැඟිලි ඉදි කිරීම් සම්බන්ධ යෝජනා ඉදිරිපත් කර ඇතත්, රජයේ වෙනත් ව්‍යාපෘති මගින් අවශ්‍ය ගොඩනැඟිලි ඉදි කිරීම කරනු ලබයි. ඒ අනුව මහජනතාවගේ අවශ්‍යතාව පරිදි පළාත් පාලන ආයතනයේ සහභාගිත්ව සංවර්ධන සැලැස්මේ ප්‍රමුඛතා ලැයිස්තුවේ සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

2012 වසර සඳහා උතුරු හා නැඟෙනහිර දෙපළාතේම පළාත් පාලන ආයතන 79 සඳහා ම මුදල් වෙන් කර ඇත. ඒ සඳහා වන ව්‍යාපෘති හඳුනා ගෙන ක්‍රියාත්මක කරමින් පවතී. වෙන් කරන ලද මුදල් වියදම් නොවීම හේතුවෙන් පළාත් පාලන ආයතන ගිණුම්වල අනවශ්‍ය ලෙස මුදල් තැන්පත් වීම වැළැක්වීම සඳහා මුදල් අමාත්‍යාංශයේද උපදෙස් පරිදි අවශ්‍යතාවය පරිදි පළාත් පාලන කොමසාරිස් විසින් මුදල් නිදහස් කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.

(ii) යෝජනා වෙනස් කර නැත. එබැවින් අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහල: ආහාර සැපයීම
அம்பலாங்கொடை மாவட்ட மருத்துவமனை : உணவு வழங்கல்
AMBALANGODA DISTRICT HOSPITAL : FOOD SUPPLY

2974/'12

11. ගරු අජිත් පී. පෙරේරා මහතා (ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවට)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மாண்புமிகு அகில விராஜ் காரியவசம் சார்பாக)
(The Hon. Ajith P. Perera on behalf of the Hon. Akila Viraj Kariyawasam)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහලේ 2012 අගෝස්තු මාසයේ දින තුනකදී ආහාර සැපයීම පිළිබඳ අර්බුදයක් නිර්මාණය වී තිබූ බවත්;

(ii) ආහාර සැපයීමේ ටෙන්ඩරය විධිමත් ආකාරයෙන් ලබා නොදීම ඊට හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(ආ) (i) 2012 ජූලි 01 දින සිට අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහලේ ආහාර සැපයීම සඳහා ලබා දුන් ටෙන්ඩරය අහෝසි කිරීමට හේතු කවරේද;

(ii) ආහාර සැපයීමේ ටෙන්ඩරය ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය කවරේද;

(iii) අම්බලන්ගොඩ දිසා රෝහලේ ඇති වූ එම ගැටලුව පිළිබඳ සොයා බලා නැවත එවැනි තත්ත්වයක් මතු නොවන ආකාරයට විධිමත්ව කටයුතු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාර අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) අම්පලාන්කොටෙ මාවට්ට මරුත්තුවමනෙයිල් 2012ආම් ආන්ඩු ආකස්ට් මාතත්තිල් මූන්රු තිනංකළිල් උණවු වළංකල් තොටර්පාක නෙරුක්කටියොන්රු තෝන්රියිරුන්තතු එන්පතෙයුම්;

(ii) උණවු වළංකලුක්කාන කේල්විමනු මුරෙයාන විතත්තිල් වළංකප්පටාමෙයේ අතර්කුක් කාරණමායිරුන්තතෙන්පතෙයුම්

අවර් අරිවාරා?

(ආ) (i) 2012 යූලෙ මාතම් 01ආම් තිකතියිලිරුන්තු අම්පලාන්කොටෙ මාවට්ට මරුත්තුවමනෙයිල් උණවු වළංකලුක්කාක වළංකප්පට්ටිරුන්ත කේල්විමනුවෙ ඉරත්තුච්චෙය්වතර්කාන කාරණංකළ් යාවෙ එන්පතෙයුම්;

(ii) උණවු වළංකලුක්කාන කේල්විමනු වළංකප්පුම්පෝතු කටෙප්පිටික්කප්පටුකින්ර චෙයල් නටෙමුරෙ යාතෙන්පතෙයුම්;

(iii) අම්පලාන්කොටෙ මාවට්ට මරුත්තුවමනෙයිල් ඒර්පට්ට මේර්පටි පිරච්චිනෙ තොටර්පාක ආරාය්න්තු ඉව්වාරාන ඔරු නිලෙමෙ මීන්ටුම් ඒර්පටාතිරුක්ක මුරෙසාර්න්ත විතත්තිල් චෙයලාර්රුවතර්කු නටවටික්කෙ එටුප්පාරා එන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Health:

(a) Is he aware -

(i) that there was a problem with regard to the provision of food for three days in the Ambalangoda District Hospital in August 2012; and

(ii) this problem cropped up as a result of the tender relating to the supply of food being granted in an improper manner?

(b) Will he state -

(i) the reasons for the cancellation of the tender awarded on 1st July 2012 for the supply of food of the Ambalangoda District Hospital ;

(ii) the procedure followed in granting the food supply tender ; and

(iii) whether steps will be taken to look into the above mentioned problem that cropped up in the Ambalangoda District Hospital in order to avoid recurrence of a situation of that type?

(c) If n ot, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් එවන ලද වාර්තාවට අනුව-

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කර පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශයේ අනුමැතියට යොමු කර ඇති අතර මිල ගණන් අධික බව තීරණය වීම නිසා නැවත ටෙන්ඩර් කැඳවන ලදී.

(ii) පුවත් පත් දැන්වීමක් පළ කර ටෙන්ඩර් කැඳවා ටෙන්ඩර් මණ්ඩලයකට ඉදිරිපත් කර ඒ සඳහා ආහාර ඇගයීම් කමිටු වාර්තාවක් ලබා ගනී. පසුව ඒ සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කෙරෙයි.

(iii) ඔව්.

(ඇ) පැන නොනගී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ස්ථාවර නියෝග 23(2) යටතේ නහනු ලබන ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

දකුණු ඉන්දියාවේදී භික්ෂූන් වහන්සේ ප්‍රමුඛ ශ්‍රී ලාංකිකයන්ට පහර දීම
தென்னிந்தியாவில் பௌத்த பிக்குகள் உட்பட இலங்கையர் மீதான தாக்குதல்கள்
ATTACKS ON SRI LANKANS IN SOUTH INDIA INCLUDING BUDDHIST MONKS

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23/2 යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

දකුණු ඉන්දියාවේ සංචාරය කරන භික්ෂූන් වහන්සේ ප්‍රමුඛ ශ්‍රී ලාංකිකයන්ට එල්ල කෙරෙන පහර දීම් හේතුවෙන් උද්ගත වී ඇති තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කිරීමට අපේක්ෂා කරනවා. දින තුනක කාලය තුළ දකුණු ඉන්දියාවේදී බෞද්ධ භික්ෂූන් වහන්සේට සිදු කෙරුණු දෙවැනි පහර දීමත් පසු ගිය 18වැනි සඳුදා ජනමාධ්‍ය විසින් වාර්තා කළා. මෙම පහර දීම් හුදෙකලාව හට ගත් සිදු වීම් නොව දකුණු ඉන්දියාව තුළ ක්‍රමිකව වර්ධනය වන ශ්‍රී ලංකා විරෝධයේ ප්‍රකාශයනුයි.

පසු ගිය වසරක කාලය සැලකුවහොත් 2012 ජනවාරි මාසයේදී මෙම සභාවේ මන්ත්‍රීවරියකගේ සැමියා දකුණු ඉන්දියාවේදී පහර කෑමට ලක් වී තිබුණා. නැවතත් එම වසරේ සැප්තැම්බර් 02වැනි දා චෙන්නායි නේරු ක්‍රීඩාංගණයේ සුහද පාපන්දු තරගාවලියකට ගිය ශ්‍රී ලංකා පාසල් කණ්ඩායමක් අපහසුතාවකට පත් කරනු ලැබ ආපසු හරවා එවනු ලැබුවා. පසු දින තන්ජාවූර් කතෝලික දේවස්ථානය වැඳීමට ගිය ශ්‍රී ලාංකිකයන් පිරිසකට පහර දෙනු ලැබුවා. නැවතත් හතර 04වැනි දින වේලක්කර්නි දේවස්ථානය වැඳීමට ගිය ශ්‍රී ලාකිකයන් 180කට ආසන්න පිරිසක් රැගත් බස් රථ 07කට පහර දෙනු ලැබ පොලීසිය විසින් හරවා එවනු ලැබුවා. පසු ගිය පෙබරවාරි 06වැනි දින මදුරාසියේ ඕහින් ලංකා ගුවන් සේවා කාර්යාලයට පහර දෙනු ලැබුවා. පෙබරවාරි 26 වැනි දින වේලක්කර්නි දේවස්ථානය වැඳීමට ගිය ශ්‍රී ලාංකිකයන් 75 දෙනෙකු හරවා එවනු ලැබුවා. මාර්තු 16වන දින දිල්ලි සරසවියේ අධ්‍යාපනය ලබන සිටි ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේ නමකට තන්ජවූර් කෝවිලේ අධ්‍යයන කටයුතුවල යෙදී සිටියදී පහර දීමේ සිදු වීම සහ මාර්තු 18වැනි දින චෙන්නායි දුම්රිය පොළේදී භික්ෂූන් වහන්සේ නමකට පහරදීම හා වන්දනා නඩයක් හරවා යැවීමේ සිදු වීම ආසන්නතම සිදුවීම් ද්විත්වයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පහරදීම් ඇතුළු ශ්‍රී ලාකිකයන් ඉන්දියාවේදී අපහසුතාවට ලක් වීම පිළිබඳව ශ්‍රී ලංකා ආණ්ඩුව ප්‍රමාණවත් රාජ්‍ය තාන්ත්‍රික පියවරයන් නොගැනීම නිසා මේ දක්වා තත්ත්වය වර්ධනය කරවා ඇති බව ඉහත සිදුවීම් විසින් පෙන්වා දෙනවා. එසේම ඉන්දියාවේ සංචාරය කිරීම ශ්‍රී ලාකිකයන්ට අනතුරුදායක බවට අනතුරු ඇඟවීමට මේ දක්වා ආණ්ඩුව අසමත් වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "තමිල්නාඩුවේ සංචාරය කිරීම අවදානම් සහගත බැවින් ශ්‍රී ලාංකිකයන් එහි සංචාරය නොකළ යුතු බව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා 'රිවිරට' පැවසීය" කියා ඒ පුවත් පතේ සඳහන් වී තිබෙනවා. විටින් විට මාරු වන ස්ථාවරයන් තිබෙන නිසා මා ඔබතුමාගෙන් දැන ගන්නට කැමතියි, මේක විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථාවරයද එහෙම නැත්නම් ආරක්ෂක අමාත්‍යාංශයේ ස්ථාවරයද, රාජ්‍ය ස්ථාවරයද කියා. ප්‍රධාන ශීර්ෂ පාඨය සහිතව අද පුවත් පතක මෙය වාර්තා කර තිබෙන නිසායි මම විශේෂයෙන් ඔබතුමාගෙන් අහන්නේ.

එසේම ඉන්දියාවේ සංචාරය කිරීම ශ්‍රී ලාංකිකයන්ට අනතුරුදායක බවට අනතුරු ඇඟවීමට මේ දක්වා ආණ්ඩුව අසමත් වී තිබෙනවා. මා ඊයේයි මේ ප්‍රශ්නය භාර දුන්නේ. අද වෙනකොට ඒක අදාළ වන්නේ නැහැ.

විශේෂයෙන් දකුණු ඉන්දීය දේශපාලකයන් විසින් දිගින් දිගටම ශ්‍රී ලාංකිකයන්ට එරෙහිව ජනතාව උසිගන්වමින් සිටින තත්ත්වයක් තුළ මෙවැනි සිදුවීම්වලට වඩා බරපතළ සිදුවීම් වුවත් ඉදිරියේ ඇති වීමේ ඉඩකඩක් පවතිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක හාමුදුරුවන් වහන්සේ නමකට පහර දුන් ආකාරය අප රූපවාහිනියෙන් දුටුවා.

පසුපස හඹා යමින්, බිම වැටී සිටියදී නැවත පහර දුන්නා. රූපවාහිනී නාලිකාවල පෙන්වූ ආකාරයට, ඒ හාමුදුරුවන් වහන්සේට දුම්රිය පළෙන් පිටත්ව යෑමට සිදු වූයේ යම් වෙස්වලා ගැනීමක් හරහායි. අපේ ස්වාමීන් වහන්සේලාට මෙවැනි තත්ත්වයන් ඇති වීම ගැන අපේ රජය ගන්නා ස්ථාවරය මොකක්ද කියලා මා දන්නේ නැහැ. එය පාර්ලිමේන්තුවට පැහැදිලි කළ යුතු වනවා. ඒ නිසා මේ තත්ත්වය තවත් අභිතකර තත්ත්වයන් දක්වා වර්ධනය වීමේ අනතුරකට මේ වන විට පත් වී තිබෙනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අපේ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් මෙම සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

01. ශ්‍රී ලාංකිකයන් ඉන්දියාවේදී අපහසුතාවට ලක්වීමේ එක් එක් සිදුවීම පිළිබඳව -මා සඳහන් කරන ලද සිදුවීම්වලට අමතරවත් සිදු වීමක් වෙලා තිබෙනවා. මාධ්‍ය වාර්තා කර තිබෙන ආකාරයට ලංකා බැංකුවේ ශාඛා කාර්යාලයකටත් පහර දීමක් සිදු වෙලා තිබෙනවා. මේ සියලු සිදුවීම් සම්බන්ධයෙන්- මේ දක්වා ගනු ලැබ ඇති පියවර කවරේද? එක් එක් සිද්ධිය සම්බන්ධයෙන් වෙන් වෙන්ව මේ සභාව හමුවේ ගරු ඇමතිතුමා කරුණු දක්වනු ඇතැයි මා බලාපොරොත්තු වනවා.

02. ඕහින් ලංකා කාර්යාලයට සිදු කරන ලද පහරදීම පිළිබඳව හානි තක්සේරුවක් කර තිබෙනවාද? එසේ නම් එය කොපමණද?

03. එම තත්ත්වයන් වැළැක්වීම සඳහා ගනු ලැබ ඇති හා ගැනීමට අපේක්ෂා කරන රාජ්‍යතාන්ත්‍රික පියවර මොනවාද?

04. ශ්‍රී ලාංකිකයන් දකුණු ඉන්දියාවේ සංචාරය කිරීම අනතුරුදායක බව පිළිගනු ලබන්නේද?

මේ කරුණු පිළිබඳව ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවට කරුණු දක්වනු ඇතැයි බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)

(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඇසූ දකුණු ඉන්දියාවේ දී ශ්‍රී ලාංකිකයන්ට මුහුණ පාන්නට වන ගැහැට සහ ශ්‍රී ලංකා රජයේ දේපළවලට ඇති වූ අලාභ හානි පිළිබඳ ප්‍රශ්නය ඉතා කාලෝචිත යැයි මා සිතනවා. ඒ මන්ද යත්, දකුණු ඉන්දියාවේදී ශ්‍රී ලාංකික සංචාරකයන් සම්බන්ධයෙන් ඇති වූ සිදුවීම්වලට පැහැදිලි පිළිතුරක් ලබා දීමටත්, එම සිදුවීම් විෂයයෙහි ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳවත් පැහැදිලි කිරීමට එමඟින් අවස්ථාව සැලසෙන නිසා. ඒ නිසා මේ ප්‍රශ්නය ඇසීම ගැන ගරු මන්ත්‍රීතුමාට මා කෘතඥ වනවා.

ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ, පසු ගිය වකවානුවේ දී ශ්‍රී ලාංකිකයන් සහ ශ්‍රී ලංකා රජයේ දේපළ සම්බන්ධව දකුණු ඉන්දියාවේ දී ඇති වූ සිද්ධීන් විස්තරාත්මකව සඳහන් වූ නිසා ඒ සිදුවීම් නැවත වරක් මෙහිදී සඳහන් කිරීම වෙනුවට එම සිද්ධීන් සම්බන්ධව රජය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග පිළිබඳ පැහැදිලි විස්තරයක් කිරීමට මා අදහස් කරනවා. මා විශ්වාස කරනවා, ඒක වඩාත් ප්‍රයෝජනවත් වෙයි කියා.

ඉන්දියාවේ දී ශ්‍රී ලාංකිකයන් සම්බන්ධව ඇති වූ සෑම සිදුවීමක්ම -එය කුඩා හෝ විශාල හෝ වේවා, එක් පුද්ගලයකු විෂයෙහි වූවක් හෝ වේවා, කණ්ඩායමක් විෂයෙහි වූවක් හෝ වේවා- නව දිල්ලියේ ඇති ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය

[ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා]

සහ චෙන්නායි නුවර පිහිටි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය මඟින් ඉන්දීය මධ්‍යම ආණ්ඩුවටත්, ප්‍රාන්ත රජයේ බලධාරින්ටත් සෑම විටම දැනුම් දී තිබෙන බව මේ ගරු සභාවට මා කියන්නට කැමැතියි.

ඉන්දියාවට පැමිණෙන ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව තහවුරු කරන ලෙසටත්, ශ්‍රී ලංකා රජයට අයත් දේපළ ආරක්ෂා කරන ලෙසටත් එසේ දැනුම් දුන් සෑම අවස්ථාවකම අප ඉන්දීය රජයෙන් ඉල්ලා සිටියා.

මෙම ඉල්ලීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගත හැකි උපරිම පියවර ගන්නා බවට ඉන්දීය රජය සහතික වී තිබෙන අතර, ශ්‍රී ලංකා රජයට අයත් දේපළ ආරක්ෂා කිරීම සඳහා ඉන්දීය ආරක්ෂක අංශ යොදවා තිබෙන බව මා කියන්නට කැමැතියි.

පසු ගිය වකවානුවේ දී ශ්‍රී ලාංකිකයන් සම්බන්ධව ඇති වූ සිද්ධීන්වලට සම්බන්ධ පුද්ගලයන් හඳුනා ගෙන ඇති අතර, ඔවුන් නීතිය ඉදිරියට පැමිණවීමට කටයුතු කර තිබෙන බව ඉන්දීය රජය අපට දන්වා තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි.

පසු ගිය මාර්තු 16වැනි දා තන්ජවූර්හි -ගරු මන්ත්‍රීතුමා ඒ සිද්ධිය සඳහන් කළා- ඇති වූ සිද්ධිය සම්බන්ධව පුද්ගලයන් හත් දෙනෙකුට විරුද්ධව අපරාධ නීතිය යටතේ නඩු පැවරීමට දැනටමත් කටයුතු කර තිබෙනවා. මාර්තු 18වැනි දින සිදු වූ සිද්ධිය -ඒ සිද්ධියත් ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විශේෂයෙන් සඳහන් කළා- සම්බන්ධයෙන් අදාළ සැකකරුවන් හඳුනාගෙන ඇති අතර, ඔවුන් අත් අඩංගුවට ගැනීම සඳහා විශේෂ පොලිස් කණ්ඩායමක් දැනටමත් යොදවා තිබෙනවා. එම සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අතරින් තිදෙනෙකු මාර්තු 19වැනි දා අධිකරණයට භාර වූ බවද අපට දන්වා තිබෙනවා.

මීහින් ලංකා කාර්යාලයට පහර දුන් අවස්ථාවේදී -ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා සඳහන් කළ පහර දුන් තවත් අවස්ථාවක්- චෙන්නායි නුවර පිහිටි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය මඟින් ඒ පිළිබඳව අදාළ බලධාරින්ට දැනුම් දුන් අතර, ඉන්දීය රජය විසින් එම කාර්යාලයට අවශ්‍ය ආරක්ෂාව සපයා දෙනු ලැබුවා. මෙම කාර්යාලයට පහර දීම සිදු වූයේ උදෑසන බැවින් කාර්යාලයේ කිසිදු සේවකයෙකුට හෝ ගනුදෙනුකරුවෙකුට හානියක් සිදු වූයේ නැහැ. චෙන්නායි නුවර පිහිටි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් දැන්වූ පරිදි මීහින් ලංකා කාර්යාලයට සිදු වූ අලාභ හානිය පිළිබඳව සම්පූර්ණ තක්සේරුවක් කර නොමැති වුවත් එය දළ වශයෙන් ශ්‍රී ලංකා රුපියල් ලක්ෂ විසිපහක් පමණ විය හැකි යැයි ඔවුන් දන්වා තිබෙනවා.

ඉන්දියාවේ සංචාරය සඳහා යන ශ්‍රී ලාංකිකයන්ට සහ ශ්‍රී ලංකා රජයේ දේපළවලට කර ඇති අලාභ හානි පිළිබඳව ඉන්දියානු මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත රජයන් දැනුවත් කිරීමට මේ ආකාරයෙන් අප කටයුතු කර තිබෙනවා. ශ්‍රී ලංකා රජය ඒ පිළිබඳව ඉන්දියානු රජයේ දැඩි අවධානය යොමු කර තිබෙනවා.

ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලාට දකුණු ඉන්දියාවේදී කරනු ලැබූ තාඩන පීඩන සහ අවමන් ශ්‍රී ලංකා රජය තරයේ හෙළා දකිනවා. ශ්‍රී ලංකාව සමඟ පොදු සංස්කෘතියකට උරුමකම් කියන, විශේෂයෙන්ම බුදු දහම උපන් දේශය වන ඉන්දියාවේදී එවැනි සිද්ධියක් සිදු වීම ගැන රජය වෙනුවෙන් මා දැඩි කනස්සල්ල පළ කරනවා.

මෙම කරුණ සහ අනෙකුත් සිදුවීම් පදනම් කර ගෙන, ශ්‍රී ලංකා රජයේ අප්‍රසාදය ඉන්දියානු විදේශ අමාත්‍යාංශය මඟින් ඉන්දීය රජයට දන්වන ලෙස මා නවදිල්ලියේ සිටින ශ්‍රී ලංකා මහ කොමසාරිස් ප්‍රසාද් කාරියවසම් මහතාට උපදෙස් දුන්නා. දැනටමත් එතුමා ඒ අදහස් ඉන්දීය රජයට ඉතාමත් සෘජු ලෙස ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම, කොළඹ සිටින ඉන්දියානු මහ කොමසාරිස්වරයාටත් මා මේ පිළිබඳව අපගේ අප්‍රසාදය පළ කර සිටියා.

ඉන්දියාවේ සංචාරය කරන ශ්‍රී ලාංකිකයන්ට ආරක්ෂාව සපයා දීම සඳහා සියලුම ක්‍රියා මාර්ග ගන්නා ලෙස නවදිල්ලි නුවර පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට සහ චෙන්නායි නුවර පිහිටි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයට විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් දැනුම් දී තිබෙනවා.

ඉන්දියාවේ වර්තමාන දේශපාලන හා අනෙකුත් සිදුවීම් පිළිබඳ ශ්‍රී ලාංකිකයන් දැනුවත් කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශය පියවර ගෙන තිබෙනවා. අත්‍යවශ්‍යම හේතුවක් මත දකුණු ඉන්දියාවේ සංචාරය කරන්නේ නම් ඉතා ප්‍රවේසම් සහගතව කටයුතු කරන ලෙසටත්, ඉන්දියාවට යෑමට පෙර චෙන්නායි නුවර පිහිටි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයට දැනුම් දෙන ලෙසටත් ශ්‍රී ලංකා රජය ජනමාධ්‍ය මඟින් සියලු ශ්‍රී ලාංකිකයන්ට දන්වා තිබෙනවා. අපේ අමාත්‍යාංශය ඒ ප්‍රකාශය ඉතාමත් පැහැදිලිව කර තිබෙනවා.

මාගේ අමාත්‍යාංශයේ නිලධාරීන් ඉන්දියාවේ, විශේෂයෙන් දකුණු ඉන්දියාවේ ඇති වන තත්ත්වයන් පිළිබඳව විමසිල්ලෙන් සිටිමින් ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය සමඟ සාකච්ඡා කොට දෛනික වාර්තා සකස් කරනවා.

ශ්‍රී ලාංකිකයන් දෙලක්ෂ පනස් දහසක් පමණ පසු ගිය වර්ෂයේදී ඉන්දියාවේ සංචාරය කර තිබෙනවා. කොළඹ සහ ඉන්දියාවේ ප්‍රධාන නගර අතර සතියකට ගුවන් ගමන් වාර 100කට ආසන්න සංඛ්‍යාවක් ක්‍රියාත්මක වනවා. මේ පවතින තත්ත්වය නිසා ඒ ප්‍රමාණය දැන් ටිකක් අඩු වෙලා තිබෙනවා. එයින් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ජනතාව අතර ඉතා සමීප සම්බන්ධතාවක් තිබෙන බවයි.

තමිල්නාඩුවේ වසන සුළු පිරිසකගේ දේශපාලන අරමුණු මුදුන්පත් කර ගැනීමට සිදු කරන මෙවැනි ක්‍රියාකාරකම් ජාති, ආගම් හා දේශපාලන පක්ෂ භේදයකින් තොරව හෙළා දැකිය යුතු බව මාගේ හැඟීමයි. එමෙන්ම රජයන්ගේත්, ජනතාවගේත් වගකීම වන්නේ එවැනි සිද්ධීන් ප්‍රචණ්ඩ ක්‍රියා දක්වා වර්ධනය නොවීමට වග බලා ගැනීමයි. අප සියලු දෙනාම පක්ෂ භේදයෙන් තොරව එකතු වෙලා ඒ අරමුණ ඉෂ්ට කර ගත යුතුයි. ඒ ගැන සැකයක්, විවාදයක් ඇති විය යුතුයි කියා මා හිතන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියාවේ සංචාරය කරන ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව පිළිබඳව රජය ඉතා අවධානයෙන් සිටින අතර ඔවුන්ගේ ජීවිතවලට සහ දේපළවලට අනතුරුදායක තත්ත්වයක් අනාගතයේදී ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සෑම පියවරක්ම ගන්නා බව මේ අවස්ථාවේදී මා මේ ගරු සභාවට ප්‍රකාශ කර සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්තූතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය.

වරප්‍රසාද: හිරිහැරයට සහ අගෞරවයට ලක් කිරීම

சிறப்புரிமை: தொந்தரவு மற்றும் அச்சுறுத்தல்

PRIVILEGE : HARASSMENT AND INTIMIDATION

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Hon. Deputy Speaker, as a Member of Parliament I consider it my bounden duty to take up issues that concern the people, especially my constituents in the Colombo District which I represent. I have had occasion to take such matters up both in and out of Parliament. I have also in my capacity as an Attorney-at-Law appeared for my constituents in various courts.

In the recent past, I have become the subject of various forms of harassment and intimidation and false complaints which, I believe, are done with a view to preventing me from taking these matters up and defaming me.

One such incident is an attempt of harassment on my way to Kandy. On this occasion, when I was proceeding after Parliament Sessions to Kandy in my vehicle, a police officer stopped me for no reason whatsoever. After inquiring for my name, he left. I then proceeded on my way and that police officer again came and crossed my vehicle and questioned me and my security officer from the MSD and sought to confiscate his identity card. I told the officer that he had no right to confiscate my security officer's identity card and that if I had committed a traffic offence, he could take my driving licence. Simultaneously I phoned the Inspector-General of Police and then this police officer hastily retreated.

Another such incident was the false complaint made by one Shamlan Mohammed Sainoor (Shamras Yehiyah) who is a party to one of the cases for which I am appearing, namely, SC (FR) 496/2012. On the basis of this false complaint, the police are seeking to obtain my call dialogue details.

These are subtle means of preventing me from performing my duties as a Member of Parliament and, to that extent, would be a breach of my Privileges.

In the circumstances, I request you to inquire into these matters and take such action as you deem appropriate.

Thank you.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

This matter will be referred to the Hon. Speaker and an appropriate decision will be taken.

වරප්‍රසාද: 2013 මාර්තු 10 දින "සිළුමිණ" වාර්තාව

சிறப்புரிமை: 2013 மார்ச் 10ஆந் திகதிய "சிலுமின" அறிக்கை

PRIVILEGE: "SILUMINA" REPORT OF 10TH MARCH 2013

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුව ගැන පුවත්පතක තිබුණු කාරණයක් පිළිබඳව මා වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා.

2013 මාර්තු මස 10 වැනි ඉරිදා "සිළුමිණ" පුවත් පතේ "කාලීන" විශේෂාංගය යටතේ පාර්ලිමේන්තුව ගැන කියලා තිබෙනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

> "මොකද ඔය දේශපාලනඥයින්ට වගේ විකාර කර කර නිකන් ඇවිදින්න මාධ්‍ය ප්‍රධානීන්ට වෙලාවක් නෑ. අනෙක මාධ්‍යවේදීන්ට හෝටලයකින් කන්න දෙන එක වියදමක් නම් පාර්ලිමේන්තුවේ ඔය කන කෑම ගැන මොකද කියන්නේ? ඒ අය යන වාහන අපේ මුදල්වලින් ගත් ඒවා. ඒ අයට ලැබෙන වරප්‍රසාද අපේ මහජන මුදල්වලින් ලැබෙන්නේ. ඒ නිසා කියන්න තියෙන්නේ ඔය කතාව පිස්සු විකාරයක් කියලා තමයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත්තලට මාධ්‍ය ප්‍රධානීන් ගිය එක ගැන මම ප්‍රකාශයක් කළා. ඒක මේ වරප්‍රසාද ප්‍රශ්නයට අදාළ නැහැ. "සිළුමිණ" පත්තරේ මත්තල ආරක්ෂා කරන නිසා, මාධ්‍යවේදීන් හය දෙනෙකුගේයි, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමේ සභාපතිතුමාගේයි අදහස්වලින් මගේ කථාවට පිළිතුරු දීලා තිබෙනවා. මට බැණලා තිබෙනවා; ඒකට හේතු දක්වලා තිබෙනවා. ඒවාත් මගේ මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

එහෙත් මෙතැන එක ප්‍රකාශයක් තිබෙනවා. එය මට පිළිතුරු දෙන එකටවත්, මට බණින එකටවත් අදාළ කාරණයක් නොවෙයි. ආරියනන්ද දොඹගහවත්ත, "ඉරිදා ලංකාදීප" කර්තෘ මේ ප්‍රකාශය කරලා තිබෙනවා. දැන් ඔබතුමා මේ ප්‍රකාශය කියවනවා නම් මා කරපු ප්‍රකාශයක් කියන්නම්. ඒකට දුන්න පිළිතුරුත් කියන්නම්. මට ඒවා ගැන දොස් කියන්න බැහැ. නමුත් පාර්ලිමේන්තුව ගැන කියපු කරුණු ගැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඇයි පාර්ලිමේන්තුව ගැන කියන්නේ? මේ කරපු ප්‍රකාශය සම්පූර්ණ වැරැදියි. අපි යන වාහන අපේ මුදල්වලින් ගත්ත ඒවා. පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා, ඒ වාගේම රජයේ සේවකයන් ගණනාවක් තමන්ගේ මුදලින් වාහන ගන්නේ. නමුත් අපට ඒ සඳහා බදු සහන ලැබෙනවා. පෞද්ගලික අංශයටත් ලැබෙනවා. අපි කාටවත් වාහනයක් දීලා නැහැ, මහ ජනතාවගේ මුදල්වලින්. ඒ නිසා ඒ කථාව සම්පූර්ණ අසත්‍යක්.

දෙවනුව, මේ පාර්ලිමේන්තුවේ කෑම ගැන මම වචනයක් කියන්න ඕනෑ. ලංකාවේත්, පිට රටත්, පාර්ලිමේන්තු සාම්ප්‍රදායක් තිබෙනවා, මන්ත්‍රීතුමන්ලාටත්, සේවය කරන අයටත් සහනදායක මුදලට ආහාර ලබා දෙන. ඒක පාර්ලිමේන්තුවට පමණක් සීමා වෙලා නැහැ. ආණ්ඩුවේ සමහර ආයතනවල, සමහර විට හමුදාවල, පෞද්ගලික අංශයේ බැංකුවල සහනදායී මුදලට ආහාර ලබා දෙනවා. ප්‍රේමදාස ජනාධිපතිතුමා ඇහලුම් කර්මාන්තශාලා 200 ආරම්භ කළාම කිව්වා, නොමිලේ ආහාරත් දෙන්න කියලා. ඒක වෙනම දරා ගන්න බරක්. සාමාන්‍යයෙන් මේ ආහාර ලබා දීමේ කටයුත්ත කෙරෙනවා. විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව අසල කන්න වෙන තැනක් තිබුණේ නැති නිසායි මේ ආහාර ලබා දුන්නේ. ඇත්ත වශයෙන් මේ පාර්ලිමේන්තුවේ වැඩ කරන හැම

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

දිනයේම, සේවය කරන හැම එක් කෙනාටම යම් කිසි විධියකට අපි ආහාර ලබා දෙනවා. ඒක අපේ යුතුකමක්. ඒ වාගේම තමයි, පාර්ලිමේන්තු රැස්වීම් තිබෙන දවස්වල සමහර මන්ත්‍රීවරු කෑම ගන්නවා. ලෝකයේ ඕනෑම රටක මේ කටයුත්ත වෙනවා. කොංග්‍රස් එකේ වුණත්, එංගලන්තයේ පාර්ලිමේන්තුවේ වුණත්, වෙනත් ඕනෑ තැනක වුණත් එහෙම කෑම ලබා දෙනවා. ඇත්ත වශයෙන්ම සමහර පාර්ලිමේන්තුවල මාධ්‍යවේදීන්ටත් සහනදායක මිලට ආහාර ලබා දෙනවා. නමුත් සමහර පාර්ලිමේන්තුවල එහෙම කරන්නේ නැහැ. මම කියන්නේ නැහැ, මේ අයගෙන් මුදල් අය කරන්න කියලා. එහෙත් දොඹගහවත්ත මැතිතුමාට මේ ගැන විශාල කැක්කුමක් තිබෙනවා නම්, "ලංකාදීප" පත්තරෙන් එන නිලධාරීන් වෙනුවෙන් ඒ සම්පූර්ණ ගණන පාර්ලිමේන්තුවට එවන්න. ඒ සම්පූර්ණ මිල පාර්ලිමේන්තුවට එවන්න.

අනික් කාරණය තමයි, අපි වෙනුවෙන් දෙන වාහනවලට වැය ශීර්ෂයක් තිබෙනවා. නමුත් මම බැලුවා, ආණ්ඩුවෙන් මාධ්‍යවේදීන්ට දෙන laptop එකට වැය ශීර්ෂයක් නැහැ. ඇත්ත වශයෙන් අපිට පුළුවන් ඒ අය Public Accounts Committeeයට ගෙනැල්ලා, ප්‍රශ්න කරලා, ඒ ගොල්ලන්ගෙන් ඒ මුදල් ටික ආපසු ගන්න. එහෙම නම් දොඹගහවත්ත අපිට ඉස්සෙල්ලාම ඒ laptop එකට ගෙවන්න ඕනෑ. ඒ වාගේම එතුමා එක සැරයක් ජනාධිපතිතුමා එක්ක චීනයට ගියා. ඒ වෙනුවෙනුත් ආණ්ඩුවෙන් තමයි ගෙවලා තිබෙන්නේ. ඒකත් ආපසු ගන්න ඕනෑ. මේක මහා සෙල්ලමක්.

මහ ජනතාව අපි මේ සභාවට එවන්න තෝරන්නේ අපට දෙන්නේ මොනවාද නැද්ද කියලා දැනගෙන. ප්‍රශ්නයක් තිබෙනවා නම් මහජනතාව අපි ඉවත් කරයි. අපව මාරු කරලා වෙන කණ්ඩායමකට බලය දෙයි. එහෙම ඕනෑ නම් මේ ක්‍රමය මාරු කරන්න. දොඹගහවත්තට් කියන්න පුළුවන්, මොකුත් වරප්‍රසාද එපා, මට ලැබුණු ඒවා දෙන්නම් කියලා. නමුත් මෙතැන වෙලා තිබෙන්නේ මේකයි. සමහර මාධ්‍යවේදීන් හිතනවා තමන්ට පාර්ලිමේන්තුවට වඩා ඉහළින් යන්න පුළුවන් කියලා. ඔන්න ඔකයි වෙලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම හොඳම දේ තමයි මාධ්‍ය සමාගම් සියල්ලටම සහනදායි මිලකට ආහාර ලබා දෙන එක. දැන් ඒ ගොල්ලන්ට සහනදායි මිලට ආහාර ලැබෙන්නේ නැහැ. ඉතින් සමහර මාධ්‍යවේදීන් අරලියගහ මන්දිරයට ඇවිල්ලා පිනට කනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ වචන ටික "සිළුමිණ" පත්තරේ නොදා ඉන්න තිබුණා. මත්තල ගැන කිව්වාට මට බැන්න එක වෙන කාරණයක්. නමුත් මේ වාක්‍ය තුන හතර නොදා ඉන්න තිබුණා. අනික, අපට හොරා කියන්නේ, පල් හොරා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මෙය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කොට නිසි තීරණයක් ලබා දීමට ඉදිරියේ දී කටයුතු කරනවා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින හා 2013.03.19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්හි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.හා.1.00 සිට අ.හා.6.30 දක්වා ද විය යුතු ය. අ.හා. 6.30ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රධාන කටයුතු; අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1 - රේගු (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම.

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

රේගු (සංශෝධන) පනත් කෙටුම්පත
சுங்கம் (திருத்தம்) சட்டமூலம்
CUSTOMS (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ. භා. 2.50]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, මා "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි යෝජනා කරනවා.

මේ අවස්ථාවේදී මම ගරු සභාවට මුලින්ම මතක් කරන්න කැමැතියි,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් සංශෝධන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි උදේ එන කොට ඒ පනත් කෙටුම්පතට තව සංශෝධන වගයක් තිබුණා. ඊට පස්සේ ඒ වගන්තියට නැවත සංශෝධන වගයක් ගෙනැත් දීලා තිබෙනවා. එතකොට දැන් මේ සභාව හමුවේ තිබෙනවා, එකම වගන්තියට සංශෝධන වර්ග තුනක්. එකක් පනත් කෙටුම්පතේ සංශෝධන; අනෙක උදේ දීපු සංශෝධන; අනෙක් එක දැන් ප.ව. 2.45ට බෙදපු සංශෝධන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එකම වගන්තියට විවිධ වර්ගයේ සංශෝධන තුනක් ගෙනැල්ලා තිබෙනවා. අපට දැන ගන්න ඕනෑ, කුමන සංශෝධනයද අද දින විවාද කරන්නේ කියලායි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක තමයි මම තේරුම් කරන්න පටන් ගත්තේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වැඩේ තිබෙන්නේ මේක නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා වාඩි වෙන්න. මම කිව්වාට පස්සේ ඒක ඔබතුමාට පැහැදිලි වේවි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, මොකක්ද මේ ඔබතුමා කරන විකාරය? පනත් කෙටුම්පත් 21ක් ඉදිරිපත් කළා. 15ක් අකුළා ගන්න වුණා. අද දිනට සම්මත කරන්න දාලා තිබුණා, පනත් කෙටුම්පත් 10ක්. ඒකෙන් එක පනත් කෙටුම්පතයි විවාදයට ගන්න පුළුවන් වුණේ. ඒ ගන්න එකත් නිවැරැදි පරිදි හදන්න බැරිද? ගරු කථානායකතුමා මොකක්ද ඊයේ මූලාසනයේ ඉඳගෙන කිව්වේ? එතුමා කිව්වේ, මේ පාර්ලිමේන්තුවේ ගරුත්වය ආරක්ෂා කරන්න අමාත්‍යවරුන්ගේ කාර්ය භාරය ඉටු කරන්න ඕනෑය කියලායි. සංශෝධනයක් හදනවා; උදේ තව සංශෝධනයක් දෙනවා; පස් වරු 2.45ට තව එකක් දෙනවා. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? අපි ලැහැස්ති වෙනවා, අපේ අතට ආපු සංශෝධන සම්බන්ධයෙන් විවාද කරන්න. ඇවිල්ලා බලන කොට මේසය උඩ තව එකක් තිබෙනවා. දවල් වෙන කොට තව එකක් බෙදනවා. මොනවා ගැනද අපි කථා කරන්නේ?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, allow the Hon. Minister to reply.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉස්සෙල්ලාම මගේ හිතවත් මන්ත්‍රීතුමාට මතක් කරන්න ඕනෑ, පාර්ලිමේන්තු සම්ප්‍රදාය යටතේ කාරක සභා අවස්ථාවේදී අපට ඕනෑ වෙලාවක සංශෝධන ගෙනෙන්න පුළුවන් කියලා. ඒක අපි තමුන්නාන්සේලාට කථා කරලා, තමුන්නාන්සේලා- [බාධා කිරීමක්] ඉන්න කෝ මම තේරුම් කරලා දෙන කල්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එකම වගන්තියට ගෙනාවේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක තමයි මගේ කථාවේ පරමාර්ථය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක තමයි මම අහන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේ කථාවෙන් මම බලාපොරොත්තු වන්නේ, ඔබතුමා නගපු ප්‍රශ්නයට පිළිතුරක් දීලා ඉදිරියට යන්නයි. කලබල වෙන්නේ නැතුව අපටත් සවන් දෙන්න. ඒකයි මම ඉල්ලා සිටින්නේ. ඉතාමත් හිතවත්වයි මම කියන්නේ. [බාධා කිරීමක්] මම තේරුම් කරලා දෙන්න එපා යැ. ඉස්සෙල්ලා මා කියන දේ අහන්න කෝ. ඊට පස්සේ ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම් අපි උත්තර දෙන්නම්. ඇත්ත වශයෙන්ම මෙතැන වෙලා තිබෙන්නේ මෙයයි. ඊට පෙර, තමුන්නාන්සේට පනත් කෙටුම්පත් ප්‍රමාණය අඩු වීම ගැන කියන්න ඕනෑ. අපේ නීතිය යටතේ ඕනෑම පනත් කෙටුම්පතක් අභියෝගයට ලක් කරන්න පුළුවන්. අභියෝගයට ලක් කළාම සුප්‍රීම් උසාවිය තීන්දුව දෙන කල් අපි මෙතැන විවාද කරන්නේ නැහැ. ඒ judicial review එක තමයි අපේ සම්මතය. "Pre-legislative judicial review" කියන්නේ අන්න ඒකයි. ඉතින් ඒ අනුව ඒක අයින් කළා. ඒකට අපට -රජයට- වැරැද්දක් කියන්නත් බැහැ. කාටවත් වැරැද්දක් කියන්නත් බැහැ. ඒක තමයි සම්මත ක්‍රමය. ඒ අංශය ගැන වැඩිය කථා කරන්නේ නැහැ. මම තේරුම් කරලා දෙන්න විතරයි මහන්සි ගන්නේ.

දෙවැනි කාරණය විධියට මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. මේ සංශෝධන ගැන ඔබතුමන්ලාත් කරුණු ඉදිරිපත් කළා. උපදේශක කාරක සභා අවස්ථාවේදීත් යම් යම් ප්‍රශ්න ආවා. අද උදේත් මම වෘත්තීය සමිති එක්කත් සාකච්ඡා කළා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒවා කලින් කරන්න ඕනෑ වැඩ නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
පොඩ්ඩක් ඉන්න කෝ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා සතුටු වෙන්න ඕනෑ, මම මේ කියන්න යන එකට. ඒ කියන්නේ විවාදාත්මක එක කොටසක් අපි අයින් කරන්න තීරණය කළා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බොහොම හොඳයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක මම දැන් තමුන්නාන්සේලාට පැහැදිලි කරනවා.

ඒක තමයි, මේ නව සංශෝධනය යටතේ විවාදාත්මක ප්‍රශ්න දෙකෙන් එකක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ත්‍යාග මුදල්වලට pickpocket ගහනවාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ. අපි වෘත්තීය සමිති සමඟත් සාකච්ඡා කරලා, ඒ සම්බන්ධයෙන් තවදුරටත් කථා කරන්න ඕනෑ නිසා සංශෝධනයක් ගෙනැල්ලා ඒ ටික අයින් කළා. ඔබතුමා ඒකට සතුටු වන්න ඕනෑ නේ. ඒකයි ඒකේ පසු බිම. දැන් තමුන්නාන්සේලාට -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එය ඉවත් කළාම ඉතිරි ඒවා මොනවාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඉතින් ඉන්නකෝ. මගේ කථාව පටන් ගත්තා විතරයි, ගරු මන්ත්‍රීතුමනි. පස්සේ ඒවා ගැන අහන්න. දැන් මෙන්න මේකයි කථාව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය තුළින් රජයට ප්‍රධාන ආදායම් ලබා ගන්නා දෙපාර්තමේන්තු තුනක් තිබෙනවා. එකක් තමයි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව. දෙවන එක තමයි, ශ්‍රී ලංකා රේගුව. අනික් එක තමයි, සුරාබදු දෙපාර්තමේන්තුව; Excise Department එක. මෙම ආයතන තුනෙන් තමයි රජයට විශාල වශයෙන් මුදල්, ආදායම් ලබා ගන්න පුළුවන් වන්නේ. එතකොට අපේ යුතුකමක් තිබෙනවා, හැම වෙලාවේම ඒ ක්‍රියා මාර්ගය streamline කරන්න, වඩාත් කාර්යක්ෂම කරන්න. එසේ කාර්යක්ෂම කිරීමේදී පාර්ශ්වයන් දෙකක් ගැන අපට කල්පනා කරන්න සිද්ධ වනවා. එක පාර්ශ්වයක් තමයි, එම කටයුතු කරන නිලධාරීන්, ඒ අයගේ පුහුණුව, බඳවා ගැනීම, වැඩිදුර පුහුණුව. මා කියන්න කැමැතියි, රජයක් හැටියට අපි ඒ ගැන විශේෂ අවධානයක් යොමු කර තිබෙනවාය කියලා. ඉස්සර අපි ඒ දෙපාර්තමේන්තුවලට ගියාම එම දෙපාර්තමේන්තුවලින් අපට බොහෝ විට අහන්න ලැබෙන දේ තමයි, කාර්ය මණ්ඩලය -සේවකයන්- මදියි කියන එක. ඊට පස්සේ අපි ඒ ප්‍රශ්නය විසඳුවා. ඔබතුමන්ලා පිළිගන්නවා ඇති, අපි ඒ ඇබෑර්තු බොහොමයක් පුරවා තිබෙනවාය කියලා.

දෙවන පාර්ශ්වය තමයි, -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා මේ සංශෝධන ඉදිරිපත් කරලා, විරෝධතාව ආපු එකේ එක කොටසක් අයින් කර ගත්තාය කිව්වාට ඔබතුමා කථාව කර ගෙන යන විධියට පෙනෙන්නේ, ඒ අයින් කර ගත්ත කොටසට අදාළව ඔබතුමා හදා ගෙන ආපු කථාව නැවත කරනවා කියලායි. මෙපමණයි දැන ගන්න ඕනෑ. දැන් ඒ කොටස අයින් වුණාම -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sunil Handunnetti, that is not a point of Order.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේ සභාවේ මේ විධියට වැඩ කරන්න බැහැ නේ. දැන් ගරු මන්ත්‍රීතුමා කරුණු කීයක් උපකල්පනය කළාද? මා කථාවක් හදා ගෙන ආවාය කිව්වා. ඇත්ත වශයෙන්ම මා එහෙම දෙයක් කළේ නැහැ. [බාධා කිරීමක්] ඉතින් ඉන්නකෝ මා කියන කල්. තමුන්නාන්සේට වෙලාව දීලා තිබෙනවා. මගේ කථාව ඉවර වෙන්න ඉස්සෙල්ලා කොහොමද දන්නේ මා මොනවාද කියන්න යන්නේ කියලා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ මගේ මිත්‍රයෙක් තමයි. තමුන්නාන්සේට බොහෝ විට පුළුවන් ඇති, මා මේ විධියට තමයි කල්පනා කළේ කියන්න. ඒක අපේ මිත්‍රකම. නමුත් මේ කථාවේදී - [බාධා කිරීමක්] ඉන්නකෝ මගේ කථාව ඉවර වන කල්.

මා දැන් තර්කයක් ගොඩ නහා ගෙනයි ආවේ. ඒ කියන්නේ අපේ ආදායම් මාර්ග තුනක් තිබෙනවා. මූලික වශයෙන් අපි ඒ ආදායම් මාර්ග streamline කරනවා. ඒ ගොල්ලන්ට අවශ්‍ය පහසුකම් -තාක්ෂණික පහසුකම්, කාර්ය මණ්ඩල පහසුකම්, ගොඩනැඟිලි පහසුකම්- අපි ලබා දෙනවා. එසේ කිරීම සේවක සංඛ්‍යාවේ කාර්යක්ෂමතාව දියුණු කිරීමේ එක පැත්තක්. අපට ඒ ගැන ලොකු විශ්වාසයක් තිබෙනවා. අපි නිතර ඒ ගොල්ලන්ව මුණ ගැහෙනවා. ඒ ගොල්ලන්ගේ ප්‍රශ්න විසඳන්න මහන්සි ගන්නවා. අද උදේත් මුණ ගැහුණා.

අනික් පැත්තෙන් සේවාදායකයන් ඉන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Strike එක ඉවරද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඉන්නකෝ කියන කල්. තමුන්නාන්සේලා strike කරවලා, ඊට පස්සේ අපෙන් අහනවා ඉවරද කියලා. මා ඒ ගැන අහන්න ඕනෑ, තමුන්නාන්සේගෙන් නේ. [බාධා කිරීමක්] ඉන්න, ඉන්න. දැන් බොහොම අමාරුයි. ඒකට හේතු අයින් කළාම අමාරුයි. ඒවා තව ටිකක් රත් වෙවී තිබෙනවා නම් බොහොම කැමැතියි. [බාධා කිරීමක්] ඉතින් ඉන්නකෝ කියන්න. [බාධා කිරීමක්] අහගෙන ඉන්නකෝ.

එතකොට අනික් පැත්තෙන් ඉන්නවා, ඒ සේවය ලබන අය. මේ දෙකේම යම් යම් දුර්වලතා තිබෙනවා. ඒවා පුළුවන් තරම් සකස් කරන්නයි අපි හදන්නේ. දැන් මෙතැනදී අංශ දෙකක් තිබුණා. එක අංශයක් තමයි ඇපැල් අංශය. යම් කිසි කෙනකු ගැන තීන්දුවක් ගත්තාම ඒ ගැන ඇපෑලක් යන්නේ කොහොමද කියන එක තමයි එක අංශයක්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක උසාවියේ නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඉන්නකෝ. දෙවන එක තමයි, ඒ ලැබෙන තැගි බෙදා ගන්නේ කොහොමද කියන ප්‍රශ්නය.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ඒක අයින් කර ගත්තා ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
දැන් අපි ඒක සම්පූර්ණයෙන්ම අයින් කළා. [බාධා කිරීමක්] කරුණාකර ඉඳ ගන්න. අනික් එක දැන් තේරුම් කරලා දීලා තිබෙනවා. මේ ත්‍යාග පිළිබඳ ප්‍රශ්නය ගැන දැන් අපට මෙතැන වාද විවාද කරන්න ඕනෑ නැහැ. ඒ වෘත්තීය සමිති සමඟ ඒ සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරලා -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ඒක ඕනෑ නැහැ නේද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඇත්ත වශයෙන් ඒක ඕනෑ නැහැ.

ඒක අවශ්‍ය නැහැ. අද අපි ඒක විවාදයට ගේන්නේත් නැහැ. තමුන්නාන්සේ කියපු දෙවැනි සංශෝධනය තමයි බලපාන සංශෝධනය. ඇත්ත වශයෙන්ම Committee Stage එකේදි ඒක අපි ඉදිරිපත් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
කරන්න හැදුවේ මොකක්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේ සංශෝධන යටතේ ඒ section එක සම්පූර්ණයෙන් ඉවත් කරලා දැන් තිබෙන-

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඉස්සෙල්ලා කරන්න හැදුවේ මොකක්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඉස්සෙල්ලා කරන්න හදපු දේත් මම කියන්නම්. ඒ ගැන අපට හංගන්න දෙයක් නැහැ. ඒක අදට අදාළ නැහැ.

අනෙක් එක, සේවාදායකයින් පිළිබඳ ප්‍රශ්නය. අපට තිබෙනවා, ආදායම් බදු ඇපැල් මණ්ඩලය. යම් කිසි විධියකින් ඒ තීන්දුව ගන්න කොට යම් කිසි කෙනෙක් හිතනවා නම්, එතැනින් එහාට අවැඩක් සිද්ධ වුණා කියලා ඒ පුද්ගලයාට ඒ ගැන තව දුරටත් පරීක්ෂණයක් කරන්න අපි අවස්ථාවක් සලසා දෙන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඒක හොඳයි. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමාගේ කථාවේදී කියන්න. දැන් කිව්වා නේ, මම මේ කථාවට ලෑස්ති වෙලා ආවා කියලා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත දැන් තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ. ඒ පනත් කෙටුම්පත සංශෝධනය වුණාම තමයි ඊට අදාළ වන පරිදි රේගු ආඥාපනත සංශෝධනය කරන්න ඕනෑකම තිබෙන්නේ. දැන් ඔබතුමන්ලා කරපු දේ තමයි, මේ දෙකම එකට දැමීම. දැන් බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ හිර වෙලා තිබෙනවා. ඒ පනත් කෙටුම්පත නැතිව දැන් මේ රේගු (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනෙන එකේ කිසිම තේරුමක් නැහැ. මොකද, නීතිය හැදෙන්නේ එතැනින්.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක මම කියන්නම්. අධිකරණ තීරණය මොකක්ද කියලා තමුන්නාන්සේලා දන්නවාද?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
දන්නේ නැහැ, තවම කිව්වේ නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේ පාර්ලිමේන්තු ක්‍රමය අනුව පනත් කෙටුම්පත් ගෙනාවාම යම් කිසි අවස්ථාවක ඒක සංශෝධනය කරන්න අවශ්‍ය නම්, ඒ සඳහා පාර්ලිමේන්තුවට බලය තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
පාර්ලිමේන්තුවේ බලය නොවෙයි, ගරු ඇමතිතුමනි. බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පතෙන් තමයි රේගු ආඥා පනතට මෙම සංශෝධන ගේන්න පුළුවන්කම තිබෙන්නේ. බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත දැන් තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේයි. මොකද ඒකෙන් තමයි මූලික නීතිය බල ගැන්වෙන්නේ. ඒ මූලික නීතියට අනුව තමයි මේකේ අතුරු සංශෝධනය විය යුත්තේ. දැන් තමුන්නාන්සේලාගේ මූලික නීතිය ශ්‍රේෂ්ඨාධිකරණයේ, අතුරු සංශෝධනය ගැන කථා කරනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
අපට අවශ්‍යයි,- [බාධා කිරීමක්] තමුන්නාන්සේලාට ඒ ගැන කථා කරන්න අවශ්‍ය නැත්නම් මේ පනත් කෙටුම්පත සම්මත කරලා අපි බලමු. අපි අය වැය ලේඛනයේ සඳහන් කළ පරිදි මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නවා. අපට අවශ්‍යතාව තිබෙන්නේ එයයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක පිළිගන්නවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේක අපි සාකච්ඡා කර ගෙන යනවා. යම් කිසි විධියකින් ඒකට අභියෝගයක් ඇති වනවා නම්, අනාගතයේදී අපි ඒ විධියට සකස් කර ගනිමු. අපි ප්‍රායෝගිකව මේ ගැන බලමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතකොට නැවත වෙනස් කරන්න වනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඉතින් මොකද වන්නේ? තමුන්නාන්සේලා කියන උපකල්පනය අනුව ඒ තත්ත්වයට ආවොත් අපට ඒ දේ කරන්න පුළුවන්. එහෙම නැත්නම් අපට ඉදිරියට යන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, අපි හරි සාධාරණ ප්‍රශ්නයක් නේ අහන්නේ. අපි යම් පනතක් සංශෝධනයකට ලක් කළ යුත්තේ ඊට අදාළ වන මූලික පනතට අනුරූපී වන පරිදියි. බදු අභියාචනා කොමිෂන් සභාව මූලික පනත සංශෝධනය කරලා නැහැ. හැබැයි ඒ සංශෝධනයට අනුරූපී ලෙස රේගු ආඥාපනත සංශෝධනය කරන්න හදනවා. එතකොට ගැටීමක් ඇති වනවා. ඒකයි මම ඔබතුමාට කියන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
දැන් නොයෙක් හේතු මත ඒ පනත් කෙටුම්පත අභියෝගයකට ලක් කරන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ පනත් කෙටුම්පතේ අදාළ සංශෝධනය තිබුණොත් විතරයි ඒ පනත් කෙටුම්පත මේ සංවාද කරන්න හදන සංශෝධනයට බල ගැන්වෙන්නේ. ඔබතුමාගේ සංශෝධන කිසිසේත්ම බල ගැන්වෙන්නේ නැහැ, අර මූලික සංශෝධනය කරන්නේ නැතිව.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තමුන්නාන්සේට මම ඒකට පැහැදිලි පිළිතුරක් දෙන්නම්. අපි මේ දෙක එකට ගෙනාවා. [බාධා කිරීම්] ඉන්න, කියන්නම්. ඒකට යම් කිසි අභියෝගයක් ඇති වෙලා තිබෙනවා. නමුත් ඒ අභියෝගයේ ප්‍රතිඵල අපි කවුරුත් දන්නේ නැහැ. ඒ හින්දා අපි මේ විධියට ක්‍රියාත්මක වෙමු. අපට උපකල්පනය කරන්න බැහැ, කොයි විධියේ තීරණයක් එයිද කියලා. ඒ තීරණයෙන් මේකට prejudice එකක් ඇති වුණොත් ඒ වෙලාවේ අපි තීරණයක් ගනිමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැවත වෙනස් කරන්න වනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔව්, අපට ඒ වෙලාවට ඕනෑ දෙයක් කරන්න පුළුවන් නේ. දැන් ඇයි අපි ඒක මේ විධියට වෙනස් වෙයි කියලා උපකල්පනය කරමින් මේ කටයුත්ත නවත්වන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාට මම පැහැදිලි කරන්නේ මෙයයි. අපි කියමු කෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එච්චර දුර යන්න ඕනෑ නැහැ. මට ඉතාම පැහැදිලියි. මෙතැන තිබෙන්නේ පැහැදිලි නොකිරීමේ ප්‍රශ්නයක් නොවෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මෙහි පදනම සකස් වන්නේ බදු අභියාචනා කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීමෙන් විතරයි. ඒ පදනම මත තමයි රේගු පනතට මේ සංශෝධන එන්නේ. තමුන්නාන්සේලා සංශෝධනය කරන්න හදපු එක දැන් සංශෝධනය වන්නේ නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කොහොමද දන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තවම නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක තවම අධිකරණයට ගිහිල්ලාත් නැහැ. අපි තවම දන්නේ නැහැ නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, දැන් තිබෙන පනතට අනුව.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා මම කියන දේ අහන්න. [බාධා කිරීමක්] නැහැ, නැහැ, මගේ පිළිතුර මේකයි. අපි මේ පනත් කෙටුම්පත සම්මත කරලා, ඒක වෙනස් කරන්න අවශ්‍යතාවක්

තිබුණොත් ඒ වෙලාවේ දී බලමු. දැනට අපි හිතනවා, එහෙම අවශ්‍යතාවක් ඇති වන එකක් නැහැ කියලා. තමුන්නාන්සේලාට ඕනෑ නම් ඒකට විරුද්ධව ඡන්දය දෙන්න පුළුවන්. ඒච්චරයි. ඒක ආවාට පසුව යම් කිසි ගැටුමක් වනවා නම් -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ කිින්දුව 'ෂුවර්' නේද? [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Two different actions. ඒක වෙනම කථාවක්. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මොකද, ඉන්නෙත් යාළුවා නේ. සෙලාන් බැංකුවේ හිටපු සභාපතිතුමා නේ දැන් ඉන්නේ. [බාධා කිරීම්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
හරි, දැන් ඔක්කොම කියලා ඉවරද? අපි ඔබතුමන්ලාට සද්භාවයෙන් මේ කරුණු ඉදිරිපත් කළා. අපි දැන් අපේ ස්ථාවරය කියන්නද? අපේ ස්ථාවරය නම්, මෙය ඉදිරිපත් කරලා - අපට වැඩි ඡන්දයකුත් ලැබෙයි කියලා අපි හිතනවා. - අපි සම්මත කර ගන්නවා. සම්මත කර ගැනීමෙන් පසුව යම් කිසි තත්ත්වයක් උද්ගත වුණොත් අපි ඒකට ඒ වෙලාවේ දී මුහුණ දෙමු. මොන Item එක යටතේද challenge කළේ කියලා අපි දන්නේ නැහැ නේ. ඒක නිසා ඒ ගැන ඒ වෙලාවේ දී බලමු. දැන් අපි රජය හැටියට තීරණය කරලා තිබෙනවා, මෙය ඉදිරිපත් කරන්න. මේ පිළිබඳව නෛතික ප්‍රශ්නයක් තිබෙනවා නම් තමුන්නාන්සේලා ඒක ඒ විධියට විසඳා ගනිමු. අන්න ඒකයි අපේ උත්තරය. [බාධා කිරීමක්] ඒක තමුන්නාන්සේලාගේ තීරණයක් නොවෙයි නේ. අපේ තීරණයක් ඒක. ඒක තමුන්නාන්සේලාගේ තීරණයක් නොවෙයි. තමුන්නාන්සේලාගේ මධ්‍යම කාරක සභාවේ දී තමුන්නාන්සේ තීරණ ගන්න. මේක පාර්ලිමේන්තුව. ඒ නිසා අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේලා ඒකට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා නම් විරුද්ධත්වය ප්‍රකාශ කරන්න. පනත් කෙටුම්පත සම්මත වනවා. එතැනදී යම් කිසි ගැටුමක් ඇති වුණොත් අපි ඒකට මුහුණ දෙමු. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාට බොහොම අමාරුයි, මේ විධියට පනත් කෙටුම්පතක් ගෙනෙන එක. සාමාජිකත්වයටත් යම් යම් ප්‍රශ්න ඇති වන්නට පුළුවන්. This is Government Business. න්‍යාය පත්‍රයේ තිබෙනවා, "Government Business" කියලා. ආණ්ඩුව ඒවා ඉදිරිපත් කරනවා. සභාවේ සාකච්ඡා කරලා තීරණයකට එනවා. නීතියත් එක්ක යම් කිසි ප්‍රශ්නයක් ඇති වුණොත් - මම හිතන්නේ නැහැ, එහෙම ප්‍රශ්නයක් ඇති වෙයි කියලා. - ඒ වේලාවේ දී අපි ඒකට මුහුණ දෙමු. [බාධා කිරීමක්] නැහැ, නැහැ. අපි මේ නීතිය සම්මත කළාට පසුව වෙන වෙන ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා නම් ඒවාට මුහුණ දෙන්න අපිට පුළුවන්. This is not a challenge at all. මේ පනත් කෙටුම්පත ගැන කොහෙත්ම අභියෝගයක් නැහැ. So, that is why we are going ahead. මේ පනත සංශෝධනය කිරීමෙන් අපි කරන්න හදන්නේ මෙකයි. අනෙකුත් පනත් තුළින් කටයුතු කරන ආකාරයටම, යම් කිසි කෙනෙකුට යම් යම් සීමාවන් තුළ - First, he has to lodge a complaint with the Director General. The Director General has to reply within a certain period of time. In the event of his not responding, then he has the right to go to this appeal body. We want to make sure that there is a freer atmosphere regarding the decision-making. Of course, an objection can be made that this will take time. So, we can, by way of Regulations, bring various other restrictions regarding the appeal that can be made, what sort of conditions can be imposed and so on. ඒ සම්බන්ධයෙන් අපිට රෙගුලාසි අනුව කටයුතු කරන්න පුළුවන්. දැන් රජය වශයෙන් අපි මේක සම්මත කර ගන්නට බලාපොරොත්තු වනවා. මෙතැනදී අපි බලාපොරොත්තු වන්නේ යම් කිසි ප්‍රශ්නයක් ඇති වුණොත් ඒ පිළිබඳව ඉස්සෙල්ලාම දෙපාර්තමේන්තු ප්‍රධානියාට දැනුම් දීමයි. ඒකෙනුත් සෑහීමකට පත් වෙලා නැත්නම්, ඒ කාලය තුළ පිළිතුරක් නොලැබුණොත් තවත් අධිකරණයක් නොවෙයි, තවත් Appellate එකකට ගිහිල්ලා, - ඒක ප්‍රසිද්ධ ආයතනයක්. ඒක දැනටමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වෙනවා. - ඒ හා සමානව appeal එකක් කරන්න තමයි අපි මේ අවස්ථාව සලසා දෙන්නේ.

මේ විවාදයේ දී මතු වුණු තව කාරණයක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Are you raising a point of Order?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ගරු ඇමතිතුමාට බාධා කරනවා නොවෙයි. දැන් මේ බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පතේ 'නීතිය බලපෑමේ ප්‍රකාශය" යටතේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන් වනවා :

"4 වන වගන්තිය : .....රේගු ආඥාපනතේ 10 වන වගන්තිය ප්‍රකාරව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාදෙන යම් තීරණයකින් අතෘප්තියට පත්වන යම් පාර්ශ්වයක් විසින් බදු අභියාචනා කොමිෂන් සභාව වෙත කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම පිළිබඳ විධිවිධාන සැලැස්වීම වේ."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පැහැදිලිවම දැන් මේක ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින නඩු කටයුත්තක් - *sub judice.* [බාධා කිරීමක්] මා ඔබතුමාගෙන් අහන්නේ- [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, do you want to answer that?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I will answer that. Sir, this is not *sub judice*. What we are bringing today is not *sub judice*.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

No, no. Let me finish. මා ඔබතුමාට ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි, ඔබතුමන්ලා ගෙනාපු කෙටුම්පතේම ඒ කොටස අයින් කරලයි තිබෙන්නේ කියා. ඉතිරි වෙලා තියෙන කැල්ල මොකක්ද? එතකොට මේ කැලි දෙක ගැනද අපි විවාද කරන්නේ?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

කැලි දෙකක් වුණත්, එක කැල්ලක් වුණත් මේක ඉදිරිපත් කරන එක-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේකේ ඇති දෙයක් නැහැ. "අපනයනකරුවකු යැයි නිශ්චිතව දැක්වෙන.... අවස්ථාවෝචිත පරිදි..."-[බාධා කිරීමක්] මම කියන්නේ මේක- [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I am sorry, Hon. Dayasiri Jayasekara, that is not a point of Order. Hon. Minister, you may carry on.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Sir, it is very clear that this is Government Business. It maybe that after discussions, we have reduced a certain part of it which we have to do really in the Committee Stage. If we abandon this now, we cannot even remove that. So, I would like to place this before the House; we will take up the amendments in the Committee Stage. I want to emphasize that this Bill is not under challenge at all. The fact that it is not under challenge means that we can discuss it in this House. If somebody else felt that the provisions of this Bill would impinge on the provisions of something else, then they would have gone to courts and pointed that out. So, it is clear as that.

So, Mr. Deputy Chairman of Committees, I would like to rest the case there. This is Government Business. We want this Bill passed. We do not anticipate any subsequent difficulties. At present, there is only a challenge. We do not know what the findings or what the determination of the courts would be. How can some Members of the House anticipate the findings or the determination of the court and tell us that we should desist from proceeding on this matter? We are supreme. So, we can take that decision. If an adverse decision is made about the other matter - we do not even know whether it is being challenged on that particular ground - then, we can take measures at that time.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රශ්නය ඒක නොවෙයි. අපි දැන් උසාවියේ විභාග වෙමින් පවතින කාරණයක් පිළිබඳව මේ ගරු සභාවේ සාකච්ඡා කරනවා. සාකච්ඡා කරලා අවසානයේදී මේ ගරු සභාව ගන්නා තීන්දුව අනුව උසාවියට සිද්ධ වෙනවා, ලංකාවේ පාර්ලිමේන්තුව උත්තරීතරයි කියන පදනමේ ඉඳගෙන මේ ගරු සභාවේ සම්මත කරපු එක අනුමත කරලා එවන්න. එතකොට එතැනදී සම්පූර්ණයෙන්ම උසාවියේ කාරණයක් අපේ අතට ගැනීමක් සිද්ධ වෙන්නේ. ඇයි ඒ? යම් කිසි පනත් කෙටුම්පතකට අදාළව උසාවියේ විභාග වෙමින් පවතින කාරණයක් පිළිබඳව අපි පාර්ලිමේන්තුවේ විවාද කර සම්මත කර ගැනීම තුළ, උසාවියට සිද්ධ වෙනවා, සති දෙකක් ඇතුළත උසාවියට යා හැකියි කියන කාරණය මත උසාවියට ගන්න තිබෙන තීන්දුවක් පැත්තකට විසි කරලා පාර්ලිමේන්තුවේ තීරණය මත උසාවියේ තීන්දුව දෙන්න. එතකොට මේක පැහැදිලිව නැවත නැවතත් දැන් ඉන්න අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයත් හැල්ලුවට ලක් කිරීමේ වැඩ පිළිවෙළක්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, the Judiciary is not going to follow the Parliament's decision. It is independent.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Sir, I think these are very amateurish arguments. Firstly, there is no challenge to this Bill. Do you agree on that? There is no challenge to this Bill in the Supreme Court. [*Interruption.*] Of course, it is not.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Why not? The decision of this Bill is connected to the other Bill.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

So, we do not know under what it is being challenged. The fact that that particular Bill - [*Interruption.*] No, no. In that case, somebody would have gone to the Supreme Court and said that this is impinging on the other Bill. There is no such thing. Now, it is up to us to decide whether we have to proceed on it. Sir, you have given a Ruling. If we are to discuss on legal matters, I think we can get better lawyers from the Opposition. We should try to get some better lawyers if that is the question. - [*Interruption.*] So, we are submitting - [*Interruption.*]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

You are kind of a doctor - [*Interruption.*]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Who mentioned about you? You are getting excited.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
You are a so-called local - [*Interruption.*]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Do not get excited.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Dayasiri Jayasekara, do not disturb the Hon. Minister's speech. The next speech is yours. So, you can raise any matter at that time.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
He can answer these things. - [*Interruption.*] Sir, I am moving the Second Reading of this Bill and then anybody can make his observations regarding the legal aspects and so on. As far as we are concerned, there is no challenge to this. We do not know the particulars under which the other matter has been challenged; we do not know what the final determination will be in respect of that. And, I have great doubts whether the challenge there will have any implications on this. That is a matter that only time will tell. So, as far as the Government is concerned, we want this Bill passed with the amendments. Subsequently, if there are any difficulties, then, we can deal with that matter. There is no law - because we do not have entrenched clauses in our Constitution - to say that it cannot be re-discussed by this House, Sir. That is up to us. There are no entrenched clauses; there is nothing in our Constitution which says that once a law is passed, it cannot be recanvassed. This House is supreme. So, let us work on that basis. The decision whether we should present this or not is left to us because this is Government Business. You can oppose. You can have your point of view. But, finally, it is up to the Government to decide whether they are going to proceed with this Legislation or not.

Thank you.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ. භා. 3.16]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ආචාර්යතුමා ඉගෙන ගත්ත පුද්ගලයකු විධියට අනෙක් අයටත් යම් කිසි ගෞරවයක් ඇතිව කථා කළ යුතුයි. එවැනි ක්‍රමවේදයක් තිබෙනවා. එතුමා හිතා ගෙන ඉන්නේ එතුමා සියලු දේ දන්නවා කියලා. නමුත් එතුමාට වඩා නීතිය ගැන මම දන්නවා. එතුමා ආර්ථික විද්‍යාව පිළිබඳව දන්නවා. ඒ නිසා තමයි එතුමාගේ නායකත්වය යටතේ අද රටේ ආර්ථිකයට මේ වින්නැහිය වෙලා තිබෙන්නේ. මම දන්නේ නැහැ, එතුමා නායකත්වය දෙනවාද, කවුරු නායකත්වය දෙනවාද කියලා. නමුත් එතුමාට වඩා නීතිය ගැන මා දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකයි මම බොහොම පැහැදිලිව කිව්වේ, මේ බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පතේ 4වන වගන්තිය සම්බන්ධව දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබෙනවා; එහි තිබෙන්නා වූ කාරණා තමයි ආපසු අපි මේ රේගු (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ සාකච්ඡා කර ගෙන යන කාරණය තුළ තිබෙන්නේ කියලා. එතුමන්ලා කොටසක් අයින් කරලා තිබුණාට ඇත්ත වශයෙන්ම මේකේ කථා කරන්න දෙයක් නැහැ. මේකේ තිබෙන්නේ වගන්ති කිහිපයක් විතරයි. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. මේ ගැන සාකච්ඡා කරලා අවසාන වශයෙන් අපි මෙය සම්මත කළායින් පස්සේ බැරි වෙලාවත් ශ්‍රේෂ්ඨාධිකරණය මේ බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ආණ්ඩුවේ මතය සම්බන්ධව, ආණ්ඩුවේ තීරණයට පක්ෂපාතීව මොනවා හෝ තීන්දුවක් දුන්නොත් අපි මේ සාකච්ඡා කර සම්මත කර ගත්ත ඒකේ තේරුමක් නැතිව යනවා. ඒක වෙනම කාරණයක්. ඒක තමයි ආණ්ඩුවේ මතය. මොකද, ආණ්ඩුවට ඕනෑ තීන්දුව ගන්න තමයි "අපේ කෙනෙකු" පත් කර ගෙන තිබෙන්නේ. ඒකයි තිබෙන ප්‍රශ්නය. අපි ඊට කලින් ශ්‍රේෂ්ඨාධිකරණයට උඩින් ගිහිල්ලා මෙතැන වැඩේ සම්මත කර ගෙන ඉවරයි. එතකොට මොකක්ද ශ්‍රේෂ්ඨාධිකරණය ගන්න තීන්දුව? මෙන්න මේකයි අපි කථා කරන්නේ. ඉතින් ඒක තේරෙන්නේ නැති වුණාම ආර්ථිකය ගැන කථා කරලා හරි යන්නේ නැහැ.

මේ සියලු කාරණා ඇති වෙලා තිබෙන්නේ වෙන හේතුවක් නිසා නොවෙයි, මේ ආණ්ඩුවේ තිබෙන උද්ධච්චකම නිසායි. ඒකයි තිබෙන ප්‍රශ්නය. තමුන්නාන්සේලාගේ තිබෙන උද්ධච්චකම නිසා තමුන්නාන්සේලා මේක රේගු නිලධාරීන් එක්ක සාකච්ඡා කළේ නැහැ. බදු අභියාචනා කොමිෂන් සභාවට මේක ගළපන්න බැහැ. ඇත්ත වශයෙන් මෙතැනදි කරන්න හැදුවේ මේකයි. සාමාන්‍යයෙන් මේ දඩ මුදල් සම්බන්ධ තත්ත්වය අපි දන්නවා. මේ දඩ මුදල්වලින් සියයට 50ක් විතර රේගු නිලධාරීන් විසින් භාණ්ඩාගාරයට යවනවා. ඒකෙන් තමයි ආණ්ඩුව - [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සංශෝධනය යටතේ - [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න. මේක විවාදයට ගෙනාවායින් පස්සේ දැන් ඔබතුමන්ලා මොකක්ද කියන්නේ? එහෙම නම් එදාට පසුව ඇවිල්ලා ආපහු මේ ගැන කථා කරන්න එපා. දැන් අපට කථා කරන්න දෙන්න. ඔබතුමා මෙච්චර වෙලා කථා කළා නේ. ඔබතුමන්ලා ගෙනෙනවාය කියන එකක් ගැන උපකල්පනය කරලා තමයි දැන් මට කථා කරන්න වෙලා තිබෙන්නේ. ඇයි? [බාධා කිරීමක්] නැහැ, නැහැ. තමුන්නාන්සේලා අයින් කළාට රේගු නිලධාරීන් - [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රේගු දෙපාර්තමේන්තුවේ ඉන්න නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා මේවා කරනවා නම් කමක් නැහැ. ආණ්ඩුවට කොහෙන් හරි සල්ලි ගන්න ඕනෑ වුණාම, ආණ්ඩුව කොහේ හරි

[ගරු දයාසිරි ජයසේකර මහතා]

තිබෙන එකකට විදිනවා. ඒක තමයි මෙතෙක් කළේ. මේ කරන්න හදන්නේත් ඒකමයි. මොකද, මේ ත්‍යාග අරමුදල කියන එකේ විශාල මුදලක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. දක්ෂතා තිබෙන රේගු නිලධාරීන් ඉන්නවා. සමහර වෙලාවට ඔවුන්ගේ ජීවිත පරදුවට තබා තමයි මේ වැටලීම් කරන්නේ. ඒ වැටලීම් කරන අතරේ ඔවුන්ට ලැබෙන ත්‍යාග අරමුදල යම් කිසි විධියකට බෙදිලා යනවා. එහෙම බෙදිලා යන නිසා තමයි, හොරකම් කරන්නේ නැතුව, මං කොල්ල කන්නේ නැතුව ශ්‍රී ලංකා රේගුව හරිහමන් විධියට තමන්ගේ වැඩ කටයුතු ටික කර ගෙන යන්නේ. ප්‍රශ්න තිබෙන සමහර කාරණා ඇති.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. (Dr.) Sarath Amunugama.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Sir, I have tabled an amendment that I am going to present at the Committee Stage. That amendment deletes *in toto* this section regarding the - [*Interruption.*] So, it is utterly irrelevant because I have given an assurance that that will not be part of the legislation. It is absolutely clear.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You carry on, Hon. Member.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Do not worry about my speaking on this. Why? This is the saga that you have made for these four to five days. That is why - ශ්‍රී ලංකා රේගුව ගිහින් strike කළේ. ඉතින් ඒවා ගැන -තමුන්නාන්සේලා ඒකට විදින්න හදනවාය කියන එක ගැන- අපට කථා කරන්න අවස්ථාව තිබෙන්න ඕනෑ. [බාධා කිරීමක්] ඇයි, ඕකට කලබල වන්නේ? මෙතැනදී කරන්න හැදුවේ වෙන එකක් නොවෙයි. මේකේ තිබෙන විශාල මුදල භාණ්ඩාගාරයට ගන්නයි හැදුවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අරගෙන තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
භාණ්ඩාගාරයෙන් ගෙනෙන්න හදන වැඩ පිළිවෙළකුත් තිබෙනවා නේ. අනික් සල්ලි ටික අපි ඇරලා තිබෙනවා. රුපියල් බිලියන තුනක්, හතරක් හැම දාම අපි යවා තිබෙනවා. තමුන්නාන්සේලා මේකට වැඩේ දුන්නායින් පස්සේ ඒකත් ඉවර කර ගන්න තමයි මේ කල්පනා කළේ. අවුරුද්දකින් භාණ්ඩාගාරයට ගන්නවාය කියා මේකේ තිබුණා. ඒ වාගේම ආයෝජනය කරන වැඩ පිළිවෙළක් සකස් කරලා තිබුණා. රේගු නිලධාරීන් දන්නේ නැහැ, මේ සල්ලි ගන්නේ කොච්චරද, ආයෝජනය කරන්නේ කොහොමද, ආයෝජනය කළාම ඒ අයට ගන්න පුළුවන්ද, ඒ ඒ නිලධාරියාට ලබා ගන්න පුළුවන් ප්‍රමාණය කොපමණද කියලා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ තිබෙන උද්ධච්චකමේ ප්‍රතිඵලය තමයි මේ තිබෙන්නේ. තමුන්නාන්සේලාට තුනෙන් දෙකක බලයක් තිබෙන නිසා ඕනෑම එකක් ගෙනැල්ලා සම්මත කර ගන්න පුළුවන් කියලා හිතේ තියා ගෙනයි ඉන්නේ. ඒක නිසා තමයි මේකටත් විදින්න හැදුවේ. හැබැයි ඒකට විරුද්ධව උද්ඝෝෂණය කරන්න රේගු නිලධාරීන්ට සිද්ධ වුණා; වැඩ වර්ජනය කරන්න සිද්ධ වුණා. ඊළඟට කර ගන්න දෙයක් නැතුව මේක අකුළා ගන්න ආණ්ඩුවට සිද්ධ වුණා. දැන් කරන්න හදන්නේ හොරෙන්ම මේක සම්මත කරලා, මේකට සමානුපාතිව අනික් පැත්තෙන් -ශ්‍රේෂ්ඨාධිකරණය පැත්තෙන්- තමන්ගේ යාළුවාගෙන් තීන්දුවක් ගන්න හදන එකයි. අපි බලමු, තව සතියක්, දෙකක් ඇතුළත ආපසු මේක ගෙනෙනවා. එතකොට රේගුවට ආපසු උද්ඝෝෂණය කරන්න වනවා; ආපසු වැඩ වර්ජනය කරන්න වනවා. ඒකයි අපි කිව්වේ රේගුවේ නිලධාරීන් එක්ක, එහෙම නැත්නම් රේගුවේ සංගම් එක්ක සාකච්ඡා කළා නම් අද මේ තත්ත්වය උද්ගත වන්නේ නැහැ කියලා. තමුන්නාන්සේලාට වුවමනා වෙලා තිබෙන්නේ කොහේ හරි තිබෙන සල්ලි ටිකක් එකතු කර ගන්නයි. ඒ නිසා තමයි මේකටත් විදින්න හදන්නේ. තමුන්නාන්සේලා වැඩ පිළිවෙළක් විධියට හදා ගෙන හිටපු ක්‍රමවේදයක් තමයි අද මේ අකුළා ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මා ඒ ගැන කනගාටු වනවා. දවස ගණනේ සංශෝධන දමනවා. උදේට එකක් දමනවා, දවාලට එකක් දමනවා, 2.45ට එකක් දමනවා, ආපසු තව එකක් දමනවා. එක එක වෙලාවට එක එක සංශෝධන දමනවා. තමුන්නාන්සේලා කරන මේ වැඩ නිසා කථා කරන්න සූදානම් වෙලා ආපු ඒවා නොවෙයි, අපටත් කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්]

ඒ නිසා ඔබතුමා විරුද්ධ වෙලා වැඩක් නැහැ. මොකද මේවා ගැන තමයි මම කථා කරන්න ආවේ. දැන් ඔබතුමන්ලා ඒකේ තිබුණු ඒවාත් අහෝසි කරගෙන. ඒවා පිළිබඳව ලබන සතියේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීරණ දුන්නාම අපට නැවත ඒවා ගැන කථා කරන්න වෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද සිද්ධ වෙලා තිබෙන දෙය බලන්න. මෙච්චරයි -රේගුව විතරයි- බේරිලා තිබුණේ. ගරු ඇමතිතුමනි, මා මේ කියන කාරණය ඔබතුමාත් දන්නවා ඇති. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ එතුමාට නියෝගයක් ආවා. එතුමාට ප්‍රශ්න ගොඩක් ආවා, රේගුවේ ලොකු හොරකම්, වංචා තිබෙනවාය කියලා. එතුමාට යෝජනාවක් ආවා පොලීසිය දමලා රේගුව යම් කිසි විධියකට පාලනය කරන්න බලමුය කියලා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කිව්වා, "රේගුව කියන්නේ ඒ විධියටම වැඩ කරන ආයතනයක්, එහෙම අල්ලන්න පුළුවන් ක්‍රමවේදයක් හදන එක වැරැදියි" කියලා. එතුමා කල්පනා කළේ රේගුවෙන් ලැබෙන ටික ගන්නවා මීසක රේගුවත් පාලනය කරන්න ගියොත් තිබෙන එකත් නැතිව යන්න පුළුවන් කියලායි. ඒ නිසා එතුමා ඒකට ඉඩ දුන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද සිද්ධ වෙමින් තිබෙන්නේ මොකක්ද? අද තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? හැම තැනම දේශපාලන බලපෑම්. දවස ගණනේ එක එක දේශපාලන බලපෑම් කරලා රේගුවේ තිබෙන ස්වාධීනත්වයත් අහෝසි කරන තැනකට තමයි අද පත් කරමින් ඉන්නේ. රේගු දෙපාර්තමේන්තුවේ තිබුණු ස්වාධීනත්වය, ඔවුන්ට යම් කිසි විධියකට මේ වැටලීම් කරන්න තිබුණු හැකියාව මොට කරමින්

දවස ගණනේ දේශපාලන අත පෙවීම් කරනවා. ඒ නිසායි මා මේවා කියලා දෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ කාරණයක් කියන්න ඕනෑ. නුගේ පාරේ තිබුණු Consolidated Cargo ආයතනයට දිගින් දිගටම ප්‍රශ්න ආවා. දේශපාලනඥයන් විසින් දවස ගණනේ මේ ආයතනයේ කටයුතුවලට අත ගහනවා. එක ඇමතිවරයෙක් ඇවිත් නුගේ පාරේ තිබුණු මේ ස්ථානයේ ගේට්ටුවට ඉබ්බෙක් දමලා වහලා ගියා. මේ වන තුරු තමුන්නාන්සේට ඒ ගැන මොකුත් තීරණයක් ගන්න බැරිව ගියා. තමුන්නාන්සේලාට සල්ලි ඕනෑ නම් සල්ලි හොයා ගන්න විධි සහ ක්‍රම ඕනෑ තරම් තිබෙනවා. [බාධා කිරීමක්] මා කියන්නම්. පසු ගිය දවස්වල ආණ්ඩුවට රුපියල් කෝටි 562ක් අහිමි වුණා. දැන් ඔබතුමාට මේවාට විදින්න ඕනෑ නැහැ. රේගුවෙන් හොරෙන් බඩු ගෙනැල්ලා, ඇමතිවරුන්ගේ බලය පාවිච්චි කරලා containers මුදාගෙන යන එක, ඇමතිවරුන්ගේ දේශපාලන බලපෑම්, ඉහළ කාර්යාලවලින්, ජනාධිපති කාර්යාලයේ ඒ නිලධාරීන්ගේ callsවලින් බඩු අරගෙන යන එක නතර කළා නම් මේකට අවශ්‍ය කරන, රටට අවශ්‍ය කරන බඩු ටික තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මේ කාර් කැලි ජාවාරම කරගෙන යන හැටි මා කියන්නම්. රේගු ආඥාපනතේ නීතිවලට සම්පූර්ණයෙන්ම පටහැනිව තමයි මේ ජාවාරම කරගෙන යන්නේ. තමුන්නාන්සේලා දන්නවා, Vehicles Lanka (Pvt.) Limited සිටුවේ තිබෙන්නේ. මේ සමාගමට ආයෝජන මණ්ඩලයෙන් බලපත්‍රය දීලා තිබෙන්නේ වාහන එකලස් කරලා ඒ වාහන ප්‍රතිඅපනයනය කරන්නයි. දැන් එතැන මොකක්ද කරන්නේ? සීඒ 1124/9/8 දරන නඩු අංකය යටතේ මේ ආයතනයට නඩුවක් තිබුණා. මොහු 2000 වසරේ අභියාචනාධිකරණයේ පෙත්සමක් ගොනු කෙරුවා. ඒ පෙත්සම අනුව බොහොම පැහැදිලිව අභියාචනාධිකරණය තීන්දුව දුන්නා මේ ආයතනය වටලා අවශ්‍ය කරන කටයුතු ටික කරන්න පුළුවන්ය කියලා. ඒ විතරක් නොවෙයි, රේගු ආඥාපනතේ 2වන රෙගුලාසියේ "ඒ" කියන උපලේඛනයෙන් 1996දී නිකුත් කරන ලද ගැසට් නිවේදනය අනුව සම්පූර්ණ තිරු බදු නොගෙවා වාහන කොටස් එකවර ගෙන්වීම කරන්න බැහැය කියලා මේ තීන්දුවත් එක්කම අභියාචනාධිකරණය බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා. මොහු මොකක්ද කරන්නේ? මොහුට තිබෙන බලපත්‍රය අනුව කළ හැක්කේ වාහන කොටස් ගෙනැල්ලා එකලස් කරලා ප්‍රතිඅපනයනය කිරීමයි. දැන් මොහු මොකද කරන්නේ? වාහනයේ engine එකේ ඉස්සරහා කැල්ල ගලවනවා. පිටුපස තිබෙන ඩිකිය කැල්ල ගලවනවා. එහෙම ගලවලා මුළු වාහනයම අරගෙන එනවා. අරගෙන ඇවිත් වාහනයට රුපියල් ලක්ෂ පහ ගණනේ දීලා වාහනය නිදහස් කර ගන්නවා. වාහනය නිදහස් කරගෙන එහෙම පිටින්ම වාහනය ලංකාවේදී විකුණනවා. තමුන්නාන්සේ රේගුවත් එක්ක සාකච්ඡා කරලා බලන්න. [බාධා කිරීමක්] මොකක්ද? [බාධා කිරීමක්] ඒක තමයි මා කියන්නේ. කවුරු බලපත්‍රය දුන්නත් 2000දී දීලා තිබෙන්නේ. [බාධා කිරීමක්] නැත්තේ මොකද? මේ තිබෙන්නේ. මා ළඟ ලැයිස්තුව තිබෙනවා. ඒකයි අහන්නේ නියෝජ්‍ය ඇමතිතුමනි. දුන්නේ කවුද, කවදාද කියලා ඔබතුමා අහන්නේ ඔබතුමාගේ දිස්ත්‍රික්කය නිසා නේ. ඒක නේ ඩුලිප් විජේසේකර නියෝජ්‍ය ඇමතිතුමාට පොඩ්ඩක් රිදිලා තිබෙන්නේ. මේ Vehicles Lanka (Pvt.) Limited ආයතනය කාර්වල පිටුපස කොටස් ගලවනවා; ඉස්සරහා කොටස් ගලවනවා. එහෙම ගලවලා වාහන අරගෙන එනවා. වාහන 2,250ක් සඳහායි මේ බලපත්‍රය දීලා තිබෙන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට විනාඩියක් දෙනවා නම් මා ඔය කාරණය පැහැදිලි කරන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔව්, කියන්න ගරු ඇමතිතුමා. හැබැයි, හුඟාක් වේලාව ගන්න එපා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන් අපේ කැබිනට් මණ්ඩලයෙන් තමයි තීන්දුව ගත්තේ ඒක නවත්වන්න. ඒ වෙලාවේ තමයි ඒ මහත්මයා උසාවියට ගියේ. රජයේ තීන්දුවට විරුද්ධව තමයි උසාවියට ගියේ. ඔබතුමා දන්නවා නේ ඒක. ඒ හින්දා මේ සම්බන්ධයෙන් යම් කිසි විධියකට යම් කිසි ලකුණක් වැටෙනවා නම් ඒක වැටෙන්න ඕනෑ අපේ Cabinet එකටයි. ගරු එස්.බී. දිසානායක ඇමතිතුමනි, ඔබතුමා දන්නවා නේ, ඒ Cabinet Paper එක ආවාම -[බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමා, ඔබතුමා දන්නවාද දැන් සිද්ධ වෙලා තිබෙන දේ? ගරු ඇමතිතුමා, ඔබතුමා හරි. කැබිනට් මණ්ඩලය ඒ තීන්දුව ගත්තාය කියන්න. නමුත් තවමත් ඒ ක්‍රමයම ක්‍රියාත්මකයි.

ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

නැහැ, නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැත්තේ මොකද? තවමත් ඒ ක්‍රමය ක්‍රියාත්මක- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මා ඔබතුමාට කියන්නම්. ඒ විධියට කටයුතු කරගෙන යන කොට තමයි රේගු අධ්‍යක්ෂවරයකු අල්ලසක් ගත්තා කියලා අල්ලා දෙන්න වැඩ පිළිවෙළක් සකස් කළේ. සමහර අවස්ථාවලදී අපිත් එතුමාට විරුද්ධව නඩුවලට ගිහින් තිබෙනවා. නමුත් එතුමාගේ කාර්ය භාරය සම්බන්ධව අප කියන්න ඕනෑ. කනගසබෙයි රන්ජන් මහත්මයා තමයි ඒ රේගු අධ්‍යක්ෂවරයා. එතුමා රේගුවට යන කොට එහේ සාමාන්‍ය ආදායම වෙලා තිබුණේ රුපියල් මිලියන 37යි. එතුමා හිටපු අවුරුදු 4ට රුපියල් මිලියන 635 ගණනේ රේගුව ආදායම් ලබා තිබෙනවා. එහෙම කරපු කෙනකුගේ රැකියාව තමයි දැන් අහිමි කරලා තිබෙන්නේ. ඒ, අර බඩු ගෙනෙන්න දුන්නේ නැති එකේ ප්‍රතිඵලයයි. අත්සන දැමූ සල්ලි ගෙනැල්ලා මේසය අස්සට දාලායි ඒ මනුස්සයා අල්ලා ගත්තේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මේසය අස්සට දාලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේසය අස්සට සල්ලි වීසි කරලා තමයි ඒ මනුස්සයා අල්ලා ගත්තේ. බොහෝ දක්ෂ එවැනි නිලධාරීන් බොහොම පැහැදිලිව එහෙම පිටින් විනාශ කර දමනවා දේශපාලනය ඒ ආයතන තුළට රිංගවාගෙන. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා Cabinet එක විධියට

[ගරු දයාසිරි ජයසේකර මහතා]

තීන්දුව ගත්තා තමයි. එතැනින් පස්සේ ආපු containers ටික රේගුවෙන් නතර කළා. නතර කළාට පස්සේ ඒක නිදහස් කරන්න කියලා දිගින් දිගට බලපෑම් කළා. බලපෑම් කළ නිසා ඒක නිදහස් කළේ නැහැ. හැබැයි නිදහස් කරන්නේ නැතිව ඉන්න කොට තමයි ඒ රේගු අධ්‍යක්ෂවරයා අත් අඩංගුවට අරගෙන ඔහුට අද රස්සාව නැති කරලා තිබෙන්නේ. ඒකයි මා කියන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට එක කාරණයක් කියන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කියන්න, ගරු ඇමතිතුමා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ බලපත්‍ර දෙන්න කැබිනට් මණ්ඩලය එකඟ වුණේ නැහැ. එය ඉතාම පැහැදිලියි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි ඉතින් මා කියන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඊට පස්සේ, උසාවිවලට ගිහිල්ලා වෙනත් වෙනත් තීන්දු ගත්තු එක වෙනම දෙයක්. මෙහිදී දේශපාලන වශයෙන් වරදක් කළා කියලා කියන්න එපා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ඔබතුමාට කිව්වේ ඒක නොවෙයි. Cabinet එක එකඟ වුණු එක හරි. උසාවියත් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළා. ඒකත් හරි. හැබැයි, කාගේ බලවත් හස්තයකින්ද මේ පුද්ගලයා ඒවා ගෙනැල්ලා නිදහස් කර ගන්නේ? මා ඒකයි තමුන්නාන්සේලාගෙන් අහන්නේ. ඔබතුමන්ලා කොතරම් කෑ ගැහුවත් වැඩක් නැහැ. මේකයි සිද්ධ වන්නේ. මේකට අත ගහන ප්‍රමාණය කොපමණද කියලා අපට හිතාගන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනෙක් එක, ගිය පාර race එකට ගෙනාපු අයි සුඛෝපභෝගි වාහන සම්බන්ධ කාරණයයි. වාහන 47ක් ගෙනාවා. Conditional imports and exports සම්බන්ධයෙන් තිබෙන වැඩ පිළිවෙළ යටතේ ඒවා ගෙනාවා. මොකක්ද ඒවාට කළේ? මේ වනතුරු ඒවාට සල්ලි ගෙවිවේ නැහැ. ඒවා, ලැම්බෝගිනි, ෆෙරාරි ආදි සුඛෝපභෝගි වාහනයි; race සඳහා ගෙනාව ඒවායි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Re-export කරලා-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ. Re-export කරලා නැහැ. ෆෙරාරි, ලැම්බෝගිනි, මැසරාටි ඇතුළු සුඛෝපභෝගී වාහන 47ක් ලංකාවට ගෙනාවා. මම බොහොම පැහැදිලිව ඔබතුමාට කියනවා, ඒ වාහනවලට මේ වනතුරු බදු ගෙවලා නැහැ කියා. වාහන 47ක්. [බාධා කිරීමක්] නැහැ, නැහැ. කොහේටවත් යවලා නැහැ. එහෙම නම් කරුණාකර ඔබතුමා මට කියන්න, මෙන්න මෙපමණ ප්‍රමාණයක් යවා තිබෙනවා කියලා ඒ පිළිබඳ විස්තර ටිකත් එක්ක. සාමාන්‍යයෙන් රේගුව කරන්නේ ඒවා අරගෙන යන්න දෙන එකයි. ඊට පස්සේ Sri Lanka Customs එකට ගෙවන්න තිබෙන ප්‍රමාණය අදාළ ආයතනය විසින් ගෙවනු ලබනවා. එහෙම නැත්නම් කරන්නේ මොකක්ද? වැඩියෙන් Sri Lanka Customs එකට ගෙවලා තිබෙනවා නම් Sri Lanka Customs එක ආපසු ඒ අයට ගෙවන එකයි කරන්නේ. එහෙමයි කරන්නේ. මම ඔබතුමාට වගකීමක් ඇතිව කියනවා, මේ වනතුරු ඒ වාහන 47ට ම ශත පහක්වත් ගෙවන්නේ නැතිව තමයි නිදහස් කරගෙන තිබෙන්නේ කියලා. ඒ, කාගේ බලපෑමක් මතද? කවුද ඒ පිටුපස ඉන්නේ? කවුද ඒවා නිදහස් කරන්න කියලා කථා කරලා තිබෙන්නේ? මේක තමයි අද රේගුවට අත් වෙලා තිබෙන ඉරණම. මෙතරම් ඉරණමක් අත් වෙලා තිබෙද්දී තමයි තමුන්නාන්සේලා අද මෙවැනි යෝජනා ගෙනැල්ලා රේගුවේ තිබෙන ඉතිරි අඩු පාඩු ටිකත් කඩා දමන්න අවශ්‍ය කටයුතු මෙසේ ලැහැස්ති කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා තවත් කාරණයක් කියන්න කැමැතියි. ප්‍රභූවරුන් එන කොට -අප නොවෙයි, ඇමතිවරුනුත් නොවෙයි, ඇමතිවරුන්ටත් ටිකක් උඩින් ඉන්න, තවත් උඩින් ඉන්න අය එනකොට- ඒ අයගේ ආරක්ෂකයන් නිකම් අර පලතුරු මල්ලට පැනපු වඳුරන් ටික වාගෙයි කටයුතු කරන්නේ. තිබෙන බඩු ටික ඔක්කෝම අරගෙන යනවා. සාමාන්‍යයෙන් ඒ අයට Airport එකෙන් ගන්න පුළුවන් ඩොලර් 187.50ක භාණ්ඩ විතරයි. නමුත් මේ අය තීරු බදු නීති සම්පූර්ණයෙන් පැත්තකට විසි කරලා ඒ අයට වුවමනා බඩු එතැනින් අරගෙන යනවා. මේ විධියට තමයි දිගින් දිගටම ක්‍රියා කරන්නේ. අද සිද්ධ වෙමින් තිබෙන්නේ ඒකයි. දවසින් දවස නිලධාරීන්ගේ කාර්යභාරය සම්පූර්ණයෙන් විනාශ කරනවා; ඔවුන්ගේ ස්වාධීනභාවය කෙලෙසනවා. ඔවුන් සම්පූර්ණයෙන්ම පැත්තකට විසි කරන තැනකට තමයි අද කටයුතු කෙරෙන්නේ. මීට වැඩිය හොඳයි තමුන්නාන්සේලා වෙනම team එකක් දාගෙන මේ වැඩ කර ගත්තා නම්. මොකද, රේගුව දැන් කටයුතු කෙරෙන ආකාරය අනුව මේ රටට ගෙනෙන භාණ්ඩ කිසිම තැනකදී බලන්න විධියක් නැහැ. අද අර ස්ත්‍රීතු වගයක් ගෙනත් වෙලා තිබෙන දේ දන්නවා නේ? ඒ ස්ත්‍රීතු රේගු නිවාරණ අංශයෙන් අල්ලාගෙන, රේගු නිවාරණ අංශයෙන්ම ඒවා අරගෙන යන්න හැදුවා ඔරුගොඩවත්තට. ඔරුගොඩවත්තට අරගෙන යන්න හදනකොට තමයි සුරාබදු දෙපාර්තමේන්තුවෙන් ඇවිත් අල්ලා ගත්තේ. ඉස්සෙල්ලාම ඒවා අල්ලා ගත්තේ රේගුවෙන්. රේගුවේ Preventive Division එකෙන් අල්ලා ගෙන ඔරුගොඩවත්තට ගෙනිහින් පරීක්ෂා කරන්න අදාළ පුද්ගලයා එන තුරු ඉන්නයි හැදුවේ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඊයේ නීතීඥ මහත්වරු මොකක්ද කිව්වේ? "මේක ඇතුළේ තිබුණු බඩු අරගෙන තිබෙනවා, ඒ නිසා මේ වගකීම ගන්න බැහැ" කිව්වා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු, ඇමතිවරු මේ සම්බන්ධයෙන් ගහගන්නවා. මම ගිය සතියේ websitesවලින් දැක්කා ඒ අය ගහ ගන්න හැටි. අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා බණිනවා ජොනී ඇමතිතුමාට. ජොනී ඇමතිතුමා බණිනවා අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට. එතුමා බණිනවා ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහත්මයාට. මම දන්නේ නැහැ කවුරු කසිප්පු ගෙනෙනවාද කියලා. වෙනදා විස්කි බීබී හිටියා. දැන් විස්කිත් නැහැ. දැන් බොන්න වෙලා තිබෙන්නේ පෙන්ටලයිට්වලට දාන තිනර්. දැන් තිනර් තමයි බොන්න

සිද්ධවෙලා තිබෙන්නේ. ඇයි? වෙනදා අඩුම තරමින් අපි දැන ගත්තා, මේක "විස්කි" කියලා. මේක double distilled කියලා. එදා අපි මොනවා හෝ දෙයක් හඳුනා ගත්තානේ. හොඳින් පෙරාපු එකද, භාගයට පෙරාපු එකද කියලා දැන ගත්තානේ. දැන් ඒ මොකුත් නැහැ. දැන් කෙළින්ම තිනර් බොන්නයි වෙලා තිබෙන්නේ. ඇයි? තමුන්නාන්සේලා containers ගණන් ඒවා ලංකාවට ගෙනෙනවානේ.

අද රට මේ තැනට වැටිලා තිබෙන තත්ත්වයක් අපි දකිනවා.

'"The Dictator" කියන චිත්‍රපටියේ චාලි චැප්ලින් ලෝක ගෝලය හැම තැනම තිය තියා, විහිළු කර කර සෙල්ලම් කර කර ඉන්නවා. දැන් ලංකාවේ ඉන්න අයත් හිතා ගෙන ඉන්නේ ඒ වාගේ. ලංකාවත් කර උඩ තියනවා, අත උඩ තියනවා, ඇඟ උඩ තියනවා. ඒ විධියට විහිළු කර කර, නට නටා ඉන්න තත්ත්වයට තමයි දැන් පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා මේ තත්ත්වය නතර කරන්න. රේගුවට නිදහසේ වැඩ කරන්න දෙන්න කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.35]

ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඇත්තටම චාලි චැප්ලින්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
චාලි චැප්ලින් වාගේ තමයි ඔබතුමන්ලා හැසිරෙන්නේ.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
මම ඔබතුමා දැක්කේ ඒ වාගේයි. ඒකයි ඇහුවේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රේගු (සංශෝධන) පනත් කෙටුම්පත ඇතුළු සංශෝධන පනත් කෙටුම්පත් කිහිපයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී විවාද කරන මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම ඉතාම සතුටු වෙනවා.

වේගයෙන් ඉස්සරහට යන රටක් වශයෙන් මේ රටේ යම් කිසි නීතියක් ඇති කරන්න, යම් කිසි විනයක් ඇති කරන්න, ශික්ෂණයක් ඇති කරන්න මුදල් ඇමතිතුමා වශයෙන් අතිගරු ජනාධිපතිතුමාත්, ඒ වාගේම ගරු සරත් අමුණුගම නියෝජ්‍ය අමාත්‍යතුමාත් මෙවැනි අණ පනත් ගෙනෙන්න උත්සුක වෙලා කටයුතු කිරීම පිළිබඳව අපි අපේ සතුට ප්‍රකාශ කරන්න ඕනෑ.

නමුත් අපි කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. විශේෂයෙන් අපේ රජය මේ වාගේ විනය නීති, රේගු අණ පනත් ගෙනාවත් තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු තිබුණු කාලයේ -ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඒ කාලයේ සිටියේ නැහැ- රේගුවේ ප්‍රවීණ නිලධාරි මහත්වරුන්ට නොයෙක් තර්ජනවලට, ගර්ජනවලට වාගේම නොයෙක් අඩන්තේට්ටම්වලට මුහුණ දෙන්න සිදු වුණා. ඒ සිද්ධි ගැන මම මේ වෙලාවේ මතක් කරන්න උත්සාහ ගන්නේ නැහැ. එදා නීතියක් තිබුණේ නැහැ. එදා නීති වල් වැදිලා තිබුණේ. නීති වල් වැදුණු යුගයක් තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේ තිබුණේ. අද රටට නීතියක් ගෙනෙන්න යන විට තමුන්නාන්සේලා මේ ආකාරයෙන් කටයුතු කිරීම පිළිබඳ අපි මේ වෙලාවේ කනගාටු වෙනවා.

විශේෂයෙන් ගුවනින් හෝ මුහුදින් -වරායෙන් වෙන්න පුළුවන්, ගුවන් තොටුපොළින් වෙන්න පුළුවන්, ඊයේ පෙරේදා ආරම්භ කළ මත්තල ගුවන් තොටුපොළින් වෙන්න පුළුවන්- භාණ්ඩ ආයාත කිරීමේදීත්, නිර්යාත කිරීමේදීත් මෙවැනි විනිවිදභාවයෙන් යුතු අණ පනත් තිබීම අපට ඉතා වැදගත් වෙනවා.

කිසියම් කෙනෙකුට අසාධාරණයක්, අකටයුත්තක් සිද්ධ වෙනවා නම් ඒ පිළිබඳව රේගු අධ්‍යක්ෂ ජනරාල්තුමාත් සමඟ සාකච්ඡා කරලා සාධාරණයක් ඉෂ්ට කරන්න කටයුතු කිරීම මම හිතන විධියට ඉතා වැදගත්. ඒ වාගේ වෙලාවක ධනාත්මකව හිතලා කටයුතු කිරීම තමයි ඉතා වැදගත් වන්නේ. මේ පනත තුළින් එවැනි අවස්ථාවක් ලබා දෙනවා. ඒක ඉතා වැදගත්. ඒ නිසා ඕනෑම කෙනෙකුට යම්කිසි අකටයුත්තක් සිදු වුණා නම් වඩාත් ඉදිරියට ගිහින් සාධාරණ විනිශ්චයක් ලබා ගන්න පුළුවන්. යම් භාණ්ඩයක් ආයාත කිරීමේදී වෙළ-හෙළඳාමක් කිරීමේදී- ඔහුට සැලසෙන වාසිය අනුව ඔහු ක්‍රියාත්මක වෙනවා.

2010 අවුරුද්දේ රුපියල් බිලියන 460ක්, 2011 අවුරුද්දේ රුපියල් බිලියන 465ක්, 2012 අවුරුද්දේ රුපියල් බිලියන 485ක් රේගු ආදායම හැටියට අපි ලබාගෙන තිබෙනවා. ඒ වාගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරා බදු දෙපාර්තමේන්තුව ඒ විධියට ආදායම් ලබාගෙන තියෙනවා. මේ යෝජනා සම්බන්ධව අද එක එක පිරිස් යම් යම් දේවල් කියන්න ඉඩ තිබෙනවා. ඒ වෘත්තීය සංගම් වෙන්න පුළුවන්, නිලධාරීන් වෙන්න පුළුවන්. ඔවුන් ප්‍රායෝගිකව සම්බන්ධ වෙන අවස්ථා ගැන කල්පනා කරලා ඔවුන්ට තිබෙන ගැටලු පිළිබඳව ජනාධිපතිතුමා හෝ මුදල් ඇමතිතුමා හෝ රජය හෝ දැනුවත් කිරීම කාලීනව වැදගත්. යමක් වැරැදි නම් ඒ වැරැදි දේ නොකර හරි දේ පමණක් ක්‍රියාත්මක කිරීමයි වැදගත් වන්නේ. ප්‍රායෝගිකව සිද්ධ වෙන යම් ආකාරයේ කටයුත්තක් ගැන වඩාත් විනිවිදභාවයකින් යුක්තව බලන්න පුළුවන් විධියට රජය මේ අණපනත් ගෙන එමින් කටයුතු කිරීම සම්බන්ධව අපි සතුටු වෙනවා.

විශේෂයෙන් රේගු ආඥා පනත සංශෝධනය කිරීමෙන් මේ රටට ලැබිය යුතු, තවමත් නොලැබෙන විශාල ආදායමක් ලබා ගන්න හැකි වන බවක් අපි දකිනවා. අපට නොලැබෙන අවිනිශ්චිත මුදල් නිශ්චිතව වශයෙන් ලබා ගන්න අවස්ථාවක් සැලසීම තුළින්, සංවර්ධන ක්‍රියාවලියේදී රේගුවේ සහාය ලබා ගෙන ලොකු ගමනක් යන්න පුළුවන් කියන විශ්වාසය මා තුළ තිබෙනවා. මේ රටේ සංවර්ධනයේදී අපට රේගුවේ සහාය නිරන්තරයෙන් ලබා ගන්න පුළුවන්.

අපි දැක්කා, ඊයේ පෙරේදා මෙවැනි අණපනත් ගෙනෙන විට මේ පාර්ලිමේන්තුව තුළ බරපතළ ලෙස විවේචනයට ලක් වුණ බව. වරාය ගැන ඒ වාගේම ගුවන් තොටුපොළ ගැන විවේචනයට ලක් වුණා. මේ වාගේ යෝජනා තුළින් නිලධාරීන් තව තවත් ප්‍රවීණ තත්ත්වයට පත් කරලා, ඔවුන් පුරුදු පුහුණු කිරීම සඳහා වැඩසටහන් සකස් කරලා, වඩාත් විනිවිදභාවයකින් යුක්තව ඒ ආයතන ක්‍රියාත්මක කර ගෙන අපට වැඩි ආදායමක් ලබා ගන්න, අපේ සේවා වැඩි දියුණු කරන්න අවස්ථාව ලැබෙනවා.

එක අවස්ථාවක මේ රටෙන් වෙනත් රටකට යන - transit - වෙන ඇත් දළ container වගයක් කොළඹ වරායේදී හෝ වෙනත් තැනකදී අත්අඩංගුවට ගන්න අපේ රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමත් වුණා. එවැනි කටයුතු කරමින් රේගු දෙපාර්තමේන්තුව එක්තරා පැත්තකින් රට තුළ විනයක් ඇති කරනවා. සමහර විට මත් ද්‍රව්‍ය සම්බන්ධව වෙන්න පුළුවන්;

[ගරු රෝහණ දිසානායක මහතා]

වෙනත් දේවල් සම්බන්ධව වෙන්න පුළුවන්. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, කොයි රජය තිබුණත්,- [බාධා කිරීමක්] ඔව්. ඒවා වෙනත් රටකින් ගෙනැත් තිබුණා. [බාධා කිරීමක්] මම internet එකෙන් දැක්කා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා හැම දාම විවේචනය කරන්නේ එහෙමයි. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා හැම දාම තේ කෝප්පයේ කිඹුලා දකිනවා නේ. ඒක ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රමය. [බාධා කිරීමක්] දයාසිරි මන්ත්‍රීතුමාත් එහෙමයි. ඒ ඔබතුමන්ලාගේ ක්‍රමය. මොකද, තමුන්නාන්සේලාට ජනතාවගේ ආකර්ෂණය නැති වෙලා ගිහින්. ජනතාව ඉස්සරහට ගිහින් බිම ඉඳගෙන තමුන්නාන්සේලා ආකර්ෂණීය වචන කථා කරන්න ඕනෑ. ජනතාවට දැනෙන විධියට කථා කරන්න ඕනෑ. හැබැයි, ඒක ඇත්ත නොවෙයි -යථාර්ථය නොවෙයි- කියන එක අපි තමුන්නාන්සේලාට පැහැදිලි කර දෙන්න ඕනෑ.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා "ලැම්බෝගිනි" ගැන කිව්වා. "ලැම්බෝගිනි" නොවෙයි, මේකට "ජම්බෝගිනි" කියන්න ඕනෑ. දැන් අලි අතර ගිනි ඇති වෙලා තිබෙන්නේ. ඒක "ලැම්බෝගිනි" නොවෙයි. "ලැම්බෝගිනි" ගැන කියන එක මම පිළිගන්නේ නැහැ. ඒක "ජම්බෝගිනි". අපේ තලතා අතුකෝරල මන්ත්‍රීතුමියත් අද මේ ගරු සභාවේ සිටිනවා. අද මොකද වෙලා තිබෙන්නේ? අද තමුන්නාන්සේලා අතර ප්‍රශ්න ඇති වෙලා. අද තමුන්නාන්සේලා අතර ගිනි ඇති වෙලා. [බාධා කිරීම්] ඔබතුමියට මම කියන්නේ.

"ලැම්බෝගිනි" ගෙනාවේ මේ රටේ ක්‍රීඩාවේ අලුත් යුගයක් ඇති කරන්නයි. හැබැයි, "ජම්බෝගිනි" නිසා මොකක්ද වෙලා තිබෙන්නේ? අද එක්සත් ජාතික පක්ෂය තුළ අවුල් ඇති වෙලා තිබෙනවා. [බාධා කිරීම්] අද එක්සත් ජාතික පක්ෂයේ තමුන්නාන්සේලාට විපක්ෂ නායකයා තෝරා ගන්න විධියක් නැහැ. දැන් විපක්ෂ නායකයා තෝරන්න වෙලා තිබෙන්නේත් ආණ්ඩු පක්ෂයටයි. [බාධා කිරීමක්] ඒක තමයි. අද විපක්ෂ නායකයා තෝරන්න වෙලා තිබෙන්නේත් ආණ්ඩු පක්ෂයටයි. ඒක තමයි ඇත්ත. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා එහෙම ඒක දන්නවා නේ. මම කියන්න ඕනෑ නැහැ නේ. මොකද, සමහර වෙලාවට එතුමාත් ඉන්නේ අපත් එක්ක. [බාධා කිරීම්] ඔබතුමන්ලාට අද පැහැදිලි නායකත්වයක් නැහැ. ඇතුළේ තිබෙන ප්‍රශ්න මොනවාද කියලා මේ මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා එහෙම කියනවා. එතුමා අපට කිව්ව දේවල්වලට වඩා නොකිව්ව දේවල් වැඩියි කියලා නිතර දෙවේලේ අපිත් එක්ක කියනවා. මම කියන්නේ තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය ගැන, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ගැන, ඔබතුමන්ලා ගහන කැරලි ගැන, අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ගැන.

තමුන්නාන්සේලා හැමදාම කළේ විවේචනය කරන එකම නේ. මම එක උදාහරණයක් කියන්න ඕනෑ. අපි අධිවේගී මාර්ගය හදන කොට - Southern Expressway එක හදන කොට- "අයියෝ ඕකේ යන්නේ කවුද" කියලා කිව්වා. එහෙම කථා කළා නේ. දැන් අද වෙලා තිබෙන්නේ මොකක්ද? දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් අද රුපියල් කෝටි ගණනක ආදායමක් ලැබෙනවා. විපක්ෂයේ ඉන්න තමුන්නාන්සේලා හැමදාම මේවා දැක්කේ ඍණ විධියටයි. හැමදාම ඍණ විධියට තමයි තමුන්නාන්සේලා මේවා දැක්කේ. මේවා දිහා ධනාත්මකව බලන්න. අධිවේගී මාර්ග හැදිලා අතුරු මාර්ග හැදිලා රටක මාර්ග පද්ධතිය සංවර්ධනය වෙලා තිබෙනවා. වරායවල් ඇති වෙනවා. වරායන් ඇති වෙන කොට Sri Lanka Customs එක එතැනට යනවා. මාගම්පුර වරාය හැදෙන කොට Sri Lanka Customs එක එතැනට යනවා. Sri Lanka Customs එකේ අලුතින් රැකියා ලබා දෙන්න, අලුතින් නිලධාරීන් බඳවා ගන්න, ඒ තුළින් යම්කිසි ආදායමක් ලබා ගන්න පුළුවන් වෙනවා. එවැනි අවස්ථා ඇති වෙනවා. මත්තල ගුවන් තොටුපොළ හැදුණාම එතැනට Sri Lanka Customs එක යනවා. මම හිතන්නේ ඒක තමයි වෙන්න ඕනෑ. රටක සංවර්ධනය සිදු වන විට ඍජුව සහ වක්‍රව ආදායම් මාර්ග ඇති වෙනවා. දැන් බලන්න, මත්තල ගුවන් තොටුපොළ ඇති කිරීම ගැන අපි සතුටු වෙනවා. ඒ නිසා ඒ ප්‍රදේශයේ නව හෝටල් සංකීර්ණ හැදෙනවා. ඒ වාගේම ආදායම් මාර්ග වැඩි වෙලා තිබෙනවා. වෙළෙඳ සංකීර්ණ හැදෙනවා. විශාල පිරිසක් මේවා ගැන උද්‍යෝගයෙන් කථා කරනවා. හැබැයි, පාර්ලිමේන්තුවට ආවාම නැත්නම් වෙනත් තැන්වලට ගියාම විපක්ෂයේ මන්ත්‍රීවරු ඒ සංවර්ධනය ගැන කවදාවත් සතුටු වන්නේ නැහැ. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා එහෙම බලන්නේ වෙනත් විධියකටයි. ඒ නිසා ඒවා පිළිබඳව යථාර්ථය දකින්න පුළුවන් පිරිසක් ඇති වෙන්න ඕනෑ. අපි ඒවායේ යථාර්ථය දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රාජ්‍ය ආදායම් තත්ත්වය විශාල වශයෙන් වැඩි කර ගන්න, උපාධිධාරීන්ට රැකියා ලබා දීලා ඒ තරුණ ජවය මේ රටේ සංවර්ධනයට යොදා ගන්න කටයුතු කරනවා. මම හිතන්නේ රැකියා වියුක්තිය ඉතිහාසයේ අඩුම අගයකට ගෙන එන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ වාගේම අපට උද්ධමන වේගය අඩු කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. මම හිතන්නේ ආණ්ඩුවක් විසින්; රජයක් විසින් කරන්න ඕනෑ මේ දේ තමයි. "දිවි නැඟුම" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කොට රටේ පවුල්වල ආර්ථික ශක්තිය වැඩි වෙනවා. ඔවුන් බල ගැන්විලා මේ රටේ ජාතික නිෂ්පාදනය වැඩි කරන්න එකතු වන පිරිසක් බවට පත් වෙනවා. ඒ වාගේම සේවා ලබා දෙන පිරිසක් බවට පත් වෙනවා. ඒකපුද්ගල ආදායම දිහා බැලුවාම සේවාවල අගය සහ නිෂ්පාදන වැඩි දියුණු කිරීම සිදුවෙලා තිබෙනවා. පසු ගිය යුගයේ -2004 වන විට - ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 836ක වාගේ අගයක තිබුණේ කියලා අපි දැක්කා. එදා ඩොලරයක වටිනාකම රුපියල් 100 නම් ආදායම රුපියල් 82,500යි. හැබැයි, අද වන විට ඒක ඇමෙරිකානු ඩොලර් 3,000 ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. ඒක නිකම්ම ආවේ නැහැ. රජය ගත් නොයෙක් ක්‍රියා මාර්ග, නොයෙක් ප්‍රතිපත්තිමය තීන්දු නිසා තමයි -මේවා ගැන අවදියෙන් ඉඳ ගෙන රජය ගත් තීන්දු නිසා තමයි- ඒකපුද්ගල ආදායම වැඩි වුණේ. රජය නිකම් බලා ගෙන සිටියේ නැහැ. මේ රජය අවදියෙන් සිටින රජයක්. රේගුව ගැන බලන, බදු සංශෝධනයන් පිළිබඳව බලන, ඒ වාගේම රටේ නොයෙක් තැන්වල සිදු වන කාර්යයන් පිළිබඳව අවදියෙන් සිටින රජයක් වශයෙන් මේ කටයුතු ක්‍රියාත්මක කරනවා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිතුමා වශයෙන් අද ඒ වගකීම නියම ආකාරයෙන් ඉෂ්ට කරනවා. ඒක තමයි වැදගත් වන්නේ. එතැන දී යම් ආකාරයක තාක්ෂණික ප්‍රශ්න තියෙන්න පුළුවන්. තාක්ෂණික ප්‍රශ්න තිබුණොත් තාක්ෂණිකව ඒ ගැටලු විසඳා ගැනීමේ ක්‍රමවේදය අප තුළ තිබෙනවා. ඒවා වඩාත් ප්‍රජාතන්ත්‍රවාදීව, නිවැරදිව කර ගන්න ක්‍රමවේදයක් අපට තිබෙනවා. ඒ නිසා අද ගෙනැවිත් තිබෙන මේ රේගු (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් අනාගතයේ ජාත්‍යන්තර වෙළඳාමේ කටයුතුවලදී -ජාත්‍යන්තරයත් එක්ක කටයුතු කිරීමේ දී- අපට වඩාත් ලෙහෙසියෙන් පහසුවෙන් ඒවා කරන්න පුළුවන් ක්‍රමවේදයන් රේගුව තුළට එනවා.

ඒ නිසා රේගු නිලධාරීන්ට වඩාත් මානසික තෘප්තියකින් යුක්තව කටයුතු කරන්න පුළුවන් අවස්ථාවක් ඇති වෙලා තිබෙනවා. පසු ගිය එක්තරා යුගවලදී රේගු නිලධාරීන්ට වෙඩි තියලා ඝාතනය කරපු අවස්ථා අපි දැක්කා. එවැනි අවස්ථා අපි දැක්කා. ඔවුන්ගේ ජීවිතවලට, ඔවුන්ගේ පවුල්වලට තර්ජනය කරපු අවස්ථා අපි දැක්කා. ඔවුන්ව සුරක්ෂිත කිරීමත් අපේ වගකීමක්. රජය මෙවැනි අණ පනත් ගෙන ඒම තුළින් ඔවුන්ව සුරක්ෂිත කිරීමත් සිද්ධ වෙනවා.

ඒ වාගේම අද දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වාහන ගැන කථා කළා. එතුමා මෙතැන නැති වුණත් මම කථා කරන්න ඕනෑ. හැබැයි අද මේ රටේ මයික්‍රෝ සමාගම ගැන අපට කථා කරන්න පුළුවන්. ඒ කර්මාන්තශාලාවට ගිහින් බලන්න, අපේ තරුණ තරුණියෝ කොයි තරම් පිරිසක් ඒ කර්මාන්තශාලාවේ වැඩ

කරනවාද කියලා. එම කර්මාන්තශාලාවෙන් කරන්නේ value addition ව්‍යාපෘතියක්. ඒ කියන්නේ අමතර වටිනාකම් එකතු කිරීමේ ව්‍යාපෘතියක්. වාහන කොටස් කරලා පිට රටින් ගේන්න පුළුවන්. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියන්නේ කුමක් අරබයාද කියලා මම දන්නේ නැහැ. වාහන කොටස් කරලා ගෙනැල්ලා මෙහේදී එකලස් කරලා විදේශගත කරන්න පුළුවන් නම්, -පිර රට පටවන්න පුළුවන් නම්- එහෙම නැත්නම් ඒ වාහන දේශීය වෙළෙඳ පොළට ලබා දෙන්න පුළුවන් නම් මේ රටට අලුත් තාක්ෂණයක් එකතු වෙනවා. ඒ වාගේම මේ රටට අවශ්‍ය වාහන අමතර කොටස් හැදීමට, සමහර විට අපේ රබර්වලට හොඳ මිලක් අරගෙන හොඳ ටයරයක් නිෂ්පාදනය කිරීමට, ඒ වාගේම පැති කණ්ණාඩියක් හදන්න, ඒ වාගේම carpet එකක් හදන්න, ඒ වාගේම buffer එකක් හදන්න අපට මේ ද්‍රව්‍යවලින් යම් කිසි ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වෙනවා. ඊට අමතරව ඒ ද්‍රව්‍යවලට වටිනාකමක් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා.

ඒ නිසා අද විශ්ව ගම්මානයක් තුළ - global village එකක් තුළ - කටයුතු කිරීමේදී අපි ඒ සඳහා සුදුසු වූ පිරිසක් බවට පත් වෙන්න ඕනෑ. ඒක දිහා අපි හැමදාම දකින ඇසෙන් බලා, ඍණ විධියට බලා හැමදාම මන්දගාමීව ආපු විධියට යන්න අවශ්‍ය නැහැ. මට තමුන්නාන්සේලාට කියන්න ඕනෑ ඒකයි. අපි තමුන්නාන්සේලා ගැන දැක්කා. මට මතකයි එක්සත් ජාතික පක්ෂ රජය 2001 දී පත් වුණා. 2001 දී පත් වෙලා මොනවාද කිව්වේ ගරු අස්වර් මන්ත්‍රීතුමනි? දවස් 100 වැඩසටහනක් ගැන කිව්වා, ඒ වාගේම වෙනත් වෙනත් වැඩසටහන් ගැන කිව්වා. මොනවාද කළේ? කිසිම දෙයක් කරන්න බැරි වුණා. අඩුම ගණනේ ගොඩනැඟිල්ලක හුණු ටිකක්වත් ගාන්න බැරි වුණානේ. ඒ වාගේම පාරකට තාර ටිකක් දාන්න බැරි වුණානේ. කිසිම දෙයක් කළේ නැහැ. අද මේ රජය ගෙන යන වැඩ පිළිවෙළ දැක්කාම ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයට ගමේ ඡන්ද පදනම නැති වෙලා තිබෙනවා. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණට ගමේ ඡන්ද පදනම නැති වෙලා තිබෙනවා. ඒක නිසා මොකක් හරි අමාරුවකට කොට්ටය මාරු කරනවා, මේට්ටය මාරු කරනවා වගේ අද විපක්ෂය උත්සාහ කරන්නේ මේකට පිළියමක් වශයෙන් නායකයෝ මාරු කරන්නයි. ඒ කට්ටිය හිතනවා නායකයෝ මාරු කළොත් මේකට උත්තරයක් ලැබෙයි කියලා. නායකයෝ මාරු කළාට වැඩක් නැහැනේ. තිබුණු එකමනේ තිබෙන්නේ. [බාධා කිරීමක්] ඔව්, ඒක තමයි. දැන් නායකයෝ මාරු කරලා මේ ගමන යන්න උත්සාහ කරනවා. ඒක තමයි ඇත්ත. ඒක නිසා වැඩක් කරන්න බැරි, ජනතාවගේ ආකර්ෂණයක් නැති, ජනතාවගෙන් ගිලිහුණු දේශපාලන පක්ෂවලට නායකයෝ මාරු කිරීම තුළින් උත්තරයක් ගන්න බැහැ. ඒ නිසා අපි ඉතා පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. අද රජය ගෙන යන වැඩ පිළිවෙළත් එක්ක වඩාත් ශක්තිමත්ව මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න අපට අවශ්‍ය වෙලා තිබෙනවා.

ඊ ළඟට, අපි කිව්වා, උද්ධමනය සියයට 7 දක්වා අඩු කර ගන්න ඕනෑ කියලා. රටකට ප්‍රශ්න එනවා. යම් යම් අවස්ථාවලදී ජාත්‍යන්තරයෙන් අපට ප්‍රශ්න ඇවිල්ලා තිබෙනවා. අද ඉන්දියාවෙන් ප්‍රශ්න ඇවිල්ලා තිබෙනවා. ඉන්දියාවෙන් මොන ප්‍රශ්න ද ඇවිල්ලා තිබෙන්නේ? අද අපි කොන්ද කෙළින් තියාගෙන කටයුතු කරන කොට අපට ජාත්‍යන්තරයෙන් එවැනි තර්ජන එල්ල වෙනවා. මේ හැම ප්‍රශ්නයක් තුළම තිබෙන්නේ මොකක්ද? ඊළාම් ත්‍රස්තවාදය.

:

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමා, කොන්ද කෙළින් තියා ගෙන මෝඩ වැඩ කරන්න එපා.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ඒ කියන්නේ? [බාධා කිරීමක්] තමුන්නාන්සේ මෝඩ වැඩ කරමින් කොන්ද කෙළින් තියාගන්න උත්සාහ කරනවා. ඒ දෙපැත්ත තමයි තිබෙන්නේ. නිරන්තරයෙන් මෝඩ වැඩ කරමින් කොන්ද කෙළින් තියාගෙන ඉන්න තමුන්නාන්සේ උත්සාහ කරනවා. ඒක තමයි තමුන්නාන්සේට වැරදිලා තිබෙන්නේ. ඒක අපි එදා ඉඳලා අද වෙනකල් දැක්කානේ. තමුන්නාන්සේට කවදාවත් නැඟිටින්න දෙන්නේ නැහැ. තමුන්නාන්සේට ඔතැන ඉඳලා නැඟී සිටින්නත් බැහැ. ඒකයි තමුන්නාන්සේට අද සිද්ධ වෙලා තිබෙන්නේ. ඒක ප්‍රායෝගිකව සිද්ධ වෙලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බලමුකෝ.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

මොනවාද බලන්නේ? බලන්න කිසි දෙයක් නැහැ. හෙට අනිද්දා වෙන කොට තමුන්නාන්සේට හම්බන්තොට අත හැරලා මැද කොළඹට හරි, වෙන කොහාට හරි එන්න වෙනවා. මොකද, අද හම්බන්තොට ඇති වෙලා තිබෙන තත්ත්වය දිහා බලන කොට; හම්බන්තොට පාරවල් හදන කොට, හම්බන්තොට ගුවන් තොටුපළවල් හදන කොට, හම්බන්තොට වරායවල් හදන කොට සජිත් ප්‍රේමදාස මහත්මයාට හම්බන්තොට ඉඳගෙන තවත් දේශපාලනය කරන්න බැහැ. ඒක තමයි ඇත්ත. ඒ ඇත්තත් එක්ක තමුන්නාන්සේ ජීවත් වෙන්න.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

රත්නපුරේත් එහෙමයි. මොකද, සබරගමුව පළාතේ රත්නපුරය කියන්නේ හම්බන්තොටට අල්ලපු වැටනේ. තමුන්නාන්සේලා අද සිහින මවනවා. තමුන්නාන්සේලා බලා ගෙන ඉන්නවා මේක කොයි වෙලාවේ වැටෙයි ද කියා. අර එළුවා පස්සෙන් ගිය නරියා වාගේ තමුන්නාන්සේලා දැන් බලාගෙන ඉන්නවා කොයි වෙලාවේ මේක වැටෙයිද කියා. වැටෙන්නේ නැහැ. මේ ගමන ඉතාම හොඳින් යනවා. එම නිසා මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ, රජය ගෙන යන මේ වැඩ පිළිවෙළට තමුන්නන්සේලාගේ සහයෝගය ලබා දෙන ලෙසයි. විවිධ අවස්ථාවලදී වැදගත් අනපනත් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, අවධානයෙන් යුක්තව මේ රටේ සංවර්ධනය ක්‍රියාත්මක වෙනකොට ඍජුව සහ වක්‍රව ඒ සඳහා උදව් උපකාර කිරීම තමුන්නාන්සේලාගේ යුතුකමක්. විවේචනය කරන්නට ඕනෑ. විවේචනය සාධාරණ විවේචනයක් වන්නට ඕනෑ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. සාධාරණ විවේචනයක් වන්නට ඕනෑ. සාධාරණ විවේචනයකදී අපට පුළුවන්, ඒ ගැන කථා කර, සාකච්ඡා කර අවසාන කරන්න. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Sunil Handunnetti. You have 12 minutes.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
I have 15 minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
We started this Debate late.

[අ. භා. 3.54]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රේගු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී අප ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නට උත්සාහ කළේ මේ කාරණා සම්බන්ධවයි. රේගු නිලධාරීන්ට අදාළව තිබෙන ත්‍යාග අරමුදල් ආණ්ඩුව යටතට පවරා ගන්නට සංශෝධන ගේන්න එක පැත්තකින් ආණ්ඩුව උත්සාහ කරනවා. ඒ වාගේම රේගු පනතට අදාළ කර රේගුව විසින් පනවන තීරුබදු සම්බන්ධයෙන් ආනයන කරුවන්ට සහ අපනයන කරුවන්ට අභියාචනා කොමිසම ඉදිරියට යන්න ඉඩ හදනවා.

එම වෘත්තීය සමිතිවලින් සහ අප ඉදිරිපත් කළ කාරණා මත ඒ රේගු ත්‍යාග අරමුදල පවරා ගැනීම පිළිබඳ වගන්තියට අදාළ සංශෝධනය ඉවත් කර ගෙන තිබෙනවා. එතකොට මෙතැන ඉතිරි වන්නේ මොකක් ද? ත්‍යාග අරමුදල් පිළිබඳ සංශෝධනය ඉවත් කර ගත්තාට පසුව මෙතැන ඉතිරි වන්නේ අභියාචනා කොමිෂන් සභාවට අදාළව රේගු පනතේ 10 වන වගන්තියට කරන සංශෝධනයයි. එතැනදී ගැටලුව මතු වී තිබෙන්නේ මෙයයි. දැන් බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත ගැන වෙනම උසාවියට ගිහින් තිබෙනවා. ඒ පිළිබඳව දැන් අධිකරණයේ නඩු නිමිත්තක් ඇති වෙලා තිබෙනවා. ඒ නඩු නිමිත්ත සහ දැන් අද සාකච්ඡා කරන කාරණය එක හා සමානයි. ඒක එහෙම වුණත් ඉහළට ගැටලුව මතු වන්නේ මෙන්න මේ නිසායි කියන එක ගරු ඇමතුමාගේ අවධානය යොමු කරන්නට ඕනෑ. මේ කරන සංශෝධනය අනුව බදු අභියාචනා කොමිෂන් සභාව යටතට dispute එකක් හැටියට, අරාවුලක් හැටියට සඳහන් කරලා රේගු පනත යටතේ රේගු බදු පැන වීමකට අදාළව කෙනෙකුව නම් කරන්නට පුළුවන්ද කියන එකයි මෙතැන තිබෙන ගැටලුව. මොකද අප දන්නවා, ආදායම් බදු සම්බන්ධ ප්‍රශ්නයකදී නම්, පුද්ගලයකු ආදායම් බදු හෙළිදරව් කළාට පස්සේ තමන් අනාවරණය කරන ප්‍රමාණය සහ තක්සේරුකරුවන් ඉදිරිපත් කරන ප්‍රමාණය අතර ගැටලුවක් මතු වුණාම ඒ ගැටලුව අරාවුලක් හැටියට -dispute සඳහන් කර බදු අභියාචනා කොමිෂන් සභාව ඉදිරියට යන්නට පුළුවන්කම තිබෙනවා. ඒ පිළිබඳවත්, ශ්‍රී පවන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමා, නීතිපතිවරයා හැටියට සිටි වර්තමාන අග්‍ර විනිශ්චයකාරතුමා විවිධ නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. එහෙම තිබියදී පවා ආදායම් බදු සම්බන්ධයෙන් පුද්ගලයෙකුට, ආයතනයකට බදු අභියාචනා කොමිෂන් සභාවට යන්නට පුළුවන්ය කියන එක ගැන විවාදයක් නැහැ. ඒක අපට පිළිගන්නට පුළුවන්.

ගරු ඇමතිතුමනි, රේගුවේදී ඇති වන ගැටලුවක් -රේගුවේදී ඇති වන ආරාවුලක්, රේගුව පනවන බද්දක්- රේගු බද්දක් පිළිබඳව ඒක විතරක් අදාළ කර ඒක එතැනට ගන්නට බැහැ. මොකද හේතුව? රේගු බදු පනවන්නේ ජාත්‍යන්තර නීතිරීති අනුවයි; ජාත්‍යන්තර guidelines අනුවයි. ඒකේදී තිබෙනවා, භාණ්ඩ මත බදු වර්ගීකරණයක්. භාණ්ඩ විස්තරයක් තිබෙනවා. ඒ වාගේම රේගු බද්ද ගෙවීමෙන් නිදහස් කිරීම් තිබෙනවා. ඒ රේගුව මත සිදු වන විවිධ ක්‍රියාවලියක් තිබෙනවා. මේ රේගුවේ තිබෙන සියලු තත්ත්වයන් පිළිබඳ විග්‍රහ කර ගන්න බදු අභියාචනා කොමිෂන් සභාවේ ඉන්න නිලධාරීන්ට, ඒ කොමිෂන් සභාවේ නියෝජිතයන්ට හැකියාවක් තිබෙනවා ද? ගැටලුව මතු වන්නේ මෙතැනදීයි. අප උදාහරණයක් හැටියට මේ ඊයේ පෙරේදා ගෙනා එතනෝල් සම්බන්ධ ප්‍රශ්නය ගනිමු. ඊයේ පෙරේදා ගෙනා නීති විරෝධී අරක්කු සම්බන්ධයෙන් අද ඒ අයිතිකරුවා කියනවා, 'ඒවා නීති විරෝධී නැහැ' කියා; 'මම දන්නේ නැහැ' කියා. මොකද, ඒක රේගු නිලධාරීන් විසින් විවෘත කළේ අයිතිකාරයා නැතිවයි. අප කියනවා, අයිතිකාරයා නැතිව රේගු නිලධාරීන් ඒක විවෘත කළේ නාමික අයිතිකාරයයි, ඇත්ත අයිතිකාරයයි දෙන්නාම නිදහස් කරන්න අවශ්‍ය නිසා බව. මොකද දැන් අධිකරණයට ගියාට පස්සේ අධිකරණය ඉස්සරහ දී කියන්න පුළුවන්, "මම දන්නේ නැහැ, මගේ භාණ්ඩ කන්ටේනරය ඇතුළට මේවා කවුරු හරි දාලා, මම දැක්කේ නැහැ, මේක විවෘත කරන කොට" කියලා. එවැනි ගැටලුවක් ආ වෙලාවේ දී ඒක dispute එකක්. මේ බදු අභියාචනා කොමිෂන් සභාව වාගේ එකක් දුර්වල විධියට අටවලා තිබුණොත් එහෙම එතැන ගැටලුවක් නිර්මාණය වෙනවා. ඒක වඩා -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව දෙන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, මට විනාඩි දොළහයි නේ තිබෙන්නේ. [බාධා කිරීමක්] නැහැ, නැහැ, ඔබතුමා ගන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා කියන තත්ත්වය ඇති වෙන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා තීන්දුවක් නොදුන්නොත් පමණයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එය නැවත කියන්න. ඒ කියපු දේ මට ඇහුණේ නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා කියන තත්ත්වය ඇති වෙන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල් නියමිත කාලය තුළ එතුමාගේ නියෝගයක් දුන්නේ නැත්නම්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. ගරු ඇමතිතුමනි, එහෙම නම් දැනටත් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ මේ බලතල තිබෙනවා. එතකොට මේකට එහායින් වෙනම බදු අභියාචනා කොමිෂන් සභාවකට රේගු බදු සම්බන්ධයෙන්, තීරු බදු සම්බන්ධයෙන් නීතියක් ආදේශ කළාම ගැටලු නිර්මාණය වෙනවා. මම එය සරලව කියන්නම් කෝ. යම් පුද්ගලයෙකුට රේගු බද්දක් පනවනවා. ඒ පුද්ගලයා "මේක ගැළපෙන්නේ නැහැ, මට අදාළ නැහැ, මට සුදුසු නැහැ" කියලා බදු අභියාචනා කොමිෂන් සභාවට යනවා. බදු අභියාචනා කොමිෂන් සභාවට ගියාම ඒ පුද්ගලයාට ගහන බදු අනුපාතය අඩු කළොත් එහෙම මොකද වෙන්නේ? රටේ පොදු බදු අනුපාතයක් තිබෙනවා. රටේ

පොදු බදු අනුපාතයක් තිබෙද්දී අදාළ පුද්ගලයාට විශේෂත්වයක් කළොත් එහෙම මොකක්ද වෙන්නේ? අපි හිතමු, මේ බදු අභියාචනා කොමිෂන් සභාවම එහෙම නියෝගයක් දුන්නාය කියලා. අපි දන්නවා, මේවා දේශපාලනීකරණය වුණු ආයතන බව. මේ ආයතන දේශපාලනීකරණය වුණු නිසා - [බාධා කිරීමක්] හරි, එය ඔබතුමාගේ අයිතිය. මේවා දේශපාලනීකරණය වුණු ආයතන. එතැන දී දේශපාලන හිතවත්කම් මත මේ වාගේ තීන්දු තීරණ අරගෙන අසාධාරණකම්, වෙනස්කම් සිද්ධ නොවෙයි කියලා සහතිකයක් දෙන්න බැහැ. මෙතැන තිබෙන බරපතළ දේ ඒකයි. යාළු මිත්‍රයෝ බේරන්න පුළුවන් ක්‍රමයක් මේක. වෙනස්කම් කරන්න ඕනෑ කෙනාට වෙනස්කම් කරන්න, ගලවා ගන්න ඕනෑ කෙනා ගලවා ගන්න, නීතිය කඩලා දෙන්න ඕනෑ කෙනාට කඩලා දෙන්න, නවලා දෙන්න ඕනෑ කෙනාට නවලා දෙන්න අවශ්‍ය විධියට හදා ගන්න ආයතන බවට මේවා පත් වෙනවා. ඒක තමයි ඇත්ත දේ. තමුන්නාන්සේලා අද එක වගන්තියක් ඉවත් කර ගත්තා. දැන් අපට කථා කරන්න වෙන්නේ ඉවත් කර ගත්ත වගන්තිය කියලායි. ඉවත් කර ගත්ත වගන්තිය ගන්න කෝ. ඉවත් කර ගත්ත වගන්තිය අනුව ත්‍යාග අරමුදල් සම්බන්ධ බලය "ඇමතිවරයා" අතට ගන්න යන කොට මොකද වෙන්නේ? ඇමතිවරයා කියන්නේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ඔබතුමා නොවෙයි. විෂය භාර ඇමතිතුමා, මුදල් අමාත්‍යවරයා. එතකොට මොකද වෙන්නේ?

මෙහි බොහොම පැහැදිලිව තිබෙනවා, ඇමතිවරයාගේ මාර්ගෝපදේශ පිළිබඳව. ඇමතිවරයාගේ මාර්ගෝපදේශ - guidelines - අනුව තමයි ඊ ළඟට ත්‍යාග අරමුදල් ලැබෙන්නේ කාටද කියලා තීරණය කරන්නේ. මොන පියවරේදී ද කියලා තීරණය කරන්නේ. ප්‍රශ්න එන්නේ එතැනදීයි. දේශපාලනඥයෙක් එතනෝල් ගෙන්වන කොට, දේශපාලනඥයෙක් නීති විරෝධී මත් ද්‍රව්‍ය ගෙනාවොත් ඒවා සම්බන්ධයෙන් රේගු නිලධාරියෙකු වැටලීම් කරන්න යයිද? ඇයි? රේගු නිලධාරියා දන්නවා, මේකට ගිහිල්ලා මට ත්‍යාග හමු වෙන්නේ නැහැ, මේක වටලලා මට හමු වෙන්නේ තෑගි නොවෙයි, punishments කියලා. තෑග්ග තීරණය කරන්නේ, තෑග්ග දෙන්නේ කොයි ප්‍රමාණයෙන් ද කියලා තීරණය කරන්නේ, ඒකට අවශ්‍ය guidelines තීරණය කරන්නේ විෂය භාර ඇමතිවරයා.

දැන් තිබෙන තත්ත්වය මොකක්ද? දැන් තිබෙන තත්ත්වය අනුව තමුන්නාන්සේලාට සියයට සියයක reward එක නම් ඒකෙන් සියයට 50ක් භාණ්ඩාගාරයට යනවා. ඒ සියයට 50න්, සියයට 60ක් ඒකාබද්ධ අරමුදලට යනවා. ඉතිරි සියයට 40න් තමයි ඔය ඔබතුමන්ලා හදන්න යන capacity building අරමුදල හදලා තිබෙන්නේ. ඒක අලුත් එකක් නොවෙයි. ගරු ඇමතිතුමනි, දැනටමත් රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල කියලා එකක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ පුළුවන් නම් නිලධාරීන්ගෙන් හොයා ගෙන හරි කියන්න, ඒ වන්දි අරමුදලේ තිබෙන රුපියල් බිලියන තුනට මොකද වුණේ කියලා. රුපියල් බිලියන තුනක් මේ වන්දි අරමුදලේ තිබෙනවා. ඒ රුපියල් බිලියන තුන දැන් අන්තර්ධාන වෙලා; වාෂ්ප වෙලා. ඒ රුපියල් බිලියන තුනට තමුන්නාන්සේලාට වග කියන්න බැහැ. එහෙම තියෙද්දී තමයි දැන් මේ රේගුවේ ත්‍යාග අරමුදල සම්පූර්ණයෙන්ම ඇමතිවරයාගේ මාර්ගෝපදේශවලට තමුන්නාන්සේලා පවරා ගන්න යන්නේ. මීට කලින් තිබෙන එකේ ප්‍රශ්නයක් තිබෙන්නේ ඒකයි. මීට කලින් රේගු නිලධාරීන්ට විශ්වාසයක් තිබුණා, මම රුපියල් මිලියන 10ක -රුපියල් ලක්ෂ 100ක- වැටලීමක් කළොත් මට මෙන්න මෙච්චර reward එකක් ලැබෙනවාය කියලා. ඒක ගැසට් පත්‍රයේ පළ කර තිබෙනවා; ගැසට් නිවේදනයක් හැටියට තිබෙනවා. ඒක මාර්ගෝපදේශයක් නොවෙයි. මේ ගැන දැන් මොකක්ද කරන්නේ? සම්පූර්ණ guideline එක හැටියට මේ බලය ඇමතිවරයා අතට ගන්නවා. මම කියන්නේ එම බලය ඇමතිතුමා අතට ගැනීමෙන් ත්‍යාග අරමුදලේ ඉතුරු වන කොටස විතරක් නොවෙයි ගන්නේ, දේශපාලන බලයත් ගන්නවා කියලායි. මෙතැන තිබෙන භයානකම දෙය ඒකයි. දේශපාලන බලය ගන්නවා. රේගු නිලධාරීන්ට අනියමින් අනතුරු ඇඟවීමක් කරනවා, නිදහස් කරන්න ඕනෑ ඒවා මොනවාද, අල්ලන්න ඕනෑ ඒවා මොනවාද, වටලන්න ඕනෑ ඒවා මොනවාද, නැති ඒවා මොනවාද කියලා.

තමුන්නාන්සේලා මේ නීතිය පාර්ලිමේන්තුවේ සම්මත කර ගෙන තිබෙනවා නම්, එසේ තිබෙන වෙලාවේදී මැතකදී වාගේ ස්ත්‍රීතු තොගයක්, හොර අරක්කු තොගයක් ගෙනාවොත් ඒක වටලන්න රේගු නිලධාරියෙකුට තිබෙන ධෛර්යය මොකක්ද?

ඊළඟට තිබෙන දේ තමයි, ඒ වැටලීම කළාට පස්සේ ඒ වැටලීම කරන්නේ නීති විරෝධී කටයුත්තකට නම්, පනවන්නේ නීති විරෝධී දණ්ඩනයක් නම් ඒ දඩ ගැහිල්ල මත ඔහුට යන්න පුළුවන් තව අතරමැදි තැනක් හදනවා. ඒක තමයි බදු අභියාචනා කොමිෂන් සභාව. මොකද, බදු අභියාචනා කොමිෂන් සභාවේ නැහැ, ජාත්‍යන්තර රේගු ප්‍රමිතීන් පිළිබඳව, රේගු guidelines පිළිබඳව දැනුම තිබෙන අය. ඒ අය නොවෙයි එතැන ඉන්නේ. එතැන ඉන්නේ සාමාන්‍ය ආදායම් බදු ගණනය කරන අය නම්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් බදු ගණනය කරන කෙනෙක් නම් කොහොමද ඔහු රේගුවේ ප්‍රමිතිය දන්නේ; රේගුවේ බදු නිදහස් කිරීම් ගැන දන්නේ? රේගුවේ බදු ගැන දන්නේ රේගුව. ඒ නිසා විශේෂයෙන්ම තමුන්නාන්සේලා බදු අභියාචනා කොමිෂන් සභාව පනතට මේ රේගු පනත අදාළ කරනවා නම් අදාළ කරන්න ඕනෑ, 10 වන වගන්තියට නොවෙයි. අදාළ කරන්න ඕනෑ, 47 හා 57 වගන්තිවලින් පස්සේ.

ගරු නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමනි, උගත් ඇමතිවරයකු හැටියට තමුන්නාන්සේ මෙය අවධානයට ගන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, රේගු ආඥාපනතේ 47 සහ 57 වන වගන්තිවල තමයි ආදායම් ආරක්ෂණ නියෝග - Revenue Protection Orders - තිබෙන්නේ. ලොකු ගැසට් නිවේදන දෙකක් තිබෙනවා. ඒවායේ තමයි තිබෙන්නේ, එක එක භාණ්ඩවලට අනුගමනය කරන බදු මොනවාද, තීරු බදු මොනවාද, බදු වර්ගීකරණයන් මොනවාද, බදු codes මොනවාද කියලා. ඒවාටයි මේක අදාළ කර ගන්න ඕනෑ. ඒ නිසා මෙතැන වැරැද්දක් තිබෙනවා ගරු අමාත්‍යතුමනි. මම කියන්නේ තමුන්නාන්සේලා හොඳ දෙයක් හොඳ විධියට කරන්න ඕනෑ කියලායි. හොඳ දෙයක් වැරදි විධියට කළෝතින් ප්‍රතිඵලය වැරදියි. අපි එය හැම දාම කියනවා. ඒ නිසා මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන්න. මේ පනත් කෙටුම්පත අද ගැනීමෙන්ම ගැටලුවක් නිර්මාණය වනවා. මොකද, බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත තවම උසාවියේ තිබෙන නිසා ඔබතුමන්ලාට එය අභියෝගයක් බවට පත් වන බව මම අවධාරණය කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Achala Jagodage. - [*Pause.*] Not here. Then, the next speaker is the Hon. Athauda Seneviratne.

ගරු අකාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
කියන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමාට අදාළ කළ යුතු කොටස පෙන්වන්න මම කැමැතියි. ගරු ඇමතිතුමා, ඔබතුමන්ලාගේ බදු අභියාචනා කොමිෂන් සභාව පනත් කෙටුම්පතේ වගන්තියකට ගන්නවා නම් ගන්න ඕනෑ, ගැසට් නිවේදනය. මේ ගැසට් නිවේදනය පුස්තකාලයේ තිබෙනවා. ඕනෑ කෙනකුට බලා ගන්න පුළුවන්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you. Hon. Minister, please continue with your speech.

[අ. භා. 4.06]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රේගු ආඥාපනතට සංශෝධනයක් ගෙන ඒම සඳහා අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා.

ඉස්සර අපේ රටට භාණ්ඩ ආවේ බොහොම ටිකයි. පිට රටින් නැව එන කල් අපි කන්න බලා ගෙන ඉන්නවා කියන තේරුම තිබෙන සිංදුවකුත් තිබෙනවා. පිට රටින් ආවේ නැත්නම් අපට කන්න නැහැ කියන තත්ත්වයක් තමයි තිබුණේ. ඒ තත්ත්වය දැන් මුළු ලෝකයේම වෙනස් වෙලා. මුළු ලෝකයම පවතින්නේ ආනයන අපනයන පදනම යටතේ. අපේ භාණ්ඩ අපි නිපදවලා පිට රට යවනවා. අපේ සංවර්ධනයේ වැදගත් අංශයක් හැටියට අපනයනය ව්‍යාප්ත කරන්න පෞද්ගලික අංශයත්, රජයත් කටයුතු කරනවා. ඒ මඟින් අපි මේ රටට විදේශ විනිමය සොයා ගන්නවා; මුදල් සොයා ගන්නවා. ඒ අනුව අපි වැඩි වැඩියෙන් අපනයනය කරන්නට ධෛර්යයක් ශක්තියක් දෙන්නට කටයුතු කරනවා; උනන්දු කරවනවා.

අප කෘෂි කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කරන්න උත්සාහ කරනවා. ඒ කියන්නේ තේ, රබර්, පොල්, කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි යනාදී විවිධ භෝග නිෂ්පාදනය කර පිට රට යවනවා. ඒ වාගේම අපේ ඇඟලුම් නිෂ්පාදන පිට රට යවනවා. අප දැන් බිස්කට් පවා පිට රට යවනවා. ඒ වාගේ තවත් නොයෙකුත් භාණ්ඩ පිට රට යවනවා. අප ඒ මඟින් අපේ රටට විදේශ විනිමය හොයා ගන්නවා. අපේ අපනයනයන් දැන් අප වැඩි කරන්න යනවා.

පසු ගිය කාලයේ කෘෂි ක්ෂේත්‍රය ගැන උනන්දුව අඩු වෙමින් තිබුණා. මොකද, කෘෂි කර්මාන්තයේ යෙදෙන අයට ලැබෙන ලාභය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වුණා, පොහොර මිල විශාල වශයෙන් ඉහළ ගිය නිසා. කෘෂි කර්මාන්තයට පොහොර යොදන්න වනවා. තෙල් ගණන් යන කොට පොහොර මිල වැඩි වනවා. ඒ නිසා අපේ නිෂ්පාදනවලට පොහොර යෙදීමේදී අපට ප්‍රශ්නයක් ඇති වුණා. පොල්වලට, රබර්වලට, තේවලට, වෙනත් නොයෙකුත් භෝගවලට පොහොර යෙදීම අඩු වෙන්න පටන් ගත්තා. ඒ කාලයේ හිටපු අපේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු පොහොර සහනාධාරය ඉවත් කළා. රනිල් වික්‍රමසිංහ මහතා පොහොර සහනාධාරය දුන්නේ නැහැ. ආර්. ප්‍රේමදාස මැතිතුමා පොහොර සහනාධාරය ඉවත් කළා. ඒක නිසා අපේ කෘෂි නිෂ්පාදනවල ලොකු පසු බැසීමක් ඇති වුණා. අපේ වත්මන් ජනාධිපතිතුමා බලයට පැමිණියාට පස්සේ පොහොර ටොන් එකක් රුපියල් 4,000ට විතර වැඩි වුණත්, පොහොර මිටියක් රුපියල් 350ට දීලා විශාල සහනාධාරයක් ලබා දුන්නා. රුපියල් 100ක පොහොර ගන්නවා නම් රුපියල් 4යි වී ගොවියා ගෙවන්නේ. ඉතිරි රුපියල් 96 ගෙවන්නේ ආණ්ඩුව. ඒ අනුව වී ගොවිතැනත් දියුණු කළා. ඒ නිසා අපේ සහල් නිෂ්පාදනය වැඩි වුණා. පිට රටින් සහල් ගෙන්වීම නතර වුණා. අප ඉඳ හිට පිට රටින් සහල් ගෙනාවා. ඉන් පසුව ඒක නතර වුණා. ඒක නිසා අපි පිට රට යවන තේවලට, රබර්වලට, පොල්වලට, කුරුඳුවලට, ගම්මිරිස්වලට, අනෙකුත් භෝගවලට පොහොර සහනාධාරය දුන්නා. ඒ වැඩ පිළිවෙළ නිසා පොළොවෙන් ලබා ගන්නා අපේ භෝගවල අස්වැන්න වැඩි කර ගන්න අපට පුළුවන්. කෘෂි කාර්මික නිෂ්පාදන වැඩි කිරීම නිසා පිට රටින් මේ රටට ගෙන්වන භාණ්ඩ අඩු කරන්නත්, කෘෂි කාර්මික පැත්තෙන් එන ආදායම වැඩි කර ගන්නත් අපට පුළුවන්. ඒ පැති දෙක තමයි අපේ ආර්ථික සංවර්ධනයට වුවමනා කරන්නේ. අපනයනය වැඩි කිරීමත්, ආනයනය අඩු කිරීමත් කියන කාර්යයන් දෙක ඉටු කරන්න තමයි අප කටයුතු කරන්නේ.

ලෝකය දැන් එකම වෙළෙඳ පොළක්. ලෝක වෙළෙඳ සංවිධානය තිබෙනවා. අප ඒකට සම්බන්ධ වෙලා මේ තත්ත්වය උඩ අලුත් අලුත් නීති-රීති සකස් කරනවා. අපට පිට රට එක්ක වෙළෙඳ ගනුදෙනු කරන්න ඕනෑ කරනවා නෑ්. ඒ සඳහා අවශ්‍ය නීති-රීති සකස් වන්න ඕනෑ. ලෝක ආර්ථිකයේ කොටස්කාරයෝ තමයි අපත්. ලංකාවට තනිවම ජීවත් වන්න බැහැ. ඒ වාගේම අනෙක් රටවලටත් තනිවම ජීවත් වන්න බැහැ. ඒ නිසා ආනයන අඩු කරමින්, අපනයන දියුණු කරමින් ඒ කටයුතු කර ගෙන යෑම තමයි අපේ අරමුණ කර ගෙන තිබෙන්නේ.

පිට රටින් භාණ්ඩ ගෙනෙන කොට වාගේම, පිට රටට යවන කොටත් හොරකම් සිදු වනවා; දූෂණ සිදු වනවා. තත්ත්වයෙන් බාල භාණ්ඩ පිට රට යවනවා.

පිට රටට තේ යවන කොට ප්‍රතික්ෂේප කරන ලද තේ තිබුණොත් ඒවා අල්ලන්න පුළුවන්. සමහර වේලාවට පාවිච්චියට ගැනීමට නුසුදුසු තේ පිට රට යවනවා. ඒ වාගේ කටයුතුත් සිදු වෙනවා. රේගුව විසින් ඒවා check කරනවා; අල්ලා ගන්නවා. ඒ වාගේම පිට රටින් අපි භාණ්ඩ ගෙන්වනවා. පිට රටින් භාණ්ඩ ගෙන්වන කොට ඒවායේ තත්ත්වය -ඒවායේ quality එක - ප්‍රමිතිය check කර ගන්න ඕනෑ. ඒ වාගේම නියම භාණ්ඩ අපට එනවාද, අපි අත්සන් කරන ලද ගිවිසුම අනුව ඒ භාණ්ඩ මෙහාට ලැබෙනවාද කියා විමසා බලන්න ඕනෑ. ඒ සඳහා නීති-රීති ඕනෑ කරලා තිබෙනවා. ඒ නීති-රීති වරින් වර වෙනස් වෙන්න පුළුවන්. කාලය අනුව, යුගයට අනුව වෙනස්කම් ඇති කරන්න පුළුවන්. ඒ විධියට වෙනස්කම් ඇති කරනවා. ඒ වාගේම ඒ වැරැදි කරන අයට දඬුවම් කරන්න නීති-රීති අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මත් ද්‍රව්‍ය හදන්න අවශ්‍ය යම් යම් ද්‍රව්‍ය පිට රටින් ගෙන්වනවා කියලා පසු ගිය දා ප්‍රසිද්ධියට පත් වුණා. ඒ පිළිබඳව ලොකු වංචාවක්, ලොකු දූෂණයක් වුණා කියලා ප්‍රසිද්ධියට පත් වුණා. මේ විධියට පොඩි දූෂණත්, ලොකු දූෂණත් තිබෙනවා. ඉතින් මේවා පරීක්ෂා කරන්න තිබෙන සංවිධානය -ආයතනය- තමයි රේගු දෙපාර්තමේන්තුව. ඒ නිසා රේගු දෙපාර්තමේන්තුවට පුළුවන්කම තිබෙනවා, ඒ භාණ්ඩ පරීක්ෂා කර බලා ප්‍රමිතියෙන් තොර භාණ්ඩ ප්‍රතික්ෂේප කරන්න, ඒවා ආපහු යවන්න, ඒවා මේ රටට ඇතුළු කිරීම වළක්වන්න. ඒ වාගේම තහනම් දේවල් වෙන නම්වලින් ප්‍රකාශයට පත් කරලා ගෙන්වන කොට ඒවා වළක්වන්න, ඒවා නවත්වන්න, ඒවා රාජසන්තක කරන්න, ඒවාට දඬුවම් කරන්න, ඒවාට දඩ ගහන්න පුළුවන්කමක් ලැබෙන නීති-රීති හදන්න ඕනෑ. ඒවා වරින් වර කාලයට ගැළපෙන පරිදි කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර විට පිට රටින් කෑමට නුසුදුසු භාණ්ඩ ගේනවා. ඒවා ගැන සොයා බලන්න, ඒවා check කරලා ප්‍රතික්ෂේප කරන්න නීති-රීති තිබෙන්න ඕනෑ. ඒකට නිලධාරීන් පත් කරන්න ඕනෑ. දූෂණ වැඩ කරන, වැරදි කරන අය ගැන බලා ඒ අයට දඬුවම් කරන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වැඩ කරන නිලධාරීන්ට ධෛර්යයක් දෙන්න තමයි මේ ත්‍යාග පිරිනැමීමේ ක්‍රමයක් වශයෙන් දිරි දීමනාවක් - incentive එකක්- ඇති කරන්න කටයුතු කරලා තිබෙන්නේ. ඒ දිරි දීමනාවන් තුළින් ඒ අයට ධෛර්යයක් දෙන්න පුළුවන්කම ලැබෙනවා. මේ දිරි දීමනා දුන්නත් සමහර අවස්ථාවලදී ඒ දිරි දීමනාවන්ට පිට පැනලා සමහර අය ඒ ව්‍යාපාරිකයන් සමඟ එකතු වෙලා යටින් ගනුදෙනු කරන අවස්ථාවනුත් තිබෙනවා. එහෙමත් කෙරෙනවා. ඒ තත්ත්වය තුළ හොඳ නිලධාරීන් හොයා ගන්නවා කියන එකත් බොහොම අමාරුයි. අහු වුණේ නැත්නම් මනුෂ්‍යයා කොයි විධියට අවංකද, නැද්ද කියලා තම තමන්ම තමයි දන්නේ. එහෙම තත්ත්වයනුත් තිබෙනවා. රේගුවේ රැකියා කරන්න යන්න ගොඩාක් පිරිස් කැමැතියි. ඒ වාගේම Motor Traffic Department එකේ රැකියාව කරන්න යන්න හරියට කැමැතියි. ඒ වාගේම Inland Revenue Department එකේ රැකියාව කරන්න යන්න හරියට කැමැතියි. මොකද ඒ තැන්වලින් යම් යම් ප්‍රයෝජන ලැබෙනවා; තෑගිත් ලැබෙනවා. ඒ ආකාරයට කටයුතු කරන්න පුළුවන්කම ලැබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දේශපාලනයට එන්නත් කැමැතියි.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
දේශපාලනයට එන්න හරියට කැමැතියි. ඒ තත්ත්වයන් තිබෙනවා. දේශපාලනය නිසාම හරි ගිය අයත් ඉන්නවා. කොහොම වුණත් රේගු දෙපාර්තමේන්තුව කියලා කියන්නේ මේ රටට, ආණ්ඩුවට විශාල ධනයක් සපයලා දෙන්න පුළුවන් ඉතා වැදගත් ආයතනයක්. මේ රටේ ආර්ථිකය දියුණු කරන්න විශාල මුදල් ප්‍රමාණයක් හොයලා දෙන්න රේගුවට පුළුවන්කම තිබෙනවා. ඒ රේගු නිලධාරීන්ගේ කැපවීම අනුව, නිලධාරීන්ගේ අවංකකම අනුව ඒ විධියට සොයලා දෙන්න පුළුවන්කම තිබෙනවා. ඉතින් ඒ අයට අපි තෑගි දෙන්න ඕනෑ; උනන්දු කරවන්න ඕනෑ.නමුත් කවුරු වැරදි කරනවාද, හොරකම් කරනවාද, නැද්ද කියන එක අහුවන කල් කියන්න බැහැ. කෑෂියර් පෙට්ටිය භාර දීලා තමයි බලන්න ඕනෑ, හොරකම් කරනවාද, නැද්ද කියලා. මොකද, දැන් ලෝකය බොහොම විවෘතව වෙළෙඳාම් කරන නිසා විවිධාකරයේ බඩුමුට්ටු පිට රටින් එනවා; අලුත් -නවීන- භාණ්ඩ, උපකරණ ලැබෙනවා. ඒ ලැබෙන භාණ්ඩ අත් පත් කර ගන්න කවුරුත් බොහොම කැමැතියි. එය මනුෂ්‍ය ගතියක්. ඒවා වැරදි පිළිවෙළට, වංචනික පිළිවෙළට, දූෂිත පිළිවෙළට අත් පත් කර ගන්න මිනිස්සු උත්සාහ කරනවා. බැලූ බැල්මටම වර්තමාන සමාජයේ හොඳ අය ඉන්නවා; අවංක අය ඉන්නවා; ශ්‍රේෂ්ඨ අය ඉන්නවා. ඒ වාගේම මහා පරිමාණයෙන් සල්ලි කරා හඹා යන සමාජයක් වර්තමාන ලෝකයේ තිබෙනවා. මේ රටේ විතරක් නොවෙයි, ලෝකය පුරාම මේ වාගේ පිරිහීමක් තිබෙනවා. දැන් මේ රටේත් පිරිහීමක් තිබෙනවා, පිට රටේත් පිරිහීමක් තිබෙනවා. ඒවා හදා ගන්න අපි කොපමණ නීති-රීති දැම්මත් ඒවා තුළින් රිංගා යන අවස්ථාවන් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ශ්‍රී ලංකා රේගුව ඉතා වැදගත් ආයතනයක්. මේ රටේ ආර්ථිකය දියුණු කිරීම සඳහා ආදායම සොයා දෙන්න, රටේ අය වැය ලේඛනයට විශාල මුදල් ප්‍රමාණයක් සොයා දෙන්න පුළුවන් ආයතනයක්. ඉතින් ඒ ආයතනය අපි ශක්තිමත් කරන්න ඕනෑ. ඒ ආයතනයේ වැඩ කරන අයට අපි ධෛර්යය, ශක්තිය දෙන්න ඕනෑ. අවංකකමට ස්තුති කළ යුතු තැන, තෑගි දිය යුතු තැන අපි එසේ කරන්න ඕනෑ. එහෙම හඳුන්න ඕනෑ, පොලඹවන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වර්තමාන වෙළෙඳ ලෝකයේ නවීන භාණ්ඩ විශාල වශයෙන් අපේ රටට එනවා. මේවා අත් පත් කර ගන්න බොහෝදෙනෙක් පෙලඹෙනවා. ඒවා අත් පත් කර ගන්න බලනවා. එම නිසා නීති-රීති බලන්නේ නැහැ; සදාචාරය බලන්නේ නැහැ; ආගම ධර්මය බලන්නේත් නැහැ. "මට මේවා ලබා දෙන්න" කියලා දෙවියන්ටත් යාච්ඤා කරමින්, ආගමේ තිබෙන හොඳ ඉගැන්වීම් පිළිපදිනවා වෙනුවට ආගමෙන් ආනුභාවයක් ලබා ගෙන, දෙවියන්ගේ පිහිටෙන්වත් වැඩි-වැඩියෙන් මුදල් සොයා ගන්න ලැබේවා!යි කියා තමයි අද මේ සමාජය ප්‍රාර්ථනා කරන්නේ. එවැනි යුගයක ශ්‍රී ලංකා රේගුව පමණක් නොවෙයි, බොහෝ තැන්වල ආගමික කටයුතුත් පිරිහිලා තිබෙනවා. සමාජය තුළ මේවා පිරිහිලා තිබෙනවා. ශ්‍රී ලංකා රේගුව නරකයි කිය-කියා සිටියාට මදියි. එයත් හදා ගෙන මේ කටයුතු කර ගෙන යන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයම අද වෙළෙඳ පොළක් හැටියටයි තිබෙන්නේ. එක වෙළෙඳ පොළක් හැටියට, එක ගම්මානයක් හැටියට ගනුදෙනු කරන යුගයක් තමයි තිබෙන්නේ. ජාත්‍යන්තර වශයෙන් කෙරෙන දූෂණ අපටත් බලපානවා. එම නිසා ජාත්‍යන්තර නීති-රීතිවලටත් ගැළපෙන්න අපි අලුතින් නීති-රීති සකස් කර ඒ අනුව කටයුතු කර ගෙන යන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රට දියුණුව කරා ගමන් කරනවා. ඒ තත්ත්වය වැඩිදියුණු කරන්න තමයි වරායවල් හදන්නේ; වරායවල් වැඩි කරන්නේ. හම්බන්තොට වරාය ජාත්‍යන්තර වරායක් හැටියට දියුණු කරන්න කටයුතු කළේ වරායවලට තිබෙන අවශ්‍යතාව අනුවයි. මෙම වරාය විතරක් නොවෙයි, අපි දැන් වරායවල් රාශියක් සංවර්ධනය කරනවා. ජාත්‍යන්තර වරායක් හැටියට හම්බන්තොට වරාය දියුණු කරලා තිබෙනවා; දියුණු කර ගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වරායවලින් විතරක් නොවෙයි, ගුවනිනුත් මේ ගනුදෙනු කරනවා; වෙළෙඳාම කරනවා; භාණ්ඩ ගෙනෙනවා; උපකරණ ගෙනෙනවා. ඒවාත් පරීක්ෂා කරන්න ඕනෑ. පුද්ගලයන් පුද්ගලයන් හැටියට ගෙනෙනවා; සමීති සමාගම් හැටියට ගෙනෙනවා; ඒවාත් පරීක්ෂා කරන්න ඕනෑ. ගුවනින් ගෙනෙන භාණ්ඩත්, මුහුදින් ගෙනෙන භාණ්ඩත් පරීක්ෂා කිරීමේ කටයුතු ශ්‍රී ලංකා රේගුව විසින් කරන්න ඕනෑ.

මිනිසුන් පැමිණෙන කොට, ගෙනෙන බඩුත් පරීක්ෂා කරන්න ඕනෑ. ඒ වාගේම සමහරු රත්තරන් අරගෙන එනවා. රත්තරන් ගෙන එනවා විතරක් නොවෙයි, විවිධාකාරයෙන් මුදලුත් අරගෙන එනවා. මේවා පරීක්ෂා කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, හෙරොයින් වැනි මත් ද්‍රව්‍ය ගෙනෙනවා. මේවා ගුවනින් ගෙනෙනවා; නැව්වලින් ගෙනෙනවා; ගිලලා ගෙනෙනවා; පැකට් හැටියට ගෙනෙනවා. සමහර විට අධෝ මුඛයේ සඟවා ගෙනත් එනවා. පරීක්ෂා කරලා ඒවාත් අල්ලන්න ඕනෑ. මේවා අල්ලාගෙන දඬුවම් කිරීමේ වැඩ පිළිවෙළක් රටක හදන්න ඕනෑ නිසායි අපි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න යන්නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, මෙරටට එවැනි දේවල් ගෙනෙන ක්‍රම ගණනාවක් ඔබතුමා කිව්වා. මම හිතන හැටියට ලොකුවටම

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

එවැනි දේවල් අරගෙන එන්නේ අධෝ මුඛයේ සහවා ගෙන නොවෙයි, කන්ටේනර්වල දමාගෙන. පසු ගිය දවස්වල එතනෝල් මද්‍යසාරය කන්ටේනර් දෙකක් අරගෙන ආවා. ඒ කාරණය පිළිබඳව රජයේ ස්ථාවරය විධියට ඔබතුමා හිතන්නේ මොකක්ද?

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු අතාවුත සෙනෙවිරත්න)
(The Hon. Athauda Seneviratne)

එතනෝල් වේවා, වෙන මොන දෙයක් වේවා, වැරදි දෙයක් නම් ඒවා අත් අඩංගුවට අරගෙන අදාළ පුද්ගලයන්ට දඬුවම් කරන්න ඕනෑ. මේ රට සුද්ධ කරන්න නම්, ලොකු එක්කෙනෙකුගේ වේවා, පොඩි එක්කෙනෙකුගේ වේවා කාගේ හෝ කමක් නැහැ ඒවා රාජ සන්තක කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, අපේ හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය ඉවත් කරන්න කථා කෙරුවේත් ඒ වාගේ දූෂණ නිසායි. ඒක නිසා කවුරු දූෂණ කෙරුවත්, කොතැන කෙරුවත් ඒ කාටත් දඬුවම් කරන්න ඕනෑ.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) තලතා අත්තුකෝරල)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ආණ්ඩුව නියෝජනය කරන පුද්ගලයන් හැටියට ඒ සඳහා වග කියන්න එපායැ.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු අතාවුත සෙනෙවිරත්න)
(The Hon. Athauda Seneviratne)

ඔබතුමිය කළත් දඬුවම් කරන්න ඕනෑ. ඔබතුමිය වැරදි කරනවාද, නැද්ද කියන්න අපි දන්නේ නැහැ. ඔබතුමියගේ හිත තමයි ඒක දන්නේ. ඔබතුමිය කරන දේ ගැන දන්නේ ඔබතුමිය විතරයි. අපි දන්නේ නැහැ. නිකම් පින්තූරය විතරයි අපට පෙනෙන්නේ. ඇතුළේ මොනවා තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. අද නිල් පාටත් ඇඳගෙන ඇවිල්ලා ඉන්නවා. [බාධා කිරීමක්]කොයි පැත්තේද කියලා දන්නේත් නැහැ. ඒක දන්නේ එතුමිය. ඒ වාගේ තත්ත්වයකටයි අද රට පත් වෙලා තිබෙන්නේ.

අපට ඕනෑ කරන්නේ මිනිස්සු හදා රට හදන්නයි. මිනිස්සු හදා ගන්න ඕනෑ. "මිනිසා හදා රට හදමු." මේ තත්ත්වය ඇති කරන්න ඕනෑ. එහෙම නැතිව කොයි මිනිහා කොතැනට දැම්මත්, මොකක් කරනවාද කියන්න අපි දන්නේ නැහැ. නමුත් මේ වැඩ පිළිවෙළ ගෙන යන්න නම් රේගුව ශක්තිමත් කරන්න ඕනෑය කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[ප.ප. 4.26]

ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා
(මාණ්පුමිකු සෙල්වම් අඩෙක්කලනාදන්)
(The Hon. Selvam Adaikkalanathan)

කෞරව කුලුක්කලින් පිරතිත් තවිසාලර් අවර්කලේ, ඉන්‍රෙය විවාතත්තිලේ පේස වාය්ප්පලිත්තතර්කු උංකළුක්කු නන්‍රි. තමිල් නාට්ටිලේ කල්ලූරි මාණවර්කළ් උට්පට තමිල් උණර්වාලර්කළ් කට්සි පේතමින්‍රි එංකළුටෙය ඉනප් පිරච්සිනෙත් තීර්වුක්කාක ඉන්‍රු පාරියලවිලේ තොටර්ච්සියාන පෝරාට්ටංකළෙ මේර්කොණ්ටිරුක්කින්‍රාර්කළ්. උණ්මෙයිලේ අන්තප් පෝරාට්ටංකළ් එංකළුටෙය මක්කළුක්කු ඒර්පටුත්තප්පටුකින්‍ර අනීතිකළෙත් තට්ටික්කේට්කින්‍ර වකෙයිලේ අමෙන්තිරුක්කින්‍රන. ආකවේ, ඉන්ත අරසාංකම් නල්ල මුරෙයිලේ සින්තිත්තු ඉනප්පිරච්සිනෙක්කුත් තීර්වුකාන මුන්වර වේණ්ටුමෙන්‍ර කෝරික්කෙයෙ නාන් මුන්වෙක්කින්‍රේන්. අතේනේරත්තිලේ තමිල්ත් තේසියක් කූට්ටමෛප්පින් සාර්පාකවුම් එංකළුටෙය මක්කළ් සාර්පාකවුම් අවර්කළුටෙය අන්තප් පෝරාට්ටංකළුක්කු එංකළුටෙය මුළුමෙයාන ආතරවෛත් තෙරිවිත්තු, අවර්ට්‍රින්මූලම් ඉනප්පිරච්සිනෙයෙත් තීර්ක්කින්‍ර ඔරු නිලෛමෙ උරුවාක වේණ්ටුමෙන්‍ර වාළ්ත්තුකින්‍රේන්.

අතුමට්ටුමල්ල, ඉන්තප් පෝරාට්ටංකළිනූටාක නටෙපෙරුකින්‍ර සිල විටයංකළ් තවරානවෛ එන්පතෙයුම් නාන් සුට්ටික්කාට්ට විරුම්පුකින්‍රේන්. තමිල්නාට්ටිලේ පුත්ත පික්කුකළ් තාක්කප්පට්ටිරුක්කිර්කළ්; සිංකළ යාත්තිරිකර්කළ් තාක්කප්පට්ටිරුක්කිර්කළ්. ඉව්වාර්ාක අවර්කළෙත් තාක්කුව තනූටාක සිංකළ මක්කළින් මනංකළෙ වෙල්ල මුටියාතෙන්පතෙ නාන් ඉංකේ කුර්ප්පිට විරුම්පුකින්‍රේන්. පෝරාට්ටම් එන්පතු නියායමානතු. එංකළුටෙය මක්කළින් විටුතලෛ එන්පතුම් නියායමානතු. අතේනේරම්, සිංකළ මක්කළින් මනංකළෙ වෙල්වතෙන්පතුම් නියායමාන ඔන්‍රාකවේ නාංකළ් කරුත වේණ්ටුම්. පුත්ත පික්කුකළෙත් තාක්කුවතනූටාකවෝ අල්ලතු පොතු මක්කළෙත් තාක්කුවතනූටාකවෝ අවර්කළින් තොප්පුල්කොටි උර්වාන එංකළින් පිරච්සිනෙ තීර්න්තුවිට වාය්ප්පිරුක්කාතු. මාර්ාක, පිරච්සිනෙ මේලුම් වලුප්පෙර්රු ඔරු වන්මුරෙයාක මාර්ක්කූටිය නිලෛතාන් ඒර්පටුම්. එංකළුටෙය කෝපත්තෙ එමතු අරසින්මීතුතාන් කාට්ට වේණ්ටුම්. පොතු මක්කළ් මීතුම් සමයත් තලෛවර්කළ් මීතුම් කාට්ටුවතනූටාක සිංකළ මක්කළින් මනංකළෙ එංකළාල් වෙල්ල මුටියාතු. අන්ත වකෙයිලේ, අංකුළ්ළ කල්ලූරි මාණවර්කළුක්කුම් තමිල්ක් කට්සිකළුක්කුම් පොතු මක්කළුක්කුම් ඉන්තප් පෝරාට්ටංකළිල් ඊටුපට්ටිරුක්කුම් අත්තනෙ තමිල් උණර්වාලර්කළුක්කුම් එංකළුටෙය නන්‍රියෛත් තෙරිවිත්තුක්කොළ්වතෝටු, උණ්මෙයිලේ මාණවර්කළුටෙය ඉන්තප් පෝරාට්ටංකළ් ඉන්නුමින්නුම් මෙරුකූට්ටප්පට්ටු එංකළුක්කු නියායම් කිටෛක්කින්‍ර වකෙයිලේ අමෙය වේණ්ටුමෙන්‍රුම් පිරාර්ත්තිත්තු, විටෛපෙරුකින්‍රේන්. නන්‍රි. වණක්කම්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Sajith Premadasa. Before he starts, will an Hon. Member propose the Hon. Udith Lokubandara to take the Chair?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන - කමත්තොළිල් අමෛච්චර්)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

I propose that the Hon. Udith Lokubandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
වැනා විටුක්කප්පට්ටු ඒර්ත්තුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ් අක්කිරාසනත්තිනින්‍රු අකලවේ, මාණ්පුමිකු උතිත් ලොක්කුපණ්ටාර අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

[අ.භා. 4.29]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රේගු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ, අපේ රටේ ආර්ථික කළමනාකරණය පිළිබඳව මගේත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වනවා.

මෙම ගරු සභාව තුළ රාජ්‍ය පාර්ශ්වයෙන් - ආණ්ඩු පාර්ශ්වයෙන් - රටේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව ගුණාත්මක, ධනාත්මක, හරාත්මක පැති ගණනාවක් පිළිබඳව අදහස් ගණනාවක් ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම අද රටේ ආර්ථික ප්‍රතිපත්ති දිහා බලනකොට, ආර්ථික කළමනාකාරිත්වය දිහා බලනකොට අපට පෙනෙන්නට තිබෙන එක දෙයක් තමයි, අද ක්‍රියාත්මක වන අදූරදර්ශී ආර්ථික ප්‍රතිපත්තිය නිසා මුළු මහත් රටම අකර්මණ්‍ය වූ තත්ත්වයකට, මුළු මහත් රටේ ජන සමාජය කඩා වැටෙන තත්ත්වයකට පාත්‍ර වෙලා තිබෙන බව.

අපි මොහොතකට අවධානය යොමු කරමු, අපේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව. තමුන්නාන්සේලා - අපි සියලු දෙනාම දන්නා කාරණාවක් තමයි, තරගයට කර්මාන්ත ශාලා බිහි වුණු කාලයක් අපේ රටේ තිබුණු බව. නගරයට සීමා වෙලා තිබුණු සම්පත්, කර්මාන්ත, ව්‍යාපාර "ඇඟලුම් කර්මාන්තශාලා 200 වැඩ සටහන" යටතේ එදා ගම තුළ ව්‍යාප්ත කළා. විශේෂයෙන්ම ගම්වලට සම්පත් ගලා යන මාර්ගයක් එදා නිර්මාණය වුණා. එසේ ගම්වලට සම්පත් ගලා යෑම තුළින් ග්‍රාමීය ආර්ථිකය, ග්‍රාමීය මුදල් සංසරණය එන්න එන්නම ශක්තිමත් වුණා; වර්ධනය වුණා. එපමණක් නොවෙයි, ග්‍රාමීය නාගරික ප්‍රදේශවල සමාජ ප්‍රාග් ධනය - social capital - වර්ධනය වුණා. නිවසට සීමා වෙලා සිටි කාන්තාව, රැකියාවක් කරලා ඒ රැකියාව තුළින් ලබන ආදායම හරහා නිවස ශක්තිමත් කරලා, ගෘහ මූලික පවුල් ඒකකයේ ජීවන මට්ටම වර්ධනය කළ ආකාරය අපි දැක්කා. නමුත් මේ ආශ්චර්යවත් ආණ්ඩුවේ අදූරදර්ශී ආර්ථික ප්‍රතිපත්ති තුළ අද කර්මාන්ත ක්ෂේත්‍රයට සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? එදා ඇඟලුම් කර්මාන්තශාලා 200ක් තරගයට විවෘත වුණා. අද ඇඟලුම් කර්මාන්තශාලා තරගයට වැසී යනවා. සිය ගණනක් කර්මාන්තශාලා අද වැහිලා. රටේ ලක්ෂ ගණනක් තරුණ පරපුර අද මහ පාරට ඇද වැටිලා. GSP plus සහනය අහිමි වීම තුළින් ලක්ෂ ගණනක් විරැකියා පෝලිමට එකතු වෙනවා. මේ රජයට මේවා දෙස බලාගෙන සිටිනවා මිස පැහැදිලි ප්‍රතිපත්තියක් තුළින් විකල්ප විසඳුම් ලබා දෙන්නට බැරි වෙලා තිබෙනවා. මේවා දෙස නිකම් බලා සිටින නිරුපද්‍රැත ප්‍රේක්ෂකයන් බවට අද රජය පත් වෙලා තිබෙනවාය කියන එක මා සඳහන් කරන්නට කැමැතියි.

නිදහස් වෙළෙඳ කලාප හා පොදු සේවක සංගමයේ සම ලේකම් වන ඇන්ටන් මාර්කස් මැතිතුමා පසු ගිය දවසක විශේෂයෙන්ම සඳහන් කර තිබුණා, 2010 වසරේ සිට මේ දක්වා කාල වකවානුව තුළ කර්මාන්තශාලා 186ක් වැසී ගිහිල්ලා, 2,17,000ක් විරැකියා පෝලිමට එකතු වෙලා සිටින බව. GSP Plus සහනය අහිමි වීම පිළිබඳව රජයට පුළුවන්කම ලැබුණේ එකම එක පියවරක් තබන්න පමණයි. ඇමතිවරුන් හතර දෙනෙකුගෙන් සංයුක්ත වුණු කමිටුවත් පත් කරලා, ඒ ප්‍රශ්නය මහ හැරලා, යට ගස්වලා, පැත්තකට විසි කරලා මේ රටේ ග්‍රාමීය ආර්ථිකයට පුනර්ජීවයක් ලබා දුන්නු ඒ ඇඟලුම් කර්මාන්ත පද්ධතිය සහමුලින්ම කඩා වැටීම දෙස බලා සිටින එක පමණයි වර්තමාන රජය ක්‍රියාත්මක කරපු එකම විකල්ප විසඳුම; තබපු එකම පියවර.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, John Maynard Keynes ගේ Aggregate Demand Management theory එක හරහා -සිංහල භාෂාවෙන් කියනවා නම්, "සමාහාර ඉල්ලුම් කළමනාකරණය" හරහා- ආර්ථිකයට යම් කිසි උත්තේජකයක්, මූල්‍ය ශක්තියක් ලබා දුන්නාම ඒ තුළින් ආර්ථිකය ගොඩ නැංවෙන ප්‍රතිපත්තිය ලොවට හඳුන්වා දුන් ආකාරය අපට මතකයි. ඇඟලුම් කම්හල් 200 ප්‍රතිපත්තිය පදනම් කර ගත්තේත් අන්න ඒ ආර්ථික න්‍යායයි. කාගේවත් අවධානයක්, හච්හරණක් -පිහිටක්, සරණක්- නොලැබුණු ගම්, නියම් ගම් සිසාරා කර්මාන්ත පද්ධතිය ස්ථාපනය කරලා අග නුවරට පමණක් සීමා වෙලා තිබුණු ඒ මූල්‍ය ශක්තිය, මූල්‍ය සම්පත ග්‍රාමීය ප්‍රදේශවලට ගෙන ගිය ඇඟලුම් කර්මාන්තශාලා පද්ධතිය අද කඩා වැටෙන කොට ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරන මේ ආශ්චර්යවත් ආණ්ඩුවට කිසිම විසඳුමක් ලබා දෙන්නට බැරි වෙලා තිබෙනවා කියන කාරණය මම මේ අවස්ථාවේ සඳහන් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය මත උපරිම බර අරගෙන රටේ ජනතාව මත අවම බර පටවලායි රටක ආණ්ඩුවක් කටයුතු කරන්නට ඕනෑ. රටක ජනතාව ඡන්ද ක්‍රමය උපයෝගී කර ගෙන ප්‍රජාතන්ත්‍රවාදී නියෝජිත දේශපාලනය හරහා ආණ්ඩු බිහි කරන්නේ රටේ ජනතාවට සහන සලසන යුගයක් බිහි කරන්නටයි. නමුත් පසු ගිය දවසක මේ රජයෙන් ආපු ආශ්චර්යවත් යෝජනාව මොකක්ද? අපේ රටේ ජනතාවට සිංහල - දෙමළ අලුත් අවුරුද්දට අලුත් බද්දක් පනවා තිබෙනවා. රටේ ජනතාව මත බර පටවන විදුලි ගාස්තු ඉහළ නංවන වැඩසටහනක් නිර්මාණය කර, අලුත් අවුරුදු තෑග්ගක් හැටියට රටේ ජනතාවට දායාද කරන්නට වර්තමාන ආණ්ඩුව කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න මේ විදුලි බිල වැඩි කළ ආකාරය. ඒකක 1 සිට 30 දක්වා විදුලි පරිභෝජනයට ලක් වී සිටින ජනතාවට සියයට 66කින් වැඩි කළා. ඒකක 30 සිට 60 දක්වා පරිභෝජනය කරන ජනතාවට සියයට 47කින් වැඩි කළා. ඒකක 61 සිට 90 දක්වා පරිභෝජනය කරන අයට සියයට 59කින් වැඩි කළා. ඒකක 91 සිට 120 දක්වා පරිභෝජනය කරන ජනතාවට සියයට 54කින් වැඩි කළා. හැබැයි ඒකක 211 සිට 300 දක්වා පරිභෝජනය කරන මේ රටේ සුපිරි පෙළැන්තියට විදුලි බිල වැඩි කරන්නට කටයුතු කරන්නේ සියයට 14කින් පමණයි. මේ රටේ අහිංසකම, අසරණම කොට්ඨාසය වන ඒකක 1 සිට 90 දක්වා විදුලි පරිභෝජනය කරන අපේ රටේ සියයට 75ක් වූ ජනතාවට විදුලි බිල වැඩි කරන්නේ සියයට 66කින්; සියයට 53කින්; සියයට 47කින්; සියයට 59කින්; සියයට 54කින්. නමුත් රටේ සුපිරි පෙළැන්තියට විදුලි බිල වැඩි වෙන්නේ සියයට 14ක් වැනි සොච්චම් මුදලකින්.

දැන් බලන්න, මේ විදුලි බිල වැඩි වීමත් සමඟම අපේ රටේ අධ්‍යාපනය ලබන අපේ දුදරුවන්ට, අපේ රටේ අනාගතයට කොයි තරම් බාධාවක්ද, කොයි තරම් බරක්ද කියලා. දවස පුරාවටම අමතර පන්තිවලට ගිහිල්ලා, උපකාරක පන්තිවලට ගිහිල්ලා, දැනුම් මිනුම් ලබා ගෙන නිවසට ඇවිල්ලා රාත්‍රී කාලයේ තමන්ගේ ඒ ඉගෙනීමේ කටයුතු ක්‍රියාත්මක කරන දුවලා පුතාලට, ඒ පවුල්වලට තවත් අමතර බරක් දැමීමයි මේ විදුලි බිල වැඩි කිරීම තුළින් මේ රජය කර තිබෙන්නේ.

ඇත්ත වශයෙන්ම ආණ්ඩුව, විශේෂයෙන්ම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමා කියනවා, විදුලි බිල වැඩි කරන්නට ප්‍රධානතම හේතුව තෙල් මිල ඉහළ යාමයි කියලා. ඒ මොකද? ලේකම්තුමා කියන විධියට අපේ රටේ සියයට 60ත්-65ත් අතර ප්‍රමාණයක් විදුලිය නිපදවන්නේ තාප බලාගාරවලින්. අමාත්‍යාංශයේ ලේකම්තුමා කියන විධියට සියයට 35ක්, 40ක් විදුලි උත්පාදනය සිදු වන්නේ ජල විදුලියෙන්. මේක සම්පූර්ණ අසත්‍යයක්. 2011 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, නියඟයක් තිබෙන අවස්ථාවේත් අපේ රටේ ජල විදුලි බලාගාර හරහා සියයට 40ක විදුලි උත්පාදනයක් සිදු වුණා. නියඟයක් තිබෙන කොටත්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ජල විදුලි බලාගාර හරහා සියයට 40ක් විදුලිය උත්පාදනය වෙන කොට, 2010 වසරේ මේ රටේ ජල බලාගාර තුළින් සිදු වන විදුලි උත්පාදනය සියයට 53ක්ව පැවතුණා. එහෙම නම් නියඟයක් තිබෙන කොටත් සියයට 40ක විදුලිය උත්පාදනයක් සිදු වුණා නම් අද ජලාශ වාන් දමන කොට, අද ගංවතුර තත්ත්වයක් තිබෙන කොට, ජලාශ පිරිලා තිබෙන කොට මේ විදුලි බලාගාර සියයට සියයක් ක්‍රියාත්මක වන මොහොතකදී අපි කොහොමද විශ්වාස කරන්නේ මේ රටේ විදුලිය උත්පාදනය සියයට 65ක් සිදු වන්නේ තාප බලාගාරවලින් කියලා. මේක සම්පූර්ණ අසත්‍යයක්. ඇත්තම කථා කරනවා නම් 2010 වසරේ ජල විදුලි බලාගාර හරහා මේ රටේ සියයට 53ක් විදුලිය උත්පාදනය සිද්ධ වුණා. එපමණක් නොවෙයි. 2012 ඉහළ කොත්මලේ විදුලි බලාගාරය හරහා තවත් මෙගාවොට් 150ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු වුණා. එහෙනම් මේ ආණ්ඩුව විදුලි බිල වැඩි කරනවා පමණක් නොවෙයි, අමුතුවෙන් ඉන්ධන ගැළපුම් ගාස්තුවකුත් එකතු කර තිබෙනවා. ඉතින් සත්‍ය කථාව මොකක්ද? සත්‍ය කථාව වන්නේ මේ රටේ විදුලි උත්පාදනයේදී ජල විදුලි බලාගාර විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරනවා කියන එකයි. එපමණක් නොවෙයි, සියයට 50කටත් වැඩි ප්‍රමාණයක් ජල විදුලි උත්පාදනය සිදු වන මොහොතක විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමා නොදන්නා කාරණා දෙකක් මම කියන්න කැමැතියි.

2012 අග භාගයේදී ඇමෙරිකානු ඩොලරයකට රුපියල් 135ක වටිනාකමක් තිබුණා. අද වන විට ඒක රුපියල් 125ට බැහැලා. මොකක්ද ඒකේ තේරුම? ආනයනික බොර තෙල්, ඩීසල්, පෙට්‍රල් සඳහා ගෙවිය යුතු ඩොලර් ප්‍රමාණය අද අඩු වෙලා. ආනයනික වියදම අඩු වෙලා. එපමණක් නොවෙයි පෙබරවාරි 15 වැනිදා ඇමෙරිකානු ඩොලර් 118ට තිබුණු බොර තෙල් බැරල් එකක මිල මේ අවුරුද්දේ මාර්තු 8 වැනි දා වනකොට ඇමෙරිකානු ඩොලර් 106.55 දක්වා අඩු වෙලා. ඩොලර් 12ක් අඩු වෙලා. එහෙම නම් එක පැත්තකින් පෙබරවාරි මාසයත්, මාර්තු මාසයත් අතර බොර තෙල් බැරලයක මිල ඩොලර් 12කින් අඩු වෙනවා. තවත් පැත්තකින් රුපියලේ අගය වැඩි වෙනවා. මේ දෙකම සිදුවනකොට විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්වරයා කිසිම හිරිකිතයකින් තොරව ඇමතිවරියකුත් ළඟ තියාගෙන ලංකාවාසී ජනතාවට කථා කරනවා තෙල් මිල වැඩි වීම නිසා, වැඩිම විදුලිය ප්‍රමාණයක් තාප බලාගාරවලින් නිපදවන නිසා විදුලිය බිල වැඩි කරන්නට සිදුවුණාය කියා. මේක අමු අමුවේ මේ රටේ ජනතාවට මහ දවල් කියපු මහා ප්‍රෝඩාකාරී, වංචාකාරී, අසත්‍ය ප්‍රකාශයක් බවට මම මේ සභාවට කියන්න කැමැතියි. මෙන්න මේ වාගේ අසත්‍යය තුළින් තමයි අද මේ රට පාලනය වෙන්නේ. මේ රටේ බොරුවක්, වංචාකාරී රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාකලාපයක් තුළින් තමයි මේ රටේ ජනතාව අද සහමුලින්ම අසරණභාවයට පත් වෙලා තිබෙන්නේ කියන එක මම මතක් කරනවා. විශේෂයෙන්ම අද ආණ්ඩුව පාර්ශ්වයේ මන්ත්‍රීතුමන්ලා, මැති ඇමතිතුමන්ලා මේ ආණ්ඩුවේ ආර්ථික ක්‍රියාවලිය පිළිබඳව පම්පෝරි ගහන අවස්ථාවකදී මම නැවත වරක් ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, මේ තරම් ශක්තිමත් විධියට ආර්ථිකය කළමනාකරණය වෙනවා නම් ඇයි දෙයියනේ මාස පහක් සමෘද්ධිලාභී පවුල් ලක්ෂ පහකට සමෘද්ධි සහනාධාරය දෙන්න බැරි වුණේ? ආර්ථිකය මේ තරම් ශක්තිමත් නම්, මේ තරම් මනා කළමනාකාරිත්වයකින් මේ රටේ නායකත්වය ක්‍රියාත්මක වෙනවා නම් -කොච්චර වරායවල්, කොච්චර ගුවන් තොටුපළවල් හැදුවත් අපි ඒවාට ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. අපි දේශපාලන කුහකයෝ නොවෙයි.- දුගී දුප්පත්කම තුරන් කරන්නට ආරම්භ කර තිබුණු ජනසවිය කියන නම වෙනස් කරලා ආරම්භ කරපු සමෘද්ධි ව්‍යාපාරයෙන් දෙන සොච්චම් සහනාධාරයවත් මාස පහක් -ගිය වසරේ නොවැම්බර් මාසයේ ඉඳලා මේ වසරේ මාර්තු මාසය වනකම්- ඇයි ලබා නොදුන්නේ? ඒවාට සල්ලි නැහැ. නමුත් night race යන්න සල්ලි තිබෙනවා. බාල් නටන්න සල්ලි තිබෙනවා. නාස්තිකාර වියදම් සඳහා සල්ලි තිබෙනවා. "දැයට කිරුළ" කියා දැයට හෙණයක් ගහන එකට වියදම් කරන්න ඕනෑ තරම් -කෝටි ප්‍රකෝටි ගණන්- සල්ලි තිබෙනවා. නමුත් සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 15කට අර සොච්චම් සමෘද්ධි සහනාධාරය ලබා දෙන එක ගැන ඇයි මේ තරම් තටමන්නේ, ඇයි මේ තරම් පසුබසින්නේ කියන එක මටත් ප්‍රහේලිකාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික කළමනාකරණය තුළ අද මේ ආණ්ඩුව මුහුණ දෙන ප්‍රධානතම ප්‍රශ්නය මම පැහැදිලි කරන්න කැමැතියි. ආණ්ඩුවට රුපියලක ආදායමක් එනකොට සත 35ක් වැය වෙනවා, ණය පොලිය සහ ණය වාරිකය ගෙවීමට. මම හිතන හැටියට ගරු ඇමතිතුමා මේකට එකඟ වෙවි. තවත් සත 33ක් වැය වෙනවා, රාජ්‍ය සේවක වැටුප් සහ විශ්‍රාම වැටුප් සඳහා. තව සත 21ක් වැය වෙනවා, රජයේ සහනාධාර සඳහා. ඒ කියන්නේ පොහොර සහනාධාරය, සමෘද්ධි සහනාධාරය වැනි දේවල්. සමෘද්ධි සහනාධාරය තවම ලබා නොදුන්නත් ඒක තමයි සැලැස්ම. එතකොට රුපියලකින් සත 89ක් වැය කරනවා,ණය පොලිය හා ණය වාරිකය ගෙවන්න, රාජ්‍ය සේවක වැටුප් හා විශ්‍රාම වැටුප් ලබා දෙන්න, සහ රාජ්‍ය තන්ත්‍රය හරහා ලබා දෙන සහනාධාර ලබා දෙන්න. එතකොට ප්‍රාග් ධන සංවර්ධනය සඳහා ඉතිරි වන්නේ කීයද? සෞඛ්‍ය ක්ෂේත්‍රය නංවා ලන්න, අධ්‍යාපන ක්ෂේත්‍රය නංවා ලන්න, මාර්ග පද්ධතිය සකස් කරන්න, ආර්ථික පුනර්ජීවනය ක්‍රියාත්මක කරන්න සහ මුළු රටම ගොඩ නගන්න තිබෙන්නේ රුපියලකින් සත 11ක් පමණයි. මේ මුදල ප්‍රමාණවත් නැති නිසා, මේ මුදල මදි නිසා, මදි වෙනකොට ණය අරගෙන මුළු රටම අද ණය උගුලක පැටලිලා ඉන්නවා. මොහොතකට හිතන්න ගරු ඇමතිතුමනි, ණය පොලියයි, ණය වාරිකයයි ගෙවීම සිදු නොකළා නම් මේ රටේ ලක්ෂ 14ක් ඉන්න රාජ්‍ය සේවකයන්ගේ වැටුප් දෙගුණ කරන්න පුළුවන්.

අපට මේ ණය පොලිය හා ණය වාරිකය ගෙවන්නට නැත්නම් රාජ්‍ය සේවකයින්ගේ වැටුප දෙගුණ කරන්න පුළුවන්. ඒ තරම් මහා විශාල මුදල් කන්දරාවක් ණය පොලිය, ණය වාරිකය ගෙවන්නට අප වැය කරනවා.

එදා ජනසවිය වැඩසටහන ක්‍රියාත්මක කරන කොට, ලෝක බැංකුව ජනසවිය සඳහා සල්ලි දුන්නේ කොහොමද? සියයට එකේ පොලියට, අවුරුදු 75කින් ගෙවන්න ඒ මුදල් දුන්නේ. එදා ජනසවි භාරකාර අරමුදලක් බිහි කළා. මේ ආණ්ඩුව මොකක්ද කළේ? ජනසවි භාරකාර අරමුදලේ නම වෙනස් කරලා සංවර්ධන භාරකාර අරමුදලක් බවට පරිවර්තනය කළා. නමුත් අද දවසේ ණය ගන්නේ කොහොමද? ණය අරගෙන, ව්‍යාපෘතිය කරලා අවුරුදු හයකට පස්සේ සියයට හයේ, හතේ ගිනි පොලියට ණය ගෙවන ක්‍රමයක් තමයි අද ක්‍රියාත්මක වන්නේ.

ණය ගත්තාට කමක් නැහැ ගරු ඇමතිතුමනි. වරායවල් හදන එක හොඳයි. ගුවන් තොටුපළවල් හදන එක හොඳයි. මහා පරිමාණයේ ව්‍යාපෘති - mega projects - කරන එක හොඳයි. නමුත් මේ කරන ආයෝජනය තුළින් රටට ඵලක් වෙන්න ඕනෑ. රටට ආදායමක් ලැබෙන්න ඕනෑ. රැකියා උත්පාදනයක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. රටට ධනාත්මක එකතුවක් වෙන්න ඕනෑ. එහෙනම් අපි හර බැර දෙපැත්තම බලලා, කොයි තරම් ණය වෙලා හරි රටට ගුණාත්මක වැඩසටහන්වලට ආයෝජනය කළාට ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් රටට ප්‍රතිලාභයක් ලැබෙන්නට ඕනෑ. රටට සහනයක් ලැබෙන්න ඕනෑ. රටට ධනාත්මක එකතුවක් ඇති වෙන්න ඕනෑ. රටින් සෘණාත්මක පිටවීමක් නොව, රටට ධනාත්මක එකතුවක් ක්‍රියාත්මක කළොත් රටක් හැටියට අපට හොඳ ගමනක් යන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, අද අපේ රට පත් වෙලා තිබෙන කනගාටුදායක තත්ත්වය පිළිබඳව මම ඔබතුමාට විස්තර කළා. ණය පැත්තෙන් මර උගුලක වැටිලා ඉන්නේ. දැන් ඔබතුමන්ලා කියනවා රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට

ගත්තොත්, 2011 දී සියයට 78.5 දක්වා අඩු වෙලාය කියලා. නමුත්, ඔබතුමා කොයි තරම් කිව්වත් රජයේ වර්තන ව්‍යයම්වලින් පොලී ගෙවීම් දිගින් දිගටම ඉහළ යනවා. රාජ්‍ය ව්‍යයම් ඉහළ යනවා. එතකොට මොකක්ද වන්නේ? අය වැය හිඟය අවම කිරීම දුෂ්කර කාර්යයක් වනවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට සංඛ්‍යා ලේඛන කීපයක් කියන්නම්. 1990ත් 2000 වසරේත් වර්තන ව්‍යයමේ සංයුතියෙන් ණය සහ පොලී ගෙවීම් වුණේ සියයට 28යි. 2000 දීත් සියයට 28යි. 1990 දීත් සියයට 28යි. නමුත් 2011 වන විට වෙලා තිබෙන්නේ මොකක්ද? වර්තන ව්‍යයමේ සංයුතියෙන් සියයට 35.4 දක්වා මේ ණය වාරික ගෙවීම, පොලී ගෙවීම වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම ණය පොලී ගෙවීමේ වර්ධන වේගය ගැන මම සංඛ්‍යා ලේඛන දෙකක් ඉදිරිපත් කරන්නම්. 2000 වසරට සාපේක්ෂව වර්තන ව්‍යයම්, පොලී ගෙවීම් අද වන විට සියයට 400කින් වැඩි වෙලා තිබෙනවා. 1990ට සාපේක්ෂව සියයට 1,000කින් වැඩි වෙලා තිබෙනවා. මෙහෙම තත්ත්වයක් තිබියදී තමුන්නාන්සේ රාජ්‍ය ව්‍යයම් කළමනාකරණය කරන්නේ කොහොමද කියලා මම නම් දන්නේ නැහැ. ණය පැත්තෙන් මර උගුලක මේ රටත්, මේ රජයත් හිර වෙලා තිබෙනවාය කියන එක මම ඔබතුමාට කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011 වසර වෙන කොට නොපියවූ සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 5,133යි. 2012 වසරට අනුමත ණයත් සමඟ මේ මුළු ගණන රුපියල් බිලියන 5,905යි. මේ තරම් ණය කන්දරාවක් තියාගෙන රටක් ඉදිරියට යන්නේ කොහොමද? මේ ණය කන්දරාව තියාගෙන තරගෙට ණය ගන්නවා. ණය ගන්නෙත් ගිනි පොලියටයි. ගිනි පොලියට, තරගෙට ණය අරගෙන මොකක්ද කරන්නේ? මතු පරපුර උකසට තබලා මේ රටේ පාලක පැළැන්තිය කෙටි කාලීන සුඛ විහරණයක් ලබා ගන්නවා. රටේ ලක්ෂ 200ක් වූ බහුතර ජනතාව අමතක කරලා, ඔවුන් කොන් කරලා ඒ අය සැප විඳිනවා. මෙන්න මේකයි සිද්ධ වන්නේ.

ගරු ඇමතිතුමනි, සමස්තයක් හැටියට ගත්තොත්, නොපියවූ ණය ප්‍රමාණයේ වර්ධනය 2000 වසරට සාපේක්ෂව සියයට 300යි. මේක සත්‍ය කථාවක්. මෙන්න මේ කාරණය පොඩ්ඩක් අහගන්න. මුළු ණය ගැනීම් දිහා බැලුවොත්, පොලී හා ණය මුදල රටේ සමස්ත ආදායමින් සියයට 95යි. මේ විධියට රටක් ගෙන යන්නේ කොහොමද? ආර්ථිකය කළමනාකරණය කරන්නේ කොහොමද? මේවාට කියන්නේ ණය සේවා ගෙවීම් - debt service repayment - කියලායි. ඒ වාගේම මුළු ණය සේවාකරණ ගෙවීම් රජයේ සමස්ත ව්‍යයම්වලින් සියයට 46යි. ගරු ඇමතිතුමනි, මේ රට ඉදිරියට ගෙන යන්න නම් මේ යන ක්‍රමයේ මහා පරිමාණයෙන් වෙනසක් සිදු වෙන්න ඕනෑය කියලා මම බොහොම අවංකව හිතනවා.

මේ ණය මර උගුලේ අවසාන ප්‍රතිඵලය මොකක්ද? 2005 දී මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ වගකීම භාර ගන්න කොට මේ රටේ සෑම පුරවැසියකුම රුපියල් 129,873ක් ණයයි. 2012 වන විට මේ රටේ සෑම පුරවැසියකුම රුපියල් 291,420ක් ණයයි. එහෙම නම්, ඒක පුද්ගල ණය බරතාව සියයට 124කින් වැඩි වෙලා තිබෙනවා. අපි හැමෝම කථා කරනවා per capita income එක ගැන. අපි හැමෝම කථා කරනවා අපේ ඒක පුද්ගල ආදායම ඩොලර් 4,000ක් කිරීම ගැන. ඩොලර් 4,000ක් නොවෙයි, ඩොලර් 10,000ක් කළත් වැඩක් නැහැ, මේ රටේ ඒක පුද්ගල ණය බරතාව පසු ගිය වසර හය තුළ සියයට 124කින් වැඩි වෙලා තිබෙනවා. මේ රටේ ජීවත් වන ලක්ෂ 200ක් වූ සෑම පුරවැසියකුම අද වන විට රුපියල් 291,420ක ණයකරුවකු බවට පත් වෙලා තිබෙනවා. මේකයි යථාර්ථය. මේක සත්‍යයක්. මේවා තමයි සත්‍ය සංඛ්‍යා ලේඛන.

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට තවත් දෙයක් ප්‍රකාශ කරන්න කැමැතියි. ප්‍රාග්ධන පැවරුම් හැටියට රාජ්‍ය සංස්ථා හා ආයතනවලට මුදල් අමාත්‍යාංශයෙන් සල්ලි බෙදනවා. 2002 වසරේදී ප්‍රාග්ධන පැවරුම් ලෙස රාජ්‍ය සංස්ථා හා ආයතනවලට රුපියල් මිලියන 32,094ක් දීලා තිබෙනවා. 2002 දී ලබා දුන් රුපියල් මිලියන 32,094 ප්‍රමාණය 2011 වන කොට රුපියල් මිලියන 160,374ක් බවට පත් වෙලා තිබෙනවා. එය සියයට 400ක වර්ධනයක්. ඒ මුදල් ලබා දුන්නේ රාජ්‍ය ආයතන නඩත්තු කරන්නයි. සල්ලි බෙදුවාට මදි ගරු ඇමතිතුමනි. ඒවා කළමනාකරණය කරන්නට ඕනෑ; කාර්යක්ෂම කරන්නට ඕනෑ; efficiency rate එක වර්ධනය කරන්නට ඕනෑ. ඒවා ලාභ ලබන ආයතන බවට පත් කරන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුව පසු ගිය වසර 7හි රුපියල් මිලියන 28,000ක් පාඩු ලබා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් බිලියන 28ක්. 2013 දී අපේක්ෂිත පාඩුවත් එකතු කළාම ලංකා විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 155ක් පාඩු විඳිනවා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවත්, ලංකා විදුලිබල මණ්ඩලයත් රුපියල් බිලියන 160ක් පාඩු ලබා තිබෙනවා. මිහින් ලංකා ආයතනය රුපියල් මිලියන 8,500ක් හෙවත් බිලියන 8.5ක් පාඩු ලබා තිබෙනවා. SriLankan Airlines එකෙන් රුපියල් මිලියන 17,000ක් හෙවත් රුපියල් බිලියන 17ක් පාඩුයි. ප්‍රාග්ධන පැවරුම් හැටියට සියයට 400ක් රාජ්‍ය පාර්ශ්වයෙන් මුදල් වෙන් කරලා රාජ්‍ය ආයතන නඩත්තු කළාට, යථාර්ථය මොකක්ද ගරු ඇමතිතුමනි? කිසිම කාර්යක්ෂමභාවයක් නැහැ; ශක්තිමත් පරිපාලනයක් නැහැ; හොඳ කළමනාකාරිත්වයක් නැහැ. මෙන්න මේක තමයි අද රටට අත් පත් වෙලා තිබෙන සැබෑ ඉරණම. ඒ නිසා ගරු ඇමතිතුමනි, රටක් හැටියට ඉදිරියට යන්න නම් අපි තරගකාරී වන්නට ඕනෑ; කාර්යක්ෂම වන්නට ඕනෑ. අපි රටක් හැටියට අපේ රටේ ඵලදායිත්වය වර්ධනය කරන්නට ඕනෑ.

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. ඇඟලුම් කම්හල් 200 වැඩසටහන යටතේ මේ රටේ කර්මාන්තශාලා රැසක් බිහි කරපු ආයතනය තමයි බ්‍රැන්ඩික්ස් ආයතනය. එදා ඇඟලුම් කම්හල් 200 වැඩසටහන යටතේ බ්‍රැන්ඩික්ස් ආයතනය මේ රටේ ගමක් ගමක් පාසා කර්මාන්තශාලා බිහි කළා. නමුත් අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ කියා ඔබතුමා මට පොඩ්ඩක් කියන්න ගරු ඇමතිතුමනි. බ්‍රැන්ඩික්ස් ආයතනය ශ්‍රී ලංකාව අත් හැරලා ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රාන්තයට ගිහිල්ලා. ශ්‍රී ලංකාව අත් හැරලා ගිහිල්ලා Brandix India Apparel City ආරම්භ කර තිබෙනවා. ඒ කියන්නේ ඇඟලුම් කර්මාන්තශාලා පුරවරයක්. රස්සා 15,000ක් බිහි කරන වැඩසටහනක්. අද කොහේද එම ආයතනය ක්‍රියාත්මක කරන්නේ? ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රාන්තයේයි. ඒ විතරක් නොවෙයි. ලෝකය අපේ රට දිහා බලන්නේ කොයි ආකාරයෙන්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මට විනාඩියක් දෙනවාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් දෙන්න විධියක් නැහැ. මට හුහක් දේවල් කියන්න තිබෙනවා ඔබතුමාට. පොඩ්ඩක් අහගෙන ඉන්න. ඊට පස්සේ ඔබතුමා උත්තර දෙන්න.

ගරු ඇමතිතුමනි, ලෝකය අපේ රට පිළිබඳව මනින මිනුම් දණ්ඩ මොකක්ද? ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඇති පහසුකම් පැත්තෙන් අපේ රට තිබෙන්නේ ලෝකයේ 89වැනි ස්ථානයේයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඉස්සර සිටියේ කී වැනි තැනද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉඩමක් ගැනීම පැත්තෙන්, ව්‍යාපාරයක් ලියා පදිංචි කිරීම පැත්තෙන් රටවල් 161ක් අතරින් අපේ රට තිබෙන්නේ 136වැනි ස්ථානයේයි. ඒ වාගේම, 2012-2013 ලෝක ආර්ථික සංසදයේ තරගකාරිත්වය පැත්තෙන්, රටවල් 144ක් අතරින් අපේ රට තිබෙන්නේ 68වැනි ස්ථානයේයි. අපි සිටියේ 52වැනි ස්ථානයේයි. ඔබතුමා ඇහුවා නේ ඉස්සර සිටියේ කී වැනි තැනද කියලා ගරු ඇමතිතුමනි. අපි හිටියේ 52 වෙනි තැන. අපි දැන් 68ට බැහැලා. අපට ඉදිරියෙන් කවුද ඉන්නේ? මැලේසියාව 25වෙනි තැන ඉන්නවා. සිංගප්පූරුව 2වෙනි තැන ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් මේ කාරණාව දන්නවා. එක්දහස් නවසිය පණස් ගණන්වල හැට ගණන්වල සිංගප්පූරුව සහ මැලේසියාව තමන්ගේ ආර්ථික සැලැස්ම ක්‍රියාත්මක කරන්න මොන රටද ආදර්ශයට ගත්තේ? මොන රටද? ඔබතුමාම කියන්න. ශ්‍රී ලංකාවයි ආදර්ශයට ගත්තේ. එදා ශ්‍රී ලංකාව ආදර්ශයට ගත්ත මැලේසියාව සහ සිංගප්පූරුව 2 වෙනි තැනේ සහ 25 වෙනි තැනේ ඉන්නවා. අපි 68 වෙනි තැනේ ළතැවෙනවා. මේකයි යථාර්ථය.

ඒ වාගේම Transparency International ආයතනය ලෝකයේ දූෂිත රාජ්‍යයන් වර්ගීකරණය කිරීමේදී අපේ රටට 2011 වසරේදී 86 වෙනි ස්ථානය ලබා දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ වාර්තාව පිළිබඳව, මේ මිනුම් දඬු පිළිබඳව අපට රටක් හැටියට ආඩම්බර වෙන්න පුළුවන්ද, බැරිද කියන කාරණාව පිළිබඳව අපි හැමෝටම හෘදය සාක්ෂියට එකඟව නිගමනයට එළැඹෙන්න පුළුවන් කියලා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මේ රජයේ ආර්ථික සැලැස්ම තුළ රජයේ ඉලක්කය වෙලා තිබෙන්නේ සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් නිරතුරුවම පවත්වා ගෙන යන්නයි. 2010 වසරේ එය සියයට 8යි. 2011 වසරේ එය සියයට 8.2යි. 2012 වසරේ එය සියයට 6.4යි. මම ඒ කරුණු කාරණා පිළිබඳව වාද විවාද කරන්නේ නැහැ. මොකද, ඒවා ඇත්තටම ප්‍රසංශනීය ඉලක්ක සහ ප්‍රසංශනීය සාධක කියන එක මම ප්‍රකාශ කරන්නට කැමැතියි. සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගෙන යනවා වාගේම 2016 වන විට ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,000 කරන්න මේ රජයේ ඉලක්කයක් තිබෙනවා. මේ ඉලක්කය කරා යන්නට නම් ගරු ඇමතිතුමනි, ජාතික නිෂ්පාදිතයෙන් සියයට 35ක් ඉක්ම වූ ආයෝජන මට්ටමක් අපේ රටට තිබෙන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, දේශීය ඉතුරුම් දිහා බලන්න. දේශීය ඉතුරුම්වල තිබෙන පහළ මට්ටම තුළ අපි කොහොමද මේ සියයට 35ක තත්ත්වය පවත්වා ගෙන යන්නේ? දැන් චීනය, ඉන්දුනීසියාව, මැලේසියාව, ඉන්දියාව වාගේ රටවල දේශීය ඉතුරුම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 35ත් සියයට 50ත් අතර ප්‍රමාණයක් වෙනවා. නමුත් අපේ රට දිහා බලන්න. අපේ රටේ ආයෝජන අනුපාතය 1995 දී සියයට 24යි. වසර 16කට පසුව 2011 දී අපේ රටේ ආයෝජන අනුපාතය සියයට 29යි. 1995 දී එය සියයට 24යි. 2011 දී එය සියයට 29යි. අවුරුදු 16ක් තුළ අපේ රටේ ආයෝජන ප්‍රතිශතය වැඩි වෙලා තිබෙන්නේ සියයට 5යි. එහෙම නම් මම ඔබතුමාගෙන් අහන්නට කැමැතියි ඇමෙරිකානු ඩොලර් 4,000ක ඒක පුද්ගල ආදායම් ඉලක්කය යථාර්ථවාදීද කියලා. වසරක් වසරක් පාසා සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් නිරතුරුවම, නොනවත්වාම පවත්වා ගෙන යා හැකිද කියලා මම ඔබතුමාගෙන් අහන්නට කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම දේශීය ඉතුරුම් ප්‍රමාණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි. දේශීය ඉතුරුම් දිහා බලන විට 1995 දී අපේ රටේ දේශීය ඉතුරුම් සියයට 15ක් තිබුණා. 2011 වසරේදීත් එය එසේමයි. කිසිම වෙනසක් වෙලා නැහැ. 1995 දී තිබුණු දේශීය ඉතුරුම් අගය සියයට 15යි. 2011 දීත් එය සියයට 15ම රැඳිලා තිබෙනවා. ජාතික ඉතුරුම් අගය දිහා බලන්න ගරු ඇමතිතුමනි. 1995 දී එය සියයට 19යි. 2010 දී එය සියයට 25යි. 2011 දී ජාතික ඉතුරුම් අගය සියයට 22 දක්වා අඩු වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපි ඉතුරුම්වල වර්ධනය ගැන කථා කළොත් පෞද්ගලික අංශයේ ඉතුරුම්වල පහළ බැසීමක් සිදු වෙලා තිබෙනවා ගරු ඇමතිතුමනි. 2010 දී එය සියයට 14.5යි. 2011 දී එය සියයට 10යි. නමුත් රාජ්‍ය ඉතුරුම් වර්ධන වේගයේ ධනාත්මක වෙනසක් තිබෙනවා. 2010 දී සියයට 33ට තිබුණු රාජ්‍ය ඉතුරුම් අගය 2011 දී සියයට 40 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, සාරාංශයක් හැටියට ගත්තොත් දේශීය ඉතුරුම් ආයෝජන පරතරය කීයද?

2010 දී සියයට 8.3ක්ව තිබුණු දේශීය ඉතුරුම් සහ ආයෝජන පරතරය 2011 වන විට සියයට 14.6 දක්වා වැඩි වෙලා තිබෙනවා. ජාතික ඉතුරුම් සහ ආයෝජන පරතරය දෙස බැලුවොත් 2010 සියයට 2.2ට තිබුණු ජාතික ඉතුරුම් සහ ආයෝජන පරතරය 2011 දී සියයට 7.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ වාගේ වර්ධනය වෙන පරතරයක් තුළ අපේ රටේ ආර්ථික වර්ධන වේගය මේ ආකාරයෙන් සියයට 8 ඉලක්කය කරා රටක් හැටියට ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියා මා ඔබතුමාගෙන් අහන්න කැමතියි. ඇත්ත වශයෙන්ම මා දැන් දුන් සංඛ්‍යා ලේඛන අනුව ඉතුරුම් සහ ආයෝජන පරතරය වැඩි වෙනවා, ගරු ඇමතිතුමනි. දේශීය ඉතුරුම් ආයෝජන අගය සියයට 8.3 ඉඳලා 14.6 දක්වා වැඩි වෙලා තිබෙනවා. ජාතික ඉතුරුම් අගය සියයට 2.2 සිට 7.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් තුළ සියයට 35ක ආයෝජන මට්ටම ක්‍රියාත්මක කරන්නේ කොහොමද? 1994 ඉඳලා 2011 වන තුරු අවුරුදු 16කට ආයෝජන ප්‍රතිශතය වැඩි වෙලා තිබෙන්නේ සියයට 5යි. ඒ නිසා මා ඔබතුමාට කියන්න කැමතියි, මේ යන ක්‍රමයේ මහා පරිමාණයේ වෙනසක් සිදු විය යුතුයි; නාස්තිකාර වියදම් අඩු කරන්න; ඵලදායී නොවන ව්‍යාපෘති නතර කරන්න කියා. යම් කිසි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන විට ඵලදායීතාවය, කාර්යක්ෂමතාවය, රටට අගයක් එකතු කරන - රටෙන් අගයක් බැහැර කිරීම නොවෙයි, රටට සෘණාත්මක ප්‍රතිඵල ගෙනදීම නොවෙයි- ආකාරයට කාර්යක්ෂමව සූක්ෂ්මව පැහැදිලි නවීන ක්‍රමෝපායන් උපයෝගී කර ගෙන මේ රටේ මුදල් කළමනාකරණය ක්‍රියාත්මක විය යුතුයි කියන එකයි මගේ අදහස.

ගරු ඇමතිතුමනි, අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ රටේ ආර්ථික වර්ධන වේගය වැඩි වෙලා තිබෙන ආකාරය ගැන ඔබලාගේ රජය බොහොම ගාම්භීරත්වයෙන් බොහොම අභිමානයෙන් ප්‍රකාශ කරනවා. අපත් ඒ ගැන සතුටු වෙනවා. නමුත් කවුරු මොන සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළත්, සියයට 8 ආර්ථික වර්ධන වේගය ගැන කථා කළත්, සියයට 6 ආර්ථික වර්ධන වේගය ගැන කථා කළත්, මේක ජනතාවගේ මුදල් පසුම්බියට දැනෙන්න ඕනෑ. මේ සියල්ලක්ම දැනෙන්න ඕනෑ ජනතාවගේ කටට; බඩට; හදවතට. මේවාට නොදැනෙන ආර්ථික වර්ධන වේගයකින් රටට ඵලක් වන්නේ නැහැ. ඔබතුමා ඒක පිළිගන්නවා ඇති. ඔබතුමන්ලා සියයට 8 ආර්ථික වර්ධන වේගය ගැන කථා කරනවා; සියයට 6 ආර්ථික වර්ධන වේගය ගැන කථා කරනවා. නමුත් ඔබතුමා දන්නවාද, අපේ රටේ ජාතික ආදායමෙන් සියයට 54.1ක් භුක්ති විඳින්නේ මේ රටේ පොහොසත්ම සියයට 20 බව. ඒක ඔබතුමා පිළිගන්නවා ඇති. මේ රටේ දුප්පත්ම සියයට 20 රටේ ජාතික ආදායමෙන් භුක්ති විඳින්නේ සියයට 4.5ක් වැනි සොච්චම් මුදලක්; සොච්චම් ප්‍රමාණයක්; සොච්චම් ප්‍රතිශතයක්. මේ වාගේ සොච්චමක් නියාගෙන, මේ වාගේ ඇති හැකි නැති බැරි පරතරය එන්න එන්න වර්ධනය වෙන යුගයක මහ ලොකුවට කථා කරන ආර්ථික

වර්ධනයේ ප්‍රතිලාභ මේ රටේ සුළුතරයක් -මේ රටේ එක්තරා පැළැන්තියක්, පාලක පැළැන්තියේ සුළුතරයක්- භුක්ති විඳින විට මේ රටේ බහුතර ලක්ෂ 200කට යන කල දසාව මොකක්ද? ඒ අයගේ අනාගතය මොකක්ද? දිනෙන් දින තරගයට ණය අරගෙන තිබෙනවා. තමුන්නාන්සේ දන්නවා ඇති, එක කාලයක ලෝකයේ ප්‍රවණතාවක් තිබුණා, tax-and-spend කියා. ඒ කියන්නේ බදු ගහනවා. ඉවක් බවක් නැතුව වියදම් කරනවා. මේ tax-and-spend කියන එක අද අපේ රටේ මේ ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නේ කොහොමද? It is borrow-and-spend; ණය ගන්නවා වියදම් කරනවා. ගිනි පොලියට ණය ගන්නවා. වියදම් කරනවා. ඉවක් බවක් නැතුව ණය ගන්නවා. වියදම් කරනවා. කිසිම විමසීමක් නැතුව, කිසිම පරීක්ෂණයක් නැතුව, කිසිම ස්ථාවරත්වයක් ගැන අවධානය යොමු කරන්නේ නැතුව රට ගැන හිතන්නේ නැතුව තමන්ගේ පෞද්ගලිකත්වය ගැන පමණක් හිතලා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් රටට ඵලයක් ඇති වන්නේ නැහැ. ඒ නිසා මගේ කථාව අවසන් කිරීමට පෙර මම පැහැදිලිවම එක දෙයක් ඔබතුමාටත් මේ උත්තරීතර සභාවටත් ප්‍රකාශ කරන්න කැමැතියි. මේ රජය ක්‍රියාත්මක කරන ඕනෑම ඵලදායී ව්‍යාපෘතියක් තිබෙනවා නම් පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව අප ඒකට සහයෝගය ලබා දෙනවා.

හම්බන්තොට වරාය හෝ වේවා, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ හෝ වේවා රටට අගයක් එකතු කරනවා නම්, රටට ශක්තියක් ලැබෙනවා නම්, රටට ආදායමක් ලැබෙනවා නම්, රටට විදේශ විනිමය උපයනවා නම්, මෙවැනි මහා පරිමාණයේ ව්‍යාපෘති තුළින් - mega projectsවලින්- රටේ විරැකියා ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවා නම්, මේ රටේ තරුණ විරැකියා ප්‍රශ්නයට පැහැදිලි ප්‍රායෝගික සැලැස්මක් හරහා හොඳ ප්‍රතිඵල ලැබෙනවා නම් අපත් ඉවක් බවක් නැතිව ඒ වාගේ හොඳ වැඩසටහන්වලට අත උස්සන්න ලැහැස්තියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් කාරණයක් අහන්න කැමැතියි. මා මේවා කියන්නේ කුහකකමකින් නොවෙයි. පසු ගිය කාලයේ හම්බන්තොට ජාත්‍යන්තර වරාය ආරම්භ කළා. ඒක මහා පරිමාණයේ ශක්තිමත් ව්‍යාපෘතියක් වෙයි කියලා අප හැමෝම හිතුවා. ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමනි, හම්බන්තොට ජාත්‍යන්තර වරායට සේවකයන් බඳවා ගැනීම ගැන මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඒ වරායට අලුතින් සේවකයන් බඳවා ගෙන නැහැ. කොළඹ වරායෙන් සේවකයන් ගෙනැල්ලා තමයි හම්බන්තොට වරායේ වැඩ කටයුතු කරන්නේ. එහෙම නම් එකම රැකියාවක්වත් බිහි නොකරන ජාත්‍යන්තර වරායකින් රටට තිබෙන ඵලය මොකක්ද? ගිනි පොලියට සල්ලි අරගෙන, බද්ධ ණය අර ගෙන මහා ආයෝජනයක් කරලා ඒ වැඩසටහන ක්‍රියාත්මක කළාට ඒ තුළින් ඒ ප්‍රදේශවල කිසිම මුදල් සංසරණයක් සිදු වන්නේ නැහැ. අල්පෙනෙත්තේ ඉඳලා හැම දෙයක්ම චීනයෙන් ගෙන්වලා නුපුහුණු, පුහුණු කම්කරුවන් චීනයෙන් ගෙන්වලා හම්බන්තොට වරාය හැදුවා. රටට ප්‍රතිඵලයක් ලැබෙනවා නම්, රටට දායකත්වයක් ලැබෙනවා නම්, රටට ශක්තියක් ලැබෙනවා නම්, රටට මුදල් සම්භාරයක්, සම්පත් සම්භාරයක් ගලා එනවා නම්, රැකියා ප්‍රශ්නය විසඳනවා නම් ඒවා කළත් කමක් නැහැ. ලජ්ජයි කියන්න, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට සේවය කරන්නවත් හම්බන්තොට ජාත්‍යන්තර වරායේ අලුතින් රැකියා බිහි වෙලා නැහැ. කොළඹ වරායේ සේවක මහත්ම මහත්මීන් අනුයුක්ත කිරීමක් පමණයි සිදු වෙලා තිබෙන්නේ. එහෙම සේවකයන් අනුයුක්ත කරන්නද, ජාත්‍යන්තර වරායක් හැදුවේ? ඒ නිසා මා මේ අවස්ථාවේ ඔබතුමාට යෝජනා කරනවා මේ යන ගමනේ පැහැදිලි වෙනසක් ඇති කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය විසින් ණය මර උගුලේ රට හිර කරවීම ජාතිද්‍රෝහී, රාජද්‍රෝහී ක්‍රියාවක් හැටියට මා දකිනවා. මේ රටේ ජීවත් වන හැම පුරවැසියකුගේම ණයබරතාව සියයට 124කින් වැඩි කළා නම්, අන්න ඒකයි ජාතිද්‍රෝහිත්වය, රාජද්‍රෝහිත්වය. දේශමාමකත්වය කියන්නේ මේ රටේ ජනතාව සුරකින වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි. මේ රටේ ජනතාව ජීවත් කරවන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි. එහෙම නම් විශේෂයෙන්ම රේගු (සංශෝධන) පනත් කෙටුම්පත සාකච්ඡා වන මේ මොහොතේ මා ඔබතුමාට යෝජනා කරනවා පාලක පැළැන්තියේ සුළු කොටසක් පමණක් වරප්‍රසාද භුක්ති විඳීමේ ක්‍රමය බැහැර කරලා -පැත්තකට විසි කරලා- මුදල් අමාත්‍යාංශයේ නායකත්වය තුළින් මේ රටේ ක්‍රියාත්මක වන ආර්ථික ප්‍රතිපත්තියේ පැහැදිලි වෙනසක්, ජනතාවාදී වෙනසක්, ප්‍රායෝගික වෙනසක් ඇති කරන්න; ජනතාව කේන්ද්‍ර කර ගත්- ජනතාව මූලික කර ගත් - සමස්ත ජනතාවටම සහන ලැබෙන පරිදි, සමස්ත ජනතාවටම වරප්‍රසාද ලැබෙන පරිදි ආර්ථික ප්‍රතිපත්තියේ මහා විප්ලවීය සංශෝධනයක් ඇති කරන්න කියලා. මේ "ආශ්චර්යවත් ශ්‍රී ලංකාව" කියන එක වචනයට පමණක් සීමා කරන්න එපා; රූප රාමුවලට පමණක් සීමා කරන්න එපා; ප්‍රවෘත්ති ප්‍රකාශනවලට පමණක් සීමා කරන්න එපා. ඒක දේශපාලන වේදිකාවල පුහු වදන්වලට පමණක් සීමා කරන්නේ නැතිව "ආශ්චර්යය" කියන එක මේ රටේ ජනතාවගේ බඩට, කටට, හදවතට දැනෙන ආශ්චර්යයක් බවට පරිවර්තනය කරන්නට ඔබතුමන්ලා කටයුතු කරන්න. එවන් කර්තව්‍යයකට විපක්ෂයේ අප ප්‍රගතිශීලීව, ඒ දායාදය, ශක්තිය, සහයෝගය ලබා දෙන්නට ඕනෑම වෙලාවක ලැහැස්තියි කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් හමාර කරනවා.

[අ.භා. 5.08]

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රේගු (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීමේ විවාදය පවත්වන වෙලාවේ ඒ කරුණු කාරණා සම්බන්ධයෙන් අපේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමු කොටම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට ආදායම් උපදවන ප්‍රධානතම ආයතනයක් වන රේගුව අපි කවුරුත් ඉතා උනන්දුවෙන් සාකච්ඡා කරන ආයතනයක්. රේගුව ආදායම් උපදවන ආයතනයක් වීම නිසා එය රට තුළ විශේෂ වූ ඉලක්කයකට, විශේෂ වූ අවධානයකට ලක් වන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසාම එම ආයතනයේ යම් යම් සාධනීය ප්‍රතිසංස්කරණයන් සිදු වෙනවා නම්, අපි ඒ පිළිබඳව විශේෂ අවධානයකින් කටයුතු කළ යුතු බව මම කල්පනා කරනවා.

විශේෂයෙන්ම රේගුවේ බොහෝ නිලධාරීන් ඉතා හොඳින්, ඉතා අවංකව මේ රට පිළිබඳව කල්පනා කරලා කටයුතු කරන බව අපි කවුරුත් දන්නවා. හැබැයි, එහෙම කටයුතු කළත්, එම ආයතනය කෙරෙහි විවිධ අවස්ථාවල යම් යම් විවේචන එල්ල වෙලා තිබෙනවා. එම විවේචනවලින් මෙම ආයතනය නිදහස් කර ගන්න පුළුවන්. ඒ වාගේම මෙම ආයතනයේ ක්‍රියාකාරිත්වය විනිවිද පෙනෙන ආකාරයෙන් ක්‍රියාවට නහන්න පුළුවන් විධියට මෙම පනත් සංශෝධනය වෙනවා නම්, මම හිතන හැටියට අපි කවුරුත් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එය අනුමත කළ යුත්තක්. ඒ නිසා අද ඉදිරිපත් කර තිබෙන මෙම සංශෝධනය මම දකින්නේ, මේ හරහා රටේ ජනතාවට රේගුව කෙරෙහි ඇති වන විශ්වාසය, රේගුව සමඟ ගනු දෙනු කරන පුද්ගලයන්ට රේගුව කෙරෙහි ඇති වන විශ්වාසය වඩාත් පුළුල් කරන සංශෝධනයක් හැටියටයි. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මා එය සඳහන් කළ යුතුව තිබෙනවා. හැබැයි, එම සංශෝධනය ගැන සාකච්ඡා කරන මෙම විවාදයේදී ඇත්තටම විපක්ෂයේ උදවියට කියන්න දේවල් ඉතිරි වෙලා නැහැ. ඊයේ විවාදයේත් මේ තත්ත්වයම තමයි තිබුණේ. ඒ නිසාම ඒ උදවිය විවාදයට අදාළ මාතෘකාව පිළිබඳව

[ගරු අචල ජාගොඩගේ මහතා]

සාකච්ඡා කරනවා වෙනුවට, ඒ මාතෘකාවෙන් එපිටට ගිහිල්ලා විවිධ වූ මාතෘකා කරා මෙම සාකච්ඡා සභාව යොමු කරලා තිබුණා. විශේෂයෙන්ම අද විපක්ෂයෙන් ඉදිරිපත් වුණු කරුණු හා ඊයේ විපක්ෂයෙන් ඉදිරිපත් වුණු කරුණු දිහා බැලුවාම, ඒ අය ප්‍රධාන වශයෙන්ම කියන්නේ රටේ නීතියක් නැහැ, මුදල් අවභාවිත වෙනවා කියන එකයි. එහෙම කියලා ආණ්ඩුවට බරපතළ විවේචන ඉදිරිපත් කළා.

අද සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මට කලින් කථා කළා. එතුමාගේ කථාව ඇහුවාට පස්සේ මට පුදුම හිතුණා. මොකද, සජිත් ප්‍රේමදාස මැතිතුමා සංඛ්‍යා ලේඛන උපුටා දක්වමින් අද රට තිබෙන තැන පිළිබඳව විශාල විග්‍රහයක් කළා. හැබැයි, අපි කවුරුත් දන්නවා, අද රටේ යම් දෙයක් ඇති වෙලා තිබෙනවා නම්, යම් කිසි ආකාරයකට රටේ ප්‍රශ්න මතු වෙලා තිබෙනවා නම්, රටේ ණය බර වැඩි වෙලා තිබෙනවා නම්, ඒවා සිද්ධ වුණේ ඊයේ රාත්‍රියේ ඉඳලා නොවෙයි කියන එක. එහෙම නැත්නම් 2005 ඉඳලා නොවෙයි. එහෙමත් නැත්නම් 1994 ඉඳලා නොවෙයි. මේ රටට ණය ගැනීම පිළිබඳව වාර්තා පිට වාර්තා තිබ්බේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි; එදා 1977 බිහි වුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. එදා 1977 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ හිටපු අගමැතිවරයාගේ පුත්‍රයා, යම් කිසි කාලයක් මේ රටේ ජනාධිපති ධුරය හොබවපු රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ පුත්‍රයා අද කියනවා නම්, ණය බර වැඩියි, ණය බරින් ජනතාව මිරිකිලා, ජනතාව පිට මේ සියල්ල පැටවිලා, මේ ක්‍රමය වැරැදියි කියලා, එහෙම නම් ඒ ඉතිහාසය නිර්මාණය කළේ, ඒ ණය බර මේ රට මත පැටෙව්වේ තමුන්නාන්සේගේ පියා නායකත්වය දරපු රජයක් යටතේයි කියන එක මම මතක් කරන්න ඕනෑ. ඒ නිසා එතුමාගේ පියාගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව වන ස්වයං විවේචනාත්මක හැරී බැලීමක් තමයි එතුමාගේ කථාවෙන් අද එතුමා කළේ.

අද මොනවාද එතුමා කථා කළේ? අද එතුමා විදුලි බිල වැඩිවීම ගැන කථා කළා, බදු වැඩිවීම් ගැන කථා කළා. එතුමා එක පැත්තකින් ඇහලුම් කර්මාන්තය රැක ගන්න ඕනෑ කියලා කියන ගමන්, දුප්පත් සුළු පිරිසකට විශාල බරක් පැටවෙන විධියට තමයි විදුලි බිල වැඩි වෙන්නේ කියලාත් එතුමා කියනවා. ඔබතුමා හෘදය සාක්ෂිය අනුව හොයලා බැලුවොත් පෙනෙයි,විදුලි පරිභෝජනයේ මැද කොටසේ විශාල වශයෙන් ඉන්නේ මේ රටේ සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් බව. සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර කඩා වැටෙන එක වළක්වන්න තමයි ඒ අයට වැඩිපුර බරක් පැටවෙන්නේ නැති විධියට විදුලි බිල වැඩි කරලා තිබෙන්නේ.

කර්මාන්ත රැක ගැනීම ඉලක්ක කරලා, ඊට ගැළපෙන විධියට තමයි විදුලි බිල වැඩි කර තිබෙන්නේ. [බාධා කිරීමක්] ඒක හරි. හැබැයි, මැද පන්තියේ මනුෂ්‍යයාගේ, කර්මන්තකරුවාගේ, නිෂ්පාදකයාගේ විදුලි බිල වැඩි වෙලා, ඒ හරහා නිෂ්පාදන වියදම වැඩි වුණොත් ඒක බලපාන්නේත් අහිංසක දුප්පත් මනුෂ්‍යයාටයි කියන එක අමතක කරලා තමයි, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි ඔබතුමාගේ කථාව පෙළ ගැස්සුවේ කියන එක මම මතක් කරන්න ඕනෑ.

ඔබතුමාගේ කථාවේදී දැයට කිරුළ ගැන කථා කළා; නාස්තිකාර වියදම් ගැන කථා කළා. හැබැයි ඔබතුමාගේ තරුණ කාලයේ ගම් උදාව පවත්වනකොට ඒ ගම් උදාවට වියදම් කළ මුදල් ප්‍රමාණය කල්පනා කර බැලුවොත්,-[බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඉලක්ක සහගතව කළ ගම් උදාවේ ගොඩනැඟිලි අදත් ප්‍රයෝජනයට ගන්නවා.

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)

දැයට කිරුළට හදන භූමිවලට වෙන්නේත් ඒක තමයි. දැයට කිරුළට හදන දේවලට වෙන්නේත් ඒකයි. ඒවා හැදෙන්නේත් ඉලක්ක සහගතවයි. ඒක තමයි මම මේ කියන්න ගියේ. ගම් උදාවට එදා වියදම් කළ මුදල එක්ක බැලුවාම අද දැයට කිරුළට වියදම් කරන්නේ ඉතා සොච්චම් මුදලක්. එදා මුදල් නාස්ති කළ විධිය ගැන මා විග්‍රහ කරන්න ඕනෑ නැහැ. මොන විධියටද ගම් උදාවට මුදල් වියදම් කළේ කියලා එදා පාර්ලිමේන්තුවේ ඕනෑ තරම් විවාද සිද්ධ වුණා. අපි රටට ණය ගත්තා නම් ඒ ණය ගත්තේ කාලා කාබාසිනියා කරලා විනාශ කර දමන්න නොවෙයි කියන එක මම වගකීමෙන් කියනවා. ඒ ණය ගත්තේ ඉලක්ක සහගත සංවර්ධනයකට මේ රට යොමු කරන පරමාර්ථයෙන්.

ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා හම්බන්තොට වරාය පිළිබඳව කථා කළා. ගරු මන්ත්‍රීවරු හුඟ දෙනෙක් ඊයේත් හම්බන්තොට වරාය ගැන කථා කළා. හම්බන්තොට වරායට නැව් කීයක් ආවාද කියලා දැන් අපෙන් අහනවා. ඒ නැව්වලින් කොච්චර සල්ලි හම්බ වුණාද කියලා අහනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම එහෙම කිව්වේ නැහැ නේ.

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)

ඔබතුමා දෙපැත්තට තියලා කථා කළා. [බාධා කිරීමක්] ඉන්න මම කියන්නම්. වෙනවා නම් හොඳයි කිව්වා. වෙනවාද නැද්ද කියන එක සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ දැක්ම ඉදිරිපත් කළා ද? නැහැ. මම කියන්නම්. හම්බන්තොට වරාය මේ රටේ හීනයක්ව තිබුණු කාලයක් තිබුණා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ඒ සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් වුණා. නමුත් වරායක් හැදුණේ නැහැ. ඔබතුමාත් එදා 2002 ආණ්ඩුව පත් වුණාට පස්සේ හම්බන්තොට සංවර්ධනය පිළිබඳව, මේවා හැදෙනවාය කියලා අභිමානයෙන් කථා කළා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒ කාලයේ ඇමති මණ්ඩලයේ හිටියේ- [බාධා කිරීමක්]

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)

ඔබතුමා ඇමති මණ්ඩලයේ හිටියේ නැති වුණාට ඒ ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයකු වශයෙන් හිටියා. හම්බන්තොට වරාය හදන එක ගැන ඔබතුමා අභිමානයෙන් කථා කළා. [බාධා කිරීමක්] නමුත් ඒක හදා ගන්නට බැරි වුණා. ඒකට අප මොනවා කරන්නද? නමුත් මේ රජය යටතේ හම්බන්තෙට වරාය හැදුවා. මේ සරල විහිළු තර්කවලින් හම්බන්තොට වරාය කියන ඒ මහා ව්‍යාපෘතිය යටපත් කරන්නට බැහැ. [බාධා කිරීමක්] මා කියන්නම්. ඔබතුමා ඉන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි දශකයේ මේ ලෝකයේ ආර්ථික සංවර්ධන වේගය වැඩි වෙනකොට ආර්ථික සංවර්ධනය වැඩියෙන්ම වෙන රට තමයි චීනය. නිෂ්පාදන කර්මාන්ත වැඩියෙන්ම නිර්මාණ වන්නේ,- [බාධා කිරීමක්]ඔබතුමාට මා බාධා කළේ නැහැනේ. පොඩ්ඩක් අහගෙන ඉන්න. හම්බන්තොට රස්සා ලැබෙන හැටි මම කියන්නම්. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමන්ලා බාධා නොකර කථා කරගෙන යන්න-

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
ආර්ථික වර්ධන වේගය වැඩිම රට චීනය. කර්මාන්තවලට අමු ද්‍රව්‍ය ගෙනෙනවා නම් ගෙනෙන්න තියෙන්නේ අප්‍රිකාවෙන්. අප්‍රිකාව තමයි ලෝකයේ වැඩියෙන්ම අමුද්‍රව්‍ය තිබෙන රට. අප්‍රිකාව සහ චීනය හරහා තනි ඉරක් ඇන්දොත් හරි මැද්දෙන් තිබෙන්නේ ලංකාව; හම්බන්තොට. හම්බන්තොට පෙනි පෙනී මුහුදේ නැව් විශාල ප්‍රමාණයක් යනවා. ඒක තමුන්නාන්සේ දන්නවා. මේ ව්‍යාපෘතිය මීට අවුරුදු විස්සකට කලින් මේ රටේ ඇති වුණා නම්, අද මේ රට සිංගප්පූරුවට වඩා එහා ගිය ශක්තිමත් රාජ්‍යයක් වෙනවාය කියන එක මා මේ අවස්ථාවේදී තමුන්නාන්සේට කියන්න ඕනෑ. අවුරුදු විස්සක් පහු වෙලා හෝ මේ ව්‍යාපෘතිය කළ එක ගැන අප සතුටු වෙන්න ඕනෑ. රස්සාවල් උපදින්නේ ඒකෙන්. හෙට උදේට රස්සාවල් උපදින්නේ නැහැ. මේ යන මහා නැව් ටික [බාධා කිරීමක්] මෙතුමා මේ ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ හරියට පේමන්ට් බිස්නස්කාරයෝ වාගෙයි. පේමන්ට් එකේ බිස්නස් කරන මනුෂ්‍යයෙක් උදේට පොලියට සල්ලි අරගෙන බඩු ටිකක් දාලා විකුණලා ලාබද පාඩුද කියලා හවසට ගණන් බලනවා. පාඩු වුණාට පස්සේ ඒ මනුෂ්‍යයා දුක් වෙනවා, අද සෑහෙන ගණනක් පාඩුයි කියලා. උදේට සල්ලි අරගෙන හවසට ලාභ බලනවා. හම්බන්තොට වාගේ මහා ව්‍යාපෘති හදා තිබෙන්නේ හෙට ලාභ උපයන්න නොවෙයි. හෙට ලාභ ලැබෙනවා ද කියලා බලන්න නොවෙයි. හම්බන්තොට ව්‍යාපෘතියේ ලාභය මේ රටට එන්නේ ලබන අවුරුදු පහ, දහය කාලය ඇතුළේ. අනාගතයේදී තමයි ඒ ලාභය පෙනෙන්නේ. ජනතාව රවටන්න අපි හෙට එන ලාභය ගැන බලා නොවෙයි දේශපාලන තීන්දු තීරණ ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්තල ගුවන් තොටුපොළ ගැන කථා කරනවා. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, හම්බන්තොට සංවිධායකවරයා වශයෙන් තමුන්නාන්සේ දන්නවා ඇති,-[බාධා කිරීමක්] නිරුපමා රාජපක්ෂ නියෝජ්‍ය ඇමතිතුමයත් සාක්ෂි දරයි. මත්තල ප්‍රදේශයේ ඉඩම් අක්කරය රුපියල් 500ට ගන්න තිබුණා. ඉඩම් අක්කරය රුපියල් 500ටවත් විකුණා ගන්න බැහැ. අද ඒ ප්‍රදේශයේ ඉඩම් අක්කරයක වටිනාකම කීයද? අද මොකක් ද සිදුව වෙමින් තිබෙන්නේ? දිය බිඳක් නැතිව සිටි හම්බන්තොට ජනතාවට අද ආර්ථික උපාය මාර්ග විවෘත වෙලා තිබෙනවා. ලෝකයේ අලුත් අවධානයක් අද හම්බන්තොටට යොමු වෙලා තිබෙනවා. හම්බන්තොටට විතරක් නොවෙයි, ඒ එළිය මොනරාගලටත් වැටෙනවා. ඒ එළිය රත්නපුරයටත් වැටෙනවා. ඒ එළිය මුළු ලංකාවටම වැටෙනවා. මේ ව්‍යාපෘති හදා තිබෙන්නේ හෙට කීයද ලාභ ලැබෙන්නේ, අද කීයද ලාභ ලැබෙන්නේ කියන සැලසුම මත නොවෙයි. හෙට මේ රට දිනවන දැවැන්ත වැඩ පිළිවෙළක් ඇතිව ඉලක්ක සහගත පදනමක් ඇතිව තමයි මේ රට තුළ ඒ වැඩ පිළිවෙළ රජය බුද්ධිමත්ව ක්‍රියාවට නහා තිබෙන්නේ කියන එක විශේෂයෙන් මා විපක්ෂයට කියන්න කැමතියි. මොකද, විපක්ෂය මේ ගැන හුහක් කථා කළා. ඊයේ පාර්ලිමේන්තුවේදී මේ airport එක ගැන ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා බොහොම දුකෙන් කථා කරනවා මට ඇහුණා.

2001 දී එක්සත් ජාතික පක්ෂ වැඩ පිළිවෙළේත් තිබුණා, මොනරාගල ගුවන් තොටුපොළක් හදන සැලැස්මක්. මෙතැන ඉන්නවා, එක්සත් ජාතික පක්ෂයේ හිටපු මන්ත්‍රීවරු, ඇමතිවරු. මොනරාගල ගුවන් තොටුපොළක් -airport එකක්- හදන සැලැස්මක් තිබුණා. මම අහනවා, අද අපි ණය අරගෙන මේ ගුවන් තොටුපොළ හදන එක වැරැදි නම්, එදා කොහොමද ඔවුන් airport එක හදන්න හිටියේ කියලා. එදා ඒ ගුවන් තොටුපොළ හදන්න හිටියේ රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ පොකැට් එකෙන් සල්ලි දාලා ද, එහෙම නැත්නම් Tamil diaspora එකෙන් එන සල්ලිවලින් ද? [බාධා කිරීමක්] ණය අරගෙන හදපු එක වැරැදියි කියලා නේ කියන්නේ. එදා ගුවන් තොටුපොළවල් හැදුවා නම් හදන්න වෙන්නේත් ණය අරගෙන තමයි. අද අපි ණය අරගෙන මේ ගුවන් තොටුපොළ හදලා තිබෙන්නේ මේ රටේ ජනතාව උගසට තියන්න නොවෙයි. ඒ ණයවලින් හෙට අනිවාර්යයෙන්ම මේ රටේ විශාල ධනයක් උත්පාදනය කරනවා. ඒ ධනයෙන් මේ රටට විශාල සේවයක් සිද්ධ වනවා. ඒක අරමුණු කරගෙන තමයි මේ කටයුතු සිද්ධ කරලා තිබෙන්නේ කියන කාරණය මා මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ රටේ හැම පුරවැසියෙකුම දෙලක්ෂ අනූඑක්දාහක ණය කාරයෝ වෙලා තිබෙන එක හරිද?

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
ඒක ඊයේ රාත්‍රියේ වුණු දෙයක් නොවෙයි. මම කියන්නේ මෑත භාගයේ ගත්ත ණය සම්බන්ධයෙනුයි. [බාධා කිරීමක්] මෑත භාගයේ සියලු ණය අරගෙන තිබෙන්නේ මේ රටේ සංවර්ධන කාර්යයන් අරමුණු කරගෙනයි. [බාධා කිරීමක්] කවුද නායකතුමා? මම හිතුවේ සජිත් ප්‍රේමදාස මැතිතුමා නායකතුමාය කියලායි. [බාධා කිරීමක්] මට සතුටුයි එතුමා මගේ මිත්‍රයෙක් නිසා. [බාධා කිරීමක්] මට නායකයෙක් ඉන්නවා. මේ රටට නායකයෙක් ඉන්නවා. රටේ නායකයා තමයි අපේ නායකයා. මේ රටේ නායකයා පැහැදිලි දැක්මක් ඔස්සේ මේ රට සංවර්ධනය කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා. [බාධා කිරීමක්] ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කියපු දේවල්වලට දැන් උත්තර ලැබෙන කොට ටිකක් හිතට අමාරුයි. මම පෞද්ගලිකත්වයට පහර දෙන්න යන්නේ නැහැ. මම දන්නවා, ඔබතුමා මගේ යාළුවාය කියලා. ඒ නිසා විශේෂයෙන්ම- [බාධා කිරීමක්] බොහොම හොඳයි. මම ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාව අගය කරනවා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ඉලක්ක කරගෙන කර ගෙන යන වැඩ පිළිවෙළ මම අගය කරනවා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ඉලක්ක කරගෙන පන්සලට යනවා, පල්ලියට යනවා, වෙනත් ආගමික සිද්ධස්ථානවලට යනවා. එතුමාගේ පෞරුෂය ගොඩ නැඟෙන ආකාරයට වැඩ කටයුතු කරනවා. ඒවා අපි අගය කරනවා. ඒ කටයුත්ත අපි අගය කරනවා. එතුමාගේ ඉලක්කය සඳහා එතුමා යන ගමනේ කිසි වරදක් නැහැ. අපි ඒවාට වැරැදියි කියලා කියන්නේ නැහැ. හැබැයි මේ රටේ නායකයාට යන්න වෙන ඉලක්කයක් නැහැ. [බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අචල ජාගොඩගේ මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
මම අවසන් කරන්නම්. මේ විවාදයේ දී දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සඳහන් කළා, - [බාධා කිරීම්] ඊයේත් කථා කළා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Can you tell us as to whose speech we should be listening to now?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Hon. Achala Jagodage's speech.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Thank you very much.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Thank you. Please do not disturb the House.

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
මේ පාර්ලිමේන්තුවේ ඊයේත්, අදත් කන්ටෙනර් දෙකක් ගැන ලොකු විවාදයක් කළා. අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? ඒ කන්ටෙනර් දෙක මේ රටට ගෙනා පුද්ගලයා අද අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා, "බී" වාර්තා සමඟ ගොනු කරලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන් වේගෙනයි එන්නේ.

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
මම අවසන් කරන්නම්.

මේ රටේ සිද්ධ වන විවිධ සිදුවීම් පාවිච්චි කරලා, මේ රජය ඉලක්ක සහගත ගමනක නොවෙයි යන්නේ; රට හදන ගමනක නොවෙයි යන්නේ කියලා කියන්න විපක්ෂය මොන තරම් උත්සාහ කළත් මම කියනවා, ඒක පුස්සක් විතරයි කියලා. අනිවාර්යය ලෙසම අද ඔප්පු කර ගන්න බැරි දෙයක් තිබුණොත් හෙට අනිවාර්යයෙන්ම අපි සාධාරණයි කියලා ඔප්පු කරලා පෙන්වනවා. ඒ වාගේම හෙට සාධාරණයි කියලා ඔප්පු කරන්න බැරි දේ අපි අනිවාර්යයෙන්ම අනාගතයේ දී ඔප්පු කරලා පෙන්වනවා. අපි කරපු හැම කාර්යයක්ම සාධාරණ, නිවැරදි කාර්යයන්ය කියලා අනාගතයේ දී ඔප්පු කරලා පෙන්වනවාය කියන කාරණය විශේෂයෙන්ම සඳහන් කරන අතරතුර මේ පනත් කෙටුම්පත- [බාධා කිරීම්] ඔබතුමාට තිබෙන ප්‍රශ්නයම තමයි මට තිබෙන්නේත්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
මෙම රේගු (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් අනිවාර්යයෙන්ම මේ ආයතනය ශක්තිමත් කිරීමේ දිසාවකට යොමු වන බව පවසන අතරම, මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට මගේ සහයෝගය පළ කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඊ ළඟට ගරු ඉරාන් වික්‍රමරත්න මහතා.

[අ.භා. 5.24]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ මන්ත්‍රීතුමාගේ කථාව අහ ගෙන ඉන්න කොට ඇත්තටම අපට පෙනුණා, මේ රේගු ආඥාපනතට ගෙනෙන සංශෝධන ගැන කියන්නට දෙයක් එතුමාට තිබුණේ නැති බව. ඒක එතුමාගේ වරදක් නොවෙයි. සංශෝධනයක් ඉදිරිපත් කළා, අද උදේ තව සංශෝධනයක් දාලා මුල් සංශෝධනයේ තිබෙන ඒවා හැම එකක්ම වාගේ අලුත් සංශෝධනය තුළින් අයින් කර ගත්තා. ඇත්තටම ඒ මන්ත්‍රීවරයා කළේ වරදක් නොවෙයි. නමුත් ඒ සම්බන්ධයෙන් කථා කරන්න තිබෙන්නේ බොහොම අඩුවෙන් කියලා පෙනෙනවා.

අවසානයකට, ණය බර ගැන කථා කරන කොට එතුමා අද සඳහන් කළා, ප්‍රේමදාස හා ජයවර්ධන රජයන් කාලයේදී ලංකාව ණයගැති වුණා කියලා. ඒක ඇත්ත. මේ රට දිගින් දිගටම ණයගැති වෙලායි තිබෙන්නේ. නමුත් ඒකේ විශාල වෙනසක් තිබෙනවා. ඒක පෙන්වන්න අවශ්‍යයි. ඒ වෙනස නම්, එදා අපි ණය ගත්තේ සහනාධාර ක්‍රමයට. විදේශීය වාණිජ ණය ගත්තේ නැහැ. එදායි අදයි අතරේ විශාල වෙනසක් තිබෙනවා. අද ගන්නේ වාණිජ ණය. ඒ ණය ගන්නේ ගිනි පොලියට. ඒවා අපිට ගෙවන්න වෙනවා. මොකද, එතැන සහනාධාරයක් නැහැ. ඒ වාගේම මුල ඉඳලාම ගෙවන්නට වෙනවා. අපට ඒ මුදල මුලින් නොගෙවා ඉන්න කාල සීමාවක් නියම කරලාවත් නැහැ.

හම්බන්තොට වරාය ගැන කථා කළා. මත්තල විවෘත කළ ගුවන් තොටු පොළ ගැන කථා කළා. අපි මත්තල ගුවන් තොටු පොළට විරුද්ධත් නැහැ. හම්බන්තොට වරායට විරුද්ධත් නැහැ. අපි කියන්නේ රටේ හැම තැනම සංවර්ධනය වෙන්න ඕනෑ කියලායි. නමුත් ආයෝජනයක් ගැන කථා කරන කොට ආයෝජනය කළ යුත්තේ ඉල්ලුම අනුවයි. ඉල්ලුමට වැඩිය ආයෝජනය කළොත් එහි ප්‍රතිලාභය අඩුයි. මට ප්‍රථමයෙන් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, සමහර විට අවුරුදු පහකින් ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් කියලා. ඒ ප්‍රතිලාභ අවුරුදු පහකින්වත් ලබා ගන්න බැහැයි කියලා සම්පූර්ණයෙන්ම පැහැදිලියි.

ඕනෑම ව්‍යාපාරයක ආයෝජනයක් කරන කොට තමන් මුදලක් දමනවා. අඩු පාඩුවට තමයි ණය මුදල දමන්නේ. අපි සමහර ව්‍යාපෘති කර ගෙන යන්නේ සම්පූර්ණයෙන්ම ණය මුදලක් යොදවා ගෙනයි. මත්තල ගුවන් තොටු පොළට විතරක් ඇමෙරිකානු ඩොලර් මිලියන 220ක් විතර වියදම් කරලා තිබෙනවා.

හම්බන්තොට වරාය ගැන කථා කළා. හම්බන්තොටට වරායක් අවශ්‍යයි. අද ඊයේ නොවෙයි, මේක දිගින් දිගටම පැහැදිලියි. ලංකාවට අවස්ථාවක් තිබෙනවා. නමුත් මම කිව්වා වාගේම අපට එතැනින් දෙන්න පුළුවන් මූලික සේවාව බංකරින් සේවාවයි. ඇත්තටම බංකරින් වරායක් අපට අවශ්‍යයි. ඒ අනුව තමයි මුලින්ම ආයෝජනය කරන්න තිබුණේ. අපි ලබා ගත් සෑම report එකකින්ම ඒක පැහැදිලි වුණා. ආයෝජනයක් කරන කොට ඉල්ලුම අනුව ක්‍රම ක්‍රමයෙන් ආයෝජනය කරන්න ඕනෑ. නැත්නම් රට ණය ගැති වෙනවා. අපට ණය ගෙවා ගන්න බැරි වන කාලයක් එනවා. මේ රටේ පළමුවන වතාවට හෙජින් ගිවිසුම වුණ අවස්ථාවේදී ඒ හෙජින් ගිවිසුම අනුව අපට වුණු අලාභය ගෙවා ගන්න අපට බැරි වුණා. ඉතින් අපට නඩු කියන්න සිදු වුණා. නඩු කියලා, ප්‍රථම වතාවට, හෙජින් ගිවිසුම සඳහා දැනුත් අපට ගෙවන්නට සිදු වෙලා තිබෙනවා. නමුත් ඒ හෙජින් ගිවිසුමට ඇතුළු වුණ, ඒ වැරදි කරපු අයට දඬුවමක් ලැබුණා කියලා අද වන තෙක්වත් අපට අහන්නට ලැබිලා නැහැ.

අද අපි කථා කරන්නේ රේගු ආඥාපනතට ගෙන ආ සංශෝධන ගැනයි. රේගු ආඥාපනතේ සංශෝධන ගැන කථා කරන කොට රේගු බදු සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරලා කෙනකුට සහනයක් ලබා ගන්න පුළුවන් තත්ත්වයක් තමයි මූලිකව මේ සංශෝධනයෙන් ගෙනාවේ. බොහොම කනගාටුවෙන් කියන්නට ඕනෑ, අද අන්තිම මොහොතේ මේ සංශෝධනයත් අයින් කර ගත් බව. මොකද, මේ සංශෝධනය අයින් කළේ? ඒ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට මේ බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත ගැන විභාගයක් කර ගෙන යන නිසායි. මම හිතනවා, අපට තව සති දෙකකින්, මාසයකින් අද මේ අයින් කළ සංශෝධන නැවතත් ඉදිරිපත් කරන්නට පුළුවන් වෙයි කියලා. ඒ නිසා තමයි මම ඒ ගැන වචනයක් කියන්නට ඕනෑ.

මේ සම්බන්ධයෙන් රේගු නිලධාරීන් සමඟ සාකච්ඡා නොකර ඉදිරිපත් කළ නිසා ඒ රේගුවේ නිලධාරීන් ඔවුන්ගේ විරුද්ධතාව ප්‍රකාශ කරලා තිබෙනවා. රේගු නිලධාරී සේවක සංගමය සඳහන් කරනවා, ඔවුන්ට බියක් තිබෙනවා කියලා රජයට එන්න ඕනෑ මුදල සමඟර විට රජයට අහිමි වන්නට පුළුවන් කියලා. ඒ නිසා ඒ බදු සම්බන්ධයෙන් අභියාචනා කොමිෂන් සභාවට යනවා නම්, සාධාරණයක් ඉෂ්ට වෙන්නට නම්, ඒ අවස්ථාවේදී රේගු නිලධාරීන් සිටිය යුතුයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙකු හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් එය සිදු විය යුතුයි කියලා ඔවුන් සඳහන් කරලා තිබෙනවා.

ඇත්තටම රජය ඇයි ඒක කරන්නේ? රජය ඇත්තටම ඒක කරන්නේ, 2011 දී ආනයන අපනයන, ජාතිය ගොඩනැඟීමේ, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන, සෙස් හා සුරාබදු යන බදු ආදායම් ඔක්කෝම එකතු කළාම රේගු බදුවලින් රජයට ලැබුණා කෝටි 4,548ක්. නමුත් 2012 දී ලැබුණේ කෝටි 4,361යි. ඉතින් බැස්මක් තිබෙනවා. විශාල බැස්මක් තිබෙනවා. කෝටි 200ක විතර බැස්මක් තිබෙනවා. රජය බලාපොරොත්තු වුණු ප්‍රමාණයෙන් බැලුවොත්, කෝටි 500ක විතර බැස්මක් තිබෙනවා. ඒ නිසා දැන් රජය කරන්න හදන්නේ මොනවාද? කොහොම හරි ඒ මුදල ලබා ගන්නයි. ඉතින් ඒ ත්‍යාග අරමුදලටත් ගහලා, රේගුවේ නිලධාරීන්ට ලැබෙන මුදලටත් ගහලා, කොහොම හරි ඒ බදු ආදායම ලබා ගන්න, ඒ අඩු පාඩුව පිරිමසා ගන්නට තමයි මේ වෑයම කර ගෙන යන්නේ. නමුත් ඊට අමතරව සඳහන් කරලා තිබෙනවා, මේ සංශෝධනය සම්පූර්ණ වුණාට පස්සේ ඒක ක්‍රියාත්මක වන්නේ අද ඉඳලා නොවෙයි, හෙට ඉඳලා නොවෙයි. ඒක 2011 අප්‍රේල් මාසයේ පළමුවැනි දවසේ ඉඳලා ක්‍රියාත්මක කරනවා කියලා. සාමාන්‍යයෙන් නීතියක් ගෙනෙන කොට සම්ප්‍රදායක් තිබෙන්න ඕනෑ, ඒ නීතිය සම්මත කළ දවසේ ඉඳලා, නැත්නම් ඉදිරි දවසක ඉඳලා ක්‍රියාත්මක වන්න ඕනෑ කියලා. ඒක බොහොම වැදගත් මූල ධර්මයක්. නැත්නම් නීතියක් ගෙනැල්ලා, ඒක අවුරුදු දෙකකට හෝ තුනකට ආ පස්සට දැම්මොත් ඉඛේටම අපට සැකයක් ඇති වනවා. සමඟර විට රේගුව එක්ක ගැටුම් තිබෙන, ප්‍රශ්න තිබෙන ව්‍යාපාරිකයෝ, දේශපාලනඥයෝ ඉන්න පුළුවන්. ඉතින් මා අහනවා, ඇයි මේක 2011 අප්‍රේල් පළමු වැනිදා ඉඳලා ක්‍රියාත්මක කරන්න හදන්නේ කියලා? ඇයි 2010 සිට, ඇයි 2009 සිට ක්‍රියාත්මක නොකරන්නේ? මොකක් හෝ හේතුවක් ඇති ඒ දිනය තෝරා ගන්න. අපට ඒ ගැන සැකයක් ඇති වනවා. රජයට හිමි වෙන්න තිබෙන ආදායමක් නැති වෙන්නට යනවාද කියන සැකය අපට ඉඛේටම ඇති වෙනවා.

ඊළඟට එතනෝල් ආනයනය ගැන කථා කළා. ලීටර් 62,000ක්, බැරල් 310ක් **විනාර්** කියලා ගෙනැල්ලා තිබෙනවා. ඒ කාරණය මා නැවතත් සඳහන් කරන්නට ඕනෑ. ඒ විස්තර ඔක්කෝම මා දැන් කියන්න යන්නේ නැහැ. නමුත් තහනම් ද්‍රව්‍යයක් රට තුළට ගෙනාවා නම් ඒ ගැන කරන්න ඕනෑ සාමාන්‍ය පරීක්ෂණයක් නොවෙයි. ඒවා පරීක්ෂා කරන්න ඕනෑ පොලීසියෙන්. ඒ නිසා අප ඉල්ලීමක් කරනවා, පොලීසියේ බුද්ධි අංශයෙන් ඒ ගැන පරීක්ෂා කරන්නට කියලා. කවුද ඒවා ගෙනාවේ? ඒ වෙනුවෙන් කෙනෙකු ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත් ලිපි ගොනුවලින් අයිතිකරු හොයා ගන්නට පුළුවන්. ඇත්තටම කවුද පාවිච්චි කරන්නට යන්නේ කියලා හොයන්නට පුළුවන්. ඒකෙන් අපට දැන ගන්නට පුළුවන් ලිපි ගොනුවල තිබෙන නම නොවෙයි, ඇත්තටම ඒකේ ලාභය ලබන්නට යන්නේ කවුද කියලා. කවුද ඒ ව්‍යාපාරයේ අයිතිකරු? අපට දැන ගන්නට ඕනෑ ඒකයි. ඒ අයිතිකරුට දේශපාලන සම්බන්ධතාවක් තිබෙනවාද, ඇමතිවරුන් එක්ක සම්බන්ධතාවක් තිබෙනවාද කියලායි. අපට තිබෙන්නේ බොහොම දක්ෂ බුද්ධි අංශයක්. ඒක හොයන්න එච්චර අමාරු නැහැ. ව්‍යවහාරයට සංචාරයේ ගිහිල්ලා තිබෙන අයගේ නම් පහසුවෙන් දැන ගන්නට පුළුවන්. පහසුවෙන් ඒ සම්බන්ධතාව හොයන්නට පුළුවන්. ඒක එච්චර අපහසු දෙයක් නොවෙයි. ඒකෙන් අපට සොයා ගන්නට පුළුවන් ඇත්තටම කවුද ඒකේ අයිතිකරු කියලා. [බාධා කිරීමක්] මට තව විනාඩි දෙක, තුනයි තිබෙන්නේ.

අප ඊට අමතරව අහන්න කැමැතියි රජයෙන්, ඇයි තවමත් කිසිවෙකු අත් අඩංගුවට අරගෙන නැත්තේ කියලා. පොලිස්පතිගෙන් අහන්න කැමැතියි, යම් කිසි දේශපාලන බාධා කිරීමක් තිබුණාද නීතියේ ක්‍රියාවලිය නිදහසේ කර ගෙන යන්න කියලා. රේගුවේ ප්‍රධානියාගෙන් අහන්න කැමැතියි, කවුද අවසර දුන්නේ තොටළඟ ගබඩාගාරයෙන් ඒවා පිට කරන්නට කියලා. ඒකේ එතනෝල් තිබෙන කොට ඇයි තොටළඟ ගබඩාගාරයෙන් පිට කරන්න අවස්ථාව දුන්නේ? ස්වල්ප දෙනෙකුගේ ක්‍රියාදාමය නිසා හුඟක් ඇමතිවරුන්ගේ හොඳ නාමය නැති වෙනවා. සමඟර ඇමතිවරු අපට ඇවිල්ලා කියනවා, "අනේ, ඔයගොල්ලන්ගේ පැත්තෙන් ආපු අය නිසා තමයි මේ ඔක්කෝම ප්‍රශ්න අපට ඇති වෙලා තිබෙන්නේ" කියලා.

අනේ, ඇත්තටම හොඳයි, ඔය වාගේ දේවල් කරනවා නම් අපේ පැත්තෙන් ඔය පැත්තට ගිය එක. නමුත් ඇත්තටම-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
පරණ පුරුද්ද වෙන්න ඇති.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඇත්තටම සොයා බලන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, පරණ පුරුද්දක්ද, නැද්ද කියලා ඔබතුමා මට වැඩිය දන්නවා ඇති නේ. ඔබතුමාත් මේ පැත්තේ හිටපු නිසා ඔබතුමා ඒක ගැන දන්නවා ඇති. මා නම් ඒ පුරුදු ගැන දන්නේ නැහැ. නමුත් මේ රජයට කළමනාකාරිත්වය ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය දිගින් දිගටම තිබෙනවා. දෙසැම්බර් 8වැනි දා අය වැය ලේඛනය සම්මත කරලා ඒ කටයුතු අවසාන කළා. ඊට පස්සේ මාස තුනකටත් වැඩිය ගියා. නමුත් මේ සංශෝධන පනත් කෙටුම්පත් ගෙනෙන්න බැරි වුණා. මේවා ඔක්කෝම මාසයක් තුළදී ගෙනෙන්න පුළුවන්. හුහාක්ම තිබුණේ බොහොම සුළු සංශෝධනයි. නමුත් මාසයක් තුළදී ඒක ගෙනෙන්න බැරි වුණා. ඒ නිසා මෙතැන තිබෙන්නේ කළමනාකාරිත්වය ගැන ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මා නිහඬ වනවා, කාලය අවසන් නිසා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තරහා ගන්නේ නැතුව කථා කරන්න.

[අ.භා. 5.36]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

බොහොම ස්තුතියි. ගරු ෆිලික්ස් පෙරේරා ඇමතිතුමා කියන්නේ අපි අගය කරන අමාත්‍යවරයෙක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු විධියටම මා කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ත්‍රීතු සම්බන්ධයෙන්, මද්‍යසාර සම්බන්ධයෙන් ඇමතිතුමා ඊයේ කථා කළා. ඇත්තටම එතුමා අපට සහතිකයක් ලබා දුන්නා, ඒ සම්බන්ධයෙන් නීතිය අකුරටම ක්‍රියාත්මක වන බවට. ගරු ඇමතිතුමනි, කලින් මේ ස්ත්‍රීතු වාගේ දේවල් ලබා දුන්නේ ටෙන්ඩර් ක්‍රමයටයි. ඒ මද්‍යසාර දැන් prohibited item එකක් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, prohibited items - මත් කුඩු වෙන්න පුළුවන්, මද්‍යසාර වෙන්න පුළුවන්- ගෙනාවාට පස්සේ අනිවාර්යෙන්ම ඒවා රාජ සන්තක වනවා. ඒ එක ක්‍රමයක්. තව ක්‍රමයක් තමයි, දඩයක් නියම කරන එක. ඒ දඩය ගෙවන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, මත් ද්‍රව්‍යවලට වාගේම අනෙකුත් prohibited itemsවලට අයත් වන දේවල් ගෙන්වූවාම දණ්ඩනීති සංග්‍රහයට අනුව දඩුවම් කරන්න පුළුවන්. එහෙම දඩුවමක් දෙන්න පුළුවන් හැකියාවක් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා මේ වාගේ දේවල් ගෙනෙන කොට ඒවායින් අහු වෙන්නේ දෙකයි, තුනයි කියලා. අවුරුද්දකට කලින් කන්ටේනර් තුනක් අහු වුණා. ඊට කලින් කන්ටේනර් පහක් අහු වුණා. අහු නොවෙන ප්‍රමාණයක් තිබෙනවා. ඔබතුමන්ලාට පුළුවන් නම්, ඒ නීති සකස් කරන්න කියලා ඒ නිලධාරීන් මට පැවසුවා. මොකද මේවා prohibited items. මම වැරැදි නම් නිවැරැදි කරන්න. මේ දේවල් ගෙනෙන්න පුළුවන් වන්නේ licence දීපු පිරිසට විතරයි. එතකොට licence නොලැබුණු පුද්ගලයෙකු ඒවා ගෙනාවා නම් ඔහුට විරුද්ධව කටයුතු කරන්න ඕනෑ. ඒවා ගෙන්වපු පුද්ගලයා කියනවා, ඒ කන්ටේනර් එකේ තිබෙන්නේ වෙන දෙයක් කියලා. අනිවාර්යයෙන්ම ඒ පුද්ගලයා වග කියන්න ඕනෑ, ඒ ගෙනාපු කොටසට. විශේෂයෙන්ම දණ්ඩනීති සංග්‍රහය අනුව දඩුවම් ලබා දෙන්න පුළුවන් නීතියක් මේ වෙන කොට නැහැ. ඉතින් ඔබතුමාගේ අවධානය ඒ කාරණය කෙරෙහිත් යොමු කරන්න කියලා කියනවා. ගරු අධිකරණ ඇමතිතුමාත් මෙතැන හිටියා. විශේෂයෙන්ම මේ prohibited items ගෙනාවොත් අනිවාර්යයෙන්ම අනෙකුත් prohibited itemsවලට තිබෙන නීතීන්ම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ සඳහා නීති සම්පාදනය වෙන්න ඕනෑ. නැත්නම් මේක පුරුද්දකට ගිහිල්ලා අහු වුණොත් දඩය ගෙවනවා. අහු නොවුණොත් විශාල ලාභයක් ලබා ගන්නවා.

ගරු ඇමතිතුමනි, මේවා සම්බන්ධයෙන් රේගුව යම් කිසි ආකාරයට ක්‍රියාත්මක වෙනවා. සමහර අවස්ථාවල අසාධාරණ සිදුවීම් සිදු වෙනවා. අපි "රට විරුවන්" කියලා කියන අය ලංකාවට එන කොට රේගුවෙන් විශාල ලෙස හිරිහැරයට ලක් වෙනවා. ගරු ඇමතිතුමනි, මම දැකලා තිබෙනවා, ඩොලර් 10ක, 15ක වෙනසකට විශාල ලෙස ප්‍රශ්න කරනවා. ඉතාමත් තද ලෙසයි ප්‍රශ්න කරන්නේ. ඔබතුමන්ලා දන්නවා, විශාල මුදලක් හම්බ කරලා දෙන්නේ මේ පිරිස බව. ඒ පිරිස මේ වාගේ හිසරදයකට ලක් කළාට පස්සේ රටට එන්නත් එපා වෙනවා. මම මේ ඇත්ත කාරණයක් කියන්නේ. මම පළාත් සභාවේ ඉන්න කාලයේ මටත් මේ ප්‍රශ්න ඇති වුණා. මම එංගලන්තයේ ඉඳලා එනකොට මගේ බෑග් එක අරින්න කියලා විශාල අවහිරයකට මාව පත් කළා. මම කිව්වා, මම පළාත් සභා මන්ත්‍රීවරයෙක් කියලා. මගේ බෑග් එක ඇතුළේ ඇඳුම් පමණයි තිබුණේ. ඒ ඇඳුම් ටික ඇඳලා එළියට දැම්මා. පළාත් සභා මන්ත්‍රීවරුන් ආවේ VIP එකේ නොවෙයි. මේ වාගේ දේවල් අපටත් උදා වෙනවා. මේ රටට නොයෙකුත් වාහන එනවා. ඒ වාගේම වෙනත් භාණ්ඩ, මත් ද්‍රව්‍ය විශාල ලෙස මේ රටට එනවා, ඔබතුමන්ලා මේ පිරිසට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්නේ නැතුව මේ අහිංසක ජනතාවට පමණක් නීතිය ක්‍රියාත්මක කරන්න එපා කියලා මම කිව්වා. විශේෂයෙන්ම විදේශ විනිමය උපයා ගෙන එන මේ පිරිසට තවත් පහසුකම් ලබා දෙන්න ඕනෑ. මොකද, මේ පිරිස රට තුළට අරගෙන එන්නේ විදේශ විනිමයයි. විශේෂයෙන් ඔවුන් ගෙනෙන්නේ එහේදී හම්බ කර ගත්ත දේවල්. එයින් රටට ආදායමක් ලැබෙනවා; රටට හොරකමක් සිදු වන්නේ නැහැ.

ඕනෑ නම් ඒ උදව්යට ඒ රටේ මුදල් තබා එන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ උදව්යට ඒ රටේ මුදල් ආයෝජනය කරලා එන්න පුළුවන්. එහෙම කරන්නේ නැතුව ඔවුන් ඒ මුදල් අරගෙන එන කොට ඔවුන්ට පහසුකම් ලබා දීම සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා රේගුවට අලුතින් අධ්‍යක්ෂ ජනරාල්තුමෙක් - Director General කෙනෙක් - පත් වෙලා ඉන්නවා. එතුමා සාධාරණව කටයුතු කරනවා කියලාත් මට තොරතුරු ලැබුණා. එතුමාට ප්‍රායෝගික දැනුමක් තිබෙනවා කියලාත් තොරතුරු ලැබුණා. එතුමාට මා කියනවා, විශේෂයෙන්ම පිට රට ගිහින් එන අපේ දුප්පත් ජනතාවට මීට වඩා පහසුකම් ලබා දෙන්න කියලා. විදේශ රැකියාවල යෙදිලා මේ රටට එන උදව්යට

duty-free shopping complex එකේ වෙනම පොඩි counter එකක් සකස් කරලා, ඒ ගොල්ලන්ට කථා කරලා ඩොලර් ප්‍රමාණයේ පොඩි වෙනසක් තිබෙනවා නම් ඩොලර් 10ක් නම්, ඩොලර් 20ක් නම්, ඩොලර් 100ක් නම් ඒ ප්‍රමාණයට ඒ ගොල්ලන්ට ඒ පහසුකම් ලබා දීම සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම තෙල් සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මා වැරැදි නම් ඔබතුමා එය නිවැරැදි කරන්න. තනිකර duty-free ක්‍රමයට තමයි ලංකාවට තෙල් එන්නේ. උදේ මේ සභාවේ කථා බහක් ඇති වුණා, අහස් යානා තෙල් හා නැව්වලට ගහන තෙල් සම්බන්ධයෙන්. ඔබතුමා දන්නවා, IOC එකත් තෙල් ගෙනෙන්නේ duty-free ක්‍රමයටයි කියලා. පිට රට සමාගමක් ලංකාවට තෙල් ගෙනෙන්නේ duty-free ක්‍රමයටයි. "Total Imports (MT) - Year 2012" කියන ලේඛනය මට ලැබුණා. මා එම ලේඛනය **සභාගත*** කරනවා.

එම ලේඛනයට අනුව ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ගෙන්වූ 180, 380, MGO යන වර්ගවල සම්පූර්ණ තෙල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,66,283යි. ගරු ඇමතිතුමනි, තනිකර duty-free ක්‍රමයටයි, 2012 වර්ෂයේ මේ තෙල් ටික ගෙන්වා තිබෙන්නේ. එපමණක් නොවෙයි, ගරු ඇමතිතුමනි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ IOC යන දෙකටම duty-free ක්‍රමයට මේ රටට තෙල් ගෙනෙන්න අයිතිය ලැබෙනවා. හැබැයි ඒ අයිතිය ලැබුණාට පස්සේ බද්දක් අය කරනවා. ඒ සියලු බදු වැටෙන්නේ අපේ අහිංසක දුප්පත් ජනතාවටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "බලපත්‍රලාභී නාවික තෙල් සැපයුම්කරුවන්ගේ වාර්ෂික ආදායම සහ රජයට අහිමි වන බදු මුදල් ප්‍රමාණය" සඳහන් තවත් වගුවක් මා ළඟ තිබෙනවා. මා එයත් **සභාගත*** කරනවා.

මෙහි සඳහන් වනවා, විශේෂයෙන්ම 180 (cst), 380 (cst), නාවික තෙල් (ඩීසල්) - MGO යන තෙල් වර්ග. ගරු ඇමතිතුමනි, ආනයනය කරනු ලැබූ වටිනාකමින් රජයට අහිමි වන බදු ප්‍රමාණය 180 (cst) එකෙන් රුපියල් කෝටි 20ක්, 380 (cst) එකෙන් රුපියල් කෝටි 109ක්, නාවික තෙල් (ඩීසල්) - MGO එකෙන් රුපියල් කෝටි 187ක් වශයෙන් මෙහි සඳහන් වනවා. එතකොට රජයට අහිමි වන මුළු බදු ප්‍රමාණය රුපියල් කෝටි 317ක් වශයෙන් මේ වගුවේ සඳහන් වනවා. ඒ වාගේම බලපත්‍රලාභී ආයතනවල ආදායම ආසන්න වශයෙන් රුපියල් කෝටි 297ක් වශයෙන් මෙහි දැක්වෙනවා. විශේෂයෙන්ම මේ තෙල්වලටත් යම් කිසි බදු ක්‍රමයක් ඇතුළත් කිරීම සඳහා ඔබතුමාගේ අවධානය කරන්න. මොකද, ජනතාවට බදු බර දෙනවා නම් ලාභ ලබන උදව්යටත්, ලාභ ලබන ආයතනවලටත් අනිවාර්යයෙන්ම යම් කිසි ආකාරයක බදු පැනවීමක් සිදු කිරීම සුදුසුයි කියන එකයි මගේ අදහස. ඔබතුමා ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා කිව්වා, මේ සංශෝධනවලින් මෙය දේශපාලනීකරණය වෙන්න දෙන්න එපාය කියලා. මමත් ඒ අදහස දරනවා. පත් වන ඇමතිවරයා කවුද කියා අපි දන්නේ නැහැ. අපි ඔබතුමන්ලාගේ ආණ්ඩුවට ඇඟිල්ල දික් කරනවා නොවෙයි. අපේ ආණ්ඩුව වන්න පුළුවන්. මොකද, රජයේ නිලධාරියෙක් නොවෙයි පත් වන්නේ. ඒ ගන්න තීන්දු අනුව ඒ ඇමතිවරයා වග කියන්නේ නැහැ. ඒ ගන්න තීන්දු අනුව ඒ ඇමතිවරයා හිරේ යන්න ඕනෑ නැහැ. ඒ ඇමතිවරයා වැරැදි තීන්දුවක් ගත්තොත් ඇමතිතුමනි, ඒ සම්බන්ධයන් ගන්න පුළුවන් ක්‍රියා මාර්ගයක් නීතියේ නැහැ. ඔබතුමන්ලා ඒ ඇමතිවරයාට අයික්ෂණ බලය දෙන කොට මීට වඩා විමසිලිමත් වන්න ඕනෑ, මොන වාගේ පුද්ගලයකුට මෙය ලැබෙයිද කියලා. හොඳ පුද්ගලයකුට ලැබුණොත් හොඳයි. නරක පුද්ගලයකුට ලැබුණොත් මහා විනාශයක් වන්න පුළුවන්; හොරකම් වැඩි වන්න පුළුවන්; ඒ ආශ්‍රයෙන් විශාල මුදලක් රජයට අහිමි වන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. මට තවත් දත්තයක් ලැබුණා. මා හිතන හැටියට මෙය ව්‍යාංගයෙන් තමයි මේ මාතෘකාවට අදාළ වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි සඳහන් වනවා, "Lanka Mahapola, the only vessel owned by Ceylon Shipping Corporation - was given on lease to Triple 'S' Shipping (Pvt.) Limited owned by -මා හිතන හැටියට මෙහි නමක් සඳහන් කර තිබෙනවා- Sedara Senarath" කියලා. එහි නෑකමක් සඳහන් කර තිබෙනවා. මා එය සඳහන් කරන්නේ නැහැ, ඒ උදව්යට උත්තර දෙන්න බැරි නිසා. But, he is not a Director of this company.
මෙහි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"The vessel was leased on Bareboat Charter Agreement for US Dollars 1,000 a day. But, shipping sources say that a vessel of this capacity could be given for at least US Dollars 3,500 - 4,000 a day. Lease was effective from 2011 September".

මේ වන කොට කිසිම බදු ප්‍රමාණයක්, කිසිම මුදලක් ගෙවා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බදු ප්‍රමාණය පමණක් නොවෙයි, lease එක ගෙවලාත් නැහැ. Ceylon Shipping Corporation එක අපේ COPE එකට ගෙන්වූවාට පස්සේ අපි ප්‍රශ්න කළා, ලංකාවේ තිබෙන එකම නැව මේ විධියට කොහොමද ලබා දුන්නේ කියලා.

"Up to date the company has paid only a small advance. The default payment is about Rs. 80 million. While the Ceylon Shipping Corporation is running at a dead loss, the company has not paid crew wages for the last five months. Now, the vessel is held up in Mombasa, Kenya".

ගරු ඇමතිතුමනි, මේ නැව බලෙන් නවත්වලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය ලංකාවට විශාල අපකීර්තියක්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 15ක් තිබෙනවා.

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තිබෙන්නේ විනාඩි 12යි.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට තව විනාඩි තුනක් දෙන්න.

"...The vessel was detained in Durban, South Africa. Through a trade union intervention, salaries were paid. Still one month's salary has to be paid. Now, the vessel is in Mombasa and if the salaries are not paid by 19th March, the Port will take Control of the vessel and the trade union will take a court order and detain the vessel. If the owner does not settle, the due ship will be auctioned".

ගරු ඇමතිතුමනි, මත්තල ගුවන් තොටුපොළ හදන්න පුළුවන්. හම්බන්තොට වරාය හදන්න පුළුවන්. අපි මේ ගැන සවිස්තරාත්මකව කථා කරන්න ඕනෑ. ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ඉල්ලුම හා සැපයුම අනුව තමයි මේ දේවල් නිර්මාණය වන්න ඕනෑ. චතුර දෙන්න මහවැලි ව්‍යාපාරය හදන කොට, වෙන මහවැලි ව්‍යාපාරයක් තිබුණා නම් තවත් මෙගාවොට් 780ක විදුලි බල ප්‍රමාණයක් නිර්මාණය කරන්න පුළුවන්, තව අවුරුදු දහයකින් ලයිට් ඕනෑ වෙයි කියලා හිතලා තව මහවැලි ව්‍යාපාරයක් හදලා වැඩක් නැහැ. කොළඹට ගොඩ බස්සන්න තිබෙන planes ටික අලුත් ගුවන් තොටුපොළක් හදලා එහේ ගොඩ බස්සලා වැඩක් නැහැ. කොළඹට එන නැව් ටික බලෙන් හම්බන්තොට වරායට තල්ලු කරලා එහේ නවත්තලා හරි යන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මම කියන්නේ ඉල්ලුම අනුව සංවර්ධනය විය යුතුය කියලායි. සංවර්ධනයට අපේ විරුද්ධත්වයක් නැහැ.

Hon. Presiding Member, before I conclude, I want to say this because my name was mentioned by an Hon. Minister yesterday. He said, “Krrish Ten”, “Krrish Five”, “Krrish 10 per cent” or something. I know "10 per cent" was used regarding one Member about a year ago, but that talk is not there anymore and now it maybe 20 or 30 per cent.

I just wanted to find out what Krrish is. Krrish is an investment company which has agreed to set up a project. The total cost is actually US Dollars 500 million. Even US Dollars 1,000 can be brought in without any taxes. Now, this is a vital point. This is supposed to be owned by Mr. Chidambaram. Sir, Krrish is nothing in India; it is a small company, not even known and they have brought in US Dollars 500 million. Mr. Chidambaram’s son, Karti, is the person who brought that money and we want to know, is this foreign policy?

This is like giving a bribe to Chidambaram to vote for us at the US Resolution. Now, what has happened? Two Sri Lankan priests and so many other people were harassed in India. Now, if you all are objecting to this, why do you not send back all these investors like Tata Group, Krrish Group to India? You are giving them bare lands in Colombo; you are giving them all the facilities including tax concessions for 25 years - no taxes for 10 years and half taxes for another 15 years, a huge amount of money. Yesterday, they mentioned my name and I do not know how my name came into Krrish. I am not the person who brought in Krrish; I know who brought in them. A huge amount of money - US Dollars 500 million - and so many other deals are involved in this project.

Now, this is black money sent through Switzerland by Mr. Chidambaram. Yesterday, even the Hon. Duminda Dissanayake spoke to me and asked what this Krrish issue is and I too wanted to find out. Then, I found out that US Dollars 500 million black money of Mr. Chidambaram, the Finance Minister of India, had been sent to Switzerland and from Switzerland, it had again been sent. This has actually been revealed by the Embassy and they have stated that they would reveal the names. So, if you go into this deal you can see that there are no taxes for them. How can this happen? Do not involve our names into these deals. This is the way that you are going to get India to vote for us. But, make sure that they vote for us. You give a land to set up a project of US Dollars 500 million to Krrish Group, you give a land to Tata Group et cetera and we are objecting to these things. If our priests are harassed in India, send all these people back. Mrs. Sonia Gandhi also made a statement yesterday; they are going to vote against us.

ගරු ඇමතිතුමනි, business එනකොට ජාති ආලය නැහැ; මුස්ලිම් මනුස්සයා එක්ක ජාති ආලය නැහැ; දෙමළ මනුස්සයාත් එක්ක ජාති ආලය නැහැ; ජාති ආලය තිබෙන්නේ පාරේ සිටින කරත්තය එළවන අහිංසක මනුස්සයා එක්කයි. ජාති ආලය අවුස්සන්නේ ඡන්ද පදනම වර්ධනය කර ගන්නයි. හැබැයි ටාටා සමාගමේ තැරැව්කරුවෙක් වශයෙන් මුස්ලිම් මනුස්සයෙක් ඉන්නවා නම්; ඒ වාගේම ඉන්දියාවේ ක්‍රිස් සමාගමේ තව පුද්ගලයෝ ඉන්නවා නම් එහෙදි ජාති ආලයක් නැහැ. මුදල් සම්බන්ධයෙන් සියයට 20, සියයට 30 පොලිය ගන්න කොට; ඒකේ අත්තිකාරම් ගන්න කොට; ඒකේ වාසිය ගන්න කොට; ඒකේ කොමිස් ගන්න කොට; ඒකේ පගා ගහන කොට මේ රටට ජාති ආලය නැහැ. ඒක හින්දා ඔබතුමාට විශේෂයෙන්ම, I am bringing it to your notice, Sir, that especially Krrish Group and all these Indian companies that the Government was trying to bring in have no taxes but taxes are levied for all the others. If I bring money, the Government will tax me. But, we ask the Government to find out the way they have made these money. Like in Sri Lanka, these investors are also supposed to be politicians in India. They have made a huge amount of money and you have to find out the way they have made these money.

Finally, if they vote against us, you have to make sure that all these Indian companies will be thrown out of Sri Lanka.

Thank you very much.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. J. Sri Ranga. You have five minutes.

[பி.ப. 5.50]

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி. இன்று நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் அவர்களால் சமர்ப்பிக்கப்பட்ட சுங்கம் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு பேசிய உறுப்பினர்கள், தற்பொழுது இந்த நாட்டின் பொருளாதாரத்தில் என்னென்ன மாற்றங்கள் ஏற்பட்டிருக்கின்றன என்பது பற்றிக் கூறினார்கள். இலங்கையின் இனப்பிரச்சினையானது நாட்டின் பொருளா தாரத்தோடு மிகவும் பின்னிப் பிணைந்ததாகக் காணப் படுகின்றது. அன்று United Nations Development Programme Index இல் கிட்டத்தட்ட 60-70ஆவது இடத்தில் இருந்த இலங்கை இன்று 99ஆவது இடத்துக்குப் பின்னோக்கித் தள்ளப்பட்டிருக்கின்றது. ஆனால், 145ஆவது இடத்தில் இருந்த இந்தியா இன்று128ஆவது இடத்துக்கு முன்னேறியிருக் கின்றது. அவ்வாறே, சீனா 100ஆவது இடத்துக்கு முன்னேறியிருக்கின்றது. ஆனால், நாங்கள் எமது நாட்டில் இனங்களுக்கு இடையில் சமத்துவம் ஏற்படவேண்டும்; பொருளாதாரத்தை முன்னேற்றவேண்டும் என்று தொடர்ந்தும் பேசிக்கொண்டிருக்கின்றோம். இதற்கான பல மாற்றங்கள் இடம்பெற்று வருகின்றன. இலங்கைக்கு பொருளாதாரத் தடை விதிக்கப்படுமா? அல்லது ஜெனீவாவிலே என்ன நடக்கப் போகின்றது? என்பது இன்று பலராலும் பலவிதமாகப் பேசப்படுகின்ற, மக்கள் மத்தியில் சூடுபிடித்திருக்கின்ற விடயமாக இருக்கின்றது. இன்று இவ்வாறானதொரு விவாதம் நடைபெறுகின்றபொழுது, எதையுமே தாங்கள்தான் முன்னின்று நடத்துவதாகத் தமிழ் மக்களுக்குக் கூறிக் கொண்டிருக்கின்ற தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர்கள் எவரையும் சபையிலே காணவில்லை. தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கென ஒதுக்கப்பட்ட நேரத்தை இன்று கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் பயன்படுத்துகின்ற அளவுக்குத்தான் இங்கு நிலைமை காணப்படுகின்றது. அதாவது, தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கென மொத்தமாக ஒதுக்கப்பட்ட 25 நிமிடங்களில் கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் 15 நிமிடங்களை எடுத்துப் பேசுகின்ற அளவுக்கு இன்று இச்சபை அவர்களுக்கு முக்கியத்துவமில்லாமல் போயிருக்கின்றது. நாளைய தினம் ஜெனீவாவில் அமெரிக்கா வின் பிரேரணை வாக்கெடுப்புக்கு விடப்படவிருக்கின்ற நிலையில் தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் இன்று இந்தச் சபையைத் தமிழர்களுக்குச் சார்பாகப் பயன்படுத்தியிருக்க வேண்டும். "நாங்கள் இலங்கையின் பிரச்சினையை ஜெனீவா வரை கொண்டுசென்று பேசப்போகின்றோம்; அதனைத் தீர்க்கப்போகின்றோம்" என்று தமிழ் மக்களுக்கும் தமிழ் ஊடகங்களுக்கும் மாத்திரம் கூறுகின்ற தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் தமக்குரிய நேரத்தை கௌரவ சஜித் பிரேமதாஸ அவர்களுக்குக் கொடுத்ததன்மூலம் அவர்களுக்குப் பாராளுமன்றக் கதிரைகள் தேவையில்லை என்ற நிலை ஏற்பட்டிருக்கிறது.

அதைவிட, கௌரவ அடைக்கலநாதன் அவர்கள் பேசியபோது, "நாங்கள் தமிழ்நாட்டில் நடைபெறுகின்ற போராட்டங்களை வரவேற்கின்றோம்" என்று கூறினார். உண்மையிலே, நானும் தமிழ்நாட்டில் நடைபெறுகின்ற போராட்டங்களை வரவேற்கின்றேன். அங்கு இன்று தமிழர்களின் உரிமைகள் பற்றிப் பேசுவது தமிழ் நாட்டு பல்கலைக்கழக மற்றும் கல்லூரி மாணவர்கள்தான். இந்தப் போராட்டங்கள் அங்கு தொடங்குவதற்குக் காரணம், இலங்கை யில் நடைபெற்ற இனப்படுகொலையும் இனரீதியான தாக்குதல்களும்தான். ஆனால் அன்று இலங்கைத் தமிழ் இளைஞர்களுக்கு ஆயுதப் பயிற்சி அளித்தது இந்திய மத்திய அரசு. ஆனால், இன்று தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைவர் இரா. சம்பந்தன் அவர்கள் இலங்கையின் பொருளாதார நலனைக் கருத்திற்கொண்ட இந்திய ஜனாதிபதி மன்மோகன் சிங் அவர்களுடன் கைகுலுக்கிப் பேசுகிறார். ஆனால், அவரோ இலங்கைத் தமிழ் மக்களின் அரசியல் உரிமைகள் பற்றியோ அல்லது மனித உரிமைகள் பற்றியோ வாயே திறப்பதில்லை; இந்திய மத்திய அரசு இன்று வரையில் அதன் முடிவுகளைத் தெரிவிக்கவில்லை. இந்த நிலைமையைப் பார்க்கும்பொழுது தெருத் தேங்காயை எடுத்து வழிப் பிள்ளையாருக்கு உடைத்துவிட்டு "பிள்ளையாரப்பா, எங்களைக் காப்பாற்று!" என்று வேண்டுவதைப்போல இருக்கிறது.

இன்று இந்திய மத்திய அரசு பொருளாதார நலனை நோக்காகக்கொண்டே இலங்கையுடன் இணைந்து செயற்படுகின்றது. 1987இல் உருவாக்கப்பட்ட இலங்கை - இந்திய ஒப்பந்தத்திலே திருகோணமலைத் துறைமுகத்தைப் பற்றிக் குறிப்பிடப்பட்டிருக்கிறது. இன்று யுத்தம் முடிவடைந்த பின்னர் பலாலி விமான நிலையம், காங்கேசன்துறைத் துறைமுகம் ஆகியனவும் இந்தியாவுக்குக் குத்தகைக்குக் கொடுக்கப்பட்டுள்ளன. இலங்கை - இந்திய ஒப்பந்தத்தில் குறிப்பிடப்பட்டிருக்கும் திருகோணமலைத் துறைமுகம் இன்றும் பொருளாதார ரீதியாக இந்தியாவின் வசமே இருக்கின்றது. ஆனால் அதே ஒப்பந்தம்மூலம் இணைக்கப் பட்டிருந்த வடக்கு - கிழக்கு இன்று பிரிக்கப்பட்டுள்ளது. இத்தகைய நிலைமை இருக்கின்றபொழுதிலும் இலங்கையுட னான வர்த்தக ஒப்பந்தத்திலே இந்தியா மிகுந்த அக்கறை செலுத்துகிறது. அந்த ஒப்பந்தங்கள் அதிகரிப்பதையும் காணக்கூடியதாக இருக்கின்றது. எனவே இன்றும் பொருளாதார ரீதியான ஒற்றுமையைத்தான் காணக்கூடியதாக இருக்கிறது. ஆனால், இன்று இந்தியாவின் தமிழ்நாட்டிலுள்ள பல்கலைக்கழக மற்றும் கல்லூரி மாணவர்கள் எந்தவிதமான அரசியல் பின்னணியும் இன்றி கிளர்ந்தெழுந்திருக்கிறார்கள். அவர்கள் பேசுவது இலங்கைத் தமிழர்களின் உரிமைகள் பற்றி. அதை நாங்கள் வரவேற்கின்றோம். 1960ஆம் ஆண்டிலே இந்தி மொழித் திணிப்புக்கு எதிராகப் போராடியவர்கள் தமிழ்நாட்டு மக்கள். ஆனால் இலங்கையிலே 1983ஆம் ஆண்டில் விடுதலைப் போராட்டம் விஸ்வரூபமெடுத்ததைத் தொடர்ந்து இந்தியாவிலே அன்று எழுந்த தமிழ்நாட்டுக் கோரிக்கையை இந்திய மத்திய அரசு நாசூக்காக இலங்கையின் பக்கம் திருப்பியிருந்தது. ஆனால், இன்று அந்த நிலைமை மாறி மீண்டும் தமிழ்நாட்டிலே அது ஒரு பாரிய பிரச்சினையாக எழுந்துள்ளது. இன்று தமிழ்நாட்டிலுள்ள பல்கலைக்கழக மாணவர்கள் எந்த விதமான பலனையும் எதிர்பார்க்காமல் தமது போராட்டத்தை முன்னெடுத்து நடத்துகின்றார்கள். ஆனால், இன்று இந்திய மத்திய அரசு ஒருபக்கம் இலங்கை அரசுடன் பொருளாதார ரீதியான உடன்படிக்கைகளை மேற்கொள்கின்ற அதேவேளை, மறுபக்கத்தில் தமிழ்த் தேசியக் கூட்டமைப்பினரையும் அணைத்துக்கொண்டு காய்நகர்த்திக் கொண்டிருக்கிறது.

எனக்கு முன்னர் இங்கு உரையாற்றிய மாண்புமிகு சுஜீவ சேனசிங்க அவர்கள் இந்திய நிறுவனங்களுக்கு இலங்கை யிலுள்ள காணிகள் எவ்வாறு இலவசமாக வழங்கப்படுகின்றன என்பது பற்றிக் குறிப்பிட்டார். நாங்கள் இங்கு ஒரு முக்கிய விடயத்தைப் பார்க்க வேண்டும். நாங்கள் அனைவரும் இலங்கையைப் பற்றிய விடயங்களைப் பேசுகின்றோம். ஆனால், இந்திய மத்திய அரசின் பொருளாதாரக் கொள்கையின்படி, தமிழ் மக்களுக்கு இலங்கை - இந்திய ஒப்பந்தத்தைப் பற்றித் தெரிவிப்பார்கள். இலங்கை

[ගරු ජේ. ශ්‍රී රංගා මහතා]

අරසාංකමුම් இලංකෙ - இන්දිය ඔප්පන්දත්තිල් කුරිප්පිඩප් පට්ට තිරුකෝණමලෙත් තුරෙමුකම් තොඩර්පාක නීතිමන්රත් තුක්කුච් චෙන්රු එව්විත නඩවඩික්කෙයුම් මේර්කොළ්ළාදු. අදු අප්පඩියේ ඉරුක්කක්කූඩියදාක අදර්කු මේලදිකමාක පලාලි විමාන නිලෙයම්, කාන්කේසන්තුරෙත් තුරෙමුකම් ආකිය වර්රෙයුම් இන්දියාවිඩම් කෙයළිත්තුළ්ළදු. இදනාල් இලංකෙයින් පොරුළාදාරත්තෛක් කට්ටුප්පඩුත්තුවදු චීනාවා අල්ලදු இන්දියාවා එන්පදේ இන්රු චර්වදේසත්තුක්කු එළුන්තුළ්ළ පිරච්චිනෛ. இදර්කුළ් චික්කිප් පිණෛන්දවර්කළාක තමිළර්කළ් இරුක්කින්රාර්කළ්. இන්රු තමිළර්කළ් තමක්කු අරසියල් තීර්වු වළුංකප්පඩ වේන්ඩුමෙන්රේ එදිර්පාර්ක් කින්රාර්කළ්. තමිළ් පේසුම් මක්කළ් තමදු අරසියල් උරිමෛකළ් වළුංකප්පඩවේන්ඩුමෙන්රුම් එදිර්පාර්ක්කින්රාර්කළ්. සුය නිර්ණය උරිමෛයුඩන් කූඩිය ඔරු තීර්වු වේන්ඩුමෙන්පදිල් இලංකෛ වාළ් තමිළර්කළුක්කුම් තමිළ්නාට්ටු මක්කළුක්කුම් මාර්රුක් කරුත්තු කිඩෙයාදු. අදු චමෂ්ටියා අල්ලදු ඔරු නාට්ටුක්කුළ් இරු තේසංකළා එන්පදෛප් පේසිත් තීර්ක්ක වේන්ඩුම්. අල්ලදු යුත්තත්තුක්කු இලංකෛක්කු උදවිචෙය්ත උලක නාඩුකළ් ඔරුමිත්තුනින්රු එමක්කුත් තීර්වෛප් පෙර්රුත්තර වේන්ඩුම්. இදර්කුච් චාර්පාක இන්රු இන්දියාවින් තමිළ්නාට්ටිලුළ්ළ කල්ලූරි මාණවර්කළ් එව්විදමාන අරසියල් කට්චිකළින් ආදරවුමින්රිප් පෝරාඩුකින්රාර්කළ්. උණ්මෛ යිලේ අදනෛ இලංකෛයිලුළ්ළ තමිළ් මක්කළ් වරවේර්කින්රාර්කළ්. තමිළ්නාට්ටිලුළ්ළ එන්තවොරු අරසියල් කට්චික්කුම් අංකු වරවේර්පිල්ලෛ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
இන්නුම් ඔරු නිමිටත්තිල් මුදිත්තුක්කොළ්කින්රේන්.

உණ්මෛයිලේ இන්දිය අරසියල්වාදිකළුඩෛය අදික් කෛකළ් තොඩර්පාක එමදු තමිළ් මක්කළ් අලට්ටික් කොළ්වදිල්ලෛ. இන්රු නාන් කෞරව අනුර දිසානායක්ක අවර්කළිඩම්, "නීංකළ් 1987-1988ආම් ආණ්ඩුකළිල් එව්වාරු இලංකෛයින් පල්කලෛක්කළක මාණවර්කළෛ ඔන්රිණෛත්තු උංකළුඩෛය අරසියල් කොල්කෛකළෛප් පුකුත්දි, පෝරාට්ටත්තෛ මුන්නෙඩුත්තීර්කළෝ, අදේපෝන්රුදාන් இන්රු තමිළ්නාට්ටිලුළ්ළ පල්කලෛක්කළක මාණවර්කළ් තමදු පෝරාට්ටඩංකළෛ මුන්නෙඩුත්තුළ්ළාර්කළ්" එන්රු කූරිනේන්. තමිළ්නාදු එන්ර වකෛයිල් இලංකෛත් තමිළර්කළුක්කාකක් කුරල් කොඩුප්පදු අවර්කළින් කඩමෛ. අව්වාරු සුයනලමර්ර ඕර් අරසියල් පෝරාට්ටත්තෛත්තාන් තමිළ් මක්කළ් එදිර්පාර්ක් කින්රාර්කළ් එනත් තෙරිවිත්තු, විඩෛපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 5.56]

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව පටන් ගන්න කලින් මේ කාරණය ගැනත් මා දැන ගන්න කැමැතියි. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට එක්සත් ජාතික පක්ෂයෙන් කාලය ලබා දුන්නේ නැහැ කියලා. එතුමා TNA එකේ කාලය ලබා ගෙන කථා කළා කියලා තමයි එම මන්ත්‍රීතුමා සඳහන් කළේ. ලංකාවේ සිටින ඩයස්පෝරාවේ කාලය ලබා ගෙන සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුව අමතන්නට කටයුතු කිරීම ගැන අප මවිත වනවා. මේ රටේ එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය සඳහා දහලන, පොරකන සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ හැසිරීම ගැන අප මේ අවස්ථාවේ මවිතය පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින මෙම විවාදයේ දී කරන ලද කථා පිළිබඳව අහගෙන සිටියාම, රේගුව ගැන විතරක් නොවෙයි විවිධ කාරණා පිළිබඳව, රටේ ආර්ථික පැතිකඩ ගැන විවිධ අදහස් ප්‍රකාශ වුණා. අපේ රටේ රේගු දෙපාර්තමේන්තුව ගැන කථා කරනවා නම්, එය අති පැරණි දෙපාර්තමේන්තුවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙය ආරම්භ වෙලා තිබෙන්නේ ඉංග්‍රීසි ආණ්ඩුව කාලයේ යි. මෙම රේගු පනත පළමුවෙන් සම්මත වෙලා තිබෙන්නේ 1869 දීයි. 1869 කාලයේ මේ රටේ තිබුණේ ව්‍යවස්ථාදායක සභාවක් - Legislative Council එකක්-. ඉංග්‍රීසි ආණ්ඩුව පැවතුණේ. එම ඉංග්‍රීසි ආණ්ඩුව කාලයේ තමයි නීත්‍යානුකූලව බදු අය කිරීම සඳහා මේ නීති මේ රටේ සම්පාදනය කර තිබෙන්නේ. ඒ නිසා අද වනකොට රේගුවට වයස අවුරුදු 150කට කිට්ටු වෙනවා. මේ අවුරුදු 150ක කාලය තුළ රේගුව මේ රටේ ආර්ථික සංවර්ධනයට දුන් දායකත්වය අප අගය කරන්නට ඕනෑ. මේ රටේ ජාතික ආදායමෙන් විශාල මුදලක් උපයන ආයතනයක් හැටියට, මේ රටේ ජාතික ආර්ථිකයට ශක්තියක් දෙන ආයතනයක් හැටියට රේගුව ඉතා වැදගත් ස්ථානයක් ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාවික කටයුතු සම්බන්ධයෙන් අපට රේගුව විශාල වශයෙන් බලපානවා. ඒ වාගේම සිවිල් ගුවන් සේවා කටයුතු සම්බන්ධයෙනුත් අපට රේගුව විශාල වශයෙන් බලපානවා. ඒ වාගේම වාණිජ කටයුතු, බලශක්ති දැනුම යන මේ ක්ෂේත්‍ර සම්බන්ධයෙනුත් රේගුව ඉතා විශාල කාර්ය භාරයක් මේ රටට ඉටු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලංකාව අඩු ආදායම් ලබන රටක් හැටියට තිබුණා අපට මතකයි. ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක්ම සඳහන් කළා, මේ රටට ලබා ගත් විශාල ණය මුදල් ගැන. අප විශාල පොලියකට වාණිජ ණය ලබා ගන්න පෙළඹිලා තිබෙනවා කියලා කිව්වා. ඒ අයට අමතක වුණු කාරණයක් තිබෙනවා. 2010 වසරට ඉස්සර වෙලා මේ රට තිබුණේ අඩු ආදායම් ලබන රටක් විධියටයි. නමුත් අද මේ රට අඩු ආදායම් ලබන රටක් නොවෙයි. අද මේ රට මධ්‍ය ආදායම් ලබන රටක්. මේ මධ්‍ය ආදායම් ලබන රටක් හැටියට ශ්‍රේණිගත කරන්නට අපේ රේගුවෙන් ලැබුණු දායකත්වය අති විශාලයි. ඒ නිසා අද මේ රටට ණය ගැනීම් සම්බන්ධයෙන්, එම ණය පොලී සම්බන්ධයෙන් කථා කරනවා නම්, 2010 වසරට ඉස්සරවෙලා තත්ත්වය ගැන සංසන්දනය කරලා කථා කරන්නට බැහැ. අද මේ රට මධ්‍ය ආදායම් ලබන රටක් හැටියට කල්පනා කරලා තමයි මේ රටේ ආර්ථිකය ගැන කථා කළ යුතු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා, මේ රටේ ඒක පුද්ගල ණය බරතාව රුපියල් දෙලක්ෂ ගණනක් වෙලා තිබෙනවා කියලා. ඒ වාගේ තර්කවලින් රටේ ආර්ථිකය මනින්න පුළුවන්ද? මේ ණය වෙලා තිබෙන්නේ මොනවාටද? අද මේ රටේ මොන තරම් දැවැන්ත පරිවර්තනයක් සිදු වෙලා තිබෙනවාද? ඊයේ පෙරේදා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් මත්තල ගුවන් තොටුපොළ විවෘත කළා. දැන් විපක්ෂය අහනවා, එයට ගුවන් යානා එනවාද කියලා. වරාය හදලා අවුරුද්දක් යනකොට අහනවා, එයට නැව් එනවාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ කොළඹ වරාය දිහා

බලන්න. එය අවුරුදු දහස් ගණනක් පැරණි වරායක්. වරායක් සංවර්ධනය වන්න අවුරුදු සිය දහස් ගණනක් ගත වෙනවා. කොළඹ වරාය නිසා තමයි කොළඹ නගරය දියුණු වුණේ. කොළඹ වරාය ඇති වන්න ඉස්සර වෙලා කොළඹ නගරය මේ තරම් දියුණු තත්ත්වයක තිබිලා නැහැ. ඒ විතරක් නොවෙයි, මීගමුව දක්වා වාණිජ ප්‍රදේශ බවට පරිවර්තනය වුණේ කොළඹ වරාය නිසායි. මේක අවුරුද්දකින්, දෙකකින්, දහයකින්, පහළොවකින් සිදු වුණු දෙයක් නොවෙයි. අවුරුදු දහස් ගණනක ඉතිහාසයක් තිබෙනවා. අද මේ පැත්තෙන් කළුතරට යන තෙක් වාණිජකරණයට යොමු වුණේ, මුහුදුබඩ පළාත් වාණිජකරණයට යොමු වුණේ කොළඹ වරාය නිසාය කියන එක අප අමතක කරන්නට හොඳ නැහැ. ඉතිහාසයේ කරන්න තිබුණු වැඩ -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please!The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. UDITH LOKUBANDARA *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතීතයේ මේ රටේ කරන්න තිබුණු වැඩ ගැන කථා කරනවා නම් නිදහස ලැබුණාට පසුව මේ රටේ බලයට ආවේ එක්සත් ජාතික පක්ෂයයි. මේ එක්සත් ජාතික පක්ෂයට දර්ශනයක් තිබුණාද?

1952 වර්ෂයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ කරන තුරු, ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන්ගේ සිතුම් පැතුම් ඉදිරියට ගෙන ගියා හැර, තිබුණු ආදායම් ටික එකතු කර ගත්තා හැර, නවතාවකින් වැඩ කරන්න එක්සත් ජාතික පක්ෂයට ශක්තියක් තිබුණේ නැහැ. ත්‍රිකුණාමලයේ වරාය ජනසතු කළේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමායි. ඒ වරාය රජයට පවරා ගත්තා. රේගුව තුළින් මේ රටට ආදායම් ගෙනෙන්න, ත්‍රිකුණාමලයේ වරාය මේ රටට වස්තුවක් හැටියට එදා මේ රටේ ජනතාවට අයිති කරලා දුන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමායි. ඒ ඉතිහාසය අමතක කරලා ඉදිරියට යන්න බැහැ.

අද කොළඹ වරාය දිහා බලන්න. කොළඹ දකුණ වරාය හෙට අනිද්දා මේ රටේ දැවැන්තම වරාය බවට පත් වනවා. විශාල නැව් ගෙනෙන්න පුළුවන් විධියට ඒ වරාය සකස් කරලා තිබෙනවා. මුදල් කන්දරාවක් මේ සඳහා වැය වෙලා තිබෙනවා. ඒවාට තමයි ණය ගත්තේ. ඒක තමයි ආර්ථිකය; ඒක තමයි ජනතාවගේ අවශ්‍යතාව. දවසකින්, දෙකකින් මේ සියලු ප්‍රශ්න විසඳන්න පුළුවන් රටක් ලෝකයේ කොහේවත් නැහැ. දවසින් දවස අපේ රට සංවර්ධනය වනවා. ණය ගන්නේ නැතුව කිසි දෙයක් කරන්න බැහැ. රස්සාවක් කරලා රුපියල් 25,000ක පඩියක් ගන්නා මිනිහෙකුට ගෙයක් හදා ගන්න රුපියල් ලක්ෂ 4ක හෝ 5ක ණයක් ගන්න අවශ්‍ය නම්, ඒ පුද්ගලයා ඒ ණය ගන්න ඕනෑ. ණය අරගෙන ගේ හදා ගන්න ඕනෑ. එහෙස නැතිව සල්ලි එකතු කරලා ගෙයක් හදා ගන්න හිටියොත් අවුරුදු 10කින්වත් ගෙයක් හදා ගන්න බැහැ. එවැනි සරල උදාහරණ මෙච්චර තියෙද්දී ණය ගැනීම ගැන භය වෙනවා. ණය ගැනීමේ ඉතිහාසය දිහා බැලුවොත්, මේ රටේ ණය ගැනීමේ ප්‍රමුඛතාව හිමි වන්නේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට. ඒ කාලයේ මේ රට විශාල වශයෙන් ණය ගත්තා. ඒ නිසා ඒ කාලයේ විශාල ණය බරක් තිබුණා. මා එහෙම කියන්නේ 1977 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පරාජය වන කොට මේ රට ශත පහක්වත් ණය තිබුණේ නැති නිසායි. රුපියල් කෝටි ගණනින් මේ රට ණය කරලා, මේ රටේ ආර්ථිකය වළ පල්ලට ගෙනිව්වේ එක්සත් ජාතික පක්ෂය නොවෙයිද?

අදත් අපි ඒ ණය ගෙවනවා. මොනවාද එයින් ලැබුණු ප්‍රතිඵල? විවෘත ආර්ථිකයෙන් ඇති වුණු අනිසි ඵල විපාක නිසා මේ රටේ ජාතික ආදායම අහිමි වුණා. අද අපි ආනයනය නොකරන්නේ මොනවාද? අද අපි සියලු දේවල් ආනයනය කරනවා. මීරිස් කරලේ ඉඳලා, කිරි වීදුරුවේ ඉඳලා, සීනි හැන්දේ ඉඳලා හැම දේම ආනයනය කරනවා. මේ ජාතිය වළ පල්ලට ගෙන ගියේ ඒ වැරදි ආර්ථික ප්‍රතිපත්තිය නිසායි. නමුත් අතිගරු ජනාධිපතිතුමාට පිං සිදු වෙන්න අද එක හාල් ඇටයක්වත් පිට රටින් ගෙනෙන්නේ නැහැ. විදේශ රටවලින් ගෙනාපු සහල්වලට එදා ගෙවාපු බදු අද අපි ගෙවන්නේ නැහැ. ඒ නිසා මේවාත් සංසන්දනය කරලා බලන්න ඕනෑ. මා හිතන්නේ නැහැ, එක්සත් ජාතික පක්ෂයේ එක මන්ත්‍රීවරයකුවත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා කියලා. පෙනෙන්න නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විවාදය අවශ්‍යද, නැද්ද කියලා කලින් කියන්න ඕනෑ. ඒ අය මේ විවාදයට සහභාගි වෙන්නේ නැත්නම්, ආණ්ඩුව හැටියට අපට එක දවසින් මේවා සම්මත කරන්න පුළුවන්, කාලය නාස්ති කරන්නේ නැතිව. මේ රට පාලනය කරන්න ජනතාව මේ ආණ්ඩුවට බලය දීලා තිබෙන නිසා මේ පනත් කෙටුම්පත් සම්මත කරන්න අපට විවාදයක් අවශ්‍ය වෙන්නේ නැහැ.

අපේ ආණ්ඩුවේ දක්ෂ අමාත්‍යවරු ඉන්නවා. මේ රට, රාජ්‍යය පාලනය කරන්න පුළුවන් පළපුරුදු අය ඉන්නවා. නීති සම්පාදනය කරලා මේ රට නිවැරදි මාර්ගයේ ගමන් කරවන්න අපට පුළුවන්කම තිබෙනවා. අපට මේවා ඉදිරිපත් කරපු මොහොතේම සම්මත කර ගන්න පුළුවන්. විවාදයක් දෙන්නේ විපක්ෂයට. නමුත් විපක්ෂයේ එක මන්ත්‍රීවරයකුවත් නැහැ මේ ගරු සභාවේ. එතුමන්ලාට අද කරන්න විවේචනයක් නැහැ. ණය බර ගැන කථා කරනවා. මේ ලෝකයේ ණය ගත්තේ නැති රටක් ගැන කියන්න. ණය ගන්නේ නැතිව සංවර්ධනය කරපු රටක් ලෝකයේ තිබෙනවාද? ගමේ කථාවක් තිබෙනවා, "ණය වෙන්න භය වෙන්න එපා" කියලා. ණය අරගෙන සංවර්ධනය වුණාම ඒ සංවර්ධනයෙන් දැවැන්ත ආදායමක් ලැබෙනවා. උදාහරණයක් හැටියට රේගුවේ ආදායම දිහා බලන්න. වර්ෂයෙන් වර්ෂය වැඩි වෙලා තිබෙනවා. 2010 අවුරුද්දේ රේගුවේ ගේට්ටුවෙන් පිටු වුණු බහලුම් ප්‍රමාණය තුන්ලක්ෂ තුන්සිය තිස්අටයි. සියයට 27ක වර්ධනයක්! 2011, 2012 වර්ෂවල සංඛ්‍යා ලේඛන මා ළඟ නැහැ. මේ සෑම වර්ෂයකම රේගුවෙන් එළියට යන බහලුම් සංඛ්‍යාව දවසින් දවස වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම විදේශ රටවලට යන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. බලන්න, කොයි තරම් ලේඛන සංඛ්‍යාවක් මේ සඳහා සකස් කරන්න ඕනෑද කියලා. Customs declarations කොයි තරම් ප්‍රමාණයක් තිබෙනවාද බලන්න. 2010 වසරේ දසලක්ෂ හයදහස්හාරසිය අසූඅටක් Customs declarations හදලා තිබෙනවා. මේ සංඛ්‍යාව ගත්තාම කලින් අවුරුද්දට වඩා විශාල වැඩි වීමක්. ඒ නිසා වරායේ කටයුතු දවසින් දවස පුළුල් වෙලා තිබෙනවා; වර්ධනය වෙලා තිබෙනවා. මේවා තේරුම් ගන්නේ නැතිව, මේවා ගැන අවබෝධ කර ගන්නේ නැතිව මෙතැන කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් වැරදි කරන්නන්ගේ සමාජයක් තිබෙනවා. වරායට මේක ප්‍රශ්නයක්. අපේ රේගු නිලධාරීන්ට පගාව දෙන්න එනවා. නීති විරෝධී ද්‍රව්‍ය මේ රටට ගෙනෙන්න උත්සාහ කරනවා. අල්ලස් කොමිසාරිස් දෙපාර්තමේන්තුවේ ශාඛාවක්, අල්ලස් හෝ දූෂණ චෝදනා

[ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා]

විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ ශාඛාවක් වරායේ දැමීමත් වරදක් නැහැ, වරාය තුළ මේ සිදු වන වැරදි නවත්වා ගන්න. මේ රජයට දැවැන්ත ආදායමක් එන ආයතනයක්. අද ඒක නිසාම නව පරිපාලන ක්‍රමයක් හදලා තිබෙනවා. සමාජ ආරක්ෂණ අංශයක් හදලා තිබෙනවා. අන්තරායකාරී ඖෂධ පාලනය කරන්න, සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් වාගේම ජෛව විවිධත්ව රැකවරණය සඳහා ජනතා උරුමයන් ආරක්ෂා කරන්න වෙනම අංශයක් අද රේගුව තුළ හදලා තිබෙනවා.

අද මේ අපනයන ආනයන වෙළෙඳාමේදී ASYCUDA World කියලා automated system එකක් Customs data සඳහා යොදා ගෙන තිබෙනවා. මේ තුළින් ඉල්ලුම් පත්‍ර අරගෙන පරිගණකය මාර්ගයෙන් තමුන්ගේ ගනු දෙනු කරන්න අද අවස්ථාව සැලසී තිබෙනවා. නවීන තාක්ෂණයට රේගුව ඇතුළත් වෙලා තිබෙනවා. ඉතින් මේවා දිහා බලලා තමයි කථා කරන්න ඕනෑ. අද අපේ බුද්ධිමය දේපොළ අයිතිය කඩ කිරීම පිළිබඳව කටයුතු කරන්න නව රේගු අධ්‍යක්ෂවරයකු පත් කර තිබෙනවා. මේ අලුත් වැඩ පිළිවෙළ තුළින් මේ රටේ වෙළෙඳාම කාර්යක්ෂම කරන්න, ආනයන අපනයන වෙළෙඳාම කාර්යක්ෂම කරන්න අපට ඉඩ කඩ ලැබිලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපේ ඒකාබද්ධ අරමුදල - Consolidated Fund එක- ගැන කථා කරමින් එක මන්ත්‍රීවරයෙක් ප්‍රශ්න කළා, මේක පසුකාලීනව බලපාන - effect එකක්- විධියට පත් කරන්නේ මොකද කියා. අද ඒකාබද්ධ අරමුදලින් -Consolidated Fund එකෙන්- කොළඹ නව රේගු ගොඩනැඟිල්ලක් ඉදි කරනවා. එය මහල් 13කින් යුත් නව මූලස්ථානයක්. සියලු කටයුතු එකම තැනකින් කර ගන්න පුළුවන් විධියට ඒකාබද්ධ කරලා අලුත් වැඩ පිළිවෙළක් ගෙන යනවා. දැනටමත් ඒකාබද්ධ අරමුදලින් රුපියල් බිලියන 4.5ක් දීලා තිබෙනවා. මේ වනකොට සියයට 95ක් වැඩ ඉවරයි. රේගුව විතරක් නොවෙයි. වරායවල් හදනවා. කොළඹ වරාය හදනවා. මත්තල ගුවන් තොටුපළ හදනවා. අධිවේගී මාර්ග හදනවා. වී ගොවිතැනින් රට ස්වයංපෝෂිත කරනවා. උඳුවලින් මේ රට ස්වයංපෝෂිත කරනවා. බඩ ඉරිඟුවලින් මේ රට ස්වයංපෝෂිත කරනවා. ඒ විතරක් නොවෙයි. අද අපි නව රේගු ගොඩනැගිල්ලක් ඉදිකරනවා. රෝහල් පද්ධතිය දිහා බලන්න, අද මොන තරම් දැවැන්ත ආයෝජනයක් කර තිබෙනවාද කියා.

අද තමුන්නාන්සේලාට මේ සංවර්ධනය දිහා බලා ගෙන ඉන්න බැහැ, ඊර්ෂ්‍යාව නිසා. මේ රටේ ජනතාව එකතු කරන්න බැරි නිසා අද එක්සත් ජාතික පක්ෂය ජිනීවා ගිහිල්ලා තිබෙනවා, ආණ්ඩුව පෙරළන්න. තමුන්නාන්සේලාට මේවා කරන්න හම්බ වෙන්නේ නැහැ. මේ රටේ අපට පෘතුගීසිකාරයින් ඇවිල්ලා පුරුදුයි; ලන්දේසිකාරයින් ඇවිල්ලා පුරුදුයි; ඉංග්‍රීසිකාරයින් ඇවිල්ලා පුරුදුයි. මොන ජගතා ආවත් මේ රටේ ජනතාවට භයියක් තිබෙනවා, ශක්තියක් තිබෙනවා මේ රටේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගන්න. මේ වකවානුවේ ඒක ආරක්ෂා කරන නායකයා හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නම ඉතිහාසයට එකතු වෙලා ඉවරයි. මේ රට ආරක්ෂා කර ගත් නායකයා හැටියට එතුමා මේ රට දැවැන්ත සංර්ධනයක් කරා ගෙනිහින් තිබෙනවා. සල්ලි අරගෙන, ණය අරගෙන කරන්නේ මොනවාද කියලා තමුන්නාන්සේලා ඇස් ඇරලා බලන්න ඕනෑ. මෙන්න මේ වැඩ පිළිවෙළ තුළ තමයි මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්නේ. සීනි කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අපේ රජය ඇමතිවරයෙක් පත් කර තිබෙනවා. රුපියල් කෝටි 5,000ක විතර විදේශ විනිමයක් වියදම් කරලා ලංකාවට සීනි ගෙන්වනවා. ඩොලරයට තිබෙන බලපෑම නිසා ඒ විදේශ විනිමය මේ රටේම නවත්වා ගන්න අපට අවශ්‍ය වෙලා තිබෙනවා. මේ රටට කිරිපිටි ආනයනය කරනවා. කිරිපිටි ආනයනය නවත්වන්න ඕනෑ වෙලා තිබෙනවා. ජනතාව අද මෙවැනි තත්ත්වයන්ට පොළඹවන්න අපහසු වෙලා තිබෙනවා. ආකල්පමය වශයෙන් අද මේ රටේ විශාල වෙනස්කමක් සිද්ධ වෙලා තිබෙනවා. ජනතාව කෘෂි ආර්ථිකයට නැඹුරු වන එක අඩු වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ. දැවැන්ත බලවේගයක් හැටියට මේ රටේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්න ඕනෑ. අද දුප්පත්කමේ රේඛාව හැටියට කියන්නේ ඩොලර් එකයි. රුපියල් 130ට අඩු ආදායමක් ගන්න කෙනෙක් අද මේ රටේ ඉන්නවාද කියා මා අහනවා. මේ රටේ රාජ්‍ය සේවයේම ලක්ෂ 13ක් ඉන්නවා. ලක්ෂ 17ක් විදේශගත වෙලා ඉන්නවා. ඒ අයත් නිර්ධන පන්තියේය කියන සමාජවාදී සංකල්පයට ඇතුල් කරගෙනද තමුන්නාන්සේලා කථා කරන්නේ. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාත් අද මේවා ගැන කථා කරනවා. එක්සත් ජාතික පක්ෂයට සමාජවාදී සංකල්ප ඇතුළු වෙන්නේ කොහොමද? මේ රට විකුණා ගෙන කන්න හදපු, මේ රට විදේශිකයන්ට පාවා දුන්නු, මේ රටේ දේපොළ ටික විකුණපු එක්සත් ජාතික පක්ෂය මොනාවද මේ කථා කරන්නේ? එක්සත් ජාතික පක්ෂයට එහෙම කථා කරන්න අයිතියක් නැහැ. අද තමුන්නාන්සේලා වැරදි සංකල්පවල පැටලිලා. අද තමන්ගේ පක්ෂය විශාල අර්බුදයකට ගෙනිහිල්ලා. අද එතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමග නායකත්වයට පොර කනවා. නමුත් එතුමාගේ ළඳ බොළඳකම නිසා, එතුමාගේ ළා බාලකම නිසා එතුමාට කිසි දිනෙක රණසිංහ ප්‍රේමදාස කෙනෙක් වෙන්න බැහැ.

මේ රටේ ජනතාවත් එක්ක එකතු වෙලා, මේ රට සංවර්ධනය කරා යන ගමනේදී අපි දන්නවා, රේගුව කොච්චර කාර්යක්ෂමව වැඩ කරනවාද කියා. වරක් මේ රටට පිළිකා කාරක තිබෙන රසායන ද්‍රව්‍ය කිහිපයක් ගෙනාවා. ඒවා ඔක්කොම අත් අඩංගුවට ගන්න කටයුතු කළා. Methamphetamine කිලෝ 17ක් ගෙනාවා; ඒ සියල්ල අත් අඩංගුවට ගත්තා. හෙරොයින් කිලෝ 36ක් අත් අඩංගුවට ගත්තා. දුම්කොළ පදනම් කර ගත්තු පිළිකා කාරක අඩංගු Pan Parag, Hans, Beedi ආදී මේවා ඔක්කොම අත් අඩංගුවට ගත්තා. ඒ නිසා සෞඛ්‍යමය වශයෙන් මේ රටේ ජනතාව ආරක්ෂා කරමින් පිළිකාකාරක රාශියක් මේ රටට පැමිණීම වළක්වන්න රේගුව කටයුතු කර තිබෙනවා. ඒ නිසා තව කිහිප දවසක් යනකොට නවීකරණයට පත් වන රේගුවේ තවත් අංශ දෙකක් -මත්තල ගුවන් තොටුපළේ සහ හම්බන්තොට වරායේ- විවෘත කරන්න පුළුවන් වෙනවා. ඒ අංශ දෙකෙන් විතරක් නොවෙයි දකුණු කොළඹ වරාය විවෘත කළායින් පසුව මේ රටේ වාණිජ වරායක් හැටියට -විශාල ආදායමක් උපයන වරායක් හැටියට- අපේ ආදායම තවත් වැඩි කර ගන්න පුළුවන් වෙනවා. හොංකොං නගරයට තිබෙන ප්‍රධානම ස්ථානයක් තමයි හොංකොං වරාය. සිංගප්පූරුව ගත්තොත්, ඒ රටේ තිබෙන ප්‍රධානම ස්ථානය තමයි සිංගප්පූරු වරාය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතිහාසයේ මේ ස්ථාන වැදගත් වුණේත්, ආර්ථික වශයෙන් දියුණු වුණේත් මත්ද්‍රව්‍ය නිසායි. ඉස්සර මත් ද්‍රව්‍ය - විශේෂයෙන්ම අබින්- ගෙන යෑමේ මධ්‍යස්ථානයක් හැටියට සිංගප්පූරු වරාය පාවිච්චි කළා. ඊළඟට එංගලන්තයට අවශ්‍ය කරන යුද්ධ පසුබිම හදන්න සිංගප්පූරුවේ වරාය සංවර්ධනය කළා. ඒ දීර්ඝ කාලයකට පෙරයි. එවැනි විවිධ කාරණා නිසා මේ ස්ථාන සංවර්ධනය වෙලා තිබෙනවා. නමුත් අද අප අවංකව, මේ රටේ ජනතාවට දැවැන්ත ආදායමක් දෙන්න පුළුවන් විධියට මේ වරාය සංවර්ධනය කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කවදාවත් නොතිබුණු විධියට අද මේ රටේ ජනතාවගේ ඒක පුද්ගල ආදායම වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා දිළිඳුකමක් ගැන කාටවත් කථා කරන්න බැහැ. මේ රටේ ජනතාවගෙන් දිළිඳුකමේ රේඛාවේ සිටිනවාය කියන කිසිවෙක් අද අපට සොයා ගන්න නැහැ. දැන් අපට අවශ්‍ය වන්නේ ආදායම වැඩි කිරීමටයි. බඩු මිල අඩු කිරීමට නොවෙයි. ජනතාවගේ ආදායම වැඩි කර දෙන්න තමයි රජය වෙහෙසෙන්නේ. ඒකට තමයි වරායවල් හදන්නේ. ඒකට තමයි ගුවන් තොටුපළවල් හදන්නේ. ඒකට තමයි මහා මාර්ග හදන්නේ. ඒ තුළින් තමයි අපට ස්වයංපෝෂිත ආර්ථිකයකට යන්න පුළුවන් වන්නේ.

අද තේ කර්මාන්තය දිහා බලන්න. තේ මිල වැඩි වීම නිසා විශාල පිරිසක් තේ වගාවට යොමු වුණා. රබර් මිල වැඩි වීම නිසා විශාල පිරිසක් රබර් වගාවට යොමු වුණා. ඒ තුළින් ඇති වුණු රක්ෂා ප්‍රමාණය ඔබතුමන්ලා ගණනය කර තිබෙනවාද? අලුතින් ඇති වුණු තේ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද? අලුතින් ඇති වුණු රබර් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද? මේවා ගැන කවුරුන් හෝ ගණන් හදලා තිබෙනවාද?

2011දී ලංකාවට වාහන 540,000ක් ආනයනය කර තිබෙනවා. වාහන ආනයනය අඩු වෙයි කියා හිතලා අපි ඒ සඳහා පනවන බදු වැඩි කළා. ඊළඟ අවුරුද්දේත් එම වාහන සංඛ්‍යාවමයි ආනයනය කර තිබෙන්නේ. අඩු වීමක් වෙලා නැහැ. ඒ විධියට වාහන විශාල සංඛ්‍යාවක් ආනයනය වෙනවා. දැවැන්ත ආර්ථික ප්‍රසාරණයක් සිද්ධ වන නිසා, ජනතාවට ආර්ථික වශයෙන් වාසිදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙන නිසා මේ රටේ ජනතාව ඒ පැත්තට තල්ලු වෙලා තිබෙනවා. අද ලංගම බස් රථවල ගමන් කරන්නේ දුර ගමන් යන අය විතරයි. කෙටි දුර ගමන් යන අය අපේ ලංගම බස් රථවල ගමන් කරනවා අඩුයි. ඒ නිසා ලංකා ගමනාගමන මණ්ඩලයේත් ප්‍රශ්නයක් තිබෙනවා. ඇයි? කලින් ගමනාගමනයට ලංගම බස් රථ යොදා ගත් ජනතාව අද ඒවායින් ඈත් වෙලා. ගම්බද ප්‍රදේශවල මේ අය යම් ප්‍රමාණයකට අඩු වෙලා තිබෙනවා. ඔවුන්ට ත්‍රී වීලර්, මෝටර් සයිකල් ලැබිලා ප්‍රවාහන පද්ධතියේත් යම් යම් පරිවර්තන සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මේ රටට විශාල වශයෙන් වාහන ආනයනය කරන කොට, ඒවායින් බදු අය කරලා රජයට ආදායම අරගෙන අපි මහා මාර්ග පද්ධතිය හදනවා. ඒකේ ඇති වරද මොකක්ද? බදු අය කරන්නේ නැතිව රටක් ගෙන යන්න බැහැ. ලෝකයේ කිසිම රටක් බදු අය කරන්නේ නැතිව පාලනය කරන්නේ නැහැ. ඒ නිසා අපේ රටටත් මේ තත්ත්වයෙන් වෙනස් වෙලා කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ රේගුව මේ රටේ ජාතික ආදායමට දුන්න සහයෝගය, බදු එකතු කරලා මේ රටේ ජනතාව සාඩම්බර ජාතියක් හැටියට නැඟී සිටුවන්න දීපු දායකත්වය අප අගය කරනවා. අද ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධන තුළින් අපි තවත් පියවරක් තබනවා. අවුරුදු 144කට පෙර මේ රටේ සම්මත කරපු රේගු ආඥාපනත තවත් වතාවක් අද සංශෝධනය කරනවා. මා හිතන හැටියට මීට පෙර පණස් වතාවක් විතර මෙය සංශෝධනය කර තිබෙනවා. අද තවත් වතාවක් එය සංශෝධනය කිරීමෙන් වර්තමාන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න ශක්තිමත් පරිසරයක් නිර්මාණය කරන්න හැකි වෙයි කියලා අප හිතනවා.

විශේෂයෙන්ම මම මෙහිදී ගරු සරත් අමුණුගම ඇමතිතුමා ගැනත් යමක් කියන්න ඕනෑ. එතුමාට මේ පිළිබඳ හසළ දැනීමක් තිබෙනවා. එතුමා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දීර්ඝ කාලයක් කටයුතු කර තිබෙනවා. එතුමා ලංකාවේ සිවිල් සේවයේ, පරිපාලන සේවයේ ඉහළම ක්ෂේත්‍රයට ගිහිල්ලා, දේශපාලන ක්ෂේත්‍රයේත් ඉහළටම ගොස් තිබෙනවා. එවැනි කීප දෙනායි අපේ රටේ සිටින්නේ. ඒ අය අතරින් කෙනෙක් තමයි අපේ සරත් අමුණුගම ඇමතිතුමා. එතුමා ස්ථිර ලේකම්වරයෙක් හැටියට කටයුතු කර තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ කටයුතු කර තිබෙනවා. අද එතුමා මේ පාර්ලිමේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක්. ඒ වාගේම මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියටත් එතුමා අද කටයුතු කරනවා. එතුමා සාර්ථක ජීවිතයකට උරුමකම් කියනවා. ඒ අත් දැකීම, ඒ පළපුරුද්ද ගැන කාටවත් අභියෝග කරන්න පුළුවන්කමක් නැහැ. මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න එතුමා දරන ප්‍රයත්නයට අප එතුමාට ස්තුතිවන්ත වෙනවා. අද ඉදිරිපත් කර තිබෙන මේ රේගු (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අපේ සහයෝගය පළ කරමින් මගේ කථාව සමාප්ත කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය. පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

විනා විවාදයකින් තොරව, ඒකමතිකව පිළිගනු ලැබිණි. ඒ අනුව, දෙ වන වර කියවීම සඳහා නියෝග කරන ලදී.

Question put, and agreed to. Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

තීරණය කරන ලදී.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." [The Hon. (Dr.) Sarath Amunugama.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]

කුලුගෙවිල් ආරාධනා කරන ලදී.
[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.

[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES in the Chair.]

1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ආම් වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Clause 1, ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (235 වන අධිකාරයවූ) 10 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 2.- (235ஆம் அத்தியாயத்தின் 10ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 2. - *(Amendment of section 10 of the Chapter 235.)*

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අපනයනකරු වෙත (1ආ) වගන්තියේ නිශ්චිතව දැක්වෙන' "

(2) "2 වන පිටුවේ, 1 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අවස්ථාවෝචිත පරිදි (1ආ) උප වගන්තියේ නිශ්චිතව දැක්වෙන' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 153ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 3. - *(Amendment of section 153 of the Principal Enactment.)*

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, 6 වන පේළියේ සිට 24 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටදු.

Amendment put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

4 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Clause 4, ordered to stand part of the Bill.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.20ට, 2013 මාර්තු 21 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් තියේය.

அதன்படி பி. ப. 6.20 மணிக்கு பாராளுமன்றம், 2013 மார்ச் 21, வியாழக்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 6.20 p.m. until 1.00 p.m. on Thursday, 21st March, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 216 - இல. 7
Volume 216 - No. 7

2013 මාර්තු 21වන බ්‍රහස්පතින්දා
2013 மார்ச் 21, வியாழக்கிழமை
Thursday, 21st March, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

කල්තැබීමේ යෝජනාව:
දකුණු ඉන්දියාව සමඟ රාජතාන්ත්‍රික සබඳතා තහවුරු කිරීම

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

மீள குடியமர்த்துதல் அதிகாரசபை (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

ஒத்திவைப்புப் பிரேரணை:
தென்னிந்தியாவுடனான இராஜதந்திர உறவுகளை வலுப்படுத்தல்

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

RESETTLEMENT AUTHORITY (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

ADJOURNMENT MOTION:
Strengthening Diplomatic Ties with South India

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මාර්තු 21වන බ්‍රහස්පතින්දා
2013 மார்ச் 21, வியாழக்கிழமை
Thursday, 21st March, 2013

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා]
මූලාසනාරූඩ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.

பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] *தலைமை வகித்தார்கள்.*

The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2013 මාර්තු මස 21වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා - පැමිණ නැත.
ගරු ජයරත්න හේරත් මහතා - පැමිණ නැත.
ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

මන්නාරම් ද්‍රෝණිය : තෙල් ගවේෂණ කටයුතු
மன்னார் கடற்படுகை : எண்ணெய் ஆராய்ச்சி
MANNAR BASIN : OIL EXPLORATION

1975/'11

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවේ මන්නාරම් ද්‍රෝණියේ තෙල් ගවේෂණ කටයුතු භාර දී ඇති සමාගම සහ එය අයත් රටේ නම කවරේද;

(ii) තෙල් ළිං කැණීමේ ගිවිසුමේ අඩංගු කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මන්නාරම් ද්‍රෝණියේ තෙල් ළිං කැණීමේ දී එහි කිසිදු කටයුත්තක් අධීක්ෂණය කිරීමට සහ ඊට අදාළ තීරණවලට එළඹීමට ශ්‍රී ලංකා රජයට නොහැකි වී ඇති බවත්;

(ii) මේ තත්ත්වය යටතේ තෙල් ළිං කැණීමට අදාළ ගිවිසුමෙහි විනිවිදභාවය පිළිබඳ ගැටලු මතු වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் மன்னார் கடற்படுகையில் எண்ணெய் ஆராய்ச்சி நடவடிக்கைகள் ஒப்படைக்கப்பட்டுள்ள கம்பனியினதும் அது உரித்தாகின்ற நாட்டினதும் பெயர்கள் யாவையென்பதையும்;

(ii) எண்ணெய்க் கிணறுகளை அகழ்வதற்கான உடன்படிக்கையில் உள்ளடங்கியுள்ள நிபந்தனைகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மன்னார் கடற்படுகையில் எண்ணெய்க் கிணறுகளை அகழ்கின்றபோது அதன் எந்தவொரு நடவடிக்கையையும் மேற்பார்வை செய்வதற்கோ அதற்குரிய தீர்மானங்களை மேற்கொள்வதற்கோ இலங்கை அரசாங்கத்திற்கு முடியாதுள்ளதென்பதையும்;

(ii) இந்த நிலைமையின் கீழ் எண்ணெய்க் கிணறுகளை அகழ்வதற்கான உடன்படிக்கையின் வெளிப்படைத் தன்மை தொடர்பாக சிக்கல்கள் எழுகின்றன என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු බුද්ධික පතිරණ මහතා]

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) of the name of the company which is entrusted with the oil exploration activities in the Mannar Basin in Sri Lanka and the name of the country to which that company belongs; and

(ii) of the conditions included in the agreement signed for the drilling of oil wells?

(b) Will he admit that -

(i) the Sri Lankan Government has not been able to supervise any activity connected to drilling of oil wells in Mannar Basin or to take any decision relevant to it; and

(ii) under the aforesaid situation, problems have arisen with regard to the transparency of the agreement relevant to the drilling of oil wells?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) කෙයාන් ලංකා පුද්ගලික සමාගම. කෙයාරන් ඉන්දියා සමාගමේ පාලිත සමාගමක් වන එය ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමකි.

(ii) අනෙකුත් කොන්දේසි අතර ඛනිජ තෙල් සම්පත් ගිවිසුමේ පහත දැක්වෙන ප්‍රධාන කොන්දේසි අන්තර්ගත කර ඇත.

1. ගවේෂණය, සංවර්ධනය සහ නිෂ්පාදනය පිළිබඳ සියලු වියදම් කොන්ත්‍රාත්කරු දැරිය යුතු ය.

2. ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී, අත්සන් ප්‍රසාද මුදලක් ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 1ක් සහ පළමු වාණිජ නිෂ්පාදනයේදී නිෂ්පාදන ප්‍රසාද දීමනාවක් ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක් කොන්ත්‍රාත්කරු විසින් ශ්‍රී ලංකා රජයට ගෙවිය යුතු ය.

3. වසර 8ක ගවේෂණ කාල සීමාව අදියර තුනකින් සමන්විත වන අතර, ඒ එක් එක් අදියර සඳහා කාර්ය සටහනකට සහ අවම මූල්‍ය බැඳීමකට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබේ.

මෙම කාර්යය සඳහා වූ බැඳීමට දත්ත අත් කර ගැනීම සහ නැවත සකස් කිරීම සහ ළිං කැණීම ඇතුළත් වේ. (පළමු අදියර සඳහා ළිං 03ක්, දෙවන අදියර සඳහා ළිං 01ක් සහ තුන් වන අදියර සඳහා ළිං 01ක් වේ.)

4. නිෂ්පාදනය ආරම්භ වීමෙන් පසු නිෂ්පාදනයෙන් සියයට 10ක් රාජ්‍ය භාගය ලෙස සෑම මාසයකම රජයට ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබේ.

5. කොන්ත්‍රාත්කරුට ගවේෂණ සහ සංවර්ධන පිරිවැයෙන් සියයට 100ක් අය කර ගත හැකි අතර පිරිවැය ආපසු ලබා ගැනීම සඳහා නිෂ්පාදන පිරිවැයෙන් සියයට 70ක් උපයෝගී කර ගත හැක. ඉතිරි නිෂ්පාදනය රජය සහ කොන්ත්‍රාත්කරු අතර බෙදා ගනු ඇත.

6. කොන්ත්‍රාත්කරුගේ ලාභ සහ වාසි රජයේ බදුවලට යටත් වේ.

7. රජයට ජාතික තෙල් සමාගමක් පිහිටුවිය හැකි අතර, ඒ සඳහා සියයට 15ක කොන්ත්‍රාත්කරුගේ සහභාගිත්වය ලබා ගත හැක.

8. පරිසරය ආරක්ෂා කිරීම සඳහා වූ පියවර සම්බන්ධයෙන් එකඟතාවන් ඇති අතර, කොන්ත්‍රාත්කරු වාර්ෂික පාරිසරික අරමුදලක් සඳහා දායක විය යුතු ය.

9. කොන්ත්‍රාත්කරු විසින් ලබා ගන්නා සියලු ඛනිජ තෙල් දත්තවල හිමිකම ශ්‍රී ලංකා රජය සතු වන්නේ ය.

10. රජයේ නිෂ්පාදන පංගුව සමස්ත ජාතික ඉල්ලුම සපුරාලීමට හැකි වන තෙක් ජාතික ඉල්ලුම සපුරාලනු පිණිස කොන්ත්‍රාත්කරු සිය කොටස දේශීය වෙළෙඳ පොළට විකිණිය යුතු ය.

(ආ) (i) නැත.

(ii) නැත.

(ඇ) ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය තෙල් ළිං කැණීම ඉතා සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කරනු ලබන අතර, පාලනය ද සිදු කරයි. තෙල් ගවේෂණය පිළිබඳ සියලු තොරතුරු ගනු ලබනුයේ ජනාධිපති ලේකම් ප්‍රධානත්වය දරන ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කමිටුව සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසිනි.

ආදර්ශ ඛනිජ තෙල් සම්පත් ගිවිසුම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ අතර, ශ්‍රී ලංකා රජය සහ කෙයාන් ලංකා (පුද්) සමාගම අතර අත්සන් තැබූ අවසාන ඛනිජ තෙල් සම්පත් ගිවිසුම නීතිපති දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලැබ ඇත.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. මන්නාරම් ද්‍රෝණියේ තෙල් ගවේෂණ කටයුතු අවසන් කර පළමුවැනි නිෂ්පාදනය ලබා ගන්නට බලාපොරොත්තු වන කාල රාමුව මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

කලින් දෙන ලද පිළිතුර පරිදි ඉහත කී කාර්යාංශය හා පෞද්ගලික සමාගම ඒ පිළිබඳව විටින් විට ප්‍රකාශයට පත් කරනවා ඇති.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් කළා මේ නිෂ්පාදනවලින් සියයට 10ක ප්‍රමාණයක් ලංකා ආණ්ඩුවට ලැබෙනවා කියලා. නිෂ්පාදනවලින් සියයට 10ක් කියන්නේ, නිෂ්පාදන බොර තෙල්වලින් ලීටර ප්‍රමාණයක්ද? එහෙම නැත්නම්, ඒ බොර තෙල් විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට 10ක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
එය විස්තරාත්මකව ගිවිසුමේ තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නිෂ්පාදනය ආරම්භ වීමෙන් පසු, නිෂ්පාදනයෙන් සියයට 10ක් -එයට අන්තර්ගත සියලු කොටස්- රාජ්‍ය භාගය ලෙස සෑම මාසයකම රජයට ගෙවන්න කියන එකයි කියන්නේ. ඒ, අනිකුත් ගෙවීම්වලට අතිරේකවයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු ඇමතිතුමා පිළිතුර දෙමින් කිව්වා මේ ගිවිසුම අත්සන් කරලා තිබෙන්නේ කෙයාන් ලංකා පුද්ගලික සමාගම සමඟයි, ඒක ශ්‍රී ලාංකීය සමාගමක් කියලා. නමුත් අපි දන්නවා කෙයාන් ඉන්දියා සමාගම කියලා එකකුත් තිබෙන බව. ඒ සමාගම සහ ලංකාවේ කෙයාන් ලංකා පුද්ගලික සමාගම අතර තිබෙන සම්බන්ධය මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මොකක්ද ප්‍රශ්නය?

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ඒක තමයි ප්‍රශ්නය.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ශ්‍රී ලංකාවේ ලියා පදිංචි සමාගමක් බව අපි ප්‍රකාශ කළා. ඒ ලියා පදිංචි සමාගම සමඟ තමයි මේ කටයුතු කෙරෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ඉන්දියන් සමාගමත් එක්ක තිබෙන සම්බන්ධය මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඉන්දියානු ආයෝජකයකු ඇවිත් ලංකාවේ ආරම්භ කළ සමාගමක් වෙන්න පුළුවන්, ඇමෙරිකන් ආයෝජකයකු ඇවිත් ලංකාවේ ආරම්භ කළ සමාගමක් වෙන්න පුළුවන්, අදාළ ආයෝජනය අනුව. ඊට පස්සේ එය ලංකාවේ ලියා පදිංචි සමාගම් නීතියට යටත් වෙනවා. එයයි ලංකාවේ ලියා පදිංචි කරනවා කියන එකේ අර්ථය. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ කළේ, තෙල් සංස්ථාව තවදුරටත් මේ කටයුතු කළ යුතු නැහැ කියලා ඒ ඔක්කෝම විදේශිකයන්ට දෙන්න ඒ පනත සංශෝධනය කළ එකයි. අපේ රජය ඇවිල්ලා ඒ මහා ජාතික අපරාධය නිවැරදි කළ නිසායි අද රජයට සහ තෙල් සංස්ථාවට මේ සඳහා මැදිහත් වෙන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
කෙයාන් ලංකා සමාගම ඒ මුදල් ටික අරගෙන ඉන්දියාවට නොයවයි කියලා ඇමතිතුමාට සහතිකයක් දෙන්න පුළුවන්ද? අපේ කාලයේ එහෙම වුණාය, මෙහෙම වුණාය කියලා තමුන්නාන්සේ කියනවානේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේලා පනත හැදුවේ ඉන්දියාවට විතරක් නොවෙයි, ඕනෑ මිනිහෙකුට ඇවිල්ලා ඕනෑම ටිකක් ඹුරාගෙන කන්නයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
එතකොට අපේ පනත්,-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
කරු ජයසූරිය නිටපු ඇමතිතුමා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඊට එරෙහිව මාත් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දුන් තීන්දුවෙන් තමයි මේක පොඩඩකින් හරි ගැට ගැහුණේ. අපේ රජය ඇවිල්ලා තමයි මේක නිවැරදි කළේ. තමුන්නාන්සේලා ආණ්ඩුවක් අරන් කරන්න හැදුවේ මහා ජාතික අපරාධයක්. ජනතාව තීරණය කරලා ඒ ආණ්ඩුව ආපහු හරවලා අපේ ආණ්ඩුවක් හැදුවේ නැත්නම් අද ලංකාවේ සියලුම තෙල් සම්ක්ෂණ ළිං සහ එම පර්යේෂණ සියල්ල අපට කිසිම පාලනයක් නොමැතිව තමුන්නාන්සේලා විකුණලා දානවා. ඒකයි කරන්න හැදුවේ. ජනතා විමුක්ති පෙරමුණත් අපත් දෙගොල්ලෝ එකට එකතු වෙලා ඒක වැළැක්වුවා. ඒක නිසා අනුර දිසානායක මන්ත්‍රීතුමාත් ඒකට ටිකක් හවුල්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 2 -2206/'11- (2), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. ඇමති මණ්ඩලය ගැන කථා කරන කොට ඒ වාගේම උත්තරයක් දෙයිද කියලා බලමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ ප්‍රශ්නයට උත්තරය දෙන්න සතුටුයි. නමුත් මෙම ප්‍රශ්නයේ එක් කාරණාවක් සම්බන්ධයෙන් සංඛ්‍යා ලේඛන ලැබී නොමැති නිසා,-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කොටස හැර ඉතිරි ඒවාට උත්තර දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ කොටස හැර උත්තර දෙන්න බැහැ. මොකද, ඊට පස්සේ තව කොටස් තුනක් තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ කැබිනට් මණ්ඩලය පැටව් ගහලා දැන් 68ක් වෙලා තිබෙනවා. ඒ සඳහා සල්ලි කාබාසිනියා කරන විධියට අපට උත්තරය ලබා දෙනවා නම් කොතරම් හොඳද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාට ඒ පිළිබඳව හැමදාම කථා කරන්න ඉඩ තබමින් අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 3 -2437/'12- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම විස්තරාත්මක කරුණු රාශියක් සපයන්නට තිබෙන නිසා මගේ නිලධාරීන් මාස තුනක කාලයක් ඉල්ලා තිබෙනවා. එම නිසා මෙම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

හිඟුරාණ සීනි කර්මාන්තශාලාව : නිෂ්පාදන කටයුතු
ஹிங்குராண சீனித் தொழிற்சாலை : உற்பத்தி நடவடிக்கைகள்
HINGURANA SUGAR FACTORY : PRODUCTION ACTIVITIES

2499/'12

4. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -
(1):

(අ) (i) රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන හිටපු අමාත්‍ය ගරු පී. දයාරත්න මැතිතුමා විසින් හිඟුරාණ සීනි කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු 2011 වර්ෂයේ දී ආරම්භ කරන බවට 2010 ඔක්තෝබර් 7වැනි දින පාර්ලිමේන්තුවේදී කර ඇති ප්‍රකාශය පරිදි ක්‍රියාකර තිබේ නම්, මේ වන විට දිනකට එම කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කරනු ලබන සීනි ප්‍රමාණය කොපමණද;

(ii) සීනි නිෂ්පාදනය ආරම්භ කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හිඟුරාණ සීනි කර්මාන්තශාලාවේ සේවය කරන (වගා අංශයේ හා කර්මාන්තශාලාවේ) මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවක සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන්ගේ වැටුප්, දීමනා, අර්ථසාධක ආදිය නිසි පරිදි ගෙවීමට කටයුතු යොදා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சீனிக் கைத்தொழில் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரச வளங்கள், தொழில் முயற்சி அபிவிருத்தி முன்னாள் அமைச்சர் கௌரவ பி.தயாரத்ன ஹிங்குராண சீனித் தொழிற்சாலையின் உற்பத்தி நடவடிக்கைகளை 2011ஆம் ஆண்டில் ஆரம்பிப்பதாக 2010 ஒற்றோபர் மாதம் 07ஆந் திகதி பாராளுமன்றத்தில் தெரிவித்துள்ள கூற்றுக்கமைய செயற்பட்டிருப்பின் தற்போது அந்த தொழிற்சாலையில் நாளொன்றுக்கு உற்பத்தி செய்யப்படும் சீனியின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) சீனி உற்பத்தி ஆரம்பிக்கப்படவில்லையெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஆ) (i) ஹிங்குராண சீனித் தொழிற்சாலையில் பணிபுரியும் (பயிர்ச் செய்கைப் பிரிவு மற்றும் தொழிற்சாலையில்) மொத்த ஊழியர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) அந்த ஊழியர் எண்ணிக்கை ஒவ்வொரு பதவிக்கமைய வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) இவர்களது சம்பளம், கொடுப்பனவு, சேமலாப நிதியம் என்பவற்றை உரியவாறு செலுத்த நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Sugar Industry Development:

(a) Will he state -

(i) if action has been taken as per the Statement made by the former Minister of State Resources and Enterprise Development, Hon. P. Dayaratna, in Parliament on 7th October, 2010 to the effect that production activities of the Hingurana Sugar Factory would commence in the year 2011, the amount of sugar produced per day at present at the aforesaid factory; and

(ii) if sugar production has not been commenced, the reasons for same?

(b) Will he inform this House -

(i) the total number of employees (in the planting division and the factory) working at the Hingurana Sugar Factory;

(ii) separately, the aforesaid number of employees as per each post; and

(iii) whether action has been taken to pay their salaries, allowances, provident fund et cetera properly ?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - சீனிக் கைத்தொழில் அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Lakshman Senewiratne - Minister of Sugar Industry Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ගල්ඔය වැවිලි සමාගමේ හිඟුරාණ සීනි කර්මාන්ත ශාලාව ලෙස සිය සීනි නිෂ්පාදන කටයුතු 2012 ජූලි මස 16වන දින ආරම්භ කරන ලදි. සීනි නිෂ්පාදන ධාරිතාව දිනකට මෙට්‍රික් ටොන් 160ක් වේ.

(ii) අදාළ නොවේ.

(ආ) (i) කර්මාන්ත ශාලාවේ විවිධ අංශවල සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

වැවිලි අංශය	317
කර්මාන්තශාලා අංශය	258
ශෂ්‍ය විද්‍යා අංශය	152
මානව සම්පත් පරිපාලන	39
ගිණුම්	25
එකතුව	791

(ii) අදාළ විස්තර ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) සී/ස ගල්ඔය වැවිලි (පුද්) සමාගමේ දැනට සේවය කරන සියලුම සේවක මහත්ම මහත්මීන් හට මේ දක්වා වැටුප්, දීමනා හා අර්ථ සාධක යනාදිය නිසි පරිදි ගෙවීමට කටයුතු යොදා ඇත.

(ඇ) අදාළ නොවේ.

සභාමේසය මත තබන ලද ඇමුණුම:

சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :

Annex tabled:

(ආ) 11. සී/ස ගල්ඔය වැවිලි (පුද්) සමාගමේ එස් එස් තනතුරුවල සේවය කරන මුළු සේවක සංඛ්‍යාව

අනු අංකය	තනතුර	සේවක සංඛ්‍යාව
1	ප්‍රධාන විධායක නිලධාරී	1
2	මූල්‍ය කළමණාකරු	1
3	ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී	1
4	ජ්‍යෙෂ්ඨ වැවිලි කළමණාකරු	1
5	සහකාර වැවිලි කළමණාකරු	1
6	වැඩපල කළමණාකරු	1
7	සහකාර ඉංජිනේරු	5
8	කෘෂි සේවා කළමණාකරු	1
9	පාලන විධායක	1
10	ශෂ්‍ය විද්‍යාඥ	1
11	පාලන නිලධාරී	1
12	සහකාර කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන	1
13	කර්මාන්තශාලා මෙහෙයුම් සම්බන්ධීකාරික	1
14	පාලන විධායක කෘෂිකර්ම	1
15	කෘෂි අධිකාරී	4
16	සහකාර ගණකාධිකාරී	1
17	සහකාර කෘෂි අධිකාරී	5
18	සහකාර කෘෂි අධිකාරී (පුහුණු වන්නා)	3
19	විදුලි කළමණාකරු	1
20	ඉංජිනේරු කළමණාකරු	1
21	මෙහෙයුම් කළමණාකරු	1
22	නිෂ්පාදන අධිකාරී	1
23	රහස්‍ය ලේකම්	1
24	ගිණුම් නිලධාරී	1
25	ගිණුම් සහකාර	2
26	ගිණුම් පුහුණු වන්නා	3
27	දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාකරු	1
28	ශෂ්‍ය විද්‍යා සහකාර	1
29	සහකාර විදුලි ශිල්පි	1
30	සහකාර වාහන විදුලි ශිල්පි	2
31	සහකාර විදුලි වෘද්ධුමිකරු ක්‍රියාකරු	4
32	සහකාර කාර්මික ශිල්පි	5
33	සහකාර පෘස්තුම් ශිල්පි	7
34	වාහන පින්තාරුකරු	1
35	බොයිලේරු ක්‍රියාකරු	1
36	සංචාරක නිවාස භාරකරු	1
37	සංචාරක නිවාස සහායක	1
38	සුපවේදී	3
39	වඩුකාර්මික	3
40	වඩුකාර්මික සහායක	1
41	වඩුකාර්මික/පෙළඹරු	2
42	කේන්ද්‍රාපසාරී ක්‍රියාකරු/වෘද්ධුමිකරු සහායක	1
43	සිවිල් ඉංජිනේරු	1
44	ක්ලැයිෆයර් උපස්ථායක	1
45	පොඹකර ක්‍රියාකරු	1
46	සැලසුම් ශිල්පි/තාක්ෂණික නිලධාරී	1
47	පියඳුරු	5
48	වෘද්ධුමිකරු/ක්‍රියාකරු	10
49	වෘද්ධුමිකරු/ක්‍රියාකරු සහායක	2
50	කර්මාන්තශාලා සහායක	24
51	ක්ෂේත්‍ර නිලධාරී	19
52	ක්ෂේත්‍ර නිලධාරී සහකාර	4
53	ගිනි නිවීමේ යන්ත්‍ර ක්‍රියාකරු	2
54	ගිනි නිවීමේ යන්ත්‍ර සහායක	2
55	විදුලි වෘද්ධුමිකරු / ක්‍රියාකරු	10
56	විදුලි වැඩ නායක	1
57	වාෂ්පිකරණ ක්‍රියාකරු/වෘද්ධුමිකරු පුහුණු වන්නා	2
58	මානව සම්පත් හා වැටුප් ලේඛන සහකාර	1

[ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා]

59	මානව සම්පත් සහකාර	3
60	මානව සම්පත් නිලධාරී	1
61	කෘෂි පුහුණු වන්නා	4
62	යුෂ පිරිපහදු කිරීමේ සහායක	2
63	යුෂ පිරිපහදු කිරීමේ ක්‍රියාකරු/වැද්දුම්කරු පුහුණුවන්නා	2
64	රසායනාගාර විශ්ලේෂක	2
65	රසායනාගාර රසඳු	1
66	හුණු උපස්ථායක පුහුණුවන්නා	1
67	කම්කරු	264
68	පරීවල්කරු	1
69	යන්ත්‍ර ශිල්පී	2
70	යන්ත්‍ර ශිල්පී/වැද්දුම්කරු	4
71	නඩත්තු ඉංජිනේරු	1
72	යාන්ත්‍රික ඉංජිනේරු	4
73	මිල් උපස්ථායක	1
74	වාත්තුකරු	2
75	මඩ පිරිපහදු කිරීමේ උපස්ථායක/වැද්දුම්කරු සහායක	1
76	කළමණාකරණ සහකාර	27
77	කළමණාකරණ සහකාර 11	1
78	කළමණාකරණ සහකාර පුහුණුවන්නා	5
79	කළමණාකරණ සහකාර/සෞඛ්‍ය නිලධාරී	2
80	පෙදෙරේරු	16
81	පෙදෙරේරු සහායක	7
82	කාර්මික ශිල්පී	2
83	කාර්මික සහායක	8
84	වාහන කාර්මික / විදුලිශිල්පී	1
85	ක්‍රියාකරු වැද්දුම්කරු සහායක	9
86	ස්ථානභාර නිලධාරී ජල සැපයුම්	1
87	කාර්යාල කාර්ය සහායක	11
88	ජලනල සහායක	1
89	යන්ත්‍ර ක්‍රියාකරු	3
90	යන්ත්‍ර ක්‍රියාකරු සහායක	1
91	විදුලි බලාගාර ක්‍රියාකරු/වැද්දුම්කරු	1
92	නිෂ්පාදන වැඩනායක පුහුණුවන්නා	3
93	පොම්ප ක්‍රියාකරු /සහායක	1
94	පොම්ප ක්‍රියාකරු	1
95	මිලදීගැනීම් සහායක	1
96	මිලදීගැනීම් විධායක	1
97	මිලදීගැනීම් නිලධාරී	1
98	ජ්‍යෙෂ්ඨ අයකැමි	1
99	ගබඩාභාරකරු	2
100	වාර කම්කරු	20
101	ජ්‍යෙ සෞඛ්‍ය නිලධාරී	5
102	සේවා සහායක	4
103	සේවාකරු	1
104	ගබඩාකරු	9
105	වැඩපරීක්ෂක	4
106	සනිපාරක්ෂක	1
107	පරිසර සංවර්ධන වැඩපරීක්ෂක	1
108	සැසඳුම් ලිපිකරු	1
109	සාක්ෂණික සහකාර	1
110	ටින්කර්කරු	1
111	ටින්කර්කරු සහායක	1
112	ට්‍රැක්ටර් රියදුරු	34
113	ට්‍රැක්ටර් රියදුරු/කර්මාන්තශාලා සහායක	1
114	ට්‍රැක්ටර් රියදුරු/ සහායක	10
115	ටයර් කාර්මික/සහායක	5
116	දොඹකර ක්‍රියාකරු පුහුණුවන්නා	2
117	බෑන් කිරීමේ වැඩ පරීක්ෂක	2
118	කේදාපසාරි ක්‍රියාකරු/වැද්දුම්කරු පුහුණුවන්නා	3
119	ක්ලැරිෆයර් උපස්ථායක/වැද්දුම්කරු සහායක පුහුණුවන්නා	2
120	වැද්දුම්කරු පුහුණුවන්නා	2
121	රසායනාගාර විශ්ලේෂක පුහුණුවන්නා	2
122	මැසීමේ යන්ත්‍ර ක්‍රියාකරු/වැද්දුම්කරු පුහුණුවන්නා	2
123	ටීක්ත උළුන් ක්‍රියාකරු /වැද්දුම්කරු පුහුණුවන්නා	2
124	ඊර්බයින් ක්‍රියාකරු/වැද්දුම්කරු	1
125	ටීක්ත උළුන් ක්‍රියාකරු	3
126	මූරකරු	71
127	මූරකරු/කම්කරු	4
128	ජල පාලක	4
129	පසස්සුම්කරු	5
130	පසස්සුම්කරු පුහුණුවන්නා	1
131	පසස්සුම්කරු සහායක	6
132	පසස්සුම්කරු /වැද්දුම්කරු	10
133	ආංගන වැඩපරීක්ෂක /කළමණාකරණ සහකාර	4
	මුළු එකතුව	791

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

බොහොම ස්තුතියි ගරු සීනි කර්මාන්ත සංවර්ධන ඇමතිතුමනි.

පෞද්ගලික අංශයත් යම් කිසි විධියකින් මේකට සම්බන්ධ වෙලා තිබෙනවා ද නැත්නම් තනිකරම රජය විධියට මේ කර්මාන්ත ශාලාවේ වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවාද කියා මා ඔබතුමාගෙන් අහන්නට කැමතියි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

මේ ආයතනය තිබුණේ රජය යටතේ. රජයට තිබෙද්දී, 1993 දී අපි මේ ආයතනය වික්කා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමාත් එක්කම.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

තමුන්නාන්සේ වෙනම ප්‍රශ්නයක් හැටියට වික්ක හැටි ඇහුවොත්, විකුණපු හැටි මම ලස්සනට කියලා දෙන්නම්. විකුණලා අවුරුදු දෙකකින් බැංකුවෙන් මිලියන අටසියයකුත් අරගෙන වීරබාහු මහත්මයා රටින් පැන්නා. එදා වැහුණු කොම්පැනිය,- [බාධා කිරීමක්] නැහැ, ඒ පැල්වත්ත. නොදන්නා දේවල් කථා කරන්න එපා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

සීනි පිළිබඳව ඔස්තාද්ලා දැන් ඉන්නේ. සීනි පිළිබඳ ඔස්තාද්.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

මෙහෙම නේ මගේ හිතවත් මන්ත්‍රීතුමා. මුහුදේ ඉන්න තෝරු මෝරුන්ට අමාත්‍යාංශයක් තිබෙනවා. ඒකට අපි කියනවා, ධීවර අමාත්‍යාංශය කියලා. කැලේ ඉන්න සතුන්ට -කොටි, ගැරඬි, නරින්ට - අමාත්‍යාංශයක් තිබෙනවා. ඒකට අපි කියනවා වනජීවී අමාත්‍යාංශය කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක සොයිසා ඇමතිතුමාට තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

මහවැලියට හැදුවා, මහවැලි අමාත්‍යාංශය. අද අපි ඒ නිසා හාල් පිට රටින් ගෙනෙන්නේ නැහැ. ඉන්ධන ගෙන්වන එක ළඟට, කෝටි 6,500ක වැඩිම විදේශ විනිමයක් වියදම් වෙන්නේ සීනි ගෙන්වන්නයි. ඉතින් මොකක්ද රජයේ බලාපොරොත්තුව? රජයේ බලාපොරොත්තුව ඒක නතර කරන්න එකයි. හිඟුරාන සීනි කර්මාන්තශාලාව ගැන කථා කරද්දී, එහි සියයට 49ක් පෞද්ගලික

අංශයේ, සියයට 51ක් රජයේ. අවුරුදු කීපයකට පස්සේ ගිය අවුරුද්දේ අපි එහි සීනි නිෂ්පාදනය කරන්න පටන් ගත්තා. ඒ නිෂ්පාදනය පටන් අරගෙන දවස් හැටයි වැඩ කරන්න පුළුවන් වුණේ. මා මේ අමාත්‍යාංශය බාර අරගෙන දැනට මාස ගණනාවක් වෙනවා.මේ අවුරුද්ද ඉවර වෙද්දී හෙක්ටයාර් 2,000ක උක් නිෂ්පාදනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. තව අවුරුද්දක් යද්දී හෙක්ටයාර් 4,000ක් වගා කරන බවට මම සහතික වෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා හිටියොත් ඔතැන.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉන්නවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කිව්වේ, වෙන ඇමතිකමක් දුන්නොත් එහෙම මම දන්නේ නැහැ මොකක්ද වෙන්නේ කියලා. වෙන ඇමතිකමක්.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මොකක් වුණත් කරනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා කිව්වා,- [බාධා කිරීමක්] ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාට තිබෙන අමාරුව මොකක්ද? ඔබතුමාට අමාරුවක් තිබෙනවාද? පොඩ්ඩක් ඉන්න කෝ කලබල වෙන්නේ නැතුව. ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාටත් මොකක් හරි නියෝජ්‍ය ඇමතිකමක් දෙන්නකෝ. ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාටත් මොකක් හෝ උත්තරයක් දෙන්න පොඩි ඇමතිකමක් දෙන්න. එතකොට හරි යනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇමතිතුමා කිව්වා, මාළුන් සඳහා ධීවර ඇමතිකමක්, සත්තු සඳහා වෙනම ඇමතිකමක් තිබෙනවා කියලා. සත්තු ටික-

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
අපි දැන් කථා කරමුකෝ සීනි ගැන. අපේ පරණ යූඑන්පී ආණ්ඩුව කාලයේනේ පැල්වත්ත, සෙවණගල කර්මාන්තශාලා දුන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉන්නකෝ මම අතුරු ප්‍රශ්නය අහනතුරු.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
අපට පුළුවන් වුණා, මාස දහයෙන් මේ කර්මාන්තශාලා හදලා ගන්න. රුපියල් කෝටි 800ක, රුපියල් කෝටි 900ක ලාභ ලබන තත්ත්වයට ගන්න අපට පුළුවන් වුණා, මාස දහයෙන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි. ඉතින්, සත්තු එක ඇමති කෙනෙකුට දීලා, වනාන්තර තව එක් කෙනෙකුට දුන්නේ ඇයි?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக්ෂ්මන් செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඒක මෙහෙම නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සත්තු සොයිසා ඇමතිතුමාට දීලා, වනාන්තර දුන්නා සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට. එතකොට ඒක හොඳයි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக්ෂ්මන් செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඒක අපි වෙනම කථා කරමු. [බාධා කිරීමක්] සතා කොහේද ඉන්නේ, වනාන්තරය කොහේද තිබෙන්නේ කියලා අපි වෙනම කථා කරමු. අපි දැන් කථා කරමු උක් කර්මාන්තය පිළිබඳව.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ගොඩක් මහන්සි වෙන බව අපට පෙනෙනවා, ඇහත් පොඩ්ඩක් අඩු වෙලා තිබෙන තත්ත්වයක් එක්ක.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக්ෂ්මන් செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
නැහැ, ඒක ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාට ඒකට වෙනම උත්තරයක් දෙන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා සීනිත් සමඟ සිටින නිසා මධුමේහය නොසෑදේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ඔබතුමන්ලා අලුතින් යෝජනාවක් ගෙනැත් තිබෙනවා, මාස් කන්නයේ වී වගා කරන්න බැහැ, වී වගා කරන ස්ථානවල උක් වගා කරන්න කියලා.

මොකක්ද ඒ වැඩ පිළිවෙළ? එතකොට ලංකාවේ වී නිෂ්පාදකයන්ට වී නිපදවන්න බැහැ?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නොදන්න දෙයක් ගැනයි මේ කථා කරන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
"වී වැව්වොත් හිරේ - උක් වවපන් කුඹුරේ." මේ යෝජනාවේ තිබෙන්නේ එහෙමයි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඔබතුමාට මා කියා දෙන්නම්. ඔබතුමා මේක අහන්න. උක් කර්මාන්තශාලාවලට ඉඩම් වෙන් කරද්දී නීතියක් දැම්මා. මොකක්ද? ඒ ඉඩම් ගොවියාට දුන්නේ උක් වගා කිරීම සඳහා පමණයි කියන කොන්දේසිය මත. ඒ කොන්දේසිය දැම්මේ කොයි කාලයේද දන්නවාද? අපේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ. ඒක හරි. ඒක හරියටම හරි. මොකද, කෝටි ගණනක factory එකක් හදලා, ඒකට අවශ්‍ය විධියට හෙක්ටයාර් 5,000ක උක් නිෂ්පාදනයක් කරලා ඒ factory එකට දුන්නේ නැත්නම් මොකද වෙන්නේ? ඒ factory එක වැහෙනවා. තවත් සීනි පිට රටින් ගෙනෙන්න වෙනවා. ඒ පදනම මතයි කොන්දේසිය දැම්මේ.

අවුරුදු ගණනක් ඒ factory එක වහලා තිබුණා නේද, ඒ ප්‍රදේශයේ උක් වගා කරපු ගොවියෝ වී ගොවිතැන පටන් ගත්තා. අපේ පරණ එක්සත් ජාතික පක්ෂයට පින් සිද්ධ වෙන්න ඒ factory එක වහලා දාපු නේද අවුරුදු විසි ගණනක් උක් වගා කරපු ගොවියන්ට සිද්ධ වුණා තැනින් තැන වී වගා කරලා ජීවිකාව කර ගන්න. නමුත් ආපසු මේ factory එක පටන් ගත්තාට පස්සේ ගොවීන්ට නීතිය අනුව සිද්ධ වනවා උක් වගා කරන්න. නමුත් වී ගොවිතැන කරපු ගොවියෝ පිරිසක් ඉන්නවා. මා ගිහින් තින්දුවක් දුන්නා, මේ කන්නයේ වී වගා කරපු කට්ටියට වගා කර ගන්න දෙන්න කියලා. එක සාධාරණයි නේ. හැබැයි එක දෙයක් අමතක කරන්න එපා. වී ගොවියා ලබන ආදායම වාගේ තුන් ගුණයක් ගන්නවා උක් ගොවියා. මේ කන්නයේ වී වගා කළ ගොවි මහත්වරු ටික වී වගා කර ගත්තා. ඒක සාධාරණයි. ඒකට දොස් කියන්න අවශ්‍ය නැහැ. මම පසු ගිය සතියේ ගිහින් කිව්වේ, ඒ ටික කර ගෙන යන්න දෙන්න කියලා. ඔවුන් ඒ ආදායම ලබා ගත්තාට පස්සේ, ඒ උදව්යට ලබන කන්නයට අවශ්‍ය පහසුකම් ටික දීලා උක් වගා කරන්න උදව් කරනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය molasses පිළිබඳවයි. හිඟුරාන සීනි කර්මාන්තශාලාවේ molasses පාවිච්චි කරන්නේ කවුද? ලංකාවට ගෙනෙන ස්ප්‍රීතු වෙනුවට ඔය ස්ප්‍රීතු ටික දෙන්න බැරිද? ඇමතිවරු ස්ප්‍රීතු කන්ටේනර්වලට ගහ ගන්නවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඇමතිවරු ගහ ගන්න චිත්තිය නම් මම දන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගහ ගන්නේ එක එක එෆ්එම් නාලිකාවලින්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක වෙලා තිබෙන්නේ මෙහෙමයි. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එෆ්එම් නාලිකා තිබෙනවා නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මම ප්‍රශ්නයට උත්තර දෙන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ මාධ්‍ය මේ මාධ්‍යයට ගහනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් මෙතැන විවාදයක් බවට පරිවර්තනය වෙලායි තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ස්ප්‍රීතු ගැන මම කියන්නම්.

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ස්ප්‍රීතු කියන කොටම නැඟිටින්නේ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමායි. එතුමාත් සම්බන්ධයිද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් දෙන්නම මේක විවාදයක් කර ගත්තා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා ඉඳ ගන්න කෝ. සීනි කර්මාන්ත සංවර්ධන ඇමතිතුමාගෙනුයි මම ප්‍රශ්නය ඇහුවේ. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! අනවශ්‍ය දේවල් කියන්නේ නැතුව ප්‍රශ්නය අහන්න. ගරු ඇමතිතුමනි, අහපු ප්‍රශ්නයට ඔබතුමා පිළිතුරු දුන්නාද ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රශ්නය අහලායි තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා උත්තර දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුරු දීලා අවසන්ද?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
තවම උත්තර දෙන්න බැරි වුණා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පිළිතුරු දෙන්න එපා යැ. වෙන ස්ත්‍රීතුකාරයෝ පනිනවා නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මගේ රජය මම ආරක්ෂා කරන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ වෙන ස්ත්‍රීතුකාරයෝ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඒක සම්පූර්ණ වැරැදියි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ස්ත්‍රීතු කොච්චර ගෙනාවාද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපේ රජය එහෙම කරන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා සේලයින් වෙනුවට ස්ත්‍රීතු ගෙනාවාද? [බාධා කිරීමක්] එහෙම ගෙනැල්ලා නැත්නම් ඉඳගන්න.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට එක දෙයක් ප්‍රකාශ කරන්න ඕනෑ. මතක තියා ගන්න මේ රටට spirits ලීටර් මිලියන 40ක් අවශ්‍යයි. අපි භාර ගත්තාට පස්සේ ගිය අවුරුද්ද ඇතුළත අපට නිෂ්පාදනය කරන්න පුළුවන් වුණා, ලීටර් මිලියන 12ක්. හිඟුරාන සීනි කර්මාන්තශාලාවේ හදන molasses නිෂ්පාදනය කරන්න distillery එකක් නැති හින්දා හිඟුරාන සීනි කර්මාන්තශාලාවේ හදන ටිකත් මම පැල්වත්තට අරගෙන ඇවිල්ලා spirits හරි ගස්සනවා. මෙතැන හිඟයක් තිබෙනවා. ඒ හිඟය ලංකාවට ගෙනෙන්න අවශ්‍යයි. මෙතැනදී කාටවත් ඇඟිල්ල දිගු කරන්න එපා. ඒක වැරැදියි. හොරු ඉන්නවා. නැත්නේ නැහැ.

අර ඔක්කොම කුණු බෙංගාල බොක්කට කිව්වා වාගේ, මොනවා හෝ දෙයක් වෙලා කවුරුන් හෝ පාරේ මැරිලා වැටුණත් තමුන්නාන්සේලා ඇඟිල්ල දික් කරන්නේ කොහේටද? ආණ්ඩුවටයි. ඒක, මමත් ඔය පැත්තේ සිටියදී කරපු දෙයක්. ඔය පැත්තේ සිටියදී ඒක අපේ job එක. නමුත් එහෙම ඇඟිල්ල දික් කරන්න එපා. ප්‍රශ්නයක් තිබෙන්නේ, හිඟයක් තිබෙන එකේයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා තමයි අපට කිව්වේ, හොඳට වැඩේ කරන්න කියලා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඔබතුමාට කියන්න දෙයක් තිබුණේ නැහැ. ඔබතුමා ඒක ඉගෙන ගෙනයි ආවේ. ඔබතුමා හොඳට ඉගෙන ගෙන ආපු කෙනෙක්.

ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු තුනක්, අවුරුදු හතරක් යද්දී ඔය හිඟය නැති වෙනවා. නමුත් එවැනි හිඟයක් තිබෙනවා. රටට අවශ්‍ය සියයට 60ක් පමණ වන හිඟ ප්‍රමාණය මෙම අවස්ථාවේදී රටට ගෙන්වන්න ම වෙනවා. හැබැයි අපි නිෂ්පාදනය කරන ඒවා විකුණා අවසන් වුණාට පස්සේ තමයි හිඟ ඒවා ගෙන්වන්න පුළුවන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

නැබඩ, කැන්දකඩුව ග්‍රාමීය රෝහල : සම්පත් ඌනතාව

நேபட கென்தகடுவ கிராமிய ஆஸ்பத்திரி : வளப் பற்றாக்குறை

NEBADA KENDAKADUWA RURAL HOSPITAL : SHORTAGE OF RESOURCES

1976/'11

7. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) කලුතර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති නැබඩ, කැන්දකඩුව ග්‍රාමීය රෝහලෙහි පවතින භෞතික හා මානව සම්පත්වල ඌනතාවයන් නිසා එය වැසී යාමේ අවදානමකට මුහුණ පා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එහි පවත්නා අඩු පාඩු කඩිනමින් සම්පූර්ණ කර ප්‍රදේශයේ ජනතාවට යහපත් සෞඛ්‍ය සේවාවක් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) එලෙස වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) களுத்துறை மாவட்டத்தில் அமைந்துள்ள நேபட கென்தகடுவ கிராமிய ஆஸ்பத்திரியில் நிலவுகின்ற பௌதிக மற்றும் மனித வளங்களின் பற்றாக்குறையின் காரணமாக அது மூடப்படும் ஆபத்துக்கு முகங்கொடுத்துள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) இங்கு காணப்படுகின்ற குறைபாடுகளைத் துரிதமாகப் பூர்த்திசெய்து பிரதேசவாழ் மக்களுக்குச் சிறந்த சுகாதாரச் சேவையினைப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) இதற்காக திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், இதற்காக நிதி ஏற்பாடுகள் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறு ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that the Nebada Kendakaduwa Rural Hospital situated in Kalutara District, is faced with the risk of being closed down as a result of the shortages of physical and human resources that exist at that hospital?

(b) Will he inform this House -

(i) whether action will be taken to remedy the existing shortcomings expeditiously and provide a better health service to the people of the area;

(ii) whether plans have been made for that;

(iii) if so, whether provisions have been allocated for that; and

(iv) of the amount of money so allocated?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) කැන්දකඩුව ග්‍රාමීය රෝහලෙහි පවතින සම්පත්වල ඌනතාවක් නොමැත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම රෝහලෙහි බාහිර රෝගී අංශයෙන් දිනකට 80ක්, 90ක් පමණ ප්‍රතිකාර ගන්නවා. සායනයට රෝගීන් 20ක්, 30ක් පමණ ඉන්නවා. නේවාසික රෝගීන් දෙදෙනෙක් පමණ ඉන්නවා. ගිය අවුරුද්දේ කිසිම දරුවකු ඉපදිලා නැහැ. වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙක් ඉන්නවා. දන්ත ශල්‍ය වෛද්‍යවරුන් දෙදෙනෙක් ඉන්නවා. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් තුන්දෙනෙක් ඉන්නවා. ළමයින් ඉපදුණේ නැතත්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් තුන්දෙනෙක් ඉන්නවා. ඔවුන් සඳහා රජය සම්පූර්ණයෙන් වැටුප් ගෙවනවා. හදිසියේ කෙනෙක් සූතිකාගාරයට ආවොත් ඔවුන්ව සේවයේ යොදවන්න ඕනෑ. එක් ඖෂධ සංයෝජකයෙක් ඉන්නවා. එක් උපස්ථායකයෙක් ඉන්නවා. එක් මුරකරුවෙක් ඉන්නවා. සාමාන්‍ය කම්කරුවෝ තුන්දෙනෙක් ඉන්නවා. සෞඛ්‍ය කම්කරුවෝ පස්දෙනෙක් ඉන්නවා. සාමාන්‍යයෙන් දන්ත සායනයෙන් දවසකට ප්‍රතිකාර ගන්න 20දෙනෙක් පමණ එනවා. එයට එක් වෛද්‍යවරයෙක් ඉන්නවා.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

2013 වසරේ රෝහලේ වාට්ටුවල අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීමට සැලසුම් කර ඇත.

(iii) සහ (iv) සංවර්ධන කටයුතු සඳහා රුපියල් 1,000,000ක් වෙන් කිරීමට සැලසුම් යෝජනා සකස් කර ඇත.

(ඇ) පැන නොනඟී.

මීට අමතරව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරිතුමා විසින් පරිත්‍යාගශීලීන්ගෙන් රුපියල් ලක්ෂ 20ක පමණ මුදලක් එකතු කර ගෙන තිබෙනවා. මේ රෝහල පළාත් සභා රෝහලක් වුණත්, වතු ජනතාවට සේවය කරන රෝහලක් නිසා සෞඛ්‍ය අමාත්‍යාංශය වශයෙන් අපටත් උදව් කරන්න පුළුවන්කම ලැබෙයි.

මේ රෝහලට ගිලන් රථයක් ලබා දීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒක ඉදිරි කාලයේදී ලබා දෙන්න ඕනෑ. එතකොට නේවාසික රෝගීන් රැගෙන යාමේ ප්‍රශ්නය විසඳෙනවා. මේ රෝහලේ කටයුතු ප්‍රමාණවත්ව සිදු වනවා. ඒකේ වෙනසක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, 2012 වසරේ සිට අලුත්වැඩියා කටයුතු කරලා තිබෙනවා. ජල ටැංකිය සකස් කිරීම සඳහා පමණක් රුපියල් ලක්ෂ 3ක් වැය වෙලා තිබෙනවා. කොරිඩෝව සහ රෝහලේ වහල අලුත්වැඩියාවට රුපියල් ලක්ෂ පහක් වෙන් කරලා ඒ කටයුතු කරලා තිබෙනවා. හැම අවුරුද්දේම මේ රෝහලේ යම් යම් සංවර්ධන කටයුතු කරලා තිබෙනවා .

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ රෝහලට ගිලන් රථයක් නැති ප්‍රශ්නය අහන්න හදන කොටම ගරු නියෝජ්‍ය ඇමතිතුමා ගිලන් රථයක් ලබා දෙන්න කටයුතු කරනවාය කිව්වා. ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කියන්න පුළුවන්ද, 2013 අවුරුද්දේ මොන කාලය වෙන කොට ගිලන් රථයේ ඌනතාව සම්පූර්ණ කරන්න පුළුවන්ද කියලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ගිලන් රථ ප්‍රමාණයක් වරායට ඇවිල්ලා තිබෙනවා. රෝහල් විශාල සංඛ්‍යාවකට ඒවා

ලබා දෙන්න පුළුවන්. ප්‍රධාන රෝහලකට අලුත් ගිලන් රථයක් ලැබෙන කොට පාවිච්චි කරපු ගිලන් රථය මේ වාගේ රෝහලකට යොදා ගන්න පුළුවන්. අන්න ඒ විධියේ ක්‍රමවේදයක් අපි අනුගමනය කරනවා. නව ගිලන් රථ 150ක්, 200ක් පමණ ලැබී තිබෙනවා. එතකොට ඒ අවශ්‍යතාව ඉටු කරන්න පුළුවන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාම සඳහන් කරන්නට යෙදුණා, 2013 අවුරුද්දේ මෙහි පිළිසකර කටයුතු සඳහා - අලුත්වැඩියා කටයුතු සඳහා- මුදල් වෙන් කරන්න සැලසුම් කරලා තිබෙනවා කියලා. සැලසුමක්ද තිබෙන්නේ? මුදල් වෙන් කරලාද තිබෙන්නේ? ඒ මුදල්වලින් වැඩ කටයුතු අවසන් කරන්න බලාපොරොත්තු වන්නේ 2013 අවුරුද්දේ කොයි කාලය වෙන කොටද?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, වයි.ඩී. නිහාල් ජයතිලක කියන වෛද්‍යවරයා තමයි අපට මේ තොරතුරු එවලා තිබෙන්නේ. ඒ අනුව සැලසුම් කරලා යවලා තිබෙනවා. එතකොට පළාත් සභාවෙන් අනුමත කළාට පසුව වැඩ කටයුතු ආරම්භ කළ හැකියි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
2013 වසරේ ඉවර කරන්න පුළුවන්?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
බොහෝවිට පුළුවන් වෙයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 8 -2208/' 11 - (2), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මහමෝදර ශික්ෂණ රෝහල : ළදරු මරණ
மஹமோதர போதனா வைத்தியசாலை : சிசு மரணங்கள்
MAHAMODARA TEACHING HOSPITAL : INFANT DEATHS

2438/'12

9. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) දකුණු පළාතේ ප්‍රධාන මාතෘ රෝහලක් වන ගාල්ල මහමෝදර ශික්ෂණ රෝහලට එක් මසකදී ඇතුළු වන ගැබිනි මව්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහලේ ප්‍රසූතිකාගාර ජීවානුහරණයට ලක් කරන්නේද;

(iii) 2012 ජනවාරි සිට මාර්තු දක්වා කාල සීමාවේදී එම රෝහලේ නොමේරූ ළදරු ඒකකයේ සිදුවූ ළදරු මරණ සංඛ්‍යාව කොපමණද;

(iv) එම ළදරු මරණවලට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මහමෝදර රෝහලේ නොමේරූ ළදරු ඒකකයේ ප්‍රතිකාර ලබන ළදරුවන්ට ප්‍රමාණවත් ජීවිත සුරක්ෂිතභාවයක් ලැබෙන බව සහ එහි කාර්ය මණ්ඩලය වගකීමෙන් තම සේවය ඉටු කරන බව එතුමා සහතික කරන්නෙහිද?

(ඇ) (i) රෝහලේ පැවති අඩුපාඩු හේතුවෙන් ළදරුවන් මියයෑම වැනි අභාග්‍යසම්පන්න සිදුවීම් ඇති නොවීම සඳහා එම රෝහලේ තත්ත්වය වැඩිදියුණු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්,ඒ මන්ද?

සුකාදාර අමෙච්සරෙක් කේට්ට වීනා:

(අ) (i) තෙන් මාකාණත්තින් පිරතාන පිරසව වෛත්තියසාලෙයාන කාලි මහමෝතර පෝතනා වෛත්තියසාලෙයිල් මාතමොන්රුක්කු අනුමතික්කප්පටුම් කර්ප්පිණිත් තාය්මාර්කළින් එණ්ණික්කෙ එව්වළවු එන්පතෙයුම්;

(ii) අන්ත වෛත්තියසාලෙයිල් පිරසව අරෙකළ් නෝය්ක්කිරුමිකළර්ර නිලෙක්කු උට්පටුත්තප්පටුකින්රතා එන්පතෙයුම්;

(iii) 2012 සනවරි තොටක්කම් මාර්චු මාතම් වරෙයාන කාල එල්ලෙක්කුළ් අන්ත වෛත්තියාසලෙයින් කුරෙමාතක් කුළන්තෙකළ් පිරිවිල් ඒර්පට්ට මරණංකළින් එණ්ණික්කෙ එව්වළවු එන්පතෙයුම්;

(iv) අන්ත සිසු මරණංකළුක්කාන කාරණංකළ් යාවෙ එන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ආ) මහමෝතර වෛත්තියසාලෙයින් කුරෙමාතක් කුළන්තෙකළ් පිරිවිල් සිකිච්සෙ පෙරුම් කුළන්තෙකළුක්කු පෝතියළවු උයිර් පාතුකාප්පු ඉරුප්පතෙයුම් මර්රුම් අංකුළ්ළ පතිවියණියිනර් මිකවුම් පොරුප්පුටන් තමතු කටමෙකළෙ ආර්රුකින්රාර්කළ් එන්පතෙයුම් අවර් උරුතිප්පටුත්තුවාරා?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

(இ) (i) வைத்தியசாலையில் நிலவிய குறைபாடுகள் காரணமாக குழந்தைகள் மரணமடைவது போன்ற துர்ப்பாக்கியமான சம்பவங்கள் இடம்பெறாதவாறு அந்த வைத்தியசாலையின் நிலைமையை மேம்படுத்த நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) அவ்வாறெனில், அதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state -

(i) the number of expectant mothers admitted per month to the teaching hospital at Mahamodara in Galle, which is a main maternity hospital in the Southern Province;

(ii) whether the labour rooms in the aforesaid hospital are sterilized;

(iii) the number of infant deaths that occurred in the premature baby unit of the aforesaid hospital during the period from January to March in 2012; and

(iv) the reasons for the aforesaid infant deaths?

(b) Will he assure that the lives of the babies that receive treatment at the premature baby unit of the Mahamodara Hospital are safe and the staff of the aforesaid unit perform their duties with responsibility ?

(c) Will he inform this House -

(i) whether steps will be taken to uplift the condition of the aforesaid hospital in order to avoid unfortunate incidents like the deaths of infants, which occur due to the shortcomings of the hospital; and

(ii) if so, the period of time that will be taken for it ?

(d) If not, why ?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) මෙම රෝහලට එක් මසකදී ගැබිණි මවුවරුන් 1361ක් ඇතුළත් වේ.

(ii) ඔව්.

(iii) 2012 ජනවාරි සිට මාර්තු දක්වා නොමේරු ළදරු ඒකකයේ ළදරු මරණ 20ක් සිදු වී ඇත.

(iv) එම ළදරු මරණවලට හේතු වන්නේ;

* අතිශයින්ම නොමේරූ ළදරු උපත්.

* සංජානනීය සංකූලතා.

* විෂබීජයක් ශරීරගත වීම.

* උපතේදීම හුස්ම ගැනීමට අපහසු වීම.

මොකද, මේ නොමේරු ළදරු ඒකකයට ඇතුළත් කරන දරුවන්ගේ ජීවිත බොහෝවිට තිබෙන්නේ සියයට 50යි, 50යි. සමහර වෙලාවට සියයට 75යි, 25ත් වන්නට පුළුවන්. ඒ නිසා නියමිත දිනයට කලින් අඩු වයසෙන් ඉපදුණු ළමයින්ට ප්‍රතිකාර කරලා ඒ ජීවිත බේරා ගැනීම සඳහා තමයි මෙම නොමේරූ ළදරු ඒකකය පිහිටුවා තිබෙන්නේ. එහි විවිධ සංකූලතා තිබෙන දරුවන් සිටිනවා. එහිදී ප්‍රතිකාර ලබා දීලා සුවපත් කරන්න පුළුවන් අවස්ථාත් තිබෙනවා; සුවපත් කරන්න බැරි වන අවස්ථාත් තිබෙනවා.

(ආ) ඔව්.

(ඇ) (i) ඔව්.

(ii) 2012 වසරේ අප්‍රේල් මාසයේ අලුත්වැඩියා කටයුතු සිදුකර 2012.07.02 දින නැවත ළදරු රෝගී සත්කාරක කටයුතු ආරම්භ කර ඇත.

(ඈ) පැන නොනඟී.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් හොඳින් දන්නවා, මහමෝදර රෝහල දකුණු පළාතටත් ඒ වාගේම රටටත් ලොකු සම්පතක් බව.

විශේෂයෙන්ම ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම රෝහලේ දැඩි සත්කාර ඒකකයේ වහල කඩා වැටීමේ අවදානමක් තිබෙන නිසා දැන් දැඩි සත්කාර ඒකකය පවත්වාගෙන යන්නේ ශල්‍යාගාරය ඇතුළේ. මේ අවදානම වසර එකහමාරක සිට තිබෙනවා. පසු ගිය මාස හය තුළම මේ දැඩි සත්කාර ඒකකය පවත්වා ගෙන ගියේ ශල්‍යාගාරය ඇතුළේ. වෙනදා දැඩි සත්කාර ඒකකයේ ඇඳන් පහක් තිබුණා. දැන් ඇඳන් දෙකයි ක්‍රියාත්මක වෙන්නේ. මා අහන්න කැමැතියි ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමාගෙන් විශේෂයෙන්ම ආසියාවේ ආශ්චර්ය බවට අපේ රට පත් කරන මේ මොහොතේ, දකුණු පළාතේ ජනතාවගේ ආශ්චර්ය බවට පත් වෙලා තිබෙන මහමෝදර රෝහලේ වසර එකහමාරක් මුළුල්ලේ අබලන් වෙලා තිබෙන වහල, කඩා වැටෙන්න ඔන්න මෙන්න තිබෙන වහල කවදාද අලුත්වැඩියා කරන්නේ; ඔබතුමන්ලාගේ සුසිරිමත්, අසිරිමත්, ආශ්චර්යවත් ආණ්ඩුව මේ යුතුකම දකුණු පළාතේ ජනතාව වෙනුවෙන් කවදාද ඉෂ්ට කරන්නේ කියලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා රෝහලට ගොඩ වුණාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා රෝහලට ගොඩ වෙන්නේවත් නැතිව නේ ප්‍රශ්නය අහන්නේ. රෝහලට ගියේම නැහැනේ. ආශ්චර්ය ගැන කථා කළාට, දකුණු පළාතේ ජීවත් වුණාට-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
තමුන්නාන්සේ අතුරු ප්‍රශ්නයට උත්තර දෙන්නකෝ. ගරු නියෝජ්‍ය කථානායකතුමාත්, දේශපාලනය කරපු දිස්ත්‍රික්කයේ ප්‍රශ්නයක්. ඔබතුමා කරුණාකර, ප්‍රශ්නයට උත්තර දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා ආශ්චර්ය ගැනත් කිව්වා. ඒකයි මා ඇහුවේ. අඩු ගණනේ හම්බන්තොට ඉඳන් කොළඹ එනකොට ඔය රෝහලට වැස්සකටවත් ගොඩ වෙලා තිබෙනවාද කියලායි මා අහන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ රෝහලක් ගැන මම අහන්නේ. මුළු දකුණු පළාතටම සම්පතක් වන රෝහලක්. මාතෘ රෝහලක්. [බාධා කිරීමක්]

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ඒක තමයි. දකුණු පළාතේ හම්බන්තොට පසු කරලා, ගාල්ල පසු කරලා එන කොට මෙච්චර වගකීමක්, මෙච්චර ඕනෑකමක්, කැක්කුමක් තිබෙන කාරණයකට ඔය හදවත උණු වෙන කොට පොඩ්ඩක් බැහැලා බලන්න ගියේ නැද්ද? [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ලක්ෂ ගණනාවකට සෞඛ්‍ය සම්පන්න ජන ජීවිතයක් උදා කරන්න ලොකු සේවාවක් කරන එම රෝහලේ දැඩි සත්කාර ඒකකයේ වහල කඩා වැටෙන්නයි යන්නේ. අවුරුදු එකහමාරක් තිස්සේ වහල පිළිසකර කරලා නැහැ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියන්නත් ලැජ්ජයි. ශල්‍යාගාරය ඇතුළේ තමයි මේ දැඩි සත්කාර ඒකකය ක්‍රියාත්මක කරන්නේ. ඇඳන් පහක් තිබුණු එක දැන් ඇඳන් දෙකට බැහැලා. කරුණාකරලා මේකට උත්තරයක් දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ පුත්‍ර රත්නයට මම කියා දෙන්න ඕනෑ නැහැ, මේ ප්‍රශ්නය - [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
තමුන්නාන්සේලාගේ ආශ්චර්යවත් ආණ්ඩුව, සෞඛ්‍ය සම්පන්න ජන ජීවිතයක් උදා කරනවාය කියපු ආණ්ඩුව දැඩි සත්කාර ඒකකයේ වහල හදා දෙන්නේ කවදාද කියා උත්තර දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුර ලබා දෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
උත්තර දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
උත්තර දෙනකම් පොඩ්ඩක් ඉන්නකෝ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව මගෙන් අහපු ප්‍රශ්නය - [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
මිලියන 800ක් වියදම් කරලා වාට්ටු සංකීර්ණයක් දැනටම හදා තිබෙනවා. මා ඊට අදාළ නැති වුණත් දිස්ත්‍රික්කය ගැන කියනකොට මට ඒක කියන්න වෙනවා. ඒ වාගේම "හෙල්මුට් කෝල්" රෝහල අගෝස්තු මාසයේදී ආරම්භ කරනවා. මුදල් ලැබී තිබෙනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ප්‍රශ්නය අහලා ඉවරද? දැන් එතුමාම අහනවා, එතුමාම උත්තර දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩ්ඩක් සවන් දෙන්න. මම අහපු ප්‍රශ්නය මේකයි. දැඩි සත්කාර ඒකකයේ වහල කඩා වැටෙන්න තිබෙන නිසා අද දැඩි සත්කාර ඒකකය ක්‍රියාත්මක වෙන්නේ ශල්‍යාගාරය තුළයි.. මම අහන්නේ තමුන්නාන්සේලාගේ ආශ්චර්යවත්, අසිරිමත්, සුසිරිමත් ආණ්ඩුව මේ කඩා වැටෙන්න තිබෙන වහල පිළිසකර කරන්නේ කවදාද කියන එකයි.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජය කථානායකතුමනි, නායකතුමාගේ තීන්දුව හරි. මොකද, "යන්නෙ කොහෙද මල්ලෙ පොල්" කියන කට්ටිය තමයි ඉන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නයට උත්තර දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
මේ ප්‍රශ්නයෙන් මහමෝදර රෝහලේ දැඩි සත්කාර ඒකකය ගැන මගෙන් අහලා නැහැ. මගෙන් අහලා නැති ප්‍රශ්නයකට උත්තර දෙන්න මම බැඳිලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නයට උත්තර දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
තමුන්නාන්සේ මගෙන් එවැනි ප්‍රශ්නයක් අහලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ප්‍රශ්නය ඇහුවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
දැඩි සත්කාර ඒකකයක් ගැන කොහේවත් අහලා නැහැ. මහමෝදර රෝහලේ දැඩි සත්කාර ඒකකයක් ගැන අහලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඇහුවේ මහමෝදර රෝහල ගැනයි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කොහේද අහලා තිබෙන්නේ?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේට උත්තර දෙන්න බැරි නම් බැහැ කියන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා නම් දැන් අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයට උත්තර දෙන්න නියෝජ්‍ය ඇමතිතුමාට ප්‍රඥාව පහළ වෙලා නැහැ. එහෙමද? [බාධා කිරීම්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා අහපු ප්‍රශ්නයේ දැඩි සත්කාර ඒකකයක් ගැන අහලා නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එතුමා ප්‍රශ්නයට උත්තර දුන්නා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට මොළයක්, බුද්ධියක් නැද්ද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මට උත්තර දෙන්න තමුන්නාන්සේ මහමෝදර රෝහලේ දැඩි සත්කාර ඒකකයක් ගැන අහලා තිබෙන්නේ කොතැනද කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහන්නේ මහ මෝදර රෝහලේ දැඩි සත්කාර ඒකකය ගැන. ඒ කියන්නේ ඔබතුමාට ඒ ගැන උත්තර දෙන්න බැරිද? [බාධා කිරීම්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
තමුන්නාන්සේ දේශපාලන වේදිකාවක වාගේ කථා කරනවා. නායකතුමාගේ තීන්දුව හරි. ඔබතුමා හරියට යන්නේ කොහේද ඇහුවාම මල්ලේ පොල් කථා නේ කියන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාට උත්තර දෙන්න බැරිද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ස්ථාවර නියෝග අනුව ප්‍රශ්න අහන ක්‍රමවේදයක් තිබෙනවා නේ. මේ ප්‍රශ්නයේ දැඩි සත්කාර ඒකකයක් ගැන අහලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාට උත්තර දෙන්න බැරි නම් බැහැ කියන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, කරුණාකර ඊළඟ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මෙතුමා දැඩි සත්කාර ඒකකයක් ගැන අහලා නැහැ. ඉතින් මම උත්තර දෙන්නේ කොහොමද? [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් ගොඩක් වෙලා කථා කළා. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාට කියන්න කැමැතියි, මම අසත්‍යයක් ප්‍රකාශ කරනවා කියා හිතනවා නම් ඔය ටෙලිෆෝන් එකෙන් 0773510111 අංකයට කථා කරලා රෝහලේ අධ්‍යක්ෂතුමිය වන සේනාධීර මහත්මියගෙන් අහන්න කියලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක අදාළ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රධාන ප්‍රශ්නයේ මේ කාරණය ගැන අහලා නැහැ. තමුන්නාන්සේ ප්‍රශ්නයක් අහලා දැනුම් දෙන්න එපා යැ, උත්තර දෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අසත්‍යයක් ප්‍රකාශ කරනවා නම් මගේ මේ පාර්ලිමේන්තු කාල වකවානුව තුළ මම එක ප්‍රශ්නයක්වත් අහන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමාට උත්තර දෙන්න කියන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නියෝජ්‍ය ඇමතිතුමාට උත්තර දෙන්න කියන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අහන ප්‍රශ්නයට තමයි මම උත්තර දෙන්නේ. මේ ප්‍රශ්නයේ කොතැනද මහ මෝදර රෝහලේ දැඩි සත්කාර ඒකකයක් ගැන අහලා තිබෙන්නේ? තමුන්නාන්සේ ප්‍රශ්නයක් අහන හැටි දන්නේ නැද්ද? නායකතුමාගෙන් ඒක පොඩ්ඩක් ඉගෙන ගන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මේ තරුණ මන්ත්‍රීවරු නායකතුමාගෙන් අහගන්න. එතුමා තෙම්පරාදු වෙලා ඉන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විෂයය පිළිබඳ මනා දැනුමක් තිබෙන සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. ඔබතුමාම සඳහන් කළා, ගාල්ල මහමෝදර ශික්ෂණ රෝහලේ නොමේරූ ළදරු ඒකකය තුළ 2012 වසරේ ජනවාරි, පෙබරවාරි මාස දෙක ඇතුළත දරුවන් 20කගේ ජීවිත අහිමි වුණාය කියලා. මේ නොමේරූ ළදරු ඒකකය තුළ ළදරු ඇඳන් 25ක් තිබෙනවා. මේ ළදරු ඇඳන් 25ට වෛද්‍යවරු 24 දෙනෙක් ඉන්න ඕනෑ. හෙදියන් 58 දෙනෙක් ඉන්න ඕනෑ. නමුත් දැනට ඉන්නේ වෛද්‍යවරුන් 10කුත්, හෙදියන් 30කුත් පමණයි. මම ඔබතුමාගෙන් අහන්නට කැමැතියි, නොමේරූ ළදරු ඒකකය තුළ මේ පවතින වෛද්‍ය හිඟය වාගේම හෙද හිඟය - විශේෂයෙන් වෛද්‍යවරුන් 14 දෙනෙකුගේ අවශ්‍යතාව සහ හෙදියන් 28 දෙනෙකුගේ අවශ්‍යතාව- ඔබතුමන්ලාගේ අසිරිමත්, ආශ්චර්යවත් ආණ්ඩුව සම්පූර්ණ කරන්නේ කවදාද කියලා?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපේ අසිරිමත් ආණ්ඩුව දැනට හෙද පුහුණු වීම් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. නොවැම්බර් මාසය වන විට ඒ අයගේ පුහුණුව අවසන් වෙනවා. තමුන්නාන්සේ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි කාලයට වඩා අද අපේ හෙදියන් පුහුණු කිරීම - [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නයට උත්තරය දෙන්න මහත්මයෝ. කවදාද දොස්තරලා දෙන්නේ?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නොවැම්බර් මාසයේ පුහුණුව ලබා අවසන් වන හෙදියන්ගෙන් අපි ඒ අය ලබා දීමට කටයුතු කරනවා. මිය ගිය ළදරුවන් 20 දෙනා සාමාන්‍ය විධියට උපන් දරුවන් නොවෙයි. සාමාන්‍යයෙන් දරුවෙක් මවගේ කුසේ මාස 9ක් සිටිය යුතුයි. මාස 9ක් නොසිටි අයට තමයි නොමේරූ ළදරුවන් කියන්නේ. Premature babies කියන්නේ අදාළ කාලයට පෙර ඉපදුණු අය; ජීවත් වීමට අවස්ථාව අඩු අය. ඒ මිය ගිය 20 දෙනාගෙන් අතිශයින්ම නොමේරූ ළදරුවන් - extremely premature babies - නව දෙනෙකු මිය ගොස් තිබෙනවා. ඒ වාගේම සංජනනීය සංකූලතා හේතුවෙන් පස් දෙනෙකු මිය ගොස් තිබෙනවා. විෂ බීජ ශරීරගත වීම නිසාත් පස් දෙනෙකු මිය ගොස් තිබෙනවා. උපතේදීම හුස්ම ගැනීමට අපහසු වීම වාගේ සංකූලතා තිබෙන අය තමයි ගරු මන්ත්‍රීතුමා මේ ආකාරයට මිය ගොස් තිබෙන්නේ. මාස 9 සම්පූර්ණ වෙලා ඉපදුණු ළමයින් මැරිලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ මාතෘ මරණ අනුපාතය ඉතාම අඩු තත්ත්වයක තිබෙනවා. එය ලක්ෂයකට දෙකයි. ළදරු මරණ අනුපාතය දහසකට දොළහයි. අග්නිදිග ආසියානු කලාපයේ හොඳම තත්ත්වයක් තිබෙන්නේ අපේ රටේ. අපි ඒ තත්ත්වයන් පවත්වා ගෙන යන්නේ මේ සම්පත් බොහෝ දුරට කළමනාකරණය කිරීම තුළිනුයි. පුද්ගලයින් 409කට එක වෛද්‍යවරයෙක් ඉන්නවා. ඒ ආකාරයට අපි හොඳ සේවාවක් පවත්වා ගෙන යනවා. යම් යම් අඩු පාඩුකම් තිබෙනවා. නමුත් මේ නිදහස් සෞඛ්‍ය සේවාව අපි ඉතාම හොඳින් පවත්වා ගෙන යනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දෙවෙනි අතුරු ප්‍රශ්නයෙන් බොහොම සරල ප්‍රශ්නයක් ඇහුවේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතුමා උත්තරය දුන්නාට පසුව- [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වෛද්‍යවරුන් 14 දෙනෙකුගේ අඩුවක් තිබෙනවා. හෙදියන් 28 දෙනෙකුගේ අඩුවක් තිබෙනවා. මම අහන්නේ නොමේරූ ළදරු ඒකකය ගැන.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතුමා උත්තරය දුන්නාට පසුව, ඒක එතුමාගේ උත්තරය හැටියට පිළිගන්නට වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍යවරුන් 14 දෙනෙකුගේ අඩුවක් තිබෙනවා. හෙදියන් 28 දෙනෙකුගේ අඩුවක් තිබෙනවා. මේ නොමේරූ ළදරු ඒකකයට අවශ්‍ය හෙදියන් සහ වෛද්‍යවරුන් සංඛ්‍යාව මේ නොමේරූ නියෝජ්‍ය ඇමතිතුමා ලබා දෙන්නේ කවදාද කියලායි මම අහන්නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ වාගේම මමත් කියන්නට ඕනෑ, මම නොමේරූ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා නම් තමුන්නාන්සේ තවම නොමේරූ, දරුවකුත් නැති ගරු මන්ත්‍රීතුමෙක් කියලා. මම තමුන්නාන්සේට උත්තර දෙන්නම්. නොමේරූ, දරුවකුත් නැති ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේට මම උත්තර දෙනවා. ඒක නේ මේ අත් දැකීමක් නැත්තේ. බබෙක්වත් නළවලා නැහැ; පියෙක් වෙලත් නැහැ. ඒ නිසා එතුමා නොමේරූ ළදරුවා කවුද, දරුවා කවුද කියලා දන්නේ නැහැ.

මම නොමේරූ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා නම් තමුන්නාන්සේ දරුවෙකුත් නොලැබූ ගරු මන්ත්‍රීතුමා, පියෙක් නොවුණු ගරු මන්ත්‍රීතුමා. මමත් ඒ විධියටම උත්තර දෙන්නම්. දරුවෝ ගැන දන්නේ නැහැ. අපේ අඩු පාඩුකම් තිබෙනවා. වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙනවා. අපි ඒ වෛද්‍යවරු සපයා දෙන්න කටයුතු කරනවා. ගාල්ල ප්‍රදේශය නියෝජනය කරන ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම පැමිණිලි තිබෙනවාද? නැහැ. අපි ඉතා හොඳින් මේ රෝහලේ කටයුතු කර ගෙන යනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා ගාල්ල ගැන කියපු නිසා මම කියන්නේ; මාස තුනකට කලින් තමයි ඒ ප්‍රශ්නය ඇවිත් තිබෙන්නේ. දැන් ටෙන්ඩර් කරලා වහල හදනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කවුද කියන්නේ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මම වගකීමෙන් කියනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අභියෝගයක් කළා. ඔබතුමා call එකක් දීලා අධ්‍යක්ෂතුමියගෙන් අහන්න. [බාධා කිරීම්] මම ඔබතුමාට එකක් කියන්න කැමැතියි. මම වරදක් කරලා තිබෙනවා නම්, මම අසත්‍යය කියනවා නම් මම පාර්ලිමේන්තුවේ නැවත ප්‍රශ්න අහන්නේ නැහැ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ කාලයේ පින්තූර ගත්ත එකම නේ කළේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාට අභියෝග කරනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
රෝහලට ගොඩ වෙලාවත් නැහැ. ඒ කාලයේ පින්තූර ගහ ගහ හිටියා. ඉතින් මිනිස්සු කට කථා ගෙතුවා නිදන් හාරනවා කියා. ඒ කාලයේ බොහොම ජොලියේ හිටියේ. අපි වාගේ නොවෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකර, අධ්‍යක්ෂතුමියට දුරකථන ඇමතුමක් දෙන්න. මොකද මම උදේ, රෝහලෙන් තමයි තොරතුරු ගත්තේ. මම කනගාටු වෙනවා, ඔබතුමා තොරතුරු නොදැන සිටීම ගැන.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ජනාධිපති මන්දිරයේ තිබුණු පින්තූර -[බාධා කිරීමක්] තමුන්නාන්සේ පොඩ්ඩක් තේරුම් ගන්නකෝ. අපේ ජනාධිපතිතුමාගේ කාලයේ එහෙම වුණේ නැහැ. අරලියගහ මන්දිරයේ තිබුණු පින්තූර තිබුණේ එංගලන්තයේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, මේ රෝහල අවදානම් ස්ථානයක තිබෙන බව. ඒ මොකද, සුනාමි අනතුරු හැඟවීමක් කරන විටත් මේ රෝගීන් ගෙන ගිහින් එක්කෝ පන්සලේ දමනවා. නැත්නම් කරාපිටිය රෝහලට ගෙන යනවා. ඒ වාගේ ස්ථානවලට ගෙන යන බව ඔබතුමාත් දන්නවා. මේක සුනාමි අවදානමක් තිබෙන රෝහලක්. කරාපිටිය භූමි භාගය තුළ මේ රෝහල නැවත අලුතින් ගොඩ නහන්නට මිලියන 3,300ක් Helmut Kohl පදනමෙන් ලබා

දුන්නා. තමුන්නාන්සේ දන්නවා, මේ Helmut Kohl පදනමෙන් ලබා දුන්නු මිලියන 3,300 මාටියා ගැහුවා; හොරා කෑවා. කවුද කියා මා දන්නේ නැහැ. හොරා කෑ මුදල්වලට මොනවා වුණාද කියා දන්නෙත් නැහැ. ඒ මුදල්වලට මොනවාද වුණේ කියා බලන්නේ නැතුව, මේ රටේ ජනතාව ණය බරතාවයෙන් මිරිකලා ආණ්ඩුව නැවත වරක් අලුතෙන් යුරෝ මිලියන 20ක ණයක් ගන්නට යනවා. හොරා කෑ මුදල්වලට මොනවාද වුණේ කියා අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Deputy Speaker, Standing Order No. 28(2) very clearly states, I quote:

"A supplementary question must not introduce matter not included in the original question."

කථාවක් කර ගෙන යනවා. ඒකට ඉඩ දෙන්න බැහැ. ඒවා ඔක්කොම expunge කරන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, your questions must be very short.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අතුරු ප්‍රශ්නය මේ ප්‍රශ්නයට අදාළ නැහැ. මේ ගරු සභාවේ මම උත්තර දීලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ මුදල් ගසා කෑවා කියන එක අදාළ නැහැ?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
මහමෝදර රෝහලේ සුනාමි ආධාර යටතේ කිසිම මුදලක් රජය හොරා කාලා නැහැ. - [බාධා කිරීමක්] ඒ අදාළ ආයතනයටම තමයි ඉදි කරන්න භාර දී තිබෙන්නේ. ඔවුන් ඒ කටයුත්ත කරලා නැහැ. මේකට රජයේ කිසිම සම්බන්ධයක් නැහැ. ජනතාව වෙනුවෙන් ඒ කටයුත්ත කරන්න රජය විසින් ඒ අදාළ ආයතනයට ඉඩම ලබා දී තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
රුපියල් මිලියන 3,300ක් කෑවා.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
මේකට රජයේ කිසිම සම්බන්ධයක් නැහැ. මහමෝදර රෝහල සම්බන්ධයෙන් සියලු විස්තර සහිතව මම මේ පාර්ලිමේන්තුවේ උත්තර දීලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
රුපියල් මිලියන 3,300ක් ගිල්ලා.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
අතිගරු ජනාධිපතිතුමා මැදිහත් වෙලා - ණයකාරයෝ කරන්න නොවෙයි, ණයක් ගන්න නොවෙයි- නැවත ඒ රජයට කළ ඉල්ලීමක් අනුව යම් මුදලක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. මට වඩා හොඳින් අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමාත් මේ ගැන දන්නවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
යුරෝ මිලියන 20ක ණයක්. ඔය කියන්නේ අමූලික අසත්‍යයක්. ඒක ණයක්.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
එතුමා දකුණේම ඉපදුණු කෙනෙක්. [බාධා කිරීම්] තමුන්නාන්සේ අලුත්කඩේ ඉපදිලා හම්බන්තොට ගිහිල්ලා රජ වෙන්න යනවා. ඒක වෙන්න බැරි දෙයක්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මට මෙතැන ඉඳ ගෙන උත්තර දෙන්න බැහැ. පහළට ඇවිල්ලා කියන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
කමක් නැහැ, ඔබතුමා උත්තර දෙන්න. මම දුරකථන අංකයත් දුන්නා. මේවා අසත්‍යයද කියලා ඒ රෝහලේ අධ්‍යක්ෂතුමියගෙන් අහන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා ගාල්ලේ - [බාධා කිරීමක්] මෙතුමා ඉපදුණේ කොළඹ අලුත්කඩේ.

කන්තලේ සීනි කර්මාන්තශාලාව: විස්තර
கந்தளாய் சீனித் தொழிற்சாலை: விபரம்
KANTALAI SUGAR FACTORY: DETAILS

2500/'12

10.ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) කන්තලේ සීනි කර්මාන්තශාලාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ පුද්ගලික ආයෝජකයන්ට පැවරීම සඳහා 2011 වර්ෂයේ මාර්තු මාසයේදී යෝජනා/ ඉල්ලුම්පත් කැඳවා තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කන්තලේ සීනි කර්මාන්තශාලාව මේ වන විට පුද්ගලික ආයෝජකයකුට පවරා තිබේද;

(ii) එසේ නම්, එම පැවරීම සිදු කළ දිනය හා පැවරූ ආයතනය, සමාගම හෝ ආයෝජකයා කවරේද;

(iii) එම පැවරීම සිදු කළ මිල කොපමණද;

(iv) එම කර්මාන්තශාලාව පැවරීමේ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වන විට එම කර්මාන්තශාලාවේ සීනි නිෂ්පාදනය ආරම්භ කිරීමට පියවර ගෙන තිබේද;

(ii) අපේක්ෂිත දෛනික නිෂ්පාදන ධාරිතාවය කොපමණද;

(iii) දැනට නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சீனிக் கைத்தொழில் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) கந்தளாய் சீனித் தொழிற்சாலையை மீள் கட்டமைப்பதற்காக நீண்டகாலக் குத்தகையின்கீழ் தனியார் முதலீட்டாளர்களுக்கு கையளிப்பதற்காக 2011ஆம் ஆண்டு மார்ச் மாதம் முன்மொழிவுகள்/ விண்ணப்பங்கள் கோரப்பட்டிருந்தன என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) கந்தளாய் சீனித் தொழிற்சாலை தற்போது தனியார் முதலீட்டாளர் ஒருவருக்குக் கையளிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனின் அந்தக் கையளிப்பு மேற்கொள்ளப்பட்ட திகதி, கையளிக்கப்பட்ட நிறுவனம், கம்பனி, அல்லது முதலீட்டாளர் யார் என்பதையும்;

(iii) அந்தக் கையளிப்பு மேற்கொள்ளப்பட்ட விலைகள் யாவை என்பதையும்;

(iv) அந்தத் தொழிற்சாலை கையளிக்கப்பட்ட நிபந்தனைகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) தற்போது இந்தத் தொழிற்சாலையில் சீனி உற்பத்தியை ஆரம்பிக்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) எதிர்பார்க்கப்பட்ட நாளாந்த உற்பத்திக் கொள்வனவு எவ்வளவு என்பதையும்;

(iii) தற்போது உற்பத்தி நடவடிக்கைகள் ஆரம்பிக்கப் படாவிட்டால் அதற்கான காரணங்கள் என்ன என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Sugar Industry Development:

(a) Is he aware that proposals /applications had been called in March 2011 to hand over the Kantalai sugar factory to private sector investors under the long term lease system in order to be restructured;

(b) Will he inform this House -

(i) whether Kantalai Sugar Factory has been handed over to a private sector investor by now;

(ii) if so, of the date on which the transfer took place, the institution, company or investor that it was transferred to;

(iii) of the price at which the transfer was done; and

(iv) of the conditions pertaining to the transfer of that factory ?

(c) Will he state -

(i) whether steps have been taken to start the sugar production in the aforesaid factory by now;

(ii) the expected daily production capacity; and

(iii) the reasons if production has not yet been started ?

(d) If not, why ?

ඔබතුමා මේ ප්‍රශ්නයටත් උත්තර දෙනවාද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගාල්ල ගැන කියලා මට බෝලය දැම්මා. මෙතැන ඉඳලා ගමේ යන්නත් ඕනෑ නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහනවාද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අහනවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

පිළිතුර SMS එකකින් එවන්නද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කන්තලේ ඉඳලා එන්න ටිකක් වෙලාව යනවා. ඒකයි මම කිව්වේ. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
නැහැ, මේ අසිරිමත් ආණ්ඩුව ගැන කිව්වා. මේ අසිරිමත් ආණ්ඩුවේ මට සිද්ධ වෙලා තිබෙන්නේ අපේ කාලයේ හොරා කාලා විකුණපු ඒවා ගැන උත්තර දෙන්නයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමාත් සම්බන්ධයි නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒවාට ඔබතුමාත් අත ඉස්සුවා නේ. ඒකයි වැඩේ. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
කන්තලේ ගැන තමුන්නාන්සේ ප්‍රශ්නයක් ඇහුවා. කන්තලේ- [බාධා කිරීමක්] මම ඒකට උත්තර දුන්නා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒවාට ඔබතුමාත් අත ඉස්සුවා නේ. ඒක නේ වැඩේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මම ඉස්සර වෙලා කිව්ව ඒවා අහ ගෙන හිටියේ නැද්ද?[බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ පැත්තෙන් ඒ පැත්තට ගියාම-

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මට භාර දුන්නු නිසායි මම කියන්නේ. අහන ප්‍රශ්නයටයි මම උත්තර දෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.

(ආ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) (i) මේ වන විට සීනි නිෂ්පාදනය කිරීමට පියවර ගෙන නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) කර්මාන්තශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර නොමැත. මෙම කර්මාන්තායතනය සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට පත් කරන ලද්දේ 2013.02.18 දිනදීය.

(ඈ) අදාළ නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු අමාත්‍යතුමනි, 2011 වර්ෂයේ කන්තලේ සීනි කර්මාන්තශාලාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පුද්ගලික ආයෝජකයන්ගෙන් යෝජනා හා ඉල්ලුම් පත්‍ර කැඳෙව්වා. ඒ සම්බන්ධයෙන් සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද කියලා මම අහන්න කැමැතියි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඒ යෝජනා ඔක්කොම ඇමති මණ්ඩලයෙන් ඉවත් කරලා ඒක පටන් ගන්න අලුතින් ක්‍රමවේදයක් හදන්න කියලා අපේ අමාත්‍යාංශයට භාර දුන්නා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා මොන විධියටද ඒක කරන්න යන්නේ? පුද්ගලික ආයෝජනයක් හැටියටද? එහෙම නැත්නම් වෙනත් මොකක් හරි විධියකටද? එය පටන් ගන්නා ක්‍රමවේදය මොකක්ද?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
අපේ හිතවත් මන්ත්‍රීතුමා, අප එය 1993 දී දුන්නේ කොළ කෑල්ලකින්. දුන්නේ රංජිත් සුමනසේකර නමැති කොළඹ, බොරැල්ලේ ඉන්න මහත්මයකුට. ඔහු අවුරුදු දෙකක් එහි ශුද්ධ ලාභය ගත්තා. කිසිම මනුස්සයකුට පඩි ගෙව්වේ නැහැ. අර්ථ සාධක, භාරකාර අරමුදල්, පාරිතෝෂික ආදි කිසි දෙයක් ගෙව්වේ නැහැ. අවුරුදු දෙකක ශුද්ධ ලාභය ගත්තා. මිනිසුන්ට කිසිවක් ගෙව්වේ නැහැ. අන්තිමේදි සිද්ධ වුණේ මොකක්ද? ප්‍රදේශයේ මහ ජනතාව එක්කාසු වෙලා උද්ඝෝෂණයක් කළා. මිනිහා පැනලා ගියා. එදා වහපු ෆැක්ටරිය අදත් වහලා. දැන් ඒ ෆැක්ටරිය සම්පූර්ණයෙන් දිරාපත් වෙලායි තිබෙන්නේ. එතැන අලුතින්ම ෆැක්ටරියක් හදන්න ඕනෑ. ඒ සම්පූර්ණ ව්‍යාපෘතියට ඇමෙරිකන් ඩොලර් මිලියන 80ක් විතර යනවා. හැබැයි ගොවි පවුල් 6,000ක් අදත් දුක් විඳිනවා. කන්තලේ කියන්නේ ඉතාම හොඳ ආදායම් ලබපු ප්‍රදේශයක්. එය අලුතින්ම පටන් ගැනීම සඳහා වූ එක් එක් ක්‍රමවේදයන් පිළිබඳව අප දැන් සාකච්ඡා කරගෙන යනවා. අප මේ අමාත්‍යාංශය භාර අරගෙන තවම මාසයයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එය පෞද්ගලික ආයෝජකයකුට දෙන්නේ නැහැ, රජය විසින්ම කරනු ලබනවා කියන කාරණය සම්බන්ධයෙන් ඔබතුමාට ස්ථිර යමක් කියන්න පුළුවන්ද?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
රජය විසින්ම කරන්න තමයි පවරා ගත්තේ. ඒක ඇත්ත. මට දැන්මම ඒ පිළිබඳව හරි උත්තරයක් දෙන්න බැහැ. අසත්‍යය කියන්න ඕනෑ නැහැ නේ. තව මාසයක් දෙකක් දෙන්න. අප මේ ගැන සාකච්ඡා කරලා රටට ගැළපෙන, ප්‍රදේශයේ ගොවි ජනතාවට ගැළපෙන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුයි. අප ඒක කරනවා. හැබැයි එක සහතිකයක් දෙන්නම්. වැඩේ පටන් ගත්තාට පස්සේ අප ඒක හරියට කරනවා. වසා දමා තිබුණු ඒවා අප මේ වන කොට හරියට කරගෙන යනවා. සෙවණගල සහ පැල්වත්ත ඒවායේ වැඩ ටික අප අකුරටම ඉෂ්ට කරලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. 1994 දී ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාට පස්සේ -චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ ඉඳලා- එහි මුල් ගල් 10ක්, 12ක් විතර තියා තිබෙනවා ගරු ඇමතිතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පළාත් සභා මැතිවරණ කාලවල.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පළාත් සභා මැතිවරණ කාල ආදී එක එක අවස්ථාවල මුල් ගල් තියනවා. දැන් කන්තලේ උක්වලට වඩා මුල් ගල් පැළවුණු ඒවා තිබෙනවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මා එහෙම දෙයක් නම් දන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ඔබතුමාට නොවෙයි කියන්නේ. කන්තලේ උක් ගොවීන්ට අයිති ඉඩම් විශාල ප්‍රමාණයක් මේ වන කොට පෞද්ගලික ආයෝජකයන්ට දීලා තිබෙනවා. ඔබතුමා මොනවා හෝ එකක් කන්තලේ පටන් ගත්තත් පෞද්ගලික කොම්පැනිවලට දුන්නු ඒ ඉඩම් ටික පවරා ගන්නේ නැතිව ඔබතුමාට උක් නිෂ්පාදනය කරන්න බැහැ. එහෙම නැත්නම්, ඔබතුමා යම් කිසි විධියකට බලපෑමකට-

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඒ ගැන ඔබතුමා කිසිම සැකයක් හිතන්න එපා. ඒ ඉඩම් දුන්නේත් මෑත කාලයේ නොවෙයි. අපේ කාලයේදීමයි. එදා ඒවා විකුණද්දී කොළ කැල්ලකින් තවත් කෙනකුට තවත් ඉඩම් ප්‍රමාණයක් විකුණුවා. ඒකත් අමතක කරන්න එපා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
එතකොට ඔබතුමාත් අපේ පැත්තේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඒක නොවෙයි මා කියන්නේ. ඒ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ දුන්නු ඒවායි. අපි ඇත්ත කථා කරමු කෝ. ඒවා රුපියලක්වත් ගන්නේ නැතිව දුන්නු දේවල්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර මේකයි. අප මේ මොහොත වෙද්දීත් හෙක්ටෙයාර 5,700ක් නිදහස් කරගෙන අවසානයි.

තවත් හෙක්ටෙයාර එක්දහස් ගණනයි තිබෙන්නේ. ඒකේ ප්‍රශ්නයක් නැහැ. මේ ව්‍යාපෘතිය පටන් ගන්න අවශ්‍ය යෝජනා ටික ක්‍රියාත්මක කරද්දී මේ වැඩ ටික අප අවසන් කරනවා. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

කඳුරට සේවය ගුවන් විදුලි නාලිකාව : වසා දැමීම
மலைநாட்டு வானொலிச் சேவை அலைவரிசை: மூடிவிடல்
UPCOUNTRY SERVICE BROADCASTING CHANNEL: CLOSURE

1977/'11

11.ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර, පුෂ්පදාන මාවතේ පිහිටුවා ඇති කඳුරට සේවය ගුවන් විදුලි නාලිකාව වසා දැමීමේ සැලසුමක් තිබේද;

(ii) වසා දැමීමෙන් පසු එහි ගොඩනැඟිලි අසළ පිහිටි කාන්තා විද්‍යාලයක නේවාසිකාගාරයට ලබා දීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ) (i) හි පරිදි කඳුරට සේවය ගුවන් විදුලි නාලිකාව වැසීමට කටයුතු කිරීම රජය විසින්, රාජ්‍ය ආයතන වසා නොදමන බවට දුන් පොරොන්දුව කඩ කිරීමක් බව පිළිගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

වෙකුසන ඌඩක, තකවල් අමෙච්චරෛක් කේට්ට වීනා:

(அ) (i) கண்டி புஷ்பதான மாவத்தையில் அமைந்துள்ள மலைநாட்டு வானொலிச் சேவையின் அலைவரிசையை மூடிவிடுவதற்கான திட்டமேதும் உள்ளதா என்பதையும்;

(ii) மூடப்பட்டதன் பின்னர் அது அமைந்துள்ள கட்டிடங்களுக்கு அருகாமையில் அமைந்துள்ள மகளிர் கல்லூரியொன்றின் விடுதிக்காகப் பெற்றுக்கொடுப்பதற்கு திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி (அ)(i) இன் பிரகாரம் மலைநாட்டு வானொலிச் சேவையின் அலைவரிசையை மூடிவிடுவதற்கு நடவடிக்கை எடுக்கப்படுவதானது, அரச நிறுவனங்கள் மூடப்படாதென அரசாங்கம் வழங்கிய வாக்குறுதியை மீறுவதாகுமென்பதை ஏற்றுக்கொள்கின்றாரா என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Information:

(a) Will he inform this House -

(i) whether there is a plan to close down the Upcountry Service (Kandurata Sevaya) broadcasting channel located on the Pushpadana Mawatha in Kandy;

(ii) whether there is a plan to give its buildings to the hostel of a nearby girls' school after its closure?

(b) Will he also inform this House whether he admits that the closure of the above broadcasting channel by the Government as per (a) (i) above, is a breach of the promise given by the Government that it will not close down State institutions?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අතුරු ප්‍රශ්නයක් අහනවා. කඳුරට සේවය ගුවන් විදුලි නාලිකාව සම්බන්ධව තිබෙන නිසායි මම මේ අතුරු ප්‍රශ්නය අහන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ අතුරු ප්‍රශ්නය ඇහුවාට පස්සේ සමහර විට හෙට උදේට ගුවන් විදුලියෙන් මට පහර දෙයි. අපි මේ පාර්ලිමේන්තුවේ කථා කළාම ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිතුමා පහුවෙනිදා උදේ 7 ඉඳලා 9 විතර වෙනකල් අපට බණිනවා. ඒ නිසා එතුමා සභාපතිවරයා විධියට ඉන්නේ නැතුව කරුණාකර නිවේදකයෙකු විධියට ඒ වැඩ කටයුත්ත කරන්න-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මූලික ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් විධියට අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගුවන් විදුලි සංස්ථාව ගැන තිබෙන නිසායි මා මේ ගැන ඇහුවේ. ගරු අමතිතුමනි, ඒ නිසා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, සභාපතිවරුන්ට පුළුවන්ද මේ විධියට,-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
No, wait.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I am raising a point of Order.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
All right.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
There is nothing in this Question about Mr. Hudson Samarasinghe, Chairman of the SLBC. - [*Interruption*.]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
He cannot - [*Interruption*.] I have showed you the - [*Interruption*.]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
I never mentioned his name.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය ඉතාම කෙටියෙන් අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
No, I never mentioned Mr. Hudson Samarasinghe's name.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, I know you never mentioned his name.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Do you have anything to do with Mr. Hudson Samarsinghe, Hon. Azwer? I do not know - [*Interruption*.]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, you do not have to drag this matter on since his name was not mentioned. කරුණාකර අතුරු ප්‍රශ්නයක් තිබෙනවා නම් අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා පැහැදිලි කරලා දුන්නාට ස්තුතියි. I did not mention Mr. Hudson Samarasinghe's name. Hon. Azwer, who asked you to mention his name? මෙතුමා සභාපති වෙන්න හදනවාද කොහේද.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර අතුරු ප්‍රශ්නය අහනවා නම් අහන්න. නැත්නම් ඊළඟ ප්‍රශ්නයට යනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති වෙන්න හදනවාද කොහේද. මා ඇහුවේ ඒකයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් වේලාව 2ට විනාඩි 10යි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමා, මා අහන්නේ මේකයි. ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා විධියට වැඩ කරන ගමන් එහි වැඩසටහන් මෙහයවලා උදේ ඉඳලා රෑ වෙනකල් ඉතාම නින්දිත විධියට විපක්ෂයට පහර දෙන්න සභාපතිවරයෙකුට පුළුවන්ද? [බාධා කිරීමක්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කරුණාකර පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] කෑ ගහන්නේ නැතිව පොඩ්ඩක් ඉන්න. මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න ඇමතිතුමා. ගරු ඇමතිතුමා මේ ප්‍රශ්නයට උත්තරයක් ඕනෑ. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක පාර්ලිමේන්තුව සම්බන්ධ ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමා එහෙම ප්‍රශ්නයක් අහනවා නම්, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුගමනය කරමින් එය අහන්න. එතකොට ගරු කථානායකතුමා ඒ ගැන තීරණයක් දේවි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා ස්ථාවර නියෝග ප්‍රකාරව ප්‍රශ්නය අහන්න.

ප්‍රශ්න අංක 13-2504/'12-(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. නමුත් ගරු ඇමතිතුමා නම් ගරු සභාවේ නැහැ. මොකද දන්නේ නැහැ. කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ ප්‍රශ්නය සම්බන්ධයෙන් තවම ගහ උඩ ඉන්න මනුෂ්‍යා බලන්න ගියාද දන්නේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා පිළිතුර දෙනවාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
ඒක ප්‍රශ්නයක් නැහැ නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ විට මේ සභා ගර්භයේ සාකච්ඡාවක් සිදු වුණාට පසුව තමන් විසින් කරන ලද කථාවට අදාළ CD පටය ලබා ගැනීම සඳහා සෑම මන්ත්‍රීවරයකුම උත්සුක වනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඒ කටයුතු කිරීම වෙනුවෙන් නිලධාරී මහත්මියක් පත් කර තිබෙනවා. අපිත් විටින් විට එම මහත්මියගෙන් අපේ කථාවලට අදාළ CD පට අපට ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. සමහර අවස්ථාවල එම මහත්මිය විසින් ප්‍රකාශ කර සිටිනවා, "ඉංජිනේරු අංශයෙන් එය ප්‍රමාද වෙලා තිබෙනවා, ඔබතුමාට පුළුවන් නම් ඉංජිනේරු අංශයට කථා කරන්න" කියලා. ඒ අනුව අපි ඉංජිනේරු අංශයට කථා කරලා, ඒ අදාළ edit කරන මහත්වරුන්ට කියනවා එය ලබා දෙන්න කියලා. දැන් කථා කරලා, තව විනාඩි පහකින් එය ලබා ගන්න පුළුවන් අවස්ථාත් තිබෙනවා. එවැනි වේගයකින් ලබා ගන්න පුළුවන් අවස්ථාත් තිබෙනවා. ඒ නිසා එය ලබා දුන් වේගය අනුව මේක මනින්න එපා. මමත් ඒ අවස්ථාවේ සභා ගර්භයේ සිටියා. ඒ CD පටය විකාශය වූ ආකාරයට මුලසුන විසින් ලබා දෙන ලද නියෝගයන්ට අනුව තමයි කටයුතු කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දුටු පරිදි එක්තරා නාලිකාවක රාත්‍රී 10.15ට පමණ තමයි එය විකාශය වූයේ. රාත්‍රී 8.00ට, 8.30ට විකාශය වුණාද කියන එක මා දන්නේ නැහැ. ඒ අනුව රාත්‍රී 10.00 සහ 10.15ට ආසන්න කාලයේදී තමයි එය විකාශය වී තිබුණේ. මා හිතනවා ඒක තමයි පළමුවැනි විකාශය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මතු කළ ආකාරයට මේ සභා ගර්භයේ මන්ත්‍රීවරුන් විසින් යම් වීඩියෝගත කරන උපකරණයකින් එය වීඩියෝගත කර තිබෙනවා නම් එම කාරණය බරපතළයි. එහෙත් අපට පෙනෙන මානයේ; අප දකින මානයේ එය මෙම සභා ගර්භයේ විකාශය වූ දෙයක් මිස කිසිසේත්ම පෞද්ගලිකව කවුරුන් හෝ විසින් පටිගත කරන ලද දෙයක් නොවෙයි. ඒ වාගේම තමයි, මා දන්නා විධියට එම විකාශය වන හැම වීඩියෝ පටයකම සභා ගර්භයට අදාළ වන පරිදි සංඥාවක් තිබෙනවා. සෙංකෝලය වැනි සංඥාවක් තිබෙනවා. එතකොට එම සංඥාව සහිතව කිසි කෙනෙකුට මේක පෞද්ගලිකව වීඩියෝගත කර ගන්නට බැහැ. නාලිකාවක විකාශයක් සිදු වනකොට හැන්සාඩ් අංශය විසින් ලබා දෙන ලද සෑම වීඩියෝ පටයකම එහි සෙංකෝලය සඳහන් වී තිබෙන සංඥාව සහිතව තමයි එය විකාශය වන්නේ. [බාධා කිරීමක්] ඔව්, වීඩියෝ එක. එය භාරව තිබෙන හැන්සාඩ් අංශයෙන් තමයි එහි editing කටයුතු හෝ එයින් ඉවත් කළ යුතු දේවල් ඉවත් කිරීම කරනු ලබන්නේ. එය භාරව තිබෙන්නේ හැන්සාඩ් සංස්කාරක වෙතයි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Video එකෙන් තමයි- [බාධා කිරීමක්] හැන්සාඩ් දෙපාර්තමේන්තුවෙන් කරන්නේ මොනවා හෝ වරදක් තිබෙනවා නම් හදන එක. ඒ අය මේවා කාටවත් දෙන්නේ නැහැ. Video එකෙන් තමයි ඒ වරද වෙලා තිබෙන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අවසන් කරනවා. අනුමත කථාවල සෙංකෝලය සහිත සංඥාව සඳහන් වී තිබෙනවා. එතකොට එම රූපවාහිනී නාළිකාවේ ප්‍රකාශයට පත් කරන ලද වීඩියෝ දර්ශනයේ ඉතා පැහැදිලි ලෙස සෙංකෝලය සහිත සංඥාව තිබෙනවා. ඒ නිසා එය අනුමත කරන ලද, පාර්ලිමේන්තුවේ ඒ ආයතන විසින් ලබා දීපු ඒවායි. එය කිසි සේත්ම කවුරුන් හෝ විසින් -ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා එය මතු කළා ඉතා බරපතළ ලෙස- අයථා පරිදි තමන් සතුව තිබෙන උපකරණයකින් වීඩියෝගත කරන ලද්දක් නොවෙයි. එහෙම වීඩියෝගත කළා නම් සෙංකෝලය සහිත සංඥාව තිබෙන්න බැහැ. ඒ වාගේම ඒවා දෘශ්‍යමානව අපි දැකපු දර්ශන. ඒ දර්ශන තුළත් ඉතා පැහැදිලියි, මෙය සභාව තුළ ස්ථාපිත කරන ලද කැමරාවල රූප රාමු බව. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මතු කරන ලද කාරණය බරපතළයි. එය කිසි සේත්ම පාර්ලිමේන්තුවේ සිදු විය යුතු නැහැ. අපි දැක තිබෙනවා සමහර අවස්ථාවලදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ යම් ගැටුම් යන අවස්ථාවලදී සමහර මන්ත්‍රීවරු -පුවත් පත්වලත් පළ වී තිබුණා ඔබතුමන්ලා දකින්න ඇති- තමන්ගේ දුරකථනය පාවිච්චි කරනවා කැමරාවක් විධියට. ඒවා වැරදියි. ඒ කියන්නේ, බොහෝ මන්ත්‍රීවරු, බොහෝ ඇමතිවරු. එහෙම කරනවා අපි එය දැක තිබෙනවා. එය කිසි සේත්ම සාධාරණ නැහැ. එයයි වැළැක්විය යුත්තේ. එසේ නැතිව මාධ්‍යවලට යම් වාරණයක් හෝ යම් බාධාවක් ඇති කිරීම කිසි සේත්ම සාධාරණ නැහැ කියන එකයි අපේ අදහස.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සිද්ධිය වන වෙලාවේ මා ගරු සභාවේ හිටියා. මා සම්පූර්ණ සංවාදයට සවන් දුන්නා. ඇත්ත වශයෙන්ම ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කිසිම මන්ත්‍රීවරයකුගේ නමක් සඳහන් කළේ නැහැ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
නමුත් පාවිච්චි කළ වචන-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තොප්පිය හරි නම් දා ගත්තාට අපට කරන්න දෙයක් නැහැ. එතුමා කිසිම මන්ත්‍රීවරයකුගේ නමක් සඳහන් කළේ නැහැ. It was a very good Parliamentary speech. Without mentioning a single name of a Member of Parliament, you can criticize. කිසිම මන්ත්‍රීවරයකුගේ නමක් සඳහන් කළේ නැහැ. තොප්පිය හරි අය දා ගත්තා. ඒකට අපට කරන්න දෙයක් නැහැ. You look at the speech.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Hon. Deputy Speaker, ideas were expressed by the Hon. Leader of the Opposition and the Hon. Chief Whip of the Government as well. I understand that a certain decorum must be maintained in this House and that is exactly what I did. I am from a good family. I studied in a good school. Therefore, I know exactly the language that I should use and that is the language that I used. Hon. Deputy Speaker, you can see that we have wasted so much time on this issue. The point here is, as to whether this CD was issued properly. You know the steps that should be followed when a CD is released to the media.

Hon. Deputy Speaker, I can show to you a picture of the telecast, which I have with me. The Mace can be very clearly seen in it. Just as the Hon. Chief Government Whip said, there has to be some sort of substance in what one speaks in Parliament.

That day, when I was speaking - unfortunately, you were not here - for 10 minutes, I could not raise a single point on the subject debated. Continuously, the Hon. Wimal Weerawansa disturbed me. He mentioned my name once and said that I have taken bribes. That is what happened. If there is someone who should be ashamed about what was telecast, it is I who should be ashamed. But, I am not because I know what I have done. I know where I come from. I know how I act and I am very clear about it. We have wasted so much time on this. I do not think you have even got a written statement by the Hon. Member at the moment. The issue is whether the CD was issued properly or whether it was not issued properly. Hon. Deputy Speaker, I can show you a picture with the Mace on it.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You cannot display that now.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
It was telecast at 10 o'clock. The Mace can be seen. This is a simple issue. Everyday this happens.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have given you enough opportunity. Hon. Sajith Premadasa, you have spoken about four times on the same issue.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ උත්තරීතර සභා ගර්භය තුළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා අදහස් ඉදිරිපත් කරන කොට ඒවා විද්‍යුත් මාධ්‍යයට නිකුත් කරන ක්‍රියාපටිපාටියක් තිබෙනවා. හැන්සාඩ් දෙපාර්තමේන්තුව හරහා ඒවා සංශෝධනයට ලක් විය යුතු නම් ඒ සංශෝධන කරලා ඊට පස්සේ සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුවට ලිඛිත අනුමැතියක් ගියායින් පසුවයි ඒ CD එක මාධ්‍යවලට නිකුත් කරන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකර මට අවස්ථාව දෙන්න. නමුත් මේ උත්තරීතර සභාවේ හුවා දක්වන්න හැදුවේ, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා මේ CD එක හොරෙන් අරගෙන, හැන්සාඩ් දෙපාර්තමේන්තුවේත්, සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේත් අනුමැතිය ගන්නේ නැතිව කුට අන්දමින් ක්‍රියා කරපු විධියක් ගැනයි.

ඇත්ත වශයෙන්ම මේක Privilege Motion එකක් හැටියට මෙහෙම ගෙනෙන්න බැහැ. මේක සම්පූර්ණයෙන්ම ව්‍යවස්ථාවට විරුද්ධයි; Standing Ordersවලට විරුද්ධයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, රාජ්‍ය මාධ්‍ය හරහා මේ සිද්ධ වුණු සංවාදය විකෘති කරලා මේ ලංකාවටම ඒක ව්‍යාප්ත කරන නිසා කරුණාකර අද ඉදිරිපත් කරපු මේ අසත්‍ය චෝදනාව -වංචාකාර චෝදනාව- හැන්සාඩ්ගත කිරීම වළක්වන්නය කියා. මේක සම්පූර්ණයෙන්ම වැරදි දෙයක්.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, you raise your point of Order, in short. I have now given an Order regarding this matter.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, when he says "බොරු චෝදනා", that is also against the Standing Orders. You cannot use the word "බොරු" in the House. So, he must withdraw that. The other thing is, since I started - [*Interruption.*] Wait, wait. You sit down. I will teach you the Standing Orders. What do you know? - [*Interruption.*] Sir, I will conclude with this. The Hon. Chief Government Whip and the Hon. Leader of the Opposition put the matter in the correct perspective. Therefore, Sir, I only want to place on record that the print media is doing a good job because they can edit their script, but not the electronic media. The print media is doing a good job.

Thank you.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු විපක්ෂ නායකතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙකු විසින් ප්‍රකාශ කරන ලද අදහස්වලට සවන් දීමෙන් අනතුරුව මේ පැන නැඟී ඇති තත්ත්වය පිළිබඳව කරුණු නිරාකරණය කර ගැනීම සඳහා, පෙරේදා දින ප්‍රකාශයට පත් කළා යයි කියන ප්‍රවෘත්ති අංගය අදාළ නාලිකාවෙන් ගෙන්වාගෙන එකී ප්‍රවෘත්ති විකාශයෙහි පාර්ලිමේන්තුව විසින් නිල ලෙස නිකුත් කරන ලද CD තැටියේ අඩංගු නොවන යමක් සඳහන් වී ඇත්දැයි තීරණය කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා අදාළ ප්‍රවෘත්තිය ප්‍රකාශ කරන ලද දිනය සහ ප්‍රවෘත්ති විකාශය සිදු කරන ලද වේලාව නිවැරදිව ලබා දෙන ලෙස ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලා සිටිමි.

ඒ අනුව එකී ප්‍රවෘත්ති සහිත CD තැටිය ගෙන්වා ගැනීමටත්, ඒ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමටත් ඒ පරීක්ෂණයෙන් අනතුරුව ගත යුතු ක්‍රියා මාර්ග හා ඒ තුළින් පාර්ලිමේන්තුවට හානියක්, වරප්‍රසාද කඩවීමක් සිදු වේ දැයි තීරණය කිරීමට කටයුතු කිරීමත් සුදුසු බව තීරණය කරමි.

මෙවන් තත්ත්වයන් පිළිබඳව විපක්ෂ නායකතුමා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විටින් විට ප්‍රශ්න කොට ඇති බැවින් ඉදිරියට පාර්ලිමේන්තුවේ අභිමානයට හානියක් සිදු නොවන ආකාරයට මේ කටයුතු හැසිරවීම පිළිබඳව කමිටුවක් පත් කිරීම පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කොට, එතුමාගේ අවසරය ඇතිව ඒ පිළිබඳව ඉදිරි කටයුතු කිරීම සුදුසු යැයි තීරණය කරමි. ඒ අනුව අද දිනම අදාළ ප්‍රවෘත්ති විකාශයේ දිනය සහ වේලාව දැනුම් දෙන්නට දන්වා සිටින අතර, එය ලැබුණු විගස අදාළ නාලිකාවෙන් හෝ නාලිකාවලින් ඒ විකාශයට අදාළ CD පට ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙස පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට නියෝග කරමි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Sajith Premadasa, what is the point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ බරපතළ ප්‍රශ්නයක් පිළිබඳව විභාගයක් සිදු වෙන්න යන්නේ. මා ඔබතුමාගෙන් එක ඉල්ලීමක් කරනවා. බොරුවට මේ චෝදනාව ඉදිරිපත් කළා නම් ඒ චෝදනාව ඉදිරිපත් කරපු පුද්ගලයාට විරුද්ධව යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. මේ උත්තරීතර සභාව උපයෝගී කරගෙන අසත්‍ය චෝදනා ඉදිරිපත් කරන්න බැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දැන් තීන්දුවක් දීලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒ වාගේ වැරදි කළොත් ඒ පුද්ගලයාටත් දඬුවම් කරන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දැන් යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 01. නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම. ගරු ගුණරත්න වීරකෝන් මහතා. Before that, the Hon. Deputy Chairman of Committees will take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත
மீள குடியமர்த்துதல் அதிகாரசபை (திருத்தம்) சட்டமூலம்
RESETTLEMENT AUTHORITY (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 2.39]

ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)
(மாண்புமிகு குணரத்ன வீரகோன் - மீள்குடியேற்ற அமைச்சர்)
(The Hon. Gunaratne Weerakoon - Minister of Resettlement)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

[ගරු ගුණරත්න වීරකෝන් මහතා]

නැවත පදිංචි කරවීමේ අධිකාරිය සංශෝධන සහිත කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතයි.

2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරියේ වලංගු කාලය වසර හයකට නියමිතව තිබුණත් එය වසර නවයක් දක්වා දීර්ඝ කර ගැනීමේ බලය සහ අනුමතිය ඉල්ලීම තමයි මේ පනත් කෙටුම්පතේ සංශෝධනවල සඳහන් වන්නේ. මුල් පනත අනුව නැවත පදිංචි කරවීමේ අධිකාරියේ කාලය 2013.04.10 වන විට අවසන් වන නිසා එම අධිකාරිය තව වසර තුනකට දීර්ඝ කර ගැනීම සඳහා අදාළ සංශෝධන මෙම කෙටුම්පතේ අන්තර්ගත වෙනවා.

මෙහිදී නැවත පදිංචි කරවීමේ අධිකාරිය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සම්බන්ධව සඳහන් කළ යුතුයි. මෙම පනත අනුව මුල් කාලයේදී නැවත පදිංචි කරවීමේ අධිකාරිය ස්ථාපිත කරලා ඒ යටතේ උතුරු නැඟෙනහිර ප්‍රදේශවල අභ්‍යන්තරව අවතැන් වුණු අය නැවත පදිංචි කිරීම සඳහා මේ වන තාක් කල් විශාල කාර්ය භාරයක් ඉෂ්ට කර තිබෙනවා. ඒ කරුණු කිහිපය මේ අවස්ථාවේ සඳහන් කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාවිල් ආරු සටනින් පසු සිදු කරන ලද මානුෂීය මෙහෙයුම මඟින් අවතැන් වූ සියල්ලන්ම මේ වන විට නැවත පදිංචි කොට අවසන් කර තිබෙනවා. එමෙන්ම ඔවුන් සඳහා ප්‍රමාණවත් තරම් සහන රජය විසින් ලබා දෙනු ලැබූ බව උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 6.86 යටතේ සඳහන් වෙනවා. මම එය උපුටා දක්වනවා:

"අවතැන්වූවන්ට දෙන ලද සහන පැස තුළ තිබූ එක් එක් අයිතමයට සුදුසුකම්ලාභීන් හඳුනා ගැනීමේ දී පැවති අනවබෝධය නිසා සහන සැපයීමේ ක්‍රියාවලියේ කළමනාකරණ දුර්වලතා පිළිබඳ ඇතැම් චෝදනා තිබුණි. (සමහර සහන නව අවතැන්වූවන් සඳහා පමණක් සීමා විය.) උදාහරණයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රදානය කරනු ලැබූ මූල්‍ය ප්‍රදාන "නව අවතැන්වූවන්" සඳහා පමණක් සීමා විය."

එහි තව දුරටත් මෙසේ සඳහන් වනවා:

"දිසාපතිවරුන්ට අනුව, "නව අවතැන්වූවන්"ගෙන් බහුතරයකට නියමිත සහන රැසක් ලැබුණි."

මෙහිදී පැරණි අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ වගකීම උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභාව විසින් අවධාරණය කෙරෙන අතර, නැවත පදිංචි කිරීමේ කටයුතු මනා සම්බන්ධීකරණයකින් සිදු නොවන බව කොමිසම විසින් අවධාරණය කොට තිබෙනවා. ඒ නිසාම ප්‍රාදේශීය මට්ටමේ කාර්යාලවල දුර්වලතා එමඟින් අවධාරණය කොට තිබෙනවා. ඒ වාගේම දැනට යාපනය දිස්ත්‍රික්කයේ සුබසාධන කඳවුරු 37ක පවුල් 1295ක් සහ ඥාතීන් සමඟ තව පවුල් 5247ක් නැවත පදිංචි කිරීමට නියමිතව තිබෙන අතර එයට අමතරව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාම්පූර් ප්‍රදේශයේ පවුල් 1225ක් නැවත පදිංචි කිරීම සඳහා දැනට නියමිතව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිසි කළමනාකරණයක් සහ සම්බන්ධීකරණයක් සහිතව නැවත පදිංචි කිරීමේ කටයුතු හොඳින් සිදු කිරීම සඳහා නියම ආකාරයෙන් බලය පවරන ලද විධිමත් ආයතනයක පැවැත්මේ අවශ්‍යතාව මේ කාරණයෙන් තහවුරු වෙන අතර, නැවත පදිංචි කරවීමේ අධිකාරිය අප විසින් පිහිටුවනු ලැබුවේ ඒ නිසායි. ඒ වාගේම අද දවසේ ඉහත කී ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා තවදුරටත් මෙම අධිකාරිය ඉදිරි කාලය සඳහාත් පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව පැන නඟිනවා.

විශේෂයෙන් නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය සඳහා -මෙම වසරේ සංවර්ධන කටයුතුවලට වියදම් කිරීම සඳහා- 2013 වසරේ අය වැය ලේඛනයෙන් අතිගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට මිලියන 300ක් වෙන් කර තිබෙනවා. එම මුදල මුළුමනින්ම නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා පමණක් නොව නිවාස සෑදීම, නැවත පදිංචි කරන ජනතාවගේ සෞඛ්‍යාරක්ෂක පහසුකම් සැලසීම සඳහා යෙදවීම සිදු කරනවා. ඒ අයට නැවත ජීවිත ගොඩ නඟා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමත් මෙම කාර්ය පථයට අයත් වෙනවා. ඒ නිසාම උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද පරිදි ඉතා ඉක්මනින් අප විසින් ළඟා කර ගත යුතු සහ විසඳා ගත යුතු අභියෝග කිහිපයක් තිබෙනවා.

විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ තිස් අවුරුද්දක් පුරා පැවති ත්‍රස්තවාදී යුද්ධයෙන් දීර්ඝ කාලීන වශයෙන් අවතැන් වූ සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාව නැවත පදිංචි කරවීම ගැන. එම ත්‍රස්තවාදී යුද්ධය නිසා සරණාගතයන් ලෙස විදේශ රටවලට ගිය, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිර්ණායකයන් මඟින් තහවුරු කරනු ලබන සරණාගතයන් නැවත ලංකාවට කැඳවලා ඒ අය නැවත පදිංචි කරවීමේ කටයුත්ත සිදු කිරීම කළ යුතු වෙනවා. මේ අභියෝගය ජය ගැනීම සඳහා නැවත පදිංචි කරවීමේ අධිකාරියේ පැවැත්ම අත්‍යවශ්‍ය වී තිබෙනවා. අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරවීම පමණක් නොව අප හමුවේ තවත් විශාල අභියෝග රැසක් තිබෙනවා. විශේෂයෙන්ම නැවත පදිංචි කරවීමේ අධිකාරිය මඟින් මෙම අවතැන් වූ ජනතාව පදිංචි කරවීමෙන් පසුව ඒ අයගේ සුබ සාධනය සහ ඒ අයගේ ජීවිත ගොඩ නඟා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව පසු විපරම් කිරීම සඳහා අධිකාරිය මඟින් නිලධාරීන් යොදවලා වාර්ෂිකව කටයුතුවල නියැලෙනවා. මොකද, මේ නැවත පදිංචි කරවන ජනතාවගේ කටයුතු සොයා බලන්න සහ ඒ අයගේ නිවාස ප්‍රශ්නය පිළිබඳව සම්ක්ෂණ පවත්වන්න වෙනත් ආයතනයක් හෝ යන්ත්‍රණයක් අපේ අමාත්‍යාංශය තුළ නැති නිසා තමයි මෙම අධිකාරියේ පැවැත්ම අපට අත්‍යවශ්‍ය වී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අවතැන් වූ ජනතාව රටේ සංවර්ධනය සඳහා දායක කර ගැනීම මෙන්ම, එම ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම්, ජලය, සනීපාරක්ෂක පහසුකම් සැපයීම අත්‍යවශ්‍ය කාරණාවක්. මේ සඳහා නැවත පදිංචි කරවීමේ අධිකාරිය - ඒ ව්‍යුහය, ඒ යන්ත්‍රණය- අපි මේ වන විටත් යොදා ගෙන තිබෙනවා. ඒ වාගේම මේ කටයුතු සිදු කරමින් පවතින නිසා ඉදිරි කාලය සඳහා -ඉදිරි වසර තුන තුළ සඳහ- මෙම අධිකාරිය බල සහිත කර ගැනීම සඳහා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරන්න කටයුතු කරනවා.

උතුරු නැඟෙනහිර නැවත පදිංචි කරවන ලද ජනතාව සඳහා නැවත පදිංචි කරවීමේ අමාත්‍යාංශය විසින් නිවාස 6,670ක් පමණ මේ වන විට ගොඩ නඟා ඇති අතර, ඉන්දියානු නිවාස ව්‍යාපෘතියද ඇතුළත්ව නව නිවාස 87,264ක් ඉදි කිරීමට නියමිතව තිබෙනවා. නිවාස 27,121ක් අලුත්වැඩියා කිරීමට ද නියමිතයි. ඉදිරි කාලය තුළ තවත් නිවාස 20,000ක් පමණ ඉදි කිරීම සඳහා සැලසුම් සකස් කළා වාගේම එය ක්‍රියාවට නැඟීමද අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිවාස ගොඩ නැඟීමේ කාර්ය භාරය සාර්ථකව ඉෂ්ට කර ගැනීම සඳහා තාක්ෂණික නිලධාරීන් සහ ඉංජිනේරුවන් බඳවා ගැනීම අපේ අමාත්‍යාංශයේ වෙනත් ආයතනයකට කළ හැකි දෙයක් නොවෙයි. අධිකාරිය යටතේ තමයි මෙම නිවාස ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉංජිනේරු මහත්වරු සහ අනෙකුත් තාක්ෂණ නිලධාරීන් බඳවා ගැනීම කළ යුත්තේ. අපි දැනට ඒ කටයුතු සිදු කරමින් පවතිනවා. සුදුසුකම්

ලක් එවැනි නිලධාරින් හිඟකම අපට දැනට බලපා තිබෙනවා. අපි පසු ගිය සතියේ කේපාපිලව් කියන ප්‍රදේශයේ ස්ථිර නිවාස 50ක් හදලා ජනතා අයිතියට පත් කරනු ලැබුවා. තව නිවාස 164ක් හදන්නට මුල් ගල තබනු ලැබුවා. මෙහිදී සඳහන් කළ යුතුයි, අපි එක නිවසක් සඳහා වෙන් කරන මුදල රුපියල් 3,85,000ක් පමණ වන බව. එහිදී අපට යුද හමුදාව ලබා දෙන සහයෝගය ඉතාම අගය කළ යුතු වෙනවා. පසු ගිය දිනවල ඒ ප්‍රදේශයේ නිවාස සෑදීමේදි අපි ද්‍රව්‍ය අර ගෙන දුන්නාම, යුද හමුදාවේ මේජර් ජනරාල් මාර්ක් මහත්මයා ඇතුළු කාර්ය මණ්ඩලය තමයි ශ්‍රමය යොදවලා ඒ නිවාස 50 ඉතාම ඉහළ තත්ත්වයෙන් හදලා තිබුණේ. ඒ වාගේම ඉදිරි කාලය තුළ තවත් නිවාස 164ක් හදන්නට බලාපොරොත්තු වෙනවා. ඉදිරි කාලය තුළත් මෙම නිවාස සෑදීමේදී මෙම අධිකාරියේ අධීක්ෂණය යටතේ යුද හමුදාව සමඟ සහයෝගයෙන් වැඩ කරන්නට, එකතු වෙලා වැඩ කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

අප අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ උතුරේ අවතැන් වූ මුස්ලිම් ජනතාව සඳහා වෙනම ලේකම් කාර්යාලයක් මීට පෙරාතුව ගොඩ නඟලා තිබුණා.

ඒ කාලයේ නිවාස 5,525ක් පුත්තලම ප්‍රදේශයේ හදලා අවතැන් වූ මුස්ලිම් ජනතාවට අවශ්‍ය පහසුකම් සලසා දුන්නා. ඒ කාලය තුළත් නැවත පදිංචි කරවීමේ අධිකාරිය තමයි එම ලේකම් කාර්යාලය සමඟ ඒකාබද්ධව සහයෝගයෙන් එම නිවාස 5,525 පුත්තලම ප්‍රදේශයේ ගොඩ නැඟුවේ. එය විශාල කාර්ය භාරයක්. එය සිදු කළේ දැනට අවුරුදු තුනකට විතර කලින්. ඒක අමාරු කාර්යයක්. මේ අධිකාරිය ඒ කාලයේ සහයෝගය දීලා ඒ කාර්යයත් ඉෂ්ට කළා. මෙවැනි කාර්යයන් කිරීම පිණිස අදාළ රේඛීය අමාත්‍යාංශ සම්බන්ධීකරණය කිරීම සඳහා විශේෂ ආයතනයක් අවශ්‍ය නිසා තමයි නැවත පදිංචි කරවීමේ අධිකාරිය ගොඩ නැඟුවේ. එය තවදුරටත් පවත්වාගෙන යෑම සඳහා තමයි, වසර තුනකට බල සහිත කිරීම සඳහා තමයි මේ උත්තරීතර සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අද මෙම සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපේ අමාත්‍යාංශය විසින් සිදු කරන ලද කාර්ය භාරයන් සමහර වෙලාවට අභියෝගවලට ලක් වෙනවා. අමාරු විෂයයක්, අමාරු කාර්ය භාරයක් තමයි උතුර සහ නැඟෙනහිර ප්‍රදේශවල අප විසින් ඉෂ්ට කරනු ලබන්නේ. අපට තිබෙන සීමිත සම්පත් තුළ එම කාර්යය උපරිම ආකාරයෙන් ඉෂ්ට කිරීම සඳහා අපි හැම උත්සාහයක්ම දරමින් සිටිනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමා, උතුර නැඟෙනහිර බල ප්‍රදේශයේ යුද්ධයෙන් විපතට පත් ජනතාවට නිවාස පහසුකම් සලසා දීමේ කර්තව්‍ය ක්‍රියාත්මක වන්නේ ඇත්ත වශයෙන්ම ඉබි ගමනින්. බොහොම නිදාගිලීවයි එය ක්‍රියාත්මක වන්නේ. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා සඳහන් කළා නිවාස අසූහත්දහස් ගණනක් ඉදි කරන්න සැලසුම් කර තිබෙනවා කියලා. යුද්ධය අවසන් වුණේ 2009 මැයි 18 වැනි දා. මේ 2013 අවුරුද්ද. යුද්ධය නිම වෙලා වසර හතරකට ආසන්න වීමට තිබියදීත් විපතට පත් ලක්ෂ ගණනක් වූ ජනතාව වෙනුවෙන් නිවාස වැඩ සටහන ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ නිවාස ඇමතිතුමා තවමත් කිසිම උත්සාහයක් අරගෙන නැහැ. පිට රටවලට පින් සිද්ධ වන්න තමයි ඒ ගෙවල් ටික හැදෙන්නේ. විපතට පත් වූ ජනතාවට අඩුම ගණනේ හිසට සෙවණක් ලබා දෙන්න කටයුතු කරන්නේ කවදාද?

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා සඳහන් කළ කාරණය සියයට සියයක් නිවැරැදි නැහැ. තමුන්නාන්සේ මා සමඟ එකඟ වනවා නම්, මා තමුන්නාන්සේට ආරාධනා කරනවා අප උතුරු ප්‍රදේශයට යන වෙලාවක තමුන්නාන්සේත් පැමිණෙන්න කියලා. අපි ආදර්ශ නිවාස ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කර තිබෙනවා. එකක් තමයි, මන්නාරම පාරේ තිබෙන ආදර්ශ නිවාස ව්‍යාපෘතිය. එතැන 50 දෙනකුට නිවාස හදා දීලා තිබෙනවා. ඒක කළේ මහජන බැංකුවෙන්. ලක්ෂ 10ක් පමණ වටිනවා ඒ එක නිවාසයක්. එවැනි නිවාස 50ක් මඩු ප්‍රදේශයේත් හදලා තිබෙනවා. ලක්ෂ 10කට වඩා වටිනවා ඒ නිවාසයක්. මහජන බැංකුවෙන් තමයි හදලා දුන්නේ. මඩු ප්‍රදේශයේයි ඒවා හැදුවේ. ඊට අමතරව, උතුරේ මුලතිව් දිස්ත්‍රික්කයේ කෝම්බාවිල් කියන ගමේ නිවාස 206ක් හදා දීලා තිබෙනවා. මුල් ගෙවල් ලබා දෙන තුරු පර්චස් 40 බැගින් ලබා දීලා, ඒවායෙහි නිවාසය බැගින් හදා දීලා, වැසිකිළි වෙනම හදා දීලා තිබෙනවා. තවම ඒවාට විදුලිය නැහැ. ළිං කපලා ජලය ලබා දුන්නා. අපි පවුල් 206ක් එතැන පදිංචි කරවලා තිබෙනවා. දැන් ඒ අය පර්චස් 40 බැගින් වූ ඒ බිම්වල වගා කටයුතු කරලා තිබෙනවා. කලින් ජල හිඟයක් තිබුණා. දැන් ජල හිඟය මඟ හැරිලා තිබෙනවා. විදුලිය ලබා දෙන්න ලොකු පහසුකමක් අපට නැති නිසා අපි ජෙනරේටරයක් ලබා දුන්නා යුද හමුදාවට. නමුත් ජෙනරේටරය මඟින් ඒ ගම්මානයට විදුලිය ලබා දීමේදී -wiring කිරීමේදී- විදුලිබල මණ්ඩලය අනුමැතිය ලබා නොදෙන නිසා ඒ ගම්මානයට විදුලිය ලබා දෙන්න තවම බැරි වුණා. කේපාපිලව් ගම්මානය කියන්නේ පසු ගිය දවස්වල මහා ආන්දෝලනයක් තිබුණු තැනක්. නමුත් ඒ අයට මුල් ඉඩම් නිදහස් කරන තුරු නිවාස සෑදීමේ කාර්යයට අත ගසන්න අපේ අමාත්‍යාංශයට බැහැ. ඒ නිසාම අප මුලතිව් දිසාපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා ඉතාම සරු සාර ඉඩමක් දිසාපතිතුමා හරහා ලබාගෙන ඉතාම හොඳ තත්ත්වයේ ගෙවල් 50ක් හදලා දුන්නා. තවම ඒවාට විදුලිය දෙන්න බැරි වුණා. ජල පහසුකම් තවම ඒ හරියේ නැහැ. නමුත් නිවාස සෑදීම මඟින් හිසට සෙවණක් හදලා ගිය සතියේ පවුල් 50ක් පදිංචි කළා.

තව මාස තුනක් ඇතුළත තවත් පවුල් 116ක් වෙනුවෙන් එවැනිම නිවාස 164ක් හදන්න, ඒ සඳහා තුන්වැනි නිවාස ව්‍යාපෘතියත් ආරම්භ කරලා පදිංචි කරවන්න අපි බලාපොරොත්තු වෙනවා. ඔබතුමා ප්‍රායෝගිකව මේ සභ්‍ය පිළිගන්නට ඕනෑ. සුනාමි ව්‍යසනය ආවා. සුනාමි ව්‍යසනය ආවාට පසුව ලෝකයේ බොහෝ රටවල් අපට ආධාර කළා. ඒ අවස්ථාවේදී රාජ්‍ය නොවන සංවිධානත් ඇවිල්ලා නිවාස හැදුවා. අද ඒ නිවාසවලින් භාගයට භාගයක් ඉවරයි. තමුන්නාන්සේ රත්ගම ප්‍රදේශයට ගිහින් බලන්න, ඒ ඔක්කොම සුනාමි ව්‍යසනය ඇති වුණාට පස්සේ හදිසියට හදපු නිවාස. දැන් ඒ නිවාසවල පදිංචි වෙලා ඉන්න බැහැ. නමුත් අපට මේ අභියෝගය -නිවාස ලක්ෂයක් හැදීමේ අභියෝගය- තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, ඒවා හැදුවේ නාගරික සංවර්ධන අධිකාරියේ සැලැස්මට.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මම පෞද්ගලිකවම ඒ ගැන දන්නවා. මම ගාල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්. සුනාමිය ඇති වුණු වෙලාවේ ඉඳලා අවසානය දක්වාම අපි ඒ කටයුතුවලට මැදිහත් වුණා. රාජ්‍ය නොවන සංවිධාන ඇවිල්ලා කොන්ත්‍රාත්කරුවෝ කැඳවලා ගෙවල් හදන්න භාර දුන්නා. ඒ අය ගෙවල් හැදුවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

UDA එකේ සැලැස්මට තමයි ඒවා හැදුවේ.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

සැලැස්ම ඒකේ වුණාට හැදුවේ පෞද්ගලික කොන්ත්‍රාත්කාරයෝ. අමු ලී දාලා තමයි ඒ ගෙවල් හැදුවේ. පාර දෙපැත්තේ ඉඳලා මිනිස්සු කෑ ගහනවා ගෙවල් දෙන්න කියලා. ගිහිල්ලා බලන්න, රත්ගම ගලගොඩ නිවාස යෝජනා ක්‍රමයේ නිවාසවල අද පදිංචි වෙන්න බැහැ. ඔක්කෝම ගෙවල් කඩාගෙන වැටිලා. එහෙම දෙයක් නොවෙයි මෙතැන සිදු කළ යුත්තේ. අපි මේ ජනතාවට තාවකාලික පදිංචිය සඳහා අවශ්‍ය පහසුකම් සලනවා වාගේම ස්ථිර නිවාසවල පදිංචි කරවන්න ලොකු උත්සාහයක් දරනවා. ඉන්දියානු රජය මේ වන විට නිවාස 50,000ක,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මට එක පුංචි ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද? මම බොහොම ධනාත්මකවයි මේක අහන්නේ. ගරු ඇමතිතුමනි, දැන් ඉන්දියානු රජය නිවාස 50,000ක් හදන්න ලැහැස්තියි. වසර ගණනාවක් මුළුල්ලේ ඉන්දියානු රජය බලාපොරොත්තුවෙන් සිටිනවා විපතට පත් වුණු ජනතාවගේ, ඒ කියන්නේ ප්‍රතිලාභී ලැයිස්තුව සකස් කරයි කියලා. දැන් මේ ප්‍රතිලාභී ලැයිස්තුව සකස් කිරීමේ ක්‍රියාවලියට දේශපාලන ඇඟිලි ගැසීම් ඇවිල්ලා තිබෙන නිසා ඒ නිවාස 50,000න් 1,000යි පටන් අරගෙන තිබෙන්නේ.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන මා සඳහන් කළ යුත්තේ මෙයයි. අපේ අමාත්‍යාංශය තුළින් අවශ්‍ය දත්ත සපයනවා. ඒ දත්ත සැපයුවාට පස්සේ ජනාධිපති කාර්ය සාධක බල කාය තමයි ඒ කටයුත්තේ නිරත වන්නේ. අපි දත්ත සපයනවා. අපි මේ සියලු දත්තයන් ලබා ගෙන තිබෙන්නේ ග්‍රාම නිලධාරි මහතා, ප්‍රාදේශීය ලේකම්වරයා, ඒ වාගේම දිස්ත්‍රික් ලේකම්වරයා හරහායි. එසේ ලැබෙන දත්ත තමයි අපි ළඟ තිබෙන්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු ඇමතිතුමා, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන්.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

අපට දත්ත ලබා ගැනීමේ වෙනත් ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා මෙන්න මේ කාරණයත් ඔබතුමාට සඳහන් කරන්න ඕනෑ. ඔබතුමන්ලා අහනවා අවුරුදු 4ක් ගත වෙලා තිබෙනවා, නමුත් මොකක්ද සිදු වුණේ කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ, නැහැ. එහෙම නොවෙයි මම කිව්වේ. අවුරුදු 4ක් ගත වෙලා අවසානයි,-

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

අවුරුදු 4යි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔව්, හරි. අවුරුදු 4ක් ගත වෙලා තිබෙනවා. නිවසක් නොමැතිව ඇයි තවමත් ලක්ෂ 2ක් මහ පාරේ ඉන්නේ?

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු මන්ත්‍රීතුමා, ජනතාව මහ පාරේ නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු ඇමතිතුමා, දැන් කථාව අවසාන කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

තමන්ගේම නිවසක් නොමැතිව ඇයි ජනතාව මහ පාරේ ඉන්නේ?

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

මහ පාරේ නැහැ. එහෙම කියන්න එපා. එහෙම නැහැ. ගිහිල්ලා බලන්න ජනතාව මහ පාරේ ඉන්නවාද කියලා. උතුරු නැහෙනහිර ප්‍රදේශවලට ගිහිල්ලා ජනතාව මහ පාරේ ඉන්නවාද කියලා පොඩ්ඩක් බලන්න. මහ පාරේ නැහැ.

දෙවැනි කාරණය මෙයයි. මම ප්‍රායෝගිකව කල්පනා කරන දේ, එහේ ගියාම පෙනෙන දේ, එහේ ගියාම දකින දේ තමයි තව අවුරුදු 6ක්වත් යනවා අපට යම් තැනකට එන්නට. යුද්ධය අවසන් වූ දිනයේ ඉඳලා අවුරුදු 10ක්වත් යාවි යම් තැනකට එන්න. මේක ලෙහෙසි දෙයක් නොවෙයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නැවත පදිංචි කිරීමේදී ඇතැම් පාර්ශ්ව දූර්වලතා පිළිබඳව කථා කළත්, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව මඟින් අවධාරණය කොට ඇති කරුණු දෙකක් අවසන් වශයෙන් මම උපුටා දක්වන්න කැමැතියි. එම කොමිෂන් සභා වාර්තාවේ 290 වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "2005 අගෝස්තු මාසයේ දී කත්‍රිනා චණ්ඩ මාරුතය අමෙරිකානු වෙරළ කලාපය හරහා හමා යද්දී ක්ෂණිකව දශ ලක්ෂයකට වඩා වැඩි ජනතාවකට තම නිවාස සහ පදිංචිව සිටි ස්ථාන අතහැර යාමට සිදුවිය. (2008 ජනවාරිවල මෙම පත්‍රිකාව පළ විය) අද වන විට අමෙරිකානු වෙරළබඩ ප්‍රදේශයේ දස දහස් ගණනක් ජනතාව අවතැන්ව සිටී."

එය උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ පිටු අංක 290හි සඳහන් වාර්තාවක්. ඇමෙරිකාව වගේ ධනවත්, බලවත් රටකට එවැනි ස්වාභාවික ව්‍යසනයකට මුහුණ දුන්නා. ඇමෙරිකාව කියන්නේ අපේ රට

වාගේ පුංචි රටක් නොවෙයි, බොහොම බලසම්පන්න රටක්. එම වාර්තාවේ සඳහන් වූ කරුණක් තමයි මම ප්‍රකාශ කළේ. ඒ අතින් අපි අපට කළ හැකි දේ, කළ යුතු දේ අපි උපරිම මට්ටමින් ඉෂ්ට කරලා තිබෙනවාය කියන කාරණය මේ සභාවේ දැන ගැනීම සඳහා ප්‍රකාශ කරනවා. ඒ වාගේම අවතැන් වූ ජනතාවට සැනීමකට පත් විය හැකි වාතාවරණයක් නිර්මාණය කර ඔවුන් යළි ජාතික ආර්ථිකයට සම්බන්ධ එලදායී පුරවැසියන් බවට පත් කර ගැනීම අප අමාත්‍යාංශයේ අභිලාෂය හා විෂය පථය බව මෙහිදී සඳහන් කළ යුතුයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Minister, please wind up. You started your speech 14 minutes late. Therefore, I cannot allow you to take extra time.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

එසේ සඳහන් කරමින් මම මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[3.00 p.m.]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

Hon. Deputy Chairman of Committees, the Resettlement Authority (Amendment) Bill seeks to amend the validity period of the Act from six years to nine years. But, now the Hon. Minister said that he will need six more years. That is about 10 years. Then, what is the use of extending the period again? You have now asked for 10 years.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

I listened to you, Hon. Minister. Do not disturb me. You have asked for 10 years.

So, you are admitting that you have not been able to do the work. What you now told is that you have built 470 houses in four years. That means, 117 houses a year. Any private company which is building homes will build more than 117 houses for a year and out of the 50,000 houses that are to be built by India, only 1,000 houses have been built. So, this is a pathetic state of affairs. Actually, I did not believe it earlier. But after I heard this, I thought the preamble in the Draft Resolution that is coming up today in the United Nations Human Rights Council seems to be correct. It says, I quote:

> "Welcoming and acknowledging the progress made by the Government of Sri Lanka in rebuilding infrastructure, demining, resettling the majority of internally displaced persons, and noting nonetheless that considerable work lies ahead in the areas of justice, reconciliation and resumption of livelihoods, and stressing the importance of the full participation of local populations, including representatives of civil society and minorities, in these efforts, ..."

I thought this was just some padding put into the preamble. But, when the Minister says that they have built only 470 houses in four years, then to build all these houses, he will need about 250 years and not 10 years. So, there seems to be some truth in this preamble and we were thinking that it was just some untruth that was put in by the NGOs. I will not take time to describe the pathetic state of affairs of the North because we are running short of time. I will leave it to some of my Colleagues in the Opposition.

You have built some of the roads. Okay, the roads are good and I must say that the army has done its share in building the infrastructure in the Vanni but we have not put the people back to work. We have not got them really resettled in a way which they can carry on with their day-to-day lives. Most of all, we do not even treat them with dignity. I mean, their claim that they are not being regarded as citizens in their own country has some basis. When you do not allow people to sing their own National Anthem, then what else can you not do? The Hon. Minister has only confirmed that the Resettlement Authority really has not started its work. Where is the political right? This is why we always ask you to hold the Northern Provincial Council Elections and let the members of those Provincial Councils get involved in it. Without having the Provincial Council Elections, you cannot put the North in order. There are protests going on in the North and now you come to the House and admit that you did not even build 500 houses.

When you look at the Resettlement Authority, look at the policy background of the Government by which the Resettlement authority operates. The Government's twin policies are reconciliation and accountability. That is contained in the Resolution that the Government of Sri Lanka moved in the Human Rights Council together with members who were supporting them in 2009. The Resolution endorses the joint communiqué issued at the conclusion of the visit of the Secretary-General. In that Joint Statement by the UN Secretary-General and the Government of Sri Lanka, what have they said? They have said that they committed themselves to address the aspirations and grievances of all communities and work

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

towards a lasting political solution and they have resolved to proceed with the implementation of the Thirteenth Amendment to the Constitution and to begin a broader dialogue with all parties, including the Tamil parties. That is one part.

Secondly, when the Secretary-General underlined the importance of an accountability process for addressing violations of international humanitarian and human rights law, the Government agreed to it.

These are the two documents: the Resolution of 2009 and the Joint Communiqué. And there is of course, the supplementary commitment made by the Government to the Darusman Committee. When you met the Darusman Committee, they specifically committed themselves to the fact that those who are involved - the security force personnel who are involved in violation of human rights law - can be tried under the court-martial or under the general law, by the civil courts of the country. So, these are commitments made by the Government. We, in the Opposition, did not ask for it, but we welcome the Resolution of 2009 as well as the Joint Communiqué by the Secretary-General and the Government.

We have to ask one question by looking at the charges that are being made. What made you to make these commitments? Kindly tell this to the House. Everyone is saying that we are traitors, we are not supporting the Government and we are not giving them help. What made you to make these commitments? In 1991, President Premadasa's Government did not agree to international inquiry. But, we allowed the Amnesty International, the Human Rights Watch - you name it, anyone - to come and inquire it by themselves. So, though we did not accept the principle, we allowed all the human rights agencies to come in. I was the one who was responsible for handling them.

In 2003, we agreed to a political solution. We asked for help in reconstructing Sri Lanka. But, I said, "We cannot agree to join the International Criminal Court. We have not yet finished the war. We have only a ceasefire". So, now, we have changed that and we have come to the other way in 2009. Okay, you did it. I am not complaining. But, I think the country wants to know what made you to make these commitments.

Then, thereafter, you appointed the LLRC and the LLRC brought out its Report. The TNA gave evidence before the LLRC but the UNP did not. But, we have accepted many of those recommendations. Now, the issue is, why are you not implementing these recommendations? We have given you all the assistance. We said, we are prepared to sit down and let us start implementing the LLRC recommendations to which Opposition parties have given their observations. We are ready to start on it. I mean, we do not want to rush to Geneva. Again, I must say that last time I advised Hon. Sampanthan that he should not go to Geneva. He did not go to Geneva. I thanked him and I must apologize to him that though I tried to move to get the Government to agree to the formula we had of the TNA coming into talks, that was not accepted. Again, feeling rather shy, I told him, "Sam, I do not know. This time I could not help but it is up to you to decide. I do not think that you should go to Geneva". He did not go to Geneva. I must thank him again in this House. It is useless attacking the TNA. The Leader of the TNA did not go to Geneva.

We are asking the Government, - I am happy that the Hon. Minister in charge is here - though I may not be able to stay in the House for too long, you could tell me and all my Colleagues here - why you are you not working with us to implement the recommendations of the LLRC Report? After all, in the Resolution of 2009, you all agreed to bring about lasting peace and development in Sri Lanka based on a consensus. What is the consensus if you keep all of us out? You are not implementing the recommendations of the Report and day by day, the situation in the North gets worse.

We were told that the Government did not want the Thirteenth Amendment. You did not want to hold the Northern Provincial Council Election, but now you have agreed to hold the Northern Provincial Council Election. That was conveyed, I think, by third parties to the movers of the Resolution. So, at least, you are holding the Northern Provincial Council Election. Then, why do you not want to implement these recommendations?

Is it that you do not like the independent commissions and you do not want the strengthening of democratic institutions, which the LLRC Report recommended? Now, while you are holding the Northern Provincial Council Election, I would ask the Minister, are we going to have the Independent Police Commission, not this Parliamentary Council and its Police Commission? Are we going to have the Independent Election Commission? Can we go back to the Seventeenth Amendment? There is still time; it is before September. Let us pass some laws; let us start from there; let us start with the independent Commissions. There is still time. What is the use of holding the Northern Provincial Election without having the independent commissions?

I got a taste of it when I went there. The army personnel came; there was a special squad; they came in civvies. They came to disturb and the people who were arrested were handed back to the army, and then the DIG said, he does not know what happened. The members of the army, the members of the security forces, have given me all the details. So, if that happened to me when there was no election, what chance do you have when you have provincial elections? So, I welcome the Government's commitment but to make it a lasting commitment, we should have the Independent Election Commission, the

Independent Police Commission, and the Independent Public Service Commission. That is essential if we are to hold the Northern Provincial Election.

I will not take too much of time. I saw the Minister, the Hon. Mahinda Samarasinghe has said, "Navi Pillay has gone beyond the mandate". I am asking, why are you blaming Navi Pillay? I mean you all are the ones who gave them the mandate. You invited her into the house, you opened the door, you gave a desk, you gave a chair, you gave the papers, you put on the lights, you put the A/C and after she writes the report, you are complaining. I mean, you did everything; you called her in; you gave her all the powers. Now, what is the use of complaining? We can complain saying you went and gave all these powers to the Human Rights Council, but you cannot complain.

So, all I would like to say is, in this present situation we are in a difficult position. But, we are prepared to work with the Government to implement the LLRC Report to make it a reality. Let us start from there. Hon. Minister, then you can accept this offer. We have given proposals, but it must be a genuine consensus and a genuine participation because even if the Resolution is passed, there is time; we can show that we are interested in implementing. When I made this statement, I got abused all around but I made it in all seriousness. In my view, we are facing these issues because you are refusing to give a commitment to implement the LLRC Recommendations, to reach a consensus on the political freedom of this country. Why are you taking this step? If you take this step, if you agree with us, it will benefit all the people. Now, the only conclusion that I can come to is that you are willing to sacrifice the good name of the country just to hang on to power.

In the meantime, we have to remember while we are talking and debating here, there are hundreds of thousands of our citizens in the North who are still suffering. I have been there once or twice; I have seen the pathetic state. I feel ashamed to be a Sri Lankan. To have been born in the North of Sri Lanka is worse than having been born in Afghanistan. That is all I can say. But, we are still prepared to make this offer. If you will accept it, let us sit down and see that there is genuine co-operation to implement the LLRC Report.

[3.13 p.m.]

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்டலு வல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)

Hon. Deputy Chairman of Committees, what we are debating is a legislation to amend Section 32 of the Resettlement Authority Act. This is an Authority which came into existence on the 10th of April, 2007, and the period of office of the Authority in terms of the existing law comes to an end on the 10th of April 2013; that is very shortly. The Hon. Minister gave us an account of what had been accomplished so far with regard to the resettlement of internally-displaced persons. It was admittedly a very complex task because at the time the hostilities ended in May, 2009, there were approximately 296,000 people who had been displaced by the conflict.

I do not think that anyone will seriously contest that a very substantial amount of work has been done. This needs to be consolidated. There is further work to be done although the process is almost complete and the purpose of amending Bill is to secure for the authority three more years within which to complete its work.

Now, resettlement of internally-displaced persons was one of the most significant challenges which the country was confronted with when a conflict which has spanned three long decades came to an end. So, that was work which had to be given priority; it had to be undertaken as an essential aspect of the initiatives that were necessary for a society from transition, from conflict, to peace and stability.

The Hon. Leader of the Opposition referred to some developments in the Human Rights Council. As the country's Minister of External Affairs, on a day when the vote is due to be taken in Geneva, I would like to deal with some of the broader issues involved particularly because the Hon. Leader of the Opposition made some reference to them. I would like to take this opportunity, Hon. Deputy Chairman of Committees, to express my thoughts on some of these issues.

The first point I would like to make is with regard to those who sponsored the Resolution as of this morning. That is very significant. There are 32 countries -

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Or more.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
Yes. Of course, other countries will be added to the list. - [*Interruption*.] The Hon. Leader of the Opposition was not interrupted when he made his views and when the Government is speaking on an important issue, I think the least we can expect is that there would be an atmosphere of seriousness in this Chamber.

Sir, the original Resolution that was presented in the Human Rights Council had 32 sponsors. Of the 32

[ගරු (මහාචාර්ය) කේ. එල්. පීරිස් මහතා]

sponsors 29 countries were from Europe; 29 out of the 32 were from Europe. Then, there were two countries from North America. That is, the United States and Canada. The only other country that was sponsoring the Resolution initally - now, I think that is important, of course, the other countries would join later. Of the 32 countries that sponsored the Resolution, all except one, came from Europe or North America - was Saint Kitts and Nevis. So, the point I am making is that these sponsors came, not at all, from Asia; not one country from the Continent of Asia, not one from Africa. Nobody from the Caribbean except Saint Kitts and Nevis. So, the geographical dimension of the countries that were sponsoring the Resolution say something about the focus, where it is coming from, the motivations. The Human Rights Council is a body that was set up by the General Assembly of the United Nations and its conspicuous characteristic, of course, is its global character. It is the Human Rights Council which encapsulates the vision of the entire world with regard to human rights and this is a Resolution about Sri Lanka, a country in South Asia. Surely, is it not remarkable that not one country from any of these continents sponsored the Resolution? So, I would like that to be reflected upon by this august Assembly because I think it is a circumstance that is more than relevant. I think it is a circumstance that is very important.

Then, when a resolution is brought, it must be objective; it must be fair. That is very essential. If I am criticizing you and if you want to take my criticism seriously, you must in your own conscience feel that there is substance and justice in this criticism. That is human nature. Nobody is going to respond constructively to criticism if the person to whom the criticism is addressed sincerely believes, on substantial grounds, that the criticism is unjust and totally unfounded.

Now, I want to tell this honourable House that on the first occasion, when the Representative of the United States met me and indicated that a Resolution would be moved in Geneva on this occasion, I was categorically told that this is a procedural resolution, it is not a condemnatory resolution; it is a resolution that is going to be balanced. I was specifically told that the Resolution would recognize the positive achievements of the country; what had been accomplished on the ground. I was told that reference would be made to those positive elements. The Resolution, I was told, was going to recognize what had been done and subsequently draw attention to what needed to be done. So, it is in that sense that I was told by the Representative of the United States that this was going to be a balanced Resolution; positives and negatives. Both of these were going to find expression in the text of the Resolution that was going to be presented in Geneva. This was the categorical assurance that I was given.

However, when we saw the draft, it became clear that there was not one word of acknowledgement about the positive things that have happened. Nobody can possibly maintain that nothing positive was done. There maybe disagreements about whether it was enough; whether it happened soon enough but nobody can possibly gainsay the fact that there were positive achievements. I was categorically told that those would be recognized, but that did not happen, not one word. Subsequently, it is because of the immense pressure that was brought to bear on the mover of the Resolution by a large number of countries, it was entirely because of the intensity of that pressure, that grudgingly a lukewarm reference was made to the positive achievements of the country. A large number of countries spoke to the mover of the Resolution and said, "This is not fair at all; this does not make sense; we cannot support this; this is entirely one-sided; you have to be factual; you have to recognize the reality of the situation". By all means, criticize what warrants criticism but you must have, not the largeness or the generosity of heart but a basic sense of justice and fairness that would impel you to recognize what has been done and to acknowledge. It is because that point of view was so persistently and vigorously expressed by a large number of countries that belatedly and, as I say, grudgingly, some words were added to make reference to the positive achievements.

Now, that is not really the spirit in which we would like our friends to act. We are told all the time by those who move resolutions of this kind, "We have only your best interest at heart; we have no other motivation. It is because we care about your welfare that we are resorting to actions of this kind". Surely, if that is the case, there must be even-handedness of approach, not a willful blindness with regard to what is demonstrably an accomplishment in exceedingly challenging circumstances. So, that approach, deliberately ignoring what has been done and focusing sharply and excessively on negative features, is not, to our minds, a hallmark of goodwill. I do not think that in our lives, from our friends and those who mean well, we expect that kind of attitude. So, this again is something very distressing, we notice, with regard to the manner in which events have moved during the last few weeks.

I also wish, Sir, to ask a question in all seriousness. We have seen the events that took place during the last few days. I would, in all earnest, request the mover of the Resolution to ask themselves, are they really pleased about the consequences they have produced? Not only within the shores of Sri Lanka but in neighbouring India, this Resolution has triggered a chain of events, a whole sequence of events which have played out during the last few days. Is it the case that those who moved the Resolution, who made a calculated, a deliberate decision to do so, when they look back on what they have done, in retrospect when they assess their own conduct in this matter, do they really feel that they have reason to be

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍යවේදින් ඝාතනය කරමින්, මාධ්‍ය ආයතන පොඩි පට්ටම් කරමින්, මාධ්‍ය ආයතනවලට ගිනි තබමින්කටයුතු කිරීමේ අරමුණ මොකක් ද? ඒ ජයග්‍රහණය තමුන්නන්සේලා උපයෝගි කර ගත්තේ ජනතාවගේ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්න නොවෙයි. ඒ ජයග්‍රහණය තමුන්නාන්සේලා උපයෝගි කර ගත්තේ මාධ්‍ය මර්දනය කරමින් තමන්ගේ අතට බලය අත්පත් කර ගන්නයි. එතැනින් නතර වුණේත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතමනි. එම ජයග්‍රහණය තව දුරටත් උපයෝගි කර ගත්තේ මොකක් වෙනුවෙන් ද? අධිකරණය තමන්ට ඕනෑ පරිදි තමන්ගේ අතට අරගෙන, තමන්ට ඕනෑ තීන්දු ලියවා ගන්නා තැනට තමුන්නාන්සේලා පරිවර්තනය කරමින් තිබුණා.[බාධා කිරීම] එතැනින් නතර වුණේත් නැහැ මූලාසාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල යළි ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කළ යුතුව තිබුණා. හැබැයි තමුන්නනාන්සේලා කටයුතු කළේ කොහොමද? කිසිදු දේශපාලන ව්‍යාපාරයකට, කිසිදු දේශපාලන කණ්ඩායමකට එම පළාත්වල නිදහසේ දේශපාලනය කරන්න අවස්ථාව දුන්නේ නැහැ. පසු ගිය පළාත්පාලන මැතිවරණයේදී අපි ඒ බව දුටුවා. සමහර අපේක්ෂක මහත්වරුන්ගේ ගෙවල් ඉදිරියේ තිබුණේ මොනවාද? හිස සුන් කර විනාශ කරන ලද සුනඛ සිරුරු![බාධා කිරීම] මොකක්ද ඒකෙන් කිව්වේ? "අද සුනඛයා, හෙට ඔබ" කියන පණිවුඩය තමයි ඒ ජනතාවට දුන්නේ. සාධාරණව රැස්වෙලා, සාධාරණව කථා කරන්න, රැස්වීමක් තියන්න අවස්ථාවක් දුන්නේ නැහැ. දෙමළ ජනතාවට මේ පළාතේ දේශපාලනය කරන්න අයිතියක් නැහැ, තමන්ගේ මාපට ඇඟිල්ලට හිර කරන ලද ජනප්‍රජාවක් හැටියට ඒ අයට සලකන්න තමයි තමුන්නාන්සේලා කටයුතු කළේ. තමුන්න්නාන්සේලාට දිගු මනසක් තිබුණේ නැහැ. තමුන්නාන්සේලාට පුළුල් හදවතක් තිබුණේ නැහැ. ඉතා කෑදර, ඉතා බලලෝභී, ඉතා කුඩා මනසකින් මෙහෙයවන පුද්ගලයන් බවට තමුන්නාන්සේලා පත් වෙලා තිබුණා. එහි ප්‍රතිඵල තමයි, අද රටක් හැටියටත් ජනතාවක් හැටියටත් අපට භුක්ති විඳින්නට සිද්ධ වෙලා තිබෙන්නේ.

එම නිසා මෙය කිසි සේත්ම මේ රටේ ජනතාව හෝ මේ රට හෝ වගකිව යුතු කරුණක් නොවෙයි. එක පවුලක බලය පාර්ලිමේන්තුව තුළද, ආණ්ඩුව තුළද සියලු රාජ්‍ය ආයතන තුළද, මිලිටරි ජුන්ටාව තුළද තහවුරු කර ගැනීම තමයි තමුන්නාන්සේලාගේ එකම ක්‍රියා මාර්ගය බවට පත් වී තිබුණේ. මේ කිසිදු අමාත්‍යාවරයෙකුට නිදහස් කොන්දක් නැහැ.

හැම කොන්දක්ම කඩපු, හැම මන්ත්‍රීවරයෙකුගේම හඬ යටපත් කරපු පාලනයකට අවතීර්ණ කරපු දොරටු විවෘත කර ගත්තා. ශිෂ්ට සම්පන්න සමාජයක්, ප්‍රජාතන්ත්‍රවාදය අපේක්ෂා කරන සමාජයක්, ජනතාවගේ යහ පැවැත්ම අපේක්ෂා කරන සමාජයක්, සිංහල, දෙමළ, මුස්ලිම් ප්‍රධාන ජන කොට්ඨාසවල ගෞරවය සහ අයිතීන් පිළිගන්න සමාජයක් කිසිසේත්ම මෙය අනුමත කරන්නේ නැහැ. තමුන්නාන්සේලා අනුගමනය කරන ලද ඉතාම ග්‍රාම්‍ය, ඉතාම වැරැදි, ඉතාම නොදියුණු, ඉතාම පහත් මානසිකත්වය විසින් තමයි මේ රට මෙතැනට ඇද දාලා තිබෙන්නේ. එහි ප්‍රතිඵල තමයි අද බුක්ති විඳිමින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු පළාතේ, නැගෙනහිර පළාතේ ජීවත් වන ජනතාවට එවැනි දේ කරන කොට ඉන්දියාවට මොනවාද තමුන්නාන්සේලා දුන්නේ? ත්‍රිකුණාමලයේ ස්වාභාවික වරායට ආසන්න සාම්පූර් භූමියෙන් වර්ග කිලෝමීටර් 625කට ආසන්න භූමියක් ඉන්දියානු ආර්ථික කලාපයකට දුන්නා. ඒ කලාපයේ ජීවත් වුණු, ඒ මහ පොළොව තමන්ගේ උරුමය බවට පත් කර ගත්තු පාරම්පරික දෙමළ ජනයා අද කොහේද ජීවත් වෙන්නේ? අදත් ත්‍රිකුණාමලයේ අවතැන් කඳවුරුවල ඒ පවුල් 321ක් ජීවත් වෙනවා. ඒ අයගේ ඉඩම් අද තමුන්නාන්සේලා දීලා තිබෙන්නේ ඉන්දියාවට. ඒ වාගේම තමයි, ලංකා බනිජ වැලි ආයතනය දෙන්න සැලසුම් කර තිබෙන්නේ කාටද? ඉන්දියානු බිර්ලා සමාගමට. මන්නාරම් ද්‍රෝණියේ තෙල් සම්පත දුන්නේ කාටද? ඉන්දියානු කෙයාන්ස් සමාගමට. දුරෙයප්පා ක්‍රීඩාංගණය අලුත්වැඩියා කරන්න දුන්නේ කාටද? ඉන්දියානු සමාගමකට. පලාලි ගුවන් තොටුපොළ අලුත්වැඩියා කරන්න දුන්නේ කාටද? ඉන්දියාවට. කන්කසන්තුරේ වරාය අලුත්වැඩියා කරන්න දුන්නේ කාටද? ඉන්දියාවට. මැදවච්චියේ ඉඳලා තලෙයිමන්නාරම දක්වා රේල් පාර හදන්න දුන්නේ කාටද? ඉන්දියාවට. ඕමන්තේ සිට කන්කසන්තුරේ දක්වා රේල් පාර හදන්න දුන්නේ කාටද? ඉන්දියාවට. ඒ ජනතාවට අයිතිවාසිකම් දෙනවා වෙනුවට, ඒ ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරනවා වෙනුවට තමුන්නාන්සේලාගේ එකම අරමුණ බවට පත් වී තිබුණේ ඉන්දියාවට දොළ පිදේනි දීම හරහා මෙම ප්‍රශ්නය විසඳන්නයි. ජනතාවගේ ප්‍රශ්න ගැන නොවෙයි තමුන්නාන්සේලා සැලකිල්ලක් දැක්වූවේ. එහි තිබෙන ස්වාභාවික සම්පත්, එහි තිබෙන ධන උල්පත් සියල්ල ඉන්දියානු සමාගම්වලට පැවරීම තමයි තමුන්නාන්සේලාගේ ඒකායන පරමාර්ථය බවට පත් වෙලා තිබුණේ. තමුන්නාන්සේලාගේ දේශපාලනයේ එකම දේ බවට පත් වී තිබුණේ අසල්වැසි රාජ්‍ය -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම මගේ කථාව අවසන් කරනවා.

අසල්වැසි රාජ්‍යයන්ට සන්තෝසම් දෙමින්, දොළ පිදේනි දෙමින් සනසා ගැනීම තමයි තමුන්නාන්සේලාගේ එකම පරමාර්ථය බවට පත් වෙලා තිබුණේ. එහෙම නැතිව ඒ පළාතේ ජනතාවගේ අයිතිවාසිකම් ලබා දීම නොවෙයි තමුන්නාන්සේලාගේ පරමාර්ථය වෙලා තිබුණේ.

මේ නැවත පදිංචි කිරීමේ අධිකාරිය මොනවාද කළේ? මම දන්නේ නැහැ, ඇයි මේ අධිකාරියේ කාලය තව දීර්ඝ කරන්නේ කියලා. කෝප් වාර්තාවෙන් මොකක්ද කිව්වේ? මේ අධිකාරිය එකතු කරන්න කිව්වා, පුනරුත්ථාපන අධිකාරියට. 2012 දෙසැම්බර් මාසය වන කොට මේ අධිකාරියේ හිටියේ සේවකයෝ දහතර දෙනායි. ඒ දහතර දෙනාත් අනියම් සේවකයෝ. 2011 අවුරුද්දේම තමුන්නාන්සේගේ ඔය අධිකාරිය කරපු වැඩේ මොකක්ද? තමුන්නාන්සේගේ අමාත්‍යාංශය හරි. හැබැයි අමාත්‍යාංශයකුයි, නැවත පදිංචි කිරීමේ -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම මගේ කථාව අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණු කියන්න ඉඩ දෙන්න. මේ අධිකාරියෙන් මොකක්ද කළේ? මන්නාරම සහ මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නිවාස 15ක් මහජන බැංකුවේ මුදල් ආධාර මත ඉදි කිරීම. ඔන්න කරපු එක කාර්යයක්. දෙවැනි කාරණය තමයි, වවුනියාව දිස්ත්‍රික්කයේ පාසල්වලට සහ යාපනය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයට පොත් ලබා දීම. මේ දෙක තමයි 2011 අවුරුද්දේ මේ අධිකාරියෙන් කරලා තිබෙන වැඩ දෙක. ඒ වාගේ වැඩ දෙකක් කරන්න මොකටද අධිකාරියක්?

ගරු ඇමතිතුමාගේ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය යටතේ බිම් බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය තිබුණා. ඒක තමුන්නාන්සේ යටතේයි තිබුණේ. දැන් ඒකත් ගත්තා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට. ඉතින් මේ ආයතනය මොකටද? මේක නඩත්තු කරන්න ඕනෑද? එදා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකා අනුව කළ සාකච්ඡාවල තිබුණේ, නැවත පදිංචි කිරීමේ අධිකාරිය පුනරුත්ථාපන අධිකාරියට ඒකාබද්ධ කළ යුතු බවයි. එසේ ඒකාබද්ධ නොකර නැවත මේ අධිකාරියේ කාලය දීර්ඝ කිරීම මහ ජනයාගේ මුදල් නාස්ති කිරීම හැරුණු කොට අන් යමක් නොවෙය කියන කාරණය සඳහන් කරමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

[අ.භා. 4.32]

ගරු ෆිලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා, ඉන්දියාවට යමක් දුන්නාය කියලා. ප්‍රශ්නය මේකයි. ඒ ඉන්දියාවට දීම නොවෙයි සිද්ධ වුණේ. ඉන්දියාවේ අරමුදල් ලවා අපේ රට සංවර්ධනය කිරීමයි සිද්ධ වුණේ; චීන අරමුදල් ලවා අපේ රට සංවර්ධනය කිරීමයි සිද්ධ වුණේ. එතැන තිබෙන්නේ concepts දෙකක්. ඊට වැඩිය මා ඒ ගැන කථා කරන්නේ නැහැ.

කෙසේ වෙතත්, ඉඩම් පිළිබඳ ප්‍රශ්නය මම බැලුවා. යාපනයේ වර්ග කිලෝමීටරයකට ජනගහනය ඉන්නේ 628යි. ත්‍රිකුණාමලයේ 17යි. මුලතිව්වල වර්ග කිලෝමීටරයකට ජනගහනය ඉන්නේ 25යි. ඒ නිසා ඒ පළාතේ ඉඩම් ප්‍රශ්නයක් නැහැ. ඉඩම් ඕනෑ තරම් තිබෙනවා. ඒ පළාතේ ජන ඝනත්වය අඩුයි. ඒ නිසා ඉඩම් පිළිබඳව නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. ජනතාව අවතැන් වෙලා සිටින්නේත් ලංකාවේ විතරක් නොවෙයි. අවතැන් වූ පිරිස් විශාල වශයෙන් ඉන්නවා; රටවල් කීපයක ඉන්නවා. මා ළඟ වාර්තාවක් තිබෙනවා. ඒ වාර්තාවේ තිබෙනවා, මේ රටේ, ලෝකයේ ජනතාව කොහොමද අවතැන් වෙලා තිබෙන්නේ කියන කාරණය.

එක්සත් ජාතීන්ගේ ප්‍රකාශය අනුව අවතැන් වුණු අය විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඇෆ්ගනිස්තානයේ 493,000ක් ඉන්නවා. ඇංගෝලාවේ, බොස්නියාවේ, සයිප්‍රසයේ, ඉන්දුනීසියාවේ වාගේම ඉන්දියාවෙත් ඉන්නවා. ඉන්දියාවේ 540,000ක් දෙනා අවතැන් වෙලා, කාශ්මීර් ප්‍රශ්නය නිසා. මට මතකයි, අපි ඔය ගැන කථා කරලා සොයා බලද්දී කැනඩාවේ සිටියේ බොහොම සුළු ගණනක්. දැන් ඒ සංඛ්‍යාව ලක්ෂ තුනක් වෙලා. අපේ ද්‍රවිඩ සහෝදරයෝ එහාට සංක්‍රමණය වෙලා. ලංකාවට එන්නේ නැහැ, ඒ ගොල්ලෝ. එහේ හොඳ ලස්සනට ජීවත් වෙනවා. ලංකාවට එන්නේ නැහැ. සමහර අය බොරු ලේඛලයක් ගහ ගෙන ඉන්නවා. මේ රට හොඳ වෙනවාට කැමැති නැහැ. කැමැති වුණොත් එන්න සිදු වන නිසා නොයෙකුත් උපක්‍රම යොදලා අපට කරදර කරන්න හදනවා.

කෙසේ වෙතත් පොන්නම්බලම් මහත්තයාගේ කාලයේ - 1946, 1947 විතර - යාපනයේ දෙමළ ජනතාව සිටියේ සියයට 11යි. තවත් සියයට 11ක් වතුකරයේ දෙමළ ජනතාව සිටියා. යාපනයේ සියයට 11ක් වුණු දෙමළ ජනතාව කවදාකවත් කථා කළේ නැහැ, ඒ ගොල්ලන්ටත් අයිතිවාසිකම් දෙන්න කියලා. ඒ ගැන කථා කළේ උඩරට සිටිය මේ තොණ්ඩමන් මහත්තයලායි. මේ අය හැම වෙලාවේම මහ ජාතියත් එක්ක එකතු වෙලා තමන්ගේ සංවර්ධනය කර ගත්තා. සියයට 11කට මේ වන විට අපේ රටේ පුරවැසිකම ලබා දීලා තිබෙනවා. ද්‍රවිඩ නායකවරු ආණ්ඩුවත් එක්ක බද්ධ වෙලා තමයි ඒක කළේ. නමුත් යාපනයේ අපේ සහෝදරවරු, ද්‍රවිඩ නායකයෝ කවදාවත් අපට බද්ධ වෙන්න කැමැති නැහැ. මොකද, දේශපාලනය නමැති වාහනය දුවන්න නම් ජාතිවාදය නමැති gear box එකෙන් තමයි gear දමන්න ඕනෑ. නැත්නම් හරි යන්නේ නැහැ. ඒ නිසා ජාතිවාදය වපුරා ගෙන තමයි ඔවුන් ජීවත් වන්නේ. පොන්නම්බලම් මහත්තයා සියයට පණහට පණහ ඉල්ලුවේ සියයට 11ක ද්‍රවිඩ ජනතාවක් යාපනයේ සිටියදීයි.

කෙසේ වෙතත් අපි හොඳට කල්පනා කරලා බැලුවොත් අපේ රටේ ජනාධිපතිතුමා අවතැන් වුණු අය - අවතැන් වුණා නොවෙයි, අපි ළඟට ආවා. යුද්ධය වෙලාවේදී නන්දිකඩාල් කළපුවේදී කථා කළාම ඒ ගොල්ලෝ සුදු කොඩිය උස්සා ගෙන අපි ළඟට ආවා.- ආපුවාම භාර ගත්තා. භාර අරගෙන මැණික්ෆාර්ම්වල ලොකු කැම්ප් එකක් හදලා ඒ අයට එතැන ඉන්න ඉඩ සලසා දුන්නා. මමත් ඒකට ගියා. එදා සිටි හමුදාපතිවරුන් තුන් දෙනාගේ බිරින්දෑවරු, අපේ ශිරන්ති රාජපක්ෂ මැතිනිය, සේවා වනිතා ඒකකය හරහා රුපියල් ලක්ෂ 80ක විතර භාණ්ඩ මට දුන්නා, "ගිහිල්ලා මේක බෙදන්න" කියලා. මම තමයි බෙදන්න ගියේ. අපි ෂැම්පු පැකට් වගයක් අරන් ගියා. අන්තිමේදී දන්නේ නැතුව ඒ අය ෂැම්පුත් බිව්වා. බොහොම අමාරුවෙන් නවත්වා ගත්තේ. මේකයි ඇත්ත තත්ත්වය. මොකද, ඒ තරමටවත් ඒ ගොල්ලන්ගේ මනස හදලා තිබුණේ නැහැ. ඒ ගොල්ලන්ට සාක්ෂරතාව නොදී, ළමා සොල්දාදුවන් බඳවා ගෙන යුද්ධයක් කරලා, යුද්ධය දිනා ගන්න බැලුවා.

නමුත් ලෝකයේ රාජ්‍ය නායකයෝ බලන්න. පිදෙල් කස්ත්‍රෝ බලන්න. ඒ ගොල්ලෝ එදා තිබුණු ඒකාධිපතිවාදයට විරුද්ධව වැඩ කර දේශපාලන විසඳුමකට ඇවිල්ලා දේශපාලන නායකත්වයක් දීලා දේශපාලනය කළා. ඒක තමයි ඇත්ත තත්ත්වය. වේ ගුවේරා බලන්න. දේශපාලන නායකත්වයක් ගත්තා. හිට්ලර්ව පරාද කර දේශපාලන නායකත්වයක් ගත්තා.

මේක එහෙම නොවෙයි. කොහොම හෝ රට කඩන්න තමයි බලන්නේ. රට දෙකට කඩලා දෙපැත්ත විනාශ කරලා දමන්න තමයි බලන්නේ. අමතක කරන්න එපා, ද්‍රවිඩ ජනතාවගෙන් සියයට 52ක් කොළඹ ඉන්නවා; ඒ අය බොහොම සහයෝගයෙන් ජීවත් වනවා කියන එක. එවැනි ප්‍රශ්නයක් නැහැ. සාක්ෂරතාව අතින් බැලුවත්, වැඩ කරන අතින් බැලුවත් එහෙමයි. අපි 1,400,000ක් රාජ්‍ය සේවකයෝ බඳවා ගෙන සිටිනවා. ඒ බඳවා ගැනීමකදී කොතැනකවත් අපේ කිසිම කෙනෙක් කියලා නැහැ, ද්‍රවිඩ ජනතාව බඳවා ගන්න එපා කියලා. ඒ ගොල්ලන්ටත් ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ අය පුනරුත්ථාපනය කරලා ශ්‍රී ලංකා හමුදාවටත් බඳවා ගෙන තිබෙනවා. කල්පනා කරලා බලන්න.

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

මේ නැවත පදිංචි කිරීමේ ඇමතිතුමා විශාල කාර්ය භාරයක් කරනවා. එතුමා ගැන මම හොඳින්ම දන්නවා. මා ප්‍රවාහන ඇමතිවරයා හැටියට කටයුතු කරද්දී සුනාමිය ඇති වුණු වෙලාවේ පැරැළියට ගියා. එතුමා මිනී අදිනවා. මිනී 1,100ක් අපි දෙන්නා වැළලුවා. එතුමා නහය ආවරණය කරගෙන ඒ කටයුත්ත කළා. එතුමා ඒ වාගේ හදවතක් තිබෙන ඇමතිවරයෙක්. ඒක නැහැයි කියන්න කාටවත් බැහැ. ඒක නිසා තමුන්නාන්සේලා ඒ කටයුතු අවතක්සේරු කරන්න එපා. අපට පුළුවන් දේ කරනවා. ඉන්දියාව දැන් ගෙවල් හදනවා. ඉන්දියාව ගෙවල් හදලා අපට දෙනවා. ඉන්දියාව ගෙවල් හදන්න ගත්තේ TNA එක ඉල්ලලා නොවෙයි. අපි කථා කරලා.

ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ අපට ඡන්ද බලය හඳුන්වා දෙන කොට පංච බල කුලය කියලා එකක් තිබුණා නේ. දෙමළ ජනතාව ඒ කුලවල අයට තැනක් දුන්නේ නැහැ. පැත්තකට කරලා තිබුණා. උඩු කයට ඇඳුම් අඳින්නත් එපායි කිව්වා. සාලුව ඇන්දේ knee එකට උඩින්. එහෙම තමයි ඒ අයගේ ජාතිවාදය, කුලවාදය. අපේ ශ්‍රී ලාංකික ජනතාව ඒ කුලවාදය නැති කරලා අද සමාජවාදයට තමුන්නාන්සේලාව කැන්දාගෙන ඇවිත් සිටිනවා. ඒ නිසා භේදයක් ඇති කරන්න එපා.

ඔය භේද ඇති කිරීම නිසා තමයි අන්තිමේදී නැති ප්‍රශ්න ඇති කරගෙන තමුන්නාන්සේලාටත් ප්‍රයෝජනයක් නැති වැඩ කරගෙන යන්නේ. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායකයාටත් - ආනන්ද සංගරී මහත්මයාටත්- කිලිනොච්චියේ ඉන්න බැරුව ගියා. ආනන්ද සංගරීට එල්ටීටීඊ එකෙන් තහංචි දාලා එළවලා දමපු නිසා තමයි කොළඹට ඇවිල්ලා හැංගිලා හිටියේ. ඒ ගැන කල්පනා කරලා බලන්න. අපේ උගත් මන්ත්‍රීවරුන් මේ වාගේ ප්‍රශ්න නැවත වරක් ඇති කරන්නේ නැතුව දෙමළ ජනතාව වෙනුවෙන් පෙනී ඉඳලා, අවශ්‍ය දේ ඉල්ලා ගෙන, මොනවා හරි කර ගන්න එකයි කරන්න තිබෙන්නේ. තමන්ගේ ප්‍රදේශවල පාරවල් ටික හදාගෙන, ලයිට් ටික අරගන්න කටයුතු කරන එකයි කරන්න ඕනෑ. දැන් වතුර ටික ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය අවසන් වේ ගෙනයි එන්නේ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
පොඩ්ඩක් ඉන්න.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
පාරක් හදන එක විතරක් නොවෙයි. දේශපාලන විසඳුමක් ගැන මොනවාද කියන්නේ?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කොළඹ සියයට 52ක් දෙමළ ජනතාව ඉන්නවා. ඒ සියයට 52න් අහන්න කෝ අපත් එක්ක ජීවත්වීමේ ප්‍රශ්නයක් තිබෙනවාද කියලා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
මම අහපු ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
අප එක ජාතියක් විධියට ඉන්න ඕනෑ. අපට තිබෙන ප්‍රශ්නය තමුන්නාන්සේලා වෙනම ජාතියක් හදන්න යන එකයි. අපි ඔක්කෝම ශ්‍රී ලාංකිකයෝ. ඉන්දියාවේ තේමා පාඨය තමයි, "Be Indian, buy Indian" කියන එක. ඉන්දියන් කාරයෙක් නම් ඉන්දියන් බඩු ගන්න ඕනෑ. තමුන්නාන්සේලා කියන්නේ එහෙම නොවෙයි නේ. තමුන්නාන්සේලාට ඕනෑ, මොකක් වුණත් කමක් නැහැ ජාතිවාදය වපුරලා, වෛරය වපුරලා තමුන්නාන්සේලාගේ නැති බැරිකම් කියා ගෙන දේශපාලන බලය තියා ගන්නටයි. පුනරීන්වල තමුන්නාන්සේලාගේ ඉස්කෝල දෙකක් මම හදලා දීලා තිබෙනවා. ආබාධිත අයට ගෙවල් 1,200ක් හදලා දීලා තිබෙනවා. ඒ ගැන කොතැනකවත් සඳහන් වෙනවාද? LLRC Report එකේ ඒ ගැන සඳහන් වෙලා තිබෙනවාද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තව පොඩි වේලාවක් දෙන්න පුළුවන්ද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, අපට කාලය බොහොම සීමා සහිතවයි තිබෙන්නේ. දැන් කාලය ගෙවිලායි තිබෙන්නේ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඉතුරු කාරණා ටික කියා ගන්න බැරි වෙනවා. මේ අය රට පැත්තකට දාලා ආපහු යුද්ධයකට ඇද ගන්නයි යන්නේ. අපි වේලකන්නි පල්ලියට යන්න බලාපොරොත්තු වෙනවා. මට තවම වේලකන්නි පල්ලියට යන්න බැරි වුණා. බුදු දහම ආවේ ඉන්දියාවෙනුයි. අපේ ගෘහ කර්මාන්තය ඒ පැත්තෙනුයි ආවේ. අපේ මිනිස්සුන්ට ඉන්දියාවට යන්න බැරි තත්ත්වයක් ඇති කරලා තිබෙන්නේ කවුද? ශ්‍රී ලාංකිකයෝද? තමුන්නාන්සේලා තමයි මේ ප්‍රශ්න ඇති කරන්නේ. රට පාලනය කරන කොයි ආණ්ඩුවක් එක්ක වුණත් කමක් නැහැ එකතු වෙලා වැඩ කරන්න. මේකට මොඩලය හැටියට ගන්න තොන්ඩමන් මොඩලය. තොන්ඩමන් මොඩලය ගත්තොත් තමුන්නාන්සේලාට එකතු වෙලා වැඩ කරන්න පුළුවන් වෙනවා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
1956 ප්‍රශ්නය ඇති කළේ කවුද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
1956 ප්‍රශ්නය ඇති කළේ 50ට, 50 ඉල්ලලා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
අපිද ඇති කළේ?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය අවසන්.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
50ට, 50 ඉල්ලුවේ කවුද? දෙමළ ජනතාව සියයට 11ක් සිටියදී 50ට, 50 ඉල්ලුවේ කවුද? අපිද? තමුන්නාන්සේලා ඒක තේරුම් ගන්නේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, බොහොම ස්තුතියි.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මොනවා කරන්නද? බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7යි තිබෙන්නේ.

[අ.භා. 4.42]

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් කෙටි කාලයකින් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද දවස ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වශයෙන් නැවත වතාවක් මරු පහරක් වැදුණු දවසක් හැටියට අපට මතක් කරන්නට සිදු වෙනවා. මොකද ලංකාවට විරුද්ධව ගෙනාපු යෝජනාවට, අපේ අසල්වැසි ඉන්දියාව අබණ්ඩව දෙවැනි වතාවටත් පක්ෂව ඡන්දය දීලා තිබෙනවා. ඔවුන් ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව සැහීමකට පත් වෙලා නැති බව පෙනෙන්නට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවතැන්වූවන් ගැන කථා කරද්දී පසු ගිය දවසකදී මහින්ද සමරසිංහ මැතිතුමාම ජිනීවා නුවරදී මේ IDPs ගැන ප්‍රකාශයක් කළා. මේ IDPs ගැන එතුමා ප්‍රකාශ කළේ, "With this last batch of IDPs, the Government has resettled a total of 242,449 IDPs. A further 28,398 have chosen to live with host families in various parts of the country. A batch of about 200 families living with host families has been resettled with their consent in their original habitat in Mullaitivu in September 2012. At the conclusion of resettlement, 7,264 IDPs had left the camps on various grounds and did not return while a further 1,380 sought admission to hospitals. The resettlement of the final batch of IDPs marks a day of historic significance as the resettlement is now complete and there are no more IDPs or IDP camps in the island".

මහින්ද සමරසිංහ මැතිතුමා කියලා තිබෙනවා, අද වෙන කොට කිසිම කෙනෙක් අවතැන් වෙලා නැහැයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, he further states, "Based on Government statistics compiled by UNHCR, as of 31st December 2012 there were 93,447 displaced persons. The Minister himself recognises the old case load of IDPs in his Opening Statement to the Working Group of the Universal Periodic Review on Sri Lanka on 1st November 2012".

දැන් බලන්න. මේක නොවෙයිද, අපේ වැරදි ප්‍රතිපත්තිය? කථා කරන්නේ එකක්. කරන්නේ තව එකක්. කියන්නේ එකක්. ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ තව එකක්.

This document further states, "Several IDP camps remain open including the Killivetti, Paddithidal and Manichchennai Welfare Centres in the Eastern Province and Nilavan Kudiyiruppu and Chunnakam Welfare Centres in the Northern Province".

Welfare Centres ඇරලා IDP camps හැටියට දැනටත් තිබෙනවා. එතකොට මහින්ද සමරසිංහ මැතිතුමා ප්‍රකාශ කර තිබෙන්නේ මොකක්ද? UN එක ඉදිරියට ගිහින් අසත්‍ය ප්‍රකාශ කරලා, අසත්‍ය ප්‍රකාශ කරලා, තවත් අසත්‍යයක් නැවත වතාවක් ප්‍රකාශ කරනවා. අපේ සුමන්තිරන් මන්ත්‍රීතුමා හොඳ දෙයට හොඳයි කිව්වා දැක්කා නේ. අපිත් හොඳ දෙයට හොඳයි කියනවා. මා ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් කිහිප දෙනකුත් එක්ක උතුරුකරයේ සංචාරයකට ගියා. එම අවස්ථාවේදී මමත් පෞද්ගලිකව දැක්කා, ආණ්ඩුව කර තිබෙන හොඳ දේවල්. ඒ වාගේම ආණ්ඩුව නොකරපු දේවලුත් විශාල වශයෙන් තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන හැටියට අතිවිශාල ප්‍රශ්නයක් තිබෙනවා. යුද්ධයෙන් පීඩාවට ලක් වුණු අතිංසක දෙමළ ජනතාවට පදිංචිය සඳහා තමන්ගේ නිජබිම්වලට යන්නට තවමත් අවස්ථාවක් ලැබී නැහැ. එය ඔබතුමා පිළිගන්නට ඕනෑ. එයට මූලික හේතුකාරක දෙකක් තිබෙනවා. එකක්, High Security Zones හැටියට සමහර ප්‍රදේශ වෙන් කර ගෙන තිබීම. ඒ වාගේම සාම්පූර් වාගේ ප්‍රදේශ Industrial Zones හැටියට වෙන් කර තිබෙනවා. මෙම ප්‍රදේශ develop කරන්න zones වෙන් කර තිබීම තුළ දෙමළ ජනතාවට තමන්ගේ නිජබිම්වලට යන්න බැරි තත්ත්වයක් තිබෙනවාය කියා මා හිතනවා.

ඒ විතරක් නොවෙයි. ඒ ප්‍රදේශවල අතිවිශාල හමුදාවක් ඉන්නවා කියන එක පිළිබඳවත් අපි යමක් ප්‍රකාශ කරන්න ඕනෑ. අප ළඟ තිබෙන වාර්තාවලට අනුව උතුරුකරයේ 1,98,000ක හමුදාවක් තවම ඉන්නවාලු. යාපනයේ දිස්ත්‍රික්කයේ ඉන්න ජනතාවගෙන් පස්දෙනකුට එක් හමුදා නිලධාරියකු ගණනේ ඉන්නවා. 6,27,000, 1,98,000න් බෙදුවාම ජනතාවගෙන් පස්දෙනකුට එක් හමුදා නිලධාරියකු ගණනේ ඉන්නවා. ඉතින් මේ හමුදාවට ඒ ප්‍රදේශ වෙන් වුණාම සමහර විට ඒ මිනිසුන්ට ඔවුන්ගේ නිජබිම්වලට යන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. මා හිතන හැටියට මේක තමයි මේ ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තියේ කර ගන්න බැරි මෝඩකම් ටික. මේ ආණ්ඩුව මීට වඩා බුද්ධිමත්ව අපිත් එක්ක කටයුතු කළා නම් අද වන කොට මේ රටේ මෙතරම් ප්‍රශ්නයක් ඇති වෙන්න ඉඩක් නැහැ.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

මා පුංචි නිදසුනක් දෙන්නම්. එදා ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ, 1990 ඔක්තෝබර් 25වන දා රංජන් විජේරත්න මැතිතුමා මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරලා තිබුණා, 1988 - 1989 කාලයේ සිදු වුණු ප්‍රශ්නය ගැන. 1988 - 1989 කාලයේ සිදු වුණු ප්‍රශ්න ගැන එතුමා තින්දුවක් දුන්නා. අසවල් murder එකට, අසවල් rape case එකට, අසවල් සිද්ධියට අප accountable වුණා කියා. ඒ අවස්ථාවේ අප අතරේ accountability එකක් තිබුණා. අද accountability එකක් දකින්න නොතිබෙන නිසා තමයි ලෝකය අපට ඇඟිල්ල දික් කරලා තිබෙන්නේ. ඒක අපේ අවාසනාව. මා කියන්නේ නැහැ, ඇමෙරිකාව නිවැරැදියි කියලා. මා කියන්නේ නැහැ, බටහිර රටවල් නිවැරැදියි කියලා. බටහිර රටවල් වරදක් කළාම ඒ ගොල්ලන් බොරුවට හෝ inquiry එකක් පැවැත්වූවා කියා පෙන්වීම තුළින් ලබා දෙන්නා වූ ආදර්ශය තුළ ලෝකයේ අනික් මිනිසුන්ට අත ගැහීමට හැකියාවක් නැති වෙනවා. "අපේ ප්‍රශ්න අපි විසඳා ගන්නවා. අපි මේවාට accountable කණ්ඩායමක් යෙදුවා"යි කියා පෙන්වූවා නම් අද අපට මෙවැනි තත්ත්වයක් උද්ගත වන්නේ නැහැයි කියන එක මා මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව තුළ මුස්ලිම් මන්ත්‍රීවරු 18දෙනෙක් ඉන්නවා. අවාසනාවකට වාගේ ඒ මුස්ලිම් මන්ත්‍රීවරුන් 18දෙනාගෙන් 16දෙනෙක් ම ඉන්නේ ආණ්ඩු පක්ෂයේ. මුස්ලිම් මන්ත්‍රීවරුන් 16දෙනෙක් පාර්ලිමේන්තුවේ සිටියාට අද පුත්තලම ප්‍රදේශයේ සිටින මුස්ලිම් අවතැන්වූවන් ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. ආණ්ඩුවේ ම ඉන්න නියෝජ්‍ය ඇමතිවරයෙක් -හිස්බුල්ලා නියෝජ්‍ය ඇමතිතුමා- කථා කරනවා මා අහගෙන සිටියා. එතුමා කියවා ගෙන කියවා ගෙන ගියා. එතුමා වැඩි හරියක් කියා ගෙන ගියේ, ඒ අවතැන් වූවන්ට පහසුකම් නැහැයි කියන එකයි. මා අහන්න කැමැතියි, හිස්බුල්ලා නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නේ අපේ පැත්තේද, ආණ්ඩු පක්ෂයේද කියලා. එම ප්‍රදේශවල තිබෙන ප්‍රශ්න විසඳා ගන්න එතුමාට බැරි නම් මෙය පාර්ලිමේන්තුවට -අපට- කියලා ඇමතිතුමාට කියන්න ලජ්ජා නැද්ද කියලා එතුමාගෙන් අහන්න ඕනෑ. රිසාඩ් බදියුදීන් මැතිතුමා ආණ්ඩුවේ ලොකු හයියක් තිබෙන ඇමතිවරයෙක්. මා එතුමාගෙනුත් අහනවා, එතුමාට මේ කටයුතු කර ගන්න බැරිද කියලා. අපි ගියා, පුත්තලමේ ඉන්න මුස්ලිම් ජනතාව බලන්න. ඒ ජනතාවට අතිවිශාල ප්‍රශ්න තිබෙනවා. යුද්ධය පැවැති අවුරුදු 30ක කාලයට පෙර සිටම අවතැන් වුණු ඒ පුද්ගලයන් ගැන කවුරුත් සැලකිල්ලක් දක්වා නැහැ.

මට නියමිත කාලය ඉතාම කෙටි නිසා කරුණු කාරණා රාශියක් කියන්න තිබුණත්, අවසාන වශයෙන් මා ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. 2013 අවුරුද්ද ජාත්‍යන්තර වශයෙන් ලංකාවට අතිවිශාල බැරෑරුම් ප්‍රශ්න රාශියක් ඇති වන අවුරුද්දක් වෙනවා. අපේ අවාසනාවට මේ නොවැම්බර් මාසයේ තිබෙන CHOGM එකෙන් වුණත් ලංකාවට වාසියක්, ප්‍රයෝජනයක් ගන්න අපට බැරි වෙනවා. එය මනමාලි නැති මඟුල් ගෙයක් බවට පත් වන මුදල් නාස්තියක් පමණයි කියා මා හිතනවා. අවසාන වශයෙන් පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව උත්සවයක් විතරක් පවත්වන්න plan කරන අවස්ථාවක් නිසා ඔබතුමාට කියනවා, -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙදතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. ඊළඟට ගරු රිසාඩ් බදියුදීන් අමාත්‍යතුමා.

[பி.ப. 3.39]

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில், வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரව තලෙමෙදතාංකුම් උරුප්පිනර් අවර්කළේ! இந்த மீளக் குடியமர்த்துதல் அதிகாரசபையின் பணிகளை மேலும் மூன்று வருடகாலத்துக்கு நீடிப்பது சம்பந்தமான விவாதத்திலே கலந்துகொண்டு உரையாற்றுவதில் நான் சந்தோஷப் படுகின்றேன். நான் மீள்குடியேற்ற அமைச்சராக இருந்த பொழுது இந்த அதிகாரசபையை உருவாக்கும் சந்தர்ப்பம் எனக்குக் கிடைத்தது. மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களும் மாண்புமிகு அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களும் அந்த அதிகாரசபையை அமைப்பதற்கு எனக்குப் பக்கபலமாக இருந்தார்கள். இன்று அந்த அதிகாரசபை ஆறு வருடங்களைப் பூர்த்திசெய்துள்ள நிலையில், அதனை மேலும் மூன்று வருட காலத்துக்கு நீடிப்பதற்கான ஏற்பாட்டை மீள்குடியேற்ற அமைச்சர் மாண்புமிகு குணரத்ன வீரக்கோன் அவர்கள் முன்மொழிந்துள்ளார். நீண்டகால அரசியல் அனுபவமுள்ள ஓர் அரசியல்வாதியான மாண்புமிகு அமைச்சர் அவர்கள் சகலருடனும் கலந்துபேசி, மிகவும் நேர்மையாகவும் நியாயமாகவும் செயற்படுகின்ற ஒருவர். அவ்வாறே, மீள் குடியேற்ற அமைச்சின் செயலாளர் அவர்களும் நீண்ட காலமாக என்னுடன் பணியாற்றிய ஒரு திறமைவாய்ந்த நிருவாகி. எனவே, அவர்கள் இருவரும் இந்த அமைச்சின் பணிகளை மீண்டும் எதிர்வரும் மூன்று வருட காலத்துக்கு நல்லமுறையிலே முன்னெடுத்துச் செல்லவேண்டுமென வேண்டிக்கொள்கின்றேன்.

மாண்புமிகு ஹரின் பர்னாந்து அவர்கள் இச்சபையிலே உரையாற்றியவேளையில், இங்கேயுள்ள 18 முஸ்லிம் உறுப்பினர்களில் 16 முஸ்லிம் உறுப்பினர்கள் ஆளுங்கட்சியில் இருக்கின்றபொழுதிலும் புத்தளத்திலே அகதிகளாக இருக்கின்ற முஸ்லிம் மக்கள் ஏன் மீள்குடியேற்றப்படவில்லை எனக் கேட்டிருந்தார். அதேபோன்று சற்றுமுன்னர் இச்சபையிலே உரையாற்றிய அமைச்சர் மாண்புமிகு ஹிஸ்புல்லா அவர்களும் அங்குள்ள முஸ்லிம் மக்கள் அனுபவிக்கின்ற துன்பங்களையும் வேதனைகளையும் தான் நேரடியாகச் சென்று பார்வையிட்டதாகக் குறிப்பிட்டிருந்தார். கௌரவ அமைச்சர் அவர்களே! 23 வருடங்களுக்கு முன்னர் முஸ்லிம் மக்கள் தமது விருப்பத்தின்பேரில் சொந்த இருப்பிடங்களைவிட்டு வெளியேறியவர்களல்லர். அந்த மண்ணில் வாழவேண்டுமென்ற ஆசையுடன் மண்ணின் மகிமையைப் பேணி கௌரவத்துடன் வாழ்ந்த அந்தச் சமூகத்தைச் சேர்ந்த ஓர் இலட்சத்துக்கு மேற்பட்ட மக்கள் எந்தவொரு காரணமுமின்றி யாழ்ப்பாணத்திலிருந்து இரண்டு மணித்தியால அவகாசத்திலும் மன்னார், கிளிநொச்சி, முல்லைத்தீவு ஆகிய மாவட்டங்களிலிருந்து 48 மணிநேர அவகாசத்திலும் தமது எந்தவொரு உடமையையும் கொண்டுசெல்ல முடியாத நிலையிலே கடல்வழியாகப் பயணம்செய்து புத்தளத்திலே 168 முகாம்களிலும் அனுராதபுரத்திலே 12 முகாம்களிலும் எஞ்சியோர் பாணந்துறை, களுத்துறை, மட்டக்குளி, நீர்கொழும்பு, குருநாகல் போன்ற பல பிரதேசங்களிலும் அகதிகளாகச் சிதறி வாழ்ந்தனர்.

2009ஆம் ஆண்டில் பாதுகாப்புப் படையினரின் தியாகத்தின் காரணமாக மேதகு ஜனாதிபதி அவர்களால்

ஏற்படுத்தப்பட்ட சமாதான சூழலுக்குப் பின்னர், அந்த மக்கள் தாங்கள் அகதிகள் என்ற நாமம் இல்லாமல் கௌரவமாக தமது சொந்தக் காணிகளுக்குச் சென்று வாழமுடியும் என நம்பினார்கள். ஆனால், இன்றுவரையில் அரச சார்பற்ற நிறுவனமோ அன்றி வேறு எவருமோ அந்த மக்கள் தமது சொந்தக் காணிகளில் வாழ்வதற்கான எந்த வசதிகளையும் செய்து கொடுக்கவில்லை. அண்மையில் நாங்கள் அந்த இடங்களுக்குச் சென்று அந்த மக்கள் மிகவும் பரிதாபகரமான நிலையில் வாழ்ந்துகொண்டிருப்பதைப் பார்வையிட்டோம். அவர்கள் போக்குவரத்துச் செய்வதற்கு ஒழுங்கான பாதைகள் அமைக்கப்படவில்லை. அங்குள்ள ஒரு பெண்மணி, "நேற்று இரவு எனது பிள்ளையைப் பாம்பு தீண்டியதனால் அந்தப் பிள்ளை இறந்துவிட்டது" என அழுதழுது சொன்னார். "ஏன், நீங்கள் பிள்ளையை வைத்தியசாலைக்குக் கொண்டு சென்றிருக்கலாமே!" என்று கேட்டபொழுது, தாங்கள் இருக்கும் இடத்திலிருந்து வைத்தியசாலைக்குச் செல்லக்கூடிய பாதை இல்லை என்று கூறினார். 23 வருட காலத்தின் பின்னர் தாம் வாழ்ந்த சொந்தக் கிராமத்துக்குச் சென்று பார்வையிட்ட பொழுது அனைத்து வீடுகளும் பாடசாலைகள், பள்ளி வாசல்கள், பாதைகள் யாவும் அழிவடைந்திருந்ததோடு, கட்டிடங்கள் இருந்த இடங்களையே அடையாளங்காண முடியாத நிலையில் அப்பிரதேசம் காடுகள் போன்று காட்சியளிப்பதாகவும் தெரிவித்தார்கள். அப்பிரதேசங்களைச் சேர்ந்த மக்களின் நிலைமை மிகவும் பரிதாபகரமாக இருந்தது.

முசலி, மாந்தை, மடு, முல்லைத்தீவு, வவுனியா ஆகிய பிரதேசங்களில் வாழ்ந்த மக்கள் 23 வருட காலத்துக்குப் பின்னர் அவர்களது கிராமங்களுக்குச் சென்று பார்வையிட்ட பொழுது அவை காடுகளாகவே காட்சியளித்தன. கடந்த 23 வருட காலமும் அம்மக்கள் அப்பிரதேசங்களிலே வாழாத காணத்தினால் அந்தக் காணிகளில் எந்த அபிவிருத்தியையும் செய்யக்கூடிய சூழல் இருக்கவில்லை. யுத்த காலத்தில் அப்பிரதேசத்திலுள்ள பொதுக்கட்டிடங்கள் சேதமாக்கப்பட்ட தால் அவை இன்று காடுகளாகக் காட்சியளிக்கின்றன. தற்போது தமது காணிகளைத் துப்புரவுசெய்து குடியேறுவதற்கு நாதியற்ற சமூகமாகவே அம்மக்கள் இருக்கின்றார்கள். இன்று பார்ப்பதற்கும் கேட்பதற்கும் எவரும் இல்லாத துர்ப்பாக்கிய நிலையிலேயே அவர்கள் வாழ்கின்றார்கள். அங்கே வேப்பங்குளம் என்ற ஒரு பாரம்பரிய கிராமம் இருக்கின்றது. இன்று காலை அந்தக் கிராம மக்கள் தங்களுடைய காணிகளைத் துப்புரவு செய்யச் சென்றபொழுது அங்கிருக் கின்ற இராணுவத்தினர் அவர்களைத் தடுத்திருக்கின்றார்கள். அன்றைய காலத்தில் புலிகள் அவர்களைத் துரத்தினார்கள்; இன்று காடுகளை அழிக்க வேண்டாமென்று இராணுவத்தினர் தடுத்து நிறுத்தியிருப்பதாக நான் அறிகிறேன். இதனால் அவர்களின் மீள்குடியேற்றத்தை இராணுவத்தினர் மறை முகமாகத் தடுக்கின்ற ஒரு துர்ப்பாக்கிய நிலை அந்தப் பிரதேசத்திலே ஏற்பட்டிருக்கின்றது. அந்த மக்கள் எங்களிடம் "சில பஸ்களை அனுப்பிவிடுங்கள்; நாங்கள் அத்தனைபேரும் மீண்டும் புத்தளத்துக்கு அல்லது எங்கேயாவது போய் வாழ்கிறோம்" என்று கூறினார்கள். இவ்வாறு பாதிக்கப்பட்ட ஒரு சமூகமாக அந்த மக்கள் இருக்கின்றார்கள். இங்கு பேசிய எதிர்க்கட்சி உறுப்பினர்கள் சொன்னதுபோல வேறு யாரிடமும் சென்று இவர்களுடைய பிரச்சினை பற்றி நாங்கள் முறையிடுவதில்லை. அவர்களுக்கு உரிய ஏற்பாடுகளைச் செய்து கொடுக்கும்படி நாங்கள் மேதகு ஜனாதிபதி அவர்களிடம்தான் சொல்லியிருக்கிறோம். அதைப்போல அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களிடமும் நாங்கள் இதுபற்றிப் பேசியிருக்கிறோம். கடந்த வரவு செலவுத் திட்டத்தின்போது இந்த அமைச்சின் குழுநிலை விவாதத்திலும்கூட நான் இந்த விடயத்தைச் சுட்டிக் காட்டியிருந்தேன்.

கௌரவ அமைச்சர் அவர்களே, மீள்குடியேற்றத்தை ஓரிரு நாட்களிலே செய்துவிட முடியாது என்பதை நான் அறிவேன். ஆயினும், நீங்கள் ஒரு திறமைசாலி! அனுபவமுள்ள ஓர் அரசியல்வாதி! நீங்கள் இது சம்பந்தமாக ஒரு கலந்துரை யாடலை ஏற்பாடுசெய்து, காணி இல்லாதவர்கள் யார்? அவர்களுக்கு ஏன் காணி இல்லை? என்பதைக் கண்ட றியுங்கள். உதாரணமாக, பெரியமடு போன்ற கிராமங்களில் இவர்கள் இருந்த காணிகளிலே பிற குடும்பங்கள் குடியமர்த்தப் பட்டதால், இவர்களுக்குக் காணி இல்லாத நிலை! முல்லைத்தீவு மாவட்டத்திலுள்ள 12 கிராமங்களிலே அந்த மக்கள் வாழ்ந்திருக்கிறார்கள். 1990ஆம் ஆண்டு வெளியேற்றப் பட்ட அந்த மக்கள் மீண்டும் அங்கு சென்று பார்த்தபொழுது, அந்தக் கிராமங்களிலே யுத்த காலத்தில் அகதிகளாக அலைந்துதிரிந்து கஷ்டப்பட்ட மக்கள் குடியேறியிருப்பதைக் காண முடிந்தது. இதனால் இன்று அந்தக் கிராமங்களிலே ஒரு துண்டு வெற்று நிலம்கூட இல்லாத நிலை ஏற்பட்டிருக்கிறது. அங்கே அரசாங்க அதிபர், பிரதேச செயலாளர், கிராம சேவகர் என எல்லோரும் இணைந்து அந்த மக்களுடைய கருத்துக்களையும் உள்வாங்கி அந்தப் பிரதேசத்தில் இரண்டு இடங்களை அவர்கள் குடியேறுவதற்காக அடையாளப் படுத்தியிருந்தார்கள். அங்கு குடியேறச் சென்ற மூவாயிரம் குடும்பங்களில் 1,400 குடும்பங்களுக்கு காணிகளை வழங்க நடவடிக்கையெடுத்தபொழுது, சில தமிழ் ஊடகங்கள் இதைப்பற்றி மிக மோசமாக எழுதின. தமிழ் ஊடகங் களைத்தான் முஸ்லிம் சமூகத்தினரும் நாடுகின்றார்கள். 10 வீதமான தமிழ்பேசும் முஸ்லிம் சமூகத்தினர் இந்த நாட்டிலே இருக்கின்றார்கள். அவர்களும் இந்தத் தமிழ் ஊடகங்களை நம்பியே இருக்கின்றார்கள். ஆயினும் இந்த ஊடகங்கள் முஸ்லிம் - தமிழ் உறவைச் சிதைக்கின்றமுறையில் எழுதுகின்றன. முஸ்லிம்களுடைய ஒரு சின்ன விடயத்தைக் கூட பெரிதுபடுத்திக் காட்டுகின்றன. "முல்லைத்தீவிலே 1,455 குடும்பங்களுக்கு காணி கொடுக்கப்படுகிறது" என்று ஒரு தமிழ்ப் பத்திரிகை தலைப்பிட்டிருந்ததை நான் பார்த்தேன். அவர்கள் தலைப்பைப் பிழையாக எழுதி, அங்குள்ள உண்மை நிலைமையைச் சொல்ல மறுக்கின்றார்கள்.

புலிகள் செய்த தவறுக்காக அப்பாவித் தமிழ் மக்களை நாங்கள் குற்றஞ்சாட்ட விரும்பவில்லை. கௌரவ சுமந்திரன் அவர்கள் இங்கு பேசினார். இந்த விடயங்களை நாங்கள் அவரிடத்திலே கூறியபொழுது இதிலுள்ள நியாயங்களை அவர் புரிந்துகொண்டார். அப்படி நியாயங்களைப் புரிந்து கொள்கின்ற ஓர் உறுப்பினராக நாங்கள் அவரையும் அவருடைய கட்சித் தலைவர் சம்பந்தன் ஐயா போன்றவர் களையும் பார்க்கின்றோம். தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கு ஒரு தார்மீகப் பொறுப்பு இருக்கின்றது. கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர்களாக இன்று இருக்கின்ற நீங்கள் புலிகள் செய்த தவறை -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாத் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
මට විනාඩි 15ක් දුන්නා නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ. ඔබතුමාගේ කාලය විනාඩි 10කට අඩු කරලා, කාලය සීමා කරලායි තිබෙන්නේ.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாத் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
මට තව විනාඩි 3ක් දෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, තවත් කාලය දෙන්න බැහැ.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாத் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
இந்திய வீடமைப்புத் திட்டத்திலே முஸ்லிம்களையும் உள்வாங்குமாறு இந்திய தூதுவருக்கு சம்பந்தன் ஐயா அவர்கள் கடிதம் எழுதியதாக கௌரவ சுமந்திரன் அவர்கள் சொன்னார். அதற்காக நாங்கள் உங்களுக்கு எங்களுடைய பாராட்டுக்களைத் தெரிவித்துக்கொள்கின்றோம். அதனோடு நின்றுவிடக்கூடாது. தமிழ் - முஸ்லிம் சமூகங்கள் பிரிந்து வாழ முடியாது. யுத்தத்தினால் மிகவும் பாதிக்கப்பட்ட இந்த முஸ்லிம் சமூகத்தையும் அந்த மண்ணிலே வாழவைப்பதற்கேற்ற சூழ்நிலையை ஏற்படுத்துகின்ற விடயத்திலே நீங்களும் உங்களுடைய காலநேரத்தைச் சற்றுச் செலவழிக்க வேண்டும். அவர்களுக்கு என்ன பிரச்சினைகள் இருக்கின்றன? என்பதைப் பார்க்க வேண்டும். பிற மாவட்டங்களைச் சேர்ந்த எந்தவொரு முஸ்லிம் நபரையும் வட மாகாணத்தில் கொண்டுபோய் குடியேற்றுவதற்கு நாங்களே உடன்படமாட்டோம்; அதற்காக எந்தவிதமான உதவியையும் செய்யமாட்டோம். அப்படி யாரும் அங்கு வரவும் மாட்டார்கள். அங்கு யார் வாழ்ந்தார்களோ அவர்களுடைய பெயர்கள் 2009ஆம் ஆண்டுக்குரிய வாக்காளர் இடாப்பிலே இருக்கின்றன. அங்குள்ள எந்தக் கிராமங்களைச் சேர்ந்தவர்களாயினும் அவர்களை அங்கு குடியமர்த்துவதற்கு நீங்கள் உதவ வேண்டும்.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න ඕනෑ.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாத் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි 2ක් දෙන්න.

எனவே, அதற்காக தமிழ்த் தேசியக் கூட்டமைப்பினராகிய நீங்கள் முன்வந்து செயற்பட வேண்டுமென்று நான் வேண்டுகின்றேன். கௌரவ அமைச்சர் குணரத்ன வீரக்கோன் அவர்களே, நீங்கள் இரவு பகலாக பாடுபட்டு நடவடிக்கை களைச் செயற்படுத்துகின்ற ஓர் அமைச்சர். இந்த ஓரிலட்சம் மக்களையும் எவ்வாறு குடியமர்த்துவது? இவர்களுடைய பிரச்சினை என்ன? இவர்களுடைய தேவைகள் என்ன? என்பவற்றையெல்லாம் நீங்கள் அறிந்து அத்தனை பேரையும் உங்களுடைய பதவிக்காலத்திலேயே குடியமர்த்துவீர்களென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඔබතුමාගේ කාලය අවසන්. The next speaker is the Hon. D.M. Swaminathan. You have 11 minutes.

[4.59 p.m.]

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
Mr. Presiding Member, today we are discussing the extension of the Resettlement Authority for a further period of three years. Really speaking, the word "resettlement" should not be debated in this Parliament. It is the responsibility of the Government to resettle the people who have been displaced by the war. The war was created and now it is over but the people are still displaced. It is the duty and obligation on the part of the Government to see that the replacement and resettlement of these people are done in a genuine manner.

Today, the Hon. (Prof.) G.L. Peiris, Minister of External Affairs spoke in Parliament. He is a Minister of great knowledge and learning.. But, I was really taken by surprise when he raised certain issues in Parliament today questioning as to why the UNHRC is bringing these resolutions against Sri Lanka, this small country, in such an aggressive manner. Sir, Sri Lanka maybe a small country but it has got its own inhabitants. The UNHRC cannot be influenced. It is a United Nations body with certain fundamental principles laid down under the UN Charter and those fundamental principles are laid down by authorities who are knowledgeable and the issues that have been placed before UNHRC is not something that can be canvassed. If there has been a genuine problem against the fundamental rights of the people of this country, it is the authority and it is the UNHRC that will have to look into this position.

If you look at the Sri Lankan history after the war was over, there were certain fundamental issues, the LLRC Commission that was appointed by the Government has forwarded its report to the Government, but it has not been enforced to a great extent. That is one issue. In fact, the LLRC Report itself refers to the enforcement of the Thirteenth Amendment. Then, the question arises about the independence of Judiciary and the other Commissions that should be there to protect the fundamental rights of this country have not been introduced. Then, the extension of the President's term of office that he can continue to be in power without any limitation. These are the fundamental issues that have been considered by the UNHRC. That is the basis of this whole resolution that was considered by the United States. The resolution that was brought forward today, fortunately or unfortunately, has been passed with 25 Members supporting it, 13

Members against it and eight Members abstaining from it. There is no reason for this. In fact, if we had fundamentally studied these issues, if we respect the international authority, if we do respect the other countries in this world, we will not come to this situation. We are facing a severe problem in this country. We do not know what the resolution is going to be, what the repercussions will be and what the reaction of the resolution is going to be to this tiny country. We do not know what will be our economic situation in future years to come. These are the things that have to be answered by the Government of Sri Lanka.

When we talk about resettlement, just because you take certain IDPs out and resettle them or keep them in some other place of living, that does not mean resettlement. Resettlement means that you have to give them some sort of habitation and a formal way to live. There should also be a way of living and there should also be food for them to eat. I think the Hon. Minister, who is respected by this Government as well as the Opposition, said that there are only 437 houses built for the last four years. If these statistics are correct, what are we talking about?

Even the UNHRC has the right to consider what the human rights position is, as far as Sri Lanka is concerned. Are they right or are they wrong? Let us be but fair in what we are trying to do. That is the reason why we are being questioned. If we, as a nation, had a proper foreign policy and if we respected all the foreign countries alike, we would not be in this situation. We, as a nation, respect only certain countries like China and a few others which are giving us aid. If that is going to be the foreign policy of this country, we would face problems. I am sure our learned Minister of External Affairs is capable of advising the Government on much more graver issues than what we are facing today.

Sir, the following are the fundamental issues that are coming up. When the Leader of the Opposition of India, Madam Sushma Swaraj, came to Sri Lanka to see the situation, the Government said that by July, 2011 the entire resettlement would be over. But, up to now, there are so many families which have not been resettled in accordance with the rules and regulations of resettlement. As I told you earlier, taking a person from Vavuniya and putting him in Thimbili is not reasonable. The people who had been in Vavuniya were fishermen. But, they had been put in Thimbili, where there is no habitation or fishing facilities. They had been brought and put into a jungle and are supposed to live there. If that is going to be your policy of resettlement, what is this country going to face in the future to come? That is the issue. These are the fundamental factors to be considered; these are the matters to be considered by the Government of Sri Lanka. It does not matter whether they are Tamils, Sinhalese or Muslims. You are quite right, we all have lived together.

We, as Tamils, Sinhalese and Muslims, have lived together. I was educated at Royal College. My best friends were all Sinhalese. There was no problem; there was no difference of opinions. There were no fundamental issues as far as the Tamils, the Sinhalese and the Muslims were concerned. Those Bills were brought in by the government machinery at that time to gain popularity. The Sinhala Only Bill of 1956 and all other subsequent Bills that were brought in this country just to get the popularity of the people, to get people's votes and to win elections have now marred the entire community of Sri Lanka. As very correctly said, we all have to live together. There is no idea of living divided as Tamils, Sinhalese and Muslims. We do not mind the Sinhalese going and staying in Jaffna, but we cannot give up our rights in Jaffna. We cannot allow the Tamils, who have been living in Jaffna, to be removed. We have to give them their lands.

We cannot let other people like the armed forces to carry out the administration of Jaffna. The administration of Jaffna should be carried out by a civil administration, not by the armed forces. Today, the armed forces are running the administration of Jaffna. Is this what we are exactly asking for? The administration of the country should be in proper form. We cannot allow the army to run the administration of Jaffna. That is what we are saying. That is why the UNHRC is jealously looking at you. It is not because of any other rights. If we do practise the correct principles and protect the political rights in this country, we would not be questioned by any authority. As you correctly said, we are a tiny country in this world, but the reason for them to check what we are doing is because we are not protecting the human rights. If you violate the principles of human rights, definitely, we are going to face a grave situation in this country, which can affect us internationally, economically and otherwise.

Thank you.

[பி.ப. 5.08]

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා (නැවත පදිංචිකිරීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன் - மீள்குடியேற்ற பிரதி அமைச்சர்)

(The Hon. Vinayagamoorthi Muralidaran - Deputy Minister of Resettlement)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று மீள குடியமர்த்துதல் அதிகாரசபை (திருத்தம்) சட்டமூலம் சம்பந்தமான விவாதத்தில், அதன் காலநீடிப்புத் தொடர்பாக நாங்கள் இங்கு உரையாற்றிக் கொண்டிருக்கின்றோம். உண்மையிலே மீள்குடியேற்றம் சம்பந்தமாக அனைத்துத் தரப்பினராலும் குற்றச்சாட்டுக்கள் முன்வைக்கப்பட்டிருக் கின்றன. அதன் காரணமாகத்தான் நாங்கள் இன்னும் மூன்று வருடங்கள் இந்த அதிகாரசபையின் சேவையை நீடிப்பதற்கு அனுமதி கேட்டிருக்கின்றோம். இந்த மீள்குடியேற்றம் என்பது

[ගරු විනායගමූර්ති මුරලීදරන් මහතා]

நிறைவடைவதற்கு இன்னும் கிட்டத்தட்ட ஐந்து வருடங்கள் தேவைப்படலாம் என்று நான் நினைக்கின்றேன். மாவிலாற்றில் ஆரம்பிக்கப்பட்ட சண்டையின் பிற்பாடு இடம் பெயர்ந்த மக்கள், அதைவிட கடந்த 30 வருடங்கள் யுத்தம் நடந்த காலத்தில் இடம்பெயர்ந்த மக்கள் என்று இடம்பெயர்ந்த மக்களை நாங்கள் இரண்டு பிரிவுகளாகப் பிரிக்கலாம். தற்பொழுது நாங்கள் முன்னுரிமை கொடுத்து மீள்குடியேற்றி யிருப்பது இந்த மாவிலாற்றுச் சண்டையின் பிற்பாடு இடம்பெயர்ந்த மக்களைத்தான். அதாவது தற்பொழுது அவர்கள் முன்னுரிமை அடிப்படையில் தங்கள் சொந்த இடங்களில் குடியேற்றப்பட்டிருக்கின்றார்கள். அதேநேரம் முப்பது வருடங்களாக இடம்பெயர்ந்த மக்கள் இனிமேல்தான் குடியேற்றப்பட இருக்கின்றார்கள். அந்தப் பிரச்சினைகளைப் பற்றியெல்லாம் இங்கு பலவாறு கூறப்பட்டது. உண்மையிலே பொதுவாக அனைத்துத் தரப்பினரும் கூறியதிலிருந்து நான் ஒரு கருத்தை இங்கு தெளிவாகக் கூற விரும்புகின்றேன். அதாவது, இந்த மீள்குடியேற்றம் என்பது உண்மையிலே அரசியலுக்கு அப்பால் அல்லது இன, மத பேதங்களுக்கு அப்பால் இடம்பெறவேண்டிய ஒரு விடயம் ஆகும். ஆகவே, சிங்கள மக்களாக இருக்கலாம், முஸ்லிம் மக்களாக இருக்கலாம், தமிழ் மக்களாக இருக்கலாம், அவர்கள் யுத்தத்தின் காரணமாக இடம்பெயர்ந்திருந்தால் அவர்களை நாங்கள் நிச்சயமாக மீள்குடியமர்த்த வேண்டும். இடம்பெயர்ந்து இன்று பல துன்பங்கள் வேதனைகளின் மத்தியில் வாழ்கின்ற அவர்கள் எல்லோரும் மனிதர்கள்தாம். ஆகவே, அவர்களை உரிய முறையில் மீள்குடியேற்ற வேண்டிய தேவை அரசாங்கத்துக்கு இருக்கின்றது. அதேநேரத்தில் இது எங்களுடைய அமைச்சினது பொறுப்பு என்பதையும் நான் இங்கு தெளிவாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இதுகுறித்து இந்த இடத்தில் முன்வைக்கப்பட்ட கருத்துக்களையும், அதாவது ஐக்கிய தேசியக் கட்சியாக இருந்தாலும் சரி, அல்லது ரீ.என்.ஏ. ஆக இருந்தாலும் சரி, அல்லது ஜே.வி.பீ. ஆக இருந்தாலும் சரி, அல்லது அரச தரப்பு அமைச்சர்களாக இருந்தாலும் சரி, அவர்கள் அனைவரது கருத்துக்களையும் ஏற்றுக்கொண்டு அந்த மீள்குடியேற்றத்தைத் திறம்படச் செய்ய வேண்டும் என்பதுதான் எங்களுடைய நோக்கம். ஏனென்றால் இதில் பலதரப்பட்ட மக்களும் உள்ளடங்கியிருக்கின்றார்கள். ஆனால், இன்று மீள்குடியேற்றம் இடம்பெறவில்லை என்று முழுமையாகக் குற்றஞ் சாட்டிவிட முடியாது. ஏனெனில் ஓரளவுக்கு மீள்குடியேற்றம் இடம்பெற்றிருக்கின்றது. அதேநேரம் மீளக் குடியமர்ந்தவர்களுக்குரிய முழு வசதி வாய்ப்புக்களையும் வழங்க வேண்டும் என்பதை நானும் ஏற்றுக்கொள்கின்றேன். ஆனால், மீள்குடியேற்றம் என்பது தனியே மீள்குடியேற்ற அமைச்சில் மட்டும் தங்கியிருக்கின்ற விடயம் அல்ல. இணை அமைச்சுக்களுடன் சேர்ந்துதான் மீள்குடியேற்ற வேலைகளைச் செய்ய வேண்டும். ஒரு புதிய கிராமத்தை நாங்கள் அமைக்கின்ற பொழுது அங்கு மின்சாரம் தேவைப்படலாம், குடிநீர் தேவைப்படலாம், பாதை அபிவிருத்தி தேவைப்படலாம், சுகாதார அமைச்சின் சேவை தேவைப்படலாம். இவ்வாறு பல அமைச்சுக்களின் செயற்பாடுகளும் அங்கே இடம்பெற வேண்டும். ஆகவே, இத்தகைய பல அமைச்சுக்களையும் இணைத்துக்கொண்டுதான் நாங்கள் மீள்குடியேற்றத்தைச் செய்ய வேண்டிய தேவை இருக்கின்றது. உதாரணமாக, அண்மையிலே கேப்பாப்பிலவு என்ற கிராமத்திலே நாங்கள் வீடுகளை அமைத்துக் கொடுத்து அந்த மக்களைக் மீள்குடியேற்றியிருக்கின்றோம். அங்கு இன்னும் கிட்டத்தட்ட 115 வீடுகளை அமைப்பதற்கான அடிக்கல்லையும் நாட்டிவிட்டு வந்திருக்கின்றோம். ஏனென்றால் அந்தக் கிராமம் முற்று முழுதாக இடம் மாற்றப்பட்டிருக்கிறது. ஆகவே, அந்த மக்களுக்குச் சகல வசதிகளையும் செய்து கொடுக்க வேண்டும் என்பதில் நாங்கள் மிகவும் கவனமாக இருக்கின்றோம். இதற்கு கிட்டத்தட்ட 115 மில்லியன் ரூபாய் நிதியைத் திறைசேரியில் இருந்து மேலதிகமாகப் பெற்று அந்த மக்களை அங்கு மீள்குடியேற்றவிருக்கின்றோம். இதேபோன்று பலதரப்பட்ட விதங்களில் மீள்குடியேற்றம் இடம்பெற்று வருகிறது.

பொதுவாக வட மாகாணத்திலே வீடு கட்டப்படவில்லை என்ற குற்றச்சாட்டுக்கள் எழுந்துள்ளன. உண்மையிலே அங்கு 2010 -2011ஆம் ஆண்டு 'நேர்ப்' என்று சொல்லப்படுகின்ற North-East Development Fund மூலம், we have already built 12,000 houses. அந்த வீடுகள் முற்றுமுழுதாக இலங்கை அரசாங்கம் பெற்ற கடன் நிதியின்மூலம் கட்டப்பட்டவை யாகும். அதாவது, அந்த வீடுகள் வெளிநாட்டு உதவிகள்மூலமோ அல்லது வேறு நிறுவனங்களின் உதவிகள் கொண்டோ கட்டப்பட்டவையல்ல. இன்று அந்த வீடுகள் அந்த மக்களிடம் கையளிக்கப்பட்டுள்ளன. இருந்தபோதிலும் அரச சார்பற்ற நிறுவனங்களும் அங்கே வீடுகளைக் கட்டியிருக் கின்றன. தற்பொழுது அங்கு இந்திய அரசாங்கத்தின் உதவியு டனான வீடுகள் அமைக்கப்பட்டு வருகின்றன. ஏற்கனவே வட மாகாணத்திலே ஆயிரம் வீடுகள் கட்டி முடிக்கப்பட்டுள்ளன. கடந்த இரண்டு வாரங்களுக்கு முன்பு நாங்கள், அதாவது அரசில் அங்கம் வகிக்கின்ற முஸ்லிம் அமைச்சர்கள், தமிழ்த் தேசியக் கூட்டமைப்பினர், முஸ்லிம் காங்கிரஸ் உறுப் பினர்கள் அனைவரும் இந்திய உயர் ஸ்தானிகரிடம் சென்று இது சம்பந்தமாகக் கதைத்திருக்கின்றோம். ஆனால், மதிப்புக்குரிய உறுப்பினர் சுமந்திரன் அவர்கள் பேசியபொழுது இந்திய வீட்டுத் திட்டத்தில் அரசியல் செல்வாக்குப் பயன் படுத்தப்படுவதாகக் கூறினார். உண்மையில் நான் அதை முற்றுமுழுதாக மறுக்கின்றேன். ஏனென்றால், இந்த வீடு களுக்கு ஆட்களைத் தெரிவுசெய்கின்ற விதம் பொதுவான ஒரு விடயமாக இருக்கின்றது. அதில் எந்த அரசியல்வாதியும் தலையிட முடியாது. அதற்கு உதாரணமாக எங்களுடைய அரசாங்கத்திலே இருக்கின்ற சம்பந்தப்பட்ட அமைச்சர்கள் மற்றும் தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர்கள் எல்லோரும் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள ஒவ்வொரு பிரதேசச் செயலகத்துக்கும் சென்று அந்த வீடுகள் கட்டப்படுவதற்குரிய திட்டங்களை வகுத்ததுடன் அந்த விபரங்களை எல்லாம் மக்கள் பார்வைக்கு வெளிப்படையாக வைக்க வேண்டும் என்ற ஒரு தீர்மானத்தையும் எடுத்திருந் ததைக் குறிப்பிட விரும்புகின்றேன் அதாவது, அந்த வீடுகள் வழங்கப்படுவதில் வெளிப்படையான செயற்பாடுகள் இடம்பெற வேண்டும் என்பதுதான் எங்களுடைய வேண்டு கோளாகும். இதுபோன்ற பல்வேறு வீட்டுத் திட்டங்களைச் செயற்படுத்த இருக்கிறோம்.

தற்பொழுது கிழக்கு மாகாணத்திலே நாலாயிரம் வீடுகளைக் கட்டுவதற்குத் திட்டமிட்டிருக்கின்றோம். அது மாத்திரமல்ல 'தேசத்துக்கு மகுடம்' திட்டத்தினூடாக கிட்டத்தட்ட 9,747 மில்லியன் ரூபாய் நிதியை நாங்கள் கிழக்கு மாகாணத்தில் செலவழித்துள்ளோம். இதில் மீள்குடியேற்றமும் உள்ளடங்குகின்றது. அதாவது அங்கு பல மின்சாரத் திட்டங்களை வழங்குகின்றோம்; பாதைகளை அபிவிருத்தி செய்கின்றோம்; வீடுகளைப் புனரமைக்கின்றோம். இவ்வாறு அங்கு அந்தத் திட்டத்தினூடாகப் பல்வேறு அபிவிருத்தித் திட்டங்கள் இடம்பெறுகின்றன. இதனுடன் ஒட்டியதாக நாளை ஒரு மகிழ்வான விடயம் இடம்பெறவிருக்கின்றது. அதாவது, மட்டக்களப்பு நகரத்தில் கிட்டத்தட்ட 100 வருடங்கள் பழமைவாய்ந்த கல்லடிப் பாலத்துக்கருகில்

சமாந்தரமாகப் அமைக்கப்பட்ட புதிய பாலத்தை மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் திறந்து வைக்கவிருக்கின்றார். அந்தப் பாலத்தின் ஊடாக இன்று மட்டக்களப்பு நகரம் எழில்மிகு தோற்றத்துடன் காட்சியளிக்கின்றது. அந்தப் பாலத்துக்காகக் கிட்டத்தட்ட 1,347 மில்லியன் ரூபாய் செலவிடப்பட்டிருக்கின்றது. அங்கு இதேபோன்று பலதரப்பட்ட வேலைத் திட்டங்கள் நடந்துகொண்டிருக்கின்றன. அதேநேரம் இந்த வேலைத் திட்டங்களில் குறைபாடுகள் இருக்கின்றன என்பதையும் நாங்கள் ஏற்றுக்கொள்கின்றோம். அது சம்பந்தமாக மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடன் கதைத்து மேலதிக நிதியைப் பெற்று அனைவரதும் ஒத்துழைப்புடன் இந்த மீள்குடியேற்ற நடவடிக்கைகளைத் திறம்பட மேற்கொள்ள வேண்டும் என்பதுதான் எங்களுடைய அவாவாகும் என்று கூறி, விடைபெற்றுக்கொள்கின்றேன். நன்றி வணக்கம்.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු ජේ. ශ්‍රී රංගා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.13]

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி. இன்று இச்சபையில் பலர் மீள்குடியேற்றம் பற்றிய வாதப்பிரதி வாதங்களை முன்வைத்தார்கள். யுத்தம் முடிவடைந்ததிலிருந்து இன்றுவரை மீள்குடியேற்றம் பற்றிய பல விடயங்கள் நடந்தேறியபோதிலும், மக்கள் இன்னமும் துன்பங்களையும் கஷ்டங்களையும் அனுபவித்தவர்களாகவே வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். இந்த நிலைமை மாறவேண்டும். யுத்தம் முடிந்துவிட்டதென்று அரசு அறிவித்த பின்பு, பாதிக்கப்பட்ட மக்கள் ஓர் எதிர்பார்ப்புடன், அதாவது, தங்களுக்கு ஒரு நிம்மதியான வாழ்க்கை கிடைக்கும் என்று எதிர்பார்ப்புடன் இருந்தார்கள். ஆனால், இந்தச் சட்டமூலத்தின் ஊடாக இந்த மீள்குடியேற்ற அதிகாரசபையின் நடவடிக்கைகள் மேலும் மூன்று ஆண்டுகளுக்குமேல் நீடிக்கவிருக்கின்றது. மாண்புமிகு அமைச்சர் றிஸாத் பதியுதீன் அவர்கள் உரையாற்றும்பொழுது, தான் அமைச்சராக இருந்த காலத்தில், தன்னால் முஸ்லிம் மக்களைக்கூட மீள்குடியேற்ற முடியவில்லை என்று கூறினார். அவ்வாறே, நான் உட்பட பல தமிழ் பாராளுமன்ற உறுப்பினர்கள், மீள்குடியேற்றத்தின்போது தமிழ் மக்கள் ஒழுங்காகக் குடியேற்றப்படவில்லை என்ற கருத்தினை இச்சபையில் கூறிவந்திருக்கின்றோம். இக்கருத்தினை முன்னாள் மீள்குடியேற்ற அமைச்சர் மாண்புமிகு மில்ரோய் பர்னாந்து அவர்களும் முன்வைத்திருந்தார். இவ்வாறான நிலையில் மீள்குடியேற்றப்பட்ட மக்கள் தங்களுடைய சொந்த இடங்களில் வசதியாக வாழ்கின்றார்களா? என்று நாங்கள் பார்க்கவேண்டும். ஆனால், அப்படியான ஒரு நிலைமை இன்னும் ஏற்படவில்லை.

உதாரணமாக, இந்திய வீட்டுத் திட்டத்தை நாங்கள் எடுத்துநோக்கினால், அந்தத் திட்டத்தின்மூலம் வீடொன்றைக் கட்டிக்கொள்வதற்கு அம்மக்களை loan எடுக்கச் சொல்கின்றார்கள். நாளாந்த வாழ்க்கைக்கே கஷ்டப்படுகின்ற அவர்கள், இவ்வாறு கடனாகப் பெறுகின்ற நிதியினால் ஒரு வீட்டைக் கட்டிமுடிக்க முடியாத நிலையில், இன்று கடனாளிகளாக மாறியிருக்கின்ற நிலைமைதான் ஏற்பட்டிருக் கின்றது. அதாவது, இன்று இந்திய வீட்டுத்திட்ட வீடும் இல்லாமல், வங்கியில் பெற்ற loan ஐயும் செலுத்தவேண்டிய நிலைமை ஏற்பட்டிருக்கின்றது. இதனால், மக்கள் பாரியதொரு பிரச்சினைக்கு முகம்கொடுத்திருக்கின்றார்கள். இதில் முறைகேடுகள் ஒரு பக்கம்! இது தொடர்பாக தமிழ்த் தேசியக் கூட்டமைப்பின் உறுப்பினர்களுடன் கதைப்பதில் எந்தப் பிரயோசனமும் இல்லை. ஆனால், தலைவர் இரா. சம்பந்தன் ஐயா அவர்களிடம் இந்த சபையிலே நான் தனிப்பட்ட ரீதியாக ஒரு வேண்டுகோளை விடுக்கின்றேன், அவர் தனது நெருங்கிய நண்பரான மன்மோகன் சிங் அவர்களிடமும் இந்திய மத்திய அரசுடனும் பேசி இந்தப் பிரச்சினையைத் தீர்க்க வேண்டுமென்று. உண்மையில், தமிழ்த் தேசியக் கூட்டமைப் பின் ஏனைய உறுப்பினர்களைவிட சம்பந்தன் ஐயா அவர்கள் இந்திய மத்திய அரசுடன் நெருங்கிய தொடர்பை வைத்திருக்கின்றார். அவர் இந்தப் பிரச்சினையைத் தீர்த்து வைக்கலாம். இந்த வீட்டுத் திட்டத்திற்கென ஒரு சொற்ப பணத்தை இந்திய அரசு கடனடிப்படையில் எடுக்கின்றது. அதையும் இந்திய அரசு விட்டுக்கொடுத்து இந்த மக்களுக்கு அதற்கான முழு நிதியையும் வழங்கவேண்டும் என்று நான் இந்தச் சபையிலே மனமாரக் கேட்டுக்கொள்கின்றேன்.

அதேநேரம் பிரதி அமைச்சரான கருணா என்றழைக்கப் படுகின்ற முரளிதரன் அவர்களும் இங்கு கருத்துத் தெரிவித்தார். இந்த மீள்குடியேற்றத்தில் இருக்கின்ற பிரச்சினை அவருக்கும் தெரியும். இந்தப் பிரச்சினை உரியமுறையில் தீர்க்கப்படவில்லை என்று ஏற்கெனவே அவரும் கூறியிருந்தார், நாங்களும் கூறியிருந்தோம். இந்த மக்கள் நாளாந்தம் கஷ்டப்பட்டுக்கொண்டிருக்கின்றார்கள். மீள்குடியேற்றம் நடந்தாலும் அவர்களால் அந்த வீட்டில் வாழக்கூடிய நிலைமை இருக்கிறதா? அவர்கள் அங்கே செய்யப்போகும் தொழில் என்ன? அவர்களுக்கு எப்படி வருமானம் கிடைக்கப்போகின்றது? இவை ஒரு பக்கம் இருக்க, அவர்கள் ஏற்கெனவே இருந்த இடத்தைவிட்டு வேறோர் இடத்துக்கு மாற்றப்பட்டிருக்கிறார்கள். அதாவது தன்னுடைய வீடு, தான் முத்தமிட்டு விளையாடிய முற்றம், தாங்கள் சென்ற பாடசாலைகள், தாம் கும்பிட்ட கோயில்கள் என்பவற்றைப் பிரிந்து அவர்கள் திடீரென வேறொரு பிரதேசத்தில் விடப்பட்டிருக்கிறார்கள். மீள்குடியேற்றத்துக்குப் பொறுப்பான அமைச்சர்களாக இருந்தவர்களே இப்படியான நிலைமை களைக் கூறுகிறார்கள். இந்த நிலைமையில் மீள்குடியேற்றம் ஒழுங்காக நடந்திருக்கின்றது என்று சாதாரணமாக ஒருவரால் எப்படி ஏற்றுக்கொள்ள முடியும்? இவ்வாறான நிலைமையில் இந்தச் சபையிலுள்ள சிலர் அந்தப் பகுதிகளில் மீள்குடியேற்ற மெல்லாம் நடந்து முடிந்துவிட்டதென்று கூறுகிறார்கள். ஆனால், அந்த மக்களைப் பார்க்கின்றபொழுது அவர்களிடம் ஏக்கமும் தயக்கமும் எதிர்பார்ப்புமே இருந்துகொண்டிருப் பதைக் காணலாம்.

உண்மையில் மீள்குடியேற்றப் பகுதிகளில் அடிப்படை வசதிகள்கூட இல்லாத நிலைமைதான் காணப்படுகிறது. இந்த நிலைமை மாற்றப்பட வேண்டும். தொடர்ந்தும் அவர்கள் யுத்த சூழ்நிலையில்தான் இருக்க வேண்டுமா? அவர்களிடம் என்ன மாற்றம் ஏற்பட்டிருக்கின்றது? ஒவ்வொருவரினது உடம்பிலும் 'ஷெல்' துண்டுகள் இருக்கின்றன. ஒருவர் காலில்லாமல் இருக்கின்றார்; இன்னொருவர் கையில்லாமல் இருக்கின்றார்; இன்னொருவர் கண்களை இழந்திருக்கிறார். இதற்கப்பால் அவர்கள் வீடில்லாமல் இருக்கின்றார்கள். மனைவியை இழந்த கணவன், கணவனை இழந்த மனைவி, தங்கை-தம்பியரை இழந்த அண்ணன்-அக்காமார், மூத்த சகோதரர்களை இழந்த சிறுவர்கள், இதனைவிட ஊனமுற்றோர், உடைமைகளை

[ගරු ජේ. ශ්‍රී රංගා මහතා]

இழந்து ஏதிலிகளானோர் என்று இப்படி அங்கு பாரிய பிரச்சினைகள்! இந்தப் பிரச்சினைகள் எப்போது தீரும்? ஒருபக்கம் சர்வதேசத்தின் அழுத்தம்! யுத்தத்தை முடித்துவைத்த சர்வதேசம் அந்த யுத்தத்தினால் நேரடியாகப் பாதிக்கப்பட்ட மக்களுக்குப் பிராயச்சித்தமாக அவர்களின் அன்றாடப் பிரச்சினைகளைத் தீர்க்கவில்லை. அவர்களின் வாழ்வாதாரப் பிரச்சினைகளையாவது தீர்க்கவில்லை. சுயநிர்ணய உரிமையு டனான அரசியல் உரிமையை இன்றுவரை பெற்றுத்தர வில்லை. எனவே, இந்த அரசாங்கம் உரியமுறையில் மீள் குடியேற்றத்தைச் செய்து, சுயநிர்ணய உரிமையுடன் தமிழ் மக்கள் வாழ்வதற்கு உரிய அரசியல் தீர்வை தனக்கிருக்கின்ற மூன்றிலிரண்டு பெரும்பான்மையூடாக முன்வைத்து, பாதிக்கப் பட்ட மக்களின் பிரச்சினைகளைத் தீர்த்துவைக்க நடவடிக்கை எடுக்கவேண்டுமென்றும் அதற்கு இந்தச் சபை உதவி செய்ய வேண்டுமென்றும் கேட்டு விடைபெறுகின்றேன்.

நன்றி.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. A. Vinayagamoorthy. You have five minutes.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Sir, I think I have about 15 minutes.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
No, you have got only five minutes.

[5.18 p.m.]

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Hon. Presiding Member, I was listening to the speakers who spoke before me and I thought I was in Geneva and not in the Parliament of Sri Lanka because a lot was said about what had been happening in the UNHRC.

Today, we are taking up the Resettlement Authority (Amendment) Bill to extend its term by another three years. As far as resettlement is concerned, Government says that 95 per cent of the displaced people have been resettled. This is not correct. According to the UN Report, 117,888 persons have not been fully resettled in their own places.

Now, take Keppapulavu, the village which is by the side of Vattapalai. About 250 families of that village are not allowed to go and resettle there. People now living in Vattapalai, they have got their agricultural lands in Keppapulavu but they are unable to go and do their cultivation in Keppapulavu. It is the same in Mullikulam They are not allowed to go and resettle there. As far as Valigamam North is concerned, there are 24 villages and 28,270 persons have not yet been resettled there. When His Excellency the President was presiding at the DDC meeting in Jaffna, I handed over to him a memorandum giving the particulars of persons to be resettled. Then, he asked me whether those figures were correct. I said that I got those figures from the Divisional Secretary and they can check it from him. Now, Major General Hathurusinghe says that all the figures are incorrect. What we now want is full resettlement of these 28,270 displaced persons. Why do you not give us at least a civilian rule in Jaffna? For how long you want us to be under the army rule? Is Major General Hathurusinghe giving orders to the GA, police and everybody? As regards 50,000 houses that India promised, you have been unable to give them a list so far.- [*Interruption*.] You have not given them that.

So, I kindly request the Government to resettle these 28,270 people in 24 villages in Valigamam North immediately because what I understand is that, that area is being taken over by the army to set up army camps. If you are not allowing these people to go and reside in their own houses, why do you find fault with the UNHRC when they bring in a Motion against you? So, we request the Government to resettle these people in those places from where they were displaced. That is the UN principle.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have one more minute.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Okay.

Then, I apologise to the Muslims for what has happened to them in Jaffna. We never sent them out.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Why were you silent then?

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
No, we were not silent.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Why not? When the LTTE gave a 24-hour ultimatum and told the Muslims to leave, you were silent. Why were you silent? Tell us today. None of your Tamil Members spoke against that.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

I apologise for what they have done. - [*Interruption*.] We are prepared to - [*Interruption.*] Let the Muslims come back. We will accommodate them.

Thank you very much.

[අ.භා. 5.23]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඉතාමත් වැදගත් මාතෘකාවක් වන නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා වන මේ මොහොතේ ඊට අදහස් කිහිපයක් එකතු කරන්නට මම කැමැතියි. අද බොහෝ දෙනා සංහිඳියාව ගැන කථා කරනවා; ප්‍රතිසන්ධානය ගැන කථා කරනවා. මම අවංකව හිතනවා, ප්‍රතිසන්ධානය ගැන සංහිඳියාව ගැන අපට රටක් හැටියට පිට රටවලින් උපදෙස් අවශ්‍ය නැහැයි කියලා. අපේ රට තුළ ප්‍රතිසන්ධානය, සංහිඳියාව, එකමුතු භාවය, සහෝදරත්වය සහ සහජීවනය යන මේ සියල්ලක්ම ක්‍රියාත්මක කරන්නට රටක් හැටියට අපට ශක්තිය තිබෙනවා කියලා මම හිතනවා. ඇයි, මම එහෙම කියන්නේ? අපේ ඉතිහාසය දිහා හොඳට බැලුවොත් අපේ රට පාලනය කළ රජවරුන් හැම දාමත්ම සංහිඳියාව වෙනුවෙන්, සුසංයෝගය වෙනුවෙන්, සහෝදරත්වය වෙනුවෙන්, සහජීවනය වෙනුවෙන් කැප වෙලා තිබෙනවා. ක්‍රිස්තු පූර්ව හතරවන ශත වර්ෂයේ පණ්ඩුකාභය රජතුමා කිසිම භේදයකින් තොරව රාජ්‍ය අනුග්‍රහය ලබා දීලා, රටේ තිබුණ සියලුම ආගම් රැක ගන්නට කටයුතු කළා. බ්‍රාහ්මණ, ජෛන, ආජීවක, දේව, වෘක්ෂ, ලිංග, යක්ෂ, ශ්‍රමණ, පාණ්ඩ්‍ය වාගේ පන්සියයක් මිථ්‍යා දෘෂ්ටික කුල සියල්ලකටම එක හා සමානව සැලකුවා. ක්‍රිස්තු පූර්ව හතරවන ශත වර්ෂයේදී පණ්ඩුකාභය රජතුමා රට එක් සේසත් කරලා හැමදෙනාටම එක හා සමානව සැලකුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිස්තු පූර්ව 12 වන ශත වර්ෂයේ i වන විජයබාහු රජ සමයේ පොළොන්නරුව අගනුවර කර ගත් සොළීන් චෝළයන් සමඟ සටන් කරලා චෝළයන්ව පරාජය කරලා චෝළ අගනුවර වන පොළොන්නරුව නැවත වරක් ජයග්‍රහණය කරලා, අට දා ගෙය නමින් දළදා මාළිගාවක් හදලා, දළදා වහන්සේ සහ පාත්‍ර ධාතූන් වහන්සේ ස්ථාපනය කරලා අට දා ගෙය ආරක්ෂා කිරීමට පැවරුවේ කාටද? දකුණු ඉන්දියාවේ වේලක්කාර හමුදාවට. අන්න ඒකත් සංහිඳියාවේ, සහෝදරත්වයේ සංකේතයක්. දකුණු ඉන්දියාවෙන් පැමිණි සියලු දෙනාම සතුරන් හැටියට සැලකුවේ නැහැ. සතුරන් තෝරා බේරා ගෙන, රටට සතුරුකම් කළ අය තෝරා බේරා ගෙන එතුමා කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ බටහිර මුහුදු බඩ ප්‍රදේශයේදී මුස්ලිම්වරුන් 4,000ක් පෘතුගීසීන්ගෙන් මහා විපතකට පත් වන විට ඒ අය නැඟෙනහිර ප්‍රදේශයේ පදිංචි කරවන්නට සෙංකඩගල රාජධානිය කර ගත් සෙනරත් රජතුමා කටයුතු කළ ආකාරය අපට මතකයි. ඒ වාගේම ක්‍රිස්තු පූර්ව 2 වන ශත වර්ෂයේදී දුටුගැමුණු රජතුමා එළාර පරාජය කරලා, රට එක් සේසත් කරලා එළාර වෙනුවෙන් සොහොනක් හැදුවා. එතැනින් දෝලාවකින් යන්න බැහැ; අඩ බෙර ගහන්නට බැහැ; ආචාර කරන්නට ඕනෑ; ගෞරව කරන්නට ඕනෑ. මේ ආදී වශයෙන් වූ උත්තුන්ග ගුණාංග තුළින් මේ රට තුළ ඒ සංහිඳියාව ව්‍යාප්ත කරන්නට, සංහිඳියාව, සහෝදරත්වය, සුසංයෝගය ස්ථාපනය කරන්නට එතුමා කටයුතු කළා. අපට ඉතිහාසය පුරාවටම ඕනෑ තරම් පූර්වාදර්ශ තිබෙනවා. ඒ නිසා අපට පිට රටවලින් උපදෙස් අවශ්‍ය නැහැ, අපේ රට තුළ සංහිඳියාව ස්ථාපනය කරන්නට; අපේ රට තුළ ප්‍රතිසන්ධානය ක්‍රියාත්මක කරන්නට. අපට ඕනෑ තරම් ආදර්ශ, උපදේශන, පූර්වාදර්ශ එදා රජ දවසේ අපේ රට පාලනය කළ, රට එක් සේසත් කළ රජවරුන් අපට ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් විශේෂයෙන්ම පිට රට බලවේග, ජාත්‍යන්තර බලවේග අපේ රටේ දේශපාලන න්‍යාය පත්‍රය පිළිබඳව, අපේ රටේ අභ්‍යන්තරයේ සිදු විය යුතු කරුණු කාරණා පිළිබඳව උපදෙස් ලබා දීම අපි බැහැර කරනවා; ප්‍රතික්ෂේප කරනවා. ඒ වාගේම රටක් හැටියට අපි සංහිඳියාව ගැන කථා කළාට මදි; කයිවාරු ගැහුවාට මදි.

අපේ අදහස් ක්‍රියාවට නංවන්නට අද කාලය එළඹිලා තිබෙනවා. අපි හැමෝම දන්නවා, 1988-1989 කාලයේ පැවැති මහා ව්‍යසනය ගැන. එදා ඒ මහා ව්‍යසනයට හේතු වූ කරුණු කාරණා පිළිබඳව සොයන්නට, ඒ තරුණයන් පිළිබඳව එදා ජනාධිපති කොමිෂන් සභාවක් ස්ථාපනය කළා. ඒ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු හැටියට වර්තමාන විදේශ කටයුතු ඇමතිතුමා කටයුතු කළා. එම ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව මගේ අතේ තිබෙනවා. ඒ වාර්තාවෙන් ඒ තරුණයන් පිළිබඳව යෝජනා කළේ මොනවාද? ජන සමාජය නිර්දේශපාලනීකරණයට ලක් කරන්නට; ඒ වාගේම මේ රටේ රැකී රක්ෂා ලබා දෙන කොට විභාග ක්‍රමයක් නිර්මාණය කරලා තමන්ගේ දක්ෂතාවන්, කුසලතාවන් මත සුදුස්සාට සුදුසු තැන ලබා දෙන්නට; අසාධාරණත්වය නැති කරන්නට. මේ කරුණු කාරණා සියල්ලක්ම එදා තරුණයන් පිළිබඳ සොයන්නට පත් කළ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව යෝජනා කරන කොට මේක පොතකට සීමා කළේ නැහැ. මේක කොළ කැල්ලකට සීමා කළේ නැහැ. මේ වාර්තාව ක්‍රියාවට නංවන්නට එදා කටයුතු කළා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාට දෝෂාභියෝගයක් එල්ල වීම ඒ වාර්තාව ක්‍රියාවට නැංවීමට එක හේතුවක් වුණා.

එක පැත්තකින් අපි වාර්තා සකස් කරනවා. කොමිටි බිහි කරනවා. රුපියල් ලක්ෂ ගණන්, රුපියල් කෝටි ගණන් මුදල් වැය කරලා රට වෙනුවෙන් කියලා කොමිෂන් සභා පත් කරනවා. නමුත් ඒවා ක්‍රියාවට නංවන්නට අද කිසිම යාන්ත්‍රණයක් නැහැ. තරුණ අසහනය පිළිබඳව කොමිෂන් සභාව ඊට කදිම උදාහරණයක්. මේ රටේ මහා ව්‍යසනයක් සිදු වුණාට පස්සේ එයට හේතු වූ කරුණු කාරණා විභාග කරලා ඒවා සමීක්ෂණය කරලා, ගවේෂණය කරලා ඒවා පිළිබඳව නිගමනවලට ඇවිල්ලා එදා රාජ්‍ය තාන්ත්‍රික නායකත්වය හරහා ඒ නිගමන ප්‍රායෝගික වැඩසටහන්වලට පරිවර්තනය කරන්නට කටයුතු කරපු ආකාරය අපට මතක් වනවා.

එපමණක් නොවෙයි, උතුරු නැඟෙනහිර ප්‍රශ්නය විසඳීම සඳහා එදා සර්වපාක්ෂික විසඳුමක් ක්‍රියාත්මක කරන්නට කටයුතු කරපු ආකාරය අපට මතක් වනවා. විශේෂයෙන්ම විශේෂ පාර්ලිමේන්තු කාරක සභාවක් ස්ථාපනය කළා. මේ පාර්ලිමේන්තු කාරක සභාවේ සභාපතිවරයා හැටියට පත් කළේ කවුද? ආණ්ඩුව

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පැත්තේ පුද්ගලයෙක් නොවෙයි, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණු මංගල මුණසිංහ මැතිතුමායි මේ සඳහා පත් කළේ. ඒ වාර්තාව මා සතුව තිබෙනවා. ඒ වාගේ නිර්දේශපාලනීකරණයට ලක් වුණු යාන්ත්‍රණයක් සකස් කළේ ඇයි? සියලුම පාර්ශ්වයන්; සියලුම පක්ෂ එකතු කර ගත් ක්‍රියාවලියකට එදා යොමු වුණේ ඇයි? තමන් ගැන පසුව හිතලා රට පෙරට තබා රටේ අනන්‍යතාව, රටේ අයිතිය, රටේ අනාගත අභිවෘද්ධිය ගැන සිතා බලා විශේෂයෙන්ම පක්ෂ දේශපාලනයෙන් තොරව උතුරු නැඟෙනහිර ප්‍රශ්නයට විසඳුමක් ලබා දීමේ ඒ සංහිඳියා කටයුත්ත නිර්දේශපාලනීකරණය කරපු මාවතක් ඔස්සේ ගෙන යන්නට එදා ක්‍රියාත්මක වුණු ඒ අවංක වැඩ පිළිවෙළ නිසා නිර්මාණශීලී වැඩසටහනක් එදා ක්‍රියාත්මක වුණා.

මේ මොහොත වන විට යුද්ධය අවසන් වෙලා වසර හතරකට ආසන්න වනවා. එදා යුද ජයග්‍රහණය ඉදිරියේ අපි සතුටු වුණා. රණ විරුවන්ට ලබා දිය යුතු ගෞරවය, ඒ අයට ලබා දිය යුතු අභිමානය, ඒ ශක්තිය අපි එදා ලබා දුන්නා. අද දවසේ අපේ වීරෝදාර රණ විරුවන්ට ඇහිලි දිගු කරන කොට රටක් හැටියට ඒක අප වෙත දිගු කරන ඇහිල්ලක් හැටියට අපි හිතා බලන්නට ඕනෑ. රණ විරුවන්ගේ ආත්ම අභිමානය රකින්නට අපි කටයුතු කරන්නට ඕනෑ. නන්දිකඩාල්වලදී ලබා ගත් ඓතිහාසික ජයග්‍රහණය අද ආපහු හරවන තැනකට ඇවිල්ලා තිබීම මේ රටට ආදරය කරන අප සියලු දෙනාටම කනගාටුවට කාරණාවක්. මව් බිමට ආදරය කරන අපි කවදත්, කොතැනත් ඊළමට විරුද්ධයි. මේ රටට ආදරය කරන පුරවැසියන් හැටියට වෙනම රාජ්‍යයන් බිහි කරනවාට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ගරු ඇමතිතුමනි, අපි ඊළමට විරුද්ධව සටන් කරනවා වාගේම, උතුරු නැඟෙනහිර ජීවත් වන ජනතාවට "එල්ලාම" ලබා දෙන්නත් අපි දැන ගන්නට ඕනෑ. ඊළම හැරුණු කොට අනෙක් සියලු දේම ලබා දෙන්නට අපි කැප වන්න ඕනෑ.

උතුරු නැඟෙනහිර ජනතාව එක පැත්තකින් මහා විපැත්තියකට ගොදුරු වෙලා, මහා ව්‍යසනයකයට ගොදුරු වෙලා නිවාස ප්‍රශ්නය නිසා ලක්ෂ ගණනක් අද අනාථ වී සිටින මොහොතක්. ඒ වාගේම උතුරු නැඟෙනහිර බලප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රය කඩා වැටෙන මොහොතක්; සෞඛ්‍ය ක්ෂේත්‍රය කඩා වැටෙන මොහොතක්. උතුරු පළාතේ සෞඛ්‍ය පැත්තෙන් ගත්තාම කුරු වීමේ ප්‍රතිශතය සියයට 22.8යි. ජාතික මට්ටමේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 19.8යි. උතුරු පළාතේ කෘශ වීමේ ප්‍රතිශතය සියයට 18.3යි. රටේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 11.7යි. උතුරු පළාතේ අඩු බර ප්‍රතිශතය සියයට 29.2යි. රටේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 22.1යි. මේ සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම අපට පැහැදිලි වෙනවා, උතුරු නැඟෙනහිර බල ප්‍රදේශයේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ශක්තිමත් කර වන්නට, අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කර වන්නට, නිවාස ක්ෂේත්‍රය ඇතුළු යටිතල පහසුකම් ක්ෂේත්‍රය ශක්තිමත් කර උතුරු නැඟෙනහිර ජනතාවගේ ජන ජීවිතය නංවාලන්නට විශේෂ පරිශ්‍රමයක් දරන්නට අද කාලය එළැඹිලා තිබෙන බව.

වැන්දඹු පවුල් අසූදහසකට වැඩි ප්‍රමාණයක් අද උතුරු නැඟෙනහිර බල ප්‍රදේශයේ ජීවත් වනවා. ඒ අය අද වන විට කාගේවත් පිළිසරණක්, හවිහරණක් නොමැතිව අන්ත අසරණභාවයට පත් වෙලා සිටිනවා කියන එක හැමෝම දන්න කාරණාවක්. මෙන්න මේ තත්ත්වය තුළ LLRC වාර්තාවේ අඩංගු නිගමනයන්, යෝජනා අකුරට, තිතට ක්‍රියාත්මක කිරීම අප හැමෝගේම වගකීමක්. අපි රටට ආදරය කරනවා නම් රට ගැන හිතලා මේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව - LLRC වාර්තාව- ක්‍රියාත්මක කරන්නට කටයුතු කළ යුතුයි. පක්ෂ භේදයෙන් තොරව, හැමෝම එකමුතු වෙලා කාල සටහනක් සහිතව, ඉලක්කයක් සහිතව මේ වැඩ සටහන ක්‍රියාත්මක කරලා මාසිකව මේ පාර්ලිමේන්තුවට ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් වන ආකාරයට වැඩ කටයුතු කළා නම් ජාත්‍යන්තරයෙන් එල්ල වන මේ අභියෝග අපට කවදාවත් එල්ල වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව - LLRC වාර්තාව - කියන්නේ ජාත්‍යන්තර බලවේගවලින් බිහි වුණු දරුවකු නොවෙයි. ඒක මේ ආණ්ඩුවේ ජානවලින් සම්පිණ්ඩනය වූ, සම්පූර්ණ වූ දරුවකු බව අපි හැමෝම දන්නා කාරණාවක්. එහෙනම් LLRC වාර්තාව, කොළයකට පමණක් සීමා නොකොට, පොතකට පමණක් සීමා නොකොට, හමස් පෙට්ටියට එය වීසි කරන්නේ නැතිව මේ ප්‍රශ්නයට මූලික විසඳුමක් හැටියට LLRC වාර්තාව ලබා දෙන ඒ යෝජනා ක්‍රියාත්මක කිරීම රටට ආදරය කරන අපි සියලු දෙනාගේම වගකීම බව මා මේ අවස්ථාවේ මතක් කරන්නට ඕනෑ.

නැවත වරක් මතක් කර සිටිනවා, උතුරු නැඟෙනහිර ක්‍රියාත්මක වුණු කොටි ත්‍රස්තවාදී යුද්ධය රටක් හැටියට අපි 2009 මැයි 18 වැනිදා ජයග්‍රහණය කරන කොට, රටට ආදරය කරන පුරවැසියන් හැටියට අපි සතුටු වුණු බව. නමුත් ඒ සතුට වාගේම අද ලොකු කනගාටුවක් අපේ හිත්වලට එනවා. ඒ තමයි අද රටේ කීර්ති නාමයට ජාත්‍යන්තර අභියෝග, ජාත්‍යන්තර කඩතොලු එල්ල වීම. එවන් අවස්ථාවකදී රටට ආදරය කරන පුද්ගලයින් හැටියට අපි කනගාටු වෙනවා. මේ රටට, රටේ කීර්ති නාමයට මේ වාගේ අභියෝග එල්ල වන කොට අපි කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ඕනෑ තරම් පූර්වාදර්ශ තිබෙනවා. දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ සමයේ ඒ උතුරේ යුද්ධය ක්‍රියාත්මක කරන මොහොතක විශේෂයෙන්ම අහසින් ගිහිල්ලා බෝම්බ දැමීම පිළිබඳව - aerial bombings - ලෝකයේ මහත් ආන්දෝලනයක්, මහා විවේචනයක් එල්ල වුණු මොහොතක මොකක්ද ක්‍රියාත්මක වුණු ක්‍රියාදාමය? එවකට හිටපු කථානායක එම්.එච්. මොහොමඩ් මැතිතුමාගේ නායකත්වයෙන් සර්ව පාක්ෂික කණ්ඩායමක් අනුර බණ්ඩාරනායක මැතිතුමාගේත් සහභාගිත්වය ඇතිව රටක් රටක් පාසා ගිහිල්ලා, ලෝකයා හමුවට ගිහිල්ලා "මේ වාගේ දෙයක් සිදු වන්නේ නැහැ, මෙය කට කථාවක්, මෙය බොරුවක්, මෙය මිථ්‍යාවක්, මෙය සාවද්‍ය තොරතුරුවලින් සමන්විත වූ මහා පවයක්" කියන එක ලොවටම කිව්වේ ආණ්ඩු පාර්ශ්වය පමණක් නොවෙයි, පක්ෂ විපක්ෂ සියලු දෙනාම එකතු වෙලායි ඒ ක්‍රියාත්මක වුණු ඒ බොරුව නිවැරදි කරන්නට කටයුතු කළේ. එහෙනම් විශේෂයෙන්ම අද අපේ මාතෘ භූමිය, අද අපේ රට වර්තමාන රජයේ නොහැකියාව නිසා, අකාර්යක්ෂමතාව නිසා මහා උවදුරකට, මහා අභියෝගයකට ලක් වී තිබෙන මොහොතක අවසාන වශයෙන් කාරණා දෙකක් මට ඉදිරිපත් කරන්නට තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* பிரதிச் சபாநாயகர் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. UDITH LOKUBANDARA *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

විශේෂයෙන්ම අද අපේ රට විදේශීය අභියෝගවලට ලක් වෙලා තිබෙනවා. අප මෙම තත්ත්වයට පාත්‍ර වුණේ මොන හේතුවක් නිසාද? මේ රජයේ අකාර්යක්ෂම ප්‍රතිපත්ති නිසායි. මේ රජයට බැරි වුණා, ලෝකයත් සමඟ ගනුදෙනු කරලා. ජාත්‍යන්තරයත් සමඟ ගනුදෙනු කරලා එදා 2009 මැයි මාසයේදී ලබා ගත්තු යුද ජයග්‍රහණය ජාතික ජයග්‍රහණයක් බවට, දීර්ඝ කාලීන ජයග්‍රහණයක් බවට පරිවර්තනය කර ගන්න. වර්තමාන රජය ඊට අපොහොසත් වුණා. එක පැත්තකින් ජාත්‍යන්තරයට ගිහිල්ලා එක එක පොරොන්දු දීලා, ලෝකයා රවටටලා, ජාත්‍යන්තර ප්‍රජාව රවටටලා, ඉන්දියාව ඇතුළු ආසියාතික රටවල්, බටහිර රටවල් රවටටලා වෙලාවකට "Thirteen Plus" කියනවා; වෙලාවකට "Thirteen" කියනවා; තව වෙලාවකට "Thirteen minus" කියනවා; වෙලාවකට ගිව්සුම් ගහනවා. රට තුළ ක්‍රියාත්මක වුණු යුද අපරාධ විභාග කරන්නට ඕනෑය ආදී ඒ හැම දෙයක් ගැනම ව්‍යාකුල තත්ත්වයක්, අපේ රට ඉතා අසරණභාවයට පත් කරන තත්ත්වයක් නිර්මාණය වුණේ අපේ රටේ රාජ්‍ය තන්ත්‍රයේ දුර්වලතාව තුළින් බව මම මතක් කරන්න කැමැතියි. මම ඉතාම වගකීමෙන් කියනවා, මේ රටේ යුද අපරාධ තිබුණය; මේ රටේ යුද අපරාධ පිළිබඳව පරීක්ෂණයක් කරනවාය කියන කාරණය පිළිබඳව එකඟතාවයකට පැමිණිලා, යුද්ධය අවසන් වෙලා එක්සත් ජාතීන්ගේ මහලේකම් බෑන් කී මූන් මහතා මේ රටට ආවායින් පසුව නිකුත් කරපු ඒකාබද්ධ නිවේදනයේ සඳහන් වෙලා තිබෙනවාය කියන එක. විදේශ ඇමතිතුමා හැටියට මහාචාර්ය ගරු ජී.එල්. පීරිස් මැතිතුමා ඉන්දියාවට ගිය හැම වතාවකදීම එවකට හිටපු විදේශ අමාත්‍යවරුන්ට එතුමා සඳහන් කළේ අපි හැමදාම දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට ගිය - Thirteen Plus - විසඳුමක් ලබා දෙනවාය කියන එකයි. **එතුමා** පුන පුනා ඉන්දියාවට ඒක ප්‍රකාශ කරලා ඉන්දියාවත් නොමඟ යැව්වා. මම අහන්න කැමැතියි, අපේ රට තුළ යුද අපරාධ සිදු වුණාය කියන ඒ ප්‍රකාශය අත්සන් කළේ රට ගැන හිතලාද, එහෙම නැත්නම් තමන් ගැන හිතලාද කියා. Thirteen Plus ගැන කථා කළේ රටේ අනාගත අභිවෘද්ධිය ගැන හිතලාද එහෙම නැත්නම් ලෝකයා රවටන්නද, ජාත්‍යන්තරය නොමඟ යවන්නද කියන එක මම අහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වනකොට අපේ රට මහා අර්බුදකාරී තත්ත්වයකට ජාත්‍යන්තර වශයෙන් ව්‍යාකුල තත්ත්වයකට පාත්‍ර වී තිබෙනවා. අපි මේ වර්තමාන රජයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා පක්ෂ, පාට, ජාති, ආගම්, කුල මල බේද සියල්ලක්ම නොතකා පක්ෂ විපක්ෂ සියලු දෙනාම එකතු වී මේ රට ගොඩ නගන්නට මේ රට තුළ සැබෑ සංහිඳියාවක්, සැබෑ ප්‍රතිසන්ධානයක්, සැබෑ සහෝදරත්වයක්, සැබෑ සාමයක්, සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් ස්ථාපනය කරන්නට කටයුතු කරමුය කියා. එහෙම වුණොත් කිසි දාක මේ රටේ ඊලමක් දියත් කරන්නට බැහැ; කිසි දාක මේ රටේ වෙනම රාජ්‍යයක් බිහි වෙන්නේ නැහැ. නමුත් මේ ස්වෛරී ශ්‍රී ලංකාව තුළ, මේ ඒකීය ශ්‍රී ලංකාවේ සියලු දෙනාම දේශපාලනික වශයෙන් සවි බල ගන්වන්නට ඕනෑ; ආර්ථික වශයෙන් සවි බල ගන්වන්න ඕනෑ. මේ රටේ සියලුම පුරවැසියන්ගේ සමාජීය, ආර්ථික අයිතිවාසිකම්, දේශපාලනික අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සුරක්ෂා කරන්නට අපි ඇප කැප වෙන්න ඕනෑ. අන්න ඒ ගමන අපි දියත් කරමු. ඒ ගමන එකමුතුභාවයෙන්, එක්සත්භාවයෙන් යුතුව දියත් කරලා මේ රට -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසන් කරනවා. මට තව තත්පර 30ක් දෙන්න. මේ රටට අත්පත් වී තිබෙන මහා උරුමයන් මේ රට ගොඩ ගන්නට, මේ රට බේරා ගන්නට අපි හැම දෙනාම එක්සත්ව, එක්සිත්ව කටයුතු කරමු. ප්‍රතිසන්ධානය ගැන කථා කරනකොට පිට රටවලින් අපේ රටට පාඩම් අවශ්‍ය නැහැ. අපේ ඉපැරණි රජ දරුවන් ලබා දුන්නු පාඩම් අකුරටම ක්‍රියාත්මක කරලා මේ රට තුළ සැබෑ සහෝදරත්වයක් ගොඩ නගන්නට අපි කටයුතු කරමුය කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[பி.ப. 5.43]

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மீள குடியமர்த்துதல் அதிகாரசபை (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்திலே உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் கிடைத்தமைக்காக நான் மகிழ்ச்சியடைகின்றேன். 2009ஆம் ஆண்டின் இறுதிப் பகுதியில் ஆரம்பிக்கப்பட்ட மீள்குடியேற்றப்பணிகள் கணிசமான அளவுக்கு முன்னேற்றம் கண்டுள்ளன. யுத்தம் முடிந்த பின்னர் எட்டப்பட்ட இந்த முன்னேற்றத்தை வடக்கு, கிழக்குப் பகுதிகளுக்கு விஜயம் செய்த வெளிநாட்டுப் பிரதிநிதிகளே பாராட்டி வாழ்த்துகின்றனர். இந்த மாற்றத்துக்காக நாங்கள் கடுமையாக உழைத்துள்ளோம். இந்த முன்னேற்றத்தை எட்டுவதற்காக அரசாங்கம் 'வடக்கின் வசந்தம்', 'கிழக்கின் உதயம்' என்ற சிறப்புத் திட்டங்களை உருவாக்கி, அதற்காகப் பெருமளவு நிதியையும் ஒதுக்கியிருந்தது. துரித அபிவிருத்தித் திட்டத்தின்கீழ் இதற்காக விசேட கட்டமைப்புக்களும் நிர்வாக ஏற்பாடுகளும் செய்யப்பட்டிருந்தன. இதனால் முப்பதாண்டு காலம் பின்னடைவு நிலையிலிருந்த பிரதேசங்கள் கணிசமான அளவுக்கு முன்னேற்றம் கண்டுள்ளன. குறிப்பாக, உட்கட்டுமானங்களைத் துரிதகதியில் அபிவிருத்தி செய்வதற்கு எடுக்கப்பட்ட நடவடிக்கைகளுக்காக நான் இந்த அவையிலே மேதகு ஜனாதிபதி அவர்களுக்கும் பொருளாதார அபிவிருத்தி அமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்களுக்கும் நன்றி தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றேன்.

மீள்குடியேற்றத்தின் வெற்றி என்பது, மக்கள் தங்கள் சொந்த ஊர்களுக்குத் திரும்பும்போது அங்கே அவர்கள் வாழ்வதற்கான சூழலை உருவாக்கிக் கொடுப்பதே ஆகும். இதை நான் அந்தப் பிரதேச மக்களுடன் இணைந்திருந்து அனுபவபூர்வமாகக் கண்டுள்ளேன். பாடசாலை, ஆசிரிய வளம், மின்சாரம், வீதி, மருத்துவ வசதி, போக்குவரத்து, வீட்டு வசதி, தொழில்வாய்ப்பு போன்ற அடிப்படை வசதிகளை முறையாக ஏற்படுத்திக் கொடுக்கும்போதே மீள்குடியேற்றம் என்பது வெற்றியடைகின்றது. இவைகளில் கணிசமான முன்னேற்றம் வடக்கு, கிழக்கில் ஏற்பட்டிருக்கின்றது. இன்னும் அங்கு பல தேவைகள் இருக்கின்றன. இத்தேவைகளில் பூரணத்துவம் இல்லாதபோது மீள்குடியேற்ற நடவடிக்கை என்பது மிகுந்த விமர்சனத்துக்குரியதாகவே இருக்கும். இப்படியான நிலையை வைத்து ஊடகங்களும் அரசியற்

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

சக்திகளும் அரசாங்கத்தை விமர்சித்து வருகின்றன. மீள்குடியேற்றத்துக்குமுன் - போருக்குமுன் - மக்கள் உழைப்பினாலும் முயற்சியினாலும் தங்கள் வாழ்க்கைக் கேற்பத் தமது பிரதேசங்களைக் கட்டமைத்து வைத்திருந்தனர். ஆனால், போரினால் ஏற்பட்ட பாதிப்புக்கள் அவர்களுடைய பிரதேசங்களை முற்றாக அழித்துவிட்டன. இதனால், அவர்கள் மீளக்குடியேறும்போது அங்கே வாழ்வதற்குக் கடினமாக உள்ளது. இந்த நிலையில் உட்கட்டுமானத்தை நாம் விரைவாக நிர்மாணிக்கும்போதே மீள்குடியேற்றம் சாத்தியமாகிறது. இதை உணர்ந்த அரசாங்கம் உட்கட்டுமான விருத்திக்காக பெருமளவு நிதியை ஒதுக்கியிருந்தது. ஆனாலும் இன்னும் சில பிரதேசங்களில் மீள்குடியேற்றமானது முழுமையடையா திருப்பது கவலையளிக்கும் ஒரு விடயமாகவே உள்ளது. இன்னும் சில பிரதேசங்களில் மக்கள் மீள்குடியேற்றம் செய்யப்படவேண்டிய நிலையில் உள்ளனர்.

கிளிநொச்சி நகரிலுள்ள பரவிப்பாஞ்சான் என்ற பகுதியில் மக்கள் இன்னமும் மீள்குடியேற்றப்படவில்லை. இந்தப் பகுதியைச் சேர்ந்த சில குடும்பங்கள் கனகபுரம் கிராம அலுவலர் பிரிவில் மாவட்டச் செயலகத்தினால் அமைக்கப் பட்டுள்ள இடைத்தங்கல் முகாமில் ஓராண்டுக்கும் மேலாகத் தங்கவைக்கப்பட்டுள்ளனர். கிளிநொச்சி நகரப் பகுதியைச் சேர்ந்த கிராம அலுவலரே தன்னுடைய வீட்டில் இன்னமும் மீளக்குடியேற முடியாதிருக்கின்றார். ஆகவே, இந்தப் பரவிப்பாஞ்சான் பகுதி மக்களை அவர்களுடைய சொந்த இடங்களில் மீளக்குடியேற்றுவதற்கான நடவடிக்கைகளைத் துரிதமாக எடுக்கவேண்டுமென நான் இங்கு வலியுறுத்து கின்றேன். இந்த மக்களை அவர்களுடைய வீடுகளில் குடியமர்த்துவதில் தாமதம் ஏற்படுவதற்கு நியாயமான காரணங்கள் ஏதுமிருப்பதாகத் தெரியவில்லை. ஆனால், அவர்கள் இன்னமும் தங்கள் வீடுகளுக்குத் திரும்பவில்லை என்பது மட்டும் உண்மை. தாம் எப்போது தங்களுடைய சொந்த வீடுகளுக்குப் போவோமோ என்ற எதிர்பார்ப்புடன் அவர்கள் காத்துக்கொண்டிருக்கிறார்கள். இவர்களை மீளக் குடியமர்த்த வேண்டிய பொறுப்பை மீள்குடியேற்ற அமைச்சு ஏற்று, அதற்கான ஏற்பாடுகளை விரைவாகச் செய்யவேண்டு மென நான் இங்கு வலியுறுத்துகின்றேன்.

மேலும், கிளிநொச்சி மாவட்டத்தில் வேம்பொடுகேணி, இத்தாவில், முகமாலை போன்ற இடங்களிலும் மீள்குடியேற்றம் செய்யப்பட வேண்டியுள்ளது. இத்தாவில், முகமாலை ஆகிய இரண்டு கிராம அலுவலர் பிரிவுகளிலும் பகுதி அளவில் மட்டுமே மக்கள் மீளக் குடியமர்த்தப்பட்டுள்ளனர். அங்கு கண்ணிவெடி அகற்றும் நடவடிக்கைகள் நடைபெற்றுக் கொண்டிருப்பதால், அந்த மக்கள் இன்னமும் மீள்குடியேற முடியாத நிலைமை இருக்கின்றது. ஆகவே, விரைவான கண்ணிவெடி அகற்றல் நடவடிக்கைகளினூடாக அவர்கள் தங்களுடைய சொந்த மண்ணில் குடியேறுவதற்கும் அவர்களுடைய வாழ்க்கையை மேம்படுத்துவதற்குமான ஒரு சூழலை ஏற்படுத்திக் கொடுக்கவேண்டும் என்பதை நான் இங்கு வலியுறுத்துகின்றேன். ஏனைய மக்களும் இந்த ஆண்டுக்குள் மீளக் குடியமர வேண்டுமென்ற ஆவலுடன் காத்திருக் கிறார்கள். இவ்வாறு வலி. வடக்கிலும் முல்லைத்தீவு மாவட்டத்திலுள்ள கேப்பாப்புலவிலும் உள்ள ஆயிரக்கணக் கான மக்கள் தங்கள் சொந்த ஊர்களுக்குச் செல்வதற்காகக் காத்திருக்கின்றனர். ஆகவே, இவர்களுடைய விடயத்தில் அரசு ஒரு நியாயமான நடவடிக்கையை மேற்கொள்ள வேண்டுமென நான் இங்கு வலியுறுத்துகின்றேன்.

போர் முடிந்த பின்னர், மீண்டும் தங்கள் சொந்த இடங்களுக்குத் திரும்பி மகிழ்ச்சியாக வாழ முடியும் என்ற நம்பிக்கையோடு எதிர்பார்த்திருந்த மக்களுக்கு இன்று கிடைத்திருப்பது ஏமாற்றமே! உண்மையில் இது கவலைக்குரிய விடயமாகும். பாதிக்கப்பட்ட மக்களின் மேம்பாட்டுக்காகவும் மறுவாழ்வுக்காகவும் பல கோடி ரூபாயைச் செலவழித்து, பல்லாயிரக்கணக்கானோரின் மனித வளத்தைப் பயன்படுத்திப் பல திட்டங்களை நடைமுறைப்படுத்தி வரும் அரசு, மீதியாக இருக்கும் சிறிய அளவிலான மக்களின் மீள்குடியேற்றப் பிரச்சினையால் பெரும் விமர்சனத்தைச் சந்தித்துக் கொண்டிருக்கிறது. இந்த நிலையை அரசாங்கம் கருத்திற் கொண்டு செயற்பட வேண்டும் என்று நான் இங்கு வலியுறுத்துகின்றேன்.

வீட்டுத் திட்டத்தைப் பொறுத்தவரையில், தற்போது இந்திய, சுவிஸ் வீடமைப்புத் திட்டங்கள் பல மாவட்டங் களிலும் பரவலாக நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றன. இந்திய வீட்டுத் திட்டத்தைப் பொறுத்தவரையில், கணிசமான அளவுக்கு அதிலே முன்னேற்றம் காணப்படுகின்றது. ஏற்கெனவே, கிளிநொச்சி மாவட்டம், முல்லைத்தீவு மாவட்டம், மன்னார், வவுனியா வடக்கு மற்றும் யாழ்ப்பாணம் போன்ற பிரதேசங்களில் இந்திய வீட்டுத் திட்டத்தின் செயற்பாடுகள் முன்னேற்றகரமாக இருக்கின்றன. இந்திய வீட்டுத் திட்டத்தை முழுமையாக அமுல்படுத்தும்போது வட மாகாணத்திலுள்ள மூன்றில் இரண்டு பகுதி மக்களுடைய வீட்டுத் தேவைகள் பூர்த்தி செய்யப்படக்கூடிய வாய்ப்புக் கிடைக்குமென்று நான் நம்புகின்றேன். தற்போதுகூட கிளிநொச்சி மாவட்டத்தில் இந்திய வீட்டுத் திட்டத்துக்குப் புறம்பாக 9,000 வீடுகள் அமைக்கப்பட்டுள்ளன. கிளிநொச்சி மாவட்டத்துக்கு அண்ணள வாக 24,000 வீடுகள் தேவைப்படுகின்றன. அதில் 9,000 வீடுகள் ஏற்கெனவே கட்டப்பட்டுள்ளன. 8,200 வீடுகள் இந்திய வீட்டுத் திட்டத்தின்கீழ் கிடைத்திருக்கின்றன. இதன்மூலம் கிளிநொச்சி மாவட்டத்தில் மூன்றிலிரண்டு பகுதி மக்களின் வீட்டுத்தேவை பூர்த்தி செய்யப்படும்.

வன்னிப் பகுதிகளில் மீள்குடியேறிய ஒரு தொகுதி மக்களுக்கு நிரந்தரக் காணிகள் இல்லாதிருப்பதனால் அவர் களுக்கு வாழ்வாதார உதவிகள், வீடமைப்பு போன்ற வசதிகளை வழங்குவதில் பல பின்னடைவுகள் காணப்படு கின்றன. இதனால் இந்த மக்கள் தொடர்ந்தும் அகதி நிலையிலேயே வாழவேண்டிய நிலை ஏற்பட்டுள்ளது. இந்த நிலைமையைப் பல ஊடகங்கள் காட்சிப் பொருளாக்கு கின்றன. தமிழ்த் தேசியக் கூட்டமைப்பினர்கூட இந்த மக்களின் அடிப்படைப் பிரச்சினைகள் தொடர்பாக முழுமை யாக அறிந்துகொள்ளாது, எழுந்தமானமாக அறிக்கைகளை வெளியிடுகின்றார்கள். நடைபெற்று முடிந்த போரின் காரணமாக காணியற்ற நிலையிலுள்ள 20 வீதமான மக்களின் காணிப் பிரச்சினைக்கு இதுவரையில் தீர்வுகாண முடியவில்லை. இப்பொழுது இவர்களுக்கு புதிய காணிகள் வழங்குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகிறது. அது துரிதப்படுத்தப்படவேண்டும். இந்த நிலைமையைக் கருத்திற்கொண்டு அரசாங்கம் முன்னெடுத்த காணி விவகாரம் தொடர்பான நடவடிக்கைகளை தமிழ்த் தேசியக் கூட்டமைப் பினர் முடக்கியிருந்தனர். அதன் பின்னர், தற்பொழுது காணியற்ற மக்களுக்குக் காணிகளைப் பகிர்ந்தளிப்பது தொடர் பான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. "சுவர் இருந்தால்தான் சித்திரம் வரையலாம்" என்பது பழமொழி. காணி இல்லாவிடில் ஒரு குடும்பம் வாழமுடியாது என்ற யதார்த்த நிலைமையே இன்று இலங்கையில், குறிப்பாக வடக்கு, கிழக்கில் நிலவுகின்றது. எமது பண்பாட்டுச் சூழலும் வாழ்க்கை அமைப்பும் அவ்வாறே அமைந்துள்ளது. ஆகவே

முதலில் நாங்கள் மீள்குடியேற்றுகின்ற மக்களுக்குக் காணிகளை வழங்குவதற்குத் துரித நடவடிக்கைகளை மேற் கொள்ள வேண்டும். காணிகளைப் பெற்றுக்கொண்டால்தான் இந்த மக்களால் பிற வசதிகளையும் பெற்றுக்கொள்ள முடியும்.

இங்கே நான் ஒரு விடயத்தைப் பெருமையுடன் கூற விரும்புகின்றேன். கிளிநொச்சி மாவட்டத்தில் இயக்கச்சி என்ற இடத்தில் காணியற்ற நிலையில் இருந்த 48 குடும்பங்களின் நிலைமையைக் கருத்திற்கொண்டு சுரேஷ் மேதர் என்ற தனியார் ஒருவரிடம் ஒருதொகைக் காணியை அன்பளிப்புச் செய்யும்படி கேட்டிருந்தோம். அவரும் எமது வேண்டுகோளுக் கிணங்கி பெருந்தன்மையுடன் தனது 15 ஏக்கர் விஸ்தீரண முடைய காணியை அந்த மக்களுக்கு அன்பளிப்புச் செய் திருந்தார். இதனையடுத்து, அந்தப் பகுதியில் தங்கள் வாழ்நாளிலேயே காணியில்லாத நிலையில் இருந்த 45 குடும்பங்களுக்கு அக்காணி பகிர்ந்தளிக்கப்பட்டு, சுவிஸ் வீடமைப்புத் திட்டத்தின்மூலம் புதிய அழகிய வீடுகளும் நிர்மாணித்து வழங்கப்பட்டுள்ளன. அத்துடன், அங்கு முன்பள்ளி ஒன்றும் அமைக்கப்பட்டுள்ளது. அத்துடன் தற்பொழுது அந்த மக்களுக்கு வாழ்வாதார உதவிகளும் வழங்கப்பட்டுள்ளன. இப்பொழுது இந்த மக்கள் வெற்றிகரமான ஒரு மீள்குடியேற்றத்தின்மூலம் வாழ்க்கையில் மேம்பாடடைந்துள்ளனர். ஆகவே, காணி இருந்தால் பல பிரச்சினைகளுக்குத் தீர்வுகாண முடியும். இவ்வாறு கிளிநொச்சி மாவட்டத்தில் 12 ஆயிரம் குடும்பங்களுக்கு காணிகள் பகிர்ந்தளிக்கப்பட வேண்டிய நிலை காணப்படுகின்றது.

மீள்குடியேற்றத்தில் இன்னொரு முக்கியமான பிரச்சினையாக நாங்கள் இனங்கண்டிருப்பது தொழில்வாய்ப் பாகும். விவசாயம், கடற்றொழில் போன்ற தொழிற்றுறை களைத் தவிர வேறு தொழில்களைச் செய்பவர்களுக்கு அம்மாவட்டங்களிலே வேலை வாய்ப்புக்கள் இல்லாத நிலைமை காணப்படுகின்றது. குறிப்பாக, முன்பு கிளிநொச்சி மாவட்டத்திலே பரந்தன் இரசாயனக் கூட்டுத்தாபனம், ஆனையிறவு உப்புக் கூட்டுத்தாபனம் போன்றன இயங்கி வந்தன. இவற்றில் பல்லாயிரக்கணக்கான குடும்ப உறுப் பினர்கள் தொழில்வாய்ப்புக்களைப் பெற்றிருந்தனர். ஆனால், இன்று அத்தனை குடும்ப உறுப்பினர்களுக்கும் தொழில்வாய்ப்பு இல்லாத நிலைமை காணப்படுகின்றது. அதைப்போன்றே பச்சிலைப்பள்ளி, கிராஞ்சி, முல்லைத்தீவு, புதுக்குடியிருப்பு போன்ற இடங்களில் தென்னை மரங்கள் தாராளமாக இருந்தன. போர்க்காலத்தில் அவை யாவும் அழிவடைந்துவிட்டன. இதனால் தென்னைப் பொருளா தாரத்தை மையமாக வைத்துத் தொழில்செய்யும் வாய்ப்புக் களைக் கொண்டிருந்த குடும்பங்களும் இன்று வேலை வாய்ப்பை இழந்திருக்கின்றன. அவர்கள் எதிர்கொள்ளும் இப்பிரச்சினையைத் தீர்ப்பதற்கு உரிய நடவடிக்கை எடுக்கப்பட வேண்டும். ஆகவே, வேலைவாய்ப்பு என்பது மீள்குடியேற்றத்தில் மிகவும் முக்கியமான ஓர் அம்சமாகவே காணப்படுகின்றது.

மீள்குடியேற்றத்தில் கணிசமான முன்னேற்றத்தை அடைவதற்காக எமது அரசாங்கம் கடந்த மூன்றரை ஆண்டுகளாக மிகப்பெரிய பாத்திரம் வகித்திருக்கிறது. எமது மீள்குடியேற்ற பிரதி அமைச்சர் மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன் அவர்கள் தனது உரையில் குறிப்பிட்டுள்ளதைப் போன்று இன்னமும் பல பிரச்சினைகள் தீர்க்கப்படாதவையாக இருக்கின்றன. இவையே இன்று அரசுக்கெதிரான ஒரு பிரசாரமாக முன்னெடுக்கப்படுகின்றன. ஆகவே, கடந்த மூன்றரை வருட காலத்தில் இந்த மக்களைத் துரிதகதியில் மீள்குடியேற்றுவதற்காக அரசாங்கம் எடுத்த முனைப்பைப் போன்றே எதிர்காலத்திலும் தீவிர முயற்சியின்மூலம் போரி னால் பாதிக்கப்பட்ட மக்களின் வாழ்வில் ஓர் ஒளிமயமான எதிர்காலத்தை ஏற்படுத்த முடியும் என்பதை நான் இங்கு வலியுறுத்தி, எனக்குச் சந்தர்ப்பமளித்தமைக்கு மீண்டும் நன்றி தெரிவித்து விடைபெறுகின்றேன். வணக்கம்.

[5.55 p.m.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Hon. Deputy Speaker, today, we are debating the extension of the life of the Resettlement Authority Act, No. 9 of 2007. This Act was passed in 2007 when the conflict in the Eastern Province was concluding, and there was a need to resettle the people who were displaced during that war. After six years, now we are extending it further for another period of three years and this is four years after the conclusion of the war, including the Northern Province.

However, even today, though the Hon. Deputy Chairman of Committees, who spoke before me, said that 60 per cent of the housing needs in Kilinochchi have been attended to, he is still speaking on the planned activities of the Indian housing scheme. The Ministry of Resettlement told us in December that as many as 87,000 fully-damaged houses and 27,000 partially-damaged houses have to be reconstructed. Out of this, though I do not have the figures, I have been told by the Hon. Deputy Chairman of Committees who spoke before me that 9,000 houses have been completed so far. That means, there is a further 105,000 houses to be completed and out of this, India is to complete 35,000 completely-damaged houses and 5,000 houses, which were partially damaged. So, if you deduct that 40,000, we still have 74,390 houses to be constructed. India has pledged Indian Rs. 13 billion, which is about Sri Lankan Rs. 32 billion for the construction of these houses. This offer was made when our President went on a State visit to India, to New Delhi. The Prime Minister of India offered 50,000 houses, out of which 1,000 have been built; 49,000 houses remain to be built with 9,000 houses going to be built in the Eastern, Central and Uva Provinces.

So, with these 40,000 houses, the number of houses to be built will come down to 74,000. If what the Hon. Deputy Chairman of Committees said was true, then there will be a further 65,000 houses to be built. Each house that will be built by India will cost approximately Sri Lankan Rs. 650,000. The Government of Sri Lanka said that they were allocating Rs. 375,000 for each house in their housing programme. Even at that price, for 65,000 houses, you need nearly Rs. 25 billion. When is the Sri Lankan Government going to make its commitment to our own people? Are we still waiting for India or for other people to do it? What is the commitment of this Government to our own citizens? This is the question that arises.

[ගරු ආර්. යෝගරාජන් මහතා]

It is very saddening to note that the Government has relocated the people from the camps that they were living in soon after the war, in their villages. That means, those people have been relocated or they have returned to their home areas or the villages of their own. But, they have not been resettled as such. To be resettled, you should first have a roof above your head, means of income and then, the necessary facilities for you to live a normal life. No, none of these are available. People are living primitive lives: some of them are still living under tarpaulin tents; some are living under tin-roofed huts in such hot, arid conditions. This is something that the Government is just ignoring, looking away. This will not solve the problems of these people or help in the reconciliation that we all expect to have in this country.

The UNHRC today, has passed the US Resolution with 25 votes against 13. Last year, it was 24 against 13 and the Government added the abstentions as favourable to them and said that they lost only by one vote. They have lost by four this time. I do not know how they are going to explain as to why the gap is becoming larger. If they had done their job as they keep saying, I am sure the world would not react to us in this manner. As far as resettlement is concerned, even the US Resolution says that resettlement has been done. They also, I believe, accept the criteria of the Government for resettlement. If the fact that these people have only been relocated and not properly resettled came up, this 25 may have been 30. So, it is so unfortunate that this is the situation we are placed in today .

There is a sort of unofficial censorship in this country. There are a lot of people who watch international news media through the Dialog TV. For the last three days, we have been unable to watch the Sun TV, the Kalaignar TV or the Raj TV because the Dialog TV has been blacking out all the news channels that are telecast from India.

Is there no right for our people to watch media, to be informed? Is there no right for our people to watch news items of their choice? Are we living in a democracy or in a dictatorship? This is the question that arises.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you have only one minute left.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Okay. I spoke to Dialog TV and they said that they have been given orders by the Government. I said, "Please give me that in writing" but they are scared to do it because they do not believe in the democracy that we live in.

As far as the Indian housing scheme is concerned, there were some questions raised by one Member who says he is in the Opposition, but he is a person who voted for the Eighteenth Amendment. There is a website of the Indian High Commission where the Indian Housing Project has been given in detail. They have given the criteria for selection of the beneficiaries. They have given a scheme that is very transparent so that any person who is selected or not selected can be challenged or can file an appeal. Though the Hon. Member who spoke before me said that 7,000 odd houses or 8,100 houses have been built in Kilinochcdhi, the schedule of activities that are given in the website says that the launch of the project on the ground in all five districts will be on the 2nd October, 2013, the birthday of Mahatma Gandhi**.** Further, they have also very transparently put out on this website the responsibilities of the Government of Sri Lanka.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, please wind up.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Sir, I am concluding. They have listed 21 items as responsibilities of the Government of Sri Lanka. I do not know why they have made it so transparent. It maybe because they do not trust the Government of Sri Lanka which has been bluffing on the Thirteenth Amendment and the speech of the Indian Representative at the UNHRC also was on the promises made by the Government of Sri Lanka on the Thirteenth Amendment. It is unfortunate that our Government is not trusted by the international community. It is a shame!

Thank you.

[අ.භා. 6.06]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද්ධය අවසන් වීමෙන් පස්සේ ජනාධිපතිවරයා කිව්වා, "මීට පස්සේ මේ රටේ සුළු ජාතියක් නැහැ" කියලා. ඒක කිව්වේ මොන අර්ථයෙන්ද කියලා එදා අපට ප්‍රශ්නයක් තිබුණා; මේ රටේ ජනතාවටත් ප්‍රශ්නයක් තිබුණා. එක්කෝ සුළු ජාතිකත්වය කියන අදහස අවසන් කරනවාද, එහෙම නැත්නම් සුළු ජාතිය කියලා හඳුන්වපු අය අවසන් කරනවාද කියන ප්‍රශ්නය අපට එදා නැඟුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් සිද්ධ වන දේවල් දිහා බැලුවාම, ඒ ජන කොටස් පීඩාවට පත් කරන, ඔවුන් ඉවත් කරන ක්‍රියාවලියක් තමයි මේ පාලකයෝ සිද්ධ කරන්නේ. ඒක නැවත පදිංචි කරවීම විතරක් නොවෙයි කියන එක, රාජ්‍ය අනුග්‍රහය ඇතිව, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව කරන දේවලින් ඉතාම පැහැදිලියි. ජනතාව අතර සංහිඳියාව, සහජීවනය හඳුන්වා දෙනවා වෙනුවට, ඒ සංහිඳියාව අවසන් කරන ක්‍රියා මාර්ග තමයි අද මේ පාලකයෝ ක්‍රියාත්මක කරන්නේ.

මේ රටේ ආරක්ෂක ඇමතිවරයා වන්නේ ජනාධිපතිවරයා. ඒ වාගේම ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වන්නේ එතුමාගේ සහෝදරයා. නමුත් ඉතාම පැහැදිලියි, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මැදිහත් වීමෙන්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ විශේෂ බලධාරින්ගේ කණ්ඩායම්වල මැදිහත් වීමෙන් උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ජනතාව පීඩාවට පත් කරන බව. ඒ වාගේම දකුණේදී පොලිසිවලටත් පහර දෙමින් ජාතිවාදය පතුරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාලකයෝ දැන් ආපහු කරන්න හදන්නේ මොකක්ද? අවුරුදු තිහක් තිස්සේ මේ රටේ පීඩිතව සිටි ජනතාවට නැවත වරක් අලුත් හතුරෙක් පෙන්වූවා; වෙනත් හතුරෙක් පෙන්නුවා. කොටි ත්‍රස්තවාදය, ප්‍රභාකරන්, දෙමළ ජනතාව හතුරන් කියලා පෙන්වපු පාලකයෝ, අද නැවත වරක් අලුතින් හතුරෙක් නිර්මාණය කරලා පෙන්වන්න හදනවා. ඒ අලුත් හතුරා මුසල්මානුවන්ය - මුස්ලිම් ජනතාවය- කියලා පෙන්වන්න උත්සාහ කරනවා. ඒකට පසු ගිය කාලයේ හැංගි හැංගි වෙස් බැඳලා දැන් එළියේ නටන්න අරගෙන තිබෙනවා. ඒ අලුත් හතුරා නිර්මාණය කරන එක රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා නැවත පදිංචි කරවීම විතරක් නොවෙයි, සහජීවනය හදන්න තිබෙන අවස්ථාවත් නැති කරමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා පසු ගිය 9 වැනිදා ගාල්ලේ, පිලානේ පැවැති වර්ගවාදය, ජාතිවාදය අවුස්සන සංවිධානයක උත්සවයක ප්‍රධාන ආරාධිත අමුත්තා වුණේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා බව. එහිදී ඔහු මෙහෙම කිව්වා.

"අපේ නායක හාමුදුරුවෝ කියනවා, හෙමින් කිව්වාම සමහරුන්ට තේරෙන්නේ නැහැ, ටිකක් හයියෙන් කියන්න ඕනෑ කියලා. මමත් ඒක අත්දැකීමෙන් දන්නවා."

මේ තමයි ආරක්ෂක ලේකම්වරයා ජාතිවාදී වර්ගවාදී කණ්ඩායම් කළ දේ අනුමත කරපු විධිය. ඒ හයියෙන් කියනවා කියන්නේ මොකක්ද? ඇහේ හයියෙන්ද, එහෙම නැත්නම් කටේ හයියෙන්ද? එහෙම නැත්නම්, මිලිටරි බලයෙන් තමන්ගේ රාජ්‍ය බලයෙන්, ආරක්ෂාවේ බලයෙන් පෙන්වන හයියද? මේ රටේ ආරක්ෂක ලේකම්වරයා ජාතිවාදය, වර්ගවාදය අවුස්සන්න කරපු ඒ ප්‍රකාශය ගැන ආරක්ෂක අමාත්‍යවරයා විධියට මේ රටේ ජනාධිපතිවරයාගේ අවධානය යොමු විය යුතුයි කියලා අපි හිතනවා.

දැන් මොකක්ද කරන්නේ? මේ පාලකයෝ තමන්ගේ බලය ගැන විතරක් හිතලා දෙමළ, මුස්ලිම් ජනතාව තවත් පීඩාවට පත් කරනවා. ඒ තිබෙන පීඩාවට අමතරවයි. දැන් නවනීදන් පිල්ලේට, ඉන්දියාවට, ජිනීවා සමුළුවට, එක්සත් ජාතීන්ගේ සංවිධානයට, ඇමෙරිකාවට, නිර්මාණය කර දී තිබෙන තත්ත්වය මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ඌරන් කැකුණ තලන කොට හබන් කුකුළන්ට මහුල්" කිව්වා ලු. මෙකත් ඒ වාගේ තමයි. වෙනත් බලවේගවලට, ජිනීවාවලට, UN එකට, එහෙම නැත්නම් ඉන්දියාවට, පිල්ලේලාට මේ රටේ පවතින තත්ත්වය වාසියක් වෙලා තිබෙනවා. ඒ වාසිය අරගෙන දුන්නේ කවුද? මේ රටේ ජනතාව වෙනුවෙන් ඒ සංවිධාන යෝජනා හදනවා. සමහර වෙලාවට ඒ යෝජනා කපනවා; සමහර වෙලාවට යෝජනා බුරුල් කරනවා; සමහර වෙලාවට යෝජනා කල් දමනවා; අතුරු වාර්තා හදනවා; ඒ වාර්තා කැඳවනවා. ඒ ගොල්ලන්ටත් තිබෙන ප්‍රශ්නය මොකක්ද? මේ රටේ සමහර බලවේගට වාගේම ඒ අයටත් අද මේ රටේ පීඩිත ජනතාවගේ ප්‍රශ්නය, දෙමළ ජනතාවගේ ප්‍රශ්නය, මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්නය "හිහන්නාගේ තුවාලය" වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ප්‍රශ්න දවසින් දවස ඉස්සරහට ගෙන යනවා. ඒ ගොල්ලන්ටත් මේ ප්‍රශ්නය විසඳන්න වුවමනාවක් නැහැ. ඒ නිසා අපි මේ අවස්ථාවේ සියලු පීඩිත දෙමළ, මුස්ලිම් ජනතාවට කියනවා, ඉන්දියාවට ලියුම් ලියලා, ජිනීවාවලට ගිහිල්ලා, පිල්ලේට ලියුම් ලියලා, ඒ ගොල්ලන්ට අපේ දුක් ගැනවිල්ල කියලා වැඩක් නැහැ කියලා. මේ රටේ පාලකයන්ගේ වාගේම ඒ අයගේත් වුවමනාව මොකක්ද? මේ රටේ මිනිස්සුන්ගේ ප්‍රශ්නය පාවිච්චි කරලා අපේ රටේ තව තවත් අවුල් හදන්නයි වුවමනාව. ඒක කරලා මේ පාලකයන්ගේ කොන්ද කඩන්නයි වුවමනාව. කොන්ද කඩලා ඔවුන්ගේ වුවමනාව ඉෂ්ට කර ගන්නයි හදන්නේ. ඒ නිසා ඉතා පැහැදිලියි, ඒ සඳහා අද ඒ බලවේග විසින් සිංහල, දෙමළ, මුස්ලිම් පීඩිතයාගේ ඇත්ත ප්‍රශ්නය පාවිච්චි කරන බව. මේ රටේ පාලකයෝ ඒ ප්‍රශ්නය පාවිච්චි කරන්න අවශ්‍ය ඉඩකඩ ඒ අයට හදලා දීලා තිබෙනවා. එහෙම පාවිච්චි කරන්න ඉඩකඩ හදන නිසා ඒ සංවිධාන ජිනීවාවලට යෝජනා ගෙනෙනවා. නමුත් ඒ යෝජනා බුරුල් කරන්නේ ඇයි? අපි ආණ්ඩුවට අභියෝග කරනවා, ජිනීවාවලට ඉදිරිපත් කරන ඒ යෝජනාව බුරුල් කරන්න ආපු එකඟතාව, ඒ deal එක මොකක්ද කියන්න කියලා. හැම දාම වුණේ මේකයි. හෙටත් වෙන්නේ මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ රටේ ජනතාව වෙනුවෙන් කියලා ජිනීවාවලට යෝජනා ගෙනෙනවා. ඉන්දියාව බලපෑම් කරනවා. පිල්ලේලා බලපෑම් කරනවා. එහෙම කරලා අන්තිමට කරන්නේ මොකක්ද? දෙමළ පීඩිතයාට, මුස්ලිම් පීඩිතයාට, සිංහල පීඩිතයාට, මේ රටේ අයිතිවාසිකම් අහිමි වන ජනතාවට යමක් කරන්නේ නැහැ. ඔවුන් ඔවුන්ගේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරනවා.

මේ නැවත පදිංචි කරවීමේ තත්ත්වය බැලුවත් ආණ්ඩුව මොකක්ද කරලා තිබෙන්නේ? ජනතාවට සහජීවනයක් උදා කර දීලා තිබෙනවාද? නැවත පදිංචි කරවීමට බලය තිබෙන ආයතනය මොකක්ද කියලා විශේෂයෙන්ම අපි රජයෙන් අහන්න කැමැතියි. බලය තිබෙන ඒ ආයතනය තමයි නැවත පදිංචි කරවීමේ අධිකාරිය. නමුත් අද ඒ කටයුත්ත කරන්නේ නැවත පදිංචි කරවීමේ අමාත්‍යාංශයද? නැත්නම් ඒ අධිකාරිය ද? නැහැ.

අද මේ කටයුතු කරන්නේ ජනාධිපති කාර්ය සාධක බල කායයි. ඔවුන් තමයි මේ කටයුතු ක්‍රියාත්මක කරන්නේ. ඒ කරන්නේ මිලිටරිමය ක්‍රියාත්මක වීමක්. මිලිටරි බලය පාවිච්චි කරලා තමයි අද උතුරේ, නැඟෙනහිර ජනතාව පදිංචි කරවන්නේ. ඔවුන්ගේ කොන්ද කඩලා දමලා, ඔවුන් තවත් පීඩාවට පත් කරලා තමයි ඒ පදිංචි කිරීම කරන්නේ. ඒ නිසා මේ සංඛ්‍යා ලේඛන ගැන කථා කරලා වැඩක් නැහැ. බලය තිබෙන ආයතනය නොවෙයි ඊට මැදිහත් වන්නේ, බලය නැති ආයතනයක්.

ගරු ඇමතිතුමනි, මම මේ කාරණයත් අහන්න කැමැතියි. මේ නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනතේ තිබෙන එක කාරණයක් තමයි නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියක් හැදීම. නමුත් එහෙම එකක් හදලා නැහැ. එහෙම ප්‍රතිපත්තියක් හදලා නැති නිසා ඕනෑ ඕනෑ විධියට ඉබාගාතේ යන්න පුළුවන්. අපේ ගරු අමාත්‍යතුමා කිව්වා, නැවත පදිංචි කිරීමට 2013 දී රුපියල් මිලියන 300ක් වෙන් කළාය කියලා. නමුත් අප මතක් කරන්න කැමැතියි, දැයට කිරුළ වැඩසටහනට අවුරුදු දෙකට රුපියල් බිලියන 60ක් වෙන් කළ බව. නමුත් නැවත පදිංචි කිරීමට ඒ අමාත්‍යාංශයෙන් වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 300යි. නැවත පදිංචි කිරීම කියලා කියන්නේ මොකක්ද? මම මීට කලිනුත් කිව්වා නැවත

[ගරු අජිත් කුමාර මහතා]

පදිංචි කිරීම කියලා කියන්නේ මිනිසුන් ආපසු ගෙනියලා ඔවුන් නැවත අවතැන් කිරීම නොවෙයි කියලා. ඒ අයට සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපන පහසුකම් සලසන්න ඕනෑ. ඒ අයගේ ජන ජීවිතය ගොඩ නහා ගන්න, ඒ අයගේ සංස්කෘතිය රැකගෙන අලුතින් රැකියාවක් කරලා හොඳ ජීවිතයක් ගත කරන්න, නැඳෑ හිතමිතුරන් ආශ්‍රය කරන්න ඉඩකඩ තියෙන්න ඕනෑ. අද මේ නැවත පදිංචි කිරීම කියලා කරන්නේ මොකක්ද? බලහත්කාරී ක්‍රියාවලියක්. ඒ අයට ඕනෑ නැති තැන්වල, අනවශ්‍ය විධියට ඔවුන් පීඩාවලට පත් කරලා, මිලිටරි මැදිහත්වීම කරලා, ඔවුන්ගේ ජීවිතයේ මූලික අවශ්‍යතා ඉටු කර ගන්න බැරි විධියට, සරණාගතයින් විධියට, අසරණයන් විධියට තමයි ගාල් කර තිබෙන්නේ.

කලින් කථා කළ ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මන්ත්‍රීතුමා කිව්වා, බිත්තියක් තිබුණොත් තමයි චිත්‍රයක් අඳින්න ලැබෙන්නේ කියලා. අද මේ දෙමළ ජනතාවට චිත්‍රය අඳින්න වෙලා තිබෙන්නේ අහසේයි. ඔවුන්ට මනඃකල්පිත චිත්‍රයක් තමයි අඳින්න වෙලා තිබෙන්නේ. මේ රටේ පීඩිත සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගෙන් -විශේෂයෙන්ම දෙමළ, මුස්ලිම් ජනතාවගෙන්- අප මෙන්න මේ ඉල්ලීම කරනවා. තමන්ව පීඩාවට පත් කරලා, තවත් පීඩාවට පත් කරලා, ඒවායින් ගැලවෙන්න කියලා, මේ ලෝකයෙන් එහා තිබෙන අදෘශ්‍යමාන බලවේග -නොපෙනෙන බලවේග- කෙරෙහි වෙන කවුරුවත් කෙරෙහි අප බලාපොරොත්තු තියලා වැඩක් නැහැ. ඒක කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ අයගේ යෝජනාවල කොන්දේසි මේ පාලකයෝ බාල කර ගන්නවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

එක එක කොන්දේසිවලට යටත් වෙලා, ජිනීවා යෝජනාවල සැර බාල කරගෙන ඉස්සරහට මේ රටේ සමස්ත ජනතාවගේම අයිතිවාසිකම් මේ පාලකයෝ පාවා දෙනවාය කියන එක හරි පැහැදිලියි. මේ දෙපාර්ශ්වයම කරන්නේ මේ පීඩිත ජනතාව රවටටන එකයි. ඒ නිසා ජිනීවාවලට, එක්සත් ජාතීන්ට, ඉන්දියාවට තමන්ගේ බල ව්‍යාපෘති ක්‍රියාත්මක කර ගන්න, ඒ වාගේම මේ රටේ පාලකයන්ට තමන්ගේ බල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න ඉඩ දීලා පාඩුවේ ඉන්න එපා. මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් පීඩිතයන්ට එකතු වෙන්න කියලා අප ඉල්ලීමක් කරනවා. අදෘශ්‍යමාන බලවේග, වෙනස් බලවේග පසු පස හඹා ගොසින් නොවෙයි, තමන්ගේ අරගළය, තමන්ගේ ජයග්‍රහණය, තමන්ගේ අයිතිවාසිකම් දිනා ගන්න පුළුවන් වන්නේ. ඒවා දිනා ගැනීමට පුළුවන් වන්නේ සියලු දෙනාම එකතු වීමෙන්. දෙමළ පීඩිතයන් සිංහල, මුස්ලිම් පීඩිතයන්ට විරුද්ධව, සිංහල පීඩිතයා දෙමළ, මුස්ලිම් පීඩිතයන්ට විරුද්ධව, සිංහල, දෙමළ, මුස්ලිම් පීඩිතයන් එකිනෙකාට විරුද්ධව අරගළ කරලා නොවෙයි තමන්ගේ ජයග්‍රහණ ලබා ගන්න පුළුවන් වන්නේ. සිංහල, දෙමළ, මුස්ලිම් සියලු පීඩිතයන් ඒකාබද්ධ වෙලා පාලකයන් කරන මේ නරුම වැඩේට, තමන්ගේ බල ව්‍යාපෘති ක්‍රියාත්මක කර ගන්න විවිධ බලවේග කරන ඒ බල ව්‍යාපෘතිවල අරමුණුවලට යට නොවී තමන්ගේ අයිතිවාසිකම් දිනා ගන්න මැදිහත් වෙන්න කියලා අප මේ රටේ සියලුම සිංහල, දෙමළ, මුස්ලිම් පීඩිතයන්ට ආරාධනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 6.14]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් කථා කරන මේ මොහොතේ මටත් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනතට තමයි අද අප මේ සංශෝධනය ගෙන එන්නේ. 2007 මාර්තු මාසයේ 23වැනි දා පාර්ලිමේන්තු පනතක් මඟින් මේ නැවත පදිංචි කරවීමේ අධිකාරිය ස්ථාපිත කළා. ඒ අනුව මෙම අධිකාරියෙන් විශේෂයෙන්ම අභ්‍යන්තර අවතැන් වූ සහ සරණාගතයන් නැවත පදිංචි කිරීම පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සහ සැලසුමක් ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම එකී තැනැත්තන් නැවත පදිංචි කිරීම, ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම, නියාමනය කිරීම යන කාරණාත් මෙම ආයතනය භරහා සිදු කෙරෙනවා. විශේෂයෙන්ම මෙම අධිකාරියේ කාලය තව වසර තුනකින් දීර්ඝ කිරීම ගැන අප ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද 2013 අප්‍රේල් 10වැනි දා වන විට මෙම අධිකාරියේ කාලය අවසන් වෙනවා. නමුත් මේ නැවත පදිංචි කිරීමට අදාළව අවසන් නොවූ කටයුතු තව විශාල වශයෙන් කරන්න තිබෙන නිසා මේ අධිකාරියේ කාලය තව අවුරුදු තුනකින් දීර්ඝ කිරීම අප ඉතාම අගය කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මනුස්සයෙක් නැවත පදිංචි කරනවා කියලා කියන්නේ ඉඩමක ගෙයක් හදා දීලා ඔහු එහි පදිංචි කරවීම විතරක් නොවෙයි. ඔහුගේ ආර්ථිකය, ඔහුගේ පවුලේ ආර්ථිකය, වටපිටාවේ තිබෙන සම්බන්ධකම් ආදී සියල්ල එක්ක ඔවුන් සම්බන්ධ කිරීම තමයි කළ යුත්තේ. මේ අධිකාරිය භරහා ඒ සියල්ල සිදු කරනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, සමාජ සේවා අමාත්‍යාංශය, සංස්කෘතික අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශත් මේ කටයුත්තට සම්බන්ධ කරගෙන ඒ පුද්ගලයා, ඒ පවුල නැවත වතාවක් මේ ආර්ථිකයට, මේ රටට හිතකර පවුලක් බවට පත් කිරීම තමයි මේ තුළින් සිද්ධ වන්නේ. ඒ නිසා මෙම අධිකාරියේ කාලය දීර්ඝ කිරීම ඉතාම කාලෝචිත දෙයක් ලෙස මා දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ටීඑන්ඒ නැත්නම් ද්‍රවිඩ පක්ෂ නියෝජනය කරන හුහක් මන්ත්‍රීවරු උතුර ගැන කථා කළා. ඇත්තෙන්ම කියනවා නම් මේ රජය උතුරේ සංවර්ධනය වෙනුවෙන් ඇමෙරිකන් ඩොලර් බිලියන දෙකහමාරක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ දකුණට වෙන් කළ මුදලට වැඩිය විශාල මුදල් ප්‍රමාණයක්. මෙහෙම ඇමෙරිකන් ඩොලර් බිලියන දෙකහමාරක් වෙන් කර තිබෙන්නේ, එදා සයනයිඩ් කරල කටේ ගහලා බලහත්කාරයෙන් යුද්ධයට බඳවාගෙන සිටි, ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදයෙන් බැට කෑ අවුරුදු දහයක්වත් නැති දරුවෝ වෙනුවෙනුයි. ඒ වාගේම යාපනයේ ජනතාවට එකට බත් වේලක් කන්න පවුලේ කෙනෙක් නැති තත්ත්වයක් තිබුණේ. ඒ වාගේ තත්ත්වයක් තිබුණ සමාජය වෙනස් කරලා අද යථා තත්ත්වයට පත් කර තිබෙන්නේ අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවයි; එතුමාගේ නායකත්වය තුළිනුයි.

අපේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඉතිහාසය බාගෙට කිව්වා. විජයබා රජ්ජුරුවෝ ගැන, ගජබා රජ්ජුරුවෝ ගැන, පණ්ඩුකාභය කුමාරයා ගැන කථා කළා. අවසානයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ ත්‍රස්තවාදය අවසන් කළාය කියන්න; අවුරුදු

30ක් තිබුණු මේ ත්‍රස්තවාදය මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ නැති කළාය කියන්න එතුමාගේ දිව නැමුණේ නැද්ද කියන්න මම දන්නේ නැහැ. එතුමා ඒක කිව්වේ නැහැ. හුහක් අය ඒක අමතක කරනවා. අපි ඒක පුන පුනා කියනවා. මොකද, ඒක අපිට ආඩම්බරයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ මිනිසුන් නිදහසේ හුස්ම හෙළන්නේ ප්‍රභාකරන්නේ ත්‍රස්තවාදය නිම කළ නිසාය කියා අපි කියන්න ඕනෑ. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට ඒක අමතක වුණා. එතුමාගේ පියාගේ රජය කාලයේ ක්‍රියාත්මක වුණ තරුණ අසහන කොමිසම ගැන කිව්වා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ තමයි හැට දහසක් තරුණයෝ මළ ගෙදරට යැව්වේ. ඒ වාගේම එතුමාට අමතක වුණා, එල්ටීටීඊ එකට ආයුධ දුන්නේ, මුදල් දුන්නේ රණසිංහ ප්‍රේමදාස මහත්මයාගේ ආණ්ඩුව කාලයේ බව. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ඉන්දියන් හමුදාව ගෙන් වූ විට ප්‍රේමදාස මහත්මයා ඒ හමුදාව පිටත් කර යැව්වා. අද ඒ අය මේ රජයේ ප්‍රතිපත්ති ගැන කථා කරන්නට එනවා. එදා එහෙමයි කටයුතු සිද්ධ වුණේ. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා තමන්ගේ පියාගේ කාලයේ කළ දේවල් ටික කිව්වේ නැහැ. එතුමා බාගෙට තමයි කථා කළේ. ඒ නිසා අපි මේ රටේ ජනතාවට මතක් කර දෙනවා, එදා එවැනි යුගයක් තිබුණ බව. අපේ අහිංසක දෙමව්පියන්ගේ දරුවෝ යුද්ධ කරන විට ඒ දරුවන්ට විරුද්ධව ත්‍රස්තවාදයට මුදල් දුන්න, වෙක්පත් ඉල්ලා දුන්න යුගයක් තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ යුගය අවසන් කර අද මේ රටට නිදහසක් ලබා දී තිබෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවයි කියලා කියන්න ඕනෑ.

ශ්‍රී රංගා මන්ත්‍රීතුමා අසත්‍යයක් කිව්වා. එතුමා කිව්වා, ඉන්දියන් රජය අද නිවාස 45,000ක් හදන්න අපට උදව් කර තිබෙනවාය කියා. අපි ඒක අගය කරනවා. කිසිම පුරවැසියෙකුට සරණාගතයෙකුට බැංකුවකට ණය වෙන්න ඕනෑ නැහැ. සතයක්වත් බැංකුවලට ණය ගෙවන්න ඕනෑ නැහැ. නමුත් මේක ඉන්දියන් රජය ලබා දී තිබෙන්නේ ඒ පවුලේ සාමාජිකයන්ට. අදාළ පුද්ගලයා ගේ හදන්න ඕනෑ. එතකොට අවස්ථා හතරකදී මුදල් දෙනවා. බැංකුවේ ගිණුම විවෘත කළාම ඒ අවස්ථා හතරේදී ඔහු නිවස හදාගෙන යනවා. දැනට නිවාස 15,000ක් හදන්න කටයුතු කර තිබෙනවා. නිවාස 1,000ක වැඩ අවසන් කර තිබෙනවා. මේවා ගැන වැරැදි ආකල්ප දෙන්න එපා.

ගරු ජේ. ශ්‍රී රංගා මන්ත්‍රීතුමා යාපනයට ගිහිනුත් නැහැ. එතුමා මේ යෝජනා ක්‍රමය ගැන දන්නෙත් නැහැ. ටයි කෝට් දමා ගෙන මෙතැනට ඇවිත් ද්‍රවිඩ ජනතාව ගැන කථා කරන මිනිස්සු තමයි ඉන්නේ. එදා ප්‍රභාකරන්ගේ යුද්ධය තිබුණු කාලයේ යාපනයට ගිහින්වත් නැහැ. එහෙම තත්ත්වයක් තමයි තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය අඩු ගණනේ වැස්සකටවත් ඉස්පිරිතාලයකට ගිහින් නැහැ. නමුත් දකුණේ ඉස්පිරිතාල ගැන කථා කරනවා. මේ ගොල්ලෝ ප්‍රායෝගිකව මිනිසුන් ළඟට ගිහින් නැහැ. අපි එහෙම නොවෙයි. අපේ ජනාධිපතිතුමාගේ මේ ආණ්ඩුව යටතේ ග්‍රාම නිලධාරි වසම් 14,000ක් තිබෙනවා. ඒ 14,000ටම කුමන හෝ සංවර්ධන වැඩ කටයුත්තක් කරලා තමයි අපි එතැනට යන්නේ. දැන් පැයකට කලින් මම අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩසටහනකට සම්බන්ධ වුණා. ඒ කියන්නේ පාසල් දහසක සංවර්ධන ව්‍යාපෘතියකට. මගේ ආසනයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පාසල් පහක් සංවර්ධනය වෙනවා. එහෙම සංවර්ධනය කර දෙන්නේ ඉතාම අහිංසක මිනිසුන්ට; මේ රටේ සාමාන්‍ය ජනතාවට. මේ රජය සාමාන්‍ය ජනතාවගේ හද ගැස්ම දන්නා රජයක්. ඒ නිසා ජනතාවත් එක්ක තමයි අපි ඉන්නේ. ද්‍රවිඩ ජනතාවට අපි වැරැදි විධියට සලකන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තරම් මේ රටේ ද්‍රවිඩ ජනතාවට, මුස්ලිම් ජනතාවට සේවය කළ කෙනෙක් නැහැ.

මේ 2013 වර්ෂය තුළ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මහින් රුපියල් මිලියන 283.50ක් වැය කරන්න අපි සැලසුම් කර තිබෙනවා. යාපන දිස්ත්‍රික්කයේ සුබසාධන මධ්‍යස්ථාන 44ක ඉන්න පවුල් 1,336ක් ඇතුළුව ඥාතීන් සහ හිතමිතුරන් සමඟ ඉන්න පවුල් 6,959ක් නැවත පදිංචි කරන්න අපි රුපියල් මිලියන 28.50ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම වැලිඔය නැවත පදිංචි කිරීමේ දෙවන පියවර යටතේ පවුල් 357ක් සඳහා නිවාස ලබා දීමට රුපියල් මිලියන 107ක් වෙන් කර තිබෙනවා. මුලතිව් ප්‍රදේශයේ පවුල් 109ක් යළි පදිංචි කරන්න රුපියල් මිලියන 32ක් වෙන් කර තිබෙනවා. වවුනියා, මුලතිව්, කිළිනොච්චිය, මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව යන දිස්ත්‍රික්කවල නැවත පදිංචි කරන්න රුපියල් මිලියන 116ක් වෙන් කර තිබෙනවා. මේ මුදල් වෙන් කර තිබෙන්නේ, මේ රටේ අහිංසක ජනතාව වෙනුවෙන්. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
When I was not in the seat, my name was mentioned twice or thrice by the Hon. Deputy Minister. I want to clarify that. I do not know whether he listened to the intepretation properly. I was talking in Tamil. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, දැන් මෙතැනදී ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා, "ඉන්දියන් රජය ගෙවල් හැදුවා කියා රංගා මන්ත්‍රීතුමා කිව්වා" කියලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඉන්දියන් රජය බැංකු හරහායි සල්ලි දෙන්නේ. Bank account එකක් පටන් ගත්තාම- ඉන්දියන් රජය ගෙවල් 45,000ක් හදන්න අපට උදව් කරනවා. අදියර හතරක් යටතේයි මුදල් ගෙවන්නේ. දැනට ගෙවල් 15,000ක් හදන්න කටයුතු කර තිබෙනවා. ගෙවල් 1,000ක් හදලා ඉවරයි. අදාළ පුද්ගලයා ණයක් හැටියට කිසිම මුදලක් -ශතයක් වත්- ගෙවන්න ඕනෑ නැහැ. අන්න ඒ ටික තමයි මා කිව්වේ.

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
ඒ විතරක් නොවෙයි. මගේ නම සඳහන් කරලා-

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔව්, මා තමුන්නාන්සේ කියපු දේයි සඳහන් කළේ.

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
මගේ නම සඳහන් කරලා කියපු දේ සම්පූර්ණ වැරැදියි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා කියපු එකයි මා කිව්වේ.

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
මම 45,000 ගණනක් ගැන කිව්වේ නැහැ. තවත් එකක් කියන්න ඕනෑ. ඔබතුමා Deputy Minister විධියට ඉන්නවා. අද මේ සභාවේ සිටින, ඔබතුමාගේ රජයේ සිටින ඩග්ලස් දේවානන්දගේ පක්ෂයේ ඉන්න චන්ද්‍රකුමාර්- [බාධා කිරීමක්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔව්, ඩග්ලස් දේවානන්ද මහත්මයා හොඳයි. ප්‍රභාකරන් ඩග්ලස් දේවානන්ද මහත්මයා මරන්න යන කොටත් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කථා කරපු මනුස්සයෙක් තමයි ඩග්ලස් දේවානන්ද කියන්නේ. ඔබතුමා ඒ ගැන ඊට වඩා කථා කරන්න එපා. [බාධා කිරීමක්] ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කථා කරපු එකම ද්‍රවිඩ නායකයා විධියට මා දකින්නේ ඩග්ලස් දේවානන්ද මහතායි. තමුන්නාන්සේ නිකම් කථා කරන්න එපා. අපි කාරණා දන්නවා. බොරුවට කහිනවා දැන්. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය 2013 ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන වැඩ සටහන් අපි ඉතාම අගය කරනවා. ශ්‍රී ලාංකික සම්භවයක් සහිත සරණාගතයන් ලක්ෂයක් දැනට දකුණු ඉන්දියාවේ රැඳී ඉන්නවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අතරින් කඳවුරුවල ඉන්නවා 68,058දෙනෙක්. ඒ වාගේම, ඥාති මිත්‍රාදීන් එක්ක ඉන්නවා 34,471දෙනෙක්. [බාධා කිරීමක්] අපි බොහොම සතුටු වෙනවා, ඉන්දියාවේ ඉන්න ඒ සරණාගතයන් මේ රටට ගෙන්වාගන්න කටයුතු කරන එක ගැන. මොකද, මේ රටේ අද යුද්ධය නැහැ, සාමයයි තිබෙන්නේ. අද මේ රටේ සාමය ඇති වී තිබෙනවා. ලක්ෂයක් වූ ඒ ජනතාව මේ රටට එන්න අද කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. ඇයි ඒ? යුද්ධය නැති වූ නිසයි, අපේ ගරු විනයාගම්පූර්ති මහතා ඇතුළු අය එදා ආයුධ අත් හැරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට එකතු වෙලා අද රජයේ මැති ඇමතිවරුන් විධියට සිටින නිසායි. ඒ නිසා තමයි අද ඒ ද්‍රවිඩ ජනතාවට එන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ. අන්න ඒ නිසා අපි විශේෂයෙන් අගය කරනවා රජයේ ඒ ක්‍රියා මාර්ගය.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, දැන් ඔබතුමාට නියමිත කාලය අවසන් වෙමින් යනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිංහල පවුල් 133ක් සිටියා. ඒ අය නැවත පදිංචි කරවලා තිබෙනවා. ඒ ගැන අපි ඉතාම සතුටු වෙනවා. මොකද, ඒ ජනතාව එදා යාපනය ප්‍රදේශයේ හිටපු අයයි. ඒ අය අද නිවාස සංවර්ධන අධිකාරියේ ඉඩම්වලයි පදිංචි කරවලා තිබෙන්නේ. ඒ අය පදිංචි කරවීම ගැනත් අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, එල්ටීටීඊය විසින් පලවා හරින ලද මුස්ලිම් පවුල් 2,800න් 1,800ක් අද නැවත පදිංචි කරවලා තිබෙනවා. එල්ටීටීඊය එදා කාන්තන්කුඩි පල්ලියේදී ආගම කියමින් හිටපු මුස්ලිම් ජනතාව මරලා දැම්මා. ඒ විධියට සලකපු ප්‍රභාකරන්ගේ මිනී මරු සමයක් තමයි එදා තිබුණේ. නමුත් අද මුස්ලිම් ජනතාව අපත් එක්ක හොඳින් ඉන්නවා. මුස්ලිම් ජනතාව වෙනත් වෙනත් විධියට භේද කරවන්න උත්සාහ කරනවා මේ රටේ සමහර ජාතිවාදීන්. නමුත් ඒක සිදු වන්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, සන්ධාන රජය සහ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක තමයි අද මුස්ලිම් ජනතාව ඉන්නේ. ඒ සමඟිය භේද භින්න කර දමන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2012 දෙසැම්බර් 31 වන විට නැවත පදිංචි කරවලා තිබෙන සංඛ්‍යාව ගෙන බලමු. උතුර පළාත ගත්තොත් 153,012ක් වූ පවුල් සංඛ්‍යාවක්; පුද්ගලයන් වශයෙන් ගත්තොත් 506,238දෙනකු නැවත පදිංචි කරවලා තිබෙනවා. ඒ වාගේම, නැඟෙනහිර පළාත ගත්තොත්, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය කියන දිස්ත්‍රික්කවල පවුල් 225,476ක් පදිංචි කරවලා තිබෙනවා. පුද්ගලයන් වශයෙන් ගත්තොත් 762,038දෙනකු පදිංචි කරවලා තිබෙනවා. මෙය ඉතාම වැදගත් කාර්යයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවදුරටත් නැවත පදිංචි කිරීමට තිබෙන පවුල් සංඛ්‍යාවේ මුළු එකතුව 7,907යි. පුද්ගලයන් සංඛ්‍යාව ගත්තොත් 26,721දෙනකුයි. කිලිනොච්චිය ප්‍රදේශයේ බිම් බෝම්බ ඉවත් කරලා නැති නිසා ඔවුන් නැවත පදිංචි කරවන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම, ත්‍රිකුණාමලය ගත්තොත්, සාම්පූර්වල තිබෙන ප්‍රශ්නය නිසා පදිංචි කරවන්න බැරි වූ අයයි ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ අය නිතර කියන කථාවක් තමයි අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරවූයේ නැහැ කියන එක. නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය යටතේ අද ඒ ජනතාව නැවත පදිංචි කරවන්න කටයුතු කරලා ඔවුන් සමාජගත කරවීම ගැන අපි ගරු ඇමතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු ඉණරත්න වීරකෝන් මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு குணரத்ன வீரகோன்]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Gunaratne Weerakoon.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. DEPUTY SPEAKER in the Chair.]

1 සිට 3 තෙක් වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ආම් වාසකත්තිලිරුන්තු 3ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 1 to 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

සට්ටමාකු වාසකමුම් තලෛප්පුම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

සට්ටමූලම් තිරුත්තමින්රි අරික්කෛ සෙය්යප්පට්ටතු.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

විනා විඩුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

අතන්පඩි, සට්ටමූලම් මූන්‍රාම්මුරෙ මතිප්පිටප්පට්ටු නිරෙ වේට්‍රප්පට්ටතු.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

විනා එටුත්තියම්පප්පෙට්‍රතු.

Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

කල් තැබීමේ යෝජනාව ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

දකුණු ඉන්දියාව සමඟ රාජතාන්ත්‍රික සබඳතා තහවුරු කිරීම
தென்னிந்தியாவுடனான இராஜதந்திர உறவுகளை வலுப்படுத்தல்
STRENGTHENING DIPLOMATIC TIES WITH SOUTH INDIA

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාව විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී වැදගත්ම සාධකය වන්නේ ඉන්දියාවයි. නමුත් පසු ගිය කාලය තුළ විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී නවදිල්ලියට විශාල බලපෑමක් කළ හැකි තම්ල්නාඩුව සමඟ රාජතාන්ත්‍රික මට්ටමෙන් කටයුතු නොකළ නිසා අද ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මට්ටමේ විශාල පසුබෑමකට ලක් වීමට සිදුව ඇත. එහෙයින් රජය දකුණු ඉන්දියාව සමඟ රාජතාන්ත්‍රික සබඳතා තහවුරු කළ යුතු බව මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා යුද්ධය පටන් ගත් දවසේ සිට අපේ හමුදා ඉදිරියට යන කොට අපට හැමදාම ඉන්දියාවෙන් බලපෑම් ආව බව. වඩමාරච්චි සටන ක්‍රියාත්මක වෙන කොට තව පැය 24ක් යුද්ධ කළා නම් එදා ප්‍රභාකරන් අත් අඩංගුවට පත් වෙනවා. නමුත් එදා ඉන්දියාව බලපෑම් කළා විශේෂයෙන්ම දකුණු ඉන්දියාවේ ඉල්ලීම මත. අපට යුද්ධය නවත්වන්න සිද්ධ වුණා. නමුත් 2009 දී අපේ හමුදා ඉදිරියට යන කොට ඉන්දියාවෙන් කිසිම බලපෑමක් ආවේ නැහැ. ඔබතුමා ඒක දන්නවා. එහෙම බලපෑමක් ආවේ නැත්තේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව යුද්ධය අවසන් කළාට පස්සේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පදනම් කර ගෙන දේශපාලන විසඳුමක් ලබා දෙනවා කියලා පොරොන්දු වූ බව නවදිල්ලිය තම්ල්නාඩු ප්‍රාන්තයට කිව්ව නිසයි. ඒ ප්‍රකාශය කළ බව අපි කවුරුත් දන්නවා - Resolution based on the Thirteenth Amendment. නමුත් යුද්ධය අවසන් වෙලා දැනට අවුරුදු 4ක් වෙනවා. එය සිද්ධ වෙලා නැහැ. මේක තමයි ප්‍රශ්නය. මේ ප්‍රශ්නය ඇති වුණේ දකුණු ඉන්දියාවෙන්. විදේශ කටයුතු ඇමතිවරයා හැටියට ඔබතුමා යුරෝපයට යනවා, අප්‍රිකාවට යනවා, වෙනත් රටවලට යනවා. ඒ රටවලට වඩා වැදගත් වෙන්නේ දකුණු ඉන්දියාවයි - South India. මට අද වාගේ මතකයි 2001-2004 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා අපට කිව්වා, නවදිල්ලියට වඩා ලංකාවට වැදගත් වෙන්නේ තම්ල්නාඩුව කියලා. For us, Tamil Nadu is more important than Delhi. මොකද, නවදිල්ලියට බලපෑම් කරන්නේ දකුණු ඉන්දියාව.

මට මතකයි ඒ වකවානුව තුළ, ඒ කියන්නේ 2001-2004 කාලයේ ජයලලිතා තමයි මහ ඇමති වෙලා හිටියේ. ඇත්ත වශයෙන්ම ජයලලිතා එල්ටීටීඊ සංවිධානයට විරුද්ධවයි කටයුතු කළේ. එල්ටීටීඊ එකේ අය අත් අඩංගුවට ගත්තා. එතුමිය එක්තරා මැතිවරණයකට ගිහිල්ලා එන කොට එතුමියට බිම් බෝම්බයක් ඇටෙව්වා. කරුණානිධි එල්ටීටීඊ සංවිධානයට පක්ෂවයි හිටියේ. නමුත් ජයලලිතා හැමදාම එල්ටීටීඊ එකට විරුද්ධවයි හිටියේ. අපි මොනවාද කළේ? එල්ටීටීඊ එකට විරුද්ධව හිටපු ජයලලිතා එක්කත් අපි අද තරහා වෙලා. එල්ටීටීඊ එකට පක්ෂව හිටපු කරුණානිධි එක්කත් අද අපි තරහා වෙලා. මුළු දකුණු ඉන්දියාවම අද අපත් එක්ක අමනාප වෙලා.

2009 දී ඉන්දියාව යුද්ධයට මැදිහත් වුණේ නැහැ. ඒක ඔබතුමා හොඳින්ම දන්නවා. ඉන්දියාව මැදිහත් වුණා නම් යුද්ධය නවත්වන්න සිද්ධ වෙනවා. නමුත් ඉන්දියාව කිව්වා, "යුද්ධය අවසන් කරන්න, යුද්ධය අවසන් කළාට පස්සේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පදනම් කර ගෙන විසඳුමක් දෙන්න" කියලා. ජනාධිපතිතුමා එහෙම පොරොන්දුවක් දීලා තිබෙනවා. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. මේ ප්‍රශ්නයට මුල අන්න ඒකයි ඇමතිතුමා.

යුරෝපයට යන්නට ඕනෑ නැහැ. අප්‍රිකාවට යන්නට ඕනෑ නැහැ.තමුන්නාන්සේලා පසු ගිය අවුරුදු ගණනාව තුළ සම්පූර්ණයෙන්ම දකුණු ඉන්දියාව අමතක කරලායි කටයුතු කළේ. අද මේ සම්මත වුණු යෝජනාවේ මොනවාද තිබෙන්නේ ගරු ඇමතිතුමා? මේ යෝජනාවේ තිබෙන්නේ අපේ ආණ්ඩුව 2009න් පස්සේ පොරොන්දු වුණු දේවල් නේ. ඔබතුමාට "නැහැ" කියන්න පුළුවන් ද? The Resolution contains what we have promised.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

යුද්ධයෙන් පස්සේ 2009 දී අපට විරුද්ධව යෝජනාවක් ගේන්න හැදුවා. ඔබතුමා දන්නවා ඇති. අප කිව්වා, අපි යෝජනාවක් ගේන්නම් කියා. ඒ යෝජනාවේ අප පොරොන්දු දුන්නා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පදනම් කර ගෙන විසඳුමක් දෙන්නත්, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වෙලා තිබෙනවා නම් ඒවාට පරීක්ෂණ කරන්නටත්. මොකක්ද ඒ යෝජනාවලට වුණේ? අප ජන්ද 19කින් එදා දිනුවා. 2009 දී ශ්‍රී ලංකාව වෙනුවෙන් ගෙනා යෝජනාව ජන්ද 19කින් දිනුවා. අද මොකක් ද වෙලා තිබෙන්නේ? අද ජන්ද 25කින් පරාදයි. මේ අවුරුදු හතර තුළ රටවල් 44ක් අපට විරුද්ධව හැරිලා තිබෙනවා.

මොනවාද තමුන්නාන්සේලා දුන්නු පොරොන්දු? මම කෙටියෙන් කියන්නම්. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන මා කලින් කිව්වා. අතුරුදහන් වීම් ගැන සොයා බලනවාය කියා තමුන්නාන්සේලා පොරොන්දු දීලා තිබෙනවා. ඒක තමුන්නාන්සේලා කරලා නැහැ. මාධ්‍ය නිදහස තහවුරු කරනවාය කියා පොරොන්දු වෙලා තිබෙනවා. ඒක ඉෂ්ට කරලා නැහැ. මාධ්‍යවේදීන් ඝාතනය කිරීම් නවත්වනවාය කියා පොරොන්දු වෙලා තිබෙනවා. ඒක සිද්ධ වෙලා නැහැ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරනවාය කියා 2006 වර්ෂයේදී ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා පොරොන්දුවක් දුන්නා. දැන් අවුරුදු කීයක්ද? දැන් අවුරුදු 8ක් වෙනවා. ඒ වාගේම මේ රටේ අවනීතිය නැති කරනවාය කිව්වා. අවි ගත් කණ්ඩායම් ඉවත් කරනවාය කිව්වා. රඳවා සිටින අයගේ ලැයිස්තු දෙනවාය කිව්වා. භාර වෙච්ච අය මැරුවා නම් ඒ ගැන පරීක්ෂණ කරනවාය කිව්වා. මේවා ඔක්කොම උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ තිබෙනවා. ඔබතුමන්ලාගේ පොරොන්දුවලට අමතරව - apart from what you have promised - මේ සියල්ලම LLRC වාර්තාවේ තිබෙනවා.

අවුරුදු හතරක් තිස්සේ ලිඛිතව හා වාචිකව අප එක්සත් ජාතීන්ගේ සංවිධානයට පොරොන්දු දුන්නා. ජනාධිපතිතුමායි, එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයායි අත්සන් කළ ඒකාබද්ධ නිවේදනය තුළින්, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභාවෙන් අප දුන් පොරොන්දු නේ ගරු ඇමතිතුමා ඉෂ්ට කර නැත්තේ. අප කොහොමද කියන්නේ අප හරිය, ඒ අය වැරදිය කියා. අප ස්වෛරී රටක් හැටියට පොරොන්දුවක් දෙනවා නම් අප එය ඉෂ්ට කරන්නට ඕනෑ.

මට පෙනෙන විධියට නම් මේ දකුණු ඉන්දියාවේ ඇති වී තිබෙන තත්ත්වය යුරෝපයේ ඇති වී තිබෙන තත්ත්වයට වඩා භයානකයි. මොකද, අද ඉන්දියාවේ ආණ්ඩු පිහිටුවන්නේ තනි පක්ෂයක් නොවෙයි. It is a coalition. එම නිසා ඒ ප්‍රාන්තවලට මධ්‍යම ආණ්ඩුවට බලපෑම් කරන්නට පුළුවන්. මේ තත්ත්වය ඉස්සර තිබුණේ නැහැ. ඉන්දියාවේ දේශපාලන සංයුතිය නිසා අද ඒක වෙනස් වෙලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාට කියන්නේ මෙකයි. අපත් අපේ රටට ආදරෙයි. අපේ රට ජාත්‍යන්තර රැස්වීම්වල සමච්චලයට ලක් වෙනවාට අප කැමැති නැහැ; අපහාසයට ලක් වෙනවාට අප කැමැති නැහැ. මට පෙනෙන විධියට ඔබතුමාට දැන් තිබෙන්නේ දේශපාලන විසඳුමකට යන්නයි. මේක උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ තිබෙනවා political solution කියන එක.

LLRC එකේ හොඳ යෝජනාවක් තිබුණා. ඔබතුමන්ලා ඒ දිහා බැලුවේවත් නැහැ. තමුන්නාන්සේලාට කිව්වා, ද්‍රවිඩ diaspora එකත් එක්ක සංවාදයක් පටන් ගන්න කියා. පටන් ගත්තා ද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
All of them are tigers.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ප්‍රසිද්ධියක් නැහැ. You may be meeting them privately. සී.ආර්. ද සිල්වා මහත්මයා කිව්වා, "Start a dialogue with the diaspora. It will be beneficial to the country". විශාල මුදල් සම්භාරයක් තිබෙනවා. මේ රට සංවර්ධනය කරන්න ඒවා පාවිච්චි කරන්නට පුළුවන්. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. අපත් රටට ආදරෙයි. අපට ඕනෑ මේ රට බේරා ගන්නයි.

ආණ්ඩුව රට අමාරුවේ දැම්මාට අපට රට අමාරුවේ දමන්න වුවමනාවක් නැහැ. ඒකයි අපේ පක්ෂයේ නායකතුමා කිව්වේ, ආණ්ඩු පක්ෂයයි, විපක්ෂයයි වට මේසයක වාඩි වෙලා මේ දුන්නු පොරොන්දු ඉෂ්ට කරන්න අපි කාල සටහනක් හදා ගෙන ඉදිරියට යමු කියලා. නමුත් මොකක්ද ආණ්ඩුවෙන් ඒ සඳහා ලැබුණු ප්‍රතිචාරය? ආණ්ඩුවේ ඇමතිවරයෙක් රනිල් වික්‍රමසිංහ මහත්තයාට බැන්නා, මේ දිනන පැත්ත පරදින පැත්තෙන් උපදෙස් ගන්නේ නැහැ කියලා. බලන්න, කොච්චර බාල ප්‍රකාශයක්ද කියලා. මේකයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය. මම ඔබතුමාට හැම දාම මේ ගැන කියනවා. මම අවුරුද්දකට කලිනුත් මේ ගැන කිව්වා. අපේ රට යන්නේ සුඩානය ගිය පාරේයි. මම දන්නේ නැහැ, ඒක ඇත්තද කියලා. මට නම් පෙනෙන විධියට සුඩානය යන පාරේ වාගේ තමයි අපේ රට යන්නේ. සුඩානයේ මොකක්ද වුණේ, ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා? සිවිල් යුද්ධයක් තිබුණා, උතුරේයි, දකුණේයි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Do you want that to happen here?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

උතුරයි, දකුණයි අතර සිවිල් යුද්ධයක් තිබුණා. ඔබතුමා ඒක දන්නවා. දකුණේ සිවිල් වැසියන් පනස්දාහක්, ලක්ෂයක් විතර මැරුණා. සුඩානයට කිව්වා, අභ්‍යන්තර පරීක්ෂණයක් කරන්න කියලා. දැන් අපිට කියලා තිබෙනවා, අභ්‍යන්තර පරීක්ෂණයක් කරන්න කියලා. කළේ නැහැ. ජාත්‍යන්තරය අභ්‍යන්තර පරීක්ෂණයක් කළා. මේ ඔක්කොම පටන් ගත්තේ Security Council එකෙන් නොවෙයි. මේ ඔක්කොම පටන් ගත්තේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමෙන්. මොකක්ද අන්තිමට කිව්වේ? අන්තිමට මේ ජාතීන් දෙකට මේ රටේ එකට ඉන්න බැහැ කියලා යෝජනාවක් සම්මත කළා. ඒකයි සුඩානයේ වුණේ. නැහෙනහිර ටිමෝරයේ වුණේත් ඕකයි. අවසාන වශයෙන් යෝජනාවක් ආවා, මේ ජාතීන් දෙකට එකට ඉන්න බැහැ කියලා. මේ යෝජනාවේ තිබෙනවා, ජාත්‍යන්තර පරීක්ෂණයක් පවත්වන්න කියලා. කොහොමද තමුන්නාන්සේලා ඒක කරන්නේ? It has to be a credible investigation. කොහොමද මේක කරන්නේ? මේවා ගැනයි හිතන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, අපි මොනවා හරි ප්‍රකාශයට පත් කරනවා නම් විශ්වාසය තහවුරු වන විධියට කියන්න ඕනෑ. දැන් බලන්න, හමුදාපතිවරයා පරීක්ෂණ කමිටුවක් පත් කරලා තිබෙනවා. මේ ගැන තොරතුරු මා ළඟ තිබෙනවා. මට ලජ්ජයි, මේක ඉදිරිපත් කරන්නත්. හමුදාපතිවරයා ඇතුළු Major-Generalලා පස් හය දෙනෙකුගෙන් සමන්විත කොමිටියකින් කියලා තිබෙනවා, මේ යුද්ධයෙන් එක සිවිල් වැසියෙක්වත් මැරුණේ නැහැ කියලා. රට වෙනුවෙන් යම් යම් දේවල් කරන්න ඕනෑ. නමුත් මේ වාගේ ප්‍රකාශ කරනවාද? කවුද විශ්වාස කරන්නේ, එකම සිවිල් වැසියෙක්වත් මැරුණේ නැහැ කියන කාරණය. ගරු ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම මහින්ද සමරසිංහ ඇමතිතුමා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම අමතන කොට මේ ගැන වචනයක්වත් සඳහන් කළේ නැහැ. මේ වාර්තාව ගැන එතුමාට විශ්වාසයක් තිබෙනවා නම් මේක නේ ඉස්සෙල්ලාම ඉදිරිපත් කරන්න ඕනෑ. ඇයි ඉදිරිපත් කළේ නැත්තේ? මෙතුමාගේ හිත දන්නවා, මේක අසත්‍යය වාර්තාවක් කියලා. හාස්‍යයට වාගේ ඇමෙරිකානු නියෝජිතයා මහින්ද සමරසිංහ ඇමතිතුමාට කිව්වා, "You have forgotten the Army Report" කියලා. ඒක හාස්‍යයට කිව්වේ because it says that there no civilian casualties. මේ වාගේ මට්ටමට තමයි අද අපේ රට වැටිලා තිබෙන්නේ. මේක සෙල්ලමක් හැටියට ගණන් ගන්න එපා. අලුත් රටවල් නිර්මාණය වෙලා තිබෙනවා. බංග්ලාදේශය නිර්මාණය වුණා. ඔබතුමා ඒක දන්නවා. සුඩානය නිර්මාණය වුණා. නැහෙනහිර ටිමෝරය නිර්මාණය වුණා. කොසෝව නිර්මාණය වුණා. පටන් ගන්නේ මෙහෙමයි. ඔබතුමා බලන්න, සුඩානයයි, නැහෙනහිර ටිමෝරයයි අතර ඒ අර්බුදය පටන් ගත්තේ කොහෙන්ද කියලා. පටන් ගත්තේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමෙන්. තමුන්නාන්සේලාට යම් යම් දේවල් කරන්න කියලා තිබෙනවා. සැප්තැම්බර් වන කොට කළේ නැත්නම් ඊ ළඟ පියවරට යන්නේ නැද්ද? ලබන මාර්තු වන කොට මේවායෙන් සෑහෙන ප්‍රමාණයක් හරි ක්‍රියාත්මක කරලා තිබෙන්න ඕනෑ. ඒක තමයි මම ඔබතුමාට කියන්නේ, දේශපාලන විසඳුමක් දුන්නොත් මේ හැම එකෙන්ම ඔබතුමන්ලාට යම් කිසි සහනයක් ගන්න පුළුවන් කියලා. If you give a political solution, all other problems can be negotiated and settled. ඒක තමයි අවශ්‍යම දේ. අද දකුණු ඉන්දියාව කැලඹිලා ඉන්නේ දේශපාලන විසඳුමක් දුන්නේ නැති නිසායි. දේශපාලන විසඳුමක් දෙනවාය කියලා පොරොන්දු වුණා. අපේ ගරු ජනාධිපතිතුමා සහභාගි වූ "Walk the Talk" කියන Programme එක මම NDTV එකේ බැලුවා. ඒ video එක මගේ ගෙදර තිබෙනවා. ඒකේ තිබුණේ Thirteen Plus ගැනයි. දහතුනට වැඩියෙන් දෙනවාය කියලා කිව්වා. හැබැයි, පසු ගිය නිදහස් උත්සවයකදී මොකක්ද කිව්වේ? කිසිම බලය බෙදීමක් කරන්නේ නැහැයි කිව්වා.[බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කරුණ, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන කොට ලොකුම ප්‍රශ්නය තමයි පොලිස් බලතල. එහෙම නේද ගරු ඇමතිතුමනි? සියලු දෙනාම කියනවා, පොලිස් බලතල දෙන්න බැහැයි කියලා. බලන්න, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මකව තිබුණා නම් පොලිස් බලතල තිබෙන්නේ පළාත් සභාවට නොවෙයි, ජාතික පොලිස් කොමිෂන් සභාවටයි. If the Seventeenth Amendment was there, all the police powers given under the Thirteenth Amendment would be vested with the Police Commission, not with the provincial councils.

නමුත් අද දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන්නේ නැති නිසා අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කෙරුවොත් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පොලිස් බලතල අයිති වන්නේ පළාත් සභාවටයි. ජාතික පොලිස් කොමිෂන් සභාව තිබුණා නම් ජාතික පොලිස් කොමිෂන් සභාව තමයි පොලිස් බලතල ක්‍රියාත්මක කරන්නේ. තමුන්නාන්සේලා ඒක අහෝසි කෙරුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අවසාන වශයෙන් මේ කාරණය කියන්න ඕනෑ. චෙන්නායි නුවර දී පහර දීමකට ලක් වුණු අපේ වංගීස ස්වාමීන් වහන්සේ මහනුවර ප්‍රදේශයේ ස්වාමීන් වහන්සේ නමක්. මා උන්වහන්සේත් එක්ක කථා කෙරුවා. කථා කෙරුවාම උන්වහන්සේ කිව්වා, ඒ ප්‍රහාරය සම්පූර්ණයෙන්ම set කරලා - plan කරලා - කරපු දෙයක් කියලා. උන්වහන්සේ කෝච්චි පෙට්ටියේ වැඩ සිටියා. පස් දෙනෙක් කෝච්චි පෙට්ටියට නැග්ගා. කැමරාකාරයෝ ආවා. -කරුණානිධිගේ පුතාට සහ පවුලේ අයට තමයි Sun TV එක අයිති- කෝච්චිය ඇතුළේ ඒ පස් හය දෙනා සිටියා. එළියෙන් cameras focus කෙරුවා. Cameraman "ready" කිව්වාම අර ගොල්ලෝ ගහන්න පටන් ගත්තා. ඒකයි වුණේ. මා ඒ ස්වාමීන් වහන්සේට දුරකථනයෙන් කථා කෙරුවා. මේ වතාවේදී අපේ ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩකයන්ට දකුණු ඉන්දියාවේ IPL ක්‍රිකට් තරග සෙල්ලම් කරන්න හම්බ වෙන්නේ නැහැ. චෙන්නායිවල ක්‍රිකට් තරග ගණනාවක් තිබෙනවා.

අනෙක් කරුණ, විදේශ කටයුතු අමාත්‍යාංශය මේ සිද්ධිය දැක්කා නේ ගරු ජී.එල්. පීරිස් අමාත්‍යතුමනි. මේක අද ඊයේ පටන් ගත්ත දෙයක් නොවෙයි. පසු ගිය අවුරුදු එක හමාර, දෙක ඇතුළත අපේ වන්දනාකරුවන්ට පහර දුන්නා; ක්‍රීඩකයන්ට පහර දුන්නා; ක්‍රිස්තියානි භක්තිකයන්ට පහර දුන්නා; දේශපාලනඥයන්ට පහර දුන්නා. හැබැයි විදේශ කටයුතු අමාත්‍යාංශය මේක හරියට තක්සේරු කෙරුවේ නැහැ. අන්න ඒකයි වැරැද්ද. දකුණු ඉන්දියාවේ වැදගත්කම තක්සේරු නොකෙරුවා වාගේම, දකුණු ඉන්දියාවේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් හරියට තක්සේරු කෙරුවේ නැහැ.

ගරු ඇමතිතුමාට මා කියනවා, මේ ස්වාමීන් වහන්සේ කියන දෙය බලන්න කියලා. අපේ භික්ෂූන් වහන්සේලාට කලිසම් ඇන්දුවේ මේ ආණ්ඩුවයි. ඒ අතින් මේ ආණ්ඩුව ඉතිහාසගත වනවා. බුද්ධ ශාසනය ආරක්ෂා කරන්න පත් වුණු මේ ආණ්ඩුව කාලයේ අපේ ස්වාමීන් වහන්සේලා දඹදිව වැඳ මහාබෝධියට ආවේ සරම් කමිස ඇඳ ගෙනයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I will wind up in one minute.

මේ වාගේ සිද්ධියක් කලින් වුණාද? මම ඇමතිතුමාට කියන්නේ අපේ සහයෝගය අප දෙන්න සූදානම් කියන එකයි. අපේ නායකතුමා කියලා තිබෙනවා, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව, එක්සත් ජාතීන්ගේ වාර්තාව ක්‍රියාත්මක කරන්න අප සහයෝගය දෙනවා කියලා. අපට බොර දියේ මාළු බාන්න ඕනෑ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි.

[නියෝජ්‍ය කථානායකතුමා]

The next speaker is the Hon. Ravi Karunanayake. Before he starts, the Hon. Deputy Chairman of Committees will take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ravi Karunanayake, you have five minutes.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ගෙන ආ වැදගත් යෝජනාව ස්ථිර කිරීමටයි මා නැඟී සිටියේ. මේ කථා කරන මොහොතේ අපේ ලංකාවට ලොකු කළු පැල්ලමක් ඇති වෙලා තිබෙනවායි කියන එක අප නැවත මතක් කරන්න අවශ්‍ය නැහැ. එක්සත් ජාතික පක්ෂයේ අප දැන් විරුද්ධ පාර්ශ්වයේ සිටියත් අප වගකීමකින් ක්‍රියා කරන පක්ෂයක්. ඔබතුමන්ලා ඉදිරියේ එක්සත් ජාතික පක්ෂය කිව්වා, අපේ සහාය රට වෙනුවෙන් ලබා දෙනවා කියලා. ඒ ඔබතුමන්ලාගේ අදක්ෂ, වංචා කරන අමානුෂික මට්ටමට ක්‍රියා කරන ආණ්ඩුව රකින්න නොවෙයි. නමුත් අපේ මාතෘ භූමිය සහ රටේ අහිංසක ජනතාව ආරක්ෂා කරන්න අප ඔබත් සමඟ ඉදිරිපත් වනවා කියලා කිව්වා. අපේ සහාය ප්‍රතික්ෂේප කළා; හාස්‍යයට ලක් කළා. බැසිල් රාජපක්ෂ මහත්තයා කිව්වේ "මේක අපට කියන්න ඕනෑ නැති දෙයක්. නමුත් උදවු කළ යුතු දෙයක්" කියලායි.

ඔබතුමන්ලා මේ රට අගාධයට ගෙනියලා, ඊට පස්සේ අපෙන් සහයෝගය ඉල්ලනවා නම්, අවශ්‍යතාව අනුව වග කීමකින් කටයුතු කරන්න අවශ්‍යයි කියා මා කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ ඉතාමත්ම වැදගත් අවස්ථාවකයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා දැනුත් කිව්වා වාගේම විපක්ෂය වශයෙන් රට වෙනුවෙන් දෙන්න පුළුවන් සහයෝගය, අප එදාත් දෙන්න හැදුවා; අදත් දෙන්න කැමැතියි; ඉදිරියටත් දෙන්න කැමැතියි. නමුත් ඔබතුමන්ලා නොයෙක් නොයෙක් ප්‍රශ්න අනා ගන්නා අවස්ථාවකදී අපේ මාතෘ භූමිය ආරක්ෂා කර ගන්න ඕනෑය කියන අදහසින් අප බොහොම ඕනෑකමින් මේවා මතක් කරනවා. Labour GSP එක සම්බන්ධයෙන් ඇති විය හැකි තත්ත්වය අප කිව්වා. නමුත් ඒ අවස්ථාවේදී ඔබතුමන්ලා අපට හිනා වුණා. ඔබතුමන්ලා දිනනවා කිව්වා. අද වාණිජ මණ්ඩලයට අවුරුද්දකට කෝටි 11,800ක් නැති වුණ එක ගැන කථා කරන කොට ඔබතුමන්ලා නිහඬයි. ඒ වාගේම තමයි පසු ගිය අවුරුද්දේ මේ වාගේම අවස්ථාවක ජිනීවා යෝජනාව එන කොට අප කිව්වා, නිදහසින් පස්සේ ලංකාවට විරුද්ධව යෝජනා ගෙනැල්ලා නැහැ; ඇයි අපට එකට වැඩ කරන්න බැරි කියලා. සුද්දන්ට දණ ගහනවා කියලා අප කියන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපති වශයෙනුත්, ජී.එල්. පීරිස් විදේශ ඇමති වශයෙනුත් ලෝකයට දුන්නු පොරොන්දු ක්‍රියාත්මක කරන්න කියන එකයි අප කියන්නේ. ලෝකයත් ඉල්ලන්නේ ඒකයි. හැබැයි ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඉන්න ඇමතිවරු අනෙක් පැත්තෙන් කියනවා, මේවා යුරෝපා කුමන්ත්‍රණ ලු; ඇමෙරිකන් කුමන්ත්‍රණ ලු. මේ වාගේ කට කථා පතුරන නිසා තමයි ලංකාව අද මේ වාගේ වළකට වැටිලා තිබෙන්නේ. මන්මෝහන් සිංට දිල්ලිවල ඡන්ද ටික හෝ ජයලලිතා, කරුණානිධිට තමිල්නාඩුවල ඡන්ද ටික වාගේ නොවෙයි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රෙජීමේන්තුවට අවශ්‍ය වන්නේ මේ රටේ සිංහල ජනතාවගේ ඡන්ද ටික උදුරා ගන්න පුළුවන් කොහොමද කියන එකයි. ඒ agenda එකට වැඩ කරලා තමයි අද රට අගාධයට ගෙනියලා තිබෙන්නේ. ඔබතුමන්ලා ඒවා මතක තබා ගන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාත්‍යන්තර ප්‍රතිපත්ති තිබිය යුත්තේ කොයි ආකාරයෙන්ද කියලා ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා බොහොම හොඳට විග්‍රහ කළා. ඒ ප්‍රතිපත්ති ඔබතුමන්ලා ළඟ ගෑවිලාවත් නැහැ. ගමේ චණ්ඩි වාගේ හැසිරිලා හිතනවා ලෝකය තමන්ගේ කකුල් ළඟට ඇවිල්ලා දණ ගහවි කියලා. ලෝකය තිබෙන්නේ ලංකාව ඇතුළේ මිසක්, ලංකාව තිබෙන්නේ ලෝකය ඇතුළේ නොවෙයි කියලා හිතනවා. ඒ වාගේ සංකල්පයක් ගෙනියලා තමයි මේ වාගේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. අප කිව්වා වාගේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, LLRC Report එක, බැන් කී මූන්ට දුන්න Report එක, ගරු ඇමතිතුමනි, ඔබතුමා External Affairs Ministry එකෙන් පසු ගිය අවුරුද්දේ දුන්නු වාචික පොරොන්දු, ඒවා ඔක්කෝම අන්තර්ගත වෙලා තමයි මෙවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. අද ඉන්දියාවේ තමිල්නාඩුවෙන් කොතරම් අභියෝගයක් නවදිල්ලි ආණ්ඩුවට ඉදිරිපත් කරලා තිබෙනවාද? මේක අවසන් නැහැ. මේ පටන් ගැනීම විතරයි. එහි ඡන්දය තිබෙන්නේ 2014 අගෝස්තු මාසයේ. ජිනීවාවලින් මේ ප්‍රශ්නය අවසන් වනවා කියලා හිතන්න එපා. ඔබතුමන්ලාගේ අන්තවාදී ගමනෙන් තමයි මේවා ඔක්කෝම ආරම්භ කරන්නේ. ත්‍රිවිධ හමුදාව දුන්න නායකත්වයත්, විපක්ෂය දුන්න සහයෝගයත් තුළින් පරාජය කළ ත්‍රස්තවාදය අද අන්තවාදී තත්ත්වයට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ අන්තවාදයට ගිහිල්ලා තිබෙන එක තමයි අප පෙන්වා දෙන්නේ. You all have finished off terrorism and brought in extremism. ජාතීන් අතර තිබෙන ප්‍රශ්න භයානකයි. ආගම්වාදී ප්‍රශ්නය ඊටත් වැඩිය භයානකයි. මේක තමයි සැබෑ තත්ත්වය. එසේ තිබෙද්දීත් දැන් මේ මොහොතේ-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Now, please wind up.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I have not finished my five minutes, have I? Just three and a half minutes have passed. I am also timing.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Then, the Members from your side would not be able to speak.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අද මේ වාගේ තත්ත්වයක් තිබෙන අවස්ථාවක අසාද් සාලි ආණ්ඩුවට විරුද්ධව කථා කරන කොට, ඔන්න අල්ලන්න හදනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you cannot blame the Chair like that. Your time is over.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Give me one more minute, Sir.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Ask for time like that. Do not blame the Chair.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Then, that way, may I ask you to give me two more minutes?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, I can give you only one more minute.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Okay. Thank you.

දැන් මේ කියන මොහොතේ ඉන්දියන් LIOC එකේ තිබෙන, ඒ දුන්නු ටැංකි ටික ඉවත් කරන්න හදනවා. ඒ වාගේම තමයි නවී පිල්ලේට සැලකුව ආකාරය. අප මීට වැඩිය නම්‍යශීලිව වැඩ කරන්න අවශ්‍යයි. දේශපාලන විසඳුමක් ලබා ගන්න අවශ්‍යයි. ඒක එක්සත් ජාතික පක්ෂයේ අප මුල ඉඳන්ම කියලා, අප ඡන්ද පැරදිලා තිබෙනවා. නමුත් රට ගැන හිතලායි එදා ඒක අප කිව්වේ. මොකද, ඩී.එස්. සේනානායක මැතිතුමා මේ රටට ගෙනාව නිදහස ආරක්ෂා කරන්න පුළුවන් වන්නේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ යන සියලු ජාතීන් එකතු වුණාමයි. මේක බෞද්ධ රටක්. ඒකේ ක්‍රිස්තියානි, ඉස්ලාම්, හින්දු යන ආගම්වල සියලු දෙනාට සහජීවනයෙන් ඉන්න පුළුවන් වාතාවරණයක් තමයි අපට අවශ්‍ය වන්නේ. ඒක තමයි ලෝකයත් කියන්නේ. නැත්නම් වෙනින් විධියකට ඇවිල්ලා නැති දේවල් ඇති කරන්නේ නැහැ. ඔබතුමන්ලාම පොරොන්දු වුණු දේවල් තමයි ක්‍රියාත්මක කරන්න කියලා තිබෙන්නේ. වැඩියෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේ මා අවසාන වශයෙන් එක ඉල්ලීමක් කරනවා. අප නම්‍යශීලි වෙලා මාධ්‍යයෙන් සත්‍ය තොරතුරු ගැන දැනුවත් කරන්න අවශ්‍යයි. අද අස්වර් මහතා ප්‍රශ්න කළ "සිරස" නාලිකාවේ ප්‍රවෘත්ති විකාශයේ මොනවාද තිබෙන්නේ? අප මේවා විවෘත කරන්න ඕනෑ. ගරු කථානායකතුමාට අප කිව්වා, මේ පාර්ලිමේන්තුවේ පවත්වන විවාද රූපවාහිනී නාලිකාවලට විවෘත කරන්න කියලා. එතකොට ඔය වාගේ අසත්‍යය චෝදනා ඉදිරිපත් කරන්නේ නැහැ. තමුන්නාන්සේලාට ඒවා දා ගන්න හොඳයි. මේවා කියන්නේ ප්‍රශ්න ඇති කරන්නයි. මා කියන්නේ, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කළා නම් මේ වාගේ ප්‍රශ්න ඇති වන්නේ නැහැ කියලායි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කථා කරන කොට මම හිතුවා එතුමා සුඛානයේ ඉන්නේ කියලා. මම එතුමාට මතක් කරන්න කැමැතියි, මේක සුඛානය නොවෙයි, ශ්‍රී ලංකාව කියලා. අනෙක් රටවල් වාගේ නොවෙයි. අපේ රටේ ජනතාව මැතිවරණ දෙකකදී overwhelmingly voted for President Mahinda Rajapaksa. තමුන්නාන්සේලාට හොල්ලන්න බැහැ. ඒකයි තමුන්නාන්සේලා මේ වධ වේදනාව විඳින්නේ. Sir, history records that the most treacherous, the most unpatriotic and the most anti-national speech ever made in this Legislature was by the Hon. Sumanthiran this morning. The Tamil community would hide their heads in shame listening to him when so audaciously and unashamedly he declared in this House that he felt happy and rejoiced that "The Geneva Motion was voted overwhelmingly".

I am telling you Sir, eminent Tamil leaders like Sir Ponnambalam Ramanathan and Sir Ponnambalam Arunachalam fought for the rights of their people, the Tamil people. They espoused their cause but they were patriotic. Even these two leaders went to England at that time and argued the case so ably against the British Colonialism. That was the type and the calibre of Tamil leaders that we have had in this country.

Now, Sir, I may say this. The Hon. Sumanthiran, born in this country, drinking the water of this country, eating the rice produced in this country and breathing the free air of this country has the audacity to say that the Motion was "overwhelmingly voted". ඒකට සිංහලෙන් කියන්නේ, "කාලකණ්ණි සතුටක්" කියලායි. See, where is this "overwhelming voting?" Sir, 25 countries voted for the Motion against Sri Lanka while 13 countries voted against. What are those countries? They are: Congo, Mauritania, Indonesia, Kuwait, Maldives Pakistan, Qatar, Thailand, UAE, Ecuador, Venezuela, Uganda and Philippines. Eight countries abstained. What are those countries? They are: Angola, Botswana, Burkina Faso, Ethiopia, Kenya, Japan, Kazakhstan and Malaysia. So, 8 plus 13 is 21. It is a very thin majority. Countries who did not vote for them are with us. Your enemies are our friends. That is the way that you must calculate and nine countries who voted for us, for Sri Lanka, against the Motion are Muslim countries. Even last time, in Geneva, Muslim countries overwhelmingly - use the word there "overwhelmingly" - voted for us. I must pay tribute to the Hon. Minister of External Affairs, the able Minister. I have been with him to other countries with Presidential Delegations. How masterly are the lectures that he gives which moves those State leaders and members of various delegations! Also, I will be failing in my duty if I do not place on record my deep appreciation of the work well done by the Hon. Mahinda Samarasinghe at the Geneva talks ably assisted by Ravinath Ariyasinghe and other

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

officials. That is the position today, Sir. Therefore, I would only tell the Hon. Lakshman Kiriella not be an anti -patriotic.

Now, what is happening in South India? The students are misled there. The students of Loyola College are misled. Loyola is a College that came and played cricket with Zahira College under Dr. A.M.A.Azeez at that time. We would invite the students of Loyola College to come again and play here. I must also stress the point that the people of Tamil Nadu - all the people there - are not against us. They are very great friends of ours. Look at Dr. Subramanian Swamy, the Leader of the Janata Party. He has put the case very well and as a result his house has been stoned.

Is this the democracy exercised in Tamil Nadu, I am asking? What has happened to Jayalalitha and Karunanidhi? They are before courts on bribery and corruption charges. Let the courts there decide; these are the people you are trying to get help from.

I also want to quote one of our greatest statesmen and leaders in this country, Dr. M.C.M Kaleel. This is recorded in the Sri Lanka Broadcasting Corporation and you could get a copy of this from the able Chairman, Mr. Hudson Samarasinghe. What did Dr. Kaleel say in 1982?

> "I am always and will continue to say that 'Ceylon' should be a single nation, a united nation with the different communities, different religions and different parties. They can all co-exist without any trouble like a jewel with so many facets. See on one side you can have rubies, the other side you can have diamonds and other side sapphires, like a jewel. Ceylon, we can have one Ceylon as a single jewel where the different facets composed of the Buddhists, Sinhalese, Muslims, Hindus, Christians and so on all jointly forming a single United Nation."

That is the "Ceylon United Nation", not the United Nations in New York that wants to bring this Government down. Dr. Kaleel further states, I quote:

> "That is my view and the Muslims should always stand by first and foremost united, they should stand not divided into this and that but as far as politics is concerned they can use their personal convictions."

That is a different matter. His leader was that great patriot and nationl leader, the Hon. Dr. T.B. Jayah. Great socialist leaders like the Hon. Philip Gunawardena who was also tutored by Dr. T.B. Jayah, fought for national independence. I would now ask some of the UNP Members not to go to India and to other countries carrying tales against Sri Lanka. We will stand as a united nation. No power on earth would defeat our will and the will of no less a person than His Excellency President Mahinda Rajapaksa.

Thank you.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Ajith P. Perera. You have five minutes.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජ කාලයේ රාජ සභාවේ සතුට වෙනුවෙන් අන්දරේ කියලා කෙනෙක් හිටියා. ඔහු රජ වාසලේ කවටයා. ඇත්තටම අපේ සභාවටත් එවැනි අය අවශ්‍යයි. මේ වාගේ දුක්බර අවස්ථාවක වුණත් මේ සභාවට, රටට ඒ සතුට ලබා දෙන එක ගැන අපි සතුටු වෙනවා.

නමුත් අපි මේ කාරණයට අවධානය යොමු කරන්න ඕනෑ. අපේ වීරෝදාර හමුදා ත්‍රස්තවාදය පරාජයට පත් කරපු අවස්ථාවේදීවත් -2009 මැයි මාසයේදීවත්- අපේ රටේ භික්ෂූන් වහන්සේලාට තමිල්නාඩුවට යන්න බැරිකමක් ඇති වුණේ නැහැ. බුද්ධගයාවට වන්දනාවේ යන අපේ දුප්පතුන් තමිල්නාඩුවට ගිහිල්ලා කෝච්චියෙන් තමයි යන්නේ. යුද්ධය තියෙද්දීත්, යුද්ධය උච්ච අවස්ථාවේදීත්, යුද්ධයෙන් අපි ත්‍රස්තවාදය පරාජයට පත් කරපු වේලාවේත් අපේ වන්දනා නව තමිල්නාඩුව හරහා ගියා. හැබැයි යුද්ධය ඉවර වෙලා අවුරුදු තුනකට පස්සේ -අවුරුදු හතරකට කිට්ටු වෙන වේලාවේ- ඇයි අපේ ගෞරවනීය භික්ෂූන් වහන්සේලාට මේ වාගේ බේදජනක ඉරණමක් අත් වෙන්නේ? ඇයි, අපේ භික්ෂූන් වහන්සේලාට ඒ ගෞරවනීය සිවුර දරාගෙන ඉන්දියාවේ -බුදුන් උපතලත් දේශයේ- ගමන් කරන්නට අවස්ථාව නැති වෙන්නේ? මේක තමයි රාජ තාන්ත්‍රික පරාජය. මේක තමයි අපි කම්පා විය යුතු තත්ත්වය. මේක තමයි අවාසනාවන්ත තත්ත්වය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යුද්ධයේ උච්ච අවස්ථාවේවත් නොතිබුණු තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා.

යුද්ධය අවසන් වෙලා දින ගණනාවක් ගියාට පස්සේ, එදා ඇමෙරිකාවේ වක්‍ර අනුග්‍රහයෙන් ගෙනාපු යෝජනාව, අපේ ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා එතරම් ආශා නොකරන, ආචාර්ය දයාන් ජයතිලක මහතා ඉතා ප්‍රඥාවන්තව, ක්‍රියාකාරීව කටයුතු කළ නිසා පරාජයට පත් කරලා, අපේ රට ඉදිරිපත් කරපු යෝජනා සම්මත කර ගන්න පුළුවන් වුණා. අපි ඒ යෝජනාව පරාජයට පත් කළා විතරක් නොවෙයි, ශ්‍රී ලංකාව කෙටුම්පත් කරපු යෝජනා සම්මත කර ගන්නත් පුළුවන් වුණා. එදා දයාන් ජයතිලක මහත්මයා මූලික වෙලා, ඉදිරිපත් කර ජයග්‍රහණය කර ගත්ත ඒ යෝජනා අපේ යෝජනා. ඒවා අපට කවුරුවත් බලෙන් පටවපු ඒවා නොවෙයි. ඒ යෝජනා අපි ක්‍රියාත්මක නොකරපු නිසා, අපි ගිය අවුරුද්දේ මාර්තු මාසයේ ජිනීවාවලදී පරාජයට පත් වුණා. එවිටත් අන්දරේලා, කවටයෝ, Ordinary Level විභාගයෙන් අංක ගණිතය fail වුණු කටටිය කිව්වා, "මේක පරාජයක් නොවෙයි, මේකේ ජයග්‍රහණයක ලකුණු තිබෙනවා, අපි පැරදුණත් දිනුම් වාගේ" කියලා. පෙළපාළිත් ගියා; විවිධ, විවිධ උත්සව පැවැත්වුවා; පැරදුණාම ඒ පැරදුම ජයග්‍රහණයක් කියලා හිතුවා. එදා ඉඳලා අවුරුද්දක් ගත වුණා. අපි ශිෂ්ට රටක් හැටියට ලෝකය සමඟ ඇති වුණු එකඟතාවන්, ජාත්‍යන්තර සම්මුති තිබෙනවා. අපි එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලබා ගත්තාම අපට සිද්ධ වෙනවා, ඒ සම්මුතීන්වලට ගරු කරන්න. එහෙම නැත්නම් අපි එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය අත හරින්න ඕනෑ.

එහෙම නැත්නම් අපි පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය අත හරින්න ඕනෑ. අපි එහෙම කළේ නැහැ. අපට එහෙම කරන්න බැහැ. එහෙම කළ යුතුත් නැහැ. අපි ජාත්‍යන්තරය සමඟ ඇති කර ගත් එකඟතා කඩ කරපු නිසා, අපි එකඟ වූ පොරොන්දුව අපි ම

කඩ කරපු නිසා ගිය අවුරුද්දේ මාර්තු මාසයේ අපට විරුද්ධව අප අකැමැති යෝජනාවක් ජිනීවා සමුළුවේදී සම්මත වුණා. එයින් පසුවත් අපට කළ හැකි දේ තිබුණා. ඒවා කරන්න උත්සාහ කළ හැකිව තිබුණා. හැබැයි අප ඒ ගැන කිසිම උනන්දුවක් දැක්වූවේ නැහැ. අපට උතුරු පළාතේ මැතිවරණය පවත්වන්න තිබුණා. රට ඇතුළේ දකුණේත් මානව හිමිකම් තත්ත්වය ආරක්ෂා කරන්න තිබුණා. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරලා, ඉහළ අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ ස්වාධීනත්වය රකින්න තිබුණා. අග්‍ර විනිශ්චයකාරතුමියට එරෙහිව පරීක්ෂණයක් පවත්වනවා නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආකාරයට නීත්‍යානුකූල, සාධාරණ පරීක්ෂණයක් පවත්වන්න තිබුණා. අප එකහ වෙලා ඉන්න පොදු රාජ්‍ය මණ්ඩලයේ මූල ධර්ම රකින්න තිබුණා. අපි ඒවා රැක්කේ නැහැ. අපි ජන මාධ්‍යවේදීන්ට ගැහුවා; ජන මාධ්‍යවේදීන් මැරුවා. රට ඇතුළේ දකුණේත් ප්‍රජාතන්ත්‍රවාදය නැති කළා. අවසානයේ අද අපි දකුණේ ප්‍රජාතන්ත්‍රවාදයත් ආරක්ෂා කරන්නේ නැහැ.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ම තිබෙන දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්නේ නැහැ. එය ඉන්දියාවේ ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නොවෙයි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි ක්‍රියාත්මක කරන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ එක මන්ත්‍රීවරයකු හැර, ඉතිරි සියලු දෙනා එකහ වෙලා 2001 දී ඒකමතිකව සම්මත කර ගත් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු වුණු ඉතාම වටිනා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි අත හැරියා. ඒ නිසා අපි නැවතත් පස්සට ගියා. අප දිහා බලා ගෙන ඉන්න ලෝකය අපව තක්සේරු කරන්නේ, යුද්ධයෙන් පස්සේ ප්‍රජාතන්ත්‍රවාදිව නීතියේ ආධිපත්‍යයට ගරු කරමින් ඉදිරියට යන රටක් හැටියට නොවෙයි. එම නිසා තමයි බලහත්කාරයෙන් අප මත මේ ප්‍රශ්න පටවන්නේ. එම නිසා තමයි ඉන්දියාවේ මේ වාගේ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙන්නේ. ඉන්දියාව අපේ හිතවතා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඉන්දියාව අපේ සහෝදරයා. ඉන්දියාව අපේ ලොකු අයියා. ඉන්දියාව තරහ කර ගත්තාම තත්ත්වය බරපතළයි. මොකද, නැදෑයෝ තරහ වුණාම අන් හැමටම වඩා නරකයි. නැදෑයෝ තරහ කර ගන්න වටින්නේ නැහැ. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. R. Yogarajan. You have four minutes.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Hon. Deputy Chairman of Committees, I think it is a very appropriate Motion that the Hon. Lakshman Kiriella has moved. It is very important that the Government of Sri Lanka establishes a relationship with the people of Tamil Nadu who consider the Tamils in Sri Lanka as their brothers. It is very unfortunate that our pilgrims, our students, our sportsmen have been today subjected to harassment in India. I issued a statement to the Indian media and said that it is against the culture of hospitality of the Tamil people to treat people who have come to their home in this manner. But, I do not blame them. When they see media reports on the conduct of the war and the conduct of this Government since the war, those people are becoming emotional and acting in this manner. The Hon. Ajith P. Perera said that in 2009, soon after the war, we did not have such a situation in Tamil Nadu. Even during the war we did not have such a situation in Tamil Nadu. This is all because of the way you treat the people in the North and East today. The whole world says, "the war is over, reduce the presence of the armed forces; restore democracy within the North and the East". Even today, you have two former commanders of the armed forces as Governors only for the North and the East but not for any other province in the rest of the country. It is the Commander of Jaffna, Major General Hathurusinghe who is issuing all political statements today.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
It is unfair.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
It is very unfair. It is true, Hon. Azwer.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
What you are saying is unfair. He is the Governor.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
An army officer has no political role. Why is he issuing these statements? This gives the feeling that there is a military authority that is trampling the people, the Tamil people in the North and the East. The only way for you to establish a rapport with the people of Tamil Nadu as a Government is to concede to a reasonable political solution to rehabilitate those people in a sincere manner. Give them housing, give them all the facilities required for life, look after their livelihood and bring them out of the poverty that they live in today. That is the only way that you can win over the Tamil people not only in Sri Lanka but also in India. Towards this, what are you doing? You are doing very little. I advised through my press release to the Indian media that the Sinhala people or the Sri Lankan people are not against the Tamils, but it is only the Government that is acting against the Tamil people and I asked them to pressurize their Government to act against Sri Lanka. The Indian Government has done it today. But, my message was, “Do not act against the people of Sri Lanka when they come as your guests”.

Thank you.

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்ட லுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරමින්, පහර දීමට ලක් වූ භික්ෂූන් වහන්සේ ප්‍රකාශ කළ පරිදි අදාළ සිද්ධිය ගැන සඳහන් කළා. ඒක අපටත් වාර්තා වෙලා තිබෙනවා. ඉස්සෙල්ලාම වුණේ කැමරා ගෙන ඒම. කැමරා සුදුසු තැන්වල තියලා ඒ සංවිධාන කටයුතු අවසාන වූ විට තමයි පහර දීමේ සිද්ධිය ආරම්භ වුණේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකෙන් යම් කිසි දෙයක් ඉතාමත් පැහැදිලිව පෙනෙනවා. මේකේ යම් කිසි අරමුණක් තිබෙනවා. ඒ අරමුණ තමයි හැඟීම් උත්සන්න කරලා මෙහේ ප්‍රති ප්‍රහාරයක් ආරම්භ කිරීම. නැත්නම් කැමරාවක් අවශ්‍ය නැහැ නේ. ඒකෙන් ඉතාමත් පැහැදිලිව පෙනෙනවා, මේකේ අවසාන අභිමතාර්ථය කුමක්ද කියලා. මේ පටු අරමුණු තිබෙන පුද්ගලයන්ට දිනන්න අවස්ථාව නොදී පක්ෂ භේදයෙන් තොරව අප සියලු දෙනාම ඇප කැප වෙලා කටයුතු කරමු. එසේ කටයුතු කළ යුතුය කියන එක අපි තරයේ විශ්වාස කරන්නේ ඒ නිසායි. මොකද මේ පටු අරමුණු ඉෂ්ට වුණොත් රටවල් දෙකම පරාජයට පත් වනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා, ඩයස්පෝරාව සමඟ අපි සාකච්ඡාවක් කරලා නැහැ, ඒක මේ ප්‍රශ්නය උග්‍රවීමට ප්‍රධාන හේතුවක් කියලා. ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි, ඒක එහෙම නොවෙයි කියලා. අද ඩයස්පෝරාව කියන්නේ එකම කණ්ඩායමක් නොවෙයි. ප්‍රභාකරන් ජීවතුන් අතර සිටි කාලයේ තත්ත්වය වෙනස්. එදා ඩයස්පෝරාව එකම මතයක් තමයි ප්‍රකාශ කළේ. ඒ භය නිසායි. වෙන මතයක් ප්‍රකාශ කළා නම්, ඒ අයට ජීවතුන් අතර සිටීමට කිසිසේත් පුළුවන්කමක් තිබුණේ නැහැ. Today, the diaspora is no longer a monolith. There are different nuances; different points of view. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඩයස්පෝරාව තුළ විවිධ මත තිබුණා. යුද්ධය අවසානයි, දැන් සුහදව ප්‍රශ්න විසඳා ගැනීමට ඉදිරිපත් විය යුතුය කියන ස්ථාවරයේ සිටින සෑහෙන කොටසක් ඩයස්පෝරාව තුළ සිටිනවා. ඩයස්පෝරාවේ විවිධ පිරිස් මාව හම්බ වෙලා තිබෙනවා. මම දන්නවා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාවත් හම්බ වෙලා තිබෙනවා. ප්‍රයෝජනවත් විධියට මේ රටේ ආයෝජන කරලා, විශේෂයෙන්ම උතුරු ප්‍රදේශයේ ආර්ථික තත්ත්වය දියුණු කිරීමට මැදහත් වන්න ඒ අය සූදානම්. ඒ සඳහා කැමැත්තක් විතරක් නොවෙයි, උද්‍යෝගයක් දක්වන පිරිසකුත් ඩයස්පෝරාව තුළ සිටිනවා.

මෙහි තව අන්තයක් තිබෙනවා. අපි අවංකව කියනවා නම්, ඒ අන්තය නියෝජනය කරන ඩයස්පෝරාවේ පිරිස යුද්ධය අවසානයි කියලා පිළිගන්නේ නැහැ. ඒගොල්ලන්ගේ අදහස තමයි දැන් පවත්නා ක්‍රමවේදය වෙනස් කළ යුතුයි කියන එක. අරමුණ එකමයි. හැබැයි ඒ අය ඊළාම් සිහිනය අත හැරලා නැහැ. විවිධ උපක්‍රම පාවිච්චි කරමින් ඒ කරා ගමන් කිරීම තමයි ඒ අයගේ අධිෂ්ඨානය වන්නේ. ඒ අය හදන්නේ මේ රටේ ආර්ථිකය සුනු විසුනු කිරීමටයි. සංචාරකයන්ට එන්න එපා කියනවා, ලංකාවේ ආයෝජන කරන්න එපා කියනවා. ඒ අනුව ජාත්‍යන්තර වෙළඳාම පුළුවන් තරම් අඩු කිරීමට සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ඒ අය දියත් කරලා තිබෙනවා. ඩයස්පෝරාව තුළ විවිධ මත දරන පිරිස් සිටිනවා. ඒ අය අතර එකඟතාවක් නැහැ. එහෙත් සාධාරණ මත දරන යථාර්ථවාදී ලෙස ප්‍රශ්නවලට මුහුණ දීලා වැඩ කිරීමට සූදානම් කණ්ඩායම් සමඟ අපි දැන් සාකච්ඡා පවත්වා ගෙන යනවා. අතිගරු ජනාධිපතිතුමා නිදහස් දින උත්සවයේදී දඟතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්නේ නැහැ කියලා කිව්වාය කියලා ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා. එය සම්පූර්ණයෙන් වැරැදියි.

එතුමා කිව්වේ, බලය බෙදා හැරීම ජාතීන් පදනම් කරගෙන කරන්න පුළුවන් දෙයක් නොවෙයි කියලායි. What he said was that there cannot be devolution on racial lines to communities. That is perfectly correct. දඟතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ එහෙම දෙයක් සඳහන් වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. The Thirteenth Amendment attempts to bring about devolution of power, but that is to Provincial Councils. භූගෝල ශාස්ත්‍රීය සාධක පදනම් කරගෙන ඒ ඒ පළාත්වල පළාත් සභාවලට තමයි බලතල පවරන්නේ. එහෙම නැත්නම් සිංහල ජාතියට හෝ ද්‍රවිඩ ජාතියට හෝ මුස්ලිම් ජාතියට නොවේ. එම නිසා අතිගරු ජනාධිපතිතුමා විසින් බලය බෙදීම ප්‍රතික්ෂේප කළාය කියන ප්‍රකාශනය සම්පූර්ණයෙන් වැරැදියි. එහෙම නම් එතැන පොරොන්දුවක් කඩ කිරීමක් සිදු වන්නේ නැහැ. මා හිතවත් ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා එය පිළිගන්නවා ඇති කියලා මා හිතනවා. වර්තමාන තත්ත්වය මොකක්ද? එතුමා කියන කාරණයේ සම්පූර්ණ හරය මොකක්ද? එතුමා කියන්නේ, මේ සියලුම ප්‍රශ්න උද්ගත වෙලා තිබෙන්නේ එක් මූලික හේතුවක් නිසාය කියලා යි. ඒ හේතුව තමයි, මේ බලය බෙදා හැරීම පිළිබඳව ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් නැතිකම කියලා යි. නමුත් එහි සාධාරණ විවේචනයක් නැහැ. රජය අද මේ ප්‍රශ්නය විසඳීමට සූදානම්. මෙම ප්‍රශ්නය විසඳන්නට පුළුවන් වන්නේ, ව්‍යාවස්ථාදායකය - පාර්ලිමේන්තුව - තුළයි; ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා සාමාජිකයකු වන මේ පාර්ලිමේන්තුව තුළයි. එය විධායකයට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීම පාර්ලිමේන්තුවේ භූමිකාව තුළ තිබෙන දෙයක්. එයට තුනෙන් දෙකක බහුතරයක් අවශ්‍යයි. සමහර වගන්ති වෙනස් කිරීම සඳහා ජනමත විචාරණයක් පැවැත්වීමත් නීතිය අනුව අත්‍යවශ්‍යයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත් දන්නවා ඇති, පසු ගිය අවුරුදු 12ක කාලය තුළ විවිධ ආණ්ඩු මෙම ප්‍රශ්නය විසඳීමට උත්සාහ දරපු බව. එහෙත් එම ප්‍රයත්න එකක්වත් සාර්ථක වුණේ නැහැ. මොකක්ද හේතුව? ඒක සංකීර්ණ ව්‍යාකූල ප්‍රශ්නයක්. හැබැයි, ප්‍රධාන හේතුව වුණේ ඒ යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වටාපිටාව රටේ ගොඩනැඟිලා නිබුණේ නැති එකයි. There was no consensus in support of implementation. ඉතින් ඒ නිසා ඒ ප්‍රශ්න ගොඩගැහුණා. 2000 වසරේ අගෝස්තු මාසයේ දී මේ ගරු සභාවට ඉදිරිපත් කෙරුණු යෝජනා මාලාව ක්‍රියාත්මක කරන්නට බැරි වුණා. මා ඔබතුමාට දොස් කියනවා නොවෙයි, එදා අවසානවකට විරුද්ධ පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ගිනි තැබුවා. මේ සභා ගර්භය තුළ මම ගින්නක් දැකපු එකම අවස්ථාව එයයි. එම ව්‍යවස්ථා සංශෝධනය ගිනිබත් කළා. ඉතින් ප්‍රශ්නය වුණේ රටේ ජනතාව තුළ ඒ යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය ලැබුණේ නැති එකයි. ඒ නිසා මේ අවස්ථාවේ දීත් ඉතිහාසයේ කළ ඒ රහපෑම කිරීම නොවෙයි අවශ්‍ය වෙලා තිබෙන්නේ. ක්‍රියාත්මක කිරීමට පුළුවන් යෝජනාවක් සකස් කිරීමයි. හැබැයි, හැමෝම ඒකට එක්කාසු වන්නට ඕනෑ. It must be inclusive. That is an essential condition for success. ඒ නිසා තමයි සියලුම දේශපාලන පක්ෂවලට රජය ඇරයුම් කර තිබෙන්නේ, පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් - Parliamentary Select Committee - තුළින් මේ සාකච්ඡාවලට සම්බන්ධ වෙන්නයි කියලා. එයට අවශ්‍ය සියලුම දේ අද රජය විසින් කරලා තිබෙනවා.

The Terms of Reference are ready. එහි සාමාජිකයන් ලෙස අපි නම් කරන අය කවුද, සභාපති හැටියට නම් කරන්නේ කාවද කියලා, ඒ සියලු වැඩ කටයුතු රජය අවසන් කරලා තිබෙනවා. අපි ආරාධනා කරලා තිබෙනවා, දම්ළ ජනතාව නියෝජනය කරන දේශපාලන පක්ෂවලටත් එම සාකච්ඡාවට අවතීර්ණ වන්නට කියලා. දෙමළ ජාතික සන්ධානය එයට එන්න මැලිකමක් දක්වනවා. ඉතින් ඒක තමයි ප්‍රශ්නය. එහි වගකීම රජයට පැවරීම වැරැදියි. ඒ අයගේ තර්කය වන්නේ, ඒ අය විශේෂ කාරක සභාවට එන්නේ දෙපාර්ශ්වය අතර ඇති වෙච්ච එකඟත්වයක් මත යම් කිසි ලියවිල්ලක් රජය ඉදිරිපත් කරනවා නම් පමණයි කියන එකයි. එය පදනම් කරගෙන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ කටයුතු ආරම්භ කරන්න කියලා යි ඒ අය කියන්නේ. එය ප්‍රායෝගික දෙයක් හැටියට අපි දකින්නේ නැහැ.

ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා දන්නවා ඇති, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා දෙමළ ජාතික සන්ධානය අතර මාස කිහිපයක් තිස්සේ සාකච්ඡා සිදු වුණු බව. ඒක කාලය නාස්ති කිරීමක් නොවෙයි. මෙන්න මේ මේ විෂයන් සම්බන්ධයෙන් තමයි අවධානය යොමු කළ යුත්තේ කියලා ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඒ සාකච්ඡාව තුළින් ඇති වුණා. දැන් ඒ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යෑම සඳහා පාර්ලිමේන්තු ක්‍රියාදාමයක දැඩි අවශ්‍යතාව අපි කවුරුත් දකිනවා. That is essential; it is indispensable. You cannot do without it. ඉතින් එහෙනම් මේ අය ඒකට පැමිණෙන්නට ඕනෑ. ඇවිල්ලා ඕනෑ මතයක් ඉදිරිපත් කළාට ඒක ගැටලුවක් නොවෙයි. එම පක්ෂයට හා සෙසු පක්ෂවලට යෝජනා ඉදිරිපත් කරන්නට පුළුවන්. රජයයි, එක දේශපාලන පක්ෂයකුයි පමණක් එකහ වෙලා යම් ලියවිල්ලක් එම කමිටුවට ඉදිරිපත් කිරීමෙන් හැහෙන්නේ මොකක්ද?

එතකොට අනෙකුත් දේශපාලන පක්ෂවලට තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට, නියම දායකත්වයක් දැක්වීමට අවකාශ ලැබෙන්නේ නැහැ. එය විසඳුමක් නොවෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Minister, can you give me half a minute?

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
Yes, sure.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක්. ආණ්ඩුවට එය ක්‍රියාත්මක කරන්න පුළුවන් නේ. You can implement the Thirteenth Amendment.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සාධාරණ ලෙස පිළිගන්න ඕනෑ, අවුරුදු 25ක් තිස්සේ කිසිම රජයක් එය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කළේ නැහැයි කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්න විපක්ෂයේ සහයෝගය අවශ්‍ය නැහැ. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක්. ඒ සඳහා ජන මත විචාරණයක් අවශ්‍ය නැහැයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අනුමත කරලා තිබෙනවා. මට මතකයි 1986 දී ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තර්ක කරන කොට, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්න ජන මත විචාරණයක් අවශ්‍ය නැහැයි කියලා පැහැදිලිව කිව්ව බව.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
දැන් මොකක්ද ප්‍රශ්නය, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්න ආණ්ඩුවට පුළුවන්.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
අවුරුදු 30කට පමණ පෙර සම්මත වුණු දෙයකට යම් කිසි නවීකරණයක් සමාජයට අවශ්‍ය වනවා නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම තිබෙන එක ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි?

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවකට එන්න තිබෙන අසීරුතාව මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Minister -

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
Please do not take my time because I have other things to say. - [*Interruption.*]

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ප්‍රකාශ කරන පරිදි එය ක්‍රියාත්මක කරන්න ගිය සමහර අවස්ථාවලදී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු වුණත් උතුරේ පළාත් සභා විසුරුවා හැරියා. ඒ ඉතිහාසය ගැන දැන් කථා කරලා වැඩක් නැහැ. අපි අනාගතය ගැන හිතමු. අනාගතය ගැන හිතනවා නම්, මෙය ඉදිරියට ගෙන යෑම සඳහා තිබෙන ප්‍රායෝගික ක්‍රමවේදය තමයි, පාර්ලිමේන්තු කාරක සභාවක් තුළින් මේ වගකීම පිළිගැනීම. එය කරන්න රජය සූදානම්.

[ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා]

ඒ වාගේම ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා තවදුරටත් කිව්වා, තමිල්නාඩු ප්‍රාන්තය සමඟ සම්බන්ධය අපි -විදේශ කටයුතු අමාත්‍යාංශය- හරියට තක්සේරු කර නැහැ කියලා. ඒකත් සම්පූර්ණයෙන් වැරදියි. එතුමා දන්නවා, අවුරුදු 30කට පස්සේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාට නවදිල්ලියේ සිටින ජයලලිතා මහ ඇමතිතුමිය හමු වෙන්න කියලා අපි උපදෙස් දුන්නා. එහෙම සාකච්ඡාවක් වුණා 2009ට පස්සේ. යුද්ධය අවසන් වීමෙන් පසු ජයලලිතා මැතිනිය හා ප්‍රසාද් කාරියවසම් මැතිතුමා අතර, චෙන්නායි නගරයේ සාකච්ඡාවක් ඇති වුණා. අපි තමිල්නාඩු ප්‍රාන්තය එහෙම අමතක කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම 2009 නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තු කණ්ඩායමක් තමිල්නාඩු ප්‍රාන්තයෙන් අපේ රටට පැමිණියා. ඒ ගනුදෙනු එහෙමම කෙරුණා. ඒ වාගේම තමිල්නාඩු ව්‍යාපාරික මණ්ඩලය හා තමිල්නාඩු මන්ත්‍රීවරු ඉල්ලීමක් කළා, මිහින් ලංකා ගුවන් සේවය ක්‍රියාත්මක විය යුතු යුතුයි කියලා මදුරේ හා කොළඹ අතර. ඒවා අපි කළා. එතකොට ටුටිකෝරින් වරාය හා කොළඹ වරාය අතර නැව් සේවයක් අපි ආරම්භ කළා. ඒ සියල්ලක්ම කෙරුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ගරු මන්ත්‍රීතුමාත් දන්නවා, උතුරු ප්‍රදේශයේ දුම්රිය මාර්ග දියුණු කිරීම සම්බන්ධයෙන් සෑහෙන අවධානයක් යොමු වෙලා තිබෙන බව. එහි එක අරමුණක් වන්නේ, රාමේශ්වරන් හා තලෙයිමන්නාරම අතර නැව් සේවයක් ආරම්භ කිරීම. ඒ සියලුම විස්තර ඉදිරිපත් කිරීමට කාලය නැහැ. හැබැයි වන්දනා ක්ෂේත්‍රය, සංචාරක ක්ෂේත්‍රය, ව්‍යාපාරික ක්ෂේත්‍රය, සංස්කෘතික ක්ෂේත්‍රය යන මේ සෑම ක්ෂේත්‍රයකම අංග සම්පූර්ණ සම්බන්ධතාවක් ඇත්ත වශයෙන් තමිල්නාඩු ප්‍රාන්තය සමඟ තිබෙනවා.

උදාහරණයක් වශයෙන් කච්චතිවුවල තිබෙන ශාන්ත අන්තෝනි දේවස්ථානයට දකුණු ඉන්දියාවෙන් විශාල සංඛ්‍යාවක් එනවා. බොහොම උණුසුම් ලෙස, මිත්‍රශීලී ලෙස ඒ අය පිළිගෙන තිබෙනවා. ඒ වාගේම තමිල්නාඩු ප්‍රාන්තයක අපේ සමාජීය ආයතන කීයක් තිබෙනවාද? ව්‍යාපාරික ආයතන කීයක් තිබෙනවාද? මහාබෝධි කේන්ද්‍රස්ථානය, ලංකා බැංකුව, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ආයතනය, මිහින් ලංකා වාගේම ව්‍යාපාරික ප්‍රජාව වශයෙන් දම්රෝ, දංකොටුව පෝසිලේන් සමාගම, එයිටිකන් ස්පෙන්ස් සමාගම, සිලෝන් බිස්කට්ස් සමාගම, මන්ච් බිස්කට්ස් සමාගම ඒ සියල්ලක්ම තිබෙනවා. ක්‍රීඩා ක්ෂේත්‍රය ගත්තොත්, 1983න් පස්සේ ගෝපාලන් අභියෝගතා කුසලාන ක්‍රිකට් තරගය පැවැත්වුණා ලංකාව සමඟ. ඒ සබැඳියාව ප්‍රාණවත් කිරීමට අපි සෑහෙන උත්සාහයක් දරා තිබෙනවා. ඉතින් ඕනෑ තරම් උදාහරණ තිබෙනවා තමිල්නාඩුව හා ශ්‍රී ලංකාව අතර තිබෙන සම්බන්ධතාව ගැන.

දැන් මේ පොරොන්දු ඉෂ්ට කළේ නැහැ කියන විවේචනය ගත්තොත් ඒවා ව්‍යාකූල ප්‍රශ්න නේ. දැන් බලන්න, LLRC වාර්තාවේ යෝජනා අතර කෙටි කාලීනව ඉටු කරන්න පුළුවන් ඒවා සියයට 95ක් විතර අවසන්. හැබැයි භාෂා ප්‍රශ්නය තිබෙනවා; ඉඩම් ප්‍රශ්නය තිබෙනවා. බලන්න, ඉඩම් ප්‍රශ්නය කොච්චර ව්‍යාකූල ඉතිහාසයක් තිබෙන ප්‍රශ්නයක්ද කියලා. ඒක අවුරුදු තුනහමාරකින් විසඳන්න පුළුවන්ද? මේ සමඟ සංසන්දනය කරන්න පුළුවන් තත්ත්වයන් තිබෙනවා. There were post-conflict situations in other parts of the world; Cambodia, former Yugoslavia and so on. අවුරුදු තුනහමාරකින් මේ ප්‍රශ්න විසඳුණාද? එතැන එහෙම තර්කයක් වුණේ නැහැනේ, පොරොන්දු ඉෂ්ට වුණේ නැහැ, ඒ නිසා ජිනීවා නගරයේ මානව හිමිකම් මණ්ඩලයෙන් මේ විධියේ විශාල බලපෑම් කළ යුතුයි කියලා. ඒ කොහේවත් ඒවා වෙලා නැහැ. ඒක සාධාරණද, නැද්ද කියලා තීරණය කරන්න පුළුවන් වන්නේ කරුණු දෙකක් අනුවයි. එකක් ඒ අභියෝගවල ස්වභාවය හා ඒ අභියෝගවලට මුහුණ දීමට ඇති කාලපරිච්ඡේදය. අවුරුදු හතරක්වත් ගත වෙලා නැහැ. ඒ නිසා ඒක සාධාරණ තර්කයක් නොවෙයි. සමහර ඒවා ඉක්මනට කරන්න පුළුවන්. අවතැන් වුණු පුද්ගලයන් පිළිබඳ ප්‍රශ්න, බිම් බෝම්බ ඉවත් කිරීම වාගේ දේවල් සඳහා කාලයක් ගත වනවා.

දැන් බලන්න, අපේ ගරු යෝගරාජන් මන්ත්‍රීතුමා කිව්වා මේකට විසඳුම උතුරු ප්‍රදේශයන්හි දරිද්‍රතාවය ඉවත් කිරීමයි කියලා. එතුමාට හෘදය සාක්ෂියට අනුකූලව කියන්න පුළුවන්ද, ඒ සම්බන්ධයෙන් සෑහෙන ප්‍රගතියක් නැහැ කියලා. අවුරුදු හතර පහකට ඉස්සෙල්ලා උතුරු ප්‍රදේශයේ තිබුණු තත්ත්වය එක්ක අද තිබෙන තත්ත්වය සම්බන්ධ කරනවා නම් අහසයි, පොළොවයි වාගේ. ඒ පැතිවල වාරිමාර්ග දියුණු වෙලා; පාරවල්, දුම්රිය පොළවල් ඉදි වෙලා; ධීවර කර්මාන්තය දියුණු වෙලා. මේවා නැහැ කියන්න බැහැ. ඒ වාගේම රක්ෂා සපයනවා. මහජන බැංකුව, ලංකා බැංකුව ඇතුළු රජයේ බැංකු තිබෙනවා. Then, there are private banks also. The HSBS is there. ඒ වාගේම ධීවර කර්මාන්තය ප්‍රාණවත් කිරීමට, කෘෂි නිෂ්පාදන අපනයනය කිරීමට අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා.

අපි ඉන්දීය රජය සමඟ සාකච්ඡා කර ගෙන යනවා. ඒවා දැමිළ ධීවරයන්ට තිබෙන මත්ස්‍ය සම්පත්. බෝට්ටු විශාල ප්‍රමාණයක් එනවා නේ. ඒ නිසා ඒ පිළිබඳව යමක් කළ යුතුයි. ඒ අය සිංහල ධීවරයන් නොවෙයි, දැමිළ ධීවරයන්. ඒ අයගේ සුබසිද්ධිය පිළිබඳව ඇප කැප වෙලා තිබෙන රජයක් ඒ සම්බන්ධයෙන් යමක් කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් අපි කථා කර ගෙන යනවා. ඒ අය උනන්දුවක් දක්වන්නේ නැහැ කියා මා කියන්නේ නැහැ.

පසුගිය අවුරුදු තුන ඇතුළත ආර්ථිකය සම්බන්ධයෙන් ප්‍රගතියක් ලබා නැහැ කියා කිසිම කෙනෙකුට කියන්න බැහැ. සමස්ත රටේ ආර්ථික සංවර්ධනය හා උතුරු ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය අතර සෑහෙන වෙනසක් තිබෙනවා.

ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ප්‍රකාශය ගැනත් සඳහන් වුණා. එතුමා කිසිසේත් කිව්වේ නැහැ, සහයෝගය අවශ්‍ය නැහැ කියා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. එතුමා කිව්වේ වෙන දෙයක් නේ. එතුමා කිව්වේ ජාතික ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සහයෝගය දීම සඳහා ගිවිසුමක් අවශ්‍ය නැහැ කියායි. ඒ දෙක වෙනස්. එකම දෙයක් නොවෙයි නේ. එතුමා කිව්වේ ජාතික ප්‍රශ්නයක් සම්බන්ධයෙන් එකට වැඩ කිරීමට MoU එකක් හෝ ගිවිසුමක් අවශ්‍ය නැහැ කියායි. එහෙම නැතිව කිසිසේත් සහයෝගය ප්‍රතික්ෂේප කිරීමක් කළේ නැහැ. ඒක නිවැරදි කළ යුතු දෙයක්.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, ඉන්දියාව අපේ හිතවතාය කියලා. ඒක අපි සම්පූර්ණයෙන් අනුමත කරනවා. ඉන්දියාවයි, ලංකාවයි අතර හැම ක්ෂේත්‍රයකින්ම ශත වර්ෂ ගණනක සමීප සම්බන්ධතාවක් තිබෙනවා. ඒ නිසා මේක රටවල් දෙක අතර තිබෙන විරසකයක් නොවෙයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි කැමරා පාවිච්චි කරන්නේ දෙපැත්තටම වටිනා ඒ සම්බන්ධය පළුදු කිරීමටයි. අපි කොහෙත්ම එවැනි දෙයක් වෙන්න ඉඩ දිය යුතු නැහැ. ඒ නිසා මට සාරාංශයක් හැටියට කියන්න තිබෙන්නේ මේකයි. තමිල්නාඩු ප්‍රාන්තය සමඟ තිබෙන සමීප සම්බන්ධතාවයේ වටිනාකම අපි හොඳ හැටි දන්නවා, නොදන්නවා නොවෙයි. නමුත් ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අනාගතය පිළිබඳ තීන්දු ගත යුත්තේ අපේ

රටේ ජනතාවගේ සුබසිද්ධිය පිළිබඳව හිතලායි. අපට කෙතරම් සමීප වුණත්, කෙතරම් මිත්‍රශීලී සම්බන්ධතා තිබුණත් මේ රටේ ජනතාවට හිතකර විධියට තමයි අවසානයේ මේ විසඳුම් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට අපි උත්සුක විය යුත්තේ. විදේශ ප්‍රතිපත්තිය කියන්නේ හුදකලාව නිර්මාණය කරන්න පුළුවන් දෙයක් නොවෙයි. දේශීය ගැටලු හා විදේශ ප්‍රතිපත්ති අතර සමීප සම්බන්ධතා තිබෙනවා. The foreign policy cannot be evolved in isolation. It is an instrument for the implementation of a holistic national policy. So, we have to give pride of place to the priorities and requirements of our own nation. That is very important. ඒ කියන්නේ, තමිල්නාඩු ප්‍රාන්තය සමහ හෝ වෙන රටක් සමග තිබෙන සමීප සම්බන්ධතාවය අවතක්සේරු කිරීමක් නොවෙයි. No two countries will agree on everything. No two sets of interest will coincide with regard to everything. So, in those situations, we have to give primacy to the national interest.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා බොහොම විශ්ලේෂණාත්මක ලෙස එතුමාගේ පැත්තෙන් අදහස් ඉදිරිපත් කළා. රජය වෙනුවෙන් මට කියන්න තිබෙන්නේ අප මේ පිළිබඳව දැඩි උත්සාහයක් දරනවාය කියන එකයි. භික්ෂූන් වහන්සේලාට පහර දීම වැනි දේවල් ඉතා සුළු පිරිසක් ඇති කරන ප්‍රශ්න. තමිල්නාඩු ප්‍රාන්තයේ හැම කෙනෙකුම ඒවා අනුමත කරන්නේ නැහැ. ඒ නිසා මේ ජාතික අරමුණු ඉෂ්ට කර ගැනීමේ ජාතික කර්තව්‍යය සම්බන්ධයෙන් එතුමාගේ නොමසුරු සහයෝගය ලබා දෙන්නය කියා අපි ඒ ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

එකල්හි වේලාව අ.භා. 7.30 වූයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2013 මාර්තු 22 වන සිකුරාදා අ.භා. 1.30 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது, பி.ப. 7.30 மணியாகிவிடவே குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2013 மார்ச் 22, வெள்ளிக்கிழமை பி.ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 7.30 p.m., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament without Question put.*

Adjourned accordingly until 1.30 p.m. on Friday, 22nd March, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.


சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 216 - இல. 8
Volume 216 - No. 8

2013 මාර්තු 22 වන සිකුරාදා
2013 மார்ச் 22, வெள்ளிக்கிழமை
Friday, 22nd March, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත:
නියෝගය

කල්තැබීමේ යෝජනාව:
වෙනිසියුලාවේ බොලිවේරියානු ජනරජයේ ජනාධිපති අතිගරු හියුගෝ චාවේස් මැතිතුමාගේ අභාවය

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

முத்திரைத் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டம்:
கட்டளை

ஒத்திவைப்புப் பிரேரணை:
வெனிசூலா பொலிவேரிய குடியரசு ஜனாதிபதி மேதகு ஹியுகோ சாவேஸ் அவர்களின் மரணம்

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

STAMP DUTY (SPECIAL PROVISIONS) ACT:
Order

ADJOURNMENT MOTION:
Demise of His Excellency Hugo Chavez President of the Bolivarian Republic of Venezuela

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මාර්තු 22වන සිකුරාදා
2013 மார்ச் 22, வெள்ளிக்கிழமை
Friday, 22nd March, 2013

අ.භා. 1.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

පාරාළුමන්ත්‍රම් පි.ප. 1.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.30 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY]
in the Chair.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XII වැනි කොටස සහ හයවැනි කාණ්ඩයේ XII, XIII, XIV, XV සහ XVI වැනි කොටස් සහ 2011 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ II සහ III වැනි කොටස්, දෙවැනි කාණ්ඩයේ VIII සහ IX වැනි කොටස්, තුන්වැනි කාණ්ඩයේ II වැනි කොටස, හතරවැනි කාණ්ඩයේ V වැනි කොටස සහ හයවැනි කාණ්ඩයේ I සහ II වැනි කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාවේ එකී කොටස් මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වගන්තියේ (3) උපවගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 20 වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව 2013 මාර්තු 01 දිනැති අංක 1799/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මේ ගැසට් නිවේදනය ඉදිරිපත් කර තිබීම ගැන අපි සතුටු වෙනවා. ශ්‍රී ලාංකිකයෝ විශාල සංඛ්‍යාවක් මද්‍යසාර පාවිච්චි කිරීම නිසා අසනීප තත්ත්වයේ පසු වන බව අද අපි දකින දෙයක්. නීත්‍යානුකූලව නිපදවන සමාගම්වලට මේක අසාධාරණයක්. මෙය තහනම් කරන්න මෙච්චර කල් හිටපු එකත් වැරැදියි. මේක කලින්ම කරන්න තිබුණු දෙයක්. කෙසේ වෙතත් ප්‍රමාද වෙලා හෝ ඒ කරන ලද කටයුත්තට අපේ පූර්ණ සහයෝගය දෙනවාය කියන එක මේ අවස්ථාවේ සඳහන් කරනවා.

2010 වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික පාලන වාර්තාව.- [ක්‍රීඩා අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

උපදේශක කාරක සභා වාර්තා
ஆலோசனைக் குழு அறிக்கைகள்
CONSULTATIVE COMMITTEE REPORTS

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2011 වර්ෂය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව;
2. 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වාර්ෂික වාර්තාව;
3. 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව;
4. 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;
5. 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

6. 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව;
7. 2011 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව;
8. 2011/2012 වර්ෂය සඳහා ඩී.එෆ්.සී.සී. බැංකුවේ විගණකවරුන්ගේ වාර්තාව හා ගිණුම්;
9. 2011 වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව;
10. 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;
11. 2011 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;
12. 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;
13. 2011 වර්ෂය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ
14. 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දොරවක, තල්ලියැද්ද, "වන්දුසිරි" නිවසෙහි පදිංචි කේ.එස්. පෙරේරා මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petition ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 3-2505/'12-(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 4-2634/'12-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 9-2506/'12- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා. අද සිකුරාදා දවස, කල් ඉල්ලන දවස බවට පත් වෙලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10-2635/'12-(1), ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නය අහනවා. ඒකට උත්තරය තිබෙනවා නේද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
උත්තරය නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒ ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මත්‍රොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 14 - 2507/'12-(2), ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
මේකෙන් නම් ගැළවෙන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ ප්‍රශ්නය අහන්නේ දෙවැනි වතාවටයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. මොකද, ඇතා වැටුණ වැව ගැන අහන්නේ. ඇතා වැටුණ තැන හරියට සොයලා දෙන්න අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මත්‍රොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 15-2636/'12-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පස්සේ මම සිකුරාදා දවස්වලට ප්‍රශ්න අහන්නේ නැතිව ඉන්නවා. මොකද, එතකොට ඇමතිවරුන්ට එන්න ඕනෑත් නැහැ, අපි එන්න ඕනෑත් නැහැ, පාඩුවේ හිටියා නම් හරි.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
ඒ විධියට තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. භාගයක් ප්‍රශ්න අහපු අය නැහැ. භාගයක් උත්තර දෙන අය නැහැ. එතකොට සියයට 100ක්ම උත්තර දෙන්නේ නැහැ. අද විශේෂිත දවසක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
මොකද, අද කොහේ හරි වටලන්න ගිහිල්ලාද?

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මේ ප්‍රශ්නයට පිළිතුර දෙනවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන්, මා ඒ ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මත්‍රොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
ප්‍රශ්න පහළොවෙන් හතකට ඇමතිවරු නැති නිසා පිළිතුරු ලැබුණේ නැහැ. ප්‍රශ්න අටක අහන මන්ත්‍රීවරු නැහැ. දැන් දෙවැනි වටය.

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි සහ වාහන: කුලිය/ බද්ද

வெகுசன ஊடக, தகவல் அமைச்சுக்குச் சொந்தமற்ற கட்டிடங்கள் மற்றும் வாகனங்கள் : வாடகை/குத்தகை

BUILDINGS AND VEHICLES NOT BELONGING TO MINISTRY OF MASS MEDIA AND INFORMATION: RENT/ LEASE

2243/'12

1. **ගරු අජිත් පී. පෙරේරා මහතා - (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා - මාණ්පුමිකු රවි කරුණානායක්ක සාර්පාග)
(The Hon. Ajith P. Perera on behalf of the Hon. Ravi Karunanayake)
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට ලබාගැනීම සඳහා දරන ලද මුළු පිරිවැය කවරේද;

(ii) එක් එක් ගොඩනැගිල්ලේ වර්ග අඩියක් සඳහා කුලිය සහ කුලී හෝ බදු කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අමාත්‍යාංශයට අයත් නොවන ආයතනවලින් කුලියට හෝ බද්දට වාහන ලබාගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(iv) කුලියට හෝ බද්දට ලබාගත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(v) අමාත්‍යාංශය විසින් බාහිරින් ලබාගත් අනෙකුත් සේවාවන් කවරේද;

(vi) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවාවන් වෙනුවෙන් දරන ලද පිරිවැය කොපමණද;

(vii) අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව කොපමණද;

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(viii) බාහිරින් සේවා ලබා ගැනීමේ පදනම යටතේ ගිවිසුම්වලට එළැඹ සේවය සපයන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න 2012 වර්ෂය සඳහා එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

වෙකුසන ඌටක, තකවල් අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) 2012 ஆம் ஆண்டில்,

(i) වෙකුසන ඌටක, තකවල් අමෙච්සුක්කුච් සොන්තමල්ලාත කට්ටිටඞ්කළින් වාටකෙක් කාක ඒර්පට්ට මොත්ත සෙලවිනත්තෙයුම්;

(ii) තනිත්තනියාක ඔව්වොරු කට්ටිටත්තිනුම්, සතුර අටික්කාන කට්ටණම් මර්රුම් කුත්තකෙ අල්ලතු වාටකෙක්කාන කාලප්පකුතියෙයුම්;

(iii) අමෙච්සුක්කුච් සොන්තමිල්ලාත අමෙප්පුකළිට මිරුන්තු වාටකෙක්කු අල්ලතු කුත්තකෙක්කුප් පෙර්ර වාකනඞ්කළ්මීතු සෙලවිටප්පට්ට මොත්තත් තොකෙයෙයුම්;

(iv) වාටකෙක්කුප් පෙරප්පට්ට අල්ලතු කුත්තකෙක්කුප් පෙරප්පට්ට මොත්ත වාකනඞ්කළින් එණ්ණික්කෙයෙයුම්;

(v) අමෙච්සිනාල් වෙළියිලිරුන්තු පෙර්රුක් කොළ්ළප්පට්ට ඒනෙය සේවෙකළෙයුම්;

(vi) ඉව්වාරු වෙළියිලිරුන්තු පෙර්රුක්කොළ්ළප් පට්ට සේවෙකළ්මීතු ඒර්පට්ට සෙලවිනත් තෙයුම්;

(vii) අමෙච්සින් මොත්ත පණියාට්ටොකුති යිනරින් එණ්ණික්කෙයෙයුම්;

(viii) වෙළියිලිරුන්තු පෙර්රුක්කොළ්ළල් අටිප් පටෙයිල් ඔප්පන්තම් සෙය්තුකොළ්ළප්පට්ට ආට්කළින් එණ්ණික්කෙයෙයුම්

අවර් වෙව්වේරාකත් තෙරිවිප්පාරා?

(ஆ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Mass Media and Information:

(a) Will he state for the year 2012 -

(i) the total cost incurred for renting buildings which are not owned by the Ministry of Mass Media and Information;

(ii) the rate per square foot and the period of lease or rent of each building separately;

(iii) the total amount spent on renting or leasing of vehicles from entities not belonged to the Ministry;

(iv) the total number of vehicles rented or leased;

(v) the other services outsourced by the Ministry;

(vi) the cost incurred for the aforesaid outsourced services;

(vii) the total staff strength of the Ministry; and

(viii) the number of persons contracted on outsourced basis?

(b) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට ලබාගෙන නැත.

(ii) අදාළ නොවේ.

(iii) වාහන කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය වැය කළ මුළු මුදල 2012 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා - රුපියල් 2,452,500.00

(iv) 2012 වර්ෂය

ජනවාරි සිට ජූලි මස දක්වා වාහන 06 බැගින් කුලියට ගෙන ඇති අතර, අගෝස්තු මස සිට වාහන 05 බැගින් කුලියට ගෙන ඇත.

(v) ආරක්ෂක සේවා, පවිත්‍රතා සේවා, පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර නඩත්තු හා සේවා කිරීම, වායු සමීකරණ නඩත්තු හා සේවා කිරීම.

(vi) **අමාත්‍යාංශය සඳහා**

ආරක්ෂක සේවා සඳහා වැය කළ මුළු මුදල

2012 ජනවාරි සිට නොවැම්බර් මස දක්වා - රුපියල් 905,973.08

පවිත්‍රතා සේවා සඳහා වැය කළ මුළු මුදල

2012 ජනවාරි සිට නොවැම්බර් මස දක්වා - රුපියල් 2,157,492.57

පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර නඩත්තු හා සේවා කිරීම - රුපියල් 412,395.00

වායු සමීකරණ නඩත්තු හා සේවා කිරීම - රුපියල් 182,350.00

රන්මිහිකැන්න ටෙලි සිනමා උද්‍යානය සඳහා

ආරක්ෂක සේවා සඳහා වැය කළ මුළු මුදල

2012 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා - රුපියල් 2,398,847.79

පවිත්‍රතා සේවා සඳහා වැය කළ මුළු මුදල

2012 ජනවාරි සිට ඔක්තෝබර් මස දක්වා - රුපියල් 3,404,507.03

(vii) 131

(viii) ගිවිසුම්වලට එළඹ, බාහිරින් පුද්ගලයන්ගේ සේවා ලබාගැනීම් නොමැත.

(ආ) අදාළ නොවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 2-2266/'12-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 5-2978/'12-(1), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය : පියවර
மொழிக் கொள்கை மீறல் : நடவடிக்கை
VIOLATION OF LANGUAGE POLICY: STEPS TAKEN

3171/'12

6. **ගරු අජිත් පී. පෙරේරා මහතා - (ගරු ඊ. සරවනපවන් මහතා වෙනුවට)**
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා - மாண்புமிகு ஈ. சரவணபவன் சார்பாக)
(The Hon. Ajith P. Perera on behalf of the Hon.E. Saravanapavan)
ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වන්නේ නම්, එයට එරෙහිව දැඩි පියවර ගන්නා බවට කළ තම ප්‍රකාශය අනුව කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ නම්, දෙමළ මාධ්‍ය පාසල්වල විදුහල්පතිවරුන්ට සිංහල භාෂාවෙන් පමණක් යොමු කෙරෙන ශ්‍රී ලංකා විදුහල්පති සේවාවේ උසස්වීම් පිළිබඳ සියලු ලිපි ලේඛනවල දෙමළ පිටපත් ද අදාළ පාසල්වලට ලැබීම සහතික කරලීමටත්;

(ii) සේවක අර්ථසාධක අරමුදල විසින් තමන්ගේ ප්‍රතිලාභීන්ගෙන් දෙමළ මාධ්‍යයෙන් ලැබෙන ඉල්ලීම් ලිපිවලට සිංහල භාෂාවෙන් පමණක් පිළිතුරු යැවීම වෙනුවට දෙමළ මාධ්‍යයෙන්ම පිළිතුරු ලබා දීම සඳහා අදාළ ආයතන යොමු කරවීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) மொழிக் கொள்கை மீறப்படுமாயின் அதற்கெதிராக கடும் நடவடிக்கை எடுப்பதாக வெளியிட்டுள்ள தமது கூற்றுக்கு அமைய நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) ஆமெனில், தமிழ் மொழி மூலமான பாடசாலைகளின் அதிபர்களுக்கு சிங்கள மொழியில் மாத்திரம் அனுப்பப்படுகின்ற இலங்கை அதிபர் சேவையின் பதவி உயர்வுகள் தொடர்பான சகல ஆவணங்களினதும் தமிழ்ப் பிரதிகள் உரிய பாடசாலைகளுக்குக் கிடைப்பதை உறுதி செய்வதற்கும்;

(ii) ஊழியர் சேமலாப நிதியமானது, அதன் பயனாளிகளிடமிருந்து தமிழ் மொழிமூலம் கிடைக்கின்ற கோரிக்கைகளுக்கு சிங்கள மொழியில் மாத்திரம் பதில் அனுப்புவதற்குப் பதிலாக தமிழ் மொழியிலேயே பதில் வழங்க உரிய நிறுவனங்களை ஆற்றுப்படுத்துவதற்கும்

நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of National Languages and Social Integration:

(a) Will he state whether action will be taken in line with the statement made by him to the effect that stern action will be taken in the event of any violation of the Language Policy?

(b) Will he inform this House -

(i) if so, whether steps will be taken to ensure that copies of all the documents pertaining to promotions in the Sri Lanka Principles' Service, which are currently forwarded only in Sinhala language to the principles of Tamil-medium schools, will be sent to the relevant schools in Tamil language; and

(ii) whether steps will be taken to direct the relevant institutions to respond in Tamil language itself instead of responding only in Sinhala language when replying letters of request received from the beneficiaries of Employees' Provident Fund in Tamil language?

(c) If not, why ?

ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිළිතුර සූදානම්. ප්‍රශ්නය අසා තිබෙන ගරු මන්ත්‍රීතුමා පැමිණ නැති නිසා මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) ඔව්.

එසේ යවන ලද ලිපි පිටපත් අප වෙත හෝ රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට ලැබීමට සැලැස්වූවහොත් එය නිවැරදි කර දීමටත්, දෙමළ භාෂා පිටපත් යැවීමට සැලැස්වීමටත් කටයුතු කළ හැක. තවද, මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යැවීමට කටයුතු කරමි.

(ii) ඔව්.


සේවක ප්‍රනිලාභීන් වෙත සිංහලෙන් පමණක් ලැබී ඇති ලිපි පිටපත් ලබා දුනහොත් ඔවුන්ට දෙමළ බසින් ලිපි ලැබීමට සැලැස්විය හැක. තවද, සේවක අර්ථසාධක අරමුදල් අංශයේ කොමසාරිස් වෙත රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් අවවාදාත්මක ලිපියක් යැවීමට කටයුතු කරමි.

දැනටමත් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති විසින් මීට අදාළව යවනු ලැබ ඇති ලිපියක පිටපතක් ඇමුණුම 01 ලෙස දක්වා ඇත.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් පවරමින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත යොමු කරන ලද ලිපියේ පිටපතක්ද ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

(ඇ) පැන නොනඟී.

ඇමුණුම 01




රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
அரசகரும மொழிகள் ஆணைக்குழு
OFFICIAL LANGUAGES COMMISSION

රාභාකො/දෙපාර්/12

2012.12. 06

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම



ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
அரசியலமைப்பு அலுவல்கள் மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சு
Ministry of Constitutional Affairs and National Integration

CANI/LPD/Del.Res./2009

2010.04.9

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් පැවරීම.

[මෙම ලිපි පුස්තකාලයේ ද තබා ඇත.]

[இந்தக் கடிதங்கள் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]

[These letters are also placed in the Library.]

නියෝජ්‍ය කථානායකතුමා

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

ප්‍රශ්න අංක 7-2245/'12-(2), ගරු රවි කරුණානායක මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා

(மாண்புமிகு அஜித் பீ. பெரேரா)

(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ටී.බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)

(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

ප්‍රශ්න අංක 8-2439/'12-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

උසස් ජාතික ඉංජිනේරු සහ ප්‍රාචීන භාෂෝපකාර ඩිප්ලෝමාධාරීන් : රජයේ පත්වීම්

உயர் தேசிய பொறியியல் மற்றும் கீழைத்தேய மொழிகள் டிப்ளோமாதாரிகள்:அரச நியமனங்கள்

DIPLOMA HOLDERS OF HIGHER NATIONAL ENGINEERING AND ORIENTAL LANGUAGES : GOVERNMENT APPOINTMENTS

2979/'12

11.ගරු අජිත් පී. පෙරේරා මහතා - (ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවට)
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා - මාණ්පුමිකු අකිල විරාජ් කාරියවසම් சார்பாக)
(The Hon. Ajith P. Perera on behalf of the Hon. Akila Viraj Kariyawasam)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ 2,000ක පමණ පිරිසකට රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලබා නොදීමටත්;

(ii) ප්‍රාචීන භාෂෝපකාර විභාගය සමත් ඩිප්ලෝමාධාරීන් සඳහා වැඩසටහන් නිලධාරි තනතුරු ලබා නොදීමටත්;

රජය තීරණය කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව සහ ප්‍රාචීන භාෂෝපකාර විභාගය අවසන් කර රැකියා අපේක්ෂාවෙන් සිටින සංඛ්‍යාව කොපමණද;

(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ට රජයේ ස්ථිර පත්වීම් ලබා නොදීමට තීරණය කිරීමට හේතු කවරේද;

(iii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ට රජයේ පත්වීම් සහ ප්‍රාචීන භාෂෝපකාර විභාගය සමත්වූවන්ට වැඩසටහන් නිලධාරි තනතුරු ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உயர் தேசிய பொறியியல் டிப்ளோமா பாட நெறியைக் கற்ற சுமார் 2000 பேருக்கு அரச சேவையில் நிரந்தர நியமனங்களை வழங்கா திருப்பதற்கும்;

(ii) கீழைத்தேய மொழிகள் தொடர்பான பரீட்சையில் சித்தியடைந்த டிப்ளோமாதாரிகளுக்கு நிகழ்ச்சித்திட்ட உத்தியோகத்தர் பதவிகளை வழங்காதிருப்பதற்கும்

அரசாங்கம் தீர்மானித்துள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) தற்போது உயர் தேசிய பொறியியல் டிப்ளோமாவையும் கீழைத்தேய மொழிகள் தொடர்பான பரீட்சையையும் பூர்த்திசெய்து தொழில் எதிர்பார்ப்புடன் இருப்போரின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) உயர் தேசிய பொறியியல் டிப்ளோமாதாரிகளுக்கு அரச நிரந்தர நியமனங்கள் வழங்கா திருப்பதற்கு தீர்மானிக்கப்பட்டமைக்கான காரணங்கள் யாவையென்பதையும்;

(iii) உயர் தேசிய பொறியியல் டிப்ளோமாதாரிகளுக்கு அரச நியமனங்களையும் கீழைத்தேய மொழிகள் தொடர்பான பரீட்சையில் சித்தியடைந்தோருக்கு நிகழ்ச்சித்திட்ட உத்தியோகத்தர் பதவிகளையும் வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Is he aware that the Government has decided -

(i) not to give permanent appointments in the Public Service to a group of about 2,000 who followed the Higher National Diploma in Engineering; and

(ii) not to give Programme Officer appointments to diploma holders who have passed the Examination in Oriental Languages?

(b) Will he state -

(i) the number of individuals expecting jobs after completing the Higher National Diploma in Engineering and the Examination in Oriental Languages, at present;

(ii) the reasons for deciding not to give permanent appointments in the Public Sector to diploma holders of Higher National Diploma in Engineering; and

(iii) whether action will be taken to give Government appointments to holders of Higher National Diploma in Engineering and Programme Officer positions to those who have passed the Examination in Oriental Languages?

(c) If not, why ?

ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) එවැනි ඉල්ලීම් ලැබී නොමැත.

(ii) නැත.

මෙවැනි ඉල්ලීම් රජයට ලැබී නැත. එම නිසා ඒ ගැන රජය තීරණයක් ගෙන නොමැත. ප්‍රාචීන භාෂෝපකාර විභාගය සමත් ඩිප්ලෝමාධාරීන් සඳහා වැඩසටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාව යටතේ සලකා නොලැබෙන්නේ එහි දක්වා ඇති සුදුසුකම්වලට අනුකූල නොවන බැවිනි.

(ආ) (i) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට එවැනි ඉල්ලීම් ලැබී නැත. එලෙසම එවැනි තොරතුරු පද්ධතියක් මෙම අමාත්‍යාංශය මඟින් නඩත්තු නොකෙරේ.

(ii) එවැනි තීරණයක් ගෙන නොමැත. එම නිසා අදාළ නොවේ.

(iii) නැත.

වැඩසටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලබා දීමේදී අධ්‍යාපන සුදුසුකම් වනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් පමණක් වන අතර වෙනත් අධ්‍යාපන සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට මෙම සේවා ව්‍යවස්ථාව යටතේ අවස්ථාව සලසා නොමැත.

(ඇ) අදාළ නොවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 12-2314/'12-(2), ගරු රවි කරුණානායක මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13-2446/'12-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දෙන්න මේ වෙලාවේ වැදගත් රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න. මා ඔබතුමාගේත්, මේ ගරු සභාවේත් අවධානය යොමු කරවනවා විශේෂයෙන් පාර්ලිමේන්තුව තුළ අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය, ඒ වාගේම ස්ථාවර නියෝග කෙරෙහි, Practice and Procedure of Parliament: M.N. Kaul, S.L. Shakdher.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහි 961වැනි පිටුවේත්, 962වැනි පිටුවේත්, 963වැනි පිටුවේත් මෙන්න මේ ආකාරයට සඳහන් වෙනවා.

"මන්ත්‍රීවරයා විසින් කථානායකතුමාට පූර්ව දැනුම් දීමක් සිදු කර එතුමාගේ අවසරය ලබා ගෙන නොමැති නම් සහ අදාළ අමාත්‍යවරයා විසින් පිළිතුරක් ලබා දීම පිණිස අදාළ කරුණ පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමට හැකි වන පරිදි එම අමාත්‍යවරයා දැනුවත් කර නොමැති නම් මන්ත්‍රීවරයකු විසින් කිසියම් පුද්ගලයකුට එරෙහිව අපකීර්තිය ගෙන දෙන හෝ දෝෂාරෝපණ සිදු කරන ස්වභාවයේ කිසිදු චෝදනාවක් එල්ල නොකළ යුතුය."

ඒ වාගේම එහි මේ විධියටත් සඳහන් වෙලා තිබෙනවා:

"මන්ත්‍රීවරයකු විසින් චෝදනාවක් එල්ල කිරීමේදී සැලකිලිමත් වීම අවශ්‍ය වේ. මන්ත්‍රීවරයකු තම තොරතුරු මූලාශ්‍ර ...."

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ point of Order එක අවසන් නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the relevancy of that to this point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, it is very relevant. You would understand if you give me a hearing. I am quoting from Kaul and Shakdher. - [*Interruption.*] So, let me kindly finish my point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Under what Standing Order are you raising it? - [*Interruption.*] Let me give him a hearing.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I am trying to exhibit an abrogation of the Standing Orders that had taken place and bring it to your notice. So, please give me an opportunity.

මට අවස්ථාව දෙන්න, මේ පාර්ලිමේන්තු ක්‍රියාදාමය තුළ සිදු වුණු අකටයුත්තක් පිළිබඳවයි ඔබතුමාට මගේ මේ ඉදිරිපත් කිරීම.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ point of Order එක ඉවර කරන්න ඉඩ දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, had there been any such breach of Standing Orders, you can bring it to the notice of the Hon. Speaker at the Party Leaders' Meeting. There is no provision to raise such matters as points of Order.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේ ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි, විශේෂයෙන්ම ඊයේ දවසේ මේ සභාව තුළ,-[බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දවසේ ප්‍රශ්නය සම්බන්ධව තීන්දුවක් දී අවසානයි. [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සියලුම ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින්, සියලුම පාර්ලිමේන්තු සම්ප්‍රදායන් උල්ලංඝනය කරමින්-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තීන්දුවක් දී අවසානයි. මූලාසනය විසින් තීන්දුවක් දෙන ලද කාරණයක් සම්බන්ධව නැවත නැවත ප්‍රශ්න කිරීමට අවස්ථාව නැත. [බාධා කිරීම්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I have not finished.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, what is your point of Order in short?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, this Hon. Member is making a statement against the Standing Orders . It cannot be allowed. If he wants to make a statement he must see the - [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒ කරුණ ඉදිරිපත් කිරීමට පුළුවන්. නමුත් point of Order එකක් හැටියට ඉදිරිපත් කිරීමට නොහැකියි, මූලාසනය විසින් තීන්දුවක් දී තිබෙන කාරණයක් සම්බන්ධව.[බාධා කිරීම්] තීන්දුවක් දී තිබෙන කාරණයක් සම්බන්ධව නැවත කථා කිරීමට නොහැකියි.

ප්‍රධාන කටයුතු අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 -මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත යටතේ-.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
අද මුළු දවසම ගත කරන්නේ මුද්දර ගාස්තු ගැන සාකච්ඡා කරන්නද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
One hour for the Order under the Stamp Duty (Special Provisions) Act and thereafter the Adjournment Motion on the late His Excellency Hugo Chavez will be taken up.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඇයි? ඒකයි මට දැන ගන්න ඕනෑ. වාවේස් ජනාධිපතිතුමාගේ අභාවය ගැන ශෝක ප්‍රකාශයක් කළා, මාර්තු 8 වනදා.

ශෝක ප්‍රකාශයක් දෙවතාවක් කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. අපි ඔක්කොම ශෝක වෙනවා, ඒ ජනාධිපතිතුමාගේ මරණය පිළිබඳව. එහෙත් එතුමාගේ අභාවය ගැන හෝ වෙන කාගේ හරි අභාවය ගැන හෝ අපි ශෝක ප්‍රකාශ කරන්නේ එක සැරයයි; එක අවස්ථාවක විතරයි. 2013 මාර්තු 08 වැනි දා හැන්සාඩ් වාර්තාවට අනුව, අපේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා පළමුවෙන්ම කථානායකතුමාගෙන් අවසර අරගෙන වාවේස් ජනාධිපතිතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුව වෙනුවෙන්, ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ශෝකය පළ කර සිටියා. අතිගරු ජනාධිපති -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
එක් කෙනෙක් කථා කර ඉවර කළාම තමයි අනික් එක්කෙනාට අවස්ථාව දෙන්නේ.

එතුමා අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද ශෝක ප්‍රකාශයත් කිව්වා. ඊට පස්සේ ජෝන් අමරතුංග මැතිතුමාත් කථා කළා. අනුර දිසානායක මන්ත්‍රීතුමාත් කථා කළා. අනතුරුව කථානායකතුමා මෙහෙම කියලා තිබෙනවා:

> "වෙනිසියුලාවේ ජනාධිපති හියුගෝ වාවේස් මැතිතුමාගේ අභාවය පිළිබඳ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද ශෝක ප්‍රකාශ මමද අනුමත කරමි."

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මට කථාව ඉවර කරන්න දෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් තිබෙන්නේ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය ගැන සාකච්ඡා කරන්නයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ගරු විපක්ෂ නායකතුමාගේ කථාවෙන් අනතුරුව ඔබතුමා කථා කරන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මගේ කථාව අවසන් කරන්න ඉඩ දෙන්න. මෙතුමා ගත්ත පියවර හරි. Public Businessවල order එක අනුව Stamp Duty (Special Provisions) Act එක යටතේ Order එක දැන් සාකච්ඡාවට ගත්තා. ශෝක ප්‍රකාශ ගන්න තිබෙන්නේ ඒකට කලින්. ශෝක ප්‍රකාශයක් ඊට පස්සේ ගන්න බැහැ. එක සැරයක් ශෝක ප්‍රකාශයක් කළාට පස්සේ - [බාධා කිරීමක්] එහෙනම් මාර්තු 08 වැනිදා ශෝක ප්‍රකාශයක් නොකර ඉන්න තිබුණා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
යෝජනාවක් ඉදිරිපත් කළේ නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
යෝජනාවක් කළා. යෝජනාවක් කර තිබෙන්නේ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
That is in black and white.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
කථානායකතුමා එම ශෝක ප්‍රකාශය අනුමත කළා. මේක ඔබතුමා කියවනවා නම්, the Hon. Speaker has endorsed the sentiments expressed by both sides. So, I am asking -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Leader of the Opposition, today there is no Vote of Condolence.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඇහුම්කන් දෙන්න, මම කියන දෙයට. මේ සභාව තුළ ශෝක ප්‍රකාශයක් ඉදිරිපත් කළ හැක්කේ එක සැරයයි. මෙතැන තිබෙන්නේ එක ප්‍රශ්නයක් විතරයි. [බාධා කිරීම්] So, Hon. Dinesh Gunawardena, can we - [*Interruption.*]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පක්ෂ නායක රැස්වීමේදී සිද්ධ වුණු දේවල් මෙතුමා දන්නේ නැහැ. ඒවා මොකක්වත් දන්නේ නැතිවයි මේ කථා කරන්නේ.

Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Leader of the Opposition, can you conclude your speech?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Yes. The point of Order is, let me and the Chief Government Whip talk this over. We do not want to have a precedent where we have a Vote of Condolence taken up twice.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Chief Government Whip.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Deputy Speaker, if I could explain, there is no Vote of Condolence resolution. So, do not confuse the issue. At the moment, there is no resolution. There is an Adjournment Motion. We have gone into this and the Party Leaders agreed to that principle on that basis. So, we will - [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභාවප්‍රාප්ත වාවේස් ජනාධිපතිවරයා පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන කොට, ඇමෙරිකන් ඒජන්තයන්ට හොඳටම රිදෙන බව අපි දන්නවා. වාවේස් ජනාධිපතිතුමා එතුමාගේ පාලන කාලයම දියත් කරලා තිබුණේ ඇමෙරිකන් අධිරාජ්‍යවාදයේ ආර්ථික දේශපාලන යුද පෙරමුණට එරෙහිවයි.

ඒ ඇමෙරිකන් අධිරාජ්‍යවාදී ආර්ථික, දේශපාලන යුද පෙරමුණේ ඉන්නත් බවට පත් වෙලා ඉන්න නායකයන්ට මේ කාරණයෙන් රිදෙන එක අමුතු දෙයක් නොවෙයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව කෙටියෙන් අවසන් කරන්න පුළුවන්ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව ගැන පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කළා. පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කළාට පසුව මෙය පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාවක්-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ද පිළිගන්නා පරිදි පක්ෂ නායක රැස්වීමේදී- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවසන්- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ කාරණය කියලා අවසන් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Adjournment Motion එකක් හැටියට ගැනීමට තීන්දු කර අවසානයි. So, let this be taken up as an Adjournment Motion. There is no Condolence Motion before this House.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ ගැන සාකච්ඡා කළ පළමුවැනි අවස්ථාවේදී පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාවක් ලෙස ගෙනෙන්න තීරණය කළා. හැබැයි ඊයේ පැවැති පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කළ පරිදි, කල් තැබීමේ යෝජනාවක් ලෙස ගෙන එන්න තීරණය කළා. මා හිතන හැටියට එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාට එතුමාගේ පක්ෂය නියෝජනය කරමින් පක්ෂ නායක රැස්වීමට සහභාගි වූ නියෝජිතයන් කරුණු කියන්න ඕනෑ. එතුමාගේ නියෝජිතයන් විසින් එතුමාට කරුණු නොකීම පිළිබඳව අපට වරද පටවන්න එපා. එක්කෝ එතුමා පක්ෂ නායක රැස්වීමට සහභාගි වන්න ඕනෑ. නැත්නම් සිද්ධ වුණේ මොකක්ද කියලා නියෝජිතයන්ගෙන් අහන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හරි, ස්තුතියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සිද්ධ වුණේ මොකක්ද කියලා දන්නේ නැතුව මෙතැන ඇවිල්ලා වාඩි වෙලා නිකම් ඒජන්තයාගේ භූමිකාව ඉටු කරන එක සාධාරණ නැහැ.

[ගරු අනුර දිසානායක මහතා]

ඊයේ අප එකඟතාවට ආවේ මෙය කල් තැබීමේ යෝජනාවක් ලෙස ගෙන එන්න. මා ඉදිරිපත් කරන්නේ කල් තැබීමේ යෝජනාවක්. ඒ පිළිබඳව පක්ෂ නායක රැස්වීමේදී තීරණය කර තිබෙනවා. ඒජන්තයන්ගේ රිදීම හෝ ඒජන්තයන්ට මේ පිළිබඳව තිබෙන කැක්කුම හෝ තව තවත් ලංකාව තුළ ඇමෙරිකන් එක්සත් ජනපදයේ බටහිර **ඒජන්තයා, නියෝජිතයා ත**මන් බව ඔප්පු කිරීම ගැන හෝ අප පුදුම වන්නේ නැහැ. එතුමා එහෙම තමයි කටයුතු කළ යුතු වන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Leader of the Opposition, what is your point of Order?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Let him speak first.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා ස්ථාවර නියෝග 83ට. එහි මෙසේ සඳහන් වනවා:

"විවාද කළ යුතු ප්‍රශ්නයක් සභාභිමුඛ කර, විවාද කොට අවසන් කරනු ලැබූ පසු, කථානායකතුමාගේ අවසරය නොමැතිව එම සභා වාරයේදී ම එම ප්‍රශ්නය නැවත වරක් මන්ත්‍රීවරයකුට සභාභිමුඛ කළ නොහැකි ය: "

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතකොට මම කියන්නේ-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාරණය ගැන මේ සභාවේ කල් තැබීමේ යෝජනාවක් හෝ 23(2) යටතේ ප්‍රශ්නයක් ඇහුවේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පොඩ්ඩක් ඉන්න. අපටත් කථා කරන්න අයිතියක් තිබෙනවා. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
කථා කරන්න ඉඩ දීලා වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 20වැනි දා මා පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. එවිට සභානායක කාර්යාලයෙන් කිව්වා, ඊට කලින් දවසේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කරපු නිසා මා ඉදිරිපත් කළ පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාව භාර ගන්න බැහැ කියලා. මා කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කළේ 20වෙනිදායි. මගේ කල් තැබීමේ යෝජනාව භාර ගන්න බැහැයි කිව්වා, ඊට කලින් දවසේ අනුර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළාය කියලා. ඇයි ඒ?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Lakshman Kiriella, we agreed to take up this matter as an Adjournment Motion at the Party Leaders' Meeting yesterday. So, why are you taking a different stand today? - [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, the Hon. Leader of the Opposition.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම ගැන කාරණා කිහිපයක් කිව්වා. ඒකත් කියන්න ඕනෑ. අපි මෙතැනට ආවේ, මේ සභාවේ පූර්වාදර්ශයන් ගැන කථා කරන්න මිස පුද්ගලයන් ගැන කථා කරන්න නොවෙයි. ඇත්ත වශයෙන්ම ඇමෙරිකන් ආධිපත්‍යයට විරුද්ධව ඒ කලාපයට නායකත්වය දුන්නේ ෆිදෙල් කැස්ත්‍රෝ. එතුමාට විරුද්ධව ක්‍රියා කරන්න කියලා ඇමෙරිකාව කිව්වාම එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කිව්වා ඔහුට විරුද්ධව ක්‍රියා කරන්නේ නැහැ කියලා. [බාධා කිරීමක්] විශාල කැක්කුමක් තිබෙනවා මේ මන්ත්‍රීතුමාට. ෆිදෙල් කැස්ත්‍රෝ ගැන කථා කරනවාටත් කැමැති නැහැ නේ. [බාධා කිරීමක්]

ෆිදෙල් කැස්ත්‍රෝ ගැන කථා කරන්නත් කැමැති නැහැ නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Thank you.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Hon. Deputy Speaker, let me finish what I have to say.

ඒ වාගේම වාවේස්ගේ හෝ ඇලෙන්ඩේගේ හෝ මරණය ගැන අපි කනගාටු වනවා. අපටත් ඒ ගැන ප්‍රකාශ කරන්න පුළුවන්. මා කියන්නේ වෙන එකක්. පූර්වාදර්ශයක් ඇති කරන්න ඕනෑද? අපි දෙවතාවක්- [බාධා කිරීමක්] අන්න එච්චරයි තිබෙන්නේ. ඒ ගැන විතරයි තිබෙන්නේ.

මා තව එක කාරණයක් ඔබතුමාට කියන්න කැමැතියි. පාර්ලිමේන්තුවේ කටයුතු ගැන රීති ප්‍රශ්නයක් තමයි දැන් මතු වුණේ. අපි දැන ගන්න ඕනෑ, මේ ගැන වාද කරන්න පුද්ගලයන් කවුරුන්- [බාධා කිරීමක්] එදා එතුමා මට චෝදනා කළා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති කරන්න, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ රජය ඇති කරන්න කටයුතු කළාය කියා. දැන් මේ පැත්තට ඇවිල්ලා කෑ ගහනවා. මා වාවේස්ගේ සල්ලි අරගෙනත් නැහැ; මහරාජාගේ සල්ලි අරගෙනත් නැහැ; අලස්ගේ සල්ලි අරගෙනත් නැහැ.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 and the motion agreed to by Parliament on 07.04.2011, the hours of sitting this day shall be 1.30 p.m. to 7.30 p.m.. At 3.30 p.m. Standing Order No. 7(5) shall operate."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 and the motion agreed to by Parliament on 09.07.2010, the hours of sitting on Tuesday, 09th and Wednesday, 10th April, 2013 shall be 9.30 a.m. to 12.30 p.m. and 1.00 p.m. to 6.30 p.m.. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාගෙන් බොහොම කාරුණිකව ඉල්ලීමක් කරනවා, මා ඉදිරිපත් කරන මේ රීති ප්‍රශ්නයට සවන් දෙන්න කියලා. මා ඉදිරිපත් කරන්න යන අදහස එක වරට කප්පාදු කරන්න එපා. එය මට කරන අසාධාරණයක්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අදාළ දෙයක් තිබෙනවා නම් කෙටියෙන් කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අදාළ දෙයක් තමයි. ස්ථාවර නියෝග 84 (vii) යටතේ මෙසේ සඳහන් වනවා:

"කවර මන්ත්‍රීවරයකු විසින් හෝ වෙන මන්ත්‍රීවරයකු නමින් සඳහන් නොකළ යුතුය."

ඒ වාගේම ස්ථාවර නියෝග 84 (viii) යටතේ මෙසේ සඳහන් වනවා:

"කවර මන්ත්‍රීවරයකු විසින් හෝ අන්‍ය මන්ත්‍රීවරයකුට අයුතු චේතනා ආරෝපණය කරමින් කථා නොකළ යුතුය."

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the relevancy? දැන් කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් එසේ කථා කළාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා මට කථා කරන්න අවස්ථාව දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ එවැනි තත්ත්වයක් ඇති වුණාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝග යටතේ "point of Order" කියලා පාර්ලිමේන්තුවේ කථා පවත්වන්න බැහැ. ඔබතුමා කිව්ව ආකාරයේ තත්ත්වයක් දැන් උද්ගත වුණාද කියලා කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාට point of Order එක කියන්නයි හැදුවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ වෙලාවේ එවැනි තත්ත්වයක් උද්ගත වුණාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට point of Order එක ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ වෙලාවේ මොකක්ද වුණේ කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ස්ථාවර නියෝග යටතේ මම ඊයේ දවසේ ඔබතුමාට පෙන්වා දුන්නා,-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊයේ දවසේ කාරණා සම්බන්ධව තීන්දුවක් දීලා අවසන්. ඒ නිසා ඊයේ දවසේ දේවල් ගැන කථා කිරීමට අවස්ථාව දෙන්න බැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 01, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝග. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ 1, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ- [බාධා කිරීම්] Let me move this first.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Leader of the Opposition.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කියන එක අහලා ඒක වැරැදි නම්, ඒකට විරුද්ධ වන්න. අපි ස්ථාවර නියෝග අනුවයි ක්‍රියා කරන්නේ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඩිලාන් පෙරේරා ඇමතිතුමාට විරුද්ධව ගේන්න හදන විශ්වාස භංග යෝජනාව කල් යනවා. ආපහු හියුගෝ චාවේස් ගැන කථා කරනවා. ඕකයි තිබෙන ප්‍රශ්නය, මට වෙන ප්‍රශ්නයක් නැහැ. අද වෙන් කරලා තිබුණේ, ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාට විරුද්ධව ගෙනෙන විශ්වාස භංග යෝජනාවටයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝගවලට පටහැනි කාරණා තිබෙනවා නම් ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කටයුතු කරනවා කියලා ඔබතුමා ඊයේ නියෝගයක් දුන්නා.

මම මගේ අත්සන සහිතව ලිපියක් යවලා, හැන්සාඩ් සංස්කාරකතුමියගෙන් අසංශෝධිත පිටපතක් ඉල්ලා සිටියා. එය ගෙනැවිත් දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහි තිබෙනවා, -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, that is not a point of Order. ඒ පිළිබඳව කමිටුවක් පත්කොට ඒ ගැන පරීක්ෂණයක් කරන්න කියලා තීන්දුවක් දීලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා කරුණාකර මට විනාඩියක් දෙන්න. කරුණාකර මම කියන දේ අහන්න. මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊයේ මතු කරන ලද කාරණාව පිළිබඳව -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා කියන දේත් විනාඩියකට අහන්නකෝ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙම අසංශෝධිත පිටපතේ තිබෙනවා, හැන්සාඩ් අංශයෙන් පටිගත කර පස්වරු 7.15ට ඉංජිනේරු අංශයට භාර දී තිබෙන්නේ, එදිනම රාත්‍රී 8.00ට සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මෙම කාරණය සම්බන්ධව කමිටුවක් පත් කරලා, ඒ පිළිබඳව පරීක්ෂණයක් කිරීමට තීන්දුවක් ගෙන තිබෙනවා. ඒ නිසා ඒ ගැන දැන් මෙතැන කථා කරන්නට බැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලන්නේ- [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I will not allow unnecessary points of Orders to be raised.

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. [බාධා කිරීම්]

මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත : නියෝගය
முத்திரைத் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டம் : கட்டளை
STAMP DUTY (SPECIAL PROVISIONS) ACT: ORDER

[අ.භා. 1.58]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2012 දෙසැම්බර් මස 17 දිනැති අංක 1789/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

මේ නියෝග පිළිබඳව දිවුරුම් පෙත්සමකට, රක්ෂණ ඔප්පුවකට, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ලෙස ක්‍රියා කිරීමේ බලපත්‍රවලට, මත්පැන් විකිණීමේ නිරත වෙළෙඳාමට, මත්පැන් විකිණීම සඳහා වූ යම් වෙළෙඳාමක් හා ව්‍යාපාරයකට, යම් කාලපරිච්ඡේදයක් තුළ ණය කාඩ් පත් - credit cards - වෙනුවෙන් ඇති මුදල් සඳහා අදාළ මුද්දර ගාස්තු නිවේදනය ඉදිරිපත් කරනවා. මේ අනුව මුද්දර ගාස්තු වැඩි කිරීම සඳහා විවාදයක් අය වැය විවාදය පැවැත්වුණු කාලයේදීද අපි පැවැත්තුවා. ඒ නිසා අපි - [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර දිසානායක මහතා. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊයේ දිනයේදී ඒ කාරණය සම්බන්ධයෙන් තීන්දුවක් දීලා තිබෙනවා. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා. [බාධා කිරීම්] කරුණාකර, ගරු විපක්ෂ නායකතුමාට බාධා කරන්න එපා. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තිබෙන්නේ මුදල් රෙගුලාසියක්. මුදල් ඇමතිවරයාත් නැහැ. අඩු ගණනේ මෙතුමන්ලා කියන මේ ප්‍රශ්නවලට ඇහුම්කන් දීලා තීරණයක් දෙන්න. Now, we are breaking it again. ඩිලාන් පෙරේරා ඇමතිතුමා ආරක්ෂා කරන්න කියලා හැම රීතියක්ම කඩලා තිබෙනවා. වාවේස් ජනාධිපතිතුමාව දෙපාරක්ම පණ ගන්වා තිබෙනවා. දැන් තව කෙනෙක් - [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර දිසානායක මහතා. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිගින් දිගටම මම හියුගෝ වාවේස් ජනාධිපතිවරයා සම්බන්ධ විවාදයට පැටලෙන්න සූදානම් නැහැ. නමුත් මට තේරෙනවා අදාළ නායකයාට - [බාධා කිරීම්] ඒ නිසා මේ ඇමෙරිකන් ඒජන්තයාට මේ පිළිබඳව රිදෙන එක ගැන කාරණයක් නැහැ. අපේ රටේ සියලු සම්පත් විකුණපු, බැංකු ටික පෞද්ගලීකරණය කරන්න හදපු, රට බෙදීමේ සැලැස්මකට අණ දීපු ඒ සියල්ල - [බාධා කිරීම්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
After the Hon. Anura Dissanayake's objection, you can raise it.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ පක්ෂ නායක රැස්වීමේදී මේ පිළිබඳ එකඟතාවකට ආවා. විශේෂයෙන්ම ස්ථාවර නියෝග 124 යටතේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවක් පිහිටුවා තිබෙනවා. ඒ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවෙන් තමයි එදිනෙදා සහ එළඹෙන සතිය සඳහා සියලු වැඩසටහන් සකස් කරන්නේ. ඒ අනුව ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාර්තු මාසයේ 08 වැනි දා රැස් වුණු පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කළා, 19 වැනි දා පනත් 9ක්, 20 වැනි දා පනත් 8ක් සහ 21 වැනි දා තවත් පනත් දෙකකුත් ආදී වශයෙන් පනත් 19ක් සාකච්ඡා කරන්න. නමුත් ඒ වෙලාවේදීත් අප විසින් පෙන්වා දුන්නා දින තුනක් ඇතුළත සංශෝධන පනත් 19ක් සාකච්ඡා කිරීම ඒ තරම් සුදුසු නැහැ කියා. නමුත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත්, සභානායකතුමාත් පක්ෂ නායක රැස්වීමේදී ඉල්ලා සිටියේ අය වැය ලේඛනයේ යෝජනා හේතුකොට ගෙන මේ මස 30 වැනි දාට පෙර මේවා අනුමත කර ගත යුතු බැවින් මෙය සම්මත කර දෙන ලෙසයි. ස්ථාවර නියෝගවලට අනුව ආණ්ඩුවේ කාර්යයන්ට ප්‍රමුඛතාව දීම හේතුකොට ගෙන ඒ දිනවලදී පාර්ලිමේන්තුව උදේ 9.30ට රැස් වෙන්නත්, පස්වරු 6.30 දක්වා මේ පිළිබඳ විවාදය පවත්වා ගෙන යාමටත් සාකච්ඡා වුණා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසානයේදී එයින් පනත් කෙටුම්පත් 15ක් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවට ගියා.

ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගෙන යන ලද සංශෝධන පනත් ටික ඉවත් කොට, ඉතුරු සංශෝධන පනත් ටික පිළිබඳ සාකච්ඡා කරන්න පසු ගිය 19වැනි දා නැවත පක්ෂ නායක රැස්වීමක් කැඳවන්න සිදු වුණා. ඒ අනුව තමයි 19, 20, 21 කියන තෙදින මේ පාර්ලිමේන්තුව රැස් වුණේ. 19වැනි දා පැවැති පක්ෂ නායක රැස්වීමේදී අප පැහැදිලි ලෙසම කිව්වා, ඔබතුමන්ලා මුද්දර පිළිබඳව ගැසට් නිවේදනයක් -දැන් විවාදයට තුඩු දෙන- නිකුත් කර තිබුණා, මෙය 20වැනි දා පැවැත්වෙන රේගු ආඥාපනත යටතේ විවාදයට ගන්න කියලා. ඊයේ විවාදය පැවැත්වුණු නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පතත් එක්ක මෙහි සම්බන්ධයක් නැහැ, මේක මුදල් අමාත්‍යාංශයට අදාළ කරුණක් නිසා 20වැනි දා සාකච්ඡාවට ගත යුතුය කියන ස්ථාවරයේ තමයි අප දිගින් දිගටම හිටියේ. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීම නියෝජනය කළ ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම මෙය 20වැනි දා සාකච්ඡාවට ගැනීම ප්‍රතික්ෂේප කළා. නැවත හදිසියේ ඊයේ සවස දෙකහමාරට පක්ෂ නායක රැස්වීමක් කැඳෙව්වා. එතකොට මේ සතියේ වැඩසටහන් සකස් කර ගැනීම වෙනුවෙන් පක්ෂ නායක රැස්වීම් 3ක් කැඳවනු ලැබ තිබෙනවා. ඊයේ දෙකහමාරට කැඳවපු පක්ෂ නායක රැස්වීමේදී තමයි තීරණය කළේ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙන එන මෙම නියෝගය විවාදයට ගත යුතුය කියලා.

මේ පාර්ලිමේන්තුව උත්තරීතරයි කියලා තමුන්නාන්සේලා ප්‍රකාශ කරනවා. බොහෝ අය ඒ වෙනුවෙන් ආ වැඩුවා. එහෙනම් මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ආරක්ෂා වන්නේ පක්ෂ නායක රැස්වීමට පැවරී තිබෙන බලතල හා ඒ අනුව කරන ක්‍රියාත්මක කිරීම් අනුවයි. අද දිනයේ මේ විවාදයට ගන්නේ විශේෂයෙන්ම ජනතාවගේ දෛනික ජීවිතවලට ඉතාම බරපතළ ලෙස බලපාන කරුණු කීපයක්. මෙමඟින් නොතාරිස්වරයෙකුගේ බලපත්‍රය වෙනුවෙන් ගෙවිය යුතු රුපියල් 10 ගාස්තුව 2,000 දක්වා වැඩි කරනවා . දිවුරුම් ප්‍රකාශයක් සඳහා තිබුණු ගාස්තුව රුපියල් 25 සිට 250 දක්වා වැඩි කරනවා. මේ අනුව දරුවකු වෙනුවෙන් ඉස්කෝල තුනකට ඉල්ලුම්පත්‍ර දමනවා නම් දිවුරුම් ප්‍රකාශ වෙනුවෙන්ම රුපියල් 750ක්, 1000ක් විතර ගෙවිය යුතු වෙනවා. ඒ නිසා මෙය අපේ රටේ සාමාන්‍ය ජන ජීවිතය හා ඉතා තදින් ගැට ගැහී, බැඳී තිබෙන යෝජනාවක්. මෙය කඩිමුඩියේ, ඉතා කෙටි කාලයක් තුළ සාකච්ඡා කිරීමෙන් සම්මත නොකළ යුතුය කියන ස්ථාවරයේ අප හිටියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙන එන මෙම නියෝගය අද දින කිසි සේත්ම සාකච්ඡාවට නොගත යුතුය කියන ස්ථාවරයේ තමයි ජනතා විමුක්ති පෙරමුණේ අප එම පක්ෂ නායක රැස්වීමට සහභාගි වෙමින් කියා සිටියේ. නමුත් ආණ්ඩු පක්ෂය විසින් තදබල ලෙස කියා සිටියා අද කෙසේ හෝ මෙය සම්මත කර ගත යුතුය කියලා. මට තේරෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 20වැනි දා සම්මත කර ගැනීම සඳහා අප ඉඩ දී තිබියදී, -මුදල් අමාත්‍යාංශයට අදාළව රේගු ආඥාපනත යටතේ විවාදයක් එදින පැවතෙද්දි- එය එදා සාකච්ඡාවට නොගෙන කඩිමුඩියේ අද විවාදයට ගන්නේ මොකද කියා. ඒ වෙනුවෙන් අපේ විරුද්ධත්වය ප්‍රකාශ කළා. ඒ විතරක් නොවෙයි. පක්ෂ නායක රැස්වීමේ තීන්දු තීරණ, එය ගලා ගෙන යන විධිය සහ එය විටින් විට වෙනස් වන ආකාරය කිසිසේත්ම සුදුසු නැහැය කියන කාරණයත් අප කියනවා.

මෙය ඉතාම වැදගත් සංශෝධනයක්. විශේෂයෙන්ම මේ සංශෝධනයට විරුද්ධව අපේ මන්ත්‍රීවරුන් ඡන්දය පාවිච්චි කළ යුතුව තිබෙනවා. අපට ඒ වෙනුවෙන් අවස්ථාව ලබා ගත යුතුයි. නමුත් ඊයේ ප.ව. 2.30ට තීරණය අරගෙන අද කොහොමද මන්ත්‍රීවරුන්ව කැඳවන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තමයි මේ පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්නේ කොහොමද? ඒ නිසා ඉතාමත් කඩිමුඩියේ මේ සිදු වන ක්‍රියාදාමය මුළුමනින්ම ප්‍රතික්ෂේප කළ යුතුයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පසු ගිය දින ගරු කථානායකතුමා මූලාසනයේ ඉඳගෙන කිව්වේ මොකක්ද? මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මේ ක්‍රියා පටිපාටිය පිළිබඳව එතුමා දැඩි අවවාදයක් දුන්නා. එතුමා දැඩි ලෙස අවවාද කොට කියා සිටියේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය කලට වේලාවට වැඩ කටයුතු නොකිරීම, ඒ පනත් කෙටුම්පත් නිවැරදි පරිදි සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීම මුළුමනින්ම පාර්ලිමේන්තුවේ බලය හැල්ලු කිරීමක් කියලායි. අවසානයේදී කථානායකතුමා කිව්වේ "මට අවවාද දීම හැරුණු කොට දඬුවම් දීමේ බලයක් නැහැ" කියලායි. එයින් හැඟෙව්වේ දඬුවම් දීමට බලයක් තිබෙනවා නම් එතුමා දඬුවම් දීමටත් සූදානම් බවයි. ඒ නිසා එතුමාගේ ප්‍රකාශවලින්ම පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි, මුදල් අමාත්‍යාංශයේ අකාර්යක්ෂමතාව, අරාජීකත්වය සහ නිවැරදි පරිදි යමක් ඉදිරිපත් කිරීමට තිබෙන අසමත්කමයි. මුදල් අමාත්‍යවරයා විධියට කටයුතු කරන්නේ කවුද කියලා අපි කවුරුත් දන්නවා. අනෙක් අමාත්‍යාංශවල තිබෙන දුක්ගැනවිලි බලන්න, අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන කටයුතු සොයා බලන්න මුදල් අමාත්‍යවරයා පැමිණෙනවා. නමුත් මුදල් අමාත්‍යවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ පවතින අමාත්‍යාංශයේ කාර්ය පටිපාටිය අපට කිසිසේත්ම පිළිගන්න පුළුවන් තත්ත්වයක නොවෙයි තිබෙන්නේ. ඒ නිසා ඊයේ ප.ව. 2.30ට පක්ෂ නායක රැස්වීම කැඳවලා, අද හදිසියේම පාර්ලිමේන්තුවේ කටයුතු වෙනස් කිරීම කිසිසේත්ම සුදුසු තත්ත්වයක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ පක්ෂ නායක රැස්වීමේදී අද ප.ව. 2.30 සිට 3.30 දක්වා කාලය මුද්දර පනතේ සංශෝධනයන් පිළිබඳව සාකච්ඡා කිරීමටත්, 3.30ට පාර්ලිමේන්තුව කල් තබලා වෙනිසියුලාවේ අභාවප්‍රාප්ත ජනාධිපති හියුගෝ චාවේස් මහත්මයා පිළිබඳව සභාව කල් තැබීමේ විවාදයක් ගෙන ඒමටත් තමයි තීරණය කළේ. මම හිතනවා පක්ෂ නායකයින්ගේ වගකීමක් තිබෙනවා කියලා, පක්ෂ නායක රැස්වීම්වලදී ගනු ලබන තීන්දු, තීරණ පිළිබඳව වහාම සොයා බලන්න. ඒක තමයි පක්ෂ නායකයින්ගේ වගකීම. පක්ෂ, විපක්ෂ නායකයින්ගේ වගකීම ඒක. ඒ වගකීම ඉටු නොකොට යම් යම් විධියට සම්පප්‍රලාප දෙඩවීම අපි මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චාවේස් සම්බන්ධයෙන් යෝජනාව පැමිණෙන්නේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස නොවෙයි කල් තැබීමේ යෝජනාවක් ලෙසයි. මීට පෙර පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳව සාකච්ඡා කළේ වෙනත් විවාදයක් පැවැත් වෙන අවස්ථාවේදී, එක් එක් මන්ත්‍රීවරුන් ඉතා කෙටි

අදහස් දැක්වීමක් කරලායි. එය කිසිසේත්ම ස්ථාවර නියෝගවලට පටහැනි නැහැ. පසු ගිය මාර්තු මාසයේ 08 වෙනි දා පක්ෂ නායක රැස්වීමට සියලු දෙනා සහභාගි වෙලා තිබුණා. නැවත මෙය න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා තිබුණා. නැවත 19 වන දින පක්ෂ නායක රැස්වීමට සහභාගි වන විට එය න්‍යාය පත්‍රයේ තිබුණා.

කිසිම මන්ත්‍රීවරයෙකු පක්ෂ නායක රැස්වීමේදී විරුද්ධතාවක් හෝ සම්ප්‍රදාය උල්ලංඝනය කිරීමක් පිළිබඳව සාකච්ඡා කළේ නැහැ. අනතුරුව ඊයේ පක්ෂ නායක රැස්වීම කැඳවුවා. ඒ අවස්ථාවේදීත් කිසිවෙක් මේ පිළිබඳව සාකච්ඡා කළේ නැහැ. හදිසි උමතු රෝගයක් වැලඳුණා වාගේ මෙතැනට පැමිණ කරුණු ප්‍රකාශ කිරීම කිසිසේත්ම සාධාරණ නැහැ. ඒ සඳහා තිබෙන අවස්ථාවන් අපි උපයෝගි කර ගත යුතුව තිබුණා. අද දින මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝග ගෙනැවිත් තිබෙනවා. කවුරු හෝ හිතනවා නම් මුදල්වලින් නටවන්න පුළුවන් කියා ඒ තරම් අඳබාල මෝඩ තකතීරු අදහසක් තවත් ඔහුගේ ඔළුවේ පහළ වෙයි කියා මම හිතන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇති වී තිබෙන සම්ප්‍රදාය අනුව පක්ෂ නායක රැස්වීමේදී ගනු ලබන තීන්දු තීරණ මත පිහිටා මේ පාර්ලිමේන්තුව මෙහෙයවීමට අසමත් වී තිබෙනවා. සභානායක කාර්යාලයක්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන කාර්යාලයත් ඒ සඳහා දක්වන මෙහෙයවීම ඉතාමත් අප්‍රාණයි, ඉතාමත් දුර්වලයි කියන එක තමයි අපේ අදහස. ඒ නිසා මෙය අද සාකච්ඡාවට නොගත යුතුයි කියන ස්ථාවරයේ තමයි අපි සිටින්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා කළේ පිළිතුරු දීමක්ද නැත්නම් point of Order එකක් ඉදිරිපත් කිරීමක්ද? I want to know.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එතුමාගේ විරුද්ධත්වය දක්වනවා කියා ඊයේ පක්ෂ නායක රැස්වීමේදී දැන්වුවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Is it a point of Order or a reply? I was speaking.

මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. මෙතුමාට දෙකක් කරන්න බැහැ. මෙතුමා point of Order එකක් ගත්තා නම් ඒක වෙනත් කාරණයක්. එතුමා කථාවක් කළා නම් මට තිබුණු අවස්ථාව ඔබතුමා නැති කළා. එහෙම නම් මෙතුමා විවාදය ආරම්භ කර තිබෙනවා. මම මේ කාරණාව ගැන යමක් කියන්න කැමැතියි.

අද මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝග ගෙනැවිත් තිබෙනවා. කෝ, අදාළ ඇමතිතුමා? [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
කෝ?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
අන්න ඒකයි අපි අහන්නේ. අපි එකඟ වෙලා තිබෙන්නේ අදාළ ඇමතිවරයා ඉන්න ඕනෑය කියායි. අදාළ ඇමතිවරයා නැත්නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක විහිළුවක්. දැන් මම මේක අරගන්න කියද්දි මේක වහන්න තව කෙනෙකුට කථා කරන්න දුන්නා. ඇයි, අදාළ ඇමතිතුමා නැත්තේ?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු ජීවන් කුමාරණතුංග ඇමතිතුමාවත් නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු විපක්ෂ නායකතුමා හොඳකාරවම දන්නවා, ගරු මුදල් ඇමතිතුමා අතිගරු ජනාධිපතිතුමා බව.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
So, why is the Hon. Deputy Minister not here?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Wait!

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Get the Hon. Deputy Minister here.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You have raised a question. I answered it. According to the Standing Orders, I have every right to move this. Whether the Hon. Deputy Minister is present or not, I can move it. We have had the procedure - [*Interruption.*]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඇයි, අමුණුගම ඇමතිතුමා මෙතැන නැත්තේ? [බාධා කිරීමක්] හරි. ජනාධිපතිතුමාට එන්න බැහැ. මම ඒක පිළිගන්නවා. ඇයි, අමුණුගම ඇමතිතුමා මෙතැන නැත්තේ? ඇයි, ඒ අය නැත්තේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ පුද්ගලයා නැත්තේ මොකද කියා මම දන්නේ නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
අපි කොහොමද විවාදය ගෙන යන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පුද්ගලයා හැටියට මිසක් වෙනත් ප්‍රශ්නයක් නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
විෂය භාර ඇමතිතුමා වග කියන ඇමතිවරයා -අමුණුගම ඇමතිවරයා- මේ සභාවේ නැත්නම් -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
Standing Orders අනුව අපට move කරන්න පුළුවන්. ඔබතුමා පළමුවැනි වතාවට තමයි ඔය ගැන අහන්නේ. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා මුදල් පනත් කෙටුම්පත් 25ක් ගිය අවුරුද්දේ ගෙනාවා. එක වෙලාවකවත් ඔය කථාව ඇහුවේ නැහැ. ඇයි, මට මේක ගේන්න බැරි? තමුන්නාන්සේලාට කිසිම ස්ථාවරයක් නැහැ. [බාධා කිරීම්] කිසිම ස්ථාවරයක් නැහැ. අද එකක් කියනවා, හෙට එකක් කියනවා. සිරසට බණිනවා. සිරසට හොඳ කියනවා. ඊයේ සෙල්ලම එහෙමයි. [බාධා කිරීම්] ඉතින් මේ විධියට වෙලාව ගැනීම කරන්න එපා. පාර්ලිමේන්තුව වැදගත්. [බාධා කිරීම්]

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එදුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
එතුමාට කථා කරන්න මෙතැන වේදිකාවක් ඕනෑ වෙලා තිබෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංක)
(The Hon. Ranil Wickremasinghe)
මට කථා කරන්න ඉඩ දෙන්න. බලන්න, දැන් මගේ කාලය ගන්නවා නේ. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා කථා කරන්න. [බාධා කිරීම්] කරුණාකර විපක්ෂ නායකතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංක)
(The Hon. Ranil Wickremasinghe)
ඊයේ හදිසියේ පක්ෂ නායක රැස්වීම කැඳෙව්වා. මමත් තව කිහිප දෙනකුත් නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වෙමින් මේ ගරු සභාවේ සිටියා. අනෙක් හැම එක්කෙනාම කිව්ව නිසා මේ සම්බන්ධයෙන් අපේ ස්ථාවරය මම කියන්නම්. අපේ ස්ථාවරය මේකයි. අද ගන්න තිබුණේ මුද්දර ගාස්තු පිළිබඳ නියෝග නොවෙයි. ඇත්ත වශයෙන්ම අද ගන්නට නියමිතව තිබුණේ ඩිලාන් පෙරේරා ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවයි. ඒක නවත්වන්න ඕනෑ නිසා ජනතා විමුක්ති පෙරමුණෙන් අභාවප්‍රාප්ත හියුගෝ වාවේස් ජනාධිපතිවරයා සම්බන්ධයෙන් යෝජනාව ගෙනාවා. ඒක එක වරක් කථා කළ එකක්. ඒකයි අපි කියන්නේ. කාට හරි කඩේ යනවා නම් කඩේ යන්න. අපට බණින්න එපා.[බාධා කිරීම්] දැන් ඇවිල්ලා කියනවා මුද්දර ගාස්තු පනත යටතේ නියෝග ගන්න එක වැරදියි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක නිසා මම එක ප්‍රශ්නයයි මතු කරන්නේ. මම කියන්නේ මුද්දර ගාස්තු පනත යටතේ නියෝග ගන්නත් බැහැ. වාවේස් ජනාධිපතිතුමාගේ අභාවය පිළිබඳ යෝජනාව ගන්නත් බැහැ. දැන් සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මොකක්ද කාරණයක් පැන නඟලා තිබෙනවා. ඒ ගැන විවාද කරලා, ඔබතුමා තීරණයක් දීලා ඊට පස්සේ අපි ගෙදර යමු. එච්චරයි. වෙනත් එකක් ගන්න බැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා -[බාධා කිරීම්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එතුමා කථා කරලා ඉවරයි. දැන් අපට අවස්ථාව දෙන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අසන වෙලාවේ 25වන ස්ථාවර නියෝගය අනුව මා ප්‍රශ්නයක් ඇහුවා. ස්ථාවර නියෝග 25 යටතේ ඕනෑම මන්ත්‍රීවරයකුගේ වරප්‍රසාද සම්බන්ධයෙනුයි මා ඔබතුමාගෙන් අහන්නේ. ඒක ඇහුවේ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවට අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගෙන්.

දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගෙන් මම ඇහුවා, ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයාට පුළුවන්ද, යම් කිසි වැඩ සටහනක - [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න. මා ගරු නියෝජ්‍ය කථානායකතුමාට කථා කරමිනුයි ඉන්නේ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න මන්ත්‍රීතුමා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාපතිවරයා විධියට, දේශපාලන වැඩ සටහන් කරලා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට පහර දෙන්න ගුවන් විදුලිය පාවිච්චි කරන්න පුළුවන්ද කියලා මා ගරු ඇමතිතුමාගෙන් ඇහුවා. ඊට පස්සේ එතුමා කිව්වා, ඒ සම්බන්ධව අවශ්‍ය කරන කටයුතු අර කමිටුව මඟින් අවශ්‍ය විධියට කරමු කියලා. දැන් අපේ ගරු විපක්ෂ නායකතුමාත් යෝජනාවක් කළා. ඒ වාගේම, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එය ස්ථිර කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. අද උදේ ප්‍රවෘත්තිවලට පෙර හඬසන් සමරසිංහ මහත්මයාගේ වැඩ සටහනේදී ගොනා, බූරුවා, බල්ලා කියලා තමයි මට බැණලා තිබුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විධියට අපට-

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරුත්වය රකින්න දැන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විධියට අප කරන ප්‍රකාශ සම්බන්ධයෙන් එතුමාට තරහා ගිහින් බල්ලා, බූරුවා කියලා එතුමා අපට බැණලා හරි යන්නේ නැහැ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාට ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි, කරුණාකර-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු කථානායකතුමා මෙරටට පැමිණි විගස එම කමිටුව පත් කොට ඒ පිළිබඳව- [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න කෝ. මා ඔබතුමාට කියන්න හදන්නේ මෙකයි. මා මේ කාරණය වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට මේ සභාවේ මතු කරනවා. කරුණාකර ඒ සභාපතිවරයා -මාධ්‍යවේදියකු විධියට හැසිරෙන එතුමා- මේ කමිටුවට ගෙනැල්ලා එතුමාගෙන් ප්‍රශ්න කරන්න ඕනෑ එතුමා පාවිච්චි කරන භාෂාව පිළිබඳව. [බාධා කිරීම්] ඉතාම නින්දිත භාෂාවක් එතුමා පාවිච්චි කරන්නේ. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු කථානායකතුමා පැමිණි විගස ඒ පිළිබඳව කටයුතු කිරීමට ක්‍රියාත්මක වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි. දැන් පැයක් විතර කෑ ගහලායි point of Order එකට අවස්ථාව ගත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මා කියන කාරණාවට මඳක් සවන් දෙන්න කියලා. මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා ස්ථාවර නියෝග 84 (vii) සහ (viii) කෙරෙහි. එහි මෙසේ සඳහන් වෙනවා:

"84. (vii) කවර මන්ත්‍රීවරයකු විසින් හෝ වෙන මන්ත්‍රීවරයකු නමින් සඳහන් නොකළ යුතු ය.

(viii) කවර මන්ත්‍රීවරයකු විසින් හෝ අන්‍ය මන්ත්‍රීවරයකුට අයුතු චේතනා ආරෝපණය කරමින් කථා නොකළ යුතු ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ රීති ප්‍රශ්නය ඊයේ ගෙනාවාට පස්සේ ඔබතුමා ඒක අනුමත කරලා තීන්දුවක් දුන්නා. තීන්දුවක් ලබා දුන්නත් හැන්සාඩ් වාර්තාවේ unedited copy එකේ -සංශෝධනය නොකරපු copy එකේ- සුජීව සේනසිංහ මැතිතුමාට අස්වර් මැතිතුමා එල්ල කරපු දෝෂාරෝපණය, ඒ මඩ ගැහිල්ල එලෙසම තිබෙනවා. [බාධා කිරීම්] මා ඔබතුමාට කියන්න කැමැතියි, කරුණාකර ස්ථාවර නියෝගවලට අනුව මේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද රැකගන්න, මේ කරන මඩ ගැහිල්ල නතර කරන්න ඔබතුමා කටයුතු කරන්න කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා unedited version එකක් අරගෙනයි කථා කරන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔව්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නිකුත් කරලා නැහැ. ඒ පිළිබඳව- [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. නැහැ. ඒක එළියට නිකුත් කළා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The unedited copy has not been released.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගේ නම සඳහන් වුණා. CDs නිකුත් කරන දෙපාර්තමේන්තුවේ මුණසිංහ මහත්මයාගේ නම සඳහන් වුණා. මේ ඔක්කෝම සඳහන් වෙලා තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
It is only a draft. Nothing has been released.
ගරු සුජීව සේනසිංහ මහතා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe
Sir, thank you for the discrimination also that you have been showing me. I have been trying to raise my issue for about -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
There is no discrimination.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe
For about 10 minutes, I have been asking for a chance to raise a point of Order. You have given everybody a chance, but not me.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You have to wait till my eye catches you.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Right.

Now, Sir, I will refer you to Standing Orders No. 25, which states, I quote:

> " An urgent motion directly concerning the privileges of Parliament shall take precedence of all other motions as well as Orders of the Day. The proceedings of Parliament may be interrupted at any moment, save during the progress of a division....."

Sir, I do not have to continue; I think you know this.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Then, Sir, Standing Order No. 84 (vii) and (viii) states, I quote:

> "(vii) No Member shall refer to any other member by name.
> (viii) No member shall impute improper motives to any other member."

Sir, we spent about one hour on this. But, still my name has been mentioned and a proper Order has not been given by you.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The same issue was raised by the Hon. Sajith Premadasa.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Yes. So, I am saying that it is a draft -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have taken note of it.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
So, Sir, can you give an Order now? If my name has been mentioned, give a Ruling on that.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I will look into it.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, there is no Ruling given by you.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
If required, a Ruling will be given. - [*Interruption*.]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
No, this is not about an inquiry; I am not talking about an inquiry.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I will take note of what you say.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
No, Sir, I am not talking about an inquiry.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, I have taken note of what you say.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, it is not about an inquiry I am talking. Either you do not understand or your brain does not work!

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Now, you have raised your point of Order.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
I am saying that my name has been mentioned. That is all I am saying, not about an inquiry. And, there is no Order given by you. - [*Interruption.*] Sir, there is no Order by you. - [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, you can raise that in short.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I listened to you, Hon Sajith Premadasa. I have taken note of it. I will do what is required.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Thank you, Hon. Deputy Speaker. I also got up 15 times. It is the sixteenth time that you are permitting me to raise the point of Order. So, thank you very much, Sir, for the consideration.

Sir, whatever he said today or had said yesterday, you gave a definite Order. Now, they cannot restart this, going into the whole history. Sir, he cast aspersions -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
No, they are not canvassing. They cannot canvas as an Order has been given. - [*Interruption.*] ගරු සජිත් ප්‍රේමදාස මහතා. [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්නේ Erskine May සහ Kaul & Shakdher ගැනයි. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I listened to you. I took your point.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තවම ඉවර නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I cannot allow you to make a speech here.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, let me say just four sentences.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You have already raised a point of Order. Points of Order have to be precise.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වාක්‍ය 4ක් කථා කරන්න ඉඩ දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You have precisely raised it and I have taken note of it.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාක්‍ය 4ක් කියන්න ඉඩ දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර දිසානායක මහතා. [බාධා කිරීමක්]

Hon. Member this is not a place to make submissions.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, you are not giving me a hearing.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have given you a hearing.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
You are discriminating me.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර දිසානායක මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
You are discriminating me - [*Interruption*.]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 84 (vii) සහ 84 (viii) කෙරෙහි මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ස්ථාවර නියෝගවල පැහැදිලි ලෙසම මේ විධියට සඳහන් වී තිබෙනවා:

(vii) කවර මන්ත්‍රීවරයකු විසින් හෝ වෙන මන්ත්‍රීවරයකු නමින් සඳහන් නොකළ යුතු ය.

(viii) කවර මන්ත්‍රීවරයකු විසින් හෝ අන්‍ය මන්ත්‍රීවරයකුට අයුතු චේතනා ආරෝපණය කරමින් කථා නොකළ යුතු ය.

මීට මොහොතකට පෙර ගරු විපක්ෂ නායකතුමා මගේ නම සඳහන් කරමින් යම් කථාවක් කළා. විශේෂයෙන්ම එතුමා ඒ කථාවට පාදක කර ගත්තේ එක්සත් ජාතික පක්ෂය විසින් ඉදිරිපත් කොට තිබෙන විශ්වාස භංගය සාකච්ඡාවට ගන්න ඉඩ නොදී මවිසින් නියුගෝ වාවේස් ජනාධිපතිවරයාගේ අභාවය පිළිබඳ සාකච්ඡාවක් ගෙනාවා කියලායි. මවිසින් ආණ්ඩුවේ වුවමනාව ඉටු කළා යැයි කියන අයුතු චෝදනාවක් තමයි විපක්ෂ නායකතුමා විසින් ලෙස කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි පක්ෂ නායක රැස්වීමේදී සිදු වුණේ මොකක්ද? 8වැනි දා පක්ෂ නායක රැස්වීමක් කැඳෙව්වා. එය කැඳවූ වෙලාවේ ආණ්ඩුව විසින් මාර්තු 19, 20, 21 සහ 22 දිනයන්වල පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වීම සඳහා කාල සටහනක් හදාගෙන ඇවිත් ඉදිරිපත් කළා.

ඊට පස්සේ අප එකඟතාවකට ඇවිත් තිබුණා, අප්‍රේල් මාසයේ මුල් සතියේ 9 වන දින පමණක් පාර්ලිමේන්තුව කැඳවන්න. ගරු ඩිලාන් පෙරේරා අමාත්‍යතුමාට එරෙහිව තිබෙන විශ්වාස භංග යෝජනාව විවාද කිරීමට අප්‍රේල් මාසයේ 9 වන දා රජයේ වෙන කටයුත්තක් නැත්නම් අවස්ථාව ලබා දෙන්න එකඟතාවකට ආවා. ඒක තමයි පක්ෂ නායක රැස්වීමේදී පැමිණි එඟතාව. මා මේ අවස්ථාවේදී ගරු විපක්ෂ නායකතුමාට කියන්නේ, පක්ෂ නායක රැස්වීමේදී ඇති වූ එකඟතාව මොකක්ද කියා කරුණාකර එතුමාගේ නියෝජිතයන්ගෙන් අසා දැන ගන්න කියන එකයි. අඩුම තරමින් එම එකඟතාවන් පිළිබඳව වූ Minutes කියවන්න. ඒක කියවනවා නම් සිහි බුද්ධියෙන් කියවන්න. තේරුම් අරගෙන කියවන්න. එහෙම කියෙව්වොත් තමයි එහි අඩංගු වෙලා තිබෙන්නේ මොකක්ද කියලා තේරෙන්නේ. 19 වන දා පැවැති ඒ රැස්වීමේ කාර්ය සටහන් මා ළඟ තිබෙනවා. 19 වන දා කාර්ය සටහන්වල පැහැදිලි ලෙස සඳහන් කර තිබෙන්නේ -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔය කලින් කිව්ව කථාව නේද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ. නැහැ. මේ වෙන චෝදනාවක්. ඒක නොවෙයි මේ කියන්නේ. මට විපක්ෂ නායකතුමා අයුතු චෝදනාවක් නැඟුවා. මවිසින් වාවේස් ජනාධිපතිතුමාගේ අභාවය පිළිබඳ යෝජනාව ගනු ලැබුවේ, ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ විශ්වාස භංග යෝජනාව පස්සට දැමීමේ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් හැටියටයි කියලා. ඒක මුළුමනින්ම වැරදියි. එවැනි ප්‍රකාශයක් කිරීම පිළිබඳව මා ඉතාම කනගාටු වෙනවා. අප පක්ෂ නායක රැස්වීමේදී පැමිණි එකතාව තමයි අපේල් 9 වන දින ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාට එරෙහිව ඇති විශ්වස භංග යෝජනාව විවාදයට ගනු ලැබිය යුතුයි කියන එක. ඒක තමයි එදා පක්ෂ නායක රැස්වීමේදී ගනු ලැබූ තීරණය. හැබැයි, ඒ ආණ්ඩුවේ කාර්යයක් නැත්නම්. ආණ්ඩුව ඊයේ කිව්වා, යම් කාර්යයන් තිබෙනවා කියලා. එක්සත් ජාතික පක්ෂයෙන් පක්ෂ නායක රැස්වීමට සහභාගි වූ නියෝජිතයන්ගේ වගකීම තමයි, තමන් විසින් ඉදිරිපත් කර තිබෙන යෝජනාවක් ඉක්මනින් න්‍යාය පත්‍රයට ඇතුළත් කර ගැනීම; පාර්ලිමේන්තුවට ගෙන ඒම. ඒ කාර්යය ඉටු නොකර මෙතැනට ඇවිත් අභූත චෝදනා නැඟීම කිසි සේත්ම පිළිගන්න බැහැ. ඒවා වැරදිම චෝදනා. ඒවා මා හෙළා දකිනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 8 වන දා වෙච්ච සිද්ධීන් ගැන කථා කළා. අප ඉල්ලා සිටියේ අප්‍රේල් 8 වන දා හෝ 9 වන දා තිබෙන පාර්ලිමේන්තුවේ රැස්වීමට ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාට එරෙහිව ඇති විශ්වාස භංග යෝජනාව විවාදයට ගත යුතුයි කියන එක. ඒක රැස්වීම් වාර්තාවේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා. නමුත් අපේ හඬට ඇහුම්කන් දුන්නේ නැහැ. මේ විධියටයි කරන්නේ කියලා ආණ්ඩු පක්ෂ තීරණයක් කළාම අපි නිශ්ශබ්දව හිටියා. නමුත් මා මෙතුමාට කියන්නට ඕනෑ, පසු ගිය කාලයේ වේ ගුවේරා ලංකාවේ වේ කී දෙනෙක් මැරුවාද? හත් අට දාහක් මරා දැම්මා. වාවේස් ගැන කථා කරන්න ඉස්සෙල්ලා ඒ ගැන කථා කරන්නට එපායැ එහෙම නම්.[බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඉතාම කෙටියෙන් මම ඔබතුමාගෙන් අහන්නේ එක ප්‍රශ්නයයි. ස්ථාවර නියෝග 83 යටතේ එකම සභා වාරයක දී එක කරුණක් ගැන දෙවතාවක් සාකච්ඡා කරන්න බැහැ නේ. ස්ථාවර නියෝග 83 යටතේ එකම කරුණක් ගැන දෙවතාවක් සාකච්ඡා කරන්න බැහැ. 21 වැනි දා විවාදයට ගන්න කියලා මම පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවේ යෝජනාවක් 20 වැනි දා ඉදිරිපත් කළා. සභානායක කාර්යාලයෙනුත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේ

කාර්යාලයෙනුත් කිව්වා, 20 වැනි දා උදේ අනුර දිසානායක මන්ත්‍රීතුමා එවැනි අදහසක් තිබෙන ප්‍රකාශයක් කරපු නිසා, පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවේ මගේ යෝජනාව ගන්න බැහැ කියලා. ඒ අනුව, එකම කරුණ දෙවතාවක් සාකච්ඡා කරන්න බැහැ. ඒකයි මගේ තර්කය.

නියෝජ්‍ය කථානායකතුමා
(*பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Deputy Speaker)
ගරු අජිත් කුමාර මහතා.

ගරු අජිත් කුමාර මහතා
(*மாண்புமிகு அஜித் குமார*)
(The Hon. Ajith Kumara)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම රීති ප්‍රශ්නයක් නඟනවා, විශේෂයෙන්ම කාරණා දෙකක් සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සතියේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය හැදිලා තිබුණේ අද දින සභාවේ පූර්ණ කාලයම හියුගෝ චාවේස් ජනාධිපතිවරයාගේ අභාවය පිළිබඳ යෝජනාව සාකච්ඡා කරන්නයි. ඒ යෝජනාවටයි අද කාලය වෙන් කරලා තිබුණේ. ඒ යෝජනාවට වෙන් කරපු කාලය ලබා නොදීම මේ සභාවේ මන්ත්‍රීවරුන්ට කරපු අසාධාරණයක් ලෙස මම සලකනවා. ඒ වාගේම මම කනගාටුවට පත් වෙනවා, එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ යෝජනාවට මේ තරම් කරන බාධාව ගැන. එය එතුමාගේ පෞද්ගලික අදහසක් ද, පක්ෂයේ අදහස් ද කියලා මම දන්නේ නැහැ. ඒකට අපේ විරෝධය ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ රීති ප්‍රශ්නය මෙයයි. මේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම්වල ගන්න තීරණ මම දැන ගත්තේ මේ සභාවේදීයි. විශේෂයෙන් අද දවස වෙන් වෙලා තිබුණේ හියුගෝ චාවේස් ජනාධිපතිවරයා ගැන කථා කරන්නයි. නමුත් රජයත්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමට සහභාගි වුණු මන්ත්‍රීවරුත් ඒ න්‍යාය පත්‍රය සංශෝධනය කරලා, අද අපි කිසි සේත්ම එකඟ නොවන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ඇති නියෝගය ගැන සාකච්ඡා කරන්න තීරණය කර තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මගේ විරෝධය ප්‍රකාශ කරනවා, මෙවැනි දෙයක් හදිසියේ ඉදිරිපත් කිරීම ගැන. මම එය පෞද්ගලිකව දැන ගත්තේ මේ සභාවේදීයි. එයට කිසි සේත්ම අපේ එකඟතාවක් නැහැ. ඒ වාගේම, හියුගෝ චාවේස් ජනාධිපතිවරයා ගැන මේ සභාවේ කරන සාකච්ඡාවට බාධාවකින් තොරව අවශ්‍ය කාලය ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(*பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Deputy Speaker)
ඒ විරෝධය වාර්තා කරනවා.
ගරු අජිත් පී. පෙරේරා මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කොපමණ වේලාවක් තිබෙනවාද?

නියෝජ්‍ය කථානායකතුමා
(*பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Deputy Speaker)
ඔබතුමාට විනාඩි 15යි තිබෙන්නේ. දැන් points of Order අරගෙන ඉවරයි නේ.

[අ.භා. 2.28]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)
බොහොම ස්තුතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ මුදල් ඇමතිවරයෙක් ඉන්නවා. එතුමාගේ විෂය යටතේ ඇති කාරණයක් තමයි අද මේ සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ මුදල් ඇමතිවරයා අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ඇති මේ නියෝගය ඉදිරිපත් කරන්නේ මොන පදනමකින් ද, ඒ සම්බන්ධ රජයේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා පැහැදිලි කරන්න අවශ්‍යයි. නමුත් අද එහෙම කරන්නේ නැහැ. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් ඉන්නවා. ඒ ඇමතිවරයාට මුදල් නියෝජ්‍ය ඇමති කියලා ධුරයකුත් දීලා තිබෙනවා. ඒ නියෝජ්‍ය ඇමතිවරයා අද මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා, මේ නියෝගය ඉදිරිපත් කරන්නේ මොන පරමාර්ථයකින්ද කියලා පැහැදිලි කරන්න අවශ්‍යයි. සදාචාරය ඒකයි.

ඒ නියෝජ්‍ය ඇමතිවරයාත් අද මේ සභාවේ නැහැ. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ඉදිරිපත් කරන නියෝගවලින් කරලා තිබෙන්නේ මුද්දර ගාස්තු අධික ප්‍රමාණයකින් වැඩි කරන එක. මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මීට කලින් රුපියල් විසිපහක් වුණු, දිවුරුම් ප්‍රකාශයකට ගහන මුද්දර ගාස්තුව අද රුපියල් දෙසිය පණහක් දක්වා වැඩි කරලා තිබෙන බව. තිබුණේ රුපියල් විසිපහට! දුප්පත් මිනිහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන්නේ බැංකු කටයුත්තකට, උසාවි කටයුත්තකට, දරුවෙක් පාසලකට දා ගන්න වාගේ තමන්ගේ ජීවිතයේ අවශ්‍ය කටයුත්තකට. ඒ දිවුරුම් ප්‍රකාශයට අද රුපියල් 250ක් වටිනා මුද්දර ගහන්න වෙලා තිබෙනවා. රුපියල් විසිපහ රුපියල් දෙසිය පණහ කරන කොට- දහගුණයකින් වැඩි කරන කොට, සියයට දාහකින් වැඩි කරන කොට- ඇයි දුප්පත් ජනතාව මත මේ වාගේ අධික බද්දක් පනවන්නේ කියලා මේ සභාවට පැහැදිලි කරලා දෙන්න විෂය භාර ඇමතිවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා ඉන්න ඕනෑ. "විෂය භාර අමාත්‍යවරයා ජනාධිපති ධුරය දරනවා, ඒක නිසා එතුමාට එන්න බැහැ" කියලා කියන්න බැහැ. මූල්‍ය බලය පාර්ලිමේන්තුවට තිබෙන නිසා පාර්ලිමේන්තුවට ඒ කරුණු පැහැදිලි කරන්න පුළුවන් නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ මෙතැන ඉන්න ඕනෑ. එතුමාත් නැහැ. ඒ නිසා මෙය මේ සභාවට කළ ඉතාම බරපතළ අගෞරවයක් වශයෙන් සලකන්න අවශ්‍යයි.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රක්ෂණ ඔප්පුවක් මත හැම රුපියල් දාහකටම තව රුපියලක් වැඩි කරලා තිබෙනවා. මේ රක්ෂණ ලබා ගන්නේ ධනවත් මිනිස්සු නොවෙයි. රක්ෂණ ලබා ගන්නේ අභිංසක මිනිස්සු; මේ රටේ සාමාන්‍ය ජනතාව. හැබැයි, ඒ ගෙවන ගෙවන හැම රුපියල් 1,000ක් පාසාම වැඩිපුර මුද්දර ගාස්තුවක් අය කරනවා. මෙහෙම වැඩි කරන්නේ ඇයි කියලා පැහැදිලි කරන්න අවශ්‍යයි. නමුත් එහෙම පැහැදිලි කරන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය බලපත්‍ර ගාස්තුව වැඩි කරලා තිබෙනවා. දැන් සෑම නීතිඥවරයෙකුම පාහේ -කිහිප දෙනකු හැර- නොතාරිස්වරුන් වශයෙන් කටයුතු කරනවා. ඒ වාගේම නීතිඥවරු නොවන නොතාරිස්වරුන් ඉන්නවා. මේ නොතාරිස්වරුන්ගේ බලපත්‍ර ගාස්තුව තිබුණේ රුපියල් 10ට. රුපියල් 10ක් වුණු ඒ බලපත්‍ර ගාස්තුව රුපියල් 2,000ක් දක්වා වැඩි කරලා තිබෙනවා. මේක එක් වරක් ගෙවන ගණනක් නොවෙයි, අවුරුද්දක් පාසාම ගෙවන්න ඕනෑ ගණනක්. මොකක්ද මේ වැඩි කිරීම සඳහා තිබෙන තර්කය, මොකක්ද තිබෙන පදනම, මොකක්ද මෙහෙම කරන්න හේතුව, කොච්චර මුදලක් මේ හරහා උපයා ගන්න අපේක්ෂා කරනවාද කියන කාරණා ගැන මේ සභාවට පැහැදිලි කරන්න අවශ්‍යයි, මේ නියෝග අනුමත කර ගැනීමට කලින්.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ඒ විතරක් නොවෙයි, මත්පැන් විකිණීමේ ව්‍යාපාර සඳහා බලපත්‍ර ගාස්තු රුපියල් 20,000ක් කරලා තිබෙනවා. ඒක නම් ප්‍රශ්නයක් කියලා කියන්න බැහැ. මොකද, මතට තිත ප්‍රතිපත්තිය නිසා. "තිතට මත" වුණත් මේක ලොකු ප්‍රශ්නයක් නොවෙයි. ඊට අමතරව පස්වැනි කාරණය තමයි, credit cards. අද දුප්පත්, පොහොසත් හැමෝම තමන්ගේ ජීවිතයේ පහසුවට credit cards පාවිච්චි කරනවා. ඒ credit cards මත සෑම රුපියල් 1,000ක් සඳහාම වැඩිපුර රුපියල් 15ක් ආණ්ඩුව ගන්නවා. ඒ කියන්නේ රුපියල් 1,000ක් ගෙවනවා නම් අපි අමතර බදු නැතිව, අමතර දීමනා නැතුව රුපියල් 1,015ක් ගෙවන්න ඕනෑ. දැන් ඒ විධියට වැඩිපුර බද්දක් ගන්න ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කුමක්ද? ඒ පිළිබඳ සාකච්ඡා කරන්න අද ඇමතිවරයා නැහැ; නියෝජ්‍ය ඇමතිවරයා නැහැ. මේක ඉතාම බරපතළ, ලජ්ජාසහගත දෙයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රෙගුලාසිවල නැති, තවමත් ඉදිරිපත් වුණේ නැති විශාල බදු ප්‍රමාණයක්; විශාල මුද්දර ගාස්තු ප්‍රමාණයක් අද වැඩි කරලා තිබෙනවා. මේ රටේ ඔප්පු ලියා පදිංචි කිරීමේ ක්‍රියාදාමය තුළ කෙනෙකුගේ ඉඩමක අයිතිවාසිකම් හොඳ එකක්ද කියා පරීක්ෂා කර බලන්න ඉඩම් කන්තෝරුවේ පරීක්ෂාවක් කරන්න ඕනෑ. තමන්ගේ ඉඩමේ අයිතිය පිරිසිදුද නිරවුල්ද කියා පරීක්ෂා කර බලන්න ඉඩම් කන්තෝරුවේ පරීක්ෂාවක් කරන්න මීට කලින් ගෙවන්න ඕනෑ වුණේ රුපියල් 2.50යි. රුපියල් 2.50ක මුද්දරයක් ගහලා පෞද්ගලිකව හෝ නීතිඥවරයකු මාර්ගයෙන් ඉඩම් කන්තෝරුවේ ලේඛන පරීක්ෂා කරන්න පුළුවන්. හැබැයි අද ඉඩම් කන්තෝරුවේ පොතක් බලන්න, -එක පොතකට- රුපියල් 500ක් අය කරනවා. මා ඔබතුමාට පැහැදිලි කරන්නම්, ඒ අනුව දැන් වැය වන මුදල් ප්‍රමාණය. ඔප්පුවක් ලිවීමේදී යම් පුද්ගලයකු ඉඩමේ අයිතිය පිරිසිදුද නිරවුල්ද කියා බලන්න ඒ ඉඩම පරීක්ෂා කරලා බලනවා. ඒ ඉඩමේ මාර්ග අයිතිවාසිකම් තිබෙන්න පුළුවන්. බිම් කැබලි කීපයක් තිබෙන්න පුළුවන්. ඔප්පුවක එකිනෙකට වෙනස් ඉඩම් කැබලි තුනක් තිබෙනවා නම් ඉඩම් කන්තෝරුවේ පරීක්ෂා කර බලන්න විතරක් රුපියල් 1,500ක් වැය වෙනවා. ඉඩමට මිල එකඟ වුණාට පස්සේ ඔප්පුව ලියන්න කලින් දවසේ ගිහිල්ලා නොතාරිස්වරයා ආපහු ඉඩම් කන්තෝරුවේ බලනවා, ඒ අතරතුර ලියවිල්ලක් ලියැවිලා තිබෙනවාද, ඒ අතරතුර හොර ඔප්පුවක්වත් ලියැවිලා තිබෙනවාද, වැරදිලා ලේඛනයක් ලියා පදිංචි වෙලා තිබෙනවාද කියලා. නැවත ඒ ඉඩම් තුන පරීක්ෂා කර බලන්න තව රුපියල් 1,500ක් ගෙවන්න ඕනෑ. ඔප්පුව ලියා පදිංචි වුණාට පස්සේ තමන්ගේ සේවාදායකයාට ලියා පදිංචි වූ ඔප්පුව භාර දෙන්න කලින් ඒ පත් ඉරුව පරීක්ෂා කර බලලා, පත් ඉරුවේ සහතික පිටපතක් ගන්නවා, හොඳ පරිවයක් තිබෙන නොතාරිස්වරයෙකු. නැවත ඉඩම් කන්තෝරුවේ පරීක්ෂා කර බලන්න තව රුපියල් 500 ඒවා තුනක්, එනම් රුපියල් 1,500ක් වැය වෙනවා. එතකොට රුපියල් 4,500යි. ඒවායේ සහතික පිටපතක් ගත්තාම එක පත් ඉරුවකට රුපියල් 500 ගණනේ ආපහු ගෙවන්න ඕනෑ. ඒ කියන්නේ තව රුපියල් 1,500ක් වැය වෙනවා. ඒ කියන්නේ, ඉඩමේ වටිනාකම මොකක් වුණත් මුද්දර ගාස්තුවට අමතරව ඉඩම් කන්තෝරුවේ පත් ඉරු බලන්නයි, පත් ඉරුවල පිටපත් ගන්නයි රුපියල් 6,000ක් වැය වෙනවා. සමහර ගම්බද ඉඩම්වල වටිනාකමත් ඒ ගණනට කිට්ටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මා කිව්වේ පදනමක් නැතුව දිගින් දිගට මේ රටේ ජනතාවට බදු බර පටවලා ජනතාව පීඩාවට පත් කරන්න කටයුතු කරන ආකාරයයි. ඇත්තටම මේ රටේ දැන් නැත්තේ බලු බද්දයි, බළල් බද්දයි විතරයි. පුළුවන් නම් ඒකටත් බදු ගහනවා. හැම ගෙදරකම ඉන්න බල්ලෙකුට මෙච්චර මුදලක් ගෙවන්න ඕනෑ කියලා කියයි. අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ විෂය නොවුණත් මම එතුමාගෙන් අහන්න කැමතියි, ඉදිරියේදී ආණ්ඩුව බල්ලන්ටත් බදු ගහනවාද, ඒ වාගේම බළලුන්ටත් බදු ගහනවාද කියලා. මොකද එතුමා විෂය භාර ඇමතිවරයා වෙනුවට,- [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම දැන ගන්න කැමතියි, බූරුවෝ ඉන්නවා නම් ඒ බූරුවන්ටත් බදු ගහනවාද කියලා. ඒ වාගේම පෝනියේ ඉන්නවා නම් ඒ පෝනියන්ටත් බදු ගහනවාද කියලා මම දැන ගන්න කැමැතියි. බල්ලෝ, බළල්ලු, පෝනියෝ, බූරුවෝ වාගේම මේ රටේ බදු ගහන්න පුළුවන් හැම දේකටම බදු ගහන්න කල්පනාවක් තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි තිබෙන අවසානවන්ත තත්ත්වය තමයි අපි බූරුවෙක් ගැන කථා කරන කොට එවැනි නමක් නැති, කිසිම සම්බන්ධයක් නැති පුද්ගලයෙකු නැඟිටලා කියනවා, "මේ මම ගැනයි කථා කරන්නේ" කියලා. අපි පෝනියෙක් ගැන කථා කරන කොට එවැනි නමක් නැති පුද්ගලයෙකු නැඟිටලා කියනවා, "මේ කථා කරන්නේ මම ගැනයි" කියලා. ඉතින් මේක හරිම පුදුම වැඩක්. අපි හොඳාකාරවම දන්නවා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රී නාම ලැයිස්තුව බැලුවාම මේ පාර්ලිමේන්තුවේ බූරුවෝත් නැහැ, පෝනියෝත් නැහැ, ගොන්නුත් නැහැ, බල්ලොත් නැහැ කියලා. හැබැයි ඒවා ගැන කරුණු සඳහන් වෙන කොට පුද්ගලයන් නැඟිටිනවා. ඒ නිසා මේක හොඳ තත්ත්වයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, what is the point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තොප්පිය දා ගන්නවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ස්ථාවර නියෝගවලට පටහැනිව අශීලාචාර විධියට බල්ලෝ, බල්ලෝ කියනවා. ඉස්කෝලේ ළමයි අහගෙන ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ මේවා නවත්වන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකරලා තමුන්නාන්සේලා සියලු දෙනාම භාෂාවේ ශීලාචාරවත්කම ආරක්ෂා කර ගත්තොත් හොඳයි, දරුවන් ගැලරියේ සිටින නිසා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල් දරුවන් ඉන්න වේලාවේ මම කිව්වේ, "මේ පාර්ලිමේන්තුවේ බූරුවෝ නැත, මේ පාර්ලිමේන්තුවේ පෝනියේ නැත, මේ පාර්ලිමේන්තුවේ බල්ලෝ නැත, මේ පාර්ලිමේන්තුවේ බළල්ලු නැත" කියලායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිව්වේ, මෙහෙම ගියොත් බල්ලන්ටත් බළලුන්ටත් බදු ගහන්න ඉඩ තිබෙනවා කියලායි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අංගොඩට යවන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔව්, ගරු මන්ත්‍රීතුමා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අස්වර් මන්ත්‍රීතුමා වීදුරුව දිහා බලාගෙන කථා කරනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරි පුදුම තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ එවැනි සත්ව නාමවලින් ආමන්ත්‍රණය කරන්න සුදුසු පුද්ගලයන් නැහැ කියලා අපි කියන කොට, සමහර අය නැඟිටලා කියනවා, "නැහැ, නැහැ, මම ගැන තමයි මේ කියන්නේ" කියලා. මේක මහා පුදුම ප්‍රශ්නයක්. මේක අපේ කථාවට බාධාවක්. අපේ කථාව කරගෙන යන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට විශේෂයෙන් කියන්න කැමතියි, මේ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙන එනු ලබන නියෝගයට අපි විරුද්ධයි කියලා. මේ නියෝගය මඟින් ජනතාව සූරා කනවා. රුපියල් විසිපහේ දිවුරුම් ප්‍රකාශ ගාස්තුව රුපියල් 250 දක්වා වැඩි කිරීමේ සිට ඉතාම බරපතළ විධියට මේ රටේ අහිංසක දුප්පත් මිනිහා සූරා ගෙන කන මේ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගයට අපි විරුද්ධයි කියන කාරණය මා කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. තව කාරණයක් කියන්න තිබෙනවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කාරණා කිහිපයක් සඳහන් කළා. එතුමා කියපු දේවල්වලින් මා එක දෙයකට එකඟ වනවා. ඒ එකඟ වන්නේ මෙයටයි. මේ නියෝගයට අදාළ ගැසට් නිවේදනය මීට කලින් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අවධානයට ලක් වුණා. එහිදී අපි ඇහුවා, මෙම ගැසට් නිවේදනයට අදාළ නියෝගය සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්ද කියලා. මෙයට වෙනම දිනයක් අවශ්‍ය නැහැ. මුදල් පනත් කෙටුම්පතක් සම්මත කරන අවස්ථාවේදී මෙය අනුමත කර ගනිමු, එය තමයි සුදුසුම ක්‍රියා මාර්ගය කියලා කිව්වා. හැබැයි ඒ වෙලාවේ මේ විෂයය භාරව කටයුතු කරන නිලධාරිවරයාවත්, ඒ වාගේම ආණ්ඩු පක්ෂයවත් කිව්වේ නැහැ, "අපි එහෙම කරමු"යි කියලා. අවසානයේ අන්තිම මොහොතේ උපදෙසක් ලැබෙනවා, "මෙම නියෝගයත් මාර්තු 31 දිනට කලින් සම්මත කර ගන්න ඕනෑ"යි කියලා. මේක තමයි ආණ්ඩුව පත් වෙලා තිබෙන තත්ත්වය. මේක තමයි මේ ආණ්ඩුවේ නිලධාරීන්ගේ ප්‍රශ්නය. මේක තමයි මේ ආණ්ඩුවට උපදෙස් දෙන අයගේ තත්ත්වය. මේක තමයි මේ සභාවේ කටයුතු පාලනය කරන පුද්ගලයන්ගේ තත්ත්වය.

මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය අන්තිම මොහොතේ ඉදිරිපත් කිරීම ගැන අජිත් කුමාර මන්ත්‍රීතුමා ඉතාම නිවැරැදිව කරුණු ඉදිරිපත් කළා. බොහෝ මන්ත්‍රීවරු මේ සම්බන්ධයෙන් දන්නේ නැහැ. විශේෂයෙන්ම නීතිඥ වෘත්තිය හා සම්බන්ධව කරුණු දන්නා මන්ත්‍රීවරුන්ට කරුණු කියන්න, දැන ගන්න, විවාදය සඳහා සහභාගි වෙන්න අවස්ථාවක් නැහැ. මොකද, අඩු ගණනේ සතියකට පමණ කලින් අපි පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය පිළිබඳව අවබෝධයක් ඇති කර ගන්නවා. ඒ අනුව විෂයය බෙදා දෙනවා. ඒ අනුව කථා කිරීමේ අවස්ථාව ලබා දෙනවා. එම නිසා මෙහෙම කඩිනමින් වෙනස් වන එක අනිවාර්යයෙන්ම වැරැදියි. මෙය පසු ගිය සතියේ, සති එකහමාරේ දිගින් දිගටම සිද්ධ වුණා. මෙය පසු ගිය මාස කිහිපයක් තිස්සේ දිගින් දිගටම සිද්ධ වනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මීට මාස කිහිපයකට කලින් කිව්වා, මේ පාර්ලමේන්තුවේ සිද්ධ වන ඇත්ත තත්ත්වය, මේ පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටියට සිද්ධ වෙලා තිබෙන ඇත්ත තත්ත්වය, මේ පාර්ලිමේන්තුව, ජනාධිපති මන්දිරයේ සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ රබර් සීල් එකක් බවට පත් වෙලා තිබෙනවාය කියන අවාසනාවන්ත තත්ත්වය ලෝකය දැන ගත්තොත් මිනිස්සු එකතු වෙලා මේ පාර්ලිමේන්තුව ගිනි තියයි කියලා. ඒ කථාව අහගෙන හිටපු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා එදා මොනවත් නොකියා පසුව දා මා නැති වෙලාවේ, "අජිත් පෙරේරා පාර්ලිමේන්තුව ගිනි තියන්න උත්සාහ කරනවා"යි කියා කථාවක් කළා. හැබැයි අද මෙය එළිදරවු වෙනවා. එදා මා කියපු දේ නැවත නැවත පෙනෙනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එහෙම නම් ගිනි තියන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ පාර්ලිමේන්තුව ගිනි තියන්න මට වුවමනාවක් නැහැ. එක්සත් ජාතික පක්ෂය හදපු මේ ලස්සන පාර්ලිමේන්තුව ගිනි තියන්න මට වුවමනාවක් නැහැ. එක්සත් ජාතික පක්ෂය

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

බොහොම දුර දිග හිතලා; රටේ අවශ්‍යතාව ගැන හිතලා; මීට වඩා ගෞරවනීය ආණ්ඩු; මීට වඩා වගකීමෙන් වැඩ කරන ආණ්ඩු; ඒ වාගේම ගෞරවනීය පාර්ලිමේන්තුවක් තිබෙයි කියන අපේක්ෂාවෙන් වඩා ඉඩකඩ ඇති ලස්සන තැනක පාර්ලිමේන්තුව ඉදි කළා. අපි මෙතැන පාර්ලිමේන්තුව හදපු නිසා තමයි තමුන්නාන්සේලාට එය ලස්සන කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අපට මේ පාර්ලිමේන්තුව ගිනි තියන්න ඕනෑත් නැහැ; ගිනි තියවන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැබැයි ප්‍රශ්නයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව කටයුතු කරන ලජ්ජාසහගත, දුර්වල, අකාර්යක්ෂම තත්ත්වය ලෝකය දැන ගත්තොත් මිනිස්සු තුළ මේ පාර්ලිමේන්තුව ගැන මොනවා හරි ගෞරවයක් ඉතිරි වෙලා තිබෙනවා නම්, ඒකත් නැති වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මම තව කරුණක් කියන්න කැමැතියි. අද මෙතැන ප්‍රශ්නයක් මතු වුණා, හිටපු ජනාධිපති තියුගෝ චාවේස් මැතිතුමාගේ අභාවය සම්බන්ධව ශෝකය පළ කිරීමේ යෝජනාව Adjournment Motion එකක් වශයෙන් අද දවසට නියමිත කාර්යයක් විධියට ඉදිරිපත් වන්නේ ඇයි කියලා.මේ කාරණයේදී මම අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා එක්ක එකඟ වනවා. ඔව්, මේ යෝජනාව Adjournment Motion එකක් වශයෙනුයි ඉදිරිපත් වන්නේ. ඒක ප්‍රශ්නයක් නැහැ කියමු කෝ. Adjournment Motion එකක් වශයෙන් මේ යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව දෙනවා. ඒ වාගේම මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගයත් හදිසියේ විවාදයට ගන්නවා. නමුත් ඩිලාන් පෙරේරා ඇමතිවරයා සම්බන්ධව විශ්වාස භංග යෝජනාවක් අරගෙන ආපු වෙලාවේ අපි කිව්වා, අප්‍රේල් මාසයේ ගන්න පුළුවන් පළමු දිනය මේ සඳහා අපට දෙන්න කියලා. ඒ නිසා එම විශ්වාස භංග යෝජනාව ගැන අපට උනන්දුවක් තිබුණේ නැහැ කියන කාරණය වැරැදියි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
අපිත් කිව්වා, අප්‍රේල් 09 ඒ සඳහා අවස්ථාව දෙන්න කියලා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ඒ විශ්වාස භංග යෝජනාව අත්සන් කරලා අරගෙන ආපු එක්සත් ජාතික පක්ෂයේ අපට ඒ ගැන උනන්දුවක් තිබුණේ නැහැ කියන එක සම්පූර්ණයෙන් වැරැදියි. තවමත් අපට ඒ ගැන උනන්දුවක් තිබෙනවා. ආණ්ඩුවේ එකඟතාව නැතිව ඒ සඳහා අපට දිනයක් ගන්න බැහැ. ඒක තමයි ප්‍රශ්නය. අප්‍රේල් 09 වැනිදාට මේ සම්බන්ධ විවාදය යෙදී තිබුණා. හැබැයි එදා අපට ආණ්ඩු පාර්ශ්වයෙන් කිව්වේ මොකක්ද? "නැහැ, නැහැ, එදාට ගන්න බැහැ. එදාට කරන්න බැහැ. එදාට අපට තව දේවල් තිබෙනවා." කියලා කිව්වා. අපි දන්නවා, ඒක යටින් තිබුණේ මොකක්ද කියලා. එළියේ කළ සාකච්ඡාවේදී කථා වුණේ වෙන දෙයක්. ඩිලාන් පෙරේරා ඇමතිවරයාට තව කල් ඕනෑ, එතුමාට background එක හදා ගන්න ඕනෑ, campaign කරන්න ඕනෑ, පොල් ගහන්න ඕනෑ, එදාට පල්ලිවලට යන්න ඕනෑ, කෝවිල්වලට යන්න ඕනෑ, අරාබියේ සහ යුරෝපයේ සිටින ශ්‍රමිකයින් දැනුවත් කරලා එතුමාට අනුකම්පාව ලබා ගන්න කල් ඕනෑ කියලා කිව්වා. ඒ නිසා ඒ සඳහා කල් ලබා ගැනීමට අපි මැයි මාසයේ 9 වැනිදාට ඒ යෝජනාව විවාදයට ගනිමු කියලා කිව්වා. එම විශ්වාස භංග යෝජනාව අප්‍රේල් 7 තිබුණත් එකයි, මැයි 9 තිබුණත් එකයි, මේ පාර්ලිමේන්තුවේ එය සම්මත වන්නේ නැහැ. නමුත් ඩිලාන් පෙරේරා ඇමතිවරයාගේ විෂය යටතේ තිබෙන කාරණා සම්බන්ධව මේ ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද කියලාත්, එතුමා වගකීම් විරහිතව කටයුතු කරන අකාර්යක්ෂම ඇමතිවරයෙක්ය කියන කාරණයත් හෙළිදරව් කරන දවස කල් යන එක පමණයි සිද්ධ වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මම ඒ කාරණය කියමින්, අපට උනන්දුවක් තිබෙනවා, ඒ වාගේම මැත කාලයේ තිබුණු හොඳම විවාදය හැටියට ඩිලාන් පෙරේරා ඇමතිවරයා හා සම්බන්ධ විශ්වාස භංග යෝජනාවේ විවාදය අපි ඉදිරිපත් කරනවා, ඒ පිළිබඳව අවශ්‍ය සූදානම අපට තිබෙනවා, කිසිම අකාර්යක්ෂමකාවක් හෝ ප්‍රමාදයක් නැහැ කියලා මම කියනවා. දැන් මැයි මාසයේ 09 වැනිදාට ඒ සඳහා දින නියම කරලා තිබෙනවා. එදාටත් මීට වැඩිය වැදගත් පනත් කෙටුම්පත් තිබෙනවා කියලා කියන්නේ නැතිව, එදාට එම යෝජනාව විවාදයට ගනිමු. ඒ නිසා ඒ තිබෙන සැලසුම් මොනවා වුණත්, ඩිලාන් පෙරේරා ඇමතිවරයා සම්බන්ධ විශ්වාස භංග යෝජනාව එදාට අපි විවාදයට ගන්නවා. අපි උපරිම වශයෙන් කටයුතු කරලා මේ රටට ධනය අරගෙන එන, මේ රටට ආදායම් අරගෙන එන මේ රටේ දුක් වේදනා විඳින මිනිසුන්-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මැයි මාසයේ 09 වැනිදා අපි, තමුන්නාන්සේලා සියලු දෙනාම- [බාධා කිරීමක්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
නැහැ, නැහැ, මැයි මාසයේ 09වැනිදාට අපි ඒ විශ්වාස භංග යෝජනාව විවාද කරනවා. එදාට අපි මේ ඇති වෙලා තිබෙන තත්ත්වය සහ මෙය ප්‍රමාද වීමට හේතුව- [බාධා කිරීමක්] මොකද, අපි දන්නවා සම්ප්‍රදාය. ඔබතුමා මට වඩා හොඳින් මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය ගැන දන්නවා. සාමාන්‍යයෙන් මාසයක් ඇතුළත විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්නට ඕනෑ. ඒක තමයි පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය. නමුත් දැන් මාස දෙකකටත් වැඩියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේකයි ප්‍රශ්නය. අපෙන් මිනිස්සු අහනවා, ඇයි මේකට උනන්දුවක් නැත්තේ කියලා. අනුර දිසානායක මන්ත්‍රීතුමාටත් එක වර හිතුණා, මේකට උනන්දුවක් නැතුව වගෙයි කියලා. මා එතුමාට මතක් කළේ එහෙම නැහැයි කියන එකයි. [බාධා කිරීමක්] උනන්දුවක් තිබෙනවා; හොඳ උනන්දුවක් තිබෙනවා; ඉතාම උනන්දුවක් තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
අපටත් උනන්දුවක් තිබෙනවා, මේ ගැන පිළිතුරු දීලා, මෙහි සැබෑ තත්ත්වය අනුව ජයග්‍රහණය කරන්න. ඒකෙ ගැටලුවක් නැහැ. නමුත් මෙහෙම එකක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඉතිහාසය බැලුවොත් එහෙම මේ විරුද්ධ පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවන් පසුව ඉල්ලා අස් කර ගත් අවස්ථා තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
නැහැ, නැහැ, එහෙම එකක් නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, එහෙම තිබෙනවා. හැන්සාඩ් වාර්තාව අරගෙන කියවලා බලන්න. How many times have you given notice and then withdrawn later? That is the way you have been behaving.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Ajith P. Perera, your time is over. Please wind up now.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දිනට නියමිත විෂයට අදාළ නොවුණත් මේ ප්‍රශ්නය මතු වුණු නිසාත්, ඒ පිළිබඳව සුළුවෙන් හෝ වෙනත් අදහස් පළවුණු නිසාත් මේ ගැන මා කියන්න කැමැතියි. ඩිලාන් පෙරේරා ඇමතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාව මැයි මාසයේ 09 වැනිදා අපි ඉදිරිපත් කරනවා. අපි එය වාද කරනවා; තදින් වාද කරනවා. මේ රටේ ශ්‍රමිකයන් මුහුණ දීලා තිබෙන ඉතාම බරපතළ අසරණ තත්ත්වය ගැන අපි එළිදරවු කරනවා කියන කාරණය මා කියනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Anura Dissanayake.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. John Amaratunga.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Can we have an additional half-an-hour for this Debate because there are some important issues that have been raised and there are a number of Members who have expressed their willingness to speak, of course, with your consent? I hope you will cooperate.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
We have agreed to have one hour for the Debate. There would be 45 minutes for the Opposition and 15 minutes for the Government. We will have that full time.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Anura Dissanayake, you may commence your speech.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. - [*Interruption.*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, Hon. Ajith P. Perera said,
ජනාධිපති මන්දිරයේ stamp එකක් බවට මේ පාර්ලිමේන්තුව පත් වෙලා තිබෙනවා කියලා. ඒක පාර්ලිමේන්තුව හෑල්ලුවට පත් කිරීමක්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. The Hon. Anura Dissanayake, you may carry with on your speech.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
It is a matter of consent that I am only asking for. - [*Interruption.*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Anura Dissanayake, you may carry on your speech.

[අ.භා. 2.45]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ආණ්ඩුව විසින් හදිසියේම මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතට සංශෝධන කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා මෙය ඉදිරිපත් කරමින් කියූ පරිදිම 2013 වසර සඳහා ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනයට අනුරූපී වන පරිදියි මෙම සංශෝධන ඉදිරිපත් කොට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය ලේඛනය සම්මත වුණේ දෙසැම්බර් මාසයේ 08 හෝ ඒ ආසන්න දිනයක. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට පැවරී තිබෙන ප්‍රධාන කාර්ය භාරය තමයි අය වැය යෝජනාවන්හි සකස් වී තිබෙන යෝජනා නියමිත පරිදි පෙළගස්වා, නියමිත දිනවකවානුවලදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට අනුමත කර ගැනීම. මොකද, පාර්ලිමේන්තුවට තමයි අපේ රටේ මුදල් බලය පැවරී තිබෙන්නේ. විධායක ජනාධිපතිවරයාට හෝ අමාත්‍යාංශ ලේකම්වරයකුට හෝ වෙනත් කිසිවකුට නොවෙයි, පාර්ලිමේන්තුවටයි මේ මුදල් බලය පැවරී තිබෙන්නේ. ඒ නිසා ජනතාවගෙන් අය කර ගැනීම්, ජනතාවට දෙන සහන, කවර හෝ මුදල්මය තීරණ මේ පාර්ලිමේන්තුවේ සභා සම්මත කර ගත යුතුව තිබෙනවා. විශේෂයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට තවත් ඉඩ කඩක් විවෘත කර දී තිබෙනවා, මේ පාර්ලිමේන්තුවෙන්ම. එනම්, යම් බද්දක්, යම් අය කර ගැනීමක් ඔවුන්ට ඒ අවශ්‍ය අවස්ථාවකදී පනවන්න පුළුවනි. හැබැයි, මාස තුනක් ඉක්මවා යාමට පෙර එය පාර්ලිමේන්තුවේ සම්මත කරගත යුතුයි. එය විශේෂ ඉඩ කඩක්.

[ගරු අනුර දිසානායක මහතා]

වෙන කිසිදු අමාත්‍යාංශයකට එවැනි ඉඩ කඩක් හම්බ වෙන්නේ නැහැ. අනෙක් හැම අමාත්‍යාංශයකටම එවැනි කාරණයක් නීතියක් බවට පත් වෙන්නේ පාර්ලිමේන්තුවේ සම්මත කළාට පසුව පමණයි. හැබැයි මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට විශේෂ අවස්ථාවක් ලබා දීලා තිබෙනවා, තමන්ට අවශ්‍ය වන බදු සංශෝධන ඉදිරිපත් කොට මාස තුනක් ඉක්මවා යාමට පෙර සම්මත කර ගන්න. ඒක මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට පැවරී තිබෙන විශේෂ අවස්ථාවක්.

හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ මාස තුනට අදාළ වන පරිදි ලබා දී තිබෙන අවස්ථාවත් නොසලකා හරිමින්; පාර්ලිමේන්තුවේ ගෞරවය, පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාවෙන් ලබා දී තිබෙන බලය, පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාවෙන් ආරෝපණය කර තිබෙන තත්ත්වයත් -ඒ සියල්ලත්- නොසලකා හරිමින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය කටයුතු කරමින් තිබෙනවා.

දැන් ජනවාරි මාසයේ පළමුවැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි, මේ ගැසට් නිවේදනය නිකුත් කළා. මෙය මාර්තු 30 වැනිදාට පෙර පාර්ලිමේන්තුවේ සම්මත කරගත යුතුයි. මාර්තු 31 වැනිදා වන කොට ආසන්න වශයෙන් මේ පාර්ලිමේන්තුව දින 24ක් රැස් වෙනවා. එතකොට ඒ දින 24 ඇතුළත මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කර ගත යුතුව තිබෙනවා. නමුත් ආණ්ඩුව මොකක්ද කරන්නේ? අද තමයි මාර්තු මාසයේ 30 වැනිදාට පෙර පාර්ලිමේන්තුව රැස්වන අවසන් දිනය. අවසන් දිනය සඳහා න්‍යාය පත්‍රය ඊට පෙර දිනයේදී සකස් කොට අද මෙය ඉදිරිපත් කරනවා. එයින් පෙන්නුම් කරන්නේ මුදල් අමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුව පිළිබඳ දක්වන ආකල්පයයි. මුදල් අමාත්‍යවරයා මාස තුනකට වරක් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා වාඩි වීමෙන් පාර්ලිමේන්තුවේ ගෞරවය හෝ පාර්ලිමේන්තුවේ අයිතිය සුරක්ෂිත වෙන්නේ නැහැ. මුදල් අමාත්‍යවරයා හැටියට ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට නිසි ගෞරවය ඉටු කරනවා නම් කළ යුතු වන්නේ පාර්ලිමේන්තුවට පැවරී තිබෙන බලතල ඊට අනුරූපී වන පරිදි ඉටු කිරීමයි. නමුත් එසේ නොවෙයි කරන්නේ. එසේ නොකොට මේ ගෙන එන පනත් කවරේද? මේ සංශෝධන කවරේද? දැන් මේ ආණ්ඩුව "නිල් අහස අපෙයි" කියනවා; "මහ සයුර අපෙයි' කියනවා. වරායන් හදා ඒවායේ බෝඩ් ගහලා තිබෙනවා, "මාළු ඇල්ලීම තහනම්" කියලා. ගුවන් තොටුපළවල් හදා ඒවාට අහස් යානාවලට වඩා දේව යානා බස්සනවා. ඒවායේ වැඩිපුර ඉන්නේ මොණරු කියා ආරංචියි. ඒ නිසා තමුන්නාන්සේලා මහා සංවර්ධනයේ විජ්ජාව අපට නිර්මාණය කරලා දෙනවා.

හැබැයි සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලා හදන මහා සංවර්ධනයේ මිථ්‍යාවෙන් මේ රටේ ජනතාවට ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැ. ජනතාවට ප්‍රතිලාභ නොලැබෙන ආර්ථික සංවර්ධනයකින් මේ රටට ඇති ප්‍රතිඵලය කුමක්ද? සංවර්ධනය පිළිබඳ මහා මිථ්‍යාවක්, සංවර්ධනය පිළිබඳ මහා ගොඩ නැංවීමක් සංවර්ධනය පිළිබඳ මහා සිහින ලෝකයක් හදනවා. හැබැයි ජනතාවට මොකක්ද කරමින් තිබෙන්නේ. ජනතාවගේ එදිනෙදා මූලික අවශ්‍යතාවන් සියල්ලට බදු පිට බදු පටවමින්, විවිධ ලියා පදිංචි ගාස්තු වැඩි කරමින් තමුන්නාන්සේලා කටයුතු කරමින් තිබෙනවා. ඒ අනුව තමයි මේ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ඇවිල්ලා තිබෙන්නේ. ඒ අනුව තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දිවුරුම් පෙත්සමක් සඳහා වන මුද්දර ගාස්තුව රුපියල් 250 දක්වා වැඩි කරලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් ඒ ගාස්තුව රුපියල් 25ක් වශයෙන් තමයි තිබුණේ. ඒක දහ ගුණයකින් වැඩි කර තිබෙනවා. ප්‍රතිශතය බැලුවොත් ඒක සියයට දහස් ගුණයක වැඩි වීමක්. කල්පනා කර බලන්න. තමුන්නාන්සේලා මේ රටේ මහජනතාවට සංවර්ධනය පිළිබඳව මහා බොරු විගඩම් පටවමින් සැබැවින්ම කර තිබෙන්නේ මොකක්ද? දිවුරුම් ප්‍රකාශයක් සඳහා වන ගාස්තුවත් සියයට දහස් ගුණයකින් වැඩි කර තිබෙනවා. හේතුව මේකයි. තමුන්නාන්සේලාගේ භාණ්ඩාගාරය හිස්. පෙබරවාරි මාසයේ 24 වැනි දා වනකොට ලංකා බැංකුවේ තිබෙන භාණ්ඩාගාරයේ ජංගම ගිණුමත් පවත්වා ගෙන යන්නේ බැංකු අයිරාවලින්. භාණ්ඩාගාර ගිණුමත් O/Dවලින් පවත්වා ගෙන රටක් තමයි මේ තිබෙන්නේ. ලංකා බැංකුවෙයි, මහජන බැංකුවෙයි O/D හරහා රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගෙවන තත්ත්වයට තමයි තමුන්නාන්සේලා මේ රට ගෙනල්ලා තිබෙන්නේ.

ඒ නිසා අපේ බැංකු පද්ධතියත් කඩා වැටෙන අනතුරකට මුහුණ දීලා තිබෙනවා. තමුන්නාන්සේලා රට හිස් කරලා තිබෙන්නේ. මහා ණය කන්දරාවක් ගෙනැල්ලා කඳු පිටින් ගොඩ ගහලා මේ රට ණය අවදානම් රේඛාව දක්වා පහළ බස්සලා තිබෙනවා. මේ රට ලෝකය වටේ ණය ඉල්ලමින් යන නිශාචරයෙක් බවට පත් කර තිබෙනවා. කල්පනා කර බලන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි අද සාමාන්‍ය ජනතාව මත අනේකවිධ දුෂ්කරතා, අනේකවිධ බර පැටවීම් කරන්නේ. ඒ නිසා තමයි මේ ගාස්තුව රුපියල් 25 සිට 250 දක්වා වැඩි කරන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා මේ නියෝගය පෙරේදා -20වැනි දා- විවාදයට නොගත්තේ ඇයි? ආණ්ඩුවේ සමහර අමාත්‍යවරු කල්පනා කළා, 21වැනි බ්‍රහස්පතින්දා උදේ කැඳවන කැබිනට් මණ්ඩල රැස්වීමේදී මේ ගාස්තුව ටිකක් අඩු කර ගන්න කථා කරන්න හැකි වෙයි කියලා. ඔකයි රහස. 20වැනි දා මෙය පාර්ලිමේන්තුවේ විවාදයට ගත යුතුයි. මුදල් අමාත්‍යාංශයට අදාළ පනත් යටතේම මේ නියෝගයත් ගන්න කියලා අප යෝජනා කරන කොට ආණ්ඩුව එය මහ ඇරියේ වෙන මොකක්වත් නිසා නොවෙයි, 21වැනි දා උදේ කැබිනට් මණ්ඩලය රැස් වුණාම මෙහි යම් අඩු කර ගැනීමක් කර ගන්න පුළුවන් වෙයි කියලා දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා වැනි සමහර අමාත්‍යවරු සිතූ නිසායි. හැබැයි කැබිනට් මණ්ඩලයේ මූලාසනය දරන ප්‍රධානියාගේ තීරණය බවට පත් වෙලා තිබුණේ මොකක්ද? මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සභානායකතුමාට හෝ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට දුරකථනයෙන් කථා කරලා කිව්වේ මොකක්ද? ලේකම්වරයා කිව්වේ තවදුරටත් ප්‍රමාද කරන්න එපා, මේක ඉදිරිපත් කරලා සම්මත කර ගන්න කියලායි. ඒ අනුව තමයි පෙරේදා මෙම නියෝගය ගන්නේ නැතිව, ඊයේ කැබිනට් මණ්ඩල රැස්වීමේදී යම් සංශෝධනයක් ගන්න උපකල්පනය කරමින් ඉඳලා හදිසියේ අද ගෙනාවේ.

මේ දිවුරුම් ප්‍රකාශවල ගාස්තුව වැඩි කිරීම බලපාන්නේ කාටද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් පාසල් දරුවෙක් පළමුවෙනි පන්තියට භාර දෙන කොට, ඒ ලේඛන දිවුරුම් ප්‍රකාශයක් හරහා සහතික කළ යුතුව තිබෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up your speech now.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම අවසන් කරනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපේ දුවා දරුවන් එක පාසලකට විතරක් නොවෙයි application ඉදිරිපත් කරන්නේ. අවට පාසල් පහ හයකට ඔවුන් ඉල්ලුම්පත් ඉදිරිපත් කරනවා. ඒ නිසා ඔවුන්ට පාසල් ලිපි ලේඛන සහතික කිරීමේ දිවුරුම් ප්‍රකාශ සඳහා පමණක් රුපියල් 1,500කට වඩා වැඩි ප්‍රමාණයක් දරන්න සිද්ධ වෙනවා. ඒ වාගේම නොතාරිස්වරු සාමාන්‍යයෙන් වර්ෂයකට වතාවක් මහාධිකරණයේ විනිශ්චයකාරවරයාගෙන් බලපත්‍රයක් ලබා ගත යුතුයි. ඒ අනුව මේ අවුරුද්දේ නොතාරිස්වරු රුපියල් දහයේ මුද්දරය ගහලා මහාධිකරණ විනිශ්චයකාරතුමාට -ඔබතුමාත් යවන්න ඇති මා හිතන්නේ- එය තැපෑලෙන් යැව්වා. තැපෑලෙන් යැව්වාට පස්සේ මහාධිකරණ විනිශ්චයකාරතුමාගේ

කාර්යාලයෙන් ආපු පිළිතුර මොකක්ද? ඒකෙන් කියා එව්වේ ඒ සඳහා තව රුපියල් 1,990ක් අඩුයි කියලායි. රුපියල් 10, රුපියල් 2,000 දක්වා අතිශය ඉහළ දැමීමක් කර තිබෙනවා. මෙයින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි, අපේ රට පත් වී තිබෙන ආර්ථික අර්බුදයේ ගැඹුර, ආර්ථික අර්බුදයේ කඩා වැටීමයි. ඒ නිසා මේ මවන සුරංගනා ලෝකය, මේ මවන මහා සංවර්ධන ප්‍රෝඩාවන්, මිථ්‍යාවන් හැරුණු කොට මෙහි අන් යමක් නොවන බව තමයි මෙම ගැසට් නිවේදන හරහා පෙන්නුම් කරන්නේ. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Dayasiri Jayasekara. You have 10 minutes.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I have 15 minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, you have only 10 minutes.

[අ.භා. 2.56]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප දිගින් දිගටම ප්‍රකාශ කළා වාගේ, අද මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කර තිබෙන මේ නියෝගය තුළිනුත් ආණ්ඩුවට කිසිම වැඩ පිළිවෙළක් නැති බව බොහොම පැහැදිලිව ඔප්පු කර පෙන්වනවා. අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපත් බොහොම පැහැදිලිව කියනවා, මීට පස්සේ පක්ෂ නායක රැස්වීම්වලදී හදිසියෙන් එන යෝජනාවලට අපටත් එකඟ වෙන්න බැරි තත්ත්වයක් තිබෙන බව. මොකද අප පෙරේදා මේ නියෝගය ගන්න කියලා බොහොම පැහැදිලිව කිව්වා. නමුත් ඒක ගත්තේ නැහැ. එදා ගන්නේ නැතිව අද මේක ගෙනාවේ ආණ්ඩුවට යම් කිසි විධියක හදිසි කාරණයක් තිබෙන නිසාය කියලා තමයි මම විශ්වාස කරන්නේ.

විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, මේ වැඩ කිරීම් සම්බන්ධයෙන් අපට ප්‍රශ්න ගණනාවක් තිබෙන බව. අප දන්නවා ලඝු කාර්ය පටිපාටිය ගැන. හැම නඩුවකටම දිවුරුම් පෙත්සම් ගණනාවක් ඉදිරිපත් කරන්න තිබෙනවා. ඒ දිවුරුම් පෙත්සම්වලට මීට කලින් අපට ගියේ රුපියල් 25යි. රුපියල් 25ක මුද්දරයකින් තමයි දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කෙරුවේ. දැන් මේක රුපියල් 250 දක්වා වැඩි කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඔබතුමා දන්නවා උප්පැන්නයක් ගන්න ගියාම, ඒ වාගේම මරණයකදී මේ දිවුරුම් පෙත්සම් ඉදිරිපත් කරන්න සිදු වන බව. තාත්තා මිය ගියාම පුතාලාට දිවුරුම් පෙත්සම් දෙන්න වෙනවා. මහත්තයා මිය ගියාම ඒ බිරිඳට දිවුරුම් පෙත්සමක් දෙන්න වෙනවා. සාමාන්‍යයෙන් හැදුනුම් පත් ලබා ගැනීමේදී හැදුනුම් පතේ නමක් වෙනස් වුණොත්, නමක ඉස්පිල්ලක් පාපිල්ලක් වැරදුණොත් ඒකටත් දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරන්න වෙනවා. මේවා කල්පනා කර බලන විට අපට පේනවා වැඩියෙන්ම දිවුරුම් පෙත්සම් අවශ්‍ය වෙලා තිබෙන්නේ මොකටද කියලා.

සාමාන්‍යයෙන් රජයේ ඉඩම් පවරා දීමේදී හෝ රජයේ ඉඩම් සම්බන්ධ ගනුදෙනුවකදී මුද්දර ගාස්තුවල ප්‍රමාණය ඉතාම වැදගත් වෙනවා. මොකද, රුපියල් 25ට තිබුණු මුද්දර ගාස්තුව රුපියල් 250 දක්වා වැඩි කිරීමේදී ඇත්ත වශයෙන්ම අපහසුතාවට පත් වන්නේ අපේ ගම්වල සිටින දුප්පත්, අහිංසක මිනිස්සුයි. සාමාන්‍ය මුද්දර ගැහීමේ ඉඳලා අද හැම දෙයක්ම වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම එක පත් ඉරුවක් ලබා ගැනීමේ මුද්දර ගාස්තුව රුපියල් 500 කරලා තිබෙනවා. ලබන සතියේ පමණ ඒ සංශෝධන පාර්ලිමේන්තුවට ගෙන එන්න නියමිතව තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් සාමාන්‍යයෙන් ලේඛන පරීක්ෂා කිරීම සඳහා අපි එක පත් ඉරුවක් ගන්න විට රුපියල් 500ක මුද්දර අවශ්‍යයි. ගිය සතියේ එක පුද්ගලයෙක් සණසබැංකුවෙන් රුපියල් ලක්ෂ 2ක ණයක් ගන්න ගියා. ඒ පුද්ගලයාට කියලා තිබෙනවා, මේ සතියේ ඉඳලා එක පත් ඉරුවකට රුපියල් 500 ගණනේ මුද්දර ගාස්තු ගෙවන්න අවශ්‍යයි කියලා. ඔහුගේ පත් ඉරු ගණනාව ගන්න රුපියල් 11,500ක් ගෙවන්න වෙනවා. මේ අහිංසක පුද්ගලයාට පත් ඉරුවලට විතරක් රුපියල් 11,500ක් ගෙවන්න වෙලා තිබෙනවා. රුපියල් ලක්ෂ 2ක ණයක් ගන්න පුද්ගලයකු කොහොමද මේ වාගේ වියදමක් දරා ගන්නේ? මේ වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම විශේෂයෙන්ම දිවුරුම් පෙත්සමේ කාර්ය භාරය වාගේම නීතිඥවරුන්ගේ නොතාරිස් බලපත්‍රය ගැනත් කියන්නට ඕනෑ. පෙබරවාරි 28 වෙනිදා, අපි නීතිඥවරුන් විධියට අපේ ඔප්පු ලිවීමේ බලපත්‍රය අලුත් කර ගන්නවා. සාමාන්‍යයෙන් අපි මේක මීට පෙර ලබා ගත්තේ රුපියල් 10 මුද්දරයක් ගහලායි. දැන් මේ මුදද්ර ගාස්තුව රුපියල් 2,000 දක්වා වැඩි කර තිබෙනවා. ශිරාණි බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රශ්නයේදී මේ රටේ සමස්ත නීතිඥවරුන් එක මතයක් වෙනුවෙන් පෙනී සිටියා. කිහිප දෙනෙකු එහෙන් මෙහෙන්, තැන් තැන්වල කෑ ගැහුවාට සමස්ත නීතිඥවරුන් ඒ ක්‍රියාදාමයේදී එකට හිටියා. සමහර අය කිව්වා ශ්‍රේෂ්ඨාධිකරණය අපායට යවන්න ඕනෑ කියලා. අධිකරණය අපායට ගියදෙන් කිව්වා. "Go to hell" කියපු කට්ටිය හිටියා. සමහර නීතිඥ ඇමතිවරු එහෙම කිව්වා. නමුත් එහෙම කිව්වා කියලා නීතිඥවරුන් නිකම් හිටියේ නැහැ. ඒ සියලු දෙනා මේ ප්‍රශ්නයට මැදිහත් වුණා. ඒ නීතිඥවරුන්ට පහර ගැසීම සඳහා තමයි ආණ්ඩුව මේ වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙන්නේ. වෙනදා රුපියල් 10කින් තමන්ගේ නොතාරිස් බලපත්‍රය අලුත් කරන නීතිඥ මහත්වරුන්ට දැන් රුපියල් 2,000ක් ගෙවන්න වෙලා තිබෙනවා. රුපියල් 1,990ක් නැවත එවන්න කියලා දැන් ලියුමක් එවලා තිබෙනවා. මෙන්න මේකයි ඇති කරලා තිබෙන තත්ත්වය. කමක් නැහැ ඔබතුමන්ලා දිගටම මේ විධියට වැඩි කර ගෙන යන්න. ප්‍රශ්නය මේකයි. අහිංසක, දුප්පත් මිනිහාගේ මුද්දරයෙනුත්, දිවුරුම් ප්‍රකාශයෙනුත් හම්බ කරන ආණ්ඩුවක් බවට තමුන්නාන්සේලා පත් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ බොරු වියදම්වලට පාවිච්චි කරන්න මේ මුදල් අරගෙන තිබෙනවා.

අද මත්තල airport එකට යන විට flight එකේ එළවන කට්ටිය තුන් දෙනෙකු ඉන්න ඕනෑ. එක් කෙනෙක් ඇත්තටම flight එක එළවනවා. අනෙක් එක්කෙනා මොනරු එළවනවා. අනෙත් එක්කෙනා පහළට බැහැපු ගමන් වෙඩි දානවා අලි එනවාට. එක් කෙනෙකු අලි එළවනවා; එක් කෙනෙකු මොනරු එළවනවා; අනෙක් එක්කෙනා flight එක එළවනවා. හෙට අනිද්දා හැම තැනම වල් ඌරෝ; හැම තැනම කුරුළු ප්‍රහාර. තමුන්නාන්සේලා අහිංසක, දුප්පත් මිනිසුන්ගෙන් ගන්නා සල්ලිවලින් තමයි airport හදලා, මේ වාගේ බිලියන ගණන්වල ගොඩනැඟිලි හදලා ඒවායින් ගහ ගන්නේ. එම උත්සවයට ගිය මන්ත්‍රීවරුන් අපට කිව්වා, අඩුම තරමින් වතුර එකක් නැහැ කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද කිව්වේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමා නොවෙයි. මම නමක් එක්කම කියන්නද? [බාධා කිරීමක්] මම කියන කථාව අහ ගෙන ඉඳලා, නැත්නම් නැහැයි කියන්න. මේ උත්සවය අවසන් වෙලා ඇවිල්ලා මන්ත්‍රීවරු මට කිව්වා, මේ තරම් පජාති උත්සවයකට අපි ඉතිහාසයේ කවදාවත් ගිහින් නැහැයි කියලා. මම ඇහුවා මොකද කියලා. අපට උඩින් ඉන්නවා කිව්වා ඇමතිවරු. ඇමතිවරුන්ට ඉස්සරහින් ඉන්නවා කිව්වා සභාපතිවරු. අපට බොන්න තේ එකක්, වතුර එකක් නැහැ කිව්වා. කටට අව්වේ එතුමන්ලා අව්වේ වේළි වේළි පැය ගණනක් හිටියා කිව්වා.

ගරු කමලා රණතුංග මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) கமலா ரணதுங்க)
(The Hon. (Ms.) Kamala Ranathunga)
කවුද කිව්වේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමිය කිව්වේ නැහැ. ඔබතුමියට එහා පැත්තේ කට්ටිය, මෙහා පැත්තේ කට්ටිය කිව්වේ. මෙහේ කට්ටිය, අරහේ කට්ටිය ඔක්කොම මට කිව්වා. ඒකයි මම මේ කිව්වේ. ඔබතුමිය ඒ වාගේ දෙයක් කියන්නේ නැහැ, ජාතික ලැයිස්තුවෙන් පත් කරලා තිබෙන නිසා. මොකද ආපහු අයින් වෙන්න කිව්වොත් එහෙම අයින් වෙන්න වෙනවා නේ. අද බොරු වියදම් කරලා සෝබන උත්සව තියලා, ඒ උත්සවවලදී අපේ මන්ත්‍රීවරුන්ව හිරිහැරයට පත් කරනවා. මම බැලුවා අපේ සිවිල් ගුවන් සේවා ඇමතිවරයා කොහේද කියලා. ඒ උත්සවයේ ගුවන් සේවා ඇමතිවරයෙක් නැහැ. හරි නම් ගුවන් තොටුපොළ විවෘත කරන්න ජනාධිපතිතුමාත් සමඟ ළඟින්ම යන්න ඕනෑ සිවිල් ගුවන් සේවා ඇමතිවරයායි. සිවිල් ගුවන් සේවා ඇමතිවරයා අඩි 15ක් පමණ පිටුපසින් සිටිනවා. එතුමා ජනාධිපතිතුමාගේ ඇහේ එල්ලෙන්න එලවාගෙන එනවා. සිවිල් ගුවන් සේවා ඇමතිවරයා පැත්තක. නාමල් රාජපක්ෂ මහත්මයා තමයි සිවිල් ගුවන් සේවා ඇමතිවරයා වාගේ ඉන්නේ. ඇත්ත කියන්න එපායැ. මේක තමයි සිද්ධ වෙලා තිබුණේ. දැක්කාම අපට හිනා ගියා. SriLankan Airlines එකේ සභාපතිවරයා ඉස්සරහා සිටියා. Airport and Aviation Services (Sri Lanka) Limited එකේ සභාපතිවරයා ඉස්සරහා සිටියා. සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා ගව් ගණනක් පිටුපසින් සිටියා. මෙන්න බලන්න අද ඇමතිවරුන්ට අත් වෙලා තිබෙන ඉරණම. මා ඒවා ගැන කියන්නේ මොකද? මේ අය මෙතැන මහ ලොකුවට කෑ ගැහුවාට එළියට ගියාම අඳෝනා සාගරයක්. වෙලා තිබෙන දේවල් එක එක අපට කියනවා. පව් නේ. ඒ මිනිසුන් ගැනත් අප කථා කරන්න ඕනෑ. මෙන්න මේක තමයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මා කියන්නේ වෙන එකක් නොවෙයි. සාමාන්‍යයෙන් අප නීතිඥයන් විධියට දිවුරුම් පෙත්සමක් අත්සන් කළේ නොමිලේයි. දැන් මිනිස්සු අපෙන් අහනවා, සර් ඒක අත්සන් කරන්න රුපියල් 250ක් ගන්නවාද කියා. පසු ගිය සතියේ මම දිවුරුම් පෙත්සමක් අත්සන් කළා. රුපියල් 250ක් කිව්වාම ඇහුවා, ඇයි සර් වෙනදා නිකම් නේ අත්සන් කළේ; දැන් අත්සන් කරන්න රුපියල් 250ක් ගන්නවාද කියා. එතකොට මම කිව්වා, නැහැ මේ ගහපු මුද්දරයටයි කියා. මෙන්න මේ වාගේ තත්ත්වයක් අද තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2013 පෙබරවාරි මාසයේ 28වන දා මධ්‍යම රාත්‍රියේ සිට බලපවත්වන පරිදි සියයට 80කට වැඩි සැර මද්‍යසාර ගෙන්වීම තහනම් කරනවාය කියා අද ගැසට් පත්‍රය ගෙනෙනවා. පසු ගිය පෙබරවාරි 28 ඉඳලා තමයි මේක නතර කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 28වන දා පැනවූ නීතිය 7වන දා වන විට කඩලා රුපියල් කෝටි 11ක් වටිනා සැර මද්‍යසාර ස්ප්‍රීතු ලංකාවට ගෙනෙනවා. කවුද ගෙනාවේ? මීට කලින් මේ වාගේ containers 14ක් ගෙනැවිත් තිබෙනවා. මම මෙහෙම කියන්නේ වගකීමක් ඇතුවයි. මෙහෙම ගෙනාපු ඒවාට ගහපු දඩය මොකක්ද? ඒ ගෙනාපු ඒවා අද කොහේද තිබෙන්නේ? සැර මත්පැන් බොන ජාතියක් බවට අප පත් වෙලා තිබෙනවා. හෙට අනිද්දා තමුන්නාන්සේලා තවත් පනත් කෙටුම්පතක් ගෙනෙන්න. අක්මාව දියවෙනවාට ආධාර දෙන වැඩ පිළිවෙළක් අඩුම තරමේ ආණ්ඩුවෙන් ගෙනෙන්න කියා මා කියනවා. මොකද, තිනර් බීලා ලංකාවේ මිනිසුන්ගේ අක්මාව විනාශ වෙලා ජීවිත නැති වෙලා යනවා. සිරෝසිස් නොවෙයි, වෙන වෙන ඒවා හැදෙයි. ඒ වාගේ බංකොලොත් තත්ත්වයකට අද මේ රට පත් වී තිබෙන බව මා කියන්න කැමතියි. අහිංසක දුප්පත් මිනිහාගේ මුද්දරෙනුත් ගසා කන තැනකට අද මේ රට පත් වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අද මේ සභාවේ ඇමතිවරයෙක් නැහැ. මුදල් ඇමතිත් නැහැ. නියෝජ්‍ය ඇමතිත් නැහැ. මේවාට උත්තර දෙන්න කිසිම ඇමති කෙනෙක් නැහැ. අපි ජී.එල්. පීරිස් ඇමතිතුමාට කරදර කරන්නේ නැහැ. එතුමා මෙතැන බිල්ලට තියලා මහින්ද සමරසිංහ මහත්මයා එහේ ගිහින්. ඒ නිසා ජාතික භාෂා ඇමතිතුමා -අඩුම තරමේ අපායට යන්න ඕනෑ කියන ඇමතිතුමා- විසින් මේකට පිළිතුරක් දෙන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 3.05]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ජනතාව ආශ්චර්යයක් කරා ගෙන යනවා වෙනුවට දිගින් දිගටම ජනතාව විපතට පත් කරවමින්, ජනතාව මත බදු බර පටවමින්, ණය බර පටවමින් අසහනය පීඩනය වර්ධනය කරවමින් අපේ මාතෘ භූමිය හිඟන රටක් බවට පත් කරන ප්‍රතිපත්ති මාලාව තවදුරටත් සාකච්ඡා කරන මොහොතක් මේ. මහා විශාල ආර්ථික විශ්මයජනක ක්‍රියාවලියක්, මහා ප්‍රාතිහාර්යයක් අපේ රටේ ක්‍රියාත්මක වන මොහොතක, වැදගත් නියෝගයක් සාකච්ඡා කරන මොහොතක, කොටින්ම කිව්වොත් මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන්නට නියෝජ්‍ය ඇමතිවරයාටවත් කොන්ද කෙළින් තියාගෙන මේ පාර්ලිමේන්තුවට ඇවිත් විපක්ෂය ඉදිරිපත් කරන යෝජනාවලට, අපි ඉදිරිපත් කරන නිර්දේශවලට සවන් දෙන්නට තරම් කොන්දක් නැති රජයක් අද මේ රටේ ක්‍රියාත්මක වෙනවාය කියන එක මා මේ අවස්ථාවේ සඳහන් කරන්නට කැමැතියි. ජනතාව මත බදු බර පටවනවා; ණය බර පටවනවා. එහෙම බර පටවමින් මේ රටේ ලක්ෂ 200ක් වූ ජනතාව විපතට පත් කරවමින්, අසහනයට පීඩනයට ලක් කරවමින්, මේ රටේ පාලක පැළැන්තිය ජනතාවගේ කර පිටින් තමන්ගේ ලැම්බෝගිනි ජීවිතය තමන්ගේ සුර සැප ජීවිතය අධි පෝෂණයට ලක් කරවමින් මේ යුගය හරහා ක්‍රියාත්මක වන මොහොතකදී දැයට කිරුළක් උදා කරනවාය කියා මහ ලොකුවට පම්පෝරි ගහනවා.

පසු ගිය වසරේ ක්‍රියාත්මක වුණු දැයට කිරුළෙන් ලැබී තිබෙන ආනිශංසය මොකක්ද? දැයට කිරුළ තිබුණ ඔයාමඩුව ප්‍රදේශය සංවර්ධිත ප්‍රදේශයක් වෙනවා වෙනුවට අද මහා වනාන්තරයක් බවට පත් වෙලා තිබෙනවා. දැයට කිරුළ අද නටබුන් බවට පත් වෙලා තිබෙනවා. දැයට කිරුළෙන් ලැබුණු සහනයක් නැහැ; එකම නිවසක්වත් ඉදි වුණේ නැහැ. නමුත් එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසි හතර පැයම, තුන්සිය හැටපස් දවසම ඇප කැප වුණේ නිවාස ලක්ෂයේ, දස ලක්ෂයේ, පහළොස් ලක්ෂයේ වැඩ සටහන්, ගම් උදාව, උදා කළ ගම්මාන, මැතිවරණ නිවාස, ධීවර නිවාස, විසිරි නිවාස වාගේ හිසට වහළක්, හිසට සෙවණක්, ගතට නිවනක් ලබා දෙන වැඩ සටහන් හරහා මේ රටේ

සාමාන්‍ය ජනතාව සුඛිත මුදිත කරවන්නටයි කියන කාරණය මා මතක් කරන්න කැමැතියි. අද නිවාස හදන වැඩ සටහන සම්පූර්ණයෙන්ම අඩපණ වෙලා; සම්පූර්ණයෙන්ම අකර්මන්‍ය වෙලා. මහ ලොකුවට නිවාස පහළොස් ලක්ෂයක් හදනවාය කිව්ව නිවාස ඇමතිවරයා අද ආර්ථික ඝාතකයෝ සොය සොයා යනවා. නිවාස ඇමතිවරයා ආර්ථික ඝාතකයන් ගැන කථා කරන යුගයක, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ආර්ථික ඝාතකයා හැටියට හඳුන්වන යුගයක, මේ රටේ නිවාස දස ලක්ෂයක්, පහළොස් ලක්ෂයක් හදනවාය කියලා බොරුවට පම්පෝරි ගහලා, බොරු පොරොන්දු ලබා දීලා, නිවාස සංවර්ධන අමාත්‍යාංශයේ මුදල්වලින් රුපියල් ලක්ෂ තිහක් වැය කරලා කෙසෙල් කොළයේ අනුරූපයට මහී ආවරණ හදන්නට කොන්දක් තිබෙනවා නම් මේ රටේ නිවසක් නොමැති ජනතාව වෙනුවෙන් ගෙවල් ටික හදලා දෙන්න බැරි ඇයි කියලා නිවාස ඇමතිවරයාගෙන් මා අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රටේ බිම් අහලකවත් අයිතියක් නොමැති, කිසිම නිවසක අයිතියක් නොමැති පවුල් ලක්ෂ පහළොවක් ඉන්නවා. ඒ පවුල් ලක්ෂ පහළොවට පිහිට වන්නේ කවුද? බොරුවට ආර්ථික ඝාතකයෝ ගැන පම්පෝරි ගහනවා. මේ ආණ්ඩුවේ නිවාස ඇමතිවරයා නිවාස හදනවා වෙනුවට, නිවාස ඝාතන කොන්ත්‍රාත්තුව හොඳ හැටි කරනවාය කියන එක අපට මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න පුළුවන්. බොරුවට උතුරට නවෝදයලු. නැහෙනහිරට වසන්තයලු. එහෙම නැත්නම් උතුරට වසන්තයලු. නැහෙනහිරට නවෝදයලු. නිකම් වචන පමණයි. ජනතාවගේ හඳවතට දැනෙන, ජනතාවගේ බඩ කට පිරෙන කිසිම නවෝදයක්, කිසිම වසන්තයක් උදා වන්නේ නැහැ. කොන්ත්‍රාත්කාරයන්ට වසන්තයයි, නවෝදයයි උදා වෙනවා. පගාකාරයන්ට, කොමිස් ගැහිලිකාරයන්ට ඕනෑ තරම් මුදල් ලැබෙනවා. මේවා රටේ සල්ලි; ජනතාවගේ සල්ලි. ජනතාව මත බදු බර පටවලා ජනතාව මත ණයබර පටවලා මේ රටේ සම්පත් මහ දවල් සූරා කාලා මේ රටේ මහජන සම්පත් සම්පූර්ණයෙන්ම විනාශ කරලා මේ රටේ සාමාන්‍ය ජනතාවට තුටු පඬුරක් පමණක්, සොච්චමක් පමණක් ලබා දෙන ඉතාමත්ම නින්දිත යුගයක, පාසල් වැසෙන යුගයක, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ නොමිලයේ බෙහෙත් ලබා දෙනවා වෙනුවට තුණ්ඩුව පමණක් නොමිලයේ ලබා දෙන නින්දිත යුගයක, අපේ රටේ මහ රෝහල්වල වහල කඩා වැටෙන යුගයක, අපේ රටේ ජනතාවගේ කුරුවීම, ක්ෂයවීම, අඩුබර දරු උපත් වර්ධනය වන යුගයක, ජනතාවගේ දුක් ගින්න, බඩගින්න, ජනතාවගේ අදෝනාව, වේදනාව, අපේක්ෂාව -බලාපොරොත්තුව- පිළිබඳව අංශු මාත්‍රයකවත් අවබෝධයක්, හැඟීමක් ගැන මේ රටේ පාලකයන්ට හිතක් පපුවක් නැද්ද කියන එක මා මේ අවස්ථාවේ අහන්න කැමැතියි.

අද අධ්‍යාපන ක්ෂේත්‍රය සහමුලින්ම කඩා වැටිලා. හතළිස්තුන් ලක්ෂයක් පාසල් යන දුදරුවන්ට ලබා දුන්න දිවා ආහාරය අද අහිමි වෙලා. පහළොස් ලක්ෂයක් සමෘද්ධිලාභී පවුල්වලට දැන් මාස පහක් තිස්සේ සමෘද්ධි දීමනාව ලැබිලා නැහැ. පොළොන්නරු දිස්ත්‍රික්කයේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගම්බද ප්‍රදේශ නියෝජනය කරන මැති ඇමතිවරු මේ සභාවේ ඉන්නවා. ඔබලාට කට උත්තර නැහැ නේද? සමෘද්ධි සහනාධාරය මාස පහක් ලබා දීලා නැහැ. මහ ලොකුවට කථා කරනවා, ආශ්චර්යවත් ශ්‍රී ලංකාවක් ගැන. මහ ලොකුවට කථා කරනවා, සපිරි ගමයි, සුපිරි රටයි ගැන. සපිරි ගමයි, සුපිරි රටයි ගැන කථා කළාට ජනතාවගේ සුභ සාධනය වෙනුවෙන් ජනතාවට සහන ලබා දෙන්නට අංශු මාත්‍රයක් හෝ වෙන් කරන්නට හිතක් පපුවක් නැති ආණ්ඩුවක් තමයි අද ක්‍රියාත්මක වන්නේ කියන එක මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අද අපේ රටේ තරුණ විරැකියා ප්‍රතිශතය එන්න එන්නම වර්ධනය වෙනවා. අපේ ගම්බද, නගරබද අහිංසක අසරණ ජනතාවගේ, මේ රටේ නිහඬ බහුතර ජනතාවගේ දූ දරුවන් පොල් අතු පැලේ ඉඳගෙන, කුප්පි ලාම්පුවෙන් ආලෝකය ලබාගෙන, ඉතාම අමාරුවෙන් අධ්‍යාපනය ලබාගෙන, අධ්‍යාපන ඉණිමගේ පුංචිම තලයේ සිට ඉහළම තලය දක්වා ගිහින් ශක්තිසම්පන්න අධ්‍යාපනයක් ලබා ගත්තාට අද කිසිම වැඩක් නැහැ. මේ රටේ රැකියා උත්පාදනය සහමුලින් නතර වෙලා. මේ රටේ කර්මාන්ත පද්ධතිය සහමුලින් පරිහානිය කරා යනවා. එදා මේ රටට තොග පිටින් ආපු විදේශීය ආයෝජන අද සම්පූර්ණයෙන් නතර වෙලා. අද කර්මාන්තශාලා බිහි වන්නේ නැහැ. අද ග්‍රාමීය, නාගරික ආර්ථිකයේ මුදල් සංසරණයක් නැහැ. අද ආර්ථික පුනර්ජීවයක් ක්‍රියාත්මක වන්නේ නැහැ. පුනර්ජීවයක් නම් ක්‍රියාත්මක වෙනවා, රට පාලනය කරන පාලක පෙළැන්තියේ. මේ රටේ කැබිනට්ටුවට නම් තිබෙනවා වසන්තය. මේ රටේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ට තිබෙනවා නවෝදය. නමුත් මේ රටේ ලක්ෂ 200ක් වූ අහිංසක, අසරණ ජනතාවට ලබා දිය යුතු වරප්‍රසාද, ලබා දිය යුතු සහන, ජනතාව ජීවත් කරවන්නට ලබා දිය යුතු සියලු උත්තේජක කෙළින්ම හරවාගෙන තිබෙනවා, මේ රට පාලනය කරන ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් ඇතුළු කැබිනට් මණ්ඩලයට. මේ රටේ ජනතාවගේ හිස මත, කර මත, බදු බර, ණය බර ඇතුළු හැම බරක්ම පටවන මේ මොහොතේ අප පැහැදිලිව ප්‍රකාශ කරන්න කැමැතියි, මේ රට යහ මහට යොමු කළ හැක්කේ ජනතාවට ආදරය කරන, ජනතාවට සහන සපයන, ජනතාවගේ දුක්ගින්න පිළිබඳ හැඟීමක් තිබෙන, ඒ හැඟීම් සංවර්ධන ක්‍රියාවලි බවට පරිවර්තනය කළ හැකි, ජනතාවාදී, ප්‍රගතිශීලී ජනතා ආණ්ඩුවකට බව. විශේෂයෙන්, මේ රටේ ජනතාවට දැනෙන ආශ්චර්යවත් ශ්‍රී ලංකාව බිහි කිරීමේ වගකීම එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ විපක්ෂයේ අප සියලු දෙනා භාර ගන්නවාය කියන එක සතුටින් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 3.15]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කරන ලද මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය සම්බන්ධව විරුද්ධ පක්ෂය බෙහෙවින් හඬ නහලා තමන්ගේ නානාප්‍රකාර තර්ක ඉදිරිපත් කළා. අවසානයේදී ආර්ථිකයේ සෑම අංශයක් ගැනම තම විරෝධය ප්‍රකාශ කරන්න ඔවුන් උත්සාහ දැරුවා. මේ නියෝගය යටතේ බදු නිදහස් කිරීම ලබා දී තිබෙනවා යම් යම් කොටස්වලට. ඒ වාගේම, අප මුද්දර ගාස්තු වැඩි කරන්නේ වසර 7කට පසුව බව විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට සඳහන් කරන්න කැමැතියි. අපේ ආර්ථික වර්ධනයක්, ඒ ආර්ථික වර්ධනය සමඟ ඇති වී තිබෙන තත්ත්වයටත් සරිලන ලෙස ගාස්තු වැඩි කිරීමේ ක්‍රියා දාමයට තමයි අප මේ අවතීර්ණ වෙලා තිබෙන්නේ. ඒ වාගේම, අපි මුද්දර බදුවලින් නිදහස් කිරීමේ ලේඛනය ඉදිරිපත් කරනවා. එය දැනට ඉදිරිපත් කර තිබෙනවා. ඒ කිසිවක් අගය කිරීමට විරුද්ධ පක්ෂය අපොහොසත් වීම ගැන අපි කනගාටු වෙනවා. ඒ වාගේම, ඉඩම් පත්ඉරු පරීක්ෂාව පිළිබඳව හඬක් නැහුවා. එය මෙයට අදාළ කාරණයක් නොවන බවත් මා පිළිතුරු වශයෙන් විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආර්ථිකය ගැන කථා කිරීමට මත්තෙන් කාරණයක් කිව යුතුයි. විශේෂයෙන් අද සිදු වෙමින් තිබෙන සංවර්ධන ක්‍රියා දාමය මඟින් අපේ රටේ ආර්ථිකයේ කේන්ද්‍රීය අංශ සංවර්ධනය වීම ගැන විරුද්ධ පක්ෂය දැඩි වෛරයකින් කථා කරන බව අප කාටත් පැහැදිලි වෙනවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

අපි දන්නවා, වරායක් ගොඩ නඟන්න කොතරම් කාලයක් ගත වෙනවාද කියලා; ගුවන් තොටුපොළක් ගොඩ නඟන්න කොතරම් කාලයක් ගත වෙනවාද කියලා.

විරුද්ධ පක්ෂයේ ප්‍රතිපත්තිය ඒ කටයුතු නොකර විදේශිකයන්ට ඒවා සම්පූර්ණයෙන් විකුණා දැමීමයි. මේ දෙක අතර වෙනස හඳුනාගත යුතුයි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය ණය අරගෙන කරන ඒ දීර්ඝ කාලීන ආයෝජන අපේ රටේ ආර්ථිකයට කොයි තරම් ශක්තියක් වෙනවාද කියන කාරණය ගැන අපට කිසිදු සැකයක් නැහැ. මගේ මිත්‍ර විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මම මතක් කරන්න කැමැතියි, රත්මලාන ගුවන් තොටුපොළ ආරම්භ කළ දවසේ සර් ජෝන් කොතලාවල ඇමතිතුමා පාර්ලිමේන්තු විවාදයේදී කළ කථාවට අදාළ හැන්සාඩ් වාර්තාව කියවා බලන ලෙස. ඒවා කියවනවා නම් තමුන්නාන්සේලා අද මේ විධියේ කරුණු කියන්න උත්සාහ කරන්නේ නැහැ.

කටුනායක ගුවන් තොටුපළ ජාත්‍යන්තර තලයේ ගුවන් තොටුපළක් හැටියට දියුණු කිරීම නිසා ඒ තුළින් ලැබෙන විවිධාකාර ආදායම් මාර්ග පිළිබඳව නොදන්නා විධියටයි තමුන්නාන්සේලාගේ අපැහැදිලි ආර්ථික ප්‍රතිපත්තිය ප්‍රකාශ කරන්නේ. ඒ වාගේම තමයි මත්තල ගුවන් තොටුපොළ පිළිබඳවත් කථා කළේ. ඉදිරියේදී මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මේ රට ආකර්ෂණය කරන, විවිධ ක්ෂේත්‍රවල ආදායම් මාර්ග විවෘත කරන කාල පරිච්ඡේදයකට අවතීර්ණ කරන්නට අපට පුළුවන්කම ලැබෙනවා.

අද විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් උත්සාහ කිහිපයක් දැරුවා. මම ඒ ගැන කනගාටු වෙනවා. පළමුවෙන් උත්සාහ කළේ අද දින විවාදය නතර කර ගැනීමටයි. විරුද්ධ පක්ෂයේ නායකතුමා ඇවිල්ලා අද දින විවාදය නතර කිරීමේ උත්සාහයක යෙදුණා. අපි ඒ ගැන කනගාටු වෙනවා. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී යම් යම් දේ සාකච්ඡා කරලා එකඟතාවකට ඇවිල්ලා තමයි අපි මේ තීරණයට පැමිණියේ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඒ ගැන විරුද්ධත්වය ප්‍රකාශ කළා. නමුත් අවසානයේ කමිටුව හැටියට අපි එකඟතාවකට ආවා, අවශ්‍ය රෙගුලාසි අනුමත කිරීමට. ඒවා මාර්තු මාසයේ 7වැනි දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කියනවා නම් ඊයේ තමයි ඒවා ඉදිරිපත් කළේ කියලා, අපි ඒ ගැන ඉතාම කනගාටු වෙනවා. මන්ත්‍රීවරුන්ගේ මේසය මත තිබෙන ගැසට් පත්‍ර සහ ලිපි ලේඛන කියවා බලන්නේ නැති නිසා ඇති වන ගැටලුවලට තමයි විරුද්ධ පක්ෂය බොහෝ විට යොමු වෙන්නේ කියන දේ මම සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, දින 7ක් ඇතුළත පනත් කෙටුම්පතක් පිළිබඳව අධිකරණයට පෙත්සම් යොමු කරන්න පුළුවන්. එසේ සිදු වූ නිසා අපි යොදා ගත් දිනවල ඒ අදාළ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට බැරි වුණා. අධිකරණ තීන්දුව ලැබුණාට පස්සේ ඒ අදාළ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අප්‍රේල් මාසයේ එක් දිනක් පාර්ලිමේන්තුව රැස් වෙන්න යෝජනා වුණත්, දින තුනක් රැස් වීම සුදුසු බවට විපක්ෂය සහ ආණ්ඩු පක්ෂය එකඟතාවකට ආවා. ඒ අධිකරණ තීන්දු ලැබීමෙන් පසු, අප්‍රේල් මාසයේ තමුන්නාන්සේලාට තව අවස්ථාවක් උදා වෙනවා අද වාගේම වගකීමක් නැති ආර්ථික ප්‍රකාශ නිකුත් කරමින් කථා පවත්වන්නට.

තමුන්නාන්සේලාගේ ආර්ථික න්‍යාය අනුව කථා කරනවා නම්, අද වන විට බටහිර ලෝකයේ බැංකු කීයක් වැහිලා තිබෙනවාද? බටහිර ලෝකයේ ව්‍යාපාර කීයක් වැටුණාද? බටහිර ලෝකයේ රැකියා කරන ලක්ෂ ගණනක මිනිසුන්ගේ රැකියා කොපමණ නැති වුණාද? විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු, විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ඒවා කියන්නේ නැහැ. ඔවුන් කියන සුන්දර ලෝක ආර්ථික තත්ත්වය නොවෙයි අපි පසු කරන්නේ කියන ටික මම ඉතාම ඕනෑකමින් සඳහන් කරන්න ඕනෑ.

මම පුදුම වෙන්නේ නැහැ, අපේ විපක්ෂ නායකතුමා ජනාධිපති හියුගෝ චාවේස් සම්බන්ධයෙන් අනුර දිසානායක මන්ත්‍රීතුමා සමඟ ඇති වුණු විවාදය පිළිබඳව.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ස්ථාවර නියෝගයක් පෙන්වා දුන්නා විතරයිනේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ස්ථාවර නියෝගය පෙන්නුවේ සමහර විට එතුමා එම ස්ථාවර නියෝගය කියවන්නේ නැතුව වෙන්න පුළුවන්. Resolution එකක සහ Adjournment Debate එකක අතර වෙනස මගේ මිත්‍ර ජෝන් අමරතුංග මැතිතුමා දන්නවා. විපක්ෂ නායකතුමා හොඳින්ම දන්නවා.

නොදැන නොවෙයි. There is no Resolution on President Chavez but there is an Adjournment Motion. That is the procedure that we have to adopt. Hon. Anura Dissanayake, under protest, agreed yesterday but he also now realizes that this is the procedure that we have to adopt.

Secondly, මම කියන්න ආවේ ඒ කාරණය ගැන නොවෙයි. අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, විපක්ෂ නායකතුමාගේ ගුරුන්නාන්සේ හැටියට එක්සත් ජනපදය සලකා, එතුමා ඒ ගුරුන්නාන්සේව අනුගමනය කරනවාය කියලා. නමුත් ජනාධිපති ඔබාමා මැතිතුමා චාවේස් විරුද්ධවාදියෙකු හැටියට සැලකුවත්, එතුමා ලෝකයාට දුන්නු දායාදය අගය කොට එතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරලා යැව්වා. විපක්ෂ නායකතුමාගේ ගුරුන්නාන්සේත් පෙන්වා දී තිබෙනවා, ඒ කනගාටුදායක තත්ත්වය. ලෝකයේ පොහොසත් මිනිසුන් ඉන්නවා; වරප්‍රසාද ලත් ධන කුවේරයන් ඉන්නවා; දුප්පත් මිනිසුන් ඉන්නවා; ඔළුව උස්සන්නට තිබෙන ජාතීන් ඉන්නවා. මේ අතර අතිගරු ජනාධිපතිතුමාට පුළුවන්කම ලැබිලා තිබෙනවා, විවිධ ආර්ථික ගැටලු මැද ආර්ථික සංවර්ධන වේගයකට අපේ රට ලක් කරන්නටත්, අපේ රටේ ගොවි ජනතාවට, අපේ රටේ සුළු ව්‍යාපාරික ප්‍රජාවට අපේ රටේ ආර්ථිකයේ නව දොරටුවක් විවෘත කර දෙන්නටත්. බදු බර එපාය කියන රටක්, බදු නැති රටක් ලෝකයේ කිසිම තැනක නැහැ. නමුත් බදු සාධාරණීකරණය කිරීම සඳහා වූ උත්සාහයටයි අපි දැන් පැමිණ තිබෙන්නේ. එය පාර්ලිමේන්තුවේ සැලකිල්ලට භාජනය විය යුතුයි කියන කාරණය සැලකිල්ලට ගෙන තමයි අවුරුදු හතකට පස්සේ මේ මුද්දර ගාස්තු වැඩි කිරීමේ අවස්ථාවට අපි පැමිණ සිටින්නේ. බදුවලින් නිදහස් කළ යුතු අංශ රාශියක් මෙයින් නිදහස් කරලා තිබෙනවා. නියෝජ්‍ය මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාට ඉතා හදිසි කටයුත්තක නිරත වෙන්න තිබුණු නිසායි එතුමා මෙතැනට අද දින නොපැමිණියේ. ඒක විශාල ප්‍රශ්නයක් හැටියට ප්‍රකාශ කරමින් දක්වපු අදහස් ගැන මම කනගාටු වෙනවා. මොකද, අද විරුද්ධ පක්ෂයට -එක්සත් ජාතික පක්ෂයට- විශේෂයෙන් මේ කාරණය ගැන කථා කරන්න දෙයක් නැහැ. මේ ගැන කථා කරනවාට වඩා හොඳයි, අද ඉන්න එක්සත් ජාතික පක්ෂයේ අය මේ වෙලාවේ රුක්මන් සේනානායක මැතිතුමා විසින් සංවිධානය කරපු, ඩී.එස්. සේනානායක ගුණානුස්මරණයට ගිහිල්ලා තමන්ගේ පක්ෂයේ නිර්මාතෘවරයා ගැනවත් දැන ගන්නවා නම්. එහෙම දැන ගෙන සිටියා නම් මෙහෙම හැසිරෙන්නේ නැති බවත් ප්‍රකාශ කරන අතරම, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ අද දින ඉදිරිපත් කර තිබෙන මේ නියෝගය සම්මත කර ගැනීමට සහයෝගය දක්වන ලෙස ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

வினா விடுக்கப்பட்டது.

குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று என குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அறிவித்தார்கள்.

Question put.

MR. DEPUTY CHAIRMAN OF COMMITTEES, *having collected the Voices, declared that the "Ayes" had it.*

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Divide!

පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ - පක්ෂව 41 : විරුද්ධව 9 යනුවෙන් - බෙදුණේය.

பாராளுமன்றம் 43ஆம் நிலைக் கட்டளைப்படி பிரிந்தது: சார்பாக 41; எதிராக 9.

The Parliament divided under Standing Order No. 43: Ayes 41*; Noes* 9.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Adjournment Motion is to be moved by the Hon. Anura Kumara Dissanayake.

වෙනිසියුලාවේ බොලිවේරියානු ජනරජයේ ජනාධිපති අතිගරු හියුගෝ චාවේස් මැතිතුමාගේ අභාවය
வெனிசுலா பொலிவேரிய குடியரசு ஜனாதிபதி மேதகு ஹியுகோ சாவேஸ் அவர்களின் மரணம்
DEMISE OF HIS EXCELLENCY HUGO CHAVEZ, PRESIDENT OF THE BOLIVARIAN REPUBLIC OF VENEZUELA

[අ.භා. 3.32]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කර සිටිනවා.

"මෑත කාලයේ ලෝක දේශපාලනයේ ජනතාවාදී ප්‍රවණතාවක් නියෝජනය කළ වෙනිසියුලාවේ ජනාධිපති හියුගෝ චාවේස් මැතිතුමාගේ අභාවය පිළිබඳව මෙම ගරු සභාව ශෝකය පළ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කර සිටී."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෙනිසියුලා බොලිවේරියානු ජනරජයේ ජනාධිපතිව සිටි හියුගෝ චාවේස්ගේ අභාවය පිළිබඳව ශෝක යෝජනාව ගෙන එන්නේ ඔහු කෙරෙහි පවතින ඉතාමත් ළෙන්ගතුභාවය හා දැඩි සහෝදරත්වයෙන් යුතුවයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හියුගෝ චාවේස් ජනාධිපතිවරයා මෑත කාලයේ ජාත්‍යන්තර වශයෙන් විශාල ආන්දෝලනයකට තුඩු දුන්, සාකච්ඡාවට බඳුන් වූ නායකයෙක් බව අප කවුරුත් දන්නවා. එපමණක් නොව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෙනිසියුලාවේ, අන්කවිධ දුක් ගැහැටවලට මුහුණ දී තිබුණු, වරප්‍රසාද අහිමි වුණු, අයිතීන් අහිමි වුණු, ගිල්වා දැමූ ඒ පීඩිත ජනතාවගේ හෘද ස්පන්දනයත් එක්ක ඒකාබද්ධ වෙමින් රට පාලනය කළ, රාජ්‍ය පාලනය කළ නායකයෙක්. එපමණක් නොව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයේ වාමාංශික දේශපාලනයන්ට, අධිරාජ්‍ය විරෝධී දේශපාලනයන්ට මහත් ජවයක්, මහත් ආස්වාදයක්, මහත් බලාපොරොත්තුවක් ඔහු කැටුව ආවා. ඒ විතරක් නොවෙයි, ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන්ගේ මහත් වෛරයකට සහ මහත් සතුරුභාවයකට ඔහු ලක් වුණා. එය තමයි අද උදේ මේ පාර්ලිමේන්තුවේදීත් පෙන්නුම් කළේ. හියුගෝ චාවේස් ජනාධිපතිවරයා පිළිබඳව අධිරාජ්‍යවාදීන්ගේ තිබුණු වෛරය, ඔවුන්ගේ තිබුණු කෝපය, වෙනිසියුලාවේ ජනතාවගේ ආර්ථිකය සහ ස්වාභාවික සම්පත් සූරාගෙන කෑමට එරෙහිව ගෙන යන අරගළය හරහා ඔහු තුළ ගොඩ නැඟී තිබුණු වෛරය අධිරාජ්‍යවාදීන් ප්‍රකාශයට පත් කරමින් තිබුණා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! will an Hon. Member propose the Hon. Udith Lokubandara to the Chair?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I propose that the Hon. Udith Lokubandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපේ හිටපු ජනාධිපති චාවේස් මැතිතුමා පිළිබඳ සාකච්ඡාව හුදු පුද්ගලයකුගේ ඝාතනයක් පිළිබඳව නොවේ; හුදු තවත් එක් රාජ්‍යයක නායකයකුගේ අභාවප්‍රාප්ත වීමක් පිළිබඳව නොවේ. මෑත කාලයේ ලෝකයේ වාමාංශික ව්‍යාපාරයන්ටත්, ප්‍රගතිශීලී

[ගරු අනුර දිසානායක මහතා]

ව්‍යාපාරයන්ටත් මහත් ආස්වාදජනක තත්ත්වයක් ඇති කරන ලද නායකයකුගේ අභාවය පිළිබඳව තමයි අද මේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ අපි සාකච්ඡාවට බඳුන් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හියුගෝ චාවේස් හුදු පුද්ගල අභිමඛයක ප්‍රතිඵලයක් නොවෙයි. වෙනිසියුලාවේ ජනරජයේ ජනාධිපති ධුරයට ඔහු පත්වීමට වෙනිසියුලාව මෙහෙයවීම සඳහා ඔහුගේ අතට එහි පාලන බලය ආවේ හුදු අභිමඛයක ප්‍රතිඵලයක් ලෙස නොවේ. ඒ වන විට ජාත්‍යන්තරයේ දේශපාලනයත්, විශේෂයෙන්ම ලතින් ඇමෙරිකානු කලාපයේ දේශපාලනයත්, ඒ වාගේම තවත් විශේෂ කොට වෙනිසියුලානු රාජ්‍යයේ තිබුණු දේශපාලනයත් ඔහු වැනි නායකයෙක් වෙනිසියුලාව තුළ බිහි කිරීම සඳහා ඉතාමත් අවශ්‍ය වන වටාපිටාවක් නිර්මාණය කළා.

1990 දශකය ආරම්භ වන්නේ වාමාංශික දේශපාලනයන්ට ඉතාමත් අහිතකර, මානසිකත්වයන් බිඳ වැටෙන දේශපාලනයක් ලෝකය තුළ නිර්මාණය වෙමින්. සෝවියට් රුසියාව ප්‍රමුඛ සමාජවාදී කඳවුර එක්දහස් නවසිය අනූව දශකයේ කඩා වැටනවාත් සමඟම ලෝකයේ බල තුලනය වෙනස් වන්නට පටන් ගත්තා. ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී ලෝකයක්, එක තැනකට බලය කේන්ද්‍රීය වන ලෝකයක්; ඒක ධ්‍රැවීය ලෝකයක් නිර්මාණය වන්නට පටන් ගත්තා. සමාජවාදී සෝවියට් රුසියාව ප්‍රමුඛ සමාජවාදී කඳවුර පැවැති කාලයේ ලෝකය තිබුණේ ද්වි කේන්ද්‍රීය ප්‍රධාන කඳවුරු දෙකක් ලෙස. එම නිසා ලෝකයේ බල තුලනයට, ලෝකයේ යහ පැවැත්මට, මිනිස් සංහතියේ පැවැත්මට, ඔවුන්ගේ සංවර්ධනයට එය හිතකර තත්ත්වයක් නිර්මාණය කර තිබුණා. එහෙත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්දහස් නවසිය අනූව දශකය ආරම්භයේ ඒ බල තුලනය මුළුමනින්ම බිඳ වටිටවා ඇමෙරිකානු එක්සත් ජනපදය ප්‍රමුඛ ඒක ධ්‍රැවීය ලෝකයක් නිර්මාණය කරනු ලැබුවා. 1990 න් පස්සේ විශේෂයෙන් ලෝකයේ ආර්ථික න්‍යාය පත්‍රය දියත් කරනු ලැබුයේ එක්සත් ජනපදයේ චුවමනාවන් අනුව අටවා ගන්නා ලද ආර්ථික පෙරමුණු විසිනුයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ලෝක වෙළඳ සංවිධානය එක්සත් ජනපදය ප්‍රමුඛ කොට ගත් ආර්ථික පෙරමුණු හැටියට කටයුතු කරමින් තිබුණා. ඒ වාගේම ඇමෙරිකා එක්සත් ජනපදය තමන්ගේ සංස්කෘතික පෙරමුණු හැටියට තමන් සතුව තිබෙන මහා තාක්ෂණික බලය; චිත්‍රපට වේවා, රූපවාහිනී නාලිකා වේවා, විවිධ සංනිවේදන මාධ්‍ය වේවා, ඒවා උපයෝගී කොට ගෙන ලෝකය පුරා තමන්ගේ සංස්කෘතික ආධිපත්‍යය වේගයෙන් පතුරුවන්නට පටන් ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජනපදය තමන්ගේ යුද පෙරමුණ වෙනුවෙන් රටවල් ආක්‍රමණය කිරීම, රටවලට පහර දීම, රටවල කුමන්ත්‍රණ ඇති කිරීම සුලභ කාරණාවක් බවට වර්ධනය වන්නට පටන් ගත්තා. ඒ වෙනුවෙන් නේටෝ හමුදාවත්, ඒ වෙනුවෙන් විටෙක එක්සත් ජාතීන්ගේ සංවිධානයත්, ඒ වෙනුවෙන් විටෙක ඇමෙරිකා එක්සත් ජනපදයේ හමුදාවත් උපයෝගී කර ගනු ලැබුවා. ඒ වාගේම ලෝකය වෙනුවෙන් දේශපාලන න්‍යාය පත්‍රය සකස් කරනු ලැබුයේ එක්සත් ජනපදය කේන්ද්‍ර කර ගත් අධිරාජ්‍යවාදයයි. ලෝකය පුරා බෙදුම්වාදයත්, ලෝකය පුරා ෆෙඩරල්වාදයත් ශක්තිමත් රාජ්‍යයන් දුබල කිරීම වෙනුවෙන් ක්‍රියා මාර්ග අනුගමනය කරමින් තිබුණා. එම නිසා එක්දහස් නවසිය අනූවේ දශකයෙන් පස්සේ එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදය විසින් මුළුමනින්ම ලෝකය ගිල ගන්නා ලද අතර, මුළුමනින්ම තමන්ගේ දේශපාලන, ආර්ථික, යුද්ධමය, සංස්කෘතිකමය න්‍යාය පත්‍රය ලෝකයේ අස්සක්මුල්ලක් නැර ව්‍යාප්ත කරන්නට ඉතා හොඳ ඉඩකඩක් විවෘත කර ගෙන තිබුණා. ඒ ඉඩකඩින් කිසි සේත්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලතින් ඇමෙරිකානු කලාපයට ගැලවෙන්නට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ලතින් ඇමෙරිකානු කලාපය විශේෂයෙන්ම එම එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදයේ මහා රළ ප්‍රවාහයට ගොදුරු වන්නට පටන් ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම එක්දහස් නවසිය හැත්තෑවේ දශකයේ මුල් භාගයේ ආර්ථික අර්බුදය සමඟ ඇමෙරිකාව විසින් ලතින් ඇමෙරිකානු කලාපයේ දේශපාලනය තුළ අන්ත දක්ෂිණාංශික හමුදා ආණ්ඩු හා ඒකාධිපති බලයන් පාලනයට ගෙනාවා. 1970 න් ආරම්භ වුණු මහා ආර්ථික අවපාතය ලතින් ඇමෙරිකානු කලාපයට ඉතිරි කර දුන්නේ, එහි නිර්මාණය කළේ එක්සත් ජනපදයට හිතකර වූ, එක්සත් ජනපදයේ චුවමනාවන් අනුව හසුරුවන හමුදා ජුන්ටාවන් සහ ඒකාධිපති පාලනයක්. බොලිවියාව, චිලිය, ඉක්වදෝරය, උරුගුවේ, ආර්ජන්ටිනාව, එල් සැල්වදෝරය, බ්‍රසීලය, වැනිසුලාව, කොලොම්බියාව මේ හැම රාජ්‍යයකම එක්කෝ හමුදා ජුන්ටාවන්, එක්කෝ ඒකාධිපති පාලනය දියත් කරන්නට ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදයේ සමාජ, ආර්ථික දේශපාලන චුවමනාවන්ට හැකියාව ලැබුණා. ඒ විතරක් නොවෙයි. නව ලිබරල් වාදය හරහා අවුරුදු දෙකහමාරක තුනක කාලයක් එම කලාපය දැඩි සූරා කෑමකට ලක්වන්නට පටන් ගත්තා.

1990 වන විට ආර්ජන්ටිනාවේ උද්ධමනය සියයට 8000කින් ඉහළ ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ජන්ටිනාවේ මුදල් ඒකකය කිසිදු සැලකිල්ලට භාජනය නොවන, කිසිදු වටිනාකමක් නිර්මාණය නොකරන මුදල් ඒකකයක් බවට පරිවර්තනය වී තිබුණා. ආර්ජන්ටිනාවේ උද්ධමනය සියයට 8,000 දක්වාත්, බ්‍රසීලයේ උද්ධමනය සියයට 5,000 දක්වාත් ඉහළ අගයක් ගනු ලැබුවා. ඒ නිසා මුළු ලතින් ඇමෙරිකානු කලාපයම 1990 දශකයේ ආරම්භ වන්නේ මහා විපත්තිදායක, මහා සූරාකෑමට ලක් වුණු, ප්‍රජාතන්ත්‍රවාදය අවුරන ලද ඒකාධිපති රාජ්‍යයක් ගොඩ නඟන ලද කලාපයක් ලෙසයි. එහිදීත් වෙනිසියුලාව විශේෂ ස්ථානයක් ගනු ලැබුවා. 1989 දී කාලෝස් ඇන්ද්‍රස් පෙරේස් ජනාධිපති ධුරයට පත් වුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශ අනුව ලංකාවේ වාගේම සිදු වූ සහන තෙල් මිල ඉහළ දැමීම ඇතුළු කප්පාදු කිරීමේ වැඩසටහන හේතුවෙන් සමාජ, ආර්ථික, දේශපාලන අර්බුදයක් පැන නැඟුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අද අපට කොන්දේසි සකස් කරලා දෙනවා වාගේම, ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි ඒකකයක මිල විදුලි පිරිවැයත් එක්ක ගළපන්න; ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විදුලි ඒකකයක මිල එම සංස්ථාවේ පිරිවැයත් එක්ක ගළපන්න කියලා එදා වටිටෝරු හදලා වෙනිසියුලාවට අත හැරියා. ඒ සඳහා ඇමෙරිකන් එක්සත් ජනපද ගැති කාලෝස් ඇන්ද්‍රස් පෙරේස් ජනාධිපතිවරයාව උපයෝගි කොට ගත්තා. ඒ විතරක් නොවෙයි. ඒ හේතු කොට ගෙන ජනතාව කැරලි ගැහුවා. වැඩ වර්ජන ඇති වුණා. ඒ වෙලාවේ 2,000කට ආසන්න පිරිසක් මිය ගියා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා වෙනිසියුලාව ආර්ථික වශයෙන් විපත්තිදායක, ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් නුසුදුසු, ඒකාධිපති පාලනයකට යට වෙච්ච, වරප්‍රසාද ලත් පෙළැන්තියක් ඉන්න, ඒ වාගේම දිළිඳු ජනතාවක් ජීවත් වන රටක් බවට පත් වී තිබුණා. එයට එරෙහිව වෙනිසියුලාවේ ප්‍රගතිශීලී ජනයා කැරලි ගැහුවා; අරගළ කළා.

1992 දී එහි ප්‍රමුඛතාවක හියුගෝ චාවේස් නම් ලුතිනන් කර්නල්වරයා කටයුතු කරමින් තිබුණා. ඔහු 1992 දී වෙනිසියුලාවේ ජනතාව පත් වී තිබුණ අධිරාජ්‍යවාදයේ ගොදුරට එරෙහිව හමුදාව හරහා බලය අත්පත් කර ගැනීමක් සඳහා සූදානම් වුණා. ඒකෙන් ඔහු පෙන්නුම් කළේ මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? රටක ප්‍රජාතන්ත්‍රවාදය මුළුමනින්ම අවුරලා නම්, රටේ මුළු සම්පත් එම රටේ ජනතාවට සාධාරණ ලෙස බෙදනවා වෙනුවට අධිරාජ්‍යවාදී රටවල් තමන්ට චුවමනා පරිදි ඒවා හසුරවමින් තිබෙනවා නම්, තමන් ජීවත් වන රට මාතෘ භූමිය කර ගත්ත ජනතාවට අනේක විධ දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා නම්, එම රටටත්, රටේ ජනතාවටත්

අසීමිතව ප්‍රේම කරන, හෘදය සාක්ෂියක් ඇති පුද්ගලයකු හැටියට ඔහු කළ යුතු වන්නේ එයට එරෙහිව නැගී සිටීමයි. හැබැයි ඔහු ඒ සඳහා තෝරා ගනු ලැබුවේ -අපි අනුමත කරනවාද, නැද්ද කියන එක වෙනම ප්‍රශ්නයක්- තමන් නියෝජනය කරමින් තිබුණු, තමන් ඒ වන කොට කටයුතු කරමින් තිබුණු හමුදා ලුහිනන් කර්නල් තනතුරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය අසාර්ථකභාවයට පත් වුණා. එය අසාර්ථකභාවයට පත් වූවාට පසුව කාලෝස් පෙරේස්ගේ ආණ්ඩුව විසින් හියුගෝ චාවේස් සිරභාරයට ගනු ලැබුවා. තමන්ගේ රටත්, තමන්ගේ ජනතාවත් මුහුණ දී තිබෙන අසීමිත වේදනාකාරී අත් දැකීම තමයි, එයට එරෙහිව අරගළ කරන්න; නැගී සිටින්නට මේ ලුහිනන් කර්නල්වරයා පොළඹවනු ලැබුවේ. අද මේ මොහොතේ මේ රටටත් මේ රටේ ජනතාවටත් සිදු වී තිබෙන විපත්තිදායක තත්ත්වය පිළිබඳව හැඟීමක් තිබෙන, මේ රටේ ජීවත් වන හෘදය සාක්ෂියක් තිබෙන සෑම ජන කොට්ඨාසයක්ම, සෑම පුරවැසියෙකුම ගත යුතු ආදර්ශයක් හැටියට තමයි එය තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ රටත්, තමන්ගේ ජනතාවත් අසීමිත ලෙස සූරා කෑමට ලක් වී තිබෙනවා නම්, අසීමිත ලෙස වද වේදනාවලට ලක් වී තිබෙනවා නම්, රටේ ඒකාධිපති වියරුවක් නිර්මාණය වී තිබෙනවා නම්, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය සහ නිදහසේ අයිතිය මුළුමනින්ම අවුරලා තිබෙනවා නම්, හෘදය සාක්ෂියක්, ධෛර්යයක් තිබෙන මනුස්සයකු හැටියට එදා හියුගෝ චාවේස් ඔහු දරපු තනතුර උපයෝගි කොට ගනිමින් එයට එරෙහිව නැගී සිටියා. එය දේශපාලනික වශයෙන් හොඳද, නරකද කියන එක වෙනම කරුණක්. හැබැයි ඔහු නැගී සිටියේ කවරක් වෙනුවෙන්ද? ජනතාවගේ පීඩිතභාවය, ජනතාවගේ නිදහස වෙනුවෙන්. ඒ වෙනුවෙන් ඔහු එදා -1992- අසාර්ථක හමුදා ක්‍රියාවලියකටයි අවතීර්ණ වුණේ.

ඔහු අත් අඩංගුවට ගත්තාය කියලා වෙනිසියුලාවේ තත්ත්වය යහපත් වුණේ නැහැ. එන්න, එන්නම වර්ධනය වීමක් තමයි සිදු වුණේ. 1993 දී කාලෝස් ඇන්ද්‍රස් පෙරේස් ජනාධිපතිවරයා දූෂණ චෝදනා මත දෝෂාභියෝගයකින් පහ කළා. ඒ ජනාධිපතිවරයාට එරෙහිව දූෂණ චෝදනා එල්ල වුණා. ඒ චෝදනා වෙනිසියුලාවේ පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට ගැනුණා. වෙනිසියුලාවේ පාර්ලිමේන්තුව ඔහුට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනැල්ලා ඒ ජනාධිපතිවරයා එයින් නෙරපා දමනු ලැබුවා. විශේෂයෙන්ම ඇමෙරිකන් එක්සත් ජනපදයෙන් දෙන ලද ඇමෙරිකන් ඩොලර් මිලියන 17ක් වංචා කිරීම පිළිබඳව ඔහුට චෝදනා ඉදිරිපත් වුණා. එදා පෙරේස් ජනාධිපතිවරයා මොකක්ද කිව්වේ? ඔහු ඒ ඩොලර් මිලියන 17 නිකරගුවාවේ සැන්ඩිස්ටාවරුන්ට එරෙහිව චමොරෝ බලයට ගෙන ඒම සඳහා වියදම් කළ බව කිව්වා. එදා සැන්ඩිස්ටාවරුන්ට එරෙහිව ඇමෙරිකන් එක්සත් ජනපදය මිලියන 17ක් ලබා දුන්නාය, ඒ ඩොලර් මිලියන 17 ඔවුන්ගේ අරමුදල් වෙනුවෙන් පාවිච්චි කළා කියලා එදා වෙනිසියුලාවේදී ඒ සාකච්ඡාවේදී එළිදරව් වීමක් සිදු වුණා. ඒ නිසා මේ මහා මුදල් කොල්ලය හේතු කොටගෙන 1996 දී හිටපු ජනාධිපතිවරයා දූෂණ චෝදනා මත සිරගත කළා. සෑම ඒකාධිපති පාලකයකුටම, සෑම හොර නායකයකුටම, සෑම දූෂිත පාලකයෙකුටම උරුම විය යුතු ඉරණම 1996 දී වෙනිසියුලාවේ පෙරේස් ජනාධිපතිවරයාට උරුම වුණා. මා හිතනවා ඉන්න සියලු නායකයන්ම ඒ පිළිබඳව සිහි බුද්ධියෙන් කටයුතු කළොත් හොඳයි කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඉතිහාසයෙන්, ඒ ජීවිතයෙන් අපේ රටේ දේශපාලනයට, අපේ රටේ දේශපාලකයන් වන අප කාටත් මහා අත් දැකීම් සම්භාරයක් උකහා ගන්න තිබෙන බව තමයි පෙන්නුම් කරන්නේ. ඒ විතරක් නොවෙයි. අනතුරුව 1996 ජූනි මාසයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් වෙනිසියුලාවට ඩොලර් මිලියන 1,400ක -බිලියන 1.4ක- ණය මුදලක් ලබා දුන්නා. ජූලි මාසයේ නැවතත් බිලියන 1.4ක ණය මුදලක් ලබා දුන්නා. ඒ ණය මුදල් හරහා අසීමිත කොන්දේසි ඉදිරිපත් කරනු ලැබුවා. පෞද්ගලීකරණය, රාජ්‍ය ආයතන විකිණීම එකම මන්ත්‍රය බවට පත් කර ගත්තා. ඒ පාලනය මුළුමනින්ම එක්සත් ජනපදයට යටත් වුණු වෙනිසියුලාවක්, එක්සත් ජනපදයේ සූරා කෑමට යටත් වුණු වෙනිසියුලාවක්, එක්සත් ජනපදයේ වුවමනාවන්ට අනුව ආර්ථිකය හසුරුවන වෙනිසියුලාවක්, එක්සත් ජනපදයට අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ පුඩුව දියත් කරන වෙනිසියුලාවක් නිර්මාණය කරලා තිබුණා. ඒ රටේ ප්‍රගතිශීලී ජනයාට හෝ වාමාංශික ජනයාට එය කිසිසේත්ම ඉවසුම්ගත කරුණක් බවට පත් වුණේ නැහැ. ඒ වාගේම 1998 දී හිටපු පෙරේස් ජනාධිපතිවරයා දූෂිත මුදල් එක්සත් ජනපදයේ බැංකුවල තැන්පත් කර ඇති බව හෙළිදරව් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදත් විශාල සාකච්ඡාවක් තිබෙනවා, ස්විස් බැංකුවල සල්ලි තැන්පත් කරලා තිබෙන්නේ කවුද කියලා. එක වේලාවක ස්විස් බැංකුවල ශ්‍රී ලංකාවේ තැන්පත් කරලා තිබෙන මුදල් ප්‍රමාණයන් පිළිබඳ කියැවුණා. හැබැයි නම් ගම් එළිදරව් වුණේ නැහැ. හැබැයි පෙරේස් ජනාධිපතිවරයා ඒ හොරා ගන්නා මුදල්, ඒ දූෂිත මහා ධනස්කන්ධය ඇමෙරිකා එක්සත් ජනපදයේ බැංකුවල තැන්පත් කරලා තිබෙන බව හෙළිදරව් වුණා. මෙන්න මේ සමාජ වටපිටාව, ඒ කියන්නේ එක පැත්තකින් ජාත්‍යන්තර තත්ත්වය, අනෙක් පැත්තෙන් ලතින් ඇමෙරිකානු කලාපයේ දේශපාලනය, ඒ වාගේම වෙනිසියුලාවේ දේශපාලනය තමයි චාවෙස් කෙනෙකු නිර්මාණය කළේ. සාමාන්‍යයෙන් ගත්තොත් ඉතිහාසය මිනිස්සු නිර්මාණය කරන්න යන කොට මිනිස්සු ඉතිහාසය නිර්මාණය කරන්න යනවා. ඒ ඉතිහාසය තමයි, ඒ ඓතිහාසික තත්ත්වය තමයි චාවෙස් නම් නායකයෙක් වෙනිසියුලාවේ බිහි කරනු ලබන්නේ.

1998 චාවෙස් නායකත්වය දුන් වාමාංශික සන්ධානය පාර්ලිමේන්තුවේ බහුතරය දිනා ගන්න සමත් වෙනවා. 1998 දෙසැම්බර් මාසයේ ජනාධිපතිවරණයක් පවත්වනවා. ඒ ජනාධිපතිවරණයේදී වෙනිසියුලාවේ හිටපු ලෝක රූ රැජිනක් තරගයට ඉදිරිපත් වෙනවා. බොහෝ අය හිතනවා, ඇයගේ රූපශ්‍රීය හරහා ඒ ජනතාව අමන්දානන්දයට පත් කරලා, මුසපත්භාවයට පත් කරලා ජයග්‍රහණය කරන්න පුළුවන් වෙයි කියලා. ඇමෙරිකන් එක්සත් ජනපදය වැනි රාජ්‍යයන් සහ මහා පරිමාණ තෙල් සමාගම් ඒ මැතිවරණයේදී චාවෙස්ගේ ජයග්‍රහණයට එරෙහිව මහා මුදල් කන්දරාවක් සහ ප්‍රචාරක ව්‍යාපෘතියක් දියත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1998 ජනාධිපතිවරණයේදී කවුරුත් නොසිතූ පරිදි, කවුරුත් අපේක්ෂා නොකරපු පරිදි චාවෙස් සියයට 53ක ඡන්ද ප්‍රතිශතයක් අරගෙන ජයග්‍රහණය කළා.

1999 පෙබරවාරි මාසයේ වෙනිසියුලාවේ ජනාධිපතිවරයා හැටියට එතුමා දිවුරුම් දුන්නා. චාවෙස් ජනාධිපතිවරයාට පැවරී තිබුණු කාර්ය භාරය කුමක්ද? වෙනිසියුලාව අධිරාජ්‍යවාදීන්ගේ තෝතැන්නක් බවට පත් වෙලා තිබුණු රටක්; සියලුම සම්පත් අධිරාජ්‍යවාදීන්ගේ බහු ජාතික සමාගම් විසින් ගිල ගෙන තිබුණු රටක්; සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය අහුරමින් ඒකාධිපති පාලනයක් නිර්මාණය කර තිබුණු රටක්; දිළිඳු ජනයා අන්ත අසරණභාවයට පත් කර තිබුණු රටක්. ඒ තමයි, චාවෙස් හිටපු ජනාධිපතිවරයාට 1999 පෙබරවාරි මාසයේදී ලැබුණු වෙනිසියුලාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා පළමු කොටම කළේ කුමක්ද? එතුමාගේ මූලික අභිප්‍රාය බවට පත් වූයේ වෙනිසියුලාවේ ජනතාවට අවශ්‍ය වන ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමයි. එය අතිශය වැදගත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම දේශපාලන ගමන් මහකදී බලයට පත් වන්නේ, ඒ දේශපාලන ගමන් මහට එරෙහි වන ඊට වෙනස් ප්‍රවණතාවක් නම්, ඒ ප්‍රවණතාවේ මූලික කාර්ය භාරය තමයි ඒ රට පාලනය කරන මූලික නීතිය ගොඩ නැඟීම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු ආණ්ඩුවේ නීතිය නොවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටේ ජනතාවගේ මූලික නීතියයි. ඒ තමයි වැදගත්ම සංකල්පය. එහෙම නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කළ යුත්තේ කෙසේද? පෙබරවාරි මාසයේ බලයට පැමිණි එතුමා අප්‍රේල් මාසයේ ව්‍යවස්ථාදායක

[ගරු අනුර දිසානායක මහතා]

සභාවක් පත් කළා. ඒ ව්‍යවස්ථාදායක සභාවට ජනතාවගේ යෝජනා, අදහස් ලබා ගත්තා. මාස හයක කාලයකදී අවස්ථා ගණනාවක් මේ ව්‍යවස්ථාදායක සභාව රැස් වෙමින් වෙනිසියුලාවට ගැළපෙන ව්‍යවස්ථාවක්, ජනතාවගේ වුවමනාවන් නියෝජනය කරන ව්‍යවස්ථාවක් සකස් කළා. අවසානයේදී 1999 දෙසැම්බර් මාසයේ 05වන දා එය ජන මත විචාරණයකට ලක් කළා. එය තමයි වෙනිසියුලාවේ ඉතිහාසයේම වැදගත්ම දේ. වෙනිසියුලාවේ ජනතාව විසින් පාලනය කර ගත යුතු නීතිය, වෙනිසියුලාවේ ජනතාව යටත් වන මූලික නීතිය, එම ජනතාවගේ කැමැත්ත ලබා ගැනීම වෙනුවෙන් ජනමත විචාරණයකට ගෙන ගියා. ව්‍යවස්ථාව සම්මත කර ගැනීම තුළ තිබුණේ හුදු පෞද්ගලික අභිලාෂයන් හෝ හුදු පාලන බලය කෑදර ලෙසට ඩැහැ ගැනීමේ අපේක්ෂාවන් නොවෙයි. හියුගෝ චාවේස් ජනාධිපතිවරයා තුළ තිබුණේ තමන්ගේ රටේ ජනතාවට, තමන්ගේ රටට කවර නීතියක් අවශ්‍ය වෙයිද කියා සොයා බැලීමේ අපේක්ෂාවයි. ඒ වෙනුවෙන් ව්‍යවස්ථායක සභාව ගොඩ නැඟීම, ජනතාවගේ අදහස් ගැනීම, අනතුරුව ජන මත විචාරණයකට යොමු කිරීම සිදු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබුණා; 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබුණා; දැනට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තිබෙනවා. හැබැයි මේ කිසිදු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මේ රටේ ජනතාවගේ අනුමැතිය යටතේ සකස් කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් නොවෙයි. කවර හෝ ආකාරයකින් බලය ගෙන, පාර්ලිමේන්තුව තුළ තමන්ට තිබෙන ඒ බලය උපයෝගී කොට ගෙන තමයි, මේ සෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්ම නිර්මාණය කළේ. පාලක පන්තියේ වුවමනාවන් නියෝජනය වන පරිදි තමයි අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් නිර්මාණය කළේ. වෙනිසියුලාවේ ව්‍යවස්ථාව හැදුවේ ඊට වඩා හාත් පසින්ම වෙනස් ආකාරයකටයි. එතුමා ව්‍යවස්ථාදායක සභාවක් කැඳවීම, ජනතාවගේ අදහස් හා යෝජනා ගැනීම, අනතුරුව ජන මත විචාරණයට ලක් කිරීම සිදු කළා. ඒ ජන මත විචාරණය හරහා නව බලයක් ජනාධිපතිවරයා සතු වන බව සත්‍යයි. ජනාධිපති ධුරය සඳහා තරග වැදීමේ ධුර දෙකේ කාලය එතුමා ඉවත් කළා. හැබැයි ඒ ඉවත් කරනු ලැබුවේ ජනතාවගේ අනුමැතියකින්; ඊනියා 2/3 බලයකින් නොවෙයි. සල්ලි දීලා, වරදාන දීලා ගොඩ නඟා ගන්නා ලද 2/3 බලයෙන් නොවෙයි, ඒ සංශෝධනය කළේ. ඒ මුළු ව්‍යවස්ථාවම වෙනස් කළේ ජනතාවගේ අනුමැතියට යටත්වයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට නිදහස ලැබී දැන් අවුරුදු 65ක් ගත වුණා කියලා කියනවා. හැබැයි මේ අවුරුදු 65ක් මුළුල්ලේ අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගණනාවක් දැකලා තිබෙනවා; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගණනාවක් දැකලා තිබෙනවා. ඒ එක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකටවත්, ඒ එක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකටවත් මේ රටේ ජනතාවගේ අනුමැතිය ගත්තේ නැහැ. ඒ හැම එකක්ම කළේ පාර්ලිමේන්තුවේ ඔළු ගෙඩි මාරු කිරීමේ සෙල්ලමෙන්.

හියුගෝ චාවේස් ජනාධිපතිවරයෙක්. එතුමා එතුමාගේ ව්‍යවස්ථාව සකස් කර ගත්තා. එසේ කළේ අන් කවරකින්වත් නොවෙයි, ජන මත විචාරණයක් මඟිනුයි. ඒක තමයි වැදගත්. ඊට පස්සේ එතුමා බලයට පත් වෙන කොට තිබුණු ව්‍යවස්ථාවේ ජනාධිපති ධුරයයි, අලුතෙන් හදපු ව්‍යවස්ථාවේ ජනාධිපති ධුරයයි අතර වෙනසක් තිබෙන බව එතුමා දුටුවා. ඒ නිසා එතුමා කල්පනා කරනවා, අලුතෙන් හදන ලද ව්‍යවස්ථාවට අනුව ජනාධිපති ධුරය හොබවන්න තමන්ට සාධාරණ අයිතියක් නැහැ කියලා. ඇයි ඒ? තමන් පත් වුණේ තිබුණු ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයා වශයෙන් නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා එතුමා මොකක්ද කරන්නේ? 2000 වසරේ යළි ජනාධිපතිවරණයක් කැඳවනවා. යළි ජනාධිපතිවරණයක් කැඳවා අලුත් ව්‍යවස්ථාවේ බලතල ප්‍රකාරව ජන මත විචාරණයකින් නැවත ජයග්‍රහණය කරලා නව ජනාධිපතිවරයා වශයෙන් එතුමා පත් වනවා. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මේක නොවෙයිද? ජනතාවගේ අනුමැතිය මේක නොවෙයිද? දැන් චාවේස් ගැන මහා බිල්ලන් මවන, චාවේස්ට මහා විරෝධත්වයෙන් කථා කරන ඇමෙරිකා එක්සත් ජනපදයේ රුකඩයන් බවට පත් වෙලා තිබෙන, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව කිසිදු තේරුමක් නැති හර සුන් වවන දොඩවන නායකයින්ගේ කාර්යය මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978 දී අපේ රටේ අලුත් ව්‍යවස්ථාවක් හැදුවා. හැබැයි 1977 දී මහ මැතිවරණය පවත්වන්නේ තිබෙන ව්‍යවස්ථාවට අනුවයි. ඒ ව්‍යවස්ථාව සංශෝධනය කරලා ජනාධිපති ධුරයක් හදලා අලුත් ව්‍යවස්ථාවෙන් ජනාධිපති ක්‍රමයේ වාඩි වෙනවා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා බලයට පත් වන ව්‍යවස්ථාවේ විධායක ජනාධිපති ධුරයක් තිබුණේ නැහැ. ඒක නාම මාත්‍ර එකක්. හැබැයි එතුමා බලයට පත් වෙලා පාර්ලිමේන්තුවේ හයෙන් පහක බලය අරගෙන ඒ හරහා පාර්ලිමේන්තුවේ විධායක බලය ආරෝපණය කර ගන්නවා. එතැනින් තමයි එතුමා පටන් ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි චාවේස් ජනාධිපතිවරයාගේ ලක්ෂණය මොකක්ද? එතුමා 1999 දී ජනාධිපති ධුරයේ වාඩි වෙන්නේ තිබුණු ව්‍යවස්ථාවේ ජනාධිපති බලතල සහිතවයි. නමුත් එතුමා ජන මත විචාරණයකින් අලුත් ව්‍යවස්ථාවක් හදනවා. එතුමා කියනවා, "පැරණි ව්‍යවස්ථාව අනුව බලයට පත් වුණු මට නව ව්‍යවස්ථාවේ ජනාධිපති බලතල හිමි නැහැ. ඒ නිසා නව ව්‍යවස්ථාවේ ජනාධිපති බලතල හොබවන්න නම්, නව ව්‍යවස්ථාවට අනුව මා ජනාධිපති ධුරයට පත් විය යුතුයි" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කවර ලක්ෂණයක්ද? ජනතාවගේ සාධාරණ කැමැත්ත එය නොවෙයිද? ජනතා නියෝජනයේ සැබෑ අර්ථය එය නොවෙයිද? ජනතාව සවි බල ගන්වනවා කියන එකේ සැබෑ තේරුම එය නොවෙයිද? ජනතාවගේ උස් නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, ජනතාවගේ අයිතීන් පිළිගන්නවා කියන එකේ ප්‍රධාන අර්ථය එය නොවෙයිද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෑත ඉතිහාසයේ එවැනි නායකයෙක් අපට හම්බ වෙලා නැහැ. අපේ ඉතිහාසය හොයනවා නම්, මොකක්ද අපට දක්නට තිබෙන්නේ? 1970 දී බලයට පත් වන ආණ්ඩුව තමන්ගේ ජන රජ ව්‍යවස්ථාව හදා ගැනීම වෙනුවෙන් අවුරුදු දෙකක් ගත කරනවා. ඊට පස්සේ මොකක්ද කරන්නේ? ඒ ගත වුණු අවුරුදු දෙක සඳහා ඒ ආණ්ඩුව 1975 සිට 1977 දක්වා නව කාලයක් ගන්නවා. එහෙම ඉතිහාසයකුයි අපට තිබෙන්නේ. එහෙම ඉතිහාසයක් තිබෙන අපට චාවේස්ගේ ආදර්ශය වන, ජන මත විචාරණයට ජනතාවගේ තිබෙන කැමැත්ත තේරුම් ගැනීම ඉතාමත් පුදුමසහගත කරුණක් බව අප කාටත් පැහැදිලියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ පාර්ලිමේන්තුවේ මේ විවාදය සාකච්ඡාවට බඳුන් කිරීම වැළැක්වීම සඳහා විවිධ පන්නයේ රීති ප්‍රශ්න හැදීමේ අරමුණ මොකක්ද? ඒ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදීන් නොවෙයි; සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයේ ගුණාංගයන් මේ සභාව තුළ, මේ රට තුළ සාකච්ඡා කිරීම නොවෙයි. තමන්ගේ සැඟවී තිබෙන ගූඪ ඉතිහාසය -සැඟවී තිබෙන රහස් ඉතිහාසය-, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා මාර්ග සභාව හමුවේත්, රට හමුවේත් හෙළිදරව් වීම වැළැක්වීමයි ඔවුන්ට වුවමනා වී තිබෙන්නේ. එය තමයි ඇමෙරිකානු එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාගේ සිට එහි අධිරාජ්‍යවාදයටත් වුවමනා වී තිබුණේ. ජනතාවත් එක්ක තිබෙන සැබෑ බැඳීම, ජනතාව කෙරෙහි තබන විශ්වාසය ආරක්ෂා කරලා චාවේස්ගේ සැබෑ ගුණය ලෝකයට පෙන්වා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, 2002 දී එතුමාගේ රාජ්‍යයට එරෙහිව විශාල කුමන්ත්‍රණයක් පැන නඟිනවා. ඒ හමුදා කුමන්ත්‍රණය මුළුමනින්ම මෙහෙය වනු ලැබුවේ එක්සත්

ජනපදයේ අධිරාජ්‍යවාදීන් විසිනුයි. ඇමෙරිකාවේ "ටයිම්ස්" පුවත්පත වාර්තා කරනවා, ඇමෙරිකාවේ ජනරාල්වරු ඇතුළු ඉහළ දේශපාලකයින් 2002 අවුරුද්දේ අප්‍රේල් මාසයේ 11වැනි දා පැන නංවන ලද කුමන්ත්‍රණය හරහා වාවේස් බලයෙන් පහ කරන්න පුළුවන් වේවි කියලා.

එතුමාට එරෙහිව විශාල සන්නද්ධ හමුදා ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තා. එතුමා අත් අඩංගුවට අරගෙන නිවාස අඩස්සියට පත් කරලා තිබුණා. එතුමා එක විටෙක එම නිවස්නයේ සිට වෙනත් ස්ථානයකට ගෙන යනවා. වාවේස් ජනාධිපතිවරයාට වේ ගුවේරා සහෝදරයාගේ දියණිය හමුවුණු අවස්ථාවක එතුමාගේ හිතට ආපු අත් දැකීමක් ගැන කියා තිබෙනවා. වේ ගුවේරා සහෝදරයා CIA අත් අඩංගුවට පත් වුණාට පසුව, CIA නිලධාරීන් විසින් ඔහුට වෙඩි තබා ඝාතනය කරන මොහොතේ දී ඔහු කියා තිබෙන්නේ, "බිත්තියට හේත්තු කර, ඇස් නිරාවරණය කර මට වෙඩි තබන්න" කියලා යි. වාවේස් ජනාධිපතිවරයා වේ ගුවේරාගේ දියණිය සමඟ කියා තිබෙනවා, එම හමුදා කුමන්ත්‍රණයෙන් එතුමා නිවාස අඩස්සියේ තබලා, නැවත වෙනත් ස්ථානයකට ගෙන යන්නට හදනකොට සිහියට ආවේ, වේ ගුවේරා එදා CIA නිලධාරීන් ඉදිරියේ කරන ලද ප්‍රකාශයයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෙබරවාරි මාසයේ 11වැනිදා දියත් වුණු කුමන්ත්‍රණය මොකක්ද? සියලු නාලිකා හරහා, ජාත්‍යන්තරයේ CNN වැනි ඇමෙරිකා එක්සත් ජනපදයට වුවමනා පරිදි හසුරුවන මාධ්‍ය ආයතන හරහා, වෙනිසියුලාවේ මහා ධන කුවේරයන් විසින් පාලනය කරන ලද මාධ්‍ය ආයතන හරහා ප්‍රකාශයක් ගෙන ගියා, වාවේස් ඉල්ලා අස්වෙලා කියලා. නමුත් එතුමා සමඟ සිටි ඉතාම ලෙන්ගතු හමුදා නිලධාරීන් ඇවිල්ලා එතුමාගෙන් ඇහුවා, "ඔබ ඉල්ලා අස්වුණාද?" කියලා. වාවේස් කියනවා, "මම ඉල්ලා අස්වුණේ නැහැ" කියලා. හමුදා නිලධාරීන් කියනවා, "ඔබ ඉල්ලා අස්වුණේ නැත්නම් මෙතැන් සිට අප ක්‍රියාත්මක කරන්නේ ඔබගේ අණයි." කියලා. ඒක තමයි එම කුමන්ත්‍රණය පරාජයට පත් කරපු ප්‍රධාන අවස්ථාව. ඒ අවස්ථාවේ මිනිසුන් ලක්ෂ ගණන් පාරට බැස්සා. එක්සත් ජනපදයේ කුමන්ත්‍රණයට එරෙහිව, 2002 වසරේ අප්‍රේල් මාසයේ 11වැනිදා වාවේස් බලයෙන් නෙරපා හැරීම සඳහා දියත් කරන ලද මහා කුප්‍රකට කුමන්ත්‍රණයට එරෙහිව ජනතාව ලක්ෂ ගණන් පාරට බැස්සා. මෙය මෑත ඉතිහාසයේ රටේ නායකයකුගේ බලය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ක්‍රියා කළ අවස්ථාවක්. ඒවා කළේ ජනතාවට කිරි පැකට් දීලා නොවෙයි, රුපියල් 500ක් දීලා නොවෙයි. ඒවාත් එක්ක මේක සංසන්දනය කරන්න එපා. වැඩ මුළු පැවැත්වෙනවා කියලා රුපියල් 800ක් දීලා නිලධාරීන් ගෙන්වාගෙන නොවෙයි ඒවා කළේ. Budget Taxi එක ඉවත් කරනවා කියලා බලපෑම් කරලා ජනතාව ගෙන්වාගෙන නොවෙයි. මේ සැබවින්ම ඒ ජනතාවගේ හෘද සාක්ෂියත් එක්ක බැඳුණු නායකයෙක්. ඒ නායකයා නෙරපා හැරීම සඳහා ක්‍රියාත්මක වුණු මහා දැවැන්ත කුමන්ත්‍රණයක්. පිදෙල් සහෝදරයා මොකක්ද ඒ වෙලාවේ දී වාවේස්ට කියන්නේ? "ඔබ මේ අර්බුදයේ දී පියවරක් පිටුපසට යන්න. මේ අර්බුදය ඔබට මුහුණ දෙන්න අවස්ථාව නොවේ" කියන එකයි. ඒක තමයි මේ මොහොතේ කළ යුත්තේ කියලා කිව්වා. හැබැයි ඒ අධිෂ්ඨානශීලි මිනිසා, වීර්යයෙන් යුතු මිනිසා කුමන්ත්‍රණය දින තුනෙන් පරාජයට පත් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 11වැනි දා නොව, 12 වැනි දා නොව, 13 වැනි දා යළි ඔහු වෙනිසියුලාවේ ජනාධිපති ධුරයේ වැඩ භාර ගන්නවා පමණක් නොවෙයි, ඒ කාර්ය මෙහෙයවන්නත් සමත් වෙනවා.

එතුමාට ඒ හැකියාව ලැබුණේ මොකක් නිසාද? හොරකම් කළ නායකයෙක් රටේ ජනතාව ආරක්ෂා කරයිද? රටේ සම්පත් මහා පරිමාණ ලෙස බහු ජාතික සමාගම්වලට විකුණන නායකයන් රටේ ජනතාව ආරක්ෂා කරයිද? ප්‍රධාන නගරවල තිබෙන ඉඩම් මහා පරිමාණයෙන් කොම්පැනිකාරයන්ට පවරන නායකයන් රටේ ජනතාව ආරක්ෂා කරයිද? නැහැ. ඒ වෙනුවට ජනතාව වෙනුවෙන් කරන අරගළයකයි වාවේස් සිටියේ. ඒ අරගළය රුස්සන්නේ නැති පිරිසක් ඇමෙරිකාවේත් සිටියා; ශ්‍රී ලංකාවේත් සිටියා. මේ පාර්ලිමේන්තුව මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකන් එක්සත් ජනපදය විසින් ඉරාකය ආක්‍රමණය කරන වෙලාවේ දී - එවකට එක්සත් ජාතික පක්ෂ රජය පැවැතුණේ- මට මතක විධියට ඔබතුමාණන්ගේ පියා තමයි මේ ගරු සභාවේ මුලසුනේ සිටියේ. නේද? නැහැ. සමාවෙන්න, ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා තමයි කථානායකතුමා හැටියට සිටියේ. ඒ වෙලාවේ ජෝර්ජ් බුෂ් ජනාධිපතිවරයා විසින් ඉරාකය ආක්‍රමණය කිරීම හෙළා දකිමින් යෝජනාවක් ගෙනැල්ලා, එය මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරනකොට "බුෂ්" කියන නම කියන්නත් තහනම් කළා. මේක එහෙම පාර්ලිමේන්තුවක්. එහෙම පාර්ලිමේන්තුවක නායකත්වය දරපු කට්ටිය දැන් වාවේස් සම්බන්ධයෙන් යෝජනාවක් ගෙන එනකොට විරුද්ධ වීම අපට අරුම පුදුම දෙයක් නොවෙයි. ඉරාකයට බෝම්බ දමන වෙලාවේ, මහා ජන සංහාරයක් සිද්ධ වන වෙලාවේ, මනුෂ්‍යත්වය අගයන මානවවාදී සෑම මිනිසෙක්ම එයට එරෙහිව කථා කරන වෙලාවේ, ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ ජෝර්ජ් බුෂ් ජනාධිපතිවරයාගේ නම කියවීම තහනම් කළා.

එහෙම ඉතිහාසයක් ඇති නායකයන් තමයි වාවේස් ගැන කථා කරන්න හය. ඒ අය හය වෙන්න ඕනෑ. ඒක තමයි ඉතිහාසය. වාවේස් ජනතාවගේ හෘදය ස්පන්දනයත් එක්ක ජීවත් වුණු සැබෑ නායකයෙක්. එතුමා විශ්වාස කළේ ජනතාවයි. 2002 දී එතුමාට එරෙහිව දියත් කරන ලද කුමන්ත්‍රණය පරාජයට පත් කළේ ජනතාවයි.

2006 දී නැවතත් ජනාධිපතිවරණය පැවැත්වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඡන්ද කලින් තියන්නේ නැහැ; games ගහන්න ගියේ නැහැ; තමන්ට හොඳම පිට්ටනිය බලන්නේ නැහැ; ව්‍යවස්ථාව සංශෝධනය කරන්නේ නැහැ; වෙන වෙන බලවේග නැහැ. 2000 ජනාධිපතිවරණය පැවැත්වුවා. නැවත ජනාධිපති ධුරය සඳහා ඡන්දය පවත්වන්න ව්‍යවස්ථාව අනුව කාලය තිබෙන්නේ අවුරුදු 06කින්. ඒ අනුව නිවැරදි ලෙස 2006 වර්ෂයේදී ජනාධිපතිවරණය පැවැත්වුවා. 2006 ජනාධිපතිවරණයේදී වෙනිසියුලා ඉතිහාසයේ විශාල ඡන්ද ප්‍රතිශතයක් ගත්තු නායකයකු බවට හියුගෝ වාවේස් ජනාධිපතිවරයා පත් වුණා. එම ඡන්දයේදී එතුමා සියයට 63ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තා.

නැවත 2012 දී නියමිත කාලවකවානුවට, නියමිත දිනට එතුමා ඡන්දය පැවැත්වුවා. තමන්ට ඕනෑ විධියට පිටිය හදලා, පොඩි පොඩි ඡන්ද තියලා සෙල්ලම් දාලා එහෙම කටයුතු කළේ නැහැ. එතුමා ඇත්තටම ජනතාවත් එක්ක කටයුතු කරන නායකයෙක්. ජනතාවගේ හෘදය ස්පන්දනයත් එක්ක ඉතා හොඳින් ගනුදෙනු කරන නායකයෙක්. ජනතාවගේ හෘදය ස්පන්දනය තමන්ගේ හෘදය ස්පන්දනය හා සලකන නායකයෙක්. බොරුවට ඉඹින නායකයෝ නොවෙයි; බොරුවට වඩා ගන්නා නායකයෝ නොවෙයි. සැබවින්ම මානවවාදී, ප්‍රේමයෙන්, දයාවෙන්, ලෙංගතුකමින්, බැඳියාවෙන් යුතු නායකයෙක්. එවැනි නායකයන් ජනතාවට භය වෙන්නේ නැහැ. ඒ අනුවයි 2006 ජනාධිපතිවරණය පැවැත්වුවේ. එහිදී එතුමා සියයට 63ක ජයග්‍රහණයක් අත්පත් කර ගත්තා.

2012 දී නියමිත පරිදි නැවත ජනාධිපතිවරණය පැවැත්වුවා. එහිදීත් එතුමා සියයට 53ක ජයග්‍රහණයක් අත්පත් කර ගත්තා. ඒ නිසා එතුමාගේ දේශපාලන ඉතිහාසය පුරාම පෙන්නුම් කරන්නේ කුමක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය යනු මොකක්ද? ජනතාවගේ කැමැත්ත විමසීමයි. එය ප්‍රෝඩාකාරී නොවෙයි, එය වංචාකාරී නොවෙයි, එය තමන්ට ගැළපෙන පරිදි හදා ගත් සූදු පිටියක් නොවෙයි. මැතිවරණ කියන්නේ සූදු පිටියක් නොවෙයි. ජනතාවගේ ඇත්ත කැමැත්තේ පිළිබිඹුව එතැනට එන්න ඕනෑ. නමුත් මැතිවරණය සූදු පිටියක් බවට පත් කර ගත්ත

[ගරු අනුර දිසානායක මහතා]

අපේ රට වැනි රටවල්වලට චාවේස් මැතිතුමාගේ මැතිවරණත්, ජනතාව එක්ක එතුමා ජීවත් වීමත්, ජනතාවගේ කැමැත්ත එක්ක එතුමා සම්බන්ධ වීමත් ඉතා හොඳ උදාහරණ හැටියට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපට චාවේස් ජනාධිපතිවරයාගේ එක ධාරාවක් තේරුම් ගන්න පුළුවන්. එතුමා ජනතාවත් එක්ක කොහොමද හිටියේ, ප්‍රජාතන්ත්‍රවාදයට කොහොමද ගරු කළේ, ජනතාවගේ අයිතීන් කොහොමද ආරක්ෂා කළේ, ඕනෑම මොහොතක ජනතාවත් එක්ක විශ්වාසයෙන් බැඳී සිටින්නේ කොහොමද කියන ආදර්ශ අපි කාටත් වැදගත්. ඒ එක පැත්තක්.

අනෙක් පැත්තෙන් ගත්තාම විශේෂයෙන්ම එතුමාගේ ආර්ථික ප්‍රතිපත්තිය බලමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා වෙනිසියුලාව කියන්නේ දැවැන්ත සම්පත් ආකරයක් බව. එවකට ඇමෙරිකා එක්සත් ජනපදයට පෙට්‍රෝලියම් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන ප්‍රධාන රටක් බවට පත් වෙලා තිබුණේ වෙනිසියුලාව. ඒ වාගේම ඇමෙරිකා එක්සත් ජනපදයට බොර තෙල් අපනයනය කරන හතරවන රට බවට පත් වෙලා තිබුණේ වෙනිසියුලාව. ඒ වාගේම දැවැන්ත ඉඩම් සම්පතක් තිබෙන රටක් වෙනිසියුලාව. ඒ නිසා මොකක්ද හියුගෝ චාවේස් ජනාධිපතිවරයාගේ ආර්ථික දැක්ම බවට පත් වුණේ? රටේ ජාතික ධනය රටේ ජනතාවට සාධාරණව බෙදා දීමයි. ඒක තමයි වැදගත්ම සාධකය. රටේ ජාතික ධනය රටේ ජනතාවට සාධාරණ ලෙස බෙදන්නේ කොහොමද?

හියුගෝ චාවේස් ජනාධිපතිවරයා 1990 දී බලයට එන කොට රටේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 60ක අයිතිය තිබුණේ, සියයට එකක ජනතාවකට. බ්‍රිතාන්‍යයේ සමහර සමාගම්වලට අක්කර පණස්දහස, ලක්ෂය අයිතිව තිබුණා. එතුමාට උරුම වුණේ එහෙම රටක්. රටේ ඉඩම්වලින් සියයට 60ක්, සියයට 1ක පිරිසකට අයිතියි. රටේ සියයට 99කටම අයිති වෙලා තිබුණේ රටේ මුළු ඉඩම් සම්පතෙන් සියයට 40යි. ඒ ඉඩම් අයිති වෙලා තිබුණේ ඇත්තටම ස්වදේශික ජනයාට නොවෙයි. විවිධ කොම්පැනිවලට, විවිධ බහුජාතික සමාගම් සතුවයි ඒ ඉඩම් සම්පත තිබුණේ. ඒ නිසා එතුමා ඉඩම් පිළිබඳ ඉතාම නිවැරදි සැලැස්මක් සකස් කළා.

පළමුකොටම දිළිඳු ජනතාවගෙන් සමන්විත ගොවි සමුපකාර සමිති පිහිටෙව්වා. ඒක හරි වැදගත් සංකල්පයක්. මේ "දිවි නැගුම" අටවන්න යන එක නොවෙයි. දැන් කියාවි ඒකම තමයි කරන්න යන්නේ කියලා. ඒක නොවෙයි. සැබෑ පහළ පන්තියේ දිළිඳු ජනතාව සඳහා ගොවි සමුපකාර සමිති පිහිටුවලා ඉඩම් විශාල ප්‍රමාණයක් ඒ සමුපකාර සමිතිවලට බෙදා දෙන්න පටන් ගත්තා. සාමාන්‍යයෙන් තමන්ට ඉඩමක් අහිමි වෙලා තිබුණු, තමන්ට වත්කමක් අහිමි වෙලා තිබුණු, කෘෂි කර්මාන්තය වෙනුවෙන් ප්‍රාග්ධනයක් යොදවන්න බැරි වෙලා හිටපු ඒ දිළිඳු ජනතාවට ප්‍රාග්ධනය දෙමින්, වත්කම් දෙමින්, ඔවුන්ගේ ජීවිතය වර්ධනය කරන්න පටන් ගත්තා. විශේෂයෙන්ම මෙම ඉඩම් අත්පත් කර ගෙන ජනතාවට බෙදා දුන්නා. 2007 දී මහා පරිමාණ ගොවිපළවල් 16ක් රජයට පවරා ගත්තා. එතැන Vestey Group Limited නමැති එංගලන්ත සමාගමක් තිබුණා. ඒකට අක්කර 32,000ක් තිබුණා. ඒ සියල්ල රජයට පවරා ගත්තා. ඒවා තමයි සමහර අයට රුස්සන්නේ නැත්තේ. ඒවා ගැන තමයි සමහර අය කලබල වෙන්නේ. කථා කරනවාටත් බයයි. ඇයි? ඒවා ඒ ජනතාවගේ ඉඩම්. ඒ ජනතාව ඉපැදෙන, ඒ ජනතාව මියැදෙන, ඒ ජනතාව පොහොර වෙන, පරම්පරා ගණනාවක් තමන්ගේ ලේ, මස්, නහර පොහොර කරපු ඉඩම්. ඒ මව්බිමේ ඉඩම් ඒ රටේ ජනතාවට අයිතියි. ඒ ඉඩම් තමයි ඇමෙරිකන් එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය වැනි මහා රාජ්‍යයන්හි මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට, සමාගම්වලට පවරා තිබුණේ. එවැනි සැබෑ ජනතාවාදී නායකයෙකුගේ ආකල්පය මොකක්ද? සැබෑ ජනතාවාදී නායකයෙක් ගත යුතු තීරණය මොකක්ද? තමන්ගේ මව්බිමේ ඉඩම් තමන්ගේ රටේ ජනතාවට දෙන එකයි. හැබැයි අද වෙන්නේ ඒකේ අනික් පැත්ත. ඇමෙරිකාවේ ඩේල් එකට සේරුවාවිල අක්කර 5,000ක් දීලා තිබෙනවා. ඒ අයත් චාවේස්ට කන් දෙනවා. ඒක තමයි මේකෙදි ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. කල්පිටියෙ දූපත් 16යි; කොළඹ නගරයේ මහා ඉඩම් "ටාටා" එකට දීලා තිබෙනවා. එහෙම නොවෙයි. සැබෑ ජනතාවාදී නායකයා කවරෙක්ද? මහා පරිමාණ සමාගම් සතුව තිබුණු මහා පරිමාණ ඉඩම් ස්වදේශික ජනතාවට පවරා දී පළමු වසර ඇතුළත ගොවි පවුල්වලට ඉඩම් කැබලි ලක්ෂයක් බෙදා දුන්නා. ඒ වාගේම දිළිඳු ගොවීන්ගේ සමුපකාර සමිති සඳහා අක්කර මිලියන 3.7ක් - අක්කර තිස් හත් ලක්ෂයක්- බෙදා දුන්නා. කල්පනා කර බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අක්කර තිස්හත් ලක්ෂයක් බෙදා දුන්නා. ජනතාවත් එක්ක මොන තරම් සම්බන්ධ වුණු නායකයෙක්ද? "උඹලා වගා කරපල්ලා, උඹලා රටට ජාතික නිෂ්පාදනය එකතු කරපල්ලා" කියා දිළිඳු ගොවි ජනතාවගෙන් සමන්විත සමුපකාර සමිතිවලට අක්කර තිස්හත් ලක්ෂයක් බෙදා දුන්නා. ඒ ජාතික නිෂ්පාදනය ආර්ථික ප්‍රතිපත්ති හරහා සාධාරණව බෙදන්න ඕනෑය කිව්වා. සූරාකෑමකින් ඉතාමත් දුෂ්කරතාවකට පත් වෙලා හිටපු ජනතාවක් මෙවැනි අදහස් තිබුණු නායකයෙක් සමඟ ලෙන්ගතුව බැඳෙනවාය කියන එක අරුම පුදුම දෙයක් නොවෙයි. ඒ නිසා ඉඩම් ප්‍රතිපත්තිය ඔහුගේ විශේෂ කාර්යයක් වුණා. එය අදත් අපේ රටේ සැබෑ නායකයනුත්, මේ රටේ සැබෑ ජනතාවත් තේරුම් ගත යුතුයි. සැබෑ ජනතාවාදී නායකයෙක් ඒ රටේ ඉඩම් ඒ රටේ ජනතාවට බෙදා දිය යුතුයි. එවැනි ක්‍රියා මාර්ගයක් තමයි එතුමා අනුගමනය කරමින් තිබුණේ.

ඒ විධියම තමයි තෙල් සම්පතත්. 2001 දී බලයට පත් වෙනකොටම හයිඩ්‍රොකාබන් පනත සම්මත කර ගත්තා. හයිඩ්‍රොකාබන් පනතින් මොකක්ද කිව්වේ? වෙනිසියුලාවේ තිබෙන සියලුම තෙල් සමාගම්වල අයිතියෙන් සියයට 51ක් රාජ්‍ය තෙල් සමාගම සතුව තිබිය යුතුයි කිව්වා. ඒක හරි වැදගත්. රටේ ආර්ථිකයේ ප්‍රධානම මධ්‍යස්ථානය තෙල් සම්පත වුණා. මා කලින් කිව්වා, ඇමෙරිකන් එක්සත් ජනපදය පෙට්‍රෝලියම් නිෂ්පාදනය පළමුවැනියාටම අපනයනය කරන රටය කියා. බොර තෙල් අපනයනයෙන් ඇමෙරිකාවේ හතර වන ස්ථානයේ තිබෙන රට, මහා දැවැන්ත තෙල් සම්පතක් තිබෙන රට. ඒ රට මොකක්ද කිව්වේ? මේ තෙල් සම්පත Exxon Mobil Corporation වැනි ඇමෙරිකාවේ විවිධ බහුජාතික සමාගම් විසින් ඩැහැ ගෙන තිබුණා. ඒ නිසා වෙනිසියුලාවේ රාජ්‍යය ගත්තු තීරණය මොකක්ද? පෙට්‍රෝලියම් හයිඩ්‍රොකාබන් පනත 2001 දී සම්මත කළා. හයිඩ්‍රොකාබන් පනත 2001 දී සම්මත කරලා, ඒ අනුව රාජ්‍ය තෙල් සංස්ථාවට සෑම පෞද්ගලික තෙල් සමාගමකින්ම සියයට 51ක කොටස් තිබෙන්න ඕනෑය කිව්වා. අනික් අයට කොටස් සියයට 49ක තියා ගන්න පුළුවන්. හැබැයි මුල් අයිතිය තිබෙන්න ඕනෑ කාටද? මුල් අයිතිය තිබෙන්න ඕනෑ රජයටයි. ඒක රටේ ස්වාභාවික සම්පතක්. ඒ රටේ ජනතාවගේ සම්පත් ආකරයේ සම්පත්වල අයිතිය රකින එක රාජ්‍ය නායකයාගේ වගකීමක්. ඒ වෙනුවෙන් තමයි රාජ්‍ය තෙල් සංස්ථාව සතුව සෑම සමාගමකම කොටස් තිබෙන්න ඕනෑය කිව්වේ. ඒකට විරුද්ධව ඇමෙරිකාවේ සමහර සමාගම් මේවා දමලා ගියා. ඔවුන් මේවා දමලා ගිහින් කිව්වා, ලෝක වෙළෙඳ සංවිධානයට පැමිණිලි කරනවාය කියලා. පැමිණිලි කරලා වන්දි අත්පත් කර ගන්නවාය කිව්වා. හැබැයි හියුගෝ චාවේස් මැතිතුමා මේවාට තනියම මුහුණ දුන්නේ නැහැ, එතුමාගේ ජනතාවත් එක්කයි මේවාට මුහුණ දුන්නේ. ඒ නිසා එතුමාට ඒ ජයග්‍රහණ අත්පත් කර ගන්න පුළුවන්කම ලැබුණා. ඒ අනුව 2007 වසරේදී තෙල් බිම් 32ක් රජයේ පාලනයට ගත්තා.

ඒ විතරක් නොවෙයි, 2002 වසරේදී පෞද්ගලික අංශය සතුව පැවති අවසන් තෙල් බිම -ලොව විශාලතම තෙල් සංචිතය තිබෙනවාය කියා සලකන ඔරිනොකෝ තෙල් බිම්- රජයට ගත්තා. ඒ බිමේ ලෝකයේ වැඩිම තෙල් සංචිතයක් අඩංගු වෙලා තිබෙනවා කියලයි කියන්නේ. ඒක ඒ රටේ ජනතාවගේ තෙල්

සම්පත. එය ජනතාවගේ ප්‍රතිලාභ වෙනුවෙන් ගෙවිය යුතුයි. සමාගම් විසින් ඉතා සොච්චම් මුදලක් තමයි එහි ජනතාවට බෙදා දුන්නේ. ඊයේ ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාත් කිව්වා වාගේ, මන්නාරම් ද්‍රෝණියේ තෙල් සම්පත ඉන්දියාවේ කෙයාන් ලංකා පුද්ගලික සමාගමට දුන්නා. අපේ පංගුව කීයද? සියයට 10යි. කෙයාන් ලංකා පුද්ගලික සමාගමේ පංගුව සියයට 90යි. ඒ වාගේ ගිවිසුම් තමයි එදාත් එහේ අත්සන් කර තිබුණේ. මන්නාරම් ද්‍රෝණියේ තෙල් සම්පත ශ්‍රී ලංකා භූමියේ, අපේ මවුබිමේ තිබුණාට, වර්තමාන ආණ්ඩුව කෙයාන් ලංකා පුද්ගලික සමාගමත් එක්ක අත්සන් කර තිබෙන ගිවිසුම මොකක්ද? එහි තිබෙන තෙල්වලින් අපට ලැබෙන්නේ සියයට 10යි. එයින් සියයට 90ක් යන්නේ කාටද? ඉන්දියාවේ කෙයාන් ලංකා පුද්ගලික සමාගමට. ඒක තමයි වෙනිසියුලාවේ තෙල් සම්පතටත් අත් වෙලා තිබුණු ඉරණම. ඒ ඉරණමේ තිබුණේ අන් කවරක්වත් නොවෙයි. ඒ රටේ මහා අනගි සම්පත, ඒ රටේ ජනතාවගේ ප්‍රතිලාභ ඒ ජනතාවගේ වුවමනාවන් වෙනුවෙන් යොදවනවා වෙනුවට බටහිර සමාගම් විසින් අත්පත් කරගෙන තිබුණා. හෘදය සාක්ෂියක් තිබෙන, ජනතාවගේ හෘදය ස්පන්දනයත් එක්ක ජීවත් වන, ඒ හෘදය ස්පන්දනය තමන්ගේ හෘදය ස්පන්දනය ලෙස තේරුම් ගත් කිසිදු නායකයකු ඒ තෙල් සම්පත සූරා ගෙන යන්න ඉඩ දෙන්නේ නැහැ. වාවේස් ජනාධිපතිවරයා තීරණයක් ගත්තා, ඒ තෙල් බිම් යළි ආණ්ඩුවට අත්පත් කර ගන්න ඕනෑය කියලා. ඒ අනුව 2006 වසරේ තෙල් බිම් 32ක් අත්පත් කර ගත්තා. අවසන් තෙල් බිමත් එනම්, වැඩිම තෙල් සංචිතයක් තිබෙනවා කියා උපකල්පනය කරන තෙල් බිමත් 2007 වසරේ අත්පත් කර ගත්තා. ඇමෙරිකානු Exxon Mobil Corporation එක මේකට විරුද්ධව පැනලා ගියා. නමුත් අප මොකක්ද කළේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා එතැනින් නතර වුණේ නැහැ. 2008 දී පිරවුම්හල් හා නිවාසවලට තෙල් බෙදා හැරීම මුළුමනින්ම රාජ්‍යයට පවරා ගත්තා. Filling stations හා නිවාසවලට බෙදා හැරීම රාජ්‍ය කාර්ය භාරයක් බවට පත් කර ගත්තා. හැබැයි, ඒ වෙනුවට අපි මොකක්ද කළේ? 2008 වන කොට වෙනිසියුලාවේ ඒ දේ සිද්ධ වුණාට, 2003 දී මේ පාර්ලිමේන්තුවේ මොකක්ද සිද්ධ වුණේ? ඒකයි මෙහි තිබෙන වෙනස. ඒකයි බොහෝ අයට කේන්ති යන්නේ. 2008 දී වෙනිසියුලාවේ ජනාධිපතිවරයා එහි තෙල් බෙදා හැරීම සහ පිරවුම්හල් සියල්ල රාජ්‍යය අතට ගන්න කොට මෙහේ නායකයා සම්මත කර තිබුණේ මොකක්ද? 2003 දී අපට තිබූ තෙල්වලින් තුනෙන් එකක් දුන්නා IOC එකට. ඔන්න වැරැද්ද. ඒ නිසා වාවේස් ගැන කේන්ති යන එක අරුම පුදුම දෙයක් නොවෙයි. මේ කේන්තිය යා යුතුයි. ඇයි ඒ? ඔහු දකින ආර්ථික ප්‍රතිපත්තියත්, ඔහුගේ තිබුණු ජනතා විරෝධීභාවයත් හා වාවේස් මැතිතුමාගේ ආර්ථික ප්‍රතිපත්තියත් එතුමාගේ ජනතාවාදීභාවයත් අතර ඔහුට ගැටලුවක් තිබෙනවා. ඒකයි මේ විවාදය සාකච්ඡා වෙන්න ඉඩ නොදෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ සම්පත් උපයෝගී කර ගැනීමේදී, ජනතාවට වැඩිම උපයෝගීතාවක් ලැබෙන්නේ කොයි ආකාරයටද කියලයි එතුමා බැලුවේ. ඒක තමයි වැදගත්ම සාධකය. එතුමා ඒ රටේ සමාජ සුබසාධනය දියත් කළේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙනිසියුලානු මහ ජනතාව වෙනුවෙන් නිදහස් සෞඛ්‍ය සේවාවක් පවතිනවා. වසර 2005 සිට 2012 දක්වා කාලය තුළ අලුතින් වෛද්‍ය මධ්‍යස්ථාන 7,873ක් නිර්මාණය කර තිබෙනවා. 2005 සිට 2012 වෙන කොට -ඒ අවුරුදු 7ට- අලුතින් වෛද්‍ය මධ්‍යස්ථාන 7,873ක් නිර්මාණය කළා. එතුමා කල්පනා කළා තමන්ගේ රටේ මිනිසුන් නිරෝගීව තියන එක තමයි වැදගත්ම සාධකය කියලා. ඔවුන් ලෙඩ කරන එක නොවෙයි; බාල බෙහෙත් පොවන එක නොවෙයි; ඉස්පිරිතාලවල බෙහෙත් පෙත්ත නැති කරන එක නොවෙයි; බාල සිරින්ජර ගෙනෙන එක නොවෙයි. එතුමා තමන්ගේ ප්‍රධාන කාර්ය භාරය හැටියට සැලකුවේ මොකක්ද? ජනතාවට නිරෝගී ජීවිතයක් ලබා දීමයි. ඒ වෙනුවෙන් නව වෛද්‍ය මධ්‍යස්ථාන 7,873ක් නිර්මාණය කළා. ලෝකයේ කිසිදු රටක ඒ අවුරුදු හත ඇතුළත වෛද්‍ය මධ්‍යස්ථාන 7,873ක් නිර්මාණය වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි 1999 දී වාවේස් ජනාධිපතිවරයා බලය ගන්න කොට, ජනගහනයෙන් ලක්ෂයකට වෛද්‍යවරු විස්සයි හිටියේ. 2010 දී එතුමා ජනගහනයෙන් ලක්ෂයකට වෛද්‍යවරු 80 ලෙසට සියයට 400කින් ඒක වැඩි කළා.

අද අපේ රටේ කියනවා, වෛද්‍යවරු වැඩියි, ඒ අයට රක්ෂා දෙන්න බැහැ කියලා. ඔන්න අපේ ප්‍රතිපත්තිය. නමුත් එදා වාවේස් ජනාධිපතිවරයා ජනතාවගේ සෞඛ්‍ය සේවය වෙනුවෙන් කළේ මොකක්ද? කල්පනා කරලා බලන්න. ලක්ෂයට 20ක්ව සිටි වෛද්‍යවරුන් සංඛ්‍යාව ලක්ෂයකට 80 දක්වා වැඩි කරනවා. ඒ වාගේම "Barrio Adentro" මෙහෙයුම මඟින් වෛද්‍ය උපදේශන සේවාව සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 534ක් වෙන් කරනවා. ලෙඩ වුණාට පසුව ඉස්පිරිතාලයෙන් ප්‍රතිකාර කිරීම නොවෙයි, ලෙඩ වළක්වා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමයි. එහි ප්‍රතිඵලය වෙනිසියුලාවේ ජනතාවට අත් පත් වෙනවා. ඒ කොහොමද? 1999 දී වෛද්‍ය ප්‍රතිකාර සඳහා ඉස්පිරිතාලවලට ඇතුළත් වූ රෝගීන් සංඛ්‍යාව ලක්ෂ 70යි. නමුත් 2010 වන විට එය ලක්ෂ 30 දක්වා අඩු කරනවා. කල්පනා කරලා බලන්න. ලක්ෂ 30 දක්වා අඩු කරනවා. 1999 දී ලෙඩුන් ලක්ෂ 70ක් රෝහල් කරා එන විට, 2010 දී එය ලක්ෂ 30 දක්වා අඩු කරනවා. ඒ කොහොමද? වෛද්‍ය උපදේශන සේවාවක් ලබා දීමෙන්; ජනතාවගේ ගෙදරට ගොස් වෛද්‍ය උපදේශන සේවාව ලබා දීමෙන්; නිරෝගීකම වෙනුවෙන් කරන මෙහෙයුම් තුළින්. ලෙඩ වුණාම ඉස්පිරිතාලෙන් බෙහෙත් දෙන එක නොවෙයි, ලෙඩේ වළක්වා ගැනීමයි. එහෙම නායකයෙක් මේ. ඒ පැත්තෙන් ගත්තාම වෛද්‍ය සේවාව.

අනෙක් පැත්තෙන් 1999 සිට 2011 දක්වා කාලයේදී දිළිඳුකමේ අගය ගැන බලමු. 1999 දී වෙනිසියුලාවේ ජනාධිපතිවරයා බලය ලබා ගන්නා විට අන්ත දිළිඳු භාවය සියයට 16.6ක් තිබුණා. සියයට 16.6ක්. ආසන්න වශයෙන් ජනගහනයෙන් පහෙන් පංගුවක් අන්ත දිළිඳු භාවයේ පතුළටම වැටිලා තිබුණා. වෙනිසියුලාව කියන්නේ මහා සම්පත් ආකරයකින් පිරුණු රටක්. නමුත් ඒ රටේ බහුතර ජනයා අන්ත දිළිඳු රේඛාවෙන් පහළට වැටිලා තිබුණා. නමුත්, 2010 වන විට නියුගෝ වාවේස් ජනාධිපතිවරයා එම අගය සියයට 7 දක්වා අඩු කරනවා. ඒ විතරක් නොවෙයි, 1940 දී වෙනිසියුලාවේ ළමා මන්ද පෝෂණය සියයට 40ක් තිබුණා. මේ වන විට එය හරි අඩකින් අඩු කරලා තිබෙනවා. ඒ වාගේම 1999 දී ජනතාවගෙන් පිරිසිදු පානීය ජලය තිබුණේ සියයට 82කට පමණයි. ඔහු එය සියයට 95 දක්වා කෙටි කාලයක් තුළ වර්ධනය කරනවා. වාවේස්ගේ පාලනය යටතේ මහජන සුබසාධනය වෙනුවෙන් සියයට 60.6ක් වෙන් කරනවා. මුළු අය වැය ලේඛනයෙන් මහජන සුබසාධනය වෙනුවෙන් සියයට 60.6ක්. මොකක්ද මේ? අපේ රටේ තිබෙන්නේ අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරන්න කියන විට "බැහැ" කියලා කෙඳිරි ගාන ආණ්ඩු; සමෘද්ධි සහනාධාරය මාස 5කින් ගෙවලා නැති ආණ්ඩු; ගොවි විශ්‍රාම වැටුප් කපා හරින ආණ්ඩු. නමුත් වාවේස්ගේ අය වැය ලේඛනය සකස් වෙලා තිබුණේ කොහොමද? වාවේස් ජනාධිපතිවරයාගේ අය වැය ලේඛනයෙන් සියයට 60.6ක්ම ජනතාවගේ සුබසාධනය වෙනුවෙන්, දිළිඳු භාවය තුරන් කිරීම වෙනුවෙන්, සෞඛ්‍ය වර්ධනය කිරීම වෙනුවෙන්, අධ්‍යාපනය පුළුල් කිරීම වෙනුවෙන්, නූගත් භාවය පිට මං කිරීම වෙනුවෙන් තමයි සකස් කරලා තිබුණේ. අපේ රටේ නම් සියයට 54ක් වාගේ ගණනක් වෙන් කරලා තිබෙන්නේ වෙනත් දේවලට. එහේ එහෙම නොවෙයි. සියයට 60.6ක් ජනතාව අතේ; ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, 1999 දී වාවේස් ජනාධිපතිවරයා බලයට එන විට වෙනිසියුලාවේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,100යි. 2011 දී එය ඇමෙරිකානු ඩොලර් 10,810 දක්වා වැඩි වෙනවා. කල්පනා කරලා බලන්න. ඇමෙරිකානු ඩොලර් 4,100 තිබුණු ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 10,810 දක්වා වර්ධනය කරනවා. අපි තවත් තෙපර බානවා 2016 වන විට අපේ රටේ ඒක පුද්ගල ආදායම ආමෙරිකානු ඩොලර් 4,000 කරනවා කියලා.

[ගරු අනුර දිසානායක මහතා]

2012 දී ලතින් ඇමෙරිකානු රටවල් අතුරින් ප්‍රීතියෙන්ම සිටින රට බවට වෙනිසියුලාව පත් වුණා. ලෝකයෙන්ම 19 වන ස්ථානය හිමි වුණා. ලතින් ඇමෙරිකානු කලාපයේ 2012 දී කරන ලද සමීක්ෂණය අනුව ප්‍රීතියෙන්ම සිටින රට වෙනිසියුලාව කියලා පළමු වෙනි ස්ථානයට ආවා. ලෝකයෙන්ම 19 වැනි ස්ථානයට පත් වුණා.

ඇමෙරිකානු කලාපයේ රටවල බල ශක්ති නිෂ්පාදනයේදී මූල්‍ය ආධාර වැඩිපුර ලබා දෙන්නේ වෙනිසියුලාව විසින්. වසර 2008 දී ඇමෙරිකා එක්සත් ජනපදය ඒ වෙනුවෙන් ඩොලර් මිලියන 3,000ක් ලබා දෙන විට වෙනිසියුලාව ඇමෙරිකානු ඩොලර් මිලියන 8,800ක් දුන්නා. කොහොමද? ඇමෙරිකානු කලාපයේ රටවල බලශක්තිය වර්ධනය වෙනුවෙන් ඇමෙරිකාව ඩොලර් මිලියන 3,000ක් පරිත්‍යාග කරන විට වෙනිසියුලාව ඇමෙරිකානු ඩොලර් මිලියන 8,800ක් ලබා දෙනවා. මේක "ඇමෙරිකාව සරණං ගච්ඡාමි "කියන නායකයින්ට ආදර්ශයක්. ඇමෙරිකාව, ඇමෙරිකානු කලාපයේ බලශක්ති වර්ධනය වෙනුවෙන් වෙන් කරන්නේ ඩොලර් මිලියන 3,000යි. නමුත් වෙනිසියුලාව ඒ වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 8,100ක් වෙන් කරනවා. ඇයි?

ඔහුට ජාත්‍යන්තර වාදය පිළිබඳ හොඳ අදහසක් තිබුණා. ඔහුගේ රටේ දිළිඳුභාවය පමණක් නොවෙයි, ලතින් ඇමෙරිකානු කලාපයේ දිළිඳුභාවය, ඒ වාගේම ලෝකයේ දිළිඳුභාවයට එරෙහි වූ අරගළය දියත් කළා. ඔහුගේ පළමු වන අරගළය දියත් කර තිබුණේ ලතින් ඇමෙරිකානු කලාපය තුළ. ඒ විතරක් නොවෙයි. ඔහුට ඉතා නිර්භය හදවතක් තිබුණා; හොඳ ධෛර්ය සම්පන්නභාවයක් තිබුණා. අපේ බොහෝ නායකයෝ සිංහල භාෂාවෙන් බොහෝ ගිගුම් දීලා ඇමෙරිකාවේදී ඔවුන් ඉස්සරහා දණින් වැටෙනවා. 2006 ඇමෙරිකාවේ -ඇමෙරිකන් රාජ්‍යයේ- නිව්යෝර්ක් නුවර පැවැත්වුණා, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ මණ්ඩල රැස්වීම. ඒ රැස්වීමට වාවේස් ජනාධිපතිවරයා කථා කරන්න කලින් දවසේ කථා කළේ ඇමෙරිකානු ජනාධිපතිවරයා. ඒ මොහොතේ හිටියේ බුෂ් ජනාධිපතිවරයා. ඔහුගේ දොරකඩ ඉඳගෙන වාවේස් ජනාධිපතිවරයා ඒ මොහොතේ මොකක්ද කිව්වේ? "මා මේ සභාව ආමන්ත්‍රණය කරන්න පෙර මේ සභාව ආමන්ත්‍රණය කළේ යක්ෂයෙක්" කිව්වා. එහෙම කාටද කියන්න පුළුවන්? අපේ ඩිවි ගුණසේකර අමාත්‍යවරයාත් හිටියා. මෙහේ වාගේ දෙකට නැමිලා එහෙට එකයි මෙහෙට එකයි කියනවා වාගේ නොවෙයි. ඔහුගේ අගනුවරට ගිහින් කිව්වේ. බුෂ් ජනාධිපතිවරයා ඒ වන විට ලෝකයට දියත් කර තිබුණු මහා යුද මෙහෙයුම, මහා මිනිස් ඝාතනය; ඔහුගේ අග නගරයේ -ඔහුගේම භූමියේ- ඉඳලා කිව්වා, "මීට පෙර කථා කළේ යක්ෂයෙක්" කියා. ඒ විතරක් නොවෙයි. "ඔහු දෙපතුල් තැබූ තැන සල්ෆර් ගඳ තවමත් එනවා"ය කිව්වා. එහෙම ශ්‍රේෂ්ඨ නායකයෝ නොවෙයිද මේ යුගයේ අවශ්‍ය වෙලා තිබෙන්නේ? ඔහුට අධිරාජ්‍යවාදය පිළිබඳ ඉතා නිවැරැදි කියවීමක් තිබුණා; ඉතා නිවැරැදි දැක්මක් තිබුණා. ඒ නිසා ඔහු දැනගෙන හිටියා මේ දිළිඳු ජනයා ප්‍රපාතයට පත් කර තිබෙන්නේ මොකද? මේ පාලකයන්ගේ වැරැද්ද සියයට 50ක් නම් ඒ හා සමානව සියයට 50ක් අධිරාජ්‍යවාදය සතුව තිබෙනවා. මේ ලෝකය අන්ත දුගීභාවයට පත් වෙලා තිබෙන, අන්ත පීඩාවට පත් වෙලා තිබෙන, ජනයාගේ ප්‍රධාන සතුරා අධිරාජ්‍යවාදය බව ඔහුගේ අත් දැකීමෙන් ඔහුගේ ජීවිතයෙන් ඔහු උකහාගෙන තිබෙනවා. ඒ නිසාම අධිරාජ්‍යවාදයට එරෙහිව ඉතාම ඍජුව පෙනී සිටියා.

අධිරාජ්‍යවාදයේ ප්‍රධාන ආර්ථික බල මධ්‍යස්ථානය වුණේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල. 2006 දී වෙනිසියුලාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කිසිදු සතයක්වත් ණය නැති රට බවට පත් වුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සියලු ණය ගෙවා දැම්මා. ණය ගෙවා දැම්මා විතරක් නොවෙයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අයින් වුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝකයට දියත් කර තිබෙන විනාශය, මේ ආර්ථිකයේ සම්පත්, ශ්‍රමය සූරා කෑම සඳහා දියත් කර තිබෙන මෙහෙයුමට විරුද්ධව නිර්භයව පෙනී සිටියා. ඔහු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රතික්ෂේප කළා. එයට ගෙවිය යුතු සියලු මුදල් ගෙවා දැම්මා.

අපි හිහා කනවා. අපි ගිහින් ඉල්ලනවා; දෙන්න බැහැ කියනවා. එහෙම කර "වාවේස්" කියලා කියනවා. මොන වාවේස්ලාද ඒ? සැබවින්ම වාවේස්ගේ ගුණ සුවඳ, ඔහුගේ හැඟීම්, ඔහුගේ ආදර්ශයන්, ඔහුගේ ආත්ම පරිත්‍යාගය අපි තේරුම් ගත යුතුයි. ඒ තමයි අපි අපේ ජීවිතවලට එකතු කර ගත යුතු ආදර්ශයන්. ඔහු තේරුම් අරගෙන හිටියා ලෝකයට අධිරාජ්‍යවාදය මොන තරම් විනාශයක් කරනවාද කියා. ඒ සඳහා ගොඩ නඟා තිබෙන මෙවලම් කවරේද? ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යනු එහි ඉතාමත් දිගු මෙවලමක්. ඔහු ඒකට ගෙවන්න තිබුණු සියලු මුදල් ගෙවලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අයින් වුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අයින් වුණා විතරක් නොවෙයි. එම කලාපයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට එරෙහිව මූල්‍ය අරමුදලක් ගොඩ නැඟිය යුතුයි කියන සාකච්ඡාවක ඔහු නිරත වුණා. ඒ වෙනුවෙන් ඔහු ලතින් ඇමෙරිකානු කලාපයේ ALBA නම් බැංකුව ගොඩ නහන්න සමත් වුණා. විශේෂයෙන්ම ලතින් ඇමෙරිකානු කලාපයේ විශාල මැදිහත්වීමක් කළා. ආර්ජන්ටිනාවේ ඩොලර් මිලියන 500ක ණයක් තිබුණා. ආර්ජන්ටිනාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විශාල කොන්දේසි දමා තිබුණා. වෙනිසියුලාව විසින් ආර්ජන්ටිනාවට ඩොලර් මිලියන 500ක් දීලා කිව්වා, "ඒ ණයෙන් නිදහස් වෙන්න; අපිට ටික ටික ගෙවන්න" කියා. එහෙම දැක්මක් තිබුණා. කියුබාවට ඉතාමත් සහනදායී මිලට තෙල් සම්පත දෙන්න ඔහු ගිවිසුම් අත්සන් කළා. විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය හතර වටින් වට කොට මහා ආර්ථික සම්බාධක පනවමින් පිදෙල් කැස්ත්‍රෝලා කියුබානු ජනතාව හිර කරලා, හුදෙකලා කරලා පරාජයට පත් කරන සැලැස්මක් දියත් කර තිබුණා.

ඒ සැලැස්මට එරෙහිව වාවේස් ඉතා ඍජුව පෙනී සිටියා. ඔහු ඉතාම සහනදායී මිලට කියුබාවට තෙල් දුන්නා. ඒ වාගේම කියුබාව වෙනිසියුලාවේ සෞඛ්‍ය සේවය වෙනුවෙන් වෛද්‍ය කණ්ඩායම් ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි, බොලිවියාවටත් එහෙමයි. කියුබාවෙන් වෛද්‍ය කණ්ඩායමක් බොලිවියාවට ඇරියා. ඒ ජනතාවගේ සෞඛ්‍ය සේවය වෙනුවෙන් කියුබාවෙන් යැවූ වෛද්‍යවරුන්ට වැටුප් ගෙව්වේ වෙනිසියුලාවේ ජනාධිපතිතුමායි. ලතින් ඇමෙරිකානු කලාපයේ අධිරාජ්‍යවාදයට එරෙහිව ඉතාමත් ප්‍රබල හඬක්, ප්‍රබල දැක්මක් ඔහු සතුව තිබුණා. ඒ නිසා තමයි හියුගෝ වාවේස් ජනාධිපතිවරයා මිය ගියාට පසුව කියුබාව විසින් නිකුත් කරන ලද ශෝක පණිවිඩයේ හිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා කියා තිබෙන්නේ වාවේස් කැස්ත්‍රෝ සහෝදරයාගේ පුතණුවෙක් කියලා. ඒ තරමට ඔවුන් අතර ඉතාමත් ළඟැදියාවක්, ළැදියාවක් තිබුණා; සහයෝගිතාවක් තිබුණා. ඒ සහයෝගිතාව හොරකම වෙනුවෙන් නොවෙයි; ඒ සහයෝගිතාව ජනතාව පීඩාවට පත් කිරීම වෙනුවෙන් නොවෙයි; ඒ සහයෝගිතාව කොමිස් ගැසීම වෙනුවෙන් නොවෙයි; ඒ සහයෝගිතාව මහා සම්පත් සූරාකෑම වෙනුවෙන් නොවෙයි; ඒ සහයෝගිතාව එකිනෙකාට එරෙහිව එකිනෙකා කෙටීම වෙනුවෙන් නොවෙයි; ඒ සහයෝගිතාව එකිනෙක රටවල් ආක්‍රමණය කිරීම වෙනුවෙන් නොවෙයි. ඒ සහයෝගිතාව එක් එක් රටවලට විවිධ වර්ගයේ බලපෑම් ඇති කර ගැනීම වෙනුවෙන් මානව ඉතිහාසයේ ගොඩ නැඟිය හැකි ඉතාමත් ශක්තිමත් සහයෝගිතාව වන මානව බැඳීම් සහිත සහයෝගිතාවක්. අපට ඕනෑ කරන්නේ එවැනි සහයෝගිතාවක් නොවෙයිද? මානවවාදී බැඳීම්වලින් පිරිපුන් සහයෝගිතාවක්. වෛද්‍යවරුන් ඒ රටට යැව්වා; ඔවුන්ගේ ජනතාව වෙනුවෙන් අඩු මිලට තෙල් ලබා දෙන්න සූදානම් වුණා; ඔහු තවත් රටක ණයබර තමන් විසින් දරා ගන්න සූදානම් වුණා; ඔහු එක්සත් ජනපදයට එරෙහිව විශාල මැදිහත් වීමක් දියත් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද සාකච්ඡා කරන්නේ සුළු පටු, හුදකලාවේ අහම්බෙන් බිහි වුණු පුද්ගලයකු පිළිබඳව නොවෙයි. අපේ ඉතිහාසයේ මහා දේශපාලන ගමන් මහ වෙනුවෙන් හැමදාමත් ඔහු වල්ගා තරුවක් මෙන් අපට මහ පෙන්වාවි. න්‍යායික පැත්තෙන් ගත්තොත් අපි අතර වෙනස්කම් තිබෙන්න ඇති. 1998 දී බලයට පත් වන කොට ඔහු සමාජවාදී පක්ෂයක හෝ නිර්ධන පන්ති ව්‍යාපාරයක හෝ නියෝජිතයකු නොවෙයි. ඔහු නිර්මාණය වුණේම වෙනිසියුලාවේ ජනතාව පත් වී තිබෙන පීඩාවත්, ලතින් ඇමෙරිකානු කලාපයේ අධිරාජ්‍යවාදී මැදිහත් වීමත්, ලෝකය පුරා අධිරාජ්‍යවාදීන් දියත් කර තිබූ මහා කුප්‍රකට කුමන්ත්‍රණත් නිසායි. ඒ කරුණු තමයි ඔහු පෙළඹවුවේ. ඒ හරහා තමයි ඔහු ජනාධිපති ධුරයට පත් වුණේ.

2006 වන විට හියුගෝ චාවේස් ජනාධිපතිවරයා ප්‍රකාශයට පත් කළේ 21 වන සියවස යනු සමාජවාදයේ සියවස කියායි. සමාජවාදය පිළිබඳව ඇල්මැරිලා හිටපු, සමාජවාදය පිළිබඳව විවිධ විශ්වාසයන් කඩා වැටෙමින් තිබුණු පොදු මහත් වාමාංශික ව්‍යාපාරයන්ට ඔහු ආස්වාදයක් බවට පත් වුණා. එය අළෙවි කරන භාණ්ඩයක් නොවෙයි. එය තමන්ගේ පරාදීන තමන්ගේ ඉතාමත් කැත, නපුරු දේශපාලනයන් වසා ගැනීම සඳහා ලෝගුවක් නොවෙයි. සමහර අය ඔහු ලෝගුවක් කර ගන්න උත්සාහ කරනවා. සමහර අය උත්සාහ කරනවා, තමන්ගේ කැත, තමන්ගේ නරක, තමන්ගේ කොමිස්, තමන්ගේ ජරාජීර්ණ වූ ජීවිතය චාවේස්ගේ ලෝගුවෙන් වහ ගන්න. චාවේස් යනු කාටවත් ලෝගුවක් හෝ පළඳනාවක් නොවෙයි. චාවේස් යනු යුගයේ මානවවාදී මිනිසුන්ගේ මානවවාදී බැඳීම් සන්තර්පණය කරන ලද, ඒ බැඳීම්වලට උත්තුංග වටිනාකමක් දෙන ලද යුගයේ මිනිසෙක්. ඒ මිනිසා පිළිබඳව අපට හෘදයංගම බැඳීමක් තිබෙනවා. භාෂාවෙන් අපි ඔහුගෙන් බොහෝ දුරස්; සංස්කෘතින්ගෙන් බොහෝ දුරස්. හැබැයි, ඔහුගේ හදවතේ අධිරාජ්‍යවාදයට එරෙහි ජනතාවට තිබුණු ඇල්මත්, ඒ තිබුණු වුවමනාවත් අපි අපේ හදවත්වලත් පුරවා ගෙන ඉන්නවා.

ඔහු ලතින් ඇමෙරිකානු කලාපයේ, අපි දකුණු ඉන්දියානු කලාපයේ. ඔහුගේ ශරීරය ගත්තොත් ඔහු සුදු, ඉන්දියානු මිශ්‍ර කෙනෙක්. අප ඊට වඩා කළු මිශ්‍ර අයයි. ඊටත් වඩා ඔහු අපේ සංස්කෘතියෙන් වෙනස් කෙනෙක්. හැබැයි, ඔහු හා අප අතර ඉතා හෘදයංගම බැඳීමක් තිබෙනවා. ඒ බැඳීම තමයි මේ අතිශය විනාශයට පත් කොට තිබෙන්නේ. මේ සමාජ ක්‍රමයට එරෙහිව ප්‍රධාන අරගළයක් කළ යුතුව තිබෙනවා. මිනිසුන් ලක්ෂ ගණන් මිය යන, දහස් ගණන් සාගතයෙන් මිය යන, කෝටිප්‍රකෝටි ගණන් ජනතාව නිරාහාරව සිටින මේ සමාජ ක්‍රමය වෙනස් කිරීම සඳහා ඔහු පණිවිඩයක් ලබා දුන්නා. ඒ පණිවිඩය ලබා දීම වෙනුවෙන් ඔහු තෝරා ගත් මාවත අපේ මාවත නොවන්න පුළුවන්. ඒ මාවත පිළිබඳව අප අතර පරස්පරතාවන් තිබෙන්න පුළුවන්. හැබැයි, ඔහුගේ හදවත, ඔහුගේ සිතිවිලි, ඔහුගේ වුවමනාවන් සහ අප අතර විශාල පරස්පරතාවන් නැහැ. ඉතා හොඳ, හෘදයංගම, ළෙන්ගතු මිනිසුන් ලෙස තමයි අප සලකන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙනිසියුලාවේ ජනතාවට ඉතාම වේදනාකාරී කාලයක් තමයි මේ ගත වෙමින් තිබෙන්නේ. අධිරාජ්‍යවාදය ඉතාම සතුටින් ගිගුම් දෙමින් තිබෙනවා; චාවේස් නැති වෙනිසියුලාව කොහොමද කියලා අහනවා. ඔය විධියටම ඇහුවා, පිදෙල් නැති කියුබාවක් ගැන. ඒ විධියටම අද මාධ්‍ය හරහා විවිධ ප්‍රචාර ගෙන යමින් තිබෙනවා චාවේස් නැති වෙනිසියුලාවක් ගැන. මදුරාට මේකට මුහුණ දෙන්න බැහැ. ඒ වාගේම, ඔහු බස් රියැදුරෙක්. ඒවායෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? ඔහු නියෝජනය කරන සමාජ තලය නොවෙයිද පෙන්නුම් කරන්නේ? ඔහුගේ උප ජනාධිපතිවරයා බස් රියැදුරකු වීමෙන් පෙන්නුම් කරන්නේ ඔහු නියෝජනය කළේ ඉතාම පහළ පන්තියේ මිනිසුන් වන බවයි. ඔහුගේ භයිය වුණේ ඔවුන්. ඔහු පිරිවරා ගෙන සිටියේ ඔවුන්. ඔහුගේ උප ජනාධිපතිවරයා බස් රියැදුරකු වන්නේ අහම්බෙන් නොවෙයි. ඒ තමයි ඔහුගේ දේශපාලන පන්තිමය පදනම. එය තමයි එමඟින් පෙන්නුම් කරන්නේ. ඒ නිසා අධිරාජ්‍යවාදය බොහෝ ගිගුම් දේවි; තවත් කාලයක් ඔවුන් යහතින් වැජඹෙන්න කල්පනා කරාවි; ලෝකයේ තිබෙන මහා ජාතික සම්පත් සහ ශ්‍රමය අනේක යුද්ධ හරහා, ආක්‍රමණයන් හරහා, බලපෑම් හරහා සූරාගෙන ඔවුන් වැජඹෙන්න උත්සාහ කරාවි. හැබැයි, ලෝකය පුරා, ඒ අධිරාජ්‍යවාදීන්ට එරෙහිව නැඟිටීමක් අවශ්‍ය වෙනවා. ඒ නැඟිටීම වෙනුවෙන් අපි කවුරුත් අදිටන් කර ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හිතනවා චාවේස් ජනාධිපතිවරයා මිය ගියාට වෙනිසියුලාව මිය නොයන රාජ්‍යයක් බවට පත් වේවි කියලා. අප සියලු දෙනාගේ හදවත් තුළ ඔහුගේ උපදේශ, ඔහුගේ අද්දැකීම් රැඳී තියේවි. ඒවා අපේ දේශපාලන ගමන් මහට ඉතා හොඳින් ඉවහල් කර ගන්න පුළුවන් වේවි. හියුගෝ චාවේස් නාමය දිගු කල් දිනේවා! වෙනිසියුලාවේ ජනතාව දිගු කල් දිනේවා! බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. මීළඟට ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා.

[අ.භා. 4.39]

ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙනිසියුලාවේ හිටපු ආදරණීය ජන නායකයා වූ හියුගෝ චාවේස්ගේ අභාවය නිමිති කොටගෙන ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව මම ස්ථිර කරනවා. එම යෝජනාව ස්ථිර කිරීමට ලැබීම මට ලොකු සතුටක්, ඒ වාගේම ආස්වාදයක්. ප්‍රමාද වී නමුත් ප්‍රජාතන්ත්‍රවාදය කරා සපැමිණෙන සියලු දෙනා සාදරයෙන් පිළිගැනීමට මෙය අවස්ථාවක් කර ගත යුතු වෙනවා. ඉකුත් මාර්තු 05වැනි දින සිට සංවේගයට පත් වූ වෙනිසියුලාවේ දසලක්ෂ ගණන් ජනයා "ටෝඩෝස් සෝමෝස් චාවේස්!" යනුවෙන් හඬ නඟා මුළු රට දෙවනත් කළා. එයින් ඔවුන් කියා සිටියේ, අපි ඔක්කෝම චාවේස්ලා යන්නයි. එසේ ඔවුන් කියා සිටියේ චාවේස්ගේ අභාවයෙන්, හිස් වූ තැනක් ඉතිරි නොකර මුළු රටම චාවේස්ගේ නාමයෙන් හා හියුගෝ චාවේස්ගේ ප්‍රතිපත්තිය මත නැඟී සිටින බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චාවේස්ගේ ජනතාවාදී භාවිතය හරහා ඔහු න්‍යායික රාමුවක් ගොඩ නඟා ගත්තා. ඒ අනුව ඔහු පිළිගත්තේ ධනවාදය තහනම් කිරීම නොවෙයි. ඔහු පිළිගත්තේ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ හරහා ධනවාදය දිය කර හැරිය යුතු බවයි. ප්‍රධාන ප්‍රතිවිරෝධය අධිරාජ්‍යවාදය හා ඔවුන්ට ගැති දක්ෂිණාංශික බලවේගයන් බව පැහැදිලි කිරීමයි ඔහු කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා වෙනිසියුලාවේ තවමත් වෙළඳ පොළ ආර්ථිකයක් පවතින බව. නමුත් ඒ වෙළඳ පොළ ආර්ථිකය තුළ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ රාශියක් ඉදිරියට ගමන් කර තිබෙනවා. එහි තිබුණු ධනවාදය, ඉතාමත්ම තුච්ඡ, මිලේච්ඡ ස්වභාවයන් තුරන් කිරීමට එම ප්‍රතිසංස්කරණවලට හැකියාව ලැබිලා තිබෙනවා.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය තමයි සර්ව ජන ඡන්ද ක්‍රමය තුළ නැවත නැවතත් වැඩි ඡන්ද විශාල ප්‍රමාණයකින් තේරී පත් වෙමින් සර්ව ජන ඡන්දය ඇතුළත් බහු පාක්ෂික ප්‍රජාතන්ත්‍රවාදය ඔහු ගොඩනඟා ගත් න්‍යාය තුළ ඇතුළත් වීම. ඔහු කිව්වේ නැහැ, කිසිම පක්ෂයක් තහනම් කළ යුතුයි කියලා. එහෙම නැත්නම් අනෙකුත් විපක්ෂයන්ට එරෙහිව ඔහු අවි එසෙව්වේ නැහැ. ඔහු තමන්ට විරුද්ධ වූ සියලු පක්ෂවලට සමාන අවස්ථාවක් ලබා දුන්නා, තමන්ට විරුද්ධව තරග කරන්නට. ඔහු ඡන්ද හා ජනමත විචාරණ 17ක් -නගර සභා ඡන්ද, පළාත් පාලන ඡන්ද, ප්‍රාන්ත ඡන්ද යන සියල්ලක්ම- පැවැත්තුවා. ඒ 17න් 16ක්ම ඔහු ජය ගත්තා. 2012 දී පැවැත්වුණු ජනාධිපතිවරණයේදී අධිරාජ්‍යවාදීන් හා ප්‍රතිගාමීන් චාවේස්ගේ පරාජය අපේක්ෂාවෙන් පුල පුලා බලා සිටියා. එසේ බලාගෙන සිටියදී හියුගෝ චාවේස් සියයට 55ක පමණ ඡන්දයෙන් ජයග්‍රහණය කළා. ඔහු සියයට 55ක් ගනු ලැබුවේ සියයට 80ක් වූ මුළු ඡන්දයෙන් වීමද වැදගත් කාරණයක්. යුරෝපා රාජ්‍ය නායකයෙකුට මෙවැනි ජයග්‍රහණයක් ගැන සිහිනයකින් පවා සිතන්නට බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තම රටේ ස්වාර්ථය මෙන්ම, තම රටේ යහපත මෙන්ම, තම රටේ දියුණුව මෙන්ම කලාපයීය සහයෝගිතාව ඔහු දැක්කේ වෙනිසියුලාවේ අනාගතයටත් අවශ්‍ය බවයි. වෙනිසියුලාවේ පමණක් නොව මුළු මහත් ලතින් ඇමෙරිකාවේම නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, ආර්ථික සංවර්ධනය, සමාජ සාධාරණත්වය කොයි තරම් අවශ්‍යද, ඒ ප්‍රමාණයට මුළු ලතින් ඇමෙරිකාවම අධිරාජ්‍ය විරෝධී මාවතේ අවදි කර ගැනීම චාවේස්ගේ බලාපොරොත්තුව වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා වේ ගුවේරා පළ කළ "සියයක් වියට්නාමයන් පිළිබඳ ප්‍රකාශය"ත් අපට මෙහිදී සිහිපත් වෙනවා. මොකද, වෙනිසියුලාව මුළු ලතින් ඇමෙරිකාවත් සමඟ එකට නැඟී සිටින්නට බොලීව් ආර්යානු ප්‍රතිපත්තිය හරහා චාවේස් ඉදිරිපත් කළ දර්ශනය ඇත්තටම ලතින් ඇමෙරිකානු ජනතා ව්‍යාපාරයට අලුත් දර්ශනයක් වුණා. ඔහු ලතින් ඇමෙරිකාවේ සියලුම රටවල් එකට ඒකාබද්ධ කිරීමේ විශාල වැයමක යෙදුණා. ඒ සඳහා ෆිදෙල් කැස්ත්‍රෝගේ නායකත්වයෙන් ලැබුණා වූ ආශිර්වාදය ඔහුට අති විශාල ශක්තියක් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙනිසියුලාව සතු අති විශාල ඛනිජ සම්පත් ගසා කමින් අධිරාජ්‍යවාදී සමාගම් ලැබූ අධික ලාභය චාවේස් විසින් ක්‍රමානුකූලව ජාතික ධනයට එකතු කර ගත්තා පමණක් නොව, එම ධනස්කන්ධය සෞඛ්‍ය හා අධ්‍යාපනය හරහා දුප්පත්ම ජනතාවට ලබා දීම සඳහාත්, අධිරාජ්‍යවාදයට එරෙහිව නැඟී සිටීමට තැත් කරන අනෙකුත් රාජ්‍යයන්ට ශක්තියක් ලබා දීම සඳහාත් ඔහු යොදා ගත්තා. මොකද, ඔහු නිතරම විශ්වාස කළේ ලතින් ඇමෙරිකාවේ සාමූහික ශක්තිය තුළ තමයි අධිරාජ්‍යවාදයට මුහුණ දෙන්න පුළුවන් කියායි. අධිරාජ්‍යවාදයේ ග්‍රහණයෙන් ලෝකයට ගැලවෙන්න පුළුවන් කලාපීය සහයෝගිතාව අනුව පමණයි; ජාත්‍යන්තරවාදීව පමණයි අධිරාජ්‍යවාදයට විරුද්ධව ජනතාවගේ අරගළය පෙරට ගෙන යන්න පුළුවන් කියා ඔහු තදින්ම විශ්වාස කළා. ඒ අනුව ඔහු ක්‍රියාත්මක වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002 ඔහු බලයෙන් පහ කළ හමුදා කුමන්ත්‍රණය පැය 48ක් ඇතුළත බිඳ වැටීමට හේතු වන දැවැන්ත ජනතා නැඟිටීමක් ඇති වූයේ චාවේස් ජනතා බලයේ ක්‍රියාකාරිත්වය ගැන තැබූ විශ්වාසය සනාථ කරමිනුයි. චාවේස් නිරන්තරයෙන්ම තම විශ්වාසය තැබුවේ ජනතාවගේ ක්‍රියාකාරී මැදිහත් වීම් පිළිබඳවයි. ප්‍රජාතන්ත්‍රවාදයේ හා ජනතා බලයේ මහිමය ලොවටම කියා පෑ මෙම අවස්ථාව සියලු ප්‍රජාතන්ත්‍ර විරෝධීන් උගත යුතු පාඩමක්. ප්‍රජාතන්ත්‍රවාදී ජනතා ව්‍යාපාරයට එය ආශ්වාදනීය උද්දාමයක්. හමුදාවේද පහළ නිලධාරීන්ගේද අනුබලය ඇතිව දසලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ දැත් මතින් එදා චාවේස් නැවත ජනාධිපති මැදුරට ගෙන එනු ලැබුවා. ඒ තමයි ජනතා ක්‍රියාකාරිත්වයේ මහිමය. එම ජනතා ක්‍රියාකාරිත්වයට, ජනතාව පෙළගැස්වීමට ජනතාව තමන්ගේම සංවිධාන තුළ ඒකරාශී කරමින්, අසල්වැසි කම්ටු ගොඩ නඟමින් රටේ පාලනයට ජනතාවගේ මැදිහත් වීම එකතු කර ගත්තා. වෙනිසියුලාවේ ඇති වෙමින් තිබුණු පරිවර්තනය, උඩින් පමණක් කෙරුණු පරිවර්තනයක් නොවෙයි. ජනතාව ඒකරාශී කරමින්, ඔවුන්ගේත් සහභාගිත්වය එකතු කරමින් ගෙන ගිය පරිවර්තනයක ක්‍රියාදාමයක් හැටියට චාවේස් අත් හදා බැලීමක් කළා. ඒ අත් හදා බැලීම අතිශය සාර්ථක බව පෙනී ගියේ එම කුමන්ත්‍රණය අවස්ථාවේ එළියට ආපු දසලක්ෂ ගණන් ජනතාවගේ ක්‍රියාකාරී ශක්තියෙනුයි.

මෑත කාලයේ ලොව පුරා වැඩි වශයෙන් සිදු වෙමින් තිබුණේ කුමක්ද? සමාජ ප්‍රගතිය ගැන විශ්වාසය තබමින් ඒ වෙනුවෙන් පොරොන්දු දෙන නායකයන් ජනතාව විසින් පත් කළාට පසු, අධිරාජ්‍යවාදී ගෝලීයකරණයට හා නූතන ලිබරල්වාදයට ඔවුන් අනුගත වීමයි. මේක තමයි තිබුණු පොදු ප්‍රවණතාවය. කාලෝස් පෙරේසුත් එහෙමයි. එදා තිබුණු ඒ තත්ත්වයෙන් ඒ රට මුදා ගැනීමට ඔහු ජනතාවාදී ලොකු පොරොන්දු ගණනාවක් දුන්නා. එයින් පිටුපා ගමන් කරද්දී තමයි කරකාසෝ නැමැති මහා ජනතා නැඟිටීම ඇති වුණේ. ඒ තත්ත්වය නැවතත් වෙනිසියුලාවේ ඇති වීමට ඉඩ නොදී හියුගෝ චාවේස් ඒ ප්‍රවණතාවත්, ඉතිහාසයත් වෙනස් කරමින් බහු පන්තික ආණ්ඩු පාලනයක වාමාංශික නායකයා ලෙස වැනිසියුලාවේ ජනතාවාදී ප්‍රතිසංස්කරණ ඔස්සේ අධිරාජ්‍යවාදයට එරෙහිව තම ක්‍රියා මාර්ගය මෙහෙයවුවා.

ඔහු න්‍යායික වශයෙන් පරිපූර්ණ වූ ප්‍රවාදයක් ගොඩ නඟා තිබුණේ නැහැ. නමුත් ඔහු භාවිතයත් සමඟ න්‍යායික රාමුවකුත් ගොඩ නැඟුවා. ඒ න්‍යායික රාමුව තුළ මෙන්න මේ කියන බහු පන්තික ආණ්ඩුවක් පවත්වාගෙන යෑමත් එයට වාමාංශික නායකත්වයක් ලබා දීමට හැකිවන තරමටත් ජනතාවගේ සහභාගිත්වය, ජනතා විඤ්ඤාණය අවදි කරන්නට පුළුවන් වන ප්‍රමාණයටත් ඒ සමාජයන්ට පෙරට ගමන් කරන්නට පුළුවන්ය, ප්‍රගතිය කරා යන්නට පුළුවන්ය කියන එක ඔහුගේ න්‍යායික රාමුව තුළ ක්‍රමානුකූලව ගොඩනැගුණු අදහසයි. මේ ආදර්ශයෙන් පිබිදුණු තවත් ලතින් ඇමෙරිකානු නායකයන් එම ක්‍රියා මාර්ගයටම අවතීර්ණ වුණා. බොලිවියාව පමණක් නොවෙයි. ඉක්වදෝරය පමණක් නොවෙයි. එමෙන්ම හියුගෝ චාවේස්ගේ නායකත්වය 4වේ ක්‍රියා මාර්ග සඳහා ආරම්භක ශක්තිය, මා මුලින් කිව්වා වාගේ උද්‍යෝගය උකහා ගත්තේ, ආස්වාදය ලබා ගත්තේ, උද්දාමය ලබා ගත්තේ කියුබාවෙන් හා ෆිදෙල් කැස්ත්‍රෝගෙන්. කියුබාවේ අධිෂ්ඨානසහගත වාමාංශික පාලනයත්, වැනිසියුලාවේ හියුගෝ චාවේස්ගේ පාලනයත් නිසා ලතින් ඇමෙරිකානු කලාපයේ බල තුලනය ජනතාවාදීව වෙනස් වුණා. මෙන්න මේකයි ලොකුම ඓතිහාසික සිද්ධිය. ලතින් ඇමෙරිකාවේ දේශපාලන බල තුලනයේ වෙනසක් ඇති වුණා, වෙනිසියුලාවේ මතු වීමත් සමඟ. කියුබාවේ ශක්තියත් සමඟ ඇදුණු ලතින් ඇමෙරිකාවේ රටවල් ගණනාවක් ඒ සමඟ එකතු වීමත් සමඟ මධ්‍යස්ථ මතවාදී වමට නැඹුරුවූ තවත් රටවල් රාශියක් එයට සම්බන්ධ වුණා. ඒ තත්ත්වයන් යටතේ තමයි ලතින් ඇමෙරිකාව ඇමෙරිකානු තහනම් බිමක් වන්නේ. තවමත් ඇමෙරිකාව හොල්මන් කරනවා. යම් යම් තැන්වල ඇමෙරිකාව තවමත් තම කුමන්ත්‍රණය අට වන තමන්ගේ මුරපොළවල් හදා ගෙන ඉන්නවා. නමුත් ලතින් ඇමෙරිකාවේ ඒ රටවල් අද තනි වෙලා. අධිරාජ්‍යවාදයට විරුද්ධව තමන්ගේ රටවල් නිදහස් කර ගැනීම සඳහා ලතින් ඇමෙරිකාවම අද එක රොත්තකට එකතු වෙමින් ඉන්නවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසන් වෙමින් පවතිනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන ප්‍රශ්නය මෙකයි. ගරු විදේශ කටයුතු ඇමතිතුමාගේ සටහනක් මට භාර දී ගියා. ඒකත් කියවන්න මට භාර කර තිබෙන්නේ. මම මගේ කථාව ඉවර කිරීමේ අවසාන භාගයේයි ඉන්නේ.

මා ඉස්සෙල්ලා කිව්වා වාගේ, වෙනිසියුලාවේ හියුගෝ වාවෙස්ගේ පාලනය නිසා ලතින් ඇමෙරිකානු බල තුලනය වෙනස් වුණා. හියුගෝ වාවෙස් ජීවතුන් අතර නැති වුණත්, ඊයේ 21වෙනි දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලය ඉදිරියේ ඇමෙරිකාව ඇතුළු බටහිර බලවතුන් ලංකාවට ගෙන ආ යෝජනාවට එරෙහිව වැනිසියුලාව සිය ඡන්දය ලංකාව වෙනුවෙන් ලබා දුන් බව කෘතවේදීව සිහිපත් කළ යුතු අවස්ථාවක් මෙය.

වාවෙස්ගේ අභාවයෙන් පසුවත් ඔහුටත්, ඔහුගේ පාලනයටත් පරිභව කරමින් නොයෙක් ලිපි පල කළ අධිරාජ්‍ය ගැති විචාරකයෝ පවසා ඇත්තේ වාවෙස්ගේ යුගය මෙතෙකින් අවසාන වන බවය. 21වැනි සියවසේ සමාජවාදය කියා ඔහු සමාජවාදයක් හඳුන්වා දුන්නා. ඒ 21වැනි සියවසේ සමාජවාදී මාවත ඔස්සේ යන්නා වූ අලුත් පරිච්ඡේදයක ආරම්භයක් සඳහා චවිස්ටා ජනාධිපති අපේක්ෂක මදුරෝ වෙනුවෙන් හා ඔහු වටා සංවේගයට පත් වූ එමෙන්ම වාවෙස්ගේ අභාවයේදී පවා ඔහුට පරිභව කරමින්, වෙනිසියුලාවට පරිභව කළ ඒ විවිධ දක්ෂිණාංශික විචාරකයන් පිළිබඳව ඇති වුණා වූ ආවේගයන්ගෙන් යුක්ත වූ දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාව අධිෂ්ඨාන සහගතව මදුරෝගේ අපේක්ෂකත්වය වටා පෙළ ගැසෙන බව අපට පෙනෙන්නට තිබෙනවා. පොදු ජනතාවගේ බලයත්, පාලක පන්තියේ රාජ්‍ය බලයත් අතර කෙළින් සිටගෙන වාවෙස් රාජ්‍ය බලය තුළින් පැන නැඟුණු හමුදා කුමන්ත්‍රණ ජනතා බලයෙන් පරාජය කළ හැකි අයුරු ආදර්ශවත්ව පෙන්වුවා. 21වැනි සියවසේ සමාජවාදයට යන මාවතේ වාවෙස්ට ඓතිහාසිකව භාර වූ වගකීම් ඉටු කිරීම නිසා වෙනිසියුලාව ආපිට හැරවිය නොහැකි ලෙස ඉතිහාසයේ ස්ථානගත වී තිබෙනවා.

කාලෝස් පෙරේස් 1989 දී, 3,000ක් පමණ ජනයා ඝාතනය කරමින් ගෙන ගිය මර්දනකාරී පාලනය අවසන් කර වැනිසියුලාවේ ජනතා ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කිරීමටත්, පාලනය සඳහා ජනතාව සහභාගි කරවා ගැනීමටත් වාවෙස් මහ පෙන්වූවා. ජාතික නිදහස හා දේශීය සම්පත් අධිරාජ්‍යවාදී මං කොල්ලයෙන් බේරා ගෙන රටම එකම ජාතියක් ලෙස ජාතික, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළක් පසු පස ඒක රාශී කර ගත්තා. සමාජ සුබසාධනයට ප්‍රමුඛත්වය දෙමින් බහුතර ජනයා දුප්පත්කමින් මුදවා ගැනීම ආර්ථිකයේ සංවර්ධන මාවත ලෙස ඔහු දැක්වූවා.

වාවෙස්ගේ ආදර්ශය අපට පෙන්වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය හා ජනතා නිදහස රැකීමත්, සියලු ජනතාව එකම ජාතියක් ලෙස එක්සත් කර ගනිමින් ජාතික සම්පත් පොදු ජන යහපත සඳහා හැරවීමත්, ජනතා බලයේ ක්‍රියාකාරිත්වය මත විශ්වාසය තැබීමත් දිගින් දිගටම ඔහු ජනප්‍රියත්වයේ රැඳ වූ බවයි. එබඳු රාජ්‍යයකට එරෙහිව අධිරාජ්‍යවාදීන්ට සිය කුමන්ත්‍රණ සාර්ථක කර ගත නොහැකියි. මේ සඳහා වාමාංශික දැක්මකින් යුත් නායකයෙකු අවශ්‍ය බව ද ඒ තරම්ම වූ සත්‍යයකි.

ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ උත්තමාරචාරයත්, මේ සභාවේ උත්තමාචාරයත් හියුගෝ වාවෙස්ගේ උතුම් නාමය වෙනුවෙන් මම පළ කරනවා.

Mr. Presiding Member, at this stage I seek your permission to read out the Statement of the Minister of External Affairs, the Hon. (Prof.) G.L. Peiris who had to leave the Chamber early for an engagement, which he had undertaken where the Thai Ambassador is to be present in Galle.

"Sir, I wish to join the other Members of the House in paying a tribute to His Excellency the late Hugo Chavez Frias, who was the President of the Bolivarian Republic of Venezuela from 1998 and sadly passed away on 5th March 2013. For a period of 15 years, he served not only as a very popular leader of the Venezuelan people but also was an outspoken voice of the developing world. President Chavez was only 58 years at the time of his death having been elected President of Venezuela at the early age of 43. Although Venezuela is a long way off from Sri Lanka, we mourn his loss because he reached out to this country as a friend and also championed the issues of developing countries as a leader of the Non Aligned Movement.

Early life

The life of the late President Chavez was remarkable. He was born to a lower middle class family where, to quote his own words, he experienced "humility, poverty, pain and sometimes not having anything to eat." He said in an interview that as a growing child he had experienced at first hand "the injustices of this world." His childhood experiences of poverty ingrained in him a fundamental spirit against injustice.

Military career

President Chavez joined the Venezuelan military and belonged to what could be best described as a group of nationalistic military officers, who believed passionately in the need for change both within their institution as well as in society at large. He rose steadily in the military ranks and gained recognition as a revolutionary voice calling for change in his country.

Bolivarian Movement

President Chavez was an admirer of the South American Revolutionary Simon Bolivar and the Marxist Revolutionary Che Guevara. He named his country the Bolivarian Republic in honour of the late Simon Bolivar. The late President Chavez was an avowed Socialist who believed that the ruling elite in his country in the early 90s had done relatively nothing to eradicate poverty and injustice. He championed the cause of the poor but maintained to quote his own words "I am not a Marxist, but I am not anti-Marxist. I am not a Communist, but I am not an anti-Communist." President Chavez has often been described as a "Socialist", but his 15 years as President of Venezuela did not see the overturn of capitalism, but rather his policies did much to challenge the more extreme neo-liberal model of development.

While Venezuela has the world's largest oil reserves and is today globally the 5th largest oil exporter, until the late President Chavez was elected to office, his countrymen remained in relative poverty. As a man who emerged from the working class, he was determined to bring about change in his country's destiny. He was the founder of the Bolivarian Movement which called for rapid social and political changes. He travelled throughout Latin America seeking support for his Movement and it was during this period that he developed a close friendship with Fidel Castro of Cuba.

Election as President

In 1998, he was elected President of Venezuela and he was re-elected 4 times to this highest office. It was only on the eve of his assuming his 4th term in office that he passed away. Throughout his 15 years as the leader of the Bolivarian Republic, he never lost his close contact with the people and had his own unique style of governance. He is a Head of State known to have presented his own Sunday morning radiotalk show called "Hello President" and a weekly television show called "Face to Face with the President." He even published his own newspaper "The President's Post". Through his direct media outreach and personal style, he answered calls from his citizens, discussed his latest policies, sang songs and joked with his people. The immense popularity of the late President Chavez is the political legacy that he had left his successors.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

The late President Chavez was not simply a populist. During his successive 4 terms as President, he radically transformed his country. It was he who made Venezuela a welfare State introducing free healthcare and education. Within a decade of the late President taking over the reins, literacy levels rose sharply, health indicators improved and he was able to significantly reduce poverty and unemployment. The lasting contribution of the late President was that he was able to use the vast wealth of oil resources in his country which had hitherto only benefited a small minority of Venezuelans to develop his country and eradicate poverty. President Chavez's socialism was not limited to political rhetoric. It consisted of a solid economic programme where he championed the cause of the poor and brought home a sea change in their lives. President Chavez established an extremely elaborate network of state-owned cooperatives which provided credit and technical training to low income families encouraging them to become self-reliant. Over the 15 years of his stewardship, extreme poverty fell by 72 per cent, the country's GDP rose by 55 per cent and government expenditure on health, education and public housing rose significantly.

International role

Sir, the late President Hugo Chavez was not only a successful leader of Venezuela, he also reached out to friends overseas. He was famous for what is called his "Oil Diplomacy" by negotiating bilateral trade and reciprocal aid agreements. He supplied oil to Cuba at preferential rates in exchange for Cuban doctors and teachers who helped raise the living standards in his country. At the OPEC Summits, he called for stringent enforcement of production quotas and higher target oil prices. He also gave leadership to Latin American economic and social integration and worked closely with his Latin American counterparts to achieve massive strides in increasing intra-regional trade. The late President Chavez strongly believed that Latin America needed to assert its power and influence in the world.

The late President was an outspoken voice that challenged even the most powerful nations of the world. He often stated, "We are going to play toughness against the toughest countries in the world." At international fora he revelled in speaking out for the rights of developing nations. It is significant that the United States-based "Time" Magazine included him in their list of the world's 100 most influential people. The British magazine "New Statesman" voted him to the 11th place in a list of "Heroes of Our Time". During his 15-year Presidency, he earned his place in history as a President who inspired the greatest zeal and love of his people.

Friend of Sri Lanka

His Excellency President Mahinda Rajapaksa has placed strong emphasis on the need for Sri Lanka to strengthen its relations with the South American Region. In pursuance of this policy, we have established diplomatic relations with over 17 countries in this Region within the last few years. Our two Embassies in Brazil and Cuba have been concurrently accredited to a number of countries in this Region. At international fora, we have increased our cooperation with the Latin American Region.

The late President Chavez has met with President Rajapaksa on a few occasions and his expression of strong support and solidarity for the Government and people of Sri Lanka is much appreciated. In 2006 when President Rajapaksa met President Chavez in Libya during the 40th anniversary celebrations of the Libyan Revolution, President Chavez praised President Rajapaksa's leadership that "enabled Sri Lanka to defeat the ruthless LTTE" to quote the words of President Chavez "a task that was deemed impossible by the world." He told President Rajapaksa that "by vanquishing a most ruthless organization such as the LTTE, President Rajapaksa had succeeded in drawing the attention of the entire international community towards Sri Lanka." At the UN General Assembly in 2008, President Chavez demonstrated his warm personal rapport with President Rajapaksa by walking up to the podium and congratulating the President and spending a few minutes conveying his solidarity with the Government and people of Sri Lanka. During bilateral meetings on the sidelines of Non-Aligned Summits he met with President Rajapaksa and appreciated Sri Lanka's success in eradicating terrorism and demonstrated sensitivity to the challenges faced in addressing post-conflict issues.

Sir, President Chavez was an outspoken critic of some developed countries for their double standards on human rights and encouraged Sri Lanka to pursue home-grown solutions to its problems in the same manner he had done in Venezuela. His support was reflected in Venezuela's consistent expression of solidarity for Sri Lanka at international fora.

Over the last five years, our bilateral trade with Venezuela increased significantly with a trade balance in Sri Lanka's favour and growing prospects for further expansion of our bilateral economic relations. Sri Lanka will continue to further strengthen her relations with the Bolivarian Republic of Venezuela, which I believe is the finest tribute we could pay to the late President Hugo Chavez Frias. I thank you, Sir."

[பி.ப. 5.02]

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மறைந்த முன்னாள் வெனிசூலா ஜனாதிபதி சாவேஸ் அவர்கள் தொடர்பாக இன்று இச்சபையிலே பலவாறான கருத்துக்கள் வெளிப்படுத்தப்படுகின்றன. மாண்புமிகு அநுர திஸாநாயக்க அவர்கள் தனது உரையிலே, "ஒரு யுத்தத்தில் எதிரியைச் சுட்டுக்கொன்றவன்கூட அந்த எதிரிக்குத் தனது தொப்பியைக் கழற்றி மரியாதை செலுத்த வேண்டும் என்பதே யுத்த தர்மம்" என்ற கருத்தைத் தெரிவித்திருந்தார். ஆனால், இறந்தவர் ஒருவர் சார்பாக ஓர் அனுதாபப் பிரேரணையைக் கொண்டுவந்து உரையாற்றுவதைக்கூடத் தடுக்கின்ற நிலைமையையே நாங்கள் இச்சபையிலே காண்கின்றோம்.

நான் நினைக்கிறேன், சுமார் 6 வருடங்களுக்கு முன்னர் முன்னாள் அமெரிக்க ஜனாதிபதி ஜோர்ஜ் புஷ் அவர்களுடைய ஆட்சியின் இறுதிக்காலத்தில் நியூயோர்க்கிலே ஐ.நா. சபைக் கூட்டத்தில் சாவேஸ் அவர்கள் ஆற்றிய உரையில், "நேற்றைய தினம் இந்த மேடையிலே ஒரு பிசாசு வந்து பேசியது" என்று கூறிய கருத்தை, சாவேஸ் அவர்கள் இறந்த பின்னரும் பல சர்வதேச ஊடகங்கள் ஒளிபரப்பிக்கொண்டிருந்தன. ஜோர்ஜ் புஷ் அவர்கள் யார் என்றுகூடப் பார்க்காமல், அவர் தெரிவித்த கருத்தை எதிர்த்துக் கூறக்கூடிய துணிவு சாவேஸ் அவர்களுக்கு இருந்தது. ஆனால், அது அமெரிக்காவுக்கும் அவருக்கும் இடையிலுள்ள பிரச்சினையாக இருக்கலாம். ஆனால், இதைவிட தலைமைத்துவம் தொடர்பான ஒரு பாடத்தை அவர் புகட்டியிருக்கிறார். அது இலங்கைக்கும் சாலப் பொருந்தும். இலங்கையிலுள்ள எந்தவோர் அரசியல் தலைமையை எடுத்துக்கொண்டாலும் அவர் தனக்குச் சமமாக இன்னோர் அரசியல் தலைமை வளரக்கூடாது என்ற நிலைப்பாட்டிலேயே கண்ணும் கருத்துமாக இருக்கிறார்கள். "நான் தான் தனிக்காட்டு ராஜா; ஒரு காட்டிலே ஒரேயொரு சிங்கம் மட்டும்தான் ராஜாவாக இருக்க வேண்டும்" என்ற கருத்துடன் செயற்படுகின்றார்கள். ஆனால், சாவேஸ் அவர்கள் தான் இறப்பதற்கு முன்னரே பஸ் சாரதியாக இருந்த சாதாரணமான ஒருவரைத் தனக்குப் பின்னர் தனது பதவிக்கு விரல் நீட்டிச் சென்றார். அவர் தனக்குப் பின் தன் வழியில் வந்த இராணுவ வீரரைத் தனது பதவிக்கு விட்டுச் செல்லவில்லை. அவர்

அவ்வாறு செய்யாவிடில் அவர் இறந்த பின்னர் வேறு பல நாட்டுத் தலைவர்கள் அந்த நாட்டுக்குள் மூக்கை நுழைத்து அந்தத் தலைமைத்துவத்துக்குள் பிரச்சினையை உருவாக்கி அப்பிரச்சினையில் குளிர்காய்ந்திருப்பார்கள். ஆனால், சாவேஸ் அவர்கள் அத்தகைய நிலைமை உருவாவதற்கு ஓர் எள்ளளவுகூட இடம்வைக்கவில்லை. தனக்குப் பின்னர் ஜனாதிபதி பதவியை யார் வகிக்க வேண்டுமென அவர் விரல் நீட்டிவிட்டுச் சென்றார். இன்று அந்த நாட்டிலுள்ள மக்களும் அந்தத் தலைமைத்துவத்தை ஏற்று நடக்கின்றார்கள். இது உண்மையிலே இலங்கையும் படிக்கவேண்டிய பாடம். எந்தவோர் அரசியல் கட்சியாக இருந்தாலும் - அது தமிழ் அரசியல் கட்சியாகவோ, சிங்கள அரசியல் கட்சியாகவோ அன்றி முஸ்லிம் அரசியல் கட்சியாகவோ இருக்கலாம் - அக்கட்சியின் தலைவராக ஒருவர் வந்துவிட்டால், அவர் தானே தொடர்ந்தும் தலைவராக இருப்பதற்கு முயற்சிப்பார். அவருக்குப் போட்டியாகத் தலைவர் பதவிக்கு இன்னொருவர் வருகிறாரெனில், அவர் தனது கட்சியைச் சேர்ந்தவராக இருந்தாலும், எதிர்க்கட்சியினரிலும் பார்க்க, அந்தத் தலைவரை எப்படி அழிப்பது என்பதிலே கண்ணுங்கருத்துமாக இருப்பார். ஆனால், அந்த விடயத்திலே மாண்புமிகு சாவேஸ் அவர்கள் மிகவும் முன்னோடியாக இருந்து தனக்கு அடுத்த தலைமை யார் என்பதைச் சுட்டிக்காட்டி விட்டுச் சென்றிருக்கிறார். தலைமைத்துவப் பதவியில் இருப்பவர்கள் தாங்கள் தொடர்ந்தும் அப்பதவியில் இருக்க வேண்டுமென்பதற்காக அதற்கான ஏற்பாடுகளை முன்னெடுத்துச்செல்கின்ற இக்காலகட்டத்திலே, சாவேஸ் அவர்களின் இந்தச் செயலினால் ஏனைய நாடுகளுக்கு அந்நாட்டின் தலைமைத்துவத்துக்குள் தமது கைகளை நீட்ட முடியாத நிலைமை ஏற்பட்டுள்ளது.

அதுமட்டுமன்றி, அவர் கம்பனிக்காரர்களுக்குக் கையளிக்கப்பட்டிருந்த எண்ணெய் வளங்களைக் குறுகிய காலத்துக்குள் அரச மயப்படுத்தி அதன்மூலம் மக்களுக்குத் தேவையான வசதிகள் பலவற்றைச் செய்திருந்தார். அவர் நினைத்திருந்தால் பல தனியார் கம்பனிகளிடம் 10 சதவீதத்தையோ அல்லது 25 சதவீதத்தையோ இலஞ்சமாக வாங்கிக்கொண்டு, அந்த மக்களுக்கு பேச்சில் ஒன்றைச் சொல்லிக்கொண்டு, செயலில் இன்னொன்றைக் செய்து கொண்டிருந்திருக்கலாம். ஆனால், அவர் அப்படிச் செய்யவில்லை. அங்கு கம்பனிகள் அதிகாரம் செலுத்திக் கொண்டிருந்த அந்த நிலைமையை மாற்றி அவற்றை அரசுடைமையாக்கி அதனூடாகப் பல வேலைத்திட்டங்களைச் செய்தாரென்று இன்றும் அந்த மக்கள் அவரைப் புகழ்ந்து கூறுகின்றார்கள். ஓர் இராணுவ வீரராக இருந்தவர்! இரண்டு வருடங்கள் சிறையில் கழித்தவர்! தான் அந்த நாட்டின் ஜனாதிபதியாக வந்தபின்பு ஜனாதிபதிக்குரிய தேசிய உடையையும் மாற்றிக்கொண்டு, தனது கருத்துக்களுடன் ஒருமித்திருந்தவர்களுடன் அவர் இணைந்து செயற்பட்டதனை நாங்கள் கண்டிருக்கிறோம். கியூபா, வட கொரியா போன்ற நாடுகளுடன் இருந்த நெருங்கிய உறவுகளை அவர் மேலும் வளர்த்துக்கொண்டார். அந்த உறவுகளுக்கப்பால், இன்று உலகமே ஏங்கிக்கொண்டிருக்கின்ற எண்ணெய் வளத்தில் அந்த நாடு எப்படிச் செழிப்படைய வேண்டுமென்பதனை நன்கு திட்டமிட்டு வழிநடத்திச் சென்றார். இன்று நாங்கள் இந்த நாட்டை முன்னேற்றுவதைப் பற்றிப் பேசிக்கொண்டிருக்கின்றோம். ஆனால், சாவேஸ் அவர்கள் தனது நாட்டை எப்படி வழிநடத்தியிருக்கிறார், அதனை எவ்வாறு முன்னேற்றியிருக்கிறார், தனக்கு பின்னர் தலைமைக்குரியவரை எவ்வாறு கண்டறிந்திருக்கிறார் என்பவையெல்லாம் நாங்கள் படிப்பினையாக எடுத்துக் கொள்ள வேண்டிய விடயங்களாகும்.

இதைவிட முக்கியமான விடயம் என்னவென்றால், ஒரு நாட்டின் தலைவரான அவர் அமெரிக்காவுக்கு எதிராகக் கருத்துக் கூறினாரோ இல்லையோ, தான் கூறும் கருத்துக்காக என்றுமே சலனப்பட்டதை நாங்கள் காணவில்லை. கம்யூனிஸ்ட் கட்சிகளும் சோசலிசக் கட்சிகளும் தங்களுக்கு அண்மைக்காலங்களில் கிடைத்த ஒரு சிறந்த தலைமைத்துவமாகத்தான் அவரைப் பார்க்கின்றன. ஆங்கிலத்தில் பிரபலமான ஒரு செய்யுள் இருக்கின்றது. அதாவது,

"When the Nazis came for the communists,
I remained silent;
I was not a communist.

When they locked up the social democrats,
I remained silent;
I was not a social democrat.

When they came for the trade unionists,
I did not speak out;
I was not a trade unionist.

When they came for the Jews,
I remained silent;
I wasn't a Jew."

When they came for me,
there was no one left to speak out."

உண்மையில் இதுதான் இன்று இந்த நாட்டில்கூட நடக்கின்றது. எங்களுக்கு உரித்தான பிரச்சினைகளை மாத்திரம் நாங்கள் கதைத்துக்கொண்டிருக்கின்றோம். மற்றவர்களுக்கு ஏற்படுகின்ற பிரச்சினைகளைப் பற்றி நாங்கள் பேசுவதில்லை. இன்று சிலர் அதைவிட ஒருபடி மேலே சென்று, தமது இனத்துக்கு ஏற்படுகின்ற பிரச்சினைகளைப் பற்றிக்கூடப் பேசாமல் வாய்மூடி இருக்கின்ற ஒரு நிலைமையை நாங்கள் காண்கின்றோம்.

சாவேஸ் அவர்கள் தனது நாட்டில் ஊடக தர்மத்தினை மிகவும் சிறப்பாக வழிநடத்தியிருந்தார். இங்கே மாண்புமிகு அஸ்வர் அவர்கள் இப்போது இருப்பது நன்று. அவர் ஊடகங்களுடன் நெருங்கிப் பழகுபவர். ஆனால், என்றுமே இல்லாதவாறு சபையில் நடந்த நிகழ்வொன்று சம்பந்தமாக ஒரு வாதத்தினை அவர் முன்வைத்திருக்கிறார். அதாவது, 'சிரச' தொலைக்காட்சிக்கு கொடுக்கப்பட்டது edit பண்ணிக் கொடுக்கப்பட்ட காணொளி ஒன்றல்லவென்று அவர் கூறுகிறார். அதேநேரம், அமைச்சர் தினேஷ் குணவர்தன அவர்களோ, இந்தப் பாராளுமன்ற அமர்வையே live telecast செய்யவேண்டுமென்று சொல்லிக்கொண்டிருக்கிறார். இந்தப் பேச்சுக்களுக்கப்பால் -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, என்னுடைய அன்புக்குரிய நண்பரான இந்த உறுப்பினர் விடயங்களைத் திரிபுபடுத்திக் கூறுகிறார். 'சிரச' தொலைக்காட்சிக்கு கொடுத்தது, கொடுக்காதது என்பதல்ல என்னுடைய கேள்வி! சபாநாயகர் அல்லது தவிசாளர் ஒரு விடயத்தை நீக்கிய பிறகு - expunge செய்தால் - அந்த வார்த்தைகள் ஏதாவது ஊடகமொன்றில் வெளிவரலாமா? எங்களுடைய பத்திரிகை ஊடகவியலாளர்களைப் பொறுத்த மட்டிலே அவர்களுக்கு இங்கிருந்தே censor பண்ணிக் கொள்ளலாம். அது உங்களுக்குத் தெரியும். உங்களுக்கு MTV உடன் நெருங்கிய சம்பந்தம் இருக்கக்கூடும். நீங்கள் 'மின்னல்' நிகழ்ச்சியை ஆரம்பித்தவர். அதைப்பற்றிப் பரவாயில்லை. ஆனால், என்னுடைய கருத்துக்களைத் திரித்துக் கூறவேண்டாம்.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අදහස පැහැදිලියි.

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
අන්ත වකෙයිල්, උංකලුක්කුත් තෙරියුම් -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය දැන් අවසන් වෙන්න ළඟයි. ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ. ඔබතුමාගේ කථාව කර ගෙන යන්න.

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
கௌரவ அஸ்வர் அவர்களே, நான் அதைப்பற்றிக் கூறவில்லை. நீங்களும் என்னுடைய நெருங்கிய நண்பர். பிரதிச் சபாநாயகராக இருந்த மறைந்த காமினி பொன்சேகா அவர்கள் அந்த மகாராஜா நிறுவனத்திலே Group Director ஆக இருந்தபொழுது நீங்கள் அவரின் செயலாளராக இருந்தீர்கள். எனவே, உங்களுக்கு என்னிலும் பார்க்க அந்த மகாராஜா நிறுவனத்தோடு நெருங்கிய தொடர்பு இருந்தது எல்லோருக்கும் தெரியும்; எங்களுக்கும் வரலாறு தெரியும்.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
நீங்கள் ஐக்கிய தேசியக் கட்சியில் இருந்தபொழுது எவ்வளவுதூரம் இந்த மகாராஜா நிறுவனத்துடன் நெருங்கிப் பழகினீர்கள் என்பதும் எங்களுக்குத் தெரியும். நாங்கள் அதைப்பற்றி விவாதிக்க இங்கு வரவில்லை. *[இடையீடு]* நன்றி.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[5.12 p.m.]

ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

Sir, on behalf of the Communist Party of Sri Lanka, I wish to associate myself with the sentiments expressed by the Hon. Members of both sides of the House on the death of President Hugo Chavez Frias of Venezuela.

Hugo Chavez representing 29 million Venezuelan people, within the 14 years that he was in power as the President of Venezuela, blossomed as a charismatic leader of the Latin American Continent and a much respected world leader at the time of his untimely death. As a close friend of Sri Lanka, I consider it most fitting and appropriate that this House should record our appreciation of his role and contribution for the cause of anti-imperialism, socialism, people's sovereignty and human dignity. He shook the world during the 14 years that he was in power as an anti-imperialist fighter who transformed the lives of the 29 million Venezuelan people through political, economic, social and cultural changes. He propelled a political tidal wave in Latin America that elected a galaxy of Left, Pro-left and Centre -left regimes in the entire continent. The revolutionary Cuba was of course the source of ideology, strength, knowledge, experience and inspiration.

He emerged as President of Venezuela in 1998, on the horizon of the 21st Century and at a time when the world balance of forces had changed decisively in favour of imperialism, neo-liberalism and unipolarity with the collapse of the Soviet Union. The US by this time had embarked on unilateralism as its foreign policy and pre-emption as its defence policy.

Sir, Latin America had been identified as a continent of military coups, political assassinations, colonial plunder, invasions and incursions, unbridled exploitation, poverty and misery for nearly three centuries. It was a backyard of US hegemony. It was a laboratory where neo -liberalism was experimented rigidly and vigorously under the heels of military dictatorships. It was where Economist Milton Friedman's theory of free markets was tried and tested. It was on the strength of this experiment that Margaret Thatcher made her infamous declaration that there was no alternative to neo-liberalism.

Chavez was raised by his grandmother in a house with a mud floor in rural Venezuela and evoked passion among the poor supporters who loved his charm and common touch.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වියෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. UDITH LOKUBANDARA *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
With the advent of Chavez to power in Venezuela, he reversed this trend through his radical, economic and social policies and through the Bolivarian Revolution, he propelled and provided to the Latin American people, a viable alternative economic policy. He survived the military putsch engineered by the US, as people walked into the streets in his defence. During his 14 years of rule, Venezuela achieved a dramatic reduction of poverty and inequality. He put the country's oil wealth at the service for the people.

His vision, oratory, diplomatic skills for initiatives, his intellectual insight, cheerful disposition, charismatic glamour of his leadership, his spirit of internationalism and commitment for the cause of his people - all earned him the love and admiration of the people the world over.

Sir, as a member of Sri Lankan delegation to the UN General Assembly, I had the privilege and fortune to listen to this charismatic socialist leader's emotional outburst at US President George W. Bush, at the UN General Assembly sessions in 2004 during the Iraq war.

Referring to George W. Bush he said, "The devil came here yesterday. It smells of Sulphur still today".

Mr. Deputy Chairman of Committees, he, under conditions of dictatorship started his political career in the early 1980s by founding a secret organization - the Revolutionary Bolivarian Movement, which was renamed "The Movement of the Fifth Republic", which has now blossomed as the United Socialist Party of Venezuela merging with the other Left and radical groups and supported by the other Left groups from outside.

He languished in jail for two years and on his release two years later, he swept to power in the 1998 Elections.

Chavez kept oil revenues within Latin America unlike Saudi Arabia, which buys US Treasury Bills and other assets. Venezuela, at one point, withdrew US Dollars 20 billion form the US Federal Reserve and since 2007 has aided the other Latin American countries with US Dollars 36 billion, the most of which has been repaid. In fact, this, in effect, supplanted the IMF and the World Bank, weakening the US regional hegemony.

In 2011, to his credit the Community of Latin American and Caribbean States came into being. Today it is known as CELAC.

He promoted the International Humanitarian Fund in 2013 in order to provide assistance to social programmes without attacking the customary neo-liberal strings, as in the case of IMF. He gave life to the OPEC causing de-dollarization of international oil sales. He paved the way for a multi-polar world through his policy of national sovereignty and human dignity. He diversified commercial and military relations in order to lessen dependency on the United States, demonstrating his spirit of internationalism. The Latin American unity that Simón Bolívar dreamt of was realized to a greater degree before the demise of Chavez.

Though he played the leading role in the transformation of the lives of his people, his real strength lay in the active involvement of the social movements and in the coalition of the Left and radical forces. Last October, he won a new six-year term and his death within five months of his magnificent victory is undoubtedly devastating for millions of his supporters and voters.

Bearing in mind, the support he gave Sri Lanka through international fora and agencies, let us pay our deep respect and honour to that great patriot and internationalist for all what he stood, fought and gave his life for.

We have no doubt that the incumbent Acting President, Nicolás Maduro, will lead the Venezuelans in defence of all what Chavez stood for.

Thank you.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you, Hon. Minister. The next speaker is the Hon. Weerakumara Dissanayake.

[අ.භා. 5.20]

ගරු වීරකුමාර දිසානායක මහතා (සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க - பாரம்பரிய கைத்தொழில்கள், சிறு தொழில்முயற்சி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Weerakumara Dissanayake - Deputy Minister of Traditional Industries and Small Enterprise Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෙනිසියුලාවේ නිටපු ජනාධිපති හියුගෝ චාවේස් මැතිතුමාගේ අභාවය ගැන මේ කල් තැබීමේ විවාදයේදී විශේෂයෙන්ම ශෝකය ප්‍රකාශ කරන්න ලැබීම මා ඉතාම වැදගත් කොට සලකනවා.

[ගරු වීරකුමාර දිසානායක මහතා]

අද මේ අවස්ථාවේදී වෙනිසියුලාවේ හිටපු ජනාධිපතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් විශේෂයෙන්ම අපට ශෝකය ප්‍රකාශ කරන්න තරම් වැදගත් වන්නේ ඇයි? වෙනත් රාජ්‍ය නායකයකුට නැති විශේෂ වැදගත්කමක් අද එතුමා සම්බන්ධයෙන් අපට තිබෙනවා. චාවේස් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අද ශෝක ප්‍රකාශ කරමින් තමන්ගේ අදහස් ඉදිරිපත් කරන්න වමේ පක්ෂ හැම එකක්ම වාගේ සහභාගි වෙලා තිබෙනවා. මේ චාවේස් කවුද? එතුමා රටක රාජ්‍ය නායකයෙක්. රාජ්‍ය නායකයකු වීම නිසාමද මේ ශෝක ප්‍රකාශය කරන්නේ? මා හිතන්නේ චාවේස් ගැන අපට මතය එන්නේ එතුමා කරපු අධිරාජ්‍ය විරෝධී දැවැන්ත අරගළයක් නිසායි. චාවේස් මැතිතුමා වෙනුවෙන් අපේ වමේ පක්ෂ හැම එකක්ම තමන්ගේ අදහස් ඉදිරිපත් කරන්න, ශෝකය පළ කරන්න එද්දී මට ප්‍රශ්නයක් ආවා චාවේස් කියන්නේ මාක්ස්වාදියෙකුද කියලා; අනෙක් පැත්තෙන් මාක්ස් ලෙනින්වාදියෙකුද කියලා; නැත්නම් සමාජවාදියෙකුද, ධනවාදියෙකුද කියලා. කවුද මේ චාවේස්? ඇත්තටම මෑත කාලීනව ගත්තාම වමේ ඇතැම් පක්ෂ තමන්ගේ පටු න්‍යායයන්ට හිර වෙලා ඉන්න කොට චාවේස් තමයි අධිරාජ්‍ය විරෝධී අරගළය ඇතුළේ බොහොම ප්‍රායෝගික නායකයකු බවට පත් වුණේ. අධිරාජ්‍ය විරෝධී අරගළය ඇතුළේ චාවේස් ප්‍රයෝගික නායකයකු බවට පත් වෙද්දි, මට මතකයි අපේ වමේ පක්ෂයක් මීට අවුරුදු දෙක තුනකට ඉස්සෙල්ලා පත්තරයකට කියලා තිබුණා, "චාවේස් පටලවා ගෙනයි ඉන්නේ" කියලා. ඇත්තටම කිව්වොත් චාවේස් ප්‍රායෝගිකව තමන්ගේ කාර්ය භාරය ඉටු කරපු නිසා තමයි මුළු ලෝකයේම අවධානය දිනා ගත්තේ. මා අනුරාධපුරයට යන අතරේ දැක්කා අපේ රටේ ඉන්න සාමාන්‍ය ජනතාව අතරට පවා චාවේස් නාමය යම් ප්‍රමාණයකට කා වැදිලා තිබුණ බව. මොකද, චාවේස් අධිරාජ්‍ය විරෝධී අරගළය ඇතුළේ සජීවීව හිටපු නිසා. එතුමා ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන්ට එරෙහිව සජීවීව හිටියා; තමන්ගේ අදහස් ඍජුව ප්‍රකාශ කළා. ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී චාවේස්ව අපට ඉතාමත්ම වැදගත් වනවා, ලතින් ඇමෙරිකානු කලාපයේදී චාවේස් තමන්ගේ මෙහෙවර ඉතාමත් මැනවින් ඉටු කිරීම නිසා. ලතින් ඇමෙරිකානු කලාපයේ රාජ්‍යයන් ගණනාවක් චාවේස්ගේ රැකවරණය, ආරක්ෂාව හා ශක්තිය විශාල වශයෙන් ලබා ගත්තා. චාවේස්ගේ ශක්තිය නිසාම ලතින් ඇමෙරිකානු කලාපය ඇමෙරිකන් අධිරාජ්‍යවාදයට අවශ්‍ය ලෙස හසුරුවන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ; ඔවුන්ගේ ක්‍රියා මාර්ග සම්පූර්ණයෙන්ම ක්‍රියාවට නඟන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. කියුබාවේ ෆිදෙල් කැස්ත්‍රෝ වාගේම අසභාය මානවවාදී මහ පෙන්වන්නෝ අදත් ඉන්නවා. චාවේස් ඊට නොදෙවෙනි දැවැන්ත ශක්තියක් මෑතකාලීනව ලබා දුන්නා.

ඒක නිසාම තමයි ලෝකය පුරා අධිරාජ්‍ය විරෝධී අරගළ පවතින රටවල, අධිරාජ්‍ය විරෝධයට නායකත්වය දෙන මිනිස්සු අතරේ චාවේස් සම්බන්ධයෙන් වඩාත් හොඳ භක්තියක්, හැඟීමක්, ශක්තියක් ආවේ. අපේ රටේ සමහර අය චාවේස්ගේ මානෘකාව ගත්තේ තමන්ගේ දේශපාලනය ව්‍යාපාරයට ආභරණයක් විධියට හදා ගන්න ඊයේ, පෙරේදායි. මීට පෙර චාවේස් විඥානවාදියෙක් කියලා පහර දුන්නා. මාක්ස්වාදී දර්ශනය හරියට හදාරලා නැහැ කියලා කිව්වා. ලෙනින්වාදය හදාරලා නැහැ කියලා කිව්වා. මේ විධියට විවිධ දේවල් කිව්වා. හැබැයි චාවේස් තමන්ගේ වැඩේ ප්‍රායෝගිකව කළා. රටේ බලය ගත්තා. බලය පවත්වා ගෙන ගියා. අධිරාජ්‍යවාදයට එරෙහිව අරගළ කළා. ඒ නිසාම තමයි අපට වැදගත් වුණේ චාවේස්ව, ඒ අර්ථයෙන් පිළිගන්න. අපි කවුරුත් චාවේස් පිළිගත්තේ ඇමෙරිකන් අධිරාජ්‍යවාදයට එරෙහිව තමන්ගේ සටන මෙහෙයවපු, තමන්ගේ සටන අබණ්ඩව ගෙන ගිය, අවසාන මොහොත දක්වා ඒ සටනේ සිටිමින් මිය ගිය නායකයෙක් ලෙසයි. එහෙම නැතුව අපි චාවේස් මාක්ස්වාදියෙක් ලෙස ගත්තේ නැහැ. මාක්ස්වාදියෙක්, ලෙනින්වාදියෙක්, සමාජවාදියෙක්, ධනවාදියෙක් කියන ඒ එක පැත්තකටවත් යන්නේ නැතුව ප්‍රායෝගිකව තමන්ගේ සටනේ හිටපු නායකයෙක් විධියට ඔහුට අවශ්‍ය වුණා, ලතින් ඇමෙරිකානු කලාපයේ බලය පවත්වා ගෙන යන්න, ලතින් ඇමෙරිකානු කලාපයට අධිරාජ්‍යවාදීන්ගෙන් එල්ල වන බලපෑම්වලට මුහුණ දෙන්න. ඒ නිසා ඔහු ඒ අවශ්‍ය ක්‍රියා මාර්ග ප්‍රායෝගිකව ගත්තා. ඒ රාජ්‍යයන් එක්ක ගනුදෙනු කළා. අවශ්‍ය හැම පැත්තටම අවශ්‍ය මෙහෙයුම් දියත් කරමින් කටයුතු කළා.

ඒ අතර මට මතක් වුණේ ඊයේ, පෙරේදා ජිනීවාවල සම්මත වුණු යෝජනාව සම්බන්ධයෙන් ඉන්දියාවේ හැසිරීම හා චාවේස් ගැනයි. මේ දෙක මම බැලුවා.

චාවේස් තමන්ගේ රටේ ආරක්ෂාව සලසා ගන්නා අතරම ලතින් ඇමෙරිකානු කලාපයේ ආරක්ෂාව වෙනුවෙන් කොයි තරම් දුරට පෙනී සිටියාද? මේ නිසා තමයි අපි හැමෝම චාවේස් ගැන කථා කළේ. අපේ රටේ මිනිස්සු, අපේ ජනාධිපතිතුමා, ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ ඇමතිතුමා, අනෙකුත් අමාත්‍යවරුන් මේ හැම කෙනෙකුම චාවේස්ට භක්තිමත් වුණේ, චාවේස් ගැන හැඟීමක් ආවේ, චාවේස් ඒ කරපු අරගළය සහ තමන්ගේ කලාපය බේරා ගැනීම නිසායි. ඒක නිසා තමයි අපට චාවේස් වැදගත් වන්නේ. ඔහුත් සාමාන්‍ය රාජ්‍ය නායකයෙකු ලෙස රට පාලනය කරලා මිය යනවා. එය රටේ ජනතාවට යම් ප්‍රමාණයකට වැදගත් වෙන්න පුළුවන්. නමුත් අද අපට ඔහු වැදගත් වෙලා තිබෙන්නේ, ඇමෙරිකානු අධිරාජ්‍යවාදය ඉස්සරහ ඔහු කරපු අරගළය නිසයි. ඒ වාගේම අද ආසියා කලාපයේ අපට අරගළයක් තිබෙනවා. ආසියා කලාපයේ අපට තිබෙන අරගළයත් ඇමෙරිකන් අධිරාජ්‍යවාදයෙන් එලෙසම නිදහස් වීමයි. එලෙසම ඒ බැම්වලින් නිදහස් වීමයි. අපේ ආසියා කලාපයේ බලවත් රාජ්‍යයක් තමයි ඉන්දියාව. අද ඉන්දියාව ජිනීවා ගිහිල්ලා මොකද කළේ? ජිනීවාවලට ගිහිල්ලා තමන්ගේ අසල්වැසි රට සම්පූර්ණයෙන්ම පාවා දුන්නා. තමන් කරුණු හරියට දැන හෝ නොදැන හෝ පාවා දීලා සම්පූර්ණයෙන්ම අනෙක් පැත්තට හැරෙන ක්‍රියා මාර්ග ගත්තා. ලතින් ඇමෙරිකාව චාවේස් පිළිගත් ආකාරයට අපට ආසියාවේදී ඉන්දියාව පිළිගන්න බැරි තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා. ආසියාවේදී ඉන්දියාව පිළිගන්න පුළුවන්කමක් නැහැ. නිකම් බොරුවට අතට අත දෙන්න පුළුවන්කම තිබෙනවා. නමුත් සජීවීව ඒ මැදිහත් වීම අපට කරන්න බැහැ. ලතින් ඇමෙරිකාව චාවේස් පිළිගත්ත ආකාරයට ආසියාවේ අපට ඉන්දියාව පිළිගන්න බැහැ. ඇයි? ඉන්දියාව ගැන විශ්වාසයක් නැහැ. ඕනෑම වේලාවක තමන්ගේ කලාපය පාවා දෙන්න පුළුවන්කම තිබෙනවා; තමන්ගේ අසල්වැසියා පාවා දෙන්න පුළුවන්කම තිබෙනවා. පසු ගිය ජිනීවා යෝජනාවලදී අපි දැක්කා, ඒ පාවා දීම කරන්න ඉන්දියාව මැදිහත් වෙනවා. ඒ නිසා චාවේස් වාගේ නායකයෝ ලෝකයට ඕනෑ වෙන්නේ, චාවේස් වාගේ නායකයෝ කලාපයකට ඕනෑ වෙන්නේ, චාවේස් වාගේ නායකයෝ රටකට ඕනෑ වෙන්නේ සජීවී දේශපාලනය කරන්නයි. අද අපි දන්නවා, මුළු ලෝකයම විශාල ජාලයකින් හිර කරලා, බැඳලා තමන්ගේ වුවමනාවන් ඉටු කර ගන්න විධියට ආර්ථික වශයෙන් හසුරුවන පාලන ක්‍රමයක් ලෝකය හසුරුවමින් යනවා කියලා. පසු ගිය දිනවල මාධ්‍යවල වාර්තා වුණා, චාවේස්ගේ මිය යාම කුමන්ත්‍රණයක්ය කියලා. මේ වාගේ සැක සංකා පවා ලෝකයේ පහළ වුණා. ඒ රටේ වර්තමාන නායකයන්ට අද ඒ තත්ත්වය ඇවිල්ලා තිබෙනවා. අද ලෝක දේශපාලනය එතරම්ම භයානක ලෙස හසුරුවන යුගයක්.

මේක අපි ආදර්ශයට ගන්න ඕනෑකම තිබෙනවා. චාවේස් ජනාධිපතිතුමාගේ අභාවය පිළිබඳව ලෝකයට, අපිට ගන්න ආදර්ශ විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපේ රටේ අපි හැම කෙනෙකුටම, ලෝකය පාලනය කරන හැම රාජ්‍ය නායකයකුටම එතුමා විශාල ආදර්ශයක්. එක කාරණයක් තමයි එතුමා තමන්ගේ රට නිසි ආකාරයෙන් පාලනය කිරීම. එතුමා අධිරාජ්‍යවාදයට හිස නමලා නැහැ. තමන්ගේ රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය කරන මැදිහත් වීම කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. තමන්ගේ රටේ ජනතාවට අවශ්‍ය කරන අනිකුත් යටිතල පහසුකම් ඉතා කෙටි කාලයක් ඇතුළත නිර්මාණය කරන්න අවශ්‍ය දායකත්වයක් ලබා දී තිබෙනවා. මේ හැම පැත්තෙන්ම බැලුවාම චාවේස් ජනාධිපතිතුමා වැදගත් වනවා. ඒ වාගේම තමන්ගේ අසල්වැසි

රාජ්‍යයන්ගේ සියලු අඩු පාඩුකම්වලට මැදිහත් වෙලා උදව් කරලා තිබෙනවා. ලතින් ඇමෙරිකානු කලාපය විශාල ස්වාභාවික සම්පත් ප්‍රමාණයක් පිරුණු කලාපයක්. ඇමෙරිකන් අධිරාජ්‍යවාදයේ මුළුමහත් ඉතිහාසය පුරාම ලතින් ඇමෙරිකානු කලාපය ආක්‍රමණය කරන්න උත්සාහ කළා. ඒ අත් කිසිවක් නිසා නොවෙයි, ඒ කලාපයේ තිබෙන ස්වාභාවික සම්පත් ටික තමන්ට ලබා ගන්න, තමන්ට කොල්ල කන්න.

1940 පමණ වන කොට දැවැන්ත විප්ලවීය රැලි නැගලා ආපු කලාපයක් තමයි ලතින් ඇමෙරිකානු කලාපය. හැම කුඩා රාජ්‍යයකම එවැනි විප්ලවීය රැලි නැගලා ආවා. කියුබාව, ලතින් ඇමෙරිකානු කලාප ඇතුළේ ඒ බලය හොබවන්න ඒ අවධියේම සමත් වුණා. මේ වාගේ නායකයෙක් මෙලෙස බිහි වෙලා ඉතා කෙටි කාලයක් ඇතුළත තමයි අධිරාජ්‍යවාදයට අභියෝග එල්ල කරමින් තමන්ගේ පාලනය ගෙන ගියේ. ඒ නිසා ඇමෙරිකාවට දශමයක්වත් යටත් වෙන්න වුවමනාවක් තිබුණේ නැහැ. තමන්ගේ කලාපයත් ආරක්ෂා කර ගෙන යන්නයි ඕනෑකම තිබුණේ. අද අපේ රට පාලනය කරද්දී එතුමාගෙන් අපිට ගන්න ආදර්ශයන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. රාජ්‍ය නායකයෙකු මිය ගියාට පසුව, අපිට ආදර්ශයට ගන්න පුළුවන්කම තිබෙන්නේ ඒ රාජ්‍ය නායකයා තමන්ගේ රටේ පාලනය ගෙන ගියේ කොහොමද, ඔහුගේ අභාවය පිළිබඳව ජනතාව ශෝක වෙන්නේ ඇයි, ඔහුගේ අභාවය පිළිබඳව ජනතාවට ශෝකය දැනෙන්නේ ඇයි කියන කාරණයි. අපේ රටේ සාමාන්‍යයෙන් ගමේ ඉන්න මිනිහෙකු "අනේ! වාවේස් පව් නේද මැරුණේ?" කියන මට්ටමට කථා කරන තැනට මිනිසුන්ගේ හඳවත්වලට ළං වුණා. ඒ විධියට වෙනත් රටක නායකයෙකුට සමීප වෙන්න පුළුවන්කම තිබෙන්නේ ඔහුගේ මතවාදය, ඔහුගේ ආකල්ප, ඔහුගේ ක්‍රියාකාරිත්වය නිසායි. ඒ ඔහු මාක්ස්වාදියෙකු, කොමියුනිස්ට්වාදියෙකු, සමාජවාදියෙකු හෝ වෙනත් යම් මතවාදයක් දරන පුද්ගලයෙකු නිසා නොවෙයි, ඔහු ප්‍රායෝගික නායකයෙකු නිසයි. වාවේස් ජනාධිපතිතුමාගේ චරිතයෙන් අපිට ගන්න ආදර්ශ තිබෙනවා. විශේෂයෙන්ම ඔහු ප්‍රායෝගිකව දේශපාලනය කරපු නායකයෙකු හැටියට තැනට සුදුසු ලෙස තමන්ගේ කාර්ය භාරය කළා වාගේම ලෝකයට අවශ්‍ය කරන මැදිහත් වීම, තමන්ගේ රටට අවශ්‍ය කරන මැදිහත් වීම සිදු කළා. විශේෂයෙන්ම ඔහුට පුළුවන් වුණා, බොලිවේරියානු මතවාදයක් නිර්මාණයක් කරන්න; බොලිවේරියානු සංස්කෘතියක් නිර්මාණය කරන්න. බොලිවේරියානු සංස්කෘතියක් ඔහු හැදුවා.

ආර්ථික වශයෙන් තමන්ගේ රට සංවර්ධනය කරන ගමන්, සමෘද්ධිමත් කරන ගමන් කෙටි කාලයක් ඇතුළත මහා දැවැන්ත වෙනස්කම් ගණනාවක් කළ නායකයෙක් වශයෙන් තමයි අපි වාවේස් මැතිතුමාව අගය කරන්නේ; එතුමාගේ අභාවය පිළිබඳව කනගාටු වෙන්නේ; එතුමාගේ අභාවය පිළිබඳව අපගේ ශෝකය ප්‍රකාශ කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ අවස්ථාවේදී, ජාතික නිදහස් පෙරමුණේ නායක ගරු විමල් වීරවංශ අමාත්‍යතුමා වාවේස් මැතිතුමාගේ ගුණසමරු දේශනයකදී කළ සම්පූර්ණ දේශනය **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අප විශේෂයෙන්ම කියනවා, අපි වාවේස් මැතිතුමා ගැන කථා කරමු; එතුමාගෙන් ආදර්ශ ගනිමු; එතුමා වාගේ තමන්ගේ රට ගැන හිතමු කියා. එහෙම නැතිව ඇමෙරිකන් රාජ්‍යවාදයට කඩේ යන ගමන්, රට පෙරළන්න වෙනත් කුමන්ත්‍රණ කරන ගමන් ඇවිත් වාවේස් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරලා වැඩක් නැහැ. ඇමෙරිකන් අධිරාජ්‍යවාදයට කඩේ ගිහිල්ලා වාවේස්ගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමෙන් එය මේ රට ඉස්සරහ සාධාරණය කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැයි කියමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[අ.භා. 5.33]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர்)

(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් වේලාව පස් වරු 5.30යි. වාවේස් මැතිතුමා ගැන මේ වන විට වැදගත් කථා රාශියක් කෙරුණා.

මා එතුමා සම්බන්ධයෙන් එක් සිද්ධියක් කියන්න කැමැතියි. අපේ හියුගෝ වාවේස් දේශපාලනඥයාගේ අභාවය අවස්ථාවේදී එතුමාගේ දේහය තැන්පත් කර තිබුණු ස්ථානයේ කාන්තාවක් අඬ අඬා සිටියා. අඬමින් සිටිය ඒ කාන්තාව ළඟට ගිය මාධ්‍යවේදියෙක් ඇහුවා, "ඔබ මොකද මේ අඬන්නේ?" කියලා. ඒ කාන්තාව කිව්වේ මෙකයි. "අපි ගැන බලන්න දෙවියන් වහන්සේ සිටිනවා, අපේ දුක ගැන වාවේස් බලා ගත්තා. ඒ දෙවියා අපට නැති වුණා" කියලා. මෙන්න මෙකයි එතුමාගේ ගමන් මාර්ගයේ සාර්ථකත්වය. ඒ රටේ ජනතාවගේ දුක නැති කරන්න, ජනතාව සැපවත් කරන්න එතුමා කළ සේවය අනුව ඒ රටේ අතිවිශාල ජනතාවක් එතුමා දෙවියෙක් හැටියට සලකා තිබුණු බව ඇගේ කථාවෙන් පෙනෙනවා. ඒ රටේ දේශපාලනයේ නායකයා හැටියටත් රටේ නායකයා හැටියටත් එතුමා රට වෙනුවෙන් එම කැප කිරීම කළා. ඒ සේවය එතුමාට කරන්න පුළුවන් වුණේ එතුමාගේ තිබුණු ප්‍රගතිශීලී අදහස් නිසායි. මාක්ස්වාදයෙන්, සමාජවාදයෙන් ඒ කලාපයේ ඉදිරියේ සිටින ෆිදෙල් කැස්ත්‍රෝ වැනි නායකයන්ගෙන් ලැබුණු ආභාෂය අනුව එතුමා හදා ගත් ආකර්ෂණීය චරිතය, එතුමා ලබා ගත් ඥාන සම්භාරය නිසා එතුමා මහා ශ්‍රේෂ්ඨ පුරුෂයෙක් බවට ලතින් ඇමෙරිකානු කලාපයේ පමණක් නොවෙයි, ලෝකයේම පිළිගැනීමක් ඇති වුණා. එතුමා ලෝක පුරුෂයෙක්; විශ්ව පුරුෂයෙක්. ඒ විශ්ව පුරුෂයා මුළු ලෝකයටම පෙනී සිටිමින් කථා කළ නායකයෙක් වුණා. ඒ නිසා තමයි ලෝකයේ ජනතාව එතුමාගේ අභාවය ගැන කනගාටු වන්නේ; ශෝක වන්නේ; ආචාර කරන්නේ.

ඒ උතුම් පුරුෂයා එක්සත් ජාතීන්ගේ මණ්ඩලය ඉදිරියේ නිර්භීතව, ඇමෙරිකාවේ ජනාධිපතිවරයාට මුහුණට මුහුණ අභියෝග කරමින්, දැඩි වචන පාවිච්චි කරමින් කථා කළා. එලෙස කථා කළ නිසා, එවැනි අභියෝග කළ නිසා එතුමාට කුමක් වේ දැයි ලෝකයාට හිතන්නට බැරි තත්ත්වයකට පත් වුණා. මොකද, ඇමෙරිකාව ලෝකයේ යම් රටවලට ගිහිල්ලා කරන මහා විනාශයන් නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවුරුදු පණහකට වැඩි කාලයක් නොයෙකුත් ගර්ජන, නොයෙකුත් වර්ජන, නොයෙකුත් සීමාවන් පනවලා ඒ රට හුදකලා කරන්නට උත්සාහ කරද්දී ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයාට ඒ රට තනිවම ගෙනියන්න පුළුවන් වුණේ, ඒ රටේ ජනතාව එතුමා සමඟ සිටින ලෙස, එතුමා අවංක ලෙස තමන්ගේ සේවය ඉටු කළ නිසායි.

රට තුළ ඒ තත්ත්වය ගොඩ නඟා ගෙන, රටේ දේශපාලන ක්‍රමය සකස් කර ගනිමින්, මහා ආර්ථික සංවර්ධනයක් ඇති කරමින් ජනතාවට ලබා දුන් ඒ ශුභ සාධන වැඩ පිළිවෙළ තුළින් තමයි එතුමා ඒ ශක්තිය ලබා ගත්තේ. ජාති භේද, ආගම් භේද, කුල භේද, වර්ණ භේද, පක්ෂ භේද නැතුව මනුෂ්‍ය වර්ගයාටම කරන සේවාව අනුව තමයි උතුම් පුරුෂයකු බවට පත් වන්නේ. අපි කල්පනා කරන විධියට, ලෝකයේ උතුම් පුරුෂයකු හැටියට එතුමාට ගරුසරු දක්වන්නේ, එතුමා ගැන කථා කරන්නේ එතුමා කළ එම සේවාවන් නිසායි.

[ගරු අනාවුදු සෙනෙවිරත්න මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා ලෝකයට ආදර්ශවත් දේශපාලනඥයෙක්. පසු ගිය කාලයේ මේ ගැන සොයන කොට මට ආරංචි වුණා, එතුමාට බැංකුවේ account එකක්වත් නැහැයි කියලා. අද ලෝකයේ දේශපාලනඥයන් ගැන බැලුවොත්, සමහර රටවල රාජ්‍ය නායකයෝ බලයට පත් වෙලා ටික කලකින් ඔළුව නමා අස් වෙලා යනවා. මනඃකල්පිත වශයෙන් නොවෙයි, ප්‍රායෝගික වශයෙන්ම එවැනි චරිතයක්, එවැනි දර්ශනයක් එතුමා තුළ තිබුණා. ලතින් ඇමෙරිකානු කලාපය තුළ එතුමා මහා ශක්තියක් වුණා. ෆිදෙල් කැස්ත්‍රෝ නායකයාට එතුමා ශක්තියක් වුණා, ලතින් ඇමෙරිකානු ප්‍රදේශය තුළ ඒ තත්ත්වය ගොඩ නඟන්න. අපට එතුමාගෙන් ආදර්ශයට ගන්න පුළුවන් බොහෝ දේ තිබෙනවා. එතුමාගේ ආදර්ශයන් තුළින් අප බලාපොරොත්තු වන්නේ මේ යුගයට අවශ්‍ය කරන ප්‍රබෝධයක් ඇති කරන්නයි; මේ යුගයට අවශ්‍ය වන නැඟිටීමක් ඇති කරන්නයි.

අධිරාජ්‍යවාදීන් ලංකාවට පහර දෙන කොට එතුමා අපේ ලංකාව කෙරෙහි, ලංකාවේ දේශපාලනය කෙරෙහි, අප කෙරෙහි දැක්වූ කරුණාව පිළිබඳවත්, අප වෙනුවෙන් පෙනී සිටීම පිළිබඳවත් එතුමාට අපේ ගෞරවය, අපේ ආචාරය පිරිනමමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

[පි. ප. 5.40]

ගරු එම්.ටී. හසන් අලි මහතා
(මාණ්පුමිකු එම්.ඒ. හසන් අලි)
(The Hon. M.T. Hasen Ali)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கடந்த மார்ச் மாதம் 05ஆந் திகதி காலமான வெனிசூலா நாட்டின் ஜனாதிபதி ஹியுகோ சாவேஸ் அவர்கள், இந்த நூற்றாண்டில் வாழ்ந்த ஓர் இலட்சிய இடதுசாரித் தலைவர் என்பதை மிகவும் காத்திரமான முறையில் நிரூபித்துக் காட்டிய ஒருவர். அவருடைய மறைவையொட்டிய இந்த ஒத்திவைப்புப் பிரேரணைமீது உரையாற்றுவதை மிகவும் பாக்கியமாகக் கருதுகின்ற அதேவேளை, ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸின் சார்பிலும் இலங்கை முஸ்லிம்களின் சார்பிலும் எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக்கொள்கின்றேன்.

1954ஆம் ஆண்டு யூலை மாதம் 28ஆந் திகதி ஒரு சாதாரண உழைப்பாளிக் குடும்பத்தில் பிறந்த ஹியுகோ சாவேஸ் அவர்கள் 1999ஆம் ஆண்டு தொடக்கம் மரணிக்கும் வரை வெனிசூலாவின் ஜனாதிபதியாகப் பதவி வகித்தார். அவரின் பெற்றோர் ஆரம்ப காலத்தில் பாடசாலை ஆசிரியர்களாகப் பணியாற்றியவர்கள். ஏழு பிள்ளைகளைக் கொண்ட மிகவும் வறுமையான ஒரு குடும்பத்தில் சாவேஸ் அவர்கள் இரண்டாவது மகனாகப் பிறந்தார். அந்த வகையில் அவர் வறுமைக்கோட்டின்கீழ் வாழ்கின்ற மக்களின் நிலைமையை நன்கு உணர்ந்திருந்தார். அதனால் அந்த நாட்டில் வறுமைக்கோட்டின்கீழ் வாழ்ந்த மக்களின் வாழ்வை மேம்படுத்துவதில் அவர் கடுமையாக உழைத்தார். தனது பதவிக் காலத்தில் அந்த நாட்டில் 48.6 வீதமாக இருந்த வறுமையை எதிர்த்துப் போராடி, 2002ஆம் ஆண்டில் புரட்சிகரமான திட்டங்களை அறிமுகப்படுத்தி, 2011ஆம் ஆண்டு அந்த வறுமையை 29.5 வீதமாகக் குறைத்தார். அதேநேரம் வறுமைக்கோட்டின் கீழுள்ள மக்களின் வாழ்வை மேம்படுத்துவதில் சிறந்த பொருளாதாரக் கொள்கைகளுக்கு முன்னுரிமை கொடுத்து, அந்நிலையை மாற்றியமைத்தார். இது மிகப் பெரியதொரு சாதனை என்று கருதப்படுகின்றது. உலகிலுள்ள பொருளாதார நிபுணர்கள் இதனை வெகுவாகப் புகழ்ந்திருக்கின்றார்கள். அதனால்தான் அந்த நாட்டு மக்கள் அவர்மீது அளப்பரிய பற்றுக் கொண்டிருந்தார்கள். அந்த வகையிலே சாவேஸ் அவர்கள் 21ஆம் நூற்றாண்டின் சிறப்பான ஓர் இடதுசாரித் தலைவர் என்பதை இந்த இடத்திலே ஐயம் திரிபறக் கூறிக்கொள்ளலாம்.

சாவேஸ் அவர்களின் வாழ்வு மிகவும் சவால் நிறைந்த ஒன்றாகத்தான் இருந்தது. ஏனெனில், உலகத் தலைவர்களின் செல்வங்களுடன் ஒப்பிட்டுப் பார்க்கும்பொழுது சாவேஸ் அவர்கள் இறக்கும் வரையிலும் ஓர் ஏழ்மையான நிலைமையிலேயே வாழ்ந்ததாகச் செய்திகள் கூறுகின்றன. அந்த அளவுக்கு இந்த உலகத்திலே வாழ்கின்ற தலைவர்களுக்கு அவர் முன்னுதாரணமாகத் திகழ்ந்தார். சாவேஸ் அவர்கள் தலைமைதாங்கிய அந்த வெனிசூலா நாடு ஏற்கெனவே வறுமைக்கோட்டின் கீழுள்ள நாடாக இருந்தாலும் இன்று அது ஒரு நடுத்தர பொருளாதார நாடாக மாறியிருக்கின்றது. அவர் இன்னும் வாழ்ந்திருந்தால் மிகவும் உயர்ந்த ஒரு நிலைக்கு அந்த நாட்டைக் கொண்டுவந்திருப்பார் என்பதில் எந்தவித சந்தேகமும் இல்லை.

நேற்று நடந்த ஐக்கிய நாடுகள் சபையின் மனித உரிமைகள் பேரவைக் கூட்டத்தில், இலங்கைக்கு எதிராகக் கொண்டுவரப்பட்ட பிரேரணை மீதான வாக்கெடுப்பில், இலங்கைக்கு ஆதரவாக வாக்களித்த நாடுகளில் வெனிசூலாவும் ஒன்றாகும். அந்தவகையில், நாங்கள் சாவேஸ் அவர்களை இங்கு நினைவுகூரக் கடமைப்பட்டிருக்கின்றோம். அதுமட்டுமல்ல, 2004ஆம் ஆண்டு இந்த நாட்டைத் தாக்கிய சுனாமி அனர்த்தத்தின்போது, வெனிசூலா அரசாங்கம் எமது நாட்டுக்குப் பல உதவிகளைச் செய்திருக்கின்றது. மருதமுனை நகரில் 178 வீடுகளை அவரது அரசாங்கம் அமைத்துத் தந்துள்ளது. துரதிஷ்டவசமாக இந்த வீடுகள் பயனாளிகளுக்கு முற்றாகக் கையளிக்கப்படாமல் இருக்கின்றன. சவூதி அரேபிய அரசாங்கம் நுரைச்சோலையில் நன்கொடையாக அமைத்துத் தந்த 500 வீடுகளும் இவ்வாறே முற்றுப்பெற்றிருந்த நிலையிலும்கூட, பயனாளிகளுக்குக் கொடுக்கப்படாமல் இருக்கின்றன. இந்த விடயங்களில் அரசாங்கம் கவனமெடுக்க வேண்டும். ஏனெனில், எங்களுக்கு நன்கொடை தருகின்ற அரசாங்கங்களைக் கௌரவித்து நன்றி செலுத்த வேண்டுமென்றால், நாங்கள் அவர்களிடமிருந்து பெற்றுக் கொண்ட நன்கொடைகளை உரியமுறையில் பயனாளி களுக்குக் கொடுக்கவேண்டும். இவ்வாறாக வெளிநாடுகளி லிருந்து பெறுகின்ற உதவிகளை உரிய முறையில் பயனாளிகளுக்கு விநியோகம் செய்யாமல் - பகிர்ந்தளிக்காமல் இருப்பது, எங்களுக்கு இந்த உதவிகளைச் செய்தவர்களை அவமதிப்பது போலாகும் என்பதை அரசாங்கம் கருத்திற் கொள்ள வேண்டும். இவ்விடயம் சம்பந்தமாக அரசாங்கம் இதனுடன் தொடர்புடைய முக்கிய அதிகாரிகளுக்கு உரிய பணிப்புரைகளை வழங்கி, விடயங்களைச் சீர்திருத்திக்கொள்ள வேண்டும்.

(Mr. Speaker)
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා - පැමිණ නැත.
ගරු රෝහණ දිසානායක මහතා - පැමිණ නැත.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මම පිටිගල, මහවත්ත පාර, කුරුඳුවත්ත පදිංචි සී.ආර්. අබේසුන්දර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - පැමිණ නැත.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) තංගල්ල, හම්බන්තොට පාර, අංක 91/22 දරන ස්ථානයෙහි පදිංචි රංජිත් ජයදීර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(2) අම්බලන්තොට, ලුණුම, උහපිටගොඩ, අංක 284 යන ස්ථානයෙහි පදිංචි ජී. ගම්හේවා මහතාගෙන් ලැබුණු පෙත්සම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මහතා - පැමිණ නැත.
ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.
ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

මාකඳුර නගර සංවර්ධන සැලසුම: හරිත නගරයක් සහ ක්‍රීඩා සංකීර්ණයක්
மாகந்துர நகர அபிவிருத்தித் திட்டம்: பசுமை நகரம் மற்றும் விளையாட்டுத் தொகுதி
MAKANDURA TOWN DEVELOPMENT PLAN: GREEN CITY AND SPORTS COMPLEX

1894/'11

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කරන මාකඳුර නගර සංවර්ධන සැලසුම යටතේ හරිත නගරයක් හා හරිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කළ නමුත්, මේ වන විට එහි ඉදි කිරීම් කටයුතු අතර මහ නවතා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙහි ඉදිකිරීම් නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම ඉදි කිරීම් සඳහා අරමුදල් සපයන ලද ආයතනය හෝ ආයතන කවරේද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හරිත නගරයේ හා හරිත ක්‍රීඩාංගණයේ ඉදි කිරීම් නැවත ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

පොදු නිර්වාහ, උළුනාට්ටලුවල්කල් අමෛච්චර෈ කේට්ට වින්නා:

(අ) කුරුනාගල් මාවට්ටත්තින් පන්නල පිරදේස සභෛයිනාල් නිර්වකික්කප්පටුකින්ර මාකන්දුර නගර අපිවිරුත්තිත් තිට්ටත්තින් කීළ් පසුමෛ නගරමොන්රෛයුම් පසුමෛ විළෛයාට්ටුත් තොකුතියොන්රෛයුම් නිර්මාණික්කින්ර පණිකළ් ආරම්පික්කප්පට්ට පෝතිලුම් තර්පෝතු ඉවර්රින් නිර්මාණප් පණිකළ් ඉටෛනටුවිල් නිරුත්තප්පට්ටුළ්ළන එන්පතෛ අවර් අරිවාරා?

(ආ) (i) ඉතන් නිර්මාණප් පණිකළ් නිරුත්තප්පට්ට මෛක්කාන කාරණංකළ් යාවෛයෙන්පතෛයුම්;

(ii) මේර්පඩි නිර්මාණප් පණිකළුක්කාක නිති වළංකිය නිරුවනම් අල්ලතු නිරුවනංකළ් යාතෙන්පතෛයුම්;

(iii) ඉතර්කාක ඔදුක්කප්පට්ට පණත්තොකෛ එව්වළවෙන්පතෛයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ඉ) (i) පසුමෛ නගරත්තිනුම් පසුමෛ විළෛයාට්ටුත් තොකුතියිනුම් නිර්මාණප් පණිකළ් මීළ ආරම්පික්කප්පටුමා එන්පතෛයුම්;

(ii) ආමෙනිල්, අත්තිකති යාතෙන්පතෛයුම්

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ඈ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Is he aware that even though construction of a green city and a green sports complex was started under the Makandura Town Development Plan implemented by the Pannala Pradeshiya Sabha of Kurunegala District, its construction work has been stopped halfway at present?

(b) Will he state -

(i) the reasons for stopping the construction work; and

(ii) the institution or institutions which provided funds for the aforesaid construction; and

(iii) the amount of money allocated for that purpose?

(c) Will he inform this House -

(i) whether construction work of the green city and the green sports complex will be recommenced; and

(ii) if so, the date on which it will be done ?

(d) If not, why?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ඇත්ත වශයෙන්ම මගේ අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. මෙම ප්‍රශ්නය නාගරික සංවර්ධන අධිකාරියට අදාළ ප්‍රශ්නයක්. කෙසේ නමුත් මට පිළිතුරක් ලැබිලා තිබෙනවා. මම එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

(අ) ඔව්.

(ආ) (i) මේ සඳහා වැඩ විෂයයන් කිහිපයක් යටතේ පරිසර අමාත්‍යාංශයේ තිරසාර පරිසර වැඩ සටහන යටතේ මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇත. පරිසර අමාත්‍යාංශය මඟින් 2011.10.31 දින කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙත එවූ ලිපිය මඟින් ක්‍රීඩා පිටියේ ඉඩ ප්‍රමාණය වැඩි වන පරිදි ක්‍රීඩා සංකීර්ණයේ ඉදි කිරීම් කටයුතු නැවත සැලසුම් කරන ලෙස දන්වා ඇත. ඒ වන විට කොන්ත්‍රාත්කරුට අත්තිකාරම් ගෙවා ඔහු විසින් වැඩ ආරම්භ කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය වැඩ බිමට ගෙනැවිත් තිබුණද පසුව වැඩ නවත්වා සැලසුම් හා ඇස්තමේන්තු නැවත සකස් කිරීම හේතුවෙන් 2011 වසරේ එහි වැඩ නිම කිරීමට නොහැකි වී ඇත.

(ii) පරිසර අමාත්‍යාංශය මඟින් "තිරසර පරිසර වැඩසටහන" යටතේ මේ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇත.

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

(iii) ක්‍රීඩාංගණය වටා වැට ඉදි කිරීම - 2010.10.27 දින රු. 4,629,000.00ක ප්‍රතිපාදන පරිසර අමාත්‍යාංශයෙන් එවා ඇත.

ක්‍රීඩාගාරය ඉදිකිරීම - I අදියර - 2011.08.25 දින රු. 12,715,240.47ක ප්‍රතිපාදන පරිසර අමාත්‍යාංශයෙන් එවා ඇත. මෙම මුදලින් 2011 වසරේ වියදම් කර ඇත්තේ රු. 2,090,808.24ක මුදලක් පමණි. එම ඉතිරි මුදල් අවලංගු වූ අතර මෙහි ඉතිරි වැඩ සඳහා රු. 9,695,111.25ක මුදලක් 2012.05.22 දින වෙන් කර ඇත.

ක්‍රීඩාගාරය ඉදි කිරීම - II අදියර ඉතිරි වැඩ නිම කිරීම. - 2012.10.15 දින රු. 788,715.00කට ගිවිසුම් ගත වී වැඩ ආරම්භ කර ඇත. 2012.12.28 වන විට වැඩ නිම කර අවසන් වී ඇත.

(ඇ) (i) හරිත නගරයේ සහ ක්‍රීඩා සංකීර්ණයේ ඉතිරි ඉදි කිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කරන ලෙස පරිසර අමාත්‍යාංශය විසින් නාගරික සංවර්ධන අධිකාරියට දැනුම් දී ඇත.

(ii) මෙම කටයුතු අවසන් වීමෙන් පසු ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය විසින් තිරසර පරිසර වැඩසටහන යටතේ මුදල් ප්‍රතිපාදන වෙන් කර දුන් පසුව නැවත වැඩ ආරම්භ කෙරේ.

(ඈ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමනි, මේක මගේ අමාත්‍යාංශයට අදාළ කාරණයක් නොවෙයි. නමුත් මේ ප්‍රශ්නය අපට එවා තිබුණු නිසා අප දන්නා විධියට සකස් කළා. මොකද, දිස්ත්‍රික් ලේකම්වරයාත් මේකට යම්කිසි ප්‍රමාණයක සම්බන්ධතාවක් තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා, ගරු ඇමතිතුමා එතුමාට හැකි ආකාරයෙන් මේ ප්‍රශ්නයට විධිමත් පිළිතුරක් ලබා දීම පිළිබඳව. ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් වුණා, රු. 4,629,000.00ක මුදලක් පරිසර අමාත්‍යාංශයෙන් එවා තිබෙනවාය කියා. 2011දී මෙහි වැඩ නැවතිලා තිබෙනවා. අපි 2013ත් මැද කාර්තුවට ළං වෙමින් ඉන්නේ. එහෙම නම් යම් මුදල් ප්‍රමාණයක් වියදම් කරලා අවුරුදු දෙකක් වැඩ නැවතිලා තිබීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයට දිස්ත්‍රික් ලේකම්තුමිය හරහා කරන්න පුළුවන් මොන වාගේ මැදිහත් වීමක්ද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ටි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න මට පුළුවන්කමක් නැහැ. මේක මගේ අමාත්‍යාංශයට අදාළ කාරණයක් නොවෙයි. ඒ නිසා කරුණාකර, අදාළ අමාත්‍යාංශයෙන් අහන්න.

ඉදි කිරීම් කටයුතු කරන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන්. සැලසුම් කරන්නේ පරිසර අමාත්‍යාංශයෙන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දිසාපතිතුමියට යම් මැදිහත් වීමක් කරන්න පුළුවන් කියලා එතුමා සඳහන් කරන්න යෙදුණා. මේ වෙනුවෙන් දිසාපතිතුමියට මොන ආකාරයේ මැදිහත්වීමක් ද කරන්න පුළුවන් කියලා මම දැන ගන්න සතුටුයි. ඒ වාගේම ගරු ඇමතිතුමාට මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න පුළුවන් මොන ආකාරයටද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ටි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)

මේ ඉඩමේ විශාලත්වය වැඩි කරන්න කියලා දිසාපතිතුමියට ලිපියක් ආවා. එතුමිය ඒ ලිපිය පරිසර අමාත්‍යාංශයට යොමු කළා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, අවසාන අතුරු ප්‍රශ්නය විධියට මම අහන්න කැමැතියි, මේ වෙනුවෙන් යම් ආකාරයේ කටයුත්තක් කරන්න අඩු ගණනේ රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයට මේ ගැන දැනුවත් කිරීමක් කරන්න ගරු ඇමතිතුමාට පුළුවන්ද කියලා. කාගෙන් වියදම් වුණත් මේ රටේ ජනතාවගේ සල්ලි නේ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ටි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය අතුරු ප්‍රශ්න ඒ අදාළ අමාත්‍යාංශයට යොමු කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව රැස් වෙන්නේත් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. අදාළ අමාත්‍යාංශයට යොමු කරන්න.

ප්‍රශ්න අංක 2-1935/11-(2), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය මම අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මම බනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 3-2139/'11-(2), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේක වැදගත් ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයට දිගින් දිගටම කල් ඉල්ලනවා. ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා එන්නේත් නැහැ. මම අපේ ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා අපහසුතාවට පත් කරන්න සූදානම් වන්නේත් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. වැදගත් නිසා තමයි කල් ඉල්ලා තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
තව මාස දෙකක් ඉල්ලන්නේ. ප්‍රශ්නේ එක්නැලිගොඩ ඉන්නවා කියලා කියනවා නේ. ඉන්නවා කිව්වාට මේවාට උත්තර දෙන්නේ නැහැ. ඉන්නවා නම් කියන්න එපායැ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4 - ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය තුන්වැනි වතාවටත් අහනවා.

ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, උත්තර දෙන්නයි හදන්නේ. ඇයි?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි. ඇයි, මට අහන්න තහනම්ද?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
උත්තර දෙන්න හදන්නේ.

අඩු ආදායම් නාගරික ජනාවාස ව්‍යාපෘතිය යටතේ ඉඩම් : අයිතිය
குறைவருமானம் பெறுவோருக்கான நகர குடியேற்றக் கருத்திட்டத்தின்கீழான காணி: உரிமை
LAND UNDER URBAN HOUSING SCHEME FOR LOW-INCOME FAMILIES : OWNERSHIP

2210/'12

4. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජන සෙවණ වැඩ සටහන අනුව, අඩු ආදායම් නාගරික ජනාවාස ව්‍යාපෘතිය යටතේ නිවාස තැනීමට දෙන ලද පර්චස් දෙකක ඉඩම් කැබැල්ලේ පූර්ණ අයිතිය එහි වත්මන් පදිංචිකරුවන්ට ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත වැඩ සටහන යටතේ මේ වන විට පර්චස් දෙකක පූර්ණ අයිතිය හිමිවූ පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

නිර්මාණ, පොරියියල් සේවෛකළ්, වීඩමෛප්පු,පොදු වසතිකළ් අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) மஹிந்த சிந்தனை, இலங்கையை வெற்றிபெறச் செய்வோம் கொள்கைகளில் ஜனசெவன நிகழ்ச்சித் திட்டத்தின்படி, குறைவருமானம் பெறுவோருக்கான நகர குடியேற்றக் கருத்திட்டத்தின் கீழ் வீடமைப் பதற்காக வழங்கப்பட்ட 2 பேச்சஸ் காணித் துண்டுக் கான முழுமையான உரிமையை அக்காணி களில் தற்போது வசிப்பவர்களுக்கு வழங்குவதாக வாக்குறுதி யளிக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி நிகழ்ச்சித் திட்டத்தின் கீழ் தற்போது 2 பேச்சஸ் காணிக்கான முழுமையான உரிமை கிடைக்கப்பெற்றுள்ள குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Is he aware that a pledge was made under the Janasevana Programme of "Mahinda Chintana - Dinawamu Sri Lanka"manifesto that the full ownership of the two-perch plot of land provided for construction of houses under the Urban Housing Scheme for low-income families would be given to the current residents of such lands?

(b) Will he inform this House the number of families that have got the full ownership of two-perch land by now, under the aforesaid programme?

(c) If not, why?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒම ප්‍රශ්නය අහනවා.

(අ) ඔව්.

(ආ) පූර්ණ අයිතිය හිමි වූ සංඛ්‍යාව - 1,431කි.

(ඇ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. අප දන්නා වූ සංඛ්‍යා ලේඛනවලට අනුකූලව පර්චස් 2ක පදිංචි වී සිටින පවුල් 60,000කට ආසන්න ප්‍රමාණයක් කොළඹ නගර ප්‍රදේශයේ ජීවත් වෙනවා. 2005 මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා වැඩ සටහනේ පොරොන්දුවක් තමයි ඒ පර්චස් දෙකේ බිම් කැබැලි අයිති, ඒවායේ පදිංචිව සිටින ජනතාවට සින්නක්කර ඔප්පු ලබා දීම. ගරු කථානායකතුමනි, දැනට වසර 8ක් ගත වෙලා තිබෙනවා. 2005 දීයි පොරොන්දුව ලබා දුන්නේ. 60,000ක් අතරින් ඔප්පු ලබා දීලා තිබෙන්නේ 1,431කටයි. මා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ඉතිරි 58,000ට ඔප්පු ලබා දීම සඳහා තවත් අවුරුදු කීයක් ගන්නවාද කියලා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, මුලින්ම මෙතුමාට පැහැදිලි කරන්න ඕනෑ 2005 මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනය නැවත 2010 ජනතාව ඉදිරියට ගිය බව. එහෙම නම්, 2010 දී "මහින්ද චින්තන ඉදිරි දැක්ම" තමයි මේ රටේ අතිමහත් බහුතර ජනතාව අනුමත කරලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ කෙරෙහි විශේෂයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න ඕනෑ. ඔබතුමාගේ සංඛ්‍යා ලේඛන වැරැදියි. 60,000ක් නොවෙයි, වර්තමාන සමීක්ෂණය අනුව කොළඹ පැල්පත් වාසින් 68,000ක් ඉන්නවා. අපේ අමාත්‍යාංශයත්, විශේෂයෙන් නාගරික සංවර්ධන අධිකාරියත් මැදිහත් වෙලා පර්චස් දෙකේ ඔප්පුව පමණක් නොව, කිව්වාටත් වඩා ඉදිරියට පියවර තබලා ඒ අයට මහල් නිවාසයකුත් සමඟ ඔප්පුව ලබා දීමට අවශ්‍ය ක්‍රියා මාර්ග රජය මේ වන විට ගෙන තිබෙනවා.

නාගරික සංවර්ධන අධිකාරිය යටතේ මේ වන විට ගෙවල් 13,000ක් ඉදි වෙමින් පවතිනවා. මේ අවුරුද්ද අවසන් වන විට ගෙවල් 20,000ක ඉදි කිරීම් කටයුතු ආරම්භ කරනවා. ඉන් පළමුවැනි අදියර වශයෙන් ඒ අයට නිවාසයත්, ඔප්පුවත් ලබා දීමේ කටයුතු අගෝස්තු මාසයේදී ආරම්භ කරන්නට දැනට කටයුතු යොදලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. ඇත්ත වශයෙන්ම පර්චස් දෙකේ බිම් කැබැල්ලේ සින්නක්කර අයිතිය ලබා දීම පමණක් නොවෙයි, ඒ සඳහා මුද්දර ගාස්තුත්, ඔප්පු ගාස්තුත් අය කරන්නේ නැහැයි කියන එක මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා වැඩසටහනේ 22වැනි පිටුවේ සඳහන් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කියන්නට කැමැතියි 2010 ජනාධිපතිවරණයට පෙර 2005 දී ලබා දුන් පොරොන්දු ටික ඉෂ්ට කරන්නට ඕනෑ කියන එක. 60,000කගෙන් 1,431 දෙනෙකුට විතරයි ඔප්පු ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා මම ගරු කථානායකතුමාගෙන් අහන්නට කැමැතියි,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මගෙන් අහන්න එපා, ගරු ඇමතිතුමාගෙන් අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමා හරහා අහන්නේ. මේ රටේ අගනුවර වටිනා ඉඩම්වලින් අක්කර 10ක් ෂැන්ග්‍රි-ලා ආයතනයට ලබා දෙන කොට, අක්කර 6ක් කැටික් ආයතනයට ලබා දෙන කොට, පැල්පත්වාසින්ගේ සින්නක්කර අයිතිය ලබා දෙන්නට ඇයි මෙච්චර මැළි වෙන්නේ? ඒ වැඩ පිළිවෙළ ඉබි ගමනින් යන්නේ ඇයි කියන එක මම අහන්නට කැමැතියි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, මෙතුමා කියන්නේ ඒ පැල්පත්වලම අයිතිය ඒ අයට ලබා දෙන්න කියලායි. අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ රජය ඒ අයට පැල්පත්වල අයිතිය දෙන්න නොවෙයි බලාපොරොත්තු වෙන්නේ. රුපියල් ලක්ෂ 30ක් විතර වටිනා ගෙයකුත් එක්කම ඒ අයිතිය ලබා දෙන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා මෙතුමා කියපු කාරණය සම්බන්ධයෙන් කනගාටු වෙන්න ඕනෑ. එතුමා කිව්වාට ඒ අය ඒ පැල්පත්වලම තියන්න අපේ රජය බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම ඉතාමත්ම ගෞරවයෙන් තුන්වැනි අතුරු ප්‍රශ්නයත් අහනවා. පුනපුනාම මේ ප්‍රශ්නය අහන්නට හේතුව තමයි ප්‍රකාශන සහ ක්‍රියාවලින් අතර ලොකු පරස්පරයක් තිබීම.

මෙච්චර සංවේදීව ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් සපයනවා නම් මම මේ කාරණය ගැනත් අහන්න කැමැතියි. ඔබතුමාගේ ගරු ඇමතිතුමා අර මීතොටමුල්ල කුණු කන්ද ළඟට ගිහින් කිව්වා, විපතට පත් වී සිටින ජනතාවට ගෙවල් ටික ඔක්කොම හදා දෙනවාය කියා. ඒ නිකම් රංගනයක් පමණයි කළේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔන්න කුණු කන්දල් අදිනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මේ උත්තරීතර සභාවේ කියවාරු ගැහුවාට මදි. ගරු ඇමතිතුමා කියිවාරුව ක්‍රියාවට නංවන්නේ කවදා ද කියා මා අහන්නට කැමැතියි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා පැමිණි විගස එතුමාට ඒ පිළිතුර ලබා දෙනවා.

ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර : පැමිණිලි

வன்புணர்ச்சி, பாலியல் தொந்தரவு மற்றும் சிறுவர் துஷ்பிரயோகம் : முறைப்பாடுகள்

RAPE, SEXUAL HARASSMENT AND CHILD ABUSE : COMPLAINTS

2548/'12

6. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලිසිය වෙත ලැබී ඇති ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වන විට පරීක්ෂණ අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2009 இலிருந்து இற்றைவரை இலங்கைப் பொலீசுக்குக் கிடைத்துள்ள வன்புணர்ச்சி, பாலியல் தொந்தரவு மற்றும் சிறுவர் துஷ்பிரயோக முறைப்பாடுகளின் எண்ணிக்கை மாவட்ட மட்டத்தில் தனித்தனியாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி முறைப்பாடுகளில் தற்போது விசார ணைகள் நிறைவுசெய்யப்பட்டுள்ள முறைப்பாடு களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) separately, at district level, of the number of complaints of rape, sexual harassment and child abuse received by the Sri Lanka Police from the year 2009 up to now; and

(ii) of the number of complaints regarding which investigations have been completed out of the number of complaints mentioned in a (i) above ?

(b) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i), (ii) ඇමුණුමෙහි දැක්වේ. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

2009 වර්ෂය සඳහා

අනු අංකය	දිස්ත්‍රික්කය	ස්ත්‍රී දූෂණ				ලිංගික අපයෝජන				ළමා අපචාර		මුළු එකතුව	
		ළමා		කාන්තා		ළමා		කාන්තා					
		වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ
1.	විවනියාව	14	14	3	3	1	1	0	0	7	7	25	25
2.	ත්‍රිකුණාමලය	17	17	6	6	5	5	0	0	11	11	39	39
3.	රත්නපුර	63	61	20	18	57	55	0	0	32	32	172	166
4.	පුත්තලම	70	64	30	28	25	25	0	0	29	29	154	146
5.	පොළොන්නරුව	31	20	8	8	16	16	1	1	8	8	64	53
6.	නුවර එළිය	23	23	5	5	6	6	0	0	20	20	54	54
7.	මුලතිව්	0	0	0	0	0	0	0	0	0	0	0	0
8.	මොනරාගල	38	35	17	16	31	30	2	2	39	39	127	122
9.	මාතර	21	20	10	10	24	22	0	0	9	9	64	61
10.	මාතලේ	31	30	10	10	13	13	0	0	23	23	77	76
11.	මන්නාරම	14	14	1	9	3	3	0	0	4	4	22	30
12.	කුරුණෑගල	63	62	20	20	32	31	2	2	45	45	162	160
13.	කිලිනොච්චිය	0	0	0	0	0	0	0	0	0	0	0	0
14.	කෑගල්ල	64	41	19	18	20	19	1	1	50	50	154	129
15.	මහනුවර	36	34	17	17	29	29	0	0	57	57	139	137
16.	කළුතර	57	55	21	21	37	30	0	0	46	4	161	110
17.	යාපනය	26	26	7	7	2	20	1	1	4	4	40	58
18.	හම්බන්තොට	32	31	25	23	31	29	1	1	0	0	89	84
19.	ගම්පහ	42	41	10	10	21	21	2	2	53	47	128	121
20.	ගාල්ල	62	58	20	20	38	37	1	1	31	31	152	147
21.	කොළඹ	53	53	21	21	21	21	1	1	21	21	117	117
22.	මඩකලපුව	17	17	2	2	7	7	0	0	3	3	29	29
23.	බදුල්ල	41	40	6	6	25	25	0	0	31	31	103	102
24.	අනුරාධපුර	68	65	16	15	38	37	1	1	33	33	156	151
25.	අම්පාර	33	31	4	4	20	20	1	1	51	51	109	107
26	ළමා හා කා/කා	15	15	5	5	9	9	1	1	11	11	41	41
27	ළමා අධිකාරිය	3	3	0	0	8	8	0	0	0	0	11	11

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

2010 වර්ෂය සඳහා

අනු අංකය	දිස්ත්‍රික්කය	ස්ත්‍රී දූෂණ				ලිංගික අපයෝජන				ළමා අපචාර		මුළු එකතුව	
		ළමා		කාන්තා		ළමා		කාන්තා					
		වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ
1.	වවුනියාව	26	11	1	1	9	3	0	0	13	6	49	21
2.	ත්‍රිකුණාමලය	23	10	6	3	21	11	1	0	6	4	57	28
3.	රත්නපුර	104	42	32	0	55	21	0	0	2	1	193	64
4.	පුත්තලම	77	15	17	11	29	14	0	0	6	1	129	41
5.	පොළොන්නරුව	60	10	18	0	15	4	0	0	29	6	122	20
6.	නුවර එළිය	38	14	12	2	10	4	0	0	5	5	65	25
7.	මුලතිව්	2	1	1	0	0	0	0	0	0	0	3	1
8.	මොනරාගල	48	8	9	1	20	6	1	1	2	1	80	17
9.	මාතර	68	8	18	4	10	4	0	4	17	7	113	27
10.	මාතලේ	45	10	12	0	16	8	0	0	1	1	74	19
11.	මන්නාරම	10	4	3	3	0	0	0	0	3	2	16	9
12.	කුරුණෑගල	138	48	27	14	49	16	2	2	20	29	236	109
13.	කිලිනොච්චිය	6	2	1	1	0	0	0	0	1	1	8	4
14.	කෑගල්ල	60	10	18	5	31	18	1	0	13	10	123	43
15.	මහනුවර	74	26	23	8	26	8	0	0	24	18	147	60
16.	කළුතර	55	12	25	16	29	7	0	0	28	10	137	45
17.	යාපනය	34	10	9	4	4	2	0	0	3	2	50	18
18.	හම්බන්තොට	72	12	16	4	29	14	1	0	1	1	119	31
19.	ගම්පහ	63	16	41	28	11	5	5	3	43	16	163	68
20.	ගාල්ල	97	27	28	4	32	13	1	1	19	16	177	61
21.	කොළඹ	91	38	42	21	28	13	5	3	42	18	208	93
22.	මඩකලපුව	36	15	3	0	12	10	1	0	11	9	63	34
23.	බදුල්ල	46	16	6	0	22	10	0	0	8	5	82	31
24.	අනුරාධපුර	107	80	30	3	35	20	7	1	9	5	188	109
25.	අම්පාර	40	10	10	0	13	10	1	0	0	0	64	20
26	ළමා හා කා/කා	6	1	3	3	7	1	0	0	5	2	21	7
27	ළමා අධිකාරිය	22	8	0	0	20	2	0	0	3	2	45	12

2011 වර්ෂය සඳහා

අනු අංකය	දිස්ත්‍රික්කය	ස්ත්‍රී දූෂණ				ලිංගික අපයෝජන				ළමා අපචාර		මුළු එකතුව	
		ළමා		කාන්තා		ළමා		කාන්තා					
		වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ
1.	වවුනියාව	21	1	7	0	1	0	0	0	8	0	37	1
2.	ත්‍රිකුණාමලය	28	0	4	0	10	0	1	0	4	0	47	0
3.	රත්නපුර	104	17	21	0	39	6	1	1	7	0	172	24
4.	පුත්තලම	86	19	19	7	24	1	0	0	11	7	140	34
5.	පොළොන්නරුව	39	0	12	0	29	0	0	0	22	0	102	0
6.	නුවර එළිය	25	6	13	3	3	0	0	0	6	0	47	9
7.	මුලතිව්	2	0	2	0	0	0	0	0	1	0	5	0
8.	මොනරාගල	53	0	17	2	20	0	0	0	2	0	92	2
9.	මාතර	62	0	11	0	30	0	3	0	20	0	126	0
10.	මාතලේ	49	1	13	5	25	0	2	1	1	0	90	7
11.	මන්නාරම	7	0	0	0	3	0	0	0	4	0	14	0
12.	කුරුණෑගල	149	5	35	7	64	0	5	2	36	0	289	14
13.	කිලිනොච්චිය	12	3	5	1	1	0	0	0	2	2	20	6
14.	කෑගල්ල	37	0	9	3	19	0	3	0	6	0	74	3
15.	මහනුවර	70	7	25	4	36	8	0	0	16	0	147	19
16.	කළුතර	64	56	25	21	22	20	5	4	27	24	143	125
17.	යාපනය	38	0	9	0	1	0	0	0	4	2	52	2
18.	හම්බන්තොට	65	5	15	5	25	5	0	0	0	0	105	15
19.	ගම්පහ	64	1	24	2	5	1	1	0	42	2	136	6
20.	ගාල්ල	85	3	21	4	38	2	2	0	10	1	156	10
21.	කොළඹ	127	3	50	4	61	2	2	0	97	17	337	26
22.	මඩකලපුව	33	1	7	0	7	0	0	0	11	3	58	4
23.	බදුල්ල	41	3	16	0	25	0	0	0	8	1	90	4
24.	අනුරාධපුර	117	4	40	3	21	0	10	0	17	10	205	17
25.	අම්පාර	44	3	7	1	31	1	0	0	1	1	83	6
26	ළමා හා කා/කා	5	1	3	1	0	0	1	0	2	2	11	4
27	ළමා අධිකාරිය	15	0	0	0	17	0	0	0	10	0	42	0

2012 වර්ෂය සඳහා

අනු අංකය	දිස්ත්‍රික්කය	දූෂණ				ලිංගික අපයෝජන				ළමා අපචාර		එකතුව	
		ළමා		කාන්තා		ළමා		කාන්තා					
		වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ	වාර්තා වූ	විසඳූ
1	වවුනියාව	22	22	7	5	10	8	0	0	14	12	53	47
2	ත්‍රිකුණාමලය	32	27	7	3	8	8	0	0	18	14	65	52
3	රත්නපුර	111	105	18	14	48	42	5	4	67	65	249	230
4	පුත්තලම	36	32	10	9	0	0	0	0	25	23	71	64
5	පොලොන්නරුව	62	58	17	10	0	0	0	0	31	29	110	97
6	නුවරඑලිය	17	16	4	4	6	6	0	0	16	12	43	38
7	මුලතිව්	6	6	0	0	0	0	0	0	6	6	12	12
8	මොණරාගල	64	58	7	6	31	29	1	1	36	34	139	128
9	මාතර	98	91	13	12	20	20	1	1	65	47	197	171
10	මාතලේ	70	64	6	5	22	20	1	1	19	19	118	109
11	මන්නාරම	10	10	4	4	7	6	0	0	12	10	33	30
12	කුරුණෑගල	166	152	27	19	40	35	0	0	99	80	332	286
13	කිලිනොච්චි	12	10	0	0	2	2	0	0	6	6	20	18
14	කෑගල්ල	59	54	5	5	32	26	0	0	33	33	129	118
15	මහනුවර	90	77	31	29	32	26	3	2	52	52	208	186
16	කළුතර	90	79	18	17	41	33	2	2	83	79	234	210
17	යාපනය	46	44	11	7	1	1	0	0	12	12	70	64
18	හම්බන්තොට	93	86	12	11	36	32	1	1	48	43	190	173
19	ගම්පහ	111	99	24	19	39	32	1	1	116	113	291	264
20	ගාල්ල	106	93	26	7	30	23	2	0	91	36	255	159
21	කොළඹ	129	116	30	17	3	0	4	3	143	110	309	246
22	මඩකලපුව	46	42	3	2	10	10	0	0	24	22	83	76
23	බදුල්ල	60	55	9	6	22	22	3	3	58	35	152	121
24	අනුරාධපුර	173	171	30	29	55	55	1	1	82	80	341	336
25	අම්පාර	32	28	5	5	30	30	3	3	24	10	94	76
26	කාන්තා කටයුතු කාර්යාංශය	2	2	6	2	2	2	1	1	7	6	18	13
27	ළමා ආරක්ෂණ අධිකාරිය	16	14	0	0	20	20	0	0	7	7	43	41

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, මා අසා තිබෙන්නේ වාර්ෂිකව කෙරෙන පැමිණිලි සංඛ්‍යාවයි. දිස්ත්‍රික් මට්ටමින් නොවුණත් වර්ෂයේ පැමිණිලි එකතුව තිබෙනවා නම් දැන ගන්නට කැමැතියි. නැත්නම් මොකක්වත් උත්තරයක් නැහැ නේ. 2009 වර්ෂයේ කියද, 2010 වර්ෂයේ කියද යනාදී වශයෙන් කියන්න පුළුවන් ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

දිස්ත්‍රික්ක විසිපහේම සම්පූර්ණ විස්තර තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එකතුව නැද්ද ගරු ඇමතිතුමා?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එකතුව තිබෙනවා, දිස්ත්‍රික්ක මට්ටමෙන්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම මතින් තොර සදාචාර සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගෙන තමයි මහින්ද චින්තන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙන්නේ. නමුත් පසු ගිය දවස්වල මේ නිල් රැල්ල ආරම්භ වීමත් සමඟ මහරගම නගර සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ළමා අපචාර සිද්ධියකට සම්බන්ධ වෙලා තිබෙනවාය කියලා පත්තරවල වාර්තා වුණා අපි දැක්කා. විශේෂයෙන්ම ඔබතුමාත් නියෝජනය කරන ආසනය නිසයි මේ ප්‍රශ්නය අහන්නේ. නිල් රැල්ල සාර්ථකව ක්‍රියාත්මක වන බව තමයි අපිට පෙනෙන්නේ. මේ පිළිබඳව දැනට පක්ෂ මට්ටමින් සහ රජය හැටියට අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද කියලා දැන ගන්න කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මහරගම නගර සභා මන්ත්‍රීවරයෙක් ඒ චෝදනාවට අත් අඩංගුවට ගත් බව පුවත් පත්වල පළ වෙලා තිබුණා. ගරු කථානායකතුමනි, අධිකරණය විසින් ඔහු රිමාන්ඩ් බන්ධනාගාරයට යවලා තිබෙනවා. ඒ අනුව මෙය අධිකරණයට භාජනය වෙලා තිබෙන ප්‍රශ්නයක්. දේශපාලන වශයෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ඒ ගැන කටයුතු කරනවා ඇති. අධිකරණයට භාජනය වෙලා තිබෙන ප්‍රශ්නයකට මට මීට වඩා විස්තර සහිත පිළිතුරක් දිය නොහැකියි. මෙය පරීක්ෂණයට ලක් වෙලා තිබෙන දෙයක්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ජනාධිපතිතුමාම නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සම්බන්ධයෙනුත් ඒ වාගේම සිද්ධියක් වාර්තා වුණා. ගරු කථානායකතුමාත් මේ සිද්ධිය ගැන හොඳටම දන්නවා ඇති.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

එවැනි ක්‍රියා මාර්ග මඟින් එක පැත්තකින් රටේ මෙවැනි අපරාධ කරන සාමාන්‍ය පුද්ගලයන්ට දිරි දීමක් තමයි සිද්ධ වෙන්නේ. මොකද, ඒ රාජ්‍ය බලය පාවිච්චි කර, දේශපාලන බලය පාවිච්චි කර ළමා අපචාර, ළමා අපයෝජනයන් කරන දේශපාලන බලවතුන් නිසා අධිකරණත් අපහසුතාවට පත් වෙනවා; නිලධාරිනුත් අපහසුතාවට පත් වෙනවා.

මොකද, ඔවුන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගයක් නැහැ. ඒ ක්‍රියා මාර්ගය ඉතාමත්ම මන්දෝත්සාහී ආකාරයෙන් සිද්ධ වෙන්නේ. මෙන්න මේ පිළිබඳවයි මම දෙවෙනි අතුරු ප්‍රශ්නය අහලා තිබෙන්නේ. මේ පැමිණිලිවලින් දැනට පරීක්ෂණ අවසන් කරලා තිබෙන සංඛ්‍යාව අහලා තිබෙන්නේ. ඔබතුමාගේ උත්තරයේ කීයක් හෝ සඳහන්ව ඇති. විශේෂයෙන්ම නගර සභා සභාපතිවරු, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු වැනි විශේෂයෙන්ම නිල් රැල්ලට අදාළ, නිල් රැල්ලේ කට්ටිය තමයි මේවා වැඩිපුර කරන්නේ. නිල් රැල්ල අන්තිමේදී කාම රැල්ල වෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මේක නිල් රැල්ලට සම්බන්ධ නැහැ. නිල් රැල්ල කියන මහා ගංවතුරට දැනටමත් මේ ගොල්ලන් යට කර ගෙන යනවා. ඔළුව උඩ තියා ගෙන කෑ ගහනවා නිල් රැල්ලක් ගැන. මේ වාගේ වැරදි වැඩ කරන සියල්ලන්ටම නීතිය, අධිකරණය ක්‍රියාත්මක වන බව අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. අධිකරණය ගමන් කරන මාර්ග තිබෙනවා. ඒ මාර්ග ඉක්මන් කරන්න, හිමින් කරන්න, මෙහෙම කරන්න කියලා කියන්න බැහැ. ඒවා අධිකරණයට භාර තීරණ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
මහරගම -[බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මම දන්නේ නැහැ. මම මහරගමට සම්බන්ධ නැහැ. බොරුවට මහරගම කියන්න එපා. මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ඒ ගැන මැදිහත් වෙලා කටයුතු කරනවා, එතුමාගේ පක්ෂයේ කෙනෙක් නිසා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ඒ මන්ත්‍රීතුමා එක්සත් ජාතික පක්ෂයෙන් ආපු කෙනෙක් නේද? [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඒ තැනැත්තා රිමාන්ඩ් කර තිබෙනවා. බන්ධනාගාරයේ ඉන්නේ. නීතිය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ආණ්ඩුවේ කියලා නිකම් ඉඳලා නැහැ නේ. [බාධා කිරීමක්] දේශපාලන ප්‍රශ්නයක් නම් ප්‍රශ්නය ඒ විධියට අහන්න. නීති ප්‍රශ්නයක් නම් ඒ විධියට අහන්න පටලවා ගන්නේ නැතිව.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
කේන්ති ගන්න එපා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
දැන් නිල් රැල්ලට යට වෙලා. නිල් රැල්ලට යට වෙලා ඔළුව උස්සා ගන්න බැරිව ඉන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
කරත්ත රෝදයද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, සිනුව. සිනුව හොයන්නත් නැහැ දැන්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
නිල් රැල්ලට යට වුණු ඒවා තිබෙනවා. කරත්ත රෝදය යට වෙලා තිබෙනවා. කහ රැලි යට වෙලා තිබෙනවා. පංචායුධ යට වෙලා තිබෙනවා. තව ගොඩක් ජාති යට වෙලා, කර කියා ගන්න දෙයක් නැතුවයි ඉන්නේ. ඒවා අපට වැඩක් නැහැ.

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි. ඒ නිල් කියන වචනය ආවේ නිල් චිත්‍රපට - blue films - එක්ක නේ. මම කියන්නේ මගේ මාතෘකාව යටතේ. ඕවා ඇත්තටම නතර කරන්න ඕනෑ දේවල්. දැන් මේක රැල්ල වාගේ එන කොට තමයි කියන්නේ නිල් රැල්ල කියලා. ඒ වාගේම කාම රැල්ල. මන්ත්‍රීවරු ඒ වාගේ අපචාර ක්‍රියාවලට සම්බන්ධ වන කොට මේ වැඩ පිළිවෙළ පහළ මට්ටමෙන් තේරුම් අරගෙන තිබෙන්නේ, නිල් රැල්ල කියන්නේ කාම රැල්ල කියලායි. මොකද, ඒ වැඩසටහන යන අතරේ තමයි අපචාර සිදුවීම්වලට නඩු පටලැවෙන්නේ. ඒ මන්ත්‍රීවරයාත් ලේසි නැහැ. මගේ හිතේ අවුරුදු ගණනක් ඒ දැරිවියයි, දැරිවියගේ මවයි යන දෙදෙනාම එක්ක ඉඳලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථා පවත්වන්නේ නැතුව අතුරු ප්‍රශ්නය අහන්න. අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
විශේෂයෙන්ම අපචාර සමාජ අර්බුදයක් බවට පත් වන එක වළක්වන්න රජය ගන්නා ක්‍රියා මාර්ග මොනවාද? අපචාර රැල්ල අද සමාජ අර්බුදයක් බවට පත් වෙලායි තිබෙන්නේ. ඒක වළක්වන්න ඔබතුමන්ලා ගන්නා පියවර කුමක්ද කියලායි මා අහන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
රජය නීතිය ක්‍රියාත්මක කරලා ඒ සියලු දෙනා අධිකරණය වෙත පැමිණවීමේ ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. ඉදිරි කටයුතු කරන්න අධිකරණයට භාර දීලා තිබෙනවා. ඒ ගැන ගරු මන්ත්‍රීතුමා හොඳින් දන්නවා. දැන ගෙනම ඒ ගැන අහන්නේ නිල් රැල්ල නිසා උණ ගැනිලා තිබෙන නිසායි. උණ ගැනිලා.

වැන්දඹු කාන්තාවන්ට ආර්ථික ස්ථාවරභාවයක් ලබා දීමට සහාය වීම : ප්‍රතිපත්ති

විතවைகளின் பொருளாதார ரீதியான உறுதித்தன்மைக்கு உதவி : கொள்கைகள்

ASSISTANCE TO WIDOWS TO BECOME ECONOMICALLY STABLE : POLICIES IMPLEMENTED

2831/'12

7. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවේ වැන්දඹු කාන්තාවන්ට ආර්ථික වශයෙන් ස්ථාවරභාවයක් ළඟා කර දීමට සහාය වනු පිණිස, රජය විසින් කිසියම් ප්‍රතිපත්තීන් සමූහයක් ක්‍රියාත්මක කරමින් සිටින්නේද;

(ii) එසේ නම්, එලෙස ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තීන් කවරේද;

(iii) එම කාන්තාවන්ට නැවත සමාජගත වීමට සහාය වනු පිණිස අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන සැලසුම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள விதவைகள் பொருளாதார ரீதியாக உறுதித் தன்மையை அடைவதற்கு உதவும் வகையில் அரசாங்கத்தால் ஏதேனும் கொள்கைகள் நடைமுறைப்படுத்தப்படுகின் றனவா என்பதையும்;

(ii) அவ்வாறாயின், நடைமுறைப்படுத்தப்படும் அத்தகைய கொள்கைகள் யாவையென்பதையும்;

(iii) அத்தகைய பெண்களை சமூகத்துடன் மீண்டும் ஒருங்கிணைப்பதற்கு உதவும் ஏதேனும் நடவடிக்கை மேற்கொள்ளப்படுகின்றதா என்பதையும்;

(iv) அவ்வாறாயின், அது தொடர்பில் நடைமுறைப் படுத்தப்படவுள்ள திட்டம் யாதென்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Child Development and Women's Affairs:

(a) Will he state -

(i) whether there are any policies being implemented by the Government to assist the widows in Sri Lanka to become economically stable;

(ii) if so, the policies being implemented as such;

(iii) whether there is any action being taken in order to assist those women to re-integrate with the society; and

(iv) if so, the plan to be implemented in that regard?

(b) If not, why?

ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) * යුද්ධය හා වෙනත් හේතූන් නිසා වැන්දඹුභාවයට පත් වූ කාන්තාවන් හා ඔවුන්ගේ පවුල්වල ආර්ථික, සමාජයීය, මනෝ සමාජයීය වශයෙන් සවි බල ගැන්වීම.

* මෙම කාන්තාවන්ගේ ජීවන තත්ත්වය ගුණාත්මක වශයෙන් ඉහළ නංවා ඔවුන් සමාජයේ පිළිගත් කණ්ඩායමක් ලෙස සමාජගත කිරීම.

* වැන්දඹු කාන්තාවන් මුහුණපාන සමාජ, ආර්ථික ගැටලු හා අභියෝග හමුවේ ඇයගේ පැවැත්ම හා සංවර්ධනය, සුරක්ෂිතභාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.

(iii) ඔව්.

* වැන්දඹු කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමෙහිලා ස්වයං රැකියා පුහුණුව සහ ආධාර ලබා දීම.

* වැන්දඹු කාන්තාවන් සඳහා ගෙවතු වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

* ක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

* වනිතා ශක්ති බැංකු වැඩසටහන.

* වැන්දඹු කාන්තාවන් සඳහා උපදේශන සේවාව ලබා දීම.

* ප්‍රජනන සෞඛ්‍ය හා HIV/AIDS පිළිබඳ දැනුවත් කිරීම.

* වැන්දඹු කාන්තාවන් සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම.

* වැන්දඹු කාන්තාවන් සඳහා නායකත්ව පුහුණුව ලබා දීම.

* වැන්දඹු කාන්තාවන් සඳහා වෘත්තිය පුහුණුව ලබා දීම.

(iv) උක්ත වැඩසටහන් සියල්ල ඉහත සඳහන් කළ ඉලක්ක කණ්ඩායම් තෝරා ගනිමින් 2013 වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිතය. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ඒකාබද්ධව දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ කෘෂිකර්ම, ධීවර, සුළු කර්මාන්ත, කුඩා ව්‍යාපාර, පශු සම්පත් ක්ෂේත්‍රවලට කාන්තා කාර්ය සංවිධාන හරහා සහය ලබා දීමට ද දිවිනැගුම වැඩසටහන යටතේ ලැබෙන ව්‍යාපෘතිවලින් කොටසක් වැන්දඹු කාන්තාවන් සඳහා ද වෙන් කිරීමට සැලසුම් කර ඇත. එම සියලු වැඩසටහන්

[ගරු කිස්ස කරල්ලියද්ද මහතා]

දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම යොදවා ඇති වනිතා සංවර්ධන නිලධාරීන් හා සහන සොයුරි නිලධාරීන් මගින් ක්‍රියාත්මක කිරීමට හා පසුවිපරම් කිරීමට ද කටයුතු සංවිධානය කර ඇත.

(ආ) පැන නොනඟී.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. වැන්දඹුවන් 89,000ක් සිටිනවා කියලා රජයම සඳහන් කරනවා. Viluthu, the Centre for Human Resource Development එකේ ශාන්ති සච්තානන්දම් මහත්මියත්, Northern Mannar Women's Development Federation එකේ ෂරීන් සරූර් මහත්මියත් සඳහන් කරනවා, ඔබතුමා කියපු මනෝ සමාජයීය උපදේශන - psychosocial counselling - අවස්ථාවන් ඒ වැන්දඹුවන්ට ලැබිලා නැහැ කියලා. ඒ වාගේම විශාඛා ධර්මදාස මහත්මිය සඳහන් කරනවා, අපේ මිය ගිය සොල්දාදුවන්ගේ වැන්දඹු කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් වුණත් ඒ අයටත් මේ වාගේ මනෝ සමාජයීය උපදේශන ලබා ගැනීමට තිබෙන අවස්ථා අඩුයි කියලා.

රාජ්‍ය නොවන ආයතන විසින් උතුරු ප්‍රදේශයේත්, නැඟෙනහිර ප්‍රදේශයේත් යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා සේවය කරනවා; නමුත් මේ counselling සේවාවන්වලට ඉඩ දීලා නැහැ කියලා අපි දන්නවා. කරුණාකරලා අපට ඒ කාරණය පොඩ්ඩක් විස්තර කරන්න.

ගරු කිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ගරු මන්ත්‍රීතුමනි, උතුරු නැඟෙනහිර ප්‍රදේශවල පැවතුණු යුද්මය වාතාවරණය තුළ අවශ්‍ය නිලධාරීන් ඒ ප්‍රදේශවලට යොමු කිරීමේ අපහසුතාවක් රජයට තිබුණා. නමුත් මේ වෙන කොට අපි උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් බඳවා ගෙන මේ ක්‍රියාවලියේ යෙදී ඉන්නා බව මා සඳහන් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම සමහර ස්වේච්ඡා සංවිධාන හරහා ලැබෙන්නා වූ දත්ත සියල්ලක්ම සත්‍යයයි කියලා මට පිළිගන්න බැරි අවස්ථා ද උදා වෙලා තිබෙනවා. කෙසේ නමුත් counselling සේවා කියන ඒ වැඩසටහන අදියරෙන් අදියර කර ගෙන යනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගණිකා වෘත්තියේ යෙදෙන -ලිංගික සේවාවන් සපයන- ගම්මාන තිබෙනවා කියලා මාධ්‍යවලත් සඳහන් වෙලා තිබෙනවා. ඒක ඇත්තද, නැද්ද, නැත්නම් ඒ ඇයි කියලා මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු කිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

එහෙම දෙයක් අපට වාර්තා වෙලා නැහැ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි. මාධ්‍යයෙන් අපට දැන ගන්න ලැබුණා, ඔබතුමා මෙහෙම සඳහන් කළා කියලා.

"අපි කාන්තා අයිතිවාසිකම්වලට මුල් තැන දුන්නත්, කාන්තාවකට දෙපාර්තමේන්තුවක හෝ අමාත්‍යාංශයක ආධිපත්‍ය දුන්නාම ඒ කාන්තාවගේ ආධිපත්‍ය යටතේ සිටින අය යටපත් කරමින් ඊර්ෂ්‍යාවෙන් ඒ කාන්තාව ක්‍රියා කරනවා. මේ නිසා ආයතනයේ අකාර්යක්ෂමතාව වැඩි වනවා. ඒ නිසා සභාපතිත්වය හැම තිස්සේම පිරිමියෙකුට දෙන්න ඕනෑය, දෙවැනි පුටුව තමයි කාන්තාවට දෙන්න ඕනෑ." ඔබතුමා මෙසේ සඳහන් කළා කියලා සෑම මාධ්‍යයකින්ම වාගේ වාර්තා වෙලා තිබෙනවා. මෙය ඔබතුමාගේ අදහසද, නැත්නම් රජයේ අදහසද කියලා මා දැන ගන්න කැමැතියි. විශේෂයෙන්ම ඔබතුමා කාන්තා කටයුතු ඇමතිතුමා නිසා මේ ප්‍රතිපත්ති සඳහා ඔබතුමා හිතන දේ බොහොම වැදගත්.

ගරු කිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ගරු මන්ත්‍රීතුමනි, මීට කලිනුත් මාධ්‍යවේදීන් මගෙන් ඔය ප්‍රශ්නය අහන කොට එයට පිළිතුරු දෙමින් මා ඔය කාරණය ගැන කිව්වේ වෙනත් ආකාරයකටයි. එනම්, පිරිමි කෙනෙක් අංශ ප්‍රධානියෙක් හැටියට ඉන්නවා නම්, එතැන දෙවැනියා කාන්තාවක් වුණොත් හොඳයි; කාන්තාවක් අංශ ප්‍රධානියෙක් හැටියට ඉන්නවා නම්, එතැන දෙවැනියා විධියට පිරිමි කෙනෙක් ඉන්නවා නම් හොඳයි කියන දේ තමයි මා ප්‍රකාශ කළේ. මේ රටේ පළමුවැනි අගමැතිතුමියත් කාන්තාවක්. එතුමිය හොඳට මේ රට පාලනය කළා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඇයි, ජනාධිපතිතුමිය?

ගරු කිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

පොඩ්ඩක් ඉන්න. පනින්න එපා, මට කථා කරන්න දෙන්න. පොඩ්ඩක් අහගෙන ඉන්න. එතකොට ඒක දිගින් දිගට යනවා. ජනාධිපති විධියටත් කාන්තාවක් හිටියා.

ලෝක විවාහක රූප සුන්දරියත් අපේ කාන්තාවක්. ඒ තමයි, අපේ රටේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමියක් වන රෝසි සේනානායක මහත්මිය. ඒත් කාන්තාවක්. ඉතින් මම කළ ප්‍රකාශය විකෘති කරලා -[බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කලබල වෙන්න ඕනෑ නැහැ.

ගරු කිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ගරු කථානායකතුමනි, එතුමා -අපේ මිත්‍රයා- කලබල වෙලා. රෝසි සේනානායක මන්ත්‍රීතුමිය ගැන කියන කොට ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කලබල වෙනවා. [බාධා කිරීමක්] කලබල වෙන්න එපා. මම ප්‍රකාශ කළේ අර කිව්ව විධියේ දෙයක් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි. මා ප්‍රකාශ කළ දේ තමයි දැන් කිව්වේ. මම කිව්වේ, අංශ ප්‍රධානියා පිරිමියෙක් වුණොත් දෙවැනියා කාන්තාවක් වුණොත් හොඳයි; අංශ ප්‍රධානියා කාන්තාවක් වුණොත් දෙවැනියා පිරිමියෙක් වුණොත් හොඳයි කියන එකයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රූප සුන්දරිය කාන්තාවක් මිසක පිරිමියෙක් වෙනවාද? [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි.

2010 සිට 2011 දක්වා පරිපූරක ඇස්තමේන්තු : මූල්‍යමය වටිනාකම

2010 - 2011 வரையான குறைநிரப்பு மதிப்பீடுகள் : நிதிப் பெறுமதி

SUPPLEMENTARY ESTIMATES FROM 2010 TO 2011: FINANCIAL VALUE

2907/'12

9. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) වර්ෂ 2010 සිට 2011 දෙසැම්බර් මස 31 දක්වා එක් එක් අමාත්‍යාංශය යටතේ ඉදිරිපත් කර ඇති පරිපූරක ඇස්තමේන්තු සංඛ්‍යාව හා ඒවායේ මූල්‍යමය වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2010 සිට 2012 දෙසැම්බර් මස 31 දක්වා ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ අය වැය සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කළ පරිපූරක වෙන්කිරීම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබේද;

(ii) එසේ නම්, එම පරිපූරක වෙන් කිරීම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත කාල සීමාව තුළදී සිදු කළ එක් එක් පරිපූරක වෙන් කිරීමට අදාළව,

(i) ප්‍රතිපාදන සලසා දුන් දිනය කවරේද;

(ii) සලසා දුන් එක් එක් ප්‍රතිපාදනයේ වටිනාකම කොපමණද;

(iii) පරිපූරක ප්‍රතිපාදන ලබාගත් වැය ශීර්ෂ අංකය කවරේද;

(iv) අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව වියදම් ඒකකය කවරේද;

(v) ප්‍රතිපාදන ලබාදුන් හේතුව කවරේද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් නොකර වැය ශීර්ෂ 240 යටතේ සිදු කෙරෙන පරිපූරක වෙන් කිරීම් මඟින් ප්‍රතිපාදන ලබා ගැනීමට තුඩු දුන් හේතු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010ஆம் ஆண்டிலிருந்து 2011 டிசம்பர் மாதம் 31ஆம் திகதி வரை ஒவ்வொரு அமைச்சின் கீழும் சமர்ப்பிக்கப்பட்டுள்ள குறைநிரப்பு மதிப்பீடுகளின் எண்ணிக்கையும் அவற்றின் நிதி ரீதியிலான பெறுமதியும் வெவ்வேறாக எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2010ஆம் ஆண்டிலிருந்து 2012 டிசம்பர் 31ஆம் திகதி வரை தேசிய வரவு-செலவுத் திட்ட திணைக்களத்தின் 240ஆம் இலக்க செலவுத் தலைப்பின் கீழ் உதவிச் சேவைகள் மற்றும் அவசர தேவைகள் பொறுப்புக் கருத்திட்டத்தின் மூலம் மேற்கொள்ளப்பட்ட குறைநிரப்பு ஒதுக்கீடுகள் பாராளுமன்றத்துக்கு சமரப்பிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி குறைநிரப்பு ஒதுக்கீடுகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்
அவர் குறிப்பிடுவாரா?

(இ) மேற்குறிப்பிட்ட காலகட்டத்தினுள் மேற்கொள்ளப் பட்ட ஒவ்வொரு குறைநிரப்பு ஒதுக்கீட்டுக்கும் ஏற்புடையதான,

(i) நிதி ஏற்பாடுகள் வழங்கப்பட்ட திகதி;

(ii) வழங்கப்பட்ட ஒவ்வொரு நிதி ஏற்பாட்டினதும் பெறுமதி;

(iii) குறைநிரப்பு நிதி ஏற்பாடுகள் பெற்றுக்கொள்ளப் பட்ட செலவுத் தலைப்பு இலக்கம்;

(iv) அமைச்சு/திணைக்களச் செலவு அலகு;

(v) நிதி ஏற்பாடுகள் வழங்கப்பட்டமைக்கான காரணம்

வெவ்வேறாக யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பரா?

(ஈ) குறைநிரப்பு மதிப்பீடுகள் சமர்ப்பிக்கப்படாது செலவுத் தலைப்பு 240 இன் கீழ் மேற்கொள்ளப்படும் குறைநிரப்பு ஒதுக்கீடுகள் மூலம் நிதி ஏற்பாடுகளை பெற்றுக்கொள்வதற்கு ஏதுவாக அமைந்த காரணங்கள் யாவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House separately, the number of Supplementary Estimates presented under each Ministry from the year 2010 up to 31st December, 2011 and their financial value?

(b) Will he state -

(i) whether supplementary allocations made from the Budgetary Support Services and Emergency Liabilities Project under the Head of Expenditure No. 240 of the Department of National Budget have been presented in Parliament from the year 2010 up to 31st December, 2012; and

(ii) if so, the number of such supplementary allocations?

(c) Will he also inform this House separately in respect of each supplementary allocation made during the above period -

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

(i) the date on which provisions were made;

(ii) the value of each provision;

(iii) the number of the Head of Expenditure under which supplementary provisions were obtained;

(iv) Ministry/department unit of expenditure; and

(v) the reason for the allocation of provision ?

(d) Will he also state the reasons that prompted the seeking of provisions through the supplementary allocations made under the Head of Expenditure No. 240 instead of presenting Supplementary Estimates ?

(e) If not, why ?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඇමුණුම I හා II හි දක්වා ඇත.

(ආ) (i) ඔව්.

2010 සිට 2012.11.30 දක්වා කාලයට අදාළ ඉහත වැය ශීර්ෂය යටතේ සිදු කළ පරිපූරක වෙන් කිරීම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. 2012.12.01 සිට 2012.12.31 අදාළව වෙන්කිරීම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

(ii) 2010 සිට 2012.12.31 දක්වා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති පරිපූරක වෙන්කිරීම් සංඛ්‍යාව පහත පරිදි වේ.

වර්ෂය	පරිපූරක වෙන්කිරීම් සංඛ්‍යාව
2010	536
2011	939
2012	813

(ඇ) (i), (ii), (iii), (iv), (v)

2010, 2011 සහ 2012 වර්ෂයන්හිදී පරිපූරක වෙන්කිරීම් පිළිබඳ වාර්තා ඇමුණුම III හි සඳහන් දිනයන්හිදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර (ඇ) (i) සිට (v) දක්වා ප්‍රශ්නවලට අදාළ සියලුම තොරතුරු එම වාර්තාවල ඇතුළත් කර ඇත. එහි පිටපත් සංයුක්ත තැටියක් (CD) මඟින් ඉදිරිපත් කර ඇත. එම සංයුක්ත තැටිය **සභාගත*** කරමි. ඇමුණුම් **සභාගත*** කරමි.

(ඈ) අදාළ වර්ෂවල විසර්ජන පනත්වල 6(I) වන වගන්තියේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි මෙම ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ. මේ සඳහා උපයෝගී කරගනු ලබන නිර්ණායකයන් පාර්ලිමේන්තුව විසින් අනුමත අය වැය ඇස්තමේන්තුවල 2.1 හි සවිස්තරාත්මකව දක්වා ඇත.

(ඉ) පැන නොනඟී.

සභාමේසය මත තබන ලද ඇමුණුම්:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு கள்:
Annexes tabled:

Annex -1

Additional Allocation given for year 2010

Name of the Ministry	No. of Allocation given	Amount
Special Spending Unit	35	2,953,689,175
Ministry of Buddha Sasana and Religous Affairs	12	123,366,707
Ministry of Finance and Planning	34	1,847,559,784
Ministry of Defence	47	13,203,207,339
Ministry of Disaster Management	6	221,000,000
Ministry of Post and Telecommunication	6	281,851,108
Ministry of Justice	30	804,120,076
Ministry of Health	10	1,441,700,000
Ministry of External Affairs	4	113,005,500
Ministry of Ports and Aviation	2	12,700,000
Ministry of Transport	2	50,040,000
Ministry of Co-operatives and Internal Trade	6	40,062,000
Ministry of Highways	8	5,995,600,000
Ministry of Agricultural	4	35,900,000
Ministry of Power and Energy	3	2,776,132,981
Ministry of Child Development and Women's Affairs	12	42,904,000
Ministry of Public Adminsitration and Home Affairs	13	75,192,312
Ministry of Mass Media and Information	9	89,025,968
Ministry of Construction, Engineering Services, Housing & Common Amenities	19	254,111,135
Ministry of Social Services	10	48,258,844
Ministry of Education	10	873,090,000
Ministry of Labour Relations and Productivity Improvement	12	97,775,000
Ministry of Traditional Industries and Small Enterprise Development	3	13,100,000
Ministry of Local Government and Provincial Councils	21	4,553,371,887
Ministry of Technology and Research	2	15,000,000
Ministry of National Languages and Social Integration	7	12,026,879
Ministry of Sports	6	183,136,390
Ministry of Indigenous Medicine	2	11,000,000
Ministry of Fisheries and Aquatic Resources Development	7	1,095,821,130
Ministry of Livestock And Rural community Development	3	87,339,240
Ministry of National Heritage and Cultural Affairs	7	147,600,000
Ministry of Parliamentary Affairs	1	15,000,000
Ministry of Re-settlement	4	106,060,600
Ministry of Industry and Commerce	1	6,300,000
Ministry of Irrigation and Water Resources Management	1	7,301,754
Ministry of Land and Land Development	1	15,500,000
Ministry of Yourth Affairs	13	1,013,938,633
Ministry of Environment	5	17,524,738
Ministry of Water Supply and Drainage	5	1,524,600,000
Ministry of Higher Education	7	130,951,940
Ministry of Public Management Reforms	1	1,660,000
Ministry of rehabilitation and Prison Reforms	10	389,999,224
Minister of State Resources and Enterprise Development	9	208,900,000
Total	410	40,936,424,344

**** ප්‍රස්තකාලයේ තබා ඇත.***
** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

Annex -11

Additional Allocation given for year 2011

Name of the Ministry	No. of Allocation given	Amount
Special Spending Unit	62	1,919,997,905
Ministry of Buddha Sasana and Religious Affairs	10	35,064,050
Ministry of Finance and Planning	91	13,493,824,823
Ministry of Defence	77	36,112,986,172
Ministry of Economic Development	18	4,584,880,000
Ministry of Disaster Management	19	1,144,302,478
Ministry of Postal Services	19	772,735,000
Ministry of Justice	10	529,610,412
Ministry of Health	29	6,006,678,000
Ministry of External Affairs	21	665,096,230
Ministry of Transport	27	11,580,040,430
Ministry of Petroleum Industries	12	9,500,000
Ministry of Co-operatives and Internal Trade	2	97,800,000
Ministry of Ports & Highways	7	18,693,072,770
Ministry of Agriculture	14	204,064,693
Ministry of Power and Energy	4	2,144,177,239
Ministry of Child Development and Women's Affairs	16	36,484,167
Ministry of Public Administration and Home Affairs	65	2,432,678,162
Ministry of Mass Media and Information	21	274,179,000
Ministry of Construction, Engineering Services, Housing and Common Amenities	15	123,548,340
Ministry of Social Services	13	38,990,906
Ministry of Education	15	1,545,814,829
Ministry of Labour & Labour Relations	15	404,106,197
Ministry of Traditional Industries and Small Enterprises Development	4	26,015,000
Ministry of Local Government and Provincial Councils	37	8,362,573,681
Ministry of Technology and Research	6	42,918,360
Ministry of National Languages and Social Integration	1	10,000,000
Ministry of Plantation Industries	5	28,134,378
Ministry of Sports	3	447,464,602
Ministry of Indigenous Medicine	12	114,898,040
Ministry of Fisheries and Aquatic Resources Development	9	69,609,060
Ministry of Livestock and Rural Community Development	7	37,757,435
Ministry of National Heritage	13	55,778,005
Ministry of Parliamentary Affairs		-
Ministry of Re-settlement	9	163,613,373
Ministry of Industry and Commerce	8	29,262,618
Ministry of Irrigation and Water Resources Management	6	513,128,597
Ministry of Lands and Land Development	8	31,270,000
Ministry of Youth Affairs & Skills Development	5	33,355,000
Ministry of Environment	10	22,288,485
Ministry of Water Supply and Drainage	8	818,543,800
Ministry of Higher Education	9	662,736,631
Ministry of Public Management Reforms	1	25,000,000
Ministry of Rehabilitation and Prison Reforms	9	226,042,720
Ministry of State Resources and Enterprise Development	15	143,300,000
Ministry of Civil Aviation	9	268,409,286
Ministry of Culture & the Arts	9	401,090,000
Ministry of Coconut Development and Janatha Estate Development	13	44,808,910
Ministry of Agrarian Services & Wildlife	13	11,394,232,302
Ministry of Minor Export Crop Promotion	14	59,089,500
Ministry of Productivity Promotion	11	76,400,000
Ministry of Foreign Employment Promotion & Welfare	10	66,770,000
Ministry of Public Relations and Public Affairs	6	23,922,228
Ministry of Private Transport Services	5	43,172,913
Ministry of Telecommunication and Information Technology	9	128,244,242
Total	866	127,219,460,969

ඇමුණුම III

2010 වර්ෂය / කාලපරිච්ඡේදය	පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දිනය
ජනවාරි 18 සිට පෙබරවාරි 25 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2010.03.16
මාර්තු 03 සිට අප්‍රේල් 19 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2010.05.06
අප්‍රේල් 20 සිට අප්‍රේල් 30 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2010.06.15
මැයි 20 සිට ජූනි 22 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2010.07.19
ජූනි 22 සිට ජූලි 07 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2010.08.18
ජූලි 16 සිට ජූලි 26 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2010.08.18
ජූලි 26 සිට අගෝස්තු 18 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2010.09.25
අගොස්තු 20 සිට සැප්තැම්බර් 21 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2010.10.25
සැප්තැම්බර් 21 සිට ඔක්තෝබර් 21 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2010.12.27
ඔක්තෝබර් 21 සිට නොවැම්බර් 30 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2011.01.25
දෙසැම්බර් 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2011.03.25

2011 වර්ෂය / කාලපරිච්ඡේදය	පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දිනය
ජනවාරි 01 සිට පෙබරවාරි 28 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2011.04.21
මාර්තු 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2011.05.13
අප්‍රේල් 01 සිට 30 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2011.07.05
මැයි 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2011.08.05
ජූනි 01 සිට 30 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2011.09.19
ජූලි 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2011.10.05
අගොස්තු 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2011.11.04
සැප්තැම්බර් 01 සිට ඔක්තෝබර් 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2011.12.09
නොවැම්බර් 01 සිට 30 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2012.01.31
දෙසැම්බර් 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2012.04.04

2012 වර්ෂය / කාලපරිච්ඡේදය	පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ- දිනය
ජනවාරි 01 සිට පෙබරවාරි 29 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2012.04.27
මාර්තු 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2012.05.24
අප්‍රේල් 01 සිට 30 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2012.06.29
මැයි 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2012.07.25
ජූනි 01 සිට 30 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2012.08.30
ජූලි 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2012.10.01
අගොස්තු 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2012.10.30
සැප්තැම්බර් 01 සිට ඔක්තෝබර් 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2012.12.28
නොවැම්බර් 01 සිට 30 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2013.02.13
දෙසැම්බර් 01 සිට 31 දින දක්වා පරිපූරක වෙන්කිරීම්	2013.04.02

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මා ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, මෙතරම් පරිපූරක ඇස්තමේන්තු ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙන්නේ වියදම් කළමනාකරණය කිරීමට මේ අමාත්‍යාංශවලට නොහැකි වෙලා තිබෙන නිසාද කියලා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, හැම රටකම පාර්ලිමේන්තුවට පරිපූරක ඇස්තමේන්තු එවා තිබෙනවා.

ලෝකයේ කොහේ වුණත්, ආදර්ශවත් අය වැයකින් ප්‍රක්ෂේපණය කරන ඒ මුදල්, ඒ අවශ්‍යතා යටතේ වියදම් කිරීම හොඳයි කියලා අපි කවුරුත් පිළිගන්නවා. නමුත් සැබෑ ලෝකයේ බොහෝ විට එය සිද්ධ වන්නේ නැහැ. අපට හසුරුවා ගන්න බැරි පිටස්තර හේතු නිසා එහෙම වෙන්න පුළුවන්. ඒ වැඩ කරන අතර, ඒ ඒ අමාත්‍යාංශවල අවශ්‍යතා වෙනස් වන්න පුළුවන්. ඇතැම් අවස්ථාවලදී අමාත්‍යාංශ වෙනස් වනවා. නමුත් ඒක නොවෙයි, එතැන වැදගත් වන්නේ. වැදගත් දේ තමයි, අපි ඒ පරිපූරක ඇස්තමේන්තු හැම එකක් ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර, ඊට හේතු දක්වා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම. සංකල්පයක් හැටියට පරිපූරක ඇස්තමේන්තු අඩු කර ගැනීම

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

අවශ්‍යයි. අපි කවුරුත් එය පිළිගන්නවා. ඒ සඳහා අපි ව්‍යායාමයක් දරනවා. නමුත් සැබෑ ලෝකයේ පරිපාලන කටයුතු කර ගෙන යන ගමන් මේවා කරන්නත් අපට සිද්ධ වනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
මාණ්පුමිකු අකිල විරාජ් කාරියවසම්)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු අමාත්‍යතුමනි, දැන් ඔබතුමා කිව්වේ හදිසි තත්ත්වයන් යටතේ තමයි එහෙම කළේ කියලා. එහෙම කරන එකේ වැරැද්දක් නැහැ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, මේ වැය ශීර්ෂ 173න් වැය ශීර්ෂ 30ක්ම වාහන මිල දී ගැනීම් සඳහා පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබෙන එකයි. මා විශ්වාස කරන හැටියට මේ කාරණා හදිසියේ මතු වන ඒවාවත්, අය වැයට ඉදිරිපත් කිරීමට නොහැකි ඒවාවත් නොවෙයි, ගරු අමාත්‍යතුමනි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු (කලානිති) සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, එක් එක් අවස්ථාවලදී එහෙම තීන්දු ගන්න සිද්ධ වනවා. මා හිතන හැටියට සමහර විට ඒ මිල ගණන් වෙනස් වනවා. වාහනවල මිල ගණන් වෙනස් වුණාම ඒකේ revision එකක් කරන්නත් සිද්ධ වනවා. නමුත් ඒක නොවෙයි, මා කිව්වේ. ප්‍රධාන දේ තමයි, අපි මේවාට නියම අනුමැතිය ලබා ගෙන තිබෙන එක. ඒවා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන, ඊට පස්සේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවේ අනුමැතියක් ලබා ගෙන තමයි ඒ කටයුතු කරලා තිබෙන්නේ. වර්ෂය අවසානයේදී අපි ඒවා balance කරනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(මාණ්පුමිකු අකිල විරාජ් කාරියවසම්)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කළ රාජ්‍ය වියදම්වලට වඩා විශාල ප්‍රමාණයක් පරිපූරක ඇස්තමේන්තු වශයෙන් ඉදිරිපත් වෙලා තිබෙනවා, ඒත් එක්කම. උදාහරණයක් හැටියට, 2011 වර්ෂයේ රුපියල් බිලියන 125ක් පරිපූරක ඇස්තමේන්තු වශයෙන් ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ වාගේ පරිපූරක ඇස්තමේන්තු විශාල ප්‍රමාණයක් මහින් මුදල් වෙන් කිරීම නිසා අය වැය ලේඛන ආශ්‍රයෙන් දෙන අදහස සම්පූර්ණයෙන් වෙනස් වනවා. දැන් මෙහි රුපියල් බිලියන 49ක් පුනරාවර්තන වියදම්. මෙම අමාත්‍යාංශවලට මෙම වියදම් සම්බන්ධයෙන් කල් වේලා ඇතිව සැලසුම් සකස් කරන්න ඇයි බැරි?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු (කලානිති) සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)

බොහෝ විට අපට හසුරුවා ගන්න බැරි හේතු තිබෙනවා. හොඳම නිදසුන තමයි, සුනාමී ව්‍යසනය ඇති වුණ අවස්ථාව. එතකොට හදිසියේ යම් යම් තීරණ ගෙන කටයුතු කරන්න සිද්ධ වනවා. එවැනි පිටස්තර හේතු සියල්ල ම සාධක වශයෙන් අපි ඉදිරිපත් කර තිබෙනවා.

පාර්ලිමේන්තුවේ අනුමැතිය අරගෙන තිබෙනවා. අය වැයට අනුමැතිය ගත්තා වාගේම පරිපූරක ඇස්තමේන්තුවලටත් අපි අනුමැතිය ලබාගෙන තිබෙනවා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 11 - 3200/'12 - (1), ගරු පී. හැරිසන් මහතා.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. ஹரிசன්)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 12 - 2143/'11 - (2), ගරු රවී කරුණානායක මහතා.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. මෙයට උත්තරය නම් ලැබෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. සතියකින් වුණත් පිළිතුරු දෙන්න පුළුවන්.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ, නැහැ, ඔබතුමා මාසයක් කල් ගන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මාසයක්? ගරු මන්ත්‍රීතුමා මාසයකින් උත්තර ඉල්ලනවා. මාසයකින් උත්තර දෙන්නම්.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මාසයකින් උත්තර දෙන්න. හැබැයි, එදාට කියන්න එපා තව සුමානයක් කල් ගන්නවා කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මාසයකින් උත්තර දෙනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ජාතික ලොතරැයි මණ්ඩලය : සේවකයින්
தேசிய லொத்தர் சபை : ஊழியர்கள்
NATIONAL LOTTERIES BOARD : EMPLOYEES

2148/'11

13. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලයට 2005 වර්ෂයේ සිට මේ දක්වා කාලසීමාව තුළ බඳවා ගෙන ඇති සේවක සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට එහි පවතින සේවක අතිරික්තය හෝ සේවක ඌනතාව කොපමණද;

(iv) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයන් බඳවාගෙන තිබේ නම්, එයට හේතු කවරේද;

(v) අතිරික්ත සේවකයන් බඳවා ගැනීමට අනුමතිය ලබා දුන් බලධරයාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய லொத்தர் சபைக்கு 2005ஆம் ஆண்டு தொடக்கம் இற்றை வரை ஆட்சேர்க்கப் பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை வருட வாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(ii) மேற்படி நிறுவனத்திற்கு அங்கீகரிக்கப்பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) தற்போது அங்கு நிலவுகின்ற ஊழியர் மிகை அல்லது ஊழியர் பற்றாக்குறை யாதென்பதை யும்;

(iv) அங்கீகரிக்கப்பட்ட ஊழியர்களின் எண்ணிக் கையை விஞ்சுகின்ற வகையில் ஆட்சேர்க்கப் பட்டிருப்பின் அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) மிகையாக பணியாட்களை ஆட்சேர்ப்பதற்கு அங்கீகாரம் வழங்கிய அதிகாரியின் பெயர் மற்றும் பதவி யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning,:

(a) Will he inform this House -

(i) separately, of the number of employees recruited to the National Lotteries Board in each of the years during the period from the year 2005 to date;

(ii) of the approved cadre of the aforesaid institution;

(iii) of the shortage or the excess of the staff existing at the aforesaid institution;

(iv) of the reasons if recruitments have been made exceeding the approved cadre; and

(v) of the name and designation of the person in authority who granted approval for the recruitment of excess staff ?

(b) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i)

2005	2006	2007	2008	2009	2010	2011	2012
21	07	17	17	07	25	50	11

(ii)

	ස්ථිර	කොන්ත්‍රාත්	දෛනික
2012.09.01 දිනට අනුමත සේවක සංඛ්‍යාව	284	33	05

(iii) ඌනතාව - 17

(iv) අනුමත සේවක සංඛ්‍යා සටහනෙහි සඳහන් සේවක සංඛ්‍යාව ඉක්මවා සේවයෙහි නිරත නිලධාරීන් පහත පරිදි වේ.

අළෙවි ප්‍රවර්ධන නිලධාරීන්	14
කලාප කළමනාකාරවරුන්	11
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි	01
ප්‍රධාන මූල්‍ය නිලධාරි	01

අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයන් බඳවාගෙන ඇත්තේ වෙළෙඳපොළ පුළුල් කර ගැනීමේ අරමුණිනි. මේ සඳහා විශේෂිත අංශ පිහිටුවමින් සේවකයන් බඳවාගෙන එම අංශවල ක්‍රියාකාරකම් ඉටු කර ගනිමින් ඒවායෙහි ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය වූ සේවකයන් වරින් වර බඳවා ගැනීම් කරන ලදී. මේ සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවාගෙන ඇති අතර, එලෙස වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාගෙන ඇත.

(v) යූ.ආර්. සෙනෙවිරත්න මහතා - අතිරේක ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

(ආ) පැන නොනඟී.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා හැටියට ඔබතුමාත් දන්නවා ඇති, අනුමත කාර්ය මණ්ඩලයට වඩා වැඩියෙන් බඳවා ගැනීම් සිදු වනකොට මුදල්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

අමාත්‍යාංශයෙන් හෝ Management Services Department එකෙන් අනුමැතියක් ලබා ගත යුතු බව.

නමුත් මේ නියමිත විධියට සේවකයන් ගන්නේ නැතිව දිගින් දිගටම කටයුතු කරන්නේ වෙනත් විධියකටයි. අනුමත කාර්ය මණ්ඩලය 247ක් ලෙස තියෙද්දී එය 284ක් දක්වා වර්ධනය වෙලා තිබුණා. ඊළඟට 2010, 2011 වර්ෂවලත් මෙහෙම තිබෙනවා. සැප්තැම්බර් 30වැනි දිනට අනුමත කාර්ය මණ්ඩලය 277යි. හැබැයි තථ්‍ය කාර්ය මණ්ඩලය 311ක් වෙනවා. කිසිම අනුමැතියක් නැතිව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවසරයක් නැතිව මේ විධියට දිගින් දිගටම සේවකයන් තබා ගැනීම නිසා පඩි ගෙවීම සම්බන්ධ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒක පළමුවෙනි කාරණය.

දෙවැනි කාරණය මෙකයි ගරු අමාත්‍යතුමනි. මේ අය දිගින් දිගටම ඉන්නේ කොන්ත්‍රාත් පදනම මතයි. ඒ නිසා ඔබතුමන්ලා මේ සම්බන්ධව යම් කිසි පියවරක් ගන්න බලාපොරොත්තු වෙනවාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, මේ අයට භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී තිබෙනවා. ඒ අනුමැතිය දීලා තිබෙන්නේ භාණ්ඩාගාරයේ අතිරේක ලේකම් යූ.ආර්. සෙනෙවිරත්න මහතායි. [බාධා කිරීමක්] කොහොම හරි අනුමැතිය තිබෙනවා. නමුත් ඒක නොවෙයි ප්‍රශ්නය. විශේෂයෙන්ම මේ ජාතික ලොතරැයි මණ්ඩලය වැනි ආයතනයකට කොන්ත්‍රාත් පදනමින් සේවකයන් ගන්න වෙනවා. මොකද, ඒ ආයතනයේ නොයෙකුත් අළෙවි කටයුතු සිද්ධ වෙන නිසා. ඒ නිසා සමහර වෙලාවට වැඩියෙන් සේවකයන් බඳවා ගන්න වෙනවා. යම් යම් විශේෂ ව්‍යාපෘති තිබෙනවා. ඒ සඳහා සේවකයන් බඳවා ගන්න වෙනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, දැන් තමුන්නාන්සේ පෙන්වා දීලා තිබෙනවා සමහර අය දීර්ඝ කාලීනව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින බව. අප ඒ ගැන සොයා බලන්නම්. ඒ අයගේ සේවා කාලය සලකා බලලා පියවරක් ගන්නම්. මෙතැන ඔබතුමාගේ තර්ක දෙකක් තිබෙනවා. එකක් තමයි, සේවකයන් බඳවා ගැනීම වැඩියි කියලා. අනික් එක තමයි බඳවා ගත්ත අය ස්ථිර කරන්න කියලා. ඒවා ඔක්කොම සලකා බලලා අප තීන්දුවක් ගන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලා වරාය හම්බන්තොටට අරගෙන ගියා වාගේ, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළත් එහේ හැදුවා වාගේ, දැන් ජාතික ලොතරැයි මණ්ඩලයත් හම්බන්තොටට අරගෙන යන්න හදනවා. මම අහන්න කැමැතියි ඒකේ තිබෙන ප්‍රායෝගිකත්වය මොකක්ද කියලා. මෙහේ ඉන්න මිනිස්සු හම්බන්තොටට ගිහින් වැඩ කරන්නේ කොහොමද? මෙහේ ඉඳලා එහාට යන්න පැය කීයක් යනවාද? ගුවනින් රැගෙන ගිහින් ඒ අය එතැන බස්සන්න හදනවාද කියලා මා දන්නේ නැහැ. නමුත් ප්‍රශ්නය මෙකයි. ජාතික ලොතරැයි මණ්ඩලය වාගේ ආයතනයක් අරගෙන ගිහින් හම්බන්තොට ස්ථාපිත කළාට පස්සේ, ඒ සේවකයන් එහාට යොමු කළාට පස්සේ ඒ ක්‍රියාදාමයෙන් ඇති වන ප්‍රතිඵලය මොකක්ද? මොකද මේ ආයතනයේ වැඩිපුරම සේවය කරන්නේ කොළඹ අවට ඉන්න අයයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

තමුන්නාන්සේ පළමුවෙනි වතාවට තමයි එහෙම දෙයක් හෙළිදරවු කරන්නේ. අප දන්නේ නැහැ, එහෙම දෙයක්-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

COPE එකේදී එහෙම දෙයක් කියැවුණා. අප දිගින් දිගටම ඇහුවා මොකක්ද ඔබතුමන්ලා මේ කරන්න හදන්නේ කියලා. අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් එතැන හිටියා; අපේ ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් හිටියා; අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමාත් හිටියා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර මම කියන දෙය අහන්න. මේ කාර්යාල හිතෙන හිතෙන විධියට එක එක තැන්වලට ගෙන යන්න බැහැ. ඒක යම් කිසි-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ ඔබතුමා කියන හැටි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ. මම කියන්නේ එහෙම වෙන්නේ නැහැ කියලායි. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මට දෙන්න පුළුවන් පොරොන්දුව මෙකයි. අපේ රජයේ, අපේ විතරක් නොවෙයි හැම රජයකම ප්‍රතිපත්තියක් තිබෙනවා, රජයේ ආයතන ස්ථාපනය කළ යුත්තේ කොහේද කියලා. පසු ගිය සතියේත් අපි ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් සමඟ සාකච්ඡා කළා, එතුමා හදපු ඒ සංකීර්ණයේ ඉඩ තිබෙනවාද කියලා. සමහර විට ලොතරැයිවල ඒජන්සි එක එක තැන්වල තිබෙන්නට පුළුවන්. සමහර විට තමුන්නාන්සේලා නිර්දේශ කළාමත් ඒජන්සි දෙනවා. ඒවා කාර්යාලයක් විධියට සලකනවා නම් වැරදියි. ඉතින් මම හිතන්නේ නැහැ, ප්‍රධාන කාර්යාලය තිබෙන තැන වෙනස් කරයි කියලා. [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, තුන්වෙනි අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තවත් අහන්න දෙයක් තිබෙනවාද ඒ සම්බන්ධයෙන්?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මුළු රටේම තිබෙන වල්පල් මේ සභාවට ඇවිල්ලා ඉදිරිපත් කරන්න බැහැනේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

වල්පල් නොවෙයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කියන දේවල් සාක්ෂි ඇතුව ඉදිරිපත් කරන්න. [බාධා කිරීමක්] සාමාන්‍ය ප්‍රතිපත්තිය අනුව මෙවැනි කරුණක් කියනකොට, එක්කෝ ලේඛනයක් තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් ප්‍රකාශනයක් තිබෙන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒවා තිබෙනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එහෙම නැත්නම් අඩුම ගණනේ තමුන්නාන්සේලා සුපුරුදු පරිදි මේ කරුණු මාධ්‍යයට ඉදිරිපත් කරලා, ඉන් පසුව අහන්නට ඕනෑ. එහෙම කරන්නේ නැතිව මේ සභාවට ඇවිල්ලා අහසෙන් වැටෙනවා වාගේ මත්තලට ගෙන යනවාද, කිලිනොච්චියට ගෙන යනවාද, මැදවච්චියට ගෙන යනවාද කියලා ඇහුවාට අපට උත්තර දෙන්නට බැහැ නේ. ඒවා කල් තියා කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙතුමා කියනවා මම එහෙන් මෙහෙන් ගෙනාපු වල්පල් මේ සභාවේදී කියනවා කියලා. ගරු කථානායකතුමනි, මම මේ කාරණය සඳහන් කළේ පසු ගිය සතියක ජාතික ලොතරැයි මණ්ඩලය COPE එකට ඉදිරිපත් කළ කාරණයක් සමහයි. මම ඒ තොරතුරු ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්. එහිදී බොහොම පැහැදිලිව මේ කාරණය සාකච්ඡා වුණා. මම ඒකයි ඒ කාරක සභාවේ සිටිය මන්ත්‍රීවරු කවුද කියන එකත් කිව්වේ. ගරු කථානායකතුමනි, ඒ වාර්තාවේ මේ කාරණය පිළිබඳව බොහොම පැහැදිලිව තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ වාර්තාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවාද? [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වල්පල් කියවන්නේ නැහැ. වල්පල් කියවන්නේ ඇමතිවරු. ජාතික ලොතරැයි මණ්ඩලය හම්බන්තොටට ගෙන යන්න වැඩ පිළිවෙළක් තිබුණා. නියෝජ්‍ය ඇමතිතුමා විධියට ඒ කාරණය පිළිබඳව ඔබතුමා දන්නේ නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නමුත් අරගෙන ගිහින් නැහැ නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ ඇමතිතුමා විධියට ජනාධිපතිතුමා තීරණයක් අරගෙන තිබෙනවා, මේ ආයතනය හම්බන්තොටට අරගෙන යන්න. ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්නත් ලැහැස්තියි. ඒ පිළිබඳව දැනුවත් වෙලා තමයි මම මේ කථා කරන්නේ. මේවා වල්පල් නොවෙයි. [බාධා කිරීමක්] නියෝජ්‍ය ඇමතිතුමා විධියට ඔබතුමා ඒක දන්නේ නැහැ. ඔබතුමා මේ සම්බන්ධයෙන් පිළිතුරක් දෙන්නේ නැද්ද? [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තවම ගෙනිහින් නැහැ ලු. එතුමා පිළිතුර ලබා දුන්නා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා පිළිතුර දුන්නේ නැහැ, ඉඳ ගත්තා. [බාධා කිරීමක්] මීට වැඩිය හොඳයි එතුමා ස්ටීප් ටිකට එකක් අරගෙන හිරුවා නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා ප්‍රශ්නය අහගෙන ඉඳලා පිළිතුරක් දුන්නා, එහෙම නැහැ කියලා. පසුව වෙන්න පුළුවන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි. ඔබතුමා දන්නවා.

"සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩ පිළිවෙළ : ඉදි කළ මහල් නිවාස

"செமட நிவசக்-ஹிதட செவனக்" வேலைத் திட்டம் : நிர்மாணிக்கப்பட்ட மாடி வீடுகள்

"SAMATA NIWASAK - HITHATA SEVANAK" PROGRAMME : FLATS CONSTRUCTED

2223/'12

14. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩ පිළිවෙළ යටතේ, කොළඹ නගරයේ පැල්පත් වාසීන්ගේ නිවාස ගැටලුව විසඳීම සඳහා නිවාස ඒකක 40,000කින් සමන්විත මහල් නිවාස යෝජනා ක්‍රම 20ක් කොළඹ සහ තදාසන්න නගරවල ඉදි කිරීම පිණිස රුපියල් කෝටි 500ක ආරම්භක ප්‍රාග්ධනයක් ඉදිරි අය වැයෙන් වෙන් කරන බවට පොරොන්දුවක් දුන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පොරොන්දුව පරිදි රුපියල් කෝටි 500 ක් අය වැයෙන් වෙන් කළ වර්ෂය කුමක්ද;

(ii) එම මුදලින් මේ වන විට ඉදි කිරීම් ආරම්භ කර ඇති මහල් නිවාස යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට ඉදි කිරීම් අවසන් කර ඇති මහල් නිවාස යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iv) ඉදි කිරීම් අවසන් මහල් නිවාස යෝජනා ක්‍රමවල මේ වන විට පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නිර්මාණ, පොරියියල් සේවෛකළ්, වීටමෛප්පු, පොදු වසතිකළ් අමෛච්චරෛක් කේට්ට විනා:

(අ) මහින්ද චින්තනෙ තොලෛනෝක්කුක් කොළ්කෛකළිල් "චෙමට නිවසක්-හිතට චෙවනක්" වේලෛත් තිට්ටත්තින් කීළ්, කොළුම්පු නකරිල් කුටිසෛවාළ් මක්කළින් වීට්ටුප් පිරච්චිනෛයෛත් තීර්ප්පතර්කාක 40,000 වීට්ටුක්කූරු කළටංකිය 20 මාටිවීට්ටුත් තිට්ටංකළ් කොළුම්පු මර්රුම් පුරනකර්ප් පකුතියිල් නටෛමුරෛප්පටුත්තු වතර්කාක 500 කෝටි රූපාවෛ ආරම්ප මූලතනමාක අටුත්තු වරුම් වරවු චෙලවුත් තිට්ටත්තිල් ඔතුක්කුවතාක වාක්කුරුති අළික්කප්පට්ටුළ්ළතෙන්පතෛ අවර් අරිවාරා ?

(ආ)(i) මේර්පටි වාක්කුරුතියින් පිරකාරම් 500 කෝටි රූපා එන්ත ආණ්ටු වරවු චෙලවුත් තිට්ටත්තිල් ඔතුක්කප්පට්ටතු එන්පතෛයුම්;

(ii) කුරිත්ත පණත්තෛක්කොණ්ටු ඉන්රළවිල් නිර්මාණප්පණිකළ් ආරම්පික්කප්පට්ටුළ්ළ මාටි වීට්ටුත් තිට්ටංකළින් එණ්ණික්කෛ යාතෙන් පතෛයුම්;

(iii) ඉන්රළවිල් නිර්මාණප් පණිකළ් පූර්ත්ති චෙය්යප් පට්ටුළ්ළ මාටිවීට්ටුත් තිට්ටංකළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(iv) නිර්මාණප් පණිකළ් පූර්ත්තියාකියුළ්ළ මාටි වීට්ටුත් තිට්ටංකළිල් ඉන්රළවිල් කුටියමර්ත්තප් පට්ටුළ්ළ කුටුම්පංකළින් එණ්ණික්කෛ යාතෙන් පතෛයුම්

අවර් ඉච්චපෛයිල් අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities :

(a) Is he aware that a pledge was made under the "Samata Niwasak - Hithata Sevanak" programme of "Mahinda Chintana - Vision for the Future" manifesto that an initial capital of Rs. 5 billion would be allocated by the forthcoming budget to construct 20 flats comprising of 40,000 housing units in Colombo and suburbs with a view to solving the housing problems of the slum dwellers in the Colombo City ?

(b) Will he inform this House -

(i) of the year in which Rs. 5 billion was allocated by the budget in accordance with the above pledge;

(ii) of the number of flats of which the construction work has been started by now using the above-mentioned allocations;

(iii) the number of flats of which the construction work has been completed by now; and

(iv) the number of families that have been settled in the flats of which the construction work has been completed by now?

(c) If not, why?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම මෙම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) ඔව්.

(ආ) (i)

වර්ෂය	වෙන් කළ ප්‍රතිපාදන රුපියල් මිලියන
2011	660.22
2012	700.20
2013	430.00
එකතුව	1,790.42

(ii) මහල් නිවාස යෝජනා ක්‍රම සංඛ්‍යාව - 10කි.

(iii) මහල් නිවාස යෝජනා ක්‍රම සංඛ්‍යාව - 01කි.

(iv) පදිංචි පවුල් සංඛ්‍යාව 60කි.

(ඇ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ජනාධිපතිවරණය 2005 "මහින්ද චින්තන-දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 21 වන පිටුවේ කියලා තිබෙනවා, පැල්පත් නිවාස ප්‍රශ්නය විසඳන්න ගෙවල් 65,000ක් හදනවාය කියා. ජනාධිපතිවරණය 2010 "මහින්ද චින්තන-ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියලා තිබෙනවා, තට්ටු නිවාස 40,000ක් හදන්න වැඩසටහන් ක්‍රියාත්මක කරනවාය කියා. එතකොට 2005ත් 2010ත් අතර පැල්පත් නිවාස ප්‍රශ්නය විසඳන්නට නිවාස 25,000ක් හදලා තිබෙන්නට ඕනෑ. මොකද, 2005 දී පොරොන්දු වුණා, නිවාස 65,000ක් හදනවාය කියා. 2010 දී කියා තිබෙනවා, නිවාස 40,000ක් හදනවාය කියා. නමුත් සංඛ්‍යා ලේඛන දෙස බලන විට 2005ත් 2010ත් අතර එක නිවසක්වත් ඉදි වෙලා නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, 2005දී නිවාස 65,000ක් හදනවාය කිව්වත් 2010දී ඒක හිටි හැටියේ 40,000ට අඩු වෙන්නත් නිවාස 25,000ක් සාදා නොතිබෙන්නටත් හේතුව මොකක්ද කියා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, මේක මම මෙතුමාට කලිනුත් පැහැදිලි කළා. 2005 ජනාධිපතිවරණයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය 2010දී මේ රටේ ජනතාව ඊට වඩා වැඩි ප්‍රතිශතයකින් අනුමත කළා. 2010 ජනාධිපතිවරණයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව තමයි අපි කටයුතු කළ යුතු වන්නේ. විශේෂයෙන්ම ඔබතුමා සඳහන් කළ සංඛ්‍යාවට වඩා මෙහි ප්‍රායෝගික සත්‍ය තත්ත්වය ගත්තාම, 2010දී කරන ලද සමීක්ෂණයට අනුව නිවාස 68,000ක අවශ්‍යතාවක් තිබෙනවා. නිවාස 40,000වත් 60,000වත් නොවෙයි. මේ නිවාස 68,000ම සෑදීම සඳහා තමයි රජය මේ වන විට අවශ්‍ය ක්‍රියා මාර්ග අරගෙන තිබෙන්නේ. මා කලිනුත් පැහැදිලි කළා, අපේ අමාත්‍යාංශයත්, නාගරික සංවර්ධන අධිකාරියත් නිවාස 13,000ක ඉදිකිරීම් කටයුතු මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතින බව. මේ වසර අවසාන

වන විට නිවාස 20,000ක ඉදි කිරීම් කටයුතු ආරම්භ කරනවා. මේ වසරේ අගෝස්තු මාසයේදී ඔප්පුත් සමහම ඒ නිවාස ලබා දීමේ කටයුතු ආරම්භ කරනවා. මේකයි සමස්ත වැඩ පිළිවෙළේ තත්ත්වය. මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කරුණු ක්‍රියාත්මක නොවන තත්ත්වයක් නැහැ. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කරුණුවලටත් වඩා ඔබ්බෙන් මේ පැල්පත් වෙනුවට නිවාස යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග රජයක් විධියට අරගෙන තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු උගත් නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම මේ කාරණය අහනවා. 2005 දී නිවාස 65,000ක් හදනවාය කියා පොරොන්දු වුණා. 2010 දී කියා තිබෙනවා, "නැහැ නිවාස 40,000යි" කියා. එතකොට නිවාස 25,000ක් හැදිලා තිබෙන්න ඕනෑ. නමුත් එක ගෙයක්වත් හැදිලා නැහැ.

දැන් එතුමා නැවත වරක් මේ උත්තරීතර සභාවට කියනවා, "නැහැ, නැහැ, ගෙවල් 40,000ක් නොවෙයි, 68,000ක් හදනවා" කියලා. මම අහන්න කැමැතියි, මොකක්ද මේ ආණ්ඩුවේ දෙබිඩි පිළිවෙත; දිව දෙකේ කථාව; ද්විත්ව රංගනය කියලා. මොකක්ද කරන්න හදන්නේ? මේ සංඛ්‍යා ලේඛන ජිල්මාට් එකක්- විජ්ජාවක් - ක්‍රියාත්මක කරන්නේ ඇයි?

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
දැන් ඒක එක වරක් ඇහුවා නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මම තවම මේ පළමුවැනි අතුරු ප්‍රශ්නයයි අහන්නේ.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
පළමුවැනි ඒවා දෙකයි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(මාණ්පුමිකු ලසන්ත අලකියවන්න)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු කථානායකතුමනි, මෙතුමාගේ අංක ගණිත ශාස්ත්‍රය අනුව විනාඩියකට ගෙවල් 1,000ක් හදන්න ඕනෑ. ඒක ප්‍රායෝගික නැහැ. නමුත් ජනතාවට අවශ්‍ය දේ අපි ඉටු කරනු ලබනවා. ඔබතුමාගේ අංක ගණිත ශාස්ත්‍රය අපි පිළිගන්නේ නැහැ.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න අංක 3. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
නැහැ, තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට පැහැදිලි උත්තරයක් ලැබුණේ නැති නිසා මම ඒ ප්‍රශ්නය ඇහුවේ.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
එහෙම බැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගමේකමට ඔබතුමා මට පොඩ්ඩක් උදව් කරන්න. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය-

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම මේ කාරණය දැන ගන්න කැමැතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ ගරු ඇමතිතුමා 2010 ප්‍රගති වාර්තාව සහ 2011 ඉදිරි සැලැස්මේ දී එතුමාගේම වචනවලින් කියා තිබෙනවා "අපේ රටේ නිවාස අවශ්‍යතාව ලක්ෂ 12යි" කියලා. ඊට පස්සේ 2011 වසරේ එතුමාගේ වාර්තාවේ කියා තිබෙනවා "නැහැ, නැහැ. අපේ රටේ නිවාස අවශ්‍යතාව ලක්ෂ 12ක් නොවෙයි, ලක්ෂ 15යි" කියලා. ඉතින්, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි , මේ රටේ නිවාස නොමැති සංඛ්‍යාව පිළිබඳව හරිහැටි නිවැරදි අවබෝධයක්, නිගමනයක් නොමැතිව ඔබතුමාගේ ඇමතිතුමා සහ ඔබතුමා ප්‍රමුඛ අමාත්‍යාංශය මේ නිවාස ප්‍රශ්නය විසඳන්නේ කොහොමද කියලා. එක අවුරුද්දක ලක්ෂ 12ක් කියනවා. තව අවුරුද්දක ලක්ෂ 15ක් කියනවා. හරියට තොරතුරු නොදැන ඔබතුමන්ලා මේ නිවාස ප්‍රශ්නය විසඳන්නේ කොහොමද?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(මාණ්පුමිකු ලසන්ත අලකියවන්න)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු කථානායකතුමනි, මේ නිවාස ප්‍රශ්නය විසඳීමේ යම් කොටසක් විතරයි අපේ අමාත්‍යාංශය මඟින් කරනු ලබන්නේ. රජයක් විධියට නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු තවත් අමාත්‍යාංශ ගණනාවක් එකතු වෙලා තමයි මේ කාර්ය භාරය ඉටු කරනු ලබන්නේ. විශේෂයෙන්ම පසු ගිය අවස්ථාවන් ගණනාවකදී අපට මේ පිළිබඳව සත්‍ය තොරතුරු තිබුණේ නැහැ. නමුත් පැවැති ජනලේඛන හා සංඛ්‍යාලේඛන සමීක්ෂණයෙන් නිවාස අවශ්‍යතාව පිළිබඳ ඉතාමත් සත්‍ය තොරතුරු අද ඉදිරිපත් වෙලා තිබෙනවා. කලින් ඒ සියලුම තොරතුරු ඉදිරිපත් කළේ ග්‍රාම නිලධාරිගෙන් සහ නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගෙන් ලබා ගත් තොරතුරු අනුවයි. ඒ අනුව තමයි කලින් සංඛ්‍යා ලේඛන මේ ප්‍රතිපත්ති ප්‍රකාශනවලට දමලා ඉදිරිපත් කර තිබෙන්නේ. නමුත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගෙන් ගෙට ගිහිල්ලා සමීක්ෂණ කරලා අද අපේ රටේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව තමයි අද මේ රජය කටයුතු කරන්නේ.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
Order, please! I wish to announce that this House cordially welcomes the Parliamentary Delegation from India, now present in the Speaker's Gallery.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි නේද?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඉවරයි, ඉවරයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, ගරු කථානායකතුමනි, මම තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථා පවත්වන්නේ නැතිව ඇඟුවොත් හරියට ගණන් කර ගන්න පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා තුන්වන අතුරු ප්‍රශ්නය විධියට අහනවා,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහන්න කෝ තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේයි. මීතොටමුල්ල ප්‍රදේශයේ ජනතාව ලොකු ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. එය මහා ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම, ඔබතුමාගේ ඇමතිතුමා මාස ගණනාවකට පෙර ඒ ස්ථානයට ගිහිල්ලා ඒ ප්‍රදේශයේ ජනතාවට පොරොන්දු වුණා, ක්ෂණිකව ඒ නිවාස නැවත වරක් ස්ථාපනය කරන්න කටයුතු කරනවා කියලා. එතුමා එසේ ලොකු පොරොන්දුවක් ලබා දුන්නා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමාගේ ඇමතිතුමා ලබා දුන් ඒ පොරොන්දුව සත්‍ය වශයෙන්ම පොරොන්දුවක්ද; එහෙමත් නැත්නම් විකට රංගනයක්ද කියලා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந්த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු මන්ත්‍රීතුමනි, ඒ පොරොන්දුවේ කරුණු ඉටු කරලා තිබෙනවා. මෙය විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයට අදාළ ගැටලුවක්. ඇත්ත වශයෙන් මා ඒ පිළිබඳව හරියට කරුණු දන්නේ නැහැ. නමුත් ගරු අමාත්‍යතුමාගෙන් තොරතුරු විමසලා ඔබතුමා දැනුවත් කිරීමක් කරන්නම්. ඒ පිළිබඳව ඔබතුමාගේ යම් යම් අදහස් යෝජනා තිබෙනවා නම් ඒවා ලබා දෙන්න.

දුම්රිය දෙපාර්තමේන්තු ආදේශක සේවකයින් : බඳවා ගැනීමේ පටිපාටිය

புகையிரதத் திணைக்கள பதிலீட்டு ஊழியர்கள் : ஆட்சேர்ப்பு நடைமுறை

SUBSTITUTE LABOURERS TO RAILWAY DEPARTMENT : RECRUITMENT PROCEDURE

2980/'12

15.ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිසිදු ප්‍රසිද්ධ දැන්වීමකින් හෝ අයදුම් පත්‍ර කැඳවීමකින් තොරව ආදේශක කම්කරුවන් 400කට ආසන්න පිරිසක් දුම්රිය දෙපාර්තමේන්තුවට හදිසියේ බඳවා ගෙන ඇති බවත්;

(ii) දැනටමත් සැලකිය යුතු සේවක සංඛ්‍යාවක් සිටින දුම්රිය දෙපාර්තමේන්තුවට තවත් ආදේශක සේවකයින් බඳවා ගැනීම නිසා එම දෙපාර්තමේන්තුව තව තවත් පාඩු ලබන ආයතනයක් බවට පත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි අතිරේක සේවක පිරිසක් දුම්රිය දෙපාර්තමේන්තුවට බඳවා ගනු ලැබූ ක්‍රියා පටිපාටිය කවරේද;

(ii) එපමණ සේවක පිරිසක් අනුයුක්ත කරගනු ලැබුවේ කවර නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේද;

(iii) එම සේවකයින් බඳවා ගැනීමට සම්බන්ධ නිලධාරීන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

පෝක්කුවරත්තු අමෛච්සරයා කේට්ට විනා:

(அ) (i) පකිරංක අරිවිත්තල් අල්ලතු විණ්ණප්පම් කෝරල් එතුවුමින්රි සුමාර් 400 පතිලීට්ටුත් තොළිලාළර්කළ් පුකෙයිරතත් තිණෙක්කළත් තුක්කු ආට්සේර්ක්කප්පට්ටුළ්ළාර්කළ් එන්බතෙයුම්;

(ii) ඒර්කනවේ කුරිප්පිටත්තක්කවු ඌළියර්කළෛක් කොණ්ටුළ්ළ පුකෙයිරතත් තිණෙක්කළත්තුක්කු මේලුම් පතිලීට්ටු ඌළියර්කළෛ ආට්සේර්ප් පතනාල් මේර්පටි තිණෙක්කළම් මෙන්මේලුම් නට්ටමටෙකින්ර ඔරු නිරුවනමාක මාරුම් එන්පතෙයුම්

අවර් අරිවාරා?

(ஆ) (i) මේලේ කුරිප්පිටප්පට්ටුළ්ළවාරු පුකෙයිරතත් තිණෙක්කළත්තුක්කු මේලතික ඌළියර්කළ් ආට්සේර්ක්කප්පට්ට නටෙමුරෙ යාතු;

(ii) ඉව්වළවු එණ්ණික්කෙයාන ඌළියර්කළ් එන්ත උත්තියෝකත්තරතු මේර්පාර්වෛයින් කීළ් ඉණෛත්තුක්කොළ්ළප්පට්ටාර්කළ්;

(iii) මේර්පටි ඌළියර්කළින් ආට්සේර්ප්පුටන් තොටර්පුටෛය උත්තියෝකත්තර්කළ් තොටර්පිල් මුරෙසාර්න්තතොරු විසාරණෙ නටත්තප්පටුමා

එන්පතෙ අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(இ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Transport:

(a) Is he aware that -

(i) an urgent recruitment of a group of nearly 400 substitute labourers have been made by the Railway Department without issuing any public notification or calling for applications; and

(ii) recruiting more substitute labourers to the Department of Railway which already has a substantial cadre would make the aforesaid Department an institution that incurs further losses?

(b) Will he inform this House -

(i) of the procedure followed when recruiting additional cadre for the Department of Railway in the aforesaid manner;

(ii) of the officer under whose supervision such a large number of employees were attached to the Department; and

(iii) whether a formal inquiry will be held regarding the officers involved in the recruitment of the aforesaid staff?

(c) If not, why?

ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) බඳවාගෙන ඇත.

(ii) මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීමට ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් අවශ්‍ය වේ. එබැවින් රාජකාරි අවශ්‍යතාව මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ආවරණ අනුමැතියට යටත්ව යථෝක්ත බඳවා ගැනීම සිදු කර ඇත. මේ සඳහා ප්‍රවාහන ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත.

(ආ) (i) සේවා අවශ්‍යතාව මත කඩිනමින් සේවයේ යොදවා ගැනීමට අවශ්‍ය වූ බැවින්ද, කම්කරු තාක්ෂණ ශිල්පී සහායක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වූ බැවින්ද රැකියා අපේක්ෂාවෙන් ප්‍රවාහන අමාත්‍යාංශයට අයදුම් පත් ඉදිරිපත් කර තිබූ අයවලුන් අතරින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ආදේශක තනතුරුවලට බඳවා ගෙන ඇත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, අපට දැනගන්න ලැබිලා තිබෙන විධියට දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ අතිරික්තයක් තිබෙනවා. එහෙම තියෙද්දී බඳවා ගන්නවා කියලායි අපට දැනගන්න ලැබිලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, සේවක අතිරික්තයක් නැහැ. සේවකයන් මදි. දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ විශාල ප්‍රමාණයක අඩුවක් තිබෙනවා. ඒ නිසා ඒ සේවයේ අවශ්‍යතාව මත ඒ බඳවා ගැනීම් -ආදේශකයන් හැටියට- කරගෙන තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මම හිතුවා කෝච්චි පෙට්ටි තල්ලු කරන්නත් මිනිසුන් ගන්නවාද කියලා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කෝච්චි පෙට්ටි තල්ලු කරන්න නම් ඕනෑ නැහැ. එන්ජිම තවම හොඳට වැඩ කරනවා ගරු කථානායකතුමනි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, ඊට අමතරව ඔබතුමාගෙන් අහන්න කැමැතියි, දුම්රිය ගාස්තු වැඩි වෙනවාද කියලා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දුම්රිය ගාස්තු තවම වැඩි වන්නේ නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
"තවම" කියලා කියන්නේ, ඉදිරියේදී වැඩි වෙනවාද?

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ. ඉදිරියේදීත් එහෙම වැඩි කරන්න සාකච්ඡා කරලා නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
බොහොම ස්තුතියි.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එච්චරද? මමත් TV එකේ පෙනී ඉන්න පුළුවන් වෙයිද කියලා බලාගෙන හිටියේ; වැඩේ ඉවරයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවැනි වටය.

මහාචාර්ය ඒකක සහිත රෝහල් : විස්තර
பேராசிரியர் பிரிவுகளைக்கொண்ட மருத்துவமனைகள்: விபரம்
HOSPITALS WITH PROFESSOR UNITS : DETAILS

2531/'12

5. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨවල සායනික පුහුණුව සඳහා වන මහාචාර්ය ඒකක (Professor Units) ඇති රෝහල් කවරේද;

(ii) එම එක් එක් මහාචාර්ය ඒකකවල 2012 මාර්තු 31 දින වන විට අනුයුක්තව සිටින මහාචාර්යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, පශ්චාත් උපාධිය හදාරන වෛද්‍යවරුන් (Senior Registrar සහ Registrar), ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් මහාචාර්ය ඒකකයේ කටයුතු සඳහා පවතින ශල්‍යාගාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජරට වෛද්‍ය පීඨයේ සායනික පුහුණුව සඳහා වන අනුරාධපුර මහ රෝහලේ මහාචාර්ය ඒකකය විවෘත කළ දිනය කවරේද;

(ii) දැනට එම මහාචාර්ය ඒකකයේ පුහුණුව ලබන වෛද්‍ය සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එහි පුහුණුව ලබන වෛද්‍ය සිසුන්ට ඉගැන්වීමට ප්‍රමාණවත් වෛද්‍යවරුන්, ශල්‍යාගාර, වාට්ටු සහ ඒවා පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය හා උපකරණ තිබේද;

(iv) නොඑසේ නම්, එම මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் மருத்துவ பீடங்களின் சிகிச்சை பயிற்சிக்கான பேராசிரியர் பிரிவுகளை (Professor unit) கொண்டுள்ள மருத்துவமனைகள் யாவையென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு பேராசிரியர் பிரிவுக்கும் 2012 மார்ச் மாதம் 31ஆம் திகதியளவில் இணைக்கப்பட்டிருந்த பேராசிரியர்கள், நிபுணத்துவ மருத்துவர்கள், பட்டப்பின் படிப்பை மேற்கொள்ளும் மருத்துவர்கள் (Senior Registrar மற்றும் Registrar), சிரேஷ்ட மருத்துவ உத்தியோகத்தர்களின் எண்ணிக்கை வெவ் வேறாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பேராசிரியர் பிரிவுகளினதும் அலுவல்களுக்காக காணப்படும் சத்திரசிகிச்சைக் கூடங்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) ரஜரட்ட மருத்துவ பீடத்தின் சிகிச்சைப் பயிற்சிக்கான அனுராதபுரம் பெரியாஸ் பத்திரியின் பேராசிரியர் பிரிவு ஆரம்பிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) தற்போது மேற்படி பேராசிரியர் பிரிவில் பயிற்சி பெறும் மருத்துவ மாணவர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iii) அங்கு பயிற்சி பெறும் மருத்துவ மாணவர்களுக்கு கற்பிப்பதற்குப் போதுமான மருத்துவர்கள், சத்திர சிகிச்சைக் கூடங்கள், வாட்டுகள், அவற்றைக் கொண்டு நடாத்துவதற்குத் தேவையான பணியாட் டொகுதியினர் மற்றும் உபகரணங்கள் உள்ளதா என்பதையும்;

(iv) இன்றேல், மேற்படி அடிப்படைத் தேவைகளைப் பூர்த்தி செய்வதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education:

(a) Will he state -

(i) the hospitals attached to the Medical Faculties in Sri Lanka with Professor Units for clinical training;

(ii) separately, the number of Professors, Medical Specialists, Doctors reading for post graduate studies (Senior Registrars and Registrars) and Senior Medical Officers attached to each Professor Unit as at 31st March 2012; and

(iii) separately, the operating theatres available for the relevant activities in each Professor Unit?

(b) Will he inform this House -

(i) the date on which the Professor Unit of the Anuradhapura General Hospital assigned for clinical training of the Rajarata University, was opened;

(ii) the number of medical students who are undergoing training at that Professor Unit at present;

(iii) whether sufficient doctors, operating theatres, wards and equipment and staff required to maintain them are available at the above-mentioned unit for the purpose of providing training to the undergraduates who are undergoing training there; and

(iv) if not, the time to be taken to fulfil those basic necessities?

(c) If not, why?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) අනුරාධපුර ශික්ෂණ රෝහල;

කොළඹ ජාතික ශික්ෂණ රෝහල;

කරාපිටිය ශික්ෂණ රෝහල;

උතුරු කොළඹ ශික්ෂණ රෝහල;

දකුණු කොළඹ ශික්ෂණ රෝහල;

පේරාදෙණිය ශික්ෂණ රෝහල.

යාපනය රෝහල ශික්ෂණ රෝහලක තත්ත්වයට තවම දියුණු වෙලා නැහැ. නමුත් මහාචාර්ය ඒකකයක් ක්‍රියාත්මක වෙනවා. මඩකලපුවේ තවම මහාචාර්ය ඒකකයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක හදාගෙන යනවා. හැබැයි එතැන ශික්ෂණ රෝහලක් හැටියට කටයුතු කරනවා.

(ii) ඇමුණුම I හි දක්වා ඇත.

(iii) ඇමුණුම II හි දක්වා ඇත. ඇමුණුම් **සභාගත*** කරමි.

(ආ) (i) 2012 පෙබරවාරි 09.

(ii) 167 යි.

(iii) ඔව්.

(iv) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

සභාමේසය මත තබන ලද ඇමුණුම්:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

ඇමුණුම I

	Medicine (වෛද්‍ය විද්‍යා)	Surgery (ශල්‍ය වෛද්‍ය විද්‍යා)	obstetrics and gynecology (නාරී හා භෘතවේද)	Pediatrics (ළමා රෝග)	Psychiatric (මනෝ වෛද්‍ය විද්‍යා)	Clinical Medicine (සායනික වෛද්‍ය)	Radiology (විකිරණවේදය)	Anesthesiology (නිර්විඳ්දනවේදය)
	Rajarata University of Sri Lanka							
Professors	1	-	-	-	-			
Consultants (Senior Lecturers)	1	1	1	1	-			
Senior Registrars	3	1	-	-	-			
Registrar	-	1	1	-	-			
Probationary Lecturers	1	-	-	2	1			
Senior House Officers	4	4	4	3	-			
	Eastern University, Sri Lanka							
Professor	0	0	0	0	-			
Senior Lecturer	0	0	01	-	-			
Senior Registrar/Registrar	0	1	0	0	-			
Senior House Officers	3	3	2	3	-			
Senior Lecturer II (opted to University)	-	-	-	1	-			
Specialist Surgeon	-	1	-	-	-			
Specialist Physician	1	-	-	-	-			
	University of Colombo							
Professor		4	5	3		5		
Consultants		4	2			8		
Registrar		2	2	4	7	2		
Senior Registrar		2		4		2		
Senior Medical Officer			4					
Senior House Officer				1				
Consultants (Senior Lecturers)				2				

	Medicine (වෛද්‍ය විද්‍යා)	Surgery (ශල්‍ය වෛද්‍ය විද්‍යා)	obstetrics and gynecology (නාරී හා භෘතවේද)	Pediatrics (ළමා රෝග)	Psychiatric (මනෝ වෛද්‍ය විද්‍යා)	Clinical Medicine (සායනික වෛද්‍ය)	Radiology (විකිරණවේදය)	Anesthesiology (නිර්විඳ්දනවේදය)
	University of Ruhuna							
Professors	05	-	01	02				
Consultants	03	05	06	05				
Senior Registrars	02	01	01	01				
Registrars	02		01					
Senior House Officers	02	03	01	01				
	University of Kelaniya							
University Employees								
Professors and Associate Professors	3	2	0	2	1			
Senior Lecturers	4	3	5	3	4			
Lecturers	0	0	0	0	0			
Postgraduate Trainees								
Senior Registrars	2	1	0	1	0			
Registrars	4	3	0	2	5			
Health Ministry Doctors								
Acting Consultants	0	0	0	1	0			
Senior House Officers	3	4	4	4	3			
Resident House Officers	2	0	2	9 (in Premature Baby Unit)	0			
Intern House Officers	3	3	3	3	0			

[ගරු එස්.බී. දිසානායක මහතා]

	Medicine (වෛද්‍ය විද්‍යා)	Surgery (ශල්‍ය වෛද්‍ය විද්‍යා)	obstetrics and gynecology (නාරි හා භෘතවේද)	Pediatrics (ළමා රෝග)	Psychiatric (මනෝ වෛද්‍ය විද්‍යා)	Clinical Medicine (සායනික වෛද්‍ය)	Radiology (විකිරණවේදය)	Anesthesiology (නිර්විඳ්දනවේදය)
	University of Sri Jayewardenepura							
Carder Chair-Professor in the specialty	01	01	01		01			
Professor	02	03	0	02	0			
Associate Professor	-	-	-	-	-			
Senior Lecturers	04	02	04	04	04			
Senior Registrar (on training from PGIM)	02	02	01	01	01			
Registrar (on training from PGIM)	04	03	02	02	05			
SHO	03	03	04	03	06			
	University of Jaffna							
Medical Specialists	02			02				
Senior Registrar	01		-					
Registrar	05	01	01					
SHOs	04		04					
Senior Registrar (Actg. Consultants)		02						

	Medicine (වෛද්‍ය විද්‍යා)	Surgery (ශල්‍ය වෛද්‍ය විද්‍යා)	obstetrics and gynecology (නාරි හා භෘතවේද)	Pediatrics (ළමා රෝග)	Psychiatric (මනෝ වෛද්‍ය විද්‍යා)	Clinical Medicine (සායනික වෛද්‍ය)	Radiology (විකිරණවේදය)	Anesthesiology (නිර්විඳ්දනවේදය)
	University of Peradeniya							
Medical Specialists (Consultant Radiologists)							2	
Doctors reading for Postgraduate							6	
Senior Medical Officers							5	
Professor		4		3				1
Specialists								2
University								1 (Consultant Anesthetist – Ministry of Health
Registrar								1 in Anesthesiology
Senior Medical Officers								35 Ministry
Operating Theaters								08
Specialists in Psychiatry					04			
Postgraduate Trainees					04			
Senior Lecturers		2		2				
Lecturer				1				
Probationary Lecturers				2				
Senior Professor		1						
Doctor reading for postgraduate studies		11						
Medical Specialists (VOG/SL)			4					
Senior Registrars		2	2					
Registrars		3	2					

	Medicine (වෛද්‍ය විද්‍යා)	Surgery (ශල්‍ය වෛද්‍ය විද්‍යා)	obstetrics and gynecology (නාරි හා භෘතවේද)	Pediatrics (ළමා රෝග)	Psychiatric (මනෝ වෛද්‍ය විද්‍යා)	Clinical Medicine (සායනික වෛද්‍ය)	Radiology (විකිරණවේදය)	Anesthesiology (නිර්වින්දනවේදය)
	University of Peradeniya							
Visiting Lecturers			1					
Professor/Consultants		1						
Senior Lecturers/Consultants		4						
Lecturers/Consultants		1						
Lecturer (Senior Registrar)		1						
Lecturer (Probationary)		1						

ඇමුණුම II

	වෛද්‍ය විද්‍යා (Medicine)	ශල්‍ය වෛද්‍ය විද්‍යා (Surgery)	නාරි හා භෘතවේද (obstetrics and gynecology)	ළමා රෝග (Pediatrics)	මනෝ වෛද්‍ය විද්‍යා (Psychiatric)	සායනික වෛද්‍ය (Clinical Medicine)
රජරට විශ්වවිද්‍යාලය	-	01	01	-	-	-
නැගෙනහිර විශ්වවිද්‍යාලය	මහාචාර්ය ඒකකයේ වෙන්වූ වශයෙන් වූ ශල්‍යාගාර නොමැත					
කොළඹ විශ්වවිද්‍යාලය	-	03	02	විධිමත් පදනමක් මත ශල්‍යාගාර භාවිත නොකරයි.	-	-
රුහුණු විශ්වවිද්‍යාලය	-	02	02	-	-	-
කැළණිය විශ්වවිද්‍යාලය	අදාළ නොවේ.	02	03	අදාළ නොවේ.	අදාළ නොවේ.	
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	අදාළ නොවේ.	09	09	අදාළ නොවේ.	අදාළ නොවේ.	
යාපනය විශ්වවිද්‍යාලය	එක් එක් මහාචාර්ය ඒකකයේ අදාළ කාර්යයන් සඳහා වෙන් වෙන් වශයෙන් ශල්‍යාගාර ඇත. යාපනය ශික්ෂණ රෝහලෙහි පහසුකම් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මෙන්ම විශ්වවිද්‍යාලීය අධ්‍යයන අංශ විසින් ද හවුලේ පරිහරණය කරනු ලැබේ.					
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	ප්‍රසවේදය සඳහා වන මහාචාර්ය ඒකකයේ ශල්‍යාගාර ඇත. නාරිවේදය සඳහා වන මහාචාර්ය ඒකකයේ ශල්‍යාගාර ඇත.					

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට අදාළ පිළිතුර මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමැතියි. රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සිසුන් සඳහා අවශ්‍ය කාලයේදී මහාචාර්ය ඒකකයක් ගොඩනැඟීම පමා වීම හේතු කොට ගෙන ඒ හා සමාන්තර අනෙක් විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨවල සිසුන් හා සන්සන්දනය කරන කොට මේ වන විට ඔවුන් ඉන්නේ පිටුපසින්. ඒ අයට රැකියා ලබා දීමේදී හෝ වෛද්‍ය වෘත්තියට බඳවා ගැනීමේදී හෝ මේ විධියට සිද්ධ වන කාල වෙනස්කම සඳහා යම් පියවරක් අනුගමනය කරන්න සූදානම්ද?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, අනුරාධපුර ශික්ෂණ රෝහලේ කටයුතු ප්‍රමාද වෙලා හෝ පටන් අරගෙන දැන් ඒ කටයුතු අවසන් කරලා තිබෙනවා. ඒක තමයි දැනට ලංකාවේ තිබෙන ලොකුම ශික්ෂණ රෝහල. හැබැයි යාපනයේ හා මඩකලපුවේ තවමත් එම ඒකක පිහිටුවලා නැහැ. ඔබතුමා ඇහුවේ නැති වුණාට ඒ ප්‍රශ්නය ඊට වඩා භයානක විධියට මඩකලපුවේ හා යාපනයේ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨවල දරුවන්ට තිබෙනවා. ගැටලුවක් නැති විධියට ඒවායේ කටයුතු කර ගෙන යනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ඒ දරුවන් එක වයසේ දරුවන්. ඒක කාලයකදී ඉපදිලා, එක වයසේදී විශ්වවිද්‍යාලයට සමත් වෙලා, එක වයසේදී වෛද්‍ය පීඨ සඳහා ගිය දරුවන්. සමහර වෛද්‍ය පීඨවලදී ඒ දරුවන්ට උපාධිය අරගෙන වෛද්‍ය වෘත්තිය ලබා ගැනීමේදී අනෙක් පීඨවල දරුවන්ට වඩා පිටුපසින් ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. කිසිසේත්ම ඒ සඳහා ඒ දරුවෝ වග කියන්න ඕනෑ නැහැ.

රජරට විශ්වවිද්‍යාලයේ හෝ මඩකලපුව විශ්වවිද්‍යාලයේ හෝ, යාපනයේ විශ්වවිද්‍යාලයේ හෝ වෛද්‍ය පීඨයේ දරුවන්ගේ ප්‍රශ්නයක් නොවෙයි, ඔවුන්ට පමා වී පත් වීම් ලැබීම. එය රජයේ ප්‍රශ්නයක්. ලොකු පොඩි කොයිකද කියන එක නොවෙයි, ගරු ඇමතිතුමා. රජය මේ ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා. මොකද, ඔවුන් එක වයස් මට්ටමේ ඉපදිලා, එක වයස් මට්ටමකදී අධ්‍යාපනය හදාරලා, එක වයස මට්ටමකදී විභාග පාස් කරලා, එකට විශ්වවිද්‍යාලයට ගිහින්, නමුත් පීඨ ගණනාවක දරුවෝ වෘත්තීය ලබා ගන්නේ පසු වෙලා. ඒක අතිශය අසාධාරණ තත්ත්වයක්. ඒ අසාධාරණ තත්ත්වය මහ හරවා ගැනීම සඳහා ගරු ඇමතිතුමා ගන්නා ක්‍රියා මාර්ගය කවරේ ද?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම වැරදියි. මොකද, එකට ඉපදුනේත් නැහැ. එකට විභාග කළේත් නැහැ. එකට ගියේත් නැහැ. සමහර අය පළමුවන සැරයේ, සමහර අය දෙවන සැරයේ, සමහර අය තුන් වන සැරයේ. එකට පටන් ගත්තේත් නැහැ. මේ සියල්ලම වැරදියි ගරු කථානායකතුමනි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මෙහෙම උසස් අධ්‍යාපන අමාත්‍යාවරයෙක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගෙන තිබීම පිළිබඳව ඒ දරුවන්ට දෙවියන්ගේම පිහිටයි. වෙන මොකුත් ආයෙත් කියන්න දෙයක් නැහැ. ඇමතිවරයාගෙන් බලාපොරොත්තු වන -

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, මෙවැනි අමනෝඥ ප්‍රශ්න අහන නිසා ජනතා විමුක්ති පෙරමුණටත් බුදුහාමුදුරුවන්ගේම පිහිටයි.[බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තුන අසා ඉවරයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එකට විභාග පාස් කළාය කියන්නේ, පළමුවන සැරය ද, දෙවන සැරය ද, තුන්වන සැරය ද කියන එක නොවෙයි. ඔවුන් එක විභාගයක් පාස් වෙලා තමයි එකට විශ්වවිද්‍යාලයට ගිහිල්ලා තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ ප්‍රශ්න නිසා ඒ දරුවන්ට වෛද්‍ය වෘත්තියට යන්නට වෙන්නේ අවුරුදු දෙකක් පමා වෙලා. රජ රට විශ්වවිද්‍යාලයේ දරුවන්ට ඒක වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්නය තමුන්නාන්සේලා විසඳන්නට ඕනෑ. ඒක විසඳන්නේ නැතිව, මෙතැන ඇවිත් වෙන වෙන කථා කියන එක වැඩක් නැහැ. එම නිසා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා -[බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි. අතුරු ප්‍රශ්න තුන අසා ඉවරයි.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

එහෙම ගැටලුවක් නැහැ. ඒක ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට තිබෙනවා. අපට එහෙම ගැටලුවක් නැහැ. [බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තේරෙන්නේ නැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වචන දෙකම අස් කර ගන්න. වචන දෙකම සභාවට සුදුසු නැහැ. [බාධා කිරීම්] හොඳයි ඒ ප්‍රශ්නය අවසානයි. තමුන්නාන්සේලා දෙගොල්ලෝම නිශ්ශබ්ද වෙන්න.

දෙවන වටය.

නුවරඑළිය විවිධසේවා සමුපකාර සමිතියට අයත් ගොඩනැඟිල්ල : බදු දීම
நுவரெலியா பலநோக்குக் கூட்டுறவுச் சங்கத்துக்கு உரித்தான கட்டிடம் : குத்தகை
BUILDING BELONGING TO NUWARA-ELIYA MULTIPURPOSE CO-OPERATIVE SOCIETY : LEASE-OUT

2849/'12

8. ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය-(3):

(අ) (i) නුවරඑළිය විවිධසේවා සමුපකාර සමිතියට අයත් දෙමහල් ගොඩනැඟිල්ලක් බදු දීමට 2011 දෙසැම්බර් 19 දින පුවත් පත් දැන්වීමක් මඟින් ටෙන්ඩර් කැඳවූයේද;

(ii) එසේ නම්, ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iii) පිළිගත් පටිපාටිය අනුව ටෙන්ඩර් කැඳවීමකදී සලකා බලන සහ ප්‍රමුඛතාවය ලබා දෙන කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ගොඩනැඟිල්ල,

(i) ලබා ගැනීමට රුපියල් 320,000/- ක් සහ රුපියල් 355,000/- ලෙස මිල ගණන් ඉදිරිපත්ව තිබූ බවත්;

(ii) ටෙන්ඩර් අයදුම්පතක් හෝ ඉදිරිපත් නොකළ පුද්ගලයකුට මේ වන විට ලබා දී ඇති බවත්;

(iii) බදු දීමේදී අක්‍රමිකතාවක් සිදු වී ඇති බවත්;

(iv) අක්‍රමිකව ලබා දීම නිසා අයදුම්කරුවන්ට අසාධාරණයක් මෙන්ම අදාළ සමුපකාර සමිතියට අලාභයක් සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහළම ටෙන්ඩරයට ගොඩනැඟිල්ල ලබා නොදීමට හේතු කවරේද;

(ii) දැනට ගොඩනැඟිල්ල ලබා දී ඇති අයගෙන් සමූපකාර සමිතිය ලබා ගන්නා මුදල කොපමණද;

(iii) ඉහත අක්‍රමිකතාව සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකොට ටෙන්ඩර්කරුවන්ට සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා කොපමණ කාලයක් ගතවේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

කූට්ටුරවු, උල්නාට්ටු වර්ත්තක අමෙච්චරෙයික් කේට්ට විනා:

(අ) (i) නුවරෙලියා පලනෝක්කුක් කූට්ටුරවුච් චංකත්තිර්කු උරිත්තාන ඉරණ්ටු මාටික් කට්ටිටමොන්රෙ කුත්තකෙක්කු වළංකුවතර්කාක 2011 ටිචම්පර් 19ආම් තිකති පත්තිරිකෙ අරිවිත්තල්මූලම් කේල්විප්පත්තිරම් කෝරප් පට්ටතා එන්පතෙයුම්;

(ii) ආමෙනිල්, චමර්ප්පික්කප්පට්ට විලෙමනුක්කළ් යාවෙ එන්පතෙයුම්;

(iii) අංගීකරික්කප්පට්ට නටෙමුරෙකළුක්කු අමෙය කේල්විප්පත්තිරංකළ් කෝරලින්පෝතු කවනත්තිල් කොළ්ළප්පටුකින්රතුම් මුන්නුරිමෙ වළංකප්පටුකින්රතුමාන විටයංකළ් යාවෙ එන්පතෙයුම්;

අවර් කුරිප්පිටුවාරා?

(ආ) මේර්පටි කට්ටිටත්තෙ,

(i) පෙර්රුක්කොළ්වතර්කු රූපා 320,000/- මර්රුම් රූපා. 355,000/- එන්රවකෙයිල් විලෙමනුක්කළ් චමර්ප්පික්කප්පට්ටිරුන්තන එන්පතෙයුම්;

(ii) කේල්විප්පත්තිර විණ්ණප්පත්තෙයේනුම් චමර්ප් පික්කාත ඔරුවරුක්කු තර්පෝතු වළංකප් පට්ටුළ්ළතු එන්පතෙයුම්;

(iii) කුත්තකෙක්කු වළංකුවතිල් මුරෙකේටු ඉටම්පෙර්රුළ්ළතු එන්පතෙයුම්;

(iv) මුරෙකේටාන මුරෙයිල් වළංකියතන් කාරණමාක විණ්ණප්පතාරර්කළුක්කු අනීතියුම්, කුරිත්ත කූට්ටුරවුච් චංකත්තිර්කු නට්ටමුම් ඒර්ප්පට්ටුළ්ළතු එන්පතෙයුම්

අවර් ඒර්රුක් කොළ්වාරා?

(ඇ) (i) උච්චළවාන කේල්විපපත්තිරත්තුක්කු කට්ටිටම් වළංකප්පටාමෙක්කාන කාරණංකළ් යාවෙ එන්පතෙයුම්;

(ii) තර්පෝතු කට්ටිටම් වළංකප්පට්ටුළ්ළවරිට මිරුන්තු කූට්ටුරවුච් චංකම් පෙර්රුක්කොළ්කින්ර පණත්තොකෙ එව්වළවු එන්පතෙයුම්;

(iii) මේර්පටි, මුරෙකේටු තොටර්පාක මුරෙයාන විචාරණෙයෙ නටත්ති කේල්විප් පත්තිරතාරර්කළුක්කු නීතියෙ නිරෙවේර්රුවතර්කු නටවටික්කෙ මේර්කොළ්ළප්පටුමා එන්පතෙයුම්;

(iv) ආමෙනිල්, අතර්කු එටුක්කුම් කාලම් එව්වළවු එන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ඈ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he state -

(i) whether tenders were called through a paper advertisement published on 19th December 2011 to lease out a two-storey building that belongs to the Nuwara Eliya Multipurpose Co-operative Society;

(ii) if so, the values of the bids that have been submitted; and

(iii) the facts that are taken into consideration and given priority when tenders are called according to the accepted tender procedure?

(b) Will he admit that -

(i) bids with the values of Rs. 320,000/- and Rs. 355,000/- had been submitted to obtain the lease of the aforesaid building;

(ii) the aforesaid building has been given to a person who has not even submitted a tender application;

(iii) an irregularity has taken place when the aforesaid building was leased out; and

(iv) as a result of the aforesaid building being given in an irregular manner the applicants have been caused an injustice and the relevant Co-operative Society has incurred a loss?

(c) Will he also state -

(i) the reason for not giving the building for the highest bid;

(ii) the amount of money charged by the Co-operative Society from the person who have been given the building at present;

(iii) whether action will be taken to conduct a proper investigation into the aforesaid irregularity and cause justice to the tenderers; and

(iv) if so, the period of time that will be taken for that?

(d) If not, why?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

නුවරඑළිය විවිධ සේවා සමූපකාර සමිතිය සම්බන්ධයෙන් මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් ලබා දී ඇති තොරතුරු සහ රේඛීය සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් පවත්වන ලද පරීක්ෂණයේදී ලබා ගත් තොරතුරු අනුව,

(අ) (i) ඔව්.

(ii) ඇමුණුම 1 හි දක්වා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මා එය කියවන්න ඕනෑ ද? [බාධා කිරීමක්] මම එය කියවන්නම්.

නුවරඑළිය විවිධ සේවා සමූපකාර සමිතියට අයත් දෙමහල් ගොඩනැඟිල්ල බදු දීමට ටෙන්ඩර් කැඳවීමේදී ඉදිරිපත් වූ මිල ගණන් රේඛීය සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් සිදු කරන ලද පරීක්ෂණයේ වාර්තාව අනුව, ටෙන්ඩර් පත්‍රිකාවල ඉදිරිපත් කර ඇති මිල ගණන් මසකට සහ අවුරුදු 05කට වශයෙන් ගණනය කිරීමේදී පහත පරිදි වේ.

[බාධා කිරීම්]

ටෙන්ඩර්කරුගේ නම	මසකට කුලිය (රු.)	වර්ෂ 05කට කුලිය (රු.)
ජෙයිනුල් ආබ්දීන් මොහමඩ් නසාර්	105,330/-	6,319,800/-
කේ.ඩී.අසංක නිරෝෂන දයානන්ද	320,000/-	19,200,000/-
රිලයන්ස් ඉන්වෙස්ට්මන්ට් හිනැන්ස්	250,000/-	15,000,000/-
ෆැන් එම්යා බැන්කින් කෝපරේෂන්	202,000/-	12,120,000/-
සීතා ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්	200,000/-	12,000,000/-
සීතා හෝල්ඩින් ප්‍රයිවට් ලිමිටඩ්	225,000/-	13,500,000/-
මොහොමඩ් මියාන් බාවා මියාන්	159,690/-	9,581,400/-

පහත ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් කර ඇති වටිනාකම් මාසයකට ද වර්ෂ 5කට ද යන්න පැහැදිලිව සඳහන් කර නැත.

ටෙන්ඩර්කරුගේ නම	වටිනාකම (රු.)
රංග පැතුම් මයා	303,000/-
ඩී. චම්ලා කස්තුරි ජාගොඩ මිය	355,000/-

(iii) ලියා පදිංචි සමුපකාර සමිති සහ රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

(ආ) (i) ඔව්.

රු. 320,000.00 (රුපියල් තුන්සිය විසිදහස) සහ රු. 355,000.00 (රුපියල් තුන්සිය පනස් පන්දහස) මිල ගණන් සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් වී ඇති අතර, අයදුම්කරුවන් තමන්ගේ නමින් ටෙන්ඩර් පත් ලබාගෙන නොමැති බැවින් එය ටෙන්ඩර් කොන්දේසි උල්ලංඝනය වී ඇති බවට සලකා ටෙන්ඩර් අනුකමිටුව විසින් එම ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කර ඇත.

(ii) ටෙන්ඩර් කැඳවීමේදී ටෙන්ඩර් පතක් ඉදිරිපත් නොකළ, එහෙත් දැනටමත් එම ගොඩනැඟිල්ලේ බදුකරු වෙත තවත් වසර 05කට සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි ලබා දී ඇත.

(iii) මෙම ගොඩනැඟිල්ල බදු දීම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත සිදු වී ඇත.

(iv) ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් අක්‍රමිකතාවක් සිදු වූ බවට ලිඛිතව පැමිණිලි කර නොමැති බව මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් දන්වා ඇත.

වැඩිම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ටෙන්ඩර් පිළිබඳව පැහැදිලි කිරීමකින් තොරව තීරණ ගැනීම නිසා සමිතියට ලැබිය යුතු ආදායමක් අහිමි වී ඇති බව වාර්තා වේ.

(ඇ) (i) මෙම ගොඩනැඟිල්ල පරිහරණය කරමින් සිටි බදුකරු වන රියෙන්සි විතානගේ මහතා රු. 2,000,000.00 (රුපියල් මිලියන දෙකක) වියදමක් දරා මෙම ගොඩනැඟිල්ල අලුත්වැඩියා කිරීම මත හා ඔහු විසින් මසකට රු. 159,690.00ක් (රුපියල් එකසිය පනස්නවදහස් හයසිය අනූවක්) ගෙවීමට කැමැත්ත ප්‍රකාශ කිරීම මත අදාළ ගොඩනැඟිල්ල ඔහුට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත බදු දී ඇති බවට වාර්තා කර ඇත.

(ii) මසකට රු. 159,690.00කි. (රුපියල් එකසිය පනස්නවදහස් හයසිය අනූවකි.)

(iii) බදු ඔප්පුවක් අත්සන් කර ලබා දී ඇති බැවින් අක්‍රමිකතාව නිවැරදි කිරීමට ක්‍රියාමාර්ගයක් ගත නොහැකි බව වාර්තා වී ඇත.

(iv) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. නුවරඑළියේ, හාවාඑළිය, ලේඩි මැක්ලම් පාර යන ලිපිනයේ පදිංචි කස්තුරි ජාගොඩ යන අය රුපියල් තුන්ලක්ෂ පනස්පන්දාහක ටෙන්ඩර් එකක් ඉදිරිපත් කර තිබෙනවා. එහි කුවිතාන්සි අංකය. 11730.

නමුත් ටෙන්ඩරය ලබා දී තිබෙන්නේ රුපියල් 150,000 එකටයි. ගරු ඇමතිතුමනි, එතකොට එතැන අක්‍රමිකතාවක් සිදු වෙලා තිබෙනවා. ඒකට විරුද්ධව ඔබතුමා කටයුතු කරනවාද? එහෙම නැත්නම් මේ සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මෙය පළාත් සභාවට අයිති කටයුත්තක්. මේක අපට වාර්තා කර තිබෙන්නේ ජාගොඩ මහත්මිය.

(ආ) (ii) ප්‍රශ්නයට උත්තර මම දුන්නා, - මන්ත්‍රීතුමා අහගෙන හිටියාද මම දන්නේ නැහැ- "පහත ටෙන්ඩර් පත්‍රිකාවේ සඳහන් කර ඇති වටිනාකම් මාසිකවද, වර්ෂ පහකටද යන්න පැහැදිලිව සඳහන් කර නොමැත" කියලා. ටෙන්ඩර් කොන්දේසි

උල්ලංඝනය කර තිබෙන නිසා තමයි ඔවුන්ව ප්‍රතික්ෂේප වෙලා තිබෙන්නේ. හැබැයි මම විශ්වාස කරනවා, ඔබතුමා මෙය උපදේශක කාරක සභාවේදී මේ ගැන ප්‍රශ්න කළොත් හොඳයි කියලා. එතකොට මට පුළුවන් ඒ පළාතේ කොමසාරිස්තුමාව ගෙන්වන්න. ඒ වාගේම ඔබතුමාට පුළුවන් පළාත් සභාවෙන් මේ ගැන සොයා බලන්න, ඔබතුමාගේ පක්ෂය නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරයකුට මේ ගැන කිව්වා නම්. මෙය විමධ්‍යගත විෂයයක්. ඇත්ත වශයෙන්ම මෙය නැවත වාරයක් ටෙන්ඩර් කළොත් වඩා හොඳයි කියලා මමත් විශ්වාස කරනවා. හැබැයි මේක විමධ්‍යගත වුණු දෙයක්. මේ සම්බන්ධයෙන් ඔබතුමාට දීර්ඝව ප්‍රශ්න කරන්න ඕනෑ නම් උපදේශක කාරක සභාවට කොමසාරිස්තුමා ගෙනැල්ලා ඒ අවස්ථාව ලබා දෙන්න මට පුළුවන්.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය. එම සමිතියට විශාල පාඩුවක් දැන් සිදු වනවා, මේ ටෙන්ඩරය හරියට ක්‍රියාත්මක වුණේ නැති නිසා. ඒ පාඩුව විතරක් රුපියල් ලක්ෂ 123ක් විතර වෙනවා. අක්‍රමිකතාවක් සිදු වෙලා තිබෙන නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, පළාත් සභාවේ අදාළ විෂය භාර අමාත්‍යවරයාට උපදෙස් දෙන්න කියලා මේ සම්බන්ධයෙන් නැවත පරීක්ෂණයක් පවත්වන්න කියලා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ඔව්, මට ඒක කරන්නත් පුළුවන්. මම ඔබතුමාටත් ඉල්ලීමක් කරනවා, -ඔබතුමාගේ පක්ෂය නියෝජනය කරන අය මධ්‍යම පළාතේ පළාත් සභාවේ ඉන්නවා- පළාත් සභා මට්ටමින් මේක විසඳා ගන්න කියලා. මම ඒ ගැන දැනුවත් කරන්නම්. මට ගැටලුවක් නැහැ.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු ඇමතිතුමා,-

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ඒ යථාර්ථය. ඔබතුමා දැන ගන්න ඕනෑ, මේක විමධ්‍යගත දෙයක්. අපට සීමාවක් තිබෙනවා බලතලවලදී. මට පුළුවන්, උපදේශක කාරක සභාවට කොමසාරිස්ව ගෙන්වලා, ඔබතුමාට ප්‍රශ්න කරන්න එතැන ඉඩ සලසා දෙන්න. ඔබතුමාට උපදේශක කාරක සභාවේදී තීන්දුවක් ගන්න පුළුවන්. මෙතැනදී මම දැනුවත් වුණා කියලා වැඩක් නැහැ.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ඇමතිතුමා කියන කථාව හරි. හැබැයි මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ පළාත් සභාවකින් ක්‍රියාත්මක වන්නේ නැත්නම් එය විෂය භාර ඇමතිවරයාට තමයි අපට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් කියන්න පුළුවන් වන්නේ.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

වඩා හොඳට තමයි මම ඔබතුමාට කියන්නේ උපදේශක කාරක සභාවට ඇවිල්ලා මේ ප්‍රශ්නය විසඳා ගන්න කථා කරමු කියලා.

යාපනය දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් : පුරප්පාඩු

யாழ். மாவட்ட கிராம அலுவலர் பிரிவுகள் : வெற்றிடங்கள்

GRAMA NILADHARI DIVISIONS IN JAFFNA DISTRICT : VACANCIES

3172/'12

10.ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා (ගරු ඊ. සරවනපවන් මහතා වෙනුවට)
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன் - மாண்புமிகு ஈ. சரவணபவன் சார்பாக)
(The Hon. M.A. Sumanthiran on behalf of the Hon. E. Saravanapavan)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මරුදන්කේනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායෙහි සේවය කරන ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කරන මෙම ප්‍රදේශවල පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) (i) යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) යාපනය දිස්ත්‍රික්කයේ මේ වන විට, ස්ථිර ග්‍රාම නිලධාරීන් නොමැති වැඩබලන ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පොදු නිර්වාක, උළුනාට්ටලුවල්කළ් අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) මරුතඞ්කේණි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායෙහි සේවය කරන ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කරන මෙම ප්‍රදේශවල පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) (i) යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) යාපනය දිස්ත්‍රික්කයේ මේ වන විට, ස්ථිර ග්‍රාම නිලධාරීන් නොමැති වැඩබලන ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மருதங்கேணி பிரதேச செயலாளர் பிரிவுக்கு உரித்தான கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) இவற்றில் சேவையாற்றுகின்ற கிராம அலுவலர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) மீள்குடியேற்ற நடவடிக்கைகள் மேற்கொள்ளப் படுகின்ற இப்பிரதேசங்களில் காணப்படுகின்ற கிராம அலுவலர் பதவி வெற்றிடங்களை நிரப்ப துரித நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) யாழ்ப்பாண நிர்வாக மாவட்டத்தின் 15 பிரதேச செயலாளர் பிரிவுகளிலும் காணப்படுகின்ற கிராம அலுவலர் பதவி வெற்றிடங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

(ii) யாழ்ப்பாண மாவட்டத்தில் தற்போது காணப்படுகின்ற நிரந்தர கிராம அலுவலர்கள் இல்லாத பதில் கடமையாற்றுகின்ற கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை பிரதேச செயலாளர் பிரிவு மட்டத்தில் தனித்தனியே எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs :

(a) Will he inform this House -

(i) the number of Grama Niladhari Divisions coming under the Maruthankarni Divisional Secretary's Division;

(ii) the number of Grama Niladharis serving in those Divisions; and

(iii) whether speedy action will be taken to fill the Grama Niladhari vacancies exist in these areas where resettlement activities are under way ?

(b) Will he also inform this House -

(i) the number of Grama Niladhari vacancies exist in 15 Divisional Secretary's Divisions of the Jaffna Administrative District; and

(ii) separately, of the number of Grama Niladhari Divisions which do not have a permanent Grama Niladharis and are currently under acting Grama Niladharis in each of the Divisional Secretary's Division in Jaffna District at present ?

(c) If not, why?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Sir, I **table*** the answer for Question No. 10.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) 18

(ii) 09

(iii) Yes. Calling for applications for filling the vacancies of Grama Niladharies existing all over the Island has already been concluded as per the Gazette notification dated 05.10.2012. Accordingly, action will be taken to conduct an open competitive examination and to call the candidates who get qualified at the examination for the interview. Further, recruitments will be made according to the number of vacancies existing in each Divisional Secretary's Division.

(b)

(i)

	Divisional Secretary's Division	Number of approved Grama Niladhari posts	Number of vacancies as at 31.12.2012
1	Delft	6	3
2	Velanai	30	8
3	Kayts	15	4
4	Karainagar	09	4
5	Jaffna	28	11
6	Nallur	40	11
7	Sandilipay	28	8
8	Chankanai	25	7
9	Uduvil	30	11
10	Thellippalai	45	15
11	Kopai	31	10
12	Thennamarachchi	60	18
13	Karaveddy	35	11
14	Point Pedro	35	11
15	Maruthankarni	18	09
	Total	435	141

(ii)

	Divisional Secretary's Division	Number of Grama Niladhari Divisions to which Grama Niladharies have been appointed on acting basis
1	Delft	3
2	Velanai	8
3	Kayts	4
4	Karainagar	4
5	Jaffna	11
6	Nallur	11
7	Sandilipay	8
8	Chankanai	7
9	Uduvil	11
10	Thellippalai	15
11	Kopai	10
12	Thennamarachchi	18
13	Karaveddy	11
14	Point Pedro	11
15	Maruthankarni	09
	Total	141

(d) Not relevant.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

A/HRC/22/L.1 අංක දරන යෝජනාව පිළිබඳ රජයේ ස්ථාවරය
A/HRC/22/L.1 ஆம் இலக்க தீர்மானம் தொடர்பான அரசின் நிலைப்பாடு
GOVERNMENT STANCE ON RESOLUTION NO. A/HRC/22/L.1

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

Mr. Speaker, soon after the Resolution No. A/HRC/22/L.1 on "Promoting Reconciliation and Accountability in Sri Lanka" was adopted, the Minister, the Hon. Mahinda Samarasinghe is reported to have said that the Government of Sri Lanka does not concur with the Resolution or its contents and the reconciliation programme initiated by the Government is at a satisfactory level.

The Government officials' position was that "Sri Lanka is being selected for this kind of attention not because of the gravity of the problem, but for other reasons which have absolutely nothing to do with moral or ethical considerations. They are considerations of a political nature".

Subsequently, the Ambassador to the USA, Mr. Jaliya Wickramasuriya stated in "The Hill's Congress Blog" dated 27th March, 2013, "We agree that while much has been accomplished since 2009, more needs to be done". This has not been contradicted to date and therefore can be accepted as reflecting the official Government position.

The Ambassador also stated, "Commitment is not just to democracy, but also to respecting the Rule of Law and the principles of sovereignty". This is in line with the Resolution which states, "Welcoming and acknowledging the progress made by the Government of Sri Lanka in rebuilding infrastructure, demining, resettling the majority of internally displaced persons, and noting nonetheless that considerable work lies ahead in the areas of justice, reconciliation and resumption of livelihoods, and stressing the importance of the full participation of local populations, including representatives of civil society and minorities, in these efforts". This, in fact, reflects Item 3 of the Resolution which states, "...call upon the Government of Sri Lanka to implement effectively the constructive recommendations made in the Report of the LLRC".

This is a change of policy which amounts to accepting the Resolution No. A/HRC/22/L.1 and signals a desire to broaden the relationship with the United States. We should all welcome this reversal of policy. I request the Government to make a clear statement regarding the changed policy. The media has also commented on this change during the weekend. In particular, will this House be informed:

(i) Where these anticipated talks will take place; whether it will be in Washington DC, Geneva or Colombo?

(ii) Will the Government consult all the concerned stakeholders before proceeding?

(iii) Will the Government indicate the timeframe in which of the recommendation of the LLRC are to be implemented?

(iv) Will the discussions be confined to the US Government or include India, United Kingdom and the other countries who voted to adopt the Resolution?

Thank you.

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)

Mr. Speaker, I am grateful to the Hon. Leader of the Opposition for raising this issue because it gives me the opportunity of clarifying the matters that he has referred to. The whole basis of the question put to me by the Hon. Leader of the Opposition is that there has been a change of Government policy. I wish to state emphatically that that is not the case. The basis on which the Hon. Leader of the Opposition has come to the conclusion that there has been a change in Government policy is the statement attributed to Sri Lanka's Ambassador to the United States of America, Mr. Jaliya Wickramasuriya.

The Hon. Ranil Wickremasinghe quoted a statement attributed to Mr. Wickramasuriya that was on the web dated 27th March, 2013. All that the Ambassador said was this.

I quote :

"We agree that while much has been accomplished sine 2009, more needs to be done."

That is all that the Ambassador said. That is self-evident. The LLRC Report consists of no fewer than about 285 recommendations. A great deal has been accomplished, during the last four years that have elapsed. But, in regard to the wide range of matters encompassed in those recommendations, it is all too obvious that there is more to be done. No one can reasonably expect the entirety of this work to be

[ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා]

completed within the short period which has elapsed since the cessation of hostilities. So, that is what the Ambassador said.

Then, the Hon. Leader of the Opposition went on to quote from the text of the Resolution and he quoted the following words.

I quote:

"Welcoming and acknowledging the progress made by the Government of Sri Lanka in rebuilding infrastructure, demining, and resettling the majority of internally displaced persons, and noting nonetheless that considerable work lies ahead in the areas of justice, reconciliation and the resumption of livelihoods, ..."

That is also obvious. Substantial work has already been done and there is more to be done. This does not mean that there has been any change in Government policy at all. The position of the Government is very clear and I wish to state it explicitly on the Floor of this House. We do not concur with the Resolution and our Representatives in Geneva distanced Sri Lanka very clearly from the content of the Resolution.

Now, I would like to ask the Hon. Leader of the Opposition in a spirit of fairness and objectivity to reflect on the reasons why this country cannot possibly acquiesce in the Resolution that was passed in Geneva a short while ago. There are several reasons. I would like to outline the more important reasons. Mr. Speaker, first and foremost, this Resolution calls for an oral update on Sri Lanka to be presented by the United Nations Commissioner for Human Rights at the 24th Session of the Human Rights Council to be held in September this year. That is not the end of the matter. The Resolution then goes on to require the Commissioner to submit a comprehensive report followed by a discussion at the 25th Session of the Human Rights Council which will be held in March 2014. So, what is the effect of this? Every six months this country is going to figure in the Agenda of the Human Rights Council. That is one of the most important objectives that had been achieved by the Resolution that was adopted a few days ago. Now, the Government of Sri Lanka does not accept this position; it never has, it never will. There is absolutely no change in that position. The reason, Mr. Speaker, is very simple. As we survey the global landscape, can anybody in their senses seriously suggest that Sri Lanka is in the most troubling situation in the world? There is no proportionality in this at all. In an increasingly troubled world where there are so many crises which are crying out for attention, how is it that this country which is living at peace with the violence of 30 years behind us, being specifically targeted in this way? Why this selective treatment? I would like the Hon. Leader of the Opposition to address that issue in a spirit of objectivity. These are not partisan issues. These are not matters that should be involved in the thrust and parry of party politics. On the contrary, these are national issues which have a vital bearing on the well-being and the future of this nation. We cannot possibly accept that position why this sharp and exclusive focus on Sri Lanka is recurring over and over again every six months. That is certainly not acceptable. We will never accept it and there will never be the slightest change in that position, which is emphatically and explicitly adopted by the Government of Sri Lanka.

There is another reason why this Resolution is fundamentally unacceptable. The Resolution, Mr. Speaker, seeks to incorporate the Report of the United Nations High Commissioner for Human Rights. The High Commissioner for Human Rights called for an international investigation in respect of this country, not this month or last month, but one week after the hostilities ended in May, 2009. On what evidence did she call for this international investigation? There was absolutely no material on which she could have based such a call. And then, subsequently, at regular intervals doggedly and persistently, she has repeated that call for an international investigation and her recent report which was presented to the Human Rights Council contains a reaffirmation. She reaffirms her call for an international investigation. Sri Lanka absolutely rejects that claim. So, that is yet another reason and, I am sure, the Hon. Leader of the Opposition would agree that it is a compelling reason why this Resolution cannot gain acceptance by us.

That is not all, Mr. Speaker. The text of the Resolution seeks to incorporate also the Report of the so-called Panel of Experts, which we refer to as the "Darusman Report". The Darusman Report has been categorically rejected by the African Group of Countries and the Organization of Islamic Conference. They have clearly and categorically rejected the Darusman Report. That is not surprising at all. It is a Report which was prepared in a bizarre manner because the people whom the three persons on that Panel spoke to asked for an assurance that their identity would not be disclosed for 20 years. So, Mr. Speaker, these were assertions made in the shadows: nobody knows who these people are; nobody knows the basis on which they made these assertions; there is no filtering process and there is no way of testing the veracity or the reliability of the statements that were made under cover of anonymity. You can say anything at all, Mr. Speaker. So, that is the evidentiary foundation of the Report which was submitted to the Secretary-General by the Panel of Experts.

I also wish to tell the Hon. Leader of the Opposition that this was a Report prepared entirely outside the inter-Governmental process. So, these are among the reasons why large swathes of the globe had no hesitation in rejecting this Report. Nevertheless, that Report has found its way into the text of the Resolution. So, there is absolutely no doubt or equivocality about this; the Government of Sri Lanka does not accept the Resolution

that was adopted in Geneva. There is no change in that position at all.

Therefore, Mr. Speaker, I would beg to disagree with the Hon. Leader of the Opposition when he says that there is a change of policy which amounts to accepting the Resolution No. A/HRC/22/L.1. There is neither a change of policy nor acceptance, expressly or by implication, of the Resolution that is referred to by the Hon. Leader of the Opposition.

We reject this Resolution, Mr. Speaker, because it is perfectly evident to anyone who cares to be objective what the consequences are. This Resolution has been the most powerful catalyst for dissention, discord and even violence. It has divided the Human Rights Council; it has divided the world; it has divided this county and it has also divided some neighbouring countries. It has spilt over into areas like cricket, cinema and its consequences have certainly not been conducive to moving forward in a constructive way, a sensitive and delicate process on which we have embarked. So, against that background, Mr. Speaker, please allow me to respond to the four questions which have been put to me specifically by the Hon. Leader of the Opposition.

The first question he asked me is whether anticipated talks will take place and whether they will be in Washington DC, Geneva or Colombo. There are no talks which are anticipated. Therefore, the question of the venue of those talks does not arise.

The second question is, will the Government consult all the concerned stakeholders before proceeding? Since there is no intention whatsoever of engaging in this exercise, the question of consulting any stakeholders does not arise.

The third question is, will the Government indicate the time frame in which the recommendations of the LLRC are to be implemented. Again, Sir, I would like to tell my Hon. Friend that these are recommendations of different kinds; different clusters of recommendations. They are very different from one another. Some are capable of being implemented in the short term. We have already done that. For example, the recommendations with regard to the resettlement of Internally Displaced Persons, reabsorption of ex-combatants into society after exposure to programmes of vocational training, the demining process, housing, the useful things which have been done with regard to the revival of the economy of the North. Those have been done. But, by their very nature, there are some recommendations which are going to take more time. For example, the recommendations with regard to the land issues, which are incredibly complex and convoluted. Also, issues relating to land, linguistic capability and cultural cross-pollination. These are not matters in respect of which delivery overnight is at all feasible. So, they are obviously going to take longer. In the public domain, information is available with respect to the time frames attaching to the different categories of recommendations. So, that is the position. They are not all recommendations of one type or kind which can be brought within a uniform time frame.

The last question which the Hon. Leader of the Opposition has put to me is, will the discussions be confined to the US Government or include India, the United Kingdom and other countries who voted to adopt the Resolution. There is no multilateral exercise of that nature, which is contemplated at all. We are talking to all these Governments. The Hon. Speaker, a few minutes ago, welcomed the distinguished Parliamentary Delegation from India and it will be my pleasure to meet them as soon as I complete this reply to the Hon. Leader of the Opposition; I will be meeting them in a few minutes. Only last evening, Mr. Speaker, I met with and had comprehensive discussions with a Parliamentary Delegation from Germany consisting of all three of the major political parties there - the CDU, the SPD and the Greens; I spoke to all of them last evening. So, these consultations are continuing, but there is no plan for the kind of multilateral exercise which the Hon Leader of the Opposition referred to because there is no need for that.

So, that, Mr. Speaker, is my reply on behalf of the Government to the questions which the Hon. Leader of the Opposition has been kind enough to put to me.
I thank you, Sir.

II
මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වය
முஸ்லிம் மக்களுக்கு எதிரான வன்முறைகள்
VIOLENCE AGAINST MUSLIM PEOPLE

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

Mr. Speaker, I wish to make a Statement on a most grave issue of national concern relating to the safety, security and well-being of the Muslim people of this Island.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Ah!

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

The Muslim people have been historical inhabitants of this Island and have contributed immensely to its development for many centuries. They have their own unique customs and traditions, food and dress and they are devout adherents of a very great religion. - [*Interruption*.] As the cultural beneficiaries of the Islamic

[ගරු ආර්. සම්පන්දන් මහතා]

Golden Age, which spanned the Eighth to the Thirteenth Centuries, the Muslim people of Sri Lanka have scaled the heights of the whole range of human endeavour from art and music to medicine, law, science, enterprise, academics and so on.

Today, however, the purveyors of hate are unleashing a bitter and spiteful campaign against the Muslim people. I do not need to recount the many acts of mob violence against the Muslim people that have taken place in the last few months. Muslim women who choose to wear the conservative religious dress have been molested and abused by strangers in broad daylight. - [*Interruption*.]

Today the Muslim people are fearful; anxious and hurt by the invective surrounding them.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
What is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, it is the LTTE who chased away 100,000 Muslims from Jaffna and killed the Muslims in the Kattankudi Mosque. These are the proxies of the LTTE. Now, the Hon. Member has become the saviour. This is all nonsense and hypocrisy at the highest level.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
Let me continue, Sir.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Yes, Hon. Leader of the Opposition.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Hon. Speaker, we should allow the Hon. R. Sampanthan to make his statement and the Government to reply. We do not want anything from the Ministers who will not resign from their positions when the Muslims are being massacred.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Hon. Sampanthan, you may carry on with your speech.- [*Interruption*.] Order, please! Listen to the Hon. R. Sampanthan.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
May I, Sir, with your permission, repeat my last sentence? - [*Interruption.*]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකරලා වාඩි වෙන්න. අදාළ ඇමතිවරු ඒවාට උත්තර දෙයි.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
Today, the Muslim people are fearful; anxious and hurt by the invective surrounding them. As fellow minorities, the Tamil people feel the pain, the insecurity, the fear and the anxiety of our Muslim brothers and sisters. - [*Interruption.*]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේලා දෙන්න දැන් වාඩි වෙන්න. කෑ ගහන්නේ නැතුව අහගෙන ඉඳලා කියන දේ තේරුම් ගන්න.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
The relationship between the Tamils and Muslims has always been close - though sometimes strained and to our perpetual shame, though very rarely, even violent and cruel - but nevertheless always close. It must be emphasized that these extremely unfortunate events occurred only during a certain stage of the time of the armed conflict and will not recur.

Our people are too closely intertwined for one to think that it can survive the fate of the other. We are connected to each other just as we are connected to the Sinhalese, the Malays and the Burghers; the bonds of a common language and home that hold us together cannot be broken easily. And so, when our Muslim brothers and sisters are harmed on the street, or attacked by mobs or have their mosques vandalized, we cannot be unconcerned spectators.

Mr. Speaker, as the Leader of the Tamil National Alliance, I urge that the violence against the Muslim people cease now. I urge an end to the repulsive hate speech that we hear everyday. I urge an end to the collusion of the State in this campaign of hate. We are

conscious that the vast majority of the Sinhalese Buddhist people do not condone such actions and that they would very much wish to live in peace and harmony paying due respect to the rights of other peoples. As victims of the worst atrocities, we, the Tamils have demanded that the country and the world heed our call for accountability, justice, genuine reconciliation and the guarantee of non-recurrence.

We wish to emphasize that the enforcement of law and order, and ensuring the safety and security of all peoples including the Muslim people is primarily the responsibility of the State. Recent events have shown that the State has not discharged this responsibility in a manner beyond reproach.

We, therefore, call upon the Government to refrain from acts of partisanship and discharge its constitutional duty to ensure that equal protection of the law be afforded to all peoples in this country including the Muslim people.

Thank you, Sir.

- [*Interruption*.] You have crossed over from this side to that side and you want to survive by selling your people. You are a shameless

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

To keep your position, you want to betray your people. - [*Interruption.*]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙයි. [බාධා කිරීමක්]

ගරු අස්වර් මන්ත්‍රීතුමනි, ගරු අගමැතිතුමා තමුන්නාන්සේ ඔය කියන ඔක්කෝටම පිළිතුරු දෙයි. තමුන්නාන්සේ පොඩ්ඩක් වාඩි වුණොත් හොඳයි.

ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)
අල්-කුර්ආනයේ සූරත් අල්-බකරහ් හතරවන කොටස ආයත් 42හි ප්‍රකාශ කරනවා, "සත්‍ය, අසත්‍ය හා මිශ්‍ර කර අවුල් නොකරව්" කියලා. අල්-කුර්ආනයේ ප්‍රකාශ කර තිබෙනවා, සත්‍ය හා අසත්‍ය දේවල් කළවම් කරලා සමාජයේ අවුලක් ඇති කරන්න එපා කියලා. ඒක අපේ මිත්‍ර සම්පන්දන් මැතිතුමා කරලා තිබෙන බවක් පෙනෙනවා. ඒක ආගමික නායකතුමාට කරපු ලොකු අගෞරවයක්ය කියලායි මම කල්පනා කරන්නේ. ඔබතුමා හරි කොටසකුත් කියනවා. ඒ වාගේම වැරැදි කොටසකුත් කියනවා. ඒ තුළින් මම මුලින් කියපු අවුල මෙතැන ඇති කරලා තිබෙන බව පෙනෙනවා.

ඔබතුමා කියනවා, මෙන්න මෙහෙම:

"The Muslim people have been historical inhabitants of this island, and have contributed immensely to its development for many centuries. They have their own unique customs and traditions; food and dress; and are devout adherents of a very great religion. As the cultural beneficiaries of the Islamic Golden Age which spanned from 8th to the 13th centuries,....."

ඒක නම් වැරැදියි. ඒක ඊට ඉස්සර ඉඳන් සිදු වෙලා තිබෙනවා.

"..... the Muslim people of Sri Lanka have scaled the heights of the whole range of human endeavour - from art and music, to medicine and law, and science, enterprise, academics and so on.

ඔබතුමා තව දුරටත් කියනවා, මෙන්න මෙහෙම:

"The relationship between the Tamils and Muslims has always been close -.."

ඒකට මම දැම්මා,

"The relationship between the Sinhalese, Tamils and Muslims has always been close" කියලා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hear! Hear!

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
තව දුරටත් ඔබතුමා කියනවා, මෙන්න මෙහෙම:

"We are conscious that the vast majority of the Sinhalese Buddhist people do not condone such actions and that they would very much wish to live in peace and harmony paying due respect to the rights of other Peoples."

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු සමහර දේවල් හරි. ඔබතුමා කියපු අනෙක් දේවල් අවුලක් ඇති කරන්න කියාපු ඒවායි. අල්-කුර්ආනයට අනුව ඔබතුමා කරලා තිබෙන්නේ වැරැද්දක් කියන එක මෙයින් පෙන්නුම් කරනවා. හරි ටිකකුත් කියලා වැඩි ප්‍රමාණයක් වැරැදි දේවල් කියලා අවුලක් ඇති කිරීමේ උත්සාහයක යෙදුණු බවක් ඔබතුමාගේ ප්‍රකාශය තුළින් පෙනෙනවා. ඔබතුමා මට එවපු කථාව මුස්ලිම් ජනතාව කියවලා බැලුවොත්, ඒ අය පිළිගනීවි එහි තිබෙන සත්‍ය, අසත්‍යතාව. ඒක මුහම්මද් නබිතුමාට කරන අගෞරවයක්ය කියන එක අපි පිළිගන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, ලංකාවේ බෞද්ධ විහාරස්ථාන 10,349ක් තිබෙනවා. ඒවායේ භාමුදුරුවරු 42,677ක් වැඩ ඉන්නවා. හින්දු ආගමික මධ්‍යස්ථාන 5,248ක් තිබෙනවා. හින්දු පූජකතුමන්ලා 1,113ක් ඉන්නවා. ඉස්ලාම් ආගමික ස්ථාන 1,982ක් තිබෙනවා. පූජකතුමන්ලා 3,964ක් ඉන්නවා. ක්‍රිස්තියානි ආගමික ස්ථාන 1,722ක් තිබෙනවා. පූජකතුමන්ලා 1,174ක් ඉන්නවා. මේ විධියට ආගමික ස්ථාන 19,301ක් තිබෙන අතර භාමුදුරුවරුන් ඇතුළු පූජකවරුන් 48,928ක් ඉන්නවා. ඉතාම සුළු පිරිසක් -හත්අට දෙනෙක්, දහයක්, පහළොවක්- ඇරෙන්න අනෙක් කිසිම කෙනෙක් ශ්‍රී ලංකාව තුළ ආගම් සම්බන්ධව කිසි විධියක වැරැද්දක්වත්, ආගම් අවුල් කිරීමක්වත් කරන්නේ නැහැ. සාමාන්‍ය ජනතාව තුළ මගේ ආගම, මගේ ඉඩම, මගේ දරුවෝ කියන ආත්මාර්ථකාමී ගතියක් තිබෙනවා. ඒ විධියට කල්පනා කරන සාමාන්‍ය ජනතාව වැඩියි.

[ගරු දි.මු. ජයරත්න මහතා]

ඒ අය අවුල් කරන්න; සමහර අය තමන්ගේ තත්ත්වය රැක ගන්න; තමන්ට තැනක් ලබා ගන්න; තමන් උසස් වන්න උත්සාහ කරන බවක් පෙනෙනවා. ඒක සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී සියලු ජාතිකයන් තුළ තිබෙන තත්ත්වයක්. ඒ දේවල් ක්‍රියාත්මක කරන ඒ විධියේ සුළු පිරිසක් ලෝකයේ ඉන්න පුළුවන්.

ටීඑන්ඒ එකේ අයත් එහෙමයි කියලාම මම කියනවා නොවෙයි. ඒ වාගේ තමන්ට තැනක් ලබා ගන්න, තමන් ප්‍රධානියෙක් වන්න, තමන්ට ප්‍රසිද්ධියක් ලබා ගන්න ක්‍රියා කරන තත්ත්වයක් මිනිස් සමාජය තුළ තිබෙනවා. ඒක දේශපාලන ක්ෂේත්‍රයේත් තිබෙනවා. තවත් තැන්වලත් තිබෙනවා. නමුත් ශ්‍රී ලංකාවේ සිටින ආගමික නායකයන්, ආගමික කර්තෘවරුන් ඒ විධියේ තත්ත්වයක් ඇති කරන්නේ නැති බව පෙනෙනවා.

ලංකාවේ බෞද්ධ ආගම උගන්වන පාසල් 10,024ක් තිබෙනවා. ඒ පාසල්වල ළමයි 1,932,582ක් සිටිනවා. ගුරුවරු 120,864ක් ඉන්නවා. හින්දු ආගම උගන්වන පාසල් 1,556ක් තිබෙනවා. ඒ පාසල්වල ළමයි 175,882ක් ඉන්නවා. ගුරුවරු 8,330ක් ඉන්නවා. ඉස්ලාම් ආගම උගන්වන පාසල් 2,453ක් තිබෙනවා. ඒ පාසල්වල ළමයි 211,034ක් ඉන්නවා. ගුරුවරු 12,420ක් ඉන්නවා. ඒ වාගේම ක්‍රිස්තියානි ආගම උගන්වන පාසල් 1,380ක් තිබෙනවා. ඒ පාසල්වල ළමයි 249,467ක් ඉන්නවා. ගුරුවරු 15,745ක් ඉන්නවා.

මෙන්න මේ විධියේ විවිධ ආගම් උගන්වන පාසල් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව තුළ තිබෙන කොට; දරුවෝ සහ ගුරුවරු ලක්ෂ ගණනක් අතර මේ වාගේ හැඟීම් තිබෙනවා නම්, ඇත්තටම මොන විධියේ අරගළයක් ඇති වන්න ඕනෑද? එහෙම දෙයක් ශ්‍රී ලංකාව තුළ මොනම ආකාරයකින්වත් සිද්ධ වෙලා නැහැ. එහෙම වුණාය කියලා කාටවත් කියන්න පුළුවන්කමකුත් නැහැ. බලන්න, ඉගෙන ගන්නා දරුවන් මෙච්චර සංඛ්‍යාවක්, ගුරුවරු මෙච්චර සංඛ්‍යාවක් සතියකට දවසක් එකතු වනවා. නමුත් ඒ වාගේ තත්ත්වයක් ඇති වෙලා නැහැ. එහෙම නම් මේ විධියේ තත්ත්වයක් ඇති කිරීම සඳහා සත්‍ය අවුල් කරලා, අසත්‍ය එකතු කරලා කරුණු ඉදිරිපත් කිරීම ආගමික වශයෙන් හරි නැහැ කියන එකයි මම කියන්නේ.

අනෙක් කාරණය, ලංකාවේ පමණක් නොවෙයි, ලෝකයේම සිටින මුස්ලිම් ජනතාවට ශ්‍රී ලංකාව වෙනුවෙන් අපේ අතිගරු ජනාධිපතිතුමා කොපමණ දේවල් කරලා තිබෙනවාද?

Sir, the message issued by His Excellency President Mahinda Rajapaksa on the 29th of November, 2012 to mark the International Day of Solidarity with the Palestinian people states, "The International Day of Solidarity with the Palestinian people serves to remind the international community that the Palestinians are still denied of their right to self-determination, independence and sovereignty and dispossessed of much of their land. The people of Sri Lanka have steadfastly stood with the Palestinian people in their decade-long struggle for justice and fulfilment of their inalienable rights and will continue to do so".

එතකොට බලන්න, ලංකාවේ මුස්ලිම් ජනතාව පමණක් නොවෙයි, පලස්තීනයේ මුස්ලිම් ජනතාවත් තමන්ට රාජ්‍යයක් නැහැ කියලා දීර්ඝ කාලයක් පුරා සටන් කරනවා. ඒ සටන්වලදී ජනතාව මැරෙනවා. එහෙම වුණාට එවැනි අවස්ථාවල අපේ අතිගරු ජනාධිපතිතුමා ලංකාවේ සිටින මුස්ලිම් ජනතාවට පමණක් නොවෙයි, ලෝකයේම සිටින මුස්ලිම් ජනතාවටත් යහපත් තත්ත්වයක් ලබා දීම සඳහා ක්‍රියා කරලා තිබෙනවා.

ඒ වාගේම පසු ගිය දවස්වල තිබුණු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සමුළුවේදී අපේ නියෝජිතයෝ පලස්තීනයේ මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්න ගැන දීර්ඝ වශයෙන් කථා කරලා තිබෙනවා. තිස් කෝටි අසූ ලක්ෂයක පමණ මුස්ලිම් ජනතාවක් ලෝකයේ ජීවත් වනවා. ලංකාවේ සිටින සියයට අටක විතර මුස්ලිම් ජනතාව ගැන පමණක් නොවෙයි, මුළු ලෝකයේම ජීවත් වන මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව වාගේ පුංචි රටක නායකයෝ ගිහිල්ලා දේශපාලන වශයෙන් ලෝකයටම ප්‍රකාශ කරලා තිබෙනවා. එහෙම නම්, මේ රටේ සිටින සියයට අටක විතර පුංචි පිරිසකට හිරිහැරයක්, කරදරයක් මේ ජාතිය, මේ රට, මේ ජනතාව කරයි කියලා තමුන්නාන්සේලාට හිතන්න පුළුවන්ද?

ඒ වාගේම මේ කාල පරිච්ඡේදයේ පමණක් නොවෙයි, පසු ගිය ඉතිහාසය ගැන කල්පනා කරලා බලන කොට ඉතිහාසයේ බොහෝ අවස්ථාවලදීත් මුස්ලිම් ජනතාවට අපි උදව් කරලා තිබෙනවා.

මුස්ලිම්වරුන් කන්ද උඩරට රාජධානියට සංක්‍රමණය වීමට බලපෑ තවත් ප්‍රබල සාධකයක් වන්නේ සිංහල රජවරුන් විසින් ඔවුන්ට සිය ආගම ඇදහීමට ලබා දුන් නිදහසයි. පෘතුගීසීන්ගේ බලප්‍රදේශය වූ මුහුදුබඩ පළාත්වල සියලු දෙනාට කතෝලික ආගම වැලඳ ගැනීමට වූ බල කිරීම්වලින් මිදී, ඉස්ලාම් ධර්මය නිදහසේ ඇදහීමේ අයිතියට සිංහල රජවරුන් හෝ බෞද්ධ භික්ෂූන් ඇතුළු ආගමික නායකයින් සම්පූර්ණ නිදහස මෙන්ම සහයෝගය ද ලබා දීම මුහුදුබඩ මුස්ලිම්වරුන්ට කන්ද උඩරට ප්‍රදේශයට සංක්‍රමණය වීමට ප්‍රබල හේතුවක් විය. අස්ගිරි විහාර පාර්ශ්වයට අයත් රිදී විහාරයේ විහාරගම් තුළ කුලියට වාසය කළ මුස්ලිම් ජනතාවට ඔවුන්ගේ ආගමික හා අධ්‍යාත්මික පිළිවෙත් ඉටු කර ගැනීම සඳහා පූජකවරයෙකු පත් කර ගැනීමට හා එම පූජකවරයාට පහසුකම් සැලසීමට රිදී විහාරයේ භික්ෂූන් වහන්සේලා ක්‍රියා කර තිබීම කෙතරම් ශ්‍රේෂ්ඨද?

සිංහල රජවරුන්ගේ සිත් දිනා ගැනීම හේතුවෙන් මුස්ලිම් වෙළෙඳුන්ට දිවයිනේ පදිංචි වීම සඳහා රාජ්‍ය අනුග්‍රහයෙන් ඉඩම් ලබා දී තිබේ. ඉස්ලාම් ධර්මය ඇදහීම සඳහා ඔවුන්ට රජු විසින් ලබා දුන් නිදහස මත ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජාතිකයන් පදිංචි ප්‍රදේශවල මුස්ලිම් දේවස්ථාන ඉදිකිරීම ද සිදු වී ඇත. ඒ අනුව මහනුවර කාටු පල්ලිය, මද්දුල් බෝව පල්ලිය, කහටපිටිය පල්ලිය රාජ්‍ය දීමනා යටතේ ලැබූ ඉඩම්වල ඉදි වූ මුස්ලිම් දේවස්ථාන වේ. ඒ විධියට පල්ලි සකස් කිරීම සඳහා බෞද්ධ විහාරවලට අයිති සිද්ධස්ථාන පවා මුස්ලිම් ජනතාවට දී තිබෙනවා. එහෙම නම් බලන්න අද විතරක් නොවෙයි, ශත වර්ෂ ගණනකට උඩදීත් මුස්ලිම් ජනතාව වෙනුවෙන් සිංහල රජවරු, ශ්‍රී ලංකා ජනතාව, බෞද්ධ ජනතාව දී තිබෙන සහයෝගය. ඒ ගැන කල්පනා කර බැලුවාම ඇත අතීතයේ ඉඳලා අද වන තුරුම ඒ තත්ත්වය තිබෙන බව පෙනෙනවා.

මුස්ලිම් ආගම අදහන්න ඉස්සර වෙලා යෝනක කියලා තමයි ඒ ජනතාව හැඳින් වුයේ. යෝනක ජනතාවටත් ලංකාවට ඇවිල්ලා නිදහසේ ඔවුන්ගේ ආගම අදහන්න පුළුවන් වුණා. ඒ වාගේම චීනයේ ඉඳලා යුරෝපය දක්වා තිබෙන "Silk Road" කියන එකේ තිබුණු වෙළෙඳ ව්‍යාපාරය තමයි අරාබිවරුන් කර ගෙන ගියේ. ඊට පස්සේ තමයි මේ ආගම ඇති වුණේ. ඒ ආගම ඇති වෙලා, ඒ වෙළඟෙළඳාම් කර ගෙන ගියත් ලංකාවේදී කවදාකවත් ඔවුන්ට හිරිහැරයක් වුණේ නැහැ. මම කියන්නේ නැහැ පොඩි පොඩි දේවල් ඇති වන්නේ නැහැ කියලා. එහෙම දේවල් ඇති වනවා. දෙදෙනෙකු කථා කරන විට වැරදි දේවල් කියැ වුණොත් ගහ ගන්නවා. මුස්ලිම් කෙනෙකුයි සිංහල කෙනෙකුයි ගහ ගත්තා වන්න පුළුවන්. දෙමළ කෙනෙකුයි මුස්ලිම් කෙනෙකුයි ගහ ගත්තා වන්න පුළුවන්. ඒකට ජාතිවාදි කලබලයක් කියන්න බැහැ. ඒවා සාමාන්‍යයෙන් මනුෂ්‍යයන් අතර තිබෙන තත්ත්වයන්. දැන් බලන්න මුස්ලිම් රටවල ඉන්න මුස්ලිම් ජනතාවට ඇති වෙලා

තිබෙන කරදර. ඉරාකය, ලිබියාව, ඊජිප්තුව, පර්සියාව, පලස්තීනය වාගේ රටවල මුස්ලිම් ජනතාවට ඇති වෙලා තිබෙන කරදරවලින් දින පතා සිය ගණනක් මැරෙනවා.

අපේ අතිගරු ජනාධිපතිතුමා ඒ තත්ත්වයන් නැති කරන්න කොච්චර නම් කටයුතු කර තිබෙනවාද? මුස්ලිම් ජනතාව තමයි ශ්‍රී ලංකාවේ අපට ඉතාම හොඳ මිත්‍රයින් හැටියට ඉන්නේ. එක්සත් ජාතීන්ගේ සම්මේලනයේදී ඇමෙරිකාව අපට විරුද්ධව යෝජනාවක් ගෙන ආ අවස්ථාවේ මුස්ලිම් රටවල් අපට සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා. ඇයි ඒ? ඒ අයගේ හදවත් දන්නවා, ශ්‍රී ලංකාවාසී ජනතාව ඒ අය එක්ක ඉතාම මිත්‍රත්වයෙන් ක්‍රියා කරන බව. ඒ වාගේම සිංහල ජනතාව, දෘවිඩ ජනතාව, මුස්ලිම් ජනතාව කියන මේ තුන් ගොල්ලන්ම බර්ගර්, මැලේ ජනතාව සමහත් එකට ජීවත් වෙනවා කියන එක මුළු ලෝකයම දන්නවා. බොහොම සුළු පිරිසක් පමණක් විරුද්ධතාවන් ඇති කරගෙන ක්‍රියා කරනවා. ඒක මනුෂ්‍ය ගතියක්. ඒක මුළු ලෝකයේම තිබෙන දෙයක්. ඒ නිසා ඒ තත්ත්වයන් ගැන අපි කල්පනා කර බලා කටයුතු කළ යුතුයි. කිසිම ආකාරයකින් මුස්ලිම් ජනතාව, සිංහල ජනතාව සහ දෘවිඩ ජනතාව අතර හැප්පීම් ඇති කරන්න, ඒ අය අතර වෛරය ඇති කරන්න කථා කරන්න හොඳ නැහැ. මේ ගරු සභාව ශ්‍රේෂ්ඨ ස්ථානයක්. මේ ගරු සභාවේ කථා කරන දේවල් ඉතාම වැදගත් වෙන්න ඕනෑ. මේ ගරු සභාව තුළ අසතය ප්‍රකාශ කිරීම තහනම්. ඒ නිසා හැම අවස්ථාවකදීම මේ ජාතීන් පහම - ජාතීන් පහක් ඉන්නවා.- එකමුතුව ජීවත් වෙන්න පුළුවන් වැඩ පිළිවෙළ සකස් කිරීමයි මේ ගරු සභාවේ පරම අධිෂ්ඨානය සහ පරම යුතුකම බවට පත් වෙන්න උවමනා කරන්නේ. ආගම් අනුව, ජාතීන් අනුව, භාෂාවන් අනුව බෙදීම නොවෙයි විය යුත්තේ. නොයෙක් විධියේ අඩු පාඩුකම් තිබෙන්න පුළුවන්. විපක්ෂයේ ඉන්න තමුන්නාන්සේලාත් ආණ්ඩුවේ කොටස්කාරයෝ. කොහොමද තමුන්නාන්සේලා ආණ්ඩුවේ කොටස්කාරයින් වෙන්නේ? ආයතනයක් වුණොත් ඒ ආයතනයේ කටයුතු පරීක්ෂා කරන්න, ඒ ආයතනයේ තිබෙන අඩු පාඩුකම් බලන්න පරීක්ෂකවරු පත් කරනවා. ඒ අය පරීක්ෂා කර බලා කියනවා, "මෙන්න මෙතැන අඩුවක් තිබෙනවා, මෙතැන වරදක් තිබෙනවා මේක හදන්න" කියලා. ඒක තමයි තමුන්නාන්සේලාටත් තිබෙන අයිතිය. පාර්ලිමේන්තුව වුණත් සමාගමක් වාගෙයි. එතකොට මේ ආයතනයේ අඩු පාඩු පෙන්වන්න තමුන්නාන්සේලාට අයිතියක් තිබෙනවා. නමුත් ඒ ආයතනය, සමාගම කඩාකප්පල් කර විනාශ කිරීමේ අයිතියක් තමුන්නාන්සේලාටවත් වෙනත් කාටවත් ඇත්තේ නැහැ. අපි දෙගොල්ලන්ම එකයි ඒ අනුව. විපක්ෂයෙන් බලාපොරොත්තු වන්නේ, අඩු පාඩුකම් පෙන්වා දීලා රජය හරි මාර්ගයේ යැවීමට කටයුතු කිරීමයි. ජාතීන් සියලු දෙනාටම, ආගම් සියල්ලටම, භාෂාවන් සියල්ලටම සාධාරණය ඉටු කිරීමේ වැඩ පිළිවෙළවල් ඉදිරිපත් කිරීමයි අපි දෙගොල්ලන්ගේම වැඩ පිළිවෙළ විය යුත්තේ. ඊර්ෂ්‍යාවෙන්, පළි ගැනීමෙන්, බලය ලබා ගැනීම සඳහා කථා කරනවා නම්, ක්‍රියා කරනවා නම් ඒක සාධාරණ නැහැ. ඒක උසස්, ශ්‍රේෂ්ඨ මනුෂ්‍යත්වයේ ලක්ෂණයක් නොවෙයි. අපි හැම වෙලාවේම බලන්න ඕනෑ සාධාරණය ඉෂ්ට වන ආකාරයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ දීර්ඝ ඉතිහාසය තුළ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ඇතුළු සියලු ජාතීන් ඉතා සහයෝගයෙන්, සහජීවනයෙන් සහ අන්‍යෝන්‍ය අවබෝධයෙන් ජීවත්ව සිටියත් එම සාමුහික සහජීවනය බිඳ දමමින් එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් මහජනයා සතු ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ඉතා කෲර ලෙස උල්ලංඝනය කරමින් වසර 30කට ආසන්න කාලයක් ශ්‍රී ලංකාද්වීපය තුළ යුද වාතාවරණයක් ඇති කරමින් මෙරට සියලු වැසියන්ගේ ජීවනෝපාය මාර්ගයන් විනාශ කළා. වත්මන් රජය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නිවැරදි මාර්ගෝපදේශකත්වය යටතේ නිවැරදිව ක්‍රියා කර වසර 30කට අධික කාලයක් පැවැති එම කුරිරු යුද්ධය අවසන් කරමින් 2009 මැයි මාසයේදී මෙරට සම්පූර්ණ සාමයක් ඇති කිරීමට ක්‍රියා කළා. නැවත එවැනි තත්ත්වයක් රට තුළ ඇති නොවීමට සියලු ජාතීන්ගේ අවශ්‍යතාවන් හොඳින් හඳුනා ගෙන ජාතික ආරක්ෂාව සහ ප්‍රජාතන්ත්‍රවාදී අභිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් අවශ්‍ය පියවර රජය විසින් මේ වන විටත් ගෙන තිබෙනවා. මා හිතන හැටියට තමුන්නාන්සේලාත් එය පිළිගන්නවා ඇති. වසර 30ක එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් තුළ උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ ජීවත් වූ සිංහල, මුස්ලිම් ජනතාව ඔවුන් උපන් ගම්බිම්වලින් ඉතා මිලේච්ඡ සහගත ලෙස පලවා හැරි අතර, 1990 ඔක්තෝබර් මස එල්ටීටීඊ සංවිධානය විසින් උතුරු ප්‍රදේශයේ ජීවත් වූ අසූදහසක පමණ මුස්ලිම් ජනතාව උපන් ගම්බිම්වලින් එලවා දමා දෙමළ නිජබිම සංකල්පය ඇති කිරීමට ක්‍රියා කළා.

මා කියන්නේ නැහැ, අපේ සම්පන්දන් මන්ත්‍රීතුමා එහෙමයි කියලා. නමුත් එදා ඒ කණ්ඩායම් මොකද කළේ? 80,000ක් පමණ මුස්ලිම් ජනතාව ඒ ප්‍රදේශවලින් එලවා දැම්මා. අපි ඒ ගැන කථා කරන්නේ නැත්තේ ඇයි? ඒ 80,000ක් පමණ වූ ජනතාවට ඉන්න තැනක් නැතුව අදත් තැන්-තැන්වල ඉන්නවා; නොයෙක් නොයෙක් රටවලට ගිහින් ඉන්නවා. ඔවුන්ට ඉන්න තැනක් නැහැ. අපි ඒ ගැන කථා කරන්නේ නැත්තේ ඇයි? අවුරුදු දහස් ගණනක් මේ රටේ අයිතිය තිබුණු මුස්ලිම් ජනතාව ඔවුන්ගේ ගම්බිම්වලින් එලවා දැම්මා නම් එය නිවැරැදි ක්‍රියා මාර්ගයක්ද කියලා අපි අහන්න ඕනෑ. විශේෂයෙන් අපේ ද්‍රවිඩ සංවිධාන, දේශපාලන පක්ෂ ඒ සම්බන්ධයෙන් විමසනවා නම් එය ඉතා ම වැදගත් කියා මා කල්පනා කරනවා.

එමෙන්ම එල්ටීටීඊ සංවිධානය විසින් ඉදිරිපත් කළ දෙමළ නිජබිම් සංකල්පය තුළ මුස්ලිම් ජාතින්ගේ අයිතින් පිළිබඳව කිසිම විටකත් කථා නොකළ අතර උතුරු සහ නැඟෙනහිර ප්‍රදේශවල මුස්ලිම් ජනතාවට විරුද්ධව මිලේච්ඡ ප්‍රහාරයන් සිදු කරමින් ඔවුන් පලවා හැරීමට කටයුතු කරන ලදී. මෙහිදී කිසිදු දෙමළ නායකයකු මුස්ලිම් ජාතින්ගේ අයිතින් වෙනුවෙන් කථා නොකළ අතර වත්මන් රජය ගෙන යන සංවර්ධන වැඩ පිළිවෙළ සහ ජාතින් අතර ආගමික සහජීවනය ඇති කිරීමේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කිරීමට දෙමළ ජාතික සන්ධානය ඇතුළු රාජ්‍ය විරෝධී සංවිධාන එල්ටීටීඊ න්‍යාය පත්‍රය තුළ සිටිමින් කිඹුල් කඳුළු හෙළීම කිසි සේත් පිළිගත නොහැක.

රුදුරු ත්‍රස්තවාදයෙන් මිදී රට තුළ දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක් ආරම්භ කරමින්, ලබා ගත් යුද ජයග්‍රහණයන්ද තවදුරටත් පවත්වා ගනිමින් රට වැසියන්ගේ ඉදිරි අභිවෘද්ධිය වෙනුවෙන් නිදහසේ අරුණලු ලබා දීමට ක්‍රියා කරන මේ මොහොතේ නොයෙකුත් දේශපාලන හා පෞද්ගලික පටු අරමුණු පෙරදැරි කොටගෙන ආගම්වාදයේ විෂබීජ මෙම රට තුළ වැපිරීමට නොයෙකුත් කොටස් ක්‍රියා කරන බව නොරහසකි. මෙම තත්ත්වයන් පිළිබඳව දැඩි අවධානයක් මෙම රජය විසින් යොමු කොට ඇති අතර ජාතිවාදයෙන් නොහැකි වූ අරමුණු ආගම්වාදය තුළින් ලබා ගැනීමට ඇතැම් පිරිස් දරන උත්සාහයන් පිළිබඳවද පුළුල් සහ තීක්ෂණ අවබෝධයකින් යුතුව රජය කටයුතු කරනු ලබයි. මෙම ක්‍රියාවලි පසු පස සිටින එල්ටීටීඊ සංවිධානයේ අභිලාෂයන් තවදුරටත් පවත්වා ගනිමින්, දමිළ ජනතාව මෙන්ම සිංහල සහ මුස්ලිම් ජනතාව ඇතුළුව රට තුළ තම දූ දරුවන්ගේ අනාගතය ආලෝකවත් කිරීම සඳහා ඔවුනට නිවැරැදි අධ්‍යාපනය ලබා දෙමින්, රටේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් රටක් වශයෙන් සාමූහිකව ක්‍රියා කිරීමට විරුද්ධව නැඟී සිටින දේශීය සහ විදේශීය බලවේගයන්, නොයෙකුත් පෞද්ගලික වාසි වෙනුවෙන් ම ක්‍රියා කරන ඊනියා රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්වී ගෙන යන ක්‍රියා මාර්ගයන් සම්බන්ධයෙන් මෙම රජය දැඩි අවධානය යොමු කොට ඇත.

පසු ගිය කාල වකවානුව තුළ නොයෙකුත් සංවිධාන ආගමික වශයෙන් යම් යම් සංවේදී කරුණු මුල් කොටගෙන නොයෙක් ආකාරයේ මතවාදයන්, ප්‍රකාශයන් සහ ක්‍රියාකාරකම් කරමින්

[ගරු දි.මු. ජයරත්න මහතා]

පැවැති අතර ආගමික සහජීවනය සඳහා මෙම තත්ත්වයන්ගේ බලපෑම පිළිබඳ දැඩි අවධානයෙන් යුතුව රජය කටයුතු කරනු ලබයි. මෙම කරුණු කාරණා පිළිබඳ සත්‍ය තත්ත්වයන් අවබෝධ කර ගැනීම, යම් යම් කරුණු පිළිබඳ ඇති විසංවාද සමතයකට පත් කර ගැනීම මෙන්ම මෙම සංවිධාන අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇති කොට එම සංවිධානයන්හි දායකත්වය ආගමික සහජීවනය සඳහා මෙන්ම රටේ ඉදිරි සංහිඳියාව පිණිසද දායක කර ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු මේ වන විටත් සම්පාදනය කොට ඇත.

පසු ගිය කාල සීමාව තුළ ආගමික වශයෙන් ඇති වූ අසමගිතාවන් සමථයකට පත් කර ආගමික සහජීවනය ශ්‍රී ලංකා ද්වීපය තුළ නැවත වරක් ස්ථාපනය කිරීම සඳහා මූලික පියවරක් ලෙස මෙලෙස සංවාදයට බඳුන් වූ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා බොදු බල සේනා සංවිධානය ඇතුළු අනෙකුත් බෞද්ධ සංවිධාන 2013 ජනවාරි මස 31 වන දින රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ දී රැස් වන ලද අතර එම සංවිධානවල අදහස් ලබා ගන්නා ලදී. මෙලෙසම 2013 පෙබරවාරි මස 01 වන දින සමස්ත ලංකා ජම්ඉයතුල්ලා උලමා සංවිධානයේ සාමාජිකයන් සමඟද සාකච්ඡා කොට ඔවුන්ගේද අදහස් ලබා ගන්නා ලදී. මෙම සාකච්ඡාවලදී ලබා ගන්නා ලද අදහස් ප්‍රකාරව ඇතැම් කරුණු සඳහා පිළියම් ඉතා කඩිනමින් ගන්නා ලදී. තවද 2013 පෙබරවාරි මස 14 වන දින ආරක්ෂක ලේකම්තුමාගේ සහභාගිත්වයෙන් බෙල්ලන්විල විහාරස්ථානයේදී මෙම තත්ත්වයන් පිළිබඳ මහා සංඝයා සමඟද සාකච්ඡා කරන ලද අතර 2013 පෙබරවාරි මස 15 වන දින බොදු බල සේනා සංවිධානය ඇතුළු අනෙකුත් බෞද්ධ සංවිධාන තම අදහස් ආරක්ෂක ලේකම්තුමා වෙත දන්වන ලදී. මෙලෙසම සමස්ත ලංකා ජම්ඉයතුල්ලා උලමා සංවිධානයේ සාමාජිකයන්ද ආරක්ෂක ලේකම්තුමා 2013 අප්‍රේල් මස 01 දින රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ දී හමු වී ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට ක්‍රියා කරන ලදී. එමෙන්ම 2013 මාර්තු මස 28 වන දින රාත්‍රී පැපිලියාන ෆෑෂන් බග් ආයතනයේ සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් සැකකරුවන් වූ පුද්ගලයින් ඔවුන්ගේ තරාතිරම නොබලා අත් අඩංගුවට ගෙන අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම සඳහා පොලිසිය හා ආරක්ෂක අංශ ඉතා කඩිනමින් කටයුතු කරන ලද අතර එම වැරැදිකරුවන් අධිකරණය වෙත ඉදිරිපත් කළ අවස්ථාවේදී දෙපාර්ශ්වය විසින් ඔවුන්ගේ නීතිඥයින් මාර්ගයෙන් ගරු අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කර ඉහත සිදුවීම් සමථයකට පත් කර ගැනීමට ක්‍රියා කරන ලදී. සමස්තයක් වශයෙන් ජාතීන් අතර අසමගියක් ඇති කරමින් මෙවැනි ක්‍රියා මාර්ග සිදු කරන හා මෙම ක්‍රියා මාර්ග සිදු කිරීමට අනුබල දෙන සියලුම පුද්ගලයින් වෙත මෙයින් ආදර්ශයක් ලබා දී ඇත. තවද මේ වන විටත් ආගමික සහජීවනය ඇති කිරීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක්ද සකස් කොට ඇති බව දන්වනු කැමැත්තෙමි.

මෙම සිද්ධියත් ආගමික වශයෙන් ඇති වුණු එකක් නොවෙයි. ඒ අය අතර තිබෙන පෞද්ගලික විරෝධයක් උඩ ඇති වුණු සිද්ධියක්. අවසානයේදී දෙගොල්ලන්ම සමාදාන වුණා. මෙතැනට ආගමක් ඇතුළු වෙලා නැහැ.

තවද, රජයක් වශයෙන් ජාතික සමගිය, සහජීවනය හා ජාතීන් අතර අන්‍යෝන්‍ය බැඳීම ආරක්ෂා කිරීමට සහ ලබා ගත් නිදහස රැක ගැනීමට දේශීය හා විදේශීය රාජ්‍ය විරෝධී බලවේග විසින් සිදු කරන සියලු ක්‍රියාවන්ට විරුද්ධව ක්‍රියා කරන අතර, ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීමට වේගවත් සංවර්ධනය තුළින් නිදහස් නිවහල් දේශයක් තුළ සෞභාග්‍යමත් අනාගතයක් ඇති කිරීම රජයේ ඒකායන අභිලාෂය බවද ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

රජය විසින් මෙතරම් පියවර රාශියක් ගෙන තිබෙන අවස්ථාවක දෙමළ ජාතික සන්ධානයේ නායකයින් විසින් මුස්ලිම් ජාතිකයින්ගේ අයිතීන් හා ආරක්ෂාව පිළිබඳව ගරු පාර්ලිමේන්තුවේදී කථා කිරීම හාස්‍ය උපදවන කරුණක් වන අතර, එල්ටීටීඊ සංවිධානය ක්‍රියාකාරීව සිටින සමයේ එල්ටීටීඊ සංවිධානය විසින් මුස්ලිම් ජනතාව වෙත සිදු කළ ප්‍රහාර සහ නිරිහැර හමුවේ මුනිවත රැකීම දෙමළ ජාතික සන්ධාන නායකයින්ගේ ක්‍රියාකාරිත්වය මනාව පැහැදිලි වන්නකි.

ඒ නිසා මේ දෙමළ සංවිධාන ඔක්කොම එකතු වෙලා 80,000ක් පමණ වූ මුස්ලිම් ජනතාවට සිදු වෙලා තිබෙන හිරිහැර ගැන නැවත වතාවක් සලකා බලා, ඒ අයගේ අයිතිවාසිකම් ලබා දෙන්න කියලාත් අපි මේ අනුව ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මගේ කථාව තවත් දීර්ඝ වශයෙන් කරන්න තිබෙනවා. ඔබතුමාගෙන් මීට වඩා වෙලාව ලබා ගන්න මම කැමැති නැහැ. ඒ නිසා මගේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථාවේ ඉතිරි කොටස පුස්තකාලයේ තැබීමට මා නියෝග කරනවා.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගරු සම්පන්දන් මන්ත්‍රීතුමාට අප ස්තුතිවන්ත වෙනවා. එක පැත්තකින් හොඳ ඒවායි, නරක ඒවායි දෙකම එතුමා සඳහන් කර තිබෙනවා. ඒ නරක දේවල් අස් කර ගත්තාම ඒ වැඩ පිළිවෙළ අපට හොඳට කරගෙන යන්න පුළුවන් වෙයි කියලා මා කල්පනා කරනවා. මා ඉල්ලා සිටිනවා අපේ වැඩ පිළිවෙළට සහයෝගය දීලා, අපි ඔක්කොම එකතු වෙලා ඒකීය ලංකාවක, එකම ශ්‍රී ලාංකික ජාතියක් හැටියට ක්‍රියා කරමු කියලා.

දකුණු ඉන්දියාවෙත් දැන් වෙනම රාජ්‍යයක් ඉල්ලලා නොයෙක් විධියට ක්‍රියා කරනවා. මම මීට කලිනුත් ප්‍රකාශ කළා, ලංකාව ගැන නොවෙයි දැන් බටහිර ජාතීන්ගේ අවධානය තිබෙන්නේ, ඉන්දියාව ගැනයි කියලා. ඉන්දියාවත් කොටස්වලට කැඩීම තමයි ඒ අයගේ බලාපොරොත්තුව. ස්ටාලින්ගේ කාලයේ රුසියාව රාජ්‍ය 14ක් එකතුව තිබුණේ. දිගටම ඒ විධියට ආවා. අන්තිමේදී මොකද වුණේ? ඒ රාජ්‍ය 14, එක රාජ්‍යයක් බවට පරිවර්තනය වුණා. ඒ වාගේ ඉන්දියාව හැමදාම ඒකීය රාජ්‍යයක් විධියට තිබෙන එකට අප කැමැතියි. මේ රටේ ජනතාව ඊට සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. ඉන්දියාව කොටස්වලට කඩන්න බටහිර ජාතීන් ගන්නා උත්සාහයට ඉඩ දෙන්න එපා. ශ්‍රී ලංකාවේ අප සැවොම එකතු වෙලා ඒක ආරක්ෂා කරමු. ශ්‍රී ලංකාවේ ඒකීයභාවයත් ආරක්ෂා කරමු. ජාතීන් වශයෙන් අපට තිබෙන සියලු අයිතිවාසිකම් ආරක්ෂා කරගෙන ශ්‍රේෂ්ඨ ජනතාවක් හැටියට, උත්තරීතර ජනතාවක් හැටියට ජීවත් වෙන්න ක්‍රියා කරමු. ඒ අනුව ඔබතුමාගේ සහයෝගයත් අතිගරු ජනාධිපතිතුමාටත් අප සියලු දෙනාටත් ලැබෙවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට අමාත්‍යාංශ නිවේදන. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

දෙරණ "වාද පිටිය" වැඩසටහනේදී ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු නිවැරදි කිරීම : ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාතුමාගේ ප්‍රකාශය

தெரண, "வாத பிட்டிய" நிகழ்ச்சியில் மாண்புமிகு ஹரின் பர்னாந்து தெரிவித்த விடயத்தின் திருத்தம்: முதலீட்டு ஊக்குவிப்பு அமைச்சரினது கூற்று

CORRECTION OF FACTS STATED BY HON. HARIN FERNANDO ON DERANA "WADA PITIYA" PROGRAMME : STATEMENT BY MINISTER OF INVESTMENT PROMOTION

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාතුමා)

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Minister of INVESTMENT PROMOTION)

ගරු කථානායකතුමනි, මේ රටේ තිබෙන ආයෝජන හා මේ රටට එන ආයෝජන පිළිබඳව ස්ථාවරභාවයක් ඇති කිරීමට සහ ඒ සම්බන්ධයෙන් යම් යම් මත තිබෙනවා නම් ඒවා නිරවුල් කිරීමට විශේෂයෙන්ම ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාවරයා හැටියට මට වගකීමක් තිබෙනවා.

ආයෝජන සඳහා රටේ සාමකාමී වාතාවරණයක් ඇති මේ අවස්ථාවේ අපේ දේශපාලන මතිමතාන්තරවලට පරිබාහිරව මේ රටේ ආයෝජන සඳහා වූ ඉල්ලීම්වලට සරිලන පරිදි අදහස් ප්‍රකාශ කිරීම සහ ඒවාට සහයෝගය දීම අපේ යුතුකමක් හැටියට මා සලකනවා.

2013.04.02 වැනි දින "දෙරණ" රූපවාහිනී නාලිකාවේ "වාද පිටිය" වැඩසටහනට එක් වෙමින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ පවතින ක්‍රිස්ටල් මාට්න් ආයතනය වසා දමා බංගලිදේශය හා වියට්නාමය යන රටවල ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කර ඇත.

මා ඉතා වගකීමෙන් මෙම ගරු සභාවට ප්‍රකාශ කර සිටින්නේ හොංකොං ආයෝජනයක් වන ක්‍රිස්ටල් මාට්න් සමාගම ශ්‍රී ලංකාව තුළ පවත්වා ගෙන යන ඔවුන්ගේ කිසිදු සමාගමක් වසා දැමීමට තීරණය කර නොමැති බවයි.

ක්‍රිස්ටල් මාට්න් සමාගම 1981 වසරේ පිහිටුවන ලද අතර, මේ වන විට ප්‍රධාන කර්මාන්තශාලා තුනක සේවකයන් 3,000කට පමණ සෘජු රැකියා සපයමින් ඉතාම සාර්ථක ලෙස ඇඟලුම් නිෂ්පාදන කටයුතු කර ගෙන යනු ලබන අතර මෙම සමාගමේ නව කර්මාන්තශාලා දෙකක් වතුපිටිවල හා ගලගෙදර ප්‍රදේශයන්හි අලුතින් ආරම්භ කිරීමටද මේ වන විට කටයුතු සූදානම් කර ඇත.

මෙවැනි සාවද්‍ය ප්‍රකාශ කිරීමෙන් ආයෝජකයන් මෙන්ම සේවකයන් මහත් කණස්සල්ලටත්, කලබලයටත් පත්ව සිටී. මෙම වැඩසටහන විකාශනය වීමත් සමඟම මෙම කර්මාන්තශාලාවල සේවකයන් හා පාලකයන් මහත් ව්‍යාකූල තත්ත්වයකට පත් වී ඇත. සේවකයන් හා නිලධාරීන් පිරිසක් ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය පිළිබඳව මහත් කලබලයට පත් වී පෞද්ගලිකව මා හමු වීමට මගේ අමාත්‍යාංශයටද පැමිණි බව සඳහන් කරමි. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය අනුව මෙම කර්මාන්තශාලා වෙනත් රටකට ගෙන යාමට කටයුතු කර ඇතැයි ඔවුන් දැන ගැනීමත් සමඟ මේ තත්ත්වය ඇති වී ඇත.

ක්‍රිස්ටල් මාට්න් සමාගම 1981 දී කටුනායක ආරම්භ කර ඇති කර්මාන්තශාලාවේ සේවකයින් 390ක් සේවය කරයි. 2001 දී වතුපිටිවල ආරම්භ කළ ශාඛාවේ සේවකයන් 876ක්ද, 2007 දී කටුනායක ආරම්භ කළ ශාඛාවේ සේවකයන් 1,283ක්ද, 2009 දී කටුනායක ආරම්භ කළ අනෙක් ශාඛාවේ සේවකයන් 471ක්ද දැනට සේවය කරයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබත් මමත් දේශපාලන දෙපිළක් නියෝජනය කළත් අප දෙදෙනාගේම නියෝජනයේ පරමාර්ථය මහජන සුබසිද්ධියයි. පටු දේශපාලන අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා මෙවන් ප්‍රකාශ කිරීම දේශපාලන සදාචාරය පිළිබඳ ගැටලුවකි.

ශ්‍රී ලාංකික අපි නව අවුරුදු උදාව ඉහළින් සලකන්නෙමු. අප පමණක් නොවේ අපේ දරුවන් අපටත් වඩා ඉහළින් ඒ වෙනුවෙන් බලා ගෙන සිටී. එවැනි වාතාවරණයක් තුළ 3,000කට අධික සේවකයන්ගේ රැකියා අහිමි වීමක් පිළිබඳව සාවද්‍ය ප්‍රකාශයක් කොට එම ජනතාව පීඩනයට පත් කිරීම තුළින් ලබන තෘප්තිය කුමක් දැයි මා නොදනී. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි ක්‍රිස්ටල් මාට්න් ආයතනය වසා දැමීමට හෝ වෙනත් රටක ප්‍රතිෂ්ඨාපනය කිරීමට හෝ සාකච්ඡා මට්ටමකින්වත් කිසිදු පියවරක් නොගත් බව මම වගකීමෙන් මෙම ගරු සභාවට දන්වා සිටිමි.

ලෝක ආර්ථික අර්බුද තත්ත්වයන් හමුවේ වුවද මෙම කර්මාන්තශාලා ශ්‍රී ලංකාව තුළ සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. මෙරට තුළ ඇති හිතකර ව්‍යාපාරික වාතාවරණයත්, ආයෝජකයන්ට හිතකර රාජ්‍ය ප්‍රතිපත්තිත් නිසා තවදුරටත් ශ්‍රී ලංකාව ආයෝජන සඳහා ආකර්ෂණීය රටක් බවට පත් කර ඇත.

"වාද පිටිය" වැඩසටහන තුළින් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කරුණු නිසා එම කර්මාන්තශාලාවල සේවකයන් රැකියා පිළිබඳ අනිශ්ත බියක් ඇති කර නොගන්නා ලෙසත්, රජය සෑම විටම සේවකයන්ගේ සේවා සුරක්ෂිතභාවය පිළිබඳව විමසිල්ලෙන් සිටින බවත් මෙම ගරු සභාවට ප්‍රකාශ කර සිටිමි.

එසේම මෙම කර්මාන්තශාලා වසා දැමීමේ කිසිදු තත්ත්වයක් නොමැති බවට මාධ්‍ය මඟින් පුළුල් ප්‍රචාරයක් කරන ලෙසට ඉල්ලා සිටිමි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, අද දින දිවා ආහාරය සඳහා ලබා දී ඇති වේලාවත් විවාදය පැවැත්වීම සඳහා ලබා ගැනීමට අවසර ඉල්ලා සිටිනවා. ඒ වාගේම අද දින පක්ෂ නායක රැස්වීමේදී ගන්නා ලද තීරණය අනුව එකතුකළ අගය මත බදු (සංශෝධන), ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන), මුදල්, ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන), බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන), මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) යන පනත් කෙටුම්පත් අද දින විවාදයට ගන්නා බව ගරු සභාවට දැනුම් දීමට කැමැතියි.

ගරු ජෝන් අමරතුංග මහතා

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, විවාදයට සහභාගි වීම දෙපැත්තෙන්ම සිදු වෙනවා. එය දැනුම් දීලා තිබෙනවා. අපි මෙම පනත් කෙටුම්පත් විවාදයට ගැනීමට විරුද්ධ බව එක්සත් ජාතික පක්ෂය ප්‍රධාන විපක්ෂය හැටියට මුලින්ම කියන්නට කැමැතියි. සමහර විට අපි විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්නත් පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකර නිශ්ශබ්ද වන්න. දිවා විවේකයකින් තොරව සභාවේ කටයුතු ඉදිරියට ගෙන යාමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත
சேர் பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்
VALUE ADDED TAX (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 12.06]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා "එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය"යි යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අද මම සභාවේ සාකච්ඡාව සඳහා සහ අනුමැතිය සඳහා එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත, ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත, මුදල් පනත් කෙටුම්පත, ඔටවු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත, බදු අභියාවනා කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත, මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත් කෙටුම්පත සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත යන පනත් කෙටුම්පත් දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.

මම ඒ පනත් කෙටුම්පත් පිළිබඳව එකින් එක විස්තර කරන්නට පෙර පොදු ප්‍රතිපත්තීන් කිහිපයක් මේ සභාවට ඉදිරිපත් කරන්නට කැමැතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේදී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීවරයාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, "ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. SPEAKER *left the Chair, and* THE HON. SHANTHA BANDARA *took the Chair.*

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලසුනට පැමිණීම ගැන අපේ සතුට ප්‍රකාශ කරන්නට කැමැතියි. ඒ වාගේම අද අපි සාකච්ඡා කරන පනත් කෙටුම්පත් මීට පෙර මේ ගරු සභාවේ සාකච්ඡා කරන්නටයි නියමිතව තිබුණේ. නමුත් ඒවායේ ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳව අභියෝගයක් ඉදිරිපත් වුණා. අපේ පාර්ලිමේන්තු ක්‍රමය යටතේ pre-legislative review, ඒ කියන්නේ නීතිය සම්මත කරන්නට පෙර උසාවියේදී අභියෝගයට ලක් කරන්නට පුළුවන්. අද අපි සාකච්ඡා කරන පනත් කෙටුම්පත් හතම සුප්‍රීම් උසාවියේ විනිශ්චය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කිසිසේත්ම පටහැනි නොවන බව පැහැදිලි කරලා තිබෙන බව මා කියන්නට කැමැතියි.

දෙවෙනි කාරණාව මෙයයි. අද අපි සාකච්ඡා කරන සියලුම කාරණා අතිගරු ජනාධිපතිතුමා විසින් 2013 අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී සඳහන් කරන ලද යෝජනායි. ඒවා ක්‍රියාත්මක වෙමින් පවතින අතර, නෛතික අවශ්‍යතාවන් අනුව මෙම සංශෝධන අද මෙම සභාව ඉදිරියට පමුණුවලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා තුන් වන කාරණය මතක් කරන්නට කැමතියි. අපි මේ ගරු සභාවේ බොහෝ විට සාකච්ඡා කරන්නේ බදු පැනවීම සහ බදු සහන ලබා දීම ගැනයි. රජයේ එක්තරා ශක්තියක් -අයිවාසිකමක්- තමයි විශේෂයෙන්ම තමන්ගේ සංවර්ධන අරමුණු මුල් කර ගෙන ඒ ඒ බදු පැන වීම සහ සහන ලබා දීම ක්‍රියාත්මක කිරීම. ඒ මාර්ගයෙන් තමයි බොහෝ විට අපේ ආර්ථිකය සංවර්ධන ඉලක්කයන් කරා යොමු කරන්නේ. සංශෝධිත බදු ක්‍රමය තුළ වෙන්න පුළුවන්. ආයෝජන ගෙනැවිත් කළමනාකරණය ගෙනැවිත් අපි බලාපොරොත්තු වන ඉසව්වලට ආර්ථිකය ගෙන යනවා. ඒ නිසා මෙවා අප ඒ පසුබිමින් බලන්න ඕනෑ. රජය අය වැය ලේඛනයේ යම් යම් ඉලක්ක සඳහන් කළා; යම් යම් ප්‍රතිපත්ති හෙළිදරවු කළා. ඒ ප්‍රතිපත්ති ක්‍රියාවට නැඟීමේදී ප්‍රබල අවියක් තමයි අද ඉදිරිපත් කරන සංශෝධන.

නිදසුනක් වශයෙන් එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත ගනිමු. ඒකෙන් අප බලාපොරොත්තු වන්නේ අපේ රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය නොයෙක් විධියේ භාණ්ඩවලට ගහන බද්ද අඩු කරන්නයි. එතකොට ඒ භාණ්ඩ ඉස්සර තිබුණාට වඩා ලාභයට වෙළෙඳ පොළේ අලෙවි කිරීමේ තත්ත්වයක් ඇති කරන්න පුළුවන්. නිදසුනක් වශයෙන් බවුසර්,

බුල්ඩෝසර්, ග්‍රේඩර්ස්, ලෙවලර්ස්, එක්ස්කැවේටර්ස්, ට්‍රැක්ටර්, බලශක්ති පිරිමසින බල්බ යනාදී වශයෙන් වඩාත් ජනප්‍රිය කළ යුතු යැයි, බහුලව ප්‍රයෝජනයට ගත යුතු යැයි අප කල්පනා කරන ඒ කොටස්වලට කිසියම් සහනයක් ලබා දෙන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජයේ එක ඉලක්කයක් තමයි මේ රටේ ශක්තිමත් ඉදි කිරීමේ කර්මාන්තයක් - construction industry එකක් - ඇති කිරීම. මේක අපේ රජයේ සුවිශේෂ ශක්තියක් -ජයග්‍රහණයක්- කියලා කියන්න පුළුවන්. මේ රටේ ඉදි කිරීමේ කර්මාන්තය අද ඉහළ මට්ටමකට ඇවිත් තිබෙනවා. අනි දැවැන්තයෝ හය හත් දෙනෙක් ඉන්නවා. මුලින්ම ඒ අය යම් යම් විදේශ කොම්පැනිවලට subcontracts ඇති කර ගත්තා. සමහරු ප්‍රශ්න කළා, විදේශ ණය ගන්නවා; විදේශ වැඩ කරනවා; මොකක්ද ඉදිරි පියවර කියා. දැන් අපේ ඉදි කිරීමේ කර්මාන්තය දිහා බැලුවාම ඒකට හොඳ පිළිතුරක් දෙන්න පුළුවන්. ඒ විධියට පටන් ගත් අය ඒ ගොල්ලන්ට අවශ්‍ය උපකරණ ගෙනැවිත්, අවශ්‍ය කළමනාකරණ ශක්තිය ලබා ගෙන අද බොහෝ විට විදේශ subcontractorsලා හැටියට නොවෙයි, ස්වතන්ත්‍රව වැඩ ආරම්භ කරන්න භාරගන්න පුළුවන් උදවිය හැටියට අද නිර්මාණය වෙලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි තවත් පියවරක් ගෙන තිබෙනවා. එනම් ඒ ගොල්ලන්ට උපකරණ ගන්න අවස්ථාව සලසනවා. දීර්ඝ කාලයක් තිස්සේ ඒ ගොල්ලන්ගේ තිබෙන උපකරණ ප්‍රමාණය - plant - වැඩි වෙලා තිබෙනවා. අපේ අලුත් අදහස තමයි හුඟක් දුරට විදේශ ආධාර සහිතව කරන ව්‍යාපෘතිවලට අමතරව දේශීය බැංකු හරහා, දේශීය ඉතිරිකිරීම් හරහා මේ ව්‍යාපාර -මාර්ග ව්‍යාපාර වෙන්න පුළුවන්. පසු ගිය සතිය ඇතුළත ජල ප්‍රවාහන ව්‍යාපාර සම්බන්ධව අපි සාකච්ඡා කළා. -අපේ ප්‍රබල දේශීය ඉදි කිරීමේ කර්මාන්තයට ලබා දෙන්න. ඒ නිසා එන වර්ෂ කිහිපය තුළ අපේ යටිතල පහසුකම් ක්ෂේත්‍රයේ වෙනසක් අපිට බලාපොරොත්තු වෙන්න පුළුවන්.

දේශීය කර්මාන්තකරුවන්, දේශීය බැංකු, දේශීය නිර්මාණශීලි ඉංජිනේරුවරුන් එකතු කරලා අපට ඊළඟ පියවරට යන්න පුළුවන්. අපි ඉන්දියාව දිහා බැලුවොත්, චීනය දිහා බැලුවොත් හුඟක් දුරට අද ඒ රටවල මේ යටිතල පහසුකම් සැපයීමේ කර්මාන්තය තිබෙනවා. අද ලෝකයේ හැම තැනම ඒ අය යනවා. අපේ ඉදි කිරීමේ කර්මාන්තය මේ රටේම තියා ගන්න කිසිම හේතුවක් නැහැ. අපටත් පිට රටවල ගිහිල්ලා වැඩ කරන්න පුළුවන්. දැන් සමහර අය මාලදිවයිනේ කොන්ත්‍රාත් ගන්නවා. අනාගතයේදී අප්‍රිකාව වාගේ රටවල කොන්ත්‍රාත් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. අද විශාල වශයෙන් චීන, ඉන්දියානු කොම්පැනි අප්‍රිකාවේ ඉදි කිරීම් ක්ෂේත්‍රයට යනවා. අනාගතයේදී අපිත් ඒ විකාශය බලාපොරොත්තු වෙනවා. ඒක තමයි සංවර්ධනය කියන්නේ. ඒක තමයි ක්‍රමානුකූලව රට ඉදිරියට ගෙන යනවා කියන්නේ. අපි දීර්ඝ කාලයක් ණය ක්‍රම යටතේ යටිතල පහසුකම් ලබා ගත්තා. නිදසුනක් වශයෙන් ගන්න, අද අපි මේ කථා කරන සභා ගර්භය. මගේ හිතවත් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා දන්නවා, මිටිෂුයි කොම්පැනියෙන් මේ ගොඩනැගිල්ල හැදුව බව. එදා ඒ ගොල්ලන්ගේ උප කොන්ත්‍රාත්කරුවන් හැටියට වැඩ කළ අය අද ලොකු ඉදි කිරීම් කොම්පැනි බවට පත් වෙලා වෙනත් වැඩ ආරම්භ කර තිබෙනවා. මේ සැලසුම් තුළින් අපි ඒ වාගේ ඉදිරියක් දකිනවා. ඒ එකක්.

ගරු කථානායකතුමනි, ඒ වාගේම බොහෝ දුරට අපට වෙන වෙන දේවල් කරන්නත් පුළුවන් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ රටේ පාරිසරික අංශයෙන් හුඟක් දුරට කථා කළ දෙයක් තමයි කැළි කසළ කළමනාකරණය; පාලනය. අද බලන්නකෝ, කොළඹ. තමුන්නාන්සේලා දන්නවා, මීට අවුරුදු හතරකට, පහකට ඉස්සරවෙලා -2005ට 2006ට ඉස්සරවෙලා- කොළඹ තිබුණේ අපායක් විධියට. කැළි කසළ හරියට කළමනාකරණය කළේ නැහැ. හැම තැනම ගොඩ ගහලා. නගරයේ පිරිසිදු භාවයක් තිබුණේ නැහැ. ඉතාම දුර්වල තත්ත්වයක් තිබුණේ. නමුත් අද කොහොමද? මේවා ගැන අපි කල්පනා කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් රූපවාහිනියේ එහෙම කථා කරන කොට මේ කරුණු ඉදිරිපත් කරනවා මම දැක්කා. ඒ වෙනස අපට දකින්න තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය උපකරණ අපි ගෙන්වලා තිබෙන්නේ කොහොමද? ඒ අවශ්‍ය විධියට බදු ක්‍රමය සකස් කිරීම තුළින්. ඒ නිසා අපි මෙහිදී බලාපොරොත්තු වන්නේ ගරු ජනාධිපතිතුමා අය වැයෙන් ඉදිරිපත් කළ පරිදි පිළිගත් ක්ෂේත්‍රවලට වැටි බද්දෙන් සහනයක් ලබා දීමටයි.

ඊළඟට ජාතිය ගොඩ නැඟීමේ බදුවලින් විශේෂයෙන්ම විදුලිය ලබා ගැනීමේ විකල්ප ව්‍යාපෘතිවලට සහනය දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි ඒවාට සහන දෙන්න ඕනෑ. සූර්ය බලශක්ති උත්පාදනය සඳහා වන සූර්ය ඒකක, සූර්ය බලශක්ති ගෘහස්ථ පද්ධති වාගේ රට වෙනත් ඉසව්වකට ගෙන යන්න පුළුවන් වන, ප්‍රතිපත්ති වෙනසකට අවශ්‍ය බදු සංශෝධන තමයි අපි ඇති කරන්නට බලාපොරොත්තු වන්නේ. මේ එක එක ක්ෂේත්‍රවලට අදාළ අපේ අරමුණු තිබෙනවා. එකක් තමයි, මැණික් ආනයනය සහ අපනයනය. ඒ සඳහා ඇති බදු වෙනස් කර තිබෙනවා. ඒ වාගේම කැළි කසළවලින් වෙනත් බලශක්ති ඇති කිරීමට අවශ්‍ය උපකරණ ගෙන්වනවා නම් ඒවාටත් සහන ලබා දෙනවා. ඒ කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම අනුව තමයි ඒවා කෙරෙන්නේ. බොහෝ දුරට ඒවා නිර්මාණය කළ විද්‍යාඥයන්ගේ ඉල්ලීම්. ඒ අනුව අපි ඒ බදු ක්‍රම සකස් කර තිබෙනවා.

ඊළඟට, ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත් කෙටුම්පත ගැන අවධානය යොමු කරන්නට අද බොහෝ දුරට ඉඩ තිබෙන බව මම දන්නවා. නමුත් මෙතැනදී අපි කරන්නේ ඒ පොදු ප්‍රශ්නය ගැන සාකච්ඡා කිරීම නොවෙයි. බුකිකරුවන්ගේ ව්‍යාපාරය සඳහා පනවන ලද ඒ බද්ද වසරකට රුපියල් මිලියන 2 දක්වා වැඩි කළ යුතුයි කියලා ගරු ජනාධිපතිතුමාගේ අය වැය යෝජනාවල තිබුණා. ඒක ක්‍රියාත්මක කිරීමට තමයි අප මේ සංශෝධනය අරගෙන එන්නේ.

ඒ වාගේම, රූජිනෝ කියන සූදු ව්‍යාපාරයට අදාළ බද්ද වසරකට රුපියල් මිලියන 100 දක්වා වැඩි කිරීමට යෝජනා කර තිබෙනවා. අද හුඟක් තැන්වල එය පැකිරිලා යනවා. මේ ගැනත් මා මතක් කර දෙන්න ඕනෑ. සමහර අය බොහෝ විට ප්‍රශ්න අහනවා, ඇයි මේ සහනය දෙන්නේ කියලා. මේ සූදුව තුළින් බදු එක්කාසු කර ගැනීම පහසු වීම සඳහා, නොයෙක් වක්‍ර බදු වෙනුවට ඒ අයගේ මාසික සම්පූර්ණ එක්කාසු කිරීම් මත flat fee එකක් - සියයට 5ක බද්දක්- පැනවීමට යෝජනා කර තිබෙනවා. ඒ අයට වැඩියෙන් ආදායම එනවා නම් රජයට ලැබෙන කොටසත් ඒ හා අනුපාතිකව වැඩි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල සමහර අය කියන කථාවක් තිබෙනවා. මා හිතනවා එය මේ සාකච්ඡාවේදීත් ඉදිරිපත් වෙන්න ඉඩ තිබෙනවා කියලා. සමහර අය කියනවා මම දැක්කා -විශේෂයෙන් මාධ්‍ය තුළින්- මේ ව්‍යාපාරය ව්‍යාප්ත වෙන්න ඉඩ තිබෙනවා කියලා. ඒ ගැන විවේචන කරනවා. අපේ අදහස නම් ඇත්ත වශයෙන් ඒ ව්‍යාපාරය දැන් මේ රටේ තිබෙනවා කියන එකයි. දැනට මේ රටේ කැසිනෝ තිබෙනවා. අන්න ඒවා සම්බන්ධයෙන් මේ කටයුතු කරනවා මිසක්, විශාල පෙරළියක් කරන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. ඒවා දැනට තිබෙන ව්‍යාපාර. අද ලෝකයේ සංචාරක ව්‍යාපාරයේ තිබෙන ප්‍රධානම අංගයක් තමයි ඔට්ටු ඇල්ලීම. ඒකට 'ඔට්ටු ඇල්ලීමේ කලාව' කියන්නත් පුළුවන්. 'ඔට්ටු ඇල්ලීමේ විද්‍යාව' කියන්න පුළුවන්. 'ඔට්ටු ඇල්ලීමේ කර්මාන්තය' කියන්න පුළුවන්. ඒ මොන වචනය පාවිච්චි කළත් විශාල වෙනසක් තිබෙනවා. ඇමෙරිකාවේ ලාස්

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

වේගාස් කියන නගරය නැහලා ආවේ කොහොමද? මගේ හිතේ එය තිබෙන්නේ නෙවාඩා කියන ප්‍රදේශයේයි. නෙවාඩා කියන ප්‍රදේශය නේද ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්, ගරු ඇමතිතුමා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නෙවාඩා කියන ප්‍රදේශය තනිකර කාන්තාරයක්. කාන්තාරයක් වූ ඒ ප්‍රදේශය නැහලා ආවේ ඒ ව්‍යාපාරය නිසායි. ඉන්දියාව, ඇමෙරිකාව ආදි හැම පැත්තෙන්ම එතැනට යනවා. අපේ සමහර අය නම් ගිහිල්ලාත් ඇති. Golden Sands යනාදි ප්‍රදේශ තිබෙනවා. අද ඒවා ආසියාවට ඇවිල්ලා. අද හැමදෙනාම කියනවා, ඇමෙරිකාවේ තිබුණු ඒ තරගයෙන් ඒ ගොල්ලෝ පරාද වෙගෙන යනවා කියලා. අද ඒ ව්‍යාපාරය මැකාවූවලට එනවා. අද ඒ ව්‍යාපාරය ආසියාවේ රටවලට එනවා. විශේෂයෙන් අප කථා කරන්න ඕනෑ සිංගප්පූරුව ගැන. සිංගප්පූරුව මේ ගැන හොඳ අධ්‍යයනයක් කළා. සිංගප්පූරුව තමයි අද ආසියාවේ විශාල වශයෙන්, මා හිතන විධියට වර්ෂයකට මිලියන 30ක් විතර සංචාරකයන් අද්දවා ගන්නා රට. මුලදී -ලීක් වාන් යූ මහතාගේ මුල් යුගයේ- ඒ අය ඉතාම දැඩි ප්‍රතිපත්තියක හිටියේ. මටත් අවුරුද්දක් සිංගප්පූරුවේ ජීවත් වෙන්න අවස්ථාව ලැබුණා. ඒ රටේ තිබුණේ ඉතාම දැඩි නීති. ඒ අයට පෙනුණා, මේ විධියට තීරණයක් අරගෙන සකස් වුණේ නැත්නම් වෙනත් රටවල් ඒ අය අභිභවා යනවා කියලා. සිංගප්පූරුවට වැඩියෙන්ම සංචාරකයන් එන්නේ කොහෙන්ද? මැලේසියාවෙන් එනවා. ඉන්දුනීසියාවෙන් එනවා. ඒ රටවල ඒ සූදු ව්‍යාපාර ඔක්කෝම තහනම් කරලා. මැලේසියාවේ ජෙන්ටින් හයිලන්ඩ් කියන කලාපයේ හැර අනෙක් තැන්වල ඒ ව්‍යාපාරවලට ඉඩ දෙන්නේ නැහැ. ඉන්දුනීසියාවෙත් ඉස්සර ඉඩ දුන්නේ නැහැ. නමුත් දැන් ඉඩ දෙනවා. ඉතින්, ඒ රටවල අය ඔක්කෝම එන්න පටන් ගත්තා සිංගප්පූරුවට. මේ ව්‍යාපාරය කොහේ හරි තහනම් කිරීමක් කළත්, ඒ ව්‍යාපාරය නැති වන්නේ නැහැ. ඒ අය වෙනත් තැනකට යනවා.

මා මතක් කරන්න කැමැතියි, අපේ රටට දැන් හොඳ අවස්ථාවක් ඇවිත් තිබෙන බව. මොකද, අපේ අර ඉස්සර තිබුණු මානසිකත්වය දැන් දකුණු ඉන්දියාවට ගිහිල්ලා. ඒ අය මහා ලක්ෂ්මී රේස් පිටිටනිය වසා දමන්න කියනවා. හරියට Puritan සංස්කෘතිය වාගෙයි. මා දන්නේ නැහැ ඒකට කියන වචන. ඒ Puritan සංස්කෘතිය දැන් එහේට යනවා. එතකොට විශාල කොටසක් ඒ රටවල් අත හැර යනවා; ඒ රටවලට යන්නේ නැහැ. සංචාරක ව්‍යාපාරය දියුණු කරනවා කියන කොට අපි හොඳට කල්පනාකාරීව, සාධක ඇතිව, විද්‍යාත්මකව බලන්න ඕනෑ. නිකම් ඕනෑ ඕනෑ විධියට අපේ හැඟීම් අවුස්සා ගෙන සංවර්ධනයක් කරන්න බැහැ. අපි ඒ ගැන හොඳ පණිවුඩයක් දෙන්න ඕනෑ. හැඟීම් ඇවිස්සීම තුළ, මාධ්‍යයට නොයෙක් විධියේ ප්‍රකාශ කිරීම තුතළ රටක් දියුණු කරන්න බැහැ. ඒ නිසා අද අලුත් විධියට කල්පනා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර්ථ ශාස්ත්‍රය පිළිබඳ දක්ෂ අපේ ගරු මන්ත්‍රීවරුන්ට මා විශේෂයෙන් මතක් කරන්න කැමැතියි, මේ සැරේ "The Economist" සඟරාවේ ඉතාම හොඳ විග්‍රහයක් තිබෙන බව. නොබෙල් තෑග්ග දිනපු, ග්‍රීක හෝ සයිප්‍රස් - මට හරියට මතක නැහැ- අර්ථ ශාස්ත්‍රඥයෙක් අලුත් අදහසක් ඉදිරිපත් කරලා තිබෙනවා.

අපේ රට වාගේ රටවල සංචාරක ව්‍යාපාරය හෙළා දකින්නේ ඇයි? පිට රටවල වැඩ කරන අයට අලුත්ම ආර්ථික ක්‍රමයක් ගොඩ නැඟෙනවා. හුඟක් දුරට මා පිළිගන්නවා, අපේ exports මත, -පිට රටවලට යවන අපේ භාණ්ඩ මත; අපනයනය මත- තමයි ආර්ථිකය ගොඩ නඟන්නට පුළුවන් වන්නේ කියන එක. ඒ සඳහා අප පුළුවන් තරම් මහන්සි ගන්නට ඕනෑ. නමුත් ඒ මතම ආර්ථිකයක සාර්ථක අසාර්ථකභාවය මනින්ට බැහැයි කියන එක අර්ථශාස්ත්‍රය පිළිබඳව නොබෙල් ත්‍යාගය දිනූ ඒ අර්ථශාස්ත්‍රඥයා ප්‍රකාශ කර තිබෙනවා. අප මේ විවිධ මත ගැන සාකච්ඡා කරන්නට ඕනෑ. විවිධ ආකෘති; විවිධ models අද ලෝකයේ ඇති වෙනවා. එම නිසා මේ බදු ක්‍රමය තුළින්, ඒ වාගේම වෙනත් ක්‍රමවලින් අපේ ආර්ථික සංවර්ධනයට මේ රටේ ආදායම වැඩි කර ගන්නට, මේ රටේ ධනය වැඩි කර ගන්නට අප පුළුවන් තරම් කීන්දු ගන්නට ඕනෑ.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, අර්ථශාස්ත්‍රඥයෙක් හැටියට ඔබතුමා මේවා ගැන බොහෝ වෙලාවට පෙන්වන්නට පුළුවන්. සමහරවිට මේවා ජනප්‍රිය ඒවා නොවන්නට පුළුවන්. දීර්ඝ කාලීන සැලැස්මක් අනුව කරන ඒවා වන්නට පුළුවන්. නමුත් අප ඒ පිළිබඳව තීරණ ගන්නට ඕනෑ. මේ බදු ක්‍රමය අප සකස් කර ගන්නට ඕනෑ, ඉලක්ක කර ගන්නට ඕනෑ, අපේ ඒ ගමන යන්නට. ඒ දර්ශනයෙන් තමයි අද සභ හෙට සාකච්ඡා කරන්නට අප මේ පනත් කෙටුම්පත් මේ ගරු සභාව ඉදිරියට ගෙනැවිත් තිබෙන්නේ. මේ හැම සංශෝධනයකටම හේතුවක් තිබෙනවා. මේවා අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කළ අපේ බදු සභ ආදායම් යෝජනා. ඒ අනුව මේ පනත් කෙටුම්පත් මේ ගරු සභාවේ සාකච්ඡා කර ඒවා සම්මත කර ගැනීමට ඔබ සැමගේ සහයෝගය ලබා දේවිය කියා අප බලාපොරොත්තු වෙනවා.

ඕනෑම ප්‍රශ්නයකට අපට උත්තර දෙන්නට පුළුවන්. එම නිසා ආරම්භයේ සිටම 'අප මෙකට විරුද්ධයි' කියන මතයේ ඉන්නේ නැතිව අප මේ පනත් කෙටුම්පත් ගැන හොඳට සාකච්ඡා කර බලමු. කොහොමටත් අප මේක ඉදිරියට ගෙන යනවා. ඒ සඳහා තමුන්නාන්සේලාගේත් සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි ගරු ඇමතිතුමනි. ඊළඟට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

[අ.භා. 12.26]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය වෙනුවෙන් මට මේ ලැබී තිබෙන අවස්ථාවේදී ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන්, මේ රටේ තිබෙන අවශ්‍යතාවලට අනුව අදහස් දක්වන්නට මා බලාපොරොත්තු වෙනවා. අපේ හිටපු මුදල් ඇමතිවරයෙක් වූ ඒ වාගේම ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් වූ, අද මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට කටයුතු කරන ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, මා ඔබතුමාට කියන්නේ ඔබතුමාගේ මේ කාර්ය භාරය ලෙහෙසි පහසු කාර්ය භාරයක් නොවන බවයි. You have a bad brief. That is why you are not speaking through your own heart but addressing issues that have been told to you.

ඒක තමයි සැබෑ තත්ත්වය. මොකද, වඩාත් දක්ෂතාවක් තිබෙන පුද්ගලයකු හැටියට ඔබතුමාට ආණ්ඩුව කරන පාපකර්මවලට උත්තර දෙන්නට සිදු වෙලා තිබෙනවා.

වරලත් ගණකාධිකාරීවරයෙක් හැටියට මා ඔබතුමාගෙන් මෙහොතකට ඉල්ලන්නේ මේ රටේ ශේෂ පත්‍රය දෙස බලන ලෙසයි. Look at the balance sheet of the country. රටේ ශේෂ පත්‍රය භයංකාරී තත්ත්වයකයි තිබෙන්නේ. ඒකට වෙනින් අර්ථ කථනයක් දෙන්නට අවශ්‍යතාවක් නැහැ. ජනතාව අද ජීවත්වන රටාව තුළින්ම මෙයට හොඳ උදාහරණයක් ගන්නට අවශ්‍ය වෙනවා. අද මේ ආණ්ඩුව නොයෙක් නොයෙක් වචන පාවිච්චි කරනවා. සුභ අනාගතයක් කියනවා. මහින්ද චින්තනය කියනවා. මහින්ද චින්තනයේ ආගමනය කියනවා. ඊට පස්සේ මතට තිත කියනවා. ආශ්චර්යවත් රටක් කියනවා. දැන් අලුත් වචනයක් තිබෙනවා, "විකසිත අනාගතයක්" කියා.

අද මා පත්තර කියවන කොට, "දිනමිණ" පත්තරයේ තිබෙනවා මා දැක්කා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු සිය දෙනෙක් හිර ගෙදරය කියා. අද ළමයෙකුට පාරේ ඉන්න බැහැ. කාන්තාවකට ගෙදර ඉන්න බැහැ. අද ජනතාවට ලැබෙන මාසික පඩිය සුමානයකට ජීවත් වන්නට මදි. විකසිත අනාගතයක් නොවෙයි, හිරිකිත අනාගතයක් තමයි මේ ආණ්ඩුව ඇති කර තිබෙන්නේ. මා ඒ සම්බන්ධයෙන් වැඩිය කථා කරන්නට කැමැති නැහැ. ඔබතුමන්ලාගේ මතට තිතක් තියා තිබෙන ආණ්ඩුවක් තුළින් සිදු වන දෙයයි මා මේ පෙන්වන්නේ.

2013 මාර්තු 24 වන දා "The Sunday Times" පත්තරයේ - "Business Times" කොටසෙන් මා quote කරනවා;

"More females get high in Sri Lanka"

ඒ කියන්නේ අද කාන්තාවන් බීමට යොමු වෙලා තිබෙනවාය කියන එක. මේ කියන්නේ යුද්ධයට පසුව මහින්ද චින්තනය තුළින් ඇති වී තිබෙන තත්ත්වයයි. මතට තිතක් තියලා අද කාන්තාවන්ට පොවන යුගයකට ගෙනැවිත් තිබෙනවා. අප නොවෙයි මෙය කියන්නේ. කොළඹ විශ්වවිද්‍යාලයේ සශ්‍රීකා අබේසිංහයි මෙහෙම කියන්නේ. මම ඔබතුමාගේ අවසරය පරිදි එම කොටස **සභාගත*** කරනවා.

ඊටත් වැඩිය භයානක තත්ත්වයක් දැන් ඇති වී තිබෙනවා. හැම එකකටම හම්බන්තොට යන යුගයක් දැන් තිබෙන්නේ. 2013 අප්‍රේල් 04 වැනිදා "මව්බිම - රුහුණ" පත්තරේ මෙසේ පළ කර තිබෙනවා.

" මෙවර පහේ ශිෂ්‍යත්වය ලියූ දකුණේ 39,000න් 34,000ක් ෆේල්."

ඒ කොටස ඇතුළත් පත්තර වාර්තාව මා **සභාගත*** කරනවා.

මේ මහින්ද චින්තනය බාර ගත්තාට පසුව -2005ට පස්සේ- ඇතිවෙලා තිබෙන තත්ත්වයක්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමනි, ඒ සංඛ්‍යා ලේඛනය හැන්සාඩ් වාර්තාවේ මුද්‍රණය කරන්න එපා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, ඒක ඔබතුමාගේ - [බාධා කිරීමක්] මම දන්නවා, ඔබතුමා -

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ඔබතුමා වග කිව යුතු මන්ත්‍රීවරයෙකු ලෙස -

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මේක මගේ පත්තරයක් නොවෙයි. මේ "මව්බිම- රුහුණ" පත්තරේ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඇමතිතුමා, මේ "මව්බිම - රුහුණ" පත්තරේ. මේ තොරතුර මා 7.00 සිට 8.00 දක්වා රූපවාහිනිය බලන කොට ලබා ගත් තොරතුරක්. රූපවාහිනියෙයි සිරසේයි -ඒ දෙකේම- විකාශය වූ අවස්ථාවකදී ලබා ගත් තොරතුරක්. මම මේ කොටස සභාගත කළා. ඔබතුමා මේ ගැන කියන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ඔබතුමා මේක සභාගත කරලා, ඔබතුමාගේ කථාවේ තිබෙන වැදගත්කම අඩු කර ගන්න එපා කියලායි මම කියන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මම මෙහි වග කීම බාර ගන්නවා. මේක ඔබතුමන්ලාගේ පත්තරයක්. මේ කරුණ සඳහන් වෙලා තිබෙන්නේ "මව්බිම- රුහුණ" පත්තරේයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
හරියට වාර්තාව කියවන්න කෝ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මම නැවත මේ කාරණය කියනවා. මේ "මව්බිම- රුහුණ" පත්තරේ. මේ පත්තරේ පළ කර තිබෙනවා, "මෙවර පහේ ශිෂ්‍යත්වය ලියූ දකුණේ 39,000න් 34,000ක් ෆේල්." කියලා. අවශ්‍ය නම් මේ වාර්තාව ලියාපු කෙනාගේ නමත් කියන්නම්. ඒ තමයි කුමාර මහත්තයා. මේ පත්තරය ප්‍රසිද්ධ පත්තරයක් ලෙස කටයුතු කරනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
තමුන්නාන්සේ දැන් -

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, මම නොවෙයි නේ මෙය කියන්නේ.

**** ප්‍රස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
තමුන්නාන්සේගේ කථාවට හොඳයි කියලා වගකීමකින් සභාගත කරනවා නම්-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම සභාගත කරනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම මේ සංඛ්‍යා ලේඛන බලලා ඇවිත් උත්තරයක් දෙන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේක සිරසෙත් රූපවාහිනියෙත් ප්‍රකාශ වෙලා තිබෙන දෙයක්. ඔබතුමා කියන්න මේ ගැන. මෙය සිදු වෙලා තිබෙන්නේ ඔබතුමාගේ කාලය තුළ නොවෙයි. මෙය ඊට ඉස්සෙල්ලා සිදු වී තිබෙන දෙයක්. හැබැයි ඔබතුමා මේවා ගැන සොයා බලන්න. විපක්ෂයක් වශයෙන් අපි මේවා පෙන්වා දෙනවා. ඒ, රටේ ආර්ථිකයේ තත්ත්වය පෙන්වන්නයි. දැන් කාරණා දෙකක් තිබෙනවා. එක කාරණයක් තමයි කාන්තාවන් වැඩි දෙනෙක් දැන් බොන්න පටන් අරගෙන තිබෙනවාය කියන කාරණය. ඒක කියන්නේත් මම නොවෙයි, "The Sunday Times" පත්තරේ. මම කියන්නේ නැහැ, කොළඹින් කියලා. අද හම්බන්තොට වරායක් තිබෙනවා; Mattala Rajapaksa International Airport එක තිබෙනවා;. අපේ Sooriyawewa Cricket Stadium එක තිබෙනවා; Foreign investments ගෙනෙන අලුත් exhibitions එහාට ගෙනෙන්න අවස්ථා ඇති කරලා තිබෙනවා. හම්බන්තොටට ලොකු තැනක් ඇති කරලා තිබෙනවා. මාගම් පුර තට්ටු 14ක ලොකු බිල්ඩින් එකක් හදලා තිබෙනවා. මාස 25ට නැව් 25ක් එන තැනක තට්ටු 14ක බිල්ඩිමක් හදලා තිබෙනවා. මම මේ පෙන්වා දෙන්නේ අද රටේ මොන වාගේ සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවාද කියන එකයි. ඒ විතරක් නොවෙයි, ඇමතිතුමනි, ඔබතුමන්ලාගේම කැබිනට් මණ්ඩලයේ සිටින ඇමතිවරයෙක් වන ඩිව් ගුණසේකර ඇමතිතුමා මොනවාද කියන්නේ? රජයේ බැංකු බංකොලොත්ලු. එතුමා තවත් කාරණයක් කියනවා. මේ එතුමාගේම වචනයෙන් කියන දෙයක්. අපි කිව්වොත් ඒක සයනයිඩ් නේ. ඩිව් ගුණසේකර ඇමතිතුමා කියනවා, වත්මන් පාලන කාලයේ දී ඇති නැති පරතරය ශීඝ්‍රයෙන් වැඩි වුණාය කියලා. මේ කාරණය කියන්නේ රවි කරුණානායක නොවෙයි, ඩිව් ගුණසේකර ඇමතිතුමායි. ඒ වාගේම ඔබතුමන්ලාගේම ඇමතිවරයෙක් වන විමල් වීරවංශ කියනවා, මුදල් අමාත්‍යාංශයේ ආර්ථික ඝාතකයෙක් ඉන්නවාය කියලා. ඒක කියලා දැන් මාසයක් වෙනවා. මම හිතන්නේ එතුමාට කොන්දක් නැහැ, මුදල් ඇමති තමයි මේක කරලා තිබෙන්නේ කියලා කියන්න. ඒ නිසා ඒක පී.බී. ජයසුන්දරට ඉලක්ක කරනවා. අග්‍රවිනිශ්චයකාරවරිය පැය 24කින් අයින් කරපු විමල් වීරවංශගේ කොමිටිය තුළින් ඇයි මේ පී.බී. ජයසුන්දර වාගේ පොඩි එක් කෙනෙක් තත්පර පහෙන් යවන්නේ නැත්තේ? එහෙම කියාගෙන ඉන්නේ, ඒකේ බර එක් කෙනෙකුට පටවලා රටේ ගෙනි යන ආර්ථික ක්‍රමයේ වැරැද්දක් තිබෙනවාය කියලා පෙන්වන්නද? ඒ වාගේම තමයි කුමාර වෙල්ගම ඇමතිතුමා. එතුමා බොහොම විචෘතව කථා කරන ඇමතිවරයෙක්. අද රටේ දූෂණය ගැන එතුමා හොඳ විග්‍රහයක් කරනවා. එතුමාගේ වැඩක් කර ගන්න ගියාලු. මෙහෙම කියන්නේ මම නොවෙයි, එතුමායි. එතුමාගේ වැඩක් කර ගන්න, එතුමාට යම් දෙයක් ඉක්මන් කර ගන්න එතුමාත් පගාවක් දුන්නාය කිව්වා. බොහොම ප්‍රසිද්ධියේ ආඩම්බරයෙන් ඒ කාරණය කිව්වා. එතුමා මේ රටේ කැබිනට් ඇමතිවරයෙක්. මම ආර්ථිකය ගැන විශ්ලේෂණයක් දෙන්න ඉස්සෙල්ලායි මේ කාරණයට එන්නේ. ඔන්න සැබෑ තත්ත්වය. අද අපේ රට සයිප්‍රස් වාගේ රටකට ගමන් කරනවාද කියන ප්‍රශ්නයක් මතු වෙනවා. අද සයිප්‍රසයටත් වඩා භයානක තත්ත්වයක් ලංකාවේ ඇති වෙලා ඉවරයි. යම් විධියකට සයිප්‍රස් රට EU එක ඇතුළේ සිටින නිසා යම් යම් දේවල් වසන් කරන්න උත්සාහ කළත් ටිකක් භයානකකාරී තත්ත්වයන් හෙළිදරවු වෙනවා.

අද අපේ මහ බැංකුවේ අධිපති රහපෑමක්, බොරුවක් කරන්නේ. අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට විස්තර දීලා තිබෙනවා. මොනවාද ඒ සම්බන්ධයෙන් කරන්නේ? මෙන්න මේ වාගේ විජ්ජා කරන නිසා තමයි අද රටේ ආර්ථිකය භයානකකාරී තත්ත්වයක් තුළින් ගෙන යන බව අප කියන්නේ. ඉතින් අපි අහනවා, අද මේ සම්බන්ධයෙන් මොනවාද කරන්න තිබෙන්නේ කියලා.

අද ඉදිරිපත් කර තිබෙනවා, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය සහ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සමීක්ෂණ තුළින්, එක පවුලකට ජීවත් වන්න මාසයකට රුපියල් 47,800ක් වියදමක් යනවා කියලා ඇමතිතුමනි. මේක එක්සත් ජාතික පක්ෂයෙන්, සිරිකොතෙන් ඉදිරිපත් කරන දෙයක් නොවෙයි. ඔබතුමන්ලාගේම ආණ්ඩුව තුළින්, ඉතාමත් වැදගත් දෙපාර්තමේන්තුවක් වන Census and Statistics Department එක සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය තුළින් කරන ලද සමීක්ෂණයක් අනුවයි එය ඉදිරිපත් කර තිබෙන්නේ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමනි.

මම නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අහනවා, අද පවුල් කීයකට මාසිකව රුපියල් 48,000ක ආදායමක් උපයන්න පුළුවන්ද කියලා. මෙහෙම වැය වනවා කියලා කියන්නේ රජයේ ආයතනයක්. මම නැවත එය කියනවා. "පවුලක මාසික වියදම රුපියල් 47,748යි. අලුත්ම සමීක්ෂණයකින් හෙළි වෙයි." මේ සමීක්ෂණය කරන ලද්දේ 2013 පෙබරවාරි මාසයේ. මෙය ප්‍රතික්ෂේප කරලා නැහැ. අද ඒකපුද්ගල ආදායම රුපියල් 26,000ක් තිබෙනවා කියලා ඔබතුමන්ලා ඒ තුළින් අසත්‍යයකුත් කියා ගෙන යනවා. ඒ කියන්නේ එක් කෙනෙක් රුපියල් කෝටි 10ක් එක පැත්තකින් හොයද්දී, තවත් කෙනෙක් තවත් පැත්තකින් රුපියල් දහදාහක් හෙව්වාම ඒ ආදායම් දෙක එකතු කරලා, දෙකෙන් බෙදලා" ඔන්න මේක තමයි ඒ දෙන්නා ගේ ඒකපුද්ගල ආදායම" කියලා හරි යන්නේ නැහැ.

මෙන්න මේකයි සැබෑ තත්ත්වය. අද මාසයක පඩිය සුමානයකට ඇතිද? වැඩිය ඕනෑ නැහැ. කථානායකතුමා - අපේ ගරු චමල් රාජපක්ෂ මැතිතුමා- ඒ වාගේ තනතුරක් දරමින් "මට මගේ පඩියෙන් ජීවත් වෙන්න බැරිව ඉන්දැද්දී අනෙක් අය කොහොම ජීවත් වනවාද?" කියලා ප්‍රශ්නයක් අහනවා. එතුමා නේ කියන්නේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න ඕනෑයි කියලා. ඒක අපිත් අනුමත කරනවා. අන්න ඒ කියන තත්ත්වයෙන් අද රටේ ආර්ථිකය කොතරම් අවදානම් තත්ත්වයක තිබෙනවාද කියන එක මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා.

අද මම සැබෑ ආර්ථික තත්ත්වය පෙන්නන්න හදනවා. අද මේ කථා කරන මොහොතේ සම්පූර්ණ පොදු ණය - public debt - බිලියන 7,250ක් වෙනවා. මේක 2005 ජනවාරි මාසයේ 01 වන දා තිබුණේ බිලියන 1,780කට. මේ වාගේ හතර ගුණයක් මේ අවුරුදු හත තුළ වැඩි වෙලා තිබෙනවා. රටේ තිබෙන සම්පත් ඒ වාගේ වැඩි වෙලා තිබෙනවාද?ණය බරතාව වැඩි වෙලා තිබෙනවා. නමුත් අද ජනතාවගේ ආදායම ඒ වාගේ වැඩි වෙලා නැහැ. එක පැත්තකින් රුපියල් 100ක වැඩක් කරන්න රුපියල් 1,000ක් ගන්න අවස්ථාවකදී, රුපියල් 900ක් කාගේ කොයි

සාක්කුවකටද යන්නේ කියලා දෙයියෝ තමයි දන්නේ. නමුත් ඒ වාගේ තත්ත්වයක් රටේ ඇති කර ගෙන රටේ ණය බරතාවක් තමයි ඇති කර ගෙන තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි අද ගෙවුම් ශේෂ හිඟයත්. එය කොතරම් අමාරු තත්ත්වයක තිබෙනවාද? පසු ගිය පෙබරවාරි මාසයේ ගෙවුම් ශේෂ හිඟය US Dollars මිලියන 725යි. මේ වාගේ බැලුවොත් අවුරුද්දක් අවසාන වෙන කොට මේ ගෙවුම් ශේෂ හිඟය US Dollars බිලියන 09ක් විතර වනවා. කොයි ආකාරයෙන්ද මේවා සොයා ගන්නේ?

තෙල් මිල අඩු වෙලා තිබෙන අවස්ථාවක මේ තත්ත්වය තිබෙන්නේ. නැවත brent crude oil එක ඩොලර් 125කට 130කට විතර ගියොත් අපේ balance of payments deficit will go up to about Rs. 13 billion. Are you in a capacity to overcome this problem? No, you are not overcoming it.

පුදුමයි, අපේ වාණිජ මණ්ඩල සභාපතිවරු දැන් නින්දෙන් නැඟිටලා කථා කරනවා. මම අගය කරනවා, ඇලෝයි ජයවර්ධන මැතිතුමාව. එතුමා කියනවා, සියයට 25කට වැඩිය සුළු හා මධ්‍ය පරිමාණයේ කොම්පැනි අද බංකොලොත් කියලා. මෙන්න රටේ තිබෙන සැබෑ ආර්ථික තත්ත්වය. මේවා අපි නොවෙයි කියන්නේ; කියන්නේ රටේ වාණිජ මණ්ඩලය නියෝජනය කරන පුද්ගලයන්. Twenty five per cent of small and medium exporters are bankrupt. Where is the growth in the country?

සියයට 11.5කට රටේ දළ දේශීය නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ එය සියයට 15ට 16ට තිබුණු රටක්. ඔබතුමන්ලා කියනවා නේ, අපේ කාලයේ ණය බරතාව සියයට 95කට තිබුණු එක දැන් සියයට 85කට අඩුවෙලා කියලා.අපේ කාලයේ සියයට 16.5ට තිබුණු දළ දේශීය නිෂ්පාදනය දැන් ඇයි 11.5කට අඩුවෙලා තිබෙන්නේ? කොහාටද මේවා ගිහිල්ලා තිබෙන්නේ? Is there tax evasion? Are earnings being duplicated or falsified? මෙන්න මේවාට උත්තර අපට ලබා දීම තමයි අවශ්‍ය වන්නේ.

අද ගොවි විශ්‍රාම වැටුප් අවුරුදු දෙකකින් ගෙවලා නැහැ. සල්ලි එකතු කරලා තිබෙනවා, මම හිතන අන්දමට රුපියල් කෝටි 300ක්. මේ ගොවීන්ට විශ්‍රාම වැටුප ගෙවලා නැහැ.

ඒ වාගේම තමයි අද පාර්ලිමේන්තුවේ කථා කරන්නෙත්. ඉදිරිපත් කරනවා, supplementary estimates.

අද ඉදිරිපත් කර තිබෙනවා රුපියල් කෝටි 2,200ක පරිපූරක ඇස්තමේන්තුවක්. ඒකෙන් ප්‍රාග්ධන වියදම්වලට වෙන් කළ රුපියල් කෝටි 700ක් කපා හැරලා ඒක පුනරාවර්තන වියදම් වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. ඔබතුමන්ලා පාර්ලිමේන්තුවෙන් අවසරය ඉල්ලනවා ගෙවුම් ශේෂය තුළින්, ඒ කියන්නේ අය වැය ඇස්තමේන්තුවල Head 240 තුළින් කෝටි 2,200ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැය කරන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා උත්තරයක් දුන්නා අපේ අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමාට, ඒකෙන් බහුතරයක් එවැනි දේවල්වලට වියදම් කරනවා කියලා. රටේ මූල්‍ය විනයක් අනුව කටයුතු කරන්නේ මෙහෙමද? ඔබතුමන්ලාගේ ක්‍රියා අනුව අප මේවා කිව්වාම, අපි දේශ ද්‍රෝහියෝ. කරන ඔබතුමන්ලා දේශ ප්‍රේමියෝ. මා කිව්වා වාගේ අද රටේ තිබෙන සැබෑ ප්‍රශ්නය ශේෂ පත්‍රය - balance sheet එක - බැලුවා නම් පැහැදිලියි.

අප මීට අවුරුදු පහකට ඉස්සෙල්ලා මේ රටේ උසාවියට ගියා හෙජින් සූදුවට විරුද්ධව. අපි කිව්වා, "හෙජින් ගිවිසුම සහ හෙජින් සූදුව රටට අහිතකර ක්‍රියාවක්. ඒක නවත්වන්න" කියලා. සුප්‍රීම් උසාවිය ඒක නැවැත්වූවා. තෙල් මිල වැඩි කරන එකත් අඩු කරලා, හෙජින් සූදුවත් නවත්වලා අන්තිමට ආණ්ඩුව මොනවාද කිව්වේ? මේක අපේ අතේ තිබෙන්නේ. අපි ඒක දිනලා දෙන්නම් කියලා. එදා අවදානම් තත්ත්වයේ තිබ්බේ කෝටි 11,800යි. අද? මා දැක්කා ඊයේ පත්තරේ තිබෙනවා, ඔබතුමන්ලා කැබිනට් මණ්ඩලයෙන් අනුමැතියක් ලබා ගත් බව US Dollars 60 million ගෙවන්න එක බැංකුවකට. මොකටද ඒ? අපි එදා උසාවි ගිහිල්ලා නවත්වන්න කිව්ව ක්‍රියාව ඔබතුමන්ලා එදා පිළිගත්තා නම් අද ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. ඒක ගෙවන්නේ ඔබතුමන්ලාද? කැබිනට් මණ්ඩලයද? ජනාධිපතිතුමාද? නැහැ. භූමිතෙල් ලීටරයට බදු ගෙවන, කිරි පැකට් එකෙන් සල්ලි උපයන, පරිප්පු ටික ආනයනය කරන කොට බදු ගෙවන අහිංසක ජනතාවගේ බදු මුදල් අරගෙන තමයි ඔබතුමන්ලා නාස්ති කරන්නේ; දූෂණය කරන්නේ; වංචා කරන්නේ. ඒවා අපි කිව්වාම අපි දේශ ද්‍රෝහියෝ. ඒවා කරන ඔබතුමන්ලා දේශ ප්‍රේමියෝ.

අධිවේගී මාර්ගයත් ඒ වාගේම තමයි. එදා අපි ප්‍රශ්න ඇහුවාම ඔබතුමන්ලා කිව්වා, මේ සංවර්ධනයට අපි විරුද්ධයි කියලා. නමුත් අපි කිව්වා, "අපි බොහොම සතුටුයි. නමුත් මූල්‍ය පාලනයක් අනුව ඒක කරන්න" කියලා. අද හෙළිදරවු කරලා තිබෙනවා අධිවේගී මාර්ගයට ණය සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් කෝටි 650ක් ගෙවන කොට ලැබී තිබෙන ආදායම කෝටි 100ක් බව. කෝටි 550ක් වූ ඒ අලාභය දරන්න වෙලා තිබෙන්නේ කාටද කියන ප්‍රශ්නය ඔබතුමන්ලාගේම මන්ත්‍රීවරු ඉදිරිපත් කරලා තිබෙනවා.

ඊළඟට මා මතක් කරනවා පසු ගිය සුමානය තුළ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන. අල ගොවියා සටනකට යොමු වෙලා තිබෙනවා. වී ගොවියා වස බොනවා. එළවලු ගොවියා අනාථ වෙලා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්ගේ ජීවිතයටත් තර්ජනයක් ඇති වෙලා තිබෙනවාය කියන අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආසනයේ වගා කරපු වී සතොසෙන් ගන්නේ නැහැ කියලා ගොවියෝ ප්‍රකාශ කර තිබෙනවා. මහ රෝහලේ ඖෂධ නැහැ කියලා කියනවා. ඒ වාගේ පසුබිමක් තුළ තමයි අද ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා රටේ ආර්ථිකය සංවර්ධනය කරන්න ඕනෑය කියන්නේ. කවුද එපාය කියන්නේ. අපි එදා ඉඳන්ම කිව්වේ රටේ ආර්ථිකයත් එක්ක සෙල්ලම් කරන්න එපා කියලා.

අද ජී.එල්. පීරිස් අමාත්‍යතුමා, විපක්ෂ නායකතුමාට උත්තර දෙන කොට කිව්වේ මහ ලොකු බණක්. අපි ඇහුවේ, ඔබතුමන්ලාගේ ක්‍රියා තුළින් ලෝකයට පෙන්වලා තිබෙන දේවල්. ලෝකය කිව්වාම උගත් පාඩම් හා ප්‍රතිසංධානය පිළිබඳ වූ ජනාධිපති කොමිසමේ වාර්තාවට අනුකූලව කටයුතු කරන්න කියලා, දැන් ඔබතුමන්ලාම කියනවා කරන්න බැහැ කියලා. ඒ යෝජනා ක්‍රියාත්මක කරනවා කියලා බැන් කී මූන්ට කිව්වේ කවුද? මහින්ද රාජපක්ෂ. 2012 මාර්තු මාසයේ 21 වැනිදා යස්වාන් සිං හිටපු විදේශ ඇමතිට කිව්වේ කවුද, අපි දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එහා යනවා කියලා? මහින්ද රාජපක්ෂයි. අපි නොවෙයි. LLRC එක අනුමත කළේ ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලයෙන් පත් කළ අනු කමිටුවෙන්. අපි හිතුවේ යෝජනා තිබෙන්නේ 258යි කියලා. අද ජී.එල්. පීරිස් ඇමතිතුමා කිව්වා, යෝජනා 285ක් තිබෙනවා කියලා. ඒකෙන් බහුතරයක් ක්‍රියාත්මක කරලා තිබෙනවා ලු. ක්‍රියාත්මක කරලා තිබෙනවා නම් මොනවාද කියා කියන්න. LLRC එක ඔබතුමන්ලාගේම කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරලා තිබෙනවා නම්, දැන් ඒක ක්‍රියාත්මක කරන්න කියලා අනෙක් අය ඇඟිලි ගහනවා නම් ඒක කාගේ වැරැද්දක්ද? ඔබතුමන්ලා ඒක ක්‍රියාත්මක නොකළ නිසායි ඒ ප්‍රශ්නය ඇති වුණේ. මේ වාගේ දේවල් කරන කොට රටේ ආර්ථිකයත් එක්ක අද සෙල්ලම් කර තිබෙන බව පෙනෙනවා. අද උසාවියකට යන්න බැහැ. උසාවියකට ගියොත් පැමිණිලිකරු තමයි වැරදිකරු බවට පත් වන්නේ. අද complaint එකක් කරන්න

[ගරු රවි කරුණානායක මහතා]

පොලීසියට ගියොත් පොලීසිය කටයුතු කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ private company එක වාගේ. එතැන වැරදිකරුවෝ නිවැරදිකරුවෝ බවට පත් කරනවා. උසාවි යන්නේ නැතුව සමථ මණ්ඩලයකට ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. මේ වාගේ දේවල් නිසා අද ආයෝජකයෝ මේ රටට ගෙන්වා ගන්න පුළුවන්ද? අද මේ රටේ ශ්‍රී ලාංකිකයන්ට ආයෝජනය කරන්න බැරි තත්ත්වයකට පත් කර තිබෙනවා. මා මතක් කරන්න අවශ්‍යයි ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා මේ කෙටි කාලය තුළ මහන්සි වෙලා වැඩ කළ බව. එතුමා ක්‍රිස්ටල් මාටින් සමාගම ගැන කිව්වා. අපිත් ඒ කොම්පැනිය එක්ක වැඩ කළ නිසා දන්නවා, ඒක බොහොම හොඳ කොම්පැනියක්.

ඒ කොම්පැනිය වැඩ කර ගෙන යනවා. මම වෙනත් නමක් කියන්නේ. මොකද, ඒකත් නැවත ආයෝජනයට බලපායි. විපක්ෂයක් වශයෙන් අපි මේ රටේ ජාතික ආයෝජන ටික ආරක්ෂා කරන්න අවශ්‍යයි. නමුත් ඔබතුමන්ලා කරන දේවල් තුළින් ආරක්ෂා කිරීම නොවෙයි සිද්ධ වන්නේ. ඔබතුමන්ලා තිබෙන ආයෝජන ටිකත් මේ රටෙන් එළවා දමන එකයි කරන්නේ.

මම හිතන විධියට අද මේ ගෙනාපු පනත් කෙටුම්පත් තුළත් වැඩියෙන්ම තිබෙන්නේ සූදු - Betting and Gaming - සම්බන්ධයි. අද මේ ඉදිරිපත් කරන Strategic Development Projects (Amendment) Bill එක යටතේත් සූදු සම්බන්ධයෙන් තිබෙනවා. අද Betting and Gaming Levy (Amendment) Bill එකත් ඉදිරිපත් කර තිබෙනවා. මේ ඔක්කොම සූදු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පනත් කෙටුම්පත්.

මම හිතන විධියට මේ රටේ ආර්ථිකය ශීඝ්‍රයෙන්ම වර්ධනය කරන්නේ CTB කියන ඒවායි. "CTB" කියන්නේ හුළං ගිහිල්ලා තිබෙන CTB එක නොවෙයි. "CTB" කියන්නේ Casinos, Taverns and Brothels. අපේ ආසනවල බහුතරයක් ඉදි වන්නේ තැබෑරුම්. ඊට පස්සේ casino එනවා. දැන් බලන්න, කෙරි පැකර්ගේ පුතා අරගෙන දුවනවා. මේ කරන්නේ මොකක්ද? එක පැත්තකින් ඔබතුමන්ලා කියනවා "මතට තිත" තියනවා කියලා; මේවා තහනම් කරන්න ඕනෑය කියලා කියනවා. රටේ ආර්ථිකය කඩා වැටෙන කොට මේවා පස්සේ දුවලා මේ වාගේ අනවශ්‍ය කටයුත්තක් කරන්නයි හදන්නේ. එක පැත්තකින් මේවා ගෙනැල්ලා තිබෙනවා කියලා කියනවා. අනෙක් පැත්තෙන් ඒක සීමා කරනවා කිව්වත්, දැන් ඒ දේවල් ඊට වඩා ප්‍රචලිත කරන්න හදනවා නේද? ඒ සම්බන්ධයෙන් අපට කියන්න තිබෙන්නේ ඔබතුමන්ලාගේ සැබෑ ස්ථාවරය ඉදිරිපත් කරන්න කියලායි.

මීට සුමාන තුනකට ඉස්සෙල්ලා ඔබතුමන්ලා ආණ්ඩුව රකින්න කථා කරන අවස්ථාවේදී Mattala Airport එක සම්බන්ධයෙන් කිව්වා. එදා අප දෙස බලා කිව්වා, "ඔබතුමන්ලා කොළඹ සිටින මන්ත්‍රීවරු. යන්න, මත්තලට ගිහිල්ලා බලන්න. එතැන තෙල් ටැංකිය තිබෙනවා" කියලා. ගරු සරත් අමුණුගම ඇමතිතුමාත්, සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත් කිව්වා, "ඔව්, එතැන නැති වුණත් මාගම්පුර වරායේ තෙල් ටැංකිය තිබෙනවා" කියලා. ගරු පියංකර ජයරත්න ඇමතිතුමා කිව්වා, "අපි යමු. එතැනට ගිහිල්ලා බලමු" කියලා. අපි කිව්වා, පාර්ලිමේන්තුවේ ඉස්සෙල්ලා ඒ ගැන විවාදයක් පවත්වමු කියලා. අද වන තුරු නිශ්ශබ්දයි. මේකේ තෙල් ටැංකිය කෝ? මේකට තිබෙන හොඳම සාක්ෂිය තමයි "Daily News" වෙබ් අඩවියේ කියන දේ. මේ වාගේ තෙල් ටැංකියක් නැහැ, මේක ඇති කරනවා කියලායි කියන්නේ.මම ඒකත් කියන්නම්. නැත්නම් කියාවි මමයි මේ දේවල් කියන්නේ කියලා. April fool's joke එකක්ද මම දන්නේ නැහැ.

අප්‍රේල් 01 වැනිදා "Daily News" වෙබ් අඩවියේ මෙසේ සඳහන් වනවා:

"CPC to build aviation fuel storage terminal at Mattala Rajapaksa International Airport"

ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, ඔබතුමා එදා කියපු දේ මේකෙන් පුහු තර්කයක් බවට පත් වෙලා තිබෙනවා නේද? අපි මෙතැන විපක්ෂයක් වශයෙන් ඔබතුමන්ලා කරන හැම එකම විවේචනය කරන්නේ නැහැ. නමුත් ඔබතුමන්ලාගේ ක්‍රියා තුළින් ඇති වෙලා තිබෙන දේවල් විවේචනය කරන්න යනකොට, විපක්ෂයෙන් මේ දේවල් කිව්වා කියලා අපි "සයනයිඩ්" වශයෙන් සලකන්න එපා. අපි කියන්නේ අපේ ආර්ථිකය සම්බන්ධයි. මෙය ඔබේ ආර්ථිකයක් නොවෙයි. කොළ පාට, නිල් පාට, රතු පාට, කහ පාට ඔක්කොම එකතු වෙලා ඒ සම්මිශ්‍රණය තුළින් තමයි මේ වාගේ ආර්ථිකයක් හදා ගෙන තිබෙන්නේ. මේ රටේ ආර්ථිකය නැති කරන එක තමයි ඔබතුමන්ලා බොහොම සාර්ථකව කර ගෙන යන්නේ. ඒක කරන්න එපා. මම කිව්වා වාගේම මේ කථා කරන මොහොතේ අපේ ගෙවුම් ශේෂ හිඟයේ බොහොම බරපතළ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. කරුණාකරලා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න.

එක පැත්තකින් අද රුපියලේ අගය අධි ප්‍රමාණය වී ගෙන එනවා. ඇමෙරිකානු ඩොලරයක අගය රුපියල් 131ක, 132ක වටිනාකමට තිබුණු එක දැන් ආයෙත් 126ට, 127ට අඩු වෙලා. ජීවන වියදම පාලනය කරන්න යන උපක්‍රමයක් වශයෙන් බැරි වෙලාවත් මහ බැංකුව මේක පාවිච්චි කරනවා නම්, මේ උත්සව කාලය අවසන් වුණාට පස්සේ; පිට රටින් එන සල්ලි ටික අඩු වුණාට පස්සේ රුපියල ආයේ කඩා ගෙන වැටිලා 135ට, 140ට යනවා නම්, රටේ ජීවන වියදමට කොතරම් බලපෑමක් ඇති වනවාද? 114 ඉඳලා 130ට ගියාම මේ රටේ ණයබරතාව වැඩි වුණා කිව්වාම මහ බැංකුවේ අධිපති නිවාඩ් කබ්රාල් සද්ද නැතිව ඉඳලා අපව විවේචනය කළා. චරිත ඝාතනය කරන්න හැදුවා. මාස තුනකට පස්සේ කිව්වා, රුපියල අවප්‍රමාණය වීම නිසා ණයබරතාවට රුපියල් කෝටි 28,500ක් එකතු වුණා කියලා. අපට මේවා කියන්න සිද්ධ වුණේ ඔබතුමන්ලාගේ ක්‍රියා තුළින් ඇති වූ දේවල් නිසායි. ඒ දේවල් කළාට පස්සේ අපට බැනලා වැඩක් තිබෙනවාද? එක්සත් ජාතික පක්ෂය කියන්නේ හැම අවස්ථාවකදීම රටේ ආර්ථිකය හදපු පක්ෂයක්. 1948 අවුරුද්දේ නිදහස ලබා ගත් අවස්ථාවේ සිට ඩඩ්ලි සේනානායක මහතා, ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා, ජේ. ආර්. ජයවර්ධන මහතා මේ රටේ ආර්ථිකයේ සුවිශේෂී වෙනසක් කළා. රණසිංහ ප්‍රේමදාස මහතාත්, ඩී.බී. විජේතුංග මහතාත්, මේ මෑතකදී -2001 දී- රනිල් වික්‍රමසිංහ මහතාත් ඒ දේ කළා. 1977 සිට 1994 වෙනකම් ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, ඔබතුමාත් අපිත් එක්ක හිටියා. ඒ කාලයේ වුණු දේ ඔබතුමා දන්නවා.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය රට පාලනය කළ කාලයේ රටේ ආර්ථිකය ඍණ බවට පත් වුණාට පසුව 2001 සිට 2004 දක්වා සුළු කාලය තුළ ඒක නැවත සියයට 6.5ක තත්ත්වයට ගෙනෙන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ නිසයි ජනතාව කියන්නේ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුණොත් රටේ මුදල් සංසරණය ඇති වෙනවා; හැම තැනම පොහොසත් භාවයක් ඇති වෙනවා; තරුණ තරුණියන්ට ජීවත් වෙන්න මාර්ගයක් ඇති වෙනවා" කියලා. අන්න ඒ වාගේ යුගයක් නැවත ඇති කරන්න ඕනෑය කියන එක අද කොළඹ ඉඳන් මඩකලපුව දක්වාත්, දෙවුන්දර තුඩුවේ ඉඳන් පේදුරු තුඩුව දක්වාත් ජනතාව කථා කරනවා නොවේද? මෙන්න මේක තමයි අපි කියන්නේ. කරුණාකර, ඔබතුමන්ලා මේ රටේ ආර්ථිකයත් එක්ක සෙල්ලම් කරන්න එපා. වැරැද්දක් තිබෙනවා නම්, ගැටලුවක් තිබෙනවා නම් අපත් එක්ක කථා කරන්න. ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා කිව්වා වාගේ අද උදේ කථා කළේ වැදි බණ. විපක්ෂ නායකතුමා බොහොම ඕනෑකමින් ඇහුවේ ඔබතුමන්ලා අද ඇමෙරිකන් තාලයට නටනවාද, නැද්ද කියලායි. එදා ජීනීවා ගිහිල්ලා හාස්‍යයට ලක් කළා. ඊට පස්සේ දැන් වෙනත් සිංදුවක් කියනවාද කියන

ප්‍රශ්නයටයි අපි උත්තර ලබා ගත්තේ. ඉන්දියාවේ ගරු මන්ත්‍රීවරු අද මෙතැන හිටියා උත්තර දෙන කොට. ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා ඇහුවා, "මේ රටේ ජාතික ප්‍රශ්නයක් තිබෙනවා; විපක්ෂ නායකතුමාටත් ජාතික වශයෙන් ඒ විධියට හිතන්න බැරි වන්නේ ඇයි?" කියලා. හිතන නිසා තමයි තවම අපි විපක්ෂයේ ඉන්නේ. අපත් මහින්ද රාජපක්ෂ වාගේ හොරෙන් මේක ජිනීවාවලට ගෙන යන්න හැදුවා නම් හෝ 1987 ඔබතුමාත් අපත් එක්ක ඉන්න කොට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එස්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එස්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, the Hon. Member must know how to address the Head of State and he did not take it to Geneva. It was the United Nations Human Rights Council in Geneva that called us. Therefore, first of all, he must learn how to address. He is talking out of turn. He is talking nonsense in this House.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
Sir, he always creates problems. You know that he is not even allowed to sit on the Chair there. So, I basically say - රටේ ජනාධිපති මහින්ද රාජපක්ෂ. ඒකත් කියන්න ඕනෑද වෙනත් විධියකට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලාට පැන පැන දෙන්න ඕනෑ වුණාට අපි කියන්නේ, මේ රටේ ජනාධිපති මහින්ද රාජපක්ෂ කියලායි. මොකක්ද ඒකේ තිබෙන වැරැද්ද? අතිගරු කියා කියන්න අපට අවශ්‍ය නැහැ. ඔබතුමන්ලාගේ අදක්ෂ ආණ්ඩුව රකින්න නොවෙයි අපි ඉන්නේ. අපි ඉන්නේ අභිංසක ජනතාව රකින්න. ඒක මතක තියා ගන්න. ඔබතුමන්ලා මේ පැත්තේ ඉඳන් ඒ පැත්තට පැන්නා කියලා අපට ප්‍රශ්නයක් නැහැ.

So, on that score, Hon. Minister, all I basically want to know is this. What did the Hon. (Prof.) G.L. Peiris say today? Look at it from a national perspective. We are looking from a national perspective. When the Labour GSP was losing out, we said, “Let us, as a common front, as Government and Opposition work together and protect it”. You said that you do not want it. You lost it. Today you lose Rs. 1.3 billion. Likewise, when we said that Geneva in 2012 is not going to be good and let us work together, you said that you do not want it and you would win and come. You lost it. In 2013, we told it in advance. Otherwise, you will say that you went to Geneva, you went to London and this tale and that tale was told. ඊට වැඩිය අන්ත පරාජයක් ඇති වුණා. කොහේද අපේ රටේ විදේශ ප්‍රතිපත්තිය ගෙන යන්නේ? ගමේ වණ්ඩි වාගේ කෑ ගහලා හිතනවා ලෝකය ලංකාවේ ඇතුළේ තිබෙනවා කියලා. ඒ වාගේ ප්‍රතිපත්තියක් ගෙන යන්න බැහැ. ඔබතුමන්ලාගේ ආර්ථික ප්‍රතිපත්තිය අද ඊටත් වඩා භයානකකාරී තත්ත්වයක් තුළින් ගෙන යන්නේ. අද කථා කරන්න භය තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. අද සාමාන්‍ය ජනතාව භයෙන් ගැහෙනවා, මේක ගැන කථා කළොත් සුදු වෑන් එකක් ඒවිද කියලා. මා සමඟර වෙලාවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් වෙනුවෙනුත් කථා කරනවා. ඇයි, ඔබතුමන්ලාටත් කථා කරන්න අමාරු තත්ත්වයක් තිබෙන නිසා අපි හිතනවා පවු කියලා. මොකද, ඔබතුමන්ලාට යම් විධියක වාරණයක් ඇති කරලා තිබෙනවා. අපි ඒ වෙනුවෙන් කථා කරන්නම්. නමුත් අද ජනතාව භයෙන් සිටින්නේ.

ගරු ඇමතිතුමනි, හිටපු මුදල් ඇමති වශයෙන් ඔබතුමා ආර්ථිකය ගැන දන්නවා. ඔබතුමා ජ්‍යෙෂ්ඨයෙක්. මා හිතන විධියට අප්‍රේල් මාසයේ 18, 19 දිනවල ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාකච්ඡාවකට යනවා. මමත් ඊට කලින් ගිහිල්ලා එතැන ගිනි තියන්නේ නැහැ. තිබෙන දේ අපි අඩු කරන්න බලනවා. නමුත් ඔබතුමන්ලා කොතරම් භයානකකාරී තත්ත්වයක් ඇති කර තිබෙනවාද කියන එක ගැන කල්පනා කර ඔබතුමන්ලා ඒ තත්ත්වයෙන් ගැලවෙන්න කටයුතු කරන්න. අපට තමුන්නාන්සේලා ඒකෙන් ගලවන්න බැහැ. ඒ නිසා තමයි අපි හැම වෙලාවේම කිව්වේ මේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් අපි එකට වැඩ කරලා පෙන්නමු කියලා. ඔබතුමන්ලාට අවශ්‍ය නැත්නම් අපට අවශ්‍ය නැහැ. ඔබතුමන්ලා රටේ ආර්ථිකය කඩා වැටෙන්න ඉඩ දීලා ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂයට හදන්නය කියන එක ඔබතුමන්ලා කියන්න ඕනෑ නැහැ. ඒක ජනතාව වැඩි කල් යන්න කලින් කියාවි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් පමණයි තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
නැහැ. මට මිනිත්තු 40ක් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
No, I have got 30 plus 10 minutes. I got it from that side.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
No, Hon. Member, you have got only 30 minutes.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
No, I have got 40 minutes. I had 30 plus 10 more minutes. That was discussed there. You can ask Mr. Dhammika Dasanayake who was there at that moment.

දැන් බලන්න, මහ බැංකුවේ අද කරන අපරාධය.

[ගරු රවි කරුණානායක මහතා]

They have contracted Thompson Advisory Group to basically give them a promotional activity in America. ඒ කියන්නේ ලංකාවේ මහ බැංකුව පිස්සු කෙළලා, නටලා ආර්ථිකය වට්ටලා පිට රට lobbiesලා පාවිච්චි කරනවා-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 30යි ඔබතුමාගේ පක්ෂයෙන් දීලා තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You give a call and check with Mr. Dhammika Dasanayake.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මේ ලැයිස්තුව අනුව විනාඩි 30යි දීලා තිබෙන්නේ. ඒ නිසා විනාඩි 30යි දෙන්න පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. ඒ ගැන අහන්න. අපි සාකච්ඡා කරලායි වෙලාව වෙන් කළේ. ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාගෙන් අහන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දීලා තිබෙන වෙලාවයි මේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා තව මිනිත්තු 5ක් ගන්නම්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි දෙකකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The Thompson Advisory Group is being paid roughly Rs. 100 million a year. For what? Is it to basically overcome the sins that are committed here? Likewise, the Sri Lankan Embassy in America is using a company called the Majority Group, which is also doing a lobbyist's role. What is this for? Are you outsourcing the activities of the Ministers? Are you outsourcing the job of the Governor of the Central Bank? Have you all lost confidence in your Ministers? මෙය පෞද්ගලීකරණය කරන්නේ නැහැ. ඔබතුමන්ලා ඇමතිතුමන්ලා පෞද්ගලීකරණය කරනවා. ඔබතුමන්ලා දැන් මහ බැංකුවේ අධිපති පෞද්ගලීකරණය කරලා ඉවරයි. ඒ සම්බන්ධයෙන් අපට කියන්න පුළුවන් වන්නේ මේකයි. 2010 දී Patton Boggs යොදා ගත්තා. දැන් Thompson Advisory Group එක අරගෙන තිබෙනවා. Majority Group එක 2013 දී USවල Sri Lankan Embassy එක අරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි Hedges Strategies Group කියන එක. 2012 වෙසක් උත්සවය සමරන්න ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපති මෙවැනි කොම්පැනියක් පත් කරලා තිබෙනවා. රටේ ආර්ථිකය නන්නත්තාර කරන්න මොන පිස්සුවක්ද මේ කෙළින්න හදන්නේ? මේ සම්බන්ධයෙන් අපට කියන්න පුළුවන් වන්නේ, කරුණාකරලා ඔබතුමන්ලා මේවා බලා උත්තර දෙන්න කියලායි.

ඒ විතරක් නොවෙයි. Mattala Airport එකේ තෙල් ටැංකියක් නැහැයි කියලා එදා අපි පෙන්වා දුන්නා. ඔබතුමන්ලාට දැන් ඒක ඔප්පු වෙලා තිබෙනවා. අද පත්‍රයේ තිබෙනවා මා දැක්කා, ශ්‍රී ලන්කන් ගුවන් සේවය තුළින් රුපියල් 4,900ට කොළඹ - මත්තල - කොළඹ දක්වා ගමන් කරන්න පුළුවන් කියලා. ඔබතුමා දන්නවා, ඒ වාගේම කොළඹ සිට චීනය දක්වා ගමන් මාර්ගය වන්නේ, කොළඹ - මත්තල - බැංකොක් - චීනය කියලා. කොළඹ සිට take off කරලා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටු පොළට යන්න US Dollars මිලියන 30ක් විතර වැය වනවා. It costs US Dollars 30,000 for every take-off and the fuel. දැන් මේ මුදල මුළු passengersලා ප්‍රමාණයෙන් බෙදුවොත් රුපියල් 17,000ක් වෙනවා. මෙතැන තිබෙනවා, ශ්‍රී ලන්කන් ගුවන් සේවය තුළින් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටු පොළේ සිට චීනයට යන්න රුපියල් 75,000යි; කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළේ සිට චීනයට යන්න රුපියල් 82,000යි කියලා. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළේ සිට චීනයට යන්න රුපියල් 82,000ක් යනවා නම්, රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටු පොළේ සිට චීනයට යන්න රුපියල් 75,000ක් යනවා නම්, රුපියල් 7,000ක් තව අඩු වෙනවා. නමුත් කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළේ take- off කරලා, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටු පොළේ land කළාම passenger කෙනකුට රුපියල් 17,000ක පාඩුවක් වනවා. ඉතින් අලාභයක් කරනවාද? මොනවාද, මේ කරන්න හදන්නේ? ඉතින් මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
But, you have to have introductory rates.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Introductory rates do not mean that -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Any airline would give that.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාගේ ප්‍රාග්ධන වියදම් කියන්නේ මොනවාටද? ඔබතුමන්ලා ඉස්සෙල්ලා පාලමක් හදලා ඊට පස්සේ බලනවා, කොහොමද එතැනට ගහක් ගෙනෙන්නේ කියලා. ඒ වාගේ දේවල් තමයි කරන්නේ.

ඔබතුමන්ලා සංවර්ධනය තුළින් හම්බන්තොට වරාය හැදුවා. ඒකෙන් අපනයනය වැඩි වුණාද? ජීවන වියදම අඩු වුණාද? නොරොච්චෝලේ විදුලි බලාගාරය හැදුවා. අද පත්‍රයේ තිබෙනවා, නොරොච්චෝලේ විදුලි බලාගාරය කඩා වැටී තිබෙනවාය කියලා. කෙරවලපිටිය බලාගාරය has also gone down කියා අද පත්‍රයේ තිබෙනවා. වැඩි ඇත නොවෙයි, මේ අද පත්‍රයේයි තිබෙන්නේ. ඉතිහාසය ගැන නොවෙයි කථා කරන්නේ. අද පත්‍රයේයි මේ කරුණු තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි, Mattala Airport එක.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට නියමිත වෙලාව අවසානයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තු දෙකක් මා ගන්නම්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට විනාඩි 3ක් වැඩිපුර දීලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, give me just two more minutes.

ඒ විතරක් නොවෙයි. Mattala Airport එක නිසා සංචාරකයෝ වැඩි වෙලා තිබෙනවාද? ඒ වාගේම ඉහළ කොත්මලේ විදුලි බලාගාරය නිසා විදුලි බිල අඩු වෙලා තිබෙනවාද? අද රටේ තිබෙන තත්ත්වය මෙකයි. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් අපට කියන්න තිබෙන්නේ මෙකයි. අද ශ්‍රී ලන්කන් ගුවන් සේවය රුපියල් කෝටි 2,900ක අලාභයක් ලබන එක තව රුපියල් කෝටි 400කින් වැඩි කරන්න හදනවාද, නැද්ද කියන එකට අපට උත්තර දෙන්න.

කාලය හරස් වීම නිසා අවසාන වශයෙන් මා තව එක කාරණයක් කියන්නම්. සරත් අමුණුගම ඇමතිතුමනි, ඔබතුමාගේ බෑනා ඉතාම දක්ෂ අපනයනකරුවෙක්. ඔහු මගේ යාළුවෙක්. රටේ ආර්ථිකය ගැන මා මේ කථා කරන්නේ ඔබතුමාත් මේ ගැන දන්නා නිසායි. අද රටේ තේ කර්මාන්තය කඩා වැටිලා තිබෙනවා. පසු ගිය සඳුදා මමත්, චන්දිම වීරක්කොඩි මැතිතුමාත්, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත්, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාත්, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් තේ කර්මාන්තයේ තිබෙන ප්‍රශ්න ගැන සාකච්ඡා කළා. මා එතැනට ගියාම ඇත්ත වශයෙන්ම මට භයක් ඇති වුණා. එතුමා ආවේ තරුණයන් 40දෙනකු සමඟයි. අවුරුදු 175ක් තිස්සේ රටේ තිබෙන කර්මාන්තයක්, ලක්ෂ 12ක පිරිසක් ජීවත් කර වන කර්මාන්තයක්, හාරලක්ෂයක සුළු තේ අපනයනකරුවන් ජීවත් කර වන කර්මාන්තයක්, කිලෝග්‍රෑම් මිලියන 3,31,000ක් අපනයනය කරන කර්මාන්තයක්, ඊටත් වඩා ලංකාවට රුපියල් කෝටි 18,500ක - US Dollars 1.4 billion - ආදායමක් උපයන කර්මාන්තයක් වශයෙන් තේ කර්මාන්තයට අද රටේ තිබෙන තත්ත්වය මෙකයි. What was mentioned by the majority of the exporters who were there is that we have missed the bus for the fourth time. අපේ රටේ තේ කර්මාන්තය භයානක තත්ත්වයක් තුළිනුයි ගමන් කරන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මිනිත්තුවකින් මගේ කථාව අවසන් කරන්නම්.

කෙන්යාවේ සියයට 40ක් වශයෙන් තිබෙන value addition එක, අද ලංකාවේ සියයට 12 දක්වා අඩු වෙලා තිබෙනවා. කෙන්යාවේ නිෂ්පාදනය අද ලංකාවට වඩා කිලෝ මිලියන 100කින් වැඩියි. එතැන තිබෙන කර්මාන්තශාලා ප්‍රමාණය 107යි. අපට කර්මාන්තශාලා 800ක් තිබෙනවා. ඒත් අපට තත්ත්ව පාලනයක් නැහැ. ඒ වාගේම මේ කාරණය ගැනත් කියන්න ඕනෑ. මෑතකදී මට තොණ්ඩමන් අමාත්‍යතුමා හමු වුණා. එතුමා කියනවා, "හරි භයානකකාරී තත්ත්වයක් තිබෙන්නේ. අද වැඩ කරන ජනතාව තේ කර්මාන්තයෙන් එළියට එනවා" කියලා. විපක්ෂය වශයෙන් මා ඉතාමත් ඕනෑකමින් මේ අවස්ථාවේ දී කියන්නේ, ලංකාවට ක්‍රිකට් ක්‍රීඩාවෙන් ගරුත්වයක් ගෙනාවා වාගේම, තේ කර්මාන්තයෙනුත් ලංකාවට එදා ඉඳලාම සුපිරි නාමයක් ලැබී තිබුණා. ඒ නිසා කරුණාකරලා මේ දක්ෂයින් කැඳවලා ජාතික ප්‍රතිපත්තියක් අනුව value addition, blending අලුත් විධියට කරන්න. ඇහලුම් කර්මාන්තය සඳහා පිට රටින් 30,000ක් කට්ටිය ගෙනෙන්න යනවා කියලා අද පත්තරේ තිබෙනවා. මේ තේ කර්මාන්තය සඳහාත් ඉන්දියාවෙන් සහ බංගලිදේශයෙන් ඕනෑ විධියකට කට්ටිය ගෙනෙන්න. මේ රටේ ආර්ථිකය නඟා සිටුවීමට revitalize this industry; reinvent the earlier situation if you have lost it.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකර කථාව අවසන් කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තුවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා විනාඩි පහකට වඩා වැඩි කාලයක් ලබාගෙන තිබෙනවා. කරුණාකර කථාව අවසන් කරන්න. බොහොම ස්තුතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ නිසා මා කියන්නේ, අප සියලු දෙනාම එකතු වී මේ තේ කර්මාන්තය ආරක්ෂා කරමු කියලායි. තේ කර්මාන්තය කඩා වැටුණොත් අපට ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවාය කියන එක තමයි මට මේ අවස්ථාවේ දී කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

[අ.භා. 1.00]

ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාමත් වැදගත් පනත් කෙටුම්පත් කිහිපයක් සම්බන්ධයෙන් පැවැත්වෙන මෙම විවාදයට සම්බන්ධ වන්නට මට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වනවා. අතිගරු ජනාධිපතිතුමා විසින් පසු ගිය අය වැය ලේඛනය මඟින් ඉදිරිපත් කරන ලද බදු සම්බන්ධ පනත් කෙටුම්පත් පිළිබඳව තමයි අද සාකච්ඡා වන්නේ. විශේෂයෙන්ම මෙහිදී අප සඳහන් කළ යුතු වනවා, රජයක් පවත්වාගෙන යාමේ දී බදු වැඩි කර ගැනීම සඳහාත්, ඒ වාගේම බදු කළමනාකරණය කිරීම සඳහාත් රජයට අත්‍යවශ්‍යයෙන්ම කටයුතු කරන්නට සිදු වන බව. ඒ තුළත් අපේ රජය විසින් වැඩි අවධානයක් යොමු කරන්නේ සාමාන්‍ය ජනතාවට බරක් ඇති නොවන ආකාරයේ බදු ක්‍රම පැනවීමටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒත් එක්කම අපට අමතක කරන්නට බැරි කාරණාවක් තිබෙනවා. අපේ රජය ජනතාව කෙරෙහි නම්‍යශීලීව කටයුතු කළත්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ බදු සම්බන්ධව කටයුතු කළ ආකාරය ගැනත් අපට මතකයි. අද රවි කරුණානායක මන්ත්‍රීතුමා සඳහන් කළ කාලය තුළ, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පාලන කාලය තුළ ජනතාවගෙන් බදු අය කළේ කොහොමද? ජනතාවට බදු සහන ලබා දුන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක් වතාවක සිදු වුණු සිද්ධියක් මට සිහිපත් වනවා. චොක්සි මැතිතුමා මුදල් අමාත්‍යවරයා විධියට කටයුතු කළ අවධියේ, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිතුමා විධියට කටයුතු කළ අවධියේ, බදු සමා පනත කියලා එකක් මේ පාර්ලිමේන්තුවට හඳුන්වා දුන්නා. රුපියල් මිලියන 70,000කට වඩා ගෙවන්නට තිබුණු බදු හොරුන්ට - බදු වංචා කළ අයට - ඒ තුළින් සමාව ලබා දීමක් තමයි සිදු වුණේ. එහි තවත් හොඳම කාරණාව තමයි චොක්සි මැතිතුමා ඒ බදු හොරුන් වෙනුවෙන් උසාවියේ පෙනී සිටියා කියන එක. ඒ නඩුවලින් ඒ අය පැරදුණා. නඩුව පැරදිලා ඒ අයට ආණ්ඩුවට බදු ගෙවන්න සිදු වුණාම, නඩුවෙන් ලබා දෙන්නට බැරි වුණු සහනය එතුමා අමාත්‍යවරයෙක් විධියට කටයුතු කරමින් බදු සමා පනත යටතේ ඒ අයට ලබා දෙන්නට කටයුතු කළාය කියන එක අපි හොඳටම දන්නවා. එම බදු සමා පනත යටතේ මේ රටට අහිමි වුණු මුදල තව වෙනකන් ලබා ගන්න බැරි වෙලා තිබෙනවා. එවැනි බදු ක්‍රමයක් තමයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රවි කරුණානායක මන්ත්‍රීතුමා අද කථා කරමින් කිව්වා, මේ කැසිනෝ සහ රේස් බුකි ගැන. අපේ ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමාත් ඒ ගැන කථා කළා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පැවැති කාලයේ කැසිනෝ කාරයන්ගේ බදු අඩු කළා; රේස් බුකි කාරයන්ගේ බදු අඩු කළා; ඔවිටු අල්ලන අයගේ බදු අඩු කළා. ඒක ජනතාවට දෙන සහනයක් නොවෙයි. හැබැයි, ඒ බදු අඩු කරන ගමන් බදු වැඩි කළේ මොනවාටද? සහන නොදුන්නේ මොනවාටද? වී ගොවියාගේ පොහොර සහනාධාරය ඉවත් කළා. පොහොර සඳහා පනවා තිබුණු බදු අඩු කරන්න කටයුතු කළේ නැහැ. ඒ සහනය ජනතාවට ලබා දුන්නේ නැහැ. ඒ වාගේම සමෘද්ධි ලාභියාට ලබා දී තිබුණු සහන ඉවත් කළා. සාමාන්‍ය ජනතාවට බදු බර දරන්න වන වෙලාවක එක්සත් ජාතික පක්ෂය කළේ මොකක්ද? සාමාන්‍ය ජනතාවට බදු බරෙන් පෙළෙන්න ඉඩ දීලා කැසිනෝ කාරයන්ගේ බදු අඩු කළා; රේස් බුකි කාරයන්ගේ බදු අඩු කළා. බදු හොරුන්ගේ බදු කප්පාදු කළ එක තමයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කළේ කියන එක අපි මේ වෙලාවේ සිහිපත් කරන්නට ඕනෑ.

අද දිනයේ ඉදිරිපත් කර තිබෙන බදු සංශෝධන පනත් කෙටුම්පත් තුළිනුත් අතිගරු ජනාධිපතිතුමා ඇතුළු මේ රජය ක්‍රියාත්මක කරන්නේ නැවත වතාවක් කැසිනෝ බදු වැඩි කිරීමයි; රේස් බුකි කාරයන්ගේ බදු වැඩි කිරීමයි; ඔවිටු අල්ලන්නන්ගේ බදු වැඩි කිරීමයි.

නමුත් සාමාන්‍ය ජනතාවට ලබා දෙන සහන ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යනවා. පොහොර සහනාධාරය අදටත් පවත්වාගෙන යනවා. මහින්ද චින්තනයෙන් තමයි පොහොර සහනාධාරය දෙන්න පොරොන්දු වුණේ. හැබැයි මහින්ද චින්තනයේ ඒ ආණ්ඩු කාලය අවසාන වෙලා "මහින්ද චින්තන ඉදිරි දැක්ම" ක්‍රියාත්මක කරන මේ දෙවැනි ආණ්ඩු කාල පරිච්ඡේදය තුළත් ගොවියාට ඒ සහනාධාරය ලබා දෙන්න මේ රජය කටයුතු කරනවාය කියන කාරණය අපට අභිමානයෙන් සඳහන් කරන්න පුළුවන්. ඒ නිසා තමයි අද අපට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වැඩි වී ප්‍රමාණයක් මේ රටේ නිෂ්පාදනය වන්නේ. පසු ගිය කාලයේ ඇති වුණු ගංවතුර තත්ත්වය නිසා, නියඟය නිසා අක්කර ලක්ෂ ගණනක් විනාශ වෙලා තියෙද්දී වුණත්, අපට පිට රටින් සහල් ගේන්න සිද්ධ වුණේ නැහැ. තවමත් අපේ රටේ ආහාරයට ගන්නා ප්‍රමාණයට වඩා වැඩි නිෂ්පාදනයක් අප රට තුළ සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පිටි ගෙන්වන එක අප සීමා කර තිබෙනවා. අප පිටිවලට සහනාධාර දීලා නැහැ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ තමයි පිටිවලට සහනාධාර දුන්නේ. අපේ ආණ්ඩු කාලයේත් -1994 -2000 යුගයේ- රුපියල් මිලියන 500 ගණනේ දීගෙන ගියා, පිටි මිල අඩු කරන්න. නමුත් අපේ මේ ආණ්ඩුව මොකක්ද කළේ? අපි පිටිවලට බද්දක් පැනෙව්වා. ඒ වෙන දෙයක් නිසා නොවෙයි, වී ගොවියා ආරක්ෂා කර ගන්නයි. ඒ බද්දෙන් අය කර ගන්නා මුදල්, ඒ වාගේම කැසිනෝ වැනි අනිකුත් ව්‍යාපාරවලින් වැඩියෙන් අය කර ගන්නා මුදල් අපි කාටද දෙන්නේ? අපි ඒවා ගොවියාට පොහොර සහනාධාර විධියට ලබා දෙනවා. ඒ නිසා අපේ රටේ ගොවියා ශක්තිමත් වෙලා තිබෙනවා. ඒ නිසා අද අපේ රටේ නිෂ්පාදකයන් ශක්තිමත් වෙලා තිබෙනවා.

රවි කරුණානායක මන්ත්‍රීතුමා මත්තල ගුවන් තොටු පොළ පිළිබඳව කිව්වා. ඒ වාගේම අධිවේගී මාර්ගය ගැනත් එතුමා කිව්වා. ඒ ගැන එතුමාට කියන්න තිබෙන්නේ මේකයි. එතුමාට හැම දාම ඉවසීමක් තිබුණේ නැහැ; බලාගෙන ඉන්න බැහැ. මේ කථාවත් පසු ගිය යුද්ධ කාලයේ අපේ හමුදා දිගින් දිගටම යුද්ධය ජය ගනිමින් ඉස්සරහට ඇදීගෙන යන වෙලාවේ එතුමා මේ පාර්ලිමේන්තුවේදී කියපු කථා වාගෙයි. අපේ හමුදාවේ අය කිලිනොච්චියට යනවා කියලා මැදවච්චියට යනවාය කිව්වා. අලිමංකඩ යනවා කියලා පාමංකඩ යනවාය කිව්වා. එතුමාට ඒක ඉවසාගෙන ඉන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මේ යුද්ධය දිනන්න බැහැ කියන එක තමයි ඒකෙන් කිව්වේ. ඒකම තමයි මේ අවස්ථාවේදී අපට මත්තල සම්බන්ධයෙනුත් කියන්න තිබෙන්නේ. එතුමාට හදිසි වුණාට හරියන්නේ නැහැ. මේ රටේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කොට, ඒවා සැලසුම් සහගතව ක්‍රියාත්මක කරන්න ඕනෑ. මත්තල ගුවන් තොටුපොළ හදපු ගමන්ම ඔක්කොම ගුවන් යානා ටික එතැනට එන්නේ නැහැ. ඒක ප්‍රචලිත කරන්න යම් යම් ක්‍රියා මාර්ග ගන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළ තමයි එතුමා විවේචනය කළේ. රුපියල් 4,999කට මනුස්සයෙකුට කොළඹ ඉඳලා මත්තලට යන්න දෙන එක හොඳයි. මම යෝජනා කරනවා පුළුවන් නම් ඒ ගණනවත් අය කරන්නේ නැතිව එතුමාත් එක්කගෙන ගිහින් මත්තල ගුවන් තොටුපොළ හදපු ආකාරය පෙන්වන්න කියලා. අනිකුත් ගුවන් සමාගම්, ඒ වාගේම මගීන් ඒ ප්‍රදේශයට ගෙන යන්න ප්‍රචලිත කිරීමේ යම් යම් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒකට මුදල් යනවා. හැබැයි එහි ප්‍රතිඵලය අනාගතයේදී අපට බලා ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒවා ආයෝජන. ඒවායෙන් ප්‍රතිලාභ ලැබෙන්න කාලයක් යනවා. ඒ ලැබෙන ප්‍රතිලාභය මේ

රටටම ඉමහත් වාසියක් බවට පත් වෙනවා. සංචාරක ව්‍යාපාරයේ දියුණුව ඒ තුළින් ඇති වෙනවා. ඒ වාගේම අපේ නිෂ්පාදන වැඩි වෙලා හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපළ හරහා ඒවා පිට රට යවන්න පුළුවන්කම ලැබෙනවා. ඒවා තමයි අපට ලැබෙන ප්‍රතිලාභ. මේවා හදලා මාසයෙන්, අවුරුද්දෙන් ඒ ප්‍රතිලාභ ලබන්න බැරි බව ඇත්තයි. නමුත් දිර්ඝකාලීනව අපට ඒ ප්‍රතිඵල ලබන්න පුළුවන්කම තිබෙනවා.

ඒ කාලයේ මහවැලිය හැදුවා. මහවැලිය හදපු ගමන් ප්‍රතිලාභ ආවේ නැහැ. හැබැයි ක්‍රමානුකූලව ඒ ව්‍යාපාරයේ ප්‍රතිඵල ලැබෙන්න පටන් ගන්නවා. ඒ වාගේම වාරිමාර්ග ව්‍යාපෘති ගොඩක් හැදුවා. අපේ ආණ්ඩු කාලයේත් හැදුවා; එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේත් හැදුවා. ඒ කාලයේ, "හදපු ගමන් ප්‍රතිලාභ එන්නේ නැහැ, මේක පාඩුයි" කියලා නිකම් හිටියා නම් අද ඇති වන තත්ත්වය මොකක්ද? දැන් අද අධිවේගී මාර්ගයටත් ඒක තමයි කියන්නේ. අධිවේගී මාර්ගය හදපු ගමන් ණය ගෙවන්න වෙනවා කිව්වා. දැන් ණය ගෙවන්න පටන් ගන්නවා. ණයට සල්ලි අරගෙන තමයි හැදුවේ. හැබැයි ඒවා කන්න බොන්න ගත්ත ණය නොවෙයි. මේ ආණ්ඩුව ණය ගත්තේ කන්න බොන්න නොවෙයි. ඒක අප වගකීමෙන් කියනවා. මේ රටේ සංවර්ධනය සඳහා තමයි මේ සියලු ණය අරගෙන තිබෙන්නේ. ඒක අප මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

මහවැලිය හදලා පළමුවෙනි අවුරුද්ද වෙන කොට වියදම් කරපු ගණන ඔක්කොම ලැබුණේ නැහැ නේ. එතුමා මේ කියන විධියට එහෙනම් ඒකෙනුත් ප්‍රතිලාභ එන්න එපා යැ. ඒ ණය ගෙවා ගන්නත් බැරි විධියට තමයි ඒවාත් තිබුණේ. ඒ එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ කරපු දේවල්. අනික් සියලු ව්‍යාපාරත් එහෙම තමයි. හැබැයි දැන් අධිවේගී මාර්ගය බලන්න කොච්චර දියුණුද කියලා. එතුමාත් අධිවේගී මාර්ගයේ යන්න පුළුවන් වේගයටත් වඩා අධිවේගයෙන් ගිහින් අහු වුණාය කියලා ආරංචි ආවා. ඔය බැණ බැණ හිටපු කට්ටිය දැන් අධිවේගී මාර්ගයේ යනවා. ඒකෙන් වෙනත් ප්‍රතිඵල කොයි තරම් මේ රටට ලැබෙනවාද?

එහෙම බැලුවොත් අපි අනෙක් පාරවල් හදන්නත් සල්ලි වියදම් කරලා තිබෙනවා. කොළඹ ඉඳන් හම්බන්තොට පැත්තට, නැහෙනහිර පැත්තට සහ උතුරු පැත්තට යන්න හදන පාරවල් සහ පාලම්වලින් කිසිම ආදායමක් අපට ලැබෙන්නේ නැහැ. නමුත් ඒකෙන් රටට ලැබෙන සේවය කොපමණද? අධිවේගී මාර්ගයේ කොපමණ සංචාරකයෝ පිරිසක් යනවාද? මේ රටේ කොපමණ පිරිසක් යනවාද? එක අතකින් කියන්න පුළුවන් අධිවේගී මාර්ගයේ යන්නේ සල්ලිකාරයෝ කියලා. මොකද, රුපියල් 400ක් දීලා නේ යන්නේ. යම් වාහන ප්‍රමාණයක් අධිවේගී මාර්ගයෙන් යන නිසා අනෙක් පැත්තෙන් බස් එකේ යන මනුෂ්‍යයාට, ඒ කියන්නේ කළුතර පැත්තෙන්, පානදුර පැත්තෙන් බස් එකේ යන මනුෂ්‍යයාට අද වෙනදා තරම් තද බදයක් නැතිව යන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ නිසා අධිවේගී මාර්ගයේ යන අයට පමණක් නොවෙයි ඒ ප්‍රතිලාභය ලැබෙන්නේ. අනෙක් පාරවල්වල යන අයටත් ලැබෙනවා. ඒ නිසා දැන් රත්නපුර පාරේ වෙන දා තිබුණ තද බදය අඩුයි. ඒ පාරවල්වල කලට වෙලාවට යන්න පුළුවන්කම තිබෙනවා. සාමාන්‍ය මහ ජනතාවට අද බස් එකේ යන වෙලාව ඉතිරි වෙලා තිබෙනවා. සංවර්ධනයක් පටන් ගත්ත ගමන් එහි ප්‍රතිලාභ බලන්න හොඳ නැහැ. ඒ මඟින් දීර්ඝ කාලීනව ඇති වන තත්ත්වයයි අපි බලන්න ඕනෑ. අධිවේගී මාර්ගය නිසා මේ රටට අනාගතයේදී කොපමණ ආයෝජන ගෙනෙන්න පුළුවන්ද කියන කාරණය පිළිබඳවයි අපි සැලකිලිමත් වෙන්න ඕනෑ. මේ අධිවේගී මාර්ගය හැදීම මෙතැනින් නවත්වන්නේ නැහැ. මේ අවුරුද්ද අවසාන වන්නට පෙර මාතර දක්වාත් අධිවේගී මාර්ගය ගෙන යන්න කටයුතු කරනවා. එතකොට තවත් මේ මාර්ගයේ ප්‍රතිලාභ අපට ලැබෙන්න පටන් ගන්නවාය කියන කාරණයත් මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු සම්බන්ධයෙන් කථා කරන විට, අමාත්‍යාතුමාගේ වාගේම මුදල් අමාත්‍යාංශයේ නිලධාරින්ගේත් දැන ගැනීම සඳහා අපේ අදහසක් සඳහන් කළ යුතු වෙනවා. බදු සරල කිරීම පිළිබඳව නිරන්තරයෙන් අතිගරු ජනාධිපතිතුමා අදහස් ඉදිරිපත් කරනවා; යම් යම් ක්‍රියාමාර්ග ගන්නවා. නමුත් ඒ කටයුත්ත තවත් සරල කිරීම අත්‍යවශ්‍යයි කියන කාරණයත් අපි මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම බදු ගෙවන පිරිසේ ප්‍රමාණය වැඩි කර ගැනීමට කටයුතු කරන්න ඕනෑ. බදු ගෙවන පුද්ගලයා විතරක් තළලා පෙළලා බදු ගන්නේ නැතිව, බදු ගෙවන පිරිසේ ප්‍රමාණය වැඩි කර ගත යුතුයි. අද බදු ගෙවන පිරිසේ සංඛ්‍යාව බැලුවොත් ඉතාම අඩුයි. බදු ගෙවිය යුතු විශාල පිරිසක් බදු ගෙවීම මහ හරිමින් සිටින බව අපි හොඳට දන්නවා. අපි කිව යුතුයි, එනිදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරීන් බදු ගෙවන්න පොලඹවනවා වෙනුවට, බදු ගෙවන්න සූදානම් වන අයටත් කියනවා, බදු ගෙවන්න එපා කියලා. ඒ වාගේම බදු ගෙවන්න එන අයගෙන් අත යටින් සල්ලි ගන්න තත්ත්වය තවමත් ක්‍රියාත්මක වෙනවා. ඒක මැඩ පවත්වන්නට අතිගරු ජනාධිපතිතුමා විවිධ වැඩ පිළිවෙළවල් අරගෙන තිබෙනවා. බොහෝ නිලධාරීන් එවැනි කටයුතු කරන්නට යෑමේදී අහු වෙනවා. අපි දන්නවා, සමහර නිලධාරීන් බදු ගෙවන අය ළඟට ගිහින් කියනවා, "එච්චර බදු ගෙවන්න ඕනෑ නැහැ. මේ මේ විධියට බදු ගෙවන්න" කියලා ඒ Sheet එක හදලා දෙන බව. ඒක හදලා දෙන ගමන් අත යටින් ගණනක් ගන්නවා. එවැනි නිලධාරීන් සිටිනවාය කියන කාරණයත් අපි සඳහන් කරන්න ඕනෑ. ඒ ආකාරයට ක්‍රියා කරන නිලධාරීන් අල්ලා ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් අපි සකස් කර ගත යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම බදු ගෙවන අයට පහසුකම් ලබා දීම සිදු කළ යුතුයි. බදු ගෙවන අයට අපි තව තවත් පහසුකම් ලබා දිය යුතුයි. මම දන්නවා, දැනටමත් කාඩ් පතක් නිකුත් කරලා යම් යම් ආකර්ෂණීය වැඩ පිළිවෙළක් බදු ගෙවන අයට මේ රජය ලබා දීලා තිබෙන බව. ඒක තවත් ව්‍යාප්ත කරන්න ඕනෑ. ඒ අයට යම් යම් සහන දෙන්න ඕනෑ. ඒ අය යන එන ගමන්වලදී ගුවන් තොටුපොළේදී විශේෂ සැලකිලි දෙන්න ඕනෑ. මොකද, ඒ අය මේ රටේ සංවර්ධනයට දායක වන නිසා. ඒ වාගේම ඒ අයට හැඟීමක් ඇති කරන්න ඕනෑ, ඒ අය දෙන බදු මුදලින් තමයි අපේ රටේ සංවර්ධනය සිදු වන්නේ කියලා. නිරන්තරයෙන් ඒ අය අගය කරන්න ඕනෑ. හරියාකාරව බදු ගෙවන්නන් අගය කිරීමේ වැඩ පිළිවෙළක් රජය සතු විය යුතුයි. එවැනි වැඩ පිළිවෙළක් සකස් කරයි කියලා මම විශ්වාස කරනවා. අද බොහෝ අයට සම්මාන ලබා දීමේ, අගය කිරීමේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වෙනවා. බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ උත්සව පවත්වලා ඒ වාගේ දේවල් කරනවා. ඒක හොඳයි. අපි දන්නවා නව නිපැයුම්කරුවන්ට සම්මාන ලබා දීම්, ඒ වාගේම විවිධ ක්ෂේත්‍රවලින් ඉහළට ආපු අයට සම්මාන ලබා දීම් වාගේ කටයුතු බොහොමයක් සිදු වනවා. ඒ විධියට හරියාකාරව බදු ගෙවන අය, මේ රටේ සංවර්ධනයට නියම ආකාරයට දායක වන අය විධියට හඳුන්වලා ඒ අයත් මේ වාගේ ස්ථානවලට ගෙනැල්ලා අගය කිරීම් කළ යුතුයි කියලා මම මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට මේ අවස්ථාවේදී යෝජනා කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ඩොලර් එක සම්බන්ධයෙන් පුදුම කථාවක් කිව්වා. ඩොලර් එකේ අගය වැඩි වන විට මේ පාර්ලිමේන්තුවේදී බෙරිහන් දෙනවා ඩොලර් එක වැඩියි කියලා. දැන් රටට අමාරුයි, රටේ අකාර්යක්ෂම පාලනය නිසා තමයි ඩොලර් එකේ අගය වැඩි වෙන්නේ කියනවා. මහ බැංකුවේ අධිපතිගේ වැරැද්ද නිසා තමයි ඩොලර් එක වැඩි වෙන්නේ කියනවා. හැම වෙලාවේම මහ බැංකුවේ අධිපතිට බණින එක නේ කරන්නේ. ඩොලර් එක වැඩි වෙන්නේ ඒකයි කිව්වා. දැන් මේ දවස්වල ඩොලර් එකේ අගය ටිකක් අඩු වන විට ඒකටත් බණිනවා.

[ගරු මහින්ද අමරවීර මහතා]

මහ බැංකුවේ අධිපතිටත් බණිනවා. ආණ්ඩුවටත් බණිනවා. මොකක්ද, මේ දෙබිඩි කථාව. ඩොලර් එකේ අගය වැඩි වෙන කොටත් බණිනවා; අඩු වෙන කොටත් බණිනවා. අද එතුමාගේ කථාවේ වැදගත් කිසිම දෙයක් තිබුණේ නැහැ. එතුමා පත්තර වාර්තා කැලි ටිකක් ගෙනැල්ලා කියෙව්වා. මේවාද, කථා? මේවා පට්ටපල් අසත්‍ය. අද සමහර පත්තරවලට ලියන්න මාතෘකා නැති වුණාම කවුරු හරි කිව්වාය කියලා මොනවා හෝ ලියනවා. පත්තරවල තිබෙන ඔක්කොම අසත්‍ය කියලා මම කියන්නේ නැහැ. ඒ ගොල්ලන් හොඳ සේවයක් කරනවා. හොඳ කාර්ය භාරයක් කරනවා. හැබැයි, සමහර වෙලාවට ඒ පත්තරවල සත්‍ය නොවන තොරතුරුත් පළ කරනවා. අපි කියන ඒවාත් පළ කරනවා නේ. අපි - දේශපාලනඥයෝ- අසත්‍ය සංඛ්‍යාලේඛන කිව්වත් ඒවාත් පළ කරනවා. එහෙම තත්ත්වයක් තිබෙනවා. ඒ ගොල්ලන්ට ගිහිල්ලා හැම එකක් ගැනම තොරතුරු සොයා ගන්න වෙන්නේ නැහැ නේ. ඒවා ගවේෂණාත්මක ලිපි නොවෙයි නේ. සමහර ඒවා කවුරුවත් කියන දේවල්. ඉතින් ඒ වාගේ ලිපියක් දෙකක් ගෙනැල්ලා මෙතැන කියවලා, ඒවා හැන්සාඩ් වාර්තාවට දමන්නය කියන එක නොවෙයි වගකීම. එතුමා ඔව්වරටම දක්ෂයෙක් නම්, ආර්ථික විශේෂඥයෙක් නම්, ගණකාධිකාරීවරයෙක් නම් එතුමා සොයා ගත් තොරතුරුයි මෙතැන කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය ඒ වාගේ මන්ත්‍රීවරයෙක් යොදවලා තිබෙන්නේ පත්තරවල තිබෙන ඒවා කියවන්න නොවෙයි. මම හිතන්නේ ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා නම් බොහෝ දුරට ඒ වාගේ දේවල් සොයලා තමයි කියන්නේ. එතුමා පත්තර වාර්තා කියවනවා අඩුයි. මම හිතනවා එතුමාගෙන්වත් ඉගෙන ගත්තා නම් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට හොඳ කථාවක් කරන්න පුළුවන් වෙයි කියලා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. M.A. Sumanthiran. You have 30 minutes.

[1.15 p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Sir, the Deputy Minister of Finance and Planning initially referred to the fact that all of these Bills were challenged in the Supreme Court for their constitutionality and announced to the House that through this pre-enactment review process, the Supreme Court has found nothing unconstitutional in any of these Bills that have been moved today. This is hardly surprising after the events of 15th January this year and the Hon. Minister was perhaps announcing the fact that this is what was sought by the Government, of a Judiciary that is amenable, a Judiciary that is under the thumb of the Executive and that it has now started delivering for the Government. That is a sad indictment on the Judiciary.

As you read each of these Determinations, you feel sorry for the way in which serious issues of retrospectivity, of classification, of validity have been dealt with. Fiscal policy of the Government has been acknowledged as of paramount importance to which even the forum, the Supreme Court, must bow down to.

What was challenged in the Supreme Court was with regard to the constitutionality of these Bills and that ought to have been examined properly without sermonizing on what the Government's fiscal policy is. That is not a matter for the Supreme Court. Nevertheless, that is what we have in these Determinations today.

If one is to look at the amendments that have been brought, the most damaging one appears in the Fiscal Management (Responsibility) (Amendment) Bill. Section 3 of the Fiscal Management (Responsibility) Act No. 3 of 2003 is sought to be amended. This House knows the history with regard to the Fiscal Management (Responsibility) Act that was brought in the year 2003.

Parliament, in the exercise of its constitutionally mandated responsibility of being in total control over public finance, saw it fit to give expression to that responsibility by way of the Fiscal Management (Responsibility) Act. In that, in the year 2003, certain safeguards were brought in and what is relevant today of those safeguards is that the country is not made indebted in such a way that succeeding generations will inherit that debt and the country will not be totally bound and chained by these fetters of debt and that it was the responsibility of whoever who had the responsibility to manage the fiscal policy to ensure that certain targets were met. One of those targets was that the State Guarantee for loans does not exceed 4.5 per centum for a particular year. Now, that is sought to be increased to 7 per cent, a huge increase. Why was that limit brought in? That limit was brought in because otherwise State Guarantees are directly chargeable on the Consolidated Fund. The moment you default, it is chargeable on the Consolidated Fund. The country's resources can be whisked away by the creditor and, therefore, there was going to be a limit on those guarantees. So, 4.5 per cent was set. There was no explanation given either in the Budget Proposals or in the Budget Speech or today by the Deputy Minister of Finance and Planning as to why this is being extended to 7 per cent, as high as 7 per cent. Of course, by bringing this very amendment, the Government is showing that it is in need of borrowing more and more and it is in need of giving State Guarantees for those loans.

When the Mattala Airport was opened, it was stated there rather apologetically by the Minister of Finance and Planning that we are not borrowing all these monies for our own use - I do not know why he thought of his own use unless that was also uppermost in his mind - but that it was being borrowed for development work. When a country's portfolio is as bad as what we have, when the debt portfolio is as bad as what we have, we must have development but that development must be sustainable development; that development must be people's

development and that development must necessarily have a view of changing that debt portfolio. It should not be development that will further -

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. (Dr.) Harsha De Silva, what is your point of Order?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපට සංශෝධන බෙදනවා. ඒ, කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරනු ලබන සංශෝධන. දැන් හතර වන කථාව කරන්නේ. මේක පුදුම වැඩක් නේ. අපි කොහොමද කථා කරන්නේ? දැන් වෙලාව ප.ව. 1.30යි. අපි කොහොමද මේවා ගැන කථා කරන්නේ? කථා කරලා ඉවර වුණාම නේ සංශෝධන දෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම කරන්න බැහැ. මේක නවත්වන්න. **Adjourn** කරන්න. **Adjourn** කරලා සංශෝධන ටික දෙන්න. සංශෝධන ටික දුන්නාට පසු කථා කරන්න. දැන් **Adjourn** කරන්න. මේක ඔබතුමාට කරන්න බැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මේ ගැන තීරණයක් ගන්නා තුරු ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
සංශෝධනවලට විපක්ෂව කාරක සභා අවස්ථාවේදී විරුද්ධ පක්ෂයට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. සංශෝධනවලට පක්ෂවද විපක්ෂවද කියන එක කාරක සභා අවස්ථාවේදී සලකා බලන්න. ඒ නිසා මීට අදාළ පාර්ලිමේන්තු සම්ප්‍රදාය පිළිබඳ තේරුමක් තියෙන්න ඕනෑ. ඕනෑ වෙලාවක රජයේ සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්. මේක කාරක සභා අවස්ථාවේදීයි සලකා බලන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
සංශෝධන ඉදිරිපත් කරන අවස්ථාවේදී මේවා ගැන හොයා බලන්න අපටත් අවස්ථාවක් දෙන්න. කථාව ඉවර වුණාම නේ දෙන්නේ. ඇමතිතුමා සංශෝධන ඉදිරිපත් කරලා ඉවරයි.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Sir. I also associate myself with the point of Order raised during the course of my speech by the Hon. (Dr.) Harsha De Silva, the National List Member from the UNP. If the Committee Stage Amendments had been taken up at the Consultative Committee, those ought to have been distributed prior to the Hon. Deputy Minister moving the Second Reading of the Bills this morning. This is highly irregular although the Hon. Minister of Education defends by saying that according to the Standing Orders, the Government can introduce Amendments at any stage, but it is the Opposition that must give notice. While that may be true, it hardly can be said to be the proper process that halfway through the Debate, these suggested Committee Stage Amendments are being distributed.

Many of the speeches made will wholly be irrelevant now because those may have touched on those areas. Then, you find that there are Committee Stage Amendments, which come in much later. So, I also wish to associate myself with the objection raised by the Hon. (Dr.) Harsha De Silva and say that this practice must be discontinued forthwith.

Sir, I was on the issue of increasing the limit of the State Guarantee for loans and development. What do we intend achieving by development, particularly by the Mattala Rajapaksa International Airport? What is the income that that investment is going to bring into the country? If the purpose of amending the limit from 4.5 to 7 per cent is so that the Government can borrow more and the Hon. Minister of Finance and Planning can grant State Guarantees at his will, extending to 7 per cent, there are two things that will happen. One, as I said before, several future generations will be indebted to those who lend. The second is, when we are unable to pay, the creditor can charge directly on the Consolidated Fund. We know that there are countries which lend at high interest rates - 6 per cent and so on - particularly the Chinese, from whom we seem to borrow quite a bit and their track record, particularly in Africa, is that when they lend more than those countries can ever hope to repay and when those countries default, their natural resources are taken by the lender. So, this is a very serious issue. We talk so much about sovereignty; we talk so much about protecting our territorial integrity, but our natural resources, all of the resources we have including the human resources and the capital of this country, must be protected. That is why there is a limit prescribed. Otherwise, there need not be a limit. As I said, extending it from 4.5 to 7 per cent is a huge extension, for which no explanation has been given except the desire of the Government to borrow more and more and invest them in projects, apart form their own personal projects that do not give a return to the country.

Then, look at the next Amendment to Clause 2(b) of the Fiscal Management (Responsibility) (Amendment) Bill. There was a target that had to be met and it was to be achieved by 2013: one part, which is 85 per cent, by 2006 and the other, by 2013. Now, that has been extended up to 2020. The fact that we have not been able to reach that target is one matter, but this is said to be the fiscal policy of the Government. The Supreme Court has pronounced that this is the fiscal policy. How can this be

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

the fiscal policy? There was a policy and in accordance with that policy, certain targets were prescribed. Being unable to meet those targets, you relax the targets and then call it the Government's fiscal policy. That cannot be.

Similarly, there are Amendments being made to the Finance Bill.

The main objection there will be to the Minister being given the discretion to make various exemptions and a very interesting argument has been advanced in these Determinations. That is, this has to be given to the Executive to do because there is pressure on Parliamentary time. The Supreme Court is so concerned about the Parliament's time, and there is a heading on page five of the Determination on the Finance (Amendment) Bill which states, "Pressure on Parliamentary time". Therefore, they want to take away some of the functions of Parliament, not give us too much work to do; they are very concerned that we are overloaded with work. This Parliament does not have that much of work. This Parliament, in addition to itself abdicating its duty, has been robbed of several of its constitutional duties like full control over public finance, and the Supreme Court has the gall to say, "There is pressure on Parliamentary time. Therefore, let us leave it to the Minister to decide and prescribe on what exemptions are to be made". Now, this is a very serious issue. Those who speak of Parliamentary supremacy will not raise a voice against this kind of thing where a backhanded compliment is being given to Parliament saying, "You have too much work to do. Leave it to the Executive". Who is saying that? The Judiciary is saying that, and we shout hoarse about Parliamentary supremacy over other organs of Government, and when even constitutionally-mandated provisions are being taken away from Parliament, we remain mute.

There are other features like the Betting and Gaming Levy (Amendment) Bill, and I want to address that issue. The Supreme Court itself has recognized in this Determination that is here today that it maybe an illegal trade. They seem to be unsure whether it is illegal or not. They say, "possibly an illegal trade". It is an illegal trade. But, we earn revenue off an illegal trade, and I say with responsibility this is not something that we should do. The legislative policy is very clear, has declared betting and gaming as illegal trades, and then nevertheless, we go ahead and prescribe revenue measures that the State earns off that illegal trade and that ought not to be.

There are a very few positive features also and I want to commend the Government for that. For instance, one of the amendments in the Tax Appeals Commission (Amendment) Bill is bringing in an appeal from the Director-General of Customs to be made to the Tax Appeals Commission. That is a welcome amendment because until now there was no review process for determinations that were being made under the Customs Ordinance. The appeals were to the Director-General himself.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SHANTHA BANDARA *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Deputy Chairman of Committees, I was saying that there are some positive features in the Amendments that have been brought in and one of those is provision for an appeal from the determination of the Director-General of Customs. Until now, any appeal was to the Director-General, the Head of that Department. But, with the advancement that we have in today's modern world, that hardly is an appeal. And, as far as I know, the Director-General never overturns any determination by his subordinate officers. So, an appeal to an independent body like the Tax Appeals Commission - one hopes that the body will be independent - is a welcome change. I wish to commend the Government for that.

But, overall, various exemptions are sought to be given. The Parliamentary supervision, where up to now the requirement of Parliament having to approve certain changes, is being taken away and a discretion is being given to the Ministers concerned. For instance, prescription of various fees: it says Rs. 5, Rs. 50 or any other figure, as may be prescribed. Now, it maybe that it is efficient, it is convenient, but nevertheless, there is no gainsaying that it actually takes away the power of Parliament to keep a tight control over public finance. Those kinds of Amendments that are being brought in, although some of those are, in fact, Budget Proposals, are detrimental to the economy of this country, particularly the debt portfolio that I highlighted. The provision that is being made today to further commit this country to huge debts without accountability by the Executive is something that we need to be conscious about and oppose.

Thank you very much.

[1.38 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Chairman of Committees, today it has fallen on the shoulders of the Members of this Legislature to pass various Amendments, which form part of the monetary Bills that are being taken up. These envisage the revival of the economy and also to drive this country to be a progressive land. In this context, Sir, we have to concentrate on many areas such as the evil forces, the conspirators and the bad eggs who are endeavouring day in and day out to bring disrepute to this country. We are a very small nation - the Pearl of the Indian Ocean - which, after 30 years of fighting cruel, dastardly and demonly forces, is trying to raise its head. For this economic revival, His Excellency Mahinda Rajapaksa is giving the guidance, the indictment and the correct leadership. It is through the economic revival that we could live as a happy and prosperous nation. This is what our President, all the Members of the Cabinet and the Members of the Government are striving to do and achieve.

If anybody would stand in the path of this progress, he could be easily named as a traitor because he is holding flags of some others, not the Sri Lankan Flag.

See what happened this morning. I must make a hurried reference to that. The leader of the TNA, the Hon. Rajavarothiam Sampanthan, spoke this morning. I was associated with his father, Mr. Rajavarothiam, and even went to some of his meetings at that time in Trincomalee with my close friend Senator S.Z.M. Mashoor Moulana. At that time, they, the Federal Party, under *Thanthai* Chelvanayakam fought to have federalism, but within a united Sri Lanka. In this context, they had dialogues with the late Hon. S.W.R.D. Bandaranaike first. When those failed, the late Hon. Dudley Senanayake invited that great man, the Hon. S.J.V. Chelvanayakam, for talks. He readily agreed. He did not say, "You Sinhalese leaders have betrayed us. Therefore, I will not come to you". No, that was not his political sagacity and wisdom. He readily agreed and went for talks and they also brought out an agreement. He never closed the door of dialogue.

Today, in this imbroglio, the Government is inviting the TNA to come for talks. The Parliamentary Select Committee is the correct forum because if the President or the Government would talk only with the TNA, there are other Tamil parties such as the EPDP which oppose it. Even Muslims would oppose it. If they talk only with the Muslim Congress, the other Muslim political parties such as the Hon. Risad Badhiutheen's All Ceylon Makkal Congress or the People's Congress, the Hon. Athaullah's National Congress and other parties would oppose. All these forces and parties which represent various communities, ethnic groups and languages are represented in this Parliament. That is the best place where we could evolve a better system in order to bring solace to all people, which we aspire and pray for this country. If they say they cannot come for talks, okay, then what?

இவர்கள் காவடி தூக்கிக்கொண்டு தமிழ்நாட்டுக்குச் செல்கின்றார்கள்; ஜெனீவாவுக்குச் செல்கின்றார்கள்; அமெரிக்காவுக்குச் செல்கின்றார்கள்; நோர்வேக்குச் செல்கின்றார்கள். சேர், நான் உங்களிடத்தில் ஒரு simple question ஐக் கேட்கின்றேன். நீங்கள் இந்த நாட்டிலே பிறந்தவர்; இந்த நாட்டிலுள்ள நீரைக் குடிப்பவர்; இந்த நாட்டிலே விளைகின்ற சோற்றைச் சாப்பிடுகின்றவர்; இந்த நாட்டிலே வீசுகின்ற தென்றலைச் சுவாசிக்கின்றவர். ஆகையால், இந்த நாட்டிலே பிறந்த நீங்கள் இந்த நாட்டிலேதான் மறைவீர்கள். நானும் ஒரு முஸ்லிம் என்ற வகையிலே அப்படித்தான். நாங்கள் எங்களுடைய பிரச்சினைகளை அங்கே போய்ச் சொல்வதன் மூலம் அவர்களால் என்ன ஈட்டிக்கொள்ள முடியும்?

This morning, the Hon. Sampanthan was shedding crocodile tears on behalf of the Muslims. Sheer hypocrisy! Sheer hypocrisy!! He has shown to the Muslim World and to the entire diaspora that there is no other

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

better than him. He must be awarded and also crowned for that. A hundred thousand Muslims were chased away overnight from Jaffna. They were living happily in the Jaffna Peninsula for centuries. That was the land that gave us the great scholar A.M.A. Azeez; that was the land that gave us the famous Supreme Court Judge Alhaj M.M. Abdul Cader; that was the land that gave us the first Muslim Mayor Quazi, M.M. Sultan. Not a word was spoken about them.

Distinguished representatives from the Indian Government were in the distinguished Gallery in the morning. They came forward to build 50,000 houses. We raised that question. The TNA would not think of allocating a single house to the Muslims. All these houses, I say, must actually be given to the Muslims because they were chased away from their land of birth. They were the real victims. It was they who suffered and not the TNA. The war between the Government forces and the LTTE is a different matter. The Muslims were chased away and they are still in refugee camps in Puttalam and other areas.

I think the Hon. Sooriyapperuma *Archaryathuma* knows these things. He has gone there; we are going there. Who is helping the Jaffna Tamils, I ask? Is it the TNA? No. It is the Hon. Douglas Devananda. The community there is very grateful to him. He is distributing tin sheets; he is building houses for them; he opens housing schemes and technical institutions there. He very often goes to the Muslim areas - to the Moor Street.

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

The Osmaniya College is going to celebrate its 100th year soon. I told the Hon. Minister of Postal Services, the Hon. Jeewan Kumaranatunga, that he must print a stamp for us when we mark that historic occasion. The Jaffna Osmaniya College is a great seat of learning in the North. The Khadija Girls' College is also a great institution of learning. Al-Manar in Marathamunai in Kalmunai in the Eastern Province is also celebrating its 100th year. We must at least have a stamp printed when we commemorate these great events of those great institutions. This is the way the Government is helping our Muslims. This is the way they are getting every one of us together.

After winning the election, the Hon. Sampanthan never set foot to his own area, Thennamaravadi in the Trincomalee District. Shame on him! I went there for an election. The people in the area were crying. They have no electricity. They have no houses. Their houses are broken because of the LTTE attacks. Thirty years ago they went from the villages to the forests of Mullaitivu and Vavuniya and lived as refugees. After this Government came into power, they came and said, "Sir, give us a road; give us a hospital; give us a maternity home".

Sir, I am very happy to state that under the direction of His Excellency President Mahinda Rajapaksa, it was only last week that the Hon. Susantha Punchinilame went to Thennamaravadi with Thoweek Adambawa, Vice-Chairman of Pulmoddai Pradeshiya Sabha and laid the foundation stone for a school. Now, this is the way we are helping the Tamils, not TNA. Now, Sir, when the Hon. Sampanthan was speaking in the morning I had to interrupt and ask him "What about the Jaffna Muslims who were chased away within 24 hours; what about the Muslims you have mercilessly massacred while they were praying in the Kattankudy Mosque; what about the Muslims you mercilessly cut and chopped into pieces in Eravur; what about the Buddhist Priests of Aranthalawa who were brutally slaughtered there?" This is what I told the Foreign Ministers and Gurus who came here. Today, the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

is unashamedly -

அவர் இங்கே வேட்டி உடுத்திக்கொண்டுதான் பேசினாரோ தெரியவில்லை சேர். இங்கே முஸ்லிம்களுக்காகக் கண்ணீர் வடிக்கின்றார். நாங்கள் அதற்கு எதிர்ப்பல்ல. முஸ்லிம் களுடைய உரிமைகளைக் காப்பது எங்களுடைய கடமை! முஸ்லிம்களுடைய உரிமைகள், கலை, கலாசாரம், மத வழிபாட்டுத்தலங்கள் என்பவற்றைக் காப்பதில் முன்னணி வகிப்பவர்களில் நானும் ஒருவன் என்பதை இச்சபையினூடாக அனைவருக்கும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். ஏனென்றால், நாளைக்கு சில பத்திரிகைகளில், "கௌரவ சம்பந்தன் அவர்கள் முஸ்லிம்களுடைய பிரச்சினைகளைப் பற்றிச் சபையில் பேசும்பொழுது, அஸ்வர் ஹாஜியாரும் காதர் ஹாஜியாரும் அதற்கு எதிர்ப்புத் தெரிவித்தார்கள்" என்ற ஓர் உண்மையற்ற செய்தி வெளிவரும். ஆகவே, இந்த விடயங் களைச் சரியாகப் பிரசுரிக்க வேண்டுமென்று, குறிப்பாக அன்புக்குரிய தமிழ் ஊடக சகோதரர்களைக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

Did you listen to the news broadcast on a private channel last night at 9.00 o' clock? It said, "Tamil Nadu opposed the Indian Delegation coming here. As a result, they are not coming here". Today, early morning, Mr. Hudson Samarasinghe, the Chairman of the SLBC, announced on "Dasa Desin" - "දස දෙසින්"- that they have arrived. We all listened and felt happy. That private channel is their channel. What greedy happiness they enjoy by spreading such false news! They will be happy if the Indians do not come. The TNA would have been happy if they did not come.

Sir, you also attended the sumptuous lunch given by the Hon. Speaker today to the Indian Delegation on the fourth floor. How happy they were! They told us that they have come here to explore the possibility of expansion of trade, to build bridges between Sri Lanka and India and also be very much closer to Sri Lanka and cooperate with us. The Indian High Commissioner, His Excellency Ashok K. Kantha, was also there. I told him, "It is a tragedy that we are going to lose you soon because you are going to be the Secretary in charge of East Asia. You are a person who has been helping us. You know every inch of the land in Jaffna and other places in the Eastern Province. Innumerable help and assistance came our way after you came here as the High Commissioner of India to this country." The Tamil Nadu must know about the hospitality extended by the Hon. Speaker to the Indian Delegation. Their arrival here is a blow to the Tamil Nadu. You may shout in the South, but there is a very close relationship between the Northern block and the Southern block of Delhi. We will do what we think right and they have done what they think right. They sent the Delegation here. That is a terrible blow to the Tamil Nadu, to Jayalalitha. Jayalalitha is a lady who wants to win the election. அவருக்கு ஏட்டிக்குப் போட்டியாக கலைஞர் கருணாநிதியும் களமிறங்கியுள்ளார். இதனால்தான் அவர், "இலங்கையில் தமிழர்களுக்கு எவ்வளவோ அநியாயங்கள் நடக்கின்றன" என்று சொல்கின்றார். இப்போது இங்கே வந்த இந்திய தூதுக்குழுவினர் -

"We bear witness to the peaceful atmosphere prevailing here", they would say. The Delegation consisted of the Hon. Saugata Roy, the All India Trinamool Congress, Lok Sabha; the Hon. Prakash Javadekar, the Bharatiya Janata Party, Rajya Sabha; the Hon. Sandeep Dikshit, the Indian National Congress, Lok Sabha; the Hon. Anurag Thakur, the Bharatiya Janata Party, Lokh Sabha and the Hon. Dhananjay Singh, the Bahujan Samaj Party, Lok Sabha.

Sir, I think the Minister, Hon. Bandula Gunawardane wants me to carry on until he comes. I do not know whether you can give me another five minutes.

The Delegation also consisted of the Hon. Madhu Goud Yaskhi, the Indian National Congress, Lok Sabha; Ms. Jyoti Malhotra, Convenor, the Forums of Parliamentarians, FICCI and Mr. Tuhin Subhro Chakraborty, the Official Forums of Parliamentarians, FICCI from the highest Legislature of India. It was a high level Delegation who was allowed to enter this country. They are going tomorrow to Jaffna to see the beauty of the land and to see for themselves the development there.

I ask, Sir, when the TNA and their henchmen went to Geneva, did they talk about the Muslim problems in Jaffna? Did they talk about the massacre of the Kattankudy Muslims? Why are they having this duplicity - the double standard - and hypocrisy at the highest level? Do not do that. Not only the Tamil Nadu, but also the whole world would not regard you hereafter. Your integrity is lost today. You should have left us alone. முஸ்லிம்களுடைய பிரச்சினைகளை நாங்கள் தீர்த்துக்கொள்வோம். அதைத்தான் எங்களுடைய அரும்பெரும் தலைவர் டாக்டர் ரி.பி. ஜாயா அவர்கள் - එදා the Hon. (Dr.) T.B. Jayah සුද්දන්ට මෙහෙම කිව්වා: "You go from this country, my colonial masters!

We will solve our problem, if there are any, with our elderly brothers, the Sinhalese and also the Tamils. That is the attitude. That is the political guidance given to us by Dr. Jayah. Therefore, Sir, I would kindly ask the Hon. Sampanthan to give to the Muslims their lands in Mullaitivu -*"முஸ்லிம்களின் குடியேற்றத்தை வலியுறுத்தி கூட்டமைப்புக்கு எதிராக முல்லையில் ஆர்ப்பாட்டம்"* என்ற தலைப்பில் தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கு எதிராக 'சுடர்ஒளி' பத்திரிகையில் செய்தி வெளிவந்திருப்பது மிகவும் பிரமாதம்! அதேபோன்றுதான் இங்கே பாருங்கள்! They are asking back their lands, Sir.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, please wind up now.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I am finishing with this.

Page A8 of "Daily Mirror" of April 9, 2013 states under the caption, "Alienation of Land to Resettle Returning Muslims : Mullaitivu Muslims Protest Against TNA Claims" and I quote:

> "…the Muslim community in the Mullaitivu District had pooh poohed these claims alleging that this was a conspiracy that was being hatched by the TNA to create havoc in the north once again."

I ask, "Hon. Sampanthan, why can you not talk about this" ?

Thank you.

[අ.භා. 1.55]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය යෝජනාවලට අදාළව සහ ඊට පරිබාහිරව සකස් කළ යෝජනා සහිතව අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් පිළිබඳව වූ මෙම වැදගත් විවාදය ආණ්ඩු පක්ෂය විසින් නොවැදගත් විවාදයක තත්ත්වයට පත් කර තිබෙනවා. මේ පනත් කෙටුම්පත්වලට අදාළ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට, ඒ ගැන අධ්‍යයනය කරන්න මන්ත්‍රීවරුන්ට ප්‍රමාණවත් කාලයක් දෙන්න කියලා ගරු කථානායකතුමා මීට කලිනුත් නියෝගයන් දුන්නා. විශේෂයෙන් මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන්. ගරු ඇමතිතුමනි, මා දැන් කථා නොකර මීට කලින් කථා කළා නම්, මේ දැන් ඉදිරිපත් කර තිබෙන සංශෝධන ගැන මා දන්නේ නැහැ. මොකද, සංශෝධනවලට ඉදිරිපත් කර තිබෙන සංශෝධන ඊට වඩා ලොකුයි.

බදු අභියාචනා කොමිෂන් සභා පනතට සංශෝධනයක් ගෙනාවා. ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කළා. ශ්‍රේෂ්ඨාධිකරණයේත් ඒක විභාග කරලා අද මේ සභාවට ඉදිරිපත් කළ අවස්ථාව වෙනකොටත්, මට කලින් කථා කළ මන්ත්‍රීවරු මේ සංශෝධන දන්නේ නැහැ. ඇයි ඒ? ඒ සංශෝධන මෙතැනට ඉදිරිපත් කරන්නේ කථා කරමින් ඉන්නකොට. මා මීට කලින් කථා කළා නම් මේ සංශෝධන මොනවාද කියලා මා දන්නේ නැහැ. එතකොට කොහොමද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මන්ත්‍රීවරුන් හැටියට අපි ගරුත්වයක් ඇතිව විෂය ගැන අධ්‍යයනය කරලා කථා කරන්නේ? විෂයකට අදාළ නැතිව ඕනෑම වල්පල් ටිකක් කථා කරනවා නම්, වල්බූරු කථාවක් කරනවා නම් ඒක කරන්න පුළුවන්. ගරු ඇමතිතුමා ඇවිත් ඉදිරිපත් කරන කරුණු එතුමා වෙනස් කරන්නේ නැති නිසා එතුමාට ප්‍රශ්නයකුත් නැහැ. එතුමා ඉදිරිපත් කරන්නේ ආණ්ඩුවේ මතය. එතුමාට මේ සංශෝධන අදාළත් නැහැ; අනෙක් අයට අදාළත් නැහැ. නමුත් අපට එහෙම නොවෙයි. අපි විෂයයක් ගැන කථා කරනවා.

දැන් බලන්න. ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පතට ඉදිරිපත් කළ සංශෝධනවලට වඩා ලොකුයි දැන් සභාගත කර තිබෙන සංශෝධන. අද සවස් වෙනකොට තව මොන මොනවා ඉදිරිපත් කරයිද කියන්න මා දන්නේ නැහැ. ඒ නිසා මේක විකාරයක්. ඒ විකාරයට යටත්ව තමයි මට මේ කථාව කරන්නට සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය කියන්නේ, රටේ ජනතාවගේ ගරුත්වයයි. ඒ ගරුත්වය මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම හැල්ලු කරන බව විතරක් මම කියන්න ඕනෑ. ඒ ගැන කනගාටුයි, රටේ ජනතාව වෙනුවෙන්. ඡන්දය දුන්නාට පස්සේ ඊළඟ ඡන්දය එන තුරු රටේ ජනතාවටත් මේ ගැන ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒ ජනතාව නියෝජනය කරමින් තමයි අපි මෙතැනට ඇවිත් ඉන්නේ. ඒ නිසා මේවා අධ්‍යයනය කරලා නිසි පරිදි කථා කරන්න අපට ආත්ම ගෞරවයක්, වගකීමක් තිබෙනවා. එක්කෝ උදේ පාර්ලිමේන්තුව පටන් ගනිද්දීම කියන්න ඕනෑ, සවස් වන තුරුම මග හිටව හිටවා යන ප්‍රයිවට් බස් වාගේ සැරින් සැරේ සංශෝධන එනවා කියලා. ඒ මොකුත් දන්නේ නැතිව අපි විෂයයක් ගැන කථා කරන්න එනවා. නමුත් කථා කරන්න ඕනෑ මොකක් ද කියලා අපට දැන ගන්න විධියක් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සංශෝධන විකාරයක්.

මීට කලින් රේගු ආඥාපනත සංශෝධනය කරන වෙලාවේදී, ඒ සාකච්ඡාවේදී අපි බදු අභියාචනා කොමිෂන් සභාව ගැන කථා

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

කළා. එහි තිබෙන බරපතළකම අපි එදා පෙන්නුවා. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය සුපුරුදු විධියටම, අප බලාපොරොත්තු වෙච්ච විධියටම කිසිම විග්‍රහයක් නොකර ඒ සියල්ල අනුමත කර තිබෙනවා. ගැටලුව තිබෙන්නේ මේකයි ගරු ඇමතිතුමනි. මෙම පනත් කෙටුම්පත අද සම්මත කළාම ඒක විපක්ෂයේ අපට නොවෙයි, මේ ආණ්ඩුවටම අභියෝගයක් වෙනවා. මා තමුන්නාන්සේට මේ කාරණය අවධාරණය කළා. [බාධා කිරීමක්] මට කථා කරන්න තිබෙන්නේ විනාඩි 12යි, ගරු ඇමතිතුමා. [බාධා කිරීමක්] හරි. හරි. ඒක ඔබතුමාට භාරයි. මා මේ මගේ අදහසයි ඉදිරිපත් කරන්නේ. මෙතැන තිබෙන විශේෂ දෙය මෙයයි. රේගුවට අදාළ තීරුබදු සම්බන්ධයෙන්, දඩයක් පැනවීම සම්බන්ධයෙන්, ඒ ගාස්තු අය කිරීම සම්බන්ධයෙන්, බදු අය කිරීම සම්බන්ධයෙන් ඇති ගැටලුවක් - dispute එකක්- සම්බන්ධයෙන් යම් තැනැත්තෙක් බදු අභියාචනා කොමිෂන් සභාවට appeal එකක් දැම්මාට පස්සේ, ඒ ඉල්ලීම ඉදිරිපත් කළාට පස්සේ ඒක සම්පූර්ණයෙන්ම රේගු ක්‍රියාවලියෙන් ඉවත් වෙනවා. ඒක සම්පූර්ණයෙන්ම විෂයභාර ඇමතිවරයාගෙන් ඉවත් වෙනවා. ඊට පස්සේ ඒ ප්‍රශ්නය බදු අභියාචනා කොමිෂන් සභාව සහ අදාළ තැනැත්තා අතර ඇති ක්‍රියාවලියක් බවට පත් වෙනවා. ඒ ක්‍රියාවලියේදී ඒ දෙන කිත්වූව තමයි අවසානයේදී ක්‍රියාත්මක වෙන්නේ. එතැනයි ගැටලුව තිබෙන්නේ. එම නිසා මෙවැනි යාන්ත්‍රණයක් හැදෙනවා නම්, අඩු තරමේ අතරමැදි තැනක් තිබෙන්න ඕනෑ. ඒ යාන්ත්‍රණය හදන්න ඕනෑ රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා. එහෙම නැත්නම් මේ විෂයය ගැන දන්නා, විෂයට අදාළ වූ පාර්ශ්ව සම්බන්ධ වූ ව්‍යුහයක් විසින්. එහිදී ඇත්තටම විෂයය භාර ඇමතිවරයාගේ බලතල රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතලවලට වඩා ඉහළින් තියන්න හොඳ නැහැ. ඊට වඩා පහළින් තමයි තියන්න ඕනෑ.

නමුත් අද ඒ තත්ත්වය වෙනස් කර තිබෙනවා. රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පැත්තෙන්, වෘත්තීය සමිති පැත්තෙන් ආපු උද්ඝෝෂණය නිසා තමුන්නාන්සේලා ත්‍යාග අරමුදල් පැහැර ගැනීමේ ක්‍රියාවලිය ඉවත් කර ගත්තා. ඒකෙන් අය සනසා, බදු අභියාචනා කොමිෂන් සභාව රේගු පනතට අදාළ කළා. ඒක තමයි අද මේ සම්මත කරන්නේ. මේ සම්මත කිරීම තුළ, ත්‍යාග අරමුදල් බලාපොරොත්තුව ඉන්න අයගේ ඒ බලාපොරොත්තුව ඉෂ්ට වන්නේ නැහැ. මොකද, රේගු දණ්ඩනයක් ලද පුද්ගලයා ඒක ගැටලුවක් හැටියට සලකා බදු අභියාචනා කොමිෂන් සභාවට පැමිණිලි කළාම ඒ ත්‍යාග හම්බ වන්නේ නැති නිසා. ත්‍යාග අරමුදල් පැහැර නොගන්නවාය කියා සැනසිල්ලට පත් වුණ වෘත්තීය සමිතිවලටත් තමුන්නාන්සේලා අවසානයේ කර තිබෙන්නේ කොකා පෙන්වීම විතරයි. මොකද, එක පැත්තකින් ඔවුන්ට යම් තරමක වාසියක් කරන බව පෙන්වලා තමුන්නාන්සේලා බදු අභියාචනා කොමිෂන් සභා පනත් කෙටුම්පත සංශෝධනය කරනවා. අපි දන්නේ නැහැ අලුතින් ඉදිරිපත් කර තිබෙන සංශෝධන කලින් ඉදිරිපත් කළ සංශෝධනවලට වඩා භයානකද නැද්ද කියලා. අපි ඒවා දැක්කේ නැහැ. ඒ කොළ විතරයි දැකලා තිබෙන්නේ. අකුරු දැක්කේ නැහැ. අකුරු කියවන්න වෙලාවක් තිබුණේ නැහැ. ඒ නිසා මේ ගෙනැවිත් තිබෙන සංශෝධනය නම් ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලාටම නැවත අභියෝගයක් බවට පත් වෙන බව අවධාරණයෙන් කියන්න ඕනෑකම තිබෙනවා.

ඊළඟට ඇමතිතුමාගෙන් දැන ගන්න, පැහැදිලි කර ගන්න දෙයක් තිබෙනවා. ඒ තමයි තමුන්නාන්සේලා මුදල් පනතට අදාළව කර තිබෙන සංශෝධන ගැන. මුදල් පනතට අදාළව කර තිබෙන සංශෝධනවල පස් වන කොටසින් තමුන්නාන්සේලා යෝජනා කරන්නේ, යම් දේපොළක් -ඉඩමක්- සම්බන්ධව. දේපොළ විදේශිකයන්ට පැවරීමේදී මෙතෙක් සියයට 100ක බද්දක් තිබුණා. විදේශිකයෙක් ඉඩමක් ලබා ගන්නවා නම් සියයට 100ක් බදු පනවා තිබුණා. දැන් ඒ බද්ද ඉවත් කරනවා. ඒ බද්ද ඉවත් කරන්නේ විදේශිකයන්ට ඒ ආකාරයෙන්වත් ඉඩම් පැවරීමක් සිද්ධ කරන්නේ නැහැ කියන පදනමින්. ඒක හොඳයි. ඒක අය වැය යෝජනාවක් විධියට තිබුණා.

ගරු ඇමතිතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සිරිවර්ධන මහත්මයා 2013.03.27 වන දා පාර්ලිමේන්තුවේ මේ පනත සම්මත වේ යැයි උපකල්පනය කර නිකුත් කර තිබෙන චක්‍රලේඛය මා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒක රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට එවා තිබෙනවා. මේ චක්‍රලේඛයේ තිබෙනවා, අය වැය යෝජනා අනුව දේපොළ මත පැනවූ සියයට 100 බදු ඉවත් කිරීම පිළිබඳව. එතුමා මෙන්න මෙහෙම කියනවා.

"The transfer of land (state owned or privately owned) to the following is prohibited:

I. a foreign national
II. a foreign company
III. a company incorporated …"

මෙහි කියන ආකාරයට පුද්ගලයා සහ සමාගම්වලටත් මේක අදාළයි. හැබැයි, තමුන්නාන්සේලා ගෙනැල්ලා තිබෙන මේ පනත් කෙටුම්පතේ පස් වැනි කොටසේ කියන්නේ "ශ්‍රී ලංකාව තුළ ඉඩමක අයිතිය ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුට පැවරීම සඳහා" කියලායි. "තැනැත්තකුට" විතරයි. මෙහි නීතියේ බලපෑමේ දී තමුන්නාන්සේලා කියන්නේ එහෙමයි. බලන්න, ගරු ඇමතිතුමනි පස් වැනි කොටස. "මෙම කොටස මඟින් 1963 අංක 11 දරන මුදල් පනතේ vi වන කොටස ඉවත් කරනු ලබන අතර ඉවත් කිරීමේ නීතිමය බලපෑම වන්නේ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන්ට" . ඒක අදාළ වන්නේ සයිමන්ට වෙන්න පුළුවන්. අපි තමුන්නාන්සේගෙන් අහනවා සයිමන් ඇන්ඩ් කම්පැනිවලට මොකද වෙන්නේ කියලා. එතකොට සිදු වන දේ මේකයි. පුද්ගලයකුට ඉඩම් ගන්න බැහැ. පුද්ගලයකුට ඉඩම් ගන්න බැරි වන විධියට තිබෙන නීතිය තවත් එහාට ගෙන යනවා. සියයට සියයක බද්දක් ගෙවලා හරි පුද්ගලයකුට ඉඩමක් ගන්න බැහැ. හැබැයි, දැන් හුහාක් වෙලාවට දේපොළ අත්පත් කර ගන්නේ පුද්ගලයෝ නොවෙයි, කොම්පැනි. සයිමන් නොවෙයි, සයිමන් ඇන්ඩ් කොම්පැනි. දැන් ඔය එන්නේ ජේම්ස් පැකර් ද කවුද කියලා කෙනෙක්. ජේම්ස් පැකර් කැසිනෝ රජා. කැසිනෝ රජා එන්නේ කැසිනෝ කොම්පැනිය හැටියටයි. රජා නොවෙයි ගන්නේ. රජාගේ කොම්පැනිය ගන්නේ. ඉඩම් ගන්නේ එහෙමයි. දේපොළ අත්පත් කර ගන්නේ එහෙමයි. ඒ කාලයේ ආවා වාගේ දැන් විදේශිකයා හැටියට තනි තනි පුද්ගලයෝ එන්නේ නැහැ. ඒ නිසා රටේ ජනතාව වෙනුවෙන් මම ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගන්න ඕනෑ - දැන ගන්න ඕනෑ- සියයට සියයක බද්දක් ගෙවලා විදේශිකයින්ට ඉඩම් පැවරීමේ බලය නවත්වන්නේ තනි පුද්ගලයින්ටද, එහෙම නැත්නම් පුද්ගලයින් සහ පුද්ගලයින් සම්බන්ධ වන සමාගම්වලටත්, ව්‍යාපාරවලටත් අදාළවද කියලා. මොකද, මේක විදේශිකයා කියන පුද්ගලයාට තහනම් කරනවා. හැබැයි, විදේශික පුද්ගලයාගේ කොම්පැනියට -සමාගම්වලට- මේ ඉඩම් දේපොළ ලබා දෙනවා නම්, ඒකට මේ නීති අදාළ වන්නේ නැත්නම් මේකෙන් වැඩක් නැහැ. මොකද, අද වන විට ඉතා පැහැදිලිව දැන් තිබෙන තත්ත්වයට පුද්ගලයෝ තනි තනිව

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ඇවිල්ලා දේපොළ පවරා ගන්නේ නැහැ. විදේශික පුද්ගලයෝ ලංකාවට එන්නේ සමාගම් හැටියටයි. අද තමුන්නාන්සේලා ලංකාවේ වටිනාම ඉඩම් ටික දෙන්නේ තනි තනි පුද්ගලයන්ට නොවෙයි, ඒ පුද්ගලයින් සතුව තිබෙන සමාගම්වලටයි. ඒ නිසා මේ ගැන පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. මේ යවලා තිබෙන චක්‍රලේඛනය නිවැරදියි. තමුන්නාන්සේ පසු ගිය 20 වැනිදා මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත වෙයි කියලා හිතලා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාට යවලා තිබෙන නිවේදනය නම් පැහැදිලියි. හැබැයි, ඒක මේ පනත් කෙටුම්පතට අදාළ සංශෝධනයේ නැහැ.

අද සම්මත වන සංශෝධනය තුළ තිබෙන්නේ මොකක්ද? විදේශිකයකු ඉඩම් අත් පත් කර ගැනීමේදී පනවා තිබූ සියයට සියයේ බදු ඉවත් කරන්නේ තනි පුද්ගලයන්ට විතරක් නම් මේ චක්‍රලේඛයයි, තමුන්නාන්සේ සම්මත කරන මේ නීතියයි ගැටෙනවා ගරු ඇමතිතුමනි. ඒ ගැටීම දැනටම සිද්ධ වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාගෙන් හරි ඔබතුමාගේ නිලධාරී මහත්වරුන්ගෙන් හරි මේ ගැන දැනගන්න කැමැතියි. මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කරන්න, දේපළ අත් පත් කර ගැනීම මත පැනවූ සියයට සියයක බද්ද ඉවත් කරන්නේ තනි තනි පුද්ගලයන්ටද කියලා; එහෙමත් නැත්නම් පුද්ගලයන් සහ පුද්ගලයන් සම්බන්ධ වන සමාගම්, ව්‍යාපාර, බද්ධ ව්‍යාපාර, හවුල් ව්‍යාපාරවලටත් මේක අදාළද කියලා. සයිමන්ට විතරද, සයිමන් ඇන්ඩ් කොම්පැනිවලටත් අදාළද කියන එක පැහැදිලි කර ගන්න ඕනෑ ගරු ඇමතිතුමා. කොයි වෙලාවේත් නැඟිටලා කරුණු දක්වන ඇමතිතුමා දැන් නිහඬව ඉන්නේ මොකද කියලා මට තේරෙන්නේ නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසාන කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කථාව අවසන් කරනවා තවත් විනාඩියකින්. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලා ඔටවු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පතට ලොකු සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. එහි තිබෙන වචන මොනවාද කියලා අපි දන්නේ නැහැ. හේතුව, කියවන්න වෙලාවක් නැති නිසයි. නමුත් මේ අනුව ඉතාම පැහැදිලියි, මෙහිදී එක් පැත්තකින්, තමුන්නාන්සේලා අය කරන ගාස්තුව වැඩි කරන බවත්, එහෙම වැඩි කරන ගමන් අනෙක් පැත්තෙන් ලෝකයේ ඉන්න ලොකුම කැසිනෝ රජාලාට -ජේම්ස් පැකර්ලාට- ලංකාවට එන්න ඉඩ හදන බවත්. ජේම්ස් පැකර්ලා ලංකාවට එන කොට ලේක් හවුස් එක ඉස්සරහා තිබෙන අර දැවැන්ත ඉඩ කොටස ජේම්ස් පැකර්ට දෙනවා buildings ගහන්න. ඒකෙන් තමයි මේක එන්නේ. ඒ මිලියන ගණන ගෙනෙන කොට ගාස්තු අය කරන්නේ කොහොමද? කථා කරන්නේ කවුද? Deal කරන්නේ කවුද? Commission ගන්නේ කවුද? මම හිතනවා මේ පාර්ලිමේන්තුවේ මේ ඉන්න ගරු ඇමතිතුමා ඒකට වග කියන්නේ නැහැ කියලා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ වග කියනවාද ඒකට? තමුන්නාන්සේ ජේම්ස් පැකර් ලංකාවට ගෙන එන්න කථා කළාද? ඔහු එනවා කියලා දන්නවාද? ඒවා ගැන තමුන්නාන්සේ දන්නේ නැහැ. තමුන්නාන්සේට තිබෙන්නේ ඔටවු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනෙන්න විතරයි. අරහේ කට්ටිය වෙනම ඔටවු අල්ලා ගන්නවා. කට්ටිය වෙනම ඔටවු අල්ලාගෙන තමයි තමුන්නාන්සේට මෙහේට පනත් කෙටුම්පත ගෙන එන්න කියන්නේ. ජේම්ස් පැකර් එක්ක කථා කළේ කොහේදීද? කවුද ඔහු මෙහේට ගෙන්වන්නේ? ඒ සාකච්ඡා මොනවාද? ඒ ඇති වූ එකඟතාවන් මොනවාද? ඒ නිසා ඉතා පැහැදිලියි මේ පනත් කෙටුම්පත් කියන්නේ ජනතාව විහිළුවට ලක් කරන, ජනතාවගේ ඡන්දයට විහිළු කරන ඒවා බව. තමුන්නාන්සේලා ගනුදෙනු කරන්නේ මේ පාර්ලිමේන්තුවෙන් එළියේයි; කැබිනට් එකෙන් එළියේයි. වෙනමයි සාකච්ඡා යන්නේ. හැබැයි ඒ ගනුදෙනුවල ප්‍රතිඵලවලට ඉතිහාසයේ කවදා හරි තමුන්නාන්සේලාට මේ රට ඉස්සරහා වග කියන්න සිද්ධ වනවා කියන එක අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.08]

ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ බදු පිළිබඳව කථා කරන්නේ වෙනත් දෘෂ්ටි කෝණයකින්. මේ 2013 වර්ෂය. පුංචි රටක පැවැත්ම ලෝකයට තවදුරටත් අදාළ වන්නේ නැති වාතාවරණයක් තමයි අද තිබෙන්නේ. 2008 වර්ෂයේදී ලෝක බැංකුවේ සභාපතිතුමා වැදගත් නිල නිවේදනයක් කළා, ලෝකයේ මෙතෙක් පැවැති බල තුලනය, තරාදියේ දාලා කිරන කොට ඇමෙරිකාව හා සෙසු රටවල් අතර තිබුණු සදාකාලික බල තුලනය 2008 වර්ෂයේ වෙනස් වුණා කියලා. ඒ වර්ෂයේදී තමයි ඇමෙරිකානු ඩොලර් කාසිය විනාශ වෙලා ගියේ. අද ඇමෙරිකාවේ ඩොලර් කාසිය කඩදාසි කොළයක් පමණයි. ඒ වෙනුවට ඒ අය බලාපොරොත්තු වුණා යූරෝ කාසිය යුරෝපයේ අමරණීය කරන්න. අද යූරෝ කාසිය කඩදාසියකටත් වඩා අන්ත තත්ත්වයකට ඇවිල්ලා. යුරෝපා සංගමය ලෝකයේ හිඟන ආදි ශිෂ්‍ය සමිතියක් බවට පත් වෙලා. උදාහරණයක් අවශ්‍ය නම් කියන්නම්. සයිප්‍රස් දූපතේ අද මේ මොහොතේදී බැංකු වහලා. බැංකුවල තිබෙන පොඩි මිනිසුන්ගේ දේපොළ අරගෙන ඒවායෙන් කොම්පැනිවල අලාභය වහනවා. යුරෝපයේ සියලු කාසි කඩා වැටිලා. ආඩම්බරකාර ෆ්‍රෑන්ක් කාසිය නැහැ. ඉතාලියේ ලීරා කාසිය නැහැ. ස්පාඤ්ඤයේ පෙසෙටා කාසිය නැහැ. ඕලන්දයේ ගිල්ඩර්ස් කාසිය නැහැ. මේ වාගේ විශාල විපත්ති රාශියක් සිද්ධ වෙලා තිබෙනවා. 1991 දී තමයි සෝවියට් දේශය බිඳ වැටිලා ලෝකයේ බල තුලනය තනි සුපිරි බලවතකුට හිමි වුණේ. ඇමෙරිකාව අවුරුදු 20ක් ලෝකයේ තනි රජා හැටියට කටයුතු කළා. අන්තිමේදී කවුරුත් විමතියට පත් කරමින් ඇමෙරිකාව ලෝක ඉතිහාසයේ මෙතෙක් රටක් හිමි කර ගත් විශාලම ණයකරය හිමි කර ගත්තා.

ඒක ප්‍රකාශ කරන්නේ ට්‍රිලියන්වලින්. මිලියනවලින්, බිලියනවලින් නොවෙයි ට්‍රිලියන්වලින්. මම මේ කථා කරන මොහොත වන විට ඇමෙරිකාව ඩොලර් ට්‍රිලියන් 13කටත් වඩා ණය තුරුස් වෙලා තිබෙනවා. ඇමෙරිකාවේ කසි කබල් ඩොලරය දැන් කොස් කොළයක් හා සමානයි. මේ තත්ත්වය ලෝකයෙන් වසන් කරලා තිබෙනවා. කොහොමද වසන් කරලා තිබෙන්නේ? මුළු ලෝකයේම ප්‍රවෘත්ති agenciesවලින් සියයට 93ක්ම ඇමෙරිකාවේ CIA එක විසින් තමයි පාලනය කරන්නේ. වෙන කිසිම ප්‍රවෘත්තියක් පළ කරන්න දෙන්නේ නැහැ. එහෙම ප්‍රවෘත්තියක් පළ කළොත් ඒ අයට අනෙක් ප්‍රවෘත්ති දෙන්නේ නැහැ. ඒ නිසා මුළු ලෝකයේම ප්‍රවෘත්ති ආඥාදායකත්වයක් CIA එක agencies හරහා ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ නිසා මහ ජනතාව සත්‍ය තත්ත්වය දන්නේ නැහැ. නමුත් ලෝකයේ ඇති වෙලා තිබෙන මුදල් ක්‍රමය කඩා වැටීම ගැන දැන ගත හැකියි.

මේ තත්ත්වය යටතේ අද ආසියාවේ තත්ත්වය ගැන වෙන පැත්තකින් අපි ඇහැ ඇරලා බලන්නට ඕනෑ. පළමුවැනි වතාවට අප්‍රිකාව නැඟිටින්න පටන් අරගෙන තිබෙනවා. පළමුවැනි වතාවට දකුණු ඇමෙරිකාව, බ්‍රසීලය, වෙනිසියුලාව, ආර්ජන්ටිනාව ආදී

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

රටවල් නැඟිටින්න පටන් අරගෙන තිබෙනවා. ලෝකයේ මීළඟ නායකයා පළමුවැනි වතාවට ආසියාවෙන් දැනටමත් පහළ වෙලා ඉවරයි. ඉන්දියාව නිදහස ලැබුවේ 1947 අගෝස්තු 15වැනිදා. ඇමෙරිකාවෙන් චීනය නිදහස් වුණේ 1949 ඔක්තෝබර් මාසයේ 01වැනිදා. නමුත් චීනයයි ඉන්දියාවයි ගිය දුර දිහා බලන්න. අද චීනය ලෝකයේ දෙවැනි ආර්ථික බලවතා බවට පත් වෙලා. තව අවුරුදු දෙකකදී චීනය ඇමෙරිකාව පරදා පළමුවැනි ආර්ථිකය හා දේශපාලන නායකයා බවට පත් වෙනවා. ඉන්දියාව එහෙම පිටින්ම පිස්සිගේ පළා මල්ලක් වගේ විනාශයට පත් වෙලා. ඉන්දියාව තව දුරටත් ශක්තිමත් රාජ්‍යයක් නොවෙයි. ජවහල්ලාල් නේරුතුමා නිදහස් ඉන්දියාවේ අගමැති හැටියට පත් වෙන කොට ඉන්දියාවේ තිබුණේ ප්‍රාන්ත 17යි. අද ප්‍රාන්ත 29ක් තිබෙනවා. ඉන්දියාවට ප්‍රාන්ත 35ක් ඉල්ලලා කලබල, කෝලාහල කරනවා. ඉන්දියාවේ ලොකුම දේ තමයි ඉන්දියාව කැබැලි කරලා - balkanize කරලා, ඉන්දියාව ප්‍රාන්ත 35කට කඩලා ඉන්දියාවේ තිබුණු වැදගත් තත්ත්වය සම්පූර්ණයෙන් විනාශ කිරීම. මේ අවස්ථාවේදී ලංකාවේ අපි එහෙම පිටින්ම තනි ඉන්දියාවක්; ශක්තිමත්, එක්සත් ඉන්දියාවක් ප්‍රාර්ථනා කරනවා. අපි ඉන්දියාවේ කැබැලිවලට සලකන්නේ නැහැ. අද ඉන්දියාවට සිද්ධ වෙලා තිබෙන දේ තමයි හින්දුස්ථානය පාලනය කරන්නේ ද්‍රවිඩස්ථානය විසින් වීම. හින්දුස්ථානය කියන ඉන්දියාව ද්‍රවිඩස්ථානය විසින් පාලනය කරන කාලකණ්ණි තත්ත්වයක් අද ඉන්දියාවේ ඇති වෙලා තිබෙනවා. අමතක කරන්න එපා, කවුරු ආවත්, කවුරු ගියත් ජවහර්ලාල් නේරුතුමා, ඉන්දිරා ගාන්ධිතුමිය, වල්ලබායි පටේල්තුමා ඉන්දියාව තනි රටක් හැටියට ආරක්ෂා කළ බව. ඒක තවදුරටත් ගෙන යන්න බැරි තත්ත්වයක් උදා කරලා තිබෙනවා මන්මෝහන් සිං

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒ නිසා අපි බොහොම කනගාටු වෙනවා, ඉන්දීය මධ්‍යම ආණ්ඩුවේ තිබෙන දුර්වලභාවය පිළිබඳව. ඒ වුණත් ආසියාවේ ශක්තිය හා මිත්‍රත්වය සඳහා අපි තනි ඉන්දියාවක් ප්‍රාර්ථනා කරනවා.

නමුත් මේ සියල්ලම පරදවමින්, මුළු ලෝකයම විමතියකට පත් කරමින් චීනය ඉහළටම ඇවිල්ලා තිබෙනවා. මේ මොහොතේදී චීනයේ ජනගහනය කෝටි 135යි. ඊළඟට ඇවිල්ලා තිබෙන්නේ ඉන්දියාව. ඉන්දියාවේ ජනගහනය කෝටි 121යි. ඊළඟට තිබෙන්නේ ඇමෙරිකාව. ඇමෙරිකාවේ ජනගහනය කෝටි 31යි. එතැනින් පහළට ගියාම ඉන්දුනීසියාවේ ජනගහනය කෝටි 24යි, බ්‍රසීලයේ ජනගහනය කෝටි 19යි.

අනික් ඒවා පුංචි රටවල් හැටියටයි ගණන් ගන්නේ. ඒ නිසා අපි විමතියෙන් මේ දිහා බලාගෙන ඉන්න ඕනෑ. අනාගතය බටහිරට තවදුරටත් අයිති නැහැ. අනාගතය පෙරදිග අපේ රටවල්වලට - අපට- අයිතියි. පෙරදිග තිබෙන්නේ අලුත් ශිෂ්ටාචාරයක්. තව අවුරුදු දෙකක දී, තුනක දී ඔබතුමන්ලා දැන ගන්නවා, කවුද පෙරදිග හාම්පුතා කියලා. පිට පිටම වාගේම අද මම මේ කතා කරන මොහොතේදීත් යුරෝපා සංගමය බංකොලොත්. යූරෝ කාසිය බංකොලොත්. සයිප්‍රස් දූපත -රට- බංකොලොත්. ඒ වාගේමයි පෘතුගාලය, ස්පාඤ්ඤය, ඉතාලිය. ඒවා එහෙන් පිටින්ම බංකොලොත් රාජ්‍යයන්. ඇමෙරිකාව තුන් මාසයෙන් තුන් මාසයට අය වැය pass කර ගන්න තරම් අවාසනාවන්ත තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. ඇමෙරිකාවේ සියලුම උගත්තු දන්නවා, ඇමෙරිකාවේ ලෝක ආධිපත්‍ය ඉවරයි කියන කාරණය. ඇමෙරිකාවේ සාමාන්‍ය අය වැයත් දැන් පියවා ගන්න බැහැ. ඒ නිසා ඇමෙරිකාව ඔබාමාට දෙවැනි වතාවටත් බාර දුන්නේ ආදරයකට නොවෙයි. ඇමෙරිකාවට ධනවාදය නමැති අවමංගල්‍යයේ පාංශුකූලය දෙන්න කළු මිනිහෙක් හොයලා දුන්නා. ඒ ගැන සුද්දන්ට ලජ්ජයි. සුද්දෝ මහ හැරියා; ඕනෑකමින් මහ ඇරියා. බුෂ්ලා තවම ජීවතුන් අතර ඉන්නවා. තාත්තායි, පුතායි කථාවක් කරන්නේ නැහැ. ක්ලින්ටන්ලා තවම ජීවතුන් අතර ඉන්නවා. නමුත් කථාවක් කරන්නේ නැහැ. ඇමෙරිකාවේ ජනාධිපති පදවිය දරාපු උදවිය ඉන්නවා. ඒ ගොල්ලෝ ඇමෙරිකාවේ හිටියාට කථා කරන්නේ නැහැ. අන්තිමේ දී අර අසරණ කළු මිනිහාට -ඔබාමාට- ඇමෙරිකාව බාර දුන්නා. ඒ වෙන මොකුත් කරන්න නොවෙයි, "බංකොලොත් ඇමෙරිකාවේ පාංශුකූලය තමුසේවත් දෙනවා, අපිට ලජ්ජයි" කියලා. අද එක සුදු මහත්මයෙක් -සුදු නායකයෙක්- ඇමෙරිකාව වෙනුවෙන් කථා කරන්නේ නැහැ. මම මේ කථාව විශේෂයෙන් කිව්වේ ඒකයි. ලංකාවට හංගලා තිබෙන රහසක් තමයි, බටහිර බංකොලොත්භාවය. රොයිටර් කිසිම දවසක ඒ ගැන කියන්නේ නැහැ. News Agenciesවලින් ඒ ගැන කියන්නේ නැහැ. ඒ ගැන නොකියා වලිගයත් අරගෙන, කෙන්ද කන්ද කරලා ඕනෑකමින් CIA ලෝක ව්‍යාපාරය විසින් ඒ ගොල්ලෝ රටින් රට නඩත්තු කරනවා. NGOs කියලා ඒ රටවල්වල ද්‍රෝහී කණ්ඩායම් නඩත්තු කරනවා; මුදල් දෙනවා; අනික් කටයුතු කරනවා. ගිය සතියේ රුසියාවේ මහා විප්ලවයක් කරවන්න, ආණ්ඩුව පෙරළන්න ලෑස්ති වුණා. ඒ විප්ලවය එළිදරවු වෙලා NGOsවල සියලු දෙනාගෙන්ම විභාග කළා, "කොහෙන්ද උඹලාට මේ සල්ලි ආවේ, මොකක්ද උඹලාගේ ප්‍රතිපත්තිය" කියලා. දැන් යුද නීතිය වාගේ අණපනත් pass කරලා ක්‍රියාත්මක කරගෙන යනවා. මුළු ලෝකය පුරාම NGOsලා කල් තබන ලද මරණ වරෙන්තුවක් උඩයි අද ජීවත් වෙන්නේ. කොළඹ අයට තව මාස ගණනක් ඇතුළත සම්පූර්ණයෙන් වග කියන්න වෙනවා, ජනතාවට අද මේ කරන විපත්ති සමූහය පිළිබඳව.

මම මේ අවස්ථාවේ දී ආඩම්බරයෙන් කියනවා, වැටිච්ච රටක් නැඟිටීම පිළිබඳව ආදර්ශයක් ගන්නවා නම් ඉන්දියානු සාගරයේ ශ්‍රී ලංකාද්වීපය තමයි ඒ ආදර්ශය ලබා දෙන්නේ කියලා. යුරෝපයේ යුද්ධය ඉවර වුණා. යුද්ධය ඉවර වෙලා "මාර්ෂල්" සැලැස්ම යටතේ ආධාර දුන්නත් යුරෝපයේ ඔක්කොම රටවල්වලට නැඟිටින්න පුළුවන් වුණේ නැහැ. නැඟිටිටේ ජර්මනිය පමණයි. ඇමෙරිකාව ජපානය නැඟිටිටෙව්වා, ඇමෙරිකාවේ ගෝලයෙක් හැටියට. නමුත් ජපානය නැඟිටිටාට පස්සේ ඇමෙරිකාව ජපානයේ බෙල්ල කැපුවා. අද ජපානය තුන්වැනි පෙළේ රටක් බවට පත් වෙලා තිබෙනවා.

ලෝකයේ ආර්ථික බලවතුන්ගේ ලේඛනයේ දෙවන තැන හිටපු ජපානය දැන් පස්වන තැනට, හයවන තැනට පහළට ඇදලා දාලා. හයවන තැන හිටපු චීනය දෙවන තැනට හෝ තව අවුරුද්දක් ඇතුළත පළමුවන තැනට එන තත්ත්වයට දැන් ඇති වෙලා තිබෙනවා.

මම ආසියානිකයෙක් හැටියට ඉතාමත් ආඩම්බරයෙන් හා විශ්වාසවන්තව ප්‍රකාශ කරනවා, යුරෝපයට අපි භය නැහැ; ඇමෙරිකාවට අපි භය නැහැ; සමස්ත එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට අපි භය නැහැ කියලා. අපට එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට පයින් ගහලා, කානුවට වීසි කරලා අලුත් ශිෂ්ටාචාරයක් හදන්න පුළුවන් ආසියානික බලවතෙක්, ශ්‍රේෂ්ඨ නායකයෙක්, අසහාය නායකයෙක් පහළ වෙලා ඉවරයි. එතුමා සිංහාසනාරූඩ කිරීම ඉදිරි වර්ෂ දෙක තුන ඇතුළතදී සිදු වනු ඇතැයි කියන එක මාගේ විශ්වාසයයි. ඒ ගැන කිසිම සැකයක් හිතන්න එපා. අපි ඒ තත්ත්වයෙන් ඉදිරියට යන්නේ.

අද නැඟී එන අලුත් රටක් හැටියට මේ බදු පනත් කෙටුම්පත් ඉදිරිපත් කරලා තිබෙන්නේ මේ කාරණා ගැන නොදන්නා

කෙනෙක් නොවෙයි. මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් මේ බදු පනත් කෙටුම්පත් ඉදිරිපත් කරලා තිබෙන්නේ ලංකාවේ ඉන්න ප්‍රධාන උගතෙක්. ඒ තමයි සරත් අමුණුගම මහත්මයා. සරත් අමුණුගම මහත්මයා වයස විසිදෙකේදී සිවිල් සේවා විභාගයෙන් සමත් වෙලා ලංකාවේ විශිෂ්ටයෙක් හැටියට රාජකාරි කටයුතු කළා ඒ අමාත්‍යාංශයේ. අගමැතිවරුන් රාශියක් යටතේ එතුමා කටයුතු කර තිබෙනවා. එතුමාට උගන්වන්න දෙයක් නැහැ.

මේ රටේ කීර්තිධර සිවිල් සේවකයන් හැටියට හඳුන්වන්න පුළුවන්, බ්‍රැඩ්මන් වීරකෝන් මහත්මයා, රොනී ද මැල් මහත්මයා, නිශ්ශංක විජේරත්න මහත්මයා. ඒ පිරිසේ අන්තිම නියෝජිතයා තමයි අපි ඉදිරියේ ඉන්නා සරත් අමුණුගම මහතා. මම එතුමාට ගරු කරන්නේ මුදල් ඇමතිවරයකු හැටියට පමණක් නොවෙයි. ලංකාවේ වියතෙක් හැටියටත්, උගත් පඬිවරයෙක් හැටියටත්, ආර්ථික විශේෂඥයෙක් හැටියටත් මා එතුමාට ගරු කරනවා. එතුමා බොරු කරන කෙනෙක් නොවෙයි. මම ඉතාම ආඩම්බරයෙන් එතුමා ගැන ඒ වචන ටික කියනවා.

මේ බදු සංශෝධන කෙන්ද කන්ද කරන්න දෙයක් නොවෙයි. මේක මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඉදිරි ගමනට අත දීම සඳහා ජනතාව දෙන ගෞරවණීය, පූජනීය මලක් හැටියටයි මම සලකන්නේ. මේ කාලය නාස්ති කරන්නේ නැතිව, බදු සම්බන්ධයෙන් පව ඇද බාන්නේ නැතිව කරුණාකරලා මේ බදු පනත් කෙටුම්පත් සම්මත කරලා එතුමාගේ ඉදිරි ගමනට අත් උදව් දෙන මෙන් ඉල්ලමින් මාගේ කථාව සමාප්ත කරනවා.

[අ.භා. 2.24]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මට පෙර කථා කළේ මම බොහොම ගරු කරන, අගය කරන මන්ත්‍රීතුමෙක්. එතුමාගේ කථාවේ මම පිළිගන්නේ නැති ඒවා පව ගහන්නේ නැතිව විස්තර කරන්න මම උත්සාහ කරනවා. මමත් එතුමාත් එක්ක එකතු වනවා සරත් අමුණුගම ගරු ඇමතිතුමා සම්බන්ධයෙන් දැක් වූ අදහස්වලට. එතුමා කොයි වෙලාවෙත් වැදගත් විධියට මේ සභාවේ කරුණු ඉදිරිපත් කරලා තමාගේ මතය ඉදිරිපත් කරන ඇමතිතුමෙක්. එතුමා අපට කොයි වෙලාවෙත් කියනවා "The Opposition can have its say, but the Government will have its way" කියලා. ඒක වෙන්න පුළුවන්. නමුත් මම හිතන්නේ ප්‍රජාතන්ත්‍රවාදී කටයුත්තකදී ඔබතුමන්ලා අපේ මතත් අහලා අවම වශයෙන් පොඩි දෙයක් හෝ තිබෙනවා නම් ඒවා අරගෙන අවශ්‍ය සංශෝධන කරයි කියලායි.

මම කැමැතියි, අද මගේ කථාව පටන් ගන්න, මේ දැන් වෙබ් අඩවියක පළ වුණ ප්‍රවෘත්තියකින්. එහි සඳහන් වනවා, "Sri Lanka lending rates to fall from May - June: Treasury Secretary" කියලා. මහා භාණ්ඩාගාරයේ ලේකම් ජයසුන්දර මැතිතුමා - සමහරු එතුමාට ආර්ථික ඝාතකයා කියලා කියනවා - කියලා තිබෙනවා, මේ කරන සංශෝධන නිසා ලංකා විදුලිබල මණ්ඩලයත්, ලංකා ඛනිජ තෙල් සංස්ථාවත් ලබා ගන්නා ණය ප්‍රමාණය ඉදිරියේදී අඩු වෙයි, ඒ අඩු වීමත් සමඟ පොලී අනුපාතය අඩු වෙයි කියලා. එතකොට මේකෙන් තේරෙනවා, ලංකා විදුලිබල මණ්ඩලයේ ආදායම වැඩි කරලා ඒ ණය ප්‍රමාණය අඩු කිරීම සඳහා මේ කරන්න උත්සාහ කරන්නේ මොකක්ද කියන එක.

නමුත් මට කියන්න සිද්ධ වනවා, එතුමා එහෙම කිව්වාට මේ සංශෝධනවලින් ඒ දේ සනාථ වන්නේ නැහැ කියන එක. මගේ කථාවේදී මා එය පෙන්වා දෙන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහජන උපයෝගිතා කොමිසමේ website එකේ දාලා තිබෙනවා unit 1 ඉඳලා units 1,000ක් දක්වා පාවිච්චි කරන කොට විදුලි බිල ඉහළ යන්නේ කොහොමද කියලා. අපි දන්නවා units 48කට වඩා අඩුවෙන් විදුලිය පාවිච්චි කරන අය විදුලි දරිද්‍රතාවෙන් පෙළෙන ගෘහස්ථ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලි බිල සියයට 126ක් වන තෙක් වැඩි වනවා. මා ඉතාමත් වග කීමෙන් කියන්නේ. මේක මහජන උපයෝගිතා කොමිසමේ website එකේ දාලා තිබෙන්නේ. කවුරු හෝ units 91ක් පාවිච්චි කරනවා නම් සියයට 126කින් විදුලි බිල වැඩි වනවා. සාධාරණ යැයි ආණ්ඩුව කියන මේ වාගේ මිල වැඩි කිරීම් තුළින් ඔවුන්ගේ ආදායම වැඩි කර ගන්න උත්සාහ කරනවා නම් මා හිතන්නේ එතැන සදාචාරය පිළිබඳව ගැටලුවක් මතු වනවා. සදාචාරය පිළිබඳව ඔවුන් විසින් ඔවුන්ගේම හදවතට තට්ටු කරලා බලන්න වනවා. මේ මහින්ද චින්තනය තුළින් දරිද්‍රතාවයෙන් පෙළෙන සාමාන්‍ය ජනතාවට සියයට 126කින් විදුලි බිල වැඩි කිරීම කළ යුතුද, නොකළ යුතුද කියන ප්‍රශ්නය අපි ඔවුන් ඉදිරියේ තබනවා. මොකද, සරත් අමුණුගම ඇමතිතුමා, "The Government will have its way." කියනවා නේ.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ගැන කිව්වා. හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා "වාදපිටිය" වැඩසටහනට ගිහිල්ලා Crystal Sweaters Lanka (Pvt.) Limited කියන ආයතනය වසා දමා තිබෙනවාය; ඔවුන් ඒක බංගලාදේශයට අරගෙන යනවාය කියා අසත්‍යයක් ප්‍රකාශ කළ බව එතුමා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ළඟ තිබෙනවා ජනවාරි මාසයේ 27 වැනි දා "The Sunday Times" පුවත් පත.

"The Sunday Times" of 27th January, 2013 under the caption "Garment industry giving way!" states, I quote:

> "Free Trade Zone (FTZ) companies, Crystal Sweaters in Malwatta and Firefox, a bicycle parts assembling plant, in Wattala recently ceased operations claiming loss of business due to loss of GSP+ concessions. The owners of both companies have returned to their native countries and have ordered the equipment on the sites to be packed and shipped to Bangladesh, where they'll resume operations."

ඒකේ කියලා තිබෙන්නේ,".. about 1,500 more workers lost jobs in Gampaha because of the GSP+ issue,..." කියලා. මේක ඒ පත්තරේ පළ වෙලා තිබෙනවා. Inter Company Employees Union එකේ නිලධාරියෙකුයි කියලා තිබෙන්නේ. එතකොට පාර්ලිමේන්තුවේ විශේෂ වරප්‍රසාදයක් අරගෙන ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා මෙතැනට ඇවිල්ලා හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා අසත්‍ය ප්‍රකාශ කළා යැයි කියන එක ඉතාමත්ම අසාධාරණයි. මා ඉතාමත්ම ඕනෑකමින් එතුමාට කියන්න ඕනෑ-

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගැන ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා ප්‍රකාශයක් කළාට පස්සේ, ගරු සරත් අමුණුගම මැතිතුමාට පසුව කථා කළ රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, ඒ ගරු ඇමතිතුමා කියපු එක ඇත්තක් කියලා. මොකද, එහෙම ආයතන වැසී යන්නේ නැහැ කියලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වන රවි කරුණානායක මන්ත්‍රීතුමා පිළිගත්තා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එතැන point of Order එකක් නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

පුවත් පතට ඒක කියලා තිබෙන්නේ, B.I. Abdeen, Organization Secretary of the Inter Company Employees' Union. එතකොට කියපු පුද්ගලයකු ඉන්නවා. ඒ නිසා ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා ඒක නිවැරදි කරන්න ඕනෑ. එතුමා මීට කලිනුත් ඒ වාගේ කථා කියලා තිබෙනවා.

මා ළඟ තිබෙනවා, 2012 නොවැම්බර් මාසයේ 24වැනි දා හැන්සාඩ් වාර්තාව. ඒකේ තිබෙනවා මේ Krrish Group එක සම්බන්ධයෙන්. හිටපු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමති හැටියට එතුමා කියනවා, "දෙසැම්බර් මාසයේ 15 වන දා මෙහි සම්පූර්ණ මුදල තැන්පත් කිරීමට එකඟ වෙලා තිබෙනවා. සියයට 10ක තැන්පතුවක් අපි ඉස්සෙල්ලා අරගෙන තිබෙනවා. අනෙක් ඉතිරි මුදල දෙසැම්බර් මාසයේ 15 වන දා ඒ ගොල්ලෝ ඇවිල්ලා ගිවිසුම අත්සන් කරන කොට තැන්පත් වෙනවා." කියලා.

මේ Krrish Group එක ගැනයි කියන්නේ. ඩොලර් මිලියන 50ක ආයෝජනයක්. අද "ඩේලි මිරර්" පත්තරය මා ළඟ තිබෙනවා. අද "ඩේලි මිරර්" පත්තරයේ තිබෙනවා, "Krrish Group pays 80 per cent of lease to UDA; cuts number of towers to 3" කියලා. අද අප්‍රේල් මාසයේ 9වැනි දා. මේ ගරු සභාවේදී ඇමතිවරයා කිව්වා, Krrish Group එක දෙසැම්බර් මාසයේ 31වැනි දා වෙන කොට මුළු ආයෝජන මුදලම ගෙවනවා කියලා. මේ මත තමයි tax benefits දීලා තිබෙන්නේ. ක්‍රමෝපාය සංවර්ධන පනතින් අවුරුදු 25කට බදු නිදහස දීලා තිබෙනවා. Towers 4ක් හදනවා; ඒක මහා ලොකු ව්‍යාපෘතියක් කියලා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපට කිව්වා. ඒකට තමයි අප අනුමැතිය ලබා දුන්නේ. අද අප්‍රේල් මාසයේ 9වැනි දා. කොච්චර ගෙව්වාද කියලා "ඩේලි මිරර්" පත්තරය ඔහුගෙන් අහලා තිබෙනවා. නබීලා හුසේන් කියන මාධ්‍යවේදිනිය තමයි ඒක අහලා තිබෙන්නේ. The "Daily Mirror" reports, I quote:

> " 'Lease payments were agreed on the ground situation at the time and we have made more than the necessary payments', he said. However, he refused to divulge the total lease amount or the payments the company has already made."

මේක එහෙම කරන්න බැහැ. මේක අපි පාර්ලිමේන්තුවේ පනතකින් සම්මත කළේ. ඒක සම්මත කරන්න යන කොට ගරු ඇමතිතුමා කියලා තිබෙනවා, දෙසැම්බර් මාසයේ 31වැනි දා වෙන කොට සියලුම දේ ගෙවනවා කියලා. එතකොට ඔහු කොහොමද පත්තරයට කියන්නේ, "අපි කියන්නේ නැහැ, අපි හරි චණ්ඩි, අපට ඕනෑ විධියට තමයි අපි වැඩ කරන්නේ" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම කරන්න බැහැ. මේ රටේ නීතියක් තිබෙනවා. අපේ පාර්ලිමේන්තුව නීති සම්පාදනය කරනවා. ඊට පස්සේ ඒ නීතිය අප අනුමත කරනවා. ඒ නීතිය අනුමත කළායින් පස්සේ ඒවා ගැසට් කරනවා. ඒ ගැසට් එක අනුව, Strategic Development Projects Act එක අනුව ඔවුන් ඒ අත්සන් කරන agreementවලට අනුව වැඩ කරන්න ඕනෑ. නැතුව තමන්ට ඕනෑ ඕනෑ විධියට වැඩ කරන්න බැහැ. අපි අක්කර දෙකක ඉඩමක් දුන්නේ towers හතරක් හදන්න කියලායි. දැන් කියනවා, "නැහැ අපි towers හතරක් හදන්නේ නැහැ, towers තුනයි හදන්නේ" කියලා. තනියෙන් ඒවා වෙනස් කර ගන්නවා. මා හිතන හැටියට අප ආයෝජකයන් ගෙන්වා ගන්න ඕනෑ එහෙම නොවෙයි. ඒක වැරැදියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඊ ළඟට මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් කථා කරන්නම්. මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අප කථා කරගෙන යන අතරතුර තමයි අපට ඒවායේ සංශෝධන ගෙනැල්ලා දෙන්නේ. මා හිතන්නේ, සදාචාරාත්මකව ඒක වැරැදියි කියලායි. සමහර විට නීත්‍යානුකූලව ආණ්ඩුවට ඒක කරන්න පුළුවන්. ඕනෑම වෙලාවක පනත්වලට සංශෝධන ගෙනැල්ලා දෙන්න පුළුවන්. නමුත් අප කථා කරන කොට සංශෝධන මොනවාද කියලා අප දන්නේ කොහොමද? නමුත් මන්ත්‍රීවරුන් කථා කරන්න කලින් සංශෝධන මොනවාද කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට දන්වන්න සදාචාරාත්මක අයිතියක් තිබෙනවා නේද? ප.ව. 1.30ට සංශෝධන වගයක් ගෙනැල්ලා දුන්නා. අද පාර්ලිමේන්තුව පටන් ගත්තේ පෙ.ව. 10ට පමණ. පෙ.ව.9.30ට පටන් අරගෙන පෙ.ව.10.00 පමණ වන තෙක් කල්දැමුවා. අද උදේ 10.00 වෙන කොට මේ සංශෝධන ටික ගරු මන්ත්‍රීතුමන්ලාට ලබා දෙන්න මේ පාර්ලිමේන්තුවට බැරි ඇයි? අපට මතකයි, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය මේවා ගෙනැල්ලා දුන්නේ ර. 12ට, 1ට බව. ර. 12ට, 1ට මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික නිවෙස්වලට ඇවිල්ලායි ඒ සංශෝධන ගෙනැල්ලා දුන්නේ. එච්චරට අපේ පාර්ලිමේන්තුව අකාර්යක්ෂම වෙලාද? අපි අවුරුද්දකට කෝටි කීයක් මේ පාර්ලිමේන්තුවට වැය කරනවාද? මේ පාර්ලිමේන්තුව බලා ගන්න පුද්ගලයෝ ඉන්නවා නේද? ගරු කථානායකතුමා ඉන්නවා. මේ පිළිබඳව එතුමාට තීරණයක් ගන්න වෙයි. හැම දාම පාර්ලිමේන්තුව මේ වාගේ අකාර්යක්ෂමව වැඩ කරනවා නම් මේ පාර්ලිමේන්තුවෙන් ඇති තේරුමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සියයට සියයේ tax එක පිළිබඳව අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කළා. දැන් සංශෝධනයට සංශෝධනයක් ඉදිරිපත් කරලා ඒක සම්පූර්ණයෙන්ම අයින් කරලා. සියයට සියයේ tax එක අයින් කරනවා කියලා සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සියයට සියයේ tax එක අයින් කරන සංශෝධනය පිළිබඳව දැන් විවාදයක් පවත්වාගෙන යනවා. කථාව පටන් ගත්තායින් පස්සේ, ඒ සංශෝධනයට තව සංශෝධනයක් එවනවා. ඒකෙන් කියනවා, "නැහැ, නැහැ. එහෙම එකක් නැහැ. ඒක අපි ඔක්කෝම හකුළා ගත්තා." කියලා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙනුත් අහන්නේ මේක සදාචාරාත්මකද කියලායි. නැහැ නේ. අපි මෙතැන වැදගත් විවාදයක් පවත්වා ගෙන යන්නේ කොහොමද? පවෝරිස් කථා කියන්න පුළුවන්. පවෝරිස් කථා කියන්න මේවා කිසි දෙයක් අවශ්‍ය නැහැ. මේවා study කරන්න ඕනෑ නැහැ. මෙතැනට ඇවිල්ලා ඕනෑ කෙනෙකුට ඕනෑ කෙංගෙඩියක් කියන්න පුළුවන්.

නමුත් අප එහෙම කථා කරන්නේ නැහැ. විපක්ෂයේ අප වග කීමක් දරන මන්ත්‍රීවරුන් හැටියට point එකට කථා කරන්නේ; topic එකට කථා කරන්නේ. අප මේවා ගැන research කරන්න ඕනෑ. ඒ නිසා කරුණාකරලා මීන් ඉදිරියටවත් සංශෝධනවලට සංශෝධන ඉදිරිපත් කරනවා නම් ඒවා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කලින් ලැබෙන්න සලස්වන්න.

දැන් ඉස්සෙල්ලාම කථාව පටන් ගන්න ඕනෑ, ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන්. මොකද මේ ගැන ගොඩක් කථා කරලා තිබෙනවා. මේ ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පතේ ඉස්සෙල්ලාම කියනවා, සියයට පහක බද්දක් ගහන්න යනවා කියලා. A levy at the rate of 5 per cent. සියයට පහක බද්දක් ගහන්න යන්නේ 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීමෙනුයි. මෙතැන නොකියා දෙයක් කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් කාර්තුවකට රුපියල් ලක්ෂ 650කට වඩා ආදායමක් තිබෙන ඕනෑම business එකකට සියයට 12ක VAT එකක් ගහන්න ඕනෑ. මා හිතන හැටියට සියයට 3ක NBT එකකුත් ගහන්න ඕනෑ. එතකොට සියයට 15ක් තිබෙනවා. මේ සංශෝධනයෙන් ඉතාමත්ම පැහැදිලිව කියනවා, සියයට 5ක බද්දක් ගහනවා, ඒ සියයට 5ක බද්ද ගහන නිසා VAT එකයි, NBT එකයි ගෙවන්න ඕනෑ නැහැ කියලා. මේකේ අවශ්‍යතාව මොකක්ද? අපට කැසිනෝ එකට සියයට 15ක බද්දක් ගහන්න පුළුවන් නම්, මේ සියයට 15 වෙනුවට සියයට 5ක බද්දක් පමණක් ගහන්න උත්සාහ කරන්නේ ඇයි?

ඊළඟට කියනවා, ඔවුන්ගේ ආදායම මාසයකට රුපියල් මිලියනයකට අඩු නම්, ඒ සියයට 5 ගෙවන්න ඕනෑත් නැහැ, සියයට 12 VAT එක ගෙවන්න ඕනෑත් නැහැ, සියයට 3 NBT එක ගෙවන්න ඕනෑත් නැහැ, කිසිම දෙයක් ගෙවන්න ඕනෑ නැහැ කියලා. දැන් මෙතැනදී අපට ප්‍රශ්න කරන්න වනවා, ආණ්ඩුව මේ කරන්න උත්සාහ කරන්නේ මොකක්ද කියන එක ගැන.

අපේ ගරු සරත් අමුණුගම මැතිතුමා කථා කරන කොට සිංගප්පූරුව ගැන කිව්වා; මකාවු ගැන කිව්වා. අපත් ඒ ගැන හොයලා බැලුවා. දැන් මේ මකාවුවලට තමයි මේ ලෝකයේ Gambling Capital එක කියලා කියන්නේ. මකාවු රටේ කැසිනෝවලට බදු ගහන්නේ කොයි විධියටද? මා හිතන හැටියට ඒක අපි දැන ගත්තොත් හොඳයි. මොකද ගරු සරත් අමුණුගම ඇමතිතුමා කියන විධියට අපට මේ සදාචාර ප්‍රශ්න ගැන කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. රජය තීරණයක් අරගෙන තිබෙනවා, කැසිනෝ තුළින් ආයෝජන ගෙනැල්ලා මේ රටේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරන්න. ඒක අපි වෙන වෙලාවක කථා කරන්න තබමු. එහෙම නම් මේකේ මේ ගණන් හිලව් පිළිබඳව අපි කථා කරමු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මතකයි, එදා සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත කළ දවසේ මේ පාර්ලිමේන්තුවට වතුර ගැලූ බව. ඒකට විරුද්ධව ඡන්දය දුන්නේ කවුද කියලා මම හෙවුවා. මම මේ හැන්සාඩ් එක ඉල්ලා ගත්තේ Library එකේ Research Division එකෙන්. ඒ හැන්සාඩ් එකේ තිබෙනවා, පාඨලී චම්පික රණවක මැතිතුමා පවා ඒ පනතට JHU එකෙන් ඡන්දය දීලා තිබෙනවා කියලා. අතුරලියේ රතන හාමුදුරුවෝත්, එල්ලාවල මේධානන්ද හාමුදුරුවෝත් මේකට විපක්ෂව ඡන්දය දීලා නැහැ කියලා කනගාටුවෙන් හරි අපට කියන්න සිද්ධ වනවා. ජාතික හෙළ උරුමයේ කිසිම මන්ත්‍රී කෙනෙක් මේ සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය දීලා නැහැ. -පූජ්‍ය මන්ත්‍රී හිමිවරු දෙදෙනා සහ ගිහි මන්ත්‍රීතුමා.-

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
විරුද්ධව ඡන්දය දෙන්න තිබෙන වුවමනාව මොකක්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
විරුද්ධව ඡන්දය දෙන්න තිබෙන වුවමනාව මා කියන්නම්. ඔබතුමන්ලා සදාචාරය ගැන කථා කරනවා; සංස්කෘතිය ගැන කථා කරනවා. මොනවාද මේ කැසිනෝවල වෙන්නේ? [බාධා කිරීමක්] රෙජිනෝද - රැජිනෝද මොකක්ද කෙහෙල් මල ගහනවාට වඩා දෙයක් කැසිනෝවල වෙනවා. ඉන්දුනීසියාවේ Ambassador මහත්තයා කියලා තිබෙනවා, ඉන්දුනීසියාවේ ගැහැනු 12,000ක් ලංකාවට ඇවිල්ලා ඉන්නවා කියලා.

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ඔවා දේශපාලන මඩ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔය කැසිනෝ එකක් ළඟින් යන්න කෝ බලන්න, කවුද ඉන්නේ කියලා බලා ගන්න. ඔය කැසිනෝ එක ළඟ සිටින ගැහැනු ඔක්කෝම වීන ගැහැනු. ඒකේ කරන්නේ මොකක්ද? [බාධා කිරීමක්] වාඩි වෙන්න, ගරු මිත්‍රපාල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාගේ වෙලාවේදී කථා කරන්න. ඔබතුමා කැසිනෝ යනවා නම් යන්න, මට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා කැසිනෝවලට කැමැති නම් යන්න. වීන ගැහැනුන්ට කැමැති නම් යන්න. මට ප්‍රශ්නයක් නැහැ. ඉන්දුනීසියා වුණත් කමක් නැහැ. අරාබි වුණත්, කොංගෝ වුණත් මට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා සාමාන්‍යයෙන් TV එකේ කියන්නේ මොකක්ද? ඔබතුමන්ලා කියන්නේ, "මේ රටේ සංස්කෘතිය බල්ලට යනවා. ඕවායේ මොනවාද දෙන්නේ? ඕවායේ බොන්න දෙන එකයි, ගැහැනු දෙන එකයි තමයි කරන්නේ." කියලායි. ඒවා දන්නේ නැතිව වාගෙයි කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, there is a survey on different countries as to what their optimal tax rate is for casinos. ඒ වාගේම, the current casino tax of Macau. You know Macau's largest revenue earning is from casino taxes. Hon. Minister, the Special Gaming Tax there is 35 per cent. සියයට 35යි. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මකාවුවල තිබෙන්නේ ලෝකයේ ලොකුම කැසිනෝ capital එක. එහි Gaming Tax is 35 per cent. සියයට 35ක් අය කරනවා ඒ බද්ද. Macau Foundation කියලා එකක් තිබෙනවා. Macau Foundation එකට සියයට දෙකක බද්දක් වෙනම අය කරනවා. ඒ වාගේම promotion and social security කියලා එකකට සියයට 3ක බද්දක් අය කරනවා. ඒ ඔක්කෝටම අමතරව තව එකක් තිබෙනවා. ලංකාවේ ඔබතුමන්ලා ඉදිරිපත් කර තිබෙනවා, අවුරුද්දකට රුපියල් මිලියන 100ක බද්දක් මේ ව්‍යාපාරවලින් අය කරන්න කියලා. ඒ වාගේම ඒ අයටත් තිබෙනවා, annual licence fee එකක්. ඒක ඇමෙරිකානු ඩොලර් 3.75යි. අද ලංකාවේ රුපියල්වලින් ගත්තොත් ඒ වටිනාකම රුපියල් මිලියන 487යි. ඒ කියන්නේ, ආසන්න වශයෙන් රුපියල් මිලියන 500ක් වෙනවා.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

එතකොට රුපියල් මිලියන 500ක් වැනි ප්‍රමාණයක් අවුරුද්දට අය කරන ගමන් සියයට 39ක බදු අය කරනවා. දැන් ඔබතුමන්ලා මොකක්ද ලංකාවේ කරන්න හදන්නේ? ලංකාවේ රුපියල් මිලියන 100යි මුළු බද්ද. මුළු levy එක රුපියල් මිලියන 100යි. ඒ කියන්නේ මකාවුවල අය කරන ප්‍රමාණයෙන් පහෙන් එකයි. සියයට 39ක මකාවු බද්ද වෙනුවට ඔබතුමන්ලා අය කරන්නේ සියයට පහයි. සියයට පහයි!

අපි කවුරුත් දන්නවා, ආණ්ඩුවට සල්ලි නැහැ කියලා. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපේ රටේ බදු ආදායම 2012 වර්ෂයේ සියයට 11.4යි. කවදාවත් එච්චර අඩු වෙලා නැතිව ඇති. මිනිස්සු බදු ගෙවන්නේ නැහැ. කෝටි ගණන් එක රැයකට හොයන කැසිනෝ ව්‍යාපාරයෙන් මකාවු රට සියයට 40ක් බදු අය කරනවා නම්, ඇයි දෙයියනේ ලංකාව සියයට පහකට මේ බද්ද අඩු කරන්නේ? ඇයි දෙයියනේ VAT එකයි, NBT - Nation Building Tax එකයි අඩු කරන්නේ? සදාචාරය පැත්තකින් තියමුකෝ. මේවාට විරුද්ධව JHU එකේ හාමුදුරුවන් වහන්සේලාවත් ඡන්දය දුන්නේ නැහැනේ. ඒකනේ එතැන තිබෙන සදාචාරය. නමුත් අපි කථා කරමු, මේ සංඛ්‍යා ගැන. මොකක්ද මේකෙන් ඔබතුමන්ලා බලාපොරොත්තු වන්නේ? What is your objective?

තව කාරණයක් කියන්න ඕනෑ. ඒ තමයි income tax. Income tax highest marginal rate එක, ඒ කියන්නේ වැඩිපුරම බදු ගෙවන තීරුව. සාමාන්‍ය බදු ගෙවන පුද්ගලයකුගෙන් ලංකාවේ අය කරන බද්ද කීයද? සියයට 24යි. සියයට 24ට අඩුවෙන් tax ගෙවන රටවල් තව කීයක් මේ ලෝකයේ තිබෙනවාද? දෙකයි. ඒ මොනවාද? හොංකොං රට සහ සිංගප්පූරුව. සමහර රටවල tax ගෙවන්නේ නැහැ. ඒ රටවල තෙල් තිබෙනවා. ඒ නිසා රජ්ජුරුවෝ කියනවා, tax ගෙවන්න ඕනෑ නැහැ කියලා. රජයේ සුබසාධන වැඩ කටයුතුවලට ඕනෑ තරම් සල්ලි තිබෙනවා. එහෙම නම් ඇයි, අපේ රටේ මේ විධියේ බදු ප්‍රතිපත්තියක් අරගෙන යන්නේ? සල්ලි තිබෙන මිනිසුන්ගෙන්, එහෙම නැත්නම් කෝටි ප්‍රකෝටි ගණන් එක රැයකට හම්බ කරන කැසිනෝ කාරයන්ගෙන් සියයට 12 VAT එක අයින් කරලා, සියයට 3 NBT එක අයින් කරලා, සියයට 5ක බද්දක් විතරක් අය කරනවා. නමුත් දුප්පත් මිනිසුන්ගේ සැමන් ටින් එකට රුපියල් 85ක බද්දක් ගහනවා. විදුලිය units 91ක් පාවිච්චි කරන සාමාන්‍ය පුද්ගලයාට සියයට 126කින් බිල වැඩි කරනවා. මොකක්ද මේකේ සදාචාරය? කැසිනෝ කාරයාගෙන් අය කරන්නේ සියයට 05යි. Units 91ක් විදුලිය පාවිච්චි කරන සාමාන්‍ය පුද්ගලයාගේ විදුලි බිල වැඩි කිරීම සියයට 126යි. [බාධා කිරීම්] හිනා වෙනවා හැරෙන්න මේවාට කරන්න දෙයක් නැහැ ඔබතුමන්ලාට. ඔබතුමන්ලා හිනා වෙන්න. හෙට අනිද්දා වෙන කොට බිල ආවාම රටේ ජනතාවත් හිනා වෙයි.

ඊළඟට මේක ඊටත් වඩා එහාට ගෙන යනවා. දැන් ඒක වෙනස් කරමින් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට සංශෝධනයක් ගෙනෙනවා. මොකක්ද, මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත? අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කිව්වා, විශාල ආයෝජන ගෙනෙන්න ඕනෑ නිසා ඒ පනත ගෙනාවා කියලා. ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ වෙලාවේ අපි ආණ්ඩුවට ප්‍රශංසා කළා. අපි කිව්වා, මේකේ යම් කිසි විධියකට විනිවිදභාවයක් - transparency එකක්- තිබෙනවා, ඒක හොඳයි කියලා. නමුත් අද වන කොට මොකක්ද වෙලා තිබෙන්නේ? මේ පනත ගෙනාවේ ලංකාවේ ජාතික තලයේ ආර්ථික හා සමාජයීය ධනාත්මක වෙනස්කම් කරන්න පුළුවන් ව්‍යාපෘති තිබෙනවා නම් ඒවා මේ රටට ගෙනැවිත් ඔවුන්ට බදු නිදහස, බදු සහන දෙන්න කියලායි. දැන් මේ පනතින් කරන්න හදන්නේ මොකක්ද?

ඔටවු ඇල්ලීම හා සූදු බදු පනතින් සූදු ව්‍යාපාර කරන අයට සියයට 5ක tax එකක් පැනෙව්වා. ඒ ව්‍යාපාර කරන අය රුපියල් මිලියන 100ක් අවුරුද්දකට ගෙවන්න ඕනෑය කිව්වා. ඒක හරි. ඊළඟට මොකද කරන්නේ? මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පතින් මා දැන් කථා කරපු සූදු බදු පනතේ සඳහන් කාරණය ඉවත් කරනවා. මා දන්නේ නැහැ, මා මේ කියන්න හදන දේ තේරෙනවාද කියලා. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත මඟින් ව්‍යාපෘතියක් කරන කෙනකුට නොයෙකුත් බදු පනවනවා නේ. ඒ බදු ඉවත් කරන්න හැකියාවක් තිබෙනවා. උදාහරණයක් හැටියට ෂැන්ග්‍රි-ලා හෝටලය හෝ කුමන හෝ ව්‍යාපෘතියක් ගත්තොත්, ඔවුන්ට බදු නිදහස ලැබෙනවා. සාමූහික බදු නිදහස යටතේ අවුරුදු 10කට බදු ගෙවන්න ඕනෑ නැහැ. එකතු කළ අගය මත බදු ගෙවන්න ඕනෑ නැහැ. වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බදු ගෙවන්න ඕනෑ නැහැ. මුදල් පනත යටතේ කොටස් ගනුදෙනු කිරීමේ බද්ද ගෙවන්න ඕනෑ නැහැ. නිෂ්පාදන බදු ගෙවන්න ඕනෑ නැහැ. ආර්ථික සේවා බදු ගෙවන්න ඕනෑ නැහැ. රේගු ආඥා පනත යටතේ එන බදු ගෙවන්න ඕනෑ නැහැ. ඒ වාගේ විශාල බදු සහන දෙනවා. ඒක හරි. ඒ බදු සහන දීම පිළිබඳව ඒ වෙලාවේ අපේ පොඩි විවේචනයක් තිබුණා. නමුත් කමක් නැහැ කියමු. ඒවා සංවර්ධන ව්‍යාපෘති කියමු. ඒ බදු සහන තෙල් කැණීම් ගවේෂණය සඳහා කෙයාන් ලංකා ආයතනයට දීලා තිබෙනවා. වානේ කොම්පැනියකට ඒ බදු සහන දීලා තිබෙනවා. නමුත් දැන් මේ සංශෝධනයෙන් මොකක්ද කරන්න හදන්නේ? මේ සංශෝධනයෙන් කරන්න හදන්නේ කැසිනෝ ව්‍යාපාරයටත් ඒ බදු නිදහස දෙන්න අවස්ථාව සකස් කරන එකයි. ඒ බදු නිදහස දෙන්නේ ගැසට් නිවේදනයක් මඟින්. ඒ ගැසට් නිවේදනය සකස් කරන්නේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට අනුකූලවයි. එතකොට ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කරලා කියනවා, එයට හැටියට කැසිනෝ ව්‍යාපාරයත් අයත් වනවා කියලා. අනේ, මොකක්ද මේ? මේකද, ඔබතුමන්ලාගේ සංවර්ධනය? මේකද ආයෝජනය?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, මා පැහැදිලි කරන්නම්. ඇත්ත වශයෙන් මේ රටේ සංචාරක ව්‍යාපාරය සඳහා අපි කැසිනෝ ව්‍යාපාරය ඇති කරනවා. සංචාරකයන් මේ රටට ගෙන්වා ගන්න අවශ්‍ය සංශෝධන අපි ඇති කරන්න ඕනෑ. අපි යථා වාදීව කටයුතු කරලා ඒ ගොල්ලන් මේ රටට ගෙන්වන්න ඕනෑ. ඒ ආයෝජනය අපි ලබා ගන්න ඕනෑ. එම නිසා තමයි අපි මේ Strategic Development Projects Billඑක ගෙනාවේ. ඒකේ හංගන්න දෙයක් නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

බොහොම ස්තුතියි. අඩු ගණනේ නැඟිටලා ඇත්ත කථා කරන්න එතුමාට කොන්දක් තිබෙනවා. මා ඒකට ගරු කරනවා. එතුමා කියනවා, "ඔව්. අපට කැසිනෝ අවශ්‍යයි" කියලා. මොකද, සුද්දන් ගෙනෙන්න ඕනෑ, චීනුන් ගෙනෙන්න ඕනෑ, ඉන්දියන්කාරයන් ගෙනෙන්න ඕනෑ, පාකිස්තානුකාරයන් ගෙනෙන්න ඕනෑ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ කාලයෙන් මට විනාඩි 5ක් දෙනවා කිව්වා.

එහෙම නම් ඇමතිතුමනි ඔබතුමා පිළිගන්නවා, කැසිනෝ තමයි මේ රටේ ඊළඟ සංවර්ධනය කියන එක. එහෙම නම් මා යෝජනා කරනවා, මහින්ද චින්තනයේ සඳහන් hubs පහ, hubs හයක් කරන්න කියලා. එහෙමත් නැත්නම් අධ්‍යාපන කේන්ද්‍රස්ථානය අයින් කරලා -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට නියමිතව තිබෙන කාලයෙන් විනාඩි 10ක් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට දෙන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Harsha De Silva, then you have 10 more minutes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඒ ඇති. දැනුමේ කේන්ද්‍රස්ථානය, බලශක්ති කේන්ද්‍රස්ථානය, ගුවන් කේන්ද්‍රස්ථානය, නාවික කේන්ද්‍රස්ථානය හා වාණිජ කේන්ද්‍රස්ථානය කියා කේන්ද්‍රස්ථාන 5ක් ගැන කියනවා.

මම කියනවා, නැහැ ඉන් එකක් ඉවත් කරලා කැසිනෝ කේන්ද්‍රස්ථානය කරන්න කියලා. කැසිනෝ කේන්ද්‍රස්ථානය කරන්න. You want to make Sri Lanka bigger than Macau in gambling. Whether you want to worry about cultural and social implications, that is up to you. I guess you are not concerned about that. That is what you said.

මම සොයලා බැලුවා. මෙහෙම කරලත් අද ලොකු කැසිනෝ මධ්‍යස්ථාන නවයක් තිබෙනවා. Ballys Colombo කියලා එකක් තිබෙනවා, Bellagio Casino කියලා එකක් තිබෙනවා. MGM Club කියලා එකක් තිබෙනවා. The Ritz Club කියලා එකක් තිබෙනවා. Star Dust Club කියලා එකක් තිබෙනවා. Continental Club කියලා එකක් තිබෙනවා. Kollupitiya Casino කියලා එකක් තිබෙනවා. Tokyo Club කියලා එකක් තිබෙනවා. මේ වාගේ කැසිනෝ මධ්‍යස්ථාන නවයක් තිබෙනවා. මේ කැසිනෝවලින් එක දවසකට කෝටි ගණනක් මුදල් හම්බ කරනවා. ආදායම් බදු රෙජිස්ට්‍රාර් ජෙනරාල්තුමියගෙන් මම ඇහුවා, මේවා කීයක් register කරලා තිබෙනවාද කියලා. මේවායින් register කරපු ඒවා තිබෙන්නේ හතරයි, නැත්නම් පහයි. ගාලු පාරේ රතු පාට, කොළ පාට, සුදු පාට, කළු පාට, රෝස පාට ටයිල් අල්ලලා තිබෙනවා. එතැනින් යනකොට කැසිනෝවල ලයිට් පත්තු වෙනවා. චීන ගෑනු එහෙන් පනිනවා, තායි ගෑනු මෙහෙන් පනිනවා, කුඩුකාරයෝ එහෙන් යනවා, Russian, Ukraine ගෑනු අනෙක් පැත්තෙන් යනවා. හැබැයි, අනේ! මේ එතැනින් උඩට පහළට යන ඇමතිලාට, උඩට පහළට යන මහ ලොකු මිනිසුන්ට මේ කැසිනෝවල ලයිට් පෙනෙන්නේ නැහැ. මේ කැසිනෝවල ලයිට් පෙනෙනවා නම්, මේ කැසිනෝ එක ඇතුළට ගිහින් අහන්න ඕනෑ, "කෝ මේවා register කළාද, රුපියල් මිලියන 100 ගෙව්වාද?" කියලා. නැහැ, ඒවා පෙනෙන්නේ නැහැ. ඒක තමයි මේ ආණ්ඩුවේ සදාචාරය. සාමාන්‍ය මිනිහාගේ ලයිට් බිල සියයට 126කින් ලජ්ජා නැතිව වැඩි කරන ආණ්ඩුවට කැසිනෝ මධ්‍යස්ථාන නවයකින් මධ්‍යස්ථාන පහක් පමණයි රෙජිස්ටර් කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

මම පොඩි දවස්වල ඉඳලා ඔය කැසිනෝ තිබෙනවා. මේක ඊයේ පෙරේදා ආපු එකක් නොවෙයි. එහෙම නම් මේ ආණ්ඩුවේ විලි ලජ්ජාව වසා ගැනීම මේ පනත් කෙටුම්පත් ගෙනල්ලා කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ජනතාව ඉස්සරහට ගියාම ජනතාව කියයි, "ඔගොල්ලන් කියන්නේ එකක්, කරන්නේ තවත් දෙයක්" කියලා.

මා ඊළඟට කථා කරන්න බලාපොරොත්තු වන්නේ මුදල් පනත් කෙටුම්පත ගැනයි. මේ මුදල් පනත් කෙටුම්පතෙන් මොකක්ද කරන්නේ? 1963 ගෙනාපු මුදල් පනතේ තිබෙනවා, ලංකාවේ නොවන පුද්ගලයෙකුට හෝ ආයතනයකට ඉඩමක් විකුණනවා නම්, සියයට 100ක බද්දක් ගෙවන්නට ඕනෑයි කියලා. මේ සියයට 100ක බද්දක් ගෙවන්නට ඕනෑයි කියන එක දිගටම තිබුණා. නොයෙකුත් අවස්ථාවලදී විශේෂ හේතූන් මත ඒවා සංශෝධනය කළා. තෝරා ගත් පුද්ගලයන්ගෙන් එම පනතට අනුව වන සියයට 100ක බද්ද අය කළේ නැහැ. මා ඉතාමත්ම වගකීමෙන් කියන්න කැමැතියි, 2011 සැප්තැම්බර් මාසයේ 22 වැනිදා මේ පාර්ලිමේන්තුවේම සභාගත කළ ලියවිල්ලක් මා ළඟ තිබෙනවා. එහි සඳහන් වනවා, ෂැන්ග්‍රි-ලා හෝටලයට වික්කා කියලා හෙක්ටයාර් 2.436ක් පළමුවැනි කොටසෙන්, හෙක්ටයාර් 1.6108ක් දෙවැනි කොටසෙන්. 2010.12.28වැනිදා සහ 2011 මාර්තු 11වැනිදා සින්නක්කර ඔප්පුවක් යටතේ සියයට 100ක් අයිතිය ෂැන්ග්‍රි-ලා හෝටලයට දුන්නාය කියලා මෙහි තිබෙනවා. ඊට වඩා තවත් දීපු ඒවා ගැනත් මෙහි තිබෙනවා. නමුත් මේ සියයට 100ක් බදු ගෙවන්නට ඕනෑ යි කියලා තිබෙන වෙලාවේත් එක සත පහක්වත්, තඹ දොයිතුවක්වත්, එහෙමත් නැත්නම් අපේ සූරියප්පෙරුම ගරු මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ අර කොස් කොළයක් වෙච්ච ඇමෙරිකන් ඩොලර් එකක්වත් ගත්තේ නැහැ, බද්දක් කියලා. දැන් ගෙනාපු මේ සංශෝධනයෙන් මොකක්ද ඉදිරිපත් කර තිබෙන්නේ? මේ සංශෝධනයෙන් කියනවා, 1963 ගෙනාපු එම පනතේ හය වැනි කොටස ඉවත් කරනවා කියලා. එම පනතේ හය වැනි කොටසෙන් කියන්නේ මොකක්ද? හයවැනි කොටසෙන් තමයි කියන්නේ, අර සියයට 100 බද්ද ගෙවන්නට ඕනෑයි කියලා. මේක මහා අපභ්‍රංශ කථාවක්. මා ඉතාමත්ම වගකීමෙන් මේ කියන්නේ. මේක අපභ්‍රංශ කථාවක්. අපේ රජයේ නිලධාරීන්ගේ හැකියාව මේක නම්, එහෙම නම් රජයේ නිලධාරීන් set එක ඔක්කොම වෙනස් කරන්නට ඕනෑ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමා, පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. එම කොටස අපි ඉවත් කරලා සම්පූර්ණයෙන් වෙනම පනතක් ගෙනෙනවා, ඒ මුළු කොටසම ඇතුළත් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

හොඳයි, ගරු ඇමතිතුමනි. මේක අයින් කළා. එතකොට දැන් තිබෙන තත්ත්වය තමයි-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

අප වෙනම පනතක් ගේනවා මේ පාර්ලිමේන්තුවට.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

එහෙම නම් දැන් ටිකකට කලින් -පස්වරු 1.30 වන තුරු- තිබුණු තත්ත්වය තමයි මේ සියයට සියයේ බද්ද පනවන එක සම්පූර්ණයෙන්ම අයින් කරන්න කටයුතු කිරීම. ඒ කියන්නේ ඕනෑම විදේශීය ජාතිකයෙකුට හෝ ආයතනයකට පුළුවන් කිසි බද්දක් ගෙවන්නේ නැතිව ලංකාවේ ඉඩම් ගන්න. දැන් එකහමාරට ගෙනාවා සංශෝධනයක්. මේ සංශෝධනයෙන් මොකක්ද කියන්නේ? පස්වරු 1.30ට ගෙනාපු සංශෝධනයෙන්

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

කියනවා, එහෙම නැහැ, අප ඒ සංශෝධනය සම්පූර්ණයෙන්ම අකුළා ගන්නවාය කියලා. එහෙනම් මොන කෙංගෙඩියකටද සංශෝධනයක් ගෙනාවේ? මේ පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කරන්නේ මොකටද? මේවා ගැන සාකච්ඡා කරන්න මේ විධියට කෝටි ගණන් වියදම් කරන්නේ ඇයි?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ බලන්න, මා ළඟ මේ තිබෙන්නේ දැන් දීපු hot-hot සංශෝධනය. "පනත් කෙටුම්පත් - කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු සංශෝධන" අර සම්පූර්ණ සංශෝධනය ඉවත් කරලා ලු. ඉතින් පළෝරිස් කියන්නේ මමද? මමද, ආණ්ඩුවද පළෝරිස්? කවුද පළෝරිස්? ගරු ඇමතිතුමනි, ආණ්ඩුවට මේවාට කට උත්තර නැහැ. කථාව ඇත්ත. සංශෝධනය ගෙනාවා. දැන් සංශෝධනය අකුළා ගන්නවා. මේකේ වාද විවාද කරන්න කිසිම දෙයක් නැහැ. නමුත් ඊට වඩා වැදගත් දෙයක් තිබෙනවා. "කේ.එම්.එම්. සිරිවර්ධන, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව" යනුවෙන් 2013.03.27 දින රෙජිස්ට්‍රාර් ජෙනරාල්ට ලියුමක් යවා තිබෙනවා. ඒකේ තිබෙන කථාව වෙනස්. ඒ ලිපියේ කියා තිබෙනවා, සියයට සියයක් ගෙවන්න ඕනෑ, නමුත් අපට ඒවාට exemptions දෙන්න පුළුවන් කියලා. Exemptions දෙන නොයෙකුත් ක්‍රම තිබෙනවා. ඉන් එකක් මෙහෙමයි.

I quote:

"...in the interest of the national economy, with the prior approval of the Cabinet of Ministers, by order published in the gazette, …"

ඒ exemptions දෙන්න පුළුවන් කියනවා. එහෙනම් ඕනෑ කෙනෙකුට පුළුවන් නේ මේක කරන්න. අපි ඇවිත් රජයේ ඉහළ ඇමති කෙනෙක් හම්බ වෙනවා. නැත්නම් ඉහළ නිලධාරියෙක් හමු වෙනවා. ගිහින් කියනවා, "මට මේක දෙන්න, මට මේ නීතිය රැස්සන්නේ නැහැ" කියලා. එහෙම නම් කියනවා, "හරි, ඔබතුමාට අප නීතියට පටහැනිව, නීතියට එළියෙන් සියයට සියයේ tax එක ගන්නේ නැතිව අප මේ ඉඩම් ගන්න අයිතිය පවරනවා." කියලා.

තවත් කාරණයක් තිබෙනවා. මෙතුමන්ලා lease ගැන කථා කරනවා. මේ ලිපියේ හොඳ කථාවක් තිබෙනවා. මේකේ තිබෙනවා අවුරුදු 99 දක්වා lease දෙන්න පුළුවන්ය කියලා. අවුරුදු 99 දක්වා lease කියන්නේ සින්නකරයට විකුණුවා වාගේ තමයි. ඔය ලොකු ලොකු හෝටල්, ලොකු ලොකු ඉස්පිරිතාල හදා තිබෙන්නේ අනුනව බද්දේ lease එකටයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනූනව බද්දේ lease එකට දෙනවා නම් මේ අලුත් සංශෝධනයෙන් සත පහකවත් බද්දක් ගෙවන්න ඕනෑ නැහැ. මේක නිකම් වචන set එකක් විතරයි. බොරුවට නිකම් එහෙන් මෙහෙන් ලස්සන කථා කියලා මොකක්ද ඇත්ත වශයෙන්ම මේ කරන්නේ? ඇ දනියෙල්, දවල් මිගෙල් වාගේ තමයි මේක. අපට කියන්නේ එක දෙයක්. යටින් කරන්නේ තවත් දෙයක්.

මේ ලිපියේ කියා තිබෙනවා, lease එකක් register කරනවා නම් සියයට 15ක් ගන්න කියලා. එතකොට සියයට සියයට මොකද වුණේ? සියයට සියයේ බද්ද මේකෙන් සියයට 15 දක්වා අඩු කර තිබෙනවා. මොකක්ද මේ කර තිබෙන්නේ? මහා විශාල කුමන්ත්‍රණයක් මෙතැන කර තිබෙන්නේ. ඉස්සර වෙලා සංශෝධනයක් ගෙනාවා. ඒ සංශෝධනය ගේන්න කලින් මුළු රටටම කිව්වා අප එක බිම් අහලක් මේ ලංකාවේ නොවන පුරවැසියන්ට විකුණන්න ඉඩ දෙන්නේ නැහැ කියලා. මිනිස්සු අත්පුඩි ගැහුවා, "ජයවේවා, ජයවේවා" කියලා. මොකද කළේ? ඒක ගෙනැත් සියයට සියයේ බද්ද සම්පූර්ණයෙන්ම අයින් කළා. ඊට පස්සේ අද තවත් සංශෝධනයක් ගෙනැත් ඒ සියයට සියයේ බද්ද නැවතත් ස්ථාපනය කරනවා. හැබැයි ලියුම් කඩදාසියක් යවලා කියනවා, සියයට පහළොවේ බද්ද පමණක් පනවන්න කියලා. එතකොට කවුද මේකේ අප විශ්වාස කරන්නේ? ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු කථාව මේකේ තිබෙනවා තමයි. Proposed law, නව නීතියක් ගේනවා ලු. කවදාද මේ නව නීතිය ගේන්නේ? Part VI එක ඔබතුමන්ලා repeal කළා නම් ඔබතුමන්ලාට අද තිබුණා නේ, amendment එකක් ගෙනැත් Part VI එක include කරන්න. එහෙම කළේ නැහැ නේ. ඒකට අලුත් නීතියක් ගේන්න ඕනෑ නැහැ. මේ තිබෙන නීතියෙන්ම - Finance Act, No. 11 of 1963 - ඒක කරන්න පුළුවන්. ඒකෙන් තමයි මේ සියලු දේවල් පාලනය වන්නේ. අලුත් නීති අවශ්‍ය නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අවසාන වශයෙන් මට කියන්න ඕනෑ දෙය මෙකයි. අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේදී 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත ඉදිරිපත් කළා. එය ඉතාම වැදගත් පනතක්.ඒ පනතින් අපේ රටේ මූල්‍ය වගකීම සම්බන්ධයෙන් හැසිරෙන්න ඕනෑ කොහොමද කියන එක නීත්‍යානුකූල කළා.

නමුත් මේකෙන් මොකක්ද කරන්න යන්නේ? This is called "Fiscal Management (Responsibility) (Amendment) Bill". I am going to rename this. I am going to call this "Fiscal Management (Irresponsibility) (Amendment) Bill", Hon. Minister. This is irresponsible. By the end of 2013, you are supposed to bring down the debt to GDP ratio to 60 per cent. What are you doing by this amendment? You are taking another seven years.

තව අවුරුදු 7ක් ගන්නවා සියයට 60 දක්වා මේක ගේන්න. ඒ වාගේම ආණ්ඩුව ණය ගන්නවා වෙනුවට ඒජන්තයෝ පත් කරනවා ආණ්ඩුව සඳහා ණය ගන්න. ඊයේ වන විට, Bank of Ceylon එක අවම වශයෙන් ඇමෙරිකන් ඩොලර් සියයට 5.5ක පොලියකට ඇමෙරිකන් ඩොලර් මිලියන 500ක ණයක් ගන්න ලෝකය වටේ යනවා. ඒ වාගේම National Savings Bank එක- ජාතික ඉතිරි කිරීමේ බැංකුව- ඇමෙරිකන් ඩොලර් මිලියන 1,000ක ණයක් ගන්න වැඩ කටයුතු කර ගෙන යනවා. මේ පාර්ලිමේන්තුවේ කථා කරලා අපි එක පාරක් National Savings Bank එක බෙරා ගත්තා. ලක්ෂ 200ක ජනතාවක් සිටින මේ රටේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ accounts ලක්ෂ 167ක් තිබෙනවා. වංචාවක් වෙන්න යන විට ඔවුන් වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂය කථා කරලා ඒක නවත්වා ගත්ත අපට දැන් සිදු වන්නට යන දේ දැක්කාම මොකක්ද හිතෙන්නේ? මෙතැන මොකක්ද කරන්න යන්නේ? මෙතැන කරන්න යන්නේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ලව්වා ඇමෙරිකන් ඩොලර් මිලියන 1,000ක ණයක් ගන්න. මොනවාටද මේ ණය? සාමාන්‍ය මිනිස්සු ගෙවල් හදන්නේ ඇමෙරිකන් ඩොලර්වලින් නොවෙයි. ඒවාට තමයි ආණ්ඩුව ණය ගන්නේ. ආණ්ඩුව මේ ණය ගන්න හදනවා. එක පැත්තකින් නිවාඩ කබ්‍රාල් තැන් තැන්වල කථා කරලා පෙන්වන්නට උත්සාහ කරනවා, "හර්ෂ ද සිල්වලාට මේවා පේන්නේ නැද්ද, අපේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව රටේ ණය බර අඩු වෙලා කියලා. සියයට 100ට තිබුණ එක සියයට 85 දක්වා අඩු වෙලා කියලා කියනවා. ඒකේ technical point එකක් තිබෙනවා, ඒ සම්බන්ධයෙන් පස්සේ කථා කරන්නම්. ඒක උද්ධමනයත් සමඟ යන ගැටලුවක්. ඊට වඩා වැදගත් කාරණය තමයි මොකක්ද මෙතැනින් කරන්නේ කියන එක.

ඊළඟ සංශෝධනය තමයි සියයට 4.5ක් දෙන්න තිබෙන guarantee එක සියයට 7 දක්වා වැඩි කරන්නට යෑම. මෙතැනදී සිදු වන්නේ මෙයයි. මෙතැන තිබෙන්නේ පොඩි "පළෝරිස්" වැඩක්. මේක "පළෝරිස්" වැඩක්. මොකද, ආණ්ඩුව, Treasury

එක ණය ගන්නවා වෙනුවට ආණ්ඩුවේ වෙනත් ආයතන හරහා ණය ගැනීමක් කරනවා. කොහෙන් ණය ගත්තත් අන්තිමට අපට තමයි ගෙවන්න වෙන්නේ. ඒ කාරණය තමයි මම අවසාන වශයෙන් මේ ජනතාවට මතක් කරලා දෙන්නට ඕනෑ. රජය කරන්න යන්නේ සාමාන්‍ය මනුෂ්‍යයාගේ බඩට ගහන එකයි. සාමාන්‍ය මනුෂ්‍යයාගේ බඩට ගහන එක. බදු ගහනවා, බදු ගහනවා, බදු ගහනවා. කෑමට වැඩියෙන්ම බදු ගහන රට ලංකාව වෙන්න ඕනෑ කියලා මම හිතනවා. පරිප්පුවලට, සීනිවලට සහ සැමන්වලට බදු ගහනවා. ටින් මාළුවලට රුපියල් 85ක බද්දක් ගහනවා. [බාධා කිරීමක්] ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමනි, හෙට අනිද්දා වන විට පුළුවන් නම් ඔබතුමාගේ ආසනය වන මාවනැල්ල පැත්තට යන්න. ගිහින් මිනිසුන්ව හම්බ වෙන්න. Units 91ක් පාවිච්චි කරන මනුෂ්‍යයාගේ ලයිට් බිල සියයට 126කින් වැඩි කරන්නට මේ ආණ්ඩුව උත්සාහ කරනවා කියන කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.04]

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අපේ පාර්ලිමේන්තුව. කුමන දේශපාලන මතිමතාන්තරයක් දැරුවත් මේ රටේ කෝටි 21ක් ජනතාව වෙනුවෙන් මන්ත්‍රීවරුන් 225 දෙනෙකු මහජන නියෝජිතයින් ලෙස පත් කර එවනවා උත්තරීතර ආයතනයට රතු පලස එළලා පිළි අරගෙන. ඒ මේ රට වෙනුවෙන් පක්ෂ විපක්ෂ මතවාද බොහොම විද්‍යාත්මක පදනමක් යටතේ ඉදිරිපත් කරයි කියලා. ඉතිහාසයේ මේ පාර්ලිමේන්තුවේ විවිධ දේශපාලන පක්ෂවල සිටි විවිධ ජන නායකයින් අපි වාගේ පොඩි අයට පූර්වාදර්ශ විශාල ප්‍රමාණයක් සපයා තිබෙනවා. මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා, පිලිප් ගුණවර්ධන මැතිතුමා, කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා, ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා, සිදම්බරම් මැතිතුමා, අමිර්තලිංගම් මැතිතුමා සහ ධර්මලිංගම් මැතිතුමා වැනි අය අපට පූර්වාදර්ශ විශාල ප්‍රමාණයක් සපයා තිබෙනවා, හැන්සාඩ් වාර්තා එකතු කරගෙන එය පසු අධ්‍යයනයන් සඳහා පාවිච්චි කරන්න කියලා.

දේශපාලන වේදිකාවක කරන කථාව ඔවුන් කිසි දවසක මේ පාර්ලිමේන්තුවේ කළේ නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුවට එන හැමටම අලුතෙන් යමක් ඉගෙන ගන්න හා එකතු කර ගන්න වගකීමක් තිබුණා. ඒ වගකීම තුළ පාර්ලිමේන්තුවේ සෑම මන්ත්‍රීවරයෙකුටම ඉතා විශාල ගෞරවයක් පාර්ලිමේන්තුවෙන් පිටත මහජනතාව අතර තිබුණා. අපිට මොන මතිමතාන්තර තිබුණත් අපි අපේ මහජන නියෝජිත ධුරය, මන්ත්‍රී ධුරය, පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තුවේ ගුණාත්මකබව පහළ මට්ටමක පවත්වාගෙන යාම අපි කාටත් ගුණදායක වන්නේ නැහැ කියා 1989 සිට පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් ලෙස මා හිතනවා. ඒ නිසාම සමහර අය අපිට ලබා දෙන මූලාශ්‍ර හා කියන දේ අනුව යම් යම් ප්‍රකාශ පාර්ලිමේන්තුවේ කරන විට, අපි විපක්ෂයේ ඉන්න විට, විපක්ෂ නායකතුමන්ලා ආණ්ඩු කරන විට,ඒ පිළිබඳ ඉගෙන ගත්ත මන්ත්‍රීවරයෙක් මම. 1980 ගණන්වල වී.ජ.මු. ලොකුබණ්ඩාර ඇමතිතුමාගේ අමාත්‍යාංශයට එක්තරා විශ්වවිද්‍යාලයක අපිට හිතවත් මහාචාර්යවරයෙක් මා දන්නා එක ආයතනයක් ගැන පුද්ගල විවේචනයක් සහිතව ඔහුගේ ආචාර්ය උපාධිය ගැන ප්‍රශ්නයක් කරුණු ඇතුව ලියලා මට ගෙනැවිත් දුන්නා. මා ඒ ප්‍රශ්නය විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ලෙස මේ පාර්ලිමේන්තුවේදී මතු කළා. ඒ අවස්ථාවේදී වී.ජ.මු. ලොකුබණ්ඩාර ඇමතිතුමා කිව්වා, "මේ පාර්ලිමේන්තුවේ උත්තර දෙන්න බැරි කෙනෙක් ගැන ඔය විධියට කථා කරන එක වැරැදියි. ඒක ඉන් පසු කරන්න එපා" කියා.

අපි පාඩම් ඉගෙන ගත්තාට ටික දවසක් යන විට ඒවා මතක නැති වෙනවා. මෑත ඉතිහාසයේ සිද්ධියක් වුණා කොට්ටාව ධර්මපාල විද්‍යාලය සම්බන්ධව. එම විද්‍යාලය ගැන ප්‍රශ්නයක් ඇති වුණා. ඒක පළාත් සභා පාසලක්. මේ පළාත් සභා පාසලේ ගහකට පුද්ගලයෙක් නැඟලා හිටියා ප්‍රතිසංවිධානයට විරුද්ධව. අතිගරු ජනාධිපතිතුමා ඒ ප්‍රදේශයේ පන්සලක් විවෘත කරන්න ආවා. ඒ අවස්ථාවේදී දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් මමත් තවත් මැතිඇමතිවරු රාශියකුත් හිටියා. ඒ අවස්ථාවේ එතැනට පැමිණි ඒ ප්‍රදේශයේ එක්තරා දේශපාලනඥයෙක් මට කිව්වා, "එයා දැන් ගහෙන් බැහැලා ඉවරයි. ගහෙන් බැහැලා ජනාධිපතිතුමා හම්බ වෙන්න දැන් මෙතැනට එනවා" කියා. මම ඒ දේශපාලන හාල්පාරුවා කිව්ව එක පිළිඅරගෙන මෙතැන ප්‍රශ්නය අහපු වෙලාවේ මම කිව්වා, "ගහෙන් බැහැලා" කියා. මම ඒ උත්සවය ඉවර වෙලා පාර්ලිමේන්තුවට තමයි ආවේ. අර මිනිසා කී දේ විශ්වාස කිරීමෙන් මගේ තිබුණු ආත්ම ගෞරවයත් ඉවර වුණා. ඒ නිසා අපි මොන යම් ප්‍රකාශයක් හෝ කරන විට ඒ ප්‍රකාශය මේ ගරු සභාවට උචිත ආකාරයට කරනවා නම් මා හිතනවා අපි අතර මොන මතිමතාන්තර තිබුණත් ඒක නිරෝගී ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වැදගත් වෙනවා කියා.

අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමා ඉතාම බරපතළ ප්‍රකාශයක් කළා. මා එතුමා ආරක්ෂා කර ගන්න නැඟිටලා කිව්වා, ඔබතුමා මේ ප්‍රකාශය පුවත් පතක තිබුණ පමණින් කරන්න එපා, මේ ප්‍රකාශය ඔබතුමාගේ වටිනාකමට හානිකරයි කියා. දේශපාලන වශයෙන් ආණ්ඩුවට වෛරයෙන් ගහනවා වෙන්න පුළුවන්. එතුමා කිව්වා, දකුණු පළාතේ දරුවෝ 39,000ක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටියා. එයින් 34,000ක් අසමතුන් බවට පත් වෙලා තිබෙනවා කියා. මා කිව්වා, "මේක කියන්න එපා" කියා. මට තේරෙනවා. මගේ හෘදය සාක්ෂියට අනුවත් අවංකවත් දකුණ කියන්නේ මේ රටේ ඉතිහාසයේ ගමන් මඟ වෙනස් කළ ප්‍රදේශයක්. මුළු රටට හැම දාම බුද්ධිමතුන් හදපු ප්‍රදේශයක්. ඒ කියන්නේ දකුණේ මිනිසුන්, ළමයින් පහළට දමා පාර්ලිමේන්තුව වාගේ තැනක, ළමයි ඉන්න තාත්තා කෙනෙක් විධියට කවුරුත් කථා කරන්න හොඳ නැහැ. එහෙම කිරීමෙන් රටට ලැබෙන ප්‍රතිඵලයක් නැහැ. මම එවර විභාග කොමසාරිස්තුමාට කථා කළා. මම එතුමාට කථා කර කිව්වා, මේක හැන්සාඩ් වාර්තාවට දෙන්න ඉස්සර මම ප්‍රකාශය හරියට බලා කියන්නම්. ඒ නිසා පත්තරේක තිබූ පමණින් කියන්න එපාය කියා. මා නැඟිටලා කිව්වා. මොකද, අපේ උගත් මිත්‍රයා අමාරුවේ වැටෙනවාට මම කැමැති නැති නිසා.

නමුත් එතුමා ඇහුවේ නැහැ, එහෙමම කිව්වා. විභාග කොමසාරිස්තුමා කියන ආකාරයට ශිෂ්‍යත්ව විභාගයට ගාල්ල දිස්ත්‍රික්කයේ දරුවෝ 16,609 දෙනෙක් වාඩි වුණා. ඒ 16,609න් 11,221ක් ශිෂ්‍යත්ව විභාගය සමත් වී තිබෙනවා. ඒ කියන්නේ සියයට 67.56ක් ශිෂ්‍යත්ව විභාගය සමත්. මාතර දිස්ත්‍රික්කයේ දරුවෝ 12,637ක් ශිෂ්‍යත්ව විභාගයට වාඩි වුණා. එයින් 8,840ක් සමත් වුණා. සමත් වීමේ ප්‍රතිශතය සියයට 69.95යි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ දරුවෝ 9,730ක් ශිෂ්‍යත්ව විභාගයට වාඩි වුණා. 6,823ක් සමත් වුණා. සමත් වීමේ ප්‍රතිශතය සියයට 70.12යි. ඒ අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ 16,609ක්, මාතර දිස්ත්‍රික්කයේ 12,637ක්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ 9,730ක් වශයෙන් දකුණු පළාතෙන් 38,976ක් විභාගයට පෙනී සිටියා. දකුණු පළාතේ විභාගයට වාඩි වුණු දරුවන් 38,976 දෙනාගෙන් 26,884 දෙනෙක් විභාගය සමත් වුණා. ඒ කියන්නේ විභාගයට පෙනී සිටි 100කගෙන් 69 දෙනෙක් විභාගය සමත්. 100ක් පෙනී සිටලා 69 දෙනෙක් සමත් වුණු වෙලාවක

මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මුළු දක්ෂිණ ලංකාවේම ළමයින්ට පාර්ලිමේන්තුව ඇතුළේදී කරන්න පුළුවන් උපරිම අපහාසය කළාය කියන චෝදනාව මට කරන්න සිද්ධ වෙනවා. මේක කළේ දකුණට. දකුණට එහෙම

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

කරන්න එපා. දකුණ මේ රටේ ඉතිහාසයේ ගමන් මඟ වෙනස් කළ ප්‍රදේශයක්. අසත්‍යයක් ප්‍රකාශ කරන කොට අභිංසක දුර්නිරූපණ කියලා තිබෙනවා; වංචා සහගත දුර්නිරූපණය කියලා තිබෙනවා. රවි කරුණානායක මන්ත්‍රීතුමා කළේ වංචා සහගත දුර්නිරූපණයක් කියලා මම කියන්නේ නැහැ. අභිංසක දුර්නිරූපණය කියන්නේ ඇත්තයි කියලා හිතා ගෙන අසත්‍යය කියන එකයි. එතකොට එතුමා කළේ අභිංසක දුර්නිරූපණයක්. පුළුල් ලෙස අධ්‍යයනයකින් තොරව එතුමා ඒක කිව්වාද කියලා මම නැවත හිතුවා. කොහොමද මෙහෙම කියන්නේ? එතුමා කිවූ ආකාරය අනුව ළමයින් දහස් ගණනක් විභාගයට ගියා. එතුමා කිව්වේ 39,000ක් විභාගයට වාඩි වෙලා 34,000ක් අසමත් වෙලා කියලායි.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා හොඳටම දන්නවා, අපේ ශිෂ්‍යත්ව විභාගයේ තිබෙනවා cut-off mark කියලා එකක් තිබෙන බව. Cut-off mark එක කියන්නේ ශිෂ්‍යත්වය සමත් වීමේ ලකුණ නොවෙයි. අපි ශිෂ්‍යත්ව 15,000ක් දෙනවා. ඒ දෙන ශිෂ්‍යත්ව ගණනට අනුව ලකුණක් හදනවා. ඒකට කියනවා කඩඉම් ලකුණ නැත්නම් cut-off mark එක කියලා. Cut-off mark එක දෙන්නේ මෙහෙමයි. ගාල්ල cut-off mark එක 152යි. මාතර 152යි. හම්බන්තොට 148යි. මේ ප්‍රශ්න පත්‍රයට ලැබෙන්නේ ලකුණු 200යි. 200න් 150ක් ගන්න ඒ දරුවන් විශිෂ්ටතමයන් හැටියට සලකන්න පුළුවන්. 200න් 150ක් ගන්නවා කියන්නේ විභාගය සමත් වීමද? එහෙම සමත් වන විභාග ජාතියක් මේ තුන් ලෝකයේ තියෙනවායැ? ඔබතුමා දන්නවා නේ විභාග කරලා ආපු කෙනෙක් ලෙස සාමාන්‍යයෙන් ලෝකයේ සම්මතය තමයි යම්කිසි විභාගයකට තුනෙන් එකක් ලකුණු තිබෙනවා නම්, ඒක තමයි "එස්" සාමාර්ථය නැත්නම්, සමත් කියන්නේ කියලා. ලකුණු 33 1/3යි කියන එකට අපි 35ක් කියලා හදා ගන්නවා. ඒක තමයි ලෝකයේ සාමාන්‍යයෙන් සම්මත විභාගයක සමත් වීමේ ලකුණ. ශිෂ්‍යත්ව 20,000ක් දුන්නොත් කඩඉම් ලකුණ කියන එක අඩු වෙනවා. ගාල්ලේ කඩඉම් ලකුණ ලැබූ දරුවෝ 1,840ක් ඉන්නවා. මාතර 1,414ක් ඉන්නවා. හම්බන්තොට 1,331ක් ඉන්නවා.

දකුණු පළාතේ විභාගයට පෙනී සිටි මුළු දරුවන් සංඛ්‍යාවෙන් දරුවන් 4,585දෙනෙක් 150ට වඩා වැඩියෙන් ලකුණු ලබා තිබෙනවා. මුළු ලංකාවෙන්ම ශිෂ්‍යත්ව දෙන ප්‍රමාණයෙන් තුනෙන් එකකට උරුමකම් කියන දරුවන් ප්‍රමාණයක් දකුණෙන් පමණක් බිහි වෙලා තිබෙනවා; විභාගය සමත් වෙලා තිබෙනවා. ඒ දරුවන් පාර්ලිමේන්තුවේ අපේ මහජන නියෝජිතයන්ගේ ප්‍රදේශවල දරුවන්. දකුණෙන් ඡන්දයක් බලාපොරොත්තු වන කවුරු හරි අයකු ඉන්නවා නම් ඒ දකුණේ දරුවන්ට ගහන්න එපා. ඒ අය මේ රටේ අනාගතය වෙනුවෙන් ඉදිරියට එන දක්ෂතම දරුවෝ. ඒ වාගේ දරුවන්ට මේ පාර්ලිමේන්තුව ඇතුළේ එක්සත් ජාතික පක්ෂය විධියට එහෙම නිර්දය ලෙස ප්‍රහාරයක් එල්ල කරලා බාල්දු කළාම ඒ දරුවෝ මතක තියා ගන්නවා එක්සත් ජාතික පක්ෂය මේ වාගේ සිද්ධියක් අරගෙන විවේචනය කළා කියලා. මම එතුමාට කිව්වා එහෙම කියන්න එපා කියලා. එතුමාගේ ගරුත්වය ආරක්ෂා කරන්න මම මුලින්ම එතුමාට කිව්වා, මේක කියන්න එපා, මම බලා ඇවිත් කියන්නම් කියලා. නැහැ, මේක පත්තරයේ තිබෙනවා කියලා එතුමා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2012 ශිෂ්‍යත්ව විභාගයේ සියලු ප්‍රතිඵල පිළිබඳ සම්පූර්ණ සංඛ්‍යා ලේඛන, දත්ත සහිතව, ප්‍රතිශතයන් සහිතව තනි පිටුවක තිබෙන මේ ලේඛනය මම හැන්සාඩ් වාර්තාවේ මුද්‍රණය කිරීම සඳහා ඉදිරිපත් කරනවා. කරුණාකර එය හැන්සාඩ් වාර්තාවේ පළ කරන්න අවසර දෙන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මා මේ අවස්ථාවේදී එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

***කථාව අවසානයේ පළ කර ඇත.**

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප හැමදාම සාම්ප්‍රදායිකව කරන දෙයක් තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ ඇමතිතුමා වන අතිගරු ජනාධිපතිතුමා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළාම විපක්ෂය පැත්තේ ඉන්න මන්ත්‍රීතුමන්ලා, විවිධ පුද්ගලයන් විවිධ සිද්ධි නම් ගම් අරගෙන මේ පැත්තට බණිනවා. අපි මේ පැත්තේ ඉඳන් ඒ පැත්තට බණිනවා. නමුත් මේ රටේ මුදල් පිළිබඳ උත්තරීතර බලය පාර්ලිමේන්තුවටයි පවරා තිබෙන්නේ. යම්කිසි මුදල් පනත් කෙටුම්පතක් එක ඡන්දයකින් හරි පරාද වුණොත් මේ පාර්ලිමේන්තුව විසුරුවන්න ඕනෑ. කවුරු ආණ්ඩු කළත්, කාගේ දේශපාලන පක්ෂය තිබුණත් පාර්ලිමේන්තුව ඇතුළේ මුදල් පනත් කෙටුම්පතක් පරාජය වුණාම මේ පාර්ලිමේන්තුව විසුරුවා ඡන්දයකට යන්න ඕනෑ. ඇයි ඒ? මහජනයා විශ්වාස කරනවා මහජනයාගේ මුදල් වියදම් කරන ආකාරය පිළිබඳ පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මේ පාර්ලිමේන්තුව වග කියාවි, වගකීමකින් කටයුතු කරාවි කියලා. අපට තිබෙන ප්‍රධාන කාර්යය ඒ වගකීම ඉටු කරන එකයි. ඒ ඒ වෙලාවේ පවතින, රජයේ ආදායම හා වියදම තමයි අපට සලකා බලන්න තිබෙන්නේ. ආණ්ඩුවේ ආදායම තිබෙනවා. රජයේ වියදම තිබෙනවා. අය වැය පරතරයක් තිබෙනවා. අය වැය පරතරය පියවන ආකාරයක් තිබෙනවා. සමස්ත ආර්ථිකය ගත්තාම සියලු ප්‍රශ්න නිර්මාණය වන්නේ, සියලු ප්‍රශ්න විසඳෙන්නේ මේ මතයි. ඒ නිසා අපි දන්නවා බදු නැතිව දුවන කිසිම ආණ්ඩුවක් මේ ලෝකයේ නැති බව. මේ ලෝකයේ කොහේ හරි රටක බදු නොපනවන ආණ්ඩුවක් තිබෙනවා නම් කියන්න. බදු පනවනවා, මිනිසුන් මරනවා, මිනිසුන් හූරාගෙන කනවා, මිනිසුන් සුද්ද කරනවා කියලා විපක්ෂය චෝදනා නඟනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අධ්‍යාපනයට වියදම් කරනවා; සෞඛ්‍යයට වියදම් කරනවා; නිවාසවලට වියදම් කරනවා; පාරවල්වලට වියදම් කරනවා; පාලම්වලට වියදම් කරනවා; ඇනිකට්වලට වියදම් කරනවා; වේලිවලට වියදම් කරනවා. වියදම් කරන්න ආදායම එන්න එපායැ. කුටුම්භයක් - ගෙදරක්- ගත්තත්, තනි මිනිසකු ගත්තත්, ආයතනයක් කොම්පැනියක් ගත්තත්, ආණ්ඩුවක් ගත්තත් ආදායමක් එන විධියක් තිබෙනවා. ඒ ආදායම අනුව තමයි අපට කොපමණ වියදම් කරන්න පුළුවන්ද කියන එක තීන්දු වන්නේ. අපේ ආදායම ප්‍රමාණවත් නැත්නම්, අපේ වියදම දරන්න බැරි නම් අප කරන්නේ ණය ගැනීමයි. එහෙම නැත්නම් අපි තිබෙන දේපොළක් විකුණනවා. ඕනෑවට වඩා ණය ගත්තොත් ණය වාරික, පොලී ගෙවා ගන්න බැරිව අපි බංකොලොත් වෙනවා; අපි අර්බුදයකට මුහුණ පානවා. අපි පවුලක් -කුටුම්බයක්- ගනිමු. පවුලක ආදායම රුපියල් 20,000 නම් ඒ රුපියල් 20,000 ලැබෙන මාර්ගයක් තිබෙනවා. ඒවා තමයි, ඒ ගෙදර ඉන්න සාමාජිකයන් වැඩ කරලා වැටුප් වශයෙන් ලබන ප්‍රමාණය; ව්‍යාපාරයක් කරලා ලබන ලාභ; එහෙම නැත්නම් ප්‍රාග්ධනය දීලා ලබන පොලිය; එහෙමත් නැත්නම් ඉඩකඩම් ආදියෙන් ලැබෙන බදු කුලිය. ඕනෑම ගෙදරකට මින් එහාට ආදායමක් ලැබෙන්න බැහැ. ගෙදර ඉන්න සාමාජිකයන් වැඩට ගිහිල්ලා වැඩ කළාම ඒ ශ්‍රමය වෙනුවෙන් ලැබෙන දීමනාව හැටියට වැටුපක් ගන්නවා. ප්‍රාග්ධනය දුන්නොත්, බැංකුවේ සල්ලි දැම්මොත්, වෙනත් කර්මාන්තශාලා තිබුණොත් පොලී ලැබෙනවා. ස්වාභාවික සම්පත් තිබුණොත් අපට බදු කුලී ලැබෙනවා. Business එකක් කළොත් ලාභ ලැබෙනවා. මේ ටික තමයි ගෙදර ආදායම. ආදායමෙන් කන්න, බොන්න, අඳින්න පළඳින්න, යන්න එන්න, ඉන්න හිටින්න, නටන්න ගයන්න වියදම් කරනවා. ආදායම රුපියල් 20,000 නම් වියදම රුපියල් 30,000 නම් තවත් රුපියල් 10,000ක් වියදමට මදි වෙනවා.

ඒක තමයි කුටුම්බයේ අය වැය පරතරය -අය වැය හිඟය. එතකොට එයා කරන්නේ කොහෙන් හරි ණය ගැනීමයි. "10,000ක් මදි වුණා" කියලා ඉස්සෙල්ලාම යාළු හිතමිත්‍රාදීන්ට කියලා කීයක් හරි ඉල්ලා ගන්න බලනවා. ඒක ප්‍රදානයක් - grant එකක්. නෑදෑයෝ හැමදාම ඒ විධියට තෑගි දෙන්නේ නැහැ.

එතකොට අපි ණය ගන්නවා. ණය ගන්න කොට බැංකුවකින් ණය ගන්න තරම් හොඳ තත්ත්වයක් නැත්නම් බැංකු ණය දෙන්නේ නැහැ. එතකොට සියයට පහේ ගිණි පොලියට ණය ගන්නවා. මාසයකට සියයට 5යි කියන්නේ අවුරුද්දකට සියයට 60යි. සියයට 10 ගණනේ ණය ගන්නවා. එතකොට අවුරුද්දට සියයට 120යි. මේ ප්‍රමාණයට ණය අරගෙන ඒ ණය ගෙවන්න තව ණය ගන්න සිද්ධ වුණොත්, එතකොට අපි කියනවා ණය උගුලකට අහු වෙලා තිබෙනවා කියලා. ඒ ණය උගුලේ දිගටම ගියොත් ඔහුට ණය ගෙවා ගන්න බැරි වෙනවා; දරුවන්ට මුහුණ දෙන්න බැරි වෙනවා; පවුලට මුහුණ දෙන්න බැරි වෙනවා; ගෙදර බාල්කයක එල්ලිලා සිය දිවි නසා ගන්නවා. ඒක තමයි සාමාන්‍ය ගෙදරක සිද්ධ වන තත්ත්වය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයකටත් ඒකයි වෙන්නේ. රජයට ආදායමක් ලැබෙනවා. රජය වෙනුවෙන් වැඩ කරන කෙනෙක් නැහැ. ඒක නිසා වැටුප් එන්නේ නැහැ. රජයට ප්‍රාග්ධන ආයෝජන තිබෙන නිසා බොහොම පොඩි පොලී ප්‍රමාණයක් එනවා. රජයේ ව්‍යාපාර තිබෙන්නේ බොහොම පොඩ්ඩයි. ඒ නිසා ලාභ තිබෙන්නේ පොඩ්ඩයි. අනෙක් සියලුම රටවල්වල රජයයන්වලට ආදායම ලැබෙන්නේ බදුවලිනුයි. බදු වර්ග 2ක් තිබෙනවා. ආදායම, ලාභය, ප්‍රාග්ධනය මත අය කරන බදු තිබෙනවා. ඒ තමයි වෙන අයට බදු බර පටවන්න බැරි ඒවා; බදු ආපාතය විතැන් කළ නොහැකි ඒවා. ඒ වාගේම සෘජු බදු තිබෙනවා. ඒ වාගේම වක්‍ර බදු තිබෙනවා. භාණ්ඩ හා සේවා මත පටවලා බද්ද ගෙවන කෙනා විසින් නොවෙයි වෙනත් අය විසින් තමයි බදු බර උසුලන්නේ. ඒ විධියට වක්‍ර බදු පනවනවා. දුප්පත් රටවල වැඩි වැඩියෙන් පනවන්නේ වක්‍ර බදුයි. පොහොසත් රටවල් -රට පොහොසත් වුණාට පස්සේ- පනවන්නේ සෘජු බදුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටවල් කිහිපයක් පිළිබඳව සඳහන් කරන්නට මා කැමැතියි. සාමාන්‍යයෙන් පිළිගත් ආර්ථික විද්‍යා විග්‍රහයකට අනුව දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් තමයි රාජ්‍ය ආදායම්, ව්‍යදම් දක්වන්නේ. කුවේට්වල ආණ්ඩුවේ ආදායම - Government revenue එක - සියයට 55.5යි. කුවේට්වල තෙල් නිෂ්පාදනය 100ක් නම්, ආදායම විධියට ඉන් 55.5ක් බදුවලින් රජය ගන්නවා. ව්‍යදම සියයට 32.6යි. එතකොට කුවේට්වල පාර්ලිමේන්තුවට අය වැය පරතරයක් නැහැ. අය වැය පරතරයක් නැත්තේ ආදායමට වඩා සමස්ත ව්‍යදම අඩු නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට නෝර්වේ ගැන මා කියනවා. සියලුම ප්‍රශ්නවලදී අපත් එක්ක යාළු වෙලා, තරහා වෙලා විවිධ ආකාරවලින් එනවා කියන නෝර්වේ රාජ්‍ය ගැන මා කියනවා. එහෙම එන්න ඔවුන්ට පුළුවන්කම ලැබිලා තිබෙන්නේ මොකද කියලා මා කියන්නම්. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ඔවුන්ගේ ආදායම 47.7යි; ව්‍යදම 35.7යි. නෝර්වේ රාජ්‍යයේ ආදායම සියයට 47.7ක් තිබෙන කොට, ඒ වාගේම සියයට 35.7ක් ව්‍යදම් කරන කොට නෝර්වේවල ව්‍යදමට වඩා ආදායම වැඩියි. නෝර්වේ පාර්ලිමේන්තුවට අය වැය හිඟය පියවන ආකාරය ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ලෝකයේ තිබෙන පාර්ලිමේන්තුවලින් ඉතාම සංවර්ධිත රටවල් කිහිපයක පමණයි අය වැයේ මෙවැනි අතිරික්තයක් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කවුරුත් දන්නා ආකාරයට කුවේට්වල තෙල් සම්පත විශාල ලෙස තිබෙන නිසා ඔවුන්ගේ රාජ්‍ය අය වැයේ අතිරික්තයක් තිබෙනවා. නෝර්වේ රාජ්‍යයේ තිබෙන දැවැන්ත ධන සම්පත් නිසා ඔවුන්ගේ රාජ්‍ය අය වැයේ අතිරික්තයක් තිබෙනවා. ඔවුන්ට පාර්ලිමේන්තුවේදී මේ විධියට බැණ ගන්න, රණ්ඩු වෙන්න ඕනෑ නැහැ. අවශ්‍ය මං මාවත්, විදුලිය, ජල බස්නා ජලාපවහන ක්‍රම ඇතුළු අනෙක් ඒවාත් කරලා, වෙන රටකත් මොනවා හෝ කටයුතුවලට සල්ලි ටිකකුත් දීලා, රාජ්‍ය නොවන සංවිධානයක් හදලා ආණ්ඩුවකට විරුද්ධව වැඩ කරන්න හරි සල්ලි දෙන්න පුළුවන්කම ඔවුන්ට තිබෙනවා. නමුත් ප්‍රංශය ගත්තොත්, ප්‍රංශයේ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ආදායම 40.9යි; ව්‍යදම 48.1යි. නෙදර්ලන්තයේ ආදායම සියයට 40.3යි; ව්‍යදම සියයට 45.5යි. බෙල්ජියමේ ආදායම සියයට 40.7යි; ව්‍යදම සියයට 44.1යි. ඩෙන්මාර්කයේ ආදායම සියයට 39.8යි; ව්‍යදම සියයට 42.2යි. ඉතාලියේ ආදායම සියයට 38.4යි; ව්‍යදම සියයට 43.8යි.

New Zealandවල ආදායම සියයට 36.1යි. ව්‍යදම සියයට 32.1යි. එහේත් අතිරික්තයක් තිබෙනවා. එක්සත් රාජධානියේ ආදායම සියයට 36.0යි. ව්‍යදම සියයට 46.4යි. මා මේ සියල්ල ඉදිරිපත් කරන්නේ, කොහේ හෝ කොළ කෑල්ලක තියෙන එකකින් නොවෙයි. ලෝකයේ තිබෙන වඩාත්ම සුරක්ෂිත දත්ත ඇතුළත් World Development Indicators කියා ලෝක බැංකුව නිකුත් කරන පොතක් තිබෙනවා. ඒ අනුව, මේ ඔක්කොම රටවල ආදායම මෙහෙම පණස්පහ, හතළිස් හත, හතළිහ, තිස් නවය, තිස් අට යනාදී වශයෙන් තියෙනකොට World Development Indicatorsවල දක්වන්නේ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම 14.9යි, ව්‍යදම 19.2යි කියායි. එතකොට තමුන්නාන්සේලාට තේරෙනවා, මේ රටේ කාගේ ආණ්ඩුවක් තිබුණත්, අප මේ බදු කොච්චර පනවනවාය කිව්වත්, ලෝකයේ දියුණු රටවල් සමඟ සාපේක්ෂව සැසඳීමේදී ලංකාව සුබසාධන රාජ්‍යයක් ලෙස මේ බදුවලින් ලබන ආදායම් මට්ටම තිබෙන්නේ ඉතාම පහළ අගයකය කියන එක. මේ රට වේගයෙන් ඉදිරියට ගෙන යාමට නම්, පොදු පිළිගැනීම වන්නේ අපේ රටේ මතු උපනුපන් පරම්පරාවල හෝ පාර්ලිමේන්තුවක් ඇති වෙනවා නම් අඩුම තරමේ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතය වශයෙන් සියයට 25කවත් ආදායමක් ලංකාණ්ඩුව ලබා ගන්නට ඕනෑය කියායි. ආණ්ඩුව කවුරු කළත්, එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කළා වන්නට පුළුවන්; පොදු ජන එක්සත් පෙරමුණ-සන්ධානය- ආණ්ඩු කළා වන්නට පුළුවන්, ආණ්ඩුව කරන්නට බලාපොරොත්තුවන කවුරු හෝ ඉන්නවා නම් ඒ අය ආණ්ඩුව කරගෙන යන්න නම් මේ රටේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 25ට වැඩි කර ගන්නට ඕනෑ. ඒ සඳහා කරන්නට තිබෙන්නේ මොකක්ද? සෘජු බදු හා වක්‍ර බදු කියන වර්ග දෙකෙන් අප පුළුවන් තරම් සෘජු බදු වැඩි කර ගන්නට බලන්නට ඕනෑ, මහජනතාවට ආදරය තිබෙනවා නම්. මහජනතාවට ආදරයෙන් කථා කරන අය, සෘජු බදු වැඩි කර ගන්නා මාර්ගවලටත් මේ පාර්ලිමේන්තුවේ විරුද්ධ වෙනවා.

බදු අය කරනකොට ආදායම මත, ලාභ මත, ප්‍රාග්ධනය මත අය කරන බදු සෘජු බදු වෙනවා. ඕස්ට්‍රේලියාවේ මුළු ආදායමෙන් -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි පහක් දෙන්න. මේ කථාව විතරක් කියා මගේ කථාව අවසාන කරනවා.

ඕස්ට්‍රේලියාවේ මුළු බදු ආදායමෙන් සියයට 65ක් සෘජු බදුයි. භාණ්ඩ හා සේවා මත බදු සියයට 23යි. ජාත්‍යන්තර වෙළඳාම මත පනවන බදු සියයට 2යි. New Zealandවල සෘජු බදු සියයට 57යි. භාණ්ඩ හා සේවා මත බදු පනවන්නේ සියයට 26යි. ජාත්‍යන්තර වෙළඳාම මත පනවන බදු සියයට 3යි. චීනයේ සෘජු බදු අඩුයි. එය සියයට 25යි. භාණ්ඩ හා සේවා මත පනවන බදු සියයට 59යි.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

ජාත්‍යන්තර වෙළඳාම මත පනවන බදු සියයට 04යි. අපේ රටට අල්ලපු ඉන්දියාවේ සෘජු බදු සියයට 47යි. භාණ්ඩ හා සේවා මත පනවන බදු සියයට 23යි. ජාත්‍යන්තර වෙළඳාම මත පනවන බදු සියයට 13යි. මැලේසියාවේ සෘජු බදු සියයට 46යි. භාණ්ඩ හා සේවා මත පනවන බදු සියයට 17යි. ජාත්‍යන්තර වෙළඳාම මත පනවන බදු සියයට 2යි. සිංගප්පූරුවේ ආදායම් බදු සියයට 34යි. භාණ්ඩ හා සේවා මත පනවන බදු සියයට 26යි. ජාත්‍යන්තර වෙළඳාමට සිංගප්පූරුවේ බදු අය කරන්නේ නැහැ. ශ්‍රී ලංකාවේ ආදායම් බදු සියයට 18යි. භාණ්ඩ හා සේවා මත පනවන බදු සියයට 48යි. ජාත්‍යන්තර වෙළඳාම මත පනවන බදු සියයට 14යි. මා මේ කියන්නේ World Development Indicatorsවල දක්වන්නාවූ විධියටයි.

අප මේ සියලුම තත්ත්වයන් තුළ ජනතාවාදී රජයක් ලෙස මුදල් අමාත්‍යවරයා; මේ රටේ ජනතාවට ආදරය කරන රාජ්‍ය නායකයකු විධියට අතිගරු ජනාධිපතිතුමා සෑම අවස්ථාවකදීම දෙන්නට පුළුවන් හැම බදු නිදහසක්ම, සහනයක්ම දී, මිනිසුන්ගේ පැත්තට පැටවෙන බදු ප්‍රමාණය විශාල ලෙස අඩු කර, වෙනත් මාර්ගවලින් ගන්නා බදු ප්‍රමාණය වැඩි කරන්නට තමයි මේ පනත් සියල්ල ගෙනැවිත් තිබෙන්නේ. ඒකයි ඇත්ත; යථාර්ථය. එම නිසා අප ඉන්නේ තව ආදායම් වැඩි කළ යුතු තත්ත්වයකයි.

ජාත්‍යන්තර උපදෙස් අනුව, 2002 හෝ 2003 වර්ෂයේදී වැඩ බලන මුදල් ඇමතිවරයා ලෙස වැට බැඳ්ද -අගයානුකූල බද්ද- කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළේ මායි. නමුත් මේ බද්ද මේ රටට ගැළපෙන බද්දක් නොවෙයි. බදු පිට බදු පැටවෙන එක - cascading effect එක - නතර කරන්න ලෝකයේ දියුණුම ගණක ක්‍රම තිබෙන රටවල ක්‍රියාත්මක කරන්නට පුළුවන් බද්දක් තමයි වැට බැඳ්ද. හරියට ගිණුම් තිබෙන රටක, හැම ගනු දෙනුවක්ම පරිගණක ආශ්‍රයෙන් සටහන් වෙන රටක, හැම ගනු දෙනුවකටම රිසිට් පතක්, බිල් පතක් නිකුත් කරන රටක, refundsවලදී හොරකම් කරන්නේ නැති රටක තමයි මේක කරන්නට පුළුවන්. එම නිසා මේ VAT බදුවලින් අර බදු ඉලක්කය කරා ළඟා වන්නට බැහැ. අද සිංගප්පූරුවේ තිබෙන්නේත් GST - Goods and Services Tax . Cascading ප්‍රශ්නය මොනවා වුණත් ආපසු ගෙවන එකක් හැදුවොත් අපේ රටේ හරියට ගණන් තියලා මේක කරන්නට බැහැ. එම නිසා එදා ඒක VAT කියලා හඳුන්වා දුන්නාට, මේ බදු ක්‍රමය තුළින් ගිහින් මේ ආදායම උස්සන්නට බැහැ.

ආර්ථික විද්‍යාව පිළිබඳ පොඩි අවබෝධයක් තිබෙන කෙනෙකු ලෙස මට කියන්න තිබෙන්නේ, මේ බදු ක්‍රම තුළින් ආදායම තවත් වැඩි කරලා, ජනතාවට වඩා සහනයක් ලැබෙන ආකාරයට බදු ප්‍රතිශතය අඩු කරලා පුළුල් පරාසයක් තුළ භාණ්ඩ හා සේවා බද්දක් - GST - විකුණුම් බද්දක් බවට පරිවර්තනය කරන්න ඕනෑ බවයි. හැම කෙනාගෙන්ම පොඩි පොඩි ප්‍රමාණයෙන් අතිවිශාල ආදායමක් ලැබෙන ආකාරයට ලංකාණ්ඩුවේ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 25ක් දක්වා වැඩි කළොත්, රටේ ජනතාවට වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබා දෙන්න අවශ්‍ය පිරිවැය දරන්න රජයට පුළුවන්කම ලැබෙනවා. වැඩි වැඩියෙන් ජනතාවට සහන දෙන්න නම් වැඩි වැඩියෙන් ආදායම ලබා ගත යුතුයි. මේ පනත් කෙටුම්පත්වලින් අපි උත්සාහ දරන්නේ එසේ කටයුතු කරන්නයි. ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන කිපය සමාප්ත කරනවා.

**** සභාමේසය මත තබන ලද ලේඛනය:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :*

** Document tabled:*

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2012

දිස්ත්‍රික්ක අනුව අයදුම්කරුවන්ගේ සාධනය

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	කවදතම ලකුණට ඉහළ ලකුණු ලබාගත්		මුළු ලකුණු 100 ට ඉහළ ලබාගත් (එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් 50 බැගින්)		මුළු ලකුණු 70 ට ඉහළ ලබාගත් (එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් 35 බැගින්)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	30940	3052	9.86	12446	40.23	20386	65.89
ගම්පහ	30050	3571	11.88	13157	43.78	20534	68.33
කළුතර	18161	2246	12.37	7550	41.57	11884	65.44
මහනුවර	21836	1748	8.01	8143	37.29	14097	64.56
මාතලේ	7740	667	8.62	2772	35.81	4775	61.69
නුවරඑළිය	12089	813	6.73	3136	25.94	6000	49.63
ගාල්ල	16609	1840	11.08	7053	42.46	11221	67.56
මාතර	12637	1414	11.19	5570	44.08	8840	69.95
හම්බන්තොට	9730	1331	13.68	4255	43.73	6823	70.12
යාපනය	8934	1027	11.50	3417	38.25	5428	60.76
කිලිනොච්චි	2230	110	4.93	507	22.74	979	43.90
මන්නාරම	1816	124	6.83	547	30.12	988	54.41
වවුනියාව	2837	297	10.47	981	34.58	1665	58.69
මුලතිව්	1635	93	5.69	384	23.49	721	44.10
මඩකලපුව	8865	943	10.64	2972	33.53	4646	52.41
අම්පාර	10987	1311	11.93	4040	36.77	6639	60.43
ත්‍රිකුණාමලය	6673	508	7.61	1868	27.99	3318	49.72
කුරුණෑගල	24637	3291	13.36	12393	50.30	18601	75.50
පුත්තලම	11621	1115	9.59	3852	33.15	6933	59.66
අනුරාධපුරය	14319	1475	10.30	5132	35.84	8943	62.46
පොළොන්නරුව	6324	807	12.76	2432	38.46	4137	65.42
බදුල්ල	13598	1453	10.69	4882	35.90	8389	61.69
මොණරාගල	7278	748	10.28	2420	33.25	4298	59.05
රත්නපුරය	15930	1901	11.93	6238	39.16	10322	64.80
කෑගල්ල	12853	1498	11.65	6050	47.07	9242	71.91
සමස්ත දිවයින	310329	33383	10.76	122197	39.38	199809	64.39

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. D.M. Swaminathan. Before he starts, will an Hon. Member propose the Hon. Janaka Bandara to take the Chair?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

I propose that the Hon. Janaka Bandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

[3.32 p.m.]

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Mr. Presiding Member, I think this morning and for a few hours of the afternoon, we heard many interesting speeches made by the Government as well as the Opposition Members. I think there was a valid point made that we, in this august Assembly, should speak what factually is correct and we should not divulge anything which is incorrect. In the same way, there must also be decorum in Parliament: the way we speak in Parliament, the way we address the Members, and we must uphold the traditions of Parliamentary democracy in this country. We have to consider all these factors as Parliamentarians for the future wellbeing of this country.

Primarily when the Hon. Leader of the Opposition raised an issue this morning and asked the Hon. Minister of External Affairs four questions wherein he mentioned and stressed the importance of the LLRC Report and what the Indian Government has also informed him after his visit to India. But, unfortunately, the Minister of External Affairs gave an extremely vague answer which did not contain anything that is fruitful for this country. I am extremely sorry to say that we, as Parliamentarians are addressing this Assembly but we do not have a clear international policy. We are disregarding the international community totally. We cannot live like frogs in the well. I mean, we cannot just talk in this Parliament about our internal problems; without having due respect to the foreign affairs and to the international community is, really a backward way of thinking. In fact, I was wondering myself what we are talking in this Parliament. If we do not accept principles of foreign affairs, how are we going to run this country? That is my simple question. I do not know, it is left to the Government to decide what they are going to do. The Hon. Minister of External Affairs has said that he is not accepting the Motion that had been brought forward by Geneva. Okay, that maybe the principle laid down by the Government.

Now, think of the other factor. We are having the CHOGM Summit in the month of November. There again, we are having a conflict of interest. There are a number of countries that have voiced their disagreement and said that this should not be held in Sri Lanka. I am not trying to criticize the Government in any way. I am only telling you the factual position. Now, as far as this issue is concerned, Canada has taken the view that the Commonwealth Summit should not be held in Sri Lanka, and the Prime Minister, Stephen Harper already issuing a warning said that they will boycott the summit if there is no progress in Sri Lanka on human rights issue. Bob Rae, the Opposition Party Leader of Canada has also said, "There is neither truth nor reconciliation after the end of the civil war. Ethnic and religious discrimination is growing, not decreasing. Attacks on journalists and opposition politicians are getting worse and more lethal. The abuse of the rule of law is increasing; the impeachment of the country's Supreme Court Chief Justice was a deep abuse of power. The situation has escalated to such a large degree that Canada can no longer in good conscience attend the upcoming Commonwealth Heads of Government Meeting in Colombo. The Sri Lankan regime has not earned the right to host this international summit, and we urge other states to boycott the meeting and push for a change of venue. The Commonwealth is too important to allow its business to be disrupted by a single rogue member's violation of the association's beliefs and values. Canada must work with other member states to create stronger mechanisms to deal with governments failing to uphold the Commonwealth's shared commitment to democracy, human rights and the rule of law".

In the same way, many human rights organizations have said, especially the Human Rights Watch has said, "A summit in Sri Lanka will cast serious doubts on the Commonwealth's commitment to supporting human rights, democratic reform, and fundamental human rights enshrined in the Commonwealth Harare Declaration of 1991.

Holding the Summit in Sri Lanka is likely to prove to be a major embarrassment to the Commonwealth and its participants". In the same way, the Human Rights Watch says that the Government should not receive the honour of hosting the Commonwealth Conference. They further state that "Handing Sri Lanka leadership of the Commonwealth at a time when democratic institutions are under direct and sustained attack by the Sri Lankan Government will be an affront to the victims of rights violations in the country and around the Commonwealth".

[ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා]

Yashwant Sinha urged the Indian Prime Minister, Manmohan Singh, to skip the Summit. Addressing a hall meeting on the Sri Lankan Tamils issue in Chennai last week, Sinha said that India was the pivot of the Commonwealth body. “If India does not go there, CHOGM cannot be held", he said.

I am not trying to tell that these governments are correct. They maybe talking on the fundamental rights and the human rights violations in this country. But, I think we have to draw our towers somewhere and come to a conclusion in this situation. We cannot allow this country to go on this way. We are not accepting the Geneva sanctions, we are not accepting the Commonwealth Summit's voice. Ultimately, how are we going to run this country? Can we run this country alone internally among ourselves with certain powers in the world close to us? I do not think that should be the way of running the country and I think this is a complete slur as far as democracy of this country is concerned. At the same time I wish to ask one pertinent question. The Commonwealth Heads of Government Meeting held on the 28th and 30th October, 2011 had laid down certain principles which the Commonwealth Association has to look into. I quote:

"The current procedure for addressing serious or persistent violations of Commonwealth values, other than the unconstitutional overthrow of a democratically elected government, should be revised as follows.

i. The Secretary-General should, in the first instance, take cognizance of a situation of concern, be it a significant structural deficiency in a democratic institution or a serious or persistent violation of Commonwealth values, and raise it with the member state in question, affording it an opportunity to respond, and offering his/her Good Offices to redress the situation;

ii. The Secretary-General’s Good Offices engagement with the government concerned could include (a) the appointment of an envoy, (b) the offer of advice and technical assistance in relevant areas to help redress the issues of concern, and (c) consultation with relevant regional leaders, with regional and other international organizations, as well as other relevant Commonwealth bodies;

iii. The Secretary-General will consult the Chair of CMAG on relevant country situations, as required, including where his/her Good Offices’ engagements are active. The Secretary-General would, of course, also retain the ability to brief and consult the Commonwealth Chairperson-in-Office on matters under consideration and seek his/her intervention as appropriate;”

Then, under "relevant considerations", it is stated, I quote:

“There should be closer consultation between the Chair of CMAG and the Secretary-General on country situations of concern as required, be it to address structural deficiencies in democratic institutions or actual violations of Commonwealth values;”

These are the fundamental outlines that have been laid down in the Summit of Commonwealth Heads of Government Meeting held between the 28th and 30th of October, 2011 which is called "Perth Outcome Documents".

According to this documentation, has the Minister of External Affairs really invoked the provisions of this and asked the Secretary-General of the Commonwealth as to why he has not exercised his rights to safeguard the interests of non-violation of fundamental rights as far as the Meeting to be held in November is concerned?

These are matters that we have to consider very carefully. I do not want to go in deeper as we have spoken about this matter many a time in this forum. I think, ultimately, the Government of Sri Lanka should at least adhere to the basic principle that has been laid down by the Geneva Resolution: go into the LLRC Report which is its own Report. We have mentioned about that and about the enforcement of the Thirteenth Amendment a number of times in this august Assembly. If we do this, at least, we will have some credibility in the world. Otherwise, we are going to face a tremendous target in the future of this country, which is going to be fairly serious.

Coming back to the Amendments to the Bill that have been proposed by the Hon. Deputy Minister - I must say with due respect that he is a very honourable Minister and as many speakers have mentioned in this Assembly, he has got the experience and powers to carry out the duties of a Finance Minister - there is one issue which I have brought up. I have already told this to the Hon. Deputy Minister and I have also discussed this matter with the Hon. Basil Rohana Rajapaksa. But, ultimately, yet the position is not clear. With regard to the implementation of the 2013 Budget Proposals and the revision of 100 per cent tax on transfer of property and prohibition of outright transfer of property to foreigners, Mr. M.M.C. Ferdinando, Secretary to the Ministry of Investment Promotion by his letter dated 11th March, 2013 addressed to the Secretaries of the Ministry of Public Administration and Home Affairs, Ministry of Finance and Planning et cetera draws attention to the letter of the Director-General of the Department of Fiscal Policy dated 28th December, 2012 under Reference No. SP 06/23/01/03; the Circular No. 12/2012 dated 31st December, 2012 issued by the Registrar-General to all the Registrars of Land; the joint ministerial paper based on the unanimous Cabinet Paper dated 21st February, 2013; Abstract dated 21st February, 2013 of the Cabinet of Ministers; Section 107 of the Notaries Ordinance and to Section 117 of the Registration of Documents Ordinance.

Then, he goes on further to say that as per the advice of Director- General of Department of Fiscal Policy and unanimous decision taken by the Cabinet of Ministers,

foreigners are prohibited from gaining the absolute ownership of State-owned and privately-owned lands within Sri Lanka. Then, he comes to a very important provision which says that when investment is made within Sri Lanka for mixed or domestic development projects, the necessity of exemption of 100 per cent stamp duty payable by foreigners on short or long term leases with regard to State or privately-owned land has been passed under the Finance Act, No. 8 of 2004 and has been published in the Government Gazettes Nos. 1386/18 and 1530/16 dated 30th March, 2005 and 1st of January, 2008 respectively. Then, some projects are exempted from 100 per cent tax. One is construction of 100 residential housing units each constructed on land not exceeding 10 perches. Then, a project relating to infrastructure development or any other development determined by the Minister as essential for the economic progress of Sri Lanka is exempted provided that the value of the said land is met by inward remittances of foreign currency and the investment on the project be not less than US Dollars 50 million or its equivalent in Sri Lankan Rupees. That is perfectly in order. A project for the construction and operation of a hospital or a hotel provided that the total value of the said land is met by inward remittances of foreign currencies and that the investment on the project should not be less than US Dollars 10 million or its equivalent in Sri Lankan Rupees is exempted. So, those were the provisions brought forward by this Circular.

Subsequently, these provisions have not been included in the Circular sent to the Land Commissioner General's Department dated 27th March, 2013. That has been done by the officials of the Ministry of Finance and Planning. That Circular does not include these exemptions. In fact, when I spoke to the Hon. Basil Rajapaksa and the Hon. (Dr.) Sarath Amunugama, they made it very clear that as far as the investments of this country is concerned, they are not going to reverse on the decision that was made earlier. But, the Circular that has been sent on 27th of March, 2013 to the Land Commissioner General's Department and Registrar General's Department does not contain those provisions. This is a ridiculous state of affairs. So, I earnestly request the Hon. Minister of Finance and Planning to kindly look into this matter and rectify it immediately by issuing a Gazette Notification or by publishing a statement in the newspapers and see that it does not hinder the progress of your Government or our Government's future.

There are also certain other issues that have been brought forward especially in regard to the Powers of Attorney Ordinance where you are charging a stamp duty of Rs. 1,500. If you go to search for a document in the Registrar General's Department it costs you Rs. 500. That is just to search for a folio. Then, to make an application for a duplicate copy, it costs you Rs. 500. It does not matter. I accept the fact that there should be some revenue coming to the Government. But, there are poor people, people who are notaries who are not lawyers, there are people who cannot afford to pay these amounts. Also, there are litigants or persons who are going to purchase a land who may not be in a position to pay this amount of money. Therefore, I think the Hon. Deputy Minister, should consider at least reducing certain figures that I have mentioned for the benefit of the people of this country.

I do not wish to take any further time to deal with this matter. I brought in one or two important matters which the Government of Sri Lanka as well as the Ministers should take cognizance of. I hope at least in future there will be a better foreign policy in this country and we respect the international community to the best of our ability.

Thank you.

[අ.භා. 3.48]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද අපේ රටට ඉතා වැදගත් වන බදු (සංශෝධන) පනත් කෙටුම්පත් කීපයක් පිළිබඳව සාකච්ඡා කරන මේ වේලාවේ මට ද වවන කීපයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා.

මේ (සංශෝධන) පනත් කෙටුම්පත් තුළින් බලාපොරොත්තු වන්නේ මොකක්ද කියන කාරණය පිළිබඳව විශේෂයෙන්ම ගරු ආචාර්ය සරත් අමුණුගම මැතිතුමා මූලික පැහැදිලි කිරීමක් කළා. අපේ අතිගරු ජනාධිපතිතුමා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා හැටියට මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඇවිල්ලා අය වැය ඉදිරිපත් කරද්දී විශේෂයෙන්ම අවධාරණය කරන්නට යෙදුණු ක්ෂේත්‍ර කීපයක ඒ කටයුතු නීත්‍යානුකූලව මේ රට තුළ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් තමයි මේ (සංශෝධන) පනත් කෙටුම්පත් ඉදිරිපත් කර තිබෙන්නේ.

අද විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීතුමන්ලා කරුණු රාශියක් ඉදිරිපත් කළා. නමුත් විශේෂයෙන් අපි තේරුම් ගන්න ඕනෑ; පක්ෂ භේදයකින් තොරව කල්පනා කරන්නට ඕනෑ; බදු අය කරන්නේ නැතිව රටක ආර්ථිකයකට ඉස්සරහට යන්න පුළුවන්ද බැරිද කියන කාරණය. ඒ නිසා අපි යම් යම් බදු සහන ලබා දෙනවා වාගේම, බදු සරල කරනවා වාගේම, ඒ ඒ ක්ෂේත්‍රවල ජනතාවට යම් සහනයන් ලබා දෙනවා වාගේම, රටේ ජනතාවගේ යම් කොටසකගේ අවශ්‍යතාව මත, එහෙම නැත්නම් විදේශිකයන්ගේ අවශ්‍යතාව මත, එහෙමත් නැත්නම් සංචාරකයන්ගේ අවශ්‍යතාව මත අපේ රාජ්‍ය ප්‍රතිපත්තියට එහෙමත් නැත්නම් අපේ ජාතික ප්‍රතිපත්තියට, මහින්ද චින්තනයට යම් කිසි පිටුපෑමක් වුණත් ඒවා ක්‍රියාත්මක කළ යුතුව තිබෙනවා නම් අපි ඒවා පාලනය කිරීම සඳහා සහ අපේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීම සඳහා ඒ බදු වැඩි කිරීම නුසුදුසුයිද කියන එක පිළිබඳව අපි සාකච්ඡාවට බඳුන් කරන්නට ඕනෑ.

අපි හැම අවස්ථාවකදීම දකින ඉතා වැදගත් දෙයක් තමයි රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න, ඒ වාගේම අපේ රට දියුණු කරන්න තීන්දු තීරණ රාශියක් අරගෙන තිබෙනවාය කියන එක. උදාහරණයක් හැටියට, එකතුකළ අගය මත බද්ද පැනවීමේදී, ඒ සංශෝධනයන් කිරීම තුළදී විශේෂ අවධානය යොමු කරලා

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

තිබෙන්නේ අපේ රටේ සංවර්ධනයට දායක වන විශේෂයෙන්ම දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වාගේම ජාත්‍යන්තර එහෙමත් නැත්නම් විදේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රය කරා ගමන් කරන්නට පුළුවන් විධියට ඒ අවශ්‍ය යන්ත්‍රෝපකරණ අපේ රටට ගෙන්වන, ඒ ව්‍යාපාරවල යෙදෙන අය ගැනයි. ඒ අනුව බවුසර්, බුල්ඩෝසර්, ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ කරන ට්‍රැක්ටර්, එස්කැවේටර් වැනි දේවල් පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. ඒවාට විශාල වැය බරක් යන නිසා ඒ ක්ෂේත්‍රයෙන් ඒ කර්මාන්තකරුවෝ ඉවත් වනවා. ඒ වාගේම ඒ ක්ෂේත්‍රයේ නියැලිලා ඉන්න කට්ටිය ඉවත් වනවා. ඒ නිසා ඔවුන් ඒ ක්ෂේත්‍රයේම රඳවා ගැනීම සඳහා ඔවුන්ට යම් කිසි පසු බලයක් ලබා දීම සඳහා තමයි එවැනි තීන්දු අරගෙන තිබෙන්නේ.

අද 'බල ශක්තිය' අපේ රටේ බෙහෙවින් කථා කරන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. බල ශක්තිය පිරිමහන බල්බ් යනාදිය ආනයනය කිරීමේදී බදු සහන ලබා දීලා ඒ පිළිබඳව ජනතාව උනන්දු කරවන්න විශේෂයෙන් බලාපොරොත්තු වනවා.

අද මහා හයියෙන් කථා කළා, ඔට්ටු ඇල්ලීම සහ සූදු සඳහා වූ බද්ද පිළිබඳව. මම මුලින් කිව්වා වාගේ මේවා අපේ මහින්ද චින්තනයට එහෙමත් නැත්නම් අපි බලාපොරොත්තු වන දේවලට, අපේ ප්‍රතිපත්තිවලට යම් කිසි අනුකූලතාවක් නැති වෙන්න පුළුවන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් අපේ රටේ සමහර ජන කොට්ඨාස, සමහර පුද්ගලයන් මේවා බලාපොරොත්තු වනවා. ඒ වාගේම රටේ නිදහසත් එක්ක අද සංචාරක ව්‍යාපාරය තුළ අපි ලොකු ගමනක් යන අවස්ථාවක්. විදේශිකයන් මේ රටට ආවාට පසුව මේ දේවල් බලාපොරොත්තු වනවා. මේවා අපේ කුරුණෑගල ඉන්න කෙනාට බුකීවලට යන්න, කැසිනෝ ගහන්න නොවෙයි. පොළොන්නරුවේ කෙනාට, හම්බන්තොට කෙනාට එහෙමත් නැත්නම් ගම්බද පුද්ගලයන්ට ඇවිල්ලා කැසිනෝ ගහන්න නොවෙයි. නමුත් මේකට හුරු වුණු, මෙය බලාපොරොත්තු වන මේ රටේ යම් කිසි පැළැන්තියක් ඉන්නවා නම්, ඒ වාගේම විදේශවලින් පැමිණෙන ඒ සංචාරකයන්ගෙන් මේ කෙරෙහි උනන්දුවක් දක්වන අය ඉන්නවා නම්, රටක් හැටියට ඒ තුළින් අපට පැහැදිලි ආදායමක් ලබන්නට පුළුවන්කම තිබෙනවා නම්, අපේ සදාචාරය, සංස්කෘතිය ආරක්ෂා කර ගන්නා ගමන් යම් කිසි සීමාවන් තුළදී, යම් කිසි නීති රාමුවන් තුළදී මේ කටයුතු කරනවා වාගේම වැඩිපුර ආදායමක් ලබා ගැනීමේ අරමුණින් ඒවාට බදු පැනවීම මම හිතන්නේ කිසිසේත් වරදක් නැති බවයි.

දැන් බලන්න, බුකීකරුවන්ගේ වාර්ෂික බද්ද ලක්ෂ දෙක දක්වා වැඩි කරනවා. ඒ මුදල් අරගෙන අපි මොකද කරන්නේ? විදුලිය සම්බන්ධව කථා කළා. මේ රටේ විදුලිය පරිභෝජනය කරන ආකාරය ගැන දැන් අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමාත්, අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් කථා කළා. මම ඊ ළඟට ඒ ගැන පැහැදිලි කරනවා. විශේෂයෙන්ම විදුලිය සම්බන්ධව එතුමන්ලා වැරැදි තොරතුරු රාශියක් මේ සභාවට ඉදිරිපත් කළා. දරිද්‍රතා රේඛාවෙන් පහළ ඉන්න විදුලි පාරිභෝගිකයින්ගෙන් සියයට 126ක බිලක් අය කරනවාය කියලා එතුමන්ලා කිව්වා. ඒක සම්පූර්ණ අසත්‍යයක්. මම ඉදිරියේ දී බලාපොරොත්තු වනවා, කරුණු සහිතව ඒ සම්බන්ධයෙන් සභාවට පැහැදිලි කරන්න. මත්පැන්වලට අය කරන බදු වාගේම මත්පැන්වල මිලත් වැඩි කරලා තිබෙනවා. මහින්ද චින්තනයේ බොහොම පැහැදිලිව කියනවා, "මතට තිත තියන්න ඕනෑ, මේ මත්පැන්වලින් අපේ රටේ ජනතාව අනිවාර්යයෙන් මුදා ගන්න ඕනෑ"ය කියලා. දුප්පත්කමට බලපාන ප්‍රධානම සාධකවලින් එකක් තමයි මත්පැන් හා දුම් වැටිවලට ජනතාව ඇබ්බැහි වීම. මේකෙන් අනිවාර්යයෙන්ම ජනතාව ගලවා ගන්න ඕනෑ. හැබැයි ඒ වෙනුවෙන් ඇබ්බැහි වුණු යම් පිරිසක් ඉන්නවා නම් ඔවුන්ව ගලවා ගැනීම, පාලනය කිරීම සඳහා තමයි මේ වාගේ මිල ගණන් වැඩි කරලා තිබෙන්නේ. ඒ මුදල් යොදාගෙන අපේ රටේ වෙනත් සංවර්ධන කාර්යයන් කරන්න පුළුවන්. දැන් රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, කාන්තාවෝ නිදහසට පස්සේ මත්පැන්වලට ඇබ්බැහි වෙලා ඉන්නවාය කියලා. මා හිතනවා, කාන්තාවෝ අවුරුදු තිහක වාගේ දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රශ්නවල මිරිකිලා හිටපු නිසා සමහර විට ඔවුන් යම් නිදහසක් බලාපොරොත්තුවෙන් මත්පැන් පානය කරන්න යොමු වුණාද කියලා. රවි කරුණානායක මන්ත්‍රීතුමා ළමයින්ගේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල ගැන බොරු මතයක් තමයි මේ සභාවට ඉදිරිපත් කළේ. දකුණේ ශිෂ්‍යත්ව සමත් වීමේ ප්‍රතිශතයන් පිළිබඳව රවි කරුණානායක මැතිතුමා කියපු සම්පූර්ණ අසත්‍ය කාරණා පිළිබඳව බොහොම පැහැදිලිව අධ්‍යාපන ඇමතිතුමා හැටියට බන්දුල ගුණවර්ධන මැතිතුමා කරුණු සහිතව ගෙන හැර පෑවා. එතුමා ඉදිරිපත් කරපු ප්‍රතිශතයන්වල මොන තරම් නිවැරැදි ආකාරයක් තිබෙනවා ද කියලා මා දන්නේ නැහැ. නමුත් කාන්තාවන් ඒ විධියට ඇබ්බැහි වෙනවා නම් අපි ඒ පිළිබඳව විශේෂයෙන්ම කනගාටු වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතිය ගොඩ නැඟීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව ගනිමු. මෙහිදී විශේෂයෙන්ම අවධානය යොමු කරලා තිබෙන්නේ විකල්ප විදුලිය ලබා ගැනීමේ ව්‍යාපෘති සඳහායි. ගෘහස්ථ සූර්ය බලශක්ති පද්ධති ශක්තිමත් කිරීම සඳහා ඒවාට අවශ්‍ය උපකරණ, ඒවාට අවශ්‍ය කරන වටපිටාවන් නිර්මාණය කර ගන්න සහන ලබා දීම තමයි මේ තුළින් වෙන්නේ. එක්සත් ජාතික පක්ෂය ඇත්තටම මේවාට විරුද්ධ වෙනවා නම් මොන පදනමේ ඉඳලා ද මේවාට විරුද්ධ වෙන්නේ කියන ප්‍රශ්නය අපිට තිබෙනවා. විශේෂයෙන්ම අද පුනර්ජනනීය බලශක්තිය උත්පාදනයට, එහෙම නැත්නම් බලශක්ති ප්‍රවර්ධනයකට අපි යා යුතුව තිබෙනවා. ඒ හැම ජාතික අවශ්‍යතාවක්ම බලා තමයි මේ බදු සහන ලබා දෙන්න විශේෂයෙන්ම කටයුතු කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ ජාතික විදුලිබල පද්ධතිය ගත්තාම අපි දන්නවා ජල විදුලිය, තාප විදුලිය, ඉන්ධන හා සුළං කියන ප්‍රභවයන් සියල්ලම භාවිත කරලා මෙගාවොට් 3,310ක විදුලි බලයක් උත්පාදනය වන බව. හැබැයි ඒ නිෂ්පාදන ඒකකයක පිරිවැය ගත්තාම සමහර අවස්ථාවල අපට එය ඉතා විශාල මුදලක්. නමුත් අපි බොහොම ආඩම්බරයෙන් කියන්න ඕනෑ, මේ කලාපයේ විදුලිය ලබා දෙන රටවල් ගත්තාම අපි තමයි විදුලිය කප්පාදු කරන්නේ නැතුව පැය 24ම විදුලිය ලබා දෙන රට බවට අද පත් වෙලා තිබෙන්නේ කියන එක. සමහර රටවල් පැය දෙකක් විදුලිය කපනවා. සමහර රටවල් පැය හතරක් විදුලිය කපනවා. සමහර රටවල් පැය අටක් විදුලිය කපනවා. නමුත් මුළු රටටම විදුලිය ලබා දෙන්න පුළුවන් තත්ත්වය අපට උදා වෙලා තිබෙනවා. හැබැයි ඒ වෙනුවෙන් රුපියල් 23.70ක් වැනි මුදලක් ඒකකයකට වියදම් වනවා. මෙතුමන්ලා අසත්‍ය ප්‍රකාශ කළා දරිද්‍රතා රේඛාවෙන් පහළ ඉන්න ගෘහස්ථ පාරිභෝගිකයන්ට වැඩි වන විදුලි බිල ගැන. මේ බලන්න, මා ළඟ තිබෙන තොරතුරු අනුව units 0 සිට 30 දක්වා පරිභෝජනය කරන පාරිභෝගියන් ප්‍රමාණය. ඒ කියන්නේ ගෘහස්ථ විදුලි පාරිභෝගිකයන්. ඔවුන්ගේ ප්‍රමාණය මිලියන 1.1යි. ඒ කියන්නේ, ලක්ෂ 11යි. අපි කවුරුත් දන්නවා මේ රටේ විදුලිය පරිභෝජනය කරන අය ඉන්නේ පවුල් ලක්ෂ 47ක් හෝ උපරිම වශයෙන් ගත්තොත් පවුල් ලක්ෂ 48ක් බව. ඒකෙන් units 0 ඉඳලා 30 දක්වා, -30ට අඩුවෙන්- පාවිච්චි කරන අය ලක්ෂ 11ක් මේක ඇතුළේ ඉන්නවා. ඒ ලක්ෂ 11ට යම් වැඩි කිරීමක් කළත්, -තවම එහෙම වැඩි කිරීමක් කරලා නැහැ.- ඒ තුළත් සහනය ලබා දීලා තිබෙනවා. මිලියන 1,200ක සහනාධාරයක් ඒ පවුල් ලක්ෂ 11 වෙනුවෙන් අපේ රජය විසින් මාසිකව මහ භාණ්ඩාගාරයෙන් වැය කරන්න කටයුතු කරලා තිබෙනවා.

ඊළඟට බලන්න units 31 ඉඳලා 60 දක්වා වූ කාණ්ඩය. ඒ තුළ ඉන්නා ප්‍රමාණය මිලියන 1.3යි. ඒ කියන්නේ, ලක්ෂ 13ක්.

එතකොට එතුමා කිව්වේ units 48ක් දක්වා පාවිච්චි කරන අය තමයි දරිද්‍රතා රේඛාවේ ඉන්නේ කියලා. අපි කියනවා, "ඔව්" කියලා. නමුත් ඒ කට්ටිය වෙනුවෙන් මිල වැඩි කිරීමේදී සියයට 126කින් විදුලි බිල වැඩි කරලා නැහැ. ඒක සම්පූර්ණ අසත්‍යයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නව මිල වැඩි කිරීම්වලදී වුණත් ඒ කාණ්ඩය වෙනුවෙන් මිලියන 1,500ක සහනයක් අපි ලබා දෙනවා. ඒ නිසා අපි බොහොම පැහැදිලිව කියනවා, මේ ගරු සභාවට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා කියලා. අපේ ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා කිව්වා වාගේ, මේ උත්තරීතර පාර්ලිමේන්තුවයි. මේ අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලා විපක්ෂයේ හිටියත් දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු අයයි. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා සම්පූර්ණයෙන් අසත්‍ය ප්‍රතිඥා, අසත්‍ය මත මේ ගරු සභාව තුළදී කිරීම පිළිබඳව අපි විශේෂයෙන්ම කනගාටු වෙනවා. ඒ නිසා අපි කියන්න ඕනෑ විදුලි බිල වැඩි කරන්න තවම තීරණය කරලා නැති බව. මහජන උපයෝගිතා කොමිසමේ අනුමැතියෙන් යම් ලෙසකින් විදුලි බිල වැඩි කළොත්, දැනට ගෘහස්ථ විදුලිය සඳහා රජයෙන් ලබා දෙන සහනාධාරය මිලියන 34,300යි. ඒකක මිලියන 12,000 දක්වා අඩු වනවා. නමුත් මිලියන 12,000ක ප්‍රමාණයක් සහනාධාරයක් හැටියට ලබා දෙනවා. ඒ වාගේම ආගමික ස්ථාන සඳහා දැනට මිලියන 1,000ක සහනාධාරයක් ආණ්ඩුව විසින් ලබා දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක මේ නව ක්‍රමය යටතේ මිලියන 1,200 දක්වා වැඩි වනවා. ආගමික ස්ථාන කිව්වාම බෞද්ධාගමික ස්ථාන පමණක් නොවෙයි. අපේ රටේ තිබෙන සියලුම ආගමික ස්ථානවලට ඒ සහනය ලබා දෙනවා. ඒ වාගේම කර්මාන්ත ශාලාවලට. අපි හැමෝම කථා කරන්නේ ව්‍යවසායකයන් ඇති කරන්න ඕනෑ, කුඩා කර්මාන්ත ඇති කරන්න ඕනෑ, කර්මාන්ත ශාලා ඇති කරන්න ඕනෑ, නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ කියලා. එහෙම නම් ඒවාට සහන ලබා දෙන්න ඕනෑ. ඒ සහනයත් රජය විසින් ලබා දෙනවා. ඒ කර්මාන්ත දියුණු කිරීම සඳහා රජය මඟින් උරා ගන්නා ප්‍රමාණය මිලියන 26,000ක්. ඒ වාගේම හෝටල් කර්මාන්තය ගත්තොත්, අද සංචාරක ව්‍යාපාරය දියුණු වෙද්දී මුළු රටේම හෝටල් ඉදි වෙනවා. හැබැයි ආරම්භයක් හැටියට ඒ අයට දිරි දීමනාවක්, දිරිය ශක්තියක් ලබා දෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 920ක් මේ අලුත් ක්‍රමය යටතේත් සහනයක් හැටියට ලබා දෙනවා. මේ අලුත් ක්‍රමය යටතේ මිල ගණන් හැදුවත් සමස්ත සහනය වශයෙන් රුපියල් මිලියන 40,100ක් ලබා දෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට මා කියන්න උත්සාහ කළේ මේ වාගේ සහන ලබා දෙන්නේ කොහොමද බදු අය කිරීම් කරන්නේ නැතුව කියන එකයි. බුකීකරුවන්ගෙන් අය කරන බදු වැඩි කරන එක, කැසිනෝවලින් අය කරන බදු වැඩි කරලා ඒ මුදල් ගන්න එක කවුද වැරදියි කියලා කියන්නේ? ඒවා අරගෙන මේ අහිංසක ජනතාවට, පැල්පත්වල ඉන්න ජනතාවට, අපේ වාගේ දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල ඉන්න ජනතාවට සහන ලබා දෙන එක වැරදියි කියනවා නම් මා හිතන්නේ ඒ අයගේ දේශපාලනය පිළිබඳව දෙවතාවක් හිතලා බලන්න ඕනෑ බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය ගැනීම් සම්බන්ධව මෙතුමන්ලා දිගින් දිගටම අපේ ආණ්ඩුවට දැන් චෝදනාවක් එල්ල කරනවා. නමුත් අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ දළ දේශීය නිෂ්පාදිතයට අනුව 2005 වන කොට මේ රටේ ණයබර සියයට 106යි. ඒ සියයට 106 මේ වන කොට සියයට 79 දක්වා අඩු කරලා තිබෙනවා.

එහෙම නැත්නම් කියන්න. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගත්තාම සියයට 79 දක්වා අඩු කරන්න අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ මේ රජයට හැකියාව ලැබිලා තිබෙනවා. නිදහසින් පසුව කාලය ගත්තාම, එහෙම නැත්නම් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලය ගත්තාම ශීඝ්‍ර ණය පියවීමක් කරලා තිබෙන්නේ මේ කාල වකවානුවේයි. කඩිනම් මහවැලියට ගත්ත ණයක් තවම අපි ගෙවනවා කියන එක විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මතක් කරලා දෙන්න ඕනෑ. ලෝකයේ ණය ලබා ගන්නේ නැති රටවල් තිබෙනවා නම් ඉතාම සීමිත සංඛ්‍යාවකුයි තිබෙන්නේ. අද ජපානය ගත්තත් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 225ක ණය අරගෙන තිබෙනවා. ගොඩාක් රටවල් සියයට වඩා ඉහළ ප්‍රතිශතයකයි ඉන්නේ. ණය අරගෙන ඒ රටවල් විවිධ සංවර්ධන ව්‍යාපෘතිවලට යනවා. හැබැයි අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, අපි මේ ණය අරගෙන තිබෙන්නේ අපේ රටේ ජනතාවට ආහාර පාන ලබා දීම සඳහා නොවෙයි කියා. අපි මේ ණය ලබා ගෙන විශාල වත්කම් අපේ රටට ඇති කර දෙන්න කටයුතු කර තිබෙනවා.

විශේෂයෙන්ම අද ලොකු චෝදනාවක් කළා. හම්බන්තොට වරායෙන් එන ආදායම කෝ, මත්තල ගුවන් තොටු පොළෙන් එන ආදායම කෝ, අධිවේගී මාර්ගයෙන් එන ආදායම් කෝ කියලා ඇහුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එකවර මේවායෙන් ලාභ බලාපොරොත්තු වෙන්නේ නැහැ. මාසෙන් දෙකෙන් මේවාට වියදම් කරපු සම්පූර්ණ මුදල ආපහු එනවාය කියලා කියනවා නම් ඒක විහිළු කථාවක්. එහෙම එන්න බැහැ. ඒවා අපේ රටේ අනාගතයට ලොකු වත්කමක් වෙනවා වාගේම පියවරෙන් පියවර අපට ඒවායෙන් ආදායම් ලැබෙනවා. හැබැයි අපි මතක් කරලා දෙන්න ඕනෑ කාරණයකුත් තිබෙනවා. එසේ ආදායම් ලැබෙන ව්‍යාපෘති තිබෙනවා වාගේම අපි එහෙම ආදායමක් නොලබන ව්‍යාපෘති ගණනාවක් මේ රට තුළ ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන්ම මොරගහකන්ද ජලාශය එවැනි ව්‍යාපෘතියක් ලෙස සඳහන් කරන්න පුළුවන්. මොරගහකන්ද ජලාශය අපි හැදුවා කියලා ඒ ජලාශයේ වතුර ටික අපි සල්ලිවලට දෙන්නේ නැහැ. අපේ ගොවි ජනතාවට ඒක නොමිලයේයි ලබා දෙන්නේ. ඒ වාගේම මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැදුරු ඔය ව්‍යාපෘතිය අද අපේ රජයේ මුදල් ප්‍රතිපාදන යටතේ ඉදි කරනවා. හැබැයි දැදුරු ඔය ජලාශය හදලා ගොවි ජනතාවට ජලය ටික ලබා දෙන කොට -ඒ සහනය ලබා දෙන කොට- අපි ඒකට මුදලක් ඉල්ලා ගන්නේ නැහැ. ඒ වාගේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ යාන් ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම දකුණු පළාතේ වෙහෙරගල ව්‍යාපෘතිය හදලා තිබෙනවා. ඒ වාගේ විශාල ව්‍යාපෘති කරලා ඒවායෙන් මුදල් උපයන ආකාරයෙන් වැඩ කටයුතු කරන්නේ නැහැ. ඒ වාගේම අද අතිවිශාල මාර්ග සංවර්ධනයක් ක්‍රියාත්මක කරනවා. අපි ඉතාම සතුටින් කියන්න ඕනෑ, ඊයේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් පාදෙනිය - අනුරාධපුරය මාර්ගය විවෘත කළ බව. කුරුණෑගල කෙනෙකුට අනුරාධපුරයට යන්න පැය දෙක තුනක් ගත වෙනවා. අද විනාඩි තිහක්, හතළිස්පහක් ඇතුළත අනුරාධපුරයට යන්න පුළුවන් වාතාවරණය ඇති කරන්න ඉතාම ඉහළ මට්ටමේ මාර්ගයක් ජනතා අයිතියට පත් කළා. මේවායෙන් සල්ලි එකතු කරන්නේ නැහැ. මේවා අපේ රටේ ජනතාවට පහසුකම් ලබා දීම සඳහා, අපේ රටේ ආර්ථිකය වර්ධනය කිරීම සඳහා කරන ව්‍යාපෘති. අනුරාධපුරයේ අයට කුරුණෑගලට, කොළඹට ඉක්මනින් ගමන් කරන්න පුළුවන් පහසුකම් ඇති කරලා තිබෙනවා. අපේ රටේ ප්‍රවාහන පද්ධතිය කාර්යක්ෂම කරලා විවිධ නිෂ්පාදනයන් ජාත්‍යන්තර තලයට යවන අයට ඒවා ඉක්මනින් ප්‍රවාහනය කිරීමේ පහසුකම් ලබා දෙනවා. එහෙම නැතුව අපි මුදල් එකතු කරන ව්‍යාපෘති කරන්නේ නැහැ. නමුත් අපි දන්නවා, සමහර රටවල් අධිවේගී මාර්ගවලින් පමණක් නොවෙයි හැම මාර්ගයකින්ම මුදල් එකතු කරන බව. අධ්‍යාපනයත් මුදලට දෙන රටවල්, සෞඛ්‍යත් මුදලට දෙන රටවල් තිබෙනවා. අපේ රටේ එහෙම කරන්නේ නැහැ. විශේෂයෙන්ම අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ.

එක්සත් ජාතික පක්ෂය කාලයේ විකුණන්න තීරණය කරලා තිබුණු මහජන සේවාවන් රැසක් ලබා දෙන ආයතන ගණනාවක් අපේ රජය "මහින්ද චින්තන" ප්‍රතිපත්තියට අනුව පවත්වා ගෙන යමින් ජනතාවට සහන ලබා දෙනවා. ඒ ආයතන අපට විකුණලා දාලා ගමන් කරන්න පහසුයි. ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

ගමනාගමන මණ්ඩලය, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විකිණීම නොවෙයි අපේ රජයේ බලාපොරොත්තුව. ඒ ආයතන අපේ රටේ සම්පත් හැටියට පවත්වා ගෙන යමින් ඒවා තුළින් ජනතාවට සහනාධාර ලබා දෙමින් පියවරෙන් පියවර ඒ ආයතන කාර්යක්ෂම කර ඉදිරියට ගෙන යන්නයි විශේෂයෙන්ම කටයුතු කර තිබෙන්නේ.

ඊළඟට තරුණයන්ගේ රැකියා ප්‍රශ්නය ගැන කිව්වා. අපේ රටේ තමයි මෑත ඉතිහාසයේ රාජ්‍ය සේවයට එකවර වැඩිම කොටසක් බඳවා ගත්තේ. එක වර උපාධිධාරීන් 50,800ක් බඳවා ගත්තා. අපි අහනවා, මේ වාගේ එක වර රාජ්‍ය සේවයට මෙච්චර ප්‍රමාණයක් බඳවා ගත්තේ කොයි රටේද කියලා. කොහොමද මෙහෙම බඳවා ගෙන වැටුප් ගෙවන්නේ? 2005 අවුරුද්දේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට භාර ගනිද්දී රාජ්‍ය සේවයේ වැටුප් සඳහා වියදම් කළේ බිලියන 175යි. ඒ බිලියන 175 මේ වන කොට 375 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ බඳවා ගත්තු දරුවෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේද, එක්සත් ජාතික පක්ෂයේද, ජනතා විමුක්ති පෙරමුණේද කියලා බැලුවේ නැහැ. මේ රටේ උපාධිය ගත්ත උගත්, බුද්ධිමත් තරුණයාට අනිවාර්යයෙන්ම රාජ්‍ය සේවයට එන්න අවස්ථාව, දොරකඩ විවෘත කරලා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ලොකු අභියෝග තිබෙද්දීයි ඒවා කළේ. හැබැයි අපි එක්සත් ජාතික පක්ෂයෙන් අහනවා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පැවැති 2001-2004 කාලයේ රාජ්‍ය සේවයට කී දෙනෙකු බඳවා ගත්තාද කියලා. ඒ ගැන අපේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී ප්‍රකාශ කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

16/01 කියන චක්‍රලේඛය ගෙනැල්ලා රාජ්‍ය සේවයට බඳවා ගැනීම් නැවැත්තුවේ නැද්ද? ඒ අයගෙන් ඇහුවාම දෙන උත්තරය තමයි, අපට තිබුණේ දුර්වල භාණ්ඩාගාරයක්, අපට ඒ දුර්වල භාණ්ඩාගාරය එක්ක සෘණ ආර්ථිකයකුයි තිබුණේ කියන එක. හැබැයි එහෙම නම් අපි අහනවා, අර බදු සහනය ලබා දුන්නේ කොහොමද කියලා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේ රටේ ඒ තරම් විශාල පිරිසකට බදු සහන ලබා දෙන්න කටයුතු කළේ කොහොමද? ඒ තුළින් රුපියල් කෝටි 39,000ක විතර බදු සහන ලබා දීලා තිබෙනවා. ඒ බදු මුදල් අරගෙන ඕනෑ නම් ජනතාවට සේවය කරන්න තිබුණා. එහෙම නැත්නම් මහජන සේවාවන් කරන්න තිබුණා. එහෙම කරන්න අවස්ථාව තිබුණේ නැද්ද? එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ ගමක පාරකට අඩි 200ක්, අඩි 300ක් දුරට කොන්ක්‍රීට් දමන්නවත් පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒක තමයි යථාර්ථය. රැකියා ලබා දුන්නේත් නැහැ; බඩු මිල අඩු කළේත් නැහැ; සංවර්ධන වැඩ කළේත් නැහැ; තිබෙන රට දෙකට බෙදන්න සාම ගිවිසුම් ගහලා වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කළා මිසක්, මේ රටේ තිබුණු බෙදුම්වාදී එල්ටීටීඊ ත්‍රස්තවාදය පරාජයට පත් කිරීම සඳහා කිසියම් වූ වැඩ පිළිවෙළක් නිර්මාණය කළේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් තව විනාඩි කීපයක් ඉල්ලා සිටිනවා. මොකද මේ රටේ දේශපාලනය කරන තරුණයින් හැටියට අපි රටට පණිවුඩයක් ලබා දෙනවා. අද අපි දකිනවා, සමහර ප්‍රදේශවල, සමහර ස්ථානවල විවිධ ආගමික ගැටලු නිර්මාණය කරන්න, ඒ වාගේම ජාතිවාදී ගැටලු නිර්මාණය කරන්න යම් යම් කණ්ඩායම් උත්සාහ දරන බව. මේ කුමන කණ්ඩායමක් වුවත්; මේ අයගේ දේශපාලන දර්ශනය මොකක් වුණත්; මේ අයගේ ආර්ථික පසුබිම මොකක් වුණත් මේවා අපි තරයේ හෙළා දකිනවා. මොකද ශ්‍රී ලංකාව කියලා කියන්නේ අවුරුදු 30ක් තිස්සේ බැට කාපු රටක්. අවුරුදු 50කට වඩා අපේ රටේ ආර්ථිකය, අපේ ගමන ආපස්සට ගිය රටක්. 1983 දී කළු ජූලිය ඇති වුණු වෙලාවේ පැවැති තත්ත්වයන්අපි දැක්කා. ඒ නිසා මේ තත්ත්වයන් නැවත අපේ රට තුළ ඇති කරන්න යම් කිසි කණ්ඩායමක් හෝ දේශපාලන පක්ෂයක් හෝ යම් පුද්ගලයින් හෝ සූදානම් වනවා නම් අපි ඒවා දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිනවාය කියන එක මතක් කරන්න ඕනෑ.

මේ ඊයේ පෙරේදා දකුණු ඉන්දියාවේ, විශේෂයෙන්ම තමිල්නාඩුවේ ඇති වුණු සිද්ධීන්වල යථාර්ථය මොකක්ද කියලාත් අපි හොඳින් බලා ගෙන හිටියා. ඒ අයගේ ප්‍රධාන චෝදනාව වන්නේ දෙමළ ජනතාවට මේ ආණ්ඩුව උදව් කරන්නේ නැහැ කියන එකයි; එහෙම නැත්නම් මේ රට තුළ දෙමළ ජනතාවට අවශ්‍ය පහසුකම් සලසන්නේ නැහැයි කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැහෙනහිර පළාත මුදා ගත්තාට පස්සේ "නැහෙනහිර නවෝදය" ආරම්භ කරලා නැහෙනහිර පළාත සම්පූර්ණයෙන්ම උඩු යටිකුරු කළා. ඒ බව ඔබතුමාත් දන්නවා. ඒ පළාතේ කැඩිලා තිබෙන පාලම්, බෝක්කු හදා දීලා පාසල් නොගිය දරුවා පාසල් යවලා, ආගමික ස්ථාන සංවර්ධනය කරලා නැහෙනහිර පළාත සංවර්ධනය කරන්න අවශ්‍ය පසුබිම නිර්මාණය කළා. උතුරු පළාත නිදහස් කර ගෙන "උතුරු වසන්තය" ආරම්භ කරලා උතුරු ප්‍රදේශය සම්පූර්ණයෙන්ම සංවර්ධනය කරලා ඒ ජනතාවට සහන ලබා දෙන්න කටයුතු කළා.

මේ දිනවල දෙමළ ජනතාව සහ සිංහල ජනතාව අතර යම් කිසි කෝලාහලයක් ඇති කිරීම සඳහා විවිධ උපක්‍රම ක්‍රියාත්මක කරන බව අපි දකිනවා. හැබැයි අපේ රටේ ජනතාව බුද්ධිමත්. අපේ හාමුදුරුවරුන්ට පහර දෙනවා අපි දැක්කා. නමුත් ඒ වෙලාවේ සිංහල බෞද්ධ ජනතාව ඒ ගම්වල දෙමළ ජනතාවත් එක්ක සහජීවනයෙන් ජීවත් වුණා මිසක් ඔවුන් එක්ක ප්‍රශ්න ඇති කර ගන්න ගියේ නැහැ. ඒ නිසා විශේෂයෙන්ම අපේ රටේ ජනතාවට අපේ ගෞරවය සහ ස්තුතිය පළ කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය පිළිබඳවත් මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. විවිධ ආර්ථික හැල හැප්පීම් තිබෙනවා. ගෝලීය ආර්ථිකයේ විවිධ ප්‍රශ්න තිබෙනවා. අද අපි දන්නවා, සයිප්‍රසයේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන බව. ඒ වාගේම ග්‍රීසියේ ආර්ථිකය කඩා වැටෙනවා. තව රටවල් ගණනාවක ආර්ථිකය කඩා වැටෙද්දි ගෝලීය ආර්ථිකයේ පීඩනයත් එක්ක අපේ රට පියවරෙන් පියවර ඉදිරියට යනවා. යම් යම් අඩු පාඩුකම් තිබෙන්න පුළුවන්. හැබැයි ආර්ථිකය ශක්තිමත් කරමින් ඉදිරියට යන ගමනට සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන්න ඕනෑය කියන කාරණය මතක් කරමින් මා නිහඬ වනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

[අ.භා. 4.10]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන්ම බදු සංශෝධන පනත් කෙටුම්පත් කීපයක් ගැන කථා කරද්දි මටත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න ලැබීම ගැන මම ඉතාමත්ම සන්තෝෂ වනවා. මගේ වෙලාවෙන් සෑහෙන ප්‍රමාණයක් ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාටත් දීලා තිබෙන නිසා මම මේ පනත් කෙටුම්පත් ගැන එකින් එක කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

වර්තමාන ආණ්ඩුවේ බදු සහ දඩ ප්‍රතිපත්තියෙන් බැට කන මේ රටේ ජනතාව -විශේෂයෙන්ම ගම්බද උදවිය- ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තිය ගැන කියන දේවල් පිළිබඳව කථා කරන්නයි මම බලාපොරොත්තු වන්නේ.

දැන් මෙතැනදි ඇහුවා, ලෝකයේ කොයි රටද බදු ගහන්නේ නැත්තේ; කොයි ආණ්ඩුවක්ද බදු නැතිව ගෙන යන්න පුළුවන් කියලා. හැබැයි අද සන්ධාන ආණ්ඩුව බදු පිට බදු ගහලා තමන්ගේ ගිනි පොලී ණය ගෙවන්නට ජනතාව බෙල්ලටම හිර කරලා තිබෙන වෙලාවේ මිනිස්සු අහන්නේ ලෝකයේ කොයි ආණ්ඩුවද මේ වාගේ බදු ගහන්නේ කියලායි.

මේ වාගේ පනත් කෙටුම්පත් නොයෙක් අවස්ථාවලදී කඩිමුඩියේ මේ ගරු සභාවට ගෙනාවා. ඒ ගෙනාපු හැම කඩිමුඩි පනත් කෙටුම්පතක්ම ජනතාව පිට බර පටවන්න ගෙනාපු ඒවා හැටියටයි අවසානයේ අපි දැක්කේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද වන කොට ආණ්ඩුව විශාල ගිනි පොලී ණය උගුලක රටේ ජනතාව හිර කර තිබෙනවා. මේ ආණ්ඩුව බදු ගහන විධිය දිහා බලලා මිනිස්සු කියනවා, අර සුද්දන්ගේ කාලයේ තිබුණු ඇඟ බද්දයි, බලු බද්දයි විතරයි තවම ගහලා නැත්තේ කියලා. හෙට අනිද්දා වන කොට බලු බද්ද, බළල් බද්ද වාගේ ඒවාත් ගැහුවේ නැත්නම් පුදුමයි කියලා මිනිස්සු කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව හැම පනත් කෙටුම්පතක්ම ගෙනෙන කොට කියන්නේ, "මේවා ගෙනෙන්නේ ජනතාවගේ යහපත, උන්නතිය වෙනුවෙන්" කියලායි. හැබැයි ඒ ගෙනාපු පනත් කෙටුම්පත් දිහා බැලුවාම අපට පෙනී ගොස් තිබෙනවා, මේවා ගෙනැවිත් තිබෙන්නේ එක්කෝ ජනතාව ගසා කන්න නැත්නම් රජයේ පැවැත්ම වෙනුවෙන් කියන එක. සේවක අර්ථසාධක අරමුදලේ මුදල් කොල්ලකාලා ප්‍රෝඩාකාරී විශ්‍රාම වැටුපක් හඳුන්වා දීම සඳහා පසු ගිය කාලයේ බොහොම කඩිමුඩියේ පනත් කෙටුම්පතක් ගෙනාවා අපට මතකයි. ඒ පනත් කෙටුම්පත ගෙනැල්ලාත් කිව්වේ, "අපි මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ විශේෂයෙන්ම වැඩ කරන ජනතාවට, පෞද්ගලික අංශයේ ජනතාවට හොඳ විශ්‍රාම දිවියක් ගත කරන්න පුළුවන් විධියට කටයුතු කරන්න" කියලායි. අන්තිමට ඒකට විරුද්ධව වෙළෙඳ කලාපයේ සේවකයින් පාරට බැස්සා; වටිනා තරුණ ජීවිතයක් බිලි ගත්තා. අවසානයේ මහජනතාවගෙන් නැඟුණු දැඩි විරෝධය මත ආණ්ඩුවට සිද්ධ වුණා, පම්පෝරි ගහලා කඩිමුඩියේ ගෙනාපු ඒ පනත් කෙටුම්පත හකුළා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට සති කිහිපයකට ඉස්සෙල්ලාත් බොහොම කඩිමුඩියේ, හදිසියට, පාර්ලිමේන්තු සම්ප්‍රදායන් පවා අමුඅමුවේ උල්ලංඝනය කරලා මහ ඇ මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වලට තට්ටු කරලා පනත් කෙටුම්පත් ගෙනැල්ලා සම්මත කර ගන්න හදපු හැටි අපි දැක්කා. ඒවායින් ඉතිරි වුණු ටික තමයි අද ගෙනැවිත් තිබෙන්නේ. බලන්න, අද මේ පනත් කෙටුම්පත් අතර තිබෙනවා, ඔටුටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත. මැතිවරණ කාලයේ කථා කරපු විධියට, වර්තමාන ආණ්ඩුව යටතේ මේවා ගෙන ඒමක් ගැන අපට අහන්න ලැබෙව්වි කියලා අපි කවදාවත් හිතුවේ නැහැ. බලය ගන්න කොට කිව්වේ මතට තිත තියන විධිය ගැනයි. බලය ගන්න කාලයේ කිව්වේ, "ඩොලර්වලට වඩා රටේ සංස්කෘතිය, සභ්‍යත්වය, අපේකම අපට ලොකුයි, ඒ නිසා අපි ඩොලර්වලට යට වෙන්න කටයුතු කරන්නේ නැහැ" කියලායි. ඒ වාගේම "රටට ලැබෙන ආදායමට වඩා අපේ දරු පරපුර අපට ලොකුයි. ඒ නිසා ඩොලර් පස්සේ යන ආණ්ඩුවක් නොවෙයි මහින්ද චින්තන ආණ්ඩුව" කියලායි බලය ගත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දශක තුනක් තිස්සේ තිබුණු යුද්ධය අවසන් වෙලා, එහෙම නැත්නම් තමුන්නාන්සේලා හැම එකකටම කථා කරන මේ යුද ජයග්‍රහණය අපේ වීරෝදාර රණ විරුවන් අපට උදා කර දීලා අවුරුදු 4ක් වෙන්න තව මාසයක විතර කාලයක් තිබෙන්නේ කියන එක මේ වෙලාව වන කොට අපි දන්නවා. යුද්ධය කාලයේ ආණ්ඩුව ජනතාවට කිව්වා, කරුණාකර රණ විරුවන්ට යුද්ධය ඉවර කරන්න කැප වීමක් කරන්න කියලා. මිනිස්සු බඩ ගැන හිතුවේ නැහැ. බඩ ගැන හිතන්න එපා, රට ගැන හිතන්න කියලා කියාපු නිසා මිනිස්සු ඒ විධියට හිටියා. හැබැයි යුද්ධය ඉවර වෙලා දැන් අවුරුදු 04ක් වෙගෙන එන වෙලාවකයි අපි මේ බදු ගැන කථා කරන්නේ. අවුරුදු 30ක යුද්ධය රණ විරුවන් අවසන් කර දුන්නාම ලංකාවේ කිසිම ආණ්ඩුවකට තිබුණේ නැති සුවිශේෂී අවස්ථාවක් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට උදා වුණාය කියන එක අපි කවුරුත් තේරුම් ගත්තා.

නමුත් අද වෙද්දී ඒ සුවිශේෂී අවස්ථාවට ආණ්ඩුව මුහුණ දීලා තිබෙන විධිය මොකක්ද කියලා අපට කනගාටුවෙන් වුවත් මතක් කරන්න වෙනවා. යුද්ධය තිබියදී, වෙඩි උණ්ඩයෙන් උණ්ඩයට තත්පරයෙන් තත්පරයට වියදම් පෙන්වා ජනතාවට කිව්වා, මේ යුද ජයග්‍රහණයෙන් පස්සේ සහන දෙන හැටි. නමුත් යුද්ධය තිබියදීට වඩා අද මිනිස්සුන්ට අමාරුයි. යුද්ධය කාලයේ මුහුණ දුන් බඩු මිලට නොවෙයි, යුද ජයග්‍රහණයෙන් අවුරුදු හතරකට පස්සේ අද මිනිස්සුන්ට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ.

ඊයේ රාත්‍රියේ තිබුණු බඩු මිල නොවෙයි, අද උදේ කඩයට ගියාම මිනිසුන්ට අහන්න වෙන්නේ. එම නිසා තමයි මේ මොහොත වන විට මේ අසාධාරණ බදුවලට එරෙහිව රට පුරා ම ජනතාවගෙන් දැවැන්ත විරෝධයක් ආණ්ඩුවට එල්ල වෙලා තිබෙන්නේ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එළවලු ගැන කථා කරන්නේ නැත්තේ ඇයි?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එළවලු ගැනත් කථා කරන්න ඕනෑ. තව පොඩ්ඩක් ඉන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පලතුරු?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පසු ගිය දවස්වල එළවලු ගැන එළවලු ගොවීන් කථා කළා. ඔවුන්ගේ අස්වැන්න සාධාරණ මිලකට විකුණා ගන්න බැරුව කුණු කොල්ලයට විකුණන්න සිද්ධ වුණා; විසි කරන්න සිද්ධ වුණා. ගොවි ජනතාව ගැන මා තව පොඩ්ඩකින් මතක් කරන්නම්.

මේ රජයේ බදු බර නිසා අද ජනතාවට විශාල ජීවන බරක් පැටවිලා තිබෙනවා. එම නිසායි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඡන්දය දීපු ජනතාව පවා, බුලත් කොළයට කතිරය ගහපු මිනිස්සු පවා අද කියන්නේ, මේ ආණ්ඩුව කන්න දීපු අත සපා කෑව ආණ්ඩුවක් කියලා. මෙතෙක් කලක් අපි දැක්කේ, සාමාන්‍යයෙන් ඕනෑම ආණ්ඩුවක් යමක් කමක් ඇති මිනිසුන්ට බදු පනවන එකයි. Taxes ගැහුවේ ධනවත් පිරිසටයි. හැබැයි අද කිසි ම අනුකම්පාවකින්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

තොරව පනවන මේ හැම බද්දක් ම සාමාන්‍ය මිනිසාට, වතු කම්කරුවාගේ සිට කම්කරු පන්තියට ම බලපානවා. සැමන් ටින් එකට, ගිනි පෙට්ටියට කීයක බද්දක් ගහනවාද? ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමා දැන් මමත් එක්ක කථා කරමින් සිටියේ, වතු කරයේ ඉන්න කම්කරුවා පරිභෝජනය කරන පාන් පිටිවලට බදු ගහන හැටියි. සීනි ටිකට, පරිප්පු කිලෝග්‍රෑම් එකට, කරවල කෑල්ලට බදු ගහන ආණ්ඩුවක් හැටියට දැන් මේ ආණ්ඩුව හංවඩු ගැහිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න. මේ හැම දෙයකට ම බලපාන දෙයක් නේ ඉන්ධන මිල. ලුණු කැටයේ සිට ආදාහනාගාරය දක්වා හැම එකකට ම ඉන්ධන මිල බලපානවා. අද ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල එකක්. හොර බදු පැනවීම නිසා ලංකාවේ මිනිසුන් ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් ගන්න කොට හැම ලීටරයකට ම අසීමිත මිලක් ගෙවන්න ඔවුන්ට සිද්ධ වෙලා තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ මිලට අනුව සිංගප්පූරුවෙන් මිලට ගෙන, ලංකාවේ වරායට ඇවිල්ලා, වරායෙන් ගබඩාවට ගිහින්, එතැනින් පිරවුම් හල දක්වා ගිහින්, පිරවුම් හල් අයිතිකරුගේ කොමිස් මුදලත් අඩු කළාට පස්සේ පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 100ක් පමණ වනවා. මේ ආණ්ඩුව හොර බදු පැනවීම නිසා, ආණ්ඩුවේ නාස්තිය හා දූෂණය නිසා, ගිනි පොලී පියවීමට සිද්ධ වෙලා තිබෙන නිසා, දූෂිත ගනුදෙනු නිසා මේ අභිංසක මිනිස්සු අද පෙට්‍රල් ලීටරයකට රුපියල් 162ක් සාක්කුවෙන් ගෙවනවා. ලෝක වෙළෙඳ පොළේ මිලට අනුව රුපියල් 100කට අඩුවෙන් දෙන්න පුළුවන් ඩීසල් ලීටරයට මිනිස්සු රුපියල් 121ක් ගෙවනවා, ආණ්ඩුවේ හොර බදු නිසා. බොර තෙල් ගෙනැල්ලා ලංකාවේ පිරිපහදුවේ සියයට 100ක් ම නිෂ්පාදනය කරන භූමිතෙල් ලීටරයකට මිනිස්සු රුපියල් 106ක් ගෙවන්නේ අසාධාරණ බදු නිසායි. අද වන කොට බොර තෙල් බැරල් එකක මිල ඩොලර් 85 දක්වා අඩු වෙලා තිබෙනවා. නමුත් ආණ්ඩුවේ නාස්තියයි, දූෂණයයි, ගිනි පොලියට ගත් ණය පියවන්න සිද්ධ වෙලා තිබෙන නිසායි බදු පිට බදු පනවලා ආණ්ඩුව අද ජනතාවගේ බෙල්ලට ම තොණ්ඩුව දමා තිබෙනවා. මේ තෙල්වල බදු අඩු කරලා ලෝක වෙළෙඳ පොළේ මිලට අනුව දෙන්න පුළුවන්කම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙට, අනිද්දා සිංහල අලුත් අවුරුදු නැකතට වැඩ අල්ලලා අවුරුදු තෑග්ග හැටියට විදුලි බිල වැඩි කරන්න ආණ්ඩුව බලා ගෙන ඉන්නවා. සිංහල අලුත් අවුරුද්දට දෙන තෑග්ග හැටියට බස් ගාස්තු, දුම්රිය ගාස්තු වැඩි කරන්න ආණ්ඩුව දත කට මැද ගෙන බලා ගෙන ඉන්නවා. ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරල් එකක මිල ඩොලර් 85 දක්වා අඩු වුණු වෙලාවේ, මේ හොර බදු ටික අයින් කරලා ලෝක වෙළෙඳ පොළේ මිලට අනුව ජනතාවට ඉන්ධන දුන්නොත් විදුලි බිල වැඩි කිරීමක් ගැන, බස් ගාස්තු වැඩි කිරීමක් ගැන, දුම්රිය ගාස්තු වැඩි කිරීමක් ගැන කථා කරන්න අවශ්‍ය වෙන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව හැම දාම කියන කථාවක් තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන අටවා ගත් සන්ධාන ආණ්ඩු, පෙරමුණු ආණ්ඩු, වාමාංශික ආණ්ඩු බලයට පැමිණියාම ජනතාවට සහන වෙනුවට ලැබුණේ අසහන විතරයි කියන එක. ඒකට හොඳම උදාහරණය තමයි, 1970 - 1977 යුගය. පොලු යුගය, පෝලිම් යුගය ගැන කියන්න ගියොත් මගේ කාලය මදි වනවා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? සුබ අනාගතයක්, විකසිත අනාගතයක්, ආශ්චර්යයක්, ආසියාවේ ආශ්චර්යය ගැන කථා කරමින්, මේ වන විට රටේ ජනතාවට තරු විසි වෙන්න බදු බර පටවා, දඩ ගසා ආණ්ඩුව ජනතාව හිර කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බලන්න, අද හාල් මැස්සන් ග්‍රෑම් 100ක මිල කීයද කියලා. රුපියල් 70ක්, රුපියල් 80ක් වනවා. අපි මේ බදු ගැන කථා කරන කොට මේ රටේ හාල් මැස්සන් කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 800යි. යුද්ධය කාලයේ කිව්වා, උතුරු නැඟෙනහිර මහ මුහුදෙන් 3/4ක් නිදහස් කර ගත්තාම සාලයන්, හාල් මැස්සන් කන ගානට තෝර මාලු කවන හැටි. අද හාල් මැස්සන් කිලෝවක් රුපියල් 800යි.

ඊළඟට බලන්න. තමුන්නාන්සේලාගේ මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රමවලින් අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? ඒවාට අපේ රටේ ශ්‍රම දායකත්වය ලබා ගන්නේ නැතිව චීනයෙන්, ඉන්දියාවෙන් ශ්‍රම දායකත්වය ලබා ගන්නවා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ මෙවැනි මහා පරිමාණ සංවර්ධන වැඩ කරනකොට, ඒ සඳහා ලංකාවේ ශ්‍රම දායකත්වය අරගෙන ලංකාවේ ජනතාවගේ බඩ පිරවීමටයි කටයුතු කළේ. ඒ වාගේම අද වනකොට විදේශ ආයෝජකයන් රට තුළට ගලා ඒමක් දකින්නට නැහැ. විරැකියාව නැති කිරීමට රැකියා ලබා දෙන සංවර්ධන ව්‍යාපෘති ඇති කරන්න ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තියේ ඇති අකාර්යක්ෂමතාව නිසාත්, විශේෂයෙන්ම මේ ආණ්ඩුව අපේ රට ජාත්‍යන්තරව හුදකලා වෙච්ච රටක් බවට පත් කර තිබීම නිසාත් රටේ ජනතාව දිනපතාම විශාල ආර්ථික අර්බුදවලට මැදිහත් වෙමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ජනතාවට බත සපයන ගොවි ජනතාවට වෙච්ච දේ බලන්න. අස්වර් මන්ත්‍රීතුමා කලින් ඒ ගැන කියපු නිසා මා දැන් එතැනට එන්නම්. [බාධා කිරීමක්] ඉස්සෙල්ලාම අපි වී ගැන කථා කරමු. මොකද, එළවලු කන්නේ බත් සමඟ නේ. ගොවි ජනතාවට වී සඳහා ලබා දෙන සහතික මිලක් ගැන පම්පෝරි ගැහුවා. අද කිව්වා, මේ පනත් කෙටුම්පත් ඔක්කෝම අය වැය කථාවේ දී සඳහන් කරපු කරුණුවලට අදාළ පනත් කෙටුම්පත් කියලා. අය වැය කථාවේ දී තමයි වී සඳහා රුපියල් 30ක, 35ක සහතික මිලක් ගැන කථා කළේත්. නමුත් අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අද සහතික මිලකට වී ටික විකුණා ගන්න බැරිව අතරමැදි වෙළෙන්දන්ට කුණු කොල්ලයට වී ටික විකුණලා ගොවි ජනතාවට හූල්ල හූල්ලා ඉන්න සිදු වෙලා තිබෙනවා. වී ටික විකුණුවාට, සිංහල අලුත් අවුරුද්ද කට ළඟට ඇවිල්ලා වුණත් ඒ සල්ලි ටික ලබා ගන්න බැරිව ඉන්නවා. ඒ ගොවි ජනතාව වෙක් පත් අතේ කියාගෙන දවස් ගණන් බැංකුවල රස්තියාදු වන හැටි මාධ්‍ය මඟින් පෙන්වනවා. ඉතින් ගොවියා රජ කරවනවා, ගොවියා නඟා සිටුවනවා කියලා බලයට ආපු ආණ්ඩුව අද ගොවි ජනතාව රස්තියාදු කරවන හැටි අපට මේ බදු පනත් ගැන කථා කරද්දී මතක් කරන්නට සිදු වනවා.

අනෙක් පැත්තෙන් රාජ්‍ය අංශයේ බැංකුවල තිබෙන තත්ත්වය බලන්න. තෙල් සංස්ථාව වාගේ තැන්වලට කෝටි ගණන්, බිලියන ගණන් ණය දීලා අද ලංකා බැංකුව, මහජන බැංකුව ලොකු අවදානමක සිටිනවා. රාජ්‍ය බැංකු දෙක කඩා වැටීමේ අවදානමක් අද අපට දකින්නට තිබෙනවා. මේ සියලුම බර දෙකෝටියක් ජනතාවගේ කර මත පටවන්නට ආණ්ඩුව ක්‍රියා කර තිබෙනවා.

මේ ආණ්ඩුවේ බාල ව්‍යාපෘතිවලින් දැන් ඇති වෙලා තිබෙන ප්‍රතිඵලය බලන්න. ජනතාව මත ගිනි පොලී ණය බර පටවලා, මහා පම්පෝරි ගහලා, තව දින 12යි, තව දින 10යි කිය කියා මාධ්‍යවලින් පෙන්න පෙන්නා පම්පෝරි ගහලා විවෘත කරපු ව්‍යාපෘතිවල තත්ත්වය බලන්න. අද තිබෙන විදුලි බලාගාර දිහා බලන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ විනාඩි ගණනත් ඉතිරි වෙලා තිබෙන නිසා මා තව විනාඩි දෙක තුනක් කථා කරන්න හිතුවා. එතුමා කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අද දින කථා කරන්නේ නැද්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එතුමා ගියා, එම අවස්ථාව ගන්න කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. ඔබතුමා කථා කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
සමහර බලාගාර දිහා බලන්න. අද වනකොට ඒවා ක්‍රියාත්මක වූ දින ගණනට වැඩියෙන් අක්‍රිය වූ දින ගණන වැඩියි. සමහර බලාගාර විදුලිය නිපද වූ වාර ගණනට වඩා ගිනි ගත් වාර ගණන අද වනකොට වැඩි වෙලා තිබෙනවා.

ඊළඟට බලන්න, දේශපාලන ප්‍රතිරූප පුම්බා ගැනීම සඳහා පවත්වන, ජනතාවට ඔරොත්තු නොදෙන නාස්තිකාර ප්‍රදර්ශන සම්බන්ධයෙන් - දැයට කිරුළ වාගේ ඒවායින් - අද වාර්තා වන්නේ මොනවාද? ඊයේ පෙරේදා පත්තරවල වාර්තා වෙලා තිබෙනවා මා දැක්කා, දැයට කිරුළ වැඩ සටහනෙන් එක කාන්තාවක් විතරක් රුපියල් කෝටි ගණනක සොරකමක් කරලා අහුවෙලා කියලා. එක්කෙනෙකුගේ සොරකමක් එච්චර නම්, අනෙක් ඒවා ටිකත් එකතු වෙනකොට කොහොම තියෙයිද කියලා මිනිස්සු දැන් කල්පනා කරනවා. ඉතින් මේක දැයට කිරුළු පැළඳවීමක්ද, එහෙම නැත්නම් සොරුන්ට කිරුළු පැළඳවීම සඳහා කරන දේශපාලන ව්‍යාපෘතියක්ද කියලා ජනතාව අද ඇත්ත වශයෙන්ම කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිනපතාම ආණ්ඩුව කරන්නේ ජනතාව පිට බර පටවන එකයි. මිනිස්සු කියනවා, "කඩේට ගියොත් බදු, පාරට බැස්සොත් දඩ" කියලා. මේ ආණ්ඩුව යැපෙන්නේ ජනතාවගෙන් බදු සහ දඩ අය කරගෙනයි කියලා අද මිනිසුන් හොඳට දන්නවා.

ඒ වාගේම බලන්න, අද මොනවාද වාර්තා වෙන්නේ කියලා. ආණ්ඩු පක්ෂයෙන් මෙතැන ලොකු කතන්දර කියනවා. ආණ්ඩුවේ මාධ්‍යයෙන් ලොකු ප්‍රචාරක වැඩ පිළිවෙළවල් ගෙන යනවා. නිල් රැල්ල කියනවා. ඒ මොනවා කිව්වත් අද අපි දකින යථාර්ථය මොකක්ද? පත්තර බලනකොට, ප්‍රවෘත්තිවලට කන් දෙනකොට දකින්නේ, ඇහෙන්නේ ජීවත් වන්නට බැරිව සතියකට වරක්වත් දරු පවුලක් සිය දිවි නසා ගැනීමක් ගැනයි.

දවස් 11ක් වයසැති කුඩා දරුවෙක් ජීවත් කරවන්න විධියක් නැතිව, ඒ දරුවාගේ උගුරේ කාසියක් හිර කරලා ඒ දරුවාගේ අම්මා විසින් ඒ දරුවා මරණයට පත් කරපු හැටි ඊයේ පුවත් පතක පළ වෙලා තිබෙනවා මා දැක්කා. බලන්න, නිදහස් අධ්‍යාපනය තිබෙන රටක් ගැන අද අපි කථා කරනවා. පාසලට ඉල්ලපු සල්ලි ගෙනියන්න විධියක් නැතිව අල්ලපු වත්තක පොල් ගෙඩි කීපයක් හොරකම් කරපු දරුවෙකුට දඬුවම් දීපු හැටි ඊයේ පෙරේදා පුවත් පත්වල පොල් ගෙඩි අකුරින් වාර්තා වුණා. ඉතින් මේ වෙලාව වෙන කොට මේ රටේ ආර්ථිකය ගැන අපට බොක්කටම දැනෙනවා. මේ යන විධියට ගිහින් අප්‍රිකාවේ දුප්පත් රටවලට අත් වුණු බේදජනක ඉරණම අපේ රටටත් මේ ආණ්ඩුව විසින් උරුම කර දෙයිද කියන සැකයත් අද ජනතාවට ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා මෙම කාරණයත් කිව යුතුයි. දැන් එළඹී තිබෙන්නේ සිංහල, දෙමළ අලුත් අවුරුදු සමයයි. සතුටු සිනා හඬ, රබන් හඬ, කොවුල් හඬ දසතින්ම නැහෙන කාලෙක තමයි අප මේ කථා කරන්නේ. හැබැයි මේ ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තිය නිසා, දඩ ප්‍රතිපත්තිය නිසා, බදු පිට බදු ගැසීම නිසා ජනතාවට මොකක්ද අද සිදු වෙලා තිබෙන්නේ? ඒ කොවුල් හඬ අභිභවා ගිහින්, සතුටු සිනා හඬ අභිභවා ගිහින් ජනතාවගෙන් නැහෙන්නේ විශාල අදෝනාවක්. ඒ තමයි බඩු මිලේ අදෝනාව; විදුලි බිල වැඩි වීමේ අදෝනාව; බස් ගාස්තු, දුම්රිය ගාස්තු වැඩි වීමේ අදෝනාව. මෙවා තමයි අද සතර දිගින්ම අහන්න ලැබෙන්නේ. අද ජනතාව කල්පනා කරනවා සිංහල අලුත් අවුරුද්දට තම යුතුකම් ඉටු කරන්නේ කොහොමද කියලා.

මත්තල ගුවන් තොටුපොළ ගැන මේ ගරු සභාවේ කථා කළා. මේ මාසයේ, සිංහල අවුරුදු නැකතට බස් ගාස්තු වැඩි කළාම බස් එකේ යන්නේ කොහොමද කියලා කල්පනා කර කර ඉන්න මිනිසුන්ට ආණ්ඩුව රූපවාහිනියෙන් ගුවන් තොටුපොළේ ආශ්චර්යය පෙන්වනවා. මේවා පෙන්වලා, කයිවාරුවලින් ජනතාවගේ ප්‍රශ්න යටපත් කරන්න බැරි තත්ත්වයට අද ඇවිත් තිබෙනවා.

මේ බදු ගැන කථා කරන කොට, අය වැයේ කියපු දේවල් අද ක්‍රියාත්මක කරන්න හදන කොට, ජනතාව කියන තවත් කාරණයක් තිබෙනවා. ඒ මොකක්ද? උප්පැන්න සහතිකයට, විවාහ සහතිකයට, මරණ සහතිකයට පවා දැන් තට්ටු කරලා තිබෙනවා. මිනිස්සු කියනවා කසාදයක් බඳින්න නම් රුපියල් 5,000යි, මැරුණොත් රුපියල් 7,000යි කියලා. මැරුණොත් ආදාහනාගාරයටයි, මරණ සහතිකයටයි යන ගණන රුපියල් 7,000යි. දැන් අපේ පැත්තේ දුප්පත් අයගේ මළ ගෙවල්වලට යන කොට, "මරණයේ වේදනාව මීය ගිය ඔබට නොව ජීවත් වන අපටය" කියලා හුහක් බැනර්වල ගහලා තිබෙනවා අපි දකිනවා. දැන් අන්න ඒ තත්ත්වයට වැටිලා තිබෙනවා.

ඊළඟට මේ කාරණය බලන්න. පින් පඩිය දෙන කොට, ඒ දුප්පත් මිනිසුන්ට අමතර දීමනාවක් හැටියට රුපියල් 150ක් දෙනවා. ඒ රුපියල් එකසියපණහේ දීමනාව ගන්න ඒ මිනිස්සු දිවුරුම් පෙත්සමක් දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පින් පඩිය ගන්න අභිංසක මිනිසුන්ට ඒ රුපියල් 150ක දීමනාව ගන්න දෙන දිවුරුම් පෙත්සමට දැන් රුපියල් 250ක් ගෙවන්න වෙලා තිබෙනවා. අර රුපියල් 150ක දීමනාව ගන්න රුපියල් 250ක් දීලා දිවුරුම් පෙත්සමක් ගන්න වෙලා තිබෙනවා. මෙහෙම තත්ත්වයක් යටතේ තමයි අද අප මේ විවාදයට එකතු වෙන්නේ.

අපේ ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා උපාධිධාරීන්ට රස්සා දීපු ආකාරයත් කියන්න කියලා. මම එතුමාගෙන් එක දෙයයි අහන්නේ. අවුරුදු ගණනකට පස්සේ -1994දී- තමයි එතුමන්ලා බලයට ආවේ. එතුමන්ලා ඒ වෙලාවේ ආණ්ඩුව ගන්න කොට එක උපාධිධාරියෙකුවත් රැකියා විරහිතව හිටියාද කියන එක විතරක් හොයලා බලන්න කියලා මම එතුමාට කියන්න කැමැතියි. අපේ කාලයේ රට දෙකට බෙදන්න කටයුතු කරපු ඒවා ගැන එතුමා කිව්වා. හැබැයි මම එතුමාට මේ කාරණය කියන්න කැමැතියි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එතුමා කිව්වා සාම සාකච්ඡා, අරවා මේවා කළාය කියලා. අපි රට දෙකඩ කිරීම කෙසේ වෙතත්, එල්ටීටීඊ එක දෙකඩ කරන්න කටයුතු කළේ අපේ මාස කීපයක ආණ්ඩුව කාලයේයි කියන එක මම එතුමාට මතක් කර දෙන්න කැමැතියි. එතුමා ඒක දන්නේ නැත්නම් එතුමන්ලාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපති ධුරයක් දරන කරුණා අම්මාන් නියෝජ්‍ය ඇමතිවරයාගෙන් හෝ එතුමන්ලාගේ ආණ්ඩුවේ ඉන්න ප්‍රබලයෙකුගෙන් ඒ ගැන වඩාත් තොරතුරු එතුමාට දැන ගන්න පුළුවන් කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බදු පැනවීම නිසා අද රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන අපේ ගම්වල මිනිස්සු නිතර නිතර කථා කරන දේවල් ගැන පොඩ්ඩක් හරි කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.32]

ගරු ෆිලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශකතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබීම ගැන සන්තෝෂ වෙනවා. එතුමා මත්තල ගුවන් තොටුපොළ ගැන කථා කළා. ඊළඟට පින් පඩිය ගැන කථා කළා. මම එතුමාට පොඩි මතක් කිරීමක් කරන්න ඕනෑ.

ලංකාවේ මත්තල ගුවන් තොටුපොළ ගැන කථා කරන අයට කියන්නට කාරණයක් තිබෙනවා. ලංකාවේ සන්නිවේදනය සම්බන්ධයෙන් කටයුතු කරන companies පහක්, හයක් තිබෙනවා. එටිසෙලාට් තිබෙනවා. එයාර්ටෙල් තිබෙනවා. ඩයලොග් තිබෙනවා. ලංකාවේ ජංගම දුරකථන පාවිච්චි කරන අය විශාල සංඛ්‍යාවක් සිටිනවා. ජංගම දුරකථන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ජනගහනයටත් වැඩියි. මේ සියලුම ආයතනවලට මාසයකට ඇදී යන මුදලින් Mattala Rajapaksa International Airport එක වාගේ තවත් එකක් හදන්න පුළුවන්. කල්පනා කරලා බලන්න. දැන් ආර්ථිකය වෙනස් වෙලා, රට වෙනස් වෙලා. තමුන්නාන්සේලා ගෙනාව විවෘත ආර්ථිකය නිසා තමයි "කැසිනෝ" මෙහාට ආවේ. "Casino" කියන්නේ "cash in, no out" කියන එක. ඇතුළට එනවා, එළියට යන්නේ නැහැ. ඒකට තමයි "කැසිනෝ" කියන්නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ බව දන්නවාද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මම දන්නවා, මම දන්නවා. ඉගෙන ගන්න ඕනෑ නම් එන්න. මේවා මේ රටට ගෙනාවේ තමුන්නාන්සේලාගේ විවෘත ආර්ථිකය. මේ ආර්ථිකය නිසා දැන් සිංගප්පූරුව හම්බ කරන සල්ලි ප්‍රමාණය අති විශාලයි. ඉස්සෙල්ලා සිංගප්පූරුව කැසිනෝ කළේ නැහැ, පසුව පටන් ගත්තා. දැන් නතර කරන්න බැහැ. නතර කළොත් මැලේසියාවට යනවා. එහෙම නැත්නම් වෙනත් රටකට යනවා. අපි කලාප 5ක් හදනවා. මෙරටට පැමිණෙන සංචාරකයින්ට ඒ අයගේ අවශ්‍යතාවන් සපුරා ගන්න බැරි නම් අපට සංචාරක ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්න බැහැ. වසරකට සංචාරකයින් ලක්ෂ 11ක් පමණ එනවා. ලක්ෂ 25ක් ආවොත් එක පුද්ගලයෙකුට එක සංචාරකයෙක් එනවා. ඒ අය වියදම් කළොත්, -අපේ තිබෙන අහේනිය, කරදර, දුක් කරදර වාගේ දේවල් නොවෙයි- මේ රට පෙන්වලා, ප්‍රදර්ශනය කරලා අපට ලොකු ගණනක් හම්බ කර ගන්නට පුළුවන්. ව්‍යාපාර ක්ෂේත්‍රයේ අලුත් මූල ධර්මවලට අනුකූලව රටක් හෝ පෞද්ගලික ව්‍යාපාර සකස් කිරීම, වෙනස් කිරීම, diversify කිරීම කළ යුතුයි. ඒවා සාමාන්‍යයෙන් ස්වාභාවික දේවල්.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා පින් පඩිය ගැන කිව්වා. අපි නම් පින් පඩිය කියලා කියන්නේ නැහැ. අපි ඒකට කියන්නේ මහජන ආධාරය කියලායි. රුපියල් 100 නොවෙයි දැන් රුපියල් 1,000ක් දෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඒ සඳහා මුදල් වෙන් කරලා, සමාජ සේවා අමාත්‍යාංශය හරහා 214,000කට එම මහජන ආධාරය ලබා දෙනවා. නමුත් අපි එයට පින් පඩිය කියලා කියන්නේ නැහැ. අපි කියන්නේ මහජන ආධාරය කියලායි. අපි මේ වාගේ කටයුතු ගොඩක් කරනවා.

උදාහරණයක් වශයෙන්, 2011 වර්ෂයේ මුළු අපනයන වටිනාකම ඇමෙරිකන් ඩොලර් බිලියන 10.9යි. ඒකෙන් ඇමෙරිකන් ඩොලර් බිලියන 4.4ක් ආවේ ඇඟලුම් කර්මාන්තශාලාවලින්. දැන් තිබෙන අලුත්ම ප්‍රශ්නය මොකක්ද කියලා දන්නවාද? කටුනායක වෙළෙඳ කලාපයට සේවකයින් 20,000කගේ අඩුවක් තිබෙනවා. ඇඟලුම් කර්මාන්ත සේවක සේවිකාවන් අඩු වෙලා. බියගම වෙළෙඳ කලාපයේ 12,000කගේ අඩුවක් තිබෙනවා. සීතාවක වෙළෙඳ කලාපයේ 10,000කගේ අඩුවක් තිබෙනවා. හොරණ වෙළෙඳ කලාපයේ 10,000කගේ අඩුවක් තිබෙනවා. තව දුරටත් මේ ක්ෂේත්‍රයේ රැඳී සිටිනවාද, එහෙම නැත්නම් වෙනත් දෙයකට යොමු වෙනවාද, එහෙමත් නැත්නම් කුමක් හෝ ක්‍රමවේදයක් හදා ගන්නවාද? මේ කාරණා ගැන අපි කල්පනා කරන්නට ඕනෑ. ඔටිටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පතෙන් කරලා තිබෙන්නේ කැසිනෝවලට බදු වැඩි කිරීමයි. නිකම් නොවෙයි, කලාප හදලා බද්ද වැඩි කරලා. වෙනත් රටවල කැසිනෝ ගහන නෞකා 500ක් විතර මුහුදේ තිබෙනවා. තමුන්නාන්සේලා දැක්කා නේ පසු ගිය දවසක 250ක් පමණ දෙනා ගින්නක් නිසා විනාශ වුණ ආකාරය. ඒ රටවල සමාජ ශාලාවල ගිනි කෙළින් තිබෙනවා. අපේ රටේ එහෙම නැහැ. ඕනේ නම් අපේ නයි නළඟනක් ඇති. නයා පෙන්වනවා, කොකා පෙන්වන්නේ නැහැ. මේවා තමයි අපි කරන්නේ. [බාධා කිරීමක්] දෂ්ට කරන්න පුළුවන් කට්ටියක් ඉල්ලන්නේ. ඒක තමයි ඇත්ත තත්ත්වය. මම තමුන්නාන්සේලාට කියන්නට ඕනෑ, තමුන්නාන්සේලාගේ ආර්ථික දර්ශන, ආර්ථිකය පිළිබඳව දරන මතිමතාන්තර කාලානුරූපව වෙනස් කරන්නට ඕනෑ කියලා. විශේෂයෙන්ම දැන් මියෙන්මාරය ගොඩක් ඉස්සරහට ගිහින්; බංග්ලාදේශය ඉස්සරහට ගිහින්. හේතුව මොකක්ද, ඒ රටවල ශ්‍රමය ලාභයි. ඒ රටවල ශ්‍රමය ලාභ නිසා අපෙන් ගිලිහී ගිහින් ඒ රටවල ශ්‍රමය පාවිච්චි කරලා ව්‍යාපාර කරනවා. ව්‍යාපාරිකයෙක් ව්‍යාපාර කරන්නේ රටටත්, ජාතියටත් ආදරයට නොවෙයි, තමන්ගේ මූල්‍ය ශක්තිය වැඩි කර ගන්නටයි. අපි දැන ගන්නට ඕනෑ, මල නොතලා රොන් ගන්නට. මල නොතලා රොන් ගැනීමක් තමයි අලුත් වැඩ පිළිවෙළ තුළින් අපි කරන්න බලාපොරොත්තු වන්නේ. විශේෂයෙන්ම මේ වැඩ පිළිවෙළ හොඳයි කියලා මම කියන්නේ සංශෝධනය අනුව ගොඩනැඟිලි ඉදිකිරීමට, මහා මාර්ග ඉදිකිරීමට සහ සේවා මූල්‍ය වෙළෙඳ පොළට සහන ගොඩක් සලසා දීලා තිබෙන නිසායි. ඒ වාගේම මාළු නිෂ්පාදනයට සහ packing materialsවලට. දැන් packing materials පිට රටින් ගේන විට ඒ සඳහා යන cost එකත් එකතු කළාමයි අවසාන මිල තීන්දු වන්නේ. ඒ විධියට අවසාන මිල තීන්දු වන විට අපි මොනවාද කරන්න ඕනෑ? මේවාට සහන දෙන්න ඕනෑ. එහෙම නැත්නම් අපට competition එකට යන්නට බැහැ.

වෙළෙඳාමේ අතිරික්තයක් නැත්නම් ආනයන අපනයනය ශේෂය අවම කර ගන්න ඕනෑ නම් අපේ රජය කාලානුරූපීව වැඩ කරන්න ඕනෑ. විදේශිකයන්ට ඉඩම් දෙනවාය කියා මෙතැන කිව්වා. විදේශිකයන්ට ඉඩම් දෙන්න පුළුවන්. ගොඩනැඟිල්ලක් හැදුවාම හතර වන තට්ටුවේ ඉඳලා දෙන්න පුළුවන්. යට කොටස අපිට. බිම අපිට. පළමුවන, දෙවන සහ තුන්වන තට්ටු අපිට. හතර වන තට්ටුවෙන් එහාට ඒ ගොල්ලන්ට ගන්න පුළුවන්. ඒවා කරන්නේ කොහොමද කියා හොඳට අධ්‍යයනය කර බලන්න. හතරවන තට්ටුවෙන් එහාට ඒගොල්ලන්ට ගන්න පුළුවන්. පළමුවන,දෙවන සහ තුන්වන තට්ටු අපිට. ඒ තට්ටු තුන නැතුව හතරවන තට්ටුව උස්සාගෙන යන්න බැහැ. කකුල් දෙක නැතුව ඇවිදගෙන යන්න බැහැ. අත් දෙකෙන් ඇවිද ගෙන යන්න පුළුවන්ද? ඔළුවෙන් ඇවිදින්න පුළුවන්ද? මේ වාගේ ආර්ථික න්‍යායන් රටට උචිත වන විධියට පාවිච්චි කරන්න ඕනෑ. ඒක තමයි මම කියන්නේ. එළවලුවලට, පළතුරුවලට, සකස් නොකළ සහල් සහ භාණ්ඩ සඳහා අපි වැට බදු අය කරන්නේ නැහැ.

කැළි කසළ ඉවත් කිරීම ගනිමු. කැළි කසළ ඉවත් කිරීම සම්බන්ධව පළාත් සභාවේ ලොකු ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. දැන් gully bowsers නැහැ. හැම තැනම ගෙවල්. එක ළඟ ගෙවල් තිබෙනවා. එක ගෙයක් අනෙක් ගෙට ළඟයි. එම නිසා මේවා යටට කාන්දු නොවන විධියට කොන්ක්‍රීට් septic tanks දමනවා. ළිඳක් කපා ගත්තේ නැත්නම් පහත් තැනින් ජලය ගලා බසියි කියන න්‍යාය අනුව එකක තියෙන ඒවා අනෙක් එකට යනවා. ඒක නවත්වා ගන්න ඕනෑ. නවත්වා ගන්න නම් ඒවා අපහරණය කරන්න ඕනෑ. අපහරණය කරන්න නම් මේවාට සහන ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ gully bowsers ප්‍රමාණය මදි. අපි ඉන්නේ ජා ඇල නගර ප්‍රදේශයේයි. අපට හදිසියක් වුණොත් gully bowser එකක් ගන්න waiting list එකේ ඉන්න ඕනෑ.

අනෙක් එක boom trucks. ශ්‍රමය අඩු නිසා හුඟක් දෙනෙක් කරන්නේ මොකක් හෝ භාණ්ඩයක් ගෙනාවාම boom truck එකෙන් උස්සලා අරගෙන ඒක තියා ගන්නවා. කී දෙනෙක් ලවා දමා ගන්නද? ඉස්සර නම් අලි ඇතුන් ලවා දමා ගත්තා. දැන් බැහැ. දැන් අපි කරන්න ඕනෑ. මේවා අපිට කරන්න පුළුවන්ද? බලන්න දියුණු රටවල කොහොමද කරන්නේ කියා. යන්ත්‍රෝපකරණ හරහා තමයි බොහෝ දේවල් කරන්නේ. අද ගොයම් කපන්නෙත් "භූතයා" කියන යන්ත්‍රයෙන්. දැන් සම්ප්‍රදාය වෙනස් වෙලා. අපි පොහොර සහනාධාරය නිකම් දෙනවා. මඩ සෝදා ගත් කල ගොවියා රජකමට හොඳයි කියලායි කිව්වේ. දැන් "භූතයා" තමයි ගොයම් ටික කපන්න උදව් වන්නේ. ඔන්න බලන්න ලෝකය වෙනස් වන හැටි. ඒ වෙනස් වීම තුළ මල නොතලා රොන් ගන්න කියන ප්‍රතිපත්තියට එන්න ඕනෑ.

දැන් කැසිනෝවලට බදු ගහනවා. තමුන්නාන්සේලා කිව්වා, බදු අඩු කරනවාය කියා. මේකේ total එකටයි බදු ගහන්නේ. Gross එකටයි tax එක ගහන්නේ. අපේ රටේ බදු ප්‍රතිපත්තිය අනුව අපි මත ස්ව තක්සේරුවක් නේ කරන්නේ. මට මෙච්චරයි. මම මෙච්චරයි හම්බ කරන්නේ, වියදම මෙච්චරයි කියලා වියදම වැඩියෙන් පෙන්නුවා. ආදායම අඩුවෙන් පෙන්නුවා. පරතරයට බදු ගෙවනවා. දැන් එහෙම බැහැ. කැසිනෝ එකට එහෙම බැහැ. කැසිනෝ එකේ කෙළින්ම gross එකට බදු ගහනවා. හැබැයි, බදු අය කර ගන්න දැන ගන්න ඕනෑ. අපේ Income Tax එකේ ඉතාමත් හොඳ අවංක නිලධාරීන් ඉන්නවා නේ. ඒ අයව යවලා හරියටම ගණන අය කර ගන්න ඕනෑ. මම කියන්නේ වැඩියෙන්ම පිරිමි යවන්නත් එපා කියලයි. ඒ කටයුත්තට ගැහැනු පක්ෂය යැව්වොත් හොඳයි. මොකද, පිරිමි යැව්වොත් කැසිනෝ ගහන්නත් පුළුවන් නේ.අපි මේවා හොඳට අධ්‍යයනය කරලා තමයි කටයුතු කරන්නේ.

දැන් බුකී ව්‍යාපාරය ගනිමු. නියෝජිතයන් මඟින් කරන ඔට්ටු ව්‍යාපාරය සඳහා වන බද්ද රුපියල් මිලියන 2 දක්වා වැඩි කළා. සජීවී රූපවාහිනී විකාශන පහසුකම් සඳහා යොදා නොගන්නා විට අදාළ බද්ද වසරකට රුපියල් 25,000 දක්වා අඩු කර තිබෙනවා. එන එන විධියට බද්ද අඩු කරනවා; වැඩි කරනවා. බඩු මිල ගැන නම් කොහොමත් කථා කරන්න එපා. නිෂ්පාදනය වැඩි වුණාම ඉබේම මිල අඩු වෙනවා. මුහුදෙන් මාළු වැඩිපුර හම්බ වුණාම අපි කවුරුත් කියන්න ඕනෑ නැහැ, මිල අඩු වෙනවා. හිඟයක් ඇති වුණාම තමයි මිල වැඩි වන්නේ. මිල න්‍යාය අනුව ඒක සිද්ධ වෙනවා. නමුත් ගොඩක් භාණ්ඩවලට ස්ථාවර මිලක් නැහැ. අපි කල්පනා කරන්න ඕනෑ, කොයි විධියටද කටයුතු කරන්නේ කියා.

ඇමෙරිකාවේ රාත්‍රී සමාජ ශාලා සිද්ධීන් බලන්න. ලාස්වේගාස් නගරයට 2011 දී පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව මිලියන 39යි. අපේ ලක්ෂ 11යි. ඒ කියන්නේ මිලියන 1.1යි. ඒ නගරයේ මිලියන 39යි. එක් කෙනෙක් දළ වශයෙන් ඇමෙරිකන් ඩොලර් 500ක්, 600ක් 1,000ක් විතර වියදම් කරනවා. ඒ ප්‍රදේශයේ තිබෙන හෝටල් ප්‍රමාණය ගත්තොත් සියයට 86ක් 90ක් විතර අවුරුද්ද පුරා සංචාරකයන්ගෙන් පිරී ඉතිරී යනවා.

අපේ නම් occupancy rate එක බහිනවා නේ. සමහරවිට 35 වෙනවා. 40 වෙනවා. Season එකේදී තමයි වැඩිපුර එන්නේ. අනෙක් වෙලාවට නිකම් තිබෙනවා. එතකොට price එක අඩු කරනවා; මිල අඩු කරනවා. මේකේ එහෙම නොවෙයි. මේක ඒකාකාරයි. හැමදාම සියයට 86ක් ඉන්නවා. ඒ නිසා එහේ අය කරන මිලත් ඒකාකාර මිලක් බවට පත් වෙලා තිබෙනවා.

ඊළඟට alternative energy ඒ කියන්නේ සූර්ය බලශක්තිය වාගේ විකල්ප බලශක්තිවලට නොයෙකුත් සහන ලබා දෙනවා. අපි නිෂ්පාදනය කරන්නේ මෙගා වොට්ස් කීයද? මගේ මතකයේ හැටියට මෙගා වොට්ස් 1300ක් විතර ජලයෙන් විදුලිය නිෂ්පාදනය කරනවා. ඉතිරී ඒවා කොහෙන්ද? මේ රටේ හැම තැනටම electricity දෙන්න ඕනෑ නම් අපි ඒ බලශක්තිය ලබා ගන්න ඕනෑ, එක්කෝ තෙල්වලින්, එහෙම නැත්නම් ගල් අඟුරුවලින්. එහෙම නැත්නම් ගෑස්වලින්, එහෙම නැත්නම් පරමාණු බලයෙන්. පරමාණු බලය ගන්න බැහැ, අපේ රට දූපතක් නිසා. ඒ නිසා අපට විකල්ප බලශක්තිවලට යන්න සිද්ධ වෙනවා. විකල්ප බලශක්තිවලට ගියාම LECO එකෙන් හොඳ ආදර්ශයක් ලබා දෙනවා. මම LECO එකේ බැලුවා. ඒකේ transmission loss එක, ඒ කියන්නේ එක කණුවක සිට අනෙක් කණුව දක්වා යාමේදී ඇති වන loss එක, එහෙම නැත්නම් පාඩුව සියයට 12 සිට සියයට 2 දක්වා අඩු කරනවා. ඒකට හේතුව වෙලා තිබෙන්නේ හොරෙන් ගන්න එකයි. ඒවා නැති කරනවා. ඒ වාගේම දිගින් දිගටම transformers දමලා ඒකාකාරීව current එක දෙන්න පුළුවන් විධියේ ක්‍රමයක් හදා ගන්න ඕනෑ. අපි ඒ පැත්තට යන්න ඕනෑ. අපට වියදම් කරන්නත් පුළුවන්. ආදායම් ලබා ගන්නත් පුළුවන්. ආදායම් වැඩියෙන් ලබා ගත්තාම වැඩියෙන් වියදම් කරන්න පුළුවන්, වැඩියෙන් සන්තෝෂ වෙන්න පුළුවන්. අනේ, අපට ආදායම නැහැයි කියලා උඩ බලා ගෙන හිටියොත් කිසි දෙයක් නැති වෙනවා. ඒ නිසා අපි මේවාට විරුද්ධ වුණත්, යම් යම් ප්‍රශ්න තිබුණත් මොනවා කරන්නද?

දැන් ඉන්දියාව බලන්නකෝ. ඉන්දියාවේ බොනවාට ගණනක් අය කරනවා. ඉන්දියාවේ බොන්න licence එකක් ඕනෑ. උදාහරණයක් වශයෙන් ගත්තොත් දිනකට ඉන්දියානු රුපියල් 5ක් ගෙවලා licence එකක් ගන්න ඕනෑ, බොන්න. අවුරුද්දකට නම් ඉන්දියානු රුපියල් 100ක් ගෙවන්න ඕනෑ. හුඟක් දෙනෙක් licence එක අර ගෙන ඉන්නේ. සිංගප්පූරුවේ බාර් අවුරුදු දෙකෙන් දෙකට වෙන්දේසි කරනවා. අපේ රටේ ජීවිත කාලය තුළම දීලා තිබෙනවා. දැන් ඒවා supermarketවලට ගන්නවා, ගරු වාසුදේව නානායක්කාර අපේ නායකතුමනි. Supermarketවලට අර ගෙන මොකක්ද කරන්නේ? ඒ ගොල්ලන්ගේ පිරිවැටුම වැඩි කර ගන්නවා. නමුත් එළවලුවලට tax නැහැ, අරවාට tax නැහැ, මේවාට tax. නැහැ. නමුත් gross එකට tax ගහන්න යනවා.

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

බොහොම හොඳයි. කොහෙන් හරි ගන්න ඕනෑ. අර ගෙන තමයි ආණ්ඩුව ගෙන යන්න ඕනෑ. ඉස්සර මුළු වෙළෙඳාමටම පිරිවැටුම් බදු ගෙවන්නේ නැහැ. අරවා අඩු කරලා තමයි ගෙවන්නේ. දැන් ඒවාටත් එක්ක ගෙවන්න ක්‍රමය හදලා තිබෙනවා. ඉතින් මේවා වැරදියි කියන්න පුළුවන්ද කියන එක තමයි මට තිබෙන ප්‍රශ්නය. මේ ගැන තමුන්නාන්සේලා හොඳට කල්පනා කර බලන්න.

මම තවත් කාරණයක් කියන්න කැමැතියි. බලන්න, අපි ඇමෙරිකාවට බණිනවා. නමුත් ඒක හරියන්නේ නැහැයි කියලා මට පෞද්ගලිකව හිතෙනවා. අපි ඇමෙරිකාවෙන් අපනයනය කරන භාණ්ඩවල වටිනාකම ඩොලර් මිලියන 2000යි. ඇමෙරිකාවෙන් මෙහාට ගෙන්වන්නේ මොනවාද? අපි අපනයනය කරනවා, ඩොලර් මිලියන 2000ක භාණ්ඩ. ආනයනය කරනවා ඩොලර් 250ක භාණ්ඩ. මම එදාත් මේ ගැන කිව්වා. යුරෝපා රටවලට අපි ඩොලර් මිලියන 3200ක් වටිනා දේවල් අපනයනය කරනවා. ආනයනය කරන්නේ ඩොලර් 2000ක් වටිනා දේවල් පමණයි. බටහිර රටවලින් අපට ලොකු වෙළෙඳ අතිරික්තයක් තිබෙනවා. අපි ඉන්දියාවෙන් ත්‍රීවීලර් ටික ද, ටාටා ලොරි ද, ටාටා බස් ද, ලේලන්ඩ් වාහනද, හැම දේම ගෙන්වනවා. සාරි ගෙන්වනවා. දැන් අඳින හැම සාරියක්ම ඉන්දියාවෙන් ගෙන්වන ඒවා නේ. දැන් නම් කාන්තාවෝ trouser එක තමයි අඳින්නේ. කමක් නැහැ. මහුල් ගෙදරට - wedding එකට- අඳින්නේ එහෙමයි. ඒ අඳින ඒවා ගෙන්වන්නේ ඉන්දියාවෙන්. ඉන්දියාව ඒක තේරුම් අර ගෙන තිබෙනවා. කවදාවත් ඉන්දියාව අපිත් එක්ක සතුරු වෙන්නේ නැහැ. අපේ ලොකු අයියා. එක ප්‍රාන්තයක් විතරක් අපට ප්‍රශ්න ඇති කරනවා. ඒ ගොල්ලන්ගේ ඡන්දය එන තෙක් විතරයි. ඒ නිසා ඒක එච්චර ලොකු ප්‍රශ්නයක් නොවෙයි කියන එක මතක් කරන්න ඕනෑ.

ඊළඟට අපේ මුහුදු ගැන බලමු. මුහුදු ගැන බලද්දීත් අපි දන්නවා ඉන්දියාවත් ලංකාවත් අතර පරතරය තිබුණේ හැතැප්ම 20ක් 22ක් වාගේ දුරක් බව. ඒකෙන් භාගයක් අපට. භාගයක් ඉන්දියාවට. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අපට කච්චතිව් දූපත අර ගෙන දුන්නා. ඒකත් කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්.

ඒ කාලයේ තමුන්නාන්සේලා තමයි ඉන්දිරා ගාන්ධිටයි, රජීව් ගාන්ධිටයි 'වැස්සි' 'වස්සා' කියලා නම් පටබැඳලා පළමුවැනි විරසකකම ඇති කළේ. ඒ විරසකකම ඇති කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි අප අතර තිබුණු මිතුරුකම කියන එක අයින් වෙලා ගියේ. 'සිරිමාවෝත් පරදිනවා. අනුරත් පරදිනවා' කියන න්‍යාය ක්‍රියාත්මක කරන්න ගත්තු example එක මොකක්ද? ඉන්දියාවේ ඉන්දිරා ගාන්ධියි, රජීව් ගාන්ධියි පරද්දනවා කියන එකයි. රජීව් ගාන්ධිට මෙහේදී ගැහුවා. ඒත් යුද්ධ කළේ නැහැ අපත් එක්ක. ලංකාවෙන් පිරිසක් ගිහිල්ලා මාලදිවයින ආක්‍රමණය කළා. ඊට පස්සේ ඉන්දියාව ගිහින් ඒ අයට ගහලා එළවා දමලා ආපසු මාලදිවයිනටම භාර දීලා ගියා. මේවා කවදාවත් ආක්‍රමණය කරන රටවල් නොවෙයි. ඒ අය අපව අල්ලා ගන්න එන්නේ නැහැ. එවැන්නක් වුවමනාවෙන් ඇති කරන්න හදනවා. හැබැයි නෝර්වේ රට භයානකයි. නෝර්වේ රටේ ආර්ථිකයේ විශාල අතිරික්තයක් තිබෙනවා. ඒ අය කිසිම යුද්ධයකට මුහුණ දීලා නැහැ. ඒ අය බලනවා අපේ රටේ වෙනත් විධියේ වැඩ පිළිවෙළ හදන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය අනුව අපට කිසිම අවැඩක් කවදාවත් සිද්ධ වන්නේ නැහැ. අපි මේ ගැන කල්පනා කර බලලා දැන් අලුත් ක්‍රමවේද හදන්න ඕනෑ. එහෙම ක්‍රමවේද හදද්දී විරසකභාවය ටික ටික අඩු වෙනවා. මේ රට බලන්න සංචාරකයෝ එනවා. දැන් කැසිනෝකාරයන් මෙහේට ආවාම ආපු තැනම ඉන්නේ නැහැ නේ. ටිකක් ඇවිදලා කරලා රට බලලා යනවා. රටේ ඇවිදලා බැලුවාම මොකද වෙන්නේ? "ඈ! සුන්දර රටක් නේ. කොළඹ ලස්සනයි නේ. අපි කියපු විධියේ රටක් නොවෙයි නේ මේක. මෙහේ වනවාරි මිනිස්සු නැහැ නේ. ලස්සනට ඇඳගෙන, හොඳට ඉංග්‍රීසි කථා කරන්න පුළුවන්, හොඳ සභ්‍යත්වයක්, සංස්කෘතියක් තිබෙන, මනුස්සකම තිබෙන, හිතා වෙන මිනිසුන් පිරිසක් නේ ලංකාවේ ඉන්නේ." කියලා සතුටු වෙලා යනවා. හැබැයි ඒ සඳහා අපි ලොකු ප්‍රචාරයක් ගෙන යන්න ඕනෑ. භාණ්ඩයක් විකුණද්දී ප්‍රචාරයට කීයක් වියදම් කරනවාද? දැන් බලන්න, අපේ භාණ්ඩ විකුණද්දී advertisementවලට කීයක් වියදම් කරනවාද කියලා. මේ වාගේ දේවලින් අපි advertisement එකකුත් බලාපොරොත්තු වෙනවා. අපේ ක්‍රිකට් කණ්ඩායම ලෝකයට ගිහින් දිනලා ආපු හැටියේ ලංකාවට ලොකු advertisement එකක් ආවා. 'ලංකාවේ තේ' කිව්වාම ලොකු advertisement එකක් ආවා. ඉතින්, මේවා ගැනයි කල්පනා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි value addition. මෙහි value additionවලට හෙවත් වටිනාකම එකතු කිරීම සම්බන්ධයෙන් ලොකු සහනයක් දීලා තිබෙනවා. මගේ ආසනයේ තමයි ලංකාවේ solid tyres හදන ලොකුම කම්හල තිබෙන්නේ. ඒ තමයි, ලෝඩ්ස්ටාර් කියන කොම්පැනිය. ලෝකයටම ටයර් ටික දෙන්නේ එතැනින්. ඉස්සර අපි රබර් විකුණුවා. දැන් රබර්වලින් ගල් ටයර් හදලා විකුණනවා. මා යිවර ඇමති විධියට ඉන්න කොට මාළු fillet එකක් හදලා දීලා කිලෝ එකකට ලංකාවේ සල්ලිවලින් රුපියල් 13,000ක්, 14,000ක් විතර ගත්තා. සමහර විට රුපියල් 25,000කුත් ගත්තා කිලෝ එකකට. බලන්න කොහොමද කියලා value addition එක. මෙහි Value additionවලට සහන දීලා තිබෙනවා. අප කවුරු මොනවා කිව්වත් මේ විධියට ආර්ථිකය කළමනාකරණය කරන්න ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට ශක්තියක් තිබෙනවා කියා මම හිතනවා. කළමනාකරණය හොඳයි. වැඩ පිළිවෙළ හොඳයි. අතිගරු ජනාධිපතිතුමා ඉන්නවා. අනෙක් පැත්තෙන්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් දැන් මේ ප්‍රදේශ කොහොම හරි සුන්දර කරනවා. දැක්කම ආසා හිතෙනවා. ඒ වාගේම, නොයෙකුත් නොයෙකුත් ලොකු හෝටල් හැදෙනවා. ඒ හෝටල්වල branches තිබෙනවා ලෝකය පුරාම. Shangri-La Hotel Group එකේ කාමර 5,000ක් තිබෙනවා ලු.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමා, කථාව අවසන් කරන්න.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්පරයක් දෙන්න. හෝටල් කාමර 5,000ක් තිබෙනවා ලු. එතකොට ඒ අයට පුළුවන් එහේ සංචාරකයන් මෙහේට එවන්න. මෙය positive විධියට හෙවත් ධනාත්මකව දකින්න ඕනෑ, හැම එකකටම කෑ ගහන්නේ නැතිව. බඩු මිල වැඩියි, අරවා වැඩියි, මේවා වැඩියි, අසහනය වැඩියි, රස්නය වැඩියි කියලා කෑ ගහනවා. මේ දවස්වල රස්නය වැඩියි කියලා ආණ්ඩුව වටිටන්න හදනවා. දැන් කාලයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 35ක් 38ක් විතර වෙනවා. මේකත් ප්‍රශ්නයක්ද රටට, අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමනි? ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ කාලයේ BOI එකේ සිටියා. ඔබතුමා කොච්චර හොඳට වැඩ කළාද. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මේවා ගැන කථා කළාට එතුමාගේ සංකල්පවලින් තමයි තවමත් ඔය ඇඟලුම් කර්මාන්ත ටික දුවන්නේ. ඒවා හොඳට මතක තියාගන්න. එදා හිටපු ඒ දක්ෂයනුත් අද අප ළඟ ඉන්නවා. ඒ වාගේම, සමාජවාදයේ පිතෘවරුත් අප ළඟ ඉන්නවා. මේක මිශ්‍ර ආණ්ඩුවක්. මේකට එහාට මෙහාට යන්න දෙන්නේ නැහැ. එක පැත්තකට වැඩිපුර යද්දී අනෙක් පැත්තෙන් අදිනවා. මේ වාගේ balance

එකේ යන ආණ්ඩුවක් කිසි දවසක වැටෙන්නේ නැහැ කියන එක මතක් කරන්න ඕනෑ. අර එළුවාගේ මොකක්දෝ එක වැටෙන කල් බලා ඉන්නවා වාගේ, 'අද වැටෙයි, හෙට වැටෙයි, අනිද්දා වැටෙයි' කියලා හිතුවාට ආණ්ඩුව වැටෙන්නේ නැහැ. අපි මේ ගමන යනවා. ආර්ථිකය සංවර්ධනය කරනවා. තැනට උචිත විධියට වැඩ කරනවා. දෙමළ කියමනක් තිබෙනවා, එක රිටි පාරක් ගහලා වැරදුණොත් රිටි පහරවල් 1,000ක් ගහලාවත් ඒ තැන සොයා ගන්න බැහැ කියලා. අපි දැන් වරදින්න රිටි පාරවල් ගහන්නේ නැහැ.

හරි පාරේ ගිහිල්ලා ඕනෑම ප්‍රශ්නයක් ආවාම ඒ ප්‍රශ්නය කළමනාකරණය කරලා, අර්බුද කළමනාකරණය කරලා ගමනක් යන්න අපේ ජනාධිපතිතුමාට ශක්තිය තිබෙනවාය කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.53]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ෆිලික්ස් පෙරේරා අමාත්‍යතුමා කිව්වා මේ රටට ගැලපෙන විධියට, උචිත විධියට මේ රටේ සංවර්ධන මාර්ගය තෝරා ගෙන තිබෙනවා කියලා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(*மாண்புமிகு ஃபிலிக்ஸ் பெரேரா*)
(The Hon. Felix Perera)
තෝරා ගන්න ඕනෑ කියලා කිව්වේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)

තෝරා ගත යුතුයි කියලා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ ආණ්ඩුව රටට උචිතම මාර්ගය තෝරා ගෙන තිබෙනවා. ඒ තමයි මේ රටේ ආර්ථිකය දියුණු කිරීමේ ප්‍රධානතම උපාය මාර්ගයක් හැටියට ශ්‍රී ලංකාව මැකාවූ දූපත වාගේ කැසිනෝ ක්‍රීඩාවේ මූලස්ථානයක් බවට පත් කරන්න; මධ්‍යස්ථානයක් බවට පත් කරන්න; ලෝකයේ කැසිනෝ කේන්ද්‍රස්ථානය බවට පත් කරන්න කටයුතු කිරීම. ලෝකයේ ඉන්න ප්‍රධාන පෙළේ කැසිනෝ ව්‍යාපාරිකයන් සඳහා විශාල සහන ලබා දීලා, රටේ තිබෙන වටිනාම ඉඩකඩම් ලබා දීලා ශ්‍රී ලංකාව කැසිනෝ ක්‍රීඩාව සඳහා ආකර්ෂණීය ස්ථානයක් බවට පත් කරන්න කටයුතු කරනවා. හැබැයි, මේ රටේ පාලනය භාර ගන්න කොට මහින්ද චින්තන ඉදිරි දැක්මෙන්, මහින්ද චින්තනයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ එතුමාගේ ආණ්ඩුවේ සගයන් මේ රටේ ජනතාවට ලබා දුන් පොරොන්දුව තමයි මේ රට ධර්මද්වීපයක් කරනවාය කියන එක. ධර්මද්වීපයක් කරනවා කියලා පාලනය භාර ගත් රාජපක්ෂ ආණ්ඩුව, රාජපක්ෂ පවුලේ ආණ්ඩුව අද වන කොට ප්‍රකාශිතවම මේ රට කැසිනෝ දීපයක් බවට පත් කරන්න ස්ථිරසාර පියවර අරගෙන තිබෙනවා. එහෙම කරනවාමයි, ඒක අපේ ප්‍රධාන උපාය මාර්ගයක් කියලා ගරු සරත් අමුණුගම ඇමතිතුමා දිගින් දිගට ස්ථිරසාරව කියනවා. එහෙම නම් මේ ආණ්ඩුව මේ රට ධර්මද්වීපයක් කරනවාද, යහපත් මාර්ගයන් ඔස්සේ මේ රටේ ආර්ථික සංවර්ධනය ඇති කරනවාද, එහෙම නැත්නම් ආචාර ධර්ම පිළිබඳ වටිනාකමක් දෙන්නේ නැති, සංස්කෘතියක් පිළිබඳ ඉතිහාසයක් නැති, ලෝකයේ අවුරුදු 150ක, 200ක, 250ක ඉතිහාසයක් තිබෙන වාණිජ මධ්‍යස්ථාන වශයෙන් භාවිත වන හුදු නගර රාජ්‍යයන් විසින් අනුගමනය කරන උපාය මාර්ග අනුගමනය කරනවාද කියන කාරණය ගැන අපට දැන් තේරුම් ගැනීමට අවස්ථාව ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල කොළඹ නගරය අලංකාර කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව නොවැම්බර් මාසයේ පවත්වනවාය කියන බලාපොරොත්තුව ඇතුව කඩිනමින් කොළඹ නගරය අලංකාර කරනවා. නගරයේ තිබෙන දැන්වීම් පුවරු කඩිමුඩියේ ඉවත් කරනවා. නගරයේ ඩිජිටල් දැන්වීම් පුවරු සවි කරන්නට ආණ්ඩුවේ හිතමිතුරන්ට කොන්ත්‍රාත් ලබා දීලා තිබෙනවා. හැබැයි, අපේ රටේ දේශීය ව්‍යාපාරිකයෝ ඉතා අසීරුවෙන් තමන් කර ගෙන යන දැන්වීම් කර්මාන්තය තුළ වසරකට දෙකකට පෞද්ගලික ස්ථාන බදු අරගෙන, ඒ වාගේම තමන්ගේ සේවාදායකයන්ගෙන් මුදල් අරගෙන, කොන්ත්‍රාත් අත්සන් කරලා තමයි ඒ දැන්වීම් පුවරු සවි කරලා තිබෙන්නේ. කිසිම අවහිරයක් නැති, නිසි ප්‍රමිතියට තිබෙන නීත්‍යානුකූල දැන්වීම් පුවරු පවා බුල්ඩෝසර් යන්ත්‍ර යොදලා ඉවත් කිරීමේ ඉතාම නරක පූර්වාදර්ශයක් තමයි අද තිබෙන්නේ. කොළඹ නගරය ලස්සන කිරීම හොඳයි. හැබැයි, ඩිජිටල් දැන්වීම් පුවරු සවි කිරීමට තමන්ට හිතවත් ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුට අවස්ථාව සලසා දෙමින් දැන්වීම් පුවරු හරහා ව්‍යාපාර කටයුතු කරන ව්‍යාපාරිකයන් විශාල ප්‍රමාණයකගේ ව්‍යාපාර සහ ඒ අනුව ජීවත් වන දහස් ගණනක් සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාව අද සම්පූර්ණයෙන් නැති කරලා තිබෙනවා. ඒ නිසා අද ආණ්ඩුවට ප්‍රමුඛතාව පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

කිහිප දෙනෙකුගේ යහපත උදෙසා, කිහිප දෙනෙකුගේ ලාභය උදෙසා, රටේ විශාල පිරිසකගේ රැකියා සහ නීත්‍යානුකූල කර්මාන්ත අනතුරකට පත් කිරීමේ ප්‍රවණතාවක් මතු වී තිබෙනවා. ඒ වාගේම කොළඹ නගරය ලස්සන කරන අතරතුර කොළඹ නගරයේ කුණු මීතොටමුල්ලට ගෙන ගිහින් දමනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීතොටමුල්ලේ මහා කුණු ගොඩක් තිබෙනවා. දිගින් දිගටම මේ කුණු ගොඩ විශාල වෙනවා. ඒ වාගේම ලෝකයේ කුණු කළමනාකරණය පිළිබඳව තිබෙන මූලික ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා. ඒ පිළිබඳව තිබෙන සෞඛ්‍ය ආරක්ෂිත විධිවිධාන කිසිවක් අනුගමනය කරන්නේ නැහැ. මේ කුණු නිසි ආකාරයට කළමනාකරණය කර, ඒවායින් ඵලප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කරන්නේ නැහැ. එක්කෝ විදුලිය නිෂ්පාදනය කරන්න, එසේ නැත්නම් වෙනත් අමු ද්‍රව්‍යයක් නිෂ්පාදනය මේවා යොදා ගන්න පුළුවන්. නමුත් එසේ කරන්නේ නැහැ. මීතොටමුල්ලේ කුණු ගොඩ නිසා දස දහස් ගණනක් අහිංසක මිනිසුන්ගේ ජීවිත අද අනතුරට පත් වෙලා තිබෙනවා; ඒ ප්‍රදේශය තුළ අද අප්‍රසන්නතාවක් ඇති වෙලා තිබෙනවා; රෝග බියක් ඇති වෙලා තිබෙනවා; ඒ ප්‍රදේශයේ ජනතාවගේ ජීවිත කඩා වැටී තිබෙනවා.

මේ දුක දිගින් දිගටම ඉවසා ගන්නට බැරි කොළොන්නාව ප්‍රදේශයේ ජනතාව මේ කුණු ගොඩට විරුද්ධව එකමුතුව සටන් කරන අවස්ථාවේදී මේ ප්‍රශ්නය සාකච්ඡාවෙන් විසඳා ගන්නට තිබුණු අවස්ථාව ආණ්ඩුවේ හිතුවක්කාර, උද්ධච්ච ප්‍රතිපත්තිය නිසා සම්පූර්ණයෙන්ම බිඳ වැටී තිබෙනවා. දැන් අද මොකක්ද වෙලා තිබෙන්නේ? ආණ්ඩුව කිව්වාම ඕනෑම දෙයක් කරන, හිතක් පපුවක් නැති, ආණ්ඩුවට කඩේ යන පොලිස් නිලධාරීන් භාවිත කරලා මීතොටමුල්ලේ කුණු ගොඩට එරෙහිව තමන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කර ගන්නට, තමන්ට ජීවත් වීමට ඇති අයිතිය වෙනුවෙන් සටන් කරන උපවාසකරුවන් බලහත්කාරයෙන් ඵලවන්නට කටයුතු කර තිබෙනවා. ආණ්ඩුවට හමුදා බලය තිබෙනවා; පොලීසියේ බලය තිබෙනවා. ඒවායේ ඉන්න සමහරු ආණ්ඩුව කියන ඕනෑම දෙයක් කරන්නට සූදානම්. දුක් විඳින, පීඩාවට පත් වුණු, ඒ අසරණ මිනිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැයි කියන කාරණය මේ ක්‍රියාදාමය තුළින් අපට පෙනී යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ කුණු කොළොන්නාවට අර ගෙන ගිහින් මීතොටමුල්ලේ ගොඩ ගහලා,

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කිසිම කළමනාකරණයක් කරන්නේ නැතිව මේ කරන්න යන්නේ කුමක්ද කියන කාරණය ගැන අපට ප්‍රශ්න කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම ආර්ථික සංවර්ධනය ගැන කථා කරද්දී එක තැනක් ලස්සන කරලා තවත් තැනක මිනිසුන්ට දුකක් පටවනවා නම් ඒක සංවර්ධනයක් වන්නට බැහැ. අප දන්නවා, සමහර කාන්තාවන්ගේ -හැමෝගෙම නොවෙයි- මුහුණ දිහා බැලුවොත් මුහුණට මේකප් කරලා, පින්තාරු කරලා, පාට පාට කරලා හැඩ කර තිබෙනවා. ඉතිරි අහපසහ දිහා පොඩ්ඩක් පරිස්සමෙන් බැලුවොත් ඒ උනන්දුව ඇත්තේ නැහැ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ නගරයේත් අන්න එහෙම තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. කොළඹ නගරය පාට කරනවා. මේ පාර්ලිමේන්තුව අවට පාට කරනවා; ලස්සන කරනවා. හැබැයි කොළඹ නගරයේ තිබෙන කුණු ටික මීතොටමුල්ලේ අහිංසක මිනිසුන්ගේ හිස මත පටවනවා. එහේ ඉන්න දරුවන්ට අද පාඩම් කරන්නට බැහැ. රෝග බිය ඇති වෙලා. ගඳ ගහනවා. ජීවත් වන්නට බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. එම නිසා රාජ්‍ය නායකයන්ට කොළඹ ලස්සන කරලා පෙන්වන්න ඒ දුක අර අහිංසක මිනිස්සු විඳින්න ඕනෑද කියන ප්‍රශ්නය - [බාධා කිරීමක්]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

අංග සම්පූර්ණයි. භාගෙට ගාලා නැහැ. බොහොම හොඳට තිබෙනවා. මෙතුමා කියන එක වැරදියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ලස්සන වෙන්න ඕනෑ. මුළු ශරීරයම ලස්සන වන්නට ඕනෑ. ලස්සනට අඳින්නට ඕනෑ. ලස්සනට පළඳින්නට ඕනෑ. ඉතිරි ඔක්කොම අවලස්සනට තියා ගෙන, අපිරිසිදුව තියා ගෙන මුහුණ විතරක් පාට කරන මහින්ද චින්තන ආර්ථික දැක්මේ ප්‍රශ්නයයි අපට තිබෙන්නේ. [බාධා කිරීමක්]

ගරු අමුණුගම අමාත්‍යතුමනි, මම ඒ උදාහරණය ගත්ත එක ගැන මාත් එක්ක අමනාප වන්නට එපා. ඒ වාගේ උදාහරණයක් ගන්න එක ඒකාධිකාරයක් නොවෙයි. ඒක මෙහි දකුණු පැත්තේ ඉන්න අයට විතරක් තිබෙන නිදහසක් නොවෙයි. අපටත් ඒ ගැන කථා කරන්නට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් සංවර්ධනයේ ප්‍රතිඵල අපේ ජනතාවට ලැබිලා තිබෙනවාය කියා ජනාධිපතිතුමා ඊයේ සඳහන් කළා. අපේ රටේ පාරවල වර්ධනයක් තිබෙනවා. අප නැහැයි කියන්නේ නැහැ. අපේ රටේ පසු ගිය වසර කිහිපය තුළ මාර්ග පද්ධතියේ දියුණුවක් ඇති වෙලා තිබෙනවා. හැබැයි ප්‍රධාන පාරවල් දියුණු වනකොට අපේ රටේ අතුරු පාරවල් ටික තවම හරියට දියුණු වෙලා නැහැ.

මාර්ග සංඥා හරියට ඉදි වෙලා නැහැ. ඒ වාගේම අපේ රටේ රියැදුරන්ට ලැබෙන පුහුණුව පිළිබඳව බැරෑරුම් ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ රියැදුරන්ගේ විනය පිළිබඳව බැරෑරුම් ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ නීතිය, සාමය ආරක්ෂා කරන පොලිස් නිලධාරීන් ඒ නීතිය ආරක්ෂා කරන ආකාරය ගැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ආදරබර පියෙකු හැටියට එතුමා තමන්ගේ දරුවන්ට සවන් දෙන කෙනෙක්; දරුවන්ගේ යාළුවන්ට සවන් දෙන කෙනෙක්. පසු ගිය දවස්වල මේ රටේ ලැම්බෝගිනිවලට, ෆෙරාරිවලට, ඇස්ටන් මාර්ටින්වලට බදු අඩු කළාම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

සුඛෝපභෝගී අධිවේගී මෝටර් රථ අරගෙන ආවා. අපි දන්නවා, රට ඇතුළේ එවැනි මෝටර් රථ සිය ගණනක් තිබෙනවාය කියන කාරණය. හැබැයි මේ අයට මේ මෝටර් රථ කොළඹ නගරය තුළ පදවන්න, ප්‍රධාන මාර්ග තුළ පදවන්න අද රටේ තිබෙන නීතිය අනුව හැකියාවක් නැහැ. සමහර වෙලාවට විවිධ ක්‍රමවලින්, අයුතු ලෙස උපයා ගත් ධනයෙන් වාගේම අයුතු ලෙස අඩු කරපු බදුවල සහාය මත මේ වාගේ මෝටර් කාර් අරගෙන ආපු, racing cars අරගෙන ආපු, ෆෙරාරි, ලැම්බෝගිනි, ඇස්ටන් මාර්ටින් අරගෙන ආපු කට්ටියට දැන් අපේ පාරවල්වල තිබෙන වේග සීමාව මදියි. ඒ නිසා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තමන්ගේ දරුවන්ට, දරුවන්ගේ දරුවන්ට සවන් දීලා තිබෙනවාය කියන කාරණය අපිට පෙනෙනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක්.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග අනුව අතිගරු ජනාධිපතිතුමා ගැන සඳහන් කරලා කථා කරන්න බැහැ. පසු ගිය අය වැය ලේඛනයට අනුව ලැම්බෝගිනි ගෙන්වන්න බැහැ. එතුමා කියන එක වැරැදියි. සම්පූර්ණ අසත්‍යයක් කියන්නේ. තමුන්නාන්සේ පසු ගිය අය වැය ලේඛනය අරගෙන කියවලා බලන්න කෝ අය වැය ලේඛනයේ කොතැන ද ලැම්බෝගිනි ගෙනෙනවාය කියලා තිබෙන්නේ කියලා? පසු ගිය අය වැය ලේඛනය අනුව පුංචි go-karts විතරයි ගෙනෙන්න පුළුවන්. ලැම්බෝගිනි ගෙන්වන්න පුළුවන් කියලා තිබෙන්නේ කොතැනද කියලා තමුන්නාන්සේ පුළුවන් නම් කියන්න. මම ඔබතුමාට අභියෝග කරනවා, අතිගරු ජනාධිපතිතුමා මුදල් ඇමති හැටියට පසු ගිය අය වැය ලේඛනයෙන් ලැම්බෝගිනි ගෙන්වන්න පුළුවන් කියලා තිබෙන්නේ කොහේද කියලා පුළුවන් නම් කියන්න කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, -

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අසත්‍ය දේවල් කියන්න එපා. මේ සභාව නොමඟ යවන්න එපා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා, ඒ කොටස ස්ථාවර නියෝගවලට පටහැනියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කොහොමද ස්ථාවර නියෝගවලට පටහැනි වෙන්නේ?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්ථාවර නියෝගවලට පටහැනියි. ඒ කරපු ප්‍රකාශය ස්ථාවර නියෝගවලට පටහැනියි. එම නිසා එම කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න නියෝග කරනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ මොහොතේ දරන තනතුරට මගේ ගෞරවයක් තිබෙනවා. ඔබතුමා නියෝගයක් දුන්නාම ඒ නියෝගය අභියෝග කරන එක මගේ සිරිත නොවෙයි. මා ලබා තිබෙන පුහුණුව ඒකයි. මේ රටේ සමහර පුද්ගලයෝ ඉන්නවා, ඒ අය රටේ ජනතාව ගැන කල්පනා කරන්නේ නැහැ. හැබැයි තමන්ගේ දරුවෝ ගැන, ඒ දරුවන්ගේ යාළුවන්ගේ උනන්දුව ගැන, ඔවුන්ගේ අයිතිවාසිකම් ගැන උනන්දු වන අය පසු ගිය කාලයේ ලැම්බෝගිනි, ෆෙරාරි, ඇස්ටන් මාර්ටින් සිය ගණනක් මේ රටට අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම තවත් නම නොකියපු, සාමාන්‍ය තත්ත්වය යටතේ ලංකාවට අරගෙන එන්න අසීරු වුණු, මෝටර් රථ විශාල ප්‍රමාණයක් අරගෙන ඇවිල්ලා තිබෙනවා. පැයට කිලෝමීටර් 150ට, 200ට, 250ට වේගයෙන් යන්න ඒ රථවල තිබෙන ජවය මේ රටේ බස් එකේ යන, කෝච්චියේ යන අහිංසක, දුප්පත් මගියාට පෙන්වන්න, ඒකේ තිබෙන රසය ගන්න දැන් අපේ රටේ තිබෙන මාර්ග නීති ගැළපෙන්නේ නැහැ කියන කාරණය මේ රටේ තීරණ ගන්න බලධාරීන් කල්පනා කරලා තිබෙනවා. අපිට පෙනෙනවා, රටේ විධායකයේ උඩ ඉන්න අය වාගේම විධායකයේ පහළ මට්ටමේ ඉන්න පුද්ගලයෝ මේ රටේ මාර්ග නීතිවල තිබෙන වැදගත්ම කාරණා ගැන සලකන්නේ නැති බව. මේ රටේ ජනතාවගේ සුරක්ෂිතතාව උදෙසා, පදිකයින්ගේ සුරක්ෂිතතාව උදෙසා, වේගයෙන් යන්න බැරි ත්‍රී වීලර් ඒකේ, මෝටර් සයිකලයේ, කරත්තේ යන මිනිසුන්ගේ සුරක්ෂිතතාව උදෙසාත් තිබෙන මාර්ග නීති හිතුවක්කාර ලෙස වෙනස් කරන්න ඒ අය අවශ්‍ය උල්පන්දම් දෙනවා. ඒ පිළිබඳව පිඹුරු පත් සකස් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මාර්ග තිබෙන්නේ sports cars පාවිච්චි කරන අයට විතරක් නොවෙයි. මේ රටේ මාර්ග තිබෙන්නේ සාමාන්‍ය දුප්පත් අහිංසක මිනිසුන්ට.

මේ රටේ මාර්ග තිබෙන්නේ කරත්තයේ යන මිනිසුන්ට; මෝටර් සයිකලයේ යන මිනිසුන්ට; ත්‍රී වීල් රථයේ යන මිනිසුන්ට. අධික වේගයෙන් යන්න බැරි වුණත්, තමන්ගේ ජීවිතයේ මූලික අවශ්‍යතාවලට ගමන් බිමන් යන අහිංසක මිනිසුන්ටයි මේ රටේ මාර්ග තිබෙන්නේ. ඒ මිනිසුන්ගේ සුරක්ෂිතතාව ගැන හිතන්නේ නැතිව මේ රටේ මාර්ගවල වේගය පිළිබඳව සීමා ඉවත් කරන්න කෙනෙක් කල්පනා කරනවා නම්, -ඉවත් කිරීම පැත්තකට දමන්න - ඒ කල්පනා කරන්නේ මේ හුදු පෞද්ගලික ස්වභාවය වන තමන් ළඟ, තමන්ගේ දරුවන්ගේ ළඟ, දරුවන්ගේ යාළුවන්ගේ ළඟ තිබෙන අධික වේගයෙන් යන්න පුළුවන් මෝටර් රථවල රඟ, ජවය ජනතාවට පෙන්වන්න බැරිකමකට තිබෙන දුක් වේදනාව නිසා විතරයි කියලා ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ මා කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මට මොහොතක් දෙනවා නම්,-

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම මගේ වෙලාව දෙන්නේ නැහැ. ගරු ඇමතිතුමාගේ කථාවේදී එතුමාට පිළිතුරු දෙන්න පුළුවන්.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අපි අලුත් මාර්ග පද්ධතියක් හදලා තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමාට බාධා කරන්න එපා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේක දෙ වන වර කියවීමේ විවාදය. එතුමා ගැන කිව්වා නම්, එතුමාට මැදිහත් වන්න පුළුවන්. මම හොඳාකාරවම දන්නවා, එතුමාට ෆෙරාරි ඇත්තේත් නැහැ, එතුමාට ඇස්ටන් මාර්ටින් ඇත්තේත් නැහැ, එතුමාට ලැම්බෝගිනි ඇත්තේත් නැහැ කියලා. එතුමාගේ දරුවෝ මේ වාගේ මෝටර් රථ පාවිච්චි කරන්නේත් නැහැ. එතුමාගේ දරුවන්ගේ යාළුවන්ට මේ වාගේ මෝටර් රථ ඇත්තේත් නැහැ. ඒ නිසා අධි වේගයෙන් යන්න වේග සීමා ඉවත් කරන්න කියලා අමුණුගම ඇමතිතුමා ඉල්ලන්නේ නැහැයි කියන කාරණයත් අපි හොඳාකාරවම දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නව මාර්ග පද්ධතියක් තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නව මාර්ග පද්ධතියක් තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ ඒ මාර්ගවල ගමන් කරන මෝටර් සයිකලයේ යන පුද්ගලයන්ගේ, ත්‍රී වීල් රථයේ යන පුද්ගලයන්ගේ, සාමාන්‍ය කාර් රථයේ යන

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

පුද්ගලයන්ගේ, ඒ වාගේම පදිකයන්ගේ ජීවිතවල ආරක්ෂාව ගැන වග කියන්නේ කවුද කියන එකයි. මේ පාරවල් තිබෙන්නේ ඔය අධික වේගයෙන් යන මෝටර් රථවල යන අයට විතරද? ඔය පාරවල් තිබෙන්නේ මේ රටේ අහිංසක දුප්පත් ජනතාවට යන්න නොවෙයිද? ඕක තමයි ප්‍රශ්නය. ඕක තමයි මේ රජයේ තිබෙන අවුල. ඕක තමයි මේ රටේ ජනතාවගේ ප්‍රමුඛතාව පිළිබඳව තිබෙන ප්‍රශ්නය. පාරවල් හදන්න. ඒ පාරවල්වල ගමන් කරන මිනිසුන්ගේ සුරක්ෂිතතාව තහවුරු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශේෂයෙන් මා තව එක කාරණයක් කියන්න කැමැතියි. පසු ගිය දවස්වල අපේ රටේ විදේශගත ශ්‍රමිකයන් පිළිබඳව විශාල උනන්දුවක් ඇති වෙලා තිබුණා. ඒ විදේශගත ශ්‍රමිකයෝ ඩොලර් බිලියන හතක්, අටක් වාගේ ප්‍රමාණයක් අපේ රටේ ආර්ථිකයට එකතු කරනවා. ආණ්ඩුවේ විශේෂ දක්ෂකමක් නැති වුණත් මේ රටේ අමාරු - දුෂ්කර- අවස්ථාවල ආර්ථිකය අරගෙන ගියේ මේ විදේශගත ශ්‍රමිකයෝ තමන්ගේ ජීවිත පරිත්‍යාගයෙන්, රුධිරය පූජා කරලා, දහඩිය පූජා කරලා, තමන්ගේ පවුල කැප කරලා රට වෙනුවෙන් එවන ඒ අතිවිශාල මුදල් සම්භාරය නිසායි. නමුත් ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව රජය අද දක්වන උනන්දුව ඉතාමත්ම අඩුයි. ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව රජය අද දක්වන ඒ කැපවීම ඉතාමත්ම අල්පයි. නමුත් කයිවාරු තිබෙනවා. රිසානා නෆීක් මරණ දඬුවමට මුහුණ දීපු අවස්ථාවේ ඒවා ගැන හොයා බලන්නේ නැතිව "රිසානා නේ, ඈත පළාතක ගැහැනු ළමයෙක්, ඇය මැරුණාට අපට මොකද" කියන හුදු පටු ආකල්පය මත හුදු වාසිතකා කටයුතු කරලා ඒ දරුවා බේරා ගන්න අපට බැරි වුණා. ඒ ගැන අප ලජ්ජා වන්න අවශ්‍යයි. හැබැයි මැයි මාසයේ හත්වැනි දා අප ඒ ගැන විවාදයක් පවත්වනවා. ඒ ගැන වග කිව යුතු පුද්ගලයින් කවුද කියලා එහිදී හෙළිදරව් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙන කොට ඒ වාගේම බරපතළ තවත් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. එනම් උතුරු කොරියාවේ හට ගෙන තිබෙන ප්‍රශ්නයයි. මොකද උතුරු කොරියාව ඇමෙරිකාවට සහ දකුණු කොරියාවටත්, ඔවුන්ගේ මිත්‍ර රටවලටත් යම් ආකාරයකට ආක්‍රමණශීලීව කරන තර්ජනයත් එක්ක අද යුද උණුසුමක් ඇති වෙලා තිබෙනවා. අපේ ප්‍රාර්ථනය යුද්ධයක් දක්වා මේ තර්ජනය යන්න එපා කියලායි. හැබැයි අපි ප්‍රායෝගිකව දන්නේ නැහැ, කොතැනින් මෙය නතර වෙයිද කියලා. මේ ගැන අද ලොකු ගැටලුවක් මතු වෙලා තිබෙනවා. දකුණු කොරියාවේ සිටින අපේ ශ්‍රමිකයන් ඔවුන්ගේ ආරක්ෂාව ගැන බැරෑරුම් ලෙස කල්පනා කරනවා. ඔවුන් ලංකාවට දුරකථන ඇමතුම් දීලා අහනවා, අපි ගැන ඇත්ත තත්ත්වය මොකක්ද, මේ වෙන්න යන්නේ මොකක්ද, මාධ්‍යවල තිබෙන කරුණු ඇත්තද, යම් ආකාරයකට යුද්ධයක් හෝ ප්‍රහාරයක් ඇති වුණොත් එයට මුහුණ දෙන ආකාරය කුමක්ද කියන කාරණා ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අනෙක් අතට තව ගැටලුවක් තිබෙනවා. අපේ රටේ සිටින ඔවුන්ගේ ඥාතීන් අපෙන් විමසනවා, ගත යුතු පියවර කුමක්ද, ඔවුන් ලංකාවට ගෙන්වා ගත යුතුද කියලා. යුද්ධයක් ඇති වුණොත් ඇති වන දුෂ්කරතාවන් ගැන ඔවුන් කල්පනා කරනවා. ඒ නිසා දකුණු කොරියාවේ සිටින අපේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට තිබෙන තත්ත්වය, ඔවුන්ට ඇති අනතුර, ඒ අනතුරේ මට්ටම සහ යම් ආකාරයකින් යුදමය තත්ත්වයක් ඇති වුණොත් ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් රජය ගන්නා වූ පියවර පිළිබඳව සැබෑ ලෙසම පැහැදිලි හා නිශ්චිත පිළිතුරක් ලබා දෙන්නට රජය කටයුතු කළ යුතුව තිබෙනවා. එහෙම නැතිව අපි හුදු ආරක්ෂාව ගැන බලා ගන්නම් කියලා කියන එක ජනතාව විශ්වාස කරන්නේ නැහැ. මොකද "අපි රිසානා නෆීක් බේරනවා, රිසානා නෆීක් බේරෙන්න යන්නේ, ලබන සතියේ නිදහස් වනවා" කියලා රජය ජනතාවට අසත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළා.

අද සවුදි අරාබියේ විතරක් නොවෙයි, අනෙකුත් රටවල්වලත් ඉන්නා ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව ගැනත් දක්වන උනන්දුව ඉතාම අල්පයි. එවැනි තත්ත්වයක් තුළ "අපි බලා ගන්නම්" කියලා දකුණු කොරියාවේ ඉන්නා ශ්‍රමිකයන් සම්බන්ධයෙන් කියන එක පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. ඔවුන් මුහුණ දීලා තිබෙන අනතුරේ තත්ත්වය ගැන නිසි තක්සේරුවක් කරලා, ඔවුන් වාගේම ලංකාවේ සිටින ඔවුන්ගේ ඥාතීන්ද දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ඉදිරිපත් කළ පනත් කෙටුම්පත් පිළිබඳව මා විශේෂයෙන්ම කිව යුතු තවත් කාරණයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියම ඉතාම ප්‍රාථමික, ඒවායේ තිබෙන මූලධර්ම සපුරා කඩ කරපු, පාර්ලිමේන්තු සම්ප්‍රදායයන්ට නොගැළපෙන ක්‍රියාවලියක්. අපි ඒවා මීට කලින් පෙන්වා දුන්නා. ඒ නිසා ඒ දේවල් ගැන නැවත නැවත කියන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් එක කාරණයක් තිබෙනවා. එකම එක ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් මේ මොහොතේ වුණත් මේ සම්බන්ධව පිළිතුරක් බලාපොරොත්තු වනවා. මේ පනත් කෙටුම්පත් සියල්ලම අධික ලෙස ප්‍රමාද වුණු බව ඔබතුමා පිළිගන්න අවශ්‍යයි. ඒවා අන්තිම මොහොතේ ඉදිරිපත් වුණේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(*மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம*)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි,-

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)
මම ඔබතුමාගෙන් ප්‍රශ්නය අහන්නම්. ඔබතුමා ඊට පස්සේ උත්තර දෙන්න.

ඒ ප්‍රමාද වීමට වග කිව යුතු පුද්ගලයෝ කවුද? නිසි වෙලාවට පනත් කෙටුම්පත් සකස් කරලා, ඒවා ගැසට් කිරීම ආදී අවශ්‍ය කරන නීත්‍යානුකූල පියවර ගැනීම ප්‍රමාද කරපු පුද්ගලයෝ කවුද? එවැනි අධික බරපතළ, ලජ්ජා සහගත ප්‍රමාදයක් ආණ්ඩුවට අත් කරපු ඒ නිලධාරීන් සම්බන්ධව ඔබතුමා ගන්නා පියවර කුමක්ද කියලා පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(*மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம*)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, එතැන සිද්ධ වුණේ මේකයි. මේ පනත් කෙටුම්පත් ඔක්කෝම අපි Consultative Committtee එකේත් සාකච්ඡා කරලා පාර්ලිමේන්තුවේ සභාගත කළා. ඒ අවස්ථාවේදී මගේ හිතේ පනත් කෙටුම්පත් 11ක් පිළිබඳව අභියෝග ඉදිරිපත් කරලා තිබුණා සුප්‍රීම් උසාවියේ. එතකොට මෙහේ තිබෙන්නේ pre -legislative review. ඒ විධියේ අභියෝගක් ඇති වුණ නිසා, ඒ අභියෝග පිළිබඳ තීරණය - Determination - එන තුරු අපට ප්‍රමාද වන්න සිද්ධ වුණා. මා හිතන හැටියට ඒ Determination එක අපට ලැබුණේ දැනට දවස් දෙකකට විතර ඉස්සෙල්ලා. ඒ නිසා අපේ වැඩ සාමාන්‍ය පිළිවෙතට කර ගෙන යන්න බැරි වුණා. සාමාන්‍යයෙන් මේ වාගේ පනත් කෙටුම්පත් විශාල ප්‍රමාණයක් තිබෙන කොට ඒ එකක් නැත්නම් දෙකක් ගැන තමයි ඒ විධියේ අභියෝගයක් තිබෙන්නේ. නමුත් මේ අවස්ථාවේදී හැම එකක් ගැනම අභියෝගයක් තිබුණා. ඒකයි ප්‍රමාද වුණේ. ඒ නිසා මා හිතන්නේ නැහැ, කවුරුවත් හිතාමතා ප්‍රමාද කළ බවක්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දුන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ලැබීමේ ඉඳලා අද දක්වා වූ අවුල ගැනයි. ඒ ගැන ඔබතුමාගේ පැහැදිලි කිරීම ගැන මට ලොකු ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඊට වඩා ප්‍රශ්නයක් තිබෙනවා නේ. ඒ තමයි පාර්ලිමේන්තුව රැස්වන අවසාන සතිය දක්වා මේ පනත් කෙටුම්පත් ගැසට් කිරීම ප්‍රමාද වුණා. ගැසට් කිරීම ප්‍රමාද වුණා. එහෙම ගැසට් කරලා ඊට පස්සේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම ප්‍රමාද වුණා. න්‍යාය පත්‍රයත් ප්‍රමාද වුණා. ඊට පස්සේ අදාළ දවසේ, ඒ අදාළ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබන්න ප්‍රමාද වුණා. ඊට පස්සේ ඒවා මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වලට මධ්‍යම රාත්‍රියත් පහු වෙලා ගිහින් දුන්නා. සමහර විට ගිහින් දුන්නේම නැහැ. එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. ඔබතුමා කියන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව සම්බන්ධයෙන් වූ ප්‍රමාදයත් අවුලක්. හැබැයි ඊට කලින් වුණු ප්‍රමාදය අනිවාර්යෙන්ම නිලධාරීන්ගේ ප්‍රමාදයක්. ඒ ගැනයි මා ඔබතුමාගෙන් අහන්නේ. එක ගැන ඔබතුමාට පැහැදිලි කිරීමක් නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා නීත්‍යානුකූලව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබුණා. ඉන් පස්සේ ඇත්ත වශයෙන්ම මේවා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට - Legal Draftsmanට- යන්න ඕනෑ. භාෂා තුනෙන්ම පරිවර්තනය කරන්න ඕනෑ. ඒ අවස්ථාවේදී, සාමාන්‍ය අවස්ථාවකට වඩා සංශෝධන විශාල ප්‍රමාණයක් ආවා. සාමාන්‍යයෙන් රටක එදිනෙදා care and maintenance කරනවා නම් සංශෝධන අවශ්‍ය නැහැ. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අය වැය යෝජනාවලින් වෙනස්වීම් සමූහයක්ම යෝජනා කළා. එවිට ඒ සෑම පනත් කෙටුම්පතකටම සංශෝධන ගෙනෙන්න අපට සිද්ධ වනවා. ඒ නිසා මා වග කීමකින් කියනවා, කිසිම අනවශ්‍ය ප්‍රමාදයක් සිද්ධ වෙලා නැහැ කියලා. සිද්ධ වෙලා තිබෙනවා නම් ඒකට හේතුව, මේ ක්‍රමය තුළ අපට විශාල සංශෝධන ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමට සිද්ධ වීමයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි ගරු ඇමතිතුමනි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සරත් අමුණුගම ඇමතිතුමාගේ පැහැදිලි කිරීමත් එක්ක මට තිබෙන්නේ කනගාටුවක් විතරයි.

දැනට මාස ගණනකට කලින් -නොවැම්බර් මාසයේ- තිබුණු විසර්ජන පනත් කෙටුම්පත් විවාදයෙන් පස්සේ, මාර්තු මාසයේ අවසානය වන තුරු මේ පනත් කෙටුම්පත් කරන්නත්, ඊට අදාළ පියවර ගන්නත් කාලය ගත වීම ප්‍රශ්නයක් නොවෙයි කියලා ඇමතිතුමා කියනවා නම්, වර්තමාන ආණ්ඩුවේ කාර්ය පටිපාටිය ප්‍රකාරව ඒක හොඳ නම්, මේ වාගේ පනත් කෙටුම්පත් 21ක කටයුතු කළමනාකරණය කරන්න, ඒවා පිළිබඳව ගෞරවාන්විත ව්‍යවස්ථාදායක ක්‍රියාවලියක් කළමනාකරණය කරන්නට කැපවීමක් නැත්නම් අප ඒ ගැන කනගාටු වෙනවා. ඒ වාගේම, එහෙම වුණාට කමක් නැහැ, පාර්ලිමේන්තුව තුළ අපට තිබෙන බලය හරහා අපි කොහොම හරි මේවා ගොඩ දා ගන්නම් කියලා නිලධාරීන්ට ඔබතුමා පණිවුඩයක් යවනවා නම් ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි. නමුත් ඒ පණිවුඩය රටට හොඳද කියලා ඔබතුමා හදවතින් කල්පනා කරලා බලන්න. මම හිතන්නේ නැහැ, ඔබතුමාට ඇත්ත කථා කරන්න හැකියාවක් තිබෙනවා කියලා. මොකද, එක්කෝ ඔබතුමා ඒ නිලධාරීන්ට ඕනෑවට වඩා භයයි. එහෙම නොවෙයි නම් ඔබතුමාට මෙතැන ප්‍රශ්නයක් තිබෙනවාය කියලා පෙනෙන්නේ නැහැ. එවැනි ප්‍රශ්නයක් තිබෙනවාය කියලා පෙනෙන්නේ නැති එක රටට හොඳ නැති බව කියමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.17]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දහවල් වරුවේ මේ පාර්ලිමේන්තුව තුළ TNA එකේ සම්පන්දන් මන්ත්‍රීතුමා මුස්ලිම් ජනතාව ගැන කථා කළා. ඒ පිළිබඳව වචනයක් කථා කරලා මගේ කථාව පටන් ගන්න ඕනෑ. සම්පන්දන් මන්ත්‍රීතුමන්ලා අද මුස්ලිම් ජනතාව ගැන කථා කරමින් කිඹුල් කඳුළු හෙළනවා.එදා කාත්තන්කුඩි පල්ලියේ 123 දෙනෙකු සිකුරාදා දවසක ආගම කියන කොට ඝාතනය කළා. එදා ඔවුන් වෙනුවෙන් ශෝක යෝජනාවක් ගෙනෙන්නට හෝ, ඒ ගැන වචනයක් කථා කරන්නට හෝ සම්පන්දන් මන්ත්‍රීතුමන්ලාට හැකියාවක්, ශක්තියක් තිබුණේ නැහැ. එදා ප්‍රභාකරන්ගේ අණසකට යටත් වෙලා බොහොම යටහත්ව බලු කුක්කෝ වාගේ තමයි හිටියේ. අද එතුමන්ලා මුස්ලිම් ජනතාව ගැන කථා කරනවා. යාපනයෙන් එළවා දැමූ ලක්ෂයක් පමණ මුස්ලිම් ජනතාව තමන්ගේ ඇඳුම් ටික පොලිතින් මලුවල දා ගෙන මේ පැත්තට ආවා. එහෙම ඉතිහාසයක් තිබුණා. නමුත් අද එතුමන්ලා මුස්ලිම් ජනතාව වෙනුවෙන් කිඹුල් කඳුළු හෙළනවා. අපේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අද මේ රටේ සියලු දෙනාටම නිදහසේ ජීවත් වෙන්න පුළුවන්කමක් ඇති වෙලා තිබෙනවා. මුස්ලිම් ජනතාවට අද විශිෂ්ට ආකාරයෙන් ජීවත් වෙන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ නිසා තමයි එදා විපක්ෂයේ සිටිමින් කෑ ගහලා අපට බාධා කරපු අස්වර් මන්ත්‍රීතුමා අද මේ පැත්තේ ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි අපේ ජයග්‍රහණය.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

දැන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

අතන් පිටකු, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. JANAKA BANDARA *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

එදා මුස්ලිම් ආගමික කටයුතු ඇමති හැටියට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ හිටපු අස්වර් මැතිතුමා අද අපේ ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙකු හැටියට ඉන්නවා. අපි ඒ ගැන සතුටු වෙනවා. ඒක තමයි මේ රටේ තිබෙන වෙනස. ජනාධිපතිතුමා ඇති කළ වෙනස.

[ගරු ලලිත් දිසානායක මහතා]

අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා සූදු ගැන කථා කළා. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ පාලන කාලයේ තමයි මේ සූදු ලංකාවට ගෙනාවේ. ගරු මන්ත්‍රීතුමනි, ආපසු හැරිලා බලන්න. එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව කාලයේ තමයි ජෝසිම් ලංකාවට ගෙනාවේ. අපි නොවෙයි. අද ඒවා දන්නේ නැහැ වාගේ කථා කරනවා. නමුත් ඔබතුමන්ලාට අතීතය අමතක කරන්න බැහැ. ඒ නිසා මේ දේවල් දිහා වැරදි විධියට බලන්න එපා.

ව්‍යාපාරික කටයුතු දියුණු වෙන කොට සමාජය තුළ විවිධ දේවල් ඇති වෙනවා. අපේ රටට සංචාරකයන් විශාල ප්‍රමාණයක් එනවා. සංචාරකයන් කරන ක්‍රීඩා තිබෙනවා. ඔවුන්ට ඒ පහසුකම් ලබා දෙන්න ඕනෑ. අපි මේ කරන්නේ සූදු අන්තුවන් සිටින රටක් බවට මේ රට පත් කරන්න කරන දෙයක් නොවෙයි. ආයෝජකයෙකු මේ රටට ගෙන එනකොට, 'මෙන්න සූදු අන්තුවන් ඔක්කෝම මේ රටට ගෙනෙනවා" කියනවා. එක පැත්තකින් ආයෝජකයන් ගෙනෙන්න කියලා කියනවා. තව පැත්තකින් ආයෝජකයන් නැහැ කියලාත් කියනවා. විවිධ ක්ෂේත්‍රවලට අදාළ ආයෝජකයන් ඉන්නවා. එවැනි එක ආයෝජකයෙකු ආවාට, ඒ ගැන වැරදි කෝණයෙන් තමුන්නාන්සේ වාගේ ඉගෙන ගත් මන්ත්‍රීවරයෙක් කථා කිරීම ගැන මම බොහොම කනගාටු වෙනවා.

ඊ ළඟට එතුමා රටේ නායකයෙක් ගැන කථා කරලා ලැම්බෝගිනි ගැන කිව්වා. ඔබතුමා අය වැය කියවන්න. මම අභියෝග කරනවා, අතිගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අය වැයේ කොතැනකවත් ලැම්බෝගිනි, ෆෙරාරි ගෙන්වන්න බදු සහන දීලා තිබෙනවාද කියලා පෙන්වන්න කියලා. පුළුවන්නම් කියන්න කොතැනද තිබෙන්නේ කියලා? ක්‍රීඩා තරහ සඳහා පුංචි ගෝකාට් විතරයි ගෙන්වන්න පුළුවන්. මෙය වැරදි විධියට මාධ්‍යවල දමමින් ගෝකාට් වෙනුවට ලැම්බෝගිනි ගෙන්වලා තිබෙනවාය කියලා වැරදි අර්ථ කථනයක් දෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එක්සත් ජාතික පක්ෂයට අද එල්ලෙන්න වැල් නැහැ. ඒ නිසා ලැම්බෝගිනියේවත් එල්ලිලා ආණ්ඩුවක් පිහිටුවන්න තමයි ඒ ගොල්ලන් බලන්නේ. නමුත් ඒ විධියට වැරදි මතයක් ජනතාවට දෙන්න එපා කියලා අපි කියනවා. පසු ගිය අය වැයේ කිසිම තැනක ලැම්බෝගිනි ගෙන්වන්නට බදු සහන දීලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම හොඳ සංශෝධනයක් තමයි 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනතට ගෙන එන්නේ. මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත ගෙනැල්ලා හුඟක් කල්. මේ පනත ගෙනෙන වේලාවේදී, එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා "Regaining Sri Lanka" කියලා වැඩ සටහනක් ඇති කර තිබුණා. මේ රටේ රාජ්‍ය සේවයට කවුරුවත් බඳවා ගත්තේ නැහැ. 16/1 චක්‍ර ලේඛයට අනුව කිසි කෙනෙක් බඳවා ගත්තේ නැහැ. රවි කරුණානායක මන්ත්‍රීතුමන්ලා මේ වාගේ උත්සව කාලවලට රජයේ සේවකයාට, මධ්‍යම පාන්තිකයාට අඩු ගණනට බඩු ටිකක් ගන්න තිබුණු සතොස එක රැයෙන් විකුණලා දැම්මා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ලංකා බැංකුව, මහජන බැංකුව වැනි බැංකුවලට විදේශික මිනිස්සු ගෙනැල්ලා ඒවා පෞද්ගලීකරණය කරන්න පිඹුරුපත් සකසා ගෙන හිටියා. නමුත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ එහෙම දේවල් වෙලා නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අදාළ කොන්දේසි දැමීම සඳහායි 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ තුන්වන වගන්තිය අපට සංශෝධනය කරන්න සිද්ධ වුණේ. එහි (ඉ) ඡේදයේ ඇතුළත් සම්බන්ධ කාරණයේදී සියයට 4.5ක ප්‍රමාණයක් තමයි සඳහන් වන්නේ. නමුත් මේ සියයට 4.5 ප්‍රමාණය අදට ගැළපෙන්නේ නැහැ. මේ ප්‍රමාණය අද වැඩි වෙන්න ඕනෑ. මොකද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය අංශයේ ව්‍යාපාරවලට තමන්ගේ ශේෂ පත්‍රය ඇපයට තබා නැත්නම් තමන්ගේ වත්කම්, තමන්ගේ ආදායම් පෙන්වා අද විදේශවලින් ණය ගන්න පුළුවන්. ඒ නිසා රාජ්‍ය ආයතනයක් සඳහා, සංස්ථාවක් සඳහා ඇපවීමකට තිබෙන ඉඩ කඩ - capacity එක- වැඩි කිරීම තමයි මෙතැනදී සිද්ධ වෙන්නේ. මේ සංශෝධනය යටතේ ඒ සියයට 4.5 ප්‍රමාණය සියයට 7 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඉතින් මොකක්ද තිබෙන වෙනස? මේ පනත ගෙනාවේ 2003. අද ආයෝජන ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම COPE එක වැනි කමිටු පිහිටුවීම තුළින් දැඩි මූල්‍ය විනයක් ඇති කර තිබෙනවා. ඒ වාගේම එදා පාඩු ලැබූ රාජ්‍ය ආයතන අද ලාභ ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එහෙම නම් ඒවායේ ව්‍යාප්තිය සඳහා මේ සියයට 4.5 අද සියයට 7 දක්වා වැඩි වීම ඉතාම කාලෝචිත සංශෝධනයක්ය කියන එක අපි කියන්න ඕනෑ.

ඊළඟට 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 3 වන වගන්තියේ (ඊ) ඡේදය සංශෝධනය කෙරෙනවා. එනම් 2006 ජනවාරි මස 1වන දිනයෙන් ආරම්භ වන මුදල් වර්ෂය අවසානයේ මුළු බැරකම් ඇස්තමේන්තු කරන ලද දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 85 නොඉක්මවන බවටත්, 2013 ජනවාරි මස 1වන දිනයෙන් ආරම්භ වන මුදල් වර්ෂය අවසානයේ සියයට 60ක් නොඉක්ම වන බවටත් සහතික වීම. ඒ කියන්නේ, 2003 මුල් පනත ගෙනෙන කොට ඒ ප්‍රමාණය සියයට 85 සිට සියයට 60 දක්වා අඩු වීමකුයි තිබෙන්නේ. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා තිබුණු තත්ත්වය වෙනස්. කලින් කියූ ආකාරයට රාජ්‍ය සේවය කප්පාදු කිරීම, රාජ්‍ය ආයතන විකිණීම, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගතකරණය කිරීම වැනි දේවල් කළේ මේ වාගේ දැඩි කොන්දේසි මතයි. නමුත් අද එහෙම නොවෙයි. අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005 මේ රට භාර ගත්තායින් පස්සේ ඊට වඩා වෙනස් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අද විරැකියාව සියයට 7 සිට සියයට 4 දක්වා අඩු වෙලා තිබෙනවා. අද රාජ්‍ය අංශය විශාල වශයෙන් පුළුල් වෙලා තිබෙනවා. මොකද, අද රාජ්‍ය අංශයේ විශාල සේවක සංඛ්‍යාවක් ඉන්නවා.

පොහොර සහනාධාරය වෙනුවෙන් රුපියල් බිලියන 36කට වැඩි ප්‍රමාණයක් අද වෙන් කර තිබෙනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උතුරු වසන්තය සඳහා අද රුපියල් මිලියන 8,307ක් මේ රජය වෙන් කර තිබෙනවා. ඒ වාගේම රුහුණු උදානය සඳහා රුපියල් මිලියන 2,285ක් වෙන් කර තිබෙනවා. රජරට නවෝදය සඳහා රුපියල් මිලියන 1,735ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම බටහිර නවෝදය වෙනුවෙන් නැත්නම් බස්නාහිර පළාත සංවර්ධනය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 3,068ක් වෙන් කර තිබෙනවා. එහෙම බැලුවාම විශාල මුදලක්. ඒ වාගේම දිවයින පුරා තිබෙන 14,035ක් පමණ වන ග්‍රාම නිලධාරී කොට්ඨාස සංවර්ධනය කිරීම වෙනුවෙන්, ඒවායේ ජීවත් වන සාමාන්‍ය ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම වෙනුවෙන් දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන වෙන් කිරීම රුපියල් බිලියන 6.5 දක්වා වැඩි කර තිබෙනවා. 2000 දී වෙන් කර තිබෙන්නේ රුපියල් බිලියන 4.4යි. එය රුපියල් බිලියන 6.5 දක්වා වැඩි කර තිබෙනවා. මේ විධියට විශාල මුදල් ප්‍රමාණයක් අද මේ රටේ සංවර්ධනය වෙනුවෙන් අපි ආයෝජනය කරනවා. එදා - 2003 - දැඩි කොන්දේසි දාලා, රාජ්‍ය අංශයේ සේවකයින් බඳවා ගන්නේ නැතිව, රාජ්‍ය ආයතන විකුණලා කටයුතු කළ තත්ත්වයක් යටතේයි අර කලින් සඳහන් කළ පරිදි, සියයට 85 සිට සියයට 60 දක්වා ඒ ණය අනුපාතය තියා ගන්න කටයුතු කළේ. නමුත් අද එහෙම නොවෙයි. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව එදා පිහිටුවන කොට සියයට 109ට තිබුණු ණය අනුපාතය අද සියයට 79 දක්වා අඩු කර තිබෙනවා. ඒ යටතේ ප්‍රායෝගිකව කටයුතු කරන්න තමයි මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ. මේ දෙස වැරදි කෝණයකින් බලනවා නම් ඒක වැරදියි. රටේ දරිද්‍රතාව පැත්තෙන් ගත්තොත් 2002 මේ

රටේ දරිද්‍රතාව සියයට 22.7යි. 2006, 2007 වන කොට ඒ ප්‍රමාණය සියයට 15. 2 දක්වා අඩු වෙලා තිබෙනවා. 2009, 2010 සිට මේ වන කොට එය සියයට 8.9 දක්වා අඩු වෙලා තිබෙනවා. දරිද්‍රතාව ඒ විධියට අඩු වන කොට මේ ගොල්ලන් අහනවා, "කොහොමද ඒක අඩු වෙන්නේ" කියලා. ඒ වාගේම ඒක පුද්ගල ආදායම වැඩි වනකොට අහනවා, "කොහොමද ඒක පුද්ගල ආදායම වැඩි වෙන්නේ" කියලා. එදා ලංකාවේ සියයට 74කට පමණ ලබා දී තිබූ විදුලිය පහසුකම් අද සියයට 97, 98 දක්වා වැඩි වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, මේ අවුරුද්ද අවසාන වන විට මා නියෝජනය කරන කැගල්ල දිස්ත්‍රික්කයට සියයට සියයක්ම විදුලිය පහසුකම් ලබා දෙන්න. ඒක අද අපි සියයට 96ක්, සියයට 97ක් දක්වා ගෙනැවිත් තිබෙනවා. එම නිසා ඒක කරන්න පුළුවන්.

මාර්ග පද්ධති ගැන, වේග සීමාවන් ගැන අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කථා කළා. අද අධිවේගී මාර්ග ආරම්භ වෙලා තිබෙනවා. හෙට, අනිද්දා වන කොට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළ දක්වා වූ අධිවේගී මාර්ගය විවෘත වනවා. ඊළඟට විකල්ප මාර්ග, වට රවුම් පාර ආරම්භ වනවා. ඒ වාගේ දැඩි සංවර්ධනයක් මේ රටේ සිද්ධ වනවා. මීට පෙර මෙපමණ ආයෝජනයන් මේ රටට සිද්ධ කළේ නැහැ. අන්න එවැනි දැඩි විශාල ආයෝජනයක් එක්ක තමයි අපි මේ සියයට 80ක් වශයෙන් සංශෝධන ගෙනෙන්නේ. එහෙම නැතුව ගෙදර ගෙන යන්න නොවෙයි. මෙය ජනතාව දන්නවා.

අද අපි සාමාජිකයන් බඳවා ගන්න ගමට යන කොට, ජනතාව එයට ලැස්තියි. ඒ අය අපට බණින්නේ නැහැ. "මේ රට ම බේරා ගත්ත නායකතුමා සමඟ මේ රට ඉදිරියට ගෙන යන තමුන්නාන්සේලා ගැන අපි සතුටු වනවා"යි කියලා තමයි ඒ ජනතාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය ලබා ගත්තේ. අන්න එම නිසා මේ සංශෝධනය මේ කාලයට ඉතා ම ගැළපෙන සංශෝධනයක් කියන එකයි මා කියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊළඟට අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, සූදු බද්ද ගැන. එතුමා කිව්වා, මැකාවල සූදු බදු වශයෙන් සියයට 39ක් අය කරනවා කියලා. නමුත් අපි පැහැදිලිව කියන්න ඕනෑ, සූදු බද්ද හැටියට මුළු ආදායමෙන් සියයට 5ක් ගන්නවා, ආදායම් බද්ද හැටියට සියයට 40ක් ගන්නවා කියලා. එතකොට මුළු සූදු බදු ප්‍රමාණය සියයට 45 දක්වා වැඩි වනවා. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මැකාවල සූදු බදු වශයෙන් සියයට 39ක් අය කරනවා කියා කියන කොට අද ඒ සූදු බද්ද සියයට 45 දක්වා අය කරන්න කටයුතු කර තිබෙනවා. එම නිසා මෙම සංශෝධනයන් තුළින් වඩා ඵලදායී බදු ක්‍රමයක් තමයි හඳුන්වා දීලා තිබෙන්නේ.

එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා, එහෙම නැත්නම් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අද බොහෝ දුරට කියන්න ගත්තේ බදු ගැනයි. නමුත් ඒ ගැන එතුමන්ලා කථා කළේ නැහැ. මා හිතන හැටියට මේ රටේ ආණ්ඩු කළ කිසි ම රජයක් බදු ආදායම් නැතුව මෙරට ආණ්ඩු කළේ නැහැ. බදු අය කරන්නේ නැතුව සිටියේ නැහැ. එක්සත් ජාතික පක්ෂය බදු සහන දුන්නා. අලුත් පනත් කෙටුම්පත් ගෙනැවිත් බොහෝදෙනකු බදුවලින් නිදහස් කරන්න, තමන්ට ගැළපෙන පන්තිය නිදහස් කරන්න යම් යම් වැඩ පිළිවෙළවල් හඳුන්වා දුන්නා. නමුත් අපි එහෙම කළේ නැහැ. අපේ රජය යටතේ සාධාරණව ජනතාවගෙන් බදු අය කළා. මොකද, මේ අය කරන බද්ද තුළින් 2005 සිට අද දක්වා ගොවියාට පොහොර සහනාධාරය ලැබෙනවා. ඒ පොහොර සහනාධාරය යුද්ධ කාලයේදීත් දුන්නා; අදත් දෙනවා.

ඒ විතරක් නොවෙයි. අනාථ කඳවුරුවල ලක්ෂ 5කට වැඩි සංඛ්‍යාවක් සිටියා. අද ඒ සියලු දෙනා ම නැවත පදිංචි කරවා, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීලා, උතුරු නැහෙනහිර ප්‍රදේශයේ ඒ අනාථ කඳවුරු ඉවත් කර යහපත් සමාජයක් බිහි කරලා තිබෙනවා. මෙන්න මේක තමයි තිබෙන වෙනස. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මූලාසනයේ සිටින ඔබතුමා දන්නවා, එදා ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදය තිබුණු කාලයේ සහ අද උතුරු හා නැහෙනහිර ප්‍රදේශය කොයි තත්ත්වයෙන්ද තිබෙන්නේ කියන එක. ඒ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා අපි විශාල මුදලක් ආයෝජනය කරලා තිබෙනවා; යට කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යම් බදු ආදායමක් රටකට අවශ්‍යයි. ඒ බදු ආදායම ඒ රටේ පුරවැසියන්ට දරන්න පුළුවන් ප්‍රමාණයට අය කරන්න ඕනෑ. සාධාරණ බද්දක් තමයි අපි ඒ ව්‍යාපාරිකයින්ගෙන් අය කරලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. පාරිභෝගික භාණ්ඩ -සීනි වෙන්න පුළුවන්, හාල් මැස්සන් වෙන්න පුළුවන්, සැමන් ටින් එක වෙන්න පුළුවන්, අල වෙන්න පුළුවන්, බී ලූනු වෙන්න පුළුවන්- සම්බන්ධයෙන් අය කරන බද්ද හැම වෙලාවේ ම ස්ථිර නැහැ. දේශීය ගොවියා බේරා ගන්න අවශ්‍ය වන විට, අල ගොවියා බේරා ගන්න අවශ්‍ය වන විට පිට රටින් ගෙනෙන අල සඳහා අය කරන බද්ද වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ අල හිඟ වන කොට පාරිභෝගිකයා ආරක්ෂා කරන්න, පාරිභෝගිකයාට ඒ සහනය දෙන්න අපි ඒ බද්ද අඩු කරලා තිබෙනවා.

මේ රටේ මෝටර් රථ ආනයනය ඉතා වැඩි වුණා. මෝටර් රථ ආනයනය වැඩි වීමත් එක්ක ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාවෙන සංචිතයක් හැටියට අපට ඩොලරයේ වටිනාකම සමාන කර ගෙන තබා ගන්න බැරි වුණා. එම නිසා මොකක්ද කළේ? අපි ප්‍රායෝගිකව ඒ මෝටර් රථ ආනයන බද්ද විශාල වශයෙන් වැඩි කළා. ඒ වැඩි කිරීම කළේ ඇයි? අද ඩොලරයේ වටිනාකම රුපියල් 150ක්, රුපියල් 160ක් දක්වා යයි කියලා කිව්වා. නමුත් අද අපට පුළුවන්කම ලැබී තිබෙනවා, විදේශ සම්පත් වැය කරන්නේ නැතුව අපේ ආර්ථිකය තුළ ඩොලරයේ අගය ආරක්ෂා කර ගන්න. ඒ ඇයි? මෝටර් රථ සම්බන්ධයෙන් යම් පාලනයක්, යම් ක්‍රමවේදයක් අපි ගෙනෙන්න ඕනෑ. ඒ ක්‍රමවේදය තුළින් විශාල වශයෙන් ගිය ඒ වියදම අඩු කරලා විනිමය පාලනයක් ඇති කරන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේ විධියට රටට ගැළපෙන බදු ක්‍රමයක් සකස් කරන්න ඕනෑ.

ඇමෙරිකන් ඩොලර් බිලියන ගණනක විදේශ සම්පත් ප්‍රමාණයක් අද අපට තිබෙනවා. මේ රටේ ආර්ථිකය ශක්තිමත්ව ඉදිරියට යන කොට අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා හැම දාම කියන්නේ මේ රටේ ආර්ථිකය කඩා වැටෙනවා කියන එකයි. ඒක අර එළවා පස්සේ යනවා වාගේ වැඩක්. එයට වෙන විකල්පයක් නැහැ.

අද අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, අපේ ජනාධිපතිතුමා ගැන සහ දරුවන් ගැන කථා කළා. ඒක හරි. ප්‍රශ්නයක් නැහැ. එක්සත් ජාතික පක්ෂයේ නායකයාටවත්, නියෝජ්‍ය නායකයා වෙන්න යන අයටවත් දරුවෝ නැහැ. ඒ අයට දරුවන් නැති වුණාට අපට කරන්න දෙයක් නැහැ. නමුත් අපේ අභිගරු ජනාධිපතිතුමාට හොඳ දරුවෝ ටිකක් ඉන්නවා. ඔවුන් හොඳට වැඩ කරනවා; ක්‍රීඩා කරනවා; ඒ අවශ්‍ය කටයුතු කරනවා; රටට ආදර්ශවත් විධියට කටයුතු කරනවා; යුද්ධය තිබුණ වෙලාවේ යුද්ධයට ගිහින් තිබෙනවා. අපේ අභිගරු ජනාධිපතිතුමා ඉතා ම ආදර්ශවත් පියෙක්. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමන්ලා ඒ ගැන ඊර්ෂ්‍යා කරලා වැඩක් නැහැ, තමන්ගෙ පැත්තෙන් තමන්ගේ නායකත්වය හඳා ගන්නවා මිසක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම බදු සංශෝධනයන් මේ රටට ගැළපෙන ආකාරයට ඉතාමත් වැදගත් ලෙස සිදු කර ඇති බවත් සඳහන් කරන්න කැමැතියි. විපක්ෂය විසින් වැරදි කණ්ණාඩියක් දමාගෙන, පක්ෂග්‍රාහී ලෙස ඊර්ෂ්‍යාවෙන් මේ සම්බන්ධව විවේචනය කිරීම ගැන මම කනගාටු

[ගරු ලලිත් දිසානායක මහතා]

වනවා. මා අවසාන වශයෙන් කියන්නට ඕනෑ, ලැම්බෝගිනි ගෙන්වන්නට පසු ගිය අය වැයෙන් කිසිදු සහනයක් ලබා දීලා නැහැ කියන එක. මෙවැනි ආකල්පවලින් ජනතාව රවටන්නට මේ අය ගෙන යන වැරැදි ක්‍රියා මාර්ග ගැන මගේ බොහොම කනගාටුව ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය. පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

විනා විවාදයෙන් පිළිගනු ලැබිණි. අතිරේක විවාදයෙන් තොරව, සභා සම්මත විය.

Question put, and agreed to. Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

තීරණය කරන ලදී.

"සම්පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" [මාණ්ඩලික නිමල් සිරිපාල ද සිල්වා]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]

කුමුවිල් ආරාධනා කරන ලදී.
[කුමුක්කලගේ පාර්ලිමේන්තු මන්ත්‍රී අවර්කල් සභාපතිත්වය දැරුවේය.]

Considered in Committee.

[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.]*

1 සහ 2 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ආම්, 2ආම් වාසගම් සම්පූර්ණ කරන ලදී.

Clauses 1 and 2 ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසගම 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 3ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 3.- (*Amendment of Section 3 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්ඩලික නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"7 වන පිටුවේ, 24 සහ 25 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'2 වන වගන්තිය යටතේ ඉවත් කර ඇති සැපයුම් හෝ පළමු වන උපලේඛනයේ II වන කොටස යටතේ නිදහස් කර ඇති සැපයුම් ඇතුළුව' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විවාදයෙන් ඉවත් කරන ලදී.

Amendment put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3 ආම් වාසගම් සම්පූර්ණ කරන ලදී.

Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසගම 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 5ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 4.- (*Amendment of section 5 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්ඩලික නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"9 වන පිටුවේ, 3 සිට 5 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි (12) වන අනුඡේදයේ "ඉහළ වටිනාකම විය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් " "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විවාදයෙන් ඉවත් කරන ලදී.

Amendment put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4ආම් වාසගම් සම්පූර්ණ කරන ලදී.

Clause 4, as amended, ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසගම 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 10ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 5.- (*Amendment of section 10 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්ඩලික නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"10 වන පිටුවේ, (1) 14 සහ 15 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'රුපියල් මිලියන දොළහක් ඉක්මවා ඇත්නම්; හෝ';

(2) 26 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'හේතු ඇත්නම්,

මේ පනත යටතේ ලියාපදිවි කරනු ලැබීමට යටත් විය යුතු ය.' "

(3) 33 සහ 34 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට "පනතේ 2 වන වගන්තිය යටතේ ඉවත් කර ඇති සැපයුම් හෝ පළමුවන උපලේඛනයේ 11 වන කොටස යටතේ" "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකල් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

Amendments put, and agreed to.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5 ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Clause 5, as amended, ordered to stand part of the Bill.

6 සිට 8 දක්වා වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6ආම් වාසකත්තිලිරුන්දු 8ආම්වාසකම් වරෙ චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Clauses 6 to 8, ordered to stand part of the Bill.

9 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 9.- (මුතන්මෛච් චට්ටවාක්කත්තින් 16ආම් පිරිවෛත් තිරුත්තුතල්)

CLAUSE 9.- (*Amendment of section 16 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "13 වන පිටුවේ, 7 සහ 8 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කාලයක් සඳහා රුපියල් මිලියන තුනක් නොඉක්මවන සමස්ත බදු අය කළ හැකි සැපයුම් වටිනාකමක් පැවති' "

(2) "14 වන පිටුවේ, 14 සිට 18 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

(ආ) එම ලියාපදිංචි තැනැත්තාගේ වෙළඳ භාණ්ඩ තොග සඳහා වන බදු බැඳියාව, 2012 දෙසැම්බර් මස 31 වන දින වන විට අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.". ' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකල් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

Amendments put, and agreed to.

9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

9ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Clause 9, as amended, ordered to stand part of the Bill.

10 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 10.- (මුතන්මෛච් චට්ටවාක්කත්තින් 21ආම් පිරිවෛත් තිරුත්තුතල්.)

CLAUSE 10.- (*Amendment of section 21 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ, (1) 8 සහ 9 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'එළඹෙන මාසයේ අවසන් දිනට වඩා පසු නොවී,'

(2) 13 සිට 15 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'එවැනි සෑම වාර්තාවක්ම නිශ්චිත ආකෘතියෙන් විය යුතු අතර, ඒ ආකෘතියේ දැක්වීමට නියමිත සියලු විස්තර එහි ඇතුළත් විය යුතු ය." ' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකල් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.
Amendments put, and agreed to.

10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

10 ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Clause 10, as amended, ordered to stand part of the Bill.

11 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 11.- (මුතන්මෛච් චට්ටවාක්කත්තින් 22ආම් පිරිවෛත් තිරුත්තුතල්)

CLAUSE 11.- (*Amendment of section 22 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "16 වන පිටුවේ, 22 සිට 24 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(i) ලිනන් රෙදි හෝ තිර රෙදි එක් කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් හතළිහයි.' "

(2) "19 වන පිටුවේ, 12 සිට 15 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අවලංගුවීම හේතුවෙන්, 2013 ජනවාරි මස 1 වන දිනට පසුව හිමිකම් කිව නොහැකි 2012 දෙසැම්බර් මස 31 වන දිනට පවතින මෙම වගන්තියේ' "

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකල් විටුක්කප්පට්ටු ඏත්රුක්කොළ්ළප්පට්ටතු.

Amendments put, and agreed to.

11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

11ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 11, as amended, ordered to stand part of the Bill.

12 සහ 13 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

12ආම්, 13ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clauses 12 and 13 ordered to stand part of the Bill.

14 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 25 ඇ වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 14.- (මුතන්මෛච් චට්ටවාක්කත්තින් 25இ එන්නුම් පිරිවෛත් තිරුත්තුතල්)

CLAUSE 14.- (*Amendment of section 25C of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "23 වන පිටුවේ, 29 සිට 31 දක්වා පේළි (ඒ පේළි දෙක ද අතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

‘(ආ) (අ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්;

‘(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ XIV වන පරිච්ඡේදය යටතේ "නිශ්චිත සේවා නියුක්තයන්" සම්බන්ධයෙන් වන විට, ඒ සේවානියුක්තයන්ට ගෙවිය යුතු වූ ද 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 119 වන වගන්තියේ (අ) ඡේදය යටතේ පවත්වාගෙන යන වැටුප් පත්‍රිකාවේ පිළිබිඹු වන්නා වූ ද දළ පඩිනඩි; සහ' "

(2) "24 වන පිටුවේ, 1 සිට 4 දක්වා පේළි (ඒ පේළි දෙකද අතුළුව) ඉවත් කරන්න."

"24 වන පිටුවේ, 18 සිට 26 දක්වා පේළි (ඒ පේළි දෙකද අතුළුව) ඉවත් කරන්න."

(3) "25 වන පිටුවේ, 1 සිට 3 දක්වා පේළි (ඒ පේළි දෙකද අතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

‘පැන නඟින හෝ උපචිත වන (ව්‍යාපාරයකින් ලැබෙන ලාභයක් නොවන) ලාභයකට හෝ ආදායමකට" යන වචන ආදේශ කිරීමෙන්;' "

"25 වන පිටුවේ, 10 සිට 15 දක්වා පේළි (ඒ පේළි දෙකද අතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

‘(ඉ) එහි (උ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

‘(උ) ව්‍යවහාර මූදල් භූවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි මූලික වශයෙන් යෙදී සිටින තැනැත්තකුට හෝ මේ පරිච්ඡේදයේ අර්ථානුකූලව යම් "නිශ්චිත ආයතනයකට" හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි නොවූ එහෙත් මූල්‍ය සමාගමක් විසින් සපයනු ලබන සේවාවලට සමාන සේවා සපයන යම් තැනැත්තකුට උපදින හෝ උපචිත වන ලාභ හෝ ආදායම් හැර, ව්‍යවහාර මූදල් භූවමාරු කිරීමෙන් ලැබෙන (ව්‍යාපාරයකින් ලැබෙන ලාභයක් නොවන) ලාභවලට හෝ ආදායමට,

ඇතුළත් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ගණනය කරන ලද ආදායම ශූන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකල් විටුක්කප්පට්ටු ඏත්රුක්කොළ්ළප්පට්ටතු.

Amendments put, and agreed to.

14 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

14ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 14, as amended, ordered to stand part of the Bill.

15 සහ 16 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

15ආම්, 16ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clauses 15 and 16, ordered to stand part of the Bill.

17 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 25 එ වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 17.- (මුතන්මෛච් චට්ටවාක්කත්තින් 25 ஐ පිරිවෛත් තිරුත්තුතල්)

CLAUSE 17.- (*Amendment of section 25I of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"26 වන පිටුවේ, 30 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ආරම්භ වන දිනයෙන් වසර දොළහක කාලයක්' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඏත්රුක්කොළ්ළප්පට්ටතු.

Amendment put, and agreed to.

17 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

17ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.

Clause 17, as amended, ordered to stand part of the Bill.

18 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 18.- (මුදන්මෛච් චට්ටවාක්කත්තින් 26ආම් පිරිවෛත් තිරුත්තුදල්)

CLAUSE 18.- (*Amendment of section 26 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"28 වන පිටුවේ, (1) 5 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'තැනැත්තා විසින්, ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ'

(2) '10 වන පේළිය ඉවත් කරන්න.'

(3) '14 සිට 19 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ii) එම මාසයේ 16 වන දින සිට එම මාසයේ අවසානය දක්වා වූ කාලසීමාව සඳහා, ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර,

වාර්තාව ඉදිරිපත් කිරීමත් සමඟ අවසාන සකස් කිරීම් ඇත්නම් ඒවා සිදු කිරීමට යටත්ව ගෙවනු ලැබිය යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තඞ්කළ් විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටදු.
Amendments put, and agreed to.

18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

18ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.

Clause 18, as amended, ordered to stand part of the Bill.

19 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 19.- (මුදන්මෛච් චට්ටවාක්කත්තින් 28ආම් පිරිවෛත් තිරුත්තුදල්)

CLAUSE 19.- (*Amendment of section 28 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"29 වන පිටුවේ, 14 සිට 17 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) එම කැනැත්තා විසින් 2014 මාර්තු මස 31 වන දිනට පෙරාතුව ඔහුගේ එම වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ඉපැයුම් කවර හෝ ව්‍යාපාරයක ආයෝජනය කිරීමට; සහ ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

19ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.

Clause 19, as amended, ordered to stand part of the Bill.

20 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

20ආම් වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.

Clause 20, ordered to stand part of the Bill.

21 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 21.- (මුදන්මෛච් චට්ටවාක්කත්තින් 67ආම් පිරිවෛත් තිරුත්තුදල්)

CLAUSE 21.- (*Amendment of section 67 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"31 වන පිටුවේ, 11 සහ 12 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ක්‍රියාකිරීම හෝ, අවස්ථාවෝචිත පරිදි, 2 හෝ 25ඇ වගන්ති යටතේ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

21 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

21ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.

Clause 21, as amended, ordered to stand part of the Bill.

22 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.)

වාසකම් 22.- (මුදන්මෛච් චට්ටවාක්කත්තින් මුදලාම් අට්ටවණෛයෛත් තිරුත්තුදල්.)

CLAUSE 22.- (*Amendment of the First Schedule of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

(1) "33 වන පිටුවේ, 18, 19 සහ 20 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(XLVI) ක්‍රීඩා විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි යම් ක්‍රීඩා ඉසව්වකට හෝ ක්‍රීඩාවකට අදාළ ක්‍රියාකාරකමකට සහභාගිවීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන ක්‍රීඩකයෙකුට,' "

(2) "35 වන පිටුවේ, 15 සහ 16 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයෙකු විසින් හෝ යම් විදේශ රැකියාවක' "

"35 වන පිටුවේ, 24 සිට 28 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ii) එම ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා ස්වකීය විදේශ රැකියාවෙන් ලද ඉපැයීම් ආයෝජනය කරන්නේ නම්,

එම පුද්ගලයා විසින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තඞ්කළ් විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

22 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

22ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 22, as amended, ordered to stand part of the Bill.

23 වන වගන්තිය.- (හානිපූරණය.)

வாசகம் 23.- (நட்டோத்தரவாதம்.)

CLAUSE 23.- (*Indemnity.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

"35 වන පිටුවේ, 29 සිට 32 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වලංගු කිරීම. 23. 2013 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භව, මෙම පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ දිනයෙන් අවසන් වන යම් කාලසීමාවක් ඇතුළත, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එකතු කළ අගය මත බදු එකතු කරන යම් තැනැත්තකු , නිසි බලය ඇතිව ක්‍රියා කර ඇති බවට සලකනු ලැබිය යුතු අතර එවැනි බදු එකතු කිරීමක් සියලු කාර්ය සඳහා වලංගු ලෙස සිදු කර ඇති බවට සලකනු ලැබිය යුතුය.

එසේ වුව ද, ඉහත කී විධිවිධාන, යම් අධිකරණයක් විසින් ඉහත කී කාලසීමාව තුළ දී, ඉහත කී පනතෙන් විධිවිධාන සලසා ඇති පරිදි එකතු කරන ලද යම් බද්දක් සම්බන්ධයෙන් දෙන ලද යම් තීරණයක් හෝ නියමයක් කෙරෙහි හෝ යම් අධිකරණයක් ඉදිරියේ අවසන් නොවී පවතින යම් නඩු කටයුත්තක් සම්බන්ධයෙන් බල නොපෑ යුතු ය.' ;

36 වන පිටුවේ, 1 සිට 11 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තඞ්කළ් විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

23 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

23ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 23 , as amended, ordered to stand part of the Bill.

24 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

24ආම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
චට්ටමාකු වාසකමුම් තලైප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
චට්ටමූලම් තිරුත්තඞ්කළුටන් අර්ික්කෛ චෙය්යප්පට්ටතු.

Clause 24, ordered to stand part of the Bill.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

විනා විටුක්කප්පට්ටු, ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.
අතන්පඩි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්ර්ාම්මුරෛයාක මතිප්පිටප්පට්ටු නිර්රෛවේර්ර්ප්පට්ටතු.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත

நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்

NATION BUILDING TAX (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

විනා විවාදයේ, ඒකමතිකව පිළිගනු ලැබිණි.
අතදන්පඩි, සිවිල් නීතිය මූලික වශයෙන් ඒකමතිකව පිළිගනු ලැබිණි.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
'පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

තීරණය කරන ලදී.
"සිවිල් නීතිය මූලික වශයෙන් පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" [මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]

කුලුගෙ ආරක්ෂක නිලධාරීන් විසින් පරීක්ෂා කරන ලදී.
[කුලුක්කලීන් පිරිසිදු කිරීම් සේවය අවශ්‍යතා කරන්නේ.]

Considered in Committee.
[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.]*

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ආම් වාසගම් සිවිල් නීතියේ පරිදි ඉදිරිපත් කරන්නේ.

Clause 1, ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (2009 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසගම් 2.- (2009ආම් ආණ්ඩුවේ 9ආම් ඉලක්කම් සිවිල් නීතියේ 3ආම් වගන්තිය නැවත සකස් කිරීම.)

CLAUSE 2.- (*Amendment of section 3 of Act, No. 9 of 2009.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, (1) 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(v) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයකු -' ;

(2) 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'විදේශ මුදල් ආයෝජනය කරන්නේ නම්' ;

(3) 18 සහ 19 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'පුද්ගලයාගේ බද්දට යටත් වන පිරිවැටුම වනුයේ එම පුද්ගලයා විසින් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනය හැර යම් භාණ්ඩයක් නිෂ්පාදනය' ;

(4) 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'හෝ එම පුද්ගලයා විසින් සපයනු ලබන' ; සහ

(5) 23 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'පුද්ගලයා වාණිජ මෙහෙයුම් ආරම්භ කළ' " ;

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
තිරුත්තංගල් විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Amendments put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
2ආම් වාසගම් තිරුත්තංගල් විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Clause 2 , as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.)

வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் முதலாம் அட்டவணையைத் திருத்துதல்.)

CLAUSE 3.- (*Amendment of First Schedule of the principal enactment*.)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ, (1) 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඇ) එහි (xxxvi) අයිතමයේ 'කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 75' ; සහ

(2) 26 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ජාත්‍යන්තර කටයුත්තක් සඳහා ආනයනය කරන';

4 වන පිටුවේ, 34 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) (xxvi) වන අයිතමයෙහි 'වරායන් සඳහා හෝ ගුවන්' ; සහ

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
තිරුත්තංගල් විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Amendments put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
3ආම් වාසගම් තිරුත්තංගල් විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Clause 3 , as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (වගකීමෙන් මුක්ත කිරීම.)
வாசகம் 4.- (நட்டோத்தரவாதம்.)
CLAUSE 4.- (*Indemnity.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 11 වන පේළියේ සිට 22 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වලංගු වීම. 4. 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මෙම පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙලින් 4 වන හෝ 5 වන වගන්තිවලින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට අවස්ථාවෝචිත පරිදි, දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් මේ පනතේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලැබූ බදු මුදල මේ පනතේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තකුගෙන් එකතු කරනු ලබන අවස්ථාවකදී එම එකතු කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස අය කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ අය කරන ලද හෝ එකතු කරන ලද එම බද්ද සම්බන්ධයෙන් අධිකරණයකින් දෙන ලද තීරණයකට හෝ ආඥාවකට හෝ අධිකරණයක අවසන් නොවී පවතින නීති කෘත්‍යයකට බලපානු නොලැබිය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විඩික්කප්පට්ටු ඒற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිකාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4 , as amended, ordered to stand part of the Bill.

5 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Clause 5, ordered to stand part of the Bill.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිකාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

මුදල් පනත් කෙටුම්පත
நிதிச் சட்டமூலம்
FINANCE BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.]*

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ආම් වාසකත්තිලිරුන්තු 3ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 1 to 3, ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (වලංගු කිරීම සහ වගකීමෙන් මුක්ත කිරීම.)

வாசகம் 4.- (செல்லுபடியாக்குதல்.)

CLAUSE 4.- (*Validation and Indemnity*.)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "2 වන පිටුවේ, 27 වන පේළියේ සිට 34 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

அற்றோணி தத்துவம் (திருத்தம்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Non-receipt of Samurdhi Benefit

Violation of Democratic Rights of Tamil People

LEAVE OF ABSENCE:

Hon. Kabir Hashim

PRIVILEGE MOTIONS:

Search of House Restraining Participation at Parliament Sessions

"The Island" and "Daily News" Reports of 7th February, 2013

PRIVATE MEMBERS' BILLS:

Deltota Mahfalul Ulama Arabic College (Incorporation) – [The Hon. M.B. Farook] – Read the First Time

INLAND REVENUE (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed as amended

NOTARIES (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed as amended

REGISTRATION OF DOCUMENTS (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed as amended

POWERS OF ATTORNEY (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed as amended

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 අප්‍රේල් 10 වන බදාදා
2013 ஏப்பிரல் 10, புதன்கிழமை
Wednesday, 10th April, 2013

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.කථානායකතුමා [ගරු වමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m, MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2011 වර්ෂය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රමසම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, 2011 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ඉඩම් හා ඉඩම් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා - පැමිණ නැත.
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා - පැමිණ නැත.
ගරු විමල් වීරවංශ මහතා - පැමිණ නැත.
ගරු ජයරත්න හේරත් මහතා - පැමිණ නැත.
ගරු සරණ ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු පොන්. සෙල්වරාසා මහතා
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)

කෞරව සභානායක් අවර්කලේ, සෙංකලඩි, මාණික්ක විනායකර් වීතියෙච් චේර්න්ත තිරු. ෆී. සේනාතිරාජාවිනතු මනුවෛච් චමර්ප්පික්කින්රේන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා - පැමිණ නැත.
ගරු නාමල් රාජපක්ෂ මහතා -පැමිණ නැත.

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

ගරු කථානායකතුමනි, මම කැස්බෑව, මාවිත්තර, හොරණ පාර, අංක 6/10 දරන ස්ථානයෙහි පදිංචි ඇම්.ඩී. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

හලාවත මහ රෝහල : භෞතික සම්පත්
சிலாபம் பொது வைத்தியசாலை : பௌதிக வளங்கள்
CHILAW GENERAL HOSPITAL: PHYSICAL RESOURCES

1958/'11

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති හලාවත මහ රෝහලෙහි මේ වන විට පවතින භෞතික සම්පත්වල ඌනතාවන් හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව තම සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමේදී දැඩි දුෂ්කරතාවන්ට මුහුණපාන බව එතුමා දන්නෙහිද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ආ) (i) හලාවත මහ රෝහලෙහි පවත්නා අඩුපාඩු කඩිනමින් සම්පූර්ණ කර ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වන විට සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාතාර අමෙච්සරෙක්කේට්ට විනා:

(அ) புத்தளம் மாவட்டத்தில் அமைந்துள்ள சிலாபம் பொது வைத்தியசாலையில் தற்போது நிலவும் பௌதிக வளப் பற்றாக்குறை காரணமாக பிரதேச மக்கள் தமது சுகாதார சேவைகளைப் பெற்றுக்கொள்வதில் பெரும் கஷ்டங்களை எதிர்நோக்குகின்றனர் என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) சிலாபம் பொது வைத்தியசாலையில் நிலவும் குறைபாடுகளைத் துரிதமாக நிறைவு செய்து பிரதேச மக்களின் சுகாதார வசதிகளை மேம்படுத்த நடவடிக்கை மேற்கொள்வாரா;

(ii) இதற்காக தற்போது திட்டமிடப்பட்டுள்ளதா;

(iii) அவ்வாறாயின், அதற்குத் தேவையான நிதி ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that due to the current shortage of physical resources at the Chilaw General Hospital situated in the Puttalam District, the people of the area face severe difficulties in obtaining health services?

(b) Will he state -

(i) whether action will be taken to address the shortcomings that exist at the Chilaw General Hospital speedily and improve health facilities provided to the people of that area;

(ii) whether plans have been made for that purpose by now; and

(iii) if so, whether the necessary provisions have been allocated?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) හලාවත මහ රෝහල මධ්‍ය රජයට පවරා ගැනීමෙන් පසුව රෝහලේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.

(ආ) (i) ඔව්.

* ගිලන් රථ තුනක් ඊයේ පෙරේදා අපි ලබා දුන්නා. හෘද රෝග සායන ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ECG යන්ත්‍ර, Echo යන්ත්‍ර ආදිය ලබා දීමට කටයුතු සිදු කරමින් පවතින අතර, වාට්ටුවල කැඩී බිඳී තිබූ වැසිකිළි, රෝගීන්ට අවශ්‍ය රෝද පුටු, ට්‍රොලී ආදිය නවීකරණය කර ඇත.

* රෝහලට අවශ්‍ය වෛද්‍ය උපකරණ (මිලියන 80ක් පමණ වටිනා) ලබා දී ඇති අතර ගැබිණි මවුවරුන්ට දරු ප්‍රසූතිය ආරක්ෂිතව සිදු කිරීමට අවශ්‍ය උපකරණ ලබා දී ඇත.

(ii) ඔව්.

දැනට රෝහලේ නව ශල්‍යාගාර වාට්ටු සංකීර්ණය ඉදිකිරීම - construction of new surgical ward complex - සහ වෛද්‍ය වාට්ටු සංකීර්ණය ඉදිකිරීම - construction of new medical ward complex - සම්බන්ධව යෝජනා, ජාතික සැලසුම් අංශයේ අනුමැතිය හා නිර්දේශ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

(iii) 2013 වසරට වෛද්‍ය වාට්ටු සංකීර්ණය ඉදිකිරීමේ - construction of new medical ward complex - ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම සඳහා රු:15,000,000.00ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වායු සමීකරණ යන්ත්‍ර - විශේෂයෙන්ම ශල්‍යාගාර තුළ- නිවීවනම අක්‍රීය වීමේ තත්ත්වයක් සහ අවශ්‍ය ප්‍රමාණයට සිසිල්කරණය වීමේ ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ඒක සැත්කම් කිරීමේදී ඉතා වැදගත්. ඔබතුමාට කියන්න පුළුවන්ද ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග මොනවාද කියලා.

ගරු ලලිත් දිසානායක මහතා

(மாண்புமிகு லலித் திசாநாயக்க)

(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, ඒ රෝහල දිසා රෝහලක් වශයෙන් තිබිලා පසු ගිය වසරේදී අපේ අමාත්‍යාංශයට පවරා ගත්තා. එහි තිබුණු ශල්‍යාගාර පහසුකම් ඉතාම පැරණියි. ඒකේ central A/C system එකක් තිබුණේ නැහැ. ඒ නිසාම තමයි අලුත් ශල්‍යාගාර පද්ධතියක් ආරම්භ කරන්න අපි කටයුතු කරලා තිබෙන්නේ. ශල්‍යාගාර කටයුතු සඳහා අවශ්‍ය ආකාරයට එය අලුත්වැඩියා කරලා ප්‍රතිකාර සඳහා පාවිච්චි කිරීමට කටයුතු කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ළඳරු ඒකකයේ සාමාන්‍ය ළමා රෝගීන් සඳහා වාගේම පාචනයට භාජනය වෙලා ඉන්න ළමා රෝගීන්ටත් තිබෙන්නේ එකම වැසිකිළි පද්ධතියක්. පාචනය වැලඳුණු රෝගීනුත් එකම වැසිකිළි පද්ධතිය පාවිච්චි කිරීම නිසා පාචනය වැලඳුණු නැති අනෙක් ළමා රෝගීන්ටත් තර්ජනයක්. ඒ නිසා ඒ වෙනුවෙන් යමක් කරන්න අමාත්‍යාංශය මැදිහත් වෙලා තිබෙනවාද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, දැනට අපි සාමාන්‍යයෙන් කරන්නේ එවැනි බෝවෙන රෝගීන් එම වාට්ටුවේ වෙනත් කොටසක තබා ගැනීමත්, පාවිච්චිය සඳහා තිබෙන වැසිකිළි පද්ධතියෙන් වැසිකිළි වෙන් කිරීමත්ය. මොකද වැසිකිළි පද්ධති එකට හදලායි තිබෙන්නේ. සාමාන්‍යයෙන් රෝගීන් එක පැත්තක ඉන්නවා. මොකද පොඩි ළමයි නේ. බෝවෙන රෝගීන්ට එක වැසිකිළියක් වෙන් කරලා පාවිච්චි කරන එක තමයි කරන්නේ. වෙනම ඉදි කිරීමක් කරන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ළමා වාට්ටුව සඳහා වූ තෙමහල් ගොඩනැගිල්ලේ ජල නළ සවි කිරීමේදී වෙලා තිබෙන අක්‍රමිකතාවක් නිසා දිගින් දිගටම ජලය කාන්දුවීම රෝහලේ ගොඩනැගිලිවල අනාරක්ෂිතභාවයට වාගේම එහි ඉන්න රෝගීන්ටත් කරදරයක් කියලා දැනුම් දීලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් හොයලා බලලා අමාත්‍යාංශයට යම් ක්‍රියා මාර්ගයක් ගන්න පුළුවන්ද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මේක අපි භාර ගන්න කලින් ඉදි කරන ලද ගොඩනැගිල්ලක්. ඒ නිසා දැනට ඉංජිනේරු අංශය හරහා මේ සම්බන්ධයෙන් කරන්න පුළුවන් දේ ගැන උපදෙස් ලබා ගන්නවා. මේක සාමාන්‍යයෙන් රෝහල්වල තිබෙන දෙයක්. මොකද වැසිකිළිත් හදන්නේ එම ගොඩනැගිල්ලේමයි. පාවිච්චියත් වැඩියි. එතකොට යම් යම් අඩු පාඩුකම් සිදු වෙනවා. ඒ සම්බන්ධයෙන් අපේ අවධානය යොමු කරන්න පුළුවන්.

ශ්‍රී දළ දා මාළිගාවේ පෙරහැර : වැය කළ මුදල

ஸ்ரீ தலதா மாளிகை ஊர்வலம் : செலவிட்ட பணம்
SRI DALADA MALIGAWA PERAHERA : MONEY SPENT

2282/'12

3. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මහනුවර ශ්‍රී දළ දා මාළිගාවේ පෙරහැර පැවැත්වීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) දළ දා පෙරහැර සඳහා දළ දා මාළිගා අරමුදලින් වියදම් කළ මුදල කොපමණද;

(iii) ඒ සඳහා රාජ්‍ය ආයතනවලින් ලබාගත් මුදල කොපමණද;

(iv) මුදල් ලබා දුන් රාජ්‍ය ආයතන සහ එම එක් එක් ආයතනයෙන් ලබා දුන් මුදල කොපමණද;

(v) පෞද්ගලික ආයතනයන්ගෙන් ලබාගත් මුදල කොපමණද;

(vi) මුදල් ලබා දුන් පෞද්ගලික ආයතන සහ එම එක් එක් ආයතනය ලබා දුන් මුදල කොපමණද;

යන්න වර්ෂ 2009 සිට 2011 දක්වා කාල සීමාව සඳහා වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி ஸ்ரீ தலதா மாளிகையின் ஊர்வலத்தை நடத்துவதற்காகச் செலவிடப்பட்ட மொத்தப் பணத்தொகை யாதென்பதையும்;

(ii) தலதா ஊர்வலத்திற்காக தலதா மாளிகையின் நிதியத்திலிருந்து செலவிடப்பட்ட பணத்தொகை யாதென்பதையும்;

(iii) இதற்காக அரசாங்க நிறுவனங்களிலிருந்து பெறப்பட்ட பணத்தொகை யாதென்பதையும்;

(iv) பணம் வழங்கிய அரசாங்க நிறுவனங்கள் மற்றும் குறிப்பிட்ட ஒவ்வொரு நிறுவனத்தால் வழங்கப் பட்ட பணத்தொகை யாதென்பதையும்;

(v) தனியார் நிறுவனங்களிலிருந்து பெறப்பட்ட பணத்தொகை யாதென்பதையும்;

(vi) பணம் வழங்கிய தனியார் நிறுவனங்கள் மற்றும் குறிப்பிட்ட ஒவ்வொரு நிறுவனத்தால் வழங்கப் பட்ட பணத்தொகை யாதென்பதையும்

2009 ஆம் ஆண்டு தொடக்கம் 2011 ஆம் ஆண்டு வரையிலான கால எல்லையின் பொருட்டு வருடாந்த அடிப்படையில் தனித்தனியாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state separately, in relation to each year during the period from the year 2009 to 2011-

(i) the total amount of money spent on conducting the Perahera of the Temple of the Sacred Tooth Relic in Kandy;

(ii) the amount of money spent on Kandy Perahera out of the funds of the Temple of the Sacred Tooth Relic;

(iii) the amount of money received as donations from the government institutions for the aforesaid purpose;

(iv) the names of the Government institutions which donated money and the amount of money donated by each of those institutions;

(v) the amount of money received from the institutions of the private sector; and

(vi) the names of the private sector institutions that donated money and the amount of money donated by each of those institutions ?

(b) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

(අ) (i) මහනුවර ශ්‍රී දළ දා මාළිගාවේ පෙරහැර පැවැත්වීම සඳහා වැය කළ මුදල 25,053,552.04යි.

(ii) දළ දා පෙරහැර සඳහා දළ දා මාළිගා අරමුදලෙන් වියදම් කළ මුදල රුපියල් 9,053,552.04යි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2009 සිට 2011 දක්වා කාල සීමාව සඳහා වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් අහලා තිබෙන්නේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒකට තමයි මේ උත්තරය දීලා තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ප්‍රශ්නයෙන් මම අහලා තිබෙන්නේ 2009 සිට 2011 දක්වා වර්ෂයෙන් වර්ෂය?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Breakdown එකක් නම් දීලා නැහැ, උත්තරයෙන්. ඔබතුමාට අවශ්‍ය එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
උත්තරය තිබෙනවා. එහෙම නම් මම කාලයක් අරගෙන ඒක දන්වලා වෙන් වෙන් වශයෙන් උත්තරය දෙන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔය රුපියල් දෙකෝටි ගණන මොන වර්ෂයටද දන්නේ නැහැ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එහෙම කියලා නැහැ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)
ගරු කථානායකතුමනි, මා ළඟ එම ප්‍රශ්නයට පිළිතුර තිබෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එහෙම නම් ඔබතුමා එම ප්‍රශ්නයට පිළිතුර ඉදිරිපත් කරන්න.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

2009 වර්ෂය සඳහා ශ්‍රී දළදා මාළිගාවේ ඇසල පෙරහැර සම්බන්ධ ආධාර සහ වියදම්

(අ) (i) රු. 25,053,552.04 (රුපියල් දෙකෝටි පණස්ලක්ෂ පණස්තුන්දහස් පන්සියපණස්දෙකයි ශත හතරයි)

(ii) රු. 9,053,552.04 (රුපියල් අනූලක්ෂ පණස්තුන්දහස් පන්සියපණස්දෙකයි ශත හතරයි)

(iii) රු. 9,900,000.00 (රුපියල් අනූනව ලක්ෂයයි)

(iv) ලංකා බැංකුව රු. 4,000,000.00 (රුපියල් හතළිස්ලක්ෂයයි)

මහජන බැංකුව රු. 2,500,000.00 (රුපියල් විසිපන් ලක්ෂයයි.

ඇසළ පෙරහැර භාරය රු. 700,000.00 (රුපියල් හත්ලක්ෂයයි)

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය

රු. 2,700,000.00 (රුපියල් විසිහත් ලක්ෂයයි)

(v) රු. 6,100,000.00 (රුපියල් හැටඑක්ලක්ෂයයි)

(vi) කොමර්ෂල් බැංකුව රු. 200,000.00 (රුපියල් දෙලක්ෂයයි)

DSI පෞද්ගලික සමාගම රු. 500,000.00 (රුපියල් පන්ලක්ෂයයි)

ඩයලොග් ටෙලිකොම් රු. 3,500,000.00 (රුපියල් තිස්පස් ලක්ෂයයි)

ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම රු.1,000.000.00 (රුපියල් දසලක්ෂයයි)

සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් රු. 700,000.00 (රුපියල් හත්ලක්ෂයයි)

ලෝඩ්ස්ටාර් පෞද්ගලික සමාගම රු. 200,000.00 (රුපියල් දෙලක්ෂයයි)

(ආ) අදාළ නොවේ.

2010 වසර සඳහා ශ්‍රී දළදා මාළිගාවේ ඇසළ පෙරහැර සම්බන්ධ ආධාර සහ වියදම්

(අ) (i) රු. 32,907,943.89 (රුපියල් තුන්කෝටි විසිනවලක්ෂ හත්දහස් නවසිය හතළිස්තුනයි ශත අසූ හතරයි)

(ii) රු. 9,407,943.89 (රුපියල් අනූහතරලක්ෂ හත්දහස් නවසිය හතළිස්තුනයි ශත අසූ නවයයි)

(iii) රු.15,400,000.00 (රුපියල් එක්කෝටි පණස්හතර ලක්ෂයයි)

(iv) ලංකා බැංකුව රු. 4,000,000.00 (රුපියල් හතළිස්ලක්ෂයයි)

මහජන බැංකුව රු.6,500,000.00 (රුපියල් හැටපන් ලක්ෂයයි.

ඇසළ පෙරහැර භාරය රු.900,000.00 (රුපියල් නවලක්ෂයයි)

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රු.3,000,000.00 (රුපියල් තිස් ලක්ෂයයි)

ජාතික ලොතරැයි මණ්ඩලය

රු. 1,000,000.00 (රුපියල් දසලක්ෂයයි)

(v) රු. 8,100,000.00 (රුපියල් අසූඑක්ලක්ෂයයි)

(vi) කොමර්ෂල් බැංකුව රු. 200,000.00 (රුපියල් දෙලක්ෂයයි)

DSI පෞද්ගලික සමාගම රු. 500,000.00 (රුපියල් පන්ලක්ෂයයි)

ඩයලොග් ටෙලිකොම් රු. 4,000,000.00 (රුපියල් හතළිස්ලක්ෂයයි)

ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම රු.1,000,000.00 (රුපියල් දසලක්ෂයයි)

සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් රු.700,000.00 (රුපියල් හත්ලක්ෂයයි)

සිංගර් ශ්‍රී ලංකා රු. 100,000.00 (රුපියල් ලක්ෂයයි)

මාස් හෝල්ඩින්ස් රු.700,000.00 (රුපියල් හත්ලක්ෂයයි)

(ආ) අදාළ නොවේ.

2011 වසර සඳහා ශ්‍රී දළදා මාළිගාවේ ඇසළ පෙරහැර සම්බන්ධ ආධාර සහ වියදම්

(අ) (i) රු. 32,338,044.46 (රුපියල් තුන්කෝටි විසිතුන්ලක්ෂ තිස්අටදහස් හතළිස්හතරයි ශත හතළිස් හයයි)

(ii) රු. 2,438,044.46 (රුපියල් විසිහතරලක්ෂ තිස්අටදහස් හතළිස්හතරයි ශත හතළිස්හයයි)

(iii) රු.14,400,000.00 (රුපියල් එක්කෝටි හතළිස්හතරලක්ෂයයි)

(iv) ලංකා බැංකුව රු. 4,000,00.00 (රුපියල් හතළිස්ලක්ෂයයි)

මහජන බැංකුව රු. 4,000,000.00 (රුපියල් හතළිස්ලක්ෂයයි.)

ඇසළ පෙරහැර භාරය රු. 900,000.00 (රුපියල් නවලක්ෂයයි)

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රු.3,000,000.00 රුපියල් තිස්ලක්ෂයයි)

ජාතික ලොතරැයි මණ්ඩලය රු. 2,500,000.00 (රුපියල් විසිපන්ලක්ෂයයි)

(v) රු.15,500,000.00 (රුපියල් එක්කෝටි පනස්පන්ලක්ෂයයි)

(vi) DSI පෞද්ගලික සමාගම රු. 500,000.00 (රුපියල් පන්ලක්ෂයයි)

ඩයලොග් ටෙලිකොම් රු. 5,000,000.00(රුපියල් පනස්ලක්ෂයයි)

ගුවන් තොටු පොළ හා ගුවන් සේවා සමාගම රු.1,000,000.00 (රුපියල් දසලක්ෂයයි)
සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් රු.1,500,000.00 - (රුපියල් පහළොස්ලක්ෂයයි)

සිංගර් ශ්‍රී ලංකා රු. 500,000.00 (රුපියල් පන්ලක්ෂයයි)

යුනිලිවර් සමාගම රු.2,000,000.00 (රුපියල් විසිලක්ෂයයි)

නෙක් එෆ්.එම්. රු.1,000,000.00 (රුපියල් දසලක්ෂයයි)

නෝලිමිට් ආයතනය රු.2,000,000.00 (රුපියල් විසිලක්ෂයයි)

මැලිබන් බිස්කට් රු. 1,500,000.00(රුපියල් පහළොස්ලක්ෂයයි)

නයනා පුෂ්පලතා සහ සමාගම රු. 500,000.00 (රුපියල් පන්ලක්ෂයයි)

(ආ) අදාළ නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මා පළමුවෙන්ම කියන්න කැමැතියි, 2007 වර්ෂයේ ඉඳලා මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ මුදල් පිළිබඳ වාර්තා බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරලා තිබුණේ නැහැ කියන කාරණය. විශේෂයෙන්ම 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් පනතේ 36(1) වගන්තිය අනුව සෑම අවුරුද්දකම ජූනි මස 30වැනි දින හා දෙසැම්බර් මස 31වැනි දින මේ වාර්තා බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන්නට ඕනෑ. නමුත් මේ වන තුරුත් ඒවා ඉදිරිපත් කරලා නැහැ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ගරු මන්ත්‍රීතුමා, -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න, මා ප්‍රශ්නය අහලා ඉවර නැහැ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඒ ගැන වෙනම ප්‍රශ්නයක් අහන්න. ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයට අප උත්තර දුන්නා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දළදා මාලිගාවේ විය හියදම් ගැන කථා කරන්නේ නැතිව වෙන මොනවා ගැනද මා අහන්නේ?

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඒ ගැන වෙනම ප්‍රශ්නයක් අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මෙපමණ මුදලක් ලැබුණාම මේකෙන් යම් කිසි මුදල් ප්‍රමාණයක් වියදම් කරලා, යම් කිසි මුදල් ප්‍රමාණයක් ඉතිරි වනවා නේ. මෙය ගණන් හදලා බැලුවාම

[ගරු දයාසිරි ජයසේකර මහතා]

රුපියල් කෝටි දෙකහමාරක් වියදම් වුණාට රුපියල් කෝටි හතරහමාරක් විතර ඇවිල්ලා තිබෙනවා. ඉතින් මා අහන්නේ, මේ අදාළ අනෙකුත් මුදල්වලට මොකද වෙන්නේ කියලායි. ගරු කථානායකතුමනි, 2007 අවුරුද්දේ ඉඳලා දිගින් දිගටම දියවඩන නිලමේවරයා විසින් අදාළ මුදල් පිළිබඳව වාර්තා ඉදිරිපත් කරලා නැහැ කියලා මා කියන්න කැමැතියි. මා ළඟ බෞද්ධ කටයුතු නියෝජ්‍ය කොමසාරිස්තුමාගේ ලේඛන කිහිපයක් තිබෙනවා. පනතේ 36(3) වගන්තිය අනුව මෙම විධි විධාන කඩ කරන අය සම්බන්ධයෙන් ගත හැකි යම් කිසි නීත්‍යානුකූල ක්‍රියා මාර්ගයන් පිළිබඳව වාර්තා වනවා. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව දඩුවම් කරන්නට ඕනෑ. හරි නම් ඔහුට ඒ තනතුර දරන්න බැහැ. ඔබතුමන්ලා මේ සම්බන්ධව ගෙන තිබෙන පියවර මොකක්ද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු එම්.කේ.ඒ.ටී.එස්. ගුණවර්තන)
(The Hon. M.K.A.D.S. Gunawardana)

ගරු කථානායකතුමනි, එය මේ ප්‍රශ්නයට අදාළ නැහැ. වෙනම ප්‍රශ්නයක් හැටියට ඉදිරිපත් කළොත් අපට උත්තර දෙන්න පුළුවන්.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
හොඳයි, ඒ ගැන සොයා බලන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මේ accountsවලට අනුවයි මා ඒ ගැන ඇහුවේ.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)

නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා අවධානයට යොමු කර ගත් ප්‍රශ්න ගැන සොයා බැලුවාම හරි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

ඒක තමයි.

අනික් කාරණය මේකයි. "නෝලිමිට්" කියන ආයතනය මුස්ලිම් ව්‍යාපාරිකයකු විසින් මෙහෙයවනු ලබන ආයතනයක්. ඒ ආයතනයෙනුත් දළදා මාලිගාවේ පෙරහැරට මුදල් දීලා තිබෙනවා. බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා වන ඔබතුමාගෙන් මා මෙන්න මේ කාරණය අහන්න කැමැතියි. මුස්ලිම් ජනතාව වෙනුවෙන් මුස්ලිම් ව්‍යාපාරිකයනුත් දළදා මාලිගාවේ කටයුතුවලට මුදල්හදල් ලබා දෙනවා.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු එම්.කේ.ඒ.ටී.එස්. ගුණවර්තන)
(The Hon. M.K.A.D.S. Gunawardana)

ඒක සතුටු විය යුතු කරුණක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමා පොඩ්ඩක් ඉන්නකෝ. ප්‍රශ්නය අහගන්න. ගරු කථානායකතුමනි, මේ එක එක සේනා, රාවණා බලකායවල්, අරවා මේවායින් කරන ක්‍රියාදාම එක්ක ඔවුන් බෞද්ධාගමික කටයුතුවලට මෙහෙම උදවු කරන එක ඇත්ත වශයෙන්ම අපට ආදර්ශයක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සිංහල බෞද්ධයින් සහ මුස්ලිම් ආගමිකයින් අතර ඇති වෙමින් යන කඩවල් කඩන, CCTV cameraවලට පහර දෙන දැවැන්ත, තර්ජනාත්මක ව්‍යාපාරයට විරුද්ධව ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු එම්.කේ.ඒ.ටී.එස්. ගුණවර්තන)
(The Hon. M.K.A.D.S. Gunawardana)

ගරු කථානායකතුමනි, එවැනි පැමිණිලි, චෝදනා ලැබුණු හැම අවස්ථාවකම අප නීත්‍යානුකූලව කටයුතු කර තිබෙනවා. ඉදිරියටත් එහෙම කටයුතු කරනවා. නමුත් මේක ජාති, ආගම් භේදයක් හැටියට මුළු රට පුරාම ගෙන යන්න -ප්‍රචාරය කරන්න- යම් කොටසකට ඕනෑ කරනවා. ඒකෙන් බලාපොරොත්තු වන්නේ රජයට මඩ ගැහිල්ලක්. වෙන ක්‍රමයකින් එය කරන්න බැරි වුණා; යුද්ධය පිට දමලා කරන්න බැරි වුණා. දැන් මේ ආගම් ප්‍රශ්නයක්. මේ එවැනි වැඩ පිළිවෙළක් ගරු කථානායකතුමනි. ඒ නිසා එම ප්‍රශ්නය අදාළ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, එතුමා කියන මුසාවාද ගැනයි මා මේ කල්පනා කළේ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු එම්.කේ.ඒ.ටී.එස්. ගුණවර්තන)
(The Hon. M.K.A.D.S. Gunawardana)

හා, ඒවා මුසාවාද! ඔබතුමා විතරයි හරියට සත්‍යය ප්‍රකාශ කරන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

මේ ආගම් භේදය ඇති කළේ වෙන කවුරුවත් නොවෙයි. මේක ජාත්‍යන්තර කුමන්ත්‍රණයක ප්‍රතිඵලයකුත් නොවෙයි.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)

පිළිතුරට අනුව අදාළ ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

මේක පිටු පස්සේ ආණ්ඩුවේ කට්ටිය ඉන්නවා; ආණ්ඩුවේ අය තමයි මේක ඇති කළේ. වෙන වෙන කට්ටිය නොවෙයි මේක ඇති කළේ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු එම්.කේ.ඒ.ටී.එස්. ගුණවර්තන)
(The Hon. M.K.A.D.S. Gunawardana)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට අදාළව පමණයි අපට කරුණු ඉදිරිපත් කරන්නට පුළුවන් වන්නේ. [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

තමුන්නාන්සේලා තමයි මේවාට උඩ ගෙඩි දෙන්නේ. [බාධා කිරීමක්]

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, තමන්ගේ මත ප්‍රකාශ කරන්න බැහැ, ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.[බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
බොදු බල සේනා සංවිධානයේ Commander-in-Chief කවුද?

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්තන)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඔය කථාව වෙනම රැස්වීමක් තියලා කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
රැස්වීමක් තියලා නොවෙයි, මා අහන්නේ බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා විධියට ඔබතුමාගෙන්. රටේ, සිංහල-දෙමළ ප්‍රශ්නය ඉවර කරලා දැන් ආයෙත් මුස්ලිම් ජනතාවත් එක්ක මරා ගන්නයි වෙලා තිබෙන්නේ.

පොලිස් ආරක්ෂක සහායකයින්: දීමනා
பொலிஸ் பாதுகாப்பு உதவியாளர்கள் : கொடுப்பனவுகள்
POLICE SECURITY ASSISTANTS: ALLOWANCES

2328/'12

4. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) පොලිස් නිලධාරීන් සමඟ සමාන රාජකාරියේ යෙදෙන පොලිස් ආරක්ෂක සහායකයින්, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ ස්ථිර කර විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලිස් ආරක්ෂක සහායකයින්ගේ සේවය ස්ථිර කිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලැබුවේද;

(ii) ඔවුන්ට නිසි නිල ඇඳුමක් සහ රාජකාරියේ යෙදෙන අවස්ථාවල තොරතුරු සටහන් පොතේ රාජකාරී වාර්තා කිරීමේ අවසරය ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) පොලිස් නිලධාරීන්ට හිමි වැටුප් වර්ධක, කලාප දීමනා, ගමන් වියදම්, දුෂ්කර දීමනා, බටා දීමනා සේවය ස්ථිර කළ දින සිටම පොලිස් ආරක්ෂක සහායකයන්ට ගෙවා තිබේද;

(iv) එසේ ගෙවා නොමැති නම්, එම වරප්‍රසාද ඔවුන්ට ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) பொலிஸ் உத்தியோகத்தர்களுடன் சமமான கடமையில் ஈடுபடும் பொலிஸ் பாதுகாப்பு உதவியாளர்கள், இலங்கை பொலிஸ் திணைக்களத்தில் இணைக்கப்பட்டு சேவையில் நிரந்தரமாக்கப்பட்டு ஓய்வூதிய சம்பள முறைக்கு பங்களிப்புச் செய்யப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) பொலிஸ் பாதுகாப்பு உதவியாளர்களின் சேவை நிரந்தரமாக்கலானது பொலிஸ் திணைக்களத் தின் ஆட்சேர்ப்பு நடைமுறையின்கீழ் இடம் பெற்றதா என்பதையும்;

(ii) இவர்களுக்குப் பொருத்தமான சீருடையையும் கடமையில் ஈடுபடும்போது தகவல் குறிப்பு புத்தகத்தில் கடமைக்கு சமுகமளிப்பதைப் பதிவதற்கான அனுமதியையும் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) பொலிஸ் உத்தியோகத்தர்களுக்கு உரித்தான சம்பள உயர்வு, வலய கொடுப்பனவு, பிரயாணச் செலவு, கஷ்டப் பிரதேச கொடுப்பனவு, இதர கொடுப்பனவுகள் என்பன சேவை நிரந்தர மாக்கப்பட்ட திகதி தொடக்கம் பொலிஸ் பாதுகாப்பு உதவியாளர்களுக்கும் செலுத்தப் பட்டுள்ளதா என்பதையும்;

(iv) இவ்வாறு செலுத்தப்படாவிடின் மேற்படி சலுகைகளை இவர்களுக்குப் பெற்றுக் கொடுப்ப தற்குத் தேவையான நடவடிக்கைகளை எடுப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that Police Security Assistants who perform the same type of duties performed by the Police Officers have been confirmed in the service of Sri Lanka Police Department and made entitled to pensions?

(b) Will he state whether -

(i) the confirmation of the service of the Police Security Assistants was done in conformity to the recruitment procedure of the Police Department;

(ii) they will be provided with a proper uniform and the permission for reporting duties in the note book during duty hours be granted to them;

(iii) salary increments, zonal allowances, transport allowances, difficult area service allowance and bata, which the Police officers are entitled to, have been paid to them from the date of confirmation of service; and

(iv) steps will be taken to grant them those privileges, if they have not been paid?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

(අ) ඔව්.

(ආ) (i) නැත

(ii) මොවුන්ගේ තනතුරු මත ඊට සරිලන පරිදි නිල ඇඳුමක් ලබා දී ඇත. පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන්ගේ අධීක්ෂණ නිලධාරියාගේ අභිමතය පරිදි හා සහායක රාජකාරියේ ස්වරූපය අනුව මොවුන් හට තොරතුරු සටහන් පොතේ රාජකාරි වාර්තා කිරීමේ අවසරය ලබා දී ඇත.

(iii) නැත.

(iv) පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන් හට පොලිස් බලතල හිමි නොවන බැවින්ද, මොවුන් ප්‍රාථමික සේවා ගණයට අන්තර්ගත වන බැවින්ද 2009.02.20වන දින අංක 1589/30 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ප්‍රකාරව මොවුන්ට හිමි වරප්‍රසාද පමණක් දැනට ලබා දීමට හැකි වේ. එසේ වුවද අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති උසස් වීමේ හා බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වීමෙන් පසුව ඔවුන්ගේ වැටුප් වර්ධක හා අනිකුත් දීමනා ගෙවීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පැන නොනඟියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, පොලිස් ආරක්ෂක සහායකයන් 1998 දී තමයි ඉස්සෙල්ලාම බඳවා ගත්තේ. යුද සමයේ පොලිස් සේවයට බැඳීමට මේ රටේ බොහෝ දෙනා මැළිකමක් දැක්වූ මොහොතක, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හරහා පොලිස් ආරක්ෂක සහායකයන් බඳවා ගත්තා. එහෙම බඳවා ගත්ත 3148 දෙනෙකුගෙන් අද ඉතුරු වෙලා සිටින්නේ 1466 දෙනයි. දැන් ඔබතුමන්ලාගේ රජය යටතේ මේ අයගේ සේවය ස්ථීර කළාට, මේ අයට වැටුප් වර්ධක නැහැ; උසස් වීමේ ක්‍රමවේදයක් නැහැ. ඒ වාගේම සංයුක්ත දීමනා හා දුෂ්කර දීමනා ගෙවීම පිළිබඳ බරපතළ ගැටලුවක් තිබෙනවා. විශේෂයෙන්ම රණ විරුවන්ට සලකන මේ ආණ්ඩුව, යුද සමයේ විශිෂ්ට සේවාවක් කළ, පොලිස් ආරක්ෂක සේවාවේ අද සිටින 1466 දෙනා නිත්‍ය පොලිස් සේවාවට අන්තර්ග්‍රහණය කරන්නේ කවදාද කියලා මා ඔබතුමාගෙන් අහනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා දැන් පිළිගත්තා මේ රජය රණ විරුවන්ට සලකන රජයක් කියලා. මේ ප්‍රශ්නයට ලබා දී ඇති පිළිතුරේ ඉතා පැහැදිලිව තිබෙනවා, "එසේ වුවද අනුමතිය සඳහා ඉදිරිපත් කර ඇති උසස් වීමේ හා බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වීමෙන් පසුව ඔවුන්ගේ වැටුප් වර්ධක හා අනිකුත් දීමනා ගෙවීමට කටයුතු කරනු ලැබේ" කියා. මේ වැටුප් වර්ධක හා දීමනා ගෙවීමේදී යම් පරිපාලනමය ක්‍රමවේදයකට අනුව තමයි කරන්න ඕනෑ. අපිට ඕනෑ ඕනෑ විධියට ඒක කරන්න බැහැ. දැනට අනුමතිය සඳහා උසස් වීමේ හා බඳවා ගැනීමේ පටිපාටි ඉදිරිපත් කර තිබෙනවා. ඒවා අනුමත වුණාට පසු ඒ වැටුප් වර්ධක ගෙවනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇමතිතුමනි, මම කිව්ව වචන පටලවා ගන්න එපා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මා පටලවා ගන්නේ නැහැ. ඔබතුමාට තමයි පැටලිලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම කිව්වේ, "රණ විරුවන්ට සලකනවා යැයි කියන ආණ්ඩුව" කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

"සලකනවා යැයි කියන" විතරක් නොවෙයි, "සලකන" ආණ්ඩුව.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

දැන් ඔබතුමාගේ උත්තරයෙන් ප්‍රකාශ කළා, ඉවසන්න කියලා. ගරු ඇමතිතුමනි, මේ අය බඳවා ගත්තේ 1998 දී. දැන් ඒ අයගේ සේවා කාලය වසර 15ක් වෙනවා. ඒ අනුව දැන් වසර 15ක් ඉවසා තිබෙනවා. යුද්ධය අවසන් වෙලා අවුරුදු 4ක් ඉවසා තිබෙනවා. ඔබතුමන්ලා 2006 වසරේ හොඳ වැඩක් කළා. ඒ තමයි උප පොලිස් -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

විස්තර එපා. ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

උප පොලිස් සේවා නිලධාරීන් 27,000ක් නිත්‍ය පොලිස් සේවාවට අන්තර් ග්‍රහණය කළා. නමුත් පොලිස් ආරක්ෂක සහායකයන් නිත්‍ය සේවාවට අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රමය ඉබි ගමනින් ක්‍රියාත්මක වෙන්නේ ඇයි කියලා මම අහන්න කැමැතියි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

නැහැ, නැහැ. එහෙම ඉබි ගමනින් ක්‍රියාත්මක වීමක් නැහැ. රටේ පරිපාලනමය කටයුතු කිරීමේ දී ඒ පරිපාලන ව්‍යුහය, නීති-රීති හා රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. ඒ නිසා තමයි අපි කිව්වේ, ඒ උසස් වීමේ පටිපාටිය අනුමත වීමෙන් පස්සේ ඔවුන්ට වැටුප් වර්ධක සහ දීමනා ගෙවනවා කියලා. අනෙක, රජය විසින් ඔවුන්ට විශ්‍රාම වැටුප් දීමේ තීරණයක් අර ගෙන ඔවුන් ඒකටත් ඇතුළත් කර තිබෙනවා. ඉතින් සේවකයන් 27,000ක් සම්බන්ධයෙන් කටයුතු කළ අපට සේවකයන් 1000ක් කියන එක එච්චර ප්‍රශ්නයක් නොවෙයි. නමුත් එය ක්‍රමවත්ව කළ යුතුයි. ආවට ගියාට - ad hoc - කරන්න පුළුවන්කමක් නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. විශේෂයෙන්ම, මව හෝ පියා අභාවයට පත් වුණොත් පොලිස් කණිෂ්ඨ නිලධාරීන්ගේ සංගමයෙන් රුපියල් 20,000ක් ලැබෙනවා. දරුවා හෝ බිරිඳ අභාවයට පත් වුණොත් රුපියල් 50,000ක් ලැබෙනවා. ඒ වාගේම තුන් වැනි දරුවාට රුපියල්

ලක්ෂයක් ලබා දෙන වැඩ සටහනකුත් තිබෙනවා. නාරාහේන්පිට පොලිස් රෝහලේ ඇති විවිධ පහසුකම් ලැබෙනවා. නමුත් පොලිස් ආරක්ෂක සහායක ක්ෂේත්‍රයට මේ එකම සහනයක්වත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, අඩුම තරමින් ඒ අය නිත්‍ය පොලිස් සේවාවට අන්තර්ග්‍රහණය කරන තෙක් - ඔබතුමන්ලාගේ රජයට අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න දැන් අවුරුදු 15ක් ගිහිල්ලා තිබෙනවා-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, හරි. ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ අය නිත්‍ය පොලිස් සේවාවට අන්තර්ග්‍රහණය කරන තෙක් මේ සහන ටික ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එහෙම පුළුවන්කමක් නැහැ ගරු කථානායකතුමනි. මෙහි ඉතා පැහැදිලිව කියනවා, පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන්ට පොලිස් බලතල හිමි නොවන බැවින්ද, මොවුන් ප්‍රාථමික සේවා ගණයට අන්තර්ගත වන බැවින්ද ඒ පිළිබඳ ගැටලු තිබෙනවා කියලා. ඒ ගැටලු විසඳන්න තමයි යම් යම් උසස් වීමේ සහ බඳවා ගැනීමේ පටිපාටි අනුමත කිරීමක් කරලා තිබෙන්නේ. කෙසේ වෙතත්, මොවුන්ට තවදුරටත් යම් යම් දේවල් ලබා දිය යුතුද කියන ප්‍රශ්නය පිළිබඳව මම ඉදිරිපත් කරන්නම්,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමා, තවත් අවුරුදු 15ක් ගන්නේ නැතිව ඉක්මනින් ඒ අය ස්ථිර කරන්න. ඒකයි මා කියන්නේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
හරි හරි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉක්මනින් පොලිස් සේවාවට ඔවුන් අන්තර්ග්‍රහණය කරන්න. ඒකට අවුරුදු 15ක් ගන්න එපා.

වර්ගීකරණය කරන ලද පාසල් : විස්තර
வகைப்படுத்தப்பட்டுள்ள பாடசாலைகள் : விபரம்
CATEGORIZED SCHOOLS : DETAILS

2969/'12

5. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පසු ගිය මාස 7ක කාලය තුළදී, මෙරටේ පාසල් 200කට අධික ප්‍රමාණයක් වසා දමා ඇති බවත්;

(ii) තවත් පාසල් 1,590ක් වැසී යෑමේ අවදානමට ලක්ව ඇති බවත්;

(iii) පාසල් වර්ගීකරණය යටතේ නවීන පහසුකම් සහිත පාසල් ඇති කරන බව රජය පැවසුවද, එවැනි එකද පාසලක් හෝ දැක ගැනීමට නොහැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රජය විසින් වර්ගීකරණය කරන ලද පාසල් කවරේද;

(ii) එම වර්ගීකරණය යටතේ නවීකරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත පාසල් වර්ගීකරණය යටතේ එක් පාසලකට වෙන් කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නිදහස් අධ්‍යාපනයේ සමාන අයිතිවාසිකම් උපරිම ලෙස දරුවන්ට ලබා දීමට රුකුල් වන රජයේ පාසල් වැසී යෑමට ඉඩ නොදී ඒවා නවීකරණය කොට රටේ අනාගත පරපුර උදෙසා ලබා දීමට කටයුතු කරනු ලබන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 7 மாத காலப்பகுதியில் இந்நாட்டில் 200 இற்கும் அதிகமான பாடசாலைகள் மூடப்பட்டுள்ளன என்பதையும்;

(ii) மேலும் 1590 பாடசாலைகள் மூடப்படக்கூடிய ஆபத்துக்கு உள்ளாகியுள்ளன என்பதையும்;

(iii) பாடசாலை வகைப்படுத்தல்களின் கீழ் நவீன வசதிகளைக் கொண்ட பாடசாலைகளை ஏற்படுத்துவதாக அரசாங்கம் கூறியுள்ள போதிலும், அவ்வாறான ஒரு பாடசாலையையேனும் காண முடியவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) அரசாங்கத்தினால் வகைப்படுத்தப்பட்டுள்ள பாடசாலைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி வகைப்படுத்தலின் கீழ் நவீனமயப்படுத்தப்பட்டுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி பாடசாலை வகைப்படுத்தலின் கீழ் ஒரு பாடசாலைக்காக ஒதுக்கப்படுகின்ற பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இலவசக் கல்வியின் சமமான உரிமைகளை உயர்ந்தபட்சம் பிள்ளைகளுக்குப் பெற்றுக் கொடுப்பதற்கு உதவியாயமைகின்ற அரசாங்க பாடசாலைகள் மூடப்படுவதற்கு இடமளிக்காது, அவற்றை நவீனமயப்படுத்தி நாட்டின் எதிர்கால சந்ததியினருக்குப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) over 200 schools of this country were closed down during the past 7 months;

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

(ii) there are another 1590 schools facing imminent closure; and

(iii) although the Government had stated that they would start schools with modern facilities under categorization scheme, not a single such school can be seen?

(b) Will he state -

(i) the schools that were categorized by the Government;

(ii) the number of schools that have been renovated under the afore-mentioned categorization; and

(iii) the amount of money allocated for each school under the above categorization?

(b) Will he also state whether action will be taken to prevent the closure of Government schools, which ensure the maximum enjoyment of equal rights of free education for children and to modernize them and make them available to posterity?

(c) If not, why ?

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

(අ) (i) ගරු කථානායකතුමනි, පසු ගිය මාස 07ක කාල පරිච්ඡේදය තුළ පාසල් 200ක් වැසී යෑම කියන කාරණය කිසිසේත් පිළිගත නොහැකියි. එවැනි වාර්තාවක් ලැබිලා නැහැ.

පාසල් වසා දැමීමක් කිසිසේත් සිදු නොකෙරේ. ඇතැම් විට ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීම මත පළාත් සභාවලට අයත් පාසල් වැසී යෑමක් සිදු විය හැක.

(ii) කිසිදු අවදානමක් නැහැ. මහින්ද චින්තන ඉදිරි දැක්මේ ඇති පරිදි, දැනුම කේන්ද්‍රීය සංවර්ධන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා තිබෙන පාසල් පද්ධතිය ළමා මිතුරු පාසල් ලෙස පුළුවන් තරම් සංවර්ධනය කරනවා. සියලු ළමා මිතුරු පාසල් සඳහා රුපියල් ලක්ෂ 5 බැගින් ලබා දීලා ඒ කුඩා දරුවන්ගේ පාසල් ටික මේ පාසල් නිවාඩු මාසයේදී නහා සිවුවිමේ කටයුත්ත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මුළු රටේම එක වර ආරම්භ කරලා තිබෙනවා.

ඒ නිසා ඒ ප්‍රාථමික පාසල් 5,000 ළමා මිතුරු පාසල් ලෙස ගොඩ නැඟීම ආරම්භ කරලා තිබෙනවා. වහනවා නොවෙයි, වැහිලා තිබුණු පාසල් විවෘත කිරීමේ කටයුත්ත කර ගෙන යනවා.

පාසල් 1,590ක් වැසී යාමේ අවදානමට ලක්ව නැත. මෙම පාසල් කුඩා පාසල් වුවත් ඒවා මහින්දෝදය ද්විතීයික පාසල් 1,000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පෝෂක පාසල් ලෙස ද්විතීයික පාසලට සම්බන්ධ කර ගෙන ඇත. ඒවා සංවර්ධනය කිරීමට අතිගරු ජනාධිපතිතුමාගේ අනුග්‍රහය හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහාය ඇතිව විශේෂ සංවර්ධන ක්‍රියාදාමයක් දියත් කර ඇත. මෙම කාර්යය මේ වන විට ඉතා සාර්ථකව ක්‍රියාත්මක වේ. අමතරව මෙම පාසල් ළමා මිතුරු ප්‍රවේශය තුළින් සංවර්ධනය කිරීම සඳහා දැනටමත් කටයුතු යොදා ඇති අතර ජනාධිපති කාර්යාලයත්, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුත් එක්ව අමාත්‍යාංශය සම්බන්ධීකරණය කරමින් මෙම පාසල් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කරමින් පවතී. ඉදිරි වර්ෂ පහ ඇතුළත මෙම පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව කුඩා වුවත් සංවර්ධිත පාසල් ලෙසට ගොඩ නැඟීමට හැකි වනු ඇත.

(iii) මම නොදන්නෙහිය. ගරු කථානායකතුමනි, මක් නිසාද යත් මේ ගරු සභාවට මම ඉදිරිපත් කළා, අය වැය විවාදය අවස්ථාවේදී "අධ්‍යාපනයේ නව දැක්ම හා ප්‍රගතියේ පිය සටහන් 2012" කියලා සම්පූර්ණ වාර්තාවක් ඇතුළත් කෘතියක්. ඊට අතිරේකව මේ පිළිබඳව ගරු මන්ත්‍රීතුමාට දැන ගැනීම සඳහා මහින්දෝදය ද්විතීයික පාසල් දහසක් ප්‍රතිනිර්මාණය කිරීම යටතේ ප්‍රතිනිර්මාණය කළ පාසල්වල ඡායාරූප සහිතව "මහින්දෝදය ද්විතීයික පාසල් දහසක් ප්‍රතිනිර්මාණය කිරීමේ ජාතික වැඩසටහන" නමින් පොත් පිංචක් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට බෙදා දුන්නා. ඊට අතිරේකව "ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ මෑතකාලීන උපනතීන්" කියලා අධ්‍යාපනයේ ඇති වුණු වෙනස්කම් පිළිබඳව මේ ගරු සභාව දැනුවත් කරන්න තවත් කෘතියක් ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීතුමාට නැවත වතාවක් ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේදී අධ්‍යයනය කරන්නට හැකි වන පරිදි ගරු කථානායකතුමාගේ අවසරය ඇතිව මෙම කෘති තුනම පාර්ලිමේන්තු පුස්තකාලයේ තැබීම සඳහා මම **සභාගත*** කරනවා.

පාසල් වර්ගීකරණය යනු වෙනම සංකල්පයකි. එය පාසල් නවීකරණයට කෙළින්ම අදාළ වන්නක් නොවේ. පාසල් නවීන පහසුකම් සහිතව වැඩි දියුණු කිරීම සඳහා මහින්දෝදය ද්විතීයික පාසල් 1,000ක් රට පුරා ඉදිකිරීම අදියර 02කින් ක්‍රියාත්මක කර ඇත. පළමු අදියරට අයත් පාසල් 409ක් දැනට ශීඝ්‍රයෙන් ඉදිකරමින් පවතී. ඉන් 06ක් නිම කර ඇත. සියයට 90ක මට්ටමට නිම කර ඇති පාසල් ගණන 133කි. සියයට 75කට වඩා වැඩ නිම කර ඇති පාසල් ගණන 110කි. සියයට 50 - සියයට 75 අතර වැඩ නිම කළ පාසල් ගණන 130කි. මෙම පාසල් 409ම 2013 වර්ෂය තුළදී නිම වේ. දෙවන අදියරේ පාසල්වල වැඩද මෙම වර්ෂය තුළම ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

මෙම පාසල් තුළ සකස් කෙරෙන මහින්දෝදය විද්‍යාගාරය තුළ පහත දැක්වෙන පහසුකම් ඇත.

01. තොරතුරු තාක්ෂණ විද්‍යාගාර
02. භාෂාගාරය
03. භෞතික විද්‍යාගාරය
04. රසායන විද්‍යාගාරය
05. ජීව විද්‍යාගාරය
06. නැණැස දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
07. ගණිතාගාරය

මෙයට අමතරව

නව ආදර්ශ ප්‍රාථමික පාසල් ව්‍යාපෘතිය යටතේ පාසල් 475ක් සංවර්ධනය කර සිසු අයිතියට පත් කර ඇත.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ළමා මිතුරු ප්‍රවේශය තුළින් පාසල් 3080ක් නවීකරණය කර ඇත.

(ආ) (i) පාසල් වර්ගීකරණය කිරීමේදී රජය පහත සඳහන් නිර්ණායක අනුව පාසල් වර්ගීකරණය කරයි.

1AB - අ.පොෂ.ස.(උසස් පෙළ) විද්‍යා විෂය ධාරාව සහිත පාසල් - 735

1C - අ.පොෂ.ස.(උසස් පෙළ) කලා/වාණිජ විෂය ධාරාව සහිත විද්‍යා විෂය ධාරාව නොමැති පාසල් - 2,041

Type 2 - අ.පොෂ.ස.(සා.පෙළ) දක්වා පංති සහිත පාසල් - 4,030

Type 3 - 8 ශ්‍රේණිය දක්වා පන්ති සහිත පාසල් - 3,125

(ii) මෙය සංකල්ප දෙකකි. නවීකරණය හා වර්ගීකරණය කියන සංකල්ප සියල්ල 2012 සිට 2016 දක්වා වෙනස් වෙලා තිබෙනවා.

පාසල් වර්ගීකරණය වෙනත් සංකල්පයකි.

පාසල් නවීකරණය සඳහා මහින්දෝදය ද්විතීයික පාසල් දහසක් හා ඒ හා බැඳුණු ප්‍රාථමික පාසල් ජාලයක් සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ නව ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහන හා ළමා මිතුරු පාසල් සංවර්ධනය යන වැඩසටහන් යොදා ගනී. මේ පිළිබඳ පූර්ණ විස්තරයක් (අ) (iii) යටතේ ඉදිරිපත් කර ඇත.

(iii) ඉහත (අ) (ii) සඳහන් මහින්දෝදය ද්විතීයික පාසල් සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ එක් පාසලකට රුපියල් මිලියන 60 බැගින් වෙන් කරනු ලැබේ.

කුඩා ප්‍රාථමික පාසල් සංවර්ධනය සඳහා ද එක් පාසලකට රුපියල් ලක්ෂ 5 බැගින් පාසල් 1,680කට ලබා දී ඇත. ජනතා සහභාගීත්වය ද ලබා ගෙන මෙයට ඔවුන්ගේ දායකත්වය එක් කර එම මුළු වටිනාකමට වැඩියෙන් සංවර්ධන කටයුතු ඉටු කර ඇත.

(ඇ) ඔව්.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, අපි මේ වන කොට පාසල් පද්ධතිය සියලුම පහසුකම් සහිතව සකස් කරනවා. විද්‍යාගාර, වාණිජ විද්‍යාගාර, භාෂාගාර, ගණිතාගාර ඇතුළත් මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සහිත පාසල් තුන බැගින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම හදනවා. මේ වන විට මේ රට තුළ පාසල් 409ක ඉදිකිරීම් කටයුතු අවසන් වෙමින් පවතිනවා. ඒක අධ්‍යාපනයට කරන දැවැන්ත ආයෝජන ව්‍යාපෘතියක්. ඒක දවසකින් කරන්න බැහැ. මොකද, දෙමහල් ගොඩනැඟිල්ලක් සහිතව පාසල් 409ක් හදනවා. ඉතුරු ටික සඳහා ලබන මාසය තුළ දී ටෙන්ඩර් කැඳවීම් කරනවා. මේ වර්ෂය අවසන් වන විට මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සහිත පාසල් දහස ඉදිකිරීමේ කටයුතු නිම වෙනවා. ලෝක බැංකුව විසින් ඒ පාසල්වලින් 175ක් තනා දෙන්න මූල්‍ය ප්‍රතිපාදන ලබා දීලා පළාත් විසින් ටෙන්ඩර් කැඳවලා තිබෙනවා. ආසියානු සංවර්ධන බැංකුව මට පොරොන්දු වෙලා තිබෙනවා, තව පාසල් 255ක් සඳහා මේ ජූලි මාසයේ දී ඇති කර ගන්නා ණය ගිවිසුම යටතේ මුදල් ලබා දෙන බවට. ඒ නිසා පාසල් පද්ධතිය වසන්නේ නැහැ. මම ඔබතුමන්ලාගේ දැනගැනීම සඳහා කියන්න කැමැතියි, මෙහෙම තත්ත්වයක් තිබෙනවාය කියලා. රටේ වේගවත් සංවර්ධනයක් අලුතින් ඇති වෙලා තිබෙනවා. දරුවෝ නගරයේ මධ්‍යස්ථාන වෙත ඒම නිසා, ගිය අවුරුද්දේ ලංකාවේ එකම දරුවෙක්වත් පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් නොවූ පාසල් 275ක් තිබෙනවා. එය සියයට 3ක්. එක දරුවෙක් පමණක් පළමුවැනි ශ්‍රේණියට පැමිණි පාසල් 123ක් තිබෙනවා. එය සියයට 1.3ක්. දරුවෝ දෙදෙනෙක් පමණක් පැමිණි පාසල් 147ක් තිබෙනවා. එය සියයට 1.6ක්. දරුවෝ තුන් දෙනෙක් විතරක් ඇතුළත් වුණු පාසල් 181ක් තිබෙනවා. සියයට 1 .9ක්. දරුවෝ හතර දෙනෙක් විතරක් ඇතුළත් වුණු පාසල් 210ක් තිබෙනවා. සියයට 2.3ක්. දරුවෝ පස් දෙනෙක් විතරක් පළමුවෙනි ශ්‍රේණියට ඇතුළත් වුණු පාසල් 223ක් තිබෙනවා. සියයට 2.4ක්. දරුවෝ හය දෙනායි නව දෙනායි අතර සංඛ්‍යාවක් ඇතුළත් වුණු පාසල් 963ක් තිබෙනවා. සියයට 10.5ක්.

ගරු කථානායකතුමනි, දරුවෝ දහ දෙනෙක්වත් පළමුවෙනි ශ්‍රේණියට ඇතුළත් වුණේ නැති පාසල් 2,123ක් මේ රටේ තිබෙනවා. එකම දරුවෙක්වත් පාසලට එන්නේ නැත්නම්, අපට මෙතැන කථා කරන්නට පුළුවන්. අලුතෙන් මාර්ග කැනිලා, මංමාවත් ඉදි වෙලා, දරුවන්ට පාසල් යන්නට පහසුකම් ලැබිලා ඒ දරුවෝ ස්වකැමැත්තෙන් තව කිලෝමීටරයක් , කිලෝමීටර් දෙකක් දුර පාසලකට යනවා නම්, අර පාසලේ දරුවෝ නැහැ. නමුත් පාසල පවත්වා ගෙන යනවා. එම නිසා ශිෂ්‍ය ගුරු අනුපාතය ගන්නට ඇතැම් ප්‍රදේශවල මේ පාසල් පද්ධතියේ සෑම ශිෂ්‍යයෝ පස් දෙනෙකුටම ගුරුවරයෙක් ඉන්නවා. ලෝකයේ කොහේවත් එහෙම ශිෂ්‍යයෝ පස් දෙනෙක් බලා ගන්න ගුරුවරයෙක් තියන්නේ නැහැ. රටේ ගුරු අනුපාතය 17: 1යි. මේ තත්ත්වය නිසා අපේ රටේ ගුරු අනුපාතය 5:1 වෙලා තිබෙනවා. එම නිසා මෙවැනි තත්ත්වයන් පිළිබඳව -පවතින යථාර්ථීක තත්ත්වයන් පිළිබඳව- උපදේශක කාරකසභාවේ දී හා පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරන්නට උදව් කරන්නටය කියා දරුවන්ගේ නාමයෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ප්‍රශ්නයේ (අ)(i)ට දුන් පිළිතුරෙන් ගරු ඇමතිතුමාම කිව්වා, පාසල් ප්‍රමාණයක් වසා දමා නැති බව. එසේ නම් මේ අවුරුදු හත තුළ කොපමණ පාසල් ප්‍රමාණයක්ද වසා දමා තිබෙන්නේ කියා මා අහන්නට කැමතියි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු මන්ත්‍රීතුමනි, " පසු ගිය මාස 7ක කාලය තුළදී " කියලයි ඔබතුමා ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

"අවුරුදු හතක කාලය තුළදී" කියායි මම අසා තිබෙන්නේ. මෙහි සඳහන් කර තිබෙන්නේ " මාස හතක කාලය තුළදී" කියලායි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඒක තමයි, පසු ගිය මාස හත තුළ පාසල් 36යි වහලා තිබෙන්නේ. ඊට ඉස්සෙල්ලා ටික මම පසු ගිය කථාවේදී -

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මම හිතන හැටියට ඒක printing mistake එකක්. "පසු ගිය අවුරුදු හතක කාලය තුළ" කියලායි මම ප්‍රශ්නය අහලා තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහපු ප්‍රශ්නයට පමණක් උත්තර දුන්නොත් ඇති.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පාසල් වැසීම පිළිබඳ සම්පූර්ණ දවසක විවාදයක් තිබුණා. මම ඒ පිළිබඳ සියලු දත්ත කිව්වා. මම ඒ දත්ත ටික පොතක් ලෙසත් මුද්‍රණය කර දෙන්නම්. මොකද, කිසිදු ඵලදායී නොවන ප්‍රශ්න කිරීමක් මේ කරන්නේ. පාසල් වැසී යාම ගැන ඔබතුමන්ලා දවසක විවාදයක් ඉල්ලා සිටියා. මම සියලු දත්ත, කරුණු කාරණා සියල්ල ගෙනැල්ලා හැන්සාඩ් වාර්තාවට ඇතුළු කරමින් කිව්වා. මම නැවතත් ඒක මුද්‍රණය කර දෙන්නම්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මෙතුමා ප්‍රශ්නය හරියට අවබෝධ කර ගෙන නැහැ. ඇමතිතුමා හැම තිස්සේම අහන්නේ, "ළමයි එක්කෙනායි, දෙන්නායි ඉන්නේ, මොකක්ද කරන්නේ?" කියලායි. මේ පාසල් වැසී යෑමට හේතුව තමයි ගරු කථානායකතුමනි, අවශ්‍ය පහසුකම් නොමැති වීම. ගුරුවරු නැහැ. ඒ පාසල්වලට අවශ්‍ය පහසුකම් නොමැති වීම නිසා තමයි මේ පාසල් වැසී යන්නේ; වසා දමන්නට සිදු වෙලා තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගුරුවරු නැත්තේ කොහේද? ඉතා වටිනා ගොඩනැඟිලි තිබෙනවා. එන්න යන්න, පෙන්වන්න. ඒවායේ සියලු පහසුකම් තිබෙනවා. නමුත් ඒ දරුවෝ එන්නේ නැත්නම් මොකද කරන්නේ? සමාජයේ විවිධ හේතු රාශියක් තිබෙනවා, දරුවෙක් පාසලකට එන්න. ඒ නිසා තමයි පුළුල් පහසුකම් සහිතව ආකර්ෂණීය ලෙස නවීන පාසල් සකස් කරන්නේ. එන්න යන්න, පෙන්වන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මමත් ඒකම තමයි කියන්නේ ගරු කථානායකතුමනි. දෙමවුපියෝ දරුවන්ව පාසලකට දමනවා, මේ සියලු පහසුකම් තිබෙනවා නම්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
සිද්ධි ගන්න එපා. එහෙම වෙන්නේ නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අධ්‍යාපනය හොඳ නම්, ගුරුවරු ඉන්නවා නම්, ගොඩනැඟිලි තිබෙනවා නම්, පහසුකම් තිබෙනවා නම් දරුවකු පාසලකට ඇතුළත් කරනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එහෙම වෙන්නේ නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මේ කිසිවක් නැති නිසා තමයි ඒ පාසල්වලින් දරුවන් අයින් කරන්නේ. ඉතින් මේක තේරුම් ගන්න බැරිද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එහෙම වෙන්නේ නැහැ. මේ සිද්ධියක් අරගෙන කථා කරන්නේ. රටේ සමස්තය ගන්න. මේවා ගැන පර්යේෂණ කරලා, සමස්තය අරගෙන කථා කරන්න.

ගරු කථානායකතුමනි, දෙමවුපියන් අහිමි දරුවන්ගේ ළමා නිවාසයක් තිබෙනවා, ගම්පහ දිස්ත්‍රික්කයේ ගමක. ඒ ළමයින් ටික පාසලකට එනවා කියලා, ළමයින් 800ක් සිටිය පාසලේ සියලුම ළමයින් ටික වෙනත් පාසල්වලට ගියා. එක ළමයෙක්වත් දැන් නැහැ. හේතු සාධකය තමයි දෙමවුපියෝ නොමැති ළමයින් ඒ පාසලේ සිටීම.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, මොකක්ද පාසල?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ විවාදයක් නොවෙයි. දැන් ප්‍රශ්න අහනවා, ප්‍රශ්නවලට පිළිතුරු දෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, අමාත්‍යතුමාමයි මෙය විවාදයක් බවට පත් කර ගන්න හදන්නේ.

මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් ඇමතිතුමා කියන විධියට ගොඩනැඟිල්ලක් හැදුවාට, එහෙමත් නැත්නම් laboratory එකක් හැදුවාට ඒක අතිනවීන පාසලක් වෙන්නේ නැහැ. ඒකට තව බොහෝ පහසුකම් සපුරා ලියයුතුව තිබෙනවා. ඔය කියන විධියේ සියලු පහසුකම් සහිත පාසල් කීයක් හදලා තිබෙනවාද කියන එකයි මට අහගන්න ඕනෑකම තිබුණේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ හදලා තිබෙන සංඛ්‍යාව මේ පොතේ තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මෙතුමා කියනවා,"මේ ගොඩනැඟිල්ල හදන්න මෙච්චර කාලයක් යනවා", "මේ ගොඩනැඟිල්ලට මෙච්චර කාලයක් යනවා" කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඇස් පෙනෙන ඕනෑම කෙනෙකුට බලා ගන්න සම්පූර්ණ පින්තූරක් එක්ක මම කිහිප වතාවක් ඉදිරිපත් කළා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
එහෙම නවීන පහසුකම් සහිත පාසල් කීයක් හදලා තිබෙනවාද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පාසල් 59ක් විවෘත කරලා තිබෙනවා. 409ක් හදනවා. කොළඹ දිස්ත්‍රික්කය තුළ විවෘත කරපු සියලු පාසල් ටික බලන්න-

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ගොඩනැඟිල්ලක් හෝ දෙකක් දීලා තමයි ඔය කියන්නේ, 59ක් හදලා තිබෙනවා. 400 ගණනක් හදනවා කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මෙතුමා ඉතාම අසත්‍ය ප්‍රකාශයක් නේ කරන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේම දත්ත ආශ්‍රයෙන් තමයි මා මේ කියන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පරිගණක laboratory එක හදන කොට පරිගණක ගුරුවරු 1,000ක් බඳවා ගත්තාම, විද්‍යා, ගණිත ගුරුවරු 1,000ක් බඳවා ගත්තාම, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ගුරුවරු 1,000ක් බඳවා ගත්තාම, මානව සම්පත් දෙන කොට, භෞතික සම්පත් දෙන කොට මෙතුමා මේ මොකක්ද කියන්නේ කියලා මට තේරෙන්නේ නැහැ. ඔබතුමා එන්න මගෙත් එක්ක යන්න. අපි දෙදෙනා යහළුවෝ නේ. අපි යමු.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, එතකොට මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
හොඳයි.

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, රජයෙන් විශාල වියදමක් දරලා, ගොඩනැඟිලි හදලා දීපු මේ වාගේ පාසල් විශාල සංඛ්‍යාවක් පසුව වසා දමා තිබෙනවා. මා නියෝජනය කරන කුලියාපිටිය ආසනයේත් තිබෙනවා. ඒවා දැන් හරක් ලඟින ස්ථාන බවට පත් වෙලා. ඒවායේ විද්‍යාගාරවල තවම උපකරණ පවා තිබෙනවා. මේවාට ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද කියා මා අහන්න කැමැතියි. තවම පියවර අරගෙන නැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
කරුණාකරලා පාසලකට ගිහින් බලන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, ගිහිල්ලා, බලලායි මේ කියන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඉන්න ප්‍රදේශය විතරක් නොවෙයි ලංකාව කියන්නේ. තමුන්නාන්සේගේ මැතිවරණ කොට්ඨාසය තුළ දියුණු පාසල් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒවාට පහසුකම් ලබා දීලා තිබෙනවා. ළමා මිතුරු පාසල්වල මේ අප්‍රේල් මාසයේ හදනවා. ඒ හදන තැන්වලට ඔබතුමා යන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කෝටි ගණනක් වියදම් කරලා හදලා, පසුව වසා දමා තිබුණු ගුරු මධ්‍යස්ථානයක් ගැන මා විසින්ම ඔබතුමාට පෙන්වා දීලා, ඔබතුමා ගිහින්-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ ගුරු මධ්‍යස්ථානය විවෘත කළා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒක විවෘත කළේ අපි පෙන්වා දුන්නාට පස්සේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඇති.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
අලුතෙන් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා එම මධ්‍යස්ථානය පළාත් සභාවට භාර දෙනවා, පළාතේ ප්‍රයෝජනය සඳහා.

අහුනකොළපැලැස්ස දිසා රෝහල : සම්පත්

அங்குணுகொலபெலஸ்ஸ மாவட்ட வைத்தியசாலை: வளங்கள்

ANGUNAKOLAPELESSA DISTRICT HOSPITAL : RESOURCES

1961/'11

6. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) අහුනකොළපැලැස්ස දිසා රෝහලෙහි පවත්නා දැඩි භෞතික හා මානව සම්පත් හිඟය හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව විශාල ගැටලු රැසකට මුහුණපා ඇති බවත්;

(ii) මෙහි ගොඩනැඟිලි කිහිපයක් ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් අත්හැර දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අහුනකොළපැලැස්ස දිසා රෝහලට අවශ්‍ය පහසුකම් කඩිනමින් ලබා දීම සඳහා සැලසුම් කර තිබේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, රෝහලේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම රෝහලේ පවතින සේවක ඌනතාව කොපමණද යන්න හඳුනා ගෙන තිබේද;

(ii) ඒ අනුව එක් එක් අංශය සඳහා පවත්නා සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அங்குணுகொலபெலஸ்ஸ மாவட்ட வைத்திய சாலையில் நிலவுகின்ற கடுமையான பௌதிக மற்றும் மனித வள பற்றாக்குறை காரணமாக பிரதேச மக்கள் பல பாரிய பிரச்சினைகளை எதிர்கொண்டுள்ளனர் என்பதையும்;

(ii) இங்கு சில கட்டிடங்கள் மறுசீரமைக்கப்படாத காரணத்தால் கைவிடப்பட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) அங்குணுகொலபெலஸ்ஸ மாவட்ட வைத்திய சாலைக்குத் தேவையான வசதிகளைத் துரிதமாக வழங்க திட்டமிடப்பட்டுள்ளதா;

(ii) இதற்குத் தேவையான நிதி ஏற்பாடுகள் ஒதுக்கப்பட்டுள்ளதா;

(iii) அவ்வாறாயின், வைத்தியசாலையின் மறு சீரமைப்பு வேலைகள் ஆரம்பிக்கப்படும் திகதி யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவ்வைத்தியசாலையில் நிலவும் ஊழியர் பற்றாக்குறை எவ்வளவு என இனங்காணப்பட்டுள்ளதா;

(ii) அதன் பிரகாரம் ஒவ்வொரு துறையிலுமுள்ள ஊழியர் வெற்றிடங்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு;

(iii) இவ்வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை மேற்கொள்ளும் திகதி யாது

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that-

(i) the people in the Angunakolapelessa area are greatly inconvenienced owing to the severe dearth of physical and human resources in the Angunakolapelessa district hospital; and

(ii) a number of buildings of this hospital has been abandoned due to lack of repair?

(b) Will he inform this House -

(i) whether it has been planned to provide the Angunakolapelessa District Hospital with the required facilities soon;

(ii) whether required provisions have been allocated for that purpose; and

(iii) if so, the date on which the reconstruction activities of the hospital will be started?

(c) Will he state -

(i) whether the shortage of employees prevailing at this hospital has been identified;

(ii) accordingly, the number of vacancies that exist in each division separately;

(iii) the date on which arrangements will be made to fill those vacancies?

(d) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) අහුනකොළපැලැස්ස දිසා රෝහලේ මේ වන විට සම්පත් හිඟයක් නොමැත.

(ii) පැරණි ගොඩනැඟිලි වෙනුවට නව ගොඩනැඟිලි ඉදිකර ඇති අතර ඉතා පැරණි ගොඩනැඟිලි 02ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයක පවතී.

(ආ) (i) 2012 වර්ෂයට අදාළ සැලසුම් දැනට සිදු කරනු ලැබ ඇත.

(ii) ඔව්. රුපියල් මිලියන 15යි.

(iii) දැනට ආරම්භ කර ඇත.

(ඇ) (i) දැනට සේවක ඌනතාවක් නොමැත.

(ii)

	ඇති විය හැකි පුරප්පාඩු සංඛ්‍යාව
වෛද්‍ය නිලධාරී	05
දන්ත ශල්‍ය වෛද්‍ය	01
ලියා පදිංචි සහකාර වෛද්‍ය	00
හෙද කාර්ය මණ්ඩලය	15
වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ	01
ඖෂධ සංයෝජක	02
සංවර්ධන සහකාර	01
පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී	04
රෝහල් උපස්ථායක	05
අරක්කෑමී	00
සාමාන්‍ය කම්කරු	05
ඉසින යන්ත්‍ර ක්‍රියාකරු	00
සනීපාරක්ෂක කම්කරු	09
හෙද (I ශ්‍රේණිය)	01
රියැදුරු	01
රෝහල් ඕවර්සියර්	01
මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී	01

(iii) මෙම වසර තුළ ලබා දීමට නියමිතය.

(ඈ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමා සඳහන් කළා, ඉතා අබලන් තත්ත්වයේ ගොඩනැඟිලි දෙකක් තිබෙනවාය කියලා. ඒ ගොඩනැඟිලි දෙක වෙනුවට නව ගොඩනැඟිලි දෙකක් ලැබුණොත් තමයි ඒ රෝහලේ කාර්යක්ෂමතාව වැඩි වෙන්නේ කියලා ඔබතුමා පිළිගන්නවාද?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
දැනට ඒ පැරණි ගොඩනැගිලි අයින් කරලා තිබෙනවා. 2012 වර්ෂයේදී ඒ සැලසුම් හදලා තිබෙනවා. මිලියන 15ක ප්‍රතිපාදන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන් කරලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අහුණුකොළපැලැස්ස රෝහල අයිති හම්බන්තොට දිස්ත්‍රික්කයටත්, උතුරු මැද පළාතටත් බලපා තිබෙන වකුගඩු රෝගීන්ගේ ප්‍රශ්නයට අමාත්‍යාංශය මේ වන කොට අරගෙන තිබෙන අලුත්ම ක්‍රියා මාර්ගය මොකක්ද?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
මේක තමුන්නාන්සේගේ පැත්තට ගන්න යන්න එපා. වකුගඩු රෝගීන්ගේ ප්‍රශ්නය උතුරු මැද පළාතේයි තිබෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ. හම්බන්තොට දිස්ත්‍රික්කයටත් බලපාලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයටත් බලපාලා තිබෙනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, පසු ගිය දවස්වල කථාවක් තිබුණා, විශාල වශයෙන් තිබෙනවා කියලා. උතුරු මැද පළාත ගත්තොත් ලක්ෂ 12ක පමණ ජනගහනයකුයි ඉන්නේ. සාමාන්‍යයෙන් දැනට අපේ දත්ත අනුව 14,786ක් තමයි රෝගීන් ඉන්නේ. ඒක උතුරු මැද පළාතේ මුළු ජනගහනයෙන් 1.6ක්. මේක විශාල වශයෙන් පෙන්වන්න මාධ්‍ය තුළින් උත්සාහ කරනවා. නමුත් මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට අවශ්‍ය පියවරයන් ගෙන තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා කියන විධියට මේක උතුරු මැදට නම් බලපාන්නේ උතුරු මැදට ජලය ලැබෙන ප්‍රධාන ජල මූලාශ්‍රය තමයි මහවැලි ගඟ. මහනුවර දිස්ත්‍රික්කයේ ගොහාගොඩ කුණු ගොඩ තුළින් මහවැලි ගඟට එකතු වෙන කුඩු වුණු CFL bulbsවල ඊයම් මේ කාරණය කෙරෙහි -මේ වකුගඩු රෝගය කෙරෙහි- බලපානවාය කියලා කියනවා. නමුත් මේ ගැන කිසිම පර්යේෂණයක් සිදු වෙලා නැහැය කියලා කියනවා. ගොහාගොඩ කුණු ගොඩ හරහා එකතු වෙන දැවැන්ත කුඩු වුණු CFL bulbsවලින් එකතු වෙන රසදිය සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවාද? මේ ගැන කවුරුවත් පරීක්ෂණයක් කරලා නැහැ. නමුත් පරීක්ෂණයක් කළොත් මේක ප්‍රබල හේතුවක් වෙන්න පුළුවන් කියලායි මතය. මේ ගැන හොයලා බලනවාද?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
අපට අදාළ නැහැ. අදාළ අංශයට කරුණු වාර්තා කරන්න පුළුවන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
වකුගඩු රෝගයට අදාළ නැති ලු.

සිවිල් ආරක්ෂක නිලධාරීන් : සේවය ස්ථිර කිරීම

சிவில் பாதுகாப்பு அலுவலர்கள் : சேவையில் உறுதிப்படுத்தல்

CIVIL SECURITY OFFICERS : CONFIRMATION OF SERVICE

2330/'12

7. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවාවට සහයවීම සඳහා 2006.08.02 දින අංක 16/1395/206/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇති බවත්;

(ii) යුද්මය වාතාවරණයක් පැවති අවස්ථාවේදී, ජාතික වැදගත්කමක් ඇති උත්සවවලදී සහ විවිධ ආපදා අවස්ථාවන්හිදී සිවිල් ආරක්ෂක නිලධාරීන් පූර්ණ කැපවීමෙන් කටයුතු කර ඇති බවත්;

(iii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2009.12.15 වැනි දින නිකුත් කළ චක්‍රලේඛයෙහි 2009.10.31 වැනි දිනට අඛණ්ඩව දින 180ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන්ගේ සේවය කඩිනමින් ස්ථිර කරන බවට සඳහන් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට සිවිල් ආරක්ෂක සේවයේ නියුතු කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එම සේවයේ විවිධ ක්ෂේත්‍රවල සේවය කරන එක් එක් නිලධාරීන්ට දැනට ගෙවනු ලබන දෛනික වැටුප කොපමණද;

(iii) දෛනික වැටුපට සේවය කරන ඉහත දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සේවය ස්ථිර කර, ස්ථිර වැටුප් තලයක පිහිටුවා රජයේ නිලධාරීන්ට හිමි සියලුම වරප්‍රසාද ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) ඒ සඳහා ගතවන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை பொலிஸ் சேவைக்கு உதவுவதற்காக 2006.08.02ஆம் திகதிய 16/1395/206/052ஆம் இலக்க அமைச்சரவைத் தீர்மானத்திற்கு அமைய சிவில் பாதுகாப்புத் திணைக்களம் தாபிக்கப் பட்டுள்ளது என்பதையும்;

(ii) யுத்த சூழல் நிலவிய காலத்தில், தேசிய முக்கியத்துவமிக்க வைபவங்கள் மற்றும் பல்வேறு அனர்த்த சந்தர்ப்பங்களில் சிவில் பாதுகாப்பு அலுவலர்கள் பூரண அர்ப்பணிப் புடன் செயற்பட்டுள்ளார்கள் என்பதையும்;

(iii) சிவில் பாதுகாப்புத் திணைக்களம் 2009.12.15ஆம் திகதி வெளியிட்டுள்ள சுற்றறிக்கைக்கு அமைய 2009.10.31ஆம் திகதியன்று தொடர்ச்சியாக 180 நாட்கள் சேவையை பூர்த்தி செய்துள்ள அலுவலர்களைச் சேவையில் உறுதிப்படுத்துவதாகக் குறிப்பிடப் பட்டுள்ளது என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) தற்போது சிவில் பாதுகாப்புச் சேவையில் ஈடுபட்டுள்ள பணியாட்டொகுதி எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி சேவையின் பல்வேறு துறைகளிலும் கடமையாற்றுகின்ற ஒவ்வொரு அலுவலருக்கும் தற்போது செலுத்தப்படுகின்ற நாளாந்தச் சம்பளம் எவ்வளவு என்பதையும்;

(iii) நாளாந்த சம்பளத்திற்கு சேவையாற்றுகின்ற மேற்படி திணைக்கள ஊழியர்களைச் சேவையில் உறுதிப்படுத்தி நிலையான சம்பள நிலையில் வைத்து அரசாங்க ஊழியர்களுக்கு உரித்தான சகல சிறப்புரிமைகளையும் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(iv) அதற்கு எடுக்கும் காலவரையறை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that -

(i) the Civil Security Department has been established as per Cabinet decision No.16/1395/206/052 dated 02.08.2006 to assist the Sri Lanka Police Service;

(ii) Civil Security Officers have acted with total commitment when a war situation prevailed, at ceremonies of national importance and in various disaster situations; and

(iii) it has been stated that the officers who had completed 180 days of uninterrupted service by 31.10.2009 would be confirmed speedily as per the Circular issued by the Civil Security Department on 15.12.2009?

(b) Will he state -

(i) the number employed in the Civil Security Service at present;

(ii) the daily wages paid to each category of officers currently serving in various fields of that service;

(iii) whether measures will be taken to confirm the employees of the aforesaid Department who are serving for daily wages, place them on a permanent salary scale and grant them all the privileges that public officers are entitled to; and

(iv) the time frame required for that?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් 2009.12.15 දින චක්‍ර ලේඛයක් නිකුත් කර නොමැත.

(ආ) (i) කිස්අට දහස් පන්සියයක් පමණ. (38,500)

(ii)

තනතුර	දෛනික දීමනාව/ වැටුප් (රු)
දිස්ත්‍රික් නිලධාරි	530.00
නියාමක	485.00
උප නියාමක	445.00
සිවිල් ආරක්ෂක භටයින්	405.00

මීට අතිරේකව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ඉහත දෛනික වැටුපට සියයට 15ක දීමනාවක්ද, වැඩ කරන දිනකට රුපියල් 220ක ජීවන වියදම් දීමනාවක්ද ගෙවනු ලැබේ.

(iii) සිවිල් ආරක්ෂක සාමාජිකයන්ගේ සේවය ස්ථීර කර විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය විසින් 2012 අගෝස්තු මස 08 දින අනුමත කර ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(iv) අදාළ චක්‍රලේඛ හා අවශ්‍ය උපදෙස් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කළ පසු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වනු ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේත් ප්‍රකාශ කළා, සිවිල් ආරක්ෂක සේවකයින්ගේ සේවාව අගය කිරීමක් හැටියට විශ්‍රාම අයිතිය ලබා දී තිබෙනවා කියලා. අය වැය කථාවේ හයවන පිටුවේ ඒක සඳහන් වෙලා තිබෙනවා. නමුත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නිකුත් කරන "ඉඳිකඩ" සඟරාවේ සඳහන් වනවා, -ඒක දෙපාර්තමේන්තුවේ සඟරාවක්- "විසි වසරක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුන්ට විශ්‍රාම අයිතිය ලබා දෙනවා - මහින්ද චින්තන ඉදිරි දැක්ම" කියලා. ගරු ඇමතිතුමනි, කොන්දේසි විරහිතව විශ්‍රාම වැටුප් අයිතියත්, නිත්‍ය සේවාවට අන්තර්ග්‍රහණය කිරීමකුත්, නිත්‍ය වැටුපකුත් ලබා දෙනවා කියලා ජනාධිපතිතුමා කියනවා. එතකොට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව කියනවා, විසි වසරක් සම්පූර්ණ කරන්න ඕනෑය කියලා මේ විශ්‍රාම වැටුප් අයිතිය ලබා දෙන්න. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, අද කුලී වැඩක් කරන පුද්ගලයාටත් රුපියල් 900කට වැඩි දෛනික දීමනාවක් ලැබෙන මොහොතක මේ රටේ රණ විරුවන් 38,000කට දිනක වැටුප හැටියට රුපියල් 405ක සොච්චමකින් සලකන්නේ ඇයි කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

සොච්චමක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ රාජ්‍ය ක්ෂේත්‍රයේ වැටුප් ලබා දීමේ යම් ක්‍රමවේද සහ මට්ටම් තිබෙනවා. අද රාජ්‍ය සේවකයකුගේ වැටුප ගත්තොත් ඒ හා සමාන පිළිවෙළකට තමයි මේ වැටුපත් සකස් වෙලා තිබෙන්නේ. මේ අයට වැඩ කරන දිනකට රුපියල් 220ක ජීවන වියදම් දීමනාවකුත් ලබා දෙනවා. එතකොට රුපියල් හයසිය ගණනක් වනවා. ඒකට තව සියයට 15ක් එකතු වනවා. ඒ නිසා ඔබතුමා හැම දේම සොච්චමක් ලෙස අපහාසයෙන් සලකන්න එපා. මේ 38,000 වෙනුවෙන් විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කරලා තිබෙනවා. ඔබතුමාට මේ පිළිබඳව දැන ගන්න ඕනෑ නම් ඊළඟ රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට එන්න.

ඒ අමාත්‍ය මණ්ඩල සංදේශය අද ගෙනැල්ලා නැහැ. ඒ සඟරාවේ මේ සඟරාවේ තිබෙන දේවල් නොවෙයි, අමාත්‍ය මණ්ඩලය තීරණය කරන දේ තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ අමාත්‍ය මණ්ඩල සංදේශය ගෙනැල්ලා ඒ ගැන ඔබතුමාව දැනුවත් කරන්නම්. ඒ කැබිනට් පත්‍රිකාව දැන් මේ ලිපිගොනුවේ නැහැ. ඒ නිසා ඔබතුමා උපදේශක කාරක සභාවට ඇවිල්ලා එතැනදී ඒ ගැන ප්‍රශ්න කරන්න. එතකොට ඔබතුමාට මේ පිළිබඳව වඩාත් විස්තර දැන ගන්න පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, උපදේශක කාරක සභාව රැස් වෙනවා නම් මම එන්නම්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
රැස් වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමා කියන්න අවසානයට රැස් වුණේ කවදාද කියලා. ඇත්තටම රාජ්‍ය ආරක්ෂක උපදේශක කාරක සභාව මාස ගණනකින් රැස් වෙලා නැහැ. ඒක ඔබතුමාත් දන්නවා. මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, යුද්ධයේදී විශිෂ්ට කාර්ය භාරයක් කළ 38,000ක් වූ මේ සිවිල් ආරක්ෂක අංශයේ රණ විරුවන්ට අද භාර දීලා තිබෙනවා හරක් දක්කන්න, ඌරු කොටු බලා ගන්න,

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කුකුළන් බලා ගන්න, එළුවන් බලා ගන්න, ගඩොල් කපන්න, අලි වැටවල් හදන්න, අලි එළවන්න. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, රණ විරුවන්ට සලකනවාය කියන සංවේදී ආණ්ඩුව 38,000ක් වූ මේ සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින්ට අභිමානවත් විධියට සැලකීම ආරම්භ කරන්නේ කවදාද කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මා ඉතාමත් කනගාටු වෙනවා ඔබතුමාගේ ප්‍රකාශය පිළිබඳව. ඔබතුමා අද මේ රටේ පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම අවමානයට ලක් කරනවාද කියා මා අහන්න කැමැතියි. පශු සම්පත් ක්ෂේත්‍රයේ රාජකාරිවල යෙදෙන අය, කෘෂිකර්මාන්තයේ යෙදෙන අය, ගොඩනැඟිලි සෑදීමේ නිරත වන ජනතාව ඔබතුමා අවමානයට ලක් කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගොඩනැඟිලි ගැන මා කිව්වේ නැහැ. මා මේ කියන්නේ ඇත්ත.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, අද ඇත්ත වශයෙන්ම වල් අලි ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නම් ඒ අලි වැටවල් සෑදීමට ඒ අය යෙදවීමේ තිබෙන වරද මොකක්ද? ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාවට අවශ්‍ය සේවයක් ලබා දීමට කටයුතු කරන කොට එතුමා ඒක අවමානයට ලක් කරනවා. අපි විශ්වාස කරනවා, ඒ අයගෙන් මේ රටට යම් ආකාරයක සේවයක් ලබා ගන්න ඕනෑය කියා. සේවය අවශ්‍ය කොතැනටද, එතැනට අපේ රණ විරුවන් කැමැත්තෙන් ගිහිල්ලා ඒ සේවය කිරීමට සූදානම් වෙලා ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔවුන්ට අවමන් කරන්න එපා කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, මා ඒ අය අවමානයට ලක් කළේ නැහැ. ඔබතුමා පොඩ්ඩක් සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින් එක්ක කථා කර බලන්න, ඒ අය කැමැත්තෙන්ද මේ සේවාව කරන්නේ කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
අනිවාර්යයෙන්ම ඒ අය කැමැත්තෙනුයි ඒ සේවාව කරන්නේ. නැත්නම් අස් වෙලා යන්න එපායැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර කරන්න දෙන්න බැහැ? ඊළඟ ප්‍රශ්නවලට යන්න කාලය ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින්ට දෙපාර්තමේන්තුවෙන් කියා තිබෙනවා, කැමැති නම් තමන්ට ස්වයං රැකියාවලත් නිරත වෙන්න පුළුවන් කියලා. ඒක හොඳ දෙයක්.

ඒ කියන්නේ තමන්ගේ කැමැත්ත අනුව ස්වයං රැකියා කටයුතු කිරීම හොඳ දෙයක්. හැබැයි මේ ස්වයං රැකියාවේ නිරත වන කොට ඒ ගොල්ලෝ මාසිකව රුපියල් 5,000ත්, රුපියල් 7,000ත් අතර මුදලක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට බැර කරන්න ඕනෑ. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ රටේ මායිම් ගම්මාන ආරක්ෂා කරපු සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිරත වී සිටින 38,000ක් නිලධාරින්ට ස්වයං රැකියා කරන්න කියලා ඔවුන්ගෙන් හැම මාසයකම රුපියල් 5,000ත්, රුපියල් 7,000ත් අතර රාජ්‍ය තාන්ත්‍රික කප්පමක් අය කිරීම සාධාරණද කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, යම් කාර්යයක් වෙනුවෙන් රාජ්‍ය භාරයක් හෝ මුදලක් රජයට අය කර ගැනීම කප්පමක් බවට පත් වන්නේ නැහැ. "කප්පම" කියන වචනයේ අර්ථ නිරූපණය මේ මන්ත්‍රීතුමා නොදැනීම ගැන -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා පිළිගන්නවා, එහෙම මුදලක් අය කරනවා කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මුදල් අය කිරීමක් නොවෙයි. යම් ආදායමක් උපයනවා නම් යම් මුදලක් ගෙවන්න ඕනෑ. දැන් වෛද්‍යවරයෙක් යම් ආදායමක් උපයනවා නම් ඒ වෙනුවෙන් යම් කිසි මුදලක් ගෙවන්න ඕනෑ. ඒ විධියට යම් රාජ්‍ය නිලධාරියෙක් යම් කාර්යයක යෙදෙනවා නම් -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආදායම් බද්දක්?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඉංජිනේරුවරයෙක්, architect කෙනෙක් අමතර වැඩක් කරනවා නම් ඒකෙන් යම් මුදලක් රජයට ගැනීම රජයේ සම්ප්‍රදාය හා මුදල් රෙගුලාසියක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා පිළිගන්නවා, රණ විරුවන්ගෙන් රුපියල් 5,000ත්, රුපියල් 7,000ත් අතර මුදලක් අය කරනවාය කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. 8වන ප්‍රශ්නයට යනවා.

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව : විමර්ශන නිලධාරි

அரசாங்க ஒளடதக் கூட்டுத்தாபனம் : புலனாய்வு உத்தியோகத்தர்

STATE PHARMACEUTICALS CORPORATION: INVESTIGATION OFFICER

2384/'12

8. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වංචා හෝ අක්‍රමිකතා විමර්ශන කටයුතු සඳහා විමර්ශන නිලධාරියෙකු පත් කර තිබේද;

(ii) එසේ නම්, ඔහු පත් කරන ලද දිනය කවරේද;

(iii) එම පත්වීම සිදු කළ බලධාරියා කවුරුන්ද;

(iv) එම නිලධාරියාට මාසිකව ගෙවනු ලබන වැටුප, දීමනා සහ හිමි වන අනෙකුත් පහසුකම් කවරේද;

(v) පත් කළ දින සිට මේ දක්වා එම නිලධාරියා විසින් විමර්ශනය කර ඇති වංචා හෝ අක්‍රමිකතා කවරේද;

(vi) ඒවා සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(vii) ඔහුගේ සේවා කාලය අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

සුකාදාර අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) அரசாங்க ஒளடதக் கூட்டுத்தாபனத்தின் ஊழல்களை அல்லது முறைகேடுகளை புலனாய்வு செய்வதற்காக புலனாய்வு உத்தியோகத்தர் ஒருவர் நியமிக்கப்பட்டுள்ளாரா என்பதையும்;

(ii) ஆமெனில், அவர் நியமிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(iii) மேற்படி நியமனத்தை மேற்கொண்ட அதிகாரி யாரென்பதையும்;

(iv) மேற்படி உத்தியோகத்தருக்கு மாதாந்தம் செலுத்தப்படும் சம்பளம், கொடுப்பனவுகள் மற்றும் உரித்தாகும் ஏனைய வசதிகள் யாவையென்பதையும்;

(v) நியமிக்கப்பட்ட திகதி தொடக்கம் இன்றுவரை இந்த உத்தியோகத்தரால் புலனாய்வு செய்யப் பட்டுள்ள ஊழல்கள் அல்லது முறைகேடுகள் யாவையென்பதையும்;

(vi) அவை தொடர்பாக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vii) இவரது சேவைக்காலம் முடிவுக்கு வரும் திகதி யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health :

(a) Will he state -

(i) whether an Investigation Officer has been appointed for investigating the frauds and malpractices that have taken place in the State Pharmaceuticals Corporation;

(ii) if so, the date on which he was appointed;

(iii) the person in authority who made the aforesaid appointment ;

(iv) the salary and allowances paid to the aforesaid officer monthly and the other facilities which that officer is entitled to;

(v) the frauds and malpractices investigated by the aforesaid officer from the date of appointment up to now;

(vi) the action taken in relation to those frauds and malpractices; and

(vii) the date on which his period of service will end?

(b) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අතුරු ප්‍රශ්න කෙටියෙන් අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ විමර්ශන කටයුතු සඳහා විශ්‍රාමික නිලධාරියකු බඳවා ගෙන රුපියල් 100,000ක දීමනාවකුත් ගෙවනවා. මා දන්නේ නැහැ, එතුමාට මේ පිළිතුර කොහෙන්ද ලැබුණේ කියලා. මා ළඟ තිබෙනවා, ඔහුගේ සියලුම පඩි විස්තර.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති වෙතින් ලද වාර්තාව අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වංචා හෝ අක්‍රමිකතා විමර්ශන කටයුතු සඳහා විමර්ශන නිලධාරියකු පත් කර නොමැති බව සඳහන් වනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මා ළඟ ඔහුගේ පඩි වාර්තාවක් තිබෙනවා නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් ඒ පඩි වාර්තාව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට බලන්න දෙන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එය නියෝජ්‍ය අමාත්‍යතුමා දන්නේත් නැහැ. එතුමා කියන්නේ වෙන පිළිතුරක්ද දන්නේ නැහැ. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර දුන්නා. ඒ සම්බන්ධයෙන් අහන්න දෙයක් තිබෙනවා නම් අහන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එහෙම වැරැදි වාර්තාවක් එවා තිබෙනවා නම් ඒ ගැන සොයා බලන්න පුළුවන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ සම්බන්ධයෙන් වෙනත් ප්‍රශ්න තිබෙනවා නම් අහන්න කියා ගරු කථානායකතුමා කිව්ව නිසා දෙවන අතුරු ප්‍රශ්නය මා අහන්නම්. නියෝජ්‍ය අමාත්‍යතුමා විධියට ඔබතුමාට මා මේ කාරණය මතක් කරන්න කැමැතියි. මේ වන කොට පිළිකා රෝහලේ බෙහෙත් වර්ග 17ක් නැහැ. මා මේ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් කථා කළා. ඒ වාගේම පිළිකා රෝගීන් සම්බන්ධයෙන් කරන iodine treatment එක සඳහා පොරොත්තු ලේඛනයේ 2016 මාර්තු මාසය දක්වා රෝගීන් ඉන්නවා.මට හමු වුණු රෝගියාට 2016 මාර්තු මාසයේ තමයි iodine treatment එක කරන්න පුළුවන් වෙන්නේ.

මේ ප්‍රතිකාර කිරීම සඳහා කාමර දෙකයි පිළිකා රෝහලේ තිබෙන්නේ, ගරු කථානායකතුමනි. සතියකට රෝගීන් 40ක් එනවා. අට දෙනාටයි ප්‍රතිකාර කරන්න පුළුවන්කම තිබෙන්නේ. ඉතින් ඇත්ත වශයෙන්ම කාට හරි එම රෝගය හැදුණොත් එහෙම, අවුරුදු දෙකක් ගත වෙද්දි ඒ මනුෂ්‍යයා මැරිලා යනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර පසුව කථා කරන්න. ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා අහන්න කැමැතියි, ඔබතුමන්ලා ළඟ මෙයට විසඳුමක් තිබෙනවාද කියලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අද දින අසා තිබෙන ප්‍රශ්නයට නම් මෙය අදාළ නැහැ. නමුත් මා ඔබතුමාට පිළිතුරු දෙන්නම්. එහෙම ඖෂධ හිඟයක් පවතින්නේ නැහැ. සමහර අවස්ථාවල ඖෂධ ඇණවුම් කිරීමේ අඩු පාඩු පවතිනවා. අති විශාල වටිනාකමක් ඇති ඖෂධ අපි රෝගීන්ට ලබා දෙනවා. සමහර ඖෂධ රුපියල් ලක්ෂ හතරක්, හතරහමාරක් පමණ වෙනවා. නමුත් අපි ඒවා රෝගීන් සඳහා ලබා දෙනවා, ගරු කථානායකතුමනි. සමහර අවස්ථාවල එම ඖෂධ ඇණවුම් කිරීමේ ප්‍රමාදයන් සහ සැපයීමේ ප්‍රමාදයන් නිසා අඩු පාඩු ඇති වනවා. නමුත් 2016 වසර වන තෙක් ඔය අයඩින් ප්‍රතිකාරය සඳහා කල් ගත කරන්න අවශ්‍යතාවක් නැහැ. දැනට මහරගම පිළිකා රෝහලේ නව වාට්ටු සංකීර්ණයක් හදන්න ඉතා විශාල මුදල් ප්‍රමාණයක් වැය කරලා අපි ඒ කටයුතු කරගෙන යනවා. මේ පිළිකා රෝගීන් වෙනුවෙන් හොඳ සේවාවක් ලබා දීම සඳහා අපි විශාල මුදලක් වැය කරනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මා කියනවා, කරුණාකර ඔබතුමා පිළිකා රෝහලේ අධ්‍යක්ෂතුමාට දැන් එළියට ගිහිල්ලා කථා කරලා අහන්න, මොන තරම් බෙහෙත් සංඛ්‍යාවක් - බෙහෙත් වර්ග 17ක් - අඩුද කියලා. එහෙම නැද්ද, එහෙම නැත්නම් ඔබතුමා කරුණාකරලා ප්‍රකාශයක් කරන්න මම වැරැදි සඳහනක් කළා කියලා. ඒ වාගේම අයඩින් ප්‍රතිකාරය සම්බන්ධයෙනුත් ඔබතුමා කිව්වා, එහෙම කල් ගත වීමක් සිදු වන්නේ නැහැ යි කියලා. මට හමු වුණු ලෙඩා 2016 මාර්තු මාසය වන තුරු ලැයිස්තුවේ ඉන්නවා. ඔබතුමා මේ දැන් එළියට ගිහිල්ලා පිළිකා රෝහලේ අධ්‍යක්ෂතුමාට කථා කරලා ඒ ගැනත් අහන්න. එතුමා "එහෙම නැහැ" කියලා කිව්වොත් මම මේ පාර්ලිමේන්තු මන්ත්‍රීකමෙන් අද ඉල්ලා අස් වෙනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා ඉල්ලා අස් වෙන්න අවශ්‍යතාවක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙකැන අසත්‍යය කියන්න වැඩක් නැහැ නේ ගරු කථානායකතුමනි. මම මේ ඇත්ත කථාව කියන්නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපි රෝගීන්ට ප්‍රතිකාර කරන්න සීමිත සම්පත් ප්‍රමාණයක් තුළින් තමයි අසීමිත මුදල් ප්‍රමාණයක් වැය කරන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, අසත්‍යය කියන්න එපා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අසත්‍යය කියන්නේ නැහැ. අසත්‍යය කියන්න අවශ්‍යතාවක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නම් මම පාර්ලිමේන්තු මන්ත්‍රීකමෙන් ඉවත් වෙනවා. අසත්‍යය කියලා තේරුමක් නැහැ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඉතින් එහෙම යමක් තිබෙනවා නම් අපි ඒ ගැන සොයා බලා කටයුතු කරන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා වැදගත් කාරණයක් ගැනයි අවධානය යොමු කළේ. ඒ ගැන සොයා බලන්න.

පාසල් ළමුන්ට නිල ඇඳුම් රෙදි : විස්තර
பாடசாலை மாணவர் சீருடைத் துணி: விபரம்
UNIFORM MATERIAL FOR SCHOOL CHILDREN : DETAILS
2468/'12

9. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) පාසල් ළමුන්ට නිල ඇඳුම් සඳහා රෙදි ලබා දීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම වැඩසටහන ආරම්භ කරනු ලැබුවේ කවරෙකු විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2011 සහ 2012 වර්ෂවලදී,

(i) ඉහත වැඩසටහන තුළින් ප්‍රතිලාභ ලැබූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩසටහන සඳහා වෙන් කරනු ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම වැඩසටහන සඳහා සත්‍ය වශයෙන් වැය කළ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පාසල් නිල ඇඳුම් සඳහා ලබා දෙන රෙදි වර්ග දේශීයව නිපදවූ ඒවාද; නොඑසේ නම්, ආනයනය කළ ඒවාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பாடசாலை மாணவர்களுக்கு சீருடைத் துணி வழங்குதல் எப்போது ஆரம்பிக்கப்பட்டதென்பதையும்;

(ii) யாரால் அத்திட்டம் ஆரம்பிக்கப்பட்டதென்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) மேற்படி இத்திட்டத்திற்காக 2011 மற்றும் 2012ஆம் ஆண்டுகளில்,

(i) நன்மைபெறும் மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) ஆண்டொன்றுக்கு ஒதுக்கப்பட்ட தொகை யாதென்பதையும்;

(iii) உண்மையிலேயே செலவிட்ட தொகை யாதென்பதையும்;

வெவ்வேறாக அறிவிப்பாரா?

(இ) பாடசாலைச் சீருடைக்காக வழங்கப்படுகின்ற துணி வகைகள் உள்நாட்டில் உற்பத்தி செய்யப் பட்டவைகளா அல்லது இறக்குமதி செய்யப் பட்டவைகளா என்பதை இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state -

(i) as to when providing of uniform materials to school children was started; and

(ii) by whom that programme was started?

(b) Will he also state, in the year 2011 and 2012 -

(i) the number of students benefited by the programme;

(ii) the amount of funds allocated to this programme; and

(iii) the actual amount spent on this programme?

(c) Will he inform this House whether materials given for school uniforms are locally produced or imported?

(d) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 1993 වර්ෂයේ දී.

(ii) මෙම වැඩසටහන සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශය එවකට මුදල් ඇමති ලෙස අතිගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

(ආ) (i) 2011 වර්ෂයේ දී - 3,972,983

2012 වර්ෂයේ දී - 3,996,531

(ii) 2011 වර්ෂයේ දී - රුපියල් මිලියන 1,595

2012 වර්ෂයේ දී - ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය - රුපියල් මිලියන 1600

මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් අතිරේක ප්‍රතිපාදන - රුපියල් මිලියන 203

මු.රෙ 66 මඟින් සලසා ගත් ප්‍රතිපාදන එකතුව - රුපියල් මිලියන 437

එකතුව රුපියල් මිලියන 2240

(iii) 2011 වර්ෂයේදී - රුපියල් 1,363,871,832.77

2012 වර්ෂයේදී - රුපියල් 2,214,068,012.67*

* මෙම මුදල පහත පරිදි වැය කර ඇත.

2011 වර්ෂය සඳහා - රුපියල් 148,747,557.17

2012 වර්ෂය සඳහා - රුපියල් 1,517,680,959.62

2013 වර්ෂය සඳහා - රුපියල් 547,639,495.88

එකතුව රුපියල් 2,214,068,012.67

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

(ඇ) 2011 වර්ෂයේදී - 100%ක් දේශීයව නිෂ්පාදිත රෙදිපිළි බෙදා හරින ලදී. (එහෙත් සැපයුම්කරුවන් කලට වේලාවට රෙදි ලබා දීමට අපොහොසත් වීම මත නියමිත කාලය තුළදී නිල ඇඳුම් රෙදි බෙදා දීමට නොහැකි වුණි.)

2012 වර්ෂයේදී - 50%ක් ආනයනය කළ රෙදිපිළි වන අතර 50%ක් දේශීයව නිපදවන රෙදිපිළි භාවිත කරන ලදී.

20%ක් ඉදිරි වර්ෂයේ ප්‍රමාදයන් අවම කර ගැනීම සඳහා ආරක්ෂිත තොගයන් වශයෙන් පවත්වා ගැනීමට ආනයනය කරන ලදී. මෙම තොගය අමාත්‍යාංශය විසින් දැනට ඔරුගොඩවත්ත ගබඩා සංකීර්ණයේ ගබඩා කර ඇති අතර අති දුෂ්කර පාසල්වල දරුවන් සඳහා ලබා දෙන අමතර නිල ඇඳුම් කට්ටලය සඳහා මෙම ආරක්ෂිත තොගය භාවිත කිරීමට යෝජිතව ඇත. ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ වැය වූ මුදල් ප්‍රමාණය ඇමුණුමෙහි දැක්වේ. ඇමුණුම **සභාගත*** කරමි.

(ඈ) අදාළ නොවේ.

සභාමේසය මත තබන ලද ඇමුණුම:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

පාසල් නිල ඇඳුම් සම්බන්ධව ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා වැය වූ මුදල :

වර්ෂය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	පාසල් නිල ඇඳුම් සඳහා වැය වූ මුදල රුපියල් මිලියන (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව)
1998	4,136,029	1,988
2001	4,187,146	1,910
2009	3,864,824	1,259
2011	3,972,983	1,363
2012	3,996,531	2,214

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි, ගරු ඇමතිතුමනි. මෙවැනි වැඩ පිළිවෙළක් ගෙන යන්න රුපියල් මිලියන 4,800ක් වැය වනවාය කියලා අධ්‍යාපන අමාත්‍යාංශයම ඇස්තමේන්තු කර තිබෙනවා. මේකේ අර්ථ කථනය වන්නේ ඔබතුමන්ලා මුළු රටටම නිල ඇඳුම් රෙදි දෙන්නේ නැති බවයි. ඒ වාගේම ඔබතුමාත් මමත් නියෝජනය කරන කොළඹ දිස්ත්‍රික්කයේ සියයට 40කට විතර මේ පාසල් නිල ඇඳුම් රෙදි ලැබිලා නැහැ. අනික් පැතිවලත් මේ වාගේම දේවල් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා වෙන් කර තිබෙන මුදල් තුළින්ම ඔප්පු වෙනවා, රට පුරාම මේ වැඩ පිළිවෙළ ගෙන යන්නේ නැහැ කියලා. ඇයි එහෙම කරන්නේ?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මම ප්‍රථම වතාවට තමයි මේ අහන්නේ සමස්ත ශ්‍රී ලංකාව තුළ මෙන්න මේ මේ තැන්වලට නිල ඇඳුම් රෙදි ලැබිලා නැහැය කියලා. ඔබතුමා මට විස්තරයක් දුන්නොත් ලංකාවේ මෙන්න මේ පාසලට -අනුරාධපුරයේ, පොළොන්නරුවේ, අම්පාරේ, ආනමඩුවේ වශයෙන්- නිල ඇඳුම් රෙදි ලැබිලා නැහැ කියලා-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කොළඹ දිස්ත්‍රික්කයේත් නිල ඇඳුම් රෙදි ලැබී නැති පාසල් තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඔබතුමා කොළඹ දිස්ත්‍රික්කයේ ඒවා නොලැබුණු පාසල් පිළිබඳ විස්තර ටික මට දෙන්න. මට පුළුවන් ඒ පිළිබඳ අපක්ෂපාත පරීක්ෂණයක් කරන්න. සමස්ත ශ්‍රී ලංකාවේ සියලුම දරුවන්ට නිසි කලට, මේ නිල ඇඳුම් බෙදා දීමේ කටයුත්ත ගිය වර්ෂයේදී නිම කළා කියලා තමයි මට සියලු වාර්තා ලැබී තිබෙන්නේ. එසේ නොවන තැනක් තිබෙනවා නම් ඔබතුමා කරුණාකර මට ඒ විස්තර ඉදිරිපත් කරන්න. මම ඒ ගැන සම්පූර්ණ පරීක්ෂණයක් කරනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි ගරු ඇමතිතුමනි.

ඔබතුමාගේ දත්තවලම කියා තිබෙනවා මේ වෙනුවෙන් රුපියල් මිලියන 2,400ක් යනවාය කියලා. එයින් මිලියන 1,300ක් තමයි වැය කර තිබෙන්නේ. මේ වැඩ පිළිවෙළ හරියට සාර්ථක වෙලා නැහැ කියලා එයින්ම ඔබතුමා දැනුවත් වෙනවා නේද? ඔබතුමාට මම ඒ පාසල් පිළිබඳ විස්තර දෙන්නම්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේ වර්ෂයේ වෙන් වෙලා තිබෙන මුදල් ප්‍රමාණය-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මා කියන්නේ ඇස්තමේන්තු කර තිබෙන මුදලත්, සැබෑ මට්ටමට වියදම් කර තිබෙන මුදලත් ගැනයි. මොකද සමහර වෙලාවට මුදල් ඇමතිතුමා මේ ගරු සභාවට ඇවිත් කියනවා මෙන්න මෙපමණ සල්ලි වෙන් කර තිබෙනවාය කියලා. ඊට පස්සේ අප පරිපූරක ඇස්තමේන්තුව බැලුවොත් ඒකේ සියයට 50ක් කපලා ඒ මුදල පුනරාවර්තන වියදම්වලට දමලා තිබෙනවා. ඒ නිසා තමයි මම අහන්නේ, මෙවැනි වැඩ පිළිවෙළක්-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, 2012 වර්ෂයේ නිල ඇඳුම් රෙදි සඳහා වෙන් කරපු ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1,600යි. නමුත් අප මිලියන 2,214ක් වියදම් කර තිබෙනවා. එතකොට ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් නිල ඇඳුම් ලබා දීම සඳහා ලබාගෙන තිබෙනවා. ඒ භාණ්ඩාගාරයෙන් ලබා ගත් අතිරේක ප්‍රතිපාදන සහ මුදල් රෙගුලාසි 66 මඟින් ලබා ගත් අතිරේක ප්‍රතිපාදන වශයෙනුයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, දැන් තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ නිල ඇඳුම් රෙදි රට පුරා තිබෙන හැම පාසලකටම ලැබිලා නැහැ වාගේම, ජනවාරි මාසයේ 1වැනි දා ලැබෙන්න තිබෙන දේ මාර්තු මාසයේ යම් තැන්වලට ලැබිලා තිබෙනවා කියලා තමයි වාර්තා වෙලා තිබෙන්නේ. මේ රෙදි ආනයනය කරන්නේ චීනයෙන්. දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කරනවා කියන ආණ්ඩුව තවම චීනයෙන් රෙදි ගෙනැල්ලායි මේ කටයුත්ත කරන්නේ. අපට මේ කටයුත්ත කරන්න පුළුවන් විශිෂ්ට ගණයේ කර්මාන්තශාලා ලංකාවේ තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඒක වැරදියි ගරු මන්ත්‍රීතුමා. මෙම රෙදි ආනයනය කිරීම පිළිබඳව කැබිනට් අනු කාරක සභාවක් විසින් 2012 වර්ෂයේදී තීන්දුවක් ගත්තා, ඒවා කලට වේලාවට නොලැබීම නිසා සියයට 50ක් දේශීය නිෂ්පාදකයින්ගෙනුත් සියයට 50ක් රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව මඟිනුත් ආනයනය කළ යුතුයි කියලා. ඊට පසුව දැන් දේශීය නිෂ්පාදකයින් කියා තිබෙනවා, දැන් ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාව වැඩි වෙලා තිබෙනවා, ඒ අනුව කලට වේලාවට සපයන්න පුළුවන් කියලා. ඒ අනුව කැබිනට් මණ්ඩලය විසින් ගරු රත්නසිරි වික්‍රමනායක අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් වෙනම කැබිනට් අනු කමිටුවක් දාලා තිබෙනවා, මේ ධාරිතාව සැබැවින්ම වැඩි වෙලා තිබෙනවාද කියා සොයා බලා, සියයට 100ම දේශීය නිෂ්පාදකයින්ට හදන්නට පුළුවන් නම් එය ඔවුන්ට බාර දීම සඳහා. දැන් රෙදි පිළි, පාවහන් යනාදිය සම්බන්ධයෙන් වෙනම අමාත්‍යාංශයක් පිහිටුවලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, කෙටියෙන් පිළිතුරු දෙන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඒ තමයි අධ්‍යාපන සේවා අමාත්‍යාංශය. එහි කැබිනට් අමාත්‍යතුමෙක් සිටිනවා. එතුමා ඉතා කාර්යක්ෂම ලෙස ඉදිරි වර්ෂයේදී රජය වෙනුවෙන් ඒ කටයුත්ත ක්‍රියාත්මක කරලා දෙනවා ඇති.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, දෙවන වටය.

ප්‍රශ්න අංක 2-2201/11' - (3), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මී ළඟට ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

සමෘද්ධි සහනාධාර නොලැබීම
சமுர்த்தி நிவாரணம் கிடைக்காமை
NON-RECEIPT OF SAMURDHI BENEFIT

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. සමෘද්ධි සහනාධාරය නොලැබීම නිසා සමෘද්ධිලාභීන් පත්ව සිටින තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කිරීමට මා අපේක්ෂා කරනවා.

ගරු කථානායකතුමනි, දිවයිනේ 1,583,961ක් වූ අඩු ආදායම්ලාභී සමෘද්ධි සහනාධාර ලබන ජනතාවට මාස 05කට ආසන්න කාලයක සිට සමෘද්ධි සහනාධාරය ලබා නොදීම නිසා ඔවුන් අතිශය පීඩාවට පත්ව සිටින බව පසු ගිය දා ජනමාධ්‍ය මඟින් හෙළිදරවු කර තිබුණා. සාමාන්‍යයෙන් අදාළ මාසයේ 01වැනි දා සිට අදාළ මුදල් සමෘද්ධි බැංකු සංගමය මඟින් ගෙවිය යුතුව තිබුණා. නමුත් 2012 නොවැම්බර්, දෙසැම්බර්, 2013 ජනවාරි, පෙබරවාරි, මාර්තු හා අප්‍රේල් මාසවලට අදාළ මුදල් නිසි පරිදි ප්‍රතිලාභීන් හට සමෘද්ධි බැංකු මඟින් ගෙවා තිබුණේ නැහැ.

මේ බව ජනමාධ්‍ය, දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති විසින් පෙන්වා දීමෙන් අනතුරුව ආණ්ඩුව 2012 නොවැම්බර්, දෙසැම්බර් හා 2013 ජනවාරි මාසවලට පමණක් අදාළ සමෘද්ධි සහනාධාර මුදල් සමෘද්ධි බැංකුවලට යවා ඇති බව ප්‍රසිද්ධ කරනු ලැබුවා. එසේ වුවද එයද සමෘද්ධිලාභී ජනතාවට මෙතෙක් නිසි ආකාරයෙන් ලැබී නොමැති බවද වාර්තා වෙනවා. එසේම පෙබරවාරි, මාර්තු හා අප්‍රේල් මාස පිළිබඳව මේ වන තෙක් කිසිදු සඳහනක් සිදු වී නැහැ. මාස තුනක් ඒවා ලැබිලා නැහැ, ගරු කථානායකතුමනි.

සමෘද්ධි සහනාධාර නොලැබීම හේතුවෙන් සමෘද්ධිලාභී ජනතාව විශාල දුෂ්කරතාවකට පත්ව සිටින බව අමුතුවෙන් කිව යුතු නැහැ. මේ දුෂ්කරතාව සමෘද්ධිලාභීන් විසින් ගමේ සේවයේ නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හට ප්‍රකාශ කළ අතර එම ගැටලුවේ අතරමැදියන් බවට පත් වීමට ඔවුන්ට සිදුවූවා. ගරු කථානායකතුමනි, සමෘද්ධිලාභීන් මේ ප්‍රශ්නය අහන්නේ ගමේ ඉන්න සමෘද්ධි නියාමක මහත්මයාගෙන්. ඔවුන් මේකේ අතරමැදි ගැටලුකාරයන් බවට පත් වෙලා සිටිනවා. ඒ නිසා එම නිලධාරීන් නියෝජනය කරන වෘත්තීය සමිතිවලට මෙම ප්‍රශ්නය රටට හෙළිදරවු කිරීමට සිදු වූවා. එහෙම වුණාම ඒ අයගේ වෘත්තීය සමිතිවලට මේ පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමේ අයිතියක් තිබෙනවා. ඒ අනුව 2013.03.17වන දින සමෘද්ධි සංවර්ධන නිලධාරි සංගමය විසින් මේ බව හෙළිදරවු කරනු ලැබුවා.

කෙසේ වුවද ආණ්ඩුව වහා මැදිහත් වී සමෘද්ධිලාභීන්ට සහනාධාර ගෙවීමට කටයුතු කිරීම වෙනුවට සමෘද්ධි නොලැබීම

[ගරු අනුර දිසානායක මහතා]

පිළිබඳව රටට ප්‍රකාශ කළ වෘත්තීය සමිතිවලට මර්දනය කැඳවනු ලැබුවා. මෙම ගැටලුව සම්බන්ධයෙන් මාධ්‍ය මඟින් කරුණු අනාවරණය කරන ලද සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් චාමර මද්දුමකළුගේ මහතා එම ප්‍රකාශය මාධ්‍ය වෙත ලබා දීම හේතුකොටගෙන වැඩ තහනමට ලක් කර තිබෙනවා. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ආර්.පී.බී. තිලකසිරි මහතාගේ අත්සනින් යුතු ස/අධි/2/14/ක/ බ/1/81 දරන 2013.3.21 වන දින ලිපිය **සභාගත*** කරනවා.

එහි හරි අපූරු එකක් තමයි තිබෙන්නේ. "වැඩ තහනම්ව සිටින කාලය තුළ මාගේ පූර්ව අවසරයක් නොමැතිව ඔබ පදිංචි ස්ථානයේ වෙනසක් නොකළ යුතුය"කියා එහි තිබෙනවා. වැඩ තහනම් කරනවා විතරක් නොවෙයි. ඒ කාලය තුළ පදිංචි ස්ථාන වෙනස් කරන්නත් බැහැ. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අදාළ නිලධාරි මහත්වරුන් අපූරු තීන්දුනේ දෙන්නේ. ගරු කථානායකතුමනි, මෙතැන ඔවුන්ගේ අයිතිවාසිකම් -වෘත්තිමය අයිතිවාසිකම්- පිළිබඳ ගැටලුවක් ඇවිත් තිබෙන්නේ. එම නිලධාරීන් තමන්ගේ වෘත්තියට අදාළව තමන්ට මතු වී තිබෙන ගැටලු ඉදිරිපත් කළාට පසු ඔවුන්ට මර්දනය ඇවිත් තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඕනෑම පිළිගත් වෘත්තීය සමිතියක් වෙත ආයතන සංග්‍රහය මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන මත තමන්ට බලපා ඇති ආයතනික ගැටලු සම්බන්ධව මාධ්‍ය වෙත කරුණු අනාවරණය කිරීම අපි ඕනෑ තරම් දැක තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ විධියේ ප්‍රශ්නයක් නම් තිබෙන්නේ, වෛද්‍යවරුන්ට සෞඛ්‍ය ගැටලු ගැන කථා කරන්නත් බැරි වෙනවා. සරසවි ආචාර්යවරුන්ට ඔවුන්ගේ ගැටලු ගැන කථා කරන්නත් බැරි වෙනවා. අපේ රටේ ගුරුවරුන්ට ඔවුන්ගේ ගැටලු ගැන කථා කරන්නත් බැරි වෙනවා.

ඒ අනුව සමෘද්ධි සංවර්ධන නිලධාරි සංගමයට ඒ අයිතිය තිබිය යුතු වුවත්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ එම අයිතිය කප්පාදු කර ඇති බව මෙම වැඩ තහනම මඟින් මනාව පෙන්නුම් කෙරෙනවා.

පසු ගිය දා පාර්ලිමේන්තුවේ සම්මත කර ගත් "දිවි නැහුම" පනත අනුව, ඒ නිලධාරීන්ට තොරතුරු දීම තහනම් බවට වගන්ති ඇතුළත් කර තිබීම මෙහිදී අපට සිහිපත් වෙනවා. "දිවි නැහුම" පනතට මේ කරුණු ඇතුළත් කළේ ඇයි කියන එක දැන් හරි පැහැදිලියි. ඒ කරුණු තවම ගැසට් කර නොතිබියදීත් මර්දනය කල් ඇතිවම පැමිණ ඇති බව මෙම සිදු වීමෙන් පෙනී යනවා.

මෙම තත්ත්වය තුළ සමෘද්ධිලාභීන්ට මින් ඉදිරියට ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කළ යුතු බවත්, ඒ බව රටට හෙළි කළ වෘත්තීය සමිති ලේකම්වරයාගේ වැඩ තහනම ඉවත් කිරීමට කටයුතු කළ යුතු බවත් මෙම ගරු සභාවට යෝජනා කර සිටිනවා.

මෙම තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් මෙම ගරු සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

(1) 2013 අප්‍රේල් දක්වා හිඟ මුදල් සහිතව සමෘද්ධිලාභීන්ගේ ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කරන්නේ කවදාද?

(2) වැඩ තහනමට ලක්ව ඇති වෘත්තීය සමිති ලේකම්වරයාගේ වැඩ තහනම ඉවත් කිරීමට කටයුතු කරන්නේද? වැඩ තහනමට අමතරව ඔහුට එම පදිංචි ප්‍රදේශයෙන් බැහැරව යන්න එපාය කියා නියෝග නිකුත් කරන්න සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරයාට තිබෙන බලය කවරේද?

මේවාට පිළිතුරු දැන ගන්න කැමැතියි. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව අදාළ අමාත්‍යාංශයෙන් එවා තිබෙන කරුණු අනුව, 2013 මාර්තු මස දක්වා සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ගෙවිය යුතු සියලුම ප්‍රතිලාභ දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින් ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා සමෘද්ධි බැංකු වෙත නිදහස් කිරීමට පියවර ගෙන ඇති බව ප්‍රකාශ කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි යන මාස තුන සහ මාර්තු, අප්‍රේල් මාස දෙක තිබෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

2013 මාර්තු මස ප්‍රතිලාභ ද සහිතව 2012 නොවැම්බර්, දෙසැම්බර් සහ 2013 ජනවාරි හා පෙබරවාරි යන මාස සඳහා මේ වන විට රුපියල් මිලියන 5865ක මුදලක් නිදහස් කර ඇත. 2013 අප්‍රේල් මාසය සඳහා නිදහස් කිරීමට නියමිත මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 1163කි. ඒ මුදල් 2013 අලුත් අවුරුද්දට පෙර සියලු සමෘද්ධි බැංකු වෙත නිදහස් කිරීමට කටයුතු සූදානම් කර ඇති බව වාර්තා කර ඇත.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
2013 අප්‍රේල් දක්වා?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒවා ඔබතුමා සභාවට ඉදිරිපත් කරන කරුණු. හොඳයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

වෘත්තීය අයිතිවාසිකම් පිළිබඳව හා අයිතිවාසිකම් දිනා ගැනීමේ අරමුණින් පුවත් පත්වලට නිවේදන නිකුත් කිරීමට වෘත්තීය සමිති ලේකම්වරයකු වශයෙන් චාමර මද්දුමකළුගේ මහතාට ප්‍රතිපාදන සැලසී තිබුණත්-

---

**** ප්‍රස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

2012 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදාළව සමෘද්ධි සහනාධාර මුදල් නිකුත් නොකරන බවට සාවද්‍ය හා ද්වේෂසහගත ප්‍රකාශ කරමින් රජයේ ප්‍රමුඛ වැඩ සටහන් නිර්දය ලෙස විවේචනය කරමින් කටයුතු කිරීම නිසා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව ඔහුට එරෙහිව විනයානුකූල කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේක වෘත්තීය සමිතියක ලේකම්වරයකුගේ ප්‍රශ්නයක්. නොවැම්බර් සහ දෙසැම්බර් කාලය තුළ සමෘද්ධි සහනාධාර ලබා දුන්නේ නැහැ කියා එතුමා කරපු ප්‍රකාශය සාවද්‍යයි කියලා ඇමතිතුමා කියනවා නම් ඒක වැරැදියි. එතුමා කරපු ප්‍රකාශය සත්‍යයක්. මොකද, සමෘද්ධි සහනාධාර ලබා දීලා තිබුණේ නැහැ. ඔවුන්ගෙන් තමයි සමෘද්ධිලාභීන් අහන්නේ, "ඇයි සහනාධාර ලබා දෙන්නේ නැත්තේ" කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒ විතරක් නොවෙයි.

සාවද්‍ය හා ද්වේෂසහගත ප්‍රකාශ කරමින් රජයේ ප්‍රමුඛ වැඩ සටහන් නිර්දය ලෙස විවේචනය-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මොනවා හරි කියන්නත් එපායැ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
රාජ්‍ය නිලධාරියකුට රජයේ වැඩ සටහන් පිළිබඳව විවේචනය කිරීමේ අයිතියක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමා කිව්වේ සමෘද්ධිය දුන්නේ නැහැ කියන එක විතරයි. ගරු ඇමතිතුමනි, එතුමා කියන්නේ, මේ මාස දෙකේ සමෘද්ධි සහනාධාරය ලැබුණේ නැහැ කියලායි. එතුමාගෙන් සමෘද්ධිලාභීන් ඒ ගැන අහන නිසයි එතුමා එහෙම කියන්නේ. එහෙම නම්, ඒක කොහොමද නිර්දය විවේචනයක් වන්නේ? මා ළඟ තිබෙනවා ඒ පුවත් පත් වාර්තා. ඒක නිර්දය විවේචනයක් වන්නේ කොහොමද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එය පරීක්ෂණයේදී-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දොස්තර මහත්වරු ලෙඩාට කිව්වොත් ඉස්පිරිතාලේ බෙහෙත් නැහැ කියලා, ඒකත් නිර්දය විවේචනයක් වෙනවාද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා පිළිතුර ලබා දෙන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එපමණයි ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර එපමණයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
උත්තරයක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර ලබා දුන්නා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට දීපු උත්තරය සාධාරණ නැහැ. අදාළ ගරු ඇමතිතුමාත් නැහැ මෙතැන.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
අමාත්‍යාංශයෙන් ලැබුණු පිළිතුර තමයි මා කියෙව්වේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට, ගරු ආර්. සම්පන්දන් මන්ත්‍රීතුමා.

II

දෙමළ ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් උල්ලංඝනය

தமிழ் மக்களின் ஜனநாயக உரிமைகள் மீறப்படல்
VIOLATION OF DEMOCRATIC RIGHTS OF TAMIL PEOPLE

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
Thank you Mr. Speaker for granting me permission to raise this matter of urgent public importance under Standing Order No. 23(2).

On Saturday, 30th March 2013, a mob of around 50 persons who came in a procession along the A-9 Highway carrying the National Flag attacked a meeting held at the Tamil National Alliance Office of the Hon. S. Shritharan MP in Kilinochchi by throwing rocks and concrete stones. In addition to the Hon. S. Shritharan, MP, the Hon. S. Senathirajah, MP, the Hon. E. Saravanapavan, MP and the Hon. M.A. Sumanthiran, MP, were present there at that time. The Members of Parliament were engaged in

[ගරු ආර්. සම්පන්දන් මහතා]

meeting with about 100 residents of Killinochchi relating to matters of concern to the Tamil people. This attack took place in the presence of the Kilinochchi Police, who did nothing to prevent it, and resulted in injuries to 13 persons and extensive damage to property. This attack was recorded on video and photographs and the persons involved are easily identifiable. However, not one person has been arrested in relation to this violence up to date, despite the presence of the police on the scene while the attack took place. In fact, one assailant apprehended by those present at the meeting was identified to be an officer of the Criminal Investigation Department - CID - of the Sri Lankan Police. He was handed over to the Deputy Inspector-General of Police who arrived at the scene later, but was released shortly thereafter. Two others, who were similarly caught in the act and handed over to the Police, were also promptly released.

This is not the first time such attacks have been carried out on TNA meetings. On 16th June, 2011, army personnel in full uniform attacked a TNA local authority election meeting at Alaveddy in Jaffna, at which five Members of Parliament were present. Although the assailants were in uniform and identifiable, to date no one has been arrested in relation to that incident. More violence was unleashed against the people the day before the local authority elections at that time, particularly, in the Kilinochchi and Mullaitivu Districts. Army personnel went house to house and confiscated National Identity Cards and the Polling Cards of the people and warned them not to vote for the TNA. I made a complaint to the Commissioner of Elections with full particulars and consequently some of those people were able to vote and the TNA emerged victorious. During the Eastern Provincial Council Election, several acts of intimidation, undue influence, misrepresentation, bribery and other malpractices were committed by persons inclusive of security intelligence personnel supporting the ruling party.

These matters were brought to the notice of the President, the Commissioner of Elections, the Inspector-General of Police and other authorities. However, no tangible action that could erase the impact of such misdeeds and ensure a free and fair election was taken raising grave doubts in regard to the independence and integrity of the electoral, police and public service authorities entrusted with the duty of conducting elections. Several other meetings and rallies were also similarly disrupted and more recently, on 15th February, 2013, military intelligence personnel disrupted a hunger strike by the Tamil people at the Durgai Amman Temple premises at Tellippallai, which was also attended by the Leader of the Opposition. There too, persons who were arrested by the police were released by the army who intervened.

Mr. Speaker, you will observe that the common feature of all these attacks is that they have been carried out by or with the connivance of the security forces and the police and even though the assailants were identifiable, no arrests have been made. These are also carried out under the watchful eyes of the police. This is clearly indicative of the complicity of the authorities.

The most recent attack was in the early hours of the morning on 3rd April, 2013, on the Kilinochchi distribution office of the "Uthayan" newspaper by armed assailants. Of the four staff injured, one is in a serious condition. Property has also been damaged. The attack took place when a vehicle carrying copies of the newspaper for distribution arrived at the Kilinochchi office. This incident is the latest in a series of brutal attacks against the "Uthayan" staff in the last few months. In December 2012, the Editor Mr. T. Premananth was hospitalized after military officers and plain-clothes policemen beat him repeatedly while he was covering a protest at the University of Jaffna. In January this year, an "Uthayan" employee who was distributing newspapers in Valvettithurai was attacked by four armed men who also torched his motorbike. The victim was admitted to hospital with a fractured arm. No arrests have been made in relation to any of these attacks. "Uthayan" is an independent newspaper that publishes news, perhaps not palatable to the Government. This demonstrates the lack of media freedom and the threat to freedom of expression in the country now.

These attacks on the democratic rights of the Tamil people of the freedom of association, freedom of opinion and freedom of expression in the North and the East are clearly carried out with the active support, sanction and collusion of the Sri Lankan Government. They are a vain and counterproductive attempt to suppress and persecute the Tamil people for their political aspirations. We call on the Sri Lankan Government to immediately cease the violence directed against the Tamil people. We reiterate that to prevent a non-recurrence of the past, Sri Lanka must expeditiously commence a meaningful and genuine process of reconciliation based on the ascertainment of the truth, ensuring justice and providing adequate reparations for the victims of violations committed by all parties.

Mr. Speaker, you may recall that some weeks ago I met you in your Chambers with my Colleague, the Hon. Sumanthiran, Member of Parliament, and we raised with you the position relating to the Hon. Shritharan, Member of Parliament and his Kilinochchi political office. This was the same office that came under attack on the 30th of March this year. You were kind enough to invite the IGP to your Chambers and the Hon. Sumanthiran and I met the IGP in the Chambers. We told the IGP that we did not want confrontation in this area. We wanted the Hon. Shritharan, who is a Member of Parliament representing that area, to be able to function with freedom.

Two persons arrested, Mr. Ponnambalam Lakshmikanthan and Mr. Arunachalam Velamaligithan,

are still in custody. They have not been released. The police personnel attached to the Hon. Shritharan's office were removed. They have not been restored yet.

I would like to make an appeal on the Floor of the House, particularly after you intervened, Mr. Speaker, to the Inspector-General of Police to ensure that these police personnel are put back on duty at the office of the Hon. Shritharan as is normally done in the case of all Members of Parliament and that these persons who have been taken into custody be released because they have not been charged in court. One does not know why they have been taken into custody. These persons must be released.

In fact, I am informed that some preparations are being made by some service personnel in Kilinochchi to attack the Hon. Shritharan's office tomorrow. Some preparations are already afoot. I want to bring that to the notice of you, Mr. Speaker, on the Floor of this House because this type of thing should not be allowed to continue. Members of Parliament must be in a position to function independently and fearlessly in the electorates to which the people have returned them. I would appeal to you to kindly intervene in this matter.

Thank you very much, Mr. Speaker.

ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)

(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු කථානායකතුමනි, අපේ මිත්‍ර සම්පන්දන් මැතිතුමා ඉදිරිපත් කරන්නේ කිලිනොච්චි ප්‍රදේශයේත්, ඊට කිට්ටු ප්‍රදේශවලත් ඇති වෙලා තිබෙන සුළු කලබල තත්ත්වයන් සම්බන්ධවයි. ඇත්තටම භූමි ප්‍රමාණයත්, ජනගහන ප්‍රමාණයත් අනුව බැලුවොත් ඒ විධියේ කරදර ඉතාම අඩුවෙන්ම තිබෙන ප්‍රදේශය තමයි යාපනය ප්‍රදේශය. මම එතුමාට කියනවා, ඕනෑම කෙනෙකු ලවා ඒ සිද්ධීන් ගැන පරීක්ෂා කර බලන්න කියලා. ජනගහනය සහ භූමි ප්‍රමාණය අනුව ලංකාවේ අනික් ප්‍රදේශ එක්ක බලන කොට ඉතාම අඩුවෙන් සිද්ධීන් ඇති වන ප්‍රදේශයක් තමයි යාපනය ප්‍රදේශය.

සෑම අවස්ථාවකදීම ටිඑන්ඒ එකේ පමණක් නොවෙයි අපේ දේශපාලන ක්ෂේත්‍රයේ බොහෝ දෙනෙකු උත්සාහ කරන්නේ මොනවා හරි සිද්ධියක් ඇති වුණාම, නීති විරෝධී ක්‍රියාවක් සිදු වුණාම ඒකට පොලීසිය වැරදිකාරයෝ හැටියටත්, හමුදාව වැරදිකාරයෝ හැටියටත් පෙන්නුම් කරන්නයි. විපක්ෂයේ අයත් ඒ විධියට පෙන්වන්නට උත්සාහ කරනවා. වැඩි වශයෙන් පොලීසිය ගැන ඒ විධියට කථා කරනවා. ඇත්ත වශයෙන්ම පොලීසියක් නැතිව අපිට ක්‍රියා කරන්න පුළුවන්ද කියලාත් අපි කල්පනා කර බලන්න ඕනෑ. පොලීසියක් ඕනෑ නැද්ද කියන කාරණයත් පරීක්ෂා කර බලන්න ඕනෑ. පොලීසියේ, සියයට සියයක්ම නිවැරදි මිනිස්සු ඉන්නවා කියලා මා කියන්නේ නැහැ. ඔවුන් අතර වැරදි කරන අයත් ඉන්න පුළුවන්. ඒ මුළු කණ්ඩායම දිහා බලනකොට ඒ අතර සියයට එක් කෙනෙක් දෙන්නෙක් ඒ වාගේ වැරදි කරන අය ඉන්න පුළුවන්. පොලීසියේ ඉන්නවාය කියලා ඔවුන් රහත් වෙලාවත්, සෝවාන් වෙලාවත්, සකෘදාගාමී වෙලාවත්, අනාගාමී වෙලාවත් නැහැ. ඔවුනුත් සාමාන්‍ය මිනිස්සුයි. ඔවුන්ගේ චිත්ත ශක්තියේ හැටියට වැරදි ටිකක් කරන්නත් ඉඩ තිබෙනවා. පූර්ණ වශයෙන් පොලීසිය හරියි කියලා මා කියන්නේ නැහැ. එහෙම තියෙන්න පුළුවන්. අප අතරත් එවැනි අය ඉන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුව ඇතුළේ වුණත් ඒ විධියේ අය ඉන්න පුළුවන්. මුළු සමාජයේම තත්ත්වය ඒකයි. මුළු ලෝකයේම හැටි එහෙමයි. අපි පොලීසියත් එක්ක මිත්‍රව ක්‍රියා කරන්න වුවමනා කරන්නේ අපේ ආරක්ෂාව සඳහායි. අපිට සන්තෝෂයෙන් කරදරයක්, හිරිහැරයක් නැතිව ජීවත් වීමට ඔවුන්ගේ සේවය වුවමනා කරනවා. ලෝකයේම පොලීසියක් තිබෙන්නේ ඒ නිසායි. යුද හමුදාවක් තිබෙන්නේ ඒ ජාතියට, ඒ රජයට විරුද්ධව විශාල වශයෙන් අරගළකාරී තත්ත්වයක් ඇති වෙනවා නම් ඒකට මුහුණ දෙන්නයි. මේ තත්ත්වය හැම රටකම තිබෙනවා. හැම රටකටම පොලීසියත්, යුද හමුදාවත් අවශ්‍යයි. සමහර තැන්වල දී ශ්‍රී ලංකාවේ පොලීසිය වැරදි කර තිබෙන බව අපිට පෙනෙනවා. අපි ඒක නැහැ කියලා කියන්නේ නැහැ. නමුත් සම්පන්දන් මැතිතුමා ඉදිරිපත් කරපු කාරණාවල හැටියට, ඒ සියලුම දේවලට අදාළ පුද්ගලයින් පොලීසිය විසින් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. අත් අඩංගුවට අරගෙන ඒ අයවලුන් උසාවියටත් ඉදිරිපත් කර තිබෙනවා. විපක්ෂ නායකතුමාත් සහභාගි වුණු ඒ කෝච්ලේ උත්සවය අවස්ථාවේ ඇති වුණු කලබලය නිසා ඒ අයත් උසාවියට ඉදිරිපත් කර තිබෙනවා. පොලීසිය තමන්ට අයිති රාජකාරිය ඉටු කර තිබෙනවා. එහෙම ඉටු කරන අතර නීතියේ හැටියට පොලීසියට බලයක් තිබෙනවා, යම් කිසි කෙනෙකු අතින් සාමාන්‍ය තත්ත්වයේ සිද්ධියක් වුණා නම් අවවාද කර යවන්න. ඒ වාගේම පොලීසියට පුළුවන්කම තිබෙනවා, ඔහු අත්අඩංගුවට අරගෙන සියලු කටයුතු සටහන් කර ගෙදර යවලා උසාවියේ නඩු පවරන්න.

ඊළඟට පොලීසියට පුළුවන්කම තිබෙනවා, ඒ පුද්ගලයා ඊට වඩා වැඩි වැරැද්දක් කර තිබෙනවා නම් උසාවියට ඉදිරිපත් කරන්න. උසාවිය ඔහුව remand කරනවා. Remand කරලා ආයෙත් උසාවියට ඉදිරිපත් කළායින් පස්සේ , ඔහුට ඇපයක් දීලා එළියට යවන්න සුදුසුද කියා සලකා බලා සුදුසු නම් ඇපයක් දෙනවා. ඔහු එළියට යවන්නට සුදුසු නැත්නම් ඔහු එහිම රඳවනවා. මේක සාමාන්‍ය තත්ත්වයක්. ඒක ඕනෑම කෙනෙක් දන්නවා. අපේ නීතිඥතුමන්ලා මේවා දන්නවා. එතුමන්ලා මේ විධියට ක්‍රියා කරලා තිබෙනවා. ඒ අනුව පොලීසිය මේ කටයුත්ත හරියාකාරව ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ දින වකවානු මා දැන් ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. ඒ වාගේම මේ වාගේ කාරණයකුත් ඉදිරිපත් කර තිබෙනවා:

> "Army personnel went house to house and confiscated National Identity Cards and the Polling Cards of the people and warned them not to vote...".

මැතිවරණයක් කියන එක තවම ළඟ පාතකවත් ඇත්තේ නැහැ. මොකද මේක දැන්ම ඉඳලා පටන් ගත්තා ද? මැතිවරණයක් තියෙන බව ගැසට් කරලා nominations දුන්නාට පස්සේයි මේක කියන්නට තිබුණේ. මේක කිව්වා කල් වැඩියි. මෙච්චර වේලාසනින් කිව්වාම කවුරුත් විශ්වාස කරන්නේ නැහැ. දැන්ම ම මේක පටන් ගත්තාද කියලා යි හිතන්නේ. Nominations දීලා පුද්ගලයෝ ඉදිරිපත් වුණාට පස්සේ මේක ප්‍රකාශ කළා නම් අපටත් හිතෙනවා, මේක ඇත්තක්වත් ද කියා. මේවාට දැන්ම ම සූදානම් වෙනවාය කියා තමයි මිනිස්සු කල්පනා කරන්නේ. මොකද, පරාජයක් වෙය; එහෙම වෙනවා නම්, දැන්ම ම කියා තිබුණාම කියන්නට පුළුවන්, "මම අසවල් කාලයේ සිටම මේක කියා ගෙන ආවා, ඒකයි අප පැරදුණේ. නැත්නම් අපට දිනන්නට තිබුණා"ය කියා. කල් ඇතිව කියා තිබුණා යයි කියන්නට උත්සාහයක් කරනවා වත්ද කියා කාටත් හිතෙන්නට ඉඩ තිබෙනවා. මම එහෙම හිතන්නේ නැහැ. පත්තරවල මේක ගියාම අපේ මන්ත්‍රීවරුන්ට, පිටස්තර අයවලුන්ට එහෙම හිතන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා ඒක කල් වැඩියි කිව්වා. තව ටිකක් කල් ගිහින් කිව්වා නම් හොඳයි.

[ගරු දි.මු. ජයරත්න මහතා]

නැඟෙනහිර පළාතේ යාපනය ප්‍රදේශයට වඩා කරදර ටිකක් වැඩියෙන් තිබෙනවා. නමුත් ලංකාව ම ගැන බලනකොට ඒක වෙනස් තත්ත්වයක තිබෙනවා. එසේ නම්, හිතන්නට තිබෙන්නේ යාපනයේ ප්‍රදේශයේ ජනතාව හුඟක් හොඳයි කියන එකයි. ඒ ගොල්ලෝ වැඩියෙ කලබල ඇති කර ගන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ලංකාවේ අනෙක් තැන්වල බැලුවත් දේශපාලන වශයෙන් අපේ පක්ෂවල - යූ.එන්පී පක්ෂයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ- නැත්නම් ආණ්ඩු පක්ෂයේ, විරුද්ධ පක්ෂයේ අය මේ විධියේ කලබල ඇති කර ගන්නවා. එහෙම නැහැ කියා අප කියන්නේ නැහැ. මේවාගේ තත්ත්වයන් ඇති වී තිබෙනවා. උසාවිවලට ගිහින් තිබෙනවා. ඒ ඒ පක්ෂවලම අයත් මේ තත්ත්වයන් ඇති කර ගන්නවා. මේ මැතිවරණ ක්‍රමය අනුව තමන්ගේම පක්ෂයේ අය අතරත් කලබල ඇති කර ගන්නවා. ඒ වාගේ තත්ත්වයන් ඇති වෙලා උසාවිවලට යනවා. මරා ගන්නවා; ගහ ගන්නවා. එවැනි තත්ත්වයන් තිබෙනවා.

එහෙම නැහැ කියලා අපි කියන්නේ නැහැ. එහෙම සිද්ධ වන අවස්ථාත් තිබෙනවා. නමුත් ඒ සියල්ලම රජයකට නතර කරන්න පුළුවන් දේවල් නොවෙයි. ගරු කථානායකතුමනි, ඔබතුමා කියනවා වාගේ රජයට පුළුවන්කම තිබෙන්නේ වුණු සිද්ධිය අරගෙන ඔහුට දඬුවම් කිරීම, අවවාද කිරීම ආදී දේවල් ක්‍රියාත්මක කිරීම පමණයි. නමුත් ඊට වඩා කල්පනා කර බලන්න වුවමනා කරන්නේ එවැනි සිද්ධීන් වෙන්න ඉස්සෙල්ලා ජනතාවගේ සිතුම් පැතුම් සාධාරණ විධියට, ශිෂ්ට විධියට, උසස් විධියට සකස් කර ගැනීමයි. ඒ තත්ත්වය අඩු වෙලා තිබෙන්නේ අපේ ආගමික තත්ත්වයන් පහළට බැසීම නිසායි. ආගමික තත්ත්වයන් පොඩි කාලයේ ඉඳලාම හරියාකාරව අවබෝධ කරන්නට වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් ඒ අයගේ චින්තන ශක්තිය නිවැරදි වෙනවා. එතකොට එවැනි අඩු පාඩුකම් අඩු වෙනවා. වැරැදි නොකරන නිවැරදි කෙනෙක් මෙලොවට උපදින්නේ නැත. වැරැදි කරන්නේ නැති කෙනෙකු මෙලොව උපදින්නේ නැහැ කියලා කියනවා. අපට ඒක පිළිගන්න සිද්ධ වෙලා තිබෙනවා. ආණ්ඩුවට පුළුවන්කම තිබෙනවා සිදු වන වැරැදි නිවැරදි කරන්න. ඒ අනුව ආණ්ඩුව ක්‍රියා කරලා තිබෙනවා. සිද්ධිය වුණාට පස්සේ ක්‍රියා කරලා තිබෙනවා. ඒ නිසා ඊට පෙර අපි මේවා ගැන කල්පනා කර බලා ජනතාවට සාධාරණ විධියට ජීවත් වීමට වුවමනා කරන පරිසරය සහ හැඟීම් ලබා දීමේ උත්සාහයක් විපක්ෂයත්, ආණ්ඩු පක්ෂයත් ඒ වාගේම ආගමික වශයෙනුත් ක්‍රියාත්මක කරනවා නම් සිදු වන සුළු වැරැදි හුඟාක් දුරට අඩු කරන්න පුළුවන් වෙනවා.

අවුරුදු 30ක භීෂණ යුද්ධයෙන් පසු වත්මන් රජය ත්‍රස්තවාදී ග්‍රහණයෙන් යටත්ව තිබූ උතුරු නැඟෙනහිර ප්‍රදේශ හා එහි වෙසෙන ජනතාවගේ යටිතල පහසුකම් සහ ජන ජීවිතය පමණක් නොව ආරක්ෂාව තර කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාවට නංවා ඇත. මෙම උත්තරීතර සභාව විසින් දැන ගත යුතු කරුණක් නම් අවුරුදු 30ක යුද්ධය පැවැති අවස්ථාවේදී උතුරු හා නැඟෙනහිර පෙදෙස්වල විසූ ජනතාව එල්ටීටීඊ සංවිධානයේ භීෂණයට හා තාඩන පීඩනවලට යටත්ව ජීවත් වූවා පමණක් නොව මිනී මැරුම්, මං කොල්ලකෑම්, අසරණ ළමුන් පැහැර ගැනීම්, දේපළ හා ඉඩම් කඩම් බලෙන් ත්‍රස්තවාදී කටයුතු සඳහා ලබා ගැනීම් ආදී මිලේච්ඡ ක්‍රියාවන්ටද යටත්ව සිටි බවයි. අවාසනාවකට මෙන් මෙවැනි සිදුවීම් මාධ්‍ය මඟින් හෝ එවකට තිබූ පාර්ලිමේන්තුවේදී දෙමළ ජාතික සන්ධාන මන්ත්‍රීවරුන් විසින් හෝ හෙළිදරව් නොකිරීම සාධාරණද? එල්ටීටීඊ සංවිධානයේ ඕනෑ එපාකම් මත එදා ක්‍රියා කළ දෙමළ ජාතික සන්ධානය කිසි විටෙකත් එල්ටීටීඊ සංවිධානයේ මිලේච්ඡත්වයට විරුද්ධව කටයුතු නොකරන ලදී. එවන් භීෂණ තත්ත්වයක ජීවත් වූ ජනතාව අද ඔවුන්ගේ ජන ජීවිතය ගොඩ නැඟීමට මහත් ප්‍රයත්නයක් දරමින් සිටින බව නොඅනුමානය.

මෙම ප්‍රයත්නයට වත්මන් රජය ජාති ආගම් භේදයකින් තොරව, ඔවුන්ගේ සමාජ, ආර්ථික, දේශපාලන තත්ත්වයන් හා ජීවත් වීමට සුදුසු ආරක්ෂාකාරී පරිසරයක් ඇති කිරීමෙහිලා මහඟු කාර්යයක නිරත වී සිටී.

මම ඊයේ කථා කරන කොට කිව්වා, ඒ ප්‍රදේශයේ 80,000ක මුස්ලිම් ජනතාවක් සිටියා කියලා. ඒ සියලු දෙනාව එලෙව්වා. සමහර අයට පැය විසිහතරෙන් එළියට යන්න කිව්වා. ඉතින් බලන්න, ඒවා ගැන මේ සභාවේ තමුන්නාන්සේලා කථා කළේ නැහැ නේ? [බාධා කිරීමක්] කථා කරන්න තිබුණා නේ. "සුළු ජාතියක් හැටියට ඉන්න මුස්ලිම් ජනතාවට මෙහෙම කරනවා. ඒකට අපි විරුද්ධයි, ආණ්ඩුවෙන් ඒ අයව ආරක්ෂා කරන්න" කියලා ඉල්ලුවේ නැහැ. ඒවා සියල්ලම ගැන දැන ගත්තේ බොහෝ කාලයකට පසුව.

මෙවැනි පසුබිමක් මත ගොඩනැඟෙන පරිසරයක විවිධ පුද්ගලයන්, ආයතන හා සංවිධාන හුදෙක්ම තම පෞද්ගලික මෙන්ම දේශපාලන අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහාත්, පෞද්ගලික සහ දේශපාලන වාසි ලබා ගැනීම සඳහාත් සාමාන්‍යයෙන් සිදු වන අපරාධ අතිශයෝක්තියෙන් හුවා දක්වමින් මෙම රජය සහ ආරක්ෂක හමුදාවන් අපහසුවට පත් කිරීමට ක්‍රියා කිරීම තරයේ හෙළා දැකිය යුතුය.

අපි එහෙම කියන්නේ, එක වැරැද්දක් කළ පුද්ගලයෙකුට "මෙයා හොරා" කියලා හැම දාම කිව්වාම, ඔහු හිතනවා, "මට දැන් හැම දාම හොරා කියලා කියනවා නේ. මම හොරකමම කරන්න ඕනෑ" කියලා. ඒ වචන තුළින් ඔහු ධෛර්යවත් වෙනවා, ඒ දේ කරන්න. නමුත් එක් දවසක් හොරකමක් කළාට පස්සේ, "නැවත මෙහෙම කරන්න එපා, මෙහෙම කරන එක හොඳ නැහැ, මේක වැරදි වැඩක්" කියලා අවවාද කළොත් ඔහු ඒ වරදින් මිදෙනවා.

අපි හැම දාම "පොලීසිය මේ විධියට කරනවා, මේ වැරදි කරනවා" කියලා කිව්වාම පොලීසියේ හොඳ මිනිහාත් නරක කෙනෙකුගේ තත්ත්වයට පත් වන්නට ඉඩ තිබෙනවා. ඒක තමයි සාමාන්‍ය මොළයක ස්වභාවය. ඒ නිසා මම ඔබතුමන්ලාට ආරාධනා කරනවා; ඉල්ලීම් කරනවා, ඒ විධියේ වැරදි කරන පුද්ගලයන් ඉන්නවා නම් ඒ පුද්ගලයන් කෙළින්ම ඉදිරිපත් කරන්න, "මෙන්න මෙයා මේ විධියට කරනවා" කියලා. එතකොට රජයට පුළුවන්, ඔහුට දඬුවම් කරන්න, නැත්නම් ඔහුව සේවයෙන් අයින් කරන්න හෝ අවශ්‍ය දෙයක් කරන්න. එහෙම නැතුව පොදු වශයෙන් මුළු සංහතියටම කිව්වොත් එයින් ඒ තරම් හොඳ තත්ත්වයක් ඇති වන්නේ නැහැ. මෙන්න මේකත් කල්පනාවට ගන්න කියලා මම බොහොම ඕනෑකමින් ඉල්ලනවා.

තවද, අප රටේ ව්‍යවස්ථාවට අනුව මෙම සභාවේදී දිවුරා පොරොන්දු වූ ඇතැම් මන්ත්‍රීවරු යම් කාල වකවානුවලදී මෙම සභාවට පැමිණීමටත්, විදේශගත වීමටත් එල්ටීටීඊ නායක ප්‍රභාකරන්ගේ අවසරය ගත් බව නොරහසකි. එල්ටීටීඊ සංවිධානය යුදමය වශයෙන් ක්‍රියාත්මක වන අවධියේ මෙම පාර්ශ්වයන් එල්ටීටීඊ මතවාද රට තුළ පමණක් නොව මෙම සභාව තුළද පැතිරවීමට උත්සාහ කළ බව කියනු කැමැත්තෙමි. එල්ටීටීඊ සංවිධානය යුදමය වශයෙන් පරාජය කර, ඔවුන් විසින් වැපිර වූ ජාතිවාදයේ බීජයන් මුලිනුපුටා දමා, සියලු ජාතීන්, ආගම් අතර සහජීවනය ඇති කරලීමට මෙම රජය කටයුතු සලසා ඇති මෙවන් අවස්ථාකදී එම තත්ත්වයන් අඩපණ කොට නැවතත් ජාතිවාදයේ බීජ වපුරවමින්, නැවතත් එල්ටීටීඊ මතවාදය පැතිරවීමට ඇතැම් පාර්ශ්වයන් කටයුතු කිරීම කනගාටුවට කරුණකි. එල්ටීටීඊ සංවිධානයෙන් බැට කෑ අභිංසක දෙමළ ජනතාව කිසිසේත් මෙම තත්ත්වය අනුමත නොකරන බවත්, මෙම පාර්ශ්වයන් පිළි නොගන්නා බවත් ඉතා හොඳින් පිළිබිඹු වෙමින් පවතී.

එල්ටීටීඊ එකට සම්බන්ධ වුණු තරුණ තරුණියන් මේ පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒ ගොල්ලන් ඉන්දවලා, ඒ

ගොල්ලන්ට පෙන්නුවා, පාර්ලිමේන්තුවේ වැඩ පිළිවෙළ කෙරෙන හැටි. ඒ වාගේම පසු ගිය දවස්වල ඔවුන් අම්බුළුවාවට ගියා; නුවරඑළියට ගියා. මම ඔවුන්ගෙන් ඇහුවා,"ඇයි මෙහෙම කර ගත්තේ, මේ වයසේ අය මෙහෙම කරන්න හොඳ නැහැ නේද? තමන්ට ජීවත් වන්න පුළුවන් විධියක් බලා ගන්න ඕනෑ නේද?" කියලා. එතකොට ඔවුන් කිව්වා, "බලෙන් අපට බැඳෙන්න කිව්වා. අපි මොනවා කරන්නද?" කියලා. සාමාන්‍යයෙන් ඒ ළමයි සිංහල දන්නවා අඩුයි. "What to do?" කියලා ඒ ගොල්ලන් කිව්වා. "என்ன செய்யிறது? ஒன்றும் செய்ய ஏலாது." කියලා කිව්වා. "අපට මොනවාවත් කරන්න පුළුවන් කමක් නැහැ, අපට එහෙම යන්න වුණා?" කියලා කිව්වා. බලන්න, ඒ තරුණ ළමයි, සාමාන්‍යයෙන් කවදාවත් ඒ වාගේ දෙයකට යන්න කැමැති වෙන්නේ නැහැ. තරුණ ළමයි ඉගෙන ගෙන තමන්ගේ තත්ත්වය හදා ගන්න තමයි උත්සාහ ගන්නේ. නමුත් එල්ටීටීඊ එකෙන් ඒ අයව බලහත්කාරයෙන් බඳවා ගෙන තිබෙනවා. ඒ අයට දැන් රජයේ රස්සාවල් දුන්නා, යුද හමුදාවට බඳවා ගත්තා. එහෙම කරලා ඒ අය හොඳ මිනිසුන් බවට පත් කරලා ඒ අයට ඉදිරියට යන්න වැඩ පිළිවෙළක් දැන් සකස් කර ගෙන යනවා. පැරණි, බොහොම හොඳ සංස්කෘතියක් තිබෙන ද්‍රවිඩ ජනතාව ලෝකයේ දියුණු ජාතියක්. අපි නැහැ කියන්නේ නැහැ. ඒ ගොල්ලන්ගේ ආගම, සංස්කෘතිය, සභ්‍යත්වය බොහොම ශ්‍රේෂ්ඨයි. සුළු පිරිසක් තමයි ඒ තත්ත්වයට ඒගොල්ලන්ව ඇදලා ගන්නේ.

දෙමළ ජාතික සංධානය විසින් කර ගෙන යනු ලබන නොයෙකුත් ව්‍යාපාරයන් තුළ අහිංසක දෙමළ වැසියන්ගේ මූලික අවශ්‍යතා හෝ ඔවුන්ගේ අභිලාෂයන් පිළිබිඹු නොකරන අතර, අහිංසක දෙමළ වැසියන් මුළා කර ඔවුන් නැවතත් ජාතිවාදී අරගළයකට ඇද දැමීමටත්, ඒ මඟින් දේශපාලන වශයෙන් ඉදිරියට යෑමටත් බලාපොරොත්තු වන බව හොඳින් පෙන්නුම් කෙරේ. මෙම තත්ත්වය තුළ උතුරු නැඟෙනහිර බොහෝ දෙමළ වැසියන් දෙමළ ජාතික සංධානය ප්‍රතික්ෂේප කරන තත්ත්වයක් මතුව ඇති බව කීමට කැමැත්තෙමි. එමෙන්ම දෙමළ ජාතික සංධානය තුළද නොයෙක් මතවාදී ගැටුම් පවතින අතර එකිනෙකා පරයමින් ඊළාම් මතවාදය වඩා තීව්‍ර ලෙස ප්‍රදර්ශනය කිරීම තුළින් ඔවුන්ගේ ප්‍රතිරූපය නංවා ගත හැක යන පටු අරමුණ තුළ එම සංධානයේ නොයෙකුත් පාර්ශ්වයන් ක්‍රියා කරනු ලබයි. එබැවින් දෙමළ ජාතික සංධානය තුළම අභ්‍යන්තර ගැටුම් ඇති බව පෙනේ.

ගරු කථානායකතුමනි, ගරු ආර්. සම්පන්දන් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ගෙන හැර දක්වන ලද නොයෙකුත් සිදුවීම් පිළිබඳව පරීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතින අතර 2013 මාර්තු 30වන දින සිදුවීමේදී උද්ඝෝෂකයන් පිරිසක් කිලිනොච්චි දෙමළ ජාතික සංධානයේ පක්ෂ කාර්යාලය ඉදිරියේ පැවැති රැස්වීමට ගල්මුල් ප්‍රහාර එල්ල කර ඇති අතර, දෙපාර්ශ්වයේම පිරිස් විසින් ගල්මුල් ප්‍රහාර එල්ල කර ගැනීම නිසා පොලීසිය මැදිහත් වීමෙන් සිද්ධිය සමථයකට පත් කර ඇත. මෙම සිදුවීම පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශ්‍රීතරන් මහතා විසින් කිලිනොච්චි පොලීසියට පැමිණිලි කර ඇති අතර, ඒ පිළිබඳ මූලික කරුණු බී 171/2013 දරන නඩු අංක මඟින් කිලිනොච්චි ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු වැඩිදුර පරීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතින අතර, 2013 මැයි 13වන දින නැවතත් පරීක්ෂණයේ ප්‍රගතිය කිලිනොච්චි අධිකරණය වෙත දැනුම් දීමට නියමිතව ඇත. උසාවියට ඉදිරිපත් කරලා දැන් ක්‍රියා කර ගෙන යනවා. එතුමන්ලාගේ හිතේ තිබෙන්නේ, ඒ ගැන කිසිවක් කළේ නැහැ කියලායි.

එමෙන්ම 2013 අප්‍රේල් මස 03 වන දින කිලිනොච්චි කරදිබෝක්කු හන්දියේ පිහිටා තිබූ උදයන් පුවත් පත් කාර්යාලයට නාඳුනන පුද්ගලයන් කණ්ඩායමක් විසින් පහර දී ඇත. මේ සිදුවීම සබැඳිව උදයන් පුවත් පත් කාර්යාලයේ ආරුමුගන් පොන්නරාජා විසින් 2013 අප්‍රේල් මස 03 වන දින කිලිනොච්චි පොලීසියට පැමිණිලි කර ඇති අතර, ඒ පිළිබඳ මූලික කරුණු බී 176/2013 දරන නඩු අංකය මඟින් කිලිනොච්චි ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු වැඩිදුර පරීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතී. 2013 ජූනි 27 වන දින නැවතත් පරීක්ෂණයේ ප්‍රගතිය කිලිනොච්චි අධිකරණය වෙත දැනුම් දීමට නියමිතව ඇත. ඒ අනුව මෙම සිදුවීම් පිළිබඳව කිසිදු පියවරක් ගෙන නොමැති බවට කරන චෝදනා ප්‍රතික්ෂේප කරන අතර, මෙම සිදුවීම් සහ නොයෙකුත් පැරණි සිදුවීම් යා කොට එම සිදුවීම් අතර ඇති සාවද්‍ය සහසම්බන්ධය පිළිබඳව සම්පන්දන් මන්ත්‍රීතුමා විසින් කරන ප්‍රකාශයන් නිවැරදි නොවන බව වග කීමෙන් කියනු කැමැත්තෙමි. එමෙන්ම නොයෙකුත් අවස්ථාවන්හිදී පුද්ගලික, විරුද්ධ කණ්ඩායම් අතර ගැටුම් මෙන්ම විරුද්ධ දේශපාලන කණ්ඩායම් අතර ගැටුම් ඉතා ලිහිල්ව හමුදා අංශ වෙත බැර කිරීමේ ප්‍රයත්නය වැඩිදුරටත් පිළිකුලෙන් යුතුව හෙළා දකිමු. යුද හමුදාව මේවාට සහභාගි වන්නේ නැහැ. නමුත් හමුදාවන් සම්බන්ධයි කියලා එතුමන්ලා කියනවා.

ගරු කථානායකතුමනි, සියලු ජාතීන් සමඟින් ලබා ඇත්තා වූ නිදහස සහ ත්‍රස්තවාදය සහමුලින්ම පරාජය කිරීමේ ජයග්‍රහණය ඉවසා දරා ගත නොහැකිව දේශීයව සහ විදේශීයව බලවේගයන් සමඟ එක්වී ශ්‍රී ලංකා මාතාවට විරුද්ධව දේශ ද්‍රෝහිව තවමත් එල්ටීටීඊ සංවිධානයේ න්‍යාය පත්‍රයන්ට අනුකූලව දෙමළ ජාතික සංධානය කටයුතු කරන බව ඉතා පැහැදිලිය. සාමයට ලැදි බහුතර දෙමළ ජනතාව දෙමළ ජාතික සංධානය විසින් ගෙන යන මෙම දේශ ද්‍රෝහී වැඩ පිළිවෙල කෙරෙහි කලකිරී ඇති බවත්, ඔවුන්ගේ ක්‍රියා කලාපයට විරුද්ධව ක්‍රියා කරන බවත්, මෙම උත්තරීතර සභාවේ සියලු දෙනා සහ ශ්‍රී ලංකාවේ ඉදිරි අභිවෘද්ධියට මනා කැප වීමෙන් කටයුතු කරන සියලු දෙනා දැන ගත යුතු කරුණකි.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, අපේ හිතවත් ගරු ආර්. සම්පන්දන් මන්ත්‍රීතුමාටත්, ඒ වාගේම TNA එකටත් මේ වාගේ සිද්ධීන් ඇති වෙලා තිබෙනවා නම් අපි එකතු වෙලා සාකච්ඡාවක් පවත්වමු කියලා. ඇයි මේ වාගේ තත්ත්වයක් ඇති වෙන්නේ, පොලීසිය මෙහෙම කරලා තිබෙනවාද කියලා සුහද සාකච්ඡාවක් රජයත් එක්ක කරන්න පුළුවන්. එවැනි සුහද සාකච්ඡාවක් තුළින් ඒ ප්‍රදේශවල ජීවත් වන පොදු මහ ජනතාවට සාධාරණව, භයෙන් සැකෙන් තොරව සන්තෝෂයෙන් ජීවත් වෙන්න ක්‍රියා කරමු. ඒක අපි දෙගොල්ලන්ට මෙන්ම සියලු දෙනාටම අයිති කාර්යයක්. රජයට අයිති ප්‍රධාන කාරණයක්. විපක්ෂයටත් අයිති කාරණයක්. ඒ නිසා අපි මේවා ගැන තරහෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන්, නොඉවසිල්ලෙන් ක්‍රියා කරනවාට, කථා කරනවාට වඩා අර විධියේ සුහද සාකච්ඡාවක් කරලා ඒවා ක්‍රියාත්මක කරනවා නම් හොඳයි කියලායි මම කල්පනා කරන්නේ. ඒ තුළින් තමන්ගේ දේශපාලන දර්ශනය අයින් කරන්න කියලා මම කියනවා නොවෙයි. දේශපාලන දර්ශන තිබෙන්න ඕනෑ. ඒවා බොහොම වැදගත්. ඒ දේශපාලන දර්ශනය ආරක්ෂා කරමින් ජනතාවට සුහදව ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයක් අපි ඇති කර ගන්න උත්සාහ කරමු කියන එක ප්‍රකාශ කරනවා. මගේ මිත්‍රයෙක් හැටියට ගරු ආර්. සම්පන්දන් මන්ත්‍රීතුමා ඒ වාගේ කල්පනා කරයි කියලා මම හිතනවා. එහෙම කල්පනා කරලා අපි දෙගොල්ලන්ම සාධාරණ තත්ත්වයක් ඇති කර ගන්න උත්සාහ කරමු කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තූතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

දෙපැත්තෙන්ම මගේ නම සඳහන් වුණු නිසා මම මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. තෙලිප්පිලෙයි සිද්ධිය සම්බන්ධයෙන්

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

නඩුවක් ගැන නම් මෙතැන සඳහන් වුණේ නැහැ. ඇත්ත වශයෙන්ම මම එතැනට සහභාගි වුණා, පලාලි ගුවන් තොටුපොළ ගැන විසඳුමක් ලබා දෙන්න. ඒ ගොල්ලෝ විසඳුමක් ඉදිරිපත් කළා. එතැන ඇති වුණු සිද්ධියේදී පොලීසිය එක පුද්ගලයෙකු අත් අඩංගුවට ගත්තා. හමුදාව මැදිහත් වෙලා ඔහුව නිදහස් කරන්න කියලා එතැනට බලපෑම් කළා. තව පුද්ගලයෙකු හමුදා කඳවුරට දිව්වා. ඔහු පොලීසියට භාර දුන්නේ නැහැ. පොලීසියෙන් වෙනම අය යැව්වා. පොලීසියට වැඩ කටයුතු කරන්න අවස්ථාව ලැබුණේ නැහැ. මම දැක්කා, යුද්ධ හමුදාවේ නිලධාරීන් කිහිප දෙනෙක්. හමුදාවේ අපි දන්නා අයත් හුඟක් ඉන්නවා. හොයලා බැලුවාම ආරංචි වුණේ හමුදාවේ සාමාන්‍ය කණ්ඩායම් මේකට සම්බන්ධ වුණේ නැහැ කියලායි. සිවිල් ඇඳුමින් වෙනම කණ්ඩායමක් තියා ගෙන ඉන්නවා. ඒ අය බේරා ගන්නයි ක්‍රියා කළේ. හමුදාවේ අය කියන එක මම පිළිගන්නවා. මොකද ඒවා ක්‍රියාත්මක කරන්නේ මේජර් ජනරාල් මහින්ද හතුරුසිංහ. මම ඔක්කෝම කරුණු එදා දුන්නා. ඒ ගැන විභාගයක් තවම සිදු වෙලා නැහැ. හමුදාවේ සමහර අයට භයක් තිබෙනවා, මේජර් ජනරාල් හතුරුසිංහයි, එල්ටීටීඊ නායක කේපීයි අපි ඔක්කෝටම විරුද්ධව ගහන්න එනවාද කියලා. දැන් තිබෙන විධියට එල්ටීටීඊ නායක කේපීයි, මේජර් ජනරාල් හතුරුසිංහයි වෙනම වැඩසටහනක් ගෙන යනවා; මම දන්නේ නැහැ, TNA එකේ අයව මරන්නද, එහෙම නැත්නම් මට විරුද්ධවද කියලා. එල්ටීටීඊ එකෙන් TNA එකේ නායකයන් ගණනාවක් මැරුවා. කොහොම හරි මේ වුණු සිද්ධිය ගැන හොයලා බලන්න. එතකොට ඒවා නැති වෙනවා.

ගරු කථානායකතුමනි, අපි යාපනයට යන කොට අපට ආරක්ෂාව දෙන්න ඕනෑ. පොලීසියට භාර දෙන්න ඕක කරන්න. මොකටද මේජර් ජනරාල් හතුරුසිංහ ඒවාට සම්බන්ධ වන්නේ? අනෙක් අය කියනවා, අපි මේකට සම්බන්ධයක් නැහැ, මේක මෙතැනින් වුණේ කියලා. ඒ ගොල්ලන් කනගාටු වුණා, ඒ වුණු සිද්ධිය ගැන.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒ දවස්වල කට කථාවක් තිබුණා, විපක්ෂ නායකතුමාත් එක්ක ගිය කට්ටිය තමයි මේ කලබලය ඇති කළේ කියලා. මම හිතන්නේ නැහැ, ඒක ඇත්තක් කියලා. ඔබතුමා දන්නවා-

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම එක්ක ගියේ පොලීසියේ අය විතරයි. වෙනත් කවුරුවත් ගියේ නැහැ. කවුරු හරි කිව්වා නම් මාත් එක්ක ගිය කට්ටිය කළා කියලා ගරු කථානායකතුමනි, ඒ ගොල්ලන් කැඳවන්න. ගරු අගමැතිතුමාට වාර්තාවක් ආවා කියලා කිව්වා. මම එක්ක කවුරුවත් ගියේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක්වත් ගියේ නැහැ. කවුරුවත් ගියේ නැහැ. මම එතැන ජනතාව එක්ක හිටියා. එතැන හිටපු මේ මන්ත්‍රීතුමා ඒ ගැන කියයි. මා එක්ක කවුරුවත් ගියේ නැහැ. එතැන ඉන්නවා, මේජර් ජනරාල් හතුරුසිංහ. මම භය නැතුව මේ සභාවේදී ඒක කියනවා. ඔබතුමාට කවුරු හරි කිව්වා නම් ඔහු නම් කරන්න. ගරු අගමැතිතුමනි, ඔබතුමා එතැන හිටියේ නැහැ.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
කවුරු හරි ප්‍රචාරයක් ඇති කළා. සමහර විට ඔබතුමාට විරුද්ධව වෙන්න ඇති. ඒක මම කවදාවත් විශ්වාස කරන්නේ නැහැ. නමුත් ඒ වාගේ කථාවක් තමයි කිව්වේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ප්‍රචාරයක් නොවෙයි. ගරු අගමැතිතුමනි, කරුණාකරලා ඒ කථාව ඉල්ලා අස් කර ගන්න. ඔබතුමාගේ ඔය තනතුර ඔහොම නැති කර ගන්න එපා. මම ගියේ විරුද්ධ පක්ෂයේ නායකයා හැටියටයි. මම ගියේ නැහැ, යූඑන්පී එකේ නායකයා හැටියට.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඔබතුමා වාගේ කෙනෙක් පළමුවැනි වතාවට එතැනට ගිහිල්ලා ඒ ගොල්ලන් එක්ක බොහොම සුභදව කටයුතු කළා. ඒකට තරහට කරපු වැඩක් කියලා මතයක් තිබුණා. ඒකයි මම කිව්වේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මට මේජර් ජනරාල් හතුරුසිංහ ගැන ප්‍රශ්නයක් නැහැ. මට හමුදාවෙන් ආපු ආරංචියයි මම කියන්නේ. මට ආරංචි වුණේ එල්ටීටීඊ එකේ කේපී එක්ක තිබෙන සම්බන්ධය එතැනට එනවා කියලා. TNA එකෙන් ආවේ නැහැ. ඒ සිද්ධිය ඇති වෙන කොට TNA එකේ කට්ටිය හිටියා. මනෝ ගනේෂන් හිටියා. එතැනදී පොලීසිය අත් අඩංගුවට ගත්තේ කවුද?

අන්න ඒක අහන්න අගමැතිතුමනි. TNA එකේ එක්කෙනෙක්ද, මනෝ ගනේෂන්ගේ එක්කෙනෙක්ද, වික්‍රමබාහු කරුණාරත්නගේ එක්කෙනෙක්ද? යූඑන්පී එකේ කවුරුවත් එතැන හිටියේ නැහැ. පස්සේ තමයි මම the Hon. (Mrs.) Maheswaran වෙනම හම්බ වුණේ. ඒ නිසා ඒ පුද්ගලයා කවුද කියලා පොලීසියෙන් අහන්න. ඇයි ඒගොල්ලන් මේ දේ කළේ කියලා අහන්න. එපමණයි මා මේ සභාවේ කියන්නේ. වෙන ප්‍රචාරයක් නැහැ.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
Sir, there are photographs and videos of what happened. We can hand them over to the Hon. Prime Minister. But, of course, it has become a habit of the Government to reject all videos and photographs. Therefore, you will not act upon them.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිලධාරියෙකු පිළිබඳව ගරු මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවේදී යම් පැමිණිල්ලක් කළොත් කරුණාකරලා ඒ ගැන සොයා බලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනාව.

කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හාෂිම් මහතා පිළිබඳ නිවාඩු යෝජනාව ගරු ජෝන් අමරතුංග මහතා විසින් ඉදිරිපත් කිරීම.

නොපැමිණීමේ අවසරය : ගරු කබීර් හාෂිම් මහතා
வராதிருக்க அனுமதி : மாண்புமிகு கபீர் ஹாஷிம்
LEAVE OF ABSENCE: HON. KABIR HASHIM

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 (ඊ) ව්‍යවස්ථාව යටතේ කැඟල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හාෂිම් මහතාට 2013 අප්‍රේල් 09වැනි දින සිට මාස 3ක කාලයක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2013 අප්‍රේල් මස 23 වැනි අහඹරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වරප්‍රසාද යෝජනා
சிறப்புரிமைப் பிரேரணைகள்
PRIVILEGE MOTIONS

I

පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගිවීම වැළැක්වෙන අන්දමින් නිවස සෝදිසි කිරීම
பாராளுமன்றக் கூட்டத்துக்குச் சமுகமளிப்பதைத் தடுக்கும்வகையில் வீட்டைச் சோதனையிட்டமை
SEARCH OF HOUSE RESTRAINING PARTICIPATION AT PARLIAMENT SESSIONS

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2013 පෙබරවාරි මස 19 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග අංක 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

2013 පෙබරවාරි 07වන දින"ද අයිලන්ඩ්" සහ "ඩේලිනිව්ස්" පුවත් පත් වාර්තා
2013 பெப்ருவரி 07ஆந் திகதிய "த ஐலன்ட்" மற்றும் "டெய்லி நியூஸ்" அறிக்கைகள்
"THE ISLAND" AND "DAILY NEWS" REPORTS OF 7TH FEBRUARY 2013

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2013 පෙබරවාරි මස 7 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග අංක 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

දෙල්තොට මහ්ෆලූල් උලමා අරාබි විද්‍යාල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
தெல்தொட்ட மஹ்பலுல் உலமா அரபுக் கல்லூரி (கூட்டிணைத்தல்) சட்டமூலம்
DELTOTA MAHFALUL ULAMA ARABIC COLLEGE (INCORPORATION) BILL

ගරු එම්.බී. ෆාරුක් මහතා
(மாண்புமிகு எம்.பி. பாறூக்)
(The Hon. M. B. Farook)

Hon. Speaker, I move,

"That leave be granted to introduce a Bill to incorporate the Deltota Mahfalul Ulama Arabic College".

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත
உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்
INLAND REVENUE (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 11.16]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා "දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතු ය"යි යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අද මම දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත, නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත, ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත යන පනත් කෙටුම්පත් හතර දෙවැනි වර විවාදය සඳහා ඉදිරිපත් කරනවා.

තමුන්නාන්සේලා දන්නවා ඊයේ අපි විවාදයට ලක් කරපු පනත් කෙටුම්පත් සහ අද අපි මේ සාකච්ඡා කරන පනත් කෙටුම්පත් සියල්ලම පසු ගිය අය වැය ලේඛනයේ ඉදිරිපත් කරපු යෝජනා ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල කිරීම සඳහා ඉදිරිපත් කරන ඒවා කියලා.

විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත් කොටස් දෙකකට බෙදන්න පුළුවන්. එකක් දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත. අනෙක් තුනම එනම්, නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත, ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත එක කොටසක් හැටියට ගන්න පුළුවන්.

පළමුවෙන්ම මම ඒ දෙක, තුන, හතර කියන පනත් කෙටුම්පත් ගැන කථා කරන්නම්. මේවා ඉතාම සරල, මිල -අය කිරීම- සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත්. ඒකට එකම හේතුව දීර්ඝ කාලයක් -බොහෝ විට අවුරුදු 30ක්, 35ක්- සංශෝධනය නොවුණු ඒ ගාස්තු යාවත්කාලීන කිරීමට -නූතන මූල්‍ය සංසරණය හා සන්සන්දනය කරලා ඒ ගාස්තු වැඩි කිරීමට- ගත් තීරණයක්.

ඒක දැන් ක්‍රියාත්මක වනවා. නමුත් රජයට සහ විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාට නීති අංශයෙන් සහ එක් එක් ඇමැතිය අංශවලින් යම් යම් යෝජනා ලැබී තිබෙනවා, මේවා සංශෝධනය කරන්න කියලා. සමහර අවස්ථාවලදී අපේ ගරු මන්ත්‍රීතුමන්ලා පවා පෙන්වා දී තිබෙනවා, ඒවායින් දුප්පත් කොටස්වලට, සමහර අයට ප්‍රශ්න ඇති වෙන්න පුළුවන් කියලා. ඒ නිසා අද අපි මේක සම්මත කළත් නැවත වරක් මේ ගැන විමර්ශනය කරලා - නෛතික හේතූන් නිසා අද මේක සම්මත කරන්න බලාපොරොත්තු වනවා- යථා කාලයේදී ඒ ඉල්ලීම් පිළිබඳව අප හොයා බලා සමහර ඒවා සංශෝධනය කරන්න මේ ගරු සභාවට ගෙනෙන්න බලාපොරොත්තු වනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඒ කියන්නේ, මේකේ විධිවිධාන තවම ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන එකද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ, නැහැ. දැනටමත් මේක අය වැය ලේඛනයත් එක්ක ජනවාරි පළමුවැනි දා ඉඳන් ක්‍රියාත්මක වනවා. නමුත් අද විවාදයේදී ඉදිරිපත් වන කරුණුත් සලකා බලා පසුව ඒ අනුව සංශෝධනය කරන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! නිවේදනයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2013 අප්‍රේල් මස 10වන බදාදා, එනම් අද දින පෙර වරු 11.30ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER left the Chair, and MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කරුණ මා ඉදිරිපත් කළේ, අවසාන ගාස්තු පිළිබඳව අප අනාගතයේ වෙනස් වීමක් කරන්න බලාපොරොත්තු වන නිසායි. ඒ නිසා මේවා වෙනස් නොකරන ගාස්තු හැටියට කල්පනා කරලා දීර්ඝ සාකච්ඡාවක් කිරීම අවශ්‍ය නැහැ. මෙහිදී වැඩියෙන්ම අවධානය යොමු වෙන්නේ දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත ගැනයි කිව්වොත් කවුරුත් එයට එකඟ වේවි. මේ සම්බන්ධයෙන් තමයි විශේෂයෙන්ම පසු ගිය අය වැය ලේඛනයේදීත් වැඩි අවධානය යොමු වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ මා පැහැදිලි කළ හැටියට රජයේ ප්‍රතිපත්ති අනුව යම් යම් බදු පනවනවා වාගේම අවස්ථානුකූලව පවතින යම් යම් බදු වෙනස් කරනවා; සමහර අවස්ථාවලදී සම්පූර්ණයෙන්ම බදු අයින් කරනවා; තවත් අවස්ථාවලදී ඒ අය කරන ප්‍රතිශතය අඩු කරනවා. ඒ කියන්නේ ඒකට concession එකක් ඇතුළත් කරනවා. මේ ආදී වශයෙන් නිරන්තරයෙන්ම ආර්ථිකය ක්‍රියාත්මක වන හැටියට අපට අවශ්‍ය ඉසව්වලට ඒක යොමු කරන්න දේශීය ආදායම් පනත තුළ තිබෙන බලතලත් අප පාවිච්චි කරනවා. අන්න ඒ පසුබිමෙන් තමයි අය වැය ලේඛනයේ ඉදිරිපත් කළ යම් යම් බලාපොරොත්තු ඉටු කර ගැනීමට මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම පසු ගිය වර්ෂ කිහිපය තුළ අප දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විමර්ශනයකට ලක් කරලා විශාල ප්‍රතිසංවිධානයකට යොමු කර තිබෙන බව මා කියන්න ඕනෑ. අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගෙන තිබෙනවා. ඒ වාගේම අවශ්‍ය තාක්ෂණික මෙවලම් ගොඩක් ලබා ගෙන තිබෙනවා. ජාත්‍යන්තර සහයෝගය මත අප විශේෂඥයින් ගෙනැල්ලා එහි තිබෙන ක්‍රමවේද ගොඩක් දුරට වෙනස් කර තිබෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ඉන්න ගරු මන්ත්‍රීවරුන්ට මතක ඇති, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක නිලධාරිනිය ඇවිල්ලා පැහැදිලි කළා, කොයි කොයි විධියටද මේ ප්‍රතිසංවිධානය සිද්ධ වෙන්නේ කියන එක ගැන. තව ටික කාලයකින් නව තාක්ෂණය යොදා ගෙන මේ දෙපාර්තමේන්තුව නවීකරණය කරන්නේ කොහොමද කියලාත් එතුමිය පැහැදිලි කළා. මේක ඒ ප්‍රතිසංවිධානයේ එක කොටසක් හැටියටත් අපට සලකන්න පුළුවන්. මොකද, සමහර තැන්වල ceiling එක වැඩි කරලා කටයුතු කිරීම තුළ හුඟක් දුරට අතරමැද තිබෙන ලිපිගොනු අකර්මණ්‍ය කරන්න පුළුවන්. ඒ වාගේම ඒ අවශ්‍ය කොටස්වලට අපේ අවධානය යොමු කරන්න පුළුවන්.

මෙම සංශෝධනවල පරමාර්ථ මොනවාද කියා මා කියන්න කැමැතියි. 2011 වසරේ සිට සිදු කළ බදු ප්‍රතිසංස්කරණ තවදුරටත් පුළුල් කිරීම, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය සඳහා පහසුකම් සැපයීම, රජය වෙනුවෙන් ජනතාවට නොමිලයේ සපයන සේවාවල පිරිවැය අඩු කිරීම, ණය සුරැකුම් පත් හා රජයේ බැඳුම්කරවල ආයෝජන දිරි ගැන්වීම, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන විෂය මාලා අනුව ලාභ ලැබීමකින් තොරව අධ්‍යාපන සේවා සපයන පාසල් සඳහා පහසුකම් සැලසීම, කාබනික පොහොර නිෂ්පාදනය, බෙදා හැරීම හා අළෙවිය ප්‍රවර්ධනය කිරීම සහ පුනර්ජනන බලශක්ති නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කිරීම මෙම සංශෝධනවල පරමාර්ථයි. ඒ විධියට යම් යම් ක්ෂේත්‍රවල දැනට තිබෙන බදු, එක්කෝ අහෝසි කරලා තිබෙනවා, එහෙම නැත්නම් අඩු කරලා තිබෙනවා.

මේ ගරු සභාවේ දැන ගැනීම සඳහා ඒවායින් කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. එකක් තමයි, renewable energy. ඒ කියන්නේ විදුලි බලය නිෂ්පාදනය කිරීමේ විකල්ප මාර්ග. තාප ක්‍රමය, ග්ලිරිසිඩියා වැනි දේවල් පාවිච්චි කරලා තාප බලය නිෂ්පාදනය කිරීම, සූර්ය බලයෙන් විදුලිය නිෂ්පාදනය කිරීම ආදී විකල්ප මාර්ගවලට සහ විශේෂයෙන් ම සුළු හා මධ්‍යම පරිමාණයේ ජල විදුලි ක්‍රමවලට සහනාධාර සැපයීම පසු ගිය අය වැය ලේඛනයේ තිබුණු එක් පරමාර්ථයක්. එහි අවශ්‍යතාව අද තමුන්නාන්සේලාට හොඳට අවබෝධ කර ගන්න පුළුවන්. මොකද, ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල සහ අනාගතයේ ගල් අඟුරු මිල උච්චාවචනය වන කොට -ඉහළට හා පහළට යන කොට- බොහෝ විට අපට විතරක් නොවෙයි, මේ අමුද්‍රව්‍ය නිෂ්පාදනය නොකරන රටවලට, ඒ රටවල ආර්ථිකයට ඉතා ම අමාරු තත්ත්වයකට මුහුණ පාන්න සිද්ධ වනවා.

ලංකාවේ අපට විශේෂයෙන් ප්‍රශ්න කිහිපයකට මුහුණ පාන්න සිද්ධ වෙලා තිබෙනවා. එක ප්‍රශ්නයක් තමයි තෙල් මිල වැඩි වීම. ඒ වාගේම ඉරානයට සම්බාධක පැනවීම නිසා අපට අවශ්‍ය ප්‍රමාණයට තෙල් ගන්න බැරි වෙලා තිබීම. ඒකත් එක්ක සම්බන්ධිතයි අපේ refinery එක. අපේ තෙල් පිරිපහදුව සකස් කරලා තිබෙන්නේ ඉරානයේ තෙල් පිරිපහදු කරන්නයි. ඒවා අපට වෙනස් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. Fossil fuels මත ම රැඳිලා විදුලි බලය නිෂ්පාදනය කරන්න අප වාගේ රටවලට සිද්ධ වෙලා තිබෙනවා. නමුත් ඒක ඉතා ම අවදානම් තත්ත්වයක්. ආර්ථිකය ගැන අපි නිතර-නිතර විවාද කරනවා. ඊට අදාළ විවිධ මාතෘකා ගැන අපි මේ සභාවේ සාකච්ඡා කරනවා. ඒ ගැටලුව අපට විතරක් නොවෙයි තිබෙන්නේ. දියුණු වන ලෝකය ම මුහුණ දෙන ලොකු ප්‍රශ්නයක් තමයි, මේ වෙනස් වන තෙල් මිලට මුහුණ දෙන්නේ කොහොමද කියන එක. ඒකත් depletable resource එකක් කියන එක අමතක කරන්න හොඳ නැහැ. දැනට මැද පෙරදිග තිබෙන තෙල් නිධි වුණත් තව අවුරුදු 15ක්, 20ක් පමණයි පවතින්නේ කියා ඒ ගොල්ලෝ ප්‍රකාශ කරනවා.

එම නිසා අපි මොකක්ද කරන්නේ? අනිවාර්යයෙන් විකල්ප බලය -තමුන්නාන්සේලා හිතන විකල්ප බලය නොවෙයි- නිපදවීමේ අවශ්‍යතාව අපට තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
2010 දී තෙල් හම්බ වුණා කිව්වා නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
2010 දී නොවෙයි, 1957 දීත් කිව්වා තෙල් හම්බ වුණාය කියලා. හැම වෙලාවේ ම ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආණ්ඩුව තමයි කිව්වේ. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඉතින් ඔබතුමන්ලාත් අත් පුඩි ගැහුවා. අපි සියලු දෙනා ම අත් පුඩි ගැහුවා. හැබැයි ඒ තත්ත්වය මා ඔබතුමන්ලාට කියන්න ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තව ම නැහැ නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තව ම තෙල් හම්බ වුණේ නැති වුණාට තව ම ඒ ගවේෂණ කර ගෙන යනවා.

අපි බලාපොරොත්තු වෙනවා, ඒ ගවේෂණ සාර්ථක වෙයි කියලා. අද පත්තරේ බලන්න. මේ ගවේෂණ කරන "කෙයාන්" කියන කොම්පැනිය අද කියනවා, ඒගොල්ලන් රාජස්තාන්වල තෙල් නිධි සොයාගෙන තිබෙනවා කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාගේ අවසරය ඇතිව මා කියන්නේ. හැම තැනම තෙල් තිබෙනවා. හැබැයි තෙල් තිබෙන්නේ පොළොවේ හුඟක් යට. ඒවායේ කැනීම්වලට යන වියදම තමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. අපට ලැබෙන ආරංචි අනුව, ලංකාවේ තෙල් තිබෙන්නේ පොළොවේ හුඟක් යට. ලිබියාවේ තෙල් තිබෙන්නේ පොළොව මට්ටමට ආසන්නව.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක ඇත්ත.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒවා කැනීම ලාභයි. අනෙක් එක, 2010 දී නේ තමුන්නාන්සේලා කිව්වේ තෙල් පෙනෙන්න තිබෙනවා කියලා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා කියන දෙයට මා විරුද්ධ වන්නේ නැහැ. තෙල් මිල නියම කිරීමේ දී විවිධ හේතු බලපානවා. තෙල් උඩට අරගෙන වෙළෙඳාම් කිරීමට යන වියදම එක වැදගත් සාධකයක්. නමුත් ඒ සියලුම ප්‍රශ්න තියෙද්දීත් අපට තවමත් අවස්ථාව තිබෙනවා. එය නැහැ කියලා කියන්න බැහැ. අපි විතරක් නොවෙයි, තමුන්නාන්සේත් දන්නවා ඇති, ඒ blocks හදලා තිබෙන හැටියට අපේ blocks වලට ආසන්න blocks තිබෙන්නේ ඉන්දියාවේ බව. ඒ සමාගම ඒ පර්යේෂණ කරගෙන යනවා. ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලාගේ පාලන කාලයේත් මොරගොඩ මැතිතුමාගේ මැදිහත්වීමෙන් Norwegian කට්ටියක් ගෙන්වලා පර්යේෂණ කරලා තිබෙනවා. ඒ නිසා අපට සම්පූර්ණයෙන්ම කියන්න බැහැ, තෙල් ලබා ගන්න බැරි වෙයි කියලා. හැම රටක්ම අද ඒ ගැන සොයලා බලනවා. අද ලෝක සිතියම විශාල වශයෙන් වෙනස් වේගෙන යනවා.

තමුන්නාන්සේට මම කාරණා දෙකක් විතරක් කියන්නම්. අද පිලිපීනයේ, චීනයේ මුහුදුවල ගැටුම් ඇති වෙලා තිබෙන්නේ ඇයි? වියට්නාමය එකක් කියනවා, චීනය තව එකක් කියනවා, ජපානය තවත් එකක් කියනවා. මේ පුංචි දූපත් අයිති කර ගැනීමට විශාල සටනක් සිදු වෙනවා. එහෙම වෙන්නේ ඒ දූපත්වල වටිනාකමටත් වඩා ඒවා යට තෙල් තිබෙන නිසා. ඒක එකක්.

දෙවැනි කාරණාව බලන්න. අද ලංකාවත් geopoliticsවලට සම්බන්ධ වෙලා තිබෙනවා. අද "Foreign Affairs" කියන සහරාවේ ජාත්‍යන්තර පර්යේෂණ පිළිබඳව සඳහන් වෙනවා. "Breakout Nations" කියන පොතේ මොකක්ද කියන්නේ? ඉන්දියාව, චීනය, ඇමෙරිකාව කියන මේ රටවල් අතර තිබෙන විශාල තරගය තුළ චීනයට තිබෙන ලොකුම බාධකය තමයි තෙල් නැතිකම. ඒ ගොල්ලන් කියනවා, තෙල් ගෙන යන මාර්ගය අල්ලාගන්න පුළුවන් - ග්‍රහණය කර ගන්න පුළුවන් - තැන් දෙකක් ගැන. එකක් හම්බන්තොට. අනෙක් එක Strait of Malacca . ඉතින් මේ පවතින තත්ත්ව ඔක්කෝම වෙනස්වේගන යනවා. ඒ නිසා අපි ගොඩක් අලුතින් කල්පනා කරන්නට ඕනෑ. අර පරණ විධියට 1940 ගණන්වල, 1950 ගණන්වල පන්තියේ ඉගෙන ගත් භූගෝලය අනුව අද අපට රට විනිශ්චය කරන්න බැහැ; ලෝකය විනිශ්චය කරන්න බැහැ. මේ දෙපැත්තේම ඉන්න අපි නව දැනුම අනුව කටයුතු කරන්න ඕනෑ. මම ඊළඟට කියන්නම් අපි ඒ නව දැනුම ලබා ගන්න කොච්චර සහන දෙනවාද කියලා.

විශේෂයෙන් අද චීනය සහ ජපානය තෙල් අර්බුදයට මුහුණ දෙනවා. ගරු මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ, චීනයට යන, ජපානයට යන ඒ සෑම තෙල් කඳුලක්ම යන්නේ හම්බන්තොට හරහා බව. ඒක නැහැ කියලා කියන්න බැහැ. ඒ මුහුදු හරහා තමයි යන්නේ. අද මුළු ලෝකයේම තිබෙන sea lanesවලින් තුනෙන් දෙකක් යන්නේ හම්බන්තොට හරහා. තමුනාන්සේලා ඒවා ගැන කල්පනා කරලා තිබෙනවාද? ගෙනැල්ලා කියවන්න, Ruchir Sharma's "Breakout Nations" කියන පොත. අද ලෝකයේ තිබෙන sea lanes ඔක්කෝම එකතු කළාම, වැඩියෙන්ම පාවිච්චි වන්නේ මැද පෙරදිග ඉඳන් චීනයට සහ ජපානයට හම්බන්තොට හරහා යන තෙල් මාර්ගයයි. ඒවා දැනගන්න. ඉගෙන ගන්න. [බාධා කිරීමක්] නැහැ, ඉතින් වරායක් නැතිව මේවා කරන්න බැහැ නේ. [බාධා කිරීමක්] bunkering කරන්න බැහැ නේ. [බාධා කිරීමක්] වරායත් එම සැලැස්මට සම්බන්ධ වනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තවම නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳ බුද්ධිමත් මන්ත්‍රීවරයෙක්. කරුණාකරලා අවංකව කියන්න, යම් කිසි ආයෝජනයකින් පස්සේ කොයි රටෙද ඊළඟ අවුරුද්දේම ප්‍රතිඵල ලැබෙන්නේ කියලා. මේවා මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන ආයෝජන. තමුන්නාන්සේ හිතනවාද පරාක්‍රමබාහු රජ්ජුරුවන් හදපු වැව් නිසා, ඊළඟ අවුරුද්දේ එක පාරටම අස්වැන්න වැඩි වුණා කියලා? මහවැලි ව්‍යාපාරය ආරම්භ කළ කාලයේ සිද්ධ වෙච්ච දේවල් ඔබතුමා හොඳට දන්නවා නේ.

මහවැලි ව්‍යාපාරය ආරම්භ කරන කොට කී දෙනෙක් ඒකට විරුද්ධ වුණාද? ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ බව දන්නවා නේද? ඊරියගොල්ල මහත්මයා පොතක් ලිව්වා මහවැලි ව්‍යාපාරය සාර්ථක වන්නේ නැහැ කියලා. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඒ බව හොඳට දන්නවා. ඒකට විරුද්ධව ලොකු ව්‍යාපාරයක් ගෙන ගියා. දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමා ලිපි ලිව්වා ඒක මෝඩ වැඩක්ය කියලා. ගල්ඔය ව්‍යාපාරය හදන කොට දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමා කිව්වා, මේක අවුරුදු දෙකකින් silt වෙනවා, වැහෙනවා කියලා. ඒ විධියේ විවේචන තිබුණා. මේ ප්‍රජාතන්ත්‍රවාදී රටවල එහෙම විවේචන තිබෙනවා. "මේක වැඩ කරන්නේ නැහැ, අහස් යාත්‍රාවේ කුරුල්ලෝ හැප්පෙයි, ගල් වැටෙනවා" ආදී දේවල් කියනවා. ඒවා සාමාන්‍ය දේශපාලන විචාර.

The "Three Gorges" කියන ලෝකයේ විශාලතම dam එක සහ විදුලිබල ව්‍යාපෘතිය ගැන තමුන්නාන්සේලා දන්නවාද? ඒක හදන කොට හැම දෙනාම ඊට විරුද්ධ වුණා. මට මතකයි, TV

එකේ තිබුණු සාකච්ඡාවකදී ඒ චීන ඇමතිවරයාගෙන් කෙනෙක් ඇහුවා, "ඔබතුමා දන්නවාද, මේ වැව නිසා ලක්ෂ දෙකක් මිනිස්සු යට වෙනවා, ඒ අයට දෙන උපදෙස මොකක්ද?" කියලා. චීන ඇමතිතුමා කිව්වා, "මම ඒ ඔක්කොටම පීනන්න ඉගෙන ගන්න කියලා උපදෙස් දෙනවා." කියලා. ඒ කියන්නේ ඒ අය එතැනින් යන්නේ නැත්නම් පීනන්න ඉගෙන ගන්නය කියන එකයි. එවැනි තීරණ අරගෙන තමයි යටිතල පහසුකම් දියුණු කරන්න ඕනෑ. ඒ ව්‍යාපාරය නිසා මිනිස්සු මිලියන ගණනකට ගෙවල් අත ඇරලා යන්න සිදු වුණා. නමුත් අද the "Three Gorges" dam එක කොයි තරම් දියුණුද? මම හිතන්නේ එස්.බී. දිසානායක ඇමතිතුමාටත් මතක ඇති, එතුමාත් ගිහින් ඒක බැලුවා. අප ජනාධිපතිතුමාත් එක්ක ගිහින් ඒක බැලුවා. ඒක තමයි අද ලෝකයේ තිබෙන විශාලතම dam එක සහ ජල විදුලිය නිෂ්පාදනය කරන බලාගාරය. ඒ වාගේ තීරණ ගන්න සිදු වෙනවා. කුරුල්ලෙක් හැප්පෙනවා, නැත්නම් වවුලෙක් එනවා කියලා මේවා නවත්වන්න බැහැ නේ. තීන්දු ගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප මේ බදු සහන ලබා දෙන්නේ යම් කිසි ඉසව්වකට යන්නයි. මෙමඟින් කොයි කොයි ඒවාටද සහන දීලා තිබෙන්නේ කියලා ඔබතුමන්ලා හොඳට කල්පනා කර බලන්න.

කලින් මම කිව්වේ renewable energy ගැනයි. අනික් එක තමයි, organic fertilizer. අප හැම දෙනාම පිළිගන්නවා, ස්වභාවික පොහොර වර්ග - organic fertilizer කියන දෙය- හඳුන්න ඕනෑය කියලා. අද අප සියලු දෙනාම මේ ප්‍රශ්නයට මුහුණ දෙනවා. වකුගඩු රෝගය ගැන මේ ගරු සභාවේ කී සැරයක් ප්‍රශ්න අහලා තිබෙනවාද? අද උදේත් බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඒ ගැන ඇහුවා. මේවා ලොකු ප්‍රශ්න. එතුමා කිව්වා,- [බාධා කිරීමක්] ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා යන්නේ නැතිව මම කියන දෙය පොඩ්ඩක් අහලා යන්න. ඔබතුමන්ලාගේ බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කිව්වා, වකුගඩු රෝගය හැදිලා තිබෙන්නේ ගොහාගොඩ ප්‍රදේශයේ කුණු දමන නිසාය කියලා. ඒක විශ්වාස කරන්න පුළුවන්ද? අප තුන් දෙනාම ගොහාගොඩ ප්‍රදේශය ගැන දන්නවා නේ, ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමනි. ඉතින් ගොහාගොඩට කුණු දැම්මාම මුළු රජ රටටම වකුගඩු රෝගය හැදෙනවාද? අද එතුමා කිව්වේ ඒකයි. ඒ වුණත් අප ඒවා ගැන සොයා බලන්න ඕනෑ. අප ඒ පර්යේෂණ කරන්න ඕනෑ. ඒ පර්යේෂණ කරන්න ඊට අවශ්‍ය වාතාවරණය හදන්න ඕනෑ; පහසුකම් දෙන්න ඕනෑ.

අද අපේ විශ්වවිද්‍යාල දිහා බලන්න. මම අවංකවම මෙන්න මේ කාරණය කියන්න ඕනෑ. අප හැම දෙනාම පිළිගන්න ඕනෑ, එස්.බී. දිසානායක මැතිතුමා උසස් අධ්‍යාපන ඇමති වශයෙන් පත් වුණාට පස්සේ, අපේ උසස් අධ්‍යාපනය නැවත වරක් පර්යේෂණ සහ දැනුම පිළිබඳ කේන්ද්‍රස්ථාන බවට පත් වෙලා තිබෙන බව. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාට පස්සේ අපේ රටේ අධ්‍යාපනයට වැඩියෙන්ම සේවයක් කළේ එස්.බී. දිසානායක මැතිතුමාය කියලා මම අවංකවම ප්‍රකාශ කරනවා. මොකද, අප ඉදිරිය ගැන හිතන නිසා. අප දැන් සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහත්මයාගේ හොඳ කථා කරන්නේ ඇයි? එතුමා ඉදිරිය ගැන හිතපු නිසායි. එදා එතුමා ඡන්දයෙන් පැරදුණා. එතුමාට බැණ්ණා. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා එදා ඡන්දයෙන් පරාජය වුණා. නමුත් අද මොකද කියන්නේ? ඒ පරාජය කරපු අයම අද එතුමාට ප්‍රතිමා හදනවා; පිළිම හදනවා. එස්.බී. දිසානායක මැතිතුමා මගේ ගෝලයා. ඒ නිසා මම එස්.බී. දිසානායක මැතිතුමා ගැන ආඩම්බරයෙන් කථා කරන්න ඕනෑ. එතුමාත් ඉදිරිය ගැන කල්පනා කරනවා. අපේ ජනාධිපතිතුමාත් ඊයේ කියා තිබෙනවා, ධනාත්මකව හිතන්න, ඉදිරිය ගැන හිතන්නය කියලා. අඩුපාඩුකම් තිබෙනවා නම් අපි හදා ගනිමු. [බාධා කිරීමක්] බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගෙත් ආසාවක් තිබෙනවා; බලාපොරොත්තුවක් තිබෙනවා. අප උදව්ව කරන්න ඕනෑ. [බාධා කිරීමක්] නැහැ. මම කථා කරන්නේ අර ඉදිරි දැක්ම ගැනයි. අන්න ඒ විධියට තමයි අප මේ යෝජනා දිහා බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මම කිව්ව එක කාරණයක් තමයි, renewable energy. ඒ කියන්නේ බලශක්ති අංශය. අනික් එක organic fertilizer. ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ ආයෝජකයින්ගේ ප්‍රශ්න; ඒ අයට දෙන සහන පිළිබඳව; ඒ සියල්ලම මේ දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පතේ තිබෙනවා. අපේ තවත් අරමුණක් තිබෙනවා. දැන් ලංකාවේ හුඟක් අයට අපේ රටේ පිහිටීම අනුව පිට රටවලින් බඩු ගෙනැවිත්, නාමික වශයෙන් අපේ භූමි භාගයට ආවත් පිටට යවන්න නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒ ආකාරයට ගෙනැල්ලා ආපසු පිට කරන භාණ්ඩවලට අපි ලොකු බදු දැම්මොත් ඒ ව්‍යාපාරිකයින් අපේ රටට එන්නේ නැහැ. තමුන්නාන්සේලා දන්නවා ඇති, ඔලන්දය වාගේ තැන්වල, Amsterdam වාගේ තැන්වල කණු හිටවලා තමයි ඒ අයගේ harbour එක හදලා තිබෙන්නේ. මම ඇහැට දැකලා තිබෙනවා. උදාහරණයක් හැටියට, ඒ අය දුම් කොළ ඒ ගබඩාවලට ගෙනැල්ලා, -භූමි භාගයටවත් ඇවිල්ලා නැහැ. මුහුදේ තිබෙන ගබඩාවලට ගෙනැල්ලා- එතැනදී නිෂ්පාදනය කරලා ආපසු විකුණනවා. ඒවා extraterritorial. අපේ නීති යටතේ අද තිබෙන විධියට ඒ ව්‍යාපාරිකයින් මොනවා හෝ ගෙනාවොත් බදු ගහන්න වෙනවා. අපි මේ දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් එය වෙනස් කරලා තිබෙනවා. ඒ අය ලංකාවට බඩු ගෙනැල්ලා, ලංකාවේදී නිෂ්පාදනය කරලා, ඒ භාණ්ඩවල අගය වැඩි කරලා ඒ සියලුම භාණ්ඩ පිට යවනවා නම් අපි ඒ අයට සහනයක් දෙනවා. මේ විධියට මේ අය වැය ලේඛනය තුළින් පොරොන්දු වුණ නොයෙක් විධියේ සහන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා එකින් එක අපි අද තමුන්නාන්සේලාට ඉදිරිපත් කරලා තිබෙනවා. යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒවා ගැන පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්. මේ සෑම පනත් කෙටුම්පතකම පරමාර්ථය වන්නේ මේ බදු ක්‍රමය තුළින් පුළුවන් තරම් නව දැක්මක් අනුව, නව ඉසව්වකට යමින් ජනතාවට සහන ගෙන ඒමයි. විශේෂයෙන් මම අවධානය යොමු කරනවා research and development සම්බන්ධයෙන්. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා පිළිගන්නවා ඇති, රටක් ආර්ථික වශයෙන් දියුණු වන්නේ, නිෂ්පාදන වශයෙන් දියුණු වන්නේ හේතු දෙකක් නිසාය කියලා. එකක් තමයි Cost of Production. අපි කොපමණ කථා කළත් භාණ්ඩ නිෂ්පාදනයේදී මිල වැඩි වුණොත්, -විදුලිය වෙනුවෙන් වෙන්න පුළුවන්. පඩි නඩි වෙනුවෙන් වෙන්න පුළුවන්, ප්‍රවාහනය වෙනුවෙන් වෙන්න පුළුවන්, පරිපාලනය වෙනුවෙන් වෙන්න පුළුවන්- අපේ භාණ්ඩය තරගකාරී තත්ත්වයකට එන්නේ නැහැ. ඒ එක කාරණයක්. අපි විවේචනය කරන විට නොයෙක් විධියට "අර සහනය දෙන්න ඕනෑ, මේ සහනය දෙන්න ඕනෑ" කියලා කියනවා. ඒක හොඳයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, please wind up now.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Give me one more minute, Sir. අපි ඒක කරන්න ඕනෑ COP එක- Cost of Production එක- තරගකාරී තත්ත්වයක තියා ගෙනයි. දෙවෙනි කාරණය තමයි පර්යේෂණ, research and development. හැම ක්ෂේත්‍රයේම අලුත් දේවල් සොයලා අපේ නිෂ්පාදනය තුළින් අනෙක් අය අබිභවා යන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න ඕනෑ. මම එදා අහ ගෙන හිටියා, අපේ ගරු එස්.බී. දිසානායක මැතිතුමාගේ කථාවේදී එතුමා ඉතාම ආඩම්බරයෙන් කිව්වා අපි "පේටන්ට්" මෙපමණ කරලා තිබෙනවා, අපේ විද්‍යා අංශය මෙපමණ වර්ධනය වෙලා තිබෙනවා, අපේ තාක්ෂණික අංශය මෙපමණ වර්ධනය වෙලා තිබෙනවා කියලා. ඒ ඉසව්ව ඉතාම පැහැදිලියි. ඒ පරිවර්තන යුගයේ යම් යම් ගැටලු ඇති වෙන්න පුළුවන්. නමුත් ඒ ඉසව්වට යන්නේ නැතිව, නිකම්ම

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

අත්පුඩි ගහලා, ජනප්‍රියත්වය තෝරා ගෙන පරණ විධියට අවුරුදු 30කට 40කට පෙර තිබුණ විධියට විශ්වවිද්‍යාල ක්‍රමයට ගියාට මේ රටට අනාගතයක් නැහැ. ඒ නිසා අපි සියලු දෙනාම වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ. මේ රට ආර්ථික වශයෙන් ඉදිරියට ගෙන යන්න ඕනෑ නම් නිෂ්පාදන ක්‍රමය තරග කරන්න පුළුවන් තත්ත්වයකට ගේන්න ඕනෑ. එක කාරණයක් තමයි නිෂ්පාදන මිල සහ වැය වීම. දෙවෙනි කාරණය තාක්ෂණය- technology . ඒ කාරණා දෙක සමහයි අපි ඉදිරියට යන්න ඕනෑ. ඒ තමයි මේ පනත් කෙටුම්පතේ දැක්ම. ඒ සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගය දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එවුත්තියම්පප්පෙරුම.
Question proposed.

[පූ.භා. 11.42]

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද සාකච්ඡා කරන පනත් කෙටුම්පත් කිහිපය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට පෙර, මේ වන විට මතු වෙලා තිබෙන කාරණයක් ගැන විශේෂයෙන් මම රජයේ අවධානය යොමු කරන්නට කැමැතියි. ඒ කාරණය තමයි ඊයේ පෙරේදා සිට උතුරු කොරියාව සහ දකුණු කොරියාව අතර මතු වෙලා තිබෙන යුද්මය පරිසරය.

අපට මේක සැහැල්ලුවෙන් සලකන්න බැහැ. හේතුව තමයි, ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් 24,000ක් නිල වශයෙන් ඉන්නවා. නිල නොවන ආකාරයට තවත් 10,000කට වැඩි ශ්‍රමිකයන් ප්‍රමාණයක් දකුණු කොරියාවේ වැඩ කරනවා. ඒ අය ශ්‍රී ලංකාවට විශාල මුදල් ප්‍රමාණයක් එවනවා. ඒ නිසා මේ දේශ සීමා ආසන්නයේ වැඩ කරන ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව ගැන විශේෂයෙන් බලන්න කියලා අපි ඉල්ලා සිටින්න කැමැතියි. මොකද, යුද්ධය ඇති වෙන්න පුළුවන්, ඇති නොවන්න පුළුවන්. ඒක වෙනම කථාවක්. හැබැයි, දැනටමත් උතුරු කොරියාව අනතුරු අඟවමින් තිබෙනවා, දකුණු කොරියාවේ සිටින සියලුම විදේශිකයන් ඉවත් කර ගන්න කියලා. ඒ අනතුර නිසා අපේ පුරවැසියන්ට යම් ආරක්ෂාවක් ලබා දීම සහ ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම රජයේ වගකීමක්; ඒ වාගේම යුතුකමක්. මම ඒ ගැන අවධානය යොමු කරවන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කර තිබෙන අණ පනත් ගණනාව ගත්තාම මේ සියල්ලම පසු ගිය වර්ෂයේ ඉදිරිපත් කළ අය වැය ලේඛනයට සමගාමීව ඒ අදාළ පනත් සංශෝධනය කරමින් බදු අය කර ගැනීම සඳහා කරන යෝජනා බව පෙනෙනවා. විශේෂයෙන්ම අපේ සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා, මේ අණ පනත්වලට මේ විධියට සංශෝධන ඉදිරිපත් කරන්නේ ඒවා යාවත්කාලීන කරන්නය කියලා. දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. මේ විධියට බදු පනත් ඉදිරිපත් කරන කොට, මේ විධියට මහජනතාවගෙන් වැඩියෙන් මුදල් අය කරන්න යෝජනා කරන කොට, අනෙක් පැත්තෙන් බැලිය යුතු ප්‍රධානම කාරණය තමයි රජයේ තිබෙන දූෂණය, වංචාව සහ හොරකම අඩු කරන්න ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම දැක්කා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය Export-Import Bank of China එකත් එක්ක අත්සන් කළ ගිවිසුම. එයට මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඒක නොරොච්චෝල ගල් අඟුරු බලාගාරය ඉදි කිරීමේ ගිවිසුම. නොරොච්චෝල ගල් අඟුරු බලාගාරය ඉදි කිරීම සඳහා අත්සන් කළ Credit Loan Agreement එක අනුව නොරොච්චෝල බලාගාරය ඉදි කරන්න Export-Import Bank of China කියන බැංකුවෙන් අර ගෙන තිබෙන මුළු මුදල් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 455යි. මේ විධියට ඇමෙරිකානු ඩොලර් මිලියන 455ක් ගන්න විදේශ සම්පත් දෙපාර්තමේන්තුව 2006 සැප්තැම්බර් මාසයේ 19 වැනිදා තමයි ඒ එකඟතා ගිවිසුම අත්සන් කළේ. මේ අත්සන් කළ එකඟතා ගිවිසුමේ එක කොන්දේසියක් තිබෙනවා, management fee එක හැටියට -කළමනාකරණ ගාස්තු හැටියට- රුපියල් කෝටි 6ක් ගෙවන්න. පොලිය වශයෙන් තීන්දු කරන්නේ LIBOR plus 2 කියන ප්‍රතිශතයට. ඒ කියන්නේ සියයට 6ක්, 6/12ක්, 7ක් විතර වෙනවා. මෙතැන තිබෙන ප්‍රශ්නය ඇමෙරිකානු ඩොලර් මිලියන 455කට මේ ගිවිසුම අත්සන් කළත් ඇත්ත වශයෙන්ම මෙහි face value එක ඇමෙරිකානු ඩොලර් මිලියන 300යි. ඒ මුදල තමයි පාවිච්චි කර තිබෙන්නේ. මෙහිදී බැංකු ගාස්තු, වෙනත් වියදම්, management fee මේ ඔක්කොම ඒවා දැම්මත් ඇමෙරිකානු ඩොලර් මිලියන 455කට ගිවිසුම අත්සන් කරලා, මේ සඳහා සත්‍ය වශයෙන්ම යොදා තිබෙන මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක් සහ ඒ ගාස්තු සමඟ එකඟ වන මුදල නම්, ඉතිරි අමෙරිකානු ඩොලර් මිලියන 100ට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ ගැන කිසිම පැහැදිලි කිරීමක් නැහැ. මෙහි තිබෙන නරක තත්ත්වය මේකයි.

දැන් නොරොච්චෝල විදුලි බලාගාරය අවුරුද්දේ වැඩි දවසක් වැඩ කරන්නේ නැහැ. දවස ගානේ ක්‍රියා විරහිත වෙනවා. මේ හදනවා, මේ කැඩෙනවා. පසු ගිය කාලයේ නම් මේක ප්‍රවෘත්තියක් වුණා. දැන් ප්‍රවෘත්තියකුත් නොවෙයි. ඒ කියන්නේ නොරොච්චෝලේ විදුලි බලාගාරය කැඩුණා, හැදුවා; ආයෙත් කැඩුණා, ආයෙත් හැදුවා කියලා පත්‍රවල දැමීමා. දැන් ඒ ප්‍රවෘත්තිය පත්‍රවලට වටිනාකමකුත් නැහැ. ඇයි, ඒක කැඩෙන වාර ගණනත්, හදන වාර ගණනත් වැඩියි. දැන් තිබෙන ප්‍රශ්නය නොරොච්චෝල ගල් අඟුරු බලාගාරය ඉදි කරන්න ඇති කර ගත් Credit Loan Agreement එක අනුව Export-Import Bank of China එකෙන් ලබා ගත් ඇමෙරිකානු ඩොලර් මිලියන 455න් ඇත්තටම වියදම් කළ මුදලට අමතරව ඇමෙරිකානු ඩොලර් මිලියන 100කට අධික ප්‍රමාණයක් අතුරුදහන් වෙලා තිබෙනවා. ආණ්ඩුවට මේ ගැන කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. ඒක වෙනම කාරණයක්. මේවා මට ලැබී තිබෙන තොරතුරු. අපි අහන්නේ මේවාට මහජනයා වන්දි ගෙවන්න ඕනෑද කියලායි.

වැදගැම්මකට නැති, නියමිත ප්‍රමිතියකට නැති බලාගාරයක් වෙනුවෙන් අපේ ජනතාව ණය වෙලා. ජනතාව ණය වුණාම ඒ ණය ගෙවන්න ජනතාවගෙන්ම අය කරනවා. මේ බදු පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්නේ ඒවා කොහොම හරි ආපසු මිනිසුන්ගෙන් අය කර ගන්නයි. මෙතැන ඩොලර් මිලියන 100කට අධික ප්‍රමාණයක මුදල් අතුරුදහන් වෙලා තිබියදී ඒවාට වන්දි ගෙවන්නත් දැන් මේ රටේ ජනතාවට සිදු වෙලා තිබෙනවා. අප කියන්නේ, ආණ්ඩුව මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න වුවමනාය කියලායි.

ඒ විතරක් නොවෙයි. තත්ත්වය මෙසේ තියෙද්දී ලංකා විදුලිබල මණ්ඩලය පසු ගිය මාසයේ යෝජනාවක් ඉදිරිපත් කරනවා විදුලි බල ගාස්තු වැඩි කරන්න. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපතිවරයා වන ආචාර්ය ජයතිස්ස ද කොස්තා මැතිතුමා විදුලි බල ගාස්තු වැඩි කරන්න කරපු යෝජනාවේ කියලා තිබෙනවා මම දැක්කා, විදුලිය බිලේ සියයට 50ක වැඩි කිරීමක් ගැන. එම කොමිෂන් සභාවේ සභාපතිතුමා වන ආචාර්ය ජයතිස්ස ද කොස්තා මැතිතුමා කියන විධියට විදුලිය බිල වැඩි කරන්න ඉදිරිපත් කරපු යෝජනාවෙන් විදුලිය බිල සියයට 50කින් වැඩි කරන්න කියා ඉල්ලන්නේ මේ පාඩු පියවා ගන්නයි. ඒ නැති වූ මුදල් ටිකට වන්දි ගෙවන්න වෙලා තිබෙන්නේ මහ ජනතාවටයි. අප කියන්නේ නොරොච්චෝලේ බලාගාරය ඉදි කරපු වියදම් ටික පියවා ගන්න, එයින් වන පාඩුව

සහ නාස්තිය පියවා ගන්න විදුලිය ගාස්තු මේ විධියට වැඩි කරලා වැඩක් නැහැ කියලායි. එයත් ආපසු යන්නේ මහ ජනතාව ළඟටමයි. ඒ නිසා අප කියන්නේ මෙය ඉතාම නරක තත්ත්වයක් බවයි. මේ විධියට නාස්තියක් වෙනවා නම් කොහොමද අය වැයක් සමබර කරන්නේ? මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්න වුවමනාවක් නැහැ, ඒ නාස්ති වළක්වා ගන්න තිබුණා නම්. ඒ විතරක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප්‍රේල් මාසයේ පළමුවැනි දා ඉඳලා විදුලිය බිල වැඩි කරනවා කියලා යෝජනාව ඉදිරිපත් කළාම එම කොමිෂන් සභාව කිව්වා මේ පිළිබඳ මහ ජන අදහස් ගන්නවා කියලා. මහ ජන අදහස් ලබා ගැනීම පිළිබඳ ප්‍රසිද්ධ කරලා මහ ජන අදහසුත් ගත්තා. ඒ වාගේම, ලිඛිත අදහසුත් ගත්තා. මම දැක්කා පත්තරයේ පළ වෙලා තිබෙනවා, විදුලිය බිල වැඩි කරන්න එපා කියලා සියයට 95ක් මහ ජනතාව -විවිධ ආකාරයෙන් ලිඛිතව නියෝජනයන් දුන්නු අය- කියන බව. එම කොමිෂන් සභාව දැන් මොකක්ද කියන්නේ? ඒ අය කිව්වා මහ ජනයාගෙන් අහලා මීසක් විදුලිය බිල වැඩි කරන්නේ නැහැ කියලා. මහ ජනයාගෙන් අහලා විදුලිය බිල වැඩි කරනවාද නැද්ද කියලා තීන්දු කරනවා නම්, මේ වෙලාවේ විදුලිය බිල වැඩි කරන එක වැරැදියි කියලා, විදුලිය බිල වැඩි කරන්න එපා කියලා මේ රටේ ජනතාවගෙන් සියයට 95ක් කිව්වා නම්, කොමිෂන් සභාව දැන් මොකක්ද කරන්නේ? ලංකා විදුලිබල මණ්ඩලය මොකක්ද කරන්නේ? අප කියන්නේ, වෙන කාගේ හරි නාස්තියක්, වෙන කොහේ හරි පාඩුවක් පියවා ගන්න පාරිභෝගිකයන් පිට මේ විධියට බර පටවන එක වැරැදියි කියලායි. අය වැයේ අවශ්‍යතාව අනුව මේ වැඩි කිරීම් කරනවා කියලා කිව්වත්, යාවත්කාලීන කරනවා කියලා කිව්වත්, මේවා සමාන කරන්න පියවර ගන්නවා කියා කිව්වත්, මේ වැඩි කිරීම විවිධ විධියට අර්ථ කථනය කළත් මේ හැම එකෙන්ම සිද්ධ වන්නේ අවසානයේදී මේ රටේ මහ ජනතාවට බදු බරක් පැටවෙන එක විතරයි. දෙවැනි කාරණය මෙකයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(*மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம*)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමා, මට විනාඩියක් දෙන්න පැහැදිලි කිරීමක් කරන්න. මේ ගෙනෙන යෝජනාවල එකකින්වත් බදු වැඩි කිරීමක් සිද්ධ වන්නේ නැහැ. මේවායෙන්, එක්කෝ බදු අහෝසි කිරීමකුයි සිද්ධ වන්නේ; එහෙම නැත්නම්, ඒ ප්‍රතිශතය අඩු කිරීමකුයි සිද්ධ වන්නේ. ඔබතුමා වෙනත් දේවල් ගැන කථා කරන එක ගැන මා දන්නේ නැහැ. නමුත් අද අප යෝජනා කරන්නේ බදු වැඩි කිරීමක් ගැන නොවෙයි.

ගරු තිස්ස අත්තනායක මහතා
(*மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க*)
(The Hon. Tissa Attanayake)

මා කිව්වේ මේකයි. මෙතැන පනත් කෙටුම්පත් ගණනාවක් තිබෙනවා. මේ හැම එකක්ම බදුවලට සම්බන්ධයි. ඇමතිතුමනි, ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්. කමක් නැහැ. මගේ මේසය උඩ තිබෙන පනත් කෙටුම්පත් ඔක්කෝම බදු සම්බන්ධයි. ඒකයි මා කිව්වේ. ඔබතුමා කියනවා වාගේ බදු යාවත් කාලීන කිරීම, එහෙම නැත්නම් බදු ගැළපීම කියලා මේවාට විවිධ අර්ථ කථන දෙන්න පුළුවන්. නමුත් අවසානයේ මේවා මහ ජනයා පිට එනවා කියන එකයි මා කියන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් මමත් කියන දෙදෙනාම මේක දන්නවා. මෙය අවසානයේ මහ ජනයා පිට එනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ පෙරේදා බරපතළ සිදුවීමක් වාර්තා වුණා ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන්. එක අවුරුද්දක් ඇතුළත එහි ප්‍රධානියෝ තුන්දෙනෙක් ඉල්ලා අස් වුණා. අවසාන වශයෙන් මාර්තු මාසයේ 23වැනි දා ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් හරේන්ද්‍ර දිසා බණ්ඩාර මහතා ඉල්ලා අස් වුණා. මාධ්‍ය මේවා වාර්තා කරලා තිබුණා. එතුමා ඉල්ලා අස් වීමේ හේතුව හැටියට සඳහන් කරලා තිබුණේ ප්‍රතිපත්තිමය කාරණයක් මත ඉල්ලා අස් වනවා කියන එකයි. මොකක්ද මේ ප්‍රතිපත්තිමය කාරණාව? මීට ඉස්සර වෙලා මේ කොමිෂන් සභාවේ ප්‍රධානින් හැටියට හිටපු ඉන්ද්‍රානි සුගතදාස මහත්මිය ඉල්ලා අස් වුණා. ඉන්ද්‍රානි සුගතදාස මහත්මිය කියන්නේ ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාගේ බිරිඳ. ඒ වාගේම, ඊට පස්සේ, තිලක් කරුණාරත්න මැතිතුමා ඉල්ලා අස් වුණා. දැන් එහි ප්‍රධානි හරේන්ද්‍ර දිසා බණ්ඩාර මහතා ඉල්ලා අස් වෙනවා. මොකක්ද මේකට හේතුව? මේක බොහොම පැහැදිලි හේතුවක්. ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව තිබෙන බරපතළ ගැටලුවක් තමයි හේතුව. ඒ ගැටලුව මොකක්ද? පසු ගිය කාලයේ NSB සහ The Finance Company එකේ කොටස් ගනුදෙනුව සම්බන්ධයෙන් අපේ "කෝප්" එක කරපු විමර්ශනයකට අදාළ කරුණු ඉදිරිපත් කරන්න කියලා ඒ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කරපු නියෝගය ක්‍රියාත්මක කරවන්න එපා කියලා ලබා දුන්නු නියෝගය හේතු කරගෙන තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

මොකක්ද මේකේ ඇත්ත කථාව? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව තමයි කොටස් වෙළෙඳ පොළ පාලනය කරන නියාමක ආයතනය. කොටස් වෙළෙඳ පොළ ඇතුළේ සිදු වන මහා බරපතළ මාෆියාව හේතු කොට ගෙන අද කොටස් වෙළෙඳ පොළේ තත්ත්වය ගැන නොයෙක් ආකාරයේ මාධ්‍ය වාර්තා පළ වෙනවා. ඒ වාගේම එහි කලින් හිටපු නිලධාරීන්, කොටස් වෙළෙඳ පොළේ කටයුතු කරන අය අද කොටස් වෙළෙඳ පොළේ තත්ත්වය ගැන නොයෙක් ආකාරයේ චෝදනා සිදු කරනවා.

NSB සහ The Finance Company එකේ ගනුදෙනුව ගැන හොයන්න, විශේෂයෙන්ම එම ගනුදෙනුව සම්බන්ධ තත්ත්වය පිළිබඳව විමර්ශනය කරන්න COPE එකට අයිතියක් තිබෙනවා. එතකොට COPE එකෙන් ඉල්ලන වාර්තාව පාර්ලිමේන්තුවට දෙන්නේ නැතුව මහ හරින්නේ ඇයි? ඇයි ඒක වළක්වන්නේ? විශේෂයෙන්ම මෙතැන තිබෙන බරපතළකම මේකයි. පසු ගිය මාර්තු මාසයේ 21වැනිදා විනිමය කොමිෂන් සභාවේ නිලධාරීන් COPE එකට කැඳවලා තිබුණා. ඒ කොමිසමේ සභාපතිවරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා, භාණ්ඩාගාර නියෝජිතයන්, ඒ වාගේම ඊට අදාළ තවත් නිලධාරීන් කැඳවලා තිබුණා. එහිදී COPE එකේ සභාපති ගරු ඩිව් ගුණසේකර මැතිතුමා විශේෂයෙන්ම කිව්වා, මෙම ගනුදෙනුව ගැන පූර්ණ වාර්තාවක් COPE එකට ඉදිරිපත් කරන්න කියලා. ඒක ඉදිරිපත් කිරීම වැළැක්වීමට දාපු නීතිය තමයි, මේ පිළිබඳව නීතිපතිවරයාට කරුණු ඉදිරිපත් කරලා තිබෙන නිසා නීතිපතිවරයාගේ අවසරයක් නැතිව එම වාර්තාව COPE එකට ඉදිරිපත් කරන්න බැහැ කියන එක. මේක පුදුම කථාවක්. ශිරාණි බණ්ඩාරනායක මහත්මියගේ සිදු වීම සාකච්ඡා කරන කොට නීතිපතිවරයාවත්, අධිකරණයවත් ශත පහකට ගණන් ගත්තේ නැහැ. නීතිපතිවරයාට කරුණු ඉදිරිපත් කළාට එම වාර්තාව විමර්ශන කටයුතු සඳහා COPE එකට ඉදිරිපත් කරන්න කිසිම නීතිමය බාධාවක් නැහැ. ඒක ඉදිරිපත් කරන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා ක්‍රියා කර ගෙන යන කොට තමයි ඒක නවත්වන්න කටයුතු කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැන කාරණා දෙකක් තිබෙනවා. එකක් තමයි කොටස් වෙළෙඳ පොළේ සිදු වෙමින් තිබෙන මහා පරිමාණ දූෂණ. දෙවැනි එක තමයි COPE එකෙන් ඉල්ලන ලද වාර්තාව පාර්ලිමේන්තුවට ලබා දීම වැළැක්වීම සඳහා ඇතුළේ ඉඳගෙන නිලධාරීන් ගන්නා ක්‍රියා මාර්ගය. ඒ හේතු කොට ගෙන අද COPE එක විතරක් නොවෙයි

[ගරු තිස්ස අත්තනායක මහතා]

පාර්ලිමේන්තුවත් හැල්ලුවට පත් වෙනවා. ඒක ඉතාම නරක පූර්වාදර්ශයක් හැටියටයි මම දකින්නේ. අවසානයේ සිද්ධ වුණේ මේ කාරණයට මැදිහත් වුණු හරීන්ද්‍ර දිසා බණ්ඩාර මහතාට ඉල්ලා අස් වෙන්නට සිදු වීම විතරයි. අපි කියනවා, මේ ගනුදෙනු පිළිබඳව බරපතළ චෝදනා තිබෙන බව. කවුද ඒවාට නියෝග දුන්නේ? කවුද ඒවා ගත්තේ? කුමන කාරණයක් සඳහාද ගත්තේ?

බලන්න, The Finance Company එකේ රුපියල් 30ක් වුණු කොටස රුපියල් 50ක වටිනාකමක් සඳහන් කරලා එම කොටස්වලින් සියයට 13ක් NSB බැංකුව මිලදී ගැනීමේ ගනුදෙනුව පිළිබඳව නොයෙක් කථා තිබෙනවා. ඒ ගනුදෙනුව නිසා රුපියල් මිලියන 390ක් වැය කරන්න බැංකුවට සිදු වුණා. ඒ ගනුදෙනුව පසුව නිවැරදි කළාය කිව්වා. නමුත් ගනුදෙනුවක් සිදු වුණා. ඒ ගැන සොයන්න COPE එකට තිබෙන අයිතිය යම් යම් ආකාරයෙන් වළක්වන්නේ කවුද? ශිරානි බණ්ඩාරනායක මහත්මිය තනතුරෙන් ඉවත් කරන කල් විතරද මේක ගැන සාකච්ඡා කරන්න උනන්දු වුණේ? එම ගනුදෙනුවේ වගකීම එක පැත්තකට පවරලා දැන් විනිමය කොමිෂන් සභාව එහෙම පිටින්ම අවුල් ජාලයක් බවට පත් කරමින් තිබෙනවාය කියන එක මම කියන්න කැමැතියි.

අද ගරු සරත් අමුණුගම ඇමතිතුමා කථා කරන කොට විශේෂයෙන්ම විශාල ආයෝජන ගැන කිව්වා. එතුමා කියන එක කාරණයක් එක්ක මම එකඟ වෙනවා. රටක ආයෝජනයක් සිදු කරන්නේ දීර්ඝ කාලීන ප්‍රතිඵල ගන්න. ඒක ඇත්ත. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, ඒ දීර්ඝ කාලීන ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් විධියට යම් කිසි දැක්මක් ඇතිව ඒවා පටන් ගන්නවාද කියන කාරණයයි. අපේ සමාජයේ කථාවක් තිබෙනවා, රෝස ඩොල්ෆින් මසුන් බලන්න නම් කල්පිටියට යන්න, නිල් තල්මසුන් බලන්න නම් මිරිස්සට යන්න, සුදු අලි බලන්න නම් හම්බන්තොටට යන්න කියලා. ඇයි එහෙම කියන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හම්බන්තොට ඉදි කළ මාගම්පුර වරාය පිළිබඳව නොයෙක් ප්‍රශ්න තිබෙනවා. ගරු සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා වාගේ ඒක සැලසුම් කරන කාලයේ සමහර විට කල්පනා කරන්නට ඇති, හම්බන්තොටට යාබදව මුහුදු මාර්ගයක් වැටිලා තිබෙනවා; ඒ මුහුදු මාර්ගය දිගේ නැව් විශාල ප්‍රමාණයක් එහා මෙහා යනවා; ඒ නැව්වලට අවශ්‍ය සැපයුම් ලබා දීමෙන් -තෙල් ටික ලබා දීමෙන්, අනෙක් සැපයුම් ලබා දීමෙන්- ප්‍රතිඵල ගන්න පුළුවන් වෙයි කියලා.

නමුත් අද නැව් එහෙම නවත්වන්නේ නැහැ. අද එක තැනකින් පටන් ගෙන ඊළඟ ගමනාන්තයට යන්න ඒ නැව්වලට පුළුවන්. අද මොකද වෙලා තිබෙන්නේ? කොළඹ වරාය ලබා ගන්නා ආදායමින් මාගම් පුර වරාය නඩත්තු කරන්න සිදු වෙනවා. ඒක එහෙන් පිටින්ම සුදු අලියෙක් බවට පත් වෙලා. සූරියවැව ක්‍රිකට් පිටියත් එහෙමයි. ඒ වාගේම මත්තල ගුවන් තොටු පොළ ගැන පසු ගිය කාලයේ ප්‍රචාරය කරනවා මම දැක්කා. ඒක ආයෝජනයක් හැටියට ප්‍රතිඵලදායක නම් අපිට මේ ගැන කථා කරන්න වුවමනාවක් නැහැ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ දැන් ඒකත් ඒ තත්ත්වයට පත් වෙමින් තිබීමයි. අපි කියන්නේ- [බාධා කිරීමක්] නැහැ, මොකක්වත් කරන එක නරක නැහැ. මම කියන්නේ ඒවා ගැන බලන්න ඕනෑ කියලායි. අපි වෙන කථාවක් නොවෙයි කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියන්නේ මේවාට වන්දි ගෙවන්න අද මහ ජනතාවට සිදු වෙලා තිබෙන බවයි. ඒ සම්බන්ධයෙන් ඊට වඩා කථා කරන්න වුවමනා නැහැ. අද මහ ජනතාව වන්දි ගෙවන්නේ කොහොමද? සිංහල අලුත් අවුරුදු කාලය දැන් උදා වෙන්නේ. අද කඩයකට ගිහිල්ලා කඩේ මුදලාලිගෙන් business තිබෙනවා ද කියලා ඇහුවාම මුදලාලි කියනවා, "සෙනහ නම් එනවා මහත්තයා, ඇවිල්ලා බලලා යනවා, අතගාලා යනවා, එච්චරයි" කියලා. Business එක වැඩි වෙලා නැහැ කියනවා. ඒ ගැන වැඩිය කියන්න ඕනෑ නැහැ. 2005 දී සීනි කිලෝ එකක් රුපියල් 34ට තිබුණේ. අද ඒක රුපියල් 100ක් වෙලා. 2005 දී පිටි කිලෝ එක රුපියල් 35ට තිබුණේ. අද ඒක රුපියල් 98ක් වෙලා. ඇයි මේ ගැන හිතන්නේ නැත්තේ? අපි කියන්නේ බදුවලින් වාගේම විවිධ ආකාරයෙන් මුදල් ලබා ගන්න ගෙනෙන මේ යෝජනා නිසා අවසානයේ වන්දි ගෙවන්නට සිද්ධ වන්නේ මහජනතාවට බවයි. ඔබතුමා කිව්වා වාගේ අද මහජනතාවට සහන දෙන්න ඕනෑ තැනට ඇවිල්ලා තිබෙනවා. රටේ සංවර්ධනය ගැන ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. ඒවා ආයෝජනය කරන්න නියම ක්‍රමවේදයක් භාවිත නොකිරීම නිසා තමයි අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

පසු ගිය දවස්වල වීරවංශ ඇමතිතුමා විශේෂ ප්‍රකාශයක් කළා. ඒ තමයි මේ රටේ මේ වර්ෂය තුළ මූල්‍ය අර්බුදයක් එනවාය කියන කාරණය. මම නොවෙයි එහෙම කිව්වේ, තමුන්නාන්සේලාගේ කැබිනට් සාමාජිකයෙක්. එතුමා කියනවා, මේ වර්ෂයේ මූල්‍ය අර්බුදයක් එනවා; එසේ වන්නේ වසර 14ක් තිස්සේ එකම තැන ඉන්න මුදල් අමාත්‍යාංශයේ ඉහළ බලධාරින් නිසාය කියලා. ඒ අය ආර්ථික ඝාතකයෝය කියනවා. එහෙම නම් මේ ආර්ථික ඝාතකයන් පිළිබඳව, මේ විධියට වැරැදි ආයෝජනයන් කිරීම පිළිබඳව කැබිනට් මණ්ඩලය සලකා බලා තිබෙනවාද? අපි අහන්නේ එයයි. අපේ සරත් අමුණුගම මැතිතුමා නම් සමහර කාරණා ගැන කෙළින් කථා කරනවා. මම දැක්කා, ගිය සතියේත් එතුමා නුවරදී කියලා තිබුණා, රාජ්‍ය ආයතනවලට මේ වාගේ ණය දෙන්න ගිහිල්ලා ලංකා බැංකුවයි, මහජන බැංකුවයි කඩාගෙන වැටෙන්න පුළුවන් කියලා. ඒ කථාව ඇත්ත. එතුමාගේ වචනවලින්ම කියනවා නම් ආර්ථිකය ගිල ගන්නා රාක්ෂයෝ ඉන්නවා. තෙල් සංස්ථාව, විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකන් ගුවන් සේවය, මිහින් එයාර් ගුවන් සේවය, සීටීබී, දුම්රිය, වරාය, ගුවන් තොටු පොළවල් -මේ ඔක්කොම- දැන් ආර්ථිකය ගිල ගන්නා මහා රාක්ෂයෝ බවට පත් වෙලා. මේවා මර්මස්ථාන. විශේෂයෙන්ම තෙල් සංස්ථාව වාගේ ආයතන පාඩු ලබනවාය කිව්වාම හිතා ගන්නවත් බැහැ. ඒ ගොල්ලෝ කරන්නේ ව්‍යාපාරයක්. ඒ ගැන වැඩිය කියන්න වුවමනා නැහැ. විදුලිබල මණ්ඩලය විදුලි ගාස්තු වැඩි කරන්න ඉල්ලුවාම ඒ නියාමන කොමිෂන් සභාව කියනවා, මේ වැඩි කරන්න ඉල්ලන්නේ සාධාරණව නොවෙයි, මේක ඇතුළේ එහා මෙහා කරලා සකස් කරන්න පුළුවන් විශාල මුදල් ප්‍රමාණයක් තිබෙනවා, ඒ වාගේම නාස්තිය සහ වෙනත් අඩු පාඩු පියවා ගන්න මේකෙන් යෝජනා වෙනවා, ඒක මහජනයා පිට පටවන එක වැරැදියි කියලා. අපි කියනවා, අනික් ආයතනවල තත්ත්වයත් මේ වාගේම තමයි කියලා.

එම නිසා අප කියනවා, මේක ඉතාමත් බරපතළ තත්ත්වයක්; විශේෂයෙන්ම මේ රටේ ආර්ථික ඝාතකයන් බවට පත්කර තිබෙන ප්‍රධාන ආයතනවල සිද්ධ වන පාඩුව සඳහාත් අද අවාසනාවකට වන්දි ගෙවන්නට සිද්ධ වෙලා තිබෙන්නේ මහජනතාවටයි කියා. එම නිසා, මේ තත්ත්වය පාලනය කර ගන්න ක්‍රියා කරනවා නම්, මහජනතාවගෙන් අය කරන බදු අඩු කර ගන්න පුළුවන්. මහජනතාවගෙන් පනවන බදු අඩු කරනවාය කියන්නේ මහජනතාවට යම් සහනයක් ලබා ගන්නට පුළුවන්ය කියන කාරණයයි. මෙතැනදී ඉතාමත් කනගාටුදායක කාරණාව වන්නේ මෙයයි. මහ බැංකු අධිපති අජිත් කබ්‍රාල් මැතිතුමා රටේ ආර්ථිකය ගැන අවස්ථා ගණනාවකදී කිව්වා. ආර්ථිකය දියුණුවෙලා තිබෙන තත්ත්වය ගැන කිව්වා. ඒ වාගේම අපට විදේශ මුදල් නැතිව ගමන් කරන්නට පුළුවන් කියලාත් එතුමා පසු ගිය කාලයේ කියා තිබුණා. IMF එකේ loan එක අපට අවශ්‍ය වන්නේම නැහැ කියාත් එතුමා කිව්වා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
IMF එකේ loan එක අපට අවශ්‍ය වන්නේම නැහැ; අපට ඇති තරම් මුදල් තිබෙනවාය කියා එතුමා කිව්වා. අපට විදේශ සම්පත් ප්‍රමාණය තිබෙනවා; රට පවත්වාගෙන යන්න ඕනෑ කරන සම්පත් ප්‍රමාණය, මුදල් ප්‍රමාණය අපට තිබෙන නිසා අප කාටවත් යට වන්නට වුවමනා නැහැ කියා එතුමා කිව්වා. එහෙම කිය කියා, පසු ගිය මාස කිහිපය තුළ වාණිජ පොලිය මත විදේශීය බැංකුවලින් ආයෝජන ගණනාවකට මුදල් ලබා ගෙන තිබුණා. ආයෝජනවලට ණය ලබා ගන්නවාට වඩා භයානක වන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය හිඟය පියවා ගැනීම සඳහා ණය ලබා ගන්නා කාරණාව ඇතුළු මේ ණය මුදල් පාරිභෝගික කටයුතු සඳහා යොදා ගන්නා කාරණයයි. ආයතනවල පාඩු පියවා ගන්නට ගන්නා ණය මුදල්වලටයි ප්‍රධානම ප්‍රශ්නය මතු වන්නේ. එම නිසා ඉතාමත් නරක තත්ත්වයකට මේ රටේ ආර්ථිකය ගමන් කරමින් තිබෙනවා.

මා තව එක කාරණයක් කියා මගේ කථාව අවසන් කරන්නට කැමතියි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඊයේ මා මාධ්‍ය ගණනාවක දුටුවා, මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් යෝජනාව ප්‍රතික්ෂේප කර තිබුණු බව. ඒක රජය වෙනුවෙන් කරන ලද ප්‍රකාශයක් කියායි මා හිතන්නේ. මෙහි තිබෙන බරපතළකම මෙයයි. මේ ගැන විශේෂයෙන්ම මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා 2011 මැයි 15 සහ මැයි 17 යන දිනවලදී කළ ඉන්දියානු සංචාරයේදී ඉන්දියානු අගමැතිතුමා, මුදල් ඇමතිතුමා, විදේශ ඇමතිතුමා, ඉන්දියාවේ ජාතික ආරක්ෂක උපදේශක, විදේශ ලේකම් මේ සියල්ලන් සමඟම කරන ලද සාකච්ඡාවකදී පැමිණි එකඟතාවක් ගැන ඒකාබද්ධ නිවේදනයක් මාධ්‍යයට නිකුත් කර තිබුණා. මොකක්ද මේ මාධ්‍ය නිවේදනයේ කියන්නේ? මේ මාධ්‍ය නිවේදනය අප දැන් සාකච්ඡා කරන බොහෝ කරුණු කියනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මත පදනම් වූ බලය බෙදීමක් ගැන සාකච්ඡා කර තිබෙනවා. "ඒක ඉක්මනින් ක්‍රියාවට නැංවීම සඳහා අප එකඟ වෙනවා. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ අප ක්‍රියාත්මක කරනවා" කියා තිබෙනවා. මා අහන්නේ මෙන්න මේ කොටස ගැන විතරයි. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කරනවාය කියා මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා ඉන්දියානු අගමැතිතුමා සහ ඉන්දියානු ඇමතිවරුන්, නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඒ දුන් පොරොන්දු තමයි මේ ක්‍රියාත්මක කරන්නටය කියා කියන්නේ. මේ ප්‍රශ්නය නිසා ජාත්‍යන්තර සංවිධානත් එක්ක අප මේ විධියට ගැටුම් ඇති කර ගැනීම ශ්‍රී ලාංකික පුරවැසියන් හැටියට හොඳ ද කියන කාරණය පිළිබඳව ආණ්ඩුවෙන් මා ප්‍රශ්න කරන්නට කැමතියි. බොහොම ස්තුතියි.

[අ.භා. 12.06]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද න්‍යාය පත්‍රයට ඇතුළත් වෙලා, මේ ගරු සභාවේ සාකච්ඡාවට භාජනය කළ පනත් කෙටුම්පත් කිහිපයෙන් ලේඛන ලියපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත, ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත යන පනත් කෙටුම්පත් තුන මගේ අමාත්‍යාංශය හා සම්බන්ධ වෙනවා. එම නිසා මා පළමුවෙන් එම පනත් කෙටුම්පත් තුන ගැන අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ විධියට මේ ගරු සභාවට මෙම පනත්වලට සංශෝධනයන් ගෙනැවිත් බලාපොරොත්තු වන්නේ, ඒ අංශවලට මෙතෙක් පැනවූ යම් යම් බදු වැඩි කරන්නටයි. ඒක අප පිළිගන්නවා. ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරනවිට ලේඛන ලියාපදිංචි කිරීමෙන් පසු එම ලේඛනවල සහතික පිටපත් ලබා ගැනීමේදී, ඒ වාගේම ඇටෝර්නි බලපත්‍ර පරීක්ෂා කිරීමේදී හා ඒ බලපත්‍ර ලබා ගැනීමේ අවස්ථාවේදී ගෙවිය යුතු මුදල් ප්‍රමාණය, ඒ වාගේම නොතාරිස් ආඥාපනත යටතේ නොතාරිස්වරුන් විසින් ඒ අයගේ වාර්ෂික බලපත්‍ර ලබා ගැනීම සඳහා ගෙවිය යුතු මුදල් ප්‍රමාණය යන මේ ගාස්තු යම් කිසි ප්‍රමාණයකින් වැඩි වෙනවා. මේවා වැඩි කරන්නට හේතු වුණු කාරණය මා කියන්නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පසු ගිය අය වැය වාර්තාවේදී අතිගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිත් මේ වැඩි වීම් සම්බන්ධයෙන් ප්‍රකාශනයන් කළා.

ඒ අය වැය වාර්තාව මේ සභාව විසින් අනුමත කළා. අනුමත කරන ලද ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම තමයි අද මේ සංශෝධනවලින් නැත්නම් මේ පනත් කෙටුම්පත්වලින් බලාපොරොත්තු වන්නේ. ලියා පදිංචි කරන ලියවිලි, ඒ වාගේම ඔප්පු, උප්පැන්න සහතික, විවාහ සහතික, මරණ සහතික මේ සියල්ලම අවුරුදු ගණන් ආරක්ෂා කරලා ඒවායේ පිටපත් ගන්නට ඕනෑ අවස්ථාවලදී ඒ දායකයන්ට ලබා දෙන්නට අප අද විධි විධාන සලස්වලා තිබෙනවා. අප දන්නවා, අවුරුදු සියයක් දෙසීයක් පරණ පොත්වල අඩංගු මේ ලියවිලිවල පිටපතක් ගන්න ගියාම බොහෝ වෙලාවට මේවා අබලන් වෙලා; සමහර කොළ දිරලා. කොළයක් පිටපත් කරන්න ගියාම එහි බොහෝ අපහසුකම් තිබෙනවා. අද ඒ සඳහා අප උපයෝගි කර ගන්නවා, computer system එක. ඒ ලියවිලි අද computerize කරනවා. ඒ වාගේම යම් යම් තාක්ෂණයන් හඳුන්වලා දීලා ඒ තාක්ෂණයන් උපයෝගි කර ගන්නවා. ඒ වාගේම යම් යම් රසායනික දේවල් මේ ලිපිලේඛන ආරක්ෂා කිරීම සඳහා යොදා ගන්නවා. මේ විධියේ වැඩ පිළිවෙළක් ලියා පදිංචි කිරීමේ අංශයන් විසින් අද පාවිච්චි කරනවා. මේවා සඳහා විශාල මුදලක් වැය කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අද අප බලාපොරොත්තු වන්නේ නැහැ, එදා වාගේ පොතක කොළයක් අතින් ලියලා දෙන්න. අද ඒවා සියල්ලම computerize කරලා විනාඩි පහකදී, හයකදී පිටපතක් ලබා දෙන්නට පුළුවන් කාර්යක්ෂම තත්ත්වයක් හැම කාර්යාලයකටම හඳුන්වා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේවාට විශාල මුදලක් වැය වනවා. මොකද, මා කලින් කිව්වා වාගේ පොත් පත් තියා ගෙන ලියලා දෙනවා නම්, පිටපත් කරලා දෙනවා නම් එහෙම වියදමක් යන්නේ නැහැ. මේ මුදල් ආවරණය කර ගැනීමට තමයි අද මේ විධියට මේ බදු පනවන්නට කටයුතු කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රෙජිස්ට්‍රාර් ජනරාල් කන්තෝරුවේ විශේෂයෙන් දැනට මේ ක්‍රියාත්මක වැඩ පිළිවෙළ සඳහා රජයේ මුදල් රුපියල් මිලියන 85ක් අපි වියදම් කරලා තිබෙනවා. ඒ වාගේම මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑම සඳහා අඛණ්ඩව මේ මුදල් වියදම් කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය උපකරණ සපයන්නට ඕනෑ; ඒ වාගේම ඒ කටයුතු කරන අය පුහුණු කරවන්නට ඕනෑ; ඒ වාගේම රසායනික ද්‍රව්‍ය පාවිච්චි කරන්නට ඕනෑ. මේ ආකාරයට විශාල මුදලක් දිගින් දිගටම වැය කරන්නට රජයට සිද්ධ වෙලා තිබෙනවා.

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

නොතාරිස් ආඥා පනතේ මේ සංශෝධනයෙන් අදහස් කරන්නේ, නොතාරිස්වරයෙකුගේ බලපත්‍රය සඳහා එදා ගෙවූ රුපියල් 10ක මුදල අද රුපියල් 1,000ක් කරන්නයි. රුපියල් 10ක මුදල පැන වූයේ 1943 දීයි. ඒ කියන්නේ මේ මුදල හඳුන්වා දීලා අවුරුදු 75කට ආසන්න කාලයක් වෙනවා. මේ අවුරුදු 75 තුළම මේ බලපත්‍ර ගාස්තුවේ සංශෝධනයක් වුණේ නැහැ. අවුරුදු 75කට පස්සේ අද තමයි මේ ගාස්තුව රුපියල් 1,000 දක්වා වැඩි කරන්නේ. ඒ නිසා කිසිම කෙනෙකුට මේවා සම්බන්ධයෙන් චෝදනා කරන්නට පුළුවන් කියලා මා හිතන්නේ නැහැ.

1976 දී ලියවිලි ලියා පදිංචි කිරීමේ ගාස්තුව රුපියල් 12.50යි. එතකොට තමුන්නාන්සේලාට පෙනෙයි, ඒ ගාස්තුව පනවා දැනට අවුරුදු තිස් පහකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම ඔප්පුවක පිටපත් සැපයීමේදී, 1976 දී වචන 120කින් යුක්ත කොටසකට ගෙවන්න වුණේ රුපියල් 2.50යි. අද ඒ ගණන රුපියල් 500 දක්වා වැඩි වෙලා තිබෙනවා. බැලූ බැල්මට මේ මුදලේ විශාල වෙනසක් තිබුණත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය පළමුවෙන්ම හඳුන්වා දුන් දවසත්, අදත් අතර කාලය බැලුවාම දීර්ඝ කාලයක් ගත වෙලා තිබෙනවා. මේ කාලය ඇතුළත විශාල වෙනස්කම් වෙලා තිබෙනවා. මේ ක්ෂේත්‍රයේ විශාල සංවර්ධනයක්, දියුණුවක්, ව්‍යාප්තියක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අද මේ කටයුතු කිරීමේදී, ඒ වාගේම සහතික පිටපත් ලබා ගැනීමේදී, ඒ වාගේම ඊට අදාළ කටයුතු කිරීමේදී විශාල කාර්යක්ෂමතාවක් ඇති වීම නිසා අද සියලු දෙනාටම ඉතාමත්ම පහසුවෙන් මේ ලියවිලි ලබා ගන්න හැකි වෙලා තිබෙනවා. ඒ වාගේම මේ ලියවිලි ආරක්ෂා කරන්න අද විධිවිධාන යොදලා තිබෙනවා.

අද මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. තිස්ස අත්තනායක මහත්මයා -එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් මහත්මයා- නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ගැන ප්‍රකාශ කළා. එතුමා පෙන්වා දෙන්න හැදුවේ අද විශාල අලාභයක්, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ඇතුළු විදුලි බලාගාරවලින් සිද්ධ වෙනවා, මේවා ආවරණය කිරීම සඳහා විදුලි ගාස්තු වැඩි කරන්න රජය බලාපොරොත්තු වනවා කියලායි.

ඇත්ත වශයෙන්ම මා කියන්නට ඕනෑ, අද මේ පාඩුවට ප්‍රධාන වශයෙන්ම හේතු වෙලා තිබෙන්නේ විදුලි බලාගාරවලින් සිද්ධ වන පාඩුවට වඩා ඉන්ධන මිල වැඩි වීම බව. මොකද, අපේ විදුලිය අවශ්‍යතාවෙන් සියයට 60ක් ඉන්ධන පාවිච්චි කරලා, ඩීසල් පාවිච්චි කරලා තමයි නිපදවන්නේ. ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩි වීම මත ඉන්ධන සඳහා අපට විශාල මුදලක් වැය කිරීමට සිදු වීම නිසා, මේ වන කොට වර්ෂයකට බිලියන 40ක පාඩුවක් ලංකා විදුලිබල මණ්ඩලයට දරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවත් ප්‍රකාශ කරලා තිබෙන්නේ, තවදුරටත් ලංකා විදුලිබල මණ්ඩලයට සහනාධාර විධියට, එහෙම නැත්නම් සහන මිලකට ඛනිජ තෙල් දෙන්න බැහැ කියලා. ඒ කාරණය සම්පූර්ණ ඇත්තක්. මොකද, ලංකා විදුලිබල මණ්ඩලයට අද සහනාධාර විධියට ඉන්ධන දීම නිසා ඇති වෙලා තිබෙන පාඩුව මකා ගන්න ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇපයට තැබීම වැරදියි. ඒ නිසා අද ඒ අය නිවැරදිව කියනවා, "දිගින් දිගටම සහනදායී විධියට ඉන්ධන දෙන්න බැහැ" කියලා.

ඇත්ත වශයෙන්ම මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, නොරොච්චෝලේ විදුලි බලාගාරය නිසා තමයි අද විදුලි බල ක්ෂේත්‍රයේ සහන මේ විධියට හෝ ජනතාවට ලැබිලා තිබෙන්නේ කියලා. අද නොරොච්චෝලේ විදුලි බලාගාරයෙන් මෙගාවොට 300ක් ලැබෙනවා. ඒ ඒකකයක් රුපියල් 11කට, නැත්නම් රුපියල් 12කට තමයි ලංකා විදුලිබල මණ්ඩලය මිලට ගන්නේ. අපි ඉන්ධන පාවිච්චි කරලා, ඩීසල් පාවිච්චි කරලා නිපදවන විදුලිය ඒකකයක් රුපියල් 22ට, රුපියල් 23ට ගන්න කොට, නොරොච්චෝලේ විදුලිය ඒකකයක් ගන්නේ රුපියල් 11ට. රුපියල් 15කුත් ශත ගණනකට ලංකා විදුලිබල මණ්ඩලය පාරිභෝගිකයන්ට ඒ විදුලිය විකුණනවා. එතකොට නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයෙන් නිපදවන විදුලිය වෙනුවෙන් අද කිසිම පාඩුවක් ලංකා විදුලිබල මණ්ඩලයට සිද්ධ වන්නේ නැහැ. ඒකෙන් යම් කිසි ලාභයක් පමණයි සිද්ධ වන්නේ.

මේ කාරණය සම්බන්ධව කථා කරද්දී මා විශේෂයෙන් කියන්නට ඕනෑ, එක්සත් ජාතික පක්ෂය ප්‍රචාරයක් අරගෙන යනවා, නොරොච්චෝලේ විදුලි බලාගාරය අසාර්ථකයි කියන්න. ඒ අය කියන දෙයක් තමයි, මේක කැඩෙනවාය කියන එක. මා පිළිගන්නවා, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය විවෘත කරන්න නියමිත වෙලා තිබුණු කාලයට වඩා මාස අටකට කලින් විවෘත කළ බව. මාස අටකට කලින් විවෘත කළා. මාස අටකට කලින් විවෘත කරන්නට සිදු වුණේ මේ නිසායි. ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රකාශ කළා, "තව මාස හයක් යන කොට විශාල විදුලි හිඟයක් ඇති වනවා. විදුලි සැපයීම කඩා වැටෙන්න ඉඩ තිබෙනවා. වර්ෂාව නැතිකම නිසා අපේ බලාගාරවල වතුර නැහැ. ඒ නිසා යම් කිසි විකල්පයකට අපි යන්න ඕනෑ" කියලා. ඒ අනුව තමයි ලංකා විදුලිබල මණ්ඩලයේ උපදෙස් අනුව අමාත්‍යාංශය තීන්දු කළේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය මාස අටකට කලින් විවෘත කරන්න. ඒ විවෘත කිරීම නිසා යම් යම් අඩු පාඩු සිද්ධ වුණා කියන එක තමයි එහි කාර්මික නිලධාරීන් පෙන්වා දීලා තිබෙන්නේ. ඒ හැර වෙන කාර්මික කඩා වැටීමක් සිද්ධ වුණේ නැහැ; තාක්ෂණික කඩා වැටීමක් සිද්ධ වුණේ නැහැ. ඊයේ පෙරේදා switch එකක් trip වෙලා තිබෙනවා. ඒ trip වීම නොරොච්චෝලේ පමණක් නොවෙයි, හැම විදුලි බලාගාරයකම සිද්ධ වනවා. සමහර විට හැම විදුලි බලාගාරයකම trip වීම සිද්ධ වනවා. Trip වුණාම ඒවා නැවත ආදේශ කරන්න ඕනෑ. එහෙම නැත්නම් අලුත්වැඩියා කරන්න ඕනෑ. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය වැනි තැනක අනිවාර්යයෙන්ම ඒවා අලුතින් ආදේශ කරන්න ඕනෑ. පසු ගිය දවසක ඒ බලාගාරය අක්‍රිය වුණා. මා දැක්කා ඒ ගැන පුවත් පත්වල තිබෙනවා, "නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය නැවත වරක් කාර්මික දෝෂයක් නිසා නවතියි" කියලා. ඒක සාමාන්‍යයෙන් සිද්ධ වන දෙයක්. අද මේ අය ඒකේ වැරදි හොයන්නම බලාගෙන ඉන්නවා. අවුරුදු 19ක් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට ඒක පටන් ගන්න බැරි වුණා. ඒ අය අවුරුදු 19ක් නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ගැන කථා කළා. නමුත් පටන් ගන්න බැරි වුණා. අපි තමයි 2006 දී ඒ වැඩ ආරම්භ කළේ, ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය යටතේ. ඒ නිසා තමයි අද මෙගාවොට 300ක් කිසි ප්‍රශ්නයක් නැතිව, පාඩුවක් නැතිව ලංකා විදුලිබල මණ්ඩලයට ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒක නිසා ඒ බලාගාරය ගැන දොස් කියන්න අවශ්‍ය නැහැ.

තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ඒ බලාගාරය ඉදි කිරීම සඳහා Exim Bank of China එකත් සමඟ ඇමෙරිකන් ඩොලර් බිලියන 455ක මුදලක් සඳහා ගිවිසුමක් අත්සන් කළා කියලා. අපි ඒක පිළිගන්නවා. ඒ වෙලාවේ තක්සේරු කළ මුදල තමයි ඩොලර් බිලියන 455. නමුත් එතුමා කියනවා, ඒකට වැය වුණේ මිලියන 300යි, අනෙක් මිලියන 155ට මොකද වුණේ කියලා? මා එතුමාට කියන්න ඕනෑ, අපි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න විදේශ බැංකුවක් එක්ක ගිවිසුමක් අත්සන් කළාම, ඒ මුදල් ටික ගෝනියක දාලා, නැත්නම් මල්ලක දාලා ගෙනෙන්නේ නැහැ. ඒ අත්සන් කළ ගිවිසුමට අදාළ මුදල ව්‍යාපෘතියේ අවශ්‍යතා සඳහා වැය කරන්න කොටස් වශයෙන් තමයි ගෙනෙන්නේ. ඒකට මිලියන 300 නම් වැය වුණේ, අපි එතැනින් අරගෙන තිබෙන්නේ මිලියන 300යි.

අපි මිලියන 455ට ගිවිසුම් අත්සන් කරපු බව ඇත්ත. ඒ ව්‍යාපෘතියට මුදල් වැය වෙන ආකාරය අනුව, ඒ ව්‍යාපෘතිය ඉදිවෙන ආකාරය අනුව, ඒ ව්‍යාපෘතියේ ප්‍රගතිය සිදු වෙන ආකාරය අනුව තමයි අපි ඒ බැංකුවෙන් මුදල් ගන්නේ. එතුමා කියන විධියට තක්සේරුව හරි නම්, ඒ අනුව තමයි මිලියන 300 වැය වුණේ. එහෙම නම් ඉතුරු මුදල් ඒ බැංකුවේ ඉතුරු වෙනවා. ඒක මම පැහැදිලිව කියන්න ඕනෑ. එහෙම නැතුව අපි ඒ මුදල් ඔක්කෝම අරගෙන ඇවිල්ලා සාක්කුවේ දාගෙන ටික ටික දෙන්නේ නැහැ. ඒ මුදල් බැංකුවේ තිබෙනවා. ඉදි කිරීම් සඳහා අවශ්‍ය මුදල් කොටස් වශයෙන් බැංකුවෙන් ලබා ගන්නවා. මිලියන 300 නම් වැය වුණේ, ඉතුරු මුදල් තිබෙන්න ඕනෑ. ඒ නිසා ගරු නිස්ස අත්තනායක මන්ත්‍රීතුමාට මම කියන්න කැමතියි, මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන කොට අපි අනුගමනය කරන වැඩ පිළිවෙළේ මූලික දේවල් ටිකක් කරුණාකරලා තේරුම් ගන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මම කියන්න ඕනෑ, විදුලි බිල වැඩි කිරීම සම්බන්ධව. එතුමා ඒ ගැනත් කථා කළා. ඇත්ත වශයෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයේ වැය ශීර්ෂය වැඩි වෙන්න පටන් ගත්තේ 1996 දී. එදා 1996 තිබුණු චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව රට පුරා විදුලිය බෙදා දීම ආරම්භ කළා. මම කියන්න ඕනෑ, මේ වෙන කොට රටේ ජනතාවගෙන් සියයට 95කට විදුලිය ලැබෙන බව. විදුලිය නොලැබෙනවා නම් සියයට 5කට පමණයි තවම නොලැබෙන්නේ. සියයට 95කට විදුලිය ලබා දෙනකොට ලංකා විදුලිබල මණ්ඩලයට විශාල පිරිවැයක් දරන්න සිද්ධ වෙනවා. මේ රටේ සෑම ගමකම, සෑම අස්සක් මුල්ලක් නැරම ගෙවල්වල කොම්පියුටර් පාවිච්චි කරන්න, ඒ වාගේම handphones battery charge කරන්න අද පුළුවන්කම ලැබිලා තිබෙනවා. ජනතාවට ඒ පහසුකම් ලැබිලා තිබෙනවා. අද ඕනෑම ගෙයක ටෙලිවිෂන් යන්ත්‍රයක් පාවිච්චි වෙනවා. ටෙලිවිෂන් යන්ත්‍ර හරහා ලෝකයේ සිද්ධ වෙන්නේ මොනවාද කියලා අද මිනිස්සු දැන ගන්නවා. මේ සියල්ලම කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ යටතේ විදුලි බලය රට පුරා බෙදා හැරීම නිසායි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පරමාර්ථය වුණේ මේ රටේ හැම කෙනෙකුටම විදුලිය දෙන්න ඕනෑය කියන එකයි. ඒ කාලයේ විදුලි බල ඇමතිවරයා වශයෙන් මගේ ප්‍රධාන කාර්ය භාරය වශයෙන් ඉලක්ක වෙලා තිබුණේ මේ රටේ විදුලිය ජනනය කරන්නත්, ඒ ජනනය කරන විදුලිය රට පුරාම බෙදා හරින්නත්. එසේ බෙදා හැරීමේදී විශාල පිරිවැයක් අපට දරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේවාට නිකම් චෝදනා කරලා වැඩක් නැහැ. විදුලිය අඩු මිලට දීම නිසා විදුලි බල මණ්ඩලය පාඩු ලැබුවත් අද මේ රටේ ජනතාව ඒ නිසා ලබන ප්‍රයෝජනය, ඔවුන්ගේ ජීවන මට්ටම නඟා සිටුවීම සඳහා ලැබී තිබෙන පහසුකම් ගැනත් අපි කල්පනා කරන්නට ඕනෑ. මේ තත්ත්වය තේරුම් අරගෙන තිබෙන නිසා තමයි, ජනතාවට ඔරොත්තු නොදෙන ආකාරයට විදුලි බිල වැඩි නොකර ජනතාවට ඔරොත්තු දෙන ආකාරයට වැඩි කිරීමට අද රජය කටයුතු කරගෙන යන්නේ.

Sir, now, I would like to draw the attention of this House to a very important matter. That is about the statement made by the US Ambassador yesterday in a foreign correspondents' forum. The US Ambassador has said that the war might erupt again. That is a very unfortunate statement made on the part of the Ambassador representing a country like America. Everybody knows that we have brought the war to an end and after the war, we are trying to bring about reconciliation in the country by improving infrastructure and by providing all the social requirements to people, irrespective of ethnic differences; whether it is Jaffna, Trincomalee, Kilinochchi, Galle, Hambantota or Colombo, the service rendered by the Government is equal. Everybody is treated equally. That is because the Government wants to bring about reconciliation in the country. So, at a time like this, making a statement of this nature is very unfortunate. We should condemn this statement; such a statement by the Ambassador is a very clear instance of where the "wish is father to the thought". This is something that nobody expects in the country. The war coming back or erupting again is something that we never expect. So, if this is the wish, I would say that the "wish is father to the thought". We do not, for a moment, condone this type of statement which is adverse to the reconciliation efforts of the Government.

Thank you.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. A. Vinayagamoorthy. You can commence your speech now and go on till the Sitting is suspended at 12.30 p.m. Then, you can continue your speech again at 1.00 p.m.

[12.23 p.m.]

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

Mr. Deputy Chairman of Committees, thank you very much for giving me opportunity to speak on this Debate. Before that, let me have the indulgence of this House to refer to what the Hon. Minister of External Affairs said yesterday. He said that he rejects the Resolution passed in the UNHRC. If that is so, the Secretary-General of the Commonwealth Parliamentary Association will have to report it back to their headquarters.

Probably, the Minister is not aware of what is happening in the Ministry. On behalf of the Ministry, Mr. Nivard Cabraal, the Governor of the Central Bank has entered into an agreement with a company in America to do propaganda work to bring about a rapprochement between Sri Lanka and America and we are paying Rs. 3 million monthly. I want to find out whether the Minister is aware of it or not. The same thing is happening in the UK as well. We have retained a company and we are paying money monthly to do propaganda work.

Now, I also want to at this stage, refer to various attacks made on the "Uthayan" newspaper. The first attack was on 23rd August, 2005; the second attack on 2nd May, 2006; the third attack on 11th August,2006 and later there were attacks on 15th August, 2006, 18th August, 2006, 10th September, 2006, 29th April, 2007, 26th January, 2008, 26th February, 2009, 24th March, 2009, 4th February, 2010, 28th May, 2011, 27th December, 2012 and 10th January, 2013. No action has been taken by anybody to arrest the people who are

[ගරු ඒ. විනායගමූර්ති මහතා]

responsible for it. Sir, we cannot ask the mother as to where the thief is. The mother will not tell us.

What happened to Ekneligoda? What happened to Lasantha Wickrematunge? Is this the media freedom that we are speaking of? I want the Government to take immediate action to arrest the people who are responsible for the attack on the "Uthayan" newspaper.

With regard to economic development of this country, the Hon. (Dr.) Sarath Amunugama who is the Deputy Minister of Finance knows very well that we have got four or five white elephants. Unless we get rid of them, nothing can be done towards development. If you want to develop the country, you will have to make the country favourable for foreign investors to come and make investments here. That is the only way to develop the country.

With regard to the Norochcholai Power Plant, what was told was that it remains closed almost all the time. I understand that you were trying to give it back to the company which sold it to you.

Another company in Jaffna entered into an agreement to supply 30 kilowatts of electricity per month but gave only 15 kilowatts. When the Minister wanted to cancel the agreement, he was not allowed to do so.

Then, with regard to public enterprises, kindly see that you take steps to bring down the losses made due to mismanagement and corruption in them. I am a Member of the COPE and I know what is happening there. I have been questioning almost everybody who comes before COPE and I think the Hon. (Dr.) Sarath Amunugama, the Deputy Minister of Finance and Planning will understand what I am trying to say. Please see that the losses are brought down to the minimum and get it done by a person who can do it efficiently.

When India gained Independence, the famous socialist Kripalani said, "what we now want is not any "isms"; capitalism, communism or socialism but an efficient government".

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Vinayagamoorthy, you can continue with your speech after lunch.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Okay.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Sitting is suspended till 1.00 p.m.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு பி.ப. 1.00 மணி வரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

සහකාර මහ ලේකම්තුමිය
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මියගේ නම යෝජනා කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
"ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.
அதன்படி, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ගරු ඒ. විනායගමූර්ති මන්ත්‍රීතුමා.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Thank you, Madam Chairperson, for allowing me to continue with my speech after the lunch interval. I am sorry that I am not in a position to say anything valuable because, at the moment, both the Ministers concerned are not here.

What the country needs now is economic development and elimination of bribery and corruption in the Government. How can you bring about economic development? We cannot take any more loans because we have gone to the maximum level. So, we will have to make the country suitable for foreign investors to come and invest. That is the only way you can develop the country.

Then, I want to speak about the Registration of Documents Ordinance also. But, the Minister concerned is not here. If you take the Registration of Documents Ordinance, you find these rates in Chapter 135, not in Chapter 117. You have increased the rates exorbitantly.

Even for a small affidavit, a person has to pay Rs. 250 and for everything, you need an affidavit. So, how can you expect a poor litigant to affix stamps to the value of Rs. 250 on an affidavit? Earlier, when we went to the Land Registry with stamps worth only Rs. 2.50, we could see all the documents and come. But, now, you want us to pay Rs. 500 to obtain a certified copy of a deed. Then, earlier, registering a power of attorney was done free but now you will have to pay Rs. 1,500 to get it registered. Do you not think that it is a very high rate? When the Minister in charge comes, he must be informed that all the rates he has fixed are on the high side. He will have to reconsider his decision to change the First Schedule so that you can help the poor litigants.

Madam, the main thrust of the Statement made by our Leader, the Hon. R. Sampanthan, in the morning is that in the presence of police officers from the Kilinochchi Police Station, people picked up stones and threw at our office and we did not get any reply for that. So, in Jaffna, what we now want is a civil government. Can the Jaffna people not have a civil government? It is four years after the war. Everything is being controlled by the Governor, who is a military person and Major General Hathurusinghe, the Security Forces Commander of Jaffna. All the officers there, including police officers, have to take orders from them. Are we not entitled to have a civil government in Jaffna? In 24 villages in the Valikamam North, 28,270 people have to be resettled, but they have not been resettled because the army is not allowing them to be resettled. So, I have filed a case in the Supreme Court and I am supporting them on the 13th of May.

Then, coming back to what the Hon. Minister of External Affairs said yesterday, I have got a letter with me, which was sent to me by the Office of the Leader of the Opposition in that regard and which states, I quote:

> "The Secretary General of the Commonwealth has acted in Item 18 of the Perth Ministerial Action Group recommendations adopted in Perth in 2011. ....."
>
> "He used his good offices to engage with the government of Sri Lanka regarding the violation of the Commonwealth values, which are in accord with UN Declaration in this regard.
>
> Hon. (Prof.) G.L. Peiris, Minister of External Affairs categorically rejected the Geneva Resolution in his reply on 9 April, 2013 in the House.
>
> The rejection is in effect, a rejection of the Commonwealth values.
>
> The result is that the Secretary General of the Commonwealth has no longer a role to play.
>
> This is a matter that should be brought to the notice of the Secretary General."

Although the Hon. Minister of Public Administration and Home Affairs is not here, I request him to reconsider the rates he has fixed. That is, to get a certified copy of a deed, we will have to pay Rs. 500; to register a power of attorney, we will have to pay Rs. 1,500 which earlier was done free and to go through the registers, we will have to again pay Rs. 500. Earlier, it was a matter of paying a mere Rs. 2.50. So, I hope the Hon. Minister would seriously consider my request and see that these rates are revised.

Thank you.

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes, Hon. (Dr.) Sarath Weerasekara?

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

Madam, there is a small clarification to be made. The Hon. Member stated just now that there is a military government in Jaffna, which is a blatant untruth. In Jaffna, we have a civil administration, but definitely, the military is assisting it. The forces have demined more than 500,000 landmines and also built houses. The TNA has never given even a cup of tea to these soldiers who are engaged in demining, risking their lives for the Tamils to resettle. So, I must object to that statement. There is absolutely no military government; there is a civil government, but the military is assisting the normal day-to-day life of the Tamil people. - [*Interruption*.] No. The TNA is not doing anything for the welfare of the Tamil people in Jaffna.

[1.09 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Madam Chairperson, I think I got an early opportunity today to have my say on the Bills that have been presented before the House.

Madam, I crave your indulgence to digress a little, firstly, to point out certain erroneous and misleading news reports about our speeches in Parliament in some of today's Tamil newspapers. When the Hon. Sampanthan was speaking, it is true that we, the Hon. Abdul Cader and myself, interrupted. I said in my speech itself that that

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

must be correctly reported by my good friends of the Tamil media in the Gallery and it had not been done. So, it becomes a matter of Privilege. We did not object to the Hon. R. Sampanthan speaking about the Muslims. Anybody can speak about the Muslims. Even the people who chased away the 100,000 Muslims - this must be reported clearly - can speak about the Muslims; even the people who massacred those who were praying in the Kattankudy Mosque can speak about the Muslims now and even those LTTE cadres who cut and chopped children who were born just the previous day, can speak about the Muslims. They brought those children to us when we went to Eravur.

பால் மணம் மாறாப் பச்சிளங் குழந்தையின் வயிற்றைக் கிழித்து, குடலை வெளியே எடுத்தவர்களும் இன்று முஸ்லிம்களைப் பற்றிப் பேச முடியும். அவர்கள் விரும்பியவாறு முஸ்லிம்களைப் பற்றிப் பேசட்டும்! ஆனால், நான் ஒன்றை மட்டும் தெரிவிக்க விரும்புகின்றேன். முஸ்லிம்களின் விவகாரங்களில் ஈடுபடுவதிலிருந்து நாங்கள் பின்வாங்க மாட்டோம்; அந்த விடயங்களில் நாங்கள் முன்னணியில் நிற்போம். அரசாங்கத்துடன் இணைந்திருக்கின்ற முஸ்லிம் அமைச்சர்களும் முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களும் எரிகின்ற நெருப்பிலே எண்ணெயை ஊற்றாது அமைதிப்படுத்துவதற்கான பணிகளையே மேற்கொண்டு வருகின்றார்கள் என்பதை நான் மீண்டும் வலியுறுத்திச் சொல்லியாக வேண்டும். நாங்கள் தூக்கமின்றி இரவோடிரவாக மேதகு ஜனாதிபதி அவர்களுடனும் கோத்தாபய ராஜபக்ஷ அவர்களுடனும் ஐ.ஜி.பீ. மற்றும் அந்தந்த மாவட்ட டி.ஐ.ஜி. ஆகியோருடன் தொடர்புகொண்டு, முஸ்லிம் மக்கள் சம்பந்தமான பிரச்சினைகள் பற்றி உரையாடி, அந்தப் பிரச்சினைகளைத் தணிக்க முயல்கின்றோம். ஆனால் முஸ்லிம்கள் பற்றிப் பேசுகின்ற சிலர், கொழும்பிலே அரசியல் செய்ய வழியின்றி வங்குரோத்து நிலையில் இருந்து கொண்டு, இதையாவது செய்வோம் என எண்ணி, வீடியோ மற்றும் புகைப்படக் கருவிகளை அனுப்பி அந்தச் சம்பவங்களைப் படம் பிடிக்கின்ற அவல நிலையிலேயே இருக்கின்றார்கள். ஆனால், நாங்கள் அப்படியல்ல. புகைப்படம் பிடித்து பத்திரிகைகளில் பிரசுரிப்பதை விடுத்து, பிரச்சினைகளை அந்த இடத்திலேயே, அதாவது முளையிலேயே, கிள்ளி எறிகின்ற பணியைத்தான் முஸ்லிம் அமைச்சர்கள் உட்பட பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்கள், குறிப்பாக நான், இன்றும் செய்து வருகின்றேன். நான் மேதகு ஜனாதிபதி அவர்களுடன் முஸ்லிம்களின் பிரச்சினைகளைப் பற்றி நேற்று, நேற்றுமுன்தினம் மட்டுமன்றி எந்தநாளும் பேசிக்கொண்டுதான் வருகின்றேன். இன்று முஸ்லிம்களின் பிரச்சினை தணிந்து வருகின்ற நிலைமை காணப்படுகிறது. மேதகு ஜனாதிபதி அவர்கள் அன்று பேருவளையில் பேசியபொழுது "சிங்கள மக்களுடைய உரிமைகளைக் காப்பதைப் போன்று முஸ்லிம் மக்களின் உரிமைகளையும் காப்பது எனது கடமை; ஆகவே, நீங்கள் எதற்கும் பயப்படத் தேவையில்லை" என்று உலகம் அறியச் சொன்னார்.

யாழ்ப்பாணத்துக்குச் சென்ற இந்தியப் பாராளுமன்றக் குழுவினர் நேற்றைய தினம் மனமகிழ்ச்சியுடன் எமது பாராளுமன்றத்தைப் பார்வையிட வந்திருந்தார்கள். இந்திய பாராளுமன்றக் குழுவினர் எமது நாட்டுக்கு எதற்காக வந்தார்கள்? எமது நாட்டின் நிலைமையை அறிவதற்காகவே இங்கு வந்திருக்கிறார்கள். அவர்கள் கோத்தாபய ராஜபக்ஷ அவர்களுடைய புனர்நிர்மாணப் பணிகளைப் பற்றியும் வனப்பும் அழகும் மிக்க தியவன்னா ஓயாவின் சௌந்தரியம் பற்றியும் மிகவும் மேன்மையாகப் பேசினார்கள். ஜெயலலிதா அவர்களே, எமது நாட்டுக்கு வாருங்கள் அம்மா! எமது நாட்டின் நிலைமையை வந்து பாருங்கள் அம்மா! அதேபோன்று கலைஞர் அவர்களே, எமது நாட்டுக்கு வந்து நிலைமைகளைப் பாருங்கள் ஐயா! இங்கு வந்து பார்த்தால்தான் உண்மை விளங்கும். ஆனால் ஒன்றைச் சொல்ல வேண்டும். நான் நேற்றைய தினம் ஆங்கிலத்தில் சொன்னேன், "டெல்லி அரசாங்கம் கருணாநிதிக்கும் கலைச்செல்விக்கும் கன்னத்தில் நல்ல அறை கொடுத்த மாதிரிச் செயற்பட்டிருக்கிறது" என்று. இந்தியப் பாராளுமன்றத் தூதுக்குழுவினர் இலங்கைக்குப் போகக்கூடாதென்று எவ்வளவுதூரம் ஆர்ப்பாட்டம் செய்தார்கள்!

One of those private channels in its news bulletin said that they are not coming and they have cancelled it. But, in the morning, when listening to Mr. Hudson Samarasinghe's programme "Dasa Desin" - everybody listens to that in the morning - you could get all the information. The Delegation has already arrived. That is a great victory that shows the bond of friendship and understanding that Delhi is having with Colombo and Colombo is having with Delhi. This is what our future is going to be.

Therefore, Sir, காதர் அவர்களும் நானும் குறுக்கீடு செய்தது முஸ்லிம்களுக்கு விரோதமாக அல்ல. நாங்கள் முஸ்லிம்களின் பாஷையிலே - இஸ்லாமிய முறையிலே - அவர் செய்த "முனாபிக்" - நயவஞ்சகத் தனத்தைத்தான் எடுத்துக் கூறினோம். யாழ்ப்பாணத்திலே வாழ்ந்த ஓரிலட்சம் முஸ்லிம் மக்களை விரட்டியபொழுது மௌனமாக இருந்த சம்பந்தன் ஐயா அவர்களுக்கு, இன்று முஸ்லிம் மக்கள்மீது பரிவு - பிரேமை ஏற்பட்டிருக்கிறது. இது பரிகாசம் இல்லையா? அதனைத்தான் நாங்கள் எடுத்துச் சொன்னோமேயொழிய, நாங்கள் பேசியது முஸ்லிம்களுக்கு விரோதமாக அல்ல என்பதை நான் மீண்டும் தெரிவித்துக்கொள்கின்றேன். இந்த விடயத்தைப் பத்திரிகைகள் சரியான முறையில் பிரசுரிக்காவிடில் நான் மீண்டும் சிறப்புரிமைப் பிரச்சினையை எழுப்புவேன். எமது ஆதங்கம், எமது எண்ணக்கரு என்ன என்பதை மக்கள் புரிந்துகொள்ளும் விதமாக எமது பேச்சுக்களைப் பிரசுரிக்க வேண்டும். ஆனால் முஸ்லிம் மக்களுக்கு எங்களைப் பற்றி நன்றாகத் தெரியும். ஆகையால், முஸ்லிம் மக்களை அவர்களுடைய இருப்பிடங்களிலிருந்து விரட்டிய தமிழ்க் குழுவோடு இருந்து வந்தவர்கள் எங்களைப் பற்றி முஸ்லிம் மக்களுக்குச் சொல்லத் தேவையில்லை.

இந்திய அரசாங்கத்தினால் கட்டித்தருவதாக வாக்குறுதியளிக்கப்பட்ட 50,000 வீடுகளில் ஒரு வீட்டையாவது முஸ்லிம் மக்களுக்குக் கொடுப்பதற்கு சம்பந்தன் ஐயா அவர்கள் ஆரம்பத்திலே பிரியப்படவில்லை. சுஷ்மா சுவராஜ் அவர்கள் இங்கு வந்து சபாநாயகர் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களுடன் கலந்துரையாடிய நேரத்தில் நான்தான் அந்த விடயத்தைச் சொன்னேன். அதாவது "முஸ்லிம்களில் ஒருவருக்குக்கூட இந்தியா கட்டிக் கொடுக்கும் வீட்டைக் கொடுக்க முடியாதென்று சொல்கிறார்கள்" என்று நான் சொன்னேன். இன்று சுபியான் மௌலவி அவர்கள் "எங்களுக்கும் வீடுகளைத் தாருங்கள், எங்களுடைய பிரச்சினைகளையும் தீருங்கள்" என்று எந்தநாளும் யாழ்ப்பாணத்திலிருந்து குரலெழுப்பி வருகின்றார். சம்பந்தன் ஐயாவிடம் இன்றும் நான் ஒன்றைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். அதாவது, ஆயிரம்முறை நான் உங்களைக் குறுக்கீடு செய்வேன். முஸ்லிம்களுக்குச் செய்த

அநியாயத்துக்கு எதிராகத்தான் நான் உங்களைக் குறுக்கீடு செய்கின்றேனே தவிர, நீங்கள் முஸ்லிம்களைப் பற்றிப் பேசியதற்காகவல்ல. மௌலவி சுபியானுக்கும் ஏனையவர்களுக்கும் வடக்கிலுள்ள காணிகள் சரியாக எல்லை நிர்ணயம் செய்யப்பட்டு இன்னமும் வழங்கப்படவில்லை. அந்தக் காணிகளை வழங்குங்கள்! என்றுதான் நான் கேட்கின்றேன். அங்கிருந்து விரட்டப்பட்டவர்கள் மீண்டும் அங்கு குடியமர்வதற்கான அனைத்து வசதிகளையும் செய்து கொடுங்கள்!

நேற்று ஜனாதிபதி அவர்கள் ஒன்றைச் சொன்னார்;

While launching the Central Bank Report, he said Rs. 226 billion has been expended for the development of the Jaffna area in the North. That is, Rs. 226 billion! I want to tell this to the Parliamentary Delegation which is here and also let the foreign press report this for the 'அம்மா' to know and 'ஐயா' to know. Now, Madam Chairperson, what happened to Ms. Jayalalitha? This same lady, until Prabhakaran died, was wearing a bulletproof jacket.

அதாவது, பிரபாகரன் அவர்கள் மடியும் வரையிலே குண்டு துளைக்காத ஒரு சட்டையைத்தான் அந்த அம்மா அணிந்து கொண்டிருந்தார். அவ்வளவுக்கு அவர் பயத்துடன் இருந்தார். பிரபாகரன் செய்த அநியாயம் எங்களுக்குத் தெரியாதா?அவர் அங்கு பிரதம அமைச்சரைக் கொன்றது எங்களுக்குத் தெரியாதா?

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

உங்களைப் பற்றிச் சொல்லவில்லை அம்மா! அவர்களைப் பற்றித்தான் நான் சொல்கின்றேன். நீங்கள் நல்ல அம்மா! நீங்கள் அவர்களோடு சேராதீர்கள்! அவர்கள் உங்களுக்கு விரோதமானவர்கள்! உங்களுக்கு அவர்கள் ஒரு நாளும் உதவி செய்யமாட்டார்கள் என்று எனக்குத் தெரியும்."ஆடு நனைகின்றது என்று ஓநாய் அழுகின்றதாம்." அதேபாணியிலேதான் இவர்களும் நயவஞ்சகம் - 'முனாபிக்' தனம் உள்ளவர்களாக இருக்கின்றார்கள்.

In the highest hypocrisy, he is standing

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

before the world community, I should say. So, you had better first of all - நீங்கள் மன்னிப்புக் கோருங்கள்! Plead with the Muslims to forgive you; ask forgiveness from them. Then only, we can get up in this House and say, “You have at least realized your former follies”.

Today, I am ashamed of the Hon. Leader of the Opposition. He is criticizing and attacking Major General Hathurusinghe, Commander for Jaffna. And, my good Friend, the Hon. Sarath Weerasekara, MP, intervened at the correct time. Major General Hathurusinghe is also a very good friend of mine. The Hon. Vinayagamoorthy said that there is a military regime or rule in the North. There is only a civil administration in Jaffna. So, do not give the wrong signal to the world. This is what you did to the Muslims in Jaffna. There is a civil administration in the Eastern Province. There is a Governor in the Northern Province; there is a Muslim Governor in Colombo; there is a lady Governor in Galle, Mrs. Kumari Balasuriya, the beloved wife of our Minister, the Hon. (Dr.) Jagath Balasuriya. All these people are engaged in civil administration. Also, there is the Secretary; there is the Government Agent; there is the Mayor of the Jaffna Municipal Council. They are all Tamils. There are various Pradeshiya Sabhas won by you. You won it. They are all running a civil administration. Now, you have come here. I am again asking the Hon. Sampanthan, have you spent a single cent through your Decentralized Budget for the development of the Tamils in the North? Rs. 226 billion, for the development of the North, is being spent by our President, His Excellency Mahinda Rajapaksa for the good of the Tamils.

Then, Madam Chairperson, මොකක්ද, මේ කියන්නේ? මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටු පොළ ගැන අහනවා. කුරුල්ලෙකු හැප්පුණාලු. තව පොඩ්ඩක් කල් යන කොට කියයි, ආකාසේ වලාකුළත් හැප්පුණාය කියලා. මේ වාගේ මගෝඩි, මේ වාගේ නෙයියාඩගම් කථා අපි කවදාවත් අහලා නැහැ. එහෙම නම් මේ යූඑන්පීකාරයන් කියන විධියට airport එකක් හදන්න නරකයි; පාරවල් හදන්න නරකයි; ගෙවල් හදා දෙන්න නරකයි; වරායක් හදන්න නරකයි.

See the benefits of this Mattala Airport project. The whole world should know and they know it. I have got all the papers ready here but I have no time to read about the beauty of Mattala: the great concept of Mattala. The future of Sri Lanka depends on the development of Mattala and Hambantota.

I must also tell in this House today, Madam Chairperson, that the Muslims in the Eastern Province like it very much. If you can operate Haj flights annually, it is very easy for them to come to the Mattala Rajapaksa International Airport from Amapara, from your district, Batticaloa and from the Trincomalee District by wearing *Ihram* cloth in order to perform the Holy Haj or Umra pilgrimage. They need not come and spend days in Colombo and then change into *Ihram*. There also, the President has helped the Muslim community in order to perform Haj very conveniently from the Mattala Airport. See the benefits. You must know the benefits of this Mattala Airport? The establishment of the international airport in the Southern region will serve as an alternate international airport to the Bandaranaike International Airport at Katunayake.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කථිකයින් බොහෝ දෙනෙක් නැති නිසා මට තව විනාඩි දෙකක් දෙන්න. Then, Madam Chairperson, new ventures such as general aviation and non-aviation sports facilities would be available at the airport at low cost. Also, this airport would be ideal to provide airport-related industries such as aircraft maintenance, aircraft workshops, engine repair shops, training schools and flight training facilities at low cost.

Madam Chairperson, the Hon. Minister of Water Supply and Drainage has just arrived here. Also, I must mention that he is giving water to the Southern Province.

நீங்கள் support பண்ணும் TNA இனர் ஒரு துளி நீரையாவது யாழ்ப்பாண மக்களுக்கு வழங்கி இருக்கின்றார்களா என்று ஐயா கருணாநிதியே, கேளுங்கள் அவர்களிடம்! அம்மா ஜெயலலிதாவே கேளுங்கள்! ஆனால், மாண்புமிகு தினேஷ் குணவர்தன அவர்கள் அங்கே போய் பாரிய நீர் வழங்கல் திட்டங்களை மேற்கொண்டுள்ளார். *[இடையீடு]* ஐயோ! அம்மா, நீங்கள் கொஞ்சம் சும்மா இருங்கள்! நான் உங்களை இடையீடு செய்ய வேண்டாமென்று சொன்னால் நீங்கள் எழுந்து ஓடிவிடுவீர்கள். நீங்கள் என் அன்பருடைய மனைவி, எங்களுடைய அன்புச் சகோதரி! ஆகவே, கொஞ்சம் பொறுமையாக இருங்கள்!

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, මට විනාඩි 5ක් දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාට විනාඩි 5ක් දෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගෙන් විනාඩි 5ක් ඉල්ලා ගත්තා. අපේ පක්ෂයේ කථිකයින් කිහිප දෙනෙක් නැහැ.

Then, another benefit is the growth of the agriculture-related industries due to the improvement of cargo. That will enhance the economy. Cargo will be a lucrative business for this location as it covers a huge agricultural processing zone which produces vegetables, fruits, dairy products et cetera.

Then, the tourism and hospitality industry would flourish with the integrated development of the port and airport in the Southern region. So, see the benefits. Every country, every nation has one or two alternative airports. We must have a second runway in case something happens. If your 'ஐயா' and 'அம்மா' do not allow us to land in Madras, what will happen to our aircraft with all the 200 or 300 passengers? His Excellency the President has thought of it very well. Now, we could say, "Here is the Mattala Airport in our own land. Come and land here". After the repairs, the Muslims going for Haj or the other travellers will take off from there.

Then, Madam, another benefit is to create indirect job opportunities by way of additional business ventures that would form as a result of airport operations and also create aviation related industries.

මොකක්ද? එතැන තිබුණු ගස් ඔක්කොම කැපුවා ලු. අනේ! දන්නේ නැද්ද, අවුරුදු 50කට විතර ඉස්සෙල්ලා කටුනායක තිබුණු පොල් ගස් ඔක්කොම කපන්න සිද්ධ වුණු බව. නොබැඳි ජාතීන්ගේ සම්මේලනයට විදේශීය නායකයන් එන විට බෝ ගසකුත් කැපුවා. ඒකත් අප දන්නවා. අප එය කියා තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කොග්ගල මුළු ගමම අයින් කළා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔව්. කොග්ගල මුළු ගමම අයින් කළා. අන්න එහෙමයි කළේ. මෙතුමන්ලා කියනවා පරෙවියෙක් හැප්පුනා ලු. පරෙවියෝ නොවෙයි, ඊට එහායින් ගිහින් වලාකුළුවල හැප්පුනාය කියලාත් කියන්න පුළුවන්.

පිට පිට 7වන වරටත් සියයට 6.7ක ආර්ථික වර්ධන වේගයක් තුළ, ඇමෙරිකානු ඩොලර් 2,923ක වැඩිම ඒක පුද්ගල ආදායමක් ලබමින්, මාස 50ක් අඛණ්ඩව තනි ඉලක්කමේ උද්ධමනයක් පවත්වාගෙන යමින්, ඉතිහාසයේ අඩුම විරැකියා ප්‍රතිශතයක - සියයට 4ක පමණ- අද අප සිටින බව ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඊයේ ලක් ජනතාවට පැවසුවා. මෙන්න මෙහෙමයි අප මේවා දියුණු කරන්නේ. ඔබතුමන්ලා එපා එපා කියන විට දකුණේ ඉන්න මිනිස්සුන්ට පොල් කටුද දෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා කියනවා මත්තල ගුවන් තොටුපළ කටු ගෙයක් - museum එකක්- කරනවාය කියලා. අනේ! හොඳයි. කටු ගෙයක් කරන්න. මොකද තමුන්නාන්සේලාගේ වර්තමාන නායකයා ඇතුළු සියලු දෙනාම අවුරුදු 25කට පස්සේ ඒ කටු ගෙයි තමයි අප ගෙනිහින් තියන්නේ. තිස්ස අත්තනායක මන්ත්‍රීතුමනි, මෙවැනි ඔළමොට්ටළ කථා කියන්නේ මොකටද? වැඩි කල් යන්න පෙර තමුන්නාන්සේගේත් ticket එක කැපෙනවා. අන්න තමුන්නාන්සේගේ නායකතුමා එතුමාගේ අනාගත අධ්‍යාපන ඇමති ලෙස අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා නම් කර තිබෙනවා. හොඳයි නේද? The name of the blue-eyed boy of the Hon. Ranil Wickremasinghe has already been announced. But, when will they come to power? There is not a word about my good Friend, the Hon. Sajith Premadasa, not a word. There is not a word about the others who are toiling and working for him. That is the way he treats his own people. But, our Leader treats all the Members equally and in a very good fashion.

Then, coming back to the benefits of the Mattala Airport, another is the creation of direct skilled and semi-skilled employment opportunities. The employment of thousands of people from the South is a benefit to the community.

හම්බන්තොට ප්‍රදේශය දියුණු කරනවාට තමුන්නාන්සේලා විරුද්ධ ඇයි? ඒ පැත්ත ලංකාවේ කොටසක් නොවෙයිද? හම්බන්තොටට ගිහින් එහෙන් මෙහෙන් මුදල් බෙදන සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මේකට මොකද කියන්නේ? හම්බන්තොට දියුණුවට තමුන්නාන්සේ කැමැති නැහැ කියලා කියන්නද? එහෙනම් අප හම්බන්තොට ජනතාවට එහෙම කියන්නම්. නමුත් එහෙම කියන්න බැහැ. මොකද අප දන්නවා ඔබතුමාට වුවමනා කරනවා දියුණුව; අනාගතය. ඒකට ඉඩ දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි. දැන් කථාව නතර කරන්න. නැත්නම් අනික් කථිකයන්ගේ කාලයෙන් අඩු කරන්න වෙනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මට තව විනාඩි දෙකක් දෙන්න.

The other benefits to the community are business, improved infrastructure facilities, a market for their agricultural products, enhancement of tourism in the area, upliftment of education and connectivity.

අද තව මන්ත්‍රීවරයෙක් සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය ගැන කිව්වා. මොකටද ඒක හැදුවේ? [බාධා කිරීමක්] අනේ! ඔව්. තමුන්නාන්සේලා සුසාන භූමියක් කරන්න හදපු තැන තමයි ඒ. අද ලෝක පූජිත ක්‍රීඩකයන් සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රිකට් ක්‍රීඩාංගණයට ඇවිත් ඉතා විශිෂ්ට අන්දමින් ජාත්‍යන්තර තරගවල යෙදෙනවා. ළඟදි බංග්ලාදේශයේ ක්‍රීඩකයන් ආවා; එංගලන්ත ක්‍රීඩකයන් ආවා; ඕස්ට්‍රේලියානු ක්‍රීඩකයන් ආවා; West Indies ක්‍රීඩකයන් ආවා. ඒ අය ආවේ කොහේටද? ඔවුන් ආවේ ශාන්ත බස්තියමට නොවෙයි; කොළඹ 05 ප්‍රදේශයට නොවෙයි; කොළඹ 03 ප්‍රදේශයට නොවෙයි. පල්ලෙකැලේ තිබෙන ක්‍රිකට් ක්‍රීඩාංගණයට ඔවුන් ආවා; බෙත්තාරාම ක්‍රීඩාංගණයට ආවා; අපේ පී. සරවනමුත්තු ක්‍රීඩාංගණයට ආවා. ඊළඟට ඔවුන් යන්නේ කොහේටද? මත්තලට. ඒ කියන්නේ සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයට. එහේ මොන තරම් අලංකාරද? ඔබතුමන්ලා ගිහින් බලන්න. එදා මත්තලට පැමිණි ප්‍රථම ගුවන් යානය අරාබි රටේ ගුවන් යානයක්. An Air Arabia airbus first came and landed in the Mattala Airport. We were there to receive them. How happy they were to see the new airport! What the Opposition wants is for the airport not to have the President's name. මහින්ද රාජපක්ෂ කියන නම ඒ ගොල්ලන්ට ඕනෑ නැහැ. චාර්ල්ස් ඩි ගෝල් කියන්නේ කවුද? ප්‍රංශයේ හිටපු ජනාධිපතිවරයෙක්. චාර්ල්ස් ඩි ගෝල් නමින් airport එකක් තිබෙනවා. King Fahad කියන්නේ කවුද? සවුදි අරාබියේ රජ කෙනෙක්. ඒ නමින් airport එකක් තිබෙනවා. ඒ වාගේම King Faisalගේ නමිනුත් airport එකක් තිබෙනවා. ගුහක් තැන්වල එහෙම තිබෙනවා, Lumumba University වැනි ඒවා. ඒවාට මොකක් හරි නමක් දමන්න ඕනෑ. Bandaranaike International Airport එකට ඒ නම දැම්මේ ඇයි කියලා කවුරු හරි දැන් අහන්න බලන්න. එතුමා ඒ ගුවන් තොටුපළ හැදුවා. එය අපේ රටට දායාද කළා.

දැන් අපි රත්මලාන ගුවන් තොටුපොළ තවත් improve කරන්න ඕනෑ. රත්මලාන ගුවන් තොටුපොළ ගොඩ නහා ගෙන යනකොට එතැනත් ප්‍රශ්න වගයක් ඇති වුණා. එතැන ගෙවල් තිබුණා. නමුත් රත්මලාන ගුවන් තොටුපොළත් හොඳට දියුණු කළොත්, we can have a fine, systematic domestic airport helping the travellers to fly hither and thither. So, His Excellency the President is carrying out the work as promised in the "Mahinda Chintana". புதியதோர் இலங்கை - வளமான எதிர்காலம்! He has gone beyond Mattala Airport.

දැන් ඒ වරායට නැව් එන්නේ නැති ලු. නමුත් නැව් එන ආකාරය ගැන විස්තර ඇතිව දැන් අපේ සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා. දැන් නැව් එනවා. දැන් නැව් ඒම නවත්වා ගන්නත් බැරි වනවා. ඉස්සර යූඑන්පීකාරයෝ කථා කළා, හම්බන්තොට වරායේ ගලක් තිබෙනවා කියලා. දැන් ඒ ගල නැහැ. ඒ මොකද දන්නවාද? ඒ ගල දැන් අපි crane එකක පටවලා සිරිකොතට යවලා තිබෙනවා. මේ වාගේ ප්‍රෝඩාකාරී දේශපාලනයක් කරලා ජනතාව රවටන්න බැහැ. අවුරුදු 15ක්, 30ක්, 35ක් ගියත් කවදාවත් තමුන්නාන්සේලාට මේ රජය භාර ගැනීමට ජනතාව වරම් දෙන්නේ නැහැ. නැවත නැවතත් මහින්ද රාජපක්ෂ මැතිතුමාට තමයි ජනතාව ඡන්දය දෙන්නේ. එතුමා තමයි මේ රටේ නායකයා කරන්නේ. නැවතත් ජනාධිපති වන්නේ එතුමායි.

I wish to congratulate the Hon. Namal Rajapaksa on his birthday. Many happy returns of the day! He is 27 years old, very young, and has a great future. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා කාරුණ්‍යයට නායකත්වය දෙනවා. "කාරුණ්‍යයට හෙටක්" සංවිධානයේ නායකතුමා එතුමායි. අපට ඒ පිළිබඳවත් සන්තෝෂ වන්න පුළුවන්. මොකද අනාගතය අපට පෙනෙනවා. අන්න අනාගත ආලෝකය විහිදුවන ආකාරය. අද ගිහිල්ලා බලන්න. අපේ මන්ත්‍රීවරු ඔක්කෝම ගිහිල්ලා එතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා. Happy Birthday to you Hon. Namal Rajapaksa!

Thank you.

[අ.භා. 1.32]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මුදල් පිළිබඳ සංශෝධන පනත් කෙටුම්පත් හතරක් ඉදිරිපත් වෙලා තිබෙනවා. එම සංශෝධන පනත් කෙටුම්පත් තුනකම ගාස්තු වැඩි කිරීමක් පිළිබඳව සඳහන් වනවා.

ඒ මූල්‍ය පනත් කෙටුම්පත් පිළිබඳව කථා බහ කරන්න කලින්, උතුරේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව අද සභ ඊයේ පාර්ලිමේන්තුවේ ඇති වූ සංවාදය පිළිබඳව මුලින්ම මම කථා කරන්න කැමැතියි. මේ දවස්වල එක පැත්තකින් තමන්ගේ මුල් ඉඩම් ඉල්ලා සිටිමින් උතුරු පළාතේ මුස්ලිම් ජනතාව උද්ඝෝෂණ කරනවා. තවත් පැත්තකින් දෙමළ ජනතාව ඔවුන්ගේ මුල් ඉඩම් ලබා දෙන්න කියලා උද්ඝෝෂණ කරනවා. ඇත්තටම යුද්ධය අවසන් වෙලා දැනට අවුරුදු හතරක් වනවා. නමුත් තවමත් ඒ මුල් පදිංචිකරුවන්ගේ ඉඩම් නිවැරැදිව ඔවුන්ට ලබා දෙන්න මේ ආණ්ඩුව සමත් වුණේ නැහැ. අවුරුදු හතරක් කියන්නේ විශාල කාලයක්. ඒ අවුරුදු හතරක කාලය තුළ අඩුම ගණනේ මේ ඉඩම්වල මුල් පදිංචිකරුවන් කවුද, ඒ අයගේ අනන්‍යතාව තහවුරු කර ගන්නේ කොහොමද, ඒ සඳහා තිබෙන ඔප්පු තිරප්පු හෝ වෙනත් ලිපි ලේඛන මොනවාද කියන එක පිළිබඳව නිවැරැදි

[ගරු විජිත හේරත් මහතා]

සොයා බැලීමක් කරලා නැහැ. එහෙම තත්ත්වයක් යටතේ තමයි, හදිසියේ පළාත් සභා මැතිවරණයක් පිළිබඳ සාකච්ඡාවක් එනකොට, ආණ්ඩුව පාර්ශ්වයෙනුත්, වෙනත් පැතිවලිනුත් කඩිමුඩියේ දැන් මේ ප්‍රශ්නය බරපතළ තත්ත්වයකට පත් කරමින් තිබෙන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නය මේ විධියට දික් ගැස්සෙන්න ඉඩ හැරීම තුළින් තවත් ජාතිවාදී ගැටුම් නිර්මාණය වීම වළක්වන්න බැහැයි කියන එක අපි ඉතා වග කීමෙන් යුක්තව නැවත මතක් කරනවා. මුස්ලිම්, දෙමළ, ඒ වාගේම සිංහල ජාතියට අයත් මුල් පදිංචිකරුවෝත් ඒ ප්‍රදේශවල සිටියා. මෙවැනි අයත් ඒ ප්‍රදේශවලට ගිහිල්ලා තමන්ගේ ඉඩම් ඉල්ලා උද්ඝෝෂණ කරන්න පටන් ගත්තොත් අනිවාර්යයෙන්ම සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකත්ව අතර ඉඩම් පිළිබඳ ආරවුල් පැන නැඟිලා, ගැටුම් නිර්මාණය වෙලා යුද ජයග්‍රහණයෙන් ලබා ගත් තත්ත්වය පවත්වා ගෙන යන්න බැරි වෙලා, ඒ ප්‍රදේශවල සාමය ගොඩ නැඟීමේ කටයුත්ත කර ගන්න බැරි වනවා. ඒ නිසා ප්‍රමාද වෙලා හරි මේ ඉඩම්වල නිරවුල්භාවය තහවුරු කරන්න. ඒ සඳහා වහාම ඉඩම් පිළිබඳ කොමිසමක් පත් කරන්න. ඒ කොමිසම පත් කරලා ජනතාවට දැනුම් දීමක් කරන්න, තමන්ගේ අනන්‍යතාව, තමන්ගේ අයිතිය තහවුරු කරන්න පුළුවන් ලිපි ලේඛන තිබෙනවා නම් ඒවා රැගෙන ඇවිල්ලා ඒ කොමිසමට භාර දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ දෙපාර්තමේන්තුවල, විශේෂයෙන්ම ඉඩම් ලියා පදිංචි කිරීමේ ආයතන තුළ ඒ ඔප්පු තිරප්පුවල පිටපත් තිබෙනවා; ඒ ලිපිලේඛන තිබෙනවා. ඒවායින් අපට සාක්ෂි ගන්න පුළුවන්. ඒ සියල්ල අරගෙන මාස තුනක් වැනි කෙටි කාලයක් තුළ උතුරේ ඉඩම් පිළිබඳ නිරවුල්භාවය තහවුරු කරලා, මුල් පදිංචිකරුවන්ට ඒ ඉඩම් ලබා දීමේ කටයුත්ත අවසන් කළ යුතු වෙනවා. ඒ මුල් පදිංචිකරුවන් කවුද කියන එක ඒ සාක්ෂිවලින් සොයා ගන්න පුළුවන්. ඔවුන් සිංහල වෙන්න පුළුවන්; ඔවුන් මුස්ලිම් වෙන්න පුළුවන්; ඔවුන් දෙමළ වෙන්න පුළුවන්. ඔවුන්ගේ ජාතිකත්වය නොවෙයි වැදගත් වෙන්නේ. ඔවුන් ඇත්ත මුල් පදිංචිකරුවන් ද, නැද්ද කියන තහවුරුව ලබා ගත්තාට පස්සේ මේ ප්‍රශ්නයට පිළියම් සොයන්න පුළුවන්. ඉතින් එහෙම කළ හැකිව තිබෙන, එහෙම කළ යුතුව තිබෙන මේ ප්‍රශ්නය දිග්ගස්සමින් තවත් ජාතිවාදී ගැටුම් නිර්මාණය වන තැනකට තල්ලු කිරීම හරහා එක පැත්තකින් පටු දේශපාලන වාසි ලබා ගන්නත්, අනෙක් පැත්තෙන් එවැනි ගැටුම්වලට ඉඩ හැරීම තුළින් නැති අලුත් ප්‍රශ්න නිර්මාණය වෙන්නත් ඉඩ හැර තිබෙනවා. ඒ නිසා මේ තත්ත්වය වහාම පාලනය කරලා, වහාම උතුරේ ඉඩම් පිළිබඳ සොයා බැලීමේ කොමිසමක් පත් කරලා, මාස තුනක් වැනි කෙටි කාලයක් තුළ ඒ මුල් පදිංචිකරුවන්ගේ නිමිකාරිත්වය තහවුරු කරගෙන ඔවුන්ට අදාළ ඉඩම් ලබා දීමේ කටයුතු වහාම අවසන් කරන්න කියලා අපි ආණ්ඩුවට අවධාරණය කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ඉදිරිපත් වෙලා තිබෙන මේ සංශෝධන පනත් කෙටුම්පත් හතරෙන් තුනක්ම ඉදිරිපත් වී තිබෙන්නේ ගාස්තු වැඩි කිරීම සඳහා. ගරු මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා ආරම්භක කථාව කරමින් කිව්වා, මේ ගාස්තු වැඩි කිරීම හරහා යම් යම් දුෂ්කරතාවන්ට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන බව එතුමා සහ එතුමන්ලාගේ ආණ්ඩුවේම සමහර මන්ත්‍රීවරුන් පවා කිව්වා කියලා. ඒ වාගේම ඒ පිළිබඳ පැමිණිලි ලැබී තිබෙනවා, ඒවා පිළිබඳව සලකා බලනවා, ඒවා සලකා බලා ගාස්තු සංශෝධනය කරන්න ඉදිරියේදී බලාපොරොත්තු වනවා කියලා එතුමා කිව්වා. ඒක පට්ටපල් අසත්‍යයක්. ඒක නොකෙරෙන වැඩක්. අද මේ ගාස්තු වැඩි කිරීම නිශ්චිතයි. ඇටෝර්නි බලපත්‍ර ගාස්තු - power of attorney ගාස්තු - ලේඛන ලියාපදිංචි කිරීමේ ගාස්තු -registration of documents ගාස්තු- ඔප්පු සහ ඔප්පු පිටපත් ඉල්ලුම් කිරීමේ ගාස්තු වැඩි කර තිබෙනවා. ඒවා පුංචි ගණන්වලින් නොවෙයි වැඩි කර තිබෙන්නේ. තිබුණු තත්ත්වයේ ඉඳලා සියයට දහස් ගුණයකින් වැඩි කර තිබෙනවා. එක වර සියයට දහස් ගුණයකින් මේ ගාස්තු වැඩි කිරීම කිසිසේත්ම සාමාන්‍ය දුප්පත් ජනතාවට දරා ගන්න බැහැ. ඒ නිසා අද මේ පනත් කෙටුම්පත් සම්මත කළාට පස්සේ, මේ ගාස්තු අඩු කරනවාය කියලා කියාපු සුරංගනා කථාවලින් වැඩක් වන්නේ නැහැ.

ඉතා පැහැදිලියි, මේ පනත් සංශෝධනය සම්මත වුණාට පස්සේ මේ සියලුම ගාස්තු වැඩි වෙන බව. ඒ ගාස්තු වැඩි කරන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාවට. සාමාන්‍ය ජනතාව මත තමයි ඔබතුමන්ලා මේ බර පැටවීම කරන්නේ. ඒකට නිකම් සුන්දර කථා කියලා බොරු සිහින මවා පෙන්වන්න ලෑස්ති වෙන්න එපා. අද මේ පනත් සංශෝධන සම්මත වීම හරහා ඉතා පැහැදිලිව ගාස්තු වැඩි වීම සිද්ධ වෙනවා. මේ ගාස්තු වැඩි කිරීමේ බර ජනතාව මත පටවන්නේ ඔබතුමන්ලාගේ ආර්ථික ප්‍රතිපත්ති සහ ආර්ථික මූලෝපායන්වල තිබෙන වැරදි තත්ත්වය නිසා.

ඇත්තටම එහෙම ගාස්තු වැඩි කරලා ජනතාව මත ඇයි ඒ බර පටවන්න සිද්ධ වෙලා තිබෙන්නේ? අද විතරක් නොවෙයි, ඊයේ සම්මත වුණු පනත් කෙටුම්පත් තව ඉදිරියේදී ගෙනෙන්න තිබෙන විවාහ ගාස්තු, උප්පැන්න ගාස්තු සහ මුස්ලිම් විවාහ නීති පිළිබඳ ගාස්තු වැඩි කිරීම් සියල්ල හරහා සිද්ධ වන්නේත් මේ රටේ සාමාන්‍ය ජනතාව මත බර පැටවීමයි. ඒ බර පැටවීම ආණ්ඩුවට කරන්න සිද්ධ වුණේ, පසු ගිය කාලයේ ආණ්ඩුව අනුගමනය කරපු වැරදි ආර්ථික ප්‍රතිපත්ති නිසා.

එදා හෙජින් සූදුව කරපු වෙලාවේ, රුපියල් කෝටි අටදහස් පන්සියයකට ආසන්න මුදලක් මේ රටේ ජනතාවට අහිමි කරන්න හදාපු වෙලාවේ, විපක්ෂයේ අපි ඉතා පැහැදිලිව අවධාරණය කළා, හෙජින් සූදුව හරහා රටට විශාල පාඩුවක් වෙනවා, මේ පාඩුව දරන්න වෙන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාවට, ඒ සාමාන්‍ය දුප්පත් ජනතාව මත බර පැටවෙන මේ සූදු සෙල්ලම් කරන්න ලෑස්ති වෙන්න එපා කියලා. එතකොට අපේ ඒ හඬ යටපත් කරමින් ඔබතුමන්ලා අත්තනෝමතිකව තීන්දු ගත්තා. ඒ තීන්දු ගත්තේ කවුද? කාගේ උපදෙස් අනුවද? මහා භාණ්ඩාගාරයේ උපදෙස් අනුව. එදා ඒ hedging ගිවිසුම ගහන කොට තෙල් සංස්ථාවේ සභාපතිවරයා හැටියට හිටියේ අසන්ත ද මෙල් මහත්මයා.

තමන්ගේ පවුලේ ඥාතියකු නොදන්නා රක්ෂාවකට පත් කරලා, ඥාතියාට බැරි වැඩක් භාර දීලා, ඒ කියන්නේ ක්‍රිකට් ගහන්න දැන ගෙන හිටපු අසන්ත ද මෙල් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ -ඒ හෙජින් සූදුව ක්‍රියාත්මක කරන ආයතනයේ - සභාපති ධුරයට පත් කරලා අන්තිමට මොකද වුණේ?

අපේ රටට රුපියල් කෝටි 8,500ක පාඩුවක් අරගෙන දුන්නා. ඥාතින්ට සලකන්න ගිහින්, ඥාතියාට උදව් කරන්න ගිහින් රටේ ජනතාව මත මහා දැවැන්ත බරක් පැටෙව්වා. මා දැක්කා, ඊයේ පෙරේදා කැබිනට් මණ්ඩලය අනුමත කරලා ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවා, මේ හෙජින් සූදුව නිසා පාඩු වුණු තවත් ඩොලර් මිලියන 60ක මුදලක් ගෙවන්න. ඒවා ගෙවන්නේ අසන්ත ද මෙල්ගේ සාක්කුවෙන් නොවෙයි. ඒවා ගෙවන්නේ පවුලේ ඥාතින්ගේ සාක්කුවෙන් නොවෙයි. ඒවා ගෙවන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාවගේ මුදලින්. ඒවා ගෙවන්නේ මේ ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් වැඩි කරන ගාස්තුවෙන්. ඒවා ගෙවන්නේ මේ රටේ කසාද බඳින හැම අලුත් ජෝඩුවකින් ම අය කරන්න තීරණය කළ වැඩි කරන ලද ගාස්තුවෙන්. ඒ හෙජින් සූදුවෙන් වූ පාඩුව වෙනුවෙන් ගෙවන්න සිද්ධ වෙලා තිබෙන ඩොලර් මිලියන 60 ගෙවන්නේ මේ රටේ

සාමාන්‍ය ජනතාව මත පනවන බදුවලින්. ඒ මුදල ගෙවන්නේ අසන්ත ද මෙල් නොවෙයි. ඒ මුදල ගෙවන්නේ මස්සිනා නොවෙයි; ඥාතියා නොවෙයි; මේ රටේ සාමාන්‍ය දුප්පත් ජනතාවයි. එම නිසා පවුලේ ඥාතිකම්, හිතවත්කම්වලට සලකන්න ගිහින් රටට සිදු වුණු පාඩුව, රටේ ජනතාව මත පටවන එක දක්ෂ ආර්ථික මූලෝපායයක් නොවෙයි. ඒක රට ගැන හිතපු ආර්ථික මූලෝපායයක් නොවෙයි. එම නිසා තමයි මේ පාඩුව අද රටේ ජනතාවට දරන්න වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. පසු ගිය දවස්වල ශ්‍රී ලංකන් ගුවන් සමාගම රුපියල් බිලියන 23ක ණය කන්දරාවක් අරගෙන තිබෙනවා. ඒ මදිවාට දිගින් දිගට ම ඒ ආයතනය වර්ෂයකට රුපියල් කෝටි 1,900කට ආසන්න මුදලක් පාඩු වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඇයි එහෙම වුණේ? මොකක්වත් නොදන්නා, ආයතනයක්, සමාගමක් පවත්වා ගෙන යන්න කළමනාකරණ හැකියාවක් නැති මස්සිනාට සලකන්න ඕනෑ නිසා ඔහුට එහි සභාපතිකම දුන්නා. රටේ ජනතාවට ලැබිය යුතු සහන කප්පාදු කරලා, රටේ ජනතාවගේ විවාහ ගාස්තු වැඩි කරලා, ඇටෝර්නි බලපත්‍ර ගාස්තු වැඩි කරලා, ඒ හම්බ කරන සල්ලිවලින් අර මස්සිනා කරපු තකතීරු වැඩෙන් සිද්ධ වුණ පාඩුව අද ගෙවන්න තීරණය කරලා තිබෙනවා. කැබිනට් මණ්ඩලය තීන්දුවක් අරගෙන තිබෙනවා, ඒ සිදු වී තිබෙන පාඩුව හැම මාසයක ම ගෙවන්න. කැබිනට් මණ්ඩලය තීන්දු ගත්තවා, මස්සිනා කරපු වැරැද්දෙන් රටට වෙච්ච පාඩුව ගෙවන්න. රටේ මහා භාණ්ඩාගාරයේ සල්ලිවලින් තමයි ඒ පාඩුව ගෙවන්නේ. දැන් ඒ බර දරන්න වෙලා තිබෙන්නේ කාටද? ඒ බර දරන්න සිද්ධ වෙලා තිබෙන්නේත් මේ රටේ සාමාන්‍ය ජනතාවටයි. ඒ බර තමයි, අද මේ සේවා ගාස්තු වැඩි කිරීම හරහා, මේ පනත් සංශෝධන හරහා එන්නේ. ඒ ඔක්කොම තකතීරුකම් කරලා එතැනින් නතර වුණේත් නැහැ.

දැන් අලුත්ම ගිවිසුම ගහලා තිබෙන්නේ පසු ගිය ජිනීවා සාකච්ඡා පැවැත්වෙන කාල වකවානුවේදීයි. ඇමෙරිකා එක්සත් ජනපදය පළමුවන වතාවේ ජිනීවා යෝජනාව ඉදිරිපත් කරලා, ඒ සාකච්ඡාව පවත්වා ගෙන යන අතර තුර තමයි ඇමෙරිකාවේ Thompson Advisory Group එකේ කණ්ඩායමක් ශ්‍රී ලංකාවට ආවේ. එහේ ජිනීවා යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වනවා. ආණ්ඩුව මෙහේ මාධ්‍යවලින් ඇමෙරිකාවට විරුද්ධව කෑ කෝ ගහනවා; හාහූ තියනවා. බොරුවට American විරෝධය පෙන්වනවා. මෙහේ එහෙම American විරෝධය පෙන්වන අතරම යස අගේට ලංකාවේ මහ බැංකුව ඇමෙරිකානු Thompson Advisory Group සමාගමත් එක්ක ගිවිසුමක් අත්සන් කළා. මොකක්ද ඒ ගිවිසුම? අපට මතකයි එදා ජනාධිපතිවරයාගේ සහ ආණ්ඩුවේ ප්‍රතිරූපය නහා සිටුවන්නට බ්‍රිතාන්‍යයේ Bell Pottinger කියන සමාගමත් සමඟ ගිවිසුමක් ගැහුවා. Bell Pottinger කියන සමාගමට පවුම් 30,000ක ගෙවීමක් කළා. අන්තිමට ඒ උපදෙස් අනුව තමයි ජනාධිපතිවරයා ලන්ඩන් විශ්වවිද්‍යාලයකට ගිහින් දේශනයක් කරන්න කටයුතු කළේ. ඒකෙන් තිබුණ ප්‍රතිරූපයත් නැති වුණා. ඒ උපදේශකයින්ට ගෙව්වෙත් මේ රටේ සල්ලි. ඒ උපදේශක සමාගමේ නිර්දේශවලට අනුව පළ කළ පත්තර දැන්වීම්වලට ගෙව්වේ මේ රටේ සාමාන්‍ය ජනතාවගේ සල්ලි. ඒ විතරක් නොවෙයි Thompson Advisory Group කියන ආයතනය සමඟ අත්සන් කළ ගිවිසුම හරහා අපි මොකක්ද කරන්නේ? පසු ගිය මාර්තු මාසයේ ගිවිසුම අත්සන් කළා. ලබන වර්ෂයේ මාර්තු මාසය දක්වා, ඒ කියන්නේ අවුරුද්දක කාලයක් ඒ ගිවිසුම වංලගුව පවතිනවා. මොකක්ද, ඒ ගිවිසුමෙන් කරන්නේ? ඒ ගිවිසුමෙන් කරන්නේ වෙන මොකක්වත් නොවෙයි. Central Bank එක සහ Thompson Advisory Group කියන ආයතනය අත්සන් කළ ගිවිසුමත් සමඟ අපි ආණ්ඩුවක්-

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Minister of Wildlife Resources Conservation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා මේ ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමැතියි, අසන්ත ද මෙල්ගේ නැකම මොකක්ද කියලා; මස්සිනාකම කාගේද කියලා. අසන්ත ද මෙල්ගේ නැ කම මොකක්ද කියලා මම මෙතුමාගෙන් අහන්න කැමැතියි. ඒක අපි දැන ගන්න ඕනෑ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
දන්නේ නැහැ නේද? මහ ඇමතිකම නැති කර ගෙන, ඇමතිකමක් නැතිව යමතම් නියෝජ්‍ය ඇමතිකමක් ගන්න වුණේ ඔය වගේ ඕනේ නැති කට කැඩිච්ච කථා කියන්නට ගිහින් තමයි. ඔබතුමාට තිබෙන නියෝජ්‍ය ඇමතිකමත් නැති වෙනවා දකින්න මම කැමැති නැහැ. ඒක රැක ගන්න. [බාධා කිරීමක්] ඒක point of Order එකක් නොවෙයි. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇමෙරිකා එක්සත් ජනපදයේ Thompson Advisory Group කියන ආයතනය සමඟ මහ බැංකුව අත්සන් කළ මේ ගිවිසුමේ මොකක්ද තිබෙන්නේ? මේ ගිවිසුමේ තිබෙන්නේ වෙන මොකක්වත් නොවයි. ආණ්ඩුව වෙනුවෙන් මහ බැංකුව අත්සන් කළ මේ ගිවිසුම නිසා මාසයකට ඇමෙරිකානු ඩොලර් 66,000ක් ගෙවනවා. මාසයකට ඇමෙරිකානු ඩොලර් 66,000ක් ගෙවන්න තීරණය කරලා තිබෙනවා. ඒ අනුව ආසන්න වශයෙන් මාසයකට රුපියල් මිලියන 8ක් අපට ගෙවන්නට වෙනවා. ඒ කියන්නේ අවුරුද්දක් ගත වන විට රුපියල් මිලියන 96ක් අපට ගෙවන්න වෙනවා. ආසන්න වශයෙන් මාසයකට රුපියල් 8,337,000 බැගින්, අපි ලබන අවුරුද්ද දක්වා මේ ගිවිසුම අනුව ගෙවනවා. දැන් මේ ගිවිසුමෙන් මොකක්ද කියන්නේ? තානාපති කාර්යාලය කරන්න ඕනෑ දේවල් අද මහ බැංකුව පවරා ගෙන තිබෙනවා. Image promote කරන ඒවා අයිති වෙන්නේ තානාපති කාර්යාලයට. නමුත් ඇමෙරිකාවේ සිටින ජාලිය වික්‍රමසූරියට ඒ කටයුත්ත තේරෙන්නේ නැහැ. ඒ නිසා මේ විධියට ගිවිසුම් ගහලා ඒ ගිවිසුමට අපි සල්ලි ගෙවනවා. මහ බැංකුව ඩොලර් මිලියන ගණන් සල්ලි ගෙවනවා. ඒ ඩොලර් මිලියන ගණන් ගෙවන්නේ මොකක් සඳහාද? කොන්ග්‍රස් මණ්ඩලයේ canvass කරන්න සහ සෙනට් මණ්ඩලයේ canvass කරන්න. ඒ විතරක් නොවෙයි. ආර්ථික කටයුතු විතරක් නොවෙයි, රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව තිබෙන කටයුතු පවා මහ බැංකුවේ කාර්ය භාරයට පවරා ගෙන තිබෙනවා. ඒවා මහ බැංකුවට අයිති කාර්ය භාරයන් නොවෙයි.

පසු ගිය දිනවල ජිනීවා සාකච්ඡා යන විට ඒ ඇමෙරිකානු කණ්ඩායම ලංකාවට ඇවිල්ලා සිටියා. Fact-finding Mission එක කියලා තමයි ආවේ. නමුත් ඒ ආපු ගමනේදී Fact-finding විතරක් නොවෙයි, ඒ අය යන විට ගිවිසුම අත්සන් කරලාත් ඉවරයි. අද බොරු ඇමෙරිකන් විරෝධයක් රටට පෙන්වලා ඇමෙරිකානු Thompson Advisory Group කියන ආයතනය

[ගරු විජිත හේරත් මහතා]

සමහ ලංකාවේ මහ බැංකුව අත්සන් කළ ගිවිසුමෙන් අපි තවත් පාඩුවක් ලබනවා. ඒ පාඩුවත් සේවා ගාස්තු විධියට මේ රටේ ජනතාව වෙත පැටවෙනවා. ඒ විතරක් නොවයි. ඇමෙරිකාවේ තිබෙන ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය පසු ගිය දිනවල Hedges Strategies කියන සමාගමත් සමහ රුපියල් මිලියන 1.3ක ගිවිසුමක් ගැහුවා. ඒ මොකක් සඳහාද? තානාපතිවරයාගේ කථා හදලා දෙන්න. ඒ විතරක් නොවයි Patton Boggs කියන සමාගමත් සමහ මිලියන 52ක ගිවිසුමක් ගැහුවා, LLRC එක ගැන සෙනෙට් මණ්ඩලයේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකුව දැනුවත් කරන්න. ඒ විතරක් නොවෙයි. Cranford Johnson Robinson Woods කියන සමාගමත් සමහ මිලියන 17ක් ගෙවලා ගිවිසුමක් ගැහුවා, embassy එකේ උත්සව ගැන කටයුතු කරන්නට. Qorvis Communications කියන සමාගමත් සමහ ගිවිසුමක් ගහලා තව මිලියන 31ක් දුන්නා. තානාපති කාර්යාල තිබෙන්නේ රට promote කරන්න. නමුත් ඒක කරන්න බැහැ. ඇයි? ඳාතිකමට, නෑදෑකමට දාපු මිනිසුන්ට ඒ හැකියාව නැති නිසා, රටක් විධියට අපි අපේ රටේ මුදල් ගෙවනවා. මේවා රටේ සාමාන්‍ය ජනතාවගේ සල්ලි.

ඒ බර තමයි සේවා ගාස්තු වැඩි කිරීම හරහා රටේ ජනතාව මත පැටවෙන්නේ. මේ බදු සංශෝධන පනත් කෙටුම්පත් එන්නේ වෙන මොකටවත් නොවෙයි. මෙන්න මේ ඳාතී සංග්‍රහයට සලකන්න ගිහින් වැඩ බැරි මිනිසුන් මේවාගේ තනතුරුවලට පත් කරලා, රටට වුණු පාඩුව දරා ගන්න ආණ්ඩුවට මුදල් නැති වෙන කොට ඒවා මේ රටේ ජනතාව මත පැටවීමක් තමයි මේ හරහා සිද්ධ වන්නේ. අන්න ඒ ක්‍රියා දාමය නිසා තමයි අද ජනතාවගේ බඩු මිල වැඩි වී තිබෙන්නේ; ජනතාවගේ උප්පැන්න සහතිකයේ ගාස්තුව, ඔප්පු ගාස්තුව, ඇටෝර්නි බලපත්‍ර ගාස්තුව, දිවුරුම් ප්‍රකාශයේ ගාස්තුව වැඩි කරන්න ආණ්ඩුවට සිද්ධ වෙලා තිබෙන්නේ. මේ වැරදි ආර්ථික ප්‍රතිපත්තිය මේ රටේ ජනතාව අනුමත කරන්නේ නැහැ; ප්‍රතික්ෂේප කරනවාය කියන එක තමයි දැන් ජනතාව විරෝධය දක්වමින් පෙන්නුම් කරන්නේ. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මේ අවස්ථාවේදී මූලාසනය වෙනුවෙන් අපේ ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට සුබ උපන් දිනයක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

ඊළඟට ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා අමාත්‍යතුමා.

[අ.භා.1.50]

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Minister of Wildlife Resources Conservation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට සුබ උපන් දිනයක් වේවා කියා මගේ පෞද්ගලික හෘදයාංගම ශුභාශීසනය පුදු කරනවා. ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමාත්, අනෙකුත් සැම දෙනාමත් එතුමාට සුබ උපන් දිනයක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බදු වැඩි කරන විට විපක්ෂය කෑ ගහනවා; ඒ ගැන කථා කරනවා. ඒ ජනතාවට තියෙන ආදරේටම නොවෙයි. ඒ තමන්ගේ දේශපාලන ව්‍යාපාරය වෙනුවෙනුයි. බදු අය කරන්න ඕනෑ. රටක සංවර්ධන වැඩ කාගෙවත් සාක්කුවෙන් ගෙනැවිත් කරන වැඩ නොවෙයි. ජනතාවගෙන් අය කරන බදුවලින් -ඒක අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත් පිළිගනියි.- තමයි භාණ්ඩාගාරය රටේ මුළු මහත් ජනතාවටම භාණ්ඩ හා සේවා සැපයුම් සියල්ල ක්‍රියාත්මක කරන්නේ. අපි කල්පනා කර බලන්න ඕනෑ; ඉදිරි සියවස ගැන, ඉදිරි පස් අවුරුදු සැලැස්ම ඒ වාගේම දස අවුරුදු සැලැස්ම ගැන. ඇමෙරිකාව වාගේ රටවල් ඊළඟ සියවස -next millennium- ගැන කල්පනා කර තමයි තමන්ගේ ආර්ථික සහ දේශපාලන වැඩ පිළිවෙළවල් ක්‍රියාවට නංවන්නේ.

වරාය ඕනෑ. Carpet පාර ඕනෑ. වැව ඕනෑ. අමුණ ඕනෑ. පීල්ල ඕනෑ. ඒ ඔක්කොම ඕනෑ. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ පියා හිටියත්, අපේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ පියා හිටියත්, හෙට අනිද්දා එන්න බලාගෙන සිටින උදවිය හීනෙන් හෝ ආවත් ඒ සියලුම කටයුතු කරන්න සිදු වන්නේ ජනතාවගේ මුදල්වලිනුයි. ජනතාව දුප්පත් නම් බදු ටිකක් හෙමින් හෙමින් ක්‍රමක්‍රමයෙන් අඩු වෙනවා. එහෙම තමයි යන්න වන්නේ. යකාගේ හැටියට තමයි විමානය හැදෙන්නේ. දළ ජාතික නිෂ්පාදිතය වැඩි නම්, ඒක පුද්ගල ආදායම වැඩි නම් ඒ වැඩි වන ප්‍රමාණයට යම් ප්‍රමාණයක බදු වැඩි කිරීමක් කරනවා. මේවා පුංචි පුංචි දේවල්. කසාද සහතිකයට ගෙවන ගණන, මුද්දර ගාස්තු වාගේ දේවල් වැඩි නොකර කොහොමද ජනතාවට පහසුකම් සලසන්නේ? එහෙම ක්‍රමයක් තිබෙනවා නම් එහෙම ආර්ථික විශේෂඥයෙක් ඉන්නවා නම් කරුණාකර පෙන්වා දෙන්න, ඒ ආර්ථික විශේෂඥයා බදු අය නොකර මේ කටයුතු කරන්නේ කොහොමද කියා.

මත්තල ගුවන් තොටු පළ හැදුවා. මත්තල ගුවන් තොටු පොළේ පවතින පාරිසරික ප්‍රශ්න ගැන කථා කළා. කුරුල්ලෝ වදිනවාය කිව්වා. ඉන්දියානු ගුවන් තොටු පළක කුරුල්ලෝ එළවන්න, කුඩාරම් ගහගෙන වෙනම කට්ටියක් ඉන්නවා. කටුනායකත් එහෙමයි. කුරුල්ලෝ එළවන්න වෙනම පිරිසක් ඉන්නවා. මේ ගුවන් තොටු පළ කලින් හදන්න සිටියේ වීරවිලයි.

වීරවිල හදන්න හදන කොට මේ රටේ වන සංරක්ෂණයට කැමැති, හැම පාරිසරික සංවිධානයක්ම කිව්වා, ඒ එතැන හදන්න එපා කියලා. ඒ අය යෝජනා කළේ, මත්තල. මත්තල ගුවන් තොටුපොළ හැදීම ගැන පාරිසරික සංවිධානවලින්, රාජ්‍ය නොවන සංවිධානවලින් අතිගරු ජනාධිපතිතුමාටත් ගරු පාර්ලිමේන්තු සභික රණවක ඇමතිතුමාටත් ස්තුති කළ ප්‍රකාශන මා ළඟ තිබෙනවා. පරිසරවේදී සංවිධානවල ප්‍රකාශනත් මා ළඟ තිබෙනවා.

දැන් බලන්න, ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා කියනවා, මත්තල ගුවන් තොටුපොළ කෞතුකාගාරයක් කරනවා කියලා. මම හිතන්නේ කෞතුකාගාරයක් හැදුවාට කමක් නැහැ, එක්සත් ජාතික පක්ෂයේ ඉන්න මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ටික කියන්න. වෙන මොකකටවත් කෞතුකාගාරයක් අවශ්‍ය වන්නේ නැහැ. මේ රටේ කෞතුකාගාර තිබෙනවා. ඒ නිසා මේ රජය "මහින්ද චින්තන ඉදිරි දැක්ම" යටතේ ආශ්චර්යවත් ශ්‍රී ලංකාවක් ගොඩ නඟන වැඩ පිළිවෙළේ ගමන් මහ මේ වාගේ තුට්ටු දෙකේ කථාවලින් අවහිර කරන්න බැහැයි කියන එක අපි විපක්ෂයට කියනවා. දැන් බලන්න, ඊයේ මේ පාර්ලිමේන්තුවේදී විපක්ෂයේ පස් දෙනෙක් ඡන්දය දුන්නා. විපක්ෂය පෙරමුණක් ගහලා තිබුණා. කෝ පෙරමුණ? අත් අල්ලා ගෙන, අත් පූටිටු කර ගෙන, උඩට උස්සා ගෙන හිටපු මහා දැවැන්ත පෙරමුණක්. යූඑන්පියේ කට්ටිය හිටියා. ඉඳලා ගියා. ජේවීපී එකේ පස් දෙනා විතරයි ඉතිරි වුණේ.

ඊළඟට වරාය ගැන බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ගියා, කොරියාවේ පොස්කෝ කොම්පැනියට. මම ගියා එල්ජී සමාගමට. ඒ අයට අයිති harbour එකක් තිබෙනවා. අපේ රටේ තිබුණේ එක වරායයි. සුද්දාගේ කාලයෙන් පස්සේ අපට වරායක් හදන්න බැරි වුණා. අපට ගුවන් තොටුපොළක් හදන්න බැරි වුණා. මේ මත්තල ගුවන් තොටුපොළේ තවත් වටිනාකමක් තිබෙනවා. සාමාන්‍යයෙන් ගුවන් යානයක් එන කොට මිනිස්සු සහ බඩු පටවා ගෙන ඒ ප්‍රමාණයට සාපේක්ෂව තමයි ඉන්ධන පුරවා ගෙන එන්නේ, අතිරේකව හදිසි අවශ්‍යතාවක් වුණොත් වෙනත් ගුවන් තොටුපොළකට යන්න. අද මත්තල ගුවන් තොටුපොලක් තිබෙන නිසා ඒ පටවන තෙල් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒ නිසා ලංකාවට එන ගුවන් යානාවල වැඩියෙන් බඩු, වැඩියෙන් මගීන් ප්‍රවාහනය කිරීමේ හැකියාව තිබෙනවා.

අද ජනතා විමුක්ති පෙරමුණ පුංචි පුංචි දේවල් අල්ලා ගෙන කථා කරනවා. ජනතා විමුක්ති පෙරමුණට ආණ්ඩුවක් ගන්න බැහැ. ජනතා විමුක්ති පෙරමුණට දේශපාලනයක් නැහැ. ජනතා විමුක්ති පෙරමුණට තිබෙන එකම දේ තමයි විපක්ෂයේ ඉන්න එක. අපට මොන නායකයා හිටියත් ප්‍රශ්නයක් නැහැයි කියලා ඒ අය සිතා ගෙන ඉන්නවා. නමුත් අද එක්සත් ජාතික පක්ෂයටත්, ජනතා විමුක්ති පෙරමුණටත් ඒ ගොල්ලන්ගේ පක්ෂවත් රැක ගන්න බැරිව ඉන්නවා. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. රටේ සංවර්ධනයට මේ පාර්ලිමේන්තුවේ - ජාතික රාජ්‍ය සභාවේ- ඉඳ ගෙන උදව් කරනවා නොවෙයි, පැහැදිලිවම ඒ ගොල්ලෝ බලන්නේ මේවා කඩාකප්පල් කරන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි කියනවා, අය කරන මේ බදුවලින් ජනතාවගේ පංගුව ලබා දෙනවා. විවිධ සමාජ තීරුවලට සහනාධාර ලබා දෙනවා. මේ රටේ ආබාධිත අයට, අන්ත අඩියේ - පහළ මට්ටමේ - ඉන්න සමෘද්ධි ප්‍රතිලාභීන්ට, අවුරුදු 70ට වැඩි මහලු අයට, ගැබිනි මව්වරුන්ට සියලු සහනාධාර ලබා දෙන්නේ අය කරන මේ බදුවලින්. විපක්ෂය කියන්නේ බදු අය කරන්න එපා කියලායි. ණය ගන්නත් එපා, ආධාර ගන්නත් එපා කියනවා. එහෙම නම් මේවා ගෙනැල්ලා දෙන්නේ කොහෙන්ද? එහෙම නම් එක්සත් ජාතික පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් බලාපොරොත්තු වන්නේ මේවා එකින් එක කප්පාදු කරලා, අඩු කරලා රජය ජනතාවට ලබා දෙන සහන වෙනුවට, ජනතාවට දෙන යටිතල පහසුකම් වෙනුවට ජනතා විමුක්ති පෙරමුණ තුණ්ඩු කැල්ලෙන් පාලනය කළා වාගේ කරන්නයි. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ තමයි ඒක නිර්මාණය වුණේ. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ පියාගේ කාලයේ. තමුන්නාන්සේගේ පියාට මේ රට පාලනය කරන්න දුන්නේ නැහැ. අපි එදා විපක්ෂයේ හිටියා. ජනතා විමුක්ති පෙරමුණ තමුන්නාන්සේගේ පියාට දුන්න වධ තිස්දෙක එහෙම ලෙහෙසි පහසු එකක් නොවෙයි. මේ රටේ එක්සත් ජාතික පාක්ෂිකයෝ හන්දියක් ගානේ මරලා දැම්මා. ඒ වාගේම ඒකට ප්‍රති උත්තර දෙන්න රජයෙනුත් අභිංසක ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ විශාල පිරිසක් ඝාතනයට ලක් කළා.

ඒකට එදා මුහුණ දීපු අය හැටියට අපි ඒ ගැන දන්නවා. මගේ දිස්ත්‍රික්කයේ ඡන්ද පොළවල් 48ක් අවලංගු කරලා පොකුරු ඡන්ද මධ්‍යස්ථාන ලෙස ඒ ඡන්ද පැවැත්වුවා. ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයෝ හත් දෙනෙකු මැරුවා. ඒ, ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරකම්. ඒ අය බස් ගිනි තිබ්බා. ගොවිජන සේවා මධ්‍යස්ථාන ගිනි තිබ්බා. මේ රටේ කලාකරුවන්, පූජකවරුන්, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය නායකයන් මේ ඔක්කෝම මැරුවා. මනුස්සකම සහ ජනතාවට තිබෙන කැක්කුම, ආදරය, වේදනාව මේ ගොල්ලන්ගේ රෙද්ද පල්ලෙන් බේරෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා මේ අයට අපට කියන්න තිබෙන්නේ එක දෙයයි. කටේ නරිවාදන් නැතුව පැහැදිලි විපක්ෂයක් හැටියට ආණ්ඩුවේ වැරදි තිබෙනවා නම් ජනතාව අතරට ගිහිල්ලා ජන බලය ගොඩ නහන්න. ජනතාව අපට විපක්ෂය පැත්තට යන්න කිව්වොත් අපි යනවා. ඒක වෙනම දෙයක්. හැබැයි ජනතාව කියන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහ මහත්මයා ළඟදී කිව්වා රැඩිකල් වෙනසක් ගැන. මොකක්ද රැඩිකල් කියන්නේ? 1988-89 කාලයේ එතුමාගේ රැඩිකල් දේවල් ගැන අපි දන්නවා. එතුමාගේ තිබුණු වදකාගාර ගැන අපි දන්නවා. ඒ වදකාගාරවල හිටපු අය ඒ මිනී වළවල්වලින් නැඟිටලා අද හොල්මන් කරනවා. ඒ හොල්මන් අද ජනතා විමුක්ති පෙරමුණේ, එක්සත් ජාතික පක්ෂයේ පිටු පස්සේ එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට කියන්න තිබෙන්නේ මෙච්චරයි. බදු අය කරන්න ඕනෑ. රජ්ජුරුවන්ගේ කාලයේදීත් බදු ගෙව්වා. රජයේ සේවකයන්ට පඩි ගෙවන්න ඕනෑ. රාජ්‍ය ආයතන පවත්වාගෙන යන්න ඕනෑ. රටේ නව සංවර්ධන ප්‍රවේශයක් කරා ගමන් කරවන්නට ඕනෑ. ජනතාවගේ ආදායම් තත්ත්වය වැඩි වෙන කොට ඒ ජනතාව ගෙවපු බදු ප්‍රමාණය ටිකක් වැඩි වෙනවා.

ඒක එහෙම නොවෙයි කියා අපි කියන්නේ නැහැ. මොකද, අපේ ගෙදරින් ගෙනැල්ලා, අපේ සාක්කුවෙන් ගෙනැල්ලා මේක කරන්න කියනවාද? මේ රජය බදු වැඩි කරලා තිබෙන්නේ ජනතාවගේ යහපතටයි. යම් වැඩි කිරීමක් කර තිබෙනවා නම් එසේ කර තිබෙන්නේ සාධාරණ ලෙසටයි. සාධාරණ බදු ක්‍රමයක් අපේ රජය පවත්වා ගෙන යනවා. ඒ බදු ක්‍රමය තුළ රටේ ජනතාවගේ සහනාධාර සහ ඔවුන්ගේ යටිතල පහසුකම් වර්ධනය කිරීමේ හැකියාව තිබෙන බව මම ප්‍රකාශ කරනවා. අපි බංකොලොත් දේශපාලනයෙන් ඈත් වෙන්න ඕනෑ. අපි සජිත් ප්‍රේමදාස මහත්මයා ඇතුළු අයට කියනවා, කරුණාකර බංකොලොත් සටන් පාඨ නැතිව නිවැරැදි, පැහැදිලි සටන් පාඨ අරගෙන ජනතාව අතරට ගිහින්, ජන බලය ගොඩ නඟලා මැතිවරණ ජයග්‍රහණය කරන්න කියලා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, එහෙම නැතිව රනිල් වික්‍රමසිංහගේ රැඩිකල් වෙනසට තමුන්නාන්සේ හසු වන්න එපා කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි ගරු අමාත්‍යතුමනි. ඊළඟට ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා.

[අ. භා. 2.02]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන් වර්තමාන රජයේ ආර්ථික ක්‍රියා දාමය, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ ආර්ථික මෙහෙයවීම් කටයුතු සාකච්ඡාවට භාජනය වන මේ මොහොතේ මගේත් අදහස් කිහිපයක් එකතු කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටක් ලබනවා.

ඊයේ දවසේ "2012 මහ බැංකු වාර්තාව" එළි දක්වපු අවස්ථාවේ බොහොම ආඩම්බරයෙන් සාඩම්බරයෙන් අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 6.7කටත් වඩා පවත්වා ගෙන යෑම පිළිබඳව ලොකු පුරසාරමක් රටටම ප්‍රකාශ කළා. ඒ අවස්ථාවේදී පැහැදිලි කරන්නට යෙදුණා අපේ රටට ලැබී තිබෙන පශ්චාත් යුද්ධ ප්‍රතිලාභ පිළිබඳව. ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා නම්, post-conflict dividends පිළිබඳව. යුද්ධයෙන් පසුව රටේ ජනතාවට ලැබුණු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ප්‍රතිලාභ පිළිබඳව ඊයේ දවසේ මහ බැංකු වාර්තාව එළි දැක්වූ මොහොතේ ප්‍රකාශයට පත් කළා. ඉතින් මමත් හිතුවා පශ්චාත් යුද ප්‍රතිලාභ පිළිබඳව කථා කිරීම බොහොම උචිතයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහින්ද චින්තනයෙන් මේ රටේ ධීවර ප්‍රජාවට ලොකු ශක්තියක් ලබා දෙනවා කියා පොරොන්දු වුණා. ධීවර ජනතාව විග්‍රහ කළේ, දළ රළ ජය ගන්නා ප්‍රජාව හැටියටයි; සයුරු සම්පත රටේ සමෘද්ධියට යොමු කරන ප්‍රජාව හැටියටයි. නමුත් 2006 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක කරනවාය කියපු ඉන්ධන සහනාධාරය ක්‍රියාත්මක කළේ 2006 ජනවාරි මාසයේ නොවෙයි; අවුරුදු 6කට පස්සේයි. 2012 දී තමයි එය ලබා දුන්නේ. 2012 දී අපේ රටේ ජීවත් වූ 26,362ක් වූ ධීවර ආම්පන්න අයිතිකරුවන්ට ඉන්ධන සහනාධාරය ලබා දෙන්න මාසයකට රුපියල් මිලියන 340ක්, වසරකට රුපියල් මිලියන 4,080ක් හෙවත් රුපියල් බිලියන 4ක් පමණ වෙන් කරලා අපේ රටේ ධීවර ගෘහයන් 185,000ක ක්‍රියාකාරී ධීවරයන් 216,000කට, ඒ වාගේම මුළුමනින් 824,000ක් වූ ධීවර ජනතාව වෙත මේ ඉන්ධන සහනාධාරය 2012 දී ලබා දුන්නා.

පශ්චාත් යුද සමයේ ලැබුණු පළමුවැනි ප්‍රතිලාභය තමයි ධීවර ජනතාව ගොනාට අන්දලා ධීවර ජනතාවට හොරෙන් මේ මාර්තු මාසයේ ඉන්ධන සහනාධාරය කප්පාදු කිරීම. මා මේ පාර්ලිමේන්තුව තුළ ධීවර ඇමතිතුමාගෙන් ඉන්ධන සහනාධාරය පිළිබඳ ප්‍රශ්නය මතු කරන කොට, ඒ වාගේම තවත් මාධ්‍යයන් හරහා මාර්තු මාසයේ ඉන්ධන සහනාධාරය ලබා නොදීම ගැන මතක් කරන කොට මර නින්දේ පසු වූ මේ ආණ්ඩුව අර පශ්චාත් යුද ප්‍රතිලාභ ගැන හිතලා මෙන්න නැවත වරක් ඉන්ධන සහනාධාරය ලබා දෙන්න මේ පසු ගිය දවසක දිස්ත්‍රික් ධීවර අධ්‍යක්ෂවරුන් කොළඹට කැඳවලා තිබුණා. හැබැයි මම වග කීමෙන් කියනවා, ඉන්ධන සහනාධාරය සඳහා කුපන් පත් ලබා දුන්නාට සියයට 10කින් කපලායි මෙවර සහනාධාරය ලබා දෙන්නේ කියලා. ඉන්ධන සහනාධාරය ක්‍රියාත්මක වුණු වසරේ ඉන්ධන මිල සියයට 5කින් වැඩි වෙලා තිබෙනවා. ඩීසල් මිල සියයට 5කින් වැඩි වෙලා තිබෙනවා. නමුත් ඒ පීඩනය ගැන හිතන්නේ නැතුව ඉන්ධන සහනාධාරය නැවත වරක් ලබා දෙන්නේ සියයට 10කින් කප්පාදු කරලායි කියන එක මම කනගාටුවෙන් මතක් කරන්නට කැමැතියි.

ඒ විතරක් නොවෙයි. පසු ගිය වසර දෙක පුරාවටම මේ රටේ සෑම ධීවර කොටියාසයකම ධීවර ග්‍රාමීය සමිති පිහිටුවලා ලක්ෂ ගණනින් සාමාජිකයෝ බඳවා ගෙන හැම සාමාජිකයෙකුගෙන්ම රුපියල් 100ක් අය කරලා ධීවර ප්‍රජාවට ඔරු දෙන්නම්, බෝට්ටු දෙන්නම්, දැල් දෙන්නම්, engines දෙන්නම්, අඩු පොලියට ණය දෙන්නම්, මූල්‍ය පහසුකම් ලබා දෙන්නම්, ධීවර පවුල්වල කාන්තාවන්ට ස්වයං රැකියා ණය ලබා දෙන්නම් කියලා නොයෙකුත් පොරොන්දු මැද්දේ බලාපොරොත්තු රැසක් ඇති කළා. නමුත් වසර දෙකක් පුරාවට අබමල් රේණුවක තරම්වත් ප්‍රතිලාභයක් ධීවර සංවිධානවලට ලබා නොදුන් බව මම මතක් කරන්න කැමැතියි. පසු ගිය දවස්වල කොළඹට කැඳවලා මහා ලොකු උජාරුවට ධීවර සම්මේලනයක් පැවැත්වුවා. එයට සහභාගි වුණු අලුත් ධීවර සංවිධානවලට ලැබුණු එකම වරප්‍රසාදය - ප්‍රතිලාභය- තමයි පිළිණු ආහාර පැකට්ටුවකුත් සමඟ ආපසු ගම් බිම් බලා යන්නට ලැබීම. ඒ විතරක් නොවෙයි. මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව රුපියල් කෝටි 150ක් වැය කරලා ධීවර ජනතාවට ගෙවල් 30,000ක් හදලා දෙන පොරොන්දුව ගැන මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ධීවර ඇමතිතුමාගෙන් මම ප්‍රශ්න කළා. ඒ පිළිබඳව කථා කරන කොට වග කිව යුතු ධීවර ඇමතිතුමාම කියනවා, මේ රටේ ධීවර ප්‍රජාවට පොරොන්දු වුණු ධීවර නිවාස 30,000 සඳහා මෙතෙක් ශත පහක්වත් වෙන් කරලා නැහැ, ඒවා හැදෙන්නේ නැහැ කියලා. ගෙවල් 100ක් විතර හදන්න සැලසුම් කරලා තිබෙනවා, ඕනෑ නම් ඒ ටික පමණයි හැදෙන්නේ කියලා කිව්වා. මේ සභාව තුළදී කිව්වේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔන්න සාමයේ ප්‍රතිලාභය; යුද ජයග්‍රහණයේ ප්‍රතිලාභය!

එපමණක් නොවෙයි. එක පැත්තකින් ධීවරයින්ට ලබා දෙන ඉන්ධන සහනාධාරය සියයට 10කින් කප්පාදු කරලා තිබෙනවා. තවත් පැත්තකින් මම අහන්න කැමැතියි අද ගොවියාට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා. අද ගොවි විශ්‍රාම වැටුපට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක වුණු වැඩසටහන මඟින් මාසයකට රුපියල් 1,000ක්, 4,166ක් වැනි සුළු විශ්‍රාම වැටුපක් ලබා දෙනවා. සියයට 95ක රාජ්‍ය අනුග්‍රහයෙන් රාජ්‍ය සහනාධාරයක් ඇතුවයි ඒක ක්‍රියාත්මක වෙන්නේ. නමුත් මොකක්ද යුද ජයග්‍රහණයේ ප්‍රතිලාභය? 2011 අප්‍රේල් ඉඳලා 2013 අප්‍රේල් මාසය වන තෙක් අවුරුදු 2ක්ම ගොවි විශ්‍රාම වැටුප ලබා දීලා නැහැ. මෙන්න යුද ජයග්‍රහණයේ ප්‍රතිලාභය! අද අපේ රටට බත සපයන, කෘෂි කාර්මික ශක්තිය ලබා දෙන ගොවි ජනතාව විසිහත්ලක්ෂයක් ඉන්නවා. සේවා නියුක්තිකයින්ගෙන් සියයට 33ක් ඒ අය. දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය සියයට 11.2ක් වෙනවා. රටට බත සපයන අපේ ගොවි පරපුරේ ගොවි විශ්‍රාම වැටුප පිට පිටම මාස 24ක් -වසර 2ක්- කප්පාදු කිරීම ඉතාමත්ම නින්දිත ක්‍රියාවක් හැටියටයි මම සඳහන් කරන්නේ. හැබැයි, මහින්ද චින්තන පොරොන්දු මාලාව තුළින් මේ උත්තරීතර සභාවට පත් වුණු මහින්ද චින්තන ආශ්චර්යයේ නියෝජිතයන් ගොවි විශ්‍රාම වැටුප ගැන මොනවාද කියන්නේ? 2011 මැයි 06වැනිදා හැන්සාඩ් වාර්තාවෙන් උපුටා ගෙනයි මම මේවා සඳහන් කරන්නේ. එවකට කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා මෙහෙම කියනවා:

"ගොවි විශ්‍රාම වැටුප් පිළිබඳව කිසිම අවිනිශ්චිතතාවක් ඇති කර ගන්නට අවශ්‍ය නැහැ."

හිටපු කෘෂිකර්ම අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා එහෙම කියනවා. එපමණක් නොවෙයි. හිටපු ගොවිජන සේවා හා වනජීවී අමාත්‍ය එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා මොකක්ද කියන්නේ? එතුමා ගොවි විශ්‍රාම වැටුප ගැන කියනවා. 2011 නොවැම්බර් 22වන දින හැන්සාඩ් වාර්තාවේ 414 සහ 415වන තීරුවලින් මා මේ කාරණය උපුටා දක්වනවා. එහි එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමා මෙහෙම කියනවා:

"මෙක දැවැන්තම වැඩසටහනක් බවට පත් වෙලා තිබෙනවා. ආණ්ඩුව හැටියට අප මේකෙන් මහ හරින්නේ නැහැ. ගොවියා අපහසුතාවට පත් කරන්නෙත් නැහැ. ..."

එහි තවදුරටත් මෙහෙම කියනවා:

"-වැඩිම වුණොත් තව සති දෙකක් යයි- මේ සියලු දෙනාටම arrears එක්ක අප විශ්‍රාම වැටුප් ලබා දෙනවා."

කවුද මේ කියන්නේ? ගොවිජන සේවා හා වනජීවී ඇමතිතුමායි. කවදාද කිව්වේ? 2011 නොවැම්බර් 22වැනි දා මේ උත්තරීතර සභාවේදීයි. ගොවි විශ්‍රාම වැටුපට අද සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? අද සම්පූර්ණයෙන්ම එය කප්පාදු කරලා තිබෙනවා. එපමණක් නොවෙයි, අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ දයාබර සහෝදරයා -එවකට මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය ඇමතිතුමා- ගොවි විශ්‍රාම වැටුප ගැන මේ උත්තරීතර සභාවට මෙන්න මෙහෙම කියනවා. මා මෙය 2011 නොවැම්බර් 22වන දින හැන්සාඩ් වාර්තාවේ 415 සහ 416වන තීරුවලින් උපුටා දක්වනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"අපේ ඇමතිතුමා කිව්වා වාගේ ඔක්තෝබර් මාසයේ මුදල් ගෙවීම සඳහා වූ කටයුත්තට අද අපට අවස්ථාව ලැබී තිබෙනවා. තැපැල් වර්ජනය අවසන් වීමත් සමඟ ඉතාම ඉක්මනින් මේ කටයුත්තට බහින්නට අවස්ථාව ලැබී

තිබෙනවා. තැපැල් කාර්යාල හරහායි මේ මුදල් ගෙවන්නේ. තැපැල් කාර්යාල හරහායි මේ මුදල ගොවීන් අතට පත් වන්නට සලස්වන්නේ. එම නිසා ඒ ප්‍රමාදය මහ හරවා අධ්‍යක්ෂ මණ්ඩලය ඉක්මනින්ම අලුත් වැඩසටහනක් තුළින් එය ක්‍රියාත්මක කරලා ගොවීන්ගේ විශ්‍රාම වැටුප් මුදල බෙදා හැරීම සඳහා වූ කටයුත්තට අද ගමන් කරලා තිබෙනවාය කියන ටික අපි මතක් කරන්නට ඕනෑ."

මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය ඇමතිතුමා මේ උත්තරීතර සභාවට 2011නොවැම්බර් 22වැනි දා තමයි මෙහෙම කියන්නේ. කෝ යුද ජයග්‍රහණයේ ප්‍රතිලාභ? කෝ සාමයේ ප්‍රතිලාභය? කෝ ජනතාවට ලබා දෙනවාය කිව්ව සහන ටික? තිබුණු සහන ටිකත් කපන යුගයකයි අද අපි ජීවත් වෙන්නේ. ගොවි විශ්‍රාම වැටුප සම්පූර්ණයෙන්ම කප්පාදු කරලා තිබෙනවා. එපමණක් නොවෙයි. මහින්ද චින්තනයේ ඒජන්තවරුන් වන එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා, මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා වාගේම ගීතාංජන ගුණවර්ධන මැතිතුමා -තුන් දෙනාම- මේ උත්තරීතර සභාවට ඇවිල්ලා මේ සභාව නොමඟ යවනවා. අමු පට්ටපල් අසත්‍ය කියනවා. අද දෙනවා, හෙට දෙනවා, අනිද්දා දෙනවාය කියලා අසත්‍ය කියනවා. අද ඒ කියපු අසත්‍ය ඔප්පු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම සාමයේ ප්‍රතිලාභ ගැන කථා කරන කොට, ආර්ථික වර්ධන වේගයේ ප්‍රතිලාභ ගැන කථා කරන කොට මේ ප්‍රතිලාභ ජනතාවට දැනෙන ආකාරයට ක්‍රියාත්මක විය යුතුයි කියන කාරණය මා ප්‍රකාශ කර සිටිනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රීති ප්‍රශ්නයක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට කරුණාකරලා මේ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එපමණක් නොවෙයි. අද ගොවියා ගැන කථා කරන කොට -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අස්වර් මන්ත්‍රීතුමාට රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පට්ටපල් බොරු" කියන වචන, very unparliamentary. මගේ තරුණ මන්ත්‍රීතුමා, මගේ බබා මේක ඉගෙන ගන්න ඕනෑ, වැඩි දුර යන්නට ඉස්සෙල්ලා. මේක ඉගෙන ගන්න බබෝ!

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
"අසත්‍ය" කියලා ඒ වචනය වෙනස් කරන්නට නියෝග කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා මේ ගරු සභාවට මේ කරුණු කාරණා ඉදිරිපත් කළේ හැන්සාඩ් වාර්තාවේ සඳහන් වී තිබෙන කථා සියල්ලක්ම උපුටා ගෙනයි. හැන්සාඩ් වාර්තාවේ සඳහන් වී තිබෙන දේ අසත්‍ය නම් ඒක මට අසත්‍යයක් කියලා කියන්න අයිතියක් තිබෙනවා. ඒ අයිතිය මට තිබෙනවා. මගේ වචන නොවෙයි මා ඉදිරිපත් කළේ. මා ඉදිරිපත් කළේ 2011 මැයි 06 හැන්සාඩ් වාර්තාවේ මේ ඇමතිවරු කියපු ප්‍රකාශ; මම ඉදිරිපත් කළේ 2011 නොවැම්බර් 22 වැනි දා හැන්සාඩ් වාර්තාවෙන් උපුටා ගත් කොටස්. ඒ නිසා කරුණාකරලා නිකම් බොරුවට මගේ කථාවට අවහිර කරන්නට, බාධාවක් කරන්නට ඔබතුමිය ඉඩ තියන්න එපා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගොවි විශ්‍රාම වැටුප විතරක් නොවෙයි කප්පාදු කරලා තිබෙන්නේ කියන කාරණය විශේෂයෙන්ම මේ අවස්ථාවේ මා සඳහන් කරන්න කැමැතියි. මේ පශ්චාත් යුද ප්‍රතිලාභ ගැන කථා කරන කොට පොහොර සහනාධාරයත් කප්පාදු කරනවා. දැන් මහ ලොකුවට කියනවා, රුපියල් 350ට පොහොර ලබා දෙනවාය කියලා. ඇත්ත, පොහොර රුපියල් 350ට ලබා දෙනවා. එදා අක්කරයකට යූරියා කිලෝ 125ක්, MOP කිලෝ 45ක්, TSP කිලෝ 45ක් ලබා දුන්නා. පොහොර සහනාධාරය අක්කරයකට කිලෝ 215ක් ලබා දුන්නා. අද සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? යූරියා කිලෝ 90ට කපලා; කිලෝ 35කින් කප්පාදු කරලා. MOP කිලෝ 30ට කපලා; කිලෝ 15කින් කප්පාදු කරලා. TSP කිලෝ 35ට කපලා; කිලෝ 10කින් කප්පාදු කරලා. එදා අක්කරයකට ලබා දුන්නු කිලෝ 215 අද කිලෝ 155ට අඩු කරලා. පොහොර සහනාධාරය කිලෝ 60කින් කප්පාදු කරලා.

ඒ විතරක් නොවෙයි. හැම කුඹුරක්ම රක්ෂණය කරන්නට හැම අක්කරයකට ම රුපියල් 150ක් අය කරනවා. ඒක නොකළොත් පොහොර සහනාධාරය දෙන්නේ නැහැ. ඒක අමතර වියදමක්. එපමණක් නොවෙයි. මේ පොහොර සහනාධාරය ලබා දීම සඳහා හැම ගොවියෙකුගෙන්ම රුපියල් 40ක ප්‍රවාහන ගාස්තුවකුත් අය කර ගන්නවා. එක පැත්තකින් පොහොර සහනාධාරය ප්‍රමාණවත්ව කප්පාදු කරලා, තවත් පැත්තකින් අමතර බදු දමලා, අමතර ගාස්තු අය කරලා, අද පොහොර සහනාධාරය සම්චිචලයට ලක් කරලා, වැඩිපුර බර මේ රටේ ගොවි පරපුරේ කරපිට පටවන්නට මේ රජය කටයුතු කර තිබෙනවා. මේකද සාමයේ ප්‍රතිලාභය කියා මා අහන්නට කැමතියි. මේකද peace dividend එක? මේකද යුද ජයග්‍රහණයෙන් ජනතාවට ලැබෙන සහනය?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි. අද ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ වී මිලදී ගැනීමේ නවතම ආශ්චර්යක් ක්‍රියාත්මක වෙනවා. දැන් අමුතුම දෙයක් සිද්ධ වෙනවා. ඔබතුමියගේ දිස්ත්‍රික්කයේත් ඕක සිද්ධ වෙනවා. වී ගබඩාවලට, වී අලෙවි මණ්ඩලයට වී ලබා දීමෙන් පස්සේ, ගොවීන් වවුවර් එක්ක රාජ්‍ය බැංකුවලට යනවා. හැබැයි මේවා අරුම පුදුම ආශ්චර්යවත් වවුවර්. වවුවරය තිබෙනවා. බැංකුවල සල්ලි නැහැ. මහ ලොකුවට කියනවා, සහතික මිලක් ලබා දෙනවාලු. නාඩුවලට රුපියල්32යි; සම්බාවලට රුපියල් 35යි කියා කියනවා. සහතික මිලක් ලබා දෙනවාය කියා මහ ලොකුවට උජාරුවට පම්පෝරි ගහනවා. නමුත් වී අලෙවි මණ්ඩලයේ ගබඩාවලින් ලබා දෙන වවුවර්වලට රාජ්‍ය බැංකුවල මුදල් නොමැති ආශ්චර්යවත් සහතික මිලක් තමයි අද අපේ රටේ වී ගොවියාට ලැබෙන්නේ කියන එක කනගාටුවෙන් හෝ ප්‍රකාශ කරන්නට ඕනෑ.

ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරිවරුන් හරහා අද මේ වන විට කෘපනිස සහතිකය රුපියල් දෙදාහට වෙන්දේසි වෙනවාය කියන එක මා වග කීමෙන් ප්‍රකාශ කරනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, රාජ්‍ය පාර්ශ්වයට සම්බන්ධ මන්ත්‍රීවරුන්, මුදලාලිලා එක්ක එකතු වෙලා මේ කෘපනිස සහතිකය එක්කාසු කරලා, වෙන්දේසි කරන නින්දිත ක්‍රියාවක් අද ක්‍රියාත්මක වෙනවා. අර මුදලාලිලා ගිහින් අහිංසක ගොවීන්ගෙන් කුණු කොල්ලයට වී ටික ගන්නවා. කුණු කොල්ලයට ගත් වී ටික අර කූට ක්‍රමෝපායන් තුළින් ලබා ගත් කෘපනිස සහතිකය හරහා ගබඩා කළමනාකරුවන්ගේ සහායත් ඇතිව වී අලෙවි මණ්ඩලයට ඒ මුදලාලිලා විසින් ලබා දෙනවා. මේක සිද්ධ වෙන්නේ කොහේද

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කියා කවුරු හෝ අභියෝග කරනවා නම්, යන්න මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල, කනාදන වී ගබඩාවට. කවුරු හෝ අභියෝග කරනවා නම්, ඡායාරූප සහිතව වීඩියෝ පට ගත කරලා ඒ සියල්ලක්ම තිබෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් සමඟ එකට එකතු වෙලා, මේ සහතිකය මුදලාලිලාට රුපියල් දෙදාහට වෙන්දේසි කරලා, ගොවි ජනතාවගේ වී ටික කුණු කොල්ලයට අරගෙන මුදලාලිලා ඒ වී සහතික මිලට අලෙවි කරලා රජවෙන යුගයක් තමයි අද අපේ රටේ ක්‍රියාත්මක වෙන්නේ කියන එක බොහොම කනගාටුවෙන් හෝ ප්‍රකාශ කරන්නට ඕනෑ. මේවාද සාමයේ ප්‍රතිලාභ? යුද ජයග්‍රහණයෙන් ජනතාවට ලැබෙන සහන ටික මේවා ද?

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, බලන්න අද අපේ රටේ පාසල් දූ දරුවන් 39,68,104ක් ඉන්නවා. රජයේ පාසල් 9714 කින් ඒ අය අධ්‍යාපනය ලබනවා. මා මතක් කරන්නට කැමතියි, එක්සත් ජාතික පක්ෂ රජයේ කාලවකවානුව තුළ 43,000,00ක් පාසල් දූ දරුවන්ට නිල ඇඳුමත්, දිවා ආහාරයත් කිසිම බෙදීමකින් තොරව ලබා දුන්නාය කියන කාරණය. නමුත් අද රටට ලැබී තිබෙන යුද ජයග්‍රහණයේ ප්‍රතිලාභය මොකක්ද? පාසල් යන දූ දරුවෝ 39,68,104 ක් ඉන්නවා. ඒ අයගෙන් දිවා ආහාරය ලැබෙන්නේ 10, 88,890කටයි. පාසල් යන දූ දරුවන්ගෙන් සියයට 27කට දිවා ආහාරය ලැබෙනවා. සියයට 73කට බඩගින්නේ ඉන්න සිද්ධ වෙනවා. මේකද සාමයේ ප්‍රතිලාභය? මේකද යුද ජයග්‍රහණයේ ප්‍රතිඵලය? යුද්ධයට වැය කළ සල්ලි යුද ජයග්‍රහණය තුළින් රටේ ජනතාවට දූ දරුවන්ට බෙදා දෙන්නේ මොහෙම තෝරා බේරලාද? පාසල් යන දූ දරු පරපුර කොටස් කරන නින්දිත යුගයකයි අද අප ඉන්නේ. දිවා ආහාරය සියයට 27කට දෙනවා; සියයට 73කට කප්පාදු කරනවා. ඒ අයව හාමතේ තියනවා. ඒ අයව බඩගින්නේ තියනවා. ඒ දූ දරුවනුත් සමඟර වෙලාවට ඒ පාසල් කාමර තුළම කලන්තය දාලා ඇද වැටෙනවා. මේකද සාමයේ ප්‍රතිලාභය, මේකද යුද ජයග්‍රහණයේ ආශ්චර්යය, මේකද අපේ රටේ ක්‍රියාත්මක වන විස්මයජනක සංවර්ධන ක්‍රියාවලිය කියලා මම අහන්න කැමැතියි.

එපමණක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි. බලන්න සමෘද්ධි සහනාධාරයේ තත්ත්වය. අපේ රටේ පවුල් 16,00,000කට ආසන්න ප්‍රමාණයකට සමෘද්ධි සහනාධාරය ලැබෙනවා. අද වන කොට අපේ රටේ තිබෙන්නේ සමෘද්ධි සහනාධාර මුද්දර වර්ග හතරයි. රුපියල් 1,500 සමෘද්ධි මුද්දරය තිබෙනවා, රුපියල් 1,000 සමෘද්ධි මුද්දරය තිබෙනවා, රුපියල් 750 සමෘද්ධි මුද්දරය තිබෙනවා, රුපියල් 210 සමෘද්ධි මුද්දරය තිබෙනවා.

විශේෂයෙන්ම අපි සියලු දෙනාම දැන ගන්න ඕනෑ කාරණාවක් තමයි, හැම මාසයකම මේ හැම සමෘද්ධි මුද්දරයකින්ම 'අනිවාර්ය ඉතිරි කිරීම්' කියලා කොටසක් කපා ගන්නා බව. රුපියල් 1,500 සමෘද්ධි මුද්දරයෙන් කපා ගන්නවා, රුපියල් 200ක්; සියයට 13ක්. රුපියල් 1,000 සමෘද්ධි මුද්දරයෙන් කපා ගන්නවා, රුපියල් 200ක්; සියයට 20ක්. රුපියල් 750 සමෘද්ධි මුද්දරයෙන් කපා ගන්නවා, සියයට 13ක්. රුපියල් 210 සමෘද්ධි මුද්දරයෙන් සියයට 100ක්ම යන්නේ අනිවාර්ය ඉතිරි කිරීම්වලට. මේ අනිවාර්ය ඉතිරි කිරීම් කියන්නේ කාගේ සල්ලිද? ඒවා සමෘද්ධිලාභියාගේ සල්ලි; සමෘද්ධිලාභියා සතු මුදල්. නමුත් අද ඒ අනිවාර්ය ඉතිරි කිරීම් ආපහු සමෘද්ධිලාභියාට ලබා දෙන්නේ කොන්දේසි තුනක් යටතේයි. සුව කළ නොහැකි රෝගයක් තිබුණොත් ලබා දෙනවා. ළමයාගේ උසස් අධ්‍යාපනය සඳහා ලබා දෙනවා. වයස්ගතභාවයට ලබා දෙනවා. නමුත් මේ සමෘද්ධි අනිවාර්ය ඉතිරි කිරීම්වල තිබෙන ලොකුම ආශ්චර්යය තමයි, නැවත ලබා දෙන්නේ එයින් සියයට 50ක් වීම. සියයට පනහයි ලබා දෙන්නේ. ඉතුරු සියයට 50 රජය කියා ගන්නවා. බලන්න, කොච්චර අසාධාරණද? මේ වාගේ අසාධාරණ චක්‍රලේඛයක් තුළින් විපතට පත් වන්නේ, පීඩනයට පත් වන්නේ, අසහනයට පත් වන්නේ අපේ රටේ ලක්ෂ 16ක් වූ සමෘද්ධි පවුල් නොවේද කියන එක අහන්න මම කැමැතියි. කොන්දේසිවලට යටත් කරලා, චක්‍රලේඛවලට යටත් කරලා, සමෘද්ධිලාභියාගේ අනිවාර්ය ඉතිරි කිරීම්වලින් සියයට 50ක් ගසා කන ක්‍රමයක් තමයි අද ක්‍රියාත්මක වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, තවත් ආශ්චර්යයක් ක්‍රියාත්මක වනවා. එනම්, මේ අනිවාර්ය ඉතිරි කිරීම් සමෘද්ධි මුද්දරයෙන් කපා ගත්තාම, ඒ සල්ලි ටික යන්නේ සමෘද්ධි අධිකාරියට. නමුත් අනිවාර්ය ඉතිරි කිරීම් සමෘද්ධිලාභියා ඉල්ලුම් කරන කොට ඒ මුදල් ටික ගෙවන්නේ සමෘද්ධි අධිකාරියෙන් නොවෙයි, සමෘද්ධි බැංකුවෙන්. සමෘද්ධි අධිකාරියට යන සල්ලි ටික, -ප්‍රාග්ධන මුදල- සමෘද්ධි බැංකුවට එන්නේ නැහැ. මාස හයකට වරක් පොලිය පමණක් ප්‍රතිපූරණ කරනවා. බලන්න, මේ වැරදි ක්‍රමය දිහා. සමෘද්ධිලාභියාගේ සල්ලි ටික කපා ගන්නවා සමෘද්ධි අධිකාරියට. නමුත් ඊට අදාළ පොලිය විතරයි සමෘද්ධි බැංකුවට ප්‍රතිපූරණය කරන්නේ. සමෘද්ධිලාභියා අනිවාර්ය ඉතිරි කිරීම් ඉල්ලන කොට, ඒ අනිවාර්ය ඉතිරි කිරීම් ටික ලබා දෙන්නේත් සමෘද්ධි ලාභියාගේ සල්ලිවලින්. මේ විසම චක්‍රය ක්‍රියාත්මක වන කොට මොකක්ද ඇති වන අවසාන ප්‍රතිඵලය? සමෘද්ධි බැංකු ක්‍රමය අනිවාර්යයෙන්ම මේ වැඩසටහන නිසා කඩා වැටෙනවා. සමෘද්ධි අධිකාරිය අර සියයට 50ක සල්ලිවලට කිසිම දවසක වග කියන්නේ නැහැ. එහෙම නම් සමෘද්ධි ලාභියාගේ - මේ රටේ අහිංසක දුප්පත් ජනතාවගේ- සල්ලි ටිකත් ගසා කන මහා සාමයේ ප්‍රතිලාභ ලබා දෙන යුගයකයි අද අපි ජීවත් වන්නේ කියන එක මම කනගාටුවෙන් වුණත් සඳහන් කරන්න ඕනෑ.

එපමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි. විශේෂයෙන්ම සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 16ට අද අලුත් අවුරුදු තෑග්ගකුත් මේ වර්තමාන රජය ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම අලුත් අවුරුද්ද නිමිත්තෙන් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරලා, හැම ග්‍රාම නිලධාරි වසමකින්ම රුපියල් 25,000ක අනිවාර්ය ඉතිරි කිරීම් සමූහයක් ඇති කරන්නට අද පිඹුරු පත් සකස් වෙමින් පවතිනවා. අනිවාර්ය ඉතිරි කිරීම් ගසා කනවා විතරක් නොවෙයි, මේ අලුත් අවුරුද්ද වෙනුවෙන් තවත් රුපියල් 25,000ක් හැම ග්‍රාම නිලධාරි වසමකම සමෘද්ධි සමිතියක් පරිත්‍යාග කරන්නට ඕනෑය කියන නියෝගය අද හෙටම එනවා. ඒක තමයි ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ ජනතාවට ලැබෙන ආශ්චර්යවත් අවුරුදු තෑග්ග. මම අහන්නේ, ඊයේ දවසේ මහ බැංකු වාර්තාව එළි දක්වන කොට අපේ රටේ ජනතාවට ලබා දෙනවාය කියපු peace dividend එක මේකද? සාමයේ ප්‍රතිලාභය මේකද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, විශේෂයෙන්ම අද රජයේ පාර්ශ්වය නියෝජනය කරන දේශ මාමක, ජාති හිතෛෂී, දේශ හිතෛෂී, රටට ආදරය කරන සමඟර මැති ඇමතිවරු ජාත්‍යන්තර ප්‍රජාවට අවලාද එල්ල කරනවා; අභියෝග කරනවා. ඒ අභියෝග කරන අවස්ථාවේ මා මේ උත්තරීතර සභාවට වැදගත් කරුණු කාරණා කීපයක් සඳහන් කරන්නට කැමැතියි අපේ රටේ වෙළෙඳ ක්ෂේත්‍ර පිළිබඳව. විශේෂයෙන්ම අපනයන ගමනාන්තයන් - export destinations, trade destinations ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, අපේ රටේ අපනයන ආදායමෙන් සියයට 20.3ක් ලැබෙන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයෙන්. එය US Dollar මිලියන 2,145ක්. එක්සත් රාජධානියෙන් අපනයන ආදායම එනවා සියයට 10.5ක්. එය US Dollar මිලියන 1,112ක්. එක්සත් රාජධානිය හැර, යුරෝපා හවුලෙන් එනවා සියයට 23.3ක්. එය US Dollar මිලියන 3,576ක්. එතකොට අපේ රටේ අපනයන ආදායමෙන් සියයට 54.1ක් ලැබෙන්නේ යුරෝපා හවුලෙන් සහ ඇමෙරිකා එක්සත්

ජනපදයෙන්. අපේ මුළු අපනයනවලින් සියයට 39.7ක් ඇඟලුම් සහ රෙදිපිළි අපනයන. ඇඟලුම් සහ රෙදිපිළි අපනයනවලින් සියයට 50.6ක ආදායමක් අපි ලබා ගන්නේ යුරෝපා හවුලෙන්. එය US Dollar මිලියන 2,019ක්. අපි සියයට 39.5ක් ලබන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයෙන්. එය US Dollar මිලියන 1,574ක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ යුරෝපා හවුලත්, ඇමෙරිකා එක්සත් ජනපදයත් මොන යම් හෝ හේතුවකට තීන්දුවක් ගත්තොත් අපේ රටට වෙළෙඳ සම්බාධක, අපනයන සම්බාධක පනවනවා කියලා, මොකක්ද අපේ රටට අත්පත් වන ඉරණම? එවන් සම්බාධක පැනෙවුවොත් මොකක්ද අපේ රට ගන්නා ක්‍රියාමාර්ගය? එවන් ඒකපාර්ශ්වික - unilateral sanctions - සම්බාධක ක්‍රියාත්මක වන කොට, අපේ රටේ අපනයන ආදායමෙන් සියයට 54.1ක් ඇමෙරිකා එක්සත් ජනපදයෙන් හා යුරෝපා හවුලෙන් අපට නොලැබුණොත් අපේ රටට මොකක්ද තිබෙන විකල්ප වැඩසටහන? මොකක්ද අපට තිබෙන විකල්ප වැඩ පිළිවෙළ? අපට තිබෙනවාද අපනයන විවිධාංගීකරණයට - export diversification - ලක් වන වැඩසටහනක්? අපේ රටේ අපනයන අවදානමක් - export vulnerability- ඇති වන කොට රටේ ආර්ථික ප්‍රතිපත්ති තීන්දු කරන කේන්ද්‍රීය මුදල් අමාත්‍යාංශයේ කාර්යභාරය මොකක්ද? මේ විශේෂ අවදානම වෙනුවෙන් අපේ යම් කිසි වැඩසටහනක් තිබෙනවාද අවදානම විවිධාංගීකරණය - risk diversification - කරන්න? එහෙම නැත්නම්, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් කොච්චර මත ගැටුම් තිබුණත්, කොච්චර ප්‍රශ්න තිබුණත් ඒ රටවල්වලින් සම්බාධක පැනවීම නතර කිරීමේ යම් කිසි රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාදාමයක් අපේ රටට තිබෙනවාද? මා මේ කරුණ විශේෂයෙන්ම ඉස්මතු කරන්නේ අපේ දේශ හිතෛෂී, ජාති මාමක, දේශ මාමක, වීරෝදාර මැති ඇමතිවරු වේදිකාවලට නැඟලා නොයෙකුත් පුරසාරම් දොඩවන නිසායි. නොයෙකුත් පම්පෝරි ගහන නිසායි. නමුත් ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා, ජාත්‍යන්තර විදේශ සබඳතා ඒ වේදිකාවල ගහන පම්පෝරි හරහා ක්‍රියාත්මක කරන්නට බැහැ. මා කියන්නේ නැහැ ඇමෙරිකා එක්සත් ජනපදය ඉදිරියේවත්, යුරෝපා හවුල ඉදිරියේවත් අපේ රටට දණ ගහන්න කියලා. කිසි සේත්ම නැහැ. රටෙකම, ගමෙකම, අපේකම, අපේ රටේ ස්වෛරීත්වය රැක ගෙන මේ බොරු පම්පෝරි ගැලරි දේශපාලනය නතර කරලා, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් අපේ රටට අහේනියක් නොවන ආකාරයට කටයුතු කළ යුතුයි. මොකක්ද සම්බාධක පැනෙවුතොත් සිදු වන්නේ? අපි විශේෂයෙන්ම ඇඟලුම් ක්ෂේත්‍රය උදාහරණයකට ගනිමු. සෘජුව 350,000ක් ඒකෙන් ප්‍රතිලාභ ලබනවා. වක්‍රව ලක්ෂ 10ක් ප්‍රතිලාභ ලබනවා. ඒකෙන් විපතට පත් වන්නේ රජ මාළිගාවේ සුරසැප විඳින දේශපාලන පෙළැන්තිය නොවෙයි. මේ රටේ මහ පොළොවේ පය ගහලා ජීවත් වන රෙද්ද, බැනියම, සරම ෂර්ට් එක අදින මේ රටේ සාමාන්‍ය ජනතාව බව අපි අමතක නොකළ යුතුයි.

විශේෂයෙන්ම මේ අවස්ථාවේ සංචාරක ක්ෂේත්‍රය ගැනත් සඳහන් කළයුතු වෙනවා. 2011 වර්ෂයේ අපේ රටට සංචාරකයන් 855,975ක් පැමිණියා. 2010 වර්ෂයට වැඩිය සියයට 30.8ක් වැඩි වෙලා. ඉන්දියාවෙන් එනවා, සියයට 20ක්; 171,374ක්. එක්සත් රාජධානියෙන් එනවා, සියයට 12.4ක්; 106,082ක්. ජර්මනියෙන් එනවා, සියයට 6.5ක්; 55,882ක්. ප්‍රංශයෙන් එනවා, සියයට 5.7ක්; 48,695ක්. බටහිර යුරෝපය ගත්තොත් අපේ රටේ සංචාරක පැමිණීම්වලින් සියයට 36.82යි; 315,210යි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බැරි වෙලාවත් මේ රටවල් අපේ රටේ දුර්වල විදේශ ප්‍රතිපත්තිය මත, අපේ රටේ ක්‍රියාත්මක වන හැකියාවෙන් තොර රාජ්‍ය තාන්ත්‍රික නොවන ප්‍රතිපත්ති තුළ අපේ රටට travel bans දැම්මොත්, travel warnings දැම්මොත් - ගමන් කිරීමේ අවදානම් තත්ත්වයන්, සංචාරක වාරණ දැම්මොත්- මොකක්ද අපේ රටට සිදු වන දේ? අන්න ඒ නිසා මම නැවත වරක් පුන පුනාම ප්‍රකාශ කරන්නේ, අපි රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් මේ විදේශ සබඳතා ක්‍රියාත්මක කරලා ස්වෛරීත්වය රැකගෙන, සුහදත්වය වර්ධනය කරගෙන අපේ විදේශ ප්‍රතිපත්තිය අපි ක්‍රියාත්මක කරන්නට ඕනෑය කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය, ඒ වාගේම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ දිහා බැලුවාම මැද පෙරදිගින් අපට හම්බ වෙනවා, සියයට 58.9ක්; US Dollar මිලියන 3,030ක්. යුරෝපා සංගමයෙන් ලැබෙනවා, US Dollar මිලියන 885ක්. සියයට 17.2ක්. අපේ විදේශ රැකියාවලින් සියයට 80.3ක් යන්නේ මැද පෙරදිග ඉස්ලාමීය භක්තික රටවලටයි. අපේ රටේ සමාජ තන්ත්‍රය තුළ ක්‍රියාත්මක වන මේ නොහොබිනා ආගම්වාදය, ජාතිවාදය, කුලල් කෑම ජාතික සමඟිය සම්පූර්ණයෙන්ම විනාශ මුඛයට ගෙන යනවා. මේ අන්තවාදය ප්‍රවර්ධනය වෙලා බැරි වෙලාවත් මැද පෙරදිග රටවල් අපේ රටේ සේවකයින්ට යම් වාරණයක් දැම්මොත් රටට මොකක්ද සිදු වන්නේ? රටට අත් වන ඉරණම මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගැලරි දේශපාලනයෙන් ඉවත් වෙලා, පම්පෝරි දේශපාලනයෙන් ඉවත් වෙලා, උඩඟු, කුහක, නොහොබිනා දේශපාලනයෙන් ඉවත් වෙලා ජනතාව ජීවත් කරවන, රට රකින, මව්බිම සුරක්ෂා කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ඉතාමත් යෝග්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම ආර්ථික න්‍යාය පිළිබඳව කථා කරන්න ඕනෑ. අද ආර්ථික න්‍යායාත්මක පැත්තෙන් අපේ රට ලොකු උගුලකට පාත්‍ර වෙලා තිබෙනවා. ඒ තමයි තෙරපුම් ප්‍රතිවිපාකයේ බලපෑම. ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා නම් crowding-out effect. මොකක්ද ඒකේ තේරුම? පෞද්ගලික අංශවලට දේශීය බැංකුවලින් ණය ගැනීම මහා ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට තව විනාඩියක කාලයකුයි තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි එකක කාලයකුයි තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට කථා කරන්න විනාඩි 43ක කාලයක් තිබෙනවා. මම පටන් ගත්තේ පස් වරු 2.05ට.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි 33යි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. විනාඩි 43යි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. වැරැද්ද නිවැරැදි වෙනවා. මට විනාඩි 43ක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම හරි නේද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හරි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි. මම වග කීමෙන් කටයුතු කරන්නේ. බොරු කියන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී මූලාසනය සඳහා ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තෙරපීමේ විපාකය ගැන කථා කරන කොට, බලපෑම් ගැන කථා කරන කොට අද පෞද්ගලික අංශයට දේශීය බැංකුවලින් ණය ගැනීම බරපතළ ගැටලුවක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අද පෞද්ගලික අංශයේ ඉල්ලුමට සරිලන සම්පත් හිඟයක් පවතිනවා. විශේෂයෙන්ම අය වැය හිඟය පියවන්නට, පාඩු ලබන රාජ්‍ය ආයතන නඩත්තු කරන්නට අද රජය තරගයට බැංකුවලින් ණය ගන්නවා. මේ රාජ්‍ය ණය ගැනීම වැඩි වීම තුළින් මොකක්ද වෙලා තිබෙන්නේ? රාජ්‍ය ණය ඉල්ලුම වැඩි වෙලා. රාජ්‍ය අංශයට සම්පත් ගලා යාම වැඩි වෙලා. පෞද්ගලික අංශයේ බරපතළ මූල්‍ය හිඟයක් -මුදල් හිඟයක්- අද ඇති වෙලා තිබෙනවා. පෞද්ගලික අංශය ලාභදායී ව්‍යාපාර සඳහා අරමුදල් හොයන්න යන කොට මේ හිඟතාව නිසා -විශේෂයෙන්ම රජය පාඩු ලබන රාජ්‍ය ආයතන නඩත්තු කිරීම සඳහා පෞද්ගලික බැංකුවලින් ණය ගැනීම නිසා- තෙරපුම් ප්‍රතිවිපාකයේ බලපෑම්වලට - crowding-out effect එකට - අද පාත්‍ර වෙලා තිබෙනවා.

මම උදාහරණයක් කියන්නම්. 2013 වසරේ ජනවාරි මාසයේ පෞද්ගලික අංශයට ලබා ගත හැකි වූ ණය ප්‍රමාණය රුපියල් බිලියන 5.3යි. නමුත් රජය පාඩු ලබන ආයතන නඩත්තු කරන්න, අය වැය හිඟය පියවන්න බැංකු මඟින් ලබා ගෙන තිබෙන සම්පූර්ණ ණය ප්‍රමාණය රුපියල් බිලියන 55.4ක්. පෞද්ගලික අංශයට වැඩිය දහ ගුණයක් වැඩියෙන් රාජ්‍ය අංශය ණය අරගෙන තිබෙනවා. මේක හිතකර කාරණාවක් නොවන බව මම මතක් කරන්න කැමැතියි.

2012 වසරේ දෙසැම්බර් මාසයේ සියයට 17.6ක්වූ පෞද්ගලික අංශයේ ණය ලබා ගැනීමේ වර්ධනය 2013 වසරේ ජනවාරි මාසය වන විට සියයට 15.5 දක්වා පහත වැටිලා තිබෙනවා. විශේෂයෙන්ම මේ තෙරපුම් ප්‍රතිවිපාකයේ බලපෑම් පිළිබඳව හොඳ අධ්‍යයනයක් කරලා, හොඳ අවබෝධයක් ලබා ගෙන පෞද්ගලික අංශයට ලබා දිය යුතු සම්පත් පෞද්ගලික අංශයට ගලා යන්නට ප්‍රවේශය සකස් කිරීම වැදගත් වනවා. රජයේ ණය ගැනීම තුළින් පෞද්ගලික අංශය තෙරපීමට ලක් කිරීම රටේ ආර්ථික වර්ධනයට අහිතකරයි කියන එකත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පාර්ශ්වය තුළින් අපට අහන්න ලැබෙනවා, අපේ රටේ ඒක පුද්ගල ආදායම විශාල ලෙස ඉහළ ගිහිල්ලා කියලා. ඒක ඇත්ත. 2005 වසරේදී ඇමෙරිකානු ඩොලර් 1,241ක්ව තිබුණු ඒක පුද්ගල ආදායම 2011 වසර වෙන කොට 2,804 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. රුපියල්වලින් ගත්තොත් එය 124,709 ඉඳලා 313,511 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඩොලර්වලින් ගත්තොත් සියයට 126ක වර්ධනයක්. රුපියල්වලින් ගත්තොත් සියයට 117.5ක වර්ධනයක්. දැන් ආණ්ඩුවේ ඉලක්කය වෙලා තිබෙන්නේ 2016 වසර වෙන කොට ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,000 කිරීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඒක පුද්ගල ආදායම රුපියල්වලින් ගත්තොත් සියයට 117.5න් ඉහළ යන කොට, ඒක පුද්ගල ණය බරතාව සියයට 158කින් වැඩි වෙලා තිබෙනවාය කියන එකත් අමතක කරන්න එපා. ඒක පුද්ගල ආදායම කොපමණ වැඩි වුණත් වැඩක් නැහැ, ඊට වැඩිය වේගයකින් ණය බරතාව වර්ධනය වනවා නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ආණ්ඩුව තවත් පැත්තකින් පම්පෝරි ගහනවා, විශාල විදේශ සංචිත ප්‍රමාණයක් තිබෙනවා කියලා. විදේශ සංචිතවලින් ආවරණය කළ හැකි වූ 1.8ට තිබුණු ආනයනික මාස ගණන 2011 වසර වන විට 4.3 දක්වා වර්ධනය වෙලාය කියලා ආණ්ඩුව පම්පෝරි ගහනවා. ඒ කියන්නේ විදේශ සංචිත වැඩි වෙලා ලු. එය ඇත්ත. ලෝකයටම ණය වෙලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන්, විවිධ රටවලින් ගිනි පොලියට සල්ලි ගන්න කොට අනිවාර්යයෙන්ම සංචිත ප්‍රමාණය වැඩි වනවා. නමුත් ඔය ගිනි පොලියට ගන්නා වූ ණයවලින් විපතට පත් වන්නේ රටේ ජනතාවයි. අසහනයට පත් වන්නේ රටේ ජනතාවයි. ණය බරතාව ඒක පුද්ගල ආදායමටත් වැඩිය වේගයකින් ඉහළ යන කොට ඇත්ත වශයෙන්ම මූර්ත ඒක පුද්ගල ආදායම සෘණ ආදායමක් බවට පත් වනවා කියන එක මම මේ අවස්ථාවේ වග කීමෙන් ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරන්නට පෙර තවත් කාරණයක් සඳහන් කළ යුතු වනවා. මේ රජයට ව්‍යාවස්ථාමය වග කීමක් තිබෙනවා. ඒ ව්‍යාවස්ථාමය වගකීම තමයි රටේ ජනතාව ශක්තිමත් කිරීම; රට සංවර්ධනය කිරීම; රට කෙටි, මධ්‍ය, දීර්ඝ කාලීන ඉලක්ක කරා ගෙන යාම; රටට සෞභාග්‍ය උදා කරලීම. නමුත් අපේ රටේ පශ්චාත් යුද සමයේ අපේ රටට ලැබිලා තිබෙන්නේ ආශ්චර්යවත් විශ්මයජනක සුභසාධන කප්පාදුවක් පමණයි. විශේෂයෙන්ම මේ රජය ව්‍යාවස්ථාමය වගකීම පැහැර හැරලා මේ රටෙහි පාලක පරපුරට, ලැම්බෝගිනි පරපුරට, ඩෙම්ලර් පරපුරට, ජගුවර් පරපුරට, ක්‍රයිස්ලර් පරපුරට ලොකු හැන්දකින් බෙදා හදා ගන්නවා. මේ රටේ සිටින ලක්ෂ 200ක්වූ සාමාන්‍ය ජනතාවට සොච්චම් හැන්දකින් ලෙවකන්න බෙදන යුගයකයි අද අපි මේ විවාදයට සහභාගි වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු මොනවා කථා කළත් අද අපේ රටේ තිබෙන්නේ දැයට කිරුළක් නොවෙයි, රටේ ජනතාවගේ බෙල්ලට තොණ්ඩුවක්. දැයට කිරුළක් නොවෙයි, බෙල්ලට තොණ්ඩුවක්. අද අපේ රට ගොඩ නහන නිල් රැල්ලක්

නැහැ. රට වනසන නිල් සාපයක් තිබෙන්නේ. රට කාබාසිනියා කරන, රටේ ප්‍රභූ පරපුර රජ කරවන පාලන තන්ත්‍රයක් පමණයි අද අපේ රටේ තිබෙන්නේ. ඇයි, මම "දැයට කිරුළක් නොවෙයි බෙල්ලට තොණ්ඩුවක්" කියලා කියන්නේ. තමුන්නාන්සේ දන්නේ නැහැ, බුද්ධංගල ආරණ්‍ය සේනාසනයට සම්බන්ධ වන සංරක්ෂිත භූමියේ අක්කර 10ක් සම්පූර්ණයෙන්ම කප්පාදු කරලා තිබෙනවා. මොනවාටද? දැයට හෙණයේ රථ ගාල හදන්න. බෙල්ලට තොණ්ඩුවේ රථ ගාල හදන්න වන සංරක්ෂණ භූමියෙන් අක්කර 10ක් සම්පූර්ණයෙන්ම විනාශ කර තිබෙනවා. අන්න ඒකයි දැයට කිරුළ වෙනුවට රටේ ජනතාවගේ බෙල්ලට තොණ්ඩුව කියලා මම කියන්නේ. අන්න ඒ නිසා විශේෂයෙන්ම මම ඉල්ලීමක් කරනවා - [බාධා කිරීමක්]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය, මොකක්ද ඔබතුමියගේ රීති ප්‍රශ්නය.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් විනාශ කළා කියන එක අසත්‍ය කාරණයක්. එහෙම නම් ඔප්පු කර පෙන්වන්න කියා මා ගරු මන්ත්‍රීතුමාට කියනවා. අම්පාර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු විධියට අපි වගකීමක් ඇතිවයි මේ කාරණය සඳහන් කරන්නේ. එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ. අඩු තරමින් ගසක අත්තක්වත් අනවශ්‍ය විධියට කපා හැරීමක් කර නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, කරුණාකර පාර්ලිමේන්තුවට නිවැරදි කරුණු -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න ඉඩ දෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරන කරුණු නිවැරදිව ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග අනුවයි මා මේ කථා කරන්නේ. මම වග කීමෙන් ප්‍රකාශ කරනවා, බුද්ධංගල වනජීවී සංරක්ෂණ භූමියෙන්, දැයට කිරුළේ නාමයෙන් බෙල්ලට තොණ්ඩුවක් දමන්නට අක්කර 10ක් ශුද්ධ කර තිබෙන බව. වගකීමෙන් කියන්නේ. ඒක මට වගකීමෙන් ප්‍රකාශ කරන්න පුළුවන්. ඒක ස්ථාවර නියෝගවලට එකඟයි. අන්න ඒ නිසා - [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා ඒ පිළිබඳ වගකීම දරනවා නම්- [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වගකීම දරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරන්න අවස්ථාව දෙන්න.[බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමාට වැරදිලා. තොණ්ඩුව දමන්නේ එක්සත් ජාතික පක්ෂය එතුමාගේ බෙල්ලට. ඒක තමයි අපි කෞතුකාගාරයට යවන්නේ. යූඑන්පී තොණ්ඩුව- [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා, කථාව කරගෙන යන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දවසේ මහ බැංකු වාර්තාව එළි දක්වපු මොහොතේ -මගේ කථාවේ ආරම්භයට මා මේ යන්නේ- මහලොකුවට කථා කළා, සියයට 6.4ක ආර්ථික වර්ධන වේගය ගැන. නමුත් ධීවරයින්ගේ ඉන්ධන සහනාධාර කප්පාදුවේ ඉඳලා, ගොවි විශ්‍රාම වැටුප කප්පාදුවේ ඉඳලා, පොහොර සහනාධාරය කප්පාදුවේ ඉඳලා, දිවා ආහාරය කප්පාදුවේ ඉඳලා, සමෘද්ධි සහනාධාර ලබන සාමාජිකයින්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් කප්පාදුවේ ඉඳලා මට කරුණු කාරණා, දත්ත සහිතව හෙට උදේ වෙනකම් කථා කරන්න පුළුවන්. මේ මහලොකුවට කථා කරන ආශ්චර්යවත් විස්මිත ආණ්ඩුව මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු කිරීමකයි පශ්චාත් යුද සමයේ නිරත වෙලා සිටින්නේ. අවසාන වශයෙන් මා තව කාරණයක් කියන්න කැමැතියි. අද ආණ්ඩුව මහ ලොකුවට යුද ජයග්‍රහණයේ ප්‍රතිලාභය ගැන කථා කරනවා. සිවිල් ආරක්ෂක නිලධාරින් කිස්අටදහසක් ඉන්නවා. අපේ රටේ මායිම් ගම්මාන ආරක්ෂා කරපු සිවිල් ආරක්ෂක නිලධාරින්. ඒ සිවිල් ආරක්ෂක නිලධාරින් නිසා තමයි යුද හමුදාව, ත්‍රිවිධ හමුදාව, කමාන්ඩෝ භටයන් යුද පෙරමුණට ගිහිල්ලා අර නීච, නින්දිත කොටින් සමඟ සටන් කළේ. සිවිල් ආරක්ෂක නිලධාරින්ට පිං සිද්ධ වෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ අයගේ රැකියාව ස්ථිර කරන්න බැරි ආණ්ඩුවක්, විශ්‍රාම වැටුප් ලබා දෙන්න බැරි ආණ්ඩුවක්, පොලිස් ආරක්ෂක සහායකයින්ගේ වැටුප් වර්ධක ලබා දෙන්න බැරි ආණ්ඩුවක්, නිත්‍ය පොලිස් සේවාවට ඒ අයව අන්තර්ග්‍රහණය කරන්න බැරි ආණ්ඩුවක් තමයි රට පාලනය කරන්නේ. මේ කාඩ්බෝඩ් වීරකම්වලින්, කාඩ්බෝඩ් දේශ හිතෛෂිත්වයෙන්, ජාති හිතෛෂිත්වයෙන් වැඩක් නැහැ. රටේ ජනතාවගේ බඩට කටට, ඇහට පතට දැනෙන ආශ්චර්යයක් උදා කරන්නට ඔබතුමන්ලාට ධෛර්ය, ශක්තිය ලැබේවා, කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා.

[අ.භා.2.46]

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මා සිංහල භාෂාවෙන් වචන කිහිපයක් කථා කරන්න බලාපොරොත්තු වනවා. මා ඉස්සෙල්ලාම පුංචි කථාවක් කියන්න කැමැතියි.

ගමක හොඳ තෙල් වෙළෙන්දෙක් සිටියාලු. ඒ තෙල් වෙළෙන්දා හොඳට තෙල් වෙළෙඳාම කර ගෙන සිටියා. ඔහු හොඳ තෙල් විකුණන්නේ නැහැ, කලවම් කරලා බාල තෙල් තමයි විකුණන්නේ. දැන් ඔහු වයසට ගිහින්. එහෙම වෙළෙඳාම කර ගෙන ඉන්න අතර ඔහු කරපු පව් නිසා අන්තිම මොහොතේ ඔහුට අංශ භාගය රෝගය හැදිලා ඉතා අමාරුවෙන් තමයි ඉඳලා තිබෙන්නේ. ඔහුගේ පුතාට ඔහු කියා තිබෙනවා, "මා මේ වාගේ තෙල් වෙළෙඳාම කරපු නිසා තමයි මට මෙහෙම වෙලා තිබෙන්නේ. ඔබ එහෙම කරන්න එපා. ඔබ හොඳ තෙල් විකුණන්න. එතකොට මිනිස්සු ඔබව පිළිගන්නවා"යි කියලා. ඒ තෙල් වෙළෙන්දා මිය ගියාට පස්සේ ඔහුගේ පුතා ඒ තෙල් වෙළෙඳාම පටන් ගෙන තිබෙනවා. පුතා තෙල් කලවම් කරන්නේ නැතුව හොඳ තෙල් තමයි විකුණා තිබෙන්නේ. නමුත් මිනිස්සු ඒ තෙල් අරගෙන ගිහින් පසුව දා ආපසු අරගෙන ආවාලු, තෙල් හොඳ නැහැයි කියලා return කරන්න. "තාත්තා හොඳ තෙල් දුන්නා. ඔබ බාල තෙල් දෙනවා"යි කියලා ඒ මිනිස්සු පුතාට චෝදනා කරලා තිබෙනවා. ඒ වාගේ තමයි, අද මේ රටේ ජනාධිපතිතුමා කොච්චර හොඳ දෙයක් කළත් විපක්ෂය ඒක පිළිගන්නේ නැහැ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බාල තෙල්.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
බාල තෙල් පිළිගන්න තමයි මේ ගොල්ලෝ සූදානම් වෙලා ඉන්නේ. එහෙම පුරුදු කරලා. ඒ පුරුද්ද වෙනස් කරන්න ඕනෑ.

දැන් බලන්න. දැයට කිරුළ, දිවි නැඟුම, ගම නැඟුම, අලුත් airport එකක්, අලුත් harbour එකක් තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ ලේකම්තුමා අද කොළඹ නගරය කොච්චර ලස්සන කරලා තිබෙනවාද? මේවා කවුරුත් පිළිගන්නේ නැහැ. මේ ගොල්ලෝ තවම අර පරණ තෙල් විකුණන ක්‍රමයට තමයි යන්නේ. අර අලුත් තෙල් පිළිගන්නේ නැහැ. එම නිසා විපක්ෂයට කියන්න මා බලාපොරොත්තු වනවා, අර අලුත් තෙල් විකුණන පුතාගේ තෙල් පිළිගන්න කියලා.

இன்று உண்ணாட்டரசிறை (திருத்தச்) சட்டமூலம், நொத்தாரிசு (திருத்தச்) சட்டமூலம், ஆவணப் பதிவு (திருத்தச்) சட்டமூலம், அற்றோனித் தத்துவம் (திருத்தச்) சட்டமூலம் போன்ற பல்வேறு சட்டமூலங்கள் விவாதத்திற்கு எடுத்துக்கொள்ளப்பட்டிருக்கின்றன. ஒரு நாடு அல்லது ஓர் அரசாங்கம் மக்களுக்கு நல்ல செயற்பாடுகளைச் செய்யவேண்டுமானால் நிச்சயமாக வரி பெற வேண்டும். வரி பெறாது ஓர் அரசாங்கம் எதையுமே செய்ய முடியாது. ஆகவே, இந்த வரி மதிப்பீடுகள் மீள்பரிசீலனை செய்யப்பட்டிருப்பது மிகவும் வரவேற்கத்தக்கது என்று சொல்வதைவிட அத்தியவசியமானது என்று சொல்லலாம். ஏனென்றால், 1976ஆம் ஆண்டுக்குப் பிறகு, அதாவது 36 வருடங்களுக்குப் பின்னர், இந்தச் சட்டமூலங்களின் ஊடாகச் சில திருத்தங்கள் முன்வைக்கப்பட்டிருக்கின்றன.

1976 දී amendments ගෙනැල්ලා තිබෙනවා. ඊට පස්සේ amendments ගෙනැල්ලා නැහැ. අවුරුදු 36කට පස්සේ මේ amendments ගෙනැල්ලා රටේ ඉදිරි වැඩ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. රටක වැඩක් කරන්න ආදායම ලැබෙන්න ඕනෑ. ආදායම උපදවන්න ඕනෑ. එහෙම නැතුව කරන්න බැහැ. මා හිතන හැටියට පසු ගිය දවස්වල extract එකක් ගන්න රුපියල් 5ක් තමයි වැය වුණේ. රුපියල් 5කට extract එකක් ගන්න පුළුවන්ද? අද පත්තර කැල්ලක් කීයක් වෙනවාද? එහෙම කරන්න බැහැ. ඒ වාගේ වැඩ කිහිපයක් රටේ ජනාධිපතිතුමා, ආණ්ඩුව කරලා තිබෙනවා. අපි ඒක පිළිගන්න ඕනෑ. ඒක පිළිගන්නේ නැතුව විවේචනය කරන එක නොවෙයි කළ යුත්තේ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු මන්ත්‍රීතුමනි, එදා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරලා පිටපතක් ලබා ගන්න මාස ගණනක් බලා ගෙන ඉන්න ඕනෑ. අද විනාඩි 5කින් ගන්න පුළුවන්.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
අද විනාඩි 5කින් ගන්න පුළුවන්. අද licence එක විනාඩි 5කින් ගන්න පුළුවන්. අද Birth Certificate එකක් විනාඩි 3කින් ගන්න පුළුවන්. ඒ වාගේ පහසුකම් ගැන හිතන්න ඕනෑ. එම නිසා ඒ ගැන පොඩ්ඩක් සොයා බලන්න.

මට තව කාරණයක් කියන්න තිබෙනවා. ඒ සඳහා මා මේ අවස්ථාව උපයෝගි කර ගන්නවා. සමහරු කියනවා, ඉන්දියාවේ දෙමළ චිත්‍රපට ලංකාවට ගෙන්වන්න එපාය කියලා. ඒ ගැන මගේ විරුද්ධතාවය හා කනගාටුව මේ සභාවේදී මා ප්‍රකාශ කරනවා.

இந்தியாவினுடைய தமிழ்த் திரைப்படங்கள் இங்கு கொண்டுவரப்படக்கூடாதென்று ஒரு சிலர் பேசியிருக்கிறார்கள். இது மிகவும் வருந்தத்தக்க ஒரு விடயம். தமிழ்நாட்டிலே அவர்களுக்குரிய அரசியல் பிரச்சினை வேறு! கலை, கலாசாரம் வேறு! அதேபோல, இங்கிருந்து கிரிக்கெட்

වීරයන්ගේ අංකය සෙල්ලම්පොලුව කට්ටායම අවයවයන්ගේ ඒත්තුක්කොල්ල වේණ්ඩුම්. අවයවයන්ගේ ඒත්තුක්කොල්ලා විට්ටාල් අදු ඉලංගෙක්කුච් සෙය්කින්ර ඔරු තුරෝහම් එන්පතේ එන්නුඩෙය කරුත්තාකුම්. ජෙයලලිතාවාක ඉරුක්කලාම්, කරුණානිතියාක ඉරුක්කලාම්! යාරාකවුම් ඉරුක්කලාම්! එංකළුඩෙය විළෙයාට්ටු වීරර්කළ් ඉන්දියාවුක්කුච් සෙල්ලුම්පොලුදු නිච්චයමාක අවර්කළ් අංකු වරවේර්කප්පඩ වේණ්ඩුම්.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)

කෞරව උරුප්පිනර් අවර්කළේ, එම්.ජී.ආර්. අවර්කළ් ඉලංගෙයිලේ පිරන්දවර්. මුරලිදරන් තමිළ්නාට්ටිලේ තිරුමණම් සෙය්තිරුක්කිරාර්. පාරුංගළ්! ජෙයලලිතා අම්මා එප්පඩි අනියායම් සෙය්කිරාර් එන්රු? ඉංකේ පිරන්ද අන්ද එම්.ජී.ආර්. අවර්කළුඩෙය ආට්කළ් අංකේ මණමුඩිත්ත මුරලිදරනෙ අංකු වරක්කූඩාදෙන්රු සොල්වදු නියායමා? තර්මමා?

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(මාණ්පුමිකු වී.එස්. ඉරාදාකිරුෂ්ණන්)
(The Hon. V.S. Radhakrishnan)

මගේ වෙලාවට ඒක එකතු කරන්න එපා. එතකොට මගේ වෙලාවෙන් කැපෙනවා.

අපි බලාපොරොත්තු වෙනවා, මෙහි සිටින ක්‍රීඩකයෝ එහි යනකොට හොඳ පිළිගැනීමක් දෙන්නට ඕනෑ කියන එක. තමිල්නාඩුවේ නොවෙයි ඕනෑම පළාතක. තමිල්නාඩුවට යනවා කියලා කවුරුවත් යන්නේ නැහැ. අපි යන්නේ ඉන්දියාවට. ඒ නිසා ඉන්දියාව අපව පිළිගන්නට ඕනෑ. ඒ විධියට කවුරුහරි තමිල්නාඩුවේ ඉඳලා ආවානම්, අපි ඒ අය තමිල්නාඩුවේ අය කියලා බලන්න හොඳ නැහැ. ඒ අය ඉන්දියාවේ කට්ටිය. ඒ රටවල් දෙක අතර තිබෙන සම්බන්ධතාවය මත තමයි අපි ඒ අයව පිළිගන්නට ඕනෑ. එහෙම නැතිව මේ අය තමිල්නාඩුවේ කට්ටිය, එහෙම නැත්නම් මේ අය ලංකාවේ කට්ටිය කියලා, එහෙමත් නැත්නම් මේ අය දෙමළ, සිංහල කියලා බෙදන්න හොඳ නැහැ. හැමදාමත් අපි කලාවටත්, ක්‍රීඩාවටත් මුල් තැන දෙන්නට හිතන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් භේද ඇති කර ගන්නට හොඳ නැහැ යි කියන එක තමයි මම කල්පනා කරන්නේ.

ඉන, මත පේතංකළුක්කු අප්පාර්පට්ටු කලෛ, කලාසාරත්තුක්කුම් මර්රුම් එංකළුඩෙය විළෙයාට්ටු වීරර්කළුක්කුම් උදවි අළිප්පදර්කාන වසදියෙ නාංකළ් සෙය්තුකොටුක්ක වේණ්ඩුම්. ඉන්රු ඉන්දිය පිරපල නටිකර්කළ් අංකු උණ්ණාවිරදම් ඉරුක්කින්රාර්කළෙන්රු සොල්කිරාර්කළ්. අවර්කළුඩෙය තිරෛප්පටත්තෙ ඉංකු ඉරක්කුමදි සෙය්යක්කූඩාදෙන්රුම් සොල්කිරාර්කළ්. ආනාල්, ඉන්දියාවුක්කුම් ඉලංගෙක්කුමිඩෙයිල් කිට්ටත්තට්ට 66 වරුඩංකළාක කලෛ සම්පන්දමාන තොඩර්පු ඉරුක්කින්රදු. ඉන්දියාවිනුඩෙය තිරෛප්පඩංකළ්තාන් මුදලිලේ ඉලංගෙක්කු වන්දිරුක්කින්රන. ඉන්රු ඉංකිරුක්කින්ර පෙරුම්පාලාන සිංකළ මක්කළ්කූඩ තමිල්, හින්දිප් පඩංකළෛත්තාන් පාර්ක්කින්රාර්කළ්.

මෙහි සිටින සිංහල ජනතාවත් වැඩි වශයෙන්ම බලන්නේ, දෙමළ films හෝ හින්දි films. ඒ තරම් ඒවා famous වෙලා තිබෙනවා. නමුත් දැන් ඒවා නතර කරන්න ගියොත් තවත් කෝලාහලයක් එන්නට පුළුවන්. එහෙම නැත්නම් එවැනි දෙයක් ඇති කරන්නට පුළුවන්. ඒකට ඉඩ දෙන්නට හොඳ නැහැ කියන එක තමයි මා කියන්න බලාපොරොත්තු වන්නේ. [බාධා කිරීමක්] 1983 වසරේ කලබල ඇති වුණාට පසුව ඉන්දියාවත්, ලංකාවත් අතර සම්බන්ධතාව වැඩි වෙලා තිබෙනවා. ඒක නතර කරන්නට කවුරු හරි උත්සාහ කරනවා නම් ඒක වැරැදියි කියලා මම මේ ගරු සභාවට කියන්නට උත්සාහ කරනවා.

කෞරව තලෛමෙදාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉව්වාරාන නිකළ්ච්චිකළෙ නාංකළ් පාර්ත්තිරුක්කිරෝම්. චිර්චිල අමෛප්පුක්කළ් මර්රුම් අරචියල් කට්චිකළ්කූඩ ශ්‍රීලංකාවුක්කු තමිළ්ත් තිරෛප්පඩංකළෛ ඉරක්කුමදි සෙය්යක්කූඩාදෙන්රු සොල්කින්රන. ඉව්වාරාන ඔරු සූළ්නිලෛ ඉලංගෙයිලේ මීණ්ඩුම් එර්පඩක්කූඩාදෙන්පදු එන්නුඩෙය කරුත්තාකුම්.

අඩුත්තදාක, අණ්මෙයිලේ තෝට්ටත් තොළිලාළර්කළුක්කු චම්පළ උයර්වු කිටෛක්කප්පෙර්රදු. ඉන්දච් චම්පළ උයර්වු පෝදාදෙන්පදෙත් තනිප්පට්ට මුරෛයියිලුම් එනදු කට්චි චාර්පිලුම් මලෛයක මක්කළ් මුන්නණි චාර්පිලුම් නාන් ඉන්ද චපෛක්කුච් චුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්. ඒනෙන්රාල්, පාරාළුමන්රත්තිලේ ඉදු කවනත්තුක්කු එදුත්තුක් කොළ්ළප්පඩාවිට්ටාලුම් ඉදු පාරාළුමන්රම් මූලමාක තෙරිවිත්තුක්කොළ්ළප්පඩ වේණ්ඩිය ඔරු විඩයම්. ඒර්කෙනවේ 380 රූපායාක ඉරුන්ද චම්පළම් ඉප්පොළුදු 450 රූපායාක අදිකරික්කප්පට්ටිරුක්කිරදු. අදන්මූලම් 70 රූපාය්දාන් චම්පළ අදිකරිප්පු කිටෛත්තිරුක්කිරදු. ඉන්ද 70 රූපාය් චම්පළ අදිකරිප්පු එන්පදු මිකවුම් චොර්පමාන අදිකරිප්පාකවේ කණික්කප්පඩුකින්රදු. ඒනෙන්රාල්, ඉම්පදු චදවීදත්තුක්කුම් අදිකමාක එංකළුඩෙය වාළ්ක්කෛච් චෙලවු ඉන්රු අදිකරිත්තිරුක්කින්රදු. ඉව්වාරු වාළ්ක්කෛච් චෙලවු උයර්න්තිරුක්කුම්පොළුදු ඉන්ද මාදිරියාන චොර්ප චම්පළ උයර්වු එංකළ් මක්කළෛප් පාදිත්තිරුක්කින්රදු එන්පදෙ නාන් ඉන්ද චපෛක්කු චුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්. එනවේ, එදිර්කාලත්තිලේ තෝට්ටත් තොළිලාළර්කළුක්කු නියායමාන චම්පළ උයර්වෛක් කොටුක්ක වේණ්ඩුමෙන්රු කේට්ටු, එනක්කු වාය්ප්පළිත්ත උංකළුක්කු නන්රි කූරි, විටෛපෙරුකින්රේන්.

[අ.භා. 2.55]

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(මාණ්පුමිකු වෛ.ජී. පත්මසිරි)
(The Hon. Y.G. Padmasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සංශෝධන පනත් කෙටුම්පත් හතරක් පිළිබඳව අපි විවාද කරනවා. මේ රටේ දීර්ඝ ඉතිහාසයක් ඇති ආඥාපනත් තුනකටම අද දින සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. මෙහිදී මා සඳහන් කරන්නට ඕනෑ, විශේෂයෙන්ම අපේ ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමාට, නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත, ඒ වාගේම ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත අදාළ වන බව. මේවා අවුරුදු 100කට අධික ඉතිහාසයක් ඇති පනත්. විශේෂයෙන්ම 1840 අංක 7 දරන ව්‍යවස්ථාගත වැළැක්වීමේ ආඥාපනතින් පසුව තමයි නොතාරිස් ආඥාපනත ඇති වෙලා තිබෙන්නේ.

මේ රටේ වැඩවසම් ආර්ථික ක්‍රමයෙන් ධනවාදී ආර්ථික ක්‍රමයකට ගමන් කිරීම සඳහා එවකට පැවැති ව්‍යිතාන්‍ය පාලන ක්‍රමය ඇති කරපු මූලික නීති පද්ධතින් කිහිපයක් තමයි, මේ. මේ ලේඛන ලියාපදිංචි කිරීමෙන් වටිනාකමක් ලබා දුන්නා. ඒ යුගයට එය අත්‍යවශ්‍ය වෙලා තිබුණා. මේ යුගය දක්වාම ඒක අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා.

අපි අහලා තිබෙන ඉතිහාස තොරතුරු අනුව පැරණි අය තමන් විසින් භුක්ති විඳපු ඉඩමක පස් මිටක් අරගෙන "අද ඉඳලා ඔබටයි මෙහි අයිතිය" කියලා කාට හරි පැවරුවාට පසුව ඒ අය නැවත

[ගරු වයි.ජී. පද්මසිරි මහතා]

කවදාවත් ඒ ඉඩම දිහාවට ගිහින් නැහැ. ඒ වාගේම අතපැන් වක්කරලා ඒ ඉඩමේ අයිතිය යම් කෙනෙකුට පැවරුවා නම්, ආයෙත් කවදාවත් ඒ ඉඩමට ගිහින් නැහැ. එවැනි තත්ත්වයක් එම වැඩවසම් යුගයේ තිබිලා තිබෙනවා. නමුත් මුදල්වලට තිබෙන ආශාව වැඩි වන්නට, වැඩි වන්නට, වංචාව හා දූෂණයත් වැඩි වුණා. ඒ නිසා මේ නීති රීති ලියා පදිංචි කිරීමේ අවශ්‍යතාව ඕනෑවටත් වඩා වැඩි වෙලා තිබෙනවා. එක්දහස් අටසිය ගණන්වල දී එවැනි යම් වුවමනාවක් තිබුණා නම්, ඒක අද ඊටත් වඩා වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මේ පනත්වල වටිනාකම අද තවත් පුළුල් වෙමින් පවතිනවා. ඒ වාගේම මේවාට අදාළ ගාස්තු බොහෝ කාලයකින් වෙනස් වෙලා නැහැ.

ඒකට මම හොඳ උදාහරණයක් කියන්නම්. නොතාරිස් ආඥාපනතේ 27වැනි වගන්තියට අදාළව අධිකරණයෙන් ගන්නා ඒ වාර්ෂික අවසර පත්‍රයට මේ දක්වාම අය කළේ රුපියල් 10යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට සඳහන් කරන්න කැමැතියි මේ අප්‍රේල් 05වැනි දාට මගේ නොතාරිස් වෘත්තියටත් අවුරුදු 40ක් සම්පූර්ණ වුණු බව. මේ අවුරුදු 40ටම මේ වාර්ෂික බලපත්‍රය ගන්න මට රුපියල් 400යි ගිහින් තිබෙන්නේ. ඒක හරි අසාධාරණයි. අපේ ඇමතිතුමා ඒ මුදල රුපියල් 1,000ක් කිරීම ඉතාම සාධාරණයි. තමන්ගේ වෘත්තීය සහතිකය ලබා ගැනීමට නොතාරිස්වරයෙක් අවුරුද්දකට රුපියල් 1,000ක් ගෙවිවාට කමක් නැහැ. එය ඉතාම සාධාරණයි. මම ඉහළින්ම එය අනුමත කරනවා.

ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේදී සහ අවලංගු කිරීමේදී අය කරන මුදල රුපියල් 1,500ක් දක්වා වැඩි කර තිබෙනවා. ඒකෙත් කිසි ගැටලුවක් නැහැ. නමුත් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතට අදාළව වැඩි කරපු මිල ගණන් කීපයක් නම් ජනතාවට ටිකක් දැනෙනවා. මම උදාහරණයක් කියන්නම්. අපි පෙර ගනුදෙනු පරීක්ෂා කිරීමේදී, පත් ඉරු පරීක්ෂා කිරීමේදී ඒ පොතක් අරගෙන එක ගනුදෙනුවක් බලන්නත් දැන් රුපියල් 500ක් වැය කරන්න වෙලා තිබෙනවා. මේ රෙජිස්ට්‍රාර් කාර්යාලවල අවුරුදු 10කට, 15කට, 20කට පෙර තිබුණු පොත්පත් දැන් දිරාපත් වෙලා ගිහින් තිබෙනවා. ඒ පොත් අබලන් වෙලා තිබෙනවා. අද ගරු ඇමතිතුමාගේ කථාවේදීත් ඒ ගැන සඳහන් කළා. සමහර පොත් ඇත්ත වශයෙන්ම සමහරු අපරීක්ෂාකාරීව බලනවා. සමහර අය ඒවායේ කොළ කඩා ගෙන යනවා. ඒ නිසා ඒවා විනාශයට පත් වෙනවා. වැඩ කරන අය ඕනෑවට එපාවට ඒ පොත් විසි කරනවා. ඒ නිසා ඒ පොත් නාස්ති වෙනවා. අපි මේවා රැක ගන්න ඕනෑ; සංරක්ෂණය කරන්න ඕනෑ; අලුතින් ලියන්න ඕනෑ. ඒවාට වියභියදම් යනවා. නමුත් එක ගනුදෙනුවක් දිහා බලන කොට මෙතෙක් තිබුණු රුපියල් 5ක මුදල රුපියල් 500ක් වීම නම් ඒ තරම් සාධාරණ නැහැ. අප ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට මේ ප්‍රශ්නය ජනාධිපතිතුමාට ඉදිරිපත් කළා. ඒ කෙරෙහි අවධානය යොමු වෙලා තිබෙනවා. අප පමණක් නොවෙයි, නීතිඥ සංගම් ඇතුළු නොයෙකුත් සංවිධාන ඒ ගැන ඉල්ලීම් කර තිබෙනවා. මේ පිළිබඳ යම් සහනදායී තත්ත්වයක් ඉදිරි කාලයේදී ඇති වෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. මේ අලුත් පනත යටතේ ඒකට ඉඩකඩ තිබෙනවා. පැරණි ලියවිලි ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ මේ ගාස්තු ලේඛනය උපලේඛනයටම සඳහන් කර තිබුණා. පාර්ලිමේන්තුවට එන තුරු එය වෙනස් කරන්න බැහැ. නමුත් දැන් 48වන අලුත් වගන්තියෙන් වරින් වර ඒ ගාස්තු සංශෝධනය කිරීමේ බලය ඇමතිතුමාට ලබා දී තිබෙනවා. ඒ නිසා අපට විශ්වාසයක් තිබෙනවා ඉදිරි මාස කීපය තුළ වුණත් මේක ක්‍රියාත්මක වන තත්ත්වය බලලා යම් වෙනසක් කිරීමට අපේ ගරු ඇමතිතුමාගේ අවධානය ස්ථිරවම යොමු වෙයි කියලා. ඒ නිසා ලියවිලි ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ එවැනි ඉඩකඩක් ඇති කරලා 48 වන වගන්තිය හැටියට ඉතාම වැදගත් කාරණයක් ඇතුළු කර තිබෙනවා. අවුරුදු හැට හැත්තෑවකට පසුව කරපු මේ වෙනස අප ඉතාම අගය කරනවා.

ඊළඟට, මා මෙම කාරණයත් සඳහන් කළ යුතුයි. අපේ පරණ භුක්ති ක්‍රමයට අනුව -රජවරුන්ගේ යුගයේදී පවා- රජුට හෝ රජයට ලොකුම ආදායම ලැබී තිබෙන්නේ ඉඩම් බද්දෙන්. මේ අවස්ථාවේදී මරාල බද්ද කියන එක ගැනත් මට මතක් කරන්න තිතුණා. පුද්ගලයෙක් මැරුණාට පස්සේ ඔහුට හිමිව තිබූ චංචල දේපළවලින් තුනෙන් එකක කොටසක් රාජ්‍ය භාණ්ඩාගාරයටයි අය කරගෙන තිබෙන්නේ. පිරිමි දරුවෙක් නැත්නම් ඔහුගේ චංචල දේපළ සම්පූර්ණයෙන්ම රජ යුගයේ අය කර ගෙන තිබෙනවා. අද ඒ විධියට අසාධාරණ බදු අය කරන්නේ නැහැ. අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ජනතා නියෝජිතයන්ට අදහස් ඉදිරිපත් කරන්න ඉඩ දීලා තමයි ඒවා කරන්නේ. රජ යුගයේ එහෙම නොවෙයි. රජ්ජුරුවෝ කියනවා හෙට ඉඳලා මෙන්න මේ විධියයි කියලා. අද මේ රටේ ඒ ආයතන පවත්වා ගෙන යන්න මුදල් සොයා ගන්න ඕනෑ කරලා තිබෙනවා. එදාට වඩා අද අපේ කාර්යාලවල පහසුකම් දියුණු කරලා නවීන විධියට ඒවා සකස් කර තිබෙනවා. උදාහරණයක් විධියට අපේ රෙජිස්ට්‍රාර් කාර්යාල ගන්න. ඉස්සර ඒවායේ දූවිලි පිරිලා ඉතාම අපිරිසිදු ආකාරයට තිබුණේ. අද දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල ඉතාම හොඳ මට්ටමකින් පවත්වා ගෙන යනවා. ඒවායේ තිබෙන පොත්පත් හොඳින් පවත්වා ගෙන යනවා. ඒ වාගේම ඔප්පු පිටපත් ආදිය ලබා ගැනීමට, උප්පැන්න සහතික ලබා ගැනීමට වැඩි කාල වේලාවක් යන්නේ නැහැ. වැඩි ප්‍රමාදයක් නොවී ඉතාම ඉක්මනින් -විනාඩි කීපයකින්, පැයකින්, පැය එකහමාරකින් - ඒවා ලබා ගන්න පුළුවන් වන විධියට අද ඒ කාර්යාලවලවල පහසුකම් දියුණු කර තිබෙනවා.

අදට ගැළපෙන විධියට, ඉදිරි අනාගතයට ගැළපෙන විධියට තව තවත් මේ පහසුකම් දියුණු කරන්න නම් මේ අංශවලින් ලබා ගන්නා ආදායම වැඩි වෙන්න ඕනෑ කියන කාරණයත් අප පිළිගත යුතුව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප මෙම ආදායම් සංශෝධන පනත් කෙටුම්පත් ඉතාම අගය කරන අතර, මේ තුළින් ලබා ගන්නා ආදායම් ප්‍රති ආයෝජනය කරමින් අපේ ජනතාවට සෙතක් සැලසීමට හැකි වෙයි කියා බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දිවුරුම් පෙත්සම් සඳහා අය කරන මුද්දර ගාස්තුව රුපියල් 250 දක්වා වැඩි කිරීම සම්බන්ධව සාධාරණයක් ඉෂ්ට වන්නට ඕනෑ. ඒ සම්බන්ධයෙන් ව්‍යතිරේකයක් හෝ ඇති කරමින් පාසල් දරුවන්ගේ අවශ්‍යතාවන් සඳහා, සමෘද්ධි හෝ අඩු ආදායම් ලාභීන්ගේ අවශ්‍යතා සඳහා, නිවාස ආධාර ලබා ගැනීමේදී, ඒ වාගේම නොයෙකුත් ආධාර මුදල් ලබා ගැනීමේ අවස්ථාවලදී, බැංකු පොත් නැති වී ඒවා නැවත ලබා ගැනීමට දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන අවස්ථාවලදී ආදී සාමාන්‍ය ජනතාවට බලපාන අවස්ථාවලදී යම් කිසි සහනදායක මට්ටමක් එම අංශවලට ඇති වන ආකාරයට දිවුරුම් පෙත්සම් සඳහා අය කරන රුපියල් 250ක මුද්දර ගාස්තුව සඳහා සහනයක් ඇති කරන්නට අවශ්‍යයි කියන කාරණයත් සඳහන් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මේ අවස්ථාවේ දී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்படி, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. UDITH LOKUBANDARA *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

[අ.භා. 3.05]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, අද සාකච්ඡා කරන පනත් කෙටුම්පත්වලින් දෙකක් සම්බන්ධයෙන් විශේෂයෙන්ම කරුණු කිහිපයක් පැහැදිලි කරන්නට මා වෑයම් කරනවා. පළමුවැන්න තමයි, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත. අද උදෑසන නියෝජ්‍ය මුදල් ඇමති සරත් අමුණුගම මැතිතුමා කථා කරන විට සඳහන් කළා අද-

[මෙම අවස්ථාවේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]

[இச்சந்தர்ப்பத்தில் மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]

[At this stage, His Excellency President Mahinda Rajapaksa entered the Chamber.]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ජනාධිපතිතුමා ඉදිරියේත් කථා කරන්නට අද මට අවස්ථාවක් ලැබිලා තිබෙනවා. [බාධා කිරීමක්] හරියටම කියන්න. මා දැන් කථා කරන්නේ දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම පිළිබඳවයි. මේකෙන් පර්යේෂණවලට - researchවලට - සහනාධාර දෙනවා කියලා සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා. ඒක බොහොම වැදගත්. ඒ වාගේම green energyවලට - පරිසරයට හානි නොකරන විධියට බලය නිෂ්පාදනය කිරීමට - organic fertilizerවලට සහනාධාර දෙනවා කිව්වා. නමුත් මේ තුළ තවත් එක කාරණයක් තිබුණා. ඒ තමයි ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව්වල අනුග්‍රාහකත්වය සඳහාත් යම් කිසි සහනාධාරයක් දෙනවා කියන එක. මා මෙතැනදී කියන්නට හදන්නේ මේකයි.

මෙහිදී මා කරුණු දෙකක් ප්‍රකාශ කරන්නට අවශ්‍යයි. එකක් තමයි ජාත්‍යන්තර ක්‍රීඩාවක් කියන්නේ මොකක්ද කියලා මේ පනතෙන් තීරණය කරන්නේ නැහැ කියන එක. මේ පනතෙන්වත්, මේ සංශෝධනයෙන්වත්, මීට ප්‍රථම තිබුණ පනතෙන්වත් මේ ජාත්‍යන්තර ක්‍රීඩාව කියන්නේ මොකක්ද කියලා තීරණය වෙලා නැහැ. එහි වගකීම ඇමතිතුමාට දීලා තිබෙනවා, එතුමාට අවශ්‍ය විධියට මේ ජාත්‍යන්තර ක්‍රීඩාව මොකක්ද කියලා ප්‍රකාශ කරන්න පුළුවන් කියලා. ඇත්තටම මේකේ ලාභයක් තිබෙනවා. මුළු ආදායම 100ක් කියලා ගත්තොත්, වියදම 25ක් කියලා ගත්තොත්, ඒ ඉතිරි වන 75න් තමයි ඒ ආයතනයට බදු ගෙවන්න වෙන්නේ. නමුත් තවත් 25ක් ප්‍රචාරක කටයුතුවලට වියදම් කළොත් ඒ සියයට 50න් තමයි ඒ බද්ද තීරණය වන්නේ. උපරිම බදු ප්‍රමාණය සියයට 25ක් කියලා ගත්තොත් ඒ බදු ප්‍රමාණයේ සියයට 6ක විතර වෙනසක් තිබෙනවා. ඒ ප්‍රචාරක කටයුත්ත සඳහා බද්ද ලබන සමාගම නාලිකාවක් වෙන්න පුළුවන්; CSN වෙන්න පුළුවන්; ITN වෙන්න පුළුවන්; සිරස වෙන්නට පුළුවන්.

ඒ සඳහා වැඩි වැඩියෙන් ආයෝජනය කරනවා නම් ඒ අයට වාසියක් තිබෙනවා. මා මතු කරන ප්‍රශ්න දෙකෙන් පළමුවැන්න තමයි ජාත්‍යන්තර ක්‍රීඩාව කියන්නේ මොකක්ද කියන ප්‍රශ්නය. මා දන්නා විධියට සාමාන්‍යයෙන් මේවා night raceවලට, රග්බි වැනි ක්‍රීඩාවලට දෙන්න පුළුවන්. නමුත් මේවා සාමාන්‍යයෙන් එල්ලේ ක්‍රීඩාවට, පාපන්දු ක්‍රීඩාවට, මාතලේ සෙල්ලම් කරන හොකී ක්‍රීඩාවට ලැබෙන්නේ නැති එකයි මා මෙතැනදී කියන්න වෑයම් කරන්නේ. සහනාධාර දෙන විට ජාතික ක්‍රීඩා බලා සහනාධාර දෙන්න අවශ්‍යයි කියා මා සඳහන් කරනවා.

ගරු කථානායකතුමනි, අද දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනා බව අප දන්නවා. එහි පිටු 34ක් තිබුණා. එයට අද උදේ අපට සංශෝධන දුන්නා. සංශෝධන පිටු 24ක් තිබෙනවා. පනත් කෙටුම්පතේ පිටු 34ක් තිබෙනවා. සංශෝධන විතරක් පිටු 24ක් තිබෙනවා. ඇත්තටම මේ සංශෝධන පිටු 24ම අපට මේ කෙටි කාලය තුළදී සාකච්ඡා කරලා ඒ ගැන යම් කිසි විවේචනයක් කරන්න අපහසුයි කියා ප්‍රකාශ කරන්න ඕනෑ.

ඊට අමතරව ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ගැනත් කරුණක් කියන්න අවශ්‍යයි, ගරු කථානායකතුමනි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
There is a point of Order being raised by the Hon. Alhaj A.H.M. Azwer.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, the Hon. Member is misleading the House.

සියලුම ක්‍රීඩාවලට සහනාධාර දෙනවා. Volleyballවලට දෙනවා; තමුන්නාන්සේ කිව්ව එල්ලේවලට දෙනවා; footballවලට දෙනවා; හැම ක්‍රීඩාවකටම දෙනවා. තමුන්නාන්සේ දන්නේ නැත්නම් අපෙන් ඉගෙන ගන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකේ point of Order එකක් තියෙනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

එතුමා කිව්ව විධියට ඒ සහනාධාර එහෙම දෙනවා වෙන්න පුළුවන්. නමුත් දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත හරහා එහෙම නොලැබෙන එක ගැනයි මා කථා කරන්නේ. මා කියන කථාවත් පොඩ්ඩක් හොඳින් අහගෙන ඉඳලා ඔබතුමාගේම කාලය භාවිතා කරලා පිළිතුරු දුන්නා නම් මීට වැඩිය හොඳයි. ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කියන්න තිබෙන්නේ බොහොම කුඩා කරුණක්. නමුත් මේ කරුණ කියන්න අවශ්‍යයි. මෙතැන කරුණු දෙකක් තිබෙනවා. පළමුවන කරුණ, මේවා ක්‍රියාත්මක වන විට පසු දිනයකට ගිහින් - retrospective effect එකකින් - තමයි මේවා ක්‍රියාත්මක වන්නේ. සාමාන්‍ය මූල ධර්මයක් හැටියට නීති පනවන විට අප එහෙම නොකළ යුතුයි කියා මා මීට ප්‍රථමයෙනුත් මේ පාර්ලිමේන්තුව තුළ සඳහන් කර තිබෙනවා. හැම අවුරුද්දේම අය වැය තිබෙන්නේ කවදාද කියා අප දන්නවා. අපේ නිලධාරීන් කලට වෙලාවට මේ පනත් කෙටුම්පත් පිළියෙල කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළොත් පස්සට කර retrospective effect එකක් එක්ක පනත දමන්න අවශ්‍ය නැහැ. ඊට අමතරව තව කරුණක් ඒකට එකතු කරන්න ඕනෑ. අපි අනාගතයේදී වුණත් මේ කාලසටහන හරියට හදා ගන්න ඕනෑ. මොකද, මීට ප්‍රථමයෙන් මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්න ක්‍රමයක් හදා ගන්න ඕනෑ. පිළිවෙළකට මේක වෙන්න ඕනෑ. මේක කුඩා කරුණක් කියා මා පටන් ගත්තේ. නමුත් මේක කියන්න ඕනෑ. මොකද, මෙතැන මූල ධර්මයක් තිබෙනවා. ඊට අමතරව සමහර දේවල්වල මුදල් එකතු

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

කර ගෙන යනවා; ජනවාරි මාසයේ ඉඳලාම එකතු කර ගෙන යනවා. ඒක retrospective problem එකක් විතරක් නොවෙයි; පස්සට ගිහින් නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රශ්නය විතරක් නොවෙයි. ඇත්තටම ඒක අනිත්‍යානුකූලයි කියා කියන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ අනුමතිය නැතුව ජනවාරි මාසයේ ඉඳලා මුදල් එකතු කරමින් පැමිණෙනවා. අද මේක සම්මත වුණාම -

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මේ යෝජනා සියල්ලම අතිගරු ජනාධිපතිතුමා එතුමාගේ අය වැය වාර්තාවෙන් ඉදිරිපත් කළේ. ඉදිරිපත් කළාට පසු මුළු සභාවම දැන ගන්නවා; මුළු රටම දැන ගන්නවා; පාර්ලිමේන්තුවේ සම්මත වෙනවා. හැම යෝජනාවක්ම ක්‍රියාත්මක වන්නේ ජනවාරි මාසයේ 1වන දා ඉඳලායි. ඒක නීතිගත කිරීම තමයි දැන් කරන්නේ. ඒකෙන් ගැලවෙන්න බැහැ. ඔබතුමා කියන විධියට retrospective effect කියන නීති ගෙනෙන්න අප කැමැති නැහැ. නමුත් මෙතැනදී අපට ඒකෙන් ගැලවෙන්න බැහැ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුරට බොහොම ස්තුතියි. එහෙම අය වැය කථාව තුළදීම ක්‍රියාත්මක වන සමහර දේවල් තිබෙනවා. මා ඒක පිළිගන්නවා. සමහර දේවල් නීති පනත් ගෙනැවිත් තමයි ක්‍රියාත්මක කරන්න ඕනෑ. නීති පනත් ගෙනැවිත් ක්‍රියාත්මක කරන්න ඕනෑ දේවල් පිටුපසට යන්නේ නැතුව අප කලට වෙලාවට කරන්න ඕනෑ.

මෙතැන නීතියක් ගෙනෙනවා. අද සංශෝධනයකුත් ගෙනෙනවා. ඒ සංශෝධනයෙන් මොනවාද කරන්නේ? ජනවාරි 1වන දා ඉඳලා කළ දේවල් ඔක්කොම පිළිගත හැකියි කියන මතයට ගෙනෙනවා. ඒ සංශෝධනය ගෙනෙන්නේ මොකද? ඒක ගෙනෙන්නේ ඒක අනිත්‍යානුකූල නිසායි. ඒක හරිගස්සන්නයි ගෙනෙන්නේ. නැත්නම් සංශෝධනයක් ගෙනෙන්න අවශ්‍ය නැහැ නේ.

ඉතින් මම ඒ තර්කය පිළිගන්නේ නැහැ. නමුත් සමහර දේවල් අය වැය ඉදිරිපත් කරන දවසේම ක්‍රියාත්මක වෙනවා. ඒවාට නීති අවශ්‍ය නැහැ. නමුත් නීති අවශ්‍ය දේවල් තිබෙනවා. ඒක සඳහන් කරන්න ඕනෑ. මේක සුළු කාරණයක් හැටියට තමයි මම ඉදිරිපත් කළේ. මේක සුළු කාරණයක් හැටියට ඉදිරිපත් කළේ ඇයි? මෙතැන නීතියේ පරමාධිපත්‍ය ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ජෝන් පර්කින්ස් කියන පුද්ගලයා 2004 දී "Confessions of an Economic Hit Man" කියලා ග්‍රන්ථයක් ලිව්වා. එතැනින් තමයි "ආර්ථික ඝාතකයා" කියන වචනය පැමිණියේ. මේ ළඟදී හලාල් පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා අපි දැක්කා. ඇත්තටම හලාල් පිළිබඳව තිබුණ ප්‍රශ්නය මොකක්ද? මේ ආර්ථිකයට සංස්කෘතියක් නැහැ. ආර්ථිකය කියන්නේ ආර්ථිකයට. නමුත් කවුරු හරි මෙතැන ප්‍රශ්නයක් මැව්වා. ආර්ථික ප්‍රතිලාභ ලැබෙන්නේ කොයි කොටසට ද කියන එක වැදගත් නැහැ. අය වැය හරහා ඕනෑම භූගෝලීය ප්‍රදේශයකට, ඕනෑම ජාතියකට, ඕනෑම කෙනකුට ආර්ථික ප්‍රතිලාභ ලැබුණාට අපට ප්‍රශ්නයක් නැහැ. මොකද, අය වැය හරහා තමයි, ප්‍රතිපත්ති හරහා තමයි මේ රටේ සිටින අඩු ආදායම්ලාභීන්ට අපට ඒවා බෙදන්න පුළුවන්. අපි තීරණය ගන්න කොට ගන්නේ දකුණද, උතුරද, නැහෙනහිරද කියලා බැලීමෙන් නොවෙයි. කළ යුතු ආයෝජනය මොකක්ද, රැකී රක්ෂා ඇති කරන්න ඕනෑද, එතැන ඇති වෙලා තිබෙන ප්‍රවර්ධනය මොකක්ද කියලා බලලා අපි ආර්ථික තීරණය ගන්නවා. ඒ සඳහා භූගෝලීය ප්‍රදේශය බලන්න ඕනෑ නැහැ. ජාතිය බලන්න ඕනෑත් නැහැ. ප්‍රතිලාභ බෙදන කොට අපි ඒ ප්‍රතිලාභ බෙදන්න ඕනෑ ඒවා මේ රටේ සිටින අඩු ආදායම්ලාභීන්ට වැඩියෙන් ලැබෙන විධියටයි. ඇඩම් ස්මිත් 1759 දී "The Theory of Moral Sentiments" පොත ලියන කොට කිව්වා,"ජාති භේද උඩ යන ආර්ථික ගමනක් නොවෙයි, ප්‍රශ්න ඇති වෙන කොට ස්වාධීන මැදිහත්කරුවකු අවශ්‍යයි, ඒ ස්වාධීන මැදිහත්කරුවා කවුද, රජය තමයි ඒ ස්වාධීන මැදිහත්කරුවා" කියලා.

ඊයේත් අදත් ගරු අගමැතිතුමාගේ ප්‍රකාශ අහන්න අපට අවස්ථාව ලැබුණා. ඇත්තටම මම මේ කියන්න යන කරුණු එතුමාගේ වයසටත්, එතුමාගේ දීර්ඝ දේශපාලන ඉතිහාසයටත් ගරු කරලා කියන කරුණක් මිස, එතුමාට අගෞරවයෙන් කියන කරුණක් නොවෙයි. නමුත් මට එතුමාගේ මතයට එකඟ වෙන්න බැරි වුණා. මොකද, විපක්ෂනායකතුමාත්, දෙමළ සන්ධානයේ නායකතුමාත් නොයෙකුත් ප්‍රශ්න මෙතැන ඉදිරිපත් කළා. ඒ වෙලාවේ අගමැතිතුමා කියන්න හැදුවේ, "මේවා පෞද්ගලික ප්‍රශ්න, මේවා පාර්ශ්ව දෙකක් අතර ඇති වන ප්‍රශ්න" කියන අදහසයි. ඒ මතය තමයි ගරු අගමැතිතුමා මෙතැන ගොඩ නැඟුවේ.

ඇත්තටම එහෙම නොවෙයි. ඊට වඩා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ ආර්ථිකය ගැනයි කථා කරන්නේ. මොකද, කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය ලියන වෙලාවේ රජතුමාට උපදෙස් දෙමින් කිව්වා, "රජයට එකතු කර ගන්න පුළුවන් ආදායම වැඩි කර ගන්න නම් අපි ජාති භේද ප්‍රශ්න විසඳන්න ඕනෑ" කියලා. ඇත්තටම මේ රටේ ආර්ථික ප්‍රශ්න අතර එක උග්‍ර ප්‍රශ්නයක් තිබෙනවා. අද දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 11ක් පමණයි අපට ආදායම එකතු වන්නේ. මෙතැන තමයි මූලික ගැටුම තිබෙන්නේ. සියයට 20ක් විතර එකතු කර ගන්නා ඉලක්කයක් රජයට තිබෙනවා. නමුත් එකතු වන්නේ සියයට 11ක් පමණයි. අපි මේ ප්‍රශ්න නිරාකරණය කර ගත යුත්තේ ආදායම වැඩි කර ගන්න ඕනෑ නිසායි. ආදායම වැඩි කළොත් පමණයි, අපට තිබෙන ආර්ථික ප්‍රශ්නවලින් මේ රට ගොඩ ගන්නට පුළුවන් වන්නේ.

මේ ප්‍රශ්න, අර්බුද ඇති වෙන කොට ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ප්‍රකාශයක් කළා. ඒ සම්බන්ධයෙන් මම එතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. එතුමා කළ ප්‍රකාශය මොකක්ද? එතුමා කිව්වා "අපි පොලිස් බලය වෙන කාටවත් ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ. රජයම තමයි පොලිස් බලය ක්‍රියාත්මක කරන්න ඕනෑ" කියලා. මම හිතන්නේ ඒක සෘජු පිළිතුරක්. නායකත්වය කියන්නේ ඒකයි. අපිට ඕනෑ කරන්නේ, සට්ටනයක් ඇති කරලා, සට්ටනය ඇති වුණාට පස්සේ පොලීසියෙන් ඇවිල්ලා සමාදාන කරන එක නොවෙයි. අපට ඕනෑ කරන්නේ, නීතියේ ආධිපත්‍යයි. කවුරු හරි නීතිය කඩ කරන කොට ඒ වෙලාවේම නීතිය ක්‍රියාත්මක කරන එකයි අපට අවශ්‍ය. ඒ නිසා එතුමා ඒ විධියට සෘජුව කරුණු සඳහන් කිරීම අපි අගය කරන්න ඕනෑ. මොකද, එතකොට නීතිය ක්‍රියාත්මක වෙනවා. ඒ ගැන එක එක අදහස් තිබෙනවා.

අද උදෑසන මේ සභාව තුළ පොලීසිය ගැන ලොකු සාකච්ඡාවක් සිදු වුණා. සමහර අය කිව්වා, "පොලීසියයි වැරැදි" කියලා. තවත් අය කිව්වා, "හැම තිස්සේම පොලීසියටම වරද පටවන්න එපා. පොලීසියේත් ඉන්නේ අප වාගේ සාමාන්‍ය මනුෂ්‍යයෝ" කියලා. අපි ඒක පිළිගන්නවා. නමුත් පොලීසිය කෙරෙහි විශාල බලාපොරොත්තුවක් තිබෙනවා. මොකද, පොලීසිය කියන්නේ සිවිල් සමාජයට සමීපතම රාජ්‍ය ආයතනයයි. අපි මෙය අය වැය විවාදයේදීත් සඳහන් කළා. අපි මෙය අද නැවතත් සඳහන් කරනවා. යුරෝපීය, ආසියාතික රටවල වාගේම පොලීසිය ආරක්ෂක අමාත්‍යාංශය තුළ නොව සිවිල් අමාත්‍යාංශයක් තුළ තියලා ක්‍රියා කරන්න ඕනෑ කියන මතයේ තමයි එක්සත් ජාතික පක්ෂය සිටින්නේ.

ගරු කථානායකතුමනි, අද සඳහන් කරපු තවත් සමහර කරුණුවලට ඉක්මනින් යම්කිසි ප්‍රතිචාරයක් දක්වන්න මා කැමැතියි. ආයෝජන ගැන අද සඳහන් කළා. විපක්ෂයේ අප කථා කරන කොට දකුණු ප්‍රදේශයේ -විශේෂයෙන් හම්බන්තොට ප්‍රදේශයේ- කරන ආයෝජන ගැන ද්වේෂයෙන් කථා කරනවා කියලා ආණ්ඩුව පැත්තෙන් කිව්වා. එහෙම එකක් නම් නැහැ. අප අවුරුදු 10කට විතර උඩදී කරපු පර්යේෂණ අනුව -ඒ researches අනුව- ඇත්තටම මම විශ්වාස කරනවා හම්බන්තොටට වරායක් අවශ්‍යමයි කියලා. නැව් විශාල සංඛ්‍යාවක් ලංකාවේ දකුණු මුහුද හරහා යනවා නම්, හම්බන්තොට වරායක් ඇති කරන්න ආර්ථිකමය හේතුවක් තිබෙනවා. නමුත් අප දෙගොල්ලන්ගේ ප්‍රතිපත්ති අතර වෙනසක් තිබෙනවා. අවාසනාවකට සරත් අමුණුගම ඇමතිතුමා දැන් මෙතැන නැහැ. එතුමා ඉදිරිපත් කරපු තර්කයට පිළිතුරක් තමයි මා මේ ඉදිරිපත් කරන්නේ.

ආයෝජනය කරන කොට ක්‍රමවත්ව ආයෝජනය කරන්න ඕනෑ. මොකද, මුලින් අවශ්‍ය වුණේ bunkering සේවාවයි. ඊට පස්සේ transshipment සේවා අවශ්‍ය වෙනවා. ඊටත් පස්සේ තමයි අනෙක් සේවා අවශ්‍ය වන්නේ. ඉක්මනට ආයෝජනයක් කළත්, ඒ ආයෝජනයේ ප්‍රතිලාභ ලබන්න හිතුවාට වඩා දීර්ඝ කාලයක් යනවා. ප්‍රතිලාභ ලබන්න දීර්ඝ කාලයක් ගියොත් රජයට අවදානමක් ඇති වෙනවා. ඒ අවදානම තමයි, cash flow එක අඩු වීම. Cash flow එක අඩු වෙන කොට ඒක ණයෙන් පිරිමහන්න ඕනෑ. ණය ගන්න බැරි දවසක් ආවොත් අනවශ්‍ය අවදානමක් ඇති වෙනවා. ඒක තමයි අපේ විවේචනය. අපේ විවේචනය වරාය ගැන නොවෙයි, වරායට ආයෝජනය කරන ප්‍රමාණයත්, ආයෝජනය කරන ශීඝ්‍රත්වයත්, එයින් ලැබෙන ප්‍රතිලාභයත් ගැනයි.

ගරු කථානායකතුමනි, මත්තල ගුවන් තොටු පොළ ගැනත් අද සාකච්ඡා කළා. අපට අද ආරංචි වුණා, අප්‍රේල් 7වැනි ඉරු දින මත්තල ගුවන් තොටු පොළෙන් යූඑල් 273 ගුවන් යානය පිටත් වන්න ප්‍රමාද වුණා කියලා. එය රියාද්වලට යන්න නියමිතව තිබුණු ගුවන් යානයක්. එය කොළඹින් මත්තලට ගියා. නමුත් මත්තල පැය පහ හමාරක ප්‍රමාදයක් ඇති වුණා. පැය පහ හමාරක ප්‍රමාදයක් ඇති වුණේ ඇයි කියන්න මම දන්නේ නැහැ. ප්‍රමාදය ගැන කියද්දී, කවුදෝ කෑ ගහලා කිව්වා කුරුල්ලන් ගැන එහෙම. අපි ඒ කිසිවක් දන්නේ නැහැ. අපි දන්නේ නැති කරුණු කියන්න යන්නේ නැහැ. නමුත් මොකක් හරි ප්‍රමාදයක් ඇති වුණා. ඒ ප්‍රමාදය ඇති වූ නිසා එතැනින් රියාද්වලට යන්න බැරි වුණා. මොකද, ගුවන් කපිතාන්ලාට, ගුවන් නියමුවන්ට ගුවන් යානය තුළ ඉන්න පුළුවන් කාල සීමාවක් තිබෙන නිසා. ඒ කාල සීමාව ඉක්මවා ගිය නිසා, ඒ ගුවන් යානයට නැවතත් මත්තල ඉඳලා කොළඹට ඇවිල්ලා රියාද්වලට යන්න සිදු වුණා. SriLankan Airlines සමඟත් මා මේ ගැන මීට ප්‍රථමයෙන් සාකච්ඡා කළා. මා කියන්න හදන්නේ, මෙතැන තිබෙන්නේ ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් කියන එකයි. ඇත්තටම ජාත්‍යන්තර ගුවන් ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. අපේ SriLankan Airlines එකේ ගුවන් යානා කොළඹට ආවත්, මත්තලට ආවත් කමක් නැහැ. මොකද, ඒක අපේ රටේ ජාත්‍යන්තර ප්‍රතිපත්තිය නම් ඒක ඒ විධියට කරන්න ඕනෑ. නමුත් කොළඹින් මත්තලට යන එක නම් සුදුසු නැහැ කියලායි මා හිතන්නේ.

අපේ දේශීය ගුවන් ප්‍රතිපත්තියයි, අපේ ජාත්‍යන්තර ගුවන් ප්‍රතිපත්තියයි කළවම් කර ගන්න අවශ්‍ය නැහැ කියලා මම හිතනවා. අපි ලන්ඩන් නුවර ඉඳලා යුරෝපයට යනවා නම්, එක්කෝ හීත්‍රෝවලින් යුරෝපයට යනවා. එහෙම නැත්නම් ගැට්වික්වලින් යුරෝපයට යනවා. අපි හීත්‍රෝවලින්, ගැට්වික්වලට ගිහිල්ලා, ගැට්වික්වලින් යුරෝපයට යන්නේ නැහැ. එහෙමත් නැත්නම්, මැන්චෙස්ටර්වලින් ලන්ඩන්වලට ඇවිල්ලා ලන්ඩන්වලින් යුරෝපයට යන්නේ නැහැ. මේ ප්‍රතිපත්ති දෙක වෙනස්. ඒ වාගේම, මේ තැන් දෙකකට යෑමේදී ආර්ථික ප්‍රශ්නයකුත් තිබෙනවා. ආර්ථික ප්‍රශ්නය මේකයි. ගුවන් යානයක් අඩි 30,000ක් ඉහළට ගන්න කොට සෑහෙන වැය වීමක් -ඉන්ධන ද ඇතුළු වැය වීමක්- තිබෙනවා. ඒ විශාල ගුවන් යානා -එකම ගුවන් ගමනකදී- එකම රට තුළ දෙවතාවක් ගුවන්ගත කරන්න අවශ්‍ය නැහැ කියන එකයි මා කියන්නේ.

ගරු කථානායකතුමනි, අද කථා කරන කොට කෙනෙක් කිව්වා, මත්තලට යන එක ගැන අවදානමක් තිබුණා කියලා. අපි ඒ ගැන නොදන්නා දේවල් කථා කරන්න යන්නේ නැහැ. අවදානමක් තිබෙනවා නම් අපේ සිවිල් ගුවන් සේවා ඇමතිතුමා ඒ ගැන සොයා බලා කාගේ හෝ ජීවිතයකට අවදානමක් නොවන විධියට ක්‍රියා කරන්න ඕනෑ.

ආයෝජනයේ ප්‍රශ්නය නොවෙයි මම මෙතැන ගත්තේ. කළමනාකාරිත්වයේ ප්‍රශ්නය තමයි මම මෙතැන මුදුන් පත් කළේ. මොකද රජයට උපදෙස් දෙන්න වෘත්තීයවේදීන් සිටිනවා. SriLankan Airlines එකේ වෘත්තීයවේදීන් ඉන්නවා. ඒ වාගේම රාජ්‍ය සේවයේ වෘත්තීයවේදීන් සිටිනවා. ඒ අය රජයට නිසි උපදෙස් දෙන්නට ඕනෑ. මොකක් හරි වුණාට පස්සේ අපි ඒ ගැන සාකච්ඡා කරලා වැඩක් නැහැ. මම මගේ කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි. මම දිහා බලපු විධියට මම හිතුවා මගේ කථාව අවසන් කරන්න වේලාව ඇවිල්ලා කියලා. විශාල ආර්ථික ප්‍රශ්න දෙකක් තිබෙනවා. එක ප්‍රශ්නයක් තමයි ආදායම අඩු වීම. සියයට 11 පවතින දළ දේශීය නිෂ්පාදනය කොහොමද සියයට 20ක් දක්වා ගෙනි යන්නේ? දෙවැනි ප්‍රශ්නය තමයි රුපියල අවප්‍රමාණය කිරීමේ ප්‍රතිශතය. ඒක කෘත්‍රිමව අවුරුදු තුනකට පාලනය කරලා තිබුණා. ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා එය නිදහස් කළා. නමුත් ආපසු අපිට පෙනෙනවා, මේක යම් කිසි පාලනයකට යනවාය කියන කාරණය. මේ කාරණය කියන්න හේතුව මේකයි. අවුරුදු දහයකට උඩ දී මේ රටින් අපි අපනයනය කළා, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 35ක් විතර. අද ඒක සියයට 15ට අඩු වෙලායි තිබෙන්නේ. අපනයනය වැදගත්. මොකද අපනයනය වැදගත්? විදේශීය මුදල් අවශ්‍යයි, අපි ගන්න ණය දීර්ඝව ගෙවා ගෙන යන්න. ඒ නිසා මෙහි අවදානම ගැන මම සඳහන් කරන්න ඕනෑ. අපි ඒ සඳහා මුල් තැනක් දෙන්නට ඕනෑ. මට නම් පෙනුණේ නැහැ, සංචාරක ව්‍යාපාරය ඇරෙන්නට අනික් අපනයන ක්ෂේත්‍රවලට එච්චර මුල් තැනක් ලැබෙනවාය කියලා. දේශීයව ආර්ථිකයකට ලැබෙන යම් කිසි සහනාධාර ප්‍රමාණයක් තිබුණා. නමුත් අපනයන ක්ෂේත්‍රවල තවමත් එපමණ ප්‍රගතියක් නැති බවත්, ඒක අවදානමක් හැටියටත් පෙන්වමින් මම නිහඬ වනවා. ස්තූතියි.

[අ.භා.3.25]

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Minister of Investment Promotion)

ගරු කථානායකතුමනි, මා හිතන්නේ ඊයේත්, අදත් වැදගත් වූ පනත් කෙටුම්පත් ගණනාවක් ගැන තමයි සාකච්ඡා වුණේ. දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත සහ වැට් බදු (සංශෝධන) පනත් කෙටුම්පත වාගේ පනත් කෙටුම්පත් රාශියක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. මම හිතන්නේ කාලීනව ඉතාමත්ම වැදගත් පනත් කෙටුම්පත් කීපයක් කඩිනමින් අපිට ඉදිරිපත් කරන්න සිද්ධ වුණා. විශේෂයෙන්ම අපේ ඉරාන් වික්‍රමරත්න ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, මේ අණපනත් කල් ඇතිව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව. මා හිතන්නේ ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා සඳහන් කළ පරිදි අය වැයෙන් මේ සඳහා මූලික දැනුම් දීමක් කරලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ට ඒ ආකාරයට කලින්ම දැනුම් දීලා තිබෙනවා. ඊට පස්සේ මේවා නීත්‍යානුකූල කිරීම තමයි මේ කරන්නේ.

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

මට ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාගෙන් එක ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට මේ ආණ්ඩුව ගෙනෙන තුරු මොන ආයෝජනයක් ගැන ද මේ පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේ? ඉඩමක් දීපු එකක් ගැන දැනුම් දුන්නාද, ආයෝජනයේ ප්‍රමාණය ගැන දැනුම් දුන්නාද, ආයෝජන ආවේ කොහොමද කියලා දැනුම් දුන්නාද? මොකක්ද මේ පාර්ලිමේන්තුවට කලින් දැනුම් දුන්නේ? මට ඒ ගැන කියන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මට ඔබතුමා අහන ප්‍රශ්නය පැහැදිලි නැහැ. ඔබතුමා අහන්නේ මීට ප්‍රථම රජයක් ගැනද?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔව්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම හිතන්නේ මට වැඩිය හොඳට ඔබතුමාට ඒකට පිළිතුරු දෙන්න පුළුවන්.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මට පිළිතුරු දෙන්න පුළුවන්. ඒකේ කිසි ගැටලුවක් නැහැ. ඒක තමයි මම පිළිතුරු දුන්නේ. තමුන්නාන්සේලා මොකක්ද මේ කථා කරන්නේ, මේ පාර්ලිමේන්තුවට දැනුම් දෙන එක නීත්‍යානුකූලව වෙලාවට කරන්න ඕනෑය කියලා. මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත මේ ආණ්ඩුව ගෙනෙන තුරු මොන ආයෝජනය ගැන ද මේ රටේ මිනිසුන්ට දැනුම් දුන්නේ? අද ඉඩම ගැන අපෙන් අහනවා. ඉඩම දීපු ගණන අහනවා. ගෙවපු මුදල් ප්‍රමාණය අහනවා. මේ එකක්වත් 2008 වන තුරු මේ පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වුණාට පස්සේ තමයි මේ පාර්ලිමේන්තුවට නියමානුකූලව මේ ගැන දැනුවත් වීමක් කළේ. විපක්ෂයේ ඉන්න කොට මේක කියන්න පුළුවන්. ආණ්ඩුවක් ඇවිල්ලා ආණ්ඩුව ඇතුළේ තමයි මේක කරන්නේ. හංගන්න දෙයක් නැහැ. පසු ගිය කාලයේ ෂැන්ග්‍රි- ලා එක පටන් ගන්න කොට මගේ මිත්‍ර හර්ෂ ද සිල්වා මැතිතුමා පාර්ලිමේන්තුවේ දී මගෙන් ඇහුවා, "එක උදැල්ලක් ගහලා තිබෙනවාද?" කියලා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද උදලු නොවෙයි, piles ගහනවා. ගිහිල්ලා බලන්න.

මුදල් ගෙවීම පිළිබඳව තමුන්නාන්සේලා ඇහුවා. මේ එකක්වත් මේ පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේ නැහැ. ගරු කථානායකතුමනි, පසු ගිය වකවානුව ඇතුළත මේ රටේ මේ තරම් ප්‍රශ්න තිබිලාත් මේ ආණ්ඩුව මේ රටේ මිනිස්සුන්ට කිසිම බරක් දුන්නේ නැහැ. අපට ආදායම් අඩුයි. හැබැයි, ආදායම් අඩුයි කියලා මිනිස්සුන්ට දුන් සහනාධාර එකක්වත් නැති කළේ නැහැ. එකම සහනාධාරයක්වත් නැති නොකර, මේ රජයේ දේවල් පෞද්ගලීකරණය නොකර, රජයේ දේවල් විකුණන්නේ නැතුව, ඒ සියල්ලමත් ආරක්ෂා කර ගෙන ආයෝජන ප්‍රමාණයත් ඉස්සරහට ගෙනාවා. මම ඔබතුමන්ලාගෙන් අහනවා, ආයෝජන වැඩියෙන්ම ආපු වකවානුව මොකක්ද කියලා. 1978 තමයි ආයෝජන මණ්ඩලය පිහිටෙව්වේ. ආයෝජන මණ්ඩලය පිහිටෙව්වාට පස්සේ 2005 ඉඳලා 2012 දක්වා වූ කාලය තුළ තමයි සියයට 67ක්ම ආයෝජන මේ රටට ආවේ. ඉතින්, කථා කරලා වැඩක් නැහැ නේ. දැන් මේ රටේ පත්තරවලට කියනවා, මාධ්‍යයට කියනවා, ආයෝජන එන්නේ නැහැ; ආයෝජකයෝ එන්නේ නැහැ කියලා. නමුත් ගණන් හදලා බැලුවාම FDI වැඩියෙන්ම ඇවිල්ලා තිබෙන්නේ මේ ආණ්ඩුව යටතේයි; 2005 ඉඳලා 2012 දක්වා වූ කාලය තුළයි. ඒ විධියට ආපු ආයෝජන පිළිබඳව භය ඇති කළේ කවුද? තමුන්නාන්සේලා තමයි භය ඇති කළේ. තමුන්නාන්සේලා තමයි මිනිස්සු භය කළේ. මිනිස්සු භය කරලා ආයෝජනය කරන්න එපා, විශ්වාසයක් නැහැ කියලා කිව්වා. ඒවා ඔක්කෝම කියද්දී තමයි මේ ආයෝජන ගෙනාවේ. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ සංශෝධන ගෙනෙන්නේ මේ කාලය ඇතුළතයි. ඒ, 2011 දියි.

මේ බදු ක්‍රමය සරල කරන්න මේ ආණ්ඩුව හුහක් මහන්සි ගත්තා. ඒක තමයි මේ කරන්නේ. මේ බදු ක්‍රමය සරල කරන්න 2011 ඉඳලා ප්‍රතිසංස්කරණ අපි තව දුරටත් පුළුල් කරලා තිබෙනවා. විශේෂයෙන්ම කුඩා හා මධ්‍යම පරිමාණ ක්ෂේත්‍රය නඟා සිටුවීමට මෙම බදු සංශෝධන මඟින් අපි ඉලක්ක කරලා තිබෙනවා. රජය වෙනුවෙන් ජනතාවට නොමිලයේ සපයන සේවාවන්වල පිරිවැය අඩු කිරීමට, ණය සුරැකුම් පත් රජයේ බැඳුම්කරවල ආයෝජනය දිරි ගැන්වීමට කටයුතු කරනවා. රසායනික පොහොර සඳහා අපි මේ රටේ මුදල් විශාල ප්‍රමාණයක් වැය කරනවා. පසු ගිය වකවානුව ඇතුළත කොයිම කාලයකවත් කාබනික පොහොර පිළිබඳව විශ්වාසයක් තිබුණේ නැහැ. නමුත් මේ ආණ්ඩුව යටතේ අද ලබා දෙන බදු සහනවලින්, ආදායම් බදු සහනවලින් කාබනික පොහොර නිෂ්පාදනයට විශාල ධෛර්යයක් ඇති වෙනවා. අපි කොච්චර කිව්වත් වැඩක් නැහැනේ. කාබනික පොහොර සඳහා දිරි දෙන්නේ නැතිව රසායනික පොහොර භාවිතය පුළුල් වශයෙන් කරන කොට පසු ගිය වකවානුව ඇතුළත අපි කොච්චර මුදල් ප්‍රමාණයක් වැය කරලා තිබෙනවාද කියලා බලන්න. ශාරීරිකව සෞඛ්‍ය පැත්තෙන් ප්‍රයෝජනයකුත් නැහැ, අනෙක් පැත්තෙන් ප්‍රයෝජනයකුත් නැහැ. මේ බදු ක්‍රමය යටතේ අපි සූදානම් කරලා තිබෙනවා ඒ සඳහා දිරි දීම් ලබා දෙන්න.

ඊළඟට, සෘජු විදේශ ආයෝජන ගැන බලමු. ඉරාන් වික්‍රමරත්න මැතිතුමා දන්නවා, සිංගප්පූරුවේ ආයෝජනය ලිහිල් කරලා තිබෙන්නේ value added productsවලට විතරයි. ඒ අය ඒ සඳහා බදු අය කරන්නේ නැතුව බදුවලින් නිදහස් කරනවා. ඒ නිසා සිංගප්පූරුවට ආයෝජන ගලා ගෙන එනවා. ඒක තමයි අපිත් කරන්නේ. සෘජු ආයෝජනවලට අපි විශාල සහනයක් දීලා තිබෙනවා. විශේෂයෙන්ම විදේශිකයන්ගෙන් ලබා ගන්නා අත්‍යවශ්‍ය සේවා සඳහා ගෙවනු ලබන බද්ද නිදහස් කිරීමට අපි මේ තුළින් කටයුතු කරනවා. විදේශයෙන් අපට තාක්ෂණය ගේනවා නම්, අපි එසේ විදේශිකයන්ගෙන් ලබා ගන්නා තාක්ෂණය සඳහා බදු සහන දෙනවා. ඒ නිසා මේ තුළින් විදේශීය තාක්ෂණය අපට ලබා ගන්න පුළුවන්කමක් ලැබිලා තිබෙනවා. ඒ නිසා තමයි මේ බදු සහනවල වැදගත්කම තිබෙන්නේ.

විශේෂයෙන්ම විශේෂඥ සේවාවන් ලබා ගැනීමේ ප්‍රවණතාව වර්ධනය කරලා තිබෙනවා. විශේෂයෙන්ම විදෙස් ශ්‍රමිකයන් මෙරට තුළ කරනු ලබන ඉපැයීම් බදුවලින් නිදහස් කිරීම තුළින් වැඩි වශයෙන් විදෙස් විශේෂඥයන්ගෙන් සේවා ලබා ගැනීම අපි වර්ධනය කරලා තිබෙනවා. එය සෘජු ලෙසම නවීන තාක්ෂණයෙන් යුත් විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට බලපාන අතර, නව තාක්ෂණය රට තුළට ගලා ඒම සඳහා තව දුරටත් ඉඩ ප්‍රස්ථා පුළුල් කරලා තිබෙනවා.

ඔබතුමන්ලා දන්නවා, අපට දැන් වැඩියෙන්ම ආදායම එන්නේ විදේශ රැකියාවලින් බව. 2013 අවුරුද්දේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 6.5ක විතර ආදායමක් අපි එයින් බලාපොරොත්තු වෙනවා. හැබැයි, අපේ ශ්‍රමය විකුණලා ගෙනෙන මුදල්වලින් පැහැදිලි ආයෝජනයක් කරන්න තමයි ඒවා ඊයේ වැට බද්දෙන් නිදහස් කළේ.

ඊයේ ගෙනා පනත්වල තිබෙන වැදගත්කම ඒකයි. තවදුරටත් අපේ ශ්‍රමයෙන් ගෙනෙන ආදායම සම්පූර්ණයෙන්ම අප වැය කරන්නේ, මේ රටේ කුඩා ව්‍යවසායකයන් බිහි කර, ඒ ව්‍යවසායකයන්ට ශක්තිය ලබා දෙන්නයි. මෙතෙක් මේ රටේ ඒක තිබුණේ නැහැ. විශාල ආදායම් ලබා ගත්තා. ආදායම් ලබා ගත්තත් ඒ අයගේ මුදල් නාස්ති වුණා. ඒ අය විදේශිකයන්ට ශ්‍රමය විකුණා විශාල වශයෙන් ගෙනෙන මුදල්වල නිසියාකාර පරිහණයක් තිබුණේ නැහැ. මොකද, ඒ ගොල්ලන්ට මේ ව්‍යවසායන් කරන්නට සහනයක් ලැබෙන ක්‍රමයක් මේ රටේ තිබුණේ නැහැ. නමුත් ඊයේ ගෙනා පනත් තුළින් මේ සහනය ඇති කළා.

ගරු කථානායකතුමනි, දැන් බලන්න. තේවලින් ලැබෙන ආදායම ගත්තොත් ඩොලර් බිලියන 1.5යි. හරි නේද,ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හරි. හරි.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඩොලර් බිලියන 1.5යි. ඇහලුම්වලින් ලැබෙන ආදායම ගත්තොත් ඩොලර් බිලියන 5යි. නමුත් ඒකෙන් ඩොලර් බිලියන 3ක්ම කොහාටද යන්නේ? ඩොලර් බිලියන 3ක් යන්නේ ආපසු විදේශිකයන්ටමයි. අපට එන්නේ ඩොලර් බිලියන 2යි. එතකොට අපේ වැඩිම ශක්තිය තිබෙන්නේ ශ්‍රමිකයන්ගෙන්. ඊළඟට සංචාරක ව්‍යාපාරයෙන්. සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ආදායම මේ අවුරුද්දේ අඩුම වශයෙන් ඩොලර් මිලියන 1.5 ක් විතර දක්වා යාවි. ගිය අවුරුද්දේ ආදායම ඩොලර් මිලියනයක් ගත්තා. හැබැයි, මේ රටේ කලබල එන්න කලින්, 1983 වර්ෂය වෙනකොට ඒ ආදායම ඩොලර් මිලියන 5යි කියන එක ඔබතුමන්ලා දන්නවා. කලබලයට පෙර කාලයේ රුපියල් මිලියන 500යි ආදායම ආවේ. කලබල නොතිබුණා නම් මේ අවුරුද්ද වෙනකොට ඩොලර් මිලියන 5 දක්වා වූ ආදායමකට අපට යන්නට තිබුණා. නමුත් එහෙම ආදායමකට යන්න අපට බැරි වුණා. එසේ බැරි වුණේ, මේ රටේ කළු ජූලියෙන් පස්සේ ඇති වුණු ත්‍රස්තවාදය නිසා සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම විනාශ වුණු නිසායි. නමුත් අද සංචාරක ව්‍යාපාරය ඉතාමත්ම ඉහළ මට්ටමකට පැමිණෙමින් තිබෙනවා. අද මේ බදු සහනවලින් ඒ අයට විශාල සහනයක් වෙලා තිබෙනවා. එක පැත්තකින් වැට් බද්ද, අනෙක් පැත්තෙන් ආදායම් බද්ද, යන්ත්‍රෝපකරණ ආනයනය කරනවිට ගෙවන්නට තිබෙන බද්ද , ඉදි කිරීමේ ක්ෂේත්‍රයේ තිබෙන බද්ද මේ සියලු බදු මේ අණපනත් වලින් ඉවත් වී තිබෙනවා. ඒකයි මේ රටට අවශ්‍ය වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ගිය අවුරුද්දේ දිවයිනේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනය සියයට 21.6යි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියයට 21.6ක වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. කාටද නැතැයි කියා කියන්නට පුළුවන්? මොන ආණ්ඩුව ද මේක කළේ? මේ සියලු ප්‍රශ්න තිබෙද්දීයි, ඔය තමුන්නාන්සේලා කියන දුර්වලකම් ඔක්කොම තිබෙද්දීයි, මේ ආණ්ඩුව යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රය සියයට 21.6කින් වැඩි වෙලා තිබෙන්නේ. ගිය අවුරුද්දේ මහ බැංකු වාර්තාවේ තිබෙන්නේ, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනය සියයට 21.6යි කියායි. පසු ගිය වකවානුව ඇතුළදී සියයට 21.6ක වර්ධනයක් වුණා. දැන් මොකක් ද මේ අණපනත්වලින් කෙරෙන්නේ? ඒකට තිබෙන බාධා තව තවත් ඉවත් කිරීමයි. ඒකයි ආණ්ඩුව කරන්නේ. ඒකයි මම කිව්වේ. පොහොර සහනාධාරවලට කෝටි ගණනක මුදල් දෙනවා. සමෘද්ධියට මුදල් දෙනවා. සමෘද්ධි සහනාධාරයට රුපියල් මිලියන තිස් දාහක් වැඩි කළා. පසුගිය අවුරුද්දේ රුපියල් මිලියන අනූ දාහයි තිබුණේ. තව මිලියන තිස් දාහක් වැඩි කළා. ඒ එක්කම වයස අවුරුදු 70ට වැඩි අයට රුපියල් 1,000ක් දෙන්නට පටන් ගත්තා. ඒ වාගේම පාසල් පොත් ටික ලබා දෙනවා. පාසල් නිල ඇඳුම ලබා දෙනවා. මේ සේරම දෙනවා. මේ සේරම දීලත් අද මොකද කථා කරන්නේ නැත්තේ? අද එළවලු ගැන කථා කරනවා ද? [බාධා කිරීම්]නැහැ. එළවලු ගැන කථා කරනවා ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ලයිට් බිල?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
එළවලු ගැන කථා කරනවා ද? [බාධා කිරීමක්] එළවලු මිල අඩු එක ගැන කථා කළා ද? කුණු කොල්ලයට එළවලු තිබෙනවා. නිකම්ම මේක ඇති වුණාද? නැහැ නේ. ඇයි මේවා ගැන කථා නොකරන්නේ? ජීවන වියදම වැඩි වීම ගැන කථා කරනවා. ලයිට් බිල ගැන තමුන්නාන්සේලා කථා කරනවා. හැබැයි අඩු වෙච්ච එකක් ගැන කථා කරන්නේ නැහැ. හාල් මිල පාලනය වෙච්ච එක ගැන කථා කරන්නේ නැහැ. අනෙක් පැත්තෙන් එළවලු මිල අඩු වෙච්ච එක ගැන කථා කරන්නේ නැහැ. ආණ්ඩුව මේ සියල්ලමත් එක්ක, සහනාධාර දෙන එක ගැන කථා කරන්නේ නැහැ. මේ ඔක්කොම පසු ගිය වකවානුව ඇතුළතදී අප දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, එක පැත්තකින් ආයෝජන මණ්ඩලයේ අනුමතිය තිබෙන ව්‍යාපෘතිවල ඉදිකිරීම්වලට අවශ්‍ය කරන යන්ත්‍රසූත්‍ර ආදිය ආනයනය කිරීමේදී දේශීය මිලදී ගැනීම්වලට වැට් බදු ඉවත් කිරීම නිසා කර්මාන්තශාලා, මාර්ග, අනෙකුත් ව්‍යාපාරික ඉදිකිරීම් කටයුතුවලින් දැරීමට සිදු වන පිරිවැය අප අඩු කර තිබෙනවා. එමෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය කරන යන්ත්‍රසූත්‍ර ආනයනය කිරීමට අප ව්‍යාපාරිකයන් දිරිමත් කර තිබෙනවා.

පසු ගිය වකවානුව ඇතුළත ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යන්ත්‍රෝපකරණවලට විශාල බද්දක් ගැහුවා. මේ අවුරුද්දේ සිට leasing ක්‍රමයට ඒ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේදීත් ඒ වැට් බද්ද අයින් වෙලා තිබෙනවා. එයින් සාමාන්‍ය මිනිහාටත් මේ කටයුතු කර ගෙන යන්න පුළුවන්කමක් ඇති වෙලා තිබෙනවා.

වැට් බද්ද නිදහස් කිරීමෙන් ගොඩනැංවීම් ක්ෂේත්‍රයේ සමස්ත පිරිවැය මෙන්ම ස්ථාපිත කිරීමේ පිරිවැයේත් අඩුවීමක් සිදු වේ. මෙම යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීමට ශක්තියක් නැති ආයෝජකයන්ට ඒවා කල්බදු - leasing - ක්‍රමයට ගන්නට පෙළඹවීමට මේ පනත් කෙටුම්පත්වල තිබෙන සහන තුළින් අපි බලාපොරොත්තු වනවා. එයින් මේ ක්ෂේත්‍රය ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්නට පුළුවන් වේවි.

දේශීය අමුද්‍රව්‍ය යෙදවුම් මඟින් කරනු ලබන නිෂ්පාදන සෘජු ආනයනකරුවන් වෙත සපයනු ලබන අවස්ථාවලදී වැට් ලියා පදිංචි පුද්ගලයන් විසින් අය කරනු ලබන බදු නිදහස් කිරීම තුළින් එවැනි භාණ්ඩ මිලදී ගැනීමට ඇති අවස්ථා පුළුල් වෙනවා. මෙයින් සෘජු ලෙසම අවසාන නිෂ්පාදන පිරිවැය අඩු වෙනවා. මෙතෙක් කල් දේශීයව නිෂ්පාදනය කරනු ලබන දේවලට මේ සහනය අඩුවෙන් දී තිබුණේ. හැබැයි දැන් අපි මෙයින් ඒ සහනය වැඩියෙන් දී තිබෙනවා. ආණ්ඩුවට එන ප්‍රධාන ආදායම් මාර්ග අහුරා ගෙන අපි මේ කරන්නේ නිෂ්පාදන ක්ෂේත්‍රයට මේ රට කොහොමද, ඉදිරි කාලය ඇතුළත යොමු කරන්නේ කියලා සොයා බැලීමයි. ඒක තමයි මේ සරල බදු ක්‍රමයේ එක පරමාර්ථයක් වෙලා තිබෙන්නේ.

[ගරු ලක්ෂ්මන් යාපා අබෙවර්ධන මහතා]

ඒ විතරක් නොවෙයි, ආයෝජකයන්ට ස්ථීර බදු ප්‍රතිපත්තියක් අපි අනුගමනය කළ යුතුයි. ගරු කථානායකතුමනි, අපි අවුරුද්දකට ගිවිසුමක් අත්සන් කළාම, ආයෝජන මණ්ඩලය අවුරුදු පහද, අවුරුදු පහක් යන තෙක් මේක සම්පූර්ණයෙන් වෙනස් කරන්නේ නැති විධියට කැමැත්තක් ගන්න අපි ඉදිරි කාලයේදී බලාපෙරොත්තු වනවා. එයින් ලොකු සහනයක් අපි බලාපොරොත්තු වනවා.

විදේශ රැකියා නියුක්තිකයන්ගෙන් ඉපැයීම් කරනු ලබන ආයෝජනවල භාණ්ඩ හා සේවා ක්ෂේත්‍රවල වැට බද්ද අහෝසි කිරීම තුළින් වඩ වඩාත් දේශීය ආයෝජන කෙරෙහි නැඹුරු වීමක් සිදු වෙනවා. විදේශ රැකියා නියුක්තිකයන්ගේ තම ඉතුරුම් බොහෝ විට ආයෝජනය කරනු ලබන්නේ පෞද්ගලික ඉදිකිරීම් කටයුතු වෙනුවෙන්. ඔවුන් ඵලදායී ආයෝජනයන් කෙරෙහි යොමු කිරීම සඳහා මෙම වැට බදු සහනය උපකාරී වනු ඇත.

දිවයිනේ සමහර ප්‍රදේශවල සංකීර්ණ ගැටලුවක්ව පවතින කැළි කසළ ඉවත් කිරීමේ කටයුතු සඳහා කරනු ලබන ආයෝජනවලට මෙය සෘජු ලෙස බලපානවා.

ප්‍රාදේශීය සභා, නගර සභා තුළ සිදු කරන කැළි කසළ ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිවලට අවශ්‍ය භාණ්ඩ මේ වැට බද්දෙන් නිදහස් කර තිබෙනවා. ඒ තුළින් අපට නගර සභා, ප්‍රාදේශීය සභා වාගේ ඒවායේ කළමනාකාරීත්වය ශක්තිමත් කරන්න පුළුවන්. වැට බද්දෙන් නිදහස්ව භාණ්ඩ ගෙන්වීමට ඉඩ දීම තුළින් මේ වාගේ ආයතනවල විශාල වෙනසක් සිදු කරන්න අපට පුළුවන්. ඉදිරි කාලයේදී සාමාන්‍ය ජනතාවටයි එය බලපාන්නේ.

ඒ නිසා ගරු කථානායකතුමනි, මේ වැට බදු සහ ආදායම් බදු පනත් සංශෝධනය මේ ආණ්ඩුව කරන්නේ මේ ආණ්ඩුවේ ආදායම් අහිමි කරගෙනයි. හැබැයි අපට බලාපොරොත්තුවක් තිබෙනවා, 2014 වර්ෂය වන කොට මේ රටේ ඉපැයුම් ක්ෂේත්‍රයට, නිෂ්පාදන ක්ෂේත්‍රයට විශාල වශයෙන් යන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසා මේ ඉතාමත්ම කාලෝචිත සංශෝධන පනත් කෙටුම්පත් බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

[අ.භා.3.43]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අද සභ ඊයේ ඉදිරිපත් කළ මේ පනත් කෙටුම්පත් ගැන අදහස් කීපයක් කියන්න අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වනවා.

මේ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු කථා කළ විධියට, බදු ගහන්නේ ජනතාවට ආදරය නිසායි, ජනතාවට සහන දෙන්නයි. එලෙසට තමයි එතුමන්ලා දිගින් දිගටම ප්‍රකාශ කළේ. විශේෂයෙන්ම ඒ බදු ගහන එක සාධාරණීකරණය කරන්න එතුමන්ලා සෑහෙන්න කථා කළා. නමුත් මම එතුමන්ලාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් ගම් දනව්වලට ගිහිල්ලා ඒ කථාව කියන්න කියලා. "බදු ගහන්නේ ජනතාවට සාධාරණයක් කරන්න" කියන ඔය කථාව ගම්වලට ගිහිල්ලා කියන්න. එහෙම කියන්න ගම්වලට යන්නෙත් නැහැ, මේ ගොල්ලෝ. ගම්වලට යන්නේ ගස්, ගල් පෙරළාගෙන, මිනිස්සු පෙරළාගෙන. ජනතාවගේ මුදල්වලින් විශාල වියදමක් කරලා, ආරක්ෂක සේනාව පිරිවරා ගෙන ගම්වලට යන්නේ. ඒ නිසා ගම්වලට ගිහිල්ලා ඒක කියන්න බැහැ.

දැන් මෙතැන ඇවිල්ලා කියනවා, බදු ගහන්නේ මිනිසුන්ට තිබෙන පීඩාව අයින් කරන්න තව තවත් සහන දෙන්නලු. මොකක්ද ඒ කථාව? අපට ඒක තේරෙන්නේ නැහැ.

රුපියල් 25ක් වුණු දිවුරුම් ප්‍රකාශයේ මුද්දර ගාස්තුව රුපියල් 250 කරලා, ගොවි රක්ෂණය අහෝසි කරලා, සෞඛ්‍ය සහ අධ්‍යාපනයේ බර සම්පූර්ණයෙන්ම මේ රටේ පීඩාවට පත් වුණු මිනිසුන්ගේ පිට දාලා දැන් විදුලි බිලත් වැඩි කරන්න ලෑස්ති කරලා තිබෙනවා. ඊළඟට ඉදිරියේදී ඉන්ධන මිල වැඩි වීමේ ප්‍රශ්නයත් එක්ක ප්‍රවාහන ගාස්තු වැඩි කරන්නත් හදනවා. අපි අහන්න කැමැතියි, ඒ ඔක්කෝම කළේ ජනතාව ගැන හිතලාද කියලා. පෙට්‍රල් හා ඩීසල්වල මිල වැඩි කළේ, විදුලි බිල වැඩි කරන්නේ, සෞඛ්‍ය සහ අධ්‍යාපනයට වෙන් කළ මුදල් දවසින් දවස කපන්නේ, ඒ බර මිනිසුන්ගේ පිට පටවන්නේ, රුපියල් 25ක් වූ දිවුරුම් ප්‍රකාශයේ මුද්දර ගාස්තුව රුපියල් 250 කළේ මිනිසුන් ගැන හිතලාද? එහෙම තමයි දිගින් දිගට කථා කළේ. මේ පාලකයෝ අලුතෙන් කිසිවක් මිනිසුන්ට නොදී මිනිසුන්ගේ මුළු සර්වාංගයම හූරා ගෙන කෑවා. මා ඒකයි කිව්වේ. හූරා ගෙන කාලා මදි වෙලා දැන් හාරා ගෙන කනවා. උඩින් හූරා ගෙන කාලා මදි. දැන් ඇතුළටම හාරා ගෙන කනවා. බඩ බොකුවලටම අත දාලා හූරා ගෙන කනවා. දැන් හාරා ගෙන කන ගමන් කියනවා, අපි ඒවා කරන්නේ මිනිසුන් ගැන හිතලා කියලා.

අද ගොවි, කම්කරු, ධීවර, තරුණ හා ශිෂ්‍ය සියලු පීඩිතයෝ සීමාවක් නැතුව පීඩාවට පත් වෙනවා. සීමාවක් නැතිව මේ පාලකයෝ ඔවුන්ට පහර දෙනවා. ගරු කථානායකතුමනි, දැන් එලෙස බදු ගහලා ගහලා මොකක්ද කරලා තිබෙන්නේ? එතැනින් නැවතිලා නැහැ. සහනාධාර දෙනවා කිව්වා. ධීවරයන්ට සහනාධාරයක් දුන්නා. මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා ඒ කාරණය සම්බන්ධව. මේ ගරු සභාවේදී මීට කලිනුත් ඒ ගැන කථා වුණා.

ධීවරයන්ට දෙනවා කිව්ව සහනාධාරයට අද මොකක්ද කරලා තිබෙන්නේ? 2012 පෙබරවාරි 11 වැනිදා මේ පාලකයෝ ඉතාම දුෂ්ට විධියට රුපියල් 36කින් ඩීසල් මිල වැඩි කළා. පෙට්‍රල් මිල වැඩි කළා. රුපියල් 35කින් භූමිතෙල් මිල වැඩි කළා. ඉන් පස්සේ ධීවරයෝ දැවැන්ත උද්ඝෝෂණයක් කළා. කාගේවත් ඉගැන්නුම් බහකට නොවෙයි ඒක කළේ. ස්වේච්ඡාවෙන් පාරට බැහැපු ධීවරයෝ උද්ඝෝෂණය කළා. මොකක්ද පාලකයෝ කළේ? ඒ උද්ඝෝෂණය කරපු ධීවරයන්ව ඝාතනය කළා. ඇන්ටනි ප්‍රනාන්දුව මැරුවා. ජේසුමරියා වෙඩි වැදිලා ඔත්පල වුණා. ඉන් පස්සේ ඔහුගේ දරුවා ජීවත් වන්න විධියක් නැති නිසා අධ්‍යාපනය නවත්වලා මුහුදු යන්න ගත්තාම ඒක දරා ගන්න බැරිව ජේසුමරියා එල්ලුණා. එල්ලුණේ නැහැ. ඇත්තටම මේ පාලකයෝ එල්ලුවා. එහෙම උද්ඝෝෂණය කරලා ඔවුන් ඉල්ලුවේ මොකක්ද? රුපියල් 71ට භූමිතෙල් දෙන්න, පරණ මිලට ඩීසල් දෙන්න කියලායි. නමුත් මේ ආණ්ඩුව මොකක්ද කළේ? ඒ ඉල්ලපු පරණ මිලට ඩීසල් දුන්නේ නැහැ. ධීවරයෝ දෙදෙනෙකුගේ ජීවිතය අහිමි වුණාට පස්සේ හිඟන සහනාධාරයක් දුන්නා. ඒක හිඟන සහනාධාරයක්. ඒ හිඟන සහනාධාරයෙන් ධීවරයන්ට ඔවුන්ගේ ජීවිත ගෙන යන්න බැරි වුණා. ඊට පස්සේ මොකක්ද කළේ? ඒ card එක ගන්න ඇමතිවරු පස්සේ, මන්ත්‍රීවරු පස්සේ යන්න වුණා.

ආණ්ඩුවේ සමිතියේ සාමාජිකයෝ වෙලා අනිවාර්යයෙන් රක්ෂණය ගන්න වුණා. තවම රක්ෂණයට card එකක්වත්, සහතිකයක්වත් නැහැ. රුපියල් 750ක්, 1,500ක් දීලා රක්ෂණය වෙලා, ආණ්ඩුවේ සමිතියේ සාමාජිකයෝ වෙලා, ඒ සහනාධාරය ගන්න දවස් ගණනක් මුහුදු නොගිහින් ගොඩ රස්තියාදු වෙන්න වුණා; කාර්යාලවල රස්තියාදු වෙන්න වුණා. ධීවරයෝ විතරක් නොවෙයි, ධීවර අමාත්‍යාංශයේ නිලධාරිනුත් ඒකෙන් බරපතළ පීඩාවකට පත් වුණා. උතුරු නැගෙනහිර ධීවරයන්ට සිද්ධ වුණා

ඒ card එක වෙනුවෙන් රුපියල් 4,000ක්, රුපියල් 4,500ක් වියදම් කරන්න. මම පසු ගිය දවස්වල කෝකිලායි කලපුවට ගියා. කෝකිලායි කලපුවේ ධීවරයන්ට තෙල් ගහන්න shed එකක් නැති නිසා ඒ card එකේ රුපියල් 9,375 ගන්න ඇතට යන්න රුපියල් 4,000ක් වියදම් කරන්න ඕනෑ.

ඊයේ වන කොට මොකක්ද තත්ත්වය? මාර්තු මාසයේ ඒ ඉන්ධන සහනාධාරයවත් දුන්නේ නැහැ. ධීවරයෝ ඉල්ලුවේ ඒ හිඟන සහනාධාරය නොවෙයි. ඒක තීරණය කළේ පාලකයෝ. එහෙම කළෙත් මිනිසුන් දෙදෙනෙකු ජීවිත පරිත්‍යාග කළාට පස්සේයි. ඒ සහනාධාරය මාර්තු මාසයේ දුන්නේ නැහැ. අප්‍රේල් මාසයේ දුන්නෙත් නැහැ. 03වැනිදා ධීවර සංවිධාන එකමුතුව විධියට තීරණයක් ගත්තා උද්ඝෝෂණයක් කරනවා කියලා. 09වැනිදා දුන්නා card එක. ඒ දුන්නෙත් කොහොමද? සියයට 10ක් කපලා. ලැබෙන්න ඕනෑ card ප්‍රමාණයෙන් සියයට 10ක් කැපුවා. මේ පාලකයෝ අටවපු උගුල නිසා නිලධාරීන් බරපතළ අසීරුතාවකට පත් වුණා. අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා ධීවරයන්ට. මේ වෙලාවේ සංවිධානාත්මකව එකතු වෙලා මේ පාලකයන්ට තරවටු කිරීම ගැන. අපි ඉල්ලුවේ හිඟන සහනාධාර නොවෙයි, පරණ මිලට තෙල්. පරණ මිලට තෙල් දෙන්න කියලා ඒ කරපු බලපෑම නිසා තමයි ඊයේ සහනාධාරය දෙන්න සිද්ධ වුණේ. ඒ නිසා අපි කියනවා, ඒ දීපු සහනාධාරයත් අඩු ගණනේ රස්තියාදු නොකර දෙන්න කියලා. මුහුදු යන ධීවරයාට මුහුදු යන්න ඉඩකඩ හදලා, හෙට අනිද්දා වන කොට මාර්තු සහ අප්‍රේල් මාස දෙකේම ධීවර සහනාධාරය දෙන්න ඕනෑ. තමන් දුන්නු එකවත් දෙන්න. ඒ එක පැත්තකින්. ඔවුන්ගේ අරගලය නිසා අද ඔවුන්ට ඒ සහනාධාරය ඒ මට්ටමෙන්වත් ගන්න පුළුවන් වුණා. අද ධීවරයාට දෛනික ජීවන බර, සෞඛ්‍ය, අධ්‍යාපන බර මදිවාට මේ තෙල් බරත් පටවලා ඔවුන් ඒ තෙල් උගුලේ හිර කරලා තිබෙනවා. ඒ නිසා අපි මේ වෙලාවේ බල කරනවා, ඒ මර උගුලෙන් ඒ ධීවරයා ගලවා ගන්න මැදිහත් වෙන්න කියලා.

ඊයේ-පෙරේදා ඩීසල් මිල වැඩි කළා. ආණ්ඩුව කිව්වා, ධීවර සම්මේලනයේදී -ආණ්ඩුව අටවපු ධීවර සම්මේලනයේදී- වැඩි වෙච්ච තෙල් මිලට ධීවරයෝ සහනාධාරයක් ඉල්ලුවේ නැහැ කියලා. ධීවර අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ තොටුපොළෙන්, තොටුපොළට ගිහිල්ලා, ඊයේ-පෙරේදා වැඩි කරපු ඉන්ධනවලට ධීවරයෝ සහනාධාරය ඉල්ලුවේ නැද්ද කියා අහලා බලන්න. තමන්ට කැමති -හිතෛෂී- සමිතියක් අටවා ගෙන ඒ සමිතියෙන් අහලා හරි යන්නේ නැහැ. තොටුපොළට,වරායට, නැංගුරම්පොළට ගිහිල්ලා ඇත්ත ධීවරයාගෙන් අහන්න. එහෙම ඇහුවේ නැහැ. තමන්ම තමන්ගේ සමිති හදා ගෙන එහෙම තීරණය කළාට හරි යන්නේ නැහැ.

විශේෂයෙන්ම ඊළඟට මම මතක් කරනවා, ඉන්දියානු බෝට්ටු මුහුදු ආක්‍රමණය කර තිබෙන බව. ආණ්ඩුවේ බලසම්පන්න ඇමතිවරු තමන්ගේ හිතෛෂීන්ට විතරක් උතුරේ මුහුදු බදු දීලා තිබෙනවා. මේ තත්ත්වය පාලනය කරන්න රාජ්‍ය තාන්ත්‍රිකව මැදිහත් වෙනවාද? අහිංසක දුප්පත් ධීවරයා අවුරුදු 30ක් තිස්සේ උතුරු, නැඟෙනහිර යුද්ධය නිසා පීඩාවට පත් වුණා. අද යුද්ධය අවසන් කරලා මේ ආණ්ඩුව පම්පෝරි ගහනවා. ඒ පම්පෝරි ගහන වෙලාවෙත් අද ඒ ධීවරයාට මුහුදේ ධීවර කර්මාන්තය කර ගන්න බැහැ. අපි ගියා පුනරීන්වලට. ගරු කථානායකතුමනි, ඒ ධීවරයෝ ඉල්ලුවා, ඔවුන්ගේ තොටුපොළ බලා ගන්න මේ පාර්ලිමේන්තුව වටේ ගහලා තිබෙනවා වාගේ solar light එකක්වත් අඩු ගණනේ ලබා දෙන්න කියලා. අද මුහුදෙන් ගොඩට එන ධීවරයාට තොටුපොළ බලා ගන්න ආලෝකයක්වත් නැහැ. ඒකවත් දෙන්න මේ පාලකයන්ට බැරි වෙලා තිබෙනවා. මේ ඔක්කෝම බදු ගහන්නේ ජනතාවට සහන දෙන්න කියලා කියන ආණ්ඩුවට අඩු ගණනේ උතුරේ ධීවරයාට light එකක් දාලා දෙන්න බැරි වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ එක කාරණයක්.

අද මිනිසුන්ට කාලා ඇඳලා ජීවත් වෙන්න බැරි මහා බරක් උරුම කරලා තිබෙනවා විතරක් නොවෙයි, අද නිදහසේ හුස්ම ගන්නවත් මේ පාලකයෝ ඉඩ දීලා නැහැ. නිදහසේ හුස්ම ගන්නවත් බැහැ. මම විශේෂයෙන්ම තමුන්නාන්සේට මතක් කරනවා, කොලොන්නාව බල ප්‍රදේශයේ මීතොටමුල්ලේදී වුණු සිද්ධිය. ඒ ප්‍රදේශයේ මිනිස්සු මොනවාද ඉල්ලුවේ? ඒ ප්‍රදේශයේ මිනිස්සු රස්සා ඉල්ලුවේ නැහැ. පඩි වැඩි කරන්න කියලා ඉල්ලුවේ නැහැ. බඩු මිල අඩු කරන්න කියලා ඉල්ලුවේ නැහැ. නිදහසේ හුස්ම ගන්න අපට ඉඩ දීපල්ලා කියායි ඉල්ලුවේ. නමුත් ඒකටවත් මේ පාලකයන් ඉඩ දෙන්නේ නැහැ. ඒකටවත් ඉඩ දෙන්නේ නැහැ. අද ආණ්ඩුව ලස්සන රටක් හදනවා කියලා පම්පෝරි ගහනවා. ලස්සන රටක් හදනවා කියලා කොළඹ ලස්සන කරන්න හදනවා. කොළඹ ලස්සන කරනවා කියන්නේ රට ලස්සන කරනවා කියන එක නොවෙයි. ලස්සන කොළඹක් හදනවා කියලා පාර්ලිමේන්තුව වටේ මේ මැති ඇමතිවරු එන කොට පෙනෙන සීමාව ලස්සන කරන්න හදනවා. කොළඹ ලස්සන කරනවා කියන්නේ පාර්ලිමේන්තුව වටේ ලස්සන කරන එක විතරක් නොවෙයි. රට කියන්නේ කොළඹ නොවෙයි. කොළඹ කියන්නේ පාර්ලිමේන්තු වටෙත් නොවෙයි. ඒක මේ පාලකයන් තේරුම් ගන්න ඕනෑ. කොළඹ ලස්සන කළාට රට ලස්සන වෙන්නේත් නැහැ. පාර්ලිමේන්තුව වටේ ලස්සන කළාට කොළඹ ලස්සන වෙන්නේත් නැහැ. අද මොකක්ද කරන්නේ? [බාධා කිරීමක්] ඉන්න මම කියන්න. පොඩ්ඩක් හැන්දෑවට එන්න. හම්බ වෙලා තමුන්නාන්සේට එක පන්තියක් කරන්නම්. හවසට එන්න, මේ සභාවේ වැඩ ඉවර වුණාම ලස්සන කරන්න ඕනෑ තැන ගැන මම උගන්වන්නම්.

ගරු කථානායකතුමනි, සුදු ඇන්දෙව්වාට මිනිස්සු ලස්සන වෙන්නේ නැහැ. ඇතුළත් ලස්සන වෙන්න ඕනෑ. සුදු ඇඳුමක් ඇන්ද පළියට ලස්සන වෙන්නේ නැහැ. ඒකත් කියන්න ඕනෑ. ඇත්තටම කොළඹ ලස්සනද? අද ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මොකක්ද කරන්න හදන්නේ? ඒ හදන ලස්සන කොළඹ තමයි කැතම කොළඹ වෙලා තිබෙන්නේ. ඒ හදන ලස්සන කොළඹ තමයි කැතම කොළඹ. අද කොළඹ කුඩු ජාවාරම, ගණිකා වෘත්තිය ඉහළ ගිහිල්ලා. ඒ වාගේම විදුලිය, සෞඛ්‍ය, සනීපාරක්ෂක පහසුකම් නැතුව කී දාහක්, ලක්ෂ ගණනක් පීඩාවට පත් වෙලාද? ඒ නිසා ඒ පීඩාව යටපත් කරන්න මේ පාර්ලිමේන්තුව වටේ විතරක් ලස්සන කරලා හරි යන්නේ නැහැ. ඒ නිසා අපි අභියෝග කරනවා පුළුවන් නම් ඒ පීඩිතයන්ගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න කියලා.

අද කොළඹ බුලත් විටක් විකුණා ගන්න, කෑද විදුරුවක් විකුණා ගන්න මිනිහෙකුට තිබෙන ඉඩකඩ, ත්‍රිරෝද රථයක් park කරන්න තිබෙන ඉඩකඩ පවා අහිමි කරලා තිබෙනවා. විකල්ප වැඩ පිළිවෙළක් නැතුව කොළඹ ජනතාව පීඩාවට පත් කරනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුව වටේ සෝලා ලාම්පු සවි කරලා ඒකෙන් කොළඹ ලස්සන කරන්න බැහැ. මේ පැල්පත්වල ජීවත් වන ඉගෙන ගැනීමේ අයිතිය නැති වෙච්ච දරුවන්ගේ, සෞඛ්‍ය පහසුකම් නැති වෙච්ච මිනිස්සුන්ගේ, එදා වේල කන්න නැති මිනිසුන්ගේ පානීය ජල ප්‍රශ්නය, වැසිකිළි ප්‍රශ්නය විසඳන්න මැදිහත් වෙන්න.

දැන් මොකක්ද කරන්නේ? කොළඹ දුප්පත්කම නැති කරනවා කියලා දුප්පතුන් පිටමං කරන, දුප්පතුන් පළවා හරින වැඩ පිළිවෙළකට මේ පාලකයන් ඇවිල්ලා. ගරු කථානායකතුමනි, එහි එක් බේදවාචකයක් තමයි මීතොටමුල්ල කුණු කන්ද.

ඊයේ මොකක්ද කළේ? මීතොටමුල්ල ප්‍රදේශයේ උද්ඝෝෂණයේ යෙදුණු මිනිසුන්ට පහර දීලා පළවා හැරියා. මීතොටමුල්ල මිනිසුන් මහජන පීඩාවක් කරනවා කියලා නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මහත්මයා උසාවියට ගියා.

[ගරු අජිත් කුමාර මහතා]

ඇත්තටම මහජන පීඩාව කරන්නේ පාලකයෝයි. මීතොටමුල්ල මිනිස්සු මහජන පීඩාවක් කරනවා, ඒ නිසා ඔවුන්ව ඉවත් කරන්න කියලා පොලීසිය උසාවි ගියා. නමුත් අධිකරණය ඒක ප්‍රතික්ෂේප කළා. මීතොටමුල්ල ප්‍රදේශයේ ජනතාවගේ උද්ඝෝෂණය නතර කරන්න කියලා ඉල්ලපු ඉල්ලීම අධිකරණය ප්‍රතික්ෂේප කළා. ඒ නිසා පොලීසිය නඩුව ඉල්ලා අස් කර ගත්තා. ඊට පස්සේ මොකක්ද කළේ? පොලීසිය නඩුව ඉල්ලා අස් කර ගෙන ඇවිල්ලා මිනිසුන්ට ගහලා පැන්නුවා; කාන්තාවන්ට පහර දුන්නා. මේ සිද්ධියට සම්බන්ධ ඡායාරූප, වීඩියෝ පට වෙබ් අඩවිවල ප්‍රදර්ශනය කරලා තිබෙනවා. පොලීසිය මේ ජනතාවට අමානුෂික විධියට පහර දුන්නා. පහර දීලා අත් අඩංගුවට ගත්තා. එම උද්ඝෝෂණයේ යෙදුණු කාන්තාවන් අත් අඩංගුවට ගත්තේ කාන්තා පොලිස් නිලධාරිනියන් නොවෙයි. බිලූමැන්ඩල් කුණු කන්ද සම්බන්ධයෙන් අධිකරණය නියෝගයක් දුන්නාට පස්සේ එම කුණු මීතොටමුල්ලට ගිහිල්ලා දමන්න තීරණය කළා. මේ සඳහා උසාවිය අවසර දුන්නේ අවුරුදු දෙකකට, අක්කර දෙකකටයි. නමුත් අක්කර 17ක කුණු කන්ද අවුරුදු හතරක් තිස්සේ තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මන්ත්‍රීතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මට එක විනාඩියක් දෙන්න. හදිසියෙන් හම්බ වන වෙලාව.

අවුරුදු හතරක් තිස්සේ මීතොටමුල්ල ප්‍රදේශයේ අක්කර 17කට කුණු දැම්මා. ඒ නිසා මීතොටමුල්ල රාහුල ඉස්කෝලය වැහුවා. කුණු කන්ද කඩා ගෙන වැටිලා ඉස්සෙල්ලා තුනේ පන්තිය වැහුවා. පස්සේ මුළු ඉස්කෝලයම වැහුවා. මොකද ළමයි ඉස්කෝලේ යනකොට ගියේ පණුවොත් එක්කයි. සියයට 90කට ශ්වසන රෝග; සියලු ළමයින්ට චර්ම රෝග; මානසික ආබාධ. කොළඹ ලස්සන කරනවා කියන්නේ පවුල් 4,500ක් විතර ජීවත් වන අක්කර දෙකක වර්ගඵලයක, ඉතා විශාල ජන ඝනත්වයක් තිබෙන තැනක මුළු කොළඹම කුණු ගිහිල්ලා එතැනට දමන එකද? එක ගෙදරක දවසක කුණු එකතු වුණොත් කොපමණද? ඒක දරා ගන්න පුළුවන්ද? මේ මිනිසුන් ජීවත් වන මේ වත්තේ පවුල් පහකට දවසකට ටොන් දෙකක කුණු වැටෙනවා. නාගරික කොමසාරිස්තුමිය කිව්වා, දවස් තුනට කුණු ටොන් 2,400ක් හිර වුණා කියලා. ඒ කියන්නේ මොකක්ද? කුණු ටොන් 800ක් දවසකට මීතොටමුල්ලට ගොඩ බස්සනවා. එක පවුලකට කුණු ටොන් එකක් විතර වෙනවා. එහෙනම් මහජන පීඩාව වෙලා තිබෙන්නේ කාටද? මහජන පීඩාව වෙලා තිබෙන්නේ මුළු කොළඹම සිටින අනෙක් මිනිසුන්ට නොවෙයි, මීතොටමුල්ලේ ජීවත් වන ඒ මිනිසුන්ටයි. අද මේ පාලකයන්ගේ වැඩේ ඒකද? දුප්පත් මිනිසුන් පීඩාවට පත් කරලා කොළඹ ලස්සන කරන එකද ඔවුන්ගේ කාර්යය?

ගරු කථානායකතුමනි, කොළඹ ලස්සන කරන්න වෙන ක්‍රමයක් හොයා ගන්න ඕනෑ. කොළඹ කුණු දමන්න වෙන සැලසුමක් තිබෙන්න ඕනෑ. එහෙම සැලසුමක් නැතිව අධිකරණ නියෝග පවා පැත්තකට දමා, උසාවි පැත්තකට දමා, නීතිය පැත්තකට දමා මීතොටමුල්ලේ දහස් ගණන් මිනිසුන් කුණු කන්දකට යට කරන එක සාධාරණද? ඒ නිසා අප අහනවා, මේ ඔක්කෝම දේවල් කරන්නේ ජනතාවට සහන දෙන්නද කියලා. ඒ නිසා ඊයේ සිදු වූ ඒ මිලේච්ඡ පොලිස් පහර දීම අප අවධාරණය කරනවා; හෙළා දකිනවා. කුණු කන්දට කලිනුයි ඒ මිනිසුන් එතැනට ආවේ. ඒ මිනිස්සු ඉල්ලුවේ ඒක. ඒ මිනිස්සු ඉල්ලුවේ, "අපට කියන්න, 2014 හරි යනවාද කියා. ඒ ගැන ලිඛිත දැන්වීමක් කරන්න." කියන එකයි. එහෙම දෙන්න බැහැ කිව්වා. ඒ කුණු කන්දට කලින් එතැනට ආවේ මීතොටමුල්ලේ මිනිස්සුයි. එහෙනම් කුණු කන්දට කලින් එතැනට ආපු මිනිසුන්ට එතැන ඉන්න අයිතිය තිබෙන්න ඕනෑ. ඒ නිසා මේ කොළඹ ලස්සන කරනවා කියන්නේ, රට ලස්සන කරනවා කියන්නේ දුප්පතුන් එළවා දමා, දුප්පතුන්ට නිදහසේ හුස්ම ගන්නවත් ඉඩ නැති කරන එක නොවෙයි, ඒකට ඉඩ සලසන එකයි. ඒ නිසා අප ජනතාවට කියනවා, මේ දුෂ්ට පාලනයට විරුද්ධව, මේ වාගේ අසාධාරණකම්වලට විරුද්ධව නැඟී සිටින්න, ඒකට භය වන්න එපා, ඒක තමන්ගේ අයිතිය, ඒ අයිතිය වෙනුවෙන් නැඟී සිටින්න කියලා මා ඒ ජනතාවට ආරාධනා කරනවා. බොහොම ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ශ්‍රියාණි විජේවික්‍රම මහත්මිය.

[අ.භා.3.57]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, අද විවාදයට සහභාගිවීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම අද විවාදයට ගන්නා දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත, ඒ වාගේම නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත, ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත සහ ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත කියන මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් මා කරුණු කීපයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

අතිගරු ජනාධිපතිතුමන් පසු ගිය අය වැයෙන් අපේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් විවිධ සහන ලබා දෙනු ලැබුවා. එහිදී ගන්නට යෙදුණු යහපත් පියවර සම්බන්ධයෙන් ජනතාවට ඒ සහන ලබා දීමේ අවස්ථාවක් විධියටයි මේ දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත අද ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම ආදායම් බදු සරල කිරීම, බදු ප්‍රතිසංස්කරණ පුළුල් කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය සඳහා පහසුකම් සැපයීම, රජය විසින් ජනතාවට නොමිලයේ සපයන සේවාවන්වල පිරිවැය අඩු කිරීම, ණය සුරැකුම්පත් හා රජයේ බැදුම්කරවල ආයෝජන දිරි ගැන්වීම වාගේම අධ්‍යාපනය සම්බන්ධයෙන්, ලාභ නොලබන ආයතනවලට සහන සැලසීම,අද අත්‍යවශ්‍ය උවමනාවක් විධියට පවතින කාබනික පොහොර වගාව සම්බන්ධයෙන් සහන සැලසීමත් ඉතා වටිනා අවස්ථාවන් වනවා. මොකද, අද අපේ රටේ රජරට ප්‍රදේශයේ වකුගඩු රෝගය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම එය පැතිරීමේ අවදානමක් තිබෙන බවත් අප සියලු දෙනාම දන්නවා. ඒ නිසා මේ කාබනික පොහොර වගාව සම්බන්ධයෙන් සහන ලබා දීම ඉතාමත් කාලෝචිත පියවරක් විධියටයි මා දකින්නේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ලෝකයේ තෙල් නිධි ඉවර වේගෙන යන යුගයක් මේ තිබෙන්නේ. ඒ නිසා දැනට ලෝකයේ තෙල් සම්බන්ධයෙන් පවතින තත්ත්වයත් එක්ක සලකා බැලීමේදී පුනර්ජනනීය බලශක්ති ක්‍රම හඳුන්වා දීම, ඒවා වැඩි වශයෙන් ජනතාවට භාවිතා කිරීමට කටයුතු කිරීම වැනි ව්‍යාපෘති ඉතාමත් වැදගත් වෙනවා. ඒ නිසා දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් අපේ රටේ ජනතාවට විශාල සහන රැසක් ලැබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අද ජනතාවට හුස්ම ගන්නවත් අවස්ථාවක් නැහැ කියලා ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා සඳහන් කළා. ජනතාවට හුස්ම ගන්න බැරි වුණේ මොන යුගයේද කියලා මා අහන්න කැමැතියි. අප මෙතරම් සහන සලසන්නේ ජනතාව වෙනුවෙනුයි. ඒ නිසා එතුමන්ලා ඒ යුගය මතක් කර ගන්නවා නම් හොඳයි කියන කාරණාව මා මතක් කරනවා.

විශේෂයෙන් නීතිඥවරියක් විධියට මට බොහොම සමීප පනත් කෙටුම්පත් තුනක් තමයි ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත, නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත සහ ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත. ගරු කථානායකතුමනි, මිනිසුන්ගේ යම් යම් සුරැකුම් සහිත ලේඛන සකස් කර ගැනීම, ඒවාට විධිවිධාන සැලැස්වීම ගැනයි මේ පනත් කෙටුම්පත්වලින් සාකච්ඡා කරන්නේ. මේවායේ මුල් පනත් ගෙනාවේ බොහොම කාලයකට පෙරයි. ඒ නිසා යම් යම් සංශෝධන කිරීමේ අවශ්‍යතාවක් පැන නඟිනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ වන කොට අපේ රට මේ හැම කටයුත්තකටම නවීන තාක්ෂණය යොදා ගෙන තිබෙනවා. ඉතින් ඒ කාර්යක්ෂමතාව ඇති කිරීමේදී රජයට යම් වැඩි වියදමක් දරන්න සිද්ධ වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට වෙනදා අපි ඔප්පුවක පත්ඉරු සටහන් ඉල්ලුම් කළාම, එය අතින් ලියලා සහතික කර දෙන නිසා අපට දවසක් දෙකක් යන්න වෙනවා. නමුත් දැන් ඒ ලේඛනවල ගුණාත්මකභාවය රඳවා ගන්න ඒ තොරතුරු පරිගණක ගත කර, ඡායා පිටපත් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. මේ වාගේ විශාල වැඩ කොටසක් කෙරිලා තිබෙනවා. එහිදී ඉතාමත් කෙටි කාලයකින් ජනතාවට තමන් ඉල්ලුම් කරන ලේඛනයක් ලබා ගන්න පුළුවන් අවස්ථාවක ඒ වියදම වැඩි වෙනවා කියන කාරණය කවුරුත් දන්නා කාරණයක්. ඒ වාගේම මේ නීති පනවා තිබෙන්නේ 1976දියි. ඒ වාගේම ඊටත් කලින් පනවන ලද පනත් රාශියක් තිබෙනවා. ඒ නිසා යම් යම් සංශෝධන කිරීමේ වරදක් නැහැ කියා මා හිතනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඇටෝර්නි බලපත්‍ර සම්බන්ධයෙන් ගත්තොත්, මේ ලේඛන හදද්දී, ලියා පදිංචි කරද්දී සමහර අවස්ථාවල ජනතාවගේ පැත්තෙන් යම් යම් ව්‍යාකූලතා ඇති වෙන අවස්ථා තිබෙන්න පුළුවන්. විශේෂයෙන් ඉඩමක් සම්බන්ධයෙන් වන ඇටෝර්නි බලපත්‍රයක් අප පළාත් රෙජිස්ට්‍රාර් කාර්යාලයට අරගෙන යන්න ඕනෑ.

විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් නම් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයට අරගෙන යන්න ඕනෑ. ඒ කටයුතු සරල වීමේ අඩුවක් මා දකිනවා. එම නිසා ඒ සම්බන්ධයෙනුත් වැඩ පිළිවෙළක් සකස් කරන්නට පුළුවන් නම් හොඳයි කියන යෝජනාව විශේෂයෙන් මා ඉදිරිපත් කරනවා.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන් ම විදේශගතව ඉන්න අයට වුණත්, තමන් විදේශ රටවල සිට එවන මුදල් සම්බන්ධයෙන් කටයුතු කරන්න ඇටෝර්නි බලපත්‍ර මඟින් බලය පවරන්න පුළුවන්. ඉඩම්, දේපොළ සම්බන්ධයෙන් බලය පවරා යන්න පුළුවන්. බොහොම වැදගත් බලය පැවරීමක් තමයි මෙම සංශෝධනය තුළින් කරලා තිබෙන්නේ.

විශේෂයෙන් අද පවතින තත්ත්වයත් එක්ක, ලේඛන සකස් කිරීමේදී පුද්ගලයන්ගේ අනන්‍යතාව සම්බන්ධයෙන් ගැටලු ඇති වන අවස්ථා තිබෙනවා. විවිධාකාර ලේඛන සම්බන්ධයෙන් වූ වැරැදි අද කෙරෙනවා. ඉඩම්වල වටිනාකම ඉහළ යෑම නිසා අද ඒවාට කූට ලේඛන සකස් කිරීම වැනි දේවල් සිද්ධ වනවා. මොන ආකාරයේ ලේඛනයක් සකස් කළත්, පුද්ගලයන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා මීටත් වඩා එහා ගිය සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් හොඳයි.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන් ඇටෝර්නි බලපත්‍රයක් ලියා පදිංචි කිරීමේ ගාස්තුව රුපියල් 1,500ක් වශයෙන් මෙහි සඳහන් වනවා. නමුත් මේ දේපොළ විශාල වටිනාකමක් තිබෙන දේපොළක් වෙන්නත් පුළුවන්, සුළු වටිනාකමක් තිබෙන දේපොළක් වෙන්නත් පුළුවන්. නමුත් ඒ හැම එකකට ම රුපියල් 1,500ක මුද්දර ගාස්තුවක් තමයි අය කරලා තිබෙන්නේ. එහිදී මා දකිනවා, දේපොළවල වටිනාකම අනුවත් අපට මේ ගාස්තු සකස් කිරීමේ හැකියාවක් තිබෙන බව. ඒ වාගේ ම ලියා පදිංචි කිරීමේදී ඒ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීමට කටයුතු කරන්නට ඕනෑ. මොකද, ඇටෝර්නි බලපත්‍රයක් වාගේ දෙයක් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයට යවන්න සිද්ධ වනවා. එහිදී කාර්යක්ෂමව කටයුතු කිරීමේ හැකියාවක් ඇති කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා.

නොතාරිස් ආඥාපනත ගැන කථා කරන කොට, අද ඔප්පු ලියා පදිංචි කිරීමේදී මුද්දර ගාස්තු වශයෙන් පළාත් සභාවට මුදල් ගෙවන්නට සිදු වන අවස්ථා තිබෙනවා. ඒ වාගේ ම යම් යම් ඔප්පු සඳහා මධ්‍යම ආණ්ඩුවට මුදල් ගෙවන්නට සිදු වන අවස්ථා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අද ගැටලු මතු වෙලා තිබෙනවා. අපි නැඟෙනහිර පළාතේ ඉන්න අය විධියට, නැඟෙනහිර පළාතට අයිති ඔප්පුවක් ලියා පදිංචි කිරීමේදී ඒ ගාස්තු වෙනුවෙන් බැංකුවට මුදල් ගෙවීමේ හැකියාවක් තිබෙනවා. නමුත් වෙනත් පළාතකින් ඉඩමක් මිල දී ගෙන ඔප්පුවක් ලියා පදිංචි කිරීමේදී මුදල් ගෙවිය යුතු කුවිතාන්සි වැනි දේවල් සොයා ගැනීමේ දුෂ්කරතා ජනතාවට තිබෙනවා. එම නිසා හැම පළාතක ම බැංකු වැනි ආයතනවලට මුදල් ගෙවීමේ කුවිතාන්සි ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් -එය බොහොම සරල දෙයක්- මා හිතන හැටියට නොතාරිස් කටයුතුවලදී, ඉඩම් සම්බන්ධ කටයුතුවලදී ජනතාවට වඩාත් පහසුවක් සැලසෙනවා. ඒ වාගේ ම -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු කථානායකතුමනි, වෙන දා රෙජිස්ට්‍රාර් කාර්යාලවලට ගිහින් පත් ඉරු වැනි දේවල් බලන අවස්ථාවලදී මුද්දර ගහලා තමයි පත් ඉරු බැලුවේ. නමුත් දැන් මුදල් ගෙවලා පත් ඉරු බලන්නට ඕනෑ. සමහර අවස්ථාවලදී සවස 3.30න් පසුව මුදල් ගෙවීමේ ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, රජයේ ආයතනවල සවස 3.30න් පසුව මුදල් තබා ගැනීමට නොහැකි කාරණය නිසා. නවීන තාක්ෂණය යොදා ගැනීමත් එක්ක මේ සේවාවල විශාල කාර්යක්ෂමතාවක් ඇති වෙලා තිබෙනවා. නමුත් මෙන්න මේ වාගේ කරුණු සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන සීමා සම්බන්ධයෙනුත් අපි ජනතාව වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කර දෙන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, මා ඒ වාගේම විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ, අද දේපොළවල වටිනාකම විශාල වශයෙන් ඉහළ යෑමක් සිදු වෙලා තිබෙන බව. කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩමක් ගත්තොත් පර්චස් එකක වටිනාකම ලක්ෂ ගණනක් වෙනවා. ඒ නිසා මේ වටිනා දේපොළවලට කූට ලේඛන සකස් කරන්නට සමහර වංචනිකයන් පුරුදු වෙලා තිබෙනවා. මේ කූට ලේඛන සකස් කිරීම නිසා විශාල අපරාධ සිදු වන අවස්ථා මා දැක තිබෙනවා. එවැනි අවස්ථාවලදී ලබා දෙන දඬුවම් ඉහළ නැංවීමේ වැඩ පිළිවෙළකුත් සකස් කළ යුතුය කියන යෝජනාව මා ඉදිරිපත් කරමින් මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු කථානායකතුමනි ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

[අ.භා.4.10]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු කථානායකතුමනි, මුදල් ඇමතිවරයා වන අපේ අතිගරු ජනාධිපතිතුමාත් මේ ගරු සභාවේ සිට පිටව ගිය අවස්ථාවකයි මා කථාව ආරම්භ කරන්නේ. මා හිතුවා එතුමා මේ ගරු සභාවේ සිටින අවස්ථාවේ මට කථා කරන්නට අවස්ථාව ලැබෙයි කියලා.

පසු ගිය අය වැයෙන් කරන ලද යෝජනා කිහිපයකට අදාළව මෙම සංශෝධන පනත් කෙටුම්පත් කිහිපය අනුමත කර ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙනවා. ඊයේත්, අදත් අපි ඒ සඳහා කාලය ගත කළා.

බදු ක්‍රමය අද කාලයේ විතරක් නොවෙයි, රජ කාලයේ සිට, මිනිස් පරපුර ඇති වූ යුගයේ සිට ඇති වෙලා තිබෙන එකක් බව අපි පිළිගන්නවා. බදු ක්‍රමයක් නැතිව සමාජයක් දියුණු වන්නේත් නැහැ. එතකොට අද අපි බලන්නට ඕනෑ, මේ බදු ගන්නේ මොකටද කියන එක. රටේ ජනතාවට, රටේ අනාගතයට, මතු පරම්පරාවට යහපතක් ඇති කරන්න තමයි මේ බදු ක්‍රමය ඇති කර තිබෙන්නේ. ඒ තුළින් රටේ සංවර්ධනයක් ඇති වෙනවා. ඒ කාලයේ සිටි රජවරු බදු මුදල් එකතු කරලා, ඒ බදු මුදල්වලින් තමයි වැව් තැනුවේ; කෙත් වතු හැදුවේ; මහා රාජධානි බිහි කළේ. සමහර රජවරු මිනිස් ශ්‍රමය පාවිච්චි කරමින් ඒ අයට මුදලක් ගෙවලා එවැනි කටයුතු කළා.

අය වැයක් කියන එක අද සාමාන්‍ය දෙයක් වෙලා තිබෙනවා. අය වැයට අමතරව, වසරේ දවස් 365ක කාලය තුළ ගැසට් පත්‍ර මඟින් බදු හා වෙනත් දේවල් අය කිරීම ඊටත් වඩා සිද්ධ වෙනවා. ඒ නිසා අය වැය ලේඛනය කියන එක සාමාන්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා විටින් විට ගැසට් පත්‍ර මඟින් ක්‍රියාත්මක කරන බදු පැනවීම, වැඩි කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම යන සෑම දෙයක්ම මේ රටේ පාර්ලිමේන්තුවේ සාමාන්‍ය ප්‍රතිපත්තියක් බවට පත්වෙලා තිබෙනවා.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා අපේ පක්ෂයේ ඉඳලා ආණ්ඩුවට ගිය කෙනෙක්. දැන් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටින මඟින්ද සමරසිංහ ඇමතිතුමාත් එහෙමයි. එතුමා මගේ මිත්‍රයෙක්. අපි ඔක්කොම සිටියේ එකම පක්ෂයක. අද ඒ අයගෙන් පිරිසක් ඔය පැත්තේ ඉන්නවා, අපි මේ පැත්තේ ඉන්නවා, කාගෙන; විකාගෙන. ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා ජනාධිපතිතුමාත් ගරු සභාවේ සිටින අවස්ථාවේ මේ බදු පිළිබඳව බොහොම ලොකු විග්‍රහයක් කළා. බොහොම හොඳයි. ඒවා ඇත්ත. අපි නැහැ කියලා කියන්නේ නැහැ. ව්‍යාප්තති වශයෙන්, සංඛ්‍යාලේඛන වශයෙන්, මුදල් වියදම් කිරීම වශයෙන් ජනතාවට විශාල ප්‍රගතියක් වෙනවාය කියන එක ගැන එතුමා විශාල විග්‍රහයක් කළා. ඒ ගැන තර්කයක් විතර්කයක් අපට නැහැ. තර්කය, විතර්කය හා ප්‍රතිඵලය යන මෙන්න මේ තුළයි - [බාධා කිරීමක්]

මම කිසි දවසක, කිසි කෙනෙකුගේ කථාවකට මේ ගරු සභාවේ දී බාධා කරලා අපහාස කරලා නැහැ, ගරු කථානායකතුමනි, මගේ ප්‍රතිපත්තිය වන්නේ තර්කානුකූලව යමක් පෙන්වීමයි. අපි මේ යන මාර්ගය හරිද, මේ මඟින් අනාගතයේ දී අපට ඉදිරියට යන්න පුළුවන්ද, මේ තුළ බාධක තිබෙද, අපි මේ බාධකවල හැප්පී, කඩා වැටී, විනාශ වෙනවාද? මෙන්න මේ තුළ තමයි මා තර්ක විතර්ක කිහිපයක් ගෙනෙන්නට බලාපොරොත්තු වන්නේ.

යම් ඉලක්කයක් අනුව කරන ව්‍යාප්තියකට මුදල් මදි වුණාම අතුරු යෝජනා ගෙනෙන බව අපි දන්නවා. කිහිප වතාවක් අතුරු යෝජනා ගෙනැල්ලා වැය ශීර්ෂ ඇස්තමේන්තුවට වඩා මුදල් වෙන් කර ගන්නවා. එවැනි තත්ත්වයක් ඇති වන්නේ ඇයි? මේකට හේතුව උද්ධමනයමයි කියලා අපට කියන්න බැහැ. මම ඒක පිළිගන්නේ නැහැ. උද්ධමනය කියන එක අපම මවා ගන්නා දෙයක්. අපම එය ඇති කර ගත්තොත්, අන්න එතැනදී ඒ උද්ධමනය තුළ ඇස්තමේන්තුව තිබෙන්නේ රුපියල් මිලියන 500 නම් අවුරුදු එකහමාරක් තුළ මිලියන 2,000 දක්වා නංවලා, වැය ශීර්ෂයක් ඉදිරිපත් කරලා ඒ ව්‍යාප්තියට වියදම් කරන්න පටන් ගන්නවා. දක්ෂකම එය නොවෙයි. රජයක් වුණොත්, පාලකයෙක් වුණොත් ඒ පාලකයා, නැත්නම් ඒ අදාළ අමාත්‍යවරයා සහ ඒ අමාත්‍යවරයාගේ ලේකම්වරයා ඇතුළු නිලධාරීන්ගේ දක්ෂකම වෙන්න ඕනෑ තමා සෑදූ සැලසුම අනුව, තමා සෑදූ ඇස්තමේන්තුව අනුව ඒ ඇස්තමේන්තුව අනුමත වූ දවසේ සිට ටෙන්ඩර් කැඳවලා ඒ මුදල තුළ ඒ ඉලක්කය කරා වැඩ අවසන් කිරීමයි. එහෙම නැතිව රුපියල් මිලියන 500ක ව්‍යාප්තියකට තව අවුරුදු එකහමාරක් අරගෙන මිලියන 1,500ක් වියදම් කරලා, කොන්ත්‍රාත්කාරයාත් වැජඹෙමින් ගෙන යන ඒ ව්‍යාප්තිය ගැන අපට කිසිම දෙයක් කියන්න බැරි වෙනවා. ඒ වාගේ තත්ත්වයන් ඇති වෙද්දී මොකද වෙන්නේ? එතැනදී රජයේ අය වැය පරතරයක් ඇති වෙනවා විතරක් නොවෙයි, ජනතාවටත් එහි බර පටවලා, ඉතාම කනගාටුදායක තත්ත්වයක් ඇති වෙනවා. ඒ විතරක් නොවෙයි, රටේ උද්ධමනයක් ඇති වෙනවා.

ගරු කථානායකතුමනි, මම ඇමතිවරයෙක්, දිසා ඇමතිවරයෙක් හා ප්‍රධාන ඇමතිවරයෙක් විධියට වැඩ කරලා පෙන්නුවේ ඉලක්කයක් දැම්මා නම් ඒ ඉලක්කයට යන මුදල සහ නිලධාරීන්ගෙන් වැඩ ගන්නා ආකාරයයි. නිලධාරීන්ට බැණීම මම අනුමත කරන්නේ නැහැ. නිලධාරීන්ට අප බණින්න ඕනෑ; අවවාද කරන්න ඕනෑ. අප කියන දෙය ඔවුන් කරන්නේ නැත්නම් ඒ අය නෙරපලා වෙන කෙනෙක් දමලා වැඩ ගැනීමත් කෙරෙන්න ඕනෑ. මේක තමයි අමාත්‍යවරුන්ගේ දක්ෂකම විය යුත්තේ; පාලකයන්ගේ දක්ෂකම විය යුත්තේ. ඒ දක්ෂකම නැතිව, පොළොව ඇදයි, නටන්න බැහැ කියන විධියේ විවේචන කරලා කවදාවත් හරි යන්නේ නැහැ.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා අද කිව්වා, අපේ කුඩා කර්මාන්තකරුවන්ට අත දෙන්න අය වැයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවාය කියලා. මම එය පිළිගන්නවා. ලොකු මුදලක් වෙන් කර තිබෙනවා. නමුත් අප ගමට ගිහින් මේ ව්‍යාප්තිය වැහුණේ ඇයි, මේ ව්‍යාප්තියට අත දෙන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මම දන්නා එක කථාවක් කියන්නම්. යාපහුවේ මම දන්නා එක්තරා ව්‍යාපාරිකයෙක් ඉන්නවා. එතුමාට ජනාධිපති සම්මාන පවා දුන්නා. එතුමාට දෙවතාවක් මේ සම්මාන ලැබුණේ මොනවාටද? මේ මහත්මයා ඔලු අල වැනි දේශීය දේවල් යොදා ගෙන කේක්, පාන් වැනි නොයෙකුත් දේවල් නිෂ්පාදනය කරනවා. තල, මුං ඇට වැනි දේවලුත් ගොවීන්ගෙන් අරගෙන ඔහු එවැනි නිෂ්පාදන කරනවා. නමුත් ජනාධිපති සම්මාන ලැබුණු වන්නිනායක කියන මේ මහත්මයාට ඒ පළාතේ ඉන්න දේශපාලනඥයන්, මැති ඇමතිවරු උදව්වු කරනවාද කියන්න මම දන්නේ නැහැ. එතුමාගේ පවුලේ අය වන්නිනායකලා වුණාට දේශපාලනයට සම්බන්ධ වෙලා නැහැ.

ගරු කථානායකතුමනි, අලුත් දෙයක් ඉදිරිපත් කරන නිෂ්පාදකයෙක් -නිර්මාතෘවරයෙක්- ඉන්නවා නම්, ඔහු පක්ෂ භේදය තුළින් අප හංවඩු ගහනවා නම් මේ රට කවදාවත් දියුණු කරන්න බැහැ. අර මහත්මයාට තවම බැරි වුණා තමන්ගේ ඒ ව්‍යාපාරය දියුණු කර ගන්න. එතුමා ජනාධිපතිතුමා අහද්දිත් කිව්වා, "මට මේ ව්‍යාපාරය කරගෙන යන්න සහාය දෙන්න" කියලා. නමුත් ඔහුට ණයක් දෙන්න ආයතනයක් හෝ වෙනත් කෙනෙක් ඉදිරිපත් වෙලා නැහැ. ආධාර දෙන ආයතන කොපමණ තිබෙනවාද? ඔහුට ඒවායින් කිසිම සහායක් දක්වලා නැහැ. මේ තත්ත්වය ඉතාම ඛේදනීයයි. කුඩා කර්මාන්තවලින් සියයට 25ක්

අද වැසී ගොස් තිබෙනවා. ඊයේ කුඩා කර්මාන්ත ආයෝජකයන්ගේ සංගමයේ සභාපතිවරයා ප්‍රකාශයක් කර තිබෙනවා, ලංකාවේ දේශීය නිෂ්පාදකයාට අප අත දෙනවාය කියලා. මොකක්ද එහෙනම් අප කළ යුත්තේ? පිට රටින් ගේන දේ කන්නද අප මේ සූදානම් වන්නේ? ලෝකයේ රටවල් දියුණු වුණේ තමන්ගේ අයට අත දීලා, ඔවුන් දියුණු කරලායි. තමන්ගේ අය දියුණු වුණු විටයි ඒ රටවල් දියුණු වුණේ. නමුත් මට මේ තත්ත්වය ගැන කියන්නත් කනගාටුයි. මම දැන් මේ කථා කරන්න යන්නේ ඒ ගැන නොවෙයි.

එක්සත් ජාතික පක්ෂය තමයි එදා කොටස් වෙළෙඳ පොළ පටන් ගත්තේ. මට මතකයි, එදා මම ප්‍රධාන ඇමති විධියට දකුණු කොරියාවට යන වෙලාවේ ඒ අහස් යානාවේම ප්‍රේමදාස ජනාධිපතිතුමාත් ජපානයට ගියා. කොටස් වෙළෙඳ පොළ ගැන ඇගැයීම් කරලා එය පටන් ගන්න කියලා ජනාධිපතිතුමා උපදෙස් දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, පසු ගිය අවුරුදු තුනේ කොටස් වෙළෙඳ පොළේ සභාපතිවරු කී දෙනෙක් සිටියාද? අන්තිමට ආපු සභාපතිවරයා දේශපාලනඥයෙක් බවත් අප කවුරුත් දන්නවා. එතුමා මොකක්ද කිව්වේ? දැන් මේ ටිකට තුන් දෙනෙක් ගියා.කොටස් වෙළෙඳ පොළ කියන්නේ ඒකාධිකාරයක්. යම් යම් හිතවත් පිරිස්, ව්‍යාපාරිකයන් ටිකක් එකතු වෙලා මාෆියා එකක් ඇති කරගෙන තිබෙනවා. අද කොටස් වෙළෙඳ පොළේ තිබෙන ඒ සුරැකුම්පත් ටිකත්, විනිමය කොමිෂන් සභාවත් කියන එක තුළ ඔවුන්ගේ ඒකාධිකාරයට අනුව වැඩ කරන්න ගිහිල්ලා විදේශීය ආයෝජකයන් කොටස් වෙළෙඳ පොළේ ආයෝජනයට එන්නේ නැහැ. ඔවුන් හයේ, දාපු මුදලුත් අරගෙන යනවා. ප්‍රජාතන්ත්‍රවාදී, අවංක රටක කොටස් වෙළෙඳ පොළ ඒකාධිකාරයට ගෙන යන්න දීලා තිබෙනවා.

මේ රටට සංචාරකයෝ එනවාය කියනවා. යුද්ධය ඉවර වෙලා සාමය ඇතිකර තිබෙනවාය කියනවා. ආයෝජකයෝ එනවාය කියනවා. කර්මාන්ත ඇති කරනවාය කියනවා. තේ, පොල්, රබර් සම්බන්ධව කටයුතු කරන මගේ මිත්‍ර වැවිලි කර්මාන්ත ඇමති මහින්ද සමරසිංහ ඇමතිතුමා මේ සභාවේ සිටිනවා. මේවා සියල්ලම කරන්න ලෝකයේ තිබෙන විවෘතම ස්ථානය කොටස් වෙළෙඳ පොළයි. එතැන තමයි ආර්ථිකයේ ආයෝජනයේ නැඟීමේ සහ වැටීමේ මිනුම් දණ්ඩ. අද ඇති වෙලා තිබෙන කනගාටුදායක තත්ත්වය දිහා බලන්න. අද එහෙන් කළු සල්ලි ගේනවා. ස්විඩන්වල, කළු සල්ලි ෆ්‍රෑන්ක් මිලියන 850ක් මේ අවුරුදු කිහිපය තුළ තැන්පත් කරලා තිබෙනවා කියලා මෑතකදී වාර්තා වුණා. මේ සම්බන්ධයෙන් රජය ගත්ත පියවර මොකක්ද? දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව කිව්වා, අපි මේ සම්බන්ධයෙන් පියවර ගන්නවා කියලා. මම ගරු ඇමතිතුමන්ලාගෙන් අහනවා, ඒ සම්බන්ධයෙන් ගත්ත පියවර මොකක්ද කියලා. ගත්ත පියවරක් නැහැ. ඒ කළු සල්ලි කාගේ ඒවාද, කොහෙන්ද ආවේ? මේ වාගේ billionaires අද ලංකාවේ, මේ කුඩා දූපතේ ඉන්නවා. කාගේද මේ සල්ලි? රජයේ අවංකත්වය පෙන්වන්න නම් පාලකයා, ඒ තිබෙන්නේ මෙන්න මේ අයගේ මුදල් කියලා හෙළිදරවු කරන්න ඕනෑ. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? ඒ කළු සල්ලි හම්බ කළ කොමිස්කාරයන්ට අද මේ රටේ ඒවා ආයෝජනය කරන්න, -බදු ලිහිල් කිරීම් කරවලා, වෙනත් ක්‍රම ඇති කරලා- ඒ සල්ලි ගලා ගෙන එන්න සලස්වන්න හදනවා. ඒ අයට තවත් වැජඹෙන්නට දෙනවා. මේ රට තවත් සූරා කන්න, ව්‍යාපෘතිවලින් commission ගහන්න ඉඩ දෙනවා. ආයෝජකයෙක් අපේ රටට එන්නේ ඒ අයට හොඳ ලාභයක් ලබා ගන්නයි. එහෙම නැත්නම් කවදාවත් ආයෝජකයෙක් එන්නේ නැහැ, කවුරුවත් ආයෝජනය කරන්නේ නැහැ. අපි දන්නවා, ලොකු හෝටල් කිහිපයකට අයෝජකයෝ එනවා කියලා. ඒක ඇත්ත. නමුත් මේ තුළින් ඇති වන හොඳ හා නරක ප්‍රතිවිපාක දෙකම අපි ගන්නට ඕනෑ. ඔබතුමා දන්නවා, අපේ රට හොඳ ශිෂ්ටාචාරයක් තිබෙන රටක් බව. අපේ රටේ ඇති වන මාෆියාවලින් අපේ ශිෂ්ටාචාරයට මොකක්ද වෙන්නේ?

ගරු කථානායකතුමනි, 2011 වසරේ මුල් භය මාසය තුළ අපේ ඍජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් මිලියන 413යි. රුපියල්වලින් නම් කෝටි 4,550යි. 2011 වසරේ ඍජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් මිලියන 850යි. දේශපාලන අවදානමක් ඇති වෙද්දි, ජාති, ආගම් භේද සහ මාෆියා කල්ලි ඇති වෙද්දී මොනම ආයෝජකයෙක්වත් මේ රටට එන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානය වන OECD සංවිධානයේ වාර්තාව අනුව ලංකාව, -1-6 දක්වා ලකුණුවලින්- සිටින ස්ථානය පෙන්වා දීලා තිබෙනවා. අපිත් එක්ක ඉන්න අනෙක් රටවල් මොනවාද? ඇන්ගෝලාව, ජෝර්ජියාව, උගන්ඩාව, ඉරානය. අද ලංකාව ජාත්‍යන්තර මට්ටමෙන් මැනලා තිබෙන ආකාරය මෙකයි. ජාත්‍යන්තර ආයෝජනයකදී හෝ තමුන්නාන්සේලා, අපි කරන අයෝජනයකදී ඒ ඉඩම අපි ගත්තේ කොහොමද කියලා බලනවා. ආරක්ෂාවක් තිබෙනවාද කියලා බලනවා, ප්‍රතිඵලය බලනවා. මේ ජාත්‍යන්තර සංවිධානය මේ විධියට ප්‍රකාශ කරලා තිබෙනවා. මේ රටේ අපි මොන වැදි බණ කිව්වත්, ආකර්ෂණීය කථා කිව්වත් එතැනදී වෙන්නේ මොකක්ද?

ආර්ථික ඝාතකයෝ ගැන කියනවා. කවුද මේ ආර්ථික ඝාතකයෝ? ඒ ආර්ථික ඝාතකයෝ ඇතුළේ සිටින හතුරාද, නැත්නම් පිට සිටින හතුරාද? මම කියනවා, මිත්‍රයෝ ලෙස එන ඇතුළේ සිටින හතුරාය කියලා. සෑම පාලක පක්ෂයක්ම විනාශ වුණේ, මුහුණ පෙන්වන්න එන ආර්ථික ඝාතකයෝ නිසායි. සෑම පක්ෂයක්ම බලයට ආවාම, ඒ අය එනවා. ඇවිල්ලා එතැන ආර්ථික ඝාතනයක් කරලා, නැවතත් බලයට එන අනෙක් පැත්තට පනින්නට හදනවා. ඒක අපි ව්‍යාපාරික ප්‍රජාවේත් දකිනවා.

අපේ විමල් වීරවංශ මැතිතුමා ගැන මම කනගාටු වෙනවා. ජනාධිපතිතුමාත් සිටින විට, නළුවෙක් ලෙස බොහොම රහපාපු විමල් වීරවංශ මැතිතුමා "ආර්ථික ඝාතකයා" කියලා කියන්නේ කාටද? අභිංසක රජයේ සේවකයින්ටද? කවුද, මුදල් ඇමති? තමුන්නාන්සේලාගේම ජනාධිපතිතුමා. එහෙම නම් තමන්ට කියන්න බැරි නිසා ආර්ථික ඝාතකයා කියා විමල් වීරවංශ මැතිතුමා වක්‍ර විධියට පහර දුන්නේ ජනාධිපතිතුමාට ද කියා මම අහනවා. ඇයි, මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට කියන්නේ? බොරුවට ආර්ථික ඝාතකයා කියා මවාපාමින් කථා කරනවා. ජනාධිපතිතුමා නොවෙයිද, මුදල් අමාත්‍යාංශයේ ලොක්කා? ලේකම්ද මුදල් අමාත්‍යාංශයේ ලොක්කා කියා මම තමුන්නාන්සේලාගෙන් අහනවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම් ලොක්කා වෙලා මුදල් ඇමති සොක්කා වෙලා පහත් තැනකට වැටුණු තත්ත්වයට නේ මේ විවේචන කරන්නේ.

මේ වාගේ රහපෑම් කරමින්, විවේචන කරමින්, රජයේ සේවකයාගේ මානසිකත්වය කඩමින්, රජයේ සේවකයාට බලපෑම් කරමින් නොයෙකුත් දූෂණ වංචා ඇති වෙද්දි රජයේ සේවකයාත් කියක් හෝ ගහගන්න හදනවා නේ. ඔන්න ඔක නේ ඇත්ත. ඇත්ත කථා කරමු කොං. ඔක නේ අද මේ රටේ විනයක් නැත්තේ? තමුන්නාන්සේලා මගෙන් ඇහුවොත් මගේ අත් දැකීම් තුළින් කියනවා. මේ රටේ නැත්තේ අවංකත්වය, කැපවීම, විනය කියන ඒවායි. මෙන්න මේවා ඇති කළා නම් අපේ රට ලෝකයේ වෙනත් රටවල නැති සම්පත් -ජනතාව, නිලධාරීන්- තියෙන රටක් කියලා කියන්න පුළුවන්. අපි අපට අවංක වෙන්න ඕනෑ. අපි අපිට අවංක වන්නේ නැතුව කොහොමද ගමේ මිනිහාට කියන්නේ අවංක වෙන්න කියා. මේක නිකම් මහ කකුළුවා ඇදේට යද්දි පොඩි එවුන්ට හරියට යන්න කියනවා වාගේ කථාවක් තමයි කියන්නේ.

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)

තමුන්නාන්සේ ගැන නේ කියා ගන්නේ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

අනේ, ඔබතුමා කට වහගෙන ඉන්න. ඔබතුමා ගැන මගෙන් කියවා ගන්න එපා. මට කියන්න තිබෙනවා නම් ඕනෑ කැඩපතක් බලාගෙන මට කියන්න. මම කියන දේ ඔබතුමාට ඇහෙනවාද? ඔබතුමා මට බාධා කරන්න හැදුවාට කැඩපත දෙසට ගිහින් තමන් තමන් දෙස බලා ගෙන කථා කරන්න. ඔබතුමාගේ නියෝජ්‍ය ඇමතිකමින් කළ දේවල් පෙන්වන්න ඕනෑ නම් මා සමඟ විවාදයකට එන්න. මම කරලා තිබෙන ඒවා මම පෙන්වන්නම්. මැණික් ගඟ හරහා කෝටි 78ක ව්‍යාපෘතිය කෝටි 56න් ඉවර කළා. නියෝජ්‍ය ඇමතිතුමනි, අපි මුදල් ඉතුරු කළ මිනිස්සු. නිකම් වමාරා ගන්න එපා.

ගරු කථානායකතුමනි, සමාජය හදන්න ඕනෑ. අපි තිරිසන්නු නොවෙයි. අපි මනුෂ්‍යයෝ. මනුෂ්‍යත්වය ලබන්න අපි බොහොම පින් කර තිබෙනවා. බලන්න, හාමුදුරුවරු -ස්වාමීන් වහන්සේලා- කොච්චර මේ සමාජයේ, මේ පොළොවේ ඉන්නවාද කියා . ගරු කථානායකතුමනි, බුදු රජාණන් වහන්සේ නිය පොත්තට වැලි ටිකක් අරගෙන, "මහණෙනි, වැඩියෙන් වැලි තියෙන්නේ මගේ නිය පොත්තේද, පොළොවේද" කියා ඇහුවාලු. පොළොවේ කිව්වාලු. එහෙනම් ඔබතුමාත් ඒ මනුෂ්‍යත්වය -මිනිස්කම- ලබන්න නිය පොත්තේ තරමට ආ පින්වත් කෙනෙක්. අපේ ආත්ම පෙරේතයෝ වෙයිද කියා අපි දන්නේ නැහැ. අපේ ආත්මය කැරපොත්තෝ වෙයිද කියා අපි දන්නේ නැහැ. අපේ ආත්මය ලැබූ කෙටි ආයුෂ කාලය තුළ තමන් තමන්ට කැඩපතක් වෙන්න.

නක්ෂත්‍ර කෙනෙක්ද කියන්න මම දන්නේ නැහැ, ඊයේ "දෙරණ" නාළිකාවේ ආන්දෝලනාත්මක ප්‍රකාශ කළා. සත්‍ය නැහැ. සදාකල් නැහැ. කවුද හිතුවේ හිටපු ප්‍රේමදාස ජනාධිපතිතුමාට එකපාරටම එහෙම වෙයි කියා. බලය තුළට අන්ධකාරය එන්න දෙන්න එපා. මම පාර්ලිමේන්තුවෙන් දෙවතාවක් අස් වුණු කෙනෙක්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මම ප්‍රතිපත්ති තුළ යන කෙනෙක්. ඒ නිසා මට ඇඟිල්ල දික් කර කථා කරන්න පුළුවන්. ඒක මතක තියා ගන්න. තමන් තමන්ගේ හිතට එකඟව යන්න. දේශපාලනය කියන එක ආගමක් විධියට සලකන්න. ඒක ගැන කථා කරනවා නම් මම විවෘත විවාදයකට එන්නම්. මේ රටට අවංකත්වය, කැපවීම, විනය ඕනෑ. ඒවා මගේ අත්දැකීම්. ජනතාවගෙන් වැඩ ගන්න ඉගෙන ගන්න.

බන්දුල ගුණවර්ධන මැතිතුමනි, රනිල් රජය තුළ රුපියල් ලක්ෂ 38යි දුන්නේ. දැදුරු ඔය, මා ඔය -බැසිල් රාජපක්ෂ මැතිතුමා දන්නවා, අනුර යාපා මැතිතුමා දන්නවා.- හරහා අඩි 16ක පාලමක් හැදුවා. දැන් කන්ටෙනර් යනවා. ඒකට දුන්නේ ලක්ෂ 38යි, ගරු කථානායකතුමනි. ගැහැනු මිනිස්සු රෑ ඉව්වා. ඉතුරු ටික වතුකරයේ අය දුන්නා. මුළු ගණන රුපියල් ලක්ෂ 78යි ගියේ. කෝටි 5ක් 6ක් යන පාලමක් හැදුවා. මෙහෙම සංවර්ධන කටයුතු කළාම ඒවා අපේ ජනතාව තමයි පාවිච්චි කරන්නේ. සමාජයක් ඇති වෙන්න නම් හෝටල්, කාපට් පාරවල් අවශ්‍යයි. මම නැහැ කියන්නේ නැහැ. එතකොට නගර අලංකාර වෙනවා. නමුත් අපි කථා කරන දියුණු සමාජයේ මිනුම් දණ්ඩ වශයෙන් ගොඩනැඟිලි, පාරවල්, පාලම්, වරායන්, ගුවන් තොටු පලවල් විතරක් ගණන් ගන්න එපා.

අපි හදන්න ඕනෑ කවුද? මොකක්ද? මිනිසා; පුද්ගලයා. තමුන්නාන්සේලාටත්, අපටත් බැරි නම් මේ සමාජයේ මිනිසා තුළින්, ඒ දෙමවුපියන්ගේ දරුවන් තුළින් මනුෂ්‍යත්වය තිබෙන - මිනිස්කම තිබෙන- සමාජයක් හදන්න, අපි තිරිසන් සමාජයක වැනි ඛේදනීය තත්ත්වයකට පත් වෙනවා. ආගමක් දහමක් නැති තිරිසන් සමාජයක් බිහි වෙනවා, ගරු කථානායකතුමනි. මම මේ කථා කරන්නේ මොකක්ද? මේ ලංකාවේ "මතට හිත" කියන එක ගැන මම කරුණු ටිකක් කියනවා. තමුන්නාන්සේලා එතනෝල් ගැන දන්නවා. ඒවා කරන තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරයෙක් අද උදේ මට කිව්වා "මම නොවෙයි කළේ" කියලා. දැන් ලීටරයකට රුපියල් 400 ගණනේ බදු ගෙවන්න වෙලාලු. දැන් බදු අය කරලා එතනෝල් විවෘත විධියට ගේන්න ඉඩ දෙනවා කියලා එයා මට කිව්වා. කවුද මත්කුඩු භාරව ඉන්නේ? ඉස්කෝලේ යන ළමයි මත්කුඩු ගන්නවා. දෙමවුපියෝ ළමයින්ව ටියුෂන් පන්තිවලට යවනවා. තාත්තයි, අම්මයි රක්ෂාවට යනවා. දරුවෝ ටියුෂන් පන්තිවලට යනවා කියලා මත්කුඩු ගහන්නත්, වෙනත් හෝටල්වලටත් යනවා. ඒ විධියට සමාජය විනාශ වෙනවා. බෝම්බයක් වාගේ භයංකාර සමාජකයි අපි ඉන්නේ.

ඒ වාගේමයි, ගණිකා මඩම්. තමුන්නාන්සේලාගේ පළාත් සභා ඇමතිවරයෙක් ලැජ්ජා නැතිව කියනවා, ගණිකා මඩම් නීත්‍යානුකූල කරන්න කියා ඇමතිතුමාට යෝජනා කරන්න ඕනෑ කියලා. මම හිතන හැටියට එතුමා තායිලන්තයේ ගිහිල්ලා "වූන්" වෙලා ඇවිල්ලා වෙන්න ඇති. ඒ, ගාල්ලේ තමුන්නාන්සේලාගේ පළාත් සභා ඇමතිවරයෙක්. එතුමා තායිලන්තයේ සහ කොරියාවේ ගියාලු. හැබැයි, මට පෙනෙන විධියට නම් එතුමා "වූන්" වෙලා ඇවිල්ලා තිබෙනවා. දෙවියනේ, මේ ගණිකා මඩම් නීත්‍යානුකූල කරන්නලු. එතුමා කියනවා ගණිකාවෝ 40,000ක් විතර ඉන්නවාලු. මා ළඟ සංඛ්‍යාලේඛන තිබෙනවා. මට මේ වෙලාවේ ඒ ඔක්කොම කථා කරන්න අපහසු නිසා මම ඒ ගැන වැඩියෙ කථා කරන්නේ නැහැ. ගණිකා මඩම් ඇති කරන්න කියලා කියන්නේ මන්ත්‍රීකමක් අර ගෙන ඉන්න තමුන්නාන්සේලාගේ රජයේ ඉන්න උත්තමයෙක්.

දකුණේ භීෂණය ගැන "රිවිර" ඉරිදා පත්‍රය බලන්න. අර බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් ආවා. සුද්දෝ, සුද්දියෝ නොවෙයි, මේ රටට මොකෙක්වත් එන්නේ නැති වෙනවා, බයේ. ඇයි, කාන්තාවෝ උස්සනවා. කණකර ආභරණ පැහැර ගන්නවා. කාමරවලට ගිහිල්ලා අතවර කරනවා. මේ සමාජයත් නැති වෙලා යයිද කියලා මම අහනවා. තමුන්නාන්සේලා හෝටල් හැදුවාට මේ වාගේ සමාජයක්, නීතියක් නැති, සදාචාරයක් නැති සමාජයක් වුණාම සංචාරකයෝ එයිද? බේබදුකමත් ඒ වාගේමයි. අද "මතට හිත" කියනවා. මෙතැන ජ්‍යෙෂ්ඨ ඇමතිවරු ඉන්නවා. ගරු හිටපු අගමැතිතුමනි, සංඛ්‍යාලේඛන අනුව ලෝකයේ වැඩියෙන්ම බොන; එක පුරවැසියෙක් ලීටර් 12 1/2ක බොන සමාජයක් අද මේ බෞද්ධ රටේ ඇති වෙලා තිබෙනවා. පපු, කැවුතු නැති, කුඩුවලින්, මත් ද්‍රව්‍යවලින් මනස විකෘති වුණු අය සිටින සමාජයක්, මේ. මේ සමාජයේ අපි කොහාටද යන්නේ? බොරු ආටෝපවලින් වැහුණු සමාජයකටද අපි යන්නේ. ඉස්සරවෙලා අධ්‍යාත්මික අංශය හදන්න. ලී ක්වාන් යූ ඒක කළා. ලී ක්වාන් යූ ආර්ථිකය හැදුවා විතරක් නොවෙයි. එහේ මුස්ලිම්, දෙමළ, චීන ජාතිවාදය ඇති වෙන්න ආවා. එතුමා තදින් ක්‍රියා කළා. එදා ඒ අය "සිංගප්පූරු වැසියන්" කියන තැනට ගෙනාවා. එතුමා 1956ට ඉස්සරවෙලා ලංකාව ආදර්ශයට අර ගෙන තිබුණා. අන්තිමට ලී ක්වාන් යූ Commonwealth Finance Ministers' Meeting එකේදී කිව්වේ "1956ට කලින් ලංකාව මම ආදර්ශයට ගන්න හැදුවේ. දැන් ලංකාව මරා ගන්නවා, කොටා ගන්නවා. අපි දැන් ලෝකයේ ඉදිරියට යනවා" කියලායි. ඒකයි vision එක - transferring your vision into mission. Be honest to yourself. Implement what is correct for the sake of the country.

එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවත් වැඩ කරන්න බැරි නම්, "ආයුබෝවන්" කියලා යනවා මිසක් මම මේ සමාජයේ පවිකාරයෙක් වෙන්න ලැහැස්ති නැහැ. කිළුටු ගා ගන්න මම මේ දේශපාලනයට ආවේ නැහැ. මම කරපු දේවල් බැබලෙනවා. ප්‍රධාන ඇමති, දිසා ඇමති හැටියට මම කරපු දේවල් ඔක්කොම එහෙමම තිබෙනවා. අන්න ඒකයි අවශ්‍ය වන්නේ. තමා තමා තුළින් යන ක්‍රමයක් ඇති වෙන්න ඕනෑ. මොනවාද කරන්නේ? ගරු හිටපු අගමැතිතුමනි, ඉරිදා පත්තරයක් අර ගෙන බලන්න. ඉරිදා පත්තර අර ගෙන ඔබතුමන්ලා කියවන්න. බය නැතිව මේ සමාජයට ඒ වාගේ දේවල් ඉදිරිපත් කිරීම ගැන ඒ කර්තෘවරයාට

මගේ ප්‍රණාමය පුද කරනවා. නමුත් ඔබතුමන්ලා ඇස් ඇරගෙන නැහැ. ඇස් වසාගෙන ඉන්නවා. මහා බලවත් අය, VVIPලා මේවා පිටුපස ඉන්නවා. ගැහැනු ළමයින් උස්සනවා; ඉඩකඩම් ලියා ගන්නවා; කප්පම් ගන්නවා; මරනවා. ඔබතුමන්ලා අද ඇති කරගෙන යන සමාජය මේකද කියා මම අහනවා. මා කියන දේවල් අහලා ඒවා ගැන කල්පනා කරන්න. තමුන්නාන්සේලා අද කථා කරන්නේ මොනවාද?

අධර්මයෙන් හම්බ කරපු දේවල් පවතින්නේ නැහැ. UNP එකේ අයට වුණත් එහෙමයි කියලා මම දන්නවා ගරු කථානායකතුමනි. අධර්මයෙන් හම්බ කරපු අයගේ දේවල් අධර්මය නිසාම විනාශ වුණා. අධර්මයෙන් හම්බ කරන තමුන්නාන්සේලාට සිද්ධ වන්නේත් ඒකයි. ලෝක නීති ධර්මය ඒකයි. අපි කාටවත් ඒක මහ හරින්න බැහැ. ඒක මතක තියා ගන්න. මේ දේවල් ගැන මහා ගාම්භීර විධියට කථා කරන්න එපා. ලෝක නීති ධර්මයක් තිබෙනවා අපට නොපෙනෙන. ස්වභාව ධර්මය එනවා ඉදිරියට. ජනතාව ශාප කරනවා වැරැදි කරන මිනිසුන්ට.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න වෙලාව හරි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, මේ වෙලාවේ ඉදිරිපත් කරන්න මා ළඟ තිබෙනවා "එතනෝල් ජාතකය". ඒ වාගේම, මතට තිත, ආසියාවේ ආශ්චර්ය සම්බන්ධ තොරතුරු සහ ගැසට් නිවේදන, ළමයින් සහ කාන්තාවන් දූෂණය කිරීම සම්බන්ධ තොරතුරු මා ළඟ තිබෙනවා. ගරු කථානායකතුමනි, වෙලාව මදි නිසා මම ඒ ලේඛන සියල්ල **සභාගත*** කරනවා.

තමුන්නාන්සේලා හදපු අය වැය ගැන තමුන්නාන්සේලා ගාම්භීරව කථා කරනවා. අද මෙහෙම ඉන්න පුළුවන් වුණත් හෙට වෙද්දී මොනවායින් මොනවා වේවිද කියලා අපි දන්නේ නැහැ. බලය ගැන නොවෙයි, රට ගැන හිතලා, රට ගැන ආදරයෙන් කටයුතු කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මගේ කථාවට පැය භාගයක් විතර තිබෙනවා කියලායි සභකාර මහ ලේකම්තුමිය කිව්වේ. මට තවත් වෙලාව තිබෙනවාද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, විනාඩි 25ක් ගත වෙලා තිබෙනවා. විනාඩි 25යි දීලා තිබෙන්නේ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මට විනාඩි 25ක් තිබෙනවා නේ? තවත් විනාඩි 10ක්වත් තිබෙනවාද?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා තවත් විනාඩි දෙකක් විතර ගන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි. Google website එක පෙන්වා දෙනවා වැඩිපුරම pornographic pictures බලන්නේ ලංකාව බව. ඉන්දියාව තමයි ඊළඟට ඉන්නේ. අද අපේ රට එවැනි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේවා ගැන හිතන්න. අපි කොහේටද මේ යන්නේ කියලා හිතන්න. අය වැයේ සඳහන් අනෙක් සංඛ්‍යා ලේඛනවලට වඩා සමාජයේ විනාශය පෙන්වන අංශ ගැනයි මා කථා කරන්නේ. තමුන්නාන්සේලා මේවා ගැන හිතන්න.

ගරු කථානායකතුමනි, අපි බලමු, ETF එකේ - Employees Trust Fund එකේ- ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද කියලා.

"The Sunday Times" dated 20th January, 2013 states, I quote:

> The Auditor General's Report submitted to Parliament noted that the capital gains received on sale of shares and units during 2011 had recorded a more than Rs. 654 million decline or 54 per cent drop as compared to 2010."

ගරු කථානායකතුමනි, මේවා අතිංසක කම්කරු ජනතාවගේ මුදල් නේ. අපි දැන් බලමු බැංකුවල තත්ත්වය මොකක්ද කියලා. රජය අය වැයේ සඳහන් කෙරුවා රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 80 දක්වා ගෙන ආවා කියලා. ඉලක්කය, 2014 වන විට එය සියයට 60 දක්වා අඩු කිරීමයි. කියන්න කනගාටුයි ගරු කථානායකතුමනි, ගරු හිටපු අගමැතිතුමනි, එම ඉලක්කගත කාලය දැන් තවත් අවුරුදු 7කින්, එනම් 2020 දක්වා දීර්ඝ කර තිබෙනවා.

Earlier you expected the debt to GDP ratio to decline to 80 per cent. Thereafter, you said you projected it to decline to 60 per cent by the year 2014. But, now you have projected the debt to GDP ratio to decline to 60 per cent by the year 2020, for which it will take another seven years. By that time what will happen to this country?

Now, I would like to talk about the situation of banks. IMF is not willing to grant loans.

තමුන්නාන්සේලා දැන් රාජ්‍ය බැංකුවලින් ණය ගන්න යනවා, guarantee දෙනවා කියලා. ඇයි ඒ? එහෙම වුණොත් පාර්ලිමේන්තුව අනුමත කරන්න ඕනෑ නැහැ නේ. චන්ද්‍රිකා මැතිනියත් අගමැතිනිය වෙලා සිටියදී ඔය දේ කෙරුවා ඔබතුමාට මතකයි නේද ගරු හිටපු අගමැතිතුමනි? ඒ විධියට ණය අරගෙන බැංකු කඩා වැටෙද්දී, එස්.බී. දිසානායක ඇමතිතුමා ඒ කාලයේ කිව්වා, "මේ ආණ්ඩුවත් එක්ක, චන්ද්‍රිකාත් එක්ක අපට යන්න වෙන්නේ කනත්තටයි." කියලා. ඊට පස්සේ ජී.එල්. පීරිස් මැතිතුමා ඇතුළු සියලු දෙනා අපේ පැත්තට ආවා. ලංකා බැංකුවේ, මහජන බැංකුවේ සල්ලි රුපියල් කෝටි 5,000ක් අරගෙන තිබුණා. කැබිනට් එක දන්නේත් නැහැ; Parliament එක දන්නේත් නැහැ. අපේ ආණ්ඩුව කාලයේ අවුරුදු දෙකක් තුළ ඒ සල්ලි ගෙවන්න අපට සිදු වුණා. අපි ගත්තේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ පඩිය. එහෙම අරගෙන අපි කිව්වා, "අපට මොකවත් ඕනෑ නැහැ. රට හදන්න." කියලා. අපි ඒ සල්ලි ඔක්කෝම ගෙව්වා. ඒවා මහජන

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

සල්ලි. දැන් ඒකම කරනවා මේ ආණ්ඩුවත්. Guarantee දෙනවා කියලා දැන් ඒ විධියට ණය ගන්න පටන් ගෙන තිබෙනවා. බැංකු හරහා රාජ්‍ය ණය ප්‍රමාණය වක්‍ර ආකාරයට වැඩි කරනවා. NSB එකේ හිටපු සභාපතිතුමා අයින් කළා. හිටපු අග්‍ර විනිශ්චයකාරතුමියගේ රස්සාවත් නැතිව ගියා; තනතුරත් නැති වුණා. එතුමියට මඩ ගැහුවා, එතුමිය මුදල් වගයක් දැම්මා කියලා. තමුන්නාන්සේලාගේ Governor ශ්‍රීක බැඳුම්කරවල මුදල් ආයෝජනය කළේ, Monetary Board එකේ අනුමැතිය අරගෙනද?

US Dollars 450 million was invested in Greece Bonds by the Governor of the Central Bank without the approval of the Monetary Board and the Cabinet. How did he deposit that money in a bankrupt bank in Greece? How are you going to get that money back? Now, the NSB is going to get loans worth US Dollars 1 billion from foreign banks at the risk of the poor people. Who is going to use that money? Your Government. You have to pay for that in Sri Lankan Rupees. There will be a downfall of this bank very soon like what happened in Cypress. Ultimately, the UNP will have to take in all these sufferings and bring the country to order. That is what is going to happen.

BoC එකට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? දැන් BoC එක බංකොලොත්. CEB එකටයි, CPC එකටයි මුදල් දීලා දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? බැංකුවට දෙන්න පුළුවන් උපරිම ප්‍රමාණය සියයට 10යි ගරු කථානායකතුමනි. මේවා ඔබතුමාට දැන ගන්න කියන්නේ. බැංකුවට දෙන්න පුළුවන් සියයට 10යි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඔය ටික කියලා කථාව නවත්වන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
අද සියයට 15ක් දීලා තිබෙනවා. එහෙම සියයට 15ක් දෙන්න බැහැ ගරු කථානායකතුමනි. එහෙම ලබා දීම නිසා අද ලංකා බැංකුව කඩා වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක කනගාටුදායක තත්ත්වයක්. මට කියන්න බොහෝ කරුණු තිබෙනවා. ජාතක කථාවක් විධියටයි මට ඒවා කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ. නමුත් වෙලාව ප්‍රමාණවත් නැති නිසා කියන්න විධියක් නැහැ. අපේ පක්ෂයේත් සාකච්ඡාවක් තිබෙනවා. මම මගේ කථාව කරලා යන්න සිටියේ. නැත්නම් මගේ හිතින් මම පව් කාරයෙක් වෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා මට කාලය වැඩියෙන් ලබා දුන්නාට ස්තුතියි. මට තව කියන්න හොඳ ලස්සන රසවත් දේවල් හුඟක් තිබුණත් කාලය ප්‍රමාණවත් මදි. බොහොම ස්තුතියි.

[4.40 p.m.]

ගරු ෆයිසර් මුස්තාපා මහතා (ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Deputy Minister of Investment Promotion)
Hon. Speaker, I am privileged to speak when four Bills dealing with the revenue mechanism of our country are being debated. As you know, these Bills primarily deal with increasing the revenue chargeable on the said documents. Some of these laws deal with the revenue as at the year 1902. The Bill to amend the Powers of Attorney Ordinance is an example.

Let us now take the Powers of Attorney (Amendment) Bill. Earlier it cost Rs.3.75 for the registration of a power of attorney. But, the documents itself would have cost much more. On any cancellation or revocation of power of attorney, the State coffers received only Rs.1. Since the 1st of July 1902, the State revenue had been in this manner.

Then, with regard to the registration of documents, for any caveat registration for a period of two years, the fee charged was Rs. 12.50 as per the Registration of Documents (Amendment) Law, No. 19 of 1976. The fee charged for an application for copies of extracts of any deed was only Rs. 2.50. That also came into effect by an amendment brought in 1976. Likewise, the fee charged for folio extract was Rs. 2.50.

Mr. Speaker, you will see that the revenue structure is archaic and not realistic. We have been stagnating for centuries without updating the Government revenue machinery in several spheres. These are the ills of the past. Unfortunately, our past leaders lacked the vision and the initiative in the interest of the people of our country. It is pertinent to say that His Excellency President Mahinda Rajapaksa is thinking in terms of the future. In this regard, I wish to quote a statement of His Excellency the President as reported in yesterday's "Daily News".

It states, I quote:

> "We should think of a development that would take place in 20 to 30 years and the people are being empowered to face this development challenges in the future."

Therefore, the vision of President Mahinda Rajapaksa is to do development work which would pay dividends even after 20 to 30 years. So, he is one of the most visionary leaders of our time. This reminds me of how some of our leaders had acted in the past without thinking far, which had been detrimental to the interest of the country. I can cite a very good example. In 2001, the UNP Government repealed the Finance Act, No. 11 of 1963 permitting the sale of land to foreigners without paying any tax. As a result of that, you can see what has happened now. In Galle, almost the entire prime lands fell into the hands of foreigners and today Galle is like a fortified foreign State. The value of a perch of land in this area is around Rs. 5 million. This has prevented Sirisena, Banda, Mohamed and Raja buying lands in this area. A good part of our coastal belt is also owned by foreigners. His Excellency President Mahinda Rajapaksa wants the fruits of the soil of our motherland to be reaped by our own citizens and through the Budget Proposals of 2013, the President proposed to prohibit the sale of lands to foreigners.

Let us have a look at the neighbouring countries, especially the emerging economies, like Bangladesh, Cambodia, India, Myanmar, Vietnam and Philippines. Bangladesh prohibits foreign companies buying land. Cambodia prohibits foreign nationals owning more that 40 per cent of shares in companies that buy land. In India, lands cannot be leased out to foreign companies for more than five years without having the permission of the Reserve Bank of India. The maximum duration of the lease contracts is 99 years.

In Myanmar, foreign companies cannot purchase or own land. But, they may lease land for a period up to 50 years. In Vietnam, foreigners cannot buy land but may lease land from an industrial zone for a maximum period of 70 years. In Philippines, the Constitution prohibits foreign companies from buying land.

We are a proud nation, Sir. I must say that we entice foreigners to come and invest here, but at the same time, we also safeguard the interests of the citizens in our country. Nobody can say that by doing so, we had failed to bring in foreign investment.

As the Deputy Minister of Investment Promotion, I would like to emphasize the fact that out of the total Foreign Direct Investments in the country from the inception of the BOI, 67 per cent had been during the period of President Mahinda Rajapaksa. This Government had the strength and courage to overcome all this and work for the betterment of Sri Lanka. If we look back at the economic progress since 2005, it would be seen that our economy has been very steady and growing.

Then, I would like to point out some facts highlighted by the Governor of the Central Bank yesterday while presenting the Central Bank Report for 2012 to His Excellency the President. The inflation has dropped to a single digit. What I would like to highlight is that we have continuously maintained the inflation on a single digit for the past 50 months. The unemployment has dropped to 4 per cent. Infrastructure development, since the defeat of terrorism, has been amazing. The per capita income was US Dollars 2,836 in 2011and in the year 2012, it had increased to US Dollars 2,923. If you take this in rupee terms, the per capita income which was at Rs. 313,506 in 2011 has increased to Rs. 373,001 in 2012. The growth rate has increased as never experienced in the history of our country.

Sir, we have achieved these milestones despite the challenges we had to face from many quarters within and beyond the shores of this country. Some of the challenges had drastic impacts on our economy. The embargo imposed on oil from Iran did affect us in a big way. We had to incur additional expenditure on oil imports. When you compare Sri Lanka with other countries in the region, you could see that our economy is very resilient. We know that the so-called developed countries are in crises. In some countries, the banking sector has collapsed but our banking sector is expanding. That indicates, Sir, how resilient we are as a nation.

So, Sir, this economic progress has to continue and these revenue proposals are only a part of this process. Therefore, the duty of all of us here is to support these Bills and contribute to the country's progress, of which the future generation would become the largest beneficiaries.

[අ.භා.4.47]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු කථානායකතුමනි, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ මේ රජය විසින් බදු සහන රාශියක් ලබා දීලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කරන්නේ බදු වැඩි කළ ඒවා ගැන විතරයි. ජනතාව වෙනුවෙන් බදු අඩු කිරීමට කටයුතු කිරීම පිළිබඳව ඒ අය කොයි වෙලාවකවත් හොඳක් කියන්නේ නැහැ. රජය කර තිබෙන වැඩවල පුංචි අඩු පාඩුවක් තිබෙනවා නම් ඒ දේ ගැන විතරයි ඒ අය හැම වෙලාවේම කියන්නේ. බදු සහන ලබා දෙන්න අපේ ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද මේ රටේ සියයට 95කට විතර විදුලිය ලබා දීලා තිබෙනවා. විදුලිය ලබා දෙන කොට විදුලිය නිෂ්පාදනය කරන්න ඕනෑ. ඒ නිසා කුඩා පරිමාණ ජල විදුලි බලාගාර හදන්න රජය මැදිහත් වෙලා ඒ අයට අවශ්‍ය කරන සහන ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඒවායින් ලැබෙන ආදායමෙන් සියයට 12 දක්වා බදු අඩු කරලා තිබෙනවා. කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර -වෙනත් විකල්ප විදුලි බලාගාර- ඇති කරලා මේ රටේ ඉන්ධන සඳහා වැය වන මුදල අවම කර ගැනීමට රජය එයින් බලාපොරොත්තු වනවා. ඒ නිසා පුංචි දිය ඇල්ලක් තිබුණත් ඒ ආශ්‍රිතව පරිසරයට හානියක් නොවන ආකාරයෙනුත් මෙම කටයුතු කරන්න අද ආයෝජකයින් කැමැත්ත ප්‍රකාශ කරලා කටයුතු කරගෙන යනවා. මේ වෙන කොට මගේ මැතිවරණ කොට්ඨාසයේත් ව්‍යාපෘති කිහිපයක් කරලා ජාතික විදුලිබල පද්ධතියට විදුලිය ලබා දෙනවා. මේ කටයුතුවලට සහන ලබා දෙන කොට වැඩි පිරිසක් ඒවාට එකතු වෙනවා. අප රජයෙන් සියලුම දේ කරන අතරේ මේ වාගේ කටයුතුවලට අනෙකුත් අයත් එකතු කර ගෙන කටයුතු කළාම රජයට තිබෙන බරත් ටිකක් අඩු වෙනවා.

ගරු කථානායකතුමනි, මෙම සහන ලබා දෙනවා වාගේම මේ පනත් කෙටුම්පතේ නැති සහන රාශියක් ගැනත් අපේ මන්ත්‍රීවරු කිව්වා. සමෘද්ධි සහනාධාරය ගැන, අනෙක් කටයුතු ගැන කිව්වා. 1994 දී අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ අපි සමෘද්ධි සහනාධාරය ලබා දුන්නා. අවුරුදු 18කට වැඩි කාලයක් තිස්සේ අප සමෘද්ධි සහනාධාරය ලබා දෙනවා. හැබැයි, එදා ජනසවිය දුන්නේ මේ රටේ කිහිප දෙනෙකුට පමණයි. ජනසවිය දීලා කිව්වා, NSB බැංකුවේ ජනසවිලාභීන්ගේ පොතේ රුපියල් 25,000ක් තිබෙනවා කියලා. මේ රටේ ඒ කියපු කිසිම බැංකුවක රුපියල් 25,000ක් තිබුණේ නැහැ. සල්ලි තිබෙනවා කියලා මිනිස්සුන්ට ලියවිල්ලක් දීලා තිබුණා. 1994 අපේ ආණ්ඩුව ආවාට පස්සේ ඊට කලින් පැවති රජය දුන් පොරොන්දුව ඉෂ්ට කරමින් අපේ ආණ්ඩුව ඒ මිනිස්සුන්ට සල්ලි ගෙව්වා. ඒ වාගේම සමෘද්ධිය හරහා අද විශාල වැඩ කොටසක් කරනවා.

ගරු කථානායකතුමනි, මම පෙරේදා දිවිනැඟුම වැඩසටහන යටතේ කිතුල් නිෂ්පාදනය කරන සිය දෙනෙකුට උපකරණ ලබා දුන්නා. කිතුල් කර්මාන්තයේ යෙදෙන අයට හකුරු, පැණි

[ගරු ජානක වක්කුඹුර මහතා]

නිෂ්පාදනය කරන්න අවශ්‍ය කරන උපකරණ දිවිනැඟුම වැඩ පිළිවෙළ යටතේ අප ලබා දුන්නා. අපේ රටට පිට රටින් ගෙනෙන සීනිවලට වැය වන මුදල අඩු කර ගැනීමත්, ඒ වාගේම ගමේ ඉන්න අභිංසක මිනිසුන්ගේ ආර්ථික මට්ටම ඉහළ නැනකට ගේන්න කටයුතු කිරීමත් තමයි අප එයින් බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා සමෘද්ධි ව්‍යාපාරය යටතේ අප විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමා, ඒ වාගේම මාස තුන හතරක සල්ලි එකතු කරගෙන ඉඳලා මේ දවස්වල ඔවුන් ඒ සල්ලි ගන්නවා. අපි ඉස්සෙල්ලා සමුපකාරයෙන් බඩු ගන්න කූපන් පතක් දුන්නා. ඒ වෙනුවට අද සමෘද්ධි බැංකුවෙන් සල්ලි ගන්න පුළුවන් ක්‍රමයක් හදලා දුන්නා, ඔවුන්ට ඕනෑ දේ ගන්න. ඒ නිසා මේ දවස්වල සමෘද්ධි බැංකු ළඟ විශාල පිරිසක් එකතු වෙලා ඉන්නවා. මේ අය ජනවාරි මාසයේ ඉඳලා සල්ලි ගන්නේ නැතිව එකතු කර ගත්තා, සිංහල අවුරුදු කාලයට ගන්න. ඒ අයගේ බැංකු පොතේ රුපියල් 500ක් ඉතුරු කරලා අපි අනික් මුදල් සියල්ලම දෙනවා. අර "ජන සවියේ" රුපියල් 25,000 වාගේ නොවෙයි, අපි මේ තිබෙන මුදල් සියල්ලම දෙනවා. ඒ නිසා මේ සමෘද්ධි ව්‍යාපාරය තුළින් මේ රටේ ඉන්න අභිංසක මිනිසුන් ලක්ෂ 18කට විතර අද සෙත සලසා තිබෙනවා. සමෘද්ධි ව්‍යාපාරය මේ රටේ තිබෙන හොඳම ව්‍යාපාරයක්. අද එය දිවි නැඟුම වැඩ පිළිවෙළක් එක්ක එකතු වෙලා කටයුතු කරනවා. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම දිවි නැඟුම පොළක් තියනවා. මම මේ දවස් ටිකේ පොළවල් කීපයකට ගියා. ගමේ ඉන්න අභිංසක මිනිස්සු මේ ව්‍යාපාරයත් එක්ක එකතු වෙලා තමන්ගේ නිෂ්පාදන අද ඒ වෙළෙඳ පොළට ගෙනැල්ලා විකුණනවා. ඒ මඟින් අඩු මිලට ජනතාවටත් යමක් ලබා දෙන්න කටයුතු කරනවා. මේ විධියට අපේ රජය යටතේ දීපු සහන රාශියයි. ගොඩක් අය අහනවා, "යුද්ධය අවසන් වුණත් ජනතාවට ලැබුණේ මොනවාද" කියලා. මේ ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මරණ බිය නැතිව තමන්ගේ වාහනය එළවාගෙන යන්න අද පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒකම මදිද?

ගරු කථානායකතුමනි, තව ටිකකින් පාර්ලිමේන්තු රැස්වීම් ඉවර වුණාම මේ මන්ත්‍රීවරුම තමන්ගේ වාහනය එළවාගෙන යනවා. මාත් ආවේ මගේ වාහනය එළවාගෙනයි. මා පළාත් සභාවේ හිටපු කාලයේ දන්නවා, පාර්ලිමේන්තු රැස්වීම් ඉවර වුණාම පාර වහලා තමයි මන්ත්‍රීවරුන්ට යන්න ඉඩ දුන්නේ කියලා. පොලීසියේ ආරක්ෂාව දීලා තමයි ගෙවල්වලට පිටත් කළේ. නමුත් මේ කථා කියන මන්ත්‍රීතුමන්ලා අද තමන්ගේ වාහනයෙන් බය නැතිව යනවා. මේ රටේ ජනතාවගේ මරණ බිය නැති කරපු එකටම අතිගරු ජනාධිපතිතුමාට පින්සිද්ධ වෙන්න ඕනෑ.

ඒ විධියේ විශාල වැඩ කටයුතු රාශියක් අපි ඉෂ්ට කරලා තිබෙනවා. පසු ගිය දවස්වල කිව්වා වාගේම, පාසල් 5,000ක් අප්‍රේල් 5 වැනිදා වන කොට නවීකරණය කරන්න කටයුතු කර තිබෙනවා. ගිය අවුරුද්දේ ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් රුපියල් ලක්ෂ පහ ගණනේ දීලා ළමා මිතුරු පාසල් එක්දහස් ගණනක් ආරම්භ කළා. ඒ අනුව මේ අප්‍රේල් 5 වැනිදා වන කොට මේ රටේ පාසල් 5,000ක් නවීකරණය කරන්න කටයුතු කර තිබෙනවා. අද පාසල්වලට දෙන පහසුකම් කපා හැරියාය කියනවා. සමෘද්ධිය කපා හැරියාය කියනවා. නමුත් අපි ඒ කිසිවක් කපා හැරලා නැහැ. සමෘද්ධි සහනාධාරය කැපුවා කියලා අද කියනවා. සමෘද්ධි සහනාධාරය කැපුවේ එදා 2002 ආණ්ඩුවෙන්. එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ආපු වෙලාවේ ඒ ගොල්ලන්ගේ ශාඛා සමිතිවල අය පත් කරලා ගමේ කමිටුවක් ඇති කළා. ඒ අය, "මෙන්න මේ අයගේ සමෘද්ධිය කපන්න" කියලා කිව්වා. ඒ විධියට සියයට 30ක සමෘද්ධි සහනාධාරය කපලා දැම්මා. එදා ඒ සහනාධාරය දෙන්න පාක්ෂිකයා කවුද කියලා බැලුවා. අපේ පාක්ෂිකයෙක් නම් සමෘද්ධිය කැපුවා. අද ඒවා අමතක වෙලා තිබෙනවා.

දැන් කියනවා, පොහොර සහනාධාරය කැපුවා කියලා. අපි තමයි පොහොර සහනාධාරය දුන්නේ. අද රුපියල් 350ට පොහොර ලබා දෙනවා. ඒ වාගේම තේ පොහොර රුපියල් 1,200ට ලබා දෙනවා. තේ පොහොර නම් ඕනෑ තරම් ගන්න පුළුවන්. අක්කරයට දෙන්නේ මෙච්චරයි කියලා සීමා කරලා නැහැ. ඉස්සර අක්කර පහට අඩු අයට තේ පොහොර සහනාධාරය දුන්නා. දැන් අක්කර 50 දක්වා ඒ සහනාධාරය දෙනවා. මේ සහනාධාර සියල්ලම දෙන්නේ මේ රජය බලයට පත් වුණාට පස්සේයි. සහනාධාර දෙන කොට යම් යම් ඒවායේ ගාස්තුව වැඩි වෙලා තිබෙනවා. ඒ අවුරුදු ගණනාවක් ඒ ගාස්තු සංශෝධනය කරපු නැති නිසායි. දැන් විවාහයක් රෙජිස්ටර් කරන මුදල පුංචි ගණනකින් වැඩි වෙලා තිබෙනවා. අඩුම ගණනේ රුපියල් 750ක් අතේ නැති කෙනෙකුට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා විවාහ වෙන්න බැහැ. ඇයි? ඔහු විවාහ වෙලා වැඩක් නැහැ නේ. තව කෙනෙකු නඩත්තු කර ගන්න බැරි, රුපියල් 750ක් නැති මනුස්සයෙක් විවාහ වෙන එකේ තේරුමක් නැහැ. රුපියල් 750ක් නැති අය විවාහ වෙන්න යන්නේ නැහැ. එහෙම දුප්පත් කෙනෙකු ඉන්නවා නම් ඒ අයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා විවාහ වෙන්න පුළුවන්. රෙජිස්ට්‍රාර්තුමාගේ ඔෆිස් එකට ගියොත් රුපියල් 1,500ක් යනවා. හැබැයි, අපේ ජනාධිපතිතුමාගේත් අවධානය මේ කාරණය කෙරෙහි යොමු වෙලා තිබෙනවා, ඉදිරියේ දී ඇමතිවරයාට බලය ලබා දීලා ඒ ගාස්තුවේ යම් කිසි සංශෝධනයක් කරන්න. කෙනෙකු හත් අට පාරක් විවාහ වෙන්නේ නැහැනේ. එක දෙයක ගාස්තුව පුංචි ගණනකින් වැඩි වුණොත් ඒ දේ ගැන කියනවා. නමුත් අපි සහන රාශියක් දීලා තිබෙනවා. ඒවා ගැන කථා කරන්නේ නැහැ.

මුදල් අමාත්‍යාංශය මේ පනත්වලට ගෙනා සංශෝධන මඟින් එකතු කරන බදු මුදල්වලින් මේ රටේ ජනතාවට ම තමයි සහනය ලැබෙන්නේ. එකතු කරන බදු මුදල් ආපසු මේ රටේ ජනතාව වෙනුවෙන් තමයි වැය කරන්නේ. මන්ත්‍රීවරුන් වන අපට විමධ්‍යගත අරමුදල් ලැබෙන්නේත් මේ එක්කාසු කරන බදු මුදල්වලින්. අපි ඒ මුදල්වලින් අපේ ප්‍රදේශ සංවර්ධනය කරනවා. අද මේ රටේ පාරවල් හදලා, විදුලිය දීලා, පාසල් හදලා, කර්මාන්තශාලා ඇති කරලා විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. මේ සියල්ලම කරන්න අපේ රජය මැදිහත්වෙලා කටයුතු කර තිබෙනවා. එම නිසා මේ ගෙනෙන ලද පනත් කෙටුම්පත්වලින් මේ රටේ ජනතාවට හානියක් වෙලා නැහැ. එහෙම හානියක් වෙන අණපනත් අපේ රජය මැදිහත් වෙලා ගෙනෙන්නේත් නැහැ.

ගරු කථානායකතුමනි, තේ කර්මාන්තය ගැනත් යමක් කියන්න ඕනෑ. කාබනික පොහොර යෙදූ තේ තොග වශයෙන් විකුණනකොට අය කරන බද්ද සියයට 12 දක්වා අඩු කර තිබෙනවා. අපේ රටේ තේ නිෂ්පාදනය කරන අය කාබනික පොහොර යොදා තේ නිෂ්පාදනය කිරීමට පෙලඹෙනු ඇතැයි එයින් බලාපොරොත්තු වෙනවා. අද කාබනික පොහොර යෙදූ තේවලට වැඩි ඉල්ලුමකුත් තිබෙනවා. රසායනික පොහොර වර්ග නැතිව, පොළොවට වල් නාශක ගහන්නේ නැතිව, උදැල්ලෙන් හෝ අතින් වල් ගලවලා පස ආරක්ෂා කර ගෙන, හොඳ තේ නිෂ්පාදනය කරන්න අද අපේ රටේ හුඟක් ගොවියෝ කැමැත්ත පළ කරලා තිබෙනවා. ඒවාට bio tea කියනවා. Bio tea වලට දැන් ලොකු ඉල්ලුමක් තිබෙනවා. එම නිසා ඒ සඳහා සහන ලබා දීලා තිබෙනවා. අපේ රජය බලාපොරොත්තු වන්නේ කාබනික පොහොර යොදා මේ කෘෂිකර්මාන්ත කටයුතු කරන්නයි. ඒ සඳහා සහන ලබා දීලා තිබෙනවා.

විපක්ෂය ලබා දෙන සහන ගැන කථා නොකර, බොහෝ වෙලාවට කථා කරන්නේ සුළු මුදලක් හෝ වැඩි වුණොත් ඒ ගැන විතරයි. ජනතාව පිට බර පටවා කිසිදු බදු වැඩි කිරීමක් කරන්න රජය කොහොමටවත් බලාපොරොත්තු වන්නේ නැහැ. අද අපේ රටේ විශාල සංවර්ධනයක් සිදු වෙනවා.

ගරු කථානායකතුමා, ඒ වාගේම උපාධිධාරීන් පණස් එක් දාහකට රක්ෂා ලබා දීලා මේ අවුරුද්දේ අප්‍රේල් 1 වනදා

වෙනකොට විශාල පිරිසකගේ රැකියා ස්ථිර කරලා ඒ කාරණාව ඉෂ්ට කළා. මේ සියල්ලම රජයට ලොකු බරක්. නමුත් ඒ බර සියල්ලම දරා ගෙන ජනතාවට සහන ලබා දෙනවා. අප එදා පුංචි කාලයේ මොනවා හෝ දෙයක් ගත්ත මිලට ම අද ගන්න බැහැ. ඕනෑම රටක එහෙමයි. බදු මුදල සුළු ප්‍රමාණයකින් වැඩි කරලා වැඩි සහන රාශියක් ලබා දෙන්න අපේ රජය කටයුතු කර තිබෙනවා. එම නිසා මේ පනත කෙටුම්පත්වලින් මේ රටේ ජනතාවට හානියක් වෙලා නැහැ. මේ පනත් කෙටුම්පත් ගෙන ඒමට කටයුතු කිරීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමන් ඇතුළු සියලු දෙනාටත් මගේ ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The next speaker is the Hon. R. Yogarajan. You have 15 minutes.

[5.01p.m.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Thank you, Hon. Speaker. This is the first opportunity I have got to speak before you. I consider it a privilege because generally I am listed as the last speaker, and you preside in the mornings.

Sir, I was waiting for the Hon. Sajin De Vass Gunawardena to be present in this House today because last time when I spoke here, I raised an issue about the airfare to Chennai and Trichy, where the per passenger mile charge is in the region of Rs. 50 - Rs. 60, whereas to UK and Paris, it is in the region of Rs. 12 - Rs. 14. He got up and said that it is because of the landing cost and take-off cost for airlines; whether it is to Trichy or to London it is the same though the distance maybe different and that is why Trichy and Chennai flights are so expensive. Today, we see advertisements in the newspapers saying that the airfare to Mattala is only Rs. 4,990. It is almost the same distance as to Trichy but it is Rs. 4,990. You compare it with the charge that the Sri Lanka Air Force charges from passengers flying from Colombo to Jaffna.

They have to pay Rs. 18,000 return fare to Jaffna. If they are possibly going through Mattala, it maybe cheaper for them. This is the way this country is ruled today where nobody gets a fair deal. The Government does as it pleases. We have fundamental rights where everyone has to be treated equally, but a person flying to Mattala - maybe to promote that airport - has to pay Rs. 4,990 whereas, another person flying to Jaffna has to pay Rs. 18,000. These are the things that bring disrepute to this country. This Government has to think again. The Mattala Airport is being promoted everyday in all media as a great achievement. If it is a development, people would recognize it. I do not see any reason for the Government to promote this airport. Promotion can come only when flights are coming in and going out, not through forced flights where a SriLankan Airlines flight from Colombo to Bangkok stops over at Mattala and one or two persons get in and on the return flight, maybe one or two persons get off at Mattala. So, the economics of this airport is a big question mark. To justify it, the Government propagates it as a development effort.

In the same way, you are planning airports in Kandy and Nuwara Eliya. I have explained in this House before that there is a flight to Nuwara Eliya which lands in the Gregory Lake. It has only eleven seats and it is always less than half full. So, there is a greater need to build houses in Nuwara Eliya than to build an airport there. This Government must realize that. It is only because you do not realize this, that there are issues of this nature.

The "Mirror Business" Supplement of “Daily Mirror” of 4th April, 2013 states, “Banks cut gold exposure on possible price crash". They give a list of the banks and their exposure:

People’s Bank - 35 per cent; Bank of Ceylon - 20 per cent; Commercial Bank - 3.3 per cent; Hatton National Bank - 16 per cent; Sampath Bank - 25.3 per cent; Seylan Bank - 14 per cent; National Development Bank - 3.1 per cent; PABC - 16.4 per cent; Nations Trust Bank - 16 per cent; Union Bank - 9.2 per cent and DFCC - 3.3 per cent.

Why is this situation? This situation has risen because the people in the country are suffering. They do not have money for their day-to-day expenses or to meet emergencies. So, they have to pawn their gold jewellery. The savings they made when they were doing better, are today being pawned and the people are living on pawned money. This is the status of the economy today. Everyday you are bringing in more and more taxes. You have brought 11 Bills, all of which are imposing burdens on the people. All these burdens are revenue measures for the Government.

Then, there is a cess on tea. You increased it to 10 per cent, but when the industry protested, you reduced it again to Rs. 6 per kilo. The Government is collecting Rs. 3 billion from that. Any export cess is supposed to support that industry. But, out of Rs. 3 billion collected from the tea cess, only Rs. 250 million is received by the Tea Board for promotion. But, they cannot do promotion with Rs. 250 million. The recurrent expenditure alone of the Tea Board is Rs. 250 million. So, they keep that institution going but there is no real development of the industry. Today, the tea exporters are making Rs. 16 billion whereas the tea manufacturing companies are making only Rs. 2 billion to 3 billion. If these tea manufacturing companies are supported by the Tea Board to move up in the value chain, then these tea manufacturing companies will earn more money. If they have more money, they would be able to share it better

[ගරු ආර්. යෝගරාජන් මහතා]

with the workers who have got a very small salary increase during the negotiations recently. We have seen that the inflation during the last two years is in the region of 50 per cent as far as the produce that the estate worker buys is concerned. Most importantly, flour prices went up by 44 per cent. Kerosene oil prices went up by 107 per cent. Sugar prices went up by 45 per cent. With all this, people are suffering. But, a salary increase of 20 per cent has been negotiated by a major union, which is with your Government. So, all this has failed the people and more and more jewellery that these people own will go into these banks. But, are these banks safe today? Because with 40 per cent exposure to gold loans and the gold prices crashing in the world market, the prospects of these banks are in danger. There is a possibility of these banks crashing if gold prices fall too low**.** So, the economy itself is very unstable.

Today, there is a big *haa-hoo* about the Central Bank Report that was released yesterday. The main thing that they are talking about is the so-called increase in the per capita income to US Dollars 2,900. But, no man in this country feels that he is earning US Dollars 2,900 per year. Nobody gets more than Rs. 300,000 individually, maybe, except five per cent of the cream of this country. But, the exposure by the Central Bank shows that our loan portfolio has gone up to Rs. 6 trillion which works out to Rs. 300,000 per individual. Every man, woman and child in this country, even the newborn, is indebted to the extent of Rs. 300,000. But, 90 per cent people of this country cannot borrow Rs. 300,000 from a bank today. - [*Interruption.*] - No, Rs. 6 trillion was not there. Even in 2004, it was Rs. 1,400 billion and not Rs. 6 trillion, Hon. Minister. So, where are we going?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
The per capita income has doubled.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
The per capita income is supposed to have doubled. But, the people do not feel it. They are living in poverty; they are living in great difficulty. You could see that the People's Bank alone has given Rs. 190 billion on gold loans. This is the status of the country and the status of the people. So, the Government has to rethink.

You have brought another piece of legislation, the Finance Bill, which was passed yesterday where you are showing the agriculturalists who suffered recently due to floods and you are trying to raise further revenue for the Government. As I said, the cess does not reach the tea industry. Similarly, you are showing the agriculturalists and going to charge 1 per cent on the turnover of the banks, finance companies and insurance industry. This is supposed to support the people who might have disasters; the agriculturists who might be facing floods or other calamities. But, how much of this is really going to reach them? This is again seen as another revenue measure and not as a measure to support the agriculturalists. So, the people in the country are today clamouring for a better deal; for you to run the Ceylon Electricity Board more efficiently without increasing the electricity charges; for you to run the Ceylon Petroleum Corporation more efficiently without increasing the prices of petroleum, but you reduce it according to world market prices. The same expectation is there for you not to tax food items so that the people can have at least their basic needs at a price that they could afford. So, the Government has to rethink its economic polices in favour of the common man in this country and not the ultrarich of the country.

Thank you.

[අ.භා. 5.15]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)
ගරු කථානායකතුමනි, විපක්ෂය නිතරම අඬන කාරණා දෙකක් තිබෙනවා. එකක් තමයි ණය ගන්නවාය කියන එක. ණය ගන්නේ නැතුව කොහොමද රටක් හදන්නේ? රට හදන්න ණය නොගත්තු ලෝකයේ රටක් කියන්න. කොයි රටද ණය අරගෙන නැත්තේ? අපේ රට අද වරායවල් හදන්නේ, ගුවන් තොටුපොළවල් හදන්නේ, අධිවේගී මාර්ග හදන්නේ, විදුලි බලාගාර හදන්නේ, වැව් හදන්නේ මේ ණය අරගෙනයි. මේ ණය ගත්තු නිසා තමයි ඕවා හදන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒක නිසා තමයි රටේ සංවර්ධනය ඉදිරියට යන්නේ. ඒක නිසා තමයි දහස් ගණනකට රස්සාව දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ලෝකයේ ආර්ථිකය කඩා වැටෙනවා. ලෝකයේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන වේලාවක, බැංකු වැහෙන වේලාවක, සේවකයන් අස් කරන වේලාවක, සුභ සාධනය කපන වේලාවක ලංකාවේ එහෙම දෙයක් නොකර සුභ සාධනයක් පවත්වාගෙන යමින් සංවර්ධනයත් කරමින් යනවා.

පොහොර සහනාධාරය දීලා, සමෘද්ධි ආධාර දීලා මේ සියල්ල කරගෙන යමින් මේ කටයුතු කරගෙන යන්නේ මේ රට සංවර්ධනය වෙන නිසායි. ඒ නිසා තමයි, උපාධිධාරීන් 50,000කට රස්සාවල් දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ. 8,000කට අද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ රස්සා දෙන්නේ. ඒ වාගේම ග්‍රාම සේවා නිලධාරීන් 6,000කට රස්සාව දෙන්නේ. ඒ වාගේම ගුරුවරුන් පත් කරන්නේ මේ රටේ ඇති වෙලා තිබෙන සංවර්ධනය නිසායි. ඒක නිසා තමයි ඒක පුද්ගල ආදායම ඉහළ ගිහින් තිබෙන්නේ. ඒ ඒක පුද්ගල ආදායම තවත් වැඩි කරන්න කටයුතු කරනවා. මේවා දැනෙන්නේ නැති ලු.

හැම එක්කෙනෙකු ළඟම; ඇමතිවරු ළඟත්, මන්ත්‍රීවරු ළඟත් cellular phones දෙක, තුන තිබෙනවා. රුපියල් 60,000, 70,000, 90,000 වටිනා ටෙලිෆෝන් තිබෙනවා. ඇඟට නොවෙයි, බඩටත් එක්කත් දැනෙනවා. මේවා නැහැ කියලා කියන්නේ කොහොමද?

ඒ වාගේම ගෙවල් හැදෙන නිසා -ඉදිකිරීම් අංශය හොඳ නිසා- තමයි අද වැලි හිඟ වෙලා තිබෙන්නේ. වැලි නැත්තේ. අද මිනිස්සු තට්ටු ගෙවල් හදන්නේ. ඒ වාගේම බිමට සිමෙන්ති නොවෙයි, tiles දාන්නේ. අද වැලි ගේන්න යන්න ඕනෑ කොහාටද? මහියංගනයට යන්න ඕනෑ. එහෙම නැත්නම් පොළොන්නරුවට යන්න ඕනෑ. ඒ ඉදිකිරීම් නිසා නේද? සල්ලි නැත්නම් කොහොමද මෙහෙම වෙන්නේ?

ඊ ළඟට, බැංකු කීයක් හැම නගරයම ඇති වෙලා තිබෙනවාද? මුළු රට පුරාම කුඩා නගරවල පවා බැංකු තිබෙනවා. සල්ලි රෝල් වෙන නිසා තමයි -ගනුදෙනු වෙන නිසා තමයි- මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා ණය අරගෙන හරි සංවර්ධනය කෙරුවොත් රක්ෂා ලැබෙනවා; නිෂ්පාදනය වැඩි වෙනවා. ඒක අරමුණ කරගෙනයි මේ වැඩේ කරගෙන යන්නේ. මෙතුමන්ලා කියන්නේ ණය ගන්න එපා කියලා.

HSBC බැංකුවෙන් ණය ගන්න ගිය වේලාවේ -එක්සත් ජාතික පක්ෂයේ තමුන්නාන්සේලා කවුරුත් දන්නවා- විපක්ෂ නායකතුමා කිව්වා, "ආණ්ඩුවට ණය දෙන්න එපා, ආණ්ඩුවට ණය දුන්නොත් අපි බලයට ආවොත් ගෙවන්නේ නැහැ" කියලා. දැනුත් ඒ වාගේ කතන්දර කියන්නේ. ඒවා ගන්නේ රට හදන්න, රටට වැඩ කරන්නයි. එදිනෙදා කන්න බොන්න නොවෙයි. එදිනෙදා වියදමට ගන්න නොවෙයි. මේ රට සංවර්ධනයට ණය ගැනීමේ තිබෙන වැරැද්ද මොකක්ද? ඒ නිසා නේද, රට හැදෙන්නේ? ඒ නිසා නේද, රක්ෂා ලැබෙන්නේ? ඒ නිසා නේද, ආදායම ඉහළ යන්නේ? ඒ නිසා නේද, මේ වාගේ ගොඩනැගිලි හැදෙන්නේ? මේවා ඔක්කෝම සිද්ධ වෙන්නේ ඒක නිසායි. ඒක නිසා මම විශේෂයෙන්ම මතක් කරන්නේ මේ ණය ගැනීම වරදක් නොවේය කියායි. ණය නොගත්තු රටක් කොහේද දියුණු කරලා තිබෙන්නේ කියලා කියන්න. කොයි රටද කියලා කියන්න. අද දියුණු රටවල බැංකු වහනවා. මේ රටේ බැංකු වැහුවේ නැහැ. ඒ වාගේම රාජ්‍ය සේවකයෝ අස් කරනවා. බැංකුවල සේවකයෝ දොට්ට දානවා.

ඊයේ ඉදිරිපත් කරපු Central Bank Report ගැන කියනවා. බැංකු වාර්තාවට අනුව ආර්ථික සංවර්ධන වේගය සියයට 6.4ක් තිබෙනවා. ඒ සංවර්ධනය යුරෝපයේ රටවල කීයද තිබෙන්නේ? සංවර්ධනය වෙච්ච රටවල කීයද තිබෙන්නේ? ඇමෙරිකාවේ කීයද තිබෙන්නේ? ඒ රටවල සංවර්ධන වේගය බැහැලා. අපේ රට මේ තත්ත්වය රැක ගෙන යන එක ගැන සන්තෝෂ වෙන්න ඕනෑ. මෙතැන තිබෙන්නේ ඊර්ෂ්‍යාවක්. මෙතුමන්ලා කියන්නේ, "ඒක බැහැලා, ඒක බැහැලා" කියලා. ලෝකයේ ගොඩාක් රටවල සංවර්ධන වේගය බැහැලායි තිබෙන්නේ. යුරෝපා රටවල සංවර්ධන වේගය සියයට එකයි, දෙකයි.

එහෙම තත්ත්වයක් ලෝකයේ තිබෙන්නේ. එහෙම තත්ත්වයක් තියෙද්දී විරුද්ධ පාර්ශ්වය හැටියට මොන තර්කද මේ දමන්නේ? මේ රට විතරයි සැලකිල්ලට ගන්නේ. අරගෙන බලන්න, යුරෝපයේ රටවල සංවර්ධනය වේගය කීයද කියලා. කීයද? [බාධා කිරීමක්] නිකම් පව ගහන්නේ නැතුව ඉන්න. තමුන්නාන්සේලා මේ තත්ත්වය අවබෝධ කර ගෙන කථා කරන්න ඕනෑ.

අද කථා කෙරුවා, අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා. එතුමා කියනවා, සමෘද්ධි ආධාර දීම ගැන. එතුමාගේ පියා දුන්නේ ජනසවිය. ජනසවියට දුන්නේ රුපියල් 250යි. ඒක කොහේවත් තැන්පත් කරලා නැහැ. එතුමා කිව්වා, ඒ මුදල් තැන්පත් කරලා තිබෙනවායි කියලා. ජනසවිය එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට දුන්නේ අවුරුදු දෙකයි. අවුරුදු දෙකකට පසුව වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට එය මාරු කරනවා. එය රට පුරාම ක්‍රියාත්මක වුණේ නැහැ.

එතුමා සමෘද්ධි මුදල් ඉතිරි කිරීම් ගැන කිව්වා. සමෘද්ධි ආධාරය රුපියල් 1,200ක් දෙන කොට රුපියල් 200ක් ඉතුරු කිරීම්වලට කපා ගන්නවා. ආණ්ඩුවෙන් සල්ලි දීලායි ඉතුරු කරන්නේ. ඒ, ඒ පුද්ගලයන්ගේ සල්ලි නොවෙයි. ඒ පුද්ගලයන් හොයාපු එකකින් තැන්පත් කිරීමක් නොවෙයි. ඔවුන්ටත් කැමැති නම් පුළුවන් තැන්පත් කරන්න. ආණ්ඩුව සල්ලි දීලා පුද්ගලයන් වෙනුවෙන් ඉතිරි කරවන ලෝකයේ එකම රට ලංකාව. මේ ආණ්ඩුව දුප්පතා නමින් ඉතුරු කිරීමක් කරනවා. ඒක වැරදිද? ඒක නරකද? සජිත් ප්‍රේමදාස මහත්තයාගේ තාත්තා ඒකද කෙරුවේ? ඒ අයගේ නමට ගන්න පුළුවන් වන විධියට ඒ මුදල් තැන්පත් කළාද? නැහැ, කොහෙවත් තැන්පත් කරලා තිබුණේ නැහැ. ඒ වාගේ කතන්දර තමයි මේ ගොල්ලෝ කියන්නේ.

රට කොයි තරම් සංවර්ධනය වුණත්, සංවර්ධන වේගය කොයි තරම් ඉහළ ගියත්, ඒකපුද්ගල ආදායම කොයි තරම් ඉහළ ගියත්, වසමක දුප්පත් අය හත් අට දෙනෙක්, දහ පහළොස් දෙනෙක් විතර ඉන්නවා. ඒක ඇත්ත. බීමත්කම නිසා වේවා, සූදුව නිසා වේවා, ලෙඩ දුක් නිසා වේවා, ආබාධිතකම නිසා වේවා, දුප්පත් අය ටික දෙනෙක් ඉන්නවා. ඒ දුප්පත් අයගේ ගෙදරින් ගෙදරට ගිහිල්ලා, ඒ අයගේ දුප්පත්කම නැති කරන්න ඉදිරි අවුරුදු දෙක ඇතුළත ක්‍රියා කරන්න වැඩ පිළිවෙළක් අද ඇති කරලා තිබෙනවා. එය තමයි දිවි නැඟුම. ඒ තුළින් සතුන් ඇති කරන්න පුළුවන් අයට සතුන් දෙන්නත්, කර්මාන්තයක් කරන්න පුළුවන් අයට කර්මාන්තයක් කරන්න උදව් කරන්නත්, වෙළෙඳාම් කරන්න පුළුවන් අයට වෙළෙඳාමට උදව් කරන්නත්, වගා කරන්න පුළුවන් අයට වගා කරන්න උදව් කරන්නත් ඒ වාගේම තවත් දියුණු වෙන්න උදව් කරනවා. ඉදිරි අවුරුදු දෙක ඇතුළතදී දුප්පත්කම මේ රටේ සෑම ගමකින්ම ඉවත් කරලා ගෙදර හදා, ගම හදා, රට සංවර්ධනය කරන වැඩ පිළිවෙළක් තමයි මේ ආණ්ඩුව, ජනාධිපතිතුමා මේ ක්‍රියාත්මක කර ගෙන යන්නේ. ඒකට මේ විරුද්ධ පාර්ශ්වයේ අයගේ ඊර්ෂ්‍යාවක් තිබෙන්නේ. මන්තරය වාගේ කියවලා, මිනිස්සු කලකිරවන්න පුළුවන්ද, භය ගන්වන්න පුළුවන්ද කියලා බලන්න මේ විරුද්ධ පාර්ශ්වය ගෙන යන පව ප්‍රචාරය තමුන්නාන්සේලාටත් මුළු රටටත් දැනෙයි කියලා මම විශ්වාස කරමින් මාගේ කථාව මෙයින් අවසාන කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔබතුමාට බොහොම ස්තුතියි, කථාව විනාඩි 10න් අවසන් කළාට.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

වීනා විටුක්කප්පට්ටු, ඒற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." [The Hon. Nimal Siripala de Silva.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. SPEAKER in the Chair.]

[ගරු කථානායකතුමා]

1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 ආම් වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 1, ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 2.- (முதன்மைச் சட்டவாக்கத்தின் 7ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 2. - *(Amendment of section 7 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 20 වන පේළියට ඉක්බිතිව පහත දැක්වෙන පේළිය ඇතුළත් කරන්න:

'(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ-' ".

"3 වන පිටුවේ, 4 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(2) ඒ වගන්තියේ (ඔ) ඡේදයේ 'ලාභ සහ ආදායම.' යන වචන වෙනුවට 'ලාභ සහ ආදායම;' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්;

'(ඕ) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ සාදන ලද නියෝග මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ලාභ සහ ආදායම,'.";

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තඞ්කළ් විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.

Amendments put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2 ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 8 ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 3. - *(Amendment of section 8 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 6 වන පේළියේ සිට 10 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.

Amendment put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4ආම් වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 4, ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 13ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 5. - *(Amendment of section 13 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ශ්‍රී ලංකාව හැර වෙනත් යම් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කර හෝ ශ්‍රී ලංකාව හැර වෙනත් යම් රටක භාණ්ඩ නිෂ්පාදනය කර ශ්‍රී ලංකාව හැර වෙනත් යම්' ";

6 වන පිටුවේ, (1) 9 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(බබබබබබබබ) 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත මඟින් පිහිටුවන ලද ඩීඑෆ්සීසී බැංකුව විසින් සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයන ලද අරමුදල්වලින් සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායන්ට, වැවිලි කර්මාන්තයට, ඉදිකිරීම් කර්මාන්තයට හෝ වෙනත් නිෂ්පාදන කර්මාන්තවලට ණයට දෙන ලද මුදල්වලින් උපයන ලද පොලිය' ;

(2) 26 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

(5) ඒ වගන්තියේ (යයයයයය) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

'(යයයයයයය) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සහ විදේශීය රටක සේවා නියුක්තව සිටි පුද්ගලයකු 2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව මෙරටට පැමිණ ඒ විදේශීය රටෙහි

සේවා නියුක්තියෙන් ඔහු උපයන ලද මුදල් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන හැර, වෙනත් යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් හෝ යම් සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ආයෝජනය කරන අවස්ථාවක දී, එම ව්‍යාපාරයේ වාණිජ කටයුතු ආරම්භ කරන ලද තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු පහක කාල සීමාවක් සඳහා ඒ ව්‍යාපාරයෙන් ඒ කැනැත්තාට ලැබෙන ලාභ සහ ආදායම.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොණ්ඩප්පට්ටදු.
Amendments put, and agreed to.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 5, as amended, ordered to stand part of the Bill.

6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தின் 15ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 6. - *(Amendment of section 15 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"7 වන පිටුවේ, 4 වන පේළියේ සිට 11 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ii) එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් සහ -

(අ) ඔහු වෙනත් යම් රටක ද පුරවැසියකු නම්; හෝ

(ආ) ඔහු වෙනත් යම් රටක ස්ථිර වාසික තත්වය හෝ වෙනත් සමාන තත්වයක් ලබා ගෙන ඇත්නම් හා ඒ යටතේ ඒ පුද්ගලයාට ඒ රටේ පුරවැසිභාවය ලබා ගත හැකි නම්,

ඒ පුද්ගලයා එසේ පැමිණි අවස්ථාවේදී සහ එසේ නැවතී සිටින සම්පූර්ණ කාලය තුළ, 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 6, as amended, ordered to stand part of the Bill.

7 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

7ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 7, ordered to stand part of the Bill.

8 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 8.- (முதன்மைச் சட்டவாக்கத்தின் 16இ ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 8. - *(Amendment of section 16D of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"8 වන පිටුවේ, 13 වන පේළියේ සිට 23 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තියේ "එම ව්‍යවසාය විසින් එම තක්සේරු වර්ෂය තුළ දී" යන වචනවල සිට "නිදහස් කරනු ලැබිය යුතු ය." යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

'එම ව්‍යවසාය කලින් පැවති යම් ව්‍යාපාරයක් කැඩීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම හෝ අත්කර ගැනීම මගින් පිහිටුවනු නොලැබුවා වූ අවස්ථාවක දී, එම ව්‍යවසාය විසින් එම තක්සේරු වර්ෂය තුළ දී සිදු කරන ලද ගනුදෙනුවලින් ලාභ ඉපයීම ආරම්භ කළේ යම් තක්සේරු වර්ෂයක ද, එම තක්සේරු වර්ෂය ආරම්භයේ සිට හෝ එම ව්‍යවසාය විසින් වාණිජ කටයුතු කරගෙන යාම ආරම්භ කළ දින සිට වසර දෙකක කාලසීමාවක් සම්පූර්ණ වන තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය ආරම්භයේ සිට, යන මෙයින් කලින් එළඹෙන වර්ෂයේ සිට ගණන් බලනු ලබන වසර පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "ආයෝජනය" යන්නෙන් යම් ඉඩමක, පිරියතවල, යන්ත්‍රෝපකරණවල, උපකරණවල සහ වෙනත් ස්ථාවර වත්කම්වල පිරිවැය අදහස් වේ.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

8 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

8 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 8, as amended, ordered to stand part of the Bill.

9 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඉ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.)

வாசகம் 9.- முதன்மைச் சட்டவாக்கத்தின் 16உ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்.)

CLAUSE 9. - *(Insertion of new section 16E in the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

"9 වන පිටුවේ, 9 වන පේළිය සහ 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ii) කාබනික පොහොර නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම සහ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 9, as amended, ordered to stand part of the Bill.

10 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 10.- (முதன்மைச் சட்டவாக்கத்தின் 17அ என்னும் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 10. - *(Amendment of section 17A of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"9 වන පිටුවේ, (1) 15 වන පේළිය සහ 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'10. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තියේ (2) වන උපවගන්තිය පහත';

(2) 24 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(3) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "වාණිජ කටයුතු" යන වචනවල සිට "ව්‍යවසායක් අදහස් වේ." යන වචන දක්වා ඇති සියලුම වචන ඉවත් කොට ඒ වෙනුවට "වාණිජ කටයුතු ආරම්භ කරන; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:

"(ඇ) කලින් පැවති යම් ව්‍යාපාරයක් කැඩීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම හෝ අත්කර ගැනීම මගින් පිහිටුවනු නොලැබුවා වූ,

යම් ව්‍යවසායක් අදහස් වේ.

මේ වගන්තියේ කාර්ය සඳහා "ආයෝජනය" යන්නෙන් යම් ඉඩමක, පිරියතවල, යන්ත්‍රෝපකරණවල, උපකරණවල සහ වෙනත් ස්ථාවර වත්කම්වල පිරිවැය අදහස් වේ.' ;

10 වන පිටුවේ, 1 වන පේළියේ සිට 3 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

10 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 10, as amended, ordered to stand part of the Bill.

11 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 11.- (முதன்மைச் சட்டவாக்கத்தின் 25ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 11. - *(Amendment of section 25 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'තැරැවිකාර සමාගමක් විසින් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් පිරියත,';

12 වන පිටුවේ, 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ඒ අඩු කිරීම ඒ තැනැත්තා' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 11, as amended, ordered to stand part of the Bill.

12 සිට 16 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

12ஆம் வாசகத்திலிருந்து 16ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 12 to 16 ordered to stand part of the Bill.

17 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 48ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.)

வாசகம் 17.- (முதன்மைச் சட்டவாக்கத்தின் 48இ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்.)

CLAUSE 17. - *(Insertion of new section 48C in the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"14 වන පිටුවේ, 19 වන පේළියේ සිට 34 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියට 48ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.	17. ප්‍රධාන ප්‍රඥප්තියේ 48ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 48ඇ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.';
'ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායවලට බදු නිදහස් කාලසීමාව අවසන්	48ඇ. යම් ව්‍යවසායක් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග බදු සහන ලබා දෙන යම් ගිවිසුමකට ඇතුළත්ව ඇති අවස්ථාවක දී සහ ඒ ගිවිසුම යටතේ

වීමෙන් පසුව අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය.

සලසා දී ඇති බදු නිදහස් කාල සීමාව අවසන් වීමෙන් පසු ඒ ගිවිසුම යටතේ අය කරනු ලබන බද්ද දේශීය ආදායම් පනත යටතේ අය කරනු ලබන බද්දට වඩා වැඩි අවස්ථාවක දී, ඒ ව්‍යවසාය විසින් ඒ ගිවිසුම සම්බන්ධයෙන් තවදුරටත් යම් බදු සහනයක් යම් පරිපූරක ගිවිසුමක් මගින් ලබා නොගන්නේ නම්, ඒ බදු නිදහස් කාලසීමාව අවසන් වීමෙන් පසු ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම මත දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.';

15 වන පිටුවේ, 1 වන පේළියේ සිට 3 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න. "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

17 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

17ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 17, as amended, ordered to stand part of the Bill.

18 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

18 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 18, ordered to stand part of the Bill.

19 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 56අ, 56ආ සහ 56ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.)

வாசகம் 19.- (முதன்மைச் சட்டவாக்கத்தின் 56அ, 56ஆ, 56இ என்னும் புதிய பிரிவுகளை உட்புகுத்துதல்.)

CLAUSE 19. - (*Insertion of new sections 56A, 56B, 56C in the principal enactment*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"16 වන පිටුවේ, (1) 9 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වුව ද, අපනයනවලින් උද්ගත වූ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ලාභ සහ ආදායමෙන් මේ පනතේ පස්වන උපලේඛනයේ' "

(2) "38 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න :

'අපනයනාභිමුඛ සමාගම් විසින් දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ දේශීය වෙළෙඳ පොළෙහි විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණය.

56 ඇ. ස්වකීය නිෂ්පාදනවලින් සියයට හැටකට නො අඩු ප්‍රමාණයක් අපනයනය කරන යම් අපනයනාභිමුඛ සමාගමක් විසින් දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද නිමි ඇඳුම්, රෙදිවලින් සාදන ලද මලු, ලිනන්, තිර රෙදි හෝ වෙනත් යම් භාණ්ඩයක් දේශීය වෙළෙඳ පොළෙහි විකිණීමෙන් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමට ලැබෙන ලාභයේ සහ ආදායමේ කොටස මත සියයට දොළහක අනුප්‍රමාණය මත ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි ඒ නිමි ඇඳුම්වල, මලුවල, ලිනන්වල, තිර රෙදිවල හෝ වෙනත් භාණ්ඩවල දේශීය වටිනාකම එකතු කිරීම ශ්‍රී ලාංකීය වෙළෙඳ නාමය සහිතව සියයට හැට පහකට වැඩිවන අවස්ථාවක ඒ නිමි ඇඳුම්, මලු, ලිනන්, තිර රෙදි හෝ වෙනත් භාණ්ඩ දේශීය වෙළෙඳ පොළෙහි විකිණීමෙන් ඒ අපනයනාභිමුඛ සමාගමට ලැබෙන ලාභයේ සහ ආදායමේ කොටස මත සියයටදහයක අනුප්‍රමාණය මත ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள்விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 19, as amended, ordered to stand part of the Bill.

20 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 20.- (முதன்மைச் சட்டவாக்கத்தின் 59ஆ பிரிவைத் திருத்துதல்.)

CLAUSE 20. - *(Amendment of section 59B of the principal enactment*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා :

"17 වන පිටුවේ, 1 වන පේළියේ සිට 20 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :

'ප්‍රධාන ප්‍රඥප්තියේ59ආ වගන්තිය සංශෝධනය කිරීම.

20. 2012 අංක 8 දරන පනත මඟින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධන කරනු ලැබේ : -

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) (i) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන, එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම්

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

තක්සේරු වර්ෂයක් වන එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් මිලියන තුන්සියයක් නොඉක්මවන;

(ii) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් මිලියන පන්සියයක් නොඉක්මවන,

(යම් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන පිරිවැටුම නොවන) පිරිවැටුමක් සහිත යම් ව්‍යවසායක් අදහස් වේ."; සහ

(2) ඒ වගන්තියේ පැනි සටහන වෙනුවට පහත දැක්වෙන පැනි සටහන ආදේශ කිරීමෙන් :-

"වාර්ෂික පිරිවැටුම එක්තරා මුදලක් නොඉක්මවන යම් ව්‍යවසායකින් යම් තැනැත්තකු ලබන ලාභ සහ ආදායමට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

Amendment put, and agreed to.

20 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

20ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 20, as amended, ordered to stand part of the Bill.

21වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

21ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 21 ordered to stand part of the Bill.

22 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 22.- (முதன்மைச் சட்டவாக்கத்தின் 60ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 22. - *(Amendment of section 60 of the principal enactment)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා :

"19 වන පිටුවේ, 28 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :

'(2) ඒ වගන්තියේ "රබර් කිරි හෝ අලුත් පොල් හැර 16 වන වගන්තියේ සඳහන් වූ අනෙක් භාණ්ඩ අදහස් වේ;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "රබර් කිරි හෝ අලුත් පොල් හෝ 16 වන වගන්තියේ සඳහන් වෙනත් යම් නිෂ්පාදනයක් නොවන භාණ්ඩ අදහස් වන අතර, ඊට තොග වශයෙන් වන ඓන්ද්‍රීය තේ ඇතුළත් වේ." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

Amendment put, and agreed to.

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)
PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන), උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) සහ මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) නමැති පනත් කෙටුම්පත් : පළාත් සභාවලින් ලැබුණු දැනුම්දීම්

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත : පළාත් සභාවලින් ලැබුණු දැනුම්දීම්

වරප්‍රසාද : පාර්ලිමේන්තුවේ කරන ලද කථාව සම්බන්ධ සීඅයිඩී පරීක්ෂණය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :

විදුලි ගාස්තු ඉහළ නැංවීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

திருமணப் பதிவு (திருத்தம்), கண்டிய திருமண, மணநீக்கம் (திருத்தம்) மற்றும் முஸ்லிம் திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலங்கள் : மாகாண சபைகளின் தெரிவிப்புகள்

பிறப்புக்கள், இறப்புக்கள் பதிவு (திருத்தம்) சட்டமூலம் : மாகாண சபைகளின் தெரிவிப்புகள்

சிறப்புரிமை : பாராளுமன்ற உரை மீதான புலனாய்வுப் பிரிவினரின் விசாரணை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா:

மின் கட்டண அதிகரிப்பு

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Marriage Registration (Amendment), Kandyan Marriage and Divorce (Amendment) and Muslim Marriage and Divorce (Amendment) Bills: Communication from Provincial Councils

Births and Deaths Registration (Amendment) Bill: Communication from Provincial Councils

Privilege: Inquiry by CID into Speech made in Parliament

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Increase of Electricity Tariff

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 අප්‍රේල් 23 වන අඟහරුවාදා
2013 ஏப்பிரல் 23, செவ்வாய்க்கிழமை
Tuesday, 23rd April, 2013

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන), උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) සහ මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) නමැති පනත් කෙටුම්පත් : පළාත් සභාවලින් ලැබුණු දැනුම්දීම්

திருமணப் பதிவு (திருத்தம்), கண்டிய திருமண, மணநீக்கம் (திருத்தம்) மற்றும் முஸ்லிம் திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலங்கள் : மாகாண சபைகளின் தெரிவிப்புகள்

MARRIAGE REGISTRATION (AMENDMENT), KANDYAN MARRIAGE AND DIVORCE (AMENDMENT) AND MUSLIM MARRIAGE AND DIVORCE (AMENDMENT) BILLS : COMMUNICATION FROM PROVINCIAL COUNCILS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

'විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන)", "උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන)" සහ "මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

මෙම පනත් කෙටුම්පත් 2013 මාර්තු මස 08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ද (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාර එක් එක් පළාත් සභාවට යොමු කර ඇති අතර, 2013 අප්‍රේල් මස 11 දින හෝ ඊට පෙර ඒ ඒ පළාත් සභාවේ අදහස් පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා ස්ථාවර නියෝග අංක 46අ (2)(අ) යටතේ ඉදිරිපත් කරන ලදී.

බස්නාහිර, වයඹ, දකුණු, නැගෙනහිර, ඌව, සබරගමුව හා උතුරු මැද නමැති පළාත් සභා, පනත් කෙටුම්පත් සලකා බැලීමෙන් අනතුරුව ඒ සඳහා එකී සභාවල එකඟතාවය පළ කර ඇත.

මධ්‍යම පළාත් සභාව මෙම පනත් කෙටුම්පත් සමගාමී ලැයිස්තුවට අදාළ නොවන බව පවසා එම පනත් කෙටුම්පත් පිළිබඳව සාකච්ඡා කිරීම අවශ්‍ය නොවන බවට වාර්තා කර ඇත.

II

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත : පළාත් සභාවලින් ලැබුණු දැනුම් දීම්

பிறப்புக்கள், இறப்புக்கள் பதிவு (திருத்தம்) சட்டமூலம் : மாகாண சபைகளின் தெரிவிப்புகள்

BIRTHS AND DEATHS REGISTRATION (AMENDMENT) BILL: COMMUNICATION FROM PROVINCIAL COUNCILS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

"උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

මෙම පනත් කෙටුම්පත 2013 මාර්තු මස 08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(උ) 5(අ) ව්‍යවස්ථාව ප්‍රකාර එක් එක් පළාත් සභාවට යොමු කර ඇති අතර, 2013 අප්‍රේල් මස 22 දින හෝ ඊට පෙර ඒ ඒ පළාත් සභාවේ අදහස් පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා ස්ථාවර නියෝග අංක 46අ (2)(අ) යටතේ ඉදිරිපත් කරන ලදී. බස්නාහිර, වයඹ, දකුණු, නැගෙනහිර, ඌව, සබරගමුව හා උතුරු මැද නමැති පළාත් සභා විසින් පනත් කෙටුම්පත සලකා බැලීමෙන් අනතුරුව ඒ සඳහා එකී සභාවල එකඟතාවය පළ කර ඇත.

මධ්‍යම පළාත් සභාව මෙම පනත් කෙටුම්පත සමගාමී ලැයිස්තුවට අදාළ නොවන බව පවසා එම පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීම අවශ්‍ය නොවන බවට වාර්තා කර ඇත.

III

වරප්‍රසාද : පාර්ලිමේන්තුවේ කරන ලද කථාව සම්බන්ධ සීඅයිඩී පරීක්ෂණය

சிறப்புரிமை : பாராளுமன்ற உரை மீதான புலனாய்வுப் பிரிவினரின் விசாரணை

PRIVILEGE: INQUIRY BY CID INTO SPEECH MADE IN PARLIAMENT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්.ශ්‍රීතරන් මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2012 නොවැම්බර් මස 30 වැනි දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යොජනාවක් ඉදිරිපත් කළ හැකිය.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2011 වර්ෂය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

1969 අංක 16 දරන පනතින්, 1981 අංක 21 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 9 දරන පනතින් සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 හා 156 වැනි වගන්ති යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද්දව, 2012 දෙසැම්බර් 07 දිනැති අංක 1787/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි. - [ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

1. පෝද්දල, මීපාවල, ගලගාවවත්ත පදිංචි සුමිත්‍රා හේවාවසම් මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ
2. කොළඹ 10, සිරිධම්ම මාවත, අංක 163 ඒ දරන ස්ථානයේ පදිංචි මානෙල් ජානකී ෆැන්සිස්කෝ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මහතා - පැමිණ නැත.
ගරු වාසුදේව නානායක්කාර මහතා - පැමිණ නැත.
ගරු ජයරත්න හේරත් මහතා - පැමිණ නැත.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister Economic Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

1. පැල්මඩුල්ල, ගොඩගම පදිංචි කේ.පී.සී. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
2. මොල්ලිපොකාන, ගල්මැටියාව දකුණ, අංක 159 දරන ස්ථානයේ පදිංචි යූ.ජී. රත්නසිරි උඩුවැල්ල මහතාගෙන් ලැබුණු පෙත්සම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ලසන්ත අලගියවන්න මහතා - පැමිණ නැත.

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, මම කහපොලේවත්ත, උරුලෑදෙනිය, දේවාලේගම පදිංචි එච්.පී. රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නියෝමල් පෙරේරා මහතා - පැමිණ නැත.
ගරු රවි කරුණානායක මහතා - පැමිණ නැත.
ගරු වසන්ත අලුවිහාරේ මහතා - පැමිණ නැත.
ගරු වී.කේ. ඉන්දික මහතා - පැමිණ නැත.

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

ගරු කථානායකතුමනි, මම හල්ඔළුව, කන්කත්තොට, පන්සල ළඟ කඩේ බාරේ පදිංචි ආර්. නිශාන්ත ප්‍රදීප් ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මම රාජගිරිය, බණ්ඩාරනායකපුර, අංක ඒ/1 දරන ස්ථානයෙහි පදිංචි ජී.එල්. රමණි ප්‍රසන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) සිදුව, රද්දොළුව, අංක 56 දරන ස්ථානයෙහි පදිංචි පී. උපාලි චන්ද්‍රසේකර ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) දෙහිවල, පාමංකඩ, ශ්‍රී සරණංකර පාර, අංක 11/4 දරන ස්ථානයෙහි පදිංචි සාලිය රණවීර මහතාගෙන් ලැබුණු පෙත්සම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ශාන්ත බණ්ඩාර මහතා - පැමිණ නැත.

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2-2459/'12-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

වැලිඔය ව්‍යාපාරය : වගා කටයුතු
வெலிஓயா திட்டம் : பயிர்ச்செய்கை நடவடிக்கைகள்
WELIOYA PROJECT : CULTIVATION

2508/'12

3. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වන්නි දිස්ත්‍රික්කයේ, මහවැලි එල් (L) කලාපය යටතේ ක්‍රියාත්මක වන, වැලිඔය ව්‍යාපාරයට අයත් වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් කවරේද;

(iii) එම එක් එක් වැවෙන් පෝෂණය වන කුඹුරු අක්කර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එක් එක් වැව යටතේ වගා කරනු ලබන කුඹුරු ඉඩම් පිහිටි ග්‍රාම නිලධාරී වසම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) අදාළ ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ප්‍රමාණවත් පරිදි ජලය නොලැබෙන නිසා මේ වන විට තම වගා කටයුතු එක් කන්නයකට පමණක් සීමා කිරීමට වැලිඔය ව්‍යාපාරය යටතේ වගා කටයුතු කරන ගොවීන්ට සිදු වී ඇති බවත්;

(ii) එම හේතුවෙන් ඔවුන් මහත් දුෂ්කරතාවන්ට මුහුණ පා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) වැලිඔය ව්‍යාපාරයේ වාරි ජලය නිහතාව නිසා මතු වී ඇති ගැටලු විසඳීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඒවා ක්‍රියාවට නැංවීම සඳහා කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வன்னி மாவட்டத்தில் மகாவலி எல் (L) வலயத்தின் கீழ் நடைமுறையிலுள்ள வெலிஓயா திட்டத்திற்குரிய குளங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி குளங்களின் பெயர்கள் யாவை யென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு குளத்திலிருந்தும் எத்தனை ஏக்கர் வயற்காணிகள் நீரைப்பெறுகின்றன என்பதை வெவ்வேறாகவும்;

(iv) ஒவ்வொரு குளத்தின் ஊடாகவும் பயிர்ச்செய்கை செய்யப்படுகின்ற வயற்காணிகள் அமைந்துள்ள கிராம உத்தியோகத்தர் பிரிவுகள் வெவ்வேறாக யாவையென்பதையும்;

(v) ஏற்புடைய விவசாய குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) போதியளவு நீர் கிடைக்காததால் வெலிஓயா திட்டத்தின் கீழ் பயிர்ச்செய்கையில் ஈடுபடுகின்ற விவசாயிகள் தங்களது பயிர்ச்செய்கை நடவடிக்கைகளை ஒரு போகத்திற்கு மாத்திரம் மட்டுப் படுத்திக்கொள்ளும் நிலைக்கு தள்ளப்பட்டுள் ளார்கள் என்பதையும்;

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

(ii) இதன் விளைவாக இவர்கள் பெரும் கஷ்டங் களுக்கு முகம்கொடுத்துள்ளார்கள் என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) வெலிஓயா திட்டத்தின் நீர்ப்பாசன நீர் பற்றாக் குறை காரணமாக தோன்றியுள்ள சிக்கல்களை தீர்ப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

(ii) இந் நடவடிக்கைகளை அமுல்படுத்துவதற்கு எவ்வளவு காலம் செல்லும் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Will he state -

(i) the number of tanks belonging to Welioya Project implemented under Mahaweli "L" zone in the Vanni District;

(ii) the names of the aforesaid tanks;

(iii) separately, the acreage of paddy fields cultivated with the waters of each of the tanks;

(iv) separately, the Grama Niladhari Divisions in which the paddy lands cultivated under each of the tanks are situated; and

(v) the number of relevant farming families?

(b) Will he admit that -

(i) the farmers carrying out cultivations under the Welioya Project have been compelled to limit their cultivation to only one season as sufficient water is not received; and

(ii) they are facing grave difficulties as a result?

(c) Will he inform this House -

(i) the courses of action taken to solve the issue that has arisen due to scarcity of irrigated water in the Welioya Project; and

(ii) the period of time it would take to put the courses of action into effect?

(d) If not, why ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) වැව් 23යි.

(ii), (iii), (iv) සහ (v) සඳහා පිළිතුරු පහත වගුවේ සඳහන් කර ඇත.

අනු අංකය	(ii) වැවේ නම	(iii) වගා කරනු ලබන ඉඩම් ප්‍රමාණය (අක්. වලින්)	(iv) වගා කරනු ලබන කුඹුරු පිහිටි ග්‍රාම නිලධාරී වසම්	(v) ගොවි පවුල් සංඛ්‍යාව
01	නික වැව	539	නික වැව	539
02	සපුමල් වැව	75		75
03	ඇතාවැටුණ වැව	200	ඇතාවැටුණ වැව	200
04	සම්පත්ගම වැව	66		66
05	නිල් පොකුණ වැව	79		79
06	ඇහැටුගස් වැව	263	ඇහැටුගස් වැව	263
07	කිරිඉඹ්බන් වැව	298	කිරිඉඹ්බන් වැව	298
08	වැලි ඇළ අමුණ	135		135
09	හැළඹ වැව	35	ජනකපුර	35
10	නෙළුම් වැව	154		154
11	සාමිළදා වැව	59		59
12	කළ්‍යානිපුර වැව	75	කළ්‍යාණිපුර	75
13	සහන් වැව	33		33
14	හංසවිල වැව	47		47
15	කම්බිලි වැව	88	බුද්ධංගල	88
16	කෝන් වැව	47		47
17	වෙහෙර වැව	54		54
18	කොහොඹගස් වැව	80		80
19	ගජබාපුර වැව	25	ගජබාපුර	25
20	මායා වැව	22		22
21	කුරුළු වැව	43		43
22	මොණර වැව	80	මොණර වැව	80
23	විකිරි වැව	43		43
	එකතුව	2540		2540

(ආ) (i) වර්ෂාවෙන් පමණක් වැව්වලට ජලය ලැබෙන බැවින් ප්‍රමාණවත් පරිදි ජලය නොලැබෙන බව පිළිගන්නා නමුත් එක් කන්නයකට පමණක් වගා කටයුතු සීමා වී ඇති බව පිළි නොගනී. වර්ෂාපතන රටාව අනුව යල කන්නයේ අතිරේක භෝග වගාව සමහර වැව් යටතේ සිදු කෙරේ. (නික වැව, ඇහැටුගස් වැව, නිල්පොකුණ වැව, ඇතාවැටුණ වැව, මොණර වැව හා කලාණි වැව යන වැව් යටතේ) ක්‍රමානුකූල ජල පාලනයක් තුළින් යල කන්නයේ අතිරේක භෝග වගාව සඳහා ගොවීන් දිරිමත් කිරීමටද කටයුතු කෙරේ.

(ii) පිළි නොගනී.

(ඇ) (i) සම්පත් ගම වැව සහ වැලි ඇළ අමුණ හැර ඉතිරි සියලු වැව්හි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් පවතී. තවද, බෙදුම් ඇළවල් හා කෙත් ඇළවල්වල ජලය බෙදා හැරීමේදී අපතේ යන ජල ප්‍රමාණය ආරක්ෂා කර ගැනීම සඳහා ඇළ පද්ධති අලුත්වැඩියා කරනු ලැබේ.

වැලි ඇළ අමුණට පහළින් තවත් වැලි ඇළ අමුණක් අලුතින් ඉදි කරමින් පවතී. එමඟින් ද තවත් ඉඩම් ප්‍රමාණයක් අස්වැද්දීමට නියමිතය.

දෙකන්නයේම වගා කිරීම සඳහා ජලය රැස් කර තැබීමට ගබඩා ජලාශ ලෙස කිවුල් ඔය හා මහකම්බිලි වැව ඉදි කිරීමට සැලසුම් කර ඇත.

(ii) වැව් ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ 2013 වසර අවසන් වන විට නිම කිරීමට නියමිතව ඇත. (මොණර වැව, ඇතාවැටුණ වැව හා නිල් පොකුණ

යන වැව්වල ප්‍රතිසංස්කරණ කටයුතු මේ වන විට අවසන් වී ඇත.) ගබඩා ජලාශ සඳහා දැනට ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ උත්තරයෙන් ඔබතුමා එක වෙලාවක කියනවා, කන්න දෙකටම ප්‍රමාණවත් ජලය තිබෙනවා කියලා. ඒ වාගේම ඔබතුමා ප්‍රකාශ කරනවා, ගබඩා ජලාශ වෙනුවෙන් ශක්‍යතා වාර්තා හදනවා කියලා. ගරු ඇමතිතුමනි, ඇත්තම කථාව මෙකයි. වැලිඔය ව්‍යාපාරයේ ජනතාව කොටි උවදුරට ලක් වෙලා ඉතාමත්ම පීඩාකාරී ජීවිතයක් ගත කරපු ජනතාවක්. දෙකන්නයම වගා කර ගන්න බැරිව ඇත්ත වශයෙන්ම අද ඔවුන් නන්නත්තාර වෙලායි ඉන්නේ. ගරු ඇමතිතුමනි, එක පැත්තකින් ගොවි විශ්‍රාම වැටුප කපලා. තව පැත්තකින් පොහොර සහනාධාරය කප්පාදු කරලා. ඒ වාගේම කොටින්ගේ වෙඩි සැරවලට අමතරව දැන් විදුලි බිලේ විදුලි සැරත් ඔවුන්ට වැදිලා තිබෙන්නේ. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala de Silva)

ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ. කථා පවත්වන්නේ නැතිව ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න කෝ.

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)

කථා පැවැත්වීමට ප්‍රශ්නය ව්‍යංග හේතුවක් කර ගන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, කොටි වෙඩිවලට මුහුණ දුන් ඒ ජනතාවට අද දවස වෙන කොට විදුලි බිලෙනුත් සියයට 66ක විදුලි සැර වැදිලා තිබෙනවා. විදුලි බිලේ විදුලි සැර වැදුණු මේ ගොවීන්ට - ලැම්බෝ ගිනි පන්තියට නොවෙයි, මේ දුක් ගිනි පන්තියට- කන්න දෙකම වගා කරන්නට අවශ්‍ය වාරි පහසුකම් ලබා දෙන්නේ කවදාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, එල්ටීටීඊ ත්‍රස්තවාදයේ ග්‍රහණයට හසු වුණු මේ ප්‍රදේශවල ජනතාව බේරා ගත්තේ අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ රජයයි. ඒ කාලයේ මේ ගම් බිම්වලින් ඔවුන් පන්නා හැර තිබුණා. පසු ගිය සතියේ මමත්, අතිගරු ජනාධිපතිතුමාත් වැලිඔයට ගිහිල්ලා ඒ පන්නා දැමූ ජනතාව නැවත පදිංචි කරවා ඔප්පු තුන්දහසක් පමණ ලබා දුන්නා. එපමණක් නොවෙයි. ඒ ප්‍රදේශයේ දැන් දැවැන්ත සංවර්ධනයක් සිදු වේගෙන යනවා. මහා මාර්ග පද්ධතිය සකස් වෙනවා. ඒ වාගේම සියලුම වැව් අමුණු ප්‍රතිසංස්කරණය කෙරෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඒ අවස්ථාවේදී ජනතාවගෙන් ඇහුවා, මේ වැඩ කෙරෙනවාද කියලා. ඔවුන් කිව්වා "ඔව්, වැව් ගණනාවක් දැන් හදලායි තිබෙන්නේ" කියලා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඒ ජනතාව පිළිබඳව ඔබතුමා කථා කරන්නට පෙර අපේ අතිගරු ජනාධිපතිතුමා ඔවුන් බේරා ගෙන, ඔවුන්ගේ ජීවිත වඩාත් ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළක් ගෙන යනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ ප්‍රදේශය එල්ටීටීඊ ග්‍රහණයට හසු වෙලා තිබුණු ප්‍රදේශයක්. විශේෂයෙන්ම මේ වැව්වලින් ලැබෙන ජලයෙන් දැනට ඔවුන් යම් ප්‍රමාණයක් වගා කර ගන්නවා. නමුත් ඔවුන් වී වගා කිරීම කරන්නේ නැහැ. ඒ වෙනුවට පළතුරු සහ අනෙකුත් බෝග වර්ග වගා කිරීමේ ක්‍රමය තමයි දැන් අනෙක් කන්නය සඳහා කරගෙන යන්නේ. නමුත් මගේ පිළිතුරෙන් කිව්වා වාගේම මේ සමස්ත ප්‍රදේශයේම දියුණුව සඳහා විශාල ජලාශ දෙකක් -කිවුල්ඔය සහ මහ කම්බිලි වැව- ඉදි කිරීමට සැලසුම් කර තිබෙනවා. පරිසරය ගැන නිතරම කථා කරන කෙනකු හැටියට මන්ත්‍රීතුමා දන්නවා, අපට ඕනෑ ඕනෑ විධියට ගිහිල්ලා මේ වැව් හදන්න බැහැ කියලා. දැනට පරිසර ශක්‍යතා අධ්‍යයන කටයුතු කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කරලා, public comments ලබා ගෙන අවසාන කරන්න අවුරුද්දකට හෝ අවුරුදු එකහමාරකට වැඩි කාලයක් ගත වනවා. අපි දැන් ඒ ක්‍රියාවලියේ යෙදිලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා වැලිඔය ජනතාවට පොරොන්දු වුණා, ශක්‍යතා අධ්‍යයන වාර්තාව සකස් කර අවසන් වූ වහාම ඒ සඳහා අවශ්‍ය මුදල් 2014 වර්ෂයේදී ලබා දෙනවාය කියලා. ඒ දැවැන්ත යෝජනා ක්‍රම දෙක ක්‍රියාත්මක කරලා කන්න දෙකටම ප්‍රමාණවත් තරම් ජලය ලබා දීමට කටයුතු කරන බව මා ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. වැලිඔය ප්‍රදේශයේ ජනතාවගේ පූර්ණ අරමුණ වන්නේ වී වගාව ක්‍රියාත්මක කිරීමයි. එළවලු හා පලතුරු වගාව ගැන කථා කරන කොට ගරු ඇමතිතුමනි, දඹුල්ලේ එළවලු කිලෝග්‍රෑම් 50,000කට වුණු විත්නැතිය අප හැමදෙනාම දන්නවා.

කෙසේ වෙතත් මා ඔබතුමාගෙන් අහන දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ වන විට වැලිඔය ප්‍රදේශයේ ජනතාව ඉමහත් අසහනයෙනුයි ඉන්නේ. මොකද, ඔවුන්ගේ ගොවි විශ්‍රාම වැටුප කපා දමා තිබෙනවා; පොහොර සහනාධාරය කපා දමා තිබෙනවා; හැම දෙයම කපා දමා තිබෙනවා. ඒ සියල්ලටම අමතරව සියයට 66කින් විදුලි බිල වැඩි කිරීම නිසා වැලිඔය ජනතාවට, රටේ ජනතාවට අද විදුලි සැර වැදිලායි තිබෙන්නේ. වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා හැටියට ඔබතුමාගෙන් මා අහන්න කැමැතියි, "අපි වවමු - රට නඟමු"යි කියලා, "වාරි යෝජනා ක්‍රම ගොඩ නඟමු"යි කියලා බොරුවට පම්පෝරි ගහන ඔබතුමන්ලා කන්න දෙකම වී වගා කරන්නට අවස්ථාව සලසා දෙන්නේ කවදාද කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, අපි බොරුවට පම්පෝරි ගහන අය නොවෙයි. මේ ප්‍රදේශවල තිබෙන බිම් මට්ටමේ තත්ත්වය එතුමා දැකලා නැහැ; දන්නේ නැහැ. එතුමා ඒ ප්‍රදේශවලට ගිහින් නැහැ. අපි ඒ ප්‍රදේශවල ජනතාව හමු වෙන්න ගියා. ඒ ජනතාව ජනාධිපතිතුමාට කිව්වේ, "ඔබතුමා අපගේ ජීවත් වීමේ අයිතිය තහවුරු කරලා දුන්නා. ඒක විතරක්ම ඇති"යි කියන එකයි. ඒ වුණත් ජනාධිපතිතුමා ඒ අයට කිව්වා, "එහෙම නොවෙයි, ජීවත් වීමේ අයිතිය තහවුරු කරලා දුන්නා වාගේම අපි අනෙක් අයිතිවාසිකම් සියල්ලත් තහවුරු කරලා දෙනවා. ඒ අනුව මේ ව්‍යාපෘතීන් අපි ඉටු කරලා දෙනවා" කියලා. විදුලි බිල ගැනවත්, තමුන්නාන්සේ කියන ඔය කිසි කාරණයක් ගැනවත් එම ජනතාව එතුමාගෙන් ඇහුවේ නැහැ. ජනතාව ඉතාම කෘතවේදීව අපව පිළිගත්තා. රූපවාහිනියේ පෙන්වූ රූප රාමු ටික බලන්න. ජනතාව අතිගරු ජනාධිපතිතුමා සහ අප පිළිගත්තේ මොන ආකාරයෙන්ද

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

කියන එක එයින් දකින්න පුළුවන්. එම ප්‍රසාදය ජනතාව තුළ තිබෙනවා. තමුන්නාන්සේ ඔළුවෙන් හිටගෙන මෙතැන කථා කළත්, ජනතාව තුළ රජය කෙරෙහි තිබෙන එම ප්‍රසාදය නැති කරන්නට පුළුවන්කමක් නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉතාම කෙටියෙන් අහන්න. එතකොට ඉතාමත් කෙටියෙන් පිළිතුරක් දෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳමයි. ඉතාමත්ම කෙටියෙන් අහන්නම්. ගරු කථානායකතුමනි, ඔබතුමාත් ගම නියෝජනය කරන නායකයෙක්. ඇත්තෙන්ම රටේ ජනතාව ඔළුවෙන් හිටවලා තිබෙන්නේ මේ විදුලි බිල වැඩි කර තිබෙන තමුන්නාන්සේලායි. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය වන්නේ මෙයයි. ගරු ඇමතිතුමා දැන් කිව්වා, ජනාධිපතිතුමා ඒ ප්‍රදේශයට ගිය වෙලාවේ එතුමා කෙරෙහි ජනතාවගේ ලොකු ප්‍රසාදයක් තිබෙන බව දැක්කා; ජනතාව ජීවත් කරවන රාජ්‍ය නායකයකු හැටියට එතුමා දුන් පොරොන්දු ක්‍රියාත්මක කිරීම ගැන ජනතාවගේ ලොකු පිළිගැනීමක් තිබුණා කියලා. මා ඔබතුමාගෙන් මේ කාරණය ගැනත් අහන්න කැමැතියි. ඔබතුමාගේ බල ප්‍රදේශයේ ගොවීන්ගේ සුබ සාධනය පිළිබඳව වාරිමාර්ග ඇමතිතුමා හැටියට ඔබතුමාටත් ලොකු වගකීමක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම එම ප්‍රදේශයේ ගොවි ජනතාව බාල රසායනික පොහොර නිසා, බාල වල් නාශක නිසා, බාල කෘමි නාශක නිසා විශාල වශයෙන් වකුගඩු ආබාධවලට ලක් වෙලා තිබෙනවා. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමන්ලා ගොවීන්ට මෙතරම් ආදරේ නම්, ආසනික් අඩංගු රසායනික පොහොර, කැඩ්මියම් අඩංගු පොහොර, බාල වල් නාශක, බාල කෘමි නාශක ආදී ප්‍රමිතියෙන් තොර දේවල් ඔබතුමන්ලා මේ රටට ගෙන්වන්නේ ඇයි කියා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් කථාව කපා හැරලා ප්‍රශ්නය විතරක් හැන්සාඩ් වාර්තාවට ගන්න වෙනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒවා ඔක්කොම කපා දමන්න. That is against the Standing Orders.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, වැලිඔය ප්‍රදේශයේ ජනතාවගෙන් කිසි කෙනෙක් බාල පොහොර ගැන කථා කළේ නැහැ. ඔවුන් එහෙම දෙයක් වෙලා කියලා කිව්වේ නැහැ. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, මේවා ඔබතුමා "සිරස" මාධ්‍යයට කියන ප්‍රබන්ධ පමණයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමාට කථාවක් දුන්නොත් නම් ඔය තරම් දිගට ප්‍රශ්න අහන එකක් නැහැ.

සුනාමි තොරතුරු ලබා ගැනීමේ කුලුනු : විස්තර
சுனாமி தகவல் அறியும் கோபுரங்கள்: விபரம்
TSUNAMI INFORMATION TOWERS : DETAILS

2637/'12

5. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සුනාමි අවස්ථාවක තොරතුරු ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව අවට මුහුදේ පිහිටුවා ඇති සුනාමි තොරතුරු ලබා ගැනීමේ කුලුනු සංඛ්‍යාව සහ ඒවා සවි කිරීම සඳහා වැය වූ මුදල කොපමණද;

(ii) ඒවා ස්ථානගත කරන ලද දිනය, ඒවා මගින් දත්ත ලබා ගන්නා ආයතනය සහ එම කුලුනු හරහා පැමිණෙන සුනාමි පිළිබඳව අදාළ ආයතනය දැනුවත් වීමෙන් පසු ශ්‍රී ලංකාවට එම සුනාමිය මගින් බලපෑමක් ඇතිවීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012.04.11 දින හෝ ඊට ආසන්න දිනක සුමාත්‍රාවල ඇති වූ සුනාමි තත්ත්වය ශ්‍රී ලංකාවට බලපාන බවට තොරතුරු අපගේ සුනාමි කුලුනු හරහා ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, එම සුනාමි තත්ත්වය පිළිබඳව මහජනයා දැනුවත් කිරීම සඳහා අදාළ තොරතුරු ලබාගත් ආකාරය කවරේද;

(iii) ඉහත (ආ) (ii) අනුව තොරතුරු වෙනත් ආකාරයකින් ලබා ගත්තේ නම්, සුනාමි තොරතුරු ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව සුනාමි කුලුනු පිහිටුවීමේ අරමුණ කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

අනර්ත්ත මුකාමෙත්තුව අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) සුනාමියොන්රු ඒර්පටුම් සන්දර්ප්පත්තිල් තකවල් කළෙප් පෙරුවතර්කාක ඉලංකෙයෙය අණ්ඩියුළ්ළ කටර්පරප්පිල් තාපික්කප්පට්ටුළ්ළ සුනාමි තකවල් අරියුම් කෝපුරංකළ්,

(i) එත්තනෙ එන්පතෙයුම්, අවර්රෙ තාපිප්පතර්කු සෙලවිටප්පට්ට පණත්තොකෙ එව්වළවු එන්පතෙයුම්;

(ii) තාපික්කප්පට්ට තිකතිකළ්, අවර්රිනූටාක තකවල්කළෙ පෙර්රුක්කොළ්ළුම් නිරුවනංකළ් මර්රුම් ඉක්කෝපුරංකළිනූටාක සම්පන්තප්පට්ට නිරුවනංකළ් තකවල්කළ් අරින්ත පින්නර් ඉලංකෙක්කු අත්තකෙය සුනාමියිනාල් තාක්කම් විළෙවතර්කු එටුක්කුම් නේරම් යාතෙන්පතෙයුම් අවර් කුරිප්පිටුවාරා?

(ஆ) (i) 2012.04.11ஆம் திகதி அல்லது அதற்கு அண்மிய தொரு தினத்தில் சுமாத்திராவில் நிகழ்ந்த சுனாமி நிலை இலங்கைக்கு தாக்கம் விளைவிக்குமென எமது சுனாமி கோபுரங்களிலிருந்து தகவல்கள் பெறப்பட்டதா என்பதையும்;

(ii) இல்லையெனில், சம்பந்தப்பட்ட சுனாமி நிலை தொடர்பாக மக்களை அறிவூட்டுவதற்கு உரிய தகவல்கள் எவ்வாறு பெறப்பட்டன என்பதையும்;

(iii) மேற்படி (ஆ)(ii) இற்கு ஏற்ப வேறு விதத்தில் தகவல்கள் பெறப்பட்டதாயின் சுனாமி பற்றிய தகவல்களை பெற்றுக்கொள்வதற்காக இலங்கை யில் சுனாமி கோபுரங்கள் தாபிக்கப்பட்டதன் நோக்கம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management :

(a) Will he state -

(i) the number of tsunami information towers installed in the sea around Sri Lanka to obtain information in the event of a tsunami and the amount of money spent for their installation; and

(ii) the date of installation, the institution that retrieve information from them and the time taken to effect Sri Lanka after the relevant institution becoming aware of an oncoming tsunami through the said towers ?

(b) Will he also state -

(i) whether information was obtained through our tsunami towers to the effect that the tsunami situation that occurred in Sumatra on or around 11.04.2012 could affect Sri Lanka;

(ii) if not, the way in which the relevant information was obtained to make people aware of the said tsunami situation; and

(iii) as per (b) (ii) above, if information was received through other means, the purpose of setting up tsunami towers to obtain information on tsunami by Sri Lanka ?

(c) If not, why ?

ගරු ඩුලිප් විජේසේකර මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு துலிப் விஜேசேகர - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Duleep Wijesekera - Deputy Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) සුනාමි තොරතුරු ලබා ගැනීමේ කුලුනු සවි කර නොමැත.

(ii) අදාළ නොවේ.

(ආ) (i) නැත.

(ii) භූ කම්පන තත්ත්වය හා සම්බන්ධව ප්‍රථම දැනුවත්වීම කැලිෆෝනියා ඒකාබද්ධ භූ කම්පන තොරතුරු ජාලය - California Integrated Seismic Network (CISN) - මඟින් ද, අනතුරුව ඉන්දියාව, ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව ආශ්‍රිතව පිහිටුවා ඇති වරලත් සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථාන මඟින් ද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට තොරතුරු ලබා ගෙන ඇත.

(iii) සුනාමි කුලුනු පිහිටුවා ඇත්තේ සුනාමි අනතුරු ඇඟවීම් නිවේදන ජනතාව වෙත නිකුත් කිරීම සඳහාය.

(ඇ) අදාළ නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමා කිව්වා මේ සුනාමි තොරතුරු ලබා ගැනීමේ කුලුනු පිහිටුවා නැහැ කියලා.

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)

ගරු කථානායකතුමනි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සුනාමි තත්ත්වයක් දැනුම් දුන්නාම, ජනතාව දැනුවත් කිරීම සඳහා තමයි රට පුරාම මේ කුලුනු 77ක් පිහිටුවා තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ ගැන තමයි මම මේ අහන්නේ. ඒ කුලුනු 77 ගැන තමයි මම ඇහුවේ. ඔබතුමා පිළිතුරේදී කිව්වා එකක්වත් පිහිටුවලා නැහැ කියලා.

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)

ඒවා ජනතාව දැනුවත් කිරීමේ කුලුනු.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි මම ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ, සුනාමි අවස්ථාවක තොරතුරු ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව අවට මුහුදේ පිහිටුවා ඇති සුනාමි තොරතුරු ලබා ගැනීමේ කුලුනු සංඛ්‍යාව කොපමණද කියලායි.

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)

කුලුනු 77යි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමා පිළිතුරේදී ඒක කිව්වේ නැහැ නේ. එකක්වත් නැහැ කියලා නේ කිව්වේ.

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)
සුනාමි අවස්ථාවක තොරතුරු ලබා ගැනීම සඳහා නොවෙයි ජනතාව දැනුවත් කිරීම සඳහා තමයි ඒ කුලුනු ස්ථාපනය කරලා තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොනවාට හෝ වේවා, මම අහපු ප්‍රශ්නයට නොවෙයි නේ ඔබතුමා පිළිතුරු දුන්නේ.

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)
අහලා තිබෙන ප්‍රශ්නයට තමයි පිළිතුරු දීලා තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ. කුලුනු 77යි කියලා දැන් තමයි කිව්වේ ගරු කථානායකතුමනි. ඔබතුමාටත් තේරෙන්න ඇති නේ ගරු කථානායකතුමනි. මම අහලා තිබෙන්නේ කුලුනු කීයක් හදලා තිබෙනවාද කියලායි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වෙනත් ප්‍රශ්නයකින් අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, වෙනත් ප්‍රශ්නයක් අවශ්‍ය නැහැ. මම අහලා තිබෙන කාරණාව 5 වන ප්‍රශ්නය බැලුවොත් ඔබතුමාටත් තේරෙනවා ඇති. එහි (අ) කොටසේ (i) ප්‍රශ්නයට දිය යුතු පිළිතුර තමයි, 77ක් කියන එක. ඒ වාගේම ඒවා සවි කිරීම සඳහා වැය වූ මුදල කීයද? ඒකයි මම අහලා තිබෙන්නේ.

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)
මුදල කොපමණද කියලා කියන්න පුළුවන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කෝ, ඉතින් කියන්න. තමුන්නාන්සේටත් සුනාමිය බලපාලා වාගේ.

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)
ඔබතුමා ප්‍රශ්නය හරියට බලන්න. සුනාමි තත්ත්ව පිළිබඳ තොරතුරු ලැබෙන්නේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට. ඉන් පසුව ජනතාව දැනුවත් කිරීම සඳහා තමයි ඒ කුලුනු සවි කරලා තිබෙන්නේ. එවැනි කුලුනු 77ක් තිබෙනවා. ඒ 77ම ක්‍රියාත්මකයි. වියදම් වූ මුදල රුපියල් 32,41,46,717.50.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම ඒ ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්නම් එතුමා ඇත්ත කථාව කියන්නේ නැති නිසා. මේ කුලුනු 10ක් ක්‍රියාත්මක වුණේ නැහැ ගරු කථානායකතුමනි. 2012.04.11 වන දා සුනාමි සංඥාවක් ඇවිල්ලා මුළු රටම කලබැගෑනියකට පත් වුණා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බම්බලපිටියේ හිටපු මිනිසුන්ට කිව්වා බත්තරමුල්ලට දුවන්න කියලා. ඊට පස්සේ දකුණු අධිවේගී මාර්ගය ඇරියා. එදා මහාමාර්ග ඇමතිතුමා කිව්වා, දකුණු අධිවේගී මාර්ගය ඇරලා මිනිසුන්ට එන්න දෙන්න කියලා. [බාධා කිරීම්] ඔබතුමා දන්නවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරට අදාළව ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට උත්තරයක් දුන්නේ නැහැ. 2012.4.11 වන දා ඒ කුලුනු 77න් කොටසක් වැඩ කළේ නැහැ කියලා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් පරීක්ෂණයක් පැවැත්වුවා. ඒ කුලුනු කීයක් වැඩ කළේ නැද්ද කියලා කරුණාකරලා ගරු ඇමතිතුමා මට කියන්න.

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)
ගරු කථානායකතුමනි, 2012 දී ඔය සිද්ධිය වන විට ඒ කුලුනු 77න් 60ක් විතර තමයි ඉදි කර තිබුණේ. ඒවායින් පහක් ක්‍රියාත්මක වුණේ නැහැ, බැටරිවල දෝෂයක් නිසා. නමුත් මේ වන විට ඒ 77ම ක්‍රියාත්මකයි. ඒ කුලුනු 77 ඉදි කරමින් පවතින වෙලාවේ තමයි 2012දී ඒ තත්ත්වය උදා වුණේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඒකත් බොරුවක්. මොකද, එතුමාගේ අමාත්‍යාංශයේ -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
'බොරු" කියලා කියන්න එපා. තමන්ගේ අදහස ප්‍රකාශ කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න. මම මේ ඇත්ත කථාව කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වෙනත් ආකාරයකින් කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඔබතුමාට බොහොම අවංකව කියන්නේ. මම අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැහැ. චන්ද්‍රදාස මහත්මයා තමයි Disaster Management Centre (Mitigation and Technology) එකේ Director. එතුමා කියනවා, ඒ වන විට කුලුනු 50ක් හදලා තිබුණා. ඒ 50න් 10ක් වැඩ කළේ නැහැ කියලා. එහෙම වැඩ නොකරපු හේතුව එතුමා කිව්වා. ඒ බැටරි නැතුව නොවෙයි. ඔබතුමන්ලාගේ කාර්යාලය එතැනට අරගෙන ගිය නිසා තමයි ඒ ප්‍රශ්නය ඇති වුණේ. එතුමාගේ ඒ report එක මා ළඟ තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම එකක් වුණා කියාද අහන්නේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, නැවත සුනාමියක් ආවොත් -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සුනාමියක් වුණත් ප්‍රශ්නයක් අහන ක්‍රමයක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි ගරු කථානායකතුමනි, ඔබතුමාට තේරෙනවා නේ-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ප්‍රශ්නය ඇහුවා නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඔබතුමාටම තේරෙනවා නේ, ඉස්සරවෙලාම ප්‍රශ්නය අහන කොට ප්‍රශ්නයට උත්තරය හරියට දුන්නේ නැතිව, මම අතුරු ප්‍රශ්න අහන්නේ කොහොමද? එතකොට තමයි එක එක ඒවා කියන්න හිතෙන්නේ.

ගරු කථානායකතුමනි, අනෙක් කාරණය මේකයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, සුනාමි අනතුරු ඇහවීම් සම්බන්ධව ඔබතුමන්ලා දැනට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය වන රුපියල් කෝටි 32ම වියදම් කර තිබෙනවාද? එහෙම නැත්නම් ඒකෙන් යම්කිසි ප්‍රමාණයක් ද වියදම් කර තිබෙන්නේ? එහෙම නැත්නම් තව මුදල් ටිකක් ගන්න බලාපොරොත්තු වෙනවාද?

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)
කුලුනු 72 හදලා ඉවර කරන්න තමයි මේ මුදල වියදම් කර තිබෙන්නේ.

ශල්‍ය අත් වැසුම් මිලදී ගැනීම : වංචාව
மருத்துவக் கையுறைகள் கொள்வனவு : முறைகேடு
PURCHASE OF SURGICAL GLOVES : FRAUD

2830/'12

6. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2)

(අ) (i) රෝහල් සඳහා ශල්‍ය අත්වැසුම් සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා යොදා ගන්නා ක්‍රියාවලිය කවරේද;

(ii) ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සම්බන්ධයෙන් තීරණ ගන්නා පුද්ගලයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) සැපයුම් දිනය, සැපයුම් කාල සීමාව සහ එකඟ වී ඇති කාල පරිච්ඡේදය තුළ සැපයුම් කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් සැපයුම් කොන්ත්‍රාත්තුවෙහි දක්වා ඇති සම්මත වගන්ති කවරේද;

(iv) 2008, 2009, 2010 හා 2011 යන වර්ෂවලදී ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සඳහා වෙන් කර තිබූ මුදල සහ වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මූලික පරීක්ෂණයකදී ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ වංචාවක් හෙළිදරව් වී ඇති බවත්;

(ii) වැඩිදුර පරීක්ෂණ සඳහා මෙම වංචාව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එකී වංචාවේ ස්වභාවය කවරේද;

(ii) එකී වංචාව හේතුවෙන් සිදුවී ඇති මූල්‍යමය පාඩුව කොපමණද;

(iii) ඉහත (ආ) (ii) හි සඳහන් පරිදි එය සිදු කළේ නම්, එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வைத்தியசாலைகளில் பயன்படுத்தப்படும் மருத்துவக் கையுறைகளின் வழங்குநர்களைத் தெரிவுசெய்யும் முறை யாதென்பதையும்;

(ii) மருத்துவக் கையுறைகளைக் கொள்வனவு செய்யத் தீர்மானம் மேற்கொள்ளும் நபர்களின் பெயர்கள் மற்றும் பதவிகள் யாவையென் பதையும்;

(iii) வழங்கல் திகதி, வழங்கல் காலப்பகுதி மற்றும் ஒப்புக்கொண்ட காலத்தினுள் வழங்க முடியாமை என்பன தொடர்பாக வழங்கல் ஒப்பந்தத்திலுள்ள நியம வாசகங்கள் யாவையென்பதையும்;

(iv) 2008, 2009, 2010 மற்றும் 2011ஆம் ஆண்டு களில் மருத்துவக் கையுறைகளின் கொள்வனவுக் காக ஒதுக்கப்பட்ட தொகைகள் மற்றும் செலவு

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

செய்யப்பட்ட தொகைகள் போன்றன தனித்தனியாக யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) முதற்கட்ட விசாரணையில் மருத்துவக் கையுறைகளின் கொள்வனவு தொடர்பாக முறைகேடொன்று வெளிக்கொணரப்பட்டுள்ளது என்பதையும்;

(ii) இம்முறைகேடு மேலதிக விசாரணைக்காக நிதி, திட்டமிடல் அமைச்சுக்கு ஆற்றுப்படுத்தப்பட்டுள்ளது என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) மேற்கூறப்பட்ட முறைகேட்டின் தன்மை யாதென்பதையும்;

(ii) முறைகேட்டினால் ஏற்பட்ட பண நஷ்டத்தையும்;

(iii) விசாரணையானது ஆ (ii) இன் படி நடைபெற்றிருப்பின், அதன் விளைவுகளையும்

அவர் கூறுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House of -

(i) the process to select suppliers of surgical gloves used in hospitals;

(ii) the names and designations of persons making decisions on purchase of surgical gloves;

(iii) the standard clauses in supply contract in relation to the date of delivery, period of delivery, and failure to supply the product within the agreed time; and

(iv) the amount allocated and spent on the purchase of surgical gloves for the years 2008, 2009, 2010 and 2011 separately?

(b) Will he admit that -

(i) a fraud regarding the purchase of surgical gloves has been revealed in a preliminary investigation; and

(ii) this fraud has been referred to the Ministry of Finance and Planning for further investigation?

(c) Will he state -

(i) the nature of the aforesaid fraud;

(ii) the financial loss due to the fraud; and

(iii) the results of the investigation, if it was done as (b) (ii)?

(d) If not, why?

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - சுகாதார அமைச்சர்)
(The Hon. Maithripala Sirisena - Minister of Health)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රජය පිළිගත් ටෙන්ඩර් පටිපාටිය මඟින් රෝහල් සඳහා ශල්‍ය අත් වැසුම් සැපයුම්කරුවන් තෝරා ගනු ලැබේ. එය පහත පරිදි සිදු කරයි.

ඖෂධ හා තත්ත්ව පාලන අධිකාරිය මඟින් ශල්‍ය අත්වැසුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

ලෝක ව්‍යාප්ත ටෙන්ඩර් පටිපාටිය හෝ රජයේ අනුමත ටෙන්ඩර් පටිපාටිය මඟින් විවෘත හෝ සීමිත ටෙන්ඩර් කැඳවීම.

විධිමත් තාක්ෂණික ඇගයීම් කමිටු මඟින් තාක්ෂණික ඇගයීම් සිදු කිරීම.

ටෙන්ඩරයේ වටිනාකම අනුව අනුමත ටෙන්ඩර් මණ්ඩලය මඟින් ටෙන්ඩර් ප්‍රදානය කිරීම.

(ii) ශල්‍ය අත් වැසුම් මිලදී ගැනීම පිළිබඳ තීරණ ගනු ලබන්නේ තාක්ෂණික ඇගයීම් කමිටු හා ටෙන්ඩර් මණ්ඩල මඟිනි.

(iii) (1) සියලුම අයිතමයන් ගමනාන්තය දක්වා නැවිගත කළ යුතු අතර භාර දෙන දිනයන්ට අනුව එය ස්ථිර වශයෙන්ම සිදු විය යුතු අතර එහිදී DHS සඳහන්ව ඇති Indent සලකුණ අනුව එය සිදු විය යුතුය.

(2) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සඳහන් කර ඇති කාල සීමාව තුළ අදාළ අයිතමයන් භාර දීමට සැපයුම්කරු අසමත් වුවහොත් (ගිවිසුම්ගත කොන්දේසි බිඳ දැමීමෙහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙහි අනෙකුත් අයිතිවාසිකම් සම්බන්ධයෙන් අනාවැකි පළ කිරීමකින් තොරව) ගිවිසුමේ වගන්ති 9.1හි සඳහන් ආකාරයට කුමන හෝ සියලුම හෝ කොටසක් ඉතිරිව ඇති දේ අදාළව ඉදිරියට සිදු කර ගෙන යන්නා වූ කුමන හෝ කටයුත්තක් අරභයා සැපයුම්කරුගේ ඒ සඳහා වූ අයිතිය නවතා දැමීමට සැපයුම්කරුට සිදු කෙරෙන්නා වූ මාගේ ලිඛිත දැනුම්දීමකින් සිදු කළ හැකි වනු ඇත.

(3) ණයවර ලිපියෙහි වලංගු කාල පරිච්ඡේදය තුළ සියලුම භාණ්ඩවලට අනුව භාර දීම් සිදු කළ යුතුය. සුවිශේෂී තත්ත්වයන් යටතේ විනා කාලය දිගු කිරීමක් කිසිසේත් ප්‍රසාභාය නොකරනු ඇත. එවන් වූ කාලය දිගු කිරීමක් නිසාවෙන් සිදු වන කිසියම් හෝ වියදමක් දැරීමට සිදු වුවහොත් එය සැපයුම්කරු විසින් දරනු ලබනවා ඇත.

(iv)

වර්ෂය	වෙන් කළ මුදල (රුපියල් මිලියන)	වියදම් කළ මුදල (රුපියල් මිලියන)
2008	721.561	679.628
2009	135.09	143.99
2010	146.34	154.383
2011	555.314	562.059

(ආ) (i) මූලික පරීක්ෂණයකදී ශල්‍ය අත් වැසුම් මිලදී ගැනීමක් සම්බන්ධව යම් වංචාවක් සිදු වී ඇති බවට හෙළිදරව් වී ඇත.

(ii) වැඩිදුර පරීක්ෂණ සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත යොමු කර නැත.

(ඇ) (i) 8" ප්‍රමාණයේ ශල්‍ය අත් වැසුම් ගබඩාවල අවශ්‍ය තරම් තොග තිබියදී සහ වාර්ෂික අවශ්‍යතාව ඉක්මවා ඇණවුම් කර මිලදී ගැනීම.

(ii) එම 8" ප්‍රමාණයේ ශල්‍ය අත් වැසුම් 103,500ක ප්‍රමාණයක් කල් ඉකුත් වීම හේතුවෙන් එහි වටිනාකම වන රුපියල් 1,794,690.00ක් අලාභ හානි සිදු වී ඇත. ඊට අමතරව ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති වීම හේතුවෙන් සහ වැල්ලවත්ත ගබඩාවේ නුසුදුසු ගබඩා තත්ත්වයන් යටතේ ගබඩා කිරීම හේතුවෙන් තවත් 8" ප්‍රමාණයේ ශල්‍ය අත්වැසුම් 20,600ක් විනාශ වී ඇති අතර එම තොගයේ වටිනාකම රුපියල් 357,204.00කි. ඒ අනුව මුළු වටිනාකම රුපියල් 2,151,894.00කි.

(iii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම තීරණ ගැනීමේදී යම් කිසි ඒකාධිපති ස්වභාවයක් තිබෙනවා. ඔහු සමාගම්වල ජ්‍යෙෂ්ඨ උපදේශකයෙකු වශයෙනුත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයෙකු හැටියටත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයෙකු හැටියටත් සේවය කළා. ඒ වාගේම පසු ගිය වසර තුනේදී ශල්‍ය අත් වැසුම් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගැයුම් කමිටුව -TEC එක- දිගින් දිගටම එකම විශේෂඥ වෛද්‍යවරයෙක් පත් කරලා තිබෙනවා, හැම තිස්සේම එය එකම සමාගමකට යනවා වගේ. මම මෙතැනදී අහන්නේ එක ගනුදෙනුවක් ගැන නොවෙයි. මේක ඊට වැඩිය පුළුල් ප්‍රශ්නයක්. ඒ වාගේම පසු ගිය කාලයකදී ඔබතුමාත් සඳහන් කරලා තිබෙනවා, මෙතැන යම් කිසි මාෆියාවක් ක්‍රියාත්මක වෙනවා කියලා. ඒ පිළිබඳව ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කරනවා නම් මම කැමැතියි.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණු සත්‍යයයි. ඒ කරුණු මම පිළිගන්නවා.

අපි පසු ගිය අවුරුද්දේ අමාත්‍ය මණ්ඩල තීරණයක් ගත්තා, අපේ දේශීය අත්වැසුම් ලබා ගැනීම පිළිබඳව. මොකද අවුරුදු විසි ගණනක් මේ රටේ අත්වැසුම් නිෂ්පාදනය කරලා තිබෙනවා. මේ රටේ අත්වැසුම් නිෂ්පාදනය කළත්, පිට රටිනුත් අපි අත්වැසුම් ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම අපේ අත්වැසුම් අපි පිට රටට යවලා තිබෙනවා. මේ පිළිබඳව දැන ගත්තාට පස්සේ අපි තීරණයක් ගත්තා, අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව දේශීයව අත්වැසුම් ලබා ගත යුතුය කියලා. ඒ වාගේම ඔබතුමා සඳහන් කළ ආකාරයට එකම සමාගමකට යෑමේ කටයුත්තත් සිදු වෙලා තිබෙනවා. එහි නීත්‍යානුකූල ස්වභාවය හරි හෝ වැරැදියි කියන කාරණය සම්බන්ධයෙන් මම අදහස් දක්වන්න බලාපොරොත්තු වන්නේ නැහැ. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන වංචාවක් පිළිබඳව පරීක්ෂණ පවත්වලා තිබෙනවා. ඒ වංචාව සිදු කළ පුද්ගලයාට මේ වන විට චෝදනා පත්‍රත් අපි දීලා තිබෙනවා. ඔබතුමා කියපු කරුණු සම්බන්ධයෙන් මම තවදුරටත් සොයා බලා කටයුතු කරන්න කැමැතියි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ස්තුතියි. මම හිතන්නේ අපි ඔක්කොම එකතු වෙලා මේ මාෆියාවල් නැති කරන්න ඕනෑය කියලායි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දේශීය නිෂ්පාදනය දිරි ගන්වන එක රජයේ ප්‍රතිපත්තියයි. ඇන්සෙල් සමාගමයි, ලලාන් සමාගමයි ලංකාවේ මේ අත්වැසුම් නිෂ්පාදනය කරනවා. ඒ වාගේම මේ සමාගම් දෙක අනික් රටවල්වලට ඒ අත්වැසුම් අපනයන කරන්න යම් කිසි ප්‍රමිතියකින් යුතුව ක්‍රියා කරනවා. එනමුත් ඒ අයටවත් තරගකාරී මිලට මේ සැපයුම් මේ රට තුළ දීමට හැකියාවක් ලැබිලා නැහැ. මම දැන ගන්නට කැමැතියි, රජයට ඒ වාගේ ප්‍රතිපත්තියක් තිබෙනවා නම් ඇයි මේ ආයතන දිරි ගන්වන්නේ නැත්තේ කියලා.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ගරු කථානායකතුමනි, මේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඇමතිවරයා විධියට මා ඉතාමත්ම දැඩි තීරණයකයි සිටින්නේ. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට ඇන්සල් සමාගම මේ සඳහා ඉදිරිපත් වෙන්නේ නැත්තේ ඇයි කියන කාරණය ගැන පසුගිය සතියේ මම අපේ නිලධාරීන්ගෙන් විමසීමක් කළා. ප්‍රධාන වශයෙන්ම, මේ ටෙන්ඩර් කැඳවීමේදී මේ රටේ දේශීය සමාගම්වලට ඉදිරිපත් වීමට පුළුවන්. නමුත් මගේ නිලධාරීන් දැනට මා වෙත වාර්තා කර තිබෙන්නේ ඇන්සල් සමාගම ඉදිරිපත් වෙලා නැහැ කියන කාරණයයි. නමුත් එවැනි සමාගම් ඉදිරිපත් වෙන්නේ නැත්තේ ඇයි කියන කාරණය ගැන මමත් විමසීමක් කළා. ඒ නිසා ඒ සමාගම් දිරි ගැන්වීමට වාගේම දේශීය කර්මාන්තකරුවන්ට මේ සඳහා ඉදිරිපත් වීමට සම්පූර්ණ ඉඩ කඩ සලසා තිබෙනවා. ඒ අයට මේ සඳහා ඉදිරිපත් වීමට අවස්ථාවක් සලසා නැහැ කියා යම්කිසි ආයතනයක් දන්වා තිබෙනවා නම් මට ඒ ගැන පෞද්ගලිකව සොයා බලන්න පුළුවන්. ඒ ගැන නිල වශයෙන් ලිපි ඉදිරිපත් කරන්නත් අමාත්‍යාංශයට පුළුවන්. ඒ ගැන සොයා බලා පහසුකම් සලසන්න මට පුළුවන්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය -තුන් වන අතුරු ප්‍රශ්නය - පුළුල් ප්‍රශ්නයක්. සේනක බිබිලේ කොමිෂන් වාර්තාව ඉදිරිපත් කරලා කලින් කල අපට කිව්වා, ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න යනවාය කියා. එතුමාගේ ගුණානුස්මරණ කථාවේදීත් ඔබතුමා ඒ ගැන සඳහන් කළා. ඊටපසුව කිව්වා, එය නීතිපති දෙපාර්තමේන්තුවටත් ගියාය කියා. ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳව ඒ පනත් කෙටුම්පත හිර වෙලා තිබෙන්නේ කොතැනද, එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නේ කවදාද කියා මා අහනවා.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේදීත්, ඊට පිටස්තරවත් මම මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට ජාතික ඖෂධ ප්‍රතිපත්තියට අදාළව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතුය කියා මීට අවුරුදු දෙකකට කලින් තමයි - විශේෂයෙන්ම ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ගැන කථා කිරීමේදී ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාත් අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ 2006 දී තමයි- රජය අනුමත කරලා තිබෙන්නේ. මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාගේ ප්‍රතිපත්තියට අනුකූලව තමයි ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සකස් වෙලා තිබෙන්නේ. මෙය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ පනත්

[ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා]

කෙටුම්පතක් සකස් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ සියලු කටයුතු මීට අවුරුදු දෙකකට කලින් අවසන් කරලා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට බාර දුන්නා. නමුත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව එය සකස් කරලා "ලබන සතියේදී දෙනවා "ය කියන ප්‍රකාශය කළා, 2011 දෙසැම්බර් මාසයේදී. සෞඛ්‍ය අමාත්‍යාංශයට පැමිණිලා, සකස් කරලා තිබෙන පනත් කෙටුම්පත පිළිබඳව ඉදිරිපත් කිරීමකුත් කරලා, 2011 දෙසැම්බර් මාසයේ තමයි ප්‍රධාන නීති කෙටුම්පත් නිලධාරිනිය ඒ ප්‍රකාශය කළේ.

ඊට සති දෙකකට පසුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු රැස්වීමකදීත් එතුමිය කිව්වා, හැකි ඉක්මනින් එය දෙනවා; දැන් ඒ පනත් කෙටුම්පත සකස් කරලා අවසානයි කියා. නමුත්, ඊට සති දෙකකට පස්සේ එතුමිය විශ්‍රාම ගියා. එතුමිය විශ්‍රාම යනවාත් එක්කම මේ පනත් කෙටුම්පතට වෙච්ච දෙයකුත් නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. මා ඇත්ත කියන්නට ඕනෑ. මොකද, බොහෝ වෙලාවට සෞඛ්‍ය අමාත්‍යාංශයට මේ ගැන නොයෙකුත් දෝෂාරෝපණ එනවා. සම්පූර්ණයෙන්ම සකස් කර අවසන් වෙලා තිබුණු පනත් කෙටුම්පත අතුරුදහන් කරලා තිබෙනවා, අතුරුදහන් වෙලා තිබෙනවා. ඊට පස්සේ අප නැවතත් කිව්වා, මේ පනත් කෙටුම්පත සකස් කළ යුතුය කියා. ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ ලිපිගොනු, ලිපිලේඛන සියල්ලම අපි භාර දුන්නා. මෙ වන විට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව මේ පනත් කෙටුම්පත සකස් කරමින් යනවා. මා නිතර මේ ගැන සොයා බලමින් සිටින්නේ. අතිගරු ජනාධිපතිතුමාත් පසු ගිය සතියේ ජාතික රෝහලේ උත්සවයකට පැමිණිලා මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළා. ඇත්ත තත්ත්වය ඒකයි. නමුත් ජාතික ඖෂධ ප්‍රතිපත්තියට අදාළ ආයතන පිහිටුවීමේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා මාත් සැම විටම ඉතාමත්ම දැඩි වුවමනාවකින් තමයි සිටින්නේ. මේ සිද්ධිය තමයි ඇති වුණේ. [බාධා කිරීමක්] මේ අවුරුද්දේ ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන් වේය කියා මා විශ්වාස කරනවා.

බුලත්සිංහල රෝහල : අඩුපාඩු
புளத்சிங்கள வைத்தியசாலை : குறைபாடுகள்
BULATHSINHALA HOSPITAL : SHORTCOMINGS

2981/'12

7. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) බුලත්සිංහල රෝහලේ ප්‍රමාණවත් තරම් හෙද හෙදියන්, සෞඛ්‍ය කළමනාකරණ සහකරුවන්, වෛද්‍ය රසායන ශිල්පීන්, විශේෂඥ වෛද්‍යවරුන්, සනීපාරක්ෂක කම්කරුවන්, ලිපිකරුවන් සහ ගිලන් රථ නොමැති බවත්;

(ii) එම අඩුපාඩු නිසා රෝගීන් දැඩි අසරණ තත්ත්වයකට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බුලත්සිංහල රෝහල වෙත ප්‍රතිකාර සඳහා දිනකට පැමිණෙන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි පවතින අඩුපාඩු පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) බුලත්සිංහල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය උසස් කිරීම උදෙසා එම රෝහලෙහි පවතින සියලු අඩුපාඩු සකස් කරදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புளத்சிங்கள வைத்தியசாலையில் போதியளவு தாதியர்கள், சுகாதார முகாமைத்துவ உதவியாளர்கள், மருத்துவ இரசாயனவியலாளர் கள், நிபுணத்துவ மருத்துவர்கள், துப்பரவேற் பாட்டு தொழிலாளர்கள், எழுதுவினைஞர்கள் மற்றும் நோயாளர் காவு வண்டிகள் இல்லையென் பதையும்;

(ii) மேற்படி குறைபாடுகள் காரணமாக நோயாளர்கள் கடும் நிர்க்கதி நிலைமைக்கு உள்ளாகியுள்ளனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) புளத்சிங்கள வைத்தியசாலைக்கு ஒரு நாளைக்கு சிகிச்சை பெறுவதற்காக வரும் நோயாளர்களின் எண்ணிக்கை யாது;

(ii) இங்கு நிலவுகின்ற குறைபாடுகள் தொடர்பில் அறிக்கையொன்றை சமர்ப்பிப்பாரா;

(iii) புளத்சிங்கள பிரதேச மக்களின் ஆரோக்கிய நிலைமையை மேம்படுத்துவதற்காக மேற்படி வைத்தியசாலையில் நிலவும் அனைத்து குறைபாடுகளையும் நிவர்த்தி செய்து தருவதற்கு நடவடிக்கை மேற்கொள்வாரா;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) the Bulathsinhala Hospital does not have an adequate number of nurses, health management assistants, medical laboratory technicians, specialist doctors, sanitary labourers, clerks and ambulances; and

(ii) the patients have become utterly helpless due to the aforesaid shortages?

(b) Will he state -

(i) the number of patients who come to the Bulathsinhala Hospital per day to obtain treatment;

(ii) whether a report will be submitted regarding the aforesaid shortcomings; and

(iii) whether action will be taken to address all shortcomings in the aforesaid hospital to uplift the health standard of the people in the Bulathsinhala area?

(c) If not, why?

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

කළුතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් එවන ලද වාර්තාවට අනුව,

(අ) (i) දැනට වෛද්‍යවරුන්ගේ හිඟයක් නොමැති අතර හෙද නිලධාරීන්ගේ, රසායන ශිල්පියෙකුගේ සහ සෞඛ්‍ය කළමනාකරණ සහකාරවරයෙකුගේ හිඟයක් පවතී.

(ii) දැනට සේවා කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන අතර ඒ සඳහා අවශ්‍ය අතිකාල සේවා, මුර සහන සේවා අනුමත කර ඇත.

(ආ) (i) ප්‍රතිකාර සඳහා දිනකට පැමිණෙන රෝගීන් සංඛ්‍යාව:

අංශය	ප්‍රතිකාර ගන්නා ප්‍රමාණය
නේවාසික රෝගී අංශය	16
බාහිර රෝගී අංශය	177
සායන රෝගී අංශය	188

(ii) මෙම රෝහලේ භෞතික සම්පත් හිඟයක් නොමැති අතර, මානව සම්පත් හිඟයක් පවතී.

තනතුර	අවශ්‍ය ප්‍රමාණය
හෙද නිලධාරී	04
සෞඛ්‍ය කළමනාකරණ සහකාර	01
වෛද්‍ය රසායනාගාර ශිල්පී	01

(iii) ඔව්.

(ඇ) පැන නොනඟී.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගැටලු නිරාකරණය කරන්න සෞඛ්‍ය අමාත්‍යතුමා ඉන්දියාවට පවා ගිහිල්ලා තිබෙනවා. එදා, දෙරණ - 360° වැඩසටහනෙන් පවා පැහැදිලි කළා. ඒ ගැන අප එතුමාට ස්තුතිවන්ත වෙනවා. හැබැයි ගරු කථානායකතුමනි ප්‍රශ්නය මෙයයි. දැන් එතුමා කිව්වා, භෞතික සම්පත් හිඟයක් නැහැ කියා. නමුත් මේ රෝහලේ ම තිබෙන වෛද්‍ය රසායනාගාරය වසර තුනක සිට වසා දමා තිබෙන්නේ. ඒවාට අවශ්‍ය පහසුකම් නැහැ. ලෙඩෙක් ගියොත් කියනවා, පෞද්ගලික අංශයෙන් check කර ගෙන එන්න කියා. ඔබතුමා ම දන්නවා, විටමින් ඌනතා වැනි විවිධ අසනීප තත්ත්වයන් හැදුණාම ඒ සම්බන්ධයෙන් බෙහෙත් ගන්නටය කියා රෝහල්වලට යවනවා. එතකොට වෛද්‍යවරු කියනවා, "මේ මේ ආහාර ගන්න" කියලා. එහෙම ගන්න පුළුවන්කමකුත් නැහැ. දැන් හාල්මැස්සෝ කිලෝ එකක් රුපියල් 900යි, 1,000යි. එතකොට ඔළුව කඩලා දැම්ම හාල් මැස්සෝ හතර පස් දෙනෙක් ආහාරයට ගනිද්දි රුපියල් විසිපහක් තිහක් වෙනවා. ඒ වාගේ අමාරු තත්ත්වයක ඉන්නේ. මම අහන්නේ මෙවැනි රසායනාගාර පහසුකම් මොනවාවත් නැතුව, එක පැත්තකින් පෝෂ්‍යදායී ආහාර වේලක් ගන්න බැරිව, කොහොමද මේ ජනතාව ජීවත් වන්නේ කියන එක. අනෙක් පැත්තෙන් විදුලි බිල වැඩි කරනවා.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
දැන් ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයක් නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මේ වෛද්‍ය රසායනාගාරය අවුරුදු තුනක සිට වහලා. ඇමතිතුමා කිව්වා, භෞතික ප්‍රශ්නයක් නැහැයි කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අහන වෙලාවට එහෙ මෙහෙ යන්නේ නැතිව කරුණාකරලා අහන දේ කෙටියෙන් කෙළින්ම අහන්න.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
පහසුකම් සැපයීමේදී ගරු මන්ත්‍රීතුමනි, රෝහල් වර්ගීකරණය කර තිබෙනවා; ශ්‍රේණිගත කර තිබෙනවා. ඒ අනුව තමයි අවශ්‍ය සම්පත් ලබා දෙන්නේ. විශේෂයෙන්ම මේ බුලත්සිංහල රෝහලේ තිබෙන අඩු පාඩුකම් සොයා බලා ඒවාට විසඳුම් වශයෙන් කරන්න පුළුවන් දෙයක් අපි කරන්නම්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, මේ රෝහලේ භෞතික පහසුකම්වල කිසි ප්‍රශ්නයක් නැහැ කියලා. ඔබතුමාම දැන් ආපහු පිළිගන්නවා, අඩු පාඩු සොයා බලනවා කියලා.

මම නැවත චෝදනා කියන්නේ අවුරුදු තුනක් තිස්සේ මේ කියන රසායනාගාරය වහලා තිබෙන බවයි. මේ රෝහලෙන් කිසිම පරීක්ෂණ කටයුත්තක් කර ගන්න බැහැ. මේ රෝහලේ විතරක් නොවෙයි ගරු ඇමතිතුමනි, මම නියෝජනය කරන ආසනයේ තිබෙන කුලියාපිටිය රෝහලේත් පරීක්ෂණාගාර පහසුකම් නැහැ. ගිහින් පෞද්ගලික අංශයෙන් පරීක්ෂා කරගන්න කියලා කියනවා. ජනතාවට නිදහස් සෞඛ්‍යයක් ගැන කථා කරන තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඊට අවශ්‍ය ප්‍රතිපාදන ලබා නොදෙන්නේ ඇයි?

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
ගරු කථානායකතුමනි, භෞතික සම්පත් තිබූ පමණින්ම, ලබා දුන් පමණින්ම ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ප්‍රධාන වශයෙන් මේ සඳහා අංශ භාරව, විශේෂඥ දැනුමක් තිබෙන, පුහුණුවක් තිබෙන නිලධාරීන් අවශ්‍යයි. නමුත් අපේ රටේ සාමාන්‍යයෙන් අතුරු වෛද්‍ය සේවාවට, විශේෂයෙන්ම පරිපූරක වෛද්‍ය සේවාවට අවශ්‍ය සම්පූර්ණ නිලධාරීන් සංඛ්‍යාව වාර්ෂිකව අපි අයැදුම්පත් කැඳවීමෙන් ලැබෙන්නේ නැහැ. ඒ නිසා හිඟතාවන් තිබෙනවා. සාමාන්‍යයෙන් වෛද්‍යවරු වාර්ෂිකව බඳවා ගැනීම් කෙරෙනවා. ඒ වාගේම හෙදියන්, පරිපූරක වෛද්‍ය සේවාවේ සහ අතුරු වෛද්‍ය සේවාවේ සෑම තනතුරක් සඳහාම වාර්ෂිකව අයැදුම් පත් කැඳවා බඳවා ගැනීම් කරනවා. නමුත් අප බලාපොරොත්තු වන ඒ සංඛ්‍යාව, සුදුසුකම් තිබෙන අය අපේ තනතුරුවලට ඒමේ අඩුවක් තිබෙනවා. ඒ අඩුව තුළ තමයි යම් යම් ප්‍රදේශවල මෙවැනි තත්ත්වයන් තිබෙන්නේ. කෙසේ වෙතත් මෙවැනි රෝහල්වලට ඒ අවට රෝහල්වලින් හෝ නිලධාරීන් යවලා සොයා බලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කරන්නම්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, රජයේ රෝහල්වල විශාල වශයෙන් බෙහෙත්වල අඩු පාඩු තිබෙනවා. ඒක අපි කාලයක් තිස්සේ කියන කථාවක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ඒකට උත්තර දීලා තිබෙනවා. හැම දාම ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා, ගන්නවා, ගන්නවා කියනවා. නමුත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවක් නම් අපට පෙනෙන්නේ නැහැ. හැම රෝහලකම ගත්තොත් මොන යම් හෝ බෙහෙත් ප්‍රමාණයක් නැහැ. ඔබතුමා රෝහල්වල පවතින ඖෂධ හිඟය ඉවත් කරන්න කටයුතු කරන්නේ කවදාද?

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයේ ඖෂධ ගැන අසා නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඖෂධ සම්බන්ධයෙනුයි මා අතුරු ප්‍රශ්නය ඇසුවේ.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
ඔබතුමා අසා තිබෙන්නේ, තනතුරු ගණනාවක හිඟයක් ගැනයි. හෙද නිලධාරින්- [බාධා කිරීමක්]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මා අදාළ අතුරු ප්‍රශ්නයක් ඇසුවේ.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
ගරු කථානායකතුමනි, ඖෂධ පිළිබඳවත් මේ ඇති වී තිබෙන තත්ත්වය විශේෂයෙන් සැලකිල්ලට අරගෙන රජය මඟින් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩයක් රැගෙන දැනට සති දෙකකට පෙර මා බංගලාදේශයට ගියා. මා බංගලාදේශ අග්‍රාමාත්‍යතුමිය හමු වුණා. බංගලාදේශ රජය ඖෂධ නිෂ්පාදනය කරනවා. අපි බලාපොරොත්තු වනවා, අපේ රජය සහ බංගලාදේශ රජය අතරේ ගිවිසුමක් ඇති කර ගැනීමට. මේ වන විට ඒ කටයුතු සිදු කරමින් පවතිනවා. අපි ප්‍රධාන වශයෙන්ම බංගලාදේශ රජය නිෂ්පාදනය කරන ඖෂධවල ප්‍රමිතිය, ගුණාත්මකභාවය ගැන සොයා බැලුවා. අන්තර්ජාතික ටෙන්ඩර් කැඳවීම වාගේ කටයුතු කිරීම වාගේම ඉන් බාහිරව දෙරට අතරේ ඇති කර ගත් ගිවිසුමක් තුළ දැනට පවතින ඖෂධවල ප්‍රමිතිය සම්බන්ධයෙන් ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට සහ වරින් වර ඇති වන ඖෂධ හිඟතාවයන් අඩු කර ගැනීමටත් අපි බලාපොරොත්තු වනවා. බොහෝ වෙලාවට ඖෂධ හිඟතාවයන් ඇති වීමට හේතුවක් තමයි ගරු කථානායකතුමනි, ඇතැම් ඖෂධ සමාගම් ටෙන්ඩර් ලබා ගෙන ලබා දෙන ඖෂධවල ප්‍රමිතියේ බරපතළ ප්‍රශ්නයක් තිබීම. ඒ ඖෂධ සමාගම් මා තහනම් කර තිබෙනවා. ඒවාට දඩුවම් දීලා තිබෙනවා. සමහර ටෙන්ඩර් ලබා ගන්නා වූ ඖෂධ සමාගම් කලට වේලාවට ඖෂධ සැපයීම කරන්නේ නැහැ. ඒ කරුණු කාරණා නිසා තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. කෙසේ වෙතත් අපි රජය විධියට ඒ සඳහා අවශ්‍ය සෑම පියවරක්ම ගැනීමට බලාපොරොත්තු වනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

"රණවිරු කොඩි" අලෙවිය : ආදායම
"இராணுவ வீரர் கொடிகள்" விற்பனை : வருமானம்
SALE OF "RANAVIRU FLAGS": INCOME

3136/'12

8. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2012 අප්‍රේල් 30 සිට මැයි 30 දක්වා වූ කාලය "රණවිරු මාසය" ලෙස සමරනු ලැබුවේද;

(ii) එකී රණවිරු මාසයට අදාළව "රණවිරු කොඩි" නිර්මාණය කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එම රණවිරු කොඩි නිර්මාණය කිරීම සඳහා ගිය වියදම කොපමණද;

(iv) රණවිරු කොඩි අලෙවියෙන් ලැබුණු ආදායම කොපමණද;

(v) රණවිරු අරමුදල් කැට නිෂ්පාදනය සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2012 ஏப்பிரல் 30ஆம் திகதி தொடக்கம் மே மாதம் 30ஆம் திகதி வரையிலான காலம் "இராணுவ வீரர் மாதம்" எனும் பெயரில் கொண்டாடப்பட்டதா என்பதையும்;

(ii) குறிப்பிட்ட இராணுவ வீரர் மாதத்துக்கு ஏற்ற வாறு "இராணுவ வீரர் கொடிகள்" அமைக் கப்பட்டதா என்பதையும்;

(iii) அவ்வாறாயின் இந்த இராணுவ வீரர் கொடிகளை அமைப்பதற்கு செலவாகிய பணத் தொகை யாது என்பதையும்;

(iv) இராணுவ வீரர் கொடிகளை விற்றுப் பெறப் பட்ட வருமானம் எவ்வளவு என்பதையும்;

(v) இராணுவ வீரர் நிதியத்துக்கான உண்டி யல்களை உற்பத்தி செய்வதற்கு செலவு செய்யப் பட்ட பணத்தொகை யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state-

(i) whether the period from 30th April to 30th May 2012 was celebrated as "War Heroes' Month" ("Ranaviru Month");

(ii) whether "War Heroes' Flags" ("Ranaviru Flags") were designed in association with the said "War Heroes' Month";

(iii) if so, the expenditure incurred in designing the said "War Heroes' Flags";

(iv) the amount of income derived from the sale of the "War Heroes Flags"; and

(v) the amount of money that was spent to make the War Heroes' Fund ("Ranaviru Fund") money tills?

(b) If not, why ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) රු. 273,400යි. (රුපියල් දෙලක්ෂ හැත්තෑතුන්දහස් හාරසියයයි.)

(iv) 2011 වර්ෂයේ ජාතික රණවිරු දිනය නිමිති කොට ගෙන ක්‍රියාත්මක වූ රණවිරු මාසය තුළ ආණ්ඩුකාර කාර්යාල විවිධ රණවිරු කොඩි අළෙවි කර ලද ආදායම රු. 4,312,505.78කි. (රුපියල් හතළිස්තුන්ලක්ෂ දොළොස්දහස් පන්සියපහයි ශත හැත්තෑඅටකි.) ත්‍රිවිධ හමුදාවෙන් හා පොලීසියෙන් ලද ආදායම රු. 255,748කි. (රුපියල් දෙලක්ෂ පනස්පන්දහස් හත්සිය හතළිස් අටකි.)

(v) රු. 99,082.34යි. (රුපියල් අනූනවදහස් අසුදෙකයි ශත තිස්හතරයි.)

(ආ) අදාළ නොවේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9 - 3196/'12-(1), ගරු රන්ජන් රාමනායක මහතා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු බීජ ගොවිපළවල් : පර්යේෂණ
கமத்தொழில் திணைக்கள விதைப் பண்ணைகள் : ஆராய்ச்சிகள்
SEED FARMS UNDER DEPARTMENT OF AGRICULTURE: RESEARCH

3201/'12

10. ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව ඇති බීජ ගොවිපළවල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් වී පිළිබඳව, වෙනත් ධාන්‍ය පිළිබඳව හා වෙනත් කටයුතු සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කරනු ලබන ගොවිපළවල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ගොවිපළ සතු ඉඩම් හෙක්ටයාර් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් වර්ෂ 2005 සිට 2012 දක්වා සිදු කළ පර්යේෂණ කටයුතු තුළින් අලුතින් සොයා ගන්නා ලද බෝග වර්ග කවරේද;

(ii) එම නව බෝග වර්ග අතරින් ගොවීන්ට හඳුන්වා දී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) මේ දක්වා බතලගොඩ හා අනෙකුත් කෘෂි පර්යේෂණ ආයතන මගින් හඳුන්වා දී ඇති නව වී වර්ග එක් එක් ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ සොයා ගෙන ඇති බාස්මති වී වර්ග සංඛ්‍යාව කොපමණද;

(v) එම බාස්මති වී වර්ගවල නම් සහ සොයා ගැනීම සිදු කළ ආයතන කවරේද;

(vi) දැනට සොයා ගෙන ඇති නව වී, ධාන්‍ය, පලතුරු හා එළවලු වර්ගවල බීජ මිලදී ගත හැකි ස්ථාන තිබේද;

(vii) එම ස්ථාන කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොළිල් අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) கமத்தொழில் திணைக்களத்துக்குச் சொந்தமான விதைப் பண்ணைகளின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(ii) மேற்படி பண்ணைகளில் நெல் தொடர்பாக வேறு தானியங்கள் தொடர்பாக, வேறு நடவடிக்கைகள் தொடர்பாக ஆராய்ச்சிகளை மேற்கொள்கின்ற பண்ணைகளின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்;

[ගරු පී. හැරිසන් මහතා]

(iii) மேற்படி ஒவ்வொரு பண்ணைக்கும் சொந்தமான காணிகளின் ஹெக்டெயர் அளவுகள் வெவ் வேறாக எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மஹா இலுப்பள்ளம் களப்பயிர் ஆராய்ச்சி, அபிவிருத்தி நிறுவனத்தினால் 2005ஆம் ஆண்டு முதல் 2012ஆம் ஆண்டுவரை மேற்கொள்ளப் பட்ட ஆராய்ச்சி நடவடிக்கைகள் மூலம் புதிதாகக் கண்டுபிடிக்கப்பட்ட பயிர் வகைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி புதிய பயிர் வகைகளில் விவசாயி களுக்கு அறிமுகப்படுத்தப்பட்ட பயிர் வகை களின் எண்ணிக்கை எவ்வளவென்பதை யும்;

(iii) இதுவரை பத்தலகொட மற்றும் ஏனைய கமத் தொழில் ஆராய்ச்சி நிறுவனங்களினால் அறிமுகப்படுத்தப்பட்ட புதிய நெல் வகைகள் ஒவ்வொரு நிறுவனத்துக்கமைய வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) இலங்கையில் கண்டுபிடிக்கப்பட்டுள்ள பாஸ்மதீ நெல் வகைகளின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(v) மேற்படி பாஸ்மதீ வகைகளின் பெயர்களும் கண்டுபிடிப்பை மேற்கொண்ட நிறுவனங்களும் யாவை என்பதையும்;

(vi) தற்போது கண்டுபிடிக்கப்பட்டுள்ள புதிய நெல், தானியங்கள், பழவகைகள் மற்றும் மரக்கறி வகைகளின் விதைகளைக் கொள்வனவு செய்யக் கூடிய நிலையங்கள் காணப்படுகின்றதா என்பதையும்;

(vii) மேற்படி நிலையங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he state -

(i) the number of seed farms coming under the Department of Agriculture;

(ii) separately, the number of farms conducting research on paddy, other types of grain and other matters out of those farms; and

(iii) separately, the number of hectares of land belonging to each farm ?

(b) Will he also state -

(i) the new varieties of crops which were discovered through research conducted between 2005 to 2012 by the Mahailluppallama Field Crop Research and Development Institute;

(ii) the number of crops which have been introduced to farmers out of those new crops;

(iii) separately, the new types of paddy which have been introduced by the Bathalagoda Agri Research Institute and other Agri Research Institutes up to now as per each of the institute;

(iv) the number of varieties of Basmathi rice which have been discovered in Sri Lanka;

(v) the names of those types of Basmathi rice and the names of the institutions which discovered them;

(vi) whether there are places from which the seeds of new types of rice, grains, fruits and vegetables that have been discovered up to now, can be purchased; and

(vii) the names of those places ?

(c) If not, why?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 20කි.

(ii) මෙම බීජ ගොවිපළවල පර්යේෂණ කටයුතු සිදු නොකරන අතර බීජ නිෂ්පාදනය වැනි සංවර්ධන කටයුතු පමණක් සිදු කරයි.

(iii)

අනු අංකය	බීජ ගොවිපළ	වපසරිය (හෙක්ටයාර)
01.	මහඉලුප්පල්ලම	181.1
02.	මල්වත්ත	152.4
03.	අළුත්තරම	226.5
04.	කන්තලේ	80.5
05.	බටඅත	150.0
06.	පොලොන්නරුව	200.0
07.	කරදියන්ආරු	252.8
08.	මුරුන්කන්	39.5
09.	පරන්තන්	36.0
10.	අම්බලන්ගොට	22.4
11.	කුණ්ඩසාලේ	49.0
12.	අඹේපුස්ස	60.0
13.	මිද්දෙණිය	54.9
14.	පිදුරුතලාගල	71.0
15.	සීතාඑළිය	113.8
16.	කඳපොල	27.1
17.	උඩරදැල්ල	65.0
18.	මීපිලිමාන	59.4
19.	රහංගල	9.40
20.	බණ්ඩාරගම	2.6
	එකතුව	1852.9

(ආ) (i)

අනු අංකය	වර්ෂය	භෝගය	ප්‍රභේදය
01.	2004	රටකජු	වීකිරි
02.	2004	මුං	MI-6
03.	2004	තුඹ කරවිල	වීසල්
04.	2004	තුඹ කරවිල	කේෂර
05.	2004	තුඹ කරවිල	තුම්ඕකා
06.	2004	තුඹ කරවිල	ගෝලිකා
07.	2004	තුඹ කරවිල	පැරකුම්
08.	2004	බඩඉරිඟු	සම්පත (දෙමුහුම්)
09.	2007	කුරක්කන්	ඕෂධ
10.	2008	තක්කාලි	KC-1
11.	2008	උදු	අනුරාධ
12.	2009	රතුළුනු	කිත්නවෙලි රතු
13.	2009	ලොකු ළුනු	දඹුල්ල වරණය
14.	2009	මිරිස්	MI Green
15.	2009	මිරිස්	MI ගල්කිරියාගම වරණය
16.	2011	මිරිස්	MI වැරණිය - 1
17	2011	මිරිස්	MICH-3
18.	2011	කව්පි	MICP-1
19.	2012	සෝයාඛෝංචී	MISB-1
20.	2012	රටකජු	ANKG-1

(ii) 20 යි.

(iii)

අවුරුද්ද	එක් එක් ආයතනයෙන් හඳුන්වා දී ඇති වී වර්ග			
	බතලගොඩ	බෝඹුවල	ලබුදුව	අම්බලන්තොට
2005	Bg 454 Bg 406 Bg 407H Bg 250			At 307
2006		Bw 364		
2008			Ld 365	At 308
2009	Bg 366			
2010			Ld 408	
2012	Bg 369	Bw 367	Ld 368	

(iv) සම්මත බාස්මති වී වර්ගයක් වීම සඳහා ඊට අදාළ ගුණාංග කිහිපයක් සම්පූර්ණ විය යුතු වුවත්, දේශීය පාරිසරික තත්ත්වයන් යටතේ එම ගුණාත්මක තත්ත්වයෙන් යුතු ප්‍රභේද නිෂ්පාදනය අසීරුය. කෙසේ වෙතත් බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් ද මෙම බාස්මති වී වර්ග නිපදවීම අත් හදා බලා ඇත. ඒ අනුව බාස්මති ගුණාංගවලට ආසන්න ගුණ ඇති වර්ග දෙකක් නිපදවා ඇත.

(v) At 306 ප්‍රභේදය - අම්බලන්තොට වී පර්යේෂණ ආයතනය.

At 405 ප්‍රභේදය - අම්බලන්තොට වී පර්යේෂණ ආයතනය.

(vi) ඔව්.

(vii)

අනු අංකය	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල	අලෙවි කරනු ලබන ද්‍රව්‍ය
01.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-කොළඹ 07	එළවළු බීජ හා රෝපණ ද්‍රව්‍ය
02.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-කොළඹ 05	එළවළු බීජ
03.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-අත්තනගල්ල	එළවළු බීජ හා රෝපණ ද්‍රව්‍ය
04.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-අම්පිටිය	එළවළු බීජ හා රෝපණ ද්‍රව්‍ය
05.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-මාතර	එළවළු බීජ හා රෝපණ ද්‍රව්‍ය
06.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-බටඅක	එළවළු බීජ,බීජ වී,අතිරේක ආහාර බෝග හා රෝපණ ද්‍රව්‍ය
07.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-නිකවැරටිය	- එම -
08.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-බකලගොඩ	- එම -
09.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල -මහඉලුප්පල්ලම	- එම -
10.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-පොලොන්නරුව	- එම -
11.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-දඹුල්ල	එළවළු බීජ
12.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-කුණ්ඩසාලේ	එළවළු බීජ,බීජ වී හා රෝපණ ද්‍රව්‍ය
13.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-ගන්නොරුව	එළවළු බීජ, රෝපණ ද්‍රව්‍ය
14.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-අළුත්කරම	එළවළු බීජ,බීජ වී,අතිරේක ආහාර බෝග හා රෝපණ ද්‍රව්‍ය
15.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-මඳුරුකැටිය	එළවළු බීජ,බීජ වී,අතිරේක ආහාර බෝග
16.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-කහගොල්ල	එළවළු බීජ, රෝපණ ද්‍රව්‍ය
17.	බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල-කිලිනොච්චිය	එළවළු බීජ,බීජ වී,අතිරේක ආහාර බෝග හා රෝපණ ද්‍රව්‍ය
18.	එළවළු බීජ මධ්‍යස්ථානය-ගන්නොරුව	එළවළු බීජ, රෝපණ ද්‍රව්‍ය
19.	බෝ-ළු බීජ මධ්‍යස්ථානය-පිකිල්ලගස්කඩ	එළවළු බීජ
20.	බීජ අර්තාපල් ගබඩාව-සීතාඑළිය	බීජ අර්තාපල්
21.	රජයේ බීජ ගොවිපළ-කුණ්ඩසාලේ	රෝපණ ද්‍රව්‍ය
22.	රජයේ බීජ ගොවිපළ-රඹඟල	බීජ අර්තාපල්, එළවළු බීජ, රෝපණ ද්‍රව්‍ය
23.	සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ(බීජ)කාර්යාලය-මහඉලුප්පල්ලම	එළවළු බීජ,බීජ වී,අතිරේක ආහාර බෝග
24.	රජයේ බීජ ගොවිපළ- මහඉලුප්පල්ලම	රෝපණ ද්‍රව්‍ය
25.	සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ(බීජ)කාර්යාලය-පොලොන්නරුව	බීජ වී,අතිරේක ආහාර බෝග
26.	රජයේ බීජ ගොවිපළ- පොලොන්නරුව	රෝපණ ද්‍රව්‍ය
27.	රජයේ බීජ ගොවිපළ-නාන්කලේ	රෝපණ ද්‍රව්‍ය
28.	සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ(බීජ)කාර්යාලය-අම්පාර	බීජ වී
29.	රජයේ බීජ ගොවිපළ-මල්වත්ත	එළවළු බීජ, රෝපණ ද්‍රව්‍ය
30.	රජයේ බීජ ගොවිපළ-පරන්තන්	බීජ වී,අතිරේක ආහාර බෝග
31.	සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ(බීජ)කාර්යාලය-පැල්වෙහෙර	එළවළු බීජ,බීජ වී,අතිරේක ආහාර බෝග හා රෝපණ ද්‍රව්‍ය
32.	සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ(බීජ)කාර්යාලය-කොළඹ	එළවළු බීජ
33.	රජයේ බීජ ගොවිපළ-අම්පිටිය	එළවළු බීජ, රෝපණ ද්‍රව්‍ය
34.	සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ(බීජ)කාර්යාලය /අලෙවිසැල - අළුත්කරම	එළවළු බීජ,බීජ වී,අතිරේක ආහාර බෝග හා රෝපණ ද්‍රව්‍ය
35.	සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ(බීජ)කාර්යාලය/ අලෙවිසැල -නිකවැරටිය	එළවළු බීජ,බීජ වී,අතිරේක ආහාර බෝග හා රෝපණ ද්‍රව්‍ය

(ඇ) අදාළ නොවේ.

[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This Answer is also placed in the Library.]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. විශේෂයෙන්ම මේ බාස්මති වී වර්ග අලුතෙන් සොයා ගැනීමේ අපහසුතාවක් තිබෙනවා කියලා ඔබතුමා කිව්වා. හැබැයි ශ්‍රී ලංකාවේ පෞද්ගලික ගොවිපොළවල මේ වන කොටත් බාස්මති වී වර්ග ගණනාවක් සොයා ගෙන තිබෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒවා නියම බාස්මති නොවෙයි. ඒවායේත් බාස්මති සහල්වල ගුණ ලක්ෂණ තිබෙනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ඒ සොයා ගත් බාස්මති සහල් Food City වැනි පෞද්ගලික වෙළඳ ව්‍යාපාරික ස්ථානවල ඕනෑ තරම් ගන්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මීට පෙර කරපු කථාවලදී කිව්වා, දැන් අපට අතිරික්ත වී තිබෙනවා කියලා. හැබැයි අපි ඒවා විදේශීය රටවලට විකිණීමේදී යම් යම් ප්‍රශ්න මතු වනවා. ඉන්දියාව, ඒ වාගේම පාකිස්තානය වාගේ රටවල බාස්මති සහල්වලට ලොකු ඉල්ලුමක් තිබෙනවා. අපිත් බාස්මති සහල් ගෙන්වන්නේ එම රටවලින්. ගරු ඇමතිතුමනි, මම හිතන්නේ ඔබතුමාගේ අවධානය මේ සම්බන්ධයෙන් යොමු කරලා මීට වඩා උනන්දුවක් දැක්වූවොත් අපට ඒකෙන් ආර්ථික වාසියක් ගන්න පුළුවන් වෙයි.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, එතුමා කිව්ව කාරණය මම පිළිගන්නවා. බාස්මතී කියලා අපි දැනට ශ්‍රී ලංකාවට ගෙන්වන වර්ගත් බාස්මතී නොවෙයි. මේ ගෙන්වන්නේ නියම බාස්මතී සහල් නොවෙයි. බාස්මතී ගුණ ලක්ෂණ තිබෙන වෙනත් ලාභ සහල් වර්ග තමයි මේ ගෙන්වන්නේ. ඔබතුමා දන්නවා, බාස්මතී වී නිෂ්පාදනය සඳහා මාස හතර හමාරක කාලයක් ගත වනවා කියලා. ඒ වාගේම ඒ ගුණාංග සහිත නියම බාස්මතී සහල් දැනට තිබෙන්නේ ඒ සඳහා අවශ්‍ය දේශගුණික තත්ත්වයන් ඇති පාකිස්තානයේ සහ ඉන්දියාවේ සමහර කොටස්වලයි.

අපේ රටට එන්නේ නියම බාස්මතී සහල් නොවෙයි. ඒක දැන් අප රේගුවටත් දන්වා තිබෙනවා. නියම බාස්මතී සහල් හඳුනා ගන්න දැන් අප උපකරණ හදුන්වා දී තිබෙනවා. දැන් නියම බාස්මතී නොවන සහල් ලංකාවට ගෙනෙන්න අප ඉඩ දෙන්නේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු ඇමතිතුමනි, මේවා නියම බාස්මතී සහල් නොවෙයි කියලා ඔබතුමා කිව්වත් මිනිස්සු පරිභෝජනයට ගන්නවා. එහෙම නම් අඩු ගණනේ අර සුවඳැල්, සම්බා වාගේ දේශීය වශයෙන් අලුත් සහල් වර්ගයක් අපේ රටේ නිෂ්පාදනය කෙරුවොත් තමයි අපට ප්‍රයෝජනවත් වෙන්නේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ පාවිච්චි කරන්නේත් නියම බාස්මතී සහල් නොවෙයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය නොවෙයි, තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

නැහැ, ගරු කථානායකතුමනි. මේ මගේ දෙවන අතුරු ප්‍රශ්නයයි. බාස්මතී සහල් ගැනමයි මම කලින් ඇහුවේ. එතකොට ඒක පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු කථානායකතුමනි, බීජ ගොවිපොළවල් 20ක් තිබෙනවා. හැබැයි අපේ රටට අවශ්‍ය බීජ වර්ගවලින් සියයට 80කට වැඩිය දැන් ගෙනෙන්නේ විදේශීය රටවල්වලිනුයි. ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශය ගත්තොත් විද්වතුන් විශාල ගණනක් ඉන්නවා. ඒ වාගේම බීජ ගොවිපොළවල් තිබෙනවා; පර්යේෂණ කරනවා. හැබැයි අප කනගාටු වෙනවා, දේශීය වශයෙන් තිබුණු බීජ වර්ග අද සම්පූර්ණයෙන්ම වඳ වීම ගැන, hybrid බීජ වර්ග වෙනත් රටවල්වලින් ගෙන්වීම ගැන. ගරු ඇමතිතුමනි, ඔබතුමා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට ඒ සඳහා ගන්නා පියවර මොකක්ද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, එතුමා කියන කථාව ඇත්ත. නමුත් ඒ ගෙන්වන්නේ hybrid බීජ වර්ගයි. මොකද, ගොවීන් ඉල්ලන්නේ ඒවායි. දැන් මේක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මොකද, දේශීය බීජ වගා කිරීමෙන් ඒ ගොල්ලන් ඉවත් වෙලා තිබෙනවා. වගා කරන උදවියත් ඉන්නවා. ඒ උදවියට උවමනා තරම් බීජ අප දෙනවා. දේශීය වර්ගවලින් උවමනා කරන සියලුම බීජ වර්ග අප ළඟ තිබෙනවා. නමුත් අප ළඟ hybrid බීජ වර්ග නැහැ.

අද වෙළෙඳ පොළේ ඉල්ලුම තිබෙන්නේ ලොකු වැටකොළු, ලොකු කරවිලවල වැනි ඒවාටයි. හැබැයි ඒවායේ සියයට 90ක් තිබෙන්නේ වතුරයි. වෙළෙඳ පොළ ආකර්ෂණය කරගෙන තිබෙන්නේ මේ වාගේ ලොකු එළවලුයි. හැබැයි ඒවායේ කිසිම ගුණාත්මක භාවයක් නැහැ. ඒවායේ වැඩිපුර තිබෙන්නේ ජලයයි. ගරු කථානායකතුමනි, කරවිල ගත්තොත් අපේ ගම්වල තිබෙන කරවිලවල තමයි නියම ගුණය තිබෙන්නේ. දැන් ඔය තිබෙන hybrid කරවිලවල කිසිම ගුණයක් නැහැ. බඩ පුරවා ගන්න පුළුවන්. නමුත් ඒවායේ කිසිම වෛද්‍ය වටිනාකමක් නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මා අහනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් අතුරු ප්‍රශ්න අහලා ඉවරයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. මේ කියන විධියට මේවා හිතකර නැතිනම් මේවා ගෙන්වන්නේ-

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

අපට තහනම් කරන්න බැහැ. තහනම් කරන්න බැහැනේ?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ඇයි, තහනම් කරන්න බැරි?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

අපට තහනම් කරන්න බැහැ. එතකොට WTO එක අපත් එක්ක ලොකු රණ්ඩුවකට එනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පරිභෝජනය කරන අයට ඔබතුමාගේ ප්‍රශ්නයත්, මෙතුමාගේ පිළිතුරත් ප්‍රයෝජනවත් වේවි.

ට්‍රිපොලි වෙළඳ සංකීර්ණය : වත්මන් භාරකරුවන්

திரிபொலி வர்த்தகக் கட்டிடத்தொகுதி : தற்போதைய பொறுப்பாளர்கள்

TRIPOLI TRADE CENTRE: CURRENT CUSTODIANS

3208/'12

11. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)

(The Hon. (Dr.) Harsha De Silva)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 1994 වර්ෂයේදී ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මඟින් ආරම්භ කරන ලද මරදාන ට්‍රිපොලි වෙළඳ සංකීර්ණය නමින් ස්ථානයක් පවතින බවත්;

(ii) දිවයින පුරා විසිරී සිටි, මිලදී ගැනීමේ මධ්‍යස්ථාන පවත්වාගෙන ගිය 350ක් පමණ වෙළඳ පිරිසකගෙන් තෝරා ගන්නා ලද නියෝජිතයන් 21 දෙනකුගේ පෞද්ගලික මුදලින් ට්‍රිපොලි වෙළඳ සංකීර්ණයේ ගොඩනැඟිල්ල ඉදි කර ඇති බවත්;

(iii) දැනට එම වෙළඳ මධ්‍යස්ථානය අවට සිදු කරනු ලබන හමුදා ක්‍රියාකාරකම් නිසා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට නොහැකිව එම ව්‍යාපාරිකයන් අසරණ තත්ත්වයට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වෙළඳ මධ්‍යස්ථානයේ වත්මන් භාරකරුවන් කවුරුන්ද;

(ii) අධි ආරක්ෂිත කලාප පවා විවෘත කර ඇති සමයක එම වෙළඳ මධ්‍යස්ථානයට ඇතුළු වන මාර්ග වසා තැබීමට හේතු කවරේද;

(iii) එහි හිමිකරුවන්ට ව්‍යාපාර කටයුතු කරගෙන යාමට එම මධ්‍යස්ථානය ලබා දෙන්නේද;

(iv) නොඑසේ නම්, වෙනත් විකල්පයන් ලබා දෙන්නේද;

(v) විකල්පයක් ලබා දෙන්නේ නම්, එය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 1994ஆம் ஆண்டு கொள்கை திட்டமிடல், அமுலாக்கல் அமைச்சினால் ஆரம்பிக்கப்பட்ட மருதானை திரிபொலி வர்த்தகக் கட்டிடத் தொகுதி என்றதொரு இடம் உள்ளதென் பதையும்;

(ii) நாடு முழுவதும் பரந்திருந்த கொள்வனவு செய்யும் நிலையங்களை பேணிவந்த சுமார் 350 வர்த்தகர்களிலிருந்து தெரிவுசெய்யப்பட்ட 21 பிரதிநிதிகளின் சொந்தப் பணத்திலிருந்து திரிபொலி வர்த்தகக் கட்டிடத் தொகுதி நிர்மாணிக்கப்பட்டுள்ளது என்பதையும்;

(iii) தற்போது மேற்படி வர்த்தக நிலையத்திற்கு பக்கத்தில் மேற்கொள்ளப்படுகின்ற இராணுவ நடவடிக்கைகள் காரணமாக தொழில்முயற்சி நடவடிக்கைகளை மேற்கொள்ள முடியாது மேற்படி வர்த்தகர்கள் நிர்க்கதி நிலைக்கு ஆளாகி யுள்ளார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வர்த்தக நிலையத்தின் தற்போதைய பொறுப்பாளர்கள் யாவர் என்பதையும்;

(ii) உயர் பாதுகாப்பு வலயங்களும் திறந்து விடப் பட்டுள்ள இச்சந்தர்ப்பத்தில் மேற்படி வர்த்தக நிலையத்திற்கு உட்பிரவேசிக்கின்ற பாதைகள் மூடப்பட்டுள்ளமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) அதன் உரிமையாளர்கள் தொழில்முயற்சி நடவடிக்கைகளை மேற்கொள்வதற்காக மேற்படி நிலையம் வழங்கப்படுமா என்பதையும்;

(iv) இல்லையெனின், மாற்றுவழிகள் செய்து கொடுக்கப்படுமா என்பதையும்;

(v) மாற்றுவழி செய்து கொடுக்கப்படுமாயின், அது யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware -

(i) that there is a place called Tripoli Trade Centre, Maradana which was initiated by the Ministry of Policy Planning and Implementation in the year 1994;

(ii) that the Tripoli Trade Centre building has been constructed using private funds of 21 representatives selected from a group of over 350 traders who ran purchasing centres which were spread islandwide; and

(iii) that those traders have been rendered helpless as they are unable to continue their businesses due to the military activities which are being conducted in the area surrounding the aforesaid trade centre?

(b) Will he inform this House -

(i) the names of the current custodians of the aforesaid trade centre;

(ii) the reasons for continuing to keep the access roads to the aforesaid trade centre closed during a period in which even the high security zones are kept open;

(iii) whether the aforesaid centre will be given to its owners to continue their business activities;

(iv) if not, whether any other alternatives will be provided; and

(v) as to what the alternative will be, if an alternative will be provided ?

(c) If not, why ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ට්‍රිපොලි වෙළඳ මධ්‍යස්ථානය නමින් ගොඩනැඟිල්ලක් මරදාන පිහිටි ට්‍රිපොලි යුද හමුදා කඳවුරු සංකීර්ණ මධ්‍යයේ පිහිටා ඇත.

(ii) මේ පිළිබඳ තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශය සතුව නොමැති අතර ට්‍රිපොලි වෙළෙඳ මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඉදි කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇත.

(iii) ව්‍යාපාරික කටයුතුවල නිරත අය අසරණ තත්ත්වයකට පත්වීමක් සිදු වී ඇතැයි වාර්තා වී නොමැත.

(ආ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

(ii) යුද්ධ හමුදා කඳවුරක් තුළ තිබිය යුතු ආරක්ෂිතභාවය හා රහස්‍යභාවය හේතුවෙන් කඳවුර මධ්‍යයේ පිහිටි මෙම ගොඩනැඟිල්ලට සිවිල් පුද්ගලයන්හට ඇතුළු වීම සඳහා ඉඩ සලසා දීමට හැකියාවක් නොමැත.

(iii) ට්‍රිපොලි වෙළෙඳ සංකීර්ණය තුළ පිහිටි යුද්ධ හමුදාවට අයත් කාර්යාල ස්ථානගත කිරීමට අවශ්‍ය ඉඩම් හා ගොඩනැඟිලි ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර ඒවා යුද්ධ හමුදාව වෙත ලබා ගත් පසු ට්‍රිපොලි යුද්ධ හමුදා කඳවුර සංකීර්ණය සම්පූර්ණයෙන්ම නිදහස් කිරීමට කටයුතු යොදා ඇත.

(iv) පැන නොනඟී.

(v) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

බොහොම ස්තුතියි, ඇමතිතුමනි. ඔබතුමා කිව්වා, මෙය දුම්රිය දෙපාර්තමේන්තුවට අයිතියි, නමුත් මෙය යුද හමුදා කඳවුරක් කියලා. ඒ කියන්නේ මේ යුද හමුදා කඳවුර තිබෙන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ගොඩනැඟිලිවලයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඔබතුමා දන්නවා, ඒ අවස්ථාවේදී ආරක්ෂක හේතූන් මත ඒ ආරක්ෂක අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා රටේ විවිධ ගොඩනැඟිලි ලබා ගෙන තිබෙන බව. දැන් යුද හමුදාව තමන්ගේ කාර්යාල වෙනත් තැනකට ගෙන යෑම සඳහා වෙනත් ඉඩම් හා ගොඩනැඟිලි සොයා ගැනීමේ කාර්යයක යෙදී සිටිනවා. එය අවසන් වූ වහාම මෙය නිදහස් කරලා දෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

දැන් ඔබතුමා කිව්වා, මේ පිළිබඳව කවුරුත් complain කරලා නැහැයි කියලා. එය සම්පූර්ණයෙන්ම වැරැදියි. එතැන සිටින ව්‍යාපාරිකයන් විසිඑක්දෙනා ඒ කාලයේ තෝරා ගෙන තිබෙන්නේ ලංකාවේ දිස්ත්‍රික්ක 21කින්. ඔවුන්ව එතැනින් ඉවතට දමා තිබෙනවා. මේ සම්බන්ධයෙන් බලන්න මා එතැනට ගියා. එය ඇතුළේ කැරම් බෝර්ඩ් තිබෙනවා, රෙදි වනලා තිබෙනවා. ඒ වාගේ වැඩ කර ගෙන පුද්ගලයෝ කට්ටියක් එතැන ඉන්නවා. එතැන යුද හමුදා කඳවුරක් පවත්වා ගෙන යන්නේ නැහැ. එතැන ඒ කට්ටිය නිකම් ඔහේ ඉන්නවා. නමුත් එතැන සිටින වෙළෙඳ ව්‍යාපාරික මහත්වරුන් 21 දෙනා එළියේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
කොයි කාලයේ ඉඳලාද ඒ අය එළියේ ඉන්නේ?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

දැන් අවුරුදු තුනක්, හතරක් විතර වෙනවා. යුද්ධය ඉවර වුණේ 2009 අවුරුද්දේ නේ ගරු ඇමතිතුමනි. දැන් 2013 අවුරුද්ද නේ. එතකොට අවුරුදු හතරක කාලය තුළ මොවුන්ව එළියට දමලාම තිබෙනවා. මොවුන්ව ඇතුළට ගන්නේ නැහැ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඒ අයව ඇතුළට ගන්න තමයි යුද හමුදාවට යන්න විකල්ප ස්ථානයක් සොයන්නේ. ඒ පිළිබඳව ක්‍රියාවලියක දැන් යෙදී සිටිනවා. ඒවා සොයා ගත්තාට පසුව යුද හමුදාව ඒ නව ගොඩනැඟිලිවලට ගිහිල්ලා, මේ අයට අර ගොඩනැඟිල්ල ලබා දෙන්න පුළුවන්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔවුන්ට යුද හමුදාවෙන් ලිඛිතව දන්වා තිබෙනවා, මේ ගොඩනැඟිල්ල නැවත ලබා ගන්න යුද හමුදාවෙන් ඔවුන්ට අවසර ලබා දීලා තිබෙනවා කියලා. එහෙම දෙයක් නැහැ කියලා ඔබතුමා කියනවා නම් ඒක සත්‍යයක් නොවෙයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ලිඛිතව දන්වා තිබෙන්නේ මොකක්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ලිඛිතව දන්වා තිබෙනවා. මා ළඟ එම ලිපිය තිබෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එය ඉදිරිපත් කරන්න. මා ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කරන්නම්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හොඳයි. මා ඔබතුමාට එය ඉදිරිපත් කරන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 12 - 2318/'12 - (2), ගරු රවි කරුණානායක මහතා.

ප්‍රධාන කටයුතු ආරම්භ කරන්නට තිබෙන්නේ පස් වරු 2.00ටයි. තව විනාඩි කිහිපයයි තිබෙන්නේ. ඒ නිසා ප්‍රශ්නවලට කෙටියෙන් පිළිතුරු දෙන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ලසන්ත අලකියවන්න - නිර්මාණ, පොරියියල් සේවෛකළ්, වීටමෛප්පු, පොතුවසතිකළ් පිරති අමෛච්චර්)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා. [බාධා කිරීමක්]

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
වෙලාවට වැඩ කරමු කෝ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෛ මර්‍රොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෛයිටප්පට්ටදු.
Question ordered to stand down.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13 -2509/12' - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෛ මර්‍රොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෛයිටප්පට්ටදු.
Question ordered to stand down.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14 -2638/12' - (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෛ මර්‍රොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෛයිටප්පට්ටදු.
Question ordered to stand down.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15 -2982/12' - (1), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(මාණ්පුමිකු අකිල විරාජ් කාරියවසම්)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෛ මර්‍රොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෛයිටප්පට්ටදු.
Question ordered to stand down.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
දෙවන වටය.

සේවක අර්ථසාධක අරමුදල් භාවිත කර ගොඩනැඟිල්ලක් ඉදිකිරීම : මුළු පිරිවැය

ஊழியர் சேமலாப நிதிமூலம் கட்டிட நிர்மாணம் : மொத்தச் செலவு

CONSTRUCTION OF BUILDING UTILIZING EPF MONEY : TOTAL COST

2315/'12

1. ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 1958 සේවක අර්ථසාධක අරමුදල පනත 2012 ජනවාරි මස 18වැනි දින සංශෝධනය කළ බවත්;

(ii) සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ඉඩමක් මිලදී ගැනීමට සහ ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට යොදා ගැනීම සඳහා එම සංශෝධනය සිදු කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගොඩනැඟිල්ල සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;

(ii) එම ගොඩනැඟිල්ලේ වර්ග අඩියක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

[ගරු රවි කරුණානායක මහතා]

(iii) එම ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අයගේ නම් සහ ඔවුන් ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ගොඩනැඟිල්ල මහල් තිස් පහකින් සමන්විත විය යුතු බවට යෝජනා කිරීමේ වගකීම් භාර ගත යුතු පුද්ගලයාගේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ගොඩනැඟිලි ඉදිකිරීම වැනි කාර්යයකට යොදවා නාස්තියක් සිදුකිරීමට හේතු කවරේද;

(ii) ඉහත සඳහන් කාර්යය සඳහා රාජ්‍ය මුදල් යොදා නොගැනීමට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

තොழිල්, තොழිල් උறවුකළ් අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) 1958 ஆம் ஆண்டின் ஊழியர் சேமலாப நிதிய - EPF - சட்டம் 2012 சனவரி 18ஆம் திகதியன்று திருத்தப்பட்டமையையும்;

(ii) காணி கொள்வனவு செய்வதற்கும் கட்டிட மொன்றை நிர்மாணிப்பதற்கும் ஊழியர் சேமலாப நிதியத்திலுள்ள பணத்தை உபயோகப் படுத்தக்கூடியவாறு திருத்தம் மேற்கொள்ளப் பட்டமையையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மேற்படி கட்டிடத்திற்கென மதிப்பீடு செய்யப் பட்ட மொத்தச் செலவினத்தையும்;

(ii) அக்கட்டிடத்தின் ஒரு சதுர அடிக்கு மதிப்பீடு செய்யப்பட்ட செலவினத்தையும்;

(iii) அக்கட்டிட நிர்மாணத்திற்குக் கேள்விப்பத்திரங் களைச் சமர்ப்பித்தவர்களின் பெயர்கள் மற்றும் ஒவ்வொரு கேள்விப் பத்திரதாரரினதும் விலை மனுப் பெறுமதி ஆகியவற்றை வெவ் வேறாகவும்;

(iv) அக்கட்டிடத்தின் தேவைப்பாட்டை 35 மாடிகளாகத் திட்டமிடலுக்குப் பொறுப்பாக விருந்த நபரையும்

அவர் கூறுவாரா?

(இ) (i) கட்டிட நிர்மாணங்களில் ஊழியர் சேமலாப நிதியம் ஏன் வீண்விரயம் செய்யப்படுகின்ற தென்பதையும்;

(ii) மேற்படி பணிக்காக அரச நிதியங்கள் பயன் படுத்தப்படாமைக்கான காரணத்தையும்

அவர் கூறுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Labour Relations:

(a) Will he admit that -
  (i) the Employees' Provident Fund - EPF - Act of 1958 was amended on the 18th of January, 2012; and
  (ii) the amendment was done so as to utilize the money in EPF for buying a land and construction of a building ?

(b) Will he state -
  (i) the total cost estimated for the aforesaid building;
  (ii) the estimated cost per square foot of the building;
  (iii) the names of the tenderers bid for the construction of that building and the bid value of each tenderer separately; and
  (iv) the person responsible for projecting the requirement of that building to be 35 floors?

(c) Will he also state -
  (i) as to why the EPF is wasted on building constructions; and
  (ii) the reason for not using State funds for the above purpose?

(d) If not, why?

ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ප්‍රශ්නය අහන්න මා මෙතැන සිටිනවා. ගරු කථානායකතුමනි, කරුණාකරලා මේ අයට කියන්න, සම්ප්‍රදායට අනුව කටයුතු කරන්න කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

සාමාන්‍ය සම්ප්‍රදාය වන්නේ, පළමු වැනි වටයේ දී ප්‍රශ්නය අහන මන්ත්‍රීතුමා ගරු සභාවේ නොසිටියොත් දෙවැනි වටයේ දී එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කිරීමයි. නමුත් අපි අවබෝධයක් ඇති කරගෙන තිබෙනවා, දෙවැනි වටයේ දී ප්‍රශ්නය අසන අවස්ථාවේ දී මන්ත්‍රීතුමා ගරු සභාවේ සිටියොත්, එයට පිළිතුර දෙන්න කියලා. ඒ නිසා ඇමතිතුමා පිළිතුර දෙනවා නම් හොඳයි.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

මා සම්ප්‍රදාය අනුවයි ක්‍රියා කළේ. [බාධා කිරීමක්] ප්‍රශ්නයට උත්තරය දෙන්න පුළුවන්. ඒ නිසා තමයි මම ඇවිත් හිටියේ. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ හිටියේ නැහැ. දැන් එතුමා ඉන්නවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වෙලාවට වැඩ කරන්න.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත 2012.01.18 දින සංශෝධනය කරන ලදී.

(ii) ඔව්.

එම සංශෝධනය සිදු කර ඇත්තේ, ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට හා තවත් අරමුණු කීපයක් ඉටු කිරීම උදෙසාය.

(ආ) (i) රුපියල් බිලියන 7.5යි

(ii) වර්ග අඩියක් සඳහා දළ වශයෙන් රුපියල් 11,845.00යි.

(iii) ගොඩනැඟිල්ල ඉදි කිරීමට අදාළ ටෙන්ඩර් කටයුතු අවසන් කර නොමැති බැවින් මේ අවස්ථාවේදී පිළිතුරු ලබා දිය නොහැක.

(iv) කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය මඟින් ගත් ප්‍රතිපත්තිමය තීරණයක් මත හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත මෙය සිදු කරන ලදී.

(ඇ) (i) මෙමඟින් නාස්තියක් සිදු නොවේ.

(ii) මෙය සේවක අර්ථසාධක අරමුදල් කටයුතු සඳහා ඉදි කරනු ලබන ගොඩනැඟිල්ලක් වන අතර, සේවක අර්ථසාධක අරමුදල පවත්වාගෙන යාමේ වියදම් එම අරමුදල විසින් දැරිය යුතු බවට සේවක අර්ථ සාධක අරමුදල් පනතෙහිද සඳහන්ව ඇත. ඒ අනුව රාජ්‍ය මුදල් යෙදවීම අවශ්‍ය නොවනු ඇත.

(ඈ) පැන නොනඟී.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මේ ගොඩනැඟිල්ල ඉදි කරන්න පටන් අරගෙන තිබෙනවා. වැඩ කරන ජනතාව මෙයට අනුමැතියක් දීලා තිබෙන්නේ කොයි ආකාරයෙන්ද?

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මොකක්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සල්ලි කන්දරාවක් පාවිච්චි කරලා දැන් මේ ගොඩනැඟිල්ල ඉදි කරනවා. වැඩ කරන ජනතාව තමයි මේකේ අයිතිකරුවෝ. ඒ වැඩ කරන ජනතාව කොයි ආකාරයෙන් ද ඔබතුමාට කිව්වේ මේ ගොඩනැඟිල්ල හදන්න කියලා?

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
එය රජයේ ප්‍රතිපත්තියක් අනුව කරන්නේ. ඒ අරමුදල පාලනය කරන්නේ රජය. රජයේ පනතක් අනුවයි ඒක කරන්නේ. ඒ පනතේ තිබෙන ප්‍රතිපාදන අනුව තමයි මේ කටයුත්ත කරන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් පාලනය කරන්නේ ආණ්ඩුව කියලා කියනවා. ඔබතුමන්ලා දැන් වගකීමක් භාර ගෙන තිබෙනවා නේ. ගිය අවුරුද්දේ සියයට 6.5ක ආර්ථික වර්ධන වේගයක් තිබුණා. නමුත් ගිය අවුරුද්දේත් මේ අයට පොලිය හැටියට ගෙව්වේ සියයට 11.5යි. ඊට පෙර අවුරුද්දේ සියයට 12.5යි. ඒ පොලියේ වර්ධනයක් නැහැ. එහෙනම් ඔබතුමන්ලා වැඩ කරන ජනතාවගේ සල්ලි සූරා කනවා නේ. මේ ගොඩනැඟිලි හදන්න කියලා කොයි ආකාරයෙන්ද ඒ අය කියන්නේ? ඒ අය කියන්නේ මීට වැඩිය හොඳ ප්‍රතිලාභයක් ලබා දෙන්න කියන එකයි. ඇයි ඒ පොලිය ලබා දෙන්නේ නැත්තේ? ඔබතුමා මේ captive source පාවිච්චි කරලා-

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඔබතුමා ප්‍රශ්නය අහන්නකෝ, උත්තරය දෙන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ captive source, ඒ කියන්නේ රජයට අයිතිය නැති මුදල් පාවිච්චි කරලා -

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, මෙතුමාට ප්‍රශ්නය අහන්න කියන්න. මම උත්තරය දෙන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ගරු මන්ත්‍රීතුමන්ලාට අහන්න ඕනෑ දේවල් කරුණාකර කෙටියෙන් අහන්න.

මෙතැන කථා පවත්වන්නට, තමන්ගේ අදහස් පවසන්නට අවස්ථාව දෙන්න බැහැ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය අහන්න. මම උත්තරය දෙන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රශ්නය ව්‍යාකූල තත්ත්වයට ගෙනැල්ලා අපට කෙළින් ප්‍රශ්න අහන්න කියනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්, කෙළින් තමයි වැඩ කරන්න ඕනෑ. ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ආණ්ඩුවට කියන්න කෝ කෙළින් වැඩ කරන්න කියලා. ඒ අය වංගු යන නිසා තමයි අපටත් වංගු තුළින් ගිහින් මේ හොරු ටික අල්ලන්න වෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇදේට යන විට ඒ අයත් ඇදේට යනවා. ඒකයි වෙලා තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ අය ඇදේට යනවා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ප්‍රශ්නය අහන්න තේරෙන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාට විතර නේ තේරෙන්නේ. වැඩ කරන ජනතාවගේ සල්ලි කාබාසිනියා කරලා මේ ගොඩනැඟිලි හදනවා. දැන් ඒ ජනතාවට පොලිය වශයෙන් සියයට 11.5ක් ගෙවනවා. මීට වඩා වැඩි පොලියක් ඒ අයට ගෙවන්නේ නැත්තේ ඇයි? ගිය අවුරුද්දේ 6.6ක ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වැඩි පොලියක් ගෙවන්නේ නැත්තේ ඇයි? ප්‍රශ්නය එතැනින් තවත්වන්න.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
සේවක අර්ථ සාධක අරමුදලේ පොලිය හැම දාම තින්දු කළේ කමිටුවක් මඟින්. අද පමණක් නොවෙයි, 1959දී මේ පනත ක්‍රියාත්මක වීම පටන් ගත්ත දවසේ සිට කළේ ඒකයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේත් කළේ ඒක; මේ ආණ්ඩුව කාලයේ කරන්නේත් ඒක. ඒ ක්‍රමය තමයි අදත් පාවිච්චි කරන්නේ. තමුන්නාන්සේට ඒ කාරණය නොතේරුණාට මට කරන්න දෙයක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මාගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. කොමිටිය කියන්නේ මොකක්ද, කවුද ඒක පත් කරන්නේ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ඇති. කොමිටිය කියන්නේ කවුද? තුන්වෙනි අතුරු ප්‍රශ්නය ඇහුවා. කොමිටිය කියන්නේ කවුද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. මම ප්‍රශ්න ඇහුවේ නැහැ. ගරු කථානායකතුමනි, එහෙම ප්‍රශ්න අහන්න නම් මේ කාලය දෙන්නේ මොකටද? එක්සත් ජාතික පක්ෂ කාලයේ හැම දාම පොලී ප්‍රමාණය වැඩි වුණා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
එක්සත් ජාතික පක්ෂ කාලයේ පොලිය කීයද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා ඒ සල්ලිවලින් සියයට 15ක් කොටස් වෙළෙඳ පොළට දාලා, ඒකට ලැබිලා තිබෙන පොලිය රුපියල් මිලියන 3,000යි. ලබා ගත යුතු ප්‍රමාණය රුපියල් මිලියන 9,500යි. වැඩ කරන ජනතාවගේ සල්ලි නාස්ති කරලා දැන් මොනවාද කියන්නේ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, හැම දාම මේ පනත අනුව තමයි පොලිය නියම කරන්නේ. ආයෝජනය කරන්නේත් මේ පනතට කලින් කලට කළ සංශෝධන අනුවයි. මේ මුදලින් සියයට 2ක් ආයෝජනය කරන්න තමයි පනත අනුව බලය තිබුණේ. නමුත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ තමයි සියයට 10ක් ආයෝජනය කරන්න අනුමැතිය අරගෙන දුන්නේ. පනත අනුව තමයි ක්‍රියා කරන්නේ. පනතට විරුද්ධව කිසිම ක්‍රියාවක් කරන්නේ නැහැ කියලා මම කියන්න කැමැතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දූෂණ කරන්නේත් පනතට අනුව තමයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒවා අදාළ නැත. ඒවා ප්‍රශ්නයට අදාළ නැත.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය : විදේශ සංචාර

ஸ்ரீ லங்கன் எயார் லைன்ஸ் நிறுவனத் தலைவர் மற்றும் பணிப்பாளர் சபையினர் : வெளிநாட்டுப் பயணங்கள்

CHAIRMAN AND BOARD OF DIRECTORS OF SRILANKAN AIRLINES : FOREIGN TOURS

2539/'12

4. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி- மாண்புமிகு அனுர திசாநாயக்க சார்பாக)
(The Hon. Sunil Handunnetti on behalf of the Hon. Anura Dissanayake)
සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3) :

(අ) (i) ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින් 2009 වර්ෂයේ සිට මේ දක්වා යෙදී ඇති විදෙස් සංචාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සංචාරය සිදු කළ රටවල්, ඒවායේ අරමුණු හා ඉන් ලැබුණු ප්‍රතිඵල එක් එක් සංචාරය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් සංචාරය සඳහා ඒ ඒ පුද්ගලයා වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

සිවිල් විමානච් සේවෛකළ් අමෛච්සරෛක් කේට්ට විනා:

(අ) (i) ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් නිරුවනත්තින් තලෛවර් මර්රුම් පණිප්පාළර් සපෛයින් ඔව්වොරු අංකත්තවරුම් 2009ආම් ආණ්ටු තොටක්කම් ඉර්රෛවරෛ මේර්කොණ්ටුළ්ළ වෙළිනාට්ටුප් පයණංකළින් එණ්ණික්කෛ තනිත්තනියේ එව්වළවෙන්පතෛයුම්;

(ii) මේර්පටි ඔව්වොරු පයණත්තිර්කුරිය නාටුකළ්, පයණත්තින් නෝක්කම්, පෙර්රුක්කොණ්ට පෙරු පේරුකළ් ඔව්වොරු පයණත්තිර්කුම් ඒර්ප තනිත්තනියේ යාවෛ එන්පතෛයුම්

(iii) ඔව්වොරු පයණත්තිර්කුමෙන අන්තන්ත නපර් කළුක්කාක සෙලවිටප්පට්ට පණත්තොකෛ තනිත්තනියේ එව්වළවෙන්පතෛයුම්

අවර් ඉච්චපෛක්කු අර්රිවිප්පාරා?

(ආ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Civil Aviation:

(a) Will he inform this House separately of -

(i) the number of foreign tours made by each member of the Board of Directors and the Chairman of the SriLankan Airlines from the year 2009 up to now;

(ii) the countries visited in each of the aforesaid tours and the objectives and the outcome of each of them; and

(iii) the amounts of money spent on each person who took part in each of those tours ?

(b) If not, why?

ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)

(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)

(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

අ (i)

	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ නම	2009	2010	2011	2012
01.	නිශාන්ත වික්‍රමසිංහ මහතා - සභාපති	06	13	19	12
02.	සුනිල් විජේසිංහ මහතා- අධ්‍යක්ෂ (2010 මැයි 10 ඉල්ලා අස්වී ඇත.)	01	-	-	-
03.	සු.එන්.බී.ඔබේසේකර මහතා -අධ්‍යක්ෂ (2009 මාර්තු 10 වන දින නැසී ගියෙ)	-	-	-	-
04.	තිහාල් ජයමාන්න මහතා - අධ්‍යක්ෂ	01	-	01	-
05.	සනත් උක්වත්ත මහතා- අධ්‍යක්ෂ (2010 මැයි 10 ඉල්ලා අස්වී ඇත.) (2011 සැප්.29 සිට නැවත පත්කර ඇත.)	02	-	-	03
06.	කපිල චන්ද්‍රසේන මහතා - අධ්‍යක්ෂ	-	01	01	-
07.	ශමින්ද්‍ර රාජපක්ෂ මහතා - අධ්‍යක්ෂ	-	-	01	-
08.	මනිලාල් ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ (2010 මැයි 17 සිට පත් කර ඇත.)	-	-	-	-
09.	ආචාර්ය ක්‍රිස් නෝනිස් මහතා - අධ්‍යක්ෂ (2010 මැයි 17 සිට පත්කර ඇත.) (2011 සැප්.29 ඉල්ලා අස්වී ඇත.)	-	01	02	-
10.	ලක්ෂ්මි සංගක්කාර මිය - අධ්‍යක්ෂිකා (2011 සැප්.01 සිට පත්කර ඇත.)	-	-	-	-
11.	ඩබ්.ඒ.නාලිනී මෙය - අධ්‍යක්ෂිකා (2011 ඔක්.14 සිට පත් කර ඇත.) (2012 ජූලි 04 ඉල්ලා අස්වී ඇත.)	-	-	-	-
12.	සුසන්ත රත්නායක මහතා - අධ්‍යක්ෂ (2011 දෙසැ.20 සිට පත් කර ඇත.)	-	-	-	-

(ii)
(iii) } අමුණුම පරිදි

(ආ) පැන නොනඟී.

අමුණුම

(අ) (ii) (iii)

සහභාගීවූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	වර්ෂය	සංචාරයට අදාළවූ රට	සංචාරයේ අරමුණු හා ලැබුණු ප්‍රතිඵල	වැය කළ මුදල (රුපියල්)
නිශාන්ත වික්‍රමසිංහ මහතා - සභාපති	2009	මාලදිවයින	ගුවුල්කරුවන් සමඟ ව්‍යාපාරික සාකච්ඡා පැවැත්වීම සඳහා. සාකච්ඡා වලින් අනතුරුව වෙළඳපළ අවස්ථාවන් පුළුල් කර ගැනීම.	33,885/- (තිස් තුන් දහස් අටසිය අසූ පහයි)
	2009	ජපානය	ජපානයට ගුවන්සේවා සැපයීමේ 25 වසර සැමරීමට සහභාගීවීම සඳහා. ගුවුල් ව්‍යාපාර සබඳතාවයන් ශක්තිමත් වීම.	398,757/- (තුන් ලක්ෂ අනූ අට දහස් හත්සිය පනස් හතයි.)
	2009	එක්සත් රාජධානිය	වාර්ෂික ලෝක සංචරණ වෙළඳ සල්පිලට සහභාගීවීම සඳහා. ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවැත්තයින් මුණ ගැසීම.	351,187/- (තුන් ලක්ෂ පනස් එක් දහස් එකසිය අසූ හතයි.)
	2009	ජර්මනිය	බර්ලිනයේ වාර්ෂික වෙළඳ සල්පිලට සහභාගීවීම සඳහා. ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවැත්තයින් මුණ ගැසීම.	344,134/- (තුන් ලක්ෂ හතළිස් හතර දහස් එකසිය තිස් හතරයි.)
	2009	කටාර්/ඕමාන්	දිවි පාර්ශ්වික සාකච්ඡා සඳහා රජයේ නියෝජිත පිරිස මෙහෙයවීම වාසිදායක දිවි පාර්ශ්වික සබඳතා ගොඩ නඟාගැනීම.	135,946/- (එක් ලක්ෂ තිස් පන් දහස් නමසිය හතළිස් හයයි.)
	2009	ඩුබායි	එමිරේට්ස් ගුවන් සේවය සමඟ කොටස් ආපසු ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය (භාණ්ඩාගාරය) සමඟ සාකච්ඡා කඩිනම්වීම.	119,929/- (එක ලක්ෂ දහතම දහස් නමසිය විසි නමයයි.)
	2010	ජර්මනිය	බර්ලිනයේ වාර්ෂික වෙළඳ සල්පිලට සහභාගීවීම සඳහා ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවැත්තයින් මුණ ගැසීම.	252,381/- (දෙලක්ෂ පනස් දෙදහස් තුන්සිය අසූ එකයි.)
	2010	සිංගප්පූරුව	අග්නිදිග ආසියාවේ කලාපීය සමුළුවට සහභාගී වීම සඳහා විකුණුම් කණ්ඩායමවලට අදයම වැඩි කරගැනීමට උපදෙස් ලබාදීම.	94,575/- (අනූ හතර දහස් පන්සිය හැත්තෑ පහයි.)
	2010	ඩුබායි	ශ්‍රී ලංකා රජයේ නියෝජිත පිරිසේ සාමාජිකයෙක් ලෙස එමිරේට්ස් සමඟ නිල සාකච්ඡා වලට සහභාගීවීම සඳහා සාකච්ඡා සාර්ථකවීම.	102,780/- (එක් ලක්ෂ දෙදහස් හත්සිය අසූවයි.)
	2010	ඉන්දියාව	ඇයිරා පුටන්පත් සාකච්ඡාවට සහභාගීවීම සඳහා ඇයිරා සම්මාන උළෙල කොළඹ පැවැත්වීම.	115,871/- (එක් ලක්ෂ පහළොස් දහස් අටසිය හැත්තෑ එකයි.)
	2010	ඉන්දියාව	ඇයිරා මධ්‍ය සාකච්ඡාවට සහභාගීවීම සඳහා ඇයිරා සම්මාන උළෙල කොළඹ පැවැත්වීම.	34,260/- (තිස් හතර දහස් දෙසිය හැටයි.)
	2010	ඉන්දියාව	ඇයිරා මධ්‍ය සාකච්ඡාවට සහභාගීවීම සඳහා ඇයිරා සම්මාන උළෙල කොළඹ පැවැත්වීම.	34,260/- (තිස් හතර දහස් දෙසිය හැටයි.)
	2010	චීනය	ෂැංහයි කාර්ය මණ්ඩලය මුණගැසීම. ආදයම වැඩිකර ගැනීම හා ව්‍යාපාරික සැලසුමේ මූලිපිරීම් ගැන උපදෙස් ලබාදීම.	136,500/- (එක් ලක්ෂ තිස් හය දහස් පන්සියයයි.)

[ගරු පියංකර ජයරත්න මහතා]

	2010	කටාර්	භාණ්ඩාගාරයේ ලේකම් සමඟ දෝහා වෙත යාම (රහස්‍ය සංචාරයක්) සංචාරය සාර්ථකවීම.	108,106/- (එක් ලක්ෂ අට දහස් එකසිය හයසි.)
	2010	සිංගප්පූරුව	Temasek SIN සමඟ සාකච්ඡා සඳහා (නියෝජිත පිරිසට එක් වෙමින්) ආයෝජන අවස්ථා සොයා බැලීම.	90,024/- (අනූ දහස් විසි හතරයි.)
	2010	සිංගප්පූරුව	Temasek SIN සමඟ සාකච්ඡා සඳහා (නියෝජිත පිරිසට එක් වෙමින්) ආයෝජන අවස්ථා සොයා බැලීම.	65,543/- (හැට පන් දහස් පන්සිය හතළිස් තුනයි.)
	2010	සිංගප්පූරුව/ ඉන්දියාව	කාර්ය මණ්ඩලය මුණ ගැසීම. ආදායම වැඩිකර ගැනීම හා ව්‍යාපාරික සැලසුම්මූලපිරීම් ගැන උපදෙස් ලබාදීම.	182,353/- (එක් ලක්ෂ අසූ දෙදහස් තුන්සිය පනස් තුනයි.)
	2010	එක්සත් රාජධානිය	වාර්ෂික ලෝක සංචරණ වෙළඳ සල්පිලට සහභාගීවීම සඳහා. ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවාන්තයින් මුණ ගැසීම.	602,545/- (හය ලක්ෂ දෙදහස් පන්සිය හතළිස් පහයි.)
	2010	ඉන්දියාව	ඉන්දියාවේ රෝල්ස් රොයිස් ආරාධනාව පිළිගැනීම. ජාලගත සබඳතා ශක්තිමත් කරගැනීම.	100,530/- (එක් ලක්ෂ පන්සිය තිහයි.)
	2011	මැලේෂියාව	ස්වාලාලාම්පූර්හි විකුණුම් කණ්ඩායම මුණගැසීම සඳහා. ආදායම වැඩිකර ගැනීම හා ව්‍යාපාරික සැලසුම්මූලපිරීම් ගැන උපදෙස් ලබාදීම	125,779/- (එක් ලක්ෂ විසිපන් දහස් හත්සියයි, හත්සිය හැත්තෑ නමයයි.)
	2011	චීනය	කැන්ටන් වෙත ආරම්භක ගමනට සහභාගීවීම සඳහා. චීන වෙළඳපලට අවතීර්ණවීම.	100,224/- (එක් ලක්ෂ දෙසිය විසි හතරයි.)
	2011	ඉන්දියාව	චෙන්නායිහි විකුණුම් කණ්ඩායම මුණ ගැසීම සඳහා. ආදායම වැඩිකර ගැනීම හා ව්‍යාපාරික සැලසුම්මූලපිරීම් ගැන උපදෙස් ලබාදීම	59,820/- (පනස් නව දහස් අටසිය විස්සයි.)
	2011	ජර්මනිය	බර්ලිනයේ වාර්ෂික වෙළඳ සල්පිලට සහභාගීවීම සඳහා ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවාන්තයින් මුණ ගැසීම.	315,251/- (තුන් ලක්ෂ පහළොස් දහස් දෙසිය පනස් එකයි.)
	2011	කැනඩාව/ඩුබායි	කැනඩා, ඩුබායි කාර්ය මණ්ඩලය මුණගැසීම සඳහා විකුණුම් ජාලය ව්‍යාප්ත කිරීමට හා විකුණුම් නියෝජිත සම්මාන උළෙල	132,600/- (එක් ලක්ෂ තිස් දෙදහස් හයසියයි.)
	2011	මැලේෂියාව	ස්වාලාලාම්පූර් කාර්ය මණ්ඩලය මුණ ගැසීම සඳහා අභිප්‍රේරණය හා ඵලදායිතාවය වර්ධනය කිරීම	25,835/- (විසි පන් දහස් අටසිය තිස් පහයි.)
	2011	මැලේෂියාව	ස්වාලාලාම්පූර් කාර්ය මණ්ඩලය මුණ ගැසීම සඳහා අභිප්‍රේරණය හා ඵලදායිතාවය වර්ධනය කිරීම	117,658/- (එක් ලක්ෂ දහස් දහස් හයසිය පනස් අටයි.)
	2011	ප්‍රංශය	පැරිසියේ ගුවන්යානා සංදර්ශනයට සහභාගීවීම සඳහා කර්මාන්තයේ හවුල්කරුවන් සමඟ ව්‍යාපාරික සබඳතා වර්ධනයවීම.	132,312/- (එක් ලක්ෂ තිස් දෙදහස් තුන්සිය දොළහයි.)
	2011	සිංගප්පූරුව	හවුල්කරුවන් සමඟ ව්‍යාපාරික සාකච්ඡා සඳහා කර්මාන්තයේ හවුල්කරුවන් සමඟ ව්‍යාපාරික සබඳතා වර්ධනයවීමග	176,250/- (එක් ලක්ෂ හැත්තෑ හය දහස් දෙසිය පනහයි.)
	2011	නායිලැන්තය	විකුණුම් කණ්ඩායම් සමුළුවට සහභාගීවීම සඳහා අභිප්‍රේරණය හා ඵලදායිතාවය වර්ධනය කිරීම	289,333/- (දෙදක්ෂ අසූ නම දහස් තුන්සිය තිස් තුනයි.)
	2011	ඩුබායි	මැදපෙරදිග කලාපීය සමුළුවට සහභාගීවීම. අභිප්‍රේරණය හා ඵලදායිතාවය වර්ධනය කිරීම	361,539/- (තුන් ලක්ෂ හැට එක් දහස් පන්සිය තිස් නමයයි.)
	2011	හොංකොං	විකුණුම් කණ්ඩායම් සමුළුවට (අග්නිදිග ආසියාව) සහභාගීවීම. අභිප්‍රේරණය හා ඵලදායිතාවය වර්ධනය කිරීම	118,120/- (එක් ලක්ෂ දහ අට දහස් එකසිය විස්සයි.)
	2011	සිංගප්පූරුව	අග්නිදිග ආසියා කලාපීය සමුළුවට සහභාගීවීම අභිප්‍රේරණය හා ඵලදායිතාවය වර්ධනය කිරීම	158,211/- (එක් ලක්ෂ පනස් අට දහස් දෙසිය එකොළහයි.)
	2011	එක්සත් රාජධානිය/ රුසියාව	ලන්ඩනයේ යුරෝපා කලාපීය සමුළුවට සහභාගීවීම සඳහා සහ මොස්කව් ගුවන් ගමන් දියත් කිරීමේ සැලසුම් සාකච්ඡා කිරීම සඳහා විකුණුම් කණ්ඩායම් වලට ආදායම වැඩි කර ගැනීමට උපදෙස් ලබාදීම	366,577/- (තුන් ලක්ෂ හැට හය දහස් පන්සිය හැත්තෑ හතයි.)
	2011	රුසියාව	මොස්කව් ගුවන් ගමන් දියත් කිරීම සඳහා මොස්කව් වෙළඳපලට අවතීර්ණවීම.	165,375/- (එක් ලක්ෂ හැට පන් දහස් තුන්සිය හැත්තෑ පහයි.)
	2011	ජර්මනිය	ගුවන් ගමන් දියත් කිරීමට පෙර පැවති මාධ්‍ය සාකච්ඡාවට සහභාගී වීම සඳහා සූරිච් වෙළඳපලට අවතීර්ණවීම.	132,300/- (එක් ලක්ෂ තිස් දෙදහස් තුන්සියයි.)
	2011	එක්සත් රාජධානිය	වාර්ෂික ලෝක සංචරණ වෙළඳ සල්පිලට සහභාගීවීම සඳහා ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවාන්තයින් මුණ ගැසීම.	402,351/- (හාර ලක්ෂ දෙදහස් තුන්සිය පනස් එකයි.)
	2011	සිංගප්පූරුව	කලාපීය සමුළුවට සහභාගීවීම සඳහා අභිප්‍රේරණය හා ඵලදායිතාවය වර්ධනය කිරීම	162,598/- (එක් ලක්ෂ හැට දෙදහස් පන්සිය අසූ අටයි.)
	2011	ස්විට්ස්ර්ලන්තය	සූරිච් ගුවන් ගමන් දියත් කිරීම සඳහා සූරිච් වෙළඳපලට අවතීර්ණවීම.	260,629/- (දෙදක්ෂ හැට දහස් හයසිය විසි තමයයි.)
	2012	කටාර්	ගරු අමාත්‍යතුමා සමඟ කටාර් එයාර්වේස් නිලධාරීන් හමුවීම සඳහා ශ්‍රී ලංකා රජයේ ආයෝජන සාකච්ඡාව	68,280/- (හැට අට දහස් දෙසිය අසුවයි.)
	2012	සිංගප්පූරුව	සිංගප්පූරු කාර්ය මණ්ඩලය මුණගැසීම සඳහා. විකුණුම් කණ්ඩායම් වලට ආදයම වැඩිකර ගැනීමට උපදෙස් ලබාදීම.	152,037/- (එක් ලක්ෂ පනස් දෙදහස් තිස් හතයි.)
	2012	ජර්මනිය	බර්ලිනයේ වාර්ෂික වෙළඳ සල්පිලට සහභාගීවීම සඳහා ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවාන්තයින් මුණ ගැසීම.	330,439/- (තුන් ලක්ෂ තිස් දහස් හාරසිය තිස් නමයයි.)
	2012	ඩුබායි	කලාපීය සමුළුව සහ ආරාධිතයානු සංචරණ වෙළඳපලට සහභාගීවීම සඳහා ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවාන්තයින් මුණ ගැසීම.	157,080/- (එක් ලක්ෂ පනස් හත් දහස් අසූවයි.)
	2012	සිංගප්පූරුව	සිංගප්පූරු කාර්ය මණ්ඩලය මුණගැසීම සඳහා විකුණුම් කණ්ඩායම්වලට උපදෙස් ලබාදීම හා ප්‍රධාන විකුණුම් නියෝජිත මුණගැසීම.	78,540/- (හැත්තෑ අට දහස් පන්සිය හතළිහයි.)
	2012	ජර්මනිය	Lufthansa Technik ආරාධනය පිළිගැනීම සඳහා Lufthansa පහසුකම් පිළිබඳ අවබෝධය ලැබීම.	156,600/- (එක් ලක්ෂ පනස් හය දහස් හයසියයි.)
	2012	ඩුබායි	කලාපීය සමුළුවට සහභාගීවීම සඳහා විකුණුම් කණ්ඩායම් වලට ආදයම වැඩිකර ගැනීමට උපදෙස් ලබාදීම.	247,284/- (දෙලක්ෂ හතළිස් හත් දහස් දෙසිය අසූ හතරයි.)
	2012	චීනය	චීන කලාපීය සමුළුවට සහභාගීවීම සඳහා විකුණුම් කාර්ය මණ්ඩලය හමුවීම.	117,450/- (එක් ලක්ෂ දහත් දහස් හාරසිය පනහයි.)
	2012	ජපානය	ජපානයේ ශ්‍රී ලංකා තානාපතිතුමාගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා ප්‍රවර්ධණ හා රාත්‍රී භෝජන සංග්‍රහයට සහභාගීවීම සඳහා වෙළඳපල සබඳතා ශක්තිමත් කරගැනීම.	278,250/- (දෙලක්ෂ හැත්තෑ අට දහස් දෙසිය පනහයි.)
	2012	ඩුබායි	මැද පෙරදිග විකුණුම් කණ්ඩායම සමඟ සාකච්ඡාවන්ට සහභාගීවීම සඳහා විකුණුම් ප්‍රවර්ධනය කිරීම.	77,970/- (හැත්තෑ හත් දහස් නමයිය හැත්තෑවයි.)
	2012	එක්සත් රාජධානිය	වාර්ෂික ලෝක සංචරණ වෙළඳ සල්පිලට සහභාගීවීම සඳහා. ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවාන්තයින් මුණ ගැසීම.	233,910/- (දෙලක්ෂ තිස් තුන් දහස් නමයිය දහයයි.)
	2012	ඩුබායි	ප්‍රධාන විකුණුම් නියෝජිත හෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම සඳහා හෝරා ගැනීමේ කටයුතු අවසාන කිරීම	77,970/- (හැත්තෑ හත් දහස් නමයිය හැත්තෑවයි.)
සුනිල් විජේසිංහ මහතා - අධ්‍යක්ෂ	2009	ජපානය	ජපානයට ගුවන්සේවා ඇපයීමේ 25 වසර සැමරුමට සහභාගී වීම සඳහා හවුල් ව්‍යාපාර සබඳතාවන් ශක්තිමත්වීම.	174,550/- (එක් ලක්ෂ හැත්තෑ හතර දහස් පන්සිය පනහයි.)
තිහාල් ජයමාන්ත මහතා - අධ්‍යක්ෂ	2009	ජපානය	ජපානයට ගුවන්සේවා ඇපයීමේ 25 වසර සැමරුමට සහභාගී වීම සඳහා හවුල් ව්‍යාපාර සබඳතාවන් ශක්තිමත්වීම.	314,191/- (තුන් ලක්ෂ දහතර දහස් එකසිය අනූ එකයි.)
	2011	චීනය	කැන්ටන් වෙත ආරම්භක ගුවන් ගමනට සහභාගීවීම සඳහා චීනයේ වෙළඳපලට අවතීර්ණවීම.	100,224/- (එක් ලක්ෂ දෙසිය විසි හතරයි.)
සනත් උක්වත්ත මහතා - අධ්‍යක්ෂ	2009	මාලදිවයින	හවුල්කරුවන් සමඟ ව්‍යාපාරික සාකච්ඡාවන්ට සහභාගීවීම සඳහා සාකච්ඡා වලින් අනතුරුව වෙළඳපල අවස්ථාවන් පුළුල් කරගැනීම.	නැත.
	2009	එක්සත් රාජධානිය	වාර්ෂික ලෝක සංචරණ වෙළඳ සල්පිලට සහභාගීවීම සඳහා ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවාන්තයින් මුණ ගැසීම.	නැත.
	2011	ජර්මනිය/එක්සත් රාජධානිය/මාලදිවයින	සූරිච් ගුවන් ගමනට සහභාගීවීම සඳහා සූරිච් වෙළඳපලට අවතීර්ණවීම.	නැත.
	2012	එක්සත් රාජධානිය/ ජර්මනිය	වාර්ෂික ලෝක සංචරණ වෙළඳ සල්පිලට සහ කලාපීය සමුළුවට සහභාගීවීම සඳහා ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවාන්තයින් මුණ ගැසීම.	නැත.
	2012	ජර්මනිය	බර්ලිනයේ තානාපතිගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා ප්‍රවර්ධන හා රාත්‍රී භෝජන සංග්‍රහයට සහභාගීවීම සඳහා. ගුවන් සේවා ක්ෂේත්‍රයේ දවාන්තයින් මුණ ගැසීම.	66,649/- (හැට හය දහස් හයසිය හතළිස් නමයයි.)
	2012	ජපානය	ජපානයේ ශ්‍රී ලංකා තානාපතිතුමාගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා ප්‍රවර්ධණ හා රාත්‍රී භෝජන සංග්‍රහයට සහභාගීවීම සඳහා වෙළඳපල සබඳතා ශක්තිමත් කිරීම.	නැත.
කපිල චන්ද්‍රසේන මහතා - අධ්‍යක්ෂ	2010	අබුඩාබි	අබුඩාබි කාර්ය මණ්ඩලය මුණ ගැසීම සඳහා. විකුණුම් කණ්ඩායම් වලට විකුණුම් ඉලක්කයන් සපුරාගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.	135,840/- (එක් ලක්ෂ තිස් පන් දහස් අටසිය හතළිහයි.)
	2011	සිංගප්පූරුව	හවුල්කරුවන් සමඟ ව්‍යාපාරික සාකච්ඡාවලට සහභාගී වීම සඳහා සාකච්ඡාවලින් අනතුරුව වෙළඳපල අවස්ථාවන් පුළුල් කරගැනීම.	240,353/- (දෙදක්ෂ හතළිස් දහස් තුන්සිය පනස් තුනයි.)
ආචාර්ය ක්‍රිස් නෝනිස් මහතා - අධ්‍යක්ෂ	2010	සිංගප්පූරුව	Temasek Sin සමඟ සාකච්ඡාවට සහභාගීවීම සඳහා (නියෝජිත පිරිසට එක් වෙමින්) ආයෝජන අවස්ථාවන් සොයාබැලීම.	18,443/- (දහ අට දහස් හාරසිය හතළිස් තුනයි.)
	2011	චීනය	කැන්ටන් වෙත ආරම්භක ගුවන් ගමනට සහභාගී වීම සඳහා චීනයේ වෙළඳපලට අවතීර්ණවීම.	100,224/- (එක් ලක්ෂ දෙසිය විසි හතරයි.)

	2011	ඉන්දියාව	කොවින් මෙහෙයුම් නැවත ආරම්භය හා ගුවන් ගමන් දියත් කිරීම සඳහා සහභාගීවීම. කොවින් වෙලඳපලට අවතීර්ණ වීම	100,224/- (එක් ලක්ෂ දෙසිය විසි හතරයි.)
ගෞරව් රාජපක්ෂ මහතා - අධ්‍යක්ෂ	2011	චීනය	කැන්ටන් වෙත ආරම්භක ගුවන් ගමනට සහභාගී වීම සඳහා චීනයේ වෙළඳපලට අවතීර්ණවීම.	100,224/- (එක් ලක්ෂ දෙසිය විසි හතරයි.)

[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This Answer is also placed in the Library.]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23 (2) යටතේ ගරු ජෝන් අමරතුංග මහතාගේ ප්‍රකාශය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයෙන් පසුව ගන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයක් නැහැ. එතුමාට බාධාවක් නොවන විධියට ගන්න.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

විදුලි ගාස්තු ඉහළ නැංවීම
மின் கட்டண அதிகரிப்பு
INCREASE OF ELECTRICITY TARIFF

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ මෙම ප්‍රකාශය සභාව ඉදිරියේ කිරීමට අවසර දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අද මේ රටේ අස්සක් මුල්ලක් නෑර කවුරුත් කථා කරන ප්‍රශ්නය විදුලි බිල ඉහළ නැංවීම පිළිබඳවයි. දිනෙන් දින ඉහළ නඟින ජනතාවගේ ජීවන වියදම මතට ඇතැම් විට සියයට 70ක් තරම් ඉහළ අගයක් ගන්නා පරිදි, විදුලි ගාස්තු ද ඉහළ නැංවීමට රජය විසින් තීරණය කර ඇත. මෙමඟින් වඩාත්ම බරපතළ බලපෑමට ලක්වන්නෝ මෙම ගාස්තු පරිමාණයේ පහළ කෙළවරේ සිටින පාරිභෝගිකයෝ වෙති.

දුගී දුප්පත් ජනතාවට අඳුරු ජීවිතයක් උරුම කර දෙමින් ධනපතීන් හට සුවදායක, වායු සම්කරණ සහිත හා හොඳින් ආලෝකකරණය වූ ජීවිත ලබා දීම රජයේ ප්‍රතිපත්තිය ද යන ප්‍රශ්නය මා අහන්න කැමැතියි.

සැබැවින්ම කුඩා නිවෙස්වල ජීවත් වන්නාවූ දුප්පත්ම පාරිභෝගිකයාගේ විදුලි බිල සියයට 75ක් තරම් ඉහළ නැඟ ඇත. මධ්‍ය ආදායම් ලබන පිරිස්වල විදුලිබිල සියයට 50 කින් පමණ ඉහළ නැඟ ඇති අතර, වායු සමනය කළ සුවදායක නිවෙස්වල ජීවත් වන ධනපති පන්තියේ විදුලි බිල ඉහළ නැඟ ඇත්තේ සියයට 25ක තරම් සොච්චම් ප්‍රමාණයකිනි.

කොපමණ විදුලිය පරිභරණය කළ ද රුපියල් 2000ක උපරිම මුදලක් පමණක් ගෙවිය යුතු වන නිල නිවෙස්වල ජීවත් වන ඇමතිවරු ඔවුන් සඳහා තවදුරටත් සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින බව ද වාර්තා විය.

වර්තමානයේ විදුලිය මත රඳා නොපවත්නා කිසිදු ආර්ථික කටයුත්තක් නොමැති තරම් වන බැවින් මෙම විදුලි බිල ඉහළ නැංවීම ආර්ථිකයේ සියලු ක්‍රියාකාරකම්වලට අයහපත් ලෙස බලපානු ඇත. උදාහරණයක් වශයෙන් කිව්වොත්, අපගේ වාහනවලට ඉන්ධන යෙදවීම ද සිදු කරනුයේ යන්ත්‍ර මඟිනි. බේකරිකරුවාගේ පෝරණුව ද විදුලි බලයෙන් ක්‍රියාත්මක වන්නකි. අතීතයේ මෙන් තවදුරටත් දන්ත වෛද්‍යවරයා තම කටයුතු සඳහා පාදිකයක් - foot pedal - භාවිත නොකරයි. එබැවින් මේ සියලු දෙනා හට පවත්නා ආර්ථිකය තුළ රැඳී සිටීමට නම් තම භාණ්ඩ හා සේවා ගාස්තු ද ඉහළ නැංවීමට සිදු වනු ඇත. මෙමඟින් දැනටමත් දිනෙන් දින ඉහළ නඟිමින් පවත්නා වූ ජීවන වියදම තවදුරටත් ඉහළට තල්ලු කරනු ඇත.

මාගේ තක්සේරුවට අනුව නම්, මෙයින් ඉතා ඉක්මනින් දුප්පත් ජනතාවට විදුලි සහන වෙනුවට විදුලි පුටුව උරුම වනු ඇති බවයි. අනෙක් අතින්, මේවා මුළුමනින්ම ලංකා විදුලිබල මණ්ඩලයේ අවකළමනාකරණයේ, දූෂණයේ හා ඔවුන්ගේ පව් වසා ගැනීම සඳහා දරන ලද ප්‍රයත්නයක ප්‍රතිඵලයක් බවයි පෙනෙන්නේ.

තවද, පෞද්ගලික විදුලි උත්පාදන සමාගම්වලට උපකාර වනු පිණිස දැරෙන කුට ප්‍රයත්නයක ප්‍රතිඵල වශයෙන් හිතාමතාම ජලාශ හිස් කරමින් පවත්නා බව ද වාර්තා වී ඇත.

මෙවන් තත්ත්වයක් තුළ වාණිජමය ආයෝකයෝ ද සිය ආයතන වසා දැමීමට සිදු වනු ඇති බවට අනතුරු අඟවා ඇති අතර, එමඟින් නිෂ්පාදනයේ පහළ බැසීමක් පමණක් නොව, විශාල සේවා වියුක්තියක් ද ඇති වනු ඇත.

ගරු කථානායකතුමනි, එබැවින් අදාළ ඇමතිතුමිය විසින් විදුලි බිල ඉහළ නැංවීම ක්‍රියාත්මක කරන ලද පදනම හා ඒ සඳහා යොදා ගත් සූත්‍රය කවරේද යන්න හා ඇතැම් අවස්ථාවල එකී ඉහළ නැඟීම සියයට 30ක් පමණක් වන අතර, තවත් අවස්ථාවල එය සියයට 70ක් පමණ ඉහළ නඟින්නේ කුමක් නිසාද යන්න පිළිබඳව මෙම සභාව දැනුවත් කරන්නේද?

තවද, මෙම තත්ත්වය ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල හා සමඟ පවත්නේ කවර සම්බන්ධයක් ද යන්න ද එතුමිය විසින් මෙම සභාව දැනුවත් කරන්නේද?

ඇමතිතුමිය විසින් ප්‍රකාශ නිකුත් කරනු වෙනුවට, එතුමිය වෙනුවෙන් ප්‍රකාශ නිකුත් කිරීම සඳහා ජනමාධ්‍ය ඇමතිතුමා කටයුතු කරන්නේ කුමක් නිසාද?

විදුලි ගාස්තු ඉහළ නැංවීමෙන් පීඩාවට පත් වූ ජනතාව වෙත කවර සහනයක් ලබා දීමට රජය අදහස් කරන්නේ ද?

[ගරු ජෝන් අමරතුංග මහතා]

ගරු කථානායකතුමනි, එබැවින් මෙම තත්ත්වය දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට අපට අවස්ථාවක් ලබා දෙමින් පූර්ණ එක් දවසක විවාදයක් ලබා දිය යුතුය යි මම යෝජනා කරමි. ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට, ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි අමාත්‍යතුමිය.

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வலு, சக்தி அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල ක්ෂේත්‍රයේ පවත්නා තත්ත්වය ගැන අද දින පාර්ලිමේන්තුව හමුවේ යම් පැහැදිලි කිරීමක් කිරීමට අවස්ථාව සලසා දීම ගැන ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාට පළමුව ස්තුතිය පුද කරමි.

විදුලි බිල වැඩි කිරීමේ යෝජනාව මා අමාත්‍ය ධුරය භාර ගැනීමට පෙර සිටම වරින් වර විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවකි. පසු ගිය වර්ෂවල විදුලිබල මණ්ඩලය දිගින් දිගටම පාඩු ලබා තිබුණි. 2011 වර්ෂයේ විදුලිබල මණ්ඩලයේ ආදායම රුපියල් බිලියන 137ක් නමුත් වියදම රුපියල් බිලියන 156ක් වූ නිසා රුපියල් බිලියන 19ක පාඩුවක් ලැබීය. මීට ප්‍රධාන හේතුව වූයේ ඉන්ධන මිල හා විදුලිය මිලදී ගැනීම සඳහා පෞද්ගලික බලාගාරවලට ගෙවනු ලබන මුදල් පාලනය කළ නොහැකි තත්ත්වයක් ලංකා විදුලිබල මණ්ඩලයට ඇති වීමයි. 2012 වර්ෂයේ රුපියල් බිලියන 61ක පාඩුවක් විදුලිබල මණ්ඩලය ලබා ඇත. එම පාඩුව ලැබීමට ප්‍රධාන හේතුව වූයේ වියදම රුපියල් බිලියන 231ක් දක්වා ඉහළ යෑමත්, ආදායම රුපියල් බිලියන 170කට සීමා වීමත්ය. මෙම වර්ෂයේ රුපියල් බිලියන 231ක වියදම සලකා බලන කල පෙනී ගියේ, විදුලිබල මණ්ඩලය විදුලිය උත්පාදනය වෙනුවෙන් ඉන්ධන සඳහා රුපියල් බිලියන 42ක්ද, පෞද්ගලික බලාගාරවලින් විදුලිය මිලදී ගැනීම සඳහා ඉන්ධන වෙනුවෙන් රුපියල් බිලියන 90ක්ද, ධාරිතා ගාස්තුව වශයෙන් රුපියල් බිලියන 19ක්ද යනාදි වශයෙන් රුපියල් බිලියන 151ක් විදුලිය ජනනය කිරීම සඳහා ඉන්ධන වෙනුවෙන් පමණක් වියදම් කරන බවකි. 2012 පෙබරවාරි 12වැනි දින සිට විදුලි ජනනය සඳහා අවශ්‍ය කරන දැව් තෙල් ලීටරයක් රුපියල් 45 සිට 65 දක්වා වැඩි කිරීමත්, අඩු සල්ෆර්වලින් යුත් දැව් තෙල් ලීටරයක් රුපියල් 50 සිට 75 දක්වා වැඩි කිරීමත් නිසා 2012 වර්ෂයේ දැරීමට සිද්ධ වූ වියදම රුපියල් බිලියන 43කි. මෙයට ක්ෂණික ප්‍රතික්‍රියාව වී ඇත්තේ ඉන්ධන ගැලපුම් ගාස්තුවක් විදුලි බිලට හඳුන්වා දීමයි. එය තාවකාලික පියවරක් වූ අතර ඉන්ධන ගැලපුම් ගාස්තුව තුළින් විදුලිබල මණ්ඩලයට එකතු වූයේ රුපියල් බිලියන 35කි. එයින් සිදු වූයේද ඇති වෙමින් පැවැති මූල්‍ය අර්බුදය තවතවත් උග්‍ර වීමකි. 2012 වර්ෂයේ සිටම මෙම තත්ත්වය මෙසේ පැවැති අතර හිටපු අමාත්‍යවරයා විදුලි බිල වැඩි කිරීමේ යෝජනාව භාණ්ඩාගාරය වෙත ද, අභිගරු ජනාධිපතිතුමා සමඟ පැවැත්වූ සාකච්ඡාවකදී ද මතු කර තිබූ අතර මා අමාත්‍ය ධුරය භාර ගන්නා තුරු නිගමනයකට එළඹී තිබුණේ නැත.

ලංකා විදුලිබල මණ්ඩලයට සපයන ලද දැව් තෙල් සහ සල්ෆර් සඳහා පිළිවෙළින් රුපියල් 65 සිට 90 දක්වාත්, රුපියල් 75 සිට 100 දක්වාත් වැඩි කිරීම ක්ෂණිකව දැරීමට සිදු වූ අතර වැය බරක් වීම නිසා මෙම ඉන්ධන මිල වැඩි වීමේ ක්‍රියාව අත් හිටුවන ලෙසටත්, එම ඉන්ධන මිල වැඩි කිරීමේ යෝජනාව විදුලි බිල සංශෝධන යෝජනාවට සමගාමීව ක්‍රියාත්මක කිරීමෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ අර්බුදය වළක්වා ගැනීමට පියවර ගත යුතු බවටත් හිටපු අමාත්‍යතුමා විසින් ජනාධිපතිතුමාට කරුණු ඉදිරිපත් කළ අතර එහි ප්‍රතිඵලය වූයේ ඉන්ධන මිල වැඩි කිරීමේ යෝජනාව 2013.01.01 සිට 2013.04.01 දක්වා කල් දැමීමයි. ඒ, මම අමාත්‍යවරිය වශයෙන් වැඩ භාර ගැනීමට ප්‍රථමයි. මා අමාත්‍යවරිය වශයෙන් දැන් මුහුණ දී සිටින්නේ මෙසේ කල් දමන ලද 2013.04.01 දින සිට ක්‍රියාත්මක වන ඉන්ධන මිල වැඩි වීමේ ක්‍රියාවෙන් ජනිත වන මූල්‍ය අර්බුදයෙන් ලංකා විදුලිබල මණ්ඩලය ගොඩ ගැනීමේ ක්‍රියාදාමයටයි.

මෙම වැඩි කිරීම නිසා පමණක් ලංකා විදුලිබල මණ්ඩලයට අමතරව දැරීමට සිදු වන ඉන්ධන ගාස්තුව රුපියල් බිලියන 28කි. මෙම රුපියල් බිලියන 28ත් එකතු කළ විට 2013 වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයේ සමස්ත වියදම රුපියල් බිලියන 256 දක්වා ඉහළ ගොස් ඇති අතර, පැවැති මිල ගණන් යටතේ ආදායම වශයෙන් ලැබුවේ රුපියල් බිලියන 178කි. ලංකා විදුලිබල මණ්ඩලය යටතේ පවතින අනුබද්ධිත සමාගම්වල ක්‍රියාකාරිත්වයෙන් ජනිත වන ලාභයට ලංකා විදුලිබල මණ්ඩලය විසින් සමාගම් 4ක ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් ආයෝජනය කර ඇති මුදල් වෙනුවෙන් ලැබෙන ලාභාංශ හා අනෙකුත් පරිපාලනමය වශයෙන් ලැබෙන රුපියල් බිලියන 5ක් එකතු කළ විට ලංකා විදුලිබල මණ්ඩලයේ ආදායම රුපියල් බිලියන 183 දක්වා ඉහළ ගොස් ඇති අතර, එම මුදලින් 2012 වර්ෂයේ ලංකා බනිජ තෙල් සංස්ථාවට රුපියල් බිලියන 146ක් සහ පෞද්ගලික විදුලිය මිලදී ගැනීම වෙනුවෙන් පෞද්ගලික බලාගාර හිමියන්ට ධාරිතා ගාස්තු වශයෙන් රුපියල් බිලියන 19ක් ගෙවූ පසු ලංකා විදුලිබල මණ්ඩලයේ අනෙකුත් කටයුතු සඳහා ශේෂ වන්නේ රුපියල් බිලියන 18ක් පමණි. මෙම රුපියල් බිලියන 18න් ලංකා විදුලිබල මණ්ඩලයේ 17,000ක් පමණ වන ස්ථිර කාර්ය මණ්ඩලයටත්, 4,000ක් පමණ වන තාවකාලික කාර්ය මණ්ඩලයටත් වැටුප් වශයෙන් රුපියල් බිලියන 17ක් ගෙවූ විට ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය අනෙකුත් සේවාවන් ලබා ගැනීමට, එනම් විදුලිය ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, අවශ්‍ය අමු ද්‍රව්‍ය මිලදී ගැනීම, නඩත්තුව හා විදුලි රැහැන් නවීකරණය කිරීමට ශේෂ වන්නේ රුපියල් බිලියන 1ක් පමණි.

ඒ නිසා අකැමැත්තෙන් වුවද බැලූ බැල්මට පෙනෙන රුපියල් බිලියන 75ක මූල්‍ය පාඩුවෙන් රුපියල් බිලියන 45ක් විදුලි ගාස්තුව වැඩි කර ගැනීමෙන් අය කර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයට අවසර දීමට මා හට සිදු විය.

මෙම රුපියල් බිලියන 45ක අමතර ආදායම ලබා ගැනීමේදී ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන්, අනෙකුත් අවශේෂ නිලධාරීන්, අමාත්‍යාංශ නිලධාරීන් හා මහජන උපයෝගීතා කමිටුවේ නිලධාරීන් එකතුව ගාස්තු අය කිරීමේ ක්‍රමය ගැන විමර්ශනය කළ අතර අඩු ආදායම් ලබන ජන කොටස්වලට අඩු බරක් පැටවෙන පරිදි හා වැඩි ආදායම් ලැබෙන ජන කොටස් සඳහා වැඩි බරක් ඇති වන පරිදි සකස් කළ හැකි ක්‍රමවේදයක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් අදාළ පාර්ශ්ව සමඟ එකතු වී සකස් කර මහජන උපයෝගීතා කොමිසමේ අනුමැතියට ඉදිරිපත් කළ අතර, ඒ සඳහා මහජන උපයෝගීතා කොමිසමේ අනුමැතිය ලැබී තිබේ. මෙහිදී අමාත්‍යවරිය වශයෙන් මගේ අවධානයට යොමු වූ කරුණු මෙසේය.

(1) 2009 අංක 20 දරන පනතේ 3(7) වන වගන්තිය අනුව විදුලි ගාස්තුව වශයෙන් පාරිභෝගිකයන්ගෙන් අය කිරීමට අවසර ඇත්තේ විදුලිය ජනනය, සම්ප්‍රේෂණය හා බෙදා හැරීමට යන සාධාරණ පිරිවැය පමණි. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහගෙන ඉන්න, පොඩ්ඩක් අහගෙන ඉන්න.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මෙම පනතේ විධිවිධාන සලකා බැලූ විට විදුලි බල ඒකකයක පිරිවැය වන රුපියල් 23.30ක - [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් කියන එකක්වත් ඇහෙන්නේ නැහැ. කරුණාකරලා වාඩි වෙන්න. බැරි නම් එළියට යන්න. පොඩ්ඩක් අහගෙන ඉන්න, කියන්නේ මොකක්ද කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අසත්‍ය කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමන්ගේ මතය විතරක් මතු කරන්න උත්සාහ කරන්නේ නැතිව කියන දේ අහගෙන ඉන්න. අසත්‍ය හරි සත්‍ය හරි කියන්න ඉඩ හරින්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පට්ටපල් අසත්‍යය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ දන්නේ කොහොමද ඇමතිතුමිය කියන දේ? කියන්න ඉඩ හරින්න. [බාධා කිරීම්] ඉස්සෙල්ලා කියන්න ඉඩ දෙන්න. විවාදයක් ඉල්ලලා තිබෙනවා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. [බාධා කිරීම්] මේ වෙලාවේ කථා කරන්න දෙන්න බැහැ. කරුණාකරලා ඇමතිතුමිය කථා කරන්න.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මෙම පනතේ විධිවිධාන සලකා බැලූ විට විදුලිබල ඒකකයක පිරිවැය වන්නේ රුපියල් 23.30කි. එය කාලාන්තරයක් තිස්සේ ක්‍රියාවට නංවන ලද ගාස්තු ක්‍රමය ඉහත ඒකාකාරී පිරිවැය අය කිරීමේ ක්‍රමයට එකවර පරිවර්තනය නොකොට වර්ෂ 05ක් තුළ ක්‍රමක්‍රමයෙන් පරිවර්තනය කළ යුතු යැයි හිටපු ගරු අමාත්‍යතුමා විසින් සකස් කර රජයට ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ලියවිල්ලේ සඳහන් වී ඇති නිසා මහජන උපයෝගීතා කොමිසමට එම ගාස්තු ක්‍රමය අය කළ යුත්තේ වර්ෂ 05කින් ඒකාකාරී පිරිවැයක් සෑම පාරිභෝගිකයෙකුගෙන්ම අය කිරීමේ වැඩ පිළිවෙළට අවතීර්ණ වීමේ රජය එළැඹුණු ප්‍රතිපත්ති තීරණය මතය.

(2) මෙම නීතිමය විධිවිධානත්, රජය අනුමත කළ ගාස්තු අය කිරීමේ ප්‍රතිපත්තියත් සමඟ එකට ගත් කළ අමාත්‍යාංශයට/ ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් 23.30ක ඒකක පිරිවැයට වඩා වැඩියෙන් විදුලි බිල ගෙවන අයවලුන්ට අසාධාරණ ලෙස තවත් මිල වැඩි කිරීමට ඉඩකඩ නැත. ඒ නිසා එම තත්ත්වය මෙම ගාස්තු ක්‍රමය සකස් කිරීමේදී සැලකිල්ලට ගත් කරුණක් විය.

මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලය ලවා කරවන ලද අධ්‍යයනයෙන් හෙළි වූ කරුණු අනුව විදුලිය පහසුකම් නොමැති ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව මසකට රුපියල් 323ක විදුලි බිලක් ගෙවීමේ පදනමින් විදුලිය ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින බවත්, රුපියල් 323ක් දක්වා විදුලි බිලක් ගෙවීමට ජනතාවට ශක්තිය ඇති බවත් තහවුරු විය. මෙම සංශෝධනයෙන් මසකට විදුලි ඒකක 30කට අඩු පාරිභෝගිකයන්ගෙන් අය කර ගනු ලබන්නේ රුපියල් 217ක් පමණකි. එනම් මසකට රුපියල් 142.50ක් වූ බිල් පත රුපියල් 217.50ක් දක්වා රුපියල් 75කින් වැඩි කිරීමකි. මෙය විදුලි පහසුකම් ලබන පහළ ආදායම් මට්ටමේ කෙනෙකු විසින් දිනකට රුපියල් 2.50 බැගින් පවුලක් විසින් අමතර වියදමක් ලෙස විදුලි බිලට එකතු කිරීමක් පමණි. මෙය අසාධාරණ,- [බාධා කිරීම්] එමෙන්ම, ඒකක 32 සිට 60 දක්වා විදුලි පරිභෝජනය කරන පවුල් දහතුන් ලක්ෂ දහඅට දහස් හත්සිය පනස් පහක් සිටිති. එම පවුලක මාසික බිල, පෙර පැවති මිල ගණන් යටතේ රුපියල් 371.85කි. එය රුපියල් 546ක් දක්වා රුපියල් 174.15කින් ඉහළ ගොස් ඇත. එනම් දිනකට රුපියල් 5.80කි. ඉහත කී ඒකක 0 - 30 දක්වා පවුලකට අමතරව රුපියල් 75ක් වැඩි කිරීමත්, ඒකක 31 - 60 දක්වා පවුලකට රුපියල් 174.15කින් මාසික බිල වැඩි කිරීමත් තුළින් රජය විසින් පෞද්ගලීකරණය නොකළ මහජන දේපළක් වශයෙන් පවත්වාගෙන යන ලංකා විදුලි බල මණ්ඩලයේ වියදම් පිරිමසා ගැනීමට දායක වීමට ඔබතුමන්ලා එකඟ නොවන්නේ මන්දැයි මා හට නොතේරේ. [බාධා කිරීම්] මෙහිදී ඔබතුමන්ලාගේ අවධානය යොමු විය යුතු වැදගත් කරුණක් වන්නේ ඒකක 0-30 දක්වා විදුලිය පරිභෝජනය කරන පවුල් - [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මොකක්ද point of Order එක?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඒකක 90දී පැවති මිල රුපියල් 728.40යි. නව මිල රුපියල් 1160යි. එතකොට මිල වැඩි වීම රුපියල් 432යි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක point of Order එකක් නොවෙයි. [බාධා කිරීම්] තමුන්නාන්සේලාට මම කිව්වා, ඇමතිතුමියගේ ප්‍රකාශය - [බාධා කිරීම්] විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉල්ලා සිටි, ඒ දිනයේ විවාදයේදී කථා කරන්න. බොරුවට කෑ ගහලා වැඩක් නැහැ නේ. තමුන්නාන්සේ කියන දෙය හරිද දන්නේත් නැහැ; මෙතුමිය කියන දෙය හරිද දන්නේත් නැහැ. [බාධා කිරීම්] බිල ආවාම අන්තිමට දැනේවි. එතකම් ඉන්න.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු කථානායකතුමනි, මෙහිදී ඔබතුමාගේ අවධානයට ලක් විය යුතු වැදගත් කරුණ නම් ඒකක 0- 30 දක්වා විදුලිය පරිභෝජනය කරන පවුල් එකොළොස් ලක්ෂ එක්දාස් එකසිය විසි පහෙන්, එක පවුලකින් රුපියල් 217.50ක විදුලි බිලක් නව ගාස්තු ක්‍රමය යටතේ අය කරමින් සිටින අතර, එක පවුලක්

[ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය]

වෙනුවෙන් රුපියල් 481.50ක සහනාධාරයක් රජය ලබා දෙන බව සැලකිය යුතු කරුණකි. එනම් ඒකක 32 සිට 60 දක්වා විදුලිය පරිභෝජනය කරන පවුල් දහතුන් ලක්ෂ දහඅටදාස් හත්සිය පනස් පහෙන්, එක පවුලකින් මාසික විදුලි බිල රුපියල් 546ක් අය කර ගන්නා අතර එම පවුල වෙනුවෙන් තවදුරටත් රුපියල් 852ක මාසික සහනාධාරයක් දෙන බව සැලකිය යුතුය. ඒකක 61 සිට 90 දක්වා ප්‍රමාණයක් විදුලිය පරිභෝජනය කරන පවුල් දොළොස් ලක්ෂ අනූනව දහස් තුන්සිය එකක් සඳහා මෙතෙක් පැවති මිල ගණන් යටතේ මසකට අය කළ විදුලි බිල රුපියල් 728.40කි. නව ගාස්තු ක්‍රමය යටතේ මෙම මුදල රුපියල් 1161ක් දක්වා වැඩි වනු ඇත. එනම් මාසයකට රුපියල් 432.60ක වැඩි වීමකි. දිනකට රුපියල් 14.42කි. ඒකක 120 දක්වා පරිභෝජනය කරන පාරිභෝගික සංඛ්‍යාව හය ලක්ෂ හැටනව දහස් විසි හයකි. පැවති මිල ගණන් යටතේ මේ අයගෙන් එක පවුලක් මසකට රුපියල් 1835ක් ගෙවන ලදී. නව මිල ක්‍රමය යටතේ එය රුපියල් 2835ක් වනු ඇත. ඒ අනුව මසකට වැඩි වී ඇති මුදල රුපියල් 999.60කි. එනම් දිනකට රුපියල් 32.33කි.

මේ අයගෙන් මසකට රුපියල් 835 ක විදුලිය බිලක් ඉදිරියේදී අය කළ ද, ඒ අය තමන් ගෙවීමට නීතියෙන් බැඳී ඇති පිරිවැයට අමතරව මසකට රුපියල් 37.40ක් ගෙවයි. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හිටපු ගරු ඇමතිතුමෙක් යනවා. [බාධා කිරීම්]

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
එමෙන්ම ඒකක 121 සිට 180 දක්වා විදුලිය පරිභෝජනය කරන පවුල් 5,29,923ක් සඳහා දැනට ගෙවනු ලබන රුපියල් 3,851. 40ක මාසික විදුලි බිල රුපියල් 5355ක් දක්වා වැඩි වී ඇති අතර, එම පවුලට වැඩි වූ මිල රුපියල් 1503.60කි. මේ අයද නියමිත පිරිවැයට වඩා වැඩියෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවීම් කරන අය වේ. [බාධා කිරීම්] එසේම ඒකක 180 සිට 210 දක්වා- [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෑ නොගහා අහගන්න. කෑ ගහන්න එපා. [බාධා කිරීම්]

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
-විදුලිය පරිභෝජනය කරන පවුල් 40,000ක් සිටින අතර ඔවුන් විසින් මසකට ගෙවනු ලබන රුපියල් 5,363.40ක බිල- [බාධා කිරීම්]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
අපට අහගන්නත් නැහැ මේ කෑ ගහන එකෙන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙතුමන්ලා කෑ ගහන ඒවා හැන්සාඩ් එකට යන්නේ නැහැ. ගරු ඇමතිතුමිය කියවන එක විතරයි හැන්සාඩ් එකට යන්නේ.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
-රුපියල් 7595 දක්වා වැඩි වීමෙන් මසකට රුපියල් 2007.68ක අමතර බරක් ලංකා විදුලි බල මණ්ඩලය වෙනුවෙන් දරයි. ඒ අයද තමා නීතියෙන් ගෙවීමට බැඳී ඇති පිරිවැයට වඩා වැඩියෙන් ගෙවන අය වේ. [බාධා කිරීම්] එමෙන්ම ඒකක 211සිට 240 දක්වා විදුලිය පරිභෝනය කරන පවුල් 60,000ක් සිටින අතර ඔවුන්ගේ මාසික බිල 9899.40 ක් වන අතර ඔවුන්ට නව ගාස්තු යටතේ රුපියල් 13, 755ක් ගෙවීමට සිදුවේ. ඒ අනුව ඒ අය මසකට අමතරව දරන මුදල රුපියල් 3,855.60කි. එනම් දිනකට රුපියල් 126.52කි. මෙම කාණ්ඩයද තමාට නීතියෙන් බැඳි ඇති පිරිවැයට වඩා වැඩි පිරිවැයක් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවන අය වේ.

මෙම කරුණ මා ඔබතුමන් හමුවේ තබන්නේ දේශපාලන මතිමතාන්තරවලින් බැහැරව හෘද සාක්ෂියට අනුව කල්පනා කිරීමට ඉඩදීම සඳහා ය.

විදුලිය බිල වැඩි වීමේ ප්‍රතිඵලය මත පදනම්ව කෑ කෝ ගැසීමෙන් රාජ්‍ය ආයතනයක් වශයෙන් පෞද්ගලීකරණයට ලක් නොකොට, මහජන දේපළක් වශයෙන් පවත්වා ගෙන යන විදුලිබල මණ්ඩලයේ අර්බුදයට විසඳුමක් ලැබෙන්නේ නැත. විදුලිබල මණ්ඩලයේ අක්‍රමිකතා හා පාඩු සම්බන්ධයෙන් කරන චෝදනා ගැන ද අමාත්‍යවරිය වශයෙන් මාගේ අවධානය යොමුව ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ අක්‍රමිකතා, අකාර්යක්ෂමතා, පාඩු නැතැයි මම නොකියමි. ඒවා අවම කිරීමට අමාත්‍යවරිය වශයෙන් මට සාධාරණ කාලයක් ලැබිය යුතුය. මාස දෙකකට ආසන්න කාලයක් තුළ ඒවාට පිළියම් යෙදිය නොහැක. වර්ෂ ගණනක් අමාත්‍ය ධුර දැරූ අමාත්‍යවරුන් යටතේ පැවති මෙම අඩුපාඩු මාස 02ක් වැනි සුළු කාලයකින් අවම කර ගත හැකි යයි ඔබතුමන්ලා සිතන්නේ නම් එය මට කරන අසාධාරණයකි.

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක පඩි නඩි වශයෙන් රුපියල් බිලියන 8 සිට 17 දක්වා වැඩි වී ඇත. 2003 වර්ෂයේ සිට වරින් වර සියයට 25, සියයට 33, සියයට 22 හා සියයට 28ක් වශයෙන් ගත වූ වර්ෂ 03ක් පාසා වැටුප් වැඩි වී ඇති අතර, ඒ නිසා පඩිනඩි වෙනුවෙන් වියදම රුපියල් බිලියන 17දක්වා වැඩි වී ඇති බව පෙනී යයි. [බාධා කිරීම්] මෙය දූෂණ, අක්‍රමිකතා සහ වංචාවක් ලෙස සැලකිය නොහැක. එලෙසම ලංකා විදුලි බල මණ්ඩලය වර්ෂයකට බිලියන 08කට ආසන්න මුදලක් භාණ්ඩ මිලදී ගනී. 2010 වර්ෂයේ රුපියල් බිලියන 03කට තිබූ එම මිලදී ගැනීමේ සීමාව අධික ලෙස වැඩි වී ඇති බව පෙනේ. මේ පිළිබඳව සෙවීමට මම පියවර ගන්නෙමි.

බැංකුවලට අධික පොලී ගෙවීමට සිදුවීම සත්‍යයකි. මෙය යහපත් මූල්‍ය කළමනාකරණයක් තුළින් අවම කළ යුතු කාර්යයකි. එහෙත් වියදමට සරිලන ආදායමක් නොලබන මණ්ඩලයක් දිගින් දිගටම යම් යම් ගෙවීම් කිරීමට මහජන බැංකුව හරහා ණය මුදල් ලබා ගැනීමට සිදු වී ඇත.එයද අවම කර ගත හැක්කේ සංශෝධිත විදුලි ගාස්තු ක්‍රමය තුළින් ආදායම් තත්ත්වය යහපත් කර ගතහොත් පමණි.

2013 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ නොරොච්චෝලේ ව්‍යාපෘතියේ II වන අදියර බලාගාරය ක්‍රියාත්මක කිරීමට නියමිත අතර එමඟින් පද්ධතියට එකතුවන ගිගාවොට් පැය 1883කි. 2013 දෙසැම්බර් 31 වන දින වන විට මෙම ව්‍යාපෘතියේ III වන අදියරේ බලාගාගරයද ඉලක්කගත පරිදි ක්‍රියාත්මක කිරීමට හැකි වුවහොත් මෙයින් ද ගිගාවොට් පැය 1883ක් පද්ධතියට එකතු කළ හැකි වේ.

මේ අනුව 2014 වර්ෂයේදී ගල්අඟුරු බලාගාර තුනෙන් ගිගාවොට් පැය 5,649ක් පද්ධතියට එකතු වීමත් සමඟ ඉන්ධනවලින් ජනනය කරනු ලබන ගිගාවොට් පැය 6,100 ගිගාවොට් පැය 2,334 දක්වා අඩු වේ යැයි ගණන් බලා ඇත. මෙම ඉලක්ක එම අන්දමින් සපුරා ගත හැකි වුවහොත් ලංකා විදුලිබල මණ්ඩලය වර්ෂයකට රුපියල් බිලියන 45ක වියදම් ඉතිරියක් අපේක්ෂා කරන අතර, ඉන් ජනිත වන ප්‍රතිලාභය විදුලි පාරිභෝගිකයන්ට ලබා දීමට අමාත්‍යාංශය වශයෙන් මම පොරොන්දු වෙමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, අපි සතුටු වනවා, විදුලිබල ඇමතිතුමියව අද අපට දැක ගන්නට අවස්ථාවක් ලැබීම ගැන.

මේ ගැන දැන් උණුසුම් තත්ත්වයක් පවතින නිසා මේ විදුලි බලය පිළිබඳ විවාදය හෙට දෙන්න බැරිද කියලා අපි අහනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ විවාදය අපට හෙට දෙන්න කියන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපේ කණ්ඩායම ඉල්ලීමක් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාමාන්‍යයෙන් විවාදයක් ඉල්ලන ක්‍රමයට ඉල්ලුවාම හම්බ වෙයි. සභානායකතුමාත් ඉන්නවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
සභානායකතුමා ඒ ගැන මොකක්ද කියන්නේ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තවම කාටවත් බිල ඇවිල්ලා තිබෙනවාද? සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා point of Order එකක් ඉස්සෙල්ලා ඉල්ලුවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපට මේ ගැන හෙට විවාදයක් දෙන්න.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
විවාදයට දින දෙන්නේ ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකතුමා නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ, අපි ඉල්ලුවේ ඔබතුමියගෙන් නොවෙයි, සභානායකතුමාගෙන්. අපි මේ ඉල්ලන්නේ සභානායකතුමාගෙන්.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේක මගේ පෞද්ගලික ඉල්ලීමක් නොවෙයි. කණ්ඩායමේ ඉල්ලීමක්. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමියගේ නියම ශබ්දය තවම ආවේ නැහැ. නියම හඬ ආවේ නැහැ. ඒකයි මේ සියලුම ප්‍රශ්න ආවේ.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු කථානායකතුමනි, මෙතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙනුවෙන් වැඩ බලන නායකතුමා. මම කොහොමද විවාදයට දිනයක් දෙන්නේ? ඒක පක්ෂ නායක රැස්වීමේදී කර ගන්න ඕනෑ දෙයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විවාදයකට දිනයක් ඉල්ලා සිටිනවා. ඒ ගැන සභානායකතුමා හා පක්ෂ නායකවරුන් සාකච්ඡා කරලා දිනයක් දෙයි.

දැන් අපි point of Order එකට හිත යොමු කරමු.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, මේ මොහොතේ පක්ෂ නායක රැස්වීමක් කැඳවුවහොත් මේ ගැන තීරණයක් ගන්න පුළුවන්. නැත්නම් සභානායකතුමාට නැඟිටලා මේ ගැන කියන්න පුළුවන්. පොඩි ප්‍රශ්නයක් තිබෙන්නේ. සභානායකතුමා මොකක්ද කියන්නේ?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අගමැතිතුමාත් ඉන්නවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, රජයේ වැඩ කටයුතු පිළිබඳව අපි පක්ෂ නායක රැස්වීමේදී තීරණ අරගෙන හෙට දිනයට විවාදය සඳහා පනත් ගණනාවක් යොදා ගෙන තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විදුලි බිල වැඩි කරන්න පුළුවන්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
විදුලි බිල සම්බන්ධයෙන් විවාදයක් අවශ්‍ය නම් හෙට පැවැත්වෙන පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කරලා ඊළඟ සතියේ දිනයක් ලබා දෙන්න අපට පුළුවන්.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එහෙම නම් සිකුරාදා දෙන්න පුළුවන්ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ, නැහැ. එහෙම බැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සජිත් ප්‍රේමදාස ගරු මන්ත්‍රීතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි, කථාවකුත් නැති එකේ මට අවස්ථාවක් දීම ගැන.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
[බාධා කිරීමක්] මැදට ආවොත් කථා ලැබෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පොඩ්ඩක් අවස්ථාවක් දෙන්න ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම General Rules of Procedure ගැන Kaul and Shakdher විසින් ලියා ඇති "Practice and Procedure of Parliament" කියන පොතේ 983 වන පිටුව කේන්ද්‍ර කර ගෙනයි මම මේ රීති ප්‍රශ්නය ඔබතුමා වෙත යොමු කරන්නේ. ඔබතුමා මට සාවධානව ඇහුම්කන් දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදයේ, රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් යටතේ ආණ්ඩුවේ වගකීමක් තමයි, සමාජ සුරක්ෂිතභාවය සහ සමාජ ශුභසාධනය ඇති කිරීම. ඒ වාගේම ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක වීමේදී ධනය, නිෂ්පාදන මාර්ග පොදු ජනතාවට හානිකර-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද? වරප්‍රසාද සාමාන්‍ය ප්‍රශ්නයක් නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට පොඩ්ඩක් සවන් දෙන්න. ගරු කථානායකතුමනි, මම - [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මෙතුමා සභාව නොමහ යවනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. සභාව නොමඟ යැවීමක් නොවෙයි, මම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සඳහන් කළේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Point of Order එකක් අහන්නේ මොන අවස්ථාවකදීද, මොන කරුණකදීද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් ගැන ඔබතුමා දැනුවත් කරන්නයි මම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් උපුටා ගත්තේ. ඇමතිතුමියට සවන් දුන්නා වාගේ මටත් පොඩ්ඩක් සවන් දෙන්න. ගරු කථානායකතුමනි, රජයක වගකීම සමාජ ශුභසාධනය සහ සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රකාශන කරන්න බැහැ. ඒ අයිතිය විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාට තමයි හිමි වෙලා තිබෙන්නේ. පැන නඟින කරුණකට අදාළව ඔබතුමා කථා කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා ඔබතුමාට කියනවා, සියයට 66කින් විදුලි බිල වැඩි කරලා, ජනතාවට විදුලි සැර වද්දවලා, ජනතාව විදුලි පුටුවට ගෙන යෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ ඔය කාරණය නැවත කථා කරලා අභියෝග කරන්නේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට. ඒ නිසා - [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා අහන්න කැමැතියි ගරු ඇමතිතුමියගෙන්, ජනතාව විනාශ කරන මේ විදුලි බිල වැඩි කිරීම සිද්ධ කළේ ඇයි කියලා?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Point of Order එකක් හරි විධියට ගෙනාවේ නැත්නම් කරුණාකරලා ඒවා - [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ point of Order එක තමයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරියට ගෙනාවේ නැත්නම් කපා හරින්න වනවා හැන්සාඩ් වාර්තාවෙන් සහ- [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
රූපවාහිනියේ ප්‍රචාරය කරන්න ඉඩ දෙන්නේත් නැහැ. නැත්නම් වැරදියි - [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙලා තිබෙනවා සමාජ සුරක්ෂිතභාවය, සමාජ ශුභසාධනය තහවුරු කරන්නේ කොහොමද කියලා. විදුලි බිල වැඩි කරලා කොහොමද සමාජ සුරක්ෂිතභාවය තහවුරු කරන්නේ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ජනතාව දැන ගන්න ඕනෑ හරි ක්‍රමය. ඒ සියල්ලම- [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කොහොමද විදුලි බිල වැඩි කරලා ජනතාවට සහනය ලබා දෙන්නේ? ඒක සමාජ සුරක්ෂිතභාවය නොවෙයි. ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සභානායකතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමාජ සුරක්ෂිතභාවය කොහොමද තහවුරු වන්නේ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභානායකතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
පරිසර හා- [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එකකට උත්තරයක් දෙන්න හදන්නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
[බාධා කිරීම්] අසාධාරණයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලා පොඩි රහපෑමක් කරන්න යන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඇති කරපු ප්‍රශ්නයට- [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
මේ කරන්නේ බොරුවක්. [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මෙතුමන්ලා පොඩි රහපෑමක් කරන්න යන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Point of Order එකක් ඉදිරිපත් කළ හැකි අවස්ථාවක් තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒකට ක්‍රමයක් තිබෙනවා. මෙතැන picketing එකක් කරන්නද යන්නේ? [ඝෝෂා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේලා සභා ගර්භය මැදට බැස්සොත්, මා නම් කරන මන්ත්‍රීවරුන්ට සති දෙකක්- [බාධා කිරීම්]

[මේ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට විය.]

[இச்சந்தர்ப்பத்தில் ஐக்கிய தேசியக் கட்சி உறுப்பினர்கள் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமெழுப்பினார்கள்]

[At this stage the Members of the United National Party walked into the Well of the House and created an uproar.]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මේක වැරදියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේලා බොරුවට points of Order ගෙනෙන්න වැඩක් නැහැ නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මේ ඔක්කෝම කට්ටිය එළියට දමන්න ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකරලා- [බාධා කිරීම්] තම තමන්ගේ ආසනවලට ගිහිල්ලා කථා කරන්න. [බාධා කිරීම්] කරුණාකරලා ආසනවලට යන්න. [බාධා කිරීම්] ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, තමුන්නාන්සේව- [බාධා කිරීම්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේලා අනවශ්‍ය විධියට points of Order ගෙනැල්ලා ගරු සභාවේ කටයුතුවලට බාධා කරන්න හදන්න එපා. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න, විවාදයක් නැහැ. නිකම් points of Order ගෙනෙන්න තමුන්නාන්සේලාට ඉඩ දෙන්න බැහැ නේ. එහෙම කොහොමද කරන්නේ? [බාධා කිරීම්] තමුන්නාන්සේත් කරන්නේ බොරුවක්ද කියලා කවුද දන්නේ? [බාධා කිරීම්] තමුන්නාන්සේලාට එහෙම චෝදනා කරන්න දෙන්න බැහැ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ආසනවලට යන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද ගරු සභාවේ මූලික කටයුතු මොනවාද? [ඝෝෂා කිරීම්] සභාවේ ප්‍රධාන කටයුතු මොනවාද? [ඝෝෂා කිරීම්] හොඳයි, දැන් මා සභාව කල් තබනවා. [ඝෝෂා කිරීම්]

ඊට අනුකූලව, කථානායකතුමා විසින් 76 වන ස්ථාවර නියෝගය යටතේ, ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදි.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 2.40ට, 2013 අප්‍රේල් 24 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේ ය.

அதன்படி சபாநாயகர் அவர்கள் 76ஆம் இலக்க நிலைக் கட்டளைப்படி வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி, பி.ப. 2.40 மணிக்கு பாராளுமன்றம் 2013 ஏப்பிரல் 24, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Accordingly, MR. SPEAKER *adjourned Parliament, without Question put, under Standing Order No. 76.*

Adjourned accordingly at 2.40 p.m. until 1.00 p.m. on Wednesday, 24th April, 2013.

:

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 216 - இல. 12
Volume 216 - No. 12

2013 අප්‍රේල් 24වන බදාදා
2013 ஏப்பிரல் 24, புதன்கிழமை
Wednesday, 24th April, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)
பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)
PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
කථානායකතුමාගේ සහතිකය
වරප්‍රසාද
: 2013 මාර්තු 10 දින "සිළුමිණ" වාර්තාව
: හිරිහැරයට සහ අගෞරවයට ලක් කිරීම

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන) – [ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා]- පළමුවන වර කියවන ලදී.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත:
නියමය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත:
නියෝගය

ආහාර පනත:
නියෝග

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙ වන වර සහ තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙ වන වර සහ තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙ වන වර සහ තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙ වන වර සහ තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

හඟුරන්කෙත මාදන්වෙල රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:
සලකා බලා සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை
சிறப்புரிமை:
2013 மார்ச் 10ஆந் திகதிய "சிலுமின" அறிக்கை
துன்புறுத்தலும் அச்சுறுத்தலும்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

சுரங்கங்கள், கனிப்பொருட்கள் (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
இலங்கை றோமன் கத்தோலிக்க அதிமேற்றிராணியார், மேற்றிராணியார் (திருத்தம்) - [மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க] - முதன்முறை மதிப்பிடப்பட்டது

உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டம் :
கட்டளை

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்:
கட்டளை

உணவுச் சட்டம் :
ஒழுங்குவிதிகள்

திருமணப் பதிவு (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

கண்டிய திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலம் :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

முஸ்லிம் திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

பிறப்புக்கள், இறப்புக்கள் பதிவு (திருத்தம்) சட்டமூலம் :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஹங்குரான்கெத மாதன்வல ரஜமகா விகாரை அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:
பரிசீலிக்கப்பட்டு, திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate
Privilege:
"Silumina" Report of 10th March 2013
Harassment and Intimidation

ORAL ANSWERS TO QUESTIONS

MINES AND MINERALS (AMENDMENT) BILL:
Read the First time

PRIVATE MEMBERS' BILLS:
Roman Catholic Archbishop and Bishops of Ceylon (Amendment) – [The Hon. Neranjan Wickremasinghe] – Read the First time

EXCISE (SPECIAL PROVISIONS) ACT:
Order

SRI LANKA EXPORT DEVELOPMENT ACT:
Order

FOOD ACT:
Regulations

MARRIAGE REGISTRATION (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

KANDYAN MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

MUSLIM MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

BIRTHS AND DEATHS REGISTRATION (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

HANGURANKETHA MADANWELA RAJAMAHA VIHARA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL:
Considered, read the Third time and passed as amended

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 අප්‍රේල් 24වන බදාදා
2013 ஏப்பிரல் 24, புதன்கிழமை
Wednesday, 24th April, 2013

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79වැනි ව්‍යවස්ථාව අනුව, 2013 අප්‍රේල් මස 23වන දින ගරු කථානායකතුමා විසින් පහත සඳහන් පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)

මුදල්

නොතාරිස් (සංශෝධන)

ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන)

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන)

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන)

II

වරප්‍රසාද : 2013 මාර්තු 10 දින "සිළුමිණ" වාර්තාව
சிறப்புரிமை: 2013 மார்ச் 10 ஆம் திகதிய "சிலுமின"அறிக்கை
PRIVILEGE: "SILUMINA" REPORT OF 10TH MARCH 2013

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2013 මාර්තු මස 20වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

III

වරප්‍රසාද : හිරිහැරයට සහ අගෞරවයට ලක් කිරීම
சிறப்புரிமை: துன்புறுத்தலும் அச்சுறுத்தலும்
PRIVILEGE: HARASSMENT AND INTIMIDATION

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුජීව සේනසිංහ මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2013 මාර්තු මස 20වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

IV

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2013 අප්‍රේල් මස 24වන බදාදා, එනම් අද දින පස්වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, මම 2011 වර්ෂය සඳහා ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රමසම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, මම 2010/2011 වර්ෂය සඳහා සීමා සහිත ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වරාය හා මහාමාර්ග කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

I wish to announce that this House cordially welcomes the Parliamentary Delegation from the Kingdom of Bahrain led by His Excellency Khalifa bin Ahmed Al Dhahrani, Speaker of the Council of Representatives of Bahrain, now present at the Speaker's Gallery.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)

Hon. Deputy Speaker, I present a petition received from Mr. D.A. Benedict of No. 57/A, Widisal Cross Road, Ratmalana.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා - පැමිණ නැත.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මැණික්හින්න, වලල, අංක 07 දරන ස්ථානයෙහි පදිංචි මතුරට ජී. ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු විමල් වීරවංශ මහතා - පැමිණ නැත.
ගරු පියංකර ජයරත්න මහතා - පැමිණ නැත.
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.
ගරු ලසන්ත අලගියවන්න මහතා - පැමිණ නැත.
ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා - පැමිණ නැත.
ගරු සරණ ගුණවර්ධන මහතා - පැමිණ නැත.
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - පැමිණ නැත.
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - පැමිණ නැත.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කුලියාපිටිය, බෝපිටිය, මැල්ලවාන පදිංචි එම්.එම්. මාතුරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මහතා - පැමිණ නැත.
ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ඌරුගමුව, වේහැල්ල, බඹරැන්දවත්තෙහි පදිංචි අසරප්පුලිගේ ඩේවිඩ් සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අකුරැස්ස, පරදුව, "ජයසු" නිවසෙහි පදිංචි ජුලාපෙගෙයි සරත් ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මහනුවර, පිටකන්ද පාර, අංක 109 දරන ස්ථානයෙහි පදිංචි වයි.ඒ.කේ. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මහව, නෙත්තිපලගම, සිරිමල් උයනෙහි පදිංචි එස්.එල්.බී. මොරගස්වැව මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මහියංගණය, ඌරණිය, 12 කණුව අසල, "සුමාලි" නිවසෙහි පදිංචි ආර්. සුමිත්‍රා මාලනී ලිවේරා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රුවන් රණතුංග මහතා - පැමිණ නැත.
ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, the Central Bank Report which should be tabled in this House - so far we have had four Sitting days for this month - has not been tabled in this House. This is a very serious issue. This is not the first time it has happened. I am sorry to say that this has not been looked into. This is the third time it has happened. This has become a ritual now. The Parliament should be treated with respect.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I will look into that.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The Central Bank Report is of much debate. Not only that, now you are saying that you will look into it -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I appreciate you for bringing it to our notice. I will certainly take appropriate action and bring it to the notice of the Hon. Speaker immediately.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, there is an even more important matter. After all, the President of this country, by looking at the Central Bank Report before it is even tabled in Parliament, has said that the country's economy has collapsed. He has basically said - [*Interruption*.]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, that is not a point of Order. You may raise it - [*Interruption*.] I have given an Order. You can raise it - [*Interruption*.]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I am on a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have given a Ruling in respect of that point of Order. - [*Interruption.*]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Do not externalize issues, Sir.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
No, I am not trying to externalize any issue.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
There is no democracy in the country. Sir, you are in that seat. Do not use it like Hitler's Chair.- [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, there are Standing Orders under which this House is guided. So, I have to see to it that this House is conducted as per the Standing Orders. If you have a question to ask, you can raise it at the appropriate time.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No, Sir. I have a more fundamental question.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The Hon. Leader of the Opposition, please.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
Hon. Deputy Speaker, this House is governed by the Standing Orders, the Constitution as well as the conventions which are referred to in the Standing Orders and the Parliament (Powers and Privileges) Act. The power of Parliament to control public finance is well-known and also the Monetary Law has made provision for the report to be tabled in this House. Otherwise, we are functioning in the dark. This is not the first time this has happened. So, all we want to know is, in enforcing this convention what steps you are going to take. His Excellency the President has reported that the economy is about to collapse. We know that. But, anyway we cannot even debate on this. The President has informed the country but this House cannot take cognizance of it. I think there are a lot of details about non-performing loans of banks. The President makes an announcement that the economy is about to collapse but we cannot debate on it because the Central Bank Report is not tabled in Parliament.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Leader of the Opposition, I have given a Ruling in respect of that.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order. My point of Order is yet to come, Sir.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, what is your point of Order?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, even after the President saying that the economy has collapsed, yesterday the Hon. (Mrs.) Pavithradevi Wanniarachchi said that she will increase the prices and that still there is a loss. So, that means, the country has collapsed even with a 50 per cent increase.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, that is not a point of Order.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Why is that, Sir?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You can raise it at the appropriate time.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Do you say that what the President has said is an untruth?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I am not here to answer for what the President has said. I am here to conduct the affairs of this House. Please do not allow others to look at our Parliamentarians as a pack of jokers.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I think they have simultaneously already established it.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ප්‍රශ්න අංක 1 අහනවාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order. You, from the Chair, are saying that -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 1 අහනවාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am on my point of Order, Sir.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා ප්‍රශ්න අංක 1 අහනවාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No, I am on my point of Order, Sir.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have given you an opportunity to raise your point of Order and I have given a Ruling. ඔබතුමා ප්‍රශ්න අංක 1 අහනවාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
As you are asking with decorum, I ask Question No. 1, Sir.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

අධි චෝදනා ගොනු කිරීමෙන් පසු ඉල්ලා අස් කරගත් නඩු : විස්තර
குற்றஞ்சாட்டப்பட்ட பின்னர் திரும்பப் பெறப்பட்ட வழக்குகள் : விபரம்
CASES WITHDRAWN AFTER INDICTMENTS: DETAILS

1601/'11

1. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3) :

(අ) (i) 2004.01.01 දින සිට අද දක්වා වූ කාලය තුළ අධිචෝදනා ගොනු කිරීමෙන් පසුව නීතිපතිවරයා විසින් ඉල්ලා අස් කර ගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එලෙස අධිචෝදනා ඉදිරිපත් කරන ලද නඩුවල සහ පුද්ගලයන්ගේ නම් සහ එම අධිචෝදනා පත්‍ර භාර දුන් දිනයන් කවරේද;

(iii) එලෙස අධිචෝදනා පත්‍ර භාර දීමෙන් අනතුරුව ඒවා ඉල්ලා අස් කර ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) භාර දුන් අධිචෝදනා පත්‍රයක් ඉල්ලා අස් කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම කොපමණද;

(ii) ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නීතීඥවරුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2004.01.01. முதல் இன்று வரை குற்றஞ்சாட்டப் பட்ட பின்னர் சட்டமா அதிபரினால் திரும்பப் பெறப்பட்ட வழக்குகளின் எண்ணிக்கையையும்;

(ii) அவ்வாறான வழக்குகளினதும் குற்றஞ்சாட்டப் பட்டவர்களினதும் பெயர்களையும், அவ்விதக் குற்றப் பகர்வுகள் மேற்கொள்ளப்பட்ட திகதிகளையும்;

(iii) மேற்படி குற்றப் பகர்வுகள் வழங்கப்பட்டமை, பின்னர் அவை திரும்பப் பெறப்பட்டமை ஆகியவற்றுக்கான காரணங்களையும்;

அவர் கூறுவாரா?

(ஆ) (i) ஒரு குற்றப் பகர்வைத் திரும்பப் பெறுதல் தொடர்பில் சட்ட மாஅதிபர் திணைக்களத்திற்கு ஏற்படுகின்ற செலவையும்;

(ii) இது தொடர்பாக சட்ட மாஅதிபர் திணைக்களத் தின் சார்பாகத் தோற்றிய சட்டத்தரணிகளது பெயர்களையும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) the number of cases withdrawn by the Attorney-General from 1st January, 2004 to date after they were indicted;

(ii) the names of the cases and persons indicted and the dates on which those indictments were served; and

(iii) the reasons for serving indictments and withdrawing them thereafter?

(b) Will he also state -

(i) the cost incurred by the Attorney-General's Department for withdrawals of indictments; and

[ගරු රවි කරුණානායක මහතා]

(ii) the names of the lawyers who appeared on behalf of the Attorney General's Department for the same?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) අධිචෝදනා ඉල්ලා අස් කර ගත් නඩු වැඩ අවසන් කළ නඩු ලෙස සලකනු ලැබේ. එම නිසා මෙම නඩුවලට අදාළ වෙන් වෙන් වාර්තා තබා ගනු නොලැබේ. වාර්තා තබා ගන්නේ වැඩ අවසන් කළ නඩු වශයෙනි.

මෙම නඩු අවසන් වූ ආකාරය පිළිබඳව වාර්තා පවත්වනු ලබන්නේ නැත. කරුණු මෙසේ හෙයින් අධි චෝදනා ඉල්ලා අස් කර ගත් නඩු සංඛ්‍යාව සඳහන් කිරීමට නොහැක.

(ii) අධි චෝදනා ඉල්ලා අස් කර ගත් නඩු වැඩ අවසන් කළ නඩු ලෙස සලකන බැවින් එම අධි චෝදනාවල ඇතුළත් චූදිතයින්ගේ නම් වෙන් වෙන් වශයෙන් සටහන් කර නොමැත.

(iii) අධි චෝදනා ඉල්ලා අස් කර ගැනීමේ කිසිදු බලයක් නීතිපතිවරයාට නොමැත. ඉල්ලා අස් කර ගැනීමට හේතු අධිකරණය හමුවේ ඉදිරිපත් කිරීමෙන් පසුව අධි චෝදනා ඉල්ලා අස් කර ගැනීමේ අවසරය පමණක් ඉල්ලා සිටීමට නීතිපතිවරයාට හැකිය. නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබූ හේතු සලකා බලා අධි චෝදනා අස් කර ගැනීමේ අවසරය ලබා දීම හෝ එය ප්‍රතික්ෂේප කිරීම අධිකරණය සතු කාර්ය භාරයකි. අධි චෝදනා ඉල්ලා අස් කර ගනු ලැබූ සියලුම නඩුවලදී ඉල්ලා අස් කර ගැනීමේ අයදුම්පතට සහායක් වශයෙන් පැමිණිල්ලේ නීතිඥවරයා විසින් ඉල්ලා අස් කර ගැනීමට හේතු අධිකරණය වෙත ඉදිරිපත් කර සිටී.

(ආ) (i) අධි චෝදනා ඉල්ලා අස් කර ගැනීමේදී කිසිදු වියදමක් දැරීමට සිදු නොවේ.

(ii) සෑම විටම රජයේ අධි නීතිඥවරයකු මඟින් අධිකරණය හමුවේ නීතිපතිවරයාව නියෝජනය කෙරෙනු ලැබේ. ඉහත අංක (අ) (i) හි දක්වා ඇති හේතු පරිදි අධි චෝදනා ඉල්ලා අස් කර ගනු ලැබූ අවස්ථාවේ නඩුව සඳහා පෙනී සිටි රජයේ අධිනීතිඥවරයා පිළිබඳව විශේෂයෙන් සටහන් කිරීමක් නැත.

(ඇ) පැන නොනඟී.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සිංහල භාෂාවෙන් අතුරු ප්‍රශ්න අහන්නම්. ඉංග්‍රීසි භාෂාවෙන් ඇහුවොත් විදේශිකයෝ දැන ගනීවි, මේක banana republic එකක් කියලා. ඇමතිතුමනි, පුවත්පත් සිරස්තලවල තිබුණා, චන්දන කත්‍රිආරච්චි, දුමින්ද සිල්වා වැනි අය උසාවි ගෙන ගිහින් පසුව ඒ නඩු ඉල්ලා අස් කරගෙන - withdraw කර - තිබුණාය කියා.

ඔබතුමා කියන්නේ ඊට හාත්පසින්ම වෙනස් කථාවක්. ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා මේ වාගේ වැරදි කළ අයට විරුද්ධව තිබෙන චෝදනා අයින් කරලා -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
දැන් ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය මොකක්ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ඒ කාලයේ කරපු ඒවා ගැන අහන්න.[බාධා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ ගොල්ලන්ට හරි කැක්කුමක් තිබෙනවා වාගේ. ඉතින් අහන්න කෝ. ඔබතුමන්ලා රවි කරුණානායකට විදේශ විනිමය පිළිබඳව charges ගේනවා. කේපීලාට මොකුත් නැහැ. මොකක්ද මේ රටේ තිබෙන ප්‍රතිපත්තිය? නීතිපති දෙපාර්තමේන්තුව තමන්ලාගේ අතේ තියා ගෙන ඒක තමන්ලා දේශපාලන උපක්‍රම සඳහා පාවිච්චි කරනවාද? නැද්ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ විදේශ විනිමය වංචාව පිළිබඳ ප්‍රශ්නය ඉල්ලා අස් කර ගන්නේ නැත්තේ ඇයි කියන එක ගැන ඔබතුමා ප්‍රශ්නයක් ඇහුවොත් ඒක නීතිපතිතුමාට යොමු කරලා උත්තරයක් ලබා දෙන්න මට පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පසු ගිය කාලයේ ආණ්ඩුවට ගිය අයටත් එහෙමයි. අබ්දුල් කාදර් ආණ්ඩුවට ගියාම-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
දැන් අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා. අබ්දුල් කාදර් මහත්මයා ගැනත් යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් වෙනම ප්‍රශ්නයක් විධියට අහන්න. නීතිපතිතුමාට යොමු කරලා ඒ පිළිබඳව තත්ත්වය මොකක්ද කියලා අපි පහදා දෙන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් මම මේ ප්‍රශ්නයෙන් ඇහුවේ ඒක නේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒක තමයි. දැන් ප්‍රශ්න දෙකක් ඇහුවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, එකයි ඇහුවේ. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ. නැහැ. තමුන්නාන්සේගේ නඩුව අස් කර ගත්තේ නැහැයි කියලා එක ප්‍රශ්නයක් ඇහුවා. අබ්දුල් කාදර් මහත්මයාගේ නඩුව අස් කර ගත්තේ ඇයි කියලා තවත් ප්‍රශ්නයක් ඇහුවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මේක අහලා තිබෙන්නේ අධිකරණ ඇමතිතුමා -[බාධා කිරීමක්] දැන් එතුමා ප්‍රශ්නයත් අහනවා. උත්තරයත් දෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අහන්න, අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විනයක් තියෙන්න ඕනෑ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න වැලක් ඇහුවා. කමක් නැහැ තව අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට වැලක් අහන්න ඕනෑ නැහැ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
තව එකයි අහන්න තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඇහුවේ එකයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි ප්‍රශ්නය හැටියට අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. විනිසුරුවරුන්ගේ සංගමය සහභාගි වූ දකුණු අප්‍රිකාවේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය නීති සම්මේලනයේදී කියලා තිබුණා, ලංකාවේ තිබෙන ප්‍රශ්නය නිසා කරුණාකරලා පොදු රාජ්‍ය මණ්ඩලීය -Commonwealth- සමුළුව මෙහේ තියන්න එපා කියලා. අපේ රටේ අගවිනිසුරුත් එතැන හිටියා. මේක ඇත්තද? නැද්ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට තමයි කියන්නේ "යන්නෙ කොහේද, මල්ලෙ පොල්" කියලා. මොකද, ඒක මේ ප්‍රශ්නයට කිසිසේත්ම අදාළ නැහැ. ඒක අප්‍රිකාවේ තිබුණු දෙයක්. ඔබතුමන්ලා කලින් කිව්වා නේ, කිලිනොච්චි යනවා කියලා මැදවච්චි ගියා කියලා.

ඉතින් ඒ වාගේ දෙයක් තමයි මේකත්. [බාධා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අහලා තිබෙන්නේ අධිකරණය සම්බන්ධ ප්‍රශ්නයක්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ඒ නිසා පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ ප්‍රශ්න අහන ක්‍රමය ගැන හිතන්න. ඔබතුමා අහන අතුරු ප්‍රශ්නය මූලික ප්‍රශ්නයට අදාළ විය යුතුයි. මූලික ප්‍රශ්නයට අදාළ නැති, රට වටේ යන ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ. ඒකට වෙනම ප්‍රශ්නයක් අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අගමැතිතුමාගෙන් මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ අධිකරණය සම්බන්ධයෙනුයි. මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අහන්න මීට වඩා හොඳ අවස්ථාවක් කොහේද තිබෙන්නේ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
අවස්ථාවක් තිබුණාට ස්ථාවර නියෝග අනුව තමයි ඔබතුමා කටයුතු කළ යුත්තේ. ස්ථාවර නියෝගවලට පිටින් ගිහින් ඕනෑ ඕනෑ දේවල් අහන්න බැහැ. ඒවාට උත්තර දෙන්න බැඳිලා නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම්, ස්ථාවර නියෝග අනුවද ඔබතුමන්ලා මහ බැංකුවේ චාර්තාව table කරලා නැත්තේ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවැනි එකයි මා ඇහුවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The answer was given by the Hon. Minister. - [*Interruption.*] Yes, Hon. Leader of the Opposition.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Will the Hon. Leader of the House find out from the Attorney-General and inform this House of the procedure followed when an application is made to court to withdraw the indictment? Does the Attorney-General enter it in writing at any stage or is it done through verbal communication, using the mobile phone or through telepathy?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I have explained in my answer the procedure adopted. So, there is nothing more to add.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order. - [*Interruption*.]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
දැන් නම් අතුරු ප්‍රශ්න තුන අසා අවසන්. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

මොරවක, කොටපොල හා පස්ගොඩ අධ්‍යාපන කලාප : ගුරු ස්ථාන මාරු

மொரவக்க, கொட்டபொல மற்றும் பஸ்கொட கல்வி வலயங்கள் : ஆசிரியர் இடமாற்றம்

MORAWAKA, KOTAPOLA AND PASGODA EDUCATIONAL ZONES: TEACHER TRANSFERS

1829/'11

2. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය අධ්‍යාපන කාර්යාලයට අයත්, මොරවක, කොටපොල හා පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවලින් පාලනය වන රජයේ පාසල්වල දුෂ්කර සේවා කාලය අවසන් වීමෙන් පසු ස්ථාන මාරුවීම් නොලැබීම නිසා දැඩි කලකිරීමට පත් විශාල ගුරු පිරිසක් සිටින බවත්;

(ii) මෙම හේතුව නිසා එම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කටයුතුවල ගුණාත්මකභාවය පිරිහීමට ලක් විය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ගුරු මාරු මණ්ඩල තීරණයන්ට අනුව ස්ථාන මාරු සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් කවරේද;

(ii) මේ වන විට ඉහත අධ්‍යාපන කලාප තුළ දුෂ්කර සේවා කාලය අවසන් වීමෙන් පසු ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට ස්ථාන මාරුවීම් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් සකසා තිබේද;

(iv) එම ක්‍රමවේදය කවරේද;

(v) ඒ අනුව ස්ථාන මාරු ලබා දෙන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමைச්சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் தெனியாய கல்விக் காரியாலயத்திற்குரிய மொரவக்க, கொட்ட பொல மற்றும் பஸ்கொட கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படும் அரச பாடசாலைகளில் கஷ்டப் பிரதேச சேவைக் காலத்தை பூர்த்தி செய்த பின்னர் இடமாற்றம் கிடைக்காததனால் பெரும் விரக்திக்கு உள்ளாகியுள்ள ஆசிரியர்கள் பெருமளவில் இருக்கின்றார்கள் என்பதையும்;

(ii) இதன் காரணமாக இவ்வாசிரியர்களின் கற்பித்தல் தரம் குறைவடையலாம் என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) ஆசிரியர் இடமாற்ற சபைகளின் தீர்மானத்திற்கேற்ப இடமாற்றத்தின் பொருட்டு பூர்த்திசெய்யவேண்டிய ஆகக்குறைந்த தகைமைகள் யாவையென்பதையும்;

(ii) தற்போது மேற்படி கல்வி வலயத்தில் கஷ்டப்பிரதேச சேவைக் காலத்தை பூர்த்தி செய்ததன் பின்னர் இடமாற்றம் கோரியுள்ள ஆசிரியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) இவர்களுக்கு இடமாற்றம் வழங்குவதற்கான வேலைத்திட்டமொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) மேற்படி முறையியல் யாதென்பதையும்;

(v) இதற்கேற்ப இடமாற்றம் வழங்கப்படுமாயின் அத்தேதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he admit that -

(i) there are many teachers who are actually frustrated as a result of not receiving transfers after the completion of the difficult area service period in the government schools administered by the Morawaka, Kotapola and Pasgoda Divisional Education Offices belonging to the Deniyaya Education Office of the Matara District; and

(ii) the quality of teaching of these teachers could decline on account of this reason?

(b) Will he inform this House -

(i) the minimum qualifications need to be fulfilled for transfers as per the decisions of the teacher transfer boards;

(ii) the number of teachers who have sought transfers by now, after the completion of their difficult service period at the above educational zones;

(iii) whether a programme has been drawn up for granting them transfers;

(vi) what that programme is; and

(v) if transfers are given accordingly, the date for same?

(c) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ආ) (i) ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියට හා ගුරු සේවා ව්‍යවස්ථාව අනුව ගුරු සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් ස්ථාවර කමිටුව විසින් නම් කරනු ලබන පාසලක අනිවාර්ය අවම සේවා කාලයක් සෑම ගුරු භවතෙක් විසින්ම සේවය කළ යුතුය. ඒ අනුව,

- අති දුෂ්කර හෝ දුෂ්කර පාසලක අවම ලෙස වසර 3ක්.
- අපහසු නොවන පාසලක අවම ලෙස වසර 4ක්.
- වඩාත් සුදුසු පාසලක උපරිම වසර 6ක්.
- පහසු පාසලක උපරිම ලෙස වසර 8ක්.

සේවය කළ යුතුය. එමෙන්ම පාසල පාදක ගුරු බඳවා ගැනීම් ප්‍රතිපත්තිමය ලෙස පිළිගන්නා අවස්ථාවලදී පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි අනුව පත් කරන ලද පාසලේ එක දිගට සේවය කළ යුතු වසර ගණන සම්පූර්ණ කළ යුතුය.

(ii) අන්තර් කලාප ස්ථාන මාරු ඉල්ලා ඇති ගුරු සංඛ්‍යාව - 111යි.

අන්තර් පළාත් ස්ථාන මාරු ඉල්ලා ඇති ගුරු සංඛ්‍යාව - 28යි.

(iii) ඔව්. පළාත් සභාව විසින් අදාළ පළාතේ ගුරු මාරු පිළිබඳව වැඩ පිළිවෙළක් සකසා තිබේ.

(iv) ස්ථාන මාරු අපේක්ෂිත ගුරුභවතුන් විසින් කලාපවලට භාර දී ඇති ස්ථාන මාරු අයදුම් පත් සඳහා ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියට අනුව තෝරා ගත් නිර්ණායකවලට අනුකූලව කලාප ගුරු මාරු මණ්ඩලය විසින් ලකුණු දීමක් සිදු කරයි.

අනතුරුව එම ලකුණු අනුපිළිවෙළ අනුව ගුරුවරුන් පෙළ ගස්වා කලාපය තුළ පවතින ගුරු ඌනතා හා අතිරික්ත පිළිබඳව ද සලකා බලා ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියේ 1.1 වගන්තියට අනුව ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා මූඛ්‍ය ස්ථානයෙහි තබා ශිෂ්‍යයන්ට හා පාසල්වලට හානියක් සිදු නොවන ලෙස ගුරු ස්ථාන මාරු ලබා දීමට කටයුතු කරන බව දන්වමි.

(v) ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියට අනුකූලව සැප්තැම්බර් මාසයේ 1 - 15ත් අතර කාල සීමාව තුළ.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා එතුමාගේ පිළිතුර පුරාවටම ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය පිළිබඳව කුමක් සඳහන් කළත්, දකුණු පළාත් සභාව දකුණු පළාතටම අදාළ ගුරු මාරු ප්‍රතිපත්තියක් හදාගෙන තිබෙනවා. ඒ ගුරු මාරු ප්‍රතිපත්තියේ කියනවා, "මේ කලාපයෙන් ගුරුවරයෙකු නිදහස් කරන්න නම් ඒ විෂයට අදාළව පාසලේයි, කොට්ඨාසයේයි, කලාපයේයි කිසිම පුරප්පාඩුවක් නැති වෙන්න ඕනෑ" කියලා. පාසල තුළ අනුප්‍රාප්තිකයෙක් යොදන්න පුළුවන්. හැබැයි කලාපය තුළයි, කොට්ඨාසය තුළයි කිසිම පුරප්පාඩුවක් නැත්නම් මේ මාරු වීම කරන්න බැහැ. ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය අභිභවනය කරමින් පළාත් ගුරු මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නට අමාත්‍යාංශය ඉඩ දීලා තිබෙන්නේ ඇයි, ඒ පිළිබඳව අමාත්‍යාංශයේ මැදිහත් වීම මොකක්ද කියලා මා දැනගන්න කැමැතියි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

එසේ ක්‍රියාත්මක වන බවක් ඔබතුමා දැන් සඳහන් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වාර්තා වෙලා නැහැ. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ඕනෑ, පළාත් සභා කටයුතු කරන්නට. ජාතික ගුරු මාරු ප්‍රතිපත්ති අභිභවා ඒ ඒ පළාතට සුවිශේෂී වූ තත්ත්වයක් පළාත් සභා සකස් කරගෙන තිබෙනවා නම් ඒ පිළිබඳව විමර්ශනය කර සොයා බලා, අදාළ පාර්ශ්වයන්ගෙන් අහලා පාර්ලිමේන්තුවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ දී ඔබතුමාට ඒ සම්බන්ධයෙන් මම පිළිතුරක් ලබා දෙන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. දෙනියාය අධ්‍යාපන කලාපයේ ඇතැම් පාසල්වල අවුරුදු 8ක්, 9ක් සේවය කරපු ගුරුවරුන්ටත් තවමත් එම කලාපයෙන් අයින් වෙලා යන්න බැරි තත්ත්වයක් තිබෙනවා. හැබැයි අවුරුදු 5ක්, 6ක් සේවය කරපු සමහර ගුරුවරු විවිධ ක්‍රමවේද තුළින් මාරු වීම් හදා ගෙන යනවා. ඒ මේ පළාත් සහා සීමාව තුළමයි. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයට කරන්න පුළුවන් මැදිහත් වීම මොකක්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල ගුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

මැදිහත් වීමක් වශයෙන් එසේ නොකරන ලෙසට උපදෙස් දෙන්න පුළුවන්. ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න කියන්න පුළුවන්. ගුරුවරයෙක් මාරු කිරීමේදී විශේෂයෙන්ම පළාත් සභාවත්, අදාළ අධ්‍යාපන බලධාරිනුත් කරුණු දෙකක් පිළිබඳව ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වෙනවා. පන්ති කාමරය තුළ සිටින ශිෂ්‍යයාගේ ජීවිතයට ඇති වන බලපෑම තමයි ප්‍රථම කරුණ හැටියට සලකන්නේ. යම් කිසි ගුරුවරයෙක් මාරු කිරීම තුළින් ශිෂ්‍ය ජීවිත විශාල ප්‍රමාණයකට අගතියක් වෙනවා නම්, ඒ අවස්ථාවේදී මාරුව ලබා දෙන්නේ නැහැ. පාසලත්, ශිෂ්‍යයාත් ගැන සලකා බලා, මාරුවීම් ඉල්ලා තිබෙන ගුරුවරුන්ගේ මාරුවීම් කලාප මට්ටමෙන් හා පළාත් මට්ටමෙන් කරන්නට හැකි සෑම උත්සාහයක්ම දරනවා. එසේ නොදරනවා නම්, ගරු මන්ත්‍රීතුමා අපට කරුණු ඉදිරිපත් කළොත් ඒ අදාළ බලධාරින් සමඟ සාකච්ඡා කර අපට එය නිවැරදි කරන්න පුළුවන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන් වන අතුරු ප්‍රශ්නය මෙයයි. ඉතා පැහැදිලිවම, අවුරුදු පහක කාලයක් සේවය කළ යුතුයි කියා දෙනියාය කලාපයේ ගුරුවරුන්ට පත්වීම් ලබා දී තිබුණත්, ඒ නියමයට පිටින් කටයුතු කර තිබෙන අයගේ ලේඛනයක් ඉදිරිපත් කරන්න මට පුළුවන්කම තිබෙනවා. අවුරුදු පහක් නොවෙයි, අවුරුදු තුනක් ඉඳලා තිබෙන අය සමහර තැන්වල අනුප්‍රාප්තිකයෙක් රහිතවම ගුරු මාරුවීම් කර තිබෙනවා. හැබැයි අර වාගේ ගුරු මාරු ප්‍රතිපත්තියක් පළාතටත් පනවා ගෙන ඉන්නවා. එම නිසා මේ සම්බන්ධයෙන් සමස්ත පළාත් සභා එක්ක කථා කර ඒකමතිකත්වයක් හදා ගන්නට අමාත්‍යාංශයට බැරි ඇයි?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල ගුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ඔය ලියවිල්ල මට දෙන්න. අනුප්‍රාප්තිකයෙක් රහිතව කුමන අවස්ථාවකවත් ගුරුවරයෙකු මාරු නොකළ යුතුයි. මක් නිසාද? අර දරුවන්ගේ ජීවිතවලට ඍජුව ඒක බලපාන නිසා. ඔබතුමා මට ඒ ලැයිස්තුව දෙන්න. දකුණේ පළාත් අමාත්‍යතුමාත්, අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාත් සමඟ මේ පිළිබඳව සාකච්ඡාවක් කරන ලෙස මා මගේ ලේකම්තුමාට නියම කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 3-2511/'12-(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අසනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ඩෙංගු මර්දනය සඳහා ගෙන්වල ලද BTI බැක්ටීරියාව : විස්තර
டெங்கு ஒழிப்புக்காகக் கொண்டுவரப்பட்ட BTI பற்றீரியா : விபரம்
BTI BACTERIUM IMPORTED FOR CONTROLLING DENGUE : DETAILS

2698/'12

4. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ඩෙංගු මර්දනය සඳහා කියුබාවෙන් BTI බැක්ටීරියාව ගෙන්වන ලද දිනය කවරේද;

(ii) එම බැක්ටීරියාව ගෙන්වන ලද ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සඳහා වැය වූ සමස්ත මුදල කොපමණද;

(iv) එම මුදල වියදම් කළ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) BTI බැක්ටීරියාව ශ්‍රී ලංකාවේ ඩෙංගු මර්දනයට සුදුසු බවට නිර්දේශ කළේ කවුරුන්ද;

(ii) මෙරට ඩෙංගු මර්දන ක්‍රියාවලිය සඳහා එම බැක්ටීරියාව භාවිතා කර ඇති ප්‍රමාණය කොපමණද;

(iii) අද වනවිට එකී බැක්ටීරියාව ගෙන්වා භාවිතා කිරීම තුළින් ඩෙංගු මර්දනයේදී අත්කර ගෙන ඇති ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) டெங்கு ஒழிப்புக்காக கியூபாவிலிருந்து BTI பற்றீரியா கொண்டுவரப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) மேற்படி பற்றீரியா எவ்வளவு கொண்டுவரப்பட்டது என்பதையும்;

(iii) இதற்கென செலவான மொத்தப் பணத்தொகை யாதென்பதையும்;

(iv) குறித்த பணம் செலவிடப்பட்ட விதம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) BTI பற்றீரியா இலங்கையில் டெங்கு ஒழிப்புக்குப் பொருத்தமானதென சிபாரிசு செய்த வர்கள் யாவர் என்பதையும்;

(ii) இந்நாட்டில் டெங்கு ஒழிப்புச் செயற்பாட்டிற்காக குறித்த பற்றீரியா பயன்படுத்தப்பட்டுள்ள அளவு யாதென்பதையும்;

(iii) மேற்கூறிய பற்றீரியா கொண்டுவரப்பட்டு பயன் படுத்தப்பட்டதன் ஊடாக டெங்கு ஒழிப்பின் போது இன்றளவில் அடையப்பெற்றுள்ள முன்னேற்றம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House of -

(i) the date on which the BTI bacterium was imported to this country from Cuba for the purpose of controlling dengue;

(ii) the amount of the aforesaid bacterium imported to this country;

(iii) the total amount of money that was spent on the aforesaid purpose; and

(iv) the manner in which the aforesaid amount of money was spent?

(b) Will he also inform this House -

(i) the names of the persons who recommended that the BTI bacterium is suitable for the purpose of controlling dengue in Sri Lanka;

(ii) the amount of the aforesaid bacterium that has been used for controlling dengue in this country; and

(iii) the progress that has been achieved up to now by the use of the aforesaid bacterium for controlling dengue?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2010.09.15.

(ii) ලීටර් 10,000.

(iii) රුපියල් 33,560,000.00

(iv) BTI බැක්ටීරියාව සඳහා මිල + වරාය රේගු ගාස්තු + බදු

(ආ) (i) පරිසරයේ රැඳී ඇති පහසුවෙන් ඉවත් කළ නොහැකි මදුරුවන් බෝවන ස්ථාන සඳහා අනිකුත් වාහක මර්දන ක්‍රම සමඟ ඒකාබද්ධව භාවිතා කිරීම සඳහා කියුබාවෙන් පැමිණි විශේෂඥයින් දෙදෙනා සහ වාහක මර්දනය සඳහා වන උපදේශාත්මක කමිටුව මඟින් BTI භාවිතය නිර්දේශ කරන ලදී.

(ii) ආනයනය කළ ලීටර් 10,000 මුළුමනින්ම ඩෙංගු මර්දනය සඳහා ප්‍රාදේශීය වශයෙන් බෙදා හරින ලදී.

(iii) විවිධ ප්‍රදේශ තුළ මදුරුවන් බෝවන, ඉවත් කළ නොහැකි ස්ථානවලට BTI සති දෙකකට වරක් අඛණ්ඩව යෙදීමෙන් මදුරු කීටයන් විනාශ වන බව කීටවිද්‍යා දත්ත මඟින් සනාථ කර ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු දයාසිරි ජයසේකර මහතා

(மாண்புமிகு தயாசிறி ஜயசேகர)

(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලා විශාල වියදමක් දරලා ඩෙංගු මර්දන කියුබානු බැක්ටීරියා ලීටර් 10,000ක් ගෙනැල්ලා ගැහුවාට පසුවත්, මේ අවුරුද්දේ අද වන කොට ඩෙංගු රෝගීන් 9,000කට වැඩි සංඛ්‍යාවක් ඉන්නවා. ඉතා දැවැන්ත විධියට මේ සංඛ්‍යාව දවසින් දවස වැඩි වෙනවා. මම අහන්න කැමැතියි, කියුබානු බැක්ටීරියාව ගෙනැල්ලාත් මේ තත්ත්වය අවසන් කර ගන්න බැරි නම්, 2,000 ගණනකට සිටි රෝගීන් සංඛ්‍යාව 9,000 ගණනකට වැඩි වෙලා තිබෙනවා නම්, ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා.

ගරු ලලිත් දිසානායක මහතා

(மாண்புமிகு லலித் திசாநாயக்க)

(The Hon. Lalith Dissanayake)

හෙට මැලේරියා දිනය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය-

ගරු දයාසිරි ජයසේකර මහතා

(மாண்புமிகு தயாசிறி ஜயசேகர)

(The Hon. Dayasiri Jayasekara)

මම ඩෙංගු ගැනයි ඇහුවේ. මැලේරියා ගැන වෙන ප්‍රශ්නයක් අහන්නම්.

ගරු ලලිත් දිසානායක මහතා

(மாண்புமிகு லலித் திசாநாயக்க)

(The Hon. Lalith Dissanayake)

ඒක හරි. මේ ගැනත් කියන්න ඕනෑ. පොඩ්ඩක් ඉඩ දෙන්නකෝ. මොකද, නොවෙන දේ ගැන විතරක් කියන්නේ. මගේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මේ දේ ගැනත් කියන්න එපා යැ.

ගරු දයාසිරි ජයසේකර මහතා

(மாண்புமிகு தயாசிறி ஜயசேகர)

(The Hon. Dayasiri Jayasekara)

ඩෙංගු ගැන අහපුවාම මැලේරියා ගැන උත්තර දෙනවා. කොහේද යන්නේ, මල්ලේ පොල් වාගෙයි උත්තර දෙන්නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මොකද, මැලේරියා රෝගය සම්බන්ධයෙනුත් මේ වාගේ විශාල වශයෙන් වසංගතය ආවා. කියන්න සතුටුයි, අද වනකොට දිවයිනේ එකම මැලේරියා රෝගියෙක්වත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ගැන අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කරලා දැනට ඉන්නේ පිට රටවලින් පැමිණෙන රෝගීන් පමණයි. 2013 වසරේ මේ වන කොට දේශීය වශයෙන් කිසිම මැලේරියා රෝගියෙක් වාර්තා වෙලා නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මැලේරියා ගැන නොවෙයි අපි අහන්නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අසත්‍යය නොවෙයි. මේක වගකීමෙන් කියන්නේ. අපි කියන්නේ ඩෙංගු රෝගය සම්බන්ධයෙනුත් මරණ සංඛ්‍යාව සියයට 50කින් අඩු කරලා තිබෙනවා. ඒ කියන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන දේ තමයි රෝගීන්ගේ ජීවිත බේරා ගැනීම. මුල සිට සිටි ඩෙංගු රෝගීන්ගේ සංඛ්‍යාව මේ ක්‍රියාදාමය නිසා අපට සියයට 50කින් අඩු කර ගන්නට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

බෝවීම වැළැක්වීම පරිසරයත් එක්ක ගෙන යන වැඩසටහනක්. ඒ වාගේම එයට වෙනත් අමාත්‍යාංශවල සම්බන්ධීකරණයත් කරන්න ඕනෑ. එය සෞඛ්‍ය අමාත්‍යාංශයට විතරක් තනිවම කරන්න බැහැ. ඒ සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කර තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය මට්ටමෙන් වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. මෙය ක්ෂණිකව -එක පාරටම- ජයග්‍රහණය කරන්න පුළුවන් දෙයක් නොවෙයි.

මේ වාගේම තමයි මැලේරියා රෝගයත්. තිස් ගණන්වලදී අසූ දහක් පමණ මැලේරියා රෝගයෙන් මිය ගියා. මේ වාගේ අභියෝග මෙතුමන්ලා කියන විධියට පැයෙන් දෙකෙන්, දවසින් දෙකෙන් අවසන් කරන්න බැහැ. නමුත් ඒ සඳහා ක්‍රියා මාර්ගයක් අරගෙන සාර්ථකව කටයුතු කරලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මට පළමුවැනි අතුරු ප්‍රශ්නයට උත්තරය ලැබුණේ නැහැ. මා ඇහුවේ ඩෙංගු ගැනයි. එතුමා උත්තරය දුන්නේ මැලේරියාව ගැනයි. මා දන්නේ නැහැ, එතුමා මැලේරියා රෝගියෙකුද කියලා. එතුමාට වසංගත රෝගයක් හැදිලාද දන්නේ නැහැ. ප්‍රශ්නය වන්නේ ඒක නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා ඇහුවේ මෙච්චර මුදල් ප්‍රමාණයක් වියදම් කරලා තිබෙද්දී ඩෙංගු රෝගය තවදුරටත් වැඩි වෙලා, මේ තරම් රෝගීන් සංඛ්‍යාවක් - 9,500කට වැඩි සංඛ්‍යාවක්.- හඳුනා ගෙන තිබෙන්නේ කොහොමද කියලායි. ඒකට නියෝජ්‍ය ඇමතිතුමාට උත්තර දෙන්න බැරි නම්, එක්කෝ ඇමතිතුමාට හෝ වෙන කාට හරි හෝ උත්තර දෙන්න කියන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
වෙන කවුරුත් උත්තර දෙන්න ඕනෑ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සෞඛ්‍ය අමාත්‍යාංශය වැඩ කරන්නේ මෙහෙමද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා ඇහුවේ-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකරලා දෙවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මා කිව්වා ඩෙංගු රෝගයෙන් මැරෙන සංඛ්‍යාව සියයට 50කින් අඩු කරලා තිබෙනවා කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ඇහුවේ ඒකයි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මැරෙන සංඛ්‍යාව සියයට 50ක් අඩු කරලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ඇහුවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එතුමාට ඒකට උත්තරය මා දුන්නා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හරි, උත්තරය දුන්නා. දැන් තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයට උත්තරය ලැබුණේ නැහැ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මැලේරියා රෝගය ගැනත් මා කිව්වා. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් කෙරෙන වැඩ ගැනත් කියන්න ඕනෑ. මොකද, හේතුව රටවල් 109ක තවම මැලේරියා රෝගය තිබෙනවා. මේ ලෝකයේ විනාඩියට එක දරුවෙකු මැරෙනවා මැලේරියා රෝගයෙන්. ඒක අපේ රටේ සිද්ධ වන්නේ නැහැ කියන එක අප ආඩම්බරයෙන් කියන්න ඕනෑ. විපක්ෂය හැටියට තමුන්නාන්සේලා නොවන දේ ගැන විතරයි කථා කරන්නේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
පිට රටිනුත් ඇවිල්ලා බලා ගෙන ඉන්නවා. මෙහෙම උත්තර දුන්නොත් අපට ලජ්ජයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ජාත්‍යන්තර වශයෙන් උදව් කරන බහරේන් රටේ නියෝජිතවරුත් ඇවිල්ලා බලා ගෙන ඉන්නවා. ඒ කට්ටිය හිතනවා ඇති-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නයද මේ අහන්නේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ. මා කියන්නේ ඒ අයත් හිතනවා ඇති, මේ යක්කු මොනවාද මේ කථා කරන්නේ කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා අහන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කරුණාකරලා මෝඩකම ප්‍රදර්ශනය කරන්න එපා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! කරුණාකරලා ගරු මන්ත්‍රීතුමාට අතුරු ප්‍රශ්නය අහන්න දෙන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බහරේන් ගැන ඇහුවාම ඇමෙරිකාව ගැන කියනවා වාගේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, මා කියන්නම් අස්වර් කියලා මන්ත්‍රීවරයකු ඉන්නවා- [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අස්වර් මන්ත්‍රීතුමා, නිශ්ශබ්ද වන්න. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වන්න. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බහරේන් නියෝජිත මහත්වරුන්ට මම කියන්නම්, -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ දූත මණ්ඩලයට මම කියන්නම්, අස්වර් කියලා මන්ත්‍රීවරයකු මෙහේ ඉන්නවා, පුළුවන් නම් එතුමාව අරගෙන යන්න කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ පළමු අතුරු ප්‍රශ්නයට උත්තරයක් දුන්නේත් නැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නයට උත්තරයක් දුන්නේත් නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. දැන් කියුබානු බැක්ටීරියාව ලීටර් 10,000ක ප්‍රමාණයක් ගෙනැල්ලා ඒක තැන් තැන්වලට බෙදා දුන්නා. සමහර විට එම බැක්ටීරියාව ගහපු නැති තැනුත් තිබෙනවා. ඒ ගැන මට විස්තර වශයෙන් කියන්න පුළුවන්. ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා උත්තරයක් දුන්නා නම් තමයි මට ඒකට උත්තරයක් දෙන්න වන්නේ. නමුත් එතුමා උත්තරයක් දුන්නේ නැති නිසා මට ඒක කියන්න බැහැ.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණය විධියට මම අහන්නේ මෙයයි. මේ බැක්ටීරියාව කියුබාවෙන් ගෙන ඒම දැන් නවත්වලා තිබෙනවා. ඒ සඳහා ලංකාවෙන් යම් කිසි ප්‍රමාණයක් මීලඟදී ගන්න උත්සාහ කරනවාද, ඒ කොහෙන්ද ගන්න හදන්නේ, මොකක්ද ක්‍රමවේදය කියලා මට කියන්න පුළුවන්ද ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමනි, මැලේරියාව ගැන කථා කරන්නේ නැතිව?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ඒක මේ මුල් ප්‍රශ්නයට අදාළ නැහැ. ඒ ගැන වෙනම ප්‍රශ්නයක් ඔබතුමා ඇහුවොත් ඒක මට කියන්න පුළුවන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ඒ මොකද අදාළ නැත්තේ?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
දේශීය වශයෙන් නිෂ්පාදනය කරන බැක්ටීරියා ප්‍රමාණයකුත් අපි අරගෙන තිබෙනවා. මෙතුමාම පාර්ලිමේන්තුවේදී අහපු ප්‍රශ්නයකට මම ඒ සම්බන්ධව උත්තර දීලා තිබෙනවා. ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න, මම උත්තර දෙන්නම්. ගරු මන්ත්‍රීතුමා කිව්වා නේ මම උත්තර දුන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මරණ සංඛ්‍යාව සියයට පණහකින් අඩු කරලා තිබෙනවා. ඒක තමයි ඩෙංගු රෝගය වැළැක්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට කටයුතු කරලා ලබා ගෙන තිබෙන පළමුවැනි ජය. ඊළඟට මේ රෝගය බෝ වීම පාලනය කිරීම සඳහා අපි කටයුතු කර ගෙන යනවා. ඒක තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ වගකීම. එනම් රෝගීන්ගේ ජීවිත බේරා ගැනීම. මරණ සංඛ්‍යාව අපි අඩු කරලා තිබෙනවා. පළමුවැනි දේ ඒක. රෝගය බෝ වීම සම්බන්ධයෙන් එතුමන්ලාත් කටයුතු කරන්න ඕනෑ. [බාධා කිරීම්] මේ අය ඊයේ මෙතැන ඇවිල්ලා දැහලුවා. ඊයේ මෙතැන ඇවිල්ලා බොරුවට දැහලුවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 5 - 2870/'12 - (2), ගරු ඉරාන් වික්‍රමරත්න මහතා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 6, ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, what is the point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
When the Hon. Speaker of the Bahrain Parliament is here, the Hon. Leader of the Opposition is sleeping. Is that the courtesy he is extending to him?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Sir -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition. Hon. Azwer, please sit down.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Hon. Deputy Speaker, keeping my eyes closed and listening to the Hon. Azwer's nonsense does not amount to sleeping. I wish I could sleep, then I need not listen to his nonsense.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

උතුරු පළාතේ යළි පදිංචි වන මුස්ලිම් ජනතාව : ලියාපදිංචිය සහ පහසුකම්

வடக்கில் மீளக்குடியமரும் முஸ்லிம்கள் : பதிவு மற்றும் வசதிகள்

MUSLIM RETURNEES OF NORTHERN PROVINCE : REGISTRATION AND FACILITIES

2984/'12

6. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යුද්ධය නිසා අවතැන් වූ උතුරු පළාතේ මුස්ලිම් ජනතාව යළි පදිංචියේදී අවශ්‍ය ලියාපදිංචි කිරීම් සහ යටිතල පහසුකම් ලබා දෙන බවට වූ පොරොන්දුව මත තම මුල් ගම්බිම් වෙත නැවත සංක්‍රමණය වී ඇති බවත්;

(ii) එවැනි පවුල් 32,000 කට පමණ අවශ්‍ය ලියාපදිංචි කිරීම්, යටිතල පහසුකම් හා අධ්‍යාපන පහසුකම් ආදිය ලබා දීමට තවමත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්;

(iii) මේ වන විට මෙම ගැටලුව පිළිබඳව සාකච්ඡා වට 1400 කදී පමණ කරුණු දක්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය තුළ නැවත මුල් ගම් බිම් කරා සංක්‍රමණය වී ඇති අවතැන් වූ මුස්ලිම්වරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) සංක්‍රමණය වූ එම ජනතාවගෙන් මේ වන විට ලියාපදිංචිකර ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) අවතැන්වූ මුස්ලිම්වරුන් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් රාජ්‍ය නොවන සංවිධාන විසින් ලබාදී තිබියදීත්, අවශ්‍ය ලියාපදිංචි කිරීම් කටයුතු සහ යටිතල පහසුකම් ලබාදීමේ කටයුතු සිදු නොකිරීමට හේතු කවරේද;

(iv) වෙනත් රටක් මැදිහත් වී මෙම ප්‍රශ්නය විසඳීමට පෙර අදාළ පහසුකම් සහ ලියාපදිංචිය ඔවුන්ට ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மீள்குடியேற்ற அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யுத்தத்தால் இடம்பெயர்ந்த வடக்கு மாகாண முஸ்லிம் மக்கள் குடியமரும்போது தேவையான பதிவுகள் மற்றும் உட்கட்டமைப்பு வசதிகள் வழங்கப்படுமென அளித்த வாக்குறுதியின் அடிப்படையில் தமது பூர்வீக நிலங்களுக்கு மீண்டும் புலம்பெயர்ந்துள்ளனர் என்பதையும்;

(ii) இவ்வாறான 32,000 குடும்பங்களுக்குத் தேவையான பதிவு, உட்கட்டமைப்பு வசதிகள், கல்வி வசதிகள் ஆகியவற்றை பெற்றுக்கொடுப்பதற்காக இற்றைவரை எவ்வித நடவடிக்கையும் எடுக்கப்படவில்லை என்பதையும்;

(iii) இன்றளவில் மேற்படி பிரச்சினை தொடர்பில் ஏறத்தாழ 1400 சுற்றுப் பேச்சுவார்த்தைகளின் போது விடயங்கள் முன்வைக்கப்பட்டுள்ளன என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) 2012ஆம் ஆண்டினுள் மீண்டும் சொந்தக் கிராமங்களை நோக்கி புலம்பெயர்ந்துள்ள இடம் பெயர்ந்த முஸ்லிம்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) புலம்பெயர்ந்த மேற்படி மக்களில் இன்றளவில் பதிவு செய்யப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) இடம்பெயர்ந்த முஸ்லிம்களை மீளக்குடியமர்த்துவதற்குத் தேவையான நிதி ஏற்பாடுகள் அரச சார்பற்ற அமைப்புக்களினூடாக வழங்கப் பட்டிருக்கையில்; தேவையான பதிவுகள் மற்றும் உட்கட்டமைப்பு வசதிகளை பெற்றுக்கொடுக்காமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) பிறிதொரு நாடு தலையிட்டு மேற்படி பிரச்சினையை தீர்ப்பதற்கு முன்னர் உரிய வசதிகளையும் பதிவுகளையும் இவர்களுக்கு வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Resettlement:

(a) Is he aware that -

(i) the Muslims of the Northern Province, displaced owing to the war, have returned to their original villages as they were promised of necessary registration and infrastructure facilities;

(ii) no steps have been taken so far to provide nearly 32,000 such families with necessary registration, infrastructure and educational facilities; and

(iii) matters relevant to this issue have been raised at nearly 1,400 rounds of discussion held by now?

(b) Will he state -

(i) the number of displaced Muslims who have returned to their original villages in the year 2012;

(ii) out of those returnees , the number that has been registered by now;

(iii) the reason for not effecting the necessary registration and not providing infrastructure facilities despite the required financial allocations being provided by Non-government Organizations for the purpose of resettling the displaced Muslims; and

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

(iv) whether arrangements will be made to register them and provide them with the necessary facilities before a foreign country intervenes to solve this problem?

(c) If not, why?

ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)
(மாண்புமிகு குணரத்ன வீரகோன் - மீள்குடியேற்ற அமைச்சர்)
(The Hon. Gunaratne Weerakoon - Minister of Resettlement)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මේ වන විට එල්ටීටීඊ සංවිධානය විසින් පලවා හැරීම හේතුවෙන් අවතැන් වූ මුස්ලිම් ජනතාව තම මුල් ගම්බිම්වල පදිංචි වීම සිදුවෙමින් පවතී. ඔවුන්ගේ කැමැත්ත මත මුල් ගම්බිම්වලට යාමට අවශ්‍ය ඕනෑම අයෙකුට කිසිදු බාධාවකින් තොරව ඒ සඳහා ලියාපදිංචිය ලබා දී ඇත.

(ii) උතුරු පළාතේ නැවත පදිංචිය සඳහා මුස්ලිම් පවුල් 19,875ක් ලියාපදිංචි කර ඇත. ඔවුන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ අධ්‍යාපන පහසුකම් ලබා දීමට අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් කටයුතු කරනු ඇත.

(iii) වාර්තා වී නොමැත.

(ආ) (i) 2012 වර්ෂය අවසන් වන විට මුල් ගම්බිම්වලට සංක්‍රමණය වූ අවතැන් මුස්ලිම් පවුල් සංඛ්‍යාව පහතින් දක්වා ඇත.

දිස්ත්‍රික්කය	සංක්‍රමණය වූ මුස්ලිම් පවුල් සංඛ්‍යාව
කිලිනොච්චිය	618
මන්නාරම	14,004
මුලතිවු	2,144
යාපනය	2,138
වවුනියාව	971
මුළු සංඛ්‍යාව	**19,875**

(ii) ඉහත සටහන අනුව උතුරු පළාතෙහි මුස්ලිම් පවුල් 19875ක් ලියාපදිංචි කර ඇත.

(iii) එල්ටීටීඊ සංවිධානය විසින් පලවා හරින ලද ඉහත සඳහන් මුස්ලිම් පවුල්වල සුබසාධනය සඳහා රාජ්‍ය නොවන සංවිධානවලින් ප්‍රමාණවත් ආධාර මුදල් මේ වන තෙක් ලැබී නොමැත. එබැවින් 2009 මැයි මාසයට පෙර අවතැන් වූ සියලුම ජන වර්ගයන්ට අයත් නමුත් ප්‍රමාණවත් ලෙස ඉඩම් හෝ නිවාස ආධාර නොලැබුණු අවතැන් වූ පවුල් පිළිබඳව අධ්‍යයනයක් මාගේ අමාත්‍යාංශය විසින් දැනට සිදු කරමින් පවතී.

(iv) ඉහත අධ්‍යයනය තුළින් අදාළ පවුල් සංඛ්‍යාව සත්‍යාපනය කර ගැනීමෙන් අනතුරුව 'මහින්ද චින්තන ඉදිරි දැක්ම' ප්‍රතිපත්ති රාමුව තුළ ඔවුන්ට අවශ්‍ය නිවාස අධාර ලබා දීමට පියවර ගනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාගේ පිළිතුර අනුව දැන් එතුමා පැහැදිලි කළා, අපේ රටේ අවතැන් වූ ජනතාව තවමත් ඉන්නවා කියලා. එක අවස්ථාවක රජය කියනවා -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

අතුරු ප්‍රශ්නය තමයි. එයට ප්‍රවේශයක් අවශ්‍යයි නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එක පාරටම අහන්න බැහැ නේ. දැන් ඔක්කොම කරලා ඉවරයි කියලාත් සමහර අය මාධ්‍යවලට කියනවා, මා දැකලා තිබෙනවා. කෙසේ වෙතත් ඉදිරියේදී පළාත් සභා මැතිවරණය පැවැත්වෙනවා. විශේෂයෙන් පුත්තලම වාගේ ප්‍රදේශවලත් මෙම ප්‍රශ්නය පැන නැඟිලා තිබෙනවා. සැප්තැම්බර් මාසයේ පමණ පළාත් සභා මැතිවරණය පවත්වනවාය කියලා තමුන්නාන්සේලා විවිධ පුවත් පත්වලට කියා තිබෙනවා මා දැක්කා. මේ මැතිවරණ පවත්වන විට ඒ අය ඡන්දය පාවිච්චි කරන්නේ කොහොමද? ඔවුන් ඒ අවතැන් කඳවුරු තුළ සිට ඡන්දය පාවිච්චි කරනවාද? එහෙම නැන්නම් ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මේ වාර්තා ලැබෙන්නේ, වාර්තා සකස් කර ගන්නේ, සංඛ්‍යා ලේඛන සකස් කර ගන්නේ දිස්ත්‍රික් ලේකම්වරුන් මාර්ගයෙනුයි. දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාම නිලධාරීන් මඟින් ලැබෙන වාර්තා අනුව තමයි අපි මේවා සකස් කරන්නේ. ඒ ලැබෙන තොරතුරු අනුව තමයි අපි මේ ලැයිස්තු ඉදිරිපත් කරන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඡන්දය පාවිච්චි කරන එක ගැන නේ මා අහන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

පළමුවන අතුරු ප්‍රශ්නයට මට පිළිතුරක් ලැබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා ඇහුවේ රජයක් විධියට පළාත් සභා මැතිවරණයක් පවත්වනවා නම් -

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ඡන්දය පාවිච්චි කරන එක මැතිවරණ කොමසාරිස්තුමා තීන්දු කරාවි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු ඇමතිතුමා පිළිතුර දුන්නාද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
පිළිතුර මට ලැබුණේ නැහැ.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
පිළිතුර දුන්නා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නයට පිළිතුරක් ලැබුණේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා පිළිතුර දීලා අවසානයි කියනවා. ඔබතුමා දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
එතුමා ඒකට පිළිතුරක් දුන්නේ නැහැ.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ඡන්ද පිළිබඳ ප්‍රශ්නය මැතිවරණ කොමසාරිස්තුමා විසඳාවි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එතුමා කියනවා නම් එය පිළිතුර කියලා, ගරු මන්ත්‍රීතුමා දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ඒ ප්‍රශ්නය මට අදාළ නැහැ නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
එතුමා කියනවා, දිස්ත්‍රික් ලේකම්වරුන්ලු තීරණය කරන්නේ. දැන් රජය නේ තීරණය කරන්නේ, පළාත් සභා මැතිවරණය වේලාසනින් පවත්වන්න. රජයේ න්‍යාය පත්‍රයක් තිබෙන්න ඕනෑ නේ, -

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
තමුන්නාන්සේ ඇහුවේ ඡන්දය පිළිබඳව නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
රජයේ න්‍යාය පත්‍රයක් තිබෙන්න ඕනෑ නේ, ඒ අනාථ කඳවුරුවල ඉන්න ජනතාව ඡන්දය පාවිච්චි කරන්නේ කොහොමද කියන එක පිළිබඳව. එහෙම නැත්නම් බොදු බල සේනා සංවිධානයද එය තීරණය කරන්නේ?

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
මැතිවරණ කොමසාරිස්වරයා එය තීන්දු කරාවි. එය මට අදාළ නැහැ නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාම කිව්වා, රාජ්‍ය නොවන සංවිධානවලින් ඒ අවශ්‍ය පහසුකම් ලැබෙන්නේ නැහැයි කියලා. එහෙම නම් රජය වශයෙන් ඒ සම්බන්ධයෙන් කරන්න බලාපොරොත්තු වන්නේ මොකක්ද?

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
රජය වශයෙන් අපි මේ වන විට නිවාස සෑදීම ආරම්භ කර තිබෙනවා. මේ වන විට ඒ කටයුතු කර ගෙන යනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා හැම දාම කිව්වේ ඒ කටයුතු ආරම්භ කරලා කර ගෙන යනවා කියලායි. නමුත් තවමත් විශාල ප්‍රමාණයක් එම කඳවුරුවල ඉන්නවා. දැන් වසර ගණනාවක් ගත වෙලා තිබෙනවා. අදාළ විෂය භාර අමාත්‍යවරයා විධියට ඔබතුමාගෙන් මා අහන්නේ පැහැදිලි සැලැස්මක් තිබෙනවාද කියලායි.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
මේ ප්‍රශ්නයට -කරපු වැඩ කොටස සහ තව කරන්න තිබෙන වැඩ කොටස් ගැන- මේ සභාවේදී කිහිප වතාවක් පිළිතුරු දුන්නා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, කිහිප වතාවක් අහන්න සිද්ධ වුණේ "කරනවා, කරනවා" කියලා හැම දාම කියන නිසායි. කාල වකවානුවක් - time frame එකක්- තිබෙන්න ඕනෑ.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
මීට කලින් අපි කියලා තිබෙනවා නේ. දැන් අපි ඒ කටයුතු කර ගෙන යනවා. තමුන්නාන්සේ ගිහින් බලන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කර ගෙන යනවා කියලා තමයි හැම දාම කියන්නේ.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
තමුන්නාන්සේ කොළඹට වෙලා ඉඳ ගෙන නේ මේ ප්‍රශ්න අහන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 8 - 3173/'12 - (1), ගරු අනෝමා ගමගේ මහත්මිය.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු කිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

බීජ ආනයනය සහ නිෂ්පාදනය : විස්තර
விதைகளின் இறக்குமதி மற்றும் உற்பத்தி : விபரம்
IMPORT AND PRODUCE OF SEEDS: DETAILS

3202/'12

9. ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවට බීජ වර්ග ආනයනය කිරීමේදී බී ලූණු, වට්ටක්කා, මාළුම්රිස්, පතෝල, මිරිස්, තක්කාලි, වැටකොළු, පිපිඤ්ඤා, කැකිරි, මෑ, ගස්ලබු, මුංඇට, කරවිල හා රටකජු යන බෝග වර්ගවලින් වාර්ෂිකව ගෙන්වන බීජ ප්‍රමාණයන්;

(ii) ආනයනික එම එක් එක් බීජ වර්ගය අතරින් පෞද්ගලික අංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගෙන්වනු ලබන ප්‍රමාණයන්;

(iii) ඉහත සඳහන් එක් එක් බීජ වර්ගයේ කිලෝ එකක මිල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දේශීයව නිෂ්පාදනය කරනු ලබන ඉහත එක් එක් බෝගයේ බීජ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණයන් දේශීය බීජ අවශ්‍යතාව සපුරාලීම සඳහා ප්‍රමාණවත් වේද;

(iii) ඉහත සඳහන් බීජ දේශීය ගොවිපළවල නිෂ්පාදනය කරන්නේ නම්, ගොවීන්ට ඒවා ලබා දිය හැකි මිල ගණන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்கு விதை வகைகளை இறக்குமதி செய்கையில், பெரிய வெங்காயம், பூசணிக்காய், கறிமிளகாய், புடலங்காய், மிளகாய். தக்காளி, பீர்க்கங்காய், வெள்ளரிக்காய், கெக்கரிக்காய், பயற்றங்காய், பப்பாசி, பயறு, பாகற்காய் மற்றும் நிலக்கடலை ஆகிய பயிர் வகைகளில் வருடாந்தம் இறக்குமதி செய்யப்படும் விதைகளின் அளவு;

(ii) இறக்குமதி செய்யப்படும் மேற்குறிப்பிடப்பட்ட ஒவ்வொரு விதை வகையிலும் தனியார் துறையினாலும் கமத்தொழில் திணைக்களத்தி னாலும் இறக்குமதி செய்யப்படும் அளவு;

(iii) மேற்குறிப்பிடப்பட்ட ஒவ்வொரு விதை வகையினதும் ஒரு கிலோவிற்கான விலை

வெவ்வேறாக யாது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உள்நாட்டில் உற்பத்தி செய்யப்படும் மேற்குறிப்பிடப்பட்ட ஒவ்வொரு பயிரினதும் விதைகளின் அளவு வெவ்வேறாக யாது;

(ii) மேற்படி அளவுகள் உள்நாட்டு விதை வகைகளின் தேவையை பூர்த்தி செய்வதற்குப் போதுமானதா;

(iii) மேற்குறிப்பிடப்பட்ட விதை வகைகளை உள்நாட்டுப் பண்ணைகளில் உற்பத்தி செய்வதாயின், விவசாயிகளுக்கு அவற்றை வழங்கக்கூடிய விலை யாது

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he state separately -

(i) the quantities of B-onion, pumpkin, capsicum, snakegourd, chillie, tomato, ridged-gourd, cucumber, long bean, papaw, greengram, bittergourd and peanut seeds imported annually to Sri Lanka;

(ii) the quantities of seeds imported out of each variety of imported seeds by the private sector and by the Department of Agriculture; and

(iii) the price of one kilo of each variety of seed mentioned above?

(b) Will he also state -

(i) separately, the quantity of seeds produced locally from each variety of crop;

(ii) whether the aforesaid quantities are sufficient to fulfil the local seed requirement; and

(iii) the price at which seeds could be provided to the farmers if the aforesaid seeds are produced in the local farms ?

(c) If not, why ?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2012 වර්ෂයේ ආනයනය පහත සඳහන් වේ.

අනු අංකය	බෝගය	මුළු ආනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.)
01.	බී ලූනු	23,112
02.	වට්ටක්කා	11,177
03.	මාළු මිරිස්	130
04.	පතෝල	5
05.	මිරිස්	7,205
06.	තක්කාලි	3,437
07.	වැටකොළු	6,312
08.	පිපිඤ්ඤා	3,304
09.	කැකිරි	-
10.	මෑ	6,565
11.	ගස් ලබු	20
12.	මුං ඇට	-
13.	කරවිල	4,352
14.	රටකජු	-

(ii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් බීජ ආනයනය නොකරන අතර, සියලුම බීජ වර්ග ආනයනය කරනු ලබන්නේ පෞද්ගලික අංශය මඟින් පමණි.

(iii) ශ්‍රී ලංකා රේගුව විසින් එළවලු බීජ කාණ්ඩ යටතේ එළවලු බීජ වර්ගය අනුව ආනයනය කිරීමේ වටිනාකම, ගත් මිල පිළිබඳව ලේඛන පවත්වා ගෙන යනු නොලැබේ. ඒවා සියල්ල ඇතුළත්ව ඇත්තේ එළවලු බීජ කාණ්ඩ යටතේ පමණි. එම නිසා එක් එක් එළවලු බීජ වර්ග ආනයනය කිරීමේ එක් කිලෝ ග්‍රෑමයක මිල ගණන් දැනට ඉදිරිපත් කළ නොහැක.

(ආ) (i) 2012 වර්ෂයේ නිෂ්පාදනය පහත පරිදි වේ.

අනු අංකය	භෝගය	බීජ පංතිය	නිෂ්පාදනය කළ ප්‍රමාණය (කි.ග්‍රෑ.)
01.	මාළු මිරිස්	සහතික	696
02.	පතෝල	මූලික	67
		සහතික	1549
03.	මිරිස්	මූලික	963
		සහතික	9869
04.	තක්කාලි	මූලික	35
		සහතික	366
05.	වැටකොළු	මූලික	222
		සහතික	1091
06.	පිපිඤ්ඤා	මූලික	0.8
		සහතික	205
07.	මෑ	මූලික	197
		සහතික	4988
08.	මුං ඇට	අත්තිවාරම්	2103
		ලියාපදිංචි	7021
		සහතික	140040
09.	කරවිල	මූලික	6
		සහතික	3610
10.	රටකජු	අත්තිවාරම්	922
		ලියාපදිංචි	5454
		සහතික	120337

(ii) ප්‍රමාණවත් නොවේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රධාන වශයෙන් මූලික බීජ නිෂ්පාදනය කරනු ලබන අතර, දෙපාර්තමේන්තුව මඟින් හා පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් එම භෝග ප්‍රභේදවල සහතික පංතියේ බීජ නිෂ්පාදනය සිදු කෙරේ.

මෙයට අමතරව පෞද්ගලික අංශය මඟින් විදේශයන්ගෙන් බීජ ප්‍රමාණයක් ආනයනය කිරීම සිදු කරයි. ඊට අමතරව දේශීයව නිෂ්පාදනය කිරීමට නොහැකි සෞම්‍ය කලාපීය එළවලු බෝගවල බීජ සම්පූර්ණ අවශ්‍යතාව පෞද්ගලික අංශය මඟින් ආනයනය කෙරේ.

(iii)

අනු අංකය	බෝගය	ප්‍රභේදය	බීජ පන්තිය	බීජ කිලෝග්‍රෑම් 1ක් අළෙවිය සඳහා මිල (රුපියල්)
01.	මාළු මිරිස්	එම	එම	8,320.00
02.	පතෝල	එම	එම	3,520.00
03.	මිරිස්	එම	සහතික	3,300.00
04.	තක්කාලි	තිළිණ	සහතික	15,000.00
		වෙනත්	සහතික	12,600.00
05.	වැටකොළු	සියලුම ප්‍රභේද	එම	5,850.00
06.	පිපිඤ්ඤා	සියලුම ප්‍රභේද	එම	3,760.00
07.	මෑ	හවරි	එම	2,680.00
		පොලොං	එම	2,240.00
08.	මුං ඇට	සියලුම ප්‍රභේද	සහතික	265.00
09.	කරවිල	එම.සී. 43	සහතික	4,300.00
		මාතලේ කොළ	සහතික	5,000.00
		තින්නවේලි සහතික		6,400.00
10.	රටකජු	වලව	සහතික	280.00
		වෙනත්	සහතික	270.00

(ඇ) අදාළ නොවේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතාම කනගාටු වෙනවා මේ රටේ කෘෂිකර්ම ඇමතිවරයා පිට රටින් ආනයනය කරන බීජවල මිල ගණන් කොපමණද කියලා දන්නේ නැති එක ගැන. ඒ සම්බන්ධ කිසිම ලේඛනයක් නැහැ. බීජ අළෙවිය සම්පූර්ණයෙන්ම බහුජාතික සමාගම්වලට දීලා ගොවියා සූරා කන්න ඉඩ දී තිබෙනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය ලෙස මම ගරු ඇමතිතුමාගෙන් අහන්නේ මෙයයි. මේ රටේ මහජන සල්ලිවලින් රුපියල් කෝටි 576ක් වියදම් කරලා තමයි කෘෂිකර්ම අමාත්‍යාංශය නඩත්තු කරන්නේ. ගරු ඇමතිතුමනි, පිට රටින් ගෙන්වන බීජවල ලේඛනය කොහේද තිබෙන්නේ කියලා ඔබතුමා අපට කියන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඒ ප්‍රශ්නයේදී කොටස් දෙකක් ගැන කිව්වා. එතුමා එක කාරණයක් වශයෙන් කිව්වා මේ බීජ නිෂ්පාදනය කරන්නේ නැති එක ගැන අප ලජ්ජා වන්න ඕනෑය කියලා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
නිෂ්පාදනය කරන්නේ නැති එක ගැන නොවෙයි මම කිව්වේ. පිට රටින් ගෙන්වන බීජවල ලේඛනයක් නැති එක ගැනයි මම කිව්වේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔව්, බීජ ගෙන්වන එක ගැන. පොඩ්ඩක් ඉන්න මම කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ලජ්ජා වෙන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ අපේ බීජ ගොවිපළවල් සියල්ලම පෞද්ගලික ආයතනවලට විකුණලා - [බාධා කිරීම්] තමුන්නාන්සේලා ඒවා පෞද්ගලික ආයතනවලට විකුණුවා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහගෙන ඉන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අද මෙතැනට ඇවිත් බීජ ගැන කථා කරනවා . ඔබතුමා ඒ ගැන ලජ්ජා වෙන්න ඕනෑ. මේ පිට රටින් ගෙන්වන්නේ - [බාධා කිරීම්] පැල්වෙහෙර බීජ ගොවිපළ දුන්නේ අපද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හිඟුරක්ගොඩ ගොවිපළ කවුද දුන්නේ?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
හිඟුරක්ගොඩ ගොවිපළ අපද දුන්නේ? තමුන්නාන්සේලා මේ රටේ බීජ නිෂ්පාදනය සම්පූර්ණයෙන් විනාශ කරලා අද මෙතැනට ඇවිත් කථා කරනවා. රජයට තිබුණු සියලු දේපළ පෞද්ගලික අංශයට කුණු කොල්ලයට විකුණුවේ තමුන්නාන්සේලායි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයට හරියට උත්තරයක් හම්බ වුණේ නැහැ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඉන්න මම උත්තර දෙන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බීජ ගෙන්වීමේ සම්පූර්ණ අයිතිය පෞද්ගලික අංශයට පැවරුවේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව කාලයේයි. අද මේ ගෙන්වන්නේ දෙමුහුන් බීජ. දෙමුහුන් බීජ ගෙන්වලා අපේ ගොවීන්ට පුරුදු කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේයි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඉතින් ඔබතුමන්ලා ඒවා හදන්න එපා යැ, 2004 ඉඳලා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඇහුවේ දේශපාලන කථාවක් නොවෙයි. කරුණාකර කියන්න පිට රටින් ගෙනෙන බීජවල ලැයිස්තුව අපට ගන්න පුළුවන් කොහෙන්ද කියලා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමන්ලාගේ නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තියේ වැඩ පිළිවෙළ යටතේ ඒක පෞද්ගලික අංශයට දීලා පෞද්ගලික අංශයෙන් සම්පූර්ණයෙන් පාලනය කරනවා. ඒකට අපේ සම්බන්ධයක් නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමනි, ඔබතුමා Sri Lanka Customs එකෙන් තොරතුරු ඉල්ලා ගන්න. අපි ඒවායේ ලේඛනයක් පවත්වා ගෙන යන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒක අවශ්‍ය නැහැ. එය පෞද්ගලික අංශයේ වැඩක්.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසු ගිය COPE අතුරු වාර්තාවේත්, 2007 ජනවාරි මාසයේ 11වැනි දා විජයදාස රාජපක්ෂ මැතිතුමාගේ සභාපතිත්වයෙන් ඉදිරිපත් කළ වාර්තාවේත් මේ කාරණය දිගින් දිගටම පෙන්වලා පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කළා. ලංකාවේ BOI සමාගම හරහා කොම්පැනි ගණනාවක් මිනිස් පරිභෝජනයට නුසුදුසු, ඉන්දියාව, පාකිස්තානය වැනි රටවල සත්ව ආහාරවලට සුදුසු තත්ත්වයේ

ආහාර ද්‍රව්‍ය -විශේෂයෙන්ම මුං ඇට, කවුපි, කඩල- මේ රටට ගෙනැල්ලා මේ රටේ ජනතාවට කන්න දෙනවා. ඌරන්ට, කුකුළන්ට, බූරුවන්ට, හරකුන්ට කන්න දෙන ආහාර ගෙනැල්ලා දැන් මෙහේ විකුණනවා. ඔබතුමා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට ඒවා නවත්වන්න ගෙන ඇති පියවර මොනවාද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මුං ඇට බීජ ගෙන්වීම මේ අවුරුද්දේදී සම්පූර්ණයෙන්ම නතර කරනවා. [බාධා කිරීමක්] නැහැ, ගිය අවුරුද්දේ අවසාන කෙරුවා. මේ අවුරුද්දේ සම්පූර්ණයෙන් අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ කඩල බීජ නිෂ්පාදනය කරන්නේ නැහැ. කඩල මේ රටේ නිෂ්පාදනය කරන්න බැහැ. අපි මුං ඇට බීජ ගෙන්වීම මේ අවුරුද්දේ සම්පූර්ණයෙන් අවසන් කරනවා.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

ගෙනාවාට කමක් නැහැ. BOI සමාගමෙන් අවසර දීලා තිබෙනවා duty free ගේන්න. සත්ව ආහාර සඳහා ගෙන්වූ ආහාර දැන් අල්ලා ගෙන තිබෙනවා. මේ බව දිගින් දිගටම COPE වාර්තාවේ සඳහන් කරනවා. ප්‍රමිතියෙන් තොර ආහාර ද්‍රව්‍ය ගෙනැල්ලායි මේ රටේ මිනිසුන්ට කන්න දෙන්නේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)

තමුන්නාන්සේ ඒ ගැන අහ ගන්න සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සහ Sri Lanka Customs එකෙන්.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

ඒක මාර කථාවක් නේ. රටේ කෘෂිකර්ම ඇමතිවරයා හැටියට අපි ඔබතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවාම කැබිනට් මණ්ඩලය වෙනුවෙන් පිළිතුරු දෙන්න ඔබතුමාට වගකීමක් තිබෙනවා නේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)

මේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශයට පාලනය කරන්න ඉඩ දුන්නේ තමුන්නාන්සේලා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

තුනෙන් දෙකක බලයක් තිබෙනවා නේද, ඇයි ඒක නවත්වන්නේ නැත්තේ?

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

මට පෙනෙන හැටියට තමුන්නාන්සේ උත්තර දෙන්නේ එහෙන් එවාපු කඩල කාලාද කොහේද.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)

මට නොවෙයි ඒ කඩල ගෙනැල්ලා තිබෙන්නේ තමුන්නාන්සේට කන්න.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලා දේශීය ගොවියා ශක්තිමත් කරන්න මේ රටේ බී ලූනු බීජ නිෂ්පාදනය කරන්න පටන් ගෙන තිබෙනවා. ඒක හොඳයි. නමුත් අද දේශීය අවශ්‍යතාවට සරිලන පරිදි බී ලූනු බීජ නිෂ්පාදනය කරන්නට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා බී ලූනු බීජ හොර පාරෙන් ගේන්න ලෑස්ති කරලා තිබෙනවා. පසු ගිය දවස්වල අවස්ථා කිහිපයකදීම ඒවා Sri Lanka Customs එකෙන් ඇල්ලුවා. අල සහ ලූනු ගෙන්වන කන්ටේනර්වල මේවා ගෙන්වනවා. එහෙම වුණාම එක පැත්තකින් විවිධ ලෙඩ රෝග බෝ වුණු බීජ අපේ රටට එනවා. අනෙක් කාරණය තමයි කිසිම පාලනයක් නැතිකම. කෘෂිකර්ම ඇමතිවරයා හැටියට මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ බීජ වර්ග ගෙන්වීම රජයේ පාලනයට ගන්න කියායි; විශේෂයෙන්ම බී ලූනු බීජ ගෙන්වීම අධීක්ෂණය කරන්න කියායි. අපි දිගින් දිගටම මේ කාරණය පෙන්වලා දුන්නා. නමුත් තවම ඒ සඳහා කිසිම වැඩ පිළිවෙළක් ගෙන නැහැ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලොකු ලූනු බීජ අවශ්‍යතාවෙන් සියයට 90ක්ම අපි දැන් නිෂ්පාදනය කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් හොරෙන් ගෙනෙන ඒවා පාලනය කරන්නට - [බාධා කිරීමක්] ඒක තමයි ඇල්ලුවේ. කටුනායක ගුවන් තොටුපොළේ සිටින අපේ නියෝජිතයා තමයි ඒ හොරෙන් ගෙනෙන ලද බීජ ප්‍රමාණය ඇල්ලුවේ. ඒ විස්තරය නේ පත්තරයේ ගියේ; තමුන්නාන්සේ දැක්කේ. වන්දනා නඩයක් ගියාම හුහක් දෙනෙකු ඒ අයගේ බෑග්වල මේ බීජ අරගෙන එනවා ලු. නමුත් අපට අහු වෙන්නේ නැහැ. ඒ විධියට අහු වෙන්නේ නැතිව ඕනෑ තරම් එනවා. ලංකාවට ඕවා විකරයිද අහු වෙන්නේ නැතිව එන්නේ? තවත් ඕනෑ තරම් දේවල් අහු වෙන්නේ නැතිව ඇවිල්ලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

Mattala Rajapaksa International Airport එකෙන්ද ආවේ?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)

මම තමුන්නාන්සේට ඒකට පස්සේ උත්තර දෙන්නම්.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

ප්‍රශ්නය මේකයි. තමුන්නාන්සේලා නිෂ්පාදනය කරන බීජ ප්‍රමාණවත් නැති නිසායි හොරෙන් ගේන්නේ. එහෙම නම් මේ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ නේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොරෙන් ගේන්නේ ඉන්දියාවෙන් මේවා ලාභයට ගන්න පුළුවන් නිසායි. ඉන්දියන්

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

රුපියල් පන්සියයට, හයසියයට මේවා එහෙන් ගන්න පුළුවන්. අපේ රටේ නිෂ්පාදනය කළාම නිෂ්පාදන වියදම පමණක් රුපියල් 8,000ක් වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ වෙලාවේ විවාදයක් පවත්වන්නට අවස්ථාවක් නැහැ. ගරු ඇමතිතුමනි, පිළිතුර දුන්නාද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවාම එතුමා හරියට පිළිතුරක් දෙන්නේ නැහැ නේ. මට පේන්නේ එතුමාට කෘෂිකර්මය ගැන තේරෙන්නේත් නැහැ, ආණ්ඩුව ගැන තේරෙන්නේත් නැහැ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එතුමා අහන්නේ හොරෙන් ගේන්නේ ඇයි කියලා. ඉතින් මම කොහොමද දන්නේ ඒක.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10 -2322/'12-(2), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රශ්නය අහනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Sir, on behalf of the Hon. Minister of Local Government and Provincial Councils, I ask for two weeks' time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11 -2445/'12-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රශ්නය අහනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා වෙනුවෙන් මෙම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය: ග්‍රාමීය මාර්ග පද්ධතිය

சம்பத்நுவர பிரதேச செயலாளர் பிரிவு : கிராமிய வீதி முறைமை

SAMPATHNUWARA DIVISIONAL SECRETARY'S DIVISION: RURAL ROAD SYSTEM

2512/'12

12. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සජිත් ප්‍රේමදාස මහතා,- වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධන වැඩසටහන් සඳහා 2010, 2011, 2012 යන වර්ෂවලදී වැය කරන ලද මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මේ වන විට එම ප්‍රදේශය තුළ තිබෙන ග්‍රාමීය මාර්ග පද්ධතිය සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම මාර්ග පිළිසකර කිරීමට අවශ්‍ය මුළු මුදල ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) අබලන් වී ඇති ඉහත මාර්ග පිළිසකර කිරීමට ගතවන කාලය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) வட மாகாணத்தின் சம்பத்நுவர பிரதேச செயலாளர் ஆளுகைப் பிரதேசத்தில் வீதி அபிவிருத்தி நிகழ்ச்சித்திட்டங்களுக்காக 2010, 2011 மற்றும் 2012ஆம் ஆண்டுகளில் செலவிடப்பட்ட மொத்தப் பணத்தொகை யாதென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) தற்போது குறித்த பிரதேசத்தில் காணப்படும் கிராமிய வீதி முறைமை முழுமையாக சேதமடைந்துள்ள தென்பதை அவர் அறிவாரா?

(இ) (i) மேற்படி வீதிகளை புனரமைக்கத் தேவையான மொத்தப் பணத்தொகையை வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) சேதமடைந்துள்ள மேற்படி வீதிகளைப் புனரமைப்பதற்கு எடுக்கும் காலம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he state the total amount of money spent on road development activities in Sampathnuwara Divisional Secretary's Division in the Northern Province in the years 2010, 2011 and 2012?

(b) Is he aware that the road system in the rural areas of the aforesaid Divisional Secretary's Division is in a state of complete dilapidation at present?

(c) Will he also state -

(i) whether action will be taken to provide the total amount of money required for repairing the aforesaid roads; and

(ii) the period of time that will be taken for repairing the aforementioned roads which are in a dilapidated condition?

(d) If not, why ?

ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Minister of Ports and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) සම්පත් නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 2010, 2011, 2012 යන වර්ෂවලට අදාළව මාර්ග සංවර්ධන කටයුතු සිදු කරනු ලැබුයේ මහවැලි සංවර්ධන අධිකාරිය මඟිනි. ඒ අනුව මිලියන 168.7ක සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා.

(ආ) සංවර්ධනය කළ යුතු මාර්ග කීපයක් ඇත.

(ඇ) (i) මාර්ග පහකට මේ වන විට ටෙන්ඩර් කැඳවා තිබෙනවා. ඒකේ දුර ප්‍රමාණයන් නමත් එක්ක සඳහන් කරන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ඒවා ඔබතුමාට අවශ්‍යද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමා සඳහන් කළානේ මිලියන 168ක් වැය කර තිබෙනවාය කියා.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ඒ, 2010, 2011, 2012 මහවැලි සංවර්ධන අධිකාරිය මඟින්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒක සම්පූර්ණයෙන් වැය කර හමාරද?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ඔව්. ඒ වාගේම 2013ත් මහවැලි සංවර්ධන අධිකාරියෙන් රුපියල් මිලියන 9.8ක් වැය කර තිබෙනවා. ඔබතුමා අහලා තිබෙන්නේ 2010, 2011 සහ 2012.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

2013 මුළු අවුරුද්දටම රුපියල් මිලියන 9.8ද?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ඒ, මහවැලි සංවර්ධන අධිකාරියෙන්. අනෙක් සියලුම මාර්ග සංවර්ධනයන් මහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉටු කරනවා. ඒ ටික ඔබතුමාට ඕනෑ නම් විස්තර සහිතව දෙන්න පුළුවන්. මන්ත්‍රීතුමනි, ඒ පාරවල් ටික අවශ්‍යද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ. Table කරන්න.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, (ඇ) (i) කොටසට අදාළ පිළිතුර මා **table*** කරනවා.

(ඇ) (ii) මේ වන විට ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට යොමු කර ඇත.

(ඈ) පැන නොනඟී.

සභාමේසය මත තබන ලද (ඇ)(i)ට අදාළ පිළිතුර:
சபாபீடத்தில் வைக்கப்பட்ட (இ) (1) க்கான விடை:
Tabled Answer for c(i):

(ඇ) (i) සම්පත් නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත සඳහන් මාර්ග සංවර්ධනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පියවර ගෙන ඇත. ඒ සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතී.

01. පරාක්‍රමපුර සිට කැළැබෝගස්වැව හරහා වව්නියාව මාර්ගය - කි.මී. 0 + 000 සිට 46 + 600 දක්වා (පාලම් 5ක් සහ බෝක්කු 165ක්ද ඇතුළත්ව)

02. ඇහැටුගස්වැව පන්සල පාර - කි.මී. 0 + 000 සිට 0 + 450 දක්වා (බෝක්කු 03ක්ද ඇතුළත්ව)

03. ඔටියමලේ සිට නෙදුමකර්නි දක්වා - කි.මී. 0 + 000 සිට 6 + 950 දක්වා (බෝක්කු 20ක්ද ඇතුළත්ව)

04. කැළැබෝගස්වැව සිට වෙඩිවෙටිකල්ලු මාර්ගය - කි.මී. 0 + 000 සිට 7 + 600 දක්වා (පාලම් 2ක් සහ බෝක්කු 13ක්ද ඇතුළත්ව)

05. කොක්කුතුඩායි සිට පන්සල් කන්ද දක්වා මාර්ගය - කි.මී. 0 + 000 සිට 8 + 400 දක්වා (බෝක්කු 17ක්ද ඇතුළත්ව)

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමා (ඇ) (ii)ට පිළිතුර -ගතවන කාලය- කිව්වේ නැහැ.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ ප්‍රදේශයේ සංචාරය කරලා එතුමාගේ නායකත්වය යටතේ මේ ප්‍රදේශයේ සියලුම මාර්ග සංවර්ධනය කරන්න මේ වන විට මහා මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කරනවා. 2013 වසරේ සියයට 70ක් 75ක් කරනවා. ඉතිරි කොටසත් ඉදිරි වකවානුවේදී කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මා අහනවා. ඇමතිතුමා සඳහන් කළා, 2010, 2011 සහ 2012 රුපියල් මිලියන 168ක මාර්ග ප්‍රතිසංස්කරණය සම්පත් නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කර තිබෙනවාය කියා. නමුත් අද වන විටත් බහුතරයක් මාර්ග අබලන් වෙලා. ඒකට ප්‍රධාන හේතුව මේකයි ඇමතිතුමනි. "මහ නැඟුම" කියා වැඩසටහනක් තිබෙනවා. නමුත් මහ නැගුම නොවෙයි ක්‍රියාත්මක වන්නේ; කොමිස් නැගුමයි. ඔබතුමන්ලාට කනගාටුවෙන් හෝ මේක කියන්න ඕනෑ. දේශපාලන අධිකාරිය මැදිහත් වෙලා මහ නැඟුමෙන් මුදල් වෙන් කර තිබෙන බව මා පිළිගන්නවා. රුපියල් මිලියන 168න් විශාල මුදල් ප්‍රමාණයක් විනාශ කර තිබෙනවා. පගා ගහලා තිබෙනවා. අවුරුද්ද ඉවර වෙන්න ඉස්සරවෙලා retention එක දෙනවා. ඒ වාගේම කියුබ් 2000ක් අතුරන්න ඇත්තටම මාසයක් යනවා. ඒක දින දහයෙන් අතුරලා අවසන් කරනවා. ඒ වාගේම රුපියල් මිලියන 38න් හදන්න පුළුවන් මාර්ගය හදන්න රුපියල් මිලියන 88ක් වැය කර තිබෙනවා. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමාගේ අවධානය යොමු කරලා "මහ නැඟුම" මහ නැඟුමේ ආකාරයට ක්‍රියාත්මක කරනවාද, එහෙම නැත්නම් ඒක කොමිස් නැඟුමක් කරනවාද කියා.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ සඳහන් කර තිබෙන්නේ සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය ගැනයි. ඒ බල ප්‍රදේශය තුළ තිබෙන සියලුම මාර්ග, මාර්ග සංවර්ධන අධිකාරියට අයිති ඒවා නොවෙයි. මහවැලි "එල්" කලාපයට අයිති ප්‍රදේශයක්. ඒ කාර්යය මහවැලි අධිකාරිය මගින් ඉටු කර තිබෙනවා. ඔබතුමා සඳහන් කරන ආකාරයට ඒ කාරණය නිසි ලෙස ඉටු කළාද, නැද්ද කියන කාරණය මා සොයලා බලලා කියන්නම්. ඔබතුමාගේ ප්‍රශ්නයට මා පිළිතුරු දෙන්නම්. ඒ අදාළ තොරතුරුත් ලබා ගෙන තිබෙනවා.

ඒ වාගේම ඔබතුමා ඔය කියන වචනවලට මටත් ප්‍රතිඋත්තර දෙන්න පුළුවන්. පසු ගිය කාල වකවානුවේ අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි අදාළ නිලධාරීන් සමඟ අපි ඒ ප්‍රදේශයට ගිහිල්ලා මේ සියලු මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර කටයුතු කරන මොහොතක තමයි ඔබතුමා මේ ප්‍රශ්නය අහන්නේ. මහ නැඟුම ව්‍යාපාරයෙන් මීට පෙර අපි මුදල් -රුපියල් මිලියන 168 තුළ- යොමු කරලා නැහැ. මාර්ග සංවර්ධන අධිකාරියෙන් කරලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒකට සම්බන්ධ වුණත්, නොවුණත් මේ උත්තරිතර සභාව තුළ වගකීමෙන් මේ ප්‍රශ්නයට උත්තර දෙන්න තමයි ඔබතුමා නැගිට්ටේ. ප්‍රශ්නයට උත්තර දෙන්න නැඟිට්ටා නම් අප අසන අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්නට ඔබතුමා සැදී පැහැදී සිටින්නට ඕනෑ. එහෙම නැත්නම් මහවැලි සංවර්ධනය භාර ඇමතිතුමා ඒකට උත්තර දෙන්න ඕනෑ.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමනි, -[බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඉන්න, ඉන්න. මා ඔබතුමාට මේ ප්‍රශ්නය යොමු කරන්නේ පෞද්ගලිකව අප ඒ ප්‍රදේශයේ සංචාරය කිරීමෙන් පසුවයි. ඒ බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 9ක් තිබෙනවා; කුඩා ගම්මාන 13ක් තිබෙනවා; පවුල් 2,500ක් ජීවත් වෙනවා. අප තොරතුරු සොයලායි, මේ ප්‍රශ්න අහන්නේ. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමාගේ -[බාධා කිරීම්] මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය. ගරු මන්ත්‍රීතුමනි, කෙටියෙන් ප්‍රශ්න අහන්න. දැනටමත් කාලය අවසානයි. වෙලාව පස්වරු 2.00යි. [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, පොඩ්ඩක් -[බාධා කිරීම්] මොකද,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

බාධා එනවා. ඒකයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

කරුණාකරලා ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

බාධා එනවා. ඒක නිසා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. "මහ නැඟුම", "දිවි නැඟුම", "දැයට කිරුළ", "උතුරු වසන්තය", "නැඟෙනහිර නවෝදය" කියන ඒවා ඔබතුමන්ලාගේ බොහොම ලස්සන වචනයි. කොපමණ ලස්සන වචන පාවිච්චි කළත් අර ලැම්බෝගිනි පරපුරට තමයි වැඩිපුර මුදලක් වෙන් කරන්නේ. මා අහන්න කැමැතියි ඔබතුමන්ලාගෙන්-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, කාලය කා දමන්නේ නැතිව කරුණාකර ප්‍රශ්නය අහන්න. දැනටමත් කාලය වැඩිපුර ගතවෙලායි තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ලැම්බෝගිනි පරපුරට වෙන් කරන කොමිස් මුදලෙන්, අඩුම ගණනේ කොටින්ගෙන් පීඩා විඳපු වැලිඔය ප්‍රදේශයේ ජනතාවට පාරවල් ටික හදලා දෙන්නේ කවදාද?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නිර්මල කොතලාවල ඇමතිතුමා පිළිතුර දෙන්න. ගරු අස්වර් මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මේ ප්‍රශ්න අහන්නේ වෛරයෙන්, කෝපයෙන් බව එතුමාගේ කථාවෙන් පැහැදිලි වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. කිසිම වෛරයක් නැහැ.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
එතුමාට අවශ්‍ය තැන හම්බ වෙන්නේ නැති ප්‍රශ්නයකුයි තිබෙන්නේ. ඒ තැන නොලැබීම පිළිබඳ ප්‍රශ්නය, අපත් එක්ක බෙරාගන්න හදනවා පාරවල් සම්බන්ධයෙන් අහලා. මේ රජය අතිවිශාල වැඩ කොටසක් කර තිබෙනවා. එතුමාට ඒ ප්‍රදේශයට යන්න පුළුවන් වුණේත් මේ රජය නිසායි. නැත්නම් යන්න හම්බ වෙන්නේ නැහැ. මේ බයිලා කථා කළාට වැඩක් නැහැ. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය තිබුණු නිසා තමයි එතුමාට ඒ සම්පත්නුවරට යන්න පුළුවන් වුණේ. එහෙම නොවුණා නම් එතුමාට ඒ පැත්ත පළාතේ යන්න හම්බ වෙන්නේ නැහැ. එතුමා, එදා එල්ටීටීඊ එකත් එක්ක ගිවිසුම් ගහලා රට බෙදපු එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළා. එතුමා අද ඒ පිළිබඳව දුක් වෙන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා ඒ ප්‍රදේශයට ගිහින් සංචාරය කළා. එතුමා ඒ ප්‍රදේශයේ ජනතාවගේ අදහස් විමසලා මාර්ග සංවර්ධන කටයුතු ඉටු කරනවා. එහි කිසි ගැටලුවක් නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කෙටියෙන් අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා මේ ප්‍රශ්නය අහන්නේ තරහකින්, ද්වේෂයකින් නොවෙයි. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට කාරණයක් කියන්න කැමැතියි. යුද ජයග්‍රහණයේ ගරුත්වය එය හිමි විය යුතු අයට හිමි වෙනවා. නමුත් යුද ජයග්‍රහණයේ නාමයෙන් කොමිස් වසන්තයක්, කොමිස් නවෝදයක් ක්‍රියාත්මක කරන්න ජනතාව ජන වරමක් ලබා දුන්නේ නැහැ. ඔබතුමන්ලා යුද ජයග්‍රහණයේ ගෞරවය ලබා ගන්න. නමුත් යුද ජයග්‍රහණයේ නාමයෙන් ජනතාවට peace dividend එක ලබා දීම සඳහා, යුද ජයග්‍රහණයේ ප්‍රතිලාභය ලබා දීම සඳහා ඒ අබලන් වූ මාර්ග ටික පිළිසකර කරන්නේ කවදාද? ඒ මහා මාර්ග ටික වාරි මාර්ග වෙන්න නොදී පිළිසකර කරන්නේ කවදාද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමා, මා ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කොමිස් වසන්තයක් ගැන කථා කරනවා. ග්‍රෑන්ඩ්පාස් පාරේ, ඒ වාගේම බෙස්ලයින් පාරේ තෙල් පිරවුම්හල් රුපියල් 25ට ලබා දුන්නු ඉතිහාසයක් තුළ කොමිස් වසන්ත ගැන කථා කරලා වැඩක් නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2013 වසර තුළ සහ 2014 මුල් කාලය වන විට ඔබතුමා අහන ඒ සියලු පාරවල කටයුතු ඉටු කරනවා.

පාම් තෙල් ආනයනය: බදු ප්‍රතිශෝධනය
பாம் எண்ணெய் இறக்குமதி: வரி மாற்றம்
IMPORT OF PALM OIL : TAX REVISION

2699/'12

13. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2005 සිට 2012 දක්වා කාල සීමාව තුළ වාර්ෂිකව ආනයනය කරන ලද පාම් තෙල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ පාම් තෙල් කිලෝග්‍රෑමයක් සඳහා ආනයන බදු වෙනස් කිරීම් සිදු කළ ආකාරය කවරේද;

(iii) ආනයන බදු එසේ වෙනස් කිරීමට හේතු කවරේද;

(iv) මේ වන විට දේශීය වෙළඳ පොළේ පාම් තෙල් හා පොල් තෙල් කිලෝවක සිල්ලර මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාම් තෙල් ආනයනයේදී ලිහිල් බදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ පොල් තෙල් නිෂ්පාදනය පහත වැටී ඇති බවත්;

(ii) පොල් තෙල් නිෂ්පාදනය පහත වැටීම හේතුවෙන් පොල් වගාකරුවන්ට සිය නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005 முதல் 2012 ஆம் ஆண்டு வரையான காலப் பகுதிக்குள் ஆண்டுதோறும் இறக்குமதி செய்யப்பட்ட பாம் எண்ணெய் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(ii) அக் காலப்பகுதிக்குள் ஒரு கிலோகிராம் பாம் எண்ணெய்க்கான இறக்குமதி வரி மாற்றியமைக்கப்பட்ட விதம் யாது என்பதையும்;

(iii) இறக்குமதி வரி அவ்வாறு மாற்றியமைக்கப் பட்டமைக்கான காரணம் யாது என்பதையும்;

(iv) தற்போது உள்நாட்டுச் சந்தையில் பாம் எண்ணெய் மற்றும் தேங்காய் எண்ணெய் கிலோ ஒன்றுக்கான சில்லறை விலை வெவ்வேறாக எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) பாம் எண்ணெய் இறக்குமதியின்போது தளர்வான வரிக் கொள்கையொன்றை கடைப்பிடித்தமை காரணமாக இலங்கையின் தேங்காய் எண்ணெய் உற்பத்தி வீழ்ச்சியடைந் துள்ளதென்பதையும்;

(ii) தேங்காய் எண்ணெய் உற்பத்தி வீழ்ச்சி அடைந்தமை காரணமாக தெங்குச் செய்கையாளர்களுக்கு தமது உற்பத்திகளுக்கான நியாயமான விலை கிடைப்பதில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Coconut Development and Janatha Estate Development:

(a) Will he state -

(i) separately, the quantity of palm oil imported annually during the period from the year 2005 to 2012;

(ii) the manner in which the import tax imposed on a kilogram of palm oil was revised during the aforesaid period;

(iii) the reasons for the aforesaid revision of the import taxes on palm oil; and

(iv) separately, the retail prices of a kilo of palm oil and coconut oil in the local market at present?

(b) Is he aware that -

(i) the coconut oil production of Sri Lanka has decreased due to adopting a lenient tax policy on importing palm oil; and

(ii) the coconut cultivators do not get a fair price for their products due to the decrease in the coconut oil production?

(c) If not, why ?

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

වර්ෂය	ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)
2005	98,216 (අනූඅටදහස් දෙසිය දහසය)
2006	96,717 (අනූහයදහස් හත්සිය දාහත)
2007	57,245 (පනස්හත්දහස් දෙසිය හතළිස්පහ)
2008	73,561 (හැත්තෑතුන්දහස් පන්සිය හැටඑක)
2009	26,083 (විසිහයදහස් අසූතුන)
2010	53,519 (පනස්තුන්දහස් පන්සිය දහනවය)
2011	105,528 (එක්ලක්ෂ පන්දහස් පන්සිය විසිඅට)
2012	44,878 (හතළිස්හතරදහස් අටසිය හැත්තෑඅට)

(ii)

2007.11.24	10%
2007.12.31	28%
2008.04.09	5%
2008.07.09	15%
2008.11.30	28%
2008.12.03	රු. 40 (kg 1ක් සඳහා)
2009.04.07	රු. 60 (kg 1ක් සඳහා)
2010.03.18	රු. 35 (kg 1ක් සඳහා)
2010.11.01	15%
2011.11.04	20%
2012.01.13	රු. 75 (kg 1ක් සඳහා)
2012.05.12	රු. 90 (kg 1ක් සඳහා)
2012.11.09	රු. 110 (kg 1ක් සඳහා)

(iii) පොල් වගාකරුට, පොල් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්ට හා පාරිභෝගිකයාට සහන ලබා දීම පිණිස අවශ්‍යතාව අනුව වරින් වර ආනයන බදු වෙනස් කරයි.

(iv) පාම් තෙල් කිලෝවක මිල - රු. 245යි (රුපියල් දෙසිය හතලිස්පහ)

පොල්තෙල් කිලෝවක මිල - රු. 270යි (රුපියල් දෙසිය හැත්තෑව)

(ආ) (i) පොල්තෙල් නිෂ්පාදනය දැනට පහත වැටී නොමැත.

(ii) ඉහත පිළිතුර අනුව පැන නොනඟී.

(ඇ) ඉහත පිළිතුර අනුව පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න තිබෙනවාද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු අමාත්‍යතුමනි, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාවරයා විධියට ඔබතුමාට නොවෙයි පාම් තෙල් ආනයනය කිරීම සම්බන්ධ පාලනය තිබෙන්නේ. එය මුදල් අමාත්‍යාංශය විසින් කරනු ලබන ක්‍රියාදාමයක්. ගරු අමාත්‍යතුමනි, වර්ෂ ගණනාවක් තිස්සේ පාම් තෙල් ගෙන්වනවා. ඒ පාම් තෙල් සමඟ වෙනත් තෙල් වර්ග කලවම් කිරීම නිසා තමයි ඒවා අඩු ගණනට ලබා දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

ආනයනය කරන පාම් තෙල්වලට ලංකාවේ තෙල් වර්ගත් එකතු කරලා පොල් තෙල්වලට වඩා අඩු මිලකට ලබා දෙනවා. පාම් තෙල්වලට ගහලා තිබෙන tax එකත් එක්ක -රුපියල් 125ක tax එකක් ගැහුවාම- ඇත්ත වශයෙන්ම දේශීය පොල් තෙල්වලට වඩා පාම් තෙල්වල මිල වැඩි වෙන්න ඕනෑ.

නමුත් එහෙම වෙන්නේ නැහැ. ඒ වාගේ වැඩ පිළිවෙළක් තමයි දැන් තිබෙන්නේ. මේ පිළිබඳව සොයා බලන්න වාගේම ඒවා ගැන යම් කිසි විධියක පරීක්ෂණයක් කරන්න වැඩ පිළිවෙළක් ඔබතුමාට තිබෙනවාද?

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(මාණ්පුමිකු ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු මන්ත්‍රීතුමනි, දැනටමත් මම නියෝග කරලා තිබෙනවා පොල් සංවර්ධන අධිකාරියට. ඒ අනුව පාරිභෝගික අධිකාරියත් එක්ක එකතු වෙලා වැටලීම් කරලා අවශ්‍ය නීතිමය පියවර ගනිමින් ඉන්නවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ දමලා තිබෙන බදු ප්‍රමාණය අඩු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(මාණ්පුමිකු ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ දමා තිබෙන බදු ප්‍රමාණය අඩු කරන වැඩ පිළිවෙළක් තිබෙනවා.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(මාණ්පුමිකු ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
අවශ්‍යතාව අනුව එය තීරණය කරනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. ඔබතුමා දන්නවා, දැන් පොල් ඵලදාව වැඩි වෙමින් තිබෙන බව. ඒ වාගේ අවස්ථාවල තමයි හැම දාම කීප දෙනෙකු එකතු වෙලා මේ තත්ත්වය ඇති කරන්නේ. අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ ඒකයි. ඒ වාගේ බදු අඩු කිරීමේ තත්ත්වයක් ඇති වුණොත් ඒකට ඔබතුමා ගන්න පියවර මොකක්ද?

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(මාණ්පුමිකු ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ඔබතුමාට අවශ්‍ය මොකක්ද? අඩු කරන්නද ඕනෑ, වැඩි කරන්නද ඕනෑ? ඔබතුමාට අවශ්‍ය මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියන්නේ පුළුවන් තරම් වැඩි කරන්න කියලා. එතකොට ලංකාවේ නිෂ්පාදන ටික බේරා ගන්න පුළුවන්.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(මාණ්පුමිකු ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මොනවාද වැඩි කරන්න ඕනෑ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පාම් තෙල්වලට ගහන බද්ද තව වැඩි කරන්න පුළුවන් නේ.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(මාණ්පුමිකු ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
වැඩි කරලා තිබෙනවා. 65 ඉඳලා 110 දක්වා වැඩි කරලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක අඩු කරන වැඩ පිළිවෙළක් දැන් යනවා. මේ වැඩ පිළිවෙළ පරාජය කරන්න ඔබතුමා ගන්න වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(මාණ්පුමිකු ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ඒ සම්බන්ධව අපේ අමාත්‍යාංශය කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුව ඒ සම්බන්ධව කටයුතු කරමින් යනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මෙය කථා පවත්වන වේලාවක් නොවෙයි. පිළිතුරු දුන්නා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ ප්‍රශ්නයට උත්තර දුන්නේ නැහැ.

පිටකොටුව - කොටුව ආශ්‍රිත පදික වෙළෙඳුන් : විකල්ප ව්‍යාපාර ස්ථාන

புறக்கோட்டை - கோட்டை நடைபாதை வர்த்தகர்கள் : மாற்று வர்த்தக நிலையங்கள்

PAVEMENT TRADERS IN PETTAH-FORT AREA : ALTERNATE BUSINESS LOCATIONS

2985/'12

14. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

(අ) (i) පිටකොටුව - කොටුව ආශ්‍රිතව පදික වෙළෙඳාමේ යෙදුනු ස්වයං රැකියා වෙළෙඳුන් 1,500කට පමණ තවමත් විකල්ප ව්‍යාපාර ස්ථාන ලැබී නොමැති බවත්;

(ii) `දිවි නැඟුම' ව්‍යාපෘතිය යටතේ ස්වයං රැකියා වෙළෙඳුන් සඳහා ක්‍රියාත්මක කළ `ඩිමෝ බට්ටා' නම් වූ ව්‍යාපෘතිය යටතේ ජංගම රථ යොදා ගනිමින් වෙළෙඳාම් කිරීමේදී රථ වාහන පොලීසියේ සහ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ බලපෑම් නිසා විවිධ අවස්ථාවලදී එම වෙළෙඳුන් දැඩි අසීරුතාවට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට විකල්ප ස්ථාන ලබාදී ඇති පදික වෙළෙඳුන් සංඛ්‍යාව කොපමණද;

(ii) `දිවි නැඟුම' යටතේ `ඩිමෝ බට්ටා' නම් වූ වාහන ලබාදී ඇති වෙළෙඳුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට තම වෙළෙඳාම් කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පොරුළාතාර අපිවිරුත්ති අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) புறக்கோட்டை - கோட்டையை அண்டியதாக நடைபாதை வர்த்தகத்தில் ஈடுபட்ட சுமார் 1500 சுயதொழில் வியாபாரிகளுக்கு இற்றைவரை மாற்று வர்த்தக நிலையங்கள் கிடைக்கவில்லை என்பதையும்;

(ii)' திவிநெகும' கருத்திட்டத்தின் கீழ் சுயதொழில் வியாபாரிகளுக்காக நடைமுறைப்படுத்தப்பட்ட `டிமோ பட்டா கருத்திட்டத்தின்' கீழ் நடமாடும் வாகனங்களை பயன்படுத்தி வியாபாரம் செய்கின்றபோது மோட்டார் வாகன பொலிஸ் மற்றும் பொலிஸ் நிலைய பொறுப்பதிகாரிகளின் நிர்ப்பந்தம் காரணமாக பல்வேறு சந்தர்ப்பங்களில் மேற்படி வர்த்தகர்கள் கடும் சிரமங்களுக்கு உள்ளாகின்றார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) தற்போது மாற்று வர்த்தக நிலையங்கள் பெற்றுக் கொடுக்கப்பட்டுள்ள நடைபாதை வர்த்தகர் களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(ii) 'திவிநெகும' திட்டத்தின் கீழ் `டிமோ பட்டா' வாகனங்கள் வழங்கப்பட்டுள்ள வர்த்தகர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) இவர்கள் தமது வர்த்தக நடவடிக்கைகளை தடையின்றி நடத்திச் செல்வதற்குத் தேவையான வசதிகள் செய்துகொடுக்கப்படுமா என்பதையும்

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Is he aware that -

(i) about 1,500 self-employed traders who engaged in trading on pavements around Pettah-Fort area have not yet received alternative business locations; and

(ii) the traders who engaged in mobile trading using vehicles provided by the "Dimo Batta Project" implemented under the "Divineguma" project for the self-employed traders, face severe difficulties at different occasions due to the action taken by the Traffic Police and Police OICs ?

(b) Will he inform this House -

(i) the number of pavement traders to whom alternative locations have been provided by now;

(ii) the number of traders to whom "Dimo Batta" vehicles have been provided under "Divineguma" project; and

(iii) whether necessary arrangements will be made to enable them to engage in their trade activities without any hindrance ?

(c) If not, why?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) වෙළෙඳුන් 823 දෙනෙකු සඳහා ස්ථිර වශයෙන්ම ව්‍යාපාර ස්ථාන ලබා දී ඇති අතර, තවත් වෙළෙඳුන් 600 දෙනෙකු සඳහා ව්‍යාපාර ස්ථාන ඉදි කරමින් පවතී.

(ii) මේ පිළිබඳව පැමිණිලි ලැබී නොමැත.

(ආ) (i) වෙළෙඳුන් 823 දෙනෙකු සඳහා

(ii) වෙළෙඳුන් 396 දෙනෙකු සඳහා

(iii) මේ පිළිබඳව පැමිණිලි ලැබී නොමැත.

(ඇ) අදාළ නොවේ.

ඒ වාගේම තවත් වෙළෙන්දන් 600 දෙනෙකු සඳහා ස්ථිර ව්‍යාපාරික ස්ථාන ඉදි වෙමින් පවතිනවා. ගරු මන්ත්‍රීතුමාට ඕනෑ නම් ඒ ස්ථාන ටික කියන්න පුළුවන්. [බාධා කිරීමක්] හඳුනා ගත් ප්‍රදේශ කියන්න පුළුවන්. හඳුනා ගත් ප්‍රදේශ තමයි, පදික වේදිකාව අවහිර වන පරිදි වෙළෙඳාම් කළ අය සඳහා -

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා අහන්නේ ස්ථාන ගැනයි.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

පස්වන හරස් වීදියේ, බෝධිරාජ මාවතේ පොදු ස්ථානයේ දැනටමත් පහසුකම් ලබා දී ඇත. මීට අමතරව මේ සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණ අනුව කොටුව, පිටකොටුව ප්‍රදේශයේ පදික වෙළෙඳුන් සඳහා විවිධ ස්ථානවල වෙළෙඳ සැල් 600ක්පමණ දැනටමත් හඳුනා ගෙන තිබෙනවා. ඔවුන් සඳහා පිටකොටුව ප්‍රදේශය කේන්ද්‍රකොට ගනිමින් විධිමත් පහසුකම් සහිත වෙළෙඳ සැල් සංකීර්ණයක් ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළක් නාගරික සංවර්ධන අධිකාරිය දැනටමත් ආරම්භ කර තිබෙනවා. එක්දාස් පන්සිය ගණනක් තමයි ඒ පහසුකම් ඉල්ලා තිබෙන්නේ. 1847 දෙනෙකු සඳහා ඒ පහසුකම් ලබා දීමට අපි කටයුතු සූදානම් කර තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඔබතුමා කිව්වා තව එක්දාස් අටසිය ගණනකට දෙන්න තිබෙනවා කියලා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ඒ ඔක්කෝම ගණන. දැනටමත් එක්දාස් පන්සිය ගණනකට දෙන්න සූදානම් කර තිබෙනවා. ඊට අමතරව -

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, "දිවි නැහුම" යටතේ තමුන්නාන්සේලා "ඩිමෝ බට්ටා" නමින් ව්‍යාපෘතියක් පටන් ගත්තා, පදික වේදිකාවෙන් අයින් කරපු අයට ජීවත් වෙන්න පිළිසරණක් වශයෙන්. හැබැයි, දැන් ප්‍රශ්නය තිබෙන්නේ ඒ ගොල්ලන්ට ඒ වාහන කොහේවත් තියාගෙන ඉන්න පුළුවන්කමක් නැති එකයි. මේ වනකොට දහ දෙනෙක් ඒ සම්බන්ධයෙන් අධිකරණයට ගිහින් තිබෙනවා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු මන්ත්‍රීතුමනි, ඒ අයට පොලීසිය කරදර කරනවා කියලා පොලීසියේ කිසිම පැමිණිල්ලක් දමා නැහැ. යම් පිරිසක් අධිකරණයට ගිහින් තිබෙනවා නම් ඒ ගැන සොයා බලා ඒ අයට සාධාරණයක් ඉටු කරලා දෙන්න පුළුවන්. පොලීසියේ ඒ වාගේ පැමිණිල්ලක් තිබෙනවා කියලා දැනට වාර්තා වෙලා නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාටත් තේරෙනවා ඇති. ඒ අය අධිකරණයට යන්නේ පලවා හරින නිසා නේ. ඩිමෝ බට්ටා ව්‍යාපෘතිය යටතේ දීලා තිබෙන මෙම වාහන park කර ගෙන ඉන්න දෙන්නේ නැහැ. පොලීසියෙන් ඇවිල්ලා ඒ අය එළවනවා. ඒ ප්‍රශ්නය නිසා තමයි නීතිඥවරුන් මාර්ගයෙන් අධිකරණයට ගිහින් තිබෙන්නේ.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු මන්ත්‍රීතුමා, සාමාන්‍යයෙන් ඉදුණු පලතුරු අතර කුණුවුණු පලතුරුත් තිබෙනවා. ඒ වාගේ සිදු වීම් සිදු වෙලා තිබෙනවා නම්, ඒ දහ දෙනා කවුද කියා අපට ඉදිරිපත් කළොත් ඒ දහ දෙනාට නිසි සාධාරණය ඉෂ්ට කර දෙන බව මම මේ ගරු සභාවට කියනවා. [බාධා කිරීමක්]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඒ ඩිමෝ බට්ටා ව්‍යාපෘතිය නිසියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු මන්ත්‍රීතුමා, දහ දෙනෙක් අධිකරණයට ගියාය කියා ඔබතුමා කියනවා. ඒක පිළි අර ගෙන ක්‍රියා කරන්න ඒ දහ දෙනා කවුද කියා අපට යොමු කරන්න. ඒ දහ දෙනා කවුද කියා හඳුනාගෙන ඒ අයට කරදරයකින් තොරව ඒ කටයුත්ත කර ගෙන යන්නට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නම්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු ඇමතිතුමනි, මට කියන්නට පුළුවන්. වෙළඳුන්ට දෙවනාවක් පහර දී එලවා තිබෙනවා. ඩිමෝ රථ 62ක් පලවා හැර තිබෙනවා. ත්‍රිරෝද රථ රියැදුරන්ට දඩ කොළ නිකුත් කර තිබෙනවා. දැන් ඔබතුමා කියනවා, "නැහැ" කියා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු මන්ත්‍රීතුමනි, කොයි පොලීසියෙන්ද මේ පිළිබඳව කටයුතු සිදු වෙලා තිබෙන්නේ කියා ඔබතුමාට කියන්න පුළුවන් නම් ඒ පිළිබඳව සොයා බලා ඒ සඳහා අවශ්‍ය කරන නිසි උපකාර ලබා දෙන්නට අප සූදානම්.

පළිබෝධ නාශක ආනයනය : විස්තර
பீடைகொல்லிகள் இறக்குமதி : விபரம்
IMPORT OF PESTICIDES : DETAILS

3203/'12

15. ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවට පළිබෝධනාශක ආනයනය සඳහා බලපත්‍ර ලබා දී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය විසින් වර්ෂ 2005 - 2012 දක්වා කාල සීමාව තුළදී ආනයනය කරන ලද පළිබෝධනාශක (කෘමිනාශක, වල්නාශක, දිලීරනාශක) ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

ඉහත සඳහන් ආයතනවලින් මේ වන විට තහනම් කර ඇති සංඛ්‍යාව; කොපමණද; යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආනයනයට පෙර පළිබෝධනාශකවල තත්ත්වය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, එය කවරේද;

[ගරු පී. හැරිසන් මහතා]

(iii) ආනයනික කෘෂිරසායනික ද්‍රව්‍ය අතර ආසනික් සහ මීනිසුන්ට හා සතුන්ට අහිතකර වෙනත් සංඝටක සහිත පළිබෝධනාශක තිබේද;

(iv) එසේ නම්, එම අහිතකර සංඝටක අඩංගු බව පරීක්ෂා කරනු ලබන ආයතන කවරේද;

(v) එම පරීක්ෂණ සඳහා රජයේ වෛද්‍ය විද්‍යාලයේ හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පර්යේෂණාගාරවල සහාය ලබා ගන්නේද;

(vi) එසේ නම්, එම ආයතන කවරේද;

(vii) ඉහත ආයතනවලින් තත්ත්ව සහතික ලබා ගත් පසු වගාවන් සඳහා එම පළිබෝධනාශක නිර්දේශ කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,

(i) කෘෂි රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් මැදිහත්වන ආකාරය කවරේද;

(ii) ඒවායේ භාවිතය සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීමට ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොழිල් අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) இலங்கைக்கு பீடைகொல்லிகளை இறக்குமதி செய்வதற்காக உரிமப்பத்திரம் வழங்கப்பட்டுள்ள நிறுவனங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி ஒவ்வொரு நிறுவனத்தினாலும் 2005-2012 வரையிலான காலப்பகுதியினுள் இறக்குமதி செய்யப்பட்ட பீடைகொல்லிகளின் (கிருமி நாசினி, களைகொல்லி, பங்கசுகொல்லி) அளவு வெவ்வேறாக யாது;

(iii) மேற்குறிப்பிடப்பட்ட நிறுவனங்களில் தற்போது தடை செய்யப்பட்டுள்ளவற்றின் எண்ணிக்கை யாது

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இறக்குமதி செய்வதற்கு முன்னர் பீடைகொல்லிகளின் தரத்தை பரிசீலிக்கும் செயல்முறை யொன்று காணப்படுகின்றதா;

(ii) ஆமெனில், அது யாது;

(iii) இறக்குமதி செய்யப்பட்ட விவசாய இரசாயனப் பொருட்களில் ஆசனிக் மற்றும் மனிதர்களுக்கும் மிருகங்களுக்கும் தீங்கு இழைக்கும் ஏனைய மூலக்கூறுகளைக் கொண்ட பீடைகொல்லிகள் காணப்படுகின்றனவா;

(iv) ஆமெனில், குறித்த தீங்கு இழைக்கும் ஆக்கக்கூறுகளின் உள்ளடக்கத்தை பரிசீலிக்கும் நிறுவனங்கள் யாவை;

(vi) குறித்த பரிசீலனைகளுக்கு அரச மருத்துவக் கல்லூரியின் அல்லது சுகாதாரத் திணைக்களத்தின் ஆய்வுகூடங்களின் ஒத்துழைப்பு பெறப்படுகின்றதா;

(vi) ஆமெனில், அந்த நிறுவனங்கள் யாவை;

(vii) மேற்குறிப்பிடப்பட்ட நிறுவனங்களிலிருந்து தரச் சான்றிதழ்கள் பெற்றுக் கொள்ளப்பட்டதன் பின்னர், பயிர்களுக்கு மேற்படி பீடை கொல்லிகள் விதந்துரைக்கப்படுகின்றனவா

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) கமத்தொழில் திணைக்களம்,

(i) விவசாய இரசாயனப் பொருட்கள் தொடர்பில் தலையிடும் விதம் யாது;

(ii) இவற்றின் பாவனை தொடர்பில் விவசாயிகளை விழிப்புணர்வூட்டுவதற்காக நடைமுறைப்படுத்தி யுள்ள வேலைத்திட்டம் யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he state -

(i) the number of institutions which have been awarded licences to import pesticides into Sri Lanka;

(ii) separately, the quantity of pesticides (insecticides, weedicides, fungicides) which have been imported during the period of time between 2005 to 2012 by each of those institutions; and

(iii) the number of institutions which have been banned out of those institutions by now?

(b) Will he inform this House -

(i) whether there is a methodology to check the quality of pesticides before they are imported;

(ii) if so, of the aforesaid methodology;

(iii) whether there are pesticides which contain arsenic and other harmful substances to man and animals among the imported agro-chemicals;

(iv) if so, of the institutions which conduct tests to check the prevalence of those harmful substances;

(v) whether the support of the government medical college or the laboratories of the Department of Health is obtained to conduct those tests;

(vi) if so, of the names of the aforesaid institutions; and

(vii) whether the pesticides are recommended to be used in cultivations after quality certificates are obtained from the above mentioned institutions ?

(c) Will he also inform this House of -

(i) the manner in which the Department of Agriculture is involved in matters related to agro-chemicals; and

(ii) the programme implemented by the Department of Agriculture to educate the farmers regarding the use of agro-chemicals ?

(d) If not, why ?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් නිසා මා එය සභාගත කරන්නද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සභාගත කරන්න ගරු ඇමතිතුමා. වෙලාවත් එක්ක බලන විට

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

කෘෂි පළිබෝධනාශක සඳහා ආයතන	29
ගෘහස්ථ හා මහජන සෞඛ්‍ය පළිබෝධනාශක සඳහා ආයතන	26
කාර්මික පළිබෝධනාශක සඳහා ආයතන	13

(ii) එක් එක් ආයතනය සහ ඒවායින් ආනයනය කරන ලද පළිබෝධනාශක ප්‍රමාණයන් පහත දැක්වේ.

සමාගම් අංකය	සමාගමේ නම
01.	A.Baur & Co. (Pvt) Ltd.
02.	Agro Technical Ltd.
03.	Agstar Cropcare (Pvt) Ltd.
04.	BASF Lanka (Pvt) Ltd.
05.	Ceylon Petroleum Corporation
06.	CIC Crop Guard (Pvt) Ltd.
07.	CIC Holdings PLC
08.	CropBeat Industries (Pvt) Ltd.
09.	Harrisons Chemicals (Pvt) Ltd.
10.	Hayleys Agriculture Holdings Ltd.
11.	Hextar (Pvt) Ltd.
12.	Innovative Pesticides Marketing (Pvt) Ltd.
13.	International Crop Sciences (Pvt) Ltd.
14.	J.L.Morison Son & Jones (Ceylon) Ltd.
15.	Kemtek (Pvt) Ltd.
16.	Lankem Ceylon PLC
17.	Mackwoods (Pvt) Ltd.
18.	M-Chems (Pvt) Ltd.
19.	Oasis Marketing Co.(Pvt) Ltd.
20.	Opex Holdings (Pvt) Ltd.
21.	Plantchem (Pvt) Ltd.
22.	Polychemix (Pvt) Ltd.
23.	Sabaragamuwa Fertilizers (Pvt) Ltd.
24.	SunAgro Life Science Ltd.
25.	Unipower (Pvt) Ltd.
26.	Island Wide marketing
27.	Novela (Pvt) Ltd.

2005 - 2012 දක්වා පළිබෝධනාශක ආනයනය පිළිබඳ සංඛ්‍යා දත්ත

සමාගම් අංකය	පළිබෝධනාශකය	2005 (මෙ.ටොං.)	2006 (මෙ.ටොං.)	2007 (මෙ.ටොං.)	2008 (මෙ.ටොං.)	2009 (මෙ.ටොං.)	2010 (මෙ.ටොං.)	2011 (මෙ.ටොං.)	2012 (මෙ.ටොං.)
01.	කෘමිනාශක	168	132	90	154.48	42.6	149.2	106.8	107
	වල්නාශක	153.2	128	207	77	77	254	342	387.4
	දිලීරනාශක	81.2	61.8	36.6	36.18	36.18	65.6	59.6	43
02.	කෘමිනාශක	125.6	88.64	50.6	19.6	36.6	21.6	22	17
	වල්නාශක	352	293	281	96	192	176	208	128
	දිලීරනාශක	59.5	60.3	39.5	0	0	0	0	0
03.	කෘමිනාශක	0	0	23	0	20	1.1	22.87	52.5
	වල්නාශක	0	0	33.8	0	21.96	152.62	226.82	110.58
	දිලීරනාශක	0	0	0	0	0	27.7	21	30
04.	කෘමිනාශක	173.3	155.58	114.23	173.14	94.15	87.94	119.7	80.1
	වල්නාශක	353.3	198.4	299.1	283.2	176.2	518.8	636.4	342.28
	දිලීරනාශක	258	128.4	141.9	183.88	72.9	150.7	47.9	126.9
05.	කෘමිනාශක	63	15	31	128	27.4	60	24	156
	වල්නාශක	140	25	290	433.6	21	160	128	96
	දිලීරනාශක	30	2	15	34.5	17.5	17	14	32
06.	කෘමිනාශක	0	116.4	148.53	71.08	141.6	222.6	304	229
	වල්නාශක	0	70	249.97	123.02	69.17	124	248.8	555.93
	දිලීරනාශක	0	5.4	56	17.3	61.8	81.1	87	54.8
07.	කෘමිනාශක	174.75	78.61	17.66	42.72	57.53	47.4	91.22	19.86
	වල්නාශක	503	413.4	468	272.97	40	241.42	380.6	516.6
	දිලීරනාශක	81.3	108.75	20	107.5	110.4	200	228	139
08.	කෘමිනාශක	0	0	0	0	5	7.5	10	0
	වල්නාශක	0	0	0	0	143.57	276.08	60.35	143.17
	දිලීරනාශක	0	0	0	0	5	6	0	0
09.	කෘමිනාශක	175.5	138.8	152	205.28	86.5	214.8	303.41	119
	වල්නාශක	403.8	373	462	618	177	774	899	846
	දිලීරනාශක	79	62	43	34	23.72	83.98	63	14
10.	කෘමිනාශක	180.2	123.7	76.5	147.69	68.9	157.3	149.56	99.2
	වල්නාශක	488.7	147.2	258.4	291.3	138.05	263.43	231.7	294
	දිලීරනාශක	110.3	123.2	97.6	183.8	148.5	157.3	162.5	164.45
11.	කෘමිනාශක	0	0	0	5	0	16	0	0
	වල්නාශක	0	0	91.35	129.3	141.22	193.8	3	0
	දිලීරනාශක	0	0	0	0	0	0	0	0
12.	කෘමිනාශක	183.84	135.07	149.53	205.64	164.84	426.48	334.58	123.8
	වල්නාශක	0	8	0	17.5	16.8	37.8	22.89	22.89
	දිලීරනාශක	0	0	12.43	24.36	0	8.39	10.78	0
13.	කෘමිනාශක	0	0	0	0	0	0	15.004	20
	වල්නාශක	0	0	0	0	0	0	148	21.22
	දිලීරනාශක	0	0	0	0	0	0	3	10
14.	කෘමිනාශක	10.66	7.3	13.91	9.28	13.79	37.74	13.66	12.08
	වල්නාශක	0	0	0	16	32	48	16	16
	දිලීරනාශක	35.72	30	36.72	48.5	42.6	88.86	106.2	38.88
15.	කෘමිනාශක	0	0	0	0	0	0	0	0
	වල්නාශක	0	0	0	0	0	36	17.18	17.12
	දිලීරනාශක	0	0	0	0	0	0	0	0
16.	කෘමිනාශක	98.89	67.86	48.06	63.65	60.69	123.18	84.73	109.75
	වල්නාශක	524.4	358	522	426	354	1035	671	566.5
	දිලීරනාශක	15	28	19	8	18	23.5	13	61
17.	කෘමිනාශක	168.4	100	79	122.78	26	12.7	31.4	37.02
	වල්නාශක	468.4	257	341	213.7	126.96	140	124	201
	දිලීරනාශක	90.9	119	85	240.33	11.96	36.49	44.82	37.02
18.	කෘමිනාශක	0	0	0	48.83	0	2	28	0
	වල්නාශක	0	0	0	165.6	0	11	114.08	2
	දිලීරනාශක	0	0	0	3.75	0	0	0	0
19.	කෘමිනාශක	22.02	26	27	12	7.4	19.75	13.6	12
	වල්නාශක	50	44	19.5	1	28	69	99	82.5
	දිලීරනාශක	19	15.5	23	14	6	25	21	16
20.	කෘමිනාශක	94.8	109.8	63	37.8	38.33	160.9	31	33
	වල්නාශක	80	192	205	72.4	192	141	22.22	94
	දිලීරනාශක	43.3	69.8	54.5	3	10.8	27	22	38
21.	කෘමිනාශක	0	60	49	77.5	20.5	44.56	89.05	74
	වල්නාශක	0	45.2	31	30	114	224	384	292
	දිලීරනාශක	0	16	8	45.5	14.6	36.2	27	27.75
22.	කෘමිනාශක	0	0	0	0	0	0	0	0
	වල්නාශක	0	494.9	153.61	281.9	227	370.88	131.99	106.17
	දිලීරනාශක	0	0	0	0	0	0	0	0
23.	කෘමිනාශක	0	45	25	23.2	22.2	22.2	14	10
	වල්නාශක	32	32	153.61	32	38	0	176	96
	දිලීරනාශක	0	0	0	0	14.6	0	12	0
24.	කෘමිනාශක	0	15	15.7	33	63.69	0	0	0
	වල්නාශක	0	48	98	115.1	376.5	0	0	144
	දිලීරනාශක	0	0	14	8	4	0	0	0
25.	කෘමිනාශක	48.7	54	20	5	10.5	29	19	44
	වල්නාශක	55.7	55	56	8	78	120	64	102
	දිලීරනාශක	7	12	9	0	0	0	0	5
26.	කෘමිනාශක	0.07	0	0	0	0	0	0	0
	වල්නාශක	0	0	0	0	0	0	0	0
	දිලීරනාශක	0	0	21.79	31.95	0	0	0	0
27.	කෘමිනාශක	26	0	0	0	0	0	0	0
	වල්නාශක	69	0	0	0	0	0	0	0
	දිලීරනාශක	0	0	0	0	0	0	0	0
එකතුව	කෘමිනාශක	1713.73	1468.76	1193.72	1585.67	1008.22	1863.95	1727.584	1355.31
	වල්නාශක	3673.5	3182.1	4220.34	3703.59	2780.43	5366.83	5355.03	5183.36
	දිලීරනාශක	910.22	842.15	733.04	1024.55	598.56	1034.82	942.8	837.8
	මුළු එකතුව	6297.45	5493.01	6147.1	6313.81	4387.21	8265.6	8025.414	7376.47

(iii) කිසිවක් තහනම් කර නැත. මක්නිසාද යත්, සියලුම සමාගම් විසින් පළිබෝධනාශක විකිණිවිධානවලට අනුකූලව කටයුතු කර තිබෙන නිසා.

(ආ) (i) සැපයුම්කරු ලබාදෙන තත්ත්ව සහතිකය හැර ආනයනය කිරීමට පෙර පළිබෝධනාශකවල ගුණාත්මක බව පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් නොමැත. පළිබෝධනාශක ආනයනයේදී ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා උපයෝගී කරගනු ලබන්නේ එම තත්ත්ව සහතිකයයි.

(ii) මෙතිලා වර්තමානයේ අනුගමනය කරන ක්‍රියාමාර්ගය වන්නේ ආනයනය කෙරෙන පළිබෝධනාශකවල තත්ත්ව සහතිකයක් නිෂ්පාදකයා/ සංයෝජකයාගෙන් ලබාගෙන එය තමා වෙත එවන ලෙස පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් ආනයනකරුගෙන් ඉල්ලා සිටීමයි. නිෂ්පාදනය ශ්‍රී ලංකාවට ආනයනය කළ පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් එසේ ආනයනය කළ පළිබෝධනාශක තොගයෙන් අහඹු නියැදි (සාම්පල්) ලබාගෙන එහි රසායනාගාරයේදී විශ්ලේෂණයට භාජනය කෙරේ. ඒවායේ ගුණාත්මක භාවය ගැන පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වන්නේ නම් දේශීය වෙළඳපලේ අලෙවි කිරීමට අවසර දෙනු ලැබේ.

(iii) සියඹුම් පළිබෝධනාශකවල මනුෂ්‍යයන්ට හා සතුනට හානිකර ද්‍රව්‍ය අඩංගු වේ. එහෙත් ක්‍රියාකාරී සංඝටක ලෙස ආසනික් අඩංගු පළිබෝධනාශක ආනයනය සඳහා අවසර දෙනු නොලැබේ. එසේ වුවද අංශුමාත්‍ර වශයෙන් ආසනික් මෙන්ම රසදිය, කැඩ්මියම් සහ ඊයම් ඇතුළු විෂ සහිත බර ලෝහ ද්‍රව්‍ය පළිබෝධනාශකවල අන්තර්ගතවීම පළිබෝධනාශක නිෂ්පාදනයේ සාමාන්‍ය තත්ත්වයකි.

(iv) බර ලෝහ වර්ග නවයක් (ආසනික්, කැඩ්මියම්, රසදිය, ඊයම්, කොබෝල්ට්, ක්‍රෝමියම්, ටින්, තැලියුම් සහ නිකල්) සහ සයනයිඩ පරීක්ෂාවට ලක්කිරීම සඳහා පළිබෝධනාශක විදේශ රටවල බලයලත් රසායනාගාරවල හෝ ශ්‍රී ලංකා කාර්මික නාක්ෂණ ආයතනයේදී විශ්ලේෂණයට භාජනය කෙරේ. ඉදිරි වර්ෂයේ සිට මෙම පරීක්ෂණ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් සතු රසායනාගාරයේදී පරීක්ෂාවට ලක්කිරීමට හැකිවන පරිදි එය වැඩිදියුණු කිරීම සඳහා මෙවර අයවැයෙන් ප්‍රතිපාදන ලබා දී තිබේ.

(v) 1994 දී සංශෝධිත 1980 අංක දරණ පළිබෝධනාශක පාලන පනතේ 22 වැනි වගන්තියට අනුව (මතභේදයට තුඩු දී ඇති) එවැනි නියැදි පනතේ නිශ්චිත වශයෙන් දක්වා ඇති බලය ලත් විශ්ලේෂකයන් ලවා ඉටුකරවා ගත යුතු බව දැක්වේ. රජයේ වෛද්‍ය විද්‍යාලයේ හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රසායනාගාරවලදී එබඳු සාම්පල පරීක්ෂා නොකෙරේ.

(vi) අදාළ නොවේ.

(vii) පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් පළිබෝධනාශක නිර්දේශ නොකෙරේ. එම නිර්දේශ ලබාදෙන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආයතන , තේ පර්යේෂණායතනය, පොල් පර්යේෂණායතනය, රබර් පර්යේෂණායතනය, උක් පර්යේෂණායතනය සහ අපනයන කෘෂිකර්ම පර්යේෂණ ආයතනය වැනි භෝග පර්යේෂණායතනයන් විසිනි. එසේ නිර්දේශ කරන ලද පළිබෝධනාශක මනුෂ්‍ය සෞඛ්‍යයට පිළිගත නොහැකි මට්ටමින් අවදානම සහිත නොවේ නම් ශ්‍රී ලංකාවේ භාවිත කිරීමට සුදුසු පළිබෝධනාශක ලෙස පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබේ. පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ කාර්යයට අමතරව මෙරටට ආනයනය කරන පළිබෝධනාශක වෙළඳපළට නිකුත් කිරීමට පෙර ඒවායේ තත්ත්ව පරීක්ෂාවද පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉටු කරනු ලැබේ.

(ඇ) (i) පළිබෝධනාශක ශ්‍රී ලංකාවේ භාවිත කිරීම සඳහා බලපත්‍ර ලබාදීම සහ මානව සෞඛ්‍යයට හා පරිසරයට එමඟින් සිදුවිය හැකි අනතුරුදායක තත්ත්වයන් අවම කරගනිමින් එහි උපරිම ප්‍රතිලාභ ලබාගත හැකි පරිදි පළිබෝධනාශක භාවිතය නියාමනය කිරීමේ බලය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුවේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ බොහෝ භෝග ආශ්‍රිත පළිබෝධ පාලනය සඳහා පළිබෝධනාශක නිර්දේශ කිරීමේ කාර්යය කරනු ලබයි . ඒ අනුව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කර තිබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පත්කරන ලද පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා රටේ ඒ ඒ දිස්ත්‍රික්කය භාරව කටයුතු කිරීම සඳහා පත් කර ඇති බලයලත් නිලධාරීන් සමඟ පළිබෝධනාශක පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාර පළිබෝධනාශක ආනයනය, සංකලනය, ගබඩා කිරීම, ප්‍රවාහනය, ප්‍රචාරණය සහ අලෙවිය පිළිබඳ නියාමන කාර්යයන් ඉටු කරනු ලබයි. ඉහත කටයුතු කිරීමට පලිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයාට උපදෙස් දීම සඳහා අදාළ පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත සාමාජිකයන් 15 දෙනෙකුගෙන් යුත් ඉහළ මට්ටමේ තාක්ෂණික හා උපදේශක කමිටුවක් පත්කර ඇත. නිලබලයෙන් පත්වන සාමාජිකයන් 10 දෙනෙකුගෙන් සහ කෘෂිකර්ම අමාත්‍යාවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත එම කමිටුව 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලන පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව පත්කර තිබේ. සෞඛ්‍ය අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු පළිබෝධනාශක භාවිතයට අදාළ සියළුම පාර්ශ්වයන් විසින් එම කමිටුව නියෝජනය කරයි.

එම තාක්ෂණික හා උපදේශක කමිටුවට තීරණ ගැනීමට උපකාර කිරීම සඳහා උප කමිටු තුනක් තාක්ෂණික කමිටුව විසින් පත්කර ඇත.එනම් කෘෂි පළිබෝධනාශක උප කමිටුව, ගෘහස්ථ හා මහජන සෞඛ්‍ය පළිබෝධනාශක උප කමිටුව සහ කාර්මික පළිබෝධනාශක උප කමිටුව වේ. අදාළ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් එම කමිටුවලට පත්කර ඇත. උදාහරණයක් වශයෙන් ගෘහස්ථ හා මහජන සෞඛ්‍ය උප කමිටුවට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කරන ලද වෛද්‍යවරුන් 9 දෙනෙකුගෙන් , පශු වෛද්‍ය පර්යේෂණායතනයේ , ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිතයෙකුගෙන් සමන්විත වේ. එමෙන්ම කාර්මික පළිබෝධනාශක උප කමිටුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මධ්‍යම පරිසර අධිකාරියේ සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නියෝජිතයින්ගෙන් සහ වෛද්‍යවරයෙකුගෙන් සමන්විත වේ.

කෘෂිකර්ම දෙපාර්ස.මේන්තුව හෝ මොන යම් ආයතනයක් /පුද්ගලයෙකු ශ්‍රී ලංකාවේ පළිබෝධනාශක ලියාපදිංචිය ලබාගැනීමට උනන්දුවක් දක්වන්නේ නම් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා නියම කර ඇති මූලික තොරතුරු සමඟින් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුවේ. රෙජිස්ට්‍රාර්වරයා විසින් එම තොරතුරු අදාළ උප කමිටුවට යොමු කරනු ඇත. එම පළිබෝධනාශකය ශ්‍රී ලංකාවේ භාවිත කිරීමට සුදුසු බව තීරණය කරන්නේ නම් ඒ බව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා වෙත නිර්දේශ කෙරේ. ඒ අනුව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා පළිබෝධනාශක නාක්ෂණ හා උපදේශක කමිටුවේ එකභාත්වය ඇතිව පළිබෝධනාශක පනත ප්‍රකාරව පළිබෝධනාශක ලියාපදිංචිය සිදුකෙරේ.

මීට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඊට අයත් පර්යේෂණ ආයතන හරහා කෘෂිරසායන භාවිතය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරයි. පළිබෝධනාශක භාවිතයේ යෝග්‍යතාව මට්ටම් සොයා දැනගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ පර්යේෂකයන් විසින් පර්යේෂණ පවත්වනු ලැබේ. එම විද්‍යාත්මක පර්යේෂණ ප්‍රතිඵල පදනම් කරගෙන පළිබෝධනාශක භාවිත පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරයි.

(ii) : පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක නොකරයි. නමුත් එමඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ඊට අමතරව "මහින්ද චින්තනය" මත පදනම්ව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල සහභාගිත්වයෙන් කෘෂි රසායන අලෙවි හා නාක්ෂණික සහයකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන අතර, එමඟින් ගොවීන් දැනුවත් කෙරේ. ඒසේ වුවද ගොවීන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙන්නේ ප්‍රධාන වශයෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශය සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු මඟිනි. පළාත් තාක්ෂණික ක්‍රියාකාරී කමිටුව හරහා එම වැඩසටහන් සම්බන්ධීකරණය කෙරේ. තවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ කාර්ය පරිපාටිය ගොවීන්ට හඳුන්වා දී ඇති අතර, පළිබෝධනාශක අඩංඩව භාවිත කිරීම පිළිබඳ අවදානම් තත්ත්වය පිළිබඳවද ඔවුන් දැනුවත් කෙරේ.

(ඈ) අදාළ නොවේ.

[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This Answer is also placed in the Library.]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු ඇමතිතුමනි, උත්තරය සභාගත කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න තුනක් අහන්න තිබෙනවා.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා පසු ගිය 7 වන දා කිව්වා, කෘමි නාශක සහ වල් නාශක වර්ග 4ක් තහනමට ලක් කළාය කියා. මා අහන්නේ ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා ද කියලායි. කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා ඔබතුමා එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවාද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතියක් අවශ්‍ය නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
හරි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේවා තහනම් කළා. හැබැයි, වෙළඳ පොළවලට ගෙන්වපුවා තවම ඇති තරම් තිබෙනවා. මේවා තහනම් කළේ ශරීරයට විෂ සහිත නිසායි. ඒ වුණාට තවමත් වෙළඳ පොළේ ඒවා විකුණන්නට තිබෙනවා. එහෙම නම්, ඒවා ඉවත් කරන්නට ඔබතුමාගේ යම් වැඩ පිළිවෙළක් තිබෙනවා ද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තහනම් කළ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියා මාර්ග පොලීසියට ගැනීම සඳහා. [බාධා කිරීමක්]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඇහුණේ නැහැ, ගරු ඇමතිතුමනි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නයක් තිබෙනවා ද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමනි, අප තහනම් කළ ද්‍රව්‍ය කොහේ හෝ තැනක විකුණනවා නම් පොලීසිය හෝ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ඒ සම්බන්ධයෙන් රාජකාරි කරන්නට ඕනෑ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මේ කාර්යය කරන්නටය කිව්වාට, මේ සඳහා අවසරයක් දීලා නැහැනේ ගරු ඇමතිතුමා?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අප ගැසට් නිවේදනයෙන් ඒවා තහනම් කළාට පස්සේ, පොලීසියට බලතල හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට බලතල ලැබෙනවා, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නට.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන වටය.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා. තව එක ප්‍රශ්නයක් අහන්න. ඔබතුමා පිළිතුර සභාගත කරන්නය කියා කිව්ව නිසා, ඔය අහන ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඔව්. මම පිළිතුරු සභාගත කරන්නය කිව්වා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අහන ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඊයේ පිළිගත්තා, -මම ඔබතුමාට ඒ ගැන ස්තුතිවන්ත වනවා. - මෙහාට එන බාස්මතී සහල් වර්ග සියල්ල බාල වර්ගයේ ඒවා බව. පළමුවන පන්තියේ බාස්මතී සහල් එන්නේ නැහැ. ඒ වාගේම ඔබතුමා මගේ කලින් අතුරු ප්‍රශ්නයේදී පිළිගත්තා, පිට රට අබලි ද්‍රව්‍ය මෙහේ එක් එක් ව්‍යාපෘති හරහා ගෙන්වනවාය කියලා. මම ඒ ගැන ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වනවා. ඒ විතරක් නොවෙයි. මම ඔබතුමාගෙන් අහනවා, ඔබතුමා කියපු බාල වර්ගයේ හාල් ඒ වාගේම ඊයේ කියූ hybrid එළවලු මේ පාර්ලිමේන්තුවටත් ආවා නම්, ඒ රටවල ඌරන්ට, බූරුවන්ට, බල්ලන්ට කන්න දෙන ඒවා නේද මේ පාර්ලිමේන්තුවේ ඉන්න මැති ඇමතිවරුන්ටත් අද කන්න දෙන්නේ කියලා.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
අන්න ඒක තමයි.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බාස්මතී සහල් ගැන එතුමා ඊයේ මගෙන් අහපු ප්‍රශ්නයට අදාළව සම්පූර්ණ වාර්තාව මම ගෙනැත් තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපි 2012.07.23 වන දින රේගු දෙපාර්තමේන්තුව දැනුවත් කර තිබෙනවා. අපි පරීක්ෂා කර බැලූ සාම්පල් එකකවත් නියම බාස්මතී තිබුණේ නැහැ. මේකත් ඔබතුමා මීට මොහොතකට කලින් කිව්වා වාගේ අපේ රට සහ ඉන්දියාව අතර තිබෙන Indo-Sri Lanka Free Trade Agreement එක යටතේ ගෙන්වන කොට ඒ ගොල්ලන්ට රේගු පහසුකම් ලැබෙනවා. ඒ ලැබීම ප්‍රයෝජනයට අරගෙන යම් යම් වෙළෙඳුන් කරන පහත් ක්‍රියාවක් මේක. රේගුව දැනුවත් කිරීම සඳහා අපි මේ සම්බන්ධයෙන් තිබෙන තාක්ෂණික වාර්තාව රේගු අධ්‍යක්ෂවරයාට 2012.07.23 වන දා යවලා තිබෙනවා, බාස්මතී වර්ගයේ සහල් සහ අනෙක් සහල් වර්ග හඳුනා ගන්නේ කොහොමද කියන එක ගැන. ඒ පිළිබඳ වාර්තාව තමයි මේ මගේ අතේ තිබෙන්නේ. මෙය අපට විතරක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ප්‍රශ්නය ඇමෙරිකාව සහ එංගලන්තයටත් තිබෙන ප්‍රශ්නයක්. Internet එකට ගිහිල්ලා බැලුවොත් පෙනෙනවා, ඒ රටවල විකුණන්නෙත් නියම බාස්මතී නොවන බව.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. දෙවන වටය.

ජනාධිපති සමාව මත නිදහස් වූ සිරකරුවන් : විස්තර

ஜனாதிபதியின் மன்னிப்பின்கீழ் விடுதலை பெற்ற சிறைக்கைதிகள் : விபரம்

PRISONERS RELEASED BY PRESIDENTIAL PARDON : DETAILS

3137/'12

7. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) 2005 වර්ෂයේ සිට 2012.06.01 දින දක්වා වූ කාලය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ලබා දෙන සමාවක් මත නිදහස් වූ මරණීය දඬුවම ලබා සිටි,

(i) සිරකරුවන්ගේ නම් කවරේද;

(ii) එම එක් එක් සිරකරුවා "මරණීය දඬුවමට යටත් කළ සිරකරුවෙකු" ලෙස බන්ධනාගාරය තුළ ගත කර ඇති කාලය කොපමණද;

(iii) එම එක් එක් සිරකරුවා නිදහස් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 ව්‍යවස්ථාව ප්‍රකාරව එක්මන් ජනාධිපතිවරයා විසින් දෙන ලද සමාව යටතේ නිදහස් කරන ලද තැනැත්තන් අතර සිටි,

(i) පුද්ගල ඝාතනයට වරදකරුවන් වූ අය කවුරුන්ද;

(ii) හෙරොයින් ජාවාරම හෝ ළඟ තබා ගැනීමට වරදකරුවන් වූ අය කවුරුන්ද;

(iii) ඉහත වර්ග දෙකට අයත් නොවන අය සිටී නම්, එම සිරකරුවන්ගේ නම් සහ අදාළ වැරදි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පුනර්වාழ්වළිප්පු, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2005 முதல் 2012.06.01 வரையிலான காலகட்டத்தில் அரசியலமைப்பின் 34ஆம் உறுப்புரையின் பிரகாரம் ஜனாதிபதியினால் வழங்கப்படுகின்ற மன்னிப்பின் கீழ் விடுதலை பெற்றுள்ள மரண தண்டனை விதிக்கப்பட்டிருந்த,

(i) சிறைக் கைதிகளின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு கைதியும் "மரண தண்டனைக்கு உட்படுத்தப்பட்ட சிறைக் கைதியாக" சிறைச்சாலையில் கழித்துள்ள காலம் எவ்வளவென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு சிறைக் கைதியும் விடுதலை செய்யப்பட்ட திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) அரசியலமைப்பின் 34ஆம் உறுப்புரையின் பிரகாரம் தற்போதைய ஜனாதிபதியினால் வழங்கப்பட்ட மன்னிப்பின் கீழ் விடுதலை செய்யப்பட்டவர்களில்

(i) கொலைக் குற்றவாளிகளாக இருந்தவர்கள் யாவர் என்பதையும்;

(ii) ஹெரொயின் வியாபாரம் சம்பந்தமாகவோ அல்லது தம்வசம் வைத்திருத்தல் சம்பந்தமாகவோ குற்றவாளிகளாக இருந்தவர்கள் யாவர் என்பதையும்;

(iii) மேற்படி இரு வகைகளையும் சேராதவர்கள் இருப்பின் அத்தகைய சிறைக் கைதிகளின் பெயர்கள் மற்றும் அவர்கள் புரிந்துள்ள குற்றங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Rehabilitation and Prison Reforms:

(a) Will he inform this House of -

(i) the names of the prisoners who were sentenced to death and released by a presidential pardon as per the Article 34 of the Constitution during the period from the year 2005 to 1st June, 2012;

(ii) the period of time that each of the aforesaid prisoner had "served the death sentence"; and

(iii) the date on which each of the aforesaid prisoner was released ?

(b) Will he state -

(i) the names of the persons who were convicted of homicide;

(ii) the names of the persons who were convicted for heroin trafficking or keeping heroin in their possession; and

(iii) the names of the prisoners and the offences committed by them who do not belong to either of the aforesaid two categories if there are any ?

(c) If not, why?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) (1) ස්ත්‍රී සිර අංක එල් 13494 මේරි ජූලියට මොනිකා ප්‍රනාන්දු

(2) සිරකරු අංක එල් 20600 ඇන්ටන් ලින්කන් විජේවර්ධන තෙන්නකෝන්

(ii) (1) අංක 1 සිරකාරිය අවුරුදු 03 දින 06යි

(2) අංක 2 සිරකරු අවුරුදු 03 දින 23යි

(iii) (1) අංක 1 සිරකාරිය 2008.03.08

(2) අංක 2 සිරකාරිය 2010.08.26

(ආ) (i) ඉහත සඳහන් දෙදෙනාම පුද්ගල සාතනයට වරදකරුවන් වී ඇත.

(ii) නැත

(iii) නැත

(ඇ) අදාළ නොවේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු විපක්ෂනායකතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Hon. Deputy Speaker, the media is under a duty to have an accurate reporting of the proceedings of this House. In that context, I bring to your notice how the proceedings of the House on 10th April, 2013 had been reported in the "Daily Mirror" of 11th April, 2013 under the heading "Army men in civils attack dissenters" referring to what I have said. It purports to state, I quote:

> "The Speaker made these remarks after Opposition Leader Ranil Wickremasinghe alleged that a top military officer based in the north kept a separate squad dressed in civilian clothes to attack people whose politics he disapproved of. Mr. Wickremasinghe named the military officer in the House."

There is no name given here. I did refer to this. I referred to the conduct of a group that operates under Major General Hathurusinghe. I do not go into the facts of those because the Hon. Speaker had ordered the Government to go into it. But, "The Island" of that day has stated, I quote:

> "Ranil blames SF Commander, Jaffna"

The "Lankadeepa" of the same day says, "මන්ත්‍රීවරයකු නිලධාරියකුට එරෙහිව පැමිණිල්ලක් කළොත් ඒ ගැන සොයා බැලිය යුතුයි. යාපනේ ආඥාපතිට එරෙහිව රනිල් නැගූ චෝදනාවෙන් පසුව කථානායක කියයි" කියලා.

Why is it that the "Daily Mirror" has deliberately misquoted what I said in order to protect an official? This is supposed to be an independent newspaper. If we have made a statement about anybody, we take responsibility in this House, for whoever it is. There is no means by which they can hold it back. So, I would like you to go into the matter.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Who is going to answer that?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
No, it is for you to take note of.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Leader of the Opposition, I will take note of what you said and refer it to the Hon. Speaker for appropriate action.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 25 යටතේ මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා, ඊයේ පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමිය විසින් කරන ලද ප්‍රකාශය. අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝන් අමරතුංග මැතිතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නයට එතුමිය පිළිතුරු දුන්නා. එතුමිය කළ ඒ ප්‍රකාශය ඇතුළත් හැන්සාඩ් වාර්තාව මා ළඟ තිබෙනවා. එහි සඳහන් කර තිබෙනවා, "2012 වර්ෂයේ සිටම මෙම තත්ත්වය මෙසේ පැවැති අතර හිටපු අමාත්‍යවරයා විදුලි බිල වැඩි කිරීමේ යෝජනාව භාණ්ඩාගාරය වෙතද, අතිගරු ජනාධිපතිතුමා සමඟ පැවැත්වූ සාකච්ඡාවකදීද මතු කර තිබූ අතර මා අමාත්‍ය ධුරය භාර ගන්නා තුරු නිගමනයකට එළඹී තිබුණේ නැත." කියා. ඒ වාගේම තවදුරටත් සඳහන් කර තිබෙනවා, "එම ඉන්ධන මිල වැඩි කිරීමේ යෝජනාව විදුලි බිල සංශෝධන යෝජනාවට සමගාමීව ක්‍රියාත්මක කිරීමෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ අර්බුදය වළක්වා ගැනීමට පියවර ගත යුතු බවටත් හිටපු අමාත්‍යතුමා විසින් ජනාධිපතිතුමාට කරුණු ඉදිරිපත් කළ අතර එහි ප්‍රතිඵලය වූයේ ඉන්ධන මිල වැඩි කිරීමේ යෝජනාව 2013.01.01 සිට 2013.04.01 දක්වා කල් දැමීමයි. මා අමාත්‍යවරිය වශයෙන් දැන් මුහුණ දී සිටින්නේ මෙසේ කල් දමන ලද 2013.04.01 දින සිට ක්‍රියාත්මක වන ඉන්ධන මිල වැඩි වීමේ ක්‍රියාවෙන් ජනිත වන මූල්‍ය අර්බුදයෙන් ලංකා විදුලිබල මණ්ඩලය ගොඩ ගැනීමේ ක්‍රියාදාමයටයි." කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මා කියන්න කැමැතියි, අද දවසේ- [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! කරුණාකරලා ගරු මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ හැසිරෙන්න ඉගෙන ගන්න.එක මන්ත්‍රීවරයෙකුට කථා කරන්න අවස්ථාව දීලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා, තාක්ෂණ, පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍ය විතරක් නොවෙයි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ පූර්වගාමී අමාත්‍යවරයා විධියට කටයුතු කරපු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා එතුමාගේ අත්සනින් අද දවසේ ඉදිරිපත් කරලා තිබෙනවා-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විසින් නඟන ලද කාරණාව ස්ථාවර නියෝග 25 යටතේ පැන නඟින්නක් නොවෙයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Let me explain this.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මා ඔබතුමාට හොඳින් ඇහුම් කන් දුන්නා. ඔබතුමාට සෑහෙන කාලයක් ප්‍රකාශ කරන්න අවස්ථාව දුන්නා. මෙතැනින් එහාට ඉඩ දෙන්න බැහැ. එය අදාළ නොවේ. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා. [බාධා කිරීම්]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මතු කරන්නේ වෙනත් කාරණාවක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පාර්ලිමේන්තුවේ අවුරුදු හතරකදී හතර වතාවක් මේ කාරණය මතු කරලා තිබෙනවා. එනම් මහ බැංකු වාර්තාව මේ වන තුරුත් පාර්ලිමේන්තුවට සභාගත කරලා නැහැ. මුදල් පනතේ වගන්ති අනුව දවස් 14ක් ඇතුළත මහ බැංකු වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන්න ඕනෑ. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ කාරණය මූලාසනයේ අවධානයට යොමු කර තිබෙනවා. දැන් ඒ පිළිබඳව තීන්දුවක් දී අවසානයි.

ගරු විපක්ෂ නායකතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Hon. Deputy Speaker, I refer to Standing Order No. 25. The House of Commons Manual states, I quote:

"Any disregard of or attack on the rights, powers and immunities of the House and its Members, either by an outside person or body, or by a Member of the House, is referred to as a "breach of privilege"

I would like to refer you to the Canadian case in 2002 when Arthur C. Eggleton, the Minister of National Defence was accused of deliberately making misleading statements in the House. Speaker Milliken ruled that the matter merited being considered by an appropriate committee because the House has been left with two versions of the event.

Now, the Hon. Member has given two versions. There are two versions in it. - [*Interruption.*] One by the Hon. Minister and the other by the former Minister.
- [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Leader of the Opposition, the Chair had already given a Ruling. - [*Interruption.*]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. -[*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අස්වර් මන්ත්‍රීතුමා- *[Interruption.]* Order, please! කරුණාකරලා අස්වර් මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, there is a grave danger of this House going into flames because all the Members of the Opposition have brought candles. - [*Interruption.*]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
No, no. - [*Interruption.*]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
They must not be allowed to light those inside the House. It is dangerous. They will set the Chamber on fire -[*Interruption.*] Sir, they cannot do that. - [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඉටි පන්දම් ගෙනා මන්ත්‍රීවරුන්ට ඉටි පන්දම් පත්තු කිරීම රාත්‍රී කාලයේදී කළ හැකියි. [බාධා කිරීම්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගමැතිතුමාත් එනවා; අහලා බලන්න. Sir, first you must inquire as to who allowed them to bring those into the House. - [*Interruption.*] This is dangerous.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order, Hon. Dayasiri Jayasekara?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට බොහොම පැහැදිලිව කිව්වේ, මේ පාර්ලිමේන්තුව වැරැදි විධියට නොමහ යැවීමේ ප්‍රකාශයක් ගරු ඇමතිතුමිය විසින් කරලා තිබෙනවාය කියලායි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් මම තීන්දුවක් දීලා අවසානයි. ඒ තීන්දුවට එරෙහිව සභනයක් ලබා ගැනීම සඳහා කථා කිරීමට ස්ථාවර නියෝග යටතේ අවස්ථාවක් නැත.

ගරු සජිත් ප්‍රේමදාස මහතා. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ කථා කරන්නේ මොකක්ද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Sajith Premadasa, are you raising your point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අවස්ථාව ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ස්ථාවර නියෝග අංක 25 යටතේත්, ඒ වාගේම ස්ථාවර නියෝග අංක 84 යටතේත්, ඒ වාගේම වරප්‍රසාදයක් හැටියටත් මම මේ කරුණ ඉදිරිපත් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ උත්තරීතර සභාවේ ඇමතිවරයෙක් වග කීමෙන් ප්‍රකාශයක් ඉදිරිපත් කරන කොට යථාර්ථවාදී -සත්‍යවාදී- තොරතුරු ඉදිරිපත් කරන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ අවධානයට මම යොමු කරන්නට කැමැතියි. ඊයේ දවසේ විදුලිය ස්ථාවර ගාස්තු සියයට 950කිනුත්, ඒ වාගේම ඒකක 60ක් පාවිච්චි කරන අයට සියයට 47කිනුත්, ඒකක 90ක් පාවිච්චි කරන අයට සියයට 59කිනුත්, ඒකක 91ක් පාවිච්චි කරන අයට සියයට 126කිනුත්- [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකරලා ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි බල ගාස්තු වැඩි කිරීම පිළිබඳව මේ උත්තරීතර සභාවට ඊයේ දිනයේ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කළා. [බාධා කිරීම්] ඇත්තටම ඒකක 60ට සියයට 47කිනුත්, ඒකක 90ට සියයට 59කිනුත්, ඒකක 91ට සියයට 126කිනුත් වශයෙන් මේ රටේ දුගීභාවයෙන් පෙළෙන ජනතාව විපතට පත් කරන්නට මේ විදුලි බල ගාස්තු වැඩි කිරීම පවිත්‍රාදේවිය නොවෙයි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ක්‍රියාත්මක කළා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, I do not see any point of Order in it. You can ask for a debate if you say that the Hon. Minister has made a misleading statement.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කියන දේවල් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න ඕනෑ. මේ "සිරස" මාධ්‍යයට කියන දේවල්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබතුමාට විවාදයක් ඉල්ලා සිටිය හැකියි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මහතා කියපු සියලු දේවල් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න ඕනෑ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Hon. Deputy Speaker, the Minister of Technology, Research and Atomic Energy has called the Hon. (Mrs.) Pavithradevi Wanniarachchi a liar. That is the summary of the whole story.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
If there is any contradictory statement made, you can ask for a debate.

ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, ස්ථාවර නියෝග 84. (viii) කෙරෙහි.

"කවර මන්ත්‍රීවරයකු විසින් හෝ අන්‍ය මන්ත්‍රීවරයකුට අයුතු චේතනා ආරෝපණය කරමින් කථා නොකළ යුතු ය."

ඊයේ දවසේ පවිත්‍රාදේවී ඇමතිතුමිය මේ සභාවට සාවද්‍ය කරුණු ඉදිරිපත් කළා.

සමාජ අසාධාරණත්වය පතුරවමින්, මේ රටේ දුක් විඳින ජනතාවට ඉතාමත් අසාධාරණ විධියට විදුලි බිල ඉහළ දමා සාවද්‍ය ප්‍රකාශයක් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට- [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Ravi Karunanayake, what is your point of Order?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, while this Debate is going on -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම් දීම. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා.[ඝෝෂා කිරීම්]

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත
சுரங்கங்கள், கனிப்பொருட்கள் (திருத்தம்) சட்டமூலம்
MINES AND MINERALS (AMENDMENT) BILL

"1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා විසිනි.

2013 මැයි 07 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர் அவர்களின் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப் பட்டது.

2013 மே 07, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.

Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Minister of Environment and Renewable Energy;
to be read a Second time upon Tuesday, 07th May, 2013 and to be printed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
යෝජනා පිළිබඳ දැනුම් දීම.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ.භා. 1.00 සිට අ.භා. 7.30 දක්වා විය යුතු ය. අ.භා. 7.30 ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය. "

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2013 මැයි මස 07 වැනි අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order? - [*Interruption.*] ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයාට කථා කරන්න ඉඩ දීලා අනෙක් ගරු මන්ත්‍රීවරුන් වාඩි වෙන්න. සභාවේ විනයක් තිබෙන්න ඕනෑ. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ස්තුතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ පාර්ලිමේන්තුවේදී ගරු කථානායකතුමා ප්‍රකාශයක් කළා, පළාත් සභාවට යොමු කළ පනත් කෙටුම්පත් කිහිපයක් පිළිබඳව. ඒ ප්‍රකාශයේ මෙසේ සඳහන් වනවා:

" "විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන)", "උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන)" සහ "මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

මෙම පනත් කෙටුම්පත් 2013 මාර්තු මස 08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඵ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාර එක් එක් පළාත් සභාවට යොමු කර ඇති අතර, 2013 අප්‍රේල් මස 11 දින හෝ ඊට පෙර ඒ ඒ පළාත් සභාවේ අදහස් පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා ස්ථාවර නියෝග අංක 46අ (2)(අ) යටතේ ඉදිරිපත් කරන ලදී.

බස්නාහිර, වයඹ, දකුණු, නැගෙනහිර, ඌව, සබරගමුව හා උතුරු මැද නමැති පළාත් සභා පනත් කෙටුම්පත් සලකා බැලීමෙන් අනතුරුව ඒ සඳහා එකී සභාවල එකඟතාවය පළ කර ඇත.

මධ්‍යම පළාත් සභාව මෙම පනත් කෙටුම්පත් සමගාමී ලැයිස්තුවට අදාළ නොවන බව පවසා එම පනත් කෙටුම්පත් පිළිබඳව සාකච්ඡා කිරීම අනවශ්‍ය බවට වාර්තා කොට ඇත. "

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී ඉතාම භයානක ප්‍රශ්නයක් මතු වෙනවා. මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ ඇති වන ප්‍රශ්නයක්. මධ්‍යම පළාත් සභාව කියන දේ හරිද, එහෙම නැත්නම් පාර්ලිමේන්තුව මේ පනත් කෙටුම්පත් පළාත් සභාවලට යැවීම හරිද කියන ප්‍රශ්නය මතු වෙනවා. මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක තිබෙන ප්‍රශ්නයක්. අපි දැන් කුමක්ද පිළිගන්නේ? ගරු කථානායකතුමා එතුමාගේ වගකීම ඉෂ්ට කළා. පළාත් සභාවට අයිතියක් නැහැ කියලා එතුමන්ලා කියනවා. නමුත් පළාත් සභාවට අයිතියි කියලා පාර්ලිමේන්තුවෙන් මේවා යොමු කර තිබෙනවා. කොයි එකද හරි?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Leader of the House of Parliament, what is your position on this?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුව මඟින් ඒවා යොමු කර තිබෙනවා. නමුත් පළාත් සභාව කියනවා නම් "ඒක ගැන අපේ උනන්දුවක් නැහැ. ඒක අපට බලපාන්නේ නැහැ" කියලා, ඒක එතැනින් අවසානයි. මාසයක් ගත වුණායින් පස්සේ එය විවාදයට ගන්න පුළුවන්. එච්චරයි. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර, නිශ්ශබ්ද වෙන්න. ගරු සභානායකතුමායි දැන් සභාව අමතන්නේ. කරුණාකර, සභානායකතුමා කථා කරන කොට බාධා කරන්න එපා. [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම පැහැදිලිව ඒ පිළිබඳව යම් මතයක් ප්‍රකාශ කළත්, නොකළත් මාසයක් ගත වුණායින් පස්සේ අපට ඒක විවාදයට ගන්න පුළුවන්. නමුත් ඔවුන් මේ පනත් කෙටුම්පතට විරුද්ධත්වයක් ප්‍රකාශ කර නැහැ. විරුද්ධත්වයක් ප්‍රකාශ කළා නම් තමයි ඒ පිළිබඳව ප්‍රශ්නයක් පැන නඟින්නේ. එවැනි විරුද්ධත්වයක් ප්‍රකාශ කර නැතිව කියනවා, "මේක අපට අදාළ නැහැ" කියලා. ඒ අයට අදාළ නැත්නම්, ඒ අය විරුද්ධත්වයක් ප්‍රකාශ කර නැත්නම් එතැනින් ඒ ප්‍රශ්නය ඉවරයි. එතැන අපට ප්‍රශ්නයක් ඇත්තේ නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ ගැන වාද කරන්න ලෑස්ති වන්නේ නැහැ. ඔබතුමාගේ අවධානයට මා මේ කරුණ යොමු කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මේ ප්‍රශ්නය මේ විධියට යොමු කිරීමේදී, එය නීතියට එකඟව යොමු කළාද කියලා ගරු කථානායකතුමාගේ ප්‍රකාශය අනුව පැහැදිලි කිරීමක් මේ පාර්ලිමේන්තුවට කරන්න. එච්චරයි මා ඉල්ලන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම පැහැදිලිව පාර්ලිමේන්තුව විසින් ඒ කාරණය ඉටු කරලා තමයි පළාත් සභාවට යොමු කර තිබෙන්නේ. නමුත් ඒ පළාත් සභාව කියනවා,

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

"මෙය අපට අදාළ නැහැ"යි කියලා. එය අදාළ නැහැයි කියා ඒ පළාත් සභාව කියනවා නම් අපට එය ප්‍රශ්නයක් නොවෙයි. පාර්ලිමේන්තුව වශයෙන් අපි ව්‍යවස්ථානුකූල යුතුකම ඉෂ්ට කරලා තිබෙනවා. ඒක එතැනින් ඉවරයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
Sir, rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුව අදාළ පනත් කෙටුම්පත පළාත් සභාව වෙත යොමු කර තිබෙන්නේ ඒ පිළිබඳව සලකා බලා තම මතය පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහායි. පළාත් සභාව "සලකා බලනවා" කියා කියන්නේ ඒ පනත් කෙටුම්පත පළාත් සභාවේ රැස්වීමකදී සලකා බැලීමයි. එසේ නොමැතිව, "අපට අදාළ නැත" කියලා කාර්යාලයීය ක්‍රියාවලියක් මඟින් ඒ පනත් කෙටුම්පත ආපසු එවනවා නම් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපේක්ෂා කරන දෙය නොවෙයි. ඒ අනුව ඒ පනත් කෙටුම්පත පළාත් සභාවට යොමු කිරීමෙන් පසු සලකා බැලීමක් සිද්ධ වෙලා නැහැ. එම නිසා මේ පිළිබඳව ගැඹුරින් සොයා බලා තීරණය කරන්න. මොකද, මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රශ්නයක්; පාර්ලිමේන්තුවේ පරමාධිපත්‍යය පිළිබඳ ප්‍රශ්නයක්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එයට එකඟ වන්නේ නැහැ. ඒ කෙසේ වෙතත් මාසයක් තුළදී පළාත් සභාව ඒ පිළිබඳව තමන්ගේ මතය, විරුද්ධත්වය ප්‍රකාශ කළේ නැත්නම් අපට ඒ පනත් කෙටුම්පත විවාදයට ගන්න පුළුවන්. දැන් මාසය ගත වෙලායි තිබෙන්නේ. එම නිසා මේ ප්‍රශ්න මොනවත් මතු වන්නේ නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියන්නේ, අපේ මතයට පටහැනිව පළාත් සභාවේ මතය එවා තිබෙනවා කියලායි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එය සඳහන් වන නිසා මෙය අපට පැහැදිලි කරලා දෙන්න කියලායි මා කියන්නේ. දැන් නොවෙයි, -

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මෙය මධ්‍යම පළාත් සභාවේ මතයක්ද, එහෙම නැත්නම් කාර්යාලයේ මතයක්ද? මෙය කාර්යාලයේ මතයක් නම් ඒ පනත් කෙටුම්පත සභාවට තවම ඉදිරිපත් කරලා නැහැ. අන්න ඒකයි තිබෙන ප්‍රශ්නය.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව උද්ගත වී තිබෙන තත්ත්වය මත මේ සම්බන්ධව ගරු නීතිපතිතුමාගේද මතය විමසා අවසාන තීන්දුවකට එළඹීම සුදුසු යැයි මම තීරණය කරමි. ඒ අනුව සභාව විනාඩි 10කට කල් තබනවා.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 3.30ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு பி.ப. 3.30 மணி வரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 3.30 p.m. and then resumed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත, මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත සහ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව මධ්‍යම පළාත් සභාව විසින් දෙනු ලැබූ අදහස් සම්බන්ධයෙන් ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා සහ අනිකුත් මන්ත්‍රීතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීම පිළිබඳව මාගේ තීරණය දැනුම් දීමට කැමැත්තෙමි.

ඉහත සඳහන් පනත් කෙටුම්පත් පිළිබඳව නීතිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව තම සහතිකය ඉදිරිපත් කරමින් එම පනත් කෙටුම්පත්වල අඩංගු විෂයය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ සමගාමී ලැයිස්තුවට ඇතුළත් වන බැවින් 154 උ (5) (අ) ව්‍යවස්ථාව අනුව පළාත් සභා විමසිය යුතු බව දන්වා ඇත. ඒ අනුව පාර්ලිමේන්තුව විසින් මෙම පනත් කෙටුම්පත් සියල්ල ස්ථාවර නියෝග 46අ. (2) (අ) යටතේ පළාත් සභා වෙත ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා යොමු කරන ලදී. මධ්‍යම පළාත් සභාව විසින් මෙම පනත් කෙටුම්පත් ඔවුන්ගේ ප්‍රඥප්ති හා නීති කාරක සභාව හා ඉන් අනතුරුව පළාත් සභාව තුළ සලකා බලා තම අදහස පාර්ලිමේන්තුව වෙත දන්වා ඇත. එම පළාත් සභාවල අදහස 2013 අප්‍රේල් මස 23වන දින පාර්ලිමේන්තුවට නිවේදනය කරන ලදී.

ස්ථාවර නියෝග 46 (2) (අ) අනුව පළාත් සභාව වෙත අදාළ පනත් කෙටුම්පත් යොමු කොට එක් මසක කාල සීමාවක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාල සීමාවක් තුළ දී හෝ එම පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අදහස් පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා, අදාළ පනත් කෙටුම්පත්වල පිටපත් පළාත් සභාවලට ඉදිරිපත් කරන ලෙස, ගරු කථානායකවරයා විසින් මහ ලේකම්වරයාට විධාන කරනු

ලැබිය යුතුය. ස්ථාවර නියෝග 46 (2) (ආ) අනුව ඉහත (අ) හි සඳහන් කාල සීමාව අවසන් වීම හෝ පළාත් සභාවල අදහස් ලැබීම යන මේ දෙකෙන් මුලින් සිදු වන දෙයින් අනතුරුව, පාර්ලිමේන්තුව විසින් ඒ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරනු ලැබිය හැකිය.

ඒ අනුව මෙම පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් මධ්‍යම පළාත් සභාවේ අදහස ලැබී ඇති බැවින්ද, ස්ථාවර නියෝග ප්‍රකාරව මාසික කාල සීමාව ඉක්මවා ගොස් ඇති හෙයින්ද, එම පනත් කෙටුම්පත් පිළිබඳව පාර්ලිමේන්තුවේ ඉදිරි කටයුතු කරගෙන යාමට කිසිදු නීතිමය හෝ කාර්ය පටිපාටිමය බාධාවක් නොමැති බව මා දන්වා සිටිමි.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන) පනත් කෙටුම්පත
இலங்கை றோமன் கத்தோலிக்க அதிமேற்றிராணியார், மேற்றிராணியார் (திருத்தம்) சட்டமூலம்
ROMAN CATHOLIC ARCHBISHOP AND BISHOPS OF CEYLON (AMENDMENT) BILL

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickramasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයෙන් ගන්නා ලදී.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දිනට නියමිත කටයුතු.

(i) අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 6 දක්වා නියමයක් සහ නියෝග 5ක් අනුමත කිරීම.

(ii) අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 7 සිට 10 දක්වා පනත් කෙටුම්පත් දෙවැනිවර කියවීම.

(iii) අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 11 ඉදිරිපත් කිරීමට.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත: නියමය
உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டம்: கட்டளை
EXCISE (SPECIAL PROVISIONS) ACT: ORDER

[අ.භා. 3.33]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතින් අවසන් වරට සංශෝධිත, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පදාන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි මස 15 දිනැති අංක 1793/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.03.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු යටතේ විෂය අංක 1 සිට 10 දක්වා සාකච්ඡා කිරීම සඳහා කරුණු ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වනවා. අද අප සාකච්ඡා කරන මේ අණපනත් කොටස් හතරකට බෙදන්නට පුළුවන්. පළමුවැනි කොටස මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කරන ලද නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය. දෙවැනි කොටස විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ ඒ අනුෂාංගික (සංශෝධන) පනත් කෙටුම්පත්. තුන්වැනි කොටස, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග (අංක1) සහ (අංක 2). හතර වැනි කොටස, 1980 අංක 26 දරන ආහාර පනත යටතේ නියෝග. මේවායින් 1 සහ 4 මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ඉදිරිපත් වන නිසා මා එම කරුණු පැහැදිලි කරනවා. ඊට පසුව ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමා සහ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා එම අමාත්‍යාංශවලට අදාළ නියෝග ගැන කරුණු පැහැදිලි කරනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පළමුවෙන්ම කියන්න කැමැතියි, -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2013 අප්‍රේල් මස 24වන බදාදා, එනම් අද දින පස්වරු 3.45ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගී වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු ඇමතිතුමනි, කථා කරන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පළමුවෙන්ම කරුණු ඉදිරිපත් කරන්නේ විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත, මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත සහ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත යන පනත් කෙටුම්පත් පිළිබඳවයි. ඔබතුමා දන්නා පරිදි පසු ගිය අය වැය ඉදිරිපත් කිරීමේදී ගරු මුදල් ඇමතිතුමා -අතිගරු ජනාධිපතිතුමා- ඉදිරිපත් කළ ඒ යෝජනා ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒවාට අනුමැතිය ලබා ගැනීම සඳහා තමයි අද අප මේ ගරු සභාවට පැමිණ සිටින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විවාහ ලියා පදිංචි කිරීමේ ගාස්තු යාවත්කාලීන කරන්න තමයි අප මෙහිදී බලාපොරොත්තු වන්නේ. විවාහ දැන්වීමක් පළ කිරීම හෝ විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතික නිකුත් කිරීම සඳහා වන ගාස්තුව රුපියල් 100 දක්වා වැඩි කිරීම සහ විවාහ රෙජිස්ට්‍රාර්වරයකුගේ කාර්යාලයේදී විවාහයක් ලියා පදිංචි කිරීම සඳහා වන ගාස්තුව රුපියල් 750ක් වශයෙන්ද, කාර්යාලයෙන් පිටතදී විවාහයක් ලියා පදිංචි කිරීමේ ගාස්තුව රුපියල් 1,500ක් හා විවාහයක් ලියා පදිංචි කිරීමට තම කාර්යාලයෙන් පිටත ස්ථානයකට යාම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා වන ගාස්තුව රුපියල් 3,500ක් දක්වාත් වැඩි කිරීමයි මෙමඟින් බලාපොරොත්තු වන්නේ. ඒ අනුව ආනුෂංගිකව වාගේ ඒ හා අදාළ වෙනත් විවාහ පනත් අප රටේ තිබෙනවා. උඩරට විවාහ හා දික්කසාද පනත, මුස්ලිම් විවාහ හා දික්කසාද පනත මා මුලින් සඳහන් කළ තීන්දු අනුව ආනුෂංගික වශයෙන් වෙනස් කරන්නයි අප බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් මරණයක් ලියා පදිංචි කිරීමේ ගාස්තුව රුපියල් 50 දක්වා වැඩි කිරීම හා එවැනි ලේඛනයක තොරතුරු වෙනස් කිරීමේ ගාස්තුව රුපියල් 50 දක්වා වැඩි කිරීමටත් බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම මේ යෝජනා අප ඉදිරිපත් කළත්, මේවා ක්‍රියාත්මක වන්නේ අපේ හිතවත් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය භාර ඇමතිතුමාගේ පාලනය යටතේයි. නමුත් මෙහිදී කරුණු කීපයක් විතරක් මතක් කරන්න මා කැමැතියි.

පළමුවෙනි කාරණය තමයි මේ ගාස්තු අවුරුදු 20ක්, 30ක් තිස්සේ වෙනස් නොවී පැවතීම. අනික් සියලුම ක්ෂේත්‍රවල -ඒ සමාන ක්ෂේත්‍රවල- වෙනස්වීම් සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව විශාල වශයෙන් නොවෙයි, යම් කිසි වෙනස්වීම්වලට ලක් කරලා, ඇත්ත වශයෙන්ම මුදල් ලබා ගැනීමේ චේතනාවෙන් කරන එකකටත් වඩා යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව අනුව මේ ගාස්තු වෙනස් කිරීම සුදුසුයි කියලා අප හිතුවා.

දෙවැනි කාරණය මේකයි. මේ සෑම ක්ෂේත්‍රයකම නියැලී සිටින රෙජිස්ට්‍රාර්වරු දීර්ඝ කාලීනව ඉල්ලීමක් කර තිබුණා, ඒ අයට ලැබෙන ඒ මුදල් ප්‍රමාණය වැඩි කරන්න කියලා. බොහෝ විට ජීවන වියදම සහ වෙනත් කරුණු දිහා බැලුවාම අප ඒවා සකස් කර තිබෙනවා; වෙනස් කර තිබෙනවා. නමුත් මේ අයගේ ගෙවීම් වෙනස් වෙලා තිබුණේ නැහැ. ඔවුන්ගේ දීර්ඝ කාලීන ඉල්ලීම් තිබුණා. ඒවා කලින් කලට වෙනස් වෙලා තිබෙනවා. විවාහ දැන්වීමක් පළ කිරීම හෝ විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ සහතික කිරීම සඳහා වන ගාස්තුව රුපියල් 100 දක්වා වැඩි කිරීම සහ වෙනත් සකස් කිරීම් ලබා දීම සුදුසුය කියා මා හිතනවා. ඒකට ඒ රෙජිස්ට්‍රාර් සමිති සමාගම්වලින් රජයට ප්‍රශංසා කරලාත් තිබෙනවාය කියලා මා කියන්න කැමැතියි.

තුන්වැනි කාරණය තමයි නව තාක්ෂණය. විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දායකත්වය යටතේ මේ හුහක් දේවල් නවීකරණය කර තිබෙනවා. කොම්පියුටර් භාවිතය, photocopying වැනි දේවල් තුළින්, ඊට වඩා විශාල තාක්ෂණික මෙවලම් පාවිච්චි කිරීමෙන් මේ කටයුතුවලට යෙදිලා තිබෙනවා.

අපි සියලු දෙනාම දන්නා හැටියට, ඉස්සර බොහෝ දුරට අතින් සටහන් කරලා තමයි කච්චේරි ලේඛනාගාරවල - record rooms වල- වාර්තා පවත්වා ගෙන ගියේ. මට මතකයි, මම දිසාපතිවරයකු හැටියට හිටපු කාලයේ, ඒ සහතිකවල copy එකක් කොළඹ ලේඛනාගාරයට යවන්න ඕනෑ. තවත් copy එකක් කච්චේරියේ තියා ගන්න ඕනෑ. ඒවා වෙනස් වුණොත් ලොකු ප්‍රශ්න ඇති වෙනවා. නමුත් දැන් එහෙම නොවෙයි, ඕනෑ තරම් පිටපත් ගන්න පුළුවන්. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගිහින් මුදල් ගෙවලා, ඒ සැණින්ම පිටපත් ලබා ගන්න පුළුවන් විධියට දැන් කටයුතු යොදලා තිබෙනවා. ඒ සඳහා යම් කිසි මුදල් ප්‍රමාණයකුත් රජය දරලා තිබෙනවා. ඒ වාගේම නව තාක්ෂණය තුළින් ඒ ඉල්ලුම සැපයීමට, -විශේෂයෙන් අධිකරණය තුළ තිබෙන ඉල්ලුම- හුහක් දුරට සහයෝගය ලබා දෙන්න අපට පුළුවන් වෙයි කියලා හිතනවා. ඒ නිසා මම හිතන්නේ නැහැ, මේ සංශෝධන එතරම්ම විවාදාත්මක කාරණා කියලා. ඒ වාගේම මෙම සංශෝධන මුදල් ලබා ගැනීමේ චේතනාවෙන් කරන විශාල වෙනසක් කියලා අපි සලකන්නේත් නැහැ. නමුත් ඒ කටයුතුවල යෙදෙන, නියැලෙන අයට සාධාරණ ගෙවීමක් කරන්න ඕනෑ. ඒ වාගේම ඒකෙන් රජයටත් යම් කිසි ප්‍රමාණයක් ලැබෙනවා. ඒ විෂය භාර අපේ ඇමතිතුමාත් මීට පෙර ප්‍රකාශ කරලා තිබෙනවා, මේ සහතික පිටපත් නොමිලේ ලබා දීම නිසා බොහෝ විට ඒවා නැති කර ගෙන නැවත නැවත ඉල්ලනවා කියලා. ඒ නිසා මේ සංශෝධන තුළින් අපට මීට වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්න පුළුවන් කියලා අපි බලාපොරොත්තු වනවා. ඒ සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙයි කියලා මා බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් පොදු ප්‍රශ්න තිබෙනවා. විශේෂයෙන්ම මේ විවාදයට කෙළින්ම අදාළ නැති වුණත් කිව යුතු කාරණයක් තිබෙනවා. වර්තමානයේදී මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සහ උඩරට විවාහ හා දික්කසාද පනත යටතේ විවාහ සිදු වනවා අඩුයි. විශේෂයෙන් මුස්ලිම් විවාහ සඳහා ඉල්ලීමක් තිබෙනවා, මීට වඩා රෙජිස්ට්‍රාර්වරු ප්‍රමාණයක් පත් කරලා ඒ සේවය ලබා දෙන්න කියලා. අපේ ඇමතිතුමා ඒ ගැන සලකා බලයි. ඒ කටයුත්ත කරන්නත් අපි බලාපොරොත්තු වනවා. නමුත් පවතින නීතිය යටතේ අද කෙනෙකුට අයිතිය තිබෙනවා, පොදු විවාහ නීතිය යටතේ තමන්ගේ විවාහය register කර ගන්න හෝ තමන්ට අදාළ විශේෂිත නීතිය යටතේ විවාහයට ඇතුළත් වෙන්න. මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මීට පෙරත් මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරලා තිබෙනවා. සමහර නීති-රීති වෙනස් කළ යුතුද, සමහර නීති-රීති ලිහිල් කළ යුතුද කියලා අධිකරණ අමාත්‍යාංශය කරුණු සොයා බලයි.

උඩ රට පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මට විශේෂයෙන් කියන්න පුළුවන් කාරණයක් තිබෙනවා. නව පර්යේෂණ අනුව සොයා බැලීමේදී උඩරට විවාහ හා දික්කසාද නීතියේ ඉතාම සාධාරණ සහ ඉතාම ප්‍රගතිශීලී ක්‍රමයක් තිබෙන බව සොයා ගෙන තිබෙනවා. විවාහය, දරුවන්ගේ නඩත්තුව, දික්කසාදය වාගේ කාරණා සම්බන්ධයෙන් කළ පර්යේෂණවලින් සොයා ගෙන තිබෙනවා එය ඉතාම හොඳ ප්‍රගතිශීලී අදහස් තිබුණ විවාහ ක්‍රමයක් කියලා. ඒ සම්බන්ධයෙන් වාද විවාද කරන්න පුළුවන්. නමුත් කාලයක් තිස්සේ ඒ සම්බන්ධයෙන් ලිපි ලේඛන පළ වෙනවා. නව සොයා ගැනීම් අනුව, නව නෛතික සංකල්ප අනුව ඒ නීතිය සංශෝධනය කළ යුතුද, නැද්ද කියලා අපට පුළුල් වශයෙන් බලන්නට පුළුවන්. නමුත් අද අපි කරන්නේ එදිනෙදා කෙරෙන කටයුත්තකට මේ ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊ ළඟට 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනෙන නියමය ගැන මම කියන්න කැමැතියි. එය මෝටර් රථ /භාණ්ඩ සඳහා නිෂ්පාදන බදු සහන ලබා දෙන නියමයක්. මීට පෙරත් මෙවැනි සංශෝධනයකට අනුමැතිය ලබා දුන්නා. එයට සිදු කරනු ලබන සංශෝධනයක් තමයි මෙයින් බලාපොරොත්තු වන්නේ.

2013 ජනවාරි මස 15 දිනැති අංක 1793/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 13 යටතේ මෙහෙම සඳහන් වෙනවා:

"... ගුවන් තොටුපළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම විසින් නිකුත් කරනු ලැබූ ගුවන් මගීන් ගුවන්තොටුපල වෙත සහ ගුවන්තොටුපළින් ප්‍රවාහනය කිරීම සඳහා වන වලංගු අවසර පත්‍රයක් දරන්නෙකු විසින් එම කාර්යය සඳහා භාවිතා කරමින් තිබෙන වසර 5කට වඩා පැරණි මෝටර් රථයක් වෙනුවට එම කාර්යය සඳහා යොදා ගැනීමට ආනයනය කරනු ලබන ..."

ආනයනය කරනු ලබන මෝටර් රථයක් සඳහා ගෙවිය යුතු බදු ප්‍රමාණය අඩු කිරීම සඳහා වූ සංශෝධන ඉහත සඳහන් කළ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ ගැසට් පත්‍රයේ ඔක්කොම විස්තර තිබෙනවා, කොයි කොයි ඒවාටද ඒ සහනය ලැබෙන්නේ කියලා.

අද හුඟක් දුරට අපි බලාපොරොත්තු වන්නේ අපේ නව සංචාරක ව්‍යාපාරය ගැනයි. ඒ සංචාරකයන්ගේ ගමන් පහසුකම් පිළිබඳව අද ලොකු චුවමනාවක් තිබෙනවා. ගුවන් තොටුපොළවල නවීකරණයට අවශ්‍ය යාන වාහනවලට යම්කිසි පහසුකමක් ලබා දෙන්න අවශ්‍යයි. මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීවරුන්ට හොඳට මතක ඇති, ඒ සම්බන්ධව විටින් විට මේ ගරු සභාවේ සාකච්ඡා පැවැත්වූ බව. අපේ ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමාටත් මතක ඇති. එතුමා සංචාරක ඇමතිතුමා වෙලා හිටපු කාලයේ ලොකු ඉල්ලීමක් තිබුණා, මේ ස්ථාන නවීකරණය කරන්න, සංචාරකයන් ආවාම ඒ ගොල්ලන්ට රට වටේ යන්න හොඳ වාහන ලබා දෙන්න කියලා. ඒ කාලයේ ඉඳන්ම ඒ ඉල්ලීම තිබුණා. මට මතක විධියට ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ කාලයේ Ceylon Hotels Corporation එක හදලා ඒකට මේ විධියේ වාහන ලබා ගන්න හුඟක් සහන දුන්නා. එහෙම නේද ඇමතිතුමනි? ඒ විතරක් නොවෙයි, හෝටල් කර්මාන්තයේ යෙදුන කොම්පැනිවලටත් ඒ සහනය දුන්නා. හැම රජයක්ම සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න වාහනවලින් සහන දීලා තිබෙනවා. ඒක අත්‍යවශ්‍යයි. අද ලෝකය දිහා බැලුවාම අපේ ටැක්සි ක්‍රමය මීට වඩා දියුණු කරන්න ඕනෑ. සංචාරකයන්ට යන්න එන්න වාහනයක් හොයා ගන්න අද බොහෝ විට අමාරුයි. ඒ නිසා ඒ අංශය තවත් දියුණු කරන්න ඕනෑ. පිට රට ගියාම අපට පෙනෙනවා මේ කියන කරුණු සැබෑවක් බව. අපි 2016 වන විට සංචාරකයන් ලක්ෂ 25ක් - 2.5 million - මේ රටට ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා. පසු ගිය වර්ෂයේ අපේ සංචාරක සංඛ්‍යා ලේඛන අනුව ලක්ෂ 10ක් මේ රටට ඇවිත් තිබෙනවා. ඒක විශාල වෙනසක්.

හෝටල් ගත්තොත් ෂැන්ග්‍රි-ලා හෝටලය, හයට් හෝටලය, මැරියට් හෝටලය, ක්ලෙරිජස් හෝටලය යනාදී හෝටල් දැන් හැදිගෙන එනවා. පෞද්ගලික අංශයේ අපේම කොම්පැනි විශාල වශයෙන් හෝටල් සඳහා මුදල් ආයෝජනය කර තිබෙනවා. අපිට කියන්න පුළුවන්, අද රටේ තිබෙන සෑම ලොකු හෝටලයක්ම පාහේ නවීකරණය වෙමින් පවතින බව. විදේශ රටවලට ගියාම අපට පෙනෙනවා, ලංකාව හොඳ රටක් බවට විශාල ප්‍රචාරයක් යන බව. හොඳ නිවාඩුවක් ගත කරන්න පුළුවන් රටක් බවට අපේ රට පරිවර්තනය වෙනවා.

නොයෙක් විධියේ කථා බහ තිබුණත් නව සංචාරකයන් ගෙනෙන්න අපි කටයුතු කරමින් පවතිනවා. British Airways, Flydubai ඒ වාගේම Korean Air වාගේ ගුවන් සේවා පවා ලංකාවේ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ වෙලා කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ ගැන අපට විශ්වාසයක් තිබෙනවා. සංචාරකයන් ලක්ෂ 25ක් මෙරටට එනවා. එතකොට ලොකු විකාශනයක් ඇති වෙනවා. රැකියා අතින්, සංවර්ධනය අතින්, ආර්ථිකය අතින් ලොකු විකාශනයක් ඇති වෙනවා. ඒ නිසා කලින් කලට පරණ නීති වෙනස් කර -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමා කිව්වා, මහා පරිමාණයේ සංචාරක හෝටල්, ෂැන්ග්‍රි-ලා වැනි ආයතන දැන් මේ රටට පිරිවරාගෙන එනවා කියලා. ඒ අයටත් විදුලිබිලේ පහසුකම ලබා දෙනවාද? නැත්නම් ඒ අය එන්න අකමැති වෙයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)

මේ රටේ නීති යටතේ ඒ හැම දෙනාටම ඒ විදුලිබිල ගෙවන්න වෙනවා. වෙන සහනයක් දෙන්නේ නැහැ. තමුන්නාන්සේලා වග කීමෙන් කථා කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාගේ කථාවෙන් පෙන්වා දුන්නා, ආර්ථිකය මෙහෙය වන මුදල් අමාත්‍යාංශය, ඔබතුමන්ලා සහ ඔබතුමන්ලාගේ රජය කාර්යක්ෂම රටක්, රටේ ශක්තිසම්පන්න වර්ධනයක් ඇති කරන්න යනවාය කියලා.

කරුණාකරලා ඔබතුමා මට පැහැදිලි කර දෙන්න, මේ රටේ ජනතාවගෙන් සියයට 75කගේ විදුලිය බිල සියයට 200කින් නංවලා, පොහොසතුන්ගේ විදුලි බිල අඩු කරලා සමාජ සාධාරණත්වය ස්ථාපනය කරන්නේ කොහොමද කියලා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒ රහස; මේ කර ගෙන යන ප්‍රෝඩාව ගැන මම ඔබතුමාට කියන්න ඕනෑ. වෙන දවස්වලට මේ ගොල්ලෝ කථා කරන්නේ මුදල ගැනයි. දැන් ප්‍රතිශතය ගැන කථා කරනවා. මේ ප්‍රෝඩාව හෙළිදරව් කරන්න අවස්ථාවක් ලබා දීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේකයි කාරණාව. දැන් බලන්න-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)

Sir, rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා ප්‍රෝඩාවක් කියන්නේ විදුලි බිල වැඩි කිරීමද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේ ගොල්ලන්ගේ මේ ප්‍රචාරක ව්‍යාපාරය තුළ එක පාරටම ප්‍රතිශත ගැන කථා කරන්නේ මොකද? ශත ගැන කථා කරන්නේ නැහැ. ප්‍රතිශත ගැන කථා කරනවා. ප්‍රතිශතයයි, ශතයයි ගැන මම දැන් කියා දෙන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවැනි විදුලි ඒකක 30 සඳහා වැඩි වන්නේ ඒකකයට රුපියල් 2.50යි. ඒකක 90ක් සඳහා වැඩි වන්නේ ඒකකයට රුපියල් 4.81යි. ප්‍රතිශත ගැන කථා කරනවා. අපි රුපියලක් ගත්තාම ඒක රුපියල් දෙකක් වුණොත් සියයට සියයක ප්‍රතිශතයක්. ඉතාම සුළු මුදල් ප්‍රමාණයක් තමයි වෙනස් වන්නේ. මේ ගොල්ලෝ ප්‍රතිශතය ගැනයි කථා කරන්නේ. ඇත්ත වශයෙන්ම ඒක ප්‍රෝඩාවක්. මහජනයා මුළා කරන්න යොදා ගත්ත ප්‍රෝඩාවක්. ඇයි, සල්ලි ගැන කථා කරන්නේ නැත්තේ? අනෙක් හැම වෙලාවේම සල්ලි ගැන කථා කරනවා. රුපියලක් වැඩි වෙනවාද, රුපියල් දහයක් වැඩි වෙනවාද කියලා කථා කරන්නේ නැහැ. කථා කරන්නේ ප්‍රතිශතය ගැනයි. මිනිස්සු බය කරන්න ප්‍රතිශතය ගැන කථා කරනවා. [බාධා කිරීමක්] මේක විවාදයක් කර ගන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කාලය දීලයි එතුමාට කථා කරන්න දුන්නේ. දැන් මේක විවාදයක් කරන්න බැහැ. ඔබතුමාගේ වෙලාවේදී කථා කරන්න.

එතුමා මේ ප්‍රශ්නය නහපු එක ගැන බොහොම සන්තෝෂයි. විදුලිය බිල වැඩි කිරීමේ ප්‍රතිශත ගැන කථා කරමින් විශාල ප්‍රෝඩාවක් කරනවා. ඇත්ත වශයෙන්ම පළමුවැනි ඒකක 30ට, ඊළඟට 30-60 දක්වා ඒකක සඳහා ඉතාම සුළු ප්‍රමාණයක් තමයි අපි වෙනස් කර තිබෙන්නේ. මේ රටේ මුදල් වෙනස් වී ගෙන යන හැටි බැලුවාම, භාණ්ඩවල විවිධ වෙනස්වීම් බැලුවාම මේක විශාල වෙනසක් නොවෙයි. ඉහළ කොටස්වලට මුදල් වශයෙන් වැඩි ගණනක් ගෙවන්න වෙනවා. කරුණාකරලා තමුන්නාන්සේලාට වාසි වන ආකාරයට මේක ප්‍රතිශතයක් විධියට කථා කරන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැවත වරක් විෂය ගැන කථා කරන කොට මේ රට වෙනස් වන විධියට, අපි ඒ සංවර්ධන කටයුතු කර ගෙන යන විධියට ඒ කරුණු මේ ගරු සභාවට හෙළිදරව් කරලා මේවා සංශෝධනය කරන්න වෙනවා. ඒක පුදුමයට කාරණාවක් නොවෙයි. මම කියන්න කැමැතියි, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා බලයට පත් වෙලා මාස හයක් යන කොට අපේ exchange rate එක; විනිමය අනුපාතය රුපියල් හයට තිබුණ ඇමෙරිකානු ඩොලර් එක රුපියල් හැට ගණනක් කළා. එතකොට ප්‍රතිශතය කොහොමද? කරුණාකරලා ඒ ප්‍රතිශතය කියන්න. ඒ නිසා ප්‍රතිශතවලින් වැඩක් නැහැ. හරි ගණන ගැන කථා කරන්න. මිනිස්සු ප්‍රතිශත ගෙවන්නේ නැහැ නේ. මිනිස්සු ගෙවන්නේ රුපියල් ශත. ඒ නිසා කලින් කලට මේ රට [බාධා කිරීමක්] ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, දැන් මට කථා කරන්න ඉඩ දීලා, ඔබතුමාගේ කථාවේදී කියන්න.

ඒ නිසා මේ අවස්ථාවේදී රටක් හැටියට අපට සෑම ක්ෂේත්‍රයක් ගැනම කල්පනා කරන්න වෙනවා. විදුලිය ක්ෂේත්‍රය, බැංකු ක්ෂේත්‍රය, ආයෝජන ක්ෂේත්‍රය ගැන කල්පනා කරන්න ඕනෑ. තමුන්නාන්සේලා දන්නවාද අවුරුදු පහක් ඇතුළත මේ රටේ සියයට 62ක් නැත්නම් 60කට තිබුණ විදුලිය ආවරණය සියයට 95, 96 දක්වා ගෙනැල්ලා තිබෙනවා. ගම්බද පළාත් විශාල ප්‍රමාණයකට විදුලිය දීලා තිබෙනවා. ඒවාට මුදල් ආයෝජනය කරන්න ඕනෑ. විදුලිය ඉල්ලුම, විදුලිය පරිභෝජනය විශාල වශයෙන් වැඩිවෙලා තිබෙනවා. මේ කරුණු ඔක්කොම සලකා බලලා තමයි අපට තීන්දුවක් ගන්න වෙන්නේ. ඔබතුමන්ලා ඒ ප්‍රශ්නය නහපු නිසා මම පොඩි digression එකක් දුන්නේ.

විශේෂයෙන්ම මම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මට මේ ගැන කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන. අවසාන වශයෙන්, පසු ගිය අය වැයෙන් අපි යෝජනා කළ මේ සංශෝධන සම්මත කර ගන්නට තමුන්නාන්සේලාගේ සහයෝගය මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා. Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[අ.භා. 3.55]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් අද ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත් කීපය සම්බන්ධයෙන් අදහස් දක්වන කොට අපේ මුදල් නියෝජ්‍ය ඇමතිතුමා පුන පුනා කිව්වා, මේක මුදල් සෙවීමේ පරමාර්ථයෙන් කරපු දෙයක් නොව මේ පනත් අලුතින් සංශෝධනය කිරීමේ බලාපොරොත්තුවෙන් කරපු වැඩක් කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ සමාජයේ ඕනෑම කටයුත්තකදී තමන් හදපු ලේඛනයක වැරැද්දක් තිබුණොත්, අඩු පාඩුවක් තිබුණොත් දිවුරුම් ප්‍රකාශයක් ලබා දෙනවා. ජනතාව දිවුරුම් ප්‍රකාශය කොතරම් දුරට ප්‍රයෝජනයට ගන්නවාද? බැංකුවකට ගිහිල්ලා බැංකු ණයක් ගන්න කොට දිවුරුම් ප්‍රකාශයක් දෙන්න වෙනවා. උප්පැන්න සහතිකයක වෙනසක් වෙලා තිබුණා නම් ඒ සඳහාත් අපි දිවුරුම් ප්‍රකාශයක්

දෙන්න ඕනෑ. ඒ වාගේම, නඩු හබයක් අවස්ථාවකදී, බෙදුම් නඩුවක් අවස්ථාවකදී, ඉඩම් ගැටලුවක් ඇති වූ අවස්ථාවකදී දිවුරුම් ප්‍රකාශයක් දෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ළමයකු පාසලකට දාගන්න යන කොට ඒ හැම දරුවකු වෙනුවෙන්ම දිවුරුම් ප්‍රකාශයක් අවශ්‍ය වෙනවා. මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් නොවෙයි මේ පනත් සංශෝධනය කළේ කියලා ඔබතුමන්ලා කියනවා නම් දිවුරුම් ප්‍රකාශ වෙනුවෙන් මුදල් වැඩි කළේ ඇයි? එක වර්ෂයකට පාසල් ළමුන් ලක්ෂයක් විතර ඉල්ලුම් පත් දමනවා. ඒ සඳහා ඉදිරිපත් කළ යුතු දිවුරුම් ප්‍රකාශයකට අදාළව පැවැති රුපියල් 25 ගාස්තුව රුපියල් 250 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වෙනුවෙන් සහනයක් දෙන්න තිබුණා නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ කලබල වෙන්න එපා. තමුන්නාන්සේ විහිළු සපයන මනුස්සයා නේ. තමුන්නාන්සේ අපුල්ලනවා. ඒකට ප්‍රශ්නයක් නැහැ. දිවුරුම් ප්‍රකාශවලට අදාළ මුදල රුපියල් 250 දක්වා වැඩි කර තිබෙනවා. කලින් රුපියල් 25ක මුද්දරයක් ගහලා දිවුරුම් ප්‍රකාශයක් ගන්න පුළුවන්කම තිබුණා. මේ වැඩි කිරීම මුදල් ඉපයීමේ පරමාර්ථයකින් තොරව කරපු වැඩක්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මා තමුන්නාන්සේට මතක් කරන්නම් මුද්දර ගාස්තු සම්බන්ධයෙන්. සාමාන්‍යයෙන් රුපියල් 10ක මුද්දර ගාස්තුවක් ගෙවලා තමයි නොතාරිස්වරු නොතාරිස් බලපත්‍රය අලුත් කළේ. රුපියල් 10ට තිබුණු ඒ ගාස්තුව දැන් රුපියල් 1,000 දක්වා වැඩි කරලා තිබෙනවා. තමුන්නාන්සේලා කියාවි, අපි ඒක නොතාරිස්ගෙනුයි අය කරගන්නේ කියලා. හැබැයි සමස්තයක් හැටියට ගත්තොත්, නොතාරිස්ට ගහන ගාස්තුව ආපසු අය කර ගන්නේ මහ ජනතාවගෙන්. මේක මුදල් උපයන්න කරපු වැඩක් නොවෙයි කියලා කිව්වා. ඒ වාගේම තමයි ඉඩම් ලියා පදිංචි ගාස්තුව. රුපියල් 12.50ට තිබුණු ගාස්තුව රුපියල් 100 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඉඩම් ආරාවුලක් තිබුණු අවස්ථාවක ඒ සඳහා කේවියට තහනමක් ගන්නවා. රුපියල් 12.50ට ගත හැකිව තිබුණු කේවියට තහනම රුපියල් 2,500 දක්වා වැඩි කළා. මිනිසුන්ට ඔළුව උස්සන්න පුළුවන් තත්ත්වයේ වැඩි කිරීමක් නොවෙයි එය. ඒවා සියයට 10කින් වැඩි කළා නම් පොඩි සාධාරණයක් තිබෙනවා. සමහර ඒවා සියයට සියයකින් වැඩි කරලා තිබෙනවා.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)

ගරු මන්ත්‍රීතුමා, මට පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මට බාධා කරන්න එපා. පොඩි වෙලාවක් තිබෙන්නේ ඇමතිතුමා. මාධ්‍ය සාකච්ඡාවේදී ඔබතුමාට කරුණු කියන්න පුළුවන් රටටම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මා තමුන්නාන්සේට මතක් කරනවා පත්තිරුවල පිටපත් සම්බන්ධයෙන්. ඉඩමක ඔප්පුවක් ලියන කොට, ඒ වාගේම බැංකු ණයක් ගන්න කොට සමහර වෙලාවට අවුරුදු 30ක ඉතිහාසයක් බලනවා. ඒ ඉඩම හතරපස්දෙනකුට මාරු වෙලා තිබුණා නම් අඩු ගණනේ පත්තිරු තිහහතළිහක් ගන්න සිදු වෙනවා. රුපියල් 2.50 මුද්දරයක් ගහලා ගත් පත්තිරුව අද රුපියල් 500 දක්වා වැඩි කරලා තිබෙනවා. සල්ලි තිබෙන මිනිසුන්ට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා කියනවා වාගේ ලොකු මිනිසුන්ට, මේ ආණ්ඩුවේ ඉන්න මැති ඇමතිවරුන්ට මේක එච්චර ප්‍රශ්නයක් නැහැ. ඒ අයට සල්ලි තිබෙනවා. ඒ මුදල රුපියල් ලක්ෂ 5ක් කළත් ප්‍රශ්නයක් නැහැ. හැබැයි ගමේ ඉන්න අහිංසක මිනිසුන්ට, කුලී වැඩ කරලා එදා වේල සොයාගෙන ජීවත් වන මිනිසුන්ට, සමෘද්ධි සහනාධාරයෙන් ජීවත් වන මිනිසුන්ට මේක ලොකු ප්‍රශ්නයක්. ඒ අයට මේ මුදල ලොකු මුදලක්. ඒ නිසා මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කියපු ඒ කාරණය පිළිගන්න අපි කොහෙත්ම සූදානමක් නැහැ.

මොකද, මේක සම්පූර්ණයෙන්ම මුදල් ඉපැයීම සඳහා කරපු වැඩ පිළිවෙළක්. අද රජයේ මුදල් රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් නාස්ති වෙනවා. එම නාස්තිය වළක්වන්න කල්පනා කරන්නේ නැහැ. දුප්පත් මිනිසුන්ගේ මුද්දරයෙන් ශත පහ, රුපියල එකතු කරලා ගන්නා මුදල වැඩි කරලා ඒ අයට බර පටවලා තිබෙනවා. එක පැත්තකින් විදුලි බිල වැඩි කරලා තිබෙනවා. අනෙක් පැත්තෙන් ජල බිල වැඩි කරන්න යනවා; ප්‍රවාහන ගාස්තු වැඩි කරන්න යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මම තමුන්නාන්සේට මතක් කරන්නම්, ගරු සරත් අමුණුගම ඇමතිතුමා ප්‍රකාශ කළා විවාහ ගාස්තු පිළිබඳවත්. දැන් බලන්න විවාහ රෙජිස්ට්‍රාර් ගාස්තු පිළිබඳව. ඇමතිතුමා කොළය වහලා ගැහුවේ. රුපියල් 3,500ක් අය කරනවා කියලා එතුමා කිව්වේ රජයේ ගාස්තුව විතරයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයේ ගාස්තුවට අමතරව වෙනම ගාස්තුවක් වශයෙන් අනිවාර්යයෙන්ම අපට තව රුපියල් 1,200ක් රෙජිස්ට්‍රාර්වරයාට ගෙවන්න වෙනවා. රෙජිස්ට්‍රාර්ගේ ගාස්තුව ආණ්ඩුවෙන් නොවෙයි ගෙවන්නේ, අදාළ පුද්ගලයායි ගෙවන්නේ. අද විවාහයක් ලියා පදිංචි කරන්න රුපියල් 5,200ක මුදලක් වැය වෙනවා. රුපියල් 250ට, රුපියල් 300ට තමයි එම ගාස්තුව තිබුණේ. රුපියල් 5,000ක් කියන්නේ ලොකු ගණනක්. පොඩි මිනිහෙකුට අමාරුයි. කෙහෙළිය ඇමතිතුමා තව කසාද දෙක තුනක් කර ගත්තොත් ලොකු ගණනක් වැය වෙනවා. ඔබතුමාට නම් එච්චර ප්‍රශ්නයක් නැහැ. ගමේ මිනිහෙකුට ඒක ලොකු ගණනක්. ඒක නිසා මේක සම්පූර්ණයෙන්ම අරමුණු කරලා තිබෙන්නේ මිනිස්සුන්ගේ බෙල්ල මිරිකලා බදු ගන්න වැඩ පිළිවෙළ තුළින් ආදායම වැඩි කර ගන්නයි කියන එක මම මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරනවා.

ඒ විතරක් නොවෙයි, උප්පැන්න සහතිකය සඳහා වන ගාස්තුව වැඩි කරලා තිබෙනවා. අඩුම තරමින් මේ ආණ්ඩුව මිනිහෙකුට ඉපදෙන්න තිබෙන අවසරයත් නැති කරලා තිබෙනවා. උප්පැන්න ලියාපදිංචි කිරීමේ ගාස්තුව වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම විවාහ ලියාපදිංචි කිරීමේ ගාස්තු වැඩි කළා, මරණ ලියාපදිංචි කිරීමේ ගාස්තුවත් වැඩි කරලා තිබෙනවා. නිදහසේ හුස්ම ගන්න තිබෙන අවස්ථාව නැති කරලා තිබෙනවා. ඒක නිසා පළමුවෙන්ම මේ සඳහා අපේ අප්‍රසාදය ප්‍රකාශ කරනවා කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා. කෙහෙළිය ඇමතිතුමනි, ඒ වාගේම අද internet එකේ තිබෙනවා මම දැක්කා, නෙදර්ලන්තයේ තිබෙන company එකකින් අහඹරු ලෝකයට මිනිස්සු ගෙනියනවා කියලා. නෙදර්ලන්තයේ තිබෙන ඒ "Mars One" කියන company එකෙන් one-way ටිකට් එකක් දීලා අහඹරු ලෝකයට මිනිස්සු ගෙනියනවා. ඉතින්, මේ විධියට මේ රටේ බදු අය කරලා පොඩි මිනිස්සුන්ගේ විදුලි බිල වැඩි කරලා, ඒ වාගේම උප්පැන්න ලියාපදිංචි කිරීමේ ගාස්තු වැඩි කරලා, මරණ ලියාපදිංචි කිරීමේ ගාස්තු වැඩි කරලා, විවාහ ලියාපදිංචි කිරීමේ ගාස්තු වැඩි කරලා, තව කන බොන ඒවාටත් බදු වැඩි කරලා තිබෙන නිසා, මේ රටේ ජීවත් වෙනවාට වැඩිය හොඳයි නෙදර්ලන්තයේ කානාපතිට කථා කරලා අහඹරු ලෝකයට ඉස්සෙල්ලාම අපේ රටෙන් කට්ටිය යැව්වා නම්. එතකොට මේ රටේ මිනිස්සුන්ටත් යන්න තැනක් තිබෙනවා. මොකද, බදු නොගෙවා ජීවත් වෙන්න පුළුවන් තැනක්. අනාගතයේදී මේ රටේ ජනාකාවට ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් ඔබතුමන්ලා ගොඩනඟන්නේ නැති වෙයි කියන එකයි මගේ අදහස.

[ගරු පී. හැරිසන් මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය සතියේ පුවත්පත්වල තිබුණා "දඹුල්ලේ එළවලු කිලෝග්‍රෑම් 50,000ක් කුණු ගොඩට දමයි" කියලා. මේ ආණ්ඩුවේ සමහර මැති ඇමතිවරුන්ගේ ප්‍රකාශත් එක්කම සමහර අයගේ උසුළු විසුළුකම් දිහා බලපුවාම අපට පුදුම හිතෙනවා. ගොවීන්ගේ එළවලු කිලෝග්‍රෑම් 50,000ක් කුණු ගොඩට දාන කොට අපේ කෘෂිකර්ම ඇමතිතුමා කියනවා - එතුමා මෙතැන ඉන්නවාද දන්නේ නැහැ- "එළවලු ඉවත දැමීම හැම වසරකම වෙනවා, ඉන් ගොවීන්ට පාඩුවක් නැහැ" කියලා. බලන්න, එළවලු කිලෝග්‍රෑම් 50,000ක් විනාශ කරලා, ඒකෙන් ගොවීන්ට කිසි පාඩුවක් නැහැ කියලා කියනවා. ඒ තමයි මේ රටේ කෘෂිකර්ම ඇමතිවරයා කියන පුදුම කථා. හරි විධියට කෘෂිකර්ම ඇමතිවරයා ඉල්ලා අස් වෙන්න ඕනෑ. මේ, එතුමා පත්තරවලට කරන ප්‍රකාශ. අද කම්කරු කුලිය රුපියල් 1,000ක් විතර වෙනවා. තෙල් බෙහෙත්වලට ගාස්තු, ප්‍රවාහන ගාස්තු, ඒ වාගේම පොහොරවලට යන මුදල දිහා බැලුවාම අපේ හිටපු කෘෂිකර්ම ඇමතිතුමා, දැන් සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා පුදුම වෙන්න ඇති. මොකද, එතුමා ගොවීන් ගැන, ගොවීන්ගේ ප්‍රදේශ ගැන හොඳ හැඟීමක් තිබෙන කෙනෙක්.

විශේෂයෙන් සෞඛ්‍ය ඇමතිතුමාත් ඉන්න නිසා මම මේ කාරණයත් එතුමාට මතක් කරන්නම්. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, කෘෂිකර්ම ඇමතිතුමා තවත් කියලා තිබුණා කෘෂි රසායන ද්‍රව්‍ය 4ක් තහනම් කරලා තිබෙනවා කියලා. මොකද, ඒවා වකුගඩු රෝගයට බලපානවා කියලා. ඒක හොඳ වැඩක්. හැබැයි සෞඛ්‍ය ඇමතිතුමනි, අපේ කෘෂිකර්ම ඇමතිතුමා මාධ්‍යයට විතරයි ඒක කිව්වේ.

නමුත් තවම කඩවල්වල ඒ කෘෂි රසායන ද්‍රව්‍ය විකුණන්න තිබෙනවා. තහනම් කළා නම් කඩවල්වල තිබෙන ඒවා ඔක්කොම ඉවත් කරන්න ඕනෑ. මම උදේ ප්‍රශ්නයක් ඇහුවාම එතුමා කිව්වා, "ඒක මගේ වැඩක් නොවෙයි, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේයි, පොලීසියේයි වැඩක්" කියලා. මම දන්නේ නැහැ, ඔබතුමා මේකට එකඟ වෙයිද කියලා. නමුත් සෞඛ්‍ය ඇමතිවරයා හැටියට මම තමුන්නාන්සේට එක පැත්තකින් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාට පොඩි හැඟීමක් තිබෙනවා, මේ කටයුතු කරන්න. හැබැයි ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු අනික් නිලධාරීන් ඔබතුමාට මේ කටයුතු කරන්න ඉඩ දෙන්නේ නැහැ. මොකද සෞඛ්‍ය අමාත්‍යාංශය ඔබතුමාව නිකම් රූකඩයක් බවට පත් කරලා ඉවරයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඕනෑ විධියට විතරයි වැඩ කෙරෙන්නේ. ඔබතුමන්ලා කියන දේ කරන්න ඒ අය සූදානම් නැහැ.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ එහෙම නැහැයි කියනවා නම් මම තමුන්නාන්සේට මේ කාරණය ගැනත් කියන්නම්. වකුගඩු රෝගය අද රටේ තිබුණු එකක් නොවෙයි. ලෝක සෞඛ්‍ය දිනය සැමරීමේ උත්සවය මැදවච්චියේ පැවැත්වුණා. මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමනි, එතැනදී ඔබතුමා කිව්වා, මේ වකුගඩු රෝගය අවුරුදු තිහක කාලයක් තිස්සේ තිබෙනවාය කියලා. එහෙනම් මේක රහසක් නොවෙයි. අපි බලාපොරොත්තු වුණා, තමුන්නාන්සේ සෞඛ්‍ය ඇමති වුණු හැටියේම මේ සම්බන්ධයෙන් ක්‍රියා කරයි කියලා. එක පැත්තකින් ඔබතුමාට කෘෂිකර්මය ගැන අවබෝධයක් තිබෙනවා. ඒ වාගේම විෂ රසායන ද්‍රව්‍ය ගැන අවබෝධයක් තිබෙනවා. ඒ නිසාම ඔබතුමාගෙන් මීට වැඩිය ලොකු සේවයක් වෙයි කියලා අප විශ්වාස කළා. පොලොන්නරුවේ -ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ- වකුගඩු සායනයේ ඉන්න වෛද්‍යවරයා පසු ගිය දවස්වල කිව්වා, මේ dialysis කරන machinesවලට දැම්මාට පස්සේ මාස දෙකක් ඇතුළත රෝගීන් 24 දෙනෙකු මැරුණාය කියලා.

ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් machine එකට රෝගියෙකු ඇතුළත් කරන කොට එයාගේ තත්ත්වය පරීක්ෂා කර බලලායි machine එකට දමන්නේ. හැබැයි පොලොන්නරුවේ වකුගඩු සායනයේ ඉන්න විශේෂඥ වෛද්‍යවරයා කියනවා, මේ මාස දෙක ඇතුළත පැරණි machines පාවිච්චි කිරීම නිසා ලෙඩ්ඩු 24 දෙනෙකු මැරුණාය කියලා. තමුන්නාන්සේලා සංඛ්‍යා ලේඛන කොයි විධියට ඉදිරිපත් කළත් උතුරු මැද පළාතේ එක දවසකට හතර දෙනෙකු, පස් දෙනෙකු මේ වකුගඩු රෝගය නිසා මැරෙනවා. යුද්ධයෙන් මැරුණාට වැඩිය මිනිසුන් පිරිසක් මේ වකුගඩු රෝගය නිසා මැරෙනවා. තමුන්නාන්සේට මම මේ කාරණයත් මතක් කරන්නම්.

සෞඛ්‍ය ඇමතිතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් මේ රටේ මහජන මුදල් ලක්ෂ දාහක් -මිලියන සියයක්- වියදම් කරලා වාර්තාවක් ගෙන්වා ගත්තා. ඒ වාර්තාවෙන් මොකක්ද කිව්වේ? පළමුවැනි වාර්තාව ඉදිරිපත් කළාම ඒකේදී පැහැදිව කිව්වා, මේ රෝගයට ප්‍රධාන හේතුව මේ රටට ගෙන්වන විෂ අධික කෘෂි රසායන ද්‍රව්‍ය සහ බාල පොහොර කියලා. ඒ නිසා ඒවායේ ප්‍රමිතිය, තත්ත්වය නංවන්න, ඒ වාගේම මේ ප්‍රදේශවල ජනතාවට කිවුල් වතුර නැතිව හොඳ පානීය ජලය ලබා දෙන වැඩ පිළිවෙළක් ඇති කරන්න කිව්වා. 2011 මුල් කාලයේදී පළමුවැනි වාර්තාව ඉස්සෙල්ලාම ලංකාවට ආවා. ඊට පස්සේ ඒකේ දෙවැනි වාර්තාව ආවා. තුන්වැනි වාර්තාව ආවා. හතරවැනි වාර්තාවේ -අවසාන වාර්තාවේ- එක දිගටම කියලා තිබෙන්නේ මේ සඳහා වැඩ පිළිවෙළක්, ක්‍රියා මාර්ගයක් ඇති කරන්න කියලායි. හැබැයි මම තමුන්නාන්සේට මේ කාරණයත් මතක් කරනවා. විශේෂයෙන්ම 2000 වර්ෂයේ ඉස්සෙල්ලාම පදවිය ප්‍රදේශයෙන් මේ වකුගඩු රෝගය හඳුනා ගන්න කොට එය සියයට දෙකක් දක්වා පමණයි වර්ධනය වෙලා තිබුණේ. 2006 වන කොට උතුරු මැද පළාතේ මේක සියයට හයක් දක්වා වර්ධනය වුණා. 2013 වන කොට ලෝක සෞඛ්‍ය සංවිධානය, ඒ වාගේම ලංකාවේ ඉන්න වෛද්‍යවරු මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් කියනවා, අද උතුරු මැද පළාතේ පමණක් සමස්ත ජනගහනයෙන් එක්ලක්ෂ අනූදාහකට වැඩිය මේ වකුගඩු රෝගය ආසාදනය වෙලා තිබෙනවාය කියලා. මෙය උතුරු මැද පළාතේ පමණක් තිබෙන දෙයක් නොවෙයි. අද මේක වසංගතයක් බවට පත් වෙලා. අද මුළු ලංකාව පුරාම පැතිරිලා තිබෙනවා. විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කය ගත්තාම තණමල්විල, වැල්ලවාය, සෙවණගල, කතරගම, බුත්තල; ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාමය, වීරකැටිය, සූරියවැව, අහුනකොළපැලැස්ස; අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය, බදුල්ල දිස්ත්‍රික්කයේ ගිරාඋරුකෝට්ටේ වාගේ ප්‍රදේශවලත් පැතිරිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, කුරුණෑගල දිස්ත්‍රික්කය ගත්තාම වන්නිහත්පත්තුවේ නිකවැරටිය, ගල්ගමුව, මීගලෑව ආදී ප්‍රදේශ පුරාමත් ව්‍යාප්ත වෙලා තිබෙනවා. හැබැයි මම දන්නවා, සෞඛ්‍ය ඇමතිවරයා හැටියට ඔබතුමා මේකට උත්සාහයක් ගත්තත් අර මම මුලින් කිව්වා වාගේ එතුමාට මේක කරන්න ඉඩ දෙන්නේ නැහැ කියන කාරණය.

බහු ජාතික සමාගම්වල ඕනෑකමට, කොම්පැනිකාරයින්ට යට වෙච්ච නිලධාරි පිරිසක් අවුරුදු දෙකකට ආසන්න කාලයක් ඒ වාර්තාව දෙන්නේ නැතිව තියා ගෙන හිටියා. සෞඛ්‍ය අමාත්‍යාංශයට එවපු වාර්තාව යට ගහගෙන හිටියා. 2011 ජූනි මාසයේදී පළමුවැනි වාර්තාව එනවා; 2011 ඔක්තෝබර් මාසයේදී දෙවැනි වාර්තාව එනවා; 2012 පෙබරවාරි මාසයේදී තුන්වැනි වාර්තාව එනවා; 2012 ජූනි මාසයේදී හතරවැනි වාර්තාව එනවා. 2013 ජනවාරි මාසයේදී අවසාන වාර්තාව එන තෙක් ලෝක සෞඛ්‍ය සංවිධානය, ඒ වාගේම දේශීය වෛද්‍යවරු, විශ්වවිද්‍යාල මහාචාර්යවරු පෙන්වා දුන්නු, එම වාර්තාවල සඳහන් එකම කරුණක්වත් ක්‍රියාත්මක කරලා නැහැ. අඩුම තරමේ උතුරු මැද

පළාතේ මිනිස්සුන්ට පිරිසිදු පානීය ජලය දෙන්න, විශේෂයෙන්ම වකුගඩු රෝගය බහුලව තිබෙන ප්‍රදේශවල ජනතාවට බොන්න වතුර ටිකක් දෙන්න වැඩ පිළිවෙළක් නැහැ. අද මේක ලොකු සමාජ ප්‍රශ්නයක් වෙලා. ගෙදර ස්වාමිපුරුෂයා මැරුණාම පවුලේ සියලු දෙනාම අනාථයි. ඒ අයට කරන්න දෙයක් නැහැ. අන්තිමේදී තමන්ගේ සියලු දේපළ ඉවර වන තෙක් බෙහෙත් කරලා මුළු පවුලම විනාශ වෙලා යන එක විතරයි වෙන්නේ. තමුන්නාන්සේලාගේ ඇස් අරවන්න වකුගඩු රෝගීන් මැදවිවියට ගෙනැල්ලා මුළු රටටම පෙන්වනකොට සමහර අය හිතුවා දේශපාලන වාසි ගන්න අපි ඒක කරනවාය කියා. අපි තමුන්නාන්සේලාට කියනවා, කරුණාකරලා මේ රෝගීන්ට අවශ්‍ය පහසුකම් ටික දෙන්නය, ඒ අයට පානීය ජලය ලබා දෙන්නය කියා. ඒ ටික කළේ ආණ්ඩුවෙන්ය කියා තමුන්නාන්සේලා කියන්න. තමුන්නාන්සේලා ඡන්ද ටිකත් ගන්න. ඒකේ කිසි ගැටලුවක් නැහැ. අපට ඕනෑ මේකෙන් ලකුණු දමා ගන්න නොවෙයි.

ඒ අය මේ රටේ ජීවත් වෙන අහිංසක මිනිස්සු. ඒ අය යමක් කමක් තිබෙන අය නොවෙයි. වකුගඩු රෝගියෙකුගේ වයස අවුරුදු 48 පැනලා නම් අද රජයේ රෝහලකින් dialysis කරන්න බාර ගන්නේ නැහැ. ඒ කියන්නේ අවුරුදු 48 පැනලා නම් මරණ වරෙන්තුව දීලා ඉවරයි කියන එකයි. ඒකයි අද තත්ත්වය. සල්ලි තිබෙනවා නම්, පෞද්ගලික රෝහල්වල අවුරුදු 95ක රෝගියෙක් වුණත් dialysis කරනවා. අවුරුදු 48 පැනලා නම් අපේ රෝහල්වලට ගියාම කියනවා දැන් බෙහෙත් කරන්න ඕනෑ නැහැ; කන්න බොන්න පුළුවන් දෙයක් දීලා ගෙදර එක්ක ගිහින් මැරෙනකම් බලා ගන්නය කියා. දැන් ඒ රෝගීන් ඒ තත්ත්වයට පත් කරලායි තිබෙන්නේ. මේක මානව අයිතිවාසිකම් සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කිරීමක්. ඇයි ඒ මිනිස්සුන්ට ජීවත් වීමේ අයිතිය නැද්ද? උතුරු මැද පළාතේ ජීවත් වන එකද ඒ මිනිස්සුන්ගේ කරුමය?

අද අපේ ප්‍රදේශවල ගැහැනු ළමයෙක් කසාද බඳින්න වෙන පළාතක කොල්ලෙක් කැමැති වෙන්නේ නැහැ. මොකද, වකුගඩු ප්‍රශ්නය නිසා. අද ඒ ප්‍රදේශවල ගැහැනු දරුවෙක් දීග දෙන්න බැහැ; භාර ගන්න කැමැති නැහැ. පිරිමි දරුවෙකුට වෙන ප්‍රදේශයකින් කෙල්ලෙක් දෙන්න කැමැති නැහැ. මොකද, ඒ අය වකුගඩු රෝගීන් බවට පත් වෙලා තිබෙන නිසා.

ගරු ඇමතිතුමනි, අනුරාධපුර මහ රෝහලේ විශේෂඥ වෛද්‍යවරු කියනවා, ඒ ප්‍රදේශයට එන ලෙඩුන්ගෙන් සියයට 95කගේම වකුගඩුව කුඩායි කියලා; මීනී කපලා බැලුවාම වකුගඩු දිය වෙලාය කියලා. මේක උතුරු මැද පළාතට විතරක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. අද මේ ප්‍රශ්නය මුළු ලංකාවම වෙළා ගෙන තිබෙනවා. ඒ ප්‍රදේශයේ නිෂ්පාදනය කරන එළවලු වර්ගවල, ඒ ප්‍රදේශයේ නිෂ්පාදනය කරන පලතුරු වර්ගවල, ඒ ප්‍රදේශයේ නිෂ්පාදනය කරන හාල්වල ආසනික් අඩංගු වෙලා තිබෙනවා; සයනයිඩ් අඩංගු වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම "රවුන්ඩ් අප්" වාගේ සමහර කෘෂි රසායන ද්‍රව්‍යවල මේවා තිබෙනවා. ඒ වාගේම විෂ සහිත කැඩ්මියම් වර්ග තිබෙනවා. තවමත් ඒවා පාවිච්චි කරන්න අවසරය දී තිබෙනවා. කෘෂිකර්ම ඇමතිතුමාගෙන් උදේ මම ඒ ගැන ඇහුවාම කිව්වා, පොලිසියෙන් ඒක නවත්වාවිය කියා. තවමත් කඩවල ඒවා විකුණනවා. ඔබතුමන්ලා තමයි බලධාරීන්.ඒ නිසා රජයක් හැටියට තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලනවා, මේවා නවත්වලා විකල්ප වැඩ පිළිවෙළකට යන්නය කියා. ලෝකයේ වෙනත් රටවල ඕනෑ තරම් කෘෂි රසායන ද්‍රව්‍ය පාවිච්චි කරනවා. හැබැයි, තත්ත්වයෙන් හොඳ ඒවා තමයි ඒ අය පාවිච්චි කරන්නේ. බාල වර්ගයේ කෘෂි රසායන ද්‍රව්‍ය, විෂ අධික කෘෂි රසායන ද්‍රව්‍ය මෙරටට ආනයනය කරන බහු ජාතික සමාගම් හතරක්, පහක් ඒකෙන් ජීවත් වෙනවා; ඒ එක්කම අනික් අයට මරණ වරෙන්තු ලබා දෙන්නට කටයුතු කරනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම තමුන්නාන්සේලාට මතක් කරන්නේ මේ මිනිස්සුන්ව ජීවත් කරවන වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියායි. සෞඛ්‍ය ඇමතිතුමා කිව්වා මේ ගැන නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කරනවාය කියා. කැබිනට් මණ්ඩලයෙන් මේ සඳහා වෙනම කමිටුවක් පත් කළා. ඒ කමිටුව පත් කළේ ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නයි. කැබිනට් මණ්ඩලය පත් කරපු ඒ කමිටුවට මොකද වුණේ?

සෞඛ්‍ය අමාත්‍යතුමා, ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යතුමා ඇතුළු තවත් මැති ඇමතිවරු ගණනාවක් එකතු වෙලා පත් කළ කැබිනට් අනු කාරක සභාවට කිව්වා, මාස දෙකක් ඇතුළත මේ ගැන වාර්තාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්නය කියා. හැබැයි ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, තවත් ඇමතිවරු ගණනාවක් හිටියත් ඒ කමිටුවේ සභාපතිවරයා හැටියට අතාවුද සෙනෙවිරත්න අමාත්‍යතුමා පත් කළා. මොනවා හෝ ක්‍රමයකින් ගරු අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා එම කමිටුවේ සභාපතිවරයා හැටියට පත් වුණා. එම කමිටුවෙන් වෙච්ච සෙත මොකක්ද කියා මා තමුන්නාන්සේගෙන් අහනවා. ඒ කැබිනට් අනු කාරක සභාව පත් කරලා මාස හයකට වැඩියි. ඒ කැබිනට් අනු කාරක සභාවට අමතරව තමුන්නාන්සේලා විද්වත් කමිටුවකුත් පත් කළා. මේ විද්වත් කමිටුවට පත් කළේත් අතාවුද ජයවර්ධන කියන ගරු අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමාගේ එක කුස උපන් සහෝදරයා. ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමාගේ සහෝදරයාය කියන්නේ කවුද? CIC සමාගමේ අවුරුදු 20ක් සේවය කරපු, මේ රටට කෘෂි රසායනික ද්‍රව්‍ය ගෙන්වන සමාගමේ ප්‍රධානියා තමයි තමුන්නාන්සේලා පත් කළේ මේ විෂ ද්‍රව්‍ය ගෙන්වන සමාගම්වල වැරදි සොයන්න. ඒ විද්වත් කමිටුවට ආපු සමහර නිලධාරීන් කමිටුවෙන් අයින් වෙලා ගියා. ඒ අයගේ ජීවිතවලට තර්ජන තිබුණා. "මේ වාගේ කමිටුවකට ඇවිත් උත්තර දීලා අපේ ජීවිත නැති කර ගන්න ඕනෑ නැහැ. එම නිසා අප මේ කමිටුවෙන් යනවා" කියා ඒ ගොල්ලෝ ගියා. අද ඒ විද්වත් කමිටුවට වෙච්ච දෙයක් නැහැ. ඒ විද්වත් කමිටුවේ වාර්තාව මොකක් ද? තමුන්නාන්සේලා ඒ විද්වත් කමිටුවට කිව්වා, මාස දෙකකින් කැබිනට් මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කරන්නය කියා. එම කමිටුව පත් කර දැන් මාස හයක් වෙනවා. තවම ඒකේ වාර්තාවක් නැහැ.

මා විශේෂයෙන් කියන්නේ මේකයි. මේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව වෙනුවෙන් තමුන්නාන්සේලා රජයක් හැටියට මීට වඩා වැඩි පියවරක් ගන්න ඕනෑ. ලෝක සෞඛ්‍ය සංවිධානය කියන හැටියට උතුරු මැද පළාතේ දැනට වකුගඩු රෝගය ආසාදනය වුණු රෝගීන් එක්ලක්ෂ අනුභය දාහකට වැඩිය ඉන්නවා. තව අවුරුදු පහක් යනකොට මේ හැම කෙනෙක්ම මැරිලා යාවි. අද පදවිය ප්‍රදේශයේ අවුරුදු දාහතරේ ළමයින්ටත් වකුගඩු රෝගය හැදිලා තිබෙනවා. අවුරුදු දහනවයේ ළමයින්ට වකුගඩු රෝගය හැදිලා තිබෙනවා. අවුරුදු විස්සේ විසිපහේ අය විතරක් නොවෙයි, පොඩි දරුවෝ පවා මේ රෝගයෙන් මැරෙන්නට පටන් ගෙන තිබෙනවා. එම නිසා මේක ජීවිතයත් මරණයත් එක්ක තිබෙන සටනක්. කරුණාකර මේ සඳහා තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරලා විතරක් මදි. මේ කටයුත්ත වෙනුවෙන් මැදිහත් වෙලා, මේක රටේ භයානක ව්‍යාවසනයක් හැටියට සලකා මේ සඳහා කරන්නට පුළුවන් වැඩ කොටස මොකක්ද කියන එක ගැන රටට පැහැදිලි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න. මා රජයෙන් ඉල්ලන්නේ ඒකයි.

ජීවත් කරවන්න රටේ මිනිස්සු ඉන්න ඕනෑ. ආසියාවේ ආශ්චර්යයට යන්නට නම් රටේ මිනිස්සු ඉන්න ඕනෑ. මෙහෙම ගියොත් මත්තල ගුවන් තොටුපළින් බහින කොට ඒ ප්‍රදේශවල

[ගරු පී. හැරිසන් මහතා]

ජනතාව කවුරුවත් ඉතිරි වන්නේ නැහැ. රටේ මිනිස්සු හිටියොත් විතරයි අපට මේවා කරන්නට පුළුවන් වන්නේ. අද බොරු සංදර්ශනවලට කෝටි ප්‍රකෝටි ගණන් වියදම් කරනවා. මේ රටේ මේ අහිංසක මිනිස්සු දුක් විඳිනවා. ඒ මිනිස්සුන්ගේ ජීවිත විනාශ වෙලා යනවා. සෞඛ්‍ය අමාත්‍යතුමනි, මැදවච්චිය රෝහලට ඔබතුමා ගිහින් පරීක්ෂා කරන තුරු ඒ රෝහලේ අඩු පාඩු ටික හොයන්න බැරි වුණා. අද පදවිය රෝහලට dialysis machines පහක් ගෙනැවිත් තිබෙනවා. ඒවා ආණ්ඩුවෙන් නොවෙයි දුන්නේ; ස්වේච්ඡා සංවිධානවලින් දුන්නු ඒවා. අඩුම තරමේ තවම නිලධාරින් ඒ රෝහලට ගිහින් නැහැ.

රජයක් හැටියට, මේ රෝගය සම්බන්ධයෙන් මීට වඩා ජනතාව දැනුවත් කර, මේක වළක්වා ගන්න වැඩ පිළිවෙළක් හදන්න. එක්කෝ අඩුම තරමින් මේ වකුගඩු රෝගය හැදිච්ච මිනිසුන්ට බෙහෙත් හේත් ටික ගන්නට වන්දියක් ලබා දෙන්න. එම ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Hon. Deputy Chairman of Committees, may I be permitted to say this in two minutes? අද පැවැති පක්ෂ නායකයින්ගේ රැස්වීමේදී ලබන 9 වනදාට විදුලි බලය පිළිබඳව කල්තැබීමේ යෝජනාවක් ලබා දීම ගැන අප ස්තුතිවන්ත වෙනවා. ඒ එක්කම අප ඉල්ලීමක් කළා, එතෙක් මේ විදුලි බිල වැඩි කිරීම නවත්වන්නය කියා. ඒ විවාදයෙන් පස්සේ ඒ ගැන තීරණයක් ගන්න කියලායි අප ඉල්ලීම කළේ. අපේ ඉල්ලීමට ඉඩ ලැබුණේ නැහැ. අපේ ඉල්ලීමට ඉඩ නොලැබීම ගැන අප කනගාටු වෙනවා. අපේ ඉල්ලීම නිශ්ප්‍රභා කළා. ඒ ගැන අප කනගාටු වෙනවා. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

කරුණාකරලා අනෙක් මන්ත්‍රීවරු වාඩි වෙන්න. [බාධා කිරීම්] අනෙක් මන්ත්‍රීවරු වාඩි වෙන්න. Hon. John Amaratunga, please control your Members.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අපට විරෝධය පාන්න වෙන ක්‍රමයක් නැහැ.

[මේ අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකු ඉටි පන්දම් දල්වමින් සහ ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට වූහ.]

[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் எரியும் மெழுகுவர்த்திகளுடன் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷ மெழுப்பினார்கள்]

[At this stage, some Members of the Opposition walked into the Well of the House with lighted candles and created an uproar.]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ඔබතුමන්ලා විවාදය කරගෙන යන්න කැමැතිද, නැද්ද? [ඝෝෂා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ලයිට් ටික නිවන්න. [ඝෝෂා කිරීම්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

Point of Order එක තියා ගන්න. [ඝෝෂා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! - [*Uproar.*]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ලයිට් නිවන්න. [ඝෝෂා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Get back to your seats, please. - [*Uproar.*] කරුණාකරලා වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Lights off කරන්න, lights off කරන්න. [ඝෝෂා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The Sitting is suspended for five minutes.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 4.45ට නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 4.45 மணி வரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 4.45 p.m. and then resumed, MR. DEPUTY SPEAKER *in the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

කරුණාකර වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීවරු දැන් කරුණාකර වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්] දැන් ඉටි පන්දම් නිවිලා, දැන් වාඩි වෙන්න.[ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීවරු කරුණාකර වාඩි වෙන්න. දැන් ගරු සභාවේ කටයුතු- [ඝෝෂා කිරීම්] හරි, දැන් පත්තු නොවුණු ඉටි පන්දමුත් පත්තු වුණා. [ඝෝෂා කිරීම්] කරුණාකර වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීවරු කරුණාකර වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලා දැන් වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. ගරු සභානායකතුමා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විපක්ෂය විසින් පාර්ලිමේන්තුවේ කටයුතු කර ගෙන යෑම සම්පූර්ණයෙන්ම අඩපණ කිරීම සඳහා කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා. ඒ නිසා මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා, ඔවුන්ට විවාද අවශ්‍ය නැත්නම් දැන් මේ පනත් කෙටුම්පත් සියල්ල සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන්න කියලා.

[මේ අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට ලූහ.]
[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமெழுப்பினார்கள்]
[At this stage, some Members of the Opposition walked into the Well of the House and created an uproar.]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාට බලය තිබෙනවා නේ, කරන්න. [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
කථා කරන්න ඕනෑ නම් මෙතැන නටන්න ඕනෑ ද? [බාධා කිරීම්] විපක්ෂයේ කාලය ඉවරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත : නියෝගය
இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம் : கட்டளை
SRI LANKA EXPORT DEVELOPMENT ACT: ORDER

I

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි මස 22 දිනැති අංක 1794/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි මස 22 දිනැති අංක 1794/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආහාර පනත : නියෝග
உணவுச் சட்டம்: ஒழுங்குவிதிகள்
FOOD ACT : REGULATIONS

I

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කම්ටුව විමසා සාදන ලදුව, 2011 ජනවාරි 14 දිනැති අංක 1688/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.04.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව, 2011 නොවැම්බර් 25 දිනැති අංක 1733/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.04.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

III

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව, 2012 ජනවාරි 26 දිනැති අංක 1742/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.04.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත

திருமணப்பதிவு (திருத்தம்) சட்டமூலம்

MARRIAGE REGISTRATION (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
විනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
අදන්පඩි, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]
තීර්මානික්කප්පට්ටදු.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament" . [The Hon. Nimal Siripala de Silva.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. DEPUTY SPEAKER in the Chair.]

1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1, ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 2.- (அத்தியாயம் 112 இன் 24ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 2.- *(Amendment of section 24 of the Marriage Registration Ordinance (Chapter 112))*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"1 වන පිටුවේ, 6 වන පේළියේ සිට 19 වන පේළිය දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 24 වන වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(6) 23 වන වගන්තියේ (1), (2) හෝ (3) වන උපවගන්තිය යටතේ හෝ එහි (4) වන උපවගන්තිය යටතේ යම් කොට්ඨාසයක රෙජිස්ට්‍රාර්වරයකු හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු වෙත කරනු ලබන සෑම නිවේදනයක් සමගම, පිළිවෙළින් රුපියල් දහයක හෝ රුපියල් නිහක නැතහොත් අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලබන වෙනත් යම් මුදලක් ගෙවීම ඔප්පු කිරීම සඳහා වූ අවස්ථාවෝචිත පරිදි, එම කොට්ඨාසයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ එම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද ලදුපතක් ද ඉදිරිපත් කළ යුතුය. " ".

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 27ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 3.- *(Amendment of section 27 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

(1) "1 වන පිටුවේ, 20 වන පේළියේ සිට 28 වන පේළිය දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ දී ප්‍රකාශය කරනු ලබන අවස්ථාවක දී, එම ප්‍රකාශය කරනු ලබන පාර්ශ්වය විසින් රුපියල් සියයක් හෝ අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන යම් මුදලක් ගෙවනු ලැබිය යුතු අතර යම් කොට්ඨාසයක රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ දී ප්‍රකාශය කරනු ලබන අවස්ථාවක දී, එම ප්‍රකාශය සමග රුපියල් සියයක් හෝ නියම කරනු ලබන වෙනත්' ".

(2) "2 වන පිටුවේ, 1 වන පේළියේ සිට 3 වන පේළිය දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යම් මුදලක් ගෙවීම සඳහා වූ සාක්ෂියක් වශයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලබන ලදුපතක් ද ඉදිරිපත් කළ යුතු ය.' ".

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 34ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 4.- *(Amendment of section 34 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"2 වන පිටුවේ, 4 වන පේළියේ සිට 14 වන පේළිය දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) විවාහය සිදු කිරීමේ දින සිට දින හතක කාලයක් ඇතුළත දේවගැතිවරයා විසින් එම විවාහයේ අනුපිටපත විවාහ රෙජිස්ටරයෙන් ඉවත් කර, එම විවාහය ලියාපදිංචි කිරීම සඳහා එම රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවිය යුතු බවට අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වූ ද, මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවක් සමග විවාහය සිදු කළ දිස්ත්‍රික්කය ඇතුළත සිටින එම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත එකී අනුපිටපත යවනු ලැබිය යුතු ය.' ".

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4, as amended, ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 38ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 5.- *(Amendment of section 38 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"2 වන පිටුවේ, 15 වන පේළියේ සිට 30 වන පේළිය දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

"ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

"5. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) ඉහතින්ම වූ උපවගන්තියේ විස්තර කර ඇති පන්තියකට හැර, ස්ත්‍රී පාර්ශ්වය යම් පන්තියකට අයත් වන අවස්ථාවක දී හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව එම උපවගන්තියේ

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ප්‍රතිලාභ සඳහා හිමිකම් නොලබන අවස්ථාවක දී, විවාහ වීමට අදහස් කර සිටින එක් පාර්ශ්වයක් විසින් ඉල්ලීමක් කිරීමෙන් පසුව සහ රුපියල් තුන්දහස් පන්සියයක මුදලක් හෝ අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි යම් මුදලක් ගෙවීමෙන් පසු ඒ පිළිබඳ සාධකයක් වශයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලබන ලදුපතක්ද සමග මෙම බලපත්‍රයේ නම් සඳහන් ස්ථානයේ දී සහ පාර්ශ්වයන් විසින් කැමැත්ත දක්වනු ලබන වේලාවක දී විවාහය සිදු කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයකු වෙත, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු විසින් බලය ලබා දෙන අවසර පත්‍රයක් නිකුත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.' ".

'අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන යම් මුදලක් ඉල්ලුම්කරු විසින් ගෙවනු ලැබිය යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තඞ්කළ් විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

6වන වගන්තිය, සංශෝධිකාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 6, as amended, ordered to stand part of the Bill.

7 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 7.- (முதன்மைச் சட்டவாக்கத்தின் 62ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 7.- (*Amendment of section 62 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"3 වන පිටුවේ, 3 වන ජේළියේ සිට 7 වන ජේළිය දක්වා වූ ජේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

"7. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ (1) වන උපවගන්තියේ 'දෙවන උපලේඛනයේ සඳහන් ගාස්තු' යන වචන වෙනුවට 'අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි දෙවන උපලේඛනයේ සඳහන් ගාස්තු' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

7 වන වගන්තිය සංශෝධිකාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 7, as amended, ordered to stand part of the Bill.

8 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.)

வாசகம் 8.- (முதன்மைச் சட்டவாக்கத்தின் 2ஆவது அட்டவணையை மாற்றீடு செய்தல்)

CLAUSE 8.- (*Replacement of the second schedule to the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தின் 51ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 6.- (*Amendment of section 51 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

(1) " 2 වන පිටුවේ, 31 වන ජේළියේ සිට 35 වන ජේළිය දක්වා වූ ජේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

"6. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

'(2) සෑම ලිඛිත ඉල්ලීමක්ම සහ එහි සෑම සහතික පිටපතක් හෝ සහතික කරන ලද උද්ධෘතයක් ලබා ගැනීම සම්බන්ධයෙන් "

(2) "3 වන පිටුවේ, 1වන ජේළිය සහ 2 වන ජේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

"3 වන පිටුවේ, 8 වන පේළියේ සිට 10 වන පේළිය (දෙවන උපලේඛනය ද ඇතුළත්ව) දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියට දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"8. 2006 අංක 36 දරන පනත මඟින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :-

"දෙවන උපලේඛනය (62 වන වගන්තිය)

	කුමන කාර්ය සඳහා ද යන වග	ගෙවිය යුත්තේ කාටද යන වග	ගෙවනු ලබන්නේ කවුරුන් විසින් ද යන වග	මුදල	
				රු	ශත
1.	ඔහුගේ කාර්යාලයේ දී හෝ වෙනත් යම් ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුළත් කිරීම.	රෙජිස්ට්‍රාර්වරයාට	අයදුම්කරු		100.00
2.	ඔහුගේ කාර්යාලයේ දී හෝ වෙනත් යම් ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුළත් කිරීම.	අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට	අයදුම්කරු		100.00
3.	විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීම.	රෙජිස්ට්‍රාර්වරයාට	විවාහ පාර්ශ්වයන්		100.00
4.	විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීම.	අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට	විවාහ පාර්ශ්වයන්		100.00
5.	ඔහුගේ කාර්යාලයේ දී විවාහය සිදු කිරීම.	රෙජිස්ට්‍රාර්වරයාට	විවාහ පාර්ශවයන්		750.00
6.	ලියාපදිංචි ප්‍රසිද්ධ පූජනීය ස්ථානයක දී සිදු කරන ලද විවාහයක් ලියාපදිංචි කිරීම.	දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට	විවාහ පාර්ශ්වයන්		750.00
7.	ඔහුගේ කාර්යාලයේ දී විවාහය සිදු කිරීම.	අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට	විවාහ පාර්ශ්වයන්		750.00
8.	38 වන වගන්තිය යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටත දී විවාහයක් සිදු කිරීම.	රෙජිස්ට්‍රාර්වරයාට	විවාහ පාර්ශ්වයන්		1500.00
9.	38 වන වගන්තිය යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටත දී විවාහයක් සිදු කිරීම.	අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට	විවාහ පාර්ශ්වයන්		1,500.00".

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.

Amendment put, and agreed to.

8වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

8ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 8, as amended, ordered to stand part of the Bill.

9 වන වගන්තිය.- (වලංගුභාවය සහ හානිපූරණය)

வாசகம் 9.- (செல்லுபடியாக்குதலும் நட்டோத்தரவாதமும்)

CLAUSE 9.- (*Validation and Indemnity.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"4 වන පිටුවේ, 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :

'9. 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන්නා වූ දිනයෙන් අවසන් වන කාලය දක්වා යම් ගාස්තුවක් අය කිරීම සඳහා හෝ.'

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 9, as amended, ordered to stand part of the Bill.

10 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

10ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Clause 10, ordered to stand part of the Bill.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත

கண்டிய திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலம்

KANDYAN MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.

Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

தீர்மானிக்கப்பட்டது.

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.

[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.

[MR. DEPUTY SPEAKER in the Chair.]

1 සිට 5 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ஆம் வாசகத்திலிருந்து 5ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 1 to 5, ordered to stand part of the Bill.

6 වන වගන්තිය.- (වලංගුභාවය සහ හානිපූරණය.)

வாசகம் 6.- (செல்லுபடியாக்குதலும் நட்டோத்தரவாதமும்)

CLAUSE 6.- (*Validation and indemnity)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"2 වන පිටුවේ, 13 වන පේළිය සහ 14 වන පේළිය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> '6. 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන්නා වූ දිනයෙන් අවසන් වන කාලය දක්වා යම් ගාස්තුවක් අයකිරීම සඳහා' ".

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 6, as amended, ordered to stand part of the Bill.

7 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

7ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Clause 7 ordered to stand part of the Bill.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවිය සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත

முஸ்லிம் திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலம்

MUSLIM MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.

Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

තීරමානිකප්පට්ටது.

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.

[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.

[MR. DEPUTY SPEAKER *in the Chair.]*

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1 ஆம் வாசகத்திலிருந்து 3 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது

Clauses 1 to 3 ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (වලංගුභාවය සහ හානිපූරණය.)

வாசகம் 4.- (செல்லுபடியாக்குதலும் நட்டோத்தரவாதமும்)

CLAUSE 4.- (*Validation and Indemnity*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"1 වන පිටුවේ, 16 වන පේළිය සහ 17 වන පේළිය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> '4. 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන්නා වූ දිනයෙන් අවසන් වන කාලය දක්වා යම් ගෘස්තුවක් අයකිරීම සඳහා' ".

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 4, as amended, ordered to stand part of the Bill.

5 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

5 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Clause 5 ordered to stand part of the Bill.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත

பிறப்புக்கள், இறப்புக்கள் பதிவு (திருத்தம்) சட்டமூலம்

BIRTHS AND DEATHS REGISTRATION (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.

Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:

" පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේ න්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

தீர்மானிக்கப்பட்டது.

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.

[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]

Considered in Committee.

[MR. DEPUTY SPEAKER *in the Chair.]*

1 සිට 5 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ஆம் வாசகத்திலிருந்து 5ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 1 to 5 ordered to stand part of the Bill.

6 වන වගන්තිය.- (වලංගු භාවය සහ හානිපූරණය.)

වාසකම 6.- (செல்லுபடியாக்குதலும் நட்டோத்தரவாதமும்)

CLAUSE 6.- (Validation and indemnity.)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"2 වන පිටුවේ, 8 වන පේළිය සහ 9 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'9. 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන්නා වූ දිනයෙන් අවසන්වන කාලය දක්වා යම් ගාස්තුවක් අයකිරීම සඳහා හෝ' ".

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
6 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 6, as amended, ordered to stand part of the Bill.

7 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
7ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 7 ordered to stand part of the Bill.

6 වන අලුත් වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.)

புதிய வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தின் 36ஆம் பிரிவைத் திருத்துதல்)

NEW CLAUSE 6.- (*Amendment of section 36 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් අලුත් වගන්තිය ඉදිරිපත් කරනවා:

2 වන පිටුවේ, 7 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න.

"ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (2) වන උපවගන්තියේ 'මරණය සිදුවී මාස දොළහක් ඇතුළතදී' යන වචනවල සිට 'ප්‍රකාශකයා විසින් සැපයිය යුතුය.' යන වචන දක්වා වූ වචන වෙනුවට 'එවැනි සෑම ප්‍රකාශයක් සමඟම රුපියල් පනහක ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් මුදලක් ඉදිරිපත් කළ යුතු අතර, එකී මුදල ප්‍රකාශකයා විසින් ගෙවනු ලැබිය යුතුය.' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ."

ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.
கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.
Brought up, and read the First time

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

"වගන්තිය දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

6 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
வாசகம் சட்டமூலத்தில் சேர்க்கப்பட வேண்டுமென்ற வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
6 ஆம் புதிய வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Question, that the Clause be added to the Bill, put and agreed to.
New Clause 6, ordered to stand part of the Bill.

7 වන අලුත් වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.)

புதிய வாசகம் 7.- (முதன்மைச் சட்டவாக்கத்தின் 52ஆம் பிரிவைத் திருத்துதல்)

NEW CLAUSE 7 .- (*Amendment of section 52 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් අලුත් වගන්තිය ඉදිරිපත් කරනවා.

"ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ 'රුපියලක මුද්දරයක් ඇලවිය යුතුය;' යන වචන වෙනුවට 'රුපියල් පනහක ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් මුදලක් ඉදිරිපත් කළ යුතුය;' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ."

ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.
கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.
Brought up, and read the First time

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

"වගන්තිය දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

7 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

වාසකම් සට්ටමූලත්තිල් සේර්ක්කප්පට වේණ්ඩුමෙන්‍ර විනා විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටදු.

7ආම් පුතිය වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ඩුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, that the Clause be added to the Bill, put and agreed to.

New Clause 7, ordered to stand part of the Bill.

8 වන අලුත් වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.)

புதிய வாசகம் 8.- (முதன்மைச் சட்டவாக்கத்தின் 61ஆம் பிரிவைத் திருத்துதல்)

NEW CLAUSE 8. - (*Amendment of section 61 of the principal enactment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් අලුත් වගන්තිය ඉදිරිපත් කරනවා.

"ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

'(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ 'තවද ඒ සඳහා මෙම ආඥාපනත යටතේ ගෙවිය යුතු මුද්දර ගාස්තුව' යන සියලු වචනවල සිට වෙළඳ නියෝජිතවරයාට එකී මුදල ගෙවිය යුතුය.' යන වචන දක්වා වූ වචන වෙනුවට 'තවද ඒ සඳහා මෙම පනත යටතේ එම ප්‍රකාශය සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට හෝ අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත එවිය යුතුය. නැතහොත් ඔහු විසින් එම ප්‍රකාශය සිදු කරනු ලැබුවේ යම් තානාපතිවරයකු හෝ වෙළඳ නියෝජිතයෙකු ඉදිරිපිටදී නම්, එම තානාපතිවරයාට හෝ වෙළඳ නියෝජිතවරයාට එකී මුදල ගෙවිය යුතුය.' ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ 'නියම වටිනාකම ඇති මුද්දරයක් අලවා සටහන් කරනු ලැබූ කඩදාසියක' යන වචන වෙනුවට 'නියම වටිනාකම ගෙවීම පිළිබඳ ලදුපතක් සමඟ සටහන් කරනු ලැබූ කඩදාසියක' යන වචන ආදේශ කිරීමෙන්."

ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.

කොණ්ඩුවරප්පට්ටු මුතන්මුරෙ මතිප්පිටප්පට්ටදු.

Brought up, and read the First time

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

"වගන්තිය දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විනා විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටදු.

Question put, and agreed to.

වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

8 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

වාසකම් සට්ටමූලත්තිල් සේර්ක්කප්පට වේණ්ඩුමෙන්‍ර විනා විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටදු.

8ආම් පුතිය වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ඩුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, that the Clause be added to the Bill, put and agreed to.

New Clause 8, ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

සට්ටමාකු වාසකමුම් තලෛප්පුම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ඩුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

සට්ටමූලම් තිරුත්තංකළුඩන් අර්ික්කෛ සෙය්යප්පට්ටදු.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

විනා විටුක්කප්පට්ටු, ඒර්ර්ුක්කොළ්ළප්පට්ටදු.

අතන්පඩි, සට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්‍රාම් මුරෙයාක මතිප්පිටප්පට්ටු නිර්රවේර්ර්ප්පට්ටදු.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

හඟුරන්කෙත මාදන්වෙල රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ஹங்குரான்கெத மாதன்வல ரஜமகா விகாரை அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

HANGURANKETHA MADANWELA RAJAMAHA VIHARA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවෙහිදී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

[නිලෛක් කුළුවිල්] තිරුත්තප්පට්ටවාරු, සට්ටමූලත්තෛප් පරිසීලිත්තර්කාන කට්ටළෛ වාසික්කප්පට්ටදු.

Order for consideration of Bill, as amended (in the Standing Committee), read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "හඟුරන්කෙත මාදන්වෙල රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විනා විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටදු.

Question put, and agreed to.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

"පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන් වන වර කියැවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.07ට, 2013 මැයි 07 වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් තියේය.

அதன்படி பி.ப. 5.07 மணிக்கு பாராளுமன்றம், 2013 மே 07, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 5.07 p.m. until 1.00 p.m. on Tuesday, 07th May, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 13 වන කලාපය
தொகுதி 216 - இல. 13
Volume 216 - No. 13

2013 මැයි 07 වන අඟහරුවාදා
2013 மே 07, செவ்வாய்க்கிழமை
Tuesday, 07th May, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ජනාධිපතිතුමාගෙන් ලක් සන්දේශය:
මහජන ආරක්ෂක ප්‍රකාශනය

නිවේදන :
කථානායකතුමාගේ සහතිකය
වරප්‍රසාද : 2013 ජනවාරි 24 වන දින "වීරකේසරී" වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :
ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම

වරප්‍රසාද යෝජනා :
2013 මාර්තු 10 වන දින "සිළුමිණ" වාර්තාව හිරිහැරයට සහ අගෞරවයට ලක් කිරීම

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් :
මෛත්‍රීපාල සිරිසේන ලක්දරු දිරිය පදනම (සංස් ථාගත කිරීමේ) – [ගරු ශාන්ත බණ්ඩාර මහතා] පළමුවන වර කියවන ලදී

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යවරයා කෙරෙහි විශ්වාස භංගත්වය- යෝජනාව නිශ්ප්‍රභ විය.

பிரதான உள்ளடக்கம்

சனாதிபதியிடமிருந்து வந்த செய்தி:
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை
சிறப்புரிமை: 2013 சனவரி 24ஆந் திகதிய "வீரகேசரி" அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா:
பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குதல்

சிறப்புரிமைப் பிரேரணைகள்:
2013 மார்ச் 10ஆந் திகதிய 'சிலுமின' அறிக்கை தொந்தரவு மற்றும் அச்சுறுத்தல்

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
மைத்திரிபால சிறிசேன லக்தரு திரிய மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு சாந்த பண்டார] - முதன்முறை மதிப்பிடப்பட்டது

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர் அவர்கள்மீது நம்பிக்கையின்மை- பிரேரணை தோல்வியுற்றது.

PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ANNOUNCEMENTS:
Speaker's Certificate
Privilege : "Virakesari" Report of 24th January, 2013

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Repeal of Prevention of Terrorism Act

PRIVILEGE MOTIONS:
"Silumina" Report of 10th March, 2013
Harassment and Intimidation

PRIVATE MEMBERS' BILLS:
Maithripala Sirisena Lakdaru Diriya Foundation (Incorporation) Bill - [Hon. Shantha Bandara] - Read the First time

VOTE OF NO CONFIDENCE ON MINISTER OF FOREIGN EMPLOYMENT PROMOTION AND WELFARE -Motion Negatived

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මැයි 07 වන අඟහරුවාදා
2013 மே 07, செவ்வாய்க்கிழமை
Tuesday, 07th May, 2013

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
சனாதிபதியிடமிருந்து வந்த செய்தி
MESSAGE FROM THE PRESIDENT

මහජන ආරක්ෂක ප්‍රකාශනය
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
PUBLIC SECURITY PROCLAMATION

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පහත සඳහන් සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා:

"ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

අංකය : ජී‍ජේඑල්/308

2013 මැයි මස 03 වන දින
කොළඹ දී ය.

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයෙන් මා විසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයින් දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ සක්‍රීය සේවය සඳහා කැඳවන ලදී.

ඉහත කී ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව ත්‍රස්තවාදය සහ යම් මහජන කැළඹීමක් වැළැක්වීම සහ මැඩ පැවැත්වීම පිණිස බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ
ජනාධිපති"

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79වැනි ව්‍යවස්ථාව අනුව, මවිසින් 2013 අප්‍රේල් මස 24වැනි දින පහත සඳහන් පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

එකතු කළ අගය මත බදු (සංශෝධන)

දේශීය ආදායම් (සංශෝධන)

ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන)

බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන)

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

II

වරප්‍රසාද : 2013 ජනවාරි 24වන දින "වීරකේසරී" වාර්තාව
சிறப்புரிமை : 2013 சனவரி 24ஆம் திகதிய "வீரகேசரி" அறிக்கை
PRIVILEGE: "VIRAKESARI" REPORT OF 24TH JANUARY 2013

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (අල්හාජ්) ඒ.එච්.එම්. අස්වර් මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2013 ජනවාරි මස 24වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 1969 අංක 1 දරන ආනයන අපනයන (පාලන) පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව 2013 අප්‍රේල් 3 දිනැති අංක 1804/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, මම 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රමසම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2012 අංක 23 දරන විසර්ජන පනතේ 6(1) වැනි වගන්තිය යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ අයවැය සභාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම - 2013. - [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන්, මම 2010/2011 වර්ෂය සඳහා සී./ස. කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වැවිලි කර්මාන්ත පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2011 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්ය සාධන වාර්තාව.- [වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, මම 2011 වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා (සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ரெஜினோல்ட் குரே - சிறு ஏற்றுமதிப் பயிர்கள் ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Reginold Cooray -Minister of Minor Export Crop Promotion)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) හොරණ, කුඩා උඩුව, උතුරු උඩුව, සේද ගොවිපළෙහි පදිංචි ජී. රත්නසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අළුබෝමුල්ල, අරුග්ගොඩ, ගල්තොටහේන පාර, අංක 42බී දරන ස්ථානයෙහි පදිංචි එස්. ඕවන් සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු කුමාර වෙල්ගම මහතා - පැමිණ නැත.
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා - පැමිණ නැත.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister Economic Development)

ගරු කථානායකතුමනි, මම හලාවත, පුත්තලම් පාර, රදගුරු නිවසෙහි පදිංචි වැලන්ස් මෙන්ඩිස් රදගුරුතුමාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ඕපනායක, උඩවෙල, "සුපිපි" නිවසෙහි පදිංචි කේ.ජී. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගුරුදෙනිය, හාරගම, රාණිවත්ත, වික්ටෝරිය බ්‍රිජ් අංක 79 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.එම්.ජී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අජිත් කුමාර මහතා - පැමිණ නැත.
ගරු වසන්ත අලුවිහාරේ මහතා - පැමිණ නැත.
ගරු වික්ටර් ඇන්ටනි මහතා - පැමිණ නැත.

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)

ගරු කථානායකතුමනි, මම මතුගම, ගාමිණී මාවත, අංක 48/5 දරන ස්ථානයෙහි පදිංචි නලින් දසන්ත විතාන මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වයි.ජී. පද්මසිරි මහතා - පැමිණ නැත.
ගරු ශාන්ත බණ්ඩාර මහතා - පැමිණ නැත.
ගරු රුවන් රණතුංග මහතා - පැමිණ නැත.

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
ගරු කථානායකතුමනි, මම සමන්තුර ජේ. බ්ලොක් බටහිර පදිංචි එම්.එම්. රෆික් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3-2224/'12-(2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නිල්වලා යෝජනා ක්‍රමයට අයත් අමුණු : ප්‍රතිසංස්කරණය
நில்வளா திட்ட அணைக்கட்டுகள் : சீர்திருத்தம்
ANICUTS OF NILWALA SCHEME : RENOVATION

2440/'12

4. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන නිල්වලා යෝජනා ක්‍රමයට අයත් මුළු අමුණු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එම අමුණුවලින් දැනට විනාශයට පත් වී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විනාශයට පත් වී ඇති ඉහත සඳහන් අමුණු ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා ගොවීන් ගැටලු රැසකට මුහුණ පා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒවා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) එසේ නම්, වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தில் நில்வளா திட்டத்திற்குரிய அணைக்கட்டுகளின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவை அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்;

(iii) இந்த அணைக்கட்டுக்களில் தற்போது அழிவடைந்துள்ள எண்ணிக்கை யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அழிவுற்றுள்ள குறிப்பிட்ட அணைக்கட்டுக்குள் சீர்திருத்தப்படாமை காரணமாக கமக்காரர்கள் பல பிரச்சினைகளை எதிர்கொண்டுள்ளனர் என்பதை அவர் அறிவாரா என்பதையும் ;

(ii) அவ்வாறாயின் அவற்றை சீர்திருத்த நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(iii) இதற்கான நிதி ஏற்பாடுகள் ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறாயின், ஒதுக்கப்பட்டுள்ள மொத்தப் பணத்தொகை யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Will he inform this House -
  (i) the total number of anicuts that belong to the Nilwala Scheme that is operative in Matara District;
  (ii) the locations where they are situated; and
  (iii) the number of dilapidated anicuts out of the aforesaid anicuts, at present?

(b) Will he state -
  (i) whether he is aware of the fact that the farmers have faced a number of difficulties, as the aforesaid dilapidated anicuts have not been renovated;
  (ii) if so, whether action will be taken to renovate them;
  (iii) whether financial provisions have been made in that regard; and
  (iv) if so, the total sum of money allocated?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

(අ) (i) 157කි.

(ii) කිරල කැලේ ව්‍යාපාරය, කඩවැද්දුව ව්‍යාපාරය, කද්දුව ව්‍යාපාරය සහ අකුරැස්ස ව්‍යාපාරය යන ව්‍යාපාර බල ප්‍රදේශ තුළ පිහිටා ඇත.

(iii) එම අමුණුවලින් එකක්වත් විනාශයට පත් වී නොමැත. එහෙත් එයින් අමුණු 36ක යම් යම් අලුත්වැඩියාවන් (විශේෂයෙන් ගේට්ටු දිරාපත් වීම) කළ යුතුව ඇත.

(ආ) (i) පසෙභි ආම්ලිකතාව අධික වීම, මුහුදු මට්ටමට ආසන්න මට්ටම්වල ඇති කුඹුරුවල ජලය බැස යෑමේ ගැටලු වැනි බරපතළ ස්වාභාවික ගැටලු රැසක් නිල්වලා ව්‍යාපාරයේ සමහර ස්ථානවල (විශේෂයෙන් කිරල කැලේ ව්‍යාපාරය තුළ) ඇත.

එසේ වුවද, අමුණු විනාශයට පත් වීමක් සිදු වී නොමැති නිසා එමඟින් බරපතළ ගැටලු පැන නැඟී නොමැත.

(ii) අලුත්වැඩියා කළ යුතු අමුණු අලුත්වැඩියා කිරීමට දැනටමත් සැලසුම් සකස් කර ඇත.

(iii) ප්‍රතිපාදන වෙන් කර ඇත.

(iv) කිරලකැලේ ව්‍යාපාරයේ අමුණු 8ක අලුත්වැඩියාවන් සඳහා රුපියල් මිලියන 2.6යි.

කඩවැද්දුව ව්‍යාපාරයේ අමුණු 25ක අලුත්වැඩියාවන් සඳහා රුපියල් මිලියන 3යි.

අකුරැස්ස ව්‍යාපාරයේ අමුණු 1ක අලුත්වැඩියාවන් සඳහා රුපියල් ලක්ෂ 4යි.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා සඳහන් කරන්නට යෙදුණා, අමුණු 36ක අලුත්වැඩියා කටයුතු කළ යුතුව තිබෙනවා කියලා. එතකොට එම අමුණු 36 අලුත්වැඩියා කටයුතු සඳහා කොපමණ කාලයක් ගන්නවාද? මේ වර්ෂය තුළදීම එම කටයුතු අවසන් කරන්නද බලාපොරොත්තු වෙන්නේ? මෙම මුදල් වෙන් කිරීම කර තිබෙන්නේ 2013 අවුරුද්දට පමණක්ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මේ අවුරුද්ද සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණයන් තමයි මෙහි සඳහන් කර තිබෙන්නේ. වාරිමාර්ග ක්ෂේත්‍රයේ සියලු දේවල් එකවරම කරන්න අපට පුළුවන්කමක් නැහැ. ප්‍රමුඛතාවන් තෝරා ගෙන ප්‍රමුඛතා පදනමක් මත අපි එම කටයුතු ඉෂ්ට කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේ (ආ) (ii) සඳහා ලබා දුන් පිළිතුර මට නැවතත් කියන්න පුළුවන්ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

අලුත්වැඩියා කළ යුතු අමුණු අලුත්වැඩියා කිරීමට දැනටමත් සැලසුම් කර ඇත.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒක නොවෙයි. (අ) (ii) ප්‍රශ්නයට අනුව ඔබතුමා කිව්ව ස්ථාන ගැනයි මම ඇහුවේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
(අ) (ii) ප්‍රශ්නයද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

කිරලකැලේ ව්‍යාපාරය, කඩවැද්දුව ව්‍යාපාරය, කද්දුව ව්‍යාපාරය සහ අකුරැස්ස ව්‍යාපාරය යන ව්‍යාපාර බල ප්‍රදේශය තුළ පිහිටා ඇත.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම අහන්නේ මේකයි. ඔබතුමා නිවැරදිව සඳහන් කරනවා, කිරලකැලේ, කද්දුව සහ කඩවැද්දුව, ඒ වාගේම අකුරැස්ස යන ව්‍යාපාර හතර තුළ අමුණු 157 පිහිටා තිබෙනවා කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

හැබැයි අලුත්වැඩියා කිරීමට අදාළ අමුණු 36 ගැන සඳහන් කරද්දී කද්දුව ව්‍යාපාරයේ අලුත්වැඩියා කළ යුතු අමුණු ගැන ඔබතුමා සඳහන් කරන්නේ නැහැ. නමුත් මේක අකුරැස්ස මැතිවරණ කොට්ඨාසයේ -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මේක අහන්න කෝ. ඔබතුමා වෙන් වෙන් වශයෙන් ඉල්ලලා නැහැ නේ. ඒ නිසා තමයි මගේ නිලධාරීන් ඒ සියලු ව්‍යාපාරවල අලුත්වැඩියා කළ යුතු අමුණු 36ක් තිබෙනවාය කියලා සඳහන් කර තිබෙන්නේ. ඔබතුමා වෙන් වෙන් වශයෙන් ඉල්ලා සිටියා නම් ඒක වෙන් වෙන් වශයෙන් ලබා දෙන්න පුළුවන්. වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට එන්න. එතකොට මම වෙන් වෙන් වශයෙන් ඒ තොරතුරු ලබා දෙන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා කිරලකැලේ ව්‍යාපාරයේ අමුණු 8ක් ප්‍රතිසංස්කරණය කරන්න රුපියල් මිලියන 2.6ක් වෙන් කර තිබෙනවාය කියලා. කඩවැද්දුව අමුණු 25ක් වෙනුවෙන් රුපියල් මිලියන 3ක් වෙන් කර තිබෙනවාය කියලා කියනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
අකුරැස්ස ව්‍යාපාරයේ අමුණු 4ක් වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවාය කියලා කියනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
හරි නේද? ගරු ඇමතිතුමනි, මෙතැනම ගත්තොත් අමුණු 37ක අලුත්වැඩියාවක් කරන්න තිබෙනවා නේද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
36යි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
නැහැ නේ. 8යි, 25යි, 4යි.

කථානායකතුමා
(සභානායකයා අවර්කළ්)
(Mr. Speaker)
හරි, හරි. 36යි. හොඳයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
කිරලකැලේ 8යි. කද්දුව 25යි.

කථානායකතුමා
(සභානායකයා අවර්කළ්)
(Mr. Speaker)
ඇති, ඇති.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ඒ වාගේම අකුරැස්සේ 4යි. 25යි, 4යි, 29යි. 29යි, 8යි, 37යි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
36යි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
එතකොට පිළිතුරේ ගැටලුවක් තිබෙනවා, ගරු ඇමතිතුමනි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ඔබතුමා ගණනක වෙනසක් ගැන කියන්න එපා. ගරු කථානායකතුමනි, අලුත්වැඩියා කිරීමේ දී ඉතාම සුළු අලුත්වැඩියාවන් තිබෙනවා. ප්‍රමුඛ මට්ටමේ 36 සම්බන්ධයෙන් තමයි අපි මේ කියලා තිබෙන්නේ.

කථානායකතුමා
(සභානායකයා අවර්කළ්)
(Mr. Speaker)
හොඳයි.

පාසල්වලට සම්බන්ධ ජාතික උත්සව : විස්තර
பாடசாலைகளுக்குரிய தேசிய விழாக்கள் : விபரம்
NATIONAL CEREMONIES IN RELATION TO SCHOOLS : DETAILS

2524/'12

5. ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) 2011 වර්ෂය තුළදී පළමු වසරට පාසල් සිසුන් ඇතුළත් කරගැනීම, පෙළ පොත් බෙදා දීම, නිල ඇඳුම් බෙදා දීම, 5 වසර ශිෂ්‍යත්වය සමත් වූ දරුවන්ට සහතික බෙදා දීම හා සපිරි පාසල් ව්‍යාපෘතිය ආරම්භ කිරීම යන කටයුතුවලට අදාළ එක් එක් ජාතික උත්සවය,

(i) පැවැත් වූ දිනය කවරේද;

(ii) පැවැත් වූ ස්ථානය කවරේද;

(iii) පැවැත්වීමට වැය කළ මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් සියලු ජාතික උත්සව පැවැත්වීමට වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එම මුදල් සපයාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි අමைச්சரைக் கேட்ட வினா:

(அ) 2011ஆம் ஆண்டில் முதலாம் ஆண்டுக்கு பாடசாலைப் பிள்ளைகளைச் சேர்த்துக் கொள்ளல், பாடப் புத்தகங்களைப் பகிர்ந்தளித்தல், சீருடைகளைப் பகிர்ந்தளித்தல், 5ஆம் ஆண்டு புலமைப் பரிசில் பரீட்சையில் சித்தியடைந்த மாணவர்களுக்குச் சான்றிதழ்களை வழங்குதல் மற்றும் நிறைவான பாடசாலைகள் கருத்திட்டத்தை ஆரம்பித்தல் ஆகிய விடயங்களுடன் தொடர்பான ஒவ்வொரு தேசிய விழாவும்,

[ගරු අනුර දිසානායක මහතා]

(i) නඩත්තුකරන ලද තිකති යාතෙන්පතෙයුම්;

(ii) නඩත්තුකරන ලද ඉඩම් යාතෙන්පතෙයුම්;

(iii) නඩත්ත සෙලවිටුප්පට්ට පණත්තොකෙ එව්වළ වෙන්පතෙයුම්

වෙව්වේරාක අවර් කුරිප්පිටුවාරා?

(ஆ) (i) මේලේ (අ) ඉල් කුරිප්පිටප්පට්ට සකල තේසිය විලාක්කළෙයුම් නඩත්ත සෙලවිටුප්පට්ට මොත්තප් පණත්තොකෙ එව්වළවු එන්පතෙයුම්;

(ii) අන්තප් පණම් එව්වාරු පෙරුප්පට්ටතු එන්පතෙයුම්

අවර් ඉච්සපෙයිල් අරිවිප්පාරා?

(இ) ඉන්රේල්, ඒන්?

asked the Minster of Education:

(a) Will he state separately -

(i) the date on which each of the national ceremonies organized in relation to admitting students to grade one, distributing text books, distributing uniforms, awarding certificates to students who have got through Grade 5 Scholarship Examination and commencement of Sapiri Schools Project were held during the year 2011;

(ii) the venue of each of those ceremonies; and

(iii) the amount of money spent on each of them?

(b) Will he inform this House -

(i) the total amount of money spent for holding all the national ceremonies mentioned in (a) above; and

(ii) the manner in which the aforesaid amount of money was obtained?

(c) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු කථානායකතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

(අ) (i), (ii), (iii) ඇමුණුම 01හි දක්වා ඇත.

(ආ) (i) රුපියල් 831,155යි. (රුපියල් අටලක්ෂ තිස්එක්දහස් එකසිය පණස්පහයි.)

(ii) ඇමුණුම 02හි දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
** Annexes tabled:*

ජාතික උත්සවය	පැවැත්වූ දිනය	පැවැත්වූ ස්ථානය	පැවැත්වීමට වැයකළ මුදල	
01. 2011 වර්ෂය තුලදී පළමු වසරට ළමුන් ඇතුලත් කරගැනීමේ ජාතික උත්සවය.	2011.01.18	බදුල්ල පත්තිපිටිය ධර්මපාල විද්‍යාලය	රු. 30,000/-යි. (රු. තිස් දහසයි.) යහළු විකාසන යන්ත්‍ර සඳහා රු.12000 විදුලි උත්පාදන යන්ත්‍ර සඳහා රු.3000 බැනර් 03ක් සඳහා 7500 ආරාධනා පත්‍ර 150 ක් සඳහා 7500	රු.30,000/-
පෙළපොත් බෙදාදීම	2011.12.06	මහනුවර උසස් බාලිකා විද්‍යාලයේදී	වාහන සඳහා ඉන්ධන රු. 58,556 සංගීත වියදම් රු.39,019 වේදිකා අලංකාරය සඳහා වෙනත් අනෙක් වියදම් රු.22,825	රු.120,400/-
03. නිල ඇඳුම් බෙදාදීම.	2011 වර්ෂය තුළදී පාසල් නිල ඇඳුම් බෙදාදීමේ උත්සවයක් පැවැත්වූයේ නැත.	අදාළ නොවේ.	ජාතික උත්සවයක් නොපැවැති බැවින් මුදල් වැය නොවුනි.	
04. 5 වසර ශිෂ්‍යත්වය සමත් වූ දරුවන්ට සහතික බෙදාදීම.	2011.12.09	නෝමාගම ගේන්ද රාජපක්ෂ විද්‍යාලය	ලංකාදීප -රු.132,787/- (රු. එක් ලක්ෂ තිස් දෙදහස් හත්සිය අසු හතයි.) Daily News - 127,008/- (රු. එක් ලක්ෂ විසි හත් දහස් අටයි)	
			රිවිරෙ - රු.120,960/- (රු. එක් ලක්ෂ විසිදහස් නවසිය හැටයි)	
05.සපිරිපාසල් ව්‍යාපෘතිය ආරම්භ කිරීම	2011.01.21	කල්පිටිය මාම්පුරිය විද්‍යාලය	ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පාසල් විවෘත කිරීමේ උත්සවයේදී අත්තින් තින්න ආලේප කරණය තාප්පෙවරු සැකසීම සහ වෙනත් උත්සව අවශ්‍යතා වෙනුවෙන් වැය කරන ලදී.	රු.300,000/-

පැවැත්වූ ජාතික උත්සවය	වැයකළ මුදල	200 මුදල් සපයාගත් ආකාරය
01. පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කර ගැනීම.	රු.30,000 /- (රු. තිස්දහසයි.)	126-2-3-1405-2-11 වැය ශීර්ෂයෙන්
02. පෙළපොත් බෙදාදීම.	රු 120,400 /- (රු.එක් ලක්ෂ විසි දහස් හාරසියයි.)	126-2-6-2-1501 වැය ශීර්ෂයෙන් හා සුබ පතන්නන්ගෙන්)
03. 2011 වර්ෂයේ නිල ඇඳුම් බෙදාදීම	ජාතික උත්සවයක් නොපැවැති බැවින් වියදමක් දරා නොමැත.	-
04. 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන්ට සහතික පත්‍ර බෙදාදීම	රු. 380,755 /- (රු. තුන් ලක්ෂ අසු දහස් හත්සිය පනස් පහයි.)	212-2-1-0-1405-(10) වැය ශීර්ෂයෙන්
05. සපිරි පාසල් ව්‍යාපෘතිය ආරම්භ කිරීම.	රු.300,000/- (රු. ලක්ෂ තුනයි.)	අදාළ ඉදිකිරීම් සඳහා ආයෝජනයන් දරා ඇති අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනුම කේන්ද්‍ර කරගත් ව්‍යාපෘතිය මගින්
	වැය කළ මුළු මුදල රු.831,155/- (අට ලක්ෂ තිස් එක්දහස් එකසිය පනස් පහයි)	

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රශ්නයේ (ආ) (i) කොටසට පිළිතුර නැවත කියන්න ගරු ඇමතිතුමනි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේ සියලුම ජාතික උත්සව වෙනුවෙන් කළ වියදම්වල සම්පූර්ණ එකතුව රුපියල් අටලක්ෂ තිස්එක්දහස් එකසිය පනස්පහයි. එම මුදල් සපයා ගත් ආකාරයත් විස්තරාත්මකව ඇමුණුමේ දක්වා තිබෙනවා. ඒ ගැන විස්තර කියන්න ඕනෑද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අවශ්‍ය නැහැ ගරු ඇමතිතුමනි. ඔබතුමාට බොහොම ස්තූතියි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම බොහොම පිරිමැසුම්දායකව ප්‍රවේශමෙන් තමයි මේ මහජන මුදල් පරිහරණය කළේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ බව හොඳින් පෙනෙනවා. වරාය විවෘත කරනකොටත් ඔහොමම කළා නම්?

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. අපොස (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල ලැබිලා මේ දිනවල උසස් පෙළ පන්තිවලට ළමයින් ඇතුළත් කර ගැනීම සිදු කරනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මේ ප්‍රශ්නයට අදාළ වන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමතිතුමා කිව්වා නේ, පාසල්වලට සල්ලි ගන්න එපාය කියා වක්‍රලේඛ කිහිපයක් නිකුත් කළාය කියා. හැබැයි දැන් සිදු වෙමින් තිබෙන්නේ මොකක්ද? එක් පාසලකින් තව පාසලකට උසස් පෙළ හදාරන්න ඇවිත් නොවෙයි, සාමාන්‍ය පෙළ විභාගය කළ පාසලම උසස් පෙළ හැදෑරීම සඳහා තෝරා ගත් දරුවන්ගෙන් පවා විශාල මුදල් ප්‍රමාණයක් - ආසන්න වශයෙන් ගත්තොත් රුපියල් 5700කට ආසන්න ප්‍රමාණයක්- එකතු කිරීම සිදු වෙනවා. මේක නතර කරන්නේ කවදා ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
සම්පූර්ණයෙන්ම වැරදි ක්‍රියාවලියක්. එම පාසලේම දරුවන් උසස් පෙළ පන්තිවලට ඇතුළත් වීමේදී එවැනි මුදලක් අය කිරීම සම්පූර්ණයෙන්ම තහනම්. එවැනි දෙයක් කරන ස්ථානයක් ගැන කවුරු හෝ පැමිණිල්ලක් කළොත් අප ඒ පිළිබඳව ක්ෂණිකව අවශ්‍ය නීතිමය ක්‍රියා මාර්ග ගන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ තොරතුරු මේ විධියට ප්‍රසිද්ධියේ කියන එක සුදුසු නැහැ. එම නිසා ඒ පාසල හා ඒ පිළිබඳව කරුණු මා ඔබතුමාට වෙනම දෙන්නම්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මට දෙන්න. මා ඒ පිළිබඳව-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා ඉතාමත් හොඳින් දන්නවා. ඉතාමත් වගකීමෙන් කියන්නේ. සමහර දෙමවුපියෝ මේ වියදම දරා ගන්න බැරිව තමන් අඩු ආදායම්ලාභීන්ය කියා ග්‍රාම නිලධාරි මහතාගෙන් සහතිකයක් අර ගෙන, ප්‍රාදේශීය ලේකම්තුමා මඟින් ඒක සහතික කරගෙන එම පාසල්වලට භාර දී තිබෙනවා. ඒ හරහා තමයි තමන්ගේ දරුවන් ඒ මුදල් අය කිරීමෙන් නිදහස් කර ගෙන තිබෙන්නේ. ගරු කථානායකතුමනි, පාසලක දරුවකුට අඩු ආදායම්ලාභී පවුලක දරුවෙක්ය කියා ග්‍රාම නිලධාරි මහතාගෙන් සහතිකයක් අර ගෙන, ප්‍රදේශීය ලේකම්තුමාගෙන් අනුමත කර ගෙන පාසලට ලබා දීමට සිදු වෙනවා නම්, ඒ දරුවාගේ මානසිකත්වය කුමක් ද? ඒක කිසිසේත්ම සාධාරණ නැහැ ගරු ඇමතිතුමනි. පාසලේ මේ, සමාන මට්ටමේ ඉන්න දරුවෝ. ඒ දරුවන්ගේ ඒ සමාන අයිතිය, සමාන ගෞරවය රැකෙන්න ඕනෑ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නීතියට පටහැනිව, නීති විරෝධී ක්‍රියා රට ඇතුළේ සිද්ධ වෙනවා. ඒ සඳහා පැමිණිල්ලක් ලැබුණොත් අපට ඒ නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ වාගේම අපි කියලා තිබෙනවා, කිසිම දරුවකුට මුදල් ගෙවීම අනිවාර්ය කරන්න බැහැ කියලා. ඒකත් වක්‍රලේඛනයක තිබෙනවා. කවුරු හෝ දිළිඳු දරුවෙක් ඇවිත් කිව්වොත්, "මට කිසිදු සේවා ගාස්තුවක් ගෙවන්න බැහැ" කියලා ඒ අවස්ථාවේදී ඒ දරුවා නිදහස් කරලා වෙනම ලේඛනයක් පවත්වා ගෙන යන්න කියලාත් විධිවිධානයක් තිබෙනවා. ඒ නිසා දරුවන් ඒ පාසලේම උසස් පෙළට ඇතුළත් කිරීමේදී ඒ දරුවන්ට කිසියම් මුදලක් ගෙවන්න කියනවා නම් එසේ කිසිම මුදලක් ගෙවීම අනිවාර්ය නැහැ. ඒ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයට පැමිණිලි කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බොහොම හොඳයි. ගරු ඇමතිතුමා, මේ දරුවන්ගෙන් මුදල් අය කර ගැනීම පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ විටින් විට ප්‍රකාශ කරලා තිබෙනවා; ගැසට් පිළිබඳව කියා තිබෙනවා; එකඟතාවන් තිබෙනවා. නමුත් ප්‍රායෝගිකව තවමත් මෙය සිදු වෙමින් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලනවා, මේ ප්‍රධාන පාසල් කීපයේ -ජාතික පාසල් කියලා තිබෙන ටිකේ- පරීක්ෂණයක් පවත්වන්න කියලා. අඩුම තරමේ මේ ප්‍රධාන නගරයේ - කොළඹ - තිබෙන පාසල් ටිකේ පරීක්ෂණයක් පවත්වන්න. මේ සිදුවීම වෙනවා. ඒ පළමුවන කාරණය.

දෙවැනි කාරණය මේකයි ගරු ඇමතිතුමනි. ඔබතුමා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්න, එලෙස මුදල් ලබා දෙන්න බැරි දෙමවුපියන් ඉන්නවා නම් "මුදල් ලබා දිය නොහැක" කියලා දෙමවුපියන්ගේ අත්සන් සහිතව ලිපියක් ලබා දුන්නොත් ප්‍රමාණවත් කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
දැනට තිබෙන ගැසට් -

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
අඩුම තරමින් එහෙම කියන්නකෝ. එතකොට ඒ දෙමවුපියන්ට පුළුවන්, ග්‍රාම නිලධාරි ළඟට ගිහින් සහතික අරගෙන, ප්‍රාදේශීය ලේකම් ළඟට ගිහින් සහතික කර ගෙන ඉදිරිපත් කරන්නේ නැතිව, "අපට ආදායමක් නැහැ. අපට ගෙවන්න විධියක් නැහැ. කරුණාකරලා අපි මේ ගෙවීමෙන් නිදහස් කරන්න" කියලා ලියුමක් ඉදිරිපත් කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ඒක පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා ඒක කියන්න. එතකොට ඒක මාධ්‍ය වාර්තා කරයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
"පාසලේ පහසුකම් ගාස්තු මට ගෙවිය නොහැක." කියලා සාධාරණවත්, යුක්ති සහගතවත් අම්මා තාත්තා කියනවා නම් අර ගැසට් නිවේදනය වෙනස් කරන්න කියලා මම කියනවා.

හැබැයි, පරීක්ෂණයකින් එය සත්‍ය යැයි කියා ඔප්පු වන්න ඕනෑ. මොකද, නැත්නම් පහසුකම් ගාස්තුවවත් නැතුව පාසල කඩා වැටෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
නැහැ, ඔබතුමා කියන්න කෝ "පහසුකම් ගාස්තුව හැර" කියලා. "පහසුකම් ගාස්තුව හැර" කියලා කියනවාද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
හොඳයි.

පැලියගොඩ මාළු වෙළඳ පොළේ කප්පම් ගැනීම් : පැමිණිලි
பேலியகொடை மீன் விற்பனை நிலையத்தில் கப்பம் பெறுதல் : முறைப்பாடுகள்
EXTORTION AT PELIYAGODA FISH MARKET : COMPLAINTS

2549/'12

6. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) පැලියගොඩ මාළු වෙළඳ පොළ තුළ කප්පම් ගැනීමේ සිදුවීම් පිළිබඳව ශ්‍රී ලංකා පොලිසිය වෙත පැමිණිලි ලැබී තිබේද;

(ii) එම පැමිණිලි පිළිබඳව කරන ලද පරීක්ෂණ අනුව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම පැමිණිලිවලට අදාළව අත් අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ අත් අඩංගුවට ගත් අයගේ නාමලේඛනයක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பேலியகொடை மீன் விற்பனை நிலையத்தில் கப்பம் பெறும் சம்பவங்கள் தொடர்பாக இலங்கைப் பொலீஸுக்கு முறைப்பாடுகள் கிடைக்கப் பெற்றுள்ளனவா என்பதையும்;

(ii) இம்முறைப்பாடுகள் தொடர்பில் மேற்கொள்ளப் பட்ட விசாரணைகளின் படி இதுவரை எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) இம்முறைப்பாடுகளின் பேரில் கைதுசெய்யப் பட்டவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) அவ்வாறு கைதுசெய்யப்பட்டவர்களின் பெயர்ப் பட்டியலை இச்சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) whether complaints have been received by the Sri Lanka Police regarding incidents of extortion in the fish market at Peliyagoda;

(ii) the steps that have been taken so far upon the investigations conducted on these complaints;

(iii) the number of persons taken into custody upon these complaints; and

(iii) whether a list of names of the persons so apprehended will be submitted to this House?

(b) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත වෙත පැලියගොඩ මාළු වෙළෙඳ පොළ තුළ කප්පම් ලබා ගන්නා බවට ලද තොරතුරක් අනුව දෙන ලද උපදෙස් පරිදි කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශන පවත්වමින් නිවටන් ස්ටැන්ලි ප්‍රනාන්දු, කනගසභාපති සදිස් කුමාර් සහ වඩු තන්ත්‍රිගේ සුමිත් සුදන්ත පෙරේරා යන අයවලුන්ගේ ප්‍රකාශ සටහන් කර ඇත.

(ii) මෙම සිද්ධියට අදාළව වැඩිදුර විමර්ශන සිදු කර සැකකරුවන් 07 දෙනෙකු 2011.04.05වන දින අත් අඩංගුවට ගෙන කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් උසාවි අංක බී 7380/05/11 යටතේ අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2011.04.06 දින හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකට යොමු කිරීම සඳහා රක්ෂිත බන්ධනාගාරගත කර ඇත.

ඒ අනුව පැවැත්වූ හඳුනා ගැනීමේ පෙරට්ටුවේදී සාක්ෂිකරුවන් විසින් සැකකරුවන් හඳුනා ගැනීම හේතුවෙන් 2011.04.29 දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කර, පසුව ඇප මත මුදා හැර ඇති අතර මෙම විමර්ශනයට අදාළ සියලුම විමර්ශන උඩෘත සටහන් ඇතුළත් ගොනුවක් නීතිපති උපදෙස් සඳහා නීතිපති යොමු අංක WP/1/99/2011 යටතේ 2011.05.25වන දින යොමු කර ඇත. මෙතෙක් නීතිපති උපදෙස් ලැබී නොමැති අතර මෙම නඩුව නැවත කැඳවීම 2013.05.20 දිනට -එනම් එන සතියේ- නියමිතව ඇති බවද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත විසින් වාර්තා කර ඇත.

(iii) 7දෙනකු පමණි.

(iv) 1. අමිල නිශාන්ත කුමාරසිංහ
2. කලුවා දේවගේ රෝෂාන් දිලිප් ජයරත්න
3. බෝලන්ද දේවගේ ගයාන් ප්‍රියංකර
4. හර්ෂ ප්‍රියංකර රූපසිංහ
5. අලවල ආරච්චිගේ සරත් නන්දසිරි
6. ඩබ්ලිව්.පී.එම්.එම්. අනිල් ද සිල්වා
7. රොහාන් තුසිත සමරවික්‍රම

(ආ) පැන නොනහියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, කැලණිය, පැලියගොඩ මෙවැනි කප්පම් ක්‍රියාවලියට අදාළව මෙම ප්‍රශ්නය මතු කරපු වෙලාවේ තිබුණු දේශපාලන වටපිටාව දැන් වෙනස් වෙලා තිබෙන නිසා මේ කාරණාවට අදාළව නිශ්චිතව අතුරු ප්‍රශ්නයක් අහන්න නැහැ. නමුත් ඊයේ වන විට මාධ්‍ය වාර්තා කළා, භාණ්ඩාගාරය සතු රත්‍රන් කිලෝග්‍රෑම් 100ක් විකුණන්න යම් ගනුදෙනුවක් සිද්ධ වෙලා, ඒ සඳහා කප්පම් ගත් පිරිසක් අත් අඩංගුවට පත් වෙලා ඉන්නවා කියලා. ඒ රත්‍රන් එල්ටීටීඊ සංවිධානයෙන් ලබා ගත් ඒවා හැටියට තමයි ඒ ගනුදෙනුකරුවන් සඳහන් කරලා තිබුණේ. මේ කාරණය බරපතළ කාරණාවක් නිසා ඔබතුමා මේ ගැන පැහැදිලි කිරීමක් කළොත් හොඳයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මේ අහන කාරණාව මේ ප්‍රශ්නයට කිසිම සම්බන්ධයක් නැහැ. ප්‍රශ්නය අසා තිබෙන්නේ මාළු වෙළෙඳ පොළ තුළ කප්පම් ගැනීම පිළිබඳවයි. ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලැබුණා, අවශ්‍ය ප්‍රචාරය ලබා ගන්න. නමුත් නිවැරදි විධියට ප්‍රශ්නයක් අහනවා නම් අප එයට පිළිතුර දෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා එය වෙනම ප්‍රශ්නයක් විධියට යොමු කරන්න.

කෘෂිකාර්මික ජල මූලාශ්‍ර වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම : මධ්‍යම කඳුකරය

பயிர்ச்செய்கைக்குரிய நீர்மூலங்களை வேறு தேவைகளுக்குப் பயன்படுத்தல்: மத்திய மலைநாடு

USE OF SOURCES OF WATER MEANT FOR AGRICULTURE FOR OTHER PURPOSES : CENTRAL HILLS

2986/'12

8. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති සඳහා ජල මූලාශ්‍ර යොදා ගැනීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා පමණක් යොදා ගැනීමට නියමිත ජල මූලාශ්‍ර වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම යන හේතූන් නිසාවෙන් මධ්‍යම කඳුකරයේ ගොවිබිම් අක්කර 30,000ක පමණ ප්‍රමාණයක් ජලය නොමැතිවීම නිසා පුරන්වීමේ අවදානමකට ලක්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මධ්‍යම කඳුකරය තුළ ස්වභාවික ජල මූලාශ්‍ර උපයෝගී කොටගෙන අස්වද්දනු ලබන වගා බිම් ප්‍රමාණය කොපමණද;

(ii) මධ්‍යම කඳුකරය තුළ ඇති ප්‍රයෝජනයට ගත හැකි ජල මූලාශ්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) අදාළ ජල මූලාශ්‍ර නිරවුල් කොට එම වගා බිම් අස්වැද්දීම සඳහා ඉඩ ලබාදී, ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා වෙනත් උපක්‍රමයක් භාවිතා කිරීමට කටයුතු සලසා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) சமூக நீர் வழங்கல் கருத்திட்டங்களுக்காக நீர் மூலங்களை உபயோகித்தல் மற்றும் விவசாய நடவடிக்கைகளுக்கு மாத்திரம் உபயோகிப்பதற்குள்ள நீர் மூலங்களை வேறு விடயங்களுக்காக உபயோகித்தல் ஆகிய காரணங்களால் மத்திய மலைநாட்டில் அண்ணளவாக 30,000 ஏக்கர் விவசாய நிலங்கள் நீர் இன்றி கைவிடப்படும் ஆபத்துக்கு உள்ளாகியுள்ளதென்பதை அவர் அறிவாரா?

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

(ஆ) (i) மத்திய மலைநாட்டில் இயற்கை நீர் மூலங்களை உபயோகித்து பயிர்ச்செய்கை செய்யப்படும் விவசாய நிலங்களின் பரப்பளவு எவ்வளவென்பதையும்;

(ii) மத்திய மலைநாட்டில் உள்ள உபயோகிக்கக்கூடிய நீர் மூலங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) மேற்கூறப்பட்ட நீர் மூலங்களை விடுவித்து, மேற்படி விவசாய நிலங்களில் பயிர்ச்செய்கை செய்வதற்கான வாய்ப்பை ஏற்படுத்திக்கொடுத்து, சமூக நீர் கருத்திட்டங்களுக்கு வேறு மூலோபாயத்தை பயன்படுத்த நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Is he aware that around 30,000 acres of farm lands in the central hills are faced with the risk of lying fallow without water due to the use of sources of water for community water supply projects and the use of the sources of water which should be used for agricultural purposes for various other activities?

(b) Will he state -

(i) the extent of farm land in the central hills, which is brought under cultivation by using natural sources of water;

(ii) the number of usable sources of water in the central hills; and

(iii) whether steps will be taken to use the relevant sources of water for the purpose of cultivating the farm lands mentioned above and use some other means for obtaining water for community water projects?

(c) If not, why ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම මගේ අමාත්‍යාංශයට අදාළ නැහැ. ඒ වුණත් මගේ අමාත්‍යාංශය පැත්තෙන් ලබා දිය හැකි තොරතුරු පමණක් මා ලබා දෙනවා.

(අ) ප්‍රජා ජල සම්පාදන කටයුතු සෘජුවම මෙම අමාත්‍යාංශයට අයත් නොවේ. ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය සහ එහි භාරය අයත් වන්නේ ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයටයි. එසේ වුවද, මෙමඟින් දක්වා ඇති ගොවිබිම් අක්කර 30,000ක ප්‍රමාණය කුමන ආයතනයකට අයත් දැයි නිශ්චිතව පැහැදිලි කර නොමැත. නමුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ගොවිබිම් ප්‍රමාණයන් හා පසු ගිය වසර 05 තුළ වගා තීව්‍රතාව පිළිබඳ විස්තර ඇමුණුමෙහි සඳහන් වගුවේ ඇතුළත් කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

සභාමේසය මත තබන ලද ඇමුණුම:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

MANCE - 2010 / 11 Maha
ENT(Acs)<1000(Acs)

No	District	Scheme	Gross Extent (Ac)	CI 2007/08	CI 2008/09	CI 2009/10	CI 2010/11	CI 2011/12	Last 5 Years Average
1	Kandy	Bandara Amuna	241	0.00	0.00	1.33	1.33	0.91	0.71
2		Bodhiela	363	2.00	1.00	1.70	1.48	2.00	1.64
3		Gampolawela Rajaela	405	1.73	1.80	2.00	2.00	2.00	1.91
4		Kitulpeela	338	1.75	1.95	2.00	2.00	1.50	1.84
5		Lamasooriya Ela	300	2.00	2.00	2.00	2.00	2.00	2.00
6		Ma Ela	1,616	2.00	2.00	2.00	2.00	2.00	2.00
7		Murapola	1,200	1.94	1.55	1.94	1.94	1.63	1.84
8		Udugoda Bandara Ela	405	2.00	1.99	1.22	2.00	1.35	1.71
9		Kehelpath Amuna	248	0.00	0.00	1.13	1.29	0.85	0.65
			5,116						
10	Matale	Bowatenna	310	1.00	2.00	0.91	2.00	2.00	1.58
11		Hattota Amuna	732	1.29	1.30	1.30	1.44	2.00	1.47
12		Meewelpitiya	200	0.00	0.00	1.00	1.55	1.80	0.87
13		Kandepitawala	600						
14		Makulethenna	494						
			2,336						
15	Nuwaraeli	Bolagandalawela	254	1.59	0.91	1.45	1.09	0.40	1.09
16		Keenawela	290	1.74	1.98	1.85	1.83	1.87	1.85
17		Mulhal Ela	426	1.53	2.00	1.88	1.92	1.70	1.81
18		Paragaha Arawa	225	1.89	1.87	2.00	1.91	1.91	1.92
19		Waduwawala	486	1.12	1.63	1.43	1.45	0.91	1.31
20		Bomburella							
21		Katumana							
			1,681						
22	Minipe	Himbiliyakada	383	1.70	0.00	2.00	0.94	1.00	1.13
23		Minipe L. B..	18,500	2.00	1.62	2.00	2.00	1.63	1.91
24		Radagalpotha	212	2.00	1.00	2.00	2.00	1.90	1.78
25		Ratne Ela	220	2.00	1.00	2.00	2.00	2.00	1.80
			19,315						
26	Dambulla	Bellan Oya	220	0.00	0.00	1.00	2.00	1.00	0.80
27		Dewahuwa	2,341	1.50	2.00	2.00	2.00	2.00	1.87
28		Dewahuwa Feeder Canal							
29		Mahanukatuwa Wewa	200						
30		Nalanda & Ebbawala							
31		Pahala Erawula	427	2.00	1.00	2.00	2.00	1.00	1.60
32		Wemedilla	1,976	[redacted]	2.00	2.00	2.00	1.52	2.00
33		Wewala wewa	240	2.00	1.50	1.50	2.00	1.54	1.71
34		Dambul Ooya	600						
			6,004						
35	Bandarawe	Kande Ela	2,400	1.94	2.00	1.94	1.94	1.31	1.95
36		Ambewela	1,000	1.67	2.00	1.65	1.65	1.65	1.74
37		Uma Ela	2,000	2.00	2.00	2.00	2.00	1.25	2.00
38		Mahatotilla	700	1.71	2.00	2.00	2.00	2.00	1.94
39		Dambawinna	322	1.70	1.00	2.00	2.00	1.70	1.68
40		Taldena	350	1.93	1.00	2.00	0.00	2.00	1.39
			6,772						

ගරු මන්ත්‍රීතුමනි, මධ්‍යම කඳුකරයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ව්‍යාපෘති ගණනාවක් -විශාල ගණනක්- තිබෙනවා. ඒවායේ ප්‍රමාණයත්, ඒවායේ වගා තීව්‍රතාවත් එම ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘතින්වලට ජලය ලබා ගන්නා ආකාරය පිළිබඳවත් මේ වගුවේ සඳහන් වෙනවා.

(ආ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මධ්‍යම කඳුකරයේ ඇති වාරිමාර්ග ව්‍යාපාර විස්තර ඇමුණුමෙහි දක්වා ඇත.

(ii) ප්‍රධාන ගංගාවලට සම්බන්ධ අතු ගංගා, ද්විතීක ගංගා, තෘතීක ගංගා යනාදී ලෙස විශාල ජල මූලාශ්‍ර සංඛ්‍යාවක් පවතින බැවින් දීර්ඝ විමර්ශනයක් සිදු කිරීමෙන් තොරව පිළිතුරු ලබා දීම අපහසුය.

ඒ කියන්නේ, සමස්ත ප්‍රජා ජල සම්පාදනය සඳහා ගත හැකි හෝ ගන්නා ප්‍රමාණය පිළිබඳ සංගණනාත්මක තොරතුරු අප ළඟ නැහැ. අතු ගංගා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඔබතුමාගේ ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් දෙන්න ඒ පිළිබඳව විමර්ශනයක් කරන්න ඕනෑ.

මධ්‍යම කඳුකරයේ ඇති ජල මූලාශ්‍ර උපයෝගි කරගෙන ජලය සපයන වාරි ව්‍යාපාර ආයතන කිහිපයක් යටතේ ක්‍රියාත්මක වන බැවින් (මධ්‍යම රජය යටතේ ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යනාදී ලෙස) මෙම ආයතන සියල්ලම නියෝජනය වන පරිදි රැස්වීමක් කැඳවා මේ සම්බන්ධව තීරණයක් ගත යුතුය.

(ඇ) අදාළ නොවේ.

මධ්‍යම කඳුකරයට අයත් ජල මූලාශ්‍ර විවිධ ආයතන ගණනාවකට අයත් වෙනවා. ඒවා විවිධ ආයතන ගණනාවක් මඟින් පාලනය වෙනවා.

ගරු කථානායකතුමනි, අනික් කාරණය මෙයයි. අප ප්‍රතිපත්තියක් වශයෙන් පානීය ජලය ලබා දීම අංක එකේ ප්‍රමුඛතාව හැටියට තමයි සලකන්නේ. ඊළඟට ප්‍රජා ජල සම්පාදනය සඳහා අවශ්‍ය ජල ප්‍රමාණය සැලකිල්ලට ගත්තොත්, වාරි ජල ප්‍රමාණය හා සංසන්දනාත්මකව බලන විට - comparatively - එය ඉතා සුළු ප්‍රමාණයක්. නමුත් අප හැම වෙලාවේම ප්‍රතිපත්තියක් වශයෙන් පළමුව ජනතාවට පානීය ජලය ලබා දීමේ අවශ්‍යතාවට ඉඩ දෙනවා. අපේ විශාල වාරි ව්‍යාපෘතිවලිනුත් අප පළමුවෙන්ම බීමට ජලය දීලා තමයි වගාව සඳහා ජලය ලබා දෙන්නේ. ඒක තමයි ප්‍රතිපත්තිය.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அகில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නයෙන් ඇහුවේ පානීය ජලය පිළිබඳව නොවෙයි. ගරු ඇමතිතුමනි, කෘෂිකාර්මික කටයුතු සම්බන්ධ ජලය පිළිබඳව තමයි මම ප්‍රධාන වශයෙන් අහලා තිබෙන්නේ. දැන් ඔබතුමා කිව්වා මේ වන තෙක් මේ සම්බන්ධයෙන් කිසිම සමීක්ෂණයක් කරලා නැහැ කියලා.

ගරු අමාත්‍යතුමනි, මා දන්නා විධියට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් යම් සමීක්ෂණයක් කර තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යවරයාම රැස්වීමකදී කියලා තිබෙනවා, "මධ්‍යම කඳුකරයේ ගොවි බිම් අක්කර 30,000ක් පුරන් වීමේ අනතුරක" කියලා. එයින් ඒ බව තහවුරු වෙලා තිබෙනවා. මම හිතන විධියට මේක බරපතළ තත්ත්වයක්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala de Silva)

එහෙම නම්, ඔබතුමා ඇත්ත වශයෙන්ම මේ කාරණය කෘෂිකර්ම අමාත්‍යතුමාට යොමු කරලා-

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அகில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

සමාවන්න. පළාත් කෘෂිකර්ම අමාත්‍යතුමා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala de Silva)

ඒක තමයි මම කිව්වේ. මේක ඒ පළාතේ පළාත් සභාවෙන් අහන්න ඕනෑ කාරණයක්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அகில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මට පළාත් සභාවට යන්න බැහැ නේ. ඒකයි මම ගරු අමාත්‍යතුමාගෙන් ඇහුවේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala de Silva)

ඔබතුමන්ලාගේ නියෝජිතයෝ පළාත් සභාවේ ඉන්නවා නේ. ගරු මන්ත්‍රීතුමනි, අහවල් පළාත් සභාවේ හෝ අහවල් අමාත්‍යවරයා මේ පිළිබඳ ප්‍රකාශක් කර තිබෙනවා කියලා ඔබතුමා නිවැරදිව ප්‍රශ්නය ඇහුවා නම්, මට මේ ප්‍රශ්නය ඒ පළාත් සභාවට යොමු කර, එතුමාට ඒ ප්‍රකාශය කරන්න පාදක වුණු කරුණු මොනවාද කියලා සොයා ගෙන උත්තර දෙන්න තිබුණා. ඔබතුමා බොහොම generalized question එකක් ඇහුවේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அகில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු අමාත්‍යතුමනි, ඒක කරන්න බැහැ නේ. පළාත් සභාවේ ඇමතිවරු විවිධ කථා කියන්න පුළුවන් කියලා හිතන්න පුළුවන් නේ. මධ්‍යම ආණ්ඩුවේ අදාළ රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා තමයි මේ සම්බන්ධයෙන් ප්‍රධාන වග කිව යුත්තා විධියට අපි දකින්නේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala de Silva)

කිසිසේත්ම නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அகில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ඒ නිසා ඔබතුමාට සත්‍ය තොරතුරු ලබා දෙන්න පුළුවන් නේ. ඒකයි මම මේ ප්‍රශ්නය ඔබතුමාගෙන් ඇහුවේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala de Silva)

ඔබතුමා ඔය කියන කාරණය ප්‍රශ්නයෙන් මතු කරලා තිබුණා නම්, අමාත්‍යාංශය වශයෙන් අපට පුළුවන්කම තිබුණා අදාළ පළාත් අමාත්‍යවරයාට දන්වලා, එතුමාගෙන් තොරතුරු ලබා ගෙන පිළිතුර සකස් කරන්න. නමුත් ඔබතුමා ඒ පිළිබඳව සඳහන් කරන්නේ නැතිව සාමාන්‍ය ප්‍රශ්නයක් නේ අහලා තිබෙන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அகில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙනවා, මධ්‍යම කඳුකර-

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala de Silva)

ඔබතුමා අපේ උපදේශක කාරක සභා රැස්වීමට එන්න. ඔය කාරණය කියලා තිබෙන්නේ කවුද කියලා ඔබතුමා කිව්වොත්,

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

එතුමාත් ගෙන්වලා අපි මේ ප්‍රශ්නය සාකච්ඡා කරමු. එහෙම නැතිව මේ විධියට විවාද කිරීමෙන් ඔබතුමාට යමක් ලබා ගන්න පුළුවන් වන්නේ නැහැ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිදු වූ මූල්‍ය වංචාව : ක්‍රියා මාර්ග

தேசிய நீர் வழங்கல், வடிகாலமைப்புச் சபையில் இடம்பெற்ற பணமோசடி: நடவடிக்கை

FRAUD AT NATIONAL WATER SUPPLY AND DRAINAGE BOARD : ACTION TAKEN

2936/'12

9. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) වර්ෂ 1996-2006 දක්වා කාලය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිදු වූ රු. 245,783,998.72ක වංචාවක් හෙළිදරව් නොකිරීම සම්බන්ධව රජයේ විගණනය භාර අධීක්ෂණ නිලධාරීන්ගේ වගකීම් පිළිබඳව පරීක්ෂා කිරීමට විගණකාධිපතිගේ අංක: S-1/12/14(xiii) හා 2008 ජනවාරි මස නියෝගයෙන් සිදු කළ පරීක්ෂණයේ වාර්තාව විගණකාධිපති වෙත ලබා දුන් දිනය;

(ii) එම වාර්තාවේ නිර්දේශ;

(iii) එම කාල සීමාවේදී ඉහත ආයතනයේ විගණනය භාරව සිටි පරීක්ෂණ නිලධාරීන් හා වෘත්තීය අධීක්ෂණ නිලධාරීන්ගේ නම් සහ වර්තමානයේ ඔවුන් දරන තනතුරු;

(iv) ඉහත නිර්දේශ අනුව වගවීමට හා වරදට යටත් නිලධාරීන්ට එරෙහිව ගත් විනය හා නීති ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 1996ஆம் ஆண்டு தொடக்கம் 2006ஆம் ஆண்டு வரையான காலத்தில் தேசிய நீர் வழங்கல், வடிகாலமைப்புச் சபையில் இடம்பெற்ற ரூபா 245,783,998.72 மோசடியை வெளிப்படுத்தாமை தொடர்பில் அரசாங்க கணகாய்வுக்குப் பொறுப்பான மேற்பார்வை உத்தியோகத்தர்களின் பொறுப்புக்கூறல் பற்றி விசாரணை நடத்துவதற்கு கணக்காய்வாளர் தலைமை அதிபதியின் S-1/12/14(xiiiஆம் இலக்க 2008 சனவரி மாத கட்டளையின்படி மேற்கொள்ளப்பட்ட விசாரணை அறிக்கை கணக்காய்வாளர் தலைமை அதிபதிக்கு வழங்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) மேற்படி அறிக்கையின் பரிந்துரைகள் யாதென்பதையும்;

(iii) மேற்படி காலகட்டத்தில் மேற்படி நிறுவனத்தில் கணக்காய்வுக்குப் பொறுப்பாகவிருந்த உத்தியோகத்தர்கள் மற்றும் தொழில்சார் மேற்பார்வை உத்தியோகத்தர்களின் பெயர்கள் மற்றும் தற்போது இவர்கள் வகிக்கும் பதவிகள் யாவை என்பதையும்;

(iv) மேற்படி பரிந்துரைகளுக்கமைய பொறுப்புக்கூற வேண்டிய மற்றும் குற்றமிழைத்த உத்தியோகத்தர்களுக்கு எதிராக மேற்கொள்ளப்பட்ட ஒழுக்காற்று மற்றும் சட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) the date on which the report of the inquiry held under the order No.S-1/12/14(xiii) of January 2008 to inquire into the accountabilities of the Government Superintendents of Audit in charge of the audit in relation to the non-exposure of the fraud to the value of Rs. 245,783,998.72 which occurred in the National Water Supply and Drainage Board during 1996-2006 ;

(ii) the recommendations of the above-mentioned report ;

(iii) the names of the Audit Examiners who were in charge of the audit of the said institution during the aforesaid period and their current positions ; and

(iv) the disciplinary and legal action taken against the officers who were found guilty of and accountable for, according to the recommendations mentioned above?

(b) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) විගණන පරීක්ෂක II ඩී.එල්.ඩී.වී. ජයවර්ධන මහතාට එරෙහිව කර තිබූ මූලික විමර්ශන වාර්තාවේ අනාවරණය කර ගෙන තිබූ කරුණු, විනය පියවර ගැනීමට ප්‍රමාණවත් නොවන්නේද යන්න තව දුරටත් පරීක්ෂා කිරීම සඳහා යොමුගත අංක එස්/1/12/14(xiii) හා 2008 ජනවාරි 30 දිනැති ලිපිය මඟින් කමිටුවක් පත් කර තිබුණ නමුත්, වර්ෂ 1996 - 2006 දක්වා කාලය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිදු වූ

රුපියල් 245,783,998.72ක වංචාවක් හෙළිදරව් නොකිරීම සම්බන්ධව රජයේ විගණනය භාර අධීක්ෂණ නිලධාරින්ගේ වගකීම පිළිබඳව පරීක්ෂා කිරීමට අදාළ කටයුතු එම කමිටුව වෙත පවරා නොතිබුණ අතර, එවැනි වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ලබා දී නොතිබුණි.

(ii) ඉහත කරුණු අනුව විස්තර කිරීමේ අවශ්‍යතාවක් පැන නොනඟී.

(iii) අවශ්‍යතාවක් පැන නොනඟී.

(iv) අවශ්‍යතාවක් පැන නොනඟී.

(ආ) අවශ්‍යතාවක් පැන නොනඟී.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විගණනය හරියාකාරව කළේ නැහැය කියන කාරණය සම්බන්ධව පියවර ගත්තේ නැහැය කියලා නේ කියන්නේ. ඒ වරද කළ තැනැත්තන්ට එරෙහිව දීපු දඩුවම් ගැන ඔබතුමාට වාර්තා වෙලා තිබෙනවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හැටියට, ඒ වරද කරපු අය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරලා ඔවුන් රැකියාවලින් ඉවත් කරලා තිබෙනවා. නමුත් විගණන කටයුතු භාර නිලධාරින් ගැන කටයුතු කිරීමේ බලයක් ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයට හෝ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට නැහැ. ඒ විගණන නිලධාරින් ගැන කටයුතු කිරීම සුදුසුද, නැද්ද කියන එක ගැනයි පිළිතුර දුන්නේ. ඒක විගණකාධිපතිතුමාට අයත් කාර්යයක්. ඔබතුමාට සහ පාර්ලිමේන්තුවට උදව් වීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සම්බන්ධව ඉදිරිපත් කරන ලද කෝප් වාර්තා දෙකක ඒ බව සඳහන් වෙලා තිබෙනවා. ත්‍රිකුණාමලය මූල්‍ය වංචාව ආදී වශයෙන්. අම්පාරේ මූල්‍ය වංචාව හුහක් පැරණි එකක්. නමුත් බරපතළම මූල්‍ය වංචාවක්. ඒවා අධිකරණයට ඉදිරිපත් කිරීමේ කටයුතු අපේ මණ්ඩලය විසින් කරලා තිබෙනවා. විගණන නිලධාරින් ගැන කටයුතු කිරීම සම්පූර්ණයෙන්ම විගණකාධිපති දෙපාර්තමේන්තුවට අයත් දෙයක්. ගරු කථානායකතුමනි, මා මේ කියන කාරණය ගැන ගරු මන්ත්‍රීතුමාත් මා සමඟ එකඟ වෙනවා ඇති. මම විගණන නිලධාරියෙක් නොවෙයි. නමුත්, විගණන කටයුතු කිරීමේදී සියලු සංඛ්‍යා ලේඛන, ගිණුම් එකින් එක හැමදේම විගණන පරීක්ෂණයට ලක් වෙනවාද කියන කාරණය මත හිඩැස් ඇති විය හැකියි. මේ පිළිබඳව තමයි කෝප් වාර්තාවෙනුත් අවධානය යොමු කරලා තිබෙන්නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මම ඇත්ත වශයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. වර්තමානයේ විෂයභාර ඇමතිවරයා හැටියට ඔබතුමා බොහොම උනන්දුවෙන් කටයුතු කරන ඇමතිවරයෙක්. අපි ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විගණන කටයුතුවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්නය පොදුවේ රජයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රශ්නයක්. ඒ අභ්‍යන්තර විගණනයන් කාර්යක්ෂමව සිදුවීම පිළිබඳව වඩා හොඳ ක්‍රියාමාර්ග ගැනීමට ඔබතුමාගේ සහ රජයේ අවධානය යොමු වේවිය කියලා කල්පනා කරනවා. බොහොම ස්තුතියි.

සංවර්ධන සහකාර ලෙස බඳවා ගන්නා ලද උපාධිධාරීන්: විස්තර
அபிவிருத்தி உதவியாளர்களாக ஆட்சேர்க்கப்பட்ட பட்டதாரிகள் : விபரம்
GRADUATES RECRUITED AS DEVELOPMENT ASSISTANTS : DETAILS

2994/'12

10. ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) රාජ්‍ය සේවයේ මේ වනවිට පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු සංඛ්‍යාව තනතුරු නාම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෑතකදී සංවර්ධන සහකාර ලෙස බඳවාගත් දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින සමස්ත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ බඳවාගත් උපාධිධාරීන් සංඛ්‍යාව පළාත් අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க சேவையில் தற்போது காணப்படுகின்ற மொத்த வெற்றிடங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி வெற்றிடங்களின் எண்ணிக்கை பதவிப் பெயர்களுக்கு அமைய தனித்தனியே எவ்வளவு என்பதையும்;

(iii) அண்மையில் அபிவிருத்தி உதவியாளர்களாக ஆட்சேர்க்கப்பட்டு தற்போது பிரதேச செயலகங்களுக்கு இணைக்கப்பட்டுள்ள மொத்தப் பட்டதாரிகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iv) அவ்வாறு ஆட்சேர்க்கப்பட்ட பட்டதாரிகளின் எண்ணிக்கை மாகாண ரீதியாக தனித்தனியே எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Will he state -

(i) the total number of vacancies that exist in Public Service at present;

(ii) the number of vacancies in relation to designations, separately;

[ගරු රෝසි සේනානායක මහත්මිය]

(iii) the total number of graduates recruited as Development Assistants recently and attached to the Divisional Secretariats at present; and

(iv) the number of graduates recruited in that manner, in relation to the provinces, separately?

(b) If not, why ?

ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රාජ්‍ය සේවයේ පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත වාර්තා වී නොමැත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතනවල පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව - 10098ක් වේ.

(ii)

ශ්‍රී ලංකා පරිපාලන සේවය	407
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	4224
රජයේ පුස්තකාලයාධිපති සේවය	26
රජයේ භාෂා පරිවර්තක සේවය	136
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය	775
ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	248
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	565
ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	100
ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය	17
ග්‍රාම නිලධාරී සේවය	3600

(iii) උපාධිධාරී අභ්‍යාසලාභීන් 2,172කි.

2012 ඔක්තෝබර් මස වන විට උපාධිධාරී අභ්‍යාසලාභීන් 51,420ක් බඳවා ගෙන තිබූ නමුත් මෙලෙස බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් ගුරු සේවය ඇතුළු උපාධි සුදුසුකම් මත බඳවා ගන්නා වෙනත් සේවාවන්හි තනතුරු සඳහා මෙම අභ්‍යාසලාභීන් අතරින් කොටසක් ඉවත්ව ගොස් ඇත. ඒ අනුව දැනට උපාධිධාරී අභ්‍යාසලාභීන් 50,821ක් පමණ මෙම වැඩසටහන යටතේ පුහුණුව ලබයි. මේ අතුරින් උපාධිධාරී අභ්‍යාසලාභීන් 2,754ක් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පුහුණුව ලබන අතර එම සංඛ්‍යාවෙන් උපාධිධාරීන් 2,172ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු හා ස්වදේශ කටයුතු අංශයට අදාළ කටයුතු ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇත.

(iv)

අනු අංකය	පළාත	බඳවාගෙන ඇති මුළු උපාධිධාරීන් සංඛ්‍යාව
1	සබරගමුව	5947
2	බස්නාහිර	7267
3	මධ්‍යම	5756
4	දකුණ	10940
5	උතුරුමැද	2947
6	වයඹ	7748
7	ඌව	2205
8	උතුර	3167
9	නැගෙනහිර	4844
	මුළු එකතුව	**50821**

(ආ) අදාළ නොවේ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, සංවර්ධන සහකාර වශයෙන් බඳවාගෙන ඇති මේ උපාධිධාරීන් එක් එක් ආයතනවලට අනුයුක්ත කර තිබෙනවා කියා. රුපියල් 15,000ක දීමනාවක් කියන්නේ අද විදුලි බිලවත් ගෙවා ගන්න බැරි මුදලක්. මේ දීමනාවෙන් තොරව නිත්‍ය වැටුපක් යටතේ කොපමණ ප්‍රමාණයක් ස්ථිරව රාජ්‍ය සේවයට අනුයුක්ත කර තිබෙනවාද?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු කථානායකතුමනි, පුහුණුව ලබන කාලය තුළ තමයි දීමනාවක් හැටියට ගෙව්වේ. මේ වන විට අවුරුද්දක් සපුරා ඇති, ලියවිලි සියල්ල සම්පූර්ණ කළ උපාධිධාරීන් සංවර්ධන සේවා ව්‍යවස්ථාව යටතේ ස්ථිර කර, ඒ අයට ඒ නියමිත වැටුප ලබන්න අවශ්‍ය කටයුතු සූදානම් කර තිබෙනවා. රාජ්‍ය සේවයේ ලැබිය යුතු සියලුම පහසුකම් ලබා දෙන්න අවශ්‍ය කටයුතු මේ වන විට ක්‍රියාත්මක කර තිබෙනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය මේ වන විට කී දෙනෙක් ස්ථිර රාජ්‍ය සේවයට අනුයුක්ත කර තිබෙනවාද කියන එකයි. කටයුතු කර තිබෙනවාය කියනවා. නමුත් ස්ථිර වශයෙන්ම අනුයුක්ත කරන්න සැලැස්මක් තිබෙනවාද? කොපමණ ප්‍රමාණයක්ද?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු කථානායකතුමනි, මේ වන විට අවුරුද්ද සම්පූර්ණ කළ අය අනුයුක්ත කර තිබෙනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

සංඛ්‍යාව?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සංඛ්‍යාව සොයා ගන්න අමාරුයි.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු කථානායකතුමනි, 2012.03.30 දිනට වයස අවුරුදු 35-40ත් අතර වන උපාධිධාරි අභ්‍යාසලාභීන් 3778 දෙනකුට මේ වන විට ස්ථිර පත්වීම් ලබා දී තිබෙනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
උපාධිධාරීන් 50,000ත් 3778කටයි, ස්ථිර පත්වීම් ලබා දී තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ පුහුණුවීම් කාල සීමාව-

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
අවුරුද්දයි.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ඒ කාල සීමාව ඉක්මවලාද?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමිය, අවුරුද්දයි. අමාත්‍යාංශවල තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව අනුව අනුයුක්ත කළ අය තමයි ස්ථිර කරන්නේ. ගරු කථානායකතුමනි, ඒ එක්කම ලිපිලේඛනවල යම් යම් අඩු පාඩු තිබෙනවා නම් -

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
කාල සීමාව ඉක්මවා ගිය ප්‍රමාණය කොපමණද? මේ අවුරුද්දක කාල සීමාව ඉක්මවා ගිය අය කී දෙනෙක් ඉන්නවාද?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
සීමාව ඉක්මවා ගිය සියල්ලම ස්ථිර කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමියනි. මොකද, වරින් වර තමයි මේ උපාධිධාරීන් බඳවා ගත්තේ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මේ වන විට රටේ මතවාදයක් තිබෙනවා, මේ උපාධිධාරීන් විවිධ කැම්ප්වලට අර ගෙන ගිහිල්ලා පුහුණුවීම් වැඩ සටහන් කරන බවට. දින හතක, දහහතරක වැඩ සටහන් කරනවා කියලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතවාදය දෙනවා මිසක් මේ අය අනුයුක්ත කරන්න වැඩ සටහනක් තිබෙනවාද? මම අහන්නේ එහෙම අනුයුක්ත කළ අයටත් නියමිත රාජකාරි ලැයිස්තුවක් - duty list එකක්- තිබෙනවාද කියන එකයි. ගරු කථානායකතුමනි, මේක මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ඒ ඒ අමාත්‍යාංශවල තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව ලබා ගත්තාට පස්සේ අවුරුද්දක පුහුණු කාලය සම්පූර්ණ කළ අයට, ඒ පත්වීම් ලබා දී තිබෙනවා. ලිපිලේඛනවල අඩු පාඩු තිබෙන අභ්‍යාසලාභී උපාධිධාරීන්ගේ පත්වීම් විතරක් දැනට නවත්වා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒවා සම්පූර්ණ වෙනවාත් එක්කම අපි එය ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමියනි, මාස දෙකෙන් දෙකට තමයි ඒ අය බඳවා ගත්තේ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ වෙන කොට 46,000ක් පමණ ස්ථිර කළ යුතු තත්ත්වයක ඉන්නවා කියා ඔබතුමා පිළිගන්නවාද? ඒ කියන්නේ රුපියල් 15,000ක දීමනාවක් අරගෙන මේ වෙන කොට 46,000ක් ස්ථිර වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා කියන එකද ඔබතුමා කියන්නේ?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු කථානායකතුමනි, ඒ අයට අපි මුලදීම ප්‍රකාශ කළා, අවුරුද්දක කාලයක් සැපිරුවාට පසුව තමයි ස්ථිර කරන්නේ කියන එක.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
අවුරුද්දක කාල සීමාව ඉක්මවා ගිය අය ගැනයි මම අහන්නේ.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
කාල සීමාව ඉක්ම ගිහින් නැහැනේ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
අවුරුද්ද ඉක්මවා ගිය අය ඉන්නවානේ.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
මාස 12 සපුරා ඇති සහ ලිපි ලේඛනවල අඩු පාඩු නොමැති අය තමයි ස්ථිර කරන්නේ. ගරු කථානායකතුමනි, ඒ එක්කම වයස අවුරුදු 45ට වැඩි කණ්ඩායම සම්බන්ධයෙන් පොඩි ගැටලුවක්

[ගරු විජය දහනායක මහතා]

තිබෙනවා. දැනට ගැටලුවක් විධියට තිබෙන්නේ එපමණයි. බඳවා ගෙන අවුරුද්දක කාල සීමාව සපුරා අවසන් අවුරුදු 45 දක්වා සියලු දෙනාම ස්ථිර කරන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා ගරු කථානායකතුමනි.

ගරු රෝසි සේනානායක මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) රෝසී සේනානායක්ක)
(The Hon. (Mrs.) Rosy Senanayake)
හැබැයි, තවම ස්ථිර කරලා නැහැ.

ගරු විජය දහනායක මහතා
(මාණ්පුමිකු විජය තහනායක්ක)
(The Hon. Wijaya Dahanayake)
ගරු කථානායකතුමනි, මේ කටයුත්ත වෙනත් ආණ්ඩුවලට හිතන්නවත් බැරි දෙයක්. මේ අභියෝගය රජය ඉටු කළා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) රෝසී සේනානායක්ක)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ස්ථිර කරන්න කටයුතු කරනවා කිව්වාට ස්ථිර කරලා නැහැ.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
එතුමිය අහන්නේ, "ලිපි ලේඛන සම්පූර්ණ නොකරපු 46,000ක් ඉන්නවාද?" කියායි.

ගරු රෝසි සේනානායක මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) රෝසී සේනානායක්ක)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, "ඒ අය ස්ථිර කරන්නේ කවදාද?" කියන එකයි මම අහන්නේ.

ගරු විජය දහනායක මහතා
(මාණ්පුමිකු විජය තහනායක්ක)
(The Hon. Wijaya Dahanayake)
ගරු කථානායකතුමනි, අවුරුද්ද සපුරනවාත් එක්කම ස්ථිර කරනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) රෝසී සේනානායක්ක)
(The Hon. (Mrs.) Rosy Senanayake)
හැමදාම මේ උත්තරය තමයි දෙන්නේ.

ගරු විජය දහනායක මහතා
(මාණ්පුමිකු විජය තහනායක්ක)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමියනි, අවුරුද්ද සම්පූර්ණ කරන අවස්ථාවේම ස්ථිර කිරීම ක්‍රියාත්මක කරනවා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
තුන්වැනි වතාවටත් අහනවා ගරු කථානායකතුමනි.

මුද්දරවල ප්‍රමාණය : විස්තර
முத்திரைகளின் அளவு: விபரம்
DIMENSIONS OF STAMPS : DETAILS

3004/'12

11. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) තැපැල් කාර්යයන් සඳහා වඩාත් ජනප්‍රිය කුමන වටිනාකමක මුද්දරද යන්න එම ජනප්‍රියත්වයේ අනුපිළිවෙළින් කවරේද;

(ii) රු. 5/=ක වටිනාකමින් යුත් මුද්දරයක සාමාන්‍ය ප්‍රමාණය සෙ.මී. 2 x සෙ.මී. 2.5ක් වෙද;

(iii) නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ (Institute of Chartered Shipbrokers) 25 වැනි සංවත්සරය සැමරීම වෙනුවෙන් මුද්‍රිත රු. 5/=ක වටිනාකමින් යුත් මුද්දරයේ දිග සහ පළල කොපමණද;

(iv) පේරාදෙණිය සංගීලි පාලම සහ මහකන්දරාවේ ඉපැරණි ගල් පාලම මුද්‍රිත රු. 10/=ක වටිනාකමින් යුත් මුද්දර දෙකේ දිග සහ පළල කොපමණද;

(v) ඉහත (iii) සහ (iv) හි සඳහන් කළ එක් එක් මුද්දරයේ, කඩදාසි, මුද්‍රණ, ප්‍රවාහන, ගබඩාකරණ සහ බෙදාහැරීම් යනාදී වියදම් ද ඇතුළත් සමස්ත පිරිවැය කොපමණද;

(vi) සෙ.මී. 2 x සෙ.මී. 2.5ක සාමාන්‍ය ප්‍රමාණයේ රු. 5/= මුද්දරයක වියදම සමඟ ඉහත (iii) සහ (iv) හි සඳහන් එකිනෙක මුද්දරයක වියදම සන්සන්දනාත්මකව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

තපාල් සේවෛකළ් අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) පිරපල්යත් තන්මෛයින් ඔළුඞ්කිල් එන්ත වරුමාන පෙරුමතියෛක් කොන්ට මුත්තිරෛකළ් තපාල් නෝක්කඞ්කඞ්කළුක්කාක මිකවුම් පිරපල්යමානවෛකළ් එන්පතෛයුම්;

(ii) රූපා 5 පෙරුමතියාන මුත්තිරෛ වළක්කමාක 2සෙ.මී. X 2.5 සෙ.මී. අළවෛක් කොණ්ටතා එන්පතෛයුම්;

(iii) කප්පල් තරකර් නිරුවනත්තින් 25 වරුට පූර්ත්තියෛ කොණ්ටාට අච්චිටප්පට්ට රූපා 5 පෙරුමතියාන මුත්තිරෛයින් අළවුකළෛයුම්;

(iv) පේරාතනෛයිලුළ්ළ තොඞ්කුපාලම් මට්රුම් මහකන්තරාවෛයිල් අමෛන්තුළ්ළ පුරාතන කට්පාලම් ආකියවෛ අච්චිටප්පට්ටුළ්ළ රූපා 10.00 පෙරුමතියාන ඉරණ්ටු මුත්තිරෛකළින් අළවුකළෛයුම්;

(v) මේලේ (iii) මට්රුම් (iv) ඉල් කුරිප්පිටප්පටුම් ඔව්වොරු මුත්තිරෛක්කුමාන කාකිතම්, අච්චිටල්, පෝක්කුවරත්තු, කළඤ්චියප්පටුත්තල්, පකිර්න්තළිත්තල් මට්රුම් ඉතර චෙලවුකළ් උළ්ළිට්ට මොත්තච් චෙලවෛයුම්; මට්රුම්

(vi) මේලේ (iii) මට්රුම් (iv)ඉල් කුරිප්පිටප්පට්ටුළ්ළ ඔව්වොරු මුත්තිරෛයිනෛතුම් චෙලවුකළුඩන් වළක්කමාන 2සෙ.මී. X 2.5 සෙ.මී. අළවිලාන

ரூபா 5.00 பெறுமதியான முத்திரையின் செலவின் ஒப்பீட்டையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Postal Services:

(a) Will he inform this House -

(i) the stamps of which revenue denomination are the most popular for postal purposes, in order of popularity;

(ii) whether the stamp of Rs. 5/= is usually of the size 2 cm x 2.5 cm;

(iii) the dimensions of the Rs. 5/= stamp printed to commemorate 25 years of the Institute of Chartered Shipbrokers;

(iv) the dimensions of the two stamps of Rs 10/ = on which the suspension bridge at Peradeniya and the ancient stone bridge at Mahakandarawa have been printed;

(v) the total cost per stamp of each of the stamps referred to in (iii) and (iv) above, inclusive of paper, printing, transport, storage and distribution etc.; and

(vi) the comparison of the costs of each of the stamps referred to in (iii) and (iv) above with a Rs. 5/= stamp of the usual size 2 cm x 2.5 cm?

(b) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා එම ප්‍රශ්නය තුන්වැනි වතාවටත් අසන නිසා කැපැල් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රුපියල් 5යි, රුපියල් 12යි, රුපියල් 15යි, රුපියල් 25යි.

(ii) ඔව්. රුපියල් 5ක වටිනාකමින් යුත් නිත්‍ය කාණ්ඩයේ මුද්දරයක දිග සහ පළල සෙ.මී. 2.0 x සෙ.මී. 2.5 කි.

(iii) සෙ.මී. 8.2 x සෙ.මී. 3.0කි.

(iv) සෙ.මී. 6 x සෙ.මී. 3.0කි.

(v)

මුද්දරය	කඩදාසි සහ මුද්‍රණ වියදම	ප්‍රවාහන, ගබඩා සහ බෙදා හැරීමේ වියදම	එකතුව
නැව් තැරැව්කරුවන්ගේ සංගමය (Institute of Shipbrokers)	ශත 48	ශත 03	ශත 51
පාලම්	ශත 36	ශත 02	ශත 38

ගරු මන්ත්‍රීතුමනි, පේරාදෙණිය සංගීලි පාලම සහ මහකන්දරාවේ ඉපැරණි ගල් පාලම මුද්‍රිත මුද්දර දෙක ගැනයි (iv) යටතේ ඔබතුමා අහලා තිබෙන්නේ. ඒ පාලම්වල දිග පළල ඇහුවා නම් ඊට වඩා වැදගත්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒවායේ දිග පළල දන්නවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ආචාර්යතුමනි, ඔබතුමා පොඩ්ඩක් ඉන්නකෝ.

(vi)

මුද්දරය	කඩදාසි සහ මුද්‍රණ වියදම	ප්‍රවාහන, ගබඩා සහ බෙදාහැරීම් වියදම	එකතුව
රු.5/-ක් වටිනා මුද්දරය	ශත 19	ශත 01	ශත 20
ඉහත අංක (iii)හි සඳහන් මුද්දරය	ශත 48	ශත 03	ශත 51
ඉහත අංක (iv)හි සඳහන් මුද්දරය	ශත 36	ශත 02	ශත 38

(ආ) අදාළ නැත.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ඇමතිතුමා, ඔබතුමාට බොහොම ස්තුතියි සම්පූර්ණ පිළිතුරක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. මා ඒ ප්‍රශ්නය අහන්න හේතුව මෙකයි. 2010 අවුරුද්දේ රුපියල් කෝටි 300ක් කැපැල් දෙපාර්තමේන්තුවට පාඩුයි. 2011 පාඩුව රුපියල් කෝටි 460යි. 2012 පාඩුව රුපියල් කෝටි 500යි. රුපියල් කෝටි 1,360ක් පාඩු ලබන ආයතනයක් තමයි එය. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් අහන්නේ, මේ ආයතනය පාඩු නොලබන තත්ත්වයකට ගෙන එන්න ඔබතුමන්ලා කවදා වෙන කොට ක්‍රියා කරනවාද කියන එකයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒක වෙනම ඇසිය යුතු ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමා මීට කලිනුත් මේවාට පිළිතුරු දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන වශයෙන්ම ඔබතුමා අහන්නේ මුද්දර ගැනයි. මුද්දරවලින් දෙපාර්තමේන්තුව ආදායමක් ලබනවා. ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් සහ එකතු කරන්නන්ගේ විශේෂ උනන්දුවක් ශ්‍රී ලංකා මුද්දර සඳහා ලොව පුරා පවතිනවා. ඒ අතින් අපේ රට, කැපැල් දෙපාර්තමේන්තුව ඉතා වැදගත් වැඩ කොටසක් කර තිබෙනවා. පසු ගිය ශත වර්ෂය පුරා කැපැල් දෙපාර්තමේන්තුව ඉටු කර තිබෙන මහා කාර්ය භාරය මොහොතකටවත් අමතක කරන්න එපා. එය ලාභය හා අලාභය මත නොව සේවාව අතිනුයි මැනිය යුත්තේ. ඇත එපිට ගම්මාන කරා ගමන් කරන්නේ කැපැල්කරුවා පමණක් වන බවත්, ඔබතුමාත් අපත් අද ඊ-මේල් යුගයට පැමිණියත්, ඒ දක්වා ආවේ බොහොම දුර ගමනක්ය කියන එකත් පිළිතුරු වශයෙන් කියන්න මා කැමැතියි. කැපැල් දෙපාර්තමේන්තුවේ තිබෙන වැය ශීර්ෂයන්ගේ ගැටලුව කෙරෙහි ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කොට ප්‍රතිසංවිධාන කටයුතු කරන්න යම් යම් නිර්දේශ කරමින් පවතිනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඇත්ත වශයෙන්ම මම තැපැල් සේවා ඇමතිතුමාගෙන් තමයි මේ ප්‍රශ්නය ඇහුවේ. එතුමා ඇවිල්ලා නැති නිසා ඔබතුමා කියනවා, එතුමාට මේක ඉදිරිපත් කරන්න කියලා. අපට කරන්න දෙයක් නැහැ, එතුමා ආපු නැති එකට.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කලිනුත් මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ප්‍රශ්නය - තැපැල් දෙපාර්තමේන්තුවේ අනාගතය ගැන- ගිය අය වැය ලේඛනයේදීත් ඇහුවා. ඊට කලිනුත් ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්නය අහලා ඇමතිතුමා එයට උත්තර දී තිබෙනවා. ඒ පිළිබඳව ප්‍රතිසංවිධානය කිරීමේ වැඩසටහනක් නිර්දේශ කරලා තිබෙනවා. ඒ අනුව ප්‍රගතියක් ඇති වනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, ඒ නිසා තමයි මේ ගැන අහන්නේ. මෙච්චර කල් කිව්වා, තැපැල් දෙපාර්තමේන්තුවේ පාඩුව කෝටි 300, කෝටි 460 වුණා කියලා. ගිය පාර ඇහුවාම කිව්වා, මේ අවුරුද්දේ ඒක අවම කරන්න වැඩ කටයුතු කර තිබෙනවාය කියලා. අද තමයි අපිට මහ බැංකුවේ වාර්තාව දී තිබෙන්නේ. මේකේ තිබෙනවා, පාඩුව කෝටි 460 සිට කෝටි 500 දක්වා වැඩි වෙලා තිබෙනවාය කියලා. ඒකයි අපි මේ ප්‍රශ්න අහන්නේ. ඇමතිතුමා එන්නේත් නැහැ, ඒවාට උත්තර දෙන්න. ඔබතුමා කියනවා, දන්නේ නැහැ කියලා. නමුත් මේ ප්‍රශ්න නිසා අහිංසක මිනිසුන්ගේ විදුලි බිල වැඩි වෙනවා. සැමන් ටින් එකේ බද්ද වැඩි වෙනවා. මේ සියලුම දේවල් වෙනවා. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය අහන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තැපැල් දෙපාර්තමේන්තුවේ වැරැද්දක් නිසා නොවෙයි ඒ අයගේ බදු වැඩි වෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැත්නම්?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒවා වෙන්නේ වෙනම මුද්දර ගාස්තු වැඩි කිරීමෙන්. ඔබතුමා තැපැල් දෙපාර්තමේන්තුව සහ රජයේ සියලු දෙපාර්තමේන්තු වහලා දමන්න කියලා යෝජනා කරන ආර්ථික න්‍යායක එල්බ ගෙන සිටීම පුදුමයක් නොවෙයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම කිසිම යෝජනාවක් කළේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එම ආර්ථික න්‍යායේ අපි එල්බිලා නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
යම් යම් සේවාවල් මහජන සේවාවන් ලෙස පවත්වාගෙන යා යුතුයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇමතිතුමනි, ඉස්සර කාලයේ ඒක පුද්ගල ලියුම් ප්‍රමාණය සියයට 50ක්, 60ක් වාගේ තමයි තිබුණේ. අද වනකොට ඒක පුද්ගල ලියුම් ප්‍රමාණය සියයට 10ට බැහැලා. අපි දන්නවා, e-mail, SMS භාවිතයත් එක්ක මේ තැපැල් පාවිච්චිය අඩු වෙලා තිබෙනවාය කියන කාරණය. ගරු ඇමතිතුමනි, මම අහන්නේ මේකයි. මේ නව සන්නිවේදන රටාව තුළ තැපැල් දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා ඔවුන්ගේ පාඩුව අඩු කර ගන්න ඔබතුමන්ලා මොකක් හරි පියවරක් අරගෙන තිබෙනවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමා බොහොම හොඳ ප්‍රශ්නයක් ඇහුවේ. ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළක් දැනට ඉදිරිපත් කර තිබෙනවා. එය උපදේශ කාරක සභාවට ගිහිල්ලා පැහැදිලි කර ගන්න පුළුවන්. ඔබතුමා කියන අලුත් සේවාවන් රාශියක් උපතැපැල් කාර්යාල හරහා සිදු කරන්න කියලා ඒ යෝජනාවේ තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම ස්තුතියි.

උතුරු මැද පළාතේ පාසල් ගුරුවරු : විස්තර
வட மத்திய மாகாண பாடசாலை ஆசிரியர்கள்: விபரம்
TEACHERS IN NORTH-CENTRAL PROVINCE : DETAILS

3100/'12

12. ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) උතුරු මැද පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) වර්ෂ 2005 සිට 2012 දක්වා කාල සීමාව තුළ වසා ඇති පාසල් සංඛ්‍යාව;

(iii) සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව;

(iv) පවතින සම්පූර්ණ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(v) එක් එක් විෂය අනුව පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(vi) වැඩබලන විදුහල්පතිවරු සංඛ්‍යාව;

(vii) ශ්‍රේණිධාරී ගුරුවරු සංඛ්‍යාව;

(viii) ස්වේච්ඡා ගුරුවරු සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරුමැද පළාතේ, පොළොන්නරු හා අනුරාධපුර දිස්ත්‍රික්කවල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන් සඳහා වැටුප් ගෙවන්නේද;

(ii) එසේ නම්, එම වැටුප කොපමණද;

(iii) ඉහත දිස්ත්‍රික්කවල රජයේ පාසල්වල ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් සේවය කරන්නේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ට අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ හෝ වෙනත් ආයතනයක් යටතේ ගුරු පුහුණුවක් ලබා දී තිබේද;

(vi) ඔවුන් ඉදිරියේදී ගුරු සේවයට අනුයුක්ත කිරීමට අපේක්ෂිතද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) வடமத்திய மாகாணத்தில் ஒவ்வொரு மாவட்டத்திலும்,

(i) அரச பாடசாலைகள்;

(ii) 2005 ஆம் ஆண்டு தொடக்கம் 2012 ஆம் ஆண்டு வரையிலான காலகட்டத்தினுள் மூடப்பட்டுள்ள பாடசாலைகள்;

(iii) கடமையாற்றும் ஆசிரியர்கள்;

(iv) காணப்படுகின்ற மொத்த ஆசிரியர் வெற்றிடங் களின் எண்ணிக்கை;

(v) ஒவ்வொரு பாடத்திற்கமைய நிலவும் ஆசிரியர் வெற்றிடங்கள்;

(vi) பதில் கடமையாற்றும் அதிபர்கள்;

(vii) தரங்களையுடைய ஆசிரியர்கள்;

(viii) தொண்டர் ஆசிரியர்கள்

எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) வட மத்திய மாகாணத்தில் பொலன்னறுவை மற்றும் அனுராதபுரம் மாவட்டங்களில் பணியாற்றும் தொண்டர் ஆசிரியர்களுக்கு சம்பளம் செலுத்தப்படுகின்றதா என்பதையும்;

(ii) அவ்வாறெனில், அந்தச் சம்பளம் எவ்வளவு என்பதையும்;

(iii) மேற்கூறிய மாவட்டங்களில் அரச பாடசாலைகளில் ஆசிரியர்களாக சிவில் பாதுகாப்பு உத்தியோகத்தர்கள் பணியாற்று கின்றார்களா என்பதையும்;

(iv) அவ்வாறெனில், அந்த எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(v) இவர்களுக்கு கல்வித் திணைக்களத்தின் அல்லது வேறு நிறுவனத்தின் கீழ் ஆசிரியர் பயிற்சி வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(vi) எதிர்காலத்தில் இவர்களை ஆசிரியர் சேவையில் இணைப்பதற்கு எதிர்பார்க்கப்படுகின்றதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state separately, the number of -

(i) Government schools;

(ii) schools that have been closed down during the period 2005 to 2012;

(iii) teachers serving;

(iv) total teaching vacancies that exist ;

(v) teaching vacancies that exist as per each subject;

(vi) acting principals;

(vii) teachers holding grades;

(viii) teachers serving on voluntary basis;

(ix) in each district of the North Central Province ?

(b) Will he also state -

(i) whether salaries are paid to the teachers serving on a voluntary basis in the districts of Polonnaruwa and Anuradhapura in the North Central Province;

(ii) if so, what that salary is;

(iii) whether officers of the Civil Security Force serve as teachers in the Government schools of the above districts;

(iv) if so, what that number is;

(v) whether they have been provided with a training under the Department of Education or any other institution; and

(vi) whether it is expected to attach them to the Teachers Service in future?

(c) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ රජයේ පාසල් සංඛ්‍යාව - 540

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රජයේ පාසල් සංඛ්‍යාව - 236

(ii) පාසල් වසා දැමීමක් කිසිදු විටක සිදු නොකෙරේ.

නමුත් ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීම මත හා ඇතැම් ප්‍රදේශවල සිදු වන සංවර්ධන ක්‍රියාවලින් නිසා දරුවන් විතැන් වීම හේතුකොටගෙන මධ්‍යම පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් පාසල් සමහරක් වැසී ගොස් ඇත. මධ්‍යම රජයේ අධ්‍යාපන

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

අමාත්‍යාංශයට අයත් කිසිදු ජාතික පාසලක් මේ කාල පරිච්ඡේදය තුළ වැසී ගොස් නැත. පළාත් සභාවලට අයත් පාසල් සමහරක් වැසී ගොස් ඇත. ඒ සංඛ්‍යාව මෙසේයි:

දි දිස්ත්‍රික්කය	එක් එක් වසර තුළ වැසී ගිය පාසල් ගණන							
	2005	2006	2007	2008	2009	2010	2011	2012
අනුරාධපුරය	0	0	4	0	2	1	6	2
පොළොන්නරුව	1	0	1	0	0	0	0	0

(iii) 13,469 යි.

(iv) 2666 යි.

(v) ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(vi) 406 යි.

(vii) 12,802 යි.

(viii) නැත.

(ආ) (i) නැත. (උතුරු මැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ලිපියට අනුව)

(ii) අදාළ නොවේ.

(iii) ඔව්.

කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය වැනි ප්‍රදේශවල පිහිටි තර්ජිත හා මායිම් ගම්මානවල කොටි උවදුර පැවතීම නිසා එම ප්‍රදේශවල ගුරුවරුන් ඒ ස්ථාන අත්හැර යාම සිදු විය. ඔවුන් ස්ථානගත කිරීම අසීරු විය.

එබැවින් එම ප්‍රදේශවල සිසු දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේදී දුෂ්කරතා රාශියක් පැන නැගුණි. එවකට ආරක්ෂක අංශ යටතේ පැවති මෙම ප්‍රදේශවල විශාල අනාරක්ෂිත බවක් තිබූ අතර, සිසු දරුවන්ගේ ඉගෙනුම ක්‍රියාවලිය පවත්වාගෙන යාමට සිවිල් ජනතාව යොදා ගැනීම අපහසු බැවින් අධ්‍යාපන සුදුසුකම් සපුරන ලද සිවිල් ආරක්ෂක අංශයේ නිලධාරීන් ගුරුවරුන් ලෙස සේවයේ යොදා ගන්නා ලදි. එම නිලධාරීන් සිසු දරුවන්ට ආරක්ෂාවද සලසමින් ආයුධ සන්නද්ධව පාසල් පද්ධතියේ අධ්‍යාපන කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමට මහඟු සේවයක් ඉටු කළ බව සඳහන් කළ යුතුව ඇත.

(iv) 123 යි.

(v) සේවාස්ථ ගුරු පුහුණුවක් ලබා දී ඇත.

(vi) මෙතෙක් කළ සේවය ද සලකා බලා ගුරු සේවයට ඇතුළත් කිරීමට මූලික සුදුසුකම් සපුරා ඇත්නම්, ස්ථීර ගුරු සේවයට ඇතුළත් වන්නට ඔවුන් බලාපොරොත්තු වේ නම්, ඉදිරියේදී ගුරු පත්වීම් ලබා දෙන විට ගුරු ව්‍යවස්ථාවට අනුව ඉල්ලුම් කරන්නට පුළුවන්. එසේ නැතිව බඳවා ගන්න අසීරුයි.

(ඇ) අදාළ නොවේ.

---

* **පුස්තකාලයේ තබා ඇත.**

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ ගොල්ලෝ ඉල්ලීමක් කළොත් ගුරු සේවයට බඳවා ගැනීමේ හැකියාව ගැන ගරු ඇමතිතුමා කිව්වා. එහෙත් අතිගරු ජනාධිපතිතුමා අප්‍රේල් මාසයේ 20 වන දා වැලිඔය කළ සංචාරයේදී පැහැදිලිව කිව්වා, මේ අය ගුරු සේවය සඳහා බඳවා ගැනීමක් සිදු කරන්නේ නැහැ කියා. ගරු ඇමතිතුමාගෙන් ඒ පිළිබඳව මා පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. මොකද, එහෙම ප්‍රකාශයක් කර තිබෙනවා, ඒ ප්‍රදේශයේ මිනිසුන්ගේ ඉල්ලීම මත. විශේෂයෙන්ම ඔබතුමා දැන් කිව්වා, ආරක්ෂාව අවශ්‍ය කාලයේදී තුවක්කු තියාගෙන සේවය කළාය කියා. දැන් යුද්ධය ඉවර වෙලාත් අවුරුදු හතරක් වෙනවා. ග්‍රාම ආරක්ෂක සේවයේ අය අනුයුක්ත කිරීමේදී සමහර වෙලාවට අධ්‍යාපන දෙපාර්තමේන්තුවට නොදන්වා, ග්‍රාම ආරක්ෂක අවශ්‍යතා මත ඒ ගොල්ලෝ හදිසි කැඳවීම්වලට යනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ඒ ගොල්ලන්ගේ බැඳීමක් නැහැ. එතකොට විෂයයක් ඉගැන්වීමට භාර දී තිබෙනවා නම්, ඒ විෂයට අදාළ -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

විස්තර නැතිව කෙටියෙන් ප්‍රශ්න අහන්න. කාලය අවසන් වීගෙන යනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

එතකොට ඒ syllabus එකට අනුව ඒ ගොල්ලන්ට හරියාකාරව ක්‍රියා කරන්නට බැරි වෙලා තිබෙනවා. මේ තත්ත්වයට දැන් අවුරුදු හතරක් වෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඔබතුමාගේ ප්‍රදේශයේ විශාල කාලයක් පැවැති අඩු පාඩු තමයි කිසියම් ආකාරයට සම්පූර්ණ කර තිබෙන්නේ. ගුරු ව්‍යවස්ථාව අනුව, අපට ගුරුවරුන් වශයෙන් බඳවා ගන්නට පුළුවන් වෙන්නේ, උපාධිධාරීන් හා විද්‍යාපීඨවල අය පමණයි. එසේ නැති කිසිවෙක් කිසිම හේතුවක් නිසාවත් ගුරු සේවයට බඳවා ගන්නට බැහැ. එවැනි අනුමතියක් රාජ්‍ය සේවා කොමිසම ලබා දෙන්නේත් නැහැ. දරුවන්ට ගුණාත්මක අතින් ඉහළ අධ්‍යාපනයක් ලබා දීමේ ජාතික ප්‍රතිපත්තිය අනුව, ගුරු ව්‍යවස්ථාව අනුව ගුරු සේවයට බඳවා ගන්නට පුළුවන් වන්නේ පාර්ශ්වකරුවන් දෙකොටසයි. අවශ්‍යයෙන්ම උපාධිධාරීන් අදාළ විභාගයට පෙනී සිට සම්මුඛ පරීක්ෂණයෙන් පසුව බඳවා ගන්නවා. අවුරුදු තුනක් විද්‍යාපීඨවල පුහුණුව ලත් ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බඳවා ගන්නවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ඔබතුමා කියන හැටියට මේ අය ගුරු සේවයට බඳවා ගැනීමක් සිද්ධ කරන්නේ නැද්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

එහෙම බඳවා ගන්නට බැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මේ ප්‍රදේශවල ගුරු පුරප්පාඩු දෙදහස් හයසිය ගණනක් තිබෙනවා. ඔබතුමා කියන විධියට-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ සඳහා විකල්ප ක්‍රමවේද අප අනුගමනය කරනවා. ඒ ඒ ප්‍රදේශවල අවශ්‍ය සුදුසුකම් සපුරන අය නැත්නම්, ඒ අය ගුරු සහායකයන් ලෙස බඳවා ගෙන අවුරුදු පහක කාල පරිච්ඡේදය තුළ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන්න ඉඩ දෙනවා. විවිධ අවස්ථාවලදී කැබිනට් තීරණ මත රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය අනුව එසේ කරන අවස්ථා තිබෙනවා. එවැනි ඉල්ලීමක් උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන්න. අපි ඒ පිළිබඳව සලකා බලන්නම්.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ කථා පවත්වන්නේ නැතුව අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමා. තමුන්නාන්සේගේ නවෝද්‍යා පාසල් ක්‍රමය යටතේ තලාවේ නවෝද්‍යා පාසලේ ප්‍රාථමික අංශය, තලාවේ මහවැලි කඳවුරේ පොහොර ගබඩාවක පවත්වා ගෙන යන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, එවැනි කිසිම නවෝද්‍යා පාසලක් ගැන මම දන්නෙත් නැහැ; එවැනි පාසලක් ඇත්තෙත් නැහැ.

මධ්‍යම රජය හා පළාත් සභා යටතේ පාලනය වන පාසල් : බුද්ධ ධර්ම ගුරුවරු

மத்திய மற்றும் மாகாண அரசு நிர்வகிக்கும் பாடசாலைகள் : பௌத்த தர்ம ஆசிரியர்கள்

SCHOOLS ADMINISTERED BY CENTRAL GOVERNMENT AND PROVINCIAL COUNCILS: BUDDHISM TEACHERS

2331/'12

14. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3) :

(අ) මධ්‍යම රජයේ හා පළාත් සභා යටතේ පාලනය වන පාසල්වල බුද්ධ ධර්මය විෂය ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමට බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් අය ගුරු සේවයට බඳවා ගැනීමට අදාළව අංක අමප/10/2376/436/052 යටතේ 2010 ඔක්තෝබර් 28 දින කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේද;

(ii) දැනට බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත්ව ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ ගුරු භවතුන් බඳවා ගන්නා ක්‍රියාපටිපාටියට අනුකූලව බුද්ධ ධර්මය විෂය ඉගැන්වීම සඳහා බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් අය බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම බඳවා ගැනීම් කොපමණ කාලයක් තුළ සිදු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மத்திய அரசாங்கம் மற்றும் மாகாண சபைகளின் கீழ் நிர்வகிக்கப்படுகின்ற பாடசாலைகளில் பௌத்த தர்மத்தைக் கற்பிக்க அவசியமான ஆசிரியர்களின் எண்ணிக்கை யாது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ)(i) பௌத்த சமயத்தைக் கற்பிக்க பௌத்த தர்மாசார்ய பரீட்சையில் சித்தியடைந்தவர்களை ஆசிரியர் சேவைக்கு சேர்த்துக்கொள்ளல் சம்பந்தமாக அமப/10/2376/436/052 இலக்கத்தின் கீழ் 2010 ஒற்றோபர் 28 ஆந் திகதி அமைச்சரவைப் பத்திரமொன்று சமர்ப்பிக் கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) தற்போது பௌத்த தர்மாசார்ய பரீட்சையில் சித்தியடைந்துள்ளோர் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அரசாங்க ஆசிரியர்களைச் சேர்த்துக் கொள்ளும் நடைமுறைக்கு அமைவாக பௌத்த சமயத்தைக் கற்பிக்கும் பொருட்டு பௌத்த தர்மாசார்ய பரீட்சையில் சித்தியடைந்தோரைச் சேர்த்துக் கொள்ள நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி ஆட்சேர்ப்பினை எவ்வளவு காலத்திற்குள் மேற்கொள்ள நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state the number of teachers required for the teaching of Buddhism in the schools administered by the Central Government and the Provincial Councils?

(b) Will he also state-

(i) whether a Cabinet Paper was presented on 28th October 2010 under No. CP/10/2376/436/052 with regard to the recruitment of those who have passed the Buddhist Dharmacharya Examination to Teacher Service to teach the subject of Buddhism;

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

(ii) the number of those who have passed the Dharmacharya Examination at present;

(iii) whether action will be taken to recruit those who have passed the Dharmacharya Examination in compliance with the procedure for the recruitment of Government teachers to teach the subject of Buddhism; and

(iv) if so, the period of time within which action will be taken to carry out such recruitments ?

(c) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) බුද්ධ ධර්මය විෂයය ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරු සංඛ්‍යාව

ජාතික පාසල් සඳහා	- 316
පළාත් සභා පාසල් සඳහා	- 742
අවශ්‍ය මුළු ගුරුවරුන් ගණන	- 1058

(ආ) (i) නැත.

(ii)

2005-2008 දක්වා	-	7679
2009	-	6275
2010	-	4617
2011	-	3031

(iii) රජයේ ගුරු භවතුන් බඳවා ගන්නා ක්‍රියා පටිපාටියට අනුකූලව බඳවා ගත නොහැක. නමුත් අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයේ ප්‍රතිපත්තිමය තීන්දුවක් මත ධර්මාචාර්ය විභාගය සමත් අය ගුරු සහායකයන් ලෙස බඳවා ගැනීමට අදාළව මා විසින් 2012/ඊඩී/ඊ/41 හා 2012.12.31 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇත. ඒ සඳහා ලැබෙන තීරණය අනුව එහි සඳහන් වන කොන්දේසි යටතේ ඔවුන් බඳවා ගැනීම පිළිබඳ ඉදිරි කටයුතු කරනු ලැබේ.

(iv) ඉතාම ඉක්මනින්. රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය ලැබුණු වහාම ගැසට් කිරීමේ කටයුත්ත කරනවා.

(ඇ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, 2010 ජනාධිපතිවරණය පැවැති කාල වකවානුව තුළ ධර්මාචාර්ය විභාගය සමත් වූ අය මහනුවර ජනාධිපති මන්දිරයට කැඳවලා ගරු ජනාධිපතිතුමා පොරොන්දුවක් දුන්නා -ප්‍රතිඥාවක් ලබා දුන්නා- ඒ සියලුම දෙනා ගුරු සේවයට බඳවා ගැනීමේ ක්‍රියාවලිය දියත් කරනවා කියලා. දැන් ඔබතුමා ලබා දුන්නු සංඛ්‍යා ලේඛනවලට අනුව 23,000කට ආසන්න ප්‍රමාණයක් ධර්මාචාර්ය විභාගය සමත් වෙලා තිබෙනවා. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ගුරු සේවයේ බඳවා ගැනීම් පටිපාටියට අනුකූලව සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන, ධර්මාචාර්ය විභාගය සහ උසස් පෙළ සමත් ඒ සියලුම දෙනා බඳවා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නේ කවදාද කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගුරු සේවයට එහෙම බඳවා ගන්න බැහැ. අතිගරු ජනාධිපතිතුමා ඉතාම පැහැදිලිව, නිවැරදිව ගුරු ව්‍යවස්ථාව දන්නා ජන නායකයෙක්. ඒ නිසා එතුමා දන්නවා, ඒ වාගේම හිටපු අධ්‍යාපන අමාත්‍යවරයකු වශයෙන් විපක්ෂ නායකතුමාත් දන්නවා අවශ්‍ය වෙනත් සුදුසුකම් තිබුණාය කියලා අපට ගුරු සේවයට බඳවා ගන්න බැහැ කියලා. ගුරු ව්‍යවස්ථාවට අනුව බඳවා ගන්නේ උපාධිධරයන් හෝ විද්‍යාපීඨ පුහුණුව ලැබූ අය පමණයි. එයින් පිට බඳවා ගැනීමට චක්‍රලේඛනයක් ඉදිරිපත් කළොත් වඩා ස්වාධීනව, වඩා පුළුල් පදනමක් යටතේ ඒ ගැන බලන්න ඔබතුමන්ලා විසින් පත් කර ගෙන තිබෙනවා රාජ්‍ය සේවා කොමිසම; Public Service Commission එක. දේශපාලනඥයන්ට හිතෙන හිතෙන ඒවා කිව්වාට Commission එක ඒ සඳහා අනුමැතියක් දෙන්නේ නැහැ. එතැන තමයි ප්‍රධාන හිර වීම. රාජ්‍ය සේවා කොමිසම නැත්නම් මීට කලින් බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් අයට පත්වීම් ටික ලබා දීලා ඉවර කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර නැතුව කෙටියෙන් අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙමයි. ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා දේශපාලනඥයන්ට හිතුණු හිතුණු ආකාරයට පොරොන්දු දුන්නාට බඳවා ගන්න බැහැ කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, පොරොන්දු දීලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
2010 ජනාධිපතිවරණයේදී ගරු ජනාධිපතිතුමා බොහොම උනන්දුවෙන් ප්‍රතිඥාවක් ලබා දුන්නා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
තමුන්නාන්සේ කියන්නේ පට්ටපල් අසත්‍යයක්. ජනාධිපතිතුමා මහනුවරට කැඳවලා කිසිම පොරොන්දුවක් දීලා නැහැ. මොකද, ජනාධිපතිතුමා ගුරු ව්‍යවස්ථාව ගැන හොඳටම දන්නා නායකයෙක්, තමුන්නාන්සේ වාගේ ගුරු ව්‍යවස්ථාව නොදන්නා කෙනෙකු නොවෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ අතුරු ප්‍රශ්නය අහන තෙක් ඉන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වෙනත් දේවල් අහන්නේ නැතුව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු මන්ත්‍රීතුමා, පට්ටපල් අසත්‍යය කියන්නේ නැතුව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මෙතුමා ව්‍යංගයෙන් කියන්නේ, ජනාධිපතිතුමා ගුරු ව්‍යවස්ථාව දන්නේ නැහැ කියලා. ඒක බරපතළ කාරණාවක්. මොකද, ඒක මා දුන්නු පොරොන්දුවක් නොවෙයි. 2010 ජනාධිපතිවරණය පැවැති වකවානුවේ ඒ සියලුම දෙනා ගුරුවරුන් හැටියට බඳවා ගන්නවාය කියන පොරොන්දුව මහනුවර ජනාධිපති මන්දිරයේදී දුන්නේ ජනාධිපතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ජනාධිපතිතුමා එහෙම පොරොන්දුවක් දුන්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා ඒ පොරොන්දුවට අනුකූලවයි මේ අතුරු ප්‍රශ්නය ඇහුවේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ජනාධිපතිතුමා පොරොන්දු ඉෂ්ට කරන නායකයෙක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කථා පවත්වන්නේ නැතුව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මා කනගාටු වනවා ඔබතුමා ව්‍යංගයෙන් හෝ ජනාධිපතිතුමාට ඒ වාගේ අවලාද නැගීම ගැන. ඒ කෙසේ වෙතත් මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අවලාද නැගුවාද කියලා අහන්න?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාගේ උත්තරයෙන්ම අවලාද නැගුවා. මොකද, ජනාධිපතිතුමා කියනවා ඔක්කෝම අය ගුරු සේවයට බඳවා ගන්නවා කියලා. මෙතුමා කියනවා, එහෙම බඳවා ගන්න බැහැ කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ඇති. ඒක අතුරු ප්‍රශ්නයක්. ඒකට උත්තරය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් වයස අවුරුදු 18ත්-45ත් අතර අයගෙන් තමයි ඒ බඳවා ගැනීම් සිදු වන්නේ. ඒ බඳවා ගැනීමේ වයස් ප්‍රමාණයන් තීන්දු කිරීමේදී -[බාධා කිරීමක්] ඉන්න, මම ප්‍රශ්නය අහන කල්. අනිකුත් අන්‍යාගමික -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න, ඇමතිතුමාගේ -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අනිකුත් අන්‍යාගමික ධර්මාචාර්ය ගුරුවරුන් බඳවා ගැනීමේදී වයස අවුරුදු 45 දක්වා අය බඳවා ගන්නවා. නමුත් අපට දැන ගන්නට ලැබී තිබෙනවා, බුද්ධ ධර්ම විෂය උගන්වන්නට ධර්මාචාර්ය ගුරුවරුන් බඳවා ගැනීමේ වයස් සීමාව අවුරුදු 45 සිට අවුරුදු 35 දක්වා අඩු කර තිබෙන බව. මා ඔබතුමාට මතක් කරන්න කැමැතියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බුද්ධ ධර්මයට ප්‍රමුඛස්ථානය ලබා දී තිබෙන බව. එවන් මොහොතක අවුරුදු 35 වයස් සීමාව අවලංගු කරලා එම සීමාව අවුරුදු 45 දක්වා වැඩි කරනවාද කියා මා අහන්න කැමැතියි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බුද්ධ ධර්මයට ප්‍රමුඛස්ථානය ලබා දී තිබෙනවා. විපක්ෂය විසින් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, එක් එක් අමාත්‍යවරුන්ට හා කැබිනට් මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීමට උඩින් විවිධ කොමිෂන් සභා පත් කර ගෙන තිබෙනවා. ඒ එක් කොමිෂන් සභාවක් තමයි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව. තව ඉල්ලීමක් කරනවා, ජාතික පොලිස් කොමිෂන් සභාව ඇතුළු අනිකුත් කොමිෂන් සභාත් පත් කරන්න කියලා. එතකොට මටවත්, අතිගරු ජනාධිපතිතුමාටවත්, කැබිනට් මණ්ඩලයටවත් අවශ්‍ය ලෙස රාජ්‍ය සේවය සම්බන්ධයෙන් කටයුතු කරන්න රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉඩ දෙන්නේ නැහැ. ගුරුවරු කියන්නේ රාජ්‍ය සේවයේ කොටසක්. ගුරුවරු කියන්නේ රාජ්‍ය සේවයේ කොටසක් නම් මේ රටේ ඉතාම පුළුල් අත් දැකීම්

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

සහිත රාජ්‍ය නායකයා ලෙස අතිගරු ජනාධිපතිතුමා ධර්මාචාර්ය විභාගය සමත් සියලුම අය ගුරු සේවයට බඳවා ගන්නවා කියා ප්‍රතිඥාවක් කිසි දවසක දීලා නැහැ. අපි ව්‍යංගයෙන් කියන්නේ නැහැ. අපේ රජයේ ප්‍රතිපත්තිය තමයි කියන ඕනෑ දෙයක් කෙළින් කියනවා මිසක් ව්‍යංගයෙන් කියන්නේ නැති එක. ජනාධිපතිතුමා එවැනි ප්‍රතිඥාවක් දීලා නැහැ. රාජ්‍ය සේවා කොමිසමේ විධිවිධාන තිබියදී අපි රජයක් ලෙස කැබිනට් මණ්ඩලයේ තීරණය අනුව තමයි බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් ගුරුවරුන්ට මේ පත්වීම් ලබා දෙන්න කටයුතු කරන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. මා ඔබතුමාගෙන් නැවතත් වරක් පුන-පුනාම අහනවා, -ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් සවන් දෙන්න- අනිකුත් ආගමික ක්ෂේත්‍රයන් තුළ මේ ධර්මාචාර්ය විභාගය සමත් අය බඳවා ගැනීමේ වයස් සීමාව අවුරුදු 18ත්-45ත් අතරයි. ඔබතුමන්ලා තීන්දු කර තිබෙනවා, බෞද්ධාගමික ධර්මාචාර්ය -[බාධා කිරීමක්] ප්‍රශ්නය අහන කල් පොඩ්ඩක් ඉන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, අපට තීන්දු කරන්න බැහැ. බඳවා ගන්නා ආකාරය රාජ්‍ය සේවා කොමිසම විසින් තීන්දු කරන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
විස්තර ඔක්කොම මා ළඟ තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
බඳවා ගන්නා ආකාරය තීන්දු කරන්නේ රාජ්‍ය සේවා කොමිසමයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මේක වැදගත් ප්‍රශ්නයක්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
කොළයක් ගෙනැල්ලා අසත්‍ය කියවනවා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15, ගරු රවි කරුණානායක මහතා. පැමිණ නැත. දෙවන වටය.

විදේශ රැකියා නියුක්තිකයන් : රක්ෂණ ආවරණය
வெளிநாட்டில் தொழில்புரிவோர் : காப்புறுதிக் காப்பீடு
PERSONS IN OVERSEAS EMPLOYMENT: INSURANCE COVERAGE

1531/'11

1. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) 2006 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) රැකියා සඳහා විදේශ රටවලට ගිය තැනැත්තන් විසින් විදේශ රැකියා නියුක්ති කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) රැකියා සඳහා විදේශ රටවලට ගිය තැනැත්තන්ට රක්ෂණ ආවරණය ලබා දීම මගින් රජය විසින් උපයා ගත් ආදායම කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රැකියා සඳහා විදේශ රටවලට යන සේවකයින් හට රක්ෂණ ඔප්පු ලබාදීමට සුදුසුකම් ලබා ඇති රක්ෂණ සමාගම් කවරේද;

(ii) එම සමාගම් තෝරා ගනු ලබන්නේ නිසි ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීම මගින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

වෙළිනාට්ටු වේලෙවාය්ප්පු ඌක්කුවිප්පු, නලනෝම්පුකෙ අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) 2006 මුතල් ඉට්රෙ වරෙ,

(i) වේලෙවාය්ප්පිට්කාක වෙළිනාට්ටු සෙන්ර නපර්කළ්, වෙළිනාට්ටු වේලෙවාය්ප්පු පණිය කත්තිල් මේට්කොණ්ටුළ්ළ මුරෙප්පාට්ටුකළින් එණ්ණික්කෙයෙයුම්;

(ii) වෙළිනාට්ටු වේලෙවාය්ප්පිට්කාක සෙන්ර නපර්කළුක්කාක වළංකප්පට්ට කාප්පුරුදිත් කාප්පීට්ටින් මූලම් අරසාංකම් තිරට්ටිය වරුමානත් තෙයුම්

වරුඩවාරියාක අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ආ) (i) වෙළිනාට්ටු වේලෙවාය්ප්පිට්කාක සෙල්ලුම් තොළිලාළර්කළුක්කු කාප්පුරුදිත් කාප්පීට්ටුකළෙ වළංකුවතර්කු තකමෙයුටෙය කම්පනිකළෙයුම්,

(ii) මේර්පටි කම්පනිකළ් මුරෙයාන කේල්විප්පත්තිර නටෙමුරෙකළිනූටාක තෙරිවුසෙය්යප්පට්ටනවා එන්පතෙයුම්

අවර් කූරුවාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Foreign Employment Promotion and Welfare:

(a) Will he inform this House from the year 2006 to date, separately on per year basis-

(i) the number of complaints made to the Foreign Employment Bureau by the persons gone overseas for employment; and

(ii) the revenue collected by the Government through the insurance coverage provided to the persons gone for overseas employment?

(b) Will he state -

(i) the companies that are eligible to provide insurance policies to the workers going for overseas employment; and

(ii) whether the aforesaid companies are selected through a proper tender process?

(c) If not, why?

ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ❖ ලැබුණු පැමිණිලි ප්‍රමාණය

වර්ෂය	2006	2007	2008	2009	2010	2011	2012	2013
පැමිණිලි සංඛ්‍යාව	8489	6141	6292	8648	9678	7749	8135	2014

❖ විසඳුම් ලබා දී ඇති පැමිණිලි ප්‍රමාණය

වර්ෂය	2006	2007	2008	2009	2010	2011	2012	2013
පැමිණිලි සංඛ්‍යාව	8010	7720	6581	7820	10617	8960	7796	2044

❖ එක් එක් වර්ෂයන්හි විසඳුම් ලබා දීමට නොහැකි වූ පැමිණිලි සංඛ්‍යාව ඊළඟ වර්ෂයට එකතු වීම නිසා සමහර වසරවල ලැබී ඇති පැමිණිලි ප්‍රමාණයට වඩා වැඩි පැමිණිලි සංඛ්‍යාවකට විසඳුම් ලබා දී ඇත.

❖ ඒ අනුව 2013 පෙබරවාරි මස අවසානයේ පැමිණිලි 2844ක් සඳහා විසඳුම් ලබා දෙමින් පවතී.

❖ පැමිණිලි සඳහා විසඳුම් ලබා දීම පමණක් නොව ඒජන්සි ආයතනවලින් ශ්‍රමිකයන්ට සිදුවී ඇති හානිය හෝ පාඩුව තක්සේරු කර ඒජන්සි මඟින් වන්දි ලබාගෙන ඒවා ශ්‍රමිකයන්ට ලබා දීමද සිදු කෙරේ. එවැනි දත්ත කිහිපයක් පහතින් දක්වා ඇත.

විසඳුම් ලබා දී වන්දි මුදල් ලබා දී ඇති ප්‍රමාණය

වර්ෂය	2011	2012	2013
වන්දි මුදල් ප්‍රමාණය (රුපියල්)	16,550,219.00	14,039,257.00	1,892,711.00

(ii) රක්ෂණ ආවරණය සඳහාකිසිම මුදලක් රැකියා සඳහා විදේශ රටවලට යන අයගෙන් අය කරනු නොලැබේ.

(අ) (i) මෙම රක්ෂණ ඔප්පුව ලබා දෙන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟිනි. ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත ආයතනය මේ සඳහා එකම බලය ලත් නියෝජිත ලෙස කටයුතු කරයි. *මෙම ආයතනය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පූර්ණ අයිතිය ඇති සමාගමකි.*

(ii) රජයට අයත් එකම රක්ෂණ ආයතනය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව බැවින්ද එය අද අප රටෙහි පවතින විශාලතම රක්ෂණ ආයතනය බැවින්ද අධ්‍යක්ෂ මණ්ඩලය එයට මෙම විශාල රක්ෂණය භාර දීමට තීරණය කරන ලදී. රජයට අයත් බැවින් ටෙන්ඩර් කැඳවීමක් අවශ්‍ය නොවීය.

(ඇ) පැන නොනඟී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 2, ගරු දයාසිරි ජයසේකර මහතා, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය. දෙවන වටයේ ප්‍රශ්නයට පිළිතුර සභාගත කළ හැක.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර කියවන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
උත්තරය කියවන්න ඕනෑද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
උත්තරය කියෙව්වොත් හොඳයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පළමුවැනි වටයේ දී ප්‍රශ්නය අහන ගරු මන්ත්‍රීතුමා හිටියේ නැත්නම් දෙවැනි වටයේ දී වෙලාව ගත වෙලා නේ. ප්‍රධාන කටයුතු ආරම්භ කරන්නට තිබෙන්නේ පස්වරු 2.00ටයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, අපි එකඟතාවකට ආවා කියා ඔබතුමා එදා කිව්වා නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර සභාගත කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ පිළිතුර කියවන්න ඉඩ දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම බැහැ නේ ගරු මන්ත්‍රීතුමා. ප්‍රධාන කටයුතු පස්වරු 2.00ට ආරම්භ කරන්නට තිබෙනවා. [බාධා කිරීමක්] එහෙම බැහැ, ඔබතුමා වෙලාවට එන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම සාමාන්‍යයෙන් හැමදාම වෙලාවට එනවා. අද විතරයි මම ප්‍රමාද වුණේ. ඒක ඔබතුමා දන්නවා නේ. මම සාමාන්‍යයෙන් වෙලාවටත් කලින් ඇවිත් සිටින කෙනෙක් බව ඔබතුමා දන්නවා නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හා, හොඳයි. එහෙනම් පිළිතුර දෙන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. ඔබතුමා අපිත් එක්ක තරහා වෙලාද කොහෙද, පොඩ්ඩක් දැඟලුවයි කියලා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමාගේ අවසරයෙන් තමයි මා මේ උත්තරය කියවන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමා එයට තරහා වෙන්න හොඳ නැහැ. ඔබතුමාට නොවෙයි නේ. **ඔබතුමා** පාඩුවේ ඉන්න එකයි තිබෙන්නේ. ආණ්ඩුවට විරුද්ධවයි අපි ඒවා කළේ. අපි සෙංකෝලය ගත්තෙත් නැහැ.

ජාතික ලොතරැයි මණ්ඩල සේවකයින් : පැමිණීමේ හා ප්‍රවාහන දීමනා

தேசிய லொத்தர் சபை ஊழியர்கள் : வரவு மற்றும் போக்குவரத்து கொடுப்பனவுகள்

EMPLOYEES OF NATIONAL LOTTERIES BOARD: ATTENDANCE AND TRANSPORT ALLOWANCES

2149/'11

2. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පැමිණීමේ හා ප්‍රවාහන දීමනා වශයෙන් වර්ෂ 2005 සිට මේ දක්වා ආයතන සේවකයින් වෙත ගෙවා ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගෙවීම් සඳහා භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන තිබෙද;

(iii) එසේ නම්, ඊට අදාළ ලේඛන සභාගත කරන්නේද;

(iv) භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන නොමැති නම්, එයට හේතු කවරේද;

(v) එම ගෙවීම් සඳහා අනුමතිය ලබා දුන් පුද්ගලයා හෝ පුද්ගලයින් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய லொத்தர் சபையினால் வரவு மற்றும் போக்குவரத்து கொடுப்பனவுகளாக 2005ஆம் ஆண்டிலிருந்து இற்றைவரை நிறுவனத்தின் ஊழியர்களுக்குச் செலுத்தப்பட்டுள்ள பணத் தொகை வருடாந்த அடிப்படையில் வெவ் வேறாக எவ்வளவென்பதையும்;

(ii) மேற்படி கொடுப்பனவுகளுக்காக திறைசேரியின் அங்கீகாரம் பெறப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அதற்கு ஏற்புடைய ஆவணங்களை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) திறைசேரியின் அங்கீகாரம் பெறப்படாதிருப்பின் அதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(v) மேற்படி கொடுப்பனவுகளுக்கான அங்கீகாரத்தை வழங்கிய நபர் அல்லது நபர்கள் யார் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House -

(i) separately, the amount of money paid by the National Lotteries Board to its employees as attendance and transport allowances in each of the years from the year 2005 upto now;

(ii) whether approval of the Treasury has been obtained for the aforesaid payments;

(iii) if so, whether the relevant documents will be tabled;

(iv) the reasons, if the approval of the Treasury has not been obtained; and

(v) the person or persons who granted approval for the aforesaid payment?

(b) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) දීමනා ගෙවීම ආරම්භ කර ඇත්තේ 2008 මැයි මස සිටය. ඒ අනුව පහත සඳහන් පරිදි මුදල් ගෙවා ඇත. 2008 මැයි මාසයේ සිට ලක්ෂ 51,21,000යි. 2009 ලක්ෂ 75,000යි. 2010 ලක්ෂ 73,000යි. 2011 ලක්ෂ 78,000යි. 2012 සැප්තැම්බර් දක්වා ලක්ෂ 51යි.

(ii) 2008 අප්‍රේල් 28 දින පැවැති ජාතික ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී දුන් අනුමැතිය මත 2008 මැයි මස සිට ගෙවීම් සිදු කර ඇත. මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත්තේ 2012.05.14 දින වේ. මෙම ප්‍රවාහන දීමනාව දෙන ලද්දේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේය. මෙය වැටුප් වැඩි කිරීමක් වැන්නක් නොව, සේවක සුබ සාධනය යටතට වැටෙන්නක් බැවින් මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රමාණවත් යැයි සැලකුව හෙයින් ගෙවීම් කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය යටතේ සිදු කර ඇත. කෙසේ වෙතත් විගණකරු විසින් මේ සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතු යැයි 2008 විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇත. 2011 පැවැති පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේ දී 2008 සහ 2009 වසරවලට අදාළ ගිණුම් වාර්තා පිළිබඳව පරීක්ෂා කරනවිට මේ පිළිබඳව සාකච්ඡාවට භාජනය වී ඇත.

එහිදී මේ සඳහා භාණ්ඩාගාරයේ ආවරණ අනුමැතිය ලබා ගන්නා ලෙස දන්වා තිබේ.

(iii) මේවාට ඇමුණුම් තිබෙනවා.

(iv) ඒ අනුව මෙම දීමනාව ගෙවීම පිළිබඳ හේතු සාධක දක්වා ජාතික ලොතරැයි මණ්ඩලය භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා 2012.02.14 දින අමාත්‍යාංශය වෙත ලිපියක් යවා ඇත.

(v) මෙම ප්‍රවාහන දීමනාව ගෙවීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කර ඇත. එසේ වුවද, භාණ්ඩාගාරයේ අනුමැතියෙන් තොරව ගෙවන ලද ප්‍රවාහන දීමනාව වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා දීම නිර්දේශ කර නැත. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම් විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇති පරිදි මෙම දීමනාව ඉදිරියට ගෙවීම අනුමත කර ඇත. ආවරණ අනුමැතිය ගැන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අවශ්‍ය තීරණයක් ගනු ඇත.

(ආ) පැන නොනඟී.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා 2003 ජූනි 02 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයේ 9. (vii) වගන්තිය අනුව පැහැදිලිව මහා භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතියකින් තොරව මේ දීමනාව ගෙවන්න බැරි බව. ඒ නිසා අප මෙය කිව්වේ ඒ අයගෙන් අය කර ගන්න කටයුතු කරන්න කියලායි. මොකද මෙහෙම-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් මම පිළිතුර අහ ගන්න අවස්ථාව දුන්නා නේ. ඊට වැඩිය කාලය දෙන්න බැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

එක අතුරු ප්‍රශ්නයයි අහන්නේ ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් ගන්නා වූ පියවර මොකක්ද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. 2008න් පසුව මේ සඳහා අනුමැතිය ලැබී තිබෙනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මේ ආවරණ අනුමැතිය පිළිබඳ ප්‍රශ්නය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අපි සාකච්ඡා කරලා දෙකින් එක තීරණයක් ගනිමු. සමහර විට එයට සාධාරණ හේතු තිබෙනවා නම් ඒ සභාවට බලතල තිබෙනවා ඒ ආවරණ අනුමැතිය දීලා ඒ ප්‍රශ්නය නිරාකරණය කරන්න. එහෙම නැතිව, මේ ගැන යම් නිලධාරියකුගෙන් හෝ නිලධාරි මණ්ඩලයකින් එය අය කළ යුතුය කියලා සභාව හිතනවා නම් ඒකත් නිර්දේශ කරන්න පුළුවන්. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එම කාරක සභාවේ සාමාජිකයෙක් වශයෙන් ඉන්නවා. එහිදී අපි සාකච්ඡා කරලා තීරණයක් ගනිමු.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

බොහොම ස්තුතියි. මම ඊට වැඩිය අහන්නේ නැහැ ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 7-2883/'12-(3), ගරු මනුෂ නානායක්කාර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස තුනක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.
Question ordered to stand down.

ළමයින් දහම් පාසල් අධ්‍යාපනයට හුරු කරවීම : පියවර

அறநெறிப் பாடசாலைக் கல்வியைப் பழக்கப்படுத்தல் : நடவடிக்கை

ENCOURAGEMENT OF CHILDREN TOWARDS DHAMMA SCHOOL EDUCATION: STEPS TAKEN

3174/'12

13. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අනෝමා ගමගේ මහත්මිය වෙනුවට)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு (திருமதி அனோமா கமகே சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. (Mrs.) Anoma Gamage)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ඉරිදා දිනවල පස්වරු 1.00 දක්වා උපකාරක පන්ති නොපවත්වන ලෙස දැඩි නීති රීති පනවා තිබියදීත් එම කාල සීමාව තුළ දිවයිනේ නොයෙක් ස්ථානවල කුඩා හා මහා පරිමාණයේ උපකාරක පන්ති පැවැත්වීම හේතුවෙන් දහම් පාසල්වලට පැමිණෙන ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවෙමින් පවතින බවත්;

(ii) දහම් පාසල් දරුවන්ට නිකුත් කරනු ලබන පෙළ පොත් අවශ්‍ය ප්‍රමාණයට, කලට වේලාවට නොලැබෙන බවත්;

(iii) දහම් පාසල් අවසාන වසර විභාග පැවැත්වීමේ දිනයන් වෙනස් කිරීම දහම් පාසල් දරුවන්ගේ අධ්‍යාපනයට බලපාන බවත්;

(iv) දහම් පාසල් ගුරුවරුන් සඳහා ලබා දෙන නිල ඇඳුම් දීමනාව කලට වේලාවට නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දරුවන් තවදුරටත් දහම් පාසල් අධ්‍යාපනයට හුරු කරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) දහම් පාසල් පෙළ පොත් නිසි පරිදි ලබාදීමට පියවර ගන්නේද;

(iii) ඒ සඳහා ඇති බාධක කවරේද;

(iv) ගුරුවරුන්ගේ නිල ඇඳුම් දීමනාව කලට වේලාවට ලබාදීමට සහ අවසන් වසර විභාග පැවැත්වෙන දිනයන් වෙනස් කර සිසුන් අපහසුතාවයට පත්වීම වැළැක්වීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ஞாயிற்றுக்கிழமைகளில் பிற்பகல் 1.00 மணி வரை தனியார் போதனை வகுப்புக்களை நடாத்தவேண்டாமென கடும் சட்டங்கள் விதிக்கப்பட்டுள்ள நிலையில் அக்காலப்பகுதி யினுள் நாட்டின் பல்வேறு இடங்களிலும் சிறிய மற்றும் பாரியளவான தனியார் போதனை வகுப்புகள் நடாத்தப்படுவதன் காரணமாக அற நெறிப் பாடசாலைகளுக்கு வருகை தருகின்ற மாணவர்களின் எண்ணிக்கை குறைவடைந்து வருகின்றது என்பதையும்;

(ii) அறநெறிப் பாடசாலை மாணவர்களுக்கு வழங்கப்படுகின்ற பாடப் புத்தகங்கள் போதிய ளவில் உரிய நேரத்திற்குக் கிடைப்பதில்லை என்பதையும்

(iii) அறநெறிப் பாடசாலை இறுதி ஆண்டுப் பரீட்சையை நடத்தும் திகதிகளை மாற்றிய மைப்பதானது அறநெறிப் பாடசாலை மாணவர் களின் கல்வியில் பாதிப்பை ஏற்படுத்தும் என்பதையும்;

(iv) அறநெறிப் பாடசாலை ஆசிரியர்களுக்கு வழங்கப்படுகின்ற சீருடைக் கொடுப்பனவு உரிய நேரத்தில் கிடைப்பதில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) பிள்ளைகளுக்கு அறநெறிப் பாடசாலைக் கல்வியை பழக்கப்படுத்துவதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) அறநெறிப் பாடசாலை பாடப் புத்தகங்களை ஒழுங்காக பெற்றுக் கொடுக்க நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(iii) அதிலுள்ள தடைகள் யாவை என்பதையும்;

(iv) ஆசிரியர்களின் சீருடைக் கொடுப்பனவை உரிய நேரத்தில் பெற்றுக் கொடுப்பதற்கும், இறுதி ஆண்டுப் பரீட்சை நடைபெறுகின்ற திகதியை மாற்றியமைத்து சிறுவர்கள் அசௌகரியங்களை எதிர்கொள்வதைத் தடுப்பதற்கும் நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that -

(i) the number of students attending the Dhamma Schools is on the decline owing to small and large-scale tuition classes being conducted in various places in the Island on Sunday morning, despite stringent laws being imposed preventing tuition classes from being conducted till 1.00 p.m. on Sundays;

(ii) the textbooks meant for Dhamma School children do not reach them on time in required quantities;

(iii) the altering of the dates of the Dhamma School final examination hampers the education of the Dhamma School students; and

(iv) the uniform allowance paid to Dhamma School teachers is not made available to them on time?

(b) Will he state -

(i) as to what steps will be taken to encourage children to take to Dhamma School education;

(ii) whether, steps will be taken to provide the Dhamma School textbooks properly;

(iii) the obstacles that impede that; and

(iv) whether, steps will be taken to pay the uniform allowance of the teachers on time and prevent the students facing inconveniences by altering the dates of the Dhamma School final examination?

(c) If not, why ?

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඉරිදා දිනවල උදය වරුවේ උපකාරක පන්ති පැවැත්වීම සඳහා දැඩි නීති පනවා නැත. පළාත් සභා හා පළාත් සභා ආයතන මඟින් උපකාරක පන්ති පවත්වනු ලබන ආයතන දැනුවත් කර ඇත.

දහම් පාසල් සිසුන්ගේ පැමිණීමේ අඩුවක් වාර්තා වී නැත.

(ii) පෙළ පොත් බෙදා හැරීමේ කිසිදු ප්‍රමාදයක් නැත. සමහර අවස්ථාවල පමණක් පරිපාලනමය ගැටලු මතු වූ බව පිළිගනිමි.

(iii) දහම් පාසල් අවසාන වසර විභාග පැවැත්වීම කෙරෙනුයේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟිනි. අත්‍යවශ්‍ය කරුණක් ඇතොත් මිස දින වකවානු වෙනස්වීම් කරනු නොලැබේ.

(iv) දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් දීමනා ලබා දෙනු නොලැබේ.

(ආ) (i) දුරුවන් තවදුරටත් දහම් පාසල් අධ්‍යාපනයට නැඹුරු කරවීම සඳහා

01. දහම් පාසල් සංවර්ධනය වෙනුවෙන් ගොඩනැඟිලි, ඩෙස්ක්, පුටු හා උපකරණ ලබා ගැනීමට මූල්‍යාධාර ලබා දීම.

02. පෙළ පොත් ගුණාත්මක බවින් වැඩිදියුණු කිරීම.

03. ගුරුවරුන් සඳහා නිල ඇඳුම් ලබා දීම.

04. ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනා ලබා දීම.

05. විවිධ දැනුම වර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇගයීමට භාජනය කිරීම.

(සිසු නිපුණතා/ දහම් දැනුම වැඩසටහන්)

(ii) ඔව්. එය අමාත්‍යාංශයේ වගකීමකි.

(iii) බාධක නොමැත.

(iv) (අ) (iii) හා (අ) (iv) අදාළ වේ.

(ඇ) අදාළ නොවේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15-2465/'12-(1), ගරු රවි කරුණානායක මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම
பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குதல்
REPEAL OF PREVENTION OF TERRORISM ACT

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, එල්ටීටීඊ සංවිධානයේ ත්‍රස්තවාදී වැඩ කටයුතු මර්දනය කරලීම සඳහා 1978 වසරේදී එල්ටීටීඊය සහ වෙනත් එවැනි සංවිධාන තහනම් කිරීමේ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කළා. නමුත් මේ පනතේ අඩු පාඩු ගණනාවක් තිබුණු බව පෙනී ගිය හෙයින් ඒ වෙනුවට 1979 වසරේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සම්මත කෙරුණා. මෙහිදී අප පදනම් කර ගත්තේ එක්සත් රාජධානියේ උතුරු අයර්ලන්ත ත්‍රස්තවාදය සම්බන්ධව බ්‍රිතාන්‍යය සම්මත කර තිබූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතයි.

මේ පනත යටතේ උතුරේත්, දකුණේත් ත්‍රස්තවාදයට හා ත්‍රස්තවාදීන්ට එරෙහිව ක්‍රියා කළා. අත් අඩංගුවට ගැනීම් සිදු කළා.

දැන් උතුරේ යුද්ධය අවසානයි. ත්‍රස්තවාදය වළක්වා හමාරයි. එවන් පසු බිමක ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කරලීමේ අවශ්‍යතාවක් පැන නඟින්නේ නැහැ. එම නිසා මෙම පනත අහෝසි කළ යුතුව තිබුණා. ඒ ගැන කෙරුණු විමසීම්වලදී මේ පාර්ලිමේන්තුවේදීම ආණ්ඩුව අවස්ථා කිහිපයකදීම ප්‍රකාශ කළේ ඔවුන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාවට නංවන්නේ නැති බවයි.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

2011 සැප්තැම්බර් 11 වන දා සිදුවීමෙන් පසු ලෝකයේම අවධානය යොමු වී ඇත්තේ ජාත්‍යන්තර ත්‍රස්තවාදී ක්‍රියා පිළිබඳවයි. එවැනි ත්‍රස්තවාදී ක්‍රියා වැළැක්වීම උදෙසා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව කලින් තිබූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට වෙනත් පනතක් සම්මත කර ගත්තා. දේශපාලන කාර්යයන් මර්දනය කිරීමට එම පනතේ වගන්ති යොදා ගැනීම එම පනත මඟින්ම තහනම් කර තිබෙනවා. නමුත් දැන් ශ්‍රී ලංකාවේ ප්‍රතිවාදී දේශපාලන කණ්ඩායම් මර්දනය කිරීම සඳහා මෙම පනත යොදා ගැනෙමින් පවතිනවා. අසාද් සාලි මහතා අත් අඩංගුවට ගත්තේ මේ පනත යටතේයි. ඔහු දේශපාලනඥයෙක්. ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් දේශපාලන කාර්යන්ට සම්බන්ධ වී තිබෙනවා. 2010 ජනාධිපතිවරණය අවස්ථාවේදී ඔහු එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත්ව මහින්ද රාජපක්ෂ මහතාට සහාය ලබා දුන්නා. සාලි මහතා සිය දේශපාලන ජීවිතය තුළ කිසි අවස්ථාවක ත්‍රස්තවාදී සංවිධානයකට සම්බන්ධව කටයුතු කර නැහැ.

ඔහු අත් අඩංගුවට ගෙන ඇත්තේ ඔහු විසින් කළ ප්‍රකාශයක් පදනම් කර ගෙන බව පැවසෙනවා. දේශපාලනඥයන් විවිධ ප්‍රකාශ කරනවා. වගකීම් සහිතව මෙන්ම වගකීම් රහිතවද ප්‍රකාශ කරන අවස්ථා අප දැක තිබෙනවා. සාලි මහතා මේ ප්‍රකාශය කළේ ආණ්ඩුව මුස්ලිම් ජනතාවට සිදු වන හිරිහැර සම්බන්ධව කිසිදු ක්‍රියා මාර්ගයක් නොගන්නා අවස්ථාවකයි. ආණ්ඩුවේ මුස්ලිම් නායකයන් ඒ සම්බන්ධයෙන් නිහඬව සිටිනා අවස්ථාවකයි.

සාලි මහතා එවන් පසු බිමක ආවේගශීලීව කළ ප්‍රකාශයක වරදක් හෝ වගකීම් රහිත බවක් ඇති බවට චෝදනා ඇත්නම්, මුලින්ම කළ යුතුව තිබුණේ එවැනි ප්‍රකාශයක් ඔහු විසින් සැබැවින්ම කළා දැයි විමර්ශනය කිරීමයි. ඒ ගැන සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වන්නට ඕනෑ ගරු කථානායකතුමනි. එහෙම පරීක්ෂණයක් පවත්වලා තිබෙනවාද? ඒ විමර්ශන කටයුතුවලින් පසුව ඔහු වරදක් කර ඇති බව ඒත්තු යන්නේ නම් සාමාන්‍ය නීතිය යටතේ කටයුතු කිරීමයි කළ යුත්තේ.

මම හිතන හැටියට දණ්ඩ නීති සංග්‍රහය යටතේ මේ ගැන ඕනෑ තරම් පියවර ගන්න පුළුවන්, incitement and all that is there in the Penal Code. එසේ නොමැතිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඔහුව අත් අඩංගුවට ගැනීම අපට කිසිසේත් අනුමත කරන්න බැහැ.

Hon. Speaker, we all know that everyone makes these types of speeches. If anyone breaks the boundaries of free speech, both the civil law and the criminal law are available to take action against them. If someone says, "We are going to take arms to defend the sovereignty of the people", is that an offence? There is a school of thought that says you have a right to bear arms in defence of liberty. But, according to this, anyone who belongs to that school of thought has to be locked up under the PTA.

මේ නිසා ආණ්ඩුවේ ක්‍රියා කලාපය පිළිබඳව බරපතළ ප්‍රශ්න මතු වනවා. "ෆෂන් බග්" එකට පහර දුන් පුද්ගලයා එළියට දමා, ඒ ගැන දොස් කිව්ව අසාද් සාලි ඇතුළට දමනවා. මෙයින් අපට එළැඹෙන්නට පුළුවන් නිගමනය වන්නේ ආණ්ඩුව දේශපාලන ප්‍රතිවාදීන් මර්දනය කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පාවිච්චි කරන බවයි.

ඉදිරියටත් මේ තත්ත්වය මීටත් වඩා නරක මට්ටමින් සිදු වන්නට පුළුවන්. තමන්ට එරෙහිව රට පුරා නැහෙන ජන රැල්ල මර්දනය සඳහා ද මේ පනත පාවිච්චි කරන්නට ආණ්ඩුව කටයුතු කරාවි. ඒ අවස්ථාවේදී යම් කෙනකු ඉටි පන්දම් පත්තු කළත් මම හිතන්නේ PTA යටතේ ඒ පුද්ගලයාව අත් අඩංගුවට ගනීවි. ඒකාධිපති පාලනයක් කරා යොමු වීමේ ප්‍රවණතාව මේ මඟින් පැහැදිලිවම ප්‍රදර්ශනය වනවා. මෙය ඉතා භයානක තත්ත්වයක්.

ඒ නිසා මම ගරු අගමැතිතුමාගෙන් පහත දැක්වෙන කාරණා විමසන්නට කැමතියි. මොකද, 2010 පාර්ලිමේන්තු ඡන්දයේදී ගරු අගමැතිතුමනි, ඔබතුමාත් ත්‍රස්තවාදියකු එක්ක වැඩ කටයුතු කළා නේ? අසාද් සාලි මහතාත් එතැන සිටියා නේ?

1. අසාද් සාලි මහතා සම්බන්ධව සාමාන්‍ය නීතිය යටතේ කටයුතු නොකොට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ කටයුතු කළේ ඇයි?
2. තව දුරටත් ප්‍රතිවාදී දේශපාලනඥයන් හා ජනතා බලවේග මර්දනය සඳහා මේ පනත යොදා ගන්නවාද?
3. දැන් ත්‍රස්තවාදය අවසන් වී ඇති නිසා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරනවාද? නැත්නම් ඒ ඇයි?

ස්තුතියි.

ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ විපක්ෂ නායකතුමා මතු කළ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න මා කැමැතියි.

වසර 30කට ආසන්න කාලයක් ශ්‍රී ලංකාව එල්ටීටීඊ රුදුරු ත්‍රස්තවාදී තර්ජනයන්ට ලක්ව පැවති අතර, 2009 මැයි මස එම බිහිසුණු ත්‍රස්තවාදය මුලින් උපුටා දමා මෙම රටට නැවතත් සාමයේ අරුණලු උදා කොට උදාරවූත්, ස්ථිරවූත් සාමයක් සහ සෑම ජාතියකටම නිදහස් නිවහල් රටක් බිහි කර දීම සඳහා වන්මන් රජය ඇප කැපව ක්‍රියා කරන ලදී.

එල්ටීටීඊ ත්‍රස්තවාදය මෙරටින් තුරන් කිරීම සඳහා නොයෙකුත් රජයන් මෙම කාලය තුළ උත්සාහ ගන්නා ලද අතර මේ සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන නොයෙක් අයුරින් දායක කර ගන්නා ලදී. ගරු කථානායකතුමනි, මෙම රජය කිසිදු අවස්ථාවක ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි ප්‍රතිපාදන පටු දේශපාලන අභිලාෂයෙන් වෙනත් දේශපාලන පක්ෂයක් හෝ පුද්ගලයන් අරමුණු කොටගෙන යොදා නොගන්නා බව ඉතාම වගකීමෙන් දන්වනු කැමැත්තෙමි.

මම මතක් කරන්න කැමැතියි, පසු ගිය කාලයේ කලබල ඇති වුණු අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ -අපේ පක්ෂයේ- මන්ත්‍රීවරු සිර භාරයට ගත්ත බව.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කොහේදීද? දවල් හීනයක් දැකලාද?

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
1972 කලබල තිබුණු කාලයේ. [බාධා කිරීම්] අපේ ආණ්ඩුව, අපේ කාලයේ, අපේම මන්ත්‍රීවරුන් පවා සිරභාරයට ගත්තා. [බාධා

කිරීමක්] ඒ ගැන මෙතැන ඉන්න මන්ත්‍රීවරු හුඟ දෙනෙකු දන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ හදිසි නීතිය යටතේ. ගරු අග්‍රාමාත්‍යතුමා,-

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒකෙන් පෙනෙන්නේ කවුරු හරි වැරැද්දක් කරනවා නම්, නීති විරෝධී ක්‍රියාවක් කරනවා නම්, රාජ්‍ය විරෝධී ක්‍රියාවක් කරනවා නම් අපේ පක්ෂයේ වුණත්, ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙකු වුණත් ඒ ඕනෑම පුද්ගලයෙකු සිර භාරයට ගන්නා බවයි. එය ඉතිහාසයෙන් පෙන්නුම් කරලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු අගමැතිතුමා, -

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒක ඉතිහාසයේම පෙන්නුම් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] ඔබතුමා ඉතිහාසය දන්නේ නැත්නම් මට කරන්න දෙයක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒ කාල සීමාව ගැන කියවලා බලන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. තමුන්නාන්සේට උගන්වන්න ඕනෑ, ගරු අමාත්‍යවරයෙක් ප්‍රකාශයක් කරන කොට-

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මෙම රජය කිසිදු අවස්ථාවක ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි ප්‍රතිපාදන පටු දේශපාලන අභිලාෂයන් වෙනත් දේශපාලන පක්ෂයක් හෝ පුද්ගලයන් අරමුණු කරගෙන යොදා නොගන්නා බව ඉතා වග කීමෙන් නැවත වාරයක් දන්වනු කැමැත්තෙමි. ශ්‍රී ලංකාව තුළ පවතින දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව රජය ක්‍රියා කරන අතර, මෙම නීති උල්ලංඝනය කරනු ලබන අවස්ථාවලදී ඒ සඳහා ක්‍රියා කිරීම රජය සතු වගකීමකි. අසාද් සාලි මහතා සම්බන්ධ සිදුවීමේදී නොයෙකුත් පාර්ශ්ව විවිධ ආකාරයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ මෙම අත් අඩංගුවට ගැනීම යා කොට හුදු තර්ක මවමින් එමඟින් දේශපාලන වාසි ලබා ගැනීමට ක්‍රියා කිරීම ඉතාම කනගාටුවට කරුණකි. ගරු විපක්ෂ නායකතුමන් මේ සම්බන්ධයෙන් පෙනී සිටිනු ලබන්නේද පටු දේශපාලන වාසි සඳහා බව කියනු කැමැති අතර එතුමන් විසින් මෙම සභාවට ඉදිරිපත් කරනු ලැබූ කරුණු සඳහා මෙලෙස පිළිතුරු ලබා දෙනු කැමැත්තෙමි.

දැන් තිබෙන තත්ත්වය හැටියට විපක්ෂයත්, රජයට විරුද්ධ තවත් පුද්ගලයන් සහ පක්ෂත් බලාපොරොත්තු වෙනවා, ජාතික හැඟීම් වර්ධනය කරලා ඒ තුළින් නොයෙක් විධියේ අරගල රටේ ඇති කරන්න. මෙවැනි තත්ත්වයක් රටක ඇති කිරීම තුළින් කාටද පාඩු වෙන්නේ කියලා තමුන්නාන්සේලා කල්පනා කරලා බලන්න ඕනෑ. එහෙම තත්ත්වයක් ඇති වීම තමන්ගේ ජීවිතයටත් හානියක්. අද ලෝකයේම තත්ත්වය ගැන කල්පනා කරලා බැලුවොත් ලෝකය විෂම ලෝකයක් බවට පත් වෙලා තිබෙනවා. මනුෂ්‍යයන්ටත් වඩා යක්කුන්ගේ තත්ත්වයට ලෝකයේ රටවල් පත් වෙලා තිබෙනවා. අද ශ්‍රී ලංකාවට විරුද්ධව තිබෙන තත්ත්වය ගැන එක එක්කෙනා නොයෙක් විධියට තමන්ගේ මත ප්‍රකාශයට පත් කිරීම වෙනත් විධියකින් බැලුවොත් ආදී කාලයේ තිබුණු තත්ත්වය නැවත වාරයක් ඇති කිරීමක්. ලෝකයේ නැවත යටත් විජිතවාදයක් ඇති කරන්න උත්සාහ කරන තත්ත්වයක් තිබෙන බව අද ලෝකයේ හැම තැනම සිදුවන සිදුවීම් අරගෙන බැලුවාම පෙනෙනවා. රට ආරක්ෂා කර ගැනීම දේශපාලන පක්ෂයකට විතරක්වත්, දේශපාලන නායකයන්ට විතරක්වත් අයිති කාරණයක් නොවෙයි. එය මේ රටේ ජීවත්වන සියලු දෙනාටම - සියලුම පුද්ගයන්ට- අයිති කාරණයක්.

ඒ නිසා මෙන්න මේ ගැනත් අපි කල්පනා කර බලන්න ඕනෑ. හුඟක් වෙලාවට අද ජාතීන් වශයෙන්, මුස්ලිම් ජනතාව වශයෙන් ඉදිරිපත් කරන හුඟක් කරුණු ආණ්ඩුවට විරුද්ධවයි ඉදිරිපත් කරන්නේ. තමන්ගේ වාසියට නොයෙක් කරුණු ඉදිරිපත් කළත් ජාතික වශයෙන් හානියක් සිද්ධ වනවා කියලා දුරදිග කල්පනා නොකරන එක ගැන මා නම් කනගාටු වෙනවා. අපි කල්පනා කර බලන්න ඕනෑ වන්නේ මේ රට ආරක්ෂා කිරීම සම්බන්ධයි. මේ රජය නොවෙයි, තමුන්නාන්සේලාගේ රජයක් බලයට ආවත්, මේ රට ආරක්ෂා වෙන්න ඕනෑ. එහෙම නැත්නම් කොහොමද කටයුතු කරන්නේ? අපි රටක් වශයෙන් එකතුව ක්‍රියා කරන්න ඕනෑ. ඉන්දියාව හා පාකිස්තානය අතර අරගලයක් ඇති වුණු වෙලාවේ ඉන්දියාවේ සියලුම පක්ෂ කිව්වේ "We are Indians" කියලායි. ඒ අවස්ථාවේ සියලු දෙනාම එකතු වුණා. එකතු වෙලා ප්‍රකාශ ඉදිරිපත් කළා. මෙන්න මේ ගැන කල්පනා කර බලන්න කියලා විපක්ෂයේ අත්පුඩි ගසන අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

අසාද් සාලි මහතා සම්බන්ධව සාමාන්‍ය නීතිය යටතේ කටයුතු නොකොට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ කටයුතු කළේ ඇයි කියන එකයි අපේ ගරු විපක්ෂ නායකතුමා ඊළඟට අහන ප්‍රශ්නය. ජාතික සමඟි පෙරමුණේ මහලේකම් මොහොමඩ් සනූන් අසාද් සාලි මහතා විසින් විවිධ අවස්ථාවලදී විදහුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා කර ඇති ප්‍රකාශ මඟින් ජනවාර්ගික ගැටුම් ඇතිවිය හැකි ආකාරයේ සහ එවැනි හැඟීම් ඇතිව නැවත මෙරටෙහි සාමය නැතිව යාමේ තර්ජනයක් ඇතිවිය හැකි බවට බුද්ධි අංශ මඟින් ලබා දෙන ලද තොරතුරක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශනයක් ආරම්භ කරන ලදි. එම තොරතුරට අනුව, අසාද් සාලි මහතා විසින් ඉන්දියාවේ ප්‍රකාශයක් වන "ජූනියර් විකටන්" සඟරාව සඳහා මාධ්‍ය සාකච්ඡාවක් ලබා දී ඇති අතර, එය 2013.04.24 දින කලාපයේ පිටු අංක 24 සහ 25හි ප්‍රචාරය වී ඇත. "ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවට ආයුධ ගැනීම හැර වෙනත් මාර්ගයක් නොමැත" යනුවෙන් එහි සඳහන්ව ඇත.

ගරු කථානායකතුමනි, අද ලංකාවේ දිස්ත්‍රික්ක 25ම මුස්ලිම් ජනතාව ජීවත් වෙනවා. මුස්ලිම් ජනතාව ජීවත් වන්නේ නැති එකම දිස්ත්‍රික්කයක්වත් ලංකාවේ නැහැ. ලංකාවේ මුස්ලිම් ජනතාව එකොළොස්ලක්ෂ විසිඑක්දහස් හත්සියපහළොවක් ජීවත් වෙනවා. වැඩිම ජනතාවක් සිටින්නේ අම්පාර දිස්ත්‍රික්කයේ. එහි එක්ලක්ෂ අසූහතරදහස් පන්සිය පණස්පහක් ජීවත් වෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ එක්ලක්ෂ හැටඅටදහස් අටසියහැටතුනක් ජීවත් වෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ එක්ලක්ෂ පහළොස්දහස් නවසිය හතළිස්එකක් ජීවත් වෙනවා. මා මේ කිව්වේ වැඩිපුරම

[ගරු දි.මු. ජයරත්න මහතා]

ජීවත් වෙන දිස්ත්‍රික්ක. ඒ දිස්ත්‍රික්කවල කිසි කලබලයක් නැහැ. කිසිම ශබ්දයක් නැහැ. දැන් මහනුවර දිස්ත්‍රික්කය තුන්වැනි තැනට ඇවිල්ලා තිබෙනවා. එහෙම වුණා කියලා මුස්ලිම් ජනතාව, සිංහල ජනතාව සහ ද්‍රවිඩ ජනතාව අතර කිසිම භේදයක්වත්, වෛරයක්වත් නැහැ.

ඒ විතරක් නොවෙයි. මා බොහොම සන්තෝෂයෙන් කියන්න කැමැතියි, එක්සත් ජාතික පක්ෂයේ සභාපතිතුමාත් සහභාගී වුණු සෝමාවතිය පුදබිමේ පැවැති උත්සවය වෙලාවේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව එකතු වෙලා, ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආශීර්වාදය ලබා ගෙන සියලු ජාතීන්ට ඒකීයව ජීවත් වෙන්න වුවමනා කරන සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ලැබෙවා! කියා ප්‍රාර්ථනා කරනවා කියලා ලොකු බෝඩ් එකක් සකස් කර තිබීම සම්බන්ධව. ඒකට තමුන්නාන්සේලාගේ සභාපතිතුමා සාක්ෂි. එතුමාත් එතැන හිටියා. බලන්න, ජාතීන් වශයෙන් කොච්චර එකමුතුව ඔවුන් ක්‍රියා කරනවාද කියලා. සමහර වෙලාවට එක් එක් පුද්ගලයාට ඕනෑ ඕනෑ විධියට කථා කරන්න, ක්‍රියා කරන්න පුළුවන්. නමුත් ජාතියක් වශයෙන්, රටක් වශයෙන්, ආගමක් වශයෙන් භේද වෙන්න කථා කරන එකේයි වරද තිබෙන්නේ.

එසේම අන්තර්ජාලයේ වෙබ් අඩවියක් හරහා උක්ත සභරාව ලොව පුරා ප්‍රචාරය කිරීමට සලස්වා ඇත. ලෝකයේ මුස්ලිම් රටවල් 51ක් තිබෙනවා. ඒ රටවල් 51ට මේවා ගියාම ඒ ජනතාව කල්පනා කරනවා, ශ්‍රී ලංකා ද්වීපයේ මුස්ලිම් ජනතාවට සාධාරණ තැනක් නැතුවාවද්ද කියලා. අන්න ඒ ගැනයි අපි කල්පනා කළ යුතුව තිබෙන්නේ. ඒක ගැනයි අපි හිතන්න ඕනෑ.

දැන් අපට විශාල වශයෙන් ආධාර උපකාර කරන්නේ ලෝකයේ මුස්ලිම් රටවල්. ඒ අපිත් එක්ක මිත්‍රශීලී අය. එහෙම නම් අද අපි මුස්ලිම් ජනතාවට හිරිහැර කරනවා, කරදර කරනවා කියලා පෙන්නුම් කළොත් ඒ අය කොයි තරම් අමනාපයට පත් වෙයිද, ඒකෙන් අපේ මිත්‍රත්වය නැති වෙයිද කියලා අපි කල්පනා කර බලන්න ඕනෑ.

මෙම සභරාවේ පළ වී ඇති ප්‍රශ්නගත වාර්තාව කියවා එහි අනතුරුදායක තත්ත්වය පිළිබඳව මහජනතාව අතුරින්ද පැමිණිලි වාර්තා වී ඇති අතර, එයට අදාළ පැමිණිලි සටහන් කර ඇත. ඉහත තොරතුරු සම්බන්ධයෙන් විමර්ශනයේදී අනාවරණය වූ කරුණු මත හා ලද පැමිණිලි අනුව අසාද් සාලි මහතා විසින් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 120 වන වගන්තිය මඟින් විග්‍රහ කර ඇති වැරදි වන ලංකාණ්ඩුවට විරුද්ධත්වය දැක්වීමේ, හැඟීම් ඇවිස්සීම හෝ ඇවිස්සීමට තැත් කිරීම, වැසියන් අතර අසන්තෝෂය හෝ විරුද්ධත්වය ඇති කිරීමට හෝ පන්නි අතර සතුරු වූද, අසමගි වූද හැඟීම් වැඩිදියුණු කිරීමට තැත් කරන ආකාරයේ ප්‍රකාශ නිකුත් කිරීම යන වැරදි කිරීමේ වරදට එම වරද කියා දී 2013.05.02 දින පැය 07.00ට කොලොන්නාව, ගාමිණී පාර, සාලමුල්ල අංක 25 දරන ලිපිනයේ සැඟව සිටියදී අත් අඩංගුවට ගන්නා ලදී.

ගරු කථානායකතුමනි, අත් අඩංගුවට ගැනීමට පෙර කිහිප වතාවකදී වාචිකව හා ලිඛිතව අසාද් සාලි මහතා හට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කාර්යාලයට පැමිණෙන ලෙස දැනුම් දුන්නද, ඔහු එසේ නොපැමිණ ඉහත ලිපිනයේ සැඟවී සිටියදී අත් අඩංගුවට ගන්නා ලද බවත් ප්‍රකාශ කරනු කැමැති අතර වැඩි දුර පරීක්ෂණ පැවැත්වෙමින් පවතී.

තවදුරටත් ප්‍රතිවාදී දේශපාලනඥයන් හා ජනතා බලවේගයන් මර්දනය සඳහා මේ පනත යොදා ගන්නවාද කියන එකයි ගරු විපක්ෂ නායකතුමා අහන්නේ. මේ පනත දේශපාලනඥයන් වෙනුවෙනුත් යොදා ගෙන ඒ අයට හිරිහැර කරනවාද කියන එකයි එතුමා අහන්නේ.

ජාතික ආරක්ෂාවට, ජාතීන් අතර සාමයට තර්ජනයක් වන, ත්‍රස්තවාදී කටයුතුවලට සෘජුව හෝ වක්‍රව අනුබල දෙන, ජාතිවාදී ක්‍රියාවන් සඳහා පොළඹවන හෝ සම්බන්ධ පුද්ගලයින් සහ සංවිධාන සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන යටතේ කටයුතු කිරීම රජයේ වගකීම බව ප්‍රකාශ කරනු කැමැත්තෙමි. තවද මෙවන් ක්‍රියාවන් සඳහා සහභාගී වන පුද්ගලයන් ඔවුන්ගේ තරාතිරම නොබලා කටයුතු කිරීම ද රජයේ වගකීම වන අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ මෙවන් ක්‍රියාවන් සඳහා පමණක් යොදවන බැව් නැවත අවධාරණය කරනු කැමැත්තෙමි. ත්‍රස්තවාදයට සම්බන්ධ කටයුතුවලදී පමණයි මෙම පනත ක්‍රියාත්මක කරන්නේ. ඒක නිසායි මම පසු ගිය කාලයේ සිද්ධියක් නිදර්ශනයක් හැටියට කිව්වේ.

ගරු විපක්ෂ නායකතුමා කියන්නේ මෙහෙමයි. "සැප්තැම්බර් 11 සිදුවීමෙන් පසු ලෝකයේම අවධානය යොමු වී ඇත්තේ ජාත්‍යන්තර ත්‍රස්තවාදී ක්‍රියාවන් පිළිබඳවයි. එවන් ත්‍රස්තවාදී ක්‍රියාවන් වැළැක්වීම උදෙසා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව කලින් තිබූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට වෙනත් පනතක් සම්මත කර ගත්තා" කියා. එහෙම සම්මත කර ගෙන කලින් පනත බල රහිත කළාය කියලායි විපක්ෂ නායකතුමා කියන්නේ. එංගලන්තයේ එහෙම කළා. ඒ විධියට ලංකාවේත් කරන්න කියන එකයි එතුමාගේ කථාවෙන් කියන්නේ. නමුත් ඔබතුමා ඒ කථාවේ එහෙම කිව්වාට මොකද, 1979 දී සම්මත කළ පනත 1998 දී නැවත වරක් සංශෝධනය කළා. ඒක තවදුරටත් බල සහිත කළා. එංගලන්තයේ ඒ විධියට කළාට එංගලන්තය අයර්ලන්තයත් එක්ක තිබුණ ආරවුල් ඉවර වෙලා දැන් ඒ රටවල් දෙකම සාධාරණ ලෙස ජීවත් වෙනවා; ක්‍රියා කරනවා. පසු ගිය සති දෙකකට උඩ දී රැජිනිය පවා අයර්ලන්තයට ගියා. එතකොට ඒ ගොල්ලන් ඒක සාධාරණව පිළිගත්තා. ඒකෙන් පෙනෙනවා ඒ රටේ ජනතාව කිසිම කරදරයක් හිරිහැරයක් නැතිව ජීවත් වෙනවා කියලා. නමුත් ශ්‍රී ලංකාවේ එබඳු තත්ත්වයක් තවම නැහැ. ශ්‍රී ලංකාව තුළ එවැනි තත්ත්වයක් නැහැ වාගේම විදේශ රටවලිනුත් ශ්‍රී ලංකාවට මේ විධියේ තර්ජනයක්, ගර්ජනයක් ඇති වෙලා තිබෙන බව පෙනෙනවා.

එල්ටීටීඊ ත්‍රස්තවාදය යුද්මය වශයෙන් පරාජය කළද එහි නොයෙකුත් අඳුරු සෙවණැලි විවිධ අවස්ථාවල ඇති වෙමින්, මතු වෙමින් පවතින අතර මෙම ක්‍රියාකාරකම් සඳහා තවදුරටත් ඉහත පනතේ ප්‍රතිපාදන අවශ්‍ය බැව් මෙම සභාවේදී නොයෙකුත් අවස්ථාවල පෙන්වා දී ඇත. මෙම පනත ප්‍රධාන වශයෙන් ත්‍රස්තවාදීන් විසින් සඟවා ඇති අවි ආයුධ, වෙඩි බෙහෙත් සොයා ගැනීම සඳහා ද, පුනරුත්ථාපනය නොවී සැඟවී සිටින එල්ටීටීඊ සාමාජිකයන් පිළිබඳ පරීක්ෂණ කටයුතු ඉටු කරලීමට මෙන්ම මතු විය හැකි ජාතික හා ජාත්‍යන්තර එල්ටීටීඊ ක්‍රියාකාරකම් මැඩලීම සඳහා ද අත්‍යවශ්‍ය වේ.

2012 මාර්තු මස 17වන දින ත්‍රිකුණාමලය ප්‍රදේශයේදී ඉන්දියාවේ සිට පැමිණි එල්ටීටීඊ සාමාජිකයන් විසින් දෙමළ දේශපාලන පක්ෂ සාමාජිකයකු ඝාතනය කිරීම සහ 2012 දෙසැම්බර් මස 20වන දින දකුණු ඉන්දියාවේදී ලංකාවේ දෙමළ තරුණයන් සඳහා පුහුණුව ලබා දුන් එල්ටීටීඊ සාමාජිකයන් හතරදෙනකු අත් අඩංගුවට ගැනීම මෙවැනි අඳුරු සෙවණැලි මතුවූ අවස්ථා ලෙස ගෙන හැර දැක්විය හැකිය.

ගරු කථානායකතුමනි, ඒ අනුව ත්‍රස්තවාදය අවසන්ව ඇති බැවින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන මෙන් ගරු විපක්ෂ නායකතුමන් කරනු ලබන ඉල්ලීම ඉටු කිරීම අපහසු බව තවදුරටත් මෙයින් දන්වා සිටිමි.

ස්තුතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු අගමැතිතුමනි, අසාද්සාලි මැතිතුමා අයිති ත්‍රස්තවාදී සංවිධානයේ නම මට කියනවාද? ඔහු අල්කයිඩා හෝ කුමක් හෝ එකකට අයිති වන්න ඕනෑ නේ.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)
ඔබතුමා ඒ ගැන විමර්ශනය කරන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සොයා බලන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
සොයා බලන්න කියලා කියන්නේ, තමුන්නාන්සේලා මේ වන විට ඒ ගැන දැන ගෙන සිටියේ නැහැ කියන එකයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කුමක් පිළිබඳවද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Mike එක දාලා නැහැ. Mike එක දැම්මාම කියන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මට ඇහෙනවා. Point of Order එක මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් mike එක දාපු නිසා කියන්නම්. ගරු කථානායකතුමනි, මා අහන්න කැමැතියි, ඊළඟට රවුල් හකීම් ඇමතිතුමාද අසාද්සාලි මහත්මයා- [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක point of Order එකක් නොවෙයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Sir, that is not a point of Order..

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. හා. 1.00 සිට අ. හා. 7.30 දක්වා විය යුතු ය. අ. හා. 7.30 ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වරප්‍රසාද යෝජනා
சிறப்புரிமைப் பிரேரணைகள்
PRIVILEGE MOTIONS

I

2013 මාර්තු 10 දින "සිළුමිණ" වාර්තාව
2013 மார்ச் 10 ஆந் திகதிய "சிலுமின" அறிக்கை
"SILUMINA" REPORT OF 10TH MARCH 2013

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2013 මාර්තු මස 20 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග අංක 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

හිරිහැරයට සහ අගෞරවයට ලක් කිරීම
தொந்தரவு மற்றும் அச்சுறுத்தல்
HARASSMENT AND INTIMIDATION

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුජීව සේනසිංහ මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2013 මාර්තු මස 20 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග අංක 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

මෛත්‍රීපාල සිරිසේන ලක්දරු දිරිය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
மைத்திரிபால சிறிசேன லக்தரு திரிய மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
MAITHRIPALA SIRISENA LAKDARU DIRIYA FOUNDATION (INCORPORATION) BILL

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මෛත්‍රීපාල සිරිසේන ලක්දරු දිරිය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெருமa)
(The Hon. J.R.P. Sooriyapperuma)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම් සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services for report.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍ය ගරු ඩිලාන් පෙරේරා මහතා කෙරෙහි විශ්වාස භංගත්වය පිළිබඳ යෝජනාව.

යෝජනාව ඉදිරිපත් කිරීම ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාවරයා කෙරෙහි විශ්වාස භංගත්වය
வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர் அவர்கள்மீது நம்பிக்கையின்மை
VOTE OF NO CONFIDENCE ON MINISTER OF FOREIGN EMPLOYMENT PROMOTION AND WELFARE

[අ.භා. 2.36]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා
ගරු ඒ. ඩී. වම්පික ප්‍රේමදාස මහතා
ගරු අනෝමා ගමගේ මහත්මිය
ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,- විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍ය ගරු ඩිලාන් පෙරේරා මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,-

බාල වයස්කාර ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක වූ රිසානා නෆීක් ඇය කිසිසේත් වගකිව යුතු නොවූ අපරාධයක් සම්බන්ධයෙන් ලඝු විනිශ්චයකින් පසු මරණීය දණ්ඩනයට යටත් කරන ලද බව මේ වන විට සියලු දෙනා දන්නා කරුණක් වන හෙයින්ද;

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩිලාන් පෙරේරා මහතාගේ විෂය පථය යටතේ එන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මුළුමනින්ම රිසානා නෆීක් හට කිසිදු ආකාරයක අර්ථාන්විත සහයක් ලබාදීමට අපොහොසත් වූඅතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඇයට අකාලයේ අවසානවන්ත ලෙස මිය යාමට සිදු වූ බව සියලු දෙනා දන්නා කරුණක් වන හෙයින්ද;

අමාත්‍යවරයා මෙම කරුණ මුළුමනින්ම සාවද්‍ය ලෙස කළමනාකරණය කරමින්, මෙහි දෝෂය සැබෑ ලෙසම එතුමා විසින් සෘජුවම දැරිය යුතු අවස්ථාවක හුදෙක් සෞදි අරාබි රජයට දොස් පැවරීමේ නිරර්ථක වෑයමක යෙදෙමින් ප්‍රකාශ නිකුත් කිරීමට පමණක් සීමා වී සිටි බව පැහැදිලි කරුණක් වන හෙයින්ද;

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩිලාන් පෙරේරා මහතාට තවදුරටත් විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය පිළිබඳව බලන කොට මූලිකවම නිරාකරණය කර ගැනීමට අවශ්‍ය කාරණය තමයි රිසානා නෆීක් දඬුවමකට යටත් වීමට තරම් වරදක් සිදු කළේද යන කාරණය. රිසානා නෆීක් ළා බාල වයස්කාරියක් කියන කාරණය පිළිබඳව වාදයක් නැහැ. ඇයගේ උප්පැන්න සහතිකය වෙනස් කරලා කූට ලෙස විදේශ ගමන් බලපත්‍රයක් හදලා ඇයව විදේශගත කළාය කියන කාරණයටත් වාදයක් නැහැ. ඒ වාගේම 2005.05.04 වැනිදා සෞදි අරාබියේ රැකියාවට ගිය ඇය සති තුනක තරම් කෙටි කාලයක් ඇතුළත 2005.05.22 වැනිදා මෙම අවාසනාවන්ත සිද්ධියට මුහුණ දුන්නාය කියන කාරණය ගැනත් කිසිම සැකයක් නැහැ.

දැන් ගැටලුව විධියට තිබෙන්නේ මෙයයි. රිසානා නෆීක් ගෘහ සේවිකාවක් ලෙස කටයුතු කිරීමේ තනතුර සඳහා ගියත්, ඇයට භාර දී තිබුණේ ළා බාල අත දරුවෙකු බලා කියා ගැනීමේ ඉතාම බරපතළ, පුරුදු පුහුණු තැනැත්තෙකු විසින් පමණක් කළ යුතු රාජකාරියක්. ගරු කථානායකතුමනි, රිසානා වරදක් කළා නම්; ඇය විසින් එම දරුවා මරා දැම්මා නම් ඒ පිළිබඳව තිබෙන්නට ඕනෑ ප්‍රධානතම සාක්ෂිය තමයි පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව. සෞදි අරාබියේ වුණත්, ලංකාවේ වුණත්, ඇමෙරිකාවේ වුණත්, එංගලන්තයේ වුණත්, ඉන්දියාවේ වුණත් යම් පුද්ගලයෙක් හදිසියේ මිය ගියා නම්, ඒ පුද්ගලයාගේ මරණය අපරාධයක් හා සම්බන්ධව සැක කරනවා නම් එම විෂය පිළිබඳව පරිණතභාවය තිබෙන අධිකරණ වෛද්‍යවරයෙකු විසින් එම මළ සිරුර පරීක්ෂාවට ලක් කරලා මරණයට හේතු වුණේ වෙඩි වැදීමක්ද, බෝම්බ පිපිරීමක්ද, පහර දීමක්ද, ගෙල සිර කිරීමක්ද, වස විස දීමක්ද යනාදී වශයෙන් මරණයට හේතු වූ කරුණ වෛද්‍ය විද්‍යාත්මකව නිගමනය කිරීම සිද්ධ වෙනවා. ගරු කථානායකතුමනි, සෞදි අරාබියේ පශ්චාත් මරණ පරීක්ෂණ කෙරෙන්නේ නැහැයි කියලා වැරදි මතයක් තිබෙනවා. ඒ මතය සත්‍යයක් නොවෙයි. අපරාධ හා සම්බන්ධ මරණයක් නම් සෞදි අරාබියේත් පශ්චාත් මරණ පරීක්ෂණ සිද්ධ වෙනවා.

රිසානා නෆීක් හා සම්බන්ධ නඩුවේ මුල් නඩු විභාගයේදීවත්, ඉන් පසුවදීවත් කිසිම අවස්ථාවක එම දරුවාව යම් අයුතු ආකාරයකින් තුවාල කොට, ගෙල සිර කොට හෝ වෙනත් ක්‍රමයකින් මරා දැමුවා කියලා කිසිම සාක්ෂියක්, වෛද්‍ය විද්‍යානුකූල සාක්ෂියක් තිබුණේ නැහැ. ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි මෙම ඊනියා වරද -ඇත්ත වශයෙන්ම සිදු නොකළ වරද- පිළිබඳව අදාළ පාපෝච්චාරණය පදනම් කරගෙනයි ඇයට එම චෝදනාව ඉදිරිපත් කළේ.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
ඔබතුමා සෞදි අරාබියට ගිහින් නඩුව කථා කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එම පාපෝච්චාරණය ලබා ගත්තේ ඇයට පහර දීලා, තර්ජනය කරලා, ඒ වාගේම බලහත්කාරකම් කරලා කියන කාරණය කවුරුත් පිළිගත් දෙයක්. ලංකාවේදී ඇය දැනගෙන හිටපු එකම භාෂාව ද්‍රවිඩ භාෂාව. අරාබියේදී සති තුනක් ඇතුළත අරාබි භාෂාව ඉගෙන ගන්න තරම් වේලාවක් ඇයට තිබුණේ නැහැ. ඒ නිසා නිසි භාෂා පරිවර්තකයෙකුගේ සහායක් නැතුව තේරුම් ගැනීමට නොහැකි භාෂාවකින්, ඒ වාගේම නොකළ වරදක් පිළිබඳව ඇගේ පාපොච්චාරණයක් වාර්තා කරලා තිබෙනවා.

ඒ නිසා මේ කරුණුත්, විශේෂයෙන්ම මේ දැරිය බාල වයස්කාර දැරියක් කියන කාරණයත් අදාළ මුල් නඩු විභාගයේදී වාගේම අභියාචනයේදීත් ඉදිරිපත් කළා නම් සවුදි අරාබියත් අත්සන් කර තිබෙන ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ විධිවිධාන ප්‍රකාරවත්, ඒ වාගේම ෂරියා නීතිය තුළ තිබෙන සාධාරණ මූල ධර්මයන් අනුවත් ඇයව නිදහස් කර ගන්න තිබුණා, ගරු කථානායකතුමනි. ෂරි-ආ නීතිය කියලා කියන්නේ බොහෝ දෙනා කියන ආකාරයට මුළුමනින්ම අශීලාචාර නීතියක් නොවෙයි. ෂරි-ආ නීතිය කියලා කියන්නේ වසර දහස් ගණනක් ලෝකයේ තිබුණු, ඒ වාගේම නිසි සාක්ෂි තිබෙන අවස්ථාවලදී පමණක් පුද්ගලයෙකු වරදකරු කළ යුතුයි කියා පිළිගන්නා වැදගත් ආගමික නීතියක්. මෙතැන ප්‍රශ්නය වුණේ රිසානා නෆීක් අතින් මේ දරුවා මිය ගියේ නැත; මේ දරුවාව ඝාතනය කිරීමක් සිදු කළේ නැත; මේ පාපෝච්චාරණය නීති විරෝධී, සාක්ෂි වශයෙන් යොදා ගැනීමට බැරි පාපෝච්චාරණයක්ය කියන කාරණය ගැන අදහස් දක්වන්නට ඇයට අවස්ථාවක් නොතිබීමයි. අපේ රටේ පුරවැසියෙකු අත් අඩංගුවට ගත්තාම ඒ අත් අඩංගුවට ගත්ත පුරවැසියාගේ අයිතිවාසිකම් පිළිබඳව සොයා බලන්නට ආයතන දෙකක් තිබෙනවා. එකක් තමයි, අපේ නානාපති කාර්යාලය. අනික තමයි ඒ රටේ තිබෙන විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නියෝජිත කාර්යාලය. හැබැයි මුල් නඩු විභාගයේ දී ඇයට අපේ නානාපති කාර්යාලයේ සහාය හෝ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ගේ සහාය ලැබුණේ නැහැ. ඒ වාගේම අභියාචනයේ දී පවා රිසානා නෆීක්ගේ නිදහස වෙනුවෙන් කළ යුතුව තිබුණේ ඇය වෙනුවෙන් නැවත නඩු විභාගයක් ලබා ගැනීමයි. ඒ වාගේම ඇය සම්පූර්ණ නිර්දෝෂියි කියන පදනම මත තර්ක කෙරුණේ නැහැ. ඒ වෙනුවට වරදකාරිත්වය පිළි අරගෙන හුදු සමාවක් ලබා ගැනීම කියන ඉතාම සරල තර්කයට ගියා.

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. නඩුවක දී අපි තෝරා ගන්නා චිත්තිවාචකය අනුව අභිංසක පුද්ගලයෙකු පවා වරදකරුවෙක් බවට තහවුරු වන්නට පුළුවන්. අපේ රට වෙනුවෙන් දුක් විඳින, අපේ රටේ පවුල් ජීවත් කරවන්න විශේෂයෙන්ම මැද පෙරදිග, ඉතාලියේ, ජපානයේ, යුරෝපයේ දුක් විඳින ලක්ෂ සංඛ්‍යාත අපේ රටේ පුරවැසියන් වෙනුවෙන්, අපේ සහෝදර සහෝදරියන් වෙනුවෙන් අවශ්‍ය යුතුකම ඉටු කරන්නට ශ්‍රී ලංකාවේ රජයට හැකියාවක් ලැබුණේ නැහැ. ගරු කථානායකතුමනි, අවුරුදු හතක කාලයක් රිසානා සිරගත වෙලා හිටියා. මම පිළිගන්නවා, ඒ කාලය තුළ මේ විෂයය පිළිබඳ ඇමතිවරුන් මාරු වුණු බව. විෂයය භාර අමාත්‍ය ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා කියන්නේ "ඇයි මට විතරක් මේ දුක, ඇයි මට විතරක් මේ වගකීම බාර දෙන්නේ, තවත් අය මේකට වග කිව යුතුයි නේද?" කියලායි. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මම මේ කාරණය පිළිගන්නවා. නමුත් කලින් හිටපු ඇමතිවරුන්ට විරුද්ධව මේ ගරු සභාවට විශ්වාස භංග යෝජනා අරගෙන එන සම්ප්‍රදායක් නැහැ. වර්තමානයේ එම ධුරය දරන අමාත්‍යවරයාට විරුද්ධව ඒ විශ්වාස භංගය අරගෙන එන්නේ ඒ නිසායි. ඒ වාගේම වසර දෙකකට ආසන්න කාලයක් -රිසානා මිය යන්න කලින් කාලය තුළ- මේ ධුරය දැරුවේ වර්තමාන අමාත්‍යතුමායි. ඒ නිසා එතුමාට ඒ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. නමුත් මා ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගන්නවා, එතුමා විතරක් නොවෙයි මෙයට වග කිව යුතු වන්නේ කියන කාරණය. තවත් වග කිව යුතු අය ඉන්නවා. ඒ අය කවුද කියලා කියන එක එතුමාගේ වගකීමක්. මම ඒ ගැන කියන්නේ නැහැ.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු කථානායකතුමනි, විෂයය භාර ඇමතිතුමා රිසානා නෆීක්ගේ ජීවිතය ගැන, ඇයව මුදා ගැනීම ගැන දක්වපු අවම සැලකිල්ල එක්තරා සිද්ධියකින් මේ ගෞරවණීය සභාවට සනාථ වුණා. 2013 ජනවාරි මාසයේ 09 වැනිදා උදෑසන ඇයව මරා දමා තිබීම පිළිබඳව මේ පාර්ලිමේන්තුව තුළදී පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයෙකු විසින් ප්‍රශ්න කරන විටවත් එතුමා දැනගෙන හිටියේ නැහැ, රිසානා නෆීක් මරා දමා තිබූ බව. එතුමා කියා සිටියේ ඇයව බේරා ගැනීමට කටයුතු කරනවාය කියන කාරණයයි. ගරු කථානායකතුමනි, මරා දැමූ රිසානා බේරා ගන්නවාය කියන එකෙන් පෙන්නුම් කරන්නේ ඇය ගැන කිසිම අවධානයකින් නොසිටියාය කියන එකයි. කරන්නම දෙයක් තිබුණේ නැත්නම්, ඒ පිළිබඳව කරන්න තිබෙන සියලු දේ කරලා ඉවර නම්, අහවල් දවසේ ඇයව මරන්න යනවා, නැත්නම් මැරීමට තිබෙනවා කියන කාරණය මත උපරිම පීඩනයක්, අවසාන පීඩනයක් යොදන්නට තිබුණා. නමුත් ඒ කිසිවක් නොකර ඒ සිදුවීම ගැන නොතකා "රිසානා ගැන අපිට කළ හැකි යමක් නැහැ, ඇය මැරුණාට කමක් නැහැ" කියන ස්ථාවරයේ තමයි හිටියේ. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. පාර්ලිමේන්තුව තුළ කරපු වගකීම් විරහිත ප්‍රකාශයෙන් එක අතකින් පෙනෙනවා, විෂයය භාර ඇමතිවරයාගේ තිබුණු නොසැලකිල්ල.

අනික් අතට පෙනෙනවා, රිසානා නෆීක් ගැන විතරක් නොවෙයි, මේ රට වෙනුවෙන් දුක් විඳින, යුද්ධය පැවති කාලයේ යුද්ධය පවත්වා ගෙන යාමට අවශ්‍ය කරන විදේශ විනිමය අපට උපයා දුන්, මේ තරමින් හරි මේ රටේ ආර්ථිකය පවත්වා ගෙන යන්න ශක්තිය දෙන, මිලියන ගණනක් තරම් වන විදේශගත ශ්‍රමිකයන් පිළිබඳව රජය තුළ ඇති නොසැලකිලිමත් ආකල්පය.

ගරු කථානායකතුමනි, විදේශගත ශ්‍රමිකයන් අතරින් සියයට 49.14ක්ම කාන්තාවනුයි. ඒ කාන්තාවන් අතරිනුත් සියයට 86ක් ගෘහ සේවිකාවන්. ඒ වාගේම මේ අතිවිශාල ගෘහ සේවිකාවන් ප්‍රමාණය විදේශගත වීම නිසා අපේ රටේ පවුල් ඒකකවලට වන හානියක්, ඒ වාගේම අපේ රටේ කාන්තාවන්ගේ ආත්ම ගෞරවයට ඇති වෙලා තිබෙන බරපතළ ප්‍රශ්නයත් පිළිබඳව මේ සභාවේ සාකච්ඡා කර තිබෙනවා. අපි මේ ගැන සාකච්ඡා කළත් විදේශගත ශ්‍රමිකයන් අතරින් නුපුහුණු, ඒ වාගේම ගෘහ සේවිකාවන් වශයෙන් පිට රට ගිහින් අපේ රටේ ගරුත්වය, ආත්ම ගරුත්වය අභියෝගයට ලක් කරන්න අවස්ථාව සලසා දෙන්නේ ඒ අයට අපේ රට තුළ සුදුසු රැකියාවක් කරන්න පරිසරයක් සකස් කර නැති නිසායි. එක අතකින් රජයට ඒ ගැනත් වගකීමක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, 2011 වසරේදී විදේශගත ශ්‍රමිකයන් පිළිබඳ පැමිණිලි 9,637ක් ලැබී තිබෙනවා. එයින් පැමිණිලි 4,635ක්ම සවුදි අරාබියෙන් තමයි ලැබී තිබෙන්නේ. ඒක විශාල ප්‍රතිශතයක්. ඒ ප්‍රමාණය සියයට පනහකටත් වඩා වැඩියි. ඒ අනුව මුළු ලෝකයෙන්ම ලැබෙන පැමිණිලිවලින් සියයට පනහකට වඩා ලැබෙන්නේ සවුදි අරාබියෙනුයි. මේක ඉතාම බරපතළ ප්‍රශ්නයක්. සවුදි අරාබිය තුළ අපේ ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව ගැන, රැකවරණය ගැන ඉතා ගැඹුරු අර්බුදයක් තිබෙන බව ඒකෙන් පෙන්නුම් කරනවා. ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, රිසානා නෆීක්ට මුල් නඩු විභාගයේදී කිසිම ආධාරයක් ලැබුණේ නැහැ. ඇයට මරණීය දඬුවම නියම වුණා. එවිට මාධ්‍යවල අවධානය යොමු වුණා. ඒ අවස්ථාවේදී ආසියානු මානව හිමිකම් කොමිසම මේ කාරණයට මැදිහත් වෙලා ඇය වෙනුවෙන් අභියාචනයක් කරන්න කටයුතු කළා. ඒ අභියාචනය කරන්න විශාල මුදලක් අවශ්‍ය වුණාම විදේශ රැකියා නියුක්ති කාර්යාංශයෙන් ආධාර ඉල්ලුවා. මුල් අවස්ථාවේ ස්ථාවරය වුණේ අපරාධ නඩුවලට මුහුණ දීලා ඉන්න අය වෙනුවෙන් උදව් කරන්නේ නැහැ කියන එකයි. නමුත් මේ ප්‍රශ්නයේ බරපතළකම නිසා පසුව මුදල් ලබා දෙන්න එකඟ වුණා. හැබැයි අභියාචනය කරන්නට නියමිත අවසාන දිනයේදී මුදල් ලබා දෙන්න බැරි වුණා. ආසියානු මානව හිමිකම් කොමිසම පසුව මුදල් ලැබෙච්ච කියන පදනම මතයි අභියාචනය කළේ. එතැනිනුත් පෙනෙනවා -පසුව මුදල් ලබා දුන් බව මා දන්නවා- කොච්චර හෙමින්ද කටයුතු කළේ, කොච්චර නොසැලකිල්ලෙන්ද කටයුතු කළේ කියන එක. ඒ වාගේම සුදුසු සහාය ලබා දෙන්නට අසමත් වුණු බවත් පෙනෙනවා.

විෂය භාර ගරු ඇමතිතුමා කියන්නේ, "සවුදි අරාබියේ රජතුමාටවත් බැරි දෙයක් මම කරන්නේ කොහොමද" කියායි. ඇත්තෙන්ම ඒක හොඳ තර්කයක්. සවුදි අරාබියේ රජතුමාටවත් බැරි වෙච්ච දෙයක් කොහොමද ඩිලාන් පෙරේරා ඇමතිතුමා කරන්නේ? ගරු කථානායකතුමනි, ඉන්දුනීසියාවේ කාන්තාවක් මේ විධියේම අවාසනාවන්ත ඉරණමකට මුහුණ දුන්නා. ඇයගේ නම මාසන් ඩාසන් නූරියා. ඒ කාන්තාවගේ වයස අවුරුදු 41යි. මාස හතරක් වයස මිෂාරි අල් බුෂාල් නමැති කුඩා දරුවාගේ මරණය ගැන 2010 ජූනි මාසයේදී ඇයට මරණීය දඬුවම නියම වුණා. ඇයට චෝදනා කර තිබුණේ ආහාරවලට වස මිශ්‍ර කරලා ඒ කුඩා දරුවා මැරුවා කියලායි. ඒ වෙලාවේ ඇයගේ නිදහස වෙනුවෙන් ගත්ත පියවර කුමක්ද?

The court in Dammam ruled that three medical reports did not prove the baby was poisoned and his death may have been due to a genetic condition.

ඩාසන් නූරියා කියන කාන්තාවගේ නඩුවේදී පෙන්වා දුන්නා, අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව එම දරුවාගේ මරණයට හේතුව වස ශරීරගත වීමක් නොවෙයි කියන කාරණය. කවුරු හරි කියනවා නම් සවුදි අරාබියේ තිබෙන ඉස්ලාමීය නීතිය අනුව කිසිසේත් මරණ පරීක්ෂණ පවත්වන්නේ නැහැ කියා ඒ තර්කය මේකෙන් බිඳ වැටෙනවා. ඒ සිද්ධිය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් කෙරිලා තිබුණා. එපමණක් නොවෙයි. ඒ සිද්ධියේදීත් පාපෝච්චාරණයක් කර තිබුණා. ඒ පාපෝච්චාරණයේදී ඇය සවුදි පොලීසිය ඉදිරියේ පිළිගෙන තිබුණා, ඒ දරුවාට වස දී මැරුවාය කියා. [බාධා කිරීමක්] ලංකාවේ පොලීසි පාපෝච්චාරණ ලබා ගන්නා හැටි අපි දන්නවා, ගරු කථානායකතුමනි. කොයි රටෙත් පොලීසි ඔහොම තමයි. සවුදි අරාබියේ පොලීසියේ තත්ත්වය අපේ පොලීසියේ තත්ත්වයටත් වඩා බොහොම බරපතළ බවයි පෙනෙන්නේ. ඉන්දුනීසියානු කාන්තාව කර තිබුණු පාපෝච්චාරණයෙන් අධිකරණ වෛද්‍ය වාර්තාවේ තිබුණු කරුණු තහවුරු නොවෙච්ච නිසා, කොටින්ම කියනවා නම් පාපෝච්චාරණයයි අධිකරණ වෛද්‍ය වාර්තාවයි පරස්පර වෙච්ච නිසා ඇයට නිදහස ලැබුණා.

ගරු කථානායකතුමනි, මා විශේෂයෙන්ම මේ කාරණය කියන්නට කැමැතියි. එම නඩුවේදීත්, එම දරුවාගේ දෙමව්පියෝ සමාව දෙන්නට කැමැති වුණේ නැහැ. එම නඩුවේදීත් එම දරුවාගේ දෙමව්පියෝ මරණ දඬුවම ඉල්ලා සිටියා. එම අවස්ථාවේ ඉන්දුනීසියානු රජය ගත් පියවර පිළිබඳව මා විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි ගරු කථානායකතුමනි. ඒ අවස්ථාවේදී ගත් පියවර සම්බන්ධයෙන් මාධ්‍ය වාර්තා කර තිබුණේ මේ ආකාරයටයි:

“Indonesia created this special task force to protect migrant workers and employs special attorneys versed in Shariah law to fight for the rights of Indonesian migrant workers facing the death penalty”. මේ අපරාධ චෝදනාවට ලක් වුණු මේ ස්ත්‍රියගේ ජීවිතය බේරා ගන්නට ඉන්දුනීසියානු රජය Special Task Force එකක් පිහිටෙව්වා. ඒ වාගේම ෂරි-ආ නීතිය පිළිබඳව විශේෂඥතාව තිබෙන දක්ෂ නීතිඥයන් රැදෙව්වා. මොකද මේක රටක ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක්. මේක රිසානා නෆීක්ගේ පෞද්ගලික ප්‍රශ්නයක් විතරක් නොවෙයි. ඇයගේ

ජීවිතය පිළිබඳ ප්‍රශ්නය වැදගත් ප්‍රශ්නයක්. හැබැයි සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකාවේ සංක්‍රමික ශ්‍රමිකයන්ගේ ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක්. කුඩා දරුවෝ මරණ විකෘති පුද්ගලයෝ, අම්මලා, සහෝදරියෝ මේ රටේ නැහැ කියන කාරණය අපට පෙන්වන්නට අවශ්‍යයි. හැබැයි ඉන්දුනීසියානු රජය ඩාසන් නූරියා බේරා ගන්නට විශේෂ කාර්ය බළ කායක් - Special Task Force එකක් - හැදුවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, ෂරි-ආ නීතිය පිළිබඳව දන්නා විශේෂඥ නීතිඥ මණ්ඩලයක සහාය ලබා දුන්නා. ලංකාවේ ආණ්ඩුව මේ එකක්වත් කළාද? අවුරුදු හතක් ගත වුණා. මොකක්ද කළේ? ඒ කාලය තුළ වැදගත් යමක් සිද්ධ වුණේ නැහැ.

මා දන්නවා, අපේ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා මේ සියල්ලටම වග කිව යුතු නැහැ කියා. මා ඒක නැවත නැවත කියනවා. එතුමා පෞද්ගලිකව මේක ඒ තරම් ගත යුතු කාරණාවක් නොවෙයි. නමුත් එතුමා තමයි මේ මරණය සිදු වුණු කාලය වන විට මේ වගකීම දරුවේ. එතුමා තමයි වැදගත්ම කාරණා ගැන මේ සභාව නොමග යැවිවේ. එම නිසා එතුමාට වගකීමක් තිබෙනවා. සම්ප්‍රදායානුකූලව ධූරය දරන ඇමතිවරයාට විරුද්ධවයි විශ්වාසභංග යෝජනාව අරගෙන එන්නේ. ඇත්තම කිව්වොත්, මේක සම්පූර්ණ රාජපක්ෂ රෙජීමයට විරුද්ධව තිබෙන විශ්වාස භංග යෝජනාවක්ය කියා මා කියන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම රිසානා නෆීක් බේරා ගැනීම සඳහා විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාංශයෙන් සෞදි ආරාබි රාජ්‍යයට දූත කණ්ඩායම් යැවීම ගැන මා කියන්න ඕනෑ. පළමු වන දූත කණ්ඩායම යවා තිබෙන්නේ අවුරුදු දෙකකට පස්සේ 2007.07.20වන දායි. ඒ කණ්ඩායමේ තුන් දෙනෙක් ඉන්නවා. එනම් එම්.බී.එම්. සාරුක් මහතා, එම්.ආර්.එම්. නෆීක් මහතා සහ එම්.එම්.එස්. නෆීක් මහතායි. මේ අයගේ තනතුරු මොනවාද කියා වාර්තා වෙන්නේ නැහැ. නමුත් මේ එක්, එක් දූත කණ්ඩායම් විසින් ළඟා කර ගත් සාර්ථකත්වය මොකක්ද, ප්‍රගතිය මොකක්ද, මේ අය සවුදි අරාබියේ සංචාරය කර රිසානාගේ නිදහස වෙනුවෙන් ලබා ගත් ප්‍රගතිය මොකක්ද කියා ඒ තොරතුරු ලබා දෙන ලෙස පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශයෙන් මා ඉල්ලා සිටියා. නමුත් ඒ තොරතුරු ලබා දෙන්න බැරි බවට පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශයට දැනුම් දී තිබුණා. මේ නම් පමණයි දැනුම් දී තිබුණේ. අඩු ගණනේ නම් ටික දීපු එක ගැන මා ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම 2007.10. 31වන දා තව කණ්ඩායමක් ගියා. ඒ කණ්ඩායමට ගියේ, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හිටපු සභාපති කිංස්ලි රණවක, එල්.කේ. රූහුණගේ මහත්මයා, එඩ්වඩ් වීරසිංහ මහත්මයා සහ එම්. ආර්. එම්. රිස්වි මහත්මයායි. මා නැවත වරක් කියනවා, මේ අය ගිහින් ලබා ගත් සාර්ථකත්වය මොකක්ද, ඒ අය වෙනුවෙන් රට වියදම් කළ මුදල්වලින් ලබා ගත් සාර්ථකත්වය මොකක්ද කියා අපට හෙළි කළ යුතුව තිබෙනවා කියා. ඒක ගරු ඇමතිතුමාගේ වගකීමක්. ඒ වාගේම 2010.08.30වන දා නැවත වරක් කිංස්ලි රණවක, එල්.කේ. රූහුණගේ, එල්.එම්. කේ. මුතුකුමාරණ -සාමාන්‍යාධිකාරී සහ අතිරේක සාමාන්‍යාධිකාරී- යන මහත්වරු ඒ සංචාරයේ යනවා. ඒ අය මොනවාද කළේ? ඒ අය වෙනුවෙන් වියදම් වුණු මුදල්වලින් ලබා ගත් ඵලප්‍රයෝජන මොනවාද, රිසානාගේ නිදහස වෙනුවෙන් ලබාගත් ප්‍රතිපලය මොකක්ද කියා මේ පාර්ලිමේන්තුවට කිව යුතු වෙනවා.

ඊට පස්සේ ගරු ඇමතිතුමා මේ ධූරයට පත් වෙනවා. ධූරයට පත් වෙලා කාලයකට පස්සේ 2011.08.04වන දා සිට 2011.08.13 දක්වා දවස් නවයක කාලයක් එතුමා සවුදි අරාබියේ ගත කරනවා. ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාත්, කිංස්ලි රණවක සභාපතිතුමාත්, අමාත්‍යතුමාගේ උපදේශක එම්.අයි.එස්. අහමඩ් මහතාත්, ඒ වාගේම එම්.එස්. සම්සුදීන් මහතාත් මේ සංචාරයේ නිරත වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් ගිය සංචාරයේදී ඔබතුමා ලබාගත් සාර්ථකත්වය මොකක්ද, ඒ දරුවාගේ අම්මා හමු වුණාද, තාත්තා හමු වුණාද, සීයා හමු වුණා ද, ඒ වාගේම ඉන් පසුව ඇති වුණු ප්‍රතිපල මොනවා ද කියා නිශ්චිතව කියන්න, ඒ ලේඛන සභාගත කරන්න ඔබතුමාට පුළුවන් වන්නට ඕනෑ. ඒ වාගේම 2011.11.15වන දා සිට දින හතරක තවත් සංචාරයක යනවා. ඒ සංචාරයේ සාමාජිකයන් වෙන්නේ, බස්නාහිර පළාතේ ආණ්ඩුකාර අලෙවි මවුලානා මහතා, ඒ වාගේම අපේ හිතවත් ගරු ඒ.එච්.එම්. අස්වර් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, ගරු එම්.එස්. තව්ෆීක් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හිටපු සභාපති කිංස්ලි රණවක මහතා, අමාත්‍යාංශයේ ලේකම් නිශ්ශංක විජේරත්න මහතා, අතිරේක ලේකම් අන්වර් මහතා, ජමාල්ඩීන් මොහමඩ් ඉම්රාන් මවුලවිතුමා, එම්.එස්.එම්. තාසිම් මවුලවිතුමා, කම්කරු සුබ සාධන නිලධාරි එම්.ඩී.එම්. ෂාරුක් මහතා, ඒ වාගේම රිසානාගේ අම්මාත්, තාත්තාත් දෙන්නා.

ලොකු කණ්ඩායමක් -එකොළොස් දෙනෙක්- ගියා. අම්මාත්, තාත්තාත් එක්ක ගෙන ගිය එක බොහොම හොඳයි. මොකද, ඒක අත්‍යවශ්‍ය දෙයක්. මම ඒකට ස්තුතිවන්ත වනවා. නමුත් මේ එක් එක් සංචාරවලදී රිසානාව නිදහස් කර ගන්න මොකක්ද කළේ? ගරු කථානායකතුමනි, මීට කලින් සභාව කල් තැබීමේ යෝජනාවේදී විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නියෝමල් පෙරේරා මැතිතුමා මීට අමතරව තවත් නම් ලැයිස්තුවක් මේ සභාවට කිව්වා, තව තව අයත් මේ වැඩේ බේරුම් කර ගන්නට ගියා කියලා. ඒ අයත් මොනවාද කළේ කියන කාරණය ගැන අපට තොරතුරු ලැබිය යුතුව තිබෙනවා. මේ සභාවට අයිතියක් තිබෙනවා, ඒ තොරතුරු දැන ගන්න. නමුත් අවසාන දෙය තමයි රිසානාව මරා දමනු ලැබීම.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ගරු ඇමතිතුමාත්, ඒ වාගේම ආණ්ඩු පාර්ශ්වයේ අනෙක් ඇමතිතුමන්ලාත් "රිසානා අහිංසකයි" කියලා පළමුවන වතාවට පිළිගත්තේ මේ කාරණය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ පැවැත්වූ කල් තැබීමේ විවාදයේදීයි. ඊට කලින් ආණ්ඩුවේ සම්පූර්ණ තර්කයම පදනම් වුණේ "රිසානා පොඩි ළමයා නිසා නොදන්නාකමට වරදක් කර ඇත. ඒ වරදට සමාව දෙනු මැනවි" කියන වැරදි පදනම මතයි. ඉන්දුනීසියාවේ ඒ චෝදනාවට ලක් වුණු ස්ත්‍රියට වයස අවුරුදු 41යි. එයාට ළමාලකම අදාළ වුණේ නැහැ. නමුත් ඇයට ඒ පිළිබඳ විශේෂ වාසියක් නැතුව තිබියදී ඇගේ නිදහස තහවුරු කර ගත්තේ මිය ගිය අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ලබා ගෙන, එය පාපෝච්චාරණය සමඟ නොගැටෙන බව ප්‍රකාශ කිරීමෙනුයි. මේ සිද්ධියේදී අඩුම ගණනේ "පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව කෝ" කියන කාරණයවත් බරපතළ ප්‍රශ්නයක් විධියට මතු කළේ නැහැ. එපමණක් නොවෙයි ගරු කථානායකතුමනි, ඉන් පස්සේ රිසානාගේ ප්‍රකාශ කීපයක් ලබා ගත්තා. ඒ ප්‍රකාශ අප සතුව තිබෙනවා. ලබා ගත් ඒ ප්‍රකාශ "ඇය වරදක් කළේම නැත" කියන ස්ථාවරයත්, ඒ වාගේම පාපෝච්චාරණයන් පහර දීලා, හිරිහැර කරලා ගත්තා කියන ඇගේ ස්ථාවරයත් කියන මේ කාරණා ගැන පැහැදිලි, සුදුසු, සැලසුම් සහගත නීති උපදෙස් නොමැතිව ලබා ගත්ත බව ඒවායේ අන්තර්ගත කරුණු අනුව පෙනී යනවා. ගරු කථානායකතුමනි, ඉන්දුනීසියාව කළා වාගේ ලබා ගත යුතු ඉහළම සහාය ලබා ගැනීමට බැරි වුණා. ඒ ගැන අපි බලන්නට අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මා තවත් කාරණා කීපයක් කියන්නට අවශ්‍යයි. මේ විශ්වාස භංගය සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා ඉතා ඉහළ ප්‍රචාරයක් ලබා දුන්නා. ඒ ලබා දුන් ප්‍රචාරය පිළිබඳව අප එතුමාට ස්තුතිවන්ත වනවා. පෝස්ටර් 10,000ක් ගහලා, කෝවිල්වල පොල් ගහලා, අමාත්‍යාංශයේ නිලධාරීන්ට නිවාඩු දීලා අද පාර්ලිමේන්තුව ඉස්සරහට ගෙනැල්ලා උද්ඝෝෂණයක් කරලා ඉතාම ඉහළ ප්‍රචාරයක් අපට ලබා දුන්නා. ඇත්ත වශයෙන්ම ගරු කථානායකතුමනි, මේ කිසි දෙයක් කිරීමෙන් රිසානාට වුණු අසාධාරණය නැති වෙන්නේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

නැහැ. මේ කිසි දෙයක් කිරීමෙන් රිසානාගේ ජීවිතය නැවත ඇති වන්නේ නැහැ. නමුත් ගරු කථානායකතුමනි, අපි මේ තර්ක ඉදිරිපත් කරන්නේ, අපි මේ කරුණු ඉදිරිපත් කරන්නේ එකම එක දෙයක් නිසායි. රිසානා නෆීක්ට සිදු වුණු දේ මිලියන දෙකක් වුණු අපේ ශ්‍රමිකයන් කිසිවෙකුට නැවත නොවිය යුතුයි. ඒ පිළිබඳව වග කීමෙන් ක්‍රියා කළ යුතුයි. ඒ වාගේම මේ ක්‍රියා දාමය තුළ අපට බොහෝ පෞද්ගලික අවලාදයන්ට මුහුණ දීමට සිද්ධ වුණා. ගරු ඩිලාන් පෙරේරා මැතිතුමාත් එක්ක මට පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමේ ඒකමතිකව සම්මත වුණු යෝජනාවක් අනුවයි මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්නේ. මීට කලින් මා පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේ අපේ පාර්ලිමේන්තු කණ්ඩායමේ තීරණයයි. ඒ කාරණයත් මා ඔබතුමාට කියන්න අවශ්‍යයි. ඒ වාගේම මා කියන්න කැමැතියි ගරු කථානායකතුමනි, මේ වාගේ බරපතළ ප්‍රශ්න ඇති වන කොට රට පාලනය කරන්න ඉන්න ඕනෑ, ගුණ නුවණ තිබෙන පුද්ගලයන් බව. ගරු කථානායකතුමනි, සුභාෂිතයෙන් උපුටා දක්වලා මා මේ කවිය කියන්න කැමැතියි. එහි මෙසේ සඳහන් වනවා:

"විපුල ගුණැති මහතුන් හට පත් විපත
නිසල නැණින් යුතු උතුමෝම දුරල ත
කලල ගිලුණු මත වරනිදු ගොඩ ගනු ත
තුමුල බලැති ගිජිඳෙකු මිස අන් කෙව ත"

ගරු කථානායකතුමනි, මෙවැනි ප්‍රශ්න විසඳන්න නුවණැති මිනිසුන් අවශ්‍යයි. පෞද්ගලික අවලාද අපහාස අද බොහෝ ඒවි. ඒවා ඇත පසුබිමින් ඇහෙනවා. කල් තියලා මා ඒ කාරණය කියන්න කැමැතියි. ඒ වාගේම මා නැවතත් සුභාෂිතයෙන් තවත් එකම එක කරුණක් කියනවා. සුභාෂිතයේ මෙසේ සඳහන් වනවා:

"කුළුණු ගුණෙන් යුතු උතුමන් සිත මහ රු
දුදන බසින් නොයෙදෙයි කරනට නපු රු
නව රුවණින් පිරි මහ සමුදුර ගැඹු රු
තණ සුලකින් උණුකළ හැකිවෙති කවු රු"

ගරු කථානායකතුමනි, අපේ හෘදය සාක්ෂිය පිරිසිදුයි. අප මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ රට වෙනුවෙන්, විදේශගතව ඉන්නා මිලියන ගණනක ශ්‍රමිකයන් වෙනුවෙනුයි. රිසානාගේ මරණයෙන් ඒ කටයුත්ත අවසන් වෙන්නේ නැහැ. විදේශගත වෙලා ඉන්න මේ රටේ අහිංසක ශ්‍රමිකයන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා කරන්න රජයට තිබෙන වගකීම නැවත නැවත මතක් කරන්න මේ ගෞරවනීය සභාවේ වටිනා කාලය මට ලබා දීම ගැන මා ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනාව ස්ථිර කරන්න, ගරු රන්ජන් රාමනායක මහතා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ගෙන ආ ඒ යෝජනාව මා ස්ථිර කරනවා. මා පසුව මගේ කථාව ඉදිරිපත් කරනවා.

[අ.භා. 3.01]

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)
ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා මේ යෝජනාව ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළ යම් යම් දේවල් නිවැරදි නොවෙයි. උදාහරණයක් වශයෙන් එතුමා සඳහන් කළා, රිසානා නෆීක්ගේ ජීවිතය බේරා ගැනීමට තවම උත්සාහ දරන බවට ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා මේ ගරු සභාවේ ප්‍රකාශයක් කළ අවස්ථාවේදී ඇත්ත වශයෙන්ම රිසානාව මරණයට පත් කර තිබුණු බව.

ඒ මරණය සිදු වුණේ සවුදි අරාබියේ වෙලාවෙන් 11.48ට. සවුදි අරාබිය හා ශ්‍රී ලංකාව අතර පැය දෙකහමාරක- [බාධා කිරීම] නැහැ, නැහැ ඒකට ලිඛිත සාක්ෂි තිබෙනවා. 11.48ට තමයි ඒ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කළේ. ඒක නිල වශයෙන් ප්‍රකාශ කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වෙලාව දන්නේ නැහැ නේ.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
සවුදි අරාබිය හා ශ්‍රී ලංකාව අතර පැය දෙකහමාරක වෙනසක් තිබෙනවා. ඒ අනුව අපේ වෙලාවෙන් දවල් 2.18ට තමයි මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කළේ. ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා එදා මේ ගරු සභාව අමතන මොහොතේ ඒ මරණය සිදු වෙලා තිබුණේ නැහැ. ගරු කථානායකතුමනි, මා පැහැදිලිව කියන්න ඕනෑ, ඒ මරණය ඉතාම ශෝචනීය සිද්ධියක් කියන එක. ඒ ගැන සැකයක් නැහැ. අවුරුදු 24ක ගැහැනු ළමයෙකු 2005 සිට 2013 දක්වා බන්ධනාගාරගත කර තබලා, ජීවිතක්ෂයට පත් කිරීම ඉතාම ශෝචනීය සිද්ධියක්. මනුස්ස හැඟීම් තිබෙන ඕනෑම කෙනෙකු ඒ සිද්ධියෙන් කම්පනයට පත් වනවා. ඒත් මෙතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාට. ඒ වගකීම එතුමාට පවරලා විශ්වාස භංග යෝජනාවක් මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට තරම් සාධාරණ හේතු තිබෙනවාද කියන ප්‍රශ්නය තමයි මෙතැන වැදගත් වන්නේ. සවුදි අරාබියේ වන සිදුවීම් සම්බන්ධයෙන් ඒ රටේ නීති පද්ධතිය සමඟ බැලීමේදී අපට හුරු පුරුදු නීති පද්ධතිය පදනම් කර ගෙන සිතන්න බැහැ. ඒ රටේ තිබෙන්නේ හාත්පසින් වෙනස් නීති පද්ධතියක්. ශ්‍රී ලංකා නීතිය යටතේ පොලීසියට කරපු පාපෝච්චාරණයක් කිසිසේත් සාක්ෂියක් හැටියට උසාවියක පාවිච්චි කරන්න බැහැ. ඒක මූලික සිද්ධාන්තයක්. -සාක්ෂි ආඥා පනතේ 25වන වගන්තිය.- සවුදි අරාබියේ නීතියේ එහෙම දෙයක් නැහැ. පොලීසියට කරන පාපෝච්චාරණ සවුදි අරාබියේ නිතර භාවිත කරනවා, උසාවියක හරයාත්මක සාක්ෂි හැටියට. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කළා ඉන්දුනීසියාවේ නඩු තීන්දුවක් ගැන. ඇත්තයි. එතැන පාපෝච්චාරණයක් තිබුණා. හැබැයි මොකක්ද උසාවිය තීරණය කළේ? ඒ පාපෝච්චාරණයේ තිබුණේ, "මම වස දුන්නා" කියලා. උසාවිය තීරණය කළා, වස දුන්නාට ඒ සොයා ගන්නා ලද වස ප්‍රමාණය මරණයක් සිදු වීමට තරම් ප්‍රමාණවත් වන්නේ නැහැ කියලා. අන්න ඒ පදනම මත තමයි උසාවිය ඒ තීරණයට ආවේ. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැහැනු ළමයා තවම සිර භාරයේ ඉන්නේ, සවුදි අරාබියානු රජය ඇපෑලක් අරගෙන. ඒ නිසා ඔබතුමා කියපු ඒ කරුණු නිවැරදි නොවෙයි.

දැන් මෙතැනදී අපට අවංකව කියන්න තිබෙන්නේ, ශ්‍රී ලංකා රජය කරන්න පුළුවන් සෑම දෙයක්ම කළ බවයි. අතිගරු ජනාධිපතිතුමා සවුදි අරාබියේ අබ්දුල්ලා රජතුමා අමතමින් ලිපි තුනක් ලිව්වා. පළමුවැනි ලිපිය ලිව්වේ 2007 දී. මා ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි මගේ පෞද්ගලික අත් දැකීමක්. මා විදේශ ඇමති හැටියට 2012 මාර්තු මාසයේ රියාද් නගරයට ගියාම මට හමු වුණා අබ්දුල්ලා රජතුමාගේ ඔටුනු හිමි කුමරා. එතුමාගේ නම මොහමඩ් බින් අබ්දුල්ලා. එම හමුවීමේදී මේ ගැන සාකච්ඡා කළා. ඒ වාගේම සවුදි අරාබියේ රජ පවුලේ තව ප්‍රධාන සාමාජිකයකු වන සල්මන් අබ්දුල් අසීස් කුමරා හමු වුණා. එතුමා තමයි රියාද් ප්‍රදේශයේ ආණ්ඩුකාරතුමා. ගරු කථානායකතුමනි, මට ඒ අය කිව්වේ, "අපි කවදාකවත් නොකරපු දේවල් මේ සම්බන්ධයෙන් කළා." ෂරි-ආ නීතිය අපේ නීතිය වාගේ නෙවෙයි. අපේ නීතියේදී මේ විධියේ අවස්ථාවකදී සමාව දීමේ පරමාධිකාරිය සතු වන්නේ වෙන කාටවත් නොවෙයි රාජ්‍ය නායකයාට. Prerogative of clemency, ඒක අපේ නීති පද්ධතියේ තහවුරු වෙලා තිබෙන මූල ධර්මයක්. සවුදි අරාබියේ එහෙම නොවෙයි. ඒ බලය පාවිච්චි කරන්න පුළුවන් වන්නේ ඒ නැසී ගිය දරුවාගේ දෙමව්පියන්ට පමණයි. වෙන කිසිම කෙනෙකුට ඒ අයිතිය නැහැ. මට ඒ අය කිව්වේ, "අපි කවදාකවත් නෙකරපු දේවල් මේ සම්බන්ධයෙන් කළා. මේ සමාව ලබා දෙනවා නම් ඒ දෙමවුපියන්ට රජ පවුලේ පෞද්ගලික මුදල්වලින් රියාල් මිලියන තුනක් ලබා දෙනවා" කියලා. ඒ කියන්නේ, අපේ ශ්‍රී ලංකා මුදල්වලින් දළ වශයෙන් රුපියල් ලක්ෂ 900ක් ඒ රජතුමා පරිත්‍යාග කරන්න සූදානම් කියලා ප්‍රකාශ කළා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. ඒ පවුලේ සිටියා, උග්‍ර ලෙස රෝගාතුර වී සිටින, විශේෂඥ වෛද්‍ය උපකාර අවශ්‍ය ළමයෙක්. සෞදි අරාබියේ රජ පවුල කියා සිටියා, ඒ ළමයා යුරෝපයේ ඕනෑම රෝහලකට ගෙන ගිහින් විශේෂඥ ප්‍රතිකාර ලබා දෙන්න, ඒ සඳහා අවශ්‍ය සියලුම මුදල් ඒ ගොල්ලන් වියදම් කරනවාය කියලා. මේ සියල්ලක්ම මට පෞද්ගලිකව කිව්වා. ඊට අමතරව, ඒ ළමයා රෝහලේ වෛද්‍ය ප්‍රතිකාර ලබන අතරේ ඒ පවුලේ අන් සියලු දෙනා සමඟ ඒ අයට නිවාඩුවක් ගත කරන්න අවස්ථාව දෙන්න පුළුවන් කියලාත් ප්‍රකාශ කළා.

තවදුරටත් මට කිව්වා, කවදාවත් නොකරපු තවත් පියවරක් ගත්තාය කියලා. ඒ නැසී ගිය දරුවාගේ මව -ඇයගේ තමයි ප්‍රශ්නය තිබුණේ- හමු වෙන්න මනෝ විද්‍යාඥයන්, ඒ පිළිබඳ විශේෂඥ දැනුමක් තිබෙන කාන්තාවන් යැවුවාය කිව්වා. ඒ රජ පවුලේ අනුග්‍රහය යටතේ ඒ අය යැව්වාය කිව්වා. "මේ දරුවා මරා දමන එකේ ප්‍රයෝජනය මොකක්ද? ඔයාගේ මාස හතරේ දරුවා මීය ගොස් අවසානයි. ඒ දරුවාට නැවත පණ ලැබෙන්නේ නැහැ. ඉතින් මේ දරුවාගේ හිස ගසා මැරීමෙන් ඔය ගොල්ලන්ට ලැබෙන ප්‍රයෝජනය මොකක්ද?" කියලා ඒ විධියට සානුකම්පික මට්ටමකින් ඒ දරුවාගේ මවට කථා කරලා, ඒ කාන්තාවගේ මනස වෙනස් කරලා, යම් කිසි නම්‍යශීලී තැනකට ගෙන ඒම සඳහා ඒ අය ඒ විධියේ පියවරක් ගත්තාය කියලා මට ප්‍රකාශ කළා. ඊට පස්සේ ඒ අය මට කිව්වා, "ඇමතිතුමනි, ඔබතුමා මේ තර්ක අපට ඉදිරිපත් කරනවා. අපි මෙතෙක් දුරට ගන්න පුළුවන් සෑම උත්සාහයක්ම අරගෙන තිබෙනවා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රජතුමාට ලිපියක් එවා තිබෙනවා. ඒ අනුව අපි මේ කටයුතු කළා. අපි දැන් වුණත් මෙය අත හරින්නේ නැහැ. අපි තව දුරටත් උත්සාහ දරනවා, ඒ කාන්තාවගේ කැමැත්ත ලබා ගැනීමට. ඒ කැමැත්ත නැතිව අපට තීරණයක් ගන්න බැහැ. ෂරි-ආ නීතිය අභිභවා යෑමට අපටත් පුළුවන්කමක් නැහැ. පොදු රට වැසියා ෂරි-ආ නීතියට අවනත වන සේ ම අපිත් ෂරි-ආ නීතිය අනුගමනය කිරීමට බැඳී සිටිනවා. ඒක තමයි අපට තිබෙන ප්‍රශ්නය" කියලා. ඒ ප්‍රශ්නය අපේ රටේ මතු වන්නේ නැහැ; එංගලන්තයේ මතු වන්නේ නැහැ. අපට හුරු පුරුදු රටවල පොදු රාජ්‍ය මණ්ඩලීය නීතියේ එහෙම ගැටලුවක් උද්ගත වීමට කිසි සේත් හැකියාවක් නැහැ. නමුත් සෞදි අරාබියේ ක්‍රියාත්මක වන ෂරි-ආ නීතියේ අන්තර්ගත මූල ධර්ම අනුව ඒ ප්‍රශ්නය ඉතාම උග්‍ර ආකාරයකින් ජනිත වනවා.

ගරු කථානායකතුමනි, අපි එතැනින් නැවතුණේ නැහැ. විශේෂයෙන්ම ඒ නැසී ගිය දරුවාගේ පියා සෞදි අරාබියේ මුදල් අමාත්‍යාංශයේ වැඩ කරපු නිලධාරියෙක් නිසා අපි පුළුවන් තරම් උත්සාහ දැරුවා, සෞදි රජය හරහා මෙය කර ගන්න. හැබැයි, අපි ස්වාධීනව පියවර ගැනීමෙන් වැළකී සිටියේත් නැහැ. ශ්‍රී ලංකා රජයත් කිව්වා, "අපි මුදල් ගෙවන්න කැමැතියි. අපට කියන්න, කොපමණ මුදල් ප්‍රමාණයක් අවශ්‍යද කියලා. අපි කිසිම පැකිළීමකින් තොරව ඒ මුදල් ගෙවන්න ඉදිරිපත් වනවා"ය කියලා.

ඒ වාගේම -

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කිරීමක් තිබෙනවා.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
එයට ඉඩ දෙන්න බැහැ. එතකොට මට මේ තර්කය මේ විධියට ඉදිරිපත් කරන්න බැරි වෙනවා. රජයේ තවත් කථිකයන් ඉන්නවා. ඒ අය ඔබතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.

ගරු කථානායකතුමනි, ඒ හැර ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කළා, මේ සඳහා විවිධ දූත පිරිස් ලංකාවෙන් ගිය බව. 2007 වර්ෂය හා 2012 වර්ෂය අතර දූත පිරිස් 8ක් ගියා. ඒ අය නිකම් රියාද් නගරයට ගිහින් ආවා නොවෙයි. ඒ ගොල්ලෝ සෞදි අරාබියේදී හමු වුණා, -

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! There is a point of Order being raised. ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, මොකක්ද, point of Order එක?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, මෙතුමා කිව්වා, ගරු ජනාධිපතිතුමා ලිපියක් යැව්වා කියලා. පුවත් පත් වාර්තාවේ තිබෙනවා, - [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් අහගන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
කරුණාකරලා පොඩ්ඩක් ඉඩ දෙන්න. ගරු ජනාධිපතිතුමා යවපු ලිපිය - [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා කථා කරනවා. ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා වාඩි වෙන්න. එය point of Order එකක් නොවෙයි.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, අපේ රටෙන් ගිය දූත පිරිස් කණ්ඩායම් තුනක් හමු වුණා. පළමු වැනි කණ්ඩායම තමයි මේ සම්බන්ධයෙන් යමක් කිරීමට නිල බලයක් ඇති සෞදි අරාබියාවේ නිලධාරීන්. උදාහරණයක් වශයෙන් පොලිසියේ ප්‍රධානියා, බන්ධනාගාරයේ ප්‍රධානියා. ඒ වාගේම මේ සිද්ධිය සිදු වුණු බන්ධනාගාරය පිහිටා තිබුණේ දවද්මි කියන ප්‍රදේශයේ. දවද්මි කියන ප්‍රදේශයේ ආණ්ඩුකාරතුමා, රියාද් ප්‍රදේශයේ ආණ්ඩුකාරතුමා ආදී වශයෙන් ලංකාවෙන් ගිය සියලුම නිලධාරීන්ව හමු වුණා. ඒ වාගේම දෙවන වශයෙන් එම මියගිය දරුවාගේ සමීප ඥාතීන්වත් හමු වුණා. එම දරුවාගේ සීයාව හමු වුණා. ඒ කියන්නේ එම දරුවාගේ මවගේ පියාව. ඒ දරුවාගේ මවගේ පියා හරහා එම මවට යම්කිසි බලපෑමක් කිරීමටයි ඒ අය හමු වුණේ. දරුවාගේ සීයාව හමුවන්න පුළුවන් වුණා. මව හමු වුණේ නැහැ. දරුවාගේ පියා එක් අවස්ථාවකදී හමු වන්නට පොරොන්දු වෙලා, අවසානයේ දී හමු වුණේ නැහැ. හැබැයි, සෞදි අරාබියාවේ සමාජීය ක්‍රමය අනුව ගෝත්‍රික නායකයන් ඒ ගමට ගිහිල්ලා, ගමේ ප්‍රධාන පුද්ගලයන් හමු වුණා. ඒ අය හරහාත් මේ කාන්තාවට යම් කිසි බලපෑමක් කරන්නට උත්සාහ කළා. ඒ සියල්ලක්ම කළා. තුන්වැනි වශයෙන් නීති පැත්තෙනුත් කටයුතු කළා. ශ්‍රී ලංකාවේ නීතිපතිතුමා, ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු මැතිතුමා සෞදි අරාබියාවේ නීතිපතිතුමා හමුවන්නට ගියා. ඉතින් මේ විවිධ ක්‍රමවලින් මේ පිළිබඳව ප්‍රයෝජනවත් යමක් කිරීමට අපි දැඩි උත්සාහයක් දැරුවා.

මෙහිදී යම් යම් ප්‍රශ්න මතු වුණා, ගරු කථානායකතුමනි. එක ප්‍රශ්නයක් තමයි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා එතුමාගේ යෝජනාව ඉදිරිපත් කරමින් පළමුවෙන්ම සඳහන් කළා, රිසානා බාල වයස්කාර දැරියක් බව. එතැනදී ඇති වුණු ප්‍රශ්නයක් තමයි, සෞදි අරාබි රජය කිව්වා, "මේ බලන්න ගමන් බලපත්‍රය. ගමන් බලපත්‍රයේ සඳහන් වනවා, මේ ළමයා වයස අවුරුදු 21කට වැඩි ළමයෙක්" කියලා. ඒ ගමන් බලපත්‍රය කියලා කියන්නේ official document එකක්. ඒක නිල වශයෙන් නිකුත් කරන ලද ලියවිල්ලක්. [බාධා කිරීමක්] ඔව්, ඒක හරි. ආණ්ඩුව ඒක නිකුත් කරන්නේ ලැබෙන සාක්ෂි අනුව නේ. පවුලේ, පියාගේ සාක්ෂි අනුව නේ ඒක ඉදිරිපත් කෙරෙන්නේ. ඒ බලපත්‍රයේ ප්‍රකාශිතව සඳහන් වුණු වයස ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් වුණා. මේ විධියේ විවිධ ගැටලු මධ්‍යයේ කරන්න පුළුවන් සෑම දෙයක්ම අපි කළා.

ඊළඟට, ඉන්තිකාර් කියලා මහනුවර ප්‍රදේශයේ කාන්තාවක් දන්ත වෛද්‍ය විද්‍යාව ඉගෙන ගෙන දැන් සෞදි අරාබියාවේ දන්ත වෛද්‍යවරියක් ලෙස සේවය කරනවා. එතුමියව සෑම මාසයකම මේ රිසානාව රඳවා තබාගෙන සිටි බන්ධනාගාරයට යැව්වා. ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් පරිවර්තකයෙක්, ප්‍රවාහන පහසුකම් ඒ සෑම දෙයක්ම සපයලා සෑම මාසයකටම වතාවක් දවද්මි බන්ධනාගාරයට එතුමියව යැව්වා, රිසානා දැරියට යම් කිසි මානසික සහනයක් ලබා දීම සඳහා. ඇත්ත වශයෙන්ම ජනවාරි 09වැනිදා මේ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කරන අවස්ථාවේ දීත් එම කාන්තාව බන්ධනාගාරයේ සිටියා. ඒ අවස්ථාවේ දී පමණයි එම බන්ධනාගාරයේ නිලධාරීන් එතුමියට රිසානාව හමු වන්නට ඉඩ නුදුන්නේ. එතුමියට කියා තිබෙනවා, "අද රිසානාව බලන්න යන්න දෙන්න බැහැ" කියලා. ඉන්තිකාර් කියන කාන්තාව බන්ධනාගාරයේ දොරටුව ළඟ සිටින අවස්ථාවේ තමයි එම මරණීය දණ්ඩනය ක්‍රියාත්මක වී තිබෙන්නේ.

ඒ රටේ නීති තත්ත්වය නිසා යම් කිසි ගැටලු තත්ත්වයක් ඇති වී තිබුණා. එම ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා සියලුම මට්ටම්වලින් මැදිහත් වෙලා තිබුණා.ඒ කියන්නේ සෞදි අරාබියාවේ රජතුමා, රජතුමාගේ ඔටුන්න හිමි කුමරා යන ඒ සියලු දෙනාටම තර්ක ඉදිරිපත් කරලා, සානුකම්පිත පදනමක් මත මෙයට යමක් කරන්නය කියලා අපි බොහොම දැඩි ලෙස ඉදිරිපත් වුණා. ඒ ගිය අයගේ විස්තර මා නවැතත් කියවන්නේ නැහැ. මොකද, ගරු මන්ත්‍රීතුමා ළඟ ඒ විස්තර තිබුණා. හැබැයි, ඒ සියල්ලක්ම අපි ළඟ තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කාලය අවසානයි. [බාධා කිරීමක්] හොඳයි, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කාලය ලබා දෙනවා.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මට අවසන් කරන්නට පුළුවන්, ගරු කථානායකතුමනි.

අප කියන්නේ ඒ රටේ නීතියට අනුකූලව ඇත්ත වශයෙන්ම මීට වඩා අපට කරන්න පුළුවන් දෙයක් තිබුණේ නැහැ කියන එකයි. අපේ රටේ හෝ ඉන්දියාවේ හෝ මැලේසියාවේ මේ විධියේ ප්‍රශ්නයක් මතු වුණා නම් ඒ සම්බන්ධයෙන් වෙන ක්‍රියා මාර්ග ගැනීමේ හැකියාවක් තිබුණා. නමුත් ඒ රටට ආවේණික වුණු නීතිය, නීති පද්ධතිය හා නීති සංස්කෘතිය අනුව යම් යම් සීමා තිබුණා. ඒ සීමා තුළ අපට ගන්න පුළුවන් උපරිම උත්සාහය අප ගත්තා. අනාගතය සඳහා ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා කෙළින්ම මැදිහත් වෙලා ව්‍යාජ ලෙස ඒ ලියවිලි සකස් කළ පුද්ගලයන්ට විරුද්ධව අපරාධ නඩු පවරා තිබෙනවා. තුන් දෙනෙකුට විරුද්ධව නඩු පවරලා ඒ තුන්දෙනා වරදකරුවන් හැටියට තීරණය කරලා දෙන්නෙක් අද දැඩි සිර දඬුවම් සහිතව අවුරුදු දෙකකට බන්ධනාගාරගත වෙලා ඉන්නවා.ගරු කථානායකතුමනි, ඒ නිසා අපේ හෘදය සාක්ෂියට එකඟව අප කියනවා මේ වෙනුවෙන් කළ යුතු සියලු දේවල් කළ බව. අප සියලුම ආකාරයෙන් මැදිහත් වුණා. නමුත් ඉතාම අවාසනාවන්ත දෙයක් සිදු වුණේ. ඒ සම්බන්ධයෙන් වරද ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාට හෝ අපේ රජයට ආරෝපණය කිරීම සම්පූර්ණයෙන් අසාධාරණයි කියා සඳහන් කරමින්, ඒ පදනම මත මේ යෝජනාව ප්‍රතික්ෂේප කරන ලෙස මෙම ගරු සභාවෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා.

ඊට පෙර ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[3.18 p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Mr. Deputy Speaker, right at the outset, I wish to inform this House that I do not agree with the Motion of No Confidence that has been presented to this House. There are reasons for that. There are also reasons why I wish to speak today and bring out certain contradictions that this House should take note of.

The Mover of the Motion, the Hon. Member from Kalutara, very clearly stated that this is not personally aimed at the Hon. Minister of Foreign Employment Promotion and Welfare but that he is presently the holder of that office and, therefore, this Motion is being moved. I do not agree with that because the Motion substantively states that the incumbent Minister is not fit to hold this post. I do not agree that it is the failure on the part of the Hon. Minister that resulted in this tragedy which we all recognize as a national tragedy because the child who was executed, was so vulnerable, was so weak, had been abandoned, been in prison for seven years and her life was taken away for no fault of hers and I do not think it is appropriate to now find scapegoats for that national tragedy. I think the Government as a whole is responsible; in some sense, all of us are also responsible for this.

The fact that a child had to falsely state her age and go abroad as a housemaid to sustain her family here, is an indictment on all of us; that we still have people in this country who are unable to make ends meet, who cannot generate enough livelihood and are forced to send their young girl children into hostile environments like this. That is something, I think, the Government of the day must take very serious note of particularly with regard to sending workers to Saudi Arabia and many other countries. I am not for a moment calling into question the laws that are extant in those countries. I am not for a moment challenging the Shariah law but I am seriously suggesting to the Government, not only because of Rizana Nafeek, but also the fact that several people who have gone as housemaids to the Middle East have returned in a coffin. Several have been very badly injured and cruelly treated. There are several who have gone missing, who have run away from their employers and have not been found. All of these things have happened, and has happened mostly in the Middle Eastern countries where our womenfolk were forced to go and find employment in order to sustain their families. This is a terrible indictment on us and I wish that the Hon. Minister - although there is a Motion of No Confidence against him that is being debated in this House - will in future take steps to address and redress.

The contradictions that I am raising have to do with what happens in our country. Mr. Deputy Speaker, today we will find Members from both sides of the House waxing eloquent about the laws that are extant in Saudi Arabia and about the provision that makes confession admissible and so on. We do have a law that makes confession admissible. Earlier in the day, the Hon. Leader of the Opposition raised that issue about the Prevention of Terrorism Act, the only law that is extant in our country today that makes confessions admissible and all of us know how these confessions are obtained. The Hon. Leader of the Opposition raised a very important issue today.

This Prevention of Terrorism Act is still being made use of against political opponents. Mr. Azath Sally's situation is an example but that is not the only one. There are persons who have been arrested. There were four university students who were arrested in Jaffna, along with them 39 others. Only the university students have been released but those 39 others are still incarcerated without even once being produced before a magistrate because there is a Regulation made under the Prevention of Terrorism Act that makes it possible for the defence authorities to call somebody a "surrendee" and send him for what is purported to be rehabilitation. You are depriving a person of his personal liberty without any judicial intervention; such is the rigour of this draconian law.

Today, you will talk about the confession of Rizana Nafeek and from both sides you will condemn it, but what are you doing in this country even today? You are using a worse law than what is even extant in Saudi Arabia. You have no worry about that. You will use this law because you think it will enable you to remain in power, to crush any kind of opposition to your rule. I am not saying this only against this Government. That law was brought in by the United National Party in 1979 as a Temporary Provisions Act valid for six months, extended and then in 1982 made permanent. Even when Emergency was lifted with such fanfare here, the Prevention of Terrorism Act was further strengthened. We pull wool over the eyes of the international community saying that we have lifted the Emergency, but the PTA was further strengthened and it is being used. So, what is the point of both sides crying foul today about the laws in Saudi Arabia when you yourself apply worse laws in this country?

There is something else that is happening. We are talking about the right to life of Rizana Nafeek and that was denied. I take this opportunity to once again express our heartfelt condolences to her family. She had a right to live and that was cruelly taken away. But, we do that in our country today. Do we not? We do that without thinking. At present the right of the Tamil people to live in their own land in this country is being taken away by this Government.

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

Never before in the history of this country was land grabbed from a community like the way it is being done today - 6,381 acres - all in one go. The Land Acquisition Act was not enacted for such a purpose. It was to take over land for public purpose. "Public" meaning the public of that area for a playground, for a cemetery, for a hospital or for a road that that public there will use. But, what are you doing today? You are not taking over one plot of land. You are taking away about 9,900 families' separate lands by one sweep, by one notice under Section 2 of the Land Acquisition Act. Is that not taking away their right to life in the traditional areas in which they have lived on land that they have inherited?

There is a definition of genocide. Genocide is not merely killing a race. Genocide is also moving people out of their traditional habitat. That is a historic definition of genocide. In several countries - in Canada, in the USA with regard to the Indians, in Australia with regard to the Aboriginals - this has been established. You move a particular community, a particular race, a particular people out of the traditional homeland where they have lived for centuries, for generations. It is clearly genocide. Now, that is happening right before our eyes today.

We are eulogizing about Rizana Nafeek and I do not find anything wrong with that. We should. As I said before, it is a national tragedy and we must all acknowledge that and take responsibility for that. But, the contradiction is, while today we agree on that, we are ourselves perpetrators of greater violence that is happening in our country. I cited two examples of the Prevention of Terrorism Act still continuing to be a law that is extant and the land grab by the military to establish a cantonment - that is what that notice says - not only 6,381 acres, but several thousand acres in other places as well, all belonging to the Tamil people. No other community of this country has ever been put to peril like this. You scream your head off when you are asked questions in international fora saying, "We are being unfairly treated. Why is there so much unnecessary attention on Sri Lanka?" Why would not there be attention on Sri Lanka when you are committing genocide at the scale that you are doing?

Thank you very much.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා.

[අ.භා. 3.32]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින අජිත් පී. පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන් පිරිසක් විසින් විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍ය ඩිලාන් පෙරේරා මැතිතුමාට එරෙහිව ගෙන එන ලද විශ්වාස භංග යෝජනාව පිළිබඳව රජය වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මම ඉතාමත්ම සතුටු වනවා.

විශේෂයෙන්ම මේ යෝජනාව ගෙන එනකොටම අතේ පත්තු වුණා. අද විපක්ෂයේම බෙදීමක් තිබෙනවා. සුමන්තිරන් මන්ත්‍රීතුමා-

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එහෙම එකක් නැහැ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මොකද නැත්තේ? [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුමන්තිරන් මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිවම කියා සිටියා, මේ යෝජනාවේ ස්වරූපය අනුව ඩිලාන් පෙරේරා මැතිතුමාට එරෙහිව මේ යෝජනාව ගෙන ඒම කිසිසේත් සුදුසු නැති බව. [බාධා කිරීම්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමා කිව්වේ ආණ්ඩුවට විරුද්ධව ගෙනෙන්න ඕනෑය කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඇයි එහෙනම් ආණ්ඩුවට විරුද්ධව ගේන්නේ නැතිව ඩිලාන් පෙරේරා ඇමතිතුමාට විරුද්ධව ගෙනාවේ? "යන්නේ කොහේද - මල්ලේ පොල්." [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාවෙන් කියන්නේ මොකක්ද? විදේශ සේවා නියුක්ති කාර්යාංශය මුළුමනින්ම රිසානා නෆීක් හට කිසිදු ආකාරයක අර්ථාන්විත සහායක් ලබා දීමට අපොහොසත් වුණාලු. අර්ථාන්විත සහායක් කියන්නේ මොකක්ද? අපේ ආණ්ඩුවත්, විදේශ කටයුතු අමාත්‍යාංශයත්, ඩිලාන් පෙරේරා අමාත්‍යතුමාත් මේ දරුවාගේ ජීවිතය බේරා ගැනීම සඳහා මොන තරම් වෙහෙසක් ගත්තාද කියලා අපේ ජී.එල්. පීරිස් අමාත්‍යතුමා මුල ඉඳන්ම කිව්වා. ඉතින් එහෙම නම් මේ මොකක්ද කියන්නේ?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
බේරා ගත්තාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

බෙරා ගත්තාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩිලාන් පෙරේරා අමාත්‍යතුමාත්, රජයත් මේ පිළිබඳව අර්ථාන්විත සහායක්, විශාල සහායක් ලබා දුන්නා; මේ වෙනුවෙන් විශාල වෑයමක් දැරුවා.

ඊළඟට කියනවා, ඩිලාන් පෙරේරා ඇමතිතුමා මේ කරුණු මුළුමනින්ම සාවද්‍ය ලෙස කළමනාකරණය කළාය කියලා. ඒ එක්කම ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කියනවා, මේ සම්බන්ධව ඩිලාන් පෙරේරා ඇමතිතුමා විතරක් නොවෙයි, ඇමතිවරු රාශියක් වග කිව යුතුයි කියලා. ඇමතිවරු රාශියක් මේ මේ විධියට කටයුතු කළා කියලා ඇයි එහෙම නම් මේ යෝජනාවේ දැම්මේ නැත්තේ? අපි අද කථා කරන්න ඕනෑ මේ යෝජනාවේ තිබෙන කරුණුයි. යෝජනාවක් හරියට හදා ගන්න බැරිව මඩ ගහන්න සලස්වන වැඩ පිළිවෙළක් තමයි මේ ගෙනැවිත් තිබෙන්නේ. [බාධා කිරීම්] රජයට විරුද්ධව හරි, එහෙම නැත්නම් ඇමතිවරයෙකුට විරුද්ධව හරි යෝජනාවක් හරියට හදා ගන්න බැරිව මොන යෝජනාවක් සම්මත කරන්න යනවාද? [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් කියනවා, රිසානා නඹීක් කියන බාල දරුවා පිට රට යැව්වා ලු. රිසානාව පිට රට යැව්වේ ඩිලාන් පෙරේරා ඇමතිතුමාද? රිසානාගේ birth certificate එක forge කරලා හැදුවේ ඩිලාන් පෙරේරා ඇමතිතුමාද? රිසානාගේ passport එක හැදුවේ ඩිලාන් පෙරේරා ඇමතිතුමාද? නැහැ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුරු හරි කෙනෙක් ව්‍යාජ රියැදුරු බලපත්‍රයක් - forged licence එකක්- සහිතව වාහනයක් පදවලා ඔහු අතින් මරණයක් වුණා කියලා අපි හිතමු. එදාට මෙතුමන්ලා ප්‍රවාහන ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගේනවා. ඊළඟට වෛද්‍යවරයකුගේ නොසැලකිල්ලෙන් දරුවෙක් මිය ගියා කියලා හිතමු. මෙතුමන්ලා එදාට සෞඛ්‍ය ඇමතිතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගේනවා. මෙන්න මේක තමයි අද විපක්ෂයට වෙලා තිබෙන දේ. කොහේ හරි යම් දෙයක් වුණාද, ඒ සෑම දෙයක්ම ආණ්ඩුවේ account එකට දමන්නයි අද විපක්ෂයට අවශ්‍ය වෙලා තිබෙන්නේ. මෙන්න මේ කාරණය පාදක කරගෙන තමයි අද මේ යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු ඉතිහාසය දිහා බලන කොට අපට පේනවා විශ්වාස භංග යෝජනා ගෙන ඒමේදී අනුගමනය කළ යුතු මූලික ක්‍රියාමාර්ග රාශියක් තිබෙන බව. ඉන් පළමුවෙනි කාරණය තමයි යම් අමාත්‍යවරයකුට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා නම් එතැනදී අප අහනවා, has he misrepresented any facts at any stage කියලා. කරුණු විකෘති කොට ඉදිරිපත් කර තිබෙනවාද, අසත්‍යයක් ප්‍රකාශ කර තිබෙනවාද, එහෙම නැත්නම් දැඩි අයථා ක්‍රමයකින් - grave misconduct - යම් දෙයක් කර තිබෙනවාද, තමන්ගේ රාජකාරිය පැහැර හැර තිබෙනවාද කියලා අපි අහනවා. මේ යෝජනාවේදීත් ඩිලාන් පෙරේරා අමාත්‍යතුමා මෙන්න මේ කියන ආකාරයේ කිසිම කාර්යයක් සඳහා දායක වෙලා තිබෙනවාය කියලා විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙකුට පෙන්වා දෙන්න පුළුවන්කමක් නැහැ. එතුමා සහ රජය සිය පූර්ණ ශක්තිය මේ අවස්ථාවේදී යෙදුවා. අපේ ජී.එල්. පීරිස් ඇමතිතුමා කිවූ පරිදි මේ සඳහා අපේ ජනාධිපතිතුමා සිය මුළු ශක්තිය, සම්බන්ධකාවන් සියල්ල පාවිච්චි කරලා ඇයගේ ජීවිතය බේරා ගන්නට හැදුවා. නමුත් ඒ රටේ රජතුමාටත් ඒක කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. මොකද ෂරි-ආ නීතිය අනුව මවගේ සහ පියාගේ -ඒ දෙදෙනාගේම- කැමැත්ත නැතිව සමාවක් ලබා ගැනීමට පුළුවන්කමක් නැහැ. මේ කරුණු ඉතා පැහැදිලිව තිබියදී ඒවා ඔක්කොම යටපත් කරලා, පාගා දමලා, නිකම් නම් ටිකක් එකතු කරගෙන අමාත්‍යවරුන්ට එරෙහිව මේ විධියට විශ්වාස භංග යෝජනා ගෙන ඒම විහිළුවක් බව මම කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම විශේෂයෙන්ම අප කියා සිටින්නට ඕනෑ, සෑම දෙයකින්ම දේශපාලන වාසි ලබා ගන්නට යන්න එපා; එතකොට ඒක සවුත්තු වෙනවාය කියන කාරණය. දේශපාලන වාසි ලබා ගන්න පුළුවන් අවස්ථා තිබෙනවා; බැරි අවස්ථා තිබෙනවා. එම නිසා හරි අවස්ථාවකදී ඒවා කරන්න. වැරදි අවස්ථාවකදී කරන්න ගියාම හරි අවස්ථාවකදී කරන දේවලුත් derail වෙනවා. අනෙක් කෝච්චිය පිලි පනිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා පටු දේශපාලන වාසියක් ලබා ගන්න රිසානා වෙනුවෙන් මේ හලන කඳුළු කිඹුල් කඳුළු පමණයි කියා මා අවසාන වශයෙන් කියා සිටිනවා. අපේ රජයේ සියලු දෙනාම ශක්තිමත් ලෙස ගරු ඩිලාන් පෙරේරා අමාත්‍යතුමා පිටු පස සිටිනවා. මේ ප්‍රශ්නයේදී අප එතුමා වෙනුවෙන් ඡන්දය දෙනවා. එතුමා වෙනුවෙන් ඡන්දය දෙන්නේ එතුමා නිර්දෝෂ නිසායි. එතුමා තමන්ගේ යුතුකම් හා වගකීම් නිසි ලෙස ඉටු කර තිබෙන බවත්, මේ විශ්වාස භංග යෝජනාව විශාල ඡන්ද ප්‍රමාණයකින් පරාජය කරන බවත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.41]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රිසානා නඹීක් සෞදි අරාබියේදී මරණ දණ්ඩනයට ලක් කිරීම මූලික කර ගෙන විෂය භාර අමාත්‍යවරයා හැටියට ගරු ඩිලාන් පෙරේරා අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන විශ්වාස භංග යෝජනාවේදී අදහස් ප්‍රමාණයක් දක්වන්නට මා බලාපොරොත්තු වෙනවා.

ඇත්තටම අප මේ කාරණයේදී දකින්නේ මෙයයි. පාර්ලිමේන්තුවේදී විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන සංස්කෘතිය අනුව, ඒ විෂය පද්ධතිය අනුව ඩිලාන් පෙරේරා අමාත්‍යතුමා වෙත මෙය ඉදිරිපත් වුණත්, ඇත්තටම මෙය විෂය කාරණාවක් හැටියට හිතුවාම විදේශ කටයුතු අමාත්‍යාංශයත් විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශයත් හා පොදුවේ රජයම වග කිව යුතු කාරණාවක්. ඒකට හේතුව මොකක්ද? මේ නිශ්චිත කාරණාවේදී -රිසානා සම්බන්ධ ප්‍රශ්නයේදී- රජයක් හැටියට රාජ්‍ය තාන්ත්‍රිකව සිදු කළ මැදිහත්වීම ප්‍රමාණවත්ද කියන ප්‍රශ්නය මුලින්ම තිබෙනවා. විදේශ කටයුතු අමාත්‍ය ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් අමාත්‍යතුමාගේ කථාවේදී මුලින්ම කිව්වේ රිසානා මරණ දණ්ඩනයට ලක් කළ වෙලාව පිළිබඳව ගරු අමාත්‍යතුමා දැන ගෙන නොවෙයි රිසානාව බේරා ගන්න මැදිහත් වෙනවා කියලා පාර්ලිමේන්තුවේදී කිව්වේ කියන එකයි. ඒ කථාව තහවුරු කරන්නට අපේ උගත් මහාචාර්ය ඇමතිතුමා ඉදිරිපත් කළ කාරණය මෙයයි. සෞදි අරාබියේ වෙලාවෙන් එකොළහයි ගණනකට ඇයට මරණ දණ්ඩනය නියම වුණා; එතකොට ලංකාවේ වෙලාව දෙකයි හතළිස් ගණනයි; ඊට කලින් අපේ ඇමතිතුමා පාර්ලිමේන්තුවේ කථා කළා කියලා එතුමා කිව්වා. එතකොට එතැනම ප්‍රශ්නයට උත්තරයක් තිබෙනවා. එතැනම ප්‍රශ්නයට තිබෙන උත්තරය මෙයයි. විෂය භාර ඇමතිතුමා අඩුම තරමින් එදා දවසේ, මේ දිනයේ රිසානාව මරණ දණ්ඩනයට ලක් කරනවාය කියන කාරණය දැන ගෙන හිටියේ නැද්ද? මොකද, එදා දිනයේ ඇයව මරණ දණ්ඩනයට ලක් කරන බව දැන ගන්නට බැරි තරමට-

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු මන්ත්‍රීතුමා, ඒ බව කලින් දැනුම් දෙන්නේ නැහැ, කලින් කියන්නේ නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඇමතිතුමා කියනවා කලින් කියන්නේ නැහැ කියලා. එතකොට අපේ තානාපති කාර්යාලය, අපේ තානාපති සේවාව මේ සංවේදී ප්‍රශ්නය පිළිබඳව මැදිහත් වුණේ මොන විධියටද? ඒ කියන්නේ නඩු අහලා රිසානාව මරණ දණ්ඩනයට ලක් කරන එක අපේ රටේ සුදු වැන්වලින් ගෙන ගිහින් අතුරු දහන් කරනවා වාගේ වැඩක්ද? අපි දන්නවා. එහෙම දේවල් නම් වෙන බව. සුදු වැන්වලින් එනවා; කලින් දැනුම් දීමක් නැහැ; උස්සා ගෙන යනවා; කොහෙන් හෝ මුහුදට දමනවා. ඒක හරි. එක්නැලිගොඩ මාධ්‍යවේදියා අතුරුදහන් වුණ ආකාරයට නම් කලින් දැනුම් දීමක් නැහැ. නමුත් රිසානාගේ ප්‍රශ්නය එහෙම විය යුතු නැහැ.

ඒ වෙනුවෙන් රාජ්‍යතාන්ත්‍රික මැදිහත් වීමක් හරියට සිදු වුණා නම් අපේ තානාපති සේවාව, විදේශ කටයුතු අමාත්‍යාංශය -ලංකාව වෙනුවෙන් ඒ රටේ ඉන්න පඹයෙක් හරි- දැන ගෙන හිටියේ නැද්ද මේ දිනයේ රිසානාට මරණ දණ්ඩනය දෙනවා, ඒක විෂය භාර ඇමතිවරයාට දැනුම් දෙන්න ඕනෑය කියලා. මෙතැන ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ ඒ දැනුවත්භාවය පිළිබඳවයි. එය අද මේ ප්‍රශ්න කරන එක කාරණයක් වෙලා තිබෙනවා. ඒ කාරණයේදී විතරයි ගරු ඩිලාන් පෙරේරා -[බාධා කිරීමක්] ඒක තමයි. ඒ කාරණයේදී අපි අසමත්. ඒ කාරණයේදී රජය අසමත්. ඒ කාරණයේදී විදේශ සේවා නියුක්ති කාර්යාංශය, අමාත්‍යාංශය අසමත්. ඒ කාරණයේදී තමයි විෂය භාර අමාත්‍යතුමා අසාර්ථක වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දකින්නේ නැහැ, ගරු ඩිලාන් පෙරේරා අමාත්‍යතුමා පෞද්ගලිකව මේ කාරණයට සෘජුව වග කිව යුතුයි කියලා. පාර්ලිමේන්තුවේදී එදා දිනයේ එතුමා ඒ ගැන කිසි දෙයක් නොදැන වගකීමකින් තොරව කථා කිරීම ප්‍රධාන දෙයක්. ඒ ඇරෙන්න මහා දැවැන්ත විධියට මේක එතුමා පෞද්ගලිකව අරගෙන තිබෙනවා. එතුමා මේ වෙනුවෙන් ප්‍රචාරක මෙහෙයුමක් කරනවා. පෝස්ටර් ගහගෙන, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේම වාහන දාගෙන, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයට සාමාන්‍ය ඇඳුම් අන්දවලා උද්ඝෝෂණවලට ගෙනැල්ලා මහා දැවැන්ත මෙහෙයුමකින් එතුමා උත්සාහ කරනවා, මේක එතුමාට ආපු පෞද්ගලික කාරණාවක් හැටියට ගන්න. එහෙම ගන්න එකෙන්ම තමයි -එතුමා මේ වෙනුවෙන් කරන මෙහෙයුම දකින කොට- අපට මේක එතුමා ඇහේ දා ගත්ත දෙයක් හැටියට තේරෙන්නේ. ඇත්තටම ගත්තොත් ඒක එහෙම නොවෙයි. අපි මේක දේශපාලන වශයෙන් තේරුම් ගන්නේ ඊට වඩා වෙනස් විධියටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටෙන් හෙටත් රිසානාලා වාගේ අය විදේශ රැකියාවලට යනවා. නිල වශයෙන් සහ නිල නොවන විධියට මුහුදෙන් එතෙර ඉතාලි යන්න, ඕස්ට්‍රේලියාවට යන්න දැනටත් පෝලිමේ ඉන්නවා. ඩොලර්, වෙන විදේශ මුදල් හොයා ගෙන රට පනින්න ගොඩාක් අය බලාගෙන ඉන්නවා. ඒ යන අම්මලා යන්නේ වහල් සේවයටයි. මේ යන්නේ නිකම් සැප ගන්න රස්සාවක් කරන්න නොවෙයි. මැද පෙරදිග ගෘහ සේවයට යනවා කියා යන්නේ නූතන වහල් සේවයටයි. මේ නූතන වහල් යුගය. ඒ නූතන වහල් සේවයට යන්නේ කවුද? අපේ රටේ සංස්කෘතිය අනුව අපි පිළිගන්නවා, පවුල කියන ඒකකය තමයි වටිනාම ඒකකය කියලා. පවුලේ මව, පියා, දූ දරුවෝ බඩ ගින්නේ හරි එකට වැටිලා තිබෙන දෙයක් කාලා ජීවත්වන සංස්කෘතියක් අපට තිබුණා. ඒ සංස්කෘතිය බිඳ දැම්මේ කවුද? ඒ සංස්කෘතිය බිඳ දැම්මේ මේ තිබෙන, බල්ලෝ මරලා හරි සල්ලි හම්බ කළේ නැති වුණොත් ජීවත් වෙන්න බැහැ කියලා නම් කරපු, සහතික කරපු ආර්ථිකයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම අද විශ්වාස භංගයට ලක් වෙන්න ඕනෑ මෙන්න මේ මිනිසුන්ගේ පවුල් ඒකක විනාශ කරන, දරුවෝ දාලා අම්මලා රට යන්න හේතුවන, අම්මලා රට යෑම නිසා ලංකාවේදී දරුවෝ අනාථ වෙන්න, වහ බොන්න, විනාශයට ලක් වෙන්න හේතුව වන ඒ ආර්ථික ක්‍රමයට විරුද්ධවයි. මේ ආර්ථික ක්‍රමය වෙනස් වෙන්නේ නැතුව, මේ ආර්ථික දේහය වෙනස් කරන්නේ නැතුව ඩිලාන් පෙරේරා ඇමතිතුමා පෞද්ගලිකව වග කිව යුත්තෙක් වෙන්නේ නැහැ. බාල වයස්කාර දැරිවියක් හැටියට තමන්ගේ passport එක වෙනස් කරගෙන රිසානා රට ගියේ ඇයි කියලා හොඳට ඔප්පු වෙනවා, ඇයගේ නිවහන දැක්කාම; ඇයගේ දෙමවුපියෝ දැක්කාම; ඇය ජීවත්වුණු පරිසරය දැක්කාම; ඒ වට පිටාව දැක්කාම. ඇය වෙනුවෙන් පෙනී ඉඳලා ඇයව නිදහස් කර ගන්න බැරි වීම පැත්තෙන් අපි අසාර්ථක වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි මේ ආර්ථික ක්‍රමය ඇතුළේ රිසානාලා වාගේ අය තව දස දහස් ගණන් බිහි කරනවා. ඒ අය බිහි වෙන එක වළක්වන්න, එවැනි අය තව රට යන එක වළක්වන්න අපට බැරි වෙලා තිබෙනවා. ඒක තමයි ඇත්තම බෙදවාචකය. අපි රටක් හැටියට කම්පා වෙන්න ඕනෑ ඒකටයි.

මේ ප්‍රශ්නයේදී අපේ නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා විහිළු කරනවා, වෛද්‍යවරයෙක් අතින් බෙහෙතක් වැරදුණොත්නින් සෞඛ්‍ය ඇමතිතුමාට විරුද්ධවත් විශ්වාස භංගයක් ගෙනෙව්, ප්‍රවාහනයේදී රියදුරෙක් අතින් වරදක් වුණොත්නින් ප්‍රවාහන ඇමතිතුමාට විරුද්ධවත් විශ්වාස භංගයක් ගෙනේවි කියලා. එවැනි කාරණයි මේකයි වෙනස්. මොකද ප්‍රවාහන ඇමතිවරයාට විශ්වාස භංගයක් ගේන්න වෙන්නේ නැහැ, වැරැදි රියදුරකුගේ අතින් accident එකක් වුණොත්නින්. රාජතාන්ත්‍රික ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා. රාජතාන්ත්‍රිකව ගනුදෙනු කරපු ආකාරයේ වැරැද්දක් මෙතැන තිබෙනවා. ඒ වැරැද්ද කොච්චරද කියලා ප්‍රකාශයට පත් වුණා, තානාපති සේවාවන්, විදේශ කටයුතු අමාත්‍යාංශය, විදේශ සේවා නියුක්ති කාර්යාංශය අඩු තරමින් රිසානාගේ මරණය සම්බන්ධයෙන් ඇමතිවරයා දැනුවත් කරලා නොතිබුණාද කියන ප්‍රශ්නයක් එක්ක.

ඇමතිවරයාගේ දැනුවත්භාවයේ ප්‍රශ්නයක් තිබුණා. ඒකයි මේ තිබෙන කාරණය. අර වෛද්‍යවරයාගේ කාරණාවයි, ප්‍රවාහනය සම්බන්ධ කාරණාවයි වාගේ නොවෙයි මෙතැන තිබෙන රාජතාන්ත්‍රිකභාවය පිළිබඳ කාරණය. අපට බැරි වුණාද රිසානා බාල වයස්කාර දැරිවියක් කියන එක ඔප්පු කර ගන්න? අපට බැරි වුණාද ඒ මීය ගිය දරුවාගේ අම්මා සතු වගකීම ඔප්පු කරන්න? මොකද, ඒ රටේ -අරාබි- නීතිය අනුව මව්කිරි දෙන මවක් වෙන කෙනකු ලවා දරුවාට කිරි දෙන එක වරදක්; කිරි පොවන එක වරදක්. ඒ වරද අපට ඔප්පු කර ගන්න බැරි වුණාද? එවැනි කාරණා ගොඩක් තිබෙනවා. ඒ කාරණා එක්ක ගැට ගැසුණු ගැටලුවක් මේක. ඒ ගැටලුව තුළ නියෝජනය වන්නේ රිසානා විතරක් නොවෙයි. ඒ තුළ අපේ රටට ඩොලර් බිලියන ගණනක විදේශ විනිමය ගෙනෙන, ඒ වෙනුවෙන් දහදුක් විඳින, ඒ වෙනුවෙන් තානාපති කාර්යාලවල වද බන්ධනයට ලක් වෙන, ඔවුන්ගේ අසාධාරණකම්වලට, කෙනෙහිලිකම්වලට ලක් වෙන අය ඉන්නවා. ඒ වහල් සේවයේ යොදවන වහල් හිමියන්ටත් වඩා දරුණු විධියට, ඔවුන් වෙනුවෙන් ඉන්නවාය කියන තානාපති නිලධාරීන් ඔවුන් පීඩාවට පත් කරනවාය කියන වෛරයක් ඔවුන් තුළ තිබෙනවා. මා හිතන හැටියට ඒක ගරු ඇමතිතුමාත් දන්නවා. විදේශ රටවලට ගියාම, ඒ රටවල රැකියා කරන අයගෙන් එන මැසිවිලි, දුක්ගැනවිලි අනුව එතුමාත් ඒක දන්නවා. අද ජෙඩා පාලම යට ඉන්න මිනිසුන්ගේ තත්ත්වය, කුවේට්වල ඉන්න මිනිසුන්ගේ තත්ත්වය බලන්න. සමහර අය ලංකාවෙන් ගෙන යනවා. ඊට පස්සේ ඒ අයගේ ගෙවල්වල තියාගෙන ඉන්නවා. ඒ ගෙදර ඉන්න රියැදුරා නේපාල රටේ කෙනෙකු නම්, බංගලි දේශයේ කෙනකු නම්, වෙන රටක කෙනකු නම් මුලින්ම ඒ අය දූෂණයට ලක් කරනවා. ඊට පස්සේ පාරට ඇද දමනවා. ඒක තමයි ඇත්ත දේ. අපේ අම්මලා, අපේ අක්කලා, එක පවුලක් හැටියට එකට ජීවත් වෙන්න ඕනෑ මිනිස්සු අද ඒ රටවලට ගිහිල්ලා

මොනවාද කරන්නේ? ඒ අය ඒ සුල්තාන්ලාගේ, අරාබි කාන්තාවන්ගේ පස්ස හෝදන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ අයගේ රූපලාවන්‍ය වෙනුවෙන් මයිල් ගලවන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒවා ඒ අය කැමැත්තෙන් කරන දේවල් නොවෙයි. ඒ අය ඒ තරම් දුක්බිත ජීවිත ගත කරනවා; තිරිසන් ජීවිත ගත කරනවා. ඇයි ඒ? ඒකට හේතුව මොකක්ද? අපේ ආර්ථිකය ඇතුළේ, අපේ රට ඇතුළේ ඒ මිනිස්සු රඳවාගෙන ඒ මිනිසුන්ට පවුලක් හැටියට ජීවත් වෙන්න ක්‍රමයක් හදා දෙන්න අපි අසමත් වෙලා තිබෙනවා. ඒකයි හේතුව. පවුලක් හැටියට අපේ සංස්කෘතිය, අපේ වටිනාකම් අපේ හර පද්ධති ආරක්ෂා කරගෙන එකට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. ඒක තමයි ඇත්ත අර්බුදය. ඒක තමයි විශ්වාස භංගයට ලක් වෙන්න ඕනෑ දේ. මේ පාර්ලිමේන්තුවේ තිබෙන ක්‍රියාවලිය ඇතුළේ, ඒ ක්‍රමය ඇතුළේ පෞද්ගලිකව මෙතුමාට මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවාට, ඇත්තටම මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න ඕනෑකම තිබෙන්නේ, අපේ රටින් ලක්ෂ ගණන් මිනිස්සු එළියට ඇද දමලා, පවුල් විනාශ කරලා තිබෙන මේ දේශපාලන සංස්කෘතියට; මේ ආර්ථිකයට; මේ ආර්ථික ක්‍රමයට. මේ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ. අපි කියන්නේ ඒකයි. මේ ක්‍රමය වෙනස් නොවන තාක්කල් තව රිසානාලා හෙට බිහි වෙනවා. ඒ වාගේම ඩිලාන් පෙරේරා ඇමතිතුමා වාගේ මේ විෂය භාර ඇමතිවරු තව තවත් බිහි වෙනවා. මේ තත්ත්වය වෙනස් නොවනතුරු ඇමතිවරු බිහි වෙන එක වළකින්නෙත් නැහැ, ඒ වාගේම රිසානාලා බිහි වන එක වළකින්නෙත් නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය.

ඊළඟට තිබෙන ප්‍රශ්නය මොකක්ද? ඒ ශ්‍රමය වගුරවා, දහදුක් විඳලා ඒ ගෙනෙන විදේශ විනිමයට අපි මොනවාද කරන්නේ? ඒ අය ඩොලර් කෝටි පන්සිය ගණනක් ලංකාවට ගෙනෙනවා. අද අපි ඒ දිහා බලාගෙන ඉන්නවා. අද අපට තිබෙන ප්‍රධානම ආදායම් මාර්ගය ඒක. ඒ අය විශාල ආදායමක් ලංකාවට ගෙනෙන නිසා අපි ඒ අය නම් කරනවා "රට විරුවන්" කියලා. හැබැයි ඒ ගෙනෙන ආදායම වෙනුවෙන් ඒ අයට අපි දීලා තිබෙන සහනය මොකක්ද? අපි ඒ අයගේ ප්‍රශ්න කොච්චර දුරට විසඳලා තිබෙනවාද? ඒ අයගෙන් අපි ලබා ගත්ත දෙයට ලබා දී තිබෙන ප්‍රතිලාභ මොනවාද? ඇත්තටම ගත්තොත් ඒ සම්බන්ධයෙන් තිබෙන්නේ බෙදජනක තත්ත්වයක්. එවැනි මැදිහත්වීම් අපි සිද්ධ කර නැති තත්ත්වයක් තිබෙන්නේ.

ඒක නිසා මූලික වශයෙන්ම විදේශ ගත වන ශ්‍රී ලාංකිකයන්ගේ ගැටලු, ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ ගැටලු වෙනුවෙන් අපේ මැදිහත්වීමේ තිබෙන දුර්වලකම් කරුණු කිහිපයක් එක්ක මා ඔබතුමාට පෙන්වන්නම්. මේ මා අතේ තිබෙන්නේ, ඔබතුමා විෂය භාර ඇමතිවරයා හැටියට ඉන්න කාලයේදීම විදේශ සේවා නියුක්ති කාර්යාංශය සම්බන්ධයෙන් 2011 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපතිවරයා ඉදිරිපත් කළ වාර්තාව.

විගණකාධිපතිවරයා ඉදිරිපත් කරන මේ වාර්තාවේ 9 වැනි පිටුවේ කොරියානු රැකියා සඳහා පිටත්ව යන පුද්ගලයන්ගෙන් අය කරන සුබසාධන මුදල් ගැන සඳහන් වෙනවා, මේ විධියට.

"එක් පුද්ගලයකුගෙන් රුපියල් 49,500ක් පමණ සුබසාධන කටයුතු සඳහා අය කර තිබූ අතර, 2011 වර්ෂය තුළ දී රුපියල් මිලියන 230ක පමණ මුදලක් අය කර ගෙන තිබුණා. මෙලෙස සුබසාධනය වෙනුවෙන් මුදල් අය කළද, කිසිදු සුබසාධන වැඩ පිළිවෙළක් හඳුන්වා දී නොතිබුණු අතර, මෙම මුදල් වෙනම බැංකු ගිණුමක ආයෝජනය කිරීමට කටයුතු නොකර පොදු බැංකු ගිණුම් යටතේ රඳවා ගෙන තිබුණා."

මේක කියන්නේ මම නොවෙයි. මේක කියන්නේ විගණකාධිපතිතුමා. මෙන්න මෙවැනි කාරණා තිබෙනවා. මේ එක සිද්ධියක් විතරයි. මේ කොරියාව සම්බන්ධයෙන්. වෙනත් රටකට අදාළව වුණත් එහෙමයි. මම අහන්නේ මේකයි. අපි "රට විරුවෝ" කියලා සලකන මිනිසුන්ගේ, අපේ රටට විදේශ විනිමය ගෙන එන ප්‍රධාන ප්‍රවාහය බවට පත් වෙලා තිබෙන මිනිසුන්ගේ, වෙනත් රටවල සේවය කරන මිනිසුන්ගේ -මැද පෙරදිග වෙන්න පුළුවන්, කොරියාව වෙන්න පුළුවන්, වෙනත් ඕනෑම රටක වෙන්න පුළුවන් - වටිනාකමට ඒ තානාපති කාර්යාල සලකන ආකාරය පිළිබඳව විදේශ කටයුතු ඇමතිතුමා හැටියට, විදේශ සේවා නියුක්ති කාර්යාංශය භාර ඇමතිතුමා හැටියට ඔබතුමන්ලා දෙදෙනා තෘප්තිමත්ද? ඒ ගැන ඔබතුමන්ලා දෙදෙනා සෑහීමට පත් වෙනවාද? හෘදය සාක්ෂියෙන් අවංකව ඇහුවොත් සෑහීමට පත් වෙන්න බැහැ. මොකද, ඒ ශ්‍රමිකයා තමන්ගේ දරු පවුල් නැතිව ඒ රටවල ඉඳ ගෙන ලංකාවට උපයා දෙන දේ වෙනුවෙන්, ඒ මිනිසුන්ගේ ජීවිත වෙනුවෙන් අපි සාධාරණයක් ඉෂ්ට කර නැති නිසා. මගේ කථාව අවසන් කරන්න මට තව එක මිනිත්තුවක් දෙන්න.

පසු ගිය අය වැය විවාදයේ දී මම මතු කළ එක කාරණාවක් සම්බන්ධයෙන් මේ විෂය භාර ඇමතිතුමා විධියට මෙතුමා කළ කථාවේ දී මටත් අපහාස වන විධියට ගොඩක් දේවල් කිව්වා. ඒ ගැන මට කොහෙත්ම ප්‍රශ්නයක් නැහැ. නමුත් ඔබතුමා මගේ කථාවට උත්තර දීලා තිබුණා. ඔබතුමා ඒ හැම වෙලාවේම කිව්වා, "මම සිල්පද හතරක් කඩනවා. හැබැයි, මම අදිත්නාදානා නම් කඩන්නේ නැහැ" කියලා. ඒ වාගේම ඔබතුමා ඒ කථාවේ දී මෙන්න මෙහෙම කිව්වා. එක කාරණාවක් ගැන කියද්දී මා සම්බන්ධයෙන් මෙහෙම කිව්වා. "මෙතුමා වෙක් එකක් ගැන කිව්වා. ඒ වෙක් එක ගැන මෙපමණයි කියන්නේ. වෙක් එකක් නොවෙයි දහයක් ගෙනැල්ලා පෙන්නුවත් මට කියන්න තිබෙන්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් නොවෙයි, වොලිබෝල් සංගමයේ සභාපතිවරයා හැටියට ඒ සංගමයෙන්වත් සල්ලි ගන්නේ නැතිව මගේ සල්ලිවලින් තමයි පිට රට යන්නේ." එහෙම කියලා ඔබතුමා තවදුරටත් කියනවා, "විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විවිධ උදව්ය විවිධ කාරණා සඳහා පිට රට යනවා. හැබැයි, මේ මොකකටවත්, විශේෂයෙන් වොලිබෝල් සම්බන්ධයෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් රුපියලක්වත් කවුරුවත් අර ගෙන නැහැ" කියලා. ඒ සංගමයේ ලේකම්තුමාවත් අර ගෙන නැහැ කිව්වා. නමුත් විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තිබෙනවා මෙන්න මේ කාරණය.

"මත භේදයට තුඩු දෙන ගනුදෙනු.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුණුවලින් බැහැරව වොලිබෝල් ක්‍රීඩාව වෙනුවෙන් රුපියල් 97,21,189ක් වියදම් කර ඒ තුළ වොලිබෝල් සංගමය විසින් දැරිය යුතු රුපියල් 26,54,304ක් ආයතනය විසින් දරා තිබුණි." ඒ "ආයතනය" කියන්නේ ඔබතුමා මේ දිවුරා කියන විදේශ සේවා නියුක්ති කාර්යාංශයම තමයි. මම නොවෙයි මේක කියන්නේ, විගණකාධිපතිතුමා. ඔබතුමාගේම වචන තමයි මේ තිබෙන්නේ. ගිය අවුරුද්දේ අය වැය විවාදයේ දී ඔබතුමා කළ කථාව නැවත කියවා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.57]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුත්තූර්වල ඉපදුණු රිසානා නෆීක් නැමති ඒ අහිංසක පාසල් ශිෂ්‍යාව මරණයෙන් බේරා ගන්නට නොහැකි වුණු විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍ය ඩිලාන් පෙරේරා මැතිතුමාට එරෙහිව මේ පවත්වන විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේ දී කථාවක් කරන්නට

[ගරු රන්ජන් රාමනායක මහතා]

ලැබීම මගේ භාග්‍යයක් නොව, මගේ යුතුකමක්, මගේ අනිවාර්ය සේවයක් හැටියට සලකා මගේ කථාව පටන් ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වභාව ධර්මයට අනුව බැලුවත්, බුද්ධ ධර්මය, ඉස්ලාම් ධර්මය, හින්දු ධර්මය, කතෝලික ධර්මය ඇතුළු සියලු ධර්මයන්ට එකහව කොයි පැත්තෙන් බැලුවත් මේ රිසානා නෂීක් කියන දැරිය, පාසල් ශිෂ්‍යාව මුත්තුර්වල ඉපදුණ දුප්පත් ළමයකු බවත්, ඒ ළමයාට එල්ල වුණු වරද, ඒ ළමයාට වුණු කරදරය ඇත්තෙන්ම ශෝචනීය තත්ත්වයක් බවත් පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව අප පිළිගන්නවා. ඒක අපරාධයක්. මේ අපරාධය අද මේ පාර්ලිමේන්තුවේ බොහෝ ඇමතිවරු, මන්ත්‍රීවරු විහිළුවට අර ගෙන හිනා වෙනවා මම දැක්කා. අද ඒක විහිළුවක් වෙලා.

අහිංසක පාසල් ශිෂ්‍යාවක ජනවාරි 09වැනි දා ඇදගෙන ගිහිල්ලා, අත් දෙක බැඳලා, බෙල්ලට කඩුවකින් කොටලා මරණ එක අද සමහර මැති ඇමතිවරුන්ට විහිළුවක් වෙලා. ඒ, ඇය එතුමන්ලාගේ කවුරුවත් නොවන හින්දයි. මේ දෝෂාභියෝගය ගැන අධ්‍යයනය කරන ජනතාවටත්, මේ සියලු මන්ත්‍රීවරුන්ටත්, ඇමතිවරුන්ටත් මා කියා සිටින්නේ, රිසානා ඝාතනය කරපු, ඝාතනයට වක්‍රාකාරව සහයෝගය දුන් අයට සහයෝගය දෙන සියලු දෙනා, මේ යෝජනාවට විපක්ෂව ඡන්දය දෙන මැති ඇමතිවරුන් සියලු දෙනා වක්‍රාකාරව මේ ඝාතනයට සම්බන්ධ වෙනවා කියලායි. ඒ අයට- [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ කොහොමද? [බාධා කිරීම්]

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
ඇයි? [බාධා කිරීම්] මේ තත්ත්වය- [බාධා කිරීම්] රිසානා කියන දැරිය- [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මාර නීතියක් නේ ඒක.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
මා කෙළින්ම මාතෘකාවට බහින්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩිලාන් පෙරේරා ඇමතිතුමා Wijeya Publication එකක් වන "අද" කියන පත්තරයට ප්‍රකාශයක් කරලා තිබෙනවා, "රිසානාගේ මරණයට මට වග කියන්න බැහැ" කියලා. අපි පිළිගන්නවා; එතුමාට වග කියන්න බැහැ කියලා. එතුමාට වග කියන්න බැරි වූ හින්දා තමයි රිසානා නෂීක් ඝාතනය වුණේ. වග කියන්න පුළුවන් ඇමතිවරයකු අපට දෙන්න. එතුමාට වග කියන්න බැහැ. එතුමා අදක්ෂයි. එතුමා තමන්ගේ යාළුවා වන නාලන්ද එල්ලාවල මැතිතුමා රැක ගන්න බැරි වූ කෙනෙක්. [බාධා කිරීමක්] තමන්ගේ යාළුවා වූ නාලන්ද එල්ලාවල රැක ගන්න බැරිවූ මනුස්සයා කොහොමද මුතුර්වල පාසල් ශිෂ්‍යාව රැක ගන්නේ? නාලන්ද එල්ලාවලගේ පිළිරුව එතැනින් ගෙන ගිය එක සම්බන්ධයෙන් ආණ්ඩුවට මොකවත් කියා ගන්න බැරි වූ කොන්දක් නැති ඇමතිතුමෙක් එතුමා. එතුමා එක්ක අපේ පෞද්ගලික තරහක් නැහැ. එතුමා හැර වෙනත් ඇමතිවරයකු මෙතැන සිටියත් ඒ ඇමති ධුරය සමඟ පමණයි අපේ ප්‍රශ්නය තිබෙන්නේ. එතුමා සමඟ නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. එතුමා මගේ මිත්‍රයෙක්. [බාධා කිරීමක්] නමුත් එතුමා -2010 පත්වූ මේ ඇමතිතුමා- කියනවා 2013 ජනවාරි 09වැනි දා මරපු රිසානාට වග කියන්න බැහැ කියලා. ඒක පුදුම කථාවක්. එතුමාට කාර්ය මණ්ඩලයක් දීලා තිබෙනවා; පඩි දීලා තිබෙනවා; එතුමාගේ කනකාට ගෙවනවා. කිෂෝලි කියන, එතුමාගේ නැඟණියට jobs දෙකක් දීලා තිබෙනවා. තමුන්නාන්සේලා මේවා දැනගන්න. එතුමාගේ නැඟණිය ආණ්ඩුවේ jobs දෙකක් කරනවා. ඇය විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවයේ නියුතු සාමාන්‍යාධිකාරිවරියක්. ඒ වාගේම, විදේශ රැකියා ඒජන්සිකරුවන්ගේ සංගමයේ වැඩ කරනවා. එහෙම කර පඩි දෙකක් ගන්නවා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(මාණ්පුමිකු ඩිලාන් පෙරේරා)
(The Hon. Dilan Perera)
එක පඩියයි ගන්නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
නමුත් jobs දෙකක් කරනවා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(මාණ්පුමිකු ඩිලාන් පෙරේරා)
(The Hon. Dilan Perera)
අසත්‍යය.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
අසත්‍යය නම් ඔබතුමාගේ කථාවේදී කියන්න. ඔබතුමන්ලා දැන ගන්න, අපට පක්ෂ භේදයක් පාට භේදයක් නැහැ කියන එක. අප ඉන්නේ මේ වැරැදි ගැන කියන්නයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට බාධා කරනවා නොවෙයි.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
කියන්න, ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා. [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා කිව්වා නේ ගරු අමාත්‍යතුමාගේ නැගණිය වැටුප් දෙකක් ගන්නවා කියලා. [බාධා කිරීම්]

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
ඔබතුමා පසුව කථා කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ වැටුප් ලේඛන සභාගත කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩිලාන් පෙරේරා ඇමතිතුමා කියනවා- [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ වැටුප් ලේඛන දැන් සභාගත කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මා එය ගෙනෙන්නම්. අනිවාර්යයෙන් ගෙනෙන්නම්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් සභාගත කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
දැන් ගෙනැවිත් නැහැ. නමුත් ගෙනෙන්නම්. ඔබතුමා කියන කියන වෙලාවට- [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒවා දැන් සභාගත කරන්න. ගරු මන්ත්‍රීතුමා වගකීමකින් කථා කරන්න. අසත්‍යය කියන්න වැඩක් නැහැ. එහෙම එකක් තිබෙනවා නම් කියන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පුවත් පතේ කියන විධියට ඩිලාන් පෙරේරා ඇමතිතුමා 2010 දීයි මේ අමාත්‍ය ධුරයට පත් වුණේ. විදේශ සේවා නියුක්ති කාර්යාංශයට, විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයට, කම්කරු අමාත්‍යාංශයට සම්බන්ධ පරණ cases ගොඩක් තිබෙනවා. ඒවාට මෙතුමා වග කියන්නේ නැද්ද? ඒවාට වග කියන්න ඕනෑ කවුද? ඇමතිවරයා නොවෙයිද? තමා ඇමති ධුරයට පත් වන්නේ 2010 දීයි කියලා ඇමතිතුමා කියනවා. එහෙම නම් යුද්ධය පැවතුණේ කවදා ඉඳලාද? යුද්ධය අවුරුදු 30කට ඉස්සර ඉඳලායි පැවතුණේ. අපි පිළිගන්නවා අතිගරු ජනාධිපතිතුමා, ආරක්ෂක ලේකම්තුමා, ජනරාල් සරත් ෆොන්සේකා මහත්මයා, ත්‍රිවිධ හමුදාව ඒ යුද්ධය දිනපු බව. ඒ සියලු දෙනා ඒ වෙනුවෙන් වැඩ කළා. අපි ඒ සම්බන්ධයෙන් ඒ අයට ප්‍රශංසාව දෙනවා. නමුත් ජයග්‍රහණයට පියවරු බොහෝය; පරාජිතයා අවජාතකයෙකි. ඒ කාරණය පරාජය වුණාම රන්ජන් රාමනායක හින්දා ලු. මා picket කරපු හින්දාලු ඒ ළමයා මැරුණේ. ඇමතිතුමා පඩි ගන්නවා. එතුමාට ලොකු කාර්ය මණ්ඩලයක් ඉන්නවා. විදේශ සංචාරවලට සහභාගි වෙනවා. එතුමාගේ සහෝදරිය පඩි දෙකක් ගන්නවා; jobs දෙකක් කරනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එතුමිය විතරද පඩි ගන්නේ විදේශ සේවා එකෙන්?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලන්න මේ ප්‍රශ්නයට ඩිලාන් පෙරේරා ඇමතිතුමා බය වූ බයවීම කොතරම්ද කියලා. මා අද එද්දී මට දුරකථන ඇමතුම් කීපයක් ආවා Bureau එකෙන්. Bureau එකේ අය කියන්නේ මොකක්ද? කොරියාවේ යන අයට, ඩුබායි යන අයට, කඩවත training centresවල අයට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කරලා තිබෙනවා, uniform නැතිව සිවිල් ඇඳුම් ඇඳගෙන අද picketing එකට සහභාගි වෙන්න පාර්ලිමේන්තු වට රවුමට එන්න කියලා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, Hon. Dilan Perera.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I am listening to his speech and I am able to face any allegation. But, all these are false allegations. So, all these must be either proved or expunged.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
If there is any statement made contrary to the Standing Orders, that will be expunged.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දකින්න ඇති පාර්ලිමේන්තු පාරේ වට රවුමේ ඉන්නවා 500කට අධික පිරිසක්. ඒ පිරිස ගෙනාවේ කොහෙන්ද? ඒ පිරිස ගෙනාවේ Bureau එකෙන්. Bureau එකේ කෙනෙක් මට දැන් කථා කරලා කිව්වා.

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
අපට ඕනෑ නම් ඕනෑ තැනකින් ගේන්න පුළුවන්. ඇයි, ගේන්න බැරිද?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ලංකාව වටේට පෝස්ටර් අලවනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
500ක් නොවෙයි 5,000කට වැඩිය ඉන්නවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
5,000ක් හරි කමක් නැහැ. [බාධා කිරීම්] ඇයි ඇමතිතුමා මේකට මෙච්චර භය? ඇමතිතුමා වරදක් කරපු හින්දා තමයි භය වෙලා ඉන්නේ. "හොරාට ඉස්සරවෙලා කෙහෙල් කැන වැට පැන්නාලු" කියන්නේ මේකට තමයි. මොකද, එතුමා දන්නවා එතුමා මේ වරද කළා කියලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
රත්නපුරේ මැණික්කාරයින්ගෙන් සල්ලි එකතු කරගෙන ඇවිල්ලා ඊට පස්සේ ඒ පළාත් සභාව පැත්තටවත් ගියේ නැහැ. නළුවා නිසා ඡන්දය දුන්නා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Picket එකක් කළේ නැහැනේ; Picket එකක් කළේ නැහැ. අපි අද කථා කරන්නේ රිසානා ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේකයි අද තත්ත්වය. අද සියලුම දෙනාට සල්ලි දීලා, -අල්ලස් දීලා- මාධ්‍ය රවට්ටලා, මාධ්‍යයට තර්ජනය කරලා, මාධ්‍යකරුවන්ට කොරියා රස්සා, ඒ වාගේම අනෙකුත් රස්සා දීලා, ප්‍රතිපාදන දීලා, වරප්‍රසාද දීලා මේක නවත්වලා තිබෙනවා. අන්න ඒක තමයි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ක්‍රමය. [බාධා කිරීමක්] ඒ කියන්නේ ඇත්ත කියනවාට භයයි. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා නිහඬ වෙන්න කියන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රිසානා නෆීක් කියන දැරිය ඉපදුණේ 1988 පෙබරවාරි 04 වැනිදා. එතකොට Omar Travels කියන කුට ජාවාරම්කාර ඒජන්සිය ඒ දැරිවියගේ උපන් දිනය 1982 පෙබරවාරි 04 කියලා උපන් දිනය වෙනස් කරලා තිබෙනවා. රිසානා කියන ළමයා විදේශගත කළේ 2005 මැයි මාසයේ. [බාධා කිරීමක්] ඒ ඒජන්සිය blacklist කරන්න මේ ආණ්ඩුවට අවුරුදු 6ක් ගත වුණා. ඒ ඒජන්සිය blacklist කරන්න කටයුතු කළේත් රිසානාගේ වයස පිළිබඳ ලේඛන මම මේ පාර්ලිමේන්තුවේ සභාගත කළාට පස්සේ. 2010 දෙසැම්බර් මාසයේ 17 වැනිදා රිසානා නෆීක්ගේ සැබෑ උප්පැන්න සහතිකයේ පිටපතත්, රිසානා නෆීක්ගේ අම්මාගෙයි තාත්තාගෙයි විවාහ සහතිකයේ පිටපතත් මම සභාගත කළා. සභාගත කරලා මම කිව්වා, පුළුවන් නම් ගිහිල්ලා මේ පිටපත් දෙක සෞදි අරාබියේ උසාවියට ඉදිරිපත් කරන්න කියලා. [බාධා කිරීමක්] ඒක කළේ නැහැ. ඔහු රට සවාරි යෙදෙමින් හිටියා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

විනෝද වෙමින් හිටියා, රිසානා නෆීක්ව අත හැරියා. ඒක තමයි ඇත්ත කථාව. [බාධා කිරීමක්]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
කා එක්කද විනෝද වුණේ?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

විනෝද වුණේ කවුද?

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Petroleum Industries)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The Hon. Anura Priyadharshana Yapa.- [*Interruption.*]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පෞද්ගලික දේවල් කියන්න එපා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කථා කියන්න එපා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, if you have made any statement contrary to the Standing Orders, that will be expunged. I repeat it.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා ඉතාම පහත් විධියටයි කථා කරන්නේ. ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, පෞද්ගලික දේවල් ගැන කථා කරන්නේ නැතුව පාර්ලිමේන්තු සම්ප්‍රදායට ගරු කරමින් කථා කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පෞද්ගලික දේවල් කියන්න එපා. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Let the Hon. Member speak. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංවේදී ප්‍රශ්නයට පොඩ්ඩක් ඇහුම් කන් දෙන්න කියලා කියන්න. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා කථා කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දැරියට අවුරුදු 17දී,- [බාධා කිරීම්]

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார
(The Hon. A.P. Jagath Pushpakumara
ප්ලේන් එකේ යන කොට කොහොමද සංවේදීකම.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞදිවල සිද්ධ වන අඩන්තේට්ටම් ගැන හිතන්න. තුංගසිරි කියන,- [බාධා කිරීමක්] බුදු පිළිමයක් තබා ගෙන වන්දනා කළා කියලා සෞදියේදී කස පහර 200ක් ගහපු තුංගසිරි මම අද පාර්ලිමේන්තුවට එක්කගෙන ඇවිත් තිබෙනවා. අන්න අතැන මහජන ගැලරියේ ඔහු ඉන්නවා. ඒ සිද්ධිය පිළිබඳව සාක්ෂියක් තිබෙනවා. තුංගසිරි මහජන ගැලරියේ ඉන්නවා. මම අම්පාරේ ඉඳලා තුංගසිරිව එක්කගෙන ආවා. තුංගසිරිගේ අම්මයි, තුංගසිරියි ඉන්නවා. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංවේදී ප්‍රශ්නය ගැන කථා කරන්න මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා කථා කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රිසානා මැරෙන්න ඉස්සෙල්ලා කිව්ව කථාව බලන්න. රිසානා අන්තිම මොහොතේ කඳුළු පිරි දෙනෙතින් මෙසේ ඉල්ලා සිටියා, "අනේ මට සමාව දෙන්න, ගෙදර ගියාම නංගිට දෙන්න හිර ගෙදර දී රේන්ද ගෙතුවා"කියලා. මරණ දඬුවම පිළිබඳව තීරණය දැනුම් දුන්නු අවස්ථාවේ දී රිසානා එක දිගට විනාඩි දෙකක් පමණ නිශ්ශබ්දව බිම බලාගෙන කල්පනා කරමින් සිට තමාට සමාව දෙන ලෙස හාම්පුතාගේ බිරියට යළි කියන්නැයි බිදුණු හඬින් හා කඳුළු පිරි දෙනෙතින් යුතුව ප්‍රකාශ කර තිබෙනවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඕවා කියලා තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
පූජකවරුන් කිව්වේ - [බාධා කිරීමක්] රිසානාගේ ප්‍රශ්නය අද රංජිත් ද සොයිසා මන්ත්‍රීවරයාට විහිළුවක් වෙන්න ඇති. මොකද ඔබතුමාගේ දුවගේ බෙල්ල කැපුවේ නැහැ නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ සියලු දේවල් විහිළුවකට අරගෙන තිබෙනවා. විහිළුවකට අරගෙන -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පොල්ලක් ගන්න වෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
සවුදි රජය විසින් දරුවෙකු ඝාතනය කළ ඉන්දුනීසියානු කත ඉන්දුනීසියාවේ රජය මරණයෙන් බේරා ගෙන තිබෙනවා. ඒ ඉන්දුනීසියානු රජය ඇතුළු අනිකුත් සියලුම රජයන් -නේපාලය, ඉන්දුනීසියාව, බංග්ලාදේශය, ඉන්දියාව, පිලිපීනය, ඉතියෝපියාව- සවුදි අරාබියේ තිබෙන "ෂරි-ආ" නීතිය තක්කඩි විධියට යොදා ගන්නා රටට ශ්‍රමිකයින් යැවීම තහනම් කරලා තිබෙද්දී අපි විතරයි යවන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම යවන්නේ මොකද? ලක්ෂ හයකට වැඩිය සවුදියේ විතරක් වැඩ කරනවා. ලක්ෂ 18ක -මිලියන 1.8ක- ජනතාවක් අද පිට රට වැඩ කරනවා. ඒ අය ගෙනෙන සල්ලිවලින් තමයි මේ අය සැප විඳින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නේ මීට වඩා වග කීමකින් අපි වැඩ කළ යුතුයි කියලායි. රිසානාගේ මරණය ඩිලාන් පෙරේරා මැතිතුමාට, අනිකුත් මන්ත්‍රීවරුන්ට විහිළුවක් වුණාට මුත්තුර්වල ඉන්න අම්මා, තාත්තා තවමත් අඩ අඩා දුක් විඳිනවා. මොකද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අම්මාගේ statement එක -

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අම්මාගේ statement එක ගත්තේ කොහොමද කියලා මම කියන්නද ඇමතිතුමා? මම කියන්නද? [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු ඇමතිතුමා, මම කියන දේ අහ ගන්න. ගරු ඇමතිතුමා කථා කරලා එයාගේ මල්ලිට job එකක් දීලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගිහිල්ලා හම්බ වෙලා සල්ලි දීලා අද මම කථා කළාම telephone එකට එන්නේ නැහැ, ඉස්පිරිතාලේ. එය ඔප්පු කරන්න පුළුවන්. ඔබතුමා දන්නවා, මම අසත්‍යය කියන්නේ නැහැ කියලා. මේ

ප්‍රශ්නයේ දී මම සංවේදීව වැඩ කරනවාය කියලා ඔබතුමන්ලාගේ හිත දන්නවා. මම ඉන්නේ අර ළමයාගේ පැත්තේ. ඩිලාන් පෙරේරා ඇමතිතුමනි, ඔබතුමා අලුත්ම රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීලා තිබෙනවා. ඔබතුමා ඒක හිතට එකඟව දන්නවා. අලුත් රක්ෂණ ක්‍රමය ගැන දන්නවා නේ. [බාධා කිරීම්] අලුත් රක්ෂණ ක්‍රමය. සහන පියස සුරක්ෂා නොවෙයි, අලුත් රක්ෂණ ක්‍රමය. මම ඒවා ඔප්පු කරන්නම්. කෑ ගහන්නේ නැතිව ඉන්නවා නම් ඔප්පු කරන්නම්.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order, Hon. Dilan Perera?

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මේ ප්‍රශ්නය ගිය අය වැය විවාදයේ දී හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මතු කරලා එයට උත්තර දීලා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව "කෝප්" එකේ දී අනුමත කළා. "කෝප්" එකේ දී දෙගොල්ලන්ම අනුමත කළා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Is that a point of Order? That is not a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you must know the Standing Orders. A Minister can always answer.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
No - [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Do you not know? - [*Interruption.*]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකර මට සවන් දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
1996 දී කම්කරු ප්‍රඥප්තියට සවුදි අරාබිය අත්සන් කළා. කරුණාකර විනාඩියක් මම කියන දේ සාවධානව අහන්න, මේ ළමයාගේ ආත්මයට සැනසීමක් දෙන්න. 1996 දී මේ ප්‍රඥප්තියට අත්සන් කළා.මේ ප්‍රඥප්තියට අනුව කිසිම ළමා අපරාධකරුවෙකුට දඬුවමක් දුන්නොත් ඒ ගැන ක්‍රියා කරන්න බැහැ. "නිර්බයා" කියන ඉන්දියාවේ වෛද්‍ය ශිෂ්‍යාවව හත් දෙනෙකු අතින් දූෂණයට ලක් වුණා. එතැන හිටියා, අවුරුදු දාහතකට අඩු ශිෂ්‍යාවෙක්. ඔහුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න බැරි වුණේ ඒකයි. ඒ වාගේම මේ රිසානා නෆීක්ගේ වයස අවුරුදු 17 මාස 4යි මේ සිද්ධිය වන කොට. මේ රජයට බැරි වුණා, මේක හොර පාස්පෝට් එකක් කියලා සවුදිවල උසාවියට කියන්න. අවුරුදු හත හමාරක් බැරි වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවුරුදු හත හමාරක් තිස්සේ - මම මෙතැන කිව්වාට පස්සේ තමයි රවුන් හකීම් මැතිතුමා - [බාධා කිරීම්] අන්න සාක්ෂි ඉන්නවා. එතුමා ඊට පස්සේ තමයි Omar Travels කියන එක අත් අඩංගුවට ගත්තේ. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න ඉඩ දෙන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
එය අත් අඩංගුවට ගත්තේ ඊට පස්සේ. ඒ කියන්නේ සවුදි රජයට පූර්වාදර්ශයක් දුන්නේ නැහැ.

බොරු වයසක් දමලා රිසානා නෆීක් කියන පාසල් ශිෂ්‍යාවට හොර passport එකක් හදා රට යැව්වේ අපිය කියන එක අපේ රජය පිළිගත්තේ නැහැ. අන්න ඒක හින්දයි මේ දෙය සිද්ධ වුණේ. රිසානා නෆීක්ට මේ ඝාතනයට මුහුණ දෙන්න සිද්ධ වුණේ පැහැදිලිවම මේ රජයේ අදක්ෂකම හින්දයි. අපි මේ කථා කරන්නේ ඒ අදක්ෂකම ගැනයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රිසානා නෆීක්ට වුණා වාගේ දේවල් හෙට, අනිද්දා තව කෙනෙකුට වෙන්න පුළුවන්.

මේ ළඟදී කින්නියා කියන ගමේ අවුරුදු 17ක සහ අවුරුදු 16ක පාසල් ශිෂ්‍යාවන් දෙදෙනෙක් තැරැවිකාරයෙක් විසින් අරගෙන ආවා. එහෙම අරගෙන ඇවිල්ලා මෙහේදී passport වෙනස් කරලා විකුණන්න හදද්දි අහු වෙලා රිමාන්ඩ බන්ධනාගාරගත වෙලා තිබෙනවා. මේක ජාවාරමක්. ඒ නිසා කරුණාකරලා මේ ගැන හිතන්න. රිසානා නෆීක් කියන මේ දැරියගේ සිද්ධිය ප්‍රසිද්ධියට පත් වුණු එක සිද්ධියක් පමණයි. තව මේ වාගේ සිද්ධීන් රාශියක් වෙනවා; වෙමින් පවතිනවා; ඉදිරියේදීත් වෙනවා. අපට මේක ඩිලාන් පෙරේරා ඇමතිතුමා එක්ක තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ අඩු වයස් දැරියන් මේ විධියට ගණිකා වෘත්තියට විකුණන එක නවත්වන්නයි. එවැනි දේවල්වලට නිත තියන එකයි අපේ ව්‍යායාමය වෙලා තිබෙන්නේ. අපට එතුමා එක්ක ප්‍රශ්නයක් නැහැ. එතුමා එක්ක නොවෙයි මෙතැනදි අපට ප්‍රශ්නය තිබෙන්නේ. අපි කියන්නේ තවත් රිසානා නෆීක්ලාගේ බෙල්ල කපන්න ඉඩ දෙන්න එපාය කියන එකයි. අපට විහිළු කරාවි, කෑ ගහවි. අපේ ගරු ඇමතිතුමා අපට එක වතාවක් කිව්වා, රිසානා නෆීක්ට දුන් දඬුවමට විරුද්ධව සවුදි අරාබියානු තානාපති කාර්යාලය ඉස්සරහට ගිහිල්ලා picket කරන එක නවත්වන්නය කියලා. අපි එතුමාගේ ඉල්ලීමට කන් දුන්නා. එතුමා කිව්වා, දිගටම picket කළොත් රිසානා නෆීක් මරන්න ඉඩ තිබෙනවාය කියා. අපි එක දිගටම picket කළා නම් අපට ඒ දැරියගේ ජීවිතය බේරා ගන්න තිබුණා. මට තිබෙන එකම දුක ඒකයි. එතුමා අපට picket කරන්න දුන්නෙත් නැහැ. උද්ඝෝෂණ, විරෝධතා කරන්න දුන්නෙත් නැහැ. එතුමා ඒ වැඩේ කළෙත් නැහැ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මෙයාගේ බෙල්ලත් කපලා දමාවි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ඔව්, sugar හින්දා ඔබතුමාගේ කකුල කපලා නේ තිබෙන්නේ, අසත්‍යය කියලා. එතුමාට දියවැඩියාව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක තමයි යථාර්ථය. මහ ලොකුවට අපි කියනවා, විදේශ ශ්‍රමිකයන් වසරකදී අපේ රටට ඩොලර් බිලියන හයක් ගෙනෙනවාය කියලා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
The Hon. Member is challenging the Law of Allah. He cannot do that.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. ගරු රන්ජන් රාමනායක මහතා, කථා කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මහ ලොකුවට කියනවා අපේ රටේ දළ ජාතික ආදායමෙන් ඩොලර් බිලියන හයක තරම් ලොකුම කොටසක් ගෙනෙන්නේ මේ රට විරුවන්ය කියලා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාත් කියනවා, අපට තෙල් ගන්නත් ඩොලර් බිලියන හයක් තරම් යනවාය, ඒ නිසා ඒ අය කරන්නේ ලොකු සේවක්ය; අපි මේක තවත් වැඩි කරලා ඒ ඩොලර් බිලියන හය, ඩොලර් බිලියන දහය දක්වා වැඩි කරන්න යනවාය කියලා. ඒ කියන්නේ එක දිගට බෙලි කැපුවත්, එක දිගට අත පය කැපුවත්, දිව කැපුවත්. කකුල් කැපුවත්, කස පහර දුන්නත් රට යවන එක නවත්වන්නේ නැහැ කියන එකයි. අපේ රටට වඩා දුප්පත් රටවල් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සුඛානය, ඉතියෝපියාව වැනි ඒ රටවල් පවා තමන්ගේ රටේ ප්‍රෞඩත්වයට, සංස්කෘතියට ගරු කරලා ඒ රටේ ඉන්න කාන්තාවන් පිට රට යවන්නේ නැහැ. සියලු දෙනාම පිට රට යවන්න එපාය කියා මම මේ අසුභවාදීව කියනවා නොවෙයි. මම කියන්නේ ෂරි-ආ නීතිය තිබෙන සවුදි අරාබියට ගෘහ සේවිකාවන් යවන්න එපාය කියන එක පමණයි. ඉංජිනේරුවන්, කම්කරුවන්, වෛද්‍යවරුන් කියන ඒ කවුරු යැව්වත් කමක් නැහැ ගෙයකට හිර කරන්න ගැහැණු ළමයෙක් යැව්වාම අනිවාර්යයෙන්ම ඇය ලිංගික අතවරවලට ලක් වෙනවා. ඒක තමයි සැබෑව. අද මාධ්‍යවල පළ වෙලා තිබෙනවා, කටුනේරියේ දෙදෙනෙක් හතරට කපා එවලා තිබෙනවාය; බෙලි කපලා එවා තිබෙනවාය කියා. ඒ අයගේ මිනී එවා තිබෙනවා. වසරකට මළ සිරුරු 436ක් ලංකාවට එවනවා. නමුත් අපේ ඇමතිතුමා කියන්නේ " මට වග කියන්න බැහැ" කියායි. අපි කියන්නේ, " මට වග කියන්න බැහැ" කියන ඇමතිවරයෙක් අපට එපාය කියන එකයි. වග කියන්න පුළුවන් ඇමතිවරයෙක් අපට දෙන්නය කියන එකයි අපේ මේ විශ්වාස භංග යෝජනාවේ එකම අරමුණ. අපේ අරමුණ වග කිව හැකි, වග කියන්න පුළුවන්, කාර්යක්ෂමව වැඩ කරන ඇමතිවරයෙක් දෙන්නය කියන එකයි. [බාධා කිරීමක්] එහෙම දුන්නා නම් ළමයා මැරුණේ කොහොමද? පොඩ්ඩක් ඉන්න. එහේ නීතිය නොවෙයි. මම කියන එක අහන්න. ළමයින්ව බෙල්ල කපලා මරන්න බැහැ කියලා, 1996 දී ලෝක ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අපි අත්සන් කළා. ඒ අත්සන අනුවවත් මේ අය සවුදි අරාබියට යවන්න නීතිඥයන් දුන්නේ නැහැ; භාෂා පරිවර්තකයන් දුන්නේ නැහැ. නීතිඥ ගාස්තු ගෙව්වේ නැහැ. අන්තිමට අපේ කොතලාවල මහත්මයා තමයි ලක්ෂ 42ක් ගෙවලා - [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. A.H.M. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
[බාධා කිරීමක්] ජනාධිපතිතුමා appoint කර තිබෙනවා ඩිලාන් මහත්මයාව. එතුමා තමයි දක්ෂ. එතුමා තමයි වග කියන්නේ. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මන්ත්‍රීවරු සහ ඇමතිවරු රිසානාව විහිළුවකට අරගෙන තිබෙනවා. [බාධා කිරීම්] රිසානාගේ මරණයට වටිනාකමක්, තක්සේරුවක් නැහැ. මොකද, ඒ කාගේවත් දූලාගේ බෙල්ල කපා මැරුවේ නැහැ. [බාධා කිරීම්] මා සිංහල ජාතිකයෙක්. මා මුස්ලිම් ජනතාව වෙනුවෙන් මේ පෙනී සිටින්නේ. මුස්ලිම් නායකයෝ මොකද මේකට නිහඬව ඉන්නේ? එහෙම ඉන්නේ ඒ අයගේ accountsවලට රියාල් ලක්ෂ ගණුනින් වැඩි වුණු නිසාය කියා මා චෝදනා කරනවා. [බාධා කිරීමක්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Lalith Dissanayake, what is your point of Order?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පළාත් සභාවේ වචනයක්වත් කථා කරන්නේ නැතිව පැනලා ආවා, සල්ලි එකතු කර ගෙන. [බාධා කිරීම්]

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
එතුමාත් ශ්‍රී ලාංකිකයෙක්.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අසත්‍යය කියන්නේ ඇයි ශ්‍රී ලාංකිකයෙක් නම්? [බාධා කිරීම්] රිසානාව මැරුවේ නැද්ද?

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
ගරු මන්ත්‍රීතුමා මුස්ලිම් නායකයෝ නොවෙයි, ලංකාවේ එක මුස්ලිම් කෙනෙක්වත් මේක මෙහෙම කියන්නේ නැහැ නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
කියන්නේ නැත්තේ මොකද, ඕනෑ තරම් කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දරුවාට වුණේ අන්තිම අපරාධයක්. මේ දරුවාගේ විදුහලටත් මම ගියා. කවුරුවත් මේ දරුවාගේ ගෙදරට ගිහින් නැහැ, අසත්‍යය කිව්වාට. මුත්තුර් ප්‍රදේශයේ සාපිනගර්වල මේ දරුවාගේ ගෙදරට මම ගියා. මේ දරුවාගේ පියා කැළයේ දර කපා ජීවත් වන අහිංසක ගැමියෙක්. ඒ දරුවාව සවුදි යවන්න පෙළඹී තිබෙන්නේ ගෙදර තිබෙන දරිද්‍රතාවය හින්දයි. එතකොට මෙතැන වැරදිකරුවන් වන passport කන්තෝරුවේ passport එක අත්සන් කරපු මහත්මයා අත් අඩංගුවට ගත්තා ද? ඔමාර් ට්‍රැවල්ස් එකේ කට්ටිය අත් අඩංගුවට ගත්තා ද? උප්පැන්න සහතිකය හදපු අය අත් අඩංගුවට ගත්තා ද? ඒ agency එකේ අය අත් අඩංගුවට ගන්න අවුරුදු භයක් ගියා. [බාධා කිරීම්] ඒ අවුරුදු භයකට පස්සේ. [බාධා කිරීම්] ඒ රිසානා මැරුවාට පස්සේ. තවත් නඩුවක් තිබෙනවා. මගේ කථාව අනුව ඕනෑම කෙනෙකුට තේරෙනවා, රජය ආකාරයක්ෂම වුණාය කියන එක. මොකද, රිසානාව රට යවපු ඒ හොර ඒජන්සිකරුවන්ව, ඒ passport එක හදපු අය, උප්පැන්න සහතිකය හදපු අය, වෛද්‍ය සහතික දුන් අය මේ සියලු දෙනාම නීතිය ඉදිරියට ගේන්න රජයට අවුරුදු භයක් ගියා. ඊට ඉස්සෙල්ලා රිසානාව ඝාතනය කළා. ඒක තමයි ඇමතිතුමාගේ තිබෙන අදක්ෂකාව.

මේ ළමයාට අවුරුදු 17යි. මෙන්න දරුවාගේ ඇත්ත උප්පැන්න සහතිකය, මෙන්න මේ දරුවාගේ අම්මාගෙයි, තාත්තාගෙයි ඇත්ත විවාහ සහතිකය, මෙන්න ඇත්ත වයස කියන එක ගරු ඇමතිතුමා කවදාවත් සවුදි උසාවියේදී කිව්වේ නැහැ. ඇය පාසල් ශිෂ්‍යාවක්, ඇයගේ සැබෑ වයස මේකයි කියා ගරු ඇමතිතුමා කවදාවත් සවුදි උසාවියේදී පෙන්නුවේ නැහැ. දැන් ලක්ෂ ගණන් දෙනවා. දැන් ගෙවල්වලට යනවා. ගෙවල් හදලා දෙන්න යනවා. Washing machine දෙනවා, තෑගි දෙනවා, මල්ලිට job දෙනවා. දැන් පින්තූර ගන්නවා. දැන් සේරම කරනවා. එදා රියාල් පන්දාහයි ඕනෑ වුණේ. නඩු ගාස්තු රියාල් පන්දාහ ලංකා රජය ගෙව්වේ නැහැ. මේක වහන්න හැදුවා. මේක වහන්න හදද්දි BBC එක විතරයි කිව්වේ, ලංකාවේ මුත්තුර්වල රිසානා නඟික් කියා මුස්ලිම් ළමයෙක් මෙහෙම අත් අඩංගුවට අර ගෙන තිබෙනවා, මරන්න යනවාය කියා. මෙහේ ඉන්න සවුදි තානාපතිවරයා අසත්‍යයක් කිව්වා. එතුමා කිව්වා, රිසානා නඟික් එන සුමානයේ ගේනවාය කියා. එතුමා කිව්ව අසත්‍යය, ඩිලාන් පෙරේරා ඇමතිතුමා මෙතැන ඇවිත් කිව්වා. මොනවා ද කිව්වේ? [බාධා කිරීම්] රිසානා නිරුපද්‍රිතව එනවාය කිව්වා. අන්තිමට මොකද වුණේ? අන්තිමට ලංකාවට මිනියවත් ගේන්න බැරි වුණා. [බාධා කිරීම්]

අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
He is breaking all ethics of protocol. He is accusing His Excellency the Saudi Arabian Ambassador, for telling an untruth. He cannot do that.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික පුවත් පත්වල තිබුණා, රිසානා නඟික් නිරුපද්‍රිතව ලංකාවට එන බව ලංකාවේ සවුදි අරාබි තානාපතිවරයා කිව්වාය කියා. අතිගරු ජනාධිපතිතුමාගේ ලිපියට එහේ රජතුමා ඇහුම්කන් දීලා ඇයව ගෙදර එවනවාය කියා තිබුණා. මේ හැන්සාඩ් වාර්තාවල තිබෙනවා. ඒක ගරු ඇමතිතුමාත් කිව්වා. එහෙම කියලා සුමානයක් ගියේ නැහැ. රිසානාගේ මළකඳවත් ගේන්න බැරි වුණා. [බාධා කිරීම්] ඇත්තෙන්ම තානාපතිතුමා ඒ කිව්ව එක "Daily Mirror" පත්තරේ, "ලංකාදීප" පත්තරේ ඇතුළු හැම ජාතික පුවත් පතකම තිබුණා. රිසානාට සමාව දෙන ලෙස ජනාධිපතිතුමා යැව්ව ලිපියට තානාපතිතුමා කැමැත්ත දීලා, ඇය ලංකාවට එනවා කියා කිව්වා. ඒ අම්මලා, තාත්තලා බලා ගෙන හිටියා, තමන්ගේ දරුවා එන තුරු. [බාධා කිරීම්]

ගරු හුනෙයිස් ෆාරූක් මහතා
(மாண்புமிகு ஹுனைஸ் பாரூக்)
(The Hon. Hunais Farook)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුළුවන් නම් ඒ වාර්තාව සභාගත කරන්න කියන්න. [බාධා කිරීම්] ඒක අසත්‍යයක් කියායි මම කියන්නේ. [බාධා කිරීම්]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඒ කියන්නේ තානාපතිතුමා එහෙම කිව්වේ නැද්ද? [බාධා කිරීම්]

ගරු හුනෙයිස් ෆාරූක් මහතා
(மாண்புமிகு ஹுனைஸ் பாரூக்)
(The Hon. Hunais Farook)
එහෙම කිව්වා නම් ඔබතුමා ඒ වාර්තාව සභාගත කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඩිලාන් පෙරේරා ඇමතිතුමා Debate එකේදීත් ඒක කිව්වා. [බාධා කිරීමක්] ඩිලාන් පෙරේරා ඇමතිතුමාත් පිළිගත්තා, තානාපතිතුමා එහෙම කිව්වායි කියලා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Adjournment Motion එකේදී කිව්වා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඒ කියන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ ලියුම බැලුවාට පසුව රිසානා නෆීක් ළඟදීම ලංකාවට එවනවාය කිව්වා. ලංකාවේ ඉන්න සවුදි තානාපතිතුමා කිව්වා, රිසානාගේ දඬුවම අත්හිටෙව්වාය කියා. දැන් මේ හුනෙයිස් ෆාරූක් මන්ත්‍රීතුමා කියනවා එහෙම කිව්වේ නැහැ කියලා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මෙතුමා. මෙතුමා පාර්ලිමේන්තුවේ හිටියා, එදා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
පටලවා ගන්න එපා. [බාධා කිරීමක්] ඒ කිව්වාය කියන දේ ගැන එතුමා කිව්වේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඉතින් ඒක තමයි මාත් කියන්නේ. [බාධා කිරීමක්] ඔබතුමා ඒක හොඳටම දන්නවා. මේ ළමයා ගැන අනුකම්පාවක් නැද්ද? ඔබතුමාට අනුකම්පාවක් නැති හින්දාද කෑ ගහන්නේ? ඔබතුමාටත් ගැහැනු දරුවෙක් ඉන්නවා නේද? ඒ දරුවාගේ බෙල්ල කැපුවා නම් මොකද වෙන්නේ? මේ කෑ ගහන මන්ත්‍රීවරුන්ටත් දූලා ඉන්නවා. ඒ එක්කෙනෙක් දණ ගස්සලා බෙල්ල කැපුවා නම් මෙහෙම කියයිද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
The Hon. T. Ranjith De Zoysa)
ඔළුව හොඳ නැහැ මේ මනුස්සයාගේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩිලාන් පෙරේරා ඇමතිතුමාටත් නැගනියක් ඉන්නවා, අර මම කියපු වෘත්තීන් දෙක කරන. එයාගේ බෙල්ල කපන්න සූදානම් වුණා නම් එයාව බේරා ගන්න එතුමා කී සැරයක් සවුදියට යයිද? රිසානාට මේක මෙහෙම වුණේ, ඇය මුත්තූර් ප්‍රදේශයේ සාපිනගර්වල, දර කපලා කරත්තයේ ගෙන ගිහින් විකුණලා ජීවත් වන අහිංසක දුප්පත් කම්කරුවෙකුගේ දුවෙකු වූ නිසාය කියා මම කියනවා. මොකද, ලංකාවට ඕනෑ වුණේ පිට රටින් එන ඩොලර් බිලියන 6 පමණයි. ඒක ලොකු සල්ලියක් හින්දා සවුදි රජය එක්ක හැප්පෙන්න ලංකාවේ රජය බය වුණා. අද තානාපතිවරයා කොහොමද හැසිරෙන්නේ? අද කොළඹ, සවුදි අරාබි තානාපති කාර්යාලයේ ඉන්න තානාපතිවරයා, "මම ජනාධිපතිගේ යාළුවා. මම ඕනෑ දෙයක් කරනවා" කියලා චණ්ඩි talks දමනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. සුඩානය, ඉතියෝපියාව, ඉන්දුනීසියාව, පිලිපීනය, බංග්ලාදේශය, ඉන්දියාව යන රටවල් සවුදිවලට ශ්‍රමිකයන් යැවීම ප්‍රතික්ෂේප කරලා තියෙද්දී එම රටට ශ්‍රමිකයන් සපයන එකම රට, මේ නපුංසක පිරිමි ඉන්න, තමන්ගේ බිරින්දෑවරුන් පිට රට යවලා සල්ලි හොයන එකම රට ආසියාවේ ආශ්චර්යය කියන මේ රටයි කියලා මම කියනවා. අද තත්ත්වය ඒකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තත්ත්වය ඉතාමත්ම භයානකයි. නමුත් මේක විහිළුවකට අරගෙන තිබෙනවා. මගේ දරුවෙක් නොවුණත්, යාළුවෙක් නොවුණත් රිසානා නෆීක්ගේ අම්මා, තාත්තා, සියලු දෙනා මගේ මේ ව්‍යායාමය දකිව්. රිසානාගේ ආත්මය කොහේ සිට හෝ මට ආශීර්වාද කරාවි. මට ඒ ඇති. මම ඇය දැකලා නැහැ. මේ කට්ටිය විහිළු කෙරුවාට, දැන් සවුදිවල පොළොව යට ඉන්න රිසානා නෆීක් කියන ඒ අහිංසක දරුවාගේ ආත්මය මට ආශීර්වාද කරාවි. මට ඒ ඇති.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා. Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு சந்திரகுமார் முருகேசு] தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[අ.භා. 4.29]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Minister of Ports and Highways)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම දැන් කථා කළ මන්ත්‍රීතුමා අද දවසේදී සභා ගැබේ සිටියා නම් හොඳයි කියලා මා කල්පනා කරනවා.

අද අපේ විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍ය ගරු ඩිලාන් පෙරේරා මැතිතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒමට හේතු කාරක වුණු රිසානා නෆීක් කියන ඒ මුස්ලිම් කාන්තාව -ඒ දයාබර දැරිය- අප අතරින් සදහටම වෙන්වීම ගැන විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, විෂය භාර අමාත්‍යතුමාත් සමඟ අප සියලු දෙනාගේම කනගාටුව ඒ පවුලේ සියලු දෙනාටම මේ අවස්ථාවේදී මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළදී අපි පුද කරනවා.

මේ විශ්වාස භංග යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, ඒ සම්බන්ධයෙන් නීතිමය ගැටලු හෝ වෙනත් කාරණා කථා කළ යුතු අවස්ථාවේ අපට දකින්නට ලැබුණේ ඒ කාරණාවෙන් එහාට ගිහිල්ලා පෞද්ගලිකවම ඩිලාන් පෙරේරා ඇමතිතුමාට චෝදනා එල්ල කරන, මඩ ප්‍රහාර එල්ල කරන කාරණයක් බවට මෙය පරිවර්තනය කර ගැනීමක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් අපි ඩිලාන් පෙරේරා ඇමතිතුමා ගැන කථා කරමු. ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ තාත්තා මාර්ෂල් පෙරේරා. අම්මා දයා පෙරේරා. මාර්ෂල් පෙරේරාට දාව දයා පෙරේරාට ඉපදුණු ඒ දරුවාට පුංචි කාලයේ නම දැම්මා ඩිලාන් පෙරේරා කියලා. ඒ දයාබර අම්මාගෙයි, තාත්තාගෙයි දරුවට දැමූ නම තමයි ඩිලාන් පෙරේරා. හැබැයි ඩිලාන් පෙරේරා අද වන තුරු තමන්ගේ අම්මාගෙයි, තාත්තාගෙයි විශ්වාසය භංග කරලා නැහැ; විශ්වාසය කඩලා

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

නැහැ. තවම ඔහු ඩිලාන් පෙරේරා. ඔහු මොහාන් නොවෙයි; රංග නොවෙයි; අල්ෆොන්සු නොවෙයි; ෆොන්සේකා නොවෙයි. හැබැයි මේ යෝජනාව ගැන කථා කරන මේ පාර්ලිමේන්තුවේ සමහර මහත්වරු තමන්ගේ අම්මාගේ, තාත්තාගේ විශ්වාසය කඩලා තිබෙනවා. අල්ෆොන්සු,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

බවට පත් වෙනවා. අල්ෆොන්සු,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

බවට පත් වන්නේ පළමුව අම්මාගෙයි, තාත්තාගෙයි විශ්වාසය කඩලා. අම්මාගේ, තාත්තාගේ විශ්වාසය කඩපු,- [බාධා කිරීම්] අම්මාගේ, තාත්තාගේ විශ්වාසය කඩපු කෙනාට වෙන ඕනෑම විශ්වාසයක් කඩන්න පුළුවන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. [බාධා කිරීම්] අහගෙන ඉන්න. [බාධා කිරීම්] අහගෙන ඉන්න. මා ඉල්ලනවා මගේ මිත්‍ර සුජීව සේනසිංහගෙන් අහගෙන ඉන්න කියලා. මට ගනුදෙනුව තිබෙන්නේ ඔබ එක්ක නොවෙයි. මට ගනුදෙනුව තිබෙන්නේ මෙන්න මේ රන්ජන් රාමනායක එක්කයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ කුල කාන්තාවෝ සාමාන්‍යයෙන් ඇන්දේ රෙද්දයි හැටිටෙයි. අපි ඉතිහාසයේ ඒක අහලා තිබෙනවා. රෙද්දයි හැටිටෙයි ඇන්දෙ නැති වුණත් පර්දාව ඇඳපු රිසානා කියන මුස්ලිම් කාන්තාවක් ගැන තමයි අද මේ කථා කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් අපේ රටේ කුල කාන්තාවෝ ඇඳපු රෙද්දයි හැටිටෙයි අද වෙනස් වෙලා තිබෙනවා. කොහොමද වෙනස් වන්නේ?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

එවැනි අය මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්] මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. [බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

අද ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාට විශ්වාස භංගය ගෙනෙන්නේ. දැන් ඒ මන්ත්‍රීතුමා එතුමාගේ භාෂාවෙන් ඩිලාන් පෙරේරා ඇමතිතුමාට නොයෙක් චෝදනා කළා. ගරු ඇමතිතුමාගේ සහෝදරිය අද විදේශ සේවා කාර්යාංශයේ හා විදේශ සේවා ඒජන්සිකරුවන්ගේ සංගමයේ වැඩ කරනවා කියලා කිව්වා. ඩිලාන් පෙරේරා මහත්මයා ඇමතිකමක් කළාම එතුමාගේ සහෝදරියට රක්ෂාවක් කරන්න බැහැ කියලා කොහේ හෝ නීතියක් තිබෙනවාද? අයියා ඇමති නම් නංගිලා ගෙදර ඉන්න ඕනෑද? ඒකද වෙන්න ඕනෑ? ඇය පශ්චාත් උපාධියක් තිබෙන කාන්තාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ මන්ත්‍රීතුමා චෝදනා කරපු හේතුක් එක්ක දැන් අපි රිසානා නෆීක් ගැන බලමු. රිසානා නෆීක් කියන්නේ අපේ රටේ මුස්ලිම් දැරියක්. ඒ මුස්ලිම් දැරියගේ වාගේම අපි මේ රටේ ඉපදුණු සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ, බර්ගර්, මැලේ කියන කිසිම කාන්තාවකගේ විශ්වාසය මොනම වෙලාවකවත් බිඳින්න හොඳ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අප ඒක කළ යුතු නැහැ; කාගේවත් විශ්වාසය බිඳිය යුතු නැහැ. දැන් එහෙම නම් විශ්වාසය බිඳිලා තිබෙන්නේ කොහොමද? දැන් මේ විශ්වාස භංගය ගැන කථා කරන, මම ඇත්ත කථා කරන්නේ, මම හරි සුද්දවන්තයි කියන කෙනාගේ විශ්වාසය බිඳිලා තිබෙන්නේ කොහොමද? අපි ඔය වෙන අය වාගේ මඩ කථා කියන්නේ නැහැ. සියලු කරුණු ටික අප ළඟ තිබෙනවා.

2010 ඔක්තෝබර් මස 15 දිනැති "ලංකාදීප" පත්‍රයේ මෙසේ සඳහන් වනවා:

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

අත් අඩංගුවට ගනී"

එසේ අත් අඩංගුවට ගනු ලැබුවේ මහනුවර ප්‍රදේශයේ විදුහලක ගුරුවරියක වන නාමලී විජේරත්න යන අයව විවාහ කර ගන්නා බවට පොරොන්දු වී ලක්ෂ 10ක් ඇයගෙන් ලබා ගැනීම සම්බන්ධයෙනුයි. [බාධා කිරීම්] මෙන්න විශ්වාසය. රිසානා වෙනුවෙන් -[බාධා කිරීම්] රිසානා වෙනුවෙන් පුදුම විධියට -[බාධා කිරීම්] කිඹුල් කඳුළු හෙළපු -[බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

"ලංකාදීප" පත්‍රයේ වාර්තා කරනවා. [බාධා කිරීම්] තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය දන්නවා, කවුද මේ, කින්ද මන්ද වුණේ කියන එක. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. තව තිබෙනවා. දැන් මේ එකක් නේ. දැන් මේ විශ්වාස භංග යෝජනාව -[බාධා කිරීම්]

ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, හොඳ, උගත් මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමා දන්නවා, දැන් මේ ගෙනැවිත් තිබෙන්නේ විශ්වාස භංග යෝජනාවක් කියන එක. විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න ඕනෑ රටට විශ්වාසයක් ඇති අයෙක්. මෙම විශ්වාස භංග යෝජනාව ගෙනාවේ රටේ විශ්වාසය විනාශ කරලා, තව කාගේ හෝ කාන්තාවකගේ විශ්වාසය සම්පූර්ණයෙන්ම විනාශ කරපු කෙනෙක් නම්, -[බාධා කිරීම්] නැහැ, නැහැ. ඔහොම ඉන්න. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීම්] ඉන්න, ඉන්න, මා කියන කල්. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Sujeewa Senasinghe, Hon. Ranjan Ramanayake, කරුණාකර වාඩි වෙන්න. You carry on, Hon. Minister.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මන්ත්‍රීතුමන්ලාගෙන් මා ඉල්ලා සිටිනවා, අහගෙන ඉන්න කියලා. ඔබතුමන්ලා කථා කරන කොට අපි බොහොම හොඳට අහගෙන

සිටියා නේ. මෙම විශ්වාස භංග යෝජනාව ගෙනාවේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා තමයි යෝජනාව ස්ථිර කළේ. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා මේ යෝජනාවට අත්සන් කරලා තිබෙනවා. අද එතුමා තමයි මේ පාර්ලිමේන්තුවේ මෙම යෝජනාව ස්ථිර කළේ. මෙහි වගකීම සම්පූර්ණයෙන්ම රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ ඇඟට ගන්න හේතුවක් තිබෙනවා. හේතුව මොකක්ද? "රන්ජන් රාමනායක පදනම" කියා පදනමක් තිබෙනවා. අද මැද පෙරදිග රටවල් සියල්ලම මේ පදනම තුළින් මොකක්ද කරන්නේ කියන එක මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට මම කියලා දෙන්නම්,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Minister, please wind up now.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, we are giving him 10 more minutes.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වන විට අපි දන්නවා, රන්ජන් රාමනායක මන්ත්‍රීවරයා මේ රටේ වෙනත් වෘත්තියකයි ඉන්නේ කියන එක. එතුමා නළුවෙක් කියන එක අපි දන්නවා. මැද පෙරදිග රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයින් සියලු දෙනා වෙනුවෙන් ඒ රටවල ප්‍රසංග පවත්වනවා. ඒ ප්‍රසංග පවත්වන කොට රන්ජන් රාමනායක මන්ත්‍රීවරයාව තමයි ප්‍රසංගවලට සහභාගි කරවා ගන්නේ. ඒ ප්‍රසංගවලට සහභාගි කරවා ගන්න කොට ඒ ප්‍රසංග සඳහා එතුමාට මුදල් ගෙවනවා, එතුමාට අවශ්‍ය කරන ගුවන් බලපත්‍ර ලබා දෙනවා. මැද පෙරදිග රටවල සේවය කරන ශ්‍රී ලාංකික කාන්තාවන්ට කරදර වන කොට ඒ සඳහා විෂයම් කරන්න කියලා රන්ජන් රාමනායක පදනමට සල්ලි එකතු කරන තත්ත්වයක් අද රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා පටන් ගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද එවැනි තත්ත්වයක් එතුමා කර ගෙන යනවා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එතුමා පාර්ලිමේන්තුවට අලුතින් ආපු මන්ත්‍රීවරයෙක් හැටියට මෙය කොච්චර හොඳ විශ්වාසයක්ද කියලා මේ විශ්වාසය ගැනත් පොඩ්ඩක් බලන්නකෝ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට තීරු බදු රහිත වාහනයක් හම්බ වෙනවා. තීරු බදු රහිත වාහනය හම්බ වුණාට පස්සේ මේ ගරු මන්ත්‍රීතුමාගේ වාහනයේ ලියකියවිලි ටික අස්ථානගත වෙනවා - නැති වෙනවා- ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒවා නැති වෙන්නේ කොහොමද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මෙන්න එතුමාගේ ලිපිනය.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මෙන්න රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ නැති වෙච්ච තීරු බදු රහිත පළමුවැනි වාහනයේ ලිපි ගොනුව. මා මෙය පසුව සභාගත කරන්නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊට පස්සේ මොකක්ද, වෙන්නේ? මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? මොකක්ද වෙන්නේ? [බාධා කිරීම්] රුපියල් ලක්ෂ 115කට ඒ මනුෂ්‍යයාට - [බාධා කිරීම්]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. John Amaratunga, what is your point of Order?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Whatever remarks made on the conduct of the Hon. Member has to be expunged from Hansard.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I will look into that.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
රුපියල් ලක්ෂ 115කට විකුණුවා. සියලුම ලිය කියවිලි අත්සන් කළා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මම කියනවා, ඕනෑම අධිකරණයකට යන්න කියලා. මේ තිබෙන්නේ පළමුවැනි ලිපි ගොනුව. රුපියල් ලක්ෂ 115කට විකුණලා, ඒ මනුෂ්‍යයාට නැවත කථා කරලා කියනවා, "මට තව ලක්ෂ 25ක් ඕනෑ" කියලා. ඒ මනුෂ්‍යයා කියනවා, "මට ඒක දෙන්න බැහැ, මම ඔබෙන් මේක අරගෙන ඉවරයි" කියලා. මෙතුමා ගිහිල්ලා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට දිවුරුම් ප්‍රකාශයක් දෙනවා, "මගේ ලිපි ගොනුව නැති වුණා, අනේ! මට තව එකක් දෙන්න" කියලා. ඒක විකුණනවා වෙනත් කැනකට. [බාධා කිරීම්] ලජ්ජා නැතිව- [බාධා කිරීම්] මේ උත්තරීතර පාර්ලිමේන්තුවට- [බාධා කිරීම්] අපි එක්සත් ජාතික පක්ෂයෙන් කාරණයක් අහන්න කැමැතියි. මේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට අනෙක් මන්ත්‍රීවරුන් සහයෝගය දුන්නා නේ. මට මෙන්න මේ ගැන කියන්න.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

මේ බලන්න, "රිසානාගේ ජීවිතය බේරා ගන්න බැරි වුණු හේතුව මම කියන්නම්. - රන්ජන් රාමනායක -" මෙතුමා කියනවා, "සමහර දේශපාලනඥයන් ඉන්නවා, කකුල් දෙක දෙපැත්තේ තබාගෙන deal දමන කට්ටිය." විපක්ෂය ගැන තමයි මේ කියන්නේ. "විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නවා, තමන්ගේ අතට එන ෆයිල් එක සහවාගෙන ඒකට මිලියන ගණන් අරගෙන account එකට දමා ගන්න. මා ඒ වාගේ විකිණෙන්නේ නැහැ. ආණ්ඩුවත් එක්ක සම්බන්ධ වන අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉන්නවා." මේ කවුරුන් ගැනද කියන්නේ? [බාධා කිරීම්] මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුන්ළතු]
[Expunged on the order of the Chair.]

ගැනද? එහෙම නැත්නම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුන්ළතු]
[Expunged on the order of the Chair.]

ගැනද මේ කියන්නේ? එහෙම නැත්නම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුන්ළතු]
[Expunged on the order of the Chair.]

ගැනද මේ කියන්නේ? මේ කවුරු ගැනද කියන්නේ? මේ කවුරු ගැනද කියන්නේ? [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please!

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විරුද්ධව චෝදනාවක් තිබෙනවා නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යන්න පුළුවන්. නමුත් මට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් කළාම, සර්පයෙක් ගහලා කියලා ගෙදර ඉන්නේ නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ ගරු සභාව තුළ වගකීමකින් ඔබතුමාට කියනවා. මගේ මේ කථාව පටන්ගත් වෙලාවේ ඉඳලා මා මේ මන්ත්‍රීවරයාට විරුද්ධව යම් දෙයක් කියලා තිබුණා නම්, ඒ කියපු හැම දෙයක්ම ලිඛිත සාක්ෂිවලින් ඔප්පු කරලා තිබෙනවා. ඒවා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරලා තිබෙනවා. අතැන මෙහෙම වුණා, මෙතැන මෙහෙම වුණා කියලා අපි මන්ත්‍රීවරුන්ට මඩගහන්න ලැස්ති නැහැ. හැබැයි මේ මන්ත්‍රීවරයා දැන ගත යුතුයි, වීදුරු ගෙවල්වල ඉඳගෙන තමයි මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ කියන එක. ඒ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න අවශ්‍ය කරන පසුබිම සකස් කළේ මෙතුමායි. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි -

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ගෙනාවේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් පාවා දෙන හැටි බලන්න කෝ. [බාධා කිරීම්] මේ බලන්න කෝ. ඉතින් මේ පාවා දීම පෙනෙන්නේ නැද්ද? දෙවි හාමුදුරුවනේ! දැන් අර මනුෂ්‍යයා අල්ලනවා. බලන්නකෝ, මෙහෙම පාවා දීමක්. මේ ජාතියේ පාවා දීම් තිබෙනවාද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක චිත්‍රපටයක්ද? එහෙම නැත්නම් මේ බයිස්කෝප් පෙන්වන තැනක්ද? ඒ වාගේ තැනක්ද මේක? නැහැ නේ. එහෙම නැත්නම් මේක "Parliament Jokes" කියලා හදන චිත්‍රපටයක කොටසක්ද? නැහැ. මේ උත්තරීතර පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් 225 දෙනෙක් පත් කර එවනවා. ඒ එවන්නේ මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ රටේ ඒ ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරන්නයි. මට තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය කිව්වා, රත්නපුරේ බෝඩ් එකක් ගහලා තිබෙනවාලු "සොයා දෙන්න" කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
අල්පෝන්සු සොයා දෙන්න කියලා. මොකද හේතුව, අද සොයා ගන්න නැහැ. ඡන්දය දීපු මිනිසුන්ට දැන් එළුවෙක්වත් අල්ලා ගන්න බැරි වෙලා තිබෙනවා. නළුවෙකුට ඡන්දය දීලා එළුවෙක්වත් අල්ලා ගන්න බැහැ. නළුවන්ට ඡන්දය දෙනවා. අඩු ගණනේ එළුවෙක්වත් සොයා ගන්න නැහැ.

අපේ ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ කාර්ය මණ්ඩලය ගැන කියනවා. හැබැයි, ඒ කාර්ය මණ්ඩලයේ ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ කවුද ඉන්නේ කියලා කියන්න බැරි වුණා. ඒ තොරතුරු සොයා ගත්තු අයට ඒකත් සොයාගෙන එන්න තිබුණා නේ. හැබැයි, මේ තිබෙන්නේ අපේ මන්ත්‍රීතුමාගේ කාර්ය මණ්ඩලයේ විස්තර. මෙන්න නම් පිටින්ම තිබෙනවා. පාර්ලිමේන්තු කටයුතු ලේකම්, කොළඹගේ දිනේෂ් වන්දිම පෙරේරා. යතුරු ලේඛක විරාජ් පීරිස්.

රියැදුරු වීරසිංහ. කාර්යාල කාර්ය සහායක මහින්දපාල. පර්යේෂණ සහකාර විජේසේකර. එකතු වන මුළු පඩිය එක්ලක්ෂ හත්දහස් හාරසියතිස්පහයි. කෝ මේ අය? කෝ මෙහෙම මිනිස්සු?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අර ගැලරියේ ඉන්නවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මේ මිනිස්සු කෝ? එක්කෙනෙක් ඉන්නවා. [බාධා කිරීම්] ඉතුරු අය ඉන්නවා නම් මම අභියෝග කරනවා. [බාධා කිරීම්]

ඉතින් රියැදුරු ඉන්න එපා යැ. එක මනුස්සයයි ඉන්නේ. තමන්ගේ කාර්ය මණ්ඩලයට-[බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාට බොහොම පැහැදිලිව කියනවා මේ සභා ගර්භය කිසිම අවස්ථාවක ගැලරියත් එක්ක සම්බන්ධ කරන්න බැරි බව. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් එතුමා ඒක දැන ගන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ නීතියක් රීතියක් දන්නේ නැති, පාර්ලිමේන්තුවේ හැසිරෙන්න දන්නේ නැති කෙනෙක්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

ශ්‍රී ලංකන් ගුවන් සේවයේ යන කොට නම් හැසිරෙන්න දන්නවා. එතුමා දන්නවා හොඳට හැසිරෙන්න! ඊයේ පෙරේදා හැසිරුණු ආකාරයේ හොඳකම නිසා තමයි Business Class එකෙන් Economy Class එකට එව්වේ. එහෙමයි එව්වේ. [බාධා කිරීම්] ඔව්, අප දන්නවා. ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ගුවන් යානයකින් තමයි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

ඩුබායි රටට ගියේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

ඔබතුමා දන්නේ නැද්ද? [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒ හැසිරීමේ හොඳකමට මෙහාට එව්වා. හැසිරීමේ හොඳකම නිසා වෙන තැනකට යැව්වා. [බාධා කිරීමක්] ඔව්. හැසිරීම හොඳ නම් ඉතින් Business Class එකෙන් pilot ළඟට යවන්න එපා යැ. හැසිරීම හොඳ නැති නිසා මේ පැත්තට එව්වා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

හැසිරීම nil. මෙතුමා කථා කරන්නේ- [බාධා කිරීම්] මේ බලන්නකෝ- [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම බොහොම පැහැදිලිව මතක් කරනවා -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, now wind up please.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මට තව විනාඩි දෙකක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රිසානාගේ මරණයට ඩිලාන් පෙරේරා ඇමතිතුමා සම්පූර්ණයෙන්ම වග කියන්න ඕනෑ. බලන්න, මේ වෙන විට මොනවාද වෙලා තිබෙන්නේ? මේ වන විට ඇය විදේශගත කරපු, ඇයට හොර උප්පැන්න සහතික හදපු අයට මොනවාද කරලා තිබෙන්නේ? ඔවුන් මේ වන විට අවුරුදු දෙකක සිර දඬුවමකට යටත් කර තිබෙනවා. පළමුවෙනි, දෙවැනි සහ තුන්වන වූදිතයන් සිරගත කර තිබෙනවා. අපේ රටේ නීතිය ක්‍රියාත්මක කර තිබෙනවා. අපේ රටේ නීතිය ක්‍රියාත්මක කරන ගමන් ඒ රටේ ෂරි-ආ නීතියට අනුව අපට කරන්න පුළුවන් දේවල් හැම එකක්ම අප කර තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා ඒ රටේ රජ්ජුරුවන්ට කථා කළා. ඩිලාන් පෙරේරා ඇමතිවරයා ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග ගත්තා. මේක ඒ රටේ ක්‍රියා මාර්ගයක්. හැබැයි, අද සමහරු උත්සාහ කරනවා මේකෙන් දේශපාලන වාසියක් ගන්න.

රිසානාට තිබෙන මේ ආදරය මොකක්ද? මේක ඇත්තටම ඇයට තිබෙන ආදරයක්ද? රිසානාගේ අම්මාට -ඒ වැදගත් කාන්තාවට- සවුදි අරාබියෙන් මුදල් දෙන්න ඇහුවා. ගරු ඇමතිතුමා එයට සාක්ෂි දරනවා. ඒ දයාබර අම්මා කිව්වා මම මගේ දරුවා සල්ලිවලට විකුණන්නේ නැහැ කියලා. නමුත් එහෙම කියපු අම්මාට අද මේ මන්ත්‍රීවරයා අපහාස කරනවා. මේ මන්ත්‍රීවරයා කියනවා, ඩිලාන් පෙරේරා ඒ දැරියගේ මල්ලිට රස්සාවක් දීලා ඒ මවගෙන් බලහත්කාරයෙන් ප්‍රකාශයක් අරගෙන කියලා. ඩිලාන් පෙරේරා ඇමතිතුමා මේකෙන් නිදහස් කර දෙන්න කියලා රිසානාගේ අම්මා අද පාන්දර පහමාරට මුස්ලිම් දේවස්ථානයේ යාච්ඤාවක් පැවැත්වූවා, දයාබර මුස්ලිම් කාන්තාවක් හැටියට. ඒ නිසා මේ වාගේ මන්ත්‍රීවරුන්ට අපි මේක කියනවා. තව රිසානලා බිහි වෙයි. ඒ රිසානලාගේ දේහය විකුණාගෙන කන්න එපා. රිසානලාගේ නම විකුණාගෙන කන්න එපා. රිසානලාව විකුණාගෙන තමන්ගේ දේශපාලන පැවැත්ම හදා ගන්න එපා. රිසානලා විකුණාගෙන මැද පෙරදිග ගිහින් සල්ලි හිඟා කන්න එපා.

අන්න එවැනි තත්ත්වයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ විශ්වාසභංග යෝජනාවක් නොවෙයි ගෙනාවේ. ඩිලාන් පෙරේරා ඇමතිවරයාගේ දේශපාලන දිවියට අවුරුදු 25ක් පිරෙන මේ වෙලාවේ මම එතුමාට හොඳ විශ්වාසයක් දෙනවා, මෙන්න මෙහෙම. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2005 දී පැවැති ජනාධිපතිවරණයෙන් පස්සේ අතිගරු ජනාධිපතිතුමා මට විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍ය ධුරය දුන්නා. මම අවුරුදු තුනක් ඒ අමාත්‍ය ධුරයේ කටයුතු කළා. නමුත් අද මම කියනවා, මම ඒ ඇමතිකමේ ඉඳගෙන අවුරුදු තුනක් තිස්සේ කරපු දේවල්වලට වඩා වැඩි යමක් කළේ අද මේ තනතුරේ ඉන්න ඩිලාන් පෙරේරා ඇමතිතුමා බව. [බාධා කිරීම්] අපි අද මේ විශ්වාස භංග යෝජනාව පරාජය කරනවා. [බාධා කිරීමක්]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. John Amaratunga, what is your point of Order?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
As I mentioned earlier, whatever references made to the conduct of the Hon. Ranjan Ramanayake should be expunged from Hansard.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. M. Joseph Michael Perera.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඔබතුමාගේ කථාව නැහැ, කථාවම ඉවරයි. වැඩක් නැහැ මහන්සි වුණාට. [බාධා කිරීම්] ඔබතුමාගේ වෙලාව ඉවරයි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාවේදී ඉදිරිපත් කළ කාරණාවලට අදාළ ලේඛන මම **සභාගත*** කරනවා. [බාධා කිරීම්]

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
කථාව ඉවරයි, මොනවාද සභාගත කරන්නේ? [බාධා කිරීම්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විනාඩි විස්සක් ඇතුළත මෙම විවාදයට සහභාගි වන විට-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have 16 minutes. The time has been reduced due to the late start.

[අ.භා. 4.51]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කිව්වා නම් මම කථා කරන්නෙත් නැහැ. ප්‍රධාන කරුණු තුනක් අපේ ගරු ඇමතිතුමන්ලාගේ අවධානයට යොමු කරන්නට මම කැමැතියි. රිසානා මේ රටින් පිට වුණේ හොර passport එකකින්. [බාධා කිරීමක්] වයස අඩු, බාල වයස්කාරියක් නිසයි. ඒ වයස් අඩු දියණිය තමයි සෞදි අරාබියට ගිහින් මේ ප්‍රශ්නයට මැදි වුණේ.

මම පළමුවෙන්ම කථා කරන්නේ මේ ප්‍රශ්නයට මැදි වුණාට පසුව ඇති වුණ නඩු ක්‍රියා මාර්ගය පිළිබඳවයි. ගරු ජී.එල්. පීරිස් අමාත්‍යතුමා එතුමාගේ කථාවේදී බොහොමයක් කරුණු කියලා විස්තර කළේ මේ දැරිය මුදවා ගන්න ජනාධිපතිතුමා කළ මැදිහත්වීම ගැනයි. මම කනගාටු වෙනවා ඔබතුමාගේ ප්‍රකාශය සම්බන්ධයෙන්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි.

එතුමා කිව්වා අපේ රටේ නීතිය වාගේ නොවෙයි සෞදි අරාබියේ නීතිය කියලා. තමුන්නාන්සේ බුද්ධිමත් ඇමතිවරයෙක්. ඒ රටේ වැරදිකරුවන්ට නිදහස දෙන්නට රජුට බැහැ. ඒ බව දැන ගෙන ඇයි ඔබතුමා අපේ ගරු ජනාධිපතිතුමාට සෞදි අරාබියේ රජුට ලියුමක් ලියන්නට කියලා උපදෙසක් දුන්නේ? ඇයි ඒ බාල්දු වැඩේ කළේ? එහෙම කළේ හොඳටම දැන ගෙන නේ. ඇයි එහෙම කළේ? ඒක කළේ මේ රටේ ජනතාව රවටන්නට. එහෙම නැතුව වෙනත් දෙයකට නොවෙයි.

ඒ වාගේම තමුන්නාන්සේ විස්තරයක් කළේ නැහැ ඒ රටේ හිටපු අපේ තානාපති මොන විධියේ ක්‍රියා මාර්ගයකින් නීතිඥයින් සමඟ මේ නඩුවට සහභාගි වුණාද කියලා. ඒක ගැන ඔබතුමා මොනවත් කිව්වේ නැහැ. අපට ඒ කරුණු ඉදිරිපත් කළා නම් කථාවෙන් නොවෙයි, ලිය කියවිලිවලින් රජයට නිදහස් වන්නට තිබුණා. ගරු ඇමතිතුමාවත් නිදහස් කරන්නට තිබුණා.

ඊළඟ කාරණය මෙයයි. මේ නඩුවේදී ඉදිරිපත් කළ කාරණා එතැනදී ඔප්පු කළාද? ඒ, මේ ව්‍යාජ passport එක හදපු, දිනය වෙනස් කළ ආයතනයට විරුද්ධව මේ නඩු තීන්දුව දෙන්නට ඉස්සෙල්ලා ලංකාවේදී අපි ක්‍රියා මාර්ගයක් ගත්තා කියලා. මේ නඩු තීන්දුව දුන්නාට පසුව නඩු දැම්ම එක හරි. උසාවියට ඉදිරිපත් කළ කරුණුවලදී ලංකාව වෙනුවෙන් ඒ කාරණය ඉෂ්ට කළාද? මේ කාරණය පිළිබඳව තමුන්නාන්සේ පැහැදිලි කිරීමක් කළේ නැහැ.

තවත් කාරණයක් තිබෙනවා. තමුන්නාන්සේලා මුළු රටම රවටනවා වාගේ අදත් රැවැට්ටුවා. හොඳටම දැන ගෙන. ෂරි-ආ නීතිය අනුව රිසානාව නිදහස් කරන්නට රජ්ජුරුවන්ට බැරි බව දැන ගෙන එතුමාට බලපෑම් කරන්නට රජ්ජුරුවන්ගේ පුතයි, තවත් කෙනෙකුයි හමු වෙලා මම කථා කළා කියලා ජී.එල්. පීරිස් අමාත්‍යතුමා ප්‍රකාශ කළා. ඒ නීතියත් හොඳටම දැන ගෙන බැරි වැඩේ කරන්නට ගියේ ඇයි? මම හිතනවා තමුන්නාන්සේ මේ ක්‍රියාව කළේ වෙන මොකුත් නිසා නොවෙයි ආණ්ඩුව බේරන්න සහ විදේශ කටයුතු අමාත්‍යතුමා විධියට තමුන්නාන්සේ බේරෙන්න. ඔබේ රාජකාරිය කළේ නැහැ කියන කාරණය තහවුරු නොකරන්නට ඩිලාන් පෙරේරාව බිල්ලට දුන්නා. ඒක තමයි තමුන්නාන්සේ කළේ. වෙන එකක් නොවෙයි.

ඩිලාන් පෙරේරා ඇමතිතුමා ගැන කියද්දි හොඳ කතන්දරයක් අපට මතක් වනවා. ළඟදි විදුලි බිල වැඩි කළා නේ? විදුලි බිල වැඩි කළාම ඒකේ වගකීම කාටද එන්නේ? ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, ඔබතුමා වරදක් කළොත් එහි වගකීම කාටද එන්නේ? ඔබතුමාට එන්න පුළුවන්, නැත්නම් ජනාධිපතිතුමාට එන්න පුළුවන්. ඒ වාගේ ඩිලාන් පෙරේරා ඇමතිතුමා වරදක් කළා නම්, සමස්තයක් හැටියට එය රජයට එන විශ්වාස භංග යෝජනාවක්. නම සඳහන් කරන්නේ ඒ අදාළ ඇමතිතුමාගේයි. මේ ඇමතිතුමා හොඳ නැහැ. මේ රටේ ආණ්ඩුව තීන්දුවක් ගන්න කොට, වැඩ කරන කොට සාමූහික වග කීමෙන් තමයි කටයුතු කරන්නේ කියලා අපි දන්නවා. එහෙනම් අද අපි ඩිලාන් පෙරේරා ඇමතිතුමාට විරුද්ධව මේ යෝජනාව ගෙනෙන්නේ එතුමාගේ කාර්ය භාරයේ අඩුවක් තිබෙන නිසායි. ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමනි, එහෙම තිබුණා නම්, ඒක හැදීමේ වගකීම විදේශ කටයුතු ඇමතිවරයා හැටියට තමුන්නාන්සේටයි තිබෙන්නේ. අපේ රටේ කෙනෙක් -ලංකාවේ කෙනෙක්- විදේශ රටකදි අසාධාරණ ලෙස මරණයට පත් කරන කොට අපි ඒ පිළිබඳව ඉදිරිපත් වන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් වෙලාව තිබුණා. ෂරි-ආ නීතිය කියලා මේ ප්‍රශ්නයෙන් බේරෙන්න බැහැ. මේ ප්‍රශ්නයේදී සෞදි අරාබියට බැනලා හරි යන්නේ නැහැ. අඩු වයසේ කෙනෙක් මෙහෙකාර සේවයේ යොදවා ගන්න බැහැ කියන එක ජාත්‍යන්තර වශයෙන්

**** ප්‍රස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පිළිගත් නීතියක්. විදේශ කටයුතු ඇමතිතුමනි, රිසානා නෆීක් කියන අඩු වයසේ දැරියට වැඩි වයසක් දමා passport එක හැදූ බවත්, එය හැදූ කෙනාට නඩුවක් දමා වැරදිකරු බවට අපි තීරණය කරලා තිබෙනවා කියලා සෞදි අරාබියේ අධිකරණයට තමුන්නාන්සේ කරුණු ඉදිරිපත් කළේ නැහැ. විදේශ රටවල් එක්ක කටයුතු කරන්නේ ඩිලාන් ඇමතිතුමා නොවෙයි. මම කොහොමවත් එතුමා නිදහස් කරන්න යන්නේ නැහැ. වෙන කවුරුවත් නොවෙයි, අපේ ආණ්ඩුව -විදේශ කටයුතු අමාත්‍යාංශය- මෙතැනදි නිදාගෙන හිටියා කියලා තමයි මම කියන්නේ. ඒ නිසා තමයි මේ දැරිය ජීවිතයෙන් වන්දි ගෙවන තුරු බොරුවට කෑ ගගහා ඉන්න තමුන්නාන්සේලාට සිද්ධ වුණේ.

ඒ එක්කම තවත් කාරණයක් අපට පෙනෙනවා. සෞදි අරාබියේ අධිකරණයක විභාග වුණු එම නඩුවට ඉදිරිපත් වෙලා මේ දැරිය බාල වයස්කාරියක් කියලා රජයක් හැටියට හරියට කරුණු ඔප්පු කරන්න බැරි වුණු එකේ වරද කාගේද? මේ වරද සිද්ධ වුණු අවස්ථාවේම එම දැරිය බාල වයස්කාර දැරියක් කියලා අපි ඔප්පු කළා නම්, මේ දැරිය මරණයට පත් වනවාද? අපට ඒකට උත්තර දෙන්න. එහෙනම් ඒ වගකීම කෙළින්ම රජය ගන්න ඕනෑ. ඩිලාන් පෙරේරා ඇමතිතුමාත් ඒ වගකීම ගන්න ඕනෑ. මම පෞද්ගලිකව මුකුත් කියන්න යන්නේ නැහැ. ඒක මගේ සිරිත නොවෙයි.

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
ඔබතුමන්ලාටත් වග කීමක් තිබුණා නේ?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
විරුද්ධ පක්ෂයයි ආණ්ඩුවයි කියන්නේ දෙකක් කියන එක තේරුම් ගන්න බැරි මිනිස්සුත් ඉන්නවා නේ. ආණ්ඩුවක වග කීමයි, විරුද්ධ පක්ෂයක වග කීමයි දෙකක්. කරුණාකර ඒක තේරුම් ගන්න. අපට තිබෙන්නේ ආණ්ඩුවට -රජයට- කරුණු කියන එකයි. සෞදි අරාබියේ රජ්ජුරුවෝ හම්බ වන්න යන්න අපට පුළුවන්ද? අපි කවුද?

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
කියලා මදි, ක්‍රියාත්මක වන්න ඕනෑ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එහෙනම් ආණ්ඩුව අපට දෙන්න.

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ඒවාට අපට උදව් කරන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපි හොඳටම දන්නවා, ඩිලාන් පෙරේරා ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා ඡන්දයකින් එතුමා පරද්දන්න බැහැ කියලා.

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මෝඩ වැඩක් නේ කරන්නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේලා මෙතැනට ඇවිල්ලා "අපි දිනනවා" කියලා හයියෙන් කෑ ගහලා හරි යන්නේ නැහැ. මේකෙන් අපි අදහස් කරන්නේ මොකක්ද? මම දන්නේ නැහැ, එතුමාගේ අඩු පාඩු මොනවාද කියලා. ඒ අඩු පාඩු ගැන දන්නා අය තමයි ඒවා දන්නේ. ඒවා මම දන්නේ නැහැ. අපි කාගේත් අඩු පාඩු තිබෙනවා. නැත්තේ නැහැ. නමුත් මෙතැනදි අපේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා කිව්වේ මොකක්ද? රිසානා මැරිලා ඉවරයි.

මේ විධියට තවත් විශාල පිරිසක් සෞදි අරාබියටම යනවා. මා ළඟ පොඩි විස්තරයක් තිබෙනවා. 1,000ක විතර පිරිසක් ඒ රටේ ගෙවල්වලින් පැනලා ඇවිල්ලා හෝ, ඒ රටේ කරපු රැකියාවලින් අස් කරලා හෝ සෞදි අරාබියේ පාලම් යට හෝ කොහේ හෝ අපේ අය අද සිටිනවා.

මම මේ කථා කරන මොහොත වන විටත් Embassy එක ඉස්සරහා 150ක් විතර ඉන්නවා. මෙහෙම වෙනවා නම් මිනිස්සු පිට රට යැවීමේදී අපි ගත යුතු ක්‍රියා මාර්ගයක් තිබෙනවා. අන්න ඒ ක්‍රියා මාර්ගය නොගැනීම ගැන තමයි අපි ඇමතිතුමාට දෝෂාරෝපණය කරන්නේ. විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙන්නේ වෙන එකකට නොවෙයි. තමුන්නාන්සේලා මොකක්ද කළේ? ඒ වැරැද්දෙන් රජය නිදහස් කරගෙන ඩිලාන් පෙරේරා ඇමතිතුමාට ඒ දෝෂාරෝපණය පැවරුවා. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා බොහොම කෙටි කථාවක් කළා. එතුමා අපට උපදෙස් දීලා තිබුණේ, ඩිලාන් පෙරේරා ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න කියලායි. මේක තමයි ඇත්ත කතන්දරය. රජයට ගෙනෙන්න ඕනෑ එක ඩිලාන් පෙරේරා ඇමතිතුමාට ගෙනෙන්න කියලා තමයි එතුමා අපට කිව්වේ. තමුන්නාන්සේලා අහගෙන හිටියා, එතුමා කරපු කථාව මොකක්ද කියලා. [බාධා කිරීම්] මට නේ. මට ගැළපෙනවාද, නැද්ද කියලා බලන්න ඉස්සර වෙලා තමුන්නාන්සේලා බදුල්ලට ගිහිල්ලා අහන්න, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ඩිලාන් පෙරේරා ඇමතිතුමාට කොහොමද වැඩ කරන්න අවස්ථාව දීලා තිබෙන්නේ කියලා. අද මෙතැන නිදහස් වෙන්න හදනවා. වෙන මොනවත් කළේ නැහැ. [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඔතැන ඉන්න මන්ත්‍රීතුමන්ලා දෙන්නා කියනවා, ඔබතුමා ගම්පහ දිස්ත්‍රික්කයේ එකට වැඩ කරන්න දෙන්නේ නැහැ කියලා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපි ඒක බලා ගන්නම්.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඇමතිතුමනි, ඒක හරි. ඒ මොන ප්‍රශ්න තිබුණත් අපි ඡන්දයක් වේලාවේදී එකට ඉන්නවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කියන්න කෝ, ඡන්ද වේලාවේදී එකට ඉන්න හැටි කොහොමද කියලා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අහන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කිසිම සැකයක් නැහැ. එකට ඉන්නවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එකට ඉන්නවා. එකට බණිනවා. [බාධා කිරීම්] ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය දුන්නේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට නේද? දැක්කද? කථා නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ ජනාධිපතිතුමාට විරුද්ධව ජනාධිපතිවරණයේදී වැඩ කළේ කොයි ආකාරයෙන්ද කියලා මම අමුතුවෙන් කියන්න යන්නේ නැහැ. [බාධා කිරීම්] ඒක අපට කිව්වේ කවුද දන්නවාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Mahindananda Aluthgamage, what is your point of Order?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
සමාවන්න, මම වැරැදි දෙයක් කිව්වා නම්, ඔබතුමා එහෙම නොකළා නම් මම ඒක ඉල්ලා අස් කර ගන්නවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please switch on the mike for the Hon. Mahindananda Aluthgamage.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කරුණාකරලා විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න හේතු වුණේ මොකක්ද කියන එක ගැන අපට කියන්න දෙන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට point of Order එක ඉදිරිපත් කරන්න ඔබතුමාගේ seat එකට යන්න ඕනෑ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විපක්ෂයේ හිටපු සංවිධායක. ඔබතුමාට විපක්ෂයේ සංවිධායකම නැති වුණේ රනිල් වික්‍රමසිංහට විරුද්ධව කුමන්ත්‍රණය කරපු හින්දායි. [බාධා කිරීම්] මට ඇමතිකම හම්බ වුණේ ජනාධිපතිතුමාට වැඩ කරපු හින්දායි. ඒ නිසා දැන්වත් පක්ෂයේ නායකයාට වැඩ කරන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි. ඔබතුමාගේ උපදෙස් මම පිළිගන්නවා. මම ඒක පිළිගන්නවා. ස්තුතියි, ඔබතුමාට. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා මේ එන්නේ. [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Nimal Siripala de Silva, what is your point of Order?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කනගාටු වෙනවා, ඔබතුමා වාඩි වෙලා ඉන්න උත්තරීතර ආසනයේ වාඩි වෙලා හිටපු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා මේ වාගේ ගල් පැළෙන බොරු කියනවාට. ඒක එකක්. දෙවැනි කාරණය අද එක්සත් ජාතික පක්ෂය පාලනය කරන්න මට භාර දීලා තිබෙනවා නම් ඒකත් මම ලබපු ලොකු ජයග්‍රහණයක්.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැන් යනවාද? තමුන්නාන්සේ කිව්වේ නැද්ද එහෙම? තමුන්නාන්සේ කිව්වේ නැද්ද එහෙම? [බාධා කිරීමක්] පෞද්ගලික තත්ත්වයට නම් එන්න එපා. ඒක වැරැදියි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
තමුන්නාන්සේලා එක විධියට වැඩ කරනවා නම් තමුන්නාන්සේලාගේ පක්ෂයට ඔහොම දේවල් වෙන්නේ නැහැ. ඒක මතක තියා ගන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ ඩිලාන් පෙරේරා ඇමතිතුමාට එහේදී කොයි විධියට හිරි හැර කරනවාද කියලා තමුන්නාන්සේම දන්නවා.

කවුද මේක කිව්වේ? තමුන්නාන්සේ දන්නවා. දැන් අද තමුන්නාන්සේ මෙතැනට ඇවිල්ලා මොකක්ද කියන්නේ? [බාධා කිරීමක්] තමුන්නාන්සේ කියන එකක් කියන්න. මම කියන එක- [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
තමුන්නාන්සේලාගේ දේශපාලන බංකොලොත්භාවය පෙන්වන විවාදයක් මේක.[බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(මාණ්පුමිකු එම්. ජෝසප් මයිකල් පෙරේරා)
(The Hon. M. Joseph Michael Perera)
අපි දැක්කා, මේ විවාදයට කොයි තරම් දුරට ඒක හොඳට බලපෑවාද, නරකට බලපෑවාද කියලා. මම කිව්වේ මෙතුමා කරපු කථාවත්, ඔබතුමා කරපු කථාවත් ගැන. තමුන්නාන්සේ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා නිදහස් කරන්න තරම් වචන ස්වල්පයක් කථා කළේ නැහැ. ඒක නිසා- [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)
ඔය කථාව අවමානයක්. [බාධා කිරීම්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(මාණ්පුමිකු එම්. ජෝසප් මයිකල් පෙරේරා)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ කියන අසත්‍යය ගැන අහපුවාම අවමානය කොහෙද තිබෙන්නේ කියලා මා දන්නවා. ඒ නිසා අපි ඒ කථාව නතර කරලා අදාළ මාතෘකාව ගැන කථා කරමු.

දැන් මම ඉදිරිපත් කළේ මූලික කරුණු කිහිපයක් විතරයි. පළමුවැනි කාරණය, රිසානා මෙහෙන් යන කොට බාල වයස්කාරියක් කියන එක. කරුණු තුනයි මා කියන්නේ. ඊට පස්සේ රිසානා බාලවයස්කාරියක් හැටියට ගියා කියලා සෞදි අරාබියේදී අහපු නඩුවේදී ලංකා ආණ්ඩුව -ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමනි, තමුන්නාන්සේගේ විදේශ කටයුතු අමාත්‍යාංශය තමයි එහේට යන්නේ. ඩිලාන් පෙරේරා ඇමතිතුමා නොවෙයි- කරුණු ඉදිරිපත් කළාද? එහෙම කළා නම් ඒක කොහොමද කළේ කියලා මේ රටට පිළිගන්න කරුණාකර, ඒ කරුණු පැහැදිලි කරලා මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් ගත කරන්න. ඒක තමුන්නාන්සේ කළේ නැහැ. තමුන්නාන්සේ කිව්වේ, ගිහිල්ලා නෑදෑයින් හම්බ වුණාය කියලයි. මගේ පළමුවන තර්කය ඒක. ඒ නිසා රිසානාගේ මරණය පිළිබඳ වගකීම රජය භාර ගත යුතුයි කියලා මා පැහැදිලිව කියනවා.

ඊළඟට ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා අතින් වැරදි කිහිපයක් වුණා. මා පෞද්ගලිකවත් එතුමාව දන්නවා. අපි බොහොම හොඳට ආශ්‍රය කරනවා. මට නම් පෙනුණු විධියට එතුමා කොයි වෙලාවකවත් පාර්ලිමේන්තුවට කිව්වේ නැහැ, "මම රිසානා නිදහස් කර ගන්න කටයුතු කරනවා" කියලා. එහෙම ප්‍රකාශයක් කරනවා මම නම් දැක්කේ නැහැ. කොයි වෙලාවේත් එතුමාගේ කථාවෙන් පැහැදිලි වුණේ, "ෂරි-ආ නීතිය අනුව අපට මේක කරන්න බැහැ" කියන එකයි. ඒකයි අපි කරන දෝෂාරෝපණය. එතුමා බැහැ කියන එක තමයි මම "කරන්න පුළුවන්" කියලා කිව්වේ. නමුත් පුළුවන් වෙන තත්ත්වයට ඒ අමාත්‍යාංශය වැඩ කටයුතු කළේ නැහැ; ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා වැඩ කටයුතු කළේ නැහැ. අද ගිහිල්ලා ඒ අම්මාට ගෙවල් හදලා දුන්නත්, රක්ෂා දුන්නත් තමන්ගේ දුව නැවත එන්නේ නැහැ. ඒ නිසා ඒකට වගකීමත් ගරු ඩිලාන් ඇමතිතුමා භාරගත යුතුයි.

මම මෙන්න මේ කරුණු ටික විතරයි තමුන්නාන්සේලාට මා කියන්නේ. වැඩිය කියන්නේ නැහැ. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා -අපේ නියෝජ්‍ය සංවිධායකතුමා- බොහොම සවිස්තරව ඒ කරුණු තමුන්නාන්සේලාට ඉදිරිපත් කළා. අපිත් ඒ නඩු පිළිබඳව කටයුතු කර තිබෙන ආකාරය පිළිබඳව පැහැදිලි කළා. ඒ වාගේම වෙනත් රටවල මෙවැනි සිද්ධීන් ඇති වුණාම කොහොමද ඒ අය කටයුතු කර තිබෙන්නේ කියලත් එතුමා පැහැදිලි කළා. මෙතැනදී මුස්ලිම් කියලා හිතන එක නොවෙයි තිබෙන්නේ. මා හිතන හැටියට එහෙම නොවෙයි. දහස් ගණනක් මේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එතැනදී රජයේ මැදිහත් වීම මීට වඩා වැඩි වෙන්න ඕනෑ.

අද තමුන්නාන්සේලා අපි -ඔක්කෝම- මෙහෙම ඉන්නේ, මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්නේ, පිට රට ගිහිල්ලා අර කාන්තාවන් හම්බ කරලා දෙන සල්ලි ටිකෙන්ය කියන එක අපි අමතක කරන්න හොඳ නැහැ. අපි ජීවත් වන්නේ ඒකෙන්. ඔය කාර් රේස් තියන්නෙත් එහෙමයි. කානිවල් තියන්නෙත් එහෙමයි. මේ රටේ ආර්ථිකය හදලා තිබෙන්නේ ඔතැන. තේ, පොල්, රබර් කියාපු ආර්ථිකය වෙනස් වෙලා තිබෙනවා. එහෙනම් මීට වඩා වැඩි අවධානයක් මේ අය ගැන යොදන්නට ඕනෑ. මේ විවාදයේ සම්පූර්ණ හරය වෙන්නේ රිසානාව මරණයෙන් ගොඩ ගැනීම නොවෙයි. ඩිලාන් පෙරේරාව මේ විශ්වාස භංගයෙන් පරාද කරලා වෙන ඇමතිකමක් දීමත් නොවෙයි. මේකේ සම්පූර්ණ හරය වෙන්නේ මොකක්ද? අපි නැවතත් මේ ගැන හිතන්න වෙනවා. ගෞරවනීය විධියට හිතන්න වෙනවා. සෞදි නීතිය ගැන මා කථා කරන්න යන්නේ නැහැ. ඒ රටේ නීතියක් තිබෙනවා නම් ඒ නීතියෙන් ගැලවෙන්නේ කොහොමද කියලා ඔළුව තිබෙන අය හැටියට අපි කල්පනා කරන්න ඕනෑ. ඒක අපි කල්පනා කළේ නැහැ. අපි ගියා සෞදි අරාබියාව පස්සෙන්; රජ්ජුරුවෝ පස්සෙන්. දැන් එහෙනම් මේ විවාදයේදී අපට මේ කරුණු දෙකට පැහැදිලි උත්තරයක් දෙනවා නම් හොඳයි. මෙතුමා - ගරු ජී.එල්.පීරිස් ඇමතිතුමා - නම් පිළිතුරක් දුන්නා, තමුන්නාන්සේ කරපිට තියලා. එතකොට තමුන්නාන්සේගේ යාළුවාත් ඒ ජොබ් එකම කරලා යන්න ගියා.

ඒ නිසා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, වැඩිය අනම්මනම් කියන්නේ නැතිව මම මේ කිවූ කරුණු සම්බන්ධයෙන් එනම්, තමුන්නාන්සේ මේ කාරණාවට මැදිහත් වුණේ කොහොමද, නඩුවට මැදිහත් වුණේ කොහොමද, වයස තහවුරු කරන්න පුළුවන් document එකක්, උසාවි නියෝගයක් නඩුව යන වෙලාවේ ඉදිරිපත් කරන්න කටයුතු කළේ කොහොමද, ඒක ඉදිරිපත් කළේ කා හරහාද කියලා මේ ගරු සභාවට ලිඛිතව ඉදිරිපත් කරන්න කියලා. එසේ ඉදිරිපත් කරනවා නම් ඒක හැන්සාඩ් එකට යනවා. ඒක වැදගත්.

[අ.භා. 5.09]

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු බෙසිල් රෝහණ රාජපක්ෂ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ විවාදයට සම්බන්ධ වීම සඳහා 1949 ඉඳලා මේ දක්වා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ගෙනා විශ්වාස භංග යෝජනා පිළිබඳව සොයා බැලුවා. මේ විශ්වාස භංග යෝජනා මූලික වශයෙන් කොටස් දෙකකට වෙන් කරන්න පුළුවන් බව මුලින්ම කියන්න ඕනෑ. එක කොටසක් තමයි රජයකට විරුද්ධව ගෙනෙන විශ්වාස භංග යෝජනා. සාමුහික වගකීමක් ඇති කැබිනට්ටුවක් සහිතව රට පාලනය කරන ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට විරුද්ධව තමයි වැඩිම

[ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]

විශ්වාස භංග යෝජනා ප්‍රමාණයක් ගෙනැවිත් තිබෙන්නේ. අනෙක් කොටස යම් පුද්ගලයකුගේ පෞද්ගලික හැසිරීමට අභියෝග කරමින් ගෙනෙන විශ්වාස භංග යෝජනා. කථානායකවරුන් හතර දෙනකුට, නියෝජ්‍ය කථානායකවරයකුට, අමාත්‍යවරුන්ට සහ විපක්ෂ නායකවරයකු වශයෙන් කටයුතු කළ කන්කසන්තුරේ මන්ත්‍රීවරයකුට විරුද්ධව විශ්වාස භංග යෝජනා ගෙනැවිත් තිබෙනවා.

ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන මෙම විශ්වාස භංග යෝජනාවට හිටපු ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු, පළපුරුදු අය අත්සන් කර තිබෙනවා. ඒ ගැන මම කනගාටු වෙනවා. මෙම විශ්වාස භංග යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ පෞද්ගලිකව නම සඳහන් කර චෝදනා එල්ල කරමිනුයි. මීට කලින් යම් පුද්ගලයකු සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු විශ්වාස භංග යෝජනා ගැන මම බැලුවා. මංගල සමරවීර මැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. ඒක ගෙනැල්ලා තිබෙන්නේ එතුමාගේ පෞද්ගලික හැසිරීම ගැනයි. ඇමතිවරයා හැටියට තමන්ට භාර අමාත්‍යාංශයට අයත් ආයතනයකින් ක්‍රෙඩිට් කාඩ් පතක් අරගෙන පෞද්ගලිකව පරිහරණය කළාය කියා චෝදනාවක් එතුමාට එල්ල කර තිබුණා. යම්කිසි අමාත්‍යවරයකුට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා නම් ඒ හැම එකක්ම ගෙනැවිත් තිබෙන්නේ පෞද්ගලිකව යම්කිසි අයථා ක්‍රියාවක යෙදීම හෝ තමන්ගේ නිලයේ -තනතුරේ- වැරදි වැඩක් කිරීම පිළිබඳවයි. නමුත් අවාසනාවකට මෙම යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ යම්කිසි ක්‍රියා දාමයක් තුළ වුණු සිද්ධියක් ගැන මිසක්, ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා පෞද්ගලිකව කළ කාරණයක් පිළිබඳව නොවෙයි.

ඒ නිසා මම විශේෂයෙන්ම විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා, මීට පස්සේ පෞද්ගලිකව මැදිහත් වීම ගැන මෙවැනි යෝජනා ගේනවා නම්, ඒ අයගේ පෞද්ගලික හැසිරීම පිළිබඳව මිසක් පොදුවේ වගකිව යුතු කාරණා පිළිබඳව ගේන්න එපා කියලා. ඇයි, එහෙම කියන්නේ? ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා මේ අමාත්‍ය ධුරයට පත් වුණේ 2010 දෙසැම්බර් මාසයේ 11 වැනිදා. රිසානා පිට රට ගියේ 2005 මැයි මාසයේ 04 වැනිදා.

ඩිලාන් පෙරේරා ඇමතිතුමා තියා ජනාධිපතිතුමාවත්, මේ විදේශ කටයුතු ඇමතිතුමාවත්, passport පිළිබඳව වගකීම් දරන ධුරවල ඉන්න මේ කිසිම කෙනකුවත් ඒ කාලය තුළ සිටියේ නැහැ. ඊළඟට මේ මිනී මැරුම් චෝදනාව නැඟුවේ 2005 මැයි මාසයේ 22වැනි දායි. එදා සිටියාද ඩිලාන් පෙරේරා ඇමතිතුමා? සිටියේ නැහැ. නඩුව පැවරුවේ 2006 මයවැනි මාසයේ 24වැනි දායි. එතකොට කවුද විදේශ ඇමතිවරයාව සිටියේ? මංගල සමරවීර ඇමතිතුමායි සිටියේ. එහෙම නම් කාට හරි කියන්න පුළුවන් මංගල සමරවීර හිටපු ඇමතිතුමායි මේකට වග කියන්න ඕනෑ කියලා. අභියාචනය කළේත් ඒ කාලය තුළමයි. ඩිලාන් පෙරේරා මැතිතුමා මේ ඇමති ධුරය භාර ගත්තේ ඒ සියල්ලටම පසුවයි.

මේ යෝජනාව අද දින සභාවට ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා කිව්වේ, අපි මුල ඉඳලාම නඩුවට අවශ්‍ය කරුණු එළිදරවු කළේ නැහැ කියලායි. ඩිලාන් පෙරේරා ඇමතිතුමා නොවෙයි ඒ කාලයේ ඇමතිතුමා. එදා විදේශ කටයුතු ඇමතිත් එතුමා නොවෙයි; විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන පිළිබඳ ඇමතිවරයාත් එතුමා නොවෙයි. ඒ කරුණු සියල්ල -හැම එකක්ම- අපි ඉදිරිපත් කරපු ඒවායි. ඇය නිසි වයස සම්පූර්ණ නොකර සිටීම ගැන අපි පළමුවැනි අදියරේ ඉඳලාම -ඩිලාන් පෙරේරා ඇමතිතුමා විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන ඇමතිකමේ නොසිටියදීත්- කරුණු කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප විශේෂයෙන් සඳහන් කරන්නේ, ඩිලාන් පෙරේරා ඇමතිතුමාට පෞද්ගලිකව සහතිකයක් දෙන්න අපට පුළුවන් කියන එකයි. මා අද තමයි එතුමාගේ දේශපාලනයට අවුරුදු 25ක් වෙනවා කියලා දැන ගත්තේ. එතුමා මෙතරම් වයස චිත්තියත් දැන ගත්තේ අද තමයි. බලන කොට ළා බාලම මන්ත්‍රීවරයා හැටියට තමයි එතුමා පළාත් සභාවට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා එතුමාගේ දේශපාලන ජීවිතයට අවුරුදු 25ක් වෙලා තිබෙනවා. ඒ අවුරුදු 25ක කාලය පුරාම දේශපාලනයෙන් ශත පහක්වත් හම්බ නොකර අවංකව ජනතාවට සේවය කරපු පුද්ගලයකු හැටියට ඕනෑම තැනකදී සහතික කරන්න පුළුවන් නායකයෙක් එතුමා. දේශපාලනය නිසා එතුමාට මේ රට අත් හැරලා යන්න සිදු වුණා ජීවිතය බේරා ගන්න. මා හිතන විධියට එතුමා සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ සම්මත කළ යුත්තේ විශ්වාස භංග යෝජනාවක් නොවෙයි, විශ්වාසය පළ කිරීමේ යෝජනාවක්ය කියන එක මම මේ අවස්ථාවේ සඳහන් කරනවා. තම පෞද්ගලික ජීවිතය කැප කරමින් දේශපාලනය කරන කොට ඒ සෑම දෙයකදීම එතුමා ඉතාම පිරිසිදුව කටයුතු කර තිබෙනවා කියන සහතිකය අපේ ආණ්ඩුව වෙනුවෙනුත්, අපේ පක්ෂය වෙනුවෙනුත් දෙන්න අපි සූදානම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාගේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් වුණත් -ඒ මත පිහිටා වුණත්- විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න පුළුවන්ද? එතුමා මේ අමාත්‍ය ධුරයේ වැඩ භාර ගත්ත දවසේ ඉඳලා මේ අමාත්‍යාංශය තුළ සම්පූර්ණ පෙරළියක් කළා. මේ රටේ රණ විරුවන්ට වාගේම විදේශ රැකියා කරන අයට ඇගයීමක් ලබා දී ඔවුන් "රට විරුවන්" ලෙස නම් කරලා ජාතිය තුළ ඔවුන්ට පිළිගැනීමක් ඇති කළා. ඒ විතරක්ද? ඒ රට විරුවන් අද මේ රටේ ආර්ථිකයට විශාල ශක්තියක් වෙලා. සමහරු ඒකට ඉරිසියයි. ඒ බව තමයි මෙතැනදී කරපු හැම කථාවකින්ම තේරුම් ගියේ. අපේ රටට අවශ්‍ය විදේශ විනිමය උපයා දෙන ඒ රට විරුවන් ගැන ඊර්ෂ්‍යාවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ළඟදී උතුරු කොරියාවයි දකුණු කොරියාවයි අතර මත භේදයක් ඇති වන කොට වැඩියෙන්ම කෑ ගැහුවේ කවුද? මේ විපක්ෂයයි. කොයි වෙලාවේ යුද්ධයක් ඇවිළේවිද කියලායි ඒ අය බලා ගෙන සිටියේ. කොරියාවේ වැඩ කරන අපේ තරුණ පිරිස ගෙන්වලා, ඔවුන්ගේ ආදායම නැති කරලා, ඒ තුළින් රටට ලැබෙන ආදායම නැති කරලා රජය අපහසුවට පත් කරන්නයි බලා සිටියේ. මේ ගරු ඇමතිතුමා විදේශ ශ්‍රමිකයන්ගේ ආදායම විශාල ලෙස වර්ධනය කරලා මා හිතන හැටියට අද සමස්ත ප්‍රේෂණ සියයට 56.1ක් දක්වා ඉහළට නංවලා තිබෙනවා.

විශේෂයෙන්ම එතුමා තවත් වැදගත් දෙයක් කළා. එතුමා කළ වැදගත්ම දේ මෙන්න මෙකයි. මෙතෙක් කල් නුපුහුණු ගෘහ සේවිකාවන් විධියට ගිය කාන්තාවන්ගේ ප්‍රතිශතය ඉතාම ඉහළ මට්ටමකයි තිබුණේ. මට ඉස්සෙල්ලා කථා කළ ගරු ජෝශප් මයිකල් පෙරේරා මහතා කම්කරු ඇමතිවරයා විධියට ඉන්න කාලයේ සියයට 80ක්ම යැව්වේ නුපුහුණු ගෘහ සේවිකාවනුයි. ඔවුන් මැද පෙරදිග හැර වෙන එකම රටකටවත් ගියේ නැහැ. කොරියාවට ගියේ නැහැ, ඉතාලියට ගියේ නැහැ, ඕශ්‍රායලයට ගියේ නැහැ, මැලේසියාවට ගියේ නැහැ. අඩු ගණනේ සිංගප්පූරුවට යැව්වේ නැහැ. ගෘහ සේවිකාවන් වශයෙන් ඔක්කෝම ගියේ මැද පෙරදිග රටවලටයි. මෙතුමා ආවාට පස්සේ එම කාන්තාවන්ගේ ප්‍රතිශතය සියයට 50කින් අඩු කරලා වැඩි පිරිමි ප්‍රතිශතයකුත් ඒ වාගේම ඉංජිනේරුවන්, ගණකාධිකාරිවරුන්, quality controllersලා වැනි උගත් විශාල පිරිසක් ඉහළ වැටුප්වලට යැව්වා. ඒ වාගේම පුහුණු ශ්‍රමිකයන් යැවීමට ක්‍රියා කළේත් මෙතුමායි. මේ රජය විසින් පවරා ගත්, BOI එක යටතේ ආරම්භ කර වසා දමා තිබූ ආයතනයක් විවෘත කරන්න එතුමාගේ

ආරාධනයක් පරිදි ළඟදී මම ගියා. අද එතැන ඉහළම විධියට ශ්‍රමිකයන් පුහුණු කරන සිංගප්පූරුවේ ආයතනයක් පිහිටුවලා තිබෙනවා. පුහුණු වන අයගේ සහතිකය ඔවුන් එම ස්ථානයේදීම දෙනවා. එසේ දෙනවා විතරක් නොවෙයි, මාස තුනක් ඇතුළතදී සිංගප්පූරුවේ ස්ථිර රැකියාවක් ලබා දෙන විධියට එතුමා ඒ ගිවිසුම් අත්සන් කරලා එම කටයුත්ත ආරම්භ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම විශේෂයෙන්ම මේ ගැන කථා කරන කොට අපි කියන්න ඕනෑ, පිට රට යන ශ්‍රමිකයන්ටත්, ගෘහ සේවිකාවන්ටත් පුහුණුව අනිවාර්ය කළාය කියන කාරණය. එදා, 2006 වර්ෂයේදී 49,160ක් වූ පුහුණු ශ්‍රමිකයන්ගේ ප්‍රමාණය 2012 වෙන කොට 90,458 දක්වා වැඩි කරන්න මෙතුමාට හැකියාව ලැබිලා තිබෙනවා. එහෙම නම් මෙතුමාට ගෙනෙන්න ඕනෑ විශ්වාස භංග යෝජනාවක් නොවෙයි, විශ්වාසය පළ කිරීමේ යෝජනාවකුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි, මෙතුමා ශිෂ්‍යත්ව ලබා දීම -සුබසාධනය- පිළිබඳව කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ දරුවන්ට ශිෂ්‍යත්ව දෙනවා. ඔවුන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම තුළින් නුපුහුණු රැකියාවලට යවන්නේ නැතුව හොඳ රැකියාවකට යවන්න පුළුවන් බව මා විශේෂයෙන්ම කියන්න ඕනෑ. මොකද, රට යන වැඩි පිරිසකගෙන් ඇයි යන්නේ කියලා අහලා බැලුවාම ඔවුන් යන්නේ කරුණු දෙකක් නිසායි. එකක් තමයි ළමයාට උගන්වන්න. දෙවැනි එක තමයි ගෙයක් හදා ගන්න. මෙතුමා ඒ කරුණු දෙකටම පිළිතුරු සපයලා තිබෙනවා. එතුමා අපේ අමාත්‍යාංශය එක්ක එකතු වෙලා රට යන හැම කෙනාටම රට යන්න ඉස්සෙල්ලා තමන්ගේ නිවසට මුල් ගල තියන්න අවස්ථාව සලසා දී තිබෙනවා. අනිවාර්යයෙන්ම රැකියා නියෝජිතයා රුපියල් 50,000කට වැඩි මුදලක්, ඒ කියන්නේ රුපියල් ලක්ෂයක් හෝ තැන්පත් කරන්න ඕනෑ. ඊළඟට අපේ අමාත්‍යාංශය මඟින් ඉතිරි මුදල දීලා අපේ කණ්ඩායමක් යොදලා අපි ඒ ගෙවල් ටික අවුරුද්දක් ඇතුළතදී හදලා දෙනවා. ඊට පස්සේ ඔහුට ක්‍රමානුකූලව ඉතාම සහන පොලියක් යටතේ ඒ මුදල් ආපසු ගෙවන්න කටයුතු සම්පාදනය කළේ ඩිලාන් පෙරේරා ඇමතිතුමායි. එහෙම නම් රට යන කෙනාගේ ප්‍රධාන බලාපොරොත්තු දෙක එතුමා ඉෂ්ට කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම රට ගිහිල්ලා ආවාම හුහක් අය දෙවැනි වරටත් යනවා, තුන්වැනි වරටත් යනවා. නමුත් ඔවුන් ලංකාවට ආවාට පස්සේ මුදල් ආයෝජනය කරලා යම් කිසි කර්මාන්තයක් ආරම්භ කරන්න මෙතුමාගේ යෝජනාවක් අනුව අභිගරු ජනාධිපතිතුමා අය වැය ලේඛනයෙන් ඒ අයට සහන දීලා තිබෙනවා.

බදු රහිතව ඕනෑම උපකරණයක් -යන්ත්‍රෝපකරණ- ගන්න සහන ලබා දී තිබෙනවා. ඒ වාගේම අඩු පොලියට, සුරැකුම් පත් නැතිව ණය දෙන්න සූදානම් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඔවුන් උපයන ආදායම ආදායම් බද්දෙන් නිදහස් කර තිබෙනවා. ඒ අනුව මෙතුමා මේ කාලය තුළ විදේශ රැකියා අංශය වෙනුවෙන් විශාල සේවයක් ඉටු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මා දන්නවා, සමහර වේලාවට අපේ රට සහ ඔවුන් සේවය කරන රට අතර වේලාව පිළිබඳව වෙනසක් තිබෙනවාය කියන කාරණය. සමහර වෙලාවට ඔවුන් කථා කරන්නේ බොහෝම රෑ වෙලා. රෑ වෙලා වුණත් කථා කළොත් කෙළින්ම ඇමතිතුමාට කථා කරන්නත්, ඒ තානාපති කාර්යාලවල ඉන්න අයට කථා කරන්නත් ඒ අයට අවස්ථාව දී තිබෙනවා. පැය 24ක් ඇතුළත ඒ වෙනුවෙන් ක්‍රියා මාර්ග ගැනීමට ඔවුන් කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මා මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. මෙතුමා මැද පෙරදිගට සීමා වෙන්නේ නැතිව විදේශ රැකියාවල විවිධත්වයක් ඇති කළා. ඒ වාගේම ශ්‍රමිකයන් යවන රටවලුත් විවිධාංගීකරණය කර තිබෙනවා. අපි දන්නවා, දකුණු කොරියාව ගැන. මෙතුමා ඇමති ධූරයට පත් වන කොට ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා යවන රටවල් 24න් ලංකාව හිටියේ 23 වැනි තැනටයි. දැන් අපි පළමුවැනි තැනට ඇවිල්ලා තිබෙනවා. ඔවුන් වැඩියෙන්ම කැමැති ලංකාවේ ශ්‍රමිකයෝ ගන්නයි. ඒ විතරක් නොවෙයි, එදා පිට රටවල සේවය කරන්න උපරිමය වශයෙන් කාලය දී තිබුණේ අවුරුදු තුනයි. දැන් උපරිමය අවුරුදු හයයි. අද ඔවුන් තව කාලයක් ඒ රටවල ඉන්න බලනවා. පළමුවැනි අවුරුදු තුන ඉවර වුණාම කෙළින්ම තව අවුරුදු තුනක් දෙනවා. මහින්ද සමරසිංහ ඇමතිතුමා මේ ගැන දන්නවා, එතුමාත් මේ කාර්යයේ නියුක්ත වුණු නිසා. අද කොරියාවේ රැකියා සඳහා යන්න බලාගෙන විශාල පිරිසක් ඉන්නවා. කොරියාවේ රැකියා සඳහා ඉතාම ඉහළ ඉල්ලුමක් තිබෙන තත්ත්වයට අද අපේ රට පත් කර තිබෙනවා. අද මැලේසියාවේ අපේ ශ්‍රමිකයින් විශාල පිරිසක් ඉන්නවා. මා හිතන හැටියට දහදාහ ඉක්මවලා ඉන්නවා. ඒ විතරක් නොවෙයි, ඉතාලියේත් අපේ ශ්‍රමිකයින් විශාල පිරිසක් ඉන්නවා. මෙතෙක් කල් අපේ ශ්‍රමිකයින් බෝට්ටුවලින් ගිහිල්ලා අතර මං වෙලා, ඒවායේ කඳවුරුවල සිටියා. ඒ විධියට ඔවුන් අමාරුවේ වැටෙන්නේ නැතිව නීත්‍යානුකූලව ඒ රටවලට යවන්න එතුමා කටයුතු කළා. ඒ වාගේම ජනාධිපතිතුමා එදා කම්කරු ඇමතිතුමා වෙලා ඉන්න කොට වෘත්තීය පුහුණු අධිකාරියත් ඒ අමාත්‍යාංශයට සම්බන්ධ වෙලා තිබුණා. ඒ කාලයේ ජපානයට ශ්‍රමිකයින් යවන එක නතර වෙලා තිබුණා. ඒක නැවත ආරම්භ කරලා අද සිය ගණනක් අවුරුදු පහා ජපානයට යවන්න එතුමා කටයුතු කර තිබෙනවා. ඒ වාගේම එතුමා ලිබියාවටත් ශ්‍රමිකයින් යවන්න පටන් ගන්න හැදුවා විතරයි. නමුත් ඒක නතර වුණා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

මොංගෝලියාවටත් ශ්‍රමිකයින් යවන්න- [බාධා කිරීමක්] ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා තමයි ඒ සම්බන්ධය හදලා දුන්නේ.

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

අපේ ඇමතිතුමා මොංගෝලියාවට ශ්‍රමිකයින් යවන්නත් සූදානම් කරලා දුන්නාලු. ඉතින් මේ විධියට රටවල් ගණනාවකට ශ්‍රමිකයින් යැවීමට ඩිලාන් පෙරේරා ඇමතිතුමා ක්‍රියා කර තිබෙනවා. මෙහිදී සඳහන්කළ තව චෝදනාවක් තමයි, මේ වැරැද්ද කළ කට්ටියට ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ කියන කාරණය. ඇත්තටම ඩිලාන් පෙරේරා ඇමතිතුමා ආවාට පස්සේ විශේෂ උනන්දුවක් දක්වලා එතෙක් කල් ප්‍රමාද වෙමින් තිබුණු පරීක්ෂණ ඉක්මන් කර තිබෙනවා. ඒකට ව්‍යාජ උප්පැන්න සහතිකය දීපු අය, ඒක සහතික කරපු අය, හැඳුනුම් පත් දීපු අය, passport දීපු අය, රට යවපු අය සියලු දෙනාටම නීතිය මඟින් දඬුවම් කරන්න එතුමාත්, මේ රජයත් ක්‍රියා කළා. ඒ නිසා මේ යෝජනාව මේ වෙලාවේවත් ඉල්ලා අස් කර ගත්තොත් සුදුසුයි කියලා මා මේ අවස්ථාවේ සඳහන් කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

ඒ වාගේම අවසාන වශයෙන් මම තවත් කාරණයක් කියන්න ඕනෑ. මීට කලින් කථා කළ ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා දැන් මෙතැනදී බදුල්ලේ ප්‍රශ්නයක් ගැන කිව්වා. බදුල්ලේ අපේ

[ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]

කොහොම වෙතත් ඒ අයගේ ප්‍රශ්නයක් නම් තිබුණා. එක්සත් ජාතික පක්ෂයේ රුවන් විජයවර්ධන මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා. එතුමන්ලා බදුල්ලේ මැයි දින රැස්වීම තියන්න ගිහිල්ලා බෝඩවලට ලොකු කලබලයක් වුණු බව අපි දැක්කා. අපේ පක්ෂයේ නම් බදුල්ලේ එහෙම කලබලයක් තිබුණේ නැහැ. අපි ඉතාම සමගියෙන් කටයුතු කළා. ඩිලාන් පෙරේරා ඇමතිතුමා වෙනුවෙන් බදුල්ලේ සියලු දෙනාම අද එක පැත්තක් වෙලා ඉන්නවා. ඒ කාරණයත් ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. (Dr.) Jayalath Jayawardana. You have 16 minutes.

[අ.භා. 5.30]

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රෝගවලට ප්‍රතිකාර කරනවාට වඩා රෝග වළක්වා ගැනීම තමයි වැදගත් වන්නේ කියලා වෛද්‍යවරයකු ලෙස මා විශ්වාස කරනවා. අන්න ඒ නිසා අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට මා මේ කාරණය මතක් කරනවා. මේ අවස්ථාවේදී මම ඉදිරිපත් කරන්න කැමැතියි Sri Lanka Bureau of Foreign Employment - 2011 නමැති මේ වාර්තාව. මේ වාර්තාව අනුව 2011 වසරේ අවුරුදු 19ට වඩා අඩු කාන්තාවන් 690 දෙනෙක් විදේශගත වෙලා තිබෙනවා. ඒ වාගේම 2012 වසරේ සවුදි අරාබියෙන් පමණක් මේ වාගේ පැමිණිලි 5,260ක් -ඒ කියන්නේ සියයට 52ක්- ඉදිරිපත් වෙලා තිබෙනවා.

ඒ වාගේම අපේ ඩිලාන් පෙරේරා ඇමතිතුමා ඇති කරපු අලුත් ව්‍යාපෘති ගැන බැසිල් රාජපක්ෂ ඇමතිතුමා බොහොම හොඳින් වර්ණනා කළා. මා මතක් කරන්න ඕනෑ, අද අපි "රට විරුවෝ" කියලා හඳුන්වන අපේ විදේශගත ශ්‍රමිකයන්ගෙන් වසරකට ලැබෙන ආදායම ඩොලර් බිලියන 5,000ට වැඩි බව. අද අපේ ආර්ථිකය රැඳී තිබෙන්නේ ඒ මුදල් මත බව තමුන්නාන්සේලා ඉතා හොඳින් දන්නවා. එපමණක් නොවෙයි, නූතන යුගයේ මැද පෙරදිග රටවලට යන අපේ බහුතරයක් කාන්තාවන්ට වහල් සේවාවකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. රිසානා නෆීක් ජීවිතක්ෂයට පත් වෙලා ඉවරයි. අපේ එකම ප්‍රාර්ථනය තවත් රිසානාලාට මෙවැනි අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ පාන්නට සිදු නොවේවා කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුව මොනවා කිව්වත්, තවමත් මැද පෙරදිගට ගෘහ සේවිකාවන් හැටියට යන සංඛ්‍යාව වැඩියි. ගෘහ සේවිකාවන් හැටියට යන මේ කාන්තාවන්ගෙන් සියයට හැටකට වැඩි පිරිසක් ලිංගික අතවරවලට ලක් වෙනවා. එහෙට ගියාම ඇණ ගහලා එවනවා. කටුනේරියේ කාන්තාවක් කැලි කැලිවලට කපලා අද ලංකාවට එවා තිබෙනවා. ඒ අය මිලේච්ඡ ලෙස, අමානුෂික ලෙස දූෂණයට ලක් වෙමින් පවතිනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව - මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව- මෙන්න මේ පිළිබඳව ගත හැකි ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවාද කියන එක තමයි මට නහන්න තිබෙන ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමා මෙහි ඉන්නවා. එතුමා ජාතික සේවක සංගමයේ හිටපු සභාපතිවරයා. ඒ වාගේම එතුමා වර්තමාන කම්කරු ඇමතිවරයා. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ගෘහ සේවික සේවිකාවන් සඳහා වූ අංක 189 දරන සම්මුතිය ගැන එතුමා දන්නවා. 2011 වර්ෂයේදී ලෝක කම්කරු සංවිධානයේ සිය වැනි සම්මේලනයේදී ගෘහ සේවක සේවිකාවන් සඳහා වූ මේ ජාත්‍යන්තර සම්මුතිය අනුමත වුණා. 2011 වසරේදී අපේ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ කාල සීමාව තුළ, අපේ කම්කරු ඇමති ගාමිණී ලොකුගේ ඇමතිතුමා කම්කරු ධුරය දරන කාල සීමාව තුළ, මේ ජාත්‍යන්තර සම්මුතියෙන් අපේ රටේ විදේශ ශ්‍රමිකයන්ට විශාල ජාත්‍යන්තර රැකවරණයක් අත්කර දෙන්න පුළුවන්. මා පිළිගන්නවා, ලෝකයේ ධනවත් රටවල් එක්ක, විශේෂයෙන්ම බනිජ තෙල් තිබෙන ධනවත් රටවල් එක්ක ශ්‍රී ලංකාවට හැප්පෙන්න බැහැ කියලා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකාව ලෝක කම්කරු සංවිධානයේ සාමාජිකත්වය දරනවා. ලෝක කම්කරු සංවිධානයේ නේවාසික නිත්‍ය නියෝජිතයෙක් අපේ රටේ ඉන්නවා. ඒ කාර්යාලයක් තිබෙනවා. ලෝක කම්කරු සංවිධානය එදා - මෙදා තුර සම්මත කර ගත්ත ජාත්‍යන්තර ප්‍රඥප්තිවලට ශ්‍රී ලංකාව එකහ වෙලා අත්සන් කර තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකාවේ රිසානාට වෙච්ච මේ බලවත් අසාධාරණය, බෙදවාචකය නැවත වෙන කෙනෙකුට සිදු වීම වළක්වා ගත යුතුයි. එවැනි සිදු වීම් වළක්වා ගන්නට තිබෙන හොඳම උපකරණය, හොඳම ක්‍රියාමාර්ගය තමයි, ලෝක කම්කරු සංවිධානය 2011 වර්ෂයේ අනුමත කර ගත්ත අංක 189 දරන ගෘහ සේවක සේවිකාවන් සඳහා වූ, ඔවුන්ගේ ආරක්ෂාව සඳහා වූ මේ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය. මේ වන විට මේ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තියට පිලිපීනය අත්සන් කර තිබෙනවා. ඉතාලිය අත්සන් කර තිබෙනවා. උරුගුවේ අත්සන් කර තිබෙනවා. මොරේෂස් රට අත්සන් කර තිබෙනවා. නමුත් ලංකාව 2011 සිට 2013 වර්ෂය දක්වා තවම මේ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තියට එකඟවෙලා අත්සන් තබා නැහැ. ඉතින් කොහොම ද අප [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී කියන්න.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Dilan Perera.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මා කියන්නේ. මෙවැනි ප්‍රඥප්තියක් එක රටක් විතරක් අත්සන් කරලා මදි. Receiving countries අත්සන් කළොත් විතරයි අපේ සේවකයන්ට ඔය කියන සහන ලැබෙන්නේ.

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඔබතුමායි, මායි එකතුවෙලා කළ යුතු වෙන්නේ receiving countries වලට ඒක අත්සන් කරන්න කියලා බල කරන එකයි.

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ඉතින් බල කරන්න. ඔබතුමාගේ ඇමතිතුමා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
අපි චිතරක් අත්සන් කරලා මදි. අපි චිතරක් අත්සන් කළාට වැඩක් වෙන්නේ නැහැ. ඒ මැද පෙරදිග රටවල් අත්සන් කරන්න ඕනෑ. එතකොට තමයි අපට ඒ වාසි ලැබෙන්නේ.

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
රජයේ පාර්ශ්වයෙන් කරුණු ඉදිරිපත් කරනවා නම් එතුමාට ඉදිරිපත් කරන්න පුළුවන්. විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට මගේ තර්කය මෙයයි. පිලිපීනය, මොරේෂස්, ඉතාලිය, උරුගුවේ යන රටවල් මේ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තියට අත්සන් කර තිබෙනවා නම්, ඒ සඳහා අප ක්‍රියා නොකරන්නේ ඇයි? ඒ සඳහා මැදිහත් වෙන්නේ නැත්තේ ඇයි? මෙන්න මේ බරපතළ ප්‍රශ්නයයි මට තිබෙන්නේ. මේ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය අත්සන් කළාට පස්සේ ඒ සේවක සේවිකාවන්ට ලැබෙන සුබ සාධනවලින් ටිකක් කියන්න මම ඔබතුමාගේ අවසරය පතනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපේ රටෙන් යන ශ්‍රමිකයන් සමහර වෙලාවට දවසකට පැය 16ක් වැඩ කරනවා. මේ කම්කරු ප්‍රඥප්තිය නිසා එහෙම අවස්ථාවක් උදා වෙන්නේ නැහැ. වහල් සේවයට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම අනුමත කළ නිවාඩු ලැබෙනවා. තමන්ගේ passport එක, තමන්ගේ ගුවන් ගමන් බලපත්‍රය තමන් ළඟ තබා ගැනීමේ අයිතිය ලැබෙනවා. තමන් පොරොන්දු වුණු ආකාරයට, අත්සන් කළ ආකාරයට, පොරොන්දු පත්‍රයේ ආකාරයට, තමන්ට හිමි වැටුප ලබා ගැනීමේ අයිතිය ලැබෙනවා. සියලුම කායික හා ලිංගික අතවරවලින් බේරී සිටීමේ හැකියාව ලැබෙනවා. එහෙම නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම රට විරුවන් කියන අපේ රටේ මේ ශ්‍රමික සේවක සේවිකාවන්ට ජාත්‍යන්තර රැකවරණය ලැබෙනවා. අනාගතයේ රිසානාලා වැනි අපේ අහිංසක කාන්තාවන් බිලිවීම ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය අනුව නවතිනවා. ජනාධිපතිවරයා, මේ ඇමතිවරු මුල් වෙලා, වහාම මැදිහත් වෙලා, රිසානාගේ නාමයෙන්, රිසානාට කරන්න පුළුවන් ලොකුම ගෞරවය, මේ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තියට අත්සන් කිරීම සඳහා යොමුවීමයි කියන එක මම ඔබට මතක් කරන්න කැමැතියි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ලංකාවේ ජාතික ව්‍යක්තීය සමිති සම්මේලනය විසින් සිංහල, ඉංග්‍රීසි, දෙමළ භාෂාවෙන් මුද්‍රණය කර තිබෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතිය දැක්වෙන මේ පොත් පිංච ඔබතුමාට ඉදිරිපත් කරමින් අනාගතය වෙනුවෙන් හැන්සාඩ්ගත* කරන ලෙසට මා ඉල්ලීමක් කරනවා.

මේ පිළිබඳව අපි කථා කරන කොට මෙන්න මේ ගැටලුවට අපි මුහුණ දෙනවා. රිසානා බේරා ගන්නට අපි අවංකව කටයුතු කරලා තිබෙනවාද? රිසානාගේ නිවැරදි වයස පිළිබඳව අප තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවාද? ව්‍යාජව සකස් කරන ලද රිසානාගේ ගුවන් ගමන් බලපත්‍රය සම්බන්ධයෙන් වැරදිකරුවන් බවට පත් වුණු ඒ ඒජන්සිකරුවන් පිළිබඳව සහ ඔවුන්ට ලබා දුන් දඬුවම් පිළිබඳව අපි ඒ රටට සත්‍ය ලෙස කරුණු ඉදිරිපත් කරලා තිබෙනවාද? මෙන්න මේවා තමයි අද තිබෙන ගැටලු.

ඒ නිසා මම විශේෂයෙන්ම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, අද වන තුරුත්-මේ වන විටත්- කටාර් රටේ බන්ධනාගාරවල ශ්‍රී ලාංකික කාන්තාවන් සියයකට වැඩිය සිටින බව. ලාංකිකයන් ලක්ෂ විස්සක් පිට රට රැකියාවල යෙදෙනවා. "සෞදි අරාබියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේදී ශ්‍රී ලාංකික කතක් අපයෝජනයට පත් වෙලා" කියා ප්‍රසිද්ධ පුවත් පත්වල ප්‍රධාන පෙළේ ප්‍රවෘත්ති පළ වෙනවා. කතුන් මැද පෙරදිග යෑම අවශ්‍යද? විදෙස්ගත වන කාන්තාවන්ගේ ජීවිත ආරක්ෂා කර දීමට නීති සැකසිය යුතුයි. ලංකාවේ මානව හිමිකම් සංවිධාන, ප්‍රජා සංවිධාන අද හඬ නහන්න පටන් අරගෙන තිබෙනවා. ජාත්‍යන්තර ප්‍රඥප්ති සකස් වෙද්දී ඒවා අනුමත වෙද්දී පිලිපීනය, මොරේෂස්, ඉතාලිය වැනි ලෝකයේ රටවල් මේ ප්‍රඥප්තිය අත්සන් කරද්දී ලංකාව නිහඬ වෙලා ඉන්නේ ඇයිද කියන බරපතළ ප්‍රශ්නය මට අහන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "වැලි කතරකට ගිය අපේ මිනිසකුගේ ඉස් මස් ලේ උරාගත් හැටි" මේ වාගේ අනන්ත අප්‍රමාණ පුවත් පත් ලිපි ලේඛන මා ළඟ තිබෙනවා. කාන්තාව පිට රට ගොස් සොයන මුදලට වඩා විශාල හානියක් ඇගේ පවුලට සිද්ධ වෙනවා. විශ්‍රාමික විදේශගත ශ්‍රමික ප්‍රජාව අතර දිළිඳු බව තුරන් කිරීමේ අභියෝගයට අද අපට මුහුණ පාන්නට සිදු වෙලා තිබෙනවා. මේ සියල්ලම කැටි කරලා ගත්තාම අද යුගයේ අවශ්‍යතාවක් බවට පත් වෙලා තිබෙනවා, මේ විදේශ ශ්‍රමිකයන්ගේ ජාත්‍යන්තර රැකවරණය, ඔවුන්ගේ ශුභ සාධනය, ඔවුන්ට සතියකට වැඩ කරන්නට තිබෙන, දිනකට වැඩ කරන්නට තිබෙන පැය ගණන සලසා දීම හා ලිංගික අතවරවලින්, අමානුෂික කායික අතවරවලින් ඔවුන්ව බේරා දීමේ අයිතිය ලබා දීම. ඒ වගකීමෙන් අද ආණ්ඩුවට පැනලා යන්න බැහැ.

ඒ සඳහා අනෙකුත් රාජ්‍යයන් කටයුතු කරද්දී ශ්‍රී ලංකාව නිහඬව ඉන්නේ ඇයි කියන බරපතළ ප්‍රශ්නය මා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයාගෙනුත්, ඒ වාගේම විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යවරයාගෙනුත් අහන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා රිසානාට වෙච්ච දේ අපේ තවත් කාන්තාවන්ට සිදු නොවේ යැයි කියා හෘදය සාක්ෂියට එකඟව අපට සහතික කරන්නට පුළුවන්ද? ඒ නිසා මා නැවත නැවතත් කියනවා, රිසානාට කරන ලොකු ගෞරවයක් හැටියටත් වහාම ගෘහ සේවකයන් සඳහා වූ අංක 189 දරන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතියට ශ්‍රී ලංකාව අත්සන් කළ යුතුයි කියලා. ඒ යෝජනාව කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.45]

ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - *நீதி அமைச்சர்*)
(The Hon. Rauff Hakeem - Minister of Justice)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රිසානා නෆීක් දැරියගේ බෙදවාචකය පිළිබඳව අද දින විශේෂයෙන්ම විපක්ෂයෙන් ගෙනැත් තිබෙන මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේදී ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කථා කරද්දි එතුමාගේ කථාවෙන් හට ගත්ත කරුණු කිහිපයක් උපුටා ගෙන මගේ කථාව කිරීමට මා අදහස් කරනවා.

ඊට කලින් මා මේ කාරණය කිව යුතුයි. අපේ දොස්තර ජයලත් ජයවර්ධන උගත් මන්ත්‍රීතුමා කථා කරද්දි රෝගයට ප්‍රතිකාර ලබා

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවුෆ් හකීම් මහතා]

දීම පිළිබඳව කථා කළා. එතුමාත්, එතුමාගේ පක්ෂයත් දැන ගත යුතුයි රෝගය කියන එක වෙනයි, රෝග ලක්ෂණ කියන එක වෙනයි කියලා. රෝග ලක්ෂණවලට ප්‍රතිකාර ලබා දීලා රෝගය සුව කරන්න බැහැ. නමුත් එතුමාගේ කථාවෙන් යම් දුරකට එතුමා ඩිලාන් පෙරේරා ඇමතිතුමාව විවේචනය නොකර හරවත් කථාවක් කළා කියන එක අප පිළිගන්නවා. එතුමාට කලින් කථා කළ මන්ත්‍රීවරු වාගේම, විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ ඇමති කෙනෙකු හැටියටත්, කථානායකවරයෙකු හැටියටත් හිටපු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කථා කරද්දි අපට පෙනුණා මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳව විපක්ෂය දරන ආකල්පය. ඒ කථාවලින් පටු දේශපාලන වාසි තකා මේ විශ්වාස භංග යෝජනාව ගෙනැත් තිබෙනවාය කියන එක ඉතාම පැහැදිලි වුණා. දැන් අපටත් කනගාටු හිතෙනවා එක්සත් ජාතික පක්ෂය ගැන හිතන කොට. මොකද, ඒ පක්ෂයේ කොටස්කාර පක්ෂයක් හැටියට අපත් හිටියා. නමුත් දැන් ඉතින් ඒක nut ගැලවුණ රෝද උඩ යන බස් එකක් වාගේයි. [බාධා කිරීම්] කවදා රෝද ටික ගැලවී ගෙන යයිද දන්නේ නැහැ. නමුත් ඒක වළක්වා ගන්න දැන් මේ විශ්වාස භංග යෝජනාව හරහා උත්සාහ දරනවා. රිසානා නෆීක්ට ලැබුණු මරණීය දණ්ඩනය පිළිබඳව සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ කථාවේදී පැහැදිලිව පෙනුණා, මේක ජාතික බේදවාචකයක් හැටියට එතුමා හඳුනා ගත් බව. අප පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මේ තුළින් ඉගෙන ගත යුතු පාඩම් කීපයක් තිබෙනවා. විශේෂයෙන්ම මේක ව්‍යාකූල ප්‍රශ්නයක්. ස්වෛරී, නිදහස් රාජ්‍යයන් දෙකක් අතරේ රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් ගත යුතු උපරිම ක්‍රියා මාර්ග අපේ රජය හරහා ගත්තාය කියන එක අප කවුරුත් පිළිගන්න ඕනෑ. මේ සිද්ධිය වන කොට මා හිටියේ විපක්ෂයේ. ඒ කාලයේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට මට කළ හැකිව තිබුණේ එක දෙයයි.

මේ රටේ මුස්ලිම් ජනතාව නියෝජනය කරන පක්ෂයේ නායකයා හැටියට මා ඒ මරණයට පත් වුණු දරුවාගේ දෙමවුපියන්ට ලිපියක් යැව්වා, මේ පිළිබඳව "සමාව ලබා දිය යුතුයි" කියලා. සමාව ලබා දීම පිළිබඳව අපේ ව්‍යවස්ථාවේ තිබෙන්නේ එක ක්‍රියාදාමයක්. අතිගරු ජනාධිපතිතුමාට තිබෙනවා, අභිමතයක්. නමුත් ඒ අභිමතය එතුමා තනි මතයට ක්‍රියාත්මක කරන්නේ නැහැ. අපේ අමාත්‍යාංශය හරහා යම් ක්‍රියා පිළිවෙතක් තිබෙනවා. නමුත් සෞදි අරාබියානු රජයේ තිබෙන්නේ වෙනත් නීති පද්ධතියක්; වෙනත් අධිකරණ පද්ධතියක්. මේ රටවල් දෙකේ නීතිය තුළ තිබෙන ගැටීම රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් ඉතාම පැහැදිලිව තේරුම් ගෙන ගත්ත ක්‍රියාදාමය අසාර්ථක වුණා කියන එක ගැන අපි කවුරුත් කනගාටු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව කාරණයක් මා කියන්නම්. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය ජාතික හෙදියන් දෙදෙනකුට සෞදි අරාබියේදී මරණීය දඬුවම නියම වුණා. 1996 දෙසැම්බර් 11වන දා King Fahd Military Medical Complex එකේදී Yvonne Gilford කියන ඕස්ට්‍රේලියානු ජාතික හෙදියක ඝාතනයට ලක් වුණා. ඒ අවස්ථාවේදී Deborah Parry සහ Lucille McLauchlan කියන බ්‍රිතාන්‍ය ජාතික හෙදියන් දෙදෙනකු ඒ පිළිබඳව සැක පිට අත් අඩංගුවට ගෙන, විභාග කරලා, ඒ දෙදෙනාට මරණීය දඬුවම නියම කළා. එසේ මරණීය දඬුවම නියම කළාට පස්සේ බ්‍රිතාන්‍ය රජය ඒ පිළිබඳව රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් ක්‍රියාත්මක වුණා. අන්තිමේදී මරණයට පත් වුණු ඕස්ට්‍රේලියානු ජාතික හෙදියගේ සහෝදරයා සෞදි අරාබියට ඇවිත් සමාව දුන්නාට පස්සේ තමයි ඒ හෙදියන් දෙදෙනාටම සමාවක් ලබා ගැනීමට අවකාශයක් ලැබුණේ. ඒ රටේ රජතුමා පවා මැදිහත් වෙලාත් කරන්න බැරි වුණාය කියන එක අපි මතක තබා ගන්න ඕනෑ. ඒ කියන්නේ මරණයට පත් වුණු එක් කෙනාත් සෞදි අරාබියේ පුරවැසියෙක් නොවෙයි. නමුත් ඒ වෙලාවේත් ඒ ඥාතීන්ගෙන් විශේෂයෙන්ම ඒ පවුලෙන් සමාව ලැබුණොත් විතරයි එය සාර්ථක වන්නේ කියන එක ඒ රටේ නීති පද්ධතියේ තිබෙන දෙයක්. එයම මෙහිදීත් සිදු වුණා. අපේ ජනාධිපතිතුමා උපරිම ලෙස මේ පිළිබඳව කටයුතු කළා විතරක් නොවෙයි. අපි මැද පෙරදිග රටවලට යන හැම ගමනකදීම, ඒ ගමන යන්න ලෑස්ති වන කොටම අපට උපදෙස් දුන්නා, පුළුවන් නම් මේ පිළිබඳව සාකච්ඡා කරලා යමක් කරන්නය කියලා.

මේ බේදවාචකයෙන් පටු දේශපාලන වාසි ගන්නට කටයුතු කරන්නේ නැතුව අපි මීන් ඉදිරියට කළ යුතු දේවල් පිළිබඳව කල්පනා කරන්න ඕනෑ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, දැන් හරස් ප්‍රශ්න අහන වෙලාවක් නොවෙයි. මට ඉතාම කෙටි කාල සීමාවක් තිබෙන්නේ. මා ඔබතුමා ගැනත් කියන්නම්. ඔබතුමා මේ පිළිබඳව විශාල උද්ඝෝෂණ රාශියක් කළා. ඒ පිළිබඳව නිතරම උද්ඝෝෂණ කර ගෙන යනවා. විදේශ රටවල සේවය කරන අපේ ශ්‍රමිකයන් පිළිබඳව ඔබතුමා උනන්දුවෙන් කටයුතු කරනවා කියන එක අපි පිළිගන්නවා. නමුත් ඔබතුමාත් දැන ගන්න ඕනෑ, "වියානා සම්මුතිය" පිළිබඳව. රාජ තාන්ත්‍රික මට්ටමින් තානාපති කාර්යාලවලට කඩා පනින්න බැහැ.

ඒ තානාපති කාර්යාල තුළ රටේ ස්වෛරී භාවය ක්‍රියාත්මක වනවා. ඒක ආරක්ෂා කිරීම රජයක් හැටියට අපි කරන්නට ඕනෑ. නමුත් ගරු මන්ත්‍රීතුමා කරන්නේ ගේට්ටු කඩාගෙන ඒ තානාපති කාර්යාල තුළට යන එකයි. එහෙම කරන්න ගියාම මේ ප්‍රශ්න විසඳා ගන්නට ලැබෙන්නේ නැහැ. ඒකෙන් ප්‍රශ්නය තවත් ව්‍යාකූල වෙනවා. [බාධා කිරීම්] ඒකයි මම කියන්නේ. මම දොස් කියනවා නොවෙයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
I am going to wind up, Sir.

මේ ප්‍රශ්නය පිළිබඳව මෙම ගරු සභාවේ දෙපැත්තේම සිටින පක්ෂවල මන්ත්‍රීවරුන් වශයෙන් අපි එකතු වෙලා කටයුතු කළ යුතුයි. වෛද්‍ය ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමාගේ කථාවේ දී ජාත්‍යන්තර conventions පිළිබඳව කිව්වා. ඒ සම්බන්ධයෙන් අපේ ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා කියපු පරිදි - receiving countries must also accept and ratify the convention. Otherwise, there is no use.

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
So, you must persuade that.

ගරු රවූෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

We can do that. But, for that, there must be a bipartisan agreement; we must work together, not to bring in such No-Confidence Motions and make it an unnecessary political drama.

අපි දැන් විනෝද සවාරි ගැන කථා කළා නේ. දැන් මේ විශ්වාස භංග යෝජනාවත් එක්ක විපක්ෂය යන්නෙත් පුදුම විනෝද සවාරියක්. [බාධා කිරීමක්] ඒ ගැන අපි පසුව කථා කරමු.

මා තව එකක් කියන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් පත්තරවල හැමදාමත් යම් යම් දේවල් ගැන ලියනවා. අදත් මේ පත්‍රවල ලියලා තිබෙන කතුවැකි දෙකක් මා ළඟ තිබෙනවා. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන් එකතු වෙලා හෙට සාකච්ඡාවක් පැවැත්වෙනවා. එම සාකච්ඡාවේ දී අපේ පක්ෂය රජයෙන් ඉවත් වන්නට යනවාය කියලා එක එක පත්තරවල කතෘවරුන් කතු වැකි ලියනවා. මා සම්පූර්ණයෙන්ම ඒක ප්‍රතික්ෂේප කරනවා. එහෙම කිසිම වුවමනාවක් අපට නැහැ. නමුත් අපට විවේචන තිබෙනවා. සමහර ක්‍රියාදාමයන් පිළිබඳව අපිට තිබෙන මත භේද ගැන අපි අභ්‍යන්තරව විවේචනය කරනවා; කථා කරනවා. නමුත් ඒකෙන් අදහස් වන්නේ නැහැ, අපි දැන් රජයෙන් ඉවත් වන්න යනවාය කියලා. ඒ බවත් කියමින් මගේ කථාව අවසන් කරනවා, ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. DEW Gunasekara. You have nine minutes.

[අ.භා. 5.56]

ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු ඉතිහාසය තුළ වරින් වර විශ්වාස භංග යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාත් සඳහන් කළ ආකාරයට, ඉදිරිපත් කර තිබුණු එවැනි විශ්වාස භංග යෝජනා පිළිබඳව මමත් නිරීක්ෂණයක් කළා. ඒ අනුව මට පෙනෙනවා, කිසිම හරයක් නැති, කිසිම අදාළකමක් නැති, පදනමක් නැති, අඥාන, බහුබූත විශ්වාස භංග යෝජනාවක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ කියලා. මා විශ්වාස කරනවා, ඇත්ත වශයෙන්ම විපක්ෂයේ කාර්ය භාරය නිසි ලෙස කරනවා නම්, මෙම විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න තිබුණේ රජයට. එහෙම ගෙනාවා නම් අද සාර්ථක විවාදයක් කරන්නට තිබුණා කියලා මම හිතනවා. මොකද, මේ යෝජනාව මඟින් ඩිලාන් පෙරේරා ඇමතිතුමාට ගෙනාවේ නිශ්චිත චෝදනා - specific charges.

අද මේ ප්‍රශ්න ගැන හොඳින් සාකච්ඡා කරන්නට තිබුණා. ඒක අපේක්ෂා කළා නම්, ඉතාම පහළ මට්ටමකට බහින්නේ නැතිව, පෞද්ගලිකව පහර ගහගන්නේ නැතිව, මඩගහ ගන්නේ නැතිව මෙය කරන්නට තිබුණා. විපක්ෂය මීට පසුව නැවත විශ්වාස භංග යෝජනාවක් ගෙන එන අවස්ථාවකදී ඒ පිළිබඳව මීට වඩා කල්පනා කරලා කටයුතු කරයි කියලා මම හිතනවා.

මා හිතන්නේ මෙය ගරු මන්ත්‍රීවරුන්ට, ඔවුන්ගේ බුද්ධියට කරපු නිගාවක් කියලා යි. මම හිතන්නේ මෙය දේශපාලන සදාචාරයට කළ නිගාවක්. දේශපාලන සංස්කෘතියට කරපු නිගාවක්. විපක්ෂය මේ විධියට හැසිරෙන්නට එපා. මම එසේ කියන්නේ ඇයි? පළමුවැනි කාරණාව තමයි, රිසානා නෆීක් කියන තරුණිය විදේශ රැකියාවකට ගියේ ඇයි කියන කාරණය අපේ මන්ත්‍රීවරුන් ගෙනහැර පෑවා. නමුත් යළිත් වරක් සම්පිණ්ඩනය කරලා කියනවා නම්, ඇය විදේශගත වන අවස්ථාවේ දී ඇමතිවරයා වශයෙන් සිටියේ ඩිලාන් පෙරේරා ඇමතිවරයා නොවෙයි. ඊළඟට එම සිද්ධිය සිදු වන අවස්ථාවේ දී ඇමතිවරයා වශයෙන් සිටියේත් ඩිලාන් පෙරේරා ඇමතිතුමා නොවෙයි. ඩිලාන් පෙරේරා ඇමතිවරයා වශයෙන් පත් වන්නේ 2010 අවුරුද්දේ. මේ සිද්ධිය ඇති වෙලා අවුරුදු පහකට පසුව. අපි පිළිගන්නට ඕනෑ දෙයක් තිබෙනවා. ඒක මුළු රටම දන්නවා; කවුරුත් දන්නවා. කොයි තරම් විවේචන කළත් විපක්ෂයත් මෙය පිළිගන්නා බව මා දන්නවා.

පෞද්ගලිකව හමු වුණාම ඩිලාන් පෙරේරා ඇමතිතුමාට ප්‍රශංසා කරනවා. මේ තරුණිය ගලවා ගැනීමට එතුමා අතිවිශාල කාර්ය භාරයක් ඉෂ්ට කළා. මේ සිද්ධියට පසුබිම් වුණු කාරණා අප තේරුම් ගන්න ඕනෑ. ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා කියා සිටියා රටවල් ගණනාවක් මේ සම්බන්ධයෙන් conventions අත්සන් කර තිබෙනවාය කියලා. ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමනි, මැද පෙරදිග රටවල් කවුරුත් අත්සන් කර නැහැ නේ. ඇයි ඔවුන් අත්සන් නොකරන්නේ? [බාධා කිරීමක්] නැහැ. මම එතැනට එනකම් පොඩ්ඩක් ඉන්න. ඒකට හේතු තිබෙනවා.

අපි 1931 ඉඳලා ඡන්දය පාවිච්චි කරලා ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායක් ගොඩ නැඟිලා තිබෙනවා. අපේ දේශපාලන සංස්කෘතිය වෙනස්. අපේ සදාචාරය වෙනස්. අපේ රටේ වහල් ක්‍රමයක් තිබුණා කියලා අපේ ලිඛිත ඉතිහාසයේ ඇත්තේ නැහැ. නමුත් අනික් රටවල වහල් ක්‍රමයක් තිබිලා, වැඩවසම් ක්‍රමයට ඇවිල්ලා ධනේශ්වර ක්‍රමයට පරිවර්තනය වෙන වකවානුවක් මේක. ඒ නිසා ඔවුන්ගේ සිතුම් පැතුම්, ආගමික කටයුතු සියල්ලක්ම සම්පූර්ණයෙන්ම වෙනස්. ඒ නිසා මේවා ජාත්‍යන්තර වශයෙන් සාමූහික ප්‍රයත්නයකින් තමයි කරන්න ඕනෑ. මම ඔබතුමාත් සමඟ එකඟ වෙනවා. ඒක සාමූහික ප්‍රයත්නයක්. එය වහාම කළ හැකි දෙයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා දන්නා ආකාරයට අපේ රාජ්‍ය නායකයා කී පාරක් මේකට මැදිහත් වුණාද? අතිගරු ජනාධිපතිතුමා රිසානාව බේරා ගන්න පෞද්ගලිකව මැදිහත් වුණා. ඒ රටේ රාජ්‍ය නායකයා හමු වෙලා කථා කළා. හැම මට්ටමෙන්ම කථා කළා. කළ හැකි හැම දෙයක්ම කළා. ඩිලාන් පෙරේරා ඇමතිතුමා ප්‍රායෝගික වශයෙන් කළ හැකි හැම දෙයක්ම කළා. එතුමා එහෙම නොකර හිටියා නම් මෙවැනි විශ්වාස භංග යෝජනාවක් එතුමාට ගෙනෙන එක සාධාරණයි.

ඇත්ත වශයෙන්ම මෙහි ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. තමුන්නාන්සේලා කවුරුත් පිළිගන්නවා මේ ග්‍රෝලීයකරණ ක්‍රියාදාමය ආවාම ඉස්සර වෙලාම ග්‍රෝලීයකරණය වන්න පටන් ගන්නේ ප්‍රාග්ධනය බව. ඊට පසුව නිෂ්පාදන ක්‍රියාවලිය ග්‍රෝලීයකරණය වෙනවා. දැන් ශ්‍රමය ග්‍රෝලීයකරණය වෙලා. ඒ නිසා ශ්‍රමය මෙහෙන් එහාට යනවා. ඉස්සර ශ්‍රමය ආවේ ඉන්දියාවෙන් මෙහාට. ඒ වතු කම්කරුවන්. දැන් අලුත් තත්ත්වයන් යටතේ මේ ග්‍රෝලීයකරණ ක්‍රියාවලියේ අලුත් ප්‍රශ්න මතු වෙනවා. ඒක අපට විතරක් අදාළ නැහැ. අනික් රටවලටත් අදාළයි. ඒ නිසා අපට අලුත් නීති සම්පාදනය කරන්න වෙනවා. ඊළඟට ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ මේවා සාකච්ඡා කරන්න වෙනවා. [බාධා කිරීමක්] ඒක මම පිළිගන්නවා. නමුත් මගේ තර්කය වී තිබෙන්නේ මේ ගෙනාපු යෝජනාව නිශ්චිත - specific - චෝදනාවක් විධියට ඩිලාන් පෙරේරා ඇමතිතුමාට ඉදිරිපත් කරන එක අසාධාරණයි, අකාරුණිකයි කියන එකයි.

[ගරු ඩිව් ගුණසේකර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. ඩිලාන් පෙරේරා ඇමතිතුමා ජාතික දේශපාලනයට ප්‍රවිෂ්ට කිරීමේ කාර්යයට මමත් යම් ප්‍රමාණයකින් මැදිහත් වුණු කෙනෙක්. මට මතකයි, 1988දී පැවැති පළමුවෙනි පළාත් සභා මැතිවරණයට එක්සත් සමාජවාදී පෙරමුණෙන් අපේක්ෂකයෙක් තෝරන්න බදුල්ලට ගිය කණ්ඩායමේ මමත් සිටියා. ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ පියාගේ -නීතිඥ මාෂල් පෙරේරා මැතිතුමාගේ- ගෙදරට ගිහින් එතුමා මේ සඳහා කැමති කරවා ගන්න අප කොයි තරම් උත්සාහයක් ගත්තාද? ඒ කාලයේ ඩිලාන් ඇමතිතුමා අවුරුදු 21ක තරුණයෙක්. නීතිඥයෙක් හැටියට නීති විද්‍යාලයෙන් පිට වුණා විතරයි. අප ඔහු කැමති කරවා ගත්තා. පළමුවෙනි වටයේදීම එතුමා ජයග්‍රහණය කළා. ඩිලාන් පෙරේරා ඇමතිවරයා ජාතික දේශපාලනයට ප්‍රවේශ කරවන්න අපත් සම්බන්ධ වුණු නිසා එතුමාට විරුද්ධව මෙවැනි විශ්වාස භංග යෝජනාවක් ගෙන ආ විට එතුමා ආරක්ෂා කිරීමට අප මැදිහත් වීම අවශ්‍යයි.

ඩිලාන් පෙරේරා මැතිතුමා පළමුවෙන්ම නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට පත් වුණේ මගේ අමාත්‍යාංශයටයි. එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත් කරනු ලැබ මා සමඟ අවුරුදු ගණනක් එකට වැඩ කළා. ඒ නිසා කිසිම පැකිළීමක් නැතිව මට කියන්න පුළුවන් අවංකභාවය පැත්තෙන් ගත්තත්, කාර්යශූරත්වය පැත්තෙන් ගත්තත් එතුමා ඉතාම හොඳින් කටයුතු කළ බව. එතුමා මනෝ මූලික වන්නේ නැතිව විෂය මූලිකව, මානුෂික පැත්තෙන් ප්‍රශ්න දෙස බලා නිගමනවලට එළඹෙනවා. මා ප්‍රශ්න දෙස බලන ආකාරයෙන්ම එතුමාත් ප්‍රශ්න දෙස බලන්න පුරුදු වී සිටියා. මා හිතන්නේ එය එතුමා එතුමාගේ පියාගෙන් ලද උරුමයක්. ඒ දෘෂ්ටි කෝණයෙන් ප්‍රශ්න දෙස බලා කටයුතු කරන නිසා රිසානාගේ මෙම සිද්ධියේදී එතුමා කවදාවත් තමන්ගේ කාර්ය භාරය අතපසු කරන පුද්ගලයෙක් කියලා අපට හිතන්න බැහැ. ඒ නිසා මා ඇත්ත වශයෙන්ම කනගාටු වෙනවා, ඒ තරම් කාර්යශූර, තරුණ ඇමතිවරයෙකුට, කිසිදු පැකිළීමක් නැතිව කටයුතු කරන, අවංකභාවයේ ප්‍රතිමූර්තියක් වශයෙන් හැඳින්විය හැකි ඇමතිවරයෙකුට නිශ්චිත වශයෙන් මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා අවමානයක් කිරීම ගැන. එතුමා කෙරෙහි සම්පූර්ණ විශ්වාසයක් අපට තිබෙන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කලින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. P. Ariyanethran. You have eight minutes.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)

Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කලින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(Mr. Deputy Chairman of Committees)

Order, please! There is a point of Order being raised by the Hon. Ranjan Ramanayake.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට දැන් call එකක් ආවා. Bureau එකේ කට්ටිය කන්න, බොන්න නැතිව ඉන්නවා කියලා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුලුක්කලින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(Mr. Deputy Chairman of Committees)

That is not a point of Order. You can make that complaint to the police. Hon. Ariyanethran, you carry on with your speech.

[பி.ப. 6.05]

ගරු පී. අරියනේත්‍රන් මහතා
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு நலனோம்புகை அமைச்சர் கௌரவ டிலான் பெரேரா அவர்களுக்கு எதிராக இன்று கொண்டுவரப்பட்டிருக்கின்ற நம்பிக்கையில்லாப் பிரேரணைக்கு, தமிழ்த் தேசியக் கூட்டமைப்பு உடன்பாடு இல்லை என்பதை முதலில் தெரிவித்துக்கொள்கின்றேன். றிஸானா நபீக் என்பவருக்கு நிறைவேற்றப்பட்ட மரண தண்டனை தொடர்பாக இங்கு பலரும் பேசியதை நான் முழுமையாக அவதானித்துக்கொண்டிருந்தேன். இலங்கை அரசாங்கமானது, றிஸானா நபீக் தொடர்பில் இயன்றவரை அனைத்து முயற்சிகளையும் மேற்கொண்டிருந்தது என்பதை மாண்புமிகு அமைச்சர் ஜீ.எல். பீரிஸ் அவர்கள் தெளிவாக எடுத்துக்கூறினார். அவர் மேலும் பேசுகையில், தாங்கள் சவூதி அரேபிய மன்னரைச் சந்தித்து, றிஸானா என்பவருக்கு பொது மன்னிப்பு வழங்க வேண்டுமென்று கேட்டுக்கொண்டதாகவும் கூறினார். எனினும், அவரால் அதனைப் பெற்றுக்கொடுக்க முடியவில்லை. ஏனெனில், இலங்கையில் நடைமுறையிலுள்ள சட்டங்களுக்கும் சவூதி அரேபியாவில் நடைமுறையிலுள்ள சட்டங்களுக்கும் இடையில் சில முரண்பாடுகள் - வித்தியாசங்கள் - இருக்கின்றன என்பது உண்மை.

பொது மன்னிப்பு வழங்குதல் என்ற விடயத்தைப் பார்க்கின்றபோது, சவூதி அரேபியாவிலே நடைமுறையில் இருக்கின்ற சட்டத்தின்படி, பாதிக்கப்பட்டவர் - அதாவது, இறந்த குழந்தையின் தாய் - மன்னித்தால் மட்டுமே, றிஸானாவுக்கு விதிக்கப்பட்டிருந்த மரண தண்டனையை நீக்க முடியும். அதேநேரம் இலங்கையைப் பொறுத்தமட்டில், நாட்டை ஆட்சி செய்கின்ற ஜனாதிபதி அவர்கள் பொதுமன்னிப்பு வழங்கினால் அதனை நீக்க முடியும். நான் இங்கு எதைக் கூற வருகின்றேனென்றால், எங்களுடைய விடுதலைப் போராட்டம் முள்ளிவாய்க்காலில் முற்றுப்பெற்று எதிர்வரும் 19ஆம் திகதியுடன் நான்கு வருடங்கள் பூர்த்தியடைகின்றன. எனினும், 860 தமிழ் அரசியல் கைதிகள் இன்னமும் சிறைச்சாலைகளில் இருந்துகொண்டிருக்கின்றார்கள்; பலர் புனர்வாழ்வு முகாம்களிலே இருந்துகொண்டிருக்கின்றார்கள். சவூதியில் றிஸானாவினால் கொலை செய்யப்பட்டதாகக் கூறப்படுகின்ற குழந்தையின் தாய், ஒரு பழிவாங்கும் மனப்பாங்குள்ளவரென்பதால், அவர் றிஸானாவுக்கு மன்னிப்பு வழங்க விரும்பவில்லை. ஆனால், நான்கு வருடங்களாகச் சிறைச்சாலைகளில் இருக்கின்ற அரசியல் கைதிகளுக்கு எமது நாட்டின் மேதகு ஜனாதிபதி அவர்களினால் ஏன், பொதுமன்னிப்பு வழங்க முடியாது? ஏன், அந்த மனோபாவம் அவருக்கு ஏற்படவில்லை? என்பது இன்று இங்கு நடைபெறுகின்ற வாதப் பிரதிவாதங்களின்மூலம் கேட்கக்கூடிய கேள்வியாக இருக்கின்றது. எனவே, இந்த மனோபாவம் என்பது மாறாதவரை வெறுமனே சட்டத்தை வைத்துக்கொண்டு எவரும் எதுவுமே செய்யமுடியாத ஒரு சூழ்நிலைதான் தொடர்ந்திருக்கும்.

අவ்வாறே இன்னுமொன்றையும் நான் இங்கு கூறவேண்டியிருக்கின்றது. நாங்கள் சவூதி அரேபிய நாட்டைப் பற்றிப் பேசிக்கொண்டிருக்கின்றோம். இன்று சவூதி அரேபியாவிலுள்ள ஜித்தா நகரத்தில் ஆயிரத்துக்கும் மேற்பட்ட இலங்கை இளைஞர்கள் துன்புறுத்தப்பட்ட நிலையில் அங்கிருக்கின்ற மேம்பாலத்துக்குக் கீழே தங்கியிருக்கின்றார்கள். அதிலே குறிப்பாக, கிழக்கு மாகாணத்தைச் சேர்ந்த 500 இளைஞர்கள் இருக்கின்றார்கள். அவர்கள் தினமும் எங்களுடன் தொலைபேசிமூலம் கதைத்துக்கொண்டிருக்கின்றார்கள். மலசலம் கழிப்பதற்குக்கூட முடியாமல் அந்த இளைஞர்கள் அவதிப்படுகின்ற அளவுக்கு மிருகத்தனமான நடவடிக்கையை சவூதி அரேபிய அரசாங்கம் எடுத்திருக்கின்றது. அவர்கள் சட்டவிரோதமாக அங்கு வேலைவாய்ப்புப் பெற்றுச் சென்றிருந்தால் இலங்கையின் வெளிநாட்டலுவல்கள் அமைச்சர் அவர்கள் என்ன செய்யவேண்டும்? அங்கிருக்கின்ற ஆயிரக்கணக்கான இளைஞர்களை உடனடியாக எமது நாட்டுக்கு திருப்பியழைத்திருக்க வேண்டும். அதற்கான எந்தவொரு நடவடிக்கையும் எடுக்கப்படவில்லை என்பதை நான் வேதனையுடன் இங்கே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். அதேவேளை, இந்திய வெளிவிவகார அமைச்சர் அவர்கள் சவூதி அரேபிய அரசாங்கத்துடன் தொடர்புகொண்டு அங்கிருக்கின்ற இந்திய இளைஞர்களை தமது நாட்டுக்கு கொண்டுவருவதற்கான முயற்சியை எடுத்திருக்கிறார். எமது அமைச்சரால் ஏன், அதைச் செய்ய முடியவில்லை? என்பதைத்தான் நான் இந்த இடத்திலே சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

வெளிநாட்டுக்கு வேலைவாய்ப்புக்குச் சென்ற றிஸானாவின் விடயத்தை நாங்கள் பார்க்கின்றபோது ஆரம்பத்திலிருந்தே மோசடி இடம்பெற்றிருப்பதைக் காணலாம். தரகர் மூலமாகப் பணம் பெறப்பட்டு மோசடியான முறையில் கடவுச்சீட்டு தயார் செய்யப்பட்டிருக்கிறது. இத்தகைய விடயங்கள் தொடர்ந்தும் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. குறிப்பாக, எமது நாட்டிலே ஒரு சட்டம் இருக்கின்றது: அதாவது, சிறுகுழந்தைகளைப் பராமரிக்கவேண்டிய தாய் வெளிநாட்டு வேலைவாய்ப்புக்குச் செல்ல முடியாது. ஆனால், இங்கே தமது குழந்தைகளைக் கணவருடன் விட்டுவிட்டு தாய் வெளிநாடு செல்வதனை யார், எந்த வகையில் அனுமதிக்கிறார்கள் என்ற கேள்வி எழுகின்றது. இவைகளை எங்களால் எவ்வாறு திருத்த முடியும்? வெளிநாடு சென்று உழைக்க வேண்டுமென்பதற்காகத் தொடர்ந்தும் தரகர் மூலமாக இவ்வாறான நடவடிக்கைகளில் ஈடுபடுவதை நினைக்கும்போது மிகவும் மனவேதனையாக இருக்கின்றது. எனக்கு முன்பு பேசிய ஐக்கிய தேசியக் கட்சி உறுப்பினர் டாக்டர் ஜயலத் ஜயவர்த்தன அவர்கள், அங்கு பணிப்பெண்களாகச் செல்கின்றவர்களில் 60 சதவீதமானோர் பாலியல் துஷ்பிரயோகத்துக்கு உள்ளாகின்றார்களென்று கூறியிருந்தார். உண்மையில் அதனையிட்டு மனவருத்தமாக இருக்கிறது. இந்த நான்கு வருடங்களுக்குள் வடக்கு, கிழக்கிலும் பாலியல் துஷ்பிரயோகங்கள் நடந்திருக்கின்றன. போராட்டம் இடம்பெற்ற காலப்பகுதியைவிட, போர் இல்லாத இந்தச் சூழலிலே இளைஞர்கள், பாடசாலை மாணவர்கள் மத்தியில் பாலியல் துஷ்பிரயோகங்கள் இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. அத்தோடு, பாடசாலை மாணவர்கள் தொலைபேசி மூலமாகவும் பாடசாலையிலும் பாடசாலைக்கு வெளியிலே பிரத்தியேக வகுப்புக்களிலும் நேரடியாகவும் பல தகாத நடவடிக்கைகளை மேற்கொள்கின்றனர். இவ்வாறான ஒழுக்கச் சீர்கேடுகள் தொடர்ச்சியாக நடைபெற்றுக்கொண்டிருக்கின்றன. மஹிந்த சிந்தனையில் குறிப்பிட்டவாறு இன்றைய கல்வித் திட்டம் மூலமாக நல்ல பிரசைகளை உருவாக்க வேண்டிய நேரத்தில், எங்களுடைய மாணவர்கள் இந்த ஒழுக்கச் சீர்கேடுகளினால் பாதிப்படைகிறார்கள்.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களது உரையை முடித்துக்கொள்ளுங்கள்.

ගරු පී. අරියනේත්‍රන් මහතා
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)
ஒரு விடயத்தைச் சொல்லி முடித்துக்கொள்கின்றேன். அண்மையில் மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற பிரபல்யமான பாடசாலையான செங்கலடி மத்திய மகா வித்தியாலயத்தைச் சேர்ந்த 16 வயதுடைய நான்கு மாணவர்கள் காதல் பிரச்சினை காரணமாக ஒரு தாயையும் தந்தையையும் கொலை செய்திருக்கிறார்கள். யுத்த காலத்தில் இவ்வாறான எந்த நடவடிக்கையும் அங்கு இடம்பெறவில்லை. இதை இங்கிருக்கின்ற பிரதி அமைச்சர் மாண்புமிகு முரளிதரன் அவர்களும் ஒத்துக்கொள்வாரென்று நான் நினைக்கின்றேன். ஆகவே, இவ்வாறான ஒழுக்கச் சீர்கேடுகளைத் தடுப்பதற்கு நடவடிக்கையெடுக்க வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 6.12]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා (යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - இளைஞர் அலுவல்கள், திறன் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Youth Affairs and Skills Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ හිත මිත්‍ර ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාට එරෙහිව ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් විවාද කරන අවස්ථාවේදී එතුමාගේ පළමු මල්බෙරි සඟයා විධියට කථා කරන්නට අවස්ථාවක් ලැබීම පිළිබඳව මම ගෞරවයට පාත්‍ර වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු හකීම් ඇමතිතුමා කිව්වා වාගේම රිසානා දියණියගේ සිද්ධිය බෙදවාචකයක්. මේ සිද්ධියේ ආරම්භය මට දැනුනේ, මේ සිද්ධියේ ආරම්භය මට පෙනුනේ මාස 4ක දරුවෙක් සහ අවුරුදු 17ක දියණියක් අතර ප්‍රශ්නයක් විධියටයි. ඒ මතුපිටින් බලද්දියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුව -දෙවන වටයේදී- ගැඹුරින් විග්‍රහ කරන විට මට දැනුනේ, මම තේරුම් ගත්තේ සවුදි ෂරී-ආ නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය අතර සටහනයක් විධියටයි. අද දවසේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ මේ විවාදයට මා මුල ඉඳලාම ඇහුම්කන් දුන්නා. මා අද -තුන්වෙනි වටයේදී- මේ කාරණාව කියවා ගන්නේ, තේරුම් ගන්නේ, දැන ගන්නේ අපේම පාර්ලිමේන්තුවේ එක්තරා මන්ත්‍රීවරයෙක් ඔහුගේ සහෝදර මන්ත්‍රීවරයකුට එරෙහිව ඉදිරිපත් කළ අතාර්කික, අසභ්‍ය අවලාදයක් විධියටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව, ඩිලාන් පෙරේරා ඇමතිතුමා, තමුන්නාන්සේලා සහ අප සියලු දෙනාම රිසානා දියණිය බේරා ගන්න ලොකු වෙහෙසක් ගත්තා. අප කවුරුත් ඒක අඩුවෙන් තක්සේරු කරන්නට හොඳ නැහැ. අපි වාගේම ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය - Amnesty International - ඒ වාගේම ආසියානු මානව හිමිකම් කොමිසම - Asian Human Rights Commission - වැනි ආයතන ඇතුළු ලෝකයේ මානව හිමිකම් ගැන වෙහෙසෙන ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන රාශියක් රිසානාව බේරා ගන්න ලොකු කැප කිරීමක් කළ බව,

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

මහන්සියක් ගත් බව අප අමතක කරන්නට හොඳ නැහැ. අසාර්ථකයි කියලා ගරු ඩිලාන් පෙරේරා මැතිතුමාට කවුරුන් හෝ ඇඟිල්ල දික් කරනවා නම්, ඒ ඇඟිලි ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය දිහාට, ආසියානු මානව හිමිකම් කොමිසම දිහාට දිගු වන්නට ඕනෑ. එය අසාර්ථක භාවයක් නම්, ඒ ගැන කිසිවෙක් කථා කරනවා මේ විවාදයේ කිසි තැනක මම දැක්කේ නැහැ; මට ඇහුනේ නැහැ. මේ අණ්ඩුවට පසු ගිය කාලයේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් චෝදනා එල්ල වුණා. මේ මොහොතේ අපි දැක්කා, තමුන්නාන්සේලා ඒවා උපුටා දක්වනවා; ඒ ගැන කථා කරනවා. හැබැයි, මේ ආණ්ඩුවට චෝදනා කළ කිසිවෙක් සවුදි අරාබියේ ආණ්ඩුව මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් කළ විධියට අර්ථ නිරූපණය කරනවා මේ විවාදයේ කොතැනක හෝ මා දැක්කේ නැහැ. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාත් කිව්වේ මේක රිසානා දියණියගේ අභිමි වුණ ආත්මය ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවගේ ඡන්ද ගිණුමට බැර කරලා එයින් දේශපාලන වාසියක් ලබා ගන්නට ගන්නා වූ උත්සාහයක් බවයි. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා මීට පෙර කියූ විධියට අපි මේ විවාදය වෙනිත් තලයකට ගෙන ගියා නම්, රිසානා දියණියගේ සාතනයෙන් -ඒක සාතනයක්- අපට ඉගෙන ගත හැකිව තිබුණ පාඩම් මොනවාද?

ඒ දිශාවටයි මේ විවාදය යොමු කළ යුතුව තිබුණේ. හැබැයි එහෙම පෝෂණයවීමක් අප දැක්කේ නැහැ. අපට මේ විවාදය ඇතුළේ සාකච්ඡා කරන්න කරුණු තිබුණා. පුහුණු ශ්‍රමිකයන් පමණක් ජාත්‍යන්තර ශ්‍රම වෙළඳ පොළට යැවීම පිළිබඳ කාරණය ජාතික මට්ටමෙන් අපට අද සාකච්ඡා කරන්න තිබුණා. විශේෂයෙන් මැද පෙරදිග කලාපයට යන අපේ ශ්‍රමිකයන්ට මැද පෙරදිග කම්කරු නීති පිළිබඳව දැනුවත් කිරීමේ අවශ්‍යතාව ගැන අද දවසේ අපට සාකච්ඡා කරන්න තිබුණා. ඒ වාගේම මැද පෙරදිග තිබෙන ආචාර ධර්ම පිළිබඳව අවබෝධයක් ලබා දීමේ වැදගත්කම ගැන අපට කථා කරන්න තිබුණා. ශ්‍රමිකයන් පිළිබඳ ප්‍රතිපත්තිය වාගේම, ඒ මූලික නීති-රීති උල්ලංඝනය කරන රැකියා ඒජන්සිකරුවන්ට අදාළව නීති බලවත් කරන්නේ කොහොමද කියන කරුණට යෝජනා අද විවාදයේදී ගේන්න තිබුණා. හැබැයි කනගාටුවට කාරණාව නම්, අප අද එහෙම දෙයක් නොදැකීමයි. ඒ කරුණු සාකච්ඡා කළා නම් පමණයි, ප්‍රාථමික පටු දේශපාලන වාසි ලබා ගැනීමකින් තොරව මේ සභාවේදී රිසානාට දිය යුතු ගෞරවය අපට ලබා දෙන්න පුළුවන්කමක් තිබුණේ. නමුත් අප ඒක ප්‍රාථමික සරල දේශපාලන කාරණාවලට ලඝු කර ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඩිලාන් පෙරේරා ඇමතිතුමා විෂය භාර ඇමතිවරයා විධියට මේ ක්ෂේත්‍රයට ගරුත්වයක් ලබා දෙන්න ගත් වෙහෙස පිළිබඳව ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා පැහැදිලිව සඳහන් කළා. ඒ සම්බන්ධව අප කවුරුත් එකඟ වනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂිය දන්නවා. අපේ දේශපාලන සංස්කෘතිය ඇතුළේ අපි පුරුදු වෙලා තිබෙන්නේ එවැනි ගෞරවනීය දේවල් අගය කරන්න නොවෙයි, එයින් දේශපාලන වාසි දිනා ගන්නයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනාව මා දකින්නේ අපේ මිත්‍ර ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ දේශපාලන ජීවිතයට දීපු හොඳම චරිත සහතිකයක් විධියටයි. මා මේ විවාදය තේරුම් ගන්නේ ඒ විධියටයි. කෙනෙක් එක ක්ෂේත්‍රයක අවුරුදු 25ක් ගත කිරීම සාමාන්‍ය සරල කාරණාවක් නොවෙයි. ඊයේ දිනයේ ඩිලාන් පෙරේරා මැතිතුමාගේ දේශපාලන ජීවිතයට අවුරුදු 25ක් පිරුණා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hear! Hear!

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெருமa)
(The Hon. Dullas Alahapperuma)
අපි ඒ 25වෙනි සංවත්සරයට කියනවා, "රිදී ජුබිලිය" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විවාදය මා හඳුනා ගන්නේ අපේ හිතවත් ඩිලාන් පෙරේරා මැතිතුමාගේ දේශපාලන ජීවිතයේ "රිදී ජුබිලිය" විධියටයි. අද දින විවාදයේදී කථා කිරීම සඳහා ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රී පිරිසේ ලේඛනගත වුණු ප්‍රමාණය වැඩියි. මා හිතන්නේ ඒ පිරිසෙන් හත්, අට දෙනෙකුට පමණයි ඒ සඳහා අද ඉඩ ලැබෙන්නේ. ඒ නිසා මා වෙලාව වැඩිපුර පාවිච්චි කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් අපි අපේ එකමුතුකම පෙන්වමින්, අපේ ශක්තිය, අපේ මිත්‍රත්වය, අපේ සහෝදරත්වය ඩිලාන් පෙරේරා සහෝදරයාට ලබා දෙනවා. අද 2013 මැයි මාසයේ හත්වැනි දා ඉතිහාසගත වන්නට ඕනෑ. ලෝක ඉතිහාසය බැලුවාම මැයි මාසයේ හත්වැනි දා විශේෂ සිදුවීම් ඉතිහාසගත වෙලා තිබෙනවා. 1945 මැයි මාසයේ හත්වැනි දා ඉතිහාසයට එකතු වුණේ දෙවැනි ලෝක මහා යුද්ධයේදී ජර්මනිය යටත් වුණු දිනය විධියටයි. එනම් යුරෝපයේ යුද්ධය අවසන් වුණු දිනය විධියට 1945 මැයි මාසයේ හත්වැනි දා ඉතිහාසගත වුණා. 1975 මැයි මාසයේ හත්වැනි දා ලෝක ඉතිහාසයට එකතු වුණේ වියට්නාම් යුද්ධයෙන් ඇමෙරිකාව පරාජිතයෙක් විධියට ඉවත් වුණු දිනය විධියටයි. අසාර්ථක යුද්ධයෙන් ඉවත් වෙන්න තීරණය කරමින් තමන්ගේ හමුදා කැඳවා ගන්න ජෙරල්ඩ් ෆෝඩ් ජනාධිපතිතුමා එම තීරණයට අත්සන් කළේ එදායි. ඒ ජාත්‍යන්තර ඉතිහාසයයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා ඉතිහාසයේ අද දිනය - 2013 මැයි මාසයේ හත්වැනි දා- සටහන් වනවා ඒකාන්තයි. අජිත් පෙරේරා මන්ත්‍රීතුමනි, ඩිලාන් පෙරේරා මැතිතුමාට එරෙහි දේශපාලන යුද්ධයෙන් කොන්දේසි විරහිතව ඔබ කණ්ඩායම පරාජයට පත් වූ දිනය විධියට අද දිනය ඉතිහාසයට එකතු වනවා ඒකාන්තයි කියමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 6.21]

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින විවාදයට ලක්වන අපේ ගරු ඩිලාන් පෙරේරා අමාත්‍යතුමාට එරෙහිව ඉදිරිපත් කර ඇති විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ස්තුතිය, ප්‍රණාමය මේ අවස්ථාවේ පුද කරනවා. මේකට හේතු සාධක වුණු ප්‍රධාන සිදුවීම සම්බන්ධයෙන් වසර ගණනාවක සිට අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයත්, එවකට හිටපු ගරු අමාත්‍යතුමන් ඇතුළු ඒ සියලුම දෙනාත් සෘජු මැදිහත් වීමක් වුණා. එදා රිසානාගේ අභිංසකභාවය ඔප්පු කරන්න ලංකාවේ සංවේදී රාජ්‍ය නායකයා වාගේම එරට ඉන්න රජතුමාත් එකතු වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයේ ඕනෑම රටක ඒ රටේ පවත්නා නීති ක්‍රමවේදයක් තිබෙනවා. ඒ රටේ නීති පද්ධතියක් තිබෙනවා. ලෝකයේ කිසිම රටකට තවත් රටක පවතින නීති පද්ධතියක් වෙනස් කරන්නවත්, ඒ සඳහා වෙනත් මාර්ගයකින් මැදිහත්වීමක් කරන්නවත් බැරි බව මේ උත්තරීතර සභාව දන්නවා. ශ්‍රී ලංකාව වෙන්න පුළුවන්, මැද පෙරදිග වෙන්න පුළුවන්, යුරෝපය වෙන්න පුළුවන් ලෝකයේ ඕනෑම රටක් තමන්ගේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීම සාමාන්‍ය දෙයක්. ඒ වාගේම තමයි ඒ ඒ රටවල අභ්‍යන්තර කටයුතුවලට, ඒ ඒ රටවල

අභ්‍යන්තර ගනුදෙනුවලට මැදිහත් වෙන්න තවත් රටකට අවකාශ නැහැ. හැබැයි අපේ අතිගරු ජනාධිපතිතුමාත්, සමස්ත රජයත් රිසානා වෙනුවෙන් හැකි ආකාරයෙන් සෘජු මැදිහත්වීමක් සිදු කෙරුවා. ඒ වාගේම තමයි අපේ ඩිලාන් පෙරේරා අමාත්‍යතුමන් විෂය භාර ඇමතිවරයා විධියට අමාත්‍යාංශය භාර ගත්තු දවසේ සිට තමන්ගෙන් ඉටු විය යුතු වගකීම් නිසි ආකාරයෙන් ඉටු කරන්න කැප වුණා. ඒ සඳහා එතුමන්ගේ අමාත්‍යාංශයත්, ඒ නිලධාරිනුත් මෙහෙයවූවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සිදුවීම නිසා කම්පනයට ලක් වුණු යම් කිසි පුද්ගලයෙකු ඉන්නවා නම්, යම් කිසි කණ්ඩායමක් ඉන්නවා නම් ඒ සියලු දෙනාම කළ යුත්තේ මේ සිදුවීම හුදෙක් දේශපාලන වාසියක් බවට පරිවර්තනය කර ගන්නා එක නොවෙයි. ඔවුන් මේ සිදුවීම හරහා රටේ අභ්‍යන්තර දේශපාලනික පිබිදීමක් ඇති කරන්න උත්සාහ නොකර, සමස්ත රටේ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් යම් නීති රීති ක්‍රියාත්මක කරන්න ඕනෑ නම්, රට තුළ නීති පනවන්න ඕනෑ නම් ඒ සඳහා ක්‍රියා කළ යුතුයි. ගරු විෂය භාර අමාත්‍යතුමාත් සමඟ එකතු වෙලා උපදේශක කාරක සභාවේදී වෙන්න පුළුවන්, මේ උත්තරීතර සභාව තුළදී වෙන්න පුළුවන්, වෙනත් ආකාරයකින් වෙන්න පුළුවන් නැවතත් එවැනි සිදු වීමක් නොවන්න පක්ෂ, විපක්ෂ දෙපක්ෂයම වග කිවයුතු තලයකට, වග කිවයුතු මතයකට පැමිණිය යුතු බව තමයි අපි දැඩි සේ විශ්වාස කරන්නේ. එහෙම නැතිව මේ පිළිබඳව ගරු අමාත්‍යතුමාටවත්, රජයටවත් විවේචන ඉදිරිපත් කරනවා වෙනුවට, වෙනත් රටක පවතින නීති-රීති අපේ රටේ ඉඳන් විවේචනය කරනවා වෙනුවට, අපේ රටට විදේශ විනිමය වැඩි පුරම ගෙනෙන "රට විරුවන්" වෙනුවෙන්, ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද, ඒ වැඩ පිළිවෙළ සඳහා සහභාගී වීම, දායකත්වය ලබා දීම, අදහස්, යෝජනා, චෝදනා ලබා දීම තමයි අපි කළ යුත්තේ කියන එක තමයි මගේ විශ්වාසය.

ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා ගැන මම අමුතුවෙන් කථා කරන්න දෙයක් නැහැ. අද මේ උත්තරීතර සභාව තුළ අදහස් ප්‍රකාශ කරපු සියලු දෙනාම අපේ ඩිලාන් පෙරේරා සහෝදර අමාත්‍යතුමන් ගැන කථා කෙරුවා. එතුමන් මේ අමාත්‍යාංශය භාර අරගෙන අද වෙනතුරු ගරු අමාත්‍යවරයා විධියට ක්‍රියා කරපු විධිය පිළිබඳව, කරගෙන ගිය වැඩ පිළිවෙළ පිළිබඳව, එතුමන් ඒ විෂය ක්ෂේත්‍රය පුළුල් කරලා, පුහුණු ශ්‍රමිකයන් රට යවලා, තරුණ, තරුණියන් පුහුණු ශ්‍රමිකයන් බවට පරිවර්තනය කරලා "රට විරුවෝ" යන නාමය යටතේ ඒ සියලු දෙනාම ඒක රාශී කරන්න ඒ ගත්තු උත්සාහය, කැපවීම පිළිබඳව අපේ ගරු ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමාගේ කථාවේදී කිව්වා. එය හෘදය සාක්ෂියට අනුව ඔබ, අප සියලු දෙනාම එකඟ වන්නා වූ කාරණයක්.

ඉතින් මේ අවස්ථාවේ රිසානා පිළිබඳව අපි සියලු දෙනාම හදවතට එකඟව කම්පනයට පත් වෙනවා. අතිගරු ජනාධිපතිතුමන්, ආර්යාව, අග්‍රාමාත්‍යතුමන් මෙන්ම මේ උත්තරීතර සභාවේ සියලු දෙනා ඒ පිළිබඳව කම්පනයට පත් වෙනවා. හැබැයි අපි කළ යුත්තේ, ඒ පිළිබඳව කම්පනයට පත් වෙලා එය දේශපාලනික ප්‍රශ්නයක් බවට පරිවර්තනය කරනවා වෙනුවට, රිසානාට සිදු වුණු දේ අපේ සහෝදරියන්ට නැවතත් සිදු නොවන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සඳහා අපේ දායකත්වය ලබා දෙන එකයි. ඒ අවශ්‍ය දැනුවත් කිරීම් සඳහා අපි මැදිහත් වෙන්න අවශ්‍යයි. ඒ අවශ්‍ය පුහුණු පාඨමාලා හඳුන්වා දෙන්න අපි ගරු විෂය භාර අමාත්‍යතුමාට ශක්තියක් වෙන්න ඕනෑ. ඒ සඳහා අදහස්, යෝජනා, උපදෙස් ලබා දෙන්න ඕනෑ. මේ කාරණය දේශපාලනීකරණය කරලා බල අරගලයක් බවට පරිවර්තනය කරන එක නොවෙයි කළ යුත්තේ. මේක රටට විදේශ විනිමය ගෙනෙන, රටේ ආර්ථිකය දියුණු කරන, රටේ ජනතාවට වැඩිම ආදායමක් ලැබෙන ක්ෂේත්‍රයක්. ඒ ක්ෂේත්‍රය දියුණු කිරීම ඔබ අප කාගේත් වගකීමක්.

මා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අද අපේ ගරු ඩිලාන් පෙරේරා සහෝදර අමාත්‍යතුමා වෙනුවෙන් අපේ ආණ්ඩු පක්ෂයේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු වැඩි දෙනෙක් කථා කරන්න, අදහස් ඉදිරිපත් කරන්න බලාගෙන ඉන්නවා. මා අවසාන වශයෙන් කියන්න කැමැතියි, ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා වසර 25ක දේශපාලන ඉතිහාසයක් තිබෙන කෙනකු බව. එතුමා නිරන්තරයෙන් මේ රටේ කම්කරු ජනතාව වෙනුවෙන්, මේ රටේ ගමේ ජනතාව වෙනුවෙන් දේශපාලනය කරන තරුණ දේශපාලන නායකයෙක්. එතුමාට අපි සුබ පතනවා. අනාගත දේශපාලන ක්ෂේත්‍රය තුළ තවත් ඉදිරියට ගිහිල්ලා රටටම වැඩදායී, වග කියන පුරවැසියකු වශයෙන් කටයුතු කරන්න එතුමාට හැකියාව ලැබේවා කියන ප්‍රාර්ථනයත් ඇතිව මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Udith Lokubandara. You have five minutes.

[අ.භා. 6.27]

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා නියෝජනය කරන බදුල්ල දිස්ත්‍රික්කයේ අපේ නායකයකු වන ගරු ඩිලාන් පෙරේරා අමාත්‍යතුමාට විරුද්ධව ගෙනාපු මේ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව වචන කිහිපයක් මගේ නායකයාගේ කථාවට පසුව කරන්න ලැබීම මගේ ජීවිතයේ ලද භාග්‍යයක් කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුවට බොහෝ අය සම්බන්ධයෙන් විශ්වාස භංග යෝජනා ඇවිල්ලා තිබෙනවා. විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වුණාට පසු ගොඩක් වෙලාවට ඒ යෝජනාවට අදාළ අමාත්‍යවරයා හෝ ඒ පුද්ගලයා භයෙන් වෙවුලනවා. මොකද, ඔහු ඒකට භයයි. විශ්වාස භංග යෝජනාවලට භය වෙන්න ඕනෑ. හැබැයි මේකේදී මොකද වුණේ? මේක ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාට ලැබුණු අස්වැසිල්ලක් බවට පත් වුණා. මේක එතුමාට ලැබුණු ලොකු අවස්ථාවක් බවට පත් වුණා.

කෙසේ වෙතත්, ඇතැම් අය මේවා ගැන මොන විධියට උපහාසාත්මකව කථා කළත්, දේශපාලනයේදී තමන්ගේ තිබෙන බංකොලොත්භාවය අභිංසක දැරියකගේ මළ මිනිය ඉදිරියේ හංගා ගන්න බැලුවත් අපි පිළිගන්න ඕනෑ එක කාරණයක් තිබෙනවා. දේශපාලනය කිරීමේදී අපි පහත් තත්ත්වයට වැටෙන්න ඕනෑ ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය වැනි ශ්‍රේෂ්ඨ පක්ෂයක නියෝජිතයන් උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන යෝජනා ගැන මීට වඩා පොඩ්ඩක් කල්පනාකාරී වෙන්න කියලා මා එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන්ගෙන් ඉල්ලා සිටිනවා. මොකද, ඔය පක්ෂය පවු. ඔය පක්ෂයට අද ඊයේ ආපු කට්ටිය- [බාධා කිරීම්] මගේ අප්පච්චිත් හිටියා ඔය ශ්‍රේෂ්ඨ පක්ෂයේ. මගේ අප්පච්චිලා ඔය පක්ෂයේ ඉන්න කාලයේ මේ විධියේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වැඩ කළේ නැහැ. ඔය පක්ෂය ඔය විධියට පහත් තත්ත්වයට ඇද දැම්මේ නැහැ. [බාධා කිරීම්] ඔය පක්ෂයට ඔය විධියේ ඉරණමක් අත් වුණේ නැහැ. මේ විධියේ විහිළුකාරයින්ගේ පක්ෂයක් බවට විජමුලා හිටපු යූඑන්පී එක පත් වුණේ නැහැ. අන්න ඒ නිසා තමයි අද අපටත් දුකක් ඇති වෙන්නේ. එදා මගේ අප්පච්චිත් එක්ක

[ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා]

එකට හිටපු එක්සත් ජාතික පක්ෂයේ දැවැන්තයෝ අද මේ පැත්තේ ඉන්නවා. මම මෙතැන හිට ගත්තාම මෙන්න බොලේ මේ පැත්තේ ඉන්නවා පෙනෙන්නේ අප්පච්චිත් එක්ක එකට හිටපු කට්ටිය. එදා යූඑන්පී එක මේ විධියට පහත් තත්ත්වයකට වැටුණේ නැහැ. ඒ නිසා මා තමුන්නාන්සේලාට එක දෙයක් කියන්නම්.

තමුන්නාන්සේලා යෝජනාවක් ගෙන එනවා නම්, ඒක වැඩකට ඇති යෝජනාවක්ද කියලා කල්පනා කරලා ගෙනෙන්න. නිකම් යෝජනා ගෙනෙන්න එපා. එතකොට හැල්ලු වෙනවා. පක්ෂයත් එක්කම හැල්ලු වෙනවා. ඒ වැඩේ කරන්න එපා.[බාධා කිරීම්] අර අසූචි වළේ බැහැලා ඉන්න එකාට මොන විධියට අසූචිවලින් ගැහුවත් ඒක දැනෙන්නේ නැහැ. ඒක තමයි මෙතැන තිබෙන යථාර්ථවාදී සත්‍ය තත්ත්වය. [බාධා කිරීම්] රිසානා නඊක් අපේ සහෝදරියක්. එතුමියට අද එතුමියගේ ජීවිතය නැති වෙලා. අද එතුමිය ජීවිතයෙන් වන්දි ගෙවලා තිබෙනවා. හැබැයි, සෞදි අරාබියේදී නැති වුණ ජීවිතයක් පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සිටින අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමන්ලාට, රන්ජන් රාමනායක මන්ත්‍රීතුමන්ලාට අද ගොඩක් දුක හිතිලා. මේ සෞදියේ දී මැරුණ කාන්තාවක් පිළිබඳව. [බාධා කිරීම්] හැබැයි, මීට අවුරුදු තුනකට කලින් මේ රටේ පාරවල, හන්දියක් හන්දියක් ගානේ අපේ සහෝදරියෝ මැරුවා. මේ රටේ හන්දියක් හන්දියක් ගානේ ළමයි මැරුවා. ඉස්කෝල ළමයි මැරුවා. හාමුදුරුවරු මැරුවා. [බාධා කිරීම්] එතකොට ඔය කැක්කුම ඇති වුණේ නැහැ. ඇයි, ඒ කැක්කුම ඇති වුණේ නැත්තේ? මොකද, ඒ දවස්වල මනුෂ්‍ය ජීවිතවල වටිනාකම අපට දැනුණේ නැහැ. හැබැයි, අද මේ රටට සාමය ගෙනැල්ලා මනුෂ්‍ය ජීවිතවල වටිනාකම හදවත්වලට ලබා දෙන්න අපේ ආණ්ඩුවට හැකියාවක් ලැබී තිබෙනවා. ඒ නිසා අද පිට රටකදී වුවත් ලාංකිකයකුගේ ජීවිතයකට හානියක් වෙන කොට ඒක අපට දැනෙනවා. අපේ හදවතට දැනෙනවා. [බාධා කිරීම්] මේක තමයි ඇත්ත කථාව.

සෞදි අරාබියේදී රිසානා කළ වැරැද්දට ඇයට විරුද්ධව තීන්දු තීරණ ගන්න කොට ඒ තීන්දු තීරණවලට අපට කරන්න පුළුවන් දේ රජයක් හැටියට අපි නොපැකිළව කළා. ඒ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා ඒ රටේ නායකයන් එක්ක සාකච්ඡා කළේ. ඒ රටේ නායකයන් හමු වෙන්න අපේ අමාත්‍ය මණ්ඩල නියෝජිතයන් ගියේ. එහෙම ගිහිල්ලා කරන්න පුළුවන් උපරිමය අපි කළා. ඒ වුණාට ඒ රටේ නීතිය හදන්න අපට බැහැ. අපේ රටේ නීති පද්ධතිය අනුව අපට කරන්න පුළුවන් දේවල් තිබෙනවා. මේ කට්ටිය හිතා ගෙන ඉන්නවා, අර ඒ කාලයේ ජනාධිපති පොදු සමාව යටතේ කට්ටිය අත්සන් කරලා මිනීමරුවන්, ස්ත්‍රී දූෂකයන් එළියට දැම්මා වාගේ මේවා කරන්න පුළුවන් කියලා. ඒ විධියට මේවා කරන්න බැහැ. එහෙම කරන්න බැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකත්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

හිතවත් කියලා ස්ත්‍රී දූෂකයන්ව, එල්ලුම් ගහට යන්න හිටපු අයව එක ලියුම් කැල්ලකින් එළියට දැම්මා. මෙහේ කළා කියලා, ඒවා ඒ රටවල කරන්නේ නැහැ. ඒ නිසා ඒක තේරුම් ගන්න. [බාධා කිරීම්] ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ, තමුන්නාන්සේලා තව තවත් පල්ලෙහාට වැටෙන්නේ නැතිව මහත්වරු වාගේ ඔළුව පාවිච්චි කරලා මේ උත්තරීතර පාර්ලිමේන්තුවෙන් වැඩක් ගන්න කියලායි. වැඩකට ඇති දෙයකට අත උස්සන්න. වැඩකට නැති දේවලට ඇවිල්ලා තව ටිකක් සවුත්තු වෙන්න එපා. ඩිලාන් ඇමතිතුමාගේ දේශපාලන ජීවිතයට අවුරුදු 25ක් පිරෙන වෙලාවේ, අපි එතුමාගේ දේශපාලන ගමන අගයන වෙලාවේ කොළඹට ඇවිල්ලා එතුමාගේ දේශපාලනික හයිය පෙන්නන්න අවස්ථාව ලබා දීම පිළිබඳව එක් පැත්තකින් ස්තුතිවන්ත වෙනවා. [බාධා කිරීම්] ඔබ සියලු දෙනාටම මම කියන්නේ මෝඩ වැඩවලට එකතු වෙන්න එපා කියලායි. [බාධා කිරීම්] ගරු ඩිලාන් ඇමතිතුමනි, ඔබතුමාගේ ඉදිරි දේශපාලන ගමන තවදුරටත් සාර්ථකව කර ගෙන යන්න ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා කියමින් මගේ කථාව අවසන් කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. (Mrs.) Malani Fonseka. Before that, will an Hon. Member propose the Hon. Udith Lokubandara to take the Chair?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

I propose that the Hon. Udith Lokubandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

[අ.භා. 6.35]

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs) Malani Fonseka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ රැකියා ප්‍රවර්ධන සහ සුබසාධන අමාත්‍ය ගරු ඩිලාන් පෙරේරා මැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කොට ඇති මේ අවස්ථාවේ දී මටත් වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම සතුටක්.

එයට හේතුව, එතුමා එම අමාත්‍යාංශය වෙනුවෙන් කරන සේවය ගැන මටත් හොඳ අවබෝධයක්, හොඳ වැටහීමක් පසු ගිය මාස කීපය ඇතුළත ලැබීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ රැකියාවලට අපේ රටේ ශ්‍රමිකයන් යැවුණේ විවෘත ආර්ථිකයත් සමඟ 1977 කාලයේ සිටයි. ඒ කාලයෙන් පසු විදේශ රැකියා අමාත්‍යාංශය කියන එක නිකම් බෝඩ් ලෑල්ලකට විතරක් සීමා වෙලා තිබුණා. නමුත් ඉන් පස්සේ අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා ඉතාම සංවිධානාත්මකව, සියලු ගැටලුවලට විසඳුම් ලැබෙන විධියට මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සිදු කළා. අනෙක් කාරණා ගැන කථා කරනවාට වඩා, මා ලද අද්දැකීම් එක්ක මේ අවස්ථාවේ මට කථා කරන්න පුළුවන් කියලා මා සිතන කාරණයක් තිබෙනවා. අනෙක් අය වාගේ ඒ ශ්‍රමිකයන්ගේ දුක ඉදිරියට ගෙනැල්ලා ඒ දුක තමන්ගේ ජීවිතය කර ගත්තේ නැහැ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා. ඔවුන්ගේ සතුට වැඩෙන විධියට, ඔවුන්ගේ මානසික ප්‍රබෝධය වැඩි වන විධියට, ඔවුන්ට යම්කිසි ආධ්‍යාත්මික සතුටක් ලැබෙන විධියට තමයි එතුමා වැඩ සටහන් ක්‍රියාත්මක කළේ. ඒ ගැන මට කියන්න පුළුවන්. තමන්ගේ දේශපාලන පැවැත්ම සඳහා ඔවුන්ගේ කඳුළු විකුණන්නේ නැතිව, කලාකරුවන් හැටියට ඒ රටට ගිහිල්ලා සින්දු කියලා නටලා ඔවුන්ගේ මුදල් හූරා ගන්නේ නැතිව "රට විරුවෝ" යන නමින් ඔවුන්ට ගෞරවයක් ලබා දීලා, ඔවුන්ගේ දක්ෂකම් රටට ලෝකයට පෙන්නලා ඔවුන්ට සතුට ලබා දීම වෙනුවෙන් එතුමා යම්කිසි වැඩ සටහනක් කළා. ඇත්ත වශයෙන් ඒ වැඩ සටහනට මමත් සහභාගි වුණා. "Rataviruwo Talent Star" නම් වූ එය reality වැඩ සටහනක්. ඒක ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ සංකල්පයක්. ඒ වැඩ සටහනින් ඔවුන් ලැබූ සතුට මම මගේ ඇස් දෙකෙන්ම දැක්කා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! ගරු මන්ත්‍රීතුමිය, මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. UDITH LOKUBANDARA *left the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs) Malani Fonseka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මගේ ඇස් දෙකෙන්ම දැක්කා ඒ රටේ ඉන්න ශ්‍රමිකයන්ට තිබුණු යම් යම් ගැටලුවලට මහ පොළොවේ පය ගසා සිටින ඇමතිතුමකු හැටියට විසඳුම් ලබා දීලා ඒවා සම්බන්ධයෙන් එතුමා ක්‍රියාත්මක වූ හැටි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අඩු වයස් දැරියක පාස්පෝට් හදලා රට යැවීම ගැන විපක්ෂය රජයට දොස් පවරනවා. නමුත් මාස ගණනක් වයසැති දරුවකු -බිලිඳකු- ගෘහ සේවිකාවකට බලා ගන්න දීම කියන වැරැද්ද කරපු ඒ අම්මා ගැන කවුරුවත් කථා කළේ නැහැ. ඇයගේ ඒ වැරැද්ද වසා ගන්න අපේ බාල වයස්කාර දැරියක් බිලි වුණා කියලා තමයි මා විශ්වාස කරන්නේ. ඒ ගැන කවුරුවත් කථා කළේ නැහැ. අද ඒවා ගැන කථා කරන්නේ නැතිව උද්ඝෝෂණ පවත්වනවා; වේදනාවෙන් කෑ ගහනවා. මම දුටුවා ඒ උද්ඝෝෂණ, ඒ කෑ ගිහිලිත් එක්ක ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා වීරයකු වෙනවා. මම දැක්කා අපේ සිතමාවේ වීරයන් පරදලා අද අපේ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා වීරයකු වෙනවා. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමිය, දැන් කථාව අවසන් කරන්න. [බාධා කිරීම්]

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs) Malani Fonseka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉතාම කෙටියෙන් කථාව අවසන් කරන්නම්. මම ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාට මේ අවස්ථාවේ සුභ පතනවා. ඒ වාගේම ඒ අවාසනාවන්ත දැරියගේ -රිසානාගේ- ආත්මයට නිදහසේ තිබෙන්න දෙන්න, එය තමන්ගේ ජීවිතය යැපෙන දෙය කර ගන්න එපා කියලා මම මේ වෙලාවේ ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඇගේ ආත්මයට අල්ලාහ්වුඩෙය කාවල්! -අල්ලා දෙවියන්ගේ පිහිටයි!- කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The next speaker is the Hon. Risad Badhiutheen. You have five minutes.

[பி.ப. 6.40]

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில், வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரும் என்னுடைய நண்பருமான மாண்புமிகு டிலான் பெரேரா அவர்களுக்கு எதிரான நம்பிக்கையில்லாத் தீர்மானத்தின்மீது பேசச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு நான் சந்தோஷமடைகின்றேன். சுமார் கடந்த 25 வருடங்களாக இந்தப் பாராளுமன்றத்துக்கு உள்ளேயும் வெளியேயும் அவர் மேற்கொண்டு வந்த அரசியல் பணியை உற்று நோக்குகின்றபொழுது அவரை மிக நேர்மையாகச் செயற்படுகின்ற ஒரு சிறந்த செயல் வீரராகவே நாங்கள் காண்கின்றோம். அவ்வாறான ஒருவருக்கு எதிராகவே இன்று இந்த நம்பிக்கையில்லாத் தீர்மானம் கொண்டு வரப்பட்டுள்ளது. கடந்த முப்பது வருடங்களாக யுத்தத்தால் பாதிக்கப்பட்ட இந்த நாடு சமாதானத்தைப் பெற்றிருக்கின்ற இந்த வேளையிலே, சகோதரி மர்ஹூமா ரிஸானா நபீக் என்பவரின் மரண தண்டனையைக் காரணமாக வைத்து, அவருடைய மரணத்தினூடாக அரசியல் இலாபம் அடைவதற்கான ஒரு வழியாகவே இந்தச் சபையிலே மாண்புமிகு அமைச்சர் அவர்கள் மீது கொண்டு வரப்பட்டுள்ள இந்த நம்பிக்கையில்லாத் தீர்மானத்தை நான் பார்க்கின்றேன்.

அந்தச் சகோதரியுடைய மரணத்தைக் கேள்வியுற்ற அவருடைய தாய், அவருடைய குடும்பத்தினர் மற்றும் அந்த ஊரவர்கள் மட்டுமல்லாமல் இன, மத, மொழி பேதங்களுக்கு அப்பால் நமது நாட்டு மக்கள் எல்லோரும் கவலையடைந்ததை நாங்கள் கண்டோம். மாண்புமிகு டிலான் பெரேரா அவர்கள் இந்த அமைச்சைப் பொறுப்பேற்பதற்கு முன்னர் அந்தச் சகோதரி மீதான அந்தத் தீர்ப்பு வழங்கப்பட்டுவிட்டது. அதன் பிறகு அதற்கு எதிராக மேன்முறையீடுகள் செய்யப்பட்டன. அந்த ஒவ்வொரு காலகட்டத்திலும் ஒவ்வோர் அமைச்சர் இந்த விடயத்துக்குப் பொறுப்பாக இருந்தார். அந்தக் காலப்பகுதியிலே வெளிநாட்டு அமைச்சர் அதேபோல் வெளிநாட்டு வேலைவாய்ப்புக்குப் பொறுப்பான அமைச்சராகப் பதவி வகித்த ஒவ்வொருவரும் அவரின் விடுதலை குறித்து முயற்சி செய்தார்கள். ஒருமுறை நான் என்னுடைய அமைச்சு சம்பந்தப்பட்ட ஒரு விடயமாக சவூதி அரேபியாவுக்குச் செல்ல ஆயத்தமான வேளையிலே என்னுடன் தொலைபேசியில் தொடர்புகொண்ட அமைச்சர் அவர்கள், "நான் றிஸானா நபீக் என்பவரின் விபரங்களை எல்லாம் உங்களிடம் தருகின்றேன்; அந்த நாட்டிலே இருக்கின்ற வர்த்தகர்கள் மற்றும் முக்கியஸ்தர்களைச் சந்தித்து அந்தச் சகோதரியின் விடுதலைக்காக முயற்சித்துப் பாருங்கள்" என்று என்னை வேண்டிக் கொண்டது இப்பொழுது எனக்கு ஞாபகத்துக்கு வருகின்றது. மேலும், அவர் அந்தச் சகோதரியின் விடுதலைக்காக அங்கு விசேட தூதுக் குழுக்களை அனுப்பி வைத்திருக்கின்றார். மேல் மாகாண ஆளுநரான அஸ்ஸெய்யத் அலவி மௌலானா மற்றும் அஸ்வர் ஹாஜியார் போன்ற பல பாராளுமன்ற உறுப்பினர்களையும் பல உத்தியோகத்தர்களையும் மட்டுமல்லாமல் சில உலமாக்களையும்கூட அந்தக் குழுக்களிலே இணைத்து அந்த நாட்டுக்கு அனுப்பி சம்பந்தப்பட்ட பெற்றோருடன் மற்றும் ஊர்ப்

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

පෙරියාර්ගුලුටන් කලන්තු පේසුවතර්කාන ඒර්පාටුකළෙ එල්ලාම් අමෙච්චර් අවර්කළ් තන්නුටෙය මනච්චාට්චික්කු ඒර්ප නූරු වීතම් චරියාකච් චෙය්තිරුක්කින්රාර් එන්පතෙ ඉන්ත ඉටත්තිලේ එනක්කු චාට්චියුටන් කූරික් කොළ්ළ මුටියුම්.

අතු මට්ටුමල්ලාතු, අන්ත නාට්ටිල් 'ෂරීඅ' චට්ටම් අමුලිල් ඉරුන්තුකොණ්ටිරුක්කින්රතු. අන්ත නාට්ටුක්කුච් චෙල්වවර්කළ් අන්තච් චට්ටත්තෙ මතිත්තු අතන්පටි නටෙමුරෙප්පටුත්තුකින්ර විටයංකළෙ ඒර්රුක්කොළ්ළ වේණ්ටුම්. එංකළුටෙය නාට්ටින් චට්ටංකළෙ නාංකළ් ඒර්රුක්කොළ්වතුපෝල, අන්ත නාට්টුක්කෙන්රු ඉරුක්කුම් 'ෂරීඅ' චට්ටත්තෙ අංකුළ්ළ මක්කළ් ඒර්රුක්කොළ්කිරාර්කළ්. ඉක්කිය තේචියක් කට්චියෙච් චේර්න්ත ඕර් උරුප්පිනර් පාරාළුමන්රත්තුක්කුළ්ළුම් වෙළියිලුම් ඉන්ත 'ෂරීඅ' චට්ටත්තුක්කෙතිරාකප් පලවිතමාකවුම් කරුත්තුක්කළ් වෙළියිට්ටතෙ නාන් ඥාපකප්පටුත්තුකින්රේන්. චවූති අරේපියාවුක්කුම් ඉලංකෙක්කුම් ඉටෙයිලේ නීණ්ටකාල උරවු නිලවි වරුකින්රතු. කටන්ත කාලංකළිලේ ඉක්කිය නාටුකළ් චපෙයිලේ ඉලංකෙක්කු එතිරාක පිරේරණෙකළෙක් කොණ්ටුවන්ත පොළුතෙල්ලාම් චවූති අරේපියා තලෙමෙයිලාන මුස්ලිම් නාටුකළ් ඉලංකෙක්කු ආතරවාක වාක්කළිත්තු තංකළුටෙය ඔත්තුළෙප්පෙක් කාට්ටියිරුක්කින්රන. ඉන්තප් පිරේරණෙයෙ ආමෝතිත්ත ඉක්කිය තේචියක් කට්චියින් උරුප්පිනර් ඔරුවර්, අව්වාරාන ඔරු නාට්ටුක්කු එතිරාක මිකවුම් මෝචමාන මුරෙයිල් කතෙත්තිරුක්කිරාර්. ඉතන්මූලම් ඉරණ්ටු නාටුකළුක්කුමිටෙයිලාන උරවුකළ් පාතික්කප්පටලාම්.

ඉන්තච් චකෝතරියින් මරණත්තෙ අරචියලාක්කි, මාණ්පුමිකු අමෙච්චර් ටිලාන් පෙරේරා අවර්කළුක්කු අවමානත්තෙ ඒර්පටුත්තලාම් එන්ර එණ්ණත්තිලේ අවරුක්කු එතිරාක ඉන්ත නම්පික්කෙයිල්ලාප් පිරේරණෙ කොණ්ටුවරප්පට්ටිරුන්තාලුම්, අවරුටෙය 25 වරුටකාල අරචියලිල් අවර් චෙය්ත චේවෙකළෙයුම් අවරුටෙය ආට්රල්කළෙයුම් ඉන්තච් චපෙයිලේ තෙළිවුපටුත්තුකින්ර ඔරු වාය්ප්පු ඉතනූටාක ඉන්රු ඔව්වොරු පාරාළුමන්ර උරුප්පිනරුක්කුම් කිටෙත්තිරුක්කින්රතු. අන්තවකෙයිල්, ඔරු නල්ල නාළාක අමෙන්තිරුක්කුම් ඉන්රෙය නාළිල් අවරුක්කු එන්නුටෙය වාළ්ත්තුක්කළෙත් තෙරිවිප්පතෝටු, අවර් එටුත්තිරුන්ත අන්ත නල්ල නටවටික්කෙකළුක්කාක නන්රියෙයුම් කූරි, විටෙපෙරුකින්රේන්.

[අ.භා. 6.45]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ - විළෙයාට්ටුත්තුරෙ අමෙච්චර්)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප හිතවත් ගරු ඩිලාන් පෙරේරා අමාත්‍යතුමාට විපක්ෂය විසින් විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන අවස්ථාවේ අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා.

අපේ ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ කථාවේදී කිව්ව ආකාරයට ඉතිහාසයේ මේ පාර්ලිමේන්තුවට ගෙන ආ විශ්වාස භංග යෝජනා ගැන අපි අහලා තිබෙන බව මුලින්ම කියන්නට ඕනෑ. එම විශ්වාස භංග යෝජනා ඉදිරිපත් කරපු සහ ස්ථිර කරපු පක්ෂවල ජ්‍යෙෂ්ඨයෝ, නායකයෝ ගැන අපි අහලා තිබෙනවා. ඒ විශ්වාස භංග යෝජනා ගෙන ආ කාරණා ගැන අපි අහලා තිබෙනවා. හැබැයි ඒ සියල්ලත් එක්ක බලපුවාම අද ගෙනැල්ලා තිබෙන විශ්වාස භංගය සහ මෙම විශ්වාස භංග යෝජනාවේ යෝජනාකරු සහ ස්ථිරකරු යන දෙදෙනා දිහා බලලා විපක්ෂය අද මෙම විශ්වාස භංග යෝජනාවට මොකක්ද කරන්නේ කියන එක මේ වෙන කොට තීරණය කරලාත් ඉවරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂය හැටියට අපි සියලු දෙනාම කනගාටු වෙනවා එම දැරියගේ මරණය පිළිබඳව. මෙවන් මරණ මීන් ඉදිරියට සිදු නොවන්න රජය මැදිහත් වන බවත්, කටයුතු කරන බවත් අපි ප්‍රකාශ කරනවා. ඒ සිද්ධිය පිළිබඳව අපි අවංකවම කනගාටු වෙනවා. හැබැයි අද ඉදිරිපත් කර තිබෙන සහ ස්ථිර කර තිබෙන මෙම යෝජනාවට විපක්ෂයෙන් කථා කරන ලැයිස්තුව බලන්න. වෙනදා විපක්ෂය වෙනුවෙන් හඬ නඟන ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අද කථා කරනවාද? අද ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කථා කරනවාද? අද ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කථා කරනවාද? අද ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කථා කරනවාද? අද ගරු තිස්ස අත්තනායක මහතා කථා කරනවාද? නැහැ. අද කථා කළේ යෝජනාවේ යෝජක, ස්ථිර කළ මන්ත්‍රීවරයා සහ එක්සත් ජාතික පක්ෂයේ pension ගිය පොලිස්කාරයෝ තුන්දෙනෙක් විතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවට එරෙහිව, ඇමතිවරයෙකුට එරෙහිව අද ගෙන ආ විශ්වාස භංග යෝජනාවේ ඡන්දය තව විනාඩි 10කින් ගන්නවා. මොකක්ද ඡන්ද ප්‍රතිඵලය? ආණ්ඩුවට ඡන්ද 162යි, විපක්ෂයට ඡන්ද 13යි. තමුන්නාන්සේලා මේ යෝජනාව ගෙන ආවත් රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, අද ඡන්දය දෙන්න තමුන්නාන්සේලාගේ පැත්තෙන් ඇවිල්ලා තිබෙන්නේ 13 දෙනයි. ඔබතුමාගේ විපක්ෂ නායකවරයාත් මේකට ඡන්දය දෙන්න ඇවිල්ලා නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(මාණ්පුමිකු ජෝන් අමරතුංග)
(The Hon. John Amaratunga)
ඇවිල්ලා ඉන්නවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
කොහේද? කොහාටද ඇවිල්ලා ඉන්නේ?

ගරු ජෝන් අමරතුංග මහතා
(මාණ්පුමිකු ජෝන් අමරතුංග)
(The Hon. John Amaratunga)
උඩ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
එතුමා කොහොමත් උඩ තමයි ඉන්නේ. එතුමා හිතාගෙන ඉන්නේ එතුමා ඉන්නේ උඩ කියලා. හැබැයි, හුහක් වෙලාවට එතුමා ඉන්නේ යට. එතුමාට දැනෙන්නේ නැහැ උඩද යටද කියලා. [බාධා කිරීමක්] එතුමා උඩට වෙලා චිත්‍රපට බලනවා. ඔබතුමාගේ විපක්ෂ නායකතුමා උඩට වෙලා games ගහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, දැන් බලන්න යූඑන්පී එකට අලුත් වීරයෝ ඇවිල්ලා. යූඑන්පී එක ඇදගෙන යන්නේ කවුද කියලා බලන්න, තමුන්නාන්සේලානේ. දැන් එක්සත් ජාතික පක්ෂයට අලුතින් නියෝජ්‍ය සංවිධායක කෙනෙක් පත් කරලා. එතකොට, අනුරාධපුරයේ පැරණි පාක්ෂිකයන් ඇදගෙන යන ගරු පී. හැරිසන්ලා කවුද? දැන් ඒ ගොල්ලෝ කැලේද? දැන් විපක්ෂයට නව නියෝජ්‍ය සංවිධායකයෙක් පත් කරලා. දැන් විපක්ෂයට

නියෝජ්‍ය සංවිධායකයෙක් පත් කරලා, අලුත් යෝජනා ගෙනැල්ලා තිබෙනවා. අලුත් වීරයෝ විපක්ෂයට ඇවිල්ලා තිබෙනවා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්ඩූමිකු දිලිප් වෙදආරච්චි)
(The Hon. Dilip Wedaarachchi)
රිසානා ගැන කථා කරන්න. [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්ඩූමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
රිසානා ගැන කථා කරන්න විපක්ෂ නායකතුමාට වැඩක් නැහැනේ. විපක්ෂ නායකතුමාත් එක්ක මම වෙනත් දෙයක් කථා කරන්නම්. එතුමාත් එක්ක රිසානා ගැන කථා කරලා වැඩක් නැහැ. ඒ නිසා අද තමුන්නාන්සේලා ගෙන ආ මෙම යෝජනාව ගැන කියන්න ඕනෑ. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා නියෝජ්‍ය සංවිධායකවරයා හැටියට අලුතින් පත් වීමක් ලබලා තිබෙනවා. තමුන්නාන්සේත් ඉතින් කලුතර දිස්ත්‍රික්කයේ හිටපු එක්සත් ජාතික පක්ෂයේ සියලුම පැරණි කට්ටිය එළවලා දාලා තමුන්නාන්සේ අද කලුතරින් නායකයෙක් හැටියට ඇවිල්ලා ලොකු වැඩක් කළා. හැබැයි, ඔබතුමා අමතක කරන්න එපා, ඔබතුමාගේ යෝජනාවට කථා කරන්න එපා කියලා සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සියලුම දෙනාට කිව්වා. තමුන්නාන්සේගේ යෝජනාවට කථා කරන්න එපා කියලා අද එතුමා සියලුම දෙනාට කිව්වා. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අද වැඩියෙන් හඬ නැඟුවේ ඔබතුමා. ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය කථා කළේ නැහැ තමුන්නාන්සේ වෙනුවෙන්. තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය අපිත් එක්ක කිව්වා, "මොනවා කථා කරන්නද, අඩු ගණනේ ඡන්දය දීපු අයවත් බලන්න එන්නේ නැති මන්ත්‍රීතුමා වෙනුවෙන් ඇයි මම කථා කරන්නේ?" කියලා. ඉතින් රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, තමුන්න්නාසේ වෙනුවෙන් ඡන්දය දීපු අය,- [බාධා කිරීමක්] දැන් විපක්ෂ නායකතුමා ඇවිල්ලා පොඩි ෂේප් න්‍යායක් දාන්න බලනවා. එතුමා හැමදාම එහෙමනේ. එතුමා හැමදාම එහෙම තමයි. ඒ, එතුමාගේ හැටි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්ඩූමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
What is your point of Order, ගරු අජිත් පී. පෙරේරා මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්ඩූමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා මගේ නම සඳහන් කරමින් - [බාධා කිරීම්] 2005 දී මහින්ද රාජපක්ෂ මහත්තයාට වැඩ නොකරපු කෙනෙක් තමයි අද මේ කථා කරන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා දැන් කථා කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්ඩූමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා නීති විද්‍යාලයට ශිෂ්‍යයෝ ඇතුළත් කරන්න වැඩිම පන්ති පවත්වන නීතිඥයා. මම අහනවා, මේ සැරේ ඔබතුමාගේ පන්තිවලින් කී දෙනෙක් pass ද කියලා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්ඩූමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
403 දෙනෙක්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්ඩූමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
500ක් විභාගයට ලිව්වා. 403ක් fail. ඇයි ඔව්වර තරහ ගන්නේ? [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇගේ වෛරය. ඇයි ඔව්වර තරහ ගන්නේ? ඔබතුමාගේ ශිෂ්‍යයෝ 500න් 430ක් fail. මම ඒක පිළිගන්නවා. ඒකට හකීම් ඇමතිතුමා පළි නැහැ නේ. ඔබතුමා ඒකට ජාතිවාදයක් හදලා මුස්ලිම් කට්ටිය වැඩි ලකුණු ගත්තාය කියලා පෙළපාළි යැව්වා. ඔබතුමාගේ පන්තියේ ළමයි fail කියලා අපි මොනවා කරන්නද? ගරු මන්ත්‍රීතුමා, ඒ නිසා මීට පස්සේ නීතිඥ විභාගයට ගන්නවා නම් අඩු ගණනේ අර විජයදාස මහත්මයා Law Entrance කළ විධියට එතුමාගෙන් අහලා හරි ඒක කරන්න. එහෙම නැත්නම් හරි අපරාධයක් වෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, -

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්ඩූමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
නාමල්?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්ඩූමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මොකක්ද සූජීව මන්ත්‍රීතුමා?

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්ඩූමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
නාමල්?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්ඩූමිකු මහින්දානන්ද අලුත්ගමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මොකක්ද නාමල් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය? ඔබතුමා කොහොමද විභාගය කළේ? ඔබතුමා විභාගය කළේ කොහොමද? මම ඒකත් කියලා දෙන්නද? ඔබතුමා විභාගය කළ හැටිත් මම කියලා දෙන්නද?

අපේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ මේ යෝජනාවේ තිබුණු අඩු පාඩු කීපයක් ගැන කියන්න ඕනෑ. පළමුවැනි අඩු පාඩුව තමයි ඔබතුමන්ලා මේකේ නීතිය පිළිබඳව අධ්‍යයනය කර නොතිබීම. දෙවැනි අඩු පාඩුව තමයි ඔබතුමන්ලා මේකේ හරි තොරතුරු ටික අරගෙන නොතිබීම. ඔබතුමන්ලා මේකේ නීතිය දන්නේ නැහැ. ඔබතුමා දැන් කිව්වා, මේ වන තුරු මේ ඒජන්සිකරු අත් අඩංගුවට අරගෙන නැහැ කියලා.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්ඩූමිකු රන්ජන් රාමනායක)
(The Hon. Ranjan Ramanayake)
මම කිව්වේ නැහැ. මම කිව්වේ 2011 වන තුරු අත් අඩංගුවට ගත්තේ නැහැ කියලායි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කිව්වා, ඒ ඒජන්සිකරු අත් අඩංගුවට අරගෙන නැහැ කියලා. ඔබතුමා කිව්වා, හිරේ දමලා නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමා, අද ඔබතුමා කිව්වා, ඔබතුමා කිව්වාට පස්සේ තමයි මේ ඔක්කොම කළේ කියලා. ඔබතුමා කිව්වා, කවුරුවත් ඒ වෙනුවෙන් රට යවලා නැහැ, අපේ තානාපතිවරු වැඩ කරලා නැහැ, රිසානාගේ දෙමව්පියෝ ගැන අපි බැලුවේ නැහැ කියලා.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විපක්ෂ නායකතුමාත් නොමහ යැව්වා. ඔබතුමා පක්ෂයත් නැති කළා. ඔබතුමා යූඑන්පී එකත් විනාශ කළා. ඔබතුමා මුළු විපක්ෂයම නැති කළා, මේ යෝජනාවක් ගෙනැල්ලා. මුළු විපක්ෂයම ඔබතුමා ඉවර කළා. එහෙම නේද? ඔබතුමා තමයි යෝජනාව ස්ථිර කළේ. ඔබතුමා අර ඊයේ පෙරේදා promotion එක ගහපු මන්ත්‍රීතුමාට ලණුව දීලා යෝජනාකරු කියලා එතුමාගෙන් අත්සන් කර ගත්තා. ඔබතුමා කෙළින්ම සජිත් මන්ත්‍රීතුමාත් එක්ක agreement එකක් ගැහුවා. දයාසිරි මන්ත්‍රීතුමාට ලැබෙන්න තිබුණු නියෝජ්‍ය සංවිධායකකම අජිත් මන්ත්‍රීතුමාට ගියා. ඔබතුමා සජිත් මන්ත්‍රීතුමා එක්ක agreement එකක් ගහලා ඔබතුමාගේ යෝජනාව දුන්නා, අජිත් පෙරේරා මන්ත්‍රීතුමාට. එතුමා ලණුව කෑවා. අජිත් මන්ත්‍රීතුමාගේ ශිෂ්‍යයින් 500න් 430ක් fail වාගේම මේ ලණුවත් කෑවා. එතුමා මේකට අත්සන් කළා.

ගරු මන්ත්‍රීතුමා, අපි ආණ්ඩුවක් හැටියට මේ දැරිය වෙනුවෙන් කරන්න පුළුවන් සියලු දේ කළා. අජිත් පෙරේරා මන්ත්‍රීතුමා මේක හොඳට මෙහෙයවුවා. නමුත් එතුමා බොහොම පහත් විධියට කරුණු කියන්න ගත්තා. අපිත් මේක ගොඩින් බේරා ගන්න ගියේ. අවසානයේ යම් යම් දේවල් අපේ අයටත් කියන්න සිද්ධ වුණා. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ සහෝදරිය ගැන කථා කළා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මට ඔබතුමාට එක දෙයක් කියන්න පුළුවන්. අපි දේශපාලනඥයෝ හැටියට මොන දේ කථා කළත් මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ අවංක දේශපාලනඥයෝ. ඒ නිසා ඩිලාන් පෙරේරා කියන චරිතයට මේ පාර්ලිමේන්තුවේ 225ම අත උස්සලා එතුමා දූෂණය නැති අවංක අමාත්‍යවරයෙක් කියන සහතිකය ලබා දෙනවා. ඒක මම නොවෙයි කියන්නේ. ඒක අහන්න සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගෙන්; ඒක අහන්න ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාගෙන්; ඒක අහන්න තිස්ස අත්තනායක මහත්මයාගෙන්; ඒක අහන්න ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාගෙන්. මේ ඔක්කොම මේ ගැන කථා කළේ නැත්තේ ඩිලාන් පෙරේරා කියන්නේ අවංක දේශපාලනඥයෙකු නිසායි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කථා කළා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එතුමා කථා කළාට බැන්නේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා ඉතින් බයිස්කෝප් කථා නේ කියන්නේ. අපි ඕවා ගණන් ගන්නේ නැහැ. අමතක කරන්න එපා, අද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පනස් ගණනක් ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාත් එක්ක එකට ආ බව. ඒ වෙන මොකුත් නිසා නොවෙයි.

ඩිලාන් පෙරේරා කියන්නේ මේ පාර්ලිමේන්තුවට, මේ රටට අවශ්‍ය කරන අවංක දේශපාලනඥයෙක් නිසා. [බාධා කිරීමක්] ඔබතුමාගේ නායකයාගෙන් - රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙන් - අහන්න ඩිලාන් පෙරේරා කියන්නේ කවුද කියලා. ඩිලාන් පෙරේරා කියන්නේ අවංක දේශපාලනඥයෙක් නොවෙයිද කියා රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙන් අහන්න. එතුමාත් පිළිගන්නවා, ඩිලාන් පෙරේරා කියන්නේ අවංක දේශපාලනඥයෙක්ය කියන එක. ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙවැනි යෝජනාවක් ගෙනාවත්, ගරු විපක්ෂ නායකතුමා ප්‍රමුඛ සියලු දෙනා පිළිගන්නවා, ඩිලාන් පෙරේරා කියන්නේ හොඳ චරිතයක්ය කියන එක. ඒ නිසා කරුණාකරලා මඩ ගහන්න එපා. තර්කානුකූලව, ලියවිලි සහිතව අපි ඕනෑම දෙයක් ගැන කථා කරමු. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා එතුමාගේ සහෝදරිය ගැන කථා කළා. තමන්ගේ සහෝදරයා අමාත්‍යවරයෙක් වුණු පමණින් සහෝදරියට රක්ෂාවක් කරන්න බැරිද? එතුමිය රක්ෂා දෙකක් කරනවාය කියා ඔප්පු කරන්න අවශ්‍ය කරුණු දැන් සභාගත කළොත් මම අද ක්‍රීඩා ඇමතිකමෙන් අයින් වෙනවා. හැබැයි දැන් සභාගත කරන්න ඕනෑ. එතුමිය පඩි දෙකක් ගන්නවාය කියා ඔප්පු කරන්න අවශ්‍ය කරුණු දැන් සභාගත කළොත් ක්‍රීඩා ඇමතිකමෙන් මම දැන් ඉල්ලා අස් වෙනවා. ඒ නිසා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[අ.භා. 6.56]

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1994 වර්ෂයේ මල්බෙරි සගයෙක් හැටියට අප සමඟ පාර්ලිමේන්තුවට ආපු, මේ දක්වා අවංකව කටයුතු කරන ඩිලාන් පෙරේරා ඇමතිතුමාට මේ වාගේ අභූත චෝදනා නගමින් කටයුතු කිරීම සම්බන්ධයෙන් පළමුවෙන්ම මම මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. අපේ නළු මන්ත්‍රීතුමා කිව්වා රිසානා නෆීක්ගේ මරණය සම්බන්ධයෙන් ඩිලාන් පෙරේරා ඇමතිතුමා සහභාගි වුණේ නැහැ කියා. ඩිලාන් පෙරේරා ඇමතිතුමා ඇයගේ ගෙදරට ගියා. ඒ බව සනාථ කෙරෙන ඡායාරූප මම **සභාගත*** කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ මේ කාරණය. ඒ මන්ත්‍රීතුමා කිව්වා තුංගසිරි මහත්මයා ගෙනාවාය කියලා. තුංගසිරි මහත්මයා කළු නූලක් බැඳගෙන ඉඳලා ඒක අයින් කරන්න ගිහිල්ලායි එහෙම වුණේ කියලා තානාපතිතුමාට යවපු ලිපිය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා. [බාධා කිරීමක්] නිකම් ඉන්න ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරපු ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ පානදුර උසාවියේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නීතිඥවරයෙක් හැටියට මගේ වෘත්තියේ යෙදීම පිළිබඳව අපහාසාත්මක ආකාරයට අසත්‍ය කරුණු ප්‍රකාශ කළා. ඒ කරුණු හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝගවලට පටහැනි යම් කාරණයක් සඳහන් වී ඇත්නම් එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙසට නියෝග කරනවා.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
එතුමාට නඩු හම්බ වෙන්නේ නැහැ. කෙසෙල් කැන් හොරකම් කරපු නඩුයි, පොල් හොරකම් කරපු නඩුයි තමයි එතුමාට හම්බ වෙන්නේ. ඒ නඩුවක් දිනා ගන්නවත් බැරි නීතිඥයෙක් තමයි එතුමා. අද මෙතැන ඉන්න ඒ පක්ෂයේ ජොෂ්ඨ, දක්ෂ මන්ත්‍රීවරයකු වන දයාසිරි ජයසේකර මැතිතුමා පක්ෂයේ කටයුතු කරගෙන යනකොට එතුමාට ලැබිය යුතු නියෝජ්‍ය සංවිධායක ධුරය නැති කරලා ලකුණු දමා ගන්න තමයි මේ වාගේ යෝජනා මේ සභාවට ගෙනාවේ කියන එක මතක් කරන්න ඕනෑ. ඒ අභිංසකයන්ගේ බෙල්ල කපලා ඒ අයගේ ජොෂ්ඨත්වයට, ඒ අයගේ දක්ෂතාවට තැන දෙන්න අරින්නේ නැතිව මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වැඩ කරන්න එපාය කියා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම ඩිලාන් පෙරේරා කියන්නේ අවුරුදු 25ක් දේශපාලනය කරපු, ඌව පළාතේ විශිෂ්ඨ දේශපාලනඥයෙක් බව කියන්න ඕනෑ. මාර්ෂල් පෙරේරා මැතිතුමාගේත්, දයා පෙරේරා මැතිනියගේත් ආදරණීය පුත්‍ර ඩිලාන් පෙරේරා මැතිතුමා අවංකකමේ ප්‍රතිමූර්තියක්ය කියා අපි මේ අවස්ථාවේදී සහතිකයක් දෙනවා.

අපේ නළු මන්ත්‍රීතුමා ගැන කථා කරන්න ඕනෑ නැහැ. එතුමා රත්නපුරේ පැත්තේ යන්නේ නැහැ. විදේශවල සිටින අයත් එක්ක එතුමාගේ තිබෙන සම්බන්ධය මොකක්ද? විදේශ රටවලට ගිහින් සින්දු කියලා ඒ අයගෙන් සල්ලි ටික එකතු කරගෙන එනවා. ගරු මාලනී ෆොන්සේකා මන්ත්‍රීතුමිය පැහැදිලිව කිව්වා, ඒ අය ගිහිල්ලා විදේශිකයන් පිනවන්න අවස්ථා ලබා ගෙන ඒ විධියට කටයුතු කරන්නේ නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ගිහින් මොකක්ද කරන්නේ? තමුන්නාන්සේ ගිහින් පදනමටය කියා, පිට රටට ගිහින් දුක් විඳින අභිංසක මිනිස්සුන්ගෙන් සල්ලි එකතු කරගෙන එනවා. ඒ නිසා මේ වාගේ කැත වැඩ කරන්න එපාය කියා මේ අවස්ථාවේදී මතක් කරනවා.

ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කළා මේ සම්බන්ධයෙන් - [බාධා කිරීමක්]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order, Hon. Member?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ රැකියාව කලා වෘත්තිය. මට කථා කරනවා -[බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ඒ කලා වෘත්තියෙන් අතරමං කළ අය ගැන මගෙන් අහන්න එපා. [බාධා කිරීම්] අතරමං කළ අය ගැන මගෙන් අහගන්න එපා. [බාධා කිරීම්]ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, මේ දඬුවම රජ්ජුරුවන්ටවත් නවත්වන්නට බැහැ කියා. එතුමා පිළිගත්තා, කථා කරන ගමන්ම. එහෙම නම් කොහොම ද ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා මේක නවත්වන්නේ? එතුමා කිව්වා, මේකට වග කියන්නට ඕනෑ විදේශ ඇමතිතුමාය කියා. නඩුව විභාග කළේ කවදා ද? අභියාචනා ඉදිරිපත් කළේ කවදා ද? ඒ කාලයේ හිටපු විදේශ ඇමතිවරයා කවුද? මංගල සමරවීර මන්ත්‍රීතුමා ද ඒකට වග කියන්නට ඕනෑ කියා මා අහන්නට කැමතියි.[බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථාව අවසන් කරන්න.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
විශේෂයෙන් ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා ඌව පළාතෙන් බිහි වූ අවංක, විශිෂ්ටතම දේශපාලනඥයකු බව මතක් කරමින්, විසිපස් වසරක දේශපාලන ජීවිතයට එතුමාට සුබ පතමින් මම නතර වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The Hon. J. Sri Ranga please. You have three minutes.

[பி.ப. 7.01]

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

இன்று இச்சபையிலே வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர் மாண்புமிகு டிலான் பெரேரா அவர்களுக்கு எதிராகக் கொண்டுவரப்பட்டுள்ள நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். எனக்கு முன்னர் மாண்புமிகு நீதியமைச்சர் அவர்கள் இந்த நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பாக உரையாற்றியபொழுது, சவூதி அரேபியாவில் றிஸானா நபீக் என்பவருக்கு எதிராகத் தீர்ப்பளிக்கப்பட்டபொழுதோ அல்லது அந்தத் தீர்ப்புக்கு எதிராக மேன்முறையீடு செய்யப்பட்டபொழுதோ வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சு என்பது இருக்கவில்லை என்பதைச் சுட்டிக்காட்டியிருந்தார். அது மாத்திரமன்றி, சிறுபான்மையினம் சம்பந்தப்பட்ட இந்த நம்பிக்கையில்லாப் பிரேரணைக்குச் சார்பாக எந்தவொரு முஸ்லிம் பாராளுமன்ற உறுப்பினரும் உரையாற்றவில்லை. அதேநேரம், தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர்களும்கூட இப்பிரேரணை தொடர்பான வாக்கெடுப்பில் கலந்துகொள்ளமாட்டார்கள் என்பதையும் அறியக்கூடியதாகவிருக்கின்றது.

உண்மையிலே, இத்தகைய விடயங்கள் தொடர்பில் சிறுபான்மை இனத்தவர்களையும் சேர்த்துக் கலந்துரையாடி அவற்றினை முன்னெடுத்துச் செல்வது இன்றைய காலத்தின் கட்டாய தேவையாக இருக்கின்றது. பொதுவாக இன்று இனங்களுக்கிடையிலும் மதங்களுக்கிடையிலும் பல பிரிவினைகள் ஏற்படுத்தப்பட்டு வருகின்றன. இவை அனைத்தையும் தடுத்து நிறுத்தவேண்டிய கடப்பாடு இந்தச் சபைக்கு உண்டு. முந்திய காலகட்டத்தில இந்தச் சபையில் இத்தகைய பிரிவினைவாதத்துக்கு இடமளித்ததன் விளைவாகவே கடந்த முப்பது வருட காலமாக இந்த நாட்டிலே யுத்தம் நடைபெற்றது. மீண்டும் மீண்டும் அதேபோன்ற நிலைமை ஏற்படாமல் இருப்பதற்கான நடவடிக்கைகளில் இந்தச் சபை முன்னுதாரணமாகத் திகழவேண்டுமென நாங்கள் கேட்டுக்கொள்கின்றோம்.

[අ.භා. 7.03]

ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙච්චර කල් බයිස්කෝප්වල ජෝක් බැලුව අපට අද පළමුවන වතාවට පාර්ලිමේන්තු ජෝක් එකක් බලන්න පුළුවන් වුණා. රන්ජන් රාමනායක අපේ රංගන ශිල්පියා පාර්ලිමේන්තුවට ආවාට පස්සේ, පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවක් ගෙන එන්නේ මොන වාගේ කාරණාවකට ද කියා නොදන්නා කෙනෙක් බව අද ඔප්පු කළා. විශ්වාස භංග යෝජනාවක් ගෙන එන්නේ මොන වාගේ දේශපාලන හේතු මත ද කියා නොදන්නවා නම්, එක්සත් ජාතික පක්ෂයේ මේ ඉදිරි පෙළ ඉන්න අයගෙන් අහගන්න. [බාධා කිරීම්]

අර මොරටුවේ ස්වාමීන් වහන්සේ නමක් අපවත් වුණා. ඒක මිනී මරුමක්. මෙහෙම විශ්වාසභංග යෝජනා ගෙන එනවා නම්, ඒකටත් බුද්ධ ශාසන අමාත්‍යතුමාට විරුද්ධවත් විශ්වාසභංග යෝජනාවක් ගෙන එන්න තමුන්නාන්සේලාට පුළුවන්. මේ රටේ මිනිහෙකුට ලෝකයේ කොහේ හෝ මොනවා හෝ වෙනවා නම් ඒකටත් විශ්වාසභංග යෝජනා ගෙන එන්නට පුළුවන් නම් මේ රටේ සිද්ධ වෙන හැම එකක්ම අල්ලා ගෙන විශ්වාසභංග යෝජනා ගෙන එන්න පුළුවන්. මෙහෙම විශ්වාස භංග යෝජනා ගෙනෙන සිරිතක් නැහැ. නොදන්නා හත්වලාමවල් කරන්න ගිහින් හත් පොළේම ගා ගෙන තිබුණු දේශපාලන පදනමත් නැති කර ගන්නේ නැතිව දෙයියනේ කියලා අනාගතය ගැනවත් හිතලා මොනවා හෝ එලක් ප්‍රයෝජනයක් තිබෙන දෙයක් කරන්න නැණ නුවණ -ඥානය- අදවත් පහළ වේවා!

ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමාත්, මාත් අතර දේශපාලන විසංවාද තිබෙනවා. ඒ මොනවා තිබුණත් එතුමා අමාත්‍යවරයෙකු විධියට මේ කාරණයේදී ඉතාම නිවැරදිව කටයුතු කර තිබෙනවාය කියන සහතිකය අප දෙනවා. තමුන්නාන්සේලා එක උදව්වක් කළා. ඩිලාන් පෙරේරා ඇමතිතුමා වෙනුවෙන් මටත් කථා කරන්න අවස්ථාවක් නිර්මාණය කර දුන්නා. ඒ සම්ගිය ඇති කරන්න උදව් කළ ඒ දෙබෑයන්ට -යෝජනාව ගෙනාව හා ස්ථිර කළ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දෙකට- මා ස්තුති කරනවා. මේ චිත්‍රපටයේ නම "හරිම බඩු දෙකක්". එක්සත් ජාතික පක්ෂයේත් භේදයක් ඇති කළා. අනේ! මේ ඉදිරි පෙළ නියාමකයෝ ඔක්කොම 'දෙයියනේ මේ මොන ගොන් තකතීරු වැඩක් ද කළේ ' කියා හිත හිතා කට බලියා ගෙන ඉන්නවා. ඊළඟට TNA එක ආ ගිය අතක් නැහැ. පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ නියෝජිතයා ඇවිල්ලාවත් නැහැ. විරුද්ධ පක්ෂයේ " යං තං සන්තං පදං අභිසමෙච්ච " වාගේ සමගියක් තිබුණා නම් ඒකත් නැති කළා. මේක හත්පොළේ ගා ගත්තු විශ්වාස භංගයක්. අනේ! මටත් කරුණාකර මෙහෙම විශ්වාස භංගයක් හැකි ඉක්මනින් ගෙන එන ලෙස යෝජනා කරමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා. [බාධා කිරීම්]

[7.05 p.m.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Hon. Deputy Speaker, today, we are going to conclude the Debate on the Vote of No Confidence on the Hon. Dilan Perera as the Minister of Foreign Employment Promotion and Welfare.

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

No, you cannot mention his name.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

I have to mention his name, Hon. Minister. - [*Interruption*.] Anyway, this is not a Motion against only the Hon. Dilan Perera but also against the Ministry itself, which had failed to protect Rizana Nafeek. So, that is the issue.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

As the Minister who takes responsibility, he is also - [*Interruption*.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

There has been a Debate today, where many of you have spoken to defend the Hon. Minister. What have you done? You had three speakers to throw mud at the Members who proposed and seconded this Motion. It is a shame! I was ashamed to sit in this House when the Hon. Rohitha Abeygunanwardena spoke. - [*Interruption*.] He was only speaking about the Mover of the Motion and not about the proposal. Then, we heard two others, the Hon. Minister of Sports and the Hon. Jagath Pushpakumara. They were both only throwing mud at others and not talking anything useful. We also heard the honourable Professor of Law - Minister of External Affairs - and the Minister of Justice. They were both speaking -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

තමුන්නාන්සේ නියෝජනය කරන්නේ වතුකරය නේද? [බාධා කිරීම්] වතුකරයේ ජනතාවට ඉංග්‍රීසි තේරෙනවාද?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

ඔබතුමාට තේරෙන්න තමයි කථා කරන්නේ. වාඩි වෙන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

ඔබතුමා තේරුම් ගන්න. ඔබතුමාට ඉංග්‍රීසි තේරෙන්නේ නැත්නම් සිංහලෙන් කියන්නම්. [බාධා කිරීම්] වාඩි වෙන්න. ටයි කෝට් ගැහුවාට ඉංග්‍රීසි තේරෙන්නේ නැත්නම් සිංහලෙන් කියන්නම්.

The Hon. Minister of External Affairs and the Hon. Minister of Justice were talking about the process of getting pardon for Rizana from the King of Saudi Arabia, the letter written by His Excellency the President, his meeting the Crown Prince and other processes. But, this is not what we are talking about.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Then, what are you talking about?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

The three Members who spoke on this - the Member who moved it, the Member who seconded it and the Hon. Joseph Michael Perera - spoke about the issue behind the execution of Rizana Nafeek.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

Hon. Member, you do not know what you are talking about at all. - [*Interruption*.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

When this incident happened in 2005 and when the case was filed in 2006, there were issues. One issue was that that child was less than 18 years old, a juvenile, accused and she had certain rights. Did this Government do anything to counter that in the courts of law? - [*Interruption*.] The case was filed in 2006. A verdict in a primary court was given in 2007 and the final order of the High Court was given in 2010. During this period, did you take up the juvenile nature of this accused in court? You did not; you failed to do it. - [*Interruption.*] Then, where is your defence? All this time, you all shouted unworthy things. Did you show that you did take this up in court? You did not show it.

The second issue is about the death of this infant. The housemaid was accused of having strangled the child to death.

To prove that this child was strangled, there should have been a postmortem report which should have been challenged, which should have been asked for by the lawyers who appeared for this country on behalf of Rizana Nafeek. But, you have not shown that you did put this forward. In this way, you have failed to fight the case of Rizana in the courts of Saudi Arabia in a proper manner. So, you have failed and this is what we are accusing you of.

The third is, during the period of the trial, if you had acted against the agent who sent this child abroad or the person who got the false passport done, if you had convicted them - [*Interruption.*] They were taken to jail in 2010. If they were taken to courts in 2007 or at least before 2010 when the appeal was being heard, then you would have had a chance of winning this case on behalf of Rizana. But, you failed to do that. After all that, what do you do? You come here and throw mud at those people who are trying to point this out. Do you know why we brought in this Motion? We brought in this Motion in order to focus on the issues that are happening in the Middle East. Your Government is dependent on the monies remitted by these poor workers in the Middle East. But, you failed to look after them. Even today, in Saudi Arabia, more than 1,300 people are suffering. What is the action you are taking? You are collecting more than Rs. 6 billion every year as Foreign Employment Bureau charges. But, to what extent are you looking after these people? They are the people who are sustaining this economy. You have failed them and that is why we brought in this No-Confidence Motion against the Hon. Dilan Perera or the Ministry of Foreign Employment

[ගරු ආර්. යෝගරාජන් මහතා]

Promotion and Welfare and your Government. We cannot debate a Motion against your Government in a day. We will have to meet for 10 days because there are so many accusations that we have to make against you. Further, to bring in a No-Confidence Motion against you, we will have to print a large book to file that Motion.

Under these circumstances, we ask you to look at this issue afresh, so that at least there are no more Rizana Nafeeks who will be executed in the Middle East because of your inaction. I feel you have not answered the queries raised by the Opposition and as such you should all support this Motion. Thank you.

[අ.භා. 7.13]

ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)

(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)

(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ පාර්ලිමේන්තුවේ විවාද වන මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳව මම පිළිතුරු කථාව කරන්නේ ඉතාම මිශ්‍ර හැඟීමකින් යුක්තව. විශ්වාස භංග යෝජනාව ගෙන ආ දිනයේ සිටම මා දැනගෙන සිටියා, මේ රජයේ අපට තිබෙන ශක්තිය අනුව මේ විශ්වාස භංග යෝජනාව පරාජය කරන්නට අමාරු නැති බව. හැබැයි මගේ හිත නිරන්තරයෙන් මගෙන් අහපු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය තමයි, අවුරුදු විසි පහක් දේශපාලනය කරලා, මටම කියලා ගෙයක් හදා ගන්න බැරිව, තවමත් සමහර වෙලාවට මගේ තාත්තාගේ සාක්කුවෙන් එදිනෙදා ජීවත් වෙන්න සල්ලි ඉල්ලන මට - මේ ගැන මට වඩා හොඳට හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා දන්නවා- පෞද්ගලිකවම එල්ල කරලා මේ වාගේ විශ්වාස භංග යෝජනාවක් ගෙනාවේ ඇයි කියන එක. ඒකයි මම කිව්වේ, මම කථා කරන්නේ මිශ්‍ර හැඟීමෙන් කියලා.

මම දේශපාලනයට එනවාට මගේ තාත්තා කැමැති වුණේ නැහැ. මා දේශපාලනයට ගන්න 1988 දී බදුල්ලට ගිය ඩිව් ගුණසේකර ඇමැතිතුමා අද කිව්වා, මා දේශපාලනයට ගන්න මගේ තාත්තාගෙනුයි, මගේ අම්මාගෙනුයි කැමැත්ත ගන්න කොච්චර අමාරු වුණාද කියලා. ඒ වන කොට මම ශ්‍රී ලංකා පරිපාලන සේවා විභාගයෙන් සමත් වෙලා, පරිපාලන සේවයට යන්න, සිරිවර්ධන කියන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති පරිපාලන සේවයට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලංකාවේ පළමුවන ස්ථානයට පත් වුණා. සරත් අමුණුගම ඇමතිතුමා දන්නවා, ඒ ලේකම්තුමාගෙන් ලකුණු ගන්න කොච්චර අමාරුද කියලා. ඒ වන කොට මා විදේශ සේවා විභාගයෙන්ද සමත් වුණා. මටත්, බ්‍රැඩ්මන් වීරකෝන් මහත්තයාගේ පුතා ඇසළ වීරකෝන් මහත්තයාටත් තමයි - එතුමා දැන් ඉන්නේ වොෂින්ටන් නුවර - විදේශ සේවාවට බැඳෙන්න ලියුම් ආවේ. මම ඒ Diplomatic Service එක අත හැරලා, පරිපාලන සේවය අත හැරලා, නීතිඥ වෘත්තිය අත හැරලා දේශපාලනයට එනවාට මගේ තාත්තායි අම්මායි අකමැති වුණේ, ඒ දවස්වල පළාත් සභා මැතිවරණයට තරග කළ කට්ටිය තරගයට මරපු නිසා. තරගයට මැරුවා. එක්සත් ජාතික පක්ෂයෙන් මැරුවා; ජනතා විමුක්ති පෙරමුණෙන් මැරුවා. හැබැයි මම දන්නවා, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා අද මේ විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් ගන්න තීන්දුව ගැන. නමුත් එහෙම වුණාට මම ඒ ගැන පටුවෙන් හිතන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණෙන් නම් මා මරන්න ආවේ නැහැ. මම දන්නේ නැහැ, ඒ මගේ තාත්තා ජේවීපී එක සමඟ තිබුණ සම්බන්ධය නිසාද කියලා. හැබැයි යූඑන්පී එකෙන් තුන් පාරක් මා මරන්න උත්සාහ කළා. ඒ 1988 දී, මට අවුරුදු විසිපහේදී, මම පළාත් සභා මැතිවරණයට තරග කරන වෙලාවේදී. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය මා කෙරෙහි විශ්වාසය භංග වීම ගැන මා පුදුම වෙන්නේ නැහැ. විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා නොවෙයි, මා මරලා දේශපාලනයෙන් අයින් කරන්නයි ඒ දවස්වල එක්සත් ජාතික පක්ෂයේ සමහරුන්ට වුවමනා කරලා තිබුණේ. මා මරලා දේශපාලනයෙන් අයින් කරන්න උත්සාහ කරපු එක්සත් ජාතික පක්ෂය මට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා මේ විධියට මඩ ගහන එක ගැන මම පුදුම වෙන්නේ නැහැ. මම පසු ගිය අවුරුදු විසිපහම ජීවත් වුණේ බෝනස්වලින්.

මගේ අම්මා 1988 දී වැඩිපුර හිටියේ පන්සල්වල. මගේ තාත්තා කතෝලිකයෙක්. අම්මා බෞද්ධ. මගේ තාත්තා පල්ලි යන්නේ නැහැ. යන්නේ නත්තල් දවසට විතරයි. ඒත් අපි එක්ක ගෙන ගියොත් විතරයි. තාත්තාගේ ඥාතීන් හිටියේ පල්ලිවල. ඒ වෙන මොකකටවත් නොවෙයි. ඡන්දය දිනන්න කියලා නොවෙයි. "මේකා මැරෙන්න එපා" කියලා ප්‍රාර්ථනය කරන්නයි. එදා සිට අද වන තෙක් අවුරුදු විසිපහක් මා දේශපාලනය කළේ අඛ මල් රේණුවක් තරමින්වත් ජනතාවගේ සල්ලිවලට අත තියන්නේ නැතුව. හාලි ඇළ ප්‍රාදේශීය සභාවේ විපක්ෂයේ නායකතුමා ඉන්නවා, යූඑන්පීයේ. ඒ ගැන අහන්න, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගෙන්. හාලි ඇළ ප්‍රාදේශීය සභාවේ විපක්ෂයේ යූඑන්පී මන්ත්‍රීවරුන් ඉන්නවා, පස් දෙනෙක්. ඒ හය දෙනාම අද අඬනවා. ඒ අඬන්නේ ඩිලාන් පෙරේරා කියන සන්ධානයේ දේශපාලනඥයාට ගහනවාට නොවෙයි. හාලි ඇළ ප්‍රදේශය තුළ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අවංකව වැඩ කරන හාලි ඇළ මනුෂ්‍යයෙකුට ගහන එකට. හෙටත් ඒ මිනිස්සු ඡන්දය දෙන්නේ හරින් ප්‍රනාන්දුට. මට ඡන්දය දෙන්නේ නැහැ. මට හිතා ගන්න බැරි ඒකයි. ඇයි, මේ රටේ අවංකව දේශපාලනය කරන්න එපාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේ වරුවේ මගේ සහෝදර මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා දහඩිය දාගෙන, මහ පාරේ සිටියා. ඒ විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ගෙනාපු සෙනහ නොවෙයි. එතැන කාර්යාංශයේ අයත් සිටියා. වරායේ අයත් සිටියා. බදුල්ලේ අයත් හිටියා. හාලිඇළ අයත් හිටියා. මොනරාගල අයත් හිටියා. රත්නපුරේ අයත් හිටියා. සල්ලි දීලා ඒ අය ගෙනෙන්න මට ඕනෑ නැහැ. ඇයි ඒ? තවම මා කෙරෙහි බදුල්ල දිස්ත්‍රික්කයේවත්, මේ ගරු සභාවේවත් විශ්වාසය භංග වෙලා නැති නිසා. අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු හදවතට තට්ටු කර කර ඉන්නේ. මා දන්නවා කීප දෙනෙක් මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව නැගිටින්නේ හිතේ මහා බරක් ඇතිව බව. හැබැයි නැගිටින්න. නැත්නම් ඔබතුමන්ලාගේ බෙල්ල කැපෙනවා. නැගිටින්න, නැත්නම් බෙල්ල කැපෙනවා. අඩු තරමින් යූඑන්පී එකේ මන්ත්‍රීවරු හය දෙනෙකු ඉන්නවා, මන්ත්‍රීවරියන් දෙදෙනෙකුත් එක්ක. ඒ අය නැගිටින්නේ හිතේ බරක් ඇතිව. තිස්ස අත්තනායක මහ ලේකම්තුමාත් හිතේ පොඩි බරක් ඇතිව තමයි නැගිටින්නේ. එතුමා දන්නවා මා කවුද කියලා. එතුමා මගේ ඉතිහාසය දන්නවා; වර්තමානය දන්නවා. මෙතැන ඉන්න යූඑන්පී එකේ මන්ත්‍රීතුමන්ලා කී දෙනෙකුට විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රශ්න මතු වුණාද? ඒවා කියන්න හොඳ නැහැ, මේ මන්ත්‍රීවරු මට බණිනවා. Telephone calls දුන්නාම පැය 24ක් තුළ උදව් කරලා තිබෙනවා. මම ඒ අයගේ නම් කිව්වොත් ඒගොල්ලන් හෙට කැපෙනවා. ඒ නිසා මම ඒ අයගේ නම් කියන්නේ නැහැ.

තිස්ස අත්තනායක මහ ලේකම්තුමනි, ප්‍රශ්නයක් මතු වුණා කාර්යාංශයේ සමවාදී සංගමයේ ලේකම්තුමාට. සජිත් ප්‍රේමදාස

මැතිතුමනි, මා පොරොන්දු වුණා "දැයට කිරුළ" ඉවර වුණු වහාම ඒක නිවැරදි කරනවා කියලා. ඒක නිවැරදි කළා. මා කියන්නේ, මට එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්ද ඕනෑ නැහැ. මට එක්සත් ජාතික පක්ෂයෙන් විශ්වාස භංග යෝජනා 10ක් ගෙනෙන්න. හැබැයි, ඩිලාන් පෙරේරාගේ ප්‍රතිපත්තිමය දේශපාලන ගමන අබ මල් රේණුවකකින්වත් හරවන්නේ නැහැ කොයි පැත්තකටවත්. නමුත් දේශපාලනය හරියට කරන මිනිසුන් මේ විධියට මානසිකව වට්ටන්න උත්සාහ කරන්න එපා. ඩිලාන් පෙරේරා මානසිකව වැටෙන්නේ නැහැ. වට්ටන්නත් බැහැ. ගහන්න ගහන්න අපි නැගිටිනවා. අපි රත්තරන්.

අනෙක් එක, මානව හිමිකම් සම්බන්ධව ජිනීවාවලට ලංකාවට එරෙහි යෝජනාව ගෙනාවේ ඇමෙරිකාව නොවෙයි, ඊශ්‍රායලය කියලා කියපු එක්සත් ජාතික පක්ෂයේ සමහර අය තමයි මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ. එක්කෙනෙකු පත්තරේට කියලා තිබුණා. -ඔහු මහ ලොකුවට දන්නා, කයිවාරුකාරයා- එයා කියලා තිබුණා, "ලංකාවට එරෙහිව ජිනීවාවලට යෝජනාව ගෙනාවේ ඊශ්‍රායලය" කියලා. තෑන්කිව්! වෙන මොකක්ද ඒ ගැන කියන්න තිබෙන්නේ? මා ආවේගශීලි වන්නේ නැහැ. මොකද මගේ දේශපාලන ගමනට ඊයේ දිනයට අවුරුදු 25ක්. මේක මේ දෙබෑයන් විසින් මට දුන්නු ලොකුම තෑග්ගක්. ගරු විමල් වීරවංශ ඇමතිතුමා කිව්වා වාගේ මේක දෙබෑයන්ගේ වැඩක්. එක්කෙනයි හිටියේ. ජෝකර් විතරයි හිටියේ. ඒ ලණුව කෑවා අනෙක් අය. අනෙක් එක්කෙනා එකතු වුණේ, රිසානා වෙනුවෙන් ඉදිරිපත් වුණු සභාව කල් තැබීමේ යෝජනාව වෙලාවේ මේ පාර්ලිමේන්තුවේදී මා එයා ගැන ඇත්ත කියපු නිසා. බොදු බළ සේනාව ජාතිවාදයෙන් උන්මාදයට ගෙනෙන්න මුලින්ම පාර කැපුව කෙනා කවුද කියන ඇත්ත මා රිසානා නෆීක් වෙනුවෙන් ගෙනා සභාව කල් තැබීමේ යෝජනාවේදී මේ පාර්ලිමේන්තුවේදී කිව්වා. ඒ කිව්ව නිසා තමයි ජෝකර්ට ඒ බෑයා එකතු වුණේ. බොදු බළ සේනාව මුලින්ම ගියේ Law College එකේ ගේට්ටුව ළඟට. ඒක පත්තු කළේ කවුද? අද මේ යෝජනාව ගෙනාපු කෙනා. ඒ වෙනින් කවුරුත් නොවෙයි, එයා. මා ඇත්ත කිව්ව නිසා තමයි එයා ද්වේෂයෙන් මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ. වෙන එකක් නිසා නොවෙයි.

ඒ නිසා මට මෙච්චරයි කියන්න තිබෙන්නේ, මම උත්තර දෙන්න යන්නේ නැහැ. මට සහතිකය දීලා තිබෙනවා රිසානා නෆීක්ගේ අම්මා; රිසානා නෆීක්ගේ තාත්තා; රිසානා නෆීක්ගේ ගමේ පල්ලියේ පූජකතුමා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අය මා සම්බන්ධයෙන් කරපු ඒ සියලු ප්‍රකාශ මා **සභාගත*** කරනවා හැන්සාඩ්ගත කරන්න.

ඉතිහාසය කියාවි රිසානාගේ මව සහ පියා මා කෙරෙහි දැක් වූ විශ්වාසය. අද උදේ ඔවුන් මා වෙනුවෙන් වෙනම යාඥාවක් කළා. මෙන්න ඒවායේ පින්තූර. කොළඹ නොවෙයි, ෂාපි නගරවල රිසානාගේ ගමේ පල්ලියේ. ගමේ පල්ලියේ ඒ යාඥාව කළේ මා වෙනුවෙන්. ඒ ඡායාරූපත් මා **සභාගත**** කරනවා. මොකද, සමහර අය කියනවා නේ මා ඒ අය සල්ලිවලට ගත්තාය කියලා. සල්ලිවලට ගන්න බැහැ රිසානාගේ අම්මා. එහෙම නම් සවුදියෙන් ආපු සල්ලි නේ ඒ අය ගන්නේ. සවුදියෙන් දෙනවාය කියපු සල්ලිත් එපා කිව්ව ඒ අහිංසක අම්මාට අද මේ පාර්ලිමේන්තුවේදී අපහාස කළා, ඒ අම්මා සල්ලිවලට ගත්තා කියලා. මේ අයට තෑන්කිව් නොදකින් නොකියා වෙන මොනවාද කියන්න තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය සිංහල අලුත් අවුරුද්ද දිනවල මා ලෙබනනයේ ඉන්න කොට මගේ ළඟම මිත්‍රයෙක් මට අවුරුදු පණිවුඩයක් එව්වා. ඒ පණිවුඩයේ මෙසේ සඳහන් වී තිබෙනවා. "Short but meaningful:You will never reach your destination if you stop and throw stones at every dog that barks. - Dr. Kamal".

මට කියන්න තිබෙන්නේත්, මගේ ඉලක්කය කරා මා යනවාය කියන එකයි. එසේ යන කොට හැම හන්දියකම බුරන බල්ලන්ට ගල් ගහන්න ගියොත් මගේ ඉලක්කය කරා යන්න බැහැ. බල්ලන්ට මා ගල් ගහන්නේ නැහැ. එම නිසා බල්ලෝ බුරති. බල්ලෝ බුරන වග විතරක් නොවෙයි, සමහර අය ගවයන් හැටියට උම්බෑ කියන වගත් අපි අද මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මෙම විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව මට සහායට සහ මට විරුද්ධව බොහොම විවේචනාත්මකව අදහස් ඉදිරිපත් කළ සියලු දෙනාටම ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම මා සතුටු වනවා, මා මුදුන් මල් කඩක් වාගේ ආරක්ෂා කළ ජාතික සමඟිය වෙනුවෙන් මා දරන මතය නිසා දෝ ආණ්ඩුවට විරුද්ධව ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් දෙමළ ජාතික සන්ධානය මෑත ඉතිහාසයේ ප්‍රථම වතාවට ඡන්දය දීමෙන් වැළකී සිටින එක ගැන. මා එය දකින්නේ, මා ලැබූ ජයග්‍රහණයක් හැටියට නොව මට මේ සියලු කාරණා කරන්නට අවශ්‍ය කරන බලය ලබා දෙන සහ මට මහ පෙන්වන මාගේ ආදරණීය නායක අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට කරපු ගෞරවයක් ලෙසයි.

අද මේ සභාවේදී ජනතා විමුක්ති පෙරමුණ ගන්නා වූ තීන්දුව මා දන්නවා. අපි එකට හිටපු සහෝදරවරු. ඔබතුමන්ලා ඒ තීන්දුව ගන්නේත් බොහොම අමාරුවෙන් කියලාත් මා දන්නවා. විවිධ තර්ක මැද තමයි එසේ කරන්නට සිද්ධ වන්නේ. ඒ තීන්දුව ගත්තාට මා තරහ නැහැ. මොකද, මා අවුරුදු 25ක් දේශපාලනය කරලා තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතා විමුක්ති පෙරමුණ අවුරුදු 12ක් හැදුණේ, වැඩුණේ මගේ නිවසේ කාමරයකයි. මගේ තාත්තා ඔබතුමන්ලාගේ පක්ෂය වෙනුවෙන් මාස හයක් හිරබත් කාපු මනුෂ්‍යයෙක්. මා තරහ නැහැ, ඔබතුමන්ලා ඒ තීන්දුව ගත්තාට. ඔබතුමන්ලාට අද ඒ තීන්දුව ගන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ තරම්ම බැඳියාව වැඩි වෙලා තිබෙනවා, අනවශ්‍ය අයත් එක්ක. එම නිසා ඒ තීන්දුව ගැනීම ගැන මා තරහ නැහැ. හැබැයි ඔබතුමන්ලාගේ දේශපාලන පක්ෂයේ මූල දන්නා කෙනෙක් හැටියට, රෝහණ විජේවීර මැතිතුමා ගෙදර කෑම කන කොට එහා පැත්තේ කාමරයේ ඉඳලා රෝහණ විජේවීර දිහා බලා ගෙන හිටපු කෙනෙක් හැටියට මට කියන්න පුළුවන්, මේ සම්බන්ධය වැඩිදුර ගියොත් රෝහණ විජේවීර මැතිතුමා නැවත වතාවක් මැරෙනවාය කියලා. ඒ පිළිබඳවත් අවවාදයක් නොවෙයි, ඉල්ලීමක් කළේ. ඔබතුමන්ලාට අවවාද කරන්න මා කවුද? ඔබතුමන්ලා දේශපාලන පණ්ඩිතයෝ. එසේ ඉල්ලීමක් කරමින්, අද මට උදව් කළ, මාව සැනසූ, මගේ දේශපාලන ගමන ස්ථාවර කරන්න ඉදිරිපත් වුණු, පසු ගිය සති ගණනාවක් තිස්සේ මමත් එක්ක හිටපු මගේ ආදරණීය සගයන්ට මා ස්තුතිවන්ත වනවා. ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් අද මමත් සමඟ තරහ වුණා, කථා කරන්න අවස්ථාව දෙන්න බැරි වීම ගැන. අද එහෙම විශ්වාස භංග යෝජනාවක් ආවා නම් මා පරදිනවා, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම තමයි, මට මේ ගමන යන්න ධෛර්යය හා ශක්තිය දුන්නු මගේ අම්මා, මගේ තාත්තා, මගේ ගමේ අය, බදුල්ල

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

**** * පුස්තකාලයේ තබා ඇත.***
** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** * Placed in the Library.*


[ගරු ඩිලාන් පෙරේරා මහතා]

දිස්ත්‍රික්කයේ අය, උෟව පළාතේ අය. මගේ ආදරණීය නායක මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ කාල සීමාව තුළ මට දුරකථන ඇමතුම් තුනක්, හතරක් දුන්නා. සාමාන්‍යයෙන් එතුමා දුරකථනයෙන් කථා කරන්නේ උපන් දිනයට විතරයි නේ. පසු ගිය දිනවල නිකම් කථා කරලා දුක, සැප අහනවා. ඊට පස්සේ කියනවා, "හිත කලබල කර ගන්න එපා. විශ්වාස භංග යෝජනා ඉදිරිපත් වුණේ ලංකාවේ හිටපු ලොකු ලොකු නායකයන්ට"යි කියලා. මා දන්නවා, මේ කියන්නේ මාව ඝනඝන්නය කියලා. එහෙම නායකයෙක් තමයි මට ඉන්නේ. ඒ නායකයා වෙනුවෙන් මගේ දේශපාලන ප්‍රතිපත්ති මත රැඳී ඉඳ ගෙන මේ ගමන අපි යනවා. ලණු කන, ගොන් වැඩ කරන එක්සත් ජාතික පක්ෂයට නම් නැවත වරක් ඉඩ දෙන්නේම නැහැ, නැහැ, නැහැයි කියමින්, අවසාන වශයෙන්, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ පියා වන ආර්. ප්‍රේමදාස මැතිතුමා වරක් කිව්ව වදනකින් මගේ කථාව අවසන් කරන්න මා තීන්දු කළා. එතුමාට විරුද්ධව දෝෂාභියෝගය ගෙනාපු වෙලාවේ එතුමා කිව්වා, "මාව මැරුවත් කමක් නැහැ. මගේ චරිතය ඝාතනය කරන්න එපා"යි කියලා. සජිත් ප්‍රේමදාස මැතිතුමනි, මා ඔබතුමාට කියන්නේත්, මාව මැරුවත් කමක් නැහැ, මගේ අවංක දේශපාලනයට පහර ගහන්න එපාය කියලායි. තමුන්නාන්සේලා සියලු දෙනාටම බොහොම ස්තුතියි.

**** සභාමේසය මත තබන ලද ලියවිලි:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள்:*

** Documents tabled:*



ادارة مسجد الجامع الشافعي

மஸ்ஜிதுல் ஷாபியா ஜும்ஆ பரிபாலன சபை

MASJITHUL SHAFIYA JUMMAH TRUSTEE BOARD

මස්ජිතුල් ෂාෆියා ජුම්මා පල්ලිය

REGD NO: R/1225/MU/T/88 051 SHAFI NAGAR, MUTUR-05

Eatad : 1968.06.21

Date : 07/04/2013

ஊர் தலைவரின் செய்தி

எதிர்கட்சியினர் தத்தமது அரசியல் உள்நோக்கங்களையும், நிகழ்ச்சி நிரல்களையும் அடிப்படையாக வைத்து டிலான் பெரேரா அமைச்சரே ரிஸானாவின் மரணத்திற்கு காரணமென்று கூறுவது நகைப்புக்கிடமானதாகும். டிலான் பெரேரா அமைச்சர் அவர்கள் வெளிநாட்டு வேலைவாய்ப்பு நலனோம்பு அமைச்சராக பதவியேற்றது டிசம்பர் 2010 ஆம் ஆண்டாகும். ரிஸானா நபீக் கைதுசெய்யப்பட்டதும், குற்றம் சாட்டப்பட்டதும், வழக்கு விசாரணைக் குட்படுத்தப்பட்டதும், மரணதண்டனை தீர்ப்பளிக்கப்பட்டதும், மரணதண்டனை உறுதிப்படுத்தப்பட்டதும் ஆகிய அனைத்துச் சம்பவங்களும் கௌரவ டிலான் பெரேரா அமைச்சர் தமது பதவியை பொறுப்பு ஏற்பதற்கு முன்னதாக நடந்தவைகளாகும். அவருடைய பதவிக் காலத்திற்கு முற்பட்ட காலத்தில் மற்றவர்களால் செய்யப்பட்ட செயல்களுக்கோ, செய்யாதவற்றுக்கோ கௌரவ டிலான் பெரேரா அமைச்சரை குறைகூறுவது எந்த தருமத்தின் அடிப்படையில் என்று கேட்கின்றேன்.


நாங்கள் அறிந்த வரையில், கௌரவ டிலான் பெரேரா அமைச்சர் பலதடவைகள் ரிஸானா நபீக்கை காப்பாற்றுவதற்காக பல்வேறு முயற்சிகளை எடுத்தார். அமைச்சர் அவர்கள் சவூதி அரேபியாவுக்குச் சென்று அந்நாட்டின் பல்வேறு உயர் மட்ட அதிகாரிகளை சந்தித்ததோடு ரிஸானாவின் பெற்றோரையும் செல்வாக்கு மிக்க பாராளுமன்ற உறுப்பினர்களையும் சவூதி அரேபியாவுக்கு அனுப்பி ரிஸானாவின் விடுதலைக்காக பாடுபட்டார். ரிஸானாவின் தாயருடனும் அவருடைய உறவினர்களுடனும் ரியாட் நகரத்தின் ஆளுனருடனும் தொடர்பு கொண்டு ரிஸானாவை விடுதலை செய்ய உதவுமாறு மேல்முறையீடுகளும் செய்தார்.

இருப்பினும் இஸ்லாமிய ஷரிஆ சட்டத்தை மிகவும் இறுக்கமாக சவூதி அரேபியா கடைப்பிடிப்பதனாலும் மரணித்த குழந்தையின் தாயார் ரிஸானாவை மன்னிக்க மறுத்ததனாலும் ரிஸானா தண்டனைக்குள்ளாக்கப்பட்டார். இது இறைவனின் நாட்டப்படி நடந்ததாகும்.

ரிஸானாவின் மரணத்தை அரசியலாக்க வேண்டாம் என்றும் மக்கள் சேவையாளரும் இன நட்புறவு அரசியல் வாதியுமான அமைச்சர் கௌரவ டிலான் பெரேரா அவர்கள் மீது சேறு பூசவேண்டாம் என்றும் நானும், ரிஸானாவின் குடும்பத்தினரும், எமது ஊரவர்களும் எதிர்க்கட்சியினரைக் கேட்டுக் கொள்ளுகின்றோம்.

MASJITHUL SHAFIYA JUMMAH TRUSTEE BOARD
Shafi Nagar, Mutur-05
Regd No: R/1225/MU/T/88

தலைவர் செயலாளர்



2013-03-27

மௌலவியின் விளக்கம்

இஸ்லாமிய மார்க்கப்படியும், ஷரியஆ சட்டப்படியும், ஒருவர் மரணித்தால், அதாவது இயற்கையாகவோ, விபத்தின் மூலமோ, கொலையுண்டோ, தற்கொலையினாலோ, மரணதண்டனை நிறைவேற்றப்படுவதன் மூலமாகவோ எதுவாகிலும் சரி, அதுவே இறைவனின் நாட்டமாகும். இறைவனின் நாட்டமே ஷரிஆ சட்டத்தின் ஆணிவேராகும். ஷரிஆ சட்டம் அல்-குர்ஆனையும் நபிபொருமானாரின் ஹதீஸ்களையும் அடிப்படையாகக் கொண்டதாகும்.

எனவே தான் முஸ்லீமாகிய ஒருவருக்கு எவ்வாறுதான் மரணம் சம்பவித்தாலும் அவரின் பிரேதத்தை ஷரிஆ சட்டத்தின்படி 24 மணித்தியாலங்களுக்குள் அடக்கம் செய்ய வேண்டும். அத்தோடு மூன்று தினங்கள் மட்டுமே மரணித்தவர் தொடர்பாக துக்கத்தை ஆனஷ்டிக்கலாம். அதன் பின்னர் உற்றாரும் உறவினரும், குடும்பத்தவர்களும் தத்தமது இயல்பு வாழ்க்கைக்குத் திரும்ப வோண்டும். மரணித்தவருக்காக சுவர்க்கம் கிடைக்க இறைவனிடம் பிராத்தனை செய்யலாமே தவிர மரணம் தொடர்பாக திட்டித் தீர்ப்பதோ, பழிவாங்குவதோ இஸ்லாமிய சட்டப்படி பரிபூரணமாக தவிர்ககப்பட வேண்டியதாகும். றிஸானா நபீக்கின் தாயார் மார்க்கச்சட்டப்படி தனது மகளை மண்ணித்து உயிர்ப்பிச்சை வழங்காத அக்குழந்தையின் தாயையே மன்னித்து விட்டார்.

நிலைமை இவ்வாறு இருக்கையில் றிஸானா நபீக்குக்கும், அவருடைய சகோதரருக்கும், குடும்பத்தினருக்கும் பல்வேறு வகையில் உதவி செய்வதுடன் அரசிடமிருந்து நிதியையும், வதிவதற்கு வீட்டையும் கட்டியளித்த கௌரவ டிலான் பெரேரா அமைச்சரை எதிர்க் கட்சியினர் ஏன் குற்றம் சாட்ட வோண்டும். எதிர் கட்சியினரின் குற்றச்சாட்டு அரசியலை உள்நோக்கமாக வைத்து பழிவாங்குவதற்காக எடுக்கப்பட்ட முயற்சியாகும். கௌரவ டிலான் பெரேரா அமைச்சர் றிஸானா நபிக்கின் மரணத்திட்கு எக்காரணம் கொண்டும் பொறுப்புக் கூரவோண்டியவரல்லர். என்பதனை மிகத் தெளிவாக கூறிவைக்கின்றோன்.

H.T.UWAIZ - MOOLAVI
A.C.ROAD,
MUTHUR - 05(EP)
SRILANKA
Tel : 0094758022277

2013

முகம்மது சுல்தான் நபீக்,
செய்யது அகமது றிபினா
ஷாபி நகர்,
முதூர்.
05.04.2013

கௌரவ. அமைச்சர் டிலான் பெரேரா (பா. உ.),
வெளிநாட்டு வேலைவாய்ப்பு, நலனோம்பல் அமைச்சர்
வெளிநாட்டு வேலைவாய்ப்பு, நலனோம்பல் அமைச்சு
கொழும்பு.

ஐயா!

நன்றி நவில்தல்

எமது மகள் றிஸானா நபீக் எங்கள் குடும்ப வறுமை காரணமாக சவூதி அரேபியாவிற்கு 2005ல் சென்று அங்கு பணிப பெண்ணாக வேலைசெய்த வீட்டில் அநியாயமாக கொலைக் குற்றம் சாட்டப்பட்டு 2013.01.09 அன்று தவாதமி சிறையில் மரண தண்டனை நிறைவேற்றப்பட்ட துயர முடிவை நாம் அறிந்து சொல்லொனா வேதனை அடைந்தோம். இன்றும் இவ்வேதனையில் இருந்து முழுமையாக எம்மால் மீள முடியவில்லை.

எமது மகள் றிஸானா சிறையில் இருந்த வேளையில் அவரை உயிருடன் மீட்க சர்வதேச அளவில் பல்வேறு தரப்பட்டவர்களும் இனம், மதம், மொழி, அரசியல் பேதங்களுக்கு அப்பால் பல்வேறு முயற்சிகளை மேற் கொண்டார்கள், அனால் அவை எவையும் இறுதியில் பலனளிக்கவில்லை.

அதே வேளையில் றிஸானாவின் விடுதலைக்காக கௌரவ அமைச்சர் டிலான் பெரேரா ஆகிய தாங்கள் பல்வேறு முயற்சிகளை மேற் கொண்டதை நாம் நன்கு அறிவோம். தாங்கள் நம் நாட்டின் சட்டமா அதிபரின் தலைமையில் தூதுக் குழு ஒன்றை சவுதிக்கு அனுப்பி றிஸானாவின் விடுதலைக்காக பெரும் முயற்சி எடுத்திருந்தீர்கள். அத்துடன் நம்நாட்டின் பாராளுமன்றத்திலும் றிஸானாவின் நலன்களுக்காக குரல் கொடுத்திருந்தீர்கள் இவற்றிற்காக தங்களுக்கு எமது மனமார்ந்த நன்றியறிதல்களை தெரிவித்துக் கொள்கிறோம்.

அத்துடன் எமது மகள் மரணமடைந்த வேளையில் தங்களின் பிரதிநிதியாக எமது வீடுவந்த வெளிநாட்டு வேலைவாய்ப்புகள் பணியக தவிசாளர் கௌரவ. அமல் சேனாதிலங்கார அவர்கள் எமக்கு ஆறுதல் வார்த்தைகள் கூறியதுடன், எமக்கான சிறந்த வீடொன்றை வெளிநாட்டு வேலைவாய்ப்புகள் பணியகம் ஊடாக அமைத்து தருவதற்கு வாக்குறுதி அளித்துச் சென்றார்கள். அதற்கும் எமது நன்றிகளை கௌரவ அமைச்சர் அவர்களுக்கு காணிக்கையாக செலுத்துகின்றோம்.

மற்றும் இதில் முக்கியமாக எமது மகளின் விடுதலைக்காக அதிமேதகு ஜனாதிபதி மகிந்த ராஜபக்ஷ அவர்கள் றிசானாவின் விடுதலை தொடர்பாக சவூதி மன்னருக்கு இரு தடவைகள் வேண்டுகோள்கள் விடுத்திருந்தும் இறைவனின் ஏற்பாடு போலும் அது கைகூடவில்லை. அதற்காக எமது நாட்டின் ஜனாதிபதி அதிமேதகு மகிந்த ராஜபக்ஷ அவர்களுக்கும் எம் மனமார்ந்த நன்றிகளை சமர்ப்பிக்கின்றோம்.

இனி இவ்வகையான துர்ப்பாக்கிய நிகழ்வுகள் காரணமாக ஏற்படும் மனக்கஷ்டம், உளப்பாதிப்பு என்பவற்றை அணுஅணுவாக அனுபவித்தவர்கள் என்ற வகையில் இவ்வகை துரதிஷ்ட நிகழ்வுகள் மீண்டும் ஒரு முறை நம் நாட்டில் நடைபெற நாம் அனுமதிக்கக்கூடாது என்பதுடன் சிறையில் உள்ள எங்கள் றிஸானா போன்ற நம் சகோதரிகள் அனைவரையும் உயிருடன் விடுவிக்க தாங்கள் ஆக்கபூர்வமான நடவடிக்கைகளை எடுப்பீர்கள் எனவும் எதிர்பார்த்து இம் மடலை முடிக்கின்றோம்.

நன்றி.

அன்புடன்.

M-நபீக்

முகமமது சுல்தான் நபீக் (தந்தை)

செய்யது அகமது றிபினா (தாய்)

[මෙම ලියවිලි පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த ஆவணங்கள் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This Documents also placed in the Library.]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
යෝජනාව සභාවට ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය විමසන ලදී.
කථාඛඩවල් අනුව " විරුද්ධ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

வினா விடுக்கப்பட்டது.
குரல்களின்படி "இல்லை" மேலோங்கிற்று என சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.

Question put.
MR. DEPUTY SPEAKER, *having collected the Voices, declared that the "Noes" had it.*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Divide.

පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ - පක්ෂව 32 : විරුද්ධව 136 යනුවෙන් බෙදුණේය.
பாராளுமன்றம் 43 ஆம் நிலைக்கட்டளைப்படி பிரிந்தது: சார்பாக 32; எதிராக 136.
The Parliament divided under Standing Order No. 43: Ayes 32; Noes 136.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ අනුව යෝජනාව පරාජය වූ බව දන්වමි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 7.30 පසු කර තිබුණෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.
පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 7.35ට 2013 මැයි 08 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி. ப. 7.30 மணிக்குப் பிந்திவிட்டமையால் பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.
அதன்படி, பி. ப. 7.35 மணிக்கு, பாராளுமன்றம் 2013 மே 08, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

And it being past 7.30 p.m., MR. DEPUTY SPEAKER *adjourned Parliament without Question put.*
Adjourned accordingly at 7.35 p.m. until 1.00 p.m. on Wednesday, 08th May, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 14 වන කලාපය
தொகுதி 216 - இல. 14
Volume 216 - No. 14

2013 මැයි 08 වන බදාදා
2013 மே 08, புதன்கிழமை
Wednesday, 08th May, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)
பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)
PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව
ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ගොවිජන සංවර්ධන පනත :
නියෝග

ආනයන හා අපනයන (පාලන) පනත:
නියෝග

මෝටර් වාහන පනත :
නියෝග

කල් තැබීමේ යෝජනාව :
2013 ලෝක කම්කරු දිනය

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

கமநல அபிவிருத்திச் சட்டம்:
ஒழுங்குவிதிகள்

ஏற்றுமதி, இறக்குமதி (கட்டுப்பாடு) சட்டம் :
ஒழுங்குவிதிகள்

மோட்டார் வாகனச் சட்டம் :
ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:
2013 உலகத் தொழிலாளர் தினக் கொண்டாட்டம்

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

AGRARIAN DEVELOPMENT ACT:
Regulations

IMPORT AND EXPORT (CONTROL) ACT:
Regulations

MOTOR TRAFFIC ACT:
Regulations

ADJOURNMENT MOTION:
Celebration of International Workers' Day 2013

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මැයි 08 වන බදාදා
2013 மே 08, புதன்கிழமை
Wednesday, 08th May, 2013

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] *මූලාසනාරූඪ විය.*
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] *தலைமை வகித்தார்கள்.*
The Parliament met at 1.00 p.m., MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ හයවැනි කාණ්ඩයේ XVII සහ XVIII වැනි කොටස් සහ 2011 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IV සහ V වැනි කොටස්, පස්වැනි කාණ්ඩයේ I, II සහ III වැනි කොටස් සහ හයවැනි කාණ්ඩයේ III, IV සහ V වැනි කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාවේ එකී කොටස් මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 31 දිනැති අංක 1795/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.- [ප්‍රවාහන අමාත්‍ය ගරු කුමාර වෙල්ගම මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, මම කෑගල්ල, තුංතොට, දැදිගම පාර, වෙද ගෙදර පදිංචි ඩබ්ලිව්. සුධර්මා කුසුම කාන්ති මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මම අංගොඩ, වල්පොල, 12 වන පටුමග, විජිතපුර මාවත, අංක 106/1 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එම්. මැක්සි පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා - පැමිණ නැත.

ගරු බන්දුල ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)

ගරු කථානායකතුමනි, මම දෙහිවල, පල්ලියදොර පාර, අංක 16/2 දරන ස්ථානයෙහි පදිංචි සිරිමත් රත්නබන්දු ඥානදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම කොළඹ 15, මට්ටක්කුලිය අලුත් මාවත පාර, අංක 876/2 දරන ස්ථානයෙහි පදිංචි ජී.එම්. ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

[ගරු වික්ටර් ඇන්ටනි මහතා]

(1) බිංගිරිය, කඳුරුවැව පදිංචි එම්.පී. රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පුත්තලම, තබ්බෝව, අනුරාධපුර පාර, 8 කණුවෙහි පදිංචි ටී.ජී. දයාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වී.කේ. ඉන්දික මහතා - පැමිණ නැත.

ගරු හේමාල් ගුණසේකර මහතා - පැමිණ නැත.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පිටබැද්දර, හුලංදාව පදිංචි කේ.එච්.ජී. කුසුමාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අකුරැස්ස, පෝරඹ, අංක 216/29/සී දරන ස්ථානයෙහි පදිංචි ආර්.පී.ජී.එම්. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කළුතර දකුණ, ගාලු පාර, අංක 350/5 දරන ස්ථානයෙහි පදිංචි එම්. සෝමදාස ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කයිතඩ්, කයිතඩ් දකුණ පදිංචි කේ. ඥානරූපී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, අලව්ව, හපුගහගෙදර, සිරිලක් නිවසෙහි පදිංචි පී. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා - පැමිණ නැත.

ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අම්පාර, ගැමුණුපුර, එස්.පී. 23/බී දරන ස්ථානයෙහි පදිංචි එච්.යූ.එස්. ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පේරාදෙනිය, මෙගොඩ කළුගමුව, අංක 229/4 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ. පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 1-1850/'11-(2), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කල් ඉල්ලන්නේ ඇයි?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට හොඳ පැහැදිලි පිළිතුරක් දෙන්නයි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

"මහින්ද චින්තන ඉදිරි දැක්ම": විශේෂඥ රෝහල්
"மஹிந்த சிந்தனை எதிர்கால நோக்கு" : நிபுணத்துவ ஆஸ்பத்திரிகள்
"MAHINDA CHINTANA—VISION FOR THE FUTURE" : SPECIALIST HOSPITALS

2338/'12

2. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව මඟින් කොළඹට පමණක් සීමා වී ඇති විශේෂඥ රෝහල්, දෙක බැගින් සෑම පළාතකම ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මේ වන විට එම රෝහල් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) "மகிந்த சிந்தனை எதிர்கால நோக்கு" கொள்கைத் திட்டத்தின்மூலம், கொழும்புக்கு மட்டும் வரையறுக்கப்பட்டுள்ள நிபுணத்துவ ஆஸ்பத்திரிகள் ஒவ்வொரு மாகாணத்திலும் இரண்டு வீதம் தாபிப்பதற்கு முன்மொழியப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) தற்போது மேற்படி ஆஸ்பத்திரிகளை தாபிப்பதற்கான நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டுள்ளனவா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that it has been proposed by the "Mahinda Chintana - Vision for the Future" manifesto, that two specialist hospitals, which have been confined only to Colombo, be established in each province?

(b) Will he state whether the work related to the establishment of the aforesaid hospitals has been commenced by now?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) සහ (ආ)

තෝරා ගත් ජාතික රෝහල්වල හා පළාත් රෝහල්වල සෞඛ්‍ය සේවා පහසුකම් වැඩි දියුණු කර උසස් කිරීමට යෝජනා කර ඇති අතර එම රෝහල් වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කර ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සමාවෙලා කියන්න, (ආ) යන්නට ඔබතුමාගේ පිළිතුර මොකක්ද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඒකම තමයි. (අ) සහ (ආ) යන කොටස් දෙකටම පිළිතුර වන්නේ, "තෝරාගත් ජාතික රෝහල්වල හා පළාත් රෝහල්වල සෞඛ්‍ය සේවා පහසුකම් වැඩි දියුණු කර උසස් කිරීමට යෝජනා කර ඇති අතර එම රෝහල් වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කර ඇත." (ඇ) සඳහා පිළිතුර, "පැන නොනඟී".

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි, මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වෙලා තිබෙන ආකාරයට පළාත් මට්ටමෙන් විශේෂඥ රෝහල් දෙක බැගින් ස්ථාපනය කරන්නේ කොහොමද, මේ රටේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ - ස්නායු ශල්‍ය, හෘදය රෝග, පිළිකා රෝග, වකුගඩු රෝග, වෛද්‍යවරුන්ගේ- හිඟයක් පවතිනකොට; ඒ වාගේම මේ රටේ හෙදියන් 44,000ක් සිටින්නට ඕනෑ තැනක 28,000යි සිටින්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එතැන ප්‍රශ්න දෙකයි. පැහැදිලිව එකක් අහන්න, එතකොට හොඳට උත්තර දෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

හොඳයි. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ රටේ විශේෂඥ වෛද්‍යවරුන්ගේත්, හෙදියන්ගේත්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේත් බරපතළ ඌනතාවක් තිබෙන මොහොතක තමුන්නාන්සේලා පළාත් මට්ටමින් විශේෂඥ රෝහල් දෙක බැගින් ස්ථාපනය කරනවාය කියන එක අසත්‍යයක් නේද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

අසත්‍යයක් නොවෙයි ගරු කථානායකතුමනි. ප්‍රශ්න තුනක් එතුමා ඇහුවා. පළමු වන කාරණය හැටියට මා කියන්න කැමැතියි, මේ වන විට තමුන්නාන්සේලාගේ කාලයේ හත්සියයක් ව තිබුණු විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව එක්දහස් අටසියය දක්වා අප වැඩි කර තිබෙන බව. තමුන්නාන්සේත් නියෝජ්‍ය ඇමතිවරයෙකු වශයෙන් හිටියා. තමුන්නාන්සේ නියෝජ්‍ය ඇමතිව ඉන්න කාලයේ විශේෂඥ වෛද්‍යවරු කී දෙනෙක් පත් කළා ද? මේ වන විට විශේෂඥ වෛද්‍යවරු 1800ක් ශ්‍රී ලංකාව තුළ ඉන්නවා. විශේෂඥ වෛද්‍යවරුන්ය කිව්වාම, අවශ්‍ය විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව එකවරම සම්පූර්ණ කරන්න බැහැ. නමුත් මේ තුළින් අපේ නිදහස් සෞඛ්‍ය සේවාව ගුණාත්මකව කර ගෙන යන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, අද විශාල රෝහල් පද්ධතියක් ග්‍රාමීය මට්ටමින් දියුණු කර තිබෙනවා. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒක තමයි. ඔබතුමාව අනුගමනය කරනවා. නියෝජ්‍ය ඇමතිතුමා, එහෙම කරන්න එපා. ඔබතුමාත් ටිකක් කෙටියෙන් පිළිතුර දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

උදාහරණය මගේ පළාත්වලින් දෙනවා, ගරු කථානායකතුමනි. එතුමාට කියන්නේ පළාත් රෝහල් දියුණු කර තිබෙන හැටියි. එදා ඇඹිලිපිටියේ මූලික රෝහලක් තිබුණේ නැහැ. රත්නපුර රෝහලට තමයි මුළු රත්නපුර දිස්ත්‍රික්කයේම කට්ටිය එන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා අහගන්න. අද විශේෂඥ වෛද්‍ය සේවාව -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එතුමා අහගෙන ඉන්නවා. ඔබතුමා උත්තර දෙන්නකො.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

අද ඇඹිලිපිටියේ රෝහල තිබෙනවා, බලන්ගොඩ රෝහල තිබෙනවා. කහවත්ත රෝහල තිබෙනවා. ඊළඟට රත්නපුර රෝහල තිබෙනවා. එදා රත්නපුර රෝහල විතරයි ඒ තත්ත්වයට තිබුණේ. අද මේ සියලුම රෝහල් මවුවරුන්ගේ සිසේරියන් සැත්කම කරන්නට පුළුවන් තත්ත්වයට දියුණු කර තිබෙනවා. අද ඇඹිලිපිටිය රෝහල දියුණු කර තිබෙනවා. බලන්ගොඩ රෝහල දියුණු කර තිබෙනවා. කහවත්ත රෝහල දියුණු කර තිබෙනවා.

මෙය තමයි ප්‍රාදේශීය දියුණුව. කෑගල්ල දිස්ත්‍රික්කය ගත්තාම මූලික රෝහලක් හැටියට තිබුණේ කෑගල්ල රෝහල විතරයි. අද මාවනැල්ල මූලික රෝහලක් බවට පත් කරලා තිබෙනවා. කරවනැල්ල රෝහල මූලික රෝහලක් බවට පත් කරලා තිබෙනවා. ඒ අනුව ඒ රෝහල් දෙකේම විශේෂඥ සේවාව සහ සැත්කම් සියල්ල කරන්න පුළුවන්කම තිබෙනවා. මගේ පළාතෙන් මම මේ ආදර්ශය ගත්තේ. අද දකුණු පළාත ගත්තත් ඒ විධියයි. තංගල්ල වාගේ රෝහල් දියුණු කරලා තිබෙනවා. හම්බන්තොට රෝහල තමයි හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධාන රෝහල වෙන්නේ. නමුත් ඒ ආශ්‍රිතව තිබෙන අනෙකුත් ප්‍රාදේශීය රෝහල් සංවර්ධනය කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම විශේෂඥ වෛද්‍යවරු හිඟය නිසා සායනික සේවාව සඳහා ඔවුන්ගේ සේවාව ලබා ගන්න කටයුතු කරලා තිබෙනවා. ඒ විධියට ප්‍රාදේශීය රෝහල්වලට අවශ්‍ය වෛද්‍ය සේවාවන් ලබා දීලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පැහැදිලියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම සිසේරියන් සැත්කම් ගැන පමණක් නොවෙයි කිව්වේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මම අනෙකුත් ඒවා ගැනත් කියන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැවත අහන්න. ප්‍රශ්නයක් හැටියට අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා මට මේ ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා ප්‍රකාශ කරලා තිබෙනවා, පළාත් මට්ටමින් විශේෂඥ රෝහල් දෙක බැඟින් ස්ථාපනය කරනවාය කියලා. වර්තමානයේ මේ පවතින රෝහල්වල ප්‍රතිජීවක ඖෂධ හිඟය, වේදනා නාශක හිඟය, බෝනොවෙන රෝගවලට බෙහෙත් හිඟය, රෝග පරීක්ෂණවලට රසායනික ද්‍රව්‍ය හිඟය, ශල්‍ය උපකරණ හිඟය තිබෙද්දී අලුතෙන් මේ විශේෂඥ රෝහල් ස්ථාපනය කරන්නේ කොහොමද කියලා ඔබතුමා මට කියන්න. ජාතික රෝහලේ තිබෙන එම්ආර්අයි ස්කෑන් යන්ත්‍රය මාස දෙකක් තිස්සේ කැඩිලා. කරුණාකරලා, ඔබතුමා මට කියන්න, මේ පවතින ක්‍රමය සාර්ථක නොවී කොහොමද ඔබතුමන්ලා අලුතෙන් ස්ථාපනය කරන ක්‍රමය ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්නේ කියලා. කොළඹ මහ රෝහලේ එම්ආර්අයි ස්කෑන් යන්ත්‍රය මාස දෙකක් තිස්සේ කැඩිලා තිබෙනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඔබතුමාගේ පියා ජනාධිපති විධියට ඉන්න කාලයේ මුළු ලංකාවට ජනසවිය දෙනවාය කියලා කිව්වා. [බාධා කිරීම්] ඉන්න කෝ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ කාලයේ අපත් එක්කයි හිටියේ. ඒ කාලයේ ඔබතුමා ජී.එල්. පීරිස් ඇමතිතුමාගේ ලේකම්. ඒ කාලයේ අපත් එක්කයි හිටියේ. ඒ නිසා පොඩ්ඩක් ඉන්න කෝ. [බාධා කිරීම්]

මම මේක කියන්න ඕනෑ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්නය ඇහුවේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා. ජයසේකර මන්ත්‍රීතුමාට මේ ගැන කථා කරන්න වැඩක් නැහැ. [බාධා කිරීම්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

තමුන්නාන්සේගේ පියා කෑගල්ල දිස්ත්‍රික්කයටම ජනසවිය දුන්නා කියලා කිව්වා. හැබැයි කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායකටයි, දැරණියගලටයි විතරයි දුන්නේ. ඔක්කෝටම දුන්නේ නැහැ. ඉතින් ඒ වාගේ- [බාධා කිරීම්] අපි කියන්නේ මෙච්චරයි. ගරු මන්ත්‍රීතුමනි, මෙම රෝහල්වල MRI යන්ත්‍ර කැඩෙන්න පුළුවන්. මහනුවර රෝහලේ MRI යන්ත්‍රය කැඩුණාම අපි පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරනායක රෝහලේ යන්ත්‍රය පාවිච්චියට ගන්නවා. කිසිම රටක මේ විධියට නිදහස් සෞඛ්‍ය සේවාව ලබා දෙන්නේ නැහැ. ලංකාවේ තමයි රක්ෂණ ආවරණයකින් තොරව මේ සේවාව නිදහස්ව ලබා දෙන්නේ. අඩු පාඩුකම් එකක් දෙකක් තිබුණාට සමස්ත වශයෙන් ගත්තාම මේ සේවාව හොඳින් සපයනවා. අද රෝහල්වල X-ray යන්ත්‍ර තිබෙනවා. සියලුම පර්යේෂණ කර ගන්න පුළුවන් පහසුකම් ටික තිබෙනවා. ඒ වාගේම විශේෂඥ වෛද්‍යවරු ඉන්නවා. අද දිස්ත්‍රික්කයක් ඇතුළත ගත්තාම ඕනෑම කෙනකුට විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවාව ලබා ගන්න පුළුවන්. සීමා මායිම් නැහැ. ඊයේ පෙරේදා එංගලන්තයේ ගිය වෛද්‍යවරයකු මා සමඟ කිව්වා, ඒ රටේ ප්‍රාදේශීය වෛද්‍යවරයාගෙන් අවසර නැතිව රෝහලකින් බෙහෙතක් ගන්න බැහැ කියලා. අද ලංකාව තුළ සම්පත් හිඟකමක් තිබෙනවා. සම්පත් හිඟකමක් තිබුණත් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යාම අතින් අද අපි ඉහළ තත්ත්වයක ඉන්නවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම සතුටු වෙනවා ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා සම්පත් හිඟතාව පිළිගැනීම පිළිබඳව. මගේ තුන්වන අතුරු ප්‍රශ්නය ගලා එන්නේ එතුමා දුන්නු පිළිතුරෙන්. ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමා සඳහන් කරපු සම්පත් හිඟතාව තුළ ලැබෙන සම්පත් ටික හරියට ඔබතුමන්ලා කළමනාකරණය කරන්න ඕනෑ. දැන් මට කියන්න-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
"කරනවාද" කියලා ඇහුවාම ප්‍රශ්නය හරිනේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මම අහලා ඉවර නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉවර නැති වෙන්න බැහැ. ඉවර කරන්න මට පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, රුපියල් 20කට ගන්න පුළුවන් ශල්‍ය අත්වැසුමකට රුපියල් 67ක් වැය කරනවා. මේ රටේ ප්‍රාදේශීය මිලදී ගැනීම්වලට, ඖෂධවලට ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව රුපියල් ලක්ෂ 50,000ක් වෙන් කර තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න බැරි ඇයි කියලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙටියෙන් ප්‍රශ්න අහන්න මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉගෙන ගන්නකෝ. කථා පවත්වන්න ඕනෑ නම් අපි ඒකට වෙලාවක් හදලා දෙන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බැහැ, බැහැ. දැන් අහලා ඉවරයි. අර භාගෙට අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමා අහපු අතුරු ප්‍රශ්නය මේ ප්‍රශ්නයට අදාළ නැහැ. මොකද, සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ගැන මේ ප්‍රශ්නයෙන් අහලා නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඒ ඇති. වෙන දේවල් කියන්න එපා. මෙතැන කාලය පාලනය කර ගන්න එපායැ. නැත්නම් හරි අමාරුයි නේ.

ප්‍රශ්න අංක 3, ගරු බුද්ධික පතිරණ මහතා.

කොටියාගල වැව : ප්‍රතිසංස්කරණය
கொட்டியாகலை குளம் : புனரமைப்பு
KOTIYAGALA TANK : RENOVATION

2444/'12

3. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කොටියාගල වැව වර්ෂ පනහකට අධික කාලයක් තුළ කිසිදු ප්‍රතිසංස්කරණයකට ලක් නොකිරීමෙන් ක්‍රමයෙන් ගොඩ වීමේ අවදානමකට ලක්ව ඇති බවත්;

(ii) යල-මහ දෙකන්නයම සඳහා ඉඩම් අක්කර හාරසීයකට පමණ ජලය සැපයූ මෙම වැව යටතේ දැනට වගා කටයුතු කරන්නේ මහ කන්නයේදී පමණක් බවත්;

(iii) මෙම වැව ආශ්‍රිතව පවත්වා ගෙන ගිය මිරිදිය ධීවර කර්මාන්තය ද මේ වන විට අඩපණ වී, ඒ මත යැපුණු අය ආර්ථික අපහසුතාවන්ට පත්ව ඇති බවත්;

(iv) එම වැව කඩිනමින් ප්‍රතිසංස්කරණය කළහොත් ප්‍රදේශයේ විශාල පිරිසකට සෙත සැලසෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කොටියාගල වැව කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ වන විට වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

නීර්ප්පාසන, නීර්වළ මුකාමෙත්තුව අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) மொனராகலை மாவட்டத்தின் சியம்பலாண்டுவ பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள கொட்டியாகலை குளம் ஐம்பது வருடங்களுக்கு மேலாக எவ்வித மறுசீரமைப்புக்கும் உள்ளாக்கப் படாததால் படிப்படியாக பாழடையும் ஆபத்திற்கு உள்ளாகியுள்ளதென்பதையும்;

(ii) பெரும்போகம் மற்றும் சிறுபோகம் ஆகிய இரண்டு போகங்களிலும் சுமார் நானூறு ஏக்கருக்கு நீர் வழங்கிய இக்குளத்தினூடாக தற்போது பெரும்போகத்தில் மாத்திரமே பயிர் செய்கை மேற்கொள்ளப்படுகின்றதென்பதையும்;

(iii) இக்குளத்தைச் சார்ந்ததாக பேணிவரப்பட்ட நன்னீர் மீன்பிடித்துறை தற்போது பாதிக்கப் பட்டு இதில் தங்கிவாழ்ந்தவர்கள் பொருளாதார ரீதியில் கஷ்டங்களுக்கு உள்ளாகியுள்ளார்கள் என்பதையும்;

(iv) இக்குளம் துரிதமாகப் புனரமைக்கப்படும் பட்சத்தில் இப்பிரதேசத்தைச் சேர்ந்த பெருந் தொகையானவர்களுக்கு நன்மை கிட்டும் என்பதையும்

[ගරු බුද්ධික පතිරණ මහතා]

අවර් අறිවාරා?

(ஆ) (i) கொட்டியாகலை குளத்தைத் துரிதமாகப் புனரமைப்பதற்கு நடவடிக்கை மேற் கொள்வாரா என்பதையும்;

(ii) இதற்குத் தேவையான நிதி ஏற்பாடுகள் தற்போது ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Is he aware that -

(i) the Kotiyagala tank in the Siyambalanduwa Divisional Secretary's Division in Moneragala District has silted up owing to non-renovation for over 50 years;

(ii) this tank which provided water to nearly 400 acres of land in both Yala and Maha seasons, can only provide water for the Maha season;

(iii) even the fishermen who depended on fresh water fishing industry associated with this tank are faced with economic hardships as the industry too has suffered a setback; and

(iv) if this tank is renovated soon a large number of people in the area will be benefited ?

(b) Will he inform this House -

(i) whether steps will be taken to renovate the Kotiyagala tank soon; and

(ii) whether funds have been allocated for it?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කොටියාගල වැව අවදානමකට ලක් වී නොමැත.

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ මේ වන විට මහ කන්නයේදී මුළු වපසරියම වන අක්කර 450ක්ද, යල කන්නයේදී පවතින ජල තත්ත්වය අනුව මුළු වපසරියෙන් සියයට 50ක්ද වගා කෙරේ.

(iii) මේ වැවේ අජීවී ජල ධාරිතාවක් - dead storage එකක්- නොමැති අතර, යල කන්නයේදී ඇති වන නියහය සමඟ වගාව සඳහා ජලය ලබා දීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සිදු වේ. එබැවින් මිරිදිය ධීවර කටයුතු සඳහා යල කන්නයේදී බලපෑමක් ඇති වේ.

(iv) මේ වැවෙහි ජල ධාරිතාවය වැඩි කොට යල කන්නය සඳහා ජලය ඉතිරි කර ගත හැකි ක්‍රමවේදයක් සකස් කළහොත් මහජනතාවට මීට වඩා සේවාවක් මෙම වැව මඟින් ලබා දිය හැක.

(ආ) (i) ආරම්භයේ සිට මේ වන විට කිහිප අවස්ථාවකදීම පුනරුත්ථාපන කටයුතු සිදු කර ඇත. (සෑම වසරකම පාහේ මහ කන්නයේ වැව වාන් දැමීම සිදු වන බැවින් තවදුරටත් වැවෙහි පිටවාන උස් කිරීම තාක්ෂණික වශයෙන් කළ හැකි දැයි සොයා බැලීමට මේ දිනවල මූලික අධ්‍යයන කටයුතු සිදු කරමින් පවතී.)

(ii) මූලික අධ්‍යයන කටයුතු නිම කිරීමෙන් පසු එහි ශක්‍යතාව අනුව ප්‍රතිපාදන වෙන් කර ගැනීමට නියමිතය.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ඒ වැව ගොඩ වීමේ අවදානමක් නැති වුණත් ඒ වැවේ ප්‍රයෝජනයට ගත හැකි ජල ධාරිතාව වැඩි කර ගන්න පුළුවන් කියලා ගරු ඇමතිතුමාගේ පිළිතුර මඟින් කියැවුණා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමා කියපු ඒවා ඔබතුමා ආපසු කියන්න යන්න එපා. එතුමා කියපු දේ ආශ්‍රයෙන් මොකක් හෝ ප්‍රශ්නයක් කෙළින්ම අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒක තමයි මේ කරන්නේ ගරු කථානායකතුමනි. ගරු අමාත්‍යතුමනි, එසේ ජල ධාරිතාව වැඩි කර ගන්න මේ වසර තුළ සැලැස්මක් තිබෙනවාද? ඒ සඳහා කොපමණ මුදලක් වෙන් කර ගෙන තිබෙනවාද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අන්න එහෙම හොඳයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, වැව්වල ධාරිතාව වැඩි කර ගැනීමේ ක්‍රමවේද රාශියක් තිබෙනවා. වැව පිහිටි ස්ථානය, එහි භූගත තත්ත්වයන් වැනි තාක්ෂණික කාරණා සලකා බලනවා. වැවකට එකී ධාරිතාව දරා ගැනීමට තරම් එහි බැම්ම ශක්තිමත්ද කියා තක්සේරු කරලා තමයි අපට ඒ කටයුත්ත කරන්න පුළුවන් වන්නේ. ඒ නිසා තමයි මා කිව්වේ ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් - feasibility study එකක් - කරනවා කියලා. ඒ වාර්තාව මඟින් කිව්වොත් එය මේ මේ ආකාරයෙන් කරන්න පුළුවන් කියලා, අපි එය ඉෂ්ට කරලා දෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. පසු ගිය වසරේ වර්ෂාව අධික වීමත් එක්ක වැව් වාන් දැමීමට විකල්පයක් වශයෙන් වැව්වල රොන් මඩ ඉවත් කරලා ඒවා පිළිසකර කිරීමේ කටයුතු කළා. දැන් ආපසු සැරයක් වර්ෂා කාලය ඇරඹෙමින් -නිරිතදිග මෝසම සක්‍රිය වෙමින්- තිබෙනවා. ගිය වසරේ රොන් මඩ ඉවත් කරලා ජල ධාරිතාව වැඩි කරන්න

නොහැකි වූ වැව් එකී කටයුතු ඉටු කිරීම සඳහා මේ වර්ෂයේදී තෝරා ගෙන තිබෙනවාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, ඒක කරන්න පුළුවන් වෙන්නේ වර්ෂා කාලය අවසන් වුණායින් පසුවයි. එවැනි දෙයක් ප්‍රායෝගිකව කළ හැකි ස්ථාන ඒ අවස්ථාවේදී සොයලා බලලා කරනවා. මොකද, ඒ අවස්ථාවේදී වැව් ජලයෙන් පිරිලා තිබුණොත් රොන් මඩ ඉවත් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ විධියට රොන් මඩ ඉවත් කරන්න නම් වැව්වල ජලය ආපසු ඉවත් කරන්න සිද්ධ වෙනවා. එවැනි දෙයක් තාක්ෂණික වශයෙන් කරන්න පුළුවන් ස්ථානවල කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න දෙකයි තිබෙන්නේ.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

සිවලාපිටිය ග්‍රාමයේ සිදු වූ නිදන් හැරීම : නීතිමය පියවර

சிவலாப்பிட்டிய கிராம புதையல் அகழ்வு : சட்ட நடவடிக்கை

TREASURE HUNTING IN SIVALAPITIYA VILLAGE : LEGAL STEPS TAKEN

2697/'12

6. ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2012.05.01හෝ ඊට ආසන්න දිනක විලච්චිය, සිවලාපිටිය ග්‍රාමයේ සිදු වූ නිදන් හැරීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් පුද්ගලයින් කවුරුන්ද;

(ii) එකී පුද්ගලයන්ට එරෙහිව ගත් නීතිමය පියවර කවරේද;

(iii) එම නිදන් හැරීම වළක්වාලීමට කටයුතු කළ අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිදන් හැරීම රජයේ අනුදැනුම ඇතිව සිදුකර තිබේද;

(ii) එම නිදන් හැරීමට විශේෂ කාර්ය බලකායේ භටයින් යොදවා තිබුණේද;

(iii) එසේ නම්, ඒ සඳහා අනුමතිය ලබා දුන් පුද්ගලයින් කවුරුන්ද;

(iv) එම නිදන් හැරීම සිදු කරනු ලැබුයේ විශේෂ කාර්ය බලකායේ භටයන් විසින් නම්, ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(v) විශේෂ කාර්ය බලකා භටයින් ඉහත නිදන් හැරීම සිදු වූ ස්ථානයට ගොස් ඇත්තේ එම නිදන් හැරීම සම්බන්ධයෙන් සොයා බැලීමේ සෝදිසි මෙහෙයුමකට නම්, ඒ පිළිබඳව එම ප්‍රදේශය භාර පොලිසිය දැනුවත් කර තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும் கேட்ட வினா:

(அ) (i) 2012.05.01ஆம் திகதியன்று அல்லது அதற்கு அண்மித்த தினத்தில் விலச்சிய சிவலாப்பிட்டிய கிராமத்தில் இடம்பெற்ற புதையல் அகழ்வு தொடர்பாக கைதுசெய்யப்பட்ட நபர்கள் யார்;

(ii) இவர்களுக்கு எதிராக எடுக்கப்பட்டுள்ள சட்ட நடவடிக்கைகள் யாவை;

(iii) மேற்படி புதையல் அகழ்வைத் தடுக்க நடவடிக்கை எடுத்தவர்கள் யார்

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்கூறிய புதையல் அகழ்வு அரசு அறியத்தக்க வகையில் இடம் பெற்றதா;

(ii) மேற்படி புதையல் அகழ்வில் விசேட அதிரடிப் படையினர் ஈடுபடுத்தப்பட்டனரா;

(iii) அவ்வாறெனின் அதற்கு அனுமதி வழங்கிய நபர்கள் யார்;

(iv) மேற்படி புதையல் அகழ்வு விசேட அதிரடிப்படையினரால் மேற்கொள்ளப்பட்டிருப்பின் அவர்க ளுக்கு எதிராக எடுக்கப்பட்ட நடவடிக்கைகள் யாவை;

(v) விசேட அதிரடிப்படையினர் மேற்கூறிய புதையல் அகழ்வு தொடர்பாக ஆராய்வதற்கான நடவடிக்கைக்கு சென்றிருப்பின் அது தொடர்பாக அந்தப் பிரதேசத்துக்குப் பொறுப்பான பொலிசாருக்கு அறிவிக்கப் பட்டிருந்ததா

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) the names of the persons who were arrested in regard to the treasure hunting that took place in the village named Sivalapitiya in Villachchiya on or around 01.05.2012;

(ii) the legal steps taken against the aforesaid persons; and

(iii) the names of the persons who took action to prevent the aforesaid treasure hunting?

(b) Will he inform this House -

(i) whether the aforesaid treasure hunting had been carried out with the knowledge of the Government;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(ii) whether the Special Task Force personnel had been deployed to carry out the aforesaid treasure hunting;

(iii) if so, the names of the persons who granted permission for it;

(iv) if the aforesaid treasure hunting was carried out by the Special Task Force personnel, the action taken against them; and

(v) if the Special Task Force personnel went to the place in which the treasure hunting took place for a search operation carried out to look into the aforesaid treasure hunting, whether the police station of the area had been informed of it ?

(c) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මේ සිද්ධිය සම්බන්ධයෙන් සැකකරුවන් කිසිවකු මෙතෙක් අත් අඩංගුවට ගෙන නොමැත. තව දුරටත් විමර්ශන කටයුතු සිදු කර ගෙන යනු ලබයි.

(ii) සැකකරුවන් කිසිවකු අත් අඩංගුවට ගෙන නොමැති බැවින් නීතිමය පියවරක් ගෙන නොමැත.

(iii) විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් හා මහවිලච්චිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මෙම නිදන් හැරීම වළකාලීමට ක්‍රියා කර ඇත.

(ආ) (i) නැත.

(ii) නැත.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) උළක්කුලම විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් විසින් මහවිලච්චිය පොලිස් බල ප්‍රදේශය ආවරණය කරන හෙයින් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් විසින් මෙම සෝදිසි මෙහෙයුම සිදු කිරීම සම්බන්ධව අදාළ පොලිස් ස්ථාන දැනුවත් කිරීමක් සිදු කිරීම අත්‍යවශ්‍ය නොවේ.

(ඇ) පැන නොනඟී.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මා අහන්න කැමැතියි. ගරු කථානායකතුමනි, මේ සිද්ධිය සිදු වුණේ 2012.05.01 සහ 2012.05.02වැනි දිනවලයි. සිවලාපිටියේ නිදන් හැරීම සම්බන්ධ ප්‍රශ්නයේ දී මා ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, විශේෂ කාර්ය බල කායේ අය මේ ප්‍රදේශයේ නිදන් හැරීමක් සම්බන්ධ වැටලීමකට ගියා නම් බැකෝ යන්ත්‍ර අරගෙන ගියේ කොහොමද, ඒ මොකටද කියලා. බැකෝ යන්ත්‍ර අරගෙන ගියේ ඇතුළේ ඉන්න මිනිසුන් හාරන්නද, නැත්නම් සිවලාපිටිය වැව ඇතුළේ ඒ ගොල්ලන් වැඩේ කරන්නද? මේ විශේෂ කාර්ය බල කායේ අය බැකෝ යන්ත්‍ර අරගෙන එතැනට ගියේ මොකටද කියලා මා අහන්න කැමැතියි. මොකද 2012.05.01 සහ 2012.05.02 කියන දවස් දෙකේම මෙය සිද්ධ වුණා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඇති, ඇති. ගියේ මොකද කියලා ඇහුවා නේ. ඒකට උත්තරයක් දෙන තුරු පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් උත්තර දෙන තුරු ඉන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ තොරතුරු ලැබුණායින් පසුව තමයි විශේෂ කාර්ය බල කායේ නිලධාරීන් එම ස්ථානයට ගියේ. ඔවුන් බැකෝ යන්ත්‍රයක් ගෙන ගියේ නැහැ. එයට මූලික වූ හොරු කල්ලියක් විසින් මේ කටයුතු සිදු කර තිබෙන බව වාර්තා වීමේ ඔත්තුව මතයි විශේෂ කාර්ය බල කායේ නිලධාරීන් සිවලාපිටියට ගියේ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා කරන චෝදනාව කිසි ලෙසකින් සත්‍යයට පදනමක් හෝ හේතුවක් නොවෙයි. මෙය විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු සහ එය ප්‍රචාරය කිරීමට කැමැති ආයතන විසින් ගෙන යන අර්ථ නිරූපණයක් පමණයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි, ගරු කථානායකතුමනි. විශේෂ කාර්ය බල කායේ අය වැටලීමකට ගියා නම්, ඇයි විශේෂ කාර්ය බල කායේ අය මේකට යන්නේ?

අදාළ පොලීසියේ පොලිස් ස්ථානාධිපති සහ ඒ පොලීසියේ අය එකතු කර නොගත්තේ ඇයි? නිදන් වස්තු කොල්ලකෑමක් කෙරෙනවාය කියන ආරංචිය ලැබුණා නම්, හොරු වගයක් හිටියාය කියා කිව්වා නම්, ඒ ප්‍රදේශයේ පොලීසිය ඒකට මැදිහත් කර ගන්නේ නැතිව කොළඹින් විශේෂ කාර්ය බල කාය ගියේ ඇයි, ඒකට විශේෂ හේතුව මොකක්ද කියා මා අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමා සම්පූර්ණ වැරදි පදනමක සිට තමයි මේ ප්‍රශ්නය අහන්නේ. කොළඹින් ගියේ නැහැ. විශේෂ කාර්ය බල කායේ අංශ ඒ ප්‍රදේශවලත් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වැව පිළිසකර කරනකොට බැකෝ යන්ත්‍රය පාවිච්චි කරපු රියැදුරා මෙවැනි දෙයක් මතු වී තිබෙන බවට තොරතුරු වාර්තා කිරීම මතයි ඒ සොරුන් එතැනට ගමන් කර තිබෙන්නේ. [බාධා කිරීමක්] නැහැ. ඔබතුමන්ලා අපේ හමුදාවට බණිනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පටලවා ගන්න එපා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැහැ, නැහැ. ඒක ඔබතුමන්ලාගේ සිරිතයි. පටලවා ගන්නේ නැහැ. ඒක ඔබතුමන්ලාගේ සිරිතයි. ඔබතුමන්ලාගේ සිරිත එයයි. අපේ රටේ ආරක්ෂක බල කායයි -[බාධා කිරීමක්] මොකද?

දැනුත් බණිනවා නේ. උතුරට ගියත් බණිනවා. දකුණට ගියත් බණිනවා. නැහෙනහිරට ගියත් බණිනවා. බණින්නේ ආරක්ෂක බල කාය හා අනුබද්ධ අංශවලටයි. සත්‍ය තොරතුරක් හරියාකාරව ඉදිරිපත් කරන්න පුළුවන්කම තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. කට කථාවක් පදනම් කරගෙන ප්‍රශ්න අහන්න එපා. රියැදුරෙක් විසින් මෙවැනි දෙයක් -වස්තුවක්- හමු වුණාය කියා කිව්වත්, එවැනි වස්තුවක් හම්බ වෙලා නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ සිද්ධිය වෙලා දැන් හරියටම අවුරුද්දකටත් කිට්ටුයි. කාටවත් විරුද්ධව චෝදනා කරන්න අපට කිසිම වුවමනාවක් නැහැ. පොලීසියේ හොඳ අයවලුන් ඉන්නවා. හමුදාවේත් හොඳ අයවලුන් ඉන්නවා. ඒ වාගේම නරක පුද්ගලයන් කිහිප දෙනෙක් සිටින නිසා මුළු පොලීසියත්, හමුදාවත් ගඳ ගහන වැඩ කරනවා.

ඔබතුමන්ලාගේ ආණ්ඩුව වාගේ. ආණ්ඩුවේත් ඉන්නවා,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්න අහන ක්‍රමයක් තිබෙනවා. කාලය පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව වාගේ තමයි. ආණ්ඩුවේත් එක් කෙනෙක් දෙන්නෙක් හන්දා මුළු ආණ්ඩුවම ගඳ ගහනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම ගඳ ගහනවාද කියලා අහන්නකෝ. එතකොට ඉවරයි නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මෙතුමා අසත්‍යය කියනවා නේ, අපි පොලීසියට බණිනවා කියලා. වැරදියි නේ ඒවා.

මම ඔබතුමාට කියන්නේ ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම කිසිම වේලාවක බැකෝ එකක් ගිහිල්ලා මේ ස්ථානය හාරන්න ගියේ නැහැ. මේ බැකෝ එකත්, දොළ පිදේනි තට්ටුවත් අනෙක් බඩු ටිකත් අරගෙන ගියේ කවුද කියලා ගම්මු දන්නවා. දැන් මේක සිද්ධ වෙලා අවුරුද්දක් ගත වෙලා ඉවරයි. මම අහන්නේ මෙච්චර දක්ෂ පොලිස් නිලධාරීන් ඉන්න පොලීසියට බැරි වුණාද මේ අය අත් අඩංගුවට අරගෙන ඉදිරිපත් කරන්න. මොකද, පොලිස්පතිතුමා කියලා තිබෙනවා, එතුමා මේ අය යැව්වේ මැයි 08 වන දා කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ඇති. අත් අඩංගුවට අරගෙන ඉදිරිපත් කරන්න බැරි වුණාද කියලා අහන්න. ඊට එහා යන්න එපා. ඒකට උත්තරය දෙන තෙක් ඉන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඉතාම දක්ෂ හිටපු පොලිස් නිලධාරියෙක් නිසා මම මේ කියන්නේ. ඔබතුමා ඉතාම දක්ෂ හිටපු පොලිස් නිලධාරියෙක්. ඔබතුමා කරපු ඒවා මා ළඟ තිබෙනවා. ඔබතුමා ගැන සඳහන් පොතේ ඒවා තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කථානායකතුමාගේ දක්ෂකම් ගැන කාගෙන්වත් සහතික ඕනෑ නැහැ. කිසි කෙනෙකුගෙන් සහතික ඕනෑ නැහැ. මුළු රටම එතුමාට ගරු කරනවා. ඒක එතුමාට තිබෙන ගෞරවය. ඒකට ඔබතුමාගේ සහතිකයක් ඕනෑ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ගොල්ලන්ට විතරයි ගරු කරන්න පුළුවන්. අපට හොඳ නැහැ. එතුමා අපටත්- [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකක්ද ප්‍රශ්නය ඇහුවේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් අහපු එකත් මතක නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වැල් වටාරම් ගොඩක් කිව්වා. අහන දේ කෙටියෙන් අහන්න. එතකොට උත්තරය දෙන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඇහුවේ ඒ අය අත් අඩංගුවට ගත්තාද කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ අය අත් අඩංගුවට ගැනීමට තවම පරීක්ෂණය හමාර කරලා නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් උත්තරය දීලා ඉවරද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික ඇමතිතුමා)
(The Hon. Dinesh Gunawardena)

ඔව්. අහපු දේට උත්තර දුන්නා. අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා, තුනටම උත්තර දුන්නා. මේ ප්‍රශ්න ඇහීම ඉවර වෙන්නේ නැහැ. මේක හොඳ ජනමාධ්‍යයට තමයි. අද හවසට රූපවාහිනියට -සිරසට - හොඳයි.

කථානායකතුමා
(සභානායකතුමා)
(Mr. Speaker)
ඒ පරීක්ෂණය තවම ඉවර නැතිලු.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩලික ඇමතිතුමා)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමාටත් ඒක පිළිගන්න පුළුවන්ද?

කුඹුක් ගස් ජාවාරම්කරුවන් : නිදහස් කිරීම
வெட்டுமர கள்ளக்கடத்தல்காரர்கள் : விடுதலை
KUMBUK TREE RACKETEERS : RELEASE

3040/'12

8. ගරු රෝසි සේනානායක මහත්මිය
(මාණ්ඩලික (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) දැදුරුඔය දෙපස කිලෝමීටර් 40ක් දුරට යෝධ කුඹුක් ගස් කපන ජාවාරමක් සිදු වන බවත්;

(ii) සීරන්ගොඩ ප්‍රදේශයේ ගම්වාසීන් විසින් 2012 ජූනි මස 01 වැනි දින කුරුණෑගල පොලිස් ස්ථානයේ දූෂණ මර්දන ඒකකයට කළ පැමිණිල්ලක් අනුව ඉහත සඳහන් දැව ජාවාරම සිදු කළ අය අත්අඩංගුවට ගෙන තිබුණු බවත්;

(iii) 2012 ජූනි මස 01 වැනි දින ප.ව. 3.00ට අත්අඩංගුවට ගත් එම ජාවාරම්කරුවන් එදිනම ප.ව. 6.30 - 7.00 අතර මුදා හළ බවත්;

(iv) එම වැටලීම සිදු කළ පොලිස් නිලධාරියාට සති දෙකකට පසු වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරුවක් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වාරියපොල - ඇල්ල ප්‍රදේශයේ සිට වැල්ලව, ගනේවත්ත ප්‍රදේශය දක්වා දැදුරු ඔය ආශ්‍රිතව මේ වන විට කපා ඇති කුඹුක් ගස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කුඹුක් ගස් විනාශය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් ජාවාරම්කරුවන් කවුරුන්ද:

(iii) අත්අඩංගුවට පත් එම ජාවාරම්කරුවන් ඉහත අ(iii) හි පරිදි නිදහස් කර යැවීමට උපදෙස් ලබා දුන් අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தெதுறு ஓயாவின் இருமருங்கிலும் 40 கிலோ மீற்றர் தூரத்திற்கு பாரிய மருதமரங்களை வெட்டும் கள்ளக்கடத்தல் இடம்பெறுகின்றது என்பதையும்;

(ii) சிரன்கொட பிரதேச கிராமவாசிகள் 2012 யூன் 01ஆம் திகதி குருநாகல் பொலிஸ் நிலைய ஊழல் ஒழிப்பு அலகில் செய்த முறைப்பாட்டுக்கு அமைய மேற்படி வெட்டுமர கள்ளக்கடத்தலை மேற்கொண்டவர்கள் கைதுசெய்யப்பட்டிருந்தார்கள் என்பதையும்;

(iii) 2012 யூன் 01ஆம் திகதி பி.ப. 3.00 மணிக்கு கைது செய்யப்பட்ட மேற்படி கள்ளக்கடத்தல்காரர்கள் அதே தினத்தன்று பி.ப. 6.30 -7.00 மணிக்கிடையே விடுதலை செய்யப்பட்டுள்ளார்கள் என்பதையும்;

(iv) மேற்படி சுற்றிவளைப்பை மேற்கொண்ட பொலிஸ் உத்தியோகத்தருக்கு இரண்டு வாரங்களின் பின்னர் உடனடியாக அமுலுக்கு வரும் வகையில் இடமாற்றம் வழங்கப்பட்டுள்ளது என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) வாரியபொல -எல்ல பிரதேசத்திலிருந்து வெல்லவ கணேவத்தை பிரதேசம் வரை தெதுறு ஓயாவை அண்மித்ததாக இதுவரை வெட்டப்பட்டுள்ள மருதமரங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி மருதமரங்கள் அழிக்கப்பட்டமை தொடர்பாக கைது செய்யப்பட்ட கள்ளக்கடத்தல் காரர்கள் யாவர் என்பதையும்;

(iii) கைது செய்யப்பட்ட மேற்படி கள்ளக்கடத்தல் காரர்களை மேலே அ (i i i)இல் குறிப்பிட்டுள்ளவாறு விடுதலை செய்து அனுப்புவதற்கு அறிவுரை வழங்கியவர்கள் யாவர் என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware -
  (i) that a giant Kumbuk (Terminal arjuna or arjun) tree felling racket is taking place in the area extending to 40 kilometres on either side of Deduru Oya;
  (ii) the persons who conducted this racket had been arrested pursuant to a complaint lodged by the villagers of the Seerangoda area with the Anti-Corruption Unit of the Kurunegala Police Station on 1st June 2012;
  (iii) these racketeers were released between 6.30 p.m. and 7.00 p.m. having been arrested on that same day of 1st June 2012 at 3.00 p.m.; and
  (iv) the police officer who conducted the raid in connection with this has been transferred with immediate effect after two weeks from the raid?

(b) Will he state -
  (i) the number of Kumbuk trees felled from the area around Deduru Oya from Wariyapola-Ella to Wellawa-Ganewatte by now;

(ii) the names of the racketeers who have been arrested for the destruction of those Kumbuk trees; and

(iii) the person who directed the release of the racketeers arrested, as stated in (a) (iii) above?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) කුරුණෑගල කොට්ඨාසය තුළ 2012 වර්ෂයේදී කුඹුක් ගස් කැපීමේ නීති විරෝධී ජාවාරමක් සම්බන්ධයෙන් වාර්තා වී හෝ අනාවරණ වී නොමැත.

(ii) 2012.06.01 වන දින කුරුණෑගල පොලිස් ස්ථානයට හෝ එහි දූෂණ මර්දන අංශය වෙත කුඹුක් ජාවාරම සම්බන්ධයෙන් කිසිම අයකු විසින් පැමිණිල්ලක් කර නොමැති අතර, එදින කිසිදු අත් අඩංගුවට ගැනීමක් සිදු කර නොමැත.

(iii) කුරුණෑගල පොලිස් ස්ථානය මඟින් කුඹුක් දැව සම්බන්ධව අත් අඩංගුවට ගැනීම් කිසිවක් සිදු කර නොමැත.

(iv) එවැනි ස්ථාන මාරුවීමක් සිදු කර නොමැත.

(ආ) (i) සංඛ්‍යාත්මක ගණනක් නොදනී.

(ii) නැත.

(iii) මෙවැනි සිදුවීමක් සිදු වී නොමැත.

(ඇ) අදාළ නැත.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, පුවත් පතක සඳහන් වුණා ගම්වාසීන්ගේ පැමිණිල්ලක් මත අත් අඩංගුවට ගත් සැකකරුවන් හවස 6.30 වන කොට -පැය තුනක් වැනි කෙටි කාලයක් ඇතුළත- නිදහස් කළා කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන්නේ, ඒ සම්බන්ධ පැමිණිල්ලක් නැහැ කියලාද? පොලීසියට දන්වා නැහැ කියලාද ඔබතුමා කියන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමියනි, පැහැදිලිව අතුරු ප්‍රශ්නය අහන්න. ඔබතුමිය ප්‍රශ්නය පැහැදිලිව අහනවා නම් මා උත්තර දෙන්නම්.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ඔබතුමා කියන්නේ පැමිණිල්ලක් තිබුණේ නැහැ කියලාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමිය අහපු ප්‍රශ්නයට මා පිළිතුරක් දුන්නා. ඒත් ඒ ප්‍රශ්නයම ආපසු අහනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

(ආ) (iii) ප්‍රශ්නයට දීපු පිළිතුර.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

There was no complaint. මා උත්තරයක් දුන්නා, එවැනි පැමිණිල්ලක් නැහැ කියලා. පුවත් පතක තිබුණාය කියන කරුණක් මත නම් ඔබතුමිය පාර්ලිමේන්තුවේ ප්‍රශ්නය ඇහුවේ, එය හරිද, නැද්ද කියලා ඒ පත්‍රයෙන්ම අහගන්න වෙනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

දැදුරු ඔය දෙපැත්තේ කුඹුක් ගස් කපා නැහැ කියලා ඔබතුමා කියනවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒක තමයි කියන්නේ. ගස් කැපුවාට කියා පැමිණිල්ලක් තිබෙනවාද කියලායි ගරු මන්ත්‍රීතුමිය ප්‍රශ්නයෙන් ඇහුවේ. එහෙම පැමිණිල්ලක් නැහැ. එහෙම කාරණාවක් ගැන පත්‍රයේ තිබෙන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් පත්‍රයෙන් තමයි අහන්න වෙන්නේ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

(ආ) (i) යටතේ වාරියපොල - ඇල්ල ප්‍රදේශයේ සිට වැල්ලව, ගනේවත්ත ප්‍රදේශය දක්වා දැදුරු ඔය ආශ්‍රිතව මේ වන විට කපා ඇති කුඹුක් ගස් සංඛ්‍යාව කොපමණද කියා අසා තිබෙනවා. එක කුඹුක් ගහක්වත් කපා නැහැ කියාද කියන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමිය අහන්නේ, නිශ්චිත වශයෙන් ගස් කැපීම සම්බන්ධයෙන් නම්, එය පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාට යොමු විය යුතු කාරණාවක්. ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු වී තිබෙන ප්‍රශ්නයටයි මා පිළිතුරු සපයන්නේ. ගස් කපා තිබුණාය කියා පුවත් පතක තිබුණු ප්‍රවෘත්තියක් මත ඔබතුමිය ප්‍රශ්න අහන්න එපා. ඔබතුමිය මන්ත්‍රීතුමියක්. Telephone එක අරගෙන කෙළින්ම පොලීසියෙන් අහන්න, "ඔබතුමන්ලාට මේ වාගේ පැමිණිල්ලක් ලැබුණාද, නැද්ද?" කියලා. එහෙම අහන්න ආණ්ඩුවේද ඉන්නේ, විපක්ෂයේද ඉන්නේ කියන එක ප්‍රශ්නයක් නැහැ. එය මන්ත්‍රීතුමියක් හැටියට ඔබතුමියට තිබෙන අයිතියක්. පුවත් පතේ තිබෙන ඒවා බලා ඒ මත නම් ප්‍රශ්න අහන්න එපා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. දැන් ඒ ප්‍රශ්න සියල්ලටම "නැහැ" කියලා සම්පූර්ණයෙන් පිළිතුර දුන්නා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැදුරු ඔය ආශ්‍රිතව කිලෝමීටර් 300කට වැඩි ප්‍රමාණයක තැනින් තැන ගස් කැපීම නිසා ඉවුරු බාදනය වන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

[ගරු රෝසි සේනානායක මහත්මිය]

අද අප මේ බලශක්ති අර්බුදයකට මුහුණ දී සිටින අවස්ථාවක පරිසරය ගැන සැලකිලිමත් විය යුතුයි. ජනාධිපතිතුමා එතුමාගේ අය වැය කථාවේදීත් මේ පිළිබඳව කිව්වා. වන සංරක්ෂණය සියයට 35කින් වැඩි කරන්න වෙනමම ප්‍රතිපාදන කොටසකුත් අය වැයෙන් වෙන් කළා. ඒ වන සංහාරයට නොවෙයි, වන සංරක්ෂණයටයි. නමුත් වන සංහාරයක් සිද්ධ වෙනවා. ගරු ඇමතිතුමා මට කියනවා ඒ ප්‍රශ්නය පරිසර ඇමතිතුමාට යොමු කරන්න කියලා. එහෙම නම්-

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
මෙහෙමයි මා හිතන්නේ. දැන් හැම ගහකම, ඔයකම ගස් වැටෙනවා. දැව සංස්ථාව ඒවා කපාගෙන යනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝසි සේනානායක්ක)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු ඇමතිතුමනි, එහෙම නම් මෙහෙම නැහැ කියන්නේ නැතිව ඔබතුමාට දෙන්න තිබුණු පිළිතුර වෙන අමාත්‍යවරයෙකුට මේ ප්‍රශ්නය යොමු කරන්න කියන එකයි. එතුමා එහෙම කියන්නේ නැතිව මේ ප්‍රශ්නය අහවල් ඇමතිතුමාගෙන් අහන්න කිව්වා නම් හරි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ. පොලීසිය සම්බන්ධව ඔබතුමිය ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අහන ප්‍රශ්නයක් නිසා ඒකට උත්තරය දීලා තිබෙනවා. දැන් ඔබතුමිය අහන්නේ වෙන ප්‍රශ්නයක්. ගස් කපන ඒවායි, ගස් පෙරළන ඒවායි, ගංගාවල ඉවුරු ගැනයි දැන් ඔබතුමිය අහන්නේ. ඉතින් ඒ ප්‍රශ්න ඒ අදාළ අමාත්‍යතුමාට ඉදිරිපත් කරන්න.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ඔබතුමිය අහන දිනය සමහර විට වැරදි ඇති. ඒ නිසා check කරලා බලලා දිනය වෙනස් කරලා වෙන දවසක අහන්න. දිනය පොඩ්ඩක් පරීක්ෂා කර බලන්න. දිනයට කලින් වෙන්නත් පුළුවන්; පස්සෙත් වෙන්න පුළුවන්. ඒ නිසා කරුණාකරලා ආපහු හරියට සොයා බලලා අහන්න.

අනුරාධපුර නගරසභා බල ප්‍රදේශය: ඉඩම් කට්ටි
அனுராதபுரம் நகரசபை ஆளுகைப் பிரதேசம் : காணித்துண்டுகள்
ANURADHAPURA MUNICIPAL COUNCIL AREA : PLOTS OF LAND

3103/'12

9. ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. ஹரிசன්)
(The Hon. P. Harrison)
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) අනුරාධපුර නගරසභා බල ප්‍රදේශය තුළ ඇති;

(i) ජනතාව පදිංචි ඉඩම් කට්ටි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත ඉඩම් අතරින් සින්නක්කර ඉඩම් කට්ටි, බදු ඉඩම් කට්ටි හා අනවසර ඉඩම් කට්ටි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් බදු ඉඩම්ලාභීන්ට සින්නක්කර ඔප්පු ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම කටයුතු කඩිනම් කිරීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුර නගරසභා බල ප්‍රදේශය තුළ සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමක් සිදු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඔවුන්ගේ පදිංචිය එම ස්ථානවලම නීත්‍යානුකූල කරන්නේද;

(iii) එම අනවසර පදිංචිකරුවන්ගෙන් වරිපනම් හෝ වෙනත් බදු මුදලක් අය කරන්නේද;

(iv) විදුලිය හා වෙනත් පහසුකම් ලබාදීමේදී ඔවුන්ගේ අයිතිය සනාථ කිරීම සඳහා පරීක්ෂා කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

කාණී, කාණී අපිවිරුත්‌தி අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) අනුරාතපුරම් නකරසපෙ ආලුකෙප් පිරතේසත්තිල් කාණප්පටුම්,

(i) මක්කළ් වසික්කුම් කාණිත් තුණ්ටුකළින් එණ්ණික්කෙ එත්තනෙයෙන්පතෙයුම්;

(ii) මේර්පටි කාණිකළිල් අරුති උරුතික් කාණිත් තුණ්ටුකළ්, කුත්තකෙ කාණිත් තුණ්ටුකළ් මර්රුම් අනුමතියර්ර කාණිත් තුණ්ටුකළින් එණ්ණික්කෙ වෙව්වේරාක එව්වළවෙන් පතෙයුම්

අවර් ඉච්චපෙක්කු කුරිප්පිටුවාරා?

(ආ) (i) මේලේ කුරිප්පිටප්පට්ටුළ්ළ කුත්තකෙ කාණි පෙරුනර්කළුක්කු අරුති උරුතිකළෙ වළංකු වතර්කු මේර්කොළ්ළප්පට්ටුළ්ළ නටවටික්කෙකළ් යාවෙයෙන්පතෙයුම්;

(ii) මේර්පටි නටවටික්කෙකළෙ තුරිතප්පටුත්තුවතර් කාන ඒතේනුම් වේලෙත්තිට්ටම් උළ්ළතා එන්පතෙයුම්

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ඉ) (i) අනුරාතපුරම් නකරසපෙ ආලුකෙප් පිරතේසත්තිල් වසික්කුම් අනුමතියර්ර කුටියිරුප්පාළර්කළ් අප්පුරප්පටුත්තප්පටුවාර්කළා එන්පතෙයුම්;

(ii) ඉන්රේල්, ඉවර්කළින් වතිවු අතේ ඉටංක ළිලේයේ චට්ටරීතියාක්කප්පටුමා එන්පතෙයුම්;

(iii) මේර්පටි අනුමතියර්ර කුටියිරුප්පාළර්කළිට මිරුන්තු ආතන වරි අල්ලතු වේරේතේනුම් වරි අරවිටප්පටුමා එන්පතෙයුම්;

(iv) මින්චාර මර්රුම් ඒනෙය වචතිකළෙ වළංකුම් පෝතු ඉවර්කළින් උරිමෙයෙය උරුතිප්පටුත්තු වතර්කාක පරිචෝතික්කප්පටුමා එන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ඊ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Lands and Land Development:

(a) Will he state -

(i) the number of plots of land occupied by people in the Anuradhapura Municipal Council area;

(ii) separately, the number of freehold plots of land, leased plots of land and illegally occupied plots of land out of the above plots of land ?

(b) Will he inform this House -

(i) of the steps taken to grant freehold deeds to the above mentioned recipients of leased lands; and

(ii) whether there is a programme to expedite such activities?

(c) Will he also state -

(i) whether an eviction of unauthorized occupants in the Anuradhapura Municipal Council area will be carried out;

(ii) if not, whether their residence in those places will be legalized;

(iii) whether assessment or any other tax is levied from those unauthorized occupants; and

(iv) whether their ownership is verified in providing electricity and other amenities?

(d) If not, why?

ගරු සිරිපාල ගමලත් මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சிறிபால கமலத் - காணி, காணி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Siripala Gamalath - Deputy Minister of Lands and Land Development)

ගරු කථානායකතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඔව්.

(i) පදිංචි ඉඩම් කට්ටි සංඛ්‍යාව - 10,921

(ii) සින්නක්කර ඉඩම් කට්ටි සංඛ්‍යාව - 3,444
බදු ඉඩම් කට්ටි සංඛ්‍යාව - 3,036
අනවසර ඉඩම් කට්ටි සංඛ්‍යාව - 3,967

(ආ) (i) දීර්ඝකාලීන බදුකර මත බදු ගෙවමින් පදිංචිව සිටින බදු ඉඩම්ලාභීන්ට බදුකරය අනුමත වී වසර 5ක් සම්පූර්ණ වූ පසු දීමනා පත්‍ර ලබා දේ.

(ii) ඔව්. 2013 වසරේ සිට දීමනා පත්‍ර නිකුත් කරන ඉලක්කය වැඩි කිරීම තුළින් මෙම වැඩ පිළිවෙළ කඩිනම් කිරීමට කටයුතු යොදා ඇත.

(ඇ) ඔව්.

(i) අනවසරකරුවන් නියමානුකූල කිරීම රජයේ ප්‍රතිපත්තිය නොවන නමුත් ඉඩම් නොමැති අයවලුන් ලියාපදිංචි කර ඉඩම් කච්චේරි ක්‍රමය මඟින් සුදුසුකම් පරීක්ෂා කර බලා ඉඩම් ලබා දේ.

(ii) ඉහත (i) පිළිතුරම අදාළ වේ.

(iii) වරිපනම් අය කිරීම මෙම අමාත්‍යාංශයට අදාළ නැත. අනවසරකරුවන්ගෙන් බදු මුදල් අය නොකෙරේ.

(iv) විදුලිය හා වෙනත් පහසුකම් සැපයීම පළාත් පාලන ආයතනවල කාර්යයක් බැවින් මෙම අමාත්‍යාංශයට අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කියන ආකාරයට අනුරාධපුර නගරයේ ඉඩම් කට්ටි 3,900 ගණනක්, ඒ කියන්නේ 4,000 ආසන්න සංඛ්‍යාවක් අනවසර පදිංචිකරුවන් සිටිනවා. නමුත් මේ වන විට එම අනවසර පදිංචිකරුවන්ට අවශ්‍ය විදුලිය, ජලය වාගේ සියලුම පහසුකම් ලබා දීලා තිබෙනවා. ඔබතුමාගේ පිළිතුරේ තිබෙනවා ඒ අයගේ ස්ථිර පදිංචිය නියමානුකූල කිරීමක් කරන්නේ නැහැයි කියලා. එහෙම නම් මේ අය සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද? ඔබතුමන්ලා ඒ අයව ඉවත් කරනවාද, එසේ ඉවත් කරලා වෙනත් තැන්වලින් විකල්ප ඉඩම් ලබා දෙනවාද?

ගරු සිරිපාල ගමලත් මහතා
(மாண்புமிகு சிறிபால கமலத்)
(The Hon. Siripala Gamalath)

ඒ ඉඩම් කට්ටිවල පරිසරය අනුව නැවත ඉඩම් කච්චේරි තියලා, register වුණ අයගේ සුදුසුකම් පරීක්ෂා කරලා ඉඩම් ලබා දෙනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

අනවසර පදිංචිකරුවන් 3,000 ගණනක් ඉන්නවා. ඉඩම් කච්චේරිවලින් පරීක්ෂා කරලා තමයි නීත්‍යානුකූලව ලබා දීලා තිබෙන්නේ. ඒ තැන්වල නොවෙයි මේ අය පදිංචි වෙලා ඉන්නේ. එහෙම නම් ඒ අය වෙනුවෙන් ගන්නා පියවර මොකක්ද?

ගරු සිරිපාල ගමලත් මහතා
(மாண்புமிகு சிறிபால கமலத்)
(The Hon. Siripala Gamalath)

ඉඩම් නැහැ කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ register වෙලා තිබෙනවා නම් එවැනි අයට පමණයි, -නැවත ඉඩම් කච්චේරි තියලා- ඉදිරිපත් වන්නට පුළුවන්කම තිබෙන්නේ. එසේ ඉදිරිපත් වන අයව පරීක්ෂා කරලා තමයි දෙන්නේ. සුදුසුකම් නැති අය ඉවත් කරනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

අනුරාධපුර මහ නගර සභාව මඟින් පනතක් pass කර ගෙන තිබෙනවා මේ සියලු දෙනාම නියමානුකූලව පදිංචි කරන්න. ඒ සඳහා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයෙන් අවසරය දීලා තිබෙනවාද?

ගරු සිරිපාල ගමලත් මහතා
(மாண்புமிகு சிறிபால கமலத்)
(The Hon. Siripala Gamalath)

අවසානයේ ඉඩම් ලබා දීම කරන්නේ ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා විසිනුයි. ඒ පරිසර ඇගැයීම් කරලා සුදුසුකම් තිබෙන අයට ඉඩම් ලබා දීම කරනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මම ඒක නොවෙයි කියන්නේ.

ගරු සිරිපාල ගමලත් මහතා
(மாண்புமிகு சிறிபால கமலத்)
(The Hon. Siripala Gamalath)
මොන ආයතනයෙන් තීරණය කළත් අවසාන තීන්දුව ගන්නේ ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා. එතුමා තමයි අවසානයේ මේ ඉඩම දීම තීරණය කරන්නේ. කුමන ආයතනය තීරණ ගත්තත් අවසාන තීරණය ගන්නේ ඉඩම් කොමසාරිස් ජනරාල්තුමායි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අනුරාධපුර මහ නගර සභාවත් UDA එකත් එකතු වෙලා ගත්ත මේ තීන්දුව පටහැනියි කියලාද ඔබතුමා කියන්නේ?

ගරු සිරිපාල ගමලත් මහතා
(மாண்புமிகு சிறிபால கமலத்)
(The Hon. Siripala Gamalath)
පරිසරය අනුව, ඒ කියන්නේ ඇළ, වේලි, වැව්, රක්ෂිත සහ කාණු පද්ධති වාගේ ඒවා උඩ ඉඩම් කවුරුන් හෝ අල්ලා ගෙන සිටිනවා නම් කවුරුන් තීන්දු ගත්තත් ඒවා දෙන්න පුළුවන්කමක් නැහැ. අනවසර නම්, ඒ සුදුසුකම් නැත්නම් ඒවායින් ඉවත් විය යුතුයි. ඒ විධියට කටයුතු කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-3287/'12-(1), ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் இந்தக் கேள்வியைக் கேட்கின்றேன்.

ගරු ජීවන් කුමාරණතුංග මහතා (තැපැල් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க - தபால் சேவைகள் அமைச்சர்)
(The Hon. Jeewan Kumaranatunga - Minister of Postal Services)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" : මන්ද පෝෂණයට ලක් වන දරුවන් මුදා ගැනීම

"மஹிந்த சிந்தனை எதிர்கால நோக்கு" : குறையூட்டத்துக்கு ஆளாகும் பிள்ளைகளை விடுவித்தல்

"MAHINDA CHINTANA - VISION FOR THE FUTURE" : RELIEF FOR CHILDREN SUFFERING FROM MALNUTRITION

2342/'12

12. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) ළමාවියේ දී මන්ද පෝෂණයට හෝ ඌන පෝෂණයට ලක් වන දරුවන් එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා අවශ්‍ය සියලුම වර්ගවල කිරි, බෙහෙත්, විටමින් හා ආහාර ද්‍රව්‍ය ජන සභාව හරහා බෙදා හැරීමට "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව මඟින් පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන ජන සභා කාර්යාල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) சிறுவயதில் குறையூட்டத்துக்கு ஆளாகின்ற பிள்ளைகளை இந்நிலையிலிருந்து விடுவிப்ப தற்குத் தேவையான அனைத்து பால், மருந்து, விட்டமின் மற்றும் உணவு வகைகளை 'ஜனசபா' ஊடாக விநியோகிப்பதற்கான உறுதிமொழி "மஹிந்த சிந்தனை எதிர்கால நோக்கு" கொள்கைத் திட்டத்தின்மூலம் வழங்கப்பட்டுள்ள தென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) தற்போது இவ்வேலைத் திட்டம் அமுல்படுத் தப்படுகின்றதா என்பதையும்;

(ii) அவ்வாறாயின் இது செயற்படுத்தப்படும் 'ஜனசபா' அலுவலகங்கள் எவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that a pledge was made under the "Mahinda Chintana - Vision for the Future" manifesto that all types of milk, medicines, vitamins and food items required to relieve the children suffering from malnutrition or undernutrition from that state would be distributed through Janasabha?

(b) Will he inform this House -

(i) whether that programme is being implemented at present; and

(ii) if so, the names of Janasabha offices which implement that programme?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) ඔව්. මේ වන විට ශ්‍රී ලංකාවේ සියලුම දරුවන්ගේ පෝෂණය නැංවීම සඳහා දිවයින පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

(ii) සියලුම සෞඛ්‍ය සේවා නිලධාරී කාර්යාල මඟින් මේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා, මේ වැඩසටහන් ක්‍රියාත්මක වනවා කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අඩු බර දරුවන්ගේ ප්‍රතිශතය සියයට 26 සිට සියයට 30 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම කෘශවීම සියයට 18 සිට සියයට 26 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ අඩු බර දරුවන්ගේ ප්‍රතිශතය සියයට 24 සිට සියයට 26 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම කෘශවීම සියයට 16 සිට සියයට 20 දක්වා වැඩි වෙලා තිබෙනවා. වෛද්‍ය පර්යේෂණ ආයතනයේ තොරතුරු හා දත්තවලට අනුව මේ වැඩසටහන අසාර්ථක වැඩසටහනක් හැටියටයි අපට දකින්නට ලැබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, සංඛ්‍යා ලේඛනවලට අනුව යම් කිසි පැහැදිලි වෙනසක් ඇති වන විධියට මන්ද පෝෂණයෙන් පෙළෙන දූ දරුවන්ගේ පෝෂණ ඌනතාවට ශක්තිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේ කවදාද කියලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, මෙතුමා කියන්නේ පෝෂණය සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් තිබෙනවා කියලායි. උසට සරිලන බර ප්‍රමාණය අඩුවීම වැනි පෝෂණ ප්‍රශ්නයක් ලංකාව තුළ තිබෙනවා. විශේෂයෙන්ම නුවරඑළිය ප්‍රදේශයේ එය ප්‍රධාන වශයෙන් තිබෙනවා. මෙය හඳුනා ගෙන මේ වන විටත් අපි ශ්‍රී ලංකාවේ ජාතික පෝෂණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම, වයසට සරිලන බර නොමැති දරුවන්ගේ ප්‍රතිශතය ගත්තාම 2000 වසරේ සියයට 22.8ක් වුණු එක 2007 වර්ෂය වෙන කොට සියයට 21.1ක් දක්වා අඩු වෙලා තිබෙනවා. මේ තොරතුරු මම කියන්නේ වග කීමෙන් යුතුවයි. 2000 වසරේ ජනවාරි මාසයේ කළ සෞඛ්‍ය සමීක්ෂණ හා ඒ තොරතුරු අනුවයි මම කියන්නේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම පෝෂණ ප්‍රශ්න අඩු වීමේ ප්‍රතිශතයකුත් තිබෙනවා. 2000 වසරේ වයසට සරිලන උස නොමැති දරුවන්ගේ ප්‍රතිශතය සියයට 18.4ක් වුණු එක 2007 වසරේදී සියයට 17.3 දක්වා අඩු වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියන ආකාරයට යම් යම් වැඩිවීම් තිබෙනවා වාගේම, යම් අඩු වීමකුත් තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ මේ සඳහා දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන වැඩසටහන තමයි "ත්‍රිපෝෂ" ව්‍යාපෘතිය.

අද ඒ ත්‍රිපෝෂ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1450ක් වෙන් කර, මේ අවුරුද්දේ මේ වනවිට රුපියල් මිලියන 559ක් වියදම් කරලා, දිවයිනේ දරුවන් සඳහා එම ත්‍රිපෝෂ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නට කටයුතු කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම දිවයිනේ ළමයින් 100ට අඩු පාසල්වල ඒ ළමයින් සියලු දෙනාටම වසර බලන්නේ නැතිව දිවා ආහාර වේල අපි සපයනවා. ඒ වාගේම ළමයින් 100ට වැඩියෙන් සිටින දිවයිනේ තෝරාගත් පාසල් සඳහාත් දිවා ආහාරය ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. ඊට අමතරව විශේෂයෙන්ම සමෘද්ධි කොමසාරිස් ජනරාල් යටතේ අපි නව වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබෙනවා. ගර්භනී සහ කිරි දෙන මවුවරුන් සඳහා පෝෂණ මල්ලක් ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන්ම නව චක්‍ර ලේඛන අනුව මාතලේ, මාතර, හම්බන්තොට, මොනරාගල සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවලින් මේ වැඩසටහන් පළමුවෙන්ම ආරම්භ වෙනවා. ඒ අනුව මේ පැකේජයට අඩංගු වනවා, මවුවරුන් සඳහා පෝෂ්‍ය ද්‍රව්‍ය කිලෝ එකක්. ඒ කියන්නේ, විශේෂ සහල්පිටි කිලෝ එකක්, සහල් පිටි තෝසේ මිශ්‍රණය ග්‍රෑම්ස් 400ක්, සුවපෝෂ ග්‍රෑම්ස් 400ක්. මෙම පෝෂණ මල්ල ලබා දීමේදී විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ග්‍රාමීය මට්ටමේ ක්‍රියාකාරී වන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි විසින් පවත්වාගෙන යනු ලබන මවුවරුන්ගේ ලේඛනයේ ලියා පදිංචි වී සිටින මවුවරුන් ගන්නවා. ඒ වාගේම සමෘද්ධිලාභී මවුවරුන් සහ නිසි ශරීර ස්කන්ධ දර්ශකයක් - BMI - නොමැති මවුවරුන්ව මෙම පෝෂණ මල්ල ලබා දීමේ වැඩසටහනට තෝරා ගන්නවා. එවැනි වැඩසටහන් තුළින් බලාපොරොත්තු වන්නේ මන්දපෝෂණය අඩු කිරීමයි.

ගරු කථානායකතුමනි, තව එක දෙයක් තිබෙනවා. මේ ආහාර පුරුදුවල වැරැදි නිසා මේ තත්ත්වය ඇති වෙනවා. ඊයේ-පෙරේදා දවසක මා දන්නා කොළඹ නගරයේ -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාමාන්‍යයෙන් ප්‍රශ්නයට පිළිතුරු දුන්නාම ඇති.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පෝෂණ තත්ත්වය නහාසිටුවීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාත් ලස්සනට කෙටියෙන් අතුරු ප්‍රශ්නය අහන්න බලන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න. මම අහපු පළමුවැනි ප්‍රශ්නය තමයි, -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඒකට උත්තරය දුන්නා. දැන් ඒක වැඩක් නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, ඒකට නොවෙයි උත්තරය දුන්නේ. ගරු කථානායකතුමනි, මම ඇහුවේ -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් මෙයත් දෙවැනි අතුරු ප්‍රශ්නය වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න. ඇමතිතුමාගේත්, නියෝජ්‍ය ඇමතිතුමාගේත් දිස්ත්‍රික්ක දෙකේ අඩු බර දරුවන්ගේ ප්‍රතිශතය, කෘශ වීමේ ප්‍රතිශතය ඉහළ ගිහින් තිබෙනවා, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ තොරතුරුවලට අනුව. කරුණාකරලා කියන්න, මේ කරගෙන යන වැඩසටහන සාර්ථකද, අසාර්ථකද කියා. ඒකයි මම අහපු පළමුවැනි ප්‍රශ්නය. ඒකට නොවෙයි උත්තර දුන්නේ. "මල්ලේ පොල්" උත්තරයක් දුන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි. දැන් එය දෙවැනි අතුරු ප්‍රශ්නය ලෙස සලකා එයට පිළිතුරු දෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
"මල්ලේ පොල්" උත්තරයක් දුන්නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
උත්තර දුන්නා. "මල්ලේ පොල්" නොවෙයි, "පොල්ලේ මල්" උත්තරයක් දුන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අන්න ඒක තමයි දැන් වෙන්නේ. ප්‍රශ්නයත් තෝරා ගන්න. අහන එකත් හොඳට කල්පනාවෙන් අහන්න. [බාධා කිරීමක්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එතකොට එතුමා "පොල්ලේ මල්" ප්‍රශ්න අහන්නේ. "මල්ලේ පොල්" නොවෙයි. එතුමා දැන ගත යුතුයි, එකපාරටම මේ මන්දපෝෂණය කියන එක තුරන් කරන්නට බැහැ කියන එක. මෙයට සෞඛ්‍ය අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය වැනි විවිධ අමාත්‍යාංශ සම්බන්ධ වන්නට ඕනෑ.

ජනතාවගේ ආහාර පුරුදුත් වෙනස් වන්නට ඕනෑ. එම නිසා අප ඒ සඳහා මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා යම් යම් ගැලපෙන වැඩ පිළිවෙළවල් අප ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කය ගත්තොත් වැඩියෙන්ම මේ තත්ත්වය තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි එතුමා ඇහුවේ ඔබතුමාගේ දිස්ත්‍රික්කයයි, ඇමතිතුමාගේ දිස්ත්‍රික්කය ගැන පමණයි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කෑගල්ල දිස්ත්‍රික්කයේත් මේක තිබෙන්නට පුළුවන්. ඒ තත්ත්වය අඩු කරන්නට තමයි මේ ප්‍රතිපත්තිය අප ක්‍රියාත්මක කරන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෑගල්ලේත් තිබෙනවාලු. ඒ තත්ත්වය අඩු කරන්න ඔබතුමාත් උදව් කරන්න. දැන් තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මා අහන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉස්සෙල්ලා ඇහැව්වේ?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මා අහන්නේ. පොඩ්ඩක් සවන් දෙන්න.

ගරු විජයමුණි සොයිසා, එවකට නියෝජ්‍ය අධ්‍යාපන අමාත්‍යතුමා කියා තිබෙනවා, 2005 සිට 2010 වනකොට පාසල් යන දරුවන්ගේ මන්ද පෝෂණය සියයට 12 සිට සියයට 17 දක්වා වැඩි වෙලාය කියා. එය සඳහන් හැන්සාඩ් වාර්තාව මා ළඟ තිබෙනවා. ඔබතුමා විශ්වාස කරන්නේ නැත්නම් මට මේක ඉදිරිපත් කරන්න පුළුවන්. ඔබතුමා සඳහන් කරන ආකාරයට ඔබතුමන්ලාගේ වැඩසටහන සාර්ථක නම්, කොහොම ද පාසල් යන දූ දරුවන්ගේ මන්ද පෝෂණ ප්‍රතිශතය 2005 වර්ෂයේ සියයට 12 සිට 2010 වර්ෂය වනකොට සියයට 17 දක්වා වැඩි වෙන්නේ? කරුණාකර උත්තර දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, හිටපු ගරු අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්ව කථාවක් එතුමා කිව්වේ. මා මෙහිදී පැහැදිලිව කියන්නට ඕනෑ, පෝෂණය සම්බන්ධව යම් ප්‍රශ්නයක් තිබෙන බව. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් දැනට අප රජය හැටියට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කටයුතු කර ගෙන යනවා. මම එහෙම ප්‍රශ්නයක් නැහැයි කිව්වේ නැහැ. යම් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තත්ත්වයට එකපාරට මාසයෙන් දෙකෙන් පිළියම් දෙන්නට බැහැ. මේ ප්‍රශ්නය සඳහා ජාතික වශයෙන් පෝෂණ ප්‍රතිපත්තියක් ඇති කර කටයුතු කරනවා. දැනට ජාතික පෝෂණ ප්‍රතිපත්තිය අප ක්‍රියාත්මක කර තිබෙනවා. දවසෙන් දෙකෙන් මේක කරන්නට බැරි වැඩක්. නමුත් දැනට ඒ සඳහා වැඩ පිළිවෙළ අප ක්‍රියාත්මක කර තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන ඒ වැඩසටහන සාර්ථක නම් විශ්වීය කුසගිනි දර්ශකයෙන් ස්වාසිලන්තය, සෙනගල්, බොස්වානා, නැමිබියා, ලෙසෝතෝ කියන රටවල් අපේ මේ ආශ්චර්යවත් ශ්‍රී ලංකාව අභිබවාගෙන ඉදිරියට ගියේ කොහොම ද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මට එක දෙයයි කියන්නට තිබෙන්නේ ගරු කථානායකතුමනි. අද අපේ රටේ කවුරුවත් කුස ගින්නේ මැරෙන්නේ නැහැ. ඒ වාගේම අද අපේ රටේ වැසියන්ගේ ආයු කාලය ඉතාම වැඩි වී තිබෙනවා. ඔය කියන රටවල් සමඟ බැලුවාම, අද අපේ රටේ මව් මරණ සංඛ්‍යාව ලක්ෂයට - 39යි. ළදරු මරණ සංඛ්‍යාවත් ඉතාම අඩුයි. මේ දර්ශකයන් ගත්තාම අප අග්නි දිග ආසියානු කලාපයේ ඉතාම හොඳ තත්ත්වයක ඉන්නවා. එම නිසා ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කොහෙන් වත් පොඩි දර්ශකයක් ගෙනැවිත් අපේ මේ රටේ තිබෙන මේ තත්ත්වය නැති කරන්න කරන්න එපා.

අද ලෝකයේ ආයු කාලය ගත්තාම අපි ඉතා හොඳ තත්ත්වයක ඉන්නවා. ඒ වාගේම ළදරු මරණ සංඛ්‍යාව, මාතෘ මරණ සංඛ්‍යාව, නව ජන්ම ළදරු මරණ සංඛ්‍යාව ඉතාම අඩු මට්ටමකයි තිබෙන්නේ. ඒ දර්ශකවලින් අපි හොඳ තත්ත්වයක ඉන්නවා. ඒ නිසා අපේ සෞඛ්‍ය තත්ත්වය අපි ඉතා හොඳින් පවත්වා ගෙන යනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි.

ප්‍රශ්න අංක 13 - 2469/'12 - (1), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහන්නේ උත්තරයක් ලැබෙයි කියන විශ්වාසයෙන්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විශ්වාසය බිඳුණා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක බිඳිලායි තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දේශීය සහ ආනයනික පලතුරු කල්තබා ගැනීම : ක්‍රමවේද
உள்நாட்டு மற்றும் இறக்குமதியான பழ வகைகளைப் பேணல்: முறைமை
PRESERVATION OF LOCAL AND IMPORTED FRUITS : METHODOLOGIES

3204/'12

14.ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2005 - 2012 කාල සීමාව තුළ වාර්ෂිකව ශ්‍රී ලංකාවට ආනයනය කළ පලතුරු වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පලතුරු වර්ගයේ කිලෝවක වත්මන් මිල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආනයනික පලතුරු කල් තබා ගැනීම සඳහා අනුමත කරන ක්‍රමවේදයන් කවරේද;

(ii) එම ක්‍රමවේදයන් මිනිස් සිරුරට හිතකර වන්නේද;

(iii) ඉහත ක්‍රමවේදයන් සම්බන්ධයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් ආයතනයක් වෙතින් සහතිකයක් ලබාගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දේශීය පලතුරු කල් තබා ගැනීමට උපයෝගී කර ගන්නා ක්‍රමවේදයන් කවරේද;

(ii) දේශීය පලතුරු ඉක්මනින් ඉදවීමට හාවිතා කරන ක්‍රමවේදයන් කවරේද;

(iii) එම ක්‍රමවේදයන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පාරිභෝගික කටයුතු අධිකාරියේ අවසරය ලබා දී තිබේද;

(iv) පලතුරු ඉදවීමට රසායනික ද්‍රව්‍ය හාවිත කිරීමෙන් මිනිස් ශරීරයට හානි නොවන බවට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පාරිභෝගික ජනතාවට සහතිකයක් ලබා දෙන්නේද;

(v) පාරිභෝගිකයන්ට පිරිසිදු හා ගුණාත්මක පලතුරු වර්ග ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, මන්ද?

කමත්තොழில් அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005 - 2011 ஆம் ஆண்டு கால கட்டத்தில் வருடாந்தம் இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட பழ வகைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு பழ வகையினதும் கிலோ ஒன்றிற்கான இன்றைய விலை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இறக்குமதி செய்யப்பட்ட பழங்களை நீண்டகாலம் பேணி வைத்திருப்பதற்கு அங்கீகரிக்கப்பட்ட முறைமைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி முறைமை மனித உடலுக்கு உகந்ததா என்பதையும்;

(iii) சுகாதாரத் திணைக்களத்திலிருந்து அல்லது வேறொரு நிறுவனத்திலிருந்து மேற்படி முறைமை தொடர்பில் சான்றிதழ் பெற்றுக் கொள்ளப்படுகின்றதா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) உள்நாட்டு பழங்களை நீண்டகாலம் பேணி வைத்திருப்பதற்கு பயன்படுத்தப்படும் முறைமைகள் யாவை என்பதையும்;

(ii) உள்நாட்டு பழங்களை விரைவாக கனியச் செய்வதற்கு பயன்படுத்தப்படும் முறைமைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி முறைமைகளுக்கு கமத்தொழில் திணைக்களம் அல்லது நுகர்வோர் அதிகார சபை அனுமதி அளித்துள்ளதா என்பதையும்;

(iv) பழங்களைக் கனியச் செய்வதற்கு இரசாயனப் பதார்த்தங்களைப் பயன்படுத்துவதால் மனித உடலுக்குப் பாதிப்பு ஏற்படாதென கமத்தொழில் திணைக்களத்தின்மூலம் நுகர்வோருக்கு உறுதி யளிக்கப்படுமா என்பதையும்;

(v) நுகர்வோருக்கு சுத்தமானதும் தரமானதுமான பழவகைகளை வழங்குவதற்காக வேலைத்திட்ட மொன்றைத் தயாரிப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු පී. හැරිසන් මහතා]

asked the Minister of Agriculture:

(a) Will he state -

(i) the number of fruit varieties that were annually imported to Sri Lanka during the period from the year 2005-2012;

(ii) the current price of a kilo of each of the aforesaid fruit varieties?

(b) Will he inform this House -

(i) the approved methodologies for the preservation of imported fruits;

(ii) whether the aforesaid methodologies are healthy for the human body; and

(iii) whether a certificate related to the aforesaid methodologies is obtained from the Ministry of Health or any other institution?

(c) Will he state -

(i) the methodologies used to preserve local fruits;

(ii) the methodologies used to ripen local fruits quickly;

(iii) whether the permission of the Ministry of Agriculture or the Consumer Affairs Authority has been granted for the aforesaid methodologies;

(iv) whether an assurance will be given to the consumers by the Ministry of Agriculture that the human body is not affected by using chemicals to ripen fruits; and

(v) whether a system will be arranged to provide clean and quality fruits for consumers?

(d) If not, why?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් අහන්නේ වැදගත් කාරණයක් සම්බන්ධයෙනුයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් උත්තර දීලා ඉවරයි නේ. තමුන්නාන්සේ ඔය ප්‍රශ්නය සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේ හොඳ විවාදයක් ඇති කර ගන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැතුව විවාදයක් ඉල්ලුවාට හරි යන්නේ නැහැ නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තර දුන්නා, මාස දෙකක් කල් ඉල්ලා. ඊට වඩා මොකක්ද ඉතින්?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ප්‍රශ්න අහන කොට මේවා කියන්න කියලා උත්තරත් දුන්නා නම්- [බාධා කිරීමක්] අපට කරන්න දෙයක් නැහැ නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක නම් මගේ වැඩක් නොවෙයි. ඒක අදාළ අමාත්‍යාංශවල වැඩක්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට විශ්වාසය තිබෙන්නේ ඔබතුමා කෙරෙහි. අපි විපක්ෂයේ. මේ ආණ්ඩුව නිදි. නැඟිටලා වැඩ කරන්නයි මෙතුමන්ලාට තිබෙන්නේ. අපි මේ ප්‍රශ්න අහන්නේ, නිදිමතේ යන ගමනේදීත් වංචා කරන හින්දයි. ඒකටවත් උත්තර ලබා දෙන්නේ නැහැ නේ.

ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)
විපක්ෂය නැඟිටින්න කෝ ඉස්සෙල්ලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද පොඩ්ඩක් කාලය තිබෙන හින්දා කමක් නැහැ. [බාධා කිරීම්] දැන් තමුන්නාන්සේ ලොකු අසාධාරණයක් කරනවා. ඔබතුමා පී. හැරිසන් මන්ත්‍රීතුමාට කරන අසාධාරණයක්. එතුමා ප්‍රශ්නය ඇහුවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් මටත් අසාධාරණයක් නේ වෙන්නේ. ප්‍රශ්නවලට උත්තර නොදෙන එක සාධාරණයිද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උත්තර ලබා දෙයි, මාස දෙකකින්. [බාධා කිරීමක්] හොඳයි. දැන් කරුණාකරලා වාඩි වෙන්න. දැන් පී. හැරිසන් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට උත්තර දෙනවා.

(අ) (i) මෙම අමාත්‍යාංශයට අදාළ නැත.

(ii) මෙම අමාත්‍යාංශයට අදාළ නැත.

(ආ) (i) අදාළ නැත.

(ii) අදාළ නැත.

(iii) අදාළ නැත.

(ඇ) (i) a. ගස මත පවතින විට වරින්වර නෙළා ගැනීම

b. ශීතකරණ හෝ සිසිල්කරණවල ගබඩා කිරීම

(ii) a. ඉදවීමේ කාමර/කුටි තුළ තැබීම

b. දුම් ගැසීම

c. කාබයිඩ් යෙදීම

d. එතිලීන් සංයෝග ඉසීම

(iii) එම ක්‍රම අනුගමනය කළ පලතුරු සඳහා පාරිභෝගික අධිකාරියේ අවසරය නොලබයි. එවැනි අවශ්‍යතාවක් ප්‍රකාශයට පත් කර නැත.

(iv) එවැනි ක්‍රමවේදයක් නොමැත.

(v) පාරිභෝගිකයන්ට හොඳ ගුණාත්මක පලතුරු ලබා දීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

a. පැසුණු ගෙඩි හඳුනා ගැනීමේ ක්‍රමවේද/ලක්ෂණ පිළිබඳ දැනුවත් කිරීම

b. උසස් ගුණාත්මක පලතුරු සඳහා පෙර හා පසු අස්වනු හඳුන්වාදී ජනප්‍රිය කිරීම

c. එල නෙළා ගැනීමේ ක්‍රම, අවස්ථා හා උපකරණ හඳුන්වා දීම

d. එල ගබඩා කිරීමේ පරිසර තත්ත්ව පෙන්වා දීම

e. කෘෂි පළිබෝධ රෝග මර්දනය /පාලනය පිළිබඳ දැනුවත් කිරීම

f. ඒකාබද්ධ පළිබෝධ මර්දන ක්‍රම හඳුන්වා දීම

g. පාසල් තුළින් මෙම දැනුම ප්‍රචලිත කිරීම

h. වෙළෙන්දන්/ප්‍රවාහකයන්/පාරිභෝගිකයන් දැනුවත් කිරීම.

(ඈ) අදාළ නොවේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. ගරු කෘෂිකර්ම ඇමතිතුමනි, අද මේ රටේ හූහක් තැන්වල හොඳ පලතුරු ගන්න නැහැ. මොකද, රසායනික ද්‍රව්‍ය යොදලා දළු පලතුරුවලට බෙහෙත් ගැසීම නිසා හොඳ පලතුරක් අද පාරිභෝගිකයාට ආහාරයට ගැනීමට අවස්ථාවක් නැහැ.

ඒ ගැන මීට කලිනුත් අවස්ථා කිහිපයකදී අපි මතක් කළා. ඒක නවත්වන්න කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියට ඔබතුමා ගෙන ඇති පියවර මොනවාද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, එතුමා කියන්නේ පලතුරු ඉදවීම සඳහා භාවිත කරන විවිධ ක්‍රම ගැනයි. මේ ව්‍යාපාරයේ යෙදෙන උදවිය ඒ සඳහා එක එක ක්‍රම භාවිත කරනවා. කෙසෙල් ගෙඩි ඉදවන්න සමහරු දුම් ගහනවා. ඒකෙන් කිසි හානියක් නැහැ. සමහරු එතිලීන් ගහනවා. තවත් සමහරු විවිධ රසායනික ද්‍රව්‍ය යොදා මේවා ඉදවනවා. ඇත්ත වශයෙන්ම ඒක නරක පුරුද්දක්. ඒක නොකළ යුතු දෙයක්. නමුත් මේවා පාලනය කරන්න අපට ක්‍රමවේදයක් නැහැ, ගරු කථානායකතුමනි. අපට කරන්නට තිබෙන්නේ ජනතාව දැනුවත් කිරීම පමණයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

කෘෂිකර්ම ඇමතිතුමා හැටියට ඔබතුමා මේ සඳහා යම්කිසි පියවරක් ගන්න ඕනෑ. මොකද, මේ රටේ-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මතක් කරලා දුන්නු එක හොඳයි. පියවරක් ගන්නවාද කියලා ඇහුවා නම් හරි.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

අපි කාබයිට් යොදලා පලතුරු ඉදවීම තහනම් කරලායි තිබෙන්නේ. නමුත් තැන් තැන්වල ඒක පාවිච්චි කරනවා. අපට කරන්න දෙයක් නැහැ. කාබයිට් ගහපු පලතුරු භාවිතයට ගන්න එපා කියලා අපි ජනතාව දැනුවත් කරනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ඒක හරියන්නේ නැහැ, වෙළෙඳ පොළේ තිබෙන එක දෙන්න ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හරි, හරි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ රටේ තහනම් වගාවන් තිබෙනවා. කෘෂිකර්ම ඇමතිතුමා හැටියට ඔබතුමා දන්නවා, කංසා වගාව අපේ රටේ සම්පූර්ණයෙන්ම තහනම් බව. අපි කංසා ගැන කියන කොට එක එක ඇමතිවරුන්ගේ නම් කියැවෙනවා. ඒක වෙනම කථාවක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ ටික අදාළ නැත.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම ඇමතිවරයා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයේ මහා පරිමාණයෙන් කොකේන් වගාවට අවශ්‍ය පැළ බෙදා දී තිබෙනවා. මේක පෙන්නුවේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරින්මයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හරි, ඉතින් ඒක ඇත්තද කියලා අහන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

එය ලෝකයේම තහනම් කරපු වගාවක්. මාතර දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම ඇමතිතුමාගේ කොට්ඨාසයේ ඒ පැළ බෙදා හැර තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, ඒ ඇති. එහෙම එකක් වෙලා තිබෙනවාද කියලා අහන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, කොකේන් කියන ගස් වර්ගය මේ රටේ අපි කවුරුවත් හඳුනා ගෙන නැහැ. එතුමා ඒක හඳුනා ගෙන තිබෙනවා. එතුමා හඳුනා ගෙන තිබෙන්නේ කොහොමද දන්නේ නැහැ. මේ ගැන එතුමාත් දන්නවා ඇති.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි දැන් අහපු එකට පිළිතුරු දුන්නා. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇමතිතුමා කිව්වා, මම හඳුනා ගෙන තිබෙනවා කියලා. අඩු ගණනේ ඒ ගැන අවබෝධයක් තිබෙන කෙනකු හැටියට මම එය හඳුනා ගෙන තිබෙනවා කියා පිළිගැනීම ගැන ඇමතිතුමාට බොහොම ස්තුතියි. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ කොකේන් වගාව ආරම්භ කර තිබෙන්නේ ඔබතුමා දේශපාලනයෙන් විශ්‍රාම ගියාට පස්සේ පොඩි බිස්නස් එකක් හැටියට ඉදිරියට පවත්වා ගෙන යන්නද කියා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එතුමා ගංජා ගැනත් කථා කළා. ඒ ගැන මට සැකයි. එතුමාට මේ ව්‍යාපාරය ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. කොකේන් ගැනත් එතුමාට හොඳ අවබෝධයක් තිබෙනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මම මාතර පැත්තේ ගිහිල්ලා නැහැ. නමුත් එහේ වගා කරනවා -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒවා වැවෙන්නේ මොන දේශගුණයේද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳ කොකේන් ගොවියෙක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමාගේ ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරට අදාළවයි මා මෙය අහන්නේ ගරු ඇමතිතුමා. පලතුරු, එළවලු කල් තබා ගැනීමට ශීතාගාර ඉදි කරන අයට තමුන්නාන්සේලා විදුලිය බිල සම්බන්ධයෙන් සහනයක් දෙනවාද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
දැනටමත් එහෙම පවත්වා ගෙන යන උදවිය ඉන්නවා. හැබැයි එවැනි සහනයක් දෙන වැඩ පිළිවෙළක් නම් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඕනෑ නම් මට දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් දෙවන වටය.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල : විදේශීය සිසුන්
இலங்கைப் பல்கலைக்கழகங்கள் : வெளிநாட்டு மாணவர்கள்
UNIVERSITIES OF SRI LANKA : FOREIGN STUDENTS

2532/'12

4. ගරු විජිත හේරත් මහතා - (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)
(மாண்புமிகு விஜித ஹேரத் - மாண்புமிகு அநுர திஸாநாயக்க சார்பாக)
(The Hon. Vijitha Herath on behalf of the Hon. Anura Dissanayake)
උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2010 - 2011 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ එක් එක් විශ්වවිද්‍යාලයේ විදේශීය සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිශතය 5% දක්වා වැඩි කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිශතය අනුව ඉහත අධ්‍යයන වර්ෂයේ එක් එක් පීඨය සඳහා විදේශීය සිසුන් වෙනුවෙන් වෙන් කරන ලද අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට එම එක් එක් පීඨයට ඇතුළත් වී ඇති විදේශීය සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ අනුව දැනට එම එක් එක් පීඨයේ විදේශීය සිසුන් සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීමට අනුගමනය කරන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 - 2011 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ විදේශීය සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

උයර් කල්වි අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) 2010-2011 කල්වි ආණ්ඩුක්කාක ඉලංකෙයින් ඔව්වොරු පල්කලෙක්කළකත්තිලුම් වෙලිනාට්ටු මාණවර්කළෙ අනුමතික්කුම් සතවීතමානතු 5% වරෙ අතිකරික්කප්පට්ටුල්ළතා;

(ii) ஆமெனில், இந்த சதவீதத்துக்கமைய மேற்படி கல்வியாண்டுக்காக ஒவ்வொரு பீடத்திற்குமென வெளிநாட்டு மாணவர்களுக்காக ஒதுக்கப்பட்ட வாய்ப்புக்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iii) தற்போது மேற்படி ஒவ்வொரு பீடத்திலும் அனுமதிக்கப்பட்டுள்ள வெளிநாட்டு மாணவர் களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iv) இதன் பிரகாரம், தற்போது குறித்த ஒவ்வொரு பீடத்திலும் வெளிநாட்டு மாணவர்களுக்காக காணப்படும் வெற்றிடங்கள் யாவை;

(v) மேற்படி வெற்றிடங்களை நிரப்புவதில் பின்பற்றப்படும் வழிமுறைகள் யாவை

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2010-2011 கல்வி ஆண்டிற்காக பல்கலைக்கழக அனுமதியைப் பெற்ற வெளிநாட்டு மாணவர்களுக்கு புலமைப் பரிசில் வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், இதற்கான நிதி ஏற்பாடுகளைப் பெற்றுக்கொள்ளும் வழிமுறைகள் யாவை என்பதையும்

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education:

(a) Will he state -

(i) whether the percentage of foreign students admitted to each of the universities in Sri Lanka has been increased up to 5 per cent for the academic year 2010 –2011;

(ii) if so, on the basis of the aforesaid percentage, the number of opportunities allocated for foreign students in each of the faculties for the above academic year separately;

(iii) separately, the number of foreign students who have entered each of the aforesaid faculties by now;

(iv) the existing number of vacancies for foreign students in each of the aforesaid faculties at present accordingly; and

(v) the measures adopted to fill the aforesaid vacancies?

(b) Will he inform this House -

(i) whether action will be taken to award scholarships for the foreign students who have entered the universities for the academic year 2010 - 2011; and

(ii) if so, the manner in which financial provisions are obtained for that purpose?

(c) If not, why?

ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)

(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)

(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඇමුණුමෙහි දක්වා ඇත.

(iii)

පාඨමාලාව	ශිෂ්‍ය සංඛ්‍යාව
වෛද්‍ය විද්‍යා පාඨමාලාව	17
දන්ත ශල්‍ය විද්‍යා පාඨමාලාව	02
ඉංජිනේරු විද්‍යා පාඨමාලාව	01
ජෛවීය විද්‍යා පාඨමාලාව	01
පරිගණක විද්‍යාව පාඨමාලාව	01

මීට අමතරව එක් එක් විශ්වවිද්‍යාල වෙනත් රටවල් සමඟ ඇති කර ගන්නා ලද ගිවිසුම් යටතේ විදේශ සිසුන් ප්‍රථම උපාධි පාඨමාලා සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනේ.

(iv)

පාඨමාලාව	පුරප්පාඩු
වෛද්‍ය විද්‍යා පාඨමාලාව	41
දන්ත ශල්‍ය විද්‍යා පාඨමාලාව	03
ඉංජිනේරු විද්‍යා පාඨමාලාව	62
ජෛවීය විද්‍යා පාඨමාලාව	57
පරිගණක විද්‍යාව පාඨමාලාව	11

ඉහත පාඨමාලා සඳහා පවතින පුරප්පාඩු හැර අනෙකුත් පාඨමාලාවන්හි පවතින පුරප්පාඩු ඇමුණුමෙහි තිරු අංක 05 යටතේ දක්වා ඇත.

(v) ඇමුණුමෙහි දක්වා ඇති පාඨමාලා සඳහා යෝජිත ස්ථාන සංඛ්‍යාව ඇතුළත විදේශීය සිසුන් ඇතුළත් කර ගනු ලබන්නේ සියයට 0.5ක ප්‍රමාණයක් පමණි. ඒ යටතේ වෛද්‍ය විද්‍යා පාඨමාලාවට හැර අනෙකුත් පාඨමාලා සඳහා විදේශීය සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික හෝ විදේශ සිසුන් අයදුම් නොකිරීම හේතුවෙන් පුරප්පාඩු ඇති වී ඇත. එහෙත් එම පුරප්පාඩු පිරවීමට හැකියාවක් නොමැත. එයට හේතුව එම පුරප්පාඩු පිරවිය යුත්තේ සුදුසුකම් ලත් විදේශීය සිසුන්ගෙන් වීමයි. තවද, සියයට 4.5ක ප්‍රමාණය යටතේ විදේශ සිසුන් ඇතුළත් කිරීම සම්පූර්ණයෙන් මුදල් ගෙවීමේ පදනම මත ඒ ඒ විශ්වවිද්‍යාලයේ එකඟතාව මත **<u>විදේශීය සිසුන්ට යෝජිත ස්ථාන සංඛ්‍යාවට අමතරව</u>** සුදුසුකම් සහිත සිසුන් අයදුම් කළහොත් පමණක් බඳවා ගන්නා බැවින් එම කොටස යටතේ පාඨමාලා සඳහා පුරප්පාඩු පිරවීමක් සිදු කිරීමට නොහැක. මෙම විදේශ සිසුන්ගෙන් ලබා ගන්නා සම්පූර්ණ ආදායම විශ්වවිද්‍යාල සිසුන්ගේ අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීම සඳහා විශ්වවිද්‍යාල විසින් යොදා ගනු ඇත.

(ආ) (i) විදේශීය සිසුන් ඇතුළත් කර ගන්නා සියයට 5ක ප්‍රමාණය යටතේ ශිෂ්‍යත්ව ලබා දීමක් සිදු නොකෙරේ.

(ii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

[ගරු එස්.බී. දිසානායක මහතා]

ඇමුණුම

2010/2011 අධ්‍යයන වර්ෂය

විදේශීය සුදුසුකම්ලත් සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම - යෝජිත ස්ථාන සංඛ්‍යාවන්

1 පාඨමාලාව	2 දේශීය සිසුන් සඳහා යෝජිත ස්ථාන සංඛ්‍යාව	3 0.5% යටතේ වෙන් කරන ලද ස්ථාන සංඛ්‍යාව (ආසන්න වශයෙන්)	4 *4.5% යටතේ වෙන් කරන ලද ස්ථාන සංඛ්‍යාව (ආසන්න වශයෙන්)	5 එකතුව (5%) (ආසන්න වශයෙන්)
වෛද්‍ය විද්‍යාව	1165	6	52	58
දන්ත ශල්‍ය විද්‍යාව	80	1	4	5
පශු වෛද්‍ය විද්‍යාව	100	1	5	6
කෘෂි තාක්ෂණය හා කළමනාකරණය	200	1	9	10
කෘෂිකර්මය	670	3	30	33
ආහාර විද්‍යාව හා පෝෂණය	100	1	5	6
ආහාර විද්‍යාව හා තාක්ෂණය	90	1	4	5
ඖෂධීය විද්‍යාව	1145	6	52	58
ආයුර්වේද	270	1	12	13
යුනානි	50	1	2	3
සිද්ධ වෛද්‍ය විද්‍යාව	70	1	3	4
ව්‍යාවහාරික විද්‍යාව (ඖෂධීය විද්‍යාව)	170	1	8	9
සත්ත්ව ප්‍රවර්ධනය	50	1	2	3
ඉංජිනේරු විද්‍යාව	1265	6	57	63
ඉංජිනේරු විද්‍යාව (EM)	50	1	2	3
ඉංජිනේරු විද්‍යාව (TM)	50	1	2	3
වාස්තු විද්‍යාව	55	1	2	3
මෝස්තර නිර්මාණ ශිල්පය (වාස්තු විද්‍යාව)	50	1	2	3
විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය	40	1	2	3
පරිගණක විද්‍යාව	240	1	11	12
තොරතුරු තාක්ෂණය	100	1	5	6
කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය	50	1	2	3
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	230	1	10	11
නගර හා ග්‍රාම නිර්මාණය	50	1	2	3
භෞතික විද්‍යාව	1735	9	78	87
ප්‍රමාණ සමීක්ෂණය	100	1	5	6
මිනුම් විද්‍යාව	60	1	3	4
ව්‍යාවහාරික විද්‍යාව (භෞතික විද්‍යා)	320	2	14	16
කළමනාකාරණය	3440	17	155	172
රාජ්‍ය කළමනාකරණය (විශේෂ)	75	1	3	4
ජන සන්නිවේදන අධ්‍යයනය	50	1	2	3
දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය	60	1	3	4
කළමනාකරණ අධ්‍යයනය (TV)-A	150	1	7	8
වාණිජ්‍යය	470	2	21	23
කලා	4800	24	216	240
කලා - (SP) ජනමාධ්‍යය	150	1	7	8

2010/2011 අධ්‍යයන වර්ෂය

විදේශීය සුදුසුකම්ලත් සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම - යෝජිත ස්ථාන සංඛ්‍යාවන්

1 පාඨමාලාව	2 දේශීය සිසුන් සඳහා යෝජිත ස්ථාන සංඛ්‍යාව	3 0.5% යටතේ වෙන් කරන ලද ස්ථාන සංඛ්‍යාව (ආසන්න වශයෙන්)	4 *4.5% යටතේ වෙන් කරන ලද ස්ථාන සංඛ්‍යාව (ආසන්න වශයෙන්)	5 එකතුව (5%) (ආසන්න වශයෙන්)
කලා (SAB) - A	200	1	9	10
නීතිය	350	2	16	18
සාමය හා ගැටුම් නිරාකරණය	35	1	2	3
ශාස්ත්‍ර	205	1	9	10
ඖෂධ විද්‍යාව	105	1	5	6
ශල්‍යාගාර රසායනාගාර විද්‍යා	100	1	5	6
විකිරණ ශිල්පය	35	1	2	3
භෞතික චිකිත්සක	60	1	3	4
පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	50	1	2	3
පහසුකම් කළමනාකරණය	50	1	2	3
ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය	50	1	2	3
අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව	60	1	3	4
කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූලධ	60	1	3	4
සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	50	1	2	3
පරිගණනය සහ කළමනාකරණය	50	1	2	3
ධීවර සහ සාගර විද්‍යාව	60	1	3	4
ඉස්ලාම් අධ්‍යයනය	150	1	7	8
අරාබි භාෂාව	100	1	5	6
විද්‍යාව සහ තාක්ෂණය	50	1	2	3
පරිගණක විද්‍යාව හා තාක්ෂණය	50	1	2	3
ව්‍යාවසායකත්වය හා කළමනාකරණය	50	1	2	3
සත්ත්ව පාලන විද්‍යාව	50	1	2	3
අපනයන කෘෂිකර්මය	50	1	2	3
සංගීතය (SVP)	315	2	14	16
නැටුම් (SVP)	300	2	14	16
චිත්‍ර සහ නිර්මාණ (රාමනාදන් ඇකඩමිය)	30	1	1	2
නාට්‍ය හා රංග කලා (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)	70	1	3	4
චිත්‍ර සහ මූර්ති කලා (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)	70	1	3	4
දෘශ්‍ය හා තාක්ෂණික කලා	50	1	2	3
තේ තාක්ෂණය සහ අගය එකතුකිරීම	50	1	2	3
කාර්මික තොරතුරු තාක්ෂණය	50	1	2	3
ගනිජ සම්පත් සහ තාක්ෂණය	50	1	2	3
ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ)	50	1	2	3

2010/2011 අධ්‍යයන වර්ෂය

විදේශීය සුදුසුකම්ලත් සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම - යෝජිත ස්ථාන සංඛ්‍යාවන්

1 පාඨමාලාව	2 දේශීය සිසුන් සඳහා යෝජිත ස්ථාන සංඛ්‍යාව	3 0.5% යටතේ වෙන් කරන ලද ස්ථාන සංඛ්‍යාව (ආසන්න වශයෙන්)	4 *4.5% යටතේ වෙන් කරන ලද ස්ථාන සංඛ්‍යාව (ආසන්න වශයෙන්)	5 එකතුව (5%) (ආසන්න වශයෙන්)
කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (SEUSL)	80	1	4	5
ආගණනය සහ තොරතුරු පද්ධති	80	1	4	5
ශාරීරික අධ්‍යාපනය	35	1	2	3
ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	35	1	2	3
කථන හා ශ්‍රවන විද්‍යාව	50	1	2	3
සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව	50	1	2	3
ජලජ සම්පත් තාක්ෂණය	50	1	2	3
තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩිකිරීම	50	1	2	3
ආගන්තුක සත්කාර, සංචාරක සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	50	1	2	3
ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය	60	1	3	4
තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය	50	1	2	3
සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය	100	1	5	6
එකතුව	21495	150	968	1118

* මෙම ස්ථාන සංඛ්‍යාවන්ට අදාළව සිසුන් බඳවාගැනීම සඳහා විදේශ සුදුසුකම්ලත් සිසුන් ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් කර නොමැත.

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]

[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]

[This annex is also placed in the Library.]

පාසල් නිල ඇඳුම් : ඇස්තමේන්තු කළ මුදල

பாடசாலைச் சீருடைகள் : மதிப்பீட்டுப் பணத்தொகை

SCHOOL UNIFORMS : MONEY ESTIMATED

2625/'12

5. ගරු විජිත හේරත් මහතා - (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)

(மாண்புமிகு விஜித ஹேரத் - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)

(The Hon. Vijitha Herath on behalf of the Hon. Sunil Handunnetti)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2012 වර්ෂය සඳහා නව පාසල් වාරය ආරම්භ වූ දිනය කවරේද;

(ii) 2012 වර්ෂය සඳහා පාසල් නිල ඇඳුම් ලබා දීම වෙනුවෙන් ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(iii) 2011 වර්ෂය සඳහා පාසල් නිල ඇඳුම් ලබා දුන් දිනය කවරේද;

(iv) එම වර්ෂයේදී පාසල් නිල ඇඳුම් ලබා දීම සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2012ஆம் ஆண்டுக்காக புதிய பாடசாலைத் தவணை தொடங்கிய திகதி யாது என்பதையும்;

(ii) 2012ஆம் ஆண்டுக்காக பாடசாலை சீருடைகளை வழங்குவதற்காக மதிப்பீடு செய்யப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) 2011ஆம் ஆண்டுக்காக பாடசாலை சீருடைகள் வழங்கப்பட்ட திகதி யாது என்பதையும்;

(iv) அவ்வாண்டில் பாடசாலை சீருடைகளை வழங்குவதற்காக மதிப்பீடு செய்யப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state -

(i) the date on which the new school term started for the year 2012;

(ii) the amount of money estimated to provide school uniforms for the year 2012;

(iii) the date on which school uniforms were given for the year 2011; and

(iv) the amount of money estimated to provide school uniforms in that year?

(b) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2012 .01.02

(ii) රුපියල් මිලියන 1,600යි.

(iii) 2011 වර්ෂය සඳහා පාසල් දරුවන් වෙත නිල ඇඳුම් ලබා දීම සඳහා 2010.11.30 දින සිට ඔරුගොඩවත්ත පිහිටි අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් නිල ඇඳුම් ගබඩාවෙන් දිවයිනේ පිහිටි සියලු කලාප අධ්‍යාපන කාර්යාල වෙත පාසල් නිල ඇඳුම් බෙදා හැරීම ආරම්භ කර ඇත.

(iv) රුපියල් මිලියන 1,595යි.

(ආ) අදාළ නොවේ.

2012 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව : අරමුණු

நட்டாண்டு அரசிறை நிலைமை பற்றிய அறிக்கை, 2012 : நோக்கம்

MID-YEAR FISCAL POSITION REPORT 2012 : OBJECTIVES

3006/'12

7. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අරමුණු වනුයේ රජයේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශනයේ දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ මූල්‍ය කාර්ය සාධනය ඇගයීමට මහ ජනතාවට අවස්ථාව ලබා දීම බවත්;

(ii) වියදම, ආදායම, මුදල් ප්‍රවාහ සහ ණය ගැනීම සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ පළමු මාස හතර සඳහා ඇස්තමේන්තුගත සහ තථ්‍ය මුදල් ප්‍රමාණ පිළිබඳ ප්‍රකාශනයක් එකී වාර්තාවේ අන්තර්ගත විය යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 2012 ජූනි 29 දිනැති 2012 සඳහා වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි, 2012 පළමු මාස හතර සඳහා,

(i) ඇස්තමේන්තුගත සහ තථ්‍ය වියදම;

(ii) ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම;

(iii) ඇස්තමේන්තුගත සහ තථ්‍ය මුදල් ප්‍රවාහය;

(iv) ඇස්තමේන්තුගත සහ තථ්‍ය ණය ගැනීම්;

ඇතුළත්ව තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2003ஆம் ஆண்டின் 3ஆம் இலக்க அரசிறை முகாமைத்துவ (பொறுப்புச்)சட்டத்தின் கீழ் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்ட நட்டாண்டு அரசிறை நிலைமை பற்றிய அறிக்கையின் நோக்கம் அதன் அரசிறை மூலோபாயக் கூற்றில் குறிப்பிடப்பட்டவாறு அரசிறை மூலோபாயத்திற்கு எதிராக அரசாங்கத்தின் அரசிறைச் செயலாற்றுகையை மதிப்பிடுவதற்கு பொதுமக்களை இயலச் செய்வதாகும் என்பதையும்;

(ii) சம்பந்தப்பட்ட வருடத்தின் முதல் நான்கு மாதங்களுக்கான மதிப்பிடப்பட்ட மற்றும் உண்மைத் தொகைகளின் ஒரு கூற்று செலவினம், வருமானம் காசுப்பாய்ச்சல், கடன்பெறுகைகள் ஆகியவை தொடர்பான சொல்லப்பட்ட அறிக்கையில் உள்ளடக்கப்பட்டிருக்க வேண்டும் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) 2012 யூன் 29ஆம் திகதிய 2012ஆம் ஆண்டுக்கான நட்டாண்டு அரசிறை நிலைமை பற்றிய அறிக்கை 2012ஆம் ஆண்டின் முதல் நான்கு மாதங்களுக்குமான

(i) மதிப்பிடப்பட்ட மற்றும் உண்மைச் செலவினத்தையும்;

(ii) மதிப்பிடப்பட்ட மற்றும் உண்மை வருமானத்தையும்;

(iii) மதிப்பிடப்பட்ட மற்றும் உண்மைக் காசுப்பாய்ச்சலையும்;

(iv) மதிப்பிடப்பட்ட மற்றும் உண்மை கடன் பெறுகைகளையும்

உள்ளடக்கியதா என அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

asked the Minister of Finance and Planning:

(a) Is he aware that -

(i) the objectives of the Mid-Year Fiscal Position Report submitted to the Parliament under the Fiscal Management (Responsibility) Act, No. 3 of 2003 enable the public to evaluate the Government's fiscal performance against the fiscal strategy as set out in its Fiscal Strategy Statement; and

(ii) a statement of estimated and actual amounts for the first four months of the relevant year must be contained in the said report for expenditure, revenue, cash flow, and borrowing?

(b) Will he state whether the Mid-Year Fiscal Position Report for the year 2012 dated 29th June, 2012 contains -

(i) the estimated and actual expenditure ;

(ii) the estimated and actual revenue;

(iii) the estimated and actual cash flow: and

(iv) the estimated and actual borrowings;

for the first four months of 2012?

(c) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, මා සභාවේ ඉන්නවා නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා, පළමුවැනි වටයේ ඇවිල්ලා සිටියේ නැහැ නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
සාමාන්‍ය සම්ප්‍රදාය, දෙවැනි වටයේ අදාළ මන්ත්‍රීතුමා ඉන්නවා නම් පිළිතුර ලබා දීමයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාමාන්‍ය සම්ප්‍රදාය නම් දෙවන වටයේදී පිළිතුර සභාගත කිරීම තමයි. කාල වේලා තිබෙනවා නම් උත්තර දුන්නාට ප්‍රශ්නයකුත් නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කාල වේලාව තිබෙනවා නේ ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කාලය ටිකක් තිබෙන නිසා ඔබතුමාට පුළුවන් පිළිතුර දෙන්න ගරු ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කමක් නැහැ ගරු කථානායකතුමනි. ඔබතුමා කියනවා නම් මට ඒ පිළිතුර කියවන්න පුළුවන්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ඇස්තමේන්තුගත සහ තථ්‍ය වියදම්;

2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ විධිවිධාන අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීමේ අරමුණ වන්නේ, වත්මන් රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය වාර්තාවේ සඳහන් රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය ඇගයීම සඳහා මහ ජනතාවට හැකි වන පරිදි රජයේ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ යාවත්කාලීන තොරතුරු මහජනතාව වෙත ලබා දීම වේ. වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2012ට අදාළ වන වත්මන් රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය වාර්තාව, 2012 අය වැයට අදාළ වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියවන දිනය වූ 2011 නොවැම්බර් 21වන දින පාර්ලිමේන්තුවේ සභාගත කළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2012 මඟින් ඉදිරිපත් කර ඇත.

එමඟින් රජයේ මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය ක්‍රියා රාමුවෙහි ඇස්තමේන්තු සහ එම ඇස්තමේන්තුවල අදාළ උපකල්පන හා එම ඇස්තමේන්තු සඳහා බලපෑ හැකි අවදානම් සාධකද ඉදිරිපත් කර ඇත.

ඒ අනුව 2012 වසරේ පළමු මාස හතර සඳහා වන රජයේ අය වැය තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු "වසර මැද රාජ්‍ය

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2012" හි (මෙම වාර්තාවේ වගුව 1.1) ඇතුළත් කර ඇත. ඊට අමතරව මෙම වාර්තාවේ පරිච්ඡේදය 1 සහ පරිච්ඡේදය 3 මඟින් රජයේ ආදායම, වියදම සහ ණය ගැනීම්වල කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සවිස්තරාත්මකව ඇතුළත් කර ඇත. තවද, 2012 වසරේ පළමු මාස පහ සඳහා වන මුදල් ප්‍රවාහ පදනම් කර ගෙන සකස් කළ රජයේ ආදායම, වියදම මුදල් ප්‍රවාහ සහ ණය ගැනීම් පිළිබඳ ඇස්තමේන්තුගත හා තථ්‍ය තොරතුරු එම වාර්තාවේ වගුව 1.14 මඟින් ඉදිරිපත් කර ඇත. එමඟින් වත්මන් රාජ්‍ය මූල්‍ය වාර්තාවේ සඳහන් රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය ඇගැයීමට හැකි වන පරිදි වඩාත් යාවත්කාලීන තොරතුරු මහජනතාවට සපයා ඇත.

(ii) (අ) (i) පිළිතුර අදාළ වේ.

(iii) (අ) (i) පිළිතුර අදාළ වේ.

(iv) (අ) (i) පිළිතුර අදාළ වේ.

(ඇ) පැන නොනඟී.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ඇමතිතුමනි, මට ඉතාමත්ම කනගාටුයි කියන්න. ඒ උත්තරය සාවද්‍යයි. ඔබතුමා මට කිව්වා, ඔබතුමා මුදල් ඇමතිවරයා හැටියට නීතියෙන් ඉදිරිපත් කළ යුතු දත්ත 1.1 වගුව මඟින් ඉදිරිපත් කරලා තිබෙනවා කියලා. ගරු ඇමතිතුමනි දැන් මගේ ළඟ 1.1 වගුව තිබෙනවා. අපි අහන්නේ මේකයි. ඇස්තමේන්තු සහ තථ්‍ය වියදම් - estimates and actuals - මෙහි තිබෙනවාද? ඔබතුමා 1.1 වගුව බලන්න. ඒකේ තිබෙන්නේ 2011 පළමුවැනි මාස 4 සහ 2012 පළමුවැනි මාස 4 පිළිබඳවයි. අහලා තිබෙන ප්‍රශ්නයට අනුව ඔබතුමා උත්තර දිය යුතු වන්නේ 2012 ඇස්තමේන්තු සහ 2012 තථ්‍ය පිළිබඳවයි. ඉතින් ඒවා නැහැනේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මම උත්තර දෙන්නම්. ගරු කථානායකතුමනි, Mid-Year Fiscal Position Report කියන එක ඉදිරිපත් කරන්නේ 2012 වර්ෂයට නොවෙයි. ඒක දීර්ඝ කාලීනව එක්තරා සම්ප්‍රදායයක් අනුව, එක format එකක් අනුව තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඒ අනුව වගුව 1.1 - Table 1.1 - යටතේ අපි ඉදිරිපත් කරලා තිබෙනවා, 2011 වර්ෂයේ තථ්‍ය - actuals - තත්ත්වය සහ 2012 වර්ෂයේ තථ්‍ය තත්ත්වය. ඊට අමතරව එකින් එකට ඇස්තමේන්තු කර ගැනීමේ අවශ්‍යතාවකුත් නැහැ. අවුරුද්ද අවසානයේ දී අය වැය ලේඛනය තුළ මේ හැම එකේම වාර්තාවක් සැපයෙනවා. මේක මහ ජනතාවගේ දැන ගැනීම සඳහා වූ සම්පිණ්ඩනයක් පමණයි. ඒ නිසා සම්ප්‍රදායානුකූලවත්, වර්තමානයේ අපේ අදහසේ හැටියටත්, අවශ්‍යතාව අනුවත් ඇත්ත වශයෙන් කරපු වියදම් මත සෑහීමකට පත් වෙන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, දැන් ප්‍රධාන කටයුතු තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඉතා වැදගත්. මොකද 2012 දී අපි රුපියල් බිලියන 1,149ක ආදායමක් බලාපොරොත්තු වුණා. නමුත් අවුරුද්ද ඉවර වන කොට ලැබුණේ රුපියල් බිලියන 1,003ක ආදායමක් පමණයි. අපේ බදු ආදායම සියයට 11.1කට තරම් ප්‍රමාණයකට අඩු වෙලා තිබුණා. ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමනි, බලන්න නීතිය. අපි වැඩ කරන්න ඕනෑ නීතියට අනුකූලව නේ. මම කියවන්නේ Fiscal Management Responsibility Act, No. 3 of 2003.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාත් ටිකක් කෙටියෙන් අහන්න. දැන් තිබෙන්නේ ප්‍රධාන කටයුතු නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

කෙටියෙන් තමයි අහන්නේ. Section 12 of the Fiscal Management Responsibility Act, No. 3 of 2003 states, I quote:

"12. The Mid-Year Fiscal Position Report in respect of a financial year shall contain -

(a) a statement of the estimated and actual expenditure for the first four months of that year; …."

ගරු කථානායකතුමනි, මෙතුමා කියන්නේ 2011යි, 2012යි. "...that year..." කියලා කියන්නේ 2011නොවෙයි, 2012. මෙතැන සාවද්‍ය ප්‍රකාශයක් නේ කරන්නේ, ගරු කථානායකතුමනි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මේක හැම දාම තිබුණු දෙයක්. ඒ අවුරුද්දේ -2011- ඇත්ත වශයෙන්ම ලැබුණු ආදායමත්, ඊට පස්සේ 2012 ලැබුණු ආදායමත් සන්සන්දනය කිරීම සඳහා අපි වාර්තා කරලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, මෙහි තිබෙන්නේ 2011 ඇත්ත වශයෙන් ලබා ගත්ත මුදල් ප්‍රමාණයයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔව්. මොකද නැත්තේ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහගෙන ඉන්න, අහගෙන ඉන්න. තමුන්නාන්සේ කියන දේ නොවෙයි, එතුමා කියන දේ අහගෙන ඉන්න. ඒක වැරැදි නම් ආපසු අහන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඊට වැඩිය කියන්න දෙයක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර කරන්නේ නැතිව කෙටියෙන් අහන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒක නොවෙයි මෙතැන කියන්නේ. මෙතැන කියන්නේ වර්ෂයක් සඳහා වූ ඇස්තමේන්තුගත සහ තථ්‍ය කියන එකයි. වර්ෂයක් සඳහා කියලා කියන්නේ ඒ financial year එක. මගේ ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලාට මේක පිළිපදින්න බැරි නම් සංශෝධනයක් ගෙනැල්ලා මේ නීතිය වෙනස් කරනවාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මෙහි සඳහන් වෙලා තිබෙන පරිදි මේක mid-year report එකක්. ඒ කියන්නේ වර්ෂය මැද වෙනකොට රටට යම් කිසි තත්ත්වයක් දැන්විය යුතුයි. මේ ඉලක්ක සම්පූර්ණ වෙලාද නැද්ද කියලා සම්පූර්ණයෙන්ම රටට දැන ගන්න පුළුවන් වෙන්නේ වර්ෂය අවසානයේදීයි. ඇත්ත වශයෙන්ම මේ වගුවේ ශීර්ෂය බැලුවොත් ඔබතුමාට පැහැදිලිවම පෙනෙනවා. කරුණාකරලා මේ ශීර්ෂය කියවන්න: "Summary of the Budget (January-April)".

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය. ප්‍රශ්න අංක 10

බන්ධනාගාර ගතව සිටින තැනැත්තන්ට සමාව දීම: ලිඛිත සංග්‍රහය
சிறைக்கைதிகளுக்கு மன்னிப்பு வழங்கல் : எழுத்திலான கொள்கைக்கோவை
GRANTING PARDON TO THE IMPRISONED: WRITTEN CODE

3138/'12

10. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ajith P. Perera)

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) දැනට වරදකරුවන්ව බන්ධනාගාර ගතව සිටින තැනැත්තන්ට සහ මරණීය දණ්ඩනයට යටත්ව සිටින තැනැත්තන්ට සමාව දීමේදී අනුගමනය කරන ප්‍රතිපත්තිය සඳහන් ලිඛිත සංග්‍රහයක් තිබේද;

(ii) එසේ නම්, එම ලිඛිත සංග්‍රහය ඉදිරිපත් කරන්නේද;

(iii) ඉහත කාර්ය පටිපාටිය සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතු විය යුතු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වරදකරුවන්වී බන්ධනාගාරගත වූ තැනැත්තන්ට සහ මරණීය දඬුවම නියමවූවන්ට සමාවදීමේදී අපරාධ චින්දිතයන්ගේ අයිතිවාසිකම් කෙරෙහි සැලකිල්ලක් දක්වා තිබේද;

(ii) එසේ නම්, එම අවස්ථා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පුනර්වාழ්වළිප්පු, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது குற்றவாளிகளாக சிறையிலிடப்பட்டுள்ளவர்களுக்கும் மரண தண்டனைக்கு உள்ளாகியுள்ளவர்களுக்கும் மன்னிப்பு வழங்கும்போது பின்பற்றப்படுகின்ற கொள்கையைக் குறிக்கும் எழுத்திலான கோவையொன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், இவ்வெழுத்திலான கோவையினை சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) மேற்படி நடைமுறையானது நியாயமானதும் வெளிப்படையானதுமாக இருக்க வேண்டுமென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) குற்றவாளிகளாக சிறையிலிடப்பட்டுள்ளவர்களுக்கும் மரணதண்டனைக்கு உள்ளாகியுள்ளவர்களுக்கும் மன்னிப்பளிக்கப்படும்போது குற்றச்செயல்களினால் பாதிக்கப்பட்டவர்களின் உரிமைகள் தொடர்பாக கவனம் செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாறான சந்தர்ப்பங்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Rehabilitation and Prison Reforms:

(a) Will he state -

(i) whether there is a written code containing the policy that is followed at present in granting pardon to those convicted and imprisoned and those on death row;

(ii) if so, whether the said written code is submitted; and

(iii) whether he admits that the above procedure should be fair and transparent?

(b) Will he inform this House -

(i) whether the rights of the victims of crimes have been taken into consideration in granting pardon to those convicted and imprisoned and those on death row; and

(ii) if so, such instances of the above?

(c) If not, why?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)

ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

(ii) ඔව්.

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සමාව ප්‍රදානය සම්බන්ධයෙන් වන බලතල අගිගරු ජනාධිපතිතුමා සතු වේ.

(ආ) (i) ඉහත (අ)හි පිළිතුර.

(ii) අදාළ නොවේ.

(ඇ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අදාළ නොවේ.

පානගමුව අන්නූර් මධ්‍ය මහා විද්‍යාලය: ක්‍රීඩා පිටියක්
பானகமுவ அந்நூர் மத்திய மஹா வித்தியாலயம் :விளையாட்டு மைதானம்
PANAGAMUWA ANNOOR CENTRAL COLLEGE : PLAYGROUND

3326/'12

15. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රධාන පාසලක් වන පානගමුව අන්නූර් මධ්‍ය මහා විද්‍යාලයයේ ක්‍රීඩා පිටියක් සඳහා දැඩි අවශ්‍යතාවයක් පවතින බවත්;

(ii) එම පාසලේ දරුවන්ගේ දෙමව්පියන් විසින් ක්‍රීඩා පිටියක් සැකසීම සඳහා අක්කර දෙකක ඉඩමක් මිලදී ගෙන පාසලට පරිත්‍යාග කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගොඩ කුඹුරක් වන ඉහත සඳහන් ඉඩම ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කර දීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தின் தொடம்கஸ்லந்த தேர்தல் தொகுதியில் ரிதீகம பிரதேச செலயலாளர் ஆளுகைப் பிரதேசத்தில் அமைந்துள்ள பிரதானமான பாடசாலையொன்றான பானகமுவ அந்நூர் மத்திய மஹா வித்தியாலயத்தில் விளையாட்டு மைதானமொன்றுக்கு கடும் தேவை நிலவுகின்றது என்பதையும்;

(ii) மேற்படி பாடசாலை மாணவர்களின் பெற்றோர் விளையாட்டு மைதானம் ஒன்றை நிர்மாணிப்பதற்காக இரண்டு ஏக்கர் காணியைக் கொள்வனவு செய்து பாடசாலைக்கு அன்பளிப்புச் செய்துள்ளார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) மேட்டுநில வயல் நிலமான மேற்படி காணியை விளையாட்டு மைதானமாக அபிவிருத்தி செய்வதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) the Panagamuwa Annoor Central College, a prominent school in the Rideegama Divisional Secretary's Division in the Dodamgaslanda electorate in Kurunegala District is in dire need of a playground; and

(ii) a land with an extent of two acres was purchased by parents of the students of this school and gifted it to the school for the purpose of making a playground?

(b) Will he inform whether the necessary arrangements will be made to develop this dry field as a playground?

(c) If not, why?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අධ්‍යාපන අමාත්‍යතුමාට ඒ පිළිතුර සභාගත කරන්න පුළුවන්. අධ්‍යාපන ඇමතිතුමාත් නැහැ, සභාගත කිරීමත් නැහැ, මොකුත් නැහැ. ප්‍රශ්න අහන වෙලාවේදී ඔබතුමන්ලා ආසනවල ඉඳලා අවධානය යොමු කළොත් හොඳයි. එතකොට අපට හරි ලෙහෙසියි. කොතැන හරි ඉඳලා ඒ ප්‍රශ්නයට පිළිතුර සභාගත කරන්නකෝ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රධාන පාසලක් වන පානගමුව අන්නූර් මධ්‍ය

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටියක් සඳහා දැඩි අවශ්‍යතාවක් පවතී. (වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ලිපියට අනුව)

(ii) ඔව්. 2010 වර්ෂයේ සැප්තැම්බර් මසදී එම පාසලේ සුභ පතන්නන් විසින් ක්‍රීඩා පිටියක් සැකසීම සඳහා අක්කර දෙකක ගොඩ කුඹුරක් මිල දී ගෙන පාසලට පරිත්‍යාග කර ඇත.

(ආ) ගොඩ කුඹුරක් වන ඉහත සඳහන් ඉඩම ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කර දීමට කටයුතු කර ඇත.

* ආදි ශිෂ්‍ය සංගමයෙන් බොරළු දමා ගොඩ කිරීම.
* 2011 වර්ෂයේදී කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිමල් විජේසිංහ මැතිතුමාගේ විමධ්‍යගත අරමුදලින් රු.150,000ක් වැය කර සංවර්ධනය කිරීම.
* 2012 වර්ෂයේදී වයඹ පළාත් මන්ත්‍රී ආර්.ඩී. විමලදාස මැතිතුමාගේ විමධ්‍යගත අරමුදලින් රු.50,000ක් වැය කර සංවර්ධනය කිරීම.
* 2013 වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් රු. 500,000ක් වෙන් කර අහල් 9ක් උසට පස් දමා සංවර්ධනය කිරීමට වැඩ ආරම්භ කර ඇත.

(ඇ) අදාළ නොවේ.

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. ප්‍රධාන කටයුතු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මහතා, මොකක්ද point of Order එක?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 25 යටතේයි මම මේ ප්‍රශ්නය මතු කරන්නේ.

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)
මොකක්ද ස්ථාවර නියෝගය?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා -

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)
මොකක්ද ස්ථාවර නියෝගය? මටත් පොඩ්ඩක් බලා ගන්න කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)
ස්ථාවර නියෝග 25. ගරු කථානායකතුමනි, සිංහල අලුත් අවුරුද්දෙන් පසුව අද අපේ රටේ වී මිල දී ගැනීම සම්පූර්ණයෙන්ම නතර කරලා. ගොවිතැන් කිරීම ක්‍රියාත්මක කරපු දේශපාලනඥයෙක් හැටියට, ගොවියෙක් හැටියට, හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන ගොවියෙකුගේ පුතෙක් හැටියට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, සිංහල අලුත් අවුරුද්දෙන් පසුව අද මුළු රටේම වී මිල දී ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම නතර කර තිබෙනවාය කියන කාරණය ගැන. අද ඒක මහා බරපතළ ප්‍රශ්නයක් වෙලා. ඉතින් ඒ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරලා මම ඉල්ලීමක් කරනවා-

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)
මම හෙට අනිද්දාම පන්තියක් පවත්වනවා, වරප්‍රසාද ප්‍රශ්න සහ ප්‍රශ්න ඇසීමේදී අතුරු ප්‍රශ්න අසන්නේ කොහොමද කියන කාරණය ගැන. හොඳයි, ඕක point of Order එකක් නොවෙයි. [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, වී මිල දී ගන්නේ නැති වුණාට බාර් මිල දී ගන්නවා. [බාධා කිරීමක්]

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)
අපි පොඩ්ඩක් ඕක කියවලා බලමු. හැබැයි තමුන්නාන්සේලා මේ සභාවට ගෞරව කරන්න ඉගෙන ගන්න. ස්ථාවර නියෝග හදා තිබෙන්නේ අපි ඔක්කෝටම පිළිපදින්නයි.

අපි හැසිරෙන හැටි, අපි අහන ප්‍රශ්න පිළිබඳව ගැලරියේ ඉන්න ළමයින් බලාගෙන ඉන්නවා. ඉතින් කොහොමද, ඔබතුමන්ලා රටට ආදර්ශයක් දෙන්නේ?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, බොහොම පැහැදිලිව ඇහුවේ.

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)
පැහැදිලි එක මොකක්ද? පැහැදිලි එක මට කියවන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
මා කියන්නම් ගරු කථානායකතුමනි, ඔබතුමාගේ පන්තියට එන්න කලින්. මට මයික් එක දෙන්න.

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මයික් එක දෙන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, 33වන ස්ථාවර නියෝගය අනුව සභාවට වැදගත් කාරණයක් සම්බන්ධයෙනුයි මා මතු කරන්නට බැලුවේ. මොකද, වී මිලදී ගන්න ඇමතිවරයා වී මිලදී ගන්න එක පැත්තකින් තියලා රට වටේ DCSL බාර් මිලදී ගන්න කොට, අපට ඒක නොවෙයි වටින්නේ. අපි කියන්නේ වී මිලදී ගන්න කියලායි. මේ තිබෙන සල්ලිවලින් රට වටේ තිබෙන බාර් සහ

distilleries companies මිලදී ගන්නවා. අපි කියන්නේ කරුණාකරලා මේ මුදල් පාවිච්චි කරලා අපේ රටේ අභිංසක දුප්පත් මිනිසුන්ගේ වී ටික මිලදී ගන්න කියලායි. ඒ සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කරනවායි කියලා කිව්වා, ඒ රුපියල් මිලියන 200ත් නැහැ. ඔබතුමා දන්නවා, ඔබතුමා වාගේම මම නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයත් ගොවීන් නියෝජනය කරන දිස්ත්‍රික්කයක් බව. ඉතින් ඒ මිනිස්සු අපෙන් අහන්නේ, "සර් මේක කථා කරලා-[බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකරලා තමුන්නාන්සේ කිව්ව 33වන ස්ථාවර නියෝගය කියවන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපේ අනෙක් -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉස්සෙල්ලා 33වන ස්ථාවර නියෝගය කියවන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාට කියවන්න තමයි මම කිව්වේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම දැන් කියවමින් ඉන්න නිසා -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඔබතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඕනෑ වැඩය කර ගත්තා නේ. දැන් දෙන්නාම වාඩි වෙන්නකෝ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එතුමා කියූ සියලු දේවල් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. එතුමා කිව්වේ කිසිම අදාළ දෙයක් නොවෙයි. සියල්ලම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න ඕනෑ. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කලබල විය යුතු නැහැ. විපක්ෂ නායකතුමාට සවන් දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විපක්ෂ නායකතුමා කථා කරන්න. මම පිළිගන්නේ එක විපක්ෂ නායකතුමායි ඉන්නේ කියලායි. කරුණාකරලා අනෙක් අය වාඩි වෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, සජිත් ප්‍රේමදාස මහත්තයා වැදගත් ප්‍රශ්නයක් මතු කළේ. ආණ්ඩුවට පුළුවන් හෙට පිළිතුරක් දෙන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මෙතැන එක එක වෙලාවට නැඟිටලා අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න අපි බැඳිලා නැහැ. ඒ ප්‍රශ්න පැන නඟන ක්‍රමයක් තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඒ ක්‍රමය දන්නවා, ඔබතුමා එය පාවිච්චි කරනවා. එතුමාට උගන්වන්න, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් අහන්නේ කොහොමද කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Point of Order එකක් වැරදි විධියට පාවිච්චි කළොත් මටත් මෙතැන point එකක් තිබෙනවා. අහන්න, අහන්න. කියපු ප්‍රශ්නය දැන් අහන්න. ප්‍රශ්නයක් අහන විධියක් තිබෙනවා. ඒක සුදුසු වෙලාවට ආවා නම් තමයි හොඳ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා රීති, වරප්‍රසාද ගැන කථා කළාට අපි හැමෝම රටේ ජනතාව සුරකින්නට ඕනෑ. මේ, ගොවීන්ට බලපාන ප්‍රශ්නයක්. අද ගොවීන්ගෙන් වී මිලදී ගැනීම සම්පූර්ණයෙන් නතර කරලා; සම්පූර්ණයෙන්ම අඩාළ වෙලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ක්‍රමවේදයක් තිබෙනවා. තමුන්නාන්සේ දැන් කථා කරන්නේ කාටද කියලා මා දන්නවා. වරප්‍රසාදවලට අයිති නැති ප්‍රශ්නයක් ඇහුවාම අපි ඒක රටටත් නොපෙන්වා සිටියොත් හොඳයි. එතකොට හරි නේ. අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම කරන්න එපා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම කරන්න එපා නම් දැන් වාඩි වෙන්න.

ප්‍රශ්නයක් තිබෙනවා ගොවීන්ට වී ටික විකුණා ගන්න බැරිව. ඒ ගැන ඇමතිතුමන්ලා කල්පනා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජය වේවා!

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ජය වේවා!

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ප්‍රධාන කටයුතු. ගරු සරත් අමුණුගම මහතා.

ගොවිජන සංවර්ධන පනත : නියෝග
கமநல அபிவிருத்திச் சட்டம் : ஒழுங்குவிதிகள்
AGRARIAN DEVELOPMENT ACT : REGULATIONS

[අ.භා. 2.10]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"2011 අංක 46 දරන පනත මගින් සංශෝධිත, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 1ආ වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 95 වැනි වගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මාර්තු 15 දිනැති අංක 1801/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.04.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධ අද න්‍යාය පත්‍රයේ දිනට නියමිත කටයුතු අංක 2 හා 3 යෝජනා ද අනුමැතිය සඳහා මා ඉදිරිපත් කරනවා.

අද දිනට නියමිත කටයුතු එකින් එක ගත්තොත්, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා ගොවිජන සංවර්ධන පනත යටතේ ඇති නියෝග මෙම ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. දෙවනුව, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඇති නියෝග මෙම ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. තුන්වැනිව මෝටර් වාහන පනත යටතේ ඇති නියෝග මෙම ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. අදාළ ගරු අමාත්‍යතුමන්ලා වෙනුවෙන් මා ඒ යෝජනා ඉදිරිපත් කරනවා. ඒ යෝජනා පිළිබඳව කථා තුනක් පසුව ඉදිරිපත් වෙයි.

විශේෂයෙන්ම මා මේ වෙලාවේ බලාපොරොත්තු වන්නේ ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඇති ඒ නියෝග පිළිබඳව මෙම ගරු සභාවට කරුණු ඉදිරිපත් කරන්නයි. අනෙක් නියෝග පිළිබඳව පසුව කථා කරන ඒ අමාත්‍යතුමන්ලා මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කරනවා ඇති.

ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් වන නියෝග ඇත්ත වශයෙන්ම ඊතයිල් මද්‍යසාරය පිළිබඳවයි. ශ්‍රී ලංකාවේ ආර්ථිකය නඟා සිටුවීමේ අරමුණින් දේශීය නිෂ්පාදන වැඩි කිරීම, ආනයන වියදම් අඩු කිරීම හා ආනයනික භාණ්ඩ වෙනුවට දේශීය නිෂ්පාදන පුළුල් කිරීම සම්බන්ධයෙන් පසු ගිය වසර කීපය තුළ රජය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග හේතුවෙන් දේශීය නිෂ්පාදන ක්ෂේත්‍රය පළල් වෙලා තිබෙනවා. අපි මීට ඉස්සර පිට රටින් ලබා ගත්ත හුඟක් දේවල් මෙරට නිෂ්පාදනය කරනවා. විශේෂයෙන් අපේ සහල්, බඩ ඉරිඟු, පලතුරු වර්ග, එළවලු වර්ග නිෂ්පාදනය පෙරට වඩා වැඩි වෙලා, ඇතැම් අවස්ථාවලදී අපට ඒවා පිටින් ගෙන්වන එක නවත්වන්නත් ශක්තියක් තිබිලා තිබෙනවා. සමහර ඒවා ලබා ගන්නා ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා.

ඊතයිල් මද්‍යසාරය නොහොත් එතනෝල් සීනි කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනයක් වන අතර, පැල්වත්ත හා සෙවනගල සීනි නිෂ්පාදන කර්මාන්තයන්හි මෑතකදී සිදු වූ නිෂ්පාදන ධාරිතාව සමඟින් එතනෝල් නිෂ්පාදන ධාරිතාවද ඉහළ නැංවී ඇත. ඒ අනුව මෙරට නිෂ්පාදනය කරනු ලබන එතනෝල් මිල දී ගැනීම අනිවාර්ය කිරීම සඳහා 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14වැනි වගන්තිය ප්‍රකාර, ආනයනය තහනම් කිරීමේ අදාළ ගැසට් නිවේදන 2013 මාර්තු 01වන දින 1799/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී. නමුත් අදාළ රෙගුලාසි සඳහා නෛතික වලංගුතාව ලැබීමට පනතේ 20වන වගන්තිය ප්‍රකාර මසක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ නමුත් ඉහත කී කාල වකවානුව ඇතුළත මේ පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කිරීමේදී කාර්මික හා ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන ඊතයිල් මද්‍යසාරය හා පරීක්ෂණ සඳහා යොදා ගනු ලබන අධිසාන්ද්‍රිත ඊතයිල් මද්‍යසාරය මෙරට නිෂ්පාදනය නොවන බව අනාවරණ විය.

ඒ කියන්නේ අපි ඒ තීරණය ගත්තාට පස්සේ විශේෂයෙන් ඒ ගැන සොයා බලන කොට පෙනුණා, අර තහනම නිසා එක් එක් සුවිශේෂ නිෂ්පාදන රටට ලබා ගන්න බැරි වෙලා තිබෙන බව.

පවතින නිෂ්පාදන ක්‍රියාවලිය නවීකරණය කොට ඉහත කී කටයුතු සඳහා අවශ්‍ය අධිසාන්ද්‍රිත ඊතයිල් මද්‍යසාරය නිපදවිය හැකි වුවද, මෙරට තුළ නිෂ්පාදනය වන සමස්ත ඊතයිල් මද්‍යසාර ප්‍රමාණයට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාවලිය නවීකරණය කොට එකී නිෂ්පාදන සිදු කිරීම ලාභදායී නොවන බව නිරීක්ෂණය වී තිබේ. ඒ කියන්නේ සුවිශේෂ නිෂ්පාදන විතරයි.

තවද, එලෙස නිෂ්පාදන ක්‍රියාවලිය නවීකරණය කිරීමට පියවර ගන්නේ නම් ඒ සඳහා යම් කිසි කාල වකවානුවක්ද ගත වේ. ඒ අනුව දේශීය නිෂ්පාදන තුළින් සපුරා ගැනීමට නොහැකි වන ප්‍රමාණය පමණක් විදේශ රටවලින් ගෙන්වීමට හැකි වන පරිදි ඉහත කී ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන ප්‍රකාර ආනයන සහ අපනයන පාලනයට යටත් කිරීම සුදුසු බව තීරණය කරන ලදී. ඒ කියන්නේ අපේ අර තීරණය ඒ විධියටම තිබෙනවා.

අපි බලාපොරොත්තු වෙනවා බලපත්‍ර ක්‍රමය තුළින් මේ රටේ නිෂ්පාදනය වන අපේ සීනි කර්මාන්තය තුළින් පුළුවන් තරම් මේ

අවශ්‍ය ප්‍රමාණය ලබා ගන්න. නමුත් සමහර විට නිෂ්පාදන ප්‍රශ්න තිබෙන ඒ සුවිශේෂ ඊතයිල් වර්ග ගෙන්වීම අවශ්‍ය වෙලා තිබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
මොනවාද ඒ හේතු? මොනවාද ඒ කර්මාන්ත?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක තමයි කිව්වේ. ඒවා වෙනම කර්මාන්ත සහ වෙනත් දේවල්වලට අවශ්‍ය දේ පමණයි. [බාධා කිරීමක්] මම කියන්නම්. ඒ අනුව සුරාබදු ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන සුරාබදු බලපත්‍රයක් යටතේ සහ කලින් කලට සුරාබදු කොමසාරිස්වරයා විසින් නිකුත් කරන රෙගුලාසිවලට යටත්ව දේශීයව සපයා ගත නොහැකි ප්‍රමාණය පමණක් ආනයනය කිරීමට හැකි වන පරිදි එතනෝල් ස්ප්‍රිතු ආනයනය පාලනය කිරීම සම්බන්ධයෙන් 2013 අප්‍රේල් මස 03 දිනැති අංක 1804/18 දරන ගැසට් නිවේදනය ප්‍රසිද්ධ කරන ලදී. ඒ අනුව 1969 අංක 1 දරන ආනයන අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද 2013 අප්‍රේල් මස 03 දිනැති අංක 1804/18 දරන ගැසට් නිවේදනය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය අප බලාපොරොත්තු වෙනවා. ආණ්ඩුවේ නිවේදනයේ - මේ ගැසට් පත්‍රයේ- අප එය පැහැදිලිවම කියා තිබෙනවා, මේ බලපත්‍රය ලැබෙන්නේ සුවිශේෂ කොන්දේසි යටතේ බව. ඒ කියන්නේ සුරාබදු ආඥාපනත යටතේ බලපත්‍රයක් ලබා ගන්න ඕනෑ. නිෂ්පාදනකරුවන් විසින් නිෂ්පාදන බදු, එකතු කළ අගය මත බදු, ආදායම් බදු ඇතුළු කලින් කලට නියම කෙරෙන අනිකුත් බදු නියමිත පරිදි ගෙවා තිබෙන්න ඕනෑ. සුරාබදු කොමසාරිස්වරයා විසින් කලින් කලට දේශීය මිලදී ගැනීමට කරනු ලබන නියමවලට යටත්ව -ඒ අවශ්‍ය ප්‍රමාණය හොයා ගන්න බැරි වුණොත් පමණක්, නැත්නම් ඒ අවශ්‍ය සේවාවලට විතරක්- ආනයනය කරනු ලබන ඊතයිල් මද්‍යසාරය පිළිගත් ප්‍රමිතිවලට ඇතුළත් කළ යුතුය. එය පැහැදිලි කර තිබෙනවා. මේ රටේ නිෂ්පාදනයට වෙළෙඳ පොළක් ලබා දීම කියන අපේ අරමුණ තියා ගන්නවා. නමුත් තාවකාලික පියවරක් හැටියට ඒ අවශ්‍යතා අනුව, මේ සුවිශේෂ ආනයනයට බලපත්‍ර ලබා දෙන්න තමයි මේ නියෝග ගෙනැත් තිබෙන්නේ.

ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඇති මේ නියෝග තමයි මට අදාළ වන්නේ. මේ විවාදය තුළදී ගොවිජන සංවර්ධන පනත යටතේ ඇති නියෝග පිළිබඳවත්, මෝටර් වාහන පනත යටතේ ඇති නියෝග පිළිබඳවත් ඒ අදාළ ඇමතිවරුන් සභාව දැනුවත් කරනවා ඇති. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එඩුත්තියම්පප්පෙරුම.
Question proposed.

[අ.භා. 2.18]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. අප බලාපොරොත්තු වුණා ගරු සරත් අමුණුගම ඇමතිතුමා අද දින න්‍යාය පත්‍රයේ ඇති මේ කාරණා තුනම ගැන කථා කරයි කියලා. නමුත් එතුමා එක දෙයක් ගැන පමණයි කිව්වේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අදාළ අමාත්‍යවරු ඒ ගැන පැහැදිලි කරයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
කමක් නැහැ, ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමනි, මම ඒ කාරණා තුනම ගැන කෙටි කථාවක් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමා පටන් ගත්තේ ඊතයිල් මද්‍යසාර ආනයනය කිරීම සඳහා වන ඒ නීතිය නැවත ලිහිල් කිරීමක් සම්බන්ධයෙන්. ඇත්ත වශයෙන්ම අප කල්පනා කර බලන්න ඕනෑ මෙයට පදනම් වුණු පසුබිම මොකක්ද කියලා. පෙබරවාරි මාසයේ 28වැනි දා මේ ඊතයිල් ගෙන්වීම තහනම් කරන්න හේතු වුණේ මොකක්ද කියලා අපි බලමු. මා මේ පාර්ලිමේන්තුවේදී මීට කලින් කථා කරලා මේ ගැන කථානායකවරයාගේ අවධානයට යොමු කළා. ඉහළ දේශපාලන ස්ථරයක ඉන්න පුද්ගලයන් පිරිසක් දැන් මාස ගණනාවකට කලින් ඊතයිල් මද්‍යසාර වගයක් ගෙනාවා කියලා පුවත් පත්වල පළ වෙලා තිබුණා. ඊට පසුව ඒ සම්බන්ධයෙන් නොයෙකුත් සාකච්ඡා තිබුණා; ඒ සම්බන්ධයෙන් පියවර ගන්නවා කියා තිබුණා. ඒ ගැන වුණු දෙයක් නම් අප දන්නේ නැහැ. නමුත් මා හිතන හැටියට පෙබරවාරි මාසයේ අග හරියේ -මෑත කාලයේදී- නැවතත් ඊතයිල් මද්‍යසාර මහා විශාල තොගයක් -ලීටර් 62,000ක්- ගෙනැල්ලා වරායෙන් හොරෙන් අරගෙන යන කොට අහු වුණු බව අප හැමෝම රූපවාහිනියෙන් පවා දැක්කා. එතැන හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරියා මේ ඊතයිල් මද්‍යසාර වැටලීම කැමරාගත කරන්න මාධ්‍යට පවා ඉඩ නොදී පන්නා ගත්ත හැටි ටීවී එකෙන් අප දැක්කා.

ඉන් පසුව අපට ආරංචි වුණා එතැන රුපියල් මිලියන 110ක ඊතයිල් මද්‍යසාර තිබුණා කියලා. නමුත් එතැන වැදගත් දෙයක් තිබෙනවා ගරු කථානායකතුමනි. අපේ ගරු ඇමතිවරයා කිව්වා සුවිශේෂී, අධි සාන්ද්‍රණය සහිත ඊතයිල් මද්‍යසාර ගෙන ඒම සඳහා තමයි බදු නීතිය ලිහිල් කරලා තිබෙන්නේ කියලා. ඒවා paint හදන්න සහ perfume හදන්න අවශ්‍යයි කියලා කියන නිසා. ගරු කථානායකතුමනි, නමුත් මෙම හොරෙන් ගෙනාව ඊතයිල් මද්‍යසාරවල සාන්ද්‍රණත්වය සියයට 96යි. මම හිතන්නේ නැහැ මේක ඊට වඩා සාන්ද්‍රණය වෙන්න පුළුවන් කියලා. සියයට 96ක් කියන්නේ අධි සාන්ද්‍රණය වුණ ඊතයිල් මද්‍යසාර. ගරු කථානායකතුමනි, නමුත් මේවා ගෙනැත් තිබුණේ මද්‍යසාර හදන්න බව අද මේ රටේ හැමෝම දන්නවා. එහෙම නැතිව අර කිව්වා වාගේ paint හදන්න නොවෙයි. එතකොට මේ address නැති ව්‍යාපාරිකයා කවුද කියලා මේ රටම දැන් දන්නවා. ගෙනාපු කෙනෙක් නැහැ. ඒ දීලා තිබෙන address එකට ගියාම එතැන තිබෙන්නේ හිස් ඉඩමක් පු. එතුමා Sri Lanka Customs documentsවල දාලා තිබෙන්නේත් paint හදන්න ගෙනාවා කියලා. ගරු කථානායකතුමනි, මම සොයා ගත් පරිදි සාමාන්‍යයෙන් මේ ඊතයිල් මද්‍යසාර ලීටරයකට රුපියල් 400ක බද්දක් ගහනවා. ඒ කියන්නේ එතැන ඒ බදු නොගෙවීම තුළින් රුපියල් මිලියන 24ක පාඩුවක් රජයට වෙලා තිබෙනවා. නමුත් අපි අඩි දෙකක් පස්සට යමු. අපේ නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා මෙය ආනයනය කිරීම නවත්වන්නට හේතුව විධියට කිව්වා, "අපි කල්පනා කළා දේශීයව මේවා නිෂ්පාදනය කර ගන්න පුළුවන් කියලා. නමුත් දේශීයව නිෂ්පාදනය කර ගන්න බැරි නිසා ඒ අවශ්‍ය ප්‍රමාණය පිට රටින් ගෙන්වන්න තීරණය කළා" කියලා. නමුත් මේ ආණ්ඩුවම නිවේදනයක් නිකුත් කර පෙබරවාරි මාසයේ අග, මාර්තු මාසයේ මුල කිව්වේ මොකක්ද? The country has an excess production of ethanol. ඉතින් "The country has an excess production of ethanol" කියලා මාර්තු මාසයේ මුල කිව්වා නම්,

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

අද මැයි මාසයේ මූල. මාස 2කින් කොහොමද මේ තත්ත්වය වෙනස් වුණේ? එතුමා කියනවා සෙවණගලයි, පැල්වත්තයි ආණ්ඩුව ගත්ත නිසා මේ නිෂ්පාදන ප්‍රමාණය වැඩි වුණා කියලා. අනේ මම දන්නේ නැහැ මහා විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කළා නම් අවශ්‍ය ප්‍රමාණයට වඩා එක පාරට අඩු වුණේ කොහොමද?

ඒ සඳහා හේතු දෙකක් තිබෙනවා. එක්කෝ ආණ්ඩුව කිව්වේ ඇත්ත නොවෙයි. අවශ්‍ය ප්‍රමාණයට ඊතයිල් මද්‍යසාර නිෂ්පාදනය කළේ නැහැ. දෙවෙනි කාරණය,- [බාධා කිරීමක්] සමා වන්න.

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)

පැල්වත්තයි, සෙවණගලයි රජයට පවරා ගත්තාම ප්‍රධාන ගැණුම්කරුවා අපෙන් ඊතයිල් මද්‍යසාර ගන්නේ නැතිව හිටියා. අපේ නිෂ්පාදන ගොඩ ගැහුණා. එවිට අපි බද්දක් දැම්මා. නමුත් ඔහු වැඩි මිලටත් පිට රටින් ගෙන්වුවා. එහෙම කරන විට තමයි අපි ආනයනය තහනම් කළේ. ඒ වන විට අපේ ගබඩා පිරිලා තිබුණේ. ඒ හේතුවෙන් අපේ සීනි නිෂ්පාදනයත් ඇණ හිටියා. අපි ආනයනය තහනම් කළාම තමයි ඔහු අපේ නිෂ්පාදන ගත්තේ. දැන් දිගටම ගන්නවා. ඒ නිසා දැන් ප්‍රශ්නයක් නැහැ. අපේ රටට අවශ්‍ය ප්‍රමාණයම අපේ රටේ නිෂ්පාදනය වෙන්නේ නැහැ. නමුත් හිතා මතා ඔහු, -අපි කර්මාන්තශාලා දෙක පවරා ගැනීම නිසා, ඔවුන්ගේ එකක් පවරා ගත්ත නිසා- ඒවා කඩාකප්පල් කරන්න තමයි අපෙන් මිලදී ගැනීම සිදු නොකළේ. අපි නීතියෙන් ආනයනය කිරීම තහනම් කරලා අපේ නිෂ්පාදන මිලදී ගන්න සැලැස්වුවා. ඒ නිසා වරදවා තේරුම් ගන්න එපා. මාර්තු මාසයේ සිදු වුණේ ගබඩා පිරිලා තිබීම.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඒ පැහැදිලි කිරීම සම්බන්ධව බොහොම ස්තුතියි. නමුත් එතැනත් පොඩි ගැටලුවක් තිබෙනවා. මොකද, නීතියෙන් බල කළා ඒ ආයතනයට. එතුමා කියන්නේ DCSL ආයතනය වෙන්න ඕනෑ. DCSL ආයතනයට නීතියෙන් බල කළා පැල්වත්තයි, සෙවණගලයි නිෂ්පාදනය කරන ඊතයිල් මද්‍යසාර ගන්නම ඕනෑ කියලා. දැන් නීතිය ලිහිල් කරලා තිබෙනවා. එහෙම නම් නැවතත් එතුමා කියූ ප්‍රශ්නය පැන නඟිනවා. [බාධා කිරීමක්] ඔබතුමාගේ කාලයේදී ඔබතුමා පැහැදිලි කරන්න කෝ. එකක් ඒ හේතුව. එහෙම නැත්නම් අනෙක් හේතුව තමයි අති විශාල ලෙස මද්‍යසාර භාවිතය වැඩි වෙලා තිබෙනවා කියන එක. ඔය දෙකෙන් එකක් වෙන්න ඕනෑ නේ. මොකද, දැන් එක පාරටම තිබුණාට වඩා අතිශයින්ම ඉල්ලුම ඉහළ ගිහින් තිබෙනවා. ඒ නිසා ලංකාව නිෂ්පාදනය කරන ඊතයිල් මද්‍යසාර ප්‍රමාණය මදි නිසා පිට රටින් ගෙනෙන්න ඕනෑ කියලා ආණ්ඩුව කියනවා. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මම සොයලා බැලුවා කොපමණ මද්‍යසාර භාවිතයක් තිබෙනවාද කියලා. ගරු කථානායකතුමනි, "මතට තිත" කියන සංකල්පයක් සමඟ නේ අපි මේක දිහා බලන්නට ඕනෑ. 2004 මතට තිත කියන සංකල්පය එන්නට කලින් hard liquor consumption, මම මේක ගත්තේ Excise Department එකේ Report එකෙන්. Hard liquor කියන්නේ මොකක්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
වැඩි සූර්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

වැඩි සූර්. අරක්කු කියලා කියමු කෝ. ගරු කථානායකතුමනි, ලීටර් මිලියන 34.5ක් නිෂ්පාදනය කරලා විකුණලා තිබෙනවා. ඒ 2004 වර්ෂයේදී. ඊට පස්සේ 2009 දී මේ ප්‍රමාණය ලීටර් මිලියන 41.1ට වැඩි වෙලා තිබෙනවා. 2010 දී ලීටර් මිලියන 49ට වැඩි වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඊට පස්සේ 2011 වර්ෂයේ දී මේ ප්‍රමාණය සියයට 53.8ට වැඩි වෙලා තිබෙනවා. එතකොට "මතට තිත" එන්න කලින් තිබුණු සියයට 34 ප්‍රමාණය දැන් සියයට 54ට වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ "මතට තිත" වැඩ පිළිවෙළ ගෙනාවාට පස්සේ මේ ප්‍රමාණය සියයට 50කට වඩා වැඩි වෙලා. එතකොට මේ රජයේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා අපට ඉතාම පැහැදිලියි. ඒ ප්‍රතිපත්තියට අනුව නීති සකස් කරලා තිබෙනවාද, නැද්ද කියලා අපි බලමු.

දැන් bar licence පිළිබඳව බලන්න. 2011 මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මක වූ මෙරට හා පිට රට මත්පැන් බලපත්‍ර ගණන 2,869යි. මේ ප්‍රමාණය එන්න එන්න වැඩි වනවා. ගරු කථානායකතුමනි, මේ රටේ මිනිස්සු කොපමණ අරක්කු ප්‍රමාණයක් බොනවාද කියලා මම විභිළුවට වාගේ බැලුවා. හැබැයි ඒ නීත්‍යානුකූල අරක්කු. කසිප්පු හැරෙන්න. කසිප්පු හැරෙන්න අරක්කු ලීටර් මිලියන 86.3ක් මේ රටේ මිනිස්සු බීලා තිබෙනවා. මේකට වොඩ්කා, රම් එකතු කළාම ලීටර් මිලියන 102ක් වනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ කියන්නේ කසිප්පු, සීනි කරිඇඳැං බොන එක අඩු වෙලා වාගේයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

නැහැ. මේක නේ, ගරු කථානායකතුමනි. කසිප්පු කොපමණ ප්‍රමාණයක් බොනවාද කියලා අපි දන්නේ නැහැ. කාට හරි ධනාත්මකව කියන්න පුළුවන්, කසිප්පු බොන ප්‍රමාණය අඩු වෙලාය කියලා. නමුත් කසිප්පුවල දත්තත් තිබුණා නම් තමයි ඇත්ත වශයෙන්ම මේක වඩාත් හොඳ. ලංකාවේ වැඩියෙන්ම බොන්නේ පිරිමි නේ. ලංකාවේ ජනගහනයෙන් මිලියන 9.8ක් පිරිමි. ලංකාවේ පිරිමියෙකුගේ ඒකපුද්ගල අරක්කු, රම් සහ වොඩ්කා පරිභෝජනය ලීටර් 11යි. එතකොට shots කීයක්ද? බර ගණනක්.

ඊළඟට අවුරුදු 15ට වැඩි කට්ටිය ගනිමු. අවුරුදු 15ට වැඩි පිරිමි ගත්තොත් එක්කෙනෙක් ලීටර් 14ක් බොනවා. ඒ කියන්නේ මාසයකට ලීටරය ගණනේ බොනවා. මාසයකට ලීටරය කියන්නේ සති අන්තයට කාල ගණනේ බොනවා. එතකොට මේ දත්තත් එක්ක බැලුවාම පැහැදිලි වනවා, පිට රටිනුත් මේ ඊතයිල් මද්‍යසාරය ගෙනෙන්න අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ ඇයි කියලා. මොකද කොපමණ නිෂ්පාදනය කළත්, මේවා මදි. ඉතින්, ඔන්න ඔය කථාව මම කියන්න අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, අද ගොවිජන සංවර්ධන පනත යටතේ නියෝග විවාදයට ගන්නවා කියපු නිසා මේ දවස්වල පවතින වැදගත් ප්‍රශ්නයක් ගැන කථා කරන්න මම පොඩ්ඩක් ලෑස්ති වෙලා ආවා. පොහොර ප්‍රශ්නය ගැන නොවෙයි. මොකද, පොහොර ප්‍රශ්නය ගැන කථා කරන්න අපේ තව මන්ත්‍රීවරු බලාපොරොත්තු වෙලා සිටිනවා. මේ දවස්වල ලොකු කථාවක් ගියා, එළවලු විසි කරනවා කියලා. ඊට ටික කාලයකට කලින් කථාවක් ගියා, එළවලු කන්න බැහැ හරි ගණන් කියලා. එක්කෝ එක දවසකට එළවලු ගන්න බැහැ, එව්වරට ගණන්. ඊළඟ දවසේ කවුරුත් ගන්නේ

නැහැ. ඒ නිසා ඒවා විසි කරන්න ගත්තා. දඹුල්ලේ market එකේ ප්‍රධාන වශයෙන්ම විකිණෙන එළවලු මොනවාද කියලා මම හොයා බැලුවා. අවුරුදු 9ක් තිස්සේ හැම දාම පැවැති මිල ගණන් මම ගත්තා. අරගෙන මාසයකට සාමාන්‍ය මිල-

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
කාගේ කොම්පැනියෙන්ද කරන්නේ?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක පිනට නේ කරන්නේ. පිනට. මම තමයි ඒ ආයතනය හැදුවේ. "ගොවි ඥාන සේවා ආයතනය". කිසිම අය කිරීමකින් තොරව අවුරුදු නවයක් තිස්සේ මේ මිල ගණන් එකතු කරලා මම රටට බෙදා දෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට, මහ බැංකුවට පවා ඒක කරනවා. ගොඩක් කට්ටිය දන්නේ නැති වුණාට ඒක social responsibility එකක් හැටියට මම කරනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
සමාජ මෙහෙවරක්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
සමාජ මෙහෙවරක් හැටියට අවුරුදු නවයක් තිස්සේ මම ඒක කරනවා. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා ඒක මතක් කරලා දුන්නාට බොහොම ස්තුතියි. I appreciate it very much.

ගරු කථානායකතුමනි, මා ළඟ ඒ මිල ගණන් අඩංගු ප්‍රස්තාරයක් තිබෙනවා. වට්ටක්කා මිල ගණන් ගැන සඳහන් වන මේ chart එක දිහා පොඩ්ඩක් බලමු. මේ අනුව වට්ටක්කා මිල එක දවසකට ඉහළ යනවා. ඊළඟට පහළ එනවා. වට්ටක්කා මිල පහළ බැස්සාම ගොවියෝ කියනවා, "අයියෝ වට්ටක්කා දමා වැඩක් නැහැ. මොකද වට්ටක්කාවලට මිලක් නැහැ." කියලා. එතකොට කවුරුත් වට්ටක්කා දමන්නේ නැහැ. ඊළඟට මොකද වෙන්නේ? වට්ටක්කා මිල ඉහළටම යනවා.

ගොවි මහත්මයා, අනෙක් ගොවි මහත්මයාට කියනවා, "ගොවි මහත්මයෝ බලන්න, වට්ටක්කා මිල හොඳටම නැග්ගා." කියලා. එතකොට මොකද කරන්නේ? හැමෝම වට්ටක්කා වගා කරනවා. ඊළඟට මොකද වෙන්නේ? වට්ටක්කා ප්‍රමාණය වැඩි වෙනවා. ඉල්ලුමට වඩා සැපයුම වැඩි වෙනවා. වට්ටක්කා සැපයුම වැඩි වුණාම වට්ටක්කා මිල සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටෙනවා. මේ බලන්න, මේ අවුරුදු පහට මොකක්ද වෙලා තිබෙන්නේ? වට්ටක්කා මිල ඉහළ යනවා, පහළ එනවා. ඉහළ යනවා, පහළ එනවා. එතකොට මෙච්චර කාලයක් කෘෂිකර්ම අමාත්‍යාංශයට, මේ කෘෂිකර්මයට සම්බන්ධ ආයතන සියල්ලටම එකතු වෙලා මේ ප්‍රශ්නයට පිළිතුරක් සොයන්න බැරි වුණේ ඇයි?

ගරු කථානායකතුමනි, මා ඒ විධියටම සොයා ගත්තා, තක්කාලි ගැනත්. මේ බලන්න, තක්කාලිවල මිල. ඉහළ යනවා, පහළ එනවා. ඉහළ යනවා, පහළ එනවා. අවුරුදු නවයක් තිස්සේ මේක තමයි සිදු වෙන්නේ. එහෙනම් අපට කෘෂිකර්ම ප්‍රතිපත්තියක් මොනවාටද? මොකක්ද වෙන්නේ? එක දවසකට ගොවියා කියනවා, "ඔව්, මට ටිකක් හොඳයි" කියලා. ඒ නිසා ගොවියා ගිහිල්ලා මොකක් හරි මිල දී ගන්නවා. ටීවී එකක් හරි, මහන මැෂිමක් හරි, මෝටර් සයිකලයක් හරි මිලදී ගන්නවා. ඊළඟට මොකක්ද වෙන්නේ? ඊළඟට මේ ගොවි නිෂ්පාදනවල මිල සම්පූර්ණයෙන්ම බහිනවා. දඹුල්ල මාර්කට් එකේ ගොවියෝ මට හමු වෙලා කියලා තිබෙනවා, "අනේ මහත්තයෝ! මේ මිරිස් ගෝනිය ඇළට දමලා මමත් ඒකටම පනිනවා නම් මීට වැඩියේ හොඳයි" කියලා. මොකද, කර ගන්න දෙයක් නැති නිසා. එතකොට මේ කෘෂිකර්ම ප්‍රතිපත්තිය ගැන මෙච්චර කල් කථා කරන ආණ්ඩුවට මේ ප්‍රශ්නය විසඳන්නට බැරි වුණේ ඇයි? මාස දෙකකට සැරයක් අපි ටීවී එකෙන් දකිනවා; පත්තරෙන් දකිනවා; ගොවීන්ගේ පලතුරු, එළවලු අලින්ට කන්න දමලා තිබෙනවා. ඊළඟ දවසේ කන්න විධියක් නැහැ, ඒවායේ මිල වැඩි වෙලා. ගරු කථානායකතුමනි, එහෙම නම් ආණ්ඩුව මේ පිළිබඳව යම් කිසි ක්‍රියා මාර්ගයක් ගත යුතුයි. පක්ෂ භේදයකින් තොරවයි මා මේ කියන්නේ. මේ සම්බන්ධයෙන් එම කමිටුවේ දී මට කරන්න පුළුවන් යෝජනා මා ඉදිරිපත් කර තිබෙනවා. නමුත් මේක වැරැදියි. මේකට මොකක් හරි කරන්නට ඕනෑ.

දැන් අලවලට අවම මිලක් නියම කරනවා කියලා තිබෙනවා. නුවර එළියේ අල කිලෝ එකක මිල රුපියල් 65කට නියම කළොත් එහෙම, පසු ගිය අවුරුදු තුනක කාලයම රුපියල් 65කට වඩා ඉහළ මිලකට තමයි අල කිලෝවක් විකුණලා තිබෙන්නේ. එතකොට රුපියල් 65ක මිලක් නියම කළොත්, මේ දත්තවලට අනුව අල ගොවියාට ඇත්ත වශයෙන්ම පාඩුයි. මොකද, මිලක් නියම කරනවා නම් නියම කරන්නට ඕනෑ, අල කිලෝවකට රුපියල් 85ක විතර මිලක්. රුපියල් 85ක විතර මිලක් නියම කළොත් ඔන්න සාධාරණයක් කරන්න පුළුවන්. ගරු කථානායකතුමනි, ඒ නිසා මා නැවත වරක් මේ ගරු සභාවට ඉදිරිපත් කර සිටින්නේ, අපි මේ ගැන දේශපාලනයෙන් තොරව ආර්ථික විද්‍යාත්මක පිළිතුරක් සොයා ගන්නට ඕනෑ කියන එකයි. මොකද, ශීත කාමරයක ඉඳගෙන ඇමතිවරයෙකුට කියන්න බැහැ, මෙච්චර අල වවන්න, මෙච්චර තක්කාලි වවන්න කියලා. ඔබතුමාත් ගොවියෙක්. මමත් ගොවිතැන ගැන අවුරුදු 10ක් තිස්සේ පර්යේෂණ කරලා තිබෙනවා. මටත් අක්කර ගණනාවක වගාවක් තිබෙනවා. නමුත් ඒ සියලුම දේවල්වලින් ඇත්ත වශයෙන්ම මට තේරුම් ගන්නට පුළුවන් වෙලා තිබෙන්නේ, වෙළෙඳ පොළ ආශ්‍රයෙන් මිල තීරණය කරන ක්‍රමවේදයකට අපට එන්න බැරිවුණොත්නේ, මේ ගොවියාට තිබෙන ප්‍රශ්නය හැමදාමත් දිගටම පවතිනවා කියන එකයි.

මේ දවස්වල කියනවා, ගොවීන්ට රක්ෂණයක් දෙනවා කියලා. දැන් බලන්න, ගොවීන්ගේ සම්පූර්ණ අස්වැන්න අපතේ ගිහින් තිබෙනවා. ඔවුන්ට කිසි රක්ෂණයක් දුන්නාද? ඔය කියන රක්ෂණය දුන්නාද? නැහැ නේ. ගොවීන්ට රක්ෂණය දෙනවා කියලා පොහොරවලට බද්දක් ගහනවා. ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කිව්වා, "මම කෘෂිකර්මය ගැන ඉතාමත්ම ඕනෑකමින් සොයනවා, බලනවා. ගොවීන්ට ප්‍රශ්නයක් තිබෙනවා නම් එම ප්‍රශ්නයෙන් ඔවුන්ව බේරා ගන්න මම රුපියල් 50ක බද්දක් ගහනවා, පොහොර මිටියට" කියලා. ඉතින් රුපියල් පනහකුත් ගෙවනවා, නමුත් ලැබෙන වන්දියකුත් නැහැ; රක්ෂණයකුත් නැහැ. ඉතින් මම ඔක කියන්න ඕනෑ කියලා කල්පනා කළා.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණය තමයි, මෙතුමා ඉදිරිපත් කරපු ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග. ඊළඟට මෝටර් වාහන පනත යටතේ නියෝග. මේ ඉදිරිපත් කර තිබෙන ඒවා හොඳයි. අපිට ඒවාත් එක්ක ගැටලුවක් නැහැ. නමුත් අපි පොඩ්ඩක් මෙහි පිටිපස්සට ගිහින් බලමු වෙන්නේ මොකක්ද කියලා. සිදු වන්නේ හොරකම. අපි ඊතයිල් ඇල්කොහොල් ගැන කථා කළාමත්, එතැන අපි කථා කළේ හොරකම සම්බන්ධයෙනුයි. "පේන්ට්" හදන්න කියලා අරක්කු හදන්න මේවා ගෙනෙනවා. එතකොට මොකද වෙන්නේ? ආදායම අඩු වෙනවා. මම බොහොම ගරු කරන අපේ ගරු ඇමතිතුමාත් එක්ක ඉස්සෙල්ලා ප්‍රශ්න අහන වෙලාවේ පොඩි විවාදයකට ආවේ මේ නිසායි. එතුමාත්, මමත් හොඳින්ම දන්නා කථාවක් තමයි ලංකාව තමයි මේ මුළු කලාපයෙන්ම දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අඩුම බදු එකතු කරන රට කියන එක.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ගරු කථානායකතුමනි, අපේ තත්ත්වයේ ආදායම තිබෙන රටකට දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව බදු සියයට 20ක්, සියයට 22ක් විතර තිබෙන්නට ඕනෑ. ගිය අවුරුද්දේ අපට ලැබුණු බදු ආදායම කීය ද කියා ඔබතුමා දන්නවා ද? බදු ආදායම සියයට 11.1යි. බදු ආදායම සියයට 11.1ක් නම්, අප නිකම් උප කල්පනය කර බලමු. FUTA එකෙන් සියයට 6ක් අධ්‍යාපනයට දාන්නය කියා කියනවා. හුහක් අය ඒ පිළිබඳව විවේචන ඉදිරිපත් කළානේ, අධ්‍යාපනයට වියදම් කරන ප්‍රතිශතය සියයට 1.8 සිට සියයට 1.5ට අඩුවෙලා කියා. අපත් ඒ සම්බන්ධයෙන් කථා කළා නේ. බදු ආදායම සියයට 14 නම් හම්බ වෙන්නේ, කොහොම ද අප සියයට 6ක් අධ්‍යාපනයට වියදම් කරන්නේ කියා ගරු එස්.බී. දිසානායක මහතා කියනවා මට හොඳටම මතකයි . ඒ පසු ගිය අවුරුද්දේ. මේ අවුරුද්ද වෙනකොට ඒ සියයට 14 ක්ව තිබුණු බදු ආදායම සියයට 11.1ට අඩු වෙලා. බදු ආදායම සියයට 11.1ට නම්, අප සියයට 6ක් අධ්‍යාපනයට වියදම් කරන්නේ කොයි ක්‍රමයට ද? ඒකට එක හේතුවක් තමයි මේ බදු පැහැර හැරීම.

ඉදිරියේදී CHOGM එක ලංකාවේ පවත්වනවා, ගරු කථානායකතුමනි. දැන් අපට ආරංචි වෙලා තිබෙනවා, චාර්ල්ස් කුමාරයා එනවා, මහ රැජින එන්නේ නැහැ කියා. හරි. කොහොම නමුත් නොවැම්බර් මාසයේ මේ රටේ ඒ කටයුත්ත කරනවා. පාරවල් හදනවා. නොයෙකුත් දේවල් කරනවා. CHOGM එකට වාහන දෙසියයක් ගේන්න plan එකක් තිබෙනවාය කියා අද පත්තරේ තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා මේ කාරණය කියන්නට කැමතියි. Sri Lanka Customs එක ඇතුළේ "Carnet" කියා නීතියක් තිබෙනවා. ඒක තමයි තාවකාලික ආනයන ක්‍රමය. වාහන ගේන්න පුළුවන්. නමුත් මාස තුනක් ඉවර වෙන්න කලින් ඒ ගෙනාපු වාහන නැවත ගෙනයන්නට ඕනෑ. එතකොට film එකක් හදනවා නම්, car race එකක් කරනවා නම්, exhibition එකක් තිබෙනවා නම් මේවා ගේන්න පුළුවන්. නමුත් අර ළඟදී තිබුණු night race එකට car race කරන්න motorcycles 10ක් ගෙනැල්ලා තිබුණාය කියා, පසු ගිය ඉරිදා "සන්ඩේ ටයිම්ස්" පත්තරයේ පළ වී තිබුණා. මේ motorcycles 10 මාස තුන ඉක්මවනකොට නැවතත් අපනයනය කරලා නැහැ කියා තිබුණා. ඒක "සන්ඩේ ටයිම්ස්" පුවත් පතේ සඳහන් වෙනවා. එතැනත් තිබෙන්නේ බදු පැහැර හැරීමක් නේ. අපි කථා කරන කොට, ජේවීපී එකේ අපේ සහෝදර මන්ත්‍රීවරු කථා කරනකොට විවේචනයක් එල්ල කළා, "බලන්න, ආණ්ඩුව බදු ගත්තේ නැහැ; බලන්න ලැම්බෝගිනි ගෙනාවා; අරවා ගෙනාවා; මේවා ගෙනා; බදු ගත්තේ නැහැ" කියා. නමුත් ජයසුන්දර ලේකම්තුමා කෙළින්ම ඉදිරිපත් වෙලා කිව්වා, රජයට බදු එකතු කර ගන්න එහෙම ප්‍රශ්නයක් නැහැ. මොකද මේවා මාස තුනෙන් ආපසු යනවාය කියා. එහෙම මාස තුනෙන් යන්නේ නැත්නම්, රුපියල් 25,000ක් බදු ගෙවා කොහොම ද මේක ගන්නේ? එතකොට අපේ බදු ආදායම වැඩි වෙන්නේ කොහොම ද? බදු ආදායම වැඩි වෙන්නේ නැති වෙනකොට අප සාමාන්‍ය ජනතාව වෙනුවෙන් වියදම් කරන්නේ කොහොම ද? එතැන ගැටලුවක් තිබෙනවා නේද ගරු කථානායකතුමනි?

දැන් බලන්න, ඒත් එක්කම අලුතෙන් නියෝගයක් ගෙනැල්ලා, අධි සාන්ද්‍රණය motorcycles - මහා power එකක් තිබෙන - high power 1000 cc motorcycles දැන් ගේන්න පුළුවන්ය කියා තිබෙනවා. වරායට ආවායින් පස්සේ, ගැසට් එක ගහලා. මා හිතන්නේ නැහැ, මේ විධියට විය යුතුය කියා.

දැන් CHOGM එකත් එක්ක එන ප්‍රශ්නය මේකයි. දැන් වාහන 200ක් ගේන්න හදනවා. CPA සභාපති හැටියට ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, 2007 වර්ෂයේදී උගන්ඩාවේ CHOGM එක තිබුණු බව. 2009 වර්ෂයේදී Trinidad and Tobago වල තිබුණා. 2007 වර්ෂයේදී උගන්ඩාවේ CHOGM එක තිබුණාම ලොකු ප්‍රශ්නයක් මතු වෙලා, උප ජනාධිපතිවරයාට අස් වන්නට සිද්ධ වුණා. එතුමාගේ නම Professor Gilbert Bukenya. Professor Gilbert Bukenya ට ගෙනා චෝදනාව තමයි, CHOGM එකට වාහන 204ක් ගෙනැවිත් එයින් මගඩියක් -චංචාවක් කර ඔහු ඒකෙන් -රජයෙන්- ඩොලර් මිලියන ගණනක් සූරා කෑවා, හොරකම් කළාය කියන එක. ඒ කාරණය නිසා එතුමා අස් වෙලා, පසුව 2011 වර්ෂයේදී මේක යට ගහලා එතුමා නිදහස් වුණා. නමුත් ඒ ප්‍රශ්නය එතැනින් ඉවර වුණේ නැහැ. මා මේ කියන්න හදන්නේ CHOGM එක කරන අවස්ථාවේදී නොයෙකුත් පුද්ගලයෝ ඉදිරිපත් වේවි ගරු කථානායකතුමනි. ඔවුන් කියාවි, " අපි මෙහෙම වාහන ගෙනෙන්නම්. අරහෙම වාහන ගෙනෙන්නම්. BMW ගෙනෙන්නම්, Rolls-Royce Ghost cars ගෙනෙන්නම් " කියා.

මා මේක කියන්න හේතුවක් තිබෙනවා ගරු කථානායකතුමනි. මා මාධ්‍ය සාකච්ඡාවකදී ජනවාරි මාසයේ 16 වනදා හෙළි කළ කාරණයක් මා ඉදිරිපත් කරන්නම්. ජනවාරි මාසයේ 14 වනදා ලංකාවට නැවක් ආවා. ඒ නැවේ තිබුණා, Rolls -Royce Ghost වාහනයක්. එකේ ලියකියවිලි මා ළඟ තිබෙනවා. ඒකට ඉදිරිපත් කර තිබෙන cost එක US Dollars 175,000 යි ගරු කථානායකතුමනි. ඩොලර් 1,75,000 යි Rolls-Royce Ghost car එකට. අප සොයා බැලුවා, කිසිම විධියකට ඩොලර් 1,75,000 කට Rolls-Royce Ghost car එකක් ගන්න බැහැ.

හොයලා බැලුවා කීයක් වෙනවාද කියලා. මේක ඇමෙරිකන් ඩොලර් 350,000ක් පමණ වෙනවා. අපි කියමු discount එකක් දීලා ඩොලර් ලක්ෂ තුනකට ගත්තා කියලා. නමුත් ඒකෙන් මොකද කළේ? බදු ගෙව්වේ, මිලියන 61යි. ඒකෙන් අවම වශයෙන් ආණ්ඩුවට තවත් මිලියන 50ක පාඩුවක් වුණා. මේ ගැන ප්‍රශ්න කළාම මොකද වුණේ? ඒ ආයතනයේ පුද්ගලයෙකු කථා කරලා මගෙන් ඇහුවා, "මන්ත්‍රීතුමා මොනවාටද මේවා ගැන කථා කරන්නේ?" කියලා. "මගෙන් එහෙම අහන්න ඔයා කවුද, මම ජනතාව වෙනුවෙනුයි පෙනී සිටින්නේ" කියලා මම කිව්වා. හොර කරන මිනිස්සු මට call කරලා කියනවා, "ඔයාට අයිතියක් නැහැ එහෙම කථා කරන්න" කියලා. මම ඔහුට කිව්වා, පුළුවන් නම් කරන දෙයක් කරන්න කියලා. ගරු කථානායකතුමනි, අපි රට වෙනුවෙන් ජනතාව වෙනුවෙන් මේ වාගේ දේවල් එළියට දමන කොට ඒ මිනිස්සුන්ට ශක්තියක් තිබෙනවා, මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීතුමන්ලාට call කරලා පාට එක දාන්න; එහෙම කරන්නේ කොහොමද කියලා අහන්න. ගරු කථානායකතුමනි, මම ඉතාමත් අවධාරණයෙන් කියනවා, මේ වාගේ හොරු මේ CHOGM එකට ඉදිරිපත් වෙන්න පුළුවන් කියා. මම දන්නේ නැහැ කවුද මේක organize කරන්නේ කියලා. ඒ professorsලාගේ පිටින් මේක ගියොත් එහෙම හරිම අසාධාරණයක් වෙනවා. මේ බලන්න professor කෙනෙකුට වෙච්ච දේ. විදේශ කටයුතු සම්බන්ධයෙන් අපි ගරු කරන professor කෙනෙක් තමයි ඉන්නේ. ඒ professorට මෙහෙම ඇබැද්දියක් වෙන්න දෙන්න එපා කියන එක තමයි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

අවසාන වශයෙන් ගරු කථානායකතුමනි,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතකොට වැඩි වේවි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
වැඩි වුණොත් හොඳයි. ගරු කථානායකතුමනි, මම කියන්න යන්නේ අපි කවුරුත් දන්නා ප්‍රශ්නයක්. This is under-invoicing.

මේක under-invoicing කරලා හොරට ගෙනැල්ලා tax ගෙවන්නේ නැහැ. ඒක නේ වෙන්නේ. Tax ගෙවන්නේ නැති වුණාම සාමාන්‍යයෙන් එකතු කරන බදු අඩු වෙනවා.

ගරු කථානායකතුමනි, වාර්ෂික වාර්තාවේ මොකක්ද තිබෙන්නේ කියලා බලන්න. 2012 කබරාල් මහත්මයාගේ වාර්ෂික වාර්තාවේ මොකක්ද තිබෙන්නේ? වැඩි පුරම බදු ගහන්නේ කාටද? Special Commodity Levy කියලා සාමාන්‍ය ජනතාවටයි බදු ගහන්නේ. සමන් කැලේගම කියන අපි කවුරුත් ගරු කරන ආර්ථික විශේෂඥයා මේ ළඟදී කියලා තිබෙනවා, වක්‍ර බදු සහ සෘජු බදුවල අනුපාතය - the ratio between direct taxes and indirect taxes - මේ වාගේ රටක තිබෙන්න ඕනෑ සෘජු බදු සියයට 40ක්, වක්‍ර බදු සියයට 20ක් වාගේ ප්‍රමාණයක් කියලා. නමුත් ලංකාවේ තිබෙන්නේ කීයද, 20යි, 80යි. වක්‍ර බදු සියයට 80යි, සාමාන්‍ය සෘජු බදු සියයට 20යි. මොකද කීයෙන් කී දෙනාද ආදායම් බදු ගෙවන්නේ? කීයෙන් කී දෙනාද අවශ්‍ය විධියට ඒ වැඩ කටයුතු කරන්නේ? අවසානයේදී මොකද වෙන්නේ, ගරු කථානායකතුමනි? මිනිස්සු හොරකම් කරනවා. බදු ගෙවන්නේ නැහැ. කෝටිපතියෝ බිහි වෙනවා. කොළඹට ගිහිල්ලා බලන්න කෝ තිබෙන වාහන, තිබෙන ගෙවල් ප්‍රමාණය කොච්චරද කියලා. මාළිගාවල් වාගේ ගෙවල් හදනවා. ඔවුන් බදු ගෙවනවාද? කොටස් වෙළෙඳ පොළෙන් හම්බ කරන සත පහකට බදු ගෙවනවාද?

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවාද කොටස් වෙළෙඳ පොළේ කෝටියක් හම්බ කළෝතින් බදු කොච්චර ගෙවන්න ඕනෑද කියලා. සතයක්වත් ගෙවන්නේ නැහැ. ඒක පුදුම වැඩක් නේ. සැමන් ටින් එකේ බද්ද මේ රටේ පෙරේදා රුපියල් 85 ඉඳලා රුපියල් 100ට වැඩි කළා. ඒවා සැමන් නොවෙයි. Norwegian salmon is very expensive. මම කියන්නේ මේ ටින් මාළු ගැනයි. මැකරල්ලුන්ගේ බද්ද රුපියල් 85 ඉඳලා රුපියල් 100ට වැඩි කෙරුවා. නමුත් insider trading කරලා, රහස් තොරතුරු තමන් ලබා ගෙන කොටස් වෙළෙඳ පොළෙන් සතියකින් කෝටියක් හම්බ කරන මහා පරිමාණ ව්‍යාපාරිකයෝ තඹ සතයක් ගෙවන්නේ නැහැ. ඒක අසාධාරණයි. ඒක නොවෙයි රටක බදු ප්‍රතිපත්තියක් විය යුත්තේ. රටක බදු ප්‍රතිපත්තිය සමාජ සාධාරණත්වයෙන් යුක්ත විය යුතුයි. දැන් බලන්න පැකර්ගේ ප්‍රශ්නය. පැකර් ගේනවා -

කථානායකතුමා
(සභානායකර් அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට මම විනාඩි පහකුත් වැඩියෙන් දුන්නා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම නවත්වන්නම්.

කථානායකතුමා
(සභානායකර් அவர்கள்)
(Mr. Speaker)
කියන ඒවා ඇත්තද, නැද්ද කියලාත් ආණ්ඩුව පැත්තෙන් කියන්න ඕනෑ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. එහෙම තමයි අපි මෙතැන වාද විවාද කරන්න ඕනෑ.

කථානායකතුමා
(සභානායකර් அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.තමුන්නාන්සේට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාගෙන් තව කාලය දෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
විනාඩි පහක් දෙන්න. මම විනාඩි පහෙන් නවත්වන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
එක්සත් ජාතික පක්ෂය යෝජනාවක් සම්මත කරන්න ඕනෑ, බදු ප්‍රතිපත්තිය ඕකයි කියලා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එක්සත් ජාතික පක්ෂයේ අපි යෝජනාවක් සම්මත කරන්න ලැහැස්තියි. අපේ නව රැඩිකල් ප්‍රතිපත්තිය අනුව අපි කියන්නේ සාධනීය, ග්‍රාමීය ආර්ථිකයක් ඇති - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න.

ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)
ඊයේ විශ්වාස භංගයට 30 දෙනයි හිටියේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මොකක්ද?

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ඊයේ විශ්වාස භංගයට එක්සත් ජාතික පක්ෂයෙන් 30 දෙනයි හිටියේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
විශ්වාස භංගයෙන් වැඩක් නැහැ. රැඩිකල් බදු ප්‍රතිපත්තියෙන් එක්සත් ජාතික පක්ෂය කරන්න යන්නේ මොකක්ද? [බාධා කිරීමක්]

කථානායකතුමා
(සභානායකර් அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, බාධා කරන්න එපා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඉතා ඉහළ තරගකාරීත්වයක් තිබෙන සමාජ සාධාරණයකින් යුත්-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒවා වචන.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
වචනවලින් තමයි මේවා කරන්නේ. හැම දේම වචනයෙන් කරන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
යූඑන්පී බදු ප්‍රතිපත්තිය-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

අපි නීතිය හදන්නේ වචනයෙන්. නීතිය වචනයෙන් හැදුවාම ඒ වචනයට අනුව තමයි වැඩ කරන්න ඕනෑ. වචනවලින් එහාට ගිහිල්ලා කටයුතු කරන්න බැහැ. අපි අතින් පයින් ගහලා දේශපාලනය කරන්නේ නැහැ. සමාජ වෙළෙඳ පොළ ආර්ථික - Social Market Economy - ක්‍රමවේදයක් ගැනයි එක්සත් ජාතික පක්ෂය කථා කරන්නේ. ඔබතුමන්ලාට වතුර බෝතල්වලින් ගහලා මේක කියන්න බැහැ. අපි එහෙම කරන්න උත්සාහ කරන්නෙත් නැහැ. අපි කියලා, ලියලා තමයි ඔබතුමන්ලාට මේ දේ ඉදිරිපත් කරන්නේ.

අවසාන වශයෙන් මා කියාගෙන ආවේ ගරු කථානායකතුමනි, කාගෙන්ද බදු ගහන්නේ, කාටද බදු නිදහස දෙන්නේ කියන එක ගැනයි. කෙරී පැකර්ගේ පුතා ජේම්ස් පැකර්, ක්‍රවුන් කියලා කැසිනෝ ව්‍යාපාරික ස්ථානයක් ඇති කරන්න ලෑස්ති වෙනවා කොටුවේ. ඒක රූන්ක් කාර් පාර්ක් ලංකා පුද්ගලික සමාගමට රුපියල් මිලියන 1240කට බදු දීපු බව ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේදී සභාගත කරපු ලියවිල්ලක තිබෙනවා. 2008 හෝ ඒ ආසන්න කාලයක තමයි ඒ කාර්යය කර තිබෙන්නේ. දැන් ඒ රූන්ක් කාර් පාර්ක් ලංකා පුද්ගලික සමාගම පැකර් කියන පුද්ගලයා එක්ක එකතු වෙලා තවවු 36ක ක්‍රවුන් කැසිනෝ ව්‍යාපාරික ස්ථානය හදන්න සූදානම් වෙලා ඉන්නවා. දැන් මේ රට ඔහුට දෙනවා බදු සහනයක්. මා එහෙම කියන්නේ ඇයි? ගිය සතියට කලින් සතියේ මේ පාර්ලිමේන්තුවේ සම්මත කරපු පනත් කෙටුම්පතට අනුව මේ සඳහා ගෙවන්න ඕනෑ විශේෂ බද්ද සියයට පහයි. නමුත් ලෝකයේ වෙනත් රටවල්වල කැසිනෝවලට ගහන බද්ද ඊට වඩා ගොඩක් වැඩියි. දැන් මකාවු රට -අපි කියන්නේ casino hub එක කියලා- තමයි ආසියාවේ කැසිනෝ කේන්ද්‍රය. මකාවු රටේ කැසිනෝ ව්‍යාපාරික ස්ථානයකට අය කරනවා, සියයට 39ක බද්දක්. නමුත් අපි විදේශිකයින්ට ආයෝජකයින් හැටියට එන්න කියලා සියයට පහක බද්දක් අය කරනවා. කැසිනෝ ව්‍යාපාර කරන අයට, කොළඹ කොටස් වෙළෙඳ පොළේ සෙල්ලම් කරලා හොරෙන් මුදල් හම්බ කරන කට්ටියට ශත පහක්වත් බදු ගහන්නේ නැහැ. සියයට බින්දුවයි බද්ද. නමුත් මැකරල් ටින් මාළු එකට බද්ද රුපියල් 85 ඉඳලා 100ට වැඩි කරනවා. ඒ වාගේම ලයිට් බිල වැඩි වෙනවා; පෙට්‍රල් මිල වැඩි වෙනවා; පාන් රාත්තලක් ගන්න බැරි තරමට මිල වැඩි වෙලා. ඉතින් මේක අසාධාරණ බදු ප්‍රතිපත්තියක් නොවේද? මෙතැනට ඇවිල්ලා අපට කියන්න පුළුවන්, "ඔව්, අපි බදු ප්‍රතිපත්තිය වෙනස් කරන්න යනවා" කියලා. හොඳ දේවල් හොඳයි, නරක දේවල් නරකයි.

ඒ වාගේම මා ඉතාම වැදගත් ප්‍රශ්නයක් ඔබතුමාගෙන් අහන්න කැමැතියි. 2009 දී යුද්ධය ඉවර වුණායින් පස්සේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් කළා බදු කොමිසමක්. කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ලක්ෂ්මන් මහත්මයා, සමන් කැලේගම මහත්මයා සහ Treasury එකේ ඉන්න මහත්වරු නෝනලා අට නව දෙනකුගෙන් යුක්ත කොමිසමක් පත් කළා. 2010 ඔක්තෝබර් මාසයේ එම කොමිසමේ වාර්තාව ජනාධිපතිතුමාට ඉදිරිපත් කළා. නමුත් 2013 මැයි මාසය වන තුරු ඒ බදු කොමිසමේ වාර්තාව මේ ගරු සභාවේ සභාගත කර නැහැ. ඒ විතරක් නොවෙයි. ඒකේ තිබෙන්නේ මොකක්ද කියලාවත් අපි දන්නේ නැහැ. ඔය අතරතුරේදී බදු එකතු කිරීම එන්න එන්න, එන්න එන්න අඩු වෙනවා. අපි බොහොම ගරු කරන ඩිව් ගුණසේකර ඇමතිතුමාත්, අපි බොහොම ගරු කරන වාසුදේව නානායක්කාර ඇමතිතුමාත් මා හිතන්නේ මේ පිළිබඳව ප්‍රශ්න කර තිබුණා. ඇමතිවරු ප්‍රශ්න කරන කොටවත් මේවාට උත්තරයක් දෙන්නේ නැහැ. ඉතින් බදු ප්‍රතිපත්තිය මොකක්ද කියන එක සාධාරණීකරණය කරන්න බැහැ. එකින් එක, හිටි හැටියේ නොයෙකුත් තැන්වලින් ගෙනැල්ලා ඊතයිල් මද්‍යසාරවලට බද්ද පොඩ්ඩක් අඩු කරනවා; අලවලට බද්ද පොඩ්ඩක් වැඩි කරනවා; tyre tube එකට බද්ද පොඩ්ඩක් වැඩි කරනවා. එහෙම කටයුතු කරන්න බැහැ. රටක් වුණාම අපට සමස්ත බදු ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ඒ සමස්ත බදු ප්‍රතිපත්තිය සකස් කරන එක දේශපාලනඥයින්ට කරන්න බැහැ. මම කියන්නේ නැහැ මෙතැන ඉන්න දේශපාලනඥයින්ට ඒක කරන්න පුළුවන් කියලා. ඒක කරන්න තමයි අපි කවුරුත් ගරු කරන ආර්ථික විද්‍යාව පිළිබඳව විශේෂඥයකු වන මහාචාර්ය ලක්ෂ්මන් මැතිතුමා ඒ කොමිසමට පත් කළේ. එතුමා දේශපාලනඥයෙක් නොවෙයිනේ. ඇත්ත වශයෙන්ම එතුමා මහින්ද චින්තනයත් එක්ක වැඩ කරපු මහත්මයෙක්. යූඑන්පී එකත් එක්ක හිටපු කෙනෙක් නොවෙයි. අපි කවුරුත් දන්නවා, එතුමා කොයි විධියටද ආර්ථික විද්‍යාව ගැන හිතන්නේ කියලා. එතුමා නව ලිබරල්වාදී ආර්ථික දර්ශනයක් තිබෙන කෙනෙක් නොවෙයි. එහෙම කෙනෙක් නොවෙයි. නමුත් එතුමා ඉදිරිපත් කරපු ඒ වාර්තාව පවා රජය පැත්තකට දමා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මගේ කථාව දැන් අවසන් කරන්න කැමැතියි. මා මේ කියන්න උත්සාහ කළේ මේකයි. අද එකක් ගැන විවාද කරනවා. තව සති දෙකකින් තවත් එකක් ගැන විවාද කරනවා. ඒවා හොඳයි. නමුත් ඒක රාමුවක් තුළ තියෙන්න ඕනෑ. ඒ රාමුව රටට ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම වුණේ නැත්නම් සියයට 11 ඉඳලා තවදුරටත් මේක බැස්සොත් මේ රට කර ගෙන යන්න ක්‍රමයක් නැති වෙනවා. ලයිට් බිල වැඩි කළේ නැත්නම් ආර්ථිකය කඩා ගෙන වැටෙනවා කියලා ජනාධිපතිතුමා කියලා තිබෙන එක හරි. ගරු කථානායකතුමනි, මේ රට ශීඝ්‍රයෙන් ආශ්වර්යය කරා යනවා කියලා කවුරු කොච්චර කිව්වත් ඒක සාවද්‍යයි. ඒක ඇත්ත නොවෙයි. එහෙම නම් දුප්පත් මිනිස්සුන්ගේ ලයිට් බිල වැඩි කළේ නැත්නම් ආර්ථිකය කඩා වැටෙනවා කියලා ජනාධිපතිතුමා කිව්වේ ඇයි? මා හිතන්නේ නැහැ, ජනාධිපතිතුමාට අසරණ මිනිස්සුන්ගේ ලයිට් බිල වැඩි කරන්න ඕනෑ කියලා. අප කාටවත් ඕනෑ නැහැ. නමුත් එතුමා කියලා තිබෙන්නේ, ඒක කළේ නැත්නම් ආර්ථිකය කඩා වැටෙන බවයි.

එහෙම නම් ගරු කථානායකතුමනි, මට වැඩිපුර වෙලාව ලබා දීම ගැන ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාට මගේ කෘතඥතාව පුද කරමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. මීළඟට ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා.

[අ.භා. 2.52]

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, 2011 අංක 46 දරන පනත මඟින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත පිළිබඳ

නියෝග පැහැදිලි කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා ඉතාම සතුටු වෙනවා. ගරු කථානායකතුමනි, මෙම සංශෝධනය කිරීමේ දී ඔබතුමාත් විශාල සහයෝගයක් ලබා දුන්නා; උපදෙස් ලබා දුන්නා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. අතිගරු ජනාධිපතිතුමාත් නිතර නිතර මේ පිළිබඳව අපට උපදෙස් ලබා දී තිබෙනවා. ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් මේ පිළිබඳව මූලිකව කටයුතු කළා.

විශේෂයෙන්ම අප දන්නවා කුඹුරු පනත ආරම්භ කළේ 1956 ජනතා ජයග්‍රහණයෙන් පසුව බණ්ඩාරනායක රජයේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍ය තනතුර දැරූ දිවංගත පිලිප් ගුණවර්ධන මැතිතුමා බව. ඒ 1958 මාර්තු මාසයේ 01වැනි දා අංක 1 දරන පනතයි. ඊට පසුව විවිධ අවස්ථාවල මෙම පනත සංශෝධනයට ලක් වුණා. 1964 අගෝස්තු මස 24වැනි දා සංශෝධනය වුණා. ඊට පසුව 1973 ඔක්තෝබර් මාසයේ 17වැනි දිනත් එවකට කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා වූ හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාගේ කාලයේත් මෙම කුඹුරු පනතට සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. ඒ තුළින් ගොවි ජනතාවට සහන ලැබී තිබෙනවා. ඒ වාගේම 1991පෙබරවාරි මාසයේ 1979 අංක 58 දරන ගොවිජන සංවර්ධන පනතටත් සංශෝධනයක් කර තිබෙනවා. 2000 වර්ෂයේත් මේ ගොවිජන සංවර්ධන පනත සංශෝධනය වුණා.

මේ විධියට විටින් විට ගොවිජන සංවර්ධන පනත සංශෝධනය වීමෙන් යහපත් සහ අයහපත් ප්‍රතිඵල ලැබී තිබෙනවා. කෙසේ හෝ අන්තිමට ගොවි ජනතාවගේ ප්‍රශ්නවලට නිසි විසඳුම් ලබා දීමේ දී සිදු වුණ අඩු පාඩු නැවත හදන්න තමයි 2011 නොවැම්බර් මස 22වැනි දා මේ පනත සංශෝධනය කරන්න කටයුතු කළේ. මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී ඇති වුණ අඩු පාඩු නිසා 6000ක පමණ පිරිසක් අසහනයට පත් වී සිටියා. ඒ 6000ක් පමණ වූ ගොවි ජනතාව වෙනුවෙන් මේ පනත සංශෝධනය කරන නිසා නැවත සහන ලැබෙනවාය කියන එක මා බොහොම සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි. මොකද, 2011 නොවැම්බර් මස 22වැනි දින සංශෝධනය කරන ලද පනතින් 6000ක් පමණ ගොවීන්ගේ ගොඩ ගැසී තිබුණ පැමිණිලි පිළිබඳව අවශ්‍ය කටයුතු කරලා සහන ලබා දෙන්නට අවශ්‍ය දේවල් අප ලැහැස්ති කර තිබෙනවා.

පළමුවැනි එක තමයි, නිසුදුගල ගොවිජන විනිශ්චය සභා වෙනුවට ඒක පුද්ගල විනිශ්චය සභා පිහිටුවීම මඟින්, ගොඩ ගැසී පවතින ගොවි ගැටලු නිරාකරණය කිරීම. මාස හයක කාලයක් තුළ එම ගැටලු විසඳීමට නව ඒක පුද්ගල විනිශ්චය සභා පත් කර තිබෙනවා. ඒ වාගේම වර්තමානයේ ජීවත් වන අඳ ගොවීන් සඳහා අනුප්‍රාප්තිකයකු නම් කිරීම මෙන්ම සුදුසු අනුප්‍රාප්තිකයකු නම් කිරීම සඳහා අඳ ගොවීන්ට අවසර ලබා දීමටද මෙමඟින් අවස්ථාව ලැබිලා තිබෙනවා. එවැනි අවස්ථාවක් කලින් තිබුණේ නැහැ. ඒ වාගේම මෙම සංශෝධනයන්ගෙන් පසුව වන්දි ලැබිය යුතු අඳ ගොවීන් සඳහා වන්දි මුදල් අක්කරයකට රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි වන සේ ගණනය කිරීම කියන සහනයත් ලැබෙනවා. ඒ වාගේම වර්තමාන අඳ ගොවීන් සඳහා අනුප්‍රාප්තිකයකු නම් කිරීම හෝ නම් කරන ලද අනුප්‍රාප්තිකයකුගේ නම වෙනස් කිරීමටද අවස්ථාව ලැබෙනවා. ඒ වාගේම, ඒක පුද්ගල ගොවිජන විනිශ්චය සභා සමාලෝචන මණ්ඩල පරිපාටිය හඳුන්වා දීමද කෙරෙනවා. මේ කාරණා වාගේම අනෙක් අඩු පාඩු සියල්ල පාහේ මහ හැරෙන විධියට, අඳට ගැළපෙන විධියට මෙකී නියෝග ඉදිරිපත් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් 2011 නොවැම්බර් 22 දරන සංශෝධන පනතත් එක්ක ගත්තාම ඒ පනතේ නියෝග සම්මත වුණාට පස්සේ තවත් අවුරුදු ගණනක් ඉදිරියට අපේ රටේ ගොවි ජනතාවගේ -විශේෂයෙන් අඳ ගොවි ජනතාවගේ- ආරක්ෂාව සලසන්න, ඒ අයට අවශ්‍ය සහන ලබා දෙන්න හැකි වන බව අප දන්නවා. අපේ රජය විශේෂයෙන් කෘෂි කර්මයට ගරු කරන, ගොවියාට ගරු කරන රජයක්. ඒ වාගේම අපේ රාජ්‍ය නායකයා වන අතිගරු ජනාධිපතිතුමා ගොවි ජනතාව පිළිබඳව නිරන්තරයෙන් සොයා බලා කටයුතු කරන නායකයකු හැටියට මේ කටයුත්ත කඩිනමින් කරන්න කියලායි අපට උපදෙස් දුන්නේ. අප දන්නවා ඉදිරියේදී අපේ රටේ කෘෂි කර්මය දියුණු කරන කොට, ගොවියා ශක්තිමත් කරන කොට, අසහනයට පත්වූ ගොවි ජනතාවට නිරන්තරයෙන් සහන ලැබෙන බව. ඒ වාගේම අප කියන්න ඕනෑ වැඩියෙන්ම පීඩා වින්දේ, වැඩියෙන්ම පීඩාවට පත් වුණේ අතිගරු ජනාධිපතිතුමාගේත්, ඒ වාගේම අපේ ගරු කථානායකතුමාගේත් දිස්ත්‍රික්කය වන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවයි කියන කාරණය. ඒ වාගේම මා නියෝජනය කරන අනුරාධපුරය දිස්ත්‍රික්කයේත් එවැනි විශාල පිරිසක් ඉන්නවා. මුළු රටටම ඉන්න ගොවීන් වෙනුවෙන් මේ සහනය ඉතාම වැදගත් වෙනවා.

ගරු කථානායකතුමනි, හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා කෘෂිකර්ම ඇමතිතුමා හැටියට හිටපු කාලයේ කෘෂිකර්ම පනත ගෙන ආවා. ඒ වාගේම අද තිබෙන ගොවිජන සේවා මධ්‍යස්ථාන 557ක් අපේ රටේ ඉදි කරන්න -පිහිටුවන්න- කටයුතු කළේ එතුමා බව අප දන්නවා. ඒ අනුව ගොවිජන සභා පිහිටෙව්වා; ගොවි කම්‌ටු පිහිටෙව්වා; ගොවි සංවිධාන ඇති කළා. දිස්ත්‍රික් මට්ටමින්, ජාතික මට්ටමින්, ඒ වාගේම ගොවිජන සේවා මට්ටමෙන් හදපු ඒ ව්‍යුහය ශක්තිමත් කිරීමේ කාර්යය තමයි අද අපට පැවරිලා තිබෙන්නේ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේයි අද ගොවිජන සේවා දෙපාර්තමේන්තුව තිබෙන්නේ. එනම්, අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ විෂයය යටතේයි. ඉදිරියේදී අප සුළු වාරි මාර්ග කටයුතු, ගොවියාගේ ගොඩ ගැසිලා තිබෙන නොයෙකුත් ප්‍රශ්න හඳුනා ගෙන ඒවාට විසඳුම් ලබා දෙනවා. ඒ විසඳුම් ලබා දීමේදී මේ සංශෝධනයත් ඉතාම වැදගත් වෙනවා. අප දන්නවා අපේ රටේ සුළු වාරි මාර්ග 30,000ක් පමණ තිබෙන බව. ඒ සුළු වාරි මාර්ග 30,000 යටතේ ගොවි සංවිධාන 13,000ක් පමණ තිබෙනවා. ඒ ගොවි සංවිධාන 13,000 තුළ අපේ ගොවියෝ ලක්ෂ 15කට වැඩි පිරිසක් ඉන්නවා. ඒ සියලු දෙනා අපේ රටේ ආහාර නිෂ්පාදනය කිරීම සඳහා වී නිෂ්පාදනය කරන්න විශාල දායකත්වයක් සපයමින් ඍජුවම කටයුතු කරන පිරිසක්. ඒ නිසා රජයක් හැටියට අපේ රජයේ වගකීම, යුතුකම ඔවුන් වෙනුවෙන් ඉටු කිරීමක් තමයි අද දවසේ අප මේ කරන්නේ.

ගරු කථානායකතුමනි, මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා විශේෂයෙන් පොහොර සහනාධාරය පිළිබඳව කථා කළා. පොහොර සහනාධාරය ලබා දීම නිසා අපේ රටේ විශාල පරිවර්තනයක් සිද්ධ වුණා.

අපි දන්නවා, මොන විවේචනය කළත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ, අපි විපක්ෂයේ ඉන්න කොට පොහොර මිටිය රුපියල් 500ට දෙන්න කියලා ඉල්ලීමක් කළා. ඊට පස්සේ කිව්වා, "පිස්සු කථාවක්නේ මේ කරන්නේ, කොහොමද රුපියල් 500ට පොහොර මිටියක් දෙන්නේ" කියලා. මට මතකයි, එක අවස්ථාවක අපේ අතිගරු ජනාධිපතිතුමා පොහොර මිටිය රුපියල් 350ට දෙනවා කියන කොට එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් තිස්ස අත්තනායක මැතිතුමා කිව්වා "එහෙම නම් මේක ඇලඩින්ගේ පුදුම පහණ වාගේ වෙන්න ඕනෑ" කියලා. ඒ ඇලඩින්ගේ පුදුම පහණ අපි දැන් පත්තු කරනවා. එහෙම පත්තු කරලා දැන් ගත වෙන්නේ 17වැනි කන්නය. ඒ විධියට අපි ගොවි ජනතාවට සහන ලබා දීලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් ලබා දෙන පොහොර ප්‍රමාණය අඩු කරලානේ තිබෙන්නේ.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැහැ, අඩු කරලා නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇලඩින්ගේ පුදුම පහණ දැන් පත්තු වෙන්නේ නැහැනේ.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
හොඳට පත්තු වෙනවා. අපි තෙල් දානවා. හොඳට තෙල් දාලා තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ලබා දෙන පොහොර ප්‍රමාණය ඔබතුමන්ලා අඩු කරලා තිබෙන්නේ.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැහැ, නැහැ. අපි කාබනික පොහොර පාවිච්චිය වැඩි කරන්න ලැහැස්ති කරලා තිබෙනවා. තමුන්නාන්සේලාම කියනවා වස විස වැඩියි, පොහොර යොදනවා වැඩියි, වකුගඩු අමාරුව හැදෙනවා, cancers හැදෙනවා කියලා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාමනේ ඒ ගැනත් කියන්නේ. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමාට කථා කරන්න අවස්ථාව දුන්නා නම් හොඳයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මට පොඩි කරුණක් අහන්න තිබෙනවා.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අහන්නකෝ, කමක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමන්ලා අක්කරයක් සඳහා ලබා දෙන පොහොර ප්‍රමාණය අඩු කරලා තිබෙනවා විතරක් නොවෙයි, රක්ෂණ බද්දක් සඳහා කියලා එක පොහොර මිටියකට රුපියල් 3ක් එකතු කරනවා.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්, රක්ෂණය කරනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක පාවිච්චි කරන්නේ මොකටද? ඒ වාගේම, ලබා දෙන පොහොර ප්‍රමාණය අඩු කිරීම තුළ ඔබතුමන්ලාගේ පහණ දල්වන හැටි මට පොඩ්ඩක් කියලා දෙන්නකෝ.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ලබා දෙන පොහොර ප්‍රමාණයේ අඩු කිරීමක් කරන්නේ නැහැ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම විශේෂඥයෝ එකතු වෙලා පොහොර ගැන පර්යේෂණයක් කළා. විශේෂයෙන්ම පොහොර වර්ග තුනක් තිබෙනවා. යූරියා, MOP හා TSP කියන පොහොර වර්ග. ශාකයක් හැදෙන මූල ධර්මයක් අනුවයි ඒ පොහොර යොදන්නේ. නමුත් ඒ පොහොර වැඩිපුර නිකුත් කරන ප්‍රදේශ තිබෙනවා. පස පරීක්ෂා කරලා ඒ පළාත්වලට අවශ්‍ය කුමන පොහොර වර්ගයද කියලා අපි නියැදි පරීක්ෂණයක් කළා. ඒ අනුව ඒ කෘෂිකර්ම විශේෂඥයන්ගේ අනුමැතිය අනුව තමයි පොහොර ලබා දීම අඩු වැඩි කරලා තිබෙන්නේ. පොහොර වර්ග තුනෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ බිම්වලට අවශ්‍ය පොහොර වර්ගය මොකක්ද කියලා සොයලා බලලා, ඒ පොහොර ප්‍රමාණය ඒ ප්‍රදේශයට අඩු නම් පිට පළාතකින් ලබා දෙනවා. ඒ පළාතට මේ පළාතෙන් ලබා දෙනවා. අනුපාත ක්‍රමය යටතේ ආසන බෙදනවා වාගේ තමයි. අන්න ඒ වාගේ අවශ්‍ය ප්‍රදේශවලට අවශ්‍ය වර්ගය ලබා දෙනවා. පොහොර ලබා දීමේ සමතුලිතතාවක් ඇති කරන්න තමයි ඒ කටයුත්ත කරන්නේ. එහෙම නැතිව ලබා දෙන පොහොර ප්‍රමාණයේ අඩු කිරීමක් කරලා නැහැ.

ඊට සමගාමීව අපේ අතිගරු ජනාධිපතිතුමා 2013 වර්ෂය සඳහා ජාතික අය වැය ඉදිරිපත් කිරීමේදී විශේෂයෙන් කාබනික පොහොර පාවිච්චිය ප්‍රවර්ධන කරන්න අවශ්‍ය කාරණා ඉදිරිපත් කළා. ඒ අනුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් එකතු වෙලා කාබනික පොහොර වැඩිපුර පාවිච්චි කරන්න උපදෙස් දෙනවා. මොකද අපි දන්නවා, රසායනික පොහොර සහ කෘමිනාශක පාවිච්චිය වැඩි නිසා යම් යම් ගැටලු මතු වෙලා තිබෙන බව. විද්‍යාඥයෝ, විශේෂඥයෝ, වෛද්‍යවරු, පරිසරවේදීන් කියන ඒ සියලු දෙනාම ඉදිරිපත් කරන කාරණා පිළිබඳවත් අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරලා තිබෙනවා. ඒ නිසා අපි කාබනික පොහොර පාවිච්චිය සඳහා යා යුතුයි. අපි දන්නවා දියුණු රටවල් වන ජපානය, කොරියාව, චීනය වාගේ රටවල්වල කාබනික පොහොර පාවිච්චිය අපි දැකලා තිබෙනවා. විශේෂයෙන්ම රසායනික පොහොර වාගේම ඊට සමව කාබනික පොහොර නිෂ්පාදනයත් කරනවා. ඒ අයගේ ගොවිපළවල්වල රසායනික පොහොර ගබඩාවක් වාගේම කාබනික පොහොර ගබඩාවකුත් තිබෙනවා. නමුත් අපි ඉතා විශාල සහනාධාරයක් වශයෙන් රුපියල් 350ට පොහොර ලබා දෙනවා. මම හිතන හැටියට අද සිගරට් පැකට් එකක මිලත් රුපියල් 350ට වඩා වැඩි වෙන්න ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමාගේ අවධානය මේ ගැනත් යොමු කරන්න. ගොවිජන සේවා මධ්‍යස්ථාන ශක්තිමත් කරලා ගොවීන්ට සේවා පහසුකම් සපයනවා නම් ගොවීන්ගේ නිෂ්පාදන වියදම් අඩු වෙනවා. ඒවා ගැනත් කල්පනා කරන්න. පොහොර ගැන විතරක් කථා කරලා මදි. ගොවිජන සේවා මධ්‍යස්ථානවල තත්ත්වය කොහොමද කියලා කරුණාකරලා ගිහිල්ලා බලන්න. ඒවායින් ගොවීන්ට වන සේවාව මොනවාද කියලා බලන්න.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අපි දන්නවා, ගරු කථානායකතුමා සැබෑ ගොවියෙක්. එතුමා ප්‍රායෝගිකව කුඹුරේ ඉන්න ගොවි මහත්මයෙක්. ඒ නිසා ඔබතුමන්ලාට වැඩිය එතුමා කියන දේ අපි පිළිගන්නවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නියර උඩ ඉන්නේ, කුඹුරේ නොවෙයි.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අපි දන්නවා, කුඹුරේ උදේට - [බාධා කිරීම්] එතුමා කියන දේත් අපි ඉතාම ඉහළින් පිළිගන්නවා. අපි මේ වන කොට ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ ගොඩනැඟිලි අලුත්වැඩියා කරන්න කටයුතු කරනවා. කාලාන්තරයක් තිස්සේ ඒ ගොඩනැඟිලි අලුත්වැඩියා වෙලා නැහැ. ගරු කථානායකතුමා කියන කාරණය අපි පිළිගන්නවා. ඒ අනුව කටයුතු කරනවා. ඒ වාගේම අපේ ගොවි ජන සංවර්ධන නිලධාරිවරුන්ගේ හිඟයක් තිබුණා. ඒක සම්පූර්ණ කරන්නත් අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා කටයුතු කරගෙන යනවා. කෘෂි පර්යේෂණ නිලධාරිවරු අඩුවෙලා තිබෙනවා. ඒ අයත් ළඟ දී බඳවාගෙන ගොවි ජන සේවා මධ්‍යස්ථාන එතුමා කියන ආකාරයට ශක්තිමත් කරන්න අපි කටයුතු කරනවා. ගොවි ජන සේවා කාර්යාල පිහිටි භූමියේ පවා ආදර්ශ ගොවි පොළක් ඉදි කරන්න දිවි නැඟුම යටතේ අපි මේ වෙන කොට කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම ගොවිජන සංවර්ධන පනතින් තමයි මේ සියලුම ගොවි ජන සේවා මධ්‍යස්ථාන පාලනය වෙන්නේ. අපි මේ ගෙනෙන ලද නියෝගවලිනුත් අපේ ගොවියාට සහනය ලැබෙනවා වාගේම ගොවි ජන සේවා මධ්‍යස්ථානයේ සියලු කටයුතු ඉතාම සාර්ථකව කරන්න පුළුවන් වෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගොවිතැන් කරන ප්‍රදේශයක, ගොවි පවුලක පුද්ගලයකු හැටියට අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. විශේෂයෙන්ම අපේ පිලිප් ගුණවර්ධන මැතිතුමා එදා ගෙනාපු ඒ සමාජවාදී පනත තුළින් අපේ රටේ කෘෂි කර්මාන්තයේ විශාල පරිවර්තනයක් වුණා. එයින් ගොවි ජීවිතවල විශාල පරිවර්තනයක් වුණා. ඒ වාගේම ගොවි ක්ෂේත්‍රයේ විශාල පරිවර්තනයක් වුණා. ඒ නිසා කුලීකාරයන්, වහලුන් හැටියට පත් වෙලා හිටපු ඒ ගොවීන් ශක්තිමත් ගොවි පරම්පරාවක් බවට පත් වුණා. කෘෂිකර්ම අමාත්‍යවරු වශයෙන් කටයුතු කරපු අමාත්‍යතුමන්ලා මෙවැනි යෝජනා විටින් විට ගෙනැල්ලා මේ කටයුතු ශක්තිමත් කරන්න කටයුතු කළා. ඒවායේ සමහර අඩු පාඩුත් තිබුණා. නමුත් අද ඒ සියල්ලම සම්පූර්ණ කරන්න වාගේම, ගොවීන්ට විශාල සහනයක් ලබා දෙන්න අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත කටයුතු කරනවා. අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ විශාල මැදිහත් වීම යටතේත්, ඔබතුමාගේත් උපදෙස් මත අපිට කටයුතු කරන්න ලැබීම පිළිබඳව විශේෂයෙන්ම ඔබතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. අද මේ සම්මත වන නියෝගවලින් අපේ රටේ ගොවි ජනතාවගේ ජීවිත සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්තුතියි.

මීළඟට ගරු අගමැතිතුමා. විනාඩි දහයකින් ඔබතුමාගේ කථාව ඉවර කළොත් හොඳයි.

[අ.භා. 3.08]

ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)
ගරු කථානායකතුමනි, විශේෂයෙන් මම වචන ස්වල්පයක් කථා කරන්න කල්පනා කළේ කෘෂිකර්මයට බොහොම ආදරය කරන කෙනෙකු හැටියටත්, අදටත් කුඹුරුවල වාගේම මගේ ඉඩකඩම්වලත් කිසි අඩු පාඩුවක් නැතිව ක්‍රියා කරන කෙනකු හැටියටයි.

අනික් කාරණය තමයි 2000 මේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ මමයි. ඒ පනත යටතේ එන නියෝග තමයි අද සාකච්ඡාවට ගැනෙන්නේ. මේ නියෝගවලින් බලාපොරොත්තු වෙන්නේ අඳ ගොවියා තව දුරටත් තහවුරු කිරීමයි. ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් කියන දෙපැත්තම මෙය කල්පනා කරන්න ඕනෑ. ඒ නිසායි වචන කීපයක් මේ සම්බන්ධයෙන් කථා කරන්න මම බලාපොරොත්තු වෙන්නේ.

අඳ ගොවි ක්‍රමය කියන්නේ වැඩවසම් ක්‍රමයේ එක් කොටසක්. මේ වැඩවසම් ක්‍රමය අහෝසි වන ආකාරයට කටයුතු කරලා, අයිතිකාරයාට හෝ අඳකාරයාට කියන එක් කෙනෙකුට මේ කුඹුරු ලැබෙන විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත් හොඳයි කියලා තමයි එදා මම කල්පනා කළේ. නමුත් අමාත්‍යාංශ වෙනස් වෙච්ච නිසා ඒක දීර්ඝ වශයෙන් ක්‍රියාත්මක කිරීමට බැරි වෙන්න ඇති කියලායි මා හිතන්නේ. කොහොම නමුත් එහෙම වුණාට අඳ බලාපොරොත්තු වෙන්නේ අඳ ගොවියා ඊට වැඩිය ස්ථාවර තත්ත්වයට ගෙන ඒමයි. ඒක වැරැද්දක් කියලා මම කල්පනා කරන්නේ නැහැ. මොකද අඳ ගොවියා තහවුරු කිරීම, අඳ ගොවියාට වාසිදායක විධියට ගොවිතැන ක්‍රියාත්මක කිරීම හොඳ වැඩක්.

ගරු කථානායකතුමනි, නමුත් මෙහි ප්‍රශ්නයක් තිබෙනවා. අද ලංකාවේ හුඟක් තැන්වල බැලුවාම, මේ අඳ ගොවියෝ හරියට ගොවිතැන කරන්නේ නැහැ. සමහරු කරන්නේම නැහැ. අයිතිකාරයා කොහොමටවත් කරන්නේ නැහැ. මේ දෙක ගැන හොඳට කල්පනා කරලා බලන්න වුවමනා කරනවා. ආණ්ඩුව විතරක් නොවෙයි, විපක්ෂත් -අපි ඔක්කොම- කල්පනා කරලා බලන්න ඕනෑ කාරණයක් තමයි මේක.

හාල්වලින් අපි ස්වයංපෝෂිත වෙන්න නම් අපේ රටේ කුඹුරු අක්කර දහඅට ලක්ෂය වගා කිරීමේ වැඩ පිළිවෙළ හරියට කරන්න ඕනෑ. අක්කර දොළොස් ලක්ෂයක් විතර ප්‍රමාණයක් තමයි දැනට අස්වද්දන්නේ. එහෙම නම් අක්කර දහඅට ලක්ෂයම අස්වැද්දුවොත් අපට හාල් පිටරට යවන්න පුළුවන්කම ලැබෙනවා. මම ඒ කාලයේදී චීනයෙන් විශේෂඥයන් දහඅට දෙනෙක් ගෙන්වලා වී වගාව දියුණු වන ආකාරයට, වැඩියෙන් අස්වැන්න ලබා ගැනීමේ ක්‍රම ක්‍රියාත්මක කළා. ඒ වැඩ පිළිවෙළ නිසා ඒ කාලයේදී අක්කරයකින් වී බුසල් 204ක් දක්වා ලබා ගන්න පුළුවන්කම ලැබුණා. ක්‍රමක්‍රමයෙන් ඒක අඩු වුණා. එහෙම වුණත් අද වී ගොවිතැනත්, ඒ වාගේම කෘෂි කර්මාන්තයත් දියුණු වෙලා නැහැයි කියා කියන්න බැහැ. ක්‍රමක්‍රමයෙන් එය දියුණු වෙලා තිබෙනවා. පහු ගිය අවුරුදු ගණනාව ගැන කල්නා කරලා බැලුවොත් 2011 අවුරුද්දේ පැවති ඉඩෝරය නිසා වී අස්වැන්න සැහෙන ප්‍රමාණයක් අඩු වුණා. එහෙම වුණත් අවුරුද්දෙන් අවුරුද්දට කෘෂි කර්මාන්තයේ දියුණුවක් වෙලා තිබෙනවා. නමුත් බැලු බැල්මට අපි අහන්නේ කෝ අපට වුවමනා කරන හාල්, කෝ අපට වුවමනා කරන එළවලු, කෝ අපට වුවමනා කරන

[ගරු දි.මු. ජයරත්න මහතා]

පලතුරු කියායි. ඒකට හේතු වෙලා තිබෙන්නේ ජනගහනයේ වැඩි වීමට යෝග්‍ය ප්‍රමාණයට අනුව ඒ අංශවල වැඩි වීමක් වෙලා නැති එකයි. අස්වැන්න ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. නමුත් ජනගහනයත් එක්ක සසඳා බලනකොට අවශ්‍ය තරමට වැඩි වෙලා නැහැ. අන්න එවැනි අඩු පාඩුවක් තිබෙනවා.

ඊළඟට "ඇයි මේ කුඹුරු අස්වද්දන්නේ නැත්තේ?" කියන ප්‍රශ්නය මතු වෙනවා. අද මේ රටේ දරුවන් හතළිස් තුන් ලක්ෂයක් පාසල්වල ඉගෙනුම ලබනවා. විශ්වවිද්‍යාලවලට තේරෙන ප්‍රමාණය හතළිස් දෙදාහක් වෙනවා. විසි දෙදාහක් විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්නවා. ගරු කථානායකතුමනි, ඒ කවුරුවත් කුඹුරකට බහින්න කැමැති නැහැ. මඩ ගෑවෙනවට වත් කැමැති නැහැ. ඒක අද මුළු ලංකාවේම තිබෙන තත්ත්වයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ කටයුතුවලදී එක්තරා ප්‍රමාණයකට යන්ත්‍ර සූත්‍රවලින් ක්‍රියා කිරීමත් අමාරුයි. මොකද, හැම කෙනෙකුටම යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමට පුළුවන්කමක් නැහැ. අනික් කාරණය තමයි යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් කටයුතු කරන්න අපහසු ප්‍රදේශත් විශාල වශයෙන් තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ කුඹුරු අක්කර 11,629ක් තිබෙනවා. එයින් බොහෝ ප්‍රමාණයක් කුඹුරු කඳුවල තිබෙන නිසා ඒ කුඹුරු වගා කිරීමේදී යන්ත්‍ර සූත්‍රවල සේවය යොදවා ගන්න බැහැ. එවැනි ස්ථානවලට යෝග්‍ය මැෂින් ලෝකයේ තවම නිෂ්පාදනය කරලා නැහැ. නමුත් දියුණු ප්‍රදේශවල තිබෙන කුඹුරු ඉඩම්වලට වුණත් අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිල දී ගැනීමට මිනිසුන්ට තවමත් පුළුවන්කමක් නැහැ. අපි සන්තෝෂ වෙනවා, රජය කෘෂිකර්මය සඳහා වුවමනා කරන යන්ත්‍ර සූත්‍රවල මිල අඩු කර තිබෙන එක ගැන. ඒ වැඩ පිළිවෙළ හොඳයි.

තවත් කාරණයක් තමයි සමහර කුඹුරු අයිතිකාරයින් ඒවා අඳේට දීලත් නැහැ, අයිතිකාරයා වගා කරන්නෙත් නැහැ. ඇයි ඒ කුඹුරු අයිතිකාරයින් ඒවා වගා කරන්නේ නැත්තේ? අඳේට දුන්නාම අඳ ගොවියා ඒක හරියට වගා කරන්නෙත් නැහැ. ඒ ඇරුණාම ඒ ඉඩම් අයිති බොහෝ අය රජයේ සේවකයෝ. එහෙම නැත්නම් වෙන මොනවා හරි සේවාවක් කරන අය. එහෙම වුණාම කුඹුරු වගා කරන්න ඒ අය කැමැති නැහැ. වෙන කාටවත් දෙන්න කැමැතිත් නැහැ. ඒ නිසා බොහෝ කුඹුරු කැළෑ බවට පත් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා යන එන වෙලාවට දියුණු ප්‍රදේශයක් වන ගම්පහ දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් ගැන බලන්න. මෙහේ ඉඳලා මහනුවරට යනකොට පාර අයිනේ තිබෙන කුඹුරු ඉඩම් ගැන බලන්නය කියා මම මේ ගරු මන්ත්‍රීවරුන්ට කියනවා. අද ඒ කුඹුරු වගා කරන්නේ නැහැ. ඒකට හේතුව මොකක්ද කියා මම ඒ ගැන සොයා බැලුවා. කුඹුරු අයිති අය ඒවා අඳ ගොවින්ට දීලත් නැහැ, අයිතිකාරයින් ඒ කුඹුරු කරන්නෙත් නැහැ. ඒ ගොල්ලන් බොහෝ විට රජයේ සේවකයෝ. එහෙම නැත්නම් වෙන වෙළඳාමක් හෝ මොනවා හෝ ජීවනෝපායක් කරන අය. අද එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ කාලයේදී මම මේ පනතට එක වගන්තියක් ගෙනාවා. ඒ වගන්තිය තවම තිබෙනවා. ඒ අනුව කිසිම කෙනෙකුට කුඹුරක් හෝ ගොඩ ඉඩමක් අස්වද්දන්නේ නැතිව, පල ප්‍රයෝජන ගන්නේ නැතිව තියන්න පුළුවන්කමක් නැහැ. ඒ ඉඩම් වගා කරන්න ඕනෑ. එහෙම නැත්නම් වෙන කාට හරි ඒවා දීලා ඇස්වැද්දුවාම හතරෙන් එකක් අයිතිකාරයාට දෙන්න ඕනෑය කියා පනතේ තිබෙනවා. නමුත් අද ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. හැබැයි ඉතින් ඒ විධියට කටයුතු කරන්න අමාරුකමකුත් තිබෙනවා. එක ගමක කුඹුරු අයිතිකාරයෙක් ඉන්නවා නම් ඒ ගමේම තවත් කෙනෙකුට ඒක අස්වද්දා වැඩ කරන්නය කිව්වොත් අයිතිකාරයෝ මේ ගමේ කට්ටිය නිසා නිකම් තරහ වේවි, ඒ නිසා ඒවා කරන්න බැහැ කියන මතයක් මිනිසුන් තුළ තිබෙනවා. ඒ නිසා මේ කුඹුරු ඉඩම් හරියාකාරව අස්වැද්දීම සඳහා මොන ආකාරයේ හරි වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වෙනවා. මේ කුඹුරු අක්කර දොළොස් ලක්ෂය අස්වැද්දුවොත් අපට වුවමනා හාල් ප්‍රමාණය ලබා ගෙන පිට රටවලට යවන්නත් පුළුවන්කමත් ලැබෙනවා.

එතකොට ස්වයංපෝෂිත ජාතියක් හැදෙනවා. අපේ රට ඒ වාගේ දියුණු තත්ත්වයකට ගෙන එන්නට පුළුවන්කම අපට තිබෙනවා. ඒ නිසා අපි එහෙම කටයුතු කළ යුතුයි.

ඊළඟට තිබෙන ප්‍රශ්නය තමයි, ජලය. 2011 අවුරුද්දේ අපේ අස්වද්දපු ප්‍රමාණය අඩු වුණේ ජලය නැති නිසායි. ලංකාවේ ජලය නැහැයි කියලා කියන්න පුළුවන්කමක් නැහැ ගරු කථානායකතුමනි. මේ ගැන අපි කල්පනා කරලා බලන්න ඕනෑ. මම නොයෙක් නොයෙක් අංශවලට කීප වතාවක් එය ඉදිරිපත් කළා. වැස්ස වැස්සාම කඳුකර ප්‍රදේශයට ඕනෑ තරම් ජලය තිබෙනවා. සුද්දන්ගේ කාලයේදී ඒ ප්‍රදේශවල පොකුණු හදලා ඒ පොකුණුවලට ජලය එකතු කළා. ඒ එකතු කළ ජලයෙන් ෆැක්ටරි වැඩ කළා. ඒකෙන් ලයින් කාමරවලට විදුලි ආලෝකය දුන්නා. ඒවාට තෙප්ප කුලම් කියලා කිව්වේ. ඒවා කඩාගෙන ගිහින්. ඒවා දැනටත් තිබෙනවා. නමුත් අද ඒ ප්‍රදේශවලට විදුලි ආලෝකය ලබා ගන්නේ රජයේ හා අනෙකුත් ආයතනවලින්. ඒවායින් ලැබෙන්නේ නැහැ. ඒවා අපි නැවත ප්‍රතිසංස්කරණය කළෝතින් අපට විදුලිය ලබා ගැනීමට පුළුවන් වෙනවා වාගේම වැහි කාලයට ජලය එහි එකතු වනවා. ඒ ජලයෙන් කුඹුරු අස්වද්දන්න පුළුවන්. අනුරාධපුරය, පොළොන්නරුව වාගේ ප්‍රදේශවලට මහවැලි ගඟෙන් වතුර ගෙනියන්න පුළුවන්.

කුරුණෑගල තමයි වැඩිම කුඹුරු අක්කර ප්‍රමාණයක් තිබෙන්නේ. හෙක්ටයාර් 60,00,666ක කුඹුරු ප්‍රමාණයක් තිබෙනවා. ඊළඟට වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ පොළොන්නරුවේ, ඊළඟට අනුරාධපුරයේ, ඊළඟට මහවැලි ප්‍රදේශයේ. ඉඩේර කාලයට කුරුණෑගලත් කුඹුරු සෑහෙන ප්‍රමාණයක් අස්වද්දන්න බැරි වෙනවා. අපේ කඳු ප්‍රදේශවල ජලය ආරක්ෂා කරලා ඒ ජලය මහවැලි ගඟට යවලා, මහවැලි ගඟ තුළින් ඔය ප්‍රදේශවලට යැව්වොත් කවදාකවත් වතුර අඩු වෙන්නේ නැහැ. ඒ වතුර ප්‍රමාණය ඕනෑ තරම් ඇති, ලංකාව පෝෂණය කරලා ඒ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න. ඒ නිසා ජලය ලබා ගැනීම සම්බන්ධයෙන් මේ තත්ත්වය ගැන කල්පනා කර බලන්න වුවමනා කරනවා. විදුලි ප්‍රශ්නයත් සෑහෙන ප්‍රමාණයකට විසඳා ගන්න එයින් අවස්ථාවක් ලැබෙනවා.

මීළඟට කියන්න යන කාරණාව කුඹුරු ගොඩ කිරීම. කුඹුරු ගොඩ කරලා ඒවායේ ගොඩනැඟිලි හදනවා. ගම්පොළ, ගඟේ ඉහළ කෝරළය, මහනුවර දිස්ත්‍රික්කය දෙස බැලුවොත් - අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා දන්නවා. ඇහුවොත් එතුමාත් කියයි. - ඒ ප්‍රදේශවල තිබුණු කුඹුරු වැඩි හරියක් දැන් ගොඩ කරලායි තිබෙන්නේ. ඒවා සියල්ලම පුරවනවා. ඒ සම්බන්ධයෙන් මේ පනතේ තිබෙන්නේ, ඒ අදාළ නිලධාරීන් පොලීසියට දැනුම් දෙන්න ඕනෑ කියලායි. නිලධාරියා පොලීසියට දැනුම් දුන්නාම ඒ වාහන රජය යටතට ගන්න පුළුවන්. ඊට පසුව ඒවාට දඩ ගහන්න පුළුවන්. කුඹුරුවලට දාලා තිබෙන පස් ආපසු ගෙනියන්න ඕනෑ. ඒක නීතියේ තිබෙනවා. එහෙම වුණාට මොකද, කිසිම ආකාරයෙකින් මේ නිලධාරීන් එය ක්‍රියාත්මක කරන්නේ නැහැ. යට වැඩ පිළිවෙළක් තුළයි මේවා ක්‍රියාත්මක වෙන්නේ කියලා මට ලියුම් හම්බ වෙනවා. ඒ නිසා අපි මේ ගැන බලන්න ඕනෑ. කුඹුරු ගොඩ කරන එක මෙහෙම කර ගෙන ගියෝතින් අපට අනාගතයේදී විශාල හානියක්, පාඩුවක් සිද්ධ වෙනවා. මොකද, බත් කෑම අපට කවදාවත් නතර කරන්න පුළුවන් වෙන්නේ නැහැ. අපි හැමදාම බත් කනවා. පාන් පිටි ගෙනෙන එකට මම හැමදාම විරුද්ධයි.

වගා කිරීමට තිබෙන නීතිය හරියාකාරව ක්‍රියාත්මක වන්න ඕනෑ. ඒ වාගේම කඳුකරයේ ජලය ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් හරියට ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහෙම කළොත් අපට මේ කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ විශාල දියුණුවක් ඇති කර ගන්න පුළුවන්. ඒ නිසා අපි ආණ්ඩු පාර්ශ්වයත්, විරුද්ධ පාර්ශ්වයත් සියලු දෙනාම එකතු වෙලා තමාගේ ගම් ප්‍රදේශවල මේ වැඩ පිළිවළවල් ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ණ සහයෝගය ලබා දීලා අපි ඒ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම යෝග්‍යයයි කියන එක මම විශේෂයෙන් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා. ඔබතුමාට ස්තුතියි.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)

බොහොම ස්තුතියි, අගමැතිතුමනි. ඊළඟට ගරු අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා. Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මුලසුන ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [මාණ්පුමිකු සන්තිම වීරක්කොඩි] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[பி.ப. 3.20]

ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා
(මාණ්පුමිකු සෙල්වම් අඩෛක්කලනාදන්)
(The Hon. Selvam Adaikkalanathan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று விவசாயம், கடற்றொழில் என்பன எமது நாட்டுக்கு வருவாயை ஈட்டித்தரக் கூடிய இரண்டு முக்கிய தொழில்களாகக் காணப்படுகின்றன. அதிலும் முக்கியமாக விவசாயத்தின் மூலமே கூடுதலான வருமானத்தை ஈட்டும்வகையில் எங்களுடைய விவசாயிகள் செயற்பட்டுக்கொண்டிருக்கின்றார்கள். வடக்கு, கிழக்கைப் பொறுத்தமட்டில், அங்கு எங்களுடைய விவசாயிகள் படுகின்ற துன்பங்களை இங்கு எடுத்துச் சொல்லிமாளாது. காரணம் என்னவென்றால், இன்றைக்கு எங்களுடைய விவசாயிகள் உற்பத்தி செய்கின்ற பொருட்கள் - அது நெல்லாக இருக்கலாம், அல்லது காய்கறிகளாக இருக்கலாம் - ஒரு நிர்ணய விலையில் கொள்வனவு செய்யப்படுவதில்லை. எங்களுடைய விவசாயிகள் விவசாயத்தைச் செய்கின்றபொழுது, தங்களுடைய நகைகளை அடகு வைக்கின்றார்கள்; உடைமைகளை அடகு வைக்கின்றார்கள். அப்படி அடகு வைத்து விவசாயத்தை மேற்கொண்டாலும்கூட, அவர்களுடைய விளைச்சலுக்கு ஒரு நிர்ணய விலை இல்லாத காரணத்தினால், அவற்றை மீட்க முடியாமல் மிகவும் கஷ்டப்பட்டுக் கொண்டிருக்கின்றார்கள். இந்த அரசு அவர்களுடைய விளைச்சலுக்கு ஒரு விலையை நிர்ணயித்தாலும், அவற்றை வாங்குவதற்கு உரிய நடவடிக்கைகளை எடுக்கவில்லை. இதனால் எங்களுடைய விவசாயிகள் மிகவும் மோசமான நிலைக்குத் தள்ளப்பட்டிருக் கின்றார்கள்.

அதுமட்டுமல்ல, இந்த நாட்டில் வரட்சியாலும் வெள்ளத் தாலும் விவசாயிகளுக்கு அழிவு ஏற்பட்டு வருகிறது. அண்மை யில் ஏற்பட்ட வரட்சியின் காரணமாக இலங்கை பூராவும் உள்ள விவசாயிகள் பாதிக்கப்பட்டிருப்பார்கள் என்று நான் நினைக்கின்றேன். கடந்த வருடம் இச்சபையில் வரவு செலவுத் திட்டத்தைச் சமர்ப்பித்து மேதகு ஜனாதிபதி அவர்கள் உரையாற்றியபொழுது, வரட்சியினால் பாதிக்கப்பட்ட விவசாயிகளுக்கு நிவாரணம் வழங்கும் வகையில், பெரும் போகம் செய்கை பண்ணப்படும் வரை அவர்கள் வங்கிகளி லிருந்து பெற்ற கடன்களை அறவிடுவதை நிறுத்துமாறு வங்கிகளைக் கேட்டுக்கொண்டதோடு, இவ்வாறான கடன் களுக்கு அறவிடப்படும் வட்டிக்கொடுப்பனவை அனைத்து வங்கிகளும் பதிவழிப்புச் செய்யவேண்டும் எனவும் கேட்டுக்கொண்டார். இதன்மூலம் நகைகளை அடகுவைத்து கடன்களைப் பெற்றவர்களுக்கு பெரும்போகத்தில் தமது நகைகளை மீட்டெடுப்பதற்கான வாய்ப்பினை அளித்திருப்ப தாகவும் அந்த உரையில் குறிப்பிட்டிருந்தார். ஆனால், எங்களுடைய விவசாயிகளிடம் - குறிப்பாக வன்னி மாவட்ட விவசாயிகளிடம் - கடனாகப் பெற்ற பணத்தை வட்டியோடு சேர்த்துக் கட்டவேண்டும் என்று வங்கிகள் அழுத்தத்தைப் பிரயோகிப்பதனால், அவர்கள் மீண்டும் மீண்டும் கடன்களைப் பெற்று வங்கிக் கடனைக் கட்டிக்கொண்டிருக்கின்றார்கள். இதனால் அவர்களுக்கு இந்த முறை போகத்தின்போது சீராகப் பயிர் செய்ய முடியவில்லை. இந்தமுறை பெரும்போகத்தின் போது 25 ஏக்கர் விளைச்சலில் ஆறு மூடை நெல்லைத்தான் அவர்களால் பெறமுடிந்தது.

இப்படியான ஒரு வரட்சி நிலையில், இந்த நாட்டுக்கும் உலகத்துக்கும் சோறு போடுகின்ற வடக்கு, கிழக்கிலுள்ள விவசாயிகள் இன்றைக்குத் தற்கொலை செய்கின்ற நிலை யிலேயே இருந்துகொண்டிருக்கின்றார்கள். அவர்களும் இந்த நாட்டில் வளர்ச்சியை ஏற்படுத்தும் சக்தியாகத்தானே இருக் கின்றார்கள்! இந்த அரசாங்கம் வடக்கு, கிழக்கு பிரதேசங் களுக்கு ஏன் பாரபட்சம் காட்டுகின்றது? இதனால் இந்த விவசாயிகள் அடுத்தமுறை போகத்திலே தங்களுடைய விவ சாயத் தொழிலைச் செய்வதற்கு மிகவும் கஷ்டப்படப் போகின்றார்கள். மேதகு ஜனாதிபதி அவர்கள் ஆற்றிய உரையும் இன்று தவறாகப் பார்க்கப்படுகின்றது. அவர் குறிப்பிட்டவாறு அந்த முன்மொழிவுகள் நடைமுறைப்படுத்தப் படவில்லை என்ற ஆதங்கம் எங்களுடைய மக்களிடத்திலே இன்றைக்கும் இருந்து கொண்டுதான் இருக்கின்றது. ஆகவே, அந்த விவசாய மக்களின் அந்த வங்கிக் கடன்களை இரத்துச்செய்து அவர்களை மேம்படுத்துகின்ற கடமை - கடப்பாடு - இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. அதேபோல பசளை மானியம் வழங்கப்படும் என்று அரசு ஆரம்பத்திலே பறை சாற்றியது. ஆனால், இப்பொழுது அந்தப் பசளை மானியத்தை குறைத்துக் கொண்டு வருகின்றது. உதாரண மாகச் சொன்னால், ஏற்கெனவே மன்னார் மாவட்டத்தில் ஓர் ஏக்கருக்கு 106 கிலோ உரம் கொடுத்தார்கள். இன்றைக்கு 65 கிலோதான் கொடுக்கின்றார்கள். எம்ஓபி என்ற உரம் ஏக்கருக்கு 30 கிலோ கொடுக்கப்பட்டது. இப்பொழுது 20 கிலோதான் கொடுக்கப்படுகின்றது. இப்படி அந்த உர வகைகள் மிகக் குறைவாக வழங்கப்படுவதுடன் அவற்றுக்கு விலையும் அதிகரிக்கப்பட்டிருக்கின்றது. அதாவது, 350 ரூபாய்க்கு மானியமாகக் கொடுக்கப்பட்ட பசளையின் விலை இப்பொழுது 500 ரூபாயாக உயர்த்தப்பட்டிருக்கின்றது. இதன் மூலம், ஏற்கெனவே துன்பத்தில் இருக்கின்ற விவசாயிகளுக்கு மேலும் துன்பத்தை அதிகரிக்கின்ற வகையில் இந்த அரசு செயற்படுவது ஏன்? என்று நான் இந்தச் சபையிலே கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

யாழ்ப்பாண மாவட்டத்திலே வலிகாமம் வடக்கில் கிட்டத்தட்ட 24 கிராம சேவையாளர் பிரிவுகளில் உள்ள 6,500 ஏக்கர் காணிகள் இராணுவத்தால் அபகரிக்கப்பட்டிருக் கின்றன. இதனால் 30 ஆயிரம் விவசாயிகள் மிகவும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அதேநேரம் இராணுவத்தால்

[ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා]

අந்த நிலங்களில் உற்பத்தி செய்யப்படுகின்ற விவசாயப் பொருள்கள் குறைந்த விலையில் விற்கப்படுகின்றன. அந்தப் பொருட்கள் குறைந்த விலையில் விற்கப்படும் நிலையிலே எங்களுடைய விவசாயிகள் தங்கள் உற்பத்திப் பொருட்களை அவற்றுக்கு இணையாக விற்கவில்லை என்றால் அவர்களுடைய உற்பத்திப் பொருட்கள் விலை போகாத ஒரு நிலை அங்கு காணப்படுகின்றது. ஆகவே, அவர்களுடைய அந்த விவசாய நிலங்களை -அவை மரக்கறி உற்பத்திக்குரியதாக இருக்கலாம் அல்லது நெல்லுற்பத்திக்குரியதாக இருக்கலாம் - மிகவும் செழிப்பான அந்த நிலங்களை இன்று இராணுவம் அந்த மக்களின் வயிற்றிலடிக்கும் வகையில் அபகரித்து வைத்திருப்பது எந்த விதத்தில் நியாயம்? என்று நான் கேட்கின்றேன். நான் ஏற்கெனவே சொன்னதுபோல, இன்றைக்கு இந்த நாட்டின் வளத்தைப் பெருக்குகின்ற சக்தியாக இருக்கின்ற இந்த விவசாயிகள், தமிழர்களாக இருக்கின்ற காரணத்தாலோ என்னவோ இப்படியான ஒரு துர்ப்பாக்கிய நிலைக்கு ஆளாகியிருக்கின்றார்கள் என்பதுதான் எங்களுடைய கருத்து.

அதுமட்டுமல்ல, முல்லைத்தீவிலுள்ள வெலிஓயா - மணலாறு - என்ற பகுதி 25 வருடங்களுக்கு முன்னர் தமிழர்கள் வாழ்ந்த பிரதேசமாகும். அவர்களில் மூவாயிரத்துக்கும் மேற்பட்டோர் அங்குள்ள காணிகளுக்கு ஒப்பந்தம் அல்லது உறுதி வைத்திருக்கின்றார்கள். அதாவது அவை தமக்குச் சொந்தம் என்பதற்கான ஆதாரங்களை வைத்திருக்கின்றார்கள். ஆனால், அவர்களை ஓரந்தள்ளி அந்த நிலங்கள் பறிமுதல் செய்யப்பட்டு சிங்கள விவசாயிகளுக்கு கொடுக்கப்பட்டிருக் கின்றன. அண்மைக் காலமாக ஜனாதிபதி அதற்கான அங்கீகாரத்தையும் வழங்கியிருக்கின்றார். இதனால் கொக்கிளாய், கொக்குத்தொடுவாய், கருநாற்றுக்கேணி உட்பட பல பகுதிகளில் எங்களுடைய விவசாயிகள் பெரிதும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அங்கு ஏழாயிரம் ஏக்கருக்கும் மேற்பட்ட தமிழர்களின் விவசாய நிலங்கள் இருக்கின்றன என்பதையும் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். இதுதான் இந்த நாட்டிலே நடந்து கொண்டிருக்கின்றது. இன்றைக்கு நல்லிணக்கம் என்று சொல்கின்றீர்கள்! இந்த நாட்டை வளப்படுத்துகின்றோம் என்று சொல்கின்றீர்கள்! ஆனால், எங்கே இருக்கின்றது நல்லிணக்கம்? எங்கே இருக்கின்றது இந்த நாட்டை வளப்படுத்துகின்ற தன்மை?

அதுமட்டுமல்ல வவுனியாவிலே கொக்கச்சான்குளம் என்ற தமிழ் விவசாயக் கிராமம் இன்று சிங்களக் கிராமமாகப் பெயர் மாற்றம் செய்யப்பட்டுள்ளது. அங்கு சிங்கள விவசாயிகள் குடியேற்றப்பட்டுள்ளனர். இன்றைக்கு தமிழருக்குச் சொந்த மான விவசாயக் காணிகள் பலதும் இவ்வாறு பறிமுதல் செய்யப்பட்டுக் கொண்டிருக்கின்றன. திருகோணமலை மாவட்டத்திலே மூதூர் பிரதேசத்திலுள்ள தமிழ் மக்களின் பூர்வீக வதிவிடங்களும் மற்றும் விவசாயக் காணிகளும் உயர் பாதுகாப்பு வலயம் என்ற வகையில் இராணுவத்தால் சுவீகரிக்கப்பட்டிருக்கின்றன. இம்மக்கள் தங்கள் சொந்த மண்ணை இழந்து ஐந்து வருடங்களுக்கு மேலாக கிளிவெட்டி, பட்டித்திடல், கட்டைபறிச்சான் உட்பட பல கிராமங்களில் - இடைத்தங்கல் முகாம்களில் அகதிகளாக வாழும் துர்ப்பாக்கிய நிலைமை உருவாகியுள்ளது. இதனால் இன்று சம்பூரில் ஆறாயிரம் ஏக்கருக்கு மேற்பட்ட விவசாய பூமி இராணுவ உயர் பாதுகாப்பு வலயத்துக்குள் சிக்கியிருப்பதனால் 6 ஆயிரம்பேர் வரையில் பாதிக்கப்பட்டிருப்பதுடன் ஆயிரத்துக்கு மேற்பட்ட குடும்பங்கள் இடைத்தங்கல் முகாம்களில் வாழவேண்டிய நிலைமை உருவாகியுள்ளது. இதைப்பற்றி விளக்கமாகச் சொல்வதாயின், அந்த மக்கள் வேறு இடங்களுக்குச் செல்ல வேண்டுமென இந்த அரசினால் நிர்ப்பந்திக்கப்பட்டிருக்கிறது. அவ்வாறு வேறு இடத்துக்குச் சென்றால்தான் "றேஷன்" தருவோம் என்று சொல்கின்றார்கள். திருகோணமலையிலே அந்த மக்களுக்கு வழங்கப்பட்டு வந்த "றேஷன்" இப்பொழுது நிறுத்தப்பட்டு அவர்களைச் சாப்பாடில்லாமல் வருத்துகின்ற துர்ப்பாக்கிய நிலை ஏற்படுத்தப்பட்டுள்ளது. இதுதானா, உங்களுடைய நல்லிணக்கம்? என்று நான் கேட்க விரும்புகின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்திலே வவுணதீவுப் பிரதேசத் திலுள்ள தமிழ் மக்களுக்குரிய கால்நடை வளர்ப்பு மற்றும் விவசாயம் மேற்கொள்ளப்பட்டு வந்த இருபத்தையாயிரம் ஏக்கர் காணிகள் கிழக்கு மாகாண ஆளுநரால் சுவீகரிக்கப்பட்டு அம்பாறை மாவட்ட சிங்கள ஊர்காவல் படையினருக்கு வழங்கபபட்டதனால் தமிழ் விவசாயிகள் பெரிதும் பாதிக்கப்பட்டிருக்கிறார்கள். கிரான் பிரதேசத்தில் பெரிய மாதவனை மற்றும் சிறிய மாதவனைப் பகுதிகளில் தமிழ் மக்களுக்குரிய விவசாயக் காணிகள் அம்பாறை மாவட்டச் சிங்கள மக்களினால் அபகரிக்கப்பட்டதனால் தமிழ் மக்களின் விவசாய நடவடிக்கைகள் பாதிக்கப்பட்டுள்ளன. அத்துடன், அங்கு தமிழ் மக்களுக்குரிய கால்நடைகளையும் வெட்டு கின்றனர். இவ்விடயம் தொடர்பாக நடவடிக்கை எடுக்கப்படும் என அரசாங்க அதிபர் கூறினாலும், இந்த விவசாய நிலப் பிரச்சினைகள் மற்றும் கால்நடைகளுக்கு ஏற்படுத்தப்படும் துன்பங்கள் தொடர்ந்தவண்ணம் உள்ளன. அதனைக் கவனத்திலெடுத்து நடவடிக்கை எடுப்பார் யாருமில்லை.

அதுமட்டுமல்ல, வாகரை மற்றும் கிரான் பிரதேச செயலகப்பிரிவில் மகாவலி அபிவிருத்தித் திட்டத்தின்கீழ் தமிழ் விவசாயிகளுக்கு உரித்தான காணிகள் மகாவலி அபிவிருத்திச் சபையால் சிங்கள மக்களுக்கு வழங்கப்படுவதால் தமிழ் விவசாயிகள் பாதிக்கப்படுகின்றனர். அதேநேரம், தமிழ், முஸ்லிம் மக்கள் வாகரை மற்றும் கிரான் பிரதேசங்களில் விவசாய நடவடிக்கைகளை மேற்கொண்டு விளைவுகளைப் பெறுகின்ற வேளையில் மகாவலி அபிவிருத்தித் திட்டத்தின் மூலம் அவர்களுக்கு வழங்கப்படும் நீர் தடைசெய்யப்படுகிறது. அதன் காரணமாக அந்த மக்களின் விவசாய நடவடிக்கைகள் வருடாந்தம் பாதிக்கப்படுகின்றன.

அம்பாறை மாவட்டத்திலுள்ள திருக்கோவில் பிரதேசத் திலே களுவாஞ்சிக்குடி, காஞ்சிரங்குடா போன்ற பகுதிகள் தமிழ் மக்களின் விவசாயப் பகுதிகளாகும். அப்பிரதேசங்களைச் சேர்ந்த மக்கள் நீண்ட காலமாக அகதி வாழ்க்கை வாழ்ந்து பின்னர் தாங்களாகவே தமது காணிகளில் குடியேறிய பொழுதிலும் அந்த மக்கள் விவசாயம் செய்வதற்குத் தேவையான வசதிகள் வழங்கப்படவில்லை. ஆனால், அரச தரப்பைச் சேர்ந்த சில அரசியல்வாதிகள் அந்த மக்களின் காணிகளைச் சுவீகரிக்கும் நடவடிக்கைகளை எடுத்து வருவதாக நான் அறிகிறேன்.

இன்று கிழக்கு மாகாண விவசாயிகளின் பயிர்ச் செய்கைகளை அழிக்கும் நடவடிக்கையில் யானைகளும் பெரும் பங்கு வகித்து வருகின்றன. போதியளவு மின் வேலிகள் அமைக்கப்படாமையால், இன்று யானைகள் அங்கு பயிர்ச் செய்கையை அழிக்கின்றன. அம்பாறை மாவட்டத்திலுள்ள தங்கவேலாயுதபுரம், கஞ்சிக்குடிச்சாறு, சாகாமம் போன்ற பிரதேசங்களிலும் மற்றும் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள வெல்லாவெளி, பட்டிப்பளை, வவுணதீவு, செங்கலடி போன்ற பிரதேசங்களிலுமுள்ள பயிர்செய்கைகள் யானைகளால்

අழிக்கப்படுகின்றன. ஆகவே, இந்த நிலைமை மாற்றப்பட வேண்டும். அதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும்.

அம்பாறை நிருவாக மாவட்ட கமநல அதிகாரிகள், மட்டக்களப்பு நிருவாக மாவட்டத்துக்குச் சொந்தமான சில காணிகளை தமது பி.எல்.ஆர். இல் பதிவு செய்து அக்காணிகளுக்குப் பசளைகள் வழங்கியுள்ளார்கள். இது முற்றிலும் பிழையான நடவடிக்கையாகும். இது சம்பந்தமாக எங்களுடைய கூட்டமைப்பிலுள்ள மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினரான மதிப்புக்குரிய செல்வராசா அண்ணன் அவர்கள் எழுதிய கடிதத்தை வாபஸ் பெறுமாறு கமநல சேவை ஆணையாளர் அவர்கள் கேட்டிருக்கிறார் என்பதையும் இங்கு நான் குறிப்பிட விரும்புகின்றேன்.

விவசாயிகளுக்கு மானியம் கொடுப்பதாக அரசு தம்பட்டம் அடித்தது. இன்றைக்கு மானியத்தின் அளவும் குறைக்கப்பட்டு, 500 ரூபாயாக அதன் விலையும் அதிகரிக்கப்பட்டதால் நிலைமைகள் மாற்றமடைந்திருக்கின்றன. வவுனியா மாவட்டத்திலே மானியம் என்ற ரீதியில் 106 கிலோகிராம் உரம் கொடுக்கப்பட்டது. பின்னர் அது 90 கிலோவாகக் குறைக்கப்பட்டு இப்பொழுது 64 கிலோவைத்தான் கொடுக்கிறார்கள். 30 கிலோ என்ற ரீதியில் கொடுக்கப்பட்ட டீ.எஸ்.பி. என்ற உரம், இப்பொழுது 16 கிலோவாகக் குறைக்கப்பட்டிருக்கின்றது. பொட்டாசியம் 30 கிலோ கொடுத்தார்கள். பின்னர் 24 கிலோவாகக் குறைக்கப்பட்டு இப்பொழுது அதையும் 16 கிலோவாகக் குறைத்திருக்கிறார்கள். அந்த வகையில் எங்களுடைய விவசாயிகளை மிகவும் மோசமான ஒரு நிலைக்கு இந்த அரசாங்கம் தள்ளியிருக்கிறது. நிர்ணயிக்கப்பட்ட விலைக்கு நெல்லை வாங்குவதில்லை; உரிய மானியங்களையும் வழங்காமல் அவர்களின் வயிற்றிலடிக்கிறார்கள். அதைவிட, விவசாயக் கடன்கள்! இவ்வாறாக எங்களுடைய விவசாயிகளின் தலைகளிலே மென்மேலும் சுமைகள் சுமத்தப்படுகின்றன. அவர்களின் அடிப்படை உரிமை மீறப்படுகின்றது. வாழ்வாதாரத்துக்காக அவர்கள் திண்டாடுகின்றார்கள். இவற்றுக்கெல்லாம் இந்த அரசு என்ன பதில் சொல்லப்போகின்றது? எதற்கெடுத்தாலும் விடுதலைப் புலிகளைச் சாட்டுகின்றீர்கள். அபிவிருத்தி நடைபெறுகிறது என்று சொல்கிறீர்கள்! எந்த விதத்தில் அபிவிருத்தி செய்யப்படுகின்றது? எங்களுடைய வன்னி மாவட்டத்தைப் பொறுத்தமட்டிலே அங்கு அபிவிருத்தி யென்பது நடைபெறவில்லையென்றுதான் சொல்ல வேண்டும். வீதியை மட்டும் செப்பனிட்டால் போதாது. அந்த மக்களை நல்லமுறையில் கைதூக்கி விடுகின்ற கடமைப்பாடும் இந்த அரசுக்கு இருக்கின்றது.

இடம்பெயர்ந்து அன்று விடுதலைப் புலிகளோடு இருந்தார்கள் என்ற காரணத்துக்காக இன்று அந்த மக்கள் கவனிப்பாரற்றிருக்கின்றார்கள். மீள்குடியேற்றம் என்ற ரீதியிலே இந்த அரசு மிக மோசமான ஒரு செயற்பாட்டை அந்த மக்களுக்குச் செய்து வருகின்றது. அவர்கள் எங்களுடைய விவசாயிகளாக இருக்கலாம் அல்லது சாதாரண மக்களாக இருக்கலாம். இந்த நாட்டிலே விவசாயிகளைச் சரிசமனாகப் பார்க்கவில்லையென்றால், எவ்வாறு இந்தியாவிலே சில மாநிலங்களில் விவசாயிகள் தற்கொலை செய்து கொண்டார்களோ, அதேநிலை எங்களுடைய வன்னிப் பகுதிகளிலும் குறிப்பாக முல்லைத்தீவு, வவுனியா, மன்னார் போன்ற மாவட்டங்களிலும் ஏற்படலாம். அப்படி அவர்கள் தற்கொலை செய்கின்ற நிலை ஏற்பட்டால், அதற்கான பொறுப்பை இந்த அரசு ஏற்றுக்கொள்ள வேண்டு மென்பதையும் நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இந்த நாட்டிலே விவசாயிகள் மிகவும் மதிப்புமிக்கவர்களாக இருக்கின்றார்கள். விவசாயிகளைக் கௌரவிக்கவில்லை யென்றால், அவர்களுடைய வாழ்வாதாரத்தை உயர்த்தவில்லை யென்றால், அவர்களை மேம்பாடடையச் செய்யவில்லை யென்றால் அவர்களைப் பற்றிப் பேசுவதற்கு இந்த அரசுக்கு அருகதையில்லையென்றுதான் நான் சொல்வேன். ஆகவே, விவசாயிகளின் நிலையை நல்ல முறையிலே மேம்படுத்த வேண்டும். குறிப்பாக, வடக்கு, கிழக்கிலே இருக்கின்ற விவசாயிகளைக் கரம்தூக்கி விடுகின்ற வகையிலே, இராணுவம் கைப்பற்றியிருக்கின்ற அவர்களுடைய விவசாய நிலங்களை அவர்களிடமே ஒப்படைக்க வேண்டும். அவர் களுடைய உற்பத்திப் பொருட்களை நிர்ணய விலைக்கு வாங்க வேண்டும். அவ்விவசாயிகளின் உற்பத்திப் பொருட்களுக்கு உரிய சந்தை வாய்ப்பினைப் பெற்றுக்கொடுக்க வேண்டும். இவற்றையெல்லாம் சரியாகச் செய்கின்றபோதுதான் இந்த நாட்டிலே தலைநிமிர்ந்து வாழ்கின்ற வாய்ப்பு அவர்களுக்கு ஏற்படும் என்பதைக் கூறிக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා. 3.40]

ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කර ඇති මෝටර් වාහන පනත යටතේ ඇති නියෝග පිළිබඳව කථා කරන්නයි මා බලාපොරොත්තු වන්නේ. ඊට පෙර මා කියන්න ඕනෑ අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා හොඳ කථාවක් කළ බව. එහිදී එතුමා ධාරිතාව දහසේ - 1000 cc - බයිසිකල් ගැන කිව්වා. ඒ බයිසිකල් ගැන කථා කරන විට මට මේ කාරණය මතක් වුණා. මොකද මමත් කුඩා කාලයේ ඒ බයිසිකල් දැක තිබෙනවා. ඒ කාලයේ ඔය BSA Triumph වාගේ බයිසිකල් තමයි තිබුණේ. නමුත් ඒ එක්කම එන්ජින් ධාරිතාව පන්සීයේ බයිසිකල් පවා තිබුණා. ඒ Harley-Davidson. ඊළඟට Indian bikes. ඒවාත් තිබුණා. ඒවා හුඟක් fast. හැබැයි ඒවායේ gear එක දැම්මේ කකුලෙන් - pedal එකෙන්- නොවෙයි. ඒවායේ තිබුණේ hand gear එකක්. අතින් තමයි ඒ gear එක දමන්න තිබුණේ. මා හිතන්නේ ඔබතුමා දැකලා නැතිව ඇති. මම ටිකක් VOC මිනිහෙක් නිසා ඒක ගැන දන්නවා. මේ 1000 cc motorcycle එකක් කියන්නේ මේ කාලයේ හැටියට ඒ තරම් ලොකු වේගයක් තිබුණු වාහනයක් නොවෙයි. [බාධා කිරීමක්] වරායට ආවාට පස්සේ. රටේ අවශ්‍යතාව අනුව ඒ වාගේ දේවල් සිද්ධ වෙනවා නේ. දැන් අපි කියමු කවුරු හරි බයිසිකලයක් ගෙනාවා කියලා. මේක මේ රටට අවශ්‍යයි කියලා ඊට පස්සේ තමයි අපට තේරෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාහනයක යන කොට අපි කවුරුත් භයියෙන් යන්න කැමැතියි නේ. අධිවේගී මාර්ගයේ යන්න පුළුවන් වේගය පැයට කිලෝමීටර් 100යි. දැන් එය කිලෝමීටර් 120ක් දක්වා දීලා තිබෙනවා, හැබැයි unofficially. මගේ වාහනය racing car එකක්. අධිවේගී මාර්ගයේ ඒ වාහනයෙන් යන විට ඒකේ පොඩ්ඩක් හරි කකුල තිබ්බොත් පැයට කිලෝමීටර් 150 පැනලා යනවා. මා හිතන්නේ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ඒ බව දන්නවා. ඒක තමයි යුගයේ අවශ්‍යතාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සර අපේ අය අවුරුදු 120ක් විතර ජීවත් වුණා. නමුත් අද කවුරුවත් අවුරුදු 120ක් ජීවත් වන්නේ නැහැ නේ. අවුරුදු 120ක් ජීවත් වෙන්න කියලා ප්‍රාර්ථනා කරන්න පුළුවන් වන්නේ මතුගම ආසනයේ ඉන්න පැස්කුවල් මහත්තයා වාගේ කෙනෙකුට තමයි. මතුගම ආසනය නියෝජනය කරපු ඒ මන්ත්‍රීතුමා තවම ඉන්නවා. එතුමාට දැන් වයස අවුරුදු

[ගරු කුමාර වෙල්ගම මහතා]

104ක් පමණ වෙනවා. මම එතුමාට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා. නමුත් දැන් අපේ ජීවිත කාලය අඩු නිසා අපට වේගවත් දේවල්වලට යන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෝටර් වාහන පනත යටතේ නියෝග ගැන කථා කරන විට මා විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. අප - [බාධා කිරීමක්] ඔව්, කොහොමත් ඔබතුමාගේ pickup එක හොඳයි. අප කවුරුත් ඒක දන්නවා. අද ඊයේද ඒක ගැන දන්නේ? Pickup එක වැඩිකමට අප කැමැතියි. අප ඒවාට බොහොම කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තුව එන්ජින් ධාරිතාව -engine capacity එක- අනුව දළ වශයෙන් සියයට 10කින් පමණ වැඩි කර තිබෙනවා. එතකොට ආදායම් බලපත්‍ර ගාස්තුවත් - ඒ තාර බර - GVWR එක අනුව සියයට 10කින් විතර වැඩි කර තිබෙනවා. අප සාමාන්‍යයෙන් දුප්පත් මිනිසුන්ගේ වාහනයක් හැටියට සලකන එන්ජින් ධාරිතාව 1000ට අඩු ලොරි - ඩීමෝ බට්ටා වැනි වාහනවල - body එකේ මොකක් හරි වෙනස්කමක් කරනවා නම් ඒ වෙනුවෙන් දඩයක් වශයෙන් RMV එක රුපියල් 25,000ක් ගත්තා. අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා තමයි එය මුලින්ම ඉදිරිපත් කළේ.

එතුමා කිව්වේ, පොඩි මිනිසුන් පාවිච්චි කරන ඩීමෝ බට්ටා වාගේ වාහනවල body එකේ වෙනස්කම් කරන කොට රුපියල් 25,000ක් අය කිරීම ඉතාම අසාධාරණයි කියලායි. එතුමා ඒක පෙන්වා දුන්නා. එදා අතිගරු ජනාධිපතිතුමාත් ඒ රැස්වීමේ හිටියා. ජනාධිපතිතුමාත් කිව්වා, එසේ අය කිරීම බොහොම වැරදියි කියන එක. ඒ නිසා අපි සාකච්ඡා කරලා ඒ body එකේ වෙනස්කම් කරන කොට අය කරන ගාස්තුව රුපියල් 25,000 ඉඳලා රුපියල් 500ට අඩු කරලා තිබෙනවා. ඩීමෝ බට්ටා එකේ එන්නේ flat body එක නේ. ඒ කියන්නේ පොඩි දොරවල් හතර එක්ක flat body එක එන්නේ. මිනිසුන් ලී බඩු ගෙනි යන්න නම් ඒකට උස වහලක් ගහනවා. මොකක් හෝ වෙළඳාමක් කරනවා නම් ඒකට සරිලන වහලක් සහ body එකක් ගහනවා. ඒ වෙනස්කම් කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් රුපියල් 25,000ක් අය කළා. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා පෙන්වා දුන්නාට පස්සේ, ජනාධිපතිතුමා එක්කත් සාකච්ඡා කරලා එතුමාගේත් ආශීර්වාදය ඇතිව රුපියල් 25,000 රුපියල් 500ට අඩු කළා. මා හිතන්නේ ඒක සෑහෙන්න වටිනවා. මොකද, පොඩි මිනිහාට ඒකෙන් ලොකු ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ එක්කම දැන් තිබෙන අනෙක් ප්‍රශ්නය තමයි, -මා හිතන්නේ තමුන්නාන්සේලාටත් ඒ ප්‍රශ්නය ඇති- දැන් වාහනයක් ලියා පදිංචි කළේ නැත්නම් ඒකට දඩයක් එනවා නේ. දැන් අලුතෙන් දඩයක් එනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෝටර් සයිකල්වලට හුහක් ඇවිල්ලා තිබෙනවා. සමහර අය මෝටර් සයිකල් අරගෙන ඒවා ලියා පදිංචි කරලා නැහැ. ලියා පදිංචි කරලා නැති වුණාම මීට පෙර ගෙනා සංශෝධනය -නීතිය- අනුව ඒගොල්ලන්ට ඒ අවුරුදු ගණනටම දඩ ගහනවා. එතකොට ඒ බයිසිකලේ ගණනටත් වැඩිය ඒගොල්ලන් මේ දඩය ගෙවන්න වනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමනි,-

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
වාහන saleවල තිබෙන මෝටර් සයිකල්වලටත් ගහනවාද?

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
පොඩ්ඩක් ඉන්න. ඒක තමයි මා මේ කියන්න යන්නේ.

මෝටර් සයිකල් ලියා පදිංචි කරලා නැත්නම් මෙතෙක් කල් ඒ දඩය ගැහුවා. නමුත් මේ ගමන ඒ සහන දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙන්දේසිවලින් මිලදී ගන්නා වාහන ගැන කථා කරනවා නම් වෙන්දේසියකින් වාහනයක් මිලදී ගත්තාම කලින් තිබුණේ මාසයක් ඇතුළත ලියා පදිංචි කරන්න ඕනෑ කියලායි. නැත්නම් දඩ ගහනවා. නමුත් වෙන්දේසියකින් ගත්ත වාහනයක සමහර වෙලාවට repair කරන්න තිබෙනවා; tinkering කරන්න තිබෙනවා; paint කරන්න තිබෙනවා; engine repairs තිබෙනවා. ඒවා මාසෙන් කරන්න බැහැ. ඒ නිසා වෙන්දේසිවලින් මිලදී ගන්නා වාහන ලියා පදිංචිය මාසය නොවෙයි, මාස හයක් දක්වා වැඩි කරලා තිබෙනවා. මා හිතන්නේ ඒකත් සාමාන්‍ය ජනතාවට ලොකු සහනයක් කියලායි. මොකද, ලොකු මිනිසුන් වෙන්දේසිවලින් වාහන ගන්නේ නැහැ නේ. නැද්ද අපේ මන්ත්‍රීතුමා? Rolls-Royce Ghost එක වෙන්දේසිවලින් ගන්නේ නැහැ නේ. නේද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා දන්නවා නේ මට වඩා.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ ඔබතුමා දන්නවා. Rolls-Royce Ghost එක ගන්නේ නැහැනේ. අන්න අර මන්ත්‍රීතුමායි වාහන ගැන දන්නේ. මමත් ඉගෙන ගන්නේ එතුමාගෙන්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමන්ලා අන්තිමට ගෙන්වන්නේ racing cars නේ.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
Racing cars ගෙන්වන්නේ අපේ pickup එක වැඩියි නේ. ඒක නේ. ගරු මන්ත්‍රීතුමා, අපේ උත්පත්තියේ ඉඳලාම pickup එක වැඩියි. ඒකයි වෙලා තිබෙන්නේ.

ඒ එක්කම යතුරු පැදි සම්බන්ධව අපේ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කියපු ප්‍රශ්නය ගැන බලමු. මීට පෙර යතුරු පැදි සම්බන්ධව තිබුණේ, ලංකාවට ආනයනය කළ දින සිට දින 30කින් පස්සේ දඩ ගැහීමයි. ලංකාවට ආනයනය කළාට පස්සේ ඒක විකුණුවත් නැතත් දින 30කට පස්සේ දඩ ගහනවා. නමුත් ඒකත් දැන් අපි වෙනස් කළා, "වෙළෙන්දන් විකුණූ දින සිට දින 90ක් ඇතුළතදී ලියා පදිංචි කළ යුතුව ඇත" කියලා. ඒ කියන්නේ ආනයනය කළ දින සිට දින 30කින් නොවෙයි. වෙළෙන්දා විකුණුවාට පස්සේ දින 90ක් දෙනවා ඒ වාහනය ලියා පදිංචි කරන්න. එහෙම නැත්නම් ඒකට අපි දඩයක් ගහනවා.

ඊළඟට ඉතුරු වාහන ගැන බලමු. කාර්, ලොරි ඇතුළු ඉතුරු වාහන සඳහා ආනයනය කළ දින සිට දින 90ක් දක්වා දඩ අය කිරීමෙන් තොරව ලියා පදිංචිය සඳහා අවසර දී තිබෙනවා. ඉස්සෙල්ලා තිබුණේ දින 30යි. දින 30ක් ඇතුළත ලියා පදිංචි කරලා තිබුණේ නැත්නම් දඩ වදිනවා. නමුත් ඒක ආනයනය කළ දින සිට දින 90ක් දක්වා දිග් කර තිබෙනවා.

අද විවාදයට ආදළ නැති වුණත් මා මේ කාරණය පොඩ්ඩක් මතක් කළොත් හොඳයි. මොකද, මේ නියෝග ඉදිරියේදී එයි. අපි ගනිමු බස් සහ වෑන්.

Private buses, CTB buses වේගයෙන් යනවා, හැප්පෙනවා. ඊට පස්සේ සමහර විට ඒවා කොහෙත්ම හදුනා ගන්න බැහැ. ඒ නිසා දැන් වර්ණ ගැල්වීම සඳහා නියෝග ගෙනැවිත් තිබෙනවා. එම නියෝග ඉදිරිපත් කළා. නමුත් ඒවා අද විවාදයට ගන්නේ නැහැ. එම නියෝග අනුව private busesවලට නිල් පාට ගැල්විය යුතුයි.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඇයි, නිල් පාට ගල්වන්නේ?

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
නිල් පාට ලස්සණ පාට නේ.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ලා නිල් පාටද?

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
නිල් පාට බොහොම ලස්සණ පාට. අපි කවුරුත් ප්‍රිය කරන, ඇහැට ලස්සණට පෙනෙන පාට තමයි නිල් පාට. ඕනෑම කාන්තාවක් වුණත් නිල් පාට සාරියක් ඇන්දාම ලස්සණයි නේ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)
රෝසි සේනානායක මන්ත්‍රීතුමියත් එහෙමද?

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
එතුමියත් එහෙම තමයි. නිල් පාට සාරියක් ඇන්දාම හරි ලස්සණයි. Powder blue ඇතුළු ලස්සණ colours තිබෙනවා. Blue ඉතා ලස්සණයි. මා නම් ඒ පාටට හරි කැමැතියි.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
කොළ පාට හොඳ නැද්ද?

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
කොළ පාටත් ලස්සණයි. නමුත් කොළ පාටේ අර වාගේ ලස්සණ පෙනුමක් එන්නේ නැහැ. ඒ පාට ඇහැට වදින්නේ නැහැ; ඇහැට ප්‍රිය කරන්නේ නැහැ. [බාධා කිරීමක්] එතුමිය ලස්සණයි. එතුමිය කැතයි කියා මා කියන්නේ නැහැ. මා දැන් ලස්සණ ගැන වැඩිය කථා කරන්නේ නැහැ. ඒවා කථා කරන්න ගිහින් මා එක වරක් ඉල්ලා ගෙන කෑවා. ඒ නිසා මා දැන් ඒවා ගැන වැඩිය කථා කරන්නේ නැහැ. මොකද, මේ ඉන්න ළමා සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා මට තහංචි දමා තිබෙනවා, ඒ ගැන කථා කරන්න එපා කියලා. ඉතින් එතුමා කියන දේ මා අහන්න එපායැ, මා කාන්තාවන් සම්බන්ධ කොච්චර විශේෂඥයකු වුණත්. ඒ නිසා එතුමා කියන දේ මා අහනවා.

Private buses වලට නිල් පාට ගාන්නත්, CTB buses වලට - [බාධා කිරීමක්] තිබෙනවා. Pantone colours තිබෙනවා. ඒ විස්තර ඉදිරියේදී ඉදිරිපත් කරයි. [බාධා කිරීමක්] නැහැ, නැහැ. පොදු මගී ප්‍රවාහන වාහනවලට වර්ණ කේත අංක 2707 C යොදා ගනිමින් ලා නිල් වර්ණය ගැල්විය යුතුයි. CTB බස් රථවලට වර්ණ කේත අංක 185 C යොදා ගනිමින් රතු වර්ණය ගැල්විය යුතුය. පාසල් ප්‍රවාහන කටයුතු සඳහා භාවිත කරන වාහනවලට වර්ණ කේත 1375 C යොදා ගනිමින් කහ වර්ණය ගැල්විය යුතුය. අපි මේ නියෝගත් ඉදිරියේදී තමුන්නාන්සේලාට ඉදිරිපත් කරනවා, අනුමැතිය ලබා ගන්න.

මා මීට වඩා කථා කරන්නේ නැහැ. ප්‍රවාහන අමාත්‍යාංශය වෙනුවෙන් මා ඉදිරිපත් කරන මෝටර් වාහන පනත යටතේ ඇති නියෝග සඳහා තමුන්නාන්සේලා සියලු දෙනාගේම සහයෝගය ලබා දීලා, ඒ කටයුතු කරන්න තමුන්නාන්සේලාගේ ආශීර්වාදය මට ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

[අ.භා. 3.52]

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොඳට pick-up තිබෙන ඇමතිවරයකුගේ කථාවකින් පස්සේ කථා කරන්න ලැබීම ගැන සතුටු වනවා. ඇත්තටම අද විවාදයට ගැනෙන නියෝග තුනෙන්, සුරාබදු පිළිබඳව වූ නියෝගවලට අදාළ ගැසට් නිවේදනය ඇත්තටම පසු ගිය දවස්වල හදිසියේ නිකුත් කළ ගැසට් නිවේදනයක් වුණා. වරායට containersවලින් තොග පිටින් හොර ස්ප්‍රිතු ගෙනැල්ලා, ඒ හොර ස්ප්‍රිතු අල්ලා ගත්ත ක්ෂණයකින් තමයි මේ ගැසට් නිවේදනය නිකුත් වුණේ. ඊට කලින් ගැසට් නිවේදන නිකුත් කරලා තිබුණා, පිට රටින් ස්ප්‍රිතු ගෙන්වීම තහනම් කරලා. නමුත් ඊට පස්සේ, තිනර් නිෂ්පාදනය හෝ තීන්ත නිෂ්පාදනය කියන labelsවලට මුවා වෙලා ස්ප්‍රිතු ආනයනය කිරීම සිද්ධ වුණා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි ස්ප්‍රිතු containers දෙකක් අත් අඩංගුවට පත් වුණේ. ඒ වෙලාවේ එහි අයිතිකරු සොයා ගන්න බැරි වුණා. නමුත් රේගු නිලධාරීන් ඒ අයිතිකරු ඒ ස්ථානයේ නොමැතිව ඒ containersවල සීල් කැඩුවා. අවසානයේ සිද්ධ වුණේ මෙයයි. නීතිය ඉදිරියට, උසාවිය ඉදිරියට ගියාම අයිතිකාරයාට දැන් හැකියාව ලැබී තිබෙනවා, "මා ඉදිරිපිට නොවෙයි මෙහි සීල් කැඩුවේ. එම නිසා මේ ස්ප්‍රිතු මා ගෙනාපු ඒවා නොවෙයි. මා ගෙනාවේ තිනර්. මේ තිබෙන්නේ මට අයිති දේවල් නොවෙයි" කියලා කියන්න. ඒ නිසා උසාවිය ඉදිරියේ ඔහු වරදකරු කිරීම පිළිබඳ ප්‍රශ්නයක් දැන් මතුවෙලා තිබෙනවා. ඒවා නොදැනුවත්ව සිද්ධ වුණු දේවල් නොවෙයි. ඒවා ඒ නීතිය පිළිබඳව අදාළ බලධාරීන් නොදන්නවා නොවෙයි. මේකෙන් සිද්ධ වන්නේ මොකක්ද? ඒ ස්ප්‍රිතු ගෙන්වපු මහා පරිමාණ ජාවාරම්කාරයාත් නිදහස් වනවා. ඒ ස්ප්‍රිතු අරගෙන අරක්කු නිෂ්පාදනය කරන්න මැදිහත් වන ජාවාරම්කාර බලවතාත් නිදහස් වනවා.

අන්තිමට වගඋත්තරකාරයෙක් නැති වෙනවා. ඒක තමයි අද වෙලා තිබෙන්නේ. රූපවාහිනීවල, පුවත් පත්වල පොල් ගෙඩි අකුරින් පළ කළ මහා ලොකු ආන්දෝලනාත්මක සිද්ධියක් වුණ

[ගරු විජිත හේරත් මහතා]

ඒ හොර ස්ප්‍රිතු ඇල්ලීමේ කටයුත්ත අවසානයේදී චූදිතයෙක් නැතිව, වගඋත්තරකාරයෙක් නැතිව, -සියලු චූදිතයින් නිදහස් වෙලා- අවසන් වෙනවා. මේක තමයි දැන් අපේ රටේ නීතියට වෙලා තිබෙන තත්ත්වය. ඒ ක්ෂණයෙන්ම තමයි මේ ගැසට් නිවේදනය නිකුත් වුණේ.

පිට රටින් ස්ප්‍රිතු ගෙන්වීම නතර කිරීමට හේතුවක් විධියට ආණ්ඩුව පැත්තෙන් කරුණු ඉදිරිපත් කිරීමේදී කියනවා, දේශීය නිෂ්පාදනය නඟා සිටුවන්න, එහෙම නැත්නම් පැල්වත්තේ සහ සෙවණගල ස්ප්‍රිතු නිෂ්පාදනය වැඩි කරන්න, ඒ ස්ප්‍රිතු මිලදී ගැනීම ප්‍රවර්ධනය කරන්න තමයි පිට රටින් ගෙන්වීම නතර කළේ කියලා. [බාධා කිරීමක්] එහෙම තමයි කිව්වේ. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමනි, ඔබතුමාට එහා පැත්තේ පුටුවේ සිටිය ඇමතිතුමා දැන් මොහොතකට කලින් එහෙම කිව්වා. දැන් මොහොතකට කලින් කිව්වා. මම දන්නේ නැහැ ඔබතුමාගේ අදහස වෙනත් එකක්ද කියලා. [බාධා කිරීමක්] දැන් ඔබතුමා කියන්නේ හේතුව ඒක නොවෙයි කියලාද? ඔබතුමා ඇත්තම හේතුව කියන්න කෝ. ඇත්ත හේතුව ඔබතුමා කියන්න. මම වෙලාව දෙන්නම්.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - சீனிக் கைத்தொழில் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Sugar Industry Development)

අපේ නිෂ්පාදනයේ අඩුවක් තිබෙනවා. [බාධා කිරීමක්] අපි නිෂ්පාදනය කරන්නේ ලීටර් ලක්ෂ 12යි. අපේ ඒ නිෂ්පාදන විකුණන්න ඕනෑ. දේශීය නිෂ්පාදනය විකුණලා ඉවර වුණාට පස්සේ තමයි මදි පාඩුව ගෙන්වන්න ඕනෑ. ඒ නිසා තමයි මේවා ගෙන්වීම තහනම් කළේ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඒක තමයි පරස්පරය.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
පරස්පරයක් නැහැ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඔබතුමාගේ නොවෙයි පරස්පරය.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
දේශීය නිෂ්පාදනය අරගෙන ඉන්න ඕනෑ ඉස්සෙල්ලාම. ඉස්සර වෙලා දේශීය නිෂ්පාදනය විකුණලා ඉන්න ඕනෑ නේ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
හරි, ඔබතුමා කියන උත්තරය ඒක නේ. නමුත් ඔබතුමා ළඟ පුටුවේ සිටිය ඇමතිතුමා කිව්වේ ඒක නොවෙයි. ඔබතුමා ළඟ පුටුවේ සිටිය ඇමතිතුමා කිව්වේ DCSL එක, -කෙළින්ම නම නොකියා කිව්වේ හැරී ජයවර්ධන ගැන- පැල්වත්තේ ස්ප්‍රිතු ගන්නේ නැහැ, සෙවණගල ස්ප්‍රිතු ගන්නේ නැහැ කියලා. ස්ප්‍රිතු ඒකාධිකාරය පවත්වා ගෙන යන්න- [බාධා කිරීමක්] මගේ වෙලාව.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
කවුරු වුණත් අපේ ඒවා ගන්නේ නැතිව පිටින් ගන්න නිසා තමයි නතර කළේ. දේශීය නිෂ්පාදනය අරගෙන ඉවර වුණාට පස්සේ පිටින් ගෙන්වන්න කියන්නේ ඒකයි. අපෙන් ගන්නේ නැතිව පිටින් ගෙන්වන නිසා තමයි නතර කළේ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
දැන් එහෙම නම් නැවත ගෙන්වන්න ඉඩ දුන්නේ ඇයි?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
අපිට රටේ අවශ්‍යතාව දෙන්න බැහැ නේ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
දැන් පිටින් ගෙන්වන්නේ නැද්ද?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
පිටින් ගෙන්වන්න ඕනෑ. ඒක ඇත්ත නේ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඉතින්, කලින් හිටපු තැනටමනේ ගිහින් තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
කලින් හිටපු තැන කියන්නේ, මෙහෙම නේ අපේ ගරු මන්ත්‍රීතුමා. පොඩ්ඩක් ඉන්න කෝ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
දැන් ගොත ගහන්න දෙයක් නැහැ. කලින් හිටපු තැනටමයි ගිහින් තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ලීටර් ලක්ෂ 30ක අවශ්‍යතාව වෙනුවෙන් අපි නිෂ්පාදනය කරන්නේ ලීටර් ලක්ෂ 12 නම්, ඉතිරි ටික පිටින් ගෙන්වන්න ඕනෑ නේ. හැබැයි, පිටින් ගෙන්වන්න කියන්නේ අපේ නිෂ්පාදනය විකුණලා ඉවර වුණාට පස්සේ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
දැන් ඉවරද? දැන් ඔබතුමන්ලාගේ නිෂ්පාදනය විකුණලා ඉවරද?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් සෙනෙවිරත්න)
(The Hon. Lakshman Senewiratne)
ඔව්. අපේ නිෂ්පාදනය විකුණලා ඉවරයි. අපි නිෂ්පාදනය කරන්නේ ලීටර් ලක්ෂ 12 යි නේ.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒක තමයි පරස්පරය.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් සෙනෙවිරත්න)
(The Hon. Lakshman Senewiratne)
ඒ මදි පාඩුව ගෙන්වන්න ඕනෑ.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමන්ලා කිව්වේ අතිරික්තයක් තිබෙනවා කියලා නේ?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් සෙනෙවිරත්න)
(The Hon. Lakshman Senewiratne)
අපේ අතිරික්තයක් තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අතිරික්තයක් තිබුණේ ඇයි? අපෙන් ගත්තේ නැති නිසා. ඒක හරි. අපෙන් ගත්තේ නැහැ. ඒ නිසා අපේ නිෂ්පාදනය සම්පූර්ණයෙන් ඉතිරි වුණා.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
දැන් මගේ වෙලාව දෙන්න කෝ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් සෙනෙවිරත්න)
(The Hon. Lakshman Senewiratne)
ඉතින් ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා සම්පූර්ණයෙන් මැදිහත් වුණා. එහෙම නොවුණා නම් ලීටර් මිලියන ගණනක් ඉතිරි වෙනවා. කාණුවට දාන්න වෙනවා.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඔබතුමා කලබල වුණා. හැප්පෙන උත්තරයක් දීලා මම අමාරුවේ වැටෙයි කියලා හිතුවා. ඒක තමයි දැන් වුණ ප්‍රශ්නය. නැහැ, ඒක නොවෙයි. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ සභාවට පැහැදිලිව කිව්වේ, හැරි ජයවර්ධන සෙවණගලින් සහ පැල්වත්තෙන් ස්ප්‍රීතු ගත්තේ නැහැ. ඒ නිසා අපි ආනයනය කරන ඒවාට වැඩි බද්දක් ගැහුවා. එතකොට, පිට රටින් ගෙන්වන එකේ ගණන වැඩියි. ලීටරයකට රුපියල් 200ක බද්දක් ගහනවා. ලංකාවේ නිෂ්පාදන ගන්නවා නම් ලීටරයට රුපියල් 100යි බද්ද. ඒ බද්ද ගැහුවේ හැරි ජයවර්ධන පිට රටින් ගෙන්වන එක නතර කරලා මෙහේ නිෂ්පාදනය ගන්න කියලා බල කරන්නයි. නමුත් හැරි ජයවර්ධන කළේ මොකක්ද? එයා වැඩි ගණනට පිට රටින් ගත්තා. [බාධා කිරීමක්] හරි, ඔබතුමාගේ වෙලාවේ ඒ පැහැදිලි කිරීම කරන්න කෝ.

හැරි ජයවර්ධන වැඩි ගණනට පිට රටින් ගෙන්වා ගත්තා. ඊට පස්සේ මොකද කළේ? හැරි ගෙන්වන එක නතර කරන්න එහෙම කළා කියමු කෝ; නැවැත්වුවා කියමු කෝ. ඊට පස්සේ ඔබතුමන්ලා මේ ගැසට් නිවේදනය නිකුත් කරලා ඊතයිල් මද්‍යසාර ගෙන්වීමට මෙතෙක් පනවා තිබූ තහනම නිදහස් කළා. ඊතයිල් පිට රටින් ගෙන්වන්න ඉඩ දුන්නා. දැන් හැරිට පුළුවන් නේ පිට රටින් ගෙනෙන ඒවා ගන්න. දැන් හැරි පිට රටින් ගෙනෙන ඒවා ගන්නවා නේ. හැරි විතරක් නොවෙයි, ඩීඅයි කොම්පැනියත් ගන්නවා නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමනි, එක පැත්තකින් අතිරික්තයක් තිබුණා කියලා ඔබතුමා කියනවා. දැන් ඔබතුමා කියනවා, "නැහැ. අපේ නිෂ්පාදනය තිබෙන්නේ ලක්ෂ 12යි. ඉතිරි ටික මදි. මදි ප්‍රමාණය අනිවාර්යයෙන් ගෙනෙන්න වෙනවා." කියලා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් සෙනෙවිරත්න)
(The Hon. Lakshman Senewiratne)
අතිරික්තයක් තිබිලා මාස ගණනක් අපෙන් ගත්තා නේ.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඔක නොවෙයි ඇත්ත කථාව. ඇත්ත කථාව මොකක්ද? පී.බී. ජයසුන්දර මහත්තයා හදිස්සි වුණා. පී.බී. ජයසුන්දර මහත්තයාට මුදල් අමාත්‍යාංශයේ සල්ලි නැති වුණා. දැන් සල්ලි ගන්න හදිසියේ -තකහණියේ- ගැසට් නිවේදනය නිකුත් කළා. දැන් මොකක්ද ක්‍රමවේදය? කලින් මේවා තිබුණේ නැහැ. දැන් ස්ප්‍රීතු ගෙන්වන කොට ලීටරයකට රුපියල් 200ක් සුරාබදු දෙපාර්තමේන්තුවට ගෙවන්න ඕනෑ. ස්ප්‍රීතු ගෙන්වන කෙනා ඒවා කොහේ හරි රටකින් ඇණවුම් කරලා ඇණවුම් බලපත්‍රය ලබා ගැනීමේදී ඒ අදාළ රුපියල් 200 ගාස්තුව සුරාබදු දෙපාර්තමේන්තුවට ගෙවන්න ඕනෑ. ඒ ඇණවුම ඒ රටට ඉදිරිපත් කරලා ඒවා නැව්ගත කරලා කොළඹ වරායට එන්න මාස එක හමාරක්, දෙකක් යනවා. මාස එක හමාරක්, දෙකක් යනකොට ඒ සල්ලි මෙහේ මුදල් අමාත්‍යාංශයට ගෙවා අවසන්. වරායෙන් නිදහස් කළාට පස්සේ අදාළ නිෂ්පාදනාගාරයට -කොහේ හරි තිබෙන DCSL කොම්පැනිය කියන්න කෝ- ගියාට පස්සේ පදම් වෙනකම් - ferment වෙනකම් - අවම වශයෙන් මාසයක්වත් ඒ කොම්පැනියේ ඒ ස්ප්‍රීතු තියා ගන්නවා. එහෙම තියාගෙන තමයි ඒවා නිෂ්පාදනය කරන්නේ, බෝතල්ගත කරන්නේ. ඒවා බෝතල්ගත කරලා බෝතල් ටික වෙළඳ පොළට නිකුත් කරන කොට අන්න ඒ බෝතලයකට නැවත බද්දක් අය කරනවා. ඒ බද්ද අය කරන්නේත් ආපහු සුරාබදු දෙපාර්තමේන්තුව හරහා මුදල් අමාත්‍යාංශයටයි. දැන් ඔබතුමන්ලා මුදල් අමාත්‍යාංශයෙන් කළ ගණිතමය සෙල්ලම මොකක්ද? ඇණවුම් කරන කොටම සුරාබදු දෙපාර්තමේන්තුවට සල්ලි ගෙවන්න ඕනෑ. එතකොට සල්ලි ටික එක පාරට මුදල් අමාත්‍යාංශයට එනවා. මේ ක්‍රියාවලිය සිද්ධ වන්න මාස තුන, හතරක් යනවා. ආනයනය කරලා, නිෂ්පාදනාගාරයේ පදම් වෙනකම් තියලා බෝතල්ගත කරලා වෙළඳ පොළට නිකුත් කරලා ඒ අදාළ බදු ප්‍රමාණයන් ගණනය කරලා ඒ බදු ලබා ගැනීම කියන එකට තවත් මාසයක් විතර යනවා. ඒ කාලය තුළ අර සල්ලි ටික මුදල් අමාත්‍යාංශයට ලැබෙනවා. ඔක තමයි ඇත්ත සූත්තරය. ඔක තමයි ගහපු සෙල්ලම. එතකොට බෝතල්ගත කළාට පස්සේ බෝතලය වෙළඳ පොළට නිකුත් වන කොට ඒ බෝතලයකින් අය කරන බදු මුදල, අර මුලදී ගෙවපු ගණන නිෂ්පාදනය කරපු බෝතල්වලින් ලැබෙන ප්‍රමාණයෙන් අඩු කරනවා. එතකොට නැවත ඒ ගෙන්වපු කෙනාට, එහෙම නැත්නම් නිෂ්පාදනය කරන කෙනාට අර ඉතිරි මුදල ගෙවනවා. එසේ ගෙවන්නත් මාස තුන, හතරක් ඒ සල්ලි ටික කියා ගන්නවා. ඔක තමයි ඇත්ත සූත්තරය. ඔක තමයි ගණිතමය විජ්ජාව. ඇයි මේ? ආණ්ඩුවට සල්ලි නැති හින්දායි. ආණ්ඩුව දැන් "මතට නික" කියලා කොයි තරම් කෑ ගැහුවත් මේ මත්වලින් තමයි හම්බ කරන්නේ. ඒකෙන් තමයි ආදායම් උපයන්නේ.

රතන හාමුදුරුවෝ නුවර දළ දා මාළිගාව ළඟට හාමුදුරුවරු පිරිවරා ගෙන ගිහිල්ලා මහා නායක හාමුදුරුවරුන්ට කෑ ගහලා කියනවා, පැය 24ක් ඇතුළත නුවර තිබෙන බාර් ටික වහන්න,

[ගරු විජිත හේරත් මහතා]

එහෙම නැත්නම් මෙතැන මාරාන්තික උපවාස කරනවා කියලා. "මතට තිත" වැඩසටහන ක්‍රියාත්මක කරන්න උන්වහන්සේලා මේ ආණ්ඩුවේ ඉඳගෙනම උද්ඝෝෂණය කරනවා. පෙළපාළි යනවා. මෙහේ කන්ටේනර් ගණන් ස්ප්‍රීතු ගෙනෙනවා. කන්ටේනර් තොග පිටින් ගෙනෙන්න ගැසට් නිවේදන නිකුත් කරලා ඒකට ඉඩ දෙනවා. එතකොට තමයි මහා පරිමාණ ස්ප්‍රීතු ජාවාරම්කාරයෝ අද මේ සෙල්ලම කර ගෙන යන්නේ. ඒ නිසා තමයි ඒකපුද්ගල මත්පැන් පරිභෝජනය ලීටර් 11 සිට ලීටර් 13 දක්වා වැඩි වන්නේ. "මතට තිත" ක්‍රියාත්මක වන්නේ නැහැ. "මතට තිත" කියන එක නිකම් බොරු පුස්සක්, ප්‍රෝඩාවක් වෙලා තිබෙනවා. අද මත්පැන් නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා, පරිභෝජනය වැඩි වෙලා තිබෙනවා. ආණ්ඩුව ඒ දමපු සෙල්ලම්; කරපු විජ්ජාවල බොරුව අද ඇස් පනා පිට ඔප්පු වෙලා තිබෙනවා. මේක තමයි දැන් මේ සිද්ධ වෙලා තිබෙන්නේ.

ආර්ථිකය මෙහෙය වන සරත් අමුණුගම ඇමතිතුමා අද කථාව පටන් ගත්තේ ආර්ථිකයේ යම් යම් වෙනස්කම් කිරීම සඳහා ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග ඉදිරිපත් කරලා මේ ගැසට් නිවේදනය ගෙනෙනවා කියලායි. එතකොට ඒකේ අවසාන අරමුණ වෙලා තිබෙන්නේ ආණ්ඩුවට සල්ලි හොයන එකයි. සල්ලි හෙව්මේ පරමාර්ථය පෙරදැරි කර ගෙන අරක්කු නිෂ්පාදනය, එහෙම නැත්නම් මත්පැන් නිෂ්පාදනය වැඩි කරලා ඒකෙන් කොහොම හරි සල්ලි හම්බ කිරීම ආණ්ඩුව දැන් ආර්ථික මූලෝපායක් බවට පත් කර ගෙන තිබෙනවා.

ඒකෙදි හැරී ජයවර්ධනද, ඩීඅයි කොම්පැනියද, කොයි කොම්පැනියද, එහෙම නැත්නම් ආණ්ඩුව ඇතුළේ සිටින ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ ස්කාගාරවලින් හම්බ කරනවාද කියන එක ආණ්ඩුවට අදාළ නැහැ. ආණ්ඩුවට ඕනෑ සල්ලි. ඒක තමයි ඇත්ත කථාව. ඒක වහලා හැංගි හොරා සෙල්ලම් කරන්න හදන්න එපා. ඇත්ත කථාව මේක. ඒකට තමයි මේ ගැසට් නිවේදනය නිකුත් කළේ. මේ ගැසට් නිවේදනය හරහා අද සිදු වෙලා තිබෙන්නේ ඒකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. දේශීය නිෂ්පාදනය වැඩි කරන්න කියලා දේවල් කරනවා නම්, ඔබතුමන්ලා මේ ස්ප්‍රීතු නිෂ්පාදනය වැඩි කිරීම නොවෙයි කළ යුත්තේ. කරන්න ඕනෑ මොකක්ද? අල නිෂ්පාදනය වැඩි කරන්න. දැන් මේ දවස්වල තිබෙන ප්‍රශ්නය ඒක. කෘෂි කර්මාන්තයේ මේ දවස්වල මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි අර්තාපල් නිෂ්පාදනය. වැලිමඩ, උඟවපරණගම, බදුල්ල, අල ගොවීන්ට මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? ඒ ගොවීන් නිෂ්පාදනය කරපු අල ටික විකුණා ගන්න විධියක් නැහැ. මාස තුනකට පසුව රුපියල් 10ක බද්දක් ගැහුවා. එතකොට පෙරහැර ගිහිල්ලා ඉවරයි. අල ටික වික්කේ රුපියල් 55ට, 60ට. දැන් නිෂ්පාදන පිරිවැය වනවා රුපියල් 75ක් විතර. හැබැයි වික්කේ කීයටද? රුපියල් 55ට, 60ට. දැන් ගහනවා, බද්දක්. දැන් වැඩක් නැහැ. ඒ ජාතියේ මෝඩ තකතිරු වැඩ කරනවා, අශ්වයා ගියාට පසුව. ඒ නිසා ස්ප්‍රීතු නිෂ්පාදනයෙන් දේශීය නිෂ්පාදනයන් නඟා සිටුවනවා කියනවා නම් ඒක නොවෙයි විය යුත්තේ. රටේ ජනතාවගේ මූලික අවශ්‍යතාවන් ඉටු කරන නිෂ්පාදනයන් වැඩි කරන්නට පියවර ගන්නට ඕනෑ. එහෙම පියවර ගන්නේ නැතිව කරන සෙල්ලම් වැඩක් නැහැ. මුදල් අමාත්‍යාංශය අද මුහුණ දීලා තිබෙන තත්ත්වය ඒකයි.

පසු ගිය දවස්වල "දෙරණ" රූපවාහිනියෙන් අපි මේ දේවල් දැක්කා. ජනවසමට, ඒ වාගේම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගමට, ඇල්කඩුව වැවිලි සමාගමට අයත් වතු 36ක් විතර තිබෙනවා. ඒ වතුවල වැඩ කරපු සේවකයෝ 20,000ක් විතර සිටිනවා. ඒ සේවකයන් 20,000ට අවුරුදු 15ක්, 20ක් තිස්සේ EPF ගෙවලා නැහැ; ETF ගෙවලා නැහැ; gratuity එක ගෙවලා නැහැ. හැබැයි ඒ සල්ලි ඔක්කොම අය කරගෙන තිබෙනවා. රුපියල් මිලියන 1800ක් විතර ඒ අයගෙන් EPF, ETF කපාගෙන තිබෙනවා; මුදල් අය කරගෙන තිබෙනවා. නමුත් සත පහක්වත් ගෙවලා නැහැ. හැබැයි, තේවතුවලට පොහොර දමන්න සල්ලි නැහැ. පොහොර ටික දමන්න සල්ලි එකතු කරලා තිබුණේ සේවකයන්ගෙන්. රුපියල් 100 ගාණේ එකතු කරලායි පොහොර දමලා තිබුණේ. අද වෙනකන් ඒ සල්ලි ගෙවලා නැහැ. මේ පාර්ලිමේන්තුවේ COPE වාර්තාවෙන් එළිදරවු කළා, ඒ අයගේ EPF එකට මුදල් කපා ගත්තා කියලා. ඒ කපාගත්තු මුදල් නැවත ඔවුන්ට ලබා දීම රජයේ වගකීමක්. ඇමතිතුමා පිළිගත්තා, එහෙම වැරැද්දක් සිදු වෙලා තිබෙනවා කියලා. අද මොකක්ද කරන්නේ? අද ඇල්බීසියා ගස් ටික කපලා, ටර්පන්ටයින් ගස් ටික කපලා ඒ සල්ලිවලින් අර සේවකයන්ගේ EPF ගෙවන්න සිදු වෙලා තිබෙනවා. අර හොරා කාපු රුපියල් මිලියන 1800ක මුදල; ඒ කාබාසිනියා කරපු රුපියල් මිලියන 1800ක මුදල; ඒකට වෙච්ච දෙයක් සොයන්නේ නැහැ. COPE වාර්තාවෙන් කියලා තිබෙනවා, ඒක සොයන්න කියලා. ඒ ගැන පරීක්ෂණ කරන්න කියලා. නමුත් ඒක සොයන්නේ නැතිව ගස් ටික කපලා ඒක ගෙවන්න යනවා. 1996 ඉඳලාම මේ පෞද්ගලික වැවිලි සමාගම් - මේවා විතරක් නොවෙයි, තවත් සමාගම් බොහෝ ගණනාවක්- මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු බදු මුදල් ගෙවලා නැහැ. ඒ අධිභාරය විතරක් රුපියල් මිලියන 500ක් විතර වෙනවා. නමුත් ඒවා අය කර ගන්න ක්‍රමවේදයක් හදන්නේ නැහැ. ගස් කපලා EPF ගෙවනවා කියලා නිකම් කියනවා. හැබැයි ඒ වතු සමාගම්වල අභිංසක සේවකයෝ, "අපෙන් EPF එකට සල්ලි කපා ගත්තා, ඒවා අපට ලැබුණේ නැහැ" යි කියලා මාධ්‍යවලට හෙළිදරවු කළාට පසුව දැන් ගිහිල්ලා සේවකයෝ දඩයම් කරනවා. සේවකයෝ හඹාගෙන ගිහිල්ලා සේවකයෝ මර්දනය කරනවා. "කවුද මේවා හෙළිදරව් කළේ? මාධ්‍යවලට මේවා හෙළිදරව් කළේ ඇයි?" කියලා ඒ අයගෙන් පළි ගන්නවා. මේකද උත්තරය? නැහැ. මහා භාණ්ඩාගාරය, එහෙම නැත්නම් කම්කරු දෙපාර්තමේන්තුව හරහා එම EPF, ETF සල්ලි ලබා දීම සඳහා මැදිහත් වන්නට ඕනෑ. නමුත් ආණ්ඩුවට ඒ සඳහා සල්ලි නැහැ. ඒවා කාබාසිනියා කරලා, නාස්ති කරලා තිබෙනවා. ඒ අභිංසක වතු කම්කරුවන්ට ලැබිය යුතු, ඒ අයගේ ශ්‍රමයෙන් උපයපු EPF අරමුදල ඔවුන්ට නැවත ලබා දෙන්න මැදිහත් වන්නේ නැහැ. මේක තමයි ආණ්ඩුවේ ආර්ථික බංකොලොත්කම. මේවා වහගන්න වෙන වෙන සෙල්ලම් දැම්මාට හරියන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මා ඉතා අවධාරණයෙන් යුතුව කියන්නේ, රටේ දේශීය නිෂ්පාදනය වැඩි කරන්නට ඕනෑ නම් ස්ප්‍රීතු නිෂ්පාදනය වැඩි කිරීම නොවෙයි උත්තරය. ස්ප්‍රීතු නිෂ්පාදනයෙන් රටේ දේශීය නිෂ්පාදනය වැඩි කරන්නට හිතනවා නම් ඒක "මතට තිත" නොවෙයි. මේ ආශ්චර්යවත් මතින් පිරුණු රටක් හදන්න ඔබතුමන්ලා උත්සාහ කරනවා මිසක්, රටේ කෘෂි නිෂ්පාදනය, ධීවර නිෂ්පාදනය, කාර්මික නිෂ්පාදනය වැඩි කරලා රට දියුණු කරන්නට උත්සාහ කිරීමක් නොවෙයි කියන එකත්, ඒ නිසා එය වෙනස් කරන්නය කියන එකත් අවධාරණය කරමින් මා නතර වෙනවා.

[4.10 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Speaker, while speaking on these Regulations that are under discussion in this House today, I must initially say that the great development revolution which is taking place during the Mahinda Rajapaksa regime has never taken place in the annals of this country. It is a new country that is emerging now in the

Indian Ocean after all the troubles and tribulations that the Government underwent for the last 30 years of the war. Even America is surprised, Japan is surprised, Germany, England and all the developed countries are amazed as to how we have turned around from such a disaster to become one of the most prosperous and ආශ්චර්යවත් wonderland in Asia.

When you relate that story, we just cannot forget the name of the Hon. Basil Rajapaksa, for he is the person who is pushing ahead the economic development or economic revival of this country. All the roads, all the bridges, all the schools, all the hospitals and all other developments, including restoration of tanks have been achieved and everything for irrigation, including water facilities, are provided. Water is given as it has never happened in the history to all parts of the country, including Jaffna. The other day, the Hon. Dinesh Gunawardena, Minister of Water Supply and Drainage and Chief Government Whip, visited Jaffna. This is the great Economic Recovery story; this is the story of marvel; this is the story that generations afterwards could talk about what Sri Lanka has achieved.

It is only the other day the High Commissioner of India was in Jaffna. He has won the hearts of every Jaffna citizen, nay, every citizen of this country for he helped us in the development of this country, obtaining necessary assistance from India. Whatever obstacles that we may have faced in South India, the North is not bothered about that at all. They gave all the assistance and this High Commissioner was the power behind to get all those assistance for the development schemes launched in this country.

Now, for instance, Sir, we are talking about the railway. The Regulations under the Motor Traffic Act is also being taken up today and the Hon. Kumara Welgama, Minister of Transport spoke a little while ago. Who is he? He is also a marvellous worker, an astonishing worker and the poor man's man who can hang on in a train, not sit in a seat comfortably and travel with the passengers. He goes right round the country in trains and buses most unassumingly.

Now, Sir, we must not forget this fact. The international community must be told this over and over again. Why the Opposition, the UNP is hiding this, I do not know. My good Friend, the Hon. (Mrs.) Nirupama Rajapaksa is also walking in now. We are going to have a railway line to Beliatta which we never had earlier. The Hon. Minister is opening the reconstructed Medawachchiya to Madhu railway line on the 20th and even Mr. Ashok K. Kantha, the High Commissioner of India will be there.

What happened to those railway tracks? It is the LTTE terrorists who removed all the sleepers - සිල්පරන් කොටන්- and put up their bunkers in order to kill our soldiers; our people. This is why we are against them. They killed and destroyed the Tamil community. That is a fact. They destroyed the younger generation of the Tamil community. It was genocide by the Tamil terrorists against the Tamils virtually. Initially, that is what happened. After that, they came to Kattankudi and massacred the innocent Muslims who were worshipping there in the Kattankudi Mosque.

අරන්තලාව භික්ෂු ඝාතනය; සාමනේර භික්ෂූන් වහන්සේලා ඝාතනය අපට අමතක කරන්නට බැහැ. කැබිතිගොල්ලෑවේ අපේ මිනිස්සු පෙති පෙති කපා මැරුවා. කොහොමද මැරුවේ? Railway lines වලින් ගෙනිච්ච සිල්පරන් කොටන්වලින් බන්කර් හදලා ඒවායේ ඉඳලා තමයි ඒ ගොල්ලෝ මේ මිනිස්සු අමු අමුවේ ඝාතනය කළේ. ඒක හරිය කියා විරුද්ධ පක්ෂය- එක්සත් ජාතික පක්ෂය- අද කියනවා ද කියා මා අහනවා. මා එක ප්‍රශ්නයක් අහන්න ඕනෑ; I must raise one pertinent question.

Has the Hon. Leader of the Opposition ever condemned the atrocities committed by those who killed the UNP leaders? Now, he is going and sitting with them comfortably. What politics is this? The LTTE killed all our leaders. [*Interruption.*] Hon. Sujeewa Senasinghe, you do not know because you came recently. They killed Muslims and they also killed former President R. Premadasa, a former Minister, the Hon. Lalith Athulathmudali, a former Minister, the Hon. Gamini Dissanayake, a former Minister, the Hon. Ranjan Wijeratne, the Chairman and the General Secretary of the United National Party. Now, the Hon. Ranil Wickremasinghe, the present Leader of the Opposition, is finding it comfortable to sit with those terrorists.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියා කියන්න ඕනෑ, මේ සභාවේදී. It is a shameful act which has never happened in any part of the civilized world.

Sir, not only that, I must tell one thing. Hon. Ranil Wickremasinghe goes to Mannar and says, "Are the Muslim Ministers and the Members of Parliament of the Government worshipping Makkah or Medamulana?" This is an anti-religious remark. There were one or two Muslims who went with him to Mannar. Could they have not corrected him? This is the knowledge the Leader of the Opposition is having about Islam. It is a shame! How can the Muslims in this country support such a Leader of the Opposition - the rank and file must be told. Sir, we, the Muslims, according to the Holy Quran, worship only Allah - *Allah Subhanahu wa Taala. "La-ilaha-illallah Muhammadur-Rasulullah".* They do not worship anybody else except Allah. He does not know even that. We do not even pray to Mecca. We pray in the direction of Mecca to our Creator - the Almighty God. He does not know these basics. Earlier, he was talking about the Sinhalese history and put his foot in his mouth. The same thing he did when he talked about *Korales*. He messed up that *korale* and this *korale*. කෝරළයක්වත් නොදැන එතුමා වරක් කථා කළා.

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

I say in this House with responsibility that if the Leader of the Opposition wants the Muslims to support him, at least, he should recognize and respect the aspirations of Islam and the Muslim community. He must ask for forgiveness from the Muslim community here because he becomes an Apostate. You know the verdict given to Salman Rushdie and Taslima Nasrin because of such talks. Salman Rushdie and Taslima Nasrin were given death sentences because they were declared Apostates for defiling Islam and the Holy Prophet. Are we to give the same judgement here? I am asking you this question. This is sheer ridiculousness.

What has happened? "අපි රට හදනවා. ආර්ථිකය ගොඩ නඟනවා." Today's newspapers say. එක්සත් ජාතික පක්ෂය අද බංකොලොත් වෙලා. ලැජ්ජයි. මා හිටපු පක්ෂය. හම්බ වුණු සල්ලි කෝ. මෙතැන ඉන්න අයට ඕවා දන්නේ නැහැ. එදා කෝටි, කෝටි හම්බ වුණා. කිරිඇල්ල මහත්මයාත් දන්නේ නැහැ. මොකද එතුමා ඒ දවස්වල මේ පැත්තේ හිටියේ. මොකද වුණේ මේ සල්ලිවලට. මේවා හොයන්න ඕනෑ. පරීක්ෂා කරන්න ඕනෑ. අර මෛත්‍රී ගුණරත්න දකුණේ ඉඳගෙන කෑ ගහන එක පුදුමයක් නොවෙයි. අනෙක් කැන්වල අනෙක් අය, "මෙයා ඉන්නකන් මේ Party එකට හරියන්නේ නහැ" කියන්නේ ඒකයි. අපට දුකයි. අප හිටපු Party එක. ඒක ඒ ගොල්ලන් බෙරා ගත්තාදෙන්.

I must pay a tribute and compliment in this House to His Excellency Ashok K. Kantha, the Indian High Commissioner, because he has done a great service as never done by any other High Commissioner or diplomat for our country. See the economic recovery. I must also say that there will be a railway line from Medawachchiya to Talaimannar which we are going to start with Indian assistance in December. Then, there will be other railway lines from Vavuniya to Kilinochchi in August, and Kilinochchi to KKS in September. ඉස්සර KKS ගිහිල්ලා අනෙක් පැත්තෙන් මන්නාරමෙන් තලෙයිමන්නාරමට ගිහින් බෝට්ටුවේ නැඟලා ඉන්දියාවට යනවා. ඉන්දියාවට ගිහින් මෙහෙ එනවා. මේ ඔක්කොම නැති කළේ කවුද? Who destroyed the Northern railways? Who destroyed the Tamil economy in this country? It is their own people who took up arms. The late Hon. Chelvanayakam said, "I believe in peaceful *sathyagraha*." These people took up arms and even killed their own politicians such as Hon. A. Amirthalingam and Hon. V. Yogeswaran, Hon. (Dr.) Neelan Thiruchelvam and several other Members of Parliament of that Party.

Then, Sir, there is a railway line from Kilinochchi to KKS. දැන් අලුත් කට්ටල් ගෙනැවිත් තිබෙනවා. Power sets have been bought from the Rites Company of India, and from China. This is to develops= the economy backed by our able, estimable and amiable Minister of Economic Development, the Hon. Basil Rajapaksa. In fact, we have bought -බදුල්ල කන්ද නඟින්න පුළුවන්- Power Sets from SIFAN Company of Japan.

You have to climb up the mountain range there. පුළුවන්, පුළුවන් දේවල් සියල්ල අප ගෙනැල්ලා තිබෙනවා. මේ ආණ්ඩුව, මේ ඇමතිතුමා ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා රටට ගෙනැල්ලා තිබෙනවා. Power Sets හතක් ගෙනැල්ලා තිබෙනවා, ඒ වෙනුවෙන්.

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
You must compile a new dictionary.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Yes, there are so much of things to say. You must compile a new dictionary. That is what the Hon. Basil Rajapaksa is saying. ගරු ඇමතිතුමනි, what you say is right. We must compile a new dictionary - a new glossary - for Sri Lanka; a new encyclopedia for Sri Lanka in order to show America, Germany, Japan, Saudi Arabia and the powerful countries the economic revival we have achieved. So, I ask the Hon. Swaminathan, "What rubbish are you talking?" You are from a very cultured and respected family. I know the contribution of your forefathers towards the revival of the economy and for national unity. Are you not ashamed of the things that have happened to your people there? Even if you do not condemn, you had better look the other side, I would say.

Then, Sir, Mr. Ashok K. Kantha, the outgoing Indian High Commissioner to Sri Lanka has done so much than anyone has done before. Today, our Hon. Speaker hosted him to lunch and Hon. Deputy Speaker, you were also present there. What a parting assembly it was - choked with emotion! Our Hon. Minister of Transport said a short while ago, "We are more sorry that he is leaving". Actually, we need him to be here much more than before. Today, he said that he will be in the South Block in Delhi and that he will continue to take an interest in the development of this country and do whatever possible as he did while he was here and continue to do the same while being there.

Then, Sir, the Kelani Valley - අර පුංචි කෝච්චිය. ඉස්සර මහරගම ඉඳලා කොළඹ සාහිරා එකට අප එන්නේ ඒ කෝච්චියෙන්. හැකැප්ම දහය යන්න පැයක් යනවා. කුවු කුවු ගගා මේ පුංචි කෝච්චිය දුවනවා. "අහුරු කකා වතුර බීබී කොළඹ දුවන යකඩ යකා" කිය කියා අප සිංදුවකුත් කිය කියා ගමන් කරන්නේ. "කොහේද යන්නේ යකඩ යකා - කොළඹට යන්නේ යකඩ යකා" කියා කියනවා. Now, this railway line has been widened. It goes up to Avissawella now, and it will be extended up to Padukka very soon. All feasibility reports are ready. As I told you, Sir, the first stage of the Southern Railway development will be from Matara to Beliatta - we have brought Chinese equipment for that and the CMEC Company has already come. The second stage will be from Beliatta to Hambantota and the third stage will be from Hambantota to Kataragama. "කතරගම ගිහිල්ලා අතරමං වෙන්න එපා" කියා කියමනක් තියෙනවා. අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව railway line එක කතරගමට දානවා. සියලු ආගම් අදහන අයට කතරගමට ගිහිල්ලා තමන්ගේ ආගම් අදහන්න පුළුවන්. මුස්ලිම් පල්ලියටත්, හින්දු කෝවිලටත් සුව

පහසුව ඇතිව ගිහින් වැඳ පුදා ගෙන එන්න railway line එක එහාට දානවා. කවුද මේක කරන්නේ? හිතන්න පුළුවන් ද?

එපමණක් නොවෙයි. තව එකක් කියන්න ඕනෑ. අපි මේ agrarian service ගැන කථා කරන කොට, අපේ නැහෙනහිර ප්‍රදේශයේ අපේ සහෝදර ගොවි මහත්වරු - the farmers - rang me from there today. "හාජ්ජියාර් මොකද කර කර ඉන්නේ?" කියා ඇහුවා. මම ඇහුවා ඇයි කියා. ඊයේ අර විශ්වාස භංග යෝජනාවේදී - No-Confidence Motion එකේදී - රන්ජන් රාමනායක මහත්මයා - "වන් ෂොට්" කියලාත් කියනවා- කියා තිබෙනවා "ජඩ ෂරී-ආ නීතිය" කියා. අද පත්තරේ තිබෙනවා. "ජඩ ෂරී-ආ නීතිය " - I ask the Leader of the Opposition, the Leader of the United National Party, are you condoning that? Shariah - නීතිය - as I told you before is the law of Almighty Allah. It is drawn from the Holy Quran. It has been described in Al-Quran. Sir, I do not want to take your time by reading that.

This is the way they treat the Divine law. This is the way they are insulting the Shariah law.

"ඇයි, එක පඹයෙක්වත් හිටියේ නැද්ද සවුදි අරාබියේ ඒ ළමයාගේ බෙල්ල කපන කොට" කියලා එතුමා ඇහුවා. මම කිව්වා, දැන් තමුන්නාන්සේගේ බෙල්ල තමයි කපන්න වෙන්නේ කියලා. ඕනෑ නම් ආපහු කියන්නම්. බෙල්ල කියලා කඳ අරන් එන්න පුළුවන්. මේ වාගේ මිනිස්සුද එක්සත් ජාතික පක්ෂයේ දැන් ඉන්නේ. Are these the calibre of people who are in the UNP Opposition benches today? නැට්ටුක්කාරයෝ, බයිස්කෝප්කාරයෝ, නාඩගම්කාරයෝ ගෙනැල්ලා දානවා. මේක නාඩගමක් නොවෙයි. ෂරී-ආ නීතිය කුර්ආණයෙන් ආපු නීතියක්. ඒක නාඩගමක් නොවෙයි. ඒ ප්‍රකාශය ගැන ප්‍රසිද්ධියේම සමාව ඉල්ලන්නට ඕනෑ. He must ask for forgiveness.

I must also say that the Hon. Ranjan Ramanayake blamed His Excellency Abdulaziz bin Abdul-Rahman Al Jammaz, the Saudi Arabian Ambassador here. In fact, the Saudi Arabian Ambassador has helped us a lot. Our President wrote thrice to King Abdullah bin Abdul Aziz Al-Saud regarding this matter. Sir, people from Indonesia, Bangladesh and from other Muslim countries are all employed in Saudi Arabia. If such Muslim countries desist from meting out the Shariah law, I think all those Governments must resign. You have to bring in No-Confidence Motions against all the Ministers of those countries.

The Hon. Dilan Perera sent a high-powered delegation to Dawadmi in Saudi Arabia under the Governor, S. Alavi Moulana, which met the tribal leaders there. I was also there. Anyway, Sir, it was a full measure of confidence that was expressed on the Hon. Dilan Perera yesterday in this House.

We were very happy. I must tell you that from yesterday, the Government of His Excellency President Mahinda Rajapaksa became further strong in this House and in this country. There were also certain tremors in certain areas.

"நீதி அமைச்சர் ஹக்கீம் அவர்கள் உரியநேரத்தில் அரசாங்கத்தை விட்டு வெளியேறி விடுவார்; அவர் அரசாங்கத்தை விட்டு வெளியேறுவதற்குரிய 'சிக்னல்' போட்டு விட்டார்" என்று 'சுடர் ஒளி' பத்திரிகை எழுதிக்கொண்டே வந்தது. இவ்வாறெல்லாம் பத்திரிகைகள் எழுதக்கூடாது.

ඊයේ හොඳට දුන්නා. Signal නොවෙයි, ඊයේ බෝම්බයක් දැම්මා. එහේ සුඩර්ඔලි පුවත් පතට පමණක් නොවෙයි, එහාට එන්න කියන සියලු දෙනාටම මේ පාර්ලිමේන්තුවේදී ලොකු බෝම්බයක් දැම්මා. "කවදාවත් අපි යන්නේත් නැහැ, යන්න වුවමනාවකුත් නැහැ" කියලා ගරු රවුෆ් හකීම් මුස්ලිම් කොංග්‍රසයේ නායකතුමා මේ සභාවේදී ප්‍රකාශ කළා. අද ගරු රිසාඩ් බදියුදීන් ඇමැතිතුමාත් එහෙමයි කියන්නේ. අපේ ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා ඇමැතිතුමාත් එහෙමයි කියන්නේ. ගරු අතාවුල්ලා ඇමතිතුමා ගැන මම වචනයක් කියන්න ඕනෑ.

I must tell that the Hon. A.L.M. Athaullah is one person who was at the risk of his life at that time when the war was waging fiercely. He is the person who stood up and said "I will not support the merger of the North and East". That is the Hon. A.L.M. Athaullah. You must understand the history of this country. I used to cross words with the late Hon. M.H.M. Ashraff everyday in this House; I did not agree with his politics. But, he did one great service. Prabhakaran invited to join him. He said, "Come, let us join to merge the North and East; we will achieve the Eelam that we want thereafter. The late Hon. M.H.M. Ashraff was with him. He said, சகோதரனே, என்னால் முடியாது. நான் வரமாட்டேன். As the Hon. Prime Minister said yesterday, three-fourths of the Muslims are living in the South, from here to Hambantota, in the Polonnaruwa District, Kegalle District, Anuradhapura District and every district. The late Hon. M.H.M. Ashraff said, "In every Pradeshiya Sabha area a Muslim is living, there is a mosque; there is a madrasa; there is a Ahadiya school. So, I will not join you". What happened? Those terrorists, the Liberation Tigers of Tamil Eelam went after him and they wanted to murder him at Maruthamune. His beloved mother, Mrs. Madheena Umma was there. He said "Good bye, mummy! I am going". He took the trunk and came to Batticaloa and he was not able to get a seat in a compartment. He was travelling up to Colombo on footboard. He told us, "I have the Sri Lanka Muslim Congress". He came to Colombo and stayed with one of my friends, Mr. Hafeef Deen at Grandpass. He used to come to, නාරායන ගුරු ස්වාමී කෝවිලක් තිබෙනවා, at Layards Broadway එකේ. එතැන තිබුණා බාල්දි ළිඳක්. නාන්න එතැනට තමයි එන්නේ. That was Mr. Ashraff. I must today pay a great tribute to him, Sir, he had done one of the greatest national services. If he had joined Prabhakaran at that time, just imagine what would have happened? What would have happened to the Muslims there? What would have happened to us? They would have formed an Eelam. But, he did not pave the way for it; he did not give in at all to Prabhakaran. He came here sacrificing everything in life. I only want these things to be told and educated the younger Muslim generations; the siblings of the Sri Lanka Muslim Congress and the Muslims at large in the country.

Yesterday, the "Sudar Oli" newspaper has given a very good report. What is that? The Hon. Sumanthiran states,

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

"நீதியைக் கேட்கின்ற நாங்கள், முஸ்லிம்களை விரட்டியது குற்றம் என்பதை ஒப்புக்கொள்ள வேண்டும்; அவர்களுக்கு நீதி வழங்க வேண்டும்".

'அடிசக்கை' என்றானாம். The other day, all the newspapers criticized me and I was called a traitor to the Muslim Community. Why? I asked questions from the Hon. Sampanthan, the Leader of the TNA when he was speaking, I said, "You are saying that there is no security for Muslims. Rubbish! My foot! Rubbish! Who killed the Muslims? It is your own Tigers. Who killed your own leaders? Your own Tigers. Now, you are shedding crocodile tears for Muslims".

There is a saying in Tamil : "The goat is getting wet in the rain and the wolf is saying, "Brother come here, come here; there is shade here; there is shelter here". That is the sort of crocodile tears that he was shedding.

Sir, I also told, "You had better ask forgiveness from the Muslim community before you ask for any sort of safety and security for them". That security is there. Our Government has assured that. The Muslim countries in the world are with our President Mahinda Rajapaksa. That is why out of 15 countries, eight voted for Sri Lanka in Geneva. The other day, all Muslim Ambassadors came and saw the President at the Presidential Secretariat and exchanged views. They were very happy to have met the President, they told us later.

Sir, I would like to mention that wisdom has dawned on the Hon. Sumanthiran.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Thank you very much. Please wind up.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I will conclude, Sir.

He says, it was wrong to have driven the Muslims from Jaffna. If that is so, let the Hon. Sumanthiran openly say it and I challenge him to say it in this House. What was done to the Muslims in Jaffna? You drew away 75,000 people including mothers, little boys and girls. The Muslim women were without their *purdah* and without sufficient clothing to wear. They were half-naked. This is how you treated the Muslim community in this country. You talk about Muslim safety. When I said this, some newspapers published news items stating that I am against the Muslims. No, I am for the Muslims. From first to last, I am for the Muslims. His Excellency President Mahinda Rajapaksa has assured me that I could talk about the Muslims and their rights and I am here to do that - *Insha Allah!*

Thank you very much, Hon. Deputy Speaker.

[අ.භා. 4.31]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධනය ගැන කථා කරන කොට ඒ වාගේම ආනයන, අපනයන ගැන කථා කරන කොට අපේ රට පසු ගිය අවුරුදු දෙක-තුන තුළ අපනයනය සම්බන්ධයෙන් විශාල පසු බෑමක් ලබා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම 2011 වර්ෂයට සාපේක්ෂව බලන කොට 2012 වර්ෂයේදී අපේ අපනයන සියයට 7.5කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම 2013 පළමුවැනි මාස තුන දිහා බලන කොට 2012 පළමුවැනි මාස තුනට වඩා සියයට 18.2කින් අපනයනය අඩු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ ප්‍රථම වතාවට 2012 වසරේදී අපේ රටේ ආදායම මදි වුණා ණය වාරිකයි, පොලියයි ගෙවන්න. අපේ රටේ ඉතිහාසයේ ප්‍රථම වතාවට 2012 වසරේ අපේ රටේ සමස්ත ආදායම මදි වුණා ණය වාරිකයි, පොලියයි ගෙවන්න. මේ තත්ත්වයට රජය කියන්නේ මේ රටේ ආර්ථික ආශ්චර්යයක් ඇති වෙලා තිබෙනවා කියලායි. නිදහස ලැබුණු දා ඉඳලා අපේ රටේ ඉතිහාසයේ කිසිම දවසක අපේ ආදායම මදි වුණේ නැහැ ණය වාරිකයි, පොලියයි ගෙවන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ මහනුවර දිස්ත්‍රික්කය දිහා බලන කොට අපනයනය අඩු වීමට විශාල හේතුවක් ලෙස අපට දකින්න පුළුවන් වන්නේ, පසු ගිය අවුරුදු හතර, පහ ඇතුළත අපේ දිස්ත්‍රික්කයේ ඇඟලුම් කර්මාන්ත ශාලා 11ක් වහන්න සිදු වුණු එකයි. එම ඇඟලුම් කර්මාන්ත ශාලාවල විස්තර මට මේ සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සෙල්ලාම මොරයායේ ඇඟලුම් කර්මාන්තශාලාවක් තිබුණා. එහි 500ක් වැඩ කෙරුවා. ඒක 2009 දී වැහුවා. ඒ වාගේම උඩුනුවර තිබුණු 800ක් වැඩ කරපු ඇඟලුම් කර්මාන්තශාලාවක් 2008 දී වැහුවා. හේවාහැට ප්‍රදේශයේ තිබුණු ග්‍රේලයන් ඇඟලුම් කර්මාන්තශාලාවේ 1,000ක් වැඩ කෙරුවා. ඒකත් 2008 දී වැහුවා. ගන්නෝරුව ඇලෙක්සැන්ඩ්‍රා ගාමන්ට් එකේ 1,500ක් වැඩ කළා. ඒකත් 2008 දී වැහුවා. හේවාහැට ප්‍රදේශයේ කීර්ති ගාමන්ට් එකේ 1,200ක් වැඩ කෙරුවා. ඒකත් 2009 දී වැහුවා. ටැන්ඩම් ලංකා කර්මාන්තශාලාවේ 2,600ක් වැඩ කෙරුවා. ඒක 2010 දී වැහුවා. ඒ වාගේම ගම්පොළ ලක්දිව ගාමන්ට් එකේ 800ක් වැඩ කෙරුවා. ඒකත් 2011 දී වැහුවා. ඉතින් මේ විධියට පසු ගිය අවුරුදු හතර ඇතුළත අපේ මහනුවර දිස්ත්‍රික්කයේ රැකියා දසදහසක් නැති වෙලා තිබෙනවා. ඉතින් මා අහන්න කැමැතියි, මේකද ආශ්චර්යය කියන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේ ජීවත් වන තරුණයන් රැකියා අවස්ථා ඉල්ලනවා; ජීවත් වෙන්න මාර්ග හදලා දෙන්න කියලා ඉල්ලනවා. නමුත් රජය මොකක්ද අපේ දිස්ත්‍රික්කයේ තරුණයන්ට ලබා දීලා තිබෙන්නේ? Night races. Night races තමයි අපේ මහනුවර දිස්ත්‍රික්කයේ තරුණයන්ට රජය ලබා දීලා තිබෙන්නේ. ඉතින් පසු ගිය අවුරුදු හතර ඇතුළත අපේ රටේ අපනයනය අඩු වෙලා තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ විතරක් ඇඟලුම් කර්මාන්තශාලා 11ක් වහලා තිබෙනවා. රැකියා දසදහසක් නැති වෙලා තිබෙනවා. ඒ වාගේම මා මේ සඳහන් කළේ ලොකු කර්මාන්තශාලා ගැනයි. තැනින් තැන පොඩි ඒවා විශාල සංඛ්‍යාවක් වහලා තිබෙනවා. ඒවා ඇත්ත වශයෙන්ම සටහන් කරගෙනත් නැහැ. ඉතින් මා රජයෙන් අහනවා මහනුවර දිස්ත්‍රික්කයේ උඩරට පළාත්වල ඇති වෙලා තිබෙන සංවර්ධනය මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපට ලැබිලා තිබෙන අලුත්ම සංඛ්‍යා ලේඛන අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පසු ගිය අවුරුද්දේ සියයට 25ක් බංකොලොත්

වුණු බව දැන ගන්න ලැබී තිබෙනවා. මා ළඟ තිබෙනවා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වාණිජ මණ්ඩලයේ සභාපතිතුමා ඉදිරිපත් කළ අදහස් ඇතුළත් 2013.04.09 දිනැති "ද අයිලන්ඩ්" පුවත් පත් වාර්තාව. It states, I quote:

" 'Twenty five per cent of SMEs suffer bankruptcy'

Around 25 per cent of Sri Lanka's Small and Medium Enterprises have collapsed over the past two to three years amid grueling financial hardships, including bank interest rates on loans,..."

අද සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට බැංකුවලින් ණය ලබා ගන්න බැහැ. ඒකට ප්‍රධාන හේතුව, අද බැංකුවල තිබෙන සල්ලි ගන්නේ ආණ්ඩුව වීමයි. ගිය මාසයේ රජයේ සේවකයින්ගේ පඩි ගෙවන්න ආණ්ඩුවට සල්ලි තිබුණේ නැහැ. රජය කෙරුවේ මොකක්ද? සියලු බැංකු ඒක රාශී කරලා මිලියන 5,500ක් බැංකුවලින් ණයට ගත්තා රජයේ සේවකයන්ට පඩි ගෙවන්න. ඉතින් මේකයි තිබෙන තත්ත්වය. සියයට 20කින් අපනයන අඩු වෙලා තිබෙනවා. මුළු රටේම ඇඟලුම් කර්මාන්තශාලා 100ක් විතර වහලා තිබෙනවා. ඒ වාගේම ඉදිරියේදී ඇති වන විදුලි අර්බුදයත් එක්ක කර්මාන්තශාලා පවත්වා ගෙන යන්න බැරි තත්ත්වයක් උදා වෙනවා. විශේෂයෙන්ම කර්මාන්තශාලාවල විදුලි බිල සියයට 10කින්, සියයට 20කින් වැඩි වෙනවා. විදුලි බිල සියයට 10කින්, 20කින් වැඩි වුණාම අපේ අපනයන තවදුරටත් අඩු වෙනවා. ඉතින් විශාල ආර්ථික අර්බුදයක අබියසයි අපි ඉන්නේ. මා කලින් කිව්වා වාගේ පසු ගිය මාසයේ රජයේ සේවකයින්ට පඩි ගෙවන්න ආණ්ඩුවට සල්ලි තිබුණේ නැහැ. සියලු බැංකු ඒක රාශී කරලා මිලියන 5,500ක් රජය ණයට ගත්තා පඩි ගෙවන්න. ඉතින් මේක තමයි අද රටේ ආර්ථිකයේ තිබෙන තත්ත්වය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම බදු ආදායම සියයට 1කින් අඩු වෙලා තිබෙනවා. දැන් රජය කියනවා හම්බන්තොට ව්‍යාපෘතිය ආරම්භ කෙරුවා; නොරොච්චෝලේ ව්‍යාපෘතිය ආරම්භ කෙරුවා; ඒ වාගේම මත්තල ව්‍යාපෘතිය ආරම්භ කෙරුවා; පාරවල් හැදුවා කියලා. දැන් මේ ව්‍යාපෘතිවලින් ලාභයක් තිබෙනවා නම් බදු ආදායම් වැඩි වෙන්න ඕනෑ. නමුත් අප දන්නවා පසු ගිය අවුරුද්දේ බදු ආදායම අඩු වෙලා තිබෙන බව.

රජය ආරම්භ කළ විශාල ව්‍යාපෘතිවලින් ශත පහක වාසියක් නැහැ කියන එක ඉතාම පැහැදිලියි. රාජ්‍ය සංස්ථා සියයට 95ක්ම පාඩුවට යන්නේ. අපට COPE එකේදී පෙනෙනවා, ලාභයට පවත්වා ගෙන යන එක රාජ්‍ය සංස්ථාවක්වත් නැහැ කියලා. හැම රාජ්‍ය සංස්ථාවම, හැම දෙපාර්තමේන්තුවම ආණ්ඩුවෙන් සල්ලි අර ගෙන තමයි පවත්වා ගෙන යන්නේ. ඉතින් මේක කොච්චර කාලයක් කරන්න පුළුවන්ද?

අද පත්‍රයේ තිබෙනවා මම දැක්කා, ඉදිරියේදී එන විදුලි අර්බුදය නිසා නිදහස් වෙළෙඳ කලාපවල විදුලිය පැය හතරක් කපන්න යනවා කියලා. මේක ඇත්තද කියලා මම දන්නේ නැහැ. මේ රජය ආරම්භ කරපු එකම විදුලි බලාගාරය තමයි නොරොච්චෝලේ විදුලි බලාගාරය. ඒක දහනව වතාවක් ගිනි අර ගෙන තිබෙනවා. අද පුවත් පත් බලන්න. රජය පොරොන්දු වූ, ජනාධිපතිතුමා පොරොන්දු වූ විදුලි සහනාධාරය දෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒක තමයි ඇත්ත. ජනාධිපතිතුමා කිව්වා පළමුවැනි units 60ට පරණ rate එක අය කරන්න කියලා. නමුත් අද මහජන උපයෝගිතා කොමිසම රජයට ඉදිරිපත් කර තිබෙන තක්සේරුව අනුව ඒ සහනය දෙන්න පොරොන්දු වෙලා තිබෙන්නේ පළමුවැනි යුනිට් 30ට පමණයි. යුනිට් 60 දක්වා සහනයක් දෙනවා කියලා එදා මැයි දින රැලියේදී ජනාධිපතිතුමා කිව්වා. නමුත් අද පත්‍රයේ තිබෙන ආකාරයට විදුලිබල මණ්ඩලය පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා, අපට units 60 දක්වා සහනයක් දෙන්න බැහැ, අපි units 30 දක්වා සහනයක් දෙන්නම් කියලා. ඉතින් කවුද, ඇත්ත කියන්නේ? මේක තමයි ඇත්තටම මේ රටේ තිබෙන ආර්ථික අර්බුදය. මම තමුන්නාන්සේලාගෙන් අහනවා. රට හැටියට ඕනෑ නැහැ, ගෙදරක් අර ගෙන බැලුවොත් ණය වාරිකයි පොලියයි ගෙවන්න අපේ ආදායම මදි නම් අපට ඉස්සරහට යන්න පුළුවන්ද? අද අපේ රටට වෙලා තිබෙන්නේ ඒකයි.

පළමුවැනි වතාවට 2012 අවුරුද්දේ ණය වාරිකයි පොලියයි ගෙවන්න අපේ අදායම මදි. එහෙම තියා ගෙන තමයි ආසියාවේ ආශ්චර්යයක් ගැන රජය කථා කරන්නේ. 2012 වර්ෂයේ අපේ ආදායම මදි, ණය වාරිකයි පොලියයි ගෙවන්න. ඉතින් මොකක්ද මේ ආර්ථික සංවර්ධනය? මොකක්ද ආශ්චර්යය? 2000-2001 කාලයේ ණය වාරිකයි පොලියයි ගෙවන්න අපි වියදම් කළේ අපේ ආදායමෙන් සියයට 51යි. Fifty one per cent of our income in 2001 was used to pay the loan instalments and interests. නමුත් අද ඒකට සම්පූර්ණ ආදායම මදි. ඉතින් මේකට තමයි ආශ්චර්යයක් කියන්නේ. මට නම් මේක තේරෙන්නේ නැහැ. සංස්ථා ඔක්කොම බංකොලොත්. විදුලිබල මණ්ඩලය පවත්වා ගෙන යන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් යටතේ, රජය මේ ප්‍රශ්න ගැන උනන්දුවෙන් කටයුතු කළේ නැත්නම් විශාල ආර්ථික අර්බුදයක් ඇති වෙලා, අපේ රටේ අසහනකාරී තත්ත්වයක් ඇති වේවි කියලා මම රජයට කියනවා. මා කලින් කිව්වා වාගේ හම්බන්තොට, මත්තල, අධිවේගී මාර්ග, නොරොච්චෝලේ විදුලි බලාගාරය වැනි රජය ආරම්භ කළ ලොකු ව්‍යාපෘතිවලින් ශත පහක ලාභයක් නැහැයි කියන එක ඉතාම පැහැදිලියි.

ඒ අදහස් තමුන්නාන්සේලා ඉදිරියේ තබමින්, රට ගැන කල්පනා කරලා අපේ ආර්ථිකය ගොඩ ගන්න රජය යම්කිසි පියවරක් ගනීවි කියලා මම විශ්වාස කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.43]

ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)

(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ගොවි අයිතිය සම්බන්ධයෙන් වන වැදගත් නියෝග ගැනයි අද කථා කරන්න තිබෙන්නේ. නමුත් ඊට පෙර ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කියපු කරුණු කිහිපයක් පිළිබඳව අදහස් දැක්විය යුතු වෙනවා. එතුමා හැම දාම කථා කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික විශේෂඥයා වාගේයි නේ. එතුමා හැම දාම කියන්නේ අපේ ආණ්ඩුව කඩා ගෙන වැටෙනවා, ආර්ථිකය බංකොලොත් වෙලා, පඩි ගෙවා ගන්න බැහැ, බැංකුවලට ණය වෙලා කියලායි. ඒක තමයි හැම දාම එතුමාගේ අදෝනාව. එතුමාගේ ප්‍රාර්ථනය ඒක වෙන්න පුළුවන්. ඒක අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ආණ්ඩුව භාර ගත්ත දවසේ ඉඳලාම කිව්වා. නමුත් අද වන තෙක් මේ ආණ්ඩුව හොඳින් කර ගෙන යනවා. ඒ කටයුතු හොඳින් කර ගෙන යනවා.

එතුමා කියපු එක් කාරණයක් තමයි මේ ආණ්ඩුව ආවාට පස්සේ පටන් ගත්තේ එක විදුලි බලාගාරයක් -නොරොච්චෝලේ විදුලි බලාගාරය- විතරයි කියන එක. නමුත් ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ හොඳටම දන්නවා කොත්මලේ විදුලි බලාගාරය කවුද පටන් ගත්තේ කියලා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ ඒක පටන් ගත්තේ නැහැ, රනිල් වික්‍රමසිංහ මහත්මයා. එතුමා ඒක පටන් ගන්න බය වෙලා සිටියා. 1994 -2000 කාලයේ

[ගරු මහින්ද අමරවීර මහතා]

අපිත් එය පටන් ගත්තේ නැහැ. පොදුජන එක්සත් පෙරමුණ රජයත් බය වෙලා සිටියා ඒ වෙලාවේ. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බය නැතිව ඒ විදුලි බලාගාරය පටන් ගත්තා. අද ඒ බලාගාරයෙන් විදුලිය දෙනවා. ඒ විතරක් නොවෙයි. ඊට පස්සේ කෙරවළපිටිය විදුලි බලාගාරය පටන් ගත්තා. ඒ විදුලියත් ලබා දෙනවා. යාපනයේ චුන්නාගම් ප්‍රදේශයේ විදුලි බලාගාරයක් පටන් ගෙන මාස ගණනක් තුළ ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් බිලියන ගණනක ඉතිරියක් කරලා දුන්නා. නොරොච්චෝලේ විදුලි බලාගාරය ගැන අද කථා කරන ඔබතුමන්ලා එදා ඒකත් පටන් ගන්නේ නැතිව බය වෙලා දණ ගහගෙන සිටියා. අලුතින් විදුලි බලාගාරක් පටන් ගත්තාම එවැනි අක්‍රිය වීම් ආදි යම් යම් දේවල් සිද්ධ වෙලා තිබෙනවා. අද නොවෙයි අතීතයේ පවා -හැම දාම- එහෙමයි. මේක ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට සිදු වූ දෙයක් නොවෙයි.

ගරු මන්ත්‍රීතුමනි, ණය ගැනීම සම්බන්ධව කථා කරමින් ඔබතුමා කිව්වා, "ණය වාරිකය ගෙවා ගන්න බැහැ. ණය උගුලේ බොහොම හිර වෙලා ඉන්නේ" කියලා. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, අපි ණය ගන්නේ කන්න බොන්න නොවෙයි. අපි ණය අරගෙන තිබෙන්නේ රටේ සංවර්ධනය වෙනුවෙන්. අද රටේ හැම තැනම සංවර්ධනයක් සිද්ධ වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ ණය ගත්තු ප්‍රමාණය කොච්චරද? දළ දේශීය නිෂ්පාදනයට සමගාමීව සියයට 103ක ණය ගත්තා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලය තුළ. නමුත් අපි තවම අරගෙන තිබෙන්නේ සියයට 77කට අඩු ප්‍රමාණයක්. තවත් ණය ගන්න හැකියාව අපට තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, රටවල් අපට ණය දෙන්නේ නැහැ ණය ගෙවා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා නම්. ආර්ථිකය තුළ ඒ වාගේ ප්‍රශ්නයක් තිබෙනවා නම් කිසිම රටක් ණය දෙන්නේ නැහැ. බැංකුවක් වුණත් එහෙමයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Will an Hon. Member propose the Hon. Hunais Farook to take the Chair?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
I propose that the Hon. Hunais Farook do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හුනෙයිස් ෆාරූක් මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. HUNAIS FAROOK *took the Chair.*

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බංකොලොත් වෙලා යන ව්‍යාපාර කරන අයට, බංකොලොත් වේවි කියලා පෙනෙන අයට, අසාර්ථක අයට බැංකු ණය දෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඇපකාරයන් ඉන්න ඕනෑ. ණය ගැන විශ්වාසයක් ඇති වෙන්න ඕනෑ. මේ රට සම්බන්ධයෙන් ඒ විශ්වාසය පලුදු වෙලා නැහැ. ගන්නා සෑම ණයකම වාරිකය හරියට ගෙවනවා. ඒ වාගේම, දැන් මේ ගෙවන ණය ඔක්කෝම අපේ ආණ්ඩු කාලයේ ගත්තු ඒවා නොවෙයි. අපේ ආණ්ඩුව කාලයේ ගත්ත ණය විතරක් නොවෙයි, තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේ ගත්තු ඒවාත් අපි තවම ගෙවා ගෙන යනවා. අපේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා. එතුමන්ලාගේ කාලයේ ගෙනාපු, අර කඩා වැටුණු ජීප් ටිකට අදාළ ණයත් අපි තවම ඉන්දියාවට ගෙවා ගෙන යනවා. ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, නැහැ.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ණයටයි ගෙනාවේ. Indian Line of Credit එකෙන් නේ ගෙනාවේ.

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
දැවැද්දට දීලා!

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔව්, ඒවා දැවැද්දට දීලා. අර අපටත් ගෙනැල්ලා දුන්නේ "ටාටා සෆාරි" ආදි එක එක ඒවා. ඒ වෙලාවේ පොලීසිවලට දිගටම දීගෙන ගියේ. [බාධා කිරීම්] ඒවා ඔක්කෝම දැන් පරණ යකඩවලට විකුණන්න සිදු වෙලා තිබෙන්නේ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමන්ලා ඒවායෙන් අවුරුදු 5ක් වැඩ ගත්තා කරදරයක් නැතිව.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ ඔක්කෝම ගෙනාවේත් ණයට.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඉන්දියාවේ සහනාධාර ලැබිලායි ගෙනාවේ.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ණයට ගෙනාවේ, Indian Line of Credit එකෙන්. ඒ විතරක් නොවෙයි. ඒ කාලයේ මන්ත්‍රීවරුන් විකුණා ගත්තු ටකරන් තහඩු ගෙනාවේත් ණයට. ඒත්, Indian Line of Credit එකෙන්. ඉතින් ඒ ණයත් අපි තවම ගෙවනවා. Indian Line of Credit කියන්නේ ණය නොවෙයිද? ණය නොවෙයි නම් ඒක වෙන මොකක්ද? ආධාරයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒක පටලා ගන්න එපා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පාන් පිටි ගෙනාවා ණයට. පාන් පිටිවලට සහනාධාර දුන්නා අවුරුදු ගණනාවක්. ගොවිජන සංවර්ධන පනත යටතේ නියෝග ගැන කථා කරන මේ වෙලාව වෙන කොට ගොවියා නහා සිටුවන්න මේ රජය කොතරම් කටයුතු

කරනවාද කියලා බලන්න. එක්සත් ජාතික පක්ෂය ආරම්භ කළ වැඩ පිළිවෙළක් තමයි පාන් පිටි සහනාධාරය ලබා දීම. එදා ඒ ආණ්ඩුව පාන් මිල අඩු කරන්න ප්‍රීමා සමාගමට රජයේ මුදලින් සහනාධාරයක් දුන්නා. ඒ වාගේම ණයට පිටි ගෙන්නුවා.

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඒවාත් ගෙවන්න සිදු වුණේ අපට.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒවාත් ගෙවන්න සිදු වුණේ අපට; මේ ආණ්ඩුවට. මේ සියල්ල කළමනාකරණය කරමින් ගොවි ජනතාව ඇතුළු මේ රටේ ජනතාව ගැන -ශ්‍රී ලාංකිකයා ගැන- විශ්වාසය තියා ගෙන තමයි අද එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව ඉස්සරහට යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතිහාසගත දිනයක් විධියට සඳහන් කරන්න මා කැමැතියි. අවුරුදු 13ක් තිස්සේ අද ගොවීන්ට ප්‍රශ්නයක් තිබුණා. විශේෂයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහ ජන නියෝජිතයකු විධියට මම ඉතාම සතුටු වෙනවා, ආඩම්බර වෙනවා අපේ රජයක් යටතේ අද ගොවියාගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීලා, කවදාවත් නැති තරමට අද ගොවියා ශක්තිමත් කරන්න ගත්තු මේ පියවර පිළිබඳව. 1956 බිහි වූ බණ්ඩාරනායක මැතිතුමාගේ ආණ්ඩුවේ ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමා තමයි කෘෂිකර්ම හා ආහාර අමාත්‍ය ධුරය දැරුවේ.

ඒ කාලය තුළ තමයි -1957 ඔක්තෝබර් මස 01වැනි දින- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවලා ඉන් අනතුරුව 1958 පෙබරවාරි මස 01වැනි දින තමයි මේ පනත ගෙන ආවේ. ඒ පනතේ ගොවි ජනතාව ශක්තිමත් කරන, අද ගොවියා ශක්තිමත් කරන වගන්ති ගණනාවක් තිබුණා. ඒ වාගේම රටේ නිෂ්පාදනය වැඩි කර ගන්න අවශ්‍ය වගන්ති ගණනාවක් තිබුණා. එහි යම් යම් ආකාරයේ සංශෝධන ඇති වෙලා, පසු ගිය කාලයේ බරපතළ තත්ත්වයක් ඇති වුණු වෙලාවේ; ගොවීන් 6,000ක් පමණ අපහසුතාවට පත් වුණු වෙලාවේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය ඒ වැරැද්ද නිවැරදි කරලා අද අද ගොවියා ශක්තිමත් කරලා තිබෙනවා. එදා පිලිප් ගුණවර්ධන මැතිතුමා සතුටු වුණා වාගේම, ඔහු ඒ ගෞරවය හිමි කර ගත්තා වාගේම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාටත්, ඒ වාගේම බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටත් ඒ ගෞරවය හිමි වෙනවා, මේ රටේ ගොවි ජනතාවගේ ගෞරවය හිමි වෙනවා කියන එක මා මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

ඒ වාගේම අනුර කුමාර දිසානායක මැතිතුමා; ඒ කියන්නේ සාමාන්‍යයෙන් අපේ පෙළැන්තියේ පුද්ගලයෙක් කියලා අපි හිතන අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කෘෂිකර්ම අමාත්‍යවරයා වශයෙන් හිටපු කාලයේත් අපි කිව්වා, මේ පනත සංශෝධනය කරලා ගොවියාට අයිතිවාසිකම් ලබා දෙන්න කියලා. නමුත් ඒ කාලය තුළවත් ඒ කටයුත්ත සිද්ධ වුණේ නැතෙයි කියන එක අපි කනගාටුවෙන් ප්‍රකාශ කරනවා. නමුත් මේ පනත සංශෝධනය කරන වෙලාවේ ඒක තනි මතයකට කරන්නේ නැතුව පක්ෂ විපක්ෂ ඒ වාගේම අඳ ගොවියාගේ, ඉඩම් හිමියාගේ, ඒ සියලු දෙනාගේ කැමැත්ත ඇතිවයි එය කරන්නේ. ඉඩම් හිමියා පැත්තකට කළේ නැහැ. මොකද, ඉඩමෙන් අස්වැන්නක් ගන්න එක, ගොවියා සාර්ථක අස්වැන්නක් ගන්න එක වගේ හැම පැත්තක් ගැනම කල්පනා කරලා, හැම කෙනෙක් සමඟම සාකච්ඡා කළා.

ඒ වාගේම මට මතකයි, ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් මන්ත්‍රීවරු සියලු දෙනාම එකතු කරලා එතුමාගේ කාර්යාලයේදී මේ පිළිබඳ සාකච්ඡාව පැවැත්වූවාය කියලා. බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් සමඟ යම් යම් තීන්දුවලට ඇවිල්ලා වෙච්ච වැරැද්ද නිවැරදි කිරීම සඳහා අවසාන වශයෙන් ඉතිහාසගත වන තවත් වැඩක් කළා. ඒ තමයි පසු ගිය කාලය තුළ 6,000කට විතර අසාධාරණ සිද්ධ වුණා; අඳ ගොවි අයිතිය නැති වුණා. සමහර පවුල් අගාධයට ගියා. සමහර අය ජීවිත නැති කර ගත්තා. අපි දන්නවා, අපේ ප්‍රදේශවල අඳ ගොවීන්ට තමන්ගේ අයිතිවාසිකම් නොලැබීම නිසා මිනී මැරුම් සිද්ධ වුණ බව. ඒ විධියේ අසාධාරණකම් සිද්ධ වුණු 6,000කට පමණ අතීතයටත් බලපාන පරිදි සහන ලබා දෙන්න කටයුතු කිරීම තවත් වැදගත් අවස්ථාවක් විධියට මා සඳහන් කරන්න කැමැතියි. එහිදී බොහෝ දේවල් සඳහා යන වියදම දරන්න රජය කටයුතු කිරීම අපට තවත් සතුටු වෙන්න පුළුවන් කාරණයක් කියලා මා සඳහන් කරන්න කැමැතියි. අපේ රජයේ අමාත්‍යවරු ගණනාවක් -හත් දෙනෙක් පමණ- මේ කටයුත්ත ඉස්සරහට ගෙනියන්න කටයුතු කළා. ඒ සියලුම දෙනාට අපි අපේ ප්‍රශංසාව, ගෞරවය හිමි කරන ගමන් විශේෂයෙන් බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට, ඒ වාගේම එස්.එම්. චන්ද්‍රසේන නියෝජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයට තමයි වැඩිම බලපෑමක් සිද්ධ වුණේ. ඒ වාගේම රටේ අනෙක් ප්‍රදේශවලටත් මේ බලපෑම ඇති වුණා. අහිංසක අඳ ගොවියන් ශක්තිමත් කරන මේ පනත් කෙටුම්පත වඩා ඵලදායී විධියට, තවත් ප්‍රබල විධියට ගෙන එන්න පුළුවන්කම ලැබීම පිළිබඳව අපි සතුටු වෙනවා.

ඒ වාගේම මේ පනත් කෙටුම්පතේ තවත් විශේෂත්වයක් මම දැක්කා. මෙවර ගෙනෙන සංශෝධනවලදී අඳ ගොවියා ජීවත්ව සිටියදී තමන්ගේ ඊළඟ අඳ ගොවි අයිතිය පවරා දෙන පුද්ගලයා නම් කිරීමේ හැකියාව තිබෙනවා. පසු ගිය කාලය තුළ ඒ පිළිබඳව පවුල් අතර යම් යම් ප්‍රශ්න නිර්මාණය වන තත්ත්වයක් ඇති වෙලා තිබුණා. ඒ තත්ත්වයත් නිවැරදි කරන්න මේ පනත තුළින් හැකි වෙනවාය කියන ආඩම්බරය අපි සතුව තිබෙනවා. පනත් කෙටුම්පත තුළ තිබෙන කාරණා අනුව අනුප්‍රාප්තිකයකු නම් කරන්න අඳ ගොවියාට අවසර දීමත් ඉතාමත් වැදගත්. මොකද, මට මතකයි මීට කලින් තිබුණු විධියට අඳ ගොවියා මැරුණාම පවුලේ වැඩිමල් දරුවාට තමයි ඒ අයිතිය ගියේ. සමහර වෙලාවට වැඩිමල් දරුවා කෘෂිකර්මය නොකරන කෙනෙක් නම්, ඔහුට යමක් තිබෙනවා නම්, අඳ ගොවියාට අයිතිය තිබෙනවා -හැකියාව තිබෙනවා- ඊළඟ දරුවා හෝ වෙනත් දරුවෙක් නම් කරලා ඒ අයිතිවාසිකම් දිගටම පවත්වාගෙන යන්න.

අද අපේ රටට බත සපයන ගොවියා වෙනුවෙන් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ගත් වැදගත් තීන්දු රාශියක් තිබෙනවා. ඒ අතරින් ප්‍රධාන තීන්දුවක් විධියටයි මම මේක හඳුන්වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට සිහිපත් වෙනවා ඇති මීට ප්‍රථම අඳ ගොවියා විතරක් නොවෙයි හැම ගොවියෙක්ම පැත්තකට දාලා, අමතක කරලා දාපු යුගයක් තිබුණ බව. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ වතාවක් එතුමා කිව්වා, "දැන් කුඹුරු වැඩියි, කුඹුරු ඉඩම් ගොඩ කරන්න ඕනෑ, ඒවා වාණිජ කටයුතුවලට ගන්න ඕනෑ" කියලා. එහෙම ප්‍රකාශ නිකුත් කළ යුගයක් තිබුණා.

ඒ යුගය අවසාන කරලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගොවියා ශක්තිමත් කරන යුගයක් ගොඩ නහන්න කටයුතු කළාය කියන කාරණය එක්සත් ජාතික පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු හෘදය සාක්ෂියට එකඟව කල්පනා කරලා බැලුවොත් අවංකව පිළිගන්නවාය කියලා මම විශ්වාස කරනවා. පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා ගත්තු ක්‍රියා මාර්ගය සහ පොහොර සහනාධාරය වශයෙන් රුපියල් 350ට පොහොර දෙනවාය කියන කාරණා දිහා බලන්න. පොහොර මිටියක මිල රුපියල් 4,000ට එහා යන කොටත් රුපියල් 350ට පොහොර දෙනවා. වැලි හොඬරයක් ගන්න බැහැ, රුපියල් 350ට. බොරලු ටිකක් ගන්න බැහැ, රුපියල් 350ට. මම හිතන හැටියට සිගරට් පැකට් එකේත් ගණන අඳ

[ගරු මහින්ද අමරවීර මහතා]

පොහොර හොණ්ඩරයක මිලට වඩා වැඩියි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය තවමත් රුපියල් 350ට පොහොර ලබා දෙනවා. මේ පොරොන්දුව වුණේ මහින්ද චින්තනයෙන් ජනාධිපතිතුමා මේ වතාවේ නොවෙයි, ඊටත් කලින් වතාවේයි. සාමාන්‍යයෙන් දේශපාලනඥයෝ, දේශපාලන පක්ෂ, රාජ්‍ය නායකයෝ දෙන පොරොන්දු දිගටම පවත්වාගෙන යන්නේ නැහැ. ඒ වාගේ උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. ඇට අටේ පොරොන්දුව, හඳෙන් හාල් ගෙනැල්ලා දෙන පොරොන්දුව, 3.50ට පාන් දෙන පොරොන්දුව වාගේ පොරොන්දු බොහොමයක් ගැන රට තුළ කථා බහට ලක් වුණා. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගොවි ජනතාව වෙනුවෙන් ලබා දුන්නු පොරොන්දුව එතුමා දෙසැරයක් බලයට පත් වෙලාත් අදත් අඛණ්ඩව කන්න 17කට වැඩි ප්‍රමාණයක් ලබා දෙනවාය කියන කාරණය අපි ආඩම්බරයෙන් සඳහන් කරන්න කැමැතියි. මේකේ ප්‍රතිඵල වශයෙන් මොකක්ද වුණේ? අපි රටින් හාල් ගෙනාපු ජාතියක් බවට පත් වෙලා තිබුණේ. අපි පාන් කන ජාතියක් බවට පත් වෙලා තිබුණේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය මේ ගත්තු තීන්දුවේ ප්‍රතිඵලයක් විධියට පරාක්‍රම රජතුමාගෙන් පස්සේ සහලින් රට ස්වයංපෝෂිත වුණු යුගය මහින්ද රාජපක්ෂ යුගය කියන එක අපිට අභිමානයෙන් අද සඳහන් කරන්න පුළුවන්. දැන් අපි ඊ ළඟ කන්නය වගා කිරීම පිළිබඳව සාකච්ඡා කරනවා. ඊ ළඟ අවුරුද්දේ අපේ කෘෂිකර්මය මෙහෙය වන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව ජනාධිපතිතුමා සාකච්ඡා කරනවා. දැන් අපි මොකක්ද සාකච්ඡා කරන්නේ? මේ රටේ ජනතාවට අවශ්‍ය සහල් පමණක් නොවෙයි, අපි ඊ ළඟ කාල පරිච්ඡේදය තුළ නිෂ්පාදනය කරන්න බලන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිට සුද්දා පාන් කන්න පුරුදු කළේ නිකම් නොවෙයි. නිකම් බොහොම දේවල් දීලා - ආධාර දීලා, සහනාධාර දීලා, ඇදිහැස බිස්කට් දීලා -. එහෙම තමයි පුරුදු කළේ. දැන් අපි කල්පනා කරනවා, සුද්දන්ට බත් කවන්න කොහොමද අපේ හාල් නිෂ්පාදනය කරන්නේ කියලා. පිට රට යවන්න කොහොමද අපේ වී ටික නිෂ්පාදනය කරන්නේ කියන කාරණය පිළිබඳව දැනට අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය කටයුතු කරනවාය කියන කාරණයත් අපිට අභිමානයෙන් සඳහන් කරන්න පුළුවන්. මේ රට දැනටමත් බොහෝ දෙයින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. එක පැත්තකින් බැලුවොත් වීවලින් ස්වයංපෝෂිත වෙලා; බඩ ඉරිහුවලින් ස්වයංපෝෂිත වෙලා. ඒ විතරක් නොවෙයි, මුංඇටවලින් ස්වයංපෝෂිත වෙලා. දැන් බලන්න, මුංඇට අතුරු කන්නයක දී වගා කරනවා. මම ගිය සතියේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇවිදගෙන ගියාම මට ඇති වුණු සතුට කියා නිම කරන්න බැහැ. හැම ඉපනැල්ලකම මුංඇට වපුරලා. දැන් මුංඇට අස්වැන්න නෙළන කාලය බවට පත් වෙලා තිබෙනවා. මම හිතනවා, තව වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා මුංඇටවලිනුත් අපි ස්වයංපෝෂිත වෙනවාය කියලා. මොකද අපි හැම දෙයක්ම රටින් ගෙනැල්ලා කාපු යුගය අවසාන කරලා, පිට රටට අපේ නිෂ්පාදන යවන යුගය මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ඉදිරියේ දී ඇති වෙනවාය කියන සහතිකය ඔබතුමන්ලාට ලබා දෙමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

[අ.භා. 4.57]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

බොහොම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජනාධිපතිතුමා කෙතරම් මෙහෙවරක් මේ ගොවි ජනතාව වෙනුවෙන් කරලා තිබෙනවා ද, ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය ගොවි ජනතාවට කිසිම දෙයක් නොකළ ආකාරය සම්බන්ධයෙනුත් මහින්ද අමරවීර ඇමතිතුමා යම් කිසි විග්‍රහයක් කළා. අපි දන්නවා, ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක් බව. ඔබතුමා මගේ මිත්‍රයා. ඇමතිතුමනි, හැබැයි ඔබතුමා ඔය ගොවි ජනතාව ගැන කෙතරම් කථා කළත් අපිට පොඩි කනගාටුවක් තිබෙනවා. ජනාධිපතිතුමා ගොවි ජනතාව ගැන කථා කළාට, මේ සියලු දේවල් ගැන කථා කළාට, ගොවි විශ්‍රාම වැටුප අද ලබා ගන්න බැරිව විශාල පිරිසක් -ලක්ෂ දහයකට ආසන්න පිරිසක්- මම හිතන්නේ අමාත්‍යතුමාට කීප වතාවක දී ප්‍රශ්න යොමු කළා. අද ඒ පිරිස අසරණභාවයට පත් වෙලා තිබෙනවා.

ඇමතිතුමනි, විශේෂයෙන්ම අද ඔබතුමා දන්නවා, දැනට ලැබිලා තිබෙන දත්ත අනුව හතර දෙනෙකු ඉන්න පවුලකට සාමාන්‍ය ජීවිතයක් ගත කරන්න රුපියල් 45,000ක මාසික ආදායමක් තිබෙන්න ඕනෑ බව. [බාධා කිරීමක්] සමා වෙන්න. රුපියල් 7,500ක් කියලා ඔබතුමන්ලාගේ ඇමතිතුමෙකු කිව්වා. මම දැක්කා කාටූනයක් දමලා තිබෙනවා, "තණ කොළ කන්න දැන් පුරුදු වෙයල්ලා" කියලා.

රුපියල් 7500කින් මාසයක් කන්න පුළුවන් කියනවා. මම දැක්කා කාටූන් එකක් දමා තිබුණා, "තණ කොළ කන්න දැන් පුරුදු වෙයල්ලා" කියලා. මම හිතන්නේ දැන් රටේ ජීවන තත්ත්වය - [බාධා කිරීමක්] සමාවෙන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තණකොළත් දැන් හරි ගණන්.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

අපි දන්නේ නැහැ, අපි කන්නේ නැති හින්දා. ඔබතුමා- [බාධා කිරීමක්] කෙසේ වෙතත් ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා හොඳින් දන්නවා. අපි නම් දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මහින්ද අමරවීර ඇමතිතුමා මොන ආකාරයට කිව්වත්, එක්සත් ජාතික පක්ෂය කාලයේ රට කළේ කොහොමද කියන එක ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඉතා ලස්සණට විග්‍රහ කර දැක්වුවා. ඒ කාලයේ හිටපු දක්ෂ ඇමතිවරු -මෙතැන ඉන්න ගොඩාක් අය- ඒ ගැන දන්නවා. ඒ අයගෙන් විශාල පිරිසක් මෙතැන ඉන්නවා. එතුමා කියපු ආකාරයට මෙතුමන්ලාගේත්, අපේත් තිබෙන වෙනස මොකක්ද? අපි, 1948 ඉඳන් එක්සත් ජාතික පක්ෂයේ හිටපු නායකවරු සියලු දෙනා රකිනවා. අපි කියන්නේ නැහැ, මේ නායකයාගේ කාලයේ මේක සිද්ධ වුණාය, මේ නායකයාගේ කාලයේ මේක සිද්ධ වුණාය, අපේ කාලයේ නොවෙයි, ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ කාලයේ නොවෙයි, රණසිංහ ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ නොවෙයි කියා. අපි එහෙම කියන්නේ නැහැ. අපි සියලු දෙනාම එතුමන්ලා රකිනවා. මෙතුමන්ලා කිව්වා, පාන් රුපියල් 3.50ට දෙන්න පොරොන්දු වුණාය කියා. දුන්නා. ඒ දුන්නෙත් ඔබතුමන්ලාගේම නායිකාවක්. හඳෙන් ගෙනල්ලා දෙනවාය කිව්වා. ඒ කිව්වේ ඒ දවස්වලය කියා දැන් ඒකෙන් ඇඟ බේරා ගන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1994 දී අපි මෙතුමන්ලාට රට බාර දෙනකොට ඒක පුද්ගල ණය රුපියල් 25,000ක් වාගේ ප්‍රමාණයක් වුණා. අද ඒක රුපියල් ලක්ෂ තුන හමාරකටත් වැඩියි. ණය ගන්න එපාය කියා අපි කියන්නේ නැහැ. ණය ගන්න ඕනෑ. රටක් වුණාම ණය ගන්න ඕනෑ. හැබැයි රටක් ණය ගන්න ඕනෑ සියයට 7.2 පොලියට නොවෙයි; සියයට 6.8ට නොවෙයි. අඩුම ගණනේ LIBOR අනුපාතය 3.4ක්, 3.5ක් වෙනවා. හතරට අඩු අනුපාතයකට ගන්න පුළුවන් නම් හොඳයි. ඒක ගෙවා ගන්න පුළුවන්. අපේ රටේ පුරවැසියෝ බංකොලොත්භාවයට පත් වෙලා නැහැ. කොහොමත් අපි ණය ගෙවනවා. රටේ ණය ගෙවීමේ හැකියාව අනුව තමුන්නාන්සේලා සියයට 10 පොලියට ගත්තත්

ඒ ණය ප්‍රමාණය ගෙවනවා. ඒක නොවෙයි ප්‍රශ්නය. රටේ ජනතාවට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ජනතාවට මාසයක් ජීවත් වෙන්න රුපියල් 45,000ක් අවශ්‍ය නම් ඒ රුපියල් 45,000 හම්බ කර ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලා දීපු පොරොන්දු මොනවාද බලන්න. 2009 දී යුද්ධය අවසන් වෙනකොට ඔබතුමන්ලා මේ කථා නොවෙයි අපට කිව්වේ. 2009 යුද්ධය අවසන් වෙනකොට කිව්වේ මේ රට ආසියාවේ ආශ්චර්යය බවට පත් කරනවාය; ජනතාවට සශ්‍රීක ආදායමක් ලබා ගන්න පුළුවන් වාතාවරණයක් ඇති කරනවාය කියායි. යුද්ධය නිසා රණ විරුවන් 25,000කගේ අත්, පා නැති වුණා. තව 25,000ක් ජීවිතක්ෂයට පත් වුණා. ඒ අයගේ පවුල්වලට ගෙවල් දෙනවාය කිව්වා. තමුන්නාන්සේලා ඒ විධියේ පොරොන්දු විශාල ප්‍රමාණයක් දුන්නා. හැබැයි අද මොකද වෙලා තිබෙන්නේ?

විශේෂයෙන්ම රටේ ආර්ථිකය ගැන, ස්වයංපෝෂණය ගැන ඔබතුමන්ලා කථා කරනවා. සහල්වලින් අපි ස්වයංපෝෂණය වෙලා තිබෙනවා. එහි ගෞරවය එක්සත් ජාතික පක්ෂයටත් හිමි වෙන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය මහවැලියෙන් කරපු ඒ කාර්ය භාරය නොකළා නම් ඔබතුමන්ලාට ලයිට් බිල මෙහෙම නොවෙයි මීට වැඩිය දහ ගුණයකින් වැඩි කරන්න සිද්ධ වෙනවා. චීනය, ආසියාව, ඉන්දියාව බඩ ගාන කාලයේ තමයි එක්සත් ජාතික පක්ෂය ඒවා කරලා මේ රට දියුණු කළේ. අපේ කාලයේ ආවාට ගියාට ණය ගත්තේ නැහැ. මහවැලියට වැය වුණේ ඩොලර් මිලියන 780යි. ඩොලර් මිලියන 350ක් ආධාර වශයෙන් ලැබුණා. ඒවා තනිකර ආධාර, ඒ කියන්නේ ආයෙත් ගෙවන්නේ නැති ආධාර. ඉතිරි ප්‍රමාණය අපි ණය වශයෙන් ගත්තා. ඒ ණය පොලී අනුපාතය වුණේ සියයට 0.8, සියයට 1.2යි, grace period එක අවුරුදු දහයයි. දැන් කෝ මේවාට grace period? අපි මේ කථා කරන්නේ වෛරයෙන්, ක්‍රෝධයෙන් යුතුව නොවෙයි. ඔබතුමන්ලා යම්කිසි හොඳ දෙයක් කළා නම් අපි හැම වෙලාවේම එහි ගෞරවය ආණ්ඩුවට දෙනවා. යුද්ධය සම්බන්ධයෙන් වුණත් එහෙමයි. එහි ගෞරවය මහින්ද රාජපක්ෂ මහත්මයාට, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට, සරත් ෆොන්සේකා මහත්මයාට, රනිල් වික්‍රමසිංහ මහත්මයාට, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය යන ඒ සියලු දෙනාට -ඒ ගෞරවය ලැබිය යුතු සියලු දෙනාට- අපි ඒ ගෞරවය දෙනවා. හැබැයි අපේ රට සහල් සහ බඩ ඉරිඟුවලින් ස්වයංපෝෂිත වුණා හැරෙන්න අපේ රටේ අපනයන භෝගවලට දැන් මොනවාද වෙලා තිබෙන්නේ? මා ඒ පිළිබඳව දත්ත පෙන්නුවා. මොකද වෙලා තිබෙන්නේ? දැන් ඒ වෙළෙඳ පොළ සම්පූර්ණයෙන්ම පහත වැටිලා. කෝෂී මතායි කියන්නේ IMF එකේ ඔබතුමන්ලාගේ හොඳම මිත්‍රයායි. ගරු ඇමතිතුමනි, එතුමා පවසා තිබෙනවා, පිට පිටම අවුරුදු 18ක් රටේ අපනයනය පහත වැටිලාය කියා. රටේ දළ ජාතික නිෂ්පාදිතයත් එක්ක සංසන්දනය කරලා තමයි ඒක ගණනය කරන්නේ. රටේ දළ ජාතික නිෂ්පාදිතයක් එක්ක සංසන්දනය කළාම අවුරුදු 18ක් පිට පිටම අපේ අපනයනය පහත වැටිලා. මොකක්ද මේකට හේතුව? අපට දැන් අපනයන කර්මාන්තයක් නැහැ. අපි නිර්මාණය කරන දේවල් නැහැ. බයිසිකලයක් - push -bicycle එකක්-, මෝටර් සයිකලයක්, කාර් රථයක්, ත්‍රී වීලර් රථයක් නිෂ්පාදනය කරන ආර්ථිකයට අපි නැඹුරු වෙලා නැහැ. ඉදිරි අනාගතයේදී ඔබතුමන්ලා මොකක්ද බලාපොරොත්තු වෙන්නේ? තේ, පොල්, රබර් නිෂ්පාදනයන් සම්බන්ධයෙන් අපේ විශාල බලාපොරොත්තුවක් තිබුණා. ගරු ඇමතිතුමනි, පරීක්ෂා කරලා බැලුවොත්, අද තිබෙන තේ පදුරු අවුරුදු 100කටත් වඩා පැරණියි. අපි අද බංකොලොත්භාවයට පත් වෙලා.

සුද්දෝ ඉතිරි කර ගියා නම් යම් කිසි අපනයන භෝගයක් අපි ඊට පස්සේ ඒ භෝගය දියුණු කර නැහැ. ඔබතුමන්ලා බලාපොරොත්තු වනවා, ඉදිරි අනාගතය සඳහා දියුණු ලෝකයත් සමඟ මේ රට දියුණු කරන්න පුළුවන් කියලා. හැබැයි, එහෙම කරන්න පුළුවන් ශක්තියක් මේ රටට නැහැ. මොකද, අපනයන හා ආනයන අතර විශාල පරතරයක් අද පවතිනවා.

ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමා මේ ගැන පැවසුවා. අපි එතුමාට කාලයක් ලබා දෙනවා. එතුමා අද සීනි කර්මාන්තය භාර ගෙන තිබෙනවා. එතුමා දක්ෂ අමාත්‍යවරයෙක්. එතුමා කරන කාර්ය භාරය සම්බන්ධයෙන් මම හබ කරන්න යන්නේ නැහැ. හැබැයි ඔබතුමන්ලා කරන එක දෙයක් සම්බන්ධයෙන් මම විරුද්ධයි. ඔබතුමන්ලා පෞද්ගලික ආයතන දෙකක් භාර ගත්තා. ඒ භාර ගෙන ඒකේ ස්ථිතු විකුණා ගන්න බැරි වෙන කොට ඔබතුමන්ලා නීති අණපනත් ගෙනෙනවා. මේ අණපනත් ඒ පෞද්ගලික ආයතනවලට, මුලින් හිටපු ඒ පුද්ගලයෝ මේවා නිෂ්පාදනය කරන කොට ගෙනාවේ නැත්තේ ඇයි? ඒ පුද්ගලයන්ටත් මේ ප්‍රශ්නය තිබෙන්න ඇති. [බාධා කිරීමක්] හැරි ජයවර්ධන මහත්තයා. හරි, ප්‍රශ්නයක් තිබෙනවා කියලා කියමුකෝ. ඒ ගැන මම ඔබතුමාත් එක්ක විවාද කරන්න යන්නේ නැහැ. සාධාරණත්වයක් තිබෙනවා, ඔබතුමා කියන කාරණයේ. ඒක නිසා මම අනවශ්‍ය ලෙස විවාදවලට පැටලෙන්නේ නැහැ. [බාධා කිරීමක්] නැහැ, ඇමතිතුමා කිව්ව කාරණය මම හොඳට අහගෙන සිටියා. ඒ නිසා මම ඔබතුමාත් සමඟ විවාද කළේ නැහැ. ඔබතුමා කිව්වා, අතිරික්තයක් තිබුණා, ඒ අතිරික්තය ගත්තාට පස්සේ අවශ්‍ය අනෙක් ප්‍රමාණය ගෙන්වන්න තමයි ඔබතුමන්ලා මේ කාර්ය භාරය සිදු කළේ කියලා. දැන් අපේ ප්‍රශ්නය මේකයි ගරු ඇමතිතුමනි. මම හිතන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ පොරොන්දුව දෙන කොට ඔබතුමා ආණ්ඩුව පැත්තේ සිටියේ නැහැ. එතුමා කිව්වේ, 'මතට තිත' කියනවා කියලා. අපට ප්‍රශ්නය ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පැත්තේ ඉන්න කොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයෝ කරපු දේවල් බොහොම විවේචන කරපු කෙනෙක් නිසයි. කියන දේ නොවෙයි කරන්නේ. 'මතට තිත' කියලා එතුමා කියනවා නම් මේ ජාතික නිෂ්පාදනයෙන් නිෂ්පාදනය වන ස්ථිතු ප්‍රමාණය පමණක් පාවිච්චි-

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මට විනාඩියක් දෙනවාද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
දෙනවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මදාසාර කියන්නේ උක්වලින් සීනි හරි ගස්සලා ඒකේ අතුරුඵලයක්.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔව්, අතුරුඵලයක්.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
තමුන්නාන්සේ කියන්නේ ඒ මදාසාර කානුවේ අරින්න කියලාද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, එහෙම කියන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ඒ මද්‍යසාරවලින් කරන්න පුළුවන් ප්‍රධානම දේ තමයි අරක්කු නිෂ්පාදනය කිරීම. ඒක විය යුතුයි.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඔබතුමා මගේ කථාව අහගෙන සිටියේ නැහැ. ඔබතුමා කියපු කථාවට නේ මම කිව්වේ අතිරික්තයක් තිබෙනවා නම් ඒක ගන්න කියලා. මම කියන්නේ නැහැ, මද්‍යසාර භාවිතය හොඳ නැහැයි කියලා. මගේ විශ්වාසය මම කියන්නම්. එය තව කෙනෙකුගේ මතය අනුව වෙනස් වෙන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදී රටක කාට හෝ මද්‍යසාර පාවිච්චි කරන්න අවශ්‍යතාවක් තිබෙනවා නම් ඒ අයිතිය තිබෙන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. බෞද්ධ දර්ශනයක් එක්ක කොයි ආකාරයෙන් ඒක ගැටෙනවාද කියන එක සම්බන්ධයෙන් මට විග්‍රහයක් කරන්න බැහැ. හැබැයි, මගේ පෞද්ගලික මතය තමයි ප්‍රජාතන්ත්‍රවාදී රටක ඒ අයිතිය තිබිය යුතු බව. එක්සත් ජාතික පක්ෂයේ අපි කිව්වේ නැහැ නේ, මතට තිත තියනවා කියලා. එය අධෛර්යවත් කරන්න, ඒවාට බදු වැඩියෙන් ගහන්න ඒ කාර්ය භාරය අපි එක්සත් ජාතික පක්ෂයෙන් කළා. හැබැයි ජනාධිපතිතුමා රටට පොරොන්දුවක් දුන්නා නේ. එතුමා එක පොරොන්දුවක් නොවෙයි, පොරොන්දු රාශියක් දුන්නා. එතුමා කිව්වා, ජනතාවගේ ජීවන බර අඩු කරනවා; අපනයන වැඩි කරනවා; ඒ වාගේම ආනයන අඩු කරනවා කියලා. අද එතුමා වටා ඉන්න සියලු දෙනා සියලු සම්පත් ලබන්නේ, සුර සැප විඳින්නේ විශේෂයෙන්ම අපේ රණ විරුවන්ට පින් සිද්ධ වෙන්න. ඒ රණ විරුවන්ට ගෙවල් දෙනවා කියලා කිව්වා. ගෙවල් හාරසියයි දීලා තිබෙන්නේ ගරු ඇමතිතුමනි, මේ අවුරුදු පහටම. මොකක්ද මේ ආණ්ඩුව? මෙච්චර මුදල් ප්‍රමාණයක්, මෙච්චර සම්පත් ප්‍රමාණයක් මේ රටේ තිබෙනවා. ඔය කියන ආකාරයෙන් කුඹුරු පනත යටතේ රණ විරුවන්ට, මියගිය රණ විරුවන්ගේ පවුල්වලට කුඹුරු කැල්ලක් දෙන්න තිබුණා නේ. ඒ වාගේම දුබල තත්ත්වයට පත් වෙලා ඉන්නා රණ විරුවන්ගේ පවුල්වලටත් කුඹුරු කැල්ලක් දෙන්න තිබුණා නේ. මේ කාර්ය භාරය මේ අණපනත්වලින් කරන්න තිබුණා නේ. ඔබතුමන්ලා අතින් දෙන්නේ නැහැ නේ. රණ විරුවන්ට දුන්නු පොරොන්දු ඉටු කළාද? නැහැ.

අද ඔබතුමන්ලා යම් කිසි ආකාරයක ආශ්චර්යයක් විඳිනවා නම් එය විඳින්නේ සුළු කොටසක්. ඕනෑ නම් රටේ සීයක් නැත්නම් එකසිය පණහක්. අනෙක් මිනිසුන්ට නීතියක් නැහැ. අනෙක් මිනිසුන්ට මේ රටෙන් ලැබෙන හවිහරණක් නැහැ. කර ගන්න කිසිම දෙයක් නැහැ. බලතල නැත්නම්, ආණ්ඩුවේ ප්‍රධාන පුද්ගලයාගේ සම්බන්ධතාවක් නැත්නම් කිසිම දෙයක් කර ගන්න විධියක් නැහැ. තමන්ට කොයි තරම් උත්සාහයක් ගන්න පුළුවන් වුණත් කර ගන්න බැහැ. මොකද, මේක පාලනය වන්නේ සුළු පිරිසක් අතින්. ඒ පාලනය සුළු පිරිසක් හෝ කරලා හරියට කළා නම් අපේ විවේචනයක් නැහැ. හැබැයි, අද මොකක්ද වෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? රටේ අපි බලාපොරොත්තු වුණ අපනයන ආදායම අවුරුදු දහඅටක් තිස්සේ පහළට වැටෙන්නේ නැහැ, එහෙම නම්. ඒ වාගේම මේ රණ විරුවන්ට ලබා දෙනවායි කියූ ඒ සහන අපි ලබා දෙන්න ඕනෑ. ගෙවල් 400ක් ලබා දීලා අපි නිකම් ඉන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂය ගම් උදාව යටතේ-ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමනි, ඔබතුමා ඒ කාලයේ හිටිය ඇමතිවරයෙක්. ඔබතුමා මේ ගැන දන්නවා. කොහොමද මේ රටේ ජනතාවට ගෙවල් සැපයුවේ කියලා ඔබතුමා දන්නවා. ගෙවල් ලක්ෂ විසිපහක් නොවෙන්න පුළුවන්. සමහර කට්ටිය මේ සංඛ්‍යාව ගැන හබ කරන්න පුළුවන්. අඩුම ගණනේ ඔබතුමන්ලා යන යන තැන තිබෙන්නේ ප්‍රේමදාස මහත්තයා හදපු ගෙවල්. ඒ වාගේමයි මහපොළ, ඒ වාගේමයි ගම් උදාව, ඒ වාගේමයි ඇහලුම් කර්මාන්තය. මෙතුමා කිව්වා, අප රටේ ලක්ෂ හතරකට වැඩිය රැකියා නැති වෙලා තිබෙනවා කියලා. අපනයනයන් සම්බන්ධයෙන් කථා කළොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, GSP සහනය ගැන අපි සුද්දන්ට දිව දික් කරන්නේ නැහැයි කියලා කිව්වා. එතකොට අපේ තිබෙන රැකියා ප්‍රශ්නය කොහොමද අපි විසඳන්නේ? කිරිඇල්ල මහතා කිව්ව ආකාරයට අපේ ඇහලුම් කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් වැසී ගියා. දැන් කවුද ඒවාට වග කියන්නේ? කවුරුත් වග කියන්නේ නැහැ. මොකද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි අනාගතයේදී අපි ණය ගෙවයි. එන අවුරුද්දේත් අපි ණය ගෙවයි. ඊට පස්සේ අවුරුද්දේත් ණය ගෙවයි. හැබැයි ඉදිරි අනාගතයේදී ආර්ථිකයට විශාල ප්‍රශ්නයකට අනිවාර්යයෙන්ම මුහුණ දෙන්න අපට සිදු වෙනවා. මොකද, මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන්, සංචිත ප්‍රමාණය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මේවා ණයට ගත්ත මුදල්. මොකද, අපනයනය අවුරුදු 18ක් තිස්සේ කඩා ගෙන වැටෙන කොට, ආනයනය තව තවත් වැඩි වන කොට පරතරය වැඩි වනවා. එතකොට ඉදිරි අනාගතයේදී විශාල ප්‍රශ්නයක් ඇති වනවා. මා පසු ගිය අය වැය විවාදය අවස්ථාවේදී පෙන්නුවා, අපනයන භෝග නිෂ්පාදනය පහළ වැටී ඇති බව. අය වැය කථාවේදී ජනාධිපතිතුමා තුන් පාරක් බඩ ඉරිහු ගැන කථා කළා. බඩ ඉරිහු අතිරික්තයක් තිබෙනවා. ඒක අප පිළිගන්නවා. රටේ නිෂ්පාදන භෝග කියන්නේ බඩ ඉරිහු පමණක් නොවෙයි. එහෙම නම් කෘෂි කර්මය සම්බන්ධයෙන් රටේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා.

ඔබතුමන්ලා කථා කළා මත්තල ගුවන් තොටුපොළ ගැන. මත්තල ගුවන් තොටුපොළේ තිබෙන අවශ්‍යතාව මොකක්ද? තව runway එකක් අවශ්‍ය නම් අපට රත්මලානේ ඇති කරන්න තිබුණා. නැත්නම් කටුනායක ඇති කරන්න තිබුණා. අද අපි මේ වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් විනාශ කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක සුදු අලියෙකු බවට පත් වෙලා. සියයට 7.2 පොලියට ණය ගැනීමෙන් කොමිස් මුදලක් ලබා ගන්න, ඒකෙන් වෙනත් දෙයක් ලබා ගන්න සුළු පිරිසකගේ වුවමනාවට කළ දෙයක් මිස රටේ ජනතාවට යහපතක් වන දෙයක් නොවෙයි.

අපි හම්බන්තොට වරාය සම්බන්ධයෙන් ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවාම ඇමතිතුමා කිව්වා, ඕනෑ නැවක් එවන්න තෙල් ගහලා පෙන්වන්නම් කියලා. ඒ අසලින් යන කොට හම්බන්තොට වරායට ආපු එක ජාත්‍යන්තර නැවක් ගැන අපට කියන්න. කොළඹට ආපු නැවක් බල කරලා එහාට යැව්වා නම් මිස, ආපු එක නැවක් කියන්න. මොනවාද එදා කිව්වේ? නැව් 400ක් එහා පැත්තෙන් යනවා; දවසකට නැව් 30ක් ආවත් අපට විශාල ආදායමක් එනවා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ බලාපොරොත්තු වුණු ආදායම මේ රටට ලැබෙන්නේ නැහැ. එහෙම නම් ඒක සුදු අලියෙකු බවට පත් වෙලා. ඒක පිළිගන්න ඕනෑ.

ඊළඟට දකුණු අධිවේගී මාර්ගය ගැන කිව්වොත් ඒකෙන් අපට විශාල පාඩුවක් තිබෙනවා. මා සාධාරණව කථා කරන මන්ත්‍රීවරයෙක්. ඒ අධිවේගී මාර්ගය වෙනුවෙන් ලබා ගත් ණය වාගේ පස් ගුණයක ප්‍රමාණයක් අපි ගෙවනවා. ඒකෙන් අපට එන ආදායම පහෙන් එකයි. හැබැයි අපි කියනවා, ඒත් කමක් නැහැ කියලා. මොකද, ඒ මාර්ගය තිබෙනවා. යම් කිසි ආකාරයක ගමනාගමනයක් තිබෙන්න පුළුවන්. ඉදිරි අනාගතයේ යම් කිසි ආදායමක් ලබා ගන්න පුළුවන්. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් විවේචනයක් හැටියට කියන්න පුළුවන්, අපි ඒ පාර වෙනුවෙන් ණය වාගේ පස් ගුණයක් ගෙවනවා; ආදායම වශයෙන් ලැබෙන්නේ පහෙන් එකයි; මේක රටට කරපු අතිවිශාල අපරාධයක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාරක් හැදුවා නම් ඒ පාරෙන් යම් කිසි ප්‍රයෝජනයක් අපට ගන්න පුළුවන්. පාරේ ප්‍රමිතිය වෙනස් වෙන්න පුළුවන්. පාරට වියදම් කළ මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් අපට ප්‍රශ්න තිබෙන්න පුළුවන්. හැබැයි යම් කිසි ආදායමක් ලැබෙනවා වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපි විදුලි බිල ගැන බලමු. ජනාධිපතිතුමා කිව්වා විදුලි බිල වැඩි කළේ නැත්නම් මේ ආර්ථිකය කඩා වැටෙනවා කියලා. එතකොට මොකක්ද මේ ආණ්ඩුව අවුරුදු පහක් තිස්සේ කරපු කාර්ය භාරය? අවුරුදු පහක් නොවෙයි, අවුරුදු 18කට ආසන්න කාලයක් මේ පිරිස ආණ්ඩු කළා. මොනවාද කරලා තිබෙන්නේ? 2001 දී අපට මේ ආණ්ඩුව භාර දෙන කොට තිබුණේ ඍණ 1.5ක ආර්ථිකයක්. අර්ල් ගුණසේකර ඇමතිතුමා, ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමා, ගාමිණී ලොකුගේ ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. මෙතුමන්ලා 2001 දී භාර ගත්තේ ඍණ 1.5ක ආර්ථිකයක්. භාර අරගෙන මොනවාද කළේ? මෙතුමන්ලා අවුරුදු දෙකකින් සියයට 6.8ක් දක්වා ආර්ථික වර්ධනයක් ඇති කළා. අපි හිටියේ නැහැ. අපට ඒකේ credit එක ගන්න බැහැ. හැබැයි එදා එක්සත් ජාතික පක්ෂය අවුරුදු දෙකකින් ඒක කළා. අපි රැකියා නොදුන්නා කියන්න පුළුවන්. රැකියා දෙන්න බැහැ; දෙන්න පුළුවන් තත්ත්වයක්, ආර්ථිකයක් තිබුණේ නැහැ. ඒවා අපේ ආණ්ඩුව අතින් දෙන දේවල්ද? නැහැ. අපි පරිත්‍යාගයක් කළා. අපි රට ගැන හිතුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂය හැම වෙලාවේම රට ගැන හිතුවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා පමණක් නොවෙයි, ප්‍රේමදාස මහත්මයා, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා, ඩඩ්ලි සේනානායක මහත්මයා, ඩී.එස්. සේනානායක මහත්මයා, ජෝන් කොතලාවල මහත්මයා 1948 ඉඳලා කරපු දේවල් සම්බන්ධයෙන් අපි වග කියනවා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට. ඒක අපට ආඩම්බරයක්. අපට ඒ ගැන වග කියන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මා දැක්කා උදේ වාසුදේව නානායක්කාර - [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
වගකීම ගන්නවාද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමාත් අපේ පක්ෂයේ නේ හිටියේ. මා ඔබතුමාගේ පරණ කථාවක් ඇහුවා. ඒකේ ඔබතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

බණින හැටි - [බාධා කිරීමක්] ලජ්ජාවේ බැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ඩාවින්ද කියලා අහනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

චින්තකයෙක්ද කියලා අහනවා. [බාධා කිරීමක්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

මාර චින්තකයෙක් නේ කියනවා. [බාධා කිරීමක්] ඔබතුමා කථා කරන්නේ- [බාධා කිරීමක්] ජනාධිපතිතුමා කියලා ඔබතුමා කියන්නේ නැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කියලා කියන්නේ. [බාධා කිරීමක්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කියලා ඔබතුමා කියන්නේ. අපි එහෙම කථා කරන්නේ නැහැ. එහෙම කථා කරපු එක්කෙනා තමයි අද එහා පැත්තට පැනලා මේ කථා කරන්නේ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

බැන්න හැටි දැක්කා නම් ලජ්ජයි. මම CD එක එවන්නම්. අවුරුදු ගණනකට ඉස්සර වෙලා කරපු කථාවේ CD එක මට හම්බ වුණා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ඩාවින්ද කියලා අහනවා. [බාධා කිරීමක්] මේ චින්තන ඉදිරිපත් කරන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ඩාවින්ද කියලා අහනවා? [බාධා කිරීමක්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ඩාවින්ද කියලා අහනවා. මේ කට අතුල්ලන්න ඕනෑ ගලේ. [බාධා කිරීමක්] අපි කවදාකවත් දේශපාලන නායකයෙකුට එහෙම කථා කරන්නේ නැහැ. මෙතුමා කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න අද මෙතුමන්ලා කෑ ගහනවා; සීනි කිරනවා එහා පැත්තට ගිහිල්ලා. කමක් නැහැ.

විශේෂයෙන්ම ගරු වාසුදේව ඇමතිතුමා කිව්වා බදු ප්‍රතිපත්තියක් අපට ඉදිරිපත් කරන්න කියලා. ඊට පස්සේ අර ඇමතිතුමා කියනවා, "We have our way; you have your say" - "අපි ඉන්නේ ආණ්ඩු පක්ෂයේ; අපට ඕනෑ දේවල් කරනවා; තමුන්නාන්සේලා ඕනෑ නම් විවේචනය කරන්න" කියලා. එතුමා එහෙම කියන ගමන් වාසුදේව නානායක්කාර ඇමතිතුමා එක්සත් ජාතික පක්ෂයේ අපට කියනවා, බදු ප්‍රතිපත්තියක් හදන්න ලු. අපි හදන්න ඕනෑ නැහැ. Stock market එක ගන්නා ආදායමෙන් කිසිම බද්දක් අය කරන්නේ නැහැ. කොළඹ හතේ ඉන්නා ලොක්කෝ, සල්ලිකාරයෝ ටික තමයි ඒකෙන් ආදායමක් ලබන්නේ. හැබැයි ගමේ පාන් කන මනුස්සයා, භූමිතෙල් ටික ගන්නා මනුස්සයා, අනෙකුත් දේවල් මිලට ගන්නා මනුස්සයා විශාල වශයෙන් බදු ගෙවන්න ඕනෑ. ඒ පිරිස සම්බන්ධයෙන් ජනාධිපතිතුමාගේ හිත උණු වන්නේ නැහැ.

[ගරු සුජීව සේනසිංහ මහතා]

විදුලි ගාස්තු බලන්න. අද විදුලි බිල වෙනුවෙන් රුපියල් 5,000ක් ගෙව්වා නම් එන මාසයේ අඩුම ගණනේ රුපියල් 10,000ක් ගෙවන්න වනවා. එතකොට විදුලි බිල පමණක් නොවෙයි නේ වැඩි වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මිනිස්සු ජීවත් වෙන්නේ කොහොමද? පඩිය වශයෙන් ගන්නේ රුපියල් 15,000යි, 25,000යි. හතර දෙනෙක් ජීවත් වන පවුලකට මාසයකට අඩුම වශයෙන් රුපියල් 45,000ක් වියදම් වෙනවා. එතකොට මේ පිරිස ජීවත් වන්නේ කොහොමද? විදුලි බිල රුපියල් 10,000යි. ඒත් එක්ක පාසල් ගාස්තු, බස් ගාස්තු ආදී සියලු දේවල් වැඩි වනවා. අද ආණ්ඩුව බංකොලොත්භාවයට පත් වෙලායි තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඉතාම දුකෙන් කථා කරන්නේ. යුද්ධය අවසන් වුණාට පස්සේ අපි බලාපොරොත්තු වුණු රට නොවෙයි, අපට ඉතිරි වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දූෂණය ඉහ වහා ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම රටේ නීතියක් නැහැ; යහ පාලනයක් නැහැ. ඒ සියලු දේවල් විනාශ වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපේ බෞද්ධාගම ආරක්ෂා කරලා තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Please wind up now.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Please give me one more minute, Sir. දැන් මෙතුමන්ලා බෞද්ධ දර්ශනය සම්බන්ධයෙන්, අපේ ආගම සම්බන්ධයෙන් කථා කරනවා. නමුත් 2013.05.07 වැනි දින colombogazette.com කියන website එකේ "Sean Kingston, Nelly in Sri Lanka" යටතේ මෙහෙම සඳහන් වනවා:

I quote:

"Parliamentarian a National rugby player himself, who is involved with Carlton, tweeted saying that the two big names will be in Sri Lanka for the concert on the 12th of July."

මම නම කියන්නේ නැහැ. මේ අය එවන්නේ කවුද? "Phat Buddha Productions". A List of Satisfied Clients යටතේ "නෙලී" කියන නම ඉහළින්ම තිබෙනවා. මා මෙම ලේඛනය **සභාගත*** කරනවා.

විශේෂයෙන්ම Phat Buddha ප්‍රතිමාවක පින්තූරයකුත් තිබෙනවා. ආරෝහ පරිණාහ දේහයක් තිබෙන, අපි විශ්වාස කරන බුදුන් වහන්සේ සම්බන්ධයෙන් ඇත්තටම අපට මේවා කියන්නත් ලජ්ජයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ බෞද්ධ ධර්මය පිළිබඳව අප දරන ආකල්පය මොකක්ද? මේ පිරිස ගැන මට නම් වශයෙන් කථා කරන්න බැහැ. Phat Buddha Productions, Buddha's Engineers and Buddha's Producers. මට මතකයි "ඒකෝන්" නමැති ගායකයා ලංකාවට ආවා. ඔහු නටන අවස්ථාවේ ඉදිරිපත් කරන පසුතල දර්ශනයන්හි පිටුපසින් මා හිතන හැටියට බුදු හාමුදුරුවන්ගේ පොඩි පින්තූරයක් තිබුණා. එය sponsor කරපු මාධ්‍ය ආයතනයට මේ රටේ විශාල පිරිසක් ගල් ගැහුවා. ඒ ගායකයන් ආණ්ඩුවෙන් තමයි ගෙන්නුවේ. නමුත් ආණ්ඩුව ඇඟ බේරා ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ Nelly සහ Sean Kingston යන දෙදෙනා ඉදිරි අනාගතයේදී කරන කාර්ය භාරය "Phat Buddha Productions" යටතේ සඳහන් වෙනවා. විශේෂයෙන්ම තවත් එකක් තිබෙනවා, "Talk to the Buddha". එම ලේඛනයත් මා **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ආණ්ඩුව බුද්ධාගම ගැන කථා කරනවා, මතට නිත කියනවාය කියනවා, ඒ වාගේම දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කප්පාදු කරනවාය කියනවා, විවෘත ආර්ථිකය නැති කරනවාය කියනවා, ජනාධිපති ක්‍රමය නැති කරනවාය කියනවා, දූෂණය නැති කරනවාය කියනවා. හැබැයි ආසියාවේ කිසිදු රටක් නොකරපු ආකාරයෙන් රට දූෂණය කරන, රට විනාශ කරන ආණ්ඩුව බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Felix Perera. You have 10 minutes.

[අ.භා. 5.17]

ගරු ෆිලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ආහාර ගැන කථා කළා, නායකයන් ගැනත් කථා කළා. එතුමා නායකයන් කාටවත් දොස් කියන්නේ නැහැයි කිව්වාට වර්තමාන නායකත්වය එතුමාට සලකන්නේ නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒකට කමක් නැහැ. හැබැයි ඔය ගොල්ලන්ට අපි ඉන්නවා. භය නැතුව මේ පැත්තට එන්න.

බුදු හාමුදුරුවෝ දේශනා කර තිබෙනවා, "සියල්ලෝම ආහාර නිසා ජීවත් වෙනි" කියලා. ඇත්ත වශයෙන් බලනවා නම්, එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ 2010 සංඛ්‍යා ලේඛන අනුව මිලියන 925ක් ජනතාව කුස ගින්නෙන් ඉන්නවා. ඇමෙරිකාවේ තමයි වැඩිපුර පිරිසක් ඉන්නේ. ඇමෙරිකාවේ එක කොටසකට සල්ලි තියෙනවා. තව කොටසක් කුස ගින්නේ ඉන්නවා. ලෝක ජනගහනයෙන් මිලියන 6.8ක් කුස ගින්නේ ඉන්නවා කියලා තමයි තක්සේරු කරලා තියෙන්නේ. ඉතින් මේ බෙදවාකයට විශාල පිරිසක් ගොදුරු වෙලා ඉන්නවා. කුස ගින්න නිසා මිය යන අවුරුදු 5ට අඩු ළමයින්ගේ සංඛ්‍යාවත් වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එකක් කියන්න ඕනෑ. සියයට 85ක් ගොවීන් සිටින මේ රටේ එහෙම දෙයක් වෙලා නැහැ. කුස ගින්නෙන් ලංකාවේ කවුරුන් හෝ මිය ගොස් තිබෙනවාය කියලා අපි තවමත් අහලා නැහැ. ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය අනුව පොහොර සහනාධාරය ලබා දීම, ඒ වාගේම ගොවියාට නිසි තැන ලබා දීම, ගොවියා සුරක්ෂිත කිරීම හා බැසිල් රාජපක්ෂ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඇමතිතුමාගේ වැඩ පිළිවෙළවල් යන සියල්ලම එකතු වුණාම අපේ ආණ්ඩුව කෘෂි ආර්ථිකයට විශාල ශක්තියක් දීලා තිබෙනවාය කියන එක මතක් කරන්න ඕනෑ.

ඊළඟට ප්‍රවාහන විෂයයට අදාළව මා කථා කරන්න ඕනෑ. සිලින්ඩර ධාරිතාව 1000ට වැඩි වාහනවල බොඩියේ නිර්මාණය වෙනස් කිරීම සඳහා වන ගාස්තුව වැඩි කිරීමට පියවර ගෙන තිබුණත්, ඩිමෝ බට්ටා වැනි පුංචි වාහනවලට ඉස්සර අය කළ මුදල දැන් රුපියල් 500 දක්වා අඩු කර තිබෙනවා.

මේ වාහන දිවි නැඟුම වැඩසටහනට ගොඩක් උදවු වුණා. පුංචි වාහන -සිලින්ඩර ධාරිතාව 1000ට වඩා අඩු වාහන- රැසක් දැන් මේ රටේ ප්‍රයෝජනයට අරගෙන තිබෙනවා. එවැනි වාහනයක body එකේ මොකක් හරි වෙනස්කමක් කරනවා නම් මෙම නියෝග මඟින් අය කරන දඩ මුදල රුපියල් 500 දක්වා අඩු කර තිබෙනවා. වාහනයක් ආනයනය කරලා ලියා පදිංචි කරන්න ඉස්සර දින 30ක් තමයි දීලා තිබුණේ. ඒ දින 30 ඇතුළත ලියා පදිංචි ගාස්තුව ගෙවන්න ඕනෑ. එය දින 90ක් දක්වා වැඩි කර තිබෙනවා. අද ඉදිරිපත් කර ඇති මෝටර් වාහන පනත යටතේ නියෝග මඟින් මෙවැනි සහන දීලා තිබෙනවා. වාහන ලියා පදිංචි කිරීමේ කාල රටාවත් වෙනස් කර තිබෙනවා. ආබාධිත අයගේ වාහන සඳහාත් සහන දීලා තිබෙනවා. මට ඒ විෂයය භාර නිසා මා ඒ ගැන කියන්න ඕනෑ. ආබාධිත පුද්ගලයන්ගේ මෝටර් රථ ලියා පදිංචි කිරීමේ ගාස්තුව ඉතා අඩු මුදලක් යටතේ තියා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විශේෂ යමක් කියන්න තිබෙනවා. ලංකා වාහන ආනයනය කරුවන්ගේ සංගමය විශේෂයෙන්ම ඉල්ලීමක් කෙරුවා. දියුණු රටවල අද නීතියක් තිබෙනවා අවුරුදු 20ට වැඩි වාහන ප්‍රධාන නගරවලට පාවිච්චි කරන්න එපාය කියලා. බස්නාහිර පළාතේ එම වාහන වෙන් කරලා, පැත්තකට දමලා තිබෙනවා. ඒ වෙනුවට වාහනයක් ආනයනය කිරීමේදී සහනයක් දෙන්න කියලා ලංකා වාහන ආනයනය කරුවන්ගේ සංගමය අපෙන් ඉල්ලුවා. දැන් සිංගප්පූරුවේ එය කරනවා. සිංගප්පූරුවේ පරණ වාහන ටික අපනයනය කරද්දි ඒ අයට සහනයක් දෙනවා. මේ රටෙත් අප ඒක කරන්න ඕනෑ. අපට විශාල විදේශ විනිමයක් ගියේ මේ වාගේ අන්තර් භාණ්ඩ ගෙන්වීම සඳහායි. ඉන්ධන, වාහන, පොහොර, ඇඟලුම් නිෂ්පාදනවලට ගන්නා දේවල්, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ අන්තර් භාණ්ඩවලට අයත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා දන්නවා අපේ රටේ පාරවල මුළු ප්‍රමාණය කිලෝමීටර් 1,12,000ක් පමණ වන බව."සැමටම විදුලිය" කියලා අපේ රටේ ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒ වාගේම "සැමටම පාරවල්" කියලා ප්‍රතිපත්තියකුත් තිබෙනවා. අප සෞඛ්‍ය පහසුකම් නොමිලේ ලබා දෙනවා. අධ්‍යාපනය නොමිලේ ලබා දෙනවා. ඒ පැත්තෙන් විශාල සංවර්ධනයක් වෙනවා. ලෝකයේ මෙහෙම සේවාවන් ලබා දෙන වෙන රටක් ගැන කියන්න බලන්න. ඔබතුමන්ලා කල්පනා කර බලන්න වෙන රටවල මෙහෙම තිබෙනවාද කියලා. දැන් අපේ රටේ පාරවල් කාපට් කරනවා කියලා තමුන්නාන්සේලා කෑ ගහනවා. නමුත් කිලෝමීටර් 1,12,000ක් කාපට් දමලා ඉවර වුණාම අප ඒ ප්‍රශ්නය අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපි විදුලිය ගැන බලමු. ඒ කාලයේ මා විදුලිබල නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කරද්දි ජනගහනයෙන් සියයට 60කටවත් විදුලිය ලබා දී තිබුණේ නැහැ. දැන් එය සියයට අනූ ගණනට නැඟලා තිබෙනවා. ලෙනින් කිව්වා සමාජවාදයට වෙනත් වචනයක් කියනවා නම් එය තමයි "විදුලිය" කියලා. ඉතින් විදුලිය සම්පූර්ණයෙන් දෙද්දි අපට තිබෙන ජල ප්‍රමාණයෙන් මෙගාවොට් 1,200ක් විතර තමයි අපට ගන්න පුළුවන් වන්නේ. ඉතිරි ටික අප ගන්න ඕනෑ කොහෙන්ද? එක්කෝ ගල් අඟුරුවලින් ගන්න ඕනෑ. එහෙම නැත්නම් ඉන්ධනවලින් ගන්න ඕනෑ. නමුත් වෙනත් විකල්ප බලශක්තියක් අපට මේකට පාවිච්චි කරන්න වෙනවා. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වුණාම අප මොකද කරන්නේ? එතකොට කොහොමද වැඩ කරන්නේ කියන එක තමුන්නාන්සේලා ප්‍රායෝගිකව කල්පනා කරන්න ඕනෑ. මේ කරුණු කාරණා ගැනත් සිතන්න කියලා තමයි මම කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම single කැබ් රථ ගැනත් කියන්න ඕනෑ. මෙච්චර කාලයක් single කැබ් රථවල දළ බර 3,500ට අඩු නම් ද්විත්ව කාර්ය වාහන ලෙස ලියා පදිංචි කිරීම හේතුවෙන් අර්ධ සුඛෝපභෝගී රථවලට රුපියල් 40,000ක බද්දක් අය කළා. මෙය ගැසට් පත්‍රයෙන් අද ඉවත් කර තිබෙනවා. අප single cab එකක් දිහා බැලුවොත් ඒකේ මිනිස්සු දෙන්නයි යන්නේ කියලා අපට පේනවා. පිටිපස්සේ බඩු දමාගෙන යනවා. පොඩි ටාටා single cab විශාල ප්‍රමාණයක් පොලීසිය පාවිච්චි කරනවා අප දැක්කා. ඒ පොලීසියේ ආරක්ෂාවටයි. පිටිපස්සෙන් ජනතාව නග්ගාගෙන යනවා. ඒ වාගේම army එකේත්, navy එකේත් ඒ වාහන පාවිච්චි කරනවා. ඒකට තිබුණු බද්ද අයින් කර තිබෙනවා. එය ඉතාම හොඳ දෙයක්. අනික් එක තමයි crew cab එක. Crew cab එකක සාමාන්‍යයෙන් ඉස්සරහා driver සහ රිය සහායකයා යනවා. තව කම්කරුවන් දෙන්නෙකුත් දමාගෙන යනවා. අනික් පැත්තෙන් භාණ්ඩ පටවාගෙන යනවා. පුළුවන් නම් මේ වාහනයටත් තිබෙන බද්ද අඩු කර දෙන්න කියලා මා යෝජනා කරනවා. මොකද අපේ රටේ මේ සංවර්ධනය වෙද්දි ප්‍රවාහනය ඉතාම වැදගත් වෙනවා. ප්‍රවාහනයෙන් අද අපට ලොකු සහනයක් ලැබී තිබෙනවා. ගමන් යන්න ගත වන කාලය අඩු වෙලා තිබෙනවා. දැන් පැය දෙකහමාරකින්, තුනකින් කොළඹ සිට අනුරාධපුරයට යන්න පුළුවන්. ඒ විධියට කාලය ගොඩක් අඩු කරන්න පුළුවන් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා මේ යන කාලය ගැන කල්පනා කළොත් මේක නාස්තියක්ද, දූෂණයක්ද, නැත්නම් මේකට අප ආයෝජනය කිරීම වරදක්ද කියන එක ගැන තව පාරක් හිතන්න සිද්ධ වෙනවා. ඇත්ත වශයෙන්ම මගේ පුංචි යෝජනාවක් තිබෙනවා. නොදියුණු රටවලට වාහන අපනයනය - export - කරන්න අපට බැරිද? මොකද, ජපන් වාහනවල Euro standards හතරකට වැඩියි කියලා අප දන්නවා. ඉන්දියාවෙන් ගෙනාපු ඒවායේ Euro standards දෙකයි තිබෙන්නේ. කාලයක් හොඳට පවතිනවා. අවුරුදු පහ, අවුරුදු හතරක් කරපු නිසා මේවායේ මිල වැඩි වෙනවා. එතකොට විදේශ විනිමය වැඩිපුර යනවා.

එම නිසා අප කළ යුත්තේ කුමක්ද? අප කළ යුත්තේ අපේ රටට ඔබින විධියට මේ නීති සකස් කිරීමයි. මේ ගැන පොඩ්ඩක් සිතන්න කියලා මා මේ දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා. පොඩ්ඩක් වැඩි කළාට කමක් නැහැ. මොකද, එන්ජින් එකේ Euro standards වැඩි වුණාම අපට ඒ රථ ආනයනය කිරීමට යන වියදම අඩු කර ගන්නට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දකුණේ හම්බන්තොට වරායේ bonded warehouses හදලා, එතැන කියලා export කරන්න පුළුවන්. මම එක දවසකුත් ඒ ගැන කිව්වා. විශේෂයෙන්ම යුරෝපා රටවලින් ගෙනත් left-hand වාහන right-hand කරනවා නම්, මේ සඳහා පොඩි conversion එකකට ඉඩ දෙනවා නම් අපට ගොඩක් අඩුවට වාහන ලබා ගන්න පුළුවන්. අනෙක් පැත්තෙන් මේවා export කරලා-

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Export කරන්න පුළුවන්, නමුත් register කරන්න බැහැ.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
Export කරන්න බැහැ නේ. Export කරනවා නම් bonded warehouses අපේ රටේ තිබෙන්න ඕනෑ. ඒ සඳහා facility එක

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

දෙන්න ඕනෑ. [බාධා කිරීමක්] Right-hand කළා නම් ආසියාවේ සමහර රටවලට අපට ඒවා export කරන්න පුළුවන්. මියන්මාරයට export කරන්න පුළුවන් නේ. දැන් මියන්මාරය දියුණු වේ ගෙන යනවා. ඒ අය අපට තර්ජනයක් කරනවා. ඒ අය ඇහලුම් කර්මාන්තවලට අඩු මුදලට ශ්‍රමය දීලා අපේ ඇහලුම් කර්මාන්තය ඒ රටට අදිනවා. බංග්ලාදේශයත් එහෙමයි. නමුත් ඒ රටවලට අපි මොනවාද විකුණන්නේ? අප දැන් ඒ රටවලට විකුණන්නට දෙයක් හදා ගන්නට ඕනෑ. කාලානුරූපීව අප හදා ගන්න ඕනෑ. එහිදී ක්ෂණිකව මේ තීන්දු, තීරණ වෙනස් කරමින්, වෙනස් කරමින්, වෙනස් කරමින්, කාලයට අනුරූප වෙමින් කටයුතු කරලා අපේ වපසරිය හදා ගන්නට ඕනෑ. Exports and importsවල වෙළෙඳ පරතය අඩුයි කියලා නේ තමුන්නාන්සේලා කියන්නේ. රට සංවර්ධනය කරද්දී ඒ පරතරයේ පොඩි අඩුවක් තිබෙනවා. නමුත් මේක හදා ගන්න පුළුවන්. වෙනත් රටවල් මේවා හදා ගෙන තිබෙනවා. Nordic system එක නිසා දැන් යුරෝපය කැළඹිලා තිබෙනවා. ඇමෙරිකාව වාගේ සමහර රටවල් කැළඹිලා තිබෙනවා; ඊර්ෂ්‍යා කරලා තිබෙනවා. කොහොමද ඒ රටවල් දියුණු කළේ? පින්ලන්තය වාගේ රටවල් කිහිපයකුත් ඒකට අයිති වෙනවා. ඒ රටවල් දියුණුව ලබා ගෙන තිබෙන්නේ ඒ රටවල තිබෙන දක්ෂතාව සහ ඒ රටවල් නීතිය වෙනස් කරමින් කටයුතු කිරීම නිසායි. අපි හැම දාම එකම නීතියේ ඉන්න ඕනෑ නැහැ. නීතිය වෙනස් කරන්න ඕනෑ, යකඩ නමනවා වාගේ. යකඩ කඩන්නේ නැතිව, -නීතියත් කඩන්නේ නැතිව- යකඩ නැමුවාට කමක් නැහැ කියන එක තමයි මගේ තර්කය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මතක් කරන්නට ඕනෑ තව කාරණයක් තිබෙනවා. විශේෂයෙන්ම මම කාලයක් ධීවර ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. එතැනදී පෙනී ගියා, බඩු භාණ්ඩ නරක් වන්නේ කොහොමද කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, you have one more minute.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

ඒ අනුව freezer trucksවලටත් සහනය දෙන්න. මොකද, අප දන්නවා යෝගට් වාගේ දෙයක්වත් කවදාවත් සාමාන්‍ය වාහනයක ගෙන යන්න බැහැ, නරක් වෙනවා කියලා. අප කොළඹ ඉඳලා ත්‍රිකුණාමලයට යෝගට් අරගෙන ගියොත් ඒවා සම්පූර්ණයෙන් නරක් වෙනවා. මේ නිෂ්පාදන සම්පූර්ණයෙන්ම නරක් වෙනවා. කිරි ආහාර නිෂ්පාදන ගෙන යද්දී ඒවා නරක් වෙනවා. එම නිසා මේවා නිවැරදිව ගෙන යන්න නම්, ඒ freezer trucksවලට සහනයක් දෙන්න ඕනෑ. අවුරුදු 7, 8 වුණත් කමක් නැහැ, - Euro standards වැඩි නිසා, කල් පැවැත්ම වැඩි නිසා - සහනයක් දීලා ඒ කටයුත්ත කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එළවලු transport කිරීමේදී කූඩවල දාලා transport කරන්න කියලා සමහරු කියනවා. නමුත් පිට රටවල මේක කරන්නේ කොහොමද? ඒවා විජලනය නොවන්නට ශීත තත්ත්වය minus යන්නේ නැතිව, plus එකට තියලා ගුණාත්මක භාවයෙන් වැඩි දේවල් ප්‍රවාහනය කරන්න අපට පුළුවන්. අපි මේවා ගැන කල්පනා කරන්න ඕනෑ. අපේ ආර්ථික සංවර්ධනය පිළිබඳව කටයුතු කරන දක්ෂ ඇමතිතුමා -ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා- මේ අවස්ථාවේ සභාවේ නැතුව ඇති. මේවා ගැන කල්පනා කරලා අපට උදව් කරන්න කියලා එතුමාගෙන් ඉල්ලීමක් කරන්න ඕනෑ. එතකොට අපේ රටේ තිබෙන මේ වාගේ ප්‍රශ්න නැති වෙනවා. හුහක් දෙනෙකු කියනවා එළවලු ටික විසි කරලා දානවා කියලා. අපි දැක්කා විසි කරලා දානවා. නමුත් මොන රටේද එහෙම විසි කරලා දාන්නේ? දැන් කොහොමද Winter එකේ අලුත් එළවලු කන්නේ? පිට රටවල Winter එකේ අලුත් එළවලු කනවා. කොහොමද පාවිච්චි කරන්නේ? ඒ අය ඒවා ශීත කරලා තමයි පාවිච්චි කරන්නේ. යම් කිසි උෂ්ණත්වයක තියලා ආයුෂ දික් කරලා, එහෙම නැත්නම් humidifiers කියන එකෙන් fire කරලා විජලනය වන ප්‍රමාණය අඩු කරලා ඒ කටයුත්ත කරන්නට පුළුවන්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, your time is over. Please wind up your speech.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

අපි මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ රටේ පුංචි, පුංචි මිනිසුන් ටිකක් එකතු වෙලා තමයි පාවිච්චි කළ වාහන ආනයනය කරන්නේ. කොම්පැනි හතරක්, පහක් තමයි සම්පූර්ණයෙන්ම අලුත් වාහන ආනයනය කරන්නේ. අලුත් වාහන ගන්න ශක්තියක් නැති මිනිස්සුත් මේ රටේ ඉන්නවානේ. ඒ අයටත් වාහන ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. පිට රට මිනිසුන් ඇඳුම් මාරු කරනවා වාගේ වාහන මාරු කරනවා. අලුත් model එකක් ආවාම එය මාරු කරනවා. අපට ප්‍රශ්නයක් නැහැ. අවුරුදු 4ක්, 5ක් ඒ අය පාවිච්චි කළාට පසු, අඩු mileage එකක් පාවිච්චි කරලා ඒවා ගන්න පුළුවන් නම්, ඒ අවස්ථාව අපේ රටේ ජනතාවට දෙන්න ඕනෑ. ඒ නිසා ඒ අයව සුරක්ෂිත කරන්නට ඉදිරියේදී අපට අලුත් යෝජනා ටිකක් ඉදිරිපත් කරන්නට වෙනවා. ඒ ගැන කල්පනා කරලා කටයුතු කරන්න කියලා ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා.

අනෙක් පැත්තෙන් අද මේ ගත් පියවර ඉතා හොඳයි. තවත් පියවර රැසක් අපි ඉදිරියේදී ගන්නවා. අද තවත් පනතක් යටතේ නියෝග ඉදිරිපත් කරනවා. ඒ පිළිබඳව කථා කරන්නත් මගේ බලාපොරොත්තුවක් තිබෙනවා. අපේ රටේ දැන් පාරවල් හැදිලා. මුළු ජනගහනයෙන් සියයට අනූ ගණනකට lights දීලා තිබෙනවා. ඒ වාගේම දැන් අපේ රටේ එක්කෙනෙක්වත් කුසගින්නේ මිය යන්නේ නැහැ. අපේ රටේ තිබුණු යුද්ධයත් දැන් අවසන් කරලා. අපේ රටේ සමහර අය ළඟ තිබෙන පසුගාමී සිතිවිලි ටික අත් හැර දමා නිකම් බොරු දේවල් කථා කරන්නේ නැතිව, ඉස්සරහට යන මේ රට දියුණු කරන්න අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. P. Harrison. Before he starts, the Hon. Deputy Chairman of Committees will take the Chair.

අනතුරුව ගරු හුනෙයිස් ෆාරූක් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. HUNAIS FAROOK *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

[අ.භා. 5.29]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ගොවිජන සංවර්ධන පනත යටතේ අද ගෙනාපු නියෝග ගැන මම ඉතාම සතුටු වනවා. මම දන්නවා, 1958 ඉඳලා පැවැති හැම රජයක්ම අද ගොවියා ආරක්ෂා කරන්න උත්සාහ කළ බව. ඒ සඳහා විවිධ ක්‍රියා මාර්ග ගත්තා. අද ගෙනාපු මේ නියෝග 2000 වර්ෂයේ සිට අවස්ථා කීපයකදී ඉදිරිපත් කරන්න උත්සාහ කළත්, ඒ සඳහා යම් යම් බාධක ඇති වුණා. හැබැයි, ඒ කොහොම හරි අද ගොවියා ආරක්ෂා කරන්න කටයුතු කරන එක හොඳයි.

අපේ රටේ 275,000ක විතර අද ගොවීන් විශාල පිරිසක් ඉන්නවා. ඒ අය විවිධාකාර අපහසුතාවලට පත් වනවා. විශේෂයෙන්ම ඉඩම් හිමියාගේ යම් යම් බලපෑම් නිසා අද ගොවියා අපහසුතාවලට පත් වනවා. අද ගොවියාගේ අසරණකම ප්‍රයෝජනයට අරගෙන ඒ අය ඉවත් කිරීමට ඉඩම් හිමියා කටයුතු කරනවා. අද ගොවීන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අණපනත් තිබුණත්, සමහර ඒවා හරියට ක්‍රියාත්මක කරන්න නොහැකි වුණා. අද ගොවියාට ලැබෙන ආදායමත්, ඔහුගේ අසරණකමත් නිසා ඔවුන්ට ඒ අණපනත් එක්ක ඉස්සරහට යන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

ඒත් එක්කම මේ නියෝග තුළින් ගෙන එන සංශෝධනවලත් මම දකින තව අඩු පාඩුකම් කිහිපයක් තිබෙනවා. යම්හෙයකින් ඉඩම් හිමියා අද ගොවියාට ඉඩම විකුණන අවස්ථාවකදී, අද ගොවියාට ඉඩම මිලදී ගන්න කියන අවස්ථාවකදී අද ගොවියාට කවදාවත් ඒ ඉඩම මිලදී ගන්න බැහැ. මොකද ඔහු ඉතා අසරණභාවයට පත් වෙලා තමයි ඉන්නේ. අද ගොවියෙකුට ලැබෙන ආදායම බලන කොට පෙනෙනවා, ඔහුට එහෙම දෙයක් කර ගන්න පුළුවන් මුදලක් ලැබෙන්නේ නැති බව. එහෙම අවස්ථාවකදී මේ අය ඉතා අසරණ තත්ත්වයකට පත් වනවා. අද ගෙන ආ නියෝග තුළ වුණත්, අද ගොවියා ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් මම දැක්කේ නැහැ. ඒ වාගේ ඉඩමක් මිලදී ගැනීමකදී බැංකුවකින් ලබා දෙන සහනයක් වාගේ වැඩ පිළිවෙළක් මේ නියෝග තුළත් අඩංගු වෙලා නැහැ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඒත් එක්කම මම තව කරුණක් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපේ ගාමිණී ලොකුගේ ඇමතිතුමාත් ගොවිතැන් කටයුතුවල නිරත වෙලා සිටින කෙනෙක්. අද එතුමාගේ උපන් දිනය. මම එතුමාට සුබ පතනවා. 2011 වර්ෂයේදී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් සිදු කර තිබෙන සමීක්ෂණය අනුව, කුඹුරු හෙක්ටෙයාර එකකින් ලැබෙන උපරිම වී අස්වැන්න හැටියට ඒගොල්ලන් දකින්නේ කිලෝග්‍රෑම් 4,000කට ආසන්න සංඛ්‍යාවක්. කිලෝග්‍රෑම් 4,000ක අස්වැන්නක් ලබා ගෙන ඒ වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 35 ගණනේ විකිණුවත් රුපියල් 140,000ක පමණ මුදලක් තමයි ගොවියකුට ලැබෙන්නේ. ඒක හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කරපු පරීක්ෂණයක්.

ඒ වාගේම, වී කිලෝ එකක සාමාන්‍ය නිෂ්පාදන වියදම 2011 අවුරුද්දේ රුපියල් 22.20ක් විතර වුණා. දැන් අපි තව අවුරුදු දෙකක් ඉස්සරහට ඇවිල්ලා. අද ඊට වැඩියෙන් නිෂ්පාදන වියදම ඉහළ ගිහිල්ලා. මේ විධියට ගොවියකු මාස හයක් තුළදී නිෂ්පාදනය කරන වී කිලෝ එකකට රුපියල් 22.20ක නිෂ්පාදන වියදමක් ගියොත්, වී කිලෝ හාරදහසකට රුපියල් 88,000ක්, රුපියල් 89,000ක් වාගේ මුදලක් තමයි ලැබෙන්නේ. ඒ මුදලින් ගොවියා වියදම් කළ මුදල අඩු කළොත් මාස හයකට ලැබෙන්නේ රුපියල් 51,000යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතකොට එක මාසයකට ලැබෙන්නේ රුපියල් 8,000ක්, 9,000ක් වාගේ මුදලක්. ඉතින්, හතර දෙනෙක් විතර ඉන්න ගොවි පවුලක මාසික වියදම රුපියල් 25,000ක්, 30,000ක් වනකොට ඒ ගොවි පවුලක් ජීවත් වන්නේ කොහොමද, ඒ සම්පූර්ණ ආදායම අරගෙනත්? අද ගොවියාට ලැබෙන්නේ ඒකෙනුත් භාගයයි. ඒ නිසා අද ගොවියාට ලැබෙන මුදල දිහා බැලුවාම, ඔවුන් ජීවත් වනවා කෙසේ වෙතත්, මැරෙනවා හැර වෙන කරන්න දෙයක් නැහැ. ඒ තරම් අසීරු තත්ත්වයකට අද ගොවියා පත් වෙනවා. ඒ නිසා අපි මේ ක්‍රමයේ වෙනසක් ඇති කළ යුතුයි.

මට ඉස්සර වෙලා මැති ඇමතිතුමන්ලා ගණනාවක් පොහොර සහනාධාරය ගැන කථා කළා. පොහොර සහනාධාරය දෙන්න මුලින්ම පටන් ගන්නකොට එක අක්කරයකට පොහොර හොණ්ඩර 10ක් විතර ලබා දුන්නා. දැන් ඒක හොණ්ඩර පහට අඩු කරලා තිබෙනවා. රසායනික පොහොර ලබා දෙන එක ගැන මගේ නම් එච්චර මනාපයක් නැහැ. මොකද, අපේ ප්‍රදේශවල අද ඇති වෙලා තිබෙන භයානක වකුගඩු රෝගයත් එක්ක අපට යම් යම් වෙනත් විකල්පවලට යන්න සිදු වෙලා තිබෙන නිසා. අපේ සාලින්ද දිසානායක මැතිතුමා කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ රසායනික පොහොර පාවිච්චි කිරීම වෙනුවට අලුත් ක්‍රම හඳුන්වා දුන්නා. මම විශේෂයෙන්ම ඒක අගය කරන්න කැමැතියි. රසායනික පොහොර පාවිච්චි නොකර, වස විසෙන් තොරව කුඹුරක ගොවිතැන් ආරම්භ කරන්නේ කොහොමද කියලා එතුමා අලුත් ක්‍රම හඳුන්වා දුන්නා. අවාසනාවකට එතුමාගේ ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්න ඉඩක් දුන්නේ නැහැ. මා දන්නා විධියට එක එක අයගේ බලපෑම් මත ඒක මැකිලා ගියා. හැබැයි, අදටත් ඒ ක්‍රමය අනුගමනය කරන ගොවීන් එය ඉතාම අගය කරලා කථා කරනවා. ඒ විධියට කටයුතු කළා නම් අපේ ප්‍රදේශවල මේ ඇති වෙලා තිබෙන ව්‍යසනයට පිළියමක් යොදා ගන්න තිබුණා.

ඒ විතරක් නොවෙයි, මේ පොහොර සහනාධාරය ගැන ආණ්ඩුව කොච්චර කථා කළත්, අපි දන්නවා දැන් ඒක ක්‍රම ක්‍රමයෙන් අඩුවේගෙන යන බව. ඒකට උත්තරයක් හැටියට කියන්නේ මොකක්ද? මගේ මිත්‍ර එස්.එම්. චන්ද්‍රසේන නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ සිටිනවා. එතුමන්ලා කථා කරන්නේ කොම්පෝස්ට් පොහොර ගැන. කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘති ආරම්භ කරලා, කොම්පෝස්ට් පොහොර යොදන්න ගොවියා හුරු කරවන්න ඕනෑ නිසා තමයි පොහොර සහනාධාරය අඩු කරලා තිබෙන්නේ කියලා එතුමන්ලා කියනවා. ගොවිජන සේවා නියෝජ්‍ය ඇමතිවරයා වන එතුමාට මා මේ කාරණය කියනවා. අපේ තිස්ස කරල්ලියද්ද ඇමතිතුමාගේ ආසනයේ ඇතාකඩ ගොවිජන බල ප්‍රදේශයේ කොම්පෝස්ට් පොහොර හදපු අයට තවම රුපියල් මිලියන 320ක් ගෙවන්න තිබෙනවා.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඒක වැරැදියි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මොකද වැරැදි? [බාධා කිරීමක්] නැහැ, නැහැ, වැරැදි නොවෙයි. මේ පුවත් පතේ තිබෙනවා. මම කියන්නම්. එහෙනම් ඔබතුමා මේ පුවත් පතට ප්‍රකාශයක් යවන්න. [බාධා කිරීමක්] මම කියන්නම්. ඇතාකඩ ගොවිජන බල ප්‍රදේශයේ මෙත්තානන්ද කියන ගොවි මහත්මයා ඇතුළු ගොවීන් ගණනාවක් ජනාධිපති ලේකම් කාර්යාලයට, ඔබතුමාට මේ ගැන දන්වලා තිබෙනවා. විශේෂයෙන්ම මේ අය ඔබතුමාගේ පදනමේ ඉන්න අය. මේ අය එක්සත් ජාතික පාක්ෂිකයෝ නොවෙයි. හැබැයි, ඒ අයට තවම

[ගරු පී. හැරිසන් මහතා]

රුපියල් මිලියන 320ක මුදල ලැබිලා නැහැ. ඒ ගැන මේ පුවත් පතේ සඳහන් කරලා තිබෙනවා. මම පෞද්ගලිකවත් ඒ ගැන දන්නවා. [බාධා කිරීමක්] පදනමේ ඇති. හැබැයි, තවමත් මේ අයට මුදල් ලැබිලා නැහැ. [බාධා කිරීමක්] නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මගේ වෙලාව ගන්න එපා. මට බොහොම පොඩි වෙලාවක් තිබෙන්නේ. [බාධා කිරීමක්] ඒ නිසා ඔබතුමා පසුව පැහැදිලි කරන්න. එහෙම නැත්නම් මේ විවාදයෙන් පසුව අපි දෙදෙනා හමුවෙලා පැහැදිලි කර ගනිමු. රුපියල් මිලියන 320ක් ගෙවන්න තිබෙනවාය කියන එක නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රතික්ෂේප කරනවා නම්, ඔබතුමාට තිබුණා, ඒ ප්‍රකාශය නිවැරදි කරලා පත්තරේට ප්‍රකාශයක් යවන්න. ඒ වාගේම, කාබනික පොහොර හදන්න තමුන්නාන්සේලාට තිබෙන ප්‍රමිතිය මොකක්ද?

දැන් බලන්න, ප්‍රාදේශීය සභාවල කුණු එකතු කරන මධ්‍යස්ථානවලින් කාබනික පෙහොර හදනවා. කාබනික පොහොර කිලෝ එකේ පැකට් තිබෙනවා. මේවා කිලෝ දෙක, තුන, හතර පැකට් කරනවා. මේවායේ ප්ලාස්ටික් කැලිත් තිබෙනවා. [බාධා කිරීමක්] මම ඔබතුමාට දෙන්නම්, මේ කථාවෙන් පස්සේ. කොම්පෝස්ට් පොහොර දෙනවාය කියා කිව්වාට, මේ පොහොරවල ප්ලාස්ටික් කැලිත් තිබෙනවා. සමහර තැන්වල වීදුරු කැලිත් තිබෙනවා. [බාධා කිරීම්] මේවා හරි ප්‍රමිතියකට නැහැ. ඒ වාගේම ප්‍රාදේශීය වශයෙන් සමහර ගොවීන් ලවා හදන කොම්පෝස්ට් පොහොරයි, පළාත් පාලන ආයතනවල හදන පොහොරයි ගොවිතැනට පාවිච්චි කරන්නට පුළුවන්ද කියන එක ප්‍රශ්නයක්. මේවායේ හරි ප්‍රමිතියක් නැහැ. ජනාධිපතිතුමා එක අයවැයකින් විශාල මුදල් ප්‍රමාණයක් මේ කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘති සඳහා වෙන් කළ බව මට මතකයි. හැබැයි එයින් ඇති වෙච්ච ප්‍රගතියක් නැහැ. මා තමුන්නාන්සේට කියන්නම්. සාමාන්‍යයෙන් කොම්පෝස්ට් පොහොර තනිකර යෙදවොත් හොඳ්ධර විස්සක්, විසිපහක් විතර දමන්න ඕනෑ. එහෙම වැඩ පිළිවෙළක් කරන්න මේ ගොවියෝ තවම ශක්තිමත් වෙලා නැහැ. ඒ සඳහා ගරු සාලින්ද දිසානායක ඇමතිතුමා, එතුමාගේ කෘෂිකාර්මික වැඩ සටහනෙන් හොඳ වැඩ පිළිවෙළක් කර ගෙන යනවා. ඒකෙදී මහා පොහොරක් දමන්න වුවමනා වන්නේ නැහැ. හැබැයි ඒකට අප වැඩ පිළිවෙළක් හදන්නට ඕනෑ. එහෙම නැත්නම් ගොවීන්ට දෙන මේ පොහොර සහනාධාරය දැන් ක්‍රමයෙන් අඩු කර, තමුන්නාන්සේලා ගන්නට බලාපොරොත්තු වන වැඩ පිළිවෙළ මොකක්ද කියා අප දැන ගන්නට කැමතියි. මොකද, එක පැත්තකින් පොහොර මිල වැඩි කර තිබෙනවා. අනෙක් පැත්තෙන් පොහොර සහනාධාරයේ පොහොර ප්‍රමාණය ක්‍රමයෙන් දැන් අඩු කර ගෙන යනවා. එම නිසා මේ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. අද වෙළඳ පොළේ පොහොර ගන්නට තැනක් නැහැ. පොහොර ගෙන්වන කොම්පැනිවල අය කියන්නේ, ඒ ගොල්ලන්ට රජයෙන් විශාල මුදලක් ගෙවන්නට තිබෙනවා. ඒ මුදල තවම ගෙවා නැහැ කියලායි. බිලියන 20ක් විතර ගෙවන්නට තිබෙනවා. පොහොර ගෙන්වන ප්‍රධාන සමාගම් තුනකට කථා කළාම ඒ ගොල්ලෝ කියන්නේ," පොහොර ගෙන්වන්නට අපට තවම සල්ලි දීලා නැහැ" කියා යි. එම නිසා රටේම පොහොර හිඟයක් ඇති වෙලා තිබෙනවා. හිටපු ගොවිජන සේවා ඇමතිවරයා හැටියට මා තමුන්නාන්සේට කියනවා, මේ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නටය කියා.

ඊළඟ කාරණය මේ ගොවි විශ්‍රාම වැටුප. විශ්‍රාම වැටුප සම්බන්ධව අවස්ථා ගණනාවකදීම මේ පාර්ලිමේන්තුවේ විවාද කිහිපයක් කළා. 1987 වර්ෂයේදී දිවංගත ගාමණි ජයසූරිය මැතිතුමා මේ විශ්‍රාම වැටුප සද්භාවයෙන් ආරම්භ කළා. සද්භාවයෙන් ආරම්භ කළේ මේ රටේ අනෙක් මිනිසුන්ට වාගේම ගොවියාටත් ඒ අයගේ ජීවිතයේ අවසාන භාගයේදී - වයසට ගියාම - පිහිටක් සරණක් නැති වෙලාවේදී සරණක් වීමේ පරමාර්ථයෙන්. එතැනින් පස්සේ, විවිධ ආණ්ඩු දේශපාලන පොරොන්දු මත එක එක දේවල් කළා. හැබැයි ගොවි විශ්‍රාම වැටුප කඩා වැටුණාට පස්සේ, මේක වැඩි කළ නිසා, අරහෙම වුණා, මෙහෙම වුණාය කියා මේකේ චෝදනාවෙන් ගැලවෙන්නට බැහැ. මට මතකයි, ගරු කථානායකතුමා, ඔබතුමාට ම කිව්වා, " මේ ගැන සොයා බලා කටයුතු කරන්නටය " කියා. ඒ සම්බන්ධයෙන් මොකක් ද කළේ? දැන් අවුරුද්දකට වැඩියි, ගොවි විශ්‍රාම වැටුප නැහැ. හැබැයි ගොවි විශ්‍රාම වැටුප ගෙවන්නේ නැති වුණාට, තවම සාමාජික මුදල් එකතු කරනවා. මේ මිනිස්සුන්ට කවදා ද දෙන්නේ මේ විශ්‍රාම වැටුප. [බාධා කිරීමක්] මම ඒකත් ඔබතුමාට මතක් කරන්නම්.

2011 නොවැම්බර් 22 වනදා සභාව කල්තබන අවස්ථාවේදී ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඔබතුමා මෙහෙම කියනවා. එය 2011 නොවැම්බර් 22 වන දා හැන්සාඩ් වාර්තාවේ 415 වන තීරුවේ සඳහන් වන්නේ මෙන්න මේ විධියටයි:

> " තව සති දෙකක් යයි- මේ සියලු දෙනාටම arrears එක්ක අප විශ්‍රාම වැටුප් අප ලබා දෙනවාය කියන ප්‍රකාශය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි."

එහෙම කියා තිබෙන්නේ 2011 නොවැම්බර් 22 වන දා. “තව සති දෙකයි” කියා තිබෙනවා. ඒත් එක්කම එවකට හිටපු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා ඒ සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණයක් කියා තවදුරටත් මෙසේ කියනවා. එම හැන්සාඩ් වාර්තාවේම 415 වන තීරුවේ එය මෙන්න මෙහෙම සඳහන් වෙනවා:

> "අපේ ඇමතිතුමා කිව්වා වාගේ ඔක්තෝබර් මාසයේ මුදල් ගෙවීම සඳහා වූ කටයුත්තට අද අපට අවස්ථාව ලැබී තිබෙනවා. තැපැල් වර්ජනය අවසන් වීමත් සමඟ ඉතාම ඉක්මනින් මේ කටයුත්තට බහින්නට අවස්ථාව ලැබී තිබෙනවා. තැපැල් කාර්යාල හරහායි මේ මුදල් ගෙවන්නේ. තැපැල් කාර්යාල හරහායි මේ මුදල ගොවීන් අතට පත් වන්නට සලස්වන්නේ."

ඒ මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කියන කථාවක්. මම මේ ප්‍රශ්නය අපේ හිටපු ගොවිජන සේවා හා වනජීවී ඇමතිතුමාගෙන් අහනවා. ඉස්සර කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේයි ගොවි ජනසේවා එකයි, ගොවි විශ්‍රාම වැටුපයි තිබුණේ. අද තමුන්නාන්සේ ගොවිජන සේවා විෂය භාරව ඉන්නවා. ඊට අමතරව කෘෂිකර්ම ඇමතිවරයෙක් ඉන්නවා. තමුන්නාන්සේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේයි ඉන්නේ. ගොවි විශ්‍රාම වැටුප දෙන්නේ මුදල් අමාත්‍යාංශයෙන්. එකට තිබුණු අමාත්‍යාංශය කැලි කැලිවලට කඩලා. ඒ 2011 දී තමුන්නාන්සේ කියපු කථාවක්. [බාධා කිරීමක්] හරි ඇමතිතුමා. ඔබතුමා කිව්වේ, සති දෙකෙන් දෙනවා කියලා. දැන් අවුරුදු එකහමාරක් ගිහිල්ලා තිබෙනවා. මේක මට විතරක් නොවෙයි, ඔබතුමාටත් බලපාන ප්‍රශ්නයක්. ඒක නිසා මේකට හරි වැඩ පිළිවෙළක් සකස් කරන්න. එහෙම නැත්නම් මේ මිනිස්සු අපට සාප කරලායි මැරෙන්නේ.

අපේ සමාජ සේවා ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා රුපියල් දාහ ගණුනේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැඩිහිටියන්ට දාහකට ආධාර වශයෙන් දෙනවා. කිසිම සාමාජික ගාස්තුවක් ගෙවන්නේ නැහැ. හැබැයි එතුමා එතුමාගේ කාර්ය කරනවා. තමුන්නාන්සේ ඒ ප්‍රදේශයේ ඉන්න ගොවි ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයා විතරක් නොවෙයි, ගොවි සංවිධාන භාරව ඉන්න ඇමතිවරයා. ඒ නිසා මේකට මීට වැඩිය වුවමනාවෙන් කටයුතු කෙරුවොත් හොඳයි කියලා මම කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් කිව්වා, අපේ රට සහලින් ස්වයං පෝෂිතයි කියලා. බොහොම හොඳයි. ඒ විතරක් නොවෙයි, අපි බඩ ඉරිගු පිට රට යවනවා කියලා කිව්වා. අපි හාල් පිට රට යවනවා කියලා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හාල් පිට රට යවපු හැටි මම කියන්නම්. "අපනයන

කරපු හාල් ප්‍රතික්ෂේප වෙයි." පොඩි ගණනක් නොවෙයි. වී අළෙවි මණ්ඩලයට කෝටි 120ක පාඩුවක්. මෙන්න ආණ්ඩුව අපනයනය කරපු හැටි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි නිකම් කඩේකට ගිහිල්ලා සීනි කිලෝ එකක්, හාල් කිලෝ එකක් ගෙනෙනවා වාගේ නොවෙයි. හාල් ටික එහාට ගියාට පස්සේ කියනවා, අපේ හාල් reject වුණා කියලා. පොඩි ගණනක් නොවෙයි. කෝටි 120ක්. කාගේ අතටද මේ සල්ලි ගියේ? ඒ විතරක් නොවෙයි, වී අළෙවි මණ්ඩලයේ GM ඇතුළු තවත් කණ්ඩායමක් යවනවා, මේ හාල් reject වුණේ ඇයි කියලා හොයන්න. මේවා කාටද කියන්නේ? තමුන්නාන්සේලා ගොවි විශ්‍රාම වැටුප විධියට රුපියල් දාහක් ගොවියාට දෙන කොට ඒක වෙනුවෙන් හඬ නහනවා. හැබැයි මේ හාල් අපනයනය කිරීම නිසා කෝටි 120ක් පාඩුයි. මෙන්න වෙන දේවල්. මේවාට කවුද වග කියන්නේ? කවුරු අතටද මේ හාල්වල මුදල් ගියේ? මොකද මේ හාල් reject වුණාට පස්සේ තමයි කට්ටිය යවන්නේ මේවාට මොනවාද වුණේ කියලා බලන්න. ඒ විතරක් නොවෙයි, ඊට පසු වැනිදා පත්තරේ තිබෙනවා, ඇමතිගේ හිතවතෙක් මිලියන 420කට විදලා කියලා. මෙන්න වී අළෙවි මණ්ඩලය වී ගත්තු හැටි. අපි සහලින් පෝෂණය වුණාය කියලා රටට අඩ බෙර ගහලා කිව්වා. හැබැයි පිට රට යවපු හාල් ටික reject වෙලා. ඒවා reject වෙලා විතරක් නොවෙයි, ඇමතිගේ හිතවතෙකුට මිලියන 426ක්. මේවා වැරදියි කියනවාද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි විශේෂයෙන්ම මෙතුමන්ට මතක් කරන්නේ, මේ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලායි. ගරු එස්.එම්. චන්ද්‍රසේන නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහනවා, තමුන්නාන්සේලා ඉදිරියේදී පොහොර දෙන්නත් quota ක්‍රමයක් හදා ගෙන යනවා නේද කියලා. ඒකට අපට හරි උත්තරයක් දෙන්න ඕනෑ. මොකද රටේ පොහොර හිඟයක් තිබෙනවා. අපට ඒ සම්බන්ධයෙන් ආරංචියක් තිබෙනවා. ඒ ඒ සමාගම්වලට කථා කරලා පොහොර නැත්තේ ඇයි කියලා ඇහුවාම ඔවුන් කියනවා ඔබතුමන්ලා මේ quota ක්‍රමයක් හදන්න යනවාය කියලා. මොකද පොහොර සහනාධාරය දෙනවා කියලා සහනාධාරය මුවාවෙන් පොහොර ප්‍රමාණය අඩු කරලා ඒකට සමාගම්වලට වෙනම quota ක්‍රමයක් දීලා මේ වැඩ කටයුත්ත කරන්න යනවාද කියන එකත් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Lalith Dissanayake. You have 10 minutes.

[අ.භා. 5.48]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂය සුපුරුදු පරිදි "නැහැ" කියන එහෙම නැත්නම් හැම වෙලාවේම කියන "නැත" කියන ප්‍රතිපත්තිය තුළ ඉඳන් තමයි කටයුතු කරන්නේ; කථා කරන්නේ. එක්සත් ජාතික පක්ෂයේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා එක්සත් ජාතික පක්ෂයේ නායකයා කවරෙකු වුණත් ඒ කරන දේවල් ඒ ආකාරයෙන් පිළිගන්නවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ පළමුව බිහි වුණේ එක්සත් ජාතික පක්ෂ රජයක්. නමුත් ඒ එක්සත් ජාතික පක්ෂ රජය තුළ, නැත්නම් ඒ වකවානුව තුළ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේවත් මේ රටේ අද ගොවියා වෙනුවෙන් පනතක් ගෙනාවේ නැහැ. ඒ පනත ගෙනාවේ 1956 දිවංගත එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ රජය යටතේ ගරු පිලිප් ගුණවර්ධන ඇමතිතුමා. එහෙම නම් මේ රටේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන් යම් කිසි සේවාවක් කළා නම් කර තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ වමේ ආණ්ඩුවයි කියන එක අපි කියන්න ඕනෑ. විශේෂයෙන්ම 1956 එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් එදා ඒ ඇති කළ අරගළය තුළ නැත්නම් වෙනස් වූ ඒ සමාජ පෙරළිය තුළයි කියන එක අපි කියන්න ඕනෑ.

මේ රටේ හදවතක් බඳු වරාය එදා ජනසතු කළා. ඒ වාගේම මේ රටේ ජාතික ප්‍රවාහන පද්ධතියක් ඇති කළා. ඒ වාගේම මේ රටේ විද්‍යෝදය, විද්‍යාලංකාර වැනි පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත් කළා. මැයි දිනය නිවාඩු දිනයක් බවට පත් කළා. එතකොට මේ වාගේ වෙනසක් ඇති කර තිබෙන්නේ, මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධාන රජයන් යටතේයි කියන එක අපි කියන්න ඕනෑ. ඒ වාගේම මේ රටට කීර්තියක් ගෙන දෙන රක්ෂණ සංස්ථාව, බනිජ තෙල් නීතිගත සංස්ථාව වැනි ආයතන මේ රටේ බිහි වුණේ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය කාලයේ. ඒ වාගේම යාපනය විශ්වවිද්‍යාලය වාගේ විශ්වවිද්‍යාල ආයතන මේ රටේ ඇති වුණා. ඒ නිසා මේ රටට යම් කිසි ඵලදායී සේවාවක් ඉටු වුණා නම් ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධාන රජයන් යටතේයි කියන එක ඉතිහාසයේ ලියැවිලා තිබෙනවා. ඒක කාටවත් වෙනස් කරන්න බැහැ. නමුත් විපක්ෂය හැම වෙලාවේම උත්සාහ කරනවා මේ රටේ සංවර්ධනයක් ඇති වෙලා නැහැ කියා පෙන්වන්න.

2002 වර්ෂයේදී සියයට 22.7ක් වශයෙන් තිබුණු මේ රටේ සාමාන්‍ය දරිද්‍රතාව 2006, 2007 වන කොට සියයට 15.2 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම 2009, 2010 කාලය වන කොට ඒ ප්‍රමාණය සියයට 8.9 දක්වා පහත වැටිලා තිබෙනවා. එතකොට දරිද්‍රතාව පහත වැටෙනවා කියන්නේ, ජනතාවගේ පැත්තෙන් ගත්තාම ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් ඉහළ යන තත්ත්වයක් තිබෙනවා කියන එකයි. අද මේ රටේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 2930 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. මේකට විවිධ විවේචන තිබෙනවා. නමුත් දළ ජාතික නිෂ්පාදිතය ජනගහනයෙන් බෙදලායි ඒක පුද්ගල ආදායම ගණනය කරන්නේ. මේක එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයට ඕනෑ විධියට ගණනය කළ දෙයක් නොවෙයි. ලෝකයේ සම්මතයන් තිබෙනවා. ඒ සම්මතයන්ට අනුවයි මේ ඒක පුද්ගල ආදායම ගණනය කර තිබෙන්නේ. ඒක අපට ඕනෑ විධියට හදන්න බැහැ. ඒක ලෝකයේ පිළිගත් සම්ප්‍රදායන්ට, නිර්ණායකයන්ට අනුවයි හදලා තිබෙන්නේ. එහෙම නම් මේක මේ රටේ ඇති වෙලා තිබෙන සංවර්ධනයක්. ඒ නිසා අද මේ රටේ ඒක පුද්ගල ආදායම ඒ තත්ත්වයට වැඩි වෙලා තිබෙන බව කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් පිළිගන්න වෙනවා. ඒ වාගේම 2020 වන කොට මේක ඇමෙරිකානු ඩොලර් 4000 දක්වා වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා.

ඊළඟට, අද උද්ධමනය තනි ඉලක්කමක පවතිනවා. අපි මීට පෙර නොයෙක් ආණ්ඩු තුළ කටයුතු කළා. ඒ වාගේම විපක්ෂය තුළ හිටියා. මීට පෙර මේ අගය පැවතියේ ඉලක්කම් දෙකක. නමුත් අපේ රජය තුළ, වසර ගණනාවක සිට මෙම අගය තනි ඉලක්කමක පවත්වාගෙන එන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. උද්ධමනය අඩු වෙනවා කියන්නේ රටේ ජනතාවගේ දරිද්‍රතාව අඩු වෙනවා කියන එක. ඒක අපි පිළිගන්න ඕනෑ. ඒක විවේචනය කරලා වැඩක් නැහැ. මොකද, රජයට පුළුවන්කම ලැබිලා තිබෙනවා මොන ප්‍රශ්න ආවත් උද්ධමන වේගය පාලනය කරගෙන යන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම විරැකියා අනුපාතය අද පහළ අගයක පවතිනවා. එදා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ කාලයේ, එහෙම නැත්නම් අන්තිමට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පැවැති කාලයේ 16/1 චක්‍රලේඛනය ගෙනැල්ලා රෝහලක විශ්‍රාම යන ගිලන් රථ රියැදුරෙකු

[ගරු ලලිත් දිසානායක මහතා]

වෙනුවෙන්වත් කෙනකු බඳවා ගත්තේ නැහැ. අද ඒ අය කෑ ගැහුවාට එදා සෞඛ්‍ය කම්කරුවන් බඳවා ගත්තේ නැහැ; හෙදියන් බඳවා ගත්තේ නැහැ. නමුත් අපේ රජය යටතේ සෞඛ්‍ය අංශයට බඳවා ගැනීම විතරක් නොවෙයි, අද 50,000කට වැඩි උපාධිධාරීන් සංඛ්‍යාවක් බඳවා ගෙන එලදායීතා සේවයට යොදවා තිබෙනවා. නමුත් ඒකට විවිධ චෝදනාවන් එල්ල වුණා. ඒ අයට රුපියල් 10,000යි ගෙවන්නේ කියලා කියනවා. මට අද කියන්න සතුටුයි, මගේ කොටියාසයේ ප්‍රාදේශීය ලේකම්තුමා අද උදේ මට දුරකථනයෙන් දැනුම් දුන්නා, මගේ ආසනය තුළ ඉන්න අයගෙන් 160කට ස්ථිර පත්වීම් ලබා දෙන්න මේ වන විට කටයුතු කරනවා කියලා. මේ අපේ උගත් පරපුර. එහෙම නම් සියයට 4.5 දක්වා විරැකියා අනුපාතය අඩු කර තිබෙනවා කියන්නේ අපි දරිද්‍රතාව අඩු කරන්න දායක වෙලා තිබෙනවා කියන එකයි.

එහෙම නම් ඒ දර්ශකයන් හරි. අද උපාධිධාරීන්ට පත්වීම් ලැබී තිබෙන බව කවුරුත් දන්නවා. රාජ්‍ය සේවය කප්පාදු කළ යුගයක් කලින් තිබුණේ. එක්සත් ජාතික පක්ෂයේ අවසාන ආණ්ඩු කාලයේ රාජ්‍ය සේවයට කට්ටිය බඳවා ගත්තේ නැහැ. නමුත් අපට පුළුවන්කම ලැබුණා, ඒ විධියට බඳවා ගැනීම සඳහා කටයුතු කරන්නට. ඒ නිසා තමයි අපි කියන්නේ, මේ රටේ සැබෑ සංවර්ධනයක් තිබෙනවාය කියලා. ජනගහනය මිලියන 20ක් ඉන්න කොට, ජංගම දුරකථන මිලියන 25කට වැඩි සංඛ්‍යාවක් අද පාවිච්චි කරනවා. අඩුම ගණනේ ජංගම දුරකථන බිලක් රුපියල් 500 ගණනේ බැලුවත් කී දෙනෙක් ඒ බිල ගෙවනවාද? ජනතාව කන්න බොන්න නැතිව බඩගින්නේ මියැදෙන්නේ නැහැ. ජංගම දුරකථන බිල අඩුම ගණනේ රුපියල් 1000ක්වත් එනවා. එහෙම නම් මේ රටේ සංවර්ධනයක් නැහැයි කියලා කියන්න බැහැ. අද ගමකට ගියොත් ත්‍රී වීලර් රථ කොච්චර තිබෙනවාද? අන්න ඒවායින් තමයි සංවර්ධනය බලන්න ඕනෑ. ඩිමෝ බට්ටෝ කීයක් තිබෙනවාද? අද කී දෙනෙක් ස්වයං රැකියා කරනවාද? මෙන්න මේක තමයි අපේ රටේ ශක්තිය. මොකද, එක්සත් ජාතික පක්ෂය බලාපොරොත්තු වන ආකාරයේ සංවර්ධනයක් නොවෙයි, අපි ගමට දැනෙන සංවර්ධනයක් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දිවි නැඟුම යටතේ අපි විශාල ආයෝජනයක් කර තිබෙනවා. 2011 වර්ෂයේදී දිවි නැඟුම වෙනුවෙන් රුපියල් බිලියන 4.4ක් ආයෝජනය කර තිබෙනවා. 2012 දී රුපියල් බිලියන 6.5ක් ආයෝජනය කර තිබෙනවා. මේකෙන් අපි බලාපොරොත්තු වන්නේ මොකක්ද? රටක් ශක්තිමත්ව ගෙන යන්න පුළුවන් වන්නේ විශාල කර්මාන්ත ආරම්භ කිරීමෙන් පමණක් නොවෙයි. ග්‍රාමීය මට්ටමේ පවුල් ඒකක සංවර්ධනය කිරීම තමයි අපි කරන්න ඕනෑ. අපි දිවි නැඟුම ව්‍යාපාරය ආරම්භ කර තිබෙන්නේ ඒකටයි. ප්‍රධාන අරමුණු කිහිපයක් තිබෙනවා. එයින් ප්‍රධානම අරමුණක් තමයි ගෙවත්ත ඵලදායීව කාර්යක්ෂමව සංවර්ධනය කිරීම. ඒ වාගේම පවුල්වල පෝෂණය සහ පවුල්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම, ඒ වාගේම කුඩා ප්‍රමාණයේ බිම් කොටස් ගොවි පොළවල් බවට පත් කරලා ග්‍රාමීය මට්ටමේ නිෂ්පාදන ඉහළ දැමීම. ඒක තමයි අපි කරන්න බලාපොරොත්තු වුණේ. ඒ සඳහා අපි ක්‍රමවත් වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවා. 2012 වසරේ සිට අදියර හතරක් යටතේ මෙහි වැඩ ආරම්භ කර තිබෙනවා. ඒ අනුව දිවි නැඟුම වැඩ සටහන යටතේ මේ වන විට බීජ කට්ටල ලක්ෂ 111ක් ලබා දී තිබෙනවා. ඒ නිසා තමයි එළවලු නිෂ්පාදනය වැඩි වෙලා තිබෙන්නේ. පසු ගිය සිංහල අවුරුදු කාලයේ අපි ගම්වල දිවි නැඟුම පොළවල් ආරම්භ කළා. ඒ තුළින් සිංහල අලුත් අවුරුදු කාලයේ එළවලු මිල අහස උසට යන්න දෙන්නේ නැතිව සහන මිලකට ලබා ගෙන ජනතාවගේ ජීවන මට්ටම උසස් තත්ත්වයෙන් පවත්වා ගෙන යන්න පුළුවන්කම ලැබුණා.

ඒ විතරක් නොවෙයි, අපි 2012 වසර අවසාන වන විට පොල් පැළ 43,45,628ක් බෙදා දී තිබෙනවා. පොල් ගෙඩිය රුපියල් 65ට ගිය කාලයක් තිබුණා. රුපියල් 80ට ගිය කාලයක් තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි හැම ගෙදරකම උදේට පොල් ගෙඩියක් ගාලා වැංජනවලට පොල් කිරි ටිකක් දමනවා. මේක අපේ දේශීය අවශ්‍යතාව. එහෙම නම් ඒ දේශීය අවශ්‍යතාවන් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ යටතේ ග්‍රාමීය පවුල් ආශ්‍රිතව කුඩා ගෙවතු හැටියට වගා කළ බිම් ප්‍රමාණය ගත්තොත් අක්කර 89,734ක්. පලතුරු වගාව සඳහා පලතුරු පැළ 57,60,873ක් දීලා තිබෙනවා. එළවලු පැළ 32,73,285ක් දීලා තිබෙනවා. ඒ වාගේම ඖෂධ පැළ වර්ග 12,04493ක් ලබා දී තිබෙනවා. මේ තුළින් අපි බලාපොරොත්තු වන්නේ ග්‍රාමීය නිෂ්පාදනය වැඩි දියුණු කිරීමයි. ග්‍රාමීය වශයෙන් කුඩා පවුලේ ආර්ථිකය වර්ධනය කිරීමට තමයි අපි මේ කටයුතු කරන්නේ. මේ වගාවන්ට අමතරව රටකජු, මුංඇට, උළුඳු, තල, මිරිස් ආදිය වගා කරලා ඒවා ආනයනය කරන්නට ගිය වියදම රුපියල් මිලියන 35ක් පමණ මුදලක් ඉතිරි කර ගන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. මෙන්න මේක තමයි අපි බලාපොරොත්තු වන දේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ගෘහස්ථ කර්මාන්ත අංශය දියුණු කර, ආහාර නිෂ්පාදන අංශයේ කර්මාන්ත 1265ක් ආරම්භ කර තිබෙනවා. ඇහලුම් ආශ්‍රිත ගෘහ කර්මාන්ත 252ක් ආරම්භ කර තිබෙනවා. මැටි ආශ්‍රිත කර්මාන්ත 563ක් ආරම්භ කර තිබෙනවා. මෙන්න මේ විධියට ග්‍රාමීය, නැත්නම් ගම ශක්තිමත් කරන, කුඩා පවුල් ශක්තිමත් කරන කර්මාන්ත ආරම්භ කිරීම තුළ අපි මේ රටේ ආර්ථිකයට දායකත්වය ලබා දී තිබෙනවා. ඒ නිසා මේ අය අද මොන කරුණු කාරණා කිව්වත් මේ ගමන අපි ශක්තිමත්ව ඉදිරියට යනවාය කියන එක අපි කියන්න ඕනෑ. මේ අය බලාපොරොත්තු වන්නේ ආණ්ඩුව වැටෙයි කියලායි. කොච්චර ඡන්ද තිබුණත්අපි ජයග්‍රහණය කරනවා.

අවසාන වශයෙන් මා එක දෙයක් කියනවා. පසු ගිය මැයි දිනයේදී එක්සත් ජාතික පක්ෂයට බැරි වුණා ජනතාව එක තැනකට රැස් කරන්න. නමුත් එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපි ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් ගෙනැල්ලා තහවුරු කළා, මෙන්න මේක තමයි ගම ශක්තිමත් කිරීමේ ප්‍රතිඵලය කියන එක. ජන බලය තිබෙන්නේ අපේ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයට හැරෙන්න වෙනත් කෙනකුට නොවෙයි කියන එක කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 5.59]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කර තිබෙන මේ නියෝග ගැන එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට මම අදහස් කරනවා. මට පෙර කථා කරපු අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දැක්වූ අදහස් ගැන නැවත කථා කරන්නේ නැතිව අපනයන ක්ෂේත්‍රය ගැන කථා කිරීමටයි මා අදහස් කරන්නේ. මට පෙර කථා කරපු, ආණ්ඩු පක්ෂයේ ගරු මැති ඇමතිතුමන්ලා දෙපළ රටේ ආර්ථිකය සවි ශක්තිමත් මට්ටමක තිබෙනවා කියන එක පෙන්නුවා. ඒක එතුමන්ලාගේ කාර්ය භාරය. දැන් විපක්ෂය ඒ ගැන කථා කළොත් හිතන්නේ විපක්ෂයක් වශයෙන් කරන්නේ ඒ නහපු තර්ක බිඳ දමන එක විතරයි කියලායි. මා කාරුණිකව ඉල්ලන්නේ එහෙම හිතන්න එපා කියලායි.

ඇහලුම් කර්මාන්ත 251ක් වර්ධනය වෙලා තිබෙනවා කියලා කිව්වා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු මන්ත්‍රීතුමා, මට යම් නිවැරැදි කිරීමක් කරන්න ඕනෑ. මා ඇහලුම් කර්මාන්ත කියලා අදහස් කළේ ගෘහ ආශ්‍රිත කර්මාන්තයි. ලොකු කර්මාන්ත ගැන නොවෙයි. දිවි නැහුම මඟින් අපි බලාපොරොත්තු වන්නේ ලොකු ඇහලුම් කර්මාන්ත නොවෙයි, ග්‍රාමීය මට්ටමේ ගෘහ ආශ්‍රිත කර්මාන්ත දියුණු කිරීමයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අගය කරනවා, ඒ නිවැරැදි කිරීම. ඒ කියපු විධියට එතුමන්ලාගේ අදහස වන්නේ හයහත්සියයක් වැඩ කරන කොම්පැනි කුඩුපට්ටන් කරලා දෙන්නෙකු, තුන්දෙනෙකු වැඩ කරන ඒවා ඇති කරන එකයි. එවැන්නක් තමයි පෙන්නා දුන්නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

නැහැ, නැහැ. ඔක තමුන්නාන්සේ කියන එකයි. ඔක නොවෙයි මා කිව්වේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම නැවත සංඛ්‍යා ලේඛන මඟින් එය ඔප්පු කරන්නම්. මා වෙළඳ ඇමති වශයෙන් 2004 දී අමාත්‍යාංශය භාර දෙන කොට ඇහලුම් කර්මාන්තශාලා 684ක් තිබුණා. 499,000ක් වැඩ කරපු ඇහලුම් ක්ෂේත්‍රය අද කොම්පැනි 199කට අඩු වෙලා ඒවායෙහි වැඩ කරන සේවක පිරිස 174,000කට අඩු වෙලා තිබෙනවා. මේකද රටේ සංවර්ධනය කියන්නේ? මේ සංඛ්‍යා ලේඛන ගැන මා නැවත මතක් කරන්න අවශ්‍ය නැහැ. ඔබතුමන්ලාගේ කොම්පැනි 259ක් ගැන -ගෘහස්ථ මට්ටමේ හෝ වෙනත් මට්ටමක- කිව්වාට ඒවායේ වටිනාකමක් තිබෙන්න ඕනෑ. මෙහිදී අපේ සහ ඔබතුමන්ලාගේ තර්ක විතර්ක නොවෙයි වැදගත් වන්නේ. රටේ ආර්ථිකය නිවැරැදි මට්ටමක යනවාද නැද්ද කියන එකයි වැදගත් වන්නේ. මෙතැනදී මගේ මිත්‍ර තලතා අතුකෝරල මැතිනිය වැදගත් දෙයක් මතක් කළා.

අද ඉදිරිපත් කරපු නියෝග පනත් තුනකට අදාළයි. හැබැයි ඒවා ඇමතිවරු තුන්දෙනෙකුයි ගෙනැවිත් තිබෙන්නේ. සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය ගෙනෙන්න ඕනෑ නියෝග මුදල් අමාත්‍යාංශය ගෙනෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ගෙනෙන්න ඕනෑ නියෝග ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ගෙනෙනවා. ඉතින් මේවා ඔක්කෝම එක තැනකට ඒක රාශි කරලා විශ්වාසය තබලා ගෙනෙන්නේ නැතිව වෙනත් අමාත්‍යාංශයක් මඟින් ගෙනෙන එක තමයි මේ කරලා තිබෙන්නේ. අපේ ප්‍රවාහන ඇමති ගැන නම් හොඳට විශ්වාස කරන නිසා මෝටර් වාහන පනත යටතේ නියෝග ගෙන එන්න එතුමාටම කියලා තිබෙනවා. ඉතින් අපි අගය කරනවා කුමාර වෙල්ගම ඇමතිතුමා තැන රැකගෙන වැඩ කිරීම ගැන. නමුත් මේක විහිළුවක්. ඇමතිවරු 65දෙනෙකු තියා ගෙන තුන්හතර දෙනකු කේන්ද්‍ර කරගෙන මොකක්ද මේ කරන්නේ? කෘෂිකර්ම ඇමති දැන් කලබලේ එනවා. ඒ, එතුමාට තිබෙන ටිකත් නැති වෙයි කියන බයටයි. කෘෂිකර්ම ඇමතිතුමනි, ඔබතුමාට මේ වාගේ දෙයක් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා එය ක්‍රියාත්මක කරනවාද නැද්ද කියලා කියන්න බැරි නම් මොකටද කෘෂිකර්ම title එක? මා ඒ ගැන වැඩිපුර කථා කරන්න යන්නේ නැහැ. එය ඔබතුමාගේ අතේ නොවෙයි තිබෙන්නේ ගරු ඇමතිතුමනි. අපට කියන්න සිදු වන්නේ, මේක තමයි විහිළුකාර තත්ත්වය කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහිදී මෝටර් වාහන පනත යටතේ නියෝග ගැන කථා කළා. ඒක බොහොම හොඳයි. නමුත් ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තියේ වෙනස මේකයි. කී දෙනෙකු සීසී 1000ට වඩා වැඩි bikes පාවිච්චි කරනවාද? ඒවා බදු රහිතව ගෙනෙනවා. නමුත් අහිංසක ත්‍රිරෝද රථ හිමියන්ට රුපියල් 50,000ක් වැඩියෙන් ගෙවන්න වෙනවා. ඇයි ඒ?ඒවා බදු. ඒ විතරක් නොවෙයි. මේ ඔක්කෝම හම්බන්තොට වරායට ගිහිල්ලා එනකොට -වහලා තිබෙන වරායෙන් ගෙනෙන කොට- තවත් රුපියල් 30,000ක් වැඩි වෙනවා. මෙන්න ඔබතුමන්ලාගේ ආර්ථික වර්ධනය. මේ රටේ එක නගරයක් දියුණු කරලා රටම නැති වුණත් කමක් නැහැ කියන ප්‍රතිපත්තිය තමයි අනුගමනය කරන්නේ. එහි ප්‍රයෝජනය රටටම බලපානවා නම් කමක් නැහැ. එහෙම නම් අපේ කැමැත්තක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඒක පුද්ගල ආදායම ගැන මෙහිදී කථා කළා. එය වැඩි වුණා කියලා කිව්වා. ඒක පුද්ගල ආදායම විධියට අවුරුද්දකට ඇමෙරිකන් ඩොලර් 2,900ක් උපයනවා නම් මාසයකට ඇමෙරිකන් ඩොලර් 254යි නේ. එහෙම නම්, විදුලි බිලට ඩොලර් තුනක් ගෙවන්න බැරි වන්නේ ඇයි? විහිළුවක් නේ. එවැනි ආදායමක් උපයන්නේ නැති නිසා තමයි එය ගෙවන්න අමාරු වන්නේ. අද මේ ගැන හැම දෙනාම කථා කරන්නේ ප්‍රශ්නයක් තිබෙන නිසායි. මහ බැංකුවේ අධිපතිගේ විජ්ඡාවක් තුළින් සංඛ්‍යා ලේඛන අලුත්වැඩියා කරලා ලෝකයට පෙන්නලා ලංකාව ඊට වෙනස් ගමනක් ගෙන යන එක තමයි කරන්නේ. නමුත් ඊට වඩා හාත් පසින් වෙනස් දෙයක් ගැන, එනම් අපනයනය ගැන කථා කරන්න තමයි මා මෙහිදී බලාපොරොත්තු වන්නේ. මොකද, රටේ අපනයනය භයානක තත්ත්වයකයි තිබෙන්නේ. Duty free පදනම මත මේ රටට bikes ගේනවා නම්, ඇයි දෙවියනේ අපනයන ක්ෂේත්‍රයේ රස්සා ඇති කරන කර්මාන්ත, හදන ගොඩනැඟිලි වැට බද්දෙන් ඉවත් කරන්න බැරි? ඇයි ඒකේ PAL සහ Port Levy ඉවත් කරන්න බැරි? ඒවා ලක්ෂ ගණන් තිබෙනවා. ඒ වාගේ ලොකු bikes ගේන්නේ ලක්ෂපතියෝ. ඒ අයට සියයට සියයක්ම බදු පැනෙච්චත් මොකද වෙන්නේ? ඇයි ඒවායේ බදු ඉවත් කරලා තිබෙන්නේ?

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා දක්ෂයි. මම ඒක කියන්න ඕනෑ ඉස්සෙල්ලාම. මම ඔබතුමාගේ විශේෂත්වයක් දැක්කා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පගාව දෙනවා වාගේ.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

අද ඔබතුමා ඇඳලා තිබෙන විධියක් ඉතාම ලස්සනයි. ඔබතුමා මගේ පරණ මිත්‍රයෙක්. අපි දෙන්නා ආණ්ඩු පක්ෂයේ එකට හිටියේ මේ සභාවේ කෙළවරේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මගේ කාලය අරගෙනද, ඔබතුමාගේ කාලය අරගෙනද කථා කරන්නේ?

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

අපි දෙන්නාම එකයිනේ. ඔබතුමා කථා කළත් එකයි, මම කථා කළත් එකයි. අපි දෙන්නා සහෝදරයෝ වාගේ. මම දන්නා

[ගරු කුමාර වෙල්ගම මහතා]

හැටියට නම් බයිසිකල්වලට බදු පනවනවා. බදු නැතුව - duty free - ගෙන්වන්න දෙන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
නැහැ ගරු ඇමතිතුමනි, 1000 cc ධාරිතාවට වැඩි bikes සඳහා බදු රහිතයි. මේක ඊයේ පත්තරේ තිබුණේ. [බාධා කිරීමක්] නැහැ, දැන් ඒවා ගෙන්වන්න පුළුවන්නේ.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ. බදු රහිත නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
සාමාන්‍යයෙන් සීසී 1000 ධාරිතාව දක්වා bikes ගෙන්වන්න පුළුවන්. ඒකට duty එකක් අය කරනවා. සීසී 1000ට වැඩි ධාරිතාවක් සහිත bikes ගෙන්වන්න පුළුවන්. [බාධා කිරීම්] ඒවායින් bikes සියයකට විතරක් duty free. ඒක තමයි විහිළුව.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
එහෙම ගෙන්වනවා ඇත්තේ පොදුරාජ්‍ය මණ්ඩලයීය නායක සමුළුව වෙනුවෙන් වෙන්න ඇති. මම දන්නේ නැහැ ඒක.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
රාජ්‍ය නායකයෝ සමුළුවට එවන්නේ bikesවලද? ඊට වැඩිය හොඳයි ජාතිකත්වය ආරක්ෂා කරනවා කියලා බර කරත්තවල එවන එක.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
ඇයි, escort කරන්න. Escort කරන්න බයිසිකල් අවශ්‍ය වෙන්නේ නැද්ද?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මේ මොකක්ද මේ?

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
පෙර ගමන්වලට බයිසිකල් ඕනෑ වෙන්නේ නැද්ද? ඔබතුමා ඇමති කාලයේ ඔබතුමාට ඉස්සරහින් ගියේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. අපේ ඉස්සරහින් යන්නෙත් නැහැ, කවුරුවත් පස්සෙන් එවන්නෙත් නැහැ. අපි ඒ වාගේ නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා ඕනෑ විධියකට අර්ථ කථනය කළත්, ඕනෑ විධියකට -

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
ඔබතුමාගේ පස්සෙන් නම් ගියේ නැහැ. ඉස්සරහින් විතරයි ගියේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා මොන සිතුවිල්ලකින් කියනවාද කියලා මම දන්නේ නැහැ. ඒකට කමක් නැහැ.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
ඒන්ජින් ධාරිතාව over 1000 cc ගෙන්වන්න බැහැ, but up to 1000 cc, you can import and not beyond that.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මම ඉතාමත් විශ්වාසයෙන් සහ වගකීමකින් කියන්නේ. Bikes සියයක් විතරක් ඒ විධියට ගෙන්වන්න පුළුවන්. ඒ සඳහා වන බද්ද කාලාන්තරයකට ලිහිල් කරලා තිබෙනවා. ඒක තමයි මේකේ තිබෙන ප්‍රශ්නය. [බාධා කිරීමක්] ඔබතුමා කියනවා ගේන්න බැහැ කියලා, රෝහණ දිසානායක නියෝජ්‍ය අමාත්‍යතුමා කියනවා ගේන්න පුළුවන් කියලා.

ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු රෝහණ දිසානායක්ක - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
නැහැ, නැහැ. ගෙන්වන්න බැහැ කියලායි මම කිව්වේ.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
You can register up to 1000 cc but not beyond that.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
1000 cc ද ඊට වැඩි ද මම දන්නේ නැහැ, bikes සියයක් ගෙන්වන්න ඉඩ දීලා තිබෙනවා. එහෙම සහන දීලා තිබෙන්නේ මොන පදනම්ින්ද, night racingවලටද කියලා දෙයියෝ තමයි දන්නේ. ෆොරෑරි ගේන්න පුළුවන් නම් duty රහිතව, පෝෂේ ගේන්න පුළුවන් නම් duty රහිතව, ලැම්බෝගිනි ගේන්න පුළුවන් නම් duty රහිතව -

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
Duty රහිතව ගෙනාපු ෆොරෑරි එකක් මට පෙන්වන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඇයි නැත්තේ?

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
නැහැ, ගෙනාවේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පී.බී. ජයසුන්දර ප්‍රසිද්ධියේ කියලා තිබෙනවා, මෙන්න මේ වාගේ කාර් 25ක් Carnet permit එක යටතේ ගෙන්වලා තිබෙනවා කියලා. ඉතින්, Carnet permit එකෙන් ගෙනැල්ලා තිබෙන්නේ duty නැතුවයි?

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මම ප්‍රවාහන ඇමති. RMV එක තිබෙන්නේ මගේ යටතේ. ඒක නිසා මම කියන දේ විශ්වාස කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ ඇමතිතුමනි! Carnet permit එක යටතේ duty නැතුව ගේනවා. ගෙනාවට පස්සේ ලංකාවේදී transfer කළා නම් මොකක්ද තිබෙන වෙනස?

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
Carnet permit ගැන අද දවල් තමුන්නාන්සේලාගේ පැත්තෙන්ම විග්‍රහයක් කළා. Carnet permit එකෙන් ගේනවා කියන්නේ, වාහනය ලංකාවට ගෙනැල්ලා ඊට පස්සේ පිට රට කෙනෙක් මාස තුන හතරක් මෙහේදී පාවිච්චි කරලා ආපසු යවනවා කියන එකයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, ආපසු යවන්නේ නැහැ. මේ රටේ register කරලා තිබෙනවා. මම හිටපු වෙළෙඳ ඇමති. [බාධා කිරීමක්] ඔබතුමා ඒ ගැන සොයලා බලලා කිව්වා නම් හොඳයි. මොකද, ඒ වගේ කාර් ඕනෑ තරම් අපට පෙන්වන්න පුළුවන්.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ වගේ වාහන තිබෙනවා නම් අපි ඒ වාහන රාජසන්තක කරන්නම්. අපට ඒ වාහනයේ අංකය දෙන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම හොඳයි. ඒ වාහන රාජසන්තක කරන්න ගිහිල්ලා ඔබතුමාගේ ඇමතිකම නැති කර ගන්න එපා. මොකද, ඒවා ගේන්නේ කා වෙනුවෙන්ද කියලා දන්නවානේ.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මගේ ඇමතිකම නැති වෙන්නේ නැහැ. මම අවුරුදු ගණනාවක්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හොඳින් වැඩ කළ කෙනෙක්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම් අපි කියන දේ අහලා වැඩේ කරන්නකෝ. අපි කියන්නේ මේකයි. අභිංසක දුප්පත් අයගේ, සමෘද්ධිලාභීන්ගේ මාළු ටින් එකට, සීනි ටිකට, කිරි පිරි පැකට් එකට, භූමි තෙල් ටිකට බදු ගහනවා නම්, ෆෙරාරි කාර්, ලැම්බෝගිනි බදු රහිතව ගේන්න ඉඩ දෙන්නේ ඇයි? එච්චරයි මම අහන්නේ.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කාර් එකයි ගෙනැල්ලා තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එකක්වත් නැහැයි කියලා ඉස්සෙල්ලා කිව්වේ. දැන් කියනවා එකක් තිබෙනවා කියලා. මම වගකීමෙන් කියනවා, කාර් 10ක් ගෙනැල්ලා තිබෙනවා කියලා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ. මම කිව්වේ duty ගෙවලා ගෙනැල්ලා තිබෙනවා කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Duty නැතුව ලංකාවට කාර් 10ක් ගෙන්වලා තිබෙනවා. ඒ වාගේම තමයි අපනයන කවුන්සිලයට - Export Council එකට - රටේ ජනාධිපති අනිවාර්යයෙන්ම අවුරුද්දකට වතාවක් ඉදිරිපත් වෙන්න අවශ්‍යයි. ලලිත් ඇතුලත්මුදලි එදා මේක ගේන කොට රටේ තිබුණු slogan එක තමයි "Export or perish". අපනයනය නැත්නම් රට බංකොලොත් වන තත්ත්වයට පත් වෙනවාය කියන වැදගත් සටන් පාඨය තමයි පාවිච්චි කළේ.

අද මොනවාද වෙලා තිබෙන්නේ? මා හිතන හැටියට 2002 ඉඳලා ජනාධිපතිතුමා මේ අපනයන කවුන්සිලයට ගිහිල්ලා නැහැ. ඒකෙන් මේකේ වටිනාකම පෙනෙනවා. අද වෙලා තිබෙන්නේ මේකයි. අවුරුද්දෙන් අවුරුද්දට තිබෙන අපනයන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. වටිනාකමත් - value එකත්- අඩු වෙලා තිබෙනවා. අපනයන ප්‍රමාණයත් අඩු වෙනවා, වටිනාකමත් අඩු වෙනවා. මෙයින් භයානක තත්ත්වයක් නොවෙයි ද ඇති වෙන්නේ? මේවා කොහොමද වැඩි කරන්නේ? අපනයනය කරන්න සුදුසු වාතාවරණයක් තිබෙන්න අවශ්‍යයි. අපනයන කරන රටක් වශයෙන් තිබෙන්නේ පුංචි ලංකාව විතරක් නොවෙයි නේ. අපේ ඒ වියදම් කරන සාධක ටික අද වැඩි වීම නිසා තමයි අපි තරගකාරී තත්ත්වයෙන් අයින් වෙලා තිබෙන්නේ. මෑතක දී වුණු ලොකුම දේ තමයි මේ විදුලි බිල වැඩි වීම. මේ විදුලි බිල වැඩි වීම තුළින් රටට වුණු ලොකුම ප්‍රශ්නය තමයි මේකේ තිබෙන තරගකාරී තත්ත්වය නැති වෙලා තිබීම. එක පැත්තකින් රුපියලේ අගය අවශ්‍ය ප්‍රමාණයට වැඩිය අධිතක්සේරු වෙලා තිබෙනවා. පඩි වැඩි කරන්නේ ඒ ජනතාවට ඊට වඩා හොඳ ජීවිතයක් ගත කරන්න නොවෙයි. වියදම් සියයට සියයකින් වැඩිවෙලා තිබෙන නිසා පඩි ටික සියයට 20කින් 25කින් වැඩි වෙලා තිබෙනවා. අන්න ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ඒ වාගේම තමයි විදුලි බිල වැඩි වීම. සියයට 35කින්, 40කින් විදුලි බිල වැඩි වන කොට කොහොමද එය දරා ගන්න පුළුවන් වෙන්නේ? මේ ආණ්ඩුව වතුර බිලයි, ලයිට් බිලයි අඩු කරනවාය කියපු ආණ්ඩුවක්. අද විදුලි බිල වැඩි වුණාම අපනයනකරුවා input cost එක දරා ගන්නේ කොහොමද? ඒක නිසා තමයි අද අපනයන ප්‍රමාණය අඩු වෙලා අපනයන වටිනාකම අඩු වෙන්නේ. ඒ නිසා තමයි ගෙවුම් ශේෂ ගිහියේ - balance of payment - ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ. වෙනින් තර්ක විතර්ක කරන්න අවශ්‍යතාවක් නැහැ. මේක තමයි ඇති වෙලා තිබෙන ප්‍රශ්නය. මේකට යම් විධියකින් විසඳුමක් හොයා ගන්න

[ගරු රවි කරුණානායක මහතා]

බැරි වුණොත් අතිභයානක තත්ත්වයක් ඇති වෙනවා. තෙල් මිල අඩු වෙනවා ද නැද්ද කියන කාරණය තුළින් ඉදිරියට යන්න බැහැ. නමුත් අපනයනය වැඩි වීමෙන් මේ රටේ විරැකියාව නැති වෙනවා; මේ රටේ සම්පත වැඩි වෙනවා; ගෙවුම් ශේෂයේ හිඟය අඩු වෙනවා; ඒ තුළින් ආර්ථිකය ඉදිරියට යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් හුඟක් යෝජනා ඇවිල්ලා තිබෙනවා, පිට රට වැඩ කරන්න යන ප්‍රමාණය අපි නවත්වන්න ඕනෑ කියලා. ඒක හොඳ දෙයක්. මොකද මම දැන් සුමාන හතර පහකට ඉස්සෙල්ලා දෝහා කටාර් රටේ හිටියා. එහේ එක company එකක අයිතිකරු ලංකාවෙන් ගිය කෙනෙක්. ඒ company එකේ security වැඩ කරන අයට ගෙවන්නේ රුපියල් 30,000යි. කියලා තිබුණේ රුපියල් ලක්ෂයක් ගෙවනවාය කියලායි. මේ රුපියල් 30,000ට ඒ අය එහේ යන්නේ නැතිව ලංකාවේ හිටියා නම් අපේ සම්පත මේ රට තුළ තිබෙනවා; ඊට වැඩිය වැටුපක් මෙහේ ලබා ගන්නවා. මේ වාගේ දේවල් තහනම් කළ යුතුමයි. නැත්නම් ඊට වැඩිය හොඳ වාතාවරණයක් ඇති කරලා දෙන්න ඕනෑ. තමන්ගේ පවුල් නැති කරගෙන ගිහිල්ලා රුපියල් 30,000ක් හොයාගෙන ඊට පස්සේ ඒ වාගේ ප්‍රශ්නයක් ඇති වෙන්න ඉඩ දෙන්නේ ඇයි? ලංකාවේ ඒ වාගේම රැකියා ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. ඇඟලුම් කර්මාන්තයේ තිබෙන ලොකුම ප්‍රශ්නය අද orders නැති එක නොවෙයි. මහන්න, වැඩ කරන්න කට්ටිය නැතිකමයි. එහෙම වෙලා තිබෙන්නේ රටේ සංවර්ධනයක් ඇති වීම නිසා නොවෙයි. එක පැත්තකින් ගෘහ සේවිකාවන් - domestic servants - වශයෙන් යනවා. අනික් පැත්තෙන් ගත්තාම කම්කරු - labour grade - සේවය වාගේ දේවල් අපි නැති කරන්න අවශ්‍යයි. අපේ අපනයන ක්ෂේත්‍රය රටේ අවශ්‍යතාව අනුව වෙනස් කරන්න අවශ්‍යයි. කොහොමද මේ විදුලි බිල දරා ගන්නේ? ගිය අවුරුද්දේ විදුලි බිලේ අලාභය කෝටි 13,500යි. මේ අවුරුද්දේ ඇස්තමේන්තු කරලා තිබෙනවා, අලාභය කෝටි 8,500ක් කියලා. මේ නිසා තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මෙහාට ආවාම සල්ලි දෙන්න බැහැ කියලා කියන්නේ. ඇයි? ඔබතුමන්ලාගේ මූල්‍ය විනයක් නැහැ. අවුරුදු හතරකට ඉස්සෙල්ලා මේ අලාභය නැති කරන්න ඕනෑය කියලා කිව්වාට, ගිවිසුම් සහගතව ඒක නැති කරනවාය කියලා කිව්වාට තවම ඒක කරන්න බැරි වෙලා තිබෙනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් සල්ලි දෙන්න බැහැ කිව්වාම අපේ මහ බැංකු අධිපති කියනවා, "උඹලාට දෙන්න බැරි නම් අපිට ඕනෑ නැහැ" කියලා. සල්ලි දෙන තුරු ගන්නවා. ඊට පස්සේ ප්‍රශ්නයක් නැහැ. දැන් අනා ගත්තා. අනා ගත්තාට පස්සේ මොනවාද වෙන්නේ? මාසයක් යන්න ඉස්සෙල්ලා ඇමති මණ්ඩලය වෙනස් කළා. චම්පික රණවක ඇමතිතුමා ඉවත් කළා. පවිත්‍රා නෝනා ගෙනාවා. එතුමිය ගෙනාවාට පස්සේ ඔන්න මාසයකින් විදුලි බිල වැඩි කළා. වැඩි කළාට පස්සේ මේක අනුමත කරන්නේ කැබිනට් එකයි. කැබිනට් එකේ ලොක්කා කවුද? ජනාධිපති. මුදල් අමාත්‍යාංශය observations දෙනවා, මේ විදුලි බිල වැඩි කරන්න ඕනෑය කියලා. හොඳ ප්‍රතිපත්තියක්ය කියලා ජනාධිපති අවසර දුන්නාට පස්සේ මැයි දිනයේ ගිහිල්ලා කියනවා, "නැහැ, මම දැනගෙන හිටියේ නැහැ" කියලා. ඒ කියන්නේ කරන දේ ගැන එතුමා නොදන්නවාද? නැහැ, දැනගෙන කරන්නේ. මේකෙන් ඊට වඩා දේශපාලන ප්‍රශ්නයක් ඇති වුණා. දරා ගන්න බැරි තත්ත්වයක් ඇති වුණා. ඔන්න ඉතින් විදුලි බිල යළි වෙනස් කළා. ඒ වෙනස් කිරීම නිසා කෝටි 900ක වියදමක් දරනවා කියලා කියනවා. මේ මැයි දිනයේ තිබෙන වරප්‍රසාද අනුව වෙනස් කිරීම කළේ. මේකෙන් අපිට අධික වියදමක් -කෝටි 900ක්- දරන්න වෙනවා කිව්වා. නමුත් අලාභය නැති වුණා, කෝටි 6,500ක්. කාටද මේ කරන විජ්ජාව? අද පත්තරේ තිබෙනවා, ඒ කෝටි 900ත් එන්නේ නැති ලකුණු තිබෙනවාය කියලා. ඒවා අපි පැත්තකට තියමු. මේවා තුළින් අර අපනයනකරුවන්ට කොතරම් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවාද? සියයට 40ක් කෙළින්ම වැඩි වෙලා තිබෙනවා. මේක දරා ගන්නේ කවුද? Labour GSP එක නැති වෙන කොට අපි කිව්වා, "මෙයින් රටේ කිසිම මානව අයිතිවාසිකම් ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ, මේ රටට කෝටි 11,500ක් වරප්‍රසාදයක් වශයෙන් ලබා ගන්නවා, ඒ නිසා කරුණාකරලා අපි මේක පාවිච්චි කරමු" කියලා. එහෙම කිව්වාම "ඕනෑ නැහැ"යි කියලා කිව්වා.

අද ඒක අනා ගෙන තිබෙනවා. අද අපේ ඇඟලුම් කර්මාන්තය සම්පූර්ණයෙන්ම බංග්ලාදේශය, වියට්නාමය, කාම්බෝජය, ලාඕසය යන රටවලට ගිහින් තිබෙනවා. මෙන්න මෙවා තමයි අපට තිබෙන ප්‍රශ්න. විදුලි බිල නැවත සංශෝධනයකට ලක් කරන්න අවශ්‍ය වෙන්නේ රටේ අවශ්‍යතාව අනුව එය කළ යුතු නිසායි. මෙතැනදී ඇති වෙලා තිබෙන ලොකුම ප්‍රශ්නය මේකයි. මෙතැනදී cost-push inflation එකක් ඇති වුණොත් ඒක අපේ සංචාරක කර්මාන්තයටත් ප්‍රශ්නයක් වෙනවා. ගිය අවුරුද්දේ මේ රටට සංචාරකයන් ලක්ෂ 10ක් ආවාලු. බොහෝම හොඳයි. අනික් අතට මහ බැංකුව කියනවා, ඒ සංචාරකයන්ගෙන් එක් අයෙක් එක් දවසකට වියදම් කර තිබෙන්නේ ඩොලර් 90යි කියා. හැබැයි මාල දිවයිනට සංචාරකයන් 975,000ක් ඇවිල්ලා තිබෙනවා. ඒ ගොල්ලන්ගෙන් එක් අයෙක් දවසකට ඩොලර් 375ක් වියදම් කර තිබෙනවා. බලන්න, ඒ තරම් පොඩි රටකුත්, මේ රටත් අතර ඇති වෙනස. ඒ හෝටල්වල විදුලි බිල සියයට 40කින් වැඩි වුණාම අඩු ගණනේ ඒවායේ වියදම් සියයට 20කින්වත් වැඩි වෙනවා. එහෙම වුණාම මොකද වෙන්නේ? අද මේ සභාවේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ කවුරුවත් නැහැ. එහෙම හිටියත් අපට කියන්න පුළුවන් එකම දෙය තමයි -

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මම ඉන්නවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කනගාටුයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. The return on investment, ඒ කියන්නේ ආයෝජනය කළොත් අවුරුදු හත හමාරකින් නැවත ගෙවන්න පුළුවන්ය කියා තමයි සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළේ. මාලදිවයිනේ ඒ කාල සීමාව අවුරුදු තුන හමාරයි. විදුලි බිල වැඩි වුණායින් පසුව ඒක අවුරුදු නවය හමාර දක්වා වැඩි වෙලා තිබෙනවා. බලන්න, එක වැඩි වීමකින් රටේ ඵලදායිතාවය හා තරගකාරිත්වය කොහොමද නැති වෙලා තිබෙන්නේ කියා. මේවා තමයි රටේ අපනයන ප්‍රශ්නවලට බල පා තිබෙන්නේ. මේවාට උත්තර දෙන්න බැරි ආණ්ඩුවක් ගැන තමයි අපි මේ කථා කරන්නේ. මෙතැනට ඇවිල්ලා racing cars ගෙනෙන්න පුළුවන්ද, හයියෙන් යන්න පුළුවන් රථ වාහන තිබෙනවාද නැද්ද කියන කාරණය නොවෙයි කථා කරන්න තිබෙන්නේ. කෘෂිකර්ම ඇමතිතුමාගේ දෙය ආර්ථික සංවර්ධන ඇමතිතුමා ගෙනෙනවාද කියන ඔය ප්‍රශ්න නොවෙයි කථා කරන්න තිබෙන්නේ. රටේ ඵලදායිතාවය, තරගකාරිත්වය මත ජීවන වියදම් අඩු කරන්න පුළුවන් වෙන්නේ කොහොමද කියන කාරණයයි කථා කරන්න තිබෙන්නේ. මේක අද ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේවා ගෙවන්න විදේශ විනිමය උපයන්න අවශ්‍යයි.

දැන් බලන්න, SriLankan Airlines ආයතනයේ ගිය අවුරුද්දේ පාඩුව කෝටි 2900ක්ය කියා තිබෙනවා. මේ අවුරුද්දේ අලාභය රුපියල් කෝටි 2700ක් හැටියට ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ වාගේම මිහින් ලංකා ආයතනයේ ගිය අවුරුද්දේ අලාභය රුපියල් කෝටි 210යි. මේ අවුරුද්දේ අලාභය රුපියල් කෝටි 110ක් හැටියට ඇස්තමේන්තු කර තිබෙනවා.

මෙවැනි අවස්ථාවක 2014 වර්ෂයේදී අපි airbus 14ක් ගන්න යනවා. කවුද මේවා ගෙවන්නේ? මේ කෝටි 31,500 ගෙවන්නේ කවුද? ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලය ඒක අනුමත කර තිබෙනවා. මේ රටේ සංවර්ධනයට සත පහක් නැහැ. බස් එකක් ගන්න බැහැ. නමුත් airbus ගන්න හදනවා. කවුද මේවාට වග කියන්නේ? කැබිනට් එකේදි මේවා ගැන කියන්න තමුන්නාන්සේලාට කොන්දක් නැද්ද? මේ company එක අවුරුද්දකට කෝටි 2900ක් අලාභ ලබනවා. පොලිය විතරක් අවුරුද්දකට කෝටි 6000ක් යනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ravi Karunanayake, your time is over. Please wind up now.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The time is over? I have been given 20 minutes. Is that not so?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, can you give me just two more minutes to finish my speech?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I will give you only one more minute.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයට අපි කාරුණිකව කියන්නේ ණය බරතාවකින් පෙළෙන රටක ජනතාවට තවදුරටත් ණය බර වැඩි කරලා තිබෙන බවයි. 2005 දී ඒක පුද්ගල ණයබරතාව රුපියල් 91,000ක් වුණා. අද ඒක රුපියල් 331,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා මොනවාද මේ කරන්නේ? මේ අවස්ථාවේදී කථා කරන්නට පෙර මම notice board එක බැලුවා. අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ජනාධිපතිතුමාට ස්තුති කරලා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා, මේ ආණ්ඩුව යටතේ රාජ්‍ය සේවකයන්ගේ සංඛ්‍යාව ලක්ෂ 13ක් දක්වා වර්ධනය වී තිබෙනවාය කියා. 1990 දී අපි මේ රට බාර දෙනකොට ලක්ෂ 13ක් තිබුණා.චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග හිටපු ජනාධිපතිනියගේ රජයෙන් ඒක ලක්ෂ 11 දක්වා අඩු කළා. අපි නැවත ඒක ලක්ෂ 12 දක්වා වැඩි කරලා තමයි බාර දුන්නේ. කාටද මේ වංචා කරන්නේ? මෙතැන විස්තර තිබෙනවා -[බාධා කිරීමක්] අදයි මේ මහ බැංකු වාර්තාව ගත්තේ. තමුන්නාන්සේලා දන්නේ නැත්නම් කථා නොකර ඉන්න. ඒ මිසක් අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. 1990 පටන් මේ රටේ රජයේ සේවකයන් ලක්ෂ 13ක් හිටියා. 1994දී ලක්ෂ 13යි; 1995 දී ලක්ෂ 13යි. කාටද මේ බොරු කරන්නේ? 2004 දී අපි මේ රට බාර දෙනකොට ලක්ෂ 12යි. තමුන්නාන්සේලාට පුළුවන් කෑ ගහන්න විතරයි. උකුණු හිසක් තරමවත් මොළයක් තිබෙනවා නම් මේ රටේ මේ තරම් ආර්ථික ප්‍රශ්න ඇඳා ගන්නේ නැහැ. මේ වාගේ රටක අපනයනය ගැන කථා කරන්න පුළුවන්ද? මහ බැංකු වාර්තාවත් වැරදි කරලා, ඊට පසුව ඒක පුම්බාගෙන ඔන්න ඉතින් අති උතුම් රජා මේක කරයි කියනවා. කාටද මේ බොරුව කරන්නේ? අසත්‍ය ප්‍රකාශ කරන්න එපා රටට. අද මේ රටේ ජනතාවට විදුලි බිල ගෙවන්න බැහැ. ඔවුන්ගේ මාසයක පඩිය සුමානයකට මදි. කෑ ගැහුවාට රටක සංවර්ධනයක් ඇති වන්නේ නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you, Hon. Ravi Karunanayake. The next speaker is the Hon. Rohana Kumara Dissanayake.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒවා ගැන කථා කරන කොට මෙතැන,- [බාධා කිරීමක්]

[අ.භා. 6.19]

ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෘෂිකර්මය ගැන, ප්‍රවාහනය ගැන රටට බලපාන ඉතා වැදගත් නියෝග කීපයක් පිළිබඳව මේ උත්තරීතර සභාවේ කථා කරන මේ වෙලාවේ ඒ සම්බන්ධයෙන් වචන කීපයක් කථා කරන්නට මට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. ඒත් පුංචි කනගාටුවක් තිබෙනවා. අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරන කොට එතුමාගේ කථාව අහන්නවත් අඩු ගණනේ එතුමාගේ පක්ෂයේ -එක්සත් ජාතික පක්ෂයේ- හෝ විරුද්ධ පාර්ශ්වයේ වෙනත් කිසිම කෙනෙක් නොමැති වීම පිළිබඳව මම කනගාටු වනවා. [බාධා කිරීමක්] ඒ කියන්නේ ඔබතුමා අද පක්ෂයෙනුත් ප්‍රතික්ෂේප වෙලා ඉවරයි. කිසි කෙනෙක් නැති එකේ තේරුම ඒකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් රවි කරුණානායක මන්ත්‍රීතුමා හැම දාම මෙතැනට ඇවිල්ලා පත්තරයට, රූපවාහිනියට තමයි කථා කරන්නේ. එකම තැටිය නැවත නැවත rewind කරමින් එතුමා මේ පාර්ලිමේන්තුවේ කථා කරන හැටි අපි දැකලා තිබෙනවා. මම හිතන හැටියට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් එතුමාගේ කථා අහලා එපා වෙලා නිසා තමයි අද එතුමාගේ කථා අහන්න විපක්ෂයේ එක් කෙනෙක්වත් නැත්තේ. හැබැයි අපට මතකයි, එතුමා වෙළෙඳ ඇමති වශයෙන් කටයුතු කරන කොට සතොස වාගේ ආයතන බංකොලොක් කරපු ආකාරය. එය මුළු රටම දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් මම එක යෝජනාවක් කරනවා, පාර්ලිමේන්තුවේ කථාවලින් බොරුව ඉවත් කරලා, ඇත්ත, සත්‍ය පමණක් හැන්සාඩ් වාර්තාවලට ඇතුළත් කරන්න කියලා. හැබැයි, පාර්ලිමේන්තුවේ වරප්‍රසාද, අයිතින්, උරුමයන් නිසා ඒක නොවුණාට, රටේ ජනතාව නම් බොරුව ප්‍රතික්ෂේප කරන බව අපි දන්නවා. මොකද, පසු ගිය මැතිවරණ කීපයකදීම, ආණ්ඩුක්‍රමය ගැනයි, වෙළෙඳ ක්‍රමය ගැනයි, ප්‍රතිපත්ති ගැනයි කථා කරන එක්සත් ජාතික පක්ෂය ජනතාව නැවත නැවත ප්‍රතික්ෂේප කරලා තිබෙන නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද කථා කළ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් ද්වේශ සහගතව තමයි

[ගරු රෝහණ දිසානායක මහතා]

මේ රජයේ ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙළ විවේචනය කළේ. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය, 2005 දී බලයට පත් වුණාට පස්සේ, එදා සිට අද දක්වා පසු ගිය වසර අටක පමණ කාලය තුළ මේ රටේ විශාල සංවර්ධනයක්, ග්‍රාමීය සංවර්ධනයක් ඇති කරන්න කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම, සෞඛ්‍ය අංශයෙන්, අධ්‍යාපන අංශයෙන් රට ඉස්සරහට ගෙන යන්න කටයුතු කරලා තිබෙනවා.නිදහස් අධ්‍යාපනය තව තවත් ඉස්සරහට ගෙන යන්න කටයුතු කරලා තිබෙනවා. මේ අවස්ථාවේදී ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා මේ සභා ගර්භයේ ඉන්නවා. අද ආරෝග්‍ය ශාලාවක පුංචි ශල්‍යාකර්මයක් -operation එකක්- කළත් රුපියල් ලක්ෂ තුනක් හතරක් ලබා දෙනවා. හැබැයි, මේවා ගැන රටේ කොහේවත් කථා කරන්නේ නැහැ. නිදහස් අධ්‍යාපනය තවදුරටත් ඒ ආකාරයෙන්ම ඉදිරියට අරගෙන යන්න කටයුතු කරලා තිබෙනවා. පාසැල් දරුවන්ගේ uniform එක දීලා, පොත් පත් ටික දීලා ඒ වැඩ පිළිවෙළ රට පුරා ක්‍රියාත්මක වන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා.

විරුද්ධ පක්ෂයේ අය අධිවේගී මාර්ග ගැන කථා කරනවා, හම්බන්තොට වරාය ගැන කථා කරනවා, ගුවන් තොටු පොළවල් ගැන කථා කරනවා. බලය තිබෙන කොට ඒ අය මේ කිසිම දෙයක් කළේ නැහැ. අඩුම ගණනේ පාරකට තාර ටිකක් දැමීමේ නැති රජයක නියෝජිතයන් තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ විධියට කථා කරන්නේ. මම හිතන හැටියට බලය තිබෙන කාලයේ ඔවුන්ට ඒවා කරන්න මතකය හෝ මොළය තිබිලා නැහැ. ඒක තමයි ඊට හේතුව.

අද ඉදිරිපත් කර ඇති මෝටර් වාහන පනත යටතේ එන නියෝග පිළිබඳව කථා කරද්දී කියන්න ඕනෑ, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අද වන කොට වාහන ලක්ෂ 48ට වැඩි සංඛ්‍යාවක් මේ රටේ ලියා පදිංචි කරලා තිබෙන බව. හැම මාසයකම රථ වාහන විශාල සංඛ්‍යාවක් ලියා පදිංචි වෙනවා. පසු ගිය අප්‍රේල් මාසයේ 29,253ක්, මාර්තු මාසයේ 26,753ක්, පෙබරවාරි මාසයේ 23,629ක්, ජනවාරි මාසයේ 28,636ක් ලියා පදිංචි වෙලා තිබෙනවා. එහි කිසිම අඩුවීමක් නැහැ. රටේ සංවර්ධනයට සමගාමීව ඒවාත් වැඩි වෙනවා. ලලිත් දිසානායක මැතිතුමාත් කියපු විධියට, රටේ සංවර්ධනයේ ප්‍රතිඵල පෙන්වන කැඩපත තමයි අපේ රටේ සෞඛ්‍ය සේවාවේ තත්ත්වය, අධ්‍යාපන තත්ත්වය, අධිවේගී මාර්ග හා උසස් ජීවන මට්ටම. මේ සියලු දේවල් ගත්තාම, දවසින් දවස සංවර්ධනය වෙමින් ඉදිරියට යන ආර්ථික ක්‍රමයකට අපි අද පියවර තබා තිබෙන බව පෙනෙනවා.

විශේෂයෙන් ඒකපුද්ගල ආදායම ගැන කථා කළා. මට මතක විධියට 2004 දී වාගේ කාලයක, -එදා එක්සත් ජාතික පක්ෂය අපට ආණ්ඩුව භාර දෙන වෙලාවේදී- ඒකපුද්ගල ආදායම තිබුණේ ඇමෙරිකන් ඩොලර් 836යි. නමුත් අද වන කොට ඒකපුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 3,000 ඉක්මවන්න පුළුවන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හෙට අනිද්දා වන කොට පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව ලංකාවේ පවත්වන කොට, විදේශීය ආකර්ෂණය අපේ රටට ඇති වන කොට, දවසින් දවස මේ රටේ සංවර්ධනය ඇති වෙන කොට, මුළු රටම එකම ආර්ථික කලාපයක් වශයෙන් සංවර්ධනය වන කොට, මා කල්පනා කරනවා අපේ ඉලක්කගත වැඩ පිළිවෙළටත් වඩා අපේ ඒකපුද්ගල ආදායම වැඩි කර ගැනීමේ හැකියාව ලැබෙයි කියලා.

දැන් අලුත් වැඩ පිළිවෙළක් අනුව ලෝකයත් එක්ක එකට එකතු වෙලා තිරසාර ප්‍රවාහන ප්‍රතිපත්තියක් මේ රටේ ඇති කරන්න අපි කටයුතු කරනවා. ගරු කුමාර වෙල්ගම අපේ ඇමතිතුමා මෙතැන ඉන්නවා. එතුමාගේ වුවමනාව තමයි අලුත් වැඩ පිළිවෙළකට යෑම. අද අපට වුවමනා වෙලා තිබෙනවා අලුත් දැක්මක් - vision - සහ මෙහෙවරක් - mission - ඇතිව කටයුතු කරන්න. ඒ දැක්ම සහ මෙහෙවර අනුව අපට අලුත්ම තේමාවක් තිබෙනවා. ඒ තමයි, මේ රටේ පාරවල්වල රථ වාහන තදබදයක් නැතිව - zero congestion - ගමනාගමනය ඇති කිරීම. ඒ සඳහා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය මාර්ග සංවර්ධනය හරහා විශාල ශක්තියක් ලබා දීලා තිබෙනවා. ඊළඟට, ඉදිරි කාලයේදී අනතුරුවලින් තොරව - zero accidents - මේ රටේ ගමනාගමනය සිදු කිරීමට බලාපොරොත්තු වනවා. අපි ඒ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වාගේම වායු දූෂණයෙන් තොරවීම - zero pollution - කියන කාරණය. ඒකට අද තිබෙන හොඳම උදාහරණය තමයි මේ දියවන්නාව අවට ප්‍රදේශය. අද කොළඹ ඇතුළු අනෙකුත් තදාසන්න ප්‍රදේශවලට ගිහිල්ලා බැලුවොත් පෙනේවි මේ රටේ ප්‍රධාන නගර ආශ්‍රිත නාගරික සංවර්ධනයේ අලුත් යුගයක් නිර්මාණය වෙමින් පවතින බව. ඒ හැම තැනම තිබුණු කුණු කඳු අද ඉවත් කර දමලා. ඒ වාගේ වැඩ පිළිවෙළක් අද මේ රට පුරා ක්‍රියාත්මක වනවා. ජනතාව ඒවාට ප්‍රිය කරනවා. එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ හෝ වෙනත් දේශපාලන පක්ෂ මේවා දකින්නේ නැහැ. හැබැයි, මේ රටේ ජනතාවට ප්‍රායෝගිකව මේවා දැනෙනවා. මේ ඇති වෙලා තිබෙන වෙනස, ජනාධිපතිතුමා මේ ගෙන යන වැඩ පිළිවෙළ ඔවුන්ට, ඔවුන්ගේ හදවත්වලට දැනෙමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ හැරිසන් මන්ත්‍රීතුමා කථා කළා ගොවි ගම්මාන ගැන. මාත් ගොවියෙකුගේ පුතෙක්. මටත් හොඳට ගොවිතැන පුළුවන්. අද ගොවි ගම්මානවලට ගිහිල්ලා බැලුවොත්, ගොවිතැන විතරක් ඔවුන්ගේ ආදායම බවට පත් වෙලා නැහැ. ඔවුන්ට තිබෙන දේපළ තමයි ගොවිතැන සහ ඒ දරුවන්. ඒ පවුල්වල අද උපාධිධාරින් ඉන්නවා. රජයේ රැකියා කරන අය ඉන්නවා. අද ඔවුන් කර්මාන්තශාලා ඇති කරලා තිබෙනවා; කඩ සාප්පු ආරම්භ කරලා තිබෙනවා; ව්‍යාපාරිකයන් බවට පත් වෙලා තිබෙනවා. අද ඔවුන් දේශ දේශාන්තරව ගනුදෙනු කරන පිරිසක් බවටත් පත් වෙලා තිබෙනවා. එක තැනකින් පමණක් ආදායම උපයන පිරිසක් බවට අද ඔවුන් පත් වෙලා නැහැ. ඒ නිසා මා හිතන විධියට රටේ සමස්ත ආදායම ගලා යන, මුදල් සංසරණය වන වැඩ පිළිවෙළකට අද අපේ රට පත් වෙලා තිබෙනවා. අද සෑම කෙනා ළඟම යහමින් මුදල් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද විදුලි බිල ගැන කථා කරනවා. අද පාකිස්තානයට යන්න, බංගලාදේශයට යන්න, නේපාලයට යන්න, දකුණු ආසියානු කලාපයේ බොහෝ රටවල්වලට යන්න. අඩු ගණනේ ඒ රටවල දවසට පැය 8ක් හෝ 10ක් විදුලිය කපනවා. නේපාලයේ පැය 14ක් විදුලිය කපනවා. හැබැයි, අපේ රටේ පැය 24ම විදුලිය ලබා දෙන්න අද මේ රජය කටයුතු කරලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයට මතක නැහැ ඔවුන්ගේ කාලය. ඒ කාලයේ විදුලි බලය තිබුණේ නැහැ. වැඩියෙන් සල්ලි දීලා හෝ කර්මාන්තකරුවන්ට තමන්ගේ කර්මාන්තය පවත්වා ගෙන යන්න අවශ්‍ය විදුලිය ලබා දීමට හැකියාව එක්සත් ජාතික පක්ෂයට තිබුණේ නැහැ. අඩු ගණනේ generator එකක් ගෙනෙන කොට tax එක අඩු කරලා තිබුණේ නැහැ. ඒවාට සහන ලබා දී තිබුණේ නැහැ. අද රජය පෞද්ගලික අංශයට, පෞද්ගලික ප්‍රවාහන ක්ෂේත්‍රයට, ටයර් එකට, ඩීසල්වලට යන හැම එකකටම සහන ලබා දීලා තිබෙනවා.

රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව පෞද්ගලික අංශය සමඟ එකට ගමනක් යමින්, රට සංවර්ධනය කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ නිසා අපි මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ ගෙන යන වැඩ පිළිවෙළට සහාය දෙන්න කියලා. මේ වෙලාවේ විපක්ෂයේ කවුරුත් සභා ගර්භයේ නැහැ. අපි කියපු විධියට මේක වටිටන්න බැරි ආණ්ඩුවක් කියන එක ඔවුන් අද තේරුම් අරගෙන තිබෙනවා. ඒ නිසා විපක්ෂයේ එකිනෙකා ඔවුන්වත් නොදැන අද

මේ විවාදය මහ හැර යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එකක් කියන්න ඕනෑ. රවි කරුණානායක මන්ත්‍රීතුමා නිරන්තරයෙන් ජනතාව තුළ කුකුසක් ඇති කරන්න කටයුතු කරනවා, අසත්‍ය ප්‍රකාශ කරමින්. එතුමා ජම්බෝ ගිනි ගැන කථා කරනවා. ලැම්බෝ ගිනි ගැන කථා කරනවා. හැබැයි අද අලින් අතර ගිනි ඇති වෙලා තිබෙනවා. ඔවුනොවුන් අතර ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. ඔවුනොවුන් අතර ගිනි කෙළි ඇති වෙලා තිබෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

ආනයන හා අපනයන (පාලන) පනත : නියෝග
ஏற்றுமதி, இறக்குமதி(கட்டுப்பாடு) சட்டம்: ஒழுங்குவிதிகள்
IMPORT AND EXPORT (CONTROL) ACT: REGULATIONS

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Sir, on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Regulations made by the President under Section 20 read with Section 14 and subsection (3) of Section 4 of the Import and Export (Control) Act, No. 1 of 1969 and Article 44(2) of the Constitution and published in the Gazette Extraordinary No. 1804/18 of 03rd April 2013, which were presented on 24.04.2013, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

මෝටර් වාහන පනත : නියෝග
மோட்டார் வாகனச் சட்டம் : ஒழுங்குவிதிகள்
MOTOR TRAFFIC ACT: REGULATIONS

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Sir, on behalf of the Minister of Transport, I move,

"That the Regulations made by the Minister of Transport under Section 237 of the Motor Traffic Act (Chapter 203) and published in the Gazette Extraordinary No. 1796/22 of 08th February 2013, which were presented on 09.04.2013, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

2013 ලෝක කම්කරු දිනය සැමරීම
2013 உலக தொழிலாளர் தினக் கொண்டாட்டம்
CELEBRATION OF INTERNATIONAL WORKERS' DAY 2013

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අතිගරු ජනාධිපතිතුමා 2005 වර්ෂයේදී ජනාධිපති ධුරයට පත්වන විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ සිටියේ ලක්ෂ 6කට ආසන්න සේවක සංඛ්‍යාවකි. නමුත් මහින්ද චින්තන වැඩසටහනට අනුව ජනාධිපතිතුමා රාජ්‍ය සේවය පුළුල් කළ අතර ඒ අනුව 2013වන විට රාජ්‍ය සේවය ලක්ෂ 13 ඉක්මවා වර්ධනය වී ඇත. එමෙන්ම දිගින් දිගටම රාජ්‍ය සේවකයන් සඳහා වැටුප් වැඩි වීමක් ලබා දීමටද රජයට හැකි වී ඇත.

තවද විවිධ සංවර්ධන යෝජනා ක්‍රම මඟින් හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් පෞද්ගලික අංශයේද රැකියා විශාල වශයෙන් මෙම කාල සීමාව තුළ ජනිත කිරීමට රජයට හැකි වී ඇත.

2013 ලෝක කම්කරු දිනය සැමරීමට අතිදැවැන්ත වාර්තාගත ජනතාවක් සහභාගි වීම තුළින් ජාත්‍යන්තර මටටමේ මැයි දින රැළියක් පැවැත්වීමට අපටද හැකියාවක් ලැබුණි. මෙසේ 2013 වර්ෂයේදී කම්කරු දිනය සැමරීම සඳහා ශ්‍රී ලාංකීය කම්කරු ජනතාව දැක් වූ කැප වීමට අපගේ ගෞරවනීය ස්තුතිය ඔවුන් වෙත පළ කළ යුතු යැයි මා මේ ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වුණේ 2005 වර්ෂයේදීයි. ඊට පෙර 1994 දී පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව තමයි බලයට පත් වුණේ. පොදුජන එක්සත් පෙරමුණු රජය බලයට පත් වීමට පෙර අවුරුදු 17ක් රට පාලනය කළේ එක්සත් ජාතික පක්ෂ රජයයි. අපට මතකයි, 1977 දී ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා බලයට පත් වුණාට පස්සේ විශේෂයෙන්ම කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන්, තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කථා කරපු, පාරට බැහැපු 1980 ජූලි වර්ජකයන් ඉතා විශාල පිරිසකගේ රැකියා

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

අහිමි කළ බව. සාමාන්‍යයෙන් ඒ වර්ජනයෙන් රැකියා අහිමි කළා විතරක් නොවෙයි. 1977 සිට ඒ කාලය පුරාවට අපේ රටේ වැඩ කරන කම්කරු පන්තිය විශාල වශයෙන් දේශපාලන පළි ගැනීම්වලට ලක් කළා.

මා උදාහරණයක් කියන්නම්. ගුවන් සේවයේ තමයි මා සේවය කළේ. එවකට තිබුණු එයාර් සිලෝන් සමාගම සම්පූර්ණයෙන් වසා දමා, එහි සේවය කළ සේවකයන් දොට්ට දමා, ශ්‍රී ලංකන් ගුවන් සේවය අලුතින් ආරම්භ කරලා, තමන්ට හිතැති අයව තමයි ඒ ඒ අංශවලට බඳවා ගත්තේ. ඒ වාගේම හැම ක්ෂේත්‍රයකම, හැම අමාත්‍යාංශයකම, හැම සංස්ථාවකම ඒ විධියේ විපර්යාසයන් සිද්ධ වුණු බව අපි දැක්කා. ඒ අවුරුදු 17ක කාලය පුරාවටම අපේ කම්කරු අයිතිවාසිකම් දිනා ගන්නට අපේ ජනතාව අරගල කළත්, ඒ ජනතාවගේ අරගලවලට නිසි තැනක් ලැබුණේ නැහැ.

අතිගරු ජනාධිපතිතුමා 2005 දී බලයට පත් වුණා. ඊට පෙර එතුමා පොදුජන එක්සත් පෙරමුණු රජයේ කම්කරු හා වෘත්තීය පුහුණු ඇමතිවරයා හැටියට සිටියා. අපට මතකයි, එතුමා කිහිප වතාවක්ම කම්කරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කම්කරු ප්‍රඥප්තියක් පවා එළි දක්වන්නට වැඩ කටයුතු කළ බව. මා හිතන හැටියට එතුමා 2005 දී බලයට පත් වුණාට පස්සේ කම්කරුවන් ගැන හිතන නායකයකු හැටියට ඉතා විශාල වැඩ කොටසක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ වැඩියෙන්ම දුක් විඳින පිරිස තමයි මාර්ග කම්කරුවෝ. ඒ වන කොට සේවය ස්ථිර නොකළ මාර්ග කම්කරුවන් අතිවිශාල ප්‍රමාණයක් සිටියා. ඒ මාර්ග කම්කරුවන්ට ස්ථිර පත්වීම් ලබා දුන්නා. ඒ වාගේම අපේ රටේ කම්කරු ජනතාව විශාල ප්‍රමාණයක් වැඩ කරන වරාය වාගේ ආයතන සඳහා විශාල රැකියා ප්‍රමාණයක් දීලා, එම රැකියා ස්ථිර කරලා තිබෙනවා. ඒ විධියට හැම ක්ෂේත්‍රයකම සේවය කරන කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දී තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. වර්තමාන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාටත් අපි ස්තුතිවන්ත වනවා. කම්කරුවන්ගේ ප්‍රශ්නවලදී, කම්කරු ආරවුල්වලදී, කම්කරුවන්ගේ අයිතිවාසිකම් ලබා ගන්න එතුමාත් විශාල වශයෙන් කැප කිරීමක්, වෙහෙසක් දරමින් ඒ වැඩ කටයුත්ත ඉදිරියට ගෙන යනවා.

අපට මතකයි, 2001 දී එක්සත් ජාතික පක්ෂ රජය සුළු කාලයකට බලයට පැමිණි ආකාරය. ඔවුන් බලයට පැමිණිලා 16/01 වක්‍රලේඛය ගෙනැල්ලා එකම රෝහල් කම්කරුවෙක්වත්, එකම පාසල් කම්කරුවෙක්වත් ගන්න ඉඩක් දුන්නේ නැහැ. අඩුම ගණනේ සුළුම කම්කරු රැකියාවක් දෙන්න අවස්ථාවක් දුන්නේ නැහැ. ඒ නිසා ඒ අයට මේ ගැන කථා කරන්න අයිතිවාසිකමක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පසුව උදා වූ කාල පරිච්ඡේදය දෙස බලන්න. දැන් අපේ රටේ දැවැන්ත සංවර්ධන යෝජනා ක්‍රම, විදුලි යෝජනා ක්‍රම ක්‍රියාත්මක වෙනවා. වරායවල්, ගුවන් තොටුපළවල් හැදෙනවා. ඒවා තුළින් විශාල වශයෙන් රැකියා අවස්ථා කම්කරු පන්තියට ලැබෙනවා. ඒ වාගේම තමයි රාජ්‍ය සේවයත්. අපේ ජනාධිපතිතුමා බලයට එන විට රාජ්‍ය සේවයේ ලක්ෂ හයයි හිටියේ. අද වන විට ලක්ෂ 13ක් දක්වා රාජ්‍ය සේවය වර්ධනය වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ උපාධිධාරින්ට සලකපු විධිය අපට මතකයි. උපාධියට සරිලන රැකියාවක් ඉල්ලන්න ගිය උපාධිධාරින්ට -හැම රජයක් යටතේදීම- මර්දනයට ලක් වෙන්නයි පසු ගිය කාලවලදී සිදු වුණේ. නමුත් අපේ අතිගරු ජනාධිපතිතුමාට අප ස්තුතිවන්ත වෙනවා. එතුමා මේ රටේ උපාධිධාරින්ට තමන්ගේ උපාධියට නිසි තැන ලබා දෙන්න වැඩ කටයුතු කළා. අතිවිශාල උපාධිධාරින් පිරිසකට රැකියා අවස්ථා ලබා දුන්නා. මම උදාහරණ කීපයක් කියන්නම්. පළාත් සභා යටතේ අවුරුදු ගණනාවක් වැඩ කරපු ස්වේච්ඡා ගුරුවරුන් ස්ථිර කරන්න, අනධ්‍යයන සේවකයන් පත් කරන්න, පළාත් සභා ගුරුවරු, මධ්‍යම රජයේ ගුරුවරු පත් කරන්න අපේ රජය කටයුතු කළා. ඊළඟට සෞඛ්‍ය ක්ෂේත්‍රය දිහා බලන්න. හෙද හෙදියන් විශාල වශයෙන් බඳවා ගත්තා. රෝහල් අනධ්‍යයන සේවකයන් බඳවා ගත්තා. මේ විධියට අධ්‍යාපන, සෞඛ්‍ය ඇතුළු හැම ක්ෂේත්‍රයකම රැකියා අවස්ථා වර්ධනය කර තිබෙනවා. රාජ්‍ය අංශයේ විතරක් නොවෙයි, කම්කරු රැකියා පවා විශාල වශයෙන් දුන්නා. සමහර වෙලාවට මේ ගණන් ගැනීම්වලට කම්කරුවන් අයත් වන්නේ නැහැ. කම්කරු පන්තිය විශාල වශයෙන් වර්ධනය කරන්න අතිගරු ජනාධිපතිතුමා වැඩ කළා. ඒ නිසා තමයි පසු ගිය මැයි 01වැනි දා ලෝක කම්කරු දිනය -මැයි දිනය- සමරන වෙලාවේ, අප කවුරුත් නොසිතපු ආකාරයේ දැවැන්ත ජනතාවක් මැයි දිනයට එකතු වුණේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම නියෝජනය කරන්නේ වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයයි. වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ උළු මෝල් 600ක් තිබෙනවා. ගඩොල් පෝරණු 6,000ක් තිබෙනවා. මේවායේ කම්කරුවන් විශාල පිරිසක් වැඩ කරනවා. පසු ගිය කාලයේදී මේ උළු කර්මාන්තය සම්පූර්ණයෙන්ම වැටිලා තිබුණේ. මේ උළු මෝල් එකින් එක වහලා තිබුණේ. හැබැයි, අද වෙන කොට මේ රජයේ සංවර්ධන වැඩ පිළිවෙළත් එක්ක, දැයට කිරුළ වැඩසටහනත් එක්ක, නිවාස සංවර්ධන වැඩ පිළිවෙළත් එක්ක මේ වහපු උළු මෝල් දැවැන්ත විධියට ඒ වැඩ ආරම්භ කරලා නැවත වතාවක් සක්‍රීය මට්ටමින් ඒ උළු මෝල්වල, ගඩොල් පෝරණුවල සේවය රටට ලබා දී තිබෙනවා. ඒ නිසා අප ඉතාම සතුටින් තමුන්නාන්සේට කියනවා විශේෂයෙන්ම ඒ උළු මෝල් සහ ගඩොල් පෝරණුවල සේවය කරන අතිවිශාල කම්කරු පිරිසක් මමත් සමඟ ඒ කම්කරු දිනය සැමරීමට එකතු වුණු බව. ඒ අයගේ බැනර්වල, පෝස්ටර්වල තිබුණේ, ඒ අය ගෙනාපු ප්‍රචාරක රැළිවලදී කිව්වේ, වසා දමා තිබූ උළු කර්මාන්තශාලා නැවත ඇති කර අපට රැකියා ලබා දුන් රජයට, අතිගරු ජනාධිපතිතුමාට ස්තුතියි කියලායි. සමහර වෙලාවට මැයි දිනයට අපේ රාජ්‍ය අංශයේ අය, සමෘද්ධි නිලධාරින්, කෘෂිකර්ම නිලධාරින්, උපාධිධාරින් එකතු කර ගන්නවා. නමුත් මට කියන්න සන්තෝෂයි, අපේ මැතිවරණ කොට්ඨාසවල ඒ අය නැතිව කම්කරු පිරිස ඉතා විශාල වශයෙන් මේ මැයි දිනයට සම්බන්ධ වුණු බව. මාර්ග කම්කරුවන් අතිවිශාල පිරිසක් මේ මැයි දිනයට සම්බන්ධ වුණා; වරාය කම්කරුවන් අතිවිශාල පිරිසක් මේ මැයි දින රැළියට සම්බන්ධ වුණා.

මේ ගරු සභාවේ සිටින අපේ කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාගෙන් මෙන්න මේ දෙය මම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. තමුන්නාන්සේගේ කාලයේදී නොවිසඳිලා තිබෙන කම්කරුවන්ගේ තවත් ප්‍රශ්න තිබෙනවා නම් ඒ ප්‍රශ්න අපි විසඳලා දෙමු. ඒ වාගේම තමයි කම්කරු ආරවුල් මහ හරවන්න තිබෙන නීති අපි තවදුරටත් ශක්තිමත් කරමු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිවිශාල සේවාවක් කරපු අතිගරු ජනාධිපතිතුමාට අප ස්තුතිවන්ත වන අතර, මැයි 1වැනි දා මුළු ලෝකයම සමරන මැයි දිනය දැවැන්ත ජනතාවක් එකතු කරගෙන ජාත්‍යන්තර මැයි දිනයක් වාගේ පවත්වන්නට අපට සහයෝගය දක්වපු ලක්ෂ සංඛ්‍යාත වූ කම්කරු ජනතාවට මාගේ ප්‍රණාමය පුද කරමින් මේ යෝජනාව මම මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ගරු ජානක බණ්ඩාර මහතා
(மாண்புமிகு ஜானக பண்டார)
(The Hon. Janaka Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාමත්ම කාලෝචිත යෝජනාවක් පමණක් නොවෙයි, සත්‍ය ලොවට හෙළි කරන යෝජනාවක් තමයි අපේ ගරු අරුන්දික මන්ත්‍රීතුමා ගෙනාවේ. අපේ ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ උපන් දිනය අද. අපි එතුමාට සුබ පතනවා. දීර්ඝායුෂ ලබා රටටත්, ජාතියටත් සේවය කිරීමේ ශක්තිය, බලය, බුද්ධිය එතුමාට පෑදේවා කියා මම මේ අවස්ථාවේදී ප්‍රාර්ථනා කරනවා. එතුමා සමඟ දීර්ඝ ගමනක සටහන් තබමින් මේ සභාවේ අදත් සාමාජිකත්වය දරන කෙනෙක් මම. එතුමා අතුරු මැතිවරණයේදී කැස්බෑව ආසනයට තරග කරන විට එදා අපි දෙදෙනාම හිටියේ තවත් පක්ෂයක. එතුමා වෙනුවෙන් මම වැඩ කළා. එතුමා කවදත් කම්කරු පන්තිය වෙනුවෙන් කථා කළ කෙනෙක්; වැඩ කළ කෙනෙක්; සේවය කළ කෙනෙක්. එතුමා නිර්භීතයි; නිරහංකාරයි. ඒ වාගේම අවංකයි. මෙවැනි ශ්‍රේෂ්ඨ නායකයින් අද අප අතරේ දුර්ලභයි. මැයි පළමු වන දා රූපවාහිනී සාකච්ඡාවක් පැවැත්වුණා. මට හුඟක් දෙනෙකු කිව්වා ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමා සරලව කථා කරනවා; හිතට වැදෙන ආකාරයට කථා කරනවා; සවනට දැනෙන ආකාරයට කථා කරනවා; ඉතාමත්ම පැහැදිලිව කථා කරනවා කියලා. එවැනි අය අප අතර සිටීම, අද අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයේ සෙවණැල්ල යටතේ සිටීම අපටත් ආඩම්බරයක්; පාර්ලිමේන්තුවටත් ආඩම්බරයක්; ඒ වාගේම මුළු රටටත් ආඩම්බරයක් කියන කාරණය මම කියන්නට වුවමනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා 2013 මැයි 01 වැනි දින ඓතිහාසික කම්කරු දිනයක් වූවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සම්බන්ධව කථා කරන විට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පාසල් යන ශිෂ්‍යයෙකු වශයෙන් සිටින විටයි මැයි දිනවලට සහභාගි වුණේ. එදා අපේ hero තමයි, අපේ වීරයා තමයි කෝට්ටේ ආසනය නියෝජනය කළ රොබට් ගුණවර්ධන මැතිතුමා. කෝට්ටේ සිංහයා යන විරුදාවලියෙන් එදා අපි එතුමාව හැඳින්වූවා. එදා කැස්බෑව අයත්ව තිබුණේත් මෙතුමා නියෝජනය කරන කෝට්ටේ ආසනයට. කඩුවෙල ආසනය තිබුණෙත් නැහැ. කොළඹ සිට රොබට් ගුණවර්ධන මැතිතුමා ඉතාමත්ම ලස්සනට වාමාංශික ජවය පෙන්වමින් left-right, left-right කියලා, -ඒ ට්‍රොස්කිවාදියා- කොළඹට එන විට එදා සමසමාජ කොඩිය අල්ලා ගෙන පැමිණි කොල්ලෙක් තමයි මම. එම නිසා මම කම්කරු දින හුඟක් දැකලා තිබෙනවා. ඒ දවස්වල සමසමාජ පක්ෂය තමයි මේ ලංකාවේ විශාලම කම්කරු දින රැලි පැවැත්වූවේ. ආචාර්ය එන්.එම්. පෙරේරා, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, ලෙස්ලි ගුණවර්ධන, බර්නාඩ් සොයිසා, රොබට් ගුණවර්ධන, චම්පි ගුණවර්ධන, ජැක් කොතලාවල සහ අනිල් මුණසිංහ ආදී වශයෙන් නම් මට කියා ගෙන යන්නට පුළුවන්. එතුමන්ලා විශාල රැස්වීමක් පැවැත්වූවා. වාමාංශික එක්සත් පෙරමුණ, - ULF - කියලා පක්ෂයක් හැදුවා. ඒ වෛද්‍යාචාර්ය එස්.ඒ. වික්‍රමසිංහ, ආචාර්ය එන්.එම්. පෙරේරා සහ පිලිප් ගුණවර්ධන මැතිතුමන්ලා. ඒක තමයි මම දැක්ක විශාලම රැස්වීම. එය පැවැත්වූයේ Galle Face පිටියේදී. ඉන් පසුව බණ්ඩාරනායක මැතිතුමා බලයට පැමිණි පසු මහජන එක්සත් පෙරමුණේ රැස්වීම කොළඹ Town Hall වල පැවැත්වූවා අති විශාල ජනකායක සහභාගිත්වයෙන්. මෙතුමන්ලාත් එකතු වෙලා, එක්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිතිය හැදුවේ ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමා නියමුවෙකු වශයෙන් සිටින විටයි. ඒ වෘත්තිය සමිතිය හදලා ඒකට ශක්තිය දුන්නා; ජවය දුන්නා. ඒ වෘත්තිය සමිතිය ගමන් කළා, පෙරටම ගමන් කළා. ඒ තරම් විශාල සේවයක් එක්සත් ජාතික පක්ෂයට ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමායි, මමයි කළා. මම යාපනයේ ඉඳලා මාතර දෙවුන්දරට යන තුරු රැස්වීම් වේදිකාවල කථා කළා.

එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ද්‍රවිඩ භාෂාවෙන් කථා කළා. සිංහල භාෂාවෙන් කථා කළා. ඉංග්‍රීසි භාෂාවෙන් කථා කළා. අන්තිමට මොකද වුණේ? නායකත්වයක් ආවා. පක්ෂයෙනුත් අපව පන්නලා දැම්මා. මොනවාද කරන්නේ කියලාවත් මම දන්නේ නැහැ. කම්කරු දිනයේදී මට මේවා මතක් වනවා. මට පඩියක් තිබුණේ නැහැ. මම හම්බ කරපු කෙනෙක් නොවෙයි. මම වතු පිටි, වෙළෙඳ ව්‍යාපාර තිබෙන කෙනෙක් නොවෙයි. පඩියක් නැහැ. Telephone එකක් නැහැ. යන්න එන්න වාහනයක් නැහැ. මම දුක් විඳ විඳ තරු ගණන් කර කර ඉඳලා උදේ පාන්දර නැඟිටිනවා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මොන තරම් බුද්ධිමත් කෙනෙක්ද? කෘත ගුණ දන්නා කෙනෙක්ද? මේක අහලා එතුමා මට කිව්වා, "අස්වර් මෙහෙම නිකම් ඉන්න එපා. ඇවිල්ලා උදව් කරන්න. මාත් එක්ක අත්වැල් බැඳගන්න. ඔබතුමාටත් යන්න දිශාවක් තිබෙන්න ඕනෑ"ය කියන එක. යම් දක්ෂකමක් තිබෙනවා නම්, හැකියාවක් තිබෙනවා නම්, එවැනි අය ඔක්කෝම ඒකරාශී කළ නායකයෙක් තමයි අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා.

පසුගිය මැයි දිනය දා -මැයි මස පළමුවැනිදා- මොස්කව් නුවර පරදමින්; බීජිං නුවර පරදමින්; කියුබාව පරදමින් අපේ රටේ කොළඹ කැම්බල් පිටිය ඉතිහාසගත වුණා. එදා ලක්ෂ 20ක ජනගහනයක් කොළඹ කැම්බල් පිටියට ආවා. උතුරෙන් ද්‍රවිඩ ජනතාව ආවා. නැඟෙනහිරෙන් මුස්ලිම් ජනතාව ආවා. සියලු දිශාවෙන්ම ආවා. එතරම් විශාල මැයි දින රැස්වීමක් තැබීමේ වාසනාව අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට හිමි වුණා. ඒකෙන් අලුත් ඉතිහාසයක් බිහි වුණා. අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා කියන්නේ, කම්කරු පන්තිය වෙනුවෙන් කෑ ගහන කෙනෙක් පමණක් නොවෙයි, පාද යාත්‍රා ගිය කෙනෙක් පමණක් නොවෙයි, ඝෝෂා කරපු කෙනෙක් පමණක් නොවෙයි, සටන් පාඨ කියපු කෙනෙක් පමණක් නොවෙයි, සේවය කිරීමට බැඳී සිටින, නව ලංකාවක් ගොඩ නැඟීමේ කාර්යය කරන ජනාධිපතිතුමෙක්ය කියන එක ලෝකය අද හඳුනා ගත්තා.

මෙවැනි යෝජනාවක් ගෙන ඒම ගැන ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමා.

ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ මේ වාගේ යෝජනාවක් ගෙන ඒම පිළිබඳව මම විශේෂයෙන්ම ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් වචන කීපයක් කථා කිරීම පිළිබඳව මගේ මිත්‍ර ගරු අස්වර් මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වනවා.

අද මේ රටේ ශ්‍රම බලකාය; කම්කරු පන්තිය අතිගරු ජනාධිපතිතුමාට ගෞරව කරන්න හේතු වන කාරණා කීපයක් තිබෙනවා. අවුරුදු 30ක් තිස්සේ මේ රටේ යුද්ධයක් තිබුණා. ඒ යුද්ධය පවතින අවස්ථාවලදී එල්ටීටීඊ සංවිධානයේ බෝම්බ ප්‍රහාරවලින් මේ ශ්‍රම බලකායේ විශාල පිරිසක් මිය ගියා. අංග විකල වුණා. සීටීඕ එකේ බෝම්බයෙන් පටන් ගත්තාම, මරදාන, Central Bank එක, බස්වල, කෝච්චිවල බෝම්බ පිපිරීම නිසා වැඩ කරන පන්තියේ දහස් ගණනකගේ ජීවිත නැති වුණා. ඔවුන්ගේ පවුල් අනාථ වුණා. ඒ පවුල්වල දරුවන්ට මවුපියන් නැති වුණා. මේ සියලු කරදරවලට මුහුණ දීපු වැඩ කරන පන්තියත්; මේ රටේ ජනතාවටත් භයක් සැකක් නැතිව තමන්ගේ රැකියාව

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

කරන්න අවස්ථාවක් අතිගරු ජනාධිපතිතුමා ලබා දුන්නා. ඒකට පක්ෂ භේදයක් නැහැ. අද සටන් කරන එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්, ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්, පොදු ජන එක්සත් පෙරමුණ වෙන්න පුළුවන්, ඒ හැම කෙනෙක්ම අද තමන්ගේ වැඩපළේදි භයක් නැතිව තමන්ගේ රැකියාව කරනවා. ඒ පළමුවැනි කාරණයයි. ඒ ගෞරවය මේ රටේ වැඩ කරන පන්තිය අතිගරු ජනාධිපතිතුමාට දක්වනවා.

අනෙක් කරුණ තමයි, මේ රටේ වෘත්තීය අරගළයක් කරන කොට ඒක මෙල්ල කරන්න එතුමා කවදාවත් ක්‍රියා නොකිරීම. එතුමා කල්පනා කළේ සාකච්ඡා කරලා; ඒ පිළිබඳව විවිධ කෝණවලින් බලා ඒ ප්‍රශ්නය විසඳන්නයි.

තමුන්නාන්සේලාත් දකින්නට ඇති පසුගිය දවස්වල විශ්වවිද්‍යාල මහාචාර්යවරුන් වැඩ වර්ජනයක් කළා. ඒක මර්දනය කරන්නට උත්සාහ කළේ නැහැ. විවිධ කෝණවලින් ඉදිරිපත් වෙලා, විවිධ කෝණවලින් සාකච්ඡා කරලා ඒකට විසඳුම් ලබා දුන්නා. එතුමාගේ ප්‍රතිපත්තිය තමයි පාර්ශ්වයක් ජයග්‍රහණය කරන්න නම් win-win policy ප්‍රතිපත්තියක් යටතේ කටයුතු කළ යුතුයි කියන එක. මටත් ඒවාට සහභාගි වන්නට පුළුවන්කමක් ලැබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විදුලිබල මණ්ඩලයේ වැඩ වර්ජනවලදී, විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන සේවකයන්ගේ වැඩ වර්ජනවලදී ඒ සෑම එකක්ම සමතයකට පත් වුණා, ජනාධිපතිතුමාගේ මේ ප්‍රතිපත්තිය උඩ. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා කෙරෙහි අද වැඩ කරන පන්තියේ විශ්වාසයක් තිබෙනවා. එතුමාට වැඩ කරන පන්තියේ ආදරයක් තිබෙනවා.

පසුගිය දවස්වල විදුලි බිල වැඩි කළාම මේ රටේ වෘත්තීය සමිති, ආණ්ඩුවේ වෘත්තීය සමිති ජනාධිපතිතුමාට කිව්වා, "අපිට ටිකක් මෙහි බර උහුලන්න අමාරුයි, අඩු ආදායම් ලබන උදවියට මේ බර උහුලන්න අමාරුයි" කියලා. එතුමා ඒ ගැන සාකච්ඡා කරලා, මැයි දිනයේ දී කථා කරන විට එතුමා කිව්වා, විදුලි ඒකක 60 දක්වා කිසිම මිල වැඩි කිරීමක් කරන්නේ නැහැ, ඒකක 60 - 120 දක්වා යම් සහනයක් දෙනවා කියලා. ඒක තමයි මේ රටේ වැඩ කරන පන්තියේ බලාපොරොත්තුව. තමන්ට ප්‍රශ්නයක් ඇති වුණු වෙලාවක තමන්ට ඒක ඉදිරිපත් කරන්නට පුළුවන් නායකයෙක් ඉන්නවා. ඒ නායකයා ඒක ගැන බලලා, ඒකට විසඳුමක් ලබා දෙනවා. එතුමා කම්කරු ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ මේ රටේ සමාගම් එක්ක, වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කරලා වාර්ෂික ගිවිසුම් ඇති කළා. අද ඒක සාර්ථක වෙලා තිබෙන නිසා ඉල්ලීම් සම්බන්ධව මේ අවුරුද්දේ එක වැඩ වර්ජනයක්වත් නැහැ. ප්‍රවෘත්ති පත්‍රවල පොල් ගෙඩි අකුරෙන් වාර්තා ඕනෑ තරම් තිබෙනවා. නමුත් ඒවා ක්‍රියාවට නඟලා නැහැ. මොකද, ඒ අය දන්නවා අපට ගැටලුවක් ඇති වුණොත් කථිකාවක් කරලා - සාකච්ඡාවක් කරලා - ඒ විසඳුම ලබා ගන්න පුළුවන් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පඩි පාලක සභා ගැනත් කියන්නට ඕනෑ. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව සෑම පඩි පාලක සභාවකින්ම මේ වන විට සියයට 25 සිට 45 වන තෙක් වැටුප් වැඩි කරලා තිබෙනවා. අවමය දැන් රුපියල් 10,000කට වැඩියි. ඒ එක්කම පඩි පාලක සභාවලට ඇතුළු වුණේ නැති අනෙකුත් අංශත් අපි දැන් ඒ පඩි පාලක සභාවලට ඇතුළු කරලා තිබෙනවා. පඩි පාලක සභාවලින් අවම වැටුපක් ඇති කළාම යම් වාසියක් තිබෙනවා. ඒක තමයි වෘත්තීය වාර්ෂික සාකච්ඡාවලදී මිනුම් දණ්ඩ වශයෙන් ගැනෙන්නේ. ඒකට තමයි අනෙකුත් අංශ එකතු කරන්නේ. ඒ නිසා හැම අංශයකම සාර්ථකව ඒ අයගේ වාර්ෂික වැටුප් වැඩිවීම් ඒ ගිවිසුම් මඟින් ක්‍රියාත්මක වනවා. අවුරුදු පතා එසේ කරන ඒවා තිබෙනවා; අවුරුදු දෙකෙන් දෙකට කරන ඒවා තිබෙනවා; අවුරුදු තුනෙන් තුනට කරන ඒවා තිබෙනවා. පසු ගිය දවස්වල වතු සේවකයන්ගේ ප්‍රශ්න ගැන බොහොම හොඳට සාකච්ඡා කරලා, ප්‍රධාන වෘත්තීය සමිති එකඟතාවකට ආවා. මේක තමයි අතිගරු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ නිසා අද ඇති වෙලා තිබෙන තත්ත්වය. ඒ නිසා අද කම්කරු පන්තිය එතුමාට ආදරය කරනවා; ගරු කරනවා.

මෙතුමා කිව්වා වාගේ ඒ පළාත්වල වසා දමා තිබුණු උළු කර්මාන්තශාලා අද ප්‍රකෘතිමත් තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ නිසා ඒ අයට යම් කිසි යහපතක් සිදු වෙලා තිබෙනවා. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඒවා ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම වැසී ගොස් තිබුණු සීනි කර්මාන්තශාලා අද ලාභ ලබන විධියට ක්‍රියාත්මක වෙනවා. එහි වාසිය යන්නේ ඒකට. ඒ අනුව එතුමාගේ වැඩ පිළිවෙළ නිසා අද සෘජු සහ වක්‍ර රක්ෂාවල් මේ රටේ ඇති වෙලා තිබෙනවා. ඒ අය තුළ විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. විපක්ෂය මොන විධියට කථා කළත්, විපක්ෂය මොන විධියේ කාරණා කිව්වත්, පසු ගිය මැයි දිනයේ දී දහස් ගණන් ජනතාව ඇවිල්ලා අති විශාල මැයි දින රැළියක් පවත්වන්නට පුළුවන්කම ලැබුණේ ඒ නිසායි. එය මේ රටේ වැඩ කරන ජනතාව විසින් අතිගරු ජනාධිපතිතුමාට කළ ගෞරවයක් හැටියටයි අපි සලකන්නේ. එතුමා කරපු සේවාවට, එතුමා දුන්නු සහායට, එතුමා කරන ක්‍රියාවට මේ රටේ වැඩ කරන පන්තිය එතුමාට ගෞරව කිරීමක් හැටියට තමයි මේ මැයි දිනය සැමරුවේ. ඒ නිසා අපි ඒ සියලු දෙනාටම අපේ ගෞරවයත්, ස්තුතියත් පුද කරන්නට ඕනෑ. මේ රජයේ විවිධ ප්‍රශ්න මතු වනකොට, ජාත්‍යන්තර ලෝකය විවිධ ප්‍රශ්න අපට ඉදිරිපත් කරනකොට, ජාත්‍යන්තර ලෝකය අපට විරුද්ධව විවිධ කෙනෙහිලිකම් කරනකොට, ජිනීවාවල විවිධ යෝජනා සම්මත කරනකොට, මේ රටේ වැඩ කරන පන්තිය ජනාධිපතිතුමාවත් ආරක්ෂා කරගෙන රජයත් එක්ක ඉන්නවා.

අපේ ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා අද දින ඉතාමත් වැදගත් යෝජනාවකුයි ඉදිරිපත් කළේ. ඒ යෝජනාව අපි අගය කරනවා වාගේම අපි මේ පාර්ලිමේන්තුව තුළ ඉඳලා අතිගරු ජනාධිපතිතුමන්ට ශක්තිය ලබා දීම පිළිබඳව වැඩ කරන පන්තියේ සියලු දෙනාටත්, අපේ වෘත්තිය සමිතිවලටත් අපේ ගෞරවයත්, ස්තුතියත් පුද කරන්න ඕනෑය කියා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.55ට, 2013 මැයි 09 වන බ්‍රහස්පතින්දා අ.භා.1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 6.55 மணிக்கு பாராளுமன்றம், 2013 மே 09, வியாழக்கிழமை மு.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 6.55 p.m. until 1.00 p.m. on Thursday, 09th May, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 15 වන කලාපය
தொகுதி 216 - இல. 15
Volume 216 - No. 15

2013 මැයි 09 වන බ්‍රහස්පතින්දා
2013 மே 09, வியாழக்கிழமை
Thursday, 09th May, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

කථානායකතුමාගේ සහතිකය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ජාතික පාසල්වල උසස් පෙළ පන්ති සඳහා සිසුන් ඇතුළත් කිරීම :

අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

වරප්‍රසාද යෝජනා:

2013 ජනවාරි 24 වන දින "වීරකේසරී" වාර්තාව

කල් තැබීමේ යෝජනාව:

විදුලි ගාස්තු ඉහළ යෑම තුළ ජනතාව මුහුණ පාන දුෂ්කරතා

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

சபாநாயகரது சான்றுரை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தேசியப் பாடசாலைகளில் உயர்தர வகுப்புகளுக்கு மாணவர் அனுமதி:

கல்வி அமைச்சரினது கூற்று

சிறப்புரிமைப் பிரேரணை:

2013 ஜனவரி 24ஆந் திகதிய "வீரகேசரி" அறிக்கை

ஒத்திவைப்புப் பிரேரணை:

மின் கட்டண உயர்வினால் மக்கள் எதிர்நோக்கும் கஷ்டங்கள்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

ADMISSION OF STUDENTS TO ADVANCED LEVEL CLASSES OF NATIONAL SCHOOLS:
Statement by Minister of Education

PRIVILEGE MOTIONS:
"Virakesari" Report of 24th January 2013

ADJOURNMENT MOTION:
Difficulties faced by People due to increase in Electricity Tariff

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මැයි 09 වන බ්‍රහස්පතින්දා
2013 மே 09, வியாழக்கிழமை
Thursday, 09th May, 2013

අ.භා 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m. MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] i*n the Chair.*

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, ගරු කථානායකතුමා විසින් 2013 මැයි මස 08 වැනි දින පහත සඳහන් පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන)
උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන)
මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන)
උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

II

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2013 මැයි මස 9 වන බ්‍රහස්පතින්දා එනම් අද දින අපර භාග 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස සියලු ගරු සභික මන්ත්‍රීවරුන්ට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2010 වර්ෂය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා - පැමිණ නැත.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිරිවත්තුඩුව, පුවක්ගහවිල, අංක 466 දරන ස්ථානයෙහි පදිංචි හේමන්ත ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මහතා - පැමිණ නැත.

ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) රද්දොළුගම, අංක 10බී/9 එල් දරන ස්ථානයෙහි පදිංචි එස්.ඩබ්ලිව්.ඩබ්ලිව්. මදනායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ඇඹිලිපිටිය, මොරකැටිය, වැලි නිවසෙහි පදිංචි එස්.සමන් පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

(3) කැලණිය, සිංහාරමුල්ල, විල්ලුඩ මාවත, අංක 14 දරන ස්ථානයෙහි පදිංචි එම්. ක්ලේරා පෙරේරා මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම;

(4) ඇහැලියගොඩ, බදුවත්ත, අංක 151බී දරන ස්ථානයෙහි පදිංචි සිත්ති නසිනියා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) මහරගම, නාවින්න, ඉසිපතන මාවත, අංක 77/2 දරන ස්ථානයෙහි පදිංචි යූ.ජී. ලාල් මහතාගෙන් ලැබුණු පෙත්සම.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ජයරත්න හේරත් මහතා - පැමිණ නැත.

ගරු දුමින්ද දිසානායක මහතා (අධ්‍යාපන සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - கல்விச் சேவைகள் அமைச்சர்)
(The Hon. Duminda Dissanayake - Minister of Education Services)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහළ මාරගහවැව, යාය 15, රාජාංගනය පදිංචි ආර්.පී.ඩී.පී.එස්. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු ලසන්ත අලගියවන්න මහතා - පැමිණ නැත.

ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මාතලේ, අකුරම්බොඩ, නාගහපොළ, අංක 300 දරන ස්ථානයෙහි පදිංචි එන්.ජී. විනීතා ජයලත් මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர - மின்வலு, எரிசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම රත්නපුර, කරංගොඩ, රද්දැල්ල පදිංචි ආර්.ජී.සී.එන්. ජයවර්ධන මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු වීරකුමාර දිසානායක මහතා - පැමිණ නැත.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පොල්ගහවෙල, ආරගොඩ, පොල්කටු ජනපදයෙහි පදිංචි බී.ඩබ්ලිව්. ලැයිසාහාමි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ඇල්කඩුව, මාතලේ පාර, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි එම්.බී. අලුවිහාරේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) දඹුල්ල, කණ්ඩලම පාර, සිසිරවත්තෙහි පදිංචි ඒ.එම්.යූ.පී.කේ. අත්තනායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

තඹලගමුව-කඩවාන වැව ප්‍රතිසංස්කරණය: ප්‍රතිපාදන
தம்பலகாமம் - கடவான வாவி மறுசீரமைப்பு: நிதி ஏற்பாடு
RENOVATION OF KADAWANA TANK : FUND ALLOCATION

1898/'11

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කඩවාන වැව් බැම්ම කොටි ත්‍රස්තවාදීන් විසින් පුපුරවා හැර වර්ෂ විසි හයක් පමණ ගතවී ඇතත්, මේ දක්වා එය පිළිසකර නොකිරීම නිසා ගොවීන්ට වගා කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීමට ඇති බාධාවන් කවරේද;

(ii) එම ගැටලු ඉවත්කර කඩිනමින් වැව අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) එසේ නම්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) திருகோணமலை மாவட்டத்தின் தம்பலகாமம் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட கடவான குளக்கட்டு புலிப் பயங்கரவாதிகளால் தகர்க்கப்பட்டு சுமார் இருபத்தாறு வருடங்கள் கடந்திருந்தபோதிலும் இன்றுவரை இது திருத்தப்படாமையால் விவசாயி களுக்கு பயிர்ச்செய்கையை ஆரம்பிக்க முடியாதுள்ள தென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) இந்த வாவியை மறுசீரமைப்பதில் உள்ள தடைகள் யாவையென்பதையும்;

(ii) மேற்படி பிரச்சினைகளைத் தீர்த்து துரிதமாக வாவியை திருத்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) இதற்காக தற்போது நிதி ஏற்பாடுகள் செய்யப் பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Is he aware that eventhough nearly 26 years have lapsed after the dam of the Kadawana tank in Thambalagamuwa Divisional Secretary's Division in Trincomalee District had been blown up by LTTE terrorists, the farmers are unable to start cultivation activities as it has not been renovated up to now ?

(b) Will he inform this House -

(i) of the problems that have cropped up in relation to the renovation of the aforesaid tank;

(ii) whether action will be taken to solve those problems and renovate the tank expeditiously;

(iii) whether provisions for this purpose have been allocated by now; and

(iv) if so, the date on which the construction work will be commenced ?

(c) If not, why?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කඩවාන වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ද සාකච්ඡා කර එම දිස්ත්‍රික්කය නියෝජනය කරන ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු සුසන්ත පුංචිනිලමේ මැතිතුමා විසින් එම වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා මහත් වෙහෙසක් ගනු ලැබීය.

(ආ) (i) මෙම කඩවාන වැව් බැම්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමියක පිහිටා ඇති බැවින් විශේෂයෙන් පරිසරයට හා වනජීවීන්ට බාධාවක් නොවන පරිදි සහ ඒවා ආරක්ෂා වන පරිදි වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ යුතු ය. එබැවින් අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කර එම කාර්යය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී.

(ii) ඔව්.

(iii) ඔව්.

(v) ඉහත බාධාවන් ඉවත් වූ වහාම ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

(ඇ) අදාළ නොවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, (ආ) (iii) ප්‍රශ්නයෙන් මම අහන්නේ "ඒ සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන් කර තිබෙද?" කියන කාරණයයි. ඔබතුමා ඒකට "ඔව්" කියලා සඳහන් කළා. එහෙම නම් 2013 අවුරුද්ද වෙනුවෙන් කොපමණ ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර තිබෙනවාද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

දැනට ඇස්තමේන්තු ඉල්ලා තිබෙනවා. තවම ඒ ඇස්තමේන්තු ලැබිලා නැහැ. නමුත් අප මේ වැවේ කටයුතු මේ අවුරුද්දේ ස්ථිර වශයෙන්ම කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් මා අහන්නේ මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ප්‍රතිපාදන වෙන් කර තිබේද කියන ප්‍රශ්නයට පිළිතුර වශයෙන් ඔබතුමා සඳහන් කළා "ඔව්" කියලා. ඇස්තමේන්තු නැතිව කොහොමද ප්‍රතිපාදන වෙන් කළේ? ඇස්තමේන්තුව රුපියල් කෝටියක් නම් දළ වශයෙන් රුපියල් ලක්ෂ 10ක් වාගේ වෙන් කරලාද තිබෙන්නේ? කොහොමද ඒ වෙන් කිරීම කරලා තිබෙන්නේ?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

දිස්ත්‍රික්කයට දළ වශයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඇස්තමේන්තුව ලැබුණු හැටියේ අපි ඒ මුදල ලබා දෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නයෙන් මා අහන්නේ, ඒ වෙන් කරපු මුදල් භාවිත කරමින් ඒ වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරන්න ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවාද, ඒ සඳහා කාල රාමුවක්, කාල නිර්ණ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලායි.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(මාණ්පුමිකු එස්.එම්. සන්තිරසේන)
(The Hon. S.M. Chandrasena)
අපට දැනට වනජීවී දෙපාර්තමේන්තුවේ අවසරය අවශ්‍ය වෙලා තිබෙනවා. වනජීවී දෙපාර්තමේන්තුවේ අවසරය පුළුවන් තරම් ඉක්මනට ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අවසරය ලැබුණු වහාම අපි ඒ වැවේ කටයුතු ආරම්භ කරනවා. කාල වකවානුවක් ඇහුවාට හරියටම අහවල් දිනය කියලා කියන්න අපට බැහැ. නමුත් මේ අවුරුද්ද තුළ එන මාස් කන්නයට ගොවීන්ට කුඹුරු වැඩ කර ගන්න පුළුවන් ආකාරයට අපි වැව හදලා දෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 2-2069/'11-(3), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 4-2214/'12-(3), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තුන්වැනි වතාවටත් මේ ප්‍රශ්නය අහනවා. ගරු ඇමතිතුමාත් නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් නැහැ. උත්තරයත් නැහැ. තුන්වැනි වතාවටයි අහන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා තුන්වැනි වතාවටත් මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මාසයක්!

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
4වැනි වතාවට පිළිතුරු දෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මාසයකින් නොවෙයි සතියකින් උත්තරය දෙන්න.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10 -3205/'12- (1), ගරු පී. හැරිසන් මහතා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11 -2449/'12- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
අද පුදුම කල් ඉල්ලීමක්නේ කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මත්‍රොරු තිනත්තිත් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටතු.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 12 -2510/'12- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු නියෝමාල් පෙරේරා - වෙළිනාට්ටලුවල්කළ් පිරති අමෙච්චර්)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)
Sir, on behalf of the Minister of External Affairs, I request for two months' time to answer this Question.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය දෙස පොඩ්ඩක් බලන්න. මම අහලා තිබෙන්නේ 2012 දී ජිනීවාහි පැවැති මානව හිමිකම් කවුන්සිල සැසිවාරය ගැනයි. 2013 වර්ෂයේ පැවැති සැසිවාරය ගැන නොවෙයි. මේකට පිළිතුරු දෙන්න මාස ගණන් කල් ගන්නේ මොකටද?

ගරු නියෝමාල් පෙරේරා මහතා
(මාණ්පුමිකු නියෝමාල් පෙරේරා)
(The Hon. Neomal Perera)
තවම 2013 වර්ෂයේ මාස 4යි ගත වෙලා තිබෙන්නේ. තව මාස 2ක් ඉන්න බැරිද? [බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ - එතිර්ක්කට්සි මුතල්වර්)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
This is information that is readily available.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා පිළිතුරු දීමට කටයුතු කරන්න. [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
What is the point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
Hon. Deputy Speaker, I want you to be reasonable. Can you kindly go through Question No. 12, please?

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
I have given a Ruling.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
Have you read the Question?

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
Hon. Member, you know, as per the Standing Orders, the Hon. Minister can move for time. I have given a Ruling from the Chair for him to answer on the next occasion. So, he will do that. ගරු ඇමතිතුමා මේ ළඟ අවස්ථාවේ දී පිළිතුරු දීමට කටයුතු කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
Due to the incompetence and ignorance of the Ministry of External Affairs, they are unable to answer.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මත්‍රොරු තිනත්තිත් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටතු.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 14 - 2772/'12 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා පොඩි ප්‍රශ්න නේ. අද උත්තර දී ගන්න බැහැ නේ, මේ ගොල්ලන්ට.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කලින් අහපු ප්‍රශ්නය තුන්වැනි වතාවට නොවෙයි හතරවැනි වතාවටයි අහන්නේ. මේවාට උත්තර දෙන්නේ නැත්නම් අපි මෙතැනට ඇවිල්ලා මොකටද? සංවිධායකතුමාට දෝෂාරෝපණය කරනවා නොවෙයි. ඒ ඒ ඇමතිවරු ඒවා දැන ගන්න එපායැ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
වෙනත් දිනයකට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
Question ordered to stand down.

දුම්රිය දෙපාර්තමේන්තුව : පාඩුව පියවා ගැනීමේ වැඩ පිළිවෙළ

புகையிரதத் திணைக்களம்: நட்ட ஈட்டு வேலைத்திட்டம்

DEPARTMENT OF RAILWAYS : PROGRAMME TO COVER LOSS

3207/'12

15. ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2005 සිට 2012 දක්වා කාල සීමාව තුළ දුම්රිය දෙපාර්තමේන්තුව ලබා ඇති පාඩුව පියවා ගැනීමට සකසා තිබෙන වැඩපිළිවෙළ කවරේද;

(ii) දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම පාඩු ලැබීමට හේතු වී ඇත්තේ දුර ගමන් සේවා ක්‍රියාත්මක කිරීමෙන්ද; නැතහොත්, කෙටි ගමන් සේවාවලින්ද;

(iii) 2005-2012 කාල සීමාව තුළ දී භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය යොදා ගැනීම වැඩිවීමක් හෝ අඩුවීමක් සිදුවී තිබේද;

(iv) එසේ අඩුවීමක් තිබේ නම්, එයට හේතු කවරේද;

(v) ඉන්ධන ප්‍රවාහනය සඳහා දුම්රිය යොදා ගැනීම ලාභදායී ක්‍රමයක් වුවත්, ඒ සඳහා එම ක්‍රමය පුළුල්ව යොදා නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005 - 2012 வரை புகையிரதத் திணைக்களம் பெற்றுள்ள நட்டத்தை ஈடுசெய்வதற்காக தயாரிக்கப்பட்டுள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

(ii) புகையிரதத் திணைக்களம் அதிகமாக நட்ட மடைவதற்குக் காரணமாகியிருப்பது, தூரப் பயணச் சேவைகளை அமுல்படுத்தியுள்ளமையா அல்லது குறுந்தூர பயணச் சேவைகளா என்பதையும்;

(iii) 2005 - 2012 காலப் பகுதிக்குள் பொருட்களை ஏற்றிச் செல்வதற்காக புகையிரத்தை பயன் படுத்துதல் அதிகரித்துள்ளதா அல்லது குறை வடைந்துள்ளதா என்பதையும்;

(iv) அவ்வாறு குறைவடைந்திருப்பின் அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) எரிபொருளை ஏற்றிச் செல்வதற்கு புகையி ரதங்களைப் பயன்படுத்துவது இலாபகரமான முறையொன்றாக உள்ளபோதிலும், இம்முறை பரவலாக பயன்படுத்தப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he state -

(i) the programme which is prepared in order to cover the loss incurred by the Department of Railways from the year 2005 to 2012;

(ii) whether the highest loss incurred by the Department of Railways is caused by implementing long distance services or short distance services;

(iii) whether a decrease or an increase has been recorded in the usage of trains for the transportation of goods during the period from the year 2005 to 2012;

(iv) if a decrease has been recorded the reasons for it; and

(v) although the usage of trains for the transportation of fuel is a profitable method, the reasons for not using the said method for that purpose widely?

(b) If not, why?

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) i උතුරු දුම්රිය මාර්ගය කඩිනමින් සංවර්ධනය කිරීම.

ii ඉන්දියානු ආධාර යටතේ දක්ෂිණ දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම.

iii නවීන දුම්රිය කට්ටල 35ක් යොදා මගීන්ගේ අවශ්‍යතා පරිදි වායු සමීකරණය කළ දෙවැනි පන්තියේ මැදිරි එක්කර අමතර ආදායම් මාර්ග උපයා ගනිමින් සිටීම.

iv උතුරු හා තලෙයිමන්නාරම මාර්ගයන් සකසා අවසන් වූ පසු ඉන්දියාවේ සිට භාණ්ඩ ප්‍රවාහනය කිරීමට තලෙයිමන්නාරම හරහා සිදු කිරීමෙන් ද හම්බන්තොට වරාය හා ගුවන් තොටු පොළ සේවා අත්පත් කර ගැනීමෙන් ද පාඩුව අවම කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

(ii) කෙටි ගමන් සේවාවලිනි.

(iii) වැඩි වී තිබේ.

(iv) අදාළ නොවේ.

(v) ඉන්ධන ප්‍රවාහනයට දුම්රිය යොදා ගැනීම 2005 සිට 2012 දක්වා වැඩි වී ඇති මුත් පුළුල් අයුරින් එය ව්‍යාප්ත නොවීමට පහත කරුණු හේතු වී ඇත.

i. දුම්රිය මාර්ග පද්ධතිය හා සම්බන්ධව පෙර පැවති ඉන්ධන ගබඩා කිසියම් වූ ප්‍රමාණයක් දැනට ක්‍රියාත්මක නොවේ.

ii. දුම්රිය ආරක්ෂක නීති රෙගුලාසි අනුව ඉහළ දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය කරවීමේදී දුම්රියට ඉහළ මාර්ගයේ තිරිංග ශක්තිය මත ගෙන යා හැකි ඒකක ප්‍රමාණය හා දුම්රිය සැකසුමේ ඇති අවශ්‍යතාව මත ප්‍රවාහනය කළ හැකි ටැංකි ප්‍රමාණය සීමා වීම.

iii. ඉන්ධන පරිභෝජනය වැඩි වීමට සාපේක්ෂව ඉන්ධන ටැංකි වැඩි ප්‍රමාණයක් ඉන්ධන බෑමේ කටයුතු සඳහා ස්ථානගත කිරීමට නොහැකි වීමෙන් ටැංකි හිස් කර ගැනීමට ප්‍රමාද වීම.

iv. ඉන්ධන ටැංකි සුළු නඩත්තු කටයුතු කොළොන්නාව අංගනය තුළම සිදු කිරීමට ඉඩ පහසුකම් සලසා ගැනීමට නොහැකිව තිබීම.

(ආ) අදාළ නොවේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. දුම්රිය පාඩු පියවා ගැනීමට එක් හේතුවක් වශයෙන් බලවේග කට්ටල් ගත්තාය කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමාම කියා තිබෙනවා. හැබැයි පහු ගිය දවස්වල කෝටි ගණනක් වියදම් කරලා IIFA සමුළුවට ගෙනා කෝච්චිය අද දුවන්න බැරිව කටුනායක නවත්වා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ගන්නා පියවර කුමක්ද කියා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුම්රිය පාඩු අවම කර ගැනීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව හා ප්‍රවාහන අමාත්‍යාංශය විශේෂ ක්‍රියා මාර්ග කිහිපයක්ම අරගෙන තිබෙනවා. ඒ අතර, 2008න් පස්සේ අපි කිසිම අවස්ථාවක ප්‍රවේශ පත්‍ර ගාස්තු රුපියලකින් හෝ වැඩි කරලා නැහැ. ඩීසල් මිල වැඩි වුණත් අපි -

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක නොවෙයි මගේ ප්‍රශ්නය. මේ කෝච්චිය කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැතුව කටුනායක නවත්වලා තිබෙනවා. ඒ කෝච්චිය කොහොමද දුවන්නේ? ඒකේ සුද්දෝ එන්නෙත් නැහැ.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ඔබතුමා සුද්දෝ එන්නේ නැහැයි කිව්වාට -[බාධා කිරීමක්]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ඒ කෝච්චියෙන් සුද්දෝ එන්නේ නැහැ කියලා කිව්වේ. ඔබතුමා ප්‍රශ්නය පටලවා ගන්න එපා.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ඔබතුමා සුද්දෝ එන්නේ නැහැයි කිව්වාට, මේ රටේ සංචාරක ව්‍යාපාරය නිසා අනන්ත අප්‍රමාණ සංඛ්‍යාවක් සුද්දෝ එනවා. දවසකට එන ගුවන් යානා ප්‍රමාණයම වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම කටුනායක අධිවේගී මාර්ගයත් හෙට අනිද්දා විවෘත වනවා. එය විවෘත කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ කෝච්චිය සම්බන්ධයෙන් අපි කටයුතු කළේ පෞද්ගලික අංශයත් එක්ක සම්බන්ධ වෙලා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මයික් එක වැඩ කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, සුද්දෝ එන්නේ නැහැයි කියලා මම කිව්වේ වෙන මාර්ගවලින් නොවෙයි. IIFA සමුළුව වෙනුවෙන් රුපියල් කෝටි ගණනක් වියදම් කරලා මේ කෝච්චිය දැම්මේ සුද්දන්ට කටුනායක ගුවන් තොටු පොළේ සිට එන්නටයි. ඒකටයි විවෘත කෙරුවේ. හැබැයි තවම එක සුද්දෙක්වත් කටුනායක සිට ඒ කෝච්චියෙන් ගෙනාවේ නැහැ.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ඒක IIFA වෙනුවෙන්ම ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

කරුණාකරලා මෙය විවාදයක් කර ගන්න එපා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා මහජන සල්ලි. IIFA ඉවර වුණාට කෝච්චිය ඉවර වෙලා නැහැ නේ. තවම කෝච්චිය තිබෙනවා නේ. IIFA එකට තැම්බිච්ච සුද්දෝ ගෙනැල්ලා රුපියල් කෝටි ගණනක් වියදම් කළ එක විතරයි කෙරුවේ.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

සංචාරක ව්‍යාපාරයෙන් අපි බලාපොරොත්තු වන විධියට, ඉදිරි අවුරුදු කීපය තුළ සංචාරකයන් මිලියන 2.5ක් දක්වා වැඩි කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු වීමත් සමඟ ඇති වන සංවර්ධනයත් සමඟ IIFA කෝච්චියටත් ලැබිය යුතු වටිනාකම් ලැබෙනවා. ඒ සඳහා ඒ ගමන් මාර්ගයේ පහසුකම්, අවශ්‍ය වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඒක එක දවසකින් හෝ එක රැයකින් සිද්ධ වන දෙයක් නොවෙයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට එතුමාගෙන් හරි පිළිතුරක් ලැබුණේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා ප්‍රශ්න වැලක් ඇහුවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙවර ඔබතුමන්ලා මැයි දිනයට ශ්‍රී ලංගම බස් රථ ගෙන ඒමෙන් කෝටි දෙකක පාඩුවක් - [බාධා කිරීමක්] බස් රථ 1,000ක් සඳහා කෝටි දෙකක - [බාධා කිරීමක්] ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා අහන්නේ.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ඒ ගැන දැන් කථා කළා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
තමුන්නාන්සේ ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිවරයා. අපි වෙන කාගෙන්ද අහන්නේ?

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
හොඳයි, මා එයට උත්තරයක් දෙන්නම්. අපි යම් කිසි ගාස්තුවක් ගෙවලා බස් ගෙනාවේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
පොඩ්ඩක් කලබල වෙන්නේ නැතුව ඉන්න කෝ ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
නැහැ, මා කලබල වෙන්නේ නැහැ. හැබැයි ඔබතුමන්ලාගේ කාලයේ බස් රථ නිකම්මයි මැයි දිනයට දුන්නේ. ඒක තමයි ඇත්ත.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අපේ කාලයක් ගැන නොවෙයි - [බාධා කිරීමක්]

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ඔබතුමන්ලා කවදාකවත්- [බාධා කිරීමක්]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මගේ අතුරු ප්‍රශ්නය අහන්න දෙන්න.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ඔබතුමන්ලා කවදාකවත් රුපියලක්වත් බස්වලට ගෙවලා තිබුණේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නියෝජ්‍ය ඇමතිවරයා ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්නේ නැහැ නේ.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ලංගමය විකුණපු team එකක් නේ ඔබතුමන්ලා. ඉතින් එහෙම අහන්න අයිතියක් තිබෙන්නේ කොහොමද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
පොඩ්ඩක් ඉන්න කෝ.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ඔබතුමන්ලා ලංගමය වික්කා නේ. කෝටි හයසිය පනහක් වටිනා ලංගමය කෝටි හයහමාරට වික්කා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය අහන්න දෙන්නේ නැහැ නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ අතුරු ප්‍රශ්නය අහන්නේ ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්නය ඇහුවාද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අහන්න ඉඩ දෙන්නේ නැහැ නේ. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
පොඩ්ඩක් ඉවසලා ඉන්න. මා ඇහුවේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා කිව්වා මැයි දිනය වෙනුවෙන් නොමිලේ ගෙනාපු බස්වලට ඒ ඒ

සංවිධායකවරුන්ගෙන් අය කර ගන්න කියලා. මැයි දිනය වෙනුවෙන් ගෙනා බස් රථ නිසා කෝටි දෙකක පාඩුවක් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ ඒ අයගෙන් මුදල් අය කර ගන්න කටයුතු කරනවාද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ප්‍රශ්නය ඇහුවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙන්න.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිසිදු බස් රථයක් මුදලක් නොගෙවා ගෙනාවේ නැහැ. මේ ගරු සභාවේදී වග කීමකින් ඒ උත්තරය දෙන්නේ. ලංගමයෙන් හෝ පෞද්ගලික අංශයෙන් ගෙනාපු හැම බස් රථයකටම ඒ අවශ්‍ය ගාස්තුව ගෙවලා තමයි අරගෙන ඇවිත් තිබෙන්නේ. ඒක වග කීමකින් මා කියන්නේ. හැබැයි ඔබතුමන්ලාගේ කාලයේ කොළඹට බස් ගෙනාවේ නිකම්. එදා සල්ලි ගෙව්වේ නැහැ. ඔබතුමන්ලාගේ කාලයේ විකුණන්නවත් ලංගමයක් තිබුණේ නැහැ. ඒක ඇත්ත.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුර දීලා අවසානද? තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මයික් එක දෙන්න කියන්නකෝ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නියෝජ්‍ය ඇමතිවරයාගෙන් මා අහනවා, එදා මැයි දිනය දවසේ ලංගමයෙන් බස් රථ 1,000ක් යෙදෙව්වා නම් ලැබුණු ආදායම කොපමණද කියලා.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ඔබතුමා ඒ ප්‍රශ්නය කලින් අහලා තිබුණා නම් මට උත්තරයක් දෙන්න තිබුණා. ඔබතුමා වෙනත් අවස්ථාවක හෝ උපදේශක කාරක සභාවේදී හෝ මේ ප්‍රශ්නය නැවත අහන්න. මා ඔබතුමාට උත්තර දෙන්නම්.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඔබතුමා කලබල වෙන්න එපා. මොකද, ඔබතුමා ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමා නේ.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
නැහැ. මා කලබල වෙන්නේ නැහැ.

ඛනිජ තෙල් සොයා ගැනීම: අමාත්‍යවරයාගේ ප්‍රකාශය

பெற்றோலியம் கண்டுபிடிப்பு: அமைச்சரது பிரகடனம்

DETECTION OF PETROLEUM : MINISTER'S DECLARATION

2189/'11

3. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 1970 - 1977 කාලයේ පැවති රජය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ පේසාලේහි ඛනිජ තෙල් ඇති බව සොයා ගනු ලැබුවේද;

(ii) එසේ නම්, ඛනිජ තෙල් සොයා ගනු ලැබූ දිනය කවරේද;

(iii) සොයා ගත් ඛනිජ තෙල් ප්‍රමාණය කොපමණද; යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සොයා ගත් බව වර්තමාන ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, සොයා ගනු ලැබූ ඛනිජ තෙල් ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය දේශීය වෙළඳ පළට විකුණනු ලබන දිනය කවරේද;

(iv) තෙල් සහ ගෑස් මිල අඩු කරනු ලබන දිනය කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 1970 — 1977ஆம் ஆண்டுகளின் போதான ஆட்சிக்காலத்தில் யாழ்ப்பாண மாவட்டத்தி லுள்ள பேசாலையில் பெற்றோலியம் கண்டு பிடிக்கப்பட்டதா என்பதையும்;

(ii) அவ்வாறெனில், அது எப்போது கண்டுபிடிக்கப் பட்டது என்பதையும்;

(iii) கண்டுபிடிக்கப்பட்ட பெற்றோலியத்தின் அளவையும்

அவர் கூறுவாரா?

[ගරු ජෝන් අමරතුංග මහතා]

(ஆ) (i) இலங்கையில் ஒக்ரோபர் 2011இல் பெற்றோலியம் கண்டுபிடிக்கப்பட்டதென தற்போதுள்ள பெற்றோலியக் கைத்தொழில் அமைச்சர் பிரகடனப்படுத்தினாரா என்பதையும்;

(ii) அவ்வாறெனில், கண்டுபிடிக்கப்பட்ட அளவையும்;

(iii) எப்போது அது உள்நாட்டுச் சந்தையில் விற்பனை செய்யப்படும் என்பதையும்;

(iv) எண்ணெய், எரிவாயு விலைகள் எப்போது குறைக்கப்படும் என்பதையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) whether petroleum was found in Pesalai, Jaffna District under the then Government during 1970 –1977;

(ii) if so, as to when it was found; and

(iii) the quantity of petroleum found?

(b) Will he inform this House -

(i) whether the present Minister of Petroleum Industries declared that petroleum was found in Sri Lanka in October, 2011;

(ii) if so, the quantity that was found;

(iii) as to when it will be sold to the local market; and

(iv) as to when oil and gas prices will be reduced?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ස්වාභාවික වායු ඇති බවට ඇඟවීමක් පමණක් සොයා ගන්නා ලදී. (පේසාලේ පිහිටා ඇත්තේ මන්නාරම් දූපතේය.)

(ii) 1974 සිට 1976 දක්වා කාලය තුළ කණින ලද ගවේෂණ ළිං තුනෙන් ළිං දෙකකින් ස්වාභාවික වායු ඇති බවට ඇඟවීම් ලැබිණි.

(iii) සොයා ගැනීම ස්වාභාවික වායු ඇති බවට ඇඟවීමක් පමණි.

(ආ) (i) ඔව්.

(ii) කොන්ත්‍රාත්කරු සොයා ගැනීම ඇගැයීමේ වැඩසටහනක් සකස් කරමින් සිටී. එය 2013 දෙසැම්බර් 31 දිනට පෙර ඉදිරිපත් කිරීමට නියමිතය.

(iii) ඇගැයීමේ වැඩසටහනේ ප්‍රතිඵල සහ ඉන් පසුව එළඹෙන ක්ෂේත්‍ර සංවර්ධන සහ ස්වාභාවික වායු නිෂ්පාදන ක්‍රියාවලිය මත රඳා පවතී.

(iv) ඇගැයීමේ වැඩසටහනේ ප්‍රතිඵල සහ ඉන් පසුව එළඹෙන ක්ෂේත්‍ර සංවර්ධන සහ ස්වාභාවික වායු නිෂ්පාදන ක්‍රියාවලිය මත රඳා පවතී.

(ඇ) අදාළ නොවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 5 -2546/'12- (3), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස 3ක් කල් ඉල්ලනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ප්‍රශ්නය අහන්නේ තුන්වන වතාවටයි. Tendersවලට register වුණු අයගේ නාම ලේඛනයක් තිබෙනවා නම් මේ ප්‍රශ්නයට පිළිතුර දෙන්න තව මාස තුනක් කල් ගන්න ඕනෑ නැහැ. මා අහන්නේ, හමුදාවට භාණ්ඩ සපයන අයගේ නාම ලේඛනයයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

කඩිනමින් පිළිතුරු දීමට කටයුතු කරන්න.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 6 -2972/'12- (2), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති 2ක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

විගණන පරීක්ෂක සිදු කළ වංචනික ක්‍රියාව : විධිමත් පරීක්ෂණයක්

கணக்காய்வுப் பரிசோதகரின் மோசடி: முறையான விசாரணை

FRAUD COMMITTED BY AUDITOR: FORMAL INVESTIGATION

3094/'12

7. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. Ajith P. Perera)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) වර්ෂ 1996-2006 කාල පරිච්ඡේදය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිදුවූ වංචාවක් වැළැක්වීමට කටයුතු නොකිරීමෙන් විගණන පරීක්ෂක ජයවර්ධන නැමැත්තා විසින් වංචනික ක්‍රියාවක් සිදුකර තිබේද යන්න පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙසට පොලිස් දෙපාර්තමේන්තුවේ කොළඹ වංචා විමර්ශන ඒකකයට දන්වා තිබේද;

(ii) ඉහත සඳහන් විගණන පරීක්ෂකවරයා අල්ලස් ලබා ගෙන තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වෙත දන්වා තිබේද;

(iii) එම නිලධාරියාට රැකියාවක් සඳහා විදේශගතවීමට වැටුප් රහිත නිවාඩු අනුමත කර දී තිබේද;

(iv) විධිමත් කමිටුවක් මගින් පැවැත්වූ මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකොට, ඉහත පරිදි ඔහුට නිවාඩු අනුමත කිරීම නීති විරෝධී බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 1996- 2006ஆம் ஆண்டு வரையான காலப் பகுதியினுள் தேசிய நீர் வழங்கல், வடிகால மைப்புச் சபையில் இடம்பெற்ற மோசடிகளைத் தடுப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளாமையின் காரணமாக கணக்காய்வுப் பரிசோதகர் ஜயவர்தன என்பவர் மோசடிச் செயலொன்றை மேற்கொண்டுள்ளாரா என்பதுபற்றி முறையான தொரு விசாரணையை நடாத்துமாறு பொலிஸ் திணைக்களத்தின், கொழும்பு மோசடிப் புலனாய்வுப் பிரிவுக்கு அறிவிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி கணக்காய்வுப் பரிசோதகர் இலஞ்சம் பெற்றுள்ளாரா என்பதை உறுதிசெய்து கொள்வதற்கான விசாரணையொன்றை நடாத்துமாறு இலஞ்சம் அல்லது ஊழல்கள் பற்றிய குற்றச் சாட்டுகளை விசாரணை செய்வதற்கான ஆணைக்குழுவுக்கு அறிவிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) மேற்படி உத்தியோகத்தர் தொழில்வாய்ப்புக்காக வெளிநாடு செல்வதற்கு சம்பளமற்ற லீவு அங்கீகரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) முறையான குழுவொன்றினால் நடாத்தப்பட்ட ஆரம்ப விசாரணை அறிக்கையின் சிபார்சுகளை அமுல்படுத்தாது, மேலே குறிப்பிடப் பட்டுள்ளவாறு இவருக்கு லீவு அங்கீகரிக்கப் பட்டுள்ளமை சட்டவிரோதமானது என்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House whether -

(i) the Colombo Crime Investigation Unit of the Department of Police has been asked to conduct a formal investigation to ascertain whether the Auditor known as Jayawardana has committed an act of fraud by not attempting to prevent a fraud that took place in the National Water Supply and Drainage Board during 1996-2006;

(ii) the Commission to Investigate Allegations of Bribery or Corruption has been asked to conduct an investigation to ascertain whether the aforesaid Auditor has obtained bribes;

(iii) No-pay leave has been approved for that officer to migrate for employment; and

(iv) he admits that it is illegal to approve leave to him without carrying out the recommendations of the preliminary inquiry conducted by a formal committee?

(b) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 1996 සිට 2006 කාල පරිච්ඡේදය තුළ සිදු වූ වංචාවක් වැළැක්වීමට කටයුතු නොකිරීමක් පිළිබඳ චෝදනාවක් විගණන පරීක්ෂක ජයවර්ධන මහතාට එරෙහිව ලැබී නොතිබුණි. නමුත් ඉහත නිලධාරියා විසින් දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන පරිදි නිකුත් කර තිබූ ලිපියක් පිළිබඳව, පරීක්ෂණ පවත්වා ඉහත නිලධාරියා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. එසේම මෙම මූල්‍ය වංචා සම්බන්ධයෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කරන ලද පැමිණිල්ලක් අනුව, 2007 වර්ෂයේදී ඒ සම්බන්ධයෙන් මෙම නිලධාරියාගෙන් ද ප්‍රශ්න කර තිබුණි.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

තවද, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වෘත්තිය සමිතියක් විසින්, මණ්ඩලයේ සිදු වූ මුදල් වංචාවක් සම්බන්ධයෙන් ජයවර්ධන මහතා ද වගඋත්තරකරුවකු කරමින් ගොනු කර තිබූ නඩුවක් නිශ්ප්‍රභ වී තිබුණි. ඒ අනුව, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිදු වී ඇති වංචාව සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස පොලිස් දෙපාර්තමේන්තුවේ කොළඹ වංචා විමර්ශන අංශයට ඉල්ලීමක් කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවුණි.

(ii) ඉහත සඳහන් ඡේදයේ නිරීක්ෂණය අනුව විගණන පරීක්ෂකවරයා අල්ලස් ලබා ගත් බවක් හෝ අල්ලස් ගත් බව සනාථ කරන තොරතුරු කිසිවක් දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී නොතිබුණ බැවින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වෙත වාර්තා කිරීමේ අවශ්‍යතාවක් පැන නැඟී නොතිබුණි.

(iii) විදේශ රැකියාවක් සඳහා නිලධාරියාට වැටුප් රහිත නිවාඩු අනුමත නොකිරීමට හේතුවන කිසිවක් ඉදිරිපත්ව නොතිබූ බැවින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සහ බැඳුම්කරයකට යටත්ව වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත කර ඇත.

(iv) මූලික විමර්ශන අනුව නිලධාරියා සම්බන්ධයෙන් කටයුතු කර ඇති නිසා විදේශ රැකියාවක් සඳහා නිවාඩු අනුමත කිරීම නීති විරෝධී වන බවක් නිරීක්ෂණය නොවේ.

(ආ) විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම නිසා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ඉහත නිලධාරියාට වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත කර ඇත.

බඩල්කුඹුර නගරයේ ස්ථාපිත කර ඇති අධිවෝල්ටීයතාවයකින් යුත් විදුලි රැහැන් පද්ධතිය : මාර්ගය වෙනස් කිරීම

படல்கும்புற நகரத்தில் நிருமாணிக்கப்பட்டுள்ள உயர் வோல்ற் மின்சாரக் கம்பிமுறைமை : மாற்றுவழி

HIGH VOLTAGE CABLE SYSTEM FIXED IN BADALKUMBURA TOWN: CHANGE OF PATH

3141/'12

8. ගරු ජෝන් අමරතුංග මහතා(ගරු ආර්.එම්. රංජිත් බද්දුම බණ්ඩාර මහතා වෙනුවට)

(මාණ්පුමිකු ජෝන් අමරතුංග - மாண்புமிகு ஆர். எம். ரஞ்சித் மத்தும பண்டார சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. R.M. Ranjith Madduma Bandara)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) බඩල්කුඹුර නගරයේ ප්‍රධාන මාර්ග දෙපස ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඉහලින් විදුලි සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන දෙකක් යා කරනු ලබන අධිවෝල්ටීයතාවයකින් යුත් (වෝල්ට් 66000) විදුලි රැහැන් පද්ධතියක් ස්ථාපිත කර ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) නගරයක් මධ්‍යයේ ඉහත සඳහන් ආකාරයේ විදුලි රැහැන් ඇදීම සිදු නොකිරීම සාමාන්‍ය ප්‍රතිපත්තිය බවත්;

(ii) එසේ තිබියදී, නගර මධ්‍යයේ එම අධිවෝල්ටීයතාවයෙන් යුතු විදුලි රැහැන් ඇදීම නගරයේ සංවර්ධනයට මෙන්ම නගරවාසීන්ටද විශාල බාධාවක් බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම අධිවෝල්ටීයතාවයෙන් යුතු විදුලි රැහැන් පද්ධතිය ඇද ඇති මාර්ගය වෙනස් කිරීමට ක්‍රියා කරන්නේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) படல்கும்புற நகரத்தின் பிரதான வீதியின் இருமருங் கிலும் நிர்மாணிக்கப்பட்டுள்ள கட்டிடங்களுக்கு மேலாக இரண்டு மின்கடத்தி நிலையங்களை இணைக் கின்றதான அதிக வோல்ற்றளவு கொண்ட (66000 வோல்ற்) மின்கம்பி முறையொன்று நிறுவப் பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) நகரமொன்றின் மத்தியில் மேலே குறிப்பிட்ட விதத்தில் மின்சாரக் கம்பியை பொருத்தா திருத்தல் பொதுவான கொள்கை என்பதையும்,

(ii) அவ்வாறு இருக்கும் பொது நகரத்தில் மேற்படி அதிக வோல்ற்றளவு கொண்ட மின்சாரக் கம்பிகளை பொருத்துதல் நகரத்தின் அபிவிருத் திக்கும் நகரவாசிகளுக்கும் பாரிய தடையாகு மென்பதையும்

அவர் ஏற்றுக் கொள்கிறாரா?

(இ) ஆமெனில், மேற்படி அதிக வோல்ற்றளவு கொண்ட மின்சாரக் கம்பிமுறைமை பொருத்தப்பட்டுள்ள வழியை மாற்றியமைக்க நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Is she aware that a high voltage cable system (66,000 volts) connecting two electricity transmission centres has been fixed over the buildings constructed on either side of the road of the Badalkumbura Town?

(b) Will she admit that -

(i) it is the general policy not to fix cable in the above manner in the centre of a town; and

(ii) nonetheless, the fixing of the aforesaid high voltage cable system in the town centre is a severe obstacle for the development of town as well as the residents of the town?

(c) If so, will she state whether action will be taken to change the path of the aforesaid high voltage cable system?

(d) If not, why ?

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමිය)

(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வலு, சக்தி அமைச்சர்)

(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) නැත. බඩල්කුඹුර නගරයේ ප්‍රධාන මාර්ගයේ එක්පසෙකවත් අධි වෝල්ටීයතාවකින් යුත් (වෝල්ට් 66000) ගොඩනැංවීමක් කර නොමැත. නගරයේ ගොඩනැගිලිවලට විදුලිය සපයන අඩු වෝල්ටීයතාවෙන් යුතු විදුලි රැහැන් මාර්ගය ඔස්සේ කිලෝ වොට් 33 (33 KV) බෙදා හැරීම මාර්ගයක් මහා මාර්ගයේ එක් පසෙක ඉදි කර

තිබේ. මෙම රැහැන් මාර්ගය කිසිදු ගොඩනැගිල්ලකට ඉහළින් ගමන් නොකරයි.

(ආ) (i) මාර්ග සංවර්ධන අධිකාරියේ උපදෙස් අනුව මහා මාර්ග සඳහා වෙන් කර තිබෙන සීමාව තුළ ප්‍රධාන මාර්ගය ඔස්සේ ඉදිකර ඇති අඩු සැර වෝල්ටීය විදුලි සැපයුම් මාර්ගය ඔස්සේම 33 KV සැපයුම් මාර්ගය ඉදි කර ඇත.

(ii) මාර්ගයට වෙන් කර ඇති ප්‍රදේශය ඔස්සේ කිලෝ වොට් 33 (33 KV) බෙදා හැරීම් මාර්ගය ඉදි කර තිබෙන්නේ මහා මාර්ගයට හා ගොඩනැගිලිවලට යෝග්‍ය ආරක්ෂිත දුර පවත්වා ගනිමිනි. එබැවින් මෙම රැහැන් මාර්ගය මඟින් කිසිදු සංවර්ධන ක්‍රියාවලියකට බාධාවක් ඇති වන්නේ නැත. විදුලිබල පනතේ රෙගුලාසි යටතේ මෙම ආරක්ෂාකාරී දුර සඳහන් කර තිබේ.

එසේම මෙම නව විදුලි මාර්ගය ඔස්සේ ප්‍රදේශයේ ආර්ථික සහ සමාජ සංවර්ධනය සඳහා තවදුරටත් පහසුකම් සැපයෙනු ඇත.

(ඇ) පැන නොනඟී.

එම බෙදා හැරීම් මාර්ගය ඉදි කර තිබෙන්නේ මහාමාර්ගයට වෙන් කර තිබෙන ප්‍රදේශය තුළ වේ.

(ඈ) පැන නොනඟී.

චක්‍රලේඛ අංක 49/89 ප්‍රකාරව ඉල්ලුම්කරුවන්ට වන්දි : පියවර

சுற்றறிக்கை இல.49/89 இன்படி விண்ணப்பித்தோருக்கு இழப்பீடு : நடவடிக்கை

COMPENSATION TO APPLICANTS AS PER CIRCULAR NO. 49/89: MEASURES TAKEN

3166/'12

9. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු ඊ. සරවනපවන් මහතා වෙනුවට)

(මාණ්පුමිකු ජෝන් අමරතුංග - மாண்புமிகு ஈ. சரவணபவன் சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. E. Saravanapavan)

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 49/89 ප්‍රකාරව දේපළ වන්දි ගෙවීමට උතුරු නැගෙනහිර පළාත් සභා අමාත්‍යාංශය කටයුතු කළ අවස්ථාවේදී, එම අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉල්ලුම්පත් ඉදිරිපත් කළ සියලු දෙනාට වන්දි මුදල් ගෙවනු ලැබුවේද;

(iii) එසේ ගෙවා නොමැතිනම්, ගෙවීම් කළ ඉල්ලුම්කරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) වන්දි නොගෙවන ලද ඉල්ලුම්කරුවන්ට අදාළ වන්දි මුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය අවස්ථාවේදී චක්‍රලේඛ අංක 49/89 අනුව ඉල්ලීම් ඉදිරිපත් කළ පිරිසගෙන් මෙතෙක් වන්දි මුදල් නොලැබී පීඩාවට පත්වූ පිරිසක් සුභසාධන කඳවුරුවල සිට පැමිණ කිළිනොච්චිය හා මුලතිව් ප්‍රදේශවල නැවත පදිංචි වීඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් පිරිසට කඩිනමින් වන්දි මුදල් ලබා දී ඔවුන්ගේ ජීවිත යථා තත්ත්වයට පත්කිරීමට යම් කිසි පියවරක් ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொது நிருவாக சுற்றறிக்கை இல.49/89 இன்படி ஆதனங்களுக்கான இழப்பீடு வழங்குவதற்கு வடக்கு, கிழக்கு மாகாண சபை அமைச்சு நடவடிக்கை எடுத்தபோது அந்த அமைச்சின் சிபாரிசுடன் புனர்வாழ்வளிப்பு சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சுக்கு கிடைத்த விண்ணப்பங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) விண்ணப்பங்களைச் சமர்ப்பித்த அனைவருக்கும் இழப்பீடு செலுத்தப்பட்டதா என்பதையும்;

(iii) அவ்வாறு செலுத்தப்படவில்லையெனில், செலுத்தப்பட்ட விண்ணப்பதாரர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iv) நட்ட ஈடு செலுத்தப்படாத விண்ணப்பதாரர்களுக்கு குறிப்பிட்ட இழப்பீட்டுத் தொகையை வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) கடந்த சந்தர்ப்பத்தில் 49/89 ஆம் இலக்க சுற்றறிக்கையின்படி விண்ணப்பித்தவர்களில் இதுவரை இழப்பீடு கிடைக்காத, பாதிக்கப்பட்ட சிலர் நலன்புரி முகாம்களிலிருந்து வந்து கிளிநொச்சி, முல்லைத்தீவு பிரதேசங்களில் மீள குடியமர்ந்துள்ளார்கள் என்பதை அவர் அறிவாரா?

(இ) மேற்கூறியவர்களுக்கு துரிதமாக இழப்பீடு வழங்கி அவர்களது வாழ்க்கையை சுமுக நிலைக்கு கொண்டுவருவதற்கு ஏதேனும் நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Rehabilitation and Prison Reforms:

(a) Will he inform this House -

(i) the number of applications received by the Ministry of Rehabilitation and Prison Reforms with the recommendations of the Provincial Ministry of the North and East Provincial Council, when that Ministry took action to pay compensation for properties as per Public Administration Circular No.49/89;

(ii) whether all who submitted applications were paid compensation;

(iii) if not, of the number of applicants who were paid compensation; and

(iv) whether steps will be taken to pay compensation to the applicants who were not paid compensation?

[ගරු ජෝන් අමරතුංග මහතා]

(b) Is he aware that a group of persons out of the people who had submitted applications as per Public Administration Circular No. 49/89 on the last occasion, but not received compensation up to now and faced with difficulties, have returned from the welfare camps and resettled in Kilinochchi and Mullaitivu areas?

(c) Will he also inform this House whether measures will be taken to provide compensation to the aforesaid people speedily and bring their lives back to normal?

(d) If not, why?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1987 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසාන වන විට ලැබී තිබූ ලිපිගොනු සංඛ්‍යාව 25,899කි. ඉන් පසු මේ දක්වා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව මුලතිව්, මන්නාරම, කිලිනොච්චි දිස්ත්‍රික්කවලින් වන අතර එය 2,405කි.

(ii) සම්පූර්ණ කරන ලද ලිපිගොනු අතරින් වැඩි දෙනෙකුට ගෙවීම් කර ඇත.

(iii) ගෙවීම් කළ ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව 17,987කි.

(iv) වන්දි නොගෙවන ලද ඉල්ලුම්කරුවන් 8,857ක් වෙනුවෙන් ලිපිගොනු සූදානම් කර ඇති අතර, 2013 වර්ෂයේදී ලිපි ගොනු 500ක් සඳහා රුපියල් මිලියන 44ක් ගෙවීම් කිරීමට සූදානම් කර ඇත.

2013.04.20 දින අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල ඉල්ලුම්කරුවන් 120 දෙනෙකු වෙත රුපියල් මිලියන 7.6ක මුදලක් ගෙවීම් කරනු ලැබිය. ඉතිරි ලිපි ගොනු සඳහා තවත් ප්‍රතිපාදන ලැබෙමින් පවතී.

(ආ) කවර ප්‍රදේශවල ද යන්න නොදනී. එය දැනගත හැකි වන්නේ අදාළ අමාත්‍යාංශයෙන් විමසීමෙනි. ඉල්ලුම්පත් එවා ඇත්තේ ආයතන ප්‍රධානියා මගිනි. කඳවුරුවල සිටි අය ඉල්ලුම්කර ඇත්තේ යුද්ධය අවසාන වීමට පෙර ය. එම අය යුද්ධය අවසානයෙන් පසු නැවත වෙන් වෙන්ව, මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල පදිංචි වී සිටිය හැකිය.

(ඇ) මෙම අයදුම්පත් සම්බන්ධව වන්දි මුදල් කඩිනමින් ලබා දීමට, අපේක්ෂාවෙන් ඉදිරි කටයුතු කරගෙන යන බවත්, ඉදිරි කාලය ඇතුළත ප්‍රතිපාදන ලැබෙන පරිදි හැකි ඉක්මනින් ලිපිගොනු ලැබී ඇති පිළිවෙළ අනුව වන්දි සහන සැලසීමෙන් ඔවුන්ගේ ජීවිත යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කරන බවත් සඳහන් කරමි.

(ඈ) පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13-2713/'12-(1), ගරු රවි කරුණානායක මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවි කරුණානායක මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නියෝමාල් පෙරේරා මහතා
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
Sir, on behalf of the Minister of External Affairs, I ask for two months' time to answer the Question. [බාධා කිරීම්]

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ප්‍රශ්න අහපු මන්ත්‍රීතුමන්ලා හත් දෙනෙකු ඇවිල්ලා නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒ වෙනුවට මම ඉන්නවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඇමතිවරු හත් දෙනෙකු පිළිතුරු දීලා නැහැ. [බාධා කිරීම්] ඒ සම්බන්ධයෙන් දෙපැත්තේම අවධානය යොමු කරවනවා. හත් දෙනෙකු ඇවිල්ලා නැහැ. හත් දෙනෙකු කල් ඉල්ලලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ප්‍රශ්න ඇසීමට සහ පිළිතුරු දීමට කටයුතු කරන්න කියලා දෙපාර්ශ්වය වෙතම මූලාසනය අවධානය යොමු කරවනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මේ සභාවට ආපු අපට මොකක්ද වෙන්නේ? අපට හුළංද හම්බ වෙන්නේ? අපට උත්තර දුන්නේ නැහැ. ඒකයි මම කියන්නේ. අපි මෙතැන ඉඳගෙන බලාගෙන ඉන්නවා උත්තර දෙයි කියලා. ඇමතිවරු උත්තර දෙන්නේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ නිසා තමයි මම දෙපාර්ශ්වයේම අවධානය යොමු කළේ.

ජාතික පාසල්වල උසස් පෙළ පන්ති සඳහා සිසුන් ඇතුළත් කිරීම : අධ්‍යාපන අමාත්‍යාතුමාගේ ප්‍රකාශය

தேசிய பாடசாலைகளில் உயர்தர வகுப்புகளுக்கு மாணவர் அனுமதி : கல்வி அமைச்சரினது கூற்று

ADMISSION OF STUDENTS TO ADVANCED LEVEL CLASSES OF NATIONAL SCHOOLS: STATEMENT BY MINISTER OF EDUCATION

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යාතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මෙම ප්‍රකාශය කිරීමට කෙටි අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මෙය ජාතික පාසල්වලට අපොස උසස් පෙළ පන්තිවලට සිසුන් ඇතුළු කිරීම සම්බන්ධයෙන් පවතින විවිධ මත පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රකාශයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1990 සිට 2012 දක්වා අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත්වීමේ ප්‍රතිශතය මා පහත සඳහන් කරන පරිදි වේ. 1990 දී සියයට 19.0යි. 1995 දී සියයට 15.2යි. 2000 දී සියයට 29.34යි. 2005 දී සියයට 46.61යි. 2010 දී සියයට 57.62යි. 2011දී 56.54යි. 2012 දී සියයට 65යි. මෙසේ අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් සුදුසුකම් ලද ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රසාරණය වීමත් සමඟ ඔවුන්ට විද්‍යා, වාණිජ, කලා, තාක්ෂණය යන අංශවලින් උසස් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව වර්ධනය කිරීමටත්, ඒ සඳහා පාසල්වලට ඇතුළු වීමේ නව ක්‍රමවේදයන් හඳුන්වා දීමටත්, ඒවා සමාජ සාධාරණය ඉටු වෙන ආකාරයෙන් සිද්ධ කිරීමටත් සිදුව ඇත. ඒ නිසා අතීතයේ සිටම උසස් පෙළ පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛන මඟින් සිසුන් ඇතුළත් කිරීමේදී සමාන පහසුකම් සහිත පාසල්වලින් සිසුන් ඇතුළත් කර ගැනීම වෙනුවට අදාළ විෂය ධාරවන් හෝ පහසුකම් නොමැති පාසල්වලින් සිසුන් ඇතුළු කර ගැනීමට ප්‍රමුඛත්වය ලබා දෙන ලෙස දන්වා ඇත. එය අවශ්‍යයෙන්ම පහසුකම් නොමැති ප්‍රදේශවල ග්‍රාමීය දරුවන් වෙනුවෙන් ඔවුන්ට හා ඔවුන්ගේ දෙමව්පියන්ට සාධාරණත්වය ඉෂ්ට කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියා පිළිවෙතකි.

1999 වර්ෂයේ සිට මේ දක්වා නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛනවල උසස් පෙළ පන්තිවලට සිසුන් ඇතුළු කිරීමේදී දක්වා ඇති නිර්ණායකවලට අනුව තම පාසලේ සිසුන් ඇතුළු කර ගැනීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සඳහා සිසුන් ඇතුළත් වීමෙදී සමාන පහසුකම් සහිත ජාතික පාසල්වලින් සිසුන් ඇතුළත් කර ගැනීම නොකළ යුතු බව අවධාරණය කර ඇත. [බාධා කිරීමක්] ඉන්න, ඉන්න. කරුණාකරලා මගේ ප්‍රකාශය අවසන් වෙන තුරු ඉන්න කෝ.

පසු ගිය කාලය තුළ නිකුත් කොට ඇති සියලුම චක්‍රලේඛන 1 සිට 7 දක්වා ඇමුණුම් මඟින් ඉතාම පුළුල් ලෙස කියවා බැලීම සඳහා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව **සභාගත*** කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මෙවර අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් සුදුසුකම් ලබන ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 65ක් වැනි ඉහළ අගයක් ගෙන ඇත. මෙම සංඛ්‍යාව තුළ පහසුකම් නොමැති ග්‍රාමීය ප්‍රදේශවල පාසල්වලින්ද සුදුසුකම් ලැබූ සිසුන් විශාල පිරිසක් සිටින බැවින් ඔවුන්ගේ අනාගත අධ්‍යාපනයට අවස්ථා තහවුරු කරවනු වස්, 1999 සිට මේ දක්වා පාසල්වල උසස් පෙළ පන්තියට ළමයින් ඇතුළත් කිරීමට අදාළව නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව, පහසුකම් නොමැති ග්‍රාමීය පාසල්වලින් අතිවිශිෂ්ට ලෙස සමත් වූ සිසුසන්ට පහසුකම් සහිත පාසලකට ඇතුළත් වීමට අවස්ථාව ලබා දීමේ පරම පවිත්‍ර චේතනාවෙන් 2013.04.29 වන දින අංක 2013/4 නව චක්‍රලේඛනය නිකුත් කරන බව මෙම ගරු සභාවට ප්‍රකාශ කර සිටිමි. එම චක්‍රලේඛනයේ සඳහන් වන ප්‍රධාන කරුණු මෙසේයි.

අ.පොස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම පහත පරිදි සිදු කළ යුතුය.

2012/14 චක්‍රලේඛනයේ 4.0 වගන්තියට අනුව 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය පහත සඳහන් පරිදි විය යුතුය.

(අ) එම පාසලේ අපේක්ෂකයන් ලෙස විභාගයට පෙනී සිටි සිසුන්.

(ආ) එකම 1AB (උසස් පෙළ විද්‍යා, කලා, වාණිජ) පාසලක් හෝ නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි පාසල්වලින් අතිවිශිෂ්ට ලෙස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ලබා ඇති ග්‍රාමීය පාසල්වල සිසුන්.

(ඇ) (අ) සහ (ආ) යන වගන්තිවලට අනුව සිසුන් ඇතුළත් කිරීමෙන් පසු තව දුරටත් පුරප්පාඩු පවතී නම්, පාසල පිහිටි දිස්ත්‍රික්කයේ 1AB නොවන පාසල්වලින් විශිෂ්ට ලෙස සමත් වූ සිසුන්.

(ඉ) මෙම අනුපිළිවෙළට සිසුන් ඇතුළත් කිරීමෙන් පසු උසස් පෙළ සියලු විෂය ධාරා යටතේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව හා උසස් පෙළ ගුරු භවතුන් පන්තිවලට අනුයුක්ත කිරීම පිළිබඳ පූර්ණ වාර්තාවක් විදුහල්පතිගේ අත්සනින් අගෝස්තු 31 වන දිනට ප්‍රථම පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන ලේකම් වෙත ද /ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත ද වාර්තා කළ යුතුය.

A සාමර්ථ 5කට වඩා වැඩියෙන් ලබපු දරුවෝ, සියලුම විෂයන්ට A සාමර්ථ ලැබූ දරුවෝ සියයට 1.4ක්, එනම් පන්දහස් ගණනක් සිටිනවා. ඒ නිසා කුප්පි ලාම්පු එළියෙන් පාඩම් කළ, කලා අංශය පමණක් තිබෙන, විද්‍යා අංශය නැති, විද්‍යාගාර පහසුකම් නැති පාසල්වල දරුවන්ට පහසුකම් සහිත පාසලකට පැමිණෙන්නට තිබෙන අවස්ථාව අවහිර කරන්න එපා කියලා මම මේ ගරු සභාවෙන් ඉතාම පැහැදිලි ලෙස ඉල්ලා සිටිනවා. ඒ ගම්වල ජනතාව ඡන්දය දීලා පත් කරපු නියෝජිත පිරිසක් ලෙස අප තමුන්නාන්සේලා සියලු දෙනා ඒ දරුවන්ට එම අවස්ථාව ලබා දෙන්න ඕනෑ.

අතීතයේ සිටි යුග පුරුෂයන් වන අපේ ශ්‍රීමත් අනගාරික ධර්මපාල මැතිතුමා, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා පහසුකම් තිබෙන පාසල්වල නේවාසිකාගාර හැදුවේ, පහසුකම් නොමැති ප්‍රදේශවල විශිෂ්ට ලෙස දක්ෂතා දැක්වූ ළමයින්ට පහසුකම් තිබෙන පාසල්වල ඉගෙනුම ලබා දෙන්නයි.

ඒ නිසා එම දරුවන්ටයි මෙය හදලා තිබෙන්නේ. ගමේ දරුවන්ට අවස්ථාව ලබා දීම සඳහායි. වරප්‍රසාද අහිමි, හඬක් නහන්නට බැරි, අවිහිංසක ළමයින් වෙනුවෙනුයි මේ චක්‍රලේඛය නිකුත් කර තිබෙන්නේ කියන එක මා මේ වේලාවේ දී මේ ගරු සභාවට මතක් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික පාසල්වලට දරුවකු මාරු වීම පිළිබඳව රටේ මතු වී තිබෙන ආන්දෝලනාත්මක තත්ත්වයට ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් පිළිතුරක් ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වනවා. මේ පිළිබඳ විශාල සාකච්ඡාවක් රටේ තිබෙනවා. ප්‍රධාන ප්‍රශ්නය තමයි පාසල්වලට ළමයින් ඇතුළත් කර ගැනීමේ දී අය කර ගන්නා මුදල -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේ ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් නොවෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා අවසන් කරනවා. අද වෙලාව තිබෙන නිසායි එතුමාගෙන් මම අහන්නේ.

ගරු ඇමතිතුමාගෙන් මේ කාරණය ගැන දැන ගන්න කැමැතියි. ගරු ඇමතිතුමා කිව්වා, මේ චක්‍රලේඛ හරහා ඒ මුදල් අය කර ගැනීම් නතර කරලා තිබෙනවා කියලා. නමුත් දැනුත් මුදල් අය කර ගැනීම් සිද්ධ වනවා. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ සභාපතිතුමාගේ දියණියගෙනුත් මුදල් අය කරගෙන තිබෙනවා. ඒ වාගේම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ පුතා පාසලට ඇතුළත් කර ගැනීමේත් දී මුදල් අය කර තිබෙනවා. ඒ නිසා ඔබතුමාට තවත් සාක්ෂි අවශ්‍ය නැහැ. ඔබතුමා එදා එකඟ වුණා, පරීක්ෂණයක් කරනවාය කියලා. දැන් ඒ පරීක්ෂණවල තත්ත්වය කුමක්ද කියලා මේ පාර්ලිමේන්තුවට කියන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා ඒ ප්‍රකාශය කළ වහාම මා මෙම ස්ථානයේ සිටම දුරකථනයෙන් දැනුම් දීලා, එතුමාගෙන් රහසිගතව අසා දැනගත් පාසලට ඒ අවස්ථාවේම අපේ අමාත්‍යාංශයෙන් පරීක්ෂණ කණ්ඩායමක් යැව්වා. කිසිම දරුවෙක් ඒ පාසලේ උසස් පෙළ පන්තිවලට ඇතුළත් කර ගෙනත් නැහැ. සිටින දරුවන්ගෙන් මුදල් අය කරන බවක් කියලාත් නැහැ. කොළඹ නගරයේ තිබෙන, ඔබතුමා සඳහන් කළ පාසලේ රැස්වීමක් පවත්වා, පාසල් සේවා ගාස්තු ගෙවන්නට ඕනෑ බව ඒ දරුවන්ට කියලා තිබෙන බව පමණයි දැනගන්නට තිබෙන්නේ. ඒ හැර කිසිම මුදලක් අය කරලා නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක තමයි ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිතුමා කියන එක ඇත්ත. නමුත් මෙහෙම දෙයක් තිබෙනවා. ඒ පාසල් විසින් අටවා ගන්නා ලද පාසල් සංවර්ධන සමිති තිබෙනවා. ඒකෙන් තමයි ඔවුන් රිංගන්නේ.ඒ පාසල් සංවර්ධන සමිතිය ලියා පදිංචි කරනවා, පුනා ආයතනයක් හැටියට.

හැබැයි මේ සියලු ක්‍රියාපටිපාටීන් නිල ලෙස පාසලේ පාලනාධිකාරීන් ඉන්න සාකච්ඡාවේදී තමයි තීරණ ගන්නේ. ඒකට අත්සන් කර දෙන්නේ විදුහල්පතිතුමා නොවෙයි. ඒකට අත්සන් කරන්නේ පාසල් සංවර්ධන සමිතියයි. එම නිසා මේ ප්‍රෝඩාව යන්නේ ඒක හරහායි. ඔබතුමාට ඒක තේරෙනවා. එම නිසා ඔබතුමා කිව්වාම," හා, දැන් එහෙම අය කිරීමක් නැහැ "කියා, මේ ඔක්කොම සිනහ වෙයි. මොකද, මේ හුහක් අයගේ දරුවෝ සල්ලි දීලා ඇවිත් තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ. නැහැ. එහෙම හිනහ වෙන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදීත් මේ ප්‍රශ්නය සාකච්ඡා වුණු බව ඔබතුමා දන්නවා. ඒක මටත් වාර්තා වෙලා තිබෙනවා. ඔබතුමා නොවෙයි. ඒකත් කියන්න එපායැ. ඒ වාගේ හරි පැහැදිලිව ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, ඔබතුමා කියන එක හරි. පරීක්ෂණ ක්‍රියාවලිය යන්නේ පාසලේ විදුහල්පතිතුමාත් එක්ක නේ. නමුත් එතැන පටලවා ගත් වෙනත් ආයතනයක් ගොඩ නහා තිබෙනවා. ඒ ආයතනය කරන දෙය ඔබතුමා පරීක්ෂාවට ලක් කරන්න. එය නිල ව්‍යුහයකට ඇතුළු කර තිබෙනවා. ඒ නිල ව්‍යුහයේ මුදල් අය කර ගැනීම සිදු වෙනවා. සල්ලි දී තිබෙනවා.[බාධා කිරීම්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
දැන් හරි නේ. ඔබතුමා වාඩි වෙන්නකෝ, මම උත්තරය දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් එහෙම කිව්වාම මට කියන්නට තිබෙන කරුණු මේවායි. අප චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා, -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, the Hon. Minister made a Ministerial Statement and there cannot be a debate after that. He cannot ask questions like this and turn that into a debate. It is against the Standing Orders. The Hon. Speaker had a workshop that day for - [*Interruption*.]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා පිළිතුර දෙන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කියන කථාවේ සත්‍යතාවක් තිබෙනවා. මොකද, විවිධ පන්ති කව හා විවිධ ජාවාරම් පාසල් තුළ සිද්ධ වෙන බව මා පිළිගන්නවා. නමුත් මේ සඳහා දෙමව්පියන්, ආදී ශිෂ්‍යයන්, අනෙකුත් දේශපාලනඥයන් අපට එවැනි දෙයකට දඩුවම් කරන්නට පුළුවන් වන ආකාරයට ක්‍රියා කරන්න උදව් කරන්නට ඕනෑ. අප චක්‍රලේඛ මඟින් මේ පන්ති කව තිබෙන ඒ වායේ මුදල්

එකතු කිරීම, අයථා මුදල් භාවිතය සම්පූර්ණයෙන්ම තහනම් කර තිබෙනවා පමණක් නොවෙයි. කවුරු හෝ ග්‍රාම සේවක සහකිකයක් ඉදිරිපත් කර දරුවෙකුට පහසුකම් ගාස්තු හෝ ගෙවන්න බැරිය කිව්වොත්, ඒ දරුවා සම්පූර්ණයෙන්ම සියලුම ගාස්තුවලින් නිදහස් කරනවා. එම වගකීම මම භාර ගන්නවා. [බාධා කිරීමක්] මේක විවාදයක් නොවෙයි. එතැනින් අතිරේකව තමුන්නාන්සේලා සද්භාවයෙන් මෙහෙම කරන තැනක මේ ක්‍රියාවලිය කියන්න. මට කරන්නට පුළුවන් පර්යේෂණය කරලා තරාතිරම නොබලා අවශ්‍ය නීතිමය පියවර ගන්න කටයුතු කරනවා. [බාධා කිරීමක්] ප්‍රශ්න අහන්න බැහැ දැන්. මම ප්‍රකාශයක් කළේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.00 සිට අ.භා. 7.00 දක්වා විය යුතු ය. අ.භා. 2.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වරප්‍රසාද යෝජනා
சிறப்புரிமைப் பிரேரணைகள்
PRIVILEGE MOTIONS

2013 ජනවාරි 24 වන දින "වීරකේසරී" වාර්තාව
2013 ஜனவரி 24ஆந் திகதிய "வீரகேசரி" அறிக்கை
"VIRAKESARI" REPORT OF 24TH JANUARY 2013

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (අල්හාජ්) ඒ.එච්.එම්. අස්වර් මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2013 ජනවාරි මස 24 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග අංක 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පසු ගිය අහඹරුවාදා ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්නයක් ඇසුවා, විශේෂයෙන්ම අසාද් සාලි මහතා රඳවා තබා ගැනීම සම්බන්ධව. එතුමාගේ පවුලේ අය කියා තිබෙනවා එතුමාට අසනීපයි කියලා. මට ගිහින් බලන්න කියා තිබෙනවා. ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාත් රජයත් මට අවසර දෙනවා නම්, මමත් අපේ මේ ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනාත් ගිහිල්ලා අද නැත්නම් හෙට එතුමාව බලලා වාර්තා කරන්න පුළුවන්. ඒක අපි ආණ්ඩුවෙන් අහනවා. පාර්ලිමේන්තුවේ මේ කාරණය සාකච්ඡා කරපු නිසා මා හිතුවා පාර්ලිමේන්තුව තුළින්ම මේක අහන්න ඕනෑ කියලා. ඊට වඩා සම්බන්ධයක් මට එතැන නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභානායකතුමාත් තව මොහොතකින් පැමිණේවි. ඉන් පසුව මේ ගැන කථා කරලා කියන්නම්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Okay.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පස් වරු 2.30ට පක්ෂ නායක රැස්වීමක් පැවැත් වෙනවා. එතැනදී සාකච්ඡා කරමු.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

විදුලි ගාස්තු ඉහළ යාම තුළ ජනතාව මුහුණ පාන දුෂ්කරතා

மின் கட்டண உயர்வினால் மக்கள் எதிர்நோக்கும் கஷ்டங்கள்

DIFFICULTIES FACED BY PEOPLE DUE TO INCREASE IN ELECTRICITY TARIFF

[අ.භා. 1.35]

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"නොනැවැත්විය හැකි තත්ත්වයකට පත්ව ඇති බව පෙනෙන අසීමිත දුෂණය හේතු කොට ගෙන දිගින් දිගටම ඉහළ යමින් පවතින ජීවන වියදමකට ජනතාව මුහුණ දී සිටින අවස්ථාවක අහස උසට විදුලි ගාස්තු වැඩි කිරීමට රජය විසින් තීරණය කිරීම කනගාටුවට කරුණකි.

මෙම ගාස්තු ඉහළ නැංවීමේ ස්වභාවය නම්, ගාස්තු ඉහළ නැංවීමේ ඉහළ ප්‍රතිශතය පහළම කෙළවරේ සිටින පාරිභෝගිකයින් විසින් ගෙවනු ලබන අතර, ජනතාව අතරින් පොහොසත්ම කොටස් වන මුදුන් මට්ටමේ පාරිභෝගිකයින් විසින් ගාස්තු ඉහළ නැංවීමේ අඩුම ප්‍රතිශතය ගෙවනු ලැබීමයි. විදුලිය ප්‍රායෝගිකව රටේ සෑම ආර්ථික කටයුත්තකදීම උපයෝගී කර ගන්නා බව රජය නොදන්නවා සේ සිටින බව පෙනේ.

මෙයට අමතරව පාසල් ළමුන්ගේ, ගෘහිනියන්ගේ සහ ආරෝග්‍ය ශාලාවල කටයුතු හා තවත් එබඳු අනෙකුත් අත්‍යවශ්‍ය සේවා සියල්ලද විදුලි බලය මත රඳා පවතී.

මෙම තත්ත්වයන් තුළ, ඇමතිතුමිය විසින්

1. මෙම ගාස්තු ඉහළ නැංවීමට බලපෑ හේතු,
2. ගාස්තු ඉහළ නැංවීම ගණනය කරන ලද සූත්‍රය සහ
3. පොදු ජනතාවගේ දුක් පීඩා තුරන් කිරීම සඳහා රජය විසින් ගැනීමට අදහස් කරන පියවර මොනවාද,

යන්න මෙම ගරු සභාවට පැහැදිලි කළ යුතු යැයි යෝජනා කර සිටිමි."

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම යෝජනාව ස්ථිර කරනවා.

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ ඇත්තටම මේ විදුලිය ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් මේ වන විට රටේ පවතින විශාල විරෝධතාව හේතු කොට ගෙනයි. විදුලිය ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් මීට සති දෙක තුනකට ඉස්සරවෙලා නිවේදනය කළාම ඒක විශාල කථා බහකට ලක් වුණා. ඒකට මූලික හේතුව තමයි, විදුලිය ගාස්තු වැඩි කිරීම හේතු කොට ගෙන සාමාන්‍ය ජනතාවට, ඒ වාගේම මේ රටේ නිෂ්පාදකයන්ට, ව්‍යාපාරිකයන්ට, සුළු හා මධ්‍යම මේ හැම කෙනාටම ඉතාමත් බරපතළ ලෙස බලපාන කාරණයක් වීම.

මෙතැන තිබෙන අපහැදිලිතාව වන්නේ මේ වැඩි කරනවාය කියලා ප්‍රකාශ කළාට පස්සේ - ඒ නිවේදනය නිකුත් කළාට පස්සේ - ඒ සම්බන්ධයෙන් මතු වුණු විශාල විරෝධතාව සහ ඉල්ලීම් සලකා බලා විදුලිය ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් යම්කිසි සහනයක් දෙන බව ජනාධිපතිතුමා මැයි දිනයේදී මැයි දින ප්‍රකාශයක් හැටියට ප්‍රකාශයට පත් කළා. දැන් මෙතැන තිබෙන ආරාවුල මේකයි. ජනාධිපතිතුමා මැයි දිනයේ ඒ ප්‍රකාශය කළේ එක්තරා කොටසකට පමණයි. එතුමා කිව්වේ විදුලිය ඒකක 60 දක්වා පාවිච්චි කරන -අඩුවෙන් විදුලිය පාවිච්චි කරන- ජනතාව වෙනුවෙන් යම් වැඩි වීමක් නොකිරීමේ සහතිකය ප්‍රකාශ කරන බවයි. එතුමා කිව්වේ "කිසිම හේතුවක් නිසා ඒකක 60 දක්වා මිල වැඩි කිරීමේ පියවරකට යන්නේ නැහැ, ඒකක 60න් එහා ඒකක 180 දක්වා පාවිච්චි කරන පිරිසට යම් සහන දෙන්න බලනවා" කියලායි. නමුත් ඇත්තටම සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ඒ නිසා මම ඉල්ලනවා, ඉස්සරවෙලාම මේ මිල වැඩි කිරීම, අඩු කිරීම කෙසේ වෙතත් දැන් විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කරන විදුලි බලය සම්බන්ධයෙන් මිල ගණන්, ඒ කියන්නේ බිල්පත් එකතු කරන මිල සූත්‍රය පිළිබඳව කරුණාකරලා මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් තිබෙන ලොකුම ප්‍රශ්නය මේකයි. මේ කියන ගණන් සම්බන්ධයෙන් පුවත් පත්වල විවිධ ගණන් පළ වුණා. අද උදේ පුවත් පතක මම දැක්කා, ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමා කියා තිබෙන කාරණයක්. "ලංකාදීප" පුවත් පතේ පළ කර තිබුණ ආකාරයට එතුමා කියනවා, "ඒකක 31-60 දක්වා කාණ්ඩයේ පාරිභෝගිකයන්ගේ ගාස්තුව සුළු වශයෙන් ඉහළ ගොස් ඇත්තේ විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමට යෝජිත නව ගණනය කිරීමේ ක්‍රමවේදය නිසා බව ද, එය වෙනස් කිරීම ඉතා අපහසු බවද ප්‍රකාශ කරනවා" කියලා. නමුත් ජනාධිපතිතුමා කිව්වේ ඒක නොවෙයි. එතුමා මැයි 1 වැනිදා කිව්වා, මේ රටේ විදුලිය පාවිච්චි කරන ජනතාවට සහනයක් වශයෙන් ඒකක 60 දක්වා පාවිච්චි කරන ජනතාවට කිසිදු වැඩි කිරීමක් කරන්නේ නැහැයි කියලා.

විදුලිය ඒකක 60 සිට 180 දක්වා පාවිච්චි කරන ජනතාවට සහනයක් වශයෙන් ඉන්ධන ගැළපුම් ගාස්තුවෙන් සියයට 25ක් අඩු කරනවා කියලා කිව්වා. දැන් ඒක වෙලා නැහැ නේ. ජනාධිපතිතුමා මැයි පළමුවැනි දා එහෙම කිව්වත් එදා එතුමා කරපු කථාවට අදාළ කාර්යයවත් ඉටු වෙලා නැහැ කියන කාරණය ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමාගේ මේ නිවේදනය මඟින් බොහොම පැහැදිලියි. ඒ විතරක් නොවෙයි. ඊයේ මහ බැංකු අධිපතිතුමාගේ සාකච්ඡාවක් "ලංකාදීප" පුවත් පතේ පළ වෙලා තිබුණා. මහ බැංකුවේ අධිපතිතුමා මොකක්ද කියන්නේ? එතුමා කියනවා, "විදුලිය බිල වැඩි වීම ඉතාම කාලෝචිතයි. මේ සංශෝධනය අනුව වැඩි වෙලා තිබෙන්නේ ඉතාම සොච්චමක්" කියලා. විදුලිබල මණ්ඩලය සිදු කරන විදුලිය බිලේ වැඩි කිරීම මහ බැංකුවේ අධිපතිතුමාට සොච්චමක්. හැබැයි සාමාන්‍ය ජනතාවට එය මහා බරක්. එතුමා කියන හැටියට පිළිගෙන තිබෙනවා ඒකක 30ක් පාවිච්චි කළත්, ඒකක 30 ඉඳලා 60 දක්වා පාවිච්චි කළත් ඒ මිල ගණන් වැඩි වෙනවා කියලා. එහෙම නම් ජනාධිපතිතුමා මෙවර මැයි දිනයේදී ප්‍රකාශ කළේ මොකක්ද? මැයි දිනයේදී කරපු කථාවට අදාළ කාරණය ඉටු වෙලා නැහැ නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ළඟ තිබෙනවා විදුලිය බිල වැඩි වීම පිළිබඳ ලේඛනයක්. මා දැන් එය කියවන්නම්. ඒකක 31ක් පාවිච්චි කරපු ජනතාවගේ පැරණි බිල වෙලා තිබුණේ රුපියල් 187.85යි. දැන් නව මිල මොකක්ද? මේ චක්‍රයට අනුව දැන් නව මිල රුපියල් 249.41යි. වැඩි වීම රුපියල් 61.56යි. එහෙම නම් වැඩි වීමක් වුණේ නැහැ කියන්නේ කොහොමද? මේ, ඒකක 31ට අදාළ ගාස්තුවයි. ජනාධිපතිතුමා කියන හැටියටම ඒකක 60ක් පාවිච්චි කළා නම් පැරණි බිල ආවේ රුපියල් 371.95යි. දැන් එනවා රුපියල් 426ක්. ඒ අනුව රුපියල් 54ක් වැඩි

වෙනවා. ඒ අනුව ඒකක 0 සිට 60 දක්වා පාවිච්චි කරපු අයට රුපියල් 116ක් වැඩි වෙනවා. මේ බව ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමාගේ මේ ප්‍රකාශනයෙන් සනාථ වෙනවා. ඒ විතරක් නොවෙයි. ඒකක 60 සිට 90 දක්වා පාවිච්චි කළාම කලින් බිල වශයෙන් ආවේ රුපියල් 728යි. දැන් රුපියල් 1,084ක් එනවා. වැඩි වීම රුපියල් 356යි. ඒකක 91ක් පාවිච්චි කළා නම් වැඩි වීම රුපියල් 1,106.70යි. අප අහන්නේ, මොකක්ද ලබා දීලා තිබෙන සහනය කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී අප විශේෂයෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. විදුලිය බිල වැඩි කරන්න හේතුව හැටියට මහජන උපයෝගිතා කොමිෂන් සභාව කිව්වේ මොකක්ද? මහජන උපයෝගිතා කොමිෂන් සභාව කියන හැටියට විදුලිය බිල වැඩි කරන්න අවශ්‍ය වෙලා තිබෙන මූලිකම කාරණය ලංකා විදුලිබල මණ්ඩලයේ දූෂණයි. ඒ තුළ තිබෙන නාස්තිකාර වියදම් ආවරණය කර ගන්න ඕනෑ, මණ්ඩලය නඩත්තු කරන්න මේ මුදල වැඩි කරන්නේ නැතිව ඉන්න බැහැ කියලා තමයි යෝජනාව දැම්මේ. මහජන උපයෝගිතා කොමිෂන් සභාව මොකක්ද කිව්වේ? මහජන උපයෝගිතා කොමිෂන් සභාව මේක බලලා කියනවා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික නඩත්තුව සඳහා යෝජනා කරලා තිබෙන සැලසුමේ රුපියල් බිලියන 40ක -රුපියල් බිලියන 40ක් කියන්නේ රුපියල් කෝටි 4,000ක්- අනවශ්‍ය වියදම් සහ දූෂිත ගනුදෙනු තිබෙනවා කියලා.

ඇයි දෙවියනේ! අපි නොවෙයි මේවා පාලනය කරන්නේ. එතකොට විදුලි බිල ගෙවන අභිංසක මහ ජනතාවද දූෂිත ගනුදෙනුවලට වග කියන්න ඕනෑ. දැන් ඒ නාස්තියට, දූෂණයට වගකීම ජනතාව පිට පටවන්නේ ඇයි? ලංකා විදුලිබල මණ්ඩලය, මහජන උපයෝගිතා කොමිෂන් සභාව නිල වශයෙන් පිළිඅරගෙන තිබෙන පරිදි අවශ්‍ය නැති නඩත්තු වියදම ඇතුළත් කරලා රුපියල් බිලියන 40ක -රුපියල් කෝටි 4,000ක- අලාභයක් සිදු වෙලා තිබෙනවා නම් ඒකට වග කියන්න ඕනෑ විදුලිබල මණ්ඩලයයි. එහෙම නම් මම කියන්නේ මේක ඉතාමත් අසාධාරණ වැඩක්.

විශේෂයෙන්ම විදුලි බිල මේ වෙලාවේ වැඩි කරන්න වුවමනා දෙයක් නොවෙයි. මොකද, විදුලි බිල වැඩි කරන්න වුවමනා නැහැ කියලා නොරොච්චෝලේ බලාගාරයට මුල්ගල තබන අවස්ථාවේ ජනාධිපතිතුමාත්, ආණ්ඩුවේ මැති ඇමතිවරුත් කරපු ප්‍රකාශ මම දැක්කා. ඒක හදලා ඉවර වුණාට පස්සේ විදුලි බිල අඩු කරන්න පුළුවන් කියලා පුන පුනා මේ රටේ ජනතාවට කිව්වා. නොරොච්චෝලේ බලාගාරය ඉදි කොට විදුලිය නිෂ්පාදන කටයුතු ආරම්භ කළාම ලංකාවට විදුලි බලය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ කියලා තමයි කිව්වේ. විදුලි බිල අඩු කරලා දෙන්න පුළුවන් කියලා මේ රටේ ජනතාවට ගණන් හදලා පෙන්නුවා මහා සුරංගනා කථාවක් ලෙස. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද මේකට වග කියන්න සිදු වෙලා තිබෙන්නේ ජනතාවටයි. නොරොච්චෝලේ විදුලි බලාගාරයේ මහා නාස්තියටයි, එය අක්‍රිය වන වාර ගණන අනුව සිදු වන පාඩුවටයි මේ රටේ ජනතාවට වන්දි ගෙවන්න සිදු වෙලා තිබෙනවා.

අපි එක ප්‍රශ්නයක් අහනවා. විදුලි බිල වැඩි කළේ කවුද? දැන් ඒකට එක එක්කෙනා චෝදනා කරනවා. මම දැක්කා විමල් වීරවංශ ඇමතිතුමා පසු ගිය දවස්වල විදුලි බිල වැඩි කිරීම පිළිබඳව ආචාර්ය පී.බී. ජයසුන්දරට දොස් කිව්වා. කවුද පී.බී. ජයසුන්දර කියන්නේ? මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා. මුදල් අමාත්‍යාංශයේ ඇමතිවරයා කවුද? ජනාධිපතිතුමා. ඒ කියන්නේ මුදල් ඇමතිතුමා. එහෙම නම් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයෙකුට පුළුවන්ද විදුලි බිල වැඩි කරන්න? එහෙම නැත්නම් ඒ ගැන නිර්දේශ ඉදිරිපත් කරන්න පුළුවන්ද? ඒක කරන්න ඕනෑ අමාත්‍යාංශය භාර ඇමතිවරයා. කැබිනට් මණ්ඩලයේදී විදුලි බිල වැඩි කිරීම පිළිබඳ යෝජනාව අනුමත කරලා, ඊට එකඟ වෙලා, ඊට පස්සේ එළියට ඇවිල්ලා තනිවම කියනවා නම් "නැහැ, මම මිනිස්සු ගැන අනුකම්පා කරලා මේකට සහනයක් දෙනවා" කියලා, මොකක්ද ඒ කථාවේ තේරුම? අපි අහන්නේ, සාමූහිකව තීන්දු කළා නම්,- මම නොවෙයි කියන්නේ, කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමායි. මම දැක්කා කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා මාධ්‍ය ප්‍රකාශයක් කරනවා, විදුලි බිල වැඩි කිරීම පිළිබඳව මුළු කැබිනට් මණ්ඩලයම සාමූහිකව වග කියනවා කියලා. එතකොට සාමූහිකව විදුලි බිල වැඩි කරලා එක්කෙනෙකුට ලකුණු දමා ගන්න තමයි මැයි පළමු වැනිදා විදුලිය ඒකක 60ක් දක්වා පාවිච්චි කරන අයට මිල අඩු කරනවා කියලා ප්‍රකාශ කළේ. අපි කියන්නේ දැන් ඒ සහනයත් නැහැ කියන එකයි. විදුලිය ඒකක 60ක් දක්වා පාවිච්චි කරන අයගේ විදුලි බිල අඩු කරනවා කිව්වාට දැන් ඒකත් සිද්ධ වෙලා නැහැ. විදුලිය ඒකක 60ක් දක්වා පාවිච්චි කරන අයගේ බිල අඩු කරනවා කිව්වත්, දැන් බලපුවාම හරියටම විදුලිය ඒකක 60ක් පාවිච්චි කළත් රුපියල් 116යි ශත 31කින් මිල වැඩි වෙනවා.

එහෙනම් මේ කරලා තිබෙන්නේ ජනතාව ගොනාට ඇන්දවීමක්. ඇත්ත වශයෙන්ම ජනතාවට සහන දෙන්න ඕනෑ වෙලාවේ ජනතාවට සහන දෙන්නේ නැතිව අද මේ විදුලි බිලේ සම්පූර්ණ බරම මේ රටේ ජනතාව පිට වක්‍රාකාරව පටවලා තිබෙනවා.

අනික් කාරණය තමයි, අපි අහන්නේ ඉන්ධන ගැළපුම් ගාස්තුවක් මොකටද කියලායි. ඉන්ධන ගැළපුම් ගාස්තුව පිළිබඳව මූලික වශයෙන් යෝජනා කරන කොට අදහස තිබුණේ නියං කාලයට ජල විදුලිය නිෂ්පාදනය කරන්න බැරි වුණාම, ඒ සඳහා යොදා ගන්නා ඉන්ධන බලාගාර හේතුවෙන් දරන්නට සිදු වන පාඩුව පියවා ගැනීම සඳහා ඉන්ධන ගැළපුම් ගාස්තුවක් ඇති කළ යුතු බවයි. අඩු ගණනේ ඉන්ධන ගැළපුම් ගාස්තුවවත් මේකෙන් අයින් කරලා ජනතාවට සහන දෙන්න තිබුණා. නමුත් ඒකක 0 - 60 දක්වා පාවිච්චි කරන අයගෙනුත් ඉන්ධන ගැළපුම් ගාස්තුව වශයෙන් සියයට 25ක් 35ක් අය කරනවා. එහෙනම් මේ මුදල අය කරන්නේ ඇයි කියන කාරණය පිළිබඳව අපි ප්‍රශ්න කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන දී විශේෂයෙන්ම මම මේ කාරණයත් ප්‍රකාශ කරන්නට ඕනෑ. වසර ගණනාවක් මේ රටේ යුද්ධය වෙනුවෙන් විශාල කැප වීමක් කරපු ජනතාවක් ඉන්නේ. මේ රටේ ජනතාව යම් කිසි සෘජු සහනයක් බලාපොරොත්තු වෙනවා. පසු ගිය කාලයේ මහ ජනතාවගේ ජීවන බර දවසින් දවස වැඩි වුණා. ඒ අයට යම් සහනයක් ඕනෑ කියලා දිගින් දිගටම ප්‍රකාශ කළා. සහන දෙනවාය කියලා ආණ්ඩුව සහතික වුණා. හැබැයි වසරින් වසර ඉහළ යන ජීවන වියදමට සාධාරණත්වයක් ඉෂ්ට කරන්න ආණ්ඩුව පියවරක් අර ගත්තේ නැහැ. ඒ පියවර ගන්නවා වෙනුවට තමයි ආණ්ඩුව විදුලි බිල වැඩි කරලා මේ විධියට ජනතාව පිට බර පැටෙව්වේ. අපි අහන්නේ දැන් මෙතැනින් එහාට මොකක්ද වෙන්නේ කියලායි. ආරංචි මාර්ගවල හැටියට මේ වන කොට විදුලි බිල වැඩි කිරීම පිළිබඳ තීන්දුව සම්බන්ධයෙන් නිසි චක්‍රලේඛනයක් වාගේම විදුලි බිල වැඩි කිරීම පිළිබඳ නිල සූත්‍රයක් ප්‍රසිද්ධියට පත් කරලා නැහැ.

හැබැයි විදුලි බිල වැඩි කරන කොට මුල් වතාවේ මේ වාගේ පැහැදිලි වගුවක් ඉදිරිපත් කළා. මේ වගුවට අනුව වැඩි වන ප්‍රතිශතය එහෙමම ක්‍රියාත්මක වෙනවාද නැද්ද කියන එකවත් පැහැදිලි නැහැ. දැන් පෙනෙන්නේ මේ අවස්ථාව පාවිච්චි කරමින් විදුලි බිල වැඩි කිරීම සඳහා මණ්ඩලය ගත්ත ක්‍රියා මාර්ග එලෙසම වෙනත් ආකාරයකින් ක්‍රියාත්මක කරන්න පියවර ගනිමින් තිබෙනවාය කියලායි. විදුලි බිල වැඩි කරලා ආණ්ඩුවේ සමහර අය ප්‍රකාශ කළේ මොකක්ද? මම දැක්කා ජනාධිපතිතුමාත් වරක් කියලා තිබුණා, විදුලි බිල වැඩි කිරීමට හේතුව වුණේ පසු ගිය කාලයේ ඇතැමුන්ගේ ක්‍රියා කලාප කියලා. මම දන්නේ නැහැ, කාට කියනවාද කියලා. දේශපාලන වශයෙන් ඇඟිල්ල දිගු කරනවාද නැත්නම් ආණ්ඩුවේම සමහර මැති ඇමතිවරුන්ගේ පාලන කාලයේ සිද්ධ වුණු දේවල් ගැන කියනවා ද කියලා දන්නේ නැහැ.

[ගරු නිස්ස අත්තනායක මහතා]

කොහොම වුණත් එක අවස්ථාවක ආණ්ඩුවේ එක්තරා ඇමතිවරයෙක් කියා තිබුණා, විදුලි බිල වැඩි කරන්න ආසන්නතම හේතුව වුණේ 1993 දී යූඑන්පී ආණ්ඩුව කාලයේ අත්සන් කරපු ගිවිසුමය කියා. යූඑන්පී ආණ්ඩුව කාලයේ අත්සන් කරපු ඒ ගිවිසුම් මොනවාද කියා මම අහනවා. 1993 කියන්නේ මීට අවුරුදු 20කට ඉහත කාල පරිච්ඡේදයක්. 1994න් පසුව මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, පොදුජන එක්සත් පෙරමුණේ, සන්ධානයේ ආණ්ඩු තමයි තිබුණේ. එහෙම නම් අපි අහන්නේ 1993ට ඉස්සෙල්ලා -අවුරුදු 20කට ඉස්සෙල්ලා- අත්සන් කරපු ගිවිසුමක් නිසාය කියා, ඒ හේතුව කියා විදුලි බිල වැඩි කරනවා නම් ආණ්ඩුවක් මොකටද කියන එකයි. එහෙම නම් ආණ්ඩුවක් ඕනෑ නැහැ නේ. යූඑන්පී කාලයේ අත්සන් කරපු ගිවිසුම් නිසාය කියලා ඔක්කොම බෙරා ගන්න තිබුණා නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා මේක ජනතාවට අමතක කරවන්න හදනවා. 1977න් පසුව මේ රටේ විදුලි බල නිෂ්පාදනයෙන් ජාතික විදුලි බල පද්ධතියට ජල විදුලිය විශාලතම ප්‍රමාණයක් එකතු කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙනුයි. කඩිනම් මහවැලි ව්‍යාපාරය, රන්දෙනිගල, රන්ටැඹේ, වික්ටෝරියා, කොත්මලේ ආදී විදුලි බලාගාර හැදුවේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේදීයි. මෙගා වොට් 1200ක පමණ ප්‍රමාණයක් -අද පාවිච්චි කරන විදුලියෙන් සියයට 50ක්ම- 1977ට පසුව ජල විදුලියෙන් නිෂ්පාදනය කරන විදුලි බලාගාර මාර්ගයෙන් තමයි මේ රටට දායක කරලා තිබෙන්නේ. මේ නිසා විදුලිය මිල වැඩි වුණාද, එහෙම නැත්නම් අලුතින් ආරම්භ කරපු නොරොච්චෝලේ බලාගාරය වැනි ව්‍යාපාර නිසා මේ රටේ විදුලිබල මණ්ඩලය නඩත්තු කර ගන්න බැරිද කියා අපි අහනවා. ඒ දෙකෙන් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? වැරදි ගිවිසුම් අත්සන් කළා නම් ඒ අත්සන් කර තිබෙන්නේ කවුද කියන එක නොවෙයි ප්‍රශ්නය. ඒ ගැන බලා ජනතාවට සහන දෙන එකයි. 1994න් පසුව විදුලිය මිල දී ගැනීම පිළිබඳව පෞද්ගලික සමාගම් සමඟ අත්සන් කරපු සියලු ගිවිසුම් මිල ගණන්, ධාරිතාවන් සමඟ පුළුවන් නම් මේ සභාවට ඉදිරිපත් කරන්නය කියා මම අභියෝගයක් කරනවා. වැඩි මිල ගණන්වලට වැඩිපුර මිල දී ගෙන තිබෙන්නේ කවුද කියන එක එයින් බලා ගන්න පුළුවන්. අද විදුලිබල මණ්ඩලය තුළ තිබෙන මහා මාෆියාවක් ගැන ලංකා විදුලිබල මණ්ඩලයේ සමහරුන් ප්‍රකාශ කර තිබුණා. ඉතින් එවැනි මාෆියාවක් තිබෙනවා නම් ඒවා පාලනය කරන්න තමයි ඇමතිවරු ඉන්නේ, ඒවා පාලනය කරන්න තමයි ආණ්ඩු තිබෙන්නේ, ජනාධිපතිවරු ඉන්නේ. එහෙම නම් මාෆියාවක් තුළින් මණ්ඩලය සිදු කරන මහා පරිමාණ ජනතා විරෝධී ක්‍රියා දාමයන්ට කිසිසේත් මේ රටේ ජනතාව වග කියන්න වුවමනා වෙන්නේ නැහැ. මේ රටේ ජනතාව මුහුණ පාන මේ බරපතළ ව්‍යසනය පිළිබඳව, බරපතළ තත්ත්වය පිළිබඳව වහාම ආණ්ඩුවේ අවධානය යොමු කරවන්නය කියා ගරු ඇමතිතුමියගෙන් විශේෂයෙන් මම ඉල්ලනවා.

අවස්ථා ගණනාවක මම දැක්කා, විදුලි ගාස්තු වැඩි කිරීම පිළිබඳ නොයෙක් දේවල් පුවත් පත්වල පළ වෙලා තිබෙනවා. ජනතාවට ඒ එකකින්වත් සහනයක් වෙන්නේ නැහැ. ඒකක 60ක් දක්වා විදුලිය පාවිච්චි කරනවා කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෙදරක පාවිච්චි කළ හැක්කේ බල්බ් දෙකයි. මේ කියන හැටියට නම් ඒකක 30න් එහා පාවිච්චි කළොත් විදුලි බිල වැඩි වෙනවා. සාමාන්‍යයෙන් අද පාරිභෝගිකයන් විදුලිය පාවිච්චි කරන ආකාරය දෙස බලන්න ඕනෑ. මොකද, මේ රටේ හැම නිවසකම රූපවාහිනියක් තිබෙනවා. ඒක දැන් සාමාන්‍ය දෙයක්. විදුලි ඉස්ත්‍රික්කයක් පාවිච්චි කරනවා. මේ අනුව ඒකක 30ක සීමාවේ කවුරුවත් රැඳෙන්නේ නැහැ. එතකොට මේ කියන යෝජනාවෙන් කාටවත් සහනයක් ලැබෙනවායි කියලා කියන්න බැහැ. ඒ නිසා අපේ යෝජනාව තමයි, මේ වෙලාවේ විදුලි ගාස්තු වැඩි කිරීම කිසිසේත් සාධාරණ නැහැ කියන එක. කරුණාකරලා විදුලි ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් මේ තිබෙන යෝජනාව ඉවත් කර ගන්න කියලායි අපි මේ වෙලාවේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කියන්නේ. මේ වෙලාව, මහජනයාට බර පටවන්න වුවමනා වෙලාවක් නොවෙයි. මේ ගැන ලොකු විරෝධයක් තිබෙනවා, හැම අංශයකම. මේක කියන්නේ දේශපාලන වශයෙන් නොවෙයි; එක්සත් ජාතික පක්ෂය වශයෙන්වත්, නැත්නම් වෙනත් ඍජුතීය සමිතියක් වශයෙන්වත්, වෙනත් සිවිල් සංවිධානයක් වශයෙන්වත් නොවෙයි. අද ආණ්ඩුව ඇතුළේ කී දෙනෙක් කථා කරලා තිබෙනවාද මේ විදුලි ගාස්තු වැඩි කිරීමට විරුද්ධව? ආණ්ඩුවේ ඇමතිවරු කොච්චර කථා කරනවාද? මේ විදුලි ගාස්තු මේ රටේ මහජනතාවට දරා ගන්න පුළුවන්කමක් නැහැ.

මම මගේ කථාව අවසන් කරන්න ඉස්සර වෙලා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ගැන සඳහන් කරන්න කැමැතියි. මහජන උපයෝගිතා කොමිෂන් සභාව මේ විදුලි ගාස්තු වැඩි කළාට පස්සේ ප්‍රසිද්ධියේ මාධ්‍යයට ප්‍රකාශ කළා, විදුලි බිල වැඩි කිරීම සම්බන්ධයෙන් මහජන අදහස් කැඳවනවායි කියලා. සමහර දේශපාලන පක්ෂවල නියෝජිතයන් ගිහින් මේ ගැන සාකච්ඡා කරලා සාධාරණයක් ඉෂ්ට කරන්න ක්‍රියා කරනවා කියලා පත්තරවල පළ වෙලා තිබෙනවා මම දැක්කා. මොකක්ද, මහජන උපයෝගිතා කොමිෂන් සභාව කළේ? මහජන උපයෝගිතා කොමිෂන් සභාව කෙරුවේ විදුලි බල මණ්ඩලයට මේ ගාස්තු වැඩි කර ගන්න ඉඩ දීමයි. ඒ ගොල්ලෝ කොන්දේසි අටක් දැම්මා. එක කොන්දේසියක තිබෙන්නේ, "විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න යන පිරිවැය කොමිෂන් සභාවට හය මාසයක් ඇතුළත දන්වන්න" කියන එකයි. මේක විහිළු කථාවක් නේ. මහජන උපයෝගිතා කොමිෂන් සභාව කියනවා නම්, "විදුලි ගාස්තු වැඩි කළාට කමක් නැහැ, නමුත් අපට හය මාසයක් ඇතුළත ඒ වැඩි කිරීම පිළිබඳව තොරතුරු දෙන්න" කියලා ඒක ජනතාව මොන තරම් රැවටීමක්ද? අපි කියන්නේ විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා විදුලිබල මණ්ඩලය දරන ඇත්ත වියදම ඔවුන් ළඟ තියෙන්න ඕනෑ කියන එකයි.

හය මාසයක් අවුරුද්දක් මේකට කල් ගත කරන්නේ මිල වැඩි කරලා ඒ ක්‍රියාමාර්ග ගන්න ඕනෑ තරම් ඉඩකඩ දෙන්නයි. අද විදුලිය පිළිබඳව මේ තිබෙන තත්ත්වය ඉතාමත් භයානකයි. ඒ නිසා අපි නැවතත් කියනවා, මේ වැඩි කිරීම අසාධාරණයි කියා. වැඩි කිරීම පිළිබඳව ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් සාමූහිකව වග කියන්න ඕනෑ. මේකට එක් කෙනෙකුට පමණක් ඇඟිල්ල දිග් කරන්න පුළුවන්කමක් නැහැ. මේ වැඩි කිරීම නිසා ජනතාව විශාල පීඩාවකටයි පත් වෙලා තිබෙන්නේ. ඒ පීඩාව නැති කර ඔවුන්ට සහනයක් දෙන්න විදුලි බිල වැඩි කිරීමේ යෝජනාව ඉවත් කර ගන්න කියලා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

යෝජනාව ස්ථිර කිරීම, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා. Order, please! Before that the Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[අ.භා. 1.55]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලි බිල වැඩි කිරීමේ ක්‍රියාදාමය පිළිබඳව අද දින ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව ස්ථිර කරමින් මගේ අදහස් කීපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා.

විදුලි බිල වැඩි කිරීමේ ක්‍රියාදාමය සාකච්ඡාවට භාජනය වන මේ අවස්ථාවේ අප කියන්නට ඕනෑ, එක්තරා රටාවකට, යම් කිසි ආශ්චර්යවත් මෝස්තරයකට විදුලි බිල වැඩි කිරීම ක්‍රියාත්මක කර තිබෙන බව. විශේෂයෙන්ම සමාජ අසාධාරණත්වයක් සිදු කරමින් පුංචි මනුස්සයාව පීඩනයට ලක් කර, ඔවුන්ව අසහනයට පත් කරමිනුයි විදුලි බිල වැඩි කර තිබෙන්නේ.

අපි බලමු විදුලි බිල වැඩි කිරීම විවිධ ක්ෂේත්‍රවලට බලපා තිබෙන්නේ කොහොමද කියලා. කර්මාන්ත ක්ෂේත්‍රය ගනිමු. සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් කියන්නේ මුළු විදුලියෙන් සියයට 9ක් පාරිභෝජනය කරන කොට්ඨාසයක්. ඒ අයට සියයට 20කින් විදුලි බිල වැඩි කර තිබෙනවා. මුළු විදුලියෙන් සියයට 91ක් පාවිච්චි කරන විශාල කර්මාන්තකරුවන්ට වැඩි කරලා තිබෙන්නේ සියයට 9ක් වැනි සුළු ප්‍රමාණයකින්. ඉතින් මෙතැනින්ම පෙන්නුම් කරනවා මේ කර්මාන්ත ක්ෂේත්‍රයේ දියත් කරලා තිබෙන අසමතුලිතභාවය. කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන්ට අධික වැඩි කිරීමකුත්, මහා පරිමාණයේ කර්මාන්තකරුවන්ට සොච්චම් වැඩි කිරීමකුත් සිදු කර තිබෙනවා. අපි හැමෝම දන්නවා රටේ ප්‍රධානතම බලවේගය, ආර්ථික ජීවනාලිය අපේ කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් බව.

ඒ කර්මාන්ත ක්ෂේත්‍රයේ තරගකාරිත්වය පැත්තෙන් මහා බරපතළ අර්බුදයක් අද ඇති වෙලා තිබෙනවා. කර්මාන්ත රැසක් වැසී යෑමේ ප්‍රවණතාවක් අද ඇති වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මා මතක් කරන්නට කැමැතියි, "මහින්ද චින්තන ඉදිරි දැක්ම" පොතේ 93වන පිටුවේ සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත ගැන මෙන්න මෙහෙම කියා තිබෙන බව.

"විසල් අරමුණු කරා යා හැක්කේ අපේ නැගී එන ව්‍යාපාරිකයන් ආරක්ෂා කොට ඉදිරියට යාමට දිරි දීමෙන් පමණි."

මහින්ද චින්තන ඉදිරි දැක්ම පොතේ එහෙම කියලා, පුංචි කර්මාන්තකරුවාට සියයට 20කිනුත්, මහා පරිමාණයේ කර්මාන්තකරුවාට සියයට 9කිනුත් විදුලි බිල වැඩි කරලා, පුංචි මනුෂ්‍යයාගේ බඩට ගැහීමකුයි කරලා තිබෙන්නේ.

අපි වාණිජ ක්ෂේත්‍රය ගනිමු. මුළු ව්‍යාපාරවලින් සියයට 99ක්ම ක්‍රියාත්මක වන්නේ සුළු ව්‍යාපාර වශයෙනුයි. විශේෂයෙන්ම ව්‍යාපාරවලින් සියයට 99ක් අයිති වන සුළු පරිමාණයේ වාණිජ ව්‍යාපාරවලට සියයට 9කින් විදුලිය ගාස්තු වැඩි කරනවා. හැබැයි දැවැන්ත ව්‍යාපාරවලට විදුලි බිල වැඩි කිරීම සියයට 5කින් තමයි ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒ කියන්නේ සිල්ලර කඩයේ විදුලි බිල සියයට 9කින් වැඩි කරලා, සුපර් මාර්කට්වල විදුලි බිල සියයට 5කින් වැඩි කරලා තිබෙනවා. පොඩි මනුෂ්‍යයාගේ බඩට ගහලා පොහොසතාව සුරක්ෂා කිරීමේ ප්‍රතිපත්තියයි මේ රජය නැවතත් වරක් අනුගමනය කරන්නේ.

ඒ විතරක් නොවෙයි. අපි ප්‍රවේශ වෙමු, ගෘහස්ථ ක්ෂේත්‍රයට. දැන් මේ විදුලි බිල වැඩි කරන කොට ලංකා විදුලි බල මණ්ඩලය කිව්වා, මීල වැඩි වන්නේ සියයට 27කින් කියලා. නමුත් අද සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? සියයට 27කින් විදුලි බිල වැඩි කරනවාය කියලා ලංකා විදුලි බල මණ්ඩලය කිව්වාට, පොඩි මනුෂ්‍යයාට සියයට 68 සිට සියයට 100 දක්වා විදුලි බිල වැඩි වෙලා තිබෙනවා. හැබැයි පොහොසතාගේ විදුලි බිල වැඩි වෙලා තිබෙන්නේ සියයට 1 සිට සියයට 13 දක්වා පමණයි. ඉතින් මොකක්ද, මෙතැන ක්‍රියාත්මක වන්නේ? දුප්පතාගේ බඩට ගහලා පොහොසතාට සහන සැලසීමේ ඉතාමත් නින්දිත ක්‍රියාවලියක් තමයි මේ වැඩසටහනින් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ගෘහස්ථ විදුලි පරිභෝජනය 5,000,401යි. ඒකක 0 - 30 දක්වා ලක්ෂ 11ක් - සියයට 22ක්-පරිභෝජනය කරනවා. ඒකක 31 සිට 60 දක්වා ලක්ෂ 13ක් -සියයට 26ක්- පරිභෝජනය කරනවා. ඒකක 61 සිට 90 දක්වා ලක්ෂ 12ක් -සියයට 26ක්- පරිභෝජනය කරනවා. ඒකක 91 සිට 120 දක්වා ලක්ෂ 6ක් -සියයට 12ක්- පරිභෝජනය කරනවා. ඒකක 121 - 180 දක්වා ලක්ෂ 5ක් -සියයට 11 ක්- පරිභෝජනය කරනවා. ඒකක 181 - 200 දක්වා 40,000ක් -සියයට 1ක්- පරිභෝජනය කරනවා. ඒකක 201 - 300 දක්වා 60,000ක් - සියයට 1ක්- පරිභෝජනය කරනවා. ඒකක 300ට වඩා විදුලිය පරිභෝජනය කරන පිරිස 29,000ක් -සියයට 1ක්- ඉන්නවා. ඒ කියන්නේ රටේ සියයට 97ක්ම විදුලිය පාරිභෝජනය කරන්නේ ඒකක 1 සිට 180 දක්වා පමණයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්‍රියාත්මක වෙලා තිබෙන අසාධාරණකම් ගැන බලන්න. ඒකක 30ක් පාරිභෝජනය කරන අයට සියයට 53කින් වැඩි කරලා තිබෙනවා. ඒකක 60ක් පාරිභෝජනය කරන අයට සියයට 47කින් වැඩි කරලා තිබෙනවා. ඒකක 90ක් පාරිභෝජනය කරන අයට සියයට 54කින් වැඩි කරලා තිබෙනවා. ඒකක 91ක් පාරිභෝජනය කරන අයට සියයට 126කින් වැඩි කරලා තිබෙනවා. ඒකක 90 ඉඳලා 91ට වැඩි වෙන කොට සියයට 91කින් වැඩි වෙනවා. හැබැයි ඒකක 500ක් භාවිතා කරන නිවසට වැඩි කරලා තිබෙන්නේ සියයට 13.7කිනුයි. ඒකක 900ක් පාරිභෝජනය කරන අයට වැඩි කරලා තිබෙන්නේ සියයට 1.2කිනුයි. ඉතින් නැවත වරක් මට කියන්න තිබෙන්නේ පොඩි මිනිහාගේ බඩට ගහලා ලොකු මිනිහාට සහන ලබා දෙන සූත්‍රයක් අද ක්‍රියාත්මක කරලා තිබෙනවාය කියන එකයි. පොඩි මනුස්සයාගේ බෙල්ල මිරිකලා මහ එවුන්ට ප්‍රතිලාභ ලබා දීමේ මේ මහා ආශ්චර්යවත් සූත්‍රය මුළු රටටම කරන මහා අපහාසයක්, නින්දාවක් හැටියටයි මා දකින්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතාවගේ බඩ අල්ලලා කථා කළාට අද ක්‍රියාත්මක වෙන්නේ පොඩි මනුස්සයාගේ බඩට ගහන යුගයක්. ජනතා ප්‍රශ්නවලදී සංවේදී යැයි පෙන්වලා ජනතාවගේ හදවතට කිණිසි පහර එල්ල කරන නින්දිත, දුර්දාන්ත, අධම වැඩි කිරීමක් හැටියටයි අප මේ වැඩි කිරීම හඳුන්වන්නේ. මේ අසාධාරණය දිහා අපි තවදුරටත් බලමු. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකකයකට මිල ගණනය කරන විට ඒකක 1 සිට 300 දක්වා රුපියල් 5 ඉඳලා රුපියල් 26 දක්වා වැඩි කරනවා. හැබැයි ඒකක 301 සිට 900 දක්වා මීල වැඩි වෙන්නේ රුපියල් හයකිනුයි. -රුපියල් 26 ඉඳලා රුපියල් 32 දක්වා- එතැනින් කරන්නේත් පොඩි මිනිහාගේ බඩට ගහන එකයි. ඒකක 1 සිට 300 දක්වා රුපියල් 5 ඉඳලා රුපියල් 26 දක්වා මහා ශීඝ්‍ර පිම්මක් පනිනවා. හැබැයි ඒකක 301 සිට 900 දක්වා වැඩි වෙන්නේ රුපියල් හයකිනුයි. එපමණක් නොවෙයි, ඒකක 900න් පස්සේ මොකක්ද වෙන්නේ? ඒකක 900න් පස්සේ 900ක් පාරිභෝජනය කළත්, 1,000ක් පාරිභෝජනය කළත්, 10,000ක් පාරිභෝජනය කළත් ඒකකයකට අය කරන්නේ රුපියල් 34යි. රුපියල් දෙකක වැඩි කිරීමක් පමණයි. මේක සාධාරණද? මේක යුක්ති සහගතද? මේකද සමාජ සාධාරණත්වය කියලා මා අහන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එපමණක් නොවෙයි, අපි ස්ථාවර ගාස්තු දිහා බලමු. ඒකක 1 සිට 30 දක්වා ස්ථාවර ගාස්තුව රුපියල් 30යි. ඒකක 31 සිට 60 දක්වා ස්ථාවර ගාස්තුව

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

රුපියල් 60යි. ඒකක 61 සිට 90 දක්වා ස්ථාවර ගාස්තුව රුපියල් 90යි. නමුත් ඒකක 90 පැනලා ඒකක 91 සිට 600ටත් රුපියල් 315යි. ඒකක 700ටත් රුපියල් 315යි. ඒකක 800ටත් රුපියල් 315යි. ඒකක 10,000ටත් රුපියල් 315යි. මෙන්න ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ ආශ්චර්යවත්, යුක්තිසහගත මිල සූත්‍රය! සංවේදී ශ්‍රී ලංකාව මේකද කියලා මා අහන්න කැමැතියි. සාධාරණත්වයේ ප්‍රතිමූර්තිය මෙයද? සාධාරණත්වයේ ආශ්චර්යය මෙයද? සංවේදීතාවයේ මහිමය මේකද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බලන්න, මේ විදුලි බිල වැඩි කිරීමත් සමඟ ගෙදර විදුලි බිල වැඩි වෙනවා. භාණ්ඩ හා සේවා ගාස්තු වැඩි වෙනවා. ඒ වාගේම තවත් පැත්තකින් කම්කරුවාගේ, පොඩි මිනිහාගේ සේවක වරප්‍රසාද සියල්ලක්ම කප්පාදු වෙනවා. මෙන්න මේ වාගේ තත්ත්වයක් තුළ අපට බොහොම අරුම පුදුම කථාවක් අහන්න ලැබෙනවා. මේ කථාව විටෙක අපේ පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනියත් කියනවා. තවත් විටෙක සරත් අමුණුගම ඇමතිතුමාත් කියනවා. ඒ දෙදෙනාම කියනවා, මේ ප්‍රතිශත ගැන කථා කරන්න එපා ලු. ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමියනි, ඔබතුමිය අප්‍රේල් 23වැනි දා ප්‍රකාශ කර තිබෙනවා, "විදුලි බිල වැඩි වීමේ ප්‍රතිශතය මත පදනම්ව කෑකෝ ගැසීමෙන් අර්බුදයට විසඳුමක් ලැබෙන්නේ නැහැ" කියලා. ඒ වාගේම සරත් අමුණුගම ඇමතිතුමාත් ප්‍රකාශ කරනවා, "මේ ප්‍රචාරක ව්‍යාපාරය තුළ එක පාරටම ප්‍රතිශත ගැන කථා කරන්නේ මොකද? සත ගැන කථා කරන්නේ නැහැ, ප්‍රතිශත ගැන කථා කරනවා" කියලා. මේ සරත් අමුණුගම ඇමතිතුමා කියන්නේ. ඒ වාගේම එතුමා කියනවා, "වෙන දවස්වල මේ ගොල්ලෝ කථා කරන්නේ මුදල ගැනයි, දැන් ප්‍රතිශතය ගැන කථා කරනවා" කියලා. නමුත් ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමියටත්, ගරු සරත් අමුණුගම ඇමතිතුමාටත් මා මෙන්න මේ කාරණය පෙන්වා දෙන්න කැමැතියි. ඔබතුමාත්, ඔබතුමියත් මේ ආණ්ඩුවේ අය වැය ගැන කථා කරන කොට ආර්ථික වර්ධන වේගයේ සියයට හත, සියයට අට ගැන බොහොම උජාරුවට කථා කරනවා. ඒ වාගේම සරත් අමුණුගම ඇමතිතුමාත් විවිධ ආර්ථික විශ්ලේෂණ ක්‍රියාත්මක කරන කොට ප්‍රතිශත ගැන කථා කරන්නට බොහොම උනන්දු වෙලා තිබෙනවා; උත්සුක වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනියට මා එක දෙයක් ප්‍රකාශ කරන්න ඕනෑ. ඔබතුමිය එක එක කථා කියන කොට කරුණාකරලා "ඔවා දෙනු පරහට, තමන් සම්මතෙහි පිහිටා සිට" කියන ආප්තෝපදේශය හොඳට මතක තියාගන්න. ඒ කියන්නේ තමන් පිවිතුරු සම්මතයක ඉඳගෙන අනුන්ට උපදෙස් ලබා දෙන්න කියන එකයි. අන්න ඒ කාරණය මා මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප දුටුවා මේ මහා උද්ඝෝෂණ, මහා ජනතා කැළඹිල්ලක් ක්‍රියාත්මක වෙන කොට ආණ්ඩුවට ලොකු පීඩනයක් ආව බව. හැබැයි, ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමා කිව්වා, විදුලි බිල අඩු කරන්න පුළුවන් එකම ක්‍රමය පැය 4ක් ලයිට් කැපුවොත් විතරයි කියලා. මේ බලන්න, මගේ අතේ දැන් තිබෙනවා එතුමා "රිවිර" පුවත් පතට දී තිබෙන ඒ සම්මුඛ සාකච්ඡාව. හැබැයි, විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමා අප්‍රේල් 28වෙනි දා විදුලි බිල අඩු කරන්නට පුළුවන් පැය 4ක් ලයිට් කැපුවොත් පමණයි කියලා මේ ප්‍රකාශය කරලා මුළු ලංකාවටම කියන විට, ගරු ජනාධිපතිතුමා මැයි පළමුවැනි දා, - ජාත්‍යන්තර කම්කරු දිනයේ- ආශ්චර්යවත් ප්‍රකාශයක් කළා. මොකක්ද මේ ආශ්චර්යවත් ප්‍රකාශය? මේ ආශ්චර්යවත් ප්‍රකාශය තමයි ඒකක 60ට අඩු සියලුම පාරිභෝගිකයින්ට ඒ වැඩි කිරීම නතර කරනවා කියන එක. අප ඒ ගැන සතුටු වෙනවා. ඒක හොඳ දෙයක්. මේ තීන්දුව නිසා ලක්ෂ 24කට සහනයක් ලැබෙනවා; සියයට 48කට සහනයක් ලැබෙනවා. හැබැයි, ඒකක 60 - 180ත් අතර පරිභෝජනය කරන ලක්ෂ 25ක් -සියයට 49ක්- සහමුලින්ම අතර මං වෙනවා. බෙදුම්වාදය තුරන් කළ මේ රජය දැන් විදුලි බෙදුම්වාදය ක්‍රියාත්මක කරලා තිබෙනවා. ලක්ෂ 24කට -සියයට 48කට- එක හැන්දකින් බෙදලා, තවත් ලක්ෂ 25කට -සියයට 49කට- තවත් හැන්දකින් බෙදලා ඒකක 60 - 180 පරිභෝජනය කරන අයට ඒකක මට්ටමින් කිසිම සහනයක් ලබා දීලා නැතිව විදුලිබල බෙදුම්වාදය අද ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ජනාධිපතිතුමා කිව්වා ඒකක 60 - 180 අතර සිටින පාරිභෝගිකයින්ගේ ඉන්ධන ගැළපුම් ගාස්තුව සියයට 25කින් අඩු කරනවා කියලා. ඒ කියන්නේ සියයට 40 සිට 30 දක්වා. නමුත් මිල ගණනය කරලා මේක ක්‍රියාත්මක වන විට මොකක්ද සිදු වන්නේ? මිල ගණනය කරලා මේක ක්‍රියාත්මක වන විට විදුලි බිල අඩු වන්නේ සියයට 6ක්, 7ක් වැනි සොච්චම් ප්‍රමාණයකිනුයි. මේකයි ඇත්ත කථාව. එපමණක් නොවෙයි සෑම පාරිභෝගිකයෙකුටම ඒකක 6ක් නොමිලයේ ලබා දෙනවා කියලා එතුමා ප්‍රකාශ කළා. මොකක්ද ඒ කියමන, මොකක්ද ඒකේ තේරුම? රුපියල් 10,000ක් රාජ්‍ය කප්පමකින් ජනතාවගෙන් අරගෙන, ශත 10ක් ආපසු ජනතාවට ලබා දීම නොවෙයිද? මේක නූල් සූත්තර, අංක ගණිත, සංඛ්‍යාත්මක ජිල්මාට් එකක් පමණයි කියන එක මා ප්‍රකාශ කරන්නට කැමැතියි. ඒ වාගේම ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, ඒකක 60 සිට 61ට යන විට, 90 සිට 91ට යන විට, 120 සිට 121ට යන විට සියයට 100 ක්ෂණික වැඩි වීම නිසා අපහසුතාවට පත් වන ජනතාවට සහනයක් ලබා දෙන්නට 61, 91 සහ 121 තව ඒකක 5ක් එහාට තල්ලු කරයි කියලා. නමුත් මේ ප්‍රශ්නයට විසඳුම ඒක නොවෙයි ගරු ඇමතිතුමියනි. මේ ප්‍රශ්නයට විසඳුම තමයි 2008 දී ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන්න උපදෙස් අනුගමනය කිරීම. මෙතෙක් කල් මේ රටේ ක්‍රියාත්මක වුණ පියවරෙන් පියවර වැඩි වන කාණ්ඩ ක්‍රමය - Increasing Block Tariff ක්‍රමය- 2008 දී සම්පූර්ණයෙන්ම ඉවත් කරලා පාරිභෝජනය අනුව තීරණය වන කාණ්ඩ ක්‍රමය - Volume Differentiated Tariff ක්‍රමය - ගෙන එන විට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් නොවෙයි උපදෙසක් ලබා දුන්නා. ඒ උපදෙස අනුව පියවරෙන් පියවර වැඩි වන කාණ්ඩ ක්‍රමය තමයි සාධාරණ ක්‍රමය.

පරිභෝජනය අනුව තීරණය වන කාණ්ඩ ක්‍රමය සම්පූර්ණයෙන්ම අසාධාරණයි, එයින් ජනතාවට ලොකු අසාධාරණයක් වනවා, ඒ නිසා ඒ ක්‍රමය ඉවත් කරලා සාධාරණ පියවරෙන් පියවර ක්‍රමය ක්‍රියාත්මක කරන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණය උපදෙසක් දුන්නා. මොකක්ද මේ ක්‍රමයේ තේරුම? යම් කිසි පුද්ගලයෙකු ඒකක 90ක් පරිභෝජනය කරනවා නම්, පියවරෙන් පියවර ක්‍රමයේදී පළමුවැනි ඒකක 30ට එක මිලකුත්, දෙවැනි ඒකක 30ට තව මිලකුත්, තුන්වැනි ඒකක 30ට තව මිලකුත් නියම කරනවා. ඒක තමයි සාධාරණ පියවරෙන් පියවර ක්‍රමය. නමුත් මේ රජය ඒ සාධාරණ ක්‍රමය ඉවත් කරලා, එදා -2008 දී- ශ්‍රේෂ්ඨාධිකරණය කරන්න එපාය කිව්ව දේ අවුරුදු පහකට පස්සේ අද 2013 දී ක්‍රියාත්මක කරනවා. ඒ අනුව ඒකක 90ටම අය කරනවා, එකම මිල.

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි ඇමතිතුමිය නීතිඥවරියක්. ඔබතුමිය අප්‍රේල් විසිතුන්වැනිදා මේ සභාවට ඇවිල්ලා මේ අලුත් මිල සූත්‍රය වෙනුවෙන් කථා කරන කොට, 2008 දී ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් ඒ උපදෙස අනුගමනය කරන්නට නීතිඥවරියක හැටියට ඔබතුමිය අපොහොසත්වීම ඇත්ත වශයෙන්ම ලජ්ජාවට කාරණාවක් කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. විශේෂයෙන්ම මම ඔබතුමියට මතක් කරන්න කැමැතියි, මේ පරිභෝජනය අනුව තීරණය වන කාණ්ඩ ක්‍රමය - Volume Differentiated Tariff - ලෝකයේ වෙන කිසිම රටක ක්‍රියාත්මක වන්නේ නැහැ කියන කරුණ. අන්න ඒ ආශ්චර්යය නම් අපි දිනලා තිබෙනවා. ලෝකයේ කිසිම රටක ක්‍රියාත්මක වන්නේ නැති, 2008 දී ශ්‍රේෂ්ඨාධිකරණය අසාධාරණයි කියලා කියපු, පරිභෝජනය අනුව තීන්දු වන කාණ්ඩ ක්‍රමය

ඔබතුමන්ලා අද ක්‍රියාත්මක කරන්න හදනවා. ආශ්චර්යවත් ශ්‍රී ලංකාවක් බිහි කරනවායැයි කියන, සදාචාර සම්පන්න යැයි කියන රජය අද -2013 දී- ඉතාම අසාධාරණ අන්දමට, අශීලාචාර අන්දමට මේ රටේ ජනතාව වටිටන්නට ක්‍රියා කිරීම නින්දිත කාරණාවක්. ඔබතුමියගේ දැන ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ උපදෙස ඇතුළත් SCFR 113/2008 සහ SCFR 82/2008 කියන මේ තීන්දු දෙකම මම **සභාගත*** කරනවා.

අඩුම තරමින් මේ තීන්දු දෙක හරි කියවලා විදුලි බිල සඳහා ක්‍රියාත්මක වන මේ නින්දිත සූත්‍රයේ වෙනසක් ඇති කරන්නට ඔබතුමිය කටයුතු කරයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

අප්‍රේල් 28 වැනිදා විදුලි බල මණ්ඩලයේ සභාපතිතුමා කිව්වා, මිල අඩු කරන්න නම් දවසකට පැය හතරක් ලයිට් කපන්න ඕනෑය කියලා. ජනාධිපතිතුමා මැයි පළමුවැනි දා යම් කිසි ප්‍රකාශයක් කරලා පොරොන්දු මාලාවක් දුන්නා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? මැයි හත්වැනි දා විදුලි බල මණ්ඩලය මහජන උපයෝගිතා කොමිසමට ගිහිල්ලා කියනවා, "ඒකක 60ට අඩුවෙන් පරිභෝජනය කරන ජනතාවගේ විදුලි බිල අඩු කරනවාය කියලා ජනාධිපතිතුමා කිව්වාට එහෙම කරන්න බැහැ" කියලා.

අනිවාර්යෙන්ම ඒකක 31ත්, 60ත් අතර මිල සියයට 33කින් වැඩි වනවාය කියනවා. ජනාධිපතිතුමාගේ කීම නොතකා, ජනාධිපති නියෝගය පයට පැගෙන දුවිලි තරම්වත් ගණන් ගන්නේ නැතිව, විදුලිබල මණ්ඩලය මැයි 07වැනි දා ගිහිල්ලා මහජන උපයෝගිතා කොමිසමට කියනවා, "සියයට 15ත්, 33ත් අතර ප්‍රමාණයකින් මිල වැඩි කරනවාය" කියලා. කොහොමද විදුලිබල මණ්ඩලයේ තරම! කොහොමද විදුලිබල මණ්ඩලයේ මහිමය! විධායක ජනාධිපතිවරයා ජනතාව වෙනුවෙන් හෝ හිතලා ලබා දුන් නියෝගය, ඔබතුමියගේ අමාත්‍යාංශය යටතේ තිබෙන විදුලි බල මණ්ඩලය සම්පූර්ණයෙන්ම පැත්තකට විසි කරලා, ඔවුන්ගේ දූෂණය, සොරකම, වංචාව, ප්‍රෝඩාව, මුසාව, මුලාව වසන් කර ගන්නට නැවත වරක් පොදු ජනතාව මත බර පැටවීම මහා නින්දිත දෙයක් හැටියටයි මා දකින්නේ ගරු ඇමතිතුමියනි.

ඒ වාගේම මේ අවස්ථාවේ දී පවතින ප්‍රධාන ගැටලුව දිහා බලන්න මම කැමැතියි. මේ විදුලිය ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම යන ක්‍රියාවලිය දෙස බැලීමේදී මේ රටේ විදුලිය උත්පාදනය කරන ක්‍රම දෙකක් තිබෙනවා. එකක් තමයි පුනර්ජනනීය ක්‍රමය. අනෙක් ක්‍රමය තමයි පොසිල ඉන්ධන භාවිතයෙන් විදුලිය ජනනය කරන ක්‍රමය. දැන් පුනර්ජනනීය ක්‍රමය මඟින් මේ රටේ විදුලිය උත්පාදනය වනවා, සියයට 37ක්. පොසිල ඉන්ධන හරහා සියයට 63ක් විදුලිය උත්පාදනය වනවා. පුනර්ජනනීය ක්‍රමයෙන් විදුලිය උත්පාදනය කරනවාය කියන්නේ, සුළං, ජීව අපද්‍රව්‍ය, ජලය, දර යනාදිය උපයෝගි කර ගනිමින් විදුලිය උත්පාදනය කිරීමයි පොසිල ඉන්ධන භාවිතයෙන් විදුලිය උත්පාදනය කරනවාය කියන්නේ තෙල්, ගල් අඟුරු යනාදී තාප බලාගාර හරහා විදුලිය උත්පාදනය කිරීමයි. දැන් බලන්න, අපේ රටේ විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්නට රුපියල් 17.03ක් වැය වෙනවා. සම්ප්‍රේෂණ වියදම් තිබෙනවා, ඒකකයකට ශත 77ක්. බෙදා හැරීමේ වියදම් තිබෙනවා, ඒකකයකට රුපියල් 2.72ක්. ඒ වාගේම කෙටි කාලීන ණය සඳහා ඒකකයකට ශත 32ක් වැය වෙනවා. එතකොට විදුලි ඒකකයක මිල රුපියල් 20.84යි.

දැන් අපේ රටේ තිබෙන ප්‍රධාන ගැටලුව මොකක්ද? අපේ රටේ තිබෙන ප්‍රධාන ගැටලුව මේකයි. අපේ රටේ ජලයෙන් උත්පාදනය වන විදුලිය කිලෝ වොට් පැය ඒකකයක මිල රුපියල් 3යි. පෞද්ගලික, කුඩා පුනර්ජනනීය ක්‍රමවලින් උත්පාදනය වන කිලෝ වොට් පැය ඒකකයක මිල රුපියල් 18යි. ගල් අඟුරුවලින් නිපදවන කිලෝ වොට් පැය ඒකකයක මිල රුපියල් 11යි. හැබැයි, තෙල් තාප බලාගාරවලින් නිපදවන කිලෝ වොට් පැය ඒකකයකට වැය වනවා, රුපියල් 28ක්. මේකයි තිබෙන ප්‍රශ්නය. එහෙම නම් මේකට විසඳුම මොකක්ද? අපි පුළුවන් තරම් පුනර්ජනනීය විදුලිබල උත්පාදන ක්ෂේත්‍රය කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. ඒ සඳහා ජාතික සැලැස්මක් හදන්න ඕනෑ.

විශේෂයෙන් ගල් අඟුරු බලාගාර ක්‍රියාත්මක කරන්නට, ජල විදුලිය උත්පාදනය කරන්නට, ස්වාභාවික ගෑස් මඟින් විදුලිය උත්පාදනය කරන්නට, දර, ජීව අපද්‍රව්‍ය, සුළං උපයෝගි කර ගෙන විදුලිය උත්පාදනය කරන්නට අප ප්‍රවේශ වන්න ඕනෑය කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා දැක්කා. විදුලිය පිළිබඳ අර්බුදයක් ඇති මොහොතක, ඒ සාකච්ඡාවකදී එතුමා ප්‍රකාශ කර තිබෙනවා, අපේ රටේ තෙල් බලාගාර මාෆියාවක් එක්සත් ජාතික පක්ෂය නිර්මාණය කළ නිසා තමයි අද අපි මේ බරපතළ අර්බුදයකට, ව්‍යසනයකට මුහුණ දී තිබෙන්නේ කියලා. තොරතුරු, කරුණු කාරණා, දත්ත ඉදිරිපත් කරමින් ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඉදිරිපත් කළ ඒ තර්කය වැරදියි කියා පෙන්වන්න මා බලාපොරොත්තු වෙනවා.

මේ රටේ තෙල් බලාගාර මාෆියාවට උප්පැන්න දුන්නේ එක්සත් ජාතික පක්ෂය ද, එහෙම නැත්නම් මේ මාෆියාව පෝෂණය කරන්නට, මේ මාෆියාව රැක ගන්නට ශක්තිය ලබා දෙන්නේ සන්ධාන රජයද කියන එක අපි පොඩ්ඩක් හොයලා බලමු.

තෙල්වලින් ක්‍රියාත්මක වන පෞද්ගලික තාප විදුලි බලාගාර 11ක් තිබෙනවා. මේ එකොළහෙන් එක්සත් ජාතික පක්ෂ රජය සමයේ ආරම්භ කර තිබෙන්නේ, විදුලි බලාගාර 2යි. මොනවාද මේ දෙක? Heladanavi සහ ACE Power Embilipitiya. සන්ධාන ආණ්ඩු කාලයේ 9ක් ආරම්භ කර තිබෙනවා: Lakdhanavi, Colombo Power (Pvt.) Limited, Asia Power, Ace Power Generation Matara Limited., Ace Power Generation Horana Limited, AES Kelanitissa (Pvt.) Limited, West Coast Power (Pvt.) Limited, Northern Power, Aggreko - Chunnakam. එතකොට, තෙල්වලින් දුවන පෞද්ගලික තාප බලාගාර 11න් 9ක්ම එක්සත් ජාතික පක්ෂ රජයක කාල වකවානුවක නොවන සන්ධාන රාජ්‍ය කාල වකවානුවක ආරම්භ කර තිබියදී, කොහොමද මේ විදුලි බල මාෆියාව එක්සත් ජාතික පක්ෂයේ නිර්මාණයක් කියලා කියන්නේ?

එපමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ විදුලි උත්පාදනයේදී රාජ්‍ය පෞද්ගලික හිමිකාරිත්වයේ පවත්නා ගැටලු ගැන 2007 මහ බැංකු වාර්තාවේ ඇති කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමතියි. මහ බැංකුව කියන්නේ රජයේ නිල උපදේශකයා. 2007 මහ බැංකු වාර්තාවේ මේ විධියට කියනවා.

"විදුලි බලය මිල දී ගැනීමේ ගිවිසුම්වල ඌනතා නිසා කොටස් හිමිකම ප්‍රාග්ධන පිරිවැයෙන් සියයට 30ක් පමණ වන විදුලි බලය සපයන පුද්ගලික අංශයේ ආයතන ඉහත වාසි අත් විඳින අතර, සාමාන්‍ය ජනතාවට අවසානයේ ලංකා විදුලි බල මණ්ඩලයේ අධික පාඩුවල බර දැරීමට සිදු වේ."

***** ප්‍රස්තකාලයේ තබා ඇත.**

* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.

* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කවුද මෙහෙම කියන්නේ? මෙහෙම කියන්නේ 2007 මහ බැංකු වාර්තාව. ඒ වාගේම, මේ විධියටත් කියා තිබෙනවා.

"ඒ අනුව විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම්වල පවත්නා අවාසිදායක කොන්දේසි නිවැරදි කිරීම තුළින් ලංකා විදුලිබල මණ්ඩලයට දළ වශයෙන් රුපියල් බිලියන 6ක් පමණ වාර්ෂිකව ඉතිරි කර ගන්නට පුළුවන්"

මේක මා නොවෙයි කියන්නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩු සමයේ 2007 මහ බැංකු වාර්තාව තමයි එහෙම කියන්නේ. ඒ වාගේම කියනවා, මෙන්න මෙහෙම:

"විදුලි බලය සපයන පුද්ගලික ආයතන සමඟ පවතින විදුලි බලය සැපයීමේ ගිවිසුම්වල බරපතළ වැරදි හේතුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයට අධික පාඩු විඳීමට සිදු වී ඇති අතර, එය විදුලි බිල දැඩි ලෙස ඉහළ යාමට ද හේතු වී ඇත."

2007 මහ බැංකු වාර්තාව කියනවා, මේ පුද්ගලික තාප බලාගාර විදුලි බල මණ්ඩලය සමඟ තිබෙන ගිවිසුම් රටට වාසිදායක වන අන්දමට සංශෝධනය කර ක්‍රියාත්මක කළොත් වසරකට කෝටි 600ක් ඉතිරි කරන්නට පුළුවන් කියලා.

2007 වර්ෂයේම මේක ක්‍රියාත්මක කළා නම් ගරු ඇමතිතුමියනි, කෝටි 3600කට වැඩි ප්‍රමාණයක් ඉතිරි කර ගන්නට තිබුණා. ඉතින්, මේ යෝජනාව ක්‍රියාත්මක නොකරපු විදුලි ඝාතකයා කවුද කියලා මා අහන්න කැමතියි. 2007 මහ බැංකු වාර්තාව, මේ ගිවිසුම් සංශෝධනය කරන්නට ඕනෑය කියලා පුන පුනාම කියද්දී, කවුද මේ විදුලි මාෆියාව රැක ගත්තේ? සන්ධානය ද, එක්සත් ජාතික පක්ෂය ද? කවුද මේ විදුලි මාෆියාව සුරක්ෂා කළේ? කවුද මේ විදුලි මාෆියාව පෝෂණය කළේ? කවුද මේ විදුලි මාෆියාවට රැකවරණය, සෙවන, සරණ, ශක්තිය යන මේ සියලු සම්පතක්ම ලබා දුන්නේ?

එපමණක් නොවෙයි ගරු ඇමතිතුමියනි. සුළං බලයෙන් විදුලිය උත්පාදනය කරන්නට හම්බන්තොට මුහුදේ යම් කිසි වැඩසටහනක් ස්ථාපනය කරන්නට උත්සාහ කරනකොට විදුලි බල මණ්ඩලයේ විදුලි මාෆියාවත්, සන්ධාන ආණ්ඩුවේ, පොදු ජන එක්සත් පෙරමුණේ ආශ්චර්යවත් විදුලි මාෆියාවත් ඒක නතර කළා. BPH International, Canada සහ Allenborough Energy Corporation, USA ස්වාභාවික ගෑස් විදුලි බලාගාරයක් රට තුළ ඉදි කරන්නට ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කළා.

2006 කැබිනට් අනුකාරක සභාව ඒක අනුමත කළා. 2006, 2007, 2008 තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ ලබා ගත්ත. මෙගාවොට් 488ක ධාරිතාවක් ලබා දීලා ඒකකය රුපියල් 11 බැගින් නිපදවන්නට මේ වැඩසටහන ක්‍රියාත්මක කරන කොටත් විදුලිබල මණ්ඩලයේ විදුලි මාෆියාවත්, ආණ්ඩුවේ දේශපාලන සන්ධාන විදුලි මාෆියාවත් මේ වැදගත් යෝජනාව අහක දැම්මා; පැත්තකට දැම්මා; වීසි කළා. ඒ නිසා බොරුවට එක්සත් ජාතික පක්ෂය විදුලි මාෆියාව ක්‍රියාත්මක කළාය; විදුලි මාෆියාව රැක ගත්තාය-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, please wind up.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I have 30 minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have been given only 25 minutes.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
No, I have 30 minutes. The Hon. Wijeyadasa Rajapakshe has also given me five minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ නිසා විශේෂයෙන්ම විදුලිබල මණ්ඩලයේ අදටත් ක්‍රියාත්මක වන මේ දැවී තෙල් මාෆියාව සුරකින්නට, ආරක්ෂා කරන්නට, පෝෂණය කරන්නට, රැකවරණය -සෙවණ, සරණ, ශක්තිය- ලබා දෙන මේ සන්ධාන ආණ්ඩුව සහමුලින්ම ඊට වග කියන්නට ඕනෑ. ඒ නිසා බැසිල් රාජපක්ෂ මැතිතුමා එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දිගු කරන්නට පෙර, විදුලි මාෆියාව ගැන කියලා එක්සත් ජාතික පක්ෂයට දෝෂාරෝපණය කරන්නට පෙර කැඩපත ඉදිරිපිටට ගිහිල්ලා තමන්ගේ ප්‍රතිරූපය දිහා සුපරීක්ෂාකාරීව බලා තමන්ගේ අඩු පාඩුකම් ගැන හිතලා බලන එක හොඳයි කියා මා මේ අවස්ථාවේ යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව අවසන් කරන්නට යන මේ මොහොතේ මා කියන්නට කැමැතියි, දැන් ආණ්ඩුව හොට පටලවාගෙනයි ඉන්නේ කියන එක. විශේෂයෙන්ම විදුලිබල ඇමතිතුමිය ප්‍රමුඛ සන්ධාන ආණ්ඩුව කොටිටෝරුවා වාගේ කොටාගෙන, කොටාගෙන ගිහිල්ලා හොට පටලවාගෙන අද වැලේ වැල් නැතිව ඉන්නවා; වැඩ වරද්දා ගෙන ඉන්නවා. ගරු ඇමතිතුමියගෙන් මා ඉල්ලීමක් කරනවා මේවා අනුන්ගේ කර පිටට දමන්න යන්න එපා කියලා. මේ වගකීම භාර ගන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇමෙරිකාවේ හැරී එස්. ටෘමන් කියලා ජනාධිපතිවරයකු හිටියා. එතුමාගේ මේසය උඩ ගහලා තිබුණා, "The buck stops here" කියලා. මොකක්ද ඒකේ තේරුම? "කවුරු මොන දේ කළත් අවසානයේ වගකීම නතර වෙන්නේ මගේ මේසය උඩ. මම මේකට වග කියන්නට ඕනෑ" කියන එකයි. ඒ නිසා මේ විදුලිබල ක්ෂේත්‍රයේ දූෂණය, වංචාව, හොරකම තුරන් කරන්නට ඇප කැප වුණු අර චම්පික රණවක මැතිතුමාගේ ඇඟ පිට තමන්ගේ වැරදි පටවලා තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නඟා ගන්නවා වෙනුවට මේ තිබෙන ප්‍රශ්නය පිළිබඳව අවබෝධයෙන් යුක්තව කටයුතු කරන එක වැදගත් කියලා මා යෝජනා කරනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමියනි, ඔබතුමිය ප්‍රකාශ කර තිබෙනවා ඔක්තෝබර් මාසයේ මෙගාවොට 300ක් නොරොච්චෝලේ බලාගාරයෙන් අපේ විදුලි පද්ධතියට එකතු වෙනවා කියලා. ඊළඟට ලබන වසරේ මාර්තු මාසයේ තවත් මෙගාවොට 300ක් එකතු වෙනවා; එතකොට විදුලි මිල අඩු කරන්නට පුළුවන් කියලා ඔබතුමිය කියා තිබෙනවා. මා ඔබතුමියගෙන් අහනවා, විදුලිබල මණ්ඩලයේ දූෂණය, වංචාව, හොරකම, ප්‍රෝඩාව නිසා ඇති වී තිබෙන මේ බර මාස 12ක් ජනතාව මත පටවන්නේ නැතිව ආණ්ඩුව විඳ දරා නොගන්නේ ඇයි කියලා. විදුලිබල පද්ධතියට නොරොච්චෝලෙන් තව මෙගාවොට 600ක් එකතු වෙනවා නම් ඒකේ වාසිය ආණ්ඩුව ගන්න. දැන් හොරකමේ, වංචාවේ, දූෂණයේ අවාසිය ජනතාවගේ

කරපිට පටවා, ජනතාව තළා පෙළා, පොඩි කරලා, මිරිකලා පැත්තකට වීසි කරනවා වෙනුවට ඔබතුමියට පුළුවන් හොඳ ධනාත්මක, ගුණාත්මක, හරාත්මක තීන්දුවක් රට වෙනුවෙන් ගන්න පෙරට යන්න. ඒ වාගේම මාස 12ක් මේ පාඩුව රජය විඳ දරා ගන්න. දැන් ඔබතුමියට අහන්න පුළුවන්, කොහෙන්ද මේකට සල්ලි කියලා. මා කියන්නම් කොහේද සල්ලි තිබෙන්නේ කියලා.

ගරු ඇමතිතුමියනි, ඔබතුමිය දන්නවා ශ්‍රී ලංකන් ගුවන් සේවයේ කෝටි 2050ක පාඩුවක් තිබෙන බව. හැබැයි, කෝටි 2050ක පාඩුවක් තිබුණාට ඔබතුමියම ඉන්න කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙනවා රුපියල් බිලියන 315ක් වැය කරලා අලුතින් ගුවන් යානා 10ක් ගන්න. පාඩුව කෙසේ වෙතත් රජයේ වියදම ක්‍රියාත්මක වෙනවා. මොනවා හෝ අමතර ප්‍රතිලාභයක්, අමතර කොමිස් මුදලක්, අමතර සන්තෝසමක් ලැබෙන නිසා මේවා ක්‍රියාත්මක වනවාද, නැද්ද කියන එක මා දන්නේ නැහැ. මා දන්නවා විදුලි බිල වැඩි වීමේ බර ආණ්ඩුව දරා ගැනීම තුළින් කොමිස් වාසියක් කාටවත් එන්නේ නැහැ; පගා වාසියක් කාටවත් එන්නේ නැහැ කියලා. ඒ නිසා මේක නොකරනවාද කියන එක මට ප්‍රහේලිකාවක්. ඇයි මාස 12ක් මේ බර තමන්ගේ කරට අරගෙන, ඉවක් බවක් නැතිව වැඩි කරපු මේ විදුලි බිල අඩු කරන්නට කටයුතු කරන්නේ නැත්තේ? විදුලි බිල අඩු කරනවා වාගේම මේ ක්‍රියාත්මක වන දූෂිත මිල සූත්‍රය 2008 ශ්‍රේෂ්ඨාධිකරණය එපා කියාපු මිල සූත්‍රයක්.

නීතිඥවරියක් හැටියට ඔබතුමිය දන්නවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි ව්‍යවස්ථාවේ (3) සහ (4) අනු ව්‍යවස්ථා යටතේ සුප්‍රීම් උසාවිය - ශ්‍රේෂ්ඨාධිකරණය- ලබා දෙන නියෝග අපි පිළිපදින්නට ඕනෑය කියන එක. මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් හරහා ශ්‍රේෂ්ඨාධිකරණය යෝජනා කළ උපදේශය අනුගමනය කරන්නේ නැත්තේ ඇයි? මේවා දැන දැනත් කිසිම හිරිකිතයකින් තොරව, දෙපාරක් තුන් පාරක් හිතන්නේ නැතිව ජනතාව මත මේ වාගේ බරක් පටවන්නේ ඇයි කියන එක මම අහන්න කැමැතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න.

විශේෂයෙන්ම බුදු වදනකින් මගේ කථාව අවසන් කරන්න මම බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමියනි, ධම්මපදයේ මෙසේ සඳහන් වෙනවා:

"සුජීවං අහිරිකේන
කාකසූරේන ධංසිනා
පක්ඛන්දිනා පගබ්භේන
සංකිලිට්ඨේන ජීවිතං"

මේ ගාථාවේ තේරුම මොකක්ද? "කවුඩෙකු මෙන් ගසා කෑමෙහි ශූර වූ, පාපයෙහි ලැජ්ජා බිය නැති, අනුන්ගේ ගුණ මකන, ගෙන් ගෙට දුවන, කිලිටි දිවි පැවැත්මක් තිබෙන පුද්ගලයාට යහතින් ජීවත් වෙන්න පුළුවන්" කියන එකයි.

ඉතින් අනුන්ගේ ගුණ මකන, කිලිටි ජීවිතයක් තිබෙන කවුඩෙකු මෙන් ගසා කන මේ රජයට ගසා කෑමේ බර ජනතාව මත පටවලා යහතින් ජීවත් වෙන්න පුළුවන්. ඒක ඇත්ත. නමුත් මේ සත්‍ය අසත්‍යයක් කරන්නට ඔබතුමිය කටයුතු කරන්න. නිර්භීත තීන්දුවක් ගන්න. කැබිනට්ටුවට යෝජනාවක් ඉදිරිපත් කරන්න. මේ දූෂිත විදුලි මිල සූත්‍රය වහාම ඉල්ලා අස් කර ගන්න. මේ විදුලි මිල වැඩි කිරීම වහාම ඉල්ලා අස් කර ගන්න. බරක් දරන්නට තිබෙනවා නම්, ආණ්ඩුවක් හැටියට ඒ බර දරන්න. ජනතාවගෙන් පත් වුණු ආණ්ඩුවක් හැටියට ජනතාවට ආශ්චර්යවත් ශ්‍රී ලංකාවක් ගොඩ නඟනවාය කියලා, අද අපායක් වූ ලංකාවක් ගොඩ නඟන්නට කටයුතු කළ තමුන්නාන්සේලා දූෂණයේ, වංචාවේ, හොරකමේ, බර තමුන්නාන්සේලාගේ කරට ගන්න. මේ රටේ සුවහසක් - ලක්ෂ 200ක්- වූ ජනතාවගේ; ගම්මාන 34,000ක ජීවත් වන, උප දිසාපති කොට්ඨාස 335ක ජීවත් වන පුංචි මනුෂ්‍යයාගේ ඇඟ පිට මේ බර පටවන්නේ නැතුව රට වෙනුවෙන් හොඳ සැදැහැවත් තීන්දුවක් ඔබතුමිය ගන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sajith Premadasa, please wind up. You have almost taken two more minutes.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම විශ්වාස කරනවා, පවදේවියක් නොවෙයි, ගින්දර දේවියක් නොවෙයි, මුළු රටටම විභාරමහා දේවියක් හැටියට මේ රට වෙනුවෙන් හොඳ උත්තරීතර තීන්දුවක් ගනීවිය කියා. ඒ සඳහා ඔබතුමියට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 2.28]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලි බිල වැඩි කිරීම සම්බන්ධව අද විරුද්ධ පක්ෂය ගෙන යන්නේ සම්පූර්ණයෙන්ම දේශපාලන වැඩ පිළිවෙළක්. අපි පැහැදිලිව කියන්න ඕනෑ විදුලි බිල වැඩි වුණේ මේ අවස්ථාවේදී විතරක් නොවන බව. 1980 ඉඳලා නොයෙක් වර විදුලි බිල වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම මේ විදුලි බිල ගැන සාකච්ඡා කරන කොට හැමදාම ජනතාවට තේරෙන රුපියල් ශතවලින් තමයි කථා කළේ. සජිත් ප්‍රේමදාස මහත්මයා මේ ගැන විවේචනයක් කළා. ඇයි, රුපියල් ශතවලින් කියන්නේ කියලා එතුමා ඇහුවා. නමුත් ඇත්ත වශයෙන්ම රුපියල් ශතවලින් කථා කිරීම තුළින් වැඩි වන විදුලි බිල ගැන මේ රටේ ජනතාවට පැහැදිලි අවබෝධයක් ලැබෙනවා විතරක් නොවෙයි, මෙහි යථා ස්වරූපය තේරුම් ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒක විකෘති කරලා, දේශපාලන ප්‍රශ්නයක් බවට පරිවර්තනය කරලා, ආණ්ඩුවට විරුද්ධව දේශපාලන ප්‍රවාහයක් ගොඩ නඟලා ඉදිරිපත් කරන්න අද විපක්ෂය මෙක යොදා ගෙන තිබෙනවාය කියන එක පැහැදිලියි.

එතුමා ප්‍රතිශතවලින්ම කියන නිසා මම කියන්න කැමැතියි, විදුලිය ගාස්තු වැඩි කිරීම පළමුවරට 2013 මේ ආණ්ඩුව යටතේ සිද්ධ වුණු දෙයක් නොවෙයි කියලා. මීට පෙරත් 1988 ජේ.ආර්. ජයවර්ධන මහත්මයා බලයේ සිටියදී විදුලිය ගාස්තු සියයට 45කින් වැඩි කළා. ඊට පස්සේ වරින් වර අඩු ගණන්වලින් විදුලිය ගාස්තු වැඩි වෙලා 2001 වර්ෂයේදී නැවතත් සියයට 23කින් වැඩි වුණා. ඒ අපේ ආණ්ඩුව කාලයේ. නැවත 2002 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂ රජය සියයට 31කින් විදුලිය ගාස්තු වැඩි කළා. [බාධා කිරීමක්]

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

මම කියන්නට ඕනෑ, යම් යම් ප්‍රශ්න නිසා, විශේෂයෙන්ම විදුලිබල ප්‍රශ්නයත් සමඟ අත්වැල් බැඳගෙන නැඟී සිටින මූල්‍ය ප්‍රශ්න විසඳීම සඳහා නොයෙක් වර විදුලි බිල වැඩි කරලා තිබෙන බව. අදට වඩා විදුලිය බිල වැඩි වුණු අවස්ථා තිබෙනවා. මම මීට කලින් තමුන්නාන්සේලාට කිව්වා, 1988 දී විදුලි බිල වැඩි කළ ප්‍රතිශතය සියයට 45ක් බව. වැඩිම ප්‍රතිශතයකින් බිල වැඩි කළේ එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. ඊළඟට 2002 දී එය සියයට 31කින් වැඩි වුණා. එදා විශාල වැඩි වීමක් සිද්ධ වුණා. විදුලි බිල වැඩි වීමට හේතු වුණු මූලික කරුණු, ප්‍රතිපත්තිමය කරුණු මොනවාද කියලා අපි සාකච්ඡා කරන්නට ඕනෑ.

ඇත්ත වශයෙන්ම අපි දන්නවා, ලක්ෂපාන ජල විදුලි බලාගාරය හදලා මේ රටට විදුලිය ජනනය කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කළේ 1950 දී බව. ඊට පස්සේ වරින් වර කැලණි ගඟ දිගට ජල විදුලි බලාගාර හදලා මේ රටේ නගරවලට, නගර ආසන්න ප්‍රදේශවලට පමණක් මෙගාවොට් 190ක පමණ විදුලිය ප්‍රමාණයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා.

ඊළඟට 1970 අග භාගයේදී මහවැලි ව්‍යාපාරය යටතේ බලාගාර කිහිපයක් හදලා මෙගාවොට් 660ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කළ බව අපි පිළිගන්නවා. ඒ නිසා මේ රටේ විදුලිය නොදැකපු, විදුලිය බුක්ති නොවිඳපු විශාල ජනකායකට විදුලිය ලබා ගන්න පුළුවන්කම ලැබුණා. නමුත් අපි කියන්නට ඕනෑ, අති මහත් බහුතරයක් විදුලි බලය බුක්ති වින්දේ නැති බව. එදත් බොහෝ ප්‍රදේශවල ළමයි පාඩම් කළේ කුප්පි ලාම්පුවේ එළියෙන්. එදා සුළු නගරවල, ඒ නගරවලට සම්බන්ධ වෙලා තිබෙන ගම්වලට, ඇත පිටිසර ප්‍රදේශවලට විදුලිය ලැබුණේ නැහැ. මම කියන්නට ඕනෑ, විදුලි බලය ව්‍යාප්ත කිරීම ආරම්භ කළේ 1994 රජය බලයට පත් වුණාට පසුවයි කියන එක. එදා, 1994 බලයට පත් වුණු ආණ්ඩුව යටතේ ගම්වල ජනතාවට විදුලිය ලබා දීම ආරම්භ කළාට පස්සේ විදුලි බලය සම්බන්ධව අර්බුදයක් ඇති වුණා. ඒ අර්බුදය තමයි, ඒ වෙන කොට ජනනය වන විදුලිය ප්‍රමාණය එම අවශ්‍යතාවන් ඉෂ්ට කරන්නට ප්‍රමාණවත් නොවීම. අන්න එතැනදී තමයි මේ ප්‍රශ්නය ආරම්භ වුණේ. ඒ නිසා 1996-1997 වෙන කොට දැවි තෙල් බලාගාර කිහිපයක් ඇති කරන්න සිද්ධ වුණා. අපට ඒකෙන් පැනලා යන්න පුළුවන්කමක් නැහැ. අවශ්‍ය විදුලි බලය ජනනය කිරීම සඳහා බලාගාර කිහිපයක් ඇති කළා.

මේ අවස්ථාවේ අපි තමුන්නාන්සේලාට තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ විදුලිබල ප්‍රශ්නයට විසඳුමක් තිබුණා. ඒ විසඳුම විදුලිබල ක්ෂේත්‍රයේ ඉංජිනේරුවන් විසින් ඉදිරිපත් කරලා තිබුණා. ඒ වාගේම මේ ක්ෂේත්‍රය ගැන දැනුමක් තිබෙන උදවිය විසින් කරපු යෝජනාව ක්‍රියාත්මක කරන්න පියවර නොගෙන පැත්තකට දාලා පරිසර හිතකාමීන්ගේ අවවාද පමණක් පිළිඅරගෙන කටයුතු කිරීම නිසා තමයි අද මේ දැවැන්ත විදුලිබල අර්බුදය ඇති වෙලා තිබෙන්නේ.

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය මේ රටේ විදුලිබල ක්ෂේත්‍රයට වැදගත් කියලා සාකච්ඡා වුණේ 1982 දීයි. එදා විදුලිබල මණ්ඩලය Least Cost Generation Plan කියන අඩු වියදමකින් විදුලි බලය නිපදවීමේ සැලැස්ම හදන කොට මෙම ගල් අඟුරු බලාගාරය සෑදීමේ අවශ්‍යතාව ඒ අය කියා පෑවා. නමුත් ඒකට අවධානය යොමු කළේ නැහැ. පළමුවෙන් ත්‍රිකුණාමලයේ ඒක පිහිටුවන්න අදහස් කළා. නමුත් පරිසර හිතකාමීන්ගේ විරෝධය නිසා ඒක ප්‍රතික්ෂේප කළා. ඊට පස්සේ 1989 දී ඒක දකුණේ වේහැල්ලේ ඉදි කරන්න යෝජනා වුණා. නමුත් ඒක කළේ නැහැ. ඊළඟට මම කියන්නට ඕනෑ, 1994 චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය බලයට පත් වෙලා ඒක ක්‍රියාත්මක කරන්න කටයුතු කරන කොට අද අපේ පැත්තේ ඉන්න, එදා තමුන්නාන්සේලාගේ පැත්තේ හිටපු මන්ත්‍රීවරයෙක් එදා පුත්තලමේදී විරෝධතාවක් නැඟුවා. දිගින් දිගටම විරුද්ධත්වය ප්‍රකාශ කරලා ජීවිතයක් පවා නැති වුණා. අද ඒ මන්ත්‍රීතුමා අද අපේ පැත්තේ ඉඳගෙන නොරොච්චෝලේ වැඩ කටයුතුවලට අත උස්සනවා. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. [බාධා කිරීමක්] මෙන්න මේ විධියට තමයි මේ ප්‍රශ්නය නිර්මාණය වුණේ.

එදා නොරොච්චෝලේ බලාගාරය හැදුවා නම්, පළමුවැනි අදියර, දෙවැනි අදියර, තුන්වැනි අදියර මේ වන කොට අවසාන කළා නම් මේ විධියේ ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. මම කියන්නට ඕනෑ, 2001 දී බලයට පත් වුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මොකද කළේ කියලා. සජිත් ප්‍රේමදාස මහත්මයා මොනවා කිව්වත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විශාල වශයෙන් ඩීසල් බලාගාර පිහිටුවීමට දායක වුණා. ඒ අය මේ ප්‍රශ්නය විසඳුවේ ඩීසල් බලාගාර පිහිටුවලා. මම කියන්නම්, ඒ පිහිටවපු ඩීසල් බලාගාර ප්‍රමාණය පිළිබඳව.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දෙකයි. නවයක්ම කළේ පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Ace Power, Matara [බාධා කිරීම්] ඉන්න මම කියන්නම්. Ace Power, Horana. [බාධා කිරීම්] ඊ ළඟට දැවි තෙල් බලාගාර තුනක් පිහිටෙව්වා. [බාධා කිරීම්] නැහැ, නැහැ. 2002 දී තමුන්නාන්සේලා අත්සන් කළේ. තමුන්නාන්සේලා අත්සන් කළේ 2002 දී. [බාධා කිරීම්] නැහැ, තමුන්නාන්සේලා කොච්චර කිව්වත් වැරැදියි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අසත්‍යයක් කියන්නේ. 1997 පටන් ගත්තේ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
අසත්‍ය නොවෙයි. මේක අත්සන් කළේ 2002 දී. ඊ ළඟට කියන්න දැවි තෙල් බලාගාර තුනක් පිහිටුවලා තමුන්නාන්සේලා විශාල ද්‍රෝහී වැඩක් කළා. මොකක්ද ඒ ද්‍රෝහී වැඩේ? ඩීසල්වලින් වැඩ කරන AES බලාගාරය ඇති කළා, 2002 දී. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! The Hon. Dayasiri Jayasekara.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මාතර 2002.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
AES බලාගාරය පිහිටෙව්වේ 2003. [බාධා කිරීම්] මේ 2003 තමුන්නාන්සේ - [බාධා කිරීම්] ඔහොම කථා කරන කොට මම එක කාරණයක් කියන්නම්. ඊයේ පෙරේදා ප්‍රකාශයක් කරලා තිබුණා -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! What is the point of Order?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ජ්‍යෙෂ්ඨ හිටපු විදුලිබල ඇමති වශයෙන් ඇයි මේ ඇමතිතුමා මේ වාගේ අවස්ථාවක මෙහෙම අසත්‍ය කියන්නේ? චන්ද්‍රිකාගේ පාලනය යටතේය කියලා 1998 -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ravi Karunanayake, when you speak you can mention all this. Hon. Minister, you carry on.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඇත්ත වශයෙන්ම 1993 - [බාධා කිරීම්] They can reply.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You did not mention your point of Order. Hon. Dayasiri Jayasekara, what is the point of Order?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඔබතුමාගෙන් ඉල්ලනවා, IPP වාර්තාව ඔබතුමා කරුණාකරලා පාර්ලිමේන්තුවට table කරන්න කියලා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ප්‍රකාශයක් මම මේ කියවන්නේ. I am quoting that. Sir, they can reply when they speak. ඊ ළඟට මම කියනවා,- [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. මෙහෙමයි තිබෙන්නේ. "මේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය 1993 දක්වා ජපන් රටේ ආධාර උඩ ඉදි කරන්න අපිට තිබුණු අවස්ථාව අපි නැති කළා. මේ කාරණය ගැන තිලක් සියඹලාපිටිය මහත්මයා "ලංකාදීප" පත්තරයට 2013 අප්‍රේල් 28 වැනිදා ප්‍රකාශයක් කරනවා. ඒ ප්‍රකාශයෙන් එතුමා මෙන්න මෙහෙම කියනවා." -දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, පොඩ්ඩක් වාඩි වෙන්න.-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කරදර කරන්නේ නැහැ. කෙරවළපිටිය ගැන කියන්න.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
කෙරවළපිටියේ මොකක්ද වුණේ? තවදුරටත් මෙහෙම කියනවා. "අපිට චීනයට යන්න වුණේ ඇයි? ජපානය අපට මේ බලාගාරය ණයට දීමට කැමැත්ත දුන්නා. ඔවුන් 2002 වන තුරු බලා හිටියා. අපි විවාද, පෙළපාළි ඉවර කර බලාගාරයක් පිහිටුවාවි යයි බලා හිටියා. 2002න් පසු වුවත් ඔවුන් කැමැත්තෙන් සිටියා. 2002 මාර්තු 31 වැනි දින එවකට අගමැතිවරයා ජපන් තානාපති නිවසට කැඳවා මුදල් අවශ්‍ය නැති බවත්, බලාගාරය පිළිබඳව හිටපු ඉංජිනේරුවන් නොමඟ යැවීමක් කර තිබෙන බවත් ප්‍රකාශ කර තිබුණා. ඒ පිළිබඳව ප්‍රවෘත්ති නිවේදනයක් ද නිකුත් කළා. ජපන් රජය හිත් වේදනාවට පත් වෙන්න ඇති. රටක් අපහසුතාවට පත් නොකළ යුතු වුවත් එය කෙරුණා."

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කවුද එහෙම කියන්නේ?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
තිලක් සියඹලාපිටිය, an Engineer. "ජපානය ණය ආපසු ගත්තා." [බාධා කිරීමක්] තමුන්නාන්සේලාට පක්ෂව කියනවා නම් හරි. "2005 දී ජපානය පළාතේවත් ආවේ නැහැ. ජපානයට ණය එපා කරලා සති දෙකක් යන කොට විදුලි බල මණ්ඩලයට නියෝග කරමින් වහාම තෙල් බලාගාර දෙකක් ගැනීමට මිල ගණන් කැඳවීමට පියවර ගත්තා. ඒ දෙක අද ක්‍රියාත්මක වෙනවා. ඒ පෞද්ගලික බලාගාර කවුරු ගත්තාද කියලා කියන්න පුළුවන්. "

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රකාශයෙන් කියවෙන්නේ AES කියන බලාගාරය ඇත්ත වශයෙන්ම ඩීසල්වලින් දුවන බලාගාරයක් බවයි. ඒ වෙලාවේ හැටියට ඒකකයක් රුපියල් 32ක් වුණා. අද වන කොට රුපියල් 40යි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා හදපු කෙරවළපිටියේ කියද? ඒකකයක් රුපියල් 47යි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
නැහැ, නැහැ. එච්චර යන්නේ නැහැ. රුපියල් 21යි. පිළිගන්න. ඉන්න, ඉන්න. [බාධා කිරීමක්] මම ඒකට උත්තර දෙන්නම්.

මේ විධියට ගල් අඟුරු බලාගාරය හැදීම දිනෙන් දින ආපස්සට දමලා ඩීසල්වලින් විදුලිය නිපදවීමේ වැඩ පිළිවෙළ ශක්තිමත් කළේ, බලගතු කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවය කියන එක මම මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, AES බලාගාරය ගැන කථා කරනකොට තවත් කාරණයක් මතක් වෙනවා. මෙතුමන්ලා නොරොච්චෝලේ බලාගාරයේ වැරදි කියනවා. ඒක හරියට නරියාගේ මිදි කෑමේ කථාව වාගෙයි. මිදි කන්න ගිය නරියාට මිදි කඩන්න බැරි වුණාම කියපු කථාව අපි අහලා තිබෙනවා. ඒ නිසා මේ නොරොච්චෝලේ බලාගාරය එතුමන්ලාට හදන්න බැරි වෙලා 2005 දී බලයට පත් වෙච්ච

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය යටතේ අපි ඒක හැදුවායින් පසු, ඒ බලාගාරයේ තාක්ෂණික අඩු පාඩුකම් තිබෙනවාය කියා අද ඒ අය කියනවා. ඒ වාගේම බාල යන්ත්‍ර සූත්‍ර ගෙනැල්ලා සවි කරලා හදපු බලාගාරයක්ය කියනවා. වැඩ කරනවාට වඩා ඒක වහලා තිබෙනවාය කියා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා. ඒක තමයි අපේ පළමුවැනි ගල් අඟුරු බලාගාරය. ඒක අපි චීනයෙන් ගත්තු බව සැබෑවක්. චීනය පමණයි අපට ඒ සඳහා මුදල් ආධාර දෙන්න 2005 දී ඉදිරියට ආවේ. අපේ පළමු වැනි ගල් අඟුරු බලාගාරයේ අඩු පාඩුකම් ඇති වෙන්න හුඟාක් දුරට ඉඩ තිබෙනවා. මේ වනකොට අපේ ඉංජිනේරුවන් ඒ ගැන අවබෝධයක් ලබා ගෙන, තාක්ෂණික පුහුණුවක් ලබා ගෙන අද හොඳින් වැඩ කර ගෙන යනවා. [බාධා කිරීමක්] දයාසිරි මන්ත්‍රීතුමාට පසුව කථා කරන්න පුළුවන්. ඔබතුමා නිතර කථා කරනවා නේ. මම මෙතැනදී එක කාරණයක් කියන්න ඕනෑ. අපි නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ඉදි නොකළා නම් මේ වනකොට අපේ රටේ දවසට පැය හතරක්, පහක් විදුලිය කපන්න සිද්ධ වෙනවා. අද අපට ගල් අඟුරු පාවිච්චි කරලා රුපියල් 7.55ක පිරිවැයක් ඇතිව විදුලි ඒකකයක් නිපදවන්න පුළුවන්. විදුලිය නිපදවීම සඳහා අපට උපයෝගි කර ගන්න තිබෙන ලාභම ප්‍රභවය වශයෙන් අපි හඳුනා ගෙන තිබෙන්නේ ගල් අඟුරුයි. ඒක නිසා අපට මේ ප්‍රශ්නය විසඳා ගන්න තිබෙන්නේ මේ ගල් අඟුරු බලාගාරයේ පළමුවැනි දෙවැනි අදියර දෙක ඉක්මනින් ක්‍රියාත්මක කරලා ඊටපසුව සාම්පූර් බලාගාරයක් ඉදි කිරීම තුළිනුයි කියන එක මම පැහැදිලිව කියනවා. මේකෙදි අරයාට මෙයාට බැණලා දොස් කියලා; හොරකම් කළා, දූෂණ කළා, ඒ නිසා මේ විදුලි බිල වැඩි කරනවාය කීමෙන් ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ හැමදාම මේ විදුලි බිල වැඩි වෙලා තිබෙනවා. කොයි රජයක් හිටියත් විදුලි බිල වැඩි වෙලා තිබෙනවා. සාධාරණව, යුක්තිගරුකව, ජනතාවට ඔරොත්තු දෙන ආකාරයට වැඩි කරන්නේ කොහොමද කියන එක තමයි අද අපි කල්පනා කළ යුතුව තිබෙන්නේ.

මෙතැනදී මම තව කාරණයක් කියන්න ඕනෑ. ඉහළ කොත්මලේ බලාගාරයත් අපේ කාලයේදී ඇති වෙච්ච බලාගාරයක්. එහි ශක්‍යතා වාර්තාව 1994 වනකොට අවසන් කරලා තිබුණා. නමුත් 2001 සිට 2004 දක්වා බලයේ සිටි එක්සත් ජාතික පක්ෂ රජයට ඒක ඉදි කරන්න බැරි වුණා. ඒ අය මේක ඉදි කරන්න මුල් ගල් තියන්න අවශ්‍ය පියවර ගන්න හැදුවත් ඒකට ඒ ප්‍රදේශයේ හිටපු එක්තරා කොටසක් විරුද්ධ වීම නිසා ඒක අත් හැරලා දැම්මා. මම දන්නවා, කරු ජයසූරිය හිටපු ඇමතිතුමා මුල් ගල් තියන්න උත්සවයකුත් සංවිධානය කරලා, ආරාධනා පත්‍රයකුත් සකස් කර තිබුණු බව.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කවුද ඒකට විරුද්ධ වුණේ?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හිටපු අය. අපේ නොවෙයි, තමුන්නාන්සේලාත් එක්ක එදා ආණ්ඩුවේ හිටපු පක්ෂයක් ඒකට විරුද්ධ වුණා. ආණ්ඩුවක් වශයෙන් තමුන්නාන්සේලා ඒක ඉස්සරහට ගෙන යන්න බැලුවේ නැහැ. ඒක හකුළා ගත්තා. අපි තමයි 2006 දී ඒකට මුල් ගල් තියලා සියලු බාධක මැඩපවත්වා, කිසිම ලේ සෙලවීමක්, අඩු වශයෙන් කිසිම කෙනෙක් පොලිස් අත්අඩංගුවටවත් ගන්නේ නැතිව මේ බලාගාරය ආරම්භ කළේ. අද වනකොට එහි කටයුතු අවසන් කරලා මෙගාවොට 150ක විදුලි ධාරිතාවක් ලබා ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. කෙරවළපිටියේත් අපි මේ විධියේ වැඩ පිළිවෙළක් ගෙන යනවා. 2008 වනකොට අපට විශාල විදුලි අර්බුදකට මුහුණ පාන්න සිද්ධ වුණා. 2008 දී විදුලි හිඟයක් ඇති වෙලා විදුලිය කැපීමකට යන්න සිද්ධ වන නිසායි ඒ වනකොට කෙරවළපිටිය බලාගාරය පිළිබඳව සැලැස්ම ක්‍රියාත්මක කළේ. ඒ සම්බන්ධයෙන් රජයට කිසිම වගකීමක් නැහැ. ඒ වෙලාවේ හැටියට Lanka Transformers සමාගම තමයි විදුලිබල මණ්ඩලයේ අනුබද්ධ සමාගමක් වශයෙන් මේ කටයුත්ත කළේ.

ඒ නිසා මම මෙතැනදී පැහැදිලි කරන්නට ඕනෑ, ඒක ද්විත්ව චක්‍රීය බලාගාරයක් බව. මේ බලාගාරය දැව් තෙල්වලින් ආරම්භ කරන්නයි අපි බලාපොරොත්තු වුණේ. අද මුළු ලෝකයේම දැව් තෙල්වල හිඟයක් තිබෙනවා. ඒ නිසා දැව් තෙල් වෙනුවට අද ඩීසල් පාවිච්චි කරලා විදුලිය නිපදවීම මත විදුලි ඒකකයක මිල වැඩි වන බව මම පිළිගන්නවා. නමුත් අපි එදා බලාපොරොත්තු වුණේ දැව් තෙල්වලින් වැඩ ආරම්භ කරලා, ඊට පසුව ස්වාභාවික ගෑස්වලින් මේ බලාගාර ක්‍රියාත්මක කරන්න. ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු දැන් කර ගෙන යනවා. ඉදිරි කාලයේදී මේ බලාගාර කීපයත් ආරක්ෂා කර ගෙන අපට සාම්පූර් බලාගාරයේ දෙවැනි සහ තුන්වැනි අදියර ක්‍රියාත්මක කර ගත යුතුව තිබෙනවා. මම මෙතැනදී මෙය මතක් කරන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ මේ වැඩ පිළිවෙළ නිසා තමයි අපට බැරි වුණේ, මේ රටේ බලශක්ති ක්ෂේත්‍රයේ විශේෂයෙන්ම විදුලිබල ක්ෂේත්‍රයේ ජනතාවට ඔරොත්තු දෙන මිලකට මේ විදුලි බලය ලබා දීමේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න. විදුලිබල හිඟයත් එක්කම ඇති වෙච්ච දෙයක් තමයි මේ මූල්‍ය අර්බුදය. විදුලිබල හිඟයත්, මූල්‍ය අර්බුදයත් දෙකම එකට එතිලා හරියට මාපිලෙක්, සර්පයෙක් වාගේ අද අපේ රටේ දේහයේ ලේ උරා බොනවා කියන එක අපි පිළිගන්නට ඕනෑ. ඒක වළක්වන්නට බැහැ. අපි නොරොච්චෝලේ, ඒ වාගේම ඉහළ කොත්මලේ බලාගාර ඉදි කිරීමට පියවර නොගත්තා නම් තත්ත්වය මීටත් වඩා භයානකයි. එහෙම පියවර නොගත්තා නම් අපට තව තවත් ඩීසල්වලට යන්න සිද්ධ වනවා; අපට තව තවත් වැඩි මිලට ඉන්ධන අරගෙන ඒවායින් විදුලිය නිපදවන්නට සිද්ධ වනවා. එහෙම වුණා නම් මේ රටේ ආර්ථිකයටත් විශාල අභියෝගයක් එල්ල වනවා. ඒ වාගේම මේ රටේ ජනතාවටත් විදුලිය සඳහා දරන්න බැරි මිලක් ගෙවන්න සිද්ධ වනවා. ඒ නිසා නොයෙක් චෝදනා කරලා, නොයෙක් විධියේ දෝෂ දර්ශනවලට ලක් කරලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමා, නොරොච්චෝලේ බලාගාරය විසි වතාවක් කැඩිලා තිබෙනවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Hon. Member, I did not disturb you. Please allow me to wind up my speech.

මේ අවස්ථාවේදී මම කියන්නට ඕනෑ, ජනාධිපතිතුමා පසු ගිය මැයි දින කළ ප්‍රකාශය ගැන අද උදේ කැබිනට් මණ්ඩලයේදී අපි සාකච්ඡා කළ බව. එතුමා මැයි දින කළ ප්‍රකාශය අනුව පැහැදිලිවම විදුලි ගාස්තු වෙනස් කරන බවට එතැනදී අපි තීන්දුවක් ගත්තා. ඒ කියන්නේ 01-60 දක්වා විදුලි ඒකක ප්‍රමාණයක් පරිභෝජනය කරන ජනතාවට සහනයක් ලැබෙනවා කියා එතුමා කළ ප්‍රකාශය අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වනවා කියන ප්‍රකාශයත් කරමින් මගේ වචන කීපය අවසන් කරනවා.

[අ.භා. 2.48]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කලින් කථා කළේ ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න අමාත්‍යතුමායි. එතුමාගේ කථාවෙන් පස්සේ මගේ කථාව කරන්නට ලැබීම ගැන මම සන්තෝෂ වනවා. මගේ ළඟ තිබෙනවා, 2006.07.17 විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා "ලංකාදීප" පුවත් පතට කරපු සාකච්ඡාවක් පළ වී තිබෙන පත්තර පිටුවක්. එහි එතුමා කියනවා, "විදුලිබල මණ්ඩලය අන්තිමට පිරිහිලා. පාඩුව දවසකට රුපියල් දසලක්ෂ 45යි" කියලා. මෙහෙම කියන ඇමතිතුමාගේ මුහුණුවරයි, මට කලින් කථා කළ ඇමතිතුමාගේ මුහුණුවරයි එක සමානයි. මම මේ පින්තූරයත් හොඳට බැලුවා, මේ කථා කරන්නේ එතුමාමද කියලා. මොකද, මට එතුමා පැත්තෙන් පෙනෙන නිසාද දන්නේ නැහැ එහෙම පෙනුණේ. දැන් බලන කොට නම් පෙනෙනවා, ඔබතුමාම තමයි මේක කියලා තිබෙන්නේ කියලා. 2006 දී හිටපු විදුලිබල හා බලශක්ති ඇමති ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න. ඔබතුමා වෙන්න ඇති මේ කියලා තිබෙන්නේ. එතුමා කියලා තිබෙනවා, විදුලිබල මණ්ඩලය අන්තිමටම පිරිහිලා, පාඩුව දවසකට රුපියල් දසලක්ෂ 45යි - රුපියල් ලක්ෂ 450යි-කියලා. මේ එක දවසක පාඩුව. ඒ විදුලිබල මණ්ඩලය ගැනම තමයි මේ කියන්නේ. මේ අද අපි කථා කරන්නේ ඒ විදුලිබල මණ්ඩලය ගැනමයි. හැබැයි මම කනගාටු වනවා, ඔබතුමා ඒ ගැන වචනයක්වත් සිහිපත් නොකරපු එක ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් අපේ ජනප්‍රවාදයට අනුව අප්‍රේල් 01වැනි දා තමයි පුංචි පුංචි බොරු කියන දවස. එදාට සමහර විට පත්තරවලත් වැරදි ප්‍රවෘත්තියක් දාලා පස්සේ ඒක නිවැරදි කරනවා. ඒ අප්‍රේල් 01වැනි දා. හැබැයි මේ අවුරුද්දේ ඒ බොරු කියන දිනය මාරු වුණා මැයි 01වැනි දාට. එදා රටේ පළමුවන පුරවැසියා හැටියට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

දිනය මාරු කර ගෙන අප්‍රේල් 01වැනි දා වෙනුවෙන් මැයි 01වැනි දා රටම රවටටන්න ලොකුම ලොකු බොරුවක් කිව්වා. ඒක බොරුවක් වෙලා තිබෙන්නේ, ඒක බොරුවක් බව ඔප්පු කරන්නේ මේ වන කොට විදුලිබල මණ්ඩලයම - එහි සභාපතිවරයා, විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් -

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කිව්වේ බොරුවක් කියලා දැන් කියන නිසායි.

ඒකට හේතුව මොකක්ද? අද වන කොට ඒ දෙනවායි කියන ප්‍රෝඩාවෙන් අඩු කරන ප්‍රමාණයවත් අඩු කර ගන්න බැරිව තමයි ඉන්නේ. මා මේ මාධ්‍යවේදී හිතවතුන්ගෙන් ඉල්ලීමක් කරනවා, මේක විදුලි බිලේ සහනයක් හැටියට සඳහන් කරන්න එපා කියලා. "සහනය" කියන්නේ මොකක්ද? "සහනය" කියලා කියන්නේ, ඒක ඇත්තටම ජනතාවට සහනයක් වනවා නම් විතරයි. විදුලි බිල උපරිමයට වැඩි කරලා-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, the Hon. Member is violating the Standing Orders. He is saying that the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

බොරුවක් කිව්වා කියලා. මෙතැන එහෙම ප්‍රකාශ කරන්න බැහැ. It was only yesterday that the Hon. Speaker had a workshop for the Press or the media personnel. He cannot speak like that. He must withdraw that or that must be expunged.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If there is anything against the Standing Orders, that will be expunged. Hon. Member, you carry on.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

හරි, මා මෙහෙම කියන්නම්. ජනාධිපතිතුමා මැයි පළමුවැනි දා, අප්‍රේල් පළමුවැනි දා කියා හිතා ගෙන කථා කළා. එතකොට හරි නේ. එතකොට - [බාධා කිරීමක්] මට පොඩි වෙලාවයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තටම මේකෙදී "සහනය" කියන වචනය පාවිච්චි කරන්න එපා කියා මා ඉල්ලනවා. මොකද, සහනයක් වන්නේ තිබුණු විදුලි බිලෙන් යම් අඩු කිරීමක් කළා නම් පමණයි. කාගේ හෝ කෙනෙකුගේ පිටු පස සාක්කුවේ තිබුණු රුපියල් 1000ක් පික්පොකට් ගහලා ඒ රුපියල් 1000න් රුපියල් 10ක් ඉස්සරහා සාක්කුවට හිනහා වෙවී දානවා නම් ඒක සහනයක් වන්නේ නැහැ. දැන් මේකේ එහෙම දැම්ම්ල්ලකුත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට ප්‍රධාන ප්‍රශ්නය මේකයි. මේ මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා හැමෝම කථා කරනවා මේ විදුලි බිල වැඩි කරන්න සිද්ධ වුණේ විදුලිය නිෂ්පාදනය සඳහා යන වියදම වැඩි නිසාය කියා. වියදම වැඩි වෙලා තිබෙන්නේ ඩීසල් බලාගාර නිසා; තාප බලාගාර නිසා; ගල් අඟුරු බලාගාර නිසා. ප්‍රශ්නය තිබෙන්නේ අපේ රටේ තාප බලාගාර, ගල් අඟුරු බලාගාර, ඩීසල් බලාගාරවලින් විදුලිය නිෂ්පාදනය කිරීමේ අවශ්‍යතාව -[බාධා කිරීම්] ඔහේ කෑ ගහනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විවාදය රජයේ වැදගත්ම විවාදයක්. දැන් මා බැලුවේ ඩිලාන් පෙරේරා ඇමතිතුමා වෙනුවෙන් විශ්වාස භංග යෝජනාව ගෙනා අවස්ථාවේදී එතුමාට සහය දෙන්න හිටපු තරම්වත් පිරිසක් මේ විදුලි බල ප්‍රශ්නය ගැන කථා කරන කොට ආණ්ඩුව ආරක්ෂා කරන්න අද පාර්ලිමේන්තුවේ නැති එක ගැනයි. පුදුම වැඩක් ඒක. ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ විශ්වාස භංග යෝජනාව ගෙනාපු අවස්ථාවේ හිටපු තරම්වත් පිරිසක් අද මේ ආණ්ඩුවේ විදුලිබල අර්බුදය ගැන කථා කරන අවස්ථාවේදී නැහැ. මේක දැන් විදුලිබල අර්බුදයක්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

නොවෙයි. මේක දැන් ආණ්ඩුවේ අර්බුදයක් වෙලා තිබෙන්නේ. එකෙන්ම පෙනෙනවා අඩු තරමේ මෙතැනට ඇවිල්ලා මේ ආණ්ඩුවේ අර්බුදය වෙනුවෙන් පෙනී ඉන්න හයියක් ඒ අයට නැහැ කියලා. ඒකයි ඇත්ත. නැත්නම් කෝ? ඒ තිබුණු රස්නය දැන් මේ පාර්ලිමේන්තුවේ නැහැ. කල්පනා කර බලන්න. ඒ නිසා අපට පෙනෙනවා අර්බුදය ඇවිල්ලා තිබෙන්නේ රටේ ජනතාවගෙන්ම විතරක් නොවන බව. ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ පවා අප්‍රසාදයක් තිබෙනවා; කලකිරීමක් තිබෙනවා. මේ විදුලි බිල වෙනුවෙන් එතුමන්ලාට පෙනී ඉන්න බැහැ. ඒකයි ඇත්ත කාරණාව. අපට ඇමතිවරු හම්බ වුණාම ඒ ගැන කියනවා. පාර්ලිමේන්තු Lobby එකේදී හමු වුණාම කියනවා, අපට ගමට යන්න බැහැ; මේ ගැන කථා කරන්න බැහැ කියා. විදුර වික්‍රමනායක මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වනවා. ආණ්ඩු පක්ෂයේ වුණත් එතුමා ජනතාව වෙනුවෙන් කෙළින් කිව්වා, මේක බරපතළ ප්‍රශ්නයක්; විදුලි බිල අඩු කරන්න ඕනෑ කියලා. එතුමා ආණ්ඩු පක්ෂයේ වුණත් ඒ දේ කෙළින් කිව්වා. මෙතැන ඉන්න ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු ගොඩක් එළියේදී බොරු චණ්ඩිකම් කියනවා. අද මෙතැනට ඇවිල්ලා කථා කරන්නවත් ඉදිරිපත් වෙලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කියන්නේ ඒකක 90ක විදුලි අවශ්‍යතාව වෙනුවෙන් රටේ ජල විදුලිය ප්‍රමාණවත් බවයි. ඒකක 90ක විදුලිය පාවිච්චි කරන පාරිභෝගික ජනතාව වෙනුවෙන් නම් විදුලිය නිෂ්පාදනය කරන්න රටේ ජල විදුලි නිෂ්පාදනය ප්‍රමාණවත්. ඔබතුමන්ලා කියනවා ඒ සඳහා ඒකකයට යන්නේ රුපියල් 3යි කියලා. එතැනින් එහාට ඒකක 90ට වඩා වැඩියෙන් පාරිභෝජනය කරන පාරිභෝගිකයාට තමයි ගල් අඟුරු, තාප, ඩීසල් ඔක්කෝම අවශ්‍ය වන්නේ. එතකොට දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි මේ දඩුවම දෙන්නේ, කෑ මකුණයි නොකෑ මකුණයි දෙගොල්ලෝටම කියන එක. දෙගොල්ලෝම තළා ගෙන සියලුම ජනතාවට මේ බර පටවනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට ප්‍රශ්නය තිබෙන්නේ, ඒ විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න දරන ඇත්ත වියදම ඇතුළේ කොච්චර නාස්තිය, දූෂණය, වංචාව, හොරකම පිරිලා තිබෙනවාද කියන එකයි. ඒවා ඉහ වහ ගිහිල්ලා තිබෙනවා. දැන් අප අහනවා, ජනාධිපතිතුමාට මේක දැනිලා, එතුමාගේ පඬුපුල් ආසනය රත්වෙලා හෝ දැන් විදුලි බිල අඩු කරන්න හදනවා නම්, ඒ ඇතුළේ තිබෙන විදුලි මාෆියාවට දෙන උත්තරය මොකක්ද කියා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේම ඇමතිවරු කථා කරන මේ විදුලි මාෆියාවට දෙන උත්තරය මොකක්ද?

2010 සැප්තැම්බර් මාසයේ 29වන දා පාඨලී චම්පික රණවක හිටපු විදුලිබල හා බලශක්ති ඇමතිතුමා කියනවා, විදුලිය මිල දී ගත්තත්, නැතත් විදුලිය නිපදවන සමාගම්වලට වසරකට රුපියල් කෝටි 1,500ක තැග්ගක් ගෙවන්න ලංකා විදුලිබල මණ්ඩලයට සිද්ධ වෙලා තිබෙනවාය කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමියනි, මෙම කරුණට අවධානය යොමු කරන්න. මෙම ගිවිසුම් 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක වනවා. විදුලිය ගත්තත්, නැතත් හැම අවුරුද්දේම විදුලිය නිෂ්පාදනය කරන සමාගම්වලට තමුන්නාන්සේලා, මේ රටේ ජනතාව රුපියල් කෝටි 1,100ක් ගෙවන්න ඕනෑ. විදුලිය ගත්තත්, නැතත් හැම අවුරුද්දේම රුපියල් කෝටි 1,100ක් ගෙවන්න වෙනවා. මෙය එක කාරණයක්.

ඒ විතරක් නොවෙයි. මාෆියාවේ ප්‍රධාන පාර්ශ්වය ආණ්ඩුවයි. අපි එහෙම කියන්නේ, තමුන්නාන්සේලා ගත්ත වැරදි දේශපාලන තීන්දුවක ප්‍රතිඵල මේ විදුලිය පාඩුව ඇතුළේ තිබෙන නිසායි. එය තමයි රුපියල අවප්‍රමාණය කිරීම. රුපියල අවප්‍රමාණය කිරීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට වන පාඩුව කීයද? ගරු ඇමතිතුමියගේ කථාවෙදී ඒ ගැන සඳහන් කළේ නැහැ. ඔබතුමිය එහිදී කාරණා රාශියක් කියලා තිබුණා. ලංකා විදුලිබල මණ්ඩලයට වන පාඩුව ඇතුළේ, රුපියල අවප්‍රමාණය වීම නිසා වුණු පාඩුව රුපියල් බිලියන 33කුත් -රුපියල් කෝටි 3,300කුත්- තිබෙනවා. ඒක ජනතාවගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක දැවී තෙල්, ඉන්ධන සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. තමුන්නාන්සේලා වැරදි ගිවිසුම් ගහලා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි මත රුපියල අවප්‍රමාණය කිරීම නිසා වුණු පාඩුව රුපියල් බිලියන 33යි.

ඒ විතරක් නොවෙයි. මේ විදුලිය මිල දී ගන්න තමුන්නාන්සේලාට වාර්ෂිකව ගෙවන්න වෙනවා, රුපියල් බිලියන 1.1ක්. එතැනම තිබෙනවා, පාඩුව වූ රුපියල් බිලියන 59න්, රුපියල් බිලියන 54ක්ම.

ගරු ඇමතිතුමියනි, ඊළඟට මා මේ කාරණයත් ඔබතුමියගේ අවධානයට යොමු කරනවා. ලංකා විදුලිබල මණ්ඩලය යටතේ, ලංකා විදුලිබල මණ්ඩලයේ අයිතිය සහිතව හදපු සමාගම් 14ක් තිබෙනවා. ඔබතුමිය පසු ගිය දවසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ කථාවේ ඔබතුමිය කිව්වේ ඉන් සමාගම් 4ක් ගැන විතරයි.

2013 අප්‍රේල් 23වන දින හැන්සාඩ් වාර්තාවේ 1796වන තීරුවේ ඔබතුමිය මෙසේ කියා තිබෙනවා:

> "ලංකා විදුලිබල මණ්ඩලය යටතේ පවතින අනුබද්ධිත සමාගම්වල ක්‍රියාකාරිත්වයෙන් ජනිත වන ලාභයට ලංකා විදුලිබල මණ්ඩලය විසින් සමාගම් 4ක ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් ආයෝජනය කර ඇති මුදල් වෙනුවෙන් ලැබෙන ලාභාංශ ....."

ඇමතිතුමියනි, සමාගම් හතරක් නොවෙයි, සමාගම් 14ක් තිබෙනවා. ඉතිරි සමාගම් 10ට මොකද වුණේ? අද ඒ ඉතිරි සමාගම් 10 ඔබතුමියට, ආණ්ඩුවට වග කියන්නේ නැහැ. මා එය ඔප්පු කරන්නම්. මා ළඟ තිබෙනවා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ලැබුණු උත්තරයක්. 2004 දී LTL Projects පෞද්ගලික සමාගමේ රජයට තිබුණු අයිතිය සියයට 63යි. ඔබතුමිය දැන් ගිහින් සොයන්න අයිතිය කොපමණද තිබෙන්නේ කියලා. දැන් ඒකේ අයිතියක් නැහැ. ලංකා විදුලිබල මණ්ඩලයට තිබුණු අයිතිය ඒ සමාගම් වක්‍රාකාරයෙන් නැති කරලා තිබෙනවා. ඒ වාගේම 2005 දී හෙළදනවි පෞද්ගලික සමාගමේ ලංකා විදුලිබල මණ්ඩලයට තිබුණු අයිතිය සියයට 63යි. දැන් තිබෙන්නේ සියයට 23යි. තවත් සමාගමක් තිබුණා, Lanka Transformers පෞද්ගලික සමාගම කියලා. එහි නම වෙනස් කළා, LTL Transformers පෞද්ගලික සමාගම කියලා. ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමා පාර්ලිමේන්තුවට -පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට- කිව්වා, ලංකා විදුලිබල මණ්ඩලයෙන් ESOT නමින් පෞද්ගලික සමාගමක් හදා තිබෙනවා, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් ටික පාර්ලිමේන්තුවට දෙන්න ඔහුට අයිතියක් නැහැයි කියලා. ඉතින් මොකක්ද තත්ත්වය? අද ඔබතුමියගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ලංකා විදුලිබල මණ්ඩලයට අයිති ආයතන ලංකා විදුලිබල මණ්ඩලයටම විකුණන්න විදුලිය හදලා තිබෙනවා.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති අපේ ඩිව් ගුණසේකර ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේ පිළිබඳව සාකච්ඡා කළා. අද ලංකාවේ පාඩු ලබන තත්ත්වයට පත් කර තිබෙන ආයතනවලින් ප්‍රධානම ආයතනයක් වෙලා තිබෙනවා, ලංකා විදුලිබල මණ්ඩලය. අනික් ඒවා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ගුවන් සමාගම්. මේවාට කවුද වග කියන්නේ? මේ දඩුවමට ලක් කරලා තිබෙන ජනතාව මෙයට වග කියන්න ඕනෑ නැහැ. ඒකයි ඇත්ත තත්ත්වය. සමාගම් කිහිපයකම ඉන්නේ එකම අධ්‍යක්ෂ මණ්ඩලයයි. මොන නීතියක්ද, මොන සදාචාරයක්ද තිබෙන්නේ, එකම අධ්‍යක්ෂ මණ්ඩලයට එක සමාන සමාගම් කිහිපයක ඉන්න? ඒ අධ්‍යක්ෂ මණ්ඩලවල එකම නමින් හැටහුටහමාරක් ඉන්නවා. LTL Holdings එකේ ඉන්නවා, විමලධර්ම අබේවික්‍රම. ඔහුම -

විමලධර්ම අබේවික්‍රම- LECO එකේත් ඉන්නවා. Lanka Coal Company එකේත් ඉන්නවා, විමලධර්ම අබේවික්‍රම. Sri Lanka Engineering (Pvt.) Limited එකේත් ඉන්නවා, විමලධර්ම අබේවික්‍රම. මේ වාගේ එකම පුද්ගලයන් ඒ හැම සමාගමකම ඉන්නවා. විෂ්ණු දෙවියෝ වාගෙයි. ලංකා විදුලිබල මණ්ඩලය යටතේ තිබෙන ආයතන හැම එකේම ඉන්නවා, එකම අධ්‍යක්ෂතුමන්ලා. හරි පුදුම දෙයක් මෙය. ඉතින් මේවා පාඩු වෙන්නේ නැද්ද, මේවා විනාශ වන්නේ නැද්ද කියලා කල්පනා කරලා බලන්න.

මම එක උදාහරණයක් ඔබතුමන්ලාට කියන්නම්. සාම්පූර් බලාගාරය සම්බන්ධයෙන් තිබෙනවා හොඳ කථාවක්. මහ ලොකුවට දැන් කියනවා නේ, විදුලි බලය ඉන්දියාවටත් දෙන්න හදලා තිබෙන්නේ කියලා. තමුන්නාන්සේලා NTPC කියන ඉන්දියානු සමාගමත් එක්ක ගිවිසුම් අත්සන් කළා. විදුලිබල මණ්ඩලය මේ Joint Venture and Shareholder Agreement එක අත්සන් කළා. මගේ ළඟ ඒ Agreement එක තිබෙනවා. විදුලි බල මණ්ඩලයයි, NTPC Limited ආයතනයයි මේ ගිවිසුමට අත්සන් කරලා තිබෙනවා. මේකට කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් තිබෙනවාද? මේ ගැන අධ්‍යක්ෂ මණ්ඩලය දන්නවාද? කවුද මේකට සම්බන්ධ වුණේ? මේකට සම්බන්ධ වුණේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් ෆර්ඩිනැන්ඩු මහත්මයායි, විදුලි බල ඉංජිනේරු සංගමයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ බන්දුල තිලකසේනයි. මෙන්න මේ දෙන්නා තමයි මේකට මැදිහත් වුණේ. ඒ අය 2011 ඔක්තෝබර් මාසයේ ඉන්දියාවට ගිහිල්ලා PPA - Power Purchasing Agreement එක ගැහුවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තිබෙන්නේ ඒ Agreement එක. සාම්පූර් බලාගාරයේ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමත් අත්සන් කරලා තිබෙනවා. විදුලිබල හා බලශක්ති ඇමතිතුමා මේ ගැන දන්නවාද? ඉන්දියාවට ගිහිල්ලා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් ගහන කොට -PPA ගහන කොට- අඩුම තරමින් අමාත්‍යාංශයේ ලේකම්වරයා තමන්ට ඉහළින් ඉන්න ප්‍රධානියා වන ඇමතිවරයාගෙන්වත් මේ ගැන අනුමැතියක් අරගෙන නැහැ.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Minister of Wildlife Resources Conservation)
මන්ත්‍රීතුමා, ඔය අතේ තිබෙන කොළය ඇත්ත කොළයක්ද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්. ඇත්ත කොළයක්. මේක ඇත්ත කොළයක්. ඔබතුමන්ලා බොරු කියලා හිතුවාට මේවා ඇත්ත කොළ. මේවා රටට හංගලා ගහපු ගිවිසුම්. මේවායේ බොරු නැහැ. මේවා හංගලා ගහපු ගිවිසුම්. ප්‍රශ්නය තිබෙන්නේ මේ නිසා,- [බාධා කිරීමක්] ඔබතුමන්ලාට අන්තිමට අහන්න වෙන්නේ, "මේවා ඇත්තද මල්ලි?" කියලා තමයි. වෙන අහන්න දෙයක් නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sunil Handunnetti, please wind up now.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මගේ කථාව ඉක්මනින් අවසන් කරනවා.

ප්‍රධාන ප්‍රශ්නය තිබෙන්නේ සාම්පූර් බලාගාරය සම්බන්ධයෙන්. ඒ සම්බන්ධ බරපතළ ගිවිසුමක් ගහලා තිබෙනවා. මේ වෙන කොට විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් පවා ගහලා ඉවරයි. හැබැයි, මේ ගිවිසුමේ මේ විදුලි බල ව්‍යාපෘතිය වෙනුවෙන් යන මුළු ප්‍රාග්ධන මුදල කීයද කියලා අහලා තිබෙන තැන හිස් තැනක් තිබෙන්නේ. ඒකට හේතුව මොකක්ද? මේ ප්‍රාග්ධන වියදම් ඉන්දියානු කොම්පැනියේ අවශ්‍යතාව අනුව ඕනෑ ඕනෑ විධියට වැඩි කරන්න පුළුවන්කම තිබෙනවා. මේ නිසා අවුරුද්දකට වෙන පාඩුව රුපියල් බිලියන 7.9ක්! කෝටි 793ක් පාඩු වෙනවා. කාගෙන්ද මේවා අය කර ගන්නේ? මේ රටේ ජනතාව මේවාට වන්දි ගෙවන්න ඕනෑ නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වේලාව ඉවරයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම අවසන් කරනවා. මට විනාඩියක් දෙන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
විනාඩියක් වැඩිපුර ගත්තා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ නිසා මේ අපරාධයට අවසානයේ මේ පාර්ලිමේන්තුවත් රටේ ජනතාව ඉදිරියේ වග කිව යුතුයි කියන එක අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.04]

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர - மின்வலு, எரிசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේදී නිස්ස අත්තනායක මැතිතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම සතුටු වෙනවා.

මේ අවස්ථාවේදී මම මුලින්ම සඳහන් කරන්න ඕනෑ, අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා එතුමාගේ කථාව කළේ, "ගණිකා වෘත්තියේ ගිහිල්ලා පහිත රැක ගන්න කටයුතු කළා වාගේයි" කියලා. මොකද, මැයි 1වැනි දා අතිගරු ජනාධිපතිතුමා කරපු සත්‍ය ප්‍රකාශය අප්‍රේල් 1වැනි දාට කරන ප්‍රකාශයකට සමාන කරලා, මැයි 1වැනි දා ජනාධිපතිතුමා බොරුවක් කිව්වාය කියලා එතුමා කිව්වා. තමුන්නාන්සේට මතක ඇති 88-89 භීෂණ කාලයේ මේ රටේ විදුලිබල ක්ෂේත්‍රය විනාශ කරපු ආකාරය. පසු ගිය කාලයේ ට්‍රාන්ස්ෆෝමර් විශාල ප්‍රමාණයක් ගිනි තැබුවා. අද මේ විදුලිබල මණ්ඩලය පාඩු විඳින තත්ත්වයට පත් වෙලා තිබෙන්නේත් තමුන්නාන්සේලා ඒ කරපු විනාශය නිසාය කියන එක මම මතක් කරන්න ඕනෑ.

[ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා]

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමා එක්ක තර්ක කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී විදුලිබල මණ්ඩලයේ ඉතිහාසය ගැන වචන කිහිපයක් සඳහන් කරන්න කැමැතියි. විදුලිබල මණ්ඩලය ආරම්භයේ සිට 1994 දක්වා, ඒ කියන්නේ අපේ ආණ්ඩුවක් බලයට එන තුරු එක්සත් ජාතික පක්ෂ රජය බලයේ සිටියදී ගෘහස්ථ පාරිභෝගික සංඛ්‍යාව සිටියේ දස ලක්ෂ 89,000ක පිරිසක්. ඒ වාගේම රජයේ සහ පෞද්ගලික ආයතනවලත්, ආගමික ස්ථානවලත් විදුලි පාරිභෝගිකයන් හිටියේ 176,000ක පමණ පිරිසක්. නමුත් මේ කෙටි කාලය තුළ අපට පුළුවන්කමක් ලැබුණා, ගෘහස්ථ පාරිභෝගික සංඛ්‍යාව 43 ලක්ෂයක් දක්වා වර්ධනය කරන්න. ඒ වාගේම මා සඳහන් කළ අනෙකුත් පාරිභෝගික ආයතන 588,000ක් දක්වා වර්ධනය කරන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ අනුව හතර ගුණයකින් ගෘහස්ථ පාරිභෝගිකයන් පිරිස වැඩි වෙලා තිබෙනවා. විහාරස්ථාන, ආගමික සිද්ධස්ථාන සහ අනෙකුත් පොදු අවශ්‍යතාවන් සඳහා විදුලිය ලබා දෙන්න අප කටයුතු කර තිබෙනවා. ඒ වාගේම තුන් ගුණයකින් පමණ මේ රටේ කර්මාන්තශාලා වැඩි වෙලා තිබෙනවා.

මේ විදුලිය උත්පාදනය කිරීම ගැනත් මම තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ. 1994ට පෙර තිබුණේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. මේ කාලයේ පමණක් නොවෙයි, 1980 ගණන්වලත් විටින් විට විශාල වශයෙන් විදුලි බිල ඉහළ ගිහින් තිබෙනවා. ඒ කාලයේ ජල විදුලි බලාගාරවලින් සියයට 80ක් විදුලිය උත්පාදනය කළත්, අද සියයට 25ක් 30ක් අතර ප්‍රමාණයක් තමයි උත්පාදනය කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කාලයේ ලංකා විදුලිබල මණ්ඩලය අවුරුදු 15කට 20කට යම් සැලැස්මක් සකස් කරලා තිබුණා, ඉදිරි කාලයේ වැඩි වන ජනගහණයත් සමඟ පාරිභෝගිකයන්ට අවශ්‍ය කරන විදුලි බලය ලබා දෙන්න නම් මේ මේ බලාගාර ඉදි කරන්න ඕනෑය කියලා. ඒ අනුව, ජේ.ආර්. ජයවර්ධන යුගයේ ආරම්භ කරන්න යෝජනා කරලා, ප්‍රේමදාස යුගයේදී අවසන් කරන්නට තිබුණ කෙරවළපිටිය සහ නොරොච්චෝලේ විදුලි බලාගාර පවා ආරම්භ කළේ අපේ අතිගරු ජනාධිපතිතුමා බලයට ආවාට පස්සේ.

අද නොරොච්චෝලේ බලාගාරය පිළිබඳව විශාල ආන්දෝලනයක් තිබෙනවා. නමුත් නොරොච්චෝලේ බලාගාරය ඉදි නොවන්නට අද තමුන්නාන්සේලාත් ඉන්නේ අඳුරේ කියන කාරණය මම මතක් කරන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද නොරොච්චෝලේ බලාගාරය නිසා තමයි ජාතික පද්ධතියට මෙගාවොට් 300ක් ලබා ගන්නේ. ඒ වාගේම 2014 අවුරුද්දේ මැද භාගය වන විට ඉතිරි මෙගාවොට් 600ත් ලබා ගෙන, මෙගාවොට් 900ක් ඒ බලාගාරය හරහා ජාතික පද්ධතියට එකතු කරන්න කටයුතු කරනවා.

ඒ විතරක් නොවෙයි. නොයෙකුත් ප්‍රශ්න තිබියදී, දේශපාලන වශයෙන් වාසි බලාපොරොත්තුවක් නැතිව අතිගරු ජනාධිපතිතුමා ඉහළ කොත්මලේ බලාගාරය ආරම්භ කරලා මේ රටට අවශ්‍ය කරන විදුලි බලය මෙගාවොට් 150ක් උත්පාදනය කිරීමට කටයුතු කරලා තිබෙනවා. ඊට අමතරව අපේ රටේ විදුලි අවශ්‍යතාව හඳුනා ගෙන මේ වන විට බ්‍රෝඩ්ලන්ඩ් බලාගාරය ආරම්භ කරන්නට කටයුතු කරලා තිබෙනවා. ඊට අමතරව ත්‍රිකුණාමලයේ සාම්පූර් බලාගාරය මෙගාවොට් 500ක ධාරිතාවක් ඇතුව ආරම්භ කරන්නට බලාපොරොත්තුවෙන් සිටිනවා. මේ කාලය වන විට මෙපමණ ජනගහනය වැඩි වෙනවා, ඒ ජනගහනයට ඔරොත්තු දෙන විදුලිය උත්පාදනය කිරීම අපේ යුතුකමක්ය කියලා එවකට හිටිය රජය, එවකට සිටි නායකයෝ තීන්දු කරලා, ඒ කාලයේ මේ අවශ්‍යතා ඉෂ්ට කළා නම් අද මෙවැනි විදුලි අර්බුදයක් පවතින්නේ නැහැයි කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යෑමත් සමඟ අපට බැරෑරුම් ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්නට සිද්ධ වුණා. පසු ගිය වර්ෂය තුළ අපට අවශ්‍ය වර්ෂාව නොලැබීම හේතුවෙන් අපේ ජලාශ හිඳිලා ජල විදුලි බලාගාරවලින් ලබා ගන්නට තිබුණ විදුලිය සියයට 10ක් දක්වා අඩු වන්නට පටන් ගත්තා. ඒ නිසා තමයි අද අපට ඉන්ධන ගැළපුම් ගාස්තු අය කරන්නට සිද්ධ වුණේ. අපි විදුලිබල මණ්ඩලය හැටියට මේ රටේ ජනතාවට අවශ්‍ය කරන විදුලිය නොකඩවා ලබා දෙනවා නම්, ඒ විදුලිය ලබා දෙන්න අපට ඉදිරි කාලය තුළදී යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට සිද්ධ වෙනවා. එහෙම නැතිව විදුලිබල මණ්ඩලය පාඩුයි කියලා වහලා දාන්න බැහැ. මේක වගකීමක් තිබෙන ආයතනයක්. අපි රටේ ජනතාවට විදුලි බලය ලබා දෙන්න ඕනෑ. මේ අමාත්‍යාංශය හරහා අනිවාර්යයෙන්ම විදුලිය ලබා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ 2012 සංඛ්‍යා ලේඛන අනුව විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා සමස්තයක් වශයෙන් රුපියල් 21.50ක් වැය වෙලා තිබෙනවා. නමුත් අපි විදුලි පාරිභෝගිකයන්ට විදුලි ඒකකයක් ලබා දීලා තිබෙන්නේ රුපියල් 15.65ට. ඒ අනුව, විදුලි ඒකකයක් වෙනුවෙන් රුපියල් 5.85ක පාඩුවක් විඳ ගෙන තමයි අද අපි මේ රටේ ජනතාවට විදුලිය ලබා දෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දියුණු වෙමින් පවතින රටක් වාගේම, අපේ රට ආශ්චර්යවත් රටක් බවට පත් කර ගෙන යන ගමනේදී, විපක්ෂයේ අය විදුලි බිල වැඩි වුණා කියලා ජනතාව නොමඟ යවලා, ලොකු වැඩි වීමක් වුණා කියලා බොරුවට පෙන්නුම් කරලා, මේ ආණ්ඩුව අපහසුතාවට පත් කරන්නට කටයුතු කරනවා නම්, මම හිතනවා ඒක එතුමන්ලා දකින දවල් හීනයක් කියලා. මොකද, මේ රජය අද විශාල සංවර්ධන ගමනක් ක්‍රියාවට නංවා ගෙන යනවා. ඒ යන මොහොතේ එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ වාගේ පක්ෂ ආණ්ඩුවට මඩ ගහන්නට උත්සාහ කරනවා, කරනවා ඉවරයක් නැහැ. අද සමහර මන්ත්‍රීවරු විදුලි බිල ගැන කථා කරනකොට කථා කරන්නේ ඒකක 30, 60 පාවිච්චි කරන අය ගැන නොවෙයි. එතැනින් එහා units දෙ තුන් සියය පාවිච්චි කරන කරන ඇමෙරිකන් තානාපති කාර්යාලය වාගේ කාර්යාල සහ පුද්ගලයන් ගැන තමයි අද තමුන්නාන්සේලා කථා කරන්නේ. මොකද, අද තමුන්නාන්සේලා ඒවායින් තමයි යැපෙන්නේ.

විදුලි බිලට සංශෝධන ගෙන ආවාට පසුවත් විදුලි බලය ලබා දීමේදී ඒකකයකට අපි රුපියල් 4.25ක අලාභයක් එහෙම නැත්නම් පාඩුවක් ලබනවා කියන කරුණත් මෙහිදී මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මැයි පළමු වැනිදා අතිගරු ජනාධිපතිතුමා කළ ප්‍රකාශය තමුන්නාන්සේලා හොඳට අහගෙන ඉන්න ඇති. අපේ රටේ දුප්පත් අහිංසක ජනතාව ගැන හිතලා විදුලි ඒකක 1-60 දක්වා පාවිච්චි කරන අයට ඒ සහනය සම්පූර්ණයෙන් ලබා දුන්නා. ඒ වාගේම ඒකක 60 දක්වා පමණක් නොවෙයි, ඒකක 180 දක්වා පාවිච්චි කරන අයටද අද ඉන්ධන **ගැ**ළපුම් ගාස්තුව සියයට 25ක් අඩු කරලා තිබෙනවා. ඉතින්, මේවා තමයි විදුලි බිලේ අඩු කිරීම්. එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ විදුලි බිල විටින් විට වැඩි කළා වෙනුවට විකල්ප බලාගාර ඉදි කළා නම්, අද අපේ රට විදුලිය අතින් ස්වයංපෝෂිත වනවා කියන එක මම පැහැදිලිවම මතක් කරනවා.

ඒ නිසා අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු විදුලිබල හා බලශක්ති ඇමතිතුමියගේත්, අප සියලු දෙනාගේත් බලාපොරොත්තුව වන්නේ මේ රටේ සිටින දරුවන්ගේ

අධ්‍යාපනය සඳහා අවශ්‍ය කරන විදුලි බලය ලබා දීමත්, ඒ වාගේම මේ රටේ කර්මාන්තශාලා ආරම්භ කිරීමට අවශ්‍ය විදුලි බලය ලබා දීමත්, පසු ගිය වසර තිහක කාලයක් තිස්සේ තිබුණු ශාපය අවසන් කරලා මේ රට සංවර්ධනයක් කරා ගෙන යන මොහොතේදී මේ රටේ ජනතාවට අවශ්‍ය කරන විදුලි බලය එහෙම නැත්නම් පාරිභෝගිකයන්ට අවශ්‍ය කරන විදුලි බලය නොකඩවා ලබා දීමත් ය.

අද ඉන්දියාව, පාකිස්තානය වාගේ ආසියාවේ රටවල් ගණනාවක විදුලිය කප්පාදු කරද්දි ඒ අතින් අපේ රට ඉදිරියෙන් සිටිනවා. අපි පැය 24ම නොකඩවා විදුලිය ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, please wind up now.

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
විදුලි බිල ඉහළ ගියා කියලා ඒ කරුණ අල්ලා ගෙන තමුන්නාන්සේලා ආණ්ඩුවට ගහන්න හදනවා නම්, ඒක තමුන්නාන්සේලා කරන ලොකු වැරැද්දක්ය කියන කරුණ මතක් කරමින්, මගේ කථාව හා සම්බන්ධිත ලේඛන කිහිපයක්ද මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මගේ කථාව සම්පූර්ණ කිරීමට කාල වේලාව මදි නිසා කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:
**சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
**Rest of the speech tabled:*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කලින් සඳහන් කළ නව විදුලි බලාගාරවල නිෂ්පාදනය ජාතික පද්ධතියට එකතු වෙද්දි, තව දුරටත් විදුලි බලය පිළිබඳ කිසිවෙකුටත් කථා කරන්නට ඉඩ නොලැබෙන බව මා විශ්වාස කරනවා.

අපට ඉලක්කයක් තිබෙනවා. ඒ මේ රට දියුණු කිරීමේ සැබෑ වුවමනාවයි. ඒ සඳහා සුදුසු දරු පරපුරක් නිර්මාණය කිරීම යුගයේ අවශ්‍යතාව බව රජය තේරුම් ගෙන තිබෙනවා. ඒ වාගේම අපේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑ. ඒ තුළින් රැකියා අවස්ථා වැඩි කරන්න ඕනෑ. මේ සියලු දේවල් එක්ක අපේ රට බලශක්ති කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම සඳහා අප සියලු දෙනා දායක විය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Wijeyadasa Rajapakshe. You have 15 minutes.

[අ.භා. 3.13]

ගරු විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්තුතියි.

I would like to commence my speech by telling the Hon. Minister of Power and Energy that there is a saying: "Victory has many fathers, but defeat is an orphan". "ජයග්‍රහණය සඳහා පියවරු ඕනෑ තරම් සිටිනවා. හැබැයි පරාජය හැම තිස්සේම අවජාතකයි." ඒ වාගේ ප්‍රශ්නයක් තමයි මේ වෙන කොට මේ පාර්ලිමේන්තුවේ තර්ක වෙමින් පවතින්නේ. ආණ්ඩු පාර්ශ්වයේ තර්කයෙන් කියන විධියට මේ රටේ විදුලි බලය පිළිබඳව යම් ප්‍රගතිශීලී වැඩ කොටසක් කෙරිලා තිබෙනවා නම්, ඒ ඔක්කෝම කරලා තිබෙන්නේ ආණ්ඩුවෙන්. මේ රටේ විදුලි බලය පිළිබඳව යම් කිසි පිරිහීමක් වෙලා තිබෙනවා නම්, ඒක කරලා තිබෙන්නේ විපක්ෂය. ඒක තමයි තර්කය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් මේ වාගේ විවාදයකදී මහජන නියෝජිතයෝ විධියට අපට තිබෙන වගකීම මේ වාගේ බොළඳ තර්ක ඉදිරිපත් කරන එක නොවෙයි. ඇත්තටම මේ රටේ විදුලි බල අර්බුදයක් තිබෙනවා; විදුලි බලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. විදුලි බිල සම්බන්ධව ජනතාවට අනවශ්‍ය බරක් පැටවිලා තිබෙනවා. එහෙමනම් ඒ විදුලි බිල ජනතාව මත පැටවීමේ සාධාරණ පදනමක් තිබෙනවාද? එහෙම සාධාරණ පදනමක් නැත්නම් ඒකට දෙන විසඳුම කුමක්ද? ඒ සඳහා වග කිව යුත්තේ කවුද? මේ කියන කාරණා අපි මේ අවස්ථාවේදී සාකච්ඡාවට භාජන කරන්නට ඕනෑ.

ආසියාවේ ආශ්චර්යය පිළිබඳව අනාවැකි කියන්නට ආණ්ඩුවට දුර ඇත පෙනුණාට මේ රටේ තිබෙන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතේ තිබෙන විදුලිබල මණ්ඩලය හරහා මේ රටේ ජනතාවට විශාල පීඩනයක්, තර්ජනයක් එනවා කියන එක ආණ්ඩුවට පෙනිලා නැහැ. ඒක තමයි ආණ්ඩුවේ කළමනාකරණය පිළිබඳව දකින්න තිබෙන; මනින්න තිබෙන හොඳ මිම්ම. හැබැයි ආණ්ඩුවට ඒක තේරුම් ගන්න බැරි වුණාට මේ ප්‍රශ්නය කල් ඇතිව තේරුම් ගත් බොහෝ අය මේ රටේ සිටියා. අපි මේ පිළිබඳව පරිශීලනය කරලා තිබෙනවා; ගවේෂණය කරලා තිබෙනවා. ඒ නිසා මේ ගැන අපි දන්නවා. අපි කල් ඇතිව ආණ්ඩුවට අනාවැකි කිව්වා, මේ විදුලි බල ප්‍රශ්නය මේ රටේ ජනතාවට දරා ගන්න බැරි ව්‍යසනයන් බවට පත් වනවා කියලා.

මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි, 2007 ජනවාරි 12වැනිදා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව එහි සභාපතිවරයා විධියට මම ඉදිරිපත් කළේ මීට අවුරුදු 6කට කලින් කියන එක. එදා COPE එකේ අපේ නිරීක්ෂණවල තිබුණු කරුණු කීපයක් මම පෙන්වා දෙන්නම්. අපි ආණ්ඩුවට එදා රතු light එකක් නැත්නම්, අවදානමක් ඇති බව පෙන්වා දෙන්න ගත් පියවර ගැන මම කියන්නම්.

එම වාර්තාවේ කියනවා, "ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණක අංශය විසින් හෙළිදරව් කරන ලද ඉඩම් ගනුදෙනුවලට අදාළව චෝදනා ලැබ සිටි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) එම චෝදනා තිබියදීත් 2006 ජූලි 30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කෙරවලපිටිය බලාගාරයේ ව්‍යාපෘති කළමනාකරු ලෙස ලංකා විදුලිබල මණ්ඩලය විසින් පත් කරනු ලැබ තිබෙනවා." කියලා.

මේ වාගේ අතිවිශාල, කෝටි ගණනක දූෂණයක යෙදුණු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු තමයි කෙරවලපිටිය බලාගාරයට ඒ කටයුතු භාරව පත් කරන්නේ. කෙරවලපිටිය බලාගාරය හදනකොට විදුලිබල මණ්ඩලයත් එක්ක ගිවිසුමක්

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විජයදාස රාජපක්ෂ මහතා]

අත්සන් කරනවා, එක විදුලි ඒකකයකට විදුලිබල මණ්ඩලය ගෙවිය යුතු වටිනාකම රුපියල් 11.50යි කියලා. අද මේ වනකොට ආණ්ඩුව විදුලි ඒකකයකට රුපියල් 28කට වැඩි මුදල් ප්‍රමාණයක් ගෙවනවා. ඒක සම්පූර්ණයෙන්ම එම ගිවිසුමෙන් පිටයි සිදු කරන්නේ. කෙරවලපිටිය බලාගාරය සමඟ එම ගිවිසුම ඇති කර ගන්නකොට, පෞද්ගලික අංශයෙන් සල්ලි අරගෙන එය නිම කරන්නට කටයුතු කළාට අවසානයේ සිදු වුණේ මොකක්ද? මේ රටේ තිබෙන ව්‍යවස්ථාපිත නීතිය මුළුමනින්ම උල්ලංඝනය කරමින්, සේවා භාරකාර අරමුදලෙන් - ETF එකෙන් - එම පනතේ ප්‍රතිපාදනවලට පටහැනිව රුපියල් මිලියන 5,000ක් අරගෙන තමයි මේ ව්‍යාපෘතිය පටන්ගෙන තිබෙන්නේ. රුපියල් මිලියන 5,500න් අවසන් කරනවාය කියපු ව්‍යාපෘතිය අවසානයේ රුපියල් මිලියන 11,000ක් දක්වා වැඩි කරනවා. මේ සියලු තීන්දු තීරණ ගන්නේ කවුද? එදා විපක්ෂයද මේ තීන්දු තීරණ ගත්තේ?

එම වාර්තාවේ මේ විධියට සඳහන් වෙනවා.

"මණ්ඩල 08ක සිට 10ක් දක්වා සේවය කර ඇති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා බරපතළ චෝදනාවලට වැරදිකරු වී සේවයෙන් නෙරපා හැරීම සඳහා නිර්දේශ වී සිටින පුද්ගලයෙකි."

නිසි පියවර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත එකී නීති වාර්තා ඉදිරිපත් නොකර ඒවා සහවා ගැනීම ගැන වග කිව යුතු විශ්‍රාම ලත් සාමාන්‍යාධිකාරිවරයාගේ නම අපි මෙහි සඳහන් කර තිබෙනවා. ටෙන්ඩර් මණ්ඩල 08ක සිට 10 දක්වා ගණනාවක් නියෝජනය කරන්නට එහි සභාපතිවරයා විධියට පත් කර තිබෙන්නේ, අතිවිශාල මුදල් දූෂණවල යෙදිලා, ඒ චෝදනාවලට ලක්වීම විතරක් නොවෙයි විමර්ශනවලින් පසුව වැරදිකරු බවටත් ඔප්පු වුණු පුද්ගලයෙක්. වැරදිකරු බවට ඔප්පු වුණාටත් පසුව තමයි මේ පුද්ගලයාව ටෙන්ඩර් මණ්ඩලවලට පත් කරගෙන තිබෙන්නේ.

එම වාර්තාවේ තවදුරටත් මෙහෙම සඳහන් වෙනවා.

"නියෝජ්‍ය කළමනාකරු කල්දේරා මහතා පාරදෘශ්‍යභාවය සම්බන්ධයෙන් දැඩි අභියෝගයකට ලක් වූ ඊළඟ ටෙන්ඩර් මණ්ඩල සභාපති වශයෙන් පත් කිරීමේ වගකීම රංජිත් ෆොන්සේකා මහතා විසින් දැරිය යුතුය. එසේ වුවත්, මේ සමාන චෝදනා ලැබූ සේවකයන් සේවයෙන් පහ කිරීම සහ නඩු පැවරීම පමණක් නොව, ඇතැමුන් බන්ධනාගාරගත වී ද සිටිති".

එතකොට මේ විදුලිබල මණ්ඩලය එවකට පාලනය කරපු සාමාන්‍යාධිකාරිවරයා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සිදු කර ඇති චෝදනාවලට සමාන චෝදනා කරපු බොහෝ උදවිය රැකියාවලින් නෙරපා තිබුණා. සමහරුන් දඬුවම් නියම වීම නිසා සිර ගෙවල්වල සිරගත වෙලා සිටියා. එතකොට මෙවැනි තත්ත්වයක් තිබෙද්දී අපි එදා සඳහන් කළා, "සංස්ථාවේ හර මට්ටම දළ වශයෙන් රුපියල් බිලියන 15 දක්වා ඉහළ නැඟීමට හේතු වූයේ අයහපත් කළමනාකරණය, අකාර්යක්ෂමතාව සහ දූෂණය ඊට බල පෑ බරපතළ සාධක බව කාරක සභාවේ තීරණය වේ." කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීට අවුරුදු හයකට කලින් බිලියන 15ක් වුණු එම පාඩුව අද වනකොට බිලියන 45 ඉක්මවා ගිහින් තිබෙනවා. එදා අපි නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. මේ පාඩු වෙලා තිබෙන්නේ, ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ ගිය නිසා නොවෙයි. මේ රටේ ජල භීතය නැත්නම්, වර්ෂාපතනය මදිකම නිසා නොවෙයි, මේ විදුලිබල ක්ෂේත්‍රයේ තිබෙන වංචාව සහ දූෂණය නිසායි කියලා. එදා මම COPE එකේ දී මේ පිළිබඳව පරීක්ෂණ කරනකොට ඉතා ඉහළින් අපට බලපෑම් ඇති වුණා. මේ සමහර කටයුතු ගැන අපට ප්‍රශ්න කරන්නට එපා කියලා කිව්වා. දූෂණ පිළිබඳව මේ පාර්ලිමේන්තු කාරක සභාවේ ප්‍රශ්න කිරීමේ දී නිලධාරීන් අපහසුතාවට පත් වෙනවා කියලා කිව්වා. නමුත් එදා ආණ්ඩුව එහෙම කල්පනා කළා, නිලධාරීන් අපහසුතාවට පත්වෙයි කියලා. නමුත් අද කවුද අපහසුතාවට පත් වෙලා තිබෙන්නේ? නිලධාරීන්ද, ආණ්ඩුවද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජනතාව.

ගරු විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)

දැන් ආණ්ඩුව අපහසුතාවට පත්වෙලා තිබෙන බව ඇත්ත. ඒක ගැන අපට ප්‍රශ්නයකුත් නැහැ. ඒක ගැන අපි දුක් වන්නේත් නැහැ. මොකද, ඒක ආණ්ඩුව වුවමනාවෙන් අපහසුතාවට පත්වීමක්. නමුත් මේ රටේ දුගී දුප්පත් ජනතාව, විශේෂයෙන්ම විදුලි ඒකක 90ක්, 180ක් වාගේ කුඩා ප්‍රමාණයන් පාවිච්චි කරන, එදිනෙදා අධ්‍යාපන කටයුතුවලට ගෙදර එක බල්බ් එකක් විතරක් දමාගෙන සිටින, එක ලයිට් එකක් පත්තු කරගෙන වැඩ කටයුතු කර ගන්නා මේ රටේ දරු පවුල් දස ලක්ෂ ගණනක් අද මේකෙන් පීඩාවට පත් වෙලා තිබෙනවා. ඒක නිසා අපට දුක තිබෙන්නේ ඒක පිළිබඳවයි. අපි කනගාටු වන්නේ ඒ පිළිබඳවයි. ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා කිව්වා, විපක්ෂය මේක දේශපාලන ප්‍රශ්නයක් කර ගන්න එක හොඳ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක දේශපාලන ප්‍රශ්නයක්. විපක්ෂය විසින් මේකට දේශපාලන මුහුණුවරක් දෙන්නට ඕනෑ නැහැ.

මේ රටේ ජනතාව දන්නවා මෙතැන තිබෙන්නේ දේශපාලන ප්‍රශ්නයක් බව. කළමනාකරණයක් නොදන්නා, දූෂණයෙන් පිරුණු ආණ්ඩුවක පරිපාලනය තුළ ජනතාවට පීඩනයට ලක් වෙන්න සිද්ධ වෙනවා නම් ඒක දේශපාලන ප්‍රශ්නයක්. ආණ්ඩු පක්ෂය කොහොමද කියන්නේ ඒක දේශපාලන ප්‍රශ්නයක් කර ගන්න එපාය කියලා. තමුන්නාන්සේලා කියනවා නම් මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි කියලා, තමුන්නාන්සේලාත් ඒ ගැන කථා කරන්න එපා. එහෙම නම් තමුන්නාන්සේලාටත් ඒ ගැන ප්‍රශ්නයක් නැහැනේ. ඒ නිසා මේ බොරු, පුහු තර්ක ගෙනෙන එක නතර කරන්න ඕනෑ. මේ රටේ ජනතාවට අත්‍යවශ්‍යම ජලය සහ විදුලිය සාධාරණ මිලකට, මිනිස්සුන්ට දරන්න පුළුවන් මිලකට ලබා දීමේ වගකීම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් වෙත අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරපු වගකීමක්. එතකොට ඒ වගකීම ආණ්ඩුව ඉෂ්ට කරන්නේ නැත්නම් ඒක බරපතළ දේශපාලන ප්‍රශ්නයක්ය කියන කාරණය අපි අමතක නොකළ යුතුයි.

අද මේ පිළිබඳව කථා කරන කොට ඇමතිවරු ඇඟ බේරා ගන්න හදනවා. මේක ආර්ථික ඝාතකයකුගේ වැඩක් කියලා කියනවා. මේක මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ, නැත්නම් විමල් වීරවංශ ඇමතිතුමා කියන විධියට මේ රටේ ආර්ථික ඝාතකයාගේ යෝජනාවක් කියලා අද ආණ්ඩුවේ ඇමතිවරු කරුණු ඉදිරිපත් කරනවා. මේ රටේ ආර්ථික ඝාතකයින් එක් කෙනකු නොවෙයි, ඉන්නේ. හුඟාක් ඉන්නවා. යම් කිසි අමාත්‍යාංශයක ලේකම්වරයකු ආර්ථික ඝාතකයකු වෙනවා නම් ඒ ලේකම්වරයා කියාගෙන ඉන්න ඇමතිවරයාත් ඒකාන්ත වශයෙන්ම ආර්ථික ඝාතකයකු වශයෙන් සලකන්නට ඕනෑ. මේ ආර්ථික ඝාතන ගැන ආණ්ඩුවේ ඉන්න සමහර ඇමතිවරුන්ට දැන් තේරුණාට, මීට අවුරුදු ගණනකට කලින් අපි මේවා හෙළිදරවු කරන කොට මේ ආර්ථික ඝාතකයින් වෙනුවෙන් මේ උදවිය පෙනී සිටියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වෙනුවෙන් අධිකරණවල නඩු පැවරුවා. ඔය කියන ආර්ථික ඝාතකයා සත්‍ය වශයෙන්ම මේ රටේ ආර්ථික ඝාතකයකු විධියට නම් කෙරුවා. එහෙම කරලා පැය 24ක් ඇතුළත මහා භාණ්ඩාගාර ලේකම් තනතුරෙන් පන්නන්න පළමුවැනි වතාවට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චය මණ්ඩලයක් විසින් නියෝගයක් ලබා දුන්නා. ජනතාවට කරපු සාපරාධී අපරාධය වෙනුවෙන් ලක්ෂ පහක් වන්දි ගෙවන්න කියලා අධිකරණයෙන් නියෝගයක් දීලා ඉවත් කළා. නැවතත්

අගවිනිසුරුවරු මාරු වන තුරු ඉඳලා, අධිකරණයට බලපෑම් කරලා, මේ රටේ අධිකරණයේ තිබුණු ස්වාධීනත්වය, ගරුත්වය ශත පහකට තකන්නේ නැතිව කෙලෙසලා දාලා, ඒ විනිශ්චයකාරවරු දුන්නු තීන්දුව මේ විනිශ්චයකාරවරු ලවා වෙනස් කරලා තමයි ඔය ආර්ථික ඝාතකයින් නැවත ගෙනැල්ලා නැවතත් මේ රටේ ආර්ථිකය සම්පූර්ණ වශයෙන් අවසානය දක්වා ඝාතනය වීම පිණිස මේ ආණ්ඩුව වැඩ පිළිවෙළ ගෙන යන්නේ. නමුත් එක්සත් ජාතික පක්ෂය කිව්වා නම් "අද ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශය මෙහෙය වන්නේ ආර්ථික ඝාතකයා" කියලා, එක්සත් ජාතික පක්ෂය නැත්නම් විපක්ෂය වෛරයෙන්, ක්‍රෝධයෙන් කථා කරනවා කියලා තමුන්නාන්සේලා චෝදනා කරනවා. හැබැයි අද තමුන්නාන්සේලාගේ කැබිනට් ඇමතිවරු කියන කොට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගෙන යන්නේ ආර්ථික ඝාතකයින් විසින්, අද මේ රටේ මූල්‍ය ප්‍රතිපත්ති තීරණය කරන්නේ මේ රටේ ඉන්න ආර්ථික ඝාතකයින් කියලා, තමුන්නාන්සේලාට ශක්තියක්, පෞරුෂත්වයක් තිබෙනවාද කොන්ද කෙළින් තියාගෙන ඇත්ත කථා කරන්න. ඒක තමයි ඇත්ත කථාව කියලා කියන්න. අඩු ගණනේ එක් කෙනකු එහෙම කියන කොට තව දෙදෙනකුවත් ඉන්නවාද ඒකට සහයෝගය ලබා දෙන්න. එහෙම නැහැ. මොකක්ද ඒකට හේතුව? හුහක් රටවල දූෂණය ගලා ගෙන ගිහිල්ලා තිබෙන්නේ පහළ සිට ඉහළට. අපේ රටේ ඉහළ සිට පහළට දූෂණය ගලා ගෙන ගිහිල්ලා තිබෙනවා. ඒක නිසා තමුන්නාන්සේලා ඒක ගැන කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හරි පුදුම හිතෙන කාරණයක් සිංහල පුවත් පතක පළ වී තිබෙනවා මා අද දැක්කා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිතුමා කියලා තිබෙනවා, "මෙච්චර කල් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් ඇල්ලුවේ හාල් මැස්සන්. -ඒ කියන්නේ අද වන තුරු අල්ලා තිබෙන්නේ හාල් මැස්සන්- හැබැයි දැන් මෝරුන් අල්ලනවා" කියලා. මම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිතුමාට අභියෝග කරනවා, පුළුවන් නම් එක මෝරෙක් අල්ලන්නය කියලා. එහෙම ශක්තියක් නැහැ. ඔය කොමිෂන් සභාවලට ඉදිරිපත් කරපු කොමසාරිස්ලාට ස්වාධීනව, අවංකව තමන්ගේ රාජකාරිය ඉෂ්ට කරන්න අවස්ථාව දෙනවා නම් මේ රටේ කිසිම හේතුවක් තිබුණේ නැහැ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවලංගු කරන්න. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවලංගු කෙරුවේ ඔය කොමිෂන් සභා හැම එකටම තමන් කියන ඕනෑ දෙයක් කරවා ගන්න පුළුවන් හෙන්චයියලා ටිකක් කොමසාරිස්ලා විධියට, සභාපතිවරු විධියට පත් කර ගන්න ඕනෑ නිසා. ඒ නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිතුමා ඒ කියාපු කාරණය හරි විහිළුවක්. මේ රටේ දූෂණ ගැන සඳහන් වෙලා තිබෙන "කෝප්" වාර්තාව මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ මහා සභාවේ ඒකමතිකව සම්මත වුණු වාර්තාවක්.

ආයතන 16ක කෝටි 30,000කට වැඩි මේ රටේ මහජනතාවගේ මුදල් සොරකම් කිරීම්, දූෂණ කිරීම් පිළිබඳව පරීක්ෂණ පවත්වා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට වාර්තාවක් යවන්නටය කියා මම යෝජනාවක් ඉදිරිපත් කළාට පස්සේ, මේ ගරු සභාවේ එදා කථානායකව සිටි වී.ජ.මු. ලොකු බණ්ඩාර මැතිතුමා ඒක සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේ එම යෝජනාව මේ සභාවේ මැති ඇමතිවරුන් සියලු දෙනාගේම - දෙසිය විසිපස් දෙනාගේ ම- එකඟත්වය ඇතිව ඒකමතිකව සම්මත කළා. ඒ විධියට සම්මත කර, ඒ වාර්තාවේ ඒ දූෂණවලට අදාළ - වග කිව යුතු- දේශපාලනඥයන්ට සහ නිලධාරීන්ට විරුද්ධව නඩු මහට යන්නටය, ඒ උදව්වට දඩුවම් කරන්නටය කියා යැවූවාම, අද වනතෙක් ඒ දූෂිත ගනුදෙනු 16 පිළිබඳව - ඒ එක කාරණයක් පිළිබඳව හෝ- විමර්ශනයක් කරන්නට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හයියක් නැහැ. එක කාරණයක් පිළිබඳවවත් පරීක්ෂණයක් පවත්වා නැහැ. එක අපරාධයක් පිළිබඳව නඩුවක් පවරා නැහැ. එදා අප මේ වාර්තාව හංගන්නේ නැතිව ඉදිරිපත් කළා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, now wind up please.

ගරු විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)
මගේ කථාව අවසාන කරන්නටයි යන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ වාර්තාවේ නම්, ගම් ඇතිව දේශපාලන පක්ෂ භේදයෙන් තොරව, මොන පක්ෂයේ හිටියත් එක ඇමතිවරයෙක් විතරක් මිලියන 5074ක් සොරකම් කළාය කියා මේ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අප යවා තිබෙනවා. ඔය මෝරු අල්ලන්න පුළුවන්ය කියන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අඩු ගණනේ මිලියන 5074 සොරකම් කළ ඒ දේශපාලනඥයාට එරෙහිවවත් නඩුවක් පවරන්නටය කියා අප ඉල්ලනවා. මේ පවතින ක්‍රමවේදය තුළ ඒ අභියෝගය ඒ අයට භාර ගන්නට බැරි බව අප දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මා කියන්නේ මෙයයි. මේ බරපතළ ව්‍යසනයට අප දැන් පත් වෙලා ඉවරයි. එම නිසා මේ පිළිබඳව එකිනෙකාට චෝදනා කරන්නට කලින්, 2006 මිලියන 15 ක්ව තිබුණු විදුලිබල මණ්ඩලයේ පාඩුව අවුරුදු හයක් යනකොට බිලියන 45ක පාඩුවක් දක්වා වැඩි වුණේ කොහොම ද කියා සොයන්න ආණ්ඩුවේ වගකීමක් තිබෙනවා. ඒක කරුණාකර නිවැරදි කර ගන්න. ඒ නිවැරදි කිරීම්වලට විපක්ෂය වශයෙන් අප තමුන්නාන්සේලාට සහයෝගය දෙනවාය කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.28]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැමදාම අලුත්කඩේ උසාවියේ වාගේ පාර්ලිමේන්තුවට ඇවිත් විවිධ තර්ක ඉදිරිපත් කරන ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්නට අවස්ථාවක් ලැබීම ගැන මා ඉතාමත් සන්තෝෂ වෙනවා. විපක්ෂයේ සියලු දෙනාගේ කථාවල සාරාංශය ගත්තාම, අද විදුලි පාරිභෝගිකයන්ගේ විදුලි ගාස්තු සංශෝධනයක් කිරීමට ආණ්ඩුව කටයුතු කරන්නේ රජයේ දූෂණ නිසා හා විදුලිබල මණ්ඩලයේ දූෂණ නිසාය කියන එකයි තමුන්නාන්සේලා අවධානය යොමු කළ කාරණය හැටියට පෙනී යන්නේ. මගේ මිත්‍ර ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා COPE එකේ සභාපති හැටියට ඉන්නකොට මාත් එම කමිටුවේ හිටියා. මා මේ අමාත්‍යාංශය ගැන ඔබතුමාට වඩා හොඳට දන්නවා. මාත් මේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයාව හිටියා. එම නිසා, ඔබතුමා වාගේම අපටත් මේ පිළිබඳව අවබෝධයක් තිබෙන නිසා, විදුලිබල මණ්ඩලය ඇයි මේ දෙය කරන්නේ කියන එක පිළිබඳව රටේ ජනතාවත්,මේ පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලාත් දැනුවත් කිරීම අපේ යුතුකමක් ගරු මන්ත්‍රීතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි මෙතුමන්ලා කියන්නේ, මේ ආණ්ඩුව විදුලි ගාස්තුව වැඩි කරන්නේ වංචා, දූෂණ තිබුණු නිසා ඒක වහගන්න මේ සොරකම් කරන සල්ලි ටික පාරිභෝගිකයන්ගේ ඇඟට දානවා කියා යි. හරි ලස්සනයි. එදා වේලටවත් එල්ලෙන්න බැරිව ඉන්න තමුන්නාන්සේලාට, අර මොනවාවත් කර ගන්නට බැරිව ගරු ඩිලාන් පෙරේරා

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ඇමතිතුමාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙනැල්ලා ආණ්ඩුව උඩින් තිබ්බා වාගේ, මොකක්ද අහු වෙන්නේ ඒකෙන් ආණ්ඩුවට ගහන්න උත්සාහ කරනවා. ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, එක්දහස් නවසිය අසූගණන්වල මේ රටේ සියයට 75ක් විදුලිබලය නිෂ්පාදනය කළේ ජල විදුලියෙන් බව. සියයට 25යි ඩීසල් බලාගාරවලින් නිෂ්පාදනය කළේ. මේක මේ විධියට සිද්ධ වෙලා අද සියයට 75ක් විදුලිබලය නිෂ්පාදනය කරන්නේ ඩීසල් විදුලිබලාගාරවලින්. ජලාශ්‍රිත බලාගාරවලින් විදුලිය නිෂ්පාදනය කරන්නේ සියයට 25යි. ජලයෙන් විදුලිය නිෂ්පාදනය කරන්න ඒකකයකට මිල කීයද යන්නේ කියා ඔබතුමා දන්නවා. ඩීසල්වලින් විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන්න යන මිලත් ඔබතුමා දන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, සියයට 75ක් ජල විදුලිබලාගාරවලින් අප විදුලිය නිෂ්පාදනය කළා නම්, අද වෙනකොට මේ මිලටත් අපට විදුලිය දෙන්නට ඕනෑ නැහැ. මීට වඩා හුඟක් අඩුවෙන් දෙන්නට පුළුවන්. හැබැයි අද වෙනකොට අපට සිද්ධ වෙලා තිබෙන්නේ සියයට 75ක් ඩීසල් ආශ්‍රිත බලාගාරවලින් විදුලිය නිෂ්පාදනය කරන්නයි.

දැන් ඔබතුමාට මා ඉතාම කෙටියෙන් කියන්නම්. මේ විදුලිබල මණ්ඩලයේ පාරිභෝගිකයෝ මිලියන 5ක් ඉන්නවා. ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමනි, මේ මිලියන පහෙන් මිලියන 3.7කට - ඒ කියන්නේ ඒකක 90කට අඩුවෙන් පාවිච්චි කරන පාරිභෝගිකයෝ මිලියන 3.7ක් ඉන්නවා. ඒ කියන්නේ සියයට 65ක් ඉන්නවා.

ඒ අයගෙන් - unit 60-90 අතර පරිභෝජනය කරන අයගෙන්- අපි unit එකකට charge කරන්නේ රුපියල් 7.50යි. ඒකක 30ක් පාවිච්චි කරන පාරිභෝගිකයාගෙන් unit එකකට අය කරන්නේ රුපියල් 3.00යි. ඒකක 30-60 දක්වා 4.70යි. ඒකක 60-90 දක්වා රුපියල් 7.50යි. ඒ අනුව unit 90 දක්වා average ගත්තාම අපි unit එකකට අය කරන ගණන රුපියල් 5.00යි. ගරු මන්ත්‍රීතුමනි, නිෂ්පාදිත වියදම කීයද? රුපියල් 23.60යි

එන්ජිමට තෙල් ටික දමලා start කරලා, දුවලා - [බාධා කිරීම්] රුපියල් 23.60යි කියන්නේ ලංකා විදුලිබල මණ්ඩලය විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන මිල. විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන cost එක. [බාධා කිරීමක්] තමුන්නාන්සේ විදුලිබල මණ්ඩලයේ සභාපතිද? Unit cost එක කීයද? සමස්ත ගණන. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, මම මේ කථා කරන්නේ ජලය, ඩීසල් යොදා නිෂ්පාදනය කරන්න වැය වන සම්පූර්ණ ගණන. දැන් ඔබතුමා කියන්නේ රුපියල් 20.00යි කියලා නේ. [බාධා කිරීමක්] දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, දැන් ඔය ටෙලිෆෝන් එකෙන් මල් කඩන එක නවත්වලා පොඩ්ඩක් මේක අහගන්නකෝ. [බාධා කිරීමක්]ඉතින් අහගන්න. මම කියන එක අහගන්නකෝ. මම වැරදියි කියලා ඔබතුමා කියනවා නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මල් නොවෙයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හරි, හරි. මල් නොවෙයි, පිච්ච මල්. [බාධා කිරීමක්] පිච්ච මල් කියමු කෝ. දැන් ඔබතුමා කියනවා නේ රුපියල් 20.00යි කියලා වියදම. ගරු මන්ත්‍රීතුමනි, අපි විකුණන්නේ - [බාධා කිරීමක්] එහෙම නම් ඔබතුමා කියන්නේ රුපියල් 12.00යි කියලාද? [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, සමා වෙන්න. රුපියල් 23.60යි නොවෙයි, 21.50යි. සමා වෙන්න, ඒක ඉල්ලා අස් කර ගන්නවා. රුපියල් 21.50යි. රුපියල් 21.50ට නිෂ්පාදනය කරන විදුලිය ඒකකයක් සියයට 65ක් පාරිභෝගිකයන්ට අපි දෙන්නේ රුපියල් 5.00කටයි. එතකොට තමුන්නාන්සේ කියන්නේ මේක හොරකම කියලාද? මේකට කියන්නේ හොරකමද? ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල මණ්ඩලයේ ආදායම කීයද? [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉතින් "සියල්ල දත්" නේ. [බාධා කිරීමක්] ඔබතුමා හිතා ගෙන ඉන්නේ COPE එකේ කෑගහලා, පාර්ලිමේන්තුවේ කෑගහලා "සියල්ල දත්" කියලා නේ. ඔබතුමා දන්න කෙහෙල්මලක් නැහැ. ඔබතුමා කෑගහලා නිකම් වීරයා වෙන්න යනවා. පොඩ්ඩක් ඉඳගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලිබල මණ්ඩලයේ ආදායම රුපියල් බිලියන 183යි. ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඒ රුපියල් බිලියන 183න් රුපියල් බිලියන 144ක් තෙල්වලට විතරක් යනවා. අපේ විදුලි බලාගාරවල තෙල් බිල විතරක් රුපියල් බිලියන 144යි. පෞද්ගලික බලාගාරවලට රුපියල් බිලියන 19ක් අපි ගෙවනවා. විකල්ප බලශක්ති බලාගාරවලට රුපියල් බිලියන 13ක් ගෙවනවා. එකතුව රුපියල් බිලියන 170යි. වැටුප්වලට යනවා රුපියල් බිලියන 17ක්. භාණ්ඩ මිල දී ගන්න රුපියල් බිලියන 7ක් යනවා. ඒකෙන් සියයට 50ක් කොමිෂන් ගැහුවා කියලා අපි හිතමු. සාමාන්‍යයෙන් කොමිෂන් ගන්නේ සියයට 10ක් 15ක් නේ. අපි හිතමු සියයට 50ක් කොමිෂන් ගැහුවා කියලා. [බාධා කිරීමක්] ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමා මගෙන් අහන්නේ - [බාධා කිරීමක්] නැහැ, නැහැ. සාමාන්‍යයෙන් නීතිඥයෝ ගන්නේ සියයට 80යි. ටෙන්ඩර්වලදී ගන්නේ සියයට 10යි. මම ඔබතුමාට average එක කිව්වේ. සාමාන්‍යයෙන් කථාවටත් කියනවා නේ. සාමාන්‍යයෙන් ඔබතුමා file එකක් ගත්තාම පාර්ලිමේන්තුවේ කථා කරන්න කියලා සියයට 15ක් ගන්නවා. යම් යම් ටෙන්ඩර්වලට කථා කරන්න සියයට 15ක් ගන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගණන් හදලා බැලුවාම මේ වෙලා තිබෙන්නේ දූෂණයක් ද, වංචාවක් ද කියන්න. නැහැ. ගරු මන්ත්‍රීතුමනි, තේරුම් ගන්න මේකට මූලික හේතුව මොකක්ද කියලා. අද අපට මේ චෝදනාව එල්ල වෙලා තිබෙන්නේ ආණ්ඩුව ජනතාවට සහන දීපු නිසායි. අද බලන්න, වතුරට සහනාධාර දෙනවා; ඩීසල් සහනාධාර දෙනවා; ප්‍රවාහන සහනාධාර දෙනවා; සෞඛ්‍ය සහනාධාර දෙනවා; අධ්‍යාපන සහනාධාර දෙනවා; කෘෂිකර්ම සහනාධාර දෙනවා. මේ ආණ්ඩුව ජනතාවට සියලු සහනාධාර දෙන ආණ්ඩුවක්. තමුන්නාන්සේ කියන්න අපි සහනාධාර දෙන්නේ නැත්තේ මොනවාටද කියලා. විදුලිය පාරිභෝගිකයන්ගෙන් සියයට 75කට මේ ආණ්ඩුව සහනාධාර දෙනවා. පළමුවැනි unit එක පාවිච්චි කරන ඇමෙරිකානු තානාපතිතුමාටත් අපි මේ concession එක දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැන තිබෙන්නේ වෙන මොකක්වත් නොවෙයි. මේ පාඩුවට වග කියන්න ඕනෑ අපි නොවෙයි. මේ පාඩුවට වග කියන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂය. ඇයි? විදුලිබල මණ්ඩලය මේ අවදානම 1980 දී දැක්කා. 1980 දී විදුලිබල මණ්ඩලය මේ අවදානම දැන ගෙන ජල විදුලිබලාගාරවලින් අයින් වෙලා ඩීසල් බලාගාර එනවා කියන එක හඳුනා ගත්තා. ඒක නිසා තමයි ලංකාවේ ගල් අඟුරු බලාගාරයක් හදන්න කියලා ඒ අය යෝජනා කළේ. 1988 දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ඒක හදන්න සියලු කටයුතු කළා. 1980 ඉඳලා තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේ මේ බලාගාරය හැදුවේ නැහැ. කොත්මලේ බලාගාරය හදන්න කරු ජයසූරිය මහත්මයා මුල් ගල තියන්න දිනත් යොදා ගත්තා. රනිල් වික්‍රමසිංහ මහත්තයා ඊට පසුවදා ඒක කල් දැම්මා.

කොත්මලේ බලාගාරය හදන එක කල් දැම්මා. තමුන්නාන්සේලාගේ දේශපාලන තීන්දු අනුව ඒ බලාගාර හදන එක කල් දැමූ නිසා තමයි මේ රටේ ජනතාවට මේ බර පටවන්න

වෙලා තිබෙන්නේ. එහි සම්පූර්ණ වගකීම එක්සත් ජාතික පක්ෂය භාර ගන්න ඕනෑ. 1980 දී තමුන්නාන්සේලා නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය හැදුවා නම්, ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය නියමිත වෙලාවට හැදුවා නම් පාඩුව මෙතරම් විශාල වන්නේ නැහැ ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා. තමුන්නාන්සේ විදුලිබල මණ්ඩලයේ සේවය කළ යම් යම් පුද්ගලයන් ගැන කිව්වා. ටෙන්ඩර් ගැන කිව්වා. මම ඒවා පිළිගන්නවා. මමත් ඔබතුමාත් එක්ක සියයට සියයක් එකහයි. මමත් නියෝජ්‍ය ඇමති කාලයේ ඔය නම් කියපු දෙදෙනා මාරු කරන්න කියලා කිව්වා. කැබිනට් මණ්ඩලය ඔය කියපු මනුස්සයා ආපසු රත්නපුරයට දමන්න ගියාම මම තමයි කැබිනට් මණ්ඩලයේදී ඒකට විරුද්ධ වුණේ. මමත් ඔබතුමා එක්ක එකහයි ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමනි. කැබිනට් මණ්ඩලයට ඉල්ලීමක් ආවා ඔහුට රත්නපුරයේ පත්වීමක් දෙන්න කියලා. මම තමයි එදා කැබිනට් මණ්ඩලයේදී ඒකට විරුද්ධ වුණේ. අපි වැරැද්ද වැරැද්ද ලෙස පිළිගන්නවා. හැබැයි ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඒ මනුස්සයා ටෙන්ඩර් එකක ඉඳගෙන කළා කියන දෙයින් වැඩිම වුණොත් රුපියල් මිලියන හතරක් හෝ පහක් ගහලා ඇති. හැබැයි මෙහි පාඩුව රුපියල් බිලියන 61යි. මේක තේරුම් ගන්න. ගිය අවුරුද්දේ පාඩුව රුපියල් බිලියන 61යි. මේක තේරුම් ගන්න තමුන්නාන්සේලා. රුපියල් බිලියන 61ක් පාඩු වන්නේ වෙන මොකවත් හින්දා නොවෙයි. මේ රටේ විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන්නේ රුපියල් 21.50ටයි. එයින් සියයට 75ක් විකුණන්නේ රුපියල් 5ටයි. දෙවි හාමුදුරුවනේ, මේක තේරුම් ගන්න! මේක තමයි පාඩුව. මෙහි තිබෙන්නේ දූෂණය නොවෙයි. මෙහි තිබෙන්නේ අකාර්යක්ෂමතාව නොවෙයි. මෙහි තිබෙන්නේ පැවැති ආණ්ඩු නියම වෙලාවට නියම තීන්දු නොගැනීමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියන්නේ නැහැ ලංකා විදුලිබල මණ්ඩලය සියයට සියයක් පිරිසිදුයි කියලා. මම කියන්නේ නැහැ ලංකා විදුලිබල මණ්ඩලයේ දූෂණය නැහැ කියලා. මමත් නියෝජ්‍ය ඇමතිවරයා විධියට ඔය සම්බන්ධයෙන් විශාල හඬක් නඟපු කෙනෙක්. මම කියනවා ලංකා විදුලිබල මණ්ඩලයේ දූෂණ අක්‍රමිකතා තිබෙනවා කියලා. හැබැයි ඒ දූෂණ අක්‍රමිකතා කියන්නේ හරියට සාගරයට පොල් ලෙල්ලක් දැම්මා වාගේ දෙයක්. ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයේ දූෂණ අක්‍රමිකතා ගත්තාම එය මේ පාඩුවෙන් දශම 0005ක්. මේක නොවෙයි ප්‍රශ්නය. තමුන්නාන්සේලා ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන්න හදනවා. අපි පාරවල් හදන්න ඕනෑ; අපි ලයිට් දෙන්න ඕනෑ; අපි වතුර දෙන්න ඕනෑ; අපි සමෘද්ධිය දෙන්න ඕනෑ; අපි පොහොර දෙන්න ඕනෑ. දැන් ඔබතුමන්ලා කියන්නේ අපි බිලියන ගණන් පාඩු කර ගෙන විදුලිය දෙන්නත් ඕනෑ කියලාද? ආණ්ඩුව මේ වෙලාවේ උත්සාහ කළා රුපියල් 5ක් වගේ බොහොම අඩුවට දීපු විදුලිය ඒකකය රුපියලකින් දෙකකින් වැඩි කරන්න. බලන්න ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඒකක 30 දක්වා පාවිච්චි කරන අයට unit එකකට අය කරන්නේ රුපියල් 3යි; එවැනි විදුලිය පාරිභෝගිකයෝ ඉන්නවා මිලියන 1.1ක්. බිල එන්නේ රුපියල් 300යි. සමහරු සිගරට් එකක් බොන්න කීයක් වැය කරනවාද? රුපියල් 14යි. දවසකට සිගරට් එකක් බැගින් අඩු කළොත් ලයිට් බිල ගෙවන්න පුළුවන් නේ. එතකොට රුපියල් 450යි නේ. දවසකට සිගරට් එකක් බැගින් අඩු කළොත් තමන්ගේ ගෙදර විදුලිය බිල ගෙවන්න පුළුවන්. මිලියන 1.1කට ලයිට් බිල විධියට එන්නේ රුපියල් 300ත් 400ත් අතර ප්‍රමාණයක්. ඉකිරි මිලියන 1.3ට බිල විධියට එන්නේ රුපියල් 400ත් 500ත් අතර ප්‍රමාණයක්. ඊළඟ මිලියන 1.3ට බිල විධියට එන්නේ රුපියල් 800ත් 1,000ත් අතර ප්‍රමාණයක්. ගරු මන්ත්‍රීතුමා, මේ රටේ විදුලිය පාරිභෝගිකයන්ගෙන් සියයට 75කට විදුලිය බිල විධියට එන්නේ රුපියල් 1,000ට වඩා අඩු මුදලක්. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා හැම දාම දුක් විඳින මිනිසුන් ගැන සිතුවා; හැම දාම සාමාන්‍ය ජනතාව ගැන සිතුවා. ඒ නිසා තමයි අප මේ සහනාධාරය දුන්නේ. තමුන්නාන්සේලා දන්නවා මේ සහනාධාරය දෙනවාත් එක්කම ආණ්ඩුව ශක්තිමත් වෙනවා කියලා. මේ සහනාධාරය ගැන කියලා ආණ්ඩුව වටා ඉන්න ජනතාව ඉවත් කරන්නයි තමුන්නාන්සේලා මේ උත්සාහ කරන්නේ. විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා, අර අලුත්කඩේ උසාවියේ දමන තර්ක, දණ්ඩ නීති සංග්‍රහයෙන්, අරකෙන් මේකෙන් දමන තර්ක මේකට ගෙනෙන්න එපා. ඔබතුමාගේ තර්කය වැරැදියි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(*மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே*)
(The Hon. Mahindananda Aluthgamage)
ඔව්, මොකක්ද ඔබතුමා කියන්නේ? ඔය කන් දෙකට ගහලා තිබෙන වයර් දෙක ගලවා ගන්න කෝ. හරියට නිකම් සේලයින් ගහලා වාගෙයි පාර්ලිමේන්තුවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා කියන විධියට මහජන උපයෝගිතා කොමිෂන් සභාව දැන් නව ගාස්තු සම්මත කරලාද තිබෙන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(*மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே*)
(The Hon. Mahindananda Aluthgamage)
තවම නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නම් ඒක approve කියලා එවලා තිබෙන්නේ කවුද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(*மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே*)
(The Hon. Mahindananda Aluthgamage)
කවුද එවලා තිබෙන්නේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
Message එකක් තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(*மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே*)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා ඒ කාලයේ සින්දු කියන කොට ඔබතුමාට message කියක් ආවාද? ඒ කාලයේ ඔබතුමා සින්දු කියන කොට ඔබතුමාට messages180,000ක් ආවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
මේ කථාව අහන්න කෝ. ඔබතුමන්ලාගේ අලුත් සංශෝධනය අනුව ඒකක 01 ඉඳලා 30 දක්වා විදුලි පරිභෝජනයට අදාළ ගාස්තුව කීයකින් වැඩි වෙනවාද? ඒකක 30 ඉඳලා 60 දක්වා ගාස්තුව කීයකින් වැඩි වෙනවාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මා ඔබතුමාට ඒ ගැන කියන්නම්. වැඩ බලන විදුලිබල ඇමති දැන් ඉඳගන්න. දැන් ආපසු කනේ අර දෙක ගහගන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, you have two more minutes.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඉක්මනින් කථාව අවසන් කරන්නම්. ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට කියන්න ඕනෑ විදුලිය ඒකකවල මිල වැඩි කිරීම පිළිබඳ තව වන කල් අවසන් තීරණයක් ගෙන නැහැ කියන එක. මේ වන කල් එවැනි තීරණයක් ගෙන නැත.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක කිව්වා නම් ඇති.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ලංකා විදුලිබල මණ්ඩලය අතිගරු ජනාධිපතිතුමාත් එක්ක මේ පිළිබඳව සාකච්ඡා කරද්දී මේ පිළිබඳ එතුමාගේ අවධානයත් යොමු කළා. මේ රටේ පාරිභෝගිකයන්ට, දුක් විඳින ජනතාවට අසාධාරණයක් නොවන විධියට විදුලිය බිල සංශෝධනය කරන්න අපි කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් අපි විපක්ෂයට කියනවා, කරුණාකර අසත්‍යය කියන්න එපා කියලා. තමුන්නාන්සේලා අසත්‍යය කියලා තමයි අවුරුදු 19ක් තිස්සේ විපක්ෂයේ ඉන්නේ. තමුන්නාන්සේලා නැති වෙලා ඉන්නේ. තමුන්නාන්සේලා අසත්‍යය කියන නිසා තමයි තමුන්නාන්සේලාගේ නායකයාට පාරේ කෙළින් යන්න බැරි. ඒ නිසා අසත්‍යය කියන්න එපා. රටට ඇත්ත කියන්න. පාඩුව තිබෙන්නේ දූෂණ, වංචා නිසා නොවෙයි.

විජයදාස රාජපක්ෂ මහත්මයා අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිසම ගැන කිව්වා. මෝරු අල්ලන්න කියලා කිව්වා. අපි මේකේ මෝරු අල්ලමු. දූෂණ ගනුදෙනු තිබෙනවා නම් අපි මෝරු අල්ලමු. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ ගනුදෙනුවේ මෝරු නැහැ. පටලවාගන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලිබල මණ්ඩලයේ ප්‍රශ්නය අරගෙන බැලුවොත් ඒකේ තිබෙන්නේ ඒකකයක නිෂ්පාදන මිලයි, ඒකකය විකුණන මිලයි අතර වෙනස පාඩුව බිලියන ගණනක් වන එකයි. මේකයි ප්‍රශ්නය. මේ රටේ ජනතාව මේක තේරුම් ගන්න ඕනෑ. අපි පාරවල් හදන්න ඕනෑ; වතුර දෙන්න ඕනෑ. ඒ වාගේ සියලුම සහනාධාර දෙන ගමන් අනෙක් හැම දෙයක්ම දෙන්න අපටත් පුළුවන්කමක් නැහැ. ආණ්ඩුව පවත්වාගෙන යන්නත් ඕනෑ. ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමනි, එහෙම නැත්නම් අපට කරන්න තිබෙන්නේ මේක මේ විධියටම තියලා නීතිඥයන්ගේ ආදායමෙන් ආදායම් බදු ලෙස සියයට 50ක tax එකක් ගහන එකයි. එහෙම කළොත් විජයදාස රාජපක්ෂ මහත්මයාට මාසයකට රුපියල් කෝටි 5ක් ගෙවන්න සිද්ධ වෙනවා.

ගරු විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)
මම දැනුත් tax ගෙවනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා දැන් ගෙව්වාට ඇත්ත ආදායම පෙන්වන්නෙත් නැහැනේ; කථා කරන ඇත්ත නඩු ගණන පෙන්වන්නෙත් නැහැනේ. [බාධා කිරීමක්]

සියලු නඩු ටික පොතේ සටහන් කරනවාද? සියලු ආදායම සටහන් කරනවාද? [බාධා කිරීමක්] ඔය බලන්නකෝ, පාර්ලිමේන්තුවේදී අසත්‍යය කියනවානේ. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි, මම අවසන් කරන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් කියන්නට ඕනෑ විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ එක නඩුවකට අය කරන ගාස්තුව සාමාන්‍යයෙන් රුපියල් මිලියන 10යි. එතකොට දවසකට නඩු 10ක් කථා කළොත්, දහය වැඩි කිරීම දහය 100යි. ඒ කියන්නේ රුපියල් මිලියන 100යි. ඒක 30න් වැඩි කළොත් ඔබතුමාගේ ආදායම කීයද? ගෙවන tax එක කීයද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා අවසාන වශයෙන් අපි විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා අසත්‍යය කියන්න එපා කියලා. ජනතාවට අපි බර දෙනවා නොවෙයි, මේක විදුලිබල මණ්ඩලයට තිබෙන පාඩුව අවම කර ගැනීම සඳහා, රජයට තිබෙන බර අවම කර ගැනීම සඳහා කරන වැඩ පිළිවෙළක් කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ප.ව. 3.41]

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மின் கட்டண அதிகரிப்புச் சம்பந்தமான இந்த ஒத்திவைப்புப் பிரேரணை தொடர்பில் ஒருசில வார்த்தைகள் கூற விரும்பு கின்றேன். இலங்கையில் மின்சார சபை, பெற்றோலியக் கூட்டுத்தாபனம் மற்றும் மிஹின் எயார் போன்ற நிறுவனங்கள் மிகவும் நஷ்டத்தில் இயங்குகின்றன. இந்நிறுவனங்கள் அரசுக்குப் பெருஞ் சுமையாக இருப்பதுடன் மானியமாக அல்லது மாற்றல் வருமானமாக ஒவ்வோர் ஆண்டும் ஏராளமான நிதியையும் அரசிடமிருந்து பெற்று வருகின்றன. இதனால் இந்நாட்டுக்கு முக்கியத்துவம் வாய்ந்த ஏனைய அபிவிருத்தித் திட்டங்கள் தடைப்படுவதுடன் மக்களின் வரிப் பணமும் வீணடிக்கப்படுகிறது. அதேவேளையில், நாட்டின் உள்நாட்டு, வெளிநாட்டுக் கடன் சுமைகளும் அதிகரிக் கின்றன. இந்த நிலைமை இறுதியில் மக்களுக்குப் பெரும் சுமையாக மாறுவதுடன் அவர்களது வாழ்க்கைத் தரத்திலும் வீழ்ச்சியை ஏற்படுத்துகின்றது. அது மாத்திரமன்றி, மக்களை வறுமை நிலைமைக்குக்கூட இட்டுச்செல்கின்றது.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! What is the point of Order, Hon. Mahindananda Aluthgamage?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sorry to disturb you, Hon. Member.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, විදුලිය ඒකක 60 දක්වා කිසිදු වැඩි වීමක් කරන්නේ නැහැ, පරණ ගණනමයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Member, you carry on. - [*Interruption.*]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා හරියට දන්නේ නැතුව කියන්න එපා. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! The Hon. Member is now speaking. Do not disturb him. - [*Interruption*-] Hon. Dayasiri Jayasekara and Hon. Mahindananda Aluthgamage, please allow the Hon. Member to speak. Hon. Yoheswaran, you carry on.

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
இன்று மின்சாரம் என்பது மக்களின் அடிப்படைத் தேவை களில் ஒன்றாகவே இருக்கின்றது. இவ்வாறான நிலையில் மேலும் மின்சாரக் கட்டணத்தை அதிகரிப்பதனூடாக மக்களின் வாழ்க்கைத்தரத்தை மிக மோசமான நிலைமைக்கு இட்டுச் செல்லும் செயற்பாட்டினை அரசு தொடரக்கூடாது என நான் கேட்டுக்கொள்கின்றேன். இந்த மின்சாரக் கட்டண அதிகரிப்புக்கான காரணம் யாது? ஒழுங்கான நல்ல நிருவாகமின்மை, திட்டமிடலின்மை, சீரான நிதிப் பயன் பாடின்மை, நீண்டகால அபிவிருத்தி சார்பான திட்டமிட லின்மை என்பனவே அதற்கான காரணங்களாகும். கடந்த சில வருடங்களுக்கு முன்னர் உலகச் சந்தையில் மசகு எண்ணெய் விலை குறைவடைந்தபொழுதும் நீதிமன்றம் எரிபொருள் விலையைக் குறைக்க உத்தரவிட்டபொழுதும் விலை குறைக்காத அதே அரசாங்கம்தான், தற்பொழுது மின்கட்டண அதிகரிப்பை மேற்கொண்டிருக்கின்றது. இன்று அரசாங்கம் எமது நாட்டிலே மின்சாரம் வழங்கும் திட்டத்தை நூறு வீதம் அமுல்படுத்துகின்ற அதேநேரம், இந்த மின் கட்டண அதிகரிப்பை மேற்கொண்டு மக்களின் வாழ்க்கைத்தரத்தை நூறு வீதம் கீழ்நிலைக்குக் கொண்டுசெல்லத் தீர்மானித் திருக்கின்றது. இன்று இலங்கையின் சக்தி வளத்துறையில் பெரும் நெருக்கடியான நிலை உருவாகியிருக்கின்றது. அதேநேரம், இத்துறையைப் பொறுத்தவரையில் இன்று சேவை வழங்குவதிலும் செலவு செய்வது தொடர்பிலும் சிக்கனமற்ற தன்மை காணப்படுவதை நாங்கள் உணர்கின்றோம்.

மின்சாரக் கட்டண அதிகரிப்பானது அபிவிருத்தியடைந்து வருகின்ற நாடாகக் கருதப்படுகின்ற எமது நாட்டில் பாரிய தாக்கத்தை ஏற்படுத்தும் என்பதை யாரும் மறுக்க முடியாது. இந்த அதிகரிப்பானது நாட்டின் பொருளாதார வளர்ச்சிக்குத் தடையாகவே காணப்படும். இன்று மின்சாரமானது மக்களின் அன்றாட தேவையுடன் இன்றியமையாத அத்தியாவசியப் பண்டமாகக் கருதப்படுகின்றது. ஆகவே, மின்கட்டண அதிகரிப்பானது நாட்டின் ஒட்டுமொத்தப் பொருளாதாரத்திலும் தாக்கத்தை ஏற்படுத்தும். இன்று சாதாரண குடிமக்களும் மின் விசிறிகளைப் பயன்படுத்துகின்ற ஒரு நிலை உருவாகி இருக்கின்றது. வறிய மக்கள் பெரும்பாலும் குடிசைக் கைத் தொழிலையே நம்பி வாழ்கின்றார்கள். இந்தத் தொழிலைப் பெரும்பாலும் மின்சாரத்தின்மூலமே அவர்கள் மேற்கொள்கின் றார்கள். ஆனால், இவ்வாறு மின்சாரக் கட்டணத்தை அதிகரிப்பதனால் அந்த மக்கள் பாரிய பிரச்சினையை எதிர்கொள்ள வேண்டியிருக்கும். இந்த வகையிலே அவர்களது வாழ்வாதாரமும் பாதிக்கப்படும். ஒட்டுமொத்தமாக இந்த மின்சாரக் கட்டண அதிகரிப்பு சகல துறைகளிலும் மக்களுக்குப் பாதிப்பை ஏற்படுத்துவதாகவே அமையும். தொழிற்றுறையின் உள்ளீட்டுச் செலவினம் அதிகரிக்கப்படுவதன்மூலம் அவற்றின் உற்பத்தி விலை அதிகரிக்கும். அதேநேரம் இந்தத் தொழிலை நம்பி வாழ்கின்ற அந்த மக்களின் வாழ்வாதாரம் வறுமைக் கோட்டின்கீழ் செல்வதற்கும் இது வழிவகுக்கும்.

பொதுவாக இலங்கையில் மின்சாரத்துக்கான கேள்வி சராசரியாக ஆண்டுக்கு 7 - 8 சதவீதம் அதிகரித்து வருகின்றது. இதற்குக் காரணம் மின் பாவனையாளர்களின் எண்ணிக்கை அதிகரித்தமையாகும். இதனை நிவர்த்தி செய்வதற்கு அண்ணளவாக நூறு 'மெகா வாட்' மின்சாரத்தை உற்பத்தி செய்யக்கூடிய வகையில் புதிய முறைகளைப் பயன்படுத்த வேண்டும். மொத்த மின்சார நுகர்வில் சுமார் 40 வீதம் வீட்டுப் பாவனைக்கும் மிகுதி 60 வீதம் கைத்தொழில் மற்றும் வணிக நிறுவனங்களின் செயற்பாடுகளுக்கும் பயன்படுத்தப் படுகின்றது.

கடந்தகால யுத்த சூழலினால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள மக்கள் தற்போது மீள்குடியேறிக் கொண்டிருக்கின்ற நிலையில் அரசாங்கமானது, 'கிழக்கின் உதயம்', 'வடக்கின் வசந்தம்' போன்ற திட்டங்களினூடாக அப்பகுதிக்கு மின்சாரம் வழங்குவதாக நாடகமாடிக்கொண்டு மின் கட்டணத்தை அதிகரிக்கின்றது. இதனால் அந்த மக்கள் பெரும் பாதிப்புக்கு உள்ளாகும் நிலை உருவாகும். தற்போது ஏற்பட்டிருக்கின்ற மின்சார நெருக்கடியைக் குறைப்பதற்கு அரசாங்கம் சில அணுகுமுறைகளைக் கையாள வேண்டி யுள்ளது. காற்றாலை, சூரிய ஒளி என்பவற்றின் மூலம் மின்சாரத்தை உற்பத்தி செய்வதற்கு அரசாங்கம் விரைவாக நடவடிக்கைகளை எடுக்கவேண்டும். நான் அறிந்தவரை, காற்றாலை மூலம் மின்சாரம் உற்பத்தி செய்வதற்கு அம்பாந் தோட்டை முதல் புத்தாவை வரையான கரையோரப்பகுதியும் கற்பிட்டி குடா முதல் புத்தளம் வரையான பகுதியும் உகந்தவையாகத் தேர்ந்தெடுக்கப்பட்டுள்ளது. அம்பாந் தோட்டையில் பொருத்தமற்ற விமான நிலையத்தை ஆரம்பித்ததை விடுத்து, காற்றாலைகளின்மூலம் மின்சார உற்பத்தியை ஆரம்பித்திருந்தால், இன்று ஏற்பட்டிருக்கும் மின்சாரத் தட்டுப்பாட்டை ஓரளவுக்கேனும் நிவர்த்தி செய்து, மின்கட்டண அதிகரிப்பையும் குறைத்திருக்கலாம்.

ගරු පී. පියසේන මහතා
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! What is the point of Order, Hon. Member?

ගරු පී. පියසේන මහතා
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)
கௌரவ உறுப்பினர் அம்பாந்தோட்டையில் பொருத்தமற்ற விமான நிலையம் அமைக்கப்பட்டிருக்கின்றது என்று கூறுகின்றார். அவர் அதற்குச் சரியான காரணத்தைக் கூறவேண்டும்.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Member, you carry on. You have only one more minute.

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, சற்றுச் சிந்தித்துப் பாருங்கள்! உண்மையில் இந்த மின்கட்டண அதிகரிப்பால் கல்வித் துறைக்கும் பாதிப்பு ஏற்படலாம். இன்று கல்வித் துறையில் நவீன முறையில் தகவல் தொழில்நுட்பம் சார்ந்த பாடங்களும் உட்புகுத்தப்பட்டிருப்பதனால், பாடசாலை களில் நவீன கற்பித்தல் முறைகள்மூலம் மாணவர்களுக்குக் கற்பிக்க வேண்டியிருக்கின்றது. இவ்வாறான ஒரு சூழலில் மின் கட்டண அதிகரிப்பானது கல்வித் துறையிலும் ஆராய்ச்சித் துறையிலும் பாரியதொரு வீழ்ச்சியை ஏற்படுத்தக்கூடும். எனவே, மின் கட்டண அதிகரிப்பின்மூலம், இந்த நாடானது வறுமையில் மட்டுமல்ல, அறிவின்மையிலும்கூட, ஆசியாவிலே ஆச்சரியமிக்க ஒரு நாடாக மிளிரும் நிலை ஏற்படக்கூடும் என்பதனைக் கூறிக்கொண்டு, எனது உரையை நிறைவு செய்கின்றேன்.

[අ.භා. 3.50]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු යෝහේස්වරන් මන්ත්‍රීතුමා ඒ විධියට කථා කරන එක පිළිබඳව ඇත්තටම අපි කනගාටු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උතුරු නැහෙනහිර ප්‍රදේශ නියෝජනය කරන මහජන නියෝජිතයකු හැටියට ඔබතුමා දන්නවා, ඒ ප්‍රදේශ ත්‍රස්තවාදයෙන් බේරා ගත්තාට පස්සේ දැන් තිබෙන තත්ත්වය. ඒ තිස් අවුරුදු කාලය තුළදී ට්‍රාන්ස්පෝමර විනාශ කරලා, විදුලි කණු සම්පූර්ණයෙන්ම විනාශ කරලා විදුලි පද්ධතියට කරන්න පුළුවන් හැම හානියක්ම කරලායි තිබුණේ. නැහෙනහිර පළාත මුදාගෙන, උතුරු පළාත මුදාගෙන තමුන්නාන්සේලා නියෝජනය කරන ප්‍රදේශවල අහිංසක ජනතාවට විදුලිය ලබා දුන්නේ අවුරුද්දක් විදුලි බිල අය කරන්නේ නැතුවයි කියන එක අමතක කරන්න එපා. අවුරුද්දක්ම විදුලි බිල අය කළේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ ප්‍රදේශවල ජනතාව යථා තත්ත්වයට පත් වන තෙක් අවුරුද්දක කාලයක් විදුලි බිල අය කරන්නේ නැතුව තමයි විදුලිය ලබා දුන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලිබල මණ්ඩලයේ පාඩුව අවම කර ගැනීම සඳහා, 2002 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේ පාර්ලිමේන්තුවේ සම්මත කළ පනතකින් ඇති කළ මහජන උපයෝගිතා කොමිසමත්, විදුලිබල මණ්ඩලයත් ඒකාබද්ධ වෙලා යෝජනා කළ විදුලි ගාස්තු පිළිබඳ අවසාන තීරණයකට එන්නේ නැතිව, ඒ ගැන සාකච්ඡාවට බඳුන් වෙලා තිබෙන වෙලාවක් මේ. ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා කිව්වා වාගේ, එල්ලෙන්න වැලේ වැල් නැතුව ඉන්න විපක්ෂය අද විදුලි බිල සම්බන්ධව ජනතාවට විශාල බිල්ලෙක් මවා පාන්න උත්සාහ කරනවා.

විදුලි බිල වැඩි කිරීම නිසා සම්පූර්ණයෙන් අපේ ආර්ථිකය කඩාගෙන වැටෙනවා, සංවර්ධනය සම්පූර්ණයෙන්ම අඩාළ වෙනවා, ජන ජීවිතයට විශාල වශයෙන් හානියක් වෙනවාය කියනවා. හැබැයි යෝජනා කර තිබෙන මේ වැඩි වෙන ප්‍රමාණය දිහා බැලුවාම පෙනෙනවා, ඉතා සොච්චම් මුදලකින් තමයි වැඩි වෙන්නේ කියලා. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, පොඩි මිනිහාගෙන් අරගෙන ලොකු කෙනාට දෙනවා කියලා. නමුත් ඔහුගේ කථාව අවසන් කරද්දී කිව්වා, ලොකු කෙනාගෙන් අරගෙන ආපසු පොඩි කෙනාට දෙනවා කියලා. මේවා හතර බීරි කථා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලි බල මණ්ඩලය 2011 අවුරුද්දේ බිලියන 11ක් පාඩු ලැබුවා. ඒ වාගේම 2012 අවුරුද්ද වන කොට විදුලි බල මණ්ඩලය බිලියන 61ක් පාඩු ලැබුවා. පැහැදිලිවම අපි දන්නවා, මේ පාඩුවට හේතුව විශාල ජනන වියදමක් දරන්න සිදු වෙලා තිබෙන එකයි. අපේ රටේ විදුලි පරිභෝජනය වැඩි වුණා. 1994 අවුරුද්ද වන කොට මේ රටේ ජාතික විදුලිබල අවශ්‍යතාව තිබුණේ මෙගාවොට් 1,800යි. හැබැයි මේ වන කොට මෙගාවොට් 3,140ක අවශ්‍යතාවක් තිබෙනවා, ජාතික වශයෙන් විදුලිය පරිභෝජනය කරන සියලු දෙනාට විදුලිය ලබා දෙන්න. ඒ නිසා ඉන්ධනවලින්, දැව තෙල් භාවිතයෙන් විදුලිය ජනනය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික අංශවලින් අධික මිලකට විදුලිය ගන්න ඕනෑ වෙලා තිබෙනවා. ආසියානු කලාපයේ රටවල් ගණනාවක විදුලිය කැපුවත්, ඉන්දියාවෙත් හැම දවසකම විදුලිය කැපුවත්, ශ්‍රී ලංකාවේ විදුලිය කපන්නේ නැතිව, රටේ ජනතාව අඳුරේ කියන්නේ නැතිව අපි යා යුතුයි කියන ස්ථාවරයේත් ඉඳගෙන කටයුතු කරන නිසාත්, හැමෝටම විදුලිය ලබා දෙන්න කටයුතු කරන නිසාත් අද මේ ජනන වියදම සියයට 80 දක්වා වැඩි වෙලා තිබෙනවා.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ මොන ඇමතිවරයා හිටියත් අනිවාර්යයෙන්ම මේ තත්ත්වයට මුහුණ දෙන්න ඕනෑ. වර්තමාන ඇමතිතුමිය -පවිත්‍රාදේවී වන්නිආරච්චි මැතිනිය- මේ ආයතනය බාර ගත්ත නිසා විදුලි බිල වැඩි කරන්න සිද්ධ වුණාය කියන පුහු තර්ක බංකොලොත් විපක්ෂය ජනතාවට ඉදිරිපත් කරන අවස්ථා අපි දැක්කා. අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, පවිත්‍රා ඇමතිතුමිය නොවෙයි කවුරු අමාත්‍යාංශය බාර ගත්තත්, කවුරු විදුලිබල මණ්ඩලයට නායකත්වය දුන්නත්, මේ පාඩුව නැති කර ගැනීම සඳහා පැහැදිලි විකල්ප වැඩ පිළිවෙළකට යා යුතුව තිබෙන බව. ඒ වාගේම අපි කියන්න ඕනෑ, මේ තත්ත්වය අපි ජාතික වශයෙන් කල්පනා කර බලන්න ඕනෑ බව. දේශපාලන කෝණවලින් බලලා, දේශපාලන පක්ෂ හැටියට බලලා අපි මේ ගැන සාකච්ඡා කරනවා නම්, මා හිතන හැටියට ඒක පදනම් විරහිතයි. හැබැයි දේශපාලන වශයෙන් කියන්න එනවා නම් අපිත් කියන්න සූදානම්. එක්සත් ජාතික පක්ෂයේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා අද මේ සභාවට බොරු ගොඩක් කිව්වා. ගරු නියෝජ්‍ය

කාරක සභාපතිතුමනි, මම බොහොම පැහැදිලිව වගකීමෙන් කියනවා, එතුමා ඒ ඉදිරිපත් කරපු සංඛ්‍යා ලේඛන සියයට 80ක් බොරු කියලා. හැබැයි, එතුමා කියපු කවියේ අවසාන පද දෙක එතුමා කිව්වේ නැහැ.

"ඔවා දෙනු පර හට -තමා සම්මතෙහි පිහිටා සිට" කියන පද දෙක කිව්වත් අනික් පද දෙක කිව්වේ නැහැ. "දුසිරිත් දනන් දෙන - ඔවා වැද්දන් කියන බණ වැනි" කියන පද දෙක එතුමා කිව්වේ නැහැ. අපි සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට ඒක කියන්න කැමැතියි. තමුන්නාන්සේලා අමතක කරන්න එපා, 1982 තමයි ලංකාවේ පළමුවැනි -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Member?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්ථාවර නියෝගවලට අනුකූලව, මම එක කාරණයක් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඔබතුමා ඕනෑ නම් මහ ලේකම්තුමාගෙන් අහන්න. You cannot impute improper motives to any Member. That is in the Standing Orders. He called me a

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

and he said that I had presented wrong facts. So, I respectfully request you -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If there is anything against the Standing Orders, that will be expunged from Hansard. Hon. Shantha Bandara, you carry on with your speech.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන් 1982 දී තමයි කිව්වේ සාම්පූර් තාප විදුලි බලාගාරය ඉදි කරන්න ඕනෑ කියලා. ඒ වෙලාවේ තාප විදුලි බලාගාරය ඉදි කරන්න එක්සත් ජාතික පක්ෂය කටයුතු කළේ නැහැ. ඒකයි අපි කියන්නේ එයාලාගේ පව් අද අපිට ගෙවන්න සිදු වෙලා තිබෙනවාය කියලා. ඊ ළඟට, දකුණේ මාවැල්ලේ තාප විදුලි බලාගාරයක් ආරම්භ කරන්න ගියා. නමුත් තමුන්නාන්සේගේ පියාණන් -ප්‍රේමදාස මැතිතුමා- එදා එය හකුළා ගත්තා. ඒ තාප විදුලි බලාගාරය එදා දකුණේ ඉදි කළේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කවුද එදා විරුද්ධ වුණේ?

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
එදා ඒක ඉදි කළා නම් අද අපට මේ තත්ත්වයට මුහණ දෙන්න වෙන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කවුද එදා විරුද්ධ වුණේ?

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
එදා කණ්ඩායමක් විරුද්ධ වුණා. කවුරු විරුද්ධ වුණත්,- [බාධා කිරීමක්] විරුද්ධ වුණේ බී.වයි. තුඩාවේ මහත්මයා. දකුණු පළාත් සභාවේ විපක්ෂ නායක වශයෙන් හිටපු බී.වයි. තුඩාවේ මහත්මයා තමයි එදා විරුද්ධ වුණේ. පළාත් සභාවක විපක්ෂ නායකවරයකු විරුද්ධ වුණාය කියලා මේ වාගේ ජාතික වැඩ පිළිවෙළක් පස්සට ගන්න නායකයෝ ඉන්නවාද? එහෙම කරලා රටක් ඉස්සරහට ගෙනයන්න බැහැ. ඒකට හොඳම උදාහරණය තමයි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. නොරොච්චෝලේ තාප බලාගාරය ඉදිකරන්න යනකොට සමහර අය කිව්වා, "හකුළා ගනිව්" කියලා. හකුළා ගත්තාද? සමහර අය ආගමික වශයෙන් ආවා. ඒත් හකුළා ගත්තේ නැහැ. සමහර අය දේශපාලන වශයෙන් ආවා. ඒත් හකුළා ගත්තේ නැහැ. තමුන්නාන්සේලා අමතක කරන්න එපා, එහෙම නොකළා නම් අද තමුන්නාන්සේලාට පැය හතක් අඳුරේ ඉන්න වෙන බව. නොරොච්චෝලේ තාප බලාගාරය හදන අභියෝගයට මුහුණ දීලා, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් ඒක ආරම්භ කරපු නිසා තමයි අද මේ කලාපයේ අඳුරේ ඉන්නේ නැති රටක් බවට ශ්‍රී ලංකාව පත් වෙලා තිබෙන්නේ. දේශපාලනමය වශයෙන් අපට ගහනවා නම් අපිත් ඒවා කියන්න කැමැතියි. අමතක කරන්න එපා, තමුන්නාන්සේලා 1979 දී සියයට 76කින් විදුලි බිල වැඩි කළා. 1980 දී සියයට 100කින් වැඩි කළා. මේවා අසත්‍ය නම් කියන්න. වගකීමෙන් යුතුවයි අපි මේවා කියන්නේ. 1980 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විදුලි මිල සියයට 100කින් වැඩි කළා. ඒ වාගේම 1981 දී සියයට 67කින් වැඩි කළා. [බාධා කිරීමක්] මන්ත්‍රීකම්, ඇමතිකම් දමලා තමයි අපි මේවාට ඇවිල්ලා ඉන්නේ. අපි ඒක බලා ගන්නම්. තමුන්නාන්සේ වාඩි වෙන්න. 1979 දී, 1980 දී, 1981 දී සියයට 67කින්, 1982 දී සියයට 50කින් වැඩි කළා. තමුන්නාන්සේලාගේ 2002 - 2004 කාලයේ පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තමයි ඊට පසුව වැඩියන්ම විදුලි මිල වැඩි කළේ. 2001 දී සියයට 21යි, 2002 දී සියයට 32යි. දැන් අපි වැඩි කරලා තිබෙන්නේ කොච්චරක්ද? සියයට 18කින් වැඩි කරන්න තමයි අපි දැන් යෝජනා කරලා තිබෙන්නේ. මේ වනකොට අපි යෝජනා කරලා තිබෙන්නේ සියයට 18කින් වැඩි කරන්නයි. සහන විශාල ප්‍රමාණයක් ලබා දෙන ගමන් තමයි ඒකත් යෝජනා කර තිබෙන්නේ.

අපේ කාලයේදී විතරක් නොවෙයි,1981 දීත් මේ රටේ විදුලිය කප්පාදු කර තිබෙනවා. 1983, 1984, 1987, 1992, 1994, 1996, 2001, 2002 කියන මේ හැම අවුරුද්දකම විදුලිය කපා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා ඒවා අමතක කරන්න එපා. දේශපාලන වශයෙන් මේවා ගැන කථා කරන්න එනවා නම් අපි දේශපාලන වශයෙන් කථා කරමු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ මොන දේ කථා කළත් අනිවාර්යයෙන්ම අපට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, මැයි පළමු වැනි දා බොරු කියන දිනය කියලා. මැයි පළමු වැනි දා නොවෙයි, අද මැයි නව වැනි දා බොරු කියන දිනය බවට පත් කළා, මේ

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

පාර්ලිමේන්තුව. ඇයි ඒ? එතුමා කියපු බොරුවලට මම එක උදාහරණයක් කියන්නම්. Lanka Transformers Limited කියන්නේ විදුලිබල මණ්ඩලයේ තිබෙන ආයතන හතරෙන් එකක්. ඒකෙන් සියයට 63ක් විදුලිබල මණ්ඩලය සතුව නැහැ කියලා එතුමා කිව්වා. අපි වගකීමෙන් කියනවා, ඒක සම්පූර්ණ අසත්‍යයක්. විදුලිබල මණ්ඩලයට එහි සියයට 63ක කොටස් තිබෙනවා. [බාධා කිරීමක්] සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා තමයි කිව්වේ. මම බොහොම පැහැදිලිව එතුමාට කියනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බොරු කියලා නැහැ කියලා. නිදහසින් පසුව මේ රටේ බිහි වෙච්ච නායකයන් මැතිවරණයකට ඉදිරිපත් වෙනකොට දීපු පොරොන්දු දිහා බැලුවාම, එතුමා තමයි මහින්ද චින්තනයෙන් ජනතාවට දුන්නු පොරොන්දු සියයට සියයකට ආසන්න ප්‍රමාණයක් ඉටු කරපු එකම නායකයා. ඒ අන්දමට පොරොන්දු ඉටු කරපු ආසියානු කලාපයේ සිටින එකම නායකයාත් එතුමායි. එතුමා මේ රටේ පැවති යුද්ධය අවසන් කරනවාය කිව්වා; යුද්ධය අවසන් කළා. හම්බන්තොට වරාය හදනවාය කිව්වා; වරාය හැදුවා. මත්තල ගුවන් තොටුපොළ හදනවාය කිව්වා; ගුවන් තොටුපොළ හැදුවා. ජාත්‍යන්තර ක්‍රීඩාංගන හදනවාය කිව්වා; ජාත්‍යන්තර ක්‍රීඩාංගන හැදුවා. තමුන්නාන්සේලාට සිහිනයක් වෙලා තිබුණු අධිවේගී මාර්ගය හදනවාය කිව්වා; අධිවේගී මාර්ගය හැදුවා. තමුන්නාන්සේලා ඒවාට ඊර්ෂ්‍යාවෙන් කථාකරන්න එපා. ඕවා කියලා තමයි විපක්ෂය දවසින් දවස බංකොලොත් වෙලා මැතිවරණවලින් පරාජයට පත් වෙවී ආපස්සට යන්නේ. ඒ නිසා අපි යථාර්ථය කථා කරන්න ඕනෑ. ජාතික විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා, පාඩුව අවම කර ගැනීම සඳහා අපි මොකක්ද කළ යුත්තේ? ඉන්ධන භාවිතයෙන් විදුලිය නිෂ්පාදනය කරන එක අඩු කරන්න ඕනෑ.

ඒ වාගේම දැවිතෙල් භාවිතයෙන් විදුලිය නිෂ්පාදනය කරන එක අඩු කරන්න ඕනෑ. ඒ වාගේම පෞද්ගලික අංශයෙන් අධික මිලට විදුලිය ලබා ගැනීම අඩු කරන්න ඕනෑ. එහෙම නම් කොහොමද මේක කරන්නේ? අපි තාප විදුලිය නිෂ්පාදනයට යන්න ඕනෑ. එදා එක්සත් ජාතික පක්ෂයට කරන්න බැරි වුණු සාම්පූර් විදුලි බලාගාරයේ වැඩ කටයුතු අපි වහාම ආරම්භ කළ යුතුව තිබෙනවා. ඒ නිසා අපේ අතිගරු ජනාධිපතිතුමා, අද මේ විෂය භාරව කටයුතු කරන අපේ රටේ දක්ෂ දේශපාලනඥවරියක් හැටියටත්, නියෝජ්‍ය අමාත්‍යවරියක්, අමාත්‍යවරියක් හැටියටත්, කැබිනට් අමාත්‍යවරියක් හැටියටත් සෑම ක්ෂේත්‍රයකම වාගේ විශාල වැඩ කොටසක් කරපු නායිකාවක් -[බාධා කිරීම්] ඇයි මොකද? තමුන්නාන්සේලාට අපි කියන්න ඕනෑ, අද මාතලේ ඇටකටු ගොඩ ගත්තා වාගේ නොවෙයි, සූරියකන්දෙ ඇටකටු ගොඩ ගත්තේ පවිත්‍රා වන්නිආරච්චි මැතිනිය. තමුන්නාන්සේලා අමතක කරන්න එපා. අද මේ නිකම් මාතලේ පහුරු ගානවා. අද මාතලේ පහුරු ගානවා වාගේ නොවෙයි. ඒ විධියට නිර්භීතව දේශපාලනයට ඇවිල්ලා අද එතුමිය කටයුතු කර ගෙන යනවා. ඒ නිසා තමුන්නාන්සේලාට අපි කියන්නේ එතුමියගේ නායකත්වය තුළ ඊළඟට අපි නොරොච්චෝලේ බලාගාරයේ දෙවන අදියර මෙගාවොට් 300, තුන්වන අදියර මෙගාවොට් 300 නිපදවලා ඒ මෙගාවොට් ප්‍රමාණය ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමත් එක්ක ඉන්ධන ගැළපුම් ගාස්තු අඩු කරලා අපට සහනයක් ලබා දෙන්න පුළුවන් බවයි.

අවසාන වශයෙන් කියනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අවධානය මේ කෙරෙහි යොමු වෙලා තිබෙන බව. තාමත් පැහැදිලි තීන්දුවක් ගත්ත නැති දේකට තමයි තමුන්නාන්සේලා ජනතාවට බිල්ලෙක් මවන්න හදන්නේ. එහෙම ජනතාව භය කළත්, අපේ රටේ ජනතාව බුද්ධිමත් ජනතාවක් හෙයින් භය වෙන්නේ නැහැයි කියන එක තමුන්නාන්සේලාට මතක් කරමින් මම නිහඬ වනවා.

[අ.භා. 4.03]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද විදුලි බිල ගැන කථා කරන අවස්ථාවේදී මුලින්ම මේ ගාස්තු ගැන මම වචනයක් කියන්න ඕනෑ, අනෙක් අය අනෙක් කරුණු කථා කළා.

මට ප්‍රථමයෙන් කථා කළ මහින්දානන්ද අලුතගමතිතුමා කිව්වා, මේ රජය හැම එකකටම සහන දෙනවා කියලා. ඒක ඇත්ත. ඒක ඇත්ත වෙන්නත් ඕනෑ. මොකද, මහින්ද චින්තනයේත් තිබෙන්නේ සහන දීලා අපි මේ රජය ගෙන යනවා කියලා. එසේ සහන දීමට තමයි මේ ජනතාව ඡන්දය දුන්නේ. අද ඒ සහනය නැති කිරීම පිළිබඳවයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. මේ විදුලි බිල වැඩි වෙනවාද, අඩු වනවාද, මොනවාද වෙන්නේ කියන එක තවම පැහැදිලි නැහැ. මොකද, මහජන උපයෝගිතා කොමිෂන් සභාව එදා අනුමත කළේ විශාල වැඩි වීමක්. ඇත්තටම මොකක්ද වුණේ? ඉස්සෙල්ලා විදුලි බිල වැඩි කරනවායි කිව්වා.

මට මතක් වෙනවා, මේක හරියට අලුත් අවුරුද්දට මාසයක් විතර තියලා කඩකාරයා මිල ඉහළට යැවීම වාගේ. මිල ඉහළට යවලා අලුත් අවුරුද්ද ළඟ වෙන කොට මිල පහළට දාලා "sale" කියලා board එකක් දාලා අපිව ඒ sale එකට යොමු කරවනවා. ඉතින් අපි අම්මලා, අක්කලා එක්ක sale එකට ආවාම අපට හිතෙනවා, අපට ලොකු සහනයක් ලැබෙනවා කියලා. ඊට පස්සේ අලුත් අවුරුද්දට සාරියක් ගන්න, සරමක් ගන්න අවශ්‍යව තිබුණා නම් එකක් වෙනුවට දෙකක් ගන්න බලාපොරොත්තුවෙන් කඩ සාප්පුවට යනවා. ඔහොම දෙයක් තමයි විදුලි බිල ගැන සිදු වුණේ. විශාල වැඩි වීමක් මාසයකට උඩදී යෝජනා කරලා, මැයි පළමුවන දා ජනාධිපතිතුමා මැයි දින රැළිය භාවිත කරලා කිව්වා, "අපි මේ විදුලි ගාස්තු අඩු කරන්න යනවා" කියලා. ඒකේ ප්‍රතිඵල එන තෙක් තමයි අපි තාමත් බලාගෙන සිටින්නේ, මොකක්ද මේ අවසාන යෝජනාව කියලා.

ඒ විතරක් නොවෙයි, විදුලි ගාස්තු වැඩි කරන කොට එක block එකකින් තවත් block එකකට, increasing block tariff එකෙන් volume-differentiated tariff එකකට ගියා. ඒ කියන්නේ ඉස්සර ඒකක 0-30 වන තෙක් පරිභෝජනය කළා නම් ඒකට රුපියල් 3ක්, ඒකක 30-60ට පරිභෝජනය කළා නම් රුපියල් 4.70ක් අනුව තමයි ගණනය කළේ. දැන් අවසාන ඒකකය බලලා -ඒ ගොල්ලන්ගේ අය කිරීම රුපියල් හයක් හෝ හතක් වෙන්න පුළුවන්.- මුළු එකම ඒ ගණනින් වැඩි කරලා විශාල වැඩි වීමක් විදුලි බිලට ඇති කරනවා. මෙහෙම විදුලි බිලට විශාල වෙනසක් ඇති කරන්නේ මේ රජයට මේ පාඩුව පිරිමහගන්න බැරි නිසායි.

තිලක් සියඹලාපිටිය ආචාර්යතුමා සඳහන් කළා, විදුලි මීටරය කියන තැනැත්තා මීටරය කියවන්නට බැරි වෙලාවක්වත් උදේට එන්නේ නැතිව හවසට ආවොත් විදුලි බිලේ රුපියල් 2,500ක වෙනසක් එක මාසයකට තිබෙන්න පුළුවන් කියලා. ඒක පෙරේදා පත්තරයේ තිබුණා.

රාජ්‍ය පාර්ශ්වයෙන් ආචාර්ය තිලක් සියඹලාපිටිය නැවත නැවත ඒ ගැන කියපු නිසා ඔහු කියපු තවත් කොටසකුත් මා මේකට එකතු කරන්නට කැමැතියි.

ඒ විතරක් නොවෙයි අපට පෙනෙනවා දැන් මෙතැන ලොකු ප්‍රශ්නයක් තිබෙන බව. මහ ජනතාව මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ගියා. මොකද, පත්තරවලින් දැනුවත් කළා ඒ

යෝජනාවට ප්‍රතිචාර දක්වන්න ඕනෑ නම් පැමිණෙන්න කියලා. ලිඛිත ප්‍රතිචාර 200ක් විතර තිබුණා. ඒ වාගේම වාචිකව 70 දෙනෙකු ඉදිරිපත් වෙලා යෝජනා ඉදිරිපත් කළා. ඒ මහ ජනයාගේ යෝජනා, විද්වතුන්ගේ යෝජනා, විදුලිය පරිභෝජනය කරන ජනතාවගේ යෝජනා, දේශපාලනඥයන්ගේ යෝජනා නොතකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව ලංකා විදුලිබල මණ්ඩලයෙන් දුන්නු යෝජනාව අනුමත කළා. ඒක අනුමත කරලා ඊට පස්සේ මැයි පළමු වැනිදා ජනාධිපතිතුමා ඒ යෝජනාව ප්‍රතික්ෂේප කරලා තවත් යෝජනාවක් ඉදිරිපත් කරනවා. දැන් බලන්න මෙතැන සිදු වුණු දේ. මහජන උපයෝගීතා කොමිෂන් සභාව තිබෙන්නේ අධීක්ෂණය කිරීමටයි. ඒවා ස්වාධීන අධීක්ෂණයට තිබෙන සභාවන්. මොනවාද දැන් මේකෙන් වෙලා තිබෙන්නේ. දේශපාලනීකරණයක් වෙලා තිබෙනවා. ඇයි, ඒ කොමිෂන් සභාවේ යෝජනාව ප්‍රතික්ෂේප කරලා ජනාධිපතිතුමා ඉදිරිපත් වෙලා අලුත් යෝජනාවක් කරනවා. ස්වාධීනත්වය නැවතත් නැති වෙලා තිබෙනවා කියලා සඳහන් කරන්න ඕනෑ. ඊට වැඩිය හොඳයි විද්වතුන්ට, විශ්වවිද්‍යාලවල අයට මාධ්‍ය හරහා කිව්වා නම්, ඉදිරිපත් කරන යෝජනා ජනාධිපතිතුමාට ගිහිල්ලා ඉදිරිපත් කරන්න කියලා. මොකද, මේ වාගේ බොරුවට මහජන උපයෝගීතා කොමිෂන් සභා තියන්නේ නැතුව. ඒ කොමිෂන් සභාවල වැඩ කරන විද්වතුන් දැන ගන්නට ඕනෑ, ඔබතුමන්ලා නිසා තමයි කොමිෂන් සභාවල ස්වාධීනත්වය නැති වෙලා තිබෙන්නේ කියලා. ඔබතුමන්ලාට ලජ්ජාවක් තිබෙනවා නම් ඉල්ලා අස් වන්න ඕනෑ. ඒ තනතුරුවලින් ඉල්ලා අස්වන්නට ඕනෑ. එතකොට තමයි අපට ස්වාධීනත්වය ඇති කරන්න පුළුවන් වන්නේ.

අපට පෙනෙනවා විදුලි බිලේ අඩු කිරීමක් සිදු වුණේ නැති බව. වැඩි කිරීමක් පමණයි සිදු වෙලා තිබෙන්නේ. අප්‍රේල් 20වැනිදා බිල, මැයි 20වැනිදා බිලත් එක්ක සැසඳුවාට පස්සේ අපි තර්ක කරමු විදුලි බිල අඩු වුණාද වැඩි වුණාද කියලා. වැඩිවීමක් පමණයි තිබෙන්නේ. මේ "සහනය" කියන වචනය වැරදියි. එය නිවැරදියි ලෙස සිතා අර්ථ කථනය කරන්නට එපා. පාරිභෝගිකයා බලන්නේ මට ඉස්සර ලැබුණු බිලයි, ඊළඟට ලැබෙන බිලයි අතරේ වෙනසක් තිබෙනවාද, ඒකේ අඩු වැඩි වීමක් තිබෙනවාද කියලායි. අනෙක් තර්කවලින් කිසිම වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා දන්නා විධියට 2009න් පස්සේ ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. ඒ විතරක් නොවෙයි. 2007, 2008, 2009 හා 2010 ඉදිරිපත් වුණු වාර්තාවල qualification එකක් තිබෙනවා. ඒ වාර්තා තුළ විගණකාධිපතිතුමාගේ සටහන් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ලංකා විදුලිබල මණ්ඩලයේ විගණන කමිටුවේ රැස්වීම් 2011දී 6ක් තිබුණා. 2012දී 4ක් තිබුණා. ඒකෙන්ම පෙනෙනවා ඒ අයට මේක හරියට කළමනාකරණය කර ගන්නට බැහැ කියලා. ලංකා විදුලිබල මණ්ඩලයේ අලාභය පසු ගිය අවුරුද්දේ විතරක් රුපියල් බිලියන 60කට කිට්ටු වෙන්න යනවා. අපි පොහොර සහනාධාරයට දෙන්නේ රුපියල් බිලියන 27යි. නමුත් දෙගුණයකට වැඩි අලාභයක් තිබෙනවා ලංකා විදුලිබල මණ්ඩලයේ. ඉතින් මෙවැනි අලාභ තිබෙන කොට, මෙවැනි දුසැරියක් තිබෙන කොට මේ විගණන-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon.Udith Lokubandara to take the Chair?

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (බනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Petroleum Industries)
I propose that the Hon.Udith Lokubandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙවැනි විශාල අලාභ තිබෙන කොට විගණන කමිටු රැස්වීම් මෙපමණ අඩු ප්‍රමාණයක් පැවැත්වීම ගැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා.

ඊළඟට මා කියන්නට කැමැතියි විශේෂයෙන්ම පෞද්ගලික විදුලි සැපයුම් ව්‍යාපාර ගැන. එවැනි ව්‍යාපාර 11ක් තිබෙනවා.

ඒ වාගේම PPAs - Power Purchase Agreements - අත්සන් කරලා තිබෙනවා. මා මේ කියන දේ වැරැදි නම්, ඇමතිතුමිය කථා කරන කොට එය නිවැරැදි කරන්නට පුළුවන්. 2002 - 2004 රජය කාලයේදී, එනම් 2003 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ 05වන දා හෙළ දනවි බලාගාරය සම්බන්ධයෙනුත්, 2003 සැප්තැම්බර් මාසයේදී ඇඹිලිපිටිය ඒස් බලාගාරය සම්බන්ධයෙනුත් Power Purchase Agreements අත්සන් කරලා තිබෙනවා. අනික් හැම PPA එකක්ම අත්සන් කරලා තිබෙන්නේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේදී හෝ චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිනියගේ කාලයේදීයි. දැන් එක් එක් අය නැඟිටලා කිව්වා, එක්සත් ජාතික පක්ෂය කාලයේ අත්සන් කරපු ඒවා කියලා. අපි ඒවා හදිසියෙන් අත්සන් කළ බව පිළිගන්නවා. මොකද, සෘණ ආර්ථිකයක් තිබුණු අඳුරු යුගයකයි 2001 දී අපි රජය භාර ගත්තේ. ඒ රජය භාර ගත්තාට පස්සේ අපට හදිසියෙන් ක්‍රියාත්මක වෙන්නට වුණා.

2007 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් කොටසක් කියවන්නට මා කැමැතියි. මේ 2007 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව ඒ රජය කාලයේදී තිබුණු වාර්තාවයි. විදුලිය උත්පාදනයේදී රාජ්‍ය, පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳව සටහන් ඒ වාර්තාවේ තිබෙනවා. ඒකෙන් කෙටි සටහන් කිහිපයක් මා උපුටා ගෙන තිබෙනවා. මෙය සඳහන් වන්නේ එම වාර්තාවේ 68වන පිටුවේයි. 2007 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ 68වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

"පමා වීමේ ගාස්තු අය කිරීමක් මගින් ගෙවීම් පමා කිරීම වෙනුවෙන් දඩ අයකරනු ලැබේ"

ලංකා විදුලිබල මණ්ඩලයට අලාභ ඇති වීම පිළිබඳවත්, පෞද්ගලික අංශයට ලාභ ඇති වීම පිළිබඳවත් තමයි මේ වාර්තාවේ සඳහන් වන්නේ. එම පිටුවේම තවදුරටත් මෙසේද සඳහන් වනවා:

"පවත්නා විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම්වල පවතින දුර්වලතා හේතුකොට ගෙන විදුලිබලය සපයන පෞද්ගලික අංශයේ ආයතන සහතික කරන ලද ලාභ ප්‍රතිශතයට වඩා ඉහළ ලාභ, ලබා ගන්නේ, මහ ජනතාවට එහි බර පටවමිනි."

එය අපේ වාර්තාවක් නොවෙයි; විපක්ෂයේ වාර්තාවක් නොවෙයි; ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවයි. කබ්රාල් වාර්තාව වෙන්න ප්‍රථමයෙන් තිබුණු ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවෙන් තමයි මා දැන් කියවන්නේ.

ඒ විතරක් නොවෙයි. එම පිටුවේම තවදුරටත් මෙසේ සඳහන් කරනවා:

"කෙසේ වුවද, -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
"කෙසේ වුවද, පවතින රාජ්‍ය - පෞද්ගලික ගිවිසුම් යටතේ සියලුම වත්කම්වල හිමිකාරිත්වය විදුලිබලය සපයන පෞද්ගලික අංශයේ ආයතනවලට ලබාදේ."

වරදක් සිද්ධ වෙලා තිබුණා නම් එය හරිගස්සන්න අවස්ථාවක් තිබුණා. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් මෙය පෙන්වා දුන්නා. නමුත් ඒක කරන්න ලෑස්ති වුණේ නැහැ. මේ ක්‍රමයටම තව-තව PPAs අත්සන් කර ගෙන ගියා. ඒවා නිවැරැදි කිරීමෙන් පමණක් රුපියල් බිලියන 6ක -අද මුදල්වලින් රුපියල් බිලියන 12ක් හෝ 13ක්- මුදලක් බේරා ගන්න තිබුණාය කියලා මේ වාර්තාවේම සඳහන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින වැඩිදුර කථා කරන්න වෙලාව නැති නිසා මා සඳහන් කරනවා, පමණයි. ලංකාව විදුලි බලය අඩුවෙන්ම පරිභෝජනය කරන පාරිභෝගිකයා වන නමුත් අනිකුත් සෑම අංශයකින්ම වාගේ දකුණු ආසියාවේ ඉහළම මට්ටමේ මිලක් තිබෙන විදුලි බලය තිබෙන්නේ ලංකාවේයි. එපමණක් නොවෙයි. කෙරවලපිටිය -වෙස්ට්කෝස්ට්- බලාගාරය සමඟ අත්සන් කර තිබෙන මේ PPA එක සභාගත කරන්න කියලා මා ඔබතුමන්ලාට අභියෝගයක් කරනවා. මේ පළාතේ විතරක් නොවෙයි, ලෝකයේම වැඩිම මුදලට ගන්න විදුලි බලය තිබෙන්නේ ලංකාවේ කියලා මා අභියෝග කරනවා. පුළුවන් නම් ඒක එහෙම නොවෙයි කියලා තර්කයෙන් පෙන්වන්න. මේ වාගේ දූෂණය නිසාත්, කළමනාකාරිත්වයේ වැරැදි නිසාත් අද පාරිභෝගිකයා අසරණ වෙලා, ඒ අයට විදුලිය සඳහා වැඩි මුදලක් ගෙවන්නට සිද්ධ වෙලා තිබෙනවා. රජය බැඳී සිටිනවා, විදුලිය සපයන්න. මොකද, එකම ආයතනයකින් විදුලිය ගන්න තිබෙන නිසා. මහජන උපයෝගිතා කොමිෂන් සභාවත්, විපක්ෂයත් බැඳී සිටින්නට ඕනෑ, පාරිභෝගිකයා ආරක්ෂා කරන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මා අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තව එක දෙයක් මෙහිදී සාකච්ඡා කරන්න බැරි වුණා. ලංකා විදුලි බල මණ්ඩලයට සාමූහික සමාගම්, එහෙම නැත්නම් සහෝදර සමාගම්, අනුසමාගම් 16ක් තිබෙනවා. මේ සමාගම් 16 ගැනත්, එහි තිබෙන අක්‍රමිකතාවන් ගැනත් අපි සොයා බලන්නට ඕනෑ. මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ගරු අනුර ප්‍රියදර්ශන යාපා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.17]

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Petroleum Industries)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතාමත්ම වැදගත් සාකච්ඡාවකයි අද දින නියැලිලා ඉන්නේ. විදුලි බලයේ ඉතිහාසය ගැන කථා කරනවා නම් මට මතකයි, අපි බලයට ආපු 1994 අවුරුද්දේ මුළු ලංකාවේ විදුලි බලය තිබුණේ සියයට 34ක්, 36ක් වාගේ ප්‍රමාණයක් බව. නමුත් අද වෙන කොට සියයට 90, සමහර තැන්වල සියයට 95 සමහර තැන්වල සියයට 97 ඉක්මවපු විදුලි බල ප්‍රමාණයක් අපි ගම්වල ජනතාවට ලබා දීලා තිබෙනවා. මෙයින් වැඩි පුරම ප්‍රතිලාභ ලබන්නේ ගම්වල ඉන්න සාමාන්‍ය ජනතාවයි. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා තාප විදුලි බලාගාර ගැන ප්‍රශ්න මතු කෙරුවා. නමුත් ඔබතුමා කිව්වේ නැහැ, යම් විධියකින් ඒවා නොගත්තා නම් කොහෙන්ද අපි විදුලි බලය දෙන්නේ කියලා. දෙන එකයි, ගන්න එකයි කියන දෙකක් මෙතැන තිබෙනවා. මේ පිළිබඳ මූලික ප්‍රතිපත්ති හැදුවේත් එක්සත් ජාතික පක්ෂය 1993 වර්ෂයේදී. 1993 වර්ෂයේ තමයි IMF ආයතනයටත්, ලෝක බැංකුවටත් කිව්වේ, මෙතැන් පටන් අපි විදුලි බලය ලබා ගැනීම සඳහා ජනතය කිරීමේ මධ්‍යස්ථාන රජය විසින් පිහිටුවන්නේ නැහැ කියලා. ඒ තීන්දුව ගත්තේ එදා. එදා ඉඳලා තමයි මේ තාප විදුලි බලාගාර නිර්මාණය වුණේ. මම මේක වැරැදියි කියලා කියනවා නොවෙයි. නමුත් හැම රජයකටම ඇති වුණු ප්‍රශ්නය මෙයයි. ඉල්ලුමක් තිබුණා. ඉල්ලුම දිය යුතුව තිබුණා. ඒ ලබා දෙන මාර්ගය තෝරා ගැනීම සඳහා වන කාර්යයට ඕනෑම රජයක් මුහුණ දෙමින් ඉන්නවා. ඔබතුමන්ලා දන්නවා, අපේ රටේ මැන භාගයේ ඇති වුණු විශාලම පෙරළිය ඇති කළේ අතිගරු ජනාධිපතිතුමා බව. අවුරුදු 10කට, 16කට වැඩි කාලයක් ලංකාවේ ගල් අඟුරු බලාගාරයක් ගැන කථා කර කර හිටියා. කවුරුවත් ඒකට ඉදිරිපත් වුණේ නැහැ. බොහෝ දෙනෙක් ඒ ප්‍රශ්නය මහ හැරියා. ගරු කරු ජයසූරිය මැතිතුමා 2001 ආණ්ඩුවේ විදුලිබල හා බලශක්ති ඇමතිවරයා වුණු වේලාවේ කොත්මලේ බලාගාරය - ගල් අඟුරු බලාගාරයක් අත හැරියා.- කරන්න දුන්නේ නැහැ. ඊළඟට කොත්මලේ බලාගාරය හදන්න සියලුම කාඩ් පවා ගහලා අන්තිම දවසේ ඒක අවලංගු කෙරුවා. හෙට උත්සවය තිබුණා නම්

අද අවලංගු කෙරුවා. මේක තමයි එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසය. මම හිතනවා, ලංකාවේ විදුලි බලය දෙන කොට ජනනය ගැන කථා නොකර ඉන්න බැහැ කියලා. ඕනෑම දෙයක් දෙන කොට ජනනය ගැන කථා කරන්න ඕනෑ.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
මහවැලිය ගැන මොකක්ද කියන්නේ?

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(මාණ්පුමිකු අනුර පිරියදර්ෂන යාප්පා)
(The Hon. Anura Priyadharshana Yapa)
මහවැලිය හොඳයි. අපි නරකයි කියන්නේ නැහැ නේ. මහවැලි ව්‍යාපාරයත් තමුන්නාන්සේලා ගෙනාපු හොඳ ව්‍යාපාරයක්. නමුත් මතක තියා ගන්න ඉල්ලුම පුළුල් වෙන කොට ඒකට අවශ්‍ය ජනන ක්‍රමවේදය පිළිබඳ වැදගත්ම තීන්දුවක් මේ දශක දෙක හෝ දශක තුන ඇතුළේ ගත්තේ අතිගරු ජනාධිපතිතුමා බව. ඒ තමයි නොරොච්චෝලේ බලාගාරයේ නිෂ්පාදනය ආරම්භ කිරීම. විදුලිබල මණ්ඩලය පවසන අන්දමට මේ අවුරුද්දේ අන්තිම වෙන කොට එහි දෙක සහ තුන කියන අංශ දෙකම ක්‍රියාත්මක වුණොත් තවත් මෙගාවොට් 600ක් අපේ විදුලිබල පද්ධතියට එකතු වෙනවා. ඊ ළඟට අපි ඉදිරිපත් කරලා තිබෙන සාම්පූර් ගල් අඟුරු බලාගාරයත් එක්ක අපේ විදුලිබල පද්ධතියට තවත් මෙගා වොට් 500ක් එකතු වෙනවා. මම මේක ඉතාමත් පටු දේශපාලන තර්කයකට ගෙනෙන්න හදන්නේ නැහැ. කවුරු වැරදි, කවුරු හරි කියලා හොයනවාට වඩා මට වුවමනා කරන්නේ මේ ජනන ක්‍රමවේදය පිළිබඳව තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරවන්නයි.

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා ඕක අත්සන් කරන්න බැහැ කිව්ව නේද?

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(මාණ්පුමිකු අනුර පිරියදර්ෂන යාප්පා)
(The Hon. Anura Priyadharshana Yapa)
ඒක එහෙම නැහැ. එහෙම එකක් නැහැ. මම ඒක ගැන දන්නේත් නැහැ. එහෙම දෙයක් වෙන්න බැහැ නේ. ඒ කාලයේ කථා කෙරුවේත් මෙගාවොට් 900ක් ගැන. අද අපි කථා කරන්නේත් මෙගාවොට් 900ක් ගැන. ඒ නිසා ඒ තර්කය මට පිළිගන්න බැහැ. අද තමුන්නාන්සේලා හුඟ දෙනෙකු මිලක් ගැන එල්ලිලා ඉන්නවා. ඒක තමුන්නාන්සේලාගේ දේශපාලන සටන් පාඨයක්. බොහොම කාලයකට පස්සේ සටන් පාඨයක් නැති පිපාසයෙන් පෙළුණු තමුන්නාන්සේලාට සටන් පාඨයක් ලැබිලා තිබෙනවා. ඒ සටන් පාඨය අරගෙන දේශපාලන වශයෙන් කථා කරන එක විතරක් ඇත්ත නොවෙයි. ඇත්ත කථාව තිබෙන්නේ, අපි ජනනය කොහොමද කරන්න ඕනෑ කියන එක තුළයි. අපි අද විදුලිබල මණ්ඩලය තමන්ගේ ජනනයෙන් විශාල ප්‍රමාණයක් කරන්නේ තාප විදුලියෙන්. අපි ඒක පිළිගන්න ඕනෑ. ඒ නිසා විදුලිබල මණ්ඩලය අලාභ ලබනවා විතරක් නොවෙයි, විදුලිබල මණ්ඩලය නිසා ලංකා ඛනිජ තෙල් සංස්ථාවත් අලාභ ලබනවා. ඒ විදුලි බල මණ්ඩලය- [බාධා කිරීමක්] ඉන්න මම කියන කල්. මම දන්නවා, ඔබතුමා කියන්න හදන්නේ මොකක්ද කියලා. මම ඒ ගැන කථා කරන්නම්. මම තමුන්නාන්සේලාට කියන්නේ, මේ අංශය කළමනාකරණය කිරීමේදී අපි කල්පනා කරන්න ඕනෑ එක විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න යන වියදම කොච්චරද කියලා.

ඒ විදුලි බල නිෂ්පාදනයේදී සාමාන්‍ය ජනතාවට සහනයක් වෙමින් ඒ සඳහා අවශ්‍ය කරන මුදල ලබා ගන්නේ කොහොමද කියන තර්කයේ තමයි අද අපි ඉන්නේ. මේක තමයි මේ විදුලි බල ගාස්තු සංශෝධනයේ ප්‍රධාන අරමුණ. විශේෂයෙන්ම මම කියන්නට කැමැතියි-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා කියන කථාව ඇත්ත. 2007 අපේ මහ බැංකු වාර්තාව පැහැදිලිවම කියා තිබෙනවා, පෞද්ගලික විදුලිය ජනනය කිරීමේ ආයතන සමඟ ඇති කර ගත්ත ගිවිසුම සම්පූර්ණයෙන්ම සංශෝධනය කළොත් වසරකට රුපියල් කෝටි 600ක් ඉතිරි කරන්නට පුළුවන් කියලා. මම ඔබතුමාගෙන් අහන්නේ මෙයයි. 2007ත් අද දවසත් අතර වසර 6ක කාල වකවානුව තුළ රුපියල් කෝටි 3,600ක් ඉතිරි කර ගන්නට තිබුණ අවස්ථාවක, ඇයි ඔබතුමන්ලාගේ රජය මහ බැංකු වාර්තාව පිළිපැද්දේ නැත්තේ?

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(මාණ්පුමිකු අනුර පිරියදර්ෂන යාප්පා)
(The Hon. Anura Priyadharshana Yapa)
මේ ගැන ඔබතුමා දන්නවා නේ. ඔබතුමා බබෙක් නොවෙයි නේ. ඔබතුමා දක්ෂ මන්ත්‍රීවරයෙක් නේ. [බාධා කිරීමක්] ඒකට තමයි මම මේ උත්තර දෙන්න යන්නේ. ඔබතුමා දන්නවා ගිවිසුමක් ඇති කර ගත්තාට පසුව ඒ ගිවිසුම පිළිබඳව දෙපාර්ශ්වයේ එකඟතාවක් තිබෙන්නට ඕනෑ බව. මෙවැනි අවස්ථාවක දෙපාර්ශ්වයේ එකඟතාවක් නිර්මාණය කර ගැනීමට තිබෙන අසීරුතාව තමුන්නාන්සේ තේරුම් ගන්නට ඕනෑ නේ. තමුන්නාන්සේලාට අපි මේවා කළත් වැරදියි, නොකළත් වැරදියි. මගේ තර්කය බොහොම සරල දෙයක්. අපි කෙටි කාලයක් තුළ දැවැන්ත විදුලි බල ප්‍රමාණයක් රටට ලබා දුන්නාට පසුව, ඒ සඳහා අවශ්‍ය කරන ජනන ක්‍රියාමාර්ගය මොකක්ද කියන කාරණය ගැන තර්කයක් තමයි අද තිබෙන්නේ. මම කථා කරන්නේ ගණන් නොවෙයි. වැඩි මුදලක් වියදම් කරලා විදුලිය ජනනය කළොත් කාටත් වැඩි මුදලක් ගෙවන්නට වෙනවා. ඒක තමයි ඇත්ත කථාව. අපි කළ යුත්තේ තමුන්නාන්සේලා කියන මහ බැංකු වාර්තාව ගැන කථා කිරීමවත්, අපි එකිනෙකාට මඩ ගසා ගැනීමවත් නොවෙයි. එක වරම විශාල ප්‍රමාණයකට විදුලිය ලබා දුන්නාම සහ විදුලිය ලබා දීමේ ක්‍රමවේදයක් ඇති වුණාම අපේ විදුලි ජනන මාර්ගය වෙනස් කළ යුත්තේ කෙසේද කියන කාරණය තමයි අපි කථා කළ යුත්තේ. මම තමුන්නාන්සේලාට කියන්නට කැමැතියි, අපි තවමත් මේ රටේ ඉතාම දුප්පත් ජනතාවට පමණක් නොවෙයි, මධ්‍යම පාන්තික ජනතාවටත්, මම හිතන්නේ මේ විදුලි ගාස්තු සංශෝධනය කළාට පසුවත් - තව අවසන් නැහැ කියලා කිව්වා - දැවැන්ත විදුලි බල සහනාධාරයක් ලබා දීලා තිබෙනවාය කියා. ඒක මතක තියා ගන්න. එක ඒකකයක් වෙනුවෙන් කවුරුවත් රුපියල් 23ක් ගෙවන්නේ නැහැ. ඒක තමයි ඇත්ත කථාන්තරය. අපි මොන විධියට සංශෝධනය කළත් ලංකාවේ විදුලිය පරිභෝජනය කරන කිසිම කෙනෙක් එක ඒකකයක් වෙනුවෙන් රුපියල් 23ක විදුලි ගාස්තුවක් ගෙවන්නේ නැහැ. ඒ නිසා විදුලිබල මණ්ඩලය අතිශය අලාභ ලබනවා. විදුලිබල මණ්ඩලයට චෝදනා කරන්නට පුළුවන්. සමහර තැන්වල අසීමිත වියදම් තිබෙන්නට පුළුවන්. මම ඒවා නැහැයි කියන්නේ නැහැ. නමුත් ඒ නිසාම විදුලිබල මණ්ඩලයට චෝදනා කරන්නත් බැහැ; විදුලිබල මණ්ඩලයට මේක මේ විධියටම කර ගෙන යන්න කියලා කියන්න කාටවත් අයිතියකුත් නැහැ. මොකද, ඒක කරන්නට බැරි වැඩක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට හුරු පුරුදුයි සහනාධාරවලට. මම දන්නවා, හැමෝම ඒකට කැමැතියි. විදුලි බලය ඉල්ලන විට තමුන්නාන්සේලා සියලු දෙනාමත් කියන්නේ විදුලි බලය දෙන්න කියලා. නමුත් අපි දැන් විදුලි ජනන ක්‍රියා මාර්ගයක් ගැන කල්පනා කරන්නට ඕනෑ. ඒ අනුව විදුලි ජනන ක්‍රියා මාර්ගය පිළිබඳව දැවැන්ත පියවරක් ඉදිරියට තැබුවේ අපේ

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

අතිගරු ජනාධිපතිතුමායි. මම හිතන හැටියට ඒක තමයි ලංකාවේ සිදු වුණු වැදගත්ම ක්‍රියාවලිය. අපි කටයුතු කළ යුත්තේ ඒ දිශාව බලා ගෙනයි. ඒ දිශාව බලන්නේ නැතිව අපට අනෙක් තැනකට යන්න බැහැ. ඇත්තටම අපට වැය වන විදුලිය ප්‍රමාණය අඩුවෙන් තියා ගන්න වුවමනා වුණා නම්, ජනනය සහ වියදම සමාන කර ගන්න ඕනෑ වුණා නම් අපි අනිවාර්යයෙන්ම විදුලි බලය පැය 6ක් නොවෙයි ඊට වැඩි කාලයක් කපා හරින්නට ඕනෑ. ආසියාවේ අනෙක් රටවල් ගැන බැලුවත් -ඉන්දියාව දිහා බැලුවත් බංග්ලාදේශය දිහා බැලුවත් භූටානය දිහා බැලුවත්- අද ඒ අය විදුලි බලය කප්පාදු කරනවා. මොකද, අද දියුණු වන හැම රටක්ම විදුලි බලය අඩු මිලට ලබා දීම පිළිබඳව විශාල ගැටලුවකට මුහුණ දී සිටිනවා. විදුලි බලය ජනනය කරන රටවල් දිහා බැලුවත්, අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අඩු මුදලකට විදුලිය ලබා ගැනීමට ඒ රටවලටත් පුළුවන්කමක් නැහැ. හැම රටක්ම උත්සාහ කරන්නේ පාරිභෝගිකයාට අඩු මුදලකට විදුලිය ලබා දෙන්නයි. අද තිබෙන තත්ත්වය අනුව මේකට තිබෙන විසඳුම මොකක්ද? ගල් අඟුරු බලාගාර කීයක් ඉදි කරන්නද? අද ලෝකයේම මේ ගල් අඟුරු බලාගාර පිළිබඳව තර්කයක් තිබෙනවා. අද ඉන්දියාව වාගේ රටවල ගල් අඟුරු බලාගාර විශාල ප්‍රමාණයක් තිබෙනවා. චීනයේත් දැවැන්ත ප්‍රමාණයක් තිබෙනවා. ඒක මිහිකත උණුසුමට බලපානවා කියලා තර්කයකුත් තිබෙනවා. අපි අද ලංකාවේ ගල් අඟුරු බලාගාර දෙකයි හදන්නේ. අපේ ඊළඟ පියවර මොකක්ද කියන කාරණය ගැන දැන් විදුලිබල මණ්ඩලය සාකච්ඡා කරනවා, අපි LNG ගේන්න ඕනෑද, එහෙම නැත්නම් වෙනත් ප්‍රභවයක් ගේන්න ඕනෑද කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, සුළං සහ අනිකුත් බලයන් උපයෝගි කරගෙන විදුලි බලය නිෂ්පාදනය කිරීම ගැන තමුන්නාන්සේ කිව්වා. නමුත් මේවා නිසා ඒකාකාරී විදුලි ජනනයක් සිදු වන්නේ නැහැ. ඒවායින් විදුලි ජනනය සිදු වන්නේ යම් කිසි ප්‍රමාණයකටයි. ඒ එක්කම අනික් පැත්තෙන් ඒකට ඔරොත්තු දෙන්න පුළුවන් තවත් ස්ථාවර විදුලිබල පද්ධතියක් තිබෙන්න ඕනෑ. ඒ නිසා පුනර්ජනනීය බලයෙන් පමණක් ලෝකයේ කිසිම රටක් තමන්ගේ විදුලිබල ප්‍රමාණය සම්පූර්ණයෙන් ලබා ගන්නේ නැහැ. ඒකාකාරීව පැය 24ක් පුරා එය ලබා ගන්නේත් නැහැ. [බාධා කිරීමක්] ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඒකේ technicalities මම දන්නේ නැහැ නේ. ඒක තමුන්නාන්සේ අපේ විදුලිබල ඇමතිතුමියගෙන් අහන්න. මම කථා කරන්නේ සාමාන්‍ය දේවල් ගැනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම විදුලිබල මණ්ඩලය ඉතාම ඉහළ මුදලක් බනිජ තෙල් සංස්ථාවට ගෙවන්න තිබෙනවා. ඒකට මම විදුලිබල මණ්ඩලයට දොස් කියන්නේ නැහැ. විදුලිබල මණ්ඩලයටත් ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා අප පුළුවන් තරම් මේ දෙපාර්ශ්වයම එකතු කරගෙන මේක විසඳන්න ඕනෑය කියන අදහසකට ඇවිත් ඉන්නවා.

රජයක් යම් තීන්දු ගන්නේ රටක අනාගත පැවැත්ම වෙනුවෙනුයි. රටක අනාගත පැවැත්මක් නැතිව රජයක් කවදාවත් තීන්දු ගන්නේ නැහැ. අද අප මේ අරගෙන තිබෙන්නේත් එවැනි පැවැත්මකට අවශ්‍ය තීරණයක්. තමුන්නාන්සේලා මොන වාගේ කථා කිව්වත් මේ කාරණාත් පිළිගන්න වෙනවා.

මම දැක්කා අපේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කාලයකට පස්සේ පිටු පිරෙන්න ලියා තිබෙන ආකාරය. මම එතුමාටත් කිව්වා, ඔබතුමා බොහොම තදබල ලෙස ලියනවා කියලා. ඒකේ වරදක් මම දකින්නේ නැහැ. [බාධා කිරීමක්] නැහැ, ඒකේ කිසි වරදක් නැහැ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි. ඔබතුමා එහෙම නොකළොත් තමයි වරද. මුළු රටේම ජනතාවට විදුලි බලය ලබා දීමේදී අප සහන මිලකට ලබා දෙන්න ඕනෑ. දරා ගන්න පුළුවන් මිලකට ලබා දෙන්නත් ඕනෑ. ඒ වාගේම මතක තියා ගන්න විදුලිය ජනනය සඳහා යන වියදම ඒකකයකට රුපියල් 23ක් බව. ඒ ඒකකය අප තවමත් ලංකාවේ කිසිම කෙනෙකුගෙන් අය කරන්නේ නැහැ. මේක තමයි විදුලිබල ක්ෂේත්‍රයේ තිබෙන විශේෂත්වය. ඒ නිසා ඒවා කථා කරන්නේ නැතිව නිකම්ම නිකම් වල්පල් කථා කිරීමෙන් මේ රටේ බුද්ධිමත් ජනතාවට යම් කිසි මතයක් දෙන්න තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙනවා නම් මා හිතන්නේ නැහැ ඒ මතය ඔබලාට දෙන්න පුළුවන් වෙයි කියලා. ඒ කාරණා අනුවයි අප මේ දෙස බලන්න ඕනෑ.

බලශක්තිය පිළිබඳව ලෝකයේ අර්බුදයක් තිබෙනවා. දෙවනුව අප කල්පනා කරන්න ඕනෑ මේ බලශක්තිය අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්නේ කොහොමද කියලා. මම ගරු ඇමතිතුමියටත් යෝජනා කළා අද අපි LED bulb වැනි එකකට මාරු වෙන්න ඕනෑය කියලා. අද ඒක බහුල වශයෙන් පාවිච්චි වෙනවා. ඒ බල්බ් එක ටිකක් ගණන්. නමුත් එවැනි උපාය මාර්ගයකටවත් මේ රට මාරු වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමියත් සම්බන්ධ වෙලා ඒ සඳහා විදුලිබල මණ්ඩලය යම් ඉදිරි පියවරක් ගනියි කියලා මා බලාපොරොත්තු වෙනවා. ඒ නිසා හැම අංශයකම ඉන්න රටේ ජනතාවගෙන් මා ඉල්ලා සිටින්න කැමැතියි බලශක්තිය අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න කියලා. මේ බලශක්තිය හැම දාම එක සමාන විධියට එන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය අරපිරිමැස්මෙන් පාවිච්චි කිරීම ගැනත් අප ඒ ජනතාවට අවධාරණය කරවන්න ඕනෑ.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
LED bulb එකක් රුපියල් 2,000ක් වෙනවා.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
වෙන්න පුළුවන්. නමුත් විදුලි ඒකක ගණන අඩු වෙනවා නේ. LED bulb එකක් රුපියල් 2,000ක් තමයි. තමුන්නාන්සේ හිතනවාද ඒකටත් කවුරු හරි සහනාධාරයක් දෙයි කියලා. එහෙම කථා කරන්න එපා. තමුන්නාන්සේ කථා කරන විධිය වැරැදියි. එවැනි මාර්ගයකට මාරු වෙන්න. [බාධා කිරීමක්] රුපියල් 2,000යි කිව්වාට පැය 10,000ක් ඒ බල්බ් එක ඇතුළේ තිබෙනවා. යෝගරාජන් මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ වලිගය පාගා ගන්න එපා. මම කිව්වේ එවැනි යම් ක්‍රමවේදයක් කෙරෙහි විදුලිබල මණ්ඩලය යොමු වෙන්න ඕනෑය කියලායි. මට රුපියල් 2,000ක් දීලා ඒ බල්බ් එකක් ගන්න පුළුවන්. මම දන්නවා ඒක සාමාන්‍ය මිනිහෙකුට ගන්න බැහැ කියලා. ඒ සාමාන්‍ය මිනිහාගේ කථාවයි මම කථා කළේ. මම ගැන නොවෙයි. මට කාගෙන්වත් සහනාධාර අවශ්‍ය නැහැ. මගේ ජීවිත කාලයේදී මම කවදාවත් සහනාධාර බලාපොරොත්තු වෙනවාද? මට ඕනෑ නැහැ. මම කථා කරන්නේ සාමාන්‍ය ජනතාව ගැනයි. අප අරපිරිමැස්ම ගැනත් කල්පනා කරන්න ඕනෑ. අරපිරිමැස්මෙන් විදුලිය භාවිත කරන්න කියලා ජනතාවට කියන්නත් ඕනෑ. ඒ කාරණාව මම මතක් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලි බිල වැඩි වීම පමණක් පදනම් කරගෙන පටු තර්කවලට යන්නේ නැතිව, පක්ෂ විපක්ෂ හැම දෙනාම මීට වඩා පුළුල් තලයකට ගමන් කරන්න ඕනෑය කියන අදහසයි මම කියන්නේ. මෙන්න මේ වෙනස්කම ඇති කර ගැනීම සඳහා අප තව ඉදිරියට ගමනක් යනවා. ඒ සඳහා ජනන මාර්ග කීපයක් අප ඇති කර තිබෙනවා. ඒවා අඩු මිල ජනන මාර්ග. ජනාධිපතිතුමා යම් කිසි පොරොන්දුවක් දීලා තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ ඒක දේශපාලනීකරණය වනවාය කියන එක මම පිළිගන්නේ නැහැ. ලෝකයේ එහෙම දේශපාලනීකරණ කථාවක් නැහැ නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
එහෙනම් ඇමෙරිකානු කොංග්‍රස් එක බජට් එක හදලා ඔබාමාට ගෙනාවාට පස්සේ ඔබාමා ඒකට විරුද්ධ වෙන කොටත් දේශපාලනය තමයි. ජනාධිපතිවරයා පත් කරන්නේ රටේ ජනතාව නිසා ජනතාවගේ පැත්තෙන් ඒක බලන එක එතුමාගේ යුතුකමක්. [බාධා කිරීමක්] ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ තර්කය හොඳයි. ඔබතුමා ඉදිරිපත් කරන තර්කය යුරෝපයේත් නැති, සමහර විට අහහරු ලෝකයේ තිබෙන තර්කයක් වන්න පුළුවන්.

අතිගරු ජනාධිපතිතුමා එහෙම යෝජනාවක් කළා. ඒ යෝජනාව සහනදායී යෝජනාවක්. ඒ යෝජනාව හරහා මෙහි තිබෙන සමහර ගතිකත්වයන් අඩු වෙනවා. ඒ අඩු වීමෙන් සහනයක් ඇති වෙනවා. ඒක තමයි බලාපොරොත්තු වන්නේ. ඒ නිසා මේ පිළිබඳ අප පුළුල් සාකච්ඡාවක් කරන්නේ නැතිව, ඔබතුමන්ලා ඉතාම පටු තර්කවලට යන්න එපා කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඊළඟට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක් තිබෙනවා.

[අ.භා. 4.32]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි.

මේ අවස්ථාවේදී අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමාට පසුව මට කථා කරන්න ලැබීම මා භාග්‍යයක් විධියට සලකනවා. මොකද ගරු අග්‍ර විනිශ්චයකාරතුමිය පැය 24ක් ඇතුළත එළවා දමා මෙතැනට ඇවිල්ලා ඔය කථා කරන නාඩගම් හොඳයි ඒ අයටම කථා කරලා කියන එක. මෙතැන ඔබතුමා දැන් තෙල්-

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම ඔබතුමා එක්ක තර්ක කරන්න යන්නේ නැහැ නේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තර්ක කරන්න බැහැ නේ, ඇමතිතුමනි. [බාධා කිරීමක්]

මම ඒක නිකම් කිව්වේ. තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරපු අපේ මන්ත්‍රීවරයෙකුට ඔය වාගේ අභියෝග කරන කොට අපට කියන්න පුළුවන් එකම දේ තමයි, වරප්‍රසාද ලැබුණේ පැය 24න් ඉවත් කරලා ඔය තැනට ආව නිසාය කියන එකයි.

තෙල් මිල වැඩි වීම නිසා තමයි ඔබතුමාගේ දකුණු පැත්තේ සිටින පවිත්‍රා ඇමතිතුමියට ඔය ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. ඔබතුමා තෙල් මිල කෘත්‍රිම වශයෙන් වැඩි කළා. ලෝක වෙළඳ පොළේ තෙල් මිල අඩු වන කොට අපේ රටේ තෙල් මිල වැඩි කළා. එහෙම කෘත්‍රිම වශයෙන් තෙල් මිල වැඩි කරපු නිසා විදුලි බිල වැඩි කිරීමේ අවශ්‍යතාවක් ඔබතුමන්ලා ඇති කළා. ඇයි මේක වුණේ? ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් කිව්වා, ඔබතුමන්ලාට ණය දෙන්නේ නැහැ කියලා. ණය දෙන්න බැරි වුණාම තමයි ඔබතුමන්ලා පත්තු වන්නේ? පත්තු වුණාට පස්සේ දැන් බලනවා මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ කොහේද කියලා. දැන් විදුලිය, වතුර සහ බනිජ තෙල් තමයි ප්‍රශ්නය ඇති කරලා තිබෙන්නේ. ඒ නිසා තෙල් මිල වැඩි කළා. තෙල් මිල වැඩි කළාම ඊට වැඩිය ලොකු රකුසෙක් තමයි විදුලි බිල. දැන් ඒ සම්බන්ධයෙන් තමයි ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. දැන් මෙතැන පවිත්‍රා ඇමතිතුමිය කියන එකද හරි, නැත්නම් විදුලිබල හා බලශක්ති හිටපු ඇමතිතුමා වන චම්පික රණවක ඇමතිතුමා කියන දේද හරි? නමුත් මෙතැන ඊට වැඩිය ප්‍රශ්නයක් තිබෙනවා.

මේ රටේ ආර්ථිකය අවුරුදු ගණනාවක් තිස්සේ කා දමා රටට සහනාධාර දෙනවා කියලා පෙන්වා තිබෙන ආණ්ඩුවේ ආර්ථිකය කඩා වැටුණාට පස්සේ දැන් තමයි ප්‍රශ්නය පත්තු වෙලා තිබෙන්නේ. දැන් ඔබතුමන්ලා තෙල් මිල වැඩි කළේ නැත්නම් විදුලි බිල වැඩි කරන්න අවශ්‍යතාවක් නැහැ. ඒක පිළිගන්නවාද, නැද්ද? තෙල් මිල වැඩි කළේ ඇයි? ලෝක වෙළඳ පොළේ තෙල් මිල අඩු වෙන කොට අපේ රටේ තෙල් මිල වැඩි කරලා තිබෙන්නේ කෘත්‍රිම වශයෙන් නේද?

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම තමුන්නාන්සේට ඒකට පිළිතුරක් දෙන්නම්. තමුන්නාන්සේ කියන දේ වැරදියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට වෙලාව නැහැ. මූලාසනයෙන් මට වැඩිපුර වෙලාව දෙනවා නම්, මම ඔබතුමාට ඉඩ දෙන්නම්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කර ගෙන යන්න. ගරු මන්ත්‍රීතුමාගේ කථාවට බාධා කරන්න එපා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් හෙට බලයට ආවොත් අපි තෙල් රුපියල් 89ට විකුණනවා කියලා මම කියනවා. හෙජින් සූදුව නිසා විදුලි බිලට කරලා තිබෙන මේ වංචාවෙන් සහ අකාර්යක්ෂමතාවෙන් එකතු වෙලා තිබෙන පාඩුව ජනතාවගෙන් අය කරන එකයි ප්‍රශ්නය. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් හෙට බලයට ආවොත් විදුලි බිල සියයට 43.5කින් අඩු කරනවා කියන එකත් අපි මේ අවස්ථාවේදී වග කීමකින් කියනවා. දැන් පවිත්‍රා ඇමතිතුමිය ඔය දේවල්වලට කියන්නේ මොකක්ද? තමුන්නාන්සේලාගේ හෙජින් සූදුව වෙනුවෙන් අපි උසාවි ගියා. තමුන්නාන්සේලාගේම ආණ්ඩුව තමයි මේක කරන්න එපා කිව්වේ. අපි එදා ඒ වෙනුවෙන් උසාවි ගිහිල්ලා සාර්ථක තත්ත්වයක් ඇති වුණා නම්, අද හෙජින් සූදුවට මේ රුපියල් කෝටි 8,900 ගෙවන්න අවශ්‍යතාවක් නැහැ. ඒක කරන්න එපා කිව්වේ කවුද? තමුන්නාන්සේලාගේම කැබිනට් එකේ සිටින ඇමතිවරු ටිකයි, තමුන්නාන්සේලාගේම ජනාධිපතියි ඒක කරන්න එපා කිව්වේ. ඒක නැවැත්වුවා නම් අද මේ ප්‍රශ්නය ඇති වන්නේ නැහැ.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පාන් රුපියල් 3.50ට දෙනවා කිව්වා. දැන් ඒක දෙන්නේත් නැහැ. ප්‍රවාහන සහනාධාරයක්

[ගරු රවි කරුණානායක මහතා]

දෙනවා කිව්වා. දැන් ඒකත් නැහැ. ධීවරයන්ට මාළු අල්ලන්න යනකොට ඉන්ධන සහනාධාරයක් දෙනවා කිව්වා. කෝ ඒක? ඇන්තනි මැරුණාට පස්සේ ඒකත් නැහැ. අද අධ්‍යාපනයට ලැබෙන සහන මොනවාද? අද අභිංසක අම්මලා, තාත්තලා තමන්ගේ ධීවර බෝට්ටු ටික විකුණනවා. පොල් ගෙඩි හොරකම් කරලා ඒකෙන් අධ්‍යාපන කටයුතුවලට වියදම් කරන්න හදනවා. අධ්‍යාපනයට දෙන සහනාධාර සම්පූර්ණයෙන් නැති වෙලා තිබෙනවා. අද මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාට විරුද්ධව කරන කුමන්ත්‍රණයෙන් නිදහස් සෞඛ්‍යයත් නැති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි පොහොර සහනාධාරය. මම පත්තරයක සිරස්තලයක් දැක්කා. ඒ අනුව පොළොන්නරුවෙන් තමයි පොහොර සහනාධාරය කපන්න පටන් අරගෙන තිබෙන්නේ. ආයෙත් මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාට පහරක් ගහනවා. මෙතෙක් තිබුණු පොහොර සහනාධාරයත් දැන් නැති වෙලා තිබෙන්නේ. විදුලි බිල සහ වතුර බිල අඩු කරනවා කියපු ආණ්ඩුවම අද ඒවා වැඩි කරලා තිබෙනවා. මෙය ජනතාවට දරා ගන්න බැරි තත්ත්වයක්. ආණ්ඩුව ආඩම්බරයෙන් කියනවා, 2012 දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 2,900යි කියලා. ඔබතුමන්ලා කියනවා නේ, විදුලි බිල වැඩි වෙලා තිබෙන්නේ ඩොලර් 3යි, 4යි කියලා. එහෙම නම් මාසයකට ඩොලර් 295ක ආදායමක් ලබා ගන්නා පවුලකට ඩොලර් තුනක් ගෙවන්න බැරිද? මේකෙන් පෙනෙන්නේ ඒක පුද්ගල ආදායමේ බොරුවයි. ඒ විතරක් නොවෙයි, ඩොලර් තුනකින් -රුපියල් 350කින්- නොවෙයි, රුපියල් 450කින්, 500කින් විදුලි බිල වැඩි කරලා තිබෙන එක තමයි මෙතැන අපට පෙනෙන්න තිබෙන්නේ.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමනි, මේ අවස්ථාවේදී අපට කියන්න පුළුවන් එකම දේ මෙයයි. ගෙදරකට හොරු ටිකක් පැනලා ඒ ගෙදරින් බඩු ටිකක් හොරකම් කර ගෙන යනවා. ඒ යන ගමන ඒ බඩුවලින් එකක්, දෙකක් වැටෙනවා. මේ හොරාගේ පස්සෙන් ඒ ගෙදර ආරක්ෂා කරන කට්ටිය එනවා. ඒ අය දුවගෙන එනකොට මෙන්න හොරා ඒ බඩුවලින් එකක්, දෙකක් දෙනවා. එහෙම දෙන්නේ අඩුවෙන්ම වටිනාකම තිබෙන බඩු ටිකක්. එහෙම දුන්නාට පස්සේ ඒ හොරා පස්සේ දුවන කට්ටිය හිතනවා, අනේ! මෙන්න අපට යමක් හම්බ වුණා කියලා. නමුත් ගෙදර ගියාට පසුව තමයි තේරෙන්නේ, මෙන්න මෙච්චර සොරකමක් ඇති වෙලා තිබෙනවා කියලා. මෙන්න මේ වාගේ තමයි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

ඇමති මණ්ඩලයත් අද හැසිරෙන්නේ. මේකෙ දී අර "ගෙදර ගියාට පසුව" කියන එකෙන් අදහස් කරන්නේ, මැයි 20වැනි දායි. මොකද, බිල එන්නේ අන්න එදාටයි. එදා තමයි දැන ගන්නේ, කැබිනට් මණ්ඩලයේ ජනාධිපති තමයි මේ වැඩි කිරීම අනුමත කළේ කියලා. ඔබතුමන්ලා අත් හැට අටක් උස්සලා තමයි මේකට අනුමැතිය දුන්නේ. නමුත් මැයි 01වැනි දා ජනාධිපතිතුමා කියනවා, "අනේ! මම දන්නේ නැහැ, මොකක්ද වුණේ" කියලා. එදා කිව්වා, විදුලි බිල අඩු කරනවා කියලා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ.

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය
මාණ්පුමිකු (තිරුමතී) පවිත්‍රාදේවි වන්නිඅූරච්චි
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi -
මේක කැබිනට් එකට යන්නේ නැහැ. ඔබතුමා දන්නේ නැද්ද?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ආ, කැබිනට් එකට යන්නේ නැහැ? මම දන්නේ නැහැ නේ. මොකද, අපි හිටපු කැබිනට් එක ගැන අපි දන්නවා. අපි කැබිනට් මණ්ඩලයේ හිටපු කාලයේ හැම එකක්ම වැඩි කළේ ඒ තුළිනුයි. එතකොට මේ කැබිනට් එකේ දී වැඩි කළේ නැහැ? මුදල් අමාත්‍යාංශය මේක අනුමත කරන්නේ නැද්ද? [බාධා කිරීමක්] ආ, සර්ගෙන් අහලා වැඩේ කරන්න. මේක "Kitchen" Cabinet එක. [බාධා කිරීමක්] ආ, "Kitchen" Cabinet එකේ ඔබතුමා නැහැ නේ. මේක මාර කැබිනට් මණ්ඩලයක් නේ. මේ වාගේ දැවැන්ත ප්‍රශ්නයක් ගැන කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කරන්නේ නැත්නම්, එහෙනම් මොකටද කැබිනට් මණ්ඩලයක්?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
Then, it is illegal.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
අද උදේ පැවැති කැබිනට් මණ්ඩල රැස්වීමේ දී වාසුදේව නානායක්කාර කෑ ගැහුවේ නැද්ද? බැසිල් රාජපක්ෂ ඒකට උත්තර දුන්නේ නැද්ද? ඔබතුමන්ලා කැබිනට් මණ්ඩලයේ මේවා ගැන කථා කළේ නැත්නම්, මොකටද එතුමා කෑ ගැහුවේ? නිකම් අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. අද උදේ මොකක්ද සිදු වුණේ? අද උදේ වාසුදේව නානායක්කාර මේ සම්බන්ධයෙන් කථා කළා. එතුමා "ඇයි මේක කළේ නැත්තේ?" කියලා ප්‍රශ්න කළාම, "මේ නිකම් ආර්ථිකය ගැන කථා කරන්නේ නැතිව වාඩි වෙන්න" කියලා බැසිල් රාජපක්ෂ කිව්වේ නැද්ද? [බාධා කිරීමක්] එහෙනම් මොනවාද මේ කථා කරන්නේ? මේ ගැන කැබිනට් මණ්ඩලයේ කථා කරන්නේ නැත්නම්, මොනවාද එහෙනම් කැබිනට් මණ්ඩලයේ කථා කරන්නේ? කැබිනට් මණ්ඩලයේ ඕපාදූපද කථා කරන්නේ? ඒ නිසා තමයි මේ රට මේ වාගේ අගාධයකට වැටිලා තිබෙන්නේ. [බාධා කිරීමක්] එහෙනම් ඒක තමයි අර airbus එකෙත් -[බාධා කිරීමක්] අනේ! අපි දන්නේ නැහැ නේ. ඔය වාගේ හොරු ටිකක් එක්ක අපි කවදාවත් ගනුදෙනු කරලා නැහැ නේ. අපේ රජය කාලයේ හැම දෙයක්ම සාකච්ඡා කළේ කැබිනට් මණ්ඩලයේ දීයි. මේ වාගේ වෙන පැත්තකින් ගිහිල්ලා "Kitchen" Cabinet එකේ කථා කරන්නේ නැහැ. ඒ වාගේම තමයි මේ අවස්ථාවේ දී -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
අන්න පුත්තලමෙන් පනිනවා, හාදයෙක්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
ගරු අස්වර් මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ රීති ප්‍රශ්නය?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

කියන දේවල්වලට උත්තරයක් දෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කැබිනට් එකට නොකියා තමයි - [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අධ්‍යක්ෂාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අස්වර් මන්ත්‍රීතුමා, සන්සුන් වෙන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මහින්ද රාජපක්ෂ 2013 අප්‍රේල් 23වැනි දා "ඩේලි මිරර්" පත්‍රයට මෙහෙම කියනවා, I quote:

"Power hike to thwart economic collapse: MR"

කවුද මේ ආර්ථිකය කඩා වැටෙනවා කියලා ඉස්සෙල්ලාම කිව්වේ? මහින්ද රාජපක්ෂ. මහින්ද රාජපක්ෂ කියලා කියන්නේ කවුද? ජනාධිපති. එතුමාම කියලා තිබෙනවා, ආර්ථික ප්‍රශ්නයක් තිබෙනවා කියලා. [බාධා කිරීමක්] ඉතින් ඔබතුමා කොහොමද නැහැ කියලා කියන්නේ? එහෙම කිව්වාට පසුව, මෙතැන ප්‍රශ්නයක් තිබෙන නිසා තමයි මේක වැඩි කරලා තිබෙන්නේ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
You should know how to address the Head of State.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා මේ අවස්ථාවේ දී එක දෙයක් මතක් කරන්නට කැමැතියි. ආර්ථික ඝාතකයෙක් සිටිනවා කියලා විමල් වීරවංශ කියලා තිබෙනවා. එතුමා මහින්ද රාජපක්ෂට කියන්න බැරි දේ පී.බී. ජයසුන්දරට කියනවා. මේක වැඩි කළේ කවුද? පී.බී ජයසුන්දරයි, බැසිල් රාජපක්ෂයි එකතු වෙලා තමයි මේක වැඩි කරන්නට ඕනෑ යි කියලා කිව්වේ. හැබැයි, ආර්ථිකය කඩා වැටුණාට පසුව ඒ කරන දේ වැරැදි නැහැ. නමුත් මෙය ජනතාව පිට පටවන එක තමයි තිබෙන ප්‍රශ්නය. හෙජින් සූදුව ඔබතුමන්ලා අනුමත කරලා, එයින් සිදු වුණු අපරාධය අද ජනතාවගේ කර මත තබලා තිබෙනවා. ඒ නිසා අපි විමල් වීරවංශට කියන්නේ මේකයි. එතුමා කියනවා, පී.බී. ජයසුන්දරව අස් කරන්නට ඕනෑ යි කියලා. මේ වාගේ පුද්ගලයකුව තමන්ට මිනිත්තු පහකින් අස් කරන්න බැරි නම්, තමන් කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයකු වීමේ වටිනාකමක් නැහැ නේ. තමන් අග්‍ර විනිශ්චයකාරවරියව පැය 24න් ඉවත් කළා. එහෙම නම් ඇයි මේ පී.බී. ජයසුන්දර වාගේ පුද්ගලයකුව තමන්ට මිනිත්තු 24කින් ඉවත් කරන්න බැරි? ඉතින් මා මේ අවස්ථාවේ දී කියන්නේ, තමන්ලා පී.බී. ජයසුන්දරගේ ඇඟ උඩ තියලා, ජනතාවගේ බර වැඩි කිරීම තමයි මේ කරන්න යන්නේ කියන එකයි. මා විමල් වීරවංශට කියන්නේ, කරුණාකර තමන් කථා කරන දේ ක්‍රියාවට නංවන්න කියලායි. එතකොට තමයි අපට කියන්න පුළුවන්, "ඔන්න කියන දේ කරන මනුෂ්‍යයෙක්" කියලා.

ඒ විතරක් නොවෙයි, දැන් මේ ඇමතිවරුන් අලුත් සංකල්පයක් ඉදිරිපත් කරලා තිබෙනවා මේ ඔක්කොම එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ඇති වුණු දේවල් කියලා. මා මේ අවස්ථාවේ දී 1985 ඉඳලා විදුලිබල මණ්ඩලයේ තිබෙන ලාභය ඇතුළත් මෙම ලේඛනය **සභාගත*** කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි මෙය **හැන්සාඩ්** වාර්තාවට ඇතුළත් කරන ලෙස මා ඉල්ලනවා.

මේ අවස්ථාවේ දී මා පෙන්වන්න කැමැතියි, කවදා ඉඳලාද මේ ලාභය නැති වුණේ කියලා. මේ ලේඛනයේ ඇතුළත් කරුණු මා කියවන්නම්. 1985 දී ලාභය රුපියල් මිලියන 1,301යි. 1986 දී ලාභය රුපියල් මිලියන 1, 285යි. 1987 දී ලාභය රුපියල් මිලියන 1,254යි. 1988 දී ලාභය රුපියල් මිලියන 1,135යි. 1989 දී ලාභය රුපියල් මිලියන 907යි. 1990 දී ලාභය රුපියල් මිලියන 1,653යි. මේ කථා කරන්නේ ලාභය ගැනයි. ශුද්ධ ලාභය ගැනයි.

ණයවලට තිබෙන පොලී ප්‍රමාණය ඔක්කොම එකතු කරලා, ක්ෂය වීමත් - amortization - එකතු කරලා තමයි මේ ශුද්ධ ලාභයක් ඇති වෙලා තිබෙන්නේ. 1992 දී රුපියල් කෝටි 275 යි. 1993 දී රුපියල් කෝටි 1264යි. එක්සත් ජාතික පක්ෂය 1994 අගෝස්තු මාසයේ 27 වන දා තමයි මේ රට තමුන්නාන්සේලාට භාර දුන්නේ. ඒ වර්ෂයේ රුපියල් කෝටි 3809යි. 1995 දී රුපියල් කෝටි 4997යි. ඔන්න ඊට පස්සේ අලාභය පටන් ගන්නවා.

1996 දී රුපියල් කෝටි 95.5යි. 1998 දී අලාභය රුපියල් කෝටි 1990යි. 1997 දී අලාභය රුපියල් කෝටි 2153යි. 1999 දී අලාභය රුපියල් කෝටි 4234යි. 2000 දී අලාභය 6723 යි. 2001 දී අලාභය 9236යි.

ඔන්න ආපසු එක්සත් ජාතික පක්ෂය තාවකාලිකව රට භාර ගන්නවා. පැය 8ක් ලයිට් නැතිව තිබුණු ඒ යුගය අපි දවස් 100න් නැති කළා. මෙන්න ඊට පස්සේ ආයෙත් අලාභය අඩු වෙනවා. 2003 දී අලාභය රුපියල් කෝටි 3750යි. 2004 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂය පන්නලා නැවත ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට එනවා. ඒ වර්ෂයේ අලාභය රුපියල් කෝටි 15,706යි. 2005 දී අලාභය රුපියල් කෝටි 6852යි. 2006 දී අලාභය රුපියල් කෝටි 12,800යි. 2007 දී අලාභය රුපියල් කෝටි 15,800යි. 2008 දී අලාභය රුපියල් කෝටි 28,300යි. 2009 දී අලාභය රුපියල් කෝටි 38,800යි. 2010 දී අලාභය රුපියල් කෝටි 45,800 යි. 2011 දී අලාභය රුපියල් කෝටි 95,800 යි. 2012 දී අලාභය රුපියල් කෝටි 89,800යි. මේ ඔක්කොම අලාභය. එක්සත් ජාතික පක්ෂ රජය ලාභයක් ඇතිව මේ ආයතනය ගෙන ගිහින් ඔබතුමන්ලාට භාර දුන්නාට පස්සේ තමයි ඔබතුමන්ලා මේ ආයතනය කාලා දමලා නැති කළේ. අද කැබිනට් මණ්ඩලයේ 67 දෙනෙක් ඉන්නවා. මේ ටික කියන්න අපේ ගරු පී. දයාරත්න ඇමතිතුමාට බැරි වුණා ද? එතුමා එක්සත් ජාතික පක්ෂයේ හිටපු ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්. අඩු ගණනේ එතුමාගේ ජ්‍යෙෂ්ඨත්වයේ හැටියට කියන්න තිබුණානේ, "එක්සත් ජාතික පක්ෂ රජය මෙහෙම තමයි කළේ" කියලා. [බාධා කිරීම්] ඔබතුමා පක්ෂය මාරු කළාට කමක් නැහැ. ඒත් කරුණාකර ඔබතුමාගේ ආත්ම ගෞරවය විකුණන්න එපා. මා දන්නවා, ඔබතුමා නිහඬව සිටින පුද්ගලයකු වන්නට පුළුවන්. නමුත් අඩු ගණනේ, "එක්සත් ජාතික පක්ෂ රජය ඒ වැඩේ හරියට කළා" කියලා කියන්න තිබුණා නේද? ඒක කිව්වා නම් ප්‍රශ්නයක් නැහැ නේ. එම නිසා මේ ගැන මා මේ අවස්ථාවේදී මීට වඩා කියන්නට ඕනෑ ද?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

ඊට පස්සේ මොනවාද කියන්නේ? [බාධා කිරීම්] ඊට පස්සේ කිව්වා, අපි මේ ආයතනය පෞද්ගලීකරණයට යොමු කළා කියලා. ඉස්සෙල්ලාම ඒක කළේ 1998 දී. ඒක පටන් ගත්තේ චන්ද්‍රිකා කුමාරතුංග. ඇග්‍රිකෝ ආයතනයේ අන්තිම ගිවිසුම අත්සන් කළේ 1999 දී. එදා රුපියල් 48ට විදුලි ඒකකයක් ගත්තේ. ඇයි ඒක වෙනස් කළේ නැත්තේ? හෙළිදරව් කරන්න ඕනෑ, කාට කොයි ඇමතිවරයාට කීයක් ගෙව්වාද කියලා. මේවා තමයි කියන්න තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ තිබෙන අදක්ෂතාව, වංචාව - දෙතුන් දෙනෙකුගේ තිබෙන වංචාව- නැති කරන්න. එක්සත් ජාතික පක්ෂයට බැණලා කවදාවත් ජනතාවට සහනයක් දෙන්න බැරි අවස්ථාවක් තමයි අද උදා වෙලා තිබෙන්නේ. මේ වැඩි කළ විදුලි බිල අනිවාර්යයෙන්ම 20 වන දා වෙනකොට අඩු කරනවාද නැද්ද කියලා එක්සත් ජාතික පක්ෂය අහන ප්‍රශ්නයට අද සවස හයහමාර වෙන කොට මේ පාර්ලිමේන්තුවේදී ගරු ඇමතිතුමියනි, ඔබතුමිය උත්තර දෙන්න අවශ්‍යයි.

ඒ විතරක් නොවෙයි, සාමූහික වගකීමක් ඇතිව, "ඔව්, අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපට විදුලි බිල වැඩි කරන්න අවශ්‍යතාවක් තිබෙනවා" යැයි කියන්නේ නැතිව, එදා ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට දීපු උත්තරය මොකක් ද? "හිටපු ඇමති කළ දේ තමයි මා ක්‍රියාත්මක කරන්නේ" කිව්වා. පැය භාගයක් යන්න ඉස්සෙල්ලා චම්පික රණවක ඇමතිතුමා කිව්වා, "මේ මොනවාද කියන්නේ, මගේ කාලයේ මෙහෙම දෙයක් තිබුණේ නැහැ. මා ඒක නැවැත්වුවා "කියලා. ඉතින්, කවුද ඇත්ත කියන්නේ කියන ප්‍රශ්නය දැන් තිබෙනවා. ඒ නිසා දැන් විශ්වාසභංග යෝජනාවකුත් ඉදිරිපත් කර තිබෙනවා.

අපට කියන්න පුළුවන් එකම දේ මෙකයි. මේ රටේ විදුලිබල යටිතල පහසුකම හරහා ඇති වී තිබෙන ප්‍රශ්නය තුළින් රටේ සංවර්ධනයේ තිබෙන තරගකාරී තත්ත්වය සම්පූර්ණයෙන්ම නැති කර තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, මා තව දෙයක් පෙන්වන්නම්. SriLankan Airlines ආයතනය අලුතෙන් aircrafts වගයක් ගන්න යනවා. ගුවන් යානා 13ක් ගන්න යනවා. ඇමතිවරු 67 දෙනෙකුගෙන් හතර පස් දෙනයි දැන් මේ සභාවේ ඉන්නේ. සුමාන තුනකට ඉස්සෙල්ලා මේ SriLankan Airlines ආයතනයට ගුවන් යානා 13ක් ගන්න ඕනෑය කියලා කැබිනට් පත්‍රිකාවක් ගෙනාවාද නැද්ද? ඔබතුමන්ලා කියලා තිබෙනවා, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය දීලා තිබෙනවා කියලා. ගුවන් සේවය භාර ඇමති කියලා තිබෙනවා, ඒක ඉදිරිපත් කළාට අනුමැතිය දුන්නේ නැහැ කියලා. අවශ්‍ය නම් මේකට SriLankan Airlines ආයතනයේ Board of Directorsලාගෙන් approval එක ගන්නට පුළුවන් ද කියලා අහලා තිබෙනවා. කැබිනට් මණ්ඩලයෙන් අවසරය ගන්නේ නැතිව, SriLankan Airlines එකේ Board of Directors ලාගෙන් අවසර ගන්න තත්ත්වයක් ඇති කර තිබෙනවාද නැද්ද කියන එක ගරු ඇමතිතුමාට කියන්න පුළුවන් නේද?

"The Sunday Times" of 28th April, 2013 states, "Government approves Rs. 315 billion deal with Airbus". When you say, "Government", it means the Cabinet. But, there is no approval given by the Cabinet. The Hon. Ministers who are present in the House today can vouch for that. It happened three weeks ago. When we asked the Hon. Minister of Civil Aviation about this he said, "Higher authorities told me that the Board of Directors of SriLankan Airlines can give the approval. Therefore, the Cabinet does not need to give approval for this". What are these *ultra vires* acts that are taking place?

මේකට තමයි කොළේ වහලා වැඩේ කරනවා කියන්නේ. අද ඇරිසෝනා කාන්තාරයට ගියොත් lease කරන්න පුළුවන් අහස් යානා ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා අපට ඒවා කෝටි 31,500කට ගන්න අවශ්‍යද? මේ ගොල්ලන් කියනවා, අපට සල්ලි නැති නිසා මේවා විකුණලා lease back කරනවා කියලා. මේවා අරගෙන ආයෙත් lease back කරන්නේ මොකටද?

මෙන්න මේ වාගේ ක්‍රියාවලියක් තමයි අද රට පුරාම තිබෙන්නේ. අද කානුවක් හදන්න බැරි මට්ටමක ඉඳගෙන, අහස් යානා ගැනීම, අභිංසක ජනතාවට විදුලි බිල වැඩි කිරීම වැනි හැම දේම තුළින් අලි බබායි, හොරු හතළිහ නොවෙයි, හොරු හැටහත් දෙනාම අද කරන්නේ එකම සෙල්ලම. අභිංසක ජනතාව පිටින් කියලා හොරකම් කරලා මේ ආණ්ඩුව කරන්නේ මොකක්ද? වම් අතින් රුපියල් 10ක් සාක්කුවට දාලා, කියන්නේ නැතිව අනෙක් අතින් රුපියල් 90ක් හොරකම් කරන එකයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රාජපක්ෂ ආණ්ඩුව අද කරන්නේ. ඒ නිසා මේ ඇමතිවරුන්ට තමන්ගේ ගමට යන්න බැරි අවස්ථාවක් ඇති වෙලා තිබෙන අවස්ථාවක අපි කාරුණිකව කියන්නේ, නිශ්ශබ්දව ඉන්නේ නැතිව රටේ ආර්ථිකය බේරා ගන්න කටයුතු කරන්න කියලයි. මේක තුළින් තමයි රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ. එක්සත් ජාතික පක්ෂයට බැණලා ඡන්ද දිනන්න ව්‍යාපෘතියක් කරන්න ඕනෑ නැහැ. තමන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා කරගෙන, රටට උදා වෙලා තිබෙන මේ ආර්ථික හෙණයට උත්තරයක් සෙවීමට අවශ්‍යයි නේද? විදුලි බිල වැඩි කරන්න ඕනෑ නම් ඇයි, ගත්තු තීන්දුව භය නැතිව ක්‍රියාත්මක කරන්නේ නැත්තේ?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න. වෙලාව ඉවරයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව මිනිත්තු දෙකක් දෙන්න පුළුවන්ද? ඔබතුමාගේ තාත්තා නම් දුන්නා. ඒ නිසා පුතා මිනිත්තු හතරක් විතර දේවි. [බාධා කිරීමක්] දැන් ඔබතුමන්ලා එක වෙලාවකට කියනවා, "අපේ නායකතුමා සෘජු තීන්දු ගන්නවා" කියලා. නමුත් කෝ, මේකෙදී එහෙම වුණාද? තුත්තිරි ගහක් වාගේ වැටුණානේ. සුමාන දෙක තුනකට ඉස්සෙල්ලා කිව්වා, විදුලි බිල වැඩි කරනවා කියලා. කැබිනට් මණ්ඩලය ඊට අනුමැතිය දුන්නා. නමුත් ඊට පස්සේ ඒක හොඳ නැහැ කියලා මැයි දිනයේදී ඒ තීරණය වෙනස් වෙනවා. මැයි දිනයේදී ඒ තීරණය වෙනස් වුණාට පස්සේ මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා තව එකක් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට SMS එකක් ආවා, මහජන උපයෝගීතා කොමිසම - Public Utilities Commission - මේක අනුමත කළාය, මේකට අවසර දීලා තිබෙනවා කියලා. මොකටද මේ මහජන උපයෝගීතා කොමිසම තිබෙන්නේ? මේ කාරණා ජනතාවත් එක්ක සාකච්ඡා කරලා ජනතාවට දරා ගන්න පුළුවන් තත්ත්වයක්ද තිබෙන්නේ කියන එක බලන්න. එම කොමිසමේ සභාපති, කොස්තා මැතිතුමා භය නැතිව කියනවා, "අපි ජනතාවත් එක්ක සාකච්ඡා කළේ නැහැ" කියලා. එහෙනම් කා එක්කද සාකච්ඡා කළේ? බැසිල් රාජපක්ෂ එක්කද? පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමිය එක්කද? නැත්නම් පී.බී. ජයසුන්දර එක්කද? ඉතින් රජයෙන්ම මේ වාගේ නොමඟ යවන කොමිෂන් සභා පත් කරලා ජනතාවට බරක් දමන එක නවත්වන්න, මේ වංචාව නවත්වන්න කියන එක අපි මතක් කරනවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය බලයට ආ පසු තෙල් මිල රුපියල් 89ට අඩු කරනවා වාගේම විදුලි බිල සියයට 43.5කින් අඩු කර මේ වංචාව, දූෂණය නතර කිරීමට කටයුතු කරනවා කියන එක නැවතත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.50]

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Minister of Wildlife Resources Conservation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1988, 1989 මම විපක්ෂයේ ඉන්න කාලයේ ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාට "ශ්‍රීමත්" කියලා පාර්ලිමේන්තුවේ කථා කරන්න වුණා මට මතකයි. අපි ඒකට විරුද්ධ වුණා. නමුත් අද මේ පාර්ලිමේන්තුවේ ඇතැම් අය කථා කරන්නේ, "මහින්ද රාජපක්ෂ", "බැසිල්", "තමා" කියලා. සිංහල භාෂාව පිළිබඳ දැනුම- [බාධා කිරීම්] තමුන්නාන්සේ කථා කරන්නේ කටේ වෙරළු ගෙඩියක් දාගෙන. තමුන්නාන්සේ කථා කරන එක තේරෙන්නේ නැහැ. තමුන්නාන්සේගේ කටේ වෙරළු ගෙඩියක්. [බාධා කිරීම්] වෙරළු ගෙඩි නොවෙයි, පුත්තලම් හොරි දමනවා ඔය විධියට කථා කළාම. [බාධා කිරීම්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, මොකක්ද point of Order එක?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ලැබුණු- [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, point of Order එක ඉදිරිපත් කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්තල ගුවන් තොටුපොළට Air Arabia එක විතරයි ආවේ. දැන් ලැබුණු වාර්තාවක් අනුව, ඊයේ හැන්දෑවේ ඒකත් නවත්තලා තිබෙනවා. [බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. [බාධා කිරීම්]

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒ කථාවලින් වැඩක් නැහැ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා කථාව කරගෙන යන්න.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1988, 1989 කාලයේ - [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, point of Order එක ඉදිරිපත් කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට වරායේ ගේට්ටුවත් ඉබි යතුරු දාලා වහලා. [බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකර, පාර්ලිමේන්තුව විහිළුවක් බවට පත් කර ගන්න එපා.[බාධා කිරීම්] ගරු ඇමතිතුමා කථා කරන්න.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි [බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මගේ කථා කිරීමේ අයිතිය ආරක්ෂා කරන්න ඕනෑ. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1988, 1989 කාලයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේ රට කෑවා. එදා රවි කරුණානායක මහත්තයලාගේ එක්සත් ජාතික පක්ෂ රජය මොනවාද කළේ? ප්‍රේමදාස යුගයේ ආයතන 28ක් ලැයිස්තුගත කරලා ප්‍රතිව්‍යුහගත කරන්න, මේ රටේ රාජ්‍ය ආයතන විකුණාගෙන කන්න -[බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පොඩ්ඩක් අහගෙන ඉන්න. [බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකර, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා විනීතව හැසිරෙන්න. දැන් ඉඳ ගන්න.[බාධා කිරීම්]

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට ඉතා පැහැදිලිව කියනවා, මේ විවෘත ආර්ථික න්‍යාය ගෙනාවේ එක්සත් ජාතික පක්ෂ රජය බව.

එක්සත් ජාතික පක්ෂය තමයි මේ විවෘත ආර්ථික න්‍යාය ගෙනාවේ. ඉල්ලුමට සැපයුම. ඉල්ලුම වැඩි වෙලා සැපයුම අඩු වෙන කොට මිල වැඩි වෙනවා. හැබැයි මේ, -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇර සොයිසා.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම කියන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

සින්දු කිව්වාට, කරුණාකරලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හරියට කථා කරන්න ඉගෙන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හරිද?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කරලා කථා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්]

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කියනවා එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ අපට මේ රටේ- [බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකරලා එතුමාට කථාව කර ගෙන යන්න ඉඩ දෙන්න.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
එක්සත් ජාතික පක්ෂය එක පැත්තකින් ලයිට් දමන කොට ජනතා විමුක්ති පෙරමුණ කියනවා, ලයිට් නිවන්න කියලා. ජනතා විමුක්ති පෙරමුණ ලයිට් නිවන්න කියන කොට යූඑන්පී එකෙන් කියනවා ලයිට් දමන්න කියලා. අන්න ඒ යුගයේ තමයි - ඒ ප්‍රේමදාස යුගයේ තමයි- මේ රටේ විදුලි බිල සියයට 100ක් වැඩි වුණේ. ඒ කාලයේ විදුලි බිල සියයට 100ක් වැඩි වුණා. ඒ නිසා මම ඔබතුමාට කියන්නේ අපේ රජය මේ සියලුම සහනාධාර දෙනවා.මේ රටේ ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිය පරිභෝජනය කරන පවුල් 47,87,668ක් සිටිනවා. මේ සංඛ්‍යාවෙන් සියයට 95ක් විදුලිය ඒකකයක් සඳහා නියමිත මිල ගෙවන්නේ නැහැ. විදුලි ඒකකයක් සඳහා නියමිත මිල ගෙවන්නේ සියයට 4.3යි. අඩු මිලට විදුලිය පරිභෝජනය කරන පවුල් 45,78,873ක් සිටිනවා. එතකොට මේ විධියට විදුලිය පරිභෝජනය කරමින්, විදුලිබල මණ්ඩලයේ සමස්ත පාඩුව ගැන විපක්ෂය කථා කරනවා. විදුලිය පරිභෝජනය කරන ජනතාව ලබන සහනාධාරයට වන්දි ගෙවන්නේ විදුලිය පරිභෝජනය නොකරන, මොනරාගල දිස්ත්‍රික්කයේ ඇත එපිට ගම්මානවල ඉන්න දුප්පත් මිනිස්සු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න ඒ සහනාධාර රුපියල් මිලියනවලින්. ගෘහස්ථ විදුලිය සැපයීම වෙනුවෙන් රජය රුපියල් මිලියන 29,845ක සහනාධාරයක් දෙනවා. රාජ්‍ය ආයතන සඳහා සහනාධාරය රුපියල් මිලියන 1,382ක්. සංචාරක අංශය සඳහා සහනාධාරය රුපියල් මිලියන 1,248ක්. කර්මාන්ත අංශය සඳහා රුපියල් මිලියන 24,684ක සහනාධාරයක් දෙනවා. ඒ වාගේම ආගමික ස්ථානවලට රුපියල් මිලියන 902ක සහනාධාරයක් දෙනවා. ඒ වාගේම වීථි ලාම්පුවලටත් සහනාධාරයක් දෙනවා. මේ රට අඳුරේ නොතබා සමස්ත රටම ආලෝකවත් කරන්න; මේ රට ඒකාලෝක කරන්න වීථි ලාම්පු සඳහා රුපියල් මිලියන1,126ක සහනාධාරයක් දෙනවා. එතකොට සහනාධාර වෙනුවෙන් වැය කරන මුළු මුදල රුපියල් මිලියන 59,187ක්.

එතකොට විදුලිය නිෂ්පාදන වියදම ගණනය කර ඒ අනුව මිල නියම කර තිබෙනවා. යම්කිසි භාණ්ඩයක් නිෂ්පාදනය කරලා ප්‍රවාහනය කිරීමෙන් පසුව ඒ භාණ්ඩයේ මිල ගණන් පිළිබඳව කිසිම හැඟීමක් නැහැ. ඒ වාගේම ඒ නිෂ්පාදනය කරන විදුලිය කිලෝ මීටර් ලක්ෂ ගණනක් විදුලි රැහැන් ඇදලා ප්‍රවාහනය කරන්න ඕනෑ. ඒවා නඩත්තු කරන්න ඕනෑ. මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් සියයට 22කට පමණයි විදුලිය තිබුණේ. ඒ සියයට 22 අද සියයට 80ක මට්ටමට වැඩිවෙලා තිබෙනවා. අපේ දුෂ්කර ප්‍රදේශවල ජනතාවටත් විදුලිය ලබා දී තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ මේ පාරිභෝගික භාණ්ඩය තිබුණේ ධනපතියන්ගේ- ලොකු මිනිස්සුන්ගේ - සුඛෝපභෝගී භාණ්ඩයක් හැටියටයි. අද මෙය මුළු මහත් රටේම පොදු ජනතාවගේ පාරිභෝගික භාණ්ඩයක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවොත් බදු අය කරන්නේ නැද්ද කියලා අපි අහනවා. තමුන්නාන්සේලා බදු අය කරන්නේ නැද්ද? [බාධා කිරීමක්] තමුන්නාන්සේලාත් බදු අය කරනවා.[බාධා කිරීමක්]

යූඑන්පී ආණ්ඩු කාලයේ තමුන්නාන්සේලා බදු අය කරලා පැහැදිලිවම කළේ නාගරික ජනතාවට පහසුකම් සපයපු එක විතරයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ වාරි මාර්ග අත් හැරියා; විදුලිය අත් හැරියා; මාර්ග අත් හැරියා; ඒ වාගේම පැති බැම්ම, පාර, පන්සල, වැව, අමුණ කියන මේ හැම දෙයක්ම අත් හැරියා. එහෙම අත් හැරලා ඒ බර සාමාන්‍ය ජනතාව මත පැටෙව්වා. අද "මහින්ද චින්තන" යටතේ ඒ සෑම දෙයකටම ආධාර

ලබා දෙනවා. සමස්ත ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කරලා තිබෙනවා. ඒ යටිතල පහසුකම් අතර භාණ්ඩ හා සේවා පමණක් නොව සන්නිවේදන පහසුකම්ද තිබෙනවා. මේ ආදි වශයෙන් සෑම අංශයකටම අදාළව, ග්‍රාමීය ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා. මේ පහසුකම් ලබා දීමේදී දරන පිරිවැය, දරන විශාල වියදම ආවරණය කර ගන්න ඕනෑ. කිසිම කෙනකු තමන්ගේ සාක්කුවෙන් ගෙනැල්ලා මේ රටේ ආණ්ඩු කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මහත්මයා කථා කළා. එතුමා කථා කරමින් කිව්වේ මොකක්ද? එතුමාගේ කාලයේ සතොස ඇතුළු ආයතන විනාශ කරපු හැටි අපි දන්නවා. එදා අප විපක්ෂයේ ඉන්න කොට අපට මතකයි එතුමා කරපු දේවල්. සතොස ව්‍යාපාරය කියන්නේ මේ රටේ පාරිභෝගික ජනතාවගේ මිල නියම කරන ආයතනයයි. අද එතුමා ගුවන් තොටුපොළ ගැන කථා කරනවා; ගුවන් යානා ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහා පරිමාණ ව්‍යාපාර පමණක් නොවෙයි, මේ රටේ ජනතාවගේ එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය දෑ, එදිනෙදා අවශ්‍යතාවන්ට වුවමනා දෑ, දෛනික දිවි පෙවෙත ගෙන යන්න අවශ්‍ය දෑ සපයා ගනිමින් ජීවන රටාව සකස් කර ගන්න තිබුණු සතොස ආයතනය සම්පූර්ණයෙන් විනාශ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියන්නම් මේ රජය විදුලි බලාගාර නවීකරණය කිරීමට කරන වියදම් ප්‍රමාණ. පැරණි ලක්ෂපාන සඳහා රුපියල් මිලියන 1,065ක්, ඉහළ කොත්මලේ සඳහා රුපියල් මිලියන 4,800ක්, සමනළ වැව ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1,000ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. එහෙම නම් සමස්ත විදුලිබල පද්ධතිය මඟින් ජනතාවට සේවාවක් ලබා දීමේ වගකීම රජයක් හැටියට අපට තිබෙනවා. රජයක් හැටියට අපට ඒ වගකීම තිබෙන නිසා තමයි ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි ඇමතිතුමිය යම්කිසි මිල සංශෝධනයක් ඉදිරිපත් කළේ. එතුමිය ඉදිරිපත් කරපු මිල සංශෝධනය අද වන කල් තිරණය වෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් විපක්ෂයට එල්ලෙන්න වැල් නැතිවයි ඉන්නේ. අතිසාරයට අමුඩය ගැහුවා වාගේ දැන් අමුඩය ගහලා තිබෙන්නේ වැටට තියලායි. දැන් ඉස්සරහට යන්නත් බැහැ; පස්සට යන්නත් බැහැ. ගහපු තැනම ඉන්නේ ඒකයි. වැටට තියලායි අමුඩය ගහලා තිබෙන්නේ. විපක්ෂයට ඉස්සරහට යන්නත් බැහැ, පස්සට යන්නත් බැහැ. [බාධා කිරීමක්] ඒ නිසා අපි විපක්ෂයට කියනවා- [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු ඇමතිතුමා. දැන් කථාව අවසන් කරන්න.

ගරු ගාමිණි විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විපක්ෂයට කාරණයක් කියනවා. ඒ අය බලාපොරොත්තු වෙනවා මේ රටේ ජනතාව පාරට බස්වන්න. ඒ අය බලාපොරොත්තු වෙනවා මේ ආණ්ඩුව පෙරලන්න. ඒ අය බලාපොරොත්තු වෙනවා ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න, මේ ආණ්ඩුව -රජය- සහ මහ ජනතාව අතර තිබෙන සම්බන්ධතාව දුර්වල කරන්න. හැබැයි එහෙම කරන්න බැහැ. මේවායෙන් විපක්ෂය තවතවත් දුර්වල වෙලා කැලි කැලිවලට කැඩිලා යනවා. මේක හරියට යුද්ධ ටැංකියකට ගල් ගහනවා වාගෙයි. ගල් ගහගෙන ගහගෙන යනකොට ඒ අයට හසු වෙලා තිබෙන්නේ බලු වසුරු. බලු වසුරු තමයි හසු වෙලා තිබෙන්නේ. ඒවායෙනුත් ගහනවා. එහි මුලත් එකයි, මැදත් එකයි, අගත් එකයි. එකම ගඳක් තිබෙන්නේ. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා. 5.02]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිතවත් ගරු විජිත් විජයමුණි ද සොයිසා ඇමතිතුමා කථා කළාට පසුවයි මට කථා කරන්න අවස්ථාව ලැබුණේ. මේ රටේ විදුලි බිල සම්බන්ධව විශාල අර්බුදයක් තිබෙන වෙලාවේ, ඒ වාගේම මේ රටේ ජනතාවගේ විදුලි බිල සියයට 50කින්, 60කින්, 70කින් වැඩි වන වෙලාවේ ඒකේ වැරැද්ද තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ කියලා කියන්න රජයේ ඇමතිවරුත්, මන්ත්‍රීවරුත් විශාල ප්‍රයත්නයක් දැරුවා. අපේ හිතවත් පී. දයාරත්න ඇමතිතුමා එදා එක්සත් ජාතික පක්ෂ රජයේ විදුලිබල ඇමතිවරයා විධියට අවුරුදු 10ක් විතර සේවය කළා. මේ කථා අහන කොට එතුමා කල්පනා කරනවා ඇති, ඇයි මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු මාව සමච්චලයට ලක් කරන්නේ කියලා. ඒ අය දැන් කථා කරපු විධියට විදුලි බිල සියයට 50කින්, 60කින් විතර වැඩි වෙනවා. 2012 දී විතරක් අලාභය රුපියල් බිලියන 61යි. රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, 1994 එක්සත් ජාතික පක්ෂය සන්ධානයට ආණ්ඩුව භාර දෙන කොට විදුලිබල මණ්ඩලයේ වාර්ෂික ලාභය විතරක් රුපියල් මිලියන 4,000කට කිට්ටු කරලා තිබුණු බව. 1994 දී ආණ්ඩුව භාර දෙන කොට විදුලිබල මණ්ඩලයේ ස්ථාවර ගිණුම්වල රුපියල් මිලියන 10,000කට වැඩිය සල්ලි තිබුණා. මහවැලියෙන් රන්දෙණිගල, වික්ටෝරියා, රන්ටැඹේ, කොත්මලේ විදුලි බලාගාර හදලා ඒවාට ණය ගෙවන ගමන් තමයි විදුලිබල මණ්ඩලය ඒ සියල්ල කළේ. කොහොමද දැන් ඒවා පාඩු ලබන්නේ?

එක්සත් ජාතික පක්ෂ රජය විසින් විශාල ලෙස විදුලි බිල වැඩි කළා කියලා ආණ්ඩුවේ මන්ත්‍රීවරු කථා කළා. 1982 විදුලිය ඒකකයක විකුණුම් මිලෙහි සාමාන්‍යය රුපියල් 1යි ශත 49යි. 1994 වෙන කොට වැඩි වෙලා තිබෙන්නේ රුපියල් 3.56 දක්වා විතරයි.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අන්න වැඩ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
1977 විදුලිය ඒකකයක් කියද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔබතුමා වාඩි වෙන්න. 1977 figures නැහැ, 1982 ඉඳලා figures විතරයි තිබෙන්නේ. සියයට 100කින්වත් වැඩි වෙලා නැහැ. නමුත් තමුන්නාන්සේලා ඒ රුපියල් 3.56 1994 ඉඳලා අද වෙන කොට හය ගුණයකින්, ඒ කියන්නේ රුපියල් 21.50 වෙනකල් වැඩි කරලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ රජය අවුරුදු 17ටම වැඩි කරලා තිබෙන්නේ දෙගුණයයි. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ තිබුණු විදුලි බිල තමුන්නාන්සේලාගේ අවුරුදු 19 ඇතුළත හය ගුණයකින් වැඩි කරලා තිබෙනවා. ඊට පස්සේ තමුන්නාන්සේලා එක්සත් ජාතික පක්ෂයට වැරදි කියන්න එනවා.

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

1970 දශකය වෙන කොට මුළු ලංකාවේම විදුලිය නිෂ්පාදනය මෙගාවොට් 268යි. ජල විදුලිය නිෂ්පාදනය මෙගාවොට් 192යි. අපේ කාලය ආරම්භයේ මෙගාවොට් 192ක්ව තිබුණු ජල විදුලිය නිෂ්පාදනය 1994 වෙන කොට මෙගාවොට් 1,137 දක්වා වැඩි කරන්න අපට පුළුවන්කම ලැබුණා. වික්ටෝරියා, කොත්මලේ, රන්දෙණිගල, රන්ටැඹේ, සමනල වැව, ඒ සියල්ලේ වැඩ අවසන් කරලා ජනතාවට රුපියල් 3.76 විදුලිය ඒකකයක් දෙන්න අපට පුළුවන්කම ලැබුණා. තමුන්නාන්සේලාගේ කාලයේ ඇයි මීල වැඩි වුණේ?

මේ රටේ ගල් අඟුරු විදුලි බලාගාර ආරම්භ කරන්න ඕනෑ කියලා එක්සත් ජාතික පක්ෂ රජය තීරණය කළා. නමුත් අපි අවුරුදු 17ක් තුළ විදුලිබල පද්ධතියට මෙගාවොට් 800ක් විතර එකතු කළා. තමුන්නාන්සේලාගේ අවුරුදු 19ක කාලයේ ගල් අඟුරු විදුලි බලාගාර හදන්නේ නැතුව 1997 දී තාප විදුලි බලාගාර හදන්න පටන් ගත්තා. ඒක නිසා තමයි අද විදුලි බිල වැඩි වෙලා තිබෙන්නේ. 1997 දී පෞද්ගලික සමාගම් 9කට ඒවා භාර දීලා තමුන්නාන්සේලා අද ඒ පෞද්ගලික සමාගම්වලින් විදුලිය ඒකකයක් රුපියල් 30ට, 35ට, 40ට වගේම රුපියල් 45ටත් ගන්නවා. අවශ්‍යතාව මෙගාවොට් 2,100යි. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ මුල් ටික කළේත්, ලක්ෂපාන ආශ්‍රිතව වැඩියෙන් විදුලි බලාගාර හැදුවේත් එක්සත් ජාතික පක්ෂ රජයේ හිටපු නායකයෙක් වන සර් ජෝන් කොතලාවල මේ රටේ වැඩ ඇමති විධියටයි.

මේ මෙගාවොට් 2,100ට තමුන්නාන්සේලාට මේ අවුරුදු දහනවයටම එක්කහු කරන්න පුළුවන්කම ලැබුණේ ඉහළ කොත්මලේ මෙගාවොට් 150 විතරයි. හිටපු විදුලිබල ඇමති දයාරත්න ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා මට වඩා හොඳින් මේ පිළිබඳව දන්නවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ඊ. රඤ්ජිත් ත සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)
නොරොච්චෝලේ?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
නොරොච්චෝලේ ජල විදුලි බලයෙන් නොවෙයි නේ ක්‍රියාත්මක වෙන්නේ. මේවා පොඩි ඒවා. මේවා මෙගාවොට් 15, මෙගාවොට් 20, මෙගාවොට් 50 ඒවා. මම අහන්නේ මේකයි. අපි ජල විදුලි ඒකකයක් රුපියල් තුනට නිපදවන කොට, ආණ්ඩුවේම ඇමතිවරු කිව්වා අද විදුලි බල ඒකකයක සාමාන්‍ය වියදම රුපියල් 23යි කියලා. තමුන්නාන්සේලා ගන්න හැම විදුලි ඒකකයකටම තමුන්නාන්සේලාගේ ආණ්ඩුව රුපියල් 40ක් ගෙවනවා.යූඑන්පී ආණ්ඩුවේ රුපියල් තුනයි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ රුපියල් 40යි එක්කහු කරලා තමයි සාමාන්‍ය ගණන රුපියල් 21.50ක් වෙන්නේ. මේ ආණ්ඩුව මේවාට වග කියන්න ඕනෑ. අවුරුදු 19ක් තිස්සේ තමුන්නාන්සේලායි ආණ්ඩු කළේ. අපේ අවුරුදු දෙක ගැන කථා කරලා වැඩක් නැහැ. අපේ අවුරුදු දෙක එන කොට මේ රටේ විදුලිය දුන්නේ පැය ගණනක් විතරයි. රත්වත්තේ ඇමතිතුමාගේ කාලයේ විදුලිය දුන්නේ එක්කෝ පැය දොළහයි, පැය හයයි නැත්නම් පැය දහයයි. තමුන්නාන්සේලා මේකට වග කියන්න ඕනෑ. අද රුපියල් 15ක්, රුපියල් 16ක්, රුපියල් 18ක්, රුපියල් 20ක් විදුලි පාරිභෝගිකයා මේ සඳහා ගෙවනවා. ගල් අඟුරු විදුලි බලාගාර 1994 ඉඳලා අවුරුදු දෙකක්, තුනක් ඇතුළත හරියට හැදුවා නම් අද විදුලි ඒකකයක් රුපියල් 8කට, නැත්නම් 9කට දෙන්න තිබුණා. තමුන්නාන්සේලා වැරැද්ද කරලා අපේ පිට පවරනවා.

ඒ විතරක් නොවෙයි. විදුලිබල මණ්ඩලය ඉදිරිපත් කර තිබෙන වාර්තාවෙන් පැහැදිලිව පෙනෙනවා, විදුලිබල මණ්ඩලය පාඩු ලබන්න පටන් අරගෙන තිබෙන්නේ 1997 වර්ෂයේ සිට බව. එහෙම පාඩු ලැබුවේ තාප විදුලි බලාගාර හදපු නිසායි. අපේ මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා කිව්වා මෙහි සියයට 70ක දූෂණ නැහැ කියා. සියයට 70ක් වියදම් කරන්නේ විදුලිබල මණ්ඩලයෙන්.මේකේ තෙල් අදින එකෙනුත් ගහනවා. කොන්ත්‍රාත් දෙන එකෙනුත් ගහනවා. සියයට 70ක් විදුලිබල මණ්ඩලයෙන් කොන්ත්‍රාත් දෙද්දී රජයේ ටෙන්ඩර් පටිපාටිය නැහැ. මේවාට ඩීසල් අදිද්දී ඛනිජ තෙල් සංස්ථාවේ ඩීසල් අදිනවා වාගේ තුන් ගුණයක ප්‍රවාහන ගාස්තු ගෙවනවා. මේවා තිබුණා, 2007 මහ බැංකු වාර්තාවේ. අපි අහනවා, පාරදෘශ්‍යභාවය බලන, විනිවිදභාවය බලන ආණ්ඩුව අවුරුදු හයක් ගත වුණත් මේ හොරකම් නැවැත්තුවාද කියලා. මේ හොරකම් නැවැත්තුවාද? මේවා ආණ්ඩුවේම මහ බැංකු වාර්තාවේ තිබෙන ඒවා. සමහර පෞද්ගලික සමාගම්වලින් රුපියල් 45කටයි විදුලිය ඒකකයක් ගත්තේ. අපි අහනවා මේවායේ කොමිස් යන්නේ කාටද කියලා. තාප විදුලි බලාගාර, දැව් තෙල්, ඩීසල් පාවිච්චි කරලා හරියට නිෂ්පාදනය කළත් රුපියල් 25කට අඩු ගණනකුයි යන්නේ. අපි අහනවා කොමිස් නැත්නම් රුපියල් 45ට දෙන්නේ ඇයි කියලා. 1997 දී මේවා අත්සන් කළේ අවුරුදු 15ට, අවුරුදු 20ට වාගේ කාල සීමාවන්වලටයි. ඊයේ පෙරේදා ආපසු මේවායේ කාලය දික් කළා. ඇයි දික් කළේ, මෙච්චර අලාභයක් ලබද්දී? මේ ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව, වැරැදි කළමනාකරණය, දූෂණය, වංචාව නිසා අද මේ රටේ ජනතාවටයි වන්දි ගෙවන්න වෙලා තිබෙන්නේ. මේකට තමුන්නාන්සේලා සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ.

මම මෙතැන දී කිව්වා, 1982 දී විදුලිය ඒකකය රුපියල් 1.49යි, 1994 දී විදුලිය ඒකකය රුපියල් 3.56යි කියලා. අද විදුලිය ඒකකය රුපියල් 21.50යි. තමුන්නාන්සේලාට අවුරුදු 19 කාලය තුළ හරියට එක ගල් අඟුරු විදුලි බලාගාරයක් හදා ගන්න බැරි වුණා. හදපු නොරොච්චෝලේත් කැඩෙනවා, හදනවා; කැඩෙනවා හදනවා. එහි නිපදවන්නේ මෙගාවොට් 300යි. ඒක කරච්චලයක් වෙලා. අපේ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න ඇමතිතුමා කිව්වා, දැන් මේක අලුත් එකක්, ඒ නිසා කැඩෙනවාය කියලා. එහෙනම් අලුත් කාර් එහෙමත් කැඩෙනවා ඇති නේද?

මම කියන්නේ තමුන්නාන්සේලා කොමිස් අරගෙන පරණ බඩු ගෙනැල්ලා විදුලි බලාගාර හදනවා කියලායි. ඊට පසුව තව මෙගාවොට් 600ක එකක් හදනවාය කියනවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ඩි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)
ඒ කාලයේ ජල විදුලිය තිබුණා. සමනලවැව ජල විදුලි බලාගාරය හැදුවාට පස්සේ මේ රටේ ජල විදුලි බලාගාර හදන්න වෙන තැන් තිබුණේ නැහැ. එකයි තිබුණේ. ඒ තමයි ඉහළ කොත්මලේ. එතකොට අපට තාප බලයට යන්න සිද්ධ වුණා. 1998 දී තාප බලාගාර බිහි කළේ දැව් තෙල්වලින්. දැව් තෙල්වලින් දුවපු ඒ බලාගාරවලින් ඒ වෙලාවේ ඒකකයකට රුපියල් 12ක්, 13ක් වාගේ මුදලක් තමයි අය කළේ. රුපියල් විසි ගණනකට කවදාවත් ගත්තේ නැහැ. ඊට පසු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ආවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
දැන් කියටද ගන්නේ?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
පොඩ්ඩක් ඉන්න. කරු ජයසූරිය මහත්මයා AES විදුලි බලාගාර ගෙනාවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඇමතිතුමනි, මම ඉඩ දෙන්නේ නැහැ. ඔබතුමා පසුව කියන්න. මට සීමාසහිත කාලයක් තමයි ලැබී තිබෙන්නේ. කරුණාකර මට අවස්ථාව දෙන්න. පෞද්ගලික විදුලි බලාගාර සියයට 90ක්ම හදා තිබෙන්නේ සන්ධාන ආණ්ඩුවෙනුයි. තමුන්නාන්සේලා වැරැද්ද කරලා තව අසත්‍ය ප්‍රකාශ කරන්නත් එපාය කියා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමනි, අපි තමුන්නාන්සේට බොහොම සලකනවා. නමුත් කරුණාකරලා මේ වැඩේ කරන්න එපාය කියා අපි තමුන්නාන්සේගෙන් ඉල්ලනවා. මෙගාවොට 550ක් ගන්නවා, පෞද්ගලික විදුලි බලාගාරවලින්. ඒවාට තමයි විදුලි බිලෙන් තුනෙන් දෙකක්ම යන්නේ. මම අහන්නේ මේ මොන ගැහිල්ලක්ද? අපි අද රුපියල් 3,000ක විදුලි බිලක් ගෙවිවොත් රුපියල් 2,000ක්ම යන්නේ පෞද්ගලික විදුලි සමාගම්වලටයි. සාක්කුවට කීයක් යනවාද කියා අපි දන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. පෞද්ගලික විදුලි බලාගාරවල රක්ෂණ වාරිකයට විතරක් CEB එක බර ගණනක් ගෙවනවා. ඒකේ ප්‍රතිලාභය පෞද්ගලික සමාගම්වලට මිස ආණ්ඩුවට නොවෙයි. එහෙමයි විදුලි බිල වැඩි වෙලා තිබෙන්නේ. අද මොකක්ද ආණ්ඩුවට වෙලා තිබෙන්නේ? අද ආණ්ඩුව මේක වහන්න යනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ජනාධිපතිතුමා කියනවා, විදුලිය බිල අඩු කරනවාය කියා. මොකද, අපි වැඩි කරපු ඒවාද අඩු කරන්නේ? ආණ්ඩුවම වැඩි කරලා ආණ්ඩුවම අඩු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් ඕනෑ. මොකද, මගේ කාලය ගත්තා. සන්ධාන ආණ්ඩුවෙන් විදුලිය බිල වැඩි කරපු නිසා අද සමහර ගෙවල්වල ශීතකරණය - fridge එක - off කරලායි තිබෙන්නේ. සමහර ගෙවල්වල iron එක පැත්තකින් තියලා. සමහර ගෙවල්වල rice cooker එක වැඩට ගන්නේ නැහැ. මම හිතන්නේ හෙට අනිද්දා වනකොට - [බාධා කිරීමක්] තමුන්නාන්සේට ගෙයක් නැති නිසා ප්‍රශ්නයක් නැහැ. තමුන්නාන්සේ කට වහගෙන ඉන්න. හෙට අනිද්දා වනකොට විදුලි බිල ආවාම මේ රටේ විදුලි උපකරණ කෞතුක භාණ්ඩ කරන්න වේවි. ජනාධිපතිතුමා කිව්වා, මේ විදුලි බිල වෙනස් කරනවාය කියා. විදුලි බිලේ තිබෙන තවත් වැරැද්දක් තමයි විදුලි ඒකක් 60ක් වනකොට -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මට නියමිත වෙලාව ඉවරද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඉවරයි. මට කරන්න දෙයක් නැහැ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
තව විනාඩියක් දෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බැහැ, තවත් කාලය දෙන්න අමාරුයි. මී ළඟට ගරු පී. දයාරත්න ඇමතිතුමා.

[අ.භා. 5.16]

ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතා වැදගත් ප්‍රශ්නයක් ගැන කථා කරන අවස්ථාවක්. විදුලිය මිල වැඩි කිරීම පිළිබඳව මේ අවස්ථාවේදී විරුද්ධ පක්ෂය ගෙනා යෝජනාවට පිළිතුරු වශයෙන් නොයෙකුත් අදහස් පළ වුණා. මේ රටේ ජනතාවට දීර්ඝ කාලයක් තිස්සේ විදුලිය ලබා දුන්නා. 1950 වනකොට කොළඹ අයට විතරක් ලැබුණු විදුලිය අද මේ රටේ ජීවත් වෙන පවුල්වලින් සියයට 90කට පමණ ලබා දෙන්නට කටයුතු කර තිබෙනවා. මේ ආකාරයට විදුලිය ලබා දීම සඳහා නොයෙකුත් ක්‍රම යොදා ගෙන තිබෙනවා. අපි මුලින්ම ආරම්භ කළේ ලක්ෂපාන වැනි ජල විදුලි යෝජනා ක්‍රමයි. ඒ කාලය තුළදී විදුලි බලාගාර සෑහෙන ප්‍රමාණයක් දිගටම ඇති කළා.

ඕනෑම රටක ජල විදුලි බලාගාර ඇති කළ හැකි ප්‍රමාණයේ සීමාවක් තිබෙනවා. ඒ සීමාවට ආවාට පස්සේ අපි විකල්ප සොයා ගෙන යනවා. මේ හැම රටකටම ඒක සිද්ධ වෙලා තිබෙනවා. අද මහා බ්‍රිතාන්‍යය වාගේ රටවල ජල විදුලිය ඇත්තේම නැහැ. හැම වෙලාවේම මුළු රටටම විදුලිය ලබා දෙන්නේ තාප බලාගාරවලින්; එක්කෝ ගල් අඟුරුවලින් වැඩ කරන යන්ත්‍රවලින් නැත්නම් න්‍යෂ්ටික බලයෙන් නැත්නම් ඩීසල් යන්ත්‍රවලින් විදුලිය ජනනය කිරීමෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අපේ රටේ තිබෙන ජලයෙන් ලබා ගත හැකි උපරිම ප්‍රමාණයට කිට්ටු වන්න ජල විදුලිය ලබා ගෙන තිබෙනවා. ප්‍රධාන පෙළේ විදුලි බලාගාර හදනවා නම් අපට තවත් ඉතුරු වෙලා තිබෙන්නේ උමා ඔය සහ බ්‍රෝඩ්ලන්ඩ්ස් පමණයි. ඊට එහාට යන්න පුළුවන්කමක් නැහැ.

සම්පූර්ණයෙන් ජල විදුලිය තිබෙන ඒ අවස්ථාවේදීත් ඩීසල් විදුලි බලාගාර කීපයක් ඇති කරන්න ඕනෑයි කියලා විදුලිබල මණ්ඩලය කියා සිටියා. ඒකට හේතුවක් තිබෙනවා. ඩීසල් විදුලි බලාගාර ඇති කරන්නේ මොකටද? රටේ දේශගුණය වෙනස් වන කොට, වර්ෂාපතනය අඩු වන කොට සමහර අවස්ථාවලදී කොතරම් ජල විදුලිය තිබෙන රටක වුණත් ඒවායේ විදුලි නිෂ්පාදනය අඩු වන කොට විදුලි බලාගාරවලට වෙනත් ආකාරයෙන් විදුලිය ලබා ගන්න ක්‍රම සොයා ගන්නට වෙනවා. මට මතකයි, ඒ නිසා තමයි මුලින්ම සපුගස්කන්දේ විදුලි බලාගාර දෙකක් එදා ආරම්භ කළේ. එසේ කළේ විදුලියේ නිෂ්පාදනය නිසා නොවෙයි, හදිසි අවස්ථාවක විදුලිය ලබා ගැනීම සඳහායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විදුලිබල අමාත්‍යාවරයා හැටියට අවුරුදු ගණනාවක් සිටියා. මට මතකයි, 1987 දී පළමුවන

[ගරු පී. දයාරත්න මහතා]

වතාවට ගල් අඟුරු බලාගාරයක් ඇති කිරීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් වුණා. ඒ අවස්ථාවේදී විදුලිය ඉල්ලීම සියයට 8කින් පමණ වැඩි වී ගෙන ගියා. විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවරු දැක්කා, වර්ෂයකට සියයට 8කින් විදුලි ඉල්ලුම වැඩි වන විට අනාගතයේ අපට විශාල විදුලි හිඟයක් ඇති වන එක්තරා අවස්ථාවක් එනවා කියලා. 1987 දී අපි කිව්වා, 1996 දී බරපතළ විදුලි හිඟයක් ඇති වනවා, පැය පහ, හය විදුලිය කපා හැරීම් කරන්නට සිද්ධ වෙයි කියලා. ඒක පැහැදිලිවම කිව්වා. ඒ වෙලාවේ මම විදුලිබල ඇමති විධියටයි කටයුතු කළේ. මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඇවිත් ඒ ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී දෙපැත්තෙන්ම මහා බරපතළ විරෝධයක් ආවා. මෙවැනි තාප විදුලි බලාගාර ඇති වුණොත් එහෙම මේ රටේ විශාල පරිසර හානියක් සිද්ධ වනවා; අපේ තේ වතුවලට විශාල හානියක් වෙයි කියලා කිව්වා. නොයෙකුත් දේවල් එදා පත්තරවල ලියුවා. හැම තැනම විශාල ප්‍රචාරයක් ගෙන ගියා. ඒ වුණත් 1987 දී ත්‍රිකුණාමලයේ තාප විදුලි බලාගාරය ඇති කරන්න වැඩ කටයුතු අපි ආරම්භ කළා. ආරම්භ කළා කියන්නේ අපි ශක්‍යතා වාර්තා සකස් කළා. මට මතකයි, 'බ්ලැක් ඇන්ඩ් වීච්' කියලා ස්විට්සර්ලන්තයේ සමාගමක් ශක්‍යතා වාර්තාව සකස් කළ බව. 1989 වන කොට සැලසුම් සකස් කරලා, ටෙන්ඩර් කැඳවලා ඒ කටයුතු කරන තත්ත්වයකට ඇවිල්ලා තිබුණා. නමුත් මොන හේතුවක් නිසා හෝ බොහෝ දෙනා මෙයට විරුද්ධ වුණා. පසුව මෙය කළේ නැහැ. එහෙමම ඉදිරියට ගියා. 1989න් පස්සේ 1992 පමණ වන විට මගේ කාලයේ ආරම්භ කළ සමනළ වැව ව්‍යාපෘතියෙන් විදුලිය ජනනය කරන්න පුළුවන් වුණා. ඒත් එක්කම අමතරව සපුගස්කන්දේ විදුලි බලාගාර දෙකත් ඇති කළ නිසා තව අවුරුදු දෙක තුනක් විදුලිය කැපීමක් නොමැතිව කටයුතු කරගෙන යන්නට පුළුවන් වුණා.

ඊට පසුව 1994 සිට හුඟක් දුරට විදුලිය හිඟයක් ඇති වන්න පටන් ගත්තා. විදුලිය කපා හැරීම සිදු වුණා. නමුත් මොන හේතුවක් නිසා හෝ එදා පැවැති ජනාධිපතිනියගේ රජයත් තාප විදුලි බලාගාරයක් නැත්නම් ගල් අඟුරු විදුලි බලාගාරයක් ඇති කිරීම සඳහා පියවරක් ගත්තේ නැහැ. ඒ යෝජනාවල් කොයි අවස්ථාවකවත් සාකච්ඡා කළේ නැහැ. ඊට පසුව විදුලිය කපා හැරීම සිද්ධ වුණා. එදා රජයට සිද්ධ වුණා, කලින් මැති ඇමතිවරු කිව්වා වාගේ විදුලිය සපයන්නට මොන ක්‍රමයකින් හෝ විදුලිය ලබා ගන්නට ක්‍රම සොයා ගන්නට. ඒ නිසා තමයි ඩීසල් විදුලි බලාගාර ගණනාවක් ඒ කාලය තුළදී ඇති කළේ.

මුලින්ම ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම ඇති කරලා මෙගාවොට් 20ක විතර විදුලියක් නිෂ්පාදනය කරන විශාල විදුලි බලාගාර දෙකක් ඇති කළා මට මතකයි. Asia Power කියලා තව සමාගමක්, Colombo Power කියලා තවත් සමාගමක් - බෝට්ටුවක සවි කරපු විදුලි බලාගාරයක්- ඇති කළා. ඒ විධියට විදුලි බලාගාර 7, 8ක් ඇති කරන්න සිදු වුණා. නමුත් ඒ කාලයේ ත්‍රිකුණාමල ප්‍රදේශය ගැන හිතන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ වන කොට ත්‍රිකුණාමල ප්‍රදේශයේ පැවැති ත්‍රස්තවාදය නිසා ඒ සියල්ලම අත හැර දාලා වෙනත් විකල්පයක් හෙව්වා. විකල්ප ස්ථානයක් සොයා ගන්නා එකත් පහසු කටයුත්තක් නොවෙයි. විදුලි බලාගාරයක් හදන්න කලින් හුඟක් පර්යේෂණ කරන්න තිබෙනවා. ඒ ස්ථානය පිළිබඳව, තිබෙන පහසුකම් පිළිබඳව, ඒ වාගේම ගල් අඟුරු ගොඩ බෑම පිළිබඳව පර්යේෂණ කරන්න තිබෙනවා. ඒ වාගේ ප්‍රශ්න රාශියක් තිබුණා. අවසානයේදී සොයා ගත්තා නොරොච්චෝලේ මෙය කරන්න පුළුවන් කියලා. නොරොච්චෝලේ කරන්න පුළුවන් කියලා සොයා ගත්ත වෙලාවෙක් නොයෙකුත් අදහස් ප්‍රකාශ කළා. ගල් අඟුරු නැවෙන් පිටතට ගන්නේ කොයි විධියටද කියන ඒ වාගේ අදහස් ප්‍රකාශ කර කර ප්‍රමාද කිරීම තමයි දිගටම සිද්ධ වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1989 දී වාගේ ඒ විදුලි බලාගාරය හදන්න අපට ජපානයෙන් ඩොලර් මිලියන 30,000ක - රුපියල් බිලියන 30ක් 35ක් පමණ- ආධාරයක්, නැත්නම් විශාල ණයක් ලබා දෙන්න ඉදිරිපත් වෙලා හිටියා මට මතකයි. එවැනි විශාල මුදලක් අපට ලබා දෙන්න ජපානයෙන් කැමැති වෙලා තිබුණා. ඒ මුදල අපට ලබා දෙන්න ජපානයෙන් කැමැති වෙලා තිබෙද්දි එදා පැවැති එක්සත් ජාතික පක්ෂ රජයවත්, ඊට පස්සේ පත් වුණු ගරු ජනාධිපතිතුමියගේ රජයවත් ඒක භාර ගත්තේ නැහැ. මොන හේතුවක් නිසාද කියා මා දන්නේ නැහැ, දිගින් දිගටම ඒක ඇද ගෙන ගියා. [බාධා කිරීමක්] ඒ කාලයේ හුඟ දෙනෙකුගෙන් නොරොච්චෝලේ ගැන විරෝධය පළ වෙන්න පටන් ගත්තා මට මතකයි. දැන් අපේ පැත්තේ ඉන්නා සමහර මන්ත්‍රීතුමන්ලාත්, විපක්ෂය පැත්තේ ඉන්න සමහර මන්ත්‍රීතුමන්ලාත්, ඒ පැත්තේ ඉඳලා මේ පැත්තට ආපු අයයි, මේ පැත්තේ ඉඳලා ඒ පැත්තට ගිය අයයි කියන සියල්ලෝම නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ගැන මේ පාර්ලිමේන්තුවේදී කථා කළා මට මතකයි. අක්කර 150ක විතර ලස්සන ඉඩම, කෘෂි කර්මාන්තයට වෙන් කරන්න පුළුවන් ඉඩමක්, අපරාදේ විදුලි බලාගාරයක් ඇති කරන්න යන්නේ කියලා නොයෙකුත් අය කිව්වා. [බාධා කිරීමක්] නමුත් මමත් ඒ අවස්ථාවේදී ඒ ස්ථානයට ගිහිල්ලා බැලුවා. තල් ගස් දෙක තුනක් හැරෙන්න, තණ කොළ හැරෙන්න වෙන කිසිවක් තිබුණේ නැහැ. ඒක කෘෂි කාර්මික ඉඩමක් කියලා කියන්න පුළුවන්කමක් නැහැ. ඒ ස්ථානය විදුලි බලාගාරයක් ඇති කරන්න සුදුසුකම් තිබෙන ස්ථානයක් බව අපට පැහැදිලිව පෙනුණා. ඉතින් මට මතකයි, ඒ අවස්ථාවේ ජපානයෙන් ලැබෙන්න තිබෙන මුදල අපි භාර ගත්තේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
හිටපු ජනාධිපතිතුමියත්-[බාධා කිරීම්] ඔබතුමන්ලාගේ ලොක්කි.

ගරු පී. දයාරත්න මහතා
(*மாண்புமிகு பீ. தயாரத்ன*)
(The Hon. P. Dayaratna)
මා දන්නා තරමින් 2002 මාර්තු මාසයේ -[බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. කාගේ ලොක්කා හෝ කමක් නැහැ. ඒක සිද්ධ වුණා. [බාධා කිරීම්] පොඩ්ඩක් අහ ගන්න කෝ.

2002 මාර්තු මාසයේ 31වැනි දා අපි ජපන් තානාපතිව කැඳවලා කිව්වා, විදුලි බලාගාරය හදන්න ඩොලර් මිලියන 30,000ක් දෙන්න ගිය එක ගැන තමුන්නාන්සේලාට බොහොම ස්තුතියි; නමුත් අපට ඒක අවශ්‍ය වෙන්නේ නැහැ කියලා. [බාධා කිරීම්] මා හිතනවා අපි එපාය කිව්ව නිසා ඒ ගැන ජපන් රජයත් වැඩි කැමැත්තෙන් හිටියේ නැහැ කියලා. ඒක එතැනින් අවසන් වුණා. ඊට පස්සේ විදුලි බලාගාර තැනීම එදා රජයටත්-

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
නොරොච්චෝලේ බලාගාරය?

ගරු පී. දයාරත්න මහතා
(*மாண்புமிகு பீ. தயாரத்ன*)
(The Hon. P. Dayaratna)
නොරොච්චෝලේ එක කළා. [බාධා කිරීමක්]

ඊට අවුරුද්දකට, දෙකකට පස්සේ විදුලි හිඟය තවත් ඇති වුණා. ඒ රජයෙනුත් මේ රජයෙනුත් දිගටම ඩීසල් විදුලි බලාගාර ඇති කළා. ඒ මොකද, මේ රටේ ජනතාවට නොකඩවා විදුලිය

සපයන්න අවශ්‍යව තිබුණා. පැය 24ක් නොකඩවා විදුලිය ලබනවාය කියන එක ලොකු වරප්‍රසාදයක්. ඒක ලොකු luxury එකක්.

එහෙම රටවල් අහල පහළ නැහැ. ඉන්දියාවේ හැම ප්‍රාන්තයකම හැම දාම විදුලිය කැපීම් සිද්ධ වනවා. ඉන්දියාවේ පමණක් නොවෙයි, අනික් SAARC රටවල් හැම එකේම පැය 4ක්, පැය 5ක් විදුලිය කපනවා. නමුත් ශ්‍රී ලංකාවේ අද එක පැයක්වත් විදුලිය කපන්නේ නැහැ. විශාල මුදලක් වියදම් කරලා තමයි එහෙම විදුලිය නොකපා විදුලිය ලබා දෙන්නට පුළුවන් වෙලා තිබෙන්නේ. එම නිසා විදුලිය සැපයීමේ මිල දිනෙන් දින වැඩි වුණා. එම නිසා තමයි විදුලිය ඒකකයක් රුපියල් 25කට, රුපියල් 30කට මිල දී ගන්නට සිද්ධ වුණේ. කොහොම වුණත් අපි එක වරදක් කළා කියලා මා හිතනවා. විදුලි ඒකකයක මිල දිගටම ටිකෙන් ටික වැඩි කරන්නට තිබුණා. එසේ කළා නම් මේ විදුලි බිල වැඩි කිරීම shock එකක් වන්නේ නැහැ. ඒ ආකාරයට වැඩි කළා නම් ජනතාවට මෙතරම් අපහසු තත්ත්වයක් ඇති වන්නේ නැහැ. අඩු ආදායම් ලබන, ඉතාම සුළු ප්‍රමාණයක් විදුලිය පරිභෝජනය කරන ජනතාව සියයට 75ක් ඉන්නවා. යුනිට් 1 සිට 90 දක්වාත්, යුනිට් 1 සිට 60 දක්වාත් පාවිච්චි කරන අය මිලියන දෙකහමාරක් පමණ -විදුලිය පාරිභෝගිකයන්ගෙන් සියයට 50ක් පමණ- ඉන්නවා. මේ වාගේ විශාල පිරිසකට විදුලිය සපයනවාය කියන එක පහසු වැඩක් නොවෙයි. ඒ සඳහා විශාල මුදලක් වියදම් කරන්න සිද්ධ වනවා. ඒ වාගේ දිගින් දිගටම තෙල් මිල වැඩි වුණා; රුපියලේ අගය අඩු වුණා. මේ හේතු නිසා, විදුලි මිල වැඩි වන කොට අය කිරීමත් වැඩි කරන්නට සිද්ධ වන බව අප කාටත් තේරුම් ගන්න පුළුවන් දෙයක්.

මෙන්න මේ වාගේ අවස්ථාවක විදුලිය සංරක්ෂණය කිරීම පිළිබඳව බොහෝ දුරට අපේ අවධානය යොමු කරන්න ඕනෑ. හැම තැනම විදුලිය නාස්තිය අපි දකිනවා. සමහර අය විශේෂයන් වීථි ලාම්පු පිළිබඳව කථා කරනවා. නගරයක වීථි ලාම්පු තිබෙනවා. නමුත් පිටිසර ප්‍රදේශවල වීථි ලාම්පු නැහැ. නගරයේ වීථි ලාම්පු රාත්‍රී හෝ පාන්දර හෝ කොයි වෙලාවේ හෝ යම් කිසි පැය ගණනක් පාවිච්චි කරලා ඊට පස්සේ නිවා දමන්නට පුළුවන් නම්, විශාල මුදලක් ඉතිරි කර ගන්න පුළුවන්. මේ රට තුළ විදුලිය ජනනය කිරීම සඳහා විශාල මුදලක් වියදම් වනවා. තෙල් මේ රටට ගෙන්වා පුච්චා දමන එකයි අපි කරන්නේ. ජාතියක් වශයෙන් අපි හැම කෙනකුටම යුතුකමක් තිබෙනවා, විදුලිය පුළුවන් තරම් අඩුවෙන් පාවිච්චි කරලා එය ඉතිරි කරන්නට.

මේ රටේ ජනතාව වෙනුවෙන් මේ විධියට පැය විසිහතරේම විදුලිය ලබා දෙන්නට පසු ගිය කාලය තුළ ඉදි කරන ලද විදුලි බලාගාර ඇත්ත වශයෙන්ම අවශ්‍ය වුණා. අද විදුලි ඒකකයක මිල පිළිබඳව බලන කොට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මුල කාණ්ඩය යම් කිසි මුදලකට දෙනවා. ඊළඟ කාණ්ඩය ගන්න කොට මුල් කාණ්ඩයේ අයටත් -ඒ ඒකක 30ටත්- අලුත් මිල ගෙවන්න සිදු වන නිසා තමයි විශාල අපහසුවක් වෙලා තිබෙන්නේ. හැබැයි මෙහිදී අපි තේරුම් ගන්න ඕනෑ, වැඩියෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයන්ට හැම ඒකකයකටම එක හා සමාන ගණනක් ගෙවන්න සිදු වන බව. මා හිතන හැටියට විදුලි ඒකක හත් අට සියයක් පාවිච්චි කරන කෙනෙක් ඒකකයට රුපියල් 35ක් ගෙවනවා. ඒකක 1 සිට 900 දක්වා පාවිච්චි කරනවා නම්, ඒ ඒකක 900ටම එක හා සමාන මුදලක් ඒ පුද්ගලයා ගෙවනවා. එම නිසා විදුලිය ඒකකයක් ජනනය කිරීම සඳහා යන සම්පූර්ණ වියදම ඔහුගෙන් අය කර ගන්නවාය කියලා අපට කියන්න පුළුවන්. ඒ අනුව බලනකොට විදුලිබල මණ්ඩලය පැත්තෙන් සාධාරණයක් වෙලා තිබෙනවා, වැඩිපුර පරිභෝජනය කරන අයගෙන් වැඩිපුර අය කර ගැනීමට කටයුතු කිරීම නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නිසා සමහර විට කුඩා කර්මාන්තකරුවන්ට අපහසුවක් වන්නට ඉඩ තිබෙනවා. එය අඩු පාඩුවක් හැටියට අපට පෙනෙනවා. එම නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා මේ පිළිබඳව නැවත සොයා බලන්නට මහජන උපයෝගිතා කොමිසමට උපදෙස් දීලා තිබෙන්නේ. ඒ නිසා තමයි දැන් එම කොමිසම ඒ පිළිබඳව තවදුරටත් සොයා බලා සහනයක් ලබා දීම සඳහා කටයුතු කරන්නේ.

පසු ගිය කාලයේ අපේ ගරු ඇමතිතුමියටත්, ඒ වාගේම හිටපු ඇමතිතුමාටත් නොයෙකුත්-නොයෙකුත් චෝදනා එල්ල වුණා. මම හිතන හැටියට, ඒ අයට මේකට වග කියන්නට පුළුවන්කමක් නැහැ. මේක දීර්ඝ කාලයක් තිස්සේ ඇති වේවැව ප්‍රශ්නයක්. ඒ ඒ අවස්ථාවලදී බලයේ හිටපු මැති ඇමතිවරු කවුරුත් ඉංජිනේරු මහත්වරුන්ගේ උපදෙස් අනුව ඒ කළ යුතු දේ කළා නම්, මම හිතනවා මේ තත්ත්වය අපට උදා වෙන්නේ නැහැ කියලා.

අද මේ තිබෙන තත්ත්වය ඉක්මනින්ම මහ හරවා ගැනීමට තවත් විදුලි බලාගාර කිහිපයක් මේ රටේ ඇති වෙනවා. චීනයෙන් අපට අධාර ලැබුණා. ආධාර කියන්නේ, ණය ලැබුණා. වෙනත් රටවල් ඒ සඳහා ඉදිරිපත් වුණේ නැහැ. ඒ නිසා අපි ඒ ණය ලබා ගත්තා. ඒ වාගේ අවස්ථාවල යම් කිසි අඩු පාඩු ඇති වෙනවා. අපේ කාර්මිකයන් පුහුණු කරලා ගත්තාට පස්සේ, ටික දවසක් යන කොට ඒ විදුලි බලාගාර හරියට නඩත්තු කරන්න පුළුවන් වේවි කියලා මා විශ්වාස කරනවා. මට නියමිත කාලය අවසන් නිසා මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මී ළඟට ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක් තිබෙනවා.

[අ.භා. 5.34]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සන්තෝෂ වෙනවා මේ වේලාවේ කථා කරන්න ලැබීම ගැන. මම ඉස්සෙල්ලාම කියන්න කැමතියි, අපේ හිටපු විදුලිබල හා බලශක්ති ඇමතිතුමෙක් ලොකු අසත්‍යක් මේ සභාවට ප්‍රකාශ කළ බව. මම ඉස්සෙල්ලාම ඒක නිවැරැදි කරලා ඉන්න ඕනෑ. එතුමා කිව්වා, AES Kelanitissa කියන විදුලි බලාගාරය එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ හැදුවා කියලා. ඔබතුමා තමයි එහෙම කිව්වේ. ඔබතුමා කිව්වේ මේ විදුලිය ලොකු ගණනකට ගත්තා කියලානේ. මේ විදුලිය ගන්න ගිවිසුම - Power Purchase Agreement එක- අත්සන් කළේ කවදාද? ඒ Power Purchase Agreement එක අත්සන් කළේ 2000.05.06 වැනි දා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. 2000.05.06 වැනි දා. මා ළඟ ඒ ඔක්කෝම විස්තර ටික තිබෙනවා. කලබල වෙන්න එපා. [බාධා කිරීමක්]නැහැ, නැහැ. AES Kelanitissa ගැන තමයි ඔබතුමා කිව්වේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඔබතුමා ඒ වැරදි දේ කිව්වා නේ. ඊ ළඟට ඒ වැඩ ආරම්භ කරලා වැඩ කරගෙන ගියේ - date of commission - 2003.10.10වැනි දා. ඔබතුමන්ලා ආරම්භ කරලා වැඩ කරගෙන ගිය එකක් ගැන තමයි එක්සත් ජාතික පක්ෂයට චෝදනාව කරන්නේ. හැබැයි, එතකොට ඔබතුමන්ලා Power Purchase Agreement එක අත්සන් කරලා ඉවරයි. විදුලිය මිලදී ගැනීමේ වැඩ පිළිවෙළට ඔබතුමන්ලා අත්සන් කරලා ඉවරයි. ඉතින් අපි මොකද ඒකට කරන්නේ? අපි මොනවා කරන්නද ඒකට? අපට තිබෙන්නේ ඔබතුමන්ලා පටන් ගත්ත වැඩේ මුල් ගල තියලා විවෘත කරන්නයි. මේක ඔබතුමන්ලා පටන් ගත්තු එකක්. ඒ නිසා සභාව නොමඟ යවන්න එපා. කැලණිතිස්ස බලාගාරයේ විදුලි ඒකකයක ගණන රුපියල් 60 වුණා නම්, ඒ 60 වීමේ වගකීම ගන්න ඕනෑ, චන්ද්‍රිකා

[ගරු දයාසිරි ජයසේකර මහතා]

බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනියගේ ආණ්ඩුවයි. ඒක මතක තියා ගන්න. ඒ පළමුවැනි එක.

දෙවැනි එක මෙකයි. මේ අර්බුදය ඉස්සෙල්ලාම පටන් ගන්නේ වෙන කොහෙන්වත් නොවෙයි, තෙල් සංස්ථාවෙන්. මේ ඇමතිතුමියට මෙතැනට යන්න සිද්ධ වුණේ ඒකයි. 2012.12.31වැනි දා වෙන කොට කැලණිතිස්ස විදුලි බලාගාරය - මේවා පෞද්ගලික විදුලි බලාගාර- තෙල් සංස්ථාවට ගෙවන්න තිබෙනවා, මිලියන 8,073ක්. කැලණිතිස්ස විදුලි බලාගාරය මිලියන 8,073ක් ගෙවන්න තිබෙනවා. West Coast Power Plant එක, මිලියන 5,605ක් ගෙවන්න තිබෙනවා.

මම තව ඉදිරියේදී ඒ ගැන කථා කරන්නම්. බැසිල් රාජපක්ෂ මැතිතුමා කියලා තිබෙනවා, මේක hundred per cent ආණ්ඩුවේ එකක් කියලා. මම කියන්නම් ඒක hundred per cent ආණ්ඩුවේ නම් ඒකේ සභාපති කොහේද ඉන්නේ කියලා.

ඊ ළඟට, West Coast Power Plant එක මිලියන 5,605ක් ගෙවන්න තිබෙනවා. Asia Power කියන පෞද්ගලික කොම්පැනිය මිලියන 1,087ක් ගෙවන්න තිබෙනවා. හෙළදනව් එක ගෙවන්න තිබෙනවා, මිලියන 580ක්. ඇඹිලිපිටිය Ace Power එක ගෙවන්න තිබෙනවා, මිලියන 1,085ක්. හොරණ Ace Power එක ගෙවන්න තිබෙනවා, මිලියන 231ක්. මාතර Ace Power එක මිලියන 98.88ක් ගෙවන්න තිබෙනවා. Colombo Power එක මිලියන 152.72ක් ගෙවන්න තිබෙනවා. Northern Power එක මිලියන 256.31ක් ගෙවන්න තිබෙනවා. ඒ අනුව මේ සමාගම් ගෙවන්න තිබෙන සමස්ත ගණන මිලියන 17,281ක්. පෞද්ගලික විදුලිය නිෂ්පාදනය කරපු ආයතන සංස්ථාවෙන් ගත්තා වූ තෙල් සඳහා ගෙවන්න තිබෙන මුදල මිලියන 17,281ක්. මේක තමයි අර්බුදය. දැන් ඔබතුමන්ලාට ඒ සල්ලි ගෙවා ගන්න විධික්‍රමයක් හොයා ගන්න බැරුවයි ඉන්නේ. ඒ විධික්‍රමය හොයා ගන්න බැරි තැන මොකද කරන්නේ? ඒ නිසා ගරු අනුර ප්‍රියදර්ශන යාපා අමාත්‍යාවරයා කරන්නේ දැවි තෙල් ලීටරයක් රුපියල් 65 ඉඳලා 90ට වැඩි කරන එකයි. කෙරවළපිටිය බලාගාරය පාවිච්චි කරන තෙල් ලීටරයක් රුපියල් 70 ඉඳලා 100ට වැඩි කරනවා. මේ හේතුවෙන් බලාගාරවල නිෂ්පාදනය වැඩි කරන්න විධික්‍රමයක් නැතිව විදුලි ඒකකයක් කලින් මිලට දෙන්න අමාරු හන්දා තමයි දැන් ඒ බර අපේ අහිංසක දුප්පත් මිනිසුන්ගේ ඔළුව උඩට දාලා තිබෙන්නේ.

මේක vicious circle එකක්. මෙය විදුලිබල මණ්ඩලයේ ප්‍රශ්නයක් විතරක්ම නොවෙයි. මේක තනිකරම ආණ්ඩුවේ මාෆියාවේ වැඩ පිළිවෙළ. රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ, තමුන්නාන්සේලාගේ අකාර්යක්ෂම, වැරැදි, වංචා සහගත හොර ගිවිසුම් නිසා hedging ගනුදෙනුවේදී කෝටි 8,000කට වැඩිය අපට ගෙවන්න සිද්ධ වුණා. ඉන් පසුව ඒක තෙල් සංස්ථාවට ආවා. තෙල් සංස්ථාවෙන් ඒක ජල විදුලියට ආවා. මේක ඊළඟට අනික් පැත්තට කැරකෙනවා. ඒ කියන්නේ ජලයට. ජල බිලත් වැඩි කරලා තමයි තමුන්නාන්සේලා නතර කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පසුව මතු වුණු ප්‍රශ්නය මොකක්ද? තමුන්නාන්සේලා විදුලි බිල වැඩි කළා. ඒ විදුලිබල මණ්ඩලයේ යෝජනාව. මේ ගැන දිගින් දිගටම කථා කළා. ගරු විදුලිබල හා බලශක්ති ඇමතිතුමියගෙන් මම මේ කාරණය අහන්න කැමැතියි. එතුමිය මෑතකදී මේ ඇමතිකමට පත් වුණේ විදුලි බිල වැඩි කරන්න නොවෙයි. නමුත් එතුමියට අන්තිමට සිද්ධ වුණා සර්ලාගේ විදුලිබල යෝජනා ගෙනැල්ලා එතුමියගේ කර මත පටවාගන්න. ඒක තමයි දැන් වෙලා තිබෙන්නේ. එතකොට කෙරවලපිටියෙන් හොරකම් කරපු ඒවා, නොරොච්චෝලේ තාප බලාගාරවල හොරකම් කරපු ඒවා, ඒවායේ මිල වැඩි වීම්, සාමූපූර්වල ගහපු ඒවා කොච්චර තිබෙනවාද? ගරු ඇමතිතුමියනි, ඔබතුමියට මම කියා දෙන්නම්. කරුණාකරලා මේවා ගැන තව බලන්න. ඔබතුමිය මහන්සි වෙනවා කොහොම හරි මේක හදා ගන්න. කරුණාකරලා මේ හොරුන්ගෙන් ඔබතුමියත් ආරක්ෂා වන්න. අනාගතයේදී ඔබතුමියටත් හොරෙක් කියන නම ගාවා ගන්න විධියට කටයුතු කරන්න එපා කියලා පළමුවෙන්ම මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

අද කිසිම ප්‍රශ්නයක් නැහැ. ඇත්ත වශයෙන්ම විදුලි බිල වැඩි කරන්න වුවමනාවක් නැහැ. 2014 වෙන කොට, ඔක්තෝබර් මාසයේ එනවා තමුන්නාන්සේලාගේ ඊළඟ මෙගාවොට් 600. නොරොච්චෝලෙන් ඉතුරු මෙගාවොට් 600 එනවා. ඒ ප්‍රමාණ එන කොට ඇත්ත වශයෙන්ම මේ ගෙන යන ජල විදුලිය ප්‍රමාණයෙන්ම ගිහින් වැඩේ අවසන් කරගෙන යන්න තිබුණා. ඒක මා හිතන හැටියට අද මෙතැන නිලධාරීන්ගේ මැදිරියට ඇවිත් ඉන්න ලේකම්තුමන්ලා බොහොම පැහැදිලිව දන්නවා. නමුත් කරන්න දෙයක් නැතිකමට, ආණ්ඩුවේ හිරවීම කොයි තරම්ද කියනවා නම්, ඔක්තෝබර් මාසයේ එන විදුලිය ප්‍රමාණයත් අත ඇරලා තමයි තමුන්නාන්සේලා දැන් මේ වැඩේට බැස්සේ.

විදුලි බිල වැඩි කිරීමේ යෝජනාව ගෙනාවාම මහජන උපයෝගිතා කොමිෂන් සභාව විදුලිබල මණ්ඩලය ගෙන්වලා කරුණු විමසුවා. කොමිසම ඒ අයගෙන් ඇහුවා, අවුරුද්දකට ඔබතුමන්ලාට ජල විදුලිය ගිගාවොට් පැය කොයි තරම් ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්න පුළුවන්ද කියලා. විදුලිබල මණ්ඩලය කිව්වා ගිගාවොට් 2,828යි කියලා. නමුත් කොමිසම පෙන්වා දුන්නා නැහැ, ඔබතුමන්ලාට පුළුවන් 2013ට ගිගාවොට් 3,681ක් දැන් මේ තිබෙන ජල ප්‍රමාණයෙන් නිෂ්පාදනය කරන්න කියලා. අනාගතයේ තව වැස්සොත් ඒ එන ජල ප්‍රමාණය අත ඇරලා මම මේ කථා කරන්නේ. එතකොට මේ වැරැදි තොරතුරු කවුද දුන්නේ? විදුලිබල මණ්ඩලය. ඒ අය පෙන්නුවා 2013 ජනවාරි මාසයට පමණක් විදුලිබල මණ්ඩලයට ගිගාවොට් පැය 248ක් පමණයි හදන්න පුළුවන් කියලා. නමුත් මහජන උපයෝගිතා කොමිසම කිව්වා, නැහැ, 248ක් නොවෙයි, 541ක් දක්වා හදන්න පුළුවන් කියලා. එහි ගණන කීයද? රුපියල් මිලියන 15,000යි. මේ වෙනස විතරක් රුපියල් මිලියන 15,000ක්. කාගේ හරි පෞද්ගලික බලාගාරයකින් විදුලිය ගන්න තමයි මේ වැඩ පිළිවෙළ සකස් කළේ. විදුලිබල මණ්ඩලයේ සමස්ත සේවකයන් හොරු නොවෙයි. නමුත් එතැන ඉන්න තුන් හතර දෙනෙකුගේ, මේ අමාත්‍යාංශවල ඉන්න කීප දෙනෙකුගේ ප්‍රශ්න නිසා අද මුළු රටටම දුක් විඳින්න වෙලා තිබෙනවා.

විදුලි බිල වැඩි කළාට පස්සේ ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ? මෙන්න එතුමා කියපු දේ. "ඒකක 1 සිට 60 දක්වා විදුලිය ගාස්තු වැඩි වීමක් නැහැ, 180 දක්වා සහනයක් - ජනපති මැයි රැලියේදී පවසයි." එතුමා කිව්වා අනිවාර්යයෙන්ම ඒකක 60 වෙන තුරු සත පහක්වත් වැඩි කරන්නේ නැහැ, නමුත් ඒකක 90 සිට 91 දක්වා වැඩි වෙන කොට රුපියල් 1,165ක් වැඩි වෙනවා. ඒ නිසා මම තව විදුලි ඒකක 5ක් දුවන්න අවශ්‍ය කරන කටයුත්ත කරනවාය කියලා. මේ චක්‍රය හදපු නිලධාරියා තමයි මේකට සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ. ගරු විදුලිබල හා බලශක්ති ඇමතිතුමියනි, මම එය ඔබතුමියට පෙන්වන්නම්. මේ බලන්න, මේ චක්‍රය අනුව බලන කොට පේනවා මේක එක තැනක සිට තවත් තැනකට ඉතාම ඉහළින් පනින වැඩ පිළිවෙළක් බව. ඔබතුමා දන්නවා මේ යෝජනාව 2008 දී ගෙනාවාම කට්ටියක් මේකට විරුද්ධව උසාවි ගිය බව. උසාවියෙන් තීන්දු කළා අනාගතයේත් මේ ක්‍රමය අනුගමනය කරන්න එපා, සාමාන්‍ය විධියට වැඩි වෙලා යන ක්‍රමවේදය අනුගමනය කරන්න කියලා. මේකෙන් තමයි තමුන්නාන්සේලාට මේ අර්බුදය ඇති වෙලා

තිබෙන්නේ. හේතුව මොකක්ද? එක පාරට පොඩි පොඩි විධියට මෙහෙන් පටන් අරගෙන ඒකක 90 සිට 91ට එන විට එක ඒකකයකට එක පාරට රුපියල් 1,165කට පනින වැඩ පිළිවෙළක් හැදුවේ කවුද? මට මතක හැටියට බන්දුල විතානගේද කවුද මම දන්නේ නැහැ, එහෙම AGM කෙනෙක් හරි DGM කෙනෙක් හරි ඉන්නවා. එයාගේ හොර සූත්තරවලට තමයි තමුන්නාන්සේලා අහු වෙලා තිබෙන්නේ. මා දන්නේ නැහැ එතුමා මොකකට මේක කෙරුවාද කියලා. මේ වැඩ පිළිවෙළම අරගෙන අපූරුවට විදුලි බලය වැඩි කරන්න පුළුවන්. මෙච්චර දරුණු වැඩක් වෙන්නේ නැහැ. අප ලයිට් දහයක් පත්තු කරන එක ලයිට් අටක් කරලා ලයිට් දෙකක් අඩු කළත්, මේ යන ක්‍රමයට වාසියක් හම්බ වන්නේ නැහැ. නමුත් අනෙක් ක්‍රමයට, 2008 දී ශ්‍රේෂ්ඨාධිකරණය අනුමත කළ ක්‍රමයට ගියා නම් හරි. මොකක්ද ඒ හදලා තිබුණ ක්‍රමය? අඩුවෙන් විදුලිය පාවිච්චි කළොත් අඩු විදුලි බිලක්, වැඩියෙන් විදුලිය පාවිච්චි කළොත් වැඩි විදුලි බිලක්. අද මොකක්ද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලා මතක තියා ගන්න, අද මේ ක්‍රමය තුළ වැඩි වැඩියෙන් විදුලිය පාවිච්චි කරන පාරිභෝගිකයින්ට සහන ලබා දෙන වැඩ පිළිවෙළක් තමයි හදලා තිබෙන්නේ කියලා. අපි හැදුවේ ඒක නොවෙයි; අපට වුවමනා කළේ ඒක නොවෙයි. අපිට වුවමනා වුණේ, අපි කිව්වේ ඒක නොවෙයි.

දැන් දයාරත්න මහත්මයා කියන්නේ මොකක්ද? අපි විදුලිය පරිභෝජනය කිරීමේදී සාධාරණ විධියට කරන්න ඕනෑ කියලා. ඔව්. සාමාන්‍යයෙන් ලංකාවේ එක පුද්ගලයෙක් මාසයකට විදුලි ඒකක 12යි පාවිච්චි කරන්නේ. සාමාන්‍යයෙන් 4 දෙනෙකු සිටින පවුලක් විදුලි ඒකක 50යි හැම මාසයකම පාවිච්චි කරන්නේ. එහෙමයි අපි මේ ගණන් හදලා තිබෙන්නේ. අපි මේ පාවිච්චි කරන්නේ අපට පාවිච්චි කරන්නට පුළුවන් අඩුම විදුලි ඒකක ප්‍රමාණයයි. ලෝකයේ අනෙක් රටවල් දිහා බලන්න.

ඉන්දියාව වාගේ රටවල් දෙස බලන්න. ඒ රටවල එක් පුද්ගලයකු මාසයකට විදුලි ඒකක 80ක් 90ක් පාවිච්චි කරනවා. මේක තමයි ඇත්ත තත්ත්වය. එතකොට අපි තවත් පහළට යන්නේ කොහාටද? ලයිට් off කරලා ගෙදරට වෙලා නිදා ගන්නද කියන්නේ? මෙතැනටයි තමුන්නාන්සේලා අපිව තල්ලු කරලා තිබෙන්නේ. ඒ නිසා මම කියන්නට කැමැතියි, මේකට එක එක ආණ්ඩුවලට හෝ අනෙක් පුද්ගලයන්ට බැණලා වැඩක් නැහැ. බණින්නට ඕනෑ මේක හදපු නිලධාරියාට. මතක තියා ගන්න. මෙතැනින් තමයි ප්‍රශ්නය පටන් ගන්නේ. ඒ නිසා කරුණාකරලා මේ ක්‍රමය අයින් කරලා මේ වැඩ පිළිවෙළට අමතරව වෙනත් ක්‍රමයක් පාවිච්චි කරන්න. .

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට මේක යටතේ මොකක්ද වුණේ? දැන් ඔබතුමන්ලා මේ ක්‍රමය යටතේ විදුලි බිල වැඩි කළා. මොකක්ද වැඩි කළ ක්‍රමය? මේකට සම්බන්ධ වුණා Minister of Economic Development, අපේ බැසිල් රාජපක්ෂ මැතිතුමා, Minister of Power and Energy, ඒ අමාත්‍යාංශයේ ලේකම්තුමා, Ministry of Finance and Planning, එහි ලේකම්තුමා, CEB Chairman, General Manager and Director-General. මේ සියලු දෙනාම සම්බන්ධ වුණා. මහජන උපයෝගිතා කමිටුවේ සියලුම සාමාජිකයින් සහභාගි වුණා. තමුන්නාන්සේලා දැන් මොකක්ද කරලා තිබෙන්නේ? මම අහන්න කැමැතියි, ජනාධිපතිතුමා දුන්න සහනය අද හම්බ වෙලා තිබෙනවාද කියලා. කරුණාකරලා කියන්න? හම්බ වෙලා නැහැ. අද ඒකක 30 සිට 31 වන විට සියයට 33ක වැඩි වීමක් තිබෙනවා. මේ ක්‍රමය නිසා ඇති වන ප්‍රශ්නය මේකයි. මේක අඩු කරන්නට බැහැ. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, මේක දෙස බලන්න. ඒකක 30 වන තුරු ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒකක 30 සිට 31 දක්වා වැඩි වන විට සියයට 33ක වැඩි වීමක් පෙන්නුම් කරනවා. රුපියල් 61.57ක වැඩි වීමක්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. UDITH LOKUBANDARA *left the Chair, and MR. DEPUTY SPEAKER took the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, කථාව කර ගෙන යන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් එක තමයි ඒකක 60 සිට 61 දක්වා වැඩි වන විට සියයට 15ක වැඩි වීමක් තිබෙනවා. මේ විධියට ගත්තාට පසුව ඒකක 180ක් පාවිච්චි කරන අයට, එන්න එන්න අඩු වේ ගෙන යනවා. විදුලි ඒකක වැඩි වැඩියෙන් පාවිච්චි කළොත් විදුලි බිල වැඩි වීමේ ප්‍රතිශතය අඩු වේ ගෙන යනවා. මම කියන්නේ වැරැද්ද ඒකයි. වැඩියෙන් විදුලි ඒකක පාවිච්චි කරන විට වැඩියෙන් අය කරන්න. අඩුවෙන් පාවිච්චි කරන මිනිසුන්ගෙන් අඩුවෙන් අය කරන්න. තමුන්නාන්සේලාගේ මේ ක්‍රමවේදය තුළ අද තව තවත් විදුලි බලය වැඩියෙන් පාවිච්චි කරන තත්ත්වයකට තමයි තල්ලු වෙලා තිබෙන්නේ. අද මහින්ද රාජපක්ෂ මැතිතුමා දුන්න යෝජනාව, එතුමා මැයි රැලියේදී දහස් ගණන් ජනතාව ඉදිරියේ දුන්න යෝජනාව එතුමාගේම මල්ලි බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් සංශෝධනය කරනවා. මම අහන්නේ මේකේ වැදගත්කම තිබෙන්නේ අයියාටද, මල්ලිටද? අයියා කියනවා, " සහන දෙන්න" කියලා, මල්ලි කියනවා, "නැහැ සහන දෙන්න බැහැ" කියලා.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

අසත්‍යය කියන්න එපා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමිය, තමුන්නාන්සේලා සියලු දෙනාම නේ මේ රැස්වීම පැවැත්වුවේ. මම ළඟ ඒ විස්තර සියල්ලම තිබෙනවා. මේ තිබෙන්නේ යවපු ලිපිය. ගරු ඇමතිතුමිය, 2013.05.03 වන දින තමුන්නාන්සේලා රැස් වුණා. ගරු ඇමතිතුමිය, මේ ඔබතුමන්ලාගේ රැස්වීම. අවසානයේදී ෆර්ඩිනැන්ඩෝ මහත්මයා අත්සන් කරලා යවපු ලිපිය මම ළඟ තිබෙනවා. [බාධා කිරීමක්] එහෙම නම් බැසිල් මහත්මයා කියන්න ඕනෑ නේ, "මගේ අයියා, ජනාධිපතිතුමා කිව්වා මේක අඩු කරන්න කියලා. ඒකක 60 දක්වා ශත පහක්වත් ගන්න එපා කියලා එතුමා කියලා තිබෙනවා. ඒ නිසා මෙතැනින් එහාට යන්නම බැහැ" කියලා. එහෙම කියන්න ඕනෑ නේ. එහෙම නොවෙයි නේ වෙලා තිබෙන්නේ. ඔබතුමියට කථා කරන්න බැහැ නේ එතැන. ඔබතුමියගෙන් ප්‍රශ්නයක් අහපුවාම දැන් මොකක්ද කියන්නේ? "මම සර්ගෙන් අහලා කියන්නම්" කියලා. මොන සර්ගෙන්ද? ජනාධිපතිතුමාගෙන්ද, බැසිල් සර්ගෙන්ද? මම අහන්නේ එපමණයි. [බාධා කිරීමක්] මම ඒක කිව්වේ නිකම්. ඒක තමයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

[බාධා කිරීමක්] මොන සර්ගෙන්ද අහන්නේ කියලායි මම ඔබතුමියගෙන් අහන්නේ? මේක තමයි අද තත්ත්වය. ඒ අනුව මැයි දිනයේ, මැයි පෙළපාළියට මේ රටේ දහස් ගණන් කම්කරු ජනතාව කැඳවලා ජනාධිපතිතුමා දුන්න පොරොන්දුව පැහැදිලිව බොරුවක් බව අද තමුන්නාන්සේලා ඔප්පු කරලා අවසන්. දැන් මොකක්ද කියන්නේ? අද විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් එවපු විධියට text message එකක් එවනවා, මේ සංශෝධනය සම්පූර්ණයෙන් approve කළා කියලා. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙට බැහැ මේවා approve කරන්න. ඒ සඳහා තමයි මහජන උපයෝගිතා කොමිසම තිබෙන්නේ. මහජන උපයෝගිතා කොමිසම තවම කියලා නැහැ මොකක්ද කරන්නේ කියලා.

හැබැයි Ministry of Power and Energy එකෙන් "දෙරණ"ට දාලා එවන message එක අනුව නම් ඔක්කෝම approve කරලා. කිසි ප්‍රශ්නයක් නැහැ. මම අහනවා, කවුද approve කළේ කියලා. කවුද ඒ සඳහා එකඟතාව දීලා තිබෙන්නේ? මේ වන තුරු කවුරුවත් එකඟතාව දීලා නැහැ. වැඩි වන ප්‍රමාණය කොපමණද කියලා තවම කවුරුත් දන්නේත් නැහැ. හැබැයි මේක තමයි ඔබතුමන්ලා දීපු යෝජනා. මම ඒකයි කියන්නේ, ඔබතුමන්ලා අද මිනිස්සුන්ට "සීදේවී" වාගේ හිටියාට "ගින්දර දේවි" වාගේ තමයි ඔක්කෝම කරලා තිබෙන්නේ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)
අද උදේත් අපි පෙන්නුම් කළා, ස්ථාවර නියෝගවලට විරුද්ධව කථා කරන්න බැහැ කියලා. "ජනාධිපතිතුමාගේ බොරුව" කියලා කිව්වා, එහෙම කියන්න බැහැ. ගරු කථානායකතුමා කියලා තිබෙනවා, ස්ථාවර නියෝග යටතේ ප්‍රශ්න අහන විධිය ගැන මේ ගොල්ලන්ට පන්තියක් පවත්වන්න ඕනෑය කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔක්කොටම කලින් පන්තිය තියා ගන්න.

ඊළඟට මම කියන්න කැමැතියි, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ගැන. අපේ පී. දයාරත්න මැතිතුමා කිව්වා, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය හදන්න යෝජනා ආවා, ඒක ඒ කාලයේ කෙරුවේ නැහැ කියලා. ඔව්. ඊළඟට චන්ද්‍රිකා මැතිනිය ආවා. එතුමිය කෙරුවේත් නැහැ. හරි. ඊළඟට අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව ආවා. එතුමාත් කළේ නැහැ. චන්ද්‍ර බණ්ඩාර මැතිතුමා ඉන්න කොට ඔය යෝජනාව ආපු වෙලාවේ කවුද ගිහිල්ලා නොරොච්චෝලෙට යන පාර දිගේ බුදිය ගත්තේ. මතක තියා ගන්න, මහින්ද රාජපක්ෂ මැතිතුමායි එහෙම කළේ. වෙන කවුරුවත් නොවෙයි. අරයාට, මෙයාට, කාටවත් ඇඟිල්ල දිගු කරලා වැඩක් නැහැ. දෙපැත්තෙන්ම අපි දෙගොල්ලන්ම ඒකට වග කියන්න ඕනෑ.

නමුත් එතැනින් පස්සේ 1994 වෙන කොට තිබුණු තත්ත්වයත්, 1996 වෙන කොට තිබුණු තත්ත්වයත් ගරු දයාරත්න ඇමතිතුමා කිව්වා. 1996 දී ලොකු ප්‍රශ්නයක් ආවා. ඔව්. ඒකට මුහුණ දෙන්න නම්, කරන්න තිබුණේ මොකක්ද? ඒ සඳහා වැඩ පිළිවෙලක් සකස් කරන්න තිබුණා. 1994 ඉඳලා 1998 වෙනකම් අවුරුදු දෙකක් තිබුණා. යම් කිසි වැඩ පිළිවෙලක් සකස් කරන්න තිබුණා. මුකුත් වුණේ නැහැ. 1998 දී තමයි තමුන්නාන්සේලාට පළමුවැනි පෞද්ගලික විදුලි බලාගාරය හදන්න සිද්ධ වන්නේ. ඒකෙන් තමයි වැඩියෙන් විදුලිය මිලදී ගත්තා කියලා කියන්නේ.

මේ කාරණයත් එක්ක අපට තව කාරණයක් ඔප්පු වනවා. තමුන්නාන්සේලාට මේ සඳහා ජපානයෙන් මුදල් හම්බ වුණත්, මෙච්චර කාලයක් තමුන්නාන්සේලා හිටියත්, තමුන්නාන්සේලා ඒක හැදුවේ නැහැ. නොරොච්චෝලෙට තමුන්නාන්සේලා ඩොලර් මිලියන 425ක ණයක් ගත්තා. ඩොලර් මිලියන 300ට හදන්න තිබුණු නොරොච්චෝලේ තමුන්නාන්සේලා හදලා ඉවර කරන කොට ඩොලර් මිලියන 425ක් ගිහිල්ලා. ඒ විතරක් නොවෙයි, කිලෝමීටර් හතරක් දුරට ජැටිය හදන්න තිබුණා. කිලෝමීටර් හතරක් දුරට ජැටිය හදලා ජැටියට ගල් අහුරු - coal - ගේන්න තිබුණු වෙලාවේ තමුන්නාන්සේලා ඒක පැත්තකට විසි කරලා දැමූ නිසා තමයි අද ආපහු bargesවලින් ගල් අහුරු ගෙන්න වෙලා තිබෙන්නේ. ඒ නිසායි වියදම double වෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමියනි, අද මොකක්ද වෙලා තිබෙන්නේ කියලා ඔබතුමිය කරුණාකරලා කියන්න. අද චීනයෙන් දෙන ණය quota එක ඉවර වෙලා තිබෙන්නේ. අද චීනය කියන්නේ මොකක්ද? ඉස්සෙල්ලා අපේ ණය වාරික ගෙවපල්ලා, නැත්නම් අපට මේ plant එක දීපල්ලා කියනවා. මේ දෙකෙන් එකක් නේද කියන්නේ? දැන් චීනය කියන කථාව ඒකයි. දැන් චීනය කියනවා, "නොරොච්චෝලේ අපට දෙන්න" කියලා. දැන් විසිඑක් වතාවක් නොරොච්චෝලේ ගිනි ගත්තා. විසිඑක් වතාවක් ගිනි ගන්න කොට මිනිස්සු මොනවාද කියන්නේ?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මම උත්තරයක් දෙන්නද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න. විනාඩියක් ඉන්න. මම තවම ප්‍රශ්නය ඇහුවේ නැහැ. විසිඑක් වතාවක් නොරොච්චෝලේ ගිනි ගන්න කොට අද යෝජනා කරනවා, ගිනි නිවන හමුදාවක් ගෙනැල්ලා නොරොච්චෝලේ ළඟ නතර කරන්න කියලා. ඇයි? මේක ගිනි ගන්නා වෙලාවක් හොයා ගන්න බැහැ.

ගරු ඇමතිතුමියනි, එදා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය භාර ගන්න කොට කිව්වා වාගේ නොවෙයි, නොරොච්චෝලේ චීනයට දෙනවාද, නැද්ද කියලා කරුණාකරලා ඔබතුමිය කියන්න.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
දැන් දෙන්නද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් නොවෙයි. ඔබතුමියගේ කාලය තුළ හරි නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය චීනයට දෙනවාද, නැද්ද කියලා ආණ්ඩුව තීන්දු කරලා තිබෙනවාද, නැද්ද කියලායි මම අහන්නේ?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
විජිත් විජයමුණි ද සොයිසා ඇමතිතුමා අහනවා, ඔබතුමා අපේ පැත්තට ආවාම විදුලිබල ඇමතිකම දුන්නොත් ඔබතුමා කරනවාද කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක නොවෙයි කථාව. ඕකට මුක්කු ගහන්න මම එන්නේ නැහැ. මතක තියා ගන්න. හැබැයි සොයිසා ඇමතිතුමා මාත් එක්ක කථා කරලා තිබෙනවා, එන්නේ කොයි වෙලාවේද කියලා. එතුමා මාත් එක්ක කථා කරලා තිබෙනවා, "මචං එන වෙලාවක් හරියට කියපන්" කියලා. එහෙම කියලා තිබෙනවා.

ගරු ඇමතිතුමියනි, හිනා වෙන්නේ නැතිව කරුණාකරලා මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය චීනයට නැවත පවරනවාද, නැද්ද?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය කිසිසේත්ම චීනයට පවරන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. මේක අනාගතයේ අපට ලොකු වැදගත්කමක් තිබෙනවා. තමුන්නාන්සේලා කියපු ඔය දේට වැඩිය ඒවා කරලා තිබෙනවා. අද තමුන්නාන්සේලා මහ ලොකුවට කෙරවලපිටිය ගැන කථා කරනවා. කෙරවලපිටියට වග කියන්න ඕනෑ ඇමතිතුමා මෙතැන ඉන්නවා. ඔබතුමන්ලා පටන් ගත්තේ ඩොලර් මිලියන 210න්. නමුත් අවසන් කරන කොට ඩොලර් මිලියන 325යි. ඒ අත්සන් කරලා තිබෙන ගිවිසුම අනුවයි. ඇමතිතුමිය මේවා තමයි හොයා බලන්න ඕනෑ. බලන්න, කෙරවලපිටියට වෙලා තිබෙන දේ? කෙරවලපිටිය අපි පටන් ගන්නේ රුපියල් කෝටි 470න්. අපේ ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා හිටපු කාලයේයි කෙරවලපිටිය හැදුවේ.

රුපියල් කෝටි 470න් පටන් ගන්නේ. මේක අපි ගෙවනවා, අවුරුදු 34ක් යනකන්. 2034 වෙනකන් අපි මේක ගෙවනවා. මතක තියා ගන්න, අපි ගෙවලා ඉවර වෙනකොට රුපියල් කෝටි 3167ක් අපි ගෙවලා තිබෙන්නට ඕනෑ. අන්තිම වෙනකොට. සාමාන්‍යයෙන් සියයට 18ක පොලියට අරගෙන අපි වැඩ පිළිවෙළක් සකස් කළොත් දළ වශයෙන් අපට ගෙවන්නට වන්නේ රුපියල් කෝටි 160යි. ඒ, සියයට 18ක පොලියට ගත්තොත්. කෙරවලපිටිය බලාගාරය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා ඇති කරගෙන තිබෙන Power Purchase Agreement එකේ ප්‍රශ්නය ගැනයි මම මේ කියන්නේ. තමුන්නාන්සේලා ඇති කරගෙන තිබෙන Power Purchase Agreement එක අනුව 2034 වනකොට අපි ගෙවන්නට ඕනෑ, රුපියල් කෝටි 3167ක්. නමුත් මෙය හදන්න වියදම් වුණේ රුපියල් කෝටි 3600යි. අපි එතකොට කොච්චර ගෙවලා ඉවර කරලා තිබෙනවාද? මෙන්න මේක තමයි මෙහි තිබෙන ලොකුම ප්‍රශ්නය. එතකොට- [බාධා කිරීමක්] බැහැ, ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමනි. වෙලාව නැහැ. [බාධා කිරීමක්] මම කිව්වේ නැහැ නේ ඔබතුමා කළා කියලා. මම කිසි වෙලාවක කිව්වේ නැහැ, ඒක ඔබතුමා කළා කියලා. අද කෙරවලපිටිය- [බාධා කිරීම්] මම කිව්වේ නැහැ, ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා ගත්තයි කියලා. ඔබතුමා සොරකම් කළායි කියලා මම කිව්වේ නැහැ. ඔබතුමා හොරෙක් කියලා කිව්වා කියනවා නම් එතුමාගෙන්ම ඒක අහගන්න. [බාධා කිරීම්] ඔබතුමා සොරකම් කළා කියලා කිව්වා කියනවා නම්, ඒක ඔබතුමාම අහගන්න.

ඊළඟට, සාම්පූර් විදුලි බලාගාරය. [බාධා කිරීමක්] ඔබතුමාට මම කියලා දෙන්නම්. අද සාම්පූර් විදුලි බලාගාරයට සිදු වෙලා තිබෙන දේ මම කියන්නම්. තමුන්නාන්සේලා මේකට අත්සන් කරනවා. 2011 ඔක්තෝබර් 28 වැනිදා ලිපියක් එවනවා, සාම්පූර් විදුලි බලාගාරය - [බාධා කිරීමක්] ඊළඟට මම ඒක ගැන කියන්නම්. [බාධා කිරීමක්]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මේ සභාව නොමඟ යවනවා. කෙරවලපිටිය විදුලි බලාගාරය සම්බන්ධව ඒ කියපු කරුණු අමූලික අසත්‍යය. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමාට මම ආරාධනා කරනවා, එය ඔප්පු කරලා පෙන්වන්න ප්‍රසිද්ධ විවාදයකට එන්න කියලා. මම කියන්නේ නැහැ, එතුමා සොරකම් කළා කියලා. මම කිව්වේ නැහැ නේ, ජෝන් සෙනෙවිරත්න මහත්මයා සොරකම් කළා කියලා. එතුමාගේ අමාත්‍යාංශයේ හිටපු නිලධාරීන් ගහපු Power Purchase Agreements වල තමයි මේ තිබෙන්නේ. [බාධා කිරීමක්] ඒ Agreement එක ගැන තමයි මම කියන්නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් කෑ ගහන්නේ නැතිව ඉන්න කෝ සොයිසා මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්]

ගරු ඇමතිතුමියනි, අද බලන්න සාම්පූර් විදුලි බලාගාරයට සිදු වෙලා තිබෙන දේ. සාම්පූර් විදුලි බලාගාරය සම්බන්ධයෙන් අද Power Purchase Agreement එක අත්සන් කරලා ඉවරයි. ගරු ඇමතිතුමියට මා කියනවා, -[බාධා කිරීම්] කරුණාකරලා අනෙක් කට්ටිය පොඩ්ඩක් අහගෙන ඉන්න. අඩුම තරමින් මෙතුමියවත් නිවැරදි කරන්නයි මම උත්සාහ කරන්නේ. සාම්පූර් විදුලි බලාගාරය සම්බන්ධයෙන් Power Purchase Agreement එක අත්සන් කරලා ඉවරයි. ශක්‍යතා වාර්තාව -

[ගරු දයාසිරි ජයසේකර මහතා]

feasibility report එක- එන්න කලින් Power Purchase Agreement එකක් අත්සන් කරන්නේ නැහැ, කොහේවත්. හැබැයි, මම ඔබතුමියට කියන්න කැමැතියි, කරුණාකරලා සොයලා බලන්න කියලා. මේ ගිවිසුම ගහන්න එපා කියලා විදුලිබල මණ්ඩලයෙන් ලිපියක් එවනවා. 2011 ඔක්තෝබර් මාසයේ 28වැනිදා "Secretary, Ministry of Power and Energy" වෙත "Chairman, Ceylon Electricity Board" මෙය ලියනවා. එතුමා ලියනවා, කරුණාකරලා මේ JV Agreement එක, එහෙම නැත්නම් මෙය හදන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යන්න. ශක්‍යතා වාර්තාව ආවාට පසුව- [බාධා කිරීමක්]මේ, CEB එක කියන්නේ. විදුලිබල මණ්ඩලය කියනවා, "කරුණාකර මේක අත්සන් කරන්න එපා, මේක අත්සන් කළොත් ලොකු ප්‍රශ්නයක් වෙනවා" කියලා.දැන් මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? ඔබතුමන්ලා මේ අත්සන් කර තිබෙන ගිවිසුමත් එක්ක මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? ඇමතිතුමාවත් දන්නේ නැහැ, හොරෙන්ම ගිහිල්ලා මේක අත්සන් කරලා ආවා. සියයට 18ක් return on equity. සාමාන්‍යයෙන් මේවාට දෙන්නේ සියයට 12යි. හැබැයි, Power Purchase Agreement එක ඉන්දියාවත් එක්ක අත්සන් කරලා ඉවරයි. දැන් මේක වෙනස් කරන්න කියලා ඒ කාලයේ හිටපු චම්පික රණවක ඇමතිතුමා කිව්වාම, ඉන්දියාව මේකට බැහැ යි කිව්වා. දැන් සියයට 18ක් අපි -

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
අද හැකි වෙලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අද හැකි වෙලා තිබෙනවා නම්, ලොකු දෙයක්.

මම දන්නේ නැහැ, පුළුවන් ද කියලා. කවුද මේකේ වගකීම භාර ගන්නේ කියා මා අහනවා. ගරු ඇමතිතුමියනි, මා ඔබතුමියගෙන් අහන්නේ කවුද මේකට වගකීම භාර ගන්නේ කියන එකයි. ඔබතුමන්ලා කයිය ගහන්න පුළුවන්, 300ක් එහෙ එනවා; 600ක් මෙහෙ එනවා; 800ක් මෙහෙ එනවා කියා. විදුලිය මිලදී ගැනීමේදී ඒකකවලට මුදල් ගන්න මේ වාගේ ගිවිසුම් අත්සන් කරනවාට වඩා මේ රටේ මිනිසුන්ට "කරන්ට්" එක වද්දලා මරන එක හොඳයි. ඒකයි මම කිව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කාරණයක් මා කියන්නට කැමතියි. මේ වාගේ දෙයක් මා පළමු වන වතාවටයි දැක්කේ. ක්‍රිකට් ආයතනයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවීමට තිබෙන විදුලි බිල වෙනුවට generators දෙකක් ගෙනැවිත් දීලා ඒ ගනුදෙනුව හුවමාරු කරන්න හදනවා. එහෙම කරන්නේ කොහොමද? ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට විදුලිබල මණ්ඩලයට ගෙවන්නට තිබෙන විදුලිය බිල වෙනුවට generators දෙකක් ගෙනැල්ලා එතැන තියලා ඒකෙන් බිල හිලව් කරන්න හදනවා. අනාගතයේදී අපේ ගම්වල ඉන්න මිනිස්සු කියාවි, "අනේ සර්, මටත් විදුලි බිල ගෙවා ගන්නට බැරි වුණා. මගේ ඇඳකුයි, පුටු දෙකකුයි තිබෙනවා. ඒකත් ඒ ඉස්සරහ ගෙනැල්ලා තියන්නද?" කියා. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා [බාධා කිරීම්].

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේක තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. තව කරුණු ගණනාවක් කියන්නට තිබෙනවා. ගරු ඇමතිතුමියනි, මා තව කාරණාවක් ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමියත් COPE එකේ ඉන්න සාමාජිකාවක් විධියට COPE වාර්තාව අර ගෙන බලන්න. Lanka Transformers Limited ගැන බලන්න. මා එදා දැක්කා, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කියනවා, "එකේ සියයට සියයක් අපේ කොටස්"ය කියා. මා කියනවා,"නැහැ" කියලා. ඒකේ සභාපති හැටියට ඉන්නේ හිටපු General Manager - ජයවර්ධන මහත්මයා, මරික්කාර් මහත්මයා, ඊළඟට පිටිගල මහත්මයා. මේ තුන් දෙනා මේ වාගේ කොම්පැනි 10ක විතර පැටව් ගහලා. මේවා ඔක්කොම පෞද්ගලික කොම්පැනි. දුවන්නේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ තුළ. ආණ්ඩුවේ transformers හදන්නට, ඒ වාගේම අනෙකුත් කටයුතුවලට මේ සියල්ලටම පාවිච්චි වෙන්නේ ඒ කොම්පැනි ටික.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. කථාව අවසාන කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ සම්බන්ධවත් කරුණාකර සොයා බලා කොහෙන් හෝ තැනකින් මේක නිවැරදි කරන්නට කටයුතු කරන්නටය කියා මා ඔබතුමියගෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසාන කරනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා.

[අ.භා. 6.01]

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාමත් උණුසුම විවාදයක් පැවැත්වෙන අවස්ථාවක විදුලි බිල වැඩි කිරීම සම්බන්ධයෙන් වවන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මා ඉතාමත් සන්තෝෂ වෙනවා.

අප විදුලිය පිළිබඳ ඉතිහාසය බැලුවොත්, 60 දශකයේ අග භාගයේ වෙනකොට විශේෂයෙන් ඩී.ජේ. විමලසුරේන්ද්‍ර මැතිතුමාගේ මග පෙන්වීම යටතේ ලක්ෂපාන සංකීර්ණ ව්‍යාපෘතිය හරහා මේ රටේ විදුලිය පද්ධතියට මෙගවොට් 195ක විදුලි ධාරිතාවක් එක් කරන්නට හැකියාව ලැබුණා.

1970 සිට 1977 වන තුරු විදුලි බිලේ වැඩි වීම පිළිබඳව වාර්තා මා ළඟ තිබෙනවා. 1972 සියයට 7යි. 1973 සියයට 7යි. ඒ වාගේම 1977 සියයට 6ක් වශයෙන් ඉතාම සුළු වශයෙන් විදුලි බිල වැඩි වී තිබෙන්නේ. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ මහවැලි ව්‍යාපාරය ආරම්භ කරනවා. උකුවෙල පොල්ගොල්ල වේල්ල ඉදි කරලා, උකුවෙල බලාගාරය හදලා 1970න් ආරම්භ කර, 2000 වර්ෂයේ අවසාන කරන ආකාරයට තමයි අවුරුදු 30ක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙන්නේ. ඒ කාලයේ ආර්ථිකයේ ඉතාමත් ක්‍රමානුකූල වර්ධනයක් තිබුණා.

ස්වයංපෝෂිත ශක්තිමත් ආර්ථිකයක් හදන්න එතුමිය උත්සාහ කළේ. ඊට සරිලන ආකාරයේ රටට, පරිසරයට ගැලපෙන, පරිසර වේදීන්අනුමත කළ ව්‍යාපෘතියක් තමයි මහවැලි ව්‍යාපාරය වශයෙන් ඉදිරිපත් කර තිබුණේ. නමුත් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා පැමිණිලා මේක කඩිනම් කරලා වික්ටෝරියා, කොත්මලේ, රන්ටැඹේ, රන්දෙනිගල වාගේ ජලාශ ඇති කරලා මෙගාවොට් 600ක පමණ ධාරිතාවයක් විදුලිබල පද්ධතියට එකතු කර තිබුණා. ඒ ඉතාමත් හොඳ දෙයක්. පරිසරයට මොනවා වුණත්, ආර්ථිකය ගැන සිතුවොත් එහෙම ඒක ශක්තිමත් දෙයක් කියා හිතනවා. නමුත් ජයවර්ධන මහත්මයාගේ පාලන කාලය ගත්තොත් -අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඒ කාලයේ විදුලි බිල වැඩි වීම ගැන කිව්වා- 1979 දී සියයට 70කින් විදුලි බිල වැඩි වෙලා තිබෙනවා. 1980 දී සියයට සියයකින් වැඩි වෙලා තිබෙනවා. 1981 දී සියයට 67කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම 1982 දී සියයට 50කින් වැඩි වෙලා තිබෙනවා. 1981 දී තමයි පළමුවෙන්ම විදුලිය කපන්න පටන් ගත්තේ. ඊට පස්සේ ලංකාවේ පළමුවැනි gas turbine බලාගාරය මෙගාවොට් 100ක ධාරිතාවකින් යුක්තව ජේ.ආර්. ජයවර්ධන මහතාගේ කාලයේ පටන් ගත්තා. ඒ කාලයේ එතුමාට තිබුණා, ජල විදුලිය අඩු වෙලා විදුලි ධාරිතාව මදි වෙන කොට, වැඩි වැඩියෙන් විදුලි උත්පාදනය අවශ්‍ය වන විට ගල් අඟුරු බලාගාර ගෙනෙන්න. එතුමා ඒ කාලයේ කළේ, රාජ්‍ය සේවකයින් දොට්ට දමලා, සිරිමාවෝ මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කරලා, යාපනය පුස්තකාලය ගිනි තියලා 1983 කලබලය හරහා යුද්ධයක් නිර්මාණය කරපු එකයි. ඊට පසුව 1988 දී තමයි ආයෙත් විදුලිය බිල වැඩි වීමක් වුණේ. වික්ටෝරියා ජලාශය විවෘත කිරීමත් එක්ක 1985 දී සියයට 20කින් විදුලි බිල අඩු වුණා. ඒ කාලයේ ඉංජිනේරුවන් යෝජනා කර තිබෙනවා, ගල් අඟුරු විදුලි බලාගාරයක් හදන්න අවශ්‍යයි කියලා. අපේ ගරු දයාරත්න මැතිතුමාත් ඒ ගැන කිව්වා. නමුත් ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ඒ පියවර අරගෙන නැහැ. මොකද, එතුමා ඒ කාලයේ ඉතාමත් කාර්ය බහුලයි. ඒ වකවානුවේදී කාලය වැය කළේ රටේ තරුණ තරුණියන් මරමින්, භීෂණ යුගයක් නිර්මාණය කරන්නයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ යුගයේ 1992 දී නැවතත් යෝජනා කර තිබෙනවා, ගල් අඟුරු බලාගාරයක් ඇති කරන්න. නමුත් එතුමාත් තව තවත් ආයුධ දීලා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා පටන් ගත්ත යුද්ධය කරගෙන ගියා මිසක, තව තවත් තරුණ තරුණියන් මරන්න පටන් ගත්තා මිසක ගල් අඟුරු බලාගාරය හදන කටයුත්තට ගියේ නැහැ. එතුමාටත් ඒක කර ගන්න බැරි වුණා. ඒ වාගේම 1990 දී සියයට 17කින්, 1991 දී සියයට 10කින්, 1992 දී සියයට 15කින්, 1993 දී සියයට 13කින් විදුලි බිල විශාල ලෙස වැඩි වුණා. චන්ද්‍රිකා ජනාධිපතිතුමියගේ යුගයේදීත් මේ ගල් අඟුරු බලාගාරය හදන්න විශාල වශයෙන් උත්සාහයක් දරා තිබෙනවා. නමුත් ඒක කරන්න නොහැකි වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය මදි නිසා මා කෙටියෙන් කියන්නම්. ඊළඟට රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ යුගයේ වර්ෂයක් එක දිගට විදුලිය කප්පාදුවට ලක් වුණා. ඒ කාලයේ ලංකාවේ හිටපු ඉතාමත් කීර්තිමත් පුද්ගලයකු වන, විදුලි බලය පිළිබඳ විශේෂඥයකු වන ආචාර්ය තිලක් සියඹලාපිටිය මහතා 2002 ජනවාරි 27 වැනිදා "ලංකාදීප" පත්තරයට ලිපියක් ලියා තිබෙනවා, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට නිර්දේශ ඉදිරිපත් කරමින්. එහි අංක 01 හැටියට නිර්දේශ කර තිබෙන්නේ, විදුලිය කැපීම අත් හිටුවීමට අවශ්‍ය හදිසි බලාගාර ගෙන එන්නේ නම් ඒ සඳහා අධික වියදම් දරන්නේ කවුද කියා තීරණය කරන්නය කියන එකයි. අංක 02 හැටියට තිබෙන්නේ දේශපාලන වශයෙන් කොතරම් අහිතකර වුවත් විදුලි මිල කෙටි කාලීනව හෝ වැඩි කර විදුලිබල මණ්ඩලයේ පාඩුව පියවිය යුතුයි කියන එකයි. මණ්ඩලය බංකොලොත්ව තබා ගැනීම රටේ විදුලි ක්ෂේත්‍රයේ දියුණුවට අහිතකර බවත් කියා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට මෙහෙම කියා තිබෙන්නේ 2002 දීයි. අංක 03 නිර්දේශය හැටියට තිබෙන්නේ කෙරවලපිටිය මෙගාවොට් 300 බලාගාරය වහාම ඉදි කිරීමට තීරණය කළ යුතුයි කියන එකයි. අංක 04 හැටියට තිබෙන්නේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ඉදි කිරීමට වහාම තීරණය කළ යුතුයි කියන එකයි. අංක 05 හැටියට තිබෙන්නේ දෙවැනි ගල් අඟුරු බලාගාරය පිළිබඳව, එය පිහිටුවන ප්‍රදේශය පිළිබඳව වහාම තීරණය කළ යුතුයි කියන එකයි. අංක 06 හැටියට තිබෙන්නේ ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය ඉදි කිරීම වහාම ඇරඹිය යුතුයි කියන එකයි. නමුත් එතුමා මොකක්ද කළේ? ගරු දයාරත්න ඇමතිතුමාත් මේ ගැන කිව්වා. ජපානයෙන් ආධාර දෙන්න ලෑස්ති වෙලා හිටියත් රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා මොකක්ද කළේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආචාර්ය තිලක් සියඹලාපිටිය මැතිතුමාම 2013 අප්‍රේල් මස 28 වැනිදා "ලංකාදීප" පත්තරයට කළ ප්‍රකාශයක වාර්තාවක් මා ළඟ තිබෙනවා. එහි මෙසේ සඳහන් වනවා:

"...අපිට චීනයට යන්න වුණේ ඇයි? 1993 දී ජපානය අපට මේ බලාගාරයට ණය දෙන්න කැමැත්ත දුන්නා. ඔවුන් 2002 වන තුරු බලාගෙන හිටියා. අපේ විවාද, පෙළ පාළි ඉවර කර බලාගාරය පිහිටුවාවි යැයි බලාගෙන සිටියා. 2002න් පසුව වුවත් ඔවුන් කැමැත්තෙන් හිටියා. 2002 මාර්තු 31 දින රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා, ජපන් තානාපතිතුමා නිවසට කැඳවා මුදල් අවශ්‍ය නැති බවත් බලාගාරය පිළිබඳව හිටපු ඉංජිනේරුවෝ නොමහ යැවීමක් කර තිබෙන බවත් ප්‍රකාශ කර තිබුණා. ඒ පිළිබඳව ප්‍රවෘත්ති නිවේදනයක්ද නිකුත් කළා. ජපන් රජය හිත් වේදනාවට පත් වෙන්න ඇති. රටක් අපහසුතාවට පත් නොකළ යුතු වුවත් එය කෙරුණා."

මේක තමයි තත්ත්වය. එදා තිබුණු විදුලිය ඉල්ලුමට රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා කටයුතු කළේ එහෙමයි. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා දැන් ටිකකට කලින් සඳහන් කළා, විදුලිබල මණ්ඩලය පෞද්ගලික බලාගාරවලට යම් යම් ගණන් ගෙවන්න තිබෙනවා කියලා. ඒ බලාගාරවලින් විශාල ප්‍රමාණයක් එතුමන්ලාගේ කාලයේ ඉදි කළ ඒවායි. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා කළේ අර යෝජනා ක්‍රියාත්මක කරන්නේ නැතිව, පෞද්ගලිකව එක එක් කෙනාට ඕනෑ විධියට බලාගාර හදන්න ඉඩ දීපු එකයි. කිහිපයක් මා කියන්නම්. Ace Power Matara මෙගාවොට් 27.8යි. 2002 මාර්තු මාසයේදීයි ගිවිසුම් අත්සන් කළේ. Ace Power Horana සඳහා 2002 දෙසැම්බර් මාසයේදීයි ගිවිසුම් අත්සන් කළේ. මෙගාවොට් 24.8යි. AES Kelanitissa - හෙලදනවි - මෙගාවොට් 100යි, 2003 ඔක්තෝබර් මාසයේදීයි ගිවිසුම් අත්සන් කළේ. Ace Power Embilipitiya සඳහා 2004 දීයි ගිවිසුම් අත්සන් කළේ. මෙගාවොට් 100යි. ඒ, ඔබතුමන්ලා අර නිර්දේශ ක්‍රියාත්මක කරන්නේ නැතිව පෞද්ගලිකව එක් එක් කෙනාට ඕනෑ ඕනෑ විධියට හදාපු බලාගාර. ඒ විධියට 05ක් හදලා තිබෙනවා.

මේ රටේ 2005ට කලින් ආණ්ඩු -[බාධා කිරීම්] ඒ ගෙවන්න තිබුණේ මෙතුමන්ලා හදපු බලාගාරවලටයි. එතැන මිල සූත්‍රයක් තිබුණා. ඉල්ලුම වැඩි වෙන කොට මිල ඉහළ දැමුවා. එහෙම කරලා රටම අඳුරේ තැබුවා. රටම අඳුරේ තබලා ඩීසල් බලාගාර ගෙනාවා. ඩීසල් බලාගාර ගෙනැල්ලා විදුලිබල මණ්ඩලය බංකොලොත් තත්ත්වයකට පත් කළා. මේක තමයි, හැම දාම හැම ආණ්ඩුවක්ම කළේ. මෙගාවොට් 300 ගල් අඟුරු බලාගාරය හදන්න කිසිම ආණ්ඩුවක් පියවර ගත්තේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2005න් පස්සේ තත්ත්වය බැලුවොත් විදුලි ජාලයට පාරිභෝගිකයෝ ලක්ෂ 18ක් එකතු වුණා. ඒ වාගේම විශාල ආයෝජනයක් කරලා විදුලිබල පද්ධතියේ

[ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා]

නවීකරණ කටයුතු කළා. උතුර සහ නැඟෙනහිර විදුලිය ඉල්ලුම වැඩි වුණා. ඒ වාගේම සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් එක්ක මේ රටේ ආර්ථිකය පුළුල් වීම තුළින් විශාල විදුලිය ඉල්ලුමක් ඇති වුණා. ඒ වාගේම පරණ ආණ්ඩු දැමූ බරත් එක්ක අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව යටතේ විශාල විදුලිබල ඉල්ලුමක් ඇති වුණා. ඒ ගැන තීරණ සංඛ්‍යාවක් ගැනීමට අවශ්‍ය වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පස්සේ කළේ මොකක්ද කියලා අපි බලමු. අවුරුදු විස්සක් තිස්සේ විදුලිබල මණ්ඩලයේ විශේෂඥයෝ, ඉංජිනේරුවෝ කියපු පළමුවැනි ගල් අඟුරු බලාගාරය නොරොච්චෝලේ ඉදි කරන්න 2005න් පස්සේ අතිගරු ජනාධිපතිතුමා කටයුතු කළා. ඒ වාගේම කෙරවලපිටිය මෙගාවොට් 300 බලාගාරය ඉදි කළා. 2010 දී නොරොච්චෝලේ බලාගාරයේ දෙවැනි අදියර ආරම්භ වුණා. ඒ තුළින් මේ අවුරුද්ද අවසාන වෙන කොට මෙගාවොට් 600ක් විදුලිබල පද්ධතියට එකතු වෙනවා. මහවැලි ව්‍යාපෘතියේ සම්පූර්ණ මෙගාවොට්ස් ප්‍රමාණයට මේ අවුරුද්ද අවසානයට විදුලිබල පද්ධතියට එකතු වන මෙගාවොට් 600 සමානයි කියන්න ඕනෑ. ඒ වාගේම හැම දාම ඇදි ඇදී තිබුණ ඉහළ කොත්මලේ බලාගාරයේ මෙගාවොට් 150ක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව මේ ආණ්ඩුවට වැඩ පිළිවෙළක් තිබෙනවා. අනෙක් හැම ආණ්ඩුවක්ම කළේ විදුලිය ඉල්ලුම එන කොට ජනතාව අඳුරේ තියලා, මිල වැඩි කරලා විදුලිබල මණ්ඩලය බංකොලොත් කරන එක විතරයි. මේ අර්බුදය විසඳා ගන්නේ කොහොමද කියන එක ගැන ස්ථිරසාර වැඩ පිළිවෙළක් කවදාවත් තිබුණේ නැහැ. ඉදිරියේදී සාම්පූර් බලාගාරය ඉදි කරන්න අතිගරු ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ගිවිසුම් අත්සන් කර තිබෙනවා. ඒ වාගේම ත්‍රෝඩිලන්ඩ්, උමාඔය, ගිං ගඟ වැනි ජල විදුලි බලාගාර ඇති කරන්නත් අවශ්‍ය කටයුතු කර ගෙන යනවා. ඒ වාගේම අනාගතයේ දකුණු ප්‍රදේශයේ ගල් අඟුරු බලාගාරයක් ඉදි කරන්නත් අවශ්‍ය කටයුතු කර ගෙන යනවා.

ඒ අනුව කිසිම ආණ්ඩුවකට තිබුණේ නැති වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුවට තිබෙනවා. අනාගතයේ විදුලිබල මණ්ඩලය සුරක්ෂිත කරන්න, ඒ හරහා විදුලිය පාරිභෝගිකයන් සුරක්ෂිත කරන්නත් අවශ්‍ය වැඩ පිළිවෙළක් මහවැලි ව්‍යාපාරයෙන් පස්සේ පළමුවැනි වතාවට ලංකාවේ තිබෙනවාය කියන එක මේ අවස්ථාවේ පැහැදිලිවම කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අද කියනවා අඩු ආදායම් ලබන අයගේ විදුලි ගාස්තු වැඩි කරලා, වැඩි ආදායම් ලබන අයට විදුලිය ගාස්තු වැඩි කරලා තිබෙන්නේ අඩුවෙන් කියලා. විදුලිබල මණ්ඩලය මේ අවුරුද්දේ ප්‍රකාශ කර තිබෙනවා විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න රුපියල් 23ක මිලක් යනවා කියලා. අපි ඒ අනුව ගණන් බැලුවොත් ඒකක 30ක් පාවිච්චි කරන කෙනෙකුට එන්න ඕනෑ රුපියල් 720ක බිලක්. නමුත් අද ගන්නේ රුපියල් 142.50යි. එක පවුලකට රුපියල් 578ක සහනාධාරයක් ලැබෙනවා. ලංකාවේ ඉන්නවා 0-30ත් අතර විදුලිය පාවිච්චි කරන පවුල් 11,11,000ක්. ඒ අනුව රුපියල් මිලියන 4,266ක සහනාධාරයක් ඒ ලක්ෂ 11ට ලැබෙනවා කියලා කියන්න ඕනෑ. ඒ වාගේම ඒකක 30-60ත් අතර විදුලිය පාරිභෝගිකයන් ලක්ෂ 13,18,000ක් ඉන්නවා. ඒකකයක් රුපියල් 23.00 ගණනේ බැලුවොත් ඒකක 60ක් විදුලිය පාවිච්චි කරන පුද්ගලයකුගේ බිල රුපියල් 1,440ක් වෙනවා. නමුත් ගෙවන්නේ රුපියල් 426යි. එක පවුලකට රුපියල් 1,014ක සහනාධාරයක් ලැබෙනවා. ඒ අනුව රුපියල් මිලියන 12,822ක සහනාධාරයක් ඒ පාරිභෝගිකයන් ලක්ෂ 13ට ලැබෙනවා. ඒ වාගේම ඒකක 60-90 අතර පාවිච්චි කරන විදුලිය පාරිභෝගිකයන් 12,99,000ක් ඉන්නවා. ඒකක 90ක් පාවිච්චි කරන පුද්ගලයකුගේ විදුලි බිල ඒකකයකට රුපියල් 23.00 ගණනේ හැදුවොත් රුපියල් 2,160ක් වෙනවා. නමුත් ගෙවන්නේ රුපියල් 1,084යි. රුපියල් 1,076ක -සියයට 99ක- සහනාධාරයක් ඒ පුද්ගලයාටත් ලැබෙනවා. මේ ඔක්කොම ගත්තාම විදුලිය පාරිභෝගිකයන් ලක්ෂ 50ක් විතර ඉන්න මේ රටේ ලක්ෂ 36කට පමණ මේ විදුලි ගාස්තු වැඩි කිරීම යටතේත් සහනාධාර ලැබෙනවාය කියන කාරණය පැහැදිලිවම කියන්න ඕනෑ. උදාහරණයක් විධියට ගත්තොත් වැඩියෙන් පාවිච්චි කරන කෙනෙක් - යුනිට් 211-240ත් අතර පාවිච්චි කරන කෙනෙක්- ගත්තොත් යුනිට් 240ක් පාවිච්චි කරන කෙනෙක් නම් රුපියල් 9051ක බිලක් එනවා. ඒ මිල ඒකකය රුපියල් 23.00 බැගින් ගණන් හැදුවොත් ඒ පුද්ගලයා ගෙවන්න ඕනෑ රුපියල් 5,835යි. ඒ අනුව ඒ පුද්ගලයා විදුලිබල මණ්ඩලයට සාධාරණ මිලට වඩා රුපියල් 3,216ක් -සියයට 55ක පමණ මුදලක්- වැඩිපුර ගෙවනවා.

මෙතැනදී බොරු බේගල් ඇද බානවා. වැඩි ඒකක ගණනක් පාවිච්චි කරන අයට ඉතාම අඩු වැඩි වීමකුත්, අඩු ඒකක ගණනක් පාවිච්චි කරන අයට විශාල වැඩි වීමකුත් තිබෙනවා කියලා ප්‍රකාශ කළත් එය අසත්‍යයක් බව කියන්න ඕනෑ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා දැන් මෙතැන නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඉන්නවා.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණය අපට පැහැදිලි නැහැ. ඒකක 55ක් පාවිච්චි කරපු කෙනෙකු light එකක් off කරලා විදුලිය අඩුවෙන් පරිභෝජනය කරලා ඒකක 54ට අඩු වුණොත් ඒ පුද්ගලයාට ඒ අඩු වූ ඒකකයේ වාසිය අනිවාර්යයෙන් තිබෙනවා. කොහොමද එහෙම නැහැ කියලා කියන්නේ? ඔබතුමා කියන්නේ ඒකකයෙන් ඒකකයට මිලක් නියම කරන්න කියලාද ගරු මන්ත්‍රීතුමා?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට කියන්නද ඒ ගැන?

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ඔව්, ඔබතුමා කියන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ නම සඳහන් කරපු නිසායි කියන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට පෙන්නපු අර නවීන ක්‍රමවේදය-

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ඒ අඩු වූ ඒකකයේ වාසිය නැති කරන්නේ කොහොමද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක නැති කරන්න පුළුවන්. මම කලින් ඒ ගැන කිව්වා. ඒක 2008 ශ්‍රේෂ්ඨාධිකරණයේ- [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු මන්ත්‍රීතුමා, අපේ අයටත් කථා කරන්න දෙන්න කෝ. හැම එකටම පනින්න එපා.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ජනතාව නොමඟ යවන ප්‍රකාශ- [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් පැහැදිලිව ප්‍රකාශ කරනවා මේ ආණ්ඩුවට ජනතාවගේ අනාගත විදුලිබල ප්‍රශ්න පිළිබඳ විසඳුමක් තිබෙනවාය කියන කාරණය. බොහොම ස්තුතියි. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු ලලිත් දිසානායක මහතා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි පහක් තිබෙනවා.

[අ.භා. 6.13]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ අපේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා කථා කළා විදුලිය ගාස්තු ගැන. ඒ වාගේම අදත් කථා කළා පෞද්ගලීකරණය ගැන. 2002 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව රුපියල් කෝටි 25ක් උපයා ගන්න ලංගම බස් 25ක් විකුණුවා. රුපියල් කෝටි 25ක් සොයා ගන්න ලංගම බස් 25ක් විකුණපු එක්සත් ජාතික පක්ෂය තමයි අද මේ විදුලිය බිල ගැන, අහිංසක ජනතාව ගැන කථා කරන්නේ. එහෙම කථා කරන එක්සත් ජාතික පක්ෂය ගැන අද මේ රටේ ජනතාවගේ විශ්වාසයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී අප කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ මොනවා කථා කළත් කවුරුත් දන්නවා අද මේ රටේ විදුලිය නිෂ්පාදනයෙන් සියයට 30ක් ජල විදුලි බලාගාරවලිනුත්, සියයට 7ක් කුඩා විදුලි බලාගාරවලිනුත්, සියයට 48ක් තෙල් භාවිතයෙනුත් සිදු වන බව. සියයට 15යි ගල් අඟුරු භාවිතයෙන් ලබා දෙන්නේ. එහෙම නම් අපි ගල් අඟුරු බලාගාරවලින් විදුලිය නිෂ්පාදනය වැඩි කරලා, ඒකකයක මිල අඩු කරලා, මේ රටේ ජනතාවගේ විදුලිය අවශ්‍යතාව සපුරන්න ඕනෑ. ඒ සඳහා පෙළපාළි ගිහිල්ලා, පන්දම් පත්තු කරලා හරි යන්නේ නැහැ. ඒ සඳහා වූ නියම ක්‍රමවේදයට අප එන්න ඕනෑ. මේ රටේ පසු ගිය කාල වකවානුවල එය කරන්න බැරි වුණා. ඒක ඇත්ත. අද මේ සම්බන්ධයෙන් දේශපාලනඥයාගේ දිහාට, ආණ්ඩු දිහාට ඇඟිල්ල දිගු කරනවා. මේ සම්බන්ධයෙන් ජනතාවගේ පැත්තෙනුත් ලොකු වගකීමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හාමුදුරුවන් වහන්සේ නමක් කියනවා, විදුලි බලාගාර දෙකේ වැඩ ඉවර වෙන තුරු සක් දෙවියන්ගේ පඬුපුල් ආසනයේත් විදුලිය කපලා කියලා. හාමුදුරුවන් වහන්සේ නමක් එහෙම කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2000 අටවැනි මාසයේ 18වැනි දා "ලංකාදීප" පත්‍රයේ තිබෙනවා,"නොරොච්චෝලේ තාප බලාගාරය ඉදිකරන්නේ නෑ" කියන ශීර්ෂය යටතේ ලිපියක්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "නොරොච්චෝලේ තාප බලාගාරය ඉදිකිරීමට ගෙන තිබූ තීරණය මුළුමනින්ම අතහැර දැමීමට රජය ඊයේ තීරණය කළේය.
>
> ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී ඊයේ පෙරවරුවේ පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මේ තීරණය ගෙන ඇත්තේ තාප බලාගාරය නොරොච්චෝලය ප්‍රදේශයේ ඉදිකිරීම සම්බන්ධයෙන් ආගමික නායකයන් ඇතුළු ප්‍රදේශවාසීන් වෙතින් එල්ලවූ බලවත් විරෝධය සැලකිල්ලට ගනිමිනි."

එහෙම නම් කවුද ඒකට විරුද්ධ වෙලා තිබෙන්නේ? ඒ නිසා අපි පැහැදිලිව කියනවා මේ රටේ විරෝධතාවන් තිබුණු නිසයි එදා එය නතර කළේ කියලා. අපි මේ සම්බන්ධයෙන් කෙනකුට ඇඟිල්ල දිගු කරලා වැඩක් නැහැ. අදාළ කාල සීමාවන් තුළදී ඒ කටයුත්ත කරන්න ඉඩ නොදීම නිසා තමයි, විවිධ විරෝධතාවන් ඇති වූ නිසා තමයි එවැන්නක් සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පැහැදිලිව කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. විපක්ෂය මේ සම්බන්ධයෙන් ආණ්ඩුවට ඇඟිල්ල දිගු කළත් අද අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට පුළුවන්කම ලැබිලා තිබෙනවා නොරොච්චෝලේ විදුලි බලාගාරය ආරම්භ කරලා, එහි ඊළඟ පියවර දෙකත් ආරම්භ කරන්න කටයුතු කරලා මේ රටේ විදුලිය අවශ්‍යතාව පිරිමසන්න. ඒ වාගේම එදා ඉහළ කොත්මලේ විදුලි ව්‍යාපෘතිය ආරම්භ කරන්න බැරි වුණා. අද එය ආරම්භ කර තිබෙනවා. එදා හිටපු විදුලිබල ඇමති ගරු කරු ජයසූරිය මැතිතුමාට ඒක කරන්න බැරි වුණා. එකට හිටපු කැබිනට් ඇමතිතුමෙක් තමයි ඒකට විරුද්ධ වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පැහැදිලිව කියනවා අතිගරු ජනාධිපතිතුමා මැයි දිනයේදී ගත්තු තීන්දුව අනුව මේ රටේ අහිංසක ජනතාවට විදුලිය ගාස්තු සම්බන්ධයෙන් වූ සහනය ලබා දෙන බව. ඒ සහනය නියත වශයෙන් ලැබෙන බව ප්‍රකාශ කරමින් මට කාලය ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්න වෙමින් මම නිහඬ වනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු වික්ටර් ඇන්ටනි ප්‍රනාන්දු මහතා. Before that, the Hon. Deputy Chairman of Committees will take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

[අ.භා. 6.17]

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනාව ගැන ඉතාමත් හොඳ සංවාදයක් ඇති වෙයි කියලා මා හිතුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් බලන කොට අපට අහන්නට ලැබුණේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ වෛරය, ද්වේශය, ඊර්ෂ්‍යාව පිරුණු කථායි. විපක්ෂය මේ රටේ බඩු මිල වැඩි වීම පිළිබඳව, ඒ වාගේම විදුලි බිල වැඩි වීම පිළිබඳව ලොකු record එකක් තියලා තිබෙනවා. ඒ record තියපු, ඒ කිරීටය පැළඳි යූඑන්පීය අද විදුලි බිල සම්බන්ධයෙන් කථා කරනවා. මේක තමයි සැබෑ තත්ත්වය. අද කළේ මොකක්ද? අද කළේ ඔක්සිජන් ගසා ගැනීම විතරයි. වැලේ වැල් නැති යූඑන්පීය අද කළේ මොකක්ද? අද ඔවුන් ඔක්සිජන් ගසා ගන්න හදනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මළ මිනියක් වුණත් එම්බාම් කරන්න පුළුවන්. නමුත් යූඑන්පී body එක කැලි කැලි කපලා. දයාසිරිට කැල්ලක්; බෙල්ල සජිත් ප්‍රේමදාස මහත්මයාගේ. ඒ නිසා අද එම්බාම් එකවත් හරියන්නේ නැහැ. සජිත් ප්‍රේමදාස මහත්මයාගේ බෙල්ලම ගිහිල්ලා. ඉතින් මේ වාගේ තත්ත්වයක් තුළ අද මේ මොකක්ද කළේ?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

දයාසිරිගේ මොකක්ද කැපිලා තිබෙන්නේ?

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

අද එම්බාම් එකවත් අල්ලන්නේ නැති තත්ත්වයකයි තිබෙන්නේ. අඩු මුදලකින් විදුලිය නිෂ්පාදනය කර ගන්න හැටි ගැන අද කථා කරයි කියලා මා හිතුවා. ක්‍රියාත්මක කරන්න හොඳ යෝජනා ගැන කථා කරනවා අපට අහන්න පුළුවන් වෙයි කියලා මා හිතුවා. ඒ වාගේම ජලයෙන් විතරක් නොවෙයි, තාප බලයෙන් විතරක් නොවෙයි, මුහුදු රළ මඟින් කොහොමද විදුලිය නිෂ්පාදනය කරන්නේ කියලා කථා කරයි කියලා අප හිතුවා. ඒ වාගේම හිරු රශ්මියෙන් විදුලි බලය ලබා ගන්නේ කොහොමද කියලා කථා කරයි කියලා අප හිතුවා. වර්ග සැතපුම් 25,000 තුළ අද අපට නිර්මාණය කරන්න දෙයක් ඉතිරි වෙලා නැහැ. සියල්ලම ජනාධිපතිතුමා කරලා ඉවරයි. එක්සත් ජාතික පක්ෂයට තිබෙන එකම භය මේකයි. වෙන මොකුත් නැහැ. අද රට වටේම වරායවල් ටික -නැව් තොටවල් ටික- හදලා ඉවරයි; මුළු රටේම තාප බලාගාර ටික හදලා ඉවරයි; සුළං බලාගාර හදලා ඉවරයි; ගල් අඟුරු බලාගාර ටික හදලා ඉවරයි; පාරවල් ටික හදලා ඉවරයි. තව මොනවාද යූඑන්පීය ඇවිල්ලා කරන්න හදන්නේ? කරන්න දෙයක් නැහැ. දැන් මොකක්ද කරන්න තිබෙන්නේ? අපි වැඩ කරන කොට පුළුවන් තරම් කකුලෙන් අදින එක තමයි කරන්න තිබෙන්නේ. කරන්න පුළුවන් picket කරන එකයි, කෑ ගහන එකයි, විරෝධතා ප්‍රකාශ කරන එකයි විතරයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගමේ කථාවක් තිබෙනවා "වදාපු බැල්ලි වාගේ" කියලා. එක්සත් ජාතික පක්ෂයත් හරියට වදාපු බැල්ලි වාගෙයි. වදාපු බැල්ලිට ගල් කැටයක් වීසි කළත් හපනවා; පොලු කැල්ලක් වීසි කළත් හපනවා; මොනවා වීසි කළත් හපනවා. අද ඒ වාගේ තත්ත්වයට එක්සත් ජාතික පක්ෂය පත් වෙලා තිබෙනවා. හරියට වදාපු බැල්ලි වාගෙයි. අද විෂයයක් නැහැ. කාලයකට පස්සේ සටන් පාඨයක් හම්බ වුණාම ඒකට ලොකු සටනක් දෙනවා. මේක තමයි අද කරන්නේ. ඇත්ත වශයෙන්ම මෙවැනි තත්ත්වයක් තුළ එක්සත් ජාතික පක්ෂය ගැන අප ඉදිරියේ හොඳ සාක්ෂියක් තිබෙනවා. පී. දයාරත්න ඇමතිතුමා හොඳ ඇමතිවරයෙක්. එදා තාප විදුලි බලාගාරය හදන්න එපා කියලා මුළු එක්සත් ජාතික පක්ෂයම කෑ ගැහුවා. දයාරත්න මැතිතුමා කොන්ද කෙළින් තියාගෙන, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ඉඳගෙන කෑ ගැහුවා තාප බලාගාරය හැදිය යුතුමයි කියලා. අද එතුමා සත්‍යයට සාක්ෂි දරන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ කරුණාවන්ත ඇමතිතුමා -ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා- එදා නොරොච්චෝලේ තාප බලාගාරය ඉදි කරන කොට මා එක්ක ගෙයින් ගෙට ගියා මට මතකයි. දහසකුත් එකක් බාධක මැද්දේ එදා අපේ අතිගරු ජනාධිපතිතුමා සමඟ තාප බලාගාරයට මුල් ගල තියන්න අපට අවස්ථාව ලැබුණා. ඒ පිළිබඳව අද අප සන්තෝෂ වෙනවා. අද අපට ගෞරවනීය ඇමතිවරියක් ලැබිලා තිබෙනවා. එතුමිය බොහොම ශක්තිමත් ඇමතිවරියක්. විදුලිබල හා බලශක්ති ඇමතිකම විතරක් නොවෙයි, මොන ඇමතිකමක් දුන්නත් භාර ගෙන කරන ඇමතිවරියක් තමයි එතුමිය. ඒ නිසා අපේ ලොකු විශ්වාසයක් තිබෙනවා එතුමිය හොඳින් කටයුතු කරයි කියලා. මේ අය තුළ විශ්වාසයක් නැතිකම තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශුද්ධ වූ බයිබලයේ තිබෙනවා "නොදැක විශ්වාස කරන්නෝ භාග්‍යවන්තයෝය" කියලා. අද ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා, විදුලි බිල අඩු කරනවා කියලා. ඒක පැහැදිලිවම කිව්වා. නමුත් මේක පිළිගන්නේ නැහැ. පිළිගන්නේ නැතිකම නොවෙයි. මේක තමයි තිබෙන නරකකම. මේක තමයි පහත්කම. මීට වඩා පහත් දෙයක් තවත් නැහැ එක්සත් ජාතික පක්ෂයේ. අද මොන තරම් දේවල් මේ රටේ කරන්න තිබෙනවාද? එදා කුප්පි ලාම්පුවෙන් එළිය ලැබූ ජනතාව කී ලක්ෂයක් අද විදුලි එළිය බලනවාද?

එදා 1994 දී එක්සත් ජාතික පක්ෂයෙන් අපි ආණ්ඩුව ගන්න කොට විදුලිය සපයලා තිබුණේ කොපමණ ප්‍රමාණයකටද? සියයට 19කටයි විදුලිය සපයලා තිබුණේ. ලංකාවේ අද සියයට 80ක් විදුලිය බලය ලබලා විදුලිය එළිය බලනවා. අද කුඩා දරුවන් විදුලිය එළියෙන් තමයි පාඩම් කරන්නේ. අද මෙවැනි දියුණු තත්ත්වයක් තිබෙනවා. අද ආර්ථිකයේ ප්‍රවර්ධනය කොච්චරද කියලා බලන්න. එදා diesel enginesවලින්, භූමි තෙල් enginesවලින් ගොවිතැන් කරපු ගොවීන්, කර්මාන්තකරුවන් විදුලිය බලය නිසා අද කොතරම් දියුණුවක් ලබා තිබෙනවාද කියලා බලන්න. අපේ සංවර්ධන වේගය ඉහළට යන්නේ ඒකයි. අද මෙතුමන්ලා මොනවා කියලා කෑ ගැහුවත් වැඩක් නැහැ. මොනවා කියලා කෑ ගැහුවත් පලක් නැහැ. ජනතාව ඉන්න ඕනෑ තැන හරියටම ඉන්නවා. ජනතාව පොදුජන එක්සත් පෙරමුණත්, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත් සමඟ ඉන්නවාය කියන එක මා මතක් කරන්න ඕනෑ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාවේ ගණපූරණය නැහැ. මේ සභාව පවත්වා ගෙන යන්න බැහැ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක විරුද්ධ පක්ෂය ගෙනාපු යෝජනාවක්. විපක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනකු පමණයි දැන් ඉන්නේ. හරි ලජ්ජයි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
හරි ලජ්ජයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay. You carry on, Hon. Victor Antony. - [*Interruption.*]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, there is no Quorum in the House.

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට අවශ්‍ය වෙනවා ඉවසීම. අපි මේ රට මෙතරම් දියුණු කළා නම්, මේ රට හිතන්න බැරි තරමට දියුණු කළා නම් අද මොකක්ද තිබෙන ප්‍රශ්නය? අවුරුදු 30ක යුද්ධය අවුරුදු තුනකින් අවසන් කළ ජනාධිපතිතුමා මුළු රටේම කරන්න තිබෙන සංවර්ධනය අද කරලා අවසානයි. අනාගත දරු පරම්පරාව වෙනුවෙන් එය කරලා ඉවරයි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, there is no Quorum in the House.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයෙන් තමයි මේ යෝජනාව ගෙනාවේ.

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
කෝ ඒ යෝජනාකරු?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇයි, උත්තර දෙන්න බයද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔය, උත්තර දෙන්න බැරිව කරන වැඩක්.

පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තිබුණෙන්-

පාරාළුමන්ට්‍රම් කණක්කිඩප්පට්ටු, කූට්ට නඩප්පෙණ් ඉල්ලෙ යෙනක් කණ්ඩතනාල්, පිරිවු මණි අඩික්කප්පඩවේණ්ඩුමෙනක් කට්ටළෙයිඩප්පට්ටදු.

පිරකු, කූට්ට නඩප්පෙණ් ඉරුන්තතනාල් -

Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.

Later, a Quorum being present-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Victor Anthony, carry on please.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා තමයි පාර්ලිමේන්තුවේ බුදියගත්තේ නොරොච්චෝලේ හදනවාට විරුද්ධව- [බාධා කිරීම්]

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
කවුද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා.

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
අනේ, අප හැම දාම,- [බාධා කිරීම්] අද නොවෙයි-,[බාධා කිරීම්] අවුරුදු 45ක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් හෙල්ලිලා නැහැ. බය වෙන්න එපා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා තමයි. [බාධා කිරීම්] තමුන්නාන්සේ දැන් බොරු කීයක් කිව්වාද? තමුන්නාන්සේ කථා කරන්න කෝ හෘදය සාක්ෂියට එකඟව. තමුන්නාන්සේ කිව්වා 26 වතාවක් නොරොච්චෝලේ බලාගාරය කැඩුණා කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
21 වතාවක්.

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
21 වතාවක් නොවෙයි, පස් වතාවක් කැඩිලා ඇති.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ තමුන්නාන්සේ දන්නා තරම. තමුන්නාන්සේ බුදියගෙනද හිටියේ?

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා එහෙම කථා කරනවා. අද ඕනෑම අලුත් වාහනයක් වුණත් කැඩෙනවා නේ.

[ගරු වික්ටර් ඇන්ටනි මහතා]

නැට්ට පිටින් අලි මැරෙන්නේ. නැට්ට පිටින් කොටි මැරෙන්නේ. නැව් ගිලෙන්නේ. [බාධා කිරීමක්] මොනවාද මන්ත්‍රීතුමා තමුන්නාන්සේ මේ කියන්නේ? අලුත් පරණ කියලා නැහැ ඕනෑම යන්ත්‍රයක් කැඩෙනවා. එහෙම කොතරම් කැඩෙනවාද? එහෙම කැඩෙන එක නවත්තන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලා ඊළඟට විශ්වාස භංගයක් ගෙනෙන්න හදනවා. මොනවා කියලා ගෙනෙන්නද? හැම දාම පරාදයි. මාතෘකා නැහැ. අද සටන් පාඨ නැහැ තමුන්නාන්සේලාට. මොනවාද තමුන්නාන්සේලාට තිබෙන සටන් පාඨ? ඔය මළ මිනියට එම්බාම් එක අල්ලන්නේත් නැහැ. ඇයි, කැලි කැලි නේ. හොඳම කැලි ටික ගිහිල්ලා. අද මැණික් ගල් යට ගිහිල්ලා ගොමරිට් තමයි උඩට ඇවිල්ලා තිබෙන්නේ යූඑන්පීයේ. මැණික් ගල් යට ගිහිල්ලා. අද මැණික් ටික යට ගිහිල්ලායි තිබෙන්නේ. අද එවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එක්සත් ජාතික පක්ෂය හැම දාම මේ වාගේ බොරු කෝලම් කරනවා; මේ වාගේ බොරු යෝජනා ගෙනෙනවා. තඹ ශතයකට ප්‍රයෝජනයක් නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසාන කරන්න.

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ස්තුතිවන්ත වෙනවා ගරු ඇමතිතුමියට. මේවායෙන් එතුමිය සොලවන්න බැහැ. එතුමිය අභීත නායිකාවක්. සිය පියාගෙන් ලබපු පන්නරය තුළ නියෝජ්‍ය ඇමතිකම් දරලා විශාල සේවාවක් මේ රටට කරපු තැනැත්තියක් එතුමිය.

අපිට ලොකු විශ්වාසයක් තිබෙනවා. ඔය හැම අමාත්‍යාංශයකම වැඩ කටයුතු කළා වාගේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයත් කවදා හරි කෙළින් කරන්නේ පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනියයි කියන එක මම ප්‍රකාශ කරන්න කැමැතියි. ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Thilanga Sumathipala. You have five minutes.

[අ.භා. 6.27]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

අද මේ විවාදයට සුළු වේලාවක් හරි සම්බන්ධ වෙලා, අපේ වික්ටර් ඇන්තනි මන්ත්‍රීතුමාට පසුව කථා කරන්න ලැබීම ගැන සන්තෝෂ වෙනවා. එතුමා බොහොම පැහැදිලිව කිව්වා, විපක්ෂය උදේ ඉඳලා කථා කරන්න උත්සාහ ගත්තත් ඔවුන්ගෙන් යමක් කියැවුණේ නැහැ කියලා. මාත් හිතන හැටියට ඒක තමයි සත්‍යය.

අද මේ විවාදයේ දී බලාපොරොත්තු වුණු දේ තමයි විදුලි බිල පිළිබඳව යම් කිසි විකල්ප අදහසක් ඉදිරිපත් කිරීම. මිල වැඩි කරනවාය කියලා කථා කරනවා මිසක්, මේ විදුලිබල අර්බුදය පිළිබඳව සාර්ථක, පැහැදිලි කතිකාවක් විපක්ෂයෙන් ඇති කළාය කියලා මට හිතා ගන්න අමාරුයි. ඔවුන් යම් යම් කරුණු කාරණා ඉදිරිපත් කළා. යම් යම් තැන් සම්බන්ධයෙන් ඔවුන් කියා සිටියා, මෙතැන දූෂණයක් වුණා, වංචාවක් වුණා, පරිපාලනය වැරදියි කියලා. අපේ CEB එකේ ඉංජිනේරුවරුන්ගෙන් අඩු පාඩු සිද්ධ වුණාය කිව්වා. නමුත් වර්තමාන තත්ත්වය ගැන අදහසක් ඇතිව යමක් ප්‍රකාශ වුණා කියලා කියන්න අමාරුයි. මම එහෙම කියන්නේ, විශේෂයෙන්ම 2009න් පස්සේ විදුලියට විශාල ඉල්ලුමක් ලැබිලා තිබෙන නිසායි. ඒ වාගේම වර්තමාන ජාතික සංවර්ධන සැලැස්ම වෙනස්. මේ රටේ සංවර්ධන කලාප, සංවර්ධන අවශ්‍යතාව සම්පූර්ණයෙන් වෙනස්. මේ උත්පාදනය කරන විදුලිය කළමනාකරණය කර ගෙන ඉදිරියට යා යුතුයි කියලා අපි විශ්වාස කරනවා. මෙහිදී ඉංජිනේරු මහත්වරු, විදුලිබල මණ්ඩලයේ සියලුම අය අලුත් අභියෝගයකට මුහුණ පාලා තිබෙනවා. ඒ අභියෝගයත් එක්ක කටයුතු කළ යුතුයි. ඒ නිසා ඔවුන්ට සැලැස්මක් තිබෙනවා. මේ සියලු දේවල් අවුරුදු ගණනාවක් තිස්සේ ආපු ප්‍රශ්න.

අද විදුලිබල මණ්ඩලය අවුරුද්දකට බිලියන 80කට කිට්ටු ප්‍රමාණයක පාඩුවකට යනවා. එක කාරණයක් කියලා මට මේ කථාව නවත්වන්න සිද්ධ වනවා, මට විනාඩි හතරක වාගේ කාලයක් ලැබිලා තිබෙන නිසා. මම හිතන හැටියට, විදුලිබල මණ්ඩලය පාඩු නැතිව යන්න නම්, කවදා හරි දවසක හැමෝටම එක ගණනකට විදුලිය අළෙවි කරන්න සිද්ධ වනවා. එහෙම නැතිව අඩු ආදායම්, අඩු පහසුකම් ගැන කථා කරන්න ගියොත්, කවදාවත් ඔවුන්ට ඒ ආයතනය දියුණු කරන්න බැහැ. දිළිඳුකම තුරන් කරන එක CEB එකේ රාජකාරිය නොවෙයි. නමුත් අපි පුරුදු වෙලා තිබෙන ක්‍රමවේදය අනුව කියනවා, අඩුවෙන් පාවිච්චි කරන අයට හරි අමාරුයි කියලා. විදුලිබල මණ්ඩලයේ තිබෙන මේ බිල් ක්‍රමය අනුව තව අවුරුදු 40කදීවත් අපට මේ ප්‍රශ්නයට විසඳුමක් සොයන්න බැහැ. නමුත් ඒ ගැන විපක්ෂයේ අය කථා කරන්නේ නැහැ. මට මතකයි,

ඉස්සර ටෙලිකොම් දුරකථනයකින් නුවරට විනාඩියක් කථා කළාම ගාස්තුව රුපියල් 5.50යි. යාපනයට කථා කළාම රුපියල් 8.75යි. එංගලන්තයට කථා කළාම රුපියල් 125යි. අපි ඒ මුදල පාරිභෝගිකයාගෙන් අඩු කරලා තිබෙනවා. ඉස්සර තිබුණේ වැඩිපුර පාවිච්චි කරන අයට වැඩිපුර බිලක් එන විධියටයි. නමුත් ඒක වෙනස් කරන්න සිද්ධ වුණා. එය වෙනස් කිරීමෙන් ටෙලිකොම් ආයතනය ලාභ උපයන ආයතනයක් බවට පත් වුණා.

දැන් විදුලිය උත්පාදනය කරනකොට ඒ ගැන ගණනයක් කරන්න වෙනවා. Peak hours තිබෙනවා, වැඩියෙන් පාවිච්චි කරන වේලාව, අඩුවෙන් පාවිච්චි කරන වෙලාව පිළිබඳව. Coal power ආදී හැම දෙයකින්ම නිෂ්පාදනය කරන විදුලිය පිළිබඳ සමතුලිතභාවයකට යන්න වෙනවා. එහෙම කරගෙන යෑමේ හැකියාවක් විදුලිබල මණ්ඩලයට තිබෙනවා. නමුත් ඒක කරගෙන යන කොට, කොච්චර ප්‍රමාණයක් උත්පාදනය කරලාද රට පුරා බෙදා හරින්නේ කියන කාරණය ගැන ගණනයක් කරන්න වෙනවා. අපි දැනට hydropowerවලින් මෙගාවොට් 8,22ක්, CEB එකේ thermal powerවලින් 636ක්, IPP generationවලින් 438ක් යනාදී වශයෙන්. නමුත් අඩුම වියදමෙන් හදන එක ගැන අවබෝධයක් ඇතිව, පරිහරණය සඳහා බෙදා හැරීමක් සිද්ධ වෙන්න ඕනෑ. සියයට සියයකටම ඇති වෙන්න නිෂ්පාදනය කරන්නත් බැහැ. මෙයට පරිගණක පද්ධතියක් සම්බන්ධ වෙන්න ඕනෑ. අලුත් තාක්ෂණය යොදවන්න ඕනෑ. එතකොට අපේ නිෂ්පාදනයට වැය වන මුදල අඩු කරන්න පුළුවන්. මේ ගැන අවංක චේතනාවකින් විදුලිබල මණ්ඩලයට - CEB එකට- උදව් කරලා, ඒ අයගේ අදහස් එක්ක සංවාදයකට ගියොත් අපිට තව අවුරුදු 5කින්, 10කින්, 15කින් සාර්ථක විසඳුමකට එන්න පුළුවන්. නමුත් මගේ පෞද්ගලික මතයට අනුව මා හිතනවා මෙන්න මෙය. වැඩිපුර

පාවිච්චි කරන පෞද්ගලික අංශයේ සමහර අයගෙන් රුපියල් 45ක් අය කරනවා. තවත් සමහර අයගෙන් රුපියල් 2.50ක් අය කරනවා. එතකොට ඒ පරාසය CEB එකේ වගකීම වෙන්න නරකයි.

CEB එකේ වගකීම වෙන්න ඕනෑ, තමන් නිෂ්පාදනය කරන විදුලිය අඩුම මුදලකට ජනතාව අතර බෙදා දෙන එකයි. මෙතැනදි ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මේ ආයතනය monopoly එකක්. අපට තිබෙන්නේ මේ ආයතනය විතරයි. ඉස්සරම අපට මතකයි CEB එකෙන් අරගෙන නගර සභාවෙන් තමයි අපට current එක අලෙවි කළේ. අද නගර සභාවෙන් වතුර ටික, විදුලිය ලබා දෙන ක්‍රමයක් නැහැ. නමුත් ප්‍රධාන වශයෙන් CEB එකෙන් විදුලිය නිෂ්පාදනය කර කලාප වශයෙන් ඒ ඒ පළාත් වශයෙන් බෙදා හොඳ පරිපාලනයක් ඇතිව, හොඳ සේවාවක් දුන්නොත් ඒ පළාත්වලින් ආදායමක් අරගෙන ඒවා නඩත්තු කිරීමේ ක්‍රමවේදයකට යන්න පුළුවන්. අපි හැම කෙනෙතුගේම අවධානය යොමු විය යුත්තේ ප්‍රතිව්‍යුහගත කිරීමක්, ප්‍රතිසංවිධානයක් තුළින් අලුත් චින්තනයකින් යුතුව CEB එකට උදව් කිරීමයි. ඒ අයට ඒ පුළුවන්කම තිබෙනවා; ඒ අයට ඒ දැනුම තිබෙනවා, ලෝකයේ තිබෙන තාක්ෂණය ගැන අවබෝධය තිබෙනවා. නමුත් දේශපාලන කෝණයකින් බලන්නේ නැතිව අපේ පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමියට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දුන්නොත් එතුමියට සම්පූර්ණ පළපුරුද්ද, අත් දැකීම තිබෙනවා මේ කර්තව්‍යය සාර්ථකව කරගෙන යන්න. එතුමිය මේ තනතුරට ඇවිල්ලා තවම මාසයක්, දෙකක් තමයි වෙන්නේ. හැම කෙනෙක්ම කථා කළේ අවුරුදු හතක්, දහයක්, විස්සක් ගැනයි. ඒකෙන්ම පෙනෙනවා විදුලිය මිල ගැන ඇමතිතුමියට ඒ අන්දමින් කරුණු ප්‍රකාශ කිරීම අසාධාරණයි කියන එක. මොකද, මේක ජාතික ප්‍රශ්නයක්. එතුමිය මේ ප්‍රශ්නයට මුහුණ දීලා, ඉංජිනේරු මහත්වරුන් සමඟ සාකච්ඡා කරලා. කතිකාවක් ඇති කරගෙන මේකට ප්‍රායෝගිකව විසඳුමක් සොයාගෙන ක්‍රියාකාරීව කරන්න පුළුවන් වැඩසටහනක් සමඟ ඉදිරිපත් වීම ගැන අපි සන්තෝෂ වෙනවා. අපි එතුමියට සුබ පතනවා. එතුමිය මේ කර්තව්‍යය සාර්ථකව කරගෙන යනු ඇතැයි රටේ ජනතාවගේත්, පොදු ජනතාවගේත් හැඟීමයි. අපටත් ඒ විශ්වාසය තිබෙනවාය කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 6.34]

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමිය)

(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வலு, சக்தி அமைச்சர்)

(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බල ශක්තිය අර්බුදය කියන්නේ මේ කාලයේදී බොහොම කථා වන මාතෘකාවක්. විශේෂයෙන්ම බල ශක්ති මිල වැඩි කිරීම, විකල්ප බල ශක්තිය යන මේවා අද ලෝකයේ බොහෝ රටවල්වල සමාජ, දේශපාලනමය වටිනාකමක් තිබෙන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. මා විශ්වාස කරනවා, මේක මේ සභා ගැබේ ඉන්න අපි පමණක් නොවෙයි මුළු ලෝකයේ ඉන්න හැමෝම පොදුවේ විසඳුම් සෙවිය යුතු අර්බුදයක් බව. දේශපාලන බෙදීම්, ජාති බෙදීම්, ආගම් බෙදීම්, කුල බෙදීම් යන මේවා මත ඒකට විසඳුම් සෙයන්න පුළුවන්කමක් නැහැ. අපි සියලු දෙනාම සාමූහිකව මේ බලශක්ති අර්බුදයට විසඳුම් සොයන්න ඕනෑ. අපි මේ විසඳුම් ගෙනෙනකොට දේශපාලන ලෙඩ ඇඳේ මියැදෙමින් ඉන්න සමහර දේශපාලන ප්‍රවාහ මේවායේ එල්ලිලා ඔක්සිජන් ගහ ගන්න හැදීම ඉතාම කනගාටුදායක තත්ත්වයක්. රටක් විධියට බැලුවාම මේක ජාතියේ අවාසනාවන්ත තත්ත්වයක්. සාමාන්‍යයෙන් මෙවැනි දේශපාලන වාසි ලබා ගන්න ලයිට් බිල විතරක් නොවෙයි පදනම් කර ගන්නේ. ඉතිහාසයේ අපි බැලුවොත් බලාගාරයක් හදන්න ගියත් NGOs මැදිහත් කර ගෙන ඒවාට විරුද්ධ වෙනවා. එහෙම නැත්නම් විදුලි රැහැන් අදින්න ගියාම සමහර වෙලාවට වෘත්තිය ක්‍රියා මාර්ග ගන්නවාය කියා ඒ හරහා ඒවා කඩාකප්පල් කරනවා. මම හිතන හැටියට මේ රටේ නූපන් දරුවන් පවා මේ සංස්කෘතියට සාප කරාවි. සමස්තව ඇති වෙලා තිබෙන මේ ප්‍රශ්නයට සාමූහිකව උත්තර සෙවීම තිබියදී දේශපාලන වාසි ලබා ගැනීමේ අරමුණින් කටයුතු කිරීම සිදු නොවිය යුත්තක්ය කියා මා විශ්වාස කරනවා. ඒ වාගේම ජාතියක් වශයෙන් ඒක අපේ රටට මහා සාපයක්.

විශේෂයෙන්ම මේවා පිටුපස ජාත්‍යන්තර බලවේගත් තිබෙනවා. බලශක්ති අර්බුදයක් රටක ඇති වුණාම යම් යම් රටවලට ජාත්‍යන්තරව ඇඟිලි ගහන්න මේවා මෙවලම් විධියටත් පාවිච්චි වෙමින් තිබෙනවා. මෙවැනි වකවානුවක තමයි ස්ථිරසාර වැඩ පිළිවෙළක් යටතේ බලශක්ති අර්බුදයට විසඳුම් සොයන්න මේ රටේ රාජ්‍ය නායකයාගේ ප්‍රමුඛත්වයෙන් අපි අද කටයුතු කර ගෙන යන්නේ. විශේෂයෙන් ඕනෑම බලපෑමකට ඔරොත්තු දෙන්න පුළුවන් ආත්ම ධෛර්යයක් තිබෙන අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ඒ ධෛර්යවන්ත නායකත්වය නිසා අපි බලශක්ති අර්බුදයට ස්ථිරසාරව විසඳුම් ගෙන ඒමේ ක්‍රියාවලියකට අද අවතීර්ණ වෙලා තිබෙනවා. නමුත් අපේ ඉතිහාසය බලන කොට පෙනෙනවා, ප්‍රධාන ජල විදුලි බලාගාර හදන්නට පුළුවන් උපරිමයට අපි ඇවිල්ලා තිබෙන බව. ලංකාවේ ගංගා ආශ්‍රිතව සහ ජලාශ ආශ්‍රිතව අපට හැදිය හැකි සියලුම විදුලි බලාගාර හදලා ඉවරයි. එහෙම වුණාට පස්සේ අපට විසඳුමක් වශයෙන් යා හැකි වියදම් අඩු බලාගාර ඇති කරන්න රටක් විධියට අපට විශාල කාලයක් තිබුණා. විශේෂයෙන් අපේ ජනාධිපතිතුමා අවුරුදු 25කට පස්සේ එතුමා ජනාධිපති ධුරයට පත් වුණාටත් පස්සේ තමයි ගල් අහුරු තාප බලාගාරයකට එතුමා අත කියන්නේ.

විශේෂයෙන් අපට මතකයි, 1982 දී ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ කාලයේදී ත්‍රිකුණාමලයේ ගල් අහුරු බලාගාරයක් හදන්න අවශ්‍ය සියලුම කර්තව්‍යයන් අවසාන කළා කියලා. හැබැයි අපි දන්නවා, ප්‍රභාකරන් ඉදිරියේ කීප වරක්ම දණ නවපු ඒ නායකයන්ට මේ වාගේ දෙයක් හදා ගන්නත් ආත්ම ධෛර්යයක් තිබුණේ නැති බව. අද ගල් අහුරු බලාගාර ගණනාවක් මේ රටේ ඉදි වෙලා තිබුණා නම් අද මේ කථා කරන ප්‍රශ්නයට ඔබට අපට මුහුණ දෙන්නට සිද්ධ වෙන්නේ නැහැ. එහෙම නම් අඩු වියදමින් විදුලිය නිපදවන ක්‍රම අපේ රටේ හැදිලා තිබෙනවා. විශේෂයෙන්ම ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ කාලයේ සියලුම කටයුතු කරලාත් 1982 දී ත්‍රිකුණාමලයේ ඒ ගල් අහුරු බලාගාරය හැදුවේ නැහැ. සජිත් ප්‍රේමදාස මහත්තයා මහත් පුරසාරමට මෙතැන කිව්වත්, එතුමාගේ පියාගේ කාලයේදීත් මාවැල්ලේ බලාගාරය හදන්න හැදුවාම නැවතත් නොයෙකුත් බලපෑම් ආවා. ඔවුන්ට එය කරන්න ධෛර්යයක් තිබුණේ නැහැ. පරිසරවේදීන්ගේ නැත්නම් ධීවරයන්ගේ නොයෙකුත් උද්ඝෝෂණ නිසා එය අතහැර දැම්මා. ඒ, රාජ්‍ය පාලනය කිරීමේදී ඒ ආත්ම ශක්තිය, රට වෙනුවෙන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නට ධෛර්යක් නොතිබුණු නිසා. මේක අපට අහන්න දෙයක් නොවෙයි. මොකද, අපි දන්නවා, මේ රටේ අවුරුදු නිහක පමණ කාලයක් තිබුණු යුද්ධය ඉවර කරන්න ආත්ම ධෛර්යයක් නොතිබුණු අයට, ප්‍රභාකරන් ඉස්සරහ දණ නවමින් හිටපු අයට එවැනි දෙයක් කිරීමටවත් ධෛර්යයක් නොතිබීම අපට ඒ තරම් අරුමයක් නොවෙයි කියා. ඒ නිසා අද අපි මේ අර්බුදයට මුහුණ දෙනවා.

මේ රටේ ජලවිදුලි බලාගාර දැන් හදලා ඉවරයි. තාප විදුලි බලාගාර හදන්න පටන් ගත්තේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමාගේ කාලයේ. ඒ වාගේම රටේ සියයට 94ක ජනතාවකට අපි විදුලිය ලබා දීලා තිබෙනවා. මේ රටේ දුප්පත් මිනිසුනට විදුලිය දෙන්නට අතිගරු ජනාධිපතිතුමා ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දුවක් ගන්නේ මහින්ද චින්තනයෙන්. ඉස්සර

නගරවලට විදුලිය තිබුණා තමයි. හැබැයි ගම්වලට විදුලිය ලබා දුන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවෙන්, විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ. එතුමා ගත්ත ඊළඟ ප්‍රතිපත්තිමය තීන්දුව තමයි "කිසිම විධියකට අපි විදුලිය කප්පාදු කරන්නේ නැහැ"යි කියන එක.

අපට මතකයි, 1981 දී, 1983 දී, 1984 දී, 1987 දී, 1992 දී, 2001 දී, 2002 දී මේ රටේ විදුලිය කප්පාදු කළ බව. එහෙම විදුලිය කප්පාදු කරලා, මේ රටේ දුප්පත් මිනිසුනට විදුලිය දෙන්නේ නැතුව රාජ්‍ය කරපු රාජ්‍ය නායකයෝත් සිටියා. අපට මතකයි, ඒ කාලයේ සාමයත් නැහැ; බලාගාරත් නැහැ; විදුලියත් නැහැ; රටේ කිසි දෙයක් නැහැ. පොඩි මිනිසුනට විදුලියක් නැහැ. ලයිට් කැපුවා. අපට මතකයි, කරු ජයසූරිය මැතිතුමාට හොඳ නමකුත් පට බැඳුණා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කරුවල ජයසූරිය කියලා.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මොකක්ද කියලා එහෙම නමකුත් පට බැඳුණා.

කර්මාන්ත අංශයේ විදුලි ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් සජිත් ප්‍රේමදාස මහත්තයා බොහොම අමාරුවෙන් කථා කළා. අපි කියන්න ඕනෑ, සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පියාගේ කාලයේ සියයට 45කින් ගෘහස්ථ විදුලි බිල වැඩි කළ බව. 1990 දී එතුමා ගෘහස්ථ හා කර්මාන්ත විදුලි ගාස්තු දෙකම සියයට 23කින් වැඩි කළා.

අද එහෙම දෙයක් ලංකාවේ සිද්ධ වුණේ නැහැ. ලයිට් කැපුවේ නැහැ. විදුලි බිල වැඩි කළේ නැහැ. නමුත් ඒ විධියට තමයි අද සජිත් ප්‍රේමදාස මැතිතුමන්ලා කථා කරන්නේ. විශේෂයෙන් යුද්ධය අවසන් කළාට පස්සේ අද අපි උතුරු නැහෙනහිරට විදුලිය ලබා දීමේ වගකීම ඉටු කර තිබෙනවා. වාකරේ වාගේ ප්‍රදේශවලට ලංකා ඉතිහාසයේ කවදාකවත් විදුලිය ලැබී තිබුණේ නැහැ. ඒ ප්‍රදේශවලටත් විදුලිය දෙනවාට අමතරව රටේ ජනගහනයෙන් සියයට 94කට විදුලිය ලබා දුන් රජයක් මේ. ඒ වාගේම මේ ආසියානු කලාපයේ විදුලිය කප්පාදුවකින් තොරව අඛණ්ඩව මිනිසුන්ට විදුලිය ලබා දෙන රජයක් අපි. අපටත් තිබුණා 1980, 1990 කාලවල සහ 2001 හා 2002 කාලවල කළා වාගේ විදුලිය කපලා, ජනතාව ලොකු අසහනයකට හා පීඩනයකට ලක් කරන්න. මේ රටේ නායකයා එහෙම තීන්දුවක් ගත්තේ නැහැ. ඒ නිසාම අපි කියන්නට ඕනෑ විශේෂයෙන් අපේ ආණ්ඩුව කාලයේ අපි උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ඇති කළා. පොඩි ව්‍යාපෘති වුණත් මෙගාවොට් 120ක විදුලියක් නිපදවනවා. අපි ඒ ව්‍යාපෘති දැන් පටන් අරගෙන කර ගෙන යනවා. ඊළඟට බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය. ඒකෙන් මෙගාවොට් 35යි. මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය. ඒකෙන් මෙගාවොට් 27යි. ගිං ගඟ ජල විදුලි බලාගාරය. ඒවා සංවර්ධනය කරමින් අද අපි කටයුතු කරමින් යනවා. ඒ වාගේම විදුලි බල පද්ධතිය නවීකරණය කරන්න අපි කටයුතු කරමින් යනවා. විශේෂයෙන්ම වසර 50කට වැඩි කාලයකට පෙරදී ඉදි කරන ලද විමලසුරේන්ද්‍ර බලාගාරය, පැරණි ලක්ෂණපාන බලාගාරය, නව ලක්ෂණපාන බලාගාරය හා උකුවෙල ජල විදුලි බලාගාරය නවීකරණය කිරීම මඟින් අපි එම බලාගාරවල කාර්යක්ෂමතාව වැඩි කරලා, විදුලි උත්පාදන ධාරිතාව වැඩි කරන්න කටයුතු කරමින් පවතිනවා.

ඊළඟට විදුලිය බෙදා හැරීමෙන් සිද්ධ වන හානිය අවම කර ගැනීමට අපි සම්ප්‍රේෂණ ජාලය ශක්තිමත් කරන්නත් කටයුතු කරලා තිබෙනවා. ඒ ක්‍රියා මාර්ග ඇතුළතට අපි ඇතුළත් කරලා තිබෙනවා, වවුනියාව කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය, කිලිනොච්චි චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය, නැහෙනහිර පළාතේ විදුලි සම්ප්‍රේෂණ ව්‍යාපෘති, මහ කොළඹ සම්ප්‍රේෂණ බෙදා හැරීම හානි අවම කිරීමේ ව්‍යාපෘතිය හා ඉන්දු ශ්‍රී ලංකා විදුලි අන්තර් සම්බන්ධතා ව්‍යාපෘති. අපි ඒවා නවීකරණය කර ගෙන, බෙදා හැරීමේ පද්ධතිය ශක්තිමත් කර ගෙන කටයුතු කර ගෙන යන කාලයක් මේ. ඒ වාගේම කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර, සුළං බල ශක්තිය, සූර්යය බල ශක්තිය. ඒවා එකකට එකක් කිසි සේත්ම සුළුවෙන් තකන්න බැහැ. අපි 2012 වසරේදී පමණක් පුනර්ජනනීය බලයෙන් ජාතික ජාලයට එක් කර ගත් විදුලි ප්‍රමාණය ගිගාවොට් 722ක්. ඒ අනුව මෙරට මුළු විදුලි ජනනයෙන් සියයට 7ක් පමණ අපි පුනර්ජනනීය බල ශක්තියෙන් පද්ධතියට එකතු කරලා තිබෙනවා. කුඩා ජල විදුලි බලාගාර 108ක් මඟින් මෙගාවොට් 236ක්, සුළං බලාගාර 9ක් මඟින් මෙගාවොට් 74ක්, සූර්ය බලාගාර මඟින් මෙගාවොට් 1.4ක් සහ ජෛව ස්කන්ධ ඩෙන්ඩ්‍රෝ බලාගාර දෙකක් මඟින් මෙගාවොට් 55ක් සහ ජෛව ස්කන්ධ සන අපද්‍රව්‍ය බලාගාර දෙකක් මඟින් මෙගාවොට් 11ක් අපි ජාතික පද්ධතියට එකතු කරලා තිබෙනවා. ඒ වාගේම දැයේ බල ශක්ති ඉල්ලුම වර්ධනය කරලා, කළමනාකරණය කරලා, බල ශක්ති භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි කරන්න අපි ජාතික බල ශක්ති කළමනාකරණ සැලැස්ම හඳුන්වා දීලා, බල ශක්ති ප්‍රමිති හා රෙගුලාසි හඳුන්වා දීලා ඒ අනුව නිසි ප්‍රමිතියකින් රටේ කටයුතු කරන්න ලොකු වැඩ පිළිවෙළක් කර ගෙන යන අවස්ථාවක් මේ.විශේෂයෙන්ම මේ සෑම ක්‍රියාකාරකමකින්ම විදුලි බල ක්ෂේත්‍රයේ ඇති වන ප්‍රගතිය ජනතාවට ලබා දෙන්න නම් විදුලිය වෙත ප්‍රවේශන මාර්ග වැඩි දියුණු කරන්න වනවා. ඒ නිසා අපි "විදුලමු ලංකා" ව්‍යාපෘතිය ඊට අනුබල ලෙස පටන් ගත්ත වැඩ පිළිවෙළක්. 2005දී සියයට 70ක්ව තිබුණු මේ රටේ විදුලි ප්‍රතිශතය අපි 2012 වන කොට සියයට 94 දක්වා වැඩි කර ගෙන ගිහිල්ලා තිබෙනවා.

විශේෂයෙන්ම විදේශ ආධාර යටතේ "උතුරු වසන්තය", "නැහෙනහිර නවෝදය", "ඌව උදානය" වැනි ග්‍රාමීය විදුලි ව්‍යාපෘති අපි ඇති කර මින් කටයුතු කර ගෙන යනවා. ඒක නිසා අපි එක්සත් ජාතික පක්ෂයට කියන්න ඕනෑ, විශේෂයෙන්ම සජිත් ප්‍රේමදාස මහත්මයා මෙතැන හිටියා නම් හොඳයි. මා එතුමාට මෙය කියන්න ඕනෑ. අපි නොවෙයි පැනලා ගියේ. මොකද, ගරු විපක්ෂ නායකතුමා එදා අගමැතිතුමා විධියට ප්‍රභාකරන් දීපු පන්දමත් පත්තු කර ගෙන ගිහිල්ලා සියයට 31කින් විදුලි බිල වැඩි කළා. එතුමා අහිංසක ජනතාවගේ ගෘහස්ථ විදුලි බිල සියයට 31කින් වැඩි කරන කොට වෙළෙඳ ව්‍යාපාරවලට සියයට 27කින් විදුලි බිල වැඩි කළා. ඒ කාලයේ බලාගාරත් නැහැ. විදුලියත් නැහැ. සාමයත් නැහැ. විදුලි බිලත් වැඩි කරලා ලයිට් කැපුවා. එහෙම කටයුතු කරපු එතුමන්ලා මෙලෙසයි අද කථා කරන්නේ. පෞද්ගලික අංශයේ දැවි තෙල් විදුලි බලාගාරවලින් ගිනි ගණනට විදුලිය ගන්න ඒ රජයෙන් මහා සැලසුම් කළා.

Ace Power, Embilipitiya , හෙළඳනවි යන ඒවා කරු ජයසූරිය හිටපු අමාත්‍යතුමාගේ කාලයේ විදුලිය ගත්ත පෞද්ගලික ආයතන. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඒ කාලයේ අපි දැක්කා, ගණන් ඇතුව 60,000ක් මරා දමා ලයිට් කණුවල එල්ලා තිබෙනවා. ලයිට් කණු යට ටයර් දමා පුච්චා තිබුණා. අපට කියන්න තිබෙන්නේ, සජිත් ප්‍රේමදාස මැතිතුමන්ලා එදා ජාතික පද්ධතියට විදුලිය එකතු කළේ නැහැ, මරා දමන ලද 60,000ක් දරුවන්ගේ අම්මලාගේ හඳවත්වලටයි ගින්දර පත්තු කළේ, විදුලිය එකතු කළේ කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම ගෞරවයෙන් කියන්න තිබෙන්නේ, අතිගරු ජනාධිපතිතුමා ඉතාම සංවේදී නායකයකු විධියට මේ රටේ ජනගහනයෙන් සියයට 50ක් පමණ ප්‍රමාණයකට සහනයක් ලබා දුන් බවයි. සාමාන්‍යයෙන් මේ රටේ ජනගහනයෙන් සියයට 50ක් පිරිස විදුලි ඒකක 60ක් පමණ භාවිත කරනවා. ජනගහනයෙන් සියයට 50කට ඒකකයකට ශතයක්වත් වැඩි කරන්න එපා කියලා තීන්දුවක් දීලා ක්‍රියාත්මක වන වෙලාවකයි, විපක්ෂය මේ විගඩම් දොඩවන්නේ. රටේ ජනතාවගෙන් සියයට 50කට විදුලි බිල වැඩි වන්නේ නැත්නම් මේ උද්ඝෝෂණය කරන්න හදන එකේ තේරුම මොකක්ද? මේ යෝජනා ගෙන ඒමේ තේරුම කුමක්ද? එම නිසා ඉතාම ගෞරවයෙන් මා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මතක් කරනවා, ඔබතුමන්ලාගේ රජයන් යටතේ ජල විදුලිය නිපදවුවාට පස්සේ ඒවා ක්‍රියාත්මක කරන්න කිසිම කොන්දක් තිබුණේ නැහැයි කියලා. නොරොච්චෝලේ බලාගාරය ඉදි කරන්න ගිහින් අඩියක් පස්සට ගත්තා. Pension අරගෙන නැවතත් ඔබතුමන්ලාක් එක්කත් එකතු වෙලා, අද මනස්ගාත දකින සමහර නායිකාවන්ටත් ඒ ධෛර්යය තිබුණේ නැහැ. හැබැයි ජනාධිපතිතුමාට ඒ ධෛර්යය තිබුණා, ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමනි. එම නිසා මට කියන්න තිබෙන්නේ, අද මේ රටේ ස්ථිරසාර අඩු වියදම් විදුලි ජනන සැලැස්මක් ක්‍රියාත්මක කරන්න - [බාධා කිරීම්]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Eran Wickramaratne.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
පොඩි පැහැදිලි කිරීමක් තිබෙනවා. විදුලිය ඒකක 0 සිට 60 දක්වා - [බාධා කිරීම්] ඒකක 0 සිට 60 දක්වා වෙනසක් වෙන්නේ නැහැ කිව්වා නේ. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! කරුණාකරලා වාඩි වෙන්න. [බාධා කිරීම්] ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි, වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)
හොඳම දෙන්නා යූඑන්පී එකේ ඉතිරි වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්]

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මා මෙය ඉතාම වග කීමකින් කියනවා. ඒකක 60ට අඩුවෙන් විදුලිය පාවිච්චි කරන පුද්ගලයින් සංඛ්‍යාව මේ රටේ ජනගහනයෙන් සියයට 50ක් පමණ වනවා. ජනාධිපතිතුමා ඒ අයට දීපු සහනය එහෙම ම ලබා දෙනවා කියන එක මා වග කීමකින් කියනවා. අපට තමුන්නාන්සේලාට කියන්න තිබෙන්නේ මෙයයි. පන්දම් පත්තු කර ගෙන ඉහළ කොත්මලේ විදුලි බලාගාරය ළඟට ගිහින්, නොරොච්චෝලේ විදුලි බලාගාරය ළඟට ගිහින්, ඔබතුමන්ලාට මේවා කරන්න බැරි වීම ගැන ජාතියෙන් සමාව ඉල්ලන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.50ට, 2013 මැයි 10වන සිකුරාදා අ. භා. 1.30වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 6.50 மணிக்கு பாராளுமன்றம், 2013 மே 10, வெள்ளிக்கிழமை பி. ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 6.50 p.m. until 1.30 p.m. on Friday, 10th May 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

216 වන කාණ්ඩය - 16 වන කලාපය
தொகுதி 216 - இல. 16
Volume 216 - No. 16

2013 මැයි 10 වන සිකුරාදා
2013 மே 10, வெள்ளிக்கிழமை
Friday, 10th May, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ)(සංශෝධන) –
[ගරු වයි.ජී. පද්මසිරි මහතා]- පළමුවන වර කියවන ලදී.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා:
දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම

කල් තැබීමේ යෝජනාව:
මාරාන්තික වකුගඩු රෝගය

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
சித்தசுவாதீனம் குறைந்த பிள்ளைகளுக்கான பாடசாலையின் நலன்புரிச் சங்கம் (கூட்டிணைத்தல்) (திருத்தம்) - [மாண்புமிகு வை.ஜி. பத்மசிரி] - முதன்முறை மதிப்பிடப்பட்டது

தனிநபர் பிரேரணை:
அரசியல் கட்சிகளினால் தேர்தல் ஆணைக்குழுவுக்கு நிதி கணக்காய்வு அறிக்கைகள் சமர்ப்பித்தல்

ஒத்திவைப்புப் பிரேரணை:
உயிர்கொல்லி சிறுநீரக நோய்

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

PRIVATE MEMBERS' BILLS:
Welfare Society of the School for the Mentally Subnormal Child (Incorporation) (Amendment) – [The Hon. Y.G. Padmasiri] - Read the First time

PRIVATE MEMBERS' MOTION:
Presenting a Financial Audit Report to the Election Commission by Political Parties

ADJOURNMENT MOTION:
Deadly Renal Disease

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 මැයි 10 වන සිකුරාදා
2013 மே 10, வெள்ளிக்கிழமை
Friday, 10th May, 2013

අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது.

சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] *தலைமை வகித்தார்கள்.*

The Parliament met at 1.30 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව. - [ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2008, 2009 සහ 2010 වර්ෂ සඳහා ටවර් හෝල් රහඟල පදනමේ වාර්ෂික වාර්තා සහ මූල්‍ය ප්‍රකාශ මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன் - காணி, காணி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Janaka Bandara Tennakoon - Minister of Lands and Land Development)

ගරු කථානායකතුමනි, මාතලේ, නාලන්ද, නන්දන වත්ත, අංක 02 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.සී.එම්. වීරසිංහ මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විමල් වීරවංශ මහතා - පැමිණ නැත.
ගරු පියංකර ජයරත්න මහතා - පැමිණ නැත.
ගරු සරණ ගුණවර්ධන මහතා - පැමිණ නැත.
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - පැමිණ නැත.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, කලමුල්ල, ජයවර්ධනාරාම පාර, අංක 485 බී දරන ස්ථානයෙහි පදිංචි එස්. සොයිසා ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මහතා
(மாண்புமிகு சில்வேஸ்திரி அலன்றின்)
(The Hon. Silvastrie Alantin)

கௌரவ சபாநாயகர் அவர்களே, யாழ்ப்பாணம், நல்லூர், பண்டாரிகுளம் ஒழுங்கை, 36ஆம் இலக்கத்தில் வதியும் திரு. இராசாவிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவைச் சமர்ப்பிக்கிறேன்.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගා/ රාමදොල කනිෂ්ඨ විද්‍යාලය: ගොඩනැඟිලි සහ සම්පත්
கா/ராமதொல கனிஷ்ட வித்தியாலயம்:கட்டிடங்கள் மற்றும் வளங்கள்
G/RAMADOLA KANISHTA VIDYALAYA : BUILDINGS AND RESOURCES

1899/'11

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්ව තිබූ, ඉඹුල්පිටිය, ගා/ රාමදොල කනිෂ්ඨ විද්‍යාලය

[ගරු බුද්ධික පතිරණ මහතා]

මීට වර්ෂ කිහිපයකට පෙර වැසී යාම නිසා ගොඩනැඟිලි ඇතුළු අනෙකුත් සම්පත් විනාශ වෙමින් පවතින බවත්;

(ii) මේ වන විට එම පාසල් භූමිය අසල්වාසීන් විසින් අත්පත්කර ගැනීමේ අවදානමක් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බලහත්කාරයෙන් පාසල් භූමිය අත්පත් කරගැනීම නවතාලීමට කටයුතු කරන්නේද;

(ii) ගා/ රාමදොල කනිෂ්ඨ විද්‍යාලයය සතු භූමිය සහ ගොඩනැඟිලි වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම කුමක්ද;

(iv) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) කාලී මාවට්ටත්තින් එල්පිට්ටිය වලයක්කල්වි කාරියාලත්තිර්කු උරිත්තායිරුන්ත ඉම්පුල්පිට්ටිය, කා/රාමතොල කනිෂ්ඨ විත්තියාලයම් ඉර්‍රෙක්කු සිල වරුඩංකළුක්කු මුන්නර් මූඩප්පට්ටමෙයිනාල් කට්ටිඩංකළ් උළ්ළිට්ට ඒනෙය වළංකළ් අළිවඩෙන්තු වරුකින්‍රන එන්පතෙයුම්;

(ii) තර්පෝතු මේර්පඩි පාඨසාලෙක්කාන නිලත්තෙ අයලවර්කළ් කෙප්පර්‍රක්කූඩිය ආපත්තාන නිලෙමෙ කාණප්පඩුකින්‍රතෙන්පතෙයුම් අවර් අරිවාරා?

(ආ) (i) පලවන්තමාක පාඨසාලෙක් කාණියෙ කෙප්පර්‍රුවතෙ නිරුත්තුවතර්කු නඩවඩික්කෙ එඩුප්පාරා එන්පතෙයුම්;

(ii) කා/රාමතොල කනිෂ්ඨ විත්තියාලයත්තිර්කුච් චොන්තමාන නිලත්තෙයුම් කට්ටිඩංකළෙයුම් පයනුළ්ළ වේරු නඩවඩික්කෙකළුක්කාකප් පයන්පඩුත්ත තිට්ටමිඩප්පට්ටුළ්ළතා එන්පතෙයුම්;

(iii) ආමෙනිල් අත්තිට්ටම් යාතෙන්පතෙයුම්;

(iv) ඉතර්කාක නිති ඒර්පාඩුකළ් ඔතුක්කප්පට්ටුළ්ළතා එන්පතෙයුම්

අවර් ඉච්චෙයිප්පක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්‍රෙයිල්, ඒන්?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) G/Ramadola Kanishta Vidyalaya at Imbulpitiya, which came under the Elpitiya Zonal Education Office in Galle District, was closed several years ago and as a result its buildings and other resources are getting destroyed at present; and

(ii) the land on which the aforesaid school has been built is currently at the risk of being encroached by neighbours?

(b) Will he inform this House -

(i) whether steps will be taken to stop encroachment of the school land;

(ii) whether a plan has been made to use the land and the buildings of G/Ramadola Kanishta Vidyalaya for some other productive activity;

(iii) if so, what that plan is; and

(iv) whether allocations have been made for that purpose?

(c) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්ව තිබූ ඉඹුල්පිටිය, ගා/ රාමදොල කනිෂ්ඨ විද්‍යාලය සිසුන් නොමැති වීම නිසා වැසී ගොස් ඇත. එම පාසල 2005 මැයි 12 දින ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී ඇත.

දැනට මෙම පාසල පවතින භූමිය හා ගොඩනැඟිලි අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දේපළක් නොවේ. එම භූමියෙහි ආරක්ෂාව හා සංවර්ධනය පිළිබඳ වගකීම ඇත්තේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් වෙතය.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. අධ්‍යාපන අමාත්‍යාංශය සතුව තිබුණු මේ වටිනා දේපළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැවරුවා. දැන් ඒ දේපළ තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම්වරයා යටතේයි. මේ වන විට අවුරුදු 8ක් ගත වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම අහන්නේ මෙයයි. මේ මොහොත වන විට අවට බොහෝ දෙනෙක් මේකේ ඉඩම් අල්ලා ගනිමින් ඉන්නවා. හැබැයි දැන් මේවායේ වගකීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැවරුවාට ඒ අය ගන්නෙත් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාවක් පවත්වන්නේ නැතිව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අවසානයේදී රජයට දැන් මේ සියල්ල අහිමි වෙමින් තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, එහෙම බාර ගන්නේ නැතිව ඉන්න බැහැ. මොකද, රාජ්‍ය දේපළවලට අදාළ ස්වභාවික නීතිය අනුව රජයේ යම් කිසි දේපළක් අත් හරිනවා නම් ඒ බල ප්‍රදේශයේ සිටින

ප්‍රාදේශීය ලේකම්වරයාට ස්වයංක්‍රියව එහි බලතල හා වගකීම් පැවරෙනවා. එම නිසා ගරු මන්ත්‍රීතුමාට ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී ඒ පිළිබඳව ප්‍රශ්න මතු කරන්නට පුළුවන්. අධ්‍යාපන අමාත්‍යාංශය වශයෙන් අපට අපේ නොවන දේපළක් පිළිබඳව කටයුතු කරන්නට බැහැ. 2005 දී වහපු රාජ්‍ය දේපළක් ප්‍රාදේශීය ලේකම්වරයාට අයිති වෙලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම පළමුවෙනි අතුරු ප්‍රශ්නයෙනුත් විමසුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මේ විධියට රාජ්‍ය දේපළ දිගින් දිගටම පැවරීම ඒ අයට දරා ගන්නට බැරි තත්ත්වයකට පත් වෙලා තිබීම ගැනයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ඒක එහෙම නොවෙයි සිදු වෙලා තිබෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම අහන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය සතු- [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය අහන්න දෙන්න කියන්න කෝ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඒක මේ රටේ තිබෙන මූලික නීතිය.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම දෙවෙනි අතුරු ප්‍රශ්නය අහලා ඉවර නැහැ. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, ප්‍රශ්නය අහන තුරු පොඩ්ඩක් ඉන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ප්‍රශ්නය අහලා ඉවර නැහැ ගරු අධ්‍යාපන ඇමතිතුමා. ඔබතුමා හොඳ සවන්දෙන්නෙක් වෙන්න ඕනෑ නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් කෙටියෙන් ප්‍රශ්නය අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, හුඟක් වෙලාවට පාසල්වලට අයිති ඉඩම්වල ගොඩනැඟිලි තිබෙනවා, ඩෙස්ක්, බංකු තිබෙනවා, සම්පත් තිබෙනවා. අපි හිතමු, ඩෙස්ක්, බංකු ළඟ පාසලකට දුන්නා කියලා. නමුත් මෙවැනි ඉඩම් පවරා දෙන්නේ නැතිව අධ්‍යාපන අමාත්‍යාංශයේම ගුරු පුහුණු කටයුතුවලට හෝ එහෙම නැත්නම් වෙනත් කටයුත්තකට දිගින් දිගටම පාවිච්චි කරන්නට බැරි ඇයි?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
පළාත් පාසල්වලට අයත් දේපළ මධ්‍යම ආණ්ඩුවට අයිති නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයට අනුව ඒවා අයිති පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ඔව්, අධ්‍යාපන අමාත්‍යාංශය කිව්වාම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයත් අයිතියි නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ඒ නිසා, ඒ පළාත් සභාවේ තිබෙන රජයේ දේපළ පිළිබඳව පැවරීම් කටයුතු කරන්නේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයයි. ඒක පවරලා ඉවරයි දැන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මාගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. පළාත් සභාවට අයිති බව ඇත්ත. නමුත් මේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සියලුම ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමේ බලය තිබෙන්නේ රේඛීය අමාත්‍යාංශයට. අපේ රටේ වැසෙන පාසල්වල ඉඩ කඩම් හා සම්පත් සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න රේඛීය අමාත්‍යාංශයට බැරි ඇයි?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
පුළුවන්. පොදු ප්‍රතිපත්තිමය තීන්දුව තමයි ඒ ප්‍රදේශයේ රාජ්‍ය දේපළක් අත් හැර දමනවා නම්, මූලික නීතිය අනුව ඒක භාර දීමේ වගකීම තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම්ට. ඒ අනුව ඒක පවරා තිබෙනවා. එතැන වැරැද්දක් වෙලා තිබෙනවා නම්, ඒක නිවැරැදි කරන්න පුළුවන්. වැරැද්දක් වෙලා නැහැ.

මාර්ග සංවර්ධන අධිකාරිය : කුලී වාහන
வீதி அபிவிருத்தி அதிகார சபை : வாடகை வாகனங்கள்
ROAD DEVELOPMENT AUTHORITY : VEHICLES OBTAINED ON RENT

2121/'11

2. ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාවේදී මාර්ග සංවර්ධන අධිකාරියට කුලී පදනම මත වාහන ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, ලබා ගත් වාහන කවරේද;

(iii) එම වාහන කවර කාර්යයන් සඳහා යොදා ගන්නේද;

(iv) එම කුලී වාහන සැපයූ ආයතනවල නම්, ලිපිනයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(v) ඉහත වාහන ලබා ගත් වර්ෂයන් කවරේද;

(vi) මේ වන විට එම වාහන නිදහස් කර තිබේ නම්, එම නිදහස් කළ වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005ஆம் ஆண்டு தொடக்கம் 2011ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் வீதி அபிவிருத்தி அதிகாரசபைக்கு வாடகை அடிப்படையில் வாகனங்கள் பெறப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், பெறப்பட்டுள்ள வாகனங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி வாகனங்கள் எப்பணிகளில் ஈடுபடுத்தப்பட்டுள்ளன என்பதையும்;

(iv) மேற்படி வாகனங்களை வழங்கிய குத்தகை நிறுவனங்களின் பெயர்கள், முகவரிகள் மற்றும் பணிப்பாளர் சபை உறுப்பினர்களின் பெயர்கள், முகவரிகள் யாவை என்பதையும்;

(v) மேற்படி வாகனங்களைப் பெற்றுக்கொண்ட ஆண்டுகள் யாவை என்பதையும்;

(vi) தற்போது இந்த வாகனங்கள் விடுவிக்கப் பட்டிருப்பின், விடுவிக்கப்பட்ட ஆண்டுகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he state -

(i) whether vehicles have been obtained for the Road Development Authority on rent basis during the period from the year 2005 to 2011;

(ii) if so, the vehicles obtained;

(iii) the purposes for which the aforesaid vehicles are used;

(iv) the names and addresses of the institutions that provided the aforesaid vehicles on rent and the names and addresses of the members of the Boards of Directors of them;

(v) the years in which the aforesaid vehicles were obtained; and

(vi) if the aforesaid vehicles have been released by now, the years in which they were released?

(b) If not, why?

ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Minister of Ports and Highways)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඇමුණුම I හි සඳහන් වේ.

(iii) ඇමුණුම I හි සඳහන් වේ.

(iv) ඇමුණුම II හි සඳහන් වේ.

(v) ඇමුණුම II හි සඳහන් වේ.

(vi) ඇමුණුම II හි සඳහන් වේ.

(ආ) පැන නොනඟී.

ඇමුණුම් **සභාගත*** කරමි.

මේ ප්‍රශ්නයට දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහලා තිබෙන්නේ වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාවේදී මාර්ග සංවර්ධන අධිකාරියට කුලී පදනම මත වාහන ලබා ගැනීම පිළිබඳ විස්තරයක්. ඒ පිළිබඳ තව මොනවා හරි විස්තර අවශ්‍ය නම්, මම එම පිළිතුරේ සඳහන් ඇමුණුම් ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. මේ සම්බන්ධයෙන් තවත් ප්‍රශ්න අහන්න තිබෙනවා නම් අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

2010 වර්ෂයේදී වාහන 50ක් බාහිර පාර්ශ්වයන්ගෙන් කුලියට අරගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ වාහන 50 පිළිබඳ විස්තරයක් ඔය ඇමුණුමේ තිබෙනවාද කියලා දැන ගන්න පුළුවන්ද?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයේ (අ) (iv)න් අහනවා, එම කුලී වාහන සැපයූ ආයතනවල නම්, ලිපිනයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද කියලා. ගරු කථානායකතුමනි, තනි පුද්ගලයන්ගෙන් තමයි මේ අදාළ වාහන ලබා ගෙන තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

දළ වශයෙන් කියන්න පුළුවන්ද, වාහන 50ක ලැයිස්තුවක් තිබෙනවාද කියලා. කාගෙන් ගත්තාද කියලා මට නම් ඕනෑ නැහැ. 2010 දී වාහන 50ක් අරගෙන තිබෙන ලැයිස්තුවක් ඔය ඇමුණුම් ඇතුළේ තිබෙනවාද කියලා කියන්න.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

2010 වර්ෂයේ දීද?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමනි, 2010 වර්ෂයේ දී ඊට වඩා වාහන සංඛ්‍යාවක් අරගෙන තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි, ඒක කමක් නැහැ. ඒ විස්තර ටික මට ලබා දෙන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
පුළුවන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එදාත් ඔබතුමාගෙන් මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් කළා. පිළිතුරුවලට අදාළව මේ වාගේ ඇමුණුම් තිබෙනකොට ඒවා අපට කලින් ලබා දෙන්න කියලා ඔබතුමා සෑම කෙනෙකුවම දැනුවත් කරනවා නම් හොඳයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරු දෙන්න ඉස්සෙල්ලා ඒවා දුන්නා නම් හොඳයි කියලා හිතනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා පොඩ්ඩක් ඒ ගැන සියලු දෙනාවම දැනුවත් කළොත් හොඳයි. Thank you.

අක්‍රීය රාජ්‍ය ව්‍යවසායන් : විස්තර
இயங்காதிருக்கும் அரசாங்க தொழில்முயற்சிகள் : விபரம்
NON-FUNCTIONAL PUBLIC ENTERPRISES : DETAILS

2187/'11

3. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) මෙරට අක්‍රියව පවතින රාජ්‍ය ව්‍යවසායන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යවසායන්හි නම් කවරේද;

(iii) එකී ආයතනයන්හි දැනට සේවයේ නියුතු සමස්ත සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන මේ වන විට ලබා ඇති සමස්ත අලාභය කොපමණද;

(v) එකී ආයතනයන්හි පවතින ගැටලු විසඳීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අක්‍රියව පවතින රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීමට හෝ වසාදැමීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, මේ අවස්ථාවේදී එම ආයතන සඳහා යළි ප්‍රාග්ධනය සැපයීමක් සිදු කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டில் இயங்காமலிருக்கும் அரசாங்க தொழில்முயற்சிகளின் எண்ணிக்கையையும்;

(ii) அம்முயற்சிகளின் பெயர்களையும்;

(iii) அந்நிறுவனங்களில் தற்போது பணிபுரிந்து கொண்டிருக்கும் ஊழியர்களின் மொத்த எண்ணிக்கையையும்;

(iv) மேற்படி நிறுவனங்களின் இற்றைவரையான மொத்த நட்டத்தையும்;

(v) அந்நிறுவனங்களில் காணப்படுகின்ற பிரச்சினைகளைத் தீர்த்துவைப்பதற்கு அரசாங்கத்தினால் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளையும்

அவர் கூறுவாரா?

(ஆ) (i) இயங்காமலிருக்கும் அரசாங்க முயற்சிகள் தனியார்மயப்படுத்தப்படவுள்ளனவா அல்லது மூடப்படவுள்ளனவா என்பதையும்;

(ii) இன்றேல், அவை இத்தருணத்தில் ஏன் மீள்மூலதனமாக்கப்படுகின்றன என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the number of non-functional Public Enterprises in the country;

(ii) the names of those Enterprises;

(iii) the total number of employees working in those institutions at present;

(iv) the total loss of the aforesaid institutions to date; and

(v) the action taken by the Government to solve the problems that exist in those institutions?

(b) Will he inform this House -

(i) whether the non-functional Public Enterprises are going to be privatized or closed; and

(ii) if not, as to why they are being recapitalized at this moment?

(c) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(මාණ්පුමිකු කලානිති සරත් අමුණුගම - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 08කි.

(ii) ඇමුණුමෙහි ii තිරුව බලන්න.

(iii) ඇමුණුමෙහි iii තිරුව බලන්න.

(iv) ඇමුණුමෙහි iv තිරුව බලන්න.

(v) ඇමුණුමෙහි 1 හි v තිරුව බලන්න.

(ආ) (i) ඇමුණුමෙහි vi තිරුව බලන්න.

(ii) ඇමුණුමෙහි vii තිරුව බලන්න.

ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**

சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :

Annex tabled:

i	ii අදාළව පවතින රාජ්‍ය ව්‍යවසායන්ගේ නම්	iii එහි සමස්ථ සේවක සංඛ්‍යාව	iv සමස්ථ අලාභය (රුපියල්)	v පවතින ගැටළු විසඳීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර	vi මෙම රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීමට හෝ වසා දැමීමට කටයුතු කරන්නේද?	vii යම් ප්‍රාග්ධන සැපයීමක් සිදු කිරීමට හේතු
1	ජනතා පොහොර සමාගම	32	(2012/07/31 දිනට) 1,355,550.70	රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුව මෙම සමාගම සතු ගබඩාව සහිත ඉඩම අඩු ආදායම් ලාභී පවුල් සඳහා නිවාස ව්‍යාපෘතියක් ඉදි කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීමටත්, එහි සේවකයන් වෙනුවෙන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් ලබා දීමට හෝ ස්ථිර සේවකයන් ලෙස රජයේ ප්‍රධාන පොහොර සමාගම් දෙක වන සී/ස ලංකා පොහොර සමාගමට හා සී/ස කොළඹ කොම්ඊෂල් පොහොර සමාගම වෙත අනුයුක්ත කිරීමටත් යෝජනා කර ඇත.	ඇවර කිරීමට නියමිතයි	අදාල නොවේ
2	හිතුරාන සීනි කර්මාන්තායතනය	10	(2007/03/31 දිනට) 1,734,056,929.69	මෙම ආයතනයේ වත්කම් වලින් කොටසක් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් යටතේ වර්ෂ 2007 දී ගල්ඔය වැවිලි (පෞද්ගලික) සමාගම නමින් පුනර්ජීවනය කරන ලද අතර දැනට එහි සීනි නිෂ්පාදනය සාර්ථකව කරගෙන යනු ලබයි. මේ වනවිට සුන්බුන් වූ සුළු වත්කම් ප්‍රමාණයක් සහිතව නාමිකව පවත්නා හිතුරාන සීනි කර්මාන්තායතනය ඉදිරියේදී ඇවර කල යුතුව පවතී.	ඇවර කිරීමට නියමිතයි	අදාල නොවේ
3	කන්තලේ සීනි කර්මාන්තායතනය	41	(2010/12/31 දිනට) 9,717,471 .00	මෙම ආයතනයට හිමි ඉඩම් හා කර්මාන්තශාලා නැවත සංවර්ධනය කිරීමේ උපාය මාර්ගයන් සැකසීම් සඳහා මෙම ආයතනය රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා දී ඇත. (ඉදිරියේ සංවර්ධනය කිරීමට පැවරීමෙන් අනතුරුව නාමික වශයෙන් ඉතිරි වන යම්කිසි ආයතන ඇවර කල යුතු වේ.)	ප්‍රතිස්ථාපනය කරනු ලැබේ	අදාල නොවේ
4	ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව	2	(2011/03/31 දිනට) 133,379,304.00	මෙම ආයතනයට අයත්ව තිබූ මාවනැල්ල හා බදුරලිය යන ස්ථාන වල පිහිටි කර්මාන්තශාලා 2012.02.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පුද්ගලික ආයෝජකයෙකු වෙත වසර 30 ක කාලයක් සඳහා කල් බදු ක්‍රමයට ලබා දී ඇත. ඉතිරිව පවත්නා ඇල්පිටිය කර්මාන්තශාලාව සුදුසු ආයෝජකයෙකු වෙත පැවරීමෙන් අනතුරුව නාමික වශයෙන් ඉතිරි වන මෙම ආයතනය ඇවර කල යුතුව පවතී.	ඇවර කිරීමට නියමිතයි	අදාල නොවේ
5	ලංකා සළුසල	253	(2012/03/31 දිනට) 834,632,492.00	සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට උපකාරී කරගත හැකි අයුරින් ලංකා සළුසල ආයතනය අත්යන්ත රේඩි නිෂ්පාදනය සඳහා යොමු කර, ප්‍රතිව්‍යුහගත කිරීමට රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය කටයුතු කරමින් පවතී.	ප්‍රතිස්ථාපනය කරනු ලැබේ	අදාල නොවේ
6	සී/ස ලංකා පැබ්රික්ස් ආයතනය	සේවකයන් නොමැත	(2010/03/31 දිනට) 15,773,188 .00	සේවකයන් පස් දෙනෙකු ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගන්වා ඇත. ඉතිරිව සිටි සේවකයින් තිදෙනාද 2012.03.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වෙනත් රාජ්‍ය ආයතන වෙත අනුයුක්ත කරන ලදි.	ඇවර කිරීමට නියමිතය	අදාල නොවේ
7	සමුපකාර තොග වෙළඳ සංස්ථාව	311	(2010/12/31 දිනට) 926,124,400.00	සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ නැවත ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු ආරම්භ කර ඇත. මෙහි දී ප්‍රධානතම ගැටළුව වන 1992 දී ක්‍රියාත්මක කල ප්‍රතිව්‍යුහගත කිරීමේ දී නිසුත් කල රුපියල් මිලියන 4,397 ක බැඳුම්කර 2016 දී කල් පිරීමට නියමිතව ඇති බැවින් ඒ සඳහා මුදල් සපයා ගන්නා ආකාරය පිළිබඳව සැලසුම් සකස් කරමින් පවතී. තවද, වී මෝල් ප්‍රතිසංස්ථාපනය කිරීම, ලොරී ප්‍රවාහන සේවා සැපයීම, පාම් ඔෆ් මෙහින් සිල්ලර වෙළඳාම දියුණු කිරීම මෙන්ම ඇසුරුම් මධ්‍යස්ථාන ආරම්භ කර අතිරික්ත සේවකයන් ඵලදායී ලෙස සේවයේ යෙදවීම මඟින් ආයතනය නැවත ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.	ප්‍රතිස්ථාපනය කරනු ලැබේ	අදාල නොවේ
8	සී/ස රාජ්‍ය වාණිජ (සමුපකාර තොග වෙළඳ) සමාගම	4	(2012/03/31 දිනට) 11,196,713.00	සමුපකාර තොග වෙළඳ සංස්ථාව සමඟ ඒකාබද්ධ කරනු ලැබේ.	ප්‍රතිස්ථාපනය කරනු ලැබේ	අදාල නොවේ

[මෙම ඇමුණුම ප්‍රශ්නකාලයේ ද තබා ඇත.]

[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]

[This annex is also placed in the Library.]

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, බොහොම ස්තුතියි එම පිළිතුර සම්බන්ධයෙන්. මේ අවස්ථාවේදී මා දැන ගන්න කැමැතියි, "non -functional" කිව්වාම මේවා දැන් ක්‍රියා විරහිතව තිබෙනවාද, නැත්නම් අලාභය තවත් වැඩි වෙමින් ඉදිරියට ගමන් කරගෙන යනවාද කියලා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒකත් මට එකින් එක ඔබතුමාට කියන්න පුළුවන්. ජනතා පොහොර සමාගම ඇවර කිරීමට නියමිතයි. ඒ වාගේම හිඟුරාන සීනි-

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඒ කියන්නේ පෞද්ගලීකරණය කරනවා කියන එකද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ. ඇවර කරනවා කියන්නේ, it will be liquidated.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
It will be liquidated.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
Yes.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
Then, who will carry out the function of that institution?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
That will be delegated to others. For example, ජනතා පොහොර සමාගමේ නම් සේවකයින් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් ලබා දීම හෝ ස්ථිර සේවකයන් ලෙස රජයේ ප්‍රධාන පොහොර සමාගම් දෙක වන සීමාසහිත ලංකා පොහොර සමාගමට සහ සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වෙත අනුයුක්ත කිරීමට යෝජනා කර තිබෙනවා. ඒ වාගේ හැම එකටම මොකක් හෝ විකල්ප යෝජනාවක් තිබෙනවා. මා එකින් එක ඔබතුමාට කියන්නම්.

හිඟුරාන සීනි කර්මාන්තය ඇවර කළ යුතුව තිබෙනවා. නමුත් දැන් එහි සීනි නිෂ්පාදනය කිරීම සඳහා එම අමාත්‍යාංශයෙන් කටයුතු කර ගෙන යනවා. කන්තලේ සීනි කර්මාන්තයත් එහෙමයි. එතකොට ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව ඇවර කිරීමට නියමිතයි. ඇල්පිටිය කර්මාන්තශාලාව සුදුසු ආයෝජකයකු වෙත පැවරීමෙන් අනතුරුව නාමික වශයෙන් ඉතිරි වන මෙම ආයතනය ඇවර කළ යුතුව පවතිනවා. ඒ වාගේ එකින් එක විස්තර මෙහි තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ඉස්සෙල්ලා ඇහුවේ?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඒක මම පෙර සූදානමක් වශයෙන් ඇහුවේ.
අද වේලාව තිබෙනවා නේ ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
කමක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මෙයින් පෙනෙනවා එක පැත්තකින් අලාභ ලබන ඒවා ඇවර කරනවාය කියා. නමුත් ඒක යම් ස්වරූපයක් ගන්නවා. ඒ කියන්නේ මේවා පෞද්ගලීකරණයට යොමු කරනවා. බලාපොරොත්තු වන සේවාව කරන්නට බැරි වුණාම මේක ඇවර කරලා ඊට පස්සේ වහලා දානවා. ඊට පස්සේ ඒකේ කාර්ය භාරය කවුරු හරි කරාවි. ඒක එක විධියකින් පෞද්ගලීකරණය කිරීමක්. ඔබතුමාට මා ගරු කරනවා. එක විධියකින් රාක්ෂයෝ පස් හය දෙනෙක් ඉන්නවාය, මේ වාගේ ඒවා නැති කරන්නට ඕනෑය කියා කියන්නට මුදල් ඇමති වශයෙන් ඔබතුමාට ශක්තියක් තිබුණා. ඒ ස්වරූපයෙන්මයි මා ප්‍රශ්නය අහන්නේ. මේක රජයට බරක් නිසාද මෙහෙම කරන්නේ? ඊට පස්සේ ඒක කරන්න බැරි නිසා පෞද්ගලීකරණය කරනවා ද කියා මා ඔබතුමාගෙන් අහනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රතිපත්තිය මා පැහැදිලි කරන්නම්. පෞද්ගලීකරණය කරන්න අප බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් ඔබතුමා දන්නවා, දැන් private sector-public sector partnership තිබෙනවා. විශේෂයෙන් අපේ ගරු දයාශ්‍රිත තිසේරා ඇමතිතුමා යටතේ අමාත්‍යාංශයක් හදා තිබෙනවා -

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
අමාත්‍යාංශ ඇවර කිරීමට?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ. නැහැ. ඇවර කිරීමට නොවෙයි. ඒවා තවදුරටත් ගෙනයන්න මොනවා හෝ ක්‍රම සොයා ගන්න. බොහෝ විට පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය ඒකාබද්ධ වෙලා කටයුතු කරන්න.

රජයේ කොටස හැටියට ඒ තිබෙන සම්පත් ලබා දීලා, ඒවා සම්බන්ධ කර ගෙන වැඩ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. සමහර ඒවා හරි ගිහිල්ලා තිබෙනවා. සමහර ඒවා අපි තවම සාකච්ඡා කර ගෙන යනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. ඔබතුමා හෙළිදරව් කර තිබෙනවා යම් ආයතන non-performing කියලා. ඒ වාගේම විදුලිබල මණ්ඩලයත් technically insolvent. ඉතින් ඔබතුමන්ලා ඒවාත් ඇවර කිරීමට කටයුතු කර ගෙන යනවාද? දැන් විදුලි බිල වැඩි කරනවා. ඒක වැඩි කරලා දැන් නැවතත් අඩු කරලා තිබෙනවා. මෙහි සැබෑ තත්ත්වය මොකක්ද? Non-performing වන්නේ නැතිව දූෂණ නැති කර ගෙන ක්‍රියාශීලීව කර ගෙන යාම තමයි කළ යුත්තේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමා කියන්නේ මොනවාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, ඒක ඇවර කරන්නේත් නැහැ. පෞද්ගලීකරණය කරන්නේත් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලා ඒක කරලා ඉවරයි නේ. ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයෙයි. එවැනිම ඉතා වැදගත් ප්‍රශ්නයක් මම මේ අවස්ථාවේදී අහන්නේ. ශ්‍රී ලංකා එයාර්ලයින්ස් ආයතනය 2011වසරේ රුපියල් කෝටි 2,100ක අලාභයක් ලැබුවා. ගිය අවුරුද්දේ රුපියල් කෝටි 2,900ක අලාභයක් ලැබුවා. ඒ මදිවාට ඔබතුමන්ලා තවත් ගුවන් යානා 13ක් ගන්න රුපියල් කෝටි 31,500ක් වියදම් කරන්න යනවා. දැන් මේක non-performing company එකක් ලෙස තියා ගෙන ඒ විධියට ගුවන් යානා 13ක් ගන්න ඔබතුමන්ලා කැබිනට් අනුමැතියක් දීලා තිබෙනවාද? එහෙම නැත්නම් ඔබතුමන්ලා කථා කරලා Board of Directorsලා මඟින් අනුමත කරන්න කියලා කැබිනට් එකේ කථාවක් වුණාද, නැද්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, ඒකෙත් යථා තත්ත්වය මේකයි. දැන් සම්පූර්ණ විමර්ශනයක් කරලා තිබෙනවා. ඒ විමර්ශනය අනුව අවුරුදු පහක් යන කොට මේ ආයතනය ලාභ ලබන ආයතනයක් බවට පත් කරන්න පුළුවන් කියලා කියනවා. විශේෂයෙන්ම ඉදිරි වර්ෂ කිහිපය තුළ අලුතින් ගුවන් යානා ගන්නවා. ඒ වාගේම තිබෙන ඒවා ප්‍රතිසංස්කරණය කරනවා. ඒ සඳහා විශාල මුදලක් වැය කරන්න සිද්ධ වෙනවා. අපේ බලාපොරොත්තුව, අපේ අභිප්‍රාය to turn it around; මේක නැවත වරක් වාසිදායක ආයතනයක් බවට පත් කරන එකයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නමුත් ඔබතුමන්ලා එහෙම කියලා නැවත කියනවා, "අපි මේක ගන්නවා, අරගෙන විකුණලා leaseback කරනවා" කියලා. Arizona Desert එකට ගියා නම් ඕනෑ තරම් ලාභයට ගන්න පුළුවන්නේ. කරුණාකරලා ඔබතුමාගේ දැනුවත්කම නෙදැනුවත් ඇමතිවරුන්ට කියලා දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම නැත්නම් කථානායකතුමාගෙන් අහන්න. එතුමා ඒ අමාත්‍යාංශය හොඳට කළා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඕක හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වුණාම අපට බලන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 4 -2215/'12- (3), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, තුන්වැනි වතාවටත් මා එම ප්‍රශ්නය අහනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අමාත්‍යතුමා පැමිණ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 5 -2537/'12- (4), ගරු අනුර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය දෙස ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ 4වැනි වතාවටයි. මේ ප්‍රශ්නය නිශ්චිත

කරුණක් පිළිබඳවයි අහලා තිබෙන්නේ. ලොකු වාර්තා හෝ ලොකු විගණනයන් හෝ පිළිබඳව අහලා තිබෙන ප්‍රශ්නයක් නොවෙයි මේක. නිශ්චිත ලෙසම අහලා තිබෙන්නේ, "ජාත්‍යන්තර ක්‍රීඩා තරග විකාශය කිරීමේ අයිතිය රාජ්‍ය රූපවාහිනී නාලිකාවලට අමතරව පෞද්ගලික රූපවාහිනී නාලිකාවලටත් ලබා දී තිබෙනවාද?" කියායි. රූපවාහිනීය දිහා බලා ගෙන හිටියොත් කියන්න පුළුවන්, "ඔව්" කියලා. ඒ අයිතිය ලබා දුන්නේ කොහොමද, නියමිත ටෙන්ඩර් පටිපාටියකින්ද, එම අයිතිය ලබා දෙන කොට අනුගමනය කරපු ක්‍රියා මාර්ග කවරේද කියන ප්‍රශ්න තමයි අසා තිබෙන්නේ. මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න බැරි නම්, එහෙම නැත්නම් මේ ප්‍රශ්නය මහ හැර යාමෙන් පෙන්නුම් කරන්නේ -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමා පැමිණ නැත.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් හතරවැනි වතාවට තමයි මේ කල් ඉල්ලන්නේ. මෙතුමා තමයි හැම දාමත් කල් ඉල්ලන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පැමිණ උත්තර දෙන්න ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇමතිතුමා ආවා නම් හොඳයි. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. අහන්න හිතේ තිබෙන ප්‍රශ්න දැනගෙන තමයි ඇමතිතුමා ගෙන්වා ගන්න ඕනෑ. ඒ නිසා ඇමතිතුමාම ගෙන්වා ගනිමු.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මාතර - කතරගම අධිවේගී මාර්ගය : ඇස්තමේන්තුගත මුදල
மாத்தறை - கதிர்காமம் அதிவேக நெடுஞ்சாலை: மதிப்பீட்டுத்தொகை
MATARA - KATARAGAMA EXPRESSWAY : ESTIMATED COST

2450/'12

8. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර සිට කතරගම දක්වා අධිවේගී මාර්ගයක් තැනීම සඳහා මේ වන විට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම අරමුදල් සපයා ගනු ලබන්නේ දේශීය අරමුදල්වලින්ද; නැතහොත්, විදේශීය අරමුදල්වලින්ද;

(iv) දේශීය හා විදේශීය වශයෙන් සපයා ගනු ලබන අරමුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම අරමුදල් සපයනු ලබන ආයතන හෝ රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අධිවේගී මාර්ගය ඉදිකිරීම නිසා නිල්වලා ගඟ පහළ නිම්නයේ පිහිටි ගම්මාන විශාල සංඛ්‍යාවක් ගංවතුරට ලක්වීම සිදු විය හැකි බව දන්නේද;

(ii) එම තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) මාර්ගය ඉදිකිරීම නිසා අහිමි විය හැකි ඉඩම්, බෝග වගාවන් ඇතුළු අනෙකුත් දේපළ සඳහා වන්දි ගෙවීමේ සැලසුමක් තිබේද;

(iv) ඒ සඳහා අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறையிலிருந்து கதிர்காமம் வரை அதிவேக நெடுஞ்சாலையொன்றை அமைப்பதற்காக தற்போது திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், குறித்த கருத்திட்டத்திற்கென மதிப்பீடு செய்யப்பட்டுள்ள பணத்தொகை யாதென்பதையும்;

(iii) மேற்படி நிதி பெறப்படுவது உள்நாட்டு நிதியங்களிலிருந்தா இல்லாவிடின் வெளிநாட்டு நிதியங்களிலிருந்தா என்பதையும்;

(iv) உள்நாடு மற்றும் வெளிநாட்டிலிருந்து பெறப்படும் நிதியங்களின் அளவு வெவ்வேறாக யாவை என்பதையும்;

(v) மேற்படி நிதியை வழங்கும் நிறுவனங்கள் அல்லது நாடுகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி அதிவேக நெடுஞ்சாலை நிர்மாணிக்கப்படுவதன் காரணமாக நில்வளா ஆற்றுப்பள்ளத்தாக்கில் அமைந்துள்ள பல கிராமங்கள் வெள்ளப்பெருக்குக்கு உள்ளாகலா மென்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) இந்நிலைமைகளை தவிர்ப்பதற்காக திட்டமிடப் பட்டுள்ளதா என்பதையும்;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) நெடுஞ்சாலை நிர்மாணிக்கப்படுவதன் காரணமாக இழக்க நேரிடும் காணிகள், பயிர்செய்கை உள்ளிட்ட ஏனைய சொத்துகளுக்கு இழப்பீடு வழங்கும் திட்ட மொன்று உள்ளதா என்பதையும்;

(iv) அதற்கென கடைப்பிடிக்கப்படும் முறைமை யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he state -

(i) whether plans have been made by now to construct an expressway from Matara to Kataragama;

(ii) if so, the estimated cost of the aforesaid project;

(iii) whether the funds required for the aforesaid project will be obtained out of domestic funds or foreign funds;

(iv) separately, the amounts obtained out of domestic funds and foreign funds; and

(v) the names of the institutions or the countries which provide the aforesaid funds?

(b) Will he inform this House -

(i) whether he is aware of the fact that a large number of villages in the lower valley of Nilwala River are likely to be inundated as a result of the construction of the aforesaid expressway;

(ii) whether plans have been made to prevent the aforesaid situations;

(iii) whether arrangements have been made to pay compensation for the lands, crop cultivations and other property likely to be lost as a result of the construction of the aforesaid expressway; and

(iv) the methodology adopted in paying the aforesaid compensation?

(c) If not, why?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මාතර සිට කතරගම දක්වා අධිවේගී මාර්ගයක් තැනීම සඳහා නව සැලැස්මක් සැලසුම් කර නොමැත. නමුත්, දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම පිණිස මේ වන විට සැලසුම් කරමින් පවතී.

(ii) දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම පිණිස අවශ්‍ය වන ශක්‍යතා අධ්‍යයනය මේ දිනවල සිදු කරමින් පවතී. ශක්‍යතා අධ්‍යයනය අවසානයේ විස්තරාත්මක මාර්ග සැලසුම් අධ්‍යයනය ද නිම කිරීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය සඳහා දළ ඇස්තමේන්තුව ගණනය කළ හැකි වේ.

(iii) මේ අවස්ථාවේ තීරණය කළ නොහැකිය.

(iv) මේ අවස්ථාවේ තීරණය කළ නොහැකිය.

(v) මේ අවස්ථාවේ තීරණය කළ නොහැකිය.

(ආ) (i) දැනට සිදු කෙරෙමින් පවතින ශක්‍යතා අධ්‍යයනය අවසානයේ මෙම ව්‍යාපෘතිය හේතුවෙන් සිදු වන පාරිසරික සහ සමාජීය බලපෑම තක්සේරු කිරීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනයක් සිදු කරනු ලැබේ.

මෙම අධ්‍යයනයේ දී මෙම ව්‍යාපෘතිය හේතුවෙන් සිදු වන පාරිසරික සහ සමාජීය බලපෑම වෙන් වෙන් වශයෙන් සැලකිල්ලට ගනු ලබන අතර, නිල්වලා ගඟ පහළ නිම්නයේ පිහිටි ගම්මානවලට මෙමඟින් සිදු වන බලපෑම ද අධ්‍යයනය කරනු ලැබේ.

(ii) පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනයේදී මෙම ව්‍යාපෘතිය මඟින් සිදු වන පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කරනු ලබන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාල සීමාවේදී සහ ඉන් පසුව මෙම ක්‍රමවේදයට අනුව ක්‍රියා කිරීමට පියවර ගනු ලැබේ.

(iii) ස්ව කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය - National Involuntary Resettlement Policy - අනුව මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ඉඩම් අහිමි වන පුද්ගලයන්ට ප්‍රතිස්ථාපන සැලැස්මක් පිළියෙල කරන අතර, වන්දි ගෙවීම, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට හා ඉහත ප්‍රතිපත්තියට අදාළව සිදු කරනු ලැබේ.

(iv) (a) ස්ව කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය - National Involuntary Resettlement Policy - අනුව මෙම

ව්‍යාපෘතිය හේතුවෙන් ඉඩම් අහිමි වන පුද්ගලයන්ට ප්‍රතිස්ථාපන සැලැස්ම පිළියෙල කිරීම.

(b) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුව වන්දි ගෙවීම සිදු කිරීම.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. හම්බන්තොට දිස්ත්‍රික්කය හරහා යන කොටස ගැන ඔබතුමා බලා ගනීවි. ගරු ඇමතිතුමනි, මාතර දිස්ත්‍රික්කයට අදාළව මම ඔබතුමාගෙන් මේ කාරණය දැන ගන්න සතුටුයි. දැනටමත් මීනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සිතියම්වල යෝජිත අධිවේගී මාර්ගය යන මාර්ගය ලකුණු කර තිබෙනවා. ඒ කියන්නේ මාතර සිට හම්බන්තොට දක්වා මේ අධිවේගී මාර්ගයේ ගමන් මාර්ගය මෙන්න මේකයි කියා දැනට අමාත්‍යාංශය හඳුනා ගෙන තිබෙනවාද?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අසා තිබුණේ මාතර සිට කතරගම දක්වා යෝජිත අධිවේගී මාර්ගයේ විස්තර ගැනයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්. ඔබතුමා කියන්නේ හම්බන්තොටය කියලා නේ.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඔබතුමාගේ ප්‍රශ්නයටයි මා උත්තර දුන්නේ. ඔබතුමාගේ ප්‍රශ්නය නිවැරදි නැහැ. විශේෂයෙන්ම රජය ප්‍රකාශ කර තිබෙන්නේ මාතර සිට හම්බන්තොට දක්වායි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හරි. කතරගමට යන්නේ හම්බන්තොට පහු කරගෙනයි.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
මේ වන විට අදාළ ශක්‍යතා වාර්තා සකස් කෙරෙමින් පවතිනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ. මම ඔබතුමාගෙන් ඇහුවේ මේකයි. මීනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර තිබෙන සිතියම්වල තිබෙනවා, 'යෝජිත මාර්ගය' කියලා track එකක් දාලා.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඊට අදාළ සැලසුම් සකස් කරමින් පවතින අතර, මොනවා හෝ ඒ ප්‍රදේශයේ අවශ්‍යතා හෝ ඉල්ලීම් අනුව ඒ පිළිබඳව සැලසුම් සකස් කරමින් පවතිනවා. එහි වෙනස්වීමක් සිදු වෙන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හඳුනා ගත්ත මාර්ගය ප්‍රසිද්ධ කරලා තිබෙනවාද?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
නැහැ, නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ඔබතුමාට බලන්න පුළුවන්, අද නාරාහේන්පිට සිතියම් කාර්යාලයෙන් හම්බන්තොට සහ මාතර දිස්ත්‍රික්කවල සිතියමක් ගත්තොත්. මේ සිතියම්වල පාරක් ලකුණු කර තිබෙනවා, 'යෝජිත මාර්ගය' කියලා.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන්නේ පොළවේ ලකුණු කරලා තිබෙනවා කියලාද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පොළොවේ පාරක් ලකුණු කරලා නැහැ. සිතියමේ.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
සිතියමේ ලකුණු කර තිබෙන්නේ ඒ අදාළ වන-

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
යෝජිත මාර්ගයක් ඇඳලා තිබෙනවා. ඒ කියන්නේ ඒ ටික පවරා ගන්නවා කියන එකනේ ගරු කථානායකතුමනි. ගිහිල්ලා පොළොවේ ලකුණු කරන්න ඕනෑ, හුණුවලින්.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමා, මේක පැහැදිලි කර ගැනීමක්. ගරු කථානායකතුමනි, මුලින් එතුමාගේ ප්‍රශ්නය එතුමා පැහැදිලි කරන්න ඕනෑ. මේ සිතියමේ ලකුණු කරලා තිබෙන්නේ අදාළ යෝජිත සැලැස්ම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහන්නේ ජනතාව දැනුවත් කරනවාද කියන එක. ඒක නේ ඕනෑ?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
කඩදාසිවල යෝජිත සැලැස්ම ලකුණු කරලා කටයුතු කළායි කියලා මේකේ ස්ථිරභාවයක් නැහැ. අදාළව නිවැරදිව සැලසුම්ගත කරලා ස්ථිර වුණාට පස්සේ තමයි ඒ පිළිබඳව තීන්දුවක් ගන්නේ. ඒ ඇරෙන්න පොළොවේ කොහේවත් දැනට සඳහන් කරලා නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පොළොවේ ඉරි ඇඳලා නැහැ.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඔබතුමාට මේකේ තිබෙන ගැටලුව මොකක්ද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම පැහැදිලිව කියන්න ඕනෑ, පසු ගිය කාලයේ -මම දන්නේ නැහැ හම්බන්තොට දිස්ත්‍රික්කයේ එහෙම වුණාද කියලා. -මාතර දිස්ත්‍රික්කයේ කොටසේ නම් ගරු

[ගරු බුද්ධික පතිරණ මහතා]

කථානායකතුමනි, හෙලිකොප්ටරයකින් ඇවිල්ලා හෙලිකොප්ටර් එක පහත් කරලා මෙන්න මේකයි කියලා ලකුණු කර ගෙන ගියා. දැන් එතුමා කියනවා, පොළොවේ නැහැයි කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා අහන්න, වැස්සොත් එහෙම ජා ඇල පැත්තේ වුණ දේ වෙනවාද කියලා. එහෙම ඇහුවා නම් හරි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, පසු ගිය කාලයේ හෙලිකොප්ටර් එකක් ඇවිල්ලා පහත් කරලා demarcate කර ගෙන ගියා.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, නවීන තාක්ෂණය අනුව ගූගල් සිතියම අනුවයි මේ කටයුතු කරන්නේ. මන්ත්‍රීතුමාට යම් කිසි පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම් ඒ වාගේම ඔබතුමා නියෝජනය කරන ප්‍රදේශය පිළිබඳව ජනතාවට යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ පිළිබඳව කථා කරලා අපට විසඳුමකට එන්න පුළුවන්. මෙන්න මේ ස්ථානයෙන් මාර්ගය හැදෙනවාය, මේ මේ ජනතාවට හානියක් වනවාය කියලා නිවැරදිව, ස්ථාවරව දැනට කොහේවත් සඳහනක් නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, එහෙම නම් මිනින්දෝරු දෙපාර්තමේන්තුවත් එක්ක අමාත්‍යාංශයට සාකච්ඡා කරන්න වෙයි. මොකද, දැන් මේ track එකේ ඉන්න මිනිස්සු කලබල වෙලා ඉන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, මා හිතන හැටියට තමුන්නාන්සේ සියලු දෙනා කැඳවලා මාතර කච්චේරියේදී ඒ ගැන සාකච්ඡාවක් කළා නම් හොඳයි.

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
හොඳමයි, ගරු කථානායකතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නයද කොහේද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, ගරු කථානායකතුමනි දෙවැනි අතුරු ප්‍රශ්නය. අපේ පළාතේ වැඩක් නේ.

ගරු අමාත්‍යතුමනි, මාතර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව නියෝජනය කරන නිල්වලා නිමින ගොවි සංවිධානය ඉතා පැහැදිලිව කියනවා, මේ ශක්‍යතා අධ්‍යයන කටයුතුවලදී විදේශීය සහ දේශීය විශේෂඥයන් මත බර තැබීමේ ක්‍රියාවලියක් සිදු වෙනවා විනා, සාම්ප්‍රදායික ගොවි මහත්වරුන්ට තිබෙන අත්දැකීම්, ඒ ප්‍රදේශවල තිබෙන භූගෝලීය තත්ත්වය හා ජලවහන රටාව ආදී කාරණා පිළිබඳව සැලකිල්ලක් දක්වන්නේ නැහැ කියලා. නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේදීත් සුද්දෝ ගැන විශ්වාසය තබලා වැඩේ කරන්න ගිහිල්ලා ඇනුණා. ඒ නිසා මේ ව්‍යාපෘතියේදී සාම්ප්‍රදායික ගොවීන්ගේ අත් දැකීම් සම්භාරය ප්‍රයෝජනයට ගන්න මොකක්ද අමාත්‍යාංශයට තිබෙන සැලැස්ම?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, සුද්දෝ ගෙනැල්ලා සැලසුම් හදපු කට්ටිය කවුද කියලා මේ රටේ ජනතාව දන්නවා. මේක ජනතාවාදී රජයක්. ජනතාවට ඇහුම් කන් දීලා කටයුතු කරන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
චීන්නු ලාංකිකයෝද?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
නිල්වලා නිමිනය මහ හැරලා තමයි මේ කටයුතු කෙරෙමින් පවතින්නේ. ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය මීට අදාළ වන අනෙකුත් අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කරන අතර, මාතර දිස්ත්‍රික් සැලසුම් කමිටුවත් සමඟ සාකච්ඡා කරලා යම් කිසි ගැටලුවක් තිබෙනවා නම් අපට නිරාකරණය කරන්න පුළුවන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මහාමාර්ග අමාත්‍යාංශය තීරණයක් අරගෙන තිබෙනවාද, මේ ඉදි කරන මාතර - හම්බන්තොට අධිවේගී මාර්ගය ඇතුළුව මින් ඉදිරියට ඉදි වන අනිකුත් අධිවේගී මාර්ග පොළොවට තරමක් ඉහළින්, පාලම් ආකාරයෙන් කොන්ක්‍රීට් කණු මත ඉදි කරන්න?

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, පහත් බිම් සහ ඒ අවටට සිදු වන පරිසර බලපෑම් පිළිබඳව ඉදිරිපත් වන වාර්තා මත ඒ කටයුතු කරන්න අභිගරු ජනාධිපතිතුමා නියෝග කරලා තිබෙනවා. ඒ අනුව කටයුතු කරමින් පවතිනවා. සැලසුම් කරන්නේත් ඒ ආකාරයෙන්ය කියන එක සඳහන් කරනවා.

මොනරවැව ගම්මානයේ නැවත පදිංචි කරවීම : විස්තර

மொனரவெவ மீள்குடியேற்றக் கிராமம் : விபரம்
RESETTLEMENT IN MONARAWEWA VILLAGE : DETAILS

2513/'12

9. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා තිබෙන මොනරවැව ගම්මානය, නැවත පදිංචි කරවීමේ වැඩපිළිවෙළ යටතේ බිහිවූ ගම්මානයක් බව පිළිගන්නෙහිද?

(ආ) (i) එම ගම්මානයේ නැවත පදිංචි කරවන ලද පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානයේ නැවත පදිංචි කළ ජනතාවට රජයේ අනුග්‍රහයෙන් ලබා දෙන සහන කවරේද;

(iii) එක පවුලක් සඳහා එම සහන ලබා දීම වෙනුවෙන් රජය වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மீள்குடியேற்ற அமைச்சரைக் கேட்ட வினா:

(அ) வட மாகாணத்தின் சம்பத்நுவர பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள மொனரவெவ கிராமமானது மீள்குடியேற்ற வேலைத்திட்டத்தின் கீழ் உருவான ஒரு கிராமம் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மேற்படி கிராமத்தில் மீள்குடியேற்றப்பட்ட குடும்பங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி கிராமத்தில் மீள்குடியேற்றப்பட்ட மக்களுக்கு அரச அனுசரணையுடன் வழங்கப் படும் நிவாரணங்கள் யாவையென்தை யும்;

(iii) குடும்பமொன்றுக்கு மேற்படி நிவாரணத்தை வழங்குவதற்கு அரசு செலவு செய்த மொத்தப் பணத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Resettlement:

(a) Will he admit that Monarawewa village in the Sampathnuwara Divisional Secretary's Division in the Northern Province is a village created under the resettlement programme?

(b) Will he state -

(i) the number of families that have been resettled in the aforesaid village;

(ii) the nature of Government assisted relief that is provided to the people who have been resettled in the aforesaid village; and

(iii) the total amount of money spent by the Government per family on providing the aforesaid relief?

(c) If not, why ?

ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)
(மாண்புமிகு குணரத்ன வீரகோன் - மீள்குடியேற்ற அமைச்சர்)
(The Hon. Gunaratne Weerakoon - Minister of Resettlement)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) මොනරවැව ගම්මානය 1984 වර්ෂයේ ඇති කරන ලද්දක් වන අතර, එහි මුල් කාලයේ පවුල් 202ක් පදිංචිව සිට ඇත. 1999 වර්ෂයේදී ත්‍රස්තවාදී ග්‍රහණයට නතු වූ මෙම ගම්මානය 2008 වර්ෂයේ මානුෂීය මෙහෙයුම්වලින් පසුව නැවත අත් පත් කර ගන්නා ලදී. පසුව මෙම ගම්මානයේ බිම් බෝම්බ ඉවත් කිරීමෙන් අනතුරුව 2011.09.15 දින සිට මේ දක්වා ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරියේ එල් කලාප මහවැලි නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලය මඟින් නැවත පදිංචි කිරීම සිදු වෙමින් පවතී. මෙම ගම්මානය නැවත පදිංචි කිරීම යටතේ ඇති වූ නව ගම්මානයක් නොවන අතර, 1984 වර්ෂයේදී ඇති කරන ලද ගම්මානයකි.

(ආ) (i) 2013.03.31 දින වන විට මොනරවැව ගම්මානයේ නැවත පදිංචි කළ පවුල් සංඛ්‍යාව 109කි.

(ii) මුල් පදිංචි පවුල් 68ක් සඳහා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වැලිඔය තිරසාර නිවාස සංවර්ධන වැඩ සටහන යටතේ නිවාස ආධාර ලබා දී ඇත.

නැවත පදිංචි පවුල් සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ ලෝක ආහාර සංවිධානය යටතේ වියළි සලාක ලබා දී ඇති අතර, ස්ථිර ජල පහසුකම් සකස් කර ගන්නා තෙක් තාවකාලිකව පානීය ජල පහසුකම් ලබා දී ඇත.

(iii) නිවාස ආධාර ලෙස රුපියල් 325,000.00ක් පමණ.

(ඇ) පැන නොනඟී.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්න මෙසේයි.

ඒ නැවත පදිංචි කරවීමට ලක් වන ජනතාවගෙන් අපට අහන්න ලැබෙන මැසිවිල්ල තමයි ඒ අයගේ යටිතල පහසුකම් සහ ජීවනෝපාය සංවර්ධනයට ප්‍රමාණවත් මුදල් අනුග්‍රහයක් ලැබෙන්නේ නැහැ කියන එක. ගරු ඇමතිතුමනි, ඔබතුමා එය සත්‍යයක් කියලා පිළිගන්නවාද?

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ගරු කථානායකතුමනි, මුලින් කරන්න ඕනෑ නිවාස සංවර්ධනයයි. ඊට පසුව තමයි අනෙක් ඒවා ලබා දෙන්න ඕනෑ. ඒ නිසා මහවැලි කලාපය තුළ වැලිඔය ප්‍රදේශයේ නිවාස 500ක් ඉදි කරන්න රුපියල් ලක්ෂ 1,500ක මුදලක් අතිගරු ජනාධිපතිතුමා මේ වන විට වෙන් කර දී තිබෙනවා. ඒ අනුව නිවාස 200ක වැඩ අවසන් කර තිබෙනවා. තව නිවාස 300ක වැඩ අවසන් වෙමින් පවතිනවා. ඒ නිවාස 500හි වැඩ අවසන් කළාට පසුව නැවතත්

[ගරු ගුණරත්න වීරකෝන් මහතා]

නිවාස 1,000ක් හදන්න අවශ්‍ය කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මේ නිවාස සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය සියලු කටයුතු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ මේ වන විට සිදු වෙමින් පවතිනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. නිවාස තැනෙන තෙක් ජනතාව ජීවත් වෙන්නට ඕනෑ. ඒ කියන්නේ පරිභෝජනයට තමන්ගේ ජන ජීවිතය ක්‍රියාත්මක කරන්න. මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න යන්නේ මේ කාරණයයි. මේ නිවාස හැදෙන තෙක් පමණක් නොවෙයි, ඒ අයගේ ජීවනෝපාය යම් කිසි තත්ත්වයට එන කල් රජයෙන් ලබා දෙන සහනාධාර මදි කියන එකයි මගේ අදහස. ඒක වැඩි දියුණු කරන්නට මොකක්ද ඔබතුමන්ලා ගන්න පියවර?

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ගරු කථානායකතුමනි, අවශ්‍ය ප්‍රමාණවත් සහනාධාර ලබා දෙනවා. තමුන්නාන්සේ මොනරවැව පැත්තට ගිහිල්ලා පොඩ්ඩක් සොයා බැලුවොත් හොඳයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගිහිල්ලා සොයා බලලා තමයි මේ ප්‍රශ්නය අහන්නේ.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
මාත් එක්ක යන්න එන්න. තමුන්නාන්සේ තනියෙන් ගියාට හරි යන්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තනියෙන් ගියාම අපක්ෂපාතී තොරතුරු හොයා ගන්න පුළුවන්.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
මට සැකයි, මොනරවැවට හරියට ගියාද කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ගියාය කියලා ඔප්පු කළොත් ඔබතුමා ඇමතිකමෙන් අස් වෙනවාද?

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
එහෙම අස් වෙන්න පුළුවන්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම නම් චෝදනාවක් කරන්නේ මොකටද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්නවලට ඒකත් අයිතියි.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ පියා එල්ටීටීඊ සංවිධානයට ආයුධ, සිමෙන්ති සහ මුදල් දුන්නා. ඒවා පාවිච්චි කරලා තමයි එල්ටීටීඊ එකෙන් අපේ හමුදාවට ගැහුවේ. ඒක ඔප්පු වුණාම තමුන්නාන්සේ ඉල්ලා අස් වෙනවාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද ඔබතුමා කිව්වේ. 2005 ජනාධිපතිවරණයේදී මුදල් දුන්නාය කියලාද කිව්වේ? මට ඇහුණේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි. සාකච්ඡාවට ඉඩ දෙන්න බැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
2005 ජනාධිපතිවරණයේදී එල්ටීටීඊ එකට මුදල් දුන්නාය කියලාද කිව්වේ ඔබතුමා.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
තමුන්නාන්සේගේ ඊ ළඟ ප්‍රශ්නයට උත්තර දෙන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අහුනේ නැහැ කියපු දේ. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
තාත්තා කරපු දේ කිව්වේ. අහපු දේට උත්තර දීලා තිබෙනවා. ආපහු උත්තර දෙන්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම නොවෙයි, එතුමායි මගෙන් ප්‍රශ්නය ඇහුවේ.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ආපහු කියන්න ඕනෑද තමුන්නාන්සේට?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙතුමා කිව්වා, 2005 ජනාධිපතිවරණයේදී එල්ටීටීඊ එකට සල්ලි දුන්නාය කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අනවශ්‍ය ඒවාවලට පැටලැවෙන්නේ නැතුව කරුණාකරලා-

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
මම කිව්වේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා ආයුධ දුන්න එක ගැන එල්ටීටීඊ එකට.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පටලැවෙන්න වුවමනාවක් නැහැ, එතුමායි කිව්වේ. මම නොවෙයි.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ඒ ආයුධ භාර ගත්තු එක්කෙනත් ඉන්නවා. එල්ටීටීඊ සංවිධානයේ දෙවැනියා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම නොවෙයි, එතුමායි කිව්වේ. [බාධා කිරීමක්] හරි බරපතළ චෝදනාවක් කළේ. 2005 ජනාධිපතිවරණයේදී එල්ටීටීඊ එකට සල්ලි දුන්නාය කියලා කිව්වා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකත් ප්‍රශ්නයක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, ඒක ප්‍රශ්නයක් නොවෙයි.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
බරපතළ චෝදනා තමයි තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක ප්‍රශ්නයක් නොවෙයි.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
එල්ටීටීඊ එක හුරතල් කරලා ආයුධ දීලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගත්තා. ඒක නේද වුණේ?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මෙතුමාට කටත් වැරදුණා, පොටත් වැරදුණා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තුනම ඉවරයි.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
එල්ටීටීඊ ත්‍රස්තවාදීන් කොළඹට ගෙන්වා ගෙන කන්න දීලා, ආයුධ දීලා-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, කෙටියෙන් අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කෙටියෙන් අහන්නම්.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
අන්තිමට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ගත්තා. ඒක නේ වුණේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගත්තාය කියලා කියන්න හොඳ නැහැ නේ මේ උත්තරීතර සභාවේදී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අන්න හරි. ඒකත් ගන්න ඕනෑ ප්‍රශ්නයක් හැටියට.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක හැදියාවේ ලක්ෂණයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉන්නවා. කරුණාකරලා එතුමන්ලාගෙන් උපදෙස් ගන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
උපදෙස් ගන්නවා. මම හැම වේලාවේම උපදෙස් අරගන්නවා.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
නායකයෙකු වෙන්න බලා ගෙන ඉන්න කොට ඔහොමද කථා කරන්නේ?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අනුගමනය කරන්නේ ඔබතුමාගේ ක්‍රියාදාමය, ගරු කථානායකතුමනි. ඔබතුමාත් කාලයක් තිස්සේ අනුගමනය කරපු ක්‍රියාදාමයක් තිබෙනවා. මමත් ඒකයි අනුගමනය කරන්නේ. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මම ඇහුවේ 2005 ජනාධිපතිවරණයේදී එල්ටීටීඊ එකට සල්ලි දුන්න එක ගැන නොවෙයි. මම කිව්වේ නැවත පදිංචි කරවීමේ ක්‍රියාවලියේදී ඒ අභිංසක ජනතාව යම් කිසි උසස් ජීවන මට්ටමකට එනතුරු ලබා දෙන රාජ්‍ය සහනාධාරය ප්‍රමාණවත් නොවන බවයි.

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
අවශ්‍ය සහනාධාර ලබා දෙනවා ගරු කථානායකතුමනි. තව මදි නම් ඒවා වාර්තා වුණාම තවත් ලබා දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි ඔබතුමාට. අර වැරැදි කථා කියන්න එපා. ඒක වැරැදියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10-2714/'12-(1), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මීට වැඩිය විධිමත් ක්‍රියාවලියක් ගෙන යන්න අවශ්‍යයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ මොකක්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිවරු 67 දෙනෙකුගෙන් දැන් මේ ගරු සභාවේ ඉන්නේ ඇමතිවරු අට දෙනායි. මොකක්ද මේ අය කරන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතුමන්ලා ඇමතිකම් කරන්නත් එපා යැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රශ්නවලට උත්තර දෙන එක මිසක් එතුමන්ලාට වෙන මොනවාද කරන්න තිබෙන්නේ?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා එන්නෙත් පහු වෙලා නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙන්න මේ වාගේ අතිපණ්ඩිතයන් නිසා තමයි අද ආර්ථිකය කඩා වැටිලා තිබෙන්නේ. නමුත් අප විපක්ෂයේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හැම පැත්තේම පණ්ඩිතයෝ ඉන්නේ. ඒකයි ප්‍රශ්නය.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

"මහින්ද චින්තන- ඉදිරි දැක්ම": ධීවර ආම්පන්න සැපයීම

"மஹிந்த சிந்தனை - எதிர்காலநோக்கு": மீனவர் உபகரணத் தொகுதி

"MAHINDA CHINTANA - VISION FOR THE FUTURE" : PROVISION OF FISHING GEAR

2773/'12

11. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මිරිදිය හා කරදිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින් සංඛ්‍යාව;

(ii) 2010 මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ "සෑම ධීවර කාර්මිකයෙකු සඳහාම ආම්පන්න කට්ටලයක් ලබා දෙන්නෙමි" යනුවෙන් වූ පොරොන්දුවට අනුව මේ වනවිට ආම්පන්න ලබා දී ඇති ධීවරයින් සංඛ්‍යාව;

(iii) එකී ආම්පන්න කට්ටල ලබා නොදුන් ධීවරයින් සංඛ්‍යාව;

(iv) උක්ත කරුණ සඳහා පොරොන්දු වූ වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව වෙන් කරන ලද මුදල;

(v) එක් ආම්පන්න කට්ටලයක් සඳහා වැය වන මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ආම්පන්න කට්ටලයට අයත් ධීවර ආම්පන්න කවරේද;

(ii) එම කට්ටල නොමිලයේ ලබා දී තිබේද;

(iii) නොඑසේ නම්, එය ලබා දුන් ක්‍රමවේදය කවරේද;

(iv) මෙතෙක් ඉහත සඳහන් ධීවර ආම්පන්න ලබා නොදුන් ධීවරයින්ට එම උපකරණ ලබාදෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කටුන්ථොළිල්, නීරක වළමූලංකළ් අපිවිරුත්ති අමෙච් සරෙක් කේට්ට විනා:

(අ) (i) ඉලංකෙයිල් නන්නීර් මට්රුම් උවර්නීර් මීන්පිටික් කෙත්තොළිලිල් ඊටුපටුකින්ර මීනවර්කළින් එණ්ණික්කෙ එව්වළවෙන්පතෙයුම්;

(ii) 2010 මහින්ද චින්තනෙ එතිර්කාලත්තිර්කාන තොලෙනෝක්කින්කීළ් "චකල මීනවර්කළුක්කුම් උපකරණත් තොකුතියොන්රෙ වළංකුවේන්" එන අළික්කප්පට්ට වාක්කුරුතියින් පිරකාරම් ඉන්රළවිල් උපකරණංකළ් වළංකප්පට්ටුළ්ළ මීනවර්කළින් එණ්ණික්කෙ එත්තනෙයෙන්පතෙ යුම්;

(iii) මේර්පටි උපකරණත් තොකුතිකළ් වළංකප්පටාත මීනවර්කළින් එණ්ණික්කෙ එව්වළවෙන්පතෙ යුම්;

(iv) මේර්පටි විටයත්තුක්කු වාක්කුරුතියළික්කප්පට්ට ආණ්ටිලිරුන්තු ඉතුවරෙ වරුටාන්තම් ඔතුක්කප්පට්ට පණත්තොකෙ යාතෙන්පතෙයුම්;

(v) ඕ උපකරණත් තොකුතික්කු චෙලවාකුම් පණත් තොකෙ එව්වළවෙන්පතෙයුම්;

වෙව්වේරාක අවර් කුරිප්පිටුවාරා?

(ආ) (i) මේර්පටි උපකරණත් තොකුතියිල් උළ්ළටඞ්කු කින්ර මීන්පිටි උපකරණංකළ් යාවෙයෙන්ප තෙයුම්;

(ii) මේර්පටි තොකුතිකළ් ඉලවචමාක වළංකප් පට්ටුළ්ළතා එන්පතෙයුම්;

(iii) ඉන්රේල්, අවෙ වළංකප්පට්ට චෙයල්මුරෙ යාතෙන්පතෙයුම්;

(iv) ඉතුවරෙ මේලේ කුරිප්පිට්ටුළ්ළ මීන්පිටි උපකරණංකළ් වළංකප්පටාත මීනවර්කළුක්කු අන්ත උපකරණංකළ් වළංකප්පටුම් තිකති යාතෙන්පතෙයුම්

අවර් ඉච්චයික්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he state separately -

(i) the number of fishermen engaged in fresh water and sea water fishing industry in Sri Lanka;

(ii) the number of fishermen to whom fishing gear has been provided as per the pledge "a fishing gear set will be provided for each fish farmer" mentioned in the "Mahinda Chintana - Vision for the future" 2010 manifesto;

(iii) the number of fishermen to whom the aforesaid gear sets have not been provided;

(iv) the amount of money allocated annually for the above matter from the year in which the pledge was given up to now; and

(v) the cost incurred on a single set of fishing gear ?

(b) Will he inform this House -

(i) the fishing equipment included in the aforesaid gear set;

(ii) whether the aforesaid sets have been provided free of charge;

(iii) if not, the system followed in providing them; and

(iv) the date on which the aforesaid fishing gear sets will be provided to the fishermen to whom the aforesaid fishing gear has not yet been provided ?

(c) If not, why ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - கடற் றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) කරදිය ධීවරයින් සංඛ්‍යාව - 222,160
මිරිදිය ධීවරයින් සංඛ්‍යාව - 44,660
එකතුව 266,820

(ii) කරදිය - 24,362
මිරිදිය - 10,023
එකතුව 34,385

(iii) කරදිය - අවශ්‍යතාව හා ඉල්ලීම අනුව ධීවර ආම්පන්න නිකුත් කෙරෙන අතර, ලබා නොදුන් ධීවරයින් සංඛ්‍යාව දැක්වීම තර්කානුකූල නොවේ.

මිරිදිය - 16,123

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

(iv) නිකුත් කරන ලද ආඥාපන්නවල වටිනාකම රුපියල් මිලියන 2867.88

(v) කරදිය - ධීවර මෙහෙයුම් වර්ගය, ප්‍රමාණයන්, රැකියාව කරන ප්‍රදේශය, මුහුදු කලාපය, රැකියාවේ ස්වභාවය අනුව ධීවර ආඥාපන්න කට්ටලවල ප්‍රමාණයන් සහ වර්ගය වෙනස් වන බැවින් ආඥාපන්න එක් කට්ටලයක් සඳහා වැය වන මුදල නිශ්චිතව දැක්විය නොහැක.

මිරිදිය - ඔරු (18 1/2) - රුපියල් 41,567.85

ඔරු (15 1/2) - රුපියල් 36,577.96

දැල් (3,1/2) 3 වෙළුම උස - දැල් ඇස් 75 දිග - දැල් ඇස් 1,500 - රුපියල් 7,190.50.

(ආ) (i) කරදිය - අවශ්‍යතාව අනුව ආඥාපන්න කට්ටලයකට අයත් වන උපාංග තීරණය වන අතර, එය පහත සඳහන් උපකරණ අතරින් එකක් හෝ කිහිපයක් විය හැක.

* යාත්‍රා කඳ
* දැල් ආඥාපන්න
* මරුවැල්
* එන්ජිම
* විවිධ නාවික උපකරණ

මිරිදිය - 3 1/2 දැල් දෙකක් (02), ඔරු නොමැති ධීවරයින්ට ඔරුවක්.

(ii) ඔව්.

(iii) අදාළ නොවේ.

(iv) සියලුම ධීවරයින්ට ආඥාපන්න ලබා දීම සඳහා නිශ්චිත දිනයක් දැක්විය නොහැකි අතර, ධීවර කළමනාකරණ ක්‍රමවේදයන් සැලකිල්ලට ගෙන වාර්ෂික සංවර්ධන සැලසුම් තුළින් ආඥාපන්න ලබාදීමට සැලසුම් කෙරේ.

(ඇ) ධීවර සම්පත් නෙළා ගැනීම සඳහා ධීවර ආඥාපන්න කට්ටල ලබා දීමේදී විවිධ ජාතික හා ජාත්‍යන්තර එකඟතාවන් සැලකිල්ලට ගනිමින් කළමනාකරණ ක්‍රමවේදයන් හා මිනුම්වලට අනුකූලව ධීවර සම්පත් විභවයන් ද සැලකිල්ලට ගනිමින් කටයුතු කළ යුතුව ඇති අතර, එබැවින් ධීවර ආඥාපන්න ලබා දී අවසන් කළ හැකි පැහැදිලි දිනයක් දැක්වීම ප්‍රායෝගික නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු *தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, දීර්ඝ පිළිතුරක් ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි. 222,160ක් සිටින ධීවරයින්ගෙන් 24,000කට පමණ තමයි මේ අමාත්‍යාංශය මඟින් ආඥාපන්න කට්ටල ලබා දීලා තිබෙන්නේ. මේ නව කැබිනට් මණ්ඩලය 2010 ආරම්භ වුණා. මේ 2013 වර්ෂය. තවත් අවුරුදු 3ක් තිබෙනවා. ඔබතුමා වසරින් වසර යම් කිසි ධීවරයින් පිරිසකට පහසුකම් සලසන්න මුදල් වෙන් කරන වැඩ පිළිවෙළක්ද ගෙන යන්නේ, එහෙම නැත්නම් ලැබෙන මුදල පාවිච්චි කරලා යම් කිසි ධීවරයින් ප්‍රමාණයකට පහසුකම් ලබා දෙන වැඩ පිළිවෙළක්ද ගෙන යන්නේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (*வைத்திய கலாநிதி*) *ராஜித சேனாரத்ன*)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු දයාසිරි මන්ත්‍රීතුමා, හැමෝම හැම දෙයක්ම ඉල්ලන්නේ නැහැ. ඒ අයට අඩු පාඩු තිබෙන දේවල් පමණයි ඉල්ලන්නේ. සමහරුන් GPS උපකරණ ඉල්ලනවා. මරුවැල් කරන අයට මරුවැල්, longline කරන අයට longline ලබා දෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු *தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

ආණ්ඩුවේ මරු වැල් නොවෙයි නේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (*வைத்திய கலாநிதி*) *ராஜித சேனாரத்ன*)
(The Hon. (Dr.) Rajitha Senaratne)

නැහැ, නැහැ. ඒ අනුව අපි ඒ අයගේ අවශ්‍යතාවන් අවුරුද්දක් පාසා ලබා ගන්නවා. ඒ කියන්නේ අලුතෙන් සම්බන්ධ වන කට්ටියට. ඒ අනුව අපි භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලා සිටිනවා. මුදල් ලැබෙන විධියට ඒ පහසුකම් ලබා දෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු *தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

2012 මහ බැංකු වාර්තාව, කබරාල් මහත්මයාගේ කබරාල් වාර්තාව අනුව මත්ස්‍ය නිෂ්පාදනය සියයට 9.3කින් වර්ධනය වෙලා තිබෙනවා කියලා කියනවා. දැන් සාමාන්‍යයෙන් මෙපමණ ප්‍රමාණයකින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි වුණාම ඉල්ලුම - සැපයුමේ ප්‍රතිඵලයක් විධියට මිල අඩු වෙන්න ඕනෑ නේ. නමුත් ඇත්ත වශයෙන්ම සියලුම වර්ගවල මාළු සියයට 6 සිට සියයට 17 දක්වා ප්‍රමාණයකින් ඉහළ ගියා කියලා තමයි සඳහන් වෙන්නේ. මම අහන්නට කැමැතියි, නිෂ්පාදනයේ මෙපමණ වර්ධනයක් තිබියදී මේ මිල ඉහළ යාමට හේතුව කුමක්ද කියා?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (*வைத்திய கலாநிதி*) *ராஜித சேனாரத்ன*)
(The Hon. (Dr.) Rajitha Senaratne)

වර්ධනය ඔය ගණන නොවෙයි. වර්ධනය ඔයිට වඩා හුඟක් වැඩියි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු *தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

එතකොට කබරාල් වාර්තාව බොරුද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (*வைத்திய கலாநிதி*) *ராஜித சேனாரத்ன*)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒක තමයි, මට ඒක තේරෙන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු *தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමාම කියනවා, කබරාල් වාර්තාව බොරු කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (*வைத்திய கலாநிதி*) *ராஜித சேனாரத்ன*)
(The Hon. (Dr.) Rajitha Senaratne)

අපට දීලා තිබෙන වාර්තාව මා ළඟ තිබෙනවා, "Fishing Households and Active Fishers".

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මම අහන්නේ. දැන් එතකොට කබරාල් වාර්තාව බොරුවක්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒක වෙනම තර්කයක් කර ගන්න. ඔබතුමා මගේ සංඛ්‍යා ලේඛන අරගෙන නිවාඩ කබරාල්ගෙන් අහන්න. එපමණයි නේ මට කියන්න තිබෙන්නේ. මටත් දැන් තමයි ඒ පොත හම්බ වුණේ. මම ඒක බලන්නම්. මම නේ -අපේ දෙපාර්තමේන්තුවෙන් නේ- ඔය සංඛ්‍යා ලේඛන මහ බැංකුවට දෙන්න ඕනෑ. අපේ දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2009 වසරේ දී මාළු නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 339,000යි. ගිය අවුරුද්ද අන්තිම වෙන කොට ඒ ප්‍රමාණය 486,000ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ සියයට 50කට ආසන්න වර්ධනයක්. ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා එක්ක ජීවන වියදම් කමිටුව මාසිකව පවත්වන බව ඔබතුමා දන්නවා නේ? භාණ්ඩාගාරයේ නියෝජිතයිනුත් ඒකට එනවා. ඔය සියලුම කටිටිය එනවා. ඒකෙදි ඔය ඔක්කොම graphs ඇඳලා අත්‍යවශ්‍ය පාරිභෝගික ආහාර ද්‍රව්‍ය එකින් එක ගන්නවා. ඒ ගත්තාම 2011 සිට 2013 දක්වා අද වන තුරු මාළු මිලෙහි වෙනසක් වෙලා නැහැ. ඔබතුමා දන්නවා, මාළු මිල එක එක කාලයට වෙනස් වනවා කියලා. වාරකන් කාලයට මාළු මිල වැඩි වනවා. අනෙක් කාලයට අඩු වනවා. ඒ විධියට මාළු මිල වෙනස් වනවා. නමුත් 2011 වර්ෂයේ ඉඳලා 2013 වර්ෂය වෙනකම් මාළු මිලෙහි කිසිම වෙනසක් වෙලා නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇත්තටම රාජිත සේනාරත්න ඇමතිතුමා මෙපමණ වැඩ ප්‍රමාණයක් කර ගෙන යනකොට ඒකවත් දමන්නේ නැත්තේ කබරාල් මහත්තයා ඔබතුමාත් එක්ක තරහක් තිබෙනවාද දන්නේ නැහැ කියලා මමත් ඒක තමයි කල්පනා කළේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒක මම වෙනම අහන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒවාත් ප්‍රශ්න. දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නයයි අහන්න තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මේ වාර්තාව ඇත්ත වශයෙන්ම සභාව නොමඟ යවන වැඩ පිළිවෙළක්. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා ළඟ නිවැරැදි සංඛ්‍යා ලේඛන තිබෙනවා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තා බලාගෙන නේ අපි ආර්ථික සංවර්ධනය ගැන කථා කරන්නේ. ඒක වැරදියි නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහන්න කැමැතියි. විශේෂයෙන්ම කරවල මිල සියයට 7 සිට 24 වනකල් විශාල වැඩිවීමක් අපි දකිනවා. මේ ප්‍රමාණයද, ඊට වැඩිද දන්නේත් නැහැ. නමුත් විශාල වැඩිවීමක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, කල්පිටියෙන් හාල් මැස්සෝ කරවලත්, තවත් කරවලත් ගෙනාවා කියලා. දැන් අපි කරවල ගෙන්වන්නේ මාලදිවයිනෙන්. නැත්නම් වෙනත් රටවලින්. ගරු ඇමතිතුමනි, දේශීය පරිභෝජනයට අවශ්‍ය කරවල ප්‍රමාණය අපි නිෂ්පාදනය කරන්නේ කවදාද කියලායි මම ඔබතුමාගෙන් අහන්නේ? ඉතිහාසයේ ලංකාවේම නිෂ්පාදනය කරන ලද හාල් මැස්සෝ කරවල තිබුණා. එදා ලංකාවේ කරවලම භාවිත කළාට අද එහෙම නැහැ. මේකට හේතුව මොකක්ද? ඔබතුමා මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙන්නේ කොහොමද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අපි කරවල ගෙන්වන්න විතරක් රුපියල් බිලියන දෙකකට වැඩි ප්‍රමාණයක් වියදම් කරනවා. නමුත් අපි ගිය අවුරුද්ද බැලුවොත් කරවල ආනයනය කිරීම සියයට 23කින් අඩු කරලා තිබෙනවා. ඊට එක හේතුවක් තමයි "දිවි නැගුම" ව්‍යාපෘතිය යටතේ සියයට 25ක පමණ පිරිසක් යිවර කර්මාන්තයේ යෙදීම.

ඒ හැම තැනකම අපි කරවල, උම්බලකඩ, ජාඩි නිෂ්පාදනය කරනවා. ඒක අනුව කරවල ආනයනය කිරීමේ විශාල බැස්මක් තිබෙනවා. අපි එම වැඩසටහන අනුගමනය කරමින් දැන් යිවර සංස්ථාවේ කරවල නිෂ්පාදනය කරන්නේ තමුන්නාන්සේලාගේ ජාතික සේවක සංගමයයි. ඒ නිෂ්පාදන සියල්ලම අපේ වෙළෙඳ සැල්වලට බෙදා හරිනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජාතික සේවක සංගමය දැන් කරවල වේලන්න දැම්මා නේද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ජාතික සේවක සංගමය ඇවිල්ලා මගෙන් ඉල්ලීමක් කළා. මා සියලුම ආධාර උපකාර කරලා, ඒ අයට ඒක කරන්න දුන්නා. ඊළඟට ශ්‍රී ලංකා නිදහස් වෘත්තිය සමිතිය ඇවිල්ලා ඒගොල්ලන්ගේ ඉල්ලීම මේකයි කිව්වාම මම කිව්වා, "බලන්න, ජාතික සේවක සංගමය විපක්ෂය වෙලත් ඒ අය මේ වැඩසටහන යටතේ කරවල හදනවා" කියලා. ඊළඟට ඒගොල්ලන් පටන් ගත්තා උම්බලකඩ හදන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් ජේවීපී එකේ සමිතියට මොනවාද දෙන්නේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒගොල්ලන් ආවොත් මම දෙනවා, ජාඩි හදන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. පිළිතුරු දීලා ඉවරද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඉතින් මගේ බලාපොරොත්තුව වන්නේ මේකයි. මේ රටේ උම්බලකඩ ආනයනයට රුපියල් මිලියන 05ක් වැය වෙනවා. මාළුවලට රුපියල් මිලියන 04ක් වැය වෙනවා. මේ හැම ආනයනයක්ම අපි අඩු කරගෙන තිබෙනවා. පසුගිය අවුරුද්දේ මත්ස්‍ය අපනයනය අපි වැඩි කරගෙන තිබෙනවා, GSP සහනය නැතිව. අපට ඊළඟ අවුරුද්දේ ඊටත් වඩා හොඳයි. මොකද, 2014 දී මාලදිවයිනට දීලා තිබෙන GSP සහනයක් ඉවත් කරනවා. එතකොට අපට ඊට වඩා හොඳ තරගයක් ඒ සඳහා දෙන්න පුළුවන්. ඔබතුමාට මා කියන්නම්, මේ ජනාධිපතිතුමා පත් වනකොට 2006 වසරේ දී මේ රටේ ධීවරයන් සිටියේ 1,43,150යි. ඒ ප්‍රමාණය අද වැඩි වෙලා තිබෙනවා, කරදිය 2,22,160ක් වනතෙක්. ඒ කියන්නේ සියයට 55.2ක වැඩිවීමක්. ධීවරයන් 79,010ක් මේ අවුරුදු හතට වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම මිරිදිය ධීවරයන්, 2005 දී සිටියේ 24,200යි. ඒ ප්‍රමාණය මේ වනකොට 44,660ක් දක්වා වැඩිවෙලා තිබෙනවා. සියයට 84.6කින් වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ 24,200ක් තිබුණු එක මේ වනකොට 20,460කින් වැඩි වෙලා තිබෙනවා. ධීවර කර්මාන්තය හොඳ නිසා තමයි, ඒක ඵලදායී නිසා තමයි මේ වැඩිවීම සිදු වෙලා තිබෙන්නේ. ඒකට ප්‍රධාන හේතුවක් වෙනවා, මේ රජය ලබා දෙනු ලබන සහනාධාර.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි. මෙන්න මේ වාගේ උත්තර දෙන්න පුළුවන් නම් හොඳයි, ආණ්ඩුව බේරා ගන්න ඕනෑ නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, දැන් ඔබතුමා වැඩියෙන්ම කැමැති මොනවාටද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ජාඩිවලටයි කැමැති. ඔබතුමා දන්නවා නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12 - 2452/'12 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13 - 2559/'12 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, 2005 සිට වර්ෂ 06ක් සඳහා විවිධ අමාත්‍යාංශ ගණනාවකින් අධ්‍යාපනය සඳහා වන වියදම ඉල්ලා ඇති බැවින්, එම අමාත්‍යාංශවලින් ඒ ඒ වර්ෂයට අදාළ තොරතුරු ලැබෙන තෙක් මට මේ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස හයක කාලයක් අවශ්‍යයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය දීර්ඝයි, කල් අවශ්‍යයි කියනවා. ඊට වඩා එහාට බැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට මා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මා ඇහුවේ එතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අධ්‍යාපනය වෙනුවෙන්-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා ඒකටයි පිළිතුරක් දුන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
-දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට වැය කරන මුදලයි මා ඇහුවේ. මේකට පිළිතුරු දෙන්න බැරි නම් කොහොම ද ආණ්ඩුවක් ගෙන යන්නේ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ කමුන්නාන්සේගේ මතය. ගරු ඇමතිතුමා පැහැදිලිව ඒ පිළිතුර ලබා දීමට කල් ඉල්ලුවා.

බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේකට එහෙම පිළිතුරු දෙන්න බැහැ, ගරු කථානායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇයි දෙන්න බැරි? බොහොම සරල ප්‍රශ්නයක් නේ.

බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අධ්‍යාපනය වෙනුවෙන් වියදම් දරනවා. අධ්‍යාපනය වෙනුවෙන් ළමා මිතුරු පාසල්වල වියදම දරන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන්. එතකොට සෞඛ්‍ය අමාත්‍යාංශය ආහාර හා පෝෂණය සඳහා වන වියදම් දරනවා. ප්‍රවාහන අමාත්‍යාංශය දරුවන්ගේ පාසල් බස් ගමන් බලපත්‍ර සඳහා වියදම දරනවා. ඒ විධියට අමාත්‍යාංශ රාශියක එකතුවෙන් තමයි දරුවන්ගේ අධ්‍යාපන සඳහා යන වියදම දරන්නේ. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නොවෙයි. ඒ නොරතුරු නැතිව ප්‍රශ්නයට පිළිතුරු දෙන්න බැහැ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා හරි. ප්‍රශ්න අංක 14, ගරු රවි කරුණානායක මහතා, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා දන්නවා, ප්‍රශ්නයට පිළිතුර ලැබෙන්නේ නැහැ කියා. උණුසුම් තත්ත්වයකදී මේකට පිළිතුරු ලැබෙන්නේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ප්‍රාතිහාර්යයකින් මවලා උත්තරය දෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කියලා වැඩක් නැහැ.

උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභාව: නිර්දේශ

கற்றுக்கொண்ட பாடங்கள் மற்றும் நல்லிணக்க விசாரணை ஆணைக்குழு: பரிந்துரைகள்

REPORT OF THE LESSONS LEARNT AND RECONCILIATION COMMISSION : RECOMMENDATIONS

2715/'12

14. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) මෙම කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද්දේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වාර්තාවේ ඇති නිර්දේශවලින් ක්‍රියාත්මක කර තිබෙන නිර්දේශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිර්දේශ ක්‍රියාත්මක කළ දිනයන් කවරේද;

(iii) එම වාර්තාවේ නිර්දේශ අතරින් ක්‍රියාත්මක නොකරන නිර්දේශ කවරේද;

(iv) රජය විසින්ම ඉහත සඳහන් කොමිසම පත් කරන ලද නමුත් එම කොමිසමේ නිර්දේශ රජය විසින් නොපිළිගැනීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கற்றுக்கொண்ட பாடங்கள் மற்றும் நல்லிணக்க விசாரணை ஆணைக்குழுவின் உறுப்பினர் களையும்;

(ii) கூறப்பட்ட ஆணைக்குழுவின் அறிக்கை பாராளு மன்றத்தில் எப்போது சமர்ப்பிக்கப்பட்ட தென்பதையும்;

அவர் கூறுவாரா?

(ஆ) (i) மேற்கூறிய அறிக்கையில் நடைமுறைப்படுத்தப் பட்டுள்ள பரிந்துரைகளின் எண்ணிக்கையையும்;

(ii) அவை எப்போது நடைமுறைப்படுத்தப்பட்டன என்பதையும்;

(iii) கூறப்பட்ட அறிக்கையில் எவை நடைமுறைப் படுத்தப்படாதது என்பதையும்;

(iv) மேற்கூறிய ஆணைக்குழு அரசாங்கத் தினாலேயே நியமிக்கப்பட்டிருப்பினும் அதன் பரிந்துரைகளை அரசாங்கம் ஏன் ஏற்றுக் கொள்ளவில்லை என்பதையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) the members of the Commission of Inquiry on Lessons Learnt and Reconciliation; and

(ii) when the Report of the said Commission was tabled in the Parliament?

(b) Will he inform this House -

(i) the number of recommendations in the aforesaid Report that have been implemented;

(ii) when they were implemented;

(iii) the recommendations of the said Report that are not going to be implemented; and

[ගරු රවි කරුණානායක මහතා]

(iv) why the Government does not accept the recommendations of the aforesaid Commission even though it was appointed by the Government itself?

(c) If not why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 1. ජනාධිපති නීතිඥ චිත්ත රංජන් ද සිල්වා මහතා
2. ජනාධිපති නීතිඥ ආචාර්ය අමිරිත් රොහාන් පෙරේරා මහතා
3. මහාචාර්ය කරුණරත්න හහවත්ත මහතා
4. චන්දිරපාල් චන්මුගම් මහතා
5. හේවා මාතර ගමගේ සිරිපාල පලිහක්කාර මහතා
6. මනෝහරී රාමනාදන් මහත්මිය
7. මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මහතා
8. මොහොමඩ් තවපික් මොහොමඩ් බෂික් මහතා (මහාචාර්ය මොහොමඩ් තහීර් මොහොමඩ් ජිෆ්රි මහතා අසනීප තත්ත්වය නිසා ඉල්ලා අස්වීමෙන් ඇති වූ පුරප්පාඩුවට පත් කරන ලදී)

(ii) 2011.12.16

(ආ) (i) සියලුම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

(ii) උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව නිකුත් වන විටත් සමහර නිර්දේශ ක්‍රියාත්මක කරමින් පැවැති අතර, අනෙකුත් නිර්දේශ, ජාතික ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් 2012 ජූලි 25 දින සිට ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ

(ඇ) පැන නොනඟී.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, දැන් මේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභාව - LLRC - තුළින් නිර්දේශ 285ක් ඉදිරිපත් කර තිබෙනවා. අපි දන්නා තොරතුරු අනුව ඒ 285න් නිර්දේශ 50ක් විතර තමයි ක්‍රියාත්මක කර තිබෙන්නේ. ඉතිරි නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම තුළින් තමයි ජිනීවා මානව හිමිකම් කවුන්සලයේ පැවැති ඡන්දයෙන් චුණත් පරදින්න ඉඩ කඩ ඇති වුණේ. මෙවැනි කටයුතු ඉක්මන් කරන්න මොන වාගේ වැඩ පිළිවෙළක්ද ගෙන යන්නේ? මොකද, ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා තමයි දැන් මේ සම්බන්ධයෙන් නායකත්වය දරන්නේ. මේ සම්බන්ධයෙන් 2011 සිට අද වන තුරු සවිස්තර විස්තරයක් දෙන්න බැරි වෙලා තිබෙන්නේ ඇයි ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ පිළිබඳව දේශීය හා ජාත්‍යන්තරව සියලු තොරතුරු සවිස්තරව ලබා දී තිබෙනවා. ගරු කථානායකතුමනි, මා කලින් සඳහන් කළ පරිදි, බොහෝ නිර්දේශ ක්‍රියාත්මක කර තිබෙන අතර, අනෙක් ඒවා ක්‍රියාත්මක කිරීම-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මා අහලා තිබෙනවා, මොනවාද ක්‍රියාත්මක කර තිබෙන්නේ කියලා. ඔබතුමා කියා තිබෙනවා-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මෙය රහසක් නොවෙයි. ඔබතුමා ඒ ගැන සතුටට පත් වෙන්න. ජනාධිපති කාර්යාලයේ වෙබ් අඩවියේ ලිපිනය වන්නේ, www.presidentsoffice.gov.lk. එහි සම්පූර්ණයෙන් සඳහන් වෙනවා, මේ වැඩ පිළිවෙළේ ක්‍රියාත්මක වුණු, ක්‍රියාත්මක කරගෙන යන මට්ටම්. ඒ නිසා කිසිදු රහසක් නැහැ. රටටයි ලෝකයාටයි සියලු දේ දැන ගන්න ලැබී තිබෙනවා. ඒ නිසා මේ ගැන වැරදි අදහස් පළ කරන්න එපා. සමහර ඒවාට නීතිය වෙනස් කරන්න තිබෙනවා. රෙගුලාසි වෙනස් කරන්න තිබෙනවා. ඒවා ගැන දැනට නීති අංශ වැඩ කරගෙන යනවා. එහෙම නැතිව එක දවසින් නීතියක් වෙනස් කරන්න බැහැ. පාර්ලිමේන්තුව හරහා එපායැ නීතිය වෙනස් කරන්න. පනත්වල යම් යම් වගන්ති වෙනස් කරන්න තිබෙනවා. ඉඩම් අයිතිය පිළිබඳ ගැටලු රාශියක් තිබෙනවා. ඒවායේ නීතිමය ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඒවා සම්පූර්ණ වාර්තාව නොවෙයි. ඒ, වාර්තාවේ කාරණාවක් දෙකක් පමණයි. ඒ නිසා කිසිවක් හංගා නැහැ. මේක ප්‍රසිද්ධ කර තිබෙනවා; හෙළදරවු කර තිබෙනවා. ඕනෑම කෙනකුට බලා ගන්න පුළුවන් විධියට වෙබ් අඩවියට ඇතුළත් කර තිබෙනවා. ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ඒ කමිටුව ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළින් 2012 ජූනි 25 දින සිට ක්‍රියාකාරී ලෙස ගත්ත සියලු පියවර විස්තරාත්මකව ලබා දී තිබෙනවා.

2011.12.16 වැනිදා ඔබතුමා අහපු ප්‍රශ්නයට මම උත්තරය දුන්නා. ඒ කියන්නේ ගිය අවුරුද්දට ඉස්සර අවුරුද්දේ දෙසැම්බර් මාසයේ මේක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඉදිරිපත් කරන්නේ නැද්ද කියලා ඔබතුමන්ලා ඇහුවා. ඉදිරිපත් කළා. ඉදිරිපත් කරලා මෙහි යම් යම් විශේෂ අංශ ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාවකට එන්න පාර්ලිමේන්තු අනු කාරක සභාවක් - විශේෂ කාරක සභාවක්- පත් කරන්න ආණ්ඩුවත් විපක්ෂයත් අතර සාකච්ඡා කළා. එක්සත් ජාතික පක්ෂ නායකතුමා ඒ අවස්ථාවේ දී කල් ඉල්ලලා පසුව එකඟ වුණා. නමුත් TNA එක එකඟ නොවුණු නිසා එක්සත් ජාතික පක්ෂයත් විශේෂ කාරක සභාවට හවුල් වීම තවමත් සිදු වෙලා නැහැ. මේ නීතිය වෙනස් කිරීමේ මාර්ග. මම හිතන්නේ, මම කියන දේ නිවැරදියි. TNA එක හවුල් වන්නේ නැති වුණත්, විරුද්ධ පක්ෂයේ බලවත්ම දේශපාලන පක්ෂය ලෙස එක්සත් ජාතික පක්ෂය මේකට හවුල් වන්නේ නැත්තේ ඇයි? හවුල් වෙලා යම්කිසි ආරම්භයක් කරන්න. මට කෙටියෙන් කියන්න තිබෙන දේ විස්තරාත්මකව මම කිව්වා, අපි කිසි දෙයක් කරලා නැහැයි කියලා ඔබතුමා කරන චෝදනාවට පිළිතුර හැටියට.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය. මේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ "නීතියේ ආධිපත්‍ය ශක්තිමත් කිරීම" යටතේ ශක්තිමත් ස්වාධීන පොලිස් කොමිසමක් ඇති කිරීමට යෝජනා කර තිබෙනවා. දැන් තිබෙන ආයතන වාගේ නොවෙයි. දැනට ඒ පිළිබඳව කිසිම ප්‍රතිචාරයක් නැහැ. ඒවා ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා ද, නැත්නම් ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්නේ නැද්ද කියලා අපට දැනුම් දෙන්න. ඒ ගැන වෙබ් අඩවියේත් හරියට සඳහන් වෙලා නැහැ. එහි විස්තර කර තිබුණා දහහත්වන ආණ්ඩුක්‍රම සංශෝධනයට වඩා බලතල තිබෙන ස්වාධීන පොලිස් කොමිසමක් පත් කළ යුතුයි කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒකත් ඇතුළුව ජාතික වශයෙන් වැදගත් වන අනෙකුත් දේ ක්‍රියාත්මක කිරීමට ඔබතුමා හෝ ඔබතුමාගේ නියෝජිතයන් තේරීම් කාරක සභාවට පත් කරලා, ඒ මඟින් ලැබෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බලන්න අතිගරු ජනාධිපතිතුමා සූදානම්. ඔබතුමන්ලා ඒ තේරීම් කාරක සභාවට සහභාගි වන්නේ නැත්තේ ඇයි?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

තේරීම් කාරක සභාවට එන එක ප්‍රශ්නයක් නැහැ. අපි කිව්වා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආපසු ගෙනාවොත් අපි එන්නම් කියලා. දහඅටවන සංශෝධනය ඉවත් කරලා, දහහත්වන සංශෝධනය ගෙනාවොත් අපි හෙටම එන්නම්. කිසිම ප්‍රශ්නයක් නැහැ. දහහත්වන සංශෝධනය ගේනවා නම් TNA එක ආවත් නැතත් අපි එන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hon. Leader of the Opposition, if you want to discuss the Seventeenth Amendment, you can participate in the Select Committee and propose that. Then, discussions will begin; others will also join in. Why do you not participate in the Select Committee which you agreed to?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේකෙන් මහ හරින්න ඕනෑ තරම් උත්තර තිබෙනවා.

ප්‍රධානම දේ, වැදගත්ම දේ නීතිය සම්පාදනය කිරීම නිර්දේශ කිරීම සඳහා විශේෂ තේරීම් කාරක සභාවට - Select Committee එකට - සහභාගි වීමයි. කථානායකතුමාත් announce කළා, පාර්ලිමේන්තුවේ එකඟතාවකින් පස්සේ ඒක කරන්න පුළුවන් කියලා. ඇයි ඒක පටන් ගන්න තමුන්නාන්සේලා හවුල් වෙන්නේ නැත්තේ? ඇයි මේ වෙන වෙන කතන්දර කියන්නේ? අපි ඊට වඩා කොච්චර ඉස්සරහට ඇවිල්ලා තිබෙනවාද? ඡන්දය පවත්වන්නත් අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා. ඔබතුමන්ලා තවම කාරක සභාවට හවුල් වෙනවාද නැද්ද - Committee එකට එනවාද නැද්ද- කියලා කල්පනා කරනවා. කථානායකතුමා announce කරලාත් තිබෙනවා. ඒකට සහභාගි වෙනවාද නැද්ද කියලා ඔබතුමන්ලාට තවම තීරණය කර ගන්න බැහැ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන අහනවා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන අහනවා, විසිවන එක ගැන අහනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Committee එක ගැන කිව්ව නිසා සඳහන් කරන්න කැමැතියි, අපි TNA පක්ෂයටත් කථා කරලා ජනාධිපතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කළා. අන්න ඒකට ආණ්ඩුවේ කැමැත්ත තිබෙනවා කියලා ප්‍රකාශ කළොත් සියලුම දෙනාට ඒ කාරක සභාවට සහභාගි වෙන්න පුළුවන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, TNA පක්ෂයයි සාකච්ඡා කරපු යෝජනා ගැන මේ සභාවේදී සාකච්ඡා කරන්න එදා විරුද්ධත්වයක් නොතිබුණාට, මේ සභාව තුළදී මම කරපු ප්‍රකාශයට එකඟත්වයක් පළ කළේ නැහැ. ඒකට එකඟත්වය ප්‍රකාශ කරනවා නම් අපටත් සහභාගි වෙන්න පුළුවන්. මම හිතන්නේ එන්න කියලා TNA පක්ෂයටත් කථා කළොත් එයි. ඒක ප්‍රශ්නයක් නොවෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hon. Leader of the Opposition, you know that in a Select Committee you can discuss all relevant issues. You can summon any party. You can summon any personality. Now, you are trying to give an excuse about a discussion that took place between the SLFP and the TNA.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

I am not giving excuses.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

This is not an SLFP-TNA affair. The entire Parliament appoints a Select Committee.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

I am talking of a discussion about getting the Committee which we had going. The group led by me and -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
You want to raise the issue in relation to the SLFP discussion. Surely, you can come to the Committee and discuss it.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremasinghe)
We had a discussion with the President and there was a formula agreed to. The TNA agreed to the formula but when we came to the House, you did not go ahead and show acceptance of the formula. The draft of the formula was given to you. ඒ යෝජනාව එතැනදී ඉදිරිපත් කළා, ඒ කෙටුම්පත දුන්නා. නමුත් මෙතැනට ආවට පස්සේ ආණ්ඩුව එකඟ වුණේ නැහැ. මේ ඔක්කෝම වුණේ අපි පිටුපසින් ගිහින් බලපෑම් කරලා ආණ්ඩුවයි, TNA පක්ෂයයි, ඉන්දියාවයි කථා කරපු නිසායි. ඒ වෙලාවේ ඉඳලා එකතු වුණා නම් මේක කොහොම හරි විසඳලා දෙනවා. ඒ ගැන අපට දොස් කියලා වැඩක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්නේ ඔබතුමාගේ www.presidentsoffice.gov.lk - [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඒ කියන්නේ Select Committee එකට සහභාගි වෙන්නේ නැහැ කියන එක නේද?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
අද ඔබතුමා ඇල්වතුරත් නිවලා බොන්න හදනවා වගේ. හැම දාම ඔය වාගේ හැසිරෙනවා නම් කොච්චර හොඳද? අද පොඩි බබා වාගේ උත්තර දෙනවා.

කථානායකතුමා
(සභානායකයන් අවර්කළ්)
(Mr. Speaker)
ඊළඟ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
www.presidentsoffice.gov.lk එකත් මාධ්‍ය වාරණයකට යටපත් වෙලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
දැම්මම බලන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඔව්, බලනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
දැම්මම බලන්න. ඒකේ තිබෙනවා සම්පූර්ණ විස්තරය.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මම හිතන්නේ මේ අවස්ථාවේදී මේක මාධ්‍ය censorship එකට යට වෙලා. මොකුත් එන්නේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ. ඔබතුමා ඕවා -

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
පොලීසියේ independent -

කථානායකතුමා
(සභානායකයන් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්නය ඇහුවා. උත්තර දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මම ඇවිල්ලා ඔබතුමාට ඕක අරගෙන දෙන්නම්. මම ඇවිල්ලා අරගෙන දෙනවා. වැරැදි එකක් ඔබතුමා press කරලා තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ආණ්ඩුවට - [බාධා කිරීමක්]අපිට තිබෙන්නේ original.

කථානායකතුමා
(සභානායකයන් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15-2775/'12 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. ඒ වාගේම මම ඔබතුමාට කියන්න ඕනෑ, මේ සභා ගැබ ඇතුළේ internet පහසුකම් ඉතාම slow බව.

මොකක්වත් අපිට හදිසියේ ගන්න බැහැ, ගරු කථානායකතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
There are disturbances.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
Internet පහසුකම් පිළිබඳ අඩු පාඩුවක් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා අපේ ලේකම්තුමාටත් කථා කරලා මේක විසඳුවොත් හොඳයි. Internet ගන්නම බැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ කාරණය කෙරෙහි අවධානය යොමු කරනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොකක් හරි කරන්න වෙයි, ගරු කථානායකතුමනි. මම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ෆයිල් එක තිබෙනවා. ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න කෝ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, මට සති දෙකක් කල් ගන්න කියලා ඇමතිතුමා උපදෙසක් එවලා තිබෙනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දෙවන වටය.

ගොවි විශ්‍රාම වැටුප් අරමුදල : වත්කම්
விவசாய ஓய்வூதிய நிதியம் : சொத்துக்கள்
FARMERS' PENSION FUND: ASSETS

2777/'12

6. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ajith P. Perera)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2012.01.01 දින වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදලේ පැවති සම්පූර්ණ වත්කම් ප්‍රමාණය කොපමණද;

(ii) ගොවි විශ්‍රාම වැටුප ගණනය කිරීමේ ප්‍රතිපත්තිය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) ගොවි විශ්‍රාම වැටුප නියමිත දිනට, නියමිත පරිදි ගෙවීමට අපොහොසත් වී ඇති තත්ත්වයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2012.01.01ஆம் திகதியளவில் விவசாய ஓய்வூதிய நிதியத்தில் காணப்பட்ட மொத்தச் சொத்துக்களின் அளவு எவ்வளவென்பதையும்;

(ii) விவசாய ஓய்வூதியம் கணிப்பிடப்படும் கொள்கையை இச்சபைக்கு சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) விவசாய ஓய்வூதியம் உரிய திகதியில், உரிய முறையில் செலுத்தத் தவறியமைக்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the total amount of the assets which remained in the Farmers' Pension Fund as at 01.01.2012 ;

(ii) whether the policy adopted for calculating the farmers' pension will be presented to this House; and

(iii) the reasons for the inability to pay the farmers' pension on due dates as prescribed ?

(b) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2012.01.01 දින වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදලේ පැවති සම්පූර්ණ වත්කම් ප්‍රමාණය පහත වගුවේ දක්වා ඇත.

වත්කම්	මුදල (රු.මි)
ආයෝජන හා මුදල්	35.9
ස්ථාවර වත්කම්	1.9
තොග	2.9
ලැබිය යුතු වත්කම්	134.6
මුළු වත්කම් ප්‍රමාණය	175.3

(ii) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ නියෝග අනුව 1987 මැයි 07 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ වයස අවුරුදු 18 - 59 අතර වයස් කාණ්ඩයේ පුද්ගලයින් සඳහා ගෙවිය යුතු වාරික මුදල සහ ගෙවනු ලබන විශ්‍රාම වැටුප් මුදල ප්‍රකාශ කොට ඇත. ඒ අනුව මෙම යෝජනා ක්‍රමයට දායකවූවන් සඳහා ගෙවීමට තීරණය කරන ලද අවම මාසික විශ්‍රාම වැටුප රු. 200/-කි.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

එසේ වුවද 1992 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක: 103(41) තීරණය අනුව 1992 අප්‍රේල් සිට ගෙවිය යුතු අවම මාසික විශ්‍රාම වැටුප රු: 500/- දක්වාත්, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක: 95/1830/105/123 තීරණය අනුව 1995 ඔක්තෝබර් සිට අවම මාසික විශ්‍රාම වැටුප රු: 1,000/- දක්වාත් වැඩිකොට ගෙවීම් කරන ලදී.

(iii) අ) (ii) පිළිතුරේ දක්වා ඇති පරිදි ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම පනතේ නියෝග පරිදි ගෙවිය යුතු අවම මාසික විශ්‍රාම වැටුප රු: 200/- වුවද, මෙම මාසික විශ්‍රාම වැටුප රු: 1,000/- දක්වා වැඩිකිරීම තුළ 2010 අගෝස්තු වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වූ අතර මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන හා වෙනත් අරමුදල් යොදා ගනිමින් 2011 දෙසැම්බර් දක්වා නියමිත පරිදි විශ්‍රාම වැටුප් ගෙවා ඇතත්, අරමුදල අවසන් වීම තුළ 2012 ජනවාරි මස සිට නියමිත පරිදි විශ්‍රාම වැටුප් ගෙවීමට නොහැකි වී ඇත.

(ආ) පැන නොනඟී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7 - 3164/'12 - (2), ගරු පාලිත තෙවරප්පෙරුම මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
ඛිනාවෛ මற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2011.04.07 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා විය යුතු ය. අ.භා. 3.30 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
ඛිනා විටුක්කප්පට්ටු ඒற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත
சித்தசுவாதீனம் குறைந்த பிள்ளைகளுக்கான பாடசாலையின் நலன்புரிச் சங்கம் (கூட்டிணைத்தல்) (திருத்தம்) சட்டமூலம்
WELFARE SOCIETY OF THE SCHOOL FOR THE MENTALLY SUBNORMAL CHILD (INCORPORATION) (AMENDMENT) BILL

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1988 අංක 75 දරන මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.
ඛිනා විටුක්කප්පට්ටු, ඒற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services for report.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු. පෞද්ගලික මන්ත්‍රී යෝජනා. අංක 01, ගරු රවි කරුණානායක මහතා.

දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම

அரசியல் கட்சிகளினால் தேர்தல் ஆணைக்குழுவுக்கு நிதி கணக்காய்வு அறிக்கைகள் சமர்ப்பித்தல்

PRESENTING A FINANCIAL AUDIT REPORT TO THE ELECTION COMMISSION BY POLITICAL PARTIES

[අ.භා. 2.29]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිය පුද කරනවා.

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"That this Parliament resolves that all income and expenditure earned and incurred by recognized political parties must be audited and presented to the Election Commission annually."

ගරු කථානායකතුමනි, මෙවැනි අදහසක් ඉදිරිපත් කරන්න අප යෝජනා කළේ මෙන්න මේ කාරණය නිසායි. දේශපාලන පක්ෂ 64ක් මේ අවස්ථාව වනකොට ලියා පදිංචි කර තිබෙන බව අද අපට පෙනෙනවා. ඒ සමහර දේශපාලන පක්ෂ තුළින් රටට ඉතාමත් වැදගත් කටයුත්තක් කරනවා වාගේම යම් පක්ෂ ඉතාමත් හානිදායක තත්ත්වයක් ඇති කරලා මේ රටේ පවතින දේශපාලන වාතාවරණයට විෂබීජ ඇතුල් කර තිබෙනවාය කියන එකත් මතක් කළ යුතු වෙනවා. ඒ නිසා යම් යම් දේශපාලන පක්ෂවලට ලැබෙන මුදල් කොයි ආකාරයෙන්ද ලැබෙන්නේ, කොහොමද ඒවා වියදම් කරන්නේ, කා වෙනුවෙන් වියදම් කරනවාද කියන ප්‍රශ්න උද්ගත වෙලා තිබෙනවා. දේශපාලන පක්ෂ 64ක් ලියා පදිංචි කර තිබුණත් මේ අවස්ථාව වනකොට දේශපාලන පක්ෂ 17ක්, 18ක් තරම් ප්‍රමාණයක් තමයි ක්‍රියාකාරීව තිබෙන්නේ. නමුත් ඒ දේශපාලන පක්ෂවලට මුදල් ලැබෙන්නේ කොහොමද කියන එක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඉන්දියාවේ මැතිවරණ කොමසාරිස්තුමා පාවිච්චි කරන උපක්‍රමයේ විධිමත් ක්‍රියාවලියක් තිබෙනවා. ඒක වාර්ෂික විගණනයට යොමු කරලා, යම් විධියකින් ඒක විශ්ලේෂණය කරලා එහිදී රට පාලනය කරන පක්ෂවලට යම් බරපතළ කාරණා ඉදිරිපත් කර තිබෙනවා. ලංකාවේ එවැනි තත්ත්වයක් ක්‍රියාත්මක කළා නම් දූෂණයෙන් ලබා ගන්නා මුදල් ප්‍රමාණය හෙළිදරව් කරන්නට පුළුවන්ය කියන අදහසින් තමයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අද අපේ රටේ ස්වාධීන කොමිෂන් නැති අවස්ථාවක මා හිතන විධියට ස්වාධීන විගණන වාර්තා ඉදිරිපත් කිරීම අවශ්‍යයි. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මේ වැරැද්ද නිවැරදි කරන්න අවස්ථාව තිබුණා. නමුත් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අද දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් යටපත් වෙලා තිබෙනවා. ඒ නිසා අපට ඒ වැරැද්ද නිවැරදි කරන්න පුළුවන් නම් හැම දේශපාලන පක්ෂයක්ම තමන්ගේ ආදායම, වියදම ඉදිරිපත් කරාවි. එහෙම වුණොත් ඒක ලොකු දෙයක්. විපක්ෂයකට ආදායම් ලබා ගන්න හරි අමාරුයි. නමුත් වියදම් කරන්න නම් හරි ලෙහෙසියි. මේක විගණනයට යොමු කළ යුතුයි කියා අප යෝජනා කර තිබෙන අවස්ථාවක ආණ්ඩු පක්ෂය හිතන්නත් බැරි ප්‍රමාණයකට වැඩියෙන් වියදම් කරනවා. මේවා ඉදිරිපත් කර තිබෙන්නේ රජයේ ආයතන තුළින් නම්, උපක්‍රමශීලීව බදු ගෙවන සල්ලි රටේ දේශපාලන පක්ෂ ඉදිරියට ගෙන යන්න පාවිච්චි කරනවා නම් ඒක ලොකු ප්‍රශ්නයක් හැටියට තමයි අප සලකන්නේ.

මේ අවස්ථාවේදී අප අදහස් කරන යෝජනාව තමයි දේශපාලනයේ විනිවිදභාවයක් ඇති විය යුතුයි කියන එක. හැම අවුරුද්දේම ජූනි මාසයේ 30වන දාට පෙර මන්ත්‍රීවරුන්ට තමන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන්න තිබෙනවා. එහිදී පසු ගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ පළමුවන දා සිට මේ අවුරුද්දේ මාර්තු 31වන දින දක්වා වූ කාලාන්තරය තුළ තමාගේ වත්කම අඩුවීම, වැඩිවීම සහ ආදායම් උපයන මාර්ග සියල්ලක්ම පෙන්වා දෙන්න අවශ්‍යයි. මන්ත්‍රීවරයකුට, දේශපාලන පක්ෂයක් නියෝජනය කරන පුද්ගලයකුට එසේ කරන්න පුළුවන් නම් දේශපාලන පක්ෂ මෙසේ කිරීම ඊටත් වඩා ලෙහෙසි කාර්ය භාරයක් ලෙසට තමයි මා සලකන්නේ. අද මැතිවරණ කොමසාරිස් -මහින්ද දේශප්‍රිය මැතිතුමා- ඉතාම උනන්දුවෙන් වෙනසක් ඇති කර ගෙන ඉදිරියට මේ කටයුතු ගෙන යන්නට වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. අප මෙම පුද්ගලයන් ගැන පෙරදී හිතුවේ වෙනින් විධියකටයි. නමුත් අප අගය කරනවා, පුළුවන් තරම් අලුත් ආකාරයකට හිතලා බලලා එතුමා වැඩ කිරීම පිළිබඳව. දයානන්ද දිශානායක මැතිතුමා ඉමහත් සේවයක් කළා වාගේම මහින්ද දේශප්‍රිය මැතිතුමාත් ඊටත් වඩා අලුත් ආකාරයට හිතලා කටයුතු කරනවා. මා මෙම යෝජනාව ඉදිරිපත් කරන්න ඉස්සර එතුමා එක්කත් කථා කළා; දයානන්ද දිශානායක මැතිතුමා එක්කත් කථා කළා. එතුමා කිව්වේ මෙවැනි යෝජනාවක් ගෙනෙන්න පුළුවන් නම් අද රටේ පාලනයේ පිරිසිදු වීමක් ඇති වෙවි කියලායි. ඒ විතරක් නොවෙයි, දේශපාලන පක්ෂවලට මීට වැඩිය වගකීමකින් කටයුතු කරන්න අවස්ථාවක් ඇති වෙවි.

ගරු කථානායකතුමනි, උදාහරණයක් වශයෙන් අප -එක්සත් ජාතික පක්ෂය- මෙවැනි කටයුතු කර ගෙන යනවා. නමුත් දේශපාලන පක්ෂ 63කින් අප දන්නා විධියට පක්ෂ හතර පහක් විතරයි මෙලෙස වාර්ෂික ආදායම් හා වියදම් විගණනය කරලා ඒ වාර්තා මැතිවරණ කොමසාරිස්ට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, රටේ නීතිය හරියාකාරව පාවිච්චි වෙනවා නම් ඒක කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් අද එහි ස්වාධීනත්වය ගැන ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අද යම් වැරදිකරුවෙක් නිවැරදිකරුවෙක් බවට පත් වෙනවා. නිවැරදිකරුවෙක් වැරදිකරුවෙක් බවට පත් වනවා. ඒ වාගේම අපට පෙනෙනවා, යම් විධියකින් රටේ ඉදිරි දැක්ම හෝ රට යන ගමන වෙනස් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් මේ දේශපාලන පක්ෂත් උපක්‍රමශීලීව පාවිච්චි කරනවා කියලා. ඒ නිසා ඒ පක්ෂවලට ලැබෙන සල්ලි කොහෙන්ද ලැබෙන්නේ කියන එක විගණනය තුළින් ඉදිරිපත් කළ යුතු බව තමයි අප මේ අදහස තුළින් ඉදිරිපත් කරන්න හදන්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන් තුළින් මේ අදහස ස්ථාපිත කිරීම තමයි මගේ අභිලාෂය.

ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, නිදසුනක් වශයෙන් ඉන්දියාව ගත්තොත් එය ජනගහනය අධික ප්‍රමාණයක් ඉන්නා රටක්. නමුත් එහි මැතිවරණයක් පවත්වන අවස්ථාවේදී යම් විධියක පිරිසිදු පාලනයක් එතැන තිබෙනවා. එහේ ඇමතිවරයෙක් යම් කිසි විධියකින් රුපියල් ලක්ෂ දෙකක් වැඩිපුර වියදම් කළා කියලා එතුමාගේ පාර්ලිමේන්තු ආසනය ප්‍රතික්ෂේප කරලා තිබුණා.

ඉන්දියන් පාර්ලිමේන්තුවේ ඒ වාගේ පාලනයක් ඇති වුණා නම්, මේ පුංචි ලංකාවේ පිරිසිදු පාලනයක් ඇති කරලා ඉදිරියට ගෙන යන්න බැරි වන්නේ ඇයි?

[ගරු රවි කරුණානායක මහතා]

ගරු කථානායකතුමනි, ඊළඟට දෙවැනි එක තමයි විනිවිදභාවය. විනිවිදභාවය සම්පූර්ණයෙන්ම මේ රටේ නැති වෙලා තිබෙන නිසා තමයි මේ යෝජනාවේ වැඩි අවශ්‍යතාවක් තිබෙන්නේ. විනිවිදභාවයක් සැබෑ මට්ටමකින් තියන්න අවශ්‍ය නම් ඇමති මණ්ඩලය මේ යෝජනාව සම්බන්ධයෙන් එකඟ වෙලා, ඕනෑකමකින් කටයුතු කිරීම තමයි මා මේ අවස්ථාවේදී ඉල්ලන්නේ. අද කැබිනට් මණ්ඩලයේ ඉන්නා වැඩි දෙනා දන්නවා අද ආණ්ඩුව ගෙන යන ආකාරය. තමන්ගේ රජයේ තිබෙන ආයතන තුළින් දේශපාලන පක්ෂවල වැඩ කටයුතු ගණනාවක් කර ගෙන යනවා. සීමිත ඇමතිවරු ප්‍රමාණයකට විතරයි ඒක කරන්න පුළුවන් වන්නේ. සමස්තයක් වශයෙන් ගත්තොත් අනෙක් අයට බැරි වෙලා තිබෙනවා. ඒ තුළින් අසාධාරණයක් වනවා කියන එකත් අපට පෙනෙන්න තිබෙනවා. සමහර විට ඔබතුමන්ලා අදහස් කරාවි, විපක්ෂයක් වශයෙන් අපි මෙවැනි අදහස් ගෙනෙනවා; ආණ්ඩු පක්ෂයේ ඉන්න කොට මීට වඩා හාත්පසින් වෙනස් විධියට වැඩ කරනවා කියලා. ඒක නොවෙයි අපේ අවශ්‍යතාව. පිරිසිදු කිරීමක් තමයි අවශ්‍ය වන්නේ. ඉහළ සිට පහළට පිරිසිදු කිරීමක් ඇති කිරීම තමයි අවශ්‍ය වන්නේ. පහළ සිට උඩට තල්ලු කිරීම අමාරු කාර්ය භාරයක්. මා සද්භාවයෙන් මේ අදහස ඉදිරිපත් කරන්නේ. කාවවත් කොන් කරන්න නොවෙයි. සමස්ත ජනතාවට පිරිසිදු පාලනයක් මේ පාර්ලිමේන්තුවෙන්ම ඇති කිරීම තමයි අවශ්‍ය වන්නේ කියන කාරණය මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, අද ස්වාධීන කොමිෂන් සභා ටික යටපත් වෙලා තිබෙනවා. අද මේ පාර්ලිමේන්තුවේදී ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගෙන් පොලිස් කොමිසමේ ස්වාධීනත්වය ගැන අපේ විපක්ෂ නායකතුමා ඇහුවාම ඒකට දුන්නු උත්තරය තුළින් අපට පෙනුණා, ඒකේ කිසිම ස්වාධීනත්වයක් නැති බව. මොකද, එවැනි අවශ්‍යතාවක් තිබෙනවා නම් එතුමන්ලාම පත් කරපු උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිසම තුළින් -කවුරුත් කියන්නේ නැතුව, ඒ අයම- ඉදිරිපත් කරලා තිබෙන දෙයක් තමයි ජනතාවගේ විශ්වාසය බිඳී ගිහිල්ලා තිබෙනවා; ඒ විශ්වාසය නැවත තහවුරු කරන්න නම් ස්වාධීනත්වයක් ඇති කරන්න අවශ්‍යයි; ඒ නිසා ඒකට මුදල් කොමිසම, මැතිවරණ කොමිසම, ඒ වාගේම පොලිස් කොමිසම යන ඒ සියල්ලගේම ස්වාධීනත්වයක් ඇති කරන්න ඕනෑ කියලා. ඔබතුමන්ලා පත් කරපු කොමිසම තුළින් ඉදිරිපත් වෙලා තිබෙන ඒ අදහසටම අපි මේ අවස්ථාවේදී ඉල්ලීමක් ඉදිරිපත් කරනවා නම් ඔබතුමන්ලාගේ සම්පූර්ණ සහයෝගය ඒකට දිය යුතුයි කියන මට්ටමෙන් තමයි මා සිටින්නේ. ඒ නිසා ගරු කථානායකතුමනි, මා මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවෙන් ඉල්ලන්නේ, මේ යෝජනාවට සම්පූර්ණ සහය ලබා දීලා, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන, නෛතිකභාවයක් ඇති කර, පුළුවන් තරම් ඉක්මනට ක්‍රියාත්මක කිරීමයි. මා හිතන්නේ මීට වැඩිය මා කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. මොකද, මේ අදහස බොහොම සෘජුයි.

මෙයට කිසිම බාධාවක් නැහැ. එක දේශපාලන පක්ෂයක් කොන් කිරීම නොවෙයි මෙයින් කරන්නේ. යම් කිසි දේශපාලන පක්ෂයක් ලියා පදිංචි වුණා නම්, එය මැතිවරණ කොමසාරිස් පිළිගෙන තිබෙනවා නම්, ඒ පක්ෂය විසින් ඒ වර්ෂයේ උපයා ගත් ආදායම් හා දැරූ වියදම් පිළිබඳව විගණනය කරලා, මැතිවරණ කොමසාරිස්වරයාට ඉදිරිපත් කිරීමෙන් පසු, මැතිවරණ කොමසාරිස්වරයා එය විශ්ලේෂණය කර පිළිගත්තාට පස්සේ කටයුතු කිරීම තමයි අවශ්‍ය වන්නේ කියන යෝජනාවයි මා ඉදිරිපත් කරන්නේ. මෙම යෝජනාව ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා ස්ථිර කරනවා ඇති.

[අ.භා. 2.39]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව මා ස්ථිර කරනවා. අද අපි සාකච්ඡා කරන්නේ දේශපාලන පක්ෂ විසින් උපයා ගත් ආදායම් හා දැරූ වියදම් පිළිබඳවත් මූල්‍ය විගණන වාර්තා මැතිවරණ කොමසාරිස්ට ඉදිරිපත් කිරීම ගැනයි.

එක්සත් ජාතීන්ගේ සම්මුතියක් තිබෙනවා, දූසැරියටයි, දූෂණයටයි එරෙහිව. එහි 7 (3)හි සඳහන් කර තිබෙනවා, විශේෂයෙන්ම දේශපාලන මූල්‍ය පිළිබඳව විනිවිදභාවයක් තිබෙන්න අවශ්‍යයි කියලා. මා හිතන හැටියට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව අනාගතය ගැන කල්පනා කරලා ඉදිරිපත් කළ සැලකිය යුතු කරුණක්. මොකද අපි මේ රටේ යහපත් දේශපාලන සංස්කෘතියක් ඇති කරන්නට ඕනෑ. අපි දිගින් දිගටම බලයේ නොසිටින එක එක්සත් ජාතික පක්ෂය හැටියට ඉගෙන ගත්තා. අද රජයත් දවසක ඒ පාඩම ම ඉගෙන ගන්න යනවා. මෙවැනි යෝජනා ඉදිරිපත් වුණාම, මේවා කවදාවත් කරන්න බැහැ කියලා යම් අය හිතුවාට මා නම් එහෙම සෘණ පැත්තෙන් හිතන්නේ නැහැ. අපි ධන පැත්තෙන් හිතලා පොඩි-පොඩි වෙනස් වීම් හෝ කරන්න අවශ්‍යයි.

දැන් මෙය පිටුපස තිබෙන මූල ධර්මය මෙයයි. ඕනෑම පක්ෂයකට, ඕනෑම පුද්ගලයකුට මැතිවරණයකට පෙනී සිටින්නත්, ඒ වාගේම ඒ මැතිවරණයට තරග කරලා ඒ තැනට එන්නත් සම අයිතියක් තිබෙන්න ඕනෑ. ඒ සම අයිතියේ මූල ධර්මය තමයි අපි මෙකෙන් තහවුරු කරන්න වෑයම් කරන්නේ. ඒ අයිතිය විතරක් නොවෙයි, අවශ්‍ය වටපිටාවත් එහෙම තිබෙන්න ඕනෑ, සම සමව දේශපාලන තරගය කරන්න.

එක්සත් ජාතීන්ගේ සංවිධානය ගත්තාම, විශේෂයෙන්ම රටවල් 175ක පමණ ඒ රටවල්වල නීතියෙන් යම් කිසි විධියකට මූල්‍ය පිළිබඳව යමක් සඳහන් කරලා තිබෙනවා. අපි සියලුදෙනාම දන්නා විධියට සමහර රටවල ඒවා යහපත් විධියට ක්‍රියාත්මක වෙනවා; සමහර රටවල අයහපත් විධියට ක්‍රියාත්මක වෙනවා.

ගරු කථානායකතුමනි, අද වෙබ් අඩවි ගැන කරුණු රාශියක් කථා කළ නිසා මා වෙබ් අඩවියෙන් පොඩ්ඩක් සෝදිසි කරලා බැලුවා, පසු ගිය ජනාධිපතිවරණයේදී, මහා මැතිවරණයේදී රාජ්‍ය දේපොළ භාවිතය ගැන තිබුණු රපෝර්තු පිළිබඳව.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ රපෝර්තු තුනක් තිබුණා. ඒවා තිබුණේ, පෙබරවාරි මාසයේ එකකුත්, අප්‍රේල් මාසයේ දෙකකුත් -2010 අප්‍රේල් 04 සහ 07වෙනි දා- වශයෙන්. විශේෂයෙන් ඒවායේ සඳහන් වුණේ, රාජ්‍ය දේපොළ භාවිතය පිළිබඳවයි. මා මේවා සඳහන් කරන්නේ උදාහරණ හැටියටයි. මම මොහොතකටවත් කියන්නේ නැහැ, ඒ මැතිවරණවලදී විතරයි මේවා සිදු වුණේ කියලා. මෑතකදී අවසන් වුණ මැතිවරණ නිසා තමයි මා ඒවායින් උදාහරණ ගන්නේ. ඒ එක කාරණයක් තමයි ලංගම බස් යොදා ගැනීම. ඒවා එදා මැතිවරණවලදීත් පාවිච්චි වුණා; අදත් පාවිච්චි වෙනවා. හැබැයි, අපි ඒකට නිත තියන්න ඕනෑ කියලායි මා හිතන්නේ. ඒ වාර්තාවක උදාහරණයක් දාලා තිබුණා, නුවරඑළිය, ගම්පොළ, නාවලපිටිය, කැප්පෙටිපොළ කියන ලංගම බස් ඩිපෝවලින් නුවරඑළියේ සින්සිටා ක්‍රීඩාංගණයේ පැවැති රැස්වීමකට බස් 69ක් ගෙනාවා කියලා. ඒවාට ඩීසල් ලීටර් 50ක්

බැගින් නිකුත් කරලා ගණනය කර තිබෙනවා. මේවා ඒ වාර්තාවේ තිබෙන උදාහරණ. මේවා හැම තැනම සිදුවූ දේවල්. මැතිවරණවලදී රාජ්‍ය දේපොළ භාවිතය පිළිබඳව උදාහරණයක් විධියටයි මා මේ උදාහරණ ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව පිළිබඳවත් ඒ වාර්තාවේ සඳහන් වනවා. තුෂාර සඳනායක කියන්නේ ගුවන් විදුලි සංස්ථාවේ ජනාධිපති ඒකකයේ අධ්‍යක්ෂවරයෙක්. ඒ වාගේම ප්‍රාදේශීයේ සේවා අධ්‍යක්ෂවරයෙක්. ඒ වාර්තාවේ ඔහුගේ නමත් සඳහන් කරලා තිබෙනවා. ඔහු ලිඛිතව දැනුම් දී තිබෙනවා, ජනාධිපතිතුමා රැස්වීම් කීපයකට සහභාගි වෙනවා, ඒ රැස්වීම් ආවරණය කරන්න කියලා. එහි වරදක් නැහැ. නමුත් ඡන්ද කොමසාරිස්ගේ නියෝගය අනුව, මාධ්‍ය තුළින් යම් කාල සීමාවක් රජයට දෙනවා නම්, ඒ හා සමාන කාල සීමාවක් දෙන්න ඕනෑ විපක්ෂයටත්. එසේ සම කාල සීමාවක් නොදීමයි එතැන තිබෙන ප්‍රශ්නය.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ඒ වාර්තාවේ තව උදාහරණයක් සඳහන් කරනවා. ඒ තමයි, අපේ ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් එකක් භාවිත කරලා, 2010 අප්‍රේල් 03 වන දා ජොන්ස්ටන් ඇමතිතුමාගේ මැතිවරණ පත්‍රිකා ගුවනින් බෙදුවාය කියන එක. ඒකත් මැතිවරණයකදී මහ ජන දේපොළක් පරිහරණය කිරීමක්. මේවා එකක්වත් සිදු වෙලා නැහැ කියලා කවුරු හරි තර්ක කරනවා නම්, ඒ රජෝර්තුවට විරුද්ධව ක්‍රියා මාර්ග ගන්න පුළුවන්. ඒක ඒ රජෝර්තුවේ සඳහන් කරලා තිබෙනවා.

ඒ වාගේම ජයතිස්ස කරුණාමුනි කියන තැනැත්තා ගුරු සේවාවේ ඉන්න අය මීගමුව ප්‍රදේශයේ පැවැති මීටිමකට රැස් කරවලා තිබෙනවා. එය පැවැත්වුණේ 2010 මාර්තු 04 වැනි දායි. ඊට පස්සේ කිව්වා, 10 වැනි දා මීගමුවේ Town Hall එකට එන්න කියලා.

ඒ Town Hall එකේ තිබුණු රැස්වීම සරත් කුමාර ගුණරත්න නියෝජ්‍ය ඇමතිතුමා ලෑස්ති කරපු රැස්වීමක්. එතැනදී ඒ මැතිවරණය පිළිබඳව යම් කිසි උපදෙස් දුන්නා. ඒ පිළිබඳව මාර්තු 6වැනි දා සහ මාර්තු 10වැනි දා ලංකා ගුරු සංගමයෙන් ලියලා තිබෙනවා, රාජ්‍ය සේවයේ ඉන්න අය මේ වාගේ දේශපාලන කටයුතුවලට කෙළින්ම යොදවන්න එපා කියලා. ඒ වාගේම ලේකම්වරු ගැන කියලා තිබෙනවා. උප කුලපතිවරු ගැන කියලා තිබෙනවා. ඒ වාගේ නොයෙකුත් දේවල් සඳහන් කරලා තිබෙනවා.

අද රවි කරුණානායක මන්ත්‍රීතුමා එතුමාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවෙන්, "උපයා ගත් ආදායම් හා වියදම් වාර්ෂිකව විගණනයට භාජන කර, ඒවා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි" යෝජනා කළත්, මම හිතන්නේ මේ මූල්‍ය විගණන වාර්තාව ගණන්වලට විතරක් සීමා කරන්නට බැහැ කියලායි. මොකද, විශේෂයෙන්ම "රාජ්‍ය දේපොළ භාවිතය" වාගේ ගණන් කරන්නට බැරි දේවල් තිබෙන නිසා. අපි මේවා හඳුන්න කියන්නේ මේ නිසායි. සාධාරණ ක්‍රමයක්, සාධාරණ සමාජයක් ගොඩ නහන්න අපට අපහසු වුණොත් ක්‍රම ක්‍රමයෙන්, ක්‍රම ක්‍රමයෙන් මේ දේශපාලන සංස්කෘතිය වෙනස් වෙලා මීට වැඩිය විශාල විපර්යාසයක් මේ රටේ ඇති වෙන්න පුළුවන්.

"සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය" අපේ මාදුළුවාවේ සෝභිත මහා නායක ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ළඟදී රැස්වෙලා, අපේ රටේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ස්ථාපිත කළ යුතුයි කියලා යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. එක්සත් ජාතික පක්ෂයේ ස්ථාවරය වන්නේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරන එක විතරක් නොවෙයි. අපි හිතන්නේ, මේ රටට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි කියලායි. ඒ ගැන දැන් අපි මහ ජන කථිකාවකට එළැඹෙනවා. නමුත් මේවා කර ගන්න බැරි වුණොත්, ඒ යෝජනාවල සඳහන් කරනවා මැතිවරණයක් තිබෙන වේලාවේ වැඩ බලන රජයක් තිබෙන්න ඕනෑ කියලා. යහ පාලනය පිළිබඳව අද මේ ගෙනාපු යෝජනා වාගේ යෝජනා පිළිගන්න මේ රජයට පුළුවන් නම්, ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් අපි එතැනට යන්න ඕනෑ නැහැ. නමුත් අපට එහෙම කර ගන්න බැරි වුණොත්, මැතිවරණයක් තියන අවස්ථාවක අපට වැඩ බලන රජයක් ඉල්ලන්න වෙයි කියමින් මා මේ යෝජනාව ස්ථිර කරනවා. ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්තුතියි. ආණ්ඩු පක්ෂයෙන් ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

[2.47 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Bismillahir Rahmanir Raheem.

Hon. Speaker, when I look at this Motion moved by our good Friend, the Hon. Ravi Karunanayake, I am reminded of a very good Sinhala saying, "හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ" කියලා. ඇයි ඒ මන්ත්‍රීතුමා කුඩම්මාගෙන් අහන්නේ? හොරාගේ අම්මාගෙන් අහන මිනිස්සු එතැන ඉන්නවා. එතුමා නියෝජනය කරන පක්ෂය විසින්ම මේ තොරතුරු කොමසාරිස්තුමාට සපයා නැති බව අපට වාර්තා වී තිබෙනවා. එහෙම නම්, මේක විදුරු ගෙවල්වල ඉඳලා අනෙක් පක්ෂවලට ගල් ගහනවා වාගේ වැඩක් වෙන්නටත් පුළුවන්. The UNP has not given their audit report. It is a very important party.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! There is a point of Order being raised.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, when we make a statement in Parliament, we present relevant facts and figures. If there is an irresponsible Member who wants to throw mud, let it be done on a question mark, not at the UNP. The UNP has done everything that is required as per the legislation and we have given it to the Commissioner of Elections. So, please tell him to withdraw that statement because there is no such thing that the UNP has not given. - [*Interruption.*]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒවා ඒ මන්ත්‍රීතුමාගේ අදහස්. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ කථාව කරගෙන යන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මම කොහොමද දෙන්නේ? එතුමා කියනවා අපට ගෙවන්න කියලා. මේ පක්ෂයට ලැබුණු සල්ලි කොහේද කියන එක රටම දැන ගන්න ඕනෑ. ඒකයි අපි කියන්නේ. මේ සභාවේ වග කිව යුතු ආණ්ඩු පක්ෂය වශයෙන් ඒ ගැන අහන්න අපට අයිතිවාසිකම තිබෙනවා.

Sir, we know what is happening there. I do not want to go into their inner circle and wash dirty linen in this House because I also have been a member of that party long before this Member who moved the Motion. Sir, I think what is sauce for the goose is sauce for the gander also. Let them tell the country that they have given all these details. I challenge them to issue a statement today or tomorrow and let the Commissioner of Elections reveal the details. There are other parties. They are also duty-bound to submit these details according to the Constitution and election laws.

I must also pay tribute to Mr. Mahinda Deshapriya, an able Commissioner of Elections who is doing his job very well. He has endeared himself to all the parties. He is free for people to meet him. He never closes his door. Therefore, Sir, as far as the Election Commission is concerned, they are doing their part well.

Sir, there is no point telling these things. At one time, it was the Hon. Thilak Karunaratne who saved this party. ගරු කථානායකතුමනි, අද -2013.05.10 දින- පළ වූ "මව්බිම" පුවත්පතේ සඳහන් වී තිබෙනවා, "එක්සත් ජාතික පක්ෂය බංකොලොත් වෙලා" කියලා. ඒ විස්තරය මා ළඟ දැන් තිබෙනවා. ඉතින් කොහොමද ගරු කථානායකතුමනි, ඒ අය Elections Commissionerට මේ විස්තර, වාර්තා ඉදිරිපත් කරන්නේ? ඔවුන් බංකොලොත් වෙලා. මම ඒ පක්ෂයේ හිටපු කෙනෙක් වශයෙන් මේක අහනවා. එදා කෝටි ගණනින් මුදල් ලැබුණා. මම කාටවත් චෝදනාවක් කරන්නේ නැහැ. අපේ මලික් සමරවික්‍රම මැතිතුමා මගේ හොඳ මිත්‍රයෙක්. නමුත් මේ මුදල් කොහේද අරගෙන ගියේ? මේ මුදල් හොංකොංවලට අරගෙන ගියේ කවුද? සිංගප්පූරුවට අරගෙන ගියේ කවුද? මොකද වුණේ? After all, the country has a right, this Parliament has a right and you have a right as the Hon. Speaker to ask because they are a party that has ruled this country from 1947. Today, you can see the plight in which they are; the abysmal and deplorable condition that they have fallen into. We feel sorry about it. We are very hurt that the party has fallen into this condition of debt as has never happened. But, the question that has been asked is, "where is that money?".

බොහෝ දෙනෙක් කෝටි ගණන් මුදල් පක්ෂයට දුන්නා. ඒ මුදල් කොහේද කියන එක එක්සත් ජාතික පාක්ෂිකයන් දැන් අහනවා. මෛත්‍රී ගුණරත්න දකුණේ ඉඳගෙන අහනවා. අනිකුත් අය අහනවා. මේ අයගෙන් කැඩිලා දැන් ඔය විකල්ප කණ්ඩායම් හදාගෙන ඉන්න අය -ඔය පැත්තේ කඳයි, අපේ පැත්තේ බෙල්ලයි, මේ පැත්තේ දකුණු අතයි, අනික් පැත්තේ වම් අතයි තියාගෙන ඉන්න සියලු දෙනාම- අහනවා අනේ! අපේ පක්ෂයට මොකද වුණේ කියලා. Electricity bills ගෙවන්න බැහැ. If the Mover of this Motion has money, let him pay like how the Hon. Thilak Karunaratne did those days, out of sympathy.

Then, another very important matter is that several commissions have been appointed under the Eighteenth Amendment to the Constitution. The Eighteenth Amendment to the Constitution was passed in this House and all the commissions have been appointed under Article 41A. The Human Rights Commission has been appointed. Justice Priyantha R.P. Perera has been appointed as Chairman of that together with Mrs. Jezima Ismail and others on 12th February, 2011. Mr. Ariyarathne Hewage has been appointed to the Finance Commission on 24th February, 2012. In the appointments to the Supreme Court, the Hon. Peter Mohan Maithri Peiris as the Chief Justice and four other members have been appointed on 15th January, 2013. Then, Vidyajothi Dr. Dayasiri Fernando as Chairman and eight others have been appointed to the Public Service Commission on 12th May, 2011. Members have been appointed to the Commission to Investigate Allegations of Bribery or Corruption. අප හාල්මැස්සන් අල්ලන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ ඉන්න තෝරු, මෝරු අල්ලනවාය කියා ඊයේ පෙරේදා එහි Chairman පවසා තිබෙනවා. ඒ බව ප්‍රවෘත්ති පත්‍රවල පළ වුණා. Members to the Judicial Service Commission have been appointed on 9th June, 2011. The Hon. S. Sriskandarajah as the President including other members have been appointed to the Court of Appeal on 23rd June, 2011 Then, Sir, Mr. H.A.S. Samaraweera has been appointed as the Auditor-General on 9th August, 2011. The Attorney-General, the Hon. Sarath Palitha Fernando, was appointed on 12th July, 2012. The Secretary-General of Parliament, Mr. Dhammika Dasanayake, our very good friend, was appointed on 8th February, 2012. The Police Commission has been appointed with Mr. Senaka Walgampaya as the Chairman on 15th February, 2012.

Now, Sir, there are pertinent questions that we ask as responsible Members. You are the Chairman of this Parliamentary Council and you have the Prime Minister and the Leader of the Opposition also in it. As envisaged, one person from one community of the Government is myself together with the Hon. D.M. Swaminathan from the Opposition. Now, the Hon. Swaminathan has gone public and revealed through so many newspapers that the Leader of the Opposition does not want him to go - he knows it. He is not here now. He is not going to say, no. -when the newspaper asked, "Why are you two not attending?". Sir, their attendance is mandatory according to the Eighteenth Amendment to the Constitution. They are asking for the Nineteenth Amendment, Twentieth Amendment and so on. This Eighteenth Amendment is being implemented properly. But, a responsible Member like the Leader of the Opposition fails to attend meetings. He has not taken

part in the appointment of any of these members. You know it very well. The Hon. Swaminathan has said, "The Leader of the Opposition does not want me to go".

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! There is a point of Order being raised by the Hon. Ravi Karunanayake.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, my Motion is on presenting a financial audit report to the Election Commission by political parties. The Member does not understand what the Motion is about and has got his wires crossed. I was given 10 minutes to propose and he is given five minutes to go on a voyage of discovery. I would greatly appreciate if you tell the Hon. Member to speak on the subject matter, which he very rarely does.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, පුරුද්දක් හැටියට හැම කෙනාම පිලි පැනලා නේ සාමාන්‍යයෙන් කථා කරන්නේ. ඒක මේකට විතරක් අදාළ දෙයක් නොවෙයි නේ. ගරු අස්වර් මන්ත්‍රීතුමා, තමුන්නාන්සේගේ අදහස් ටික තමුන්නාන්සේ කථා කරන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, people who played out the UNP, people who played out the late Hon. Lalith Athulath Mudali, and people who destroyed the CWC, now have the audacity to rise up in this House, dressed in coat and tie, and speak like this. I am referring to the Constitution. Under the Eighteenth Amendment to the Constitution, the Parliamentary Council has been appointed and it makes appointments to all these Commissions and to the Election Commission too. The responsible Leader of the Opposition has not attended one single meeting. This must be reported to the Commonwealth Parliamentary Association. Not only that, he has committed a punishable offence. He has told his party nominee not to attend meetings.

How much respect do they pay to the Constitution? Therefore, Sir, I believe this must be investigated into. We must amend at least this Article and include other parties or more members from the Government to the Council. They have deliberately refused to attend any of its meetings and all appointments in the Commissions have been signed by you, the Hon. Speaker, the Hon. Prime Minister and myself.

Therefore, I must say that when you throw stones at others, sometimes they can come direct back on you. You are not able to properly prop up your image because there is a skeleton in the cupboard of the Mover and the United National Party.

Thank you, Sir.

[අ.භා. 2.58]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන් මම සන්තෝෂ වනවා අපේ ගරු රවි කරුණානායක මැතිතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනාව පිළිබඳව. එය ඉතාම කාලෝචිත යෝජනාවක්. රටේ කුමන දේශපාලන පක්ෂයක් ක්‍රියාත්මක වුණත්, ඒ අය මොනවා කරන්න හැදුවත්, මේ රටේ පාලන ක්‍රම ගෙන යන විට ඒ පාලන ක්‍රමවල යම් යම් වැදගත් දේවල් සිදු විය යුතු බව විපක්ෂ මන්ත්‍රීවරුන් විධියට අපි දකිනවා. ඒ පැත්තෙන් කල්පනා කරලා තමයි විශේෂයෙන් රවි කරුණානායක මැතිතුමා මේ යෝජනාව ගෙන ආවේ. මේ දේශපාලන පක්ෂවල අරමුදල් පිළිබඳව යම් කිසි විධියක විනිවිද භාවයක් ඇති කරන්න, එහෙම නැත්නම් ඒවා ලැබුණේ කොහොමද කියන කාරණා සහ ඒවායේ ගිණුම්කරණයන් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාට ඉදිරිපත් කරන්න කියලා තමයි මේ යෝජනාව කරන්නේ. මෙය ඉතාම කාලෝචිත යෝජනාවක් ලෙස මම සලකනවා. අපේ රටේ තිබෙන ප්‍රශ්න ගණනාවක් මේ කාරණයත් සමඟ බද්ධ වෙලා තිබෙනවා. අපේ ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාත් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළා.

මම විශේෂයෙන්ම කනගාටු වෙනවා අස්වර් මැතිතුමා ගැන. එතුමා එක්සත් ජාතික පක්ෂයේ හිටපු සාමාජිකයෙක් විධියට, දිගින් දිගටම ඒක නිවැරදි කරන්නේ නැතුව එතැනින් එහාට ගියා. ඒ පැත්තේ ඉඳලා දැන් එතුමාට තේරිලා තිබෙනවා. අපේ පැත්තේ ඉන්න කාලයේ එතුමා මේවා රකින්නට ගියේ නැහැ. මේවායේ තිබුණ වැරදි, අඩු පාඩු පෙන්වා දුන්නේ නැහැ. වැරදි අඩු පාඩු තිබුණා නම් ඒවාට පුළුවන් තරම් පවන් සලපු එක තමයි එතුමා මේ පැත්තට වෙලා කළේ. මට හොඳට මතකයි. එහෙම කරලා අද ඒ පැත්තට ගිහින්- [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අපි කොල්ල කන්න ඉඩ දුන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
I never disturbed you. Please listen to me.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අපි කොල්ල කන්න ඉඩ දුන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

I never disturbed you. Be patient. ගරු කථානායකතුමනි, ඒ නිසා මම කියන්නට කැමැතියි, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැනත් එතුමා කථා කළ නිසා-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියා ගෙන ආවේ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැනයි. මේ රටේ තිබුණු සියලුම නීත්‍යානුකූල සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන විනාශ කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් තමයි දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඒක එක සතියක, දවසක, දෙකක කාලයක් තුළ පාර්ලිමේන්තුවට ගෙනත්, එක්සත් ජාතික පක්ෂයෙන් පත් වුණු මන්ත්‍රීවරුන් 08 දෙනෙකු ආණ්ඩුව පැත්තට අරන් ඉතාම නීති විරෝධී ලෙස සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක්. ඒ සංශෝධනය වෙලාවේ අපි අඩුම තරමින් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නවත් සිටියේ නැහැ. අපේ ඒ තරම් දැවැන්ත විරෝධයක් ඒකට තිබුණා. අද ඒකේ ප්‍රතිඵල රටම අත් දකිමින් තිබෙනවා. ඒ අත් දකිමින් තිබෙන ප්‍රතිඵලය තමයි, අද අස්වර් මැතිතුමා වාගේ කෙනෙක් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කළ ඒ පාර්ලිමේන්තු සභාවට පත් කිරීම. ඒකම ඇති. ඒකෙන් බොහොම පැහැදිලියි, බුද්ධිමත්කමක් තිබෙන, යම් කිසි දෙයක් ගැන කල්පනා කරන්නට පුළුවන්, නැත්නම් යම් කිසි දෙයක් සම්බන්ධයෙන් හොඳ, නරක හිතන්නට පුළුවන් අය මේ සභාවට පත් කරලා නැති බව. කෙළින්ම පත් කරලා තිබෙන්නේ එන ඒවාට අත උස්සන්නට පුළුවන් අය. එන ඒවාට අත උස්සන්නට පුළුවන් කෙනෙකු පත් කළාම ඔහු එතැන සිට මේ පැත්තට චෝදනා කරනවා නම්, ඒක විශාල ප්‍රශ්නයක්. අපි දන්නවා. සමහර වෙලාවට ජනාධිපතිතුමා එවන්නේ මොන නිර්දේශ ද, ඒ නිර්දේශයට අත උස්සලා, "ඔව්. Yes, Sir."කියන්න ඔනෑ කරන කිහිප දෙනෙකු තමයි මේ සභාවට දාලා තිබෙන්නේ. මම කියන්නට කැමැතියි-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Deputy Chairman of Committees, he is referring to the conduct of the Chairman - that is, the Hon. Speaker - and the Hon. Members, which he cannot do. "නිකම් අත උස්සන, signal" කියන කොට, do you understand what a signal is? Your people do not have a single signal. All the signals in the UNP are broken now.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

All right. Hon. Dayasiri Jayasekara, you may continue with your speech.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඉගෙන ගත්තේ නැති කෙනෙකුට මේ විධියට නැඟිටලා කෑ ගහන්නට පුළුවන්. ඒක තමයි මම කිව්වේ. නිකම් අත උස්සන signal කණු බවට පත් වන අයට මේ වාගේ කථා කරන්නට පුළුවන්. මම ඒ අය ගැන කථා කළේ නැහැ මේ සභාවේ. ඒ නිසා මම කියන්නේ ඒ වාගේ සාමාජිකයින් ඒවාට දාලා තිබෙන්නේ ඒකට තමයි. ඒ වාගේ අති බහුතරයක් එතැන ඉන්න විට විපක්ෂ නායකතුමාත්, තවත් කවුරුන් හෝ කෙනෙකුත් එතැනට ගියාට කථා කරන්නට පුළුවන් තත්ත්වයක් එතැන නැහැ. මොකද, අපි දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එපා කියන තැන තමයි ඉන්නේ. LLRC වාර්තාවෙන් කියනවා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න කියලා. ඒකේ තිබෙන පොලිස් කොමිසම ගේන්න කියනවා. ඒකේ තිබෙන මැතිවරණ කොමිසම ගේන්න කියනවා. ඒකේ තිබෙන කොමිෂන් සභා සියල්ල නැවත ස්ථාපිත කරන්න කියනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I pity the ignorance of the Member regarding the Constitution. If he says and if his Party Leader is agreeable that it is not necessary to attend, then it is a violation of the Constitution. If the Leader of the Opposition agrees to what this Member of Parliament says - [*Interruption.*] He has no knowledge of the Constitution, Sir. - [*Interruption.*]

He talks about - [*Interruption.*] No, Sir. if he is a member, according to the Constitution he has not resigned. The most important thing is, he has not resigned from the Parliamentary Council. මේ මොනවා කථා කරනවාද? තමුන්නාන්සේ-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, If there is anything against the Standing Orders, it will be expunged.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Hon. Deputy Chairman of Committees, can you ask him to go out because I want to speak. This is a very good Debate that we are having. So, ask him to go out and wait outside if he cannot listen.

මම ඔබතුමාට බොහොම ගෞරවයෙන් මේ කියන්නේ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැවත ස්ථාපිත කරන්නට, පොලිස් කොමිසම ස්ථාපිත කරන්නට ජනාධිපති ලේකම්තුමා විසින් පත් කරපු ප්‍රධාන කමිටුවක් තීන්දු ගනිමින් ඉන්න වෙලාවක, මේ ක්‍රියාකාරකම් ටික ආපසු අනික් පැත්තට කරකවන්න අස්වර් මන්ත්‍රීතුමා කල්පනා කරනවා. මම දන්නේ නැහැ එතුමා මොකක්ද මේ කරන්නේ කියලා. මේ කාරණාත් එක්ක අප දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන නිසා තමයි අපි ඒකට පැමිණෙන්නේ නැත්තේ. එය බොහොම පැහැදිලියි. [බාධා කිරීමක්] තමුන්නාන්සේට ඒවායින් නිදහස් වෙන්න බැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Dayasiri Jayasekara, your time is over.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
No. He did not allow me to speak.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Then, you are going to take more time from your side.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
He took two or three minutes from my allotted time.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, no. The Opposition can take only half an hour. You have already taken more than half an hour.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The Hon. Azwer has taken 11 minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Opposition has already taken more than 30 minutes.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තව විනාඩි දෙක තුනක් දෙන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Then, you have to speak after -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
I will conclude.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, we can speak for one hour. Of that, I can get 10 minutes, the Seconder can get five minutes and the Hon. Dayasiri Jayasekara can get -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, no. You have half an hour.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I know that. There is another 15 minutes time.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
He is only the third speaker.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Let me finish in another two or three minutes, the time that was taken by the Hon. Azwer. I will wind up in another two or three minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Eran Wickramarathne has also taken nine minutes. Now, please wind up.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම තව විනාඩි දෙකක් ගන්නවා. මට කථාව අවසන් කරන්න දෙන්නේ නැතිව බාධා කරනවා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණාව කියා ගෙන ආවා. නමුත් මට කථා කරන්න ඉඩ දුන්නේ නැති නිසා මේ කියන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවලින් විවිධ රූපවාහිනී ආයතනවලට අද වන විට කොයි තරම් මුදලක් ගෙවන්න තිබෙනවාද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ advertisements

[ගරු දයාසිරි ජයසේකර මහතා]

සඳහා ඒ අය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට මිලියන දහයකට වැඩිය ණය ගෙවන්න තිබෙනවා. ලේක්හවුස් එකට ලක්ෂ 90කට, 100කට වැඩිය ණය ගෙවන්න තිබෙනවා. ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නමින් ගත්ත ඒවා. ඒ කාලයේ භාණ්ඩාගාරික විධියට හිටපු මංගල සමරවීර මැතිතුමාගෙන් තමයි දැන් මේවා ගැන ප්‍රශ්න කරන්නේ. දැන් භාණ්ඩාගාරික ලෙස ඉන්නේ වෙනත් කෙනෙක්. තමන්ගේ ආණ්ඩුවක් තියාගෙනත්, ඒ සල්ලි ටිකවත් නැවත රාජ්‍ය ආයතනවලට දෙන්න බැරි නම් කොහොමද මේ රටේ නැවත අප මේවා ගැන කථා කරන්නේ? විනිවිදභාවය ගැන අප කථා කරන්නේ කොහොමද? ඒ නිසා මම බොහොම කරුණාවෙන් ඔබතුමන්ලාට මේ කාරණය කියන්න කැමැතියි. දෙපැත්තක් තියෙන්න පුළුවන්. විපක්ෂයක් වෙන්නත් පුළුවන්, ආණ්ඩුවක් වෙන්නත් පුළුවන්. නමුත් රටක් විධියට මේ විනිවිදභාවය තිබෙන්න ඕනෑය කියන ක්‍රියාකාරකම තුළ ඉඳගෙන අප මේ කටයුතු කරගෙන යනවා නම් කරුණාකර මෙවැනි ක්‍රියාදාමයක් ස්ථාපිත කරලා, නිවැරැදි බලතල දීලා, මැතිවරණ කොමිෂන් සභාවක් ස්ථාපිත කරන්න. එහෙම කරන්නේ නැතිව නිකම් මැතිවරණ කොමසාරිස් කෙනෙක් තියලා ඔහුව පණ නැති තත්ත්වයට පත් කිරීම නොවෙයි කරන්න තිබෙන්නේ. එතුමාට නිවැරැදි බලතල දීලා ඉන්දියාවේ ක්‍රියාත්මක වෙනවා වාගේ නිවැරැදි විධියට ක්‍රියාත්මක වෙන මැතිවරණ කොමිසමක් ලංකාව තුළ ස්ථාපිත කරන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.07]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කර ඇති යෝජනාව ගැන සාකච්ඡා වෙන අවස්ථාවේදී මා පළමුවෙන්ම කියන්න ඕනෑ එතුමා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම එක පැත්තකින් අප අගය කරන බව.

ඒ වාගේම මම තව කරුණක් සඳහන් කරන්න ඕනෑ. මෙම යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාව වන විටත් දේශපාලන පක්ෂ මැතිවරණ කටයුතුවලදී දරන ආදායම් හා වියදම් පිළිබඳ නීතියක් පාර්ලිමේන්තුවේ සම්මත කරලා, එය 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතේ අන්තර්ගත වන බවත්, මෙම කාරණය ඉටු කිරීමට සෑම දේශපාලන පක්ෂයක්ම බැඳී සිටින බවත් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව දන්නවා. නව නීති මාලාව අනුව මැතිවරණ කොමසාරිස්තුමාට ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ බලය පවරා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

That is just the Government's view. There is no compulsion.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

No, no.

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

There is a representation but there is no compulsion. What I am telling you is, at this particular moment, the Audit Report is accepted but it is not made compulsory.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

It is compulsory, Hon. Member. I am sorry. I disagree with you.

2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතේ 8(1) (4) යටතේ මෙසේ සඳහන් වනවා:

"ලියාපදිංචි විගණකවරයකු විසින් විගණනය කරන ලද සෑම පිළිගත් දේශපාලන පක්ෂයකම වාර්ෂික ගිණුම් ප්‍රකාශයේ පිටපතක් කොමිෂන් සභාව වෙත භාර දිය යුතු ය."

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

It is not a "must".

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

It is. Let me answer your question. You say it is not, but, the Election Commissioner has already cancelled four political parties for not following these procedures. එක්සත් ජාතික විකල්ප පෙරමුණ, ඊළාම් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විමුක්ති පෙරමුණ, විමුක්ති කොටි ජනතා පෙරමුණ, ජාතික සමඟි පෙරමුණ කියන පක්ෂ හතර මේ පනතේ වගන්ති අනුව කටයුතු නොකිරීම නිසා එම පක්ෂ අහෝසි කරලා තිබෙනවා. ඒ වාගේම තවත් පක්ෂවලට දැනුම් දීලා තිබෙනවා, මේ විස්තර ඉදිරිපත් කරන්න කියලා. මැතිවරණ කොමසාරිස්තුමා ඉෂ්ට කරන ඒ වැදගත් කාර්ය භාරය අපි-

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

Hon. Minister, I appreciate your comment on this. The reason for de-registering the four political parties was because they did not have any representation. It is not because of the Audit Report. I have got the Election Commissioner's statement.- [*Interruption*.]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

No, no. The Audit Report is also included in a section of this Act. It is not just the Audit Report. There are so many sections under which each party has to submit the Annual Report to the Election Commissioner. On that, the Election Commissioner can act. It is very clear.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඒක වැඩි දියුණු කරන්න ඔබතුමා අදහස් මතු කරපු එක හොඳයි. එක්සත් ජාතික පක්ෂය ගිණුම් ඉදිරිපත් කරලා නැහැ කියලා අපේ අස්වර් මන්ත්‍රීතුමාත් සඳහන් කළා. එක්සත් ජාතික පක්ෂය ගිණුම් ඉදිරිපත් කරලා

නැත්නම්, එම පක්ෂය ආදර්ශවත්ව ඒ කටයුත්ත කළ යුතුයි. මොකද, ලංකාවේ වැඩියෙන්ම සල්ලි හම්බ වන පක්ෂය එක්සත් ජාතික පක්ෂයයි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කෝ ඒ සල්ලි?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකද වුණේ? මේ කාරණය බලන්න. කවුද මේ මැතිවරණ නීතිය ගෙනාවේ?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒ සල්ලි ටික අරගෙන පැනලා ගියා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක ඉතින් මම අහන්න ඕනෑ, රාජකීය විද්‍යාලයේ හිටපු අපේ ශිෂ්‍යයෙකුගෙන්. ඒ ගැන මම කියන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, මේ ගිණුම් ඉදිරිපත් නොකිරීම නිසා මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රී ධුර පවා අහෝසි වෙලා තිබෙනවා කියලා. ඔව්, ඒ පැරණි නීතිය. කවුද ඒ නීතිය වෙනස් කළේ? එක්සත් ජාතික පක්ෂය ඒ නීතිය අහෝසි කළා. මන්ත්‍රීවරයෙකු, අපේක්ෂකයෙකු මැතිවරණයට ගිය වියදම් ඉදිරිපත් කිරීමේ නීතිය අලුත් නීති ගෙනැල්ලා අහෝසි කළේ එක්සත් ජාතික පක්ෂයයි. ඒවායේ ඵල විපාක තමයි අද ඇති වෙලා තිබෙන්නේ කියලා රවි කරුණානායක මහත්මයාම කියනවා. පළාත් පාලන මැතිවරණ නීතිවල ඒ වගන්ති ඇතුළත් වනවා. ඒ නිසා මම දීර්ඝ වශයෙන් ඒ ගැන කථා කරන්නේ නැහැ.

මීට අතිරේකව මම තව කරුණක් කෙරෙහි අවධානය යොමු කරන්න කැමැතියි. මේ නව මැතිවරණ නීති හැදුවේ පාර්ලිමේන්තුවේ සර්ව පාක්ෂික කමිටුවකිනුයි. ඒ සඳහා තමුන්නාන්සේලාත් සහයෝගය දුන්නා.

අපි බොහොම දුර ගමනක් ඇවිල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතේ 2 (4) (ඈ) ඡේදයේ මෙසේ සඳහන් වනවා:

> "දේශපාලන පක්ෂවල හා දේශපාලනයෙහි කාන්තාවන්ගේ වඩාත් හොඳ නියෝජනයක් ඇතිවන බවට සහතික වීම සඳහා සෑම දේශපාලන පක්ෂයක් ම ඒ පක්ෂයේ නිලධාරීන්ගේ ලැයිස්තුවට කාන්තා නිලධාරීන් එක් අයකු හෝ ඊට වැඩි දෙනකු ඇතුළත් කිරීමට වග බලා ගත යුතු ය."

ඉතින් මෙක කරන්නේ නැති දේශපාලන පක්ෂ තිබෙනවා. කාන්තාවන් පිළිබඳව අපේ රටෙත්, ලෝකයේත් සාකච්ඡා වන අද වැනි අවස්ථාවකදී මේ ගැනත් අවධානය යොමු කරන්නට ඕනෑ. මේ නීතිය ක්‍රියාත්මක කරන්න මැතිවරණ කොමසාරිස්තුමා ගෙන තිබෙන පියවර අපි අගය කරනවා. ඒ වාගේම අඩු පාඩුකම් පෙන්වා දීලා, ඒවායේ නිවැරදි කිරීම් කරන්න මැතිවරණ කොමසාරිස්තුමා දරන උත්සාහය අපි මේ අවස්ථාවේ අගය කරනවා. මැතිවරණ ක්‍රමය වෙනස් වෙමින් පවතිනවා. ඒ නිසා විශාල අභියෝග කිහිපයක් තිබෙනවා. ඒ වෙනස් වන මැතිවරණ ක්‍රමයක් තුළ මේ පියවරවල් ගැනීමට විවිධ නව නීති මාලාවන් සකස් විය යුතුයි.

ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා සඳහන් කළා, ලෝකයේ මැතිවරණ දූෂණයන් සම්බන්ධ වාර්තාවක් ගැන. එම වාර්තාවේ වගන්ති කිහිපයක් කියවලා එතුමා කුමක් කියන්නට උත්සාහ දැරුවාද කියලා මට නම් තේරෙන්නේ නැහැ. මොකද, මැතිවරණයකට අපේක්ෂකයකු ඉදිරිපත් වුණාම එම අපේක්ෂකයා මැතිවරණ කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව නීතියක් තිබෙනවා. ඒ නීතිය අනුව තමයි කටයුතු කළ යුත්තේ. ඒ අනුව ඔහු වියදම් කරලා යම් යම් ප්‍රචාර කරනවා. යම් යම් බලවත් අයත් සිටිනවා. දැන් ඔබතුමන්ලාගේ පක්ෂයට වක්‍ර ආකාරයකින් ගුවන් විදුලි ප්‍රචාරයක්, ටෙලිවිෂන් ආයතනයක ප්‍රචාරයක් හිමි වෙලා තිබෙනවා නම් ඔබතුමන්ලාට එම ප්‍රචාරයේ දී විශේෂ වාසියක් හිමි වෙනවා. කොච්චර නැහැ කිව්වත් ඒක තමයි සිදු වන්නේ. තමුන්නාන්සේ ඒ සම්බන්ධයෙන් ලංකාව ගැන විතරක් කථා කරන්නට ඕනෑ නැහැ. ඇමෙරිකා එක්සත් ජනපදයෙත් ඒක සිදු වෙනවා. "Newsweek" සඟරාව එක අපේක්ෂකයකුට වක්‍ර විධියට සහයෝගය දෙනවා. මේක ලෝකයේ ඇති වී තිබෙන ප්‍රචාරක මාධ්‍ය තුළ මැතිවරණ ක්‍රමයන් සම්බන්ධ වෙමින් සමාජයේ ඇති වී තිබෙන දේවල්. සර්ව සාධාරණ යයි ඔබතුමා පෙන්වන්නට හදන American system එකෙන් මොකක්ද වුණේ? මැක්ගවර්ගේ මැතිවරණ කාර්යාලය වංචනික ලෙස හැම දෙයක්ම වාර්තා කළා. ඒ නිසා නික්සන් මැතිතුමාට මොකද වුණේ? ජනාධිපති ධුරයෙන් යන්නට සිදු වුණා. අපි ඇමෙරිකන් ක්‍රමය අගය කරනවා. නමුත් ඒකෙත් වැරදි හුඟාක් තිබෙනවා. මැතිවරණයේදී බුෂ්ට මොකද වුණේ? මියාමියේ මොකද වුණේ? ඡන්ද 52ක එහා මෙහා වීමක් සිදු වුණේ. What happened in the Al Gore's election? ඒ සම්බන්ධයෙන් චිත්‍රපටයක් තිබෙනවා. ඒක බලන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Sir, allow me to say this.

මා පළමුවෙන්ම කියන්නට ඕනෑ, මා ඇමෙරිකාව ගැන කිසිම දෙයක් සඳහන් කළේ නැහැ කියා. එක්සත් ජාතීන්ගේ සම්මුතිය ගැනයි සඳහන් කළේ. එපමණයි. දෙවනුව, ඔබතුමා කිව්වා, පෞද්ගලික දේපොළ එක එක අය එක එක විධියට හැම රටෙම භාවිත කරනවා කියලා. ඒකත් පිළිගන්නවා. මම කථා කළේ විශේෂයෙන්ම රාජ්‍ය දේපොළ අයුතු ලෙස භාවිත කිරීම ගැනයි. ඒක අද විතරක් වන දෙයක් නොවෙයි. මේක දිගින් දිගටම මේ රටේ සිදු වෙලා තිබෙනවා. ඒක නතර කරන්න අපි එකතු වෙලා ක්‍රියා කරන්න ඕනෑ කියන කරුණ තමයි මම කිව්වේ. අන්න ඒක ගැන - රාජ්‍ය දේපොළ ගැන - සඳහන් කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
බොහොම හොඳයි. එහෙම දේවල් සිදු වෙනවා නම් මැතිවරණ කොමසාරිස්තුමාට පූර්ණ බලය තිබෙනවා, ඒවාට මැදිහත් වන්න. ඒවා වළක්වන ක්‍රමවේදයකට අපි යන්නට ඕනෑ කියන කාරණය තමයි අපිත් මේ කියන්නේ. තමුන්නාන්සේලා එකතු වෙලා ඒකට සහයෝගය දෙන්න. අලුත් දේ නිර්මාණය කරන්න පාර්ලිමේන්තුවට බලයක් තිබෙනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අදහස් කිහිපයක් ඉදිරිපත් කළා. අපි ඒවා අගය කරනවා. නමුත් ඒවායේ අඩු පාඩුකම් සිදු වෙලා තිබෙනවා. ඒ යටගියාව වෙනස් කරමින් මේ රජය කටයුතු කරනවා.

තමුන්නාන්සේගේ යෝජනාව දැන් නීතියේ පවතින දෙයක් කියන ටික සඳහන් කරමින් ඒකට අලුතෙන් එකතු කළ යුතු දෙයක් සුවිශේෂව තිබෙනවා ද කියන එක ගැන සැකයක් තිබෙන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Ravi Karunanayake. You have five minutes.

[අ.භා. 3.18]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ අවස්ථාවේදී ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාටත්, ගරු දයාසිරි ජයසේකර මැතිතුමාටත්, අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාටත් මගේ ස්තුතිය පුද කරනවා. මා පාර්ලිමේන්තුවේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනාවක් ඉදිරිපත් කරන්නේ, බුද්ධිමත් මන්ත්‍රීවරුන්ටයි. පාර්ලිමේන්තුවේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

සියයට එකක් විතර ඉන්නවා. මා යෝජනා ඉදිරිපත් කරන්නේ ඒ වාගේ අයට නොවෙයි කියන එකත් මා මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. ඒ අතර මා මෙතැන කථා කරන්නේ කවුද හරි කියන එක ගැන නොවෙයි; කුමක් ද හරි කියන එක ගැනයි. මෙතැන යම් වැරැද්දක් වෙලා තිබෙනවා නම් කොයි කාලාන්තරයක වුණා ද කියන එක නොවෙයි අවශ්‍ය වන්නේ. ඒ වැරැද්ද නිවැරදි කිරීමයි අවශ්‍ය වෙන්නේ. මා නැවත කියන්නේ මේ නීතියේ තිබෙන ක්‍රියාපටිපාටිය තුළ වාර්ෂිකව විගණන වාර්තාව -

ගරු පී. පියසේන මහතා
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Piyasena, what is the point of Order?

ගරු පී. පියසේන මහතා
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා දැන් කිව්වේ පාර්ලිමේන්තුවේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඉන්නවා -[බාධා කිරීමක්] "මයික්" එක දාන්න. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please give the mike to the Hon. Piyasena.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තවත්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කිව්වා -[බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please give the mike to the Hon. Piyasena. ගරු පී. පියසේන මන්ත්‍රීතුමාට "මයික්" එක දෙන්න.

ගරු පී. පියසේන මහතා
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)
එතුමන්ලාගේ ආණ්ඩුවෙන් තමයි, මේ රට විනාශ කළේ. දන්නවා නේ. ප්‍රේමදාස මහත්මයා මොනවා ද කළේ? කොටින්ට තුවක්කු දීලා මේ රට විනාශ කළා නේ. දැන් මෙතැන බුද්ධිමත් අය වාගේ කථා කරන්න එපා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, is there a point of Order in that? Why are you allowing him?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! That is not a point of Order.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, you are allowing the Government side to waste time.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, it is only just now that I heard what the Hon. Piyasena was raising.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
But, you hear it immediately when we tell you something.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ravi Karunanayake, you carry on.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, you must have a sense of decency when you conduct the House from there. All I say is, එක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තවත්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කිව්වා. නමුත් මා කියනවා, මම මෙතැන කිව්වේ," සියයට 99ක්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නොවෙයි කියා" යි. සියයට එකක්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වෙන්න පුළුවන්. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ravi Karunanayake, do not use that word.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා කිව්වේ, "සියයට 99ක්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නොවෙයි" කියායි. Sir, always, there is a majority and a minority.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, you cannot say that. You can address the Hon. Members by their names.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You can have your own interpretation.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I will get that word expunged from Hansard. - [*Interruption.*]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I beg your pardon?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඒ වචන expunge කරනවා, හැන්සාඩ් වාර්තාවෙන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You give an interpretation to that. I am saying with responsibility that there is 1 per cent of

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

in this House, but 99 per cent of the Members are not. You can give any interpretation you want [*Interruption]*

ඉඉඉඉ

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You said that word. You cannot use that word. Now, you carry on.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, what is the point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, it is highly abominable for a

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

person to cast aspersions on the Chair, which he cannot do. So, he must withdraw it himself or, Sir, you have the

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

right, according to the Standing Orders, to ask him to withdraw that. Who is the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

He is the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

No one else in this House is a

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

except for him.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I have already ordered to expunge that word. Hon. Ravi Karunanayake, you carry on.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එම නිසා මේ අවස්ථාවේදී අප කියන්නේ, ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ රටේ රජයේ දේපළ අනිසි ලෙස දේශපාලන පක්ෂ පාවිච්චි කරනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මතක් කළා වාගේ රූපවාහිනී සංස්ථාවට මේ මොහොතේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ලක්ෂ 400ක් ගෙවන්නට තිබෙනවා. ඒ වාගේම පොදුජන එක්සත් පෙරමුණෙන් ලක්ෂ 90ක් ගෙවන්නට තිබෙනවාය කියා වාර්තා කර තිබෙනවා. මේවා මුල්කොට ගෙන තමයි අප තීරණය කර තිබෙන්නේ බලයේ ඉන්න දේශපාලන පක්ෂ අනිසි ලෙස මේවා පාවිච්චි කරනවාය කියා. ස්වාධීන කොමිෂන් සභා නැති වීමේ ප්‍රශ්නය තමයි තිබෙන ලොකුම පාඩුව. එම නිසා කරුණාකර මේක නිවැරදි කිරීමක් තමයි අපට අවශ්‍ය වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්දියාවේ තිබෙන ක්‍රමවේදය අනුව යම් පුද්ගලයකු යම් ප්‍රමාණයකට ලක්ෂ දෙකකට වඩා වියදම් කළොත් ඒ මුදල් කොහොමද ලැබෙන්නේ කියන එක ප්‍රකාශ කිරීම අවශ්‍යයි. අප වාගේ මන්ත්‍රීවරු අවුරුදු 19ක් අපේ වත්කම් බැරකම් ප්‍රකාශ - assets and liabilities - ඉදිරිපත් කර තිබෙනවා. පිරිසිදු දේශපාලනයට අවතීර්ණවෙලා තිබෙන අපට යම් අය චෝදනා කළාට අපේ ඇහේ ගැවෙන්නේ නැහැ. අප මේ යෝජනා ගෙන එන්නේ රට පිරිසිදු කිරීමටයි. මේ අයට රට අපිරිසිදු කිරීම අවශ්‍ය නම් ඒක තියාගෙන කරන්න.

අපට අවශ්‍ය වන්නේ, ඉදිරි අනාගතය වෙනුවෙන් මේ කටයුත්ත කිරීමටයි. අද රටේ ආර්ථිකය නැති කර තිබෙන අවස්ථාවක, මේ දේශපාලන පක්ෂ ඒකට හේතු වෙලා තිබෙනවා නම් ඒ හේතු වන දේශපාලන පක්ෂ නිවැරදි කිරීමක් තමයි අපට අවශ්‍ය වන්නේ. [බාධා කිරීම්] මෙතැන කෑ ගහන අයට අපි කියන්න අවශ්‍යයි, මොළයට වඩා කට ලොකු නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ කියන එක. ඒ නිසා අර දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා කිව්වා වාගේ මෙතැන යම් විධියක අඩු පාඩුවක් තිබෙනවා නම් ඒක නිවැරදි කිරීමකුයි අවශ්‍ය වන්නේ. මා හිතන විධියට මේක අනිවාර්ය කිරීමක් කළොත් හොඳයි. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය වශයෙන් අප මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙනවා. වැරැද්ද නිවැරදි කිරීම වාගේම කවුරු හරිද කියන කාරණය අනුව නොවෙයි, කුමක් හරිද කියන කාරණය අනුව අපි මේක ඉදිරියට ගෙන යන්න ඕනෑ. ඒ නිසා සියලුම පාර්ලිමේන්තු ගරු මන්ත්‍රීවරු මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව ස්ථිර කරලා කැබිනට් මණ්ඩලයෙන් ඊට නෛතිකභාවයක් ඇති කරගෙන ව්‍යවස්ථාවට අඩංගු කළ යුතුයි කියන අදහස තමයි මේ අවස්ථාවේදී අප ඉදිරිපත් කර තිබෙන්නේ.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මාරාන්තික වකුගඩු රෝගය
உயிர் கொல்லி சிறுநீரக நோய்
DEADLY RENAL DISEASE

[අ.භා. 3.24]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"වසර 15කට ආසන්න කාලයකට පෙර අනුරාධපුර පදවිය හා කැබිතිගොල්ලෑව ප්‍රදේශ ආශ්‍රිතව පළමුවෙන්ම දක්නට ලැබුණු මාරාන්තික වකුගඩු අකර්මණ්‍ය වීමේ රෝගයට අදාළව මේ වන විට පොළොන්නරුව, අම්පාර, මොනරාගල, කුරුණෑගල, පුත්තලම, මහනුවර, බදුල්ල ආදී යාබද දිස්ත්‍රික්ක ගණනාවකින්ද රෝගීන් වාර්තා වන්නට පටන් ගෙන තිබේ.

මෙම වකුගඩු අකර්මණ්‍ය වීමේ රෝගය එකී ප්‍රදේශවල අවුරුදු 15 - 70 අතර වයස් කාණ්ඩයේ ජනගහනයෙන් 15%ක් පමණ ගොදුරු කරගෙන ඇති අතර, රෝගය උත්සන්නව ඇති සමහර ගොවි ගම්මානවල 30%ක් පමණ දෙනා වකුගඩු උවදුරට ගොදුරු වී සිටී. මේ වන විට දහස් ගණනක් මෙම රෝගය නිසා මිය ගොස් ඇත.

වකුගඩු අකර්මණ්‍ය වීම විවිධ හේතුකාරක නිසා සිදු වුවත්, මෙකී රෝගී තත්ත්වයට අදාළ වන්නා වූ නිශ්චිත හේතු සාධක හඳුනා ගැනීමට මෙතෙක් සමත් වී නැති අතර, රජයේ මැදිහත් වීම සහිත විශේෂ ආයතනයක් ඒ වෙනුවෙන් ස්ථාපිත කොටද නැත. ගෙවුණු වසර 15කට ආසන්න කාලය තුළ රෝගයේ හේතුකාරකයන් සෙවීම සඳහා විවිධ

සෞඛ්‍ය සංවිධාන හා පර්යේෂණ කණ්ඩායම් විසින් සිදු කෙරුණු පර්යේෂණ කිහිපයක ප්‍රතිඵල සමාජයේ කතාබහට ලක්ව තිබේ. රෝගය පැතිරෙන ප්‍රදේශවල පානීය ජලයේ අඩංගු අධික ෆ්ලෝරයිඩ් සාන්ද්‍රණය මේ සඳහා බලපාන බව මුලින්ම කියැවිණි. ඉන් පසුව ශරීරගත වන කැඩ්මියම් ප්‍රමාණය අධික වීමට පානීය ජලයේ අඩංගු ඇල් ගී විශේෂයක් මඟින් නිපදවන විෂ මූලික හේතුව බව මෙන්ම ශරීරගත වන අධික ආසනික් ප්‍රමාණය නිසා වකුගඩු රෝගය ඇති වන බව විවිධ කාලවලදී පර්යේෂණ මඟින් ප්‍රකාශයට පත් විණි. මේ අනුව පෙනෙන්නට තිබෙන්නේ රෝගය හා පානීය ජලය අතර සෘජු සබඳතාවක් ඇති බවය. ඒ නිසා නිශ්චිත විසඳුමක් සොයා ගන්නා තෙක් අවම වශයෙන් දැනට එම රෝගය ව්‍යාප්ත වෙමින් යන ප්‍රදේශවල ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීමේ විධිමත් ක්‍රමවේදයක් සැකසිය යුතු යැයි යෝජනා කරමි.

දැනට සිදුව ඇති පර්යේෂණ ප්‍රතිඵල පිළිගත හැකි විද්වත් සමූළුවක් තුළ සමාලෝචනයට බඳුන් කරන ලෙසත් රෝගයේ සියලු පැතිකඩයන් සොයා බැලීම සඳහා ආයතනයක් ස්ථාපිත කර ජනතාවට මෙම මාරාන්තික රෝගයෙන් වැළකී සිටීමේ හා දැනටමත් වැළඳී ඇති අයට දිවි බේරා ගැනීමේ මහක් පෙන්වා දීමට රජය මැදිහත් විය යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප අද මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කර තිබෙන්නේ, අපේ ශිෂ්ටාචාරයේ මුල් ගම්බිම් බවට පත් වෙලා තිබුණු පළාත් -මූලික වශයෙන් රජරට පළාත- කේන්ද්‍රගත කොට ගෙන සහ ක්‍රමානුකූලව අනෙක් පළාත් දක්වාත් මේ වන විට ව්‍යාප්ත වෙමින් තිබෙන ලංකාවේ මාරාන්තිකම, ප්‍රමුඛතම වසංගතයක් පිළිබඳවයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පිළිබඳව මේ පාර්ලිමේන්තුව තුළත්, ඒ වාගේම විවිධ විද්වත් ආයතන තුළත්, ඒ වාගේම මෙයට සෘජුව බැඳී සිටින අමාත්‍යාංශ තුළත් පුළුල් සාකච්ඡාවක් සිදු වෙමින් අපේ මැදිහත් වීමක අවශ්‍යතාව තිබෙන බව අප විශ්වාස කරනවා. මෙතැන අපට තිබෙන්නේ දේශපාලනමය ප්‍රශ්නයක් නොවෙයි. මෙය අප ඉතා හොඳින් තේරුම් ගත යුතු අවස්ථාවකටයි ඇවිල්ලා තිබෙන්නේ.

මේ මහ පොළොව තමන්ගේ ප්‍රධාන ජීවනෝපාය බවට පත් කොට ගෙන තිබෙන, අනෝරා වැස්සේ තෙමෙමින්, මහා අව් කාෂ්ටකයේ වේලෙමින් මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා තමන්ගේ ජීවිතයම වැය කරන, පරම්පරා ගණනාවක ඉතිහාසය පොදි බැඳගෙන සිටින, ඒ වාගේම අද අතිශය පීඩාවට පත්වී සිටින ජන ජීවිතවලට ඇති වී තිබෙන දැවැන්තම බේදවාචකය මෙයයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ පළාත්වල පැතිරී තිබෙන මේ රෝගය නිසා ඒ ජනතාව මුහුණ දී තිබෙන ගැටලු කෙරෙහි අවධානය ලක් නොකොට, ඒ පිළිබඳව සැලකිල්ලක් නොකොට, මනසක් ඇති කෙනෙකු, කනක් ඇහෙන කෙනෙකු, ඇසක් පෙනෙන කෙනෙකු මානව වර්ගයක කෙනකු හැටියට ජීවත් වීම සුදුසුය කියලා මා හිතන්නේ නැහැ. ඒ තරමට බරපතළ වූ බේදවාචකයක් අද පැතිර යමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා හිටියා නම් වඩාත් හොඳයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ඉන්නවා. මම හිතන්නේ එතුමා ඇමතිතුමා වෙනුවෙන් පිළිතුරු ලබා දෙයි. මේ පාර්ලිමේන්තුවේදී අපි ඒවාට වගකිව යුත්තේ කොච්චරද කියලා මම හිතන්නේ නැහැ. ඒක නොවෙයි වැදගත්කම. මේ ඇති වී තිබෙන බේදවාචකය අපි මොන තරම් බැරෑරුම් ලෙස තේරුම් ගන්නවාද, ඒ සඳහා අපි සොයා ගත යුතු පිළියම් මොනවාද, ඒ සඳහා අපි අර ගෙන තිබෙන ක්‍රියා මාර්ග, අදහස් සහ යෝජනා පිළිබඳව පුළුල් කථිකාවතක අවශ්‍යතාව තමයි මා මතු කරන්නේ. ඒ හැර වෙන කිසිවක් නොවෙයි.

විශේෂයෙන්ම රජරට පළාත කේන්ද්‍ර කර ගෙන සිටින ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා මේ අවස්ථාවේ හිටියා නම් වඩාත් හොඳයි. නියෝජ්‍ය ඇමතිතුමා ඉන්න එක ගැන මා විරෝධය පළ කරනවා නොවෙයි. ඡන්ද කාලයේ "රජරටින් අගමැතිවරයෙක්" කියලා පෝස්ටර්ස් ගහලා තිබුණා. එහෙව් එකේ එතුමා හිටියා නම් වඩාත් යෝග්‍යයි. එතුමා 2012 ඔක්තෝබර් මාසයේ 18 වැනිදා කැබිනට් තීන්දු තීරණ දැනුම් දෙන මාධ්‍ය සාකච්ඡාවේදී කියනවා මා දැක්කා, මෙම පළාත් තුළ ජීවත් වන ජනතාවගෙන් සියයට 15කට ආසන්න පිරිසකට මේ රෝගය පැතිරී තිබෙනවා කියලා. කෘෂිකර්ම අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාත් මේ සියයට 15 කියන ප්‍රතිශතය මීට පෙර පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කළා මට මතකයි. ඒ වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ප්‍රකාශයට පත් කළා යැයි කියා අප විශ්වාස කරන වාර්තාව අනුවත් එහෙමයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙකද ඒ වාර්තාව කියලා නිශ්චිතවම මා දන්නේ නැහැ. මොකද, සෞඛ්‍ය අමාත්‍යාංශයට හෝ කෘෂිකර්ම අමාත්‍යාංශයට නිල වශයෙන් මේ වාර්තාව ලැබුණා නම්, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිශ්චිත ලෙස ඉදිරිපත් කොට තිබෙන වාර්තාව මේකයි කියන එක තවමත් මේ පාර්ලිමේන්තුවට හෝ මාධ්‍ය හරහා රටට හෝ ඉදිරිපත් කොට නැති නිසා. ඒ නිසා මේ මා සතුව තිබෙන්නේ ඒ වාර්තාව කියලා මා හිතනවා. ඒක නොවෙයි නම් ඔබතුමන්ලාගේ වගකීම තමයි සත්‍ය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. මා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිකුත් කරන ලද ඒ සම්මක්ෂණ වාර්තාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න, ඒක මේ මන්ත්‍රීවරුන් අතට පත් කරන්න කියලා. ඊට පසුව එහි සඳහන් කරුණු පිළිබඳව අපි සාකච්ඡා කරමු. අපි විවාද කරමු. මොකද, අපි මුහුණ දී සිටින්නේ ඒ පළාත්වල සියයට 15ක ජනතාවගේ ඉරණම පිළිබඳ බේදවාදකයටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඒ වාර්තාවේත් එක තැනක කියනවා ඒ ප්‍රමාණය සියයට 15ක් කියලා. සියයට 15ක් කියන්නේ කොච්චරද? අපේ ගරු තිස්ස කරල්ලියද්ද ඇමතිතුමා දන්නවා, ආසන්න වශයෙන් ගත්තොත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ 8,55,562ක් ජනතාව ජීවත් වෙන බව. ලක්ෂ අටක් අටහමාරක් විතර. එයින් සියයට 15ක් කියන්නේ 1,28,334ක්. ඒ කියන්නේ සෞඛ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශයේ, කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රකාශයේ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවේ අඩංගු වන ප්‍රතිශතය නිවැරදි නම්, රජරට මේ රෝගය වැලඳී තිබෙන පිරිසේ ප්‍රමාණය 1,28,334යි. මා ඒක හරියටම දන්නේ නැහැ, ඒක ඔබතුමන්ලා කියන්න ඕනෑ. පොළොන්නරුවේ ජීවත් වන ජනගහනය 4,03,859යි. ඒ අනුව රෝගය වැලඳී සිටින ප්‍රමාණය 60,578ක් විය යුතුයි. බදුල්ලේ ජීවත් වන ජනගහනය 8,11,022යි. ඒ අනුව රෝගය වැළඳී සිටින ප්‍රමාණය 1,21,683ක් විය යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ දිස්ත්‍රික්ක තුන පමණක් පදනම් කර ගත්තොත් ආසන්න වශයෙන් ලක්ෂ හතරකට අධික පිරිසක්. මේ සංඛ්‍යා දත්ත නිවැරදිද කියන එක පිළිබඳව අපට විවාදයක් තිබෙනවා.

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ඔබතුමා කියන සංඛ්‍යා දත්ත කොයි අවුරුද්දටද අදාළ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එකක් තමයි, 2012 ඔක්තෝබර් මාසයේ 18 වැනිදා ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා කැබිනට් තීරණ දැනුම් දීමේ සාකච්ඡාවේදී ප්‍රකාශ කළා, එම පළාතේ ජනතාවගෙන් සියයට 15කට වකුගඩු රෝගය වැලඳී තිබෙනවාය කියලා. කෘෂිකර්ම අමාත්‍යතුමාත් මේ පාර්ලිමේන්තුවේ විවාදයකදී කිව්වා සියයට 15ක් කියලා. මට ඒ

[ගරු අනුර දිසානායක මහතා]

දිනය මතක නැහැ. ඇත්තටම මම ඒක සෙව්වේ නැහැ. එතුමා සභාවේ සිටින නිසා ඒ ගැන සාක්ෂි දරයි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවේත් ඒක සඳහන් වෙලා තිබෙනවා. ඒකෙන් තමයි මම මේවා කියන්නේ. මේවා මා සොයා ගත් කරුණු නොවෙයි. ඒ නිසා අපට ඒවා පිළිගන්න සිද්ධ වෙනවා. අමාත්‍යවරු දෙදෙනෙක් සහ ලෝක සෞඛ්‍ය සංවිධානයත් කියලා තිබෙනවා, ඒ ප්‍රමාණය සියයට 15ක් කියලා. ඒක පිළිගත යුතු එකක් හැටියට අපි හිතනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම ගත්තොත් ලක්ෂ 4ක් තමන්ගේ මරණයේ දොරකඩ අභියස සිටිමින් එදිනෙදා ජීවිතය ගත කරමින් ඉන්නවා.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක)
(The Hon. Lalith Dissanayake)
එම සංඛ්‍යාව විසිදහස් එකසිය ගණනක් තමයි වෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ඒක මා දන්නේ නැහැ. එහෙම නම් මා සතුව තිබෙන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිවැරදි වාර්තාව නොවෙයිද?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක)
(The Hon. Lalith Dissanayake)
අපි වෙනම සමීක්ෂණයක් කරලා තිබෙනවා දිස්ත්‍රික්ක අනුව රෝහල්වලට ඇතුළත් වන පිරිස කොච්චරද කියලා. කොළඹ දිස්ත්‍රික්කය, ගම්පහ දිස්ත්‍රික්කය ආදි වශයෙන් සම්පූර්ණ වාර්තාවක් අරගෙන තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ඒක ඔබතුමා කියන්න. මම මේ කියන්නේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා කියපු එක අනුව, ගරු සෞඛ්‍ය ඇමතිතුමා කියපු එක අනුව සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාව අනුව. මට වෙන ඒවා අදාළ නැහැ.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක)
(The Hon. Lalith Dissanayake)
වකුගඩු රෝගය වැලඳී ඇති ප්‍රමාණය කීයද?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
වකුගඩු රෝගය වැලඳී ඇති ප්‍රමාණය ලක්ෂ 4කට ආසන්න වෙනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා කොහොමද හරියටම කියන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
නැහැ, මා කියනවා නොවෙයි. ඒ ප්‍රමාණය සියයට 15ක් කියලා මේ පාර්ලිමේන්තුවේදී මීට පෙර කිව්වා; සෞඛ්‍ය ඇමතිතුමා මාධ්‍ය සාකච්ඡාවේදී ප්‍රකාශ කළා; ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. ඒක මගේ සොයා ගැනීමක් නොවෙයි. ඒ ගැන මගෙන් ප්‍රශ්න කරන්න එපා. ඔබතුමන්ලා විසින් මීට පෙර ප්‍රකාශ කරන ලද සංඛ්‍යා දත්ත හා තොරතුරු මත අනුවයි මා මේ කියන්නේ. ඒක එහෙම නොවෙයි නම්, එදා සෞඛ්‍ය ඇමතිතුමා මාධ්‍ය සාකච්ඡාවේදී කළ ප්‍රකාශය වැරැදියි කියන්න. කෘෂිකර්ම ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේදී කරපු ප්‍රකාශය වැරැදියි කියන්න. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වර්තාව වැරැදියි කියන්න. මම හරිද වැරැදිද කියන එක නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. මා උපුටා ගන්නේ ඔබතුමන්ලා විසින් මීට පෙර අවස්ථාවලදී ඉදිරිපත් කර තිබෙන සංඛ්‍යා දත්ත හා තොරතුරුවලින්. ඒවා පදනම් කර ගෙනයි මා මේ කියන්නේ. එම සංඛ්‍යා පිළිබඳව අපි වෙනම විවාදයක් කරමු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අයගේ ජීවිතය කොහොමද ගත වෙමින් තිබෙන්නේ? ඒ රෝගය වැලඳීමට හේතු සාධකය සොයා ගෙන නැත්නම්, ඒ රෝගය වැලඳීම වැළැක්විය හැක්කේ කෙසේද කියලා සොයා ගෙන නැත්නම්, රෝගය හැදිලා තිබෙන අයට කළ යුත්තේ කුමක්ද කියලා හොයා ගෙන තිබෙන කුඩා ප්‍රමාණයේ විසඳුම් ප්‍රමාණවත් නැත්නම් ඔවුන් මරණයේ දොරකඩ අභියස නොවෙයිද සිටින්නේ? මේ වන විට තිබෙන සංඛ්‍යා දත්ත හා තොරතුරු අනුව රජරට පළාතේ දසදහසකට ආසන්න පිරිසක් මියැදිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය තිස් අවුරුදු යුද්ධයේදීවත් දසදහසක් මිය ගියේ නැහැ. ඒ නිසා ඔවුන්ගේ ජීවිතත් එක්ක ගැට ගැසී තිබෙන බරපතළම බේදවාචකය තමයි මේ තිබෙන්නේ. ඒ පිළිබඳව තිබෙන ජාතික අවධානය කොපමණද? එය සැළකිල්ලට ලක් කොට තිබෙන ජාතික මෙහෙයුමක් තිබෙනවාද? එහෙම නැත්තේ ඔවුන් අපේ රටේ රජරට පළාතේ ඇත ගම්වල ඉපදුණු මිනිස්සු හන්දාද? ඔවුන් කැබැතිගොල්ලෑවේ හන්දාද? ඔවුන් මැදවච්චියේ හන්දාද? ඔවුන් ගිරාඳුරුකෝට්ටේ හන්දාද? ඔවුන්ද මේ රටේ දෙමව්පියන්ට සුජාත වූ දරුවෝ; මිනිස්සු. ඒ අයටත් අපි මිනිසුන් ලෙස සැලකිය යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ දැවැන්ත බේදවාචකය නිසා අද රජරට පළාතේ මිනිසුන් මුහුණ දී තිබෙන බියමුසු තත්ත්වය සරල නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔවුන් ලේ පරීක්ෂණයක් සඳහා යන්නේ දෙගිඩියාවෙන් යුතුව. ඔවුන්ගෙන් ඇහුවොත් ඒක කියයි. ලේ පරීක්ෂණයකින් ඔවුන්ට කිව්වොත් ඔබට මේ රෝගයේ ලක්ෂණ පෙන්නුම් කරනවා කියලා, එතැන් සිට ඔවුන් මානසිකව බිඳ වැටිලා, ශරීරය වැහැරෙමින්, හිස කෙස් සුදු වෙමින්, හම රැළි වැටෙමින් ඉතා වේගයෙන් අබල දුබල තත්ත්වයට පත් වෙනවා. මේ රෝගය වැලඳී ඇතැයි කියන සංඥාව ලැබීමෙන්ම, ඒක ඇසීමෙන්ම ඔවුන් එම තත්ත්වයට පත් වෙනවා. ඒක තමයි තත්ත්වය. ඒක අහන කොටම ඔවුන්ගේ ජීවිත පිළිබඳ විශ්වාසය ඔවුන්ට නැති වෙලා යනවා; ඔවුන්ගේ ජීවිතය පිළිබඳ වටිනාකම ඔවුන්ට නැති වෙලා යනවා. ඒ නිසා අද බොහෝ අය එය මානසිකව විඳ දරා ගනිමින්, විශාල මානසික අභියෝගවලට මුහුණ දෙමින් ජීවත් වෙනවා. එහෙම මිනිසුන් දහස් ගණනක් රටක ජීවත් විය යුතුද? ඒ නිසා අප ගත යුතු පළමුවැනි ක්‍රියා මාර්ගය නම් මේ රෝගය සඳහා වන හේතු කරක සොයා ගන්න එකයි; ඒ හේතු කාරක වැළැක්වීම සඳහා ක්‍රියා මාර්ග ගන්න එකයි. දෙවනුව, දැන් ඉන්න ලෙඩුන්ට අවශ්‍ය උපකාර ලබා දෙන එකයි.

ඔවුන්ගේ ජීවිතවල එම ප්‍රශ්නය පමණක් නොවෙයි තිබෙන්නේ. ඔවුන්ගේ පවුල්වල තත්ත්වය මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා අවස්ථා ගණනාවකදී මාධ්‍ය හරහා දැක්කා ඔවුන්ගේ බිරින්දෑවරු ඇවිල්ලා කියනවා, "මා ඔහු සමඟ විවාහ වෙලා අවුරුදු විස්සයි, විසිපහයි ජීවත් වුණේ. මගේ ඇස් පනා පිටම ඔහු වැහැරෙන්න පටන් ගත්තා; ඔහු මිය ගියා. අද මට ගෙවල්වල මෙහෙකාරකම් කරලා දරුවෝ තුන් දෙනා නඩත්තු කරමින් ජීවත් වෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ" කියලා. දැන් ඒ මුළු පවුල් සංස්ථාවම බිඳ වැටිලායි තිබෙන්නේ. දරුවෝ පාසල් යන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර තැන්වල ඒ බිරින්දෑවරු ඉතාමත්ම දු:ඛ දෝමනස්සයන්ට පත්වෙලා තිබෙනවා. ඔවුන්ගේ මුළු පවුල් සංස්ථාවම දෙදරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර තැන්වල එක පවුලේ හතර දෙනෙකුට, පස් දෙනෙකුට, හය දෙනෙකුට ලෙඩ රෝග හැදිලා. මෙහා ගෙදර කෙනාට හැදිලා එහා ගෙදර කෙනා මැරෙනවා. ඔහු කියනවා, ඒක දැකලා මැරි මැරි ජීවත් වෙනවාය කියලා. මට එක වෙලාවක දී රජ රට පළාතේ මන්ත්‍රීවරයෙක් කිව්වා, - මෙතුමා දැන් මේ ස්ථානයේ නැහැ. අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කිව්වා,- ගිය සතියේ එතුමා අනුරාධපුරයේ මළ ගෙවල් අටකට ගියාය, ඒ අට දෙනාගෙන් හය දෙනෙකුම වකුගඩු රෝගය නිසා මිය ගිහිල්ලාය කියලා. මිනිසුන් ඉබාගාතේ මිය යන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා නේද? ඒ තත්ත්වය පිළිබඳ අවශ්‍ය අවධානය යොමු කළාද? මම කියන්නේ, මේ සඳහා අවධානය යොමු කර මදි, ප්‍රමාණවත් නැහැ, හොයා ගෙන නැහැ, සැකැස්මක් නැහැ, ජාතික මෙහෙයුමක් නැහැ, ජාතික වැඩ පිළිවෙළක් නැහැ, ඔහේ අත් ඇරලා තිබෙනවා, ඉපදුණා නම් ඔහේ මැරිලා පලයල්ලා කියලායි. ඒක සාධාරණ නැහැ, ගරු ඇමතිතුමනි. එක පැත්තකින් ඒක සමාජ ජීවිතයට බලපෑම් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක ආර්ථික ජීවිතයට බලපෑම් කරලා තිබෙනවා. ඒ රෝගියා මිය යන්නේ තමන්ගේ මුළු දේපළත්, තමන්ගේ මුළු පවුලත් ඉතාමත් අසරණභාවයට පත් කරලා. ඉඩම් උගස් කියනවා; ගෙවල් උගස් කියනවා; කන කර උගස් කියනවා. මා දැක්කා, සමහර නාලිකාවලට ඇවිල්ලා වකුගඩු රෝගය වැලඳුණු රෝගීන් කියපු කථා. ඔවුන් කියනවා, පදවියේ සිට අනුරාධපුරයට ඇවිල්ලා බෙහෙත් අර ගන්න රුපියල් 15,000ක් වැය වෙනවාය කියලා. තව එක රෝගියෙකුට නුවර යන්න වෙලා තිබෙනවා. ඔහුට මාසයකට ආසන්න වශයෙන් රුපියල් 30,000ක් යනවාය කියලා කියනවා. රජ රට පළාතේ ගොවි අම්මා, තාත්තා කෙනෙකුගේ දරුවෙකුට වකුගඩු රෝගය නිසා මාසයකට රුපියල් 15,000ක්, 30,000ක් වැය කරන්න පුළුවන්ය කියලා ඔබතුමන්ලා හිතනවාද? එහෙම බැහැ. මේ බෙදවාචකයට ගොදුරු වුණු ජනතාව රජ රට පළාත අත් ඇර දමා ගිහින් තිබෙනවා. එය කිසිසේත් උචිත ක්‍රමයක් නොවෙයි. එය ශිෂ්ට සම්පන්න සමාජයක්; මිනිසුන් හැටියට හිතන සමාජයක්; කිසිසේත්ම පිළිගත යුතු තත්ත්වයක් නොවෙයි එම පළාත්වල නිර්මාණය වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒක කොහොමද තිබුණේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1990 දශකයේ මැද භාගයේ මේ වකුගඩු රෝගය පිළිබඳව හොයා ගන්න කොට ඉස්සෙල්ලාම වකුගඩු රෝගීන් හම්බ වුණේ අවුරුදු 50ට වැඩි අයගෙන්. කට්ටිය හිතුවා, කමක් නැහැ, අවුරුදු 50ක්වත් ජීවත් වේවිය කියලා. 2000 විතර වන කොට මේ වකුගඩු රෝගය වැලඳුණු අවුරුදු 40 අයත් හම්බ වෙන්න පටන් ගත්තා. 2005 විතර වන කොට අවුරුදු 30 අයත් හම්බ වෙන්න පටන් ගත්තා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් මේ වකුගඩු රෝගීන්ගෙන් සියයට 20ක්, අවුරුදු 20ට වඩා අඩු යෞවනයේ පෙළෙන තරුණයන් සහ දරුවන්. ඒ සියයට 20කගේ ජීවිත කොච්චර කාලයක් ද තිබෙන්නේ? මා එක වෛද්‍යවරයෙක් එක්ක සාකච්ඡා කරන කොට එතුමා කිව්වා, පියවර පහයි තිබෙන්නේ කියලා. පළමුවැනි, දෙවැනි පියවර, තුන්වැනි පියවර, හතරවැනි පියවර පසු කර පස්වැනි පියවරට ආවොත් මොකද වෙන්නේ? පස් වැනි පියවර කියන්නේ අපිට කරන්න දෙයක් නැහැ, මැරෙන්න අත් අරින්න වෙනවා, මැරෙන තුරු හොඳින් ඔහුට ජීවත් වෙන්න, රූක බලා ගන්න කියලා උපදෙස් දෙනවාය කියන එකයි. මේ රෝගීන්ගෙන් බහුතරයක් අද ඉන්නේ පස්වැනි පියවරේයි. ඒ පවුලට දීලා තිබෙන සංඥාව මොකක්ද? ඔහු මැරෙන එක කොහොමත් නියතයි. මා කියන්නේ එහෙම නොවෙයි. මේ රෝගය හේතු කොටගෙන ඔහු මැරෙන එක නියත බවට පත් වෙලා තිබෙනවා. හැබැයි ඒකට අද බෙහෙතක් නැහැ. තවදුරටත් බෙහෙත් කරලා වැඩක් නැහැ, ඔහු පස්වැනි පියවරේ ඉන්නේ, ඒ නිසා ඔහුගේ හිත සතුටු කරලා, බණක්, භාවනාවක් කරලා, පිරිත් ටිකක් කියලා, කන්න බොන්න දීලා, මැරෙන තුරු ඔහේ බලා ගන්න කියන එකයි. මේ රෝගීන්ගෙන් බහුතරයක් අද එම තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේක ජීවිතවල ප්‍රශ්නයක්; සමාජ ජීවිතයේ ප්‍රශ්නයක්; පවුල් ජීවිතයේ ප්‍රශ්නයක්; ආර්ථික ජීවිතයේ ප්‍රශ්නයක්. මේක මුළු රජ රටත්, ඒ ආසන්න දිස්ත්‍රික්කත් වෙළාගෙන තිබෙන මහා දැවැන්තම බෙදවාචකයක්. අපි රජ රට තිබුණු බෙදවාචකයන් ගැන අහලා තිබුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එක කාලයක දී රජ රට සොළී ආක්‍රමණය නිසා ජනගහනය ශූන්‍ය ප්‍රදේශ බවට පත් වුණා. ඊට පස්සේ මැලේරියා වසංගතය හේතු කරගෙන ජනගහනය ශූන්‍ය වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ පිළිබඳව අවධානය යොමු කරලා අපි විසඳුම් හෙව්වේ නැත්නම් තව අවුරුදු 25ක්, 30ක් යන්න කලින් මෙම රජ රට ජන ශූන්‍ය ප්‍රදේශයක් වන එක වළක්වන්න බැහැ. මිනිසුන්ට මේ ප්‍රදේශ අත් ඇරලා යන්න වෙනවා. තමන්ට ලැබෙන සුරතල් දරුවා පිළිබඳව අවුරුදු තුන, හතර වන කොට විශාල බලාපොරොත්තු ඇති කර ගන්නවා. නමුත් දරුවා අවුරුදු හත, අට වන කොට වකුගඩු රෝගියෙකු බවට පත් වෙනවා නම් මොකක්ද ඒ තත්ත්වය? ඔවුන් එම පළාත්වල ජීවත් වේවිද? ගරු කරල්ලියද්ද ඇමතිතුමා මේ කාරණය ගැන දන්නවා. සාධාරණද මෙක? ඒ නිසා මේකට විසඳුම් සෙවිය යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සඳහා අපි මාවත් දෙකක් අනුගමනය කරන්න ඕනෑය කියලා මා හිතනවා. එක මාවතක් තමයි, හේතුව සෙවීම පිළිබඳ පර්යේෂණ හා වැළැක්වීමේ ක්‍රියා මාර්ග.

දෙවන එක තමයි දැනට රෝගයට ලක් වී සිටින අයවලුන් වෙනුවෙන් ගත යුතු ක්‍රියා මාර්ග. මම හිතනවා, ඒ පාර්ශ්ව දෙක ඔස්සේ අපේ සාකච්ඡාව පවත්වාගෙන යාවිය කියා. හේතුව සෙවීම සඳහා පර්යේෂණ හා වැළැක්වීමේ ක්‍රියාමාර්ග. දැන් මොකක්ද හේතුව පිළිබඳව තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුල් කාල සීමාව තුළ මේක සොයා ගැනීම පිළිබඳව විශ්වවිද්‍යාල විද්වතුන් ආදී විවිධ පර්යේෂණ කණ්ඩායම්, මේ පිළිබඳව ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා පර්යේෂණ කළා. විවිධ අවස්ථාවල ඒ පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත් වුණා. මාධ්‍ය හරහා, ඒ වාගේම විවිධ ග්‍රන්ථ හරහා ඒ පර්යේෂණ වාර්තා

[ගරු අනුර දිසානායක මහතා]

ප්‍රකාශයට පත් කරලා තිබුණා. එක් එක් කාල වකවානුවලදී ඒ පර්යේෂණ වාර්තා එක් එක් නිගමනයන්ට එළඹෙන්න පටන් ගත්තා. මුල් කාල වකවානුවේදී කියන්න පටන් ගත්තා මෙය හැදෙන්නේ මතුපිට ජලය පාවිච්චි කිරීම හේතුකොටගෙන නොවෙයි ගැඹුරු ළිංවලින් ගන්නා ජලය මගින් මේ රෝගය හැදෙනවාය කියා වාර්තාවක් ආවා. මාධ්‍ය හරහා ඒක ප්‍රකාශයට පත් කළා. මතු පිට ජලයෙන් නොවෙයි ගැඹුරු පොළොවෙන් ලබා ගන්නා ජලය මගින් මෙය වැලඳෙනවාය කියා. රජ රට මිනිස්සුන්ට ඒක ඇත්තද නැද්ද කියා කිව්වේ නැහැ.

සාමාන්‍ය ජනතාව ඒකෙන් අවබෝධ කර ගත්තේ මොකක්ද? ළිංවල වතුර බිව්වාම මේක හැදෙනවාය; වැවේ වතුර බිව්වොත් හැදෙන්නේ නැහැ කියලායි. ඒ නිසා ජනතාව වැවේ වතුර බොන්න පෙළඹුණා. ඊට පසුව ටික කාලයක් යනකොට තව පර්යේෂණ වාර්තාවක් ඇවිල්ලා ඒකෙන් කිව්වා, ඒක වැවේ වතුර පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි, මේක ඇති වෙන්නේ ජලයේ ඇති වෙන ඇල්ගි වර්ගයක් හේතුකොටගෙනය කියා. ඒ පළාත්වල ඇල්ගි වගයක් පැතිරෙමින් යනවාය; ඒ ඇල්ගි වර්ගය හේතුකොටගෙනයි මේක හැදෙන්නේ කියා තවත් පර්යේෂණ කණ්ඩායමක් කිව්වා. ඊට පසුව ජනතාව මොකක්ද කල්පනා කළේ? ඒ ඇල්ගි වර්ගය හේතුකොටගෙන ළිඳේ වතුර බොන්නත් බැහැ; වැවේ වතුර බොන්නත් බැහැ කියා. ඊට පසුව ජනතාව බෝතල් කරන ලද ජාතීය ජලය පරිභරණයට පෙළඹුණා. ඒ සඳහා වැව් බැඳි රාජ්‍යයයි කියා අප හඳුනා ගන්නා රජ රට වතුර කඩ දමන්න පටන් ගත්තා. ඒක බිස්නස් එකක් වුණා. දැනුත් එහෙමයි. ලොරිවල පටවා ගෙන ඒ පළාතේම වතුර කඩ දමා තිබෙනවා. ඊටපසුව ඒ රෝගීන් වතුර කඩවලින් වතුර අරගෙන පාවිච්චි කරන්න පටන් ගත්තා. ඊටපසුව ආපු පර්යේෂණ කණ්ඩායමක් කිව්වා, මේකට හේතුව නෙළුම් අල කෑමය කියා. නෙළුම් අල කෑවාම මේක හැදෙනවාය; ඒ නිසා නෙළුම් අල කනවා නම් ඒවායේ අතරේ තිබෙන කුහරය සුද්ධ කරලා කෑමට ගන්නය කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගම්වලට හිටපු අය වශයෙන් අපි දන්නවා, නෙළුම් අල සුද්ධ කරන්නේ කොහොමද කියා. නෙළුම් අලේ කුහර සුද්ධ කරන්න ජූකී මැෂින් එකක්වත් දමන්න වෙනවා. එහෙම නැතිව නෙළුම් අලවල කුහර සුද්ධ කරන්න බැහැ. ජනතාව තමන්ගේ ශරීරයට ප්‍රෝටීන් සහිත ආහාරයක්, පිෂ්ඨය සහිත ආහාරයක් එකතු කර ගත්තේ නෙළුම් අල පාවිච්චි කරලායි. එතකොට ඒ ජනතාව නෙළුම් අල කන එක නතර කළා.

ඊට පසුව තව පර්යේෂණ කණ්ඩායමක් ඇවිල්ලා කියන්න පටන් ගත්තා, මෙහෙම වන්නේ මේ වැවේ ඉන්න මත්ස්‍යයන් පරිභෝජනය කිරීම හේතුකොටගෙනය කියා. වැවේ ඉන්න මත්ස්‍යයන්ගේ බඩේ ඇල්ගි වර්ගයක් හැදෙනවාය ඒවා හේතුකොටගෙන වැව් මාළු පරිභෝජනයෙන් මේක හැදෙනවාය කිව්වා. ගම්වල හිටපු අය දැලක් දමලා එහෙම නැත්නම් බිලී කොක්කක් දමලා වැවේ මාළුවෙක් අල්ලගෙන තමන්ගේ දරුවාට ප්‍රෝටීන් සහිත ආහාරයක් දුන්නා නම් ඒකත් නතර කළා, වැව් මාළු කෑවොත් මේක හැදෙනවාය කියා. කාලයක් එහෙම කිව්වා. ඊටපසුව ඊළඟ පර්යේෂණ කණ්ඩායම කිව්වා, මේකට හේතුව ඇලුමිනියම් භාජන පාවිච්චි කරන එකය, ඒ නිසා මැටි භාජන පාවිච්චි කළොත් හරිය කියලා. ඇලුමිනියම් භාජනවල වතුර දැම්මාම වතුරවල තිබෙන ක්ලෝරයිඩ් හා ඇලුමිනියම් ප්‍රතික්‍රියා කරලා ඒකෙන් ශරීරයට අහිතකර සංඝටක හැදෙනවාය. ඒ නිසා මේ රෝගය හැදෙනවාය කිව්වා. එතකොට ජනතාව මොකද කළේ? ඇලුමිනියම් භාජන අයින් කළා, ඇලුමිනියම් කළ අයින් කළා. මට මතකයි තිස්ස කරල්ලියද්ද ඇමතිතුමා ගිහින් වළං බෙදුවා. මතක නේද ඡන්දෙ කාලයේදී-

ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
නැහැ, නැහැ. ඡන්දෙ කාලයේදී වළං බෙදුවේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සමාවෙන්න, ඡන්දෙ කාලයේදී නොවෙයි. එච්චර කලබල වෙන්න එපා. එතුමා නිකම් වළං බෙදුවා. එතුමාට කණ්ඩායමක් කිව්වා, මේකට හේතුව ඇලුමිනියම් භාජන පාවිච්චි කිරීමය, ඇලුමිනියම් කළ පාවිච්චි කිරීමය කියා.

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
ඇත්ත වශයෙන්ම බාල වර්ගයේ ඇලුමිනියම් භාජන පාවිච්චියත් ඔය රෝගයට බලපානවාය කියා පරීක්ෂණයකින් කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, මම මේ කියන්නේ ඒක හරිද වැරදිද කියන එක නොවෙයි. එහෙම කියනවාය කියන එකයි.

ඊට පස්සේ තව කණ්ඩායමක් ඇවිල්ලා කිව්වා, "නැහැ, මේකට හේතුව කැඩ්මියම් හා ආසනික්" කියලා. පොහොර පාවිච්චි කිරීම හේතු කොටගෙන, කෘමි නාශක පාවිච්චි කිරීම හේතු කොටගෙන ඒවා පොළොවට යනවා; ඒවා ජලයට මිශ්‍ර වෙනවා; ඒවා හාල්වලට එනවා; හාල් කාපුවාම බඩට යනවා; බඩට ගියාම මුළු ශරීරය පුරාම පැතිරෙනවා, ඒ නිසා මේ වකුගඩු රෝගීන් පරීක්ෂා කර බැලුවාට පස්සේ ඔවුන්ගේ ආසනික් ඝනත්වය වැඩිවෙලා තිබුණා, කැඩ්මියම් ඝනත්වය වැඩිවෙලා තිබුණාය කියලා ඔන්න පරීක්ෂණයක් ආවා. මේක මොන තරම් සහතික ද කියලා කිව්වොත් නාථ දෙවියෝත් කිව්වාය කිව්වා. එහෙම කිව්වා නේද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ධම්මිකා මැණිකේගේ-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියමින් සිටියේ ඉතිහාසය පිළිබඳවයි. පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ධම්මිකා මැණිකේ මැතිතුමියගේ සිට නාථ දෙවියෝ දක්වා විවිධ කණ්ඩායම් මේකට හේතු කියලා තිබෙනවා. දැන් මම කියන්නේ රජය මේකට පිළිගන්නා නිශ්චිත හේතුව කියන්න කියලායි. දැන් එහෙම කරන්න ඕනෑ. මොකක්ද පිළිගන්නා නිශ්චිත හේතුව? ඊට පස්සේ මේකට පර්යේෂණ ගණනාවක් සිද්ධ වෙමින් ආවා. 2008 අවුරුද්දේ දී නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ඉල්ලා හිටියා, "මේ පිළිබඳව පර්යේෂණයක් කරන්න" කියලා. ලෝක සෞඛ්‍ය සංවිධානය ඒකට මිලියන 30ක් දුන්නා. සෞඛ්‍ය අමාත්‍යාංශය මිලියන 70ක් දුන්නා. මිලියන 100ක් දීලා මේ වාර්තාව හැදුවා. මේ වාර්තාව සකස් වන කාලය තුළ අනුවාර්තා - ඒකට කිව්වේ, "Mission Report" කියලායි. මා දන්නේ නැහැ, ඇත්තටම ඒකේ තේරුම. "Mission Report" කියලා කිව්වා.- තුනක් ඉදිරිපත් කළා. මා ළඟ ඒ reports තුනත් තිබෙනවා. අනුවාර්තා තුනක් ඉදිරිපත් කළා. අතරමැදි වාර්තා තුනක් ඉදිරිපත් කළා. දැන් ඉදිරිපත් කරලා තිබෙනවා, "Final Report" කියලා එකක්. මේකද ගරු හාමුදුරුවනේ ඔය කියන වාර්තාව? මට ඇත්තටම ඒ කාරණය දැනගන්න ඕනෑ. දැන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම කාරුණික ඉල්ලීමක් කරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ නේ මේ සම්බන්ධව දැන් ක්‍රියාත්මක වෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මට ඔබතුමා කරුණාකරලා කියන්න, දැන් ඔබතුමා සතුව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඉදිරිපත් කොට තිබෙන වාර්තාව තිබෙනවා ද කියලා. පිටු කීයද, ගරු ඇමතිතුමනි? පිටු කීයක් තිබෙනවාද ඔකේ?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැහැ, ඒකයි මේකයි දෙකම එකක් ද කියලා බලන්න. පිටු 153ක් තිබෙන වාර්තාවක් තිබෙන්නේ. දැන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔය වාර්තාව සභාගත කරන්න කියලා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මම සභාගත කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අපේ හාමුදුරුවෝ සභාගත කරනවා, මේ වාර්තාව. ඒ කියන්නේ මේ වාර්තාව දැන් සභාගත විය යුතුයි. මොකද මේක හංගාගෙන ඉන්න බැහැ නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මේක ප්‍රසිද්ධ වාර්තාවක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. කොහේද ප්‍රසිද්ධ කළේ? මාධ්‍ය සාකච්ඡාවක් පවත්වලා, මෙන්න ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාව කියලා සමාජයට ඉදිරිපත් කළාද? පාර්ලිමේන්තුවේ නිරන්තරයෙන් උපදේශක කාරක සභාවේ දී මේ ප්‍රශ්නය මතුවනවා. ඒ අවස්ථාවක දී ඔබතුමන්ලා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට මෙන්න වාර්තාව කියලා ඉදිරිපත් කළාද? එහෙම නැත්නම් මේ පාර්ලිමේන්තුවේ දී විවිධ අවස්ථාවල දී ප්‍රශ්න නැඟෙනවා. ඒ අවස්ථාවක දී තමුන්නාන්සේලා ඉදිරිපත් කළාද, මෙන්න වාර්තාව කියලා. නැහැ. නිල වශයෙන් තමුන්නාන්සේලා කොතැනකවත් මේ වාර්තාව ඉදිරිපත් කරලා නැහැ. අපේ හාමුදුරුවන්ට වෙන කොහෙන් හරි හම්බ වෙන්න ඇති. එහෙම නේද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ලෝක සෞඛ්‍ය සංවිධානය මේක ප්‍රකාශයට පත් කරලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

බාධා කරන්න එපා. ඔබතුමාගේ වේලාවේ දී උත්තර දෙන්න. දැන් ඒ වාර්තාව තිබෙනවාද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හරි. දැන් ඒක මේ සභාවේ ඉදිරිපත් කරන්න ඕනෑ. මේ සභාවේ සභාගත කරන්න. ඒ වාර්තාව දැන ගන්න ඕනෑ. හරි. අපේ හාමුදුරුවෝ ළඟ ඒ වාර්තාවම තිබෙනවා නේද ?

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඔව්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒකම සභාගත කරන්න. දැන් මම අහනවා, ඒකේ නිර්දේශ දීලා තිබෙනවාද කියලා. මොනවාද තිබෙන නිර්දේශ? ඔතැන තමයි ප්‍රශ්නය පැන නැඟෙන්නේ? මේ වාර්තාවේ තිබෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොඩක් ගොඩක් තැන්වල විසුරුණු අදහසක්. කැඩිමියම් ගැන කථා කරනවා; ආසනික් ගැන කථා කරනවා; පොහොර ගැන කථා කරනවා; කෘමි නාශක ගැන කථා කරනවා. හැබැයි අන්තිමට නිගමනයක් නැහැ. ඔතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. වෙන වෙන වටපිටාවේ තිබෙන දේවල් ගැන කථා කරන්න පුළුවන්. මෙතෙක් කල් හැම paper එකකම කථා වුණු, හැම තැනකම කථා වුණු සාකච්ඡා ටිකක් තිබුණා. හැබැයි මේ වාර්තාවේත් නිශ්චිතව, කැටිකොට මේකයි නිගමනය කියලා ඉදිරිපත් වෙලා නැහැ. තේරුණා නේද? එතකොට මේකේ ඉදිරිපත්

[ගරු අනුර දිසානායක මහතා]

වෙන්න ඕනෑ, මේක තමයි හේතුව කියලා. මිලියන 100ක් වැය වෙලා තිබෙනවා. ලංකාවේ ආණ්ඩුවත් ඒකට යම් මුදල් ප්‍රමාණයක් දරලා තිබෙනවා. මේ ඉදිරිපත් කොට තිබෙන වාර්තාවේ මේකට නිශ්චිත හේතු කාරකය සඳහන් වෙනවාද? නැහැ. මේකේ එක තැනක කැඩිමියම් ගැන කථා කරනවා. තව තැනක ආසනික් ගැන කථා කරනවා. තව තැනක පොහොර ගැන කියනවා. තව තැනක කෘමි නාශක ගැන කියනවා. තැන තැන ඔහොම කිය කියා ඉඳලා හරි යන්නේ නැහැ නේ. මේ පර්යේෂණ කණ්ඩායම ගැන මම දන්නවා. ශාන්ති මෙන්ඩිස් මැතිතුමිය මේකේ ප්‍රධානත්වය දැරුවා. එතුමිය වාර්තාව ඉදිරිපත් කළා. හැබැයි වාර්තාවේ නිශ්චිත recommendation එකක් තිබෙන්න ඕනෑ. ඒකයි වාර්තාවක වැදගත්.

මොකක්ද නිගමන? මේකේ නිගමන නැහැ නේ. අපේ හාමුදුරුවනේ, දැන් අපි නේ නිගමන හදා ගන්නේ. ආසනික් ගැන කියන අය මේ වාර්තාව බලලා කියනවා, "ආ, ආසනික් වාගේ තමයි මේ ප්‍රශ්නයත්" කියලා. කැඩිමියම් ගැන කිව්ව අය මේ වාර්තාව බලලා කැඩිමියම්වලට අදාළ කොටස ගන්නවා. වතුරේ හැදුණු ඇල්ගි ගැන කියන කවුරු හෝ ඉන්නවා නම් මේ වාර්තාව බලලා ඇල්ගි ගැන තිබෙන කොටස ගන්නවා. ඉතින් එහෙම වාර්තා එනවාද? ඕනෑම පර්යේෂණ කණ්ඩායමකට තම තමන් කැමැති ලෙස මේ වාර්තාවේ කැමැති පරිච්ඡේද ගන්න පුළුවන්. ඒ නිසා තමයි කියන්නේ මේ වාර්තාවේ නිශ්චිත නිගමන නැහැයි කියලා. හේතු කාරකය මොකක්ද කියලා හොයා ගෙන නැහැ. හේතු කාරකය හොයා ගන්නේ නැතුව, හේතු කාරකය වළක්වන ක්‍රියා මාර්ග ගන්න බැහැ. ඒ නිසා පළමුවන ප්‍රශ්නය, තාමත් නිශ්චිත පරිදි නිගමන සොයා ගෙන නැහැ කියන එක. මේක තමයි අද දිනයේත් අප පිළිගත යුතු පරම සත්‍යය.

දැන් කළ යුතු වන්නේ කුමක්ද? නිශ්චිත පරිදි නිගමන නැති වාර්තාවක් මේ තිබෙන්නේ. එහෙම නම් දැන් මොකක්ද කෙරෙන්නේ? මේ පිළිබඳ විවිධ සාකච්ඡා තිබෙනවා. පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කණ්ඩායමක් වාර්තාවක් ඉදිරිපත් කළා. කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කණ්ඩායමක් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. තවත් වෛද්‍යවරු කණ්ඩායමක් විසින් වාර්තාවන් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ විධියට විවිධ කණ්ඩායම් විසින් වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා. එහෙම නම් දැන් මොකක්ද කරන්න ඕනෑ? මේ ප්‍රශ්නය කේන්ද්‍රගත කර ගෙනම එය මෙහෙය විය හැකි ජාතික මණ්ඩලයක් පිහිටු වන්නට ඕනෑ. මේ සියලු වාර්තා ටික එකැනට ගෙනෙන්න ඕනෑ. මේක මේ තිස්ස කරල්ලියද්ද මැතිතුමා හෝ මම හෝ අපේ රතන හාමුදුරුවෝ හෝ කළ යුතු දෙයක් නොවෙයි. අපට බැහැ, අපි දන්නේ නැහැ. ඒකත් කියන්න එපා යැ. මේක විද්වතුන්ගේ කාර්ය භාරයක්. විද්වතුන්ගේ තිබෙන ඒ තොරතුරු අරගෙන, ඒ දත්ත සම්පිණ්ඩනය කරලා, ඒවා එක්රැස් කරලා, නිගමනයක් අරගෙන හේතු කාරක සොයන එකයි පරිපාලන වැඩ කටයුත්ත. එය මෙහෙය වීමේ වැඩ කටයුත්ත තමයි ආණ්ඩුවට තිබෙන්නේ. ආණ්ඩුව එය මෙහෙය වන්නේ නැහැ. මේ තරම් ජාතික ව්‍යසනයක් ගරු නියෝජ්‍ය කථානායකතුමනි! මේක යුද්ධයටත් වඩා රජරට පළාතට භයානක ව්‍යසනයක්. යුද්ධ කාලයේදී මිය ගියාට වඩා වැඩියෙන් මියැදෙන කාරණයක්. යුද්ධයකට වඩා අමාරු වැඩක්. යුද්ධයකදී සොල්දාදුවෝ, යුද උපක්‍රම, යුද උපකරණවල බලවත්වීම මත යුද්ධය දිනන්න පුළුවන්. හැබැයි මේ කාරණය එහෙම දිනන්න පුළුවන්ද? සොල්දාදුවන් මත, උපක්‍රම මත මේ කාරණය දිනන්න බැහැ. යුද්ධයටත් වඩා අතිශය භයානක මෙහෙයුමක් අප හමුවේ මේ තිබෙන්නේ. ඊටත් වඩා අසීරු මෙහෙයුමක් අප හමුවේ තිබෙන්නේ. ඕනෑම යුද්ධයකට හමුදාවයි, උපක්‍රමයි, අවි ආයුධයි ප්‍රබලයි. හැබැයි මෙහි ඊට වඩා ප්‍රබල වෙන්නේ මොකක්ද? මේ විද්‍යාඥ ඥානය උපයෝගි කර ගෙන හැබෑ හේතු කාරකය හොයන එක. ඒක දුෂ්කර කාර්යයක්.

1990 මැද භාගයේ සිට දැනට අවුරුදු විස්සකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. හැබැයි අපි තාමත් මේ වකුගඩු රෝගයට නිශ්චිත හේතුව හොයා ගෙන නැත්නම් එයින් පිළිබිඹු කරන්නේ කුමක්ද? එයින් පිළිබිඹු කරන්නේ ගරු කථානායකතුමනි, අන් කවරක්වත් නොවෙයි, මේ ජනතාවගේ ජීවිත පිළිබඳව අපට තිබෙන හැඟීම ආණ්ඩුවට නොමැති බව. මේ අයගේ ජීවිත, ජීවිත හැටියට ආණ්ඩුවට පෙනෙන්නේ නැතිකම. ඔවුන් ඔහේ මිය යන්න ඕනෑ, මිනිසුන්ද? ඔවුන් ඉපදීම ඔවුන්ගේ වරදක්ද? ඔවුන් එම පළාත්වල ඉපදීම වරදක්ද? ඒක ඔවුන්ගේ තෝරා ගැනීම නොවෙයි. ඒක තමයි ස්වභාව ධර්මය. ඒ අනුව ඉපදුණු ඔවුන්ගේ ජීවිත අද මියැදෙන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වකුගඩු රෝගියෙක් මිය ගියොත් ඔහුගේ වෛද්‍ය වාර්තාව එන්නේ කොහොමද? ඕනෑම කෙනෙක් මිය ගියොත් වෛද්‍ය වාර්තාව තමයි ප්‍රබල වන්නේ. වෛද්‍ය වාර්තාවේ තිබෙනවා, මෙන්න මේ හේතු සාධකය මත මිය ගියා කියලා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මොකක්ද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අවස්ථාවේදී සෞඛ්‍ය අමාත්‍යතුමා හෝ නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යතුමා ගරු සභා ගර්භයේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
It is not a point of Order. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙසේ කථා කිරීමෙන් තේරුමක් නැහැ. මෙය රටට බලපාන විශේෂ කටයුත්තක්. මේ ඇමතිවරුන් කවුරු හෝ මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියන්නේත් මේ මන්ත්‍රීවරු මතු කරන සත්‍ය කථාව නේ. ඒ කියන්නේ එතුමන්ලා මේ ගරු සභා ගර්භය තුළ නැති වීමෙන්ම පෙන්නුම් කරන්නේ ඔවුන්ට මේ ජීවිත පිළිබඳව තිබෙන හැඟීම නේ. ඔවුන්ට මේ ජීවිත වැදගත් වන්නේ එක වකුගඩුවෙන් හෝ වකුගඩු දෙකම නැතිව හෝ, ලේ ඇතිව හෝ ලේ නැතිව හෝ ඡන්ද පොළට ගිහින් කතිරය ගස්සවා ගන්න. ඒ තරමට පහත්, බිඳ වැටුණු තත්ත්වයකට ඒ පළාත්වල මිනිසුන්ව පත් කරලා තිබෙනවා.

එහෙම නම් දැන් අපි හමුවේ තිබෙන ප්‍රශ්නය මොකක්ද? මේකට නිශ්චිත නිගමනයක් හොයා ගැනීමට අපි ක්‍රමවේදයක් අනුගමනය කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි මා නිශ්චිත වශයෙන්ම කියන්නේ මේ පිළිබඳව විධිමත් ආයතනයක් අපේ රටේ පිහිටුවන්න ඕනෑය කියලා. ඒ ආයතනයට සියලු වගකීම දෙන්න ඕනෑ.

තමුන්නාන්සේලා මොන මොන ජාතියේ ආයතන හදනවාද? "මිහින් ලංකා" කියලා ආයතනයක් හැදුවා. තමුන්නාන්සේලාට හිතුණාම "දිවි නැගුම" කියලා දෙපාර්තමේන්තු හදනවා. තව මොකක් හරි හිතුණාම එක එක වර්ගයේ ආයතන හදනවා. හැබැයි දැන් රටේ ප්‍රධාන ජාතික ව්‍යසනයක් බවට පත් වී තිබෙන, මිනිස්සු දස දහස් ගණනක් මිය ගිහින් තිබෙන, තවත් දස දහස් ගණනක් මිය යෑමේ දොරටුවට තල්ලු කොට තිබෙන මේ ව්‍යසනය පිළිබඳව ජාතික මධ්‍යස්ථානයක් හදලා තිබෙනවාද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

සෞඛ්‍ය අමාත්‍යාංශය කෝකටත් තෙලය. ඕක නේ වෙලා තිබෙන්නේ. නියමයි. ඕක හරි ෂෝක්. ඉස්පිරිතාලෙට පෙනඩෝල් යවන්න බැහැ. මහරගම පිළිකා රෝහලට ඉන්ජෙක්ෂන් ටික යවන්න බැහැ. ඉන්ජෙක්ෂන් එක ඇතුළේ ඉදි කටු එවන, සේලයින් බෝතලය ඇතුළේ බිත්තර කටු එවන වාගේ දේවල් තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයට කරන්න පුළුවන්. ඔබතුමා තේරුම් ගන්න. සෞඛ්‍ය අමාත්‍යාංශයට අපේ රටේ මුළු සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ වගකීමක් තිබෙනවා. අඩුම තරමේ- [බාධා කිරීමක්] තුවිටු දෙකේ කථා කියන්න එපා, මහත්තයෝ. වාඩි වෙන්න,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වෙන්නේ නැතුව.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වෙන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට අමාත්‍යාංශ තිබෙනවා. ඒක ඇත්ත. හැබැයි යම් නිශ්චිත, ජාතික වැදගත්කමකින් යුතු විශේෂ කරුණක් පිළිබඳව අපි අවධානය යොමු කරන කොට එයම කේන්ද්‍ර කර ගත්තු ඉලක්ක අපි හදන්න ඕනෑ. ඒ මොකටද? සෞඛ්‍ය අමාත්‍යාංශය රටේ මුළු සෞඛ්‍ය පිළිබඳව කාර්ය භාරයක් කරනවා ඇති. කමක් නැහැ. හොඳයි. හැබැයි ඒ අතරම මේක ජාතික ව්‍යසනයක් නම්, ඒ ජාතික ව්‍යසනය මූලික ලෙස ඉලක්ක කොට ගත් මධ්‍යස්ථානයක් හැදීමේ වැරැද්ද මොකක්ද? මට ඒක කියන්න. කලබල වෙන්න එපා. මා යෝජනා කරන්නේ ඒකයි. ජාතික මධ්‍යස්ථානයක් හදන්න. මේ තැන තැන එකතු කරලා තිබෙන පර්යේෂණ වාර්තා එතැනට එකතු කරන්න. ඒ වාර්තා පිළිබඳව සෙවීමට විද්වත් සභාවක් කැඳවන්න. ඒවා සාකච්ඡාවට බඳුන් කරන්න. ඒවා ගැටෙන්න සලස්වන්න. මෙය නොසලකා හැරිය යුතු කාරණයක් නොවෙයි. යම් රෝගයක් පිළිබඳව හේතුකාරක සෙවීමේ විද්‍යාත්මක විධික්‍රමයක් තිබෙනවා. කොහේ හරි ගිහිල්ලා ෂෙඩ් එකක් ගිනි කියන එක හරි ලෙහෙසියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. භූමි තෙලුයි, පන්දමයි, රාත්‍රියයි ඕනෑ කරන්නේ. ඒක හරි ලෙහෙසි වැඩක්.

හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට වැඩිය අමාරුයි, ලෙඩක හේතු කාරකයක් හොයා ගන්න එක. ඒක විද්‍යාත්මක ක්‍රමවේදයක්. ඒ විද්‍යාත්මක ක්‍රමවේදය අනුගමනය කිරීම වෙනුවෙන්, ඒ සඳහා වූ නිශ්චිත ආයතනයක් පිහිටුවන්න. අපි යෝජනා කරන්නේ ඒකයි. වකුගඩු පිළිබඳ ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවලා - [බාධා කිරීමක්] දෙපාර්තමේන්තු කැලි නොවෙයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන්න, මෙතෙක් වකුගඩු රෝගය පිළිබඳව ඉදිරිපත් කරපු වාර්තා කොහේ හරි එක තැනක තිබෙනවාද කියලා. එහෙම තිබෙනවාය කියලා එක තැනක් කියන්න. එක තැනකවත් නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙනවාද මේ සියලුම විද්වත් කම්ටු විසින්, විවිධ පර්යේෂණ කණ්ඩායම් විසින් ඉදිරිපත් කරපු වාර්තා? කොහේවත් නැහැ. කැලණිය විශ්වවිද්‍යාලයේ ඒවා ටික ඒ ගොල්ලන් ළඟ තිබෙනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහත්වරුන්ගේ ඒවා ඒ ගොල්ලන්ගේ ළඟ තිබෙනවා. දොස්තර මහත්වරුන්ගේ ටික ඒ ගොල්ලන් ළඟ තිබෙනවා. එහෙම නොවෙයි. මේ පර්යේෂණ කණ්ඩායම් මේ වැඩේට උපයෝගි කර ගන්න ඕනෑ. මේක නිතුවක්කාරිකමට හෝ, තක්කඩිකමට හෝ, සුදු වෑන් එවලා හෝ, එහෙම නැත්නම් වෙන මොනවා හෝ කරලා විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. හදිසි නීතියෙන් හෝ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ හෝ විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මේ තිබෙන්නේ රෝගයක හේතුකාරකයක් හොයන්න ඕනෑ ප්‍රශ්නයක්. ඒ හේතුකාරක හොයන්න ඕනෑ, මේ රටේ විද්වතුන්; ඒ ක්ෂේත්‍රය ගැන නිපුණත්වයක් තිබෙන විද්‍යාඥයන්. විද්‍යාඥයන් පර්යේෂණ කරනවා. පර්යේෂණ වාර්තා ඉදිරිපත් කරනවා. ඒ ඉදිරිපත් කරන ලද පර්යේෂණ වාර්තා එක තැනකට ගෙනැල්ලා ඒවා පිළිබඳව සංවාදයක් ඇති කරන්න විද්වතුන් කැඳවන්න. ලංකාවේ විද්වතුන් මදි නම් විදේශීය විද්වතුන් කැඳවන්න. මම අපේ දොස්තර මහත්වරුන්, අපේ විද්වතුන් පිළිබඳව අඩු තක්සේරුවක් කරනවා නොවෙයි.

හැබැයි ලෝක සෞඛ්‍ය සංවිධාන වාර්තාව කියන කොටම අපට හැඟෙන්නේ යම් ප්‍රමාණයකට විදේශීය විශේෂඥ මහත්වරුන් මේකේ ඉන්න ඇති කියලා. නමුත් එහෙම නැහැ. මේ මුළු පර්යේෂණ කණ්ඩායමම ලංකාවේ අයගෙනුයි සමන්විත වෙලා තිබෙන්නේ. මම ඔවුන්ට අපහාස කරනවා නොවෙයි. හැබැයි ලෝකයේ මෙවැනි ව්‍යසනයක් හොයා ගන්න කොට ඒ ව්‍යසනයන් පිළිබඳ ලෝක පරිමාණයෙන් පර්යේෂණ කරන ලද නිලධාරීන් ඉන්නවා; විද්‍යාඥයන් ඉන්නවා. ඒ ගොල්ලන් එකතු කරලා ඒ ගොල්ලන්ගේ තොරතුරු, ඒ ගොල්ලන්ගේ කාර්ය භාරය ප්‍රයෝජනයට ගන්න පුළුවන් ජාතික මධ්‍යස්ථානයක් හදන්න ඕනෑ. ඒ ජාතික මධ්‍යස්ථානයට සියලු වාර්තා එන්න ඕනෑ. කැමති මන්ත්‍රීවරයෙකුට ඒ ජාතික මධ්‍යස්ථානයට ගිහිල්ලා වාර්තා ටික ගන්න අයිතිය තිබෙන්න ඕනෑ. අද ඒවා හංගා ගෙන නේ ඉන්නේ. වාර්තාවක් දන්නේ නැහැ; හේතුවක් දන්නේ නැහැ; ඔහේ තිබෙනවා.

[ගරු අනුර දිසානායක මහතා]

ඇයි ජාතික මධ්‍යස්ථානයක් හදන්න බැරි? වකුගඩු රෝගයට හේතු කාරක සෙවිය යුතුයි. වකුගඩු රෝගයට හේතු කාරක සෙවීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් ආරම්භ කළ යුතුයි. ඒකට මේ කාබාසිනියා කරන මුදල්වලින් සියයට එකක් දෙන්න කෝ. හොඳටම ඇති. දැයට කිරුළෙන් සියයට එකක් දෙන්න කෝ. ජීවිත ලක්ෂ ගණනක් බේරෙනවා නේ. ගුවන් යානා ගෙනෙන්න හදනවා බිලියන 315ක; කෝටි 31,500ක. ඒ සල්ලිවලින් සියයට එකක් දෙන්න කෝ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෝටි 31,500ක ගුවන් යානා ගෙනෙන රටේ ඒ කෝටි 31,500න් සියයට එකක් මේ වෙනුවෙන් වෙන් කරන්න බැරි ඇයි? ලක්ෂ ගණනක ජනතාවගේ ජීවිත විනාශ වෙමින් යනවා. ඒ සඳහා පර්යේෂණ කරන්න ආයතනයක් පිහිටුවන්න. ඒ සඳහා තමුන්නාන්සේලාට වුවමනාවක් නැහැ. ඒ මිනිසුන්ගේ ජීවිත ගැන - [බාධා කිරීමක්] මහ විකාරයක් නේ. මේ නියෝජ්‍ය ඇමති කෙනෙක්ද? මේ නියෝජ්‍ය ඇමති හිටියාට වඩා හොඳයි නොහිටියා නම්. [බාධා කිරීමක්] සමහර අය කිව්වා, මේ නියෝජ්‍ය ඇමති ගරු සභාවේ නැහැ කියලා. මේ ලෙඩේ එළියේ හිටියා නම් හොඳයි. මොකටද ඇතුළට ගෙන්වා ගත්තේ?

මා කියන්නේ මේ කෝටි, ප්‍රකෝටි ගණන් මුදල් වැය කරන ඒවායෙන් යම් ප්‍රතිශතයක් මේ සඳහා වෙන් කරන්න කියලායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට ඒ සඳහා යෝජනා ගෙනෙන්න ඕනෑ. මේ මහා පරිමාණ - [බාධා කිරීමක්] මේ මහා ධන සම්භාරය තමන්ගේ සල්ලි නොවෙයි. මේ රටේ මහජනතාවගෙන් බදු ගහලා එකතු කර ගන්න මුදල්. ඒ බදු ගෙවපු ජනතාවගේ ජීවිත තමයි මේ විනාශ වෙමින් යන්නේ. ඒගොල්ලන්ට තමයි මේ අනිසි ප්‍රතිවිපාක අත් වෙලා තිබෙන්නේ. ඒගොල්ලන්ට තමයි තමන්ගේ ජීවිත පිළිබඳ අවිනිශ්චිතභාවයක් ඇති වෙලා තිබෙන්නේ. ඒගොල්ලන්ට තමයි ඉබාගාතේ මැරෙන්න වෙලා තිබෙන්නේ. ඒ ජනතාව පිළිබඳව සොයා බලන්න මේ මහා නාස්තිකාර වියදම්වලින් සියයට එකක් වෙන් කරන්න බැරිද? දැයට කිරුළෙන් සියයට එකක් වෙන් කරන්න බැරිද? ඒ තරම් ලෝභද? ඒ තරම් අරපරිස්සම්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් මුදල් ප්‍රතිශතයක් වෙන් කරලා වකුගඩු රෝගය සඳහා ජාතික මධ්‍යස්ථානයක් හදන්න ඕනෑ. ඊට පස්සේ ඒ ජාතික මධ්‍යස්ථානය හරහා ඒ රෝගයට හේතුව හොයලා ඒ හේතුව වැළැක්වීම සඳහා ක්‍රියාවලියක් ආරම්භ කරන්න ඕනෑ. ඒ පළමුවැනි කාරණය.

දැනට අනුමාන වශයෙන් හොයා ගත්ත කරුණු ටිකක් තිබෙනවා. ඒවා වැදගත්. එතකොට තමයි අපේ රතන හාමුදුරුවන් වහන්සේ අනුමාන වශයෙන් කියන ආසනික් ප්‍රශ්නය, කැඩ්මියම් ප්‍රශ්නය, එහෙම නැත්නම් ඇල්ගී වර්ගයක ප්‍රශ්නය හා ජලයේ මතු වී තිබෙන ප්‍රශ්නය එන්නේ. නිශ්චිත ලෙස හේතුවක් හොයා ගන්නා තෙක් මේ අනුමාන වශයෙන් මතු වී තිබෙන මත පිළිබඳ සැලකිල්ලක් දක්වන වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. එය අවසන් හේතුව වන්නේ නැහැ. ඒකයි අප අතර තිබෙන පරස්පරය. ඒක අවසන් එක නොවෙයි. මේකට හේතුව කෘමි නාශක සහ කෘෂි රසායනික ද්‍රව්‍ය කියලා කවුරු හෝ කල්පනා කරනවා නම්, ඒකට පර්යේෂණ කණ්ඩායමක් විසින් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා නම්, ඒ පිළිබඳව සැලකිල්ලක් යොමු කර අවශ්‍ය ක්‍රියා මාර්ගවලට යන්න. ඊළඟට තවත් පර්යේෂණ කණ්ඩායමක් කියනවා නම් ගුණාත්මකභාවයෙන් යුතු ජලය නැති නිසා මේ රෝගය හැදෙනවාය කියලා, ජලය දෙන්න වැඩ පිළිවෙළක් හදන්න. තව කවුරු හෝ කල්පනා කරනවා නම්, ඒගොල්ලන්ගේ ජීවන චක්‍රයේ තිබෙන ගැටලු මේකට ප්‍රධාන ප්‍රශ්නය බවට පත් වෙලා තිබෙනවාය කියා, ඒ පිළිබඳව උපදෙස් දෙන්න. එතකොට අපි දන්නවා, නිශ්චිත හේතුවක් හොයා ගන්න අපේ වැඩ පිළිවෙළක් තිබෙනවා; දැනට අනුමාන හේතු මත පදනම්ව ක්‍රියාමාර්ගවලට යනවා කියලා. එහෙම නේ කෙරෙන්න ඕනෑ. මේකට හේතුව ආසනික් හෝ කැඩ්මියම් හෝ කියන අය ඒක අවසන් හේතුව බව කියන්නේ නැහැ නේ. ඒක එකක්.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කැබිනට් මණ්ඩලයට චක්‍රලේඛනයක් ඉදිරිපත් කරලා තිබෙනවා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඉදිරිපත් කරපු වාර්තාව ගැන. ඒ වාර්තාවේ කිසිම අවිනිශ්චිතභාවයක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හාමුදුරුවනේ ඔබවහන්සේ පසුව කියන්න කෝ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

කිසිම අවිනිශ්චිතභාවයක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මා කියන්නේ අවිනිශ්චිතයි කියලා. මා කියන්නේ- [බාධා කිරීමක්] එහෙම කථා කරන්න එපා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

කියන්න වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හාමුදුරුවනේ, දැන් අනුමාන කරන දේවල් තිබෙනවා. ඒවා අනුමාන. ඒ එක් එක් විද්‍යාත්මක කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද මත. එහෙම නම් ආණ්ඩුව නිශ්චිත ලෙස කියන්න ඕනෑ, "ඒ මතවලින් අප මේක නිශ්චිත ලෙස පිළිගත්තා" කියලා. එහෙම නම් ඒක කියන්න ඕනෑ. ඒ කියන්නේ, රජයක් හැටියට නිශ්චිතව පිළිනොගන්නා තාක් ඒවා අවිනිශ්චිත මත ලෙසට පවතිනවා. ඒ අවිනිශ්චිත මතවලට ඒ බරින්ම විසඳුම් හොයන්න ඕනෑ. ඒ පිළිබඳව විවාදයක් නැහැ. හැබැයි ඒක අවසන් හේතුව කියලා කවුරු හෝ කල්පනා කරනවා නම්, ඒක තමයි වර්තමානයේ වකුගඩු රෝගයට තවත් හේතු කාරක සෙවීම සඳහා තිබෙන බාධාව; barrier එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර කණ්ඩායම් තමන්ගේ දේශපාලන මතයම, තමන් එල්බ ගත්ත මතයම තහවුරු කිරීම සඳහා අනෙක් සියලු මත පොඩි පට්ටම් කරන්න හදනවා. ඒකත් වැරදියි. ඒකත් සාධාරණ නැහැ. අප කියන්නේ, අනුමාන වශයෙන් ඉදිරිපත් වූ මතවලට ක්‍රියා මාර්ග හදන්න කියලායි.

හැබැයි තවත් ඉස්සරහට හේතු කාරක සොයන මත තිබෙන්න පුළුවන්. ඒවාට ජාතික මධ්‍යස්ථානයක් හදලා ඒ සඳහා වැඩ පිළිවෙළක් හදන්න. ඒක වැරැදි නැහැ නේ. මා හිතන්නේ නැහැ, ඒකට කාටවත් විරුද්ධ වෙන්න වෙයි කියලා. පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ කියනවා වාගේම සමහර මත කොම්පැනිකාරයන්ගේ සල්ලිවලින් එන්න පුළුවන්. ඒකත්

වෙන්න පුළුවන් නේ. ඒවා අනුමාන මත. එම නිසා ජාතික විද්වත් මණ්ඩලයක් මඟින් අනුමාන මත නිශ්චිත මතයන් කරා එන තෙක් අනුමාන මතවලට ක්‍රියාමාර්ග ගන්නවා වාගේම අපි කරන්න ඕනෑකම තිබෙන්නේ හේතු කාරකය සොයා ගන්න විද්වත් ක්‍රියා මාර්ගයන් ගැනීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට දැන් රෝගය හැදිලා ඉන්න අයට මොකද කරන්නේ? ඒක ඊළඟ බරපතළම ප්‍රශ්නයයි. මේ හේතු කාරක සොයා ගන්නා තෙක්, මේ අනුමාන මතවලට ක්‍රියා මාර්ග සොයා ගන්නා තෙක්, දැන් රෝගය හැදිලා ඉන්න අයට මොකක්ද කරන්න ඕනෑකම තිබෙන්නේ? දැනට වෛද්‍ය විද්‍යාවෙන් සොයා ගෙන තිබෙන බෙහෙත් ටික දෙන්න පටන් ගන්න ඕනෑ. ඒක කරන්න බැහැ. තමුන්නාන්සේලා ඒක කරන්නේ නැහැ. තමුන්නාන්සේලා රුපියල් කෝටි, ප්‍රකෝටි ගණන් මුදල් නාස්ති කරනවා. ඒ මිනිසුන්ගේ ජීවිත දහස් ගණනක් මිය යනවා. ඒ සඳහා මුදල් වෙන් කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැදවච්චියේ -අපේ තිස්ස කරල්ලියද්ද ඇමතිතුමා දන්නවා- වකුගඩු වාට්ටුව තිබෙන්නේ කොතැනද? මැදවච්චිය රෝහලේ කලින් භික්ෂු වාට්ටුව වශයෙන් පාවිච්චි කළ වාට්ටුව තමයි දැන් වකුගඩු වාට්ටුව වශයෙන් පාවිච්චි කරන්නේ. ඒ වාට්ටුව තමයි කලින් භික්ෂු වාට්ටුව වශයෙන් පාවිච්චි කළේ. ඉතින් භික්ෂු වාට්ටුව තමයි දැන් වකුගඩු වාට්ටුව බවට පරිවර්තනය කරන්නේ. තිස්ස කරල්ලියද්ද ඇමතිතුමා ඒ වාට්ටුවට ගිහින් ඇති. මමත් ගියා. එහි තිබෙන ප්‍රමිතිය අනුව මෙවැනි බරපතළ රෝග කාරකයක් සහිත ලෙඩුන්ට ඉන්න පුළුවන් තැනක් නොවෙයි, ඒ වාට්ටුව. එය වහින කොට තෙමෙන තැනක්; කොට බිත්තියෙන් වතුර ගහන තැනක්. මේක තමයි ඇත්ත කථාව. ඒ ලෙඩුන්ට අවශ්‍ය කරන පහසුකම් ටික නැහැ. මැදවච්චිය රෝහල ගත්තත්, පදවිය රෝහල ගත්තත් අද ඇති වෙලා තිබෙන තත්ත්වය ඒකයි. එම නිසා මේ රෝහල්වලට අවශ්‍ය යටිතල පහසුකම් ඉතා ඉක්මනින් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට, මා දැක්කා, සෞඛ්‍ය ඇමතිතුමාත්, සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමාත් නිරන්තරයෙන් කියනවා, රුධිර කාන්දුකරණය - dialysis - සඳහා ප්‍රශ්නයක් පැන නැඟිලා නැහැ, ඕනෑ තරම් පිරිසක් පැමිණියත් වේගයෙන් කර ගන්න පුළුවන් කියලා. එහෙම එකක් නැහැ. ඒක වැරදි මතයක්. ඇත්තටම රුධිර කාන්දුකරණය කර ගැනීම වෙනුවෙන් පෝලිමක් පවතිනවා. පෞද්ගලික අංශයෙන් කර ගන්න ඕනෑ සමහර අය පෞද්ගලික අංශයට පෙලඹිලා තිබෙනවා. ඒ සඳහා මාසයකට රුපියල් 15,000ක්, රුපියල් 30,000ක් අතර ප්‍රමාණයක් වැය වනවා. පදවිය රෝහලේ, විශේෂයෙන් වැඩි සනත්වයක් තිබෙන ප්‍රදේශවල රෝහල්වල රුධිර කාන්දුකරණය සඳහා වූ උපකරණවල සහ පහසුකම්වල හිඟයක් තිබෙනවා. ශ්‍රී ලංකා රොටරි සමාජයෙන් ලබා දීලා තිබුණු එවැනි machine එකක් එක් මාධ්‍ය ආයතනයකින් පෙන්වනවා මා දැක්කා. ශ්‍රී ලංකා රොටරි සමාජයෙන් පදවිය රෝහලට පරිත්‍යාගයක් හැටියට එය දීලා තිබුණා. හැබැයි ඒ පරිත්‍යාගය ලැබී දැනට බොහෝ කාලයක් ගත වෙලා තිබෙනවා. ඒ machine එකට තව කුඩා බට කැලි ටිකක් ඕනෑ. ඉතින් මේ කියන මහා සෞඛ්‍ය අමාත්‍යාංශය තවම ඒ බට කැලි ටික දෙන්නේ නැතුව -දැන් තත්ත්වය මොකක්ද කියලා මා දන්නේ නැහැ. සති දෙකකට පමණ පෙර තත්ත්වයයි මා කියන්නේ- එය ගබඩාවක තැන්පත් කර තිබෙනවා. රුධිර කාන්දුකරණය සඳහා වූ machines ව්‍යාප්ත කරලා, ඒ සඳහා වූ පහසුකම් ටික ලබා දීම වේගයෙන් කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට වෛද්‍යවරු පවසන පරිදි මෙම රෝගය හැදුණාට පස්සේ ලැබෙන ඉතාම හොඳ උත්තරය බවට පත් වෙලා තිබෙන්නේ වකුගඩුවක් බද්ධ කිරීමයි. ඔබ හිතන්න, සාමාන්‍ය පවුලක කෙනකුට වකුගඩුවක් බද්ධ කරන්න කොපමණ මුදලක් වැය වනවාද කියලා. සාමාන්‍ය කෙනකුට වකුගඩුවක් බද්ධ කිරීමේදී රුපියල් ලක්ෂ 7කට, ලක්ෂ 8කට වඩා වැඩි මුදලක් වැය වනවා. ඒ වාගේම වකුගඩුව තමන්ගේ ශරීරයේ අනික් අවයවයන් එක්ක ඉතා හොඳින් සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක වීම සඳහා සැලකිය යුතු කාලයක් ඕනෑ වනවා. ඒ සඳහා බෙහෙත් ලබා දීමට මාසයකට සැලකිය යුතු මුදලක් වැය වනවා. එම නිසා මා හිතන්නේ නැහැ, රජ රට පළාතේ සහ උඹ පළාතේ දැනට රෝගය ව්‍යාප්ත වෙලා තිබෙන දිස්ත්‍රික්කවල කිසිදු ගොවියකුට මෙය කරන්න පුළුවන් කියලා. ඔවුන්ගේ කන්නයේ සම්පූර්ණ ආදායම තමන්ගේ ජීවිතය පවත්වා ගෙන යන්න ප්‍රමාණවත් නැත්නම්, වෙනත් සියලු ආදායම් මාර්ග ඇහිරිලා නම් ඒ ගොවි ජනතාවට වකුගඩුවක් බද්ධ කර ගැනීම කියන්නේ සිහිනයක්. එම නිසා වකුගඩු බද්ධ කිරීම සඳහා තෝරා ගන්නා රෝගීන් සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ; ඒක පහසුවෙන් කරලා දෙන්න ඕනෑ. ඔවුන්ගෙන් ඒ සඳහා සල්ලි ගන්න එපා. ඔවුන්ට සල්ලි දෙන්න බැහැ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ශතයක්වත් ගන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ශතයක්වත් ගන්නේ නැහැ, තමුන්නාන්සේගේ ඔය දෙදෙනාට, තුන්දෙනාට ප්‍රතිකාර කරන තැන. හැබැයි ඒ ගොල්ලන්ට සල්ලිවලට නේ කර ගන්න වෙලා තිබෙන්නේ. සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේ කියනවා, ශතයක්වත් ගන්නේ නැහැයි කියලා. [බාධා කිරීමක්] ඔබතුමාගේ කථාවේදී කියන්න. සංවාදයකට නම් මා ඉඩ දෙනවා. මේක සංවාදයක් නොවෙයි නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙයින් ප්‍රධාන ලෙස පැන නඟින ඊළඟ ප්‍රශ්නය තමයි මේ අයගේ ආර්ථික හැකියාව වාගේම ඒ අයගේ සමාජ ජීවිතයේ මතු වී තිබෙන ගැටලු. මේ වකුගඩු රෝගය නිසා සමහර පවුල්වල ස්වාමියා මිය ගිහින් තිබෙනවා. සමහර පවුල්වල තමන්ගේ ආදායම් මාර්ග උපයපු දරුවා මිය ගිහින් තිබෙනවා. සමහර පවුල්වල දරුවන් ඉන්න මව මිය ගිහින් තිබෙනවා. මා දැක්කා සමහර තැන්වල මේ රෝගය වැළඳිලා අම්මායි, තාත්තායි දෙදෙනාම මිය ගොස් තිබෙන බව. එතකොට ඒ පවුල් සංස්ථාව ගැන දක්වන අවධානය මොකක්ද? ඒවාත් ජීවිත නේද? ඒ ජීවිත පිළිබඳ වගකීමක් නැද්ද? ආණ්ඩුවට වගකීම තිබෙන්නේ මොන ජීවිත ගැනද? Nightclub යන, car race කියන, rugby සෙල්ලම් කරන -ඒ ජාතියේ- ජීවිත පිළිබඳ විතරද රජයකට වගකීම තිබෙන්නේ? ඒ ජීවිතවල සිට ඇත පතුලේ ජීවත් වන ගමේ පුරවැසියා දක්වා වූ ජීවිතවල වග කීමක් රජයට තිබෙනවා. මේ රෝගය විසින් ඔවුන්ගේ ජීවිත සමාජයීය වශයෙන් කඩා වට්ටලා තිබෙනවා. සමාජයීය වශයෙන් කඩා වට්ටන ලද ඒ ජීවිත යළි නහා සිටුවීම වෙනුවෙන් ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම අවසන් කරනවා.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නැවතත් කියන්නේ මේ කාරණයයි. ඇති වී තිබෙන බෙදවාචකය අප හොඳින් තේරුම් ගත්තොත්, මෙය තමයි මෑත යුගයේ ලංකා ශිෂ්ටාචාරය ආරම්භ වූ රජරට මුහුණ දී තිබෙන දැවැන්තම බෙදවාචකය. එය ගැන ඒ තරමටම සමාජයේ අවධානය යොමු වී නැත්තේ කොළඹ කේන්ද්‍ර කරගෙන මේ රෝගය පැතිරී නැති නිසායි. මේ ව්‍යසනය කොළඹ හෝ නගර හෝ කේන්ද්‍රගත කරගෙන පැතිරී තිබුණා නම් මෙයට දක්වන දායකත්වය, සැලකිල්ල, මැදිහත්වීම මීට වඩා වැඩියි. නමුත් මේ රෝගය ප්‍රධාන ලෙස තිබෙන්නේ ඈත ගම්මානවලයි. ඔවුන් හඬක් නඟන්නේ නැහැ; ඔවුන්ට බලයක් නැහැ; ඔවුන්ට ආර්ථික හයියක් නැහැ. ඒ නිසා ඒ රෝගය පිළිබඳ තමුන්නාන්සේලාගේ අවධානය ගිලිහිලා තිබෙනවා. ඒ නිසා මා මුලින් කියූ පරිදිම ඒ රෝගයට හේතුකාරකය සොයා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක්, දැනට අනුමාන කරන හේතුකාරකවලින් යෝජනා කර තිබෙන විසඳුම්, දැනට රෝගයට ගොදුරු වෙලා සිටින අය සඳහා නියමිත පරිදි සෞඛ්‍ය සේවාවක්, රෝගය නිසා මිය ගිය අයගේ පවුල් යළි නඟා සිටුවීම සඳහා ක්‍රමවේදයක් වශයෙන් සමස්ත ක්‍රියාවලියක් ආරම්භ කළ යුතුය කියා මා මේ පාර්ලිමේන්තුවට යෝජනා කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු පී. හැරිසන් මහතා.

[අ.භා. 4.15]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉතාම කාලීන යෝජනාවක් තමයි අද මේ ඉදිරිපත් කර තිබෙන්නේ. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා හොඳ අදහස් ටිකක් ඉදිරිපත් කළා. පළමුවෙන්ම මා ඒ යෝජනාව ස්ථිර කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සමඟම මා මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මා මිත්‍ර තිස්ස කරල්ලියද්ද ඇමතිතුමා උතුරුමැද පළාතේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනඥයෙක්. ඒ නිසා විපක්ෂයේ අප සියලු දෙනාගේම ගෞරවය එතුමාට හිමි වෙනවා. එතුමාට සුබ උපන් දිනයක් වේවායි කියා පළමුවෙන්ම මා ප්‍රාර්ථනා කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු තිස්ස කරල්ලියද්ද ඇමතිතුමනි, ඔබතුමාට සුබ උපන් දිනයක් වේවා!

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විශේෂයෙන්ම කියන්න ඕනෑ මේ වකුගඩු රෝගය අපේ දේශපාලන ප්‍රශ්නයක් නොවන බව. මේ රෝගයට ගොදුරු වන අය මොන පක්ෂයේද, මොන පාටද කියලා අප බලන්නේ නැහැ. මේ රෝගීන් වෙනුවෙන් අප මේ හඬ නඟන්නේ. විශේෂයෙන්ම මේ රෝගය කෙරෙහි රටේ අවධානය යොමු කරලා, මේ අයගේ ජීවිතවලට වටිනාකමක් දීලා, මේ රෝගයෙන් මිය ගිය සාමාජිකයන්ගේ පවුල්වලට යම් සහනයක් සැලසිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙය අද සමාජීය ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම තමුන්නාන්සේට මුලින්ම කිව යුතුයි අද පරාක්‍රමපුර ප්‍රදේශයේ, පදවිය ප්‍රදේශයේ පාසල් නොයන දරුවන් 1,000කට 1,500කට වඩා සිටින බව. එහෙම වෙලා තිබෙන්නේ මොකද? මේ රෝගයට ගොදුරු වෙලා ගෙදර හිටපු තාත්තා මැරිලා; නැත්නම් අම්මා මැරිලා. මේ මිනිස්සු මහා ලොකු දැවැද්දක්, බූදලයක් තිබෙන අය නොවෙයි. එදිනෙදා කුලී වැඩ කරලා මේ අයට හම්බ වෙන තුට්ටු දෙකෙන් තමයි ජීවිතය ගෙන යන්නේ. ගොවිතැන් කරන කොට යල කන්නය හරි ගියොත් එක්කෝ මහ කන්නය මැරෙනවා. මහ කන්නය හරි ගියොත් යල කන්නය මැරෙනවා. ඒ ගන්නා ආදායම් මාර්ගයෙන් තමයි පවුලේ ඉන්න තුන් හතර දෙනා යැපෙන්නේ. මෙවැනි ආර්ථික තත්ත්වයක් යටතේ ඒ ගෙදර ඉන්න ප්‍රධාන ස්වාමියා මැරුණාට පස්සේ ඔවුන්ට උදා වන කල දසාව මොන වගේද? ගෙදර ප්‍රධාන ස්වාමියා මැරෙන්නෙත් නිකම් නොවෙයි. මුළු සේසතම ඉවර කරගෙන තමයි ඔහු මැරෙන්නේ.

ඒ අය අසරණ වුණාම ඉස්සර වෙලාම තමන්ගේ අතේ කරේ තිබෙන බඩු මුට්ටු ටික උගසට කියනවා; එහෙම නැත්නම් විකුණනවා. ඒ අය හැකැම්ම 100ක්150ක් ගෙවාගෙන අනුරාධපුරය මහ රෝහලට එන්න ඕනෑ. බස් කුලී ගෙවාගන්න තමන්ගේ අතේ කරේ තිබෙන ඒවා විකුණලා ඉවර වෙලා අමාරු තත්ත්වයකට පත් වෙන කොට අන්තිමේදී තමන්ගේ ජීවනෝපාය සලසා ගන්න තිබෙන ඉඩම-කඩම උගසට කියනවා; නැත්නම් විකුණනවා. ඒ ඔක්කෝම කරලාත් අවුරුද්දක් දෙකක් තුනක් යන කොට රෝගියා මැරිලා යනවා. එහෙම මැරිලා ගියාට පස්සේ ඒ පාප කර්මය ගෙවන්න වෙන්නේ ජීවත් වෙලා ඉන්න බිරිඳට; පාසල් යන දූ දරුවන්ට. ඊට පස්සේ ඒ බිරිඳ රට රස්සාවකට යනවා. එහෙම නැත්නම් කුලී වැඩක යෙදෙනවා. අන්තිමේදී මුළු පවුල් සංස්ථාවම කඩා වැටිලා ඒ ප්‍රදේශයේ ඉන්න දරුවන්ගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා වාගේ මේ වාගේ තත්ත්වයක් කොළඹ පැත්තේ ඇති වුණා නම් වෙන්නේ මොකක්ද? ඩෙංගුවලින් කොළඹ දෙදෙනකු මැරෙන කොට ඒ කෙරෙහි මාධ්‍යවලින් මුළු රටේම අවධානය යොමු වෙනවා. ඒ රෝගය වළක්වන්න ගෙනෙන්න ඕනෑ බැක්ටීරියා කොහේද තිබෙන්නේ, ඒවා ලෝකයේ ඕනෑම රටකින් ගෙනෙනවා. හැබැයි, උතුරු මැද පළාතේ, පදවිය ප්‍රදේශයේ දවසකට 10දෙනකුට වඩා මැරෙනවා මේ වකුගඩු රෝගයෙන්. ඒ ගැන අවධානයක් නැහැ. මා මේවා කියන්නේ දේශපාලනයක් හිතේ තියා ගෙන නොවෙයි. ඒ නිසා කරුණාකර මේ ගැන අවධානය යොමු කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ තිස්ස කරල්ලියැද්ද ඇමතිතුමාත් මේ කාරණය දන්නවා. පදවිය රෝහලට රොටරි සමාජයෙන් dialysis machines 6ක් දුන්නා. අඩුම තරමින් ඒ මැෂින් 6ට ඕනෑ කරන නිලධාරීන් දෙන්න මාස 6ක් යන කල් ආණ්ඩුවට -සෞඛ්‍ය අමාත්‍යාංශයට- බැරි වුණා. අපි තමුන්නාන්සේලාට කියන්නේ මේ ගැන සොයා බලන්න කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ මාළිගාවත්ත රෝහලේ වකුගඩු ඒකකයේ සැත්කම් ගැන "රිවිර" පත්තරයේ තිබෙනවා. වකුගඩු සැත්කම් සඳහා පෝලිමේ හිටපු 200දෙනෙක් මැරිලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තමුන්නාන්සේගෙන් අහනවා. මේවා ජීවිත නොවෙයිද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මාළිගාවත්ත රෝහලේ වකුගඩු ඒකකය ක්‍රියාත්මක වන්නේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
දැන් එහි අධ්‍යක්ෂවරයා මාරු කරලා. හැබැයි, 200දෙනෙකු මරුණාට පස්සේ තමයි අධ්‍යක්ෂ මාරු කරලා තිබෙන්නේ. කවුද ඒ ජීවිතවලට වග කියන්නේ?

අද අනුරාධපුර රෝහලේ ලියා පදිංචි රෝගීන් සංඛ්‍යාව ගැන ඇහුවොත් මා හිතන්නේ තමුන්නාන්සේලාට පුදුම හිතෙයි. සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්නවා නේ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේවා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්ම ගත්තු දත්ත. මා කියන්නම් පරණ රෝගීන්ට අමතරව සිටින අලුත් රෝගීන් සංඛ්‍යාව. 2009 දී 1,143දෙනයි අලුතින් ලියා පදිංචි වූ අය. 2010 වෙන කොට 1,451යි. ඒ විතරක් නොවෙයි. 2011 වෙන කොට ඒ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා තවත් 1,200 ගණනකින්. ඒ අවුරුදු 3ට අලුත් රෝගීන් 4,118 දෙනයි. මෙය අනුරාධපුරයට විතරක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා මීට කලින් සෞඛ්‍ය ඇමතිතුමාගෙන් අහපු ප්‍රශ්නයකට උත්තර දුන්නේ ඒ ප්‍රමාණය එකසිය ගණනයි, දෙසිය ගණනයි කියලා. අනුරාධපුරය රෝහලේ ලියා පදිංචි වෙලා, අනුරාධපුරය රෝහලේදී මැරුණු අයගේ ගණන විතරයි ඒ දෙන්නේ. යම් රෝගියකුගේ වයස අවුරුදු 48ක් නම්, ඒ රෝගියාගේ මරණ වරෙන්තුව ලියා දීලායි තිබෙන්නේ. ඉස්පිරිතාලෙන් කියනවා, අවුරුදු 48ට වැඩි රෝගීන්ගේ dialysis කිරීම නවත්වනවා කියලා. ඒ අය ගෙදරට ගෙනිහින් කන්න බොන්න තිබෙන දෙයක් දීලා සාත්තු සප්පායමක් කරන්න කියනවා. ඊට පස්සේ තියෙන්නේ අවසන් කටයුතු කරන්නයි. ඒ ටික තමයි අද අපට උරුම වෙලා තිබෙන්නේ. ඒ නිසා මේක ජාතික ප්‍රශ්නයක්. අපි මේවා කියන්නේ ආණ්ඩුවට මඩ ගහන්නවත්, වෙනත් දෙයක් හන්දාවත් නොවෙයි. කරුණාකර ජාතික ව්‍යසනයක් හැටියට සලකා මේ රෝගය වැළැක්වීමට කටයුතු කරන්න කියන එක තමයි මා ඉල්ලන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙලාවේ අපේ කෘෂිකර්ම ඇමතිතුමා ඉන්නවා. එතුමා බොහොම හොඳ වැඩක් කළා. විෂ අධික රසායන ද්‍රව්‍ය කියලා කෘෂි රසායන ද්‍රව්‍ය හතරක් එතුමා තහනම් කළා. හැබැයි, ඒ කෘෂි රසායන ද්‍රව්‍ය හතර ආනයනය කිරීම විතරයි තහනම් කරලා තිබෙන්නේ. මම ඇහුවා, එතකොට මේ රටට ගෙනැල්ලා තිබෙන ඒවාට මොකද කරන්නේ කියලා. එතුමා පසු ගිය 24වැනි දා පාර්ලිමේන්තුවේදී මට උත්තරයක් දුන්නා, මේවා පාරිභෝගික අධිකාරියටයි, පොලීසියටයි කියලා අල්ලන්න පුළුවන් කියලා. මේක කෘෂිකර්ම ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේදී කියපු කථාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කථා කළා පොලිස්පතිතුමාගේ කාර්යාලයට. මේ කෘෂි රසායන ද්‍රව්‍ය අල්ලන්න ඔබතුමන්ලාට බලයක් දීලා තිබෙනවාද කියලා මම ඇහුවා. "නැහැ, අපට එහෙම දැනුම් දීමක් නැහැ." කිව්වා. මම ඇහුවා පාරිභෝගික අධිකාරියෙනුත්. පාරිභෝගික අධිකාරියෙන් කිව්වා, "අපට එහෙම එකක් කියලා නැහැ. අපි මේ සම්බන්ධ විශේෂඥයනුත් නොවෙයි." කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක් තිබෙනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මට විනාඩි 10ක් තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
විනාඩි 10ක් ගතවෙලා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
නැහැ, නැහැ. තව ඉවර වුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙකක් දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ වේලාවෙන් විනාඩි 4ක කාලයක් ලැබෙනවා. ඔබතුමාගේ කාලයෙන් තව ඉතිරිව තිබෙන්නේ විනාඩියක කාලයක් පමණයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
බොහොම ස්තුතියි. ඔබතුමා හොඳ කෙනකු නිසා ඔබතුමා ගණනේත් මට විනාඩියක් දෙකක් දෙන්න.

මම පොලීසියෙන් ඇහුවා. පොලීසියෙන් කිව්වා කසිප්පුකාරයෝ අල්ලන්න අපට බලයක් තිබෙනවා. හැබැයි, මේ කෘෂි රසායන ද්‍රව්‍ය අල්ලන්න බලයක් නැහැ කියලා. පාරිභෝගික ආරක්ෂක අධිකාරිය කිව්වා අපට කන බොන දේවල් පරීක්ෂා කරන්න පුළුවන් කියලා. ගරු කෘෂිකර්ම ඇමතිතුමනි, තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුවේදී මම අහපු ප්‍රශ්නයකට පිළිතුරු දීලා එහෙම කරන බව කිව්වා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

මේ අවස්ථාවේ දී ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි පොලීසිය කිව්වා, කසිප්පුකාරයකුගේ කට ඉඹලා පරීක්ෂා කරන්න පුළුවන්, බැලුම පුම්බලා පරීක්ෂා කරන්න පුළුවන්, නමුත් අපි කොහොමද කෘෂි රසායනික ද්‍රව්‍ය පරීක්ෂා කරන්නේ කියලා. පොලීසිය කිව්වා අපට ඒ සඳහා බලයක් නැහැ කියලා. පාරිභෝගික ආරක්ෂක අධිකාරියත් එහෙම කිව්වා. දැන් මේකට ඔබතුමන්ලා මොකක්ද කරලා තිබෙන්නේ? සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන්ට ලියුමක් යවලා තිබෙනවා කාබෝෆියුරාන්, කාබරිල්, ප්‍රොපනිල් සහ තවත් රසායනික ද්‍රව්‍යයක් තහනම් කරන්න කෘෂිකර්ම උපදේශකවරුන් සමඟ සාකච්ඡා කරන්න කියලා. ඉස්පිරිතාලේ ඉන්න දොස්තර මහත්වරුන්ට පුළුවන්ද කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන් පස්සේ යන්න මේ කටයුතු කරන්න? ඒක කෙරෙන්නේ නැහැ. මේවා තහනම් කරන්න තමුන්නාන්සේලාට චුවමනාවක් තිබෙනවා නම් කරන්න ඕනෑ මේකයි. ලංකාවට chemicals ගෙන්වන කොම්පැනි තිබෙනවා. ඒ වාගේම ඒවා විකුණන කඩ තිබෙනවා. ඒ කඩ ප්‍රමාණය කොපමණද කියලා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ ලැයිස්තු තිබෙනවා. මේ රටේ කෘෂි පර්යේෂණ නිලධාරීන් 10,000ක් ඉන්නවා. ඒ අය යොදවලා ඒ ලැයිස්තුව අනුව දවස් දෙකෙන් මේ පරීක්ෂාව කරලා ඉවර කරන්න පුළුවන්. ඇයි ඒක කරන්නේ නැත්තේ?

ගරු කෘෂිකර්ම ඇමතිතුමනි, මම තමුන්නාන්සේට කියන්නම්. තව අවුරුදු දෙකකට ඇති වෙන්න කෘෂි රසායනික ද්‍රව්‍ය මේ රටට ගෙනැත් තිබෙනවා. පෞද්ගලික කොම්පැනිකාරයෝ තමුන්නාන්සේලාට මේවා පාලනය කරන්න දෙන්නේ නැහැ. ඒ මාෆියාව තමුන්නාන්සේට ඒ කාර්ය කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා රටේ අවශ්‍යතාවක් හැටියට සලකලා මේ සඳහා පියවර ගන්න ඕනෑ.

අපට, අපේ ප්‍රදේශයට මේ ප්‍රශ්නය තදින්ම දැනෙනවා. අපේ කරල්ලියැද්ද ඇමතිතුමාට කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. හෙට අනිද්දා වන විට උතුරු මැද පළාතේ ගෑණු ළමයෙක් දීග දෙන්න හම්බ වෙන්නේ නැහැ. අපි දන්නා විධියට ඉස්සර නම්, කුජ 7ද, සිකුරු 8ද, කොටද, උසද කියන ප්‍රශ්න තමයි විවාහයකදී බැලුවේ. දැන් එහෙම නොවෙයි. දැන් ඉල්ලන්නේ වකුගඩු පරීක්ෂණය කළ ස්කෑන් වාර්තාවේ පිටපතක්. කේන්දර පිටපතක් සමඟ වකුගඩු ස්කෑන් කළ වාර්තාවේ පිටපතක් තමයි දැන්ඉල්ලන්නේ. එහෙම නැත්නම් ගෑණු ළමයකු දීග දෙන්නට ලැබෙන්නේ නැහැ. උතුරු මැද පළාතේ ගෑණු ළමයකු කොහොමටවත් දීග දෙන්න ලැබෙන්නේ නැහැ. එහෙම නැත්නම්, වකුගඩුවක් බද්ධ කරන්නට කෙනකු ලෑස්ති කර ගෙන තමයි කසාදයක් බඳින්න වෙන්නේ. අද ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේක බැරෑරුම් ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි මම ඔබතුමියට මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. අපේ කෘෂිකර්ම ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. මම දන්නවා එතුමා මේ ප්‍රශ්නය විසඳන්නට යම් උත්සාහයක් ගන්නවා කියලා. ඒක අපි අගය කරනවා. නමුත් එතුමා උත්සාහ ගත්තාට ඒවායේ ප්‍රතිඵල නැහැ. දැන් තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ තිබෙන පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය දිහා බලන්න. මේ රටට ගෙනෙන කෘෂි රසායනික ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා ඒ කාර්යාලයේ තිබෙන machines කැඩිලා දැනට අවුරුදු 15ක් වෙනවා. අවුරුදු 15ක්! අද ඒවා හදන්න වැඩ පිළිවෙළක් නැහැ. ඒවා හදන්නේ නැත්තේ ඇයි? මේ රටට කෘෂි රසායනික ද්‍රව්‍ය ගෙනෙන කොම්පැනි 4ක් 5ක් තිබෙනවා. වරායේදී මේ කෘෂි රසායනික ද්‍රව්‍ය තහනම් කළාට පස්සේ, අපේ ගරු අතුරලියේ රතන නායක ස්වාමීන් වහන්සේගේ වියදමින් මැලේසියාවට ගිහින් ඒවා පරීක්ෂා කරලා ගෙනාව වාර්තා ටික පදනම් කර ගෙන පරිසර සංවිධාන සමඟ එකතු වෙලා නඩු දැම්මා. නමුත් අන්තිමේදී පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්ගේ ලියුමෙන් ඒ containers 16ම නිදහස් කළා. මොකක්ද ඒකට හේතුව? පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා දන්නවාද සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව කියන්න. මේවා ශරීරවලට විෂ නැහැ කියලා පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයාගේ ලියුම ගියාම, උසාවියේ නීත්‍යුවත් ඒ විධියටම ගියා. උසාවියේ නඩුව දාලා දවස් දෙකක් යන විට කිව්වා, අපි ඒවා බෝතල් කරලා බෙදා හැරලාත් ඉවරයි කියලා.

මේකයි තත්ත්වය. පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්ගේ ඉඳලා සිදු වන මේ මාෆියාව, අද මේ රටේ වකුගඩු රෝගීන්ගේ ජීවිතවලට සම්පූර්ණයෙන් වන්දි ගෙවන්න ඕනෑ. වකුගඩු රෝගය නිසා ජීවිත අහිමි වූ අයගේ පවුල්වලටත්; ඒ වාගේම අද මේ රෝගයෙන් පෙළෙන ලක්ෂ ගණනක මිනිස්සුන්ගේ පවුල්වලටත් මේ කෘෂි රසායන කොම්පැනිකාරයන්ගෙන් වන්දි අය කරලා දෙන්න අනිවාර්යයෙන්ම රජය මැදිහත් වන්න ඕනෑය කියලා මම කියනවා. ඒක තමයි අපේ ඉල්ලීම. ඒක කෙරුවේ නැත්නම් ඒ පවුල් සම්පූර්ණයෙන් විනාශ වනවා. උතුරු මැද පළාතේ යුද්ධයෙන් මැරුණු මිනිස්සුන්ට වැඩි ප්‍රමාණයක් අද වකුගඩු රෝගය නිසා මැරෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මට විනාඩියක් දෙන්න.

යුද්ධයෙන් මැරුණු මිනිස්සුන්ට වැඩි ප්‍රමාණයක් අද වකුගඩු රෝගය නිසා මැරෙනවා. හැබැයි, ඒ ගැන අද කවුරුත් කථා කරන්නේ නැහැ. ඒ ගැන මම ඉතාමත් කනගාටු වනවා. මොකද, උතුරු මැද පළාතේ ජනතාවගෙන් වැඩි පිරිසක් ඉන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට ඡන්දය දීපු අයයි. ඒක මම කියනවා. හැබැයි අද ඒ මිනිස්සු වෙනුවෙන් මේ රටේ හඬක් නැහෙන්නේ නැති එක ගැන අපි කනගාටු වනවා.

ඒ නිසා මේ ප්‍රශ්නය ජාතික ප්‍රශ්නයක් හැටියට සලකා කටයුතු කරන්න කියන ඉල්ලීම අපි ආණ්ඩුවට කරමින්, මූලාසනයේ සිටින ඔබතුමියටත් ස්තුති කරමින් මම නිහඬ වනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු තිස්ස කරල්ලියද්ද අමාත්‍යතුමා.

[අ.භා. 4.29]

ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමාගේ අදහස් ප්‍රකාශ කිරීමෙන් පසුව මට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට සුබ ප්‍රාර්ථනා කරන්න ඕනෑ, අද ඔබතුමාගේ උපන්දිනය නේ.

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමාගේ උපන් දිනයට මූලාසනයෙනුත් සුබ පැතුම් ගෙනෙනවා.

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

බොහොම ස්තුතියි, ඔබතුමිය කාන්තාවක්, මම කාන්තා කටයුතු විෂය භාර අමාත්‍යතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

වයස කීයද?

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

නොදැවී 61යි. හංගන්න දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ මතකය නිවැරැදි නම්, මේ මාතෘකාව සම්බන්ධයෙන් මම මීට පෙර මේ උත්තරීතර සභාවේ අවස්ථා තුන, හතරකදී අදහස් ප්‍රකාශ කරලා තිබෙනවා. 1998ත්, 2000ත් අතර කාල වකවානුව තුළදී තමයි අද මේ කථාවට ලක් වුණු මැදවච්චිය ආසනයේ පදවිය ජනපදයේ මේ ප්‍රශ්නය ඇති වුණේ. පදවිය ජනපදය නැවත ආරම්භ කරලා මේ වෙන කොට අවුරුදු 50ක්, 55ක් වනවා කියලා මම හිතනවා. මේ ජනපදයේ හැම ස්ථානයකින්ම ජලය ගෙනැල්ලා පර්යේෂණයක් පැවැත්වුවා. ඒ පර්යේෂණ වාර්තාව මට ලැබෙන කොට ඒ වාර්තාවේ සඳහන් වෙලා තිබුණු කාරණා අද තරම් ස්ථිරභාවයකින් නොවෙයි ප්‍රකාශ කරලා තිබුණේ. මෙන්න මේ කාරණා වකුගඩු රෝගයට හේතු වන්න පුළුවන් කියලා එහි කාරණා කීපයක් සඳහන් වුණා.

ඉන් එකක් තමයි, බීමට නුසුදුසු තහනම් මත් ද්‍රව්‍ය -අපේ භාෂාවෙන් කියනවා නම්, කසිප්පු- පානය කිරීම. ඒක මේ රෝගයට හේතුවක් වන්න පුළුවන්. දෙවැනි කාරණාව තමයි, උතුරු මැද පළාතේ ජනතාවට වතුර තිබහ දැනෙන්නේ නැහැ කියන එක. එම නිසා ඒ ජනතාව දිනකට අවශ්‍ය වතුර ප්‍රමාණය පානය නොකිරීම. විශේෂයෙන් පිරිසිදු වතුර පානය නොකිරීම. තුන්වැනි කාරණාව තමයි, දැන් මොහොතකට කලින් කියපු බාල වර්ගයේ ඇලුමිනියම් භාජනවල ඉවුම් පිහුම් කිරීම. හතරවැනි කාරණාව තමයි, දීර්ඝ කාලීනව කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ ගොඩ මඩ වගාවන්ට කෘත්‍රිම පොහොර සහ කෘමි නාශක භාවිත කිරීම.

මෙම වාර්තාව ලැබුණත්, මට කර ගන්න දෙයක් තිබුණේ නැහැ. නමුත් මම 2000 වර්ෂයේදී දේශීය වෛද්‍ය අමාත්‍යවරයා හැටියට පත් වුණාට පස්සේ බාල වර්ගයේ ඇලුමිනියම් භාජන ඉවත් කරන්න කැලි 7ක මැටි වළං කට්ටලයක් පක්ෂ භේදයෙන් තොරව ග්‍රාම සේවා වසම් මට්ටමෙන් හැම නිවසකටම බෙදා දුන්නා. මේ කාලයේ වෙළඳ පොළේ මැටි භාණ්ඩ තිබුණේ නැහැ. ප්ලාස්ටික් භාජනවලටත්, ඇලුමිනියම් භාජනවලටත් තමයි ජනතාව හුරු වෙලා තිබුණේ. ඒ නිසා මම අනුරාධපුරය දිස්ත්‍රික්කයේ කුඹල් කර්මාන්ත ගම්මාන 24ක් පණ ගැන්වුවා.

1,50,000කට වැඩි සංඛ්‍යාවකට මැටි වළං කට්ටල බෙදා දුන්නා. මේ ප්‍රදේශවලට පමණක් නොවෙයි, දකුණු පළාතටත් බෙදා දුන්නා. උතුරු පළාතටත් බෙදුවා. තිබෙන ප්‍රතිපාදනයන් තුළ ඕවා බෙදනකොට තමයි අර කථාවක් කිව්වේ, ඡන්දය කාලයේත් බෙදුවා කියලා. ඡන්ද කාලයේ මම ඡන්දය ලබා ගත්තේ භාණ්ඩ බෙදා දීලාවත්, වෙන වෙන දේවල් දීලාවත් නොවෙයි. අපි කරපු සේවාව මත ජනතාව අතරට ගිහින් ජනතාවගේ කැමැත්ත මත අපි ඡන්දය ලබා ගන්නවා. ඒ නිසා මේ දක්වා එහෙම බොළඳ දේශපාලනයක් මා කරලා නැහැ. නමුත් තෝරා බේරාගෙන සෑම ග්‍රාම සේවා වසමක්ම පුළුවන් තරම් දැනුවත් කළා. අද බොහෝ දෙනෙක් මැටි වළං පරිභෝජනය කිරීම ගැන අපි සතුටු වෙනවා. ඉතින් මේක තමයි ඒ කාලයේ තිබුණු තත්ත්වය. අද මොකක්ද වාර්තාව? ඒ කාලයේ මට හිනා වුණා, මම මේවා කියනවා කියලා. මේවා ඉදිරිපත් කරනකොට කිව්වේ, බොළඳ තර්ක කියලා යි. අද වාර්තාවයි, එදා වාර්තාවයි සංසන්දනය කරලා බලන්න. එදා කියපු දේම තමයි අද වෛද්‍ය වාර්තාවලත් තිබෙන්නේ. මා එදා ක්‍රියාත්මක කළ එම වැඩ පිළිවෙළ ගැන සාක්ෂි දරන නිලධාරීන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිටිනවා.

වෛද්‍ය බෙලිගස්වත්ත මැතිතුමා නුවර රෝහලක් ආරම්භ කළ බව අපට මතකයි. ඒ වාගේම අනුරාධපුරයේත් රෝහලක් ආරම්භ කළා.

කාල වේලාව නොමැති නිසා මම කෙටියෙන් කියන්නම්. ලෝක සෞඛ්‍ය සංවිධාන දිනය වෙනුවෙන් තෝරා ගත්තේ මැදවච්චිය ආසනයේ මහ දිවුල් වැව කියන ග්‍රාම නිලධාරී වසමේ ගුරුකන්දේගම කියන ග්‍රාමය -මෙහිදී තිලක් අබේසේකර මැතිතුමාවත් සිහිපත් කරන්නට ඕනෑ.- කොඩියබැන්ද වැව කියන ග්‍රාමවල තමයි වැඩියෙන්ම වකුගඩු රෝගීන් සිටිනවාය කියලා හඳුනාගත්තේ. ඒ සඳහා පරීක්ෂණ කර ඒ අයට අවශ්‍ය උපදෙස් මාලාවන් ලබා දෙමින් කටයුතු කළා. සෞඛ්‍ය අමාත්‍යාංශය නිදාගෙන සිටියේ නැහැ. එහෙම කියන්න නරකයි. මට මතකයි, නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ දීත් ඒ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කරමින් එම වැඩ පිළිවෙළ කරගෙන ගියා. වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාත් වෛද්‍යවරුන් සමඟ එකතු වෙලා මේ පර්යේෂණ සඳහා අවශ්‍ය සෑම දෙයක්ම ඒක රාශී කරනවා.

[ගරු තිස්ස කරල්ලියද්ද මහතා]

මේ වකුගඩු රෝගය වැලඳෙන්නේ කෙසේද? දියවැඩියා රෝගයත් අවසානයේ වකුගඩුවලට බලපානවා කියලා මා හිතනවා. ඒ නිසා , කාලයෙන් කාලයට එන විවිධ රෝග වර්ගවලට ප්‍රතිකාර කිරීම සඳහා යම් කිසි කාල වකවානුවක් අවශ්‍ය වෙනවා. විද්‍යාව කොතරම් දියුණු වුණත් ඒ සම්බන්ධයෙන් පර්යේෂණ කරලා නිසි ප්‍රතිකාර ලබා දීමට යම් කිසි කාල වකවානුවක් අවශ්‍ය වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා දකින හැටියට අනෙක් කාරණාව තමයි ජීවන රටාව වෙනස් වීම. ගම්වලත් අපේ ජීවන රටාව වෙනස් වෙලා තිබෙනවා. එදිනෙදා ගනු ලබන ආහාර වර්ග වෙනස් වෙලා තිබෙනවා. ඉස්සෙල්ලාම හේනේ කැකිරි ටිකක් හිටවන්නේ ඇයි? කෂ්ටක දිය තිබහට කැකිරි ගෙඩිය කපලා ඇට ටිකත් එක්ක හපලා කනකොට මූත්‍රාශයේ තිබෙන වැලි කැට කුඩු වෙලා මූත්‍රාත් සමඟ පිට වෙනවා. හැබැයි ඒ කාලයේ හිටෙව්වේ පොහොර ගහපු කැකිරි නොවෙයි. අද උතුරු මැද පළාතේ රණවරා කෝප්පයක් බොන ගෙයක් බලන්න සොයන්න. අපට මතකයි අපි පොඩි කාලයේ රණවරා බිව්වා. මේ කෂ්ටකයට රණවරා කෝප්පයක් බොන්න ඕනෑ. ඒ නිසා ජීවන රටාව, ආහාර රටාව වෙනස් වීම තුළත් කඳට විවිධ රෝග ඇවිල්ලා තිබෙනවා. මේ රටේ ඉදිවෙලා තිබෙන රෝහල් දිහා බැලුවාම, මේ රෝහල්වලට ප්‍රතිකාර ලබා ගන්නට එන රෝගීන් දිහා බැලුවාම, ඇයි මෙච්චර ලෙඩ රෝග හැදෙන්නේ කියන එක ගැන අපට අධ්‍යයනයක් කරන්නට සිදු වෙනවා. එහෙම නම් අපේ ජීවන රටාවේ දී එදි නෙදා පාවිච්චි කරන යම් යම් දේවලුත් එයට හේතු වෙනවා.

මැදවච්චිය රෝහලේ, කැබිතිගොල්ලෑව රෝහලේ, පදවිය රෝහලේ, දිනකට රෝගීන් 55 දෙනෙක් පරීක්ෂාවට ලක් කරන්නටත්, රුධිර කාන්දු ඒකකයට ඇතුළත් කර, ඒ ප්‍රතිකාර සහ පර්යේෂණයන් සිදු කර ගැනීමට පහසුකම් ලබා දීමටත් නොබෝදා අපි කටයුතු කළා. මැදවච්චිය රෝහලේත් දැනට මේ කටයුත්ත ආරම්භ කර තිබෙනවා. ඊයේ පෙරේදා අපේ නියෝජ්‍ය ඇමතිතුමා එහෙම ඒ ස්ථානයට ගිහිල්ලා පරීක්ෂා කර බලා, එහි ප්‍රතිසංස්කරණයක් කරන්න කිව්වා. ඒ සඳහා දැන් මුදල් වෙන් කර තිබෙනවා. ඒ නිසා අපි මෙහෙම කටයුතු කළොත් හොඳයි කියලා මා කල්පනා කරනවා. වැඩියෙන්ම වකුගඩු රෝගය තිබෙන ප්‍රදේශවල, අප තෝරාගත් කලාපවල රසායනික පොහොර භාවිතය අඩු කරලා, කොම්පෝස්ට් පොහොර භාවිත කිරීමේ යම් කිසි ක්‍රමවේදයක් ආරම්භ කරන්නට පුළුවන්. එහෙම නැත්නම් පොහොර නැතිව අස්වැන්න වැඩි කර ගන්නට බැහැ යි කියලා අපිට නොගැළපෙන පොහොරම යොදලා අපි වැඩේ කරනවා නම්, එහෙම නම් මේක අමතක කරලා දමන්න. තෝරා ගත් ප්‍රදේශවල - වැඩියෙන්ම උතුරු මැද පළාතේ, පොළොන්නරුව ප්‍රදේශයේ - තමයි මේ රෝගය තිබෙන්නේ. හැබැයි මේ ලංකාවේ තිබෙන අනෙකුත් රෝගත් එක්ක සංසන්දනය කරලා බැලුවාම මෙම රෝගය අඩු ප්‍රතිශතයක් තිබෙන්නේ. නමුත් රෝගයක් තිබෙනවා.

අද වෛද්‍ය ක්ෂේත්‍රය විශාල උනන්දුවකින් කටයුතු කරනවාය කියන එක මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. විවේචනය කරන්න බොහොම ලෙහෙසියි. මේක මිනිසාගේ කඳට අද ඊයේ ආව දෙයක් නොවෙයි. මේක මිනිසාගේ කඳට ක්ෂණිකව එන දෙයක් නොවෙයි. මේ රෝගය එන්න අවුරුදු විසිපහක් තිහක් වාගේ කාලයක් ගත වෙනවා. පදවි ජන ප්‍රදේශ අවුරුදු පණස් ගණනක් ගොවිතැන් කළ ජන ප්‍රදේශ. මේ ප්‍රදේශවල මේ රෝගය ඇති වීමට තව තව හේතු තියෙන්න පුළුවන්. කාලයක් කිව්වා, ප්ලාස්ටික් වතුර බෝතල්වල වතුර බීලා ඒවා විසි කර දමන්නය, ඒවායෙන් නැවත වතුර බොන්න එපාය, ඒකත් වකුගඩු රෝගයට බලපානවාය කියා. ඒ වාගේම කථාවක් හැදුණා, දීර්ඝ කාලීන යුද්ධය වාතාවරණයක් පැවති ප්‍රදේශයකට අසන්නයේ පිහිටා තිබෙන කැබිතිගොල්ලෑවේත්, පදවියේත් අර බෝම්බවල දුම ආශ්වාස ප්‍රශ්වාස කිරීම තුළින් මේ රෝගය හට ගත්තාය කියා.

ලංකාවේ හොඳම උල්පත් ජලය තිබෙන්නේත් කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ. [බාධා කිරීමක්] ඔව්. කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ. ඒ ප්‍රදේශයේ තමයි ලංකාවේ හොඳම උල්පත් ජලය තිබෙන්නේ. ඒක ඔප්පු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් ඒ බව දන්නවා. ඒ වාගේම බීමට නුසුදුසු ජලයත් තිබෙනවා. නෙළුම් අලත් කන්න එපාය කිව්වා. ඒක නොවෙයි, ලොකුම විහිළුව, ලූල් මාළු කන්නත් එපාය කිව්වා. අප දන්නා කාලයේ ඉඳන් ගම්වල දරුවෙක් ලැබෙන්න ඉන්න කාන්තාවකට වැඩියෙන්ම කන්න කිව්වේ, ලූල් මාළු. මොකද? ලේ උනනවාය කියා. දැන් ඇයි ඒ ලූල් මාළු කන්න එපාය කිව්වේ?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමාට නියමිත කාලය අවසානයි.

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමියනි මට තව විනාඩියක් දෙන්න. ඇයි නෙළුම් අල කන්න එපාය කිව්වේ? වැවේ ඉහත්තාවේ තිබෙන කුඹුරුවලට යොදපු රසායන පොහොර, කෘමි නාශක මිශ්‍ර ජලය සෝදා ගෙන එන්නේ වැවට. වැවේ ඉන්න ලූලාත් ඒ මඩ කනවා. නෙළුම් අලවලටත් අර විෂ උරා ගන්නවා. ඒකයි. නමුත් ඒ කාලයේ අප වැවෙනුයි වතුර බිව්වේ. ඉඟිනි ඇට ටිකක් දාලා වතුර ශුද්ධ කරලා වතුර බිව්වේ. එහෙම නැත්නම් උණු කරලා, නිවලා, මැටි මුට්ටියක දාලා තමයි වතුර බිව්වේ. එම නිසා මේක දීර්ඝ කාලීනව සමීක්ෂණ, පර්යේෂණ මඟින් කළ යුතු දෙයක්. මේක බොත්තම එබුවාම වෙන දෙයක් වාගේ විසඳන්න පුළුවන් දෙයක් නොවෙයි. එම නිසා අපේ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය අමාත්‍යතුමාත්, සියලුම නිලධාරීනුත් මේ වෙනුවෙන් කැපවීම් කරන නිසා ද්වේෂ සහගතව යමක් ඉදිරිපත් කරනවාට වඩා, පක්ෂ භේදයෙන් තොරව අදහස් ඉදිරිපත් කර මේ සඳහා සහාය වීම වැදගත් වෙනවා.

එදා පක්ෂ භේදයෙන් තොරවයි කොටි අපට ගැහැව්වේ. පක්ෂ භේදයෙන් තොරවයි වකුගඩු රෝගයත් වැළඳෙන්නේ. එම නිසා මේ සඳහා වැඩ පිළිවෙළක් රජයෙන් ක්‍රියාත්මක වෙනවාය කියන එක ප්‍රකාශ කරන්න ඕනෑ. නියත පර්යේෂණයක් කරලා අපට ප්‍රතිඵල හඳුනා ගන්නට තිබෙන නිසා, එහි ප්‍රතිඵල අපට ගන්නට ටිකක් ප්‍රමාද වෙයි කියන එකත් මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව සමාප්ත කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු අමාත්‍යතුමනි. ඊළඟට ගරු එස්.එම්. චන්ද්‍රසේන නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 4.40]

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන් රජ රටට බලපාන වකුගඩු රෝගය පිළිබඳව මේ උත්තරීතර සභාවේ සාකච්ඡා කිරීම ඉතාම වැදගත් වෙනවා. දේශපාලනය ඇදාගෙන කථා කරන්නට ගියොත් මේකේ වටිනාකම නැති වෙන එකත් අප කියන්නට ඕනෑ. මෙම රෝගයේ ආරම්භය හැටියට කියනවා නම්, 2000 වර්ෂයේ යි මේ රෝගය හුහක් දුරට හඳුනා ගත්තේ. මේ 2013 අවුරුද්ද. දැන් සෑහෙන කාලයක් වෙලා.මේක රජයකටවත්, ආණ්ඩුවකටවත් ඇතිල්ල දිගු කරන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මේක අප කාටත් පොදුවේ මුහුණ දෙන්නට වෙලා තිබෙන වසංගතයක්. අනුරාධපුරයේ, මැදවච්චිය මැතිවරණ කොට්ඨාසයේත්, මා නියෝජනය කරන හොරොව්පතාන මැතිවරණ කොට්ඨාසයේත් බහුල වශයෙන් මේ රෝගය පැතිරී තිබෙනවා. වැමොල්ලෑගොඩ කියන ගමේ ඉන්නේ පවුල් 300යි. ඒ 300න් 30 දෙනෙක් මේ රෝගයෙන් මිය ගිහින් තිබෙනවා. මේ රෝගය උග්‍ර තත්ත්වයට පත් වෙලා සියයට 10ක ප්‍රමාණයක් මිය ගිහින් තිබෙන ගම්මාන තිබෙනවා. මේ වාගේ ගම්මාන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා ලක්ෂ හතරහමාරක් මේ රෝගයට ගොදුරු වෙලා තිබෙනවාය කියා. ඒක නම් අපට පිළිගන්නට බැහැ. ඒවා කොහෙන් සොයා ගත් සංඛ්‍යාලේඛන ද කියා මා දන්නේ නැහැ. අප යථාර්ථවාදීව කථා කරන්නට ඕනෑ. දේශපාලන වශයෙන් ආණ්ඩුවට පහර ගැසීමවත්, මේ තිබෙන තත්ත්වය විකෘති කර කථා කිරීමවත් සුදුසු නැහැ. මේක කාටත් පොදු ප්‍රශ්නයක්. ගරු තිස්ස කරල්ලියැද්ද ඇමතිතුමා කිව්වා වාගේ මේකට දේශපාලන භේදයක් නැහැ. අනුරාධපුර රෝහලට එන වකුගඩු රෝගීන් අතර හැම පක්ෂයකම අය ඉන්නවා.

විශේෂයෙන්ම අප අනුමාන කරන දේවල් තිබෙනවා. අපේ පූජ්‍ය රතන ස්වාමීන් වහන්සේත් අනුමාන කරන දේවල් තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ. ඒක තමයි. ඒවා තවම කවුරුවත් හරියට ස්ථිර කර නැහැ. ඒකත් කියන්න එපායැ. [බාධා කිරීමක්]

ඒ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා මෙවර -2013- අය වැයෙන් කාබනික පොහොර හැකි තරම් පාවිච්චි කරන්න පුළුවන් වන විධියට ඒ අවශ්‍ය කටයුතු සකස් කර තිබෙන්නේ. රසායනික පොහොර සහ කෘමිනාශක පාවිච්චිය වැඩි නිසා මේ තත්ත්වය ඇති වන බවට දැඩි මතයක් තිබෙනවා. ඒකට පිළිතුරක් හැටියට තමයි කාබනික පොහොර වාගේම සාම්ප්‍රදායික කෘමිනාශක වැනි දේවල් පාවිච්චි කිරීම සුදුසුයි කියා කල්පනා කරලා අතිගරු ජනාධිපතිතුමා කාබනික පොහොර ප්‍රවර්ධනය කරන්න කෘෂිකර්ම අමාත්‍යාංශයට, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට උපදෙස් දීලා තිබෙන්නේ. අපි ඒ කටයුතු දැනට කරගෙන යනවා. ඉතින් ඒකට දේශපාලනයකින් තොරව සියලු දෙනාගේම සහයෝගයත් අවශ්‍ය වනවා. නමුත් පොහොර භාවිතය ටිකක් අඩු කරන්න ලෑස්ති වෙන කොට ඇතැම් අය සටන් පාඨ කියනවා, පොහොර සහනාධාර කපන්න යනවා, අඩු කරන්න යනවා කියලා. ඒකටත් පෙළ පාළි යනවා. ඒ වාගේම වකුගඩු රෝගය හැදුණාමත් රුපියල් ලක්ෂ 10ක්, 15ක් දෙන්න කියලා ඒ පැත්තෙනුත් පෙළ පාළි යනවා. ඉතින් මේක තමයි තිබෙන ගැටලුව. මේකෙන් දේශපාලන වාසි ගන්න එපාය කියන්නේ ඒකයි. විද්‍යාඥයින්, වෛද්‍යවරු, අපේ රටේ උගත්තු ඇතුළු අපි සියලුම දෙනා එකතු වෙලා පොදුවේ මේ කාරණය පිළිබඳව සංවාදයක් ඇති කරගෙන-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සංවාදයක් ඇති කරන කොට කී දෙනෙක් මැරේවිද දන්නේ නැහැ.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ඒ කියන්නේ, අවුරුදු ගණන් සංවාද කරන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේලාත් කියන්නේ, එක එක මතවලට යන්නේ නැතිව කථා කරලා, සාකච්ඡා කරලා, කමිටුවක් හදාගෙන, එක තැනකට ඇවිල්ලා කටයුතු කරමු කියලානේ. ඒකයි මම කිව්වේ. පළමුව මේකේ රෝග නිධානය මොකක්ද කියලාත් අපි හොයා ගන්න ඕනෑ. එහෙම නැතිව ප්‍රතිකාර කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා කාබනික පොහොරවලට වාගේම සාම්ප්‍රදායික කෘමිනාශක යෙදීම වැනි දේවල්වලට යන්න ඕනෑ කියලා රජයක් හැටියටත් අපි විශ්වාස කරනවා; මගේ පෞද්ගලික මතයත් ඒකයි.

ඊළඟ කාරණය, මේ වකුගඩු රෝගයට ජලය බලපානවා කියන කාරණය. මමත් ඒක පිළිගන්නවා. දැන් අපි නුවර පැත්තේ එහෙම නැත්නම් කඳුකර ප්‍රදේශයේ, බස්නාහිර පළාතේ හෝ දකුණේ වෙන්න පුළුවන් වතුර ටිකක් අරගෙන භාජනයකට දැම්මාම භාජනයේ අග මණ්ඩි වාගේ ද්‍රව්‍යයක් ඉතිරි වෙන්නේ නැහැ. නමුත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැඩියෙන්ම මෙම රෝගය තිබෙන රජරට ප්‍රදේශවල වතුර ටිකක් උණු කරලා තිබුණාම මණ්ඩි විශාල තොගයක් දකින්න ලැබෙනවා. ඒවායින් තමයි අපි අනුමාන කරන්නේ, වකුගඩු රෝගයට බලපාන යම් කිසි බනිජ වර්ග එහෙම නැත්නම් ඊට බලපාන සාධක වතුරේ තිබෙන්න පුළුවන් කියලා. ඉතින් අපි මේවා ගැන තමයි සැලකිලිමත් වෙන්න ඕනෑ. ඒ නිසා අපි ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට කිව්වා, ඒ ප්‍රදේශවලට පුළුවන් තරම් පිරිසිදු පානීය ජල පහසුකම් ලබා දෙන්න යොමු වෙන්න කියලා.

ඒ ප්‍රදේශවල හුහක් දුරට කසිප්පු භාවිතය තිබෙනවා. මේවාත් බලපානවා. මොකද, වකුගඩුවලට ඔරොත්තු දෙන්නේ නැති විධියට පාවිච්චි කරනවා. සමහර තැන්වල යූරියා දමා කසිප්පු පෙරන බව දැන ගන්න ලැබී තිබෙනවා. ඒවා පොලීසියට අහු වෙලාත් තිබෙනවා. යූරියා දමා කසිප්පු බිව්වාමත් වකුගඩු රෝගය එනවා. ඒකත් එක හේතුවක් බවට පත් වෙනවා. මේ වාගේ විවිධ දේවල් එකතු වෙලා තමයි අද මේ වසංගතය ඇති වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම රජයක් හැටියට අපි මේකට මුහුණ දෙන්න ඕනෑ. ඒ වාගේම විපක්ෂය -ප්‍රතිපක්ෂය- පැත්තෙනුත් මේක දේශපාලන ප්‍රශ්නයක් කර නොගෙන සාමූහික තැනකට ඇවිල්ලා, එක වගකීමකට ඇවිල්ලා කටයුතු කළොත් හොඳයි කියලා අපි හිතනවා. අපි විශ්වාස කරනවා, ඒකයි වෙන්න ඕනෑ කියලා. අද ලෝකයේ විද්‍යාව දියුණුයි; තාක්ෂණය දියුණුයි. මීට අවුරුදු දහස් ගණනකට ඉස්සෙල්ලා තිබුණු ලෝකය නොවෙයි දැන් තිබෙන්නේ. ඒ නිසා අපි එකතු වෙලා මේවාට ප්‍රතිකර්ම හොයන්න ඕනෑ. විශේෂයෙන් හුහාක් මේකට ගොදුරු වන්නේ ගොවි ජනතාව. සමහර වෙලාවට ඒ අය මුහුණු ආවරණ නැතිව කෘමිනාශක තෙල් ගහනවා අපි දැක තිබෙනවා. ඒ වාගේ අනාරක්ෂිත දේවලුත් කරනවා. අපි ඒවාටත් පිළියම් යොදන්න ඕනෑ. කෘෂිකර්ම අමාත්‍යතුමාත් ඒ සම්බන්ධයෙන් දැඩි නීති ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. අපි ඒ නීති ක්‍රියාත්මක කරන්න ඕනෑ. කවුරු පෙළපාළි ගියත් මොනවා කළත් කරන්න දෙයක් නැහැ. මේ දේවල් කරන කොට ඒ ඔක්කොම සුබවාදී වෙන්නේ නැහැ. ජනතාව ඉල්ලන දේ මොකක්ද, විද්‍යාඥයන් පරිසරවේදීන් ඉල්ලන දේ මොකක්ද කියලා තේරුම් අර ගෙන ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය පැත්තෙනුත් අවශ්‍ය

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

කටයුතු කරන්න ඕනෑ. ඒ නිසාය කියලා අන්තිමට අපට කෘෂිකර්මය සම්පූර්ණයෙන්ම නැති කර ගන්නත් බැහැ. ඊට පසුව කියාවි, සාගින්න ඇති වුණා; කන්න නැහැ කියලා. එතකොට ඒකත් වසංගතයක්. ඒ නිසා මේවා ඔක්කෝම සමතුලිත තත්ත්වයට අරගෙන රජරට ඇතුළු ප්‍රදේශවල ජනතාව මේ වකුගඩු රෝගයෙන් මුදා ගන්න අප සියලු දෙනාම එක්ව කටයුතු කරමුය කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු චන්ද්‍රානි බණ්ඩාර මන්ත්‍රීතුමිය.

[අ.භා. 4.48]

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු එස්.එම්. චන්ද්‍රසේන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කථාවෙන් පසුව කථා කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. මේ වන විට උතුරු මැද පළාතම ගිල ගෙන තිබෙන මාරාන්තික වකුගඩු රෝගය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට ඒ පළාත නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

අපි කවුරුත් දන්නවා, මේ වන විට උතුරු මැද පළාත වාගේම උතුරු පළාතේත්, නැඟෙනහිර පළාතේත් මේ රෝගය පැතිරී ගොස් හමාරයි කියන එක. ඒ වාගේම අනෙකුත් පළාත්වලටත් මේ රෝගය ශීඝ්‍රයෙන් පැතිරෙමින් පවතින කාලයක් මේ. දවසකට උතුරු මැද පළාතේ වකුගඩු රෝගීන් දහ දෙනෙක් මැරෙනවා නම් ඒ දහ දෙනා අතරින් පස් දෙනෙක් නැත්නම් හය දෙනෙක් අනිවාර්යයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ අය බව අප කවුරුත් දන්නවා. මේ වාගේ භයානක තත්ත්වයක් උදා වෙලා තිබෙද්දී බහුජාතික සමාගම්වලින් රසායනික පොහොර ගෙන්වීම නතර කරන්න ආණ්ඩුව හරියාකාරව කටයුතු කරන්නේ නැත්තේ ඇයි කියා අපි අහනවා. මීට සති කිහිපයකට උඩදී පුවත් පත්වල අපට දකින්න ලැබුණා ප්‍රධාන රසායනික පොහොර වර්ග තුනක් ගෙන්වීම නතර කළාය කියලා. පුවත් පත්වල පළ වුණාට තවම ඒවා නතර කිරීමේ ක්‍රියා මාර්ගයක් හරියාකාරව අර ගෙන නැහැයි කියන එක මේ අවස්ථාවේ දී මතක් කරන්න ඕනෑ. බාල පොහොර වර්ග ගෙන්වා බෙදා හරින නිසා තමයි අද මේ වාගේ තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මේ වකුගඩු රෝගයට ප්‍රධානම හේතුව වන්නේ ඒ ප්‍රදේශවල ජනතාවට පානය කිරීමට ගුණාත්මක ජලය නොලැබීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම විෂ ද්‍රව්‍ය තිබෙන කෘමි නාශක මොනවාද කියන එක ගැන විශේෂයෙන්ම ඒ ප්‍රදේශවල ඉන්න ගොවි ජනතාව දැනුවත් කරන්න ඕනෑ. ඒ ගොවි ජනතාව අතරට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් හරිහැටි දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් තවම ක්‍රියාත්මක නොකරන්නේ ඇයි කියලා මම මේ අවස්ථාවේ දී අහන්න කැමැතියි.

මේ වන විට ලෝක සෞඛ්‍ය සංවිධානය මේ සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර තිබෙන බව අපි කවුරුත් දන්නවා. නමුත් අද වන තෙක් ඒක මාධ්‍යයට හෙළි කර නැහැ. මේවා මාධ්‍යයට හෙළි කරන්නේ නැත්තේ ඇයි කියා අපි අහනවා. එදා ඒඩිස් රෝගය ගැන, ඩෙංගු රෝගය ගැන ලබා දුන් වාර්තා ක්ෂණිකව මාධ්‍ය හරහා හෙළි කළා නම්, බොහොම භයානක රෝගයක් වන වකුගඩු රෝගය ගැන සමීක්ෂණය කර සකස් කර තිබෙන වාර්තාව තවම ඉදිරිපත් කර නැත්තේ ඇයි කියලා අපි අහන්න කැමැතියි. විශේෂයෙන්ම මේ අය ඒ බහුජාතික සමාගම්වලට යට වෙලාද දන්නේත් නැහැයි කියලා සැකයක් මතු වෙලා තිබෙනවා. අපට දැන ගන්න ලැබී තිබෙනවා, කෘෂි නිලධාරීන්ගේ දරුවෝ ඒ බහුජාතික සමාගම් එක්ක වැඩ කරනවා කියලා. ඒ දරුවන්ගේ වරප්‍රසාද නැති වෙයි කියන හේතුව උඩද දන්නේ නැහැ, මේ බහුජාතික සමාගම්වලට විරුද්ධව කටයුතු නොකරන්නේ. ඒ සැකය මේ වන විට මතු වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම පසු ගිය අවුරුදු 5 තුළදී පදවිය ප්‍රදේශයේ එක ගමකින් වකුගඩු රෝගීන් 40 දෙනෙක් මිය ගිහින් තිබෙන බව වාර්තා වුණා. අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තාම එම දිස්ත්‍රික්කයේ ගම් 610ක් තිබෙනවා. එහෙම නම් අපට හිතා ගන්න පුළුවන් මේ වන කොට ඉතිරි ගම් 609 තුළ වකුගඩු රෝගය නිසා කොයි තරම් ජනතාවක් මිය ගිහින් තිබෙනවාද කියලා. ඒ වාගේ භයානක තත්ත්වයක් තමයි අද අපේ පළාත්වලට උදා වෙලා තිබෙන්නේ. අපි කියන්නේ මේ වන කොට අඩුම තරමින් මේ රෝගය නිසා මිය ගිය අයගේ පවුල්වලට වන්දි මුදලක් ගෙවන්නවත් මේ ආණ්ඩුවෙන් කටයුතු සූදානම් කරලා නැහැ කියන එකයි. විශේෂයෙන්ම එම රෝගය වැලඳී තිබෙන අයට අඩුම තරමින් ඖෂධ ටික ලබා ගන්නට දීමනාවක් ලබා දීමටවත් මේ වන තෙක් කටයුතු කරලා නැහැ. මේ වාගේ දේවල් ගැන මීට වඩා උනන්දුවෙන් කටයුතු කරන්න ඕනෑ. මොකද, මේ රටේ අනවශ්‍ය වැඩ කටයුතුවලට විශාල වශයෙන් මුදල් යට කරන වෙලාවක මේ වගේ අත්‍යවශ්‍ය දෙයකට මීට වඩා උනන්දුවෙන් කටයුතු කරනවා නම් හොඳයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම බහුජාතික සමාගම් විෂ සහිත පොහොර වර්ග, ඒ වාගේම කෘමි නාශක බෙදා හැරලා විශාල මුදල් ප්‍රමාණයක් හම්බ කරනවා. ඒකෙන් සුගතියක් නොවෙයි, අගතියක් තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, ඒ අය උපයන මුදලින් අඩුම තරමින් සියයට 10ක් හෝ 15ක් වෙන් කර, එම රෝගය වැලඳී තිබෙන අයටත්, ඒ වාගේම එම රෝගයෙන් මිය ගිය අයගේ පවුල්වලටත් ලබා දෙන්න කියලා විශේෂයෙන්ම ආණ්ඩුව බහුජාතික සමාගම්වලට නියෝග කරන්න ඕනෑය කියා. මොකද, එල්ටීටීඊ ත්‍රස්තවාදය තිබුණු කාලයේ යුද්ධය නිසා මිය ගිය පිරිසට වඩා වැඩි පිරිසක් මේ වන විට අපේ දිස්ත්‍රික්කවල වකුගඩු රෝගය නිසා මරණයට පත් වෙලා තිබෙනවා. අපි කියන්නේ මෙච්චර දේවල් වෙද්දීත්, විශේෂයෙන්ම -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ලබා දී තිබෙන කාලය අවසන්.

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
ඇත්තටම මට තව ගොඩක් දේවල් කථා කරන්න තිබුණත් ඒකට කාල වේලාව හරස් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

විශේෂයෙන්ම අපේ රෝහල්වල මෙම රෝගයට අවශ්‍ය කරන බෙහෙත් නැහැ; එම රෝගීන්ට අවශ්‍ය ඇඳන් නැහැ. ඒ වාගේම dialysis කරන්න අවශ්‍ය කරන උපකරණවල හිඟයක් තිබෙනවා. මැදවච්චිය ප්‍රදේශයේ තමයි වැඩියෙන්ම මේ රෝගය තිබෙන්නේ. මැදවච්චිය ප්‍රාදේශීය රෝහලේ එම රෝගීන්ට අවශ්‍ය බෙහෙත් නොතිබූ නිසා නගරයේ ඉන්න ව්‍යාපාරික මහත්වරු ටික එකතු වෙලා එම රෝගීන්ට අවශ්‍ය බෙහෙත් ටික අරන් දෙන්න කටයුතු කළා. මේ වාගේ බොහොම භයානක තත්ත්වයක් තිබෙනවා. මට තවත් කරුණු ගණනාවක් කියන්න තිබුණත්, ඒකට කාලය හරස් වී තිබෙන නිසා මම අවසාන වශයෙන් තවත් එක දෙයක් කියා මගේ කථාව අවසන් කරනවා.

විශේෂයෙන්ම අපට මතකයි දකුණට සුනාමිය ආපු වෙලාවේ එය ජාතික උවදුරක් හැටියට සලකා ක්ෂණිකව -කඩිනමින්- ක්‍රියා මාර්ග ගත් බව. ඒ වගේ අද මුළු රජරටම වෙලා ගෙන තිබෙන මේ මාරාන්තික රෝගය පිළිබඳවත් ආණ්ඩුවේ උදවිය මීට වඩා වැඩි වගකීමකින් යුතුව කටයුතු කරන්න අවශ්‍ය බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.57]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අතිශය වැදගත් මෙම මාතෘකාව වෙනුවෙන් වචන ස්වල්පයක් එකතු කරන්නට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉතාම කාලෝචිත මාතෘකාවක් ඉදිරිපත් කර තිබෙනවා. මේ ගැන අපි බොහොම උනන්දුවෙන් කථිකාවක් ඇති කර ගැනීම අතිශය වැදගත්. අපේ මැති ඇමතිවරුන් අදහස් ප්‍රකාශ කළ විධියට දේශපාලනයෙන් තොරව බොහොම පුළුල් සංවාදයක් සඳහා මෙය අවස්ථාවක් කර ගත යුතුයි කියලා අප විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානය මෑතකදී ඉදිරිපත් කළ ඒ වාර්තාව බැලුවාම, කෘෂිකර්මය සඳහා අපේ රටට ගෙන්වන නොයෙකුත් කෘමිනාශක හා රසායනික ද්‍රව්‍ය නිසා ඒ ක්ෂේත්‍රවල යම් ප්‍රශ්නයක් තිබෙන බව අපට පැහැදිලිව පෙනෙනවා. මෙවැනි වාර්තාවක් ඉදිරිපත් වීම ගැන අප සන්තෝෂ වන්නට ඕනෑ. මොකද, අප එහෙම කියන්නේ? එතකොට අපට ඒ අනුව ක්‍රියාත්මක වන්නට හැකියාවක් තිබෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය අමාත්‍යතුමා හැටියට අමාත්‍යාංශ හතක් පමණ සම්බන්ධ කරගෙන කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ නිර්දේශ මත සෞඛ්‍ය අමාත්‍යතුමාගේ යම් වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම අපේ කෘෂිකර්ම අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාත් මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා බොහොම අවංකව ඉතාම වැදගත් තීන්දු තීරණවලට එළඹිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීතුමා මේ අදහස ඉදිරිපත් කළත්, රජයේත් අමාත්‍ය මණ්ඩලයේත් විශාල උනන්දුවක් මත පසු ගිය මාස හයක කාලය තුළ දී මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙන බව අප පිළිගන්න ඕනෑ. හැබැයි මෙහි මුල් කාලයට සාපේක්ෂව -දැන් අවුරුදු විස්සකට වඩා කාලයක් තිස්සේ- මේ රටේ අලුතෙන් ඇති වුණු ප්‍රවණතාවක් හැටියට, වකුගඩු රෝගවලින් මිය යන ප්‍රමාණය දිනෙන් දින වැඩි වීමක් තිබෙන බව පෙනෙනවා. ඒක නැහැයි කියන්න අපට බැහැ. අපේ රටේ වකුගඩු රෝග පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. "එහෙම දෙයක් නැහැ", "ඒක ප්‍රශ්නයක් නොවෙයි" කියන අරමුණක් අපේ රජයේවත් අමාත්‍ය මණ්ඩලයේවත් නැහැ. මේ පිළිබඳ අපේ අදහස තමයි, මේ සංවාදයේ හොඳ පැත්ත බැලීම. අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ අදහස වූයේ, "මොකක්ද, මේ පැති කඩ?" කියලා මේ සංවාදයෙන් අවංකවම සොයා බැලීමයි. අද ලංකාවට කෘමි නාශක, රසායනික ද්‍රව්‍ය ගෙන්වන අය ගැන ලොකු චෝදනාවක් එතුමා කළේ නැහැ. නමුත් පොදුවේ හැඟීමක් තිබෙනවා, මේ රටේ පොහොරවලින්, කෘමි නාශකවලින් පසට එකතු වන රසායනික ද්‍රව්‍යවලින් හානියක් සිද්ධ වනවා කියලා. මෙහිදී අපට ලෝක සෞඛ්‍ය සංවිධානයේ - WHO - වාර්තාව හොඳ ආරම්භයක් සහ හොඳ ස්ථාවරයක් ලබා දුන්නා, අපේ ඉදිරි වැඩ කටයුතු කරන්න. මෙහිදී සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් මේ ප්‍රශ්නය ගත්තාම මා හිතනවා, දහසකටත් වඩා විශාල සංඛ්‍යාවකගේ වකුගඩු රෝගවලට සාර්ථක පිළියමක් දෙන්න පුළුවන් වැඩසටහනක් අපි ආරම්භ කළ යුතුයි; ආරම්භ කර තිබෙන වැඩසටහන් ප්‍රමාණය මදි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප දන්නවා, වකුගඩු රෝග සඳහා හොඳ විශේෂඥ වෛද්‍යවරු විශාල පිරිසක් මහනුවර ඉන්නා බව. රෝගීන් ඔවුන් සොයා ගෙන ගිහිල්ලා අවශ්‍ය වෛද්‍ය කටයුතු කර ගන්නවා. නමුත් කොළඹ බැලුවොත්, පෞද්ගලික අංශයේ ආරෝග්‍ය ශාලා ටික තමයි වකුගඩු රෝග සඳහා ප්‍රතිකාර ලබා දීමට වැඩි වශයෙන් ක්‍රියාත්මක වන්නේ. රජයේ රෝහල්වල ඉන්නා වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව සහ තිබෙන වෛද්‍ය පහසුකම් මත එන වකුගඩු රෝගීන්ට සාපේක්ෂිතව සාර්ථකව විසඳුම් ලබා දීමට අමාරු වෙලා තිබෙනවා. ඒ වාගේම දවසකට රුපියල් 8,000ක් වාගේ වැය වනවා, ඒ වකුගඩු රෝගීන්ගේ ලේ පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය - dialysis - කරන්න. ඉස්සර ඒ සඳහා රුපියල් 3,000ක් විතර වැය වුණා. ඉස්සර වකුගඩුවක් බද්ධ කිරීමක් - transplant - කරන්න රුපියල් ලක්ෂ තුනක් විතර වැය වුණා. අද ඒ සඳහා රුපියල් ලක්ෂ නවයක්, දහයක් විතර වැය වනවා. ඒ වාගේම වකුගඩුවක් දිය හැකි නිරෝගි අයෙක්ව සොයා ගන්න ඕනෑ. වකුගඩු බද්ධ කිරීමෙන් පසු රෝගියා වාගේම වකුගඩුව ලබා දුන් අයත් ආරක්ෂාකාරීව බලා ගන්න ඕනෑ. එහෙම වකුගඩුවක් transplant කළාට පස්සේ රුපියල් 80,000ක්, රුපියල් 1,00,000 පමණ මුදලක් වැය වනවා, අවුරුද්දක විතර කාලයක් වකුගඩුව බද්ධ කළ රෝගියා සහ වකුගඩුව ලබා දුන්න කෙනා බලා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වකුගඩු රෝග නිසා අපේ රටේ සෞඛ්‍යය සේවයට වන ව්‍යදම මෙන්ම අපේ සමාජයට වන හානිය බැලුවොත් අතිවිශාල බව පෙනෙනවා. පවුලක එක් වකුගඩු රෝගියක් සිටියොත් ඔහුට ප්‍රතිකාර කිරීමට, ඔහුගේ දේපළ විකුණලා, සියලුම සේසත ව්‍යදම් කරනවා. රෝගියා ඇඳේ ඉන්න මාස ගණනම බෙහෙත් කරලා, ඒ පවුල දුගී තත්ත්වයට පත් වෙලා, රෝගියාත් බොහෝ දුක් විඳලා අන්තිමට ඒ පවුලත් විනාශ වෙලා රෝගියාත් මිය ගිහින් ආර්ථික වශයෙන් ඒ පවුල සීසීකඩ වන බව අපි දන්නවා.

මේක ජාතික ප්‍රශ්නයක්ය කියන එක වගකීමක් ඇති රජයක් හැටියට අපට තේරෙනවා. අපි ඒ ගැන කතිකාවක් ඇති කර ගන්නවා. මේ ප්‍රශ්නයට විසඳුමක් සොයන්න, මේ ගැන විධිමත් වැඩසටහනකට යන්න සතියකින්, දෙකකින්, මාසයකින් බැහැ. ඒ නිසා අපි සන්තෝෂ වෙනවා, මේ වනකොට අපේ කෘෂිකර්ම ඇමතිතුමා ඉතා දැඩි තීන්දු කිහිපයක්, හොඳ තීන්දු කිහිපයක් අරගෙන තිබීම ගැන. මේ වනකොට කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් රසායනික ද්‍රව්‍ය වර්ග හතරක් තහනම් කර තිබෙනවා. ක්ලෝපයිරිෆෝස්, ප්‍රොපනිල්, කාබෝෆියුරාන්, ග්ලයිෆොසෙට් මේවා තහනම් කළේ ඇයි? මේ ඇමතිතුමා එන්න කලින් අපි එවැනි දේවල් දැක්කේ නැහැ. සාක්ෂි ඇතිව, හේතු ඇතිව එතුමා

[ගරු තිලංග සුමතිපාල මහතා]

ක්‍රියාත්මක වුණා. මේ තහනම් කිරීම වාගේම ඒවා ගෙන්වන අය ගැන, ඒවා ගෙන්වන ලද හේතූන් ගැන බලා ලෝකයේ කොයි කොයි රටවලටද ආනයනය කර තිබෙන්නේ, ඒවා අනික් රටවල පරිභෝජනය කරනවාද, එසේ පරිභෝජනය කිරීමෙන් ඒ ඒ රටවලට වෙලා තිබෙන යම්යම් බලපෑම් මොනවාද කියා සොයා බැලීමේ වගකීමකුත් අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කෘෂි රසායනික ද්‍රව්‍ය ගැන අපට පෙනෙන වැදගත්ම දෙය තමයි මෙහි යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා; ආසනික් වැනි දේවල් තිබෙනවාය කියන එක. ඒවා ශරීරයට සුදුසු නැහැ කියන එක සනාථ වෙන්න හේතුව තමයි කෘෂි රසායනික පාවිච්චි කරන රටවල්වල, කෘෂිකාර්මික - agriculture-based - රටවල්වල ප්‍රශ්න ඇති වෙලා තිබීම. ඒ නිසා මේක ලංකාවට විතරක් බලපා තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා අපි දැඩි ස්ථාවරයකට ගිහිල්ලා ඒ ඒ රටවල්වල තත්ත්වයට සාපේක්ෂව අපේ රටේ තත්ත්වය අධ්‍යයනය කළොත් අපට තව ඉදිරියට යන්න පුළුවන්ය කියා අපි විශ්වාස කරනවා. නමුත් මේ කර්තව්‍යය කරන්න අමාරුයි. මොකද රුපියල් කෝටි ගණනක ආදායමක් තිබෙන එවැනි ආයතන මේ පිටුපස ඉන්නවා. ඒ හැම ආයතනයකටම Research and Development - R and D - Unit එකක් තිබෙනවා. අපි අද 2013 මැයි මාසයේ කථා කරනකොට ඒ අය කථා කරන්නේ 2020 නිෂ්පාදන ධාරිතාව ගැනයි. ඒ නිසා අපි මේකට පිළියමක් යොදනකොට ව්‍යාපාරික ලෝකයේ ආයෝජනය කරන අය දැන් ඉඳලාම සැලසුම් කරනවා, වෙන නම්වලින් වෙන සාන්ද්‍රණයකින්, වෙන ක්‍රමයකට මෙවැනි අලුත් දේවල් ඉදිරිපත් කරන්න. ඒ නිසා අපි රටක් හැටියට තාක්ෂණය පැත්තෙන්, විද්වත් මණ්ඩලයේ දැනුම අනුව, පළපුරුද්ද අනුව බැලුවොත් මෙවැනි ස්ථාවරයකට යන්න අපට මීට වඩා හොඳ ශක්තිමත් පදනමක් අවශ්‍ය වෙනවා. ඒ සඳහා අවංක කැපවීමක් අවශ්‍ය වෙනවා. ඒ සඳහා අදාළ ක්ෂේත්‍රයේ විද්‍යාඥයන්ගේ දැනුම ලබා ගත යුතු වෙනවා. එහෙම නැතිව අපට මේ අභියෝගයට මුහුණ දෙන එක ලෙහෙසි වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහින්ද යාපා අබේවර්ධන ඇමතිතුමාට අපි ගරු කරනවා. කෙටි කාලයකින් එතුමා මෙය හදුනාගෙන යම් කිසි ස්ථාවරයකට පැමිණි එක ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම සෞඛ්‍ය ඇමතිතුමා මීට අවශ්‍ය නායකත්වය දීම ගැන අපි එතුමාටත් ස්තුතිවන්ත වෙනවා. සෞඛ්‍ය ඇමතිතුමාට තිබෙන්නේ ලෙඩ වුණායින් පසුව බලා ගන්නා එකයි. මේ ප්‍රශ්නය ඇති වුණේ කෘෂිකර්මය පදනම් කරගෙනයි. පසු ගිය අවුරුදු 20-22 පමණ කාලය තුළ මේ ප්‍රශ්නය දිගින් දිගටම වැඩි වෙලා තිබෙනවා. එහෙම නම් අපි කල්පනා කරන්න ඕනෑ අපේ රටට ඇති වී තිබෙන මේ අලුත් තත්ත්වය මොකක්ද කියන එක ගැන.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා මේ කතිකාව ඉතා වැදගත්ය කියා මා හිතනවා. අපේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා බොහොම අවංක චේතනාවෙන් මේ කතිකාව ඇති කරන්න ඇතිය කියා අප සිතනවා. මේක ජාතික ප්‍රශ්නයක්. අවංකවම අපි ඒකට පිළිතුරක් සොයන්න ඕනෑ. ඒ වාගේම දේශපාලන කතිකාවකට යන්නේ නැතිව සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් සඳහා අවශ්‍ය පසුබිම හැදීමට පුළුල් සංවාදයක් ඇති කරගෙන හොඳ තීන්දු ගන්න, දැඩි තීන්දු ගන්නය කියා අපි ඉල්ලනවා. අපේ ජනතාවට, කෘෂිකර්මයට, භෝග වගාවට අයහපත් බලපෑම් ඇති කරන යම් කිසි ආයෝජනයක් එනවා නම් එය නතර කරන්න අපට හැකියාව තිබෙන්න ඕනෑ. ඒ හැකියාව ඇති දේශපාලන තීන්දු ගැනීමට ශක්තිය ඇති ඇමතිවරුන් දෙදෙනෙක් සිටීම ගැන සන්තෝෂ වෙන බව කියමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 5.07]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින මා ඉතා ස්තුතිවන්ත වනවා අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට, වකුගඩු රෝගය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුව තුළ සංවාදයක් ඇති කිරීමට මහ පෑදීම පිළිබඳව. මට වෙන් වී තිබෙන කාලය සීමා සහිත නිසා මා ඒ ගැන කරුණු කීපයක් පමණක් ඉදිරිපත් කරන්න කැමැතියි.

අද බහු ජාතික සමාගම්වල පළමුවැනි ඕනෑකම තමයි, මෙම වකුගඩු රෝගයට හේතුව පැහැදිලි නැහැයි කියන එක. මේක තමයි අද කොම්පැනිකාරයන්ට ඕනෑ කරන්නේ. ආසනික් ප්‍රශ්නයක් තිබෙනවාය කියලා ගෙනාපු රසායනික ද්‍රව්‍ය කන්ටේනර්වලට වරායෙන් ලක්ෂ 20, ලක්ෂ 30 දඩ ගැහුවාට පස්සේ ඒ කොම්පැනිකාරයෝ කිව්වා, එහෙම ප්‍රශ්නයක් නැහැ, ඒක බොරුවක් කියලා. නමුත් අන්තිමේදී ඒවාට දඩ ගැහුවා. ඒ බහු ජාතික සමාගම් වරායට දඩ ගෙව්වා. අපට තිබෙන ප්‍රශ්නය, ඒ දඩ ගහපු කෘෂි රසායනික වස ටික ආපහු ගොවීන්ට ගියේ කොහොමද කියන එකයි.

අද අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම ගැන මා සන්තෝෂ වනවා. ජනතා විමුක්ති පෙරමුණ වාගේ පක්ෂයකට ඉතිහාසයේ පුළුවන්කම තිබුණා සිදු වන දේ කලින් දැන ගන්න. එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ගිවිසුම ගහන්න අවුරුද්දකට විතර කලින් තමයි ඔවුන් දැන ගත්තේ ගිවිසුමක් ගහනවා කියලා. ගිවිසුම මොකක්ද කියලාත් දැන ගෙන හිටියා. ඒ වාගේම, ලෝක සෞඛ්‍ය සංවිධානයේ මේ වාර්තාව ජනතා විමුක්ති පෙරමුණ කියෙව්වේ නැහැයි කියලා මා හිතන්නේ නැහැ. ඒක ඔවුන් කියවන්න ඇති කියලා මා විශ්වාස කරනවා. ඒ වාර්තාව "ලංකාදීප" පත්තරයේ පළ වුණා. ඒ වාර්තාව ඇමතිතුමාට ලැබෙන්න කලින් කොහොම හරි අපට ලබා ගන්න පුළුවන් වුණා. ඒ අපි රටට ආදරේ නිසා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සුද්දෝ ඉන්නවාද, නැද්ද, කවුද ඉන්නේ කියන ඒවා නොවෙයි වැදගත්. [බාධා කිරීමක්] මට පොඩි වේලාවයි තිබෙන්නේ. අපි පස්සේ කථා කරමු. ඔබතුමායි මායි පස්සේ ඒක කථා කර ගනිමු. මට වේලාව නැති නිසායි මා කථාව කර ගෙන යන්නේ.

අද බහු ජාතික සමාගම්වල එකම එක න්‍යාය පත්‍රය තමයි, වකුගඩු රෝගයට හේතුව පැහැදිලි නැහැයි කියන එක. ඒක කියන්න පත්තරකාරයෝ කුලියට අරගෙන තිබෙනවා; දේශපාලන පක්ෂ අරගෙන තිබෙනවා. අපි හිතාගෙන හිටියාට නැහැයි කියලා, අද විප්ලවවාදී පක්ෂත් කුලියට අරගෙනද කියලා සැක කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔය කථාව කිව්වේ,- [බාධා කිරීමක්]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
අපි එහෙම හිතමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
චර්යාව පිළිබඳ ප්‍රශ්නයක් එතැන තිබෙන්නේ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
නැහැ, නැහැ. ඔබතුමා කරුණාකරලා මගේ කාලය දෙන්න. ඔබතුමාගේ නමවත් මා කිව්වේ නැහැ නේ. [බාධා කිරීමක්] කරුණාකරලා බාධා කරන්න එපා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකරලාට ස්වාමීන් වහන්සේට කථාව කර ගෙන යන්න දෙන්න.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඔබතුමා කථා කළා නේ. [බාධා කිරීමක්] අපි ඒවා කථා කරමු වෙනම. අද මේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවෙන් ඉතාම නිශ්චිතව හේතු පෙන්වලා තිබෙනවා. ඒවා මා කියනවාත් නොවෙයි. වෙනත් කල්පියක් හෝ කණ්ඩායමක් කියනවාත් නොවෙයි. ඒ වාර්තාවේ ඉතාම පැහැදිලිව, නිශ්චිතව ඒ කරුණු කියලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ කෘෂිකර්ම ආයතනවල සමහර නිලධාරීන්ට හා පළිබෝධක නාශක රෙජිස්ට්‍රාර්වරයාට ඉතා පැහැදිලිව ඕනෑකම තිබුණා, මේක යට කරන්න. ඒක කොච්චර දුර ගියාද කියනවා නම් රජයේම මාධ්‍ය යොදා ගෙන කිව්වා, ආසනික් කියන්නේ ශරීරයට අත්‍යාවශ්‍ය දෙයක් කියලා. අපි ඒ ගැන ඉතාම කනගාටුවට පත් වුණා. මා විශ්වාස කරනවා සියලුම දේශපාලන පක්ෂ මේ වාර්තාව කියවලා ඇති කියලා. ලෝක සෞඛ්‍ය සංවිධානය ඉදිරිපත් කළ වාර්තාවේ 111 පිටුවේ අග කොටසේ සිට 112 පිටුව දක්වා කොටස මා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානයේ එම සම්පූර්ණ වාර්තාව අද මා **සභාගත**** කරනවා. එවිට ඕනෑම කෙනෙකුට එය කියවන්න පුළුවන්.

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

වකුගඩු රෝගය පමණක් නොවෙයි, අද මුළු රට පුරාම භයානක විධියට පැතිරිලා තිබෙනවා දියවැඩියාව, හෘදය රෝග, හා පිළිකා තත්ත්වයක්. වසරෙන් වසර 5,000 ගණනේ පිළිකා රෝගීන් සංඛ්‍යාත්මකව වැඩි වනවා. මේක ඉතාම භයානක තත්ත්වයක්. දැනට අප කථා කරන්නේ වකුගඩු රෝගය ගැන පමණයි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ මේ වාර්තාවට අනුව අප සියලු දෙනාටම ආසනික් ශරීරගත වෙලා තිබෙනවා. ඒ සංවිධානයේ සුද්දෙක් ඉන්නවාද, නැද්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. ජීනිවාවලත් පිළිගත්ත විද්‍යාගාරවල මිනිසුන්ගේ කෙස්, මැරිච්ච මිනිසුන්ගේ වකුගඩු, අපි කන ආහාර, අපි බෙදන පොහොර, සමාගම්වල කෘෂි රසායනික ද්‍රව්‍ය නිශ්චිතව පර්යේෂණයට භාජන කරලා තිබෙනවා.

ශාන්ති මෙන්ඩිස් කියන්නේ, ලංකාවෙන් බිහි වුණු අද්විතීය, විශිෂ්ට ගණයේ විද්‍යාඥවරියක්. එතුමිය ඒ වාර්තාව නිකුත් කිරීමේ වග කීමේ සභාපතිතුමිය හැටියට කටයුතු කර තිබෙනවා. පසු ගිය දිනක ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිත්‍ය නියෝජිතයා ආචාර්ය මේතා මහත්මා හිටියා දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ සාකච්ඡාවක. එතුමා කිව්වා, ඇයි මේ වාර්තාව ගැන අවධානය යොමු නොකරන්නේ කියලා.

ඒ වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ 111වන පිටුවේ මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරන්න, කෘෂි රසායනික ද්‍රව්‍ය පරිහරණයේදී ඇති වන තත්ත්වය ගැන සාකච්ඡා කරන්න, අන්තර් අමාත්‍ය කමිටුවක් පත් කරන්න ආදී වශයෙන් ඉතා නිශ්චිතව කරුණු දක්වා තිබෙනවා. එම නිසා නැවතත් පර්යේෂණ කරන්න ඕනෑය කියා යම් කිසි කෙනෙක් කියනවා නම්, ඒකත් කොම්පැනිකාරයන්ගේ වුවමනාවක්.

ඇත්ත වශයෙන් මා රජයට ස්තුතිවන්ත වනවා, රජයක් හැටියට අද කෘෂි රසායනික ද්‍රව්‍ය වර්ග හතරක් තහනම් කර තිබීම ගැන. කාර්යය නිශ්චිත නැත්නම් ඒවා තහනම් කරපු එක අපරාදේ නේ. එහෙම නම්, Carbofuran තහනම් කරන්න ඕනෑ නැහැ. මා ගිහින් මැලේසියාවේ පර්යේෂණය කළා. එතැනදීත් මේ ප්‍රශ්නය තිබුණා. [බාධා කිරීමක්] ඒක ප්‍රශ්න කරන එක වෙනම දෙයක්. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන ප්‍රශ්න කරනවා නම් මාත් එයට එකඟ වෙනවා. ඔබතුමාත් එක්ක මාත් එකඟ වෙනවා. විපක්ෂයද, ආණ්ඩු පක්ෂයද, ජනතා විමුක්ති පෙරමුණද, ජාතික හෙළ උරුමයද කියන ප්‍රශ්නයක් නොවෙයි මෙතැන තිබෙන්නේ. මේ පිළිබඳව පොදු ජාතික කථිකාවතක් අවශ්‍යයි. අනුර දිසානායක මන්ත්‍රීතුමා සමඟ හෝ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සමඟ හෝ ආණ්ඩුව සමඟ හෝ ප්‍රශ්නයක් මෙතැන නැහැ. පොදු සම්මුතියකට ඒම පිළිබඳ ප්‍රශ්නයක් තමයි මෙතැන තිබෙන්නේ. අද සමහර බලවතුන්, සමහර නිලධාරීන් මේ කොම්පැනි විසින් කුලියට අරගෙන තිබෙනවා. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. "මෙය යට ගහන්නේ ඇයි?" කියන ප්‍රශ්නය අපි අහන්න ඕනෑ. ලෝක සෞඛ්‍ය සංවිධානය වාර්තාව නිකුත් කරලා තිබියදී, ඒක නිකුත් කරන්න රුපියල් මිලියන 100ක් වියදම් කරලා තිබියදී අද රජ රට ප්‍රදේශය නියෝජනය කරන සෞඛ්‍ය ඇමතිවරයා මධ්‍යවලින් වෙන වෙන කතන්දර කියනවා. ඒක අපට ප්‍රශ්නයක්. අපි ඒ ගැන ප්‍රශ්න කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ස්තුතිවන්ත වනවා, කෘෂිකර්ම ඇමතිවරයා කෘෂිකර්ම කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදී කරුණු 15ක් සම්බන්ධයෙන් සාකච්ඡා කරලා රජයක් හැටියට නිශ්චිත තීන්දු ගෙන තිබීම ගැන. අපි බලාපොරොත්තු වනවා, එතුමා උපදේශක කාරක සභාවේදී ගත්ත

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන මහතා]

ඒ තීන්දු ටික ක්‍රියාත්මක කරයි කියලා. එසේ ක්‍රියාත්මක කළොත් රජයක් විධියට අපි මේ ප්‍රශ්නයට ඇත්ත වශයෙන්ම මුහුණ දීමේ පියවර ආරම්භ කරනවා. එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණේ අනුර දිසානායක මන්ත්‍රීතුමා වැනි අය, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ඉන්න මැති ඇමතිවරු ඇතුළු අපි සියලු දෙනාම එකතු වෙලා මේ ප්‍රතිපත්ති ලියවිල්ල ඉදිරියට ගෙන ගියොත් අපට මේ ප්‍රශ්නය ජයග්‍රහණයක් කරා ගෙන යන්න පුළුවන්කම තිබෙනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, තවමත් බහු ජාතික සමාගම් "කරුණු පැහැදිලි නැහැ, තවත් සල්ලි කන්න ඕනෑ, තවත් රුපියල් මිලියන 100ක් වියදම් කරන්න ඕනෑ, මෙය තව අවුරුදු 5ක් ගෙන යන්න ඕනෑ"යි කියලා කියන එකයි. ආසනික මිනිසුන්ගේ ශරීරවල තිබෙනවා නම්, කෙස්වල තිබෙනවා නම්, නිය පොතුවල තිබෙනවා නම්, කන ආහාරවල තිබෙනවා නම්, රජය බෙදන පොහොරවල තිබෙනවා නම්, කෘෂි රසායනික ද්‍රව්‍යවල තිබෙනවා නම් 2001 වාර්තාවේ ඉතා නිශ්චිතව දක්වපු විධියට අද කෘෂි රසායනික ද්‍රව්‍යවල ඒ සීමාව ඉක්මවා අධික්‍රියාකාරිත්වයකින්, අතිබහුල ලෙස වස විස තිබෙනවාය කියන එක පැහැදිලියි. එය අපැහැදිලියි කියා කියනවා නම් ඉතා පැහැදිලිව එය තක්කඩිකමක්; පාවා දීමක්. එම නිසා වකුගඩු රෝගයට හේතු වන කාරණය අධික කෘෂි රසායනික ද්‍රව්‍ය සහ පොහොර භාවිතය කියන එක ඉතාම පැහැදිලියි. ඒ සඳහා අපි ගත යුතු පියවර කුමක්ද?

කෘෂිකර්ම ඇමතිවරයා යටතේ ගත්ත තීරණ ටික ක්‍රියාවට නැඟීම අත්‍යවශ්‍ය කාරණයක්. මා හිතන හැටියට ඒ තීරණ ක්‍රියාවට නැඟීමේදීත් විවිධාකාර වූ බළල් අත්, විවිධාකාර වූ යකඩ අත් මෙයට විරුද්ධව ක්‍රියාත්මක වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. එම නිසා විපක්ෂයේ දේශපාලනඥයන් සියලු දෙනාගෙන්ම අපි ඉල්ලා සිටිනවා, ආණ්ඩුව ලවා මෙය ජයග්‍රහණය කර ගන්න ඕනෑය කියලා. එතැනට ආණ්ඩුව ඇවිල්ලා තිබෙනවා. අපි ඒ ගැන ආණ්ඩුවට ස්තුති කරන්න ඕනෑ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. බහු ජාතික සමාගම් විසින් කුලියට ගත්ත මහාචාර්යවරු අද පත්තරවලට ලියනවා, "මෙයට හේතුව පැහැදිලි නැහැ"යි කියලා. තවත් රුපියල් මිලියන 100ක් වැය කරලා, තවත් අවුරුදු 5ක් මිනිසුන් මරන්නයි ඔවුන් එසේ කියන්නේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉන්න විද්‍යාඥයෝ කවුද? ලංකාවේ හැම ක්ෂේත්‍රයකම ඉන්න සියලුම විද්‍යාඥයන්ගේ නාම ලේඛනය මෙහි තිබෙනවා. ඊළඟට විද්‍යාගාරවල කරන විශ්ලේෂණ ක්‍රමයට, සංශ්ලේෂණ ක්‍රමයට හා සමාජ විද්‍යාත්මකව හැම කෝණ තුනකින්ම මේ පර්යේෂණය සිද්ධ කරලා තිබෙනවා. එම නිසා මෙය ප්‍රමාණික වාර්තාවක්. මෙහි අඩු පාඩු තිබෙනවාද, නැද්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. කොම්පැනිවලට අභියෝගයක් වෙලා තිබෙනවා, ලෝක සෞඛ්‍ය සංවිධානයේ මේ වාර්තාව. කුලියට කහින, එදා සල්ලිවලට ගත්ත විද්‍යාඥයෝ 20දෙනෙක් පමණ සිටියා. දැන් එක් කෙනෙක් හෝ දෙදෙනෙක් ඉන්නවා, එයට පක්ෂව ලියන්න. මොකද, ඒ ගොල්ලන්ට ජීවත් වීම සඳහා එය අවශ්‍ය වනවා. ජනතා විමුක්ති පෙරමුණ හෝ වේවා ජාතික හෙළ උරුමය හෝ වේවා, යූඑන්පී එක හෝ වේවා, ආණ්ඩුව හෝ වේවා කාරණය පැහැදිලියි, පර්යේෂණය පැහැදිලියි, මේ අවුරුදු 10, 15 තුළ තමයි වකුගඩු රෝගය ඇති වුණේ.

සමාජ විද්‍යාත්මකව බැලුවාම විශේෂයෙන් ළිං වතුර බීමෙන් තමයි මෙම රෝගය ඇති වන්නේ කියලා කියනවා. ඇත්තටම ළිං වතුර සහ ආසනික් එකට ඒකාබද්ධ වීමෙන් මෙය සිද්ධ වන බව පැහැදිලියි.

වස විසෙන් තොරව ගොවිතැන් කිරීම ගල් යුගයේ අදහසක් කියලා සමහරු කියන බව විශේෂයෙන් මා කියන්න ඕනෑ. මා කියන්න කැමැතියි, මෙය ගල් යුගයේ අදහසක් නොවෙයි කියලා. පිදෙස් කැස්ත්‍රෝ ඇමෙරිකාවට විරුද්ධව තමන්ගේ රටේ ස්වාධීනත්වය ඇති කර ගැනීමේදී, කෘෂි රසායනික ද්‍රව්‍ය නැතිව ගොවිතැන් කරන්න අපටත් පුළුවන් කියලා කිව්වා. අද ලෝකයෙන්ම කෘෂි රසායනික ද්‍රව්‍යවලට විරුද්ධව තිබෙන ආදර්ශය කොහේද තිබෙන්නේ? කියුබාවේ.

ඒක ගල් යුගයේ අදහසක් නොවෙයි. ඒක වනචාරී යුගයේ අදහසක් නොවෙයි. මෙතැනට ඇවිල්ලා සමහරු කස්ත්‍රෝ ගැන කථා කරනවා; විප්ලවය ගැන කථා කරනවා. ඒ අය වේ ගුවේරාගේ සමුළු තියනවා. නමුත් අපි කියුබාවෙන් ඉගෙන ගන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලතින් ඇමෙරිකානු රටවල වකුගඩු රෝගය සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වූවා. පසු ගිය මාසයේ වෛද්‍ය වන්න ජයසුමන මහතා ඒ සඳහා ලංකාවේ පර්යේෂකයකු හැටියට සහභාගි වුණා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේට නියමිත කාලය අවසානයි.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඒ පර්යේෂණයේදී අනාවරණය කරගෙන තිබෙනවා ආසනික්, ඒ වාගේම කෘෂි රසායනික ද්‍රව්‍යවල තිබෙන අධික කැඩිමියම් ලතින් ඇමෙරිකානු රටවල මිනිසුන්ගේ වකුගඩු රෝගයට බලපාන බව. ඒ පර්යේෂණ වාර්තාව දැන් අන්තර්ජාලය හරහා බලා ගන්න පුළුවන්.


මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාරණය පැහැදිලියි. කෘෂි රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කරන සමාගම්වලට යට වන්නේ කවුද? ඒ බහු ජාතික සමාගම් දේශපාලනඥයන් සල්ලිවලට ගන්නවා; රාජ්‍ය නිලධාරීන් සල්ලිවලට ගන්නවා; පත්තරකාරයන් සල්ලිවලට ගන්නවා; විකල්ප දේශපාලන පක්ෂවල නායකයන් සල්ලිවලට ගන්නවා. කොයි පක්ෂය බලයට ආවත්, කවුරු බලයට ආවත් ඒ සමාගම්වල ග්‍රහණයෙන් ගැලවෙන්න බැහැ. අන්න ඒක නිසා ජනතාව අතරට යන්න වැඩ පිළිවෙළක් අද අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආණ්ඩුව මේ වන විට වස විසෙන් තොරව ගොවිතැන් කිරීම සඳහා බිත්තර වී ලබා දීමේ ව්‍යාපාරයක් පටන් ගෙන තිබෙනවා. අපේ රටේ ආහාර ස්වෛරීත්වය ඇති කර ගැනීම අත්‍යවශ්‍යයි. අපට එය ඇති කරගත හැකියි. එය කළ හැක්කේ බහු ජාතික සමාගම්වල ග්‍රහණයෙන් මිදීමෙනුයි. බිත්තර වී ටික හැදීමේ බලය අද ඒ බහු ජාතික සමාගම්වලට දීලා තිබෙනවා. අපි ඒක රජය අතට ගන්න ඕනෑ. අපේ ගොවි පොළවල් විකුණලා තිබෙනවා. ඒ ගොවි පොළවල් ටික ආපසු ගන්න ඕනෑ. මොකද, ඒ අය හදන බීජ වර්ගවලින් සම්පූර්ණයෙන් වස විස නැති වගා කටයුත්තක් කරන්න අපට බැහැ. ඒ හින්දා අද ඒ බහු ජාතික සමාගම්වල ග්‍රහණයෙන් මිදීම අත්‍යවශ්‍යයි. ජනතා විමුක්ති පෙරමුණ ගැන හෝ වේවා, යූඑන්පී එක ගැන හෝ වේවා, ආණ්ඩුවේ අය ගැන හෝ වේවා කුමන විවේචනය කළත් අපේ එකම බලාපොරොත්තුව -ඒකායන බලාපොරොත්තුව- අපේ රටේ මේ සුන්දර මහ පොළොව වස විසෙන් තොර බිමක් බවට පත් කර ගැනීමයි. එයින් තොරව මෙයට විසඳුමක් නැහැ කියා කියමින් මගේ කථාව අවසන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**** සභාමේසය මත තබන ලද ලේඛනය:***
சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:
Document tabled:

Conclusions

Exposure to a combinations of factors that are toxic to the kidney (rather than one single factor) seems to cause this kidney disease. Toxic factors identified up to now include, nephrotoxic agrochemicals, arsenic and cadmium. Genetic factors and other known risk factors of kidney disease appear to increase the individual susceptibility to this triple threat. Several other predisposing factors that may contribute to the development of this disease are under investigation. The social and economic impact of CKDu on impoverished households is grave.



Recommendations

Based on the above findings and the progressive nature of this serious disease for which there is no cure, the following interim measures are recommended:

1. Develop a regulatory framework to improve the quality control of imported fertilizer particularly with regard to nephrotoxic agents such as cadmium and arsenic.
2. Implement measures to reduce the exposure of farmers to the harmful health effects of agrochemicals through i) health education ii) compulsory provision of safety clothing , gloves and masks at the point of sale of agrochemicals and iii) control of the sale of agrochemicals which are known to be nephrotoxic e.g. propanil, chlopyrifos and others
3. Disseminate health education messages to people living in these areas e.g. to thoroughly wash vegetables and rice before cooking, to boil these food items in excess water and to discard the excess water once the food is cooked.
4. Increase the financial assistance provided to farmer families affected by CKDu to prevent them from getting more impoverished.
5. Provide more funds to expand and fast -track this National Research Programme of major public health importance.

It is imperative that the above steps are taken as soon as possible. Delaying action will cause further accumulation of toxic agents in the environment and result in cumulative damage to the health of the people living in these areas.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු ස්වාමීන් වහන්ස, මීළඟට ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා.

[අ.භා. 5.19]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රට පුරා ශීඝ්‍ර ලෙස පැතිර යන වකුගඩු රෝගය පිළිබඳව මගේත් අදහස් කීපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන් 1993, 1994 කාලය තුළ තමයි පළමුවැනි වතාවට වකුගඩු රෝගය පදවිය බල ප්‍රදේශයෙන් සොයා ගනු ලැබුවේ. දීර්ඝ කාලීන වකුගඩු රෝගයට බලපාන ප්‍රධාන කරුණු දෙකක් තිබෙනවා. ඒ තමයි දියවැඩියාව සහ අධික රුධිර පීඩනය. නමුත් අද ඇති වෙලා තිබෙන වකුගඩු රෝගී ව්‍යසනය දිහා බැලුවාම එය හදුනා නොගත් හේතුවකින් හට ගන්නා බරපතළ වකුගඩු රෝගයක්. ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා නම්, "Chronic Kidney Disease of Uncertain Aetiology". 2000 වසරේ උතුරු මැද පළාතේ සියයට 2ක් වකුගඩු රෝගීන් සිටියා. 2006 වන කොට එය වර්ධනය වුණා සියයට 6කට. හැබැයි 2013 ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවලට අනුව අද මේ ප්‍රතිශතය සියයට 15.3ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. 2012 ජන සංගණනයට අනුව උතුරු මැද පළාතේ ජන ගහනය 12,59,564යි. හැබැයි උතුරු මැද පළාතේ ඇස්තමේන්තුගත රෝගීන් ප්‍රමාණය අද වන විට 190,000යි. 2010 වසර වන විට උපදිසාපති කොට්ඨාස 44ක ලේඛනගත කරලා තිබෙන රෝගීන් ප්‍රමාණය 22,336ක් හැටියට වාර්තා වෙලා තිබෙනවා. මම ඒ වාර්තාව මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

දිස්ත්‍රික්ක 9ක, එනම් අනුරාධපුරය, පොළොන්නරුව, වවුනියාව, ත්‍රිකුණාමලය, කුරුණෑගල, මුලතිව්, මාතලේ, බදුල්ල, අම්පාර කියන දිස්ත්‍රික්ක 9හි ව්‍යාප්ත වූ මේ රෝගී තත්ත්වය අද වන විට -විශේෂයෙන් පසු ගිය වසර දෙකක කාලය තුළ- හම්බන්තොට දිස්ත්‍රික්කයටත්, මොනරාගල දිස්ත්‍රික්කයටත් ව්‍යාප්ත වෙලා තිබෙනවා. මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල, වැල්ලවාය, සෙවණගල, කතරගම, බුත්තල, හම්බන්තොට, තිස්සමහාරාමය, වීරකැටිය, සූරියවැව, අහුණුකොළපැලැස්ස කියන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසවල මේ ප්‍රශ්නය අද බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මේ හඳුනා නොගත් වකුගඩු රෝගයේ විශේෂත්වය මොකක්ද? වකුගඩුවලින් සියයට 70ක් අක්‍රිය වෙලා තිබීමයි විශේෂත්වය. ඉතිරි ටික අක්‍රිය වෙන්න යන්නේ වසර 1ත් 5ත් අතර කාලයක්. ඒ රෝගී තත්ත්වය සියයට 70ක් පමණ වර්ධනය වුණාම තමයි එය මතු පිටට පෙනෙන්නේ. එහෙම නම් රෝගීන් වෙමින් සිටින ප්‍රමාණය අපි අදටත් දන්නේ නැහැ. ඒක නොපෙනෙන දෙයක්. අපි අනුමාන කරනවා එය විශාල ප්‍රමාණයක් කියලා. ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා නම්, "It is the tip of the iceberg".

ලෝක සෞඛ්‍ය සංවිධානය නිකුත් කළ අවසන් වාර්තාවේ, 121වැනි පිටුවේ මෙසේ සඳහන් වී තිබෙනවා:

"It is essential that steps are taken as soon as possible. Delaying action will cause further accumulation of toxic agents in the environment and result in cumulative damage to the health of the people living in these areas and with time, also affects younger age groups."

ලෝක සෞඛ්‍ය සංවිධානය මේ ප්‍රශ්නයේ බරපතළභාවය විග්‍රහ කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පැතිර යන මේ වකුගඩු රෝගයට අමතරව සෞඛ්‍යමය වශයෙන් වෙනත් මහා ව්‍යසනයක් තිබෙනවාද, නැද්ද කියලා බලන්න අද අපේ රටේ කෘෂිකාර්මික ප්‍රදේශවල යම් කිසි සංගණනයක් කළොත් අපට පෙනෙනවා ඇත්ත වශයෙන්ම එවන් ව්‍යසනයක් නැති බව. මේ වකුගඩු රෝගී තත්ත්වය මහා බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. හැබැයි මේක කාටවත් රහසක් නොවෙයි. දේශීය පර්යේෂණ ගණනාවකදී මේ කරුණු හෙළි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම බාල පළිබෝධ නාශක සහ රසායනික පොහොර නිසා මේ ප්‍රශ්නය උද්ගත වෙලා තිබෙනවාය කියන එක 2009, 2010 වර්ෂවලදී දේශීය විශේෂඥවරුන් පෙන්වා දුන්නා. කැලණිය විශ්වවිද්‍යාලයේ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, රජ රට විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් රැසක් මේ ප්‍රශ්නය පෙන්වා දෙන කොට ආණ්ඩුව මොකක්ද කළේ? මේ අයව කුමන්ත්‍රණකාරීන් හැටියට හංවඩු ගැහුවා; ආහාර සුරක්ෂිතභාවය, රටේ ස්වයංපෝෂිතභාවය විනාශ කරන්නට කර අදින විදේශීය කුමන්ත්‍රණකාරීන් හැටියට මේ අයට අපහාස කළා. සෞඛ්‍ය අමාත්‍යාංශයත්, කෘෂිකර්ම අමාත්‍යාංශයත් දේශීය විශේෂඥවරුන් කරපු ඒ යෝජනා සියල්ලක්ම ප්‍රතික්ෂේප කළා. නමුත් ලෝක සෞඛ්‍ය සංවිධානය මේ ප්‍රශ්නයේ බරපතළකම හඳුනා ගත්තා. ඒ නිසා තමයි පර්යේෂණ ගණනාවක් පවත්වලා අතුරු වාර්තා ඉදිරිපත් කළේ. ඉන් පළමුවෙනි වාර්තාව 2011 වසරේ ජූනි මාසයේත්, දෙවැනි වාර්තාව 2011 වසරේ ඔක්තෝබර් මාසයේත්, තුන්වැනි වාර්තාව 2012 වසරේ පෙබරවාරි මාසයේත්, හතරවැනි

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

වාර්තාව 2012 වර්ෂයේ ජූනි මාසයේත් ඉදිරිපත් කළා. අවසාන වාර්තාව 2013 වසරේ ජනවාරි මාසයේ ඉදිරිපත් කළා. ඔක්කොම වාර්තා පහයි. අපේ රටේ පාලකයන්ට මේක තේරුණේ නැති වුණාට ලෝක සෞඛ්‍ය සංවිධානය මෙහි තිබෙන බැරෑරුම්කම අවබෝධ කර ගත්තා. එහෙම අවබෝධ කරගෙන [බාධා කිරීමක්] කරුණාකරලා ඔබතුමාගේ කථාවේදී ඉදිරිපත් කරන්න. ඒ බව අවබෝධ කරගෙන ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රකාශ කළේ මොකක්ද? ලෝක සෞඛ්‍ය සංවිධානය 2011 ජූනි මාසයේදී අතුරු වාර්තාවලින් පැහැදිලිවම ප්‍රකාශ කළා කෘමි නාශක, වල් නාශක සහ රසායනික පොහොර මඟින් එක් වන ආසනික් සහ කැඩ්මියම් නිසා මේ බරපතළ ආසාදනය, මේ බරපතළ ව්‍යසනය ඇති වෙනවාය කියලා. ඔවුන් 2011 ජූනි මස ඉදිරිපත් කළ වාර්තාවේ නිර්දේශ පහක් ඉදිරිපත් කළා. රසායනික පොහොරවල ගුණාත්මකභාවය වැඩි කිරීමට යාන්ත්‍රණයක් ඇති කරන්න කිව්වා. රජය ඒ මොකක්වත් කළේ නැහැ. වකුගඩුවලට විෂ ලෙස හඳුනා ගත් ක්ලෝරොෆයිරිපොස්, ප්‍රොපනිල්, ග්ලයිෆෝසේට් සහ කාබරිල් වැනි පළිබෝධ නාශක අළෙවිය සීමා කරලා ඒවායේ අනතුරුදායක තත්ත්වය ගොවි ජනතාවට පැහැදිලි කරන්න කිව්වා. ඒක කළෙත් නැහැ. පානීය ජලය පරිහරණය කිරීම හා ආහාර පිසීමේදී අනුගමනය කළ යුතු විශේෂ ක්‍රමවේද පිළිබඳව ජනතාව දැනුවත් කරන්න කිව්වා. ඒකත් හරියට ක්‍රියාත්මක කළේ නැහැ. වකුගඩු රෝගීන්ට ලබා දෙන මූල්‍යාධාර වර්ධනය කරන්න කිව්වා; වැඩි කරන්න කිව්වා. ඒකත් ක්‍රියාත්මක කළේ නැහැ. ඒ වාගේම දැවැන්ත සෞඛ්‍ය තර්ජනයක් වන මෙම රෝගය පිළිබඳව පර්යේෂණ පවත්වන්නට ප්‍රමුඛතාව ලබා දෙන්න කිව්වා. නමුත් පවත්වපු හැම පර්යේෂණයකින්ම, හැම වාර්තාවකින්ම ඉදිරිපත් වුණු යෝජනා, නිගමන සියල්ලක්ම හමස් පෙට්ටියට දැම්මා; කුණු බක්කියට දැම්මා. ඒකයි පාලකයන් ක්‍රියාත්මක කරපු ක්‍රියා මාර්ගය.

විශේෂයෙන්ම මා සඳහන් කරන්න කැමැතියි, 2011 ජූනි මාසය වන විටත් සෞඛ්‍ය අමාත්‍යාංශය මේ රෝගයට හේතු කාරක වන කරුණු කාරණා සියල්ලක්ම දැන ගෙන හිටියත්, 2012 සැප්තැම්බර් මාසයේ හැරිසන් මන්ත්‍රීතුමා, වන්දානි බණ්ඩාර ජයසිංහ මැතිනිය, සූජා අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ, මම, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමන්ලා ඇතුළු සියලු දෙනාම මේ උත්තරීතර සභාවේ මේ කරුණු අනාවරණය කරන තෙක් මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම මහ හරිමින් සිටි බව. අතුරු වාර්තා පිළිබඳව මේ ගරු සභාවට හෙළි කළේ නැහැ. ඔක්කොම හංගාගෙන හිටියා. බලන්න මේකේ බරපතළකම? සාමාන්‍යයෙන් අවසන් වාර්තාවට පෙර අතුරු වාර්තා ඉදිරිපත් කරන්නේ කෙටිකාලීනව, මධ්‍යකාලීනව පියවර ගන්නයි; විශේෂ අවධානය යොමු කරවන්නයි. සිය දෙවැනි, තුන්වැනි, හතරවැනි වාර්තාවලින් ලෝක සෞඛ්‍ය සංවිධානය මොනවාද කියන්නේ?

"අනේ, කරුණාකරලා පළමුවෙනි වාර්තාවේ යෝජනා ටික ක්‍රියාත්මක කරන්න" කියලා ආයාචනය කිරීමක් තමයි කරන්නේ. එහෙම නම් ඇයි මේක අපේ රටේ ජනතාවගෙන් අවුරුදු ගණනාවක් හැංගුවේ? විශේෂයෙන්ම 2011 ජූනි වන විට හඳුනා ගත්ත ප්‍රශ්නවලට පැහැදිලි විසඳුම් ක්‍රියාමාර්ගයන් නොගත්තේ මොකද? අද වන විට මාස 22ක් ගත වෙලා තිබෙනවා, පැහැදිලි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා නැහැ. අපි පැහැදිලිවම මෙන්න මේ ප්‍රශ්න අහන්නට ඕනෑ. විශේෂයෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානය ක්‍රියාවට නංවන්නට කියූ නිර්දේශවලට මොකක්ද කළේ, ඇයි ඒවා ක්‍රියාත්මක නොකළේ? සෞඛ්‍ය අමාත්‍යාංශයේ මොන නිලධාරියාටද මේ වාර්තාව ලැබුණේ? සෞඛ්‍ය අමාත්‍යවරයා දැන ගෙන සිටියාද භාවිතයෙන් ඉවත් කරන්නට කියූ වල් නාශක සහ කෘමි නාශක පිළිබඳව? අමාත්‍යාංශය දැනුවත් වුණාද, කෘෂිකර්ම අමාත්‍යාංශය දැනුවත් කළාද? දැනුවත් කළා නම් කෘෂිකර්ම අමාත්‍යාංශය මාස 22ක් තිස්සේ මොකක්ද කළේ? අදටත් වෙළෙඳ පොළේ මේ සියල්ලක්ම තිබෙනවා.

ලෝක සෞඛ්‍ය සංවිධානය ත්‍රිත්ව තර්ජනයක් ගැන ඉදිරිපත් කළා. එක පැත්තකින් ආසනික්. තවත් පැත්තකින් කැඩ්මියම්. තුන්වෙනි පැත්තෙන් nephrotoxic agrochemicals; ඒ කියන්නේ වකුගඩුවලට විෂ සහිත පළිබෝධ නාශක. මේ විෂ වර්ග කිහිපයම එකතු වෙලා තමයි සම්ප්‍රයුක්ත බලපෑම ඇති කරන්නේ. ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා නම් cumulative toxic damage. මොකක්ද පාලකයින් ගත්ත පියවරයන්? ඇයි මේ ප්‍රශ්නය කථා කරන විද්වතුන්ට මඩ ගැහුවේ, තර්ජනය කළේ, දෝෂාරෝපණය කළේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ප්‍රශ්නයට කිවුල් වතුරත් බරපතළ බලපෑමක් එල්ල කරනවා කියන කාරණය 2012 පෙබරවාරි වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. මේ රෝගීන්ගෙන් සියයට 99ක් පරිහරණය කරලා තිබෙන්නේ කිවුල් ජලය. ආසනික් සහ කැඩ්මියම්වලට බරපතළ බලපෑමක් කිවුල් ජලය වැඩි වීම නිසාත් සිදු වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ පර්යේෂණවල මෙන්න මේ ආකාරයට සඳහන් වෙලා තිබෙනවා. උතුරු මැද පළාතේ ජනගහනයෙන් සියයට 61ක් දිනකට පානය කරන්නේ වතුර ලීටර් 1යි. ඒ වාගේම තවත් සියයට 14ක් දිනකට පානය කරන්නේ වතුර ලීටර් 2යි. වෛද්‍ය නිර්දේශය මොකක්ද? දිනකට වතුර ලීටර් 5ක් පානය කළ යුතු බව. නමුත් කිවුල නිසා ඒ ප්‍රදේශයේ ජනතාව ඒ ජලය පරිහරණය කිරීම අවම කරලා තිබෙනවා. විශේෂයෙන්ම දේශීය පර්යේෂණවලින් මේ අධික කිවුලේ ප්‍රශ්නය, බාල රසායනික පොහොර සහ පළිබෝධ නාශකවල ප්‍රශ්නය සහ ලවණ තත්ත්වය නිසා ඇති වෙන මහා සෞඛ්‍යමය ගැටලුව පිළිබඳව රට දැනුවත් කරන විට බලධාරීන් නිහඬව සිටියේ ඇයි කියන කාරණය මහා ප්‍රහේලිකාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්ත වශයෙන්ම ආසනික් අපේ රටට එන ප්‍රධානම ප්‍රභවය triple superphosphate. මඩ පොහොර; පොස්පේට් පොහොර. ඒ මොකද, අපේ රටේ පොහොරවලට ආසනික් ප්‍රමිතියක් නැහැ. විශේෂයෙන්ම මාස 22ක් මේ ප්‍රශ්නය ගැන දැන දැනත් අපේ බලධාරීන් ප්‍රමිතියක් පනවන්නට කටයුතු කළේ නැහැ. මොකක්ද මේකේ රහස? අපේ රටට ගෙන්වන්නේ ගුණාත්මක භාවයෙන් බාල තිබෙන පොහොර. චීනයෙන්, ඇල්ජීරියාවෙන් සහ උතුරු අප්‍රිකාවෙන් තමයි ගෙන්වන්නේ. ටොන් එකකට වැය කරනවා ඇමෙරිකානු ඩොලර් 280 - 300ක් අතර ප්‍රමාණයක්. ගුණාත්මක භාවයෙන් යුතු හොඳ පොහොර තිබෙනවා ඇමෙරිකා එක්සත් ජනපදයේ, ඕස්ට්‍රේලියාවේ සහ රුසියාවේ. නමුත් ඒවා ටිකක් ගණන්. ටොන් එකක් වටිනවා ඇමෙරිකානු ඩොලර් 575 - 650 අතර ප්‍රමාණයක්. මොකක්ද අපේ රටේ ආණ්ඩුව කරන්නේ? බාල පොහොර ගෙන්වලා, රුපියල් 350ට පොහොර දෙනවා කියලා මේ රටේ ජනතාව වනසන; මේ රටේ ජනතාව මරු කට තුළට ගෙන යන්නට මාර්ගෝපදේශකත්වයක් ලබා දීම. බාල පොහොර ගෙන්වන, බාල වැඩ කරන, බාල රජයක් නිසා අද උතුරු මැද ඇතුළු මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවට වකුගඩු රෝගය නිසා මහා ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා කියන කාරණය මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඇයි ලංකාවට ගෙන එන කෘමි නාශක, වල් නාශක, දිලීර නාශක සහ රසායනික පොහොරවලට ආසනික්, කැඩ්මියම්, රසදිය වැනි උග්‍ර විෂ වර්ග පිළිබඳව ප්‍රමිතියක් දමන්නේ නැත්තේ? මොකක්ද මේක නොදමන්න හේතුව? පසු ගිය දවස්වල අපට හොරය අහු වුණා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා ඉන්නවා. එතුමා ප්‍රකාශ කරලා තිබෙනවා ලංකාවේ භාවිත වන පළිබෝධ නාශකවල ගුණාත්මක භාවයේ කිසිම ප්‍රශ්නයක් නැහැයි කියලා.

විශේෂඥවරු පර්යේෂණ පවත්වලා මේ පළිබෝධ නාශකවල ගුණාත්මකභාවයේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා කියලා 2011 ජූනි මාසයේ කිව්වාට පස්සේත්, පළිබෝධ නාශකවල ගුණාත්මකභාවය ගැන සහතිකය දෙන්නේ පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයායි. ඇත්ත වශයෙන්ම ශරීරයේ වර්ධනයට ආසනික් වැදගත්, ශරීරයේ වර්ධනයට ආසනික් අවශ්‍යයි කියලා එතුමා ප්‍රකාශ කරනවා. ලෝකයේ තිබෙන උග්‍රම විෂ වර්ගයක් තමයි "ආසනික්" කියන්නේ. ඒකට ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නේ, "potent carcinogen" කියලා. පිළිකා කාරකයක්. නමුත් 2011 ඔක්තෝබර් තුන්වැනිදා උදේ නවයට ස්වදේශීය සේවයේ "ගොවිතැනට තැනක්" කියන වැඩසටහනේදී කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සිටින පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා කියනවා, ශරීර වර්ධනයට ආසනික් අවශ්‍යයි කියලා. එතුමා එසේ ප්‍රකාශ කරලා රටේ ජනතාව නොමඟ යැව්වා. එහෙමනම් අපි දැන් මේ ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ "යකඩ සිරජ්" හඳුන්න ඕනෑ නැහැ. "ආසනික් සිරජ්" තමයි අපි හඳුන්න ඕනෑ. මේ රටේ ජනතාව මරු කටට ගෙන යන්න නම්, මේ රජයේ නිලධාරියා කියන කටයුතු අනුගමනය කරන්න ඕනෑ.

මේ වාගේ තත්ත්වයක් ලෝකයේ තවත් රටවලත් තිබෙනවා. විශේෂයෙන්ම මධ්‍යම ඇමෙරිකාවේ සහ ලතින් ඇමෙරිකාවේ El Salvador, Costa Rica, Nicaragua, Guatemala, Honduras, Belize, Dominican Republic කියන රටවල උක් වගාව ආශ්‍රිතව මේ වාගේම ප්‍රශ්නයක් එළඹිලා තිබෙන මොහොතක වසර හයකට, හතකට ඉස්සෙල්ලා ඒ රටවල රාජ්‍ය නායකයෝ හැසිරුණේ කොහොමද? SICA කියලා වෙනම සමුළුවක් තිබෙනවා. Central American Integration System යනුවෙන් ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් පැවැත්වුවා. විශේෂයෙන්ම මේ ප්‍රශ්නය පිළිබඳව කරුණු කාරණා හොයා බලා එහිදී ඒ අය තීන්දුවක් ගත්තා, කෘමි නාශක සහ වල් නාශක රැසක් තහනම් කරන්න. ඒ වාගේම ගොවීන්ට විජලනය සැලැස්වීමට ද්‍රාවණ - dehydration solution - ලබා දෙන්නට එනම්, ශරීරයේ ජලය සහ අයන සමතුලිතභාවය සුරකින්නට අවශ්‍ය සහන ලබා දෙන්නට ඒ රටවල නායකයෝ ඉදිරිපත් වුණා. එපමණක් නොවෙයි, ඒගොල්ලන් වෙන මොනවාද කළේ? "International Conference on Chronic Kidney Disease of non-traditional Causes and the Scientific Debate" මේ සම්බන්ධයෙන් වෙනම විවාදයක් පවත්වලා විශේෂයෙන්ම ඒ රටවල රාජ්‍ය නායකයෝ සහ සෞඛ්‍ය ඇමතිවරු මොනවාද කළේ? අපේ රටේ විශේෂඥවරුන්ට ආරාධනා කළා, ඇවිල්ලා සාකච්ඡා කරමු, අදහස් හුවමාරු කර ගනිමු, මොකද අපේ රටවල ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, ඔබලාගේත් අදහස් උදහස් ලබා දෙන්න; අපි කැමැතියි ඔබලාගේ තොරතුරුවලින්, ඔබලාගේ නිගමනවලින් පෝෂණය වෙලා අපේ රටේ ප්‍රශ්නය විසඳන්න කියලා කිව්වා. බලන්න වෙනස. අපේ රටේ විශේෂඥවරුන්ට මඩ ගහනවා, චරිත ඝාතන කරනවා, රාජ්‍ය කුමන්ත්‍රණ දියත් කරනවා කියනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වියෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம *அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் *அவர்கள் தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
රාජ්‍ය කුමන්ත්‍රණ දියත් කරනවා කියලා අපේ රටේ විශේෂඥවරුන්ට, විද්වතුන්ට මඩ ගහන කොට මධ්‍යම ඇමෙරිකානු හා ලතින් ඇමෙරිකානු රටවල සෞඛ්‍ය ඇමතිවරු ඔවුන්ට ඒ රටවලට එන්න කියලා ආරාධනා කරනවා.

ඒ ආරාධනා ලිපි සහ තොරතුරු සියල්ලක්ම මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා. දොස්තර ජයසුමන මහත්තයාට ආරාධනා කරනවා, දොස්තර දහනායක මහත්තයාට ආරාධනා කරනවා, ලතින් ඇමෙරිකානු රටවලට, මධ්‍යම ඇමෙරිකානු රටවලට ඇවිල්ලා අපේ මේ ප්‍රශ්නයට ඔබලාගේ බුද්ධිය, ඥානය, දැනුම, මිනුම, නිගමන, නිර්දේශ ලබා දෙන්න කියලා. ඔබලාගේ තොරතුරුවලින් පෝෂණය වෙලා අපේ වැඩසටහන සාර්ථක කර ගන්න අපි ලෑස්තියි කියලා එතුමන්ලා කියනවා. අන්න නායකයෝ හැසිරෙන්න ඕනෑ ආකාරය.

මහ ලොකුවට මේ ප්‍රශ්නය එළියට එනකොට කෘෂිකර්ම ඇමතිතුමා කිව්වා, chlorpyrifos, propanil, glyphosate, carbaryl; ඒ කියන්නේ චටාස්, පටාස්, ජම්බෝ, සැන්ඩෝ, ජූඩෝ, මරුනිල්, රවුන්ඩප්, ඩෑෂ් යනාදී වෙළෙඳ නාමයන්ගෙන් අද වෙළෙඳ පොළේ තිබෙන මේ රසායනික ද්‍රව්‍ය ඔක්කොම තහනම් කරනවා කියලා. කෘෂිකර්ම ඇමතිතුමනි, නමුත් මනුෂ්‍ය භාවිතයට විෂ සහිතයි කියන මේ සියලුම රසායනික ද්‍රව්‍ය අදටත් වෙළඳ පොළේ තිබෙනවා. ඔබතුමාගේ තහනම පුස් තහනමක්, හිස් තහනමක් බවට අද පත් වෙලා තිබෙනවා කියන එක කනගාටුවෙන් හෝ ප්‍රකාශ කරන්නට ඕනෑ.

මගේ කථාව අවසන් කරන්නට පෙර මේ වකුගඩු රෝගය පිළිබඳව ප්‍රතිකාරක පැත්ත ගැන පොඩ්ඩක් කථා කරන්න මා කැමැතියි. මම ඉස්සෙල්ලා කථා කළේ නිවාරණ පැත්ත ගැනයි; අපි මේ තත්ත්වය prevent කරන්නේ කොහොමද කියන එක ගැනයි. දැන් අපි බලමු curative පැත්ත ගැන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බරපතළ ලෙස වකුගඩු රෝගය වැලඳී ගිලන් වුණු ජනතාව වසරකට 1,500ත් 2,000ත් අතර ප්‍රමාණයක් කොළඹ ජාතික රෝහලට එනවා. වකුගඩු අක්‍රියතාව නිසා ගිලන් වුණු පුද්ගලයන් මාසයකට 3,000ක් පමණ එනවා. වකුගඩු ආසාදනය නිසා ජාතික රෝහලේ 30දෙනෙකු පමණ සෑම මසකම මිය යනවා. දිනකට එක් අයකු මිය යනවා. නමුත් කියන්නට කනගාටුයි, ජාතික රෝහලේ රුධිර කාන්දු කිරීමේ පහසුකම් ප්‍රමාණවත් ලෙස නැහැ. බොහෝ දෙනා පෞද්ගලික රෝහල්වලට යන්නට ඕනෑ. මේ සඳහා මාසයකට රුපියල් 68,000ක් වැය වනවා. රටේම අවශ්‍යතාව රුධිරය කාන්දුකරණ කට්ටල 1,500යි. කියන්නට කනගාටුයි, ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ මේ කට්ටල තිබෙන්නේ 170යි. අහනකොට කියනවා, ඕනෑ තරම් තිබෙනවාය කියා. දළ දේශීය නිෂ්පාදනයෙන් කට පිරෙන්නට බෙදනවා ලු. සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඇති වෙන්නට සල්ලි තිබෙනවා ලු. නමුත් රටට ප්‍රමාණවත් රුධිර කාන්දුකරණ කට්ටල නැති ශ්‍රී ලංකාව බංකොලොත් ආශ්චර්යයක් හැටියටයි මම දකින්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, please give me two more minutes.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, I will give you one more minute.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

වකුගඩු බද්ධ කිරීමේ වැඩසටහන අද අක්‍රිය වෙලා තිබෙනවා. මාලිගාවත්තේ වකුගඩු බද්ධ කිරීමේ ඒකකය විවෘත කරලා වසර එකහමාරක් වෙනවා. නමුත් එක වකුගඩු බද්ධ කිරීමක්වත් එහි ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ වාගේම මහ රෝහලේ ප්‍රමාණවත් ශල්‍යාගාර පහසුකම් නොමැති නිසා විශ්වවිද්‍යාල ඒකකයේ බද්ධ කිරීම් නතර වෙලා තිබෙනවා. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ ඒකකයේ බද්ධ කිරීම් අඩාල වෙලා තිබෙනවා. ඇයි? ඖෂධ හිඟය නිසා. Simulect කියන බෙහෙත නැහැ. ඒ වාගේම Micera කියන බෙහෙත නැහැ. Erythropoietin කියන බෙහෙත නැහැ. Valganciclovir කියන බෙහෙත නැහැ. ඖෂධ හිඟයෙන් පිරුණු ශ්‍රී ලංකාවක් අද ක්‍රියාත්මක වන්නේ. එපමණක් නොවෙයි. පුදුමයේ මහිමය නම් සෞඛ්‍ය ඇමතිතුමා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රෝහල්වලත් ප්‍රමාණවත් රුධිර කාන්දුකරණ කට්ටල නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පරණ මැෂින් හයක් තිබෙනවා. එක අලුත් මැෂිමක් තිබෙනවා. තවත් අලුත් මැෂින් 13ක අවශ්‍යතාව තිබෙනවා. වකුගඩු රෝගීන්ට විශේෂිත වූ වාට්ටුවක් නැහැ. සායන පවත්වන්න තැනක් නැහැ. ශල්‍ය වෛද්‍ය සායනය සහ විකලාංග සායනයේ තමයි මෙය ක්‍රියාත්මක වන්නේ. කායික රෝග වාට්ටුවෙයි, ශල්‍ය වාට්ටුවෙයි තමයි මේ සියලු වැඩ කොටස් ක්‍රියාත්මක වන්නේ.

අවසාන වශයෙන් මා එකක් කියන්නට කැමැතියි. මේ ප්‍රශ්නය ගැන පක්ෂ භේදයෙන් තොරව කථා කරන්නලු; මේක ජාතික ප්‍රශ්නයක් ලු; ජාතික ව්‍යසනයක් ලු. නමුත් මේ ප්‍රශ්නය ගැන මාස 22ක් දැන සිටියදීත් මේ රට පාලනය කරපු ආණ්ඩුව කට වහගෙන සිටියා; තක්බීර් වෙලා සිටියා; මේ ප්‍රශ්නයට නිසි විසඳුම් ලබා දෙන්නේ නැතිව වාර්තා හැංගුවා. අදවත් තමුන්නාන්සේලා මේ හොරකමින් ඉවත් වෙලා, බහු ජාතික සමාගම්වල සුවච කීකරු සේවකයන් වන්නේ නැතිව රටේ ජනතාව ගැන හිතලා, රටේ ජනතාව ජීවත් කරවන්නට - මරවන්නට නොවෙයි - කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මගේ කථාව නතර කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.41]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික වැදගත්කමකින් යුතු මාතෘකාවක් අද දින මේ උත්තරීතර සභාවේ සාකච්ඡාවට ලක් වන මොහොතේ දී ඒ පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ස්තුතිය ඔබතුමාට පුද කර සිටිනවා.

විශේෂයෙන්ම මෙම යෝජනාව ඉදිරිපත් කළ අනුර දිසානායක මැතිතුමා ඇතුළු අනෙකුත් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් සියලු දෙනෙක්ම මේ පිළිබඳව සාධාරණ විග්‍රහයන් කළ බව අපට හැඟෙනවා.

1990 දශකයේ මැද කාලයේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍යයකු වශයෙන් ඉගෙන ගන්නා කාලයේ මට මතකයි, රජ රට ප්‍රදේශයේ වකුගඩු රෝගී තත්ත්වයන් පිළිබඳ වාර්තා වනකොට වකුගඩු රෝගය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් එම ප්‍රදේශවල සේවය කළේ නැති නිසා මහනුවර මහ රෝහලේ එවකට සේවය කරමින් සිටි වෛද්‍ය තිලක් අබේසේකර මැතිතුමාත්, පේරාදෙණිය මහ රෝහලේ සේවය කරමින් සිටි විශේෂඥ වෛද්‍ය ශාන්ති මෙන්ඩිස් මැතිනියත් එම ප්‍රදේශවලට ගිහිල්ලා සායන ආරම්භ කරන්නට මූලික කටයුතු සූදානම් කළ බව. මා හිතන හැටියට සජිත් ප්‍රේමදාස මැතිතුමාත් සඳහන් කළා වාගේ ශ්‍රී ලංකාව පුරාම වකුගඩු රෝගය පැතිර යාමේ අවදානමක් තිබෙනවා. ඒ සඳහා පාදක වන්නා වූ විශේෂම කරුණු දෙක තමයි පාලනයකින් තොරව දියවැඩියා රෝගය දීර්ඝ කාලයක් පැවතීම සහ පාලනයකින් තොරව අධික රුධිර පීඩනය දීර්ඝ කාලයක් පැවතීම.

ඊට අමතරව වෘක්ක ප්‍රදාහය - glomerulonephritis - වැනි තත්ත්වයන් නිසා මේ රටේ විශාල පිරිසක් වකුගඩු රෝගී තත්ත්වයට පාත්‍ර වෙලා තිබෙනවා. නමුත් අවාසනාවකට වාගේ මේ සඳහා හඳුනා ගත් හේතු සාධක, බාහිර කරුණු නොමැතිව උතුරු මැද පළාතේ, විශේෂයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේත්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් 1990 දශකයේ මැද කාලයේත්, අවසන් කාලයේත් සිට වකුගඩු රෝගය ආශ්‍රිතව රෝගීන් විශාල පිරිසක් වාර්තා වෙලා තිබෙනවා. අවාසනාවකට වාගේ ජීවිතයේ දෙවැනි, තුන්වැනි දශකවලදී ආරම්භ වෙලා රෝගය හඳුනා නොගෙන රෝගයේ අවසාන අවස්ථාවට පත් වුණාට පස්සේ - end stage renal disease -වෛද්‍ය සායනයකදී මේ රෝගය හඳුනා ගැනීමට ලක් වන නිසා රෝගීන් විශාල සංඛ්‍යාවක් ඉතාම අපහසුතාවට පත් වී තිබෙනවා.

ආර්ථික වශයෙන් ශක්තිමත් පවුලක කෙනකුට වුණත් වකුගඩු ආබාධයකට මුහුණ දෙන්නට සිදු වුණොත් සමහර විට පිළිකා රෝගී තත්ත්වයට වඩා අපහසුතාවකට පත් වෙනවාය කියන එක අප බොහොම පැහැදිලිව දන්නවා. ඒකට හේතුව, මේ රෝගය සඳහා දීර්ඝ කාලයක් රුධිර කාන්දුකරණය - dialysis - වෙනුවෙන් විශාල මුදලක් දරන්නට සිදු වීම. දෙවැනි කාරණය, වකුගඩු බද්ධ කිරීමෙන් ජීවිතය බේරා ගත හැකිය කියන බලාපොරොත්තුව තිබීම. මේ බලාපොරොත්තුව මත එළඹිලා විශාල පිරිසක් මුදල් වියදම් කර ගෙන රජයේ හෝ පෞද්ගලික රෝහල්වලින් වකුගඩු බද්ධ කිරීම කර ගන්නටත්, ඊට පසුව ශරීරය මගින් මේ වකුගඩුව ප්‍රතික්ෂේප කිරීම වළක්වා ගන්නට විශාල මුදලක් ගෙවා immunosuppressive drugs ලබා ගන්නවා. මේ තත්ත්වය ආර්ථික වශයෙන් සමාජයට විශාල බලපෑමක්. උතුරු මැද පළාතේ මේ තත්ත්වය වඩාත් උග්‍ර වෙලා තිබෙනවා. තරුණ ජීවිත විශාල සංඛ්‍යාවකට මේ රෝගී තත්ත්වය බලපා තිබෙන නිසා සමාජමය වශයෙන් විශාල ගැටලුවක් මතු වී තිබෙනවා. එක පැත්තකින් පවුලේ ජීවිකාව ගෙන යන; හරි හම්බු කරන පුද්ගලයාට මේ රෝගී තත්ත්වය ඇති වීම තුළින් විශාල ආර්ථික අගාධයකට මේ පවුල් සංස්ථාව පත් වී තිබෙනවා. වාර්තා වන ආකාරයට විවිධ සංඛ්‍යා ලේඛන මේ හරහා ඉදිරිපත් වුණත් උතුරු මැද පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කරන වාර්තා අනුව මේ කාලය වන විට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආසන්න වශයෙන් රෝගීන් 3,000ක් 3,500ක් පමණ ප්‍රමාණයකුත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ රෝගීන් දස දහසකට ආසන්න ප්‍රමාණයකුත් මේ රෝගයට ප්‍රතිකාර ලබා ගන්නට රජයේ රෝහල්වල ලියාපදිංචි වෙලා තිබෙනවා.

කවුරු මොනවා කිව්වත්, මේ රෝගය පැතිරී ගෙන යනකොට මේ පිළිබඳව අවධානය යොමු කරන්නට අපේ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය පසු ගිය කාලයේ විශාල අවධානයක් යොමු කර තිබෙනවා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා වාගේ නොවෙයි. එවකට සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් සිටි ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ඉල්ලීම අනුව ලෝක

සෞඛ්‍ය සංවිධානය පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණයේ අවසන් වාර්තාව ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය මිලියන 30ක් වියදම් කරනකොට රජය මිලියන 70ක් වියදම් කරලා මේ කටයුත්තට නිශ්චිත කරුණු කාරණා හඳුනා ගන්නට කටයුතු කර තිබෙනවා. ඒ වාර්තාව අද එළි දක්වා තිබෙනවා. පක්ෂ, විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා අතර අද එම වාර්තාව තිබෙනවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණුවලට පරිබාහිරව මා කියන්නට සතුටුයි, මේ වාර්තාවේ බොහොම පැහැදිලිව නිශ්චිත ප්‍රතිකර්ම සහ කළ යුතු දේවල් - recommendations - පිළිබඳව සාධනීය කරුණු ඉදිරිපත් කර තිබෙන බව. ඔවුන් යෝජනා කරන පරිදි අපට ජාතික මට්ටමේ කතිකාවතක් ගොඩ නඟන්නට, ඒ පිළිබඳව වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්නට සෞඛ්‍ය අමාත්‍යාතුමාගේ ප්‍රධානත්වයෙන්, අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් විවිධ අංශවල සහයෝගය ලබා ගෙන කටයුතු කරන අවස්ථාවකට අප එළඹිලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා මේ පිළිබඳව විශේෂ උනන්දුවකින් කටයුතු කරනවා වාගේම කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු ඇමතිවරුන් තමන්ගේ අමාත්‍යාංශ මට්ටමින් මේ සඳහා ගත හැකි, ගත යුතු ක්‍රියාමාර්ග අරඹන්නට මේ වන විටත් කටයුතු ආරම්භ කර තිබෙනවා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණය පිළිබඳව සලකා බලන විට අප සෑම දෙනෙක්ම බොහොම පැහැදිලිව දැන ගත යුතු කාරණය මෙයයි. මේ වාර්තාවේ අන්තර්ගත කරුණු පිළිබඳව පරීක්ෂා කිරීමේදී විශේෂයෙන් කැඩ්මියම්, ආසනික්, ලෙඩ් වැනි රසායනික ද්‍රව්‍ය පදවිය, කැබිනිගොල්ලෑව, රඹෑව, මැදවච්චිය ඇතුළු කෘෂිකාර්මික ජනතාව ජීවත් වන ප්‍රදේශවල මේ රෝගයට ගොදුරු වුණු ජනතාවගේ ශරීරවල ඉතාම භානිදායක මට්ටමින් වැඩිපුර තිබෙන බව නිශ්චිතව හඳුනා ගෙන තිබෙනවා. අපට මේ තත්ත්වය පාලනය කරන්නට ගත යුතු ක්‍රියාමාර්ග ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවේ බොහොම පැහැදිලිව දක්වා තිබෙනවා. ඒ වෙනුවෙන් මේ රටට ආනයනය කරනු ලබන සමහර විෂ කෘෂි රසායනික ද්‍රව්‍යවල පාලනයක් ඇති කළ යුතුය, සමහර කෘෂි රසායන ද්‍රව්‍ය මේ රටට ආනයනය කිරීම තහනම් කළ යුතුය කියන නිර්දේශ ඔවුන් ලබා දී තිබෙනවා.

ගරු කෘෂිකර්ම අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන අමාත්‍යාතුමාට අප ඉතාම ගෞරවයෙන් ස්තුතිවන්ත වෙනවා. මේ වාර්තාව නිකුත් වුණාට පසුව එතුමා එතුමාගේ මට්ටමෙන් කරන්න පුළුවන් කටයුත්ත කළා. එතුමා දැනටමත් කාබරිල්, ප්‍රොපනිල්, ක්ලෝපයිරිෆෝස් වැනි රසායන ද්‍රව්‍ය මෙරටට ගෙන්වීම තහනම් කරන්න නියෝග නිකුත් කරලා තිබෙනවා. අපි ඒ පිළිබඳව එතුමන්ට අපගේ ගෞරව පූර්වක ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා සඳහන් කළා වාගේ මේ තහනමට පෙර මෙරට වෙළඳ පොළට ආනයනය කරන ලද රසායන ද්‍රව්‍ය දැනටමත් වෙළඳ පොළේ සංසරණය වෙනවා නම් ඒවා බෙදා හැරීමේ කටයුතු තහනම් කරන්න අවශ්‍ය නීති රෙගුලාසි පනවන්නත් අප එකතු වෙලා කටයුතු කළ යුතුයි කියන කාරණය මේ අවස්ථාවේ සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒත් එක්කම ඉදිරි කාල වකවානුව තුළදී මෙරටට ගෙන්වන පොහොරවල ප්‍රමිතිය පරීක්ෂා කරනවා වාගේම තත්ත්වයෙන් ඉහළ ගුණාත්මක පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය මෙරටට ගෙන්වීම සඳහා අවශ්‍ය පදනම සැකසිය යුතුයි කියන කාරණය අපි සඳහන් කරනවා. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා රැස්වීම්වලදීත්, විවිධ ස්ථානවලදීත් මෙරටට ගෙන්වන බෙහෙත්වල ගුණාත්මක තත්ත්වය ඉහළ නංවන්න අවශ්‍යයි කියන කරුණ අපි සඳහන් කරනවා. ඒ වාගේම කෘෂි රසායනික ද්‍රව්‍යවල ප්‍රමිතියත්, තත්ත්වයත් ඉහළ නංවන්න කටයුතු කළ යුතුයි. හැබැයි ඒ වෙනුවෙන් බැදුණු විශේෂ ආයතනවලින් මේ පරීක්ෂණය සඳහා අවශ්‍ය පිරිවැය දරන්න වෙනවා. ආණ්ඩුවක් හැටියට අපට වගකීමක් තිබෙනවා, කරුණු හොඳින් analyse කරලා, අවශ්‍ය පිරිවැය දරලා, අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ගෙන්වලා, එවැනි ආයතන ස්ථාපනය කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම කෙටියෙන් තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතයේදී ගොවි මහත්වරුන් ඉතාම මූලික මට්ටමේ විධි ක්‍රමවත් භාවිතා කරන්නේ නැහැ කියන කාරණය වාර්තා වෙලා තිබෙනවා. හිස් වැසුම්, මුඛවාඩම් සහ ආරක්ෂිත ඇඳුම් පාවිච්චි කරන්නේ නැහැ කියන කාරණය වාර්තා වෙලා තිබෙනවා. අපි ඉතාම ඉක්මනින් එය අවධානයට යොමු කළ යුතුයි. ඒ වාගේම ගරු ජලසම්පාදන හා ජලාපවහන ඇමතිතුමාගේ නායකත්වයෙන් ජලය බෙදා හැරීමේ කටයුතු විධිමත් කරන්න කටයුතු කර තිබෙනවා. නිවෙස්වලට ජල පෙරන ලබා දීම, වැසි වතුර එකතු කර ජනතාවට ලබා දීම වාගේම ටැංකි මාර්ගයෙන් ජනතාවට වතුර ලබා දීමේ වැඩ සටහනක් ද දැනටමත් ආරම්භ කරන්න විශේෂ කමිටුවක් පත් කර තිබෙනවා. අපි ඊයේ ඒ කමිටුවටත් සම්බන්ධ වුණා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා තවත් විනාඩියකින් කථාව අවසන් කරනවා. මේ කරුණු මෙසේ සඳහන් කරන අතරේ, රජයේ මෙන්ම මෙරටට කෘෂි රසායන ද්‍රව්‍ය ගෙන්වන සමාගම් ඇතුළු පෞද්ගලික අංශයේ මැදිහත් වීමත් ලබා ගෙන විපතට පත් පවුල් සඳහා කිසියම් සමාජ සුභසාධන වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු වෙනවා. මේ සෑම සමාගමකටම Corporate Social Responsibility එකක් තිබෙනවා, තමුන් උපයන ලාභයෙන් කොටසක් සමාජ වැඩ කටයුතු සඳහා යොදවන්න. ඒ නිසා මෙවැනි සමාගම්වල කිසියම් දායකත්වයක් මෙම වැඩසටහන සඳහා ලබාගෙන, රජයේ මූලිකත්වයෙන් විපතට පත් පවුල් සඳහා හොඳ සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් සකස් කරන්නට කටයුතු කරමුයි කියන කාරණය මතක් කරමින් මේ වෙනුවෙන් අපි සෑම දෙනකුම එකතු වෙලා කටයුතු කරමු කියන ඉල්ලීමත් කරමින් මගේ කථාව අවසන් කරනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

[අ.භා. 5.50]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව කාලෝචිත යෝජනාවක්. මොකද, අද අපේ රට මේ වකුගඩු රෝගයෙන් ව්‍යසනයකට පත් වෙලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමන්, ගරු අමාත්‍යාතුමන්ලා ඇතුළු අපේ රජය මේ සඳහා පිළියම් යෙදීම සම්බන්ධයෙන් මේ වන කොට පියවර රාශියක් අරගෙන තිබෙනවා.

[ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් මේ රෝග නිධානය -රෝගයට හේතුව- හොයන්නට කටයුතු කළේ අපේ රජයයි. ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමන් සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරද්දී තමයි ලෝක සෞඛ්‍ය සංවිධානයට මේ කාරණය භාර දුන්නේ; අපේ සල්ලි වියදම් කරලා මේ වාර්තා ලබා ගන්නට කටයුතු කළේ. ඒ වාගේම මේ වාර්තා ලැබීමෙන් පසු අපට යම් යම් අවශ්‍ය තොරතුරු රැස් කරගෙන තිබෙනවා. ඒ අනුව අපට මේ සම්බන්ධයෙන් ගත හැකි කෙටි කාලීන පියවර මොනවාද, මධ්‍ය කාලීන පියවර මොනවාද සහ දිගු කාලීන පියවර මොනවාද කියන කාරණය අවබෝධ කරගෙන අපේ රජය කටයුතු කරගෙන යනවා. විශේෂයෙන් පානීය ජලයත් එක්ක මෙහි ඇති සම්බන්ධතාව පිළිබඳව අතිගරු ජනාධිපතිතුමන්ගේත් විශේෂ අවධානය යොමු වෙලා තිබෙනවා.

රජරට සහ අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය, මහඔය, පදියතලාව වැනි ප්‍රදේශවලත්, බදුල්ල දිස්ත්‍රික්කයේ ගිරාඳුරුකෝට්ටේ, මහියංගනය, රිදීමාලියද්ද වාගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලත් මේ තත්ත්වය තිබෙන බව හඳුනා ගෙන තිබෙනවා. අද මේ වන කොට අනුරාධපුරය ප්‍රදේශයේ ගෙවල්වලට බවුසර් මඟින් ජලය ලබා දෙන්නට කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ වන කොට මේ වකුගඩු රෝගය සම්බන්ධයෙන් ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා යටතේ විශේෂ උපදේශක කාරක සභාවක් පත් කරලා කරුණු කාරණා හොයනවා වාගේම ඉක්මන් -කෙටිකාලීන- විසඳුමක් විධියට පිරිසිදු පානීය ජලය ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමත්, වැසි ජලය පිරිසිදුව ලබා ගන්නට දැනුවත් කිරීමත්, ජල පෙරන - filters - නිවෙස්වලට ලබා දීමත් වැනි වැඩ කටයුතු රාශියක් කරනවා. ඒ වාගේම තාක්ෂණය දියුණු රටවල් පාවිච්චි කරන ජලය, ලවණ වෙන් කරන යන්ත්‍රයක් එම ගම්වල ප්‍රජාවට ලබා දෙන වැඩ පිළිවෙළකුත් ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න මුදල් ප්‍රතිපාදන වෙන් කර දීලා උදව් උපකාර කර තිබෙනවා. බහු ජාතික සමාගම්වලට අපේ රට විනාශ කරන්නට ඉඩ නොදී අපි ඇත්ත සොයා ගන්න ඕනෑ. ඒ සොයා ගත් ඇත්ත පදනම් කරගෙන අපි යථාර්ථවාදීව මේ ප්‍රශ්නයට මුහුණ දීලා ජාතිය නිදහස් කර ගන්නට කටයුතු කරන්නට ඕනෑය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. එහිදී අපි කෙටිකාලීන වශයෙන් ඒ ප්‍රදේශ තෝරා ගෙන පිරිසිදු පානීය ජලය ලබා දෙන්නට කටයුතු කරනවා වාගේම නිවැරදි සෞඛ්‍ය සිරිත් සම්බන්ධයෙන් ඉක්මනින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්, අවශ්‍ය ඖෂධ ලබා දීම, අවශ්‍ය කරන වෙනත් සහන ලබා දීම, රෝහල්වල යටිතල පහසුකම් ඉහළ නැංවීම වැනි කාර්යයනුත් අපට ඉක්මනින් කරන්නට වෙනවා. ඒ වාගේම ජල මූලාශ්‍ර විනාශ වීම හේතුවෙන් දිගුකාලීන වශයෙන් අප දැවැන්ත ප්‍රශ්නයකට මුහුණ දී තිබෙනවා. අපේ ජල සම්පත හානියට පත් වන්නේ කොහොමද, පස හානියට පත් වන්නේ කොහොමද කියන මේ කරුණු කාරණා සියල්ල ගැනම අද මේ ගරු සභාවේ කථා කළා. මේ සියලු හේතුසාධක එකතු වුණාම තමයි මේ වකුගඩු රෝගය ඇති වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි, අද පිළිකා රෝගය අපේ රටේ බහුලව පවතිනවා. හැම ගෙයක් ගානේම තිබෙන තරමට ඒ රෝගයත් දැන් බහුලව පවතින රෝගයක් බවට පත් වෙලා තිබෙනවා. දියවැඩියා රෝගය සම්බන්ධයෙන් බලාපොරොත්තු වුණු ඉලක්ක ඉක්මවා වාර්තා ලැබී තිබෙනවා. ඒ නිසා ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම, වැව් තාවුළු ආරක්ෂා කර ගැනීම වාගේම අධ්‍යාපනය මඟින් මේ පිළිබඳ දැනුම ලබා දීමේ වැඩ පිළිවෙළක් අපි ඇති කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම රසායනික පොහොර භාවිතය විශේෂයෙන්ම මේකට මූලික සාධකයක් විධියට තිබෙන බව ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් කරන ලද පර්යේෂණ - research - වාර්තාවල තිබෙනවා. ඇත්තටම ගරු සෞඛ්‍ය ඇමතිතුමා සිගරට්වල අවදානම පිළිබඳව ඒ පාරිභෝගිකයාට දැන ගන්න සිගරට් පැකට්ටුව තුළින් පණිවිඩයක් දුන්නා. ඒ වාගේ මේවායේත් නියම ප්‍රමිතිය, මේ රසායනික ද්‍රව්‍යවල තිබෙන තත්ත්වය මොකක්ද කියන එක අපි ගොවි ජනතාවට පැහැදිලි කර දෙන්නට ඕනෑ. අපේ කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද යාපා ඇමතිතුමා ඉතාමත් ප්‍රගතිශීලී තීරණයක් ගත්ත එක ගැන විශේෂයෙන්ම අපි ස්තුතිවන්ත වෙනවා. අපි වාගේ රටවල්වලට බහු ජාතික සමාගම්වලින් විශාල තර්ජනයක් තිබෙනවා. නමුත් ඉතාමත් දරුණු ගණයේ රසායනික ද්‍රව්‍ය හතරක් තහනම් කිරීම තුළින් එතුමා හොඳ තීන්දුවක් ගත්තා. ඒ සම්බන්ධයෙන් අපි ගරු ඇමතිතුමාට අපේ ස්තුතිය, ජාතියේ ස්තුතිය පළ කරන්නට ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මම යෝජනාවක් කරනවා. ඒ තහනම් කළ ඒවා වෙළෙඳ පොළේ තිබෙනවා නම් අත් අඩංගුවට ගන්න ඕනෑ. තහනම් කළ දෙයක් අත්අඩංගුවට ගන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් නීති රීති නැති වෙන්න විධියක් නැහැ. නීති රීති නැත්නම් අලුතින් නීති රීති පනවලා හරි අපේ ජනතාව ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළකට අපි යා යුතුයි කියලා මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ප්‍රමිතියෙන් යුතු පොහොර, තෙල් වර්ග ගොවීන්ට ලබා දිය යුතුයි. අපට හානිකර නොවන, නියම ප්‍රමිතියෙන් යුතු රසායනික පොහොර පාවිච්චි කරනවා නම් එහි වරදක් නැහැ. එහෙම නැත්නම් ඉතා ඉක්මනට අපේ කෘෂිකර්ම රටාව වෙනස් කරන්න ඕනෑ. කාබනික පොහොර යොදා කරන වගාව ව්‍යාප්ත කරන වැඩ පිළිවෙළ ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා මීට වසර කීපයකට කලින් පටන් ගත්තා. ඒ අනුව දැන් අපේ දිස්ත්‍රික්කවල ගොවීන් සියයට 25ක් පමණ කාබනික ක්‍රමයට වගා කරනවා. ගරු අමාත්‍යතුමනි, නමුත් එය ප්‍රමාණවත් නැහැ. අපේ ආණ්ඩුවේම ඉන්නවා, මේ සම්බන්ධයෙන් පර්යේෂණ කළ හොඳ අමාත්‍යවරයෙක්. ඒ තමයි ගරු සාලින්ද දිසානායක අමාත්‍යතුමා. එතුමා අපට මහා සම්පතක්. මේ උවදුර ව්‍යාප්ත කලින් අපේ ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාත් එක්ක එකතු වෙලා ඒ පණිවිඩය රටට ගෙන යන්නට, ගොවීන්ට දෙන්නට, ඒ තුළින් ඒ ගොවිතැන් ක්‍රමය අපේ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන්නට අපි උත්සාහ ගත්තා. එය කෙසේ හෝ කරන්න තමයි අපිත් බලාපොරොත්තු වන්නේ.

අපේ ගරු අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ ඉන්නවා. උන්වහන්සේ මේ රෝගය සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් ඇතිව කටයුතු කරනවා. ඒ වාගේ සම්පත් විශාල ප්‍රමාණයක් අපට මේ පාර්ලිමේන්තුවේ තිබෙනවා. ඒ නිසා එකිනෙකාට දොස් පවරා ගන්නවාට වඩා අපි රටක් විධියට, ජාතියක් විධියට එකතු වෙලා මේ ව්‍යසනයෙන් අපේ රට නිදහස් කර ගන්නට කටයුතු කළ යුතුය කියන යෝජනාව ඉදිරිපත් කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 5.59]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික ප්‍රශ්නයක් හැටියට පවතින, උතුරු මැද පළාත ආශ්‍රිතව පැතිර යන වකුගඩු රෝගය සම්බන්ධයෙන් අද දින සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. මා පළමුවෙන්ම කියන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙන බව. ඒ වාර්තාවට මූල්‍යමය දායකත්වය අපේ රජය ලබා දීලා තිබෙනවා. මෙම වාර්තාව සැහවීමක් හෝ ඒ වාර්තාවේ අඩංගු කරුණු යට ගැසීමක් කරනවාය කියන මතයක් විපක්ෂය මාධ්‍යය තුළින් ගෙන යන්න හදනවා අපි දැක්කා. නමුත් මෙම වාර්තාව යට ගැසීමක් කරන්න අපට කිසිම අවශ්‍යතාවක් නැහැ. මෙම වාර්තාවේ 52 වැනි පිටුවට මම අවධානය යොමු කරනවා. අපේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය මහීපාල මහත්මයා පැහැදිලිවම කියා තිබෙනවා, මෙම කටයුත්ත ඉදිරියට ගෙන යන්නට කටයුතු කරන බව. ඒ වාගේම එහි 56 සහ 57 පිටුවල සඳහන් කර තිබෙන කමිටුව සමන්විත වන්නේ අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍යවරු ඇතුළු කාර්ය මණ්ඩලයෙන්. ඒ අනුව අදාළ කමිටු පත් කිරීමට කටයුතු කර තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාව යට ගහන්න යනවාය කියලා මතයක් තිබෙනවා. නමුත් එහෙම යට ගහන්න අපට අවශ්‍යතාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මම අපේ අතිරේක ලේකම්වරයකුට උපදෙස් දුන්නා මේ වාර්තාවේ පිටපත් පහක් පාර්ලිමේන්තුවේ පුස්තකාලයට ලබා දෙන්න කියලා. හැන්සාඩ්ගත කරනවාට වඩා ඒක හොඳයි. එතකොට, අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට අවශ්‍ය වෙලාවට ඒක බලන්න පුළුවන්. ඒ නිසා වහාම ඒවා ලබා දෙන්න කටයුතු කරන්න කිව්වා. ඒකයි විය යුත්තේ. එහෙම නැතිව සෞඛ්‍ය අමාත්‍යාංශයට හෝ අපට ඒ වාර්තාව යට ගහන්න අවශ්‍යතාවක් නැහැ. ඒක වැරදි මතයක්. අපි ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට මේ රටේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කරන්නට අවශ්‍ය කටයුතු කර අපි තිබෙනවා. අද අපේ රටේ ජනතාවගේ ආයු කාලය ගත්තොත් එය දෙවැනි වන්නේ ජපානයේ ජනතාවට පමණයි. ඒ වාගේ දීර්ඝ ආයු කාලයක් අපට තිබෙනවා. ඒ වාගේම මාතෘ මරණ සංඛ්‍යාව ගත්තාම, ළමා මරණ සංඛ්‍යාව ගත්තාම ඒවා ඉතාම අඩු සංඛ්‍යාවක් බවට පත් වෙලා තිබෙනවා. අපේ රටේ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩ සටහන - National Immunization Programme - සියයට 99ක් ක්‍රියාත්මක කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් අද ඉතා හොඳ තත්ත්වයක් ඇති වී තිබෙනවා.

2013 වසරේ එකම රෝගියකුවත් නැති තත්ත්වයට මැලේරියා රෝගය අපි මැඩපවත්වා තිබෙනවා. මේවා කාලයක් තිස්සේ කටයුතු කරමින් ඉදිරියට ඒම තුළින් සෞඛ්‍ය අමාත්‍යාංශය ලබා ගත් ජයග්‍රහණ. එදා මැලේරියා රෝගයෙන් විශාල පිරිසක් මිය ගියා. වසූරිය රෝගයෙන් විශාල පිරිසක් මිය ගියා. විවිධ කාලවල, විවිධ අභියෝග මේ රටට එනවා. අද ඩෙංගු රෝගය ගැන ලොකු අභියෝගයක් තිබෙනවා.

අද අපි වකුගඩු රෝගීන් ගැන කථා කළාට, පිළිකා රෝගීනුත් 15,000ක් විතර මේ රටේ ඉන්නවා. දියවැඩියා රෝගය අරගෙන බැලුවොත්, අපේ ජනගහනයෙන් සියයට 11ක් දියවැඩියා රෝගීන් ඉන්නවා. ඒ කියන්නේ දසදෙනෙක් ගත්තොත් ඒ අයගෙන් එක්කෙනෙක් දියවැඩියා රෝගියකු බවට පත් වෙලා. ප්‍රධාන වශයෙන්ම ඒකට හේතු වෙලා තිබෙන්නේ පාරිසරික හේතු සහ ඔවුන්ගේ පුරුදු, ආහාර පුරුදු ආදී ඒ සියල්ලයි.

වකුගඩු රෝගය සම්බන්ධයෙනුත් අපේ අවධානය යොමු වුණා. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු වුණේ නැහැ කියලා අපි කියන්නේ නැහැ. 1990 දී පමණ ඒ සම්බන්ධ තොරතුරු අපට ලැබුණා. විශේෂයෙන්ම 1994 වසර තුළ ඒ පිළිබඳව අපේ අවධානය යොමු කිරීමේදී, ඒ කාල වකවානුව තුළ මහනුවර රෝහලේ වැඩ කළ විශේෂඥ වෛද්‍යවරු දෙදෙනෙක් අපි මතක් කරන්න ඕනෑ. ඒ තමයි විශේෂඥ වෛද්‍ය තිලක් අබේසේකර මහත්මයා සහ විශේෂඥ වෛද්‍ය බෙලිගස්වත්ත මහත්මයා. ප්‍රධාන වශයෙන්ම මහනුවර රෝහලට තමයි අනුරාධපුර සහ පොළොන්නරු ප්‍රදේශවල ලෙඩුඩු ආවේ. පසු ගිය දා තිබුණු සෞඛ්‍ය දිනයේදී මැදවච්චිය ප්‍රදේශයට ගිය වෙලාවේ මම මිනිසුන්ගේ ඇහුවා, කොහොමද මේ රෝගය හඳුනා ගන්නේ කියලා. ඒ අය කිව්වා "මහනුවර රෝහලට යන්න කියලා මේ වෛද්‍යතුමා අපට කිව්වා, එහෙම ගියාට පස්සේ තමයි රෝගය වැලඳිලා කියලා හඳුනා ගත්තේ" කියලා. ඒ වෛද්‍යවරුන් දෙපළ මේ රෝගය හඳුනා ගැනීම තුළ රජයට ඒ පිළිබඳව නිසි අවධානය යොමු කරන්න පුළුවන් වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එසේ අවධානය යොමු කරලා, 2000 වසර වන විට වකුගඩු රෝගය සම්බන්ධයෙන් වූ විශේෂ ඒකකයක් අපි මහනුවර රෝහලේ ආරම්භ කළා. ඒ නිසා රජය මේ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. අද ඒ ඒකකය තුළ රෝගීන් විශාල සංඛ්‍යාවකට ප්‍රතිකාර කරන්න පුළුවන් වෙලා තිබෙනවා. 1994 දී තමයි මහනුවර මහ රෝහලේ වකුගඩු පිළිබඳ දැඩි සත්කාර ඒකකය පටන් ගත්තේ. ඒ තුළ තමයි අපි ඒ විශේෂ ප්‍රතිකාර ඒකකය ආරම්භ කරලා තිබෙන්නේ. අද වන විට මහනුවර රෝහලේ දිනකට සිදු කරනු ලබන dialysis ප්‍රමාණය 70ක්, 80ක් පමණ වෙනවා. සාමාන්‍යයෙන් එක් රෝගියකු dialysis කරන්න අපි රුපියල් 6,000ක්, 8,000ක් විතර වියදම් කරන්න ඕනෑ. ඒ වාගේම සාමාන්‍යයෙන් මහනුවර මහ රෝහලේ වකුගඩු ඒකකයේ මාසයක් තුළදී වකුගඩු බද්ධ කිරීම් 12ක්, 16ක් පමණ කරනවා. ඒ එක බද්ධ කිරීමකට රුපියල් ලක්ෂ 12ක්, 15ක් පමණ වැය වෙනවා. එම සේවාව අද සම්පූර්ණයෙන්ම නොමිලයේ ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම බද්ධ කිරීමෙන් පස්සේ අපි දෙනු ලබන,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා

(மாண்புமிகு சஜித் பிரேமதாஸ)

(The Hon. Sajith Premadasa)

නැහැ, ඒක අසත්‍යයක්.

ගරු ලලිත් දිසානායක මහතා

(மாண்புமிகு லலித் திசாநாயக்க)

(The Hon. Lalith Dissanayake)

තමුන්නාන්සේ කොහොමද ඒක අසත්‍යය කියලා කියන්නේ? තමුන්නාන්සේ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමති වෙලා හිටියා. මහ ලොකුවට පස්ස උඩ දාගෙන කිව්වාට, තමුන්නාන්සේ නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ මේ රටේ ජනතාව වෙනුවෙන් අඩු ගණනේ එක dialysis machine එකක් අරගෙන දුන්නාද? සෞඛ්‍ය නියෝජ්‍ය ඇමති හැටියට අවුරුදු දෙකක් හිටියා. මම අභියෝග කරනවා. පුළුවන් නම් කියන්න, තමුන්නාන්සේ එක dialysis machine එකක් අරගෙන දුන්නාද? නැහැ. දැන් බොරුවට කෑ ගහන්න පුළුවන්. මෙතැනට ඇවිල්ලා ජනතාවට ඇහෙන්න ගිරිය පුප්පාගෙන කෑ ගහනවා. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කළත්, කොයි රෝහලටද dialysis යන්ත්‍රයක් අරගෙන දුන්නේ කියලා පුළුවන් නම් නැඟිටලා කියන්න. තමුන්නාන්සේ බොරු කියන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කියන්නම්. මට අවස්ථාව දෙන්න මම කියන්නම්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පස්සේ කියන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
"මම මෙහෙම කළා" කියලා තමුන්නාන්සේගේ කථාවේදී කියන්න තිබුණානේ. තමුන්නාන්සේ එහෙම කිව්වේ නැහැනේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1994 දී මේ පිළිබඳව වෛද්‍යවරු අපට පෙන්වා දෙන කොට මේ රජය ඊට සංවේදී වෙලා මහනුවර මහ රෝහලේ ඒ සම්බන්ධ ප්‍රධාන ඒකකය ආරම්භ කළා. ඒ තුළින් අද අපට විශාල සේවාවක් ඉටු කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ වාගේම අපි වකුගඩු රෝගීන්ව රැක ගන්නවා; නිකම් මැරෙන්න දෙන්නේ නැහැ. එක් රෝගියකු වෙනුවෙන් බෙහෙත් විශාල ප්‍රමාණයක් ලබා දෙනවා. ප්‍රධාන වශයෙන් ඔවුන්ට බෙහෙත් වර්ග 4ක් ලබා දෙන්න ඕනෑ. එම බෙහෙත් වර්ග 4ට,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Member?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සභා ගර්භය තුළ අසත්‍යය කියන්න බැහැ. අද වකුගඩු බද්ධ කිරීම සඳහා මුදල් අය කරනවා. Drugsවලට සල්ලි අය කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
රජයේ රෝහල්වල සල්ලි අය කරන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමා, අසත්‍යය කියන්න එපා. තමුන්නාන්සේ සෞඛ්‍ය සේවය හැල්ලුවට ලක් කරන්න එපා. රජයේ රෝහල්වල ශතයක්වත් අය කරන්නේ නැහැ. පුළුවන් නම් ඒක ඔප්පු කරන්න. තමුන්නාන්සේ අසත්‍යය කියන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අසත්‍යය නම් මම මන්ත්‍රීකමින් අස් වෙනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
රජයේ රෝහල්වල ශතයක්වත් අය කරන්නේ නැහැ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා, තමුන්නාන්සේගේ බෙල්ල කැපිලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
රජයේ රෝහල්වල ශතයක්වත් අය කරන්නේ නැහැ. තමුන්නාන්සේ පුළුවන් නම් ඔප්පු කරන්න. මගේ කාලය නාස්ති කරන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ඉතා සුවිශේෂ වූ සේවාවක් අපි ඉටු කරනවාය කියන එක කියන්න ඕනෑ. ඒ වාගේම සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා, රෝහල් තුළ අපි කිසිම දෙයක් කරන්නේ නැහැ කියලා. ප්‍රධාන වශයෙන් ගත්තාම මේ රටේ වකුගඩු බද්ධ කිරීම් කරන රෝහල් 7ක් තිබෙනවා. කොළඹ ජාතික රෝහල, මහනුවර මහ රෝහල, පේරාදෙණිය රෝහල, ජයවර්ධනපුර මහ රෝහල, අනුරාධපුර රෝහල, ඒ වාගේම කරාපිටිය රෝහල වාගේ රෝහල් තුළ වකුගඩු බද්ධ කිරීම් - kidney transplant - කරනවා. ඒ වාගේම මාලිගාවත්තේ අපි දැන් ආරම්භ කර තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මාලිගාවත්තට මොකක්ද වුණේ?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
දැන් අපි ආරම්භ කර තිබෙනවා. [බාධා කිරීමක්] ඒක හරි. තමුන්නාන්සේලාට ඒක කරන්න බැරි වුණා නේ. නමුත් අපි දැන් ආරම්භ කර තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අසත්‍යයක් නොවෙයි. තමුන්නාන්සේ ඇවිල්ලා බලන්න. වැස්සටවත් මාලිගාවත්තට ගොඩ වුණාද? තමුන්නාන්සේ කී වතාවක් මාලිගාවත්තට ගිහින් තිබෙනවාද? අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැතිව වාඩිවෙන්න. නියෝජ්‍ය ඇමති වෙලා හිටපු කාලයේදී එතුමා එක dialysis යන්ත්‍රයක්වත් දුන්නේ නැහැ. ඊ ළඟට අපි පැහැදිලිව කියන්න ඕනෑ, අද අපි ප්‍රධාන රෝහල් හයකට dialysis පහසුකම් ලබා දී තිබෙනවා. ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා පොළොන්නරුව රෝහලේ ඒ කටයුතු සිද්ධ වෙන්නේ නැහැ කියලා. මම පැහැදිලිව කියනවා, 2013 වර්ෂයේදී පොළොන්නරුව රෝහලේ රෝගීන් 434 දෙනෙකුට dialysis

එහෙම නැත්නම් රුධිර කාන්දු පෙරණය කරලා තිබෙනවා. [බාධා කිරීමක්] ඒ සංඛ්‍යා ලේඛන අපි ළඟ තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. එක dialysis එකකට රුපියල් 7000ක් පමණ වැය කරන්න ඕනෑ. අහිංසක ජනතාව වෙනුවෙනුයි අපි මේ නිදහස් සෞඛ්‍ය සේවය ලබා දෙන්නේ. තමුන්නාන්සේලාට කර ගන්න බැරි වුණාට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේදී අපි මේ සෞඛ්‍ය සේවා කටයුතු කරනවාය කියන එක අපි කියනවා. ඒ විතරක් නොවෙයි විශේෂයෙන්ම රුධිර කාන්දු පෙරණය සඳහා ආයතන 20ක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා නියෝජනය කරන යාපනය පැත්තෙන් ඒක පටන් ගත්තාම ආයතන 20ක ඒවා පිහිටුවා තිබෙනවා. [බාධා කිරීමක්] ඒ ගරු මන්ත්‍රීතුමාගේ පියා ජනාධිපති වශයෙන් හිටපු කාලයේදී ඔබතුමා නියෝජනය කරන යාපනය ප්‍රදේශයට යන්නවත් බැරි වුණා. ප්‍රභාකරන් තමයි මැයි මාසයේ පළමු වැනි දා එතුමාගේ තාත්තා මැරෙව්වේ. ඒ කාලයේ යාපනයට යන්නවත් බැරි වුණත් අද යාපනයේ එවැනි ආයතන 6ක් පිහිටුවා තිබෙනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ කථා කරන්න එපා. මහ පාරේ තමයි තමුන්නාන්සේ ගේ පියා කොටින් විසින් මරා දැම්මේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තමුන්නාන්සේ ඒක මතක තියා ගන්න. යාපනයේ dialysis යන්ත්‍ර -රුධිර කාන්දුපෙරණ යන්ත්‍ර - භයක් තිබෙනවා. අනුරාධපුරයේ 24ක් තිබෙනවා; බදුල්ලේ 27ක් තිබෙනවා. ප්‍රධාන වශයෙන් තිබෙන ඒවා තමයි මම මේ කියන්නේ. මාලිගාවත්තේ 10ක් තිබෙනවා; කරාපිටියේ 13ක් තිබෙනවා. මේ විධියට යන්ත්‍ර 170කට වැඩි ප්‍රමාණයක් අපට තිබෙනවා. මීට අමතරව නව වැඩසටහන යටතේ තවත් dialysis යන්ත්‍ර 65ක් මිලට ගන්න මුදල් වෙන් කර තිබෙනවා. ඒ නිසා මේ රටේ වකුගඩු රෝගීන් මියැදෙන්නට අපි කටයුතු කරන්නේ නැහැ. කාලයක් මේ රටේ ජනතාව මැලේරියාව රෝගයෙන් මිය ගියා. වෙන රෝග නිසා මිය ගියා. 88, 89 කාලයේදී තමන්ගේ පක්ෂයට විරුද්ධව ජන්දෙ ඉල්ලපු මිනිස්සුන් මරපු කාලයක් තිබුණා.

අද අපේ රජය යටතේ තිබෙන මිහින් ලංකා ආයතනය ගැන තමුන්නාන්සේලා කථා කරනවා. මේ රටේ බස්වලට ගිනි තියපු කාලයක් තිබුණා. එහෙම නොවෙන්න ඒවා ප්‍රයෝජනයට අරගෙන මේ රට දියුණු කරන්න අවස්ථාව තිබුණා. අපි මේවා කියන්නේ මේ රටේ නිදහස් සෞඛ්‍ය සේවාව වෙනුවෙන් මේ රටේ වෛද්‍ය කාර්ය මණ්ඩලය ඇතුළු අනිකුත් කාර්ය මණ්ඩලය සුවිශේෂී සේවාවක් ඉටු කරන බව කියන්නයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තවත් කරුණක් ගැන කියන්න ඕනෑ. විශේෂයෙන්ම මෙතුමන්ලා අනුරාධපුර, පොළොන්නරුව ප්‍රදේශ ගැන අවධානය යොමු කළා. ඒ ප්‍රදේශවල විශාල ප්‍රශ්නයක් තිබෙනවාය කියා මෙතුමන්ලා මවා පාන්න හැදුවා. ඒ සම්බන්ධ වාර්තා මම ඉදිරිපත් කරනවා. 2009 - 2012 කාලයේදී අපි ගෙයින් ගෙට ගිහිල්ලා සංඛ්‍යා ලේඛන ගත්තා. මැදවච්චිය, රඹෑව, කැබිතිගොල්ලෑව කියන ප්‍රදේශවල තමයි දිවයිනේ වැඩියෙන්ම වකුගඩු රෝග තිබෙන ප්‍රදේශ වශයෙන් හඳුනා ගෙන තිබෙන්නේ. මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනගහනය 50,141යි. 2009 - 2012 කාලයේදී ඒ ප්‍රදේශයේ මුළු රෝගීන් සංඛ්‍යාව - 1945යි; රඹෑව ප්‍රදේශයේ මුළු රෝගීන් සංඛ්‍යාව - 786යි; කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ මුළු රෝගීන් සංඛ්‍යාව - 786යි. මැදවච්චිය, රඹෑව, කැබිතිගොල්ලෑව කියන ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනේ මුළු රෝගීන් සංඛ්‍යාව - 3517යි. 2003-2012 දක්වා මිය ගොස් තිබෙන රෝගීන් සංඛ්‍යාව - 826යි. තමුන්නාන්සේලා නිකම් මේ අසත්‍ය ප්‍රකාශ කළාට වැඩක් වෙන්නේ නැහැ. මේවා ගෙයින් ගෙට ගිහිල්ලා ගත්තු තොරතුරු. [බාධා කිරීමක්] තමුන්නාන්සේට නැගිටලා කෑ ගහන්න පුළුවන්. වේදිකාවේ කියන්න පුළුවන්. මේවා අපි ගෙයින් ගෙට ගිහිල්ලා ගත්තු සංඛ්‍යා ලේඛන තොරතුරු.

පන්දම් පත්තු කරලා විදුලිය ගැන පෙන්වන්න ආවා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අපේ ජනාධිපතිතුමා ඒකට විසඳුමක් ගෙනාවා. අද පත්තු කරන්න පන්දමක් නැහැ. අද මේ රටේ 1-30 දක්වාත් 60-90 දක්වාත් විදුලි ඒකක ප්‍රමාණයක් පාවිච්චි කරන අයට කිසිම ගාස්තු වැඩි කිරීමක් නැහැ. මැයි දිනයට කම්කරු ජනතාව කොළඹට ගෙන්වන්න බැරි තමුන්නාන්සේලාගේ විරුද්ධ පාර්ශ්වය මොකටද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පැහැදිලිව කියනවා, විශේෂයෙන්ම මේ වකුගඩු රෝගය මේ රටේ සෞඛ්‍ය අංශය විසින් අවධානය යොමු කළ යුතු රෝගයක් බව. ඒ රෝගය වැළැක්වීම සඳහා අපි කටයුතු කර තිබෙනවා කියන එකත් අපි කියන්න ඕනෑ.

අනුරාධපුර ප්‍රදේශයේ මේ රෝගයෙන් මිය යන අයගේ මරණ සංඛ්‍යාව ගත්තොත් පෙනෙනවා, ඒ ප්‍රදේශය තුළ මේ රෝගය ව්‍යාප්ත වීමක් තිබෙන බව. එය වැළැක්වීමට අපි කටයුතු කර තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවට අනුව රසායනික ද්‍රව්‍යය පසට, ජලයට, විවිධ ආහාර වර්ගවලට මුසු වන බව පැහැදිලිවම සඳහන් වෙලා තිබුණා. අපි නිකම් සිටියේ නැහැ. අපේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සම්බන්ධ කර ගෙන කමිටුවක් හදලා, ඒ කමිටුවෙන් කීන්දු ගත්තා. අපි කොම්පැනිකාරයන්ට යට වුණේ නැහැ. අපේ කෘෂිකර්ම අමාත්‍යතුමා මේ වන විට අවශ්‍ය නිර්දේශ ලබා දී තිබෙනවා. සෞඛ්‍ය ලේකම්තුමා පැහැදිලිවම, 2013 අප්‍රේල් 18 වන දින "carbofuran, carbaryl, propanil, chlorpyrifos" කියන මේ පළිබෝධ නාශකයන් සම්පූර්ණයෙන් තහනම් කරලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කියන හැම දේම වෙළෙඳ පොළේ තිබෙනවා. ඔය අසත්‍ය කියන්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, now wind up please. Your time is over.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් එක් දෙයක් කියන්න ඕනෑ. අපේ මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යතුමා ප්‍රමුඛ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්, සිගරට් පැකට් එකේ පිළිකා රෝගය සම්බන්ධව digital print එකක් ඇතුළත් කරන්න ගියාම ඒ ගොල්ලෝ උසාවි ගියා. අදත් ඒ බහුජාතික සමාගම් එක්ක අපි නඩු කියනවා. අපේ ගරු ඇමතිතුමාත්, මමත් ඒ සම්බන්ධයෙන් උසාවි ගියා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශය අනුව පිළිකා රෝගය සම්බන්ධයෙන් digital print එකක් ඇතුළත් කරන්න ගියාම ඒ කොම්පැනිකාරයෝ නඩු දාලා සුප්‍රීම් උසාවියට ගියා. මමත් ඇමතිතුමාත් උසාවියට ගිහින් කරුණු කිව්වා. ඒ වාගේම තමයි මේක එක පාරටම කෘෂිකර්ම ඇමතිතුමාට තහනම් කරන්න බැහැ. දැන් තහනම් කරලා තිබෙනවා. ඊළඟට අපි අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්න ඕනෑ, ඉතුරු ටිකත් තහනම් කරන්න. මොකද, මේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාව අනුව අපට එය කරන්න පුළුවන්. අපි මේවා පියවරෙන් පියවර ක්‍රියාත්මක කරනවා.

[ගරු ලලිත් දිසානායක මහතා]

තමුන්නාන්සේලා වාගේ අපි නිදාගෙන සිටියේ නැහැ. මේ වකුගඩු රෝගයෙන් පීඩා විඳින අයට සහනයක් ලබා දෙන්න අපි කටයුතු කරනවා කියන එක කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තවත් එක දෙයක් කියන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
එකම සහනය මරණය.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
තමුන්නාන්සේලා තමයි මැරුවේ.

අපි පැහැදිලිව කියන්න ඕනෑ, ප්‍රාථමික සෞඛ්‍ය සේවා ප්‍රතිපාදන අපි අරන් තිබෙන බව. අපි රුපියල් මිලියන 25ක් ඊයේ පෙරේදා ලබා ගත්තා, වකුගඩු රෝග නිවාරණයට හා වැළැක්වීමට. ඒ කියන්නේ මුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ලේම අපි සමීක්ෂණයක් ආරම්භ කරලා, උතුරු මැද පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අදාළ පුද්ගලයන් පරීක්ෂණයට ලක් කරලා ඔවුන් ගැන සොයා බලන්න, ඒ පරීක්ෂණ කරන්න අපි ඒ මුදල් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම නිකවැව රෝහල උතුරු මැද පළාතට අවශ්‍යම රෝහලක් කියලා කිව්වා. නිකවැව රෝහල සංවර්ධනය කරන්න සම්පූර්ණ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 327යි. ඒ රුපියල් ලක්ෂ 327 ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මැදවච්චිය රෝහලට අවශ්‍ය රුධිර කාන්දුකරණ යන්ත්‍ර පහසුකම් ලබා දෙන්න අපි මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. අපි නව සහකාර ලේකම්තුමියක් පත් කරලා -අපේ රාජිත සේනාරත්න ඇමතිතුමාගේ නෝනා මහත්මියවයි පත් කරලා තිබෙන්නේ.- සියලු සම්බන්ධීකරණ කටයුතු කරලා දැනටමත් අපි උතුරුමැද පළාත ඇතුළු මුළු රටේම තිබෙන මේ වකුගඩු රෝග ප්‍රශ්නය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න රජය හැටියට පියවර අරගෙන තිබෙනවා කියන එක මම මතක් කරනවා. ඒ නිසා කොච්චර බල්ලෝ බිරුවත් අපේ මේ ගැල ඉස්සරහට යනවා; අපේ ආණ්ඩුව ඉස්සරහට යනවා. ඒ නිසා මොනවා කිව්වත් අපි ඒවා ගණන් ගන්නේ නැහැ. ජනතාවටයි අපි වැඩ කරන්නේ. අපි ඉන්නේ ජනතාවත් එක්කයි. කවුරු මොනවා කිව්වත් අපට ප්‍රශ්නයක් නැහැ, ජනතාවත් එක්ක අපි ඉන්නවා.

[අ.භා. 6.16]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන - කමත්තොෆිල් අමෛච්සර්)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විහිළුවට ලක් කළාට ඉතාමත් වැදගත් මාතෘකාවක් අද සාකච්ඡා කළේ.

වකුගඩු රෝගය සම්බන්ධයෙන් අපි කථා කරනවා නම් මේ හදුනා නොගත් වකුගඩු රෝගය අපේ රටේ විතරක් නොවෙයි, තවත් රටවල් රාශියක තිබ්ලා තිබෙනවා. එල් සැල්වදෝරය, නිකරගුවාව, හොන්ඩුරාස්, කොස්ටා රිකා, ගෝතමාලා, පැනමා, ඩොමිනිකන් මේ රාජ්‍යයන්වලත් හදුනා නොගත් වකුගඩු රෝගය ප්‍රශ්නයක් හැටියට ව්‍යාප්ත වෙලා තිබෙනවා. නමුත් ඒකේ ප්‍රශ්නය තිබෙන්නේ මේ රටවල් සියල්ලම කෘෂිකර්මාන්තය හා සම්බන්ධ රටවල් වීමයි. ඒ නිසා අපි මේ ගැන අවධානය යොමු කිරීම ඉතාමත්ම වැදගත් වනවා. පසු ගිය කාල වකවානුවේ- [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා කියන්න, ආසනික් ශරීර වර්ධනයට අවශ්‍යද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
මා ඔබතුමාට බාධා කළේ නැහැ. කරුණාකරලා ඔබතුමා මගේ කථාව කර ගෙන යන්න මට ඉඩ දෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වකුගඩු රෝගය මේ රටේ වාර්තා වුණේ 1994 අවුරුද්දේදී. 1994 අවුරුද්දේ වාර්තා වුණු වකුගඩු රෝගය ක්‍රමක්‍රමයෙන් වැඩි වෙලා 2000 වසර වන කොට රෝහලක් ප්‍රතිෂ්ඨාපනය කිරීමට වෙනමම අංශයක් ප්‍රතිෂ්ඨාපනය කිරීමට තරම් -අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ- ඒ රෝග ව්‍යාප්තිය වැඩි වුණා. ඒ නිසා මේ සම්බන්ධයෙන් හේතු කාරක සොයන්න විවිධාකාරයේ පර්යේෂණ විවිධ අවස්ථාවල කෙරුණා. ඒකට අපේ රජය නිකම් හිටියේ නැහැ. මේ රටේ ආණ්ඩුව නිකම් හිටියේ නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශය නිකම් හිටියේ නැහැ. ඒ ගැන හොඳට සොයා බැලුවා, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, තහනම් කරපු පොහොර වෙළෙඳ පොළේ තවම තිබෙනවා. ඇයි තවම තිබෙන්නේ?

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් දිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
ඒ පොහොර ගෙනාවේ තමුන්නාන්සේලා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
වකුගඩු රෝගය ව්‍යාප්තිය සම්බන්ධයෙන් තව වන තුරුත් නිශ්චිත තීරණයක් දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. දැන් වකුගඩු රෝගය සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාර්තාව සකස් කරන්න මුදල් යෙදෙව්වේ අපේ රජය. අපේ රජයත් ඒකට දායක වුණා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මුදල් යොදවලා වාර්තාව හැංගුවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
වාර්තාවේ හංගන්න දෙයක් නැහැ. වාර්තාවක් කියන්නේ ප්‍රසිද්ධ ලියවිල්ලක්. ඒක හංගන්නේ කොහොමද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඒ අසත්‍යය. මාස 22ක් හැංගුවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒක හංගන්න කිසිම අවශ්‍යතාවක් තිබුණේ නැහැ. හංගපු දෙයක් නැහැ නේ. දැන් තමුන්නාන්සේලා දැකලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
දැන් තිබෙනවා. මාස 22කට පස්සේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ වාර්තා අපි හැංගුවේ නැහැ. ඒක හංගන්න කාටවත් අවශ්‍යතාවක් තිබුණෙත් නැහැ. ඒ වාර්තාව සකස් කිරීමේ කටයුත්ත කළේ අපේ රජයේ මුදල් වියදම් කරලායි. ඒක රජයට හංගන්න අවශ්‍ය නැහැ. අපි දැන් ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග ගන්නවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මාස 22කට පස්සේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)
Carbofuran රසායනික ද්‍රව්‍යය තහනම් කරන්න කියලා අපට කිව්වේ ඒ රසායනික ද්‍රව්‍යවල තිබෙන සංඝටක රෝගීන්ගේ- [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
අද සභාගත කරනවාද වාර්තාව?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)
-වකුගඩුවල තිබුණයි කියලා වාර්තා වුණ නිසා. එහෙම නැතුව ඒකේ සම්බන්ධතාවක් තිබුණයි කියලා අපට කෙළින්ම කියපු නිසා නොවෙයි. ඒ සංඝටක එම රෝගීන්ගේ වකුගඩුවල තිබුණයි කියලා හඳුනා ගත්ත නිසා තමයි ඒවා වහාම තහනම් කළේ. ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. කෝ තහනම?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගෙන්වන්න තහනම් කරලායි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීමක්] ඒවා විතරක් නොවෙයි, අපි සොයා ගත්ත තොරතුරු අනුව ඒ රෝගීන්ගේ වකුගඩුවල තිබුණු සමහර සංඝටක මේ රටේ කවදාකවත් භාවිත නොකරපු කෘමි නාශක හා වල් නාශක වර්ගවල ඇතුළත් ඒවා. ඒවා කොහොමද ආවේ? ඒවා කොහොමද ආවේ? ඒවාත් තිබුණා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ආසනික්.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)
එම නිසා තවම ඒ සම්බන්ධව නිශ්චිත තීරණයක් නැහැ. ඒ ගැන අපට එන වාර්තාවල හැටියට, ඒ එන තොරතුරුවල හැටියට ගත යුතු ක්‍රියාමාර්ග සියල්ලම මේ වන කොට අපි අරගෙන තිබෙනවා. එම නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේට මා කියනවා -අපේ ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ- මේ වැඩසටහනේදී ගත යුතු ක්‍රියා මාර්ගවලදී කොයි වෙලාවකවත් අපේ රජය පැකිළිලා නැහැ; පස්සට ගිහිල්ලා නැහැ; කරන්න ඕනෑ සියල්ලම කර තිබෙනවා කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
පැකිළිලා නැහැ හැකිළිලා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෘෂි කර්මාන්තයේදී රසායනික පොහොර භාවිතය සම්බන්ධයෙන් චෝදනා එල්ල කරන නිසා මේ සම්බන්ධයෙන් මා කථා කරන්නට ඕනෑ. මොකද, පොහොර සහනාධාරයක් රජය විසින් දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
බාල පොහොර.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)
සියයට අනූවක්- [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
බාල පොහොර සහනාධාරයක්.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්ධන)
(The Hon. Mahinda Yapa Abeywardena)
තමුන්නාන්සේලා ඒ පොහොර සහනාධාරය බාල කරන්න මහන්සි ගත්තේ අද ඊයේ නොවෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
පොහොර බාලයි.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒ සභනාධාරය දෙන දවසේ ඉඳලා හැල්ලු කරන්න මහන්සි ගත්තා. රජය දෙන ඒ සහනයේ තිබෙන වටිනාකම බාල්දු කරන්න තමුන්නාන්සේලා මහන්සි ගත්ත එක ඇත්ත. ඒක අපි දන්නවා. ඒක තමුන්නාන්සේලා කළ යුතු දෙයක්. තමුන්නාන්සේලාගේ පැවැත්මක් නැහැ ඒක නැති නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොරු කියන්න එපා. අඩු මිලට පොහොර-

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අපේ රජය ආඩම්බරයෙන් කියනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ පොහොර සහනාධාරය අපේ රජය ගෙන ගිය ඉතාම වැදගත් ක්‍රියාවලියක් බව. ඒ වාගේම අනාගතයේදීත් අපි ඒ වැඩ පිළිවෙළ ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරනවා. නමුත් අපි එකකදී ප්‍රවේශම් වනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොහොර කොහොමද ගෙන්වන්නේ?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
පොහොර ගෙන්වන්නේ, ලෝකයේ විවෘත ටෙන්ඩර් මඟින්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බාල පොහොර.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අපි ගෙන්වන හැම පොහොර තොගයක්ම අපි හතර වතාවක් පරීක්ෂා කර බලලයි රට ඇතුළට ගන්නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා වහගෙන ඉන්නවා ඇති. අපි වහගෙන නැහැ. අපි ඇරගෙන ඉන්නේ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට තිබෙන ප්‍රශ්නය මෙයයි. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, මෙහිදී පිළිතුරු දෙන්න බැරි නිලධාරියකුට ඔබතුමා අභූත චෝදනා එල්ල කරන්න එපා. රජයේ නිලධාරියකුට එහෙම කථා කරන එක ඔබතුමාට තරම් වටින්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon.Sajith Premadasa. What is your point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් ජනරාල් කියා තිබෙනවා, ශරීරයේ වර්ධනයට ආසනික් ඕනෑය කියලා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Azwer? - [*Interruption.*]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මෙතැනට ඇවිල්ලා පිළිතුරු දෙන්න බැරි නිලධාරියකුට - [බාධා කිරීම්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I think the Hon. Sajith Premadasa is suffering from a kidney disease. Therefore, he must be referred to a doctor immediately. He is continuously disturbing. He cannot do that. - [*Interruption.*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. - [*Interruption.*] - Hon. Sajith Premadasa, please sit down.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ අවස්ථාවේදී කියනවා, - [බාධා කිරීමක්] මගේ නිලධාරියා තමයි. මම ආරක්ෂා කරන නිලධාරියා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer and Hon. Sajith Premadasa, both of you please sit down. Hon. Minister, you have only five more minutes.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම අවස්ථාවේදී ලෝක ආහාර සංවිධානයේ වගුවක් මා ඉදිරිපත් කරනවා. ලෝක ආහාර සංවිධානය මඟින් ප්‍රසිද්ධ කරන ලද වගුවක් අපේ රටේ භාවිත කරනවා. ලෝකයේ වැඩියෙන්ම පොහොර භාවිත කරන රටක් හැටියට තමයි ශ්‍රී ලංකාව සඳහන් වන්නේ. ඒක වැරැදියි. මේ වගුවේ හැටියට ඇමෙරිකාවේ භාවිත කරන යූරියා පොහොර ප්‍රමාණය වාගේ දෙගුණයක් අපි භාවිත කරනවා. චීනයේ භාවිත කරන යූරියා පොහොර ප්‍රමාණය වාගේ දෙගුණයක් අපි භාවිත කරනවා. ඒක තමයි මා කිව්වේ. ලෝක ආහාර සංවිධානය මඟින් ඉදිරිපත් කර තිබෙන වගුව දිහා බැලුවාම අපට පෙනෙනවා, අපි අනවශ්‍ය විධියට පොහොර භාවිත කරනවා, අපේ නිර්දේශයන් වැරැදියි කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ආසනික් පොහොර.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා - [බාධා කිරීමක්] පොහොර සම්බන්ධ විෂයය මට ලැබුණේ දැනට මාස 3කට පමණ කලින්. ඊට පස්සේ මම -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
දැන් ආසනික් නැද්ද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
එම නිසා මේ පොහොර නිර්දේශය අපි නැවත වාරයක් සංශෝධනය කළා. එය සංශෝධනය කළ විටත් අපේ හිතවත් ගරු මන්ත්‍රීතුමන්ලා කෑ ගහනවා, "ආණ්ඩුවට පොහොර දෙන්න බැහැ. එම නිසා සහනාධාරය කපන්න යනවා"යි කියලා. ඒක තමයි ඒ ගොල්ලන්ගේ ජීවිතය. ඒ ගොල්ලන්ගේ ජීවිතය ඒකයි. පොහොර නිර්දේශය -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
බාල පොහොර දෙන්නේ ඇයි?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒක තමයි මා කිව්වේ. පොහොර සහනාධාරය බාල කරන්න තමුන්නාන්සේලා හැම දාම මහන්සි ගන්නවා. ඒක ස්වාභාවිකයි. මේ රජය මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන කල් තමුන්නාන්සේලාට අනාගතයක් නැහැ. ඒක හැල්ලු කරන්න, ඒක බාල කරන්න, ඒක පහළට දමන්න එපා කියලායි තමුන්නාන්සේලාට මා කියන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
බාල පොහොර. ආසනික පොහොර.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ගෙන ගිය මේ වැඩ පිළිවෙළ -ගොවි ජනතාව වෙතට ගෙන ගිය ප්‍රචාරය හා ඒ පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම- නිසා පසු ගිය කාල වකවානුවේ රසායනික පොහොර භාවිතය වාගේම රසායනික ද්‍රව්‍ය භාවිතයත් අඩු වුණා. තමුන්නාන්සේට මා වගුවක් පෙන්වනවා. මෙය 2008 සිට 2011 දක්වා සකස් කර තිබෙන වගුවක්. මෙහි තමුන්නාන්සේට පැහැදිලිව පෙනෙනවා, මේ වර්ෂවල රසායනික ද්‍රව්‍ය භාවිතය කොපමණ අඩු වෙලා තිබෙනවාද කියලා. ඒ කියන්නේ ජනතාව දැන් දන්නවා. අපි ගෙන ගිය ප්‍රචාරයේ ප්‍රතිඵලයක් තිබෙනවා. ඒ ප්‍රතිඵලය තමයි, මේ හේතුව නිසා ජනතාව දැන් එන්නේ නැති එක.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
පොහොර සහනාධාරය කිලෝග්‍රෑම් 60කින් අඩු කළා නේ, ලජ්ජා නැතුව.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
දැන් අනික් පැත්තට කථා කරනවා. තමුන්නාන්සේ මෙපමණ වෙලා කිව්වා, පොහොර බාලයි කියලා. දැන් තමුන්නාන්සේ කියනවා, පොහොර සහනාධාරය අඩු කළාය කියලා. පොහොර සහනාධාරය අඩු කළා නොවෙයි. අවශ්‍ය ප්‍රමාණයට දෙන්නයි මේ කථා කරන්නේ. ඒක නේ කියන්නේ, දෙපැත්තට කථා කරනවා කියලා. එක සැරයක් මේ පැත්තට කථා කරනවා. අනික් සැරේ ඒ පැත්තට කථා කරනවා. ඔහොම කථා කරලා තමුන්නාන්සේට කවදාවත් මේ රටේ බලයට එන්න බැහැ. ඒකනම් මම කියන්නම්. තමුන්නාන්සේ ඒ තරම් බංකොලොක් තත්ත්වයට වැටිලා අතට හසු වන ඕනෑම එකකින් දමා ගහනවා. අතට හසු වන ඕනෑම දෙයකින් දමා ගසන තත්ත්වයට එතුමා පත් වෙලා තිබෙනවා. එතුමා ඒ තරම් frustrated. ඒකයි වෙලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
I am not at all frustrated, but you are frustrated.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමා frustrate වෙලා තිබෙන තරම මට දැන් තේරෙනවා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේවාට පැටලෙන්න අවශ්‍ය නැහැ. නමුත් අපේ රටට යම් යම් අහිතකර දේවල් නොපැමිණෙනවාය කියලා අප කාටවත් කියන්න බැහැ. කෘමි නාශක, වල් නාශක භාවිතයෙන් මහජන සෞඛ්‍යයට හානියක් නොවනවාය කියලා කාටවත් කියන්න බැහැ. ඒ ගැන අපි කියන්නේ නැහැ. එහෙම වෙනවා. මේවා ප්‍රවේශමෙන් පාවිච්චි කරන්න කියලා හැම දැන්වීමකම, රූපවාහිනී දැන්වීමකම යොදන්නේ එම නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහි අවධානමක් තිබෙන බව අපි කියන්නට ඕනෑ. අපි ඒ අවධානම පිළිබඳව පැහැදිලිව, නිවැරැදි කල්පනාවෙන් මේ රටේ ජනතාව දැනුවත් කළ යුතුව තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
'අවධානම' නොවෙයි 'අවදානම' යි. සිංහල භාෂාව හරියට උච්චාරණය කරන්න. 'අවධානම' නොවෙයි, 'අවදානම' යි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීමක්]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
පොහොර අධිභාවිතයත්, ඒ වාගේම අවභාවිතයත් කියන දෙකම අපේ රටේ අනාගතයට, අපේ රටේ මේ ප්‍රශ්නයට බලපානවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. [බාධා කිරීමක්] මේ කාරණය විතරක් නොවෙයි. අපි අවධානයට ලක් කළ යුතු තවත් එක කාරණයක් තිබෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, 6.30ට අපි adjourn කරන්න ඕනෑ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි පහක කාලයක් ඕනෑ. මගේ කාලය එතුමා ගත්තා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No. We want to adjourn the House at 6.30 p.m.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලාගේ අවධානයට ලක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. දැන් මේ රටට ගෙන්වන කිරි පිටි පවා නැවත වාරයක් පරීක්ෂණයට ලක් කළ යුතුව තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි එකතු වෙලා තව කාලය දෙමු,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කථා කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියවන්න තවත් වෙලාව දෙන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ විවිධ නම්වලින් කිරි පිටි විකුණනවා. ඒවායේ විවිධ රසායනික ද්‍රව්‍ය ගැබ් වෙලා තිබෙනවා. Internet එකේ තිබෙන වාර්තාවකයි එසේ සඳහන්ව තිබෙන්නේ. නවසීලන්තයේ තණ කොළ වවන්න ගහපු රසායනික ද්‍රව්‍ය නිසා ඒ තණ කොළ ආහාරයට ගත්ත සතුන්ගෙන් වෙනත් හානිකර ද්‍රව්‍ය මේ කිරිවලට ඇතුළු වෙලා තිබෙනවා. ඒ ගැන පර්යේෂණ කරලා තිබෙනවා. දැන් එක එක්කෙනා ඒවා යටපත් කරනවා. ඒ පිළිබඳවත් අපේ ජනතාවට කියන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමනි, ඕවා තණ කොළ කාලා කියන කථා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
පිට රටින් ගෙන්වන කිරි පිටි භාවිතය පුළුවන් තරම් අඩු කරන්න. එම කිරි පිටිවල නොයෙක් විෂ ජාති ඇතුළු වෙලා තිබෙනවා. වකුගඩු රෝගය සඳහා මේවා සියල්ල හේතු වෙන්න පුළුවන්. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා දැන් කෑ ගහනවා. වකුගඩු රෝගය අපි හඳුනා ගත්තේ 1994 දීයි. අපි 2000 වන කොට ඒ සම්බන්ධයෙන් විශේෂ ඒකකයක් මහනුවර පටන් ගත්තා. එතුමා සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටියා. නමුත් මේ රෝගය වෙනුවෙන් එතුමා කරපු කෙංගෙඩියක් නැහැ. දැන් ඇවිල්ලා කථා කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, now, wind up, please.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මෙකැනට ආවේත් විවිධාකාරයේ පොරොන්දු දීලායි. නමුත් එහෙම නොවෙයි වෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කථාවේ ඉතිරි කොටස table කරන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය, රටක් හැටියට අපි මුහුණ දිය යුතු බරපතළ ප්‍රශ්නයක්. අපි මේ ගැන කල්පනා කරන්න ඕනෑ. අපේ රටේ මේ වැඩ පිළිවෙළ - [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බාල පොහොර ගෙන එන එක නතර කරන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
තමුන්නාන්සේ බාල විධියට සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් වැඩ කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසාම අපි ගත්තු පියවරවල සාර්ථක ප්‍රතිඵල තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමනි, බාල පොහොර ගෙන එන එක නතර කරන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අපි කෘමි නාශක, වල් නාශක භාවිතය අඩු කරලා තිබෙනවා. අපි පොහොර භාවිතයත් අඩු කරගෙන යනවා. ඒ වාගේම මේ රසායනික ද්‍රව්‍ය මිශ්‍ර වෙලා එන වෙනත් ආහාර ද්‍රව්‍ය ගැනත් අපි පරීක්ෂණයට ලක් කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමනි, කොමිස් පොහොර ගෙන එන එකත් නතර කරන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒ වාගේමයි සීනි. මේ කියනවාටත් වඩා ආසනික් ප්‍රමාණයක් පිට රටින් ගෙන්වන සුදු සීනිවලත් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේවා ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ. කිරි පිටිවල ආසනික් තිබෙනවා. මේ කිරි පිටි අපේ දරුවන්ට දෙන්න එපා කියලා මා කියනවා. ඒ තරම් අද-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කොහේද යන්නේ මල්ලෙ පොල්.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒක නේ මා කියන්නේ. තමුන්නාන්සේ රෝගයක් ගැන කථා කරනවා, ශරීරයේ-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, the time is over. I am going to adjourn the House.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මේ මන්ත්‍රීතුමා, අසනීපය ගැන කථා කරනවා. නමුත් අවශ්‍යතාව ගැන කථා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තූතියි.

එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2013 මැයි 21 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2013 மே 21 செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது

It being 6.30 p.m., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament without Question put.*

Adjourned accordingly until 1.00 p.m. on Tuesday, 21st May, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.